The Hon. (Dr.) Dammika Patabendi (Chairman), The Hon. Anton Jayakody, The Hon. Eranga Gunasekara, The Hon. Asoka Sapumal Ranwala, The Hon. Dilip Wedaarachchi, The Hon. (Mrs.) Rohini Kumari Wijerathna, The Hon. Kins Nelson, The Hon. W.H.M. Dharmasena, The Hon. (Mrs.) Sagarika Athauda, The Hon. (Prof.) L.M. Abeywickrama, The Hon. (Dr.) Nihal Abeysinghe, The Hon. Upul Kithsiri, The Hon. (Dr.) Jagath Gunawardana, The Hon. Ruwanthilaka Jayakody, The Hon. Padmasiri Bandara, The Hon. Manoj Rajapaksha, The Hon. (Mrs.) Hasara Liyanage, The Hon. (Mrs.) Deepthi Wasalage, The Hon. Priyantha Wijerathna, The Hon. Asitha Niroshana Egoda Vithana, The Hon. (Dr.) Elayathamby Srinath, The Hon. Aravinda Senarath, The Hon. Bhagya Sri Herath

Ministerial Consultative Committee on Buddhasasana, Religious and Cultural Affairs

The Hon. (Dr.) Hiniduma Sunil Senevi (Chairman), The Hon. Gamagedara Dissanayake, The Hon. (Dr.) Nalinda Jayatissa, The Hon. Gayantha Karunathilleka, The Hon. Nihal Galappaththi, The Hon. Lakshman Nipuna Arachchi, The Hon. Nayana Wasalathilaka, The Hon. (Ms.) Krishnan Kalaichelvi, The Hon. Chaminda Lalith Kumara, The Hon. Rajeevan Jeyachandramoorthy, The Hon. Sugath Wasantha de Silva, The Hon. Sujeewa Dissanayake, The Hon. (Prof.) Sena Nanayakkara, The Hon. Nishantha Perera, The Hon. Lal Premanath, The Hon. Nanda Bandara, The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga, The Hon. Jagath Manuwarna, The Hon. Manjula Sugath Rathnayaka, The Hon. Thurairasa Ravikaran, The Hon. Fasmin Sharif

Ministerial Consultative Committee on Justice and National Integration

The Hon. Harshana Nanayakkara (Chairman), The Hon. Muneer Mulaffer, The Hon. Rauff Hakeem, The Hon. G.G. Ponnambalam, The Hon. U.P. Abeywickrama, The Hon. M.K.M. Aslam, The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, The Hon. (Mrs.) Chamindranee Kiriella, The Hon. Sarath Kumara, The Hon. (Mrs.) Nilanthi Kottahachchi, The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, The Hon. (Mrs.) Thushari Jayasingha, The Hon. (Mrs.) Anushka Thilakarathne, The Hon. Susantha Dodawatta, The Hon. (Prof.) Sena Nanayakkara, The Hon. Chithral Fernando, The Hon. (Dr.) S. Sri Bavanandarajah, The Hon. Priyantha Wijerathna, The Hon. (Mrs.) Hiruni Wijesinghe, The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara, The Hon. Chandima Hettiaratchi, The Hon. Bhagya Sri Herath

PARLIAMENT

THE SPEAKER - The Hon. (Dr.) Jagath Wickramaratne
THE DEPUTY SPEAKER AND CHAIRMAN OF COMMITTEES - The Hon. (Dr.) Rizvie Salih
THE DEPUTY CHAIRPERSON OF COMMITTEES - The Hon. (Mrs.) Hemali Weerasekara

PRINCIPAL OFFICIALS

SECRETARY-GENERAL OF PARLIAMENT – Mrs. K.A. Rohanadeera
CHIEF OF STAFF AND DEPUTY SECRETARY-GENERAL OF PARLIAMENT- Mr. G.K.A. Chaminda Kumara Kularatne
ASSISTANT SECRETARY-GENERAL - Mr. A. H. M. H. H. S. Abeyrathne

OFFICE OF THE SECRETARY-GENERAL OF PARLIAMENT

CO-ORDINATING SECRETARY TO THE SGP - Mrs. S.P. Gamage
PARLIAMENTARY OFFICER - Mrs. E.A. Sirisena
CONSTITUTIONAL COUNCIL - Mrs. S.R.W. Gunasekara, Miss. D.I.T. Sarathchandra, Mrs. C.S.C. Fonseka (Assistant Principal Officers)

INTERNAL AUDIT OFFICE

CHIEF INTERNAL AUDITOR – Mr. W.K.D.C. Withana
PRINCIPAL OFFICER - Mrs. G.N.D. Thilakarathna
ASSISTANT PARLIAMENTARY OFFICER - Mrs. W.R.G.S. Shamalee

DEPARTMENT OF THE SERJEANT-AT-ARMS

SERJEANT-AT-ARMS - Mr. Kushan Sampath Jayarathna
DEPUTY SERJEANT-AT-ARMS - Mr. N.A.S. Cooray
ASSISTANT SERJEANT-AT-ARMS - Mr. K.S.L. Kadigamuwa
Mr. P.D.N. Fernando, (Deputy Principal Officer); Mr. U.D.M.M. Wijesinghe (Assistant Principal Officer); Mr. A.G.R.K. Abeyrathne (Parliamentary Officer); Mrs. N.A. Dharmadasa (Telephone Supervisor); Mrs. K.T.D. Sooriyabandara (Assistant Parliamentary Officer)

ADMINISTRATION DEPARTMENT

DIRECTOR (ADMINISTRATION) - Mrs. C.I. Dissanayaka

DEPUTY DIRECTOR (ADMINISTRATION) - Mrs. E.D.S.M. Fernando

ESTABLISHMENTS OFFICE - Mr. W.A.K.C. Udapola (Assistant Director - Administration); Mr. P.G.P. Priyankara, Mrs. V.P.G.S. Vidanapathirana (Principal Officers); Mrs. J.A.D. Jayasinghe (Deputy Principal Officer); Mrs. K.I.M. Perera, Mrs. W.S.Y. Zoysa, Mrs. G.M.H.S. Gamlath, Mrs. R.R.G.D.K. Jayathilaka (Assistant Principal Officers); Mrs. U.G.T.P. Gunasekara, Mrs. I.U. Dewage (Parliamentry Officers); Mrs. H.A.R.R. Gunasekara (Assistant Parliamentary Officer)

MEMBERS' SERVICES OFFICE - Mr. K.P. Chandana, Mr. W.P.J. Pushpakumara Pathirana (Principal Officers); Mr. J. Naseerdeen (Deputy Principal Officer); Mr. A.G.M.M.M. Nusky (Parliamentary Officer)

HUMAN RESOURCE DEVELOPMENT OFFICE – Mr. P. K. D. S. W. Wijegunawardena (Principal Officer); Mrs. G.K.S. Priyadarshani (Assistant Principal Officer)

FOREIGN RELATIONS AND PROTOCOL OFFICE – Mrs. G.V. Ama Sudanthi, Mrs. T.W.A. Jayaratne, Mr. H.N.D.R.B. Nanayakkara (Senior Parliamentary Protocol Officers)

TRANSPORT OFFICE - Mr. H.M.L.A. Samaranayake (Transport Officer); Mrs. R.C. Kulathilaka, Mr. D. A. M. Baddewithana (Assistant Principal Officers); Mr. R.P.H. Kularatne, Mr. G.M. Prasantha (Assistant Parliamentary Officers)

RIGHT TO INFORMATION UNIT - Mrs. N.N. Hettige (Parliamentary Officer)

SENIOR STENOGRAPHERS - Mr. H.P.C.S. Tilakaratne, Mr. R.P. Rasika Rajapaksha

STENOGRAPHERS - Mrs. P.D.N.P. Kumari, Mrs. S. Rajanimala, Mrs. D.W.B.A. Jayanatha, Mrs. P.W.C. Priyadarshani

SENIOR TRANSLATORS - Mrs. A. Rukmanidevi, Mr. S.M. Nazir, Mr. M.M. Haleemdeen

BUNGALOW MANAGER - Mr. D.M.P. Athukorala, Mr. Y. M. Chaminda

RECORD KEEPER - Mr. E.K.K.P. Pushpalal

DOCUMENTATION SUPERVISOR – Mr. S.V. Bokalawela

HANSARD DEPARTMENT

EDITOR OF HANSARD – Mrs. C.N. Lokukodikara de Silva

DEPUTY EDITORS OF HANSARD – Mrs. S.K.M.W. Samarasekera, Mr. M.S.M. Linnas, Miss H.G. Pujika

ASSISTANT EDITORS OF HANSARD - Mrs. R.D.P. Sujeewani, Mrs. D.P.A.N.N. Weerasinghe, Mrs. K.G.N.P. Rabel, Mrs. K.P.S. Perera, Mrs. K.D.S. Kularatne Aluthgamage, Miss Geethani Warnasuriya, Mr. H.G. Lakshitha, Mrs. P.M.G.P. Priyangika, Mrs. M.I.S. Nishra, Mrs. E.H.W. Irangika, Mrs. T.T. Kumanayake

SENIOR HANSARD REPORTERS – Mrs. P.V.T.V. Gamage Arumadura, Mrs. W.A.D.P. Wijekonda, Miss S.M.A. Kumuduni, Mrs. F.H.A.N. Silva, Mrs. H.R.P. Chandani, Miss C.R. Karunaratna, Mr. M.T.A.D. Millagastenna, Mr. H.G. Manjula, Mrs. D.R.D. Hettige, Miss M.M.C.K. Marasinghe, Mrs. M.P. Niroshi Sajeewani, Mrs. T.U. Weerasekara, Miss G.A. Hiruni Punsara, Mr. K.M.D. Lanka, Mrs. M. Pushpakumara, Mrs. T.N. Samarasinghe, Mrs. H.R.U.S. Nivarchana

HANSARD REPORTERS – Mrs. E.V.T.R. Edirisinghe, Mrs. Indunil Dhammika, Mrs. M.A. Jesmina, Miss A. Mirunalini, Mrs. W.G.P.R. Samanmali, Mrs. R.S. Alahapperuma, Mrs. H.G. Maduka Shithari, Mrs. M.B.T.N. Priyadarshani, Miss S. Thushanthini, Miss S.U. Ranasinghe, Mrs. M.A.K.S. Sanjeewani, Mrs. S.N. Kalawana

SENIOR COMMITTEE REPORTERS - Mrs. P.G.K.N. Mihiri, Mrs. J.A.T. Samanthika

COMMITTEE REPORTERS – Mrs. J.K.I. Nilmini, Mrs. L.P.Wadanambi, Miss T.P.R.T. Kumari, Mrs. D.S. Hewavithana, Miss R.P.G. Kumari

SENIOR INDEXING OFFICERS – Mr. M.M.M. Nasaar, Miss S.A.D. Manori, Mrs. M.B.V.N.T. Fernando, Mr. A.M.C.M. Adikari

RECORDING SUPERVISOR – Mr. S.D.S.K. Thilakasiri

FINANCE AND SUPPLIES DEPARTMENT

DIRECTOR (FINANCE) – Mr. G. Sarath Kumara

FINANCE AND ACCOUNTS OFFICE – Mrs. K.A.I. Senarathna (Assistant Director - Administration); Mrs. D.V.O. Weerakoon (Principal Officer); Mrs. R.A.N.D. Alwis, Mr. R.C. Wijayathilake (Deputy Principal Officers); Mrs. L.D.H. Molligoda, Miss H.M.D. Lakmali, Mrs. H.E.C. Silva, Mr. T.G. Balasooriya, Mr. K.M.G.K. Jayawardana (Assistant Principal Officers); Miss. L.B.L.I. Laddusinghe (Parliamentary Offices)

SUPPLIES AND SERVICES OFFICE – Mrs. H.A.T.D. Hewarachchi (Principal Officer); Mrs. D.M.D. Alahakone, Mrs. G.R.U. Gamage (Deputy principal Officers); Mrs. E.A.N.M. Edirisinghe, Mrs. U.M.S. Prabhashini, Mrs. M.S. Bandulahewa (Assistant Principal Officers); Mrs. B.N.H. Tissera (Senior Help Desk Co-ordinator)

CATERING ACCOUNTS OFFICE – Mr. I.M.A.K. Idirisinghe (Assistant Parliamentary Officer)

RECEIVING OFFICER – Mr. B. K. Sampath

SHROFF – Mr. M.G.N.G. Dharmasena

STOREKEEPER (TECHNICAL) - Mr. M.P. G. Silva

PURCHASING OFFICER - Mr. M.G.P.K. Dharmasena

DEPARTMENT OF THE CO-ORDINATING ENGINEER

CO-ORDINATING ENGINEER – Mr. D.L.D. Adikari

DEPUTY CO-ORDINATING ENGINEER – Mr. K. K. D. Hannadi

CHIEF INSPECTOR (ELECTRICAL) – Mr. P.W.A.U.K. Dayaratne

CHIEF INSPECTOR (CIVIL) – Mr. C.S. Balasooriya

INSPECTOR (ELECTRICAL) - Mr. W.R.A. de Mel

INSPECTOR (CIVIL) – Mr. C. U. B. Gamage

SENIOR TECHNICAL OFFICER (ELECTRICAL) - Mr. P.A.S. Lalith Kumara

TECHNICAL OFFICER (ELECTRICAL) - Mr. N.M.S.S. Nawarathne

TECHNICAL OFFICER (CIVIL) - Mrs. H.D. Jayakody, Mr. P. R. Wickramaarachchi

ASSISTANT PARLIAMENTARY OFFICER - Mr. B..K. Chanaka

CATERING AND HOUSEKEEPING DEPARTMENT

DIRECTOR (CATERING AND HOUSEKEEPING SERVICES) - Mr. R. H. Edirisinghe

EXECUTIVE CHEF - Mr. L.K.C.S. Gajanayaka

EXECUTIVE HOUSEKEEPER - Mr. D.D.I. Thushara

F & B MANAGER - Mr. K.S. Sumanaweera

DEPUTY F & B MANAGER - Mr. G.D. Anil

SOUS CHEF - Mr. D.M.M.M.B. Ulapane

ASSISTANT HOUSEKEEPER -

RESTAURANT MANAGERS - Mr. W.N.R. Wijewardena, Mr. D.H.B.B. Pathmasiri, Mr. H.D.T. Priyantha, Mr. J.A.S.K. Jayakody, Mr. W.D.S.R. Kumara

GARDEN SUPERVISOR – Mr. R.M.J. Rajapaksha

SENIOR HOUSEKEEPING SUPERVISORS - Mr. M.D.E.M.N. Karunarathna, Mr. S.D. Rathnasiri

HOUSEKEEPING SUPERVISORS – Mr. G.R.S.K.D. Gamlath, Mr. B. D. Jagath Kumara, Mr. N.H.M. Janaka

F & B SUPERVISORS - Mr. N. W. M. Turin, Mr. A.D.D.S. Gunasekara, Mr. S.J. Gamage, Mr. H.R.K.S.K. Peiris, Mr. U.A.D. Nishantha, Mr. I.G.C. Kumara

KITCHEN STEWARDING SUPERVISOR - Mr. G.A. Wijesinghe

CHEF-DE-PARTIE - Mr. P.R. Wijesinghe, Mr. B.T.R. Hewamana , Mr. R.P. Helambage, Mr. M.W.W.M.P.C.C. Walgama

LEADING COOKS - Mr. A.A.D. Suranga, Mr. K.V.A. Jayawardena, Mr. R.M.M. Srimal, Mr. G.S.P. Suraweera, Mr. B.A.P. Pushpakumara, Mr. D.A.A. Amarathunga, Mr. P.D.P. Pushpakumara, Mr. M.B.A.P. Muthukumarana, Mr. R.K.A.D.T. Roshan, Mr. R.L.A.C.P. Rajakaruna

DEPARTMENT OF LEGISLATIVE SERVICES

DIRECTOR (LEGISLATIVE SERVICES) - Mr. M. J. Perera

TABLE OFFICE - Mr. P.H. Kumarasinghe, Mr. K.R. Herath (Assistant Directors - Administration); Mr. R.A.R.L. Ranawaka, Mr. S.A.M. Shaheed, Mrs. T.M.N.P. Tennakoon (Deputy Principal Officers); Mrs. A.N.D. Gunarathna, Mrs. J.M.S. Nirmani, Mr. U.P.B.M. Undugoda, Miss D.R.K. Ranasinghe (Assistant Principal Officers); Miss E.H. Jayaweera, Mr. K.D.G.M. Krisantha (Parliamentary Officers)

BILLS OFFICE - Mr. W.W.N.S.C. Fernando (Assistant Director - Administration); Mrs. B.J.Abeysinghe (Principal Officer); Mrs. K.C.K. Peiris, Mrs. A.C.F. Nusrath (Deputy Principal Officers); Mrs. M.E.K.K. Fernando, Miss G.K.C. Thilakarathna (Assistant Principal Officers)

COMMITTEE OFFICE - Mrs. C.M. Bulathsinhala (Assistant Director - Administration); Mrs. U. N. Panditha (Principal Officer); Mr. D.G.M.S.M. Dehigahalanda, Mrs. W.L.S.D. de Alwis, Mr. M.A.K.D.C. Kumara, Mrs. R.M.S. Samanjika (Deputy Principal Officers); Mrs. W.M.L.M. Weerasinghe, Mrs. B.W.K.J. Welaratne, Mrs. H.N. Fernandopulle, Mr. T.H.S.U. Thirimanna (Assistant Principal Officers)

COMMITTEE OFFICE II – Mrs. H.M.C.N.K. Herath (Assistant Director - Administration); Mrs. S.W.T.R. de Silva (Principal Officer); Mr. H.U.P. Kumara, Mrs. D.C.S. Rupasinghe (Deputy Principal Officers)

PUBLIC ACCOUNTS AND PUBLIC ENTERPRISES COMMITTEE OFFICE - Mrs. K.T.C.K. Peiris, Ms. S.R.M.H.G. Samaradiwakara, (Assistant Directors - Administration); Mr. L.B.R. Pathmasiri, Mrs. H.R. de Soysa (Principal Officers); Mr. S.L. Wickrma (Deputy Principal Officer); Mrs. R.A.D.N. Geyowanee, Mr. J.T.L.P. Sameera (Assistant Principal Officers); Mrs. G.V.S.K. Kumari, Miss. G.D.J.D. Ayeshmanthi (Parliamentary Officers)

PUBLIC PETITIONS COMMITTEE OFFICE - Mr. M.M.M. Mabrook (Assistant Director - Administration); Mrs. M.K.S.D. Alwis (Principal Officer); Mrs. R.P.Y.T. Warusavithana, Mr. M.R.D.T. Thilakasiri (Deputy Principal Officers); Mr. K.T.L.A. Chandrasiri, Mrs. T.P. de Costa (Assistant Principal Officers); Ms. D.I.T. Munasinghe (Parliamentary Officer)

MINISTERIAL CONSULTATIVE COMMITTEE OFFICE - Mr. D.D.U.K. Munasinghe (Assistant Director - Administration); Mrs. C.M. Subasinghe (Principal Officer); Mrs. O.R.A.M.D. Sewwanthi (Assistant Principal Officer); Mr. W.K.A.M.M.M. Arthanayaka (Parliamentary Officer)

NATIONAL COUNCIL OFFICE –

LIBRARIAN - Mr. S.L. Siyath Ahemed

DEPUTY LIBRARIAN - Miss K.D.S. Wijenayake

ASSISTANT LIBRARIAN - Mrs. J.P.M.P. Jayasinghe, Mrs. D.G. Wasana Madushani, Mr. A.H.L.A.R. Weerasiri

JUNIOR ASSISTANT LIBRARIAN - Mrs. W.K.H. Jayani, Mr. S.H.M.W. Samarakoon, Mr. W.A.A.Wekkasinghe

CHIEF RESEARCH OFFICER - Mrs. G.R.A. Godagama

SENIOR RESEARCH OFFICERS - Mr. M. Ajiwadeen, Mrs. P.L.T. Erandathi

RESEARCH OFFICERS - Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mr. V. Muralithas, Mrs. D.S.P.A.K. De Silva, Miss A.G.J. Chathurika

ASSISTANT RESEARCH OFFICERS - Ms. G. H. M. S. S. Ananda

CHIEF PARLIAMENTARY INTERPRETER - Mr. C.J. Karunarathna

DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS - Mr. A.G. Mohamed Fiqrhi, Mr. K.D.R. Padmasiri, Mr. A. Saravanabavanandan

SENIOR PARLIAMENTARY INTERPRETERS - Mr. G.F.B. Sureshwaran, Mrs. N.B.C.J. Nissanga, Mr. P.L.P.L. Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. M.H.M. Ramis, Mrs. A.L.A.D. Thiumini, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake, Mr. D.D.V.N. Dhammage, Mr. M.Z.M. Azka

PARLIAMENTARY INTERPRETERS - Mr. M.I.M. Fazi, Mr. C. Manimaran, Mr. P.M.A. Hussain, Mr. B.M. Razeel, Mr. S. Pradeep

DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

DIRECTOR (INFORMATION SYSTEMS AND MANAGEMENT) - Mr. N.B.U. Nawagamuwa

SYSTEMS ENGINEER - Mr. C.J. Willoraarachchi

SYSTEMS ANALYST - Mr. M.N.C. Wickramasinghe

COMMUNICATION / SECURITY ENGINEER - Mr. G.N. Lakmahal

SYSTEMS DESIGNER -

SYSTEMS ADMINISTRATOR - Mr. A.S.D.M. Wickramaratne

WEB AND NETWORK ADMINISTRATOR -

SENIOR COMPUTER PROGRAMMERS- Mr. D. Panditha, Miss P.M.M. Chandima

COMPUTER PROGRAMMER - Mrs. S.A.A.B. Athukorala

SENIOR WEB EDITOR (SINHALA/ ENGLISH) - Mr. U.L. Geeganage

SENIOR WEB EDITOR (ENGLISH/ TAMIL) - Mr. M.N.M. Shifaq

ASSISTANT PRINCIPAL OFFICER – Miss A.P.K.K.P. Thilakaratne

SENIOR COMPUTER OPERATORS - Mrs. P. Jehanya, Mr. J.S. Colambage, Mrs. K.G.S. Sewwandhi, Mr. W.H.U.D. Piyathunga, Mr. N.D.D.P. Premasiri, Mr. K.P.P.S. Romawardhana, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashiq Ali, Mr. A.R.M. Rikaz Aly, Mr. A.M. Fowsul Ameen

SENIOR COMPUTER TECHNICIANS - Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

SENIOR TECHNICAL ASSISTANTS - Mr. V.R.S.J. Somaratne, Mr. W.S. Suranga

DEPARTMENT OF COMMUNICATION

DIRECTOR (COMMUNICATION) (ACTING) - Mr. M. J. Perera

PUBLIC OUTREACH MANAGER – Miss R.M.B.R. Ramanayake

MEDIA MANAGER – Mrs. R.M.N.P.M. Hathiyaldeniya

PUBLIC OUTREACH OFFICERS – Mrs. H.D.I.E. Wickramasinghe, Mr. P. Rudrakumar, Mr. M.G.D.L. Wickramasinghe, Mrs. Y.L. Rishmiya Nootan, Mr. A.S.M. Yasry

MEDIA OFFICERS – Mr. H.A.K.A.M. Jayalath, Mr. M. Pirassath, Mr. B.S.K. Ekanayake, Mrs. U.U.M. Perera

MEDIA OFFICER (STILL AND VIDEO PHOTOGRAPHY) – Mr. U.G. Nuwan Duminda

PUBLIC OUTREACH OFFICE COORDINATORS – Mr. A.G.P. Amarasinghe, Mr. S. Jeyaprakash

MEDIA OFFICE COORDINATOR - Mr. K.R.G. Jayathilaka

පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

දසවන පාර්ලිමේන්තුව - පළමුවන සභා වාරය

பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

பத்தாவது பாராளுமன்றம் - முதலாவது கூட்டத் தொடர்

PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT

THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

TENTH PARLIAMENT - FIRST SESSION

318 වන කාණ්ඩය **தொகுதி 318** **VOLUME 318**

පාර්ලිමේන්තුව

பாராளுமன்றம்

PARLIAMENT

2025 පෙබරවාරි 27වන බ්‍රහස්පතින්දා
2025 பெப்ருவரி 27, வியாழக்கிழமை
Thursday, 27th February, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය

சனாதிபதியிடமிருந்து வந்த செய்தி

MESSAGE FROM THE PRESIDENT

මහජන ආරක්ෂක ප්‍රකාශනය

பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

PUBLIC SECURITY PROCLAMATION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත දැක්වෙන සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පිඑස්/සිඑස්ඒ/00/7/IX/3/01

2025 පෙබරවාරි මස 24 වන දින

ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කාරක සභා අවස්ථාවේදී අසුන් ගැනීම
குழுநிலையின் போதான இருக்கை ஒழுங்கு
SEATING ARRANGEMENT DURING COMMITTEE STAGE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස කාරක සභා අවස්ථාවේ විවාදය 2025 පෙබරවාරි 27 දින, එනම් අද දින ආරම්භ කිරීමට නියමිත බැවින් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේ විවාදයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භය තුළ අසුන් ගැනීම පිළිබඳ රීති සම්බන්ධයෙන් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ දැනගැනීම සහ අවධානය සඳහා මතු සඳහන් නිවේදනය මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

සාම්ප්‍රදායිකව අය වැය කාරක සභා අවස්ථාවේදී නියෝජ්‍ය අමාත්‍යවරයාට, තම කැබිනට් අමාත්‍යවරයා ආසන්නයේ අසුන්ගත හැකි වුවද, විවාදයේදී කථා කිරීම තමාට වෙන් කරන ලද අසුනේ සිට පමණක් සිදු කළ යුතු බව මෙම ගරු සභාවේ අවධානයට යොමු කරවීමට කැමැත්තෙමි.

II
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 පෙබරවාරි 27වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පූර්ව භාග 11.00ට කාරක සභා කාමර අංක 02හිදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් කාරුණිකව දැනුම්දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Notification made by the Minister of Finance, Planning and Economic Development under Section 22 of the Excise Ordinance (Chapter 52), as amended from time to time, regarding Excise Duty on Liquor, and published in Gazette Extraordinary No. 2418/42 of 10th January, 2025 (Excise Notification No. 01/2025); and

(ii) Order made by the Minister of Finance, Planning and Economic Development under Section 3 of the Excise (Special Provisions) Act, No. 13 of 1989, relating to Excise Duty and published in Gazette Extraordinary No. 2418/43 of 10th January, 2025.

I move that the Notification and the Order be referred to the Committee on Public Finance.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

The List of Proposed Alterations in the Legends of Draft Estimates - 2025.- [The Hon. (Dr.) Harini Amarasuriya]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(1) 2023 වර්ෂය සඳහා 1990 සුවසැරිය පදනමේ වාර්ෂික වාර්තාව; සහ

(2) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the Appropriation Bill for the Financial Year 2025 in terms of Standing Order No. 121 (5)(ii) of Parliament (on the estimates including whether the allocation of money is in compliance with the policies

of the Government) only in the English language with special leave of the House and the copies of Sinhala and Tamil languages will be presented as soon as possible.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මේක තමයි 2025 විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය පටන් ගැනීමට කලින් ඉදිරිපත් කරන දෙවැනි වාර්තාව. අපි ඉදිරිපත් කර තිබෙන මෙම වාර්තාව පිටු පනස් ගණනක වාර්තාවක්. මම මෙය දීර්ඝව කියවන්න යන්නේ නැහැ. ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවාද, නැද්ද කියන එක තමයි මේ වාර්තාවේ සඳහන්ව තිබෙන්නේ.

ඒ කියන්නේ, අධ්‍යාපනයට අපි ප්‍රමුඛතාවක් දෙනවා නම්, ඒකට මුදල් කොච්චර වියදම් කරලා තිබෙනවාද, ඒක සාපේක්ෂව කොහොමද වැඩි වෙන්නේ සහ අඩු වෙන්නේ යනාදී වශයෙන් විශ්ලේෂණයක් තමයි මේ වාර්තාවේ තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

මම නැවතත් මතක් කරන්න ඕනෑ, අපට තාක්ෂණ සහාය ලැබිලා නැහැ කියන කාරණය. තාක්ෂණ සහාය නැතුව මේ වැඩ කරගෙන යන්න අතිශයින්ම අපහසුයි. සංවරණ හා තුලන සම්බන්ධයෙන් තමයි මේ කාරක සභාව ස්ථාපනය කරලා තිබෙන්නේ. COPE එකටයි, COPA එකටයි විගණකාධිපතිවරයා හරහා දාහක විතර තාක්ෂණික මණ්ඩලයක් ඉන්නවා උදවු වෙන්න. නමුත් අපට කිසිම කෙනෙක් නැහැ. අපට හරි අමාරුයි ගරු කථානායකතුමනි, මේ වැඩේ මේ විධියට කරගෙන යන්න.

මහ ලේකම්තුමිය මට ලියුමක් එවා තිබුණා. එතුමිය කියා තිබුණා, උපදේශකවරයෙක් තෝරාගන්න කියලා. මට සභානායකතුමාත් කථා කරලා කිව්වා, උපදේශකවරයෙක් තෝරා ගන්න, අනෙක් කාරක සභා දෙකටත් උපදේශකවරු තෝර ගන්නවා කියලා. උපදේශකයෙකුට වඩා ගරු කථානායකතුමනි, අපට තාක්ෂණික කණ්ඩායමක් තමයි අවශ්‍ය. ඒක අවශ්‍යමයි. මොකද, රට කඩා වැටුණාට පස්සේ අපට මෙම කාරක සභාව නැවතත් භාර දුන්නා. මම හිතන විධියට එතැනදී අපි පනත් කෙටුම්පත් 7ක හෝ 8ක, අලුත් නීති සම්පූර්ණයෙන්ම විශ්ලේෂණය කළා. ඊළඟට, රෙගුලාසි 200 ගණනක් විශ්ලේෂණය කළා. ප්‍රශ්නයකට තිබෙන්නේ, අපේ කාරක සභාවට ගරු මන්ත්‍රීතුමන්ලා ආවාම, එතුමන්ලාට මේවා විශ්ලේෂණය කරන්න අවශ්‍ය පසුබිම සකස් කර ගන්න මට අමාරුයි. ඒ නිසා මම ඔබතුමාගෙන් නැවතත් කාරුණිකව ඉල්ලනවා, මගේ ප්‍රශ්නය තේරුම් ගන්න කියලා. මොකද, COPE එකටයි, COPA එකටයි වඩා මේ කමිටුව වෙනස්. මෙතැනට අපට තාක්ෂණික සහාය අත්‍යවශ්‍යයි.

අපි මේ වාර්තාව ඉදිරිපත් කළේ තාක්ෂණික සහාය නැතුව. මොකද, මේ වාර්තාව නම් අපි හැම අවුරුද්දේම IPS - Institute of Policy Studies of Sri Lanka - එකෙන් කරන්නේ. මේ අවුරුද්දේත් කළේ ඒ ආයතනයෙන්.

මෙහිදී Dr. Dushni Weerakoon, Dr. Nisha Arunathilake and Dr. Lakmini Fernando යන අයට කමිටුව වෙනුවෙන් අපේ විශේෂ ස්තුතිය පුදකර සිටින්නත් අවශ්‍යයි. බොහොම ස්තුතියි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අපි ඇත්තටම හර්ෂ ද සිල්වා මැතිතුමාගේ කාර්යභාරය අගය කරනවා. එතුමා මේ පාර්ලිමේන්තුව වෙනුවෙන් කරන කාර්යභාරය විශාලයි. ඇත්තටම එතුමාට expertsලා නැතිවත් මේක කරන්න පුළුවන් බව එතුමා ඔප්පු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නායකත්වයෙන් පැවති SAC එකේදී අපි එකඟ වුණා, ඒ කාරක සභා තුනටම උපදේශකයන් ලබා දෙන්නත්, ඒවාට අදාළ කරන ප්‍රමිතිය පිළිබඳ කාරණාවලටත්. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, නමුත් ලේකම් මණ්ඩලයෙන් නිකුත් කරන ලද ලිපිය හරහා ඔබතුමාට කියලා තිබෙන්නේ උපදේශකයා ගැන පමණක් නම්, මම හිතන විධියට අපි එහෙම නොවෙයි තීන්දු කළේ. ඔබතුමාගේ කාරක සභාවට උපදේශකයන්ට අමතරව මට මතක විධියට ඔබතුමා යෝජනා කර තිබුණා, technical staff එකට තව 3දෙනෙක් හෝ 4දෙනෙක්. මට මතක හැටියට නම්, ගරු කථානායකතුමනි, අපි ඒකත් එක්කම තමයි තීන්දු කළේ. අනෙක් කාරක සභා දෙකට එහෙම technical staff එකක් අත්‍යවශ්‍ය නැහැ. මොකද, එයාලාට Auditor-General ඉන්න නිසා. ඒ නිසා ඔබතුමාට එවන ලද ඒ ලිපියේ අඩු පාඩුවක් තිබෙනවා නම් ලේකම් මණ්ඩලයෙන් ඒක නිවැරදි කරයි. ගරු කථානායකතුමනි, ඒ කාරක සභාවට ඉතාම ඉක්මනින් ඒ දේවල් සපයන්න කියන ඉල්ලීම තමයි අපි ඔබතුමාගෙන් කරන්නේ.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල, ගාමිණී විද්‍යාල මාවත, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි අමාශා නිර්මාණි එදිරිමුණි මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම,

(2) ඔට්ටමාවඩි, කවත්තමුන, කඩදාසි නගරය දරන ස්ථානයෙහි පදිංචි එම්.එච්. සෙයියදු උමර් මහතාගෙන් ලැබුණු පෙත්සම,

(3) රාගම, කැන්දලියැද්දපාළුව, අංක 531 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. චන්ද්‍රසෝම මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) හෙට්ටිපොල, රත්මලේ, පිහිඹිය, මැද පිහිඹිය දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. ජයසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, හොරේතුඩුව, මඩකිස්ස පාර, අත්කම් නිවාස, අංක 34 දරන ස්ථානයෙහි පදිංචි නුවන් සල්ගාදු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, නාවලපිටිය, බේලි පාර, අංක 54 දරන ස්ථානයෙහි පදිංචි එස්.එල්. ෆාතිමා රියානා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ජයන්තිපුර, අංක 22, පොදු වෙළඳපොළ අසල යන ලිපිනයෙහි පදිංචි ජී.ඩබ්ලිව්. ලාල් අමරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පොළොන්නරුව, ජයන්තිපුර, විරුවන්ගම, යාය 11, අංක 793 දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී. ස්වර්ණලතා ගුණසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මම පොළොන්නරුව, නව නගරය පාර, සුගත් ඉංජිනියරින් වර්ක්ස්, අංක 249 දරන ස්ථානයෙහි පදිංචි පී.ඩී. ජයලත් මුණිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජගත් විතාන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு தினிந்து சமன்)
(The Hon. Dinindu Saman)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) බදුල්ල, බදුලු ඔය, යුනිට් 04/බී 17 දරන ස්ථානයෙහි පදිංචි බී.එම්. ප්‍රේමදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බදුල්ල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යන ලිපිනයෙහි සේවයේ නියුතු ඩී. දුලීත් අසෝක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) බිබිල, 1 කනුව, මහියංගන පාර, බදුල්ල කැටිය යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. ගුණවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) බදුල්ල, විනීතගම, ගල්පොත්තාවල යන ලිපිනයෙහි පදිංචි එම්.ඒ. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කිරීම නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2024 පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය: විභාග ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න පිටවීම
தரம் 5 புலமைப்பரிசில் பரீட்சை, 2024: வினாப்பத்திரத்திலுள்ள கேள்விகள் வெளியாதல்
GRADE 5 SCHOLARSHIP EXAM, 2024: LEAK OF QUESTIONS IN EXAM PAPER

105/2024

1. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 වර්ෂයේදී පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගයට අදාළ ප්‍රශ්න පත්‍ර හෝ එම ප්‍රශ්න පත්‍රවල අන්තර්ගත ප්‍රශ්න, ඉහත විභාගය පැවැත්වූ දිනට පෙර බාහිර පාර්ශ්වයන් වෙත ලැබී තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) ඒ හේතුවෙන් අගතියට පත් වූ සිසුන් වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද;

(v) එම විභාගයේ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම අත්හිටුවා තිබේද;

(vi) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2024ஆம் ஆண்டு ஐந்தாம் தர புலமைப்பரிசில் பரீட்சைக்குத் தோற்றிய மாணவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பரீட்சையின் வினாத்தாள்கள் அல்லது வினாத்தாள்களில் உள்ளடங்கியுள்ள வினாக்கள், மேற்படி பரீட்சை நடைபெற்ற திகதிக்கு முன்னர் வெளித்தரப்பினருக்கு கிடைக்கப்பெற்றுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், இது தொடர்பில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) இதன் காரணமாகப் பாதிக்கப்பட்ட மாணவர்கள் சார்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) மேற்படி பரீட்சையின் விடைத்தாள் மதிப்பீட்டுப் பணிகள் இடைநிறுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(vi) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of students who sat for the Grade 5 Scholarship Examination in 2024;

(ii) whether the examination papers relating to that examination or the contents thereof had been received by external parties before the date of the above-mentioned examination;

(iii) if so, the steps that have been taken regarding it;

(iv) the steps that will be taken in respect of the students who have been aggrieved from it;

(v) whether the evaluation of the answer scripts of that examination has been suspended; and

(vi) if so, the reasons for it?

(b) If not, why?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2024 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා ඉල්ලුම් කර ඇති සිසුන් සංඛ්‍යාව 323,901ක් වන අතර, පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 319,284කි.

(ii) එම විභාගයට අදාළව මෙම දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද I ප්‍රශ්න පත්‍රයේ ඇතුළත්ව තිබූ ප්‍රශ්න තුනකට සංකල්පීය වශයෙන් සමානතාවක් පෙන්නුම් කරන ප්‍රශ්න තුනක් විභාගයට පෙර දින, කුරුණෑගල ප්‍රදේශයේ උපකාරක පන්ති ගුරුවරයකු විසින් සිය උපකාරක පන්තියට අදාළ WhatsApp සමාජ මාධ්‍ය සමූහය තුළ බෙදා හැර ඇති බව මෙම දෙපාර්තමේන්තුව සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද විමර්ශන මඟින් අනාවරණය කරගෙන ඇත.

(iii) මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සම් 04ක් විභාග වූ අතර, එම පෙත්සම් සම්බන්ධයෙන් වන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව 2024.12.31 දින ප්‍රකාශයට පත් කරමින් පහත සඳහන් නියෝග නිකුත් කර ඇත.

(a) විභාගයට පෙර සාකච්ඡා වූ දෙපාර්තමේන්තු ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තුනකට සමානකමක් පෙන්නුම් කරන ප්‍රශ්න තුන සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පත් කරන ලද විද්වත් කමිටුව විසින් නිර්දේශිත විසඳුම් ක්‍රියාමාර්ග තුන අතරින් එකක් ක්‍රියාත්මක කිරීම.

(b) සිද්ධියට සම්බන්ධ චූදිතයින් වන, පෙත්සමේ 13වන වගඋත්තරකරු වන අයි.ජී.එස්. ප්‍රේමතිලක යන අය විසින් රුපියල් මිලියන තුනක් (03) සහ මූලික අයිතිවාසිකම් පෙත්සම් අංක SC/FR 291/2024 සහ SC/FR 294/2024 යන පෙත්සම්වල පිළිවෙළින් 6වන සහ 9වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති සී.එම්. චමින්ද කුමාර යන අය විසින් රුපියල් මිලියන දෙකක් (02)ක් රජයේ ගාස්තු ලෙස ගෙවිය යුතු බව.

මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වූ මූලික අයිතිවාසිකම් පෙත්සම්වලට අමතරව සිද්ධිය සම්බන්ධ විමර්ශනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් ද සිදු කරනු ලැබිණ. එම විමර්ශනය මඟින් අනාවරණය කරගෙන ඇති කරුණු මත පදනම්ව විමර්ශන කමිටුව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

(a) ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ ඕනෑම මණ්ඩලයක සාමාජිකයින් අදාළ ප්‍රශ්න සකස් කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුවේ රහස්‍ය ශාඛාවන් තුළදී පමණක් සිදු කළ යුතු බවත්, එම කටයුතු අවසානයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ මණ්ඩල සාමාජිකයින් බැහැර වන විටදී අදාළ රහස්‍ය ලේඛන රහස්‍ය ශාඛාවන්ගෙන් පිටතට රැගෙන නොයන බවට වගබලා ගැනීම සහ රහස්‍ය ශාඛාවන් තුළට ඇතුළුවීමේදී හා ඉන් පිටතට යාමේදී සියලුම පුද්ගලයින් දැඩි පරීක්ෂාවන්ට භාජන කළ යුතු බව

(b) ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ මණ්ඩල සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම හා පුහුණු කිරීම මඟින් සම්පත්දායක සංචිතයක් සකස් කිරීම හා ප්‍රශ්න පත්‍ර බැංකුවක් ස්ථාපනය කිරීම

මේක ඉතාම වැදගත් එකක්.

(c) චූදිත ජාතික අධ්‍යාපන ආයතනයේ සැලසුම් අධ්‍යක්ෂ අයි.ජී.එස්. ප්‍රේමතිලක යන අය වහාම ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ මණ්ඩලයෙන් ඉවත් කිරීම සහ ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා ඔහුගේ විනය බලධාරියා වෙත විමර්ශන තීරණ දැනුම් දීම.

26.08.2025 දිනැති 491 වන ආයතන සභාව ඉදිරිපත් කළ අධ්‍යක්ෂ (සැලසුම්) අයි.ජී.එස්. ප්‍රේමතිලක මහතා පිළිබඳ නිර්දේශ ඇතුළත් වාර්තාවේ අන්තර්ගත කරුණු මම ඉදිරිපත් කරන්න කැමැතියි. ගරු කථානායකතුමනි, ඒකේ සඳහන් වන අන්දමට,

- ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 27.10 වගන්තිය සහ 31.1.2, 31.1.10 සහ 31.1.2 ප්‍රකාරව අයි.ජී.එස්. ප්‍රේමතිලක මහතාගේ (අධ්‍යක්ෂ - සැලසුම්) තහනම් කිරීම සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව යටතේ කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම.

- ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 31:11, 31:11:1 වැනි වගන්තිය අනුව වැඩ තහනමකට ලක් වූ කාලය තුළ කිසිදු වැටුපක් නොගෙවිය යුතු බැවින් වහාම ක්‍රියාත්මක වන පරිදි වැටුප් නවතා ඇත.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහතා]

- ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 27-31:7 සහ 31:5:3 වගන්තිවලට අනුව රජයේ නිලධාරියෙකුට අධිකරණය විසින් චෝදනා එල්ල කර ඔහුට එරෙහිව නඩුවක් පවතින අවස්ථාවක සහ වැඩ තහනම් කිරීමට යටත් වන අවස්ථාවක මූලික පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගත යුතු අතර, එබැවින් මෙම පරීක්ෂණය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් ආරම්භ කර දැනට එම පරීක්ෂණය පවත්වා ගෙන යයි.

(d) සිද්ධියට සම්බන්ධ බවට අනාවරණය වී ඇති ව/ගිරි/ආඬියාදෙනිය ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරයා සහ ඔහුගේ බිරිඳ යන අයවලුන් තවදුරටත් එකම සේවා ස්ථානයක රාජකාරි ඉටු කිරීම වළක්වාලීම සඳහා ඔවුන්ගේ විනය බලධාරියා දැනුවත් කිරීම.

ගරු කථානායකතුමනි, මෙම ගුරුවරුන්ගේ නම් මම ප්‍රසිද්ධ කරන්නේ නැහැ, ඔවුන් තවම සේවයේ ඉන්න නිසා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවශ්‍ය නම් මට ඒ තොරතුරු වෙනම ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත්, මේ දෙදෙනා තවම සේවයේ ඉන්නවා.

(e) එම ගුරුවරයා වෙත සිය රාජකාරි කාලයටම බලපැවැත්වෙන පරිදි විභාග රාජකාරි තහනමක් පැනවීම සහ ඔහුට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සඳහා ඔහුගේ විනය බලධාරියා දැනුවත් කිරීම.

ඒ අනුව ගිරිඋල්ල කලාප කාර්යාලය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්ද තොරතුරු ලබා ගනිමින්, මේ පිළිබඳව මූලික පරීක්ෂණයක් සිදු කරමින් පවතින අතර, ඔහුව වැඩ තහනමකට ලක් කර ඇත. මේ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින්ද පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

(f) විභාගයේ II ප්‍රශ්න පත්‍රයේ සමහර ප්‍රශ්න හෝ ඊට සමාන අනුමාන ප්‍රශ්න සිය WhatsApp සමූහයට මුදා හරින ලද කුරුණෑගල මලියදේව ආදර්ශ විද්‍යාලයේ ගුරුවරයෙකු මෙන්ම, ශිෂ්‍යත්ව විභාගය සඳහා පෞද්ගලික උපකාරක පන්ති පවත්වන අයෙකු - ඒ පුද්ගලයාගේ නමත් ඕනෑ නම් මම ඉදිරිපත් කරන්නම් - වෙත වසර පහක විභාග තහනමක් පැනවීම සහ ඔහුට එරෙහිව විනයානුකූල කටයුතු කිරීම සඳහා ඔහුගේ විනය බලධාරියා දැනුවත් කිරීම.

ඒ අනුව ඔහුට තාවකාලිකව ලබා දී තිබූ අනුයුක්තය අවසන් කර පුත්තලම කලාපයේ රාජකාරිවලට යොමු කර ඇති අතර, 230B ආකෘතිය අනුව දෝෂ දර්ශනයට ලක් කර නිදහසට කරුණු විමසා තරවටු කිරීම් සිදු කර ඇත.

- මීට අමතරව, ඉදිරියේදී මෙවැනි සිද්ධි ඇතිවීම වළක්වා ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සැලසුම් කර ඇත.

i. දෙපාර්තමේන්තුවේ රහස්‍ය ශාඛාවන් තුළ මේ වන විට යොදවා ඇති ආරක්ෂක විධිවිධාන තවදුරටත් තර කිරීම.

ii. රහස්‍ය ශාඛාවන් වඩාත් සමීපව නිරීක්ෂණය කළ හැකි වන පරිදි අභ්‍යන්තර ආරක්ෂිත කැමරා - CCTV - පද්ධතිය යාවත්කාලීන කිරීම - upgrade කිරීම.

iii. ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ මණ්ඩල මඟින් ප්‍රශ්න පත්‍ර සකස් කිරීම වෙනුවට අර්ධ ස්වයංක්‍රීය පද්ධතියක් මඟින් ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ ක්‍රමවේද නිර්මාණය කිරීම සහ එමඟින් ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ කාර්යයට ඇති පුද්ගල මැදිහත්වීම අවම කිරීම.

iv. විභාගවල අරමුණු හා ගැළපෙන ප්‍රමිතගත ප්‍රශ්න මෙම ස්වයංක්‍රීය පද්ධතිය මඟින් නිර්මාණය කළ හැකි තත්ත්වයක් දක්වා එම පද්ධති සංවර්ධනය කිරීම.

v. විභාග වංචා වළක්වා ගැනීම සඳහා දැනටමත් ක්‍රියාත්මක වන විභාග අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සහ අධීක්ෂණයේ යෙදෙන වාර ගණන - frequency - වැඩි කිරීම.

vi. විභාග මධ්‍යස්ථාන තුළ ජංගම දුරකථන භාවිත කිරීමේ අවසරය විභාග ශාලාධිපතිවරුන්ට පමණක් සීමා කිරීම.

vii. විභාග මධ්‍යස්ථාන සඳහා යොදවනු ලබන නීත්‍ය කාර්ය මණ්ඩලවලට අමතරව බාහිර අධීක්ෂකයින් පූර්ණ කාලීනව විභාග මධ්‍යස්ථානවලට යෙදවීම මඟින් විභාග මධ්‍යස්ථාන කාර්යයන්ගේ ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීමට ක්‍රමවේද සකස් කිරීම.

(iv) මෙම සිදුවීම හේතුවෙන් විභාගයට මුහුණ දුන් කිසිදු සිසුවෙකුට අගතියක් සිදු නොවන පරිදි මේ සම්බන්ධයෙන් පත් කරන ලද විශේෂඥ කමිටුව විසින් නිර්දේශ කර ඇති ආකාරයට විභාගයට පෙර සාකච්ඡා වූ ප්‍රශ්න තුන සඳහා සියලු අපේක්ෂකයින්ට නිදහස් ලකුණු ලබා දී පිළිතුරු පත්‍ර ඇගැයීම් කටයුතු සිදු කිරීමට තීරණය කර ඇත.

(v) අගතියට පත් දෙමව්පියන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සම් කිහිපයක් ගොනු කිරීම හේතුවෙන් විභාගයේ පිළිතුරු පත්‍ර ඇගැයීම් කටයුතු තාවකාලිකව අත්හිටුවා තිබූ අතර, 2024.12.31 දින එම පෙත්සම් වලට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය

තීන්දුව ප්‍රකාශයට පත් කිරීමත් සමඟ පිළිතුරු පත්‍ර ඇගැයීම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරන ලදී.

ඒ අනුව, එම ඇගැයීම් කටයුතු 2025.01.08 දින ආරම්භ කළ අතර 2025.01.12 දින ඇගැයීම් කටයුතු අවසන් කර ඇත.

(vi) ඉහත (v) කොටසෙහි පිළිතුර ම අදාළ වෙනවා.

(ආ) අදාළ නොවේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට ගරු අග්‍රාමාත්‍යතුමිය ඉතාම හොඳ උත්තරයක් ලබා දුන්නා. ඒ ගැන එතුමියට ස්තුතිවන්ත වෙනවා.

මේ වංචාව, වැරැද්ද කරපු අයට එරෙහිව සුදුසු තීන්දුව අරගෙන තිබෙනවා. නමුත් ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මෙයයි. විභාගය ලියපු 319,000ක් විතර වූ අහිංසක දරුවෝ දිගටම ඉල්ලුවේ මොකක්ද? ඔබතුමන්ලා පත් කරපු ඒ කමිටුවේ නිර්දේශවලින් එකක් තෝරා ගන්න කියලා තමයි ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වේ, අවශ්‍යතාව මත. එම කමිටුව මඟින් නිර්දේශිත විසඳුම් ක්‍රියාමාර්ග තුන මේවායි. පළමු එක, එම ප්‍රශ්න 3 ඉවත්කොට ලකුණු සකස් කිරීම. දෙවන එක, ප්‍රශ්න තුනට සම්පූර්ණ ලකුණු ලබා දීම. තුන්වැනි එක, විභාගය නැවත පැවැත්වීම. ගරු අගමැතිතුමියනි, වැඩි පිරිසකගේ ඉල්ලීම වුණේ, නැවත ඒ ප්‍රශ්න පත්‍රය තියන්න කියන එකයි. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. කෙසේ වෙතත්, දැන් මේ ක්‍රියාදාමය තුළ මේ විභාගය ලියපු දරුවන්ට ප්‍රශ්න දෙකකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඇත්තටම දක්ෂ දරුවෝ ටික මේ ප්‍රශ්නවලට උත්තර ලිව්වා. උත්තර ලිව්වාට අර ලකුණු ටික දුන්නත් එක්කම පහළ හිටපු දරුවෝ ටික උඩට ඇවිල්ලා තිබෙනවා. සමහර විට මේ ප්‍රශ්නවලට උත්තර නොලියපු දරුවන්ට, ඒ ප්‍රශ්නවලට උත්තර ලියපු දරුවන්ට වඩා ලකුණු තිබෙන අවස්ථාවක් දැන් ඇවිල්ලා තිබෙනවා. ඒක එක කාරණයක්.

දෙවැනි කාරණය මෙයයි, ගරු අගමැතිතුමියනි. සාමාන්‍යයෙන් මාස තුනකින් පමණ, ඒ කියන්නේ ජනවාරි මාසය වෙනකොට පාසල්වල 6 වසර පන්ති පටන් ගන්නවා. ඔබතුමිය කිව්වා, මේ දරුවෝ තාවකාලිකව පාසල්වලට අනුයුක්ත කරන්න කියලා.

පෙබරවාරි 28වැනි දා -හෙට- තමයි මම හිතන විධියට date එක දාලා තිබුණේ. නමුත් කඩඉම් ලකුණු තවම දීලා නැහැ. කඩඉම් ලකුණු දීලා නැති නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? ළමයි ඔක්කෝම ගෙනැල්ලා පාසල්වලට ඇතුළත් කරලා තිබෙනවා. අපි දන්නවා, සමහර පාසල්වල පුටු නැහැ, ඉඳගන්න තැනක් නැහැ, ඩෙස්ක් නැහැ. හැබැයි, ඔක්කෝම දරුවන් ගෙනැල්ලා පුරවලා තිබෙනවා, ගරු කථානායකතුමනි. අද උදේත් අපි ඒ ගැන check කළා. තවම පාසල්වල කඩඉම් ලකුණු දීලා නැහැ. සාමාන්‍යයෙන් 6 වසර පන්ති ජනවාරි මාසයේදී පටන් ගන්නවා. අද පෙබරවාරි මාසයේ 27වැනි දා. තවමත් මේ කටයුත්ත පටන් අරගෙන නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා, ගරු අගමැතිතුමියනි. ගන්න තිබුණු පියවර ඔබතුමිය ගත්තේ නැති ප්‍රශ්නය තමයි මෙතැන තිබෙන්නේ. ඔබතුමිය කමිටුවක් පත් කරලා ඒකේ තීරණය ලබා දුන්නා. ඒක නොවෙයි කරන්න තිබුණේ. ඇත්තටම තීන්දුවක් අරගෙන කිව්වා නම් හරි, විභාගය වහාම නැවත පවත්වන්න කියලා. නමුත් ඔබතුමිය ඒක කළේ නැහැ. ඔබතුමිය පත් වුණු ගමන්ම තමයි ඒක සිද්ධ වුණේ. ඒ නිසා ඒකට අතගහන්න ඔබතුමිය එක වතාවටම භය වෙන්න ඇති. කෙසේ වෙතත්, මේ සිද්ධිය නිසා දැනට ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. ඩෙස්ක් නැහැ, පුටු නැහැ. නමුත් දරුවන් පාසල්වල පිරිලා ඉන්නවා, කඩඉම් ලකුණු - cut-off marks - දීලා නැති නිසා. ඒ නිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් ඔබතුමිය වහාම ක්‍රියාමාර්ගයක් ගන්නවාද, නැද්ද කියලා අපි දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(*மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய*)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එතැන නිවැරදි කරන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. එකක්, වැඩිපුර ඉල්ලීම තිබුණේ විභාගය නැවත පවත්වන්න කියලා නොවෙයි. උසාවියට ගියේ ඒ ඉල්ලීම කරපු දරුවන්ගේ දෙමව්පියන් පිරිසක්. නමුත් බහුතරයක් ඉල්ලුම් කරලා තිබුණේ විභාගය නැවත පවත්වන්න එපා කියලා. ඒගොල්ලන් නඩු කිව්වේ නැති නිසා ඒගොල්ලන්ගේ හඬ මේ විධියට මතු වුණේ නැහැ. මෙතැනදී සැලකිල්ලට ගන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. මේ විභාගයට දෙමළ මාධ්‍යයෙනුත් සිසුන් ඉදිරිපත් වුණා. දෙමළ මාධ්‍ය ප්‍රශ්න පත්‍රයේ කිසිසේත්ම ප්‍රශ්නයක් වුණේ නැහැ. විභාගය අපි නැවත වතාවක් පැවැත්වුවා නම් දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් එම විභාගයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

ඒ නිසාම තමයි මේකේ සියලු පැති සලකා බලන්න අපි විශේෂඥ කමිටුවක් පත් කළේ. ඒ කියන්නේ assessment පැත්තෙන් ගන්න පුළුවන් හොඳම තීරණය, දරුවන්ගේ මානසික සෞඛ්‍ය පැත්තෙන් ගන්න පුළුවන් හොඳම තීරණය කියන මේ කාරණා දෙක තමයි අපිට වැඩියෙන්ම වැදගත් වුණේ, ගරු කථානායකතුමනි. ඔබතුමා දන්නවා, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය නිසා දරුවන් සහ දෙමව්පියන් විඳින දුක. ඒක දරුවන් 1 ශ්‍රේණියේ ඉඳන් පටන් ගන්න stress එකක්. අපිට කිසිසේත්ම ඕනෑ වුණේ නැහැ, මේ stress එක වැඩි කරන්න. ඒ නිසා තමයි අපි ඒ විශේෂඥ කමිටුවට child phychologistsලා පත් කළේ. ඒගොල්ලන්ගේ නිර්දේශ අනුව ළමයින්ටත් stress එකක් නොවන, ඔවුන්ගේ ප්‍රතිඵලවලටත් අගතියක් නොවන විධියේ තීන්දුවක් ඒ කමිටුවෙන් නිර්දේශ කළා කියලා මට විශ්වාසයි.

ගරු කථානායකතුමනි, මම මේකට අතගහන්න කිසිසේත්ම භය වුණේ නැහැ, මේක මගේ කාලයේ සිද්ධ වුණු ප්‍රශ්නයක් නොවුණාට. මම වැඩ භාර ගත්ත ගමන් තමයි මේ ප්‍රශ්නය මතු වුණේ. නමුත් මම ඒකට අතගහන්න භය වුණේ නැහැ. මම ඒ කමිටුව පත් කළේ මගේ වගකීම අත්හරින්න නොවෙයි. නමුත් විභාග දෙපාර්තමේන්තුවේ වැඩකට ඇමතිවරයාට කෙළින්ම මැදිහත් වෙලා, කරන්න ඕනෑ මොකක්ද කියලා කියන්න බැහැ. එහෙම සංස්කෘතියක් කලින් තිබෙන්න ඇති. කලින් වතාවල ඒ විධියට සිද්ධ වුණාට අපි ඒක කරන්න සූදානම් නැහැ. අපි විභාග දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය පවත්වාගෙන යන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඒ ගරු මන්ත්‍රීතුමා ඒ පැත්තේම හිටියා නම් හොඳයි, ගරු කථානායකතුමනි. මේ පැත්තට නම් වැරදිලාවත් එන්න එපා කියලා මම තරයේ කියා සිටිනවා.

ගරු කථානායකතුමනි, ඇමතිවරයාට විභාග දෙපාර්තමේන්තුවේ වැඩකට අත ගහන්න බැහැ. ඒ නිසා තමයි කමිටුවේ නිර්දේශ අනුව විභාග දෙපාර්තමේන්තුවට තීරණ ගන්න අපි ඉඩ දුන්නේ. අනෙක් කාරණය තමයි, කඩඉම් ලකුණු.

ගරු කථානායකතුමනි, මේ සියලු දේ පරක්කු වුණේ විභාග දෙපාර්තමේන්තුවේ වැරැද්දක් නිසා නොවෙයි, නඩුව නිසායි. නඩුව ඉවර වනකල් අපට කිසි දෙයක් කරන්න බැරි වුණා. අපට තහනම් නියෝගයක් ආවා, paper marking නවත්වන්න කියලා.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහතා]

ඒ නිසා නඩු තීන්දුව ආවාට පස්සේ තමයි අපට මේ සියල්ලම කරන්න සිද්ධ වුණේ. ඒ අනුව කඩඉම් ලකුණු අපි දාලා තිබෙන්නේ. බොහොම ඉක්මනට ඒ කටයුතු ඉවර වෙනවා. ඒ ප්‍රශ්නය අපි පුළුවන් ඉක්මනින් නිරාකරණය කළා, ගරු කථානායකතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු අගමැතිතුමියනි, ඔබතුමියගේ උත්තරය හොඳයි. නමුත්, මම විශ්වාස කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව එනතුරු වැඩේ වුණේ නැහැ කියලායි. කමක් නැහැ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන්. විශේෂයෙන්ම ඔබතුමිය සේවය කළ විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපති පත් කිරීමේදී,-

ගරු කථානායකතුමා
(*මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට අදාළවම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නකෝ. එතකොට ප්‍රශ්නයක් නැහැ නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ ප්‍රශ්නය අහනවාට එතුමියගෙන් බාධාවක් නැති නිසා ප්‍රශ්නයක් නැහැ. අපි සාමාන්‍යයෙන් එහෙම අහනවා නේ. ඒකත් නවත්වන්න හදන්න එපා, ගරු කථානායකතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(*මාණ්පුමිකු பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)
ආසාව නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ආසාව නොවෙයි. මේක ප්‍රශ්නයක්. ආසාව මොකක්ද කියලා මම කියන්නම්. ගරු කථානායකතුමනි, බලන්න, හැම වෙලාවේම මම කථා කළාම පුදුම අමාරුවක් තිබෙන්නේ. මේක පුදුම ප්‍රශ්නයක් නේ. Egos තිබෙන්නේ මට නොවෙයි, ඔබතුමන්ලාට.

ගරු කථානායකතුමා
(*මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග හරියට කියවන්නකෝ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග මම කියවනවා; ස්ථාවර නියෝග මම කියවලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අපි ගරු ඇමතිතුමා කැමැති නම්,-

ගරු කථානායකතුමා
(*මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
ඔබතුමිය ප්‍රශ්නය අහනවාට කැමැතිද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමිය ප්‍රශ්නය අහන්න කිව්වා. මේ ප්‍රශ්නය අහනවාට එතුමිය අකැමැති නම් මම වෙනත් ප්‍රශ්නයක් අහන්නම්. නමුත්, එතුමිය "හා" කිව්වා. ගරු අගමැතිතුමිය ඒ ප්‍රශ්නය අහනවාට කැමැතියි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(*මාණ්පුමිකු (கலாநிதி) ஹரினி அமரசூரிய*)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ නේ. එක එක ඒවා කියනවා නේ.

දෙවැනි අතුරු ප්‍රශ්නය මම දැන් අහනවා.

ගරු අගමැතිතුමියනි, ඔබතුමියට මතක ඇති, ඔබතුමිය විවෘත විශ්වවිද්‍යාලයේ වැඩ කරන කාලයේ; රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපතිවරයා හැටියට හිටපු කාලයේ,-

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(*මාණ්පුමිකු (கலாநிதி) ஹரினி அமரசூரிய*)
(The Hon. (Dr.) Harini Amarasuriya)
රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති හැටියට හිටපු කාලයේ නොවෙයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, මට සමාවෙන්න. එතුමා ජනාධිපති වශයෙන් ඉන්නකොට නොවෙයි, ඊට කලින් උප කුලපති පත් කිරීමේදී ඇති වුණු ප්‍රශ්නයක් වෙලාවේ ඔබතුමිය ඊට මැදිහත් වුණා. මැදිහත් වෙලා එයට සාධාරණය ඉෂ්ට කරන්න කටයුතු කළා. මට මතක හැටියට, එදා එම පාලක සභාවෙන් නම් කර තිබුණු තුන්දෙනා වෙනුවට වෙනත් කෙනෙක් පත් කිරීම ගැන ඔබතුමියලා විශාල සටනක් කළා. මම වැරදි නම් නිවැරදි කරන්න. හැබැයි දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කරනකොට ඔබතුමියලා ඒ කාරණයට විරුද්ධ වුණා. දැන් ඔබතුමියගේ ආණ්ඩුව යටතේත් පාලක සභාවක් විසින් යෝජනා කර තිබෙන,- ඔබතුමියලා එන්න කලින් තමයි මේක යෝජනා කරලා තිබුණේ - නම් සම්බන්ධයෙන් එවැනි දෙයක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. විශේෂයෙන් රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුරට මහාචාර්ය ගිනිගද්දර, ආචාර්ය රාජපක්ෂ සහ මහාචාර්ය පර්සි විජේවර්ධන යන මහත්වරුන්ගේ නම් යෝජනා කරලා තිබුණා. මේ ආණ්ඩුව එන්න කලින් තමයි ඒ පාලක සභාව පත් කරලා තිබුණේ. මේක එම පාලක සභාවෙන් යෝජනා කරලා එවපු කාරණයක්. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ නම් තුන ආපහු යවලා, නැවත පාලක සභාවක් පත් කරලා, ඒ පාලක සභාවට කියනවා, නැවත නම් තුනක් එවන්න කියලා. පාලක සභාවල ඉන්නේ දේශපාලන හෙන්චයියලා නොවෙයි. ඒවායේ ඉන්නේ බොහොම උගත්, බුද්ධිමත් අය. කොහොම නමුත්, ඒක ඒ විධියට සිද්ධ වෙලා තිබෙනවා.

ඊළඟට, අග්නිදිග විශ්වවිද්‍යාලයේත් දැන් ඔය වාගේම තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා, නැහෙනහිර විශ්වවිද්‍යාලයේත් ඔය වාගේම තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඇත්තටම මෙය ඉතා වැරදිසහගත දෙයක්. මොකද, පරණ දේශපාලන ක්‍රමය අරගෙන යන්න නොවෙයි, ඒ දේශපාලන ක්‍රමවේදය ඉවත් කරන්නයි ඔබතුමියලා පත්වෙලා ඇවිල්ලා ඉන්නේ, ගරු අගමැතිතුමියනි. එම නිසා මම ගෞරවයෙන් ඉල්ලන්න කැමැතියි, නැවත පාලක සභාවක් පත් කරලා, ඒ තුළින් නැවත, - ඔබතුමියලාගේ කට්ටිය තමයි පත් කරලා තිබෙන්නේ. වැඩ කරලා තිබෙන කට්ටිය කවුද කියලා මම පෙන්වන්නම්. එසේ වැඩ කරපු කට්ටිය ඔක්කෝම ඔබතුමියලා තමයි පත් කරලා තිබෙන්නේ - මේ ක්‍රියාදාමය කරන්න යන්න එපා කියලා. අපට ප්‍රශ්නයක් නැහැ. මම අහන්නේ, ඇයි මේ පරණ ක්‍රියාදාමය විධියටම, පාලක සභාව විසින් නම් කරපු පිරිස තෝරා ගන්නේ නැතුව, ඒ අයව ඉවත් කරන්න, එහෙම නැත්නම් ඒ අය වෙනුවට වෙනත් අයගේ නම් යෝජනා කරලා මේ ක්‍රියාදාමය නැවත පටන් ගන්න කටයුතු කළේ? මොකද, මේක ඉතාම අසාධාරණයි. ආණ්ඩුවක් පත් වුණා කියලා ඊට මාස කිහිපයකට කලින් ලබා දුන් තීන්දුවක් ක්‍රියාත්මක නොකිරීම වැරැදියි කියන එකයි මම කියන්නේ.

මේ තත්ත්වය ඇති වුණේ එක විශ්වවිද්‍යාලයක විතරක් නොවෙයි. ඔබතුමන්ලා දන්නවා, රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මැතිතුමා එම තනතුරෙන් ඉවත් කළා. ඊළඟට, දැන් Rajarata University එකේත් මේ තත්ත්වය ඇතිවෙලා තිබෙනවා. නැගෙනහිර විශ්වවිද්‍යාලයේත් මේ තත්ත්වය ඇතිවෙලා තිබෙනවා. ඒ වාගේම අග්නිදිග විශ්වවිද්‍යාලයේත් ඇතිවෙලා තිබෙනවා. එතැන වෙනත් ප්‍රශ්නයක් තිබෙන්නට පුළුවන්. ඒ ගැන මම කථා කරන්නේ නැහැ. නමුත් මම කියන්නේ, සමස්තයක් විධියට නැවත පාලක සභා පත් කරලා ඒවායින් නැවත නිර්දේශ ගැනීම විශාල ප්‍රශ්නයක්. මොකද හේතුව, සාමාන්‍යයෙන් මාස 6කට කලින් තමයි මේ process එක පටන් ගන්නේ.

ඉතින්, මේක සම්පූර්ණ වැරදි කාරණයක්. මොකද, එතකොට ඉන්න අය සමහරවිට විශ්‍රාම යන්න පුළුවන්. මේ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේක අසාධාරණයි කියන කාරණය තමයි මම මතු කරන්නේ. මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එතුමා නීතිඥවරයකු නිසා මම මේක මතත් කරන එක කළ යුතු දෙයක්ද කියලා දන්නේ නැහැ. නමුත් මම මතක් කරන්න ඕනෑ, විශ්වවිද්‍යාල පනත යටතේ UGC - University Grants Commission - එකට තමයි Council එකෙන් නම් එවන්නේ. එතකොට University Grants Commission එක තමයි ඒ නිර්දේශය ජනාධිපතිට ඉදිරිපත් කරන්නේ. අමාත්‍යවරයාගේ මැදිහත්වීමක් ඒ ක්‍රියාවලියට කිසිසේත්ම නැහැ. උප කුලපති පත් කරන්නේ ජනාධිපති. නම් යවන්නේ UGC එක. එතකොට ඔය නම් කරපු විශ්වවිද්‍යාල තුනෙන්ම -රජරට, අග්නිදිග සහ නැගෙනහිර- ආපු ඒ යෝජනා UGC එක විශ්ලේෂණයකින් පසුව ප්‍රතික්ෂේප කළා කියලා මට දැනුම් දුන්නා. එතැන යම් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ marking scheme එක ඔවුන්ට පිළිගන්න බැහැ කියන එක UGC එකෙන් දැනුම් දීලා, ගරු ජනාධිපතිතුමාට දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා මේ ක්‍රියාවලිය නැවත වතාවක් advertise කරලා, recall කරලා නැවත පටන් ගන්නවා කියන එක තමයි UGC එක දැනුම් දුන්නේ. ඒ marking schemeවල ඔවුන්ට තිබුණා යම් ප්‍රශ්නයක්. ඒකත් එක්ක තමයි UGC එක ඒක නැවත advertise කළේ. එතකොට ඒ මහාචාර්යවරුන්ට නැවත වතාවක් ඉදිරිපත් වෙන්නත් පුළුවන්. ඒ කාලය තුළ, මාස තුන හතරක කාලයක් තුළ ඒ Council එක අපි නැවත පත් කළ බව හරි; ඒක සිද්ධ වුණා. නමුත් ඒකයි, මේ උප කුලපතිවරු පත් කිරීමයි අතර කිසිම සම්බන්ධයක් නැහැ.

රුහුණ විශ්වවිද්‍යාලයේ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස්. එහිදී සිද්ධ වුණේ, විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක් ඇති වුණා. ශිෂ්‍යයන් strike කළා, අනධ්‍යයන කාර්ය මණ්ඩලයත් strike කළා, Academicsලාත් strike කළා. එතකොට උප කුලපතිවරයාට ඇතුළු වෙන්න බැරි තත්ත්වයක් ඇති වුණා. මේ සම්බන්ධයෙන් නඩුවක් යන නිසා මම ඒ ගැන වැඩිපුර විස්තර කියන්න කැමති නැහැ. නමුත් ඇමතිවරිය හැටියට මට පනතින් පැවරිලා තිබෙන බලතල පාවිච්චි කරලා තමයි මම එතැනට Competent Authority කෙනෙක් පත් කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -153/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඕනෑ නම්, ගරු බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මට මේ ප්‍රශ්නයට පිළිතුර කියවන්න පුළුවන්. නමුත් ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා එතුමා ඔබතුමා එක්ක කථාබහ කර ගත් බව, එතුමා ඉන්න දවසක උත්තරය දෙන්නම් කියලා.

ගරු කථානායකතුමනි, බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අලි-මිනිස් ගැටුම: තිරසර විසඳුමක්
யானை - மனித மோதல்: நிரந்தரத் தீர்வு
HUMAN-ELEPHANT CONFLICT: SUSTAINABLE SOLUTION

188/2024

3. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලිවැට ඉදිකිරීම සහ ඒවා නඩත්තු කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

(ii) අලි-මිනිස් ගැටුම හේතුවෙන් ඉහත කාල සීමාව තුළ දී මිය ගිය වනඅලින් සංඛ්‍යාව, මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව සහ සිදු වූ දේපළ හානි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අලිවැට ඉදිකිරීමට සහ ඒවා නඩත්තු කිරීමට වැය කරන ලද මුදලට සාපේක්ෂව අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලැබී නැති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, අලි-මිනිස් ගැටුමට තිරසර විසඳුමක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

සුර්තාඩල් අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) 2015ආම ආණ්ඩු තොඩක්කම් ඉතුවරෙ යානෙ වේලිකළෙ අමෙප්පතර්කුම් අවර්රෙප් පරාමරිප්පතර්කුම් සෙලවිඩප්පට්ටුළ්ළ තොකෙ ඔව්වෝර් ආණ්ඩුවාරියාක වෙව්වේරාක එව්වළවු එන්පතෙයුම්;

(ii) මේර්කුරිප්පිට්ට කාලප්පකුතියිල් යානෙ-මනිත මෝතල්කළාල් උයිරිළන්ත යානෙකළිනතුම්, ආට්කළිනතුම් එණ්ණික්කෙ මර්රුම් සොත්තුච් සේතංකළින් එණ්ණික්කෙ ඔව්වෝර් ආණ්ඩු වාරියාක වෙව්වේරාක එව්වළවු එන්පතෙයුම්;

(iii) යානෙ වේලිකළෙ අමෙප්පතර්කුම් අවර්රෙප් පරාමරිප්පතර්කුම් සෙලවිඩප්පට්ටුළ්ළ තොකෙක්කු නිකරාක, යානෙ-මනිත මෝතලුක්කු නිරන්තරත් තීර්වු කිටෙක්කාතතෙ ඒර්රුක් කොළ්වාරා එන්පතෙයුම්;

(iv) ආමෙනිල්, යානෙ-මනිත මෝතලුක්කු නිරන්තරත් තීර්වොන්රෙ වළංකුවතර්කාක එටුක්කප්පටුම් නටවටික්කෙකළ් යාවෙ එන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අර්විවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Environment:

(a) Will he inform this House-

(i) the amount that was spent on the construction and maintenance of electric fences from 2015 to date, separately for each year;

(ii) the number of wild elephants and the number of people who perished and the amount of property damage caused by the human-elephant conflict during the above-mentioned period, separately for each year;

(iii) whether he accepts that a permanent solution to the human-elephant conflict has not been found, compared to the amount spent on the construction and maintenance of electric fences;

(iv) if so, the measures that will be taken to provide a sustainable solution to the human-elephant conflict?

(b) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

වර්ෂය	විදුලි වැට ඉදි කිරීමේ වියදම (රුපියල් මිලියන)	විදුලි වැට නඩත්තු වියදම (රුපියල් මිලියන)
2015	275.82	-
2016	239.5	71.82
2017	99.95	96.1
2018	141.5	9.1
2019	-	-
2020	-	-
2021	12.1	-
2022	9.6	-
2023	58.64	14.333
2024	69.81	37.435

විදුලි වැට ඉදි කිරීමේ වියදම, 2015 සිට 2019 දක්වා රුපියල් මිලියන 756.77යි; 2020 සිට 2024 දක්වා රුපියල් මිලියන 150.15යි.

විදුලි වැට නඩත්තු කිරීමේ වියදම, 2015 සිට 2019 දක්වා රුපියල් මිලියන 177.02යි; 2020 සිට 2024 දක්වා රුපියල් මිලියන 51.76යි.

(ii)

වර්ෂය	අලි මරණ සංඛ්‍යාව	මිනිස් මරණ සංඛ්‍යාව	සිදු වූ දේපළ හානි සංඛ්‍යාව
2015	205	63	1,151
2016	279	88	1,604
2017	256	87	1,425
2018	319	96	1,470
2019	407	122	2,094
2020	328	112	2,223
2021	375	142	1,808
2022	439	146	2,647
2023	488	184	3,429
2024	388	155	3,617
2025.01.31 දක්වා	43	03	-

අලි මරණ සිදු වෙලා තිබෙනවා, 2015 සිට 2019 දක්වා කාලය තුළ 1,466ක්; 2020 සිට 2024 දක්වා 2,018ක්; 2025 ජනවාරි 31 දක්වා 43ක්.

මිනිස් මරණ සිදු වෙලා තිබෙනවා, 2015 සිට 2019 දක්වා කාලය තුළ 456ක්; 2020 සිට 2024 දක්වා 739ක්; 2025 ජනවාරි 31 දක්වා 03ක්.

දේපළ හානි සිදු වෙලා තිබෙනවා, 2015 සිට 2019 දක්වා කාලය තුළ 7,744ක්; 2020 සිට 2024 දක්වා 13,724ක්. 2025 අවුරුද්දේ ජනවාරි මාසය තුළ සිදු වූ දේපළ හානි වාර්තා වී නැහැ.

දිස්ත්‍රික් වන්දි කමිටු මඟින් දේපළ හානිවලට අදාළව ගෙවීම් සිදු කරන බැවින් එම තොරතුරු ලබා ගැනීමේදී ප්‍රමාදයන් ඇති වේ. 2025.01.31දින වන විට මේ සම්බන්ධව ලැබී ඇති තොරතුරු ඉහත වගුවේ සඳහන් කර ඇත.

(iii) නැත.

(iv) අලි-මිනිස් ගැටුමට තිරසාර විසඳුමක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග රාශියක් තිබෙනවා. මේ අවස්ථාවේදී මා එම තොරතුරු ඇතුළත් ලේඛනය **සභාගත*** කරනවා.

වනඅලින් සිදු කරන වගා හානි, දේපළ හානි අවම කර ගන්න අපි විදුලි වැට ඉදිකිරීමේ කටයුතු සිදු කරනවා. 2024 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර විදුලි වැට මේ වනවිට කිලෝමීටර 5,612ක ඉදිකර තිබෙනවා. ඒ වාගේම විදුලි වැට ආරක්ෂා කර ගැනීමේ කටයුතු සඳහා ද මැදිහත් වෙනවා. ඒ සඳහා සිවිල් ආරක්ෂක භටයින් 4,005ක් යොදවා තිබෙනවා. වනඅලි හානි බහුලව සිදු වන ස්ථානවල වනඅලි පලවා හැරීම සඳහා මුර පොළවල් ස්ථාපිත කරලා, සිවිල් ආරක්ෂක භටයින් 737ක් යොදවා තිබෙනවා.

මේ ආකාරයට වනඅලි-මිනිස් ගැටුම් ඇති වීම වැළැක්වීම සඳහා පැතිරුණු ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන තිබෙනවා. වන අලින්ගේ සංචරණ රටා හඳුනා ගැනීම සඳහා GPS කරපටි යොදවා විද්‍යාත්මක පර්යේෂණ සිදු කර එම දත්ත පාවිච්චි කරගෙන පර්යේෂණ කටයුතුවල යෙදිලා අපට අලුතින් අත්හදා බලන්න පුළුවන් ක්‍රම සම්බන්ධයෙන් මැදිහත් වෙනවා. ඒ විධියට පුළුල් ක්‍රියාමාර්ග ප්‍රමාණයක් අරගෙන තිබෙනවා, මෙම ගැටුම නැති කරන්න.

(ආ) අදාළ නොවේ.

සභාමේසය මත තබන ලද ලේඛනය:
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:
Document tabled:

- වන අලි විසින් සිදු කරන වගා හානි, දේපළ හානි ජීවිත හානි අවම කිරීම සඳහා 2024 වර්ෂයේදී ඉදි කිරීම් ආරම්භ කර විදුලි වැට ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. විදුලි වැට මේ වනවිට කි.මී. 5,612ක ඉදි කර ඇත. වනජීවී කලාප දකුණ, ඌව, නැගෙනහිර, මධ්‍යම, වයඹ, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, වවුනියාව, කිලිනොච්චිය හා පොළොන්නරුව ආවරණය වන පරිදි කි.මී. 588ක විදුලි වැට ඉදි කරමින් පවතී.
- දැනට ඉදි කර ඇති විදුලි වැට නඩත්තුව හා ආරක්ෂා කිරීම සඳහා සිවිල් ආරක්ෂක භටයින් 4,005ක් යොදවා ඇත.
- වනඅලි හානි බහුලව සිදු වන ස්ථානවල වනඅලි පලවා හැරීම සඳහා මුර පොළවල් ස්ථාපිත කර සිවිල් ආරක්ෂක භටයින් 737ක් යොදවා ඇත.
- විදුලි වැට නඩත්තු කටයුතු හා ආරක්ෂාව සඳහා බහුකාර්යය සංවර්ධන සහයකයින් 3,647ක් දිවා රාත්‍රී අඛණ්ඩව විදුලි වැට නඩත්තුව හා ආරක්ෂා කිරීමේ කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.
- වනජීවී කලාපවල වනඅලි විසින් සිදු කරනු ලබන වගා හානි අවම කිරීමටත්, දෛනිකව වනඅලි පලවා හැරීමේ කටයුතු සඳහාත් වාර්ෂිකව 1,620,000ක් අලි වෙඩි මිල දී ගෙන බෙදා හැරීමට කටයුතු කර ඇති අතර, ඒ සඳහා වියදම රු.මී. 350කි.
  - වනඅලි විසින් සිදු කරන ජීවිත හානි, දේපළ හානි සඳහා වන්දි ගෙවීම සඳහා 2023 වර්ෂයේ රු.මී. 380ක් හා 2024 වර්ෂයට අදාළව මේ දක්වා ලබා දී ඇති තොරතුරු අනුව රු.මී. 372ක් ද ලබා දී ඇත.
  - වනඅලින්ගේ සංචරණ රටා හඳුනා ගැනීම සඳහා GPS කරපටි යොදවා විද්‍යාත්මක පර්යේෂණ සිදු කර ඇති අතර, මෙම දත්ත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්ම කරන ප්‍රදේශවල භාවිත කරමින් පවතී.
  - හානිදායක වශයෙන් හඳුනාගත් වනඅලින් අල්ලා ඉවත් කිරීම සිදු කොට ඇත.
  - වනඅලින්ගේ සංචරණවලට වන බාධා ඉවත් කිරීම සඳහා වනඅලි සංක්‍රමණ මාර්ග -අලිමංකඩ- හඳුනා ගැනීම හා ඒවායේ වන අලින්ගේ සංක්‍රමණවලට සිදු වන බාධා ඉවත් කිරීමට හා ආරක්ෂා කිරීමට කටයුතු කරමින් පවතී.
  - 2023 වර්ෂයේ සිට වන අලින්ගෙන් සිදු වන ජීවිත හානි අවම කිරීම සඳහා කළමනාකරණ ක්‍රමවේද කලාප මට්ටමින් ප්‍රායෝගිකව අනුගමනය කර ගනිමින් වනඅලි විසින් ජීවිත හානි සිදු කරන ග්‍රාම නිලධාරි වසම් හඳුනා ගෙන ගම්වාසීන්, ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් හා අදාළ ප්‍රාදේශීය සභා සම්බන්ධ කර ගනිමින් ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර, වනඅලින් සැරිසරන අතුරු මාර්ගයේ වනඅලින් දර්ශනය වන අයුරින් යටි පඳුරු ඉවත් කිරීම හා අතුරු මාර්ගවල අඳුරු සහිත ස්ථානවල වීදි ලාම්පු සවි කිරීමට කටයුතු කර ඇත.
  - වාසස්ථාන සුපෝෂණ කටයුතු 2023 - 2024

වර්ෂය	ආක්‍රමණශීලි ශාක ඉවත් කිරීම (හෙක්ටෙයාර)	තෘණ භූමි කළමනාකාරණය (හෙක්ටෙයාර)	මාර්ග දෙපස යටි රෝපණ ඉවත් කිරීම (හෙක්ටෙයාර)	ජල මූලාශ්‍ර වැඩිදියුණු කිරීම (සංඛ්‍යාව)
2023	386.9	258.27	118.64	9
2024	105	222	365	5

- වනඅලි හානි අවම කිරීම සඳහා සාර්ථක හා අසාර්ථකභාවය අධ්‍යයනය සඳහා පහත සඳහන් නව තාක්ෂණය යොදා ගැනීම අත්හදා බලා ඇත.
  1. ලංකාවේ දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද energizers භාවිත කරමින් උඩවලව, අම්පාර, පුත්තලම යන ප්‍රදේශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.
  2. අලින්ට අප්‍රිය වන පරිදි තරංග නිකුත් කරන උපකරණ භාවිත කරමින් අම්පාර, ගල්ගමුව, පොළොන්නරුව වනජීවී කලාපවල වනඅලින් පලවා හැරීම හා වනඅලින් ගම්මානවලට ඇතුළු වීම වැළැක්වීම සඳහා මෙම උපකරණ යොදා ගනිමින් අත්හදා බැලීම් සිදු කර ඇත.
  3. නාවික හා ගුවන් හමුදාව සම්බන්ධ කරගෙන ඩ්‍රෝන යාත්‍රා යොදා ගනිමින් වනඅලි පලවා හැරීමේ කටයුතු පුත්තලම, අනුරාධපුර, දකුණ යන වනජීවී කලාපවල සිදු කර ඇත.
  4. මීමැසි පාලනය උපයෝගී කරගෙන මීමැස්සන්ගේ ශබ්ද තරංග භාවිත කරමින් මාදුරුඔය, අම්පාර කලාපවල මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.
  5. කළුතෙල් කලවම් කර කඹ පිලිස්සීමෙන් ඇති වන දුම උපයෝගී කරගෙන වනඅලි විකර්ෂණය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කර ඇත.

**** පිළිතුර අවසානයේ පළ කර ඇත.***
** பதிலினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

6. උඩවලව ජාතික උද්‍යානයේ ප්‍රධාන විදුලි වැට කඩා බිඳ දමමින් වනඅලි ගම්මානවලට පැමිණෙන මාර්ග හඳුනාගෙන එම ස්ථානවල කොන්ක්‍රීට් තැටි සකස් කර බිම ඇතිරීමෙන් අධ්‍යයනයන් සිදු කර ඇත.

7. ඖෂධ ගැල්වූ හඳුන්කුරු වර්ගයකින් නිකුත් වන දුම උපයෝගී කරගෙන වනඅලින් විකර්ෂණය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කර ඇත.

8. දැනට භාවිත කරන විදුලි වැට ව්‍යුහයේ වැඩිදියුණු කිරීම් සිදු කර ඒවායේ කාර්යක්ෂමතාව ඉහළ දැමීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, සංඛ්‍යාලේඛන සහිතව බෙහෙවින් විස්තරාත්මකව මේ ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සම්බන්ධව.

ගරු ඇමතිතුමා මේ උත්තරය දුන්නාම ඇත්තටම මමත් shock වුණා. මේ සංඛ්‍යාලේඛන දිහා බැලුවාම ගරු ඇමතිතුමාත් පුදුම වෙන්න ඇති. ගරු අගමැතිතුමියත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු සංඛ්‍යා එකතු කළාම මේ අවුරුදු 10ට වනඅලි 3,519ක් මැරිලා තිබෙනවා. මිනිස්සු 1,198දෙනෙක් මැරිලා තිබෙනවා. අපට අලියෙකුගේ ජීවිතයක වටිනාකම මිල කරන්න බැහැ. ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් වනඅලියෙකුගේ මරණයකදී රුපියල් ලක්ෂ 10ක් විතර cost වෙනවා, දෙපාර්තමේන්තුවට. ඒ කියන්නේ, අලි මරණ වෙනුවෙන් මේ අවුරුදු 10 තුළ විතරක් රුපියල් මිලියන 3,519ක් දෙපාර්තමේන්තුවට වියදම් වෙලා තිබෙනවා. ඒ වාගේම, මිනිස් ජීවිතයක වටිනාකමත් අපට මිල කරන්න බැහැ. මේ අවුරුදු 10ට වනඅලි පහරදීම් නිසා මිනිස්සු 1,198ක් මැරිලා තිබෙනවා. ඒ කියන්නේ ඒ වෙනුවෙන් වන්දිවලට විතරක් මා දන්නා විධියට එක් අයෙකුට රුපියල් මිලියනය බැගින්, රුපියල් මිලියන 1,198ක් ගෙවා තිබෙනවා. ඉතින්, මේක බරපතළ තත්ත්වයක්. ගරු අගමැතිතුමියනි, මේ කාරණයේදී අවුරුදු 76ක කාලයට ශාප කරන එක නොවෙයි, අප එකතු වෙලා මෙය විසඳන වැඩ පිළිවෙළක් සඳහා දැඩි අවධානය යොමු කිරීම ඉතාම වැදගත් කියන කාරණයයි මම මේ කියන්නේ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම මේ කියන කාරණය කෙරෙහිත් ඔබතුමා අවධානය යොමු කරන්න. 2023 අවුරුද්දට සාපේක්ෂව 2024දී වනඅලි මරණ 100ක් අඩු වෙලා තිබෙනවා. පුද්ගල මරණ 29ක් අඩු වෙලා තිබෙනවා. ඒකට හේතුව මා සොයා බැලුවා. දෙපාර්තමේන්තුව විසින් මේක යම් මට්ටමකට manage කර තිබෙනවා. නොයෙක් ආණ්ඩු බලයට පත් වුණාම අලිවැට ගහනවා; තවත් සමහරු අලි අගල් කපනවා; තවත් සමහරු එක එක යෝජනා - proposals - ගෙන එනවා, ගරු ඇමතිතුමනි. *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

කකුල් දෙකේ අලි ප්‍රශ්නය විසඳලා නේ තිබෙන්නේ. ඒ නිසා- *[බාධා කිරීමක්]*

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

හැබැයි, නරි ප්‍රශ්නය තවම විසඳිලා නැහැ. වඳුරු ප්‍රශ්න, රිළා ප්‍රශ්න තවම තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මෙය manage කරන්න දෙපාර්තමේන්තුවක් තිබෙනවා. ඒ දෙපාර්තමේන්තුවට තමයි ඒ පිළිබඳව අත්දැකීම් වැඩියෙන්ම තිබෙන්නේ. ආණ්ඩුවක් බලයට පත් වුණාම ඔබතුමන්ලාගේ පැත්තේ උගත්, වියත් අය එක එක යෝජනා එවන්න පුළුවන්; තවත් අය යෝජනා එවන්න පුළුවන්. වැදගත්ම දේ ඒ දෙපාර්තමේන්තුවේ අයත් එක්ක එකතු වෙලා මේක manage කරන්නේ කොහොමද කියලා බලන එකයි. ගරු ඇමතිතුමනි, ඒකට ඔබතුමාට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි නිලධාරීන් සහ සේවක හිඟය. අය වැයෙනුත් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙන බව මම දැක්කා. ගරු ඇමතිතුමාත් මේ ගැන කථා කළා. ගරු ලාල් කාන්ත ඇමතිතුමාත් කථා කළා. මොකද, මේ සේවක හිඟය කියන ප්‍රශ්නය විසඳලා විතරක් ප්‍රමාණවත් නැහැ. ඒ සේවකයන් වැඩ කරනවා ද කියලා බලන්නත් ඕනෑ. මේකට අනෙක් ආයතනවල සහයෝගය ද ඔබතුමාට අවශ්‍යයි. ගමක ග්‍රාම නිලධාරිවරයා ඉන්නවා; කෘපනිස නිලධාරි ඉන්නවා; සංවර්ධන නිලධාරි ඉන්නවා; තව නොයෙක් නිලධාරීන් ඉන්නවා. ඒ නිලධාරීන් ලවා එම සේවකයන් වැඩ කරනවා ද කියලා ඔබතුමා සොයා බැලුවොත්, මා හිතන විධියට මේක manage කරන්න පුළුවන් වේවි කියලායි. විදුලි වැට හරියාකාරව කළමනාකරණය කරන්න නිලධාරීන් යෙදෙව්වොත් මේ ප්‍රශ්න තවත් ගොඩක් දුරට අඩු කර ගන්න පුළුවන් කියන එක තමයි දෙපාර්තමේන්තුව පැත්තෙන් අප දැකපු දේ. ඒක 2024 වර්ෂයේදී යම් මට්ටමකට කරලා තිබුණා. ඒ වෙනුවෙන් සිවිල් ආරක්ෂකයනුත් යොදවා තිබෙනවා. මේ ප්‍රශ්නය දැන් තිබෙන්නේ බරපතළ තත්ත්වයක. අවුරුදු 10කදී වනඅලින් 3,500ක් විතර මැරුණා කියන්නේ, average එක අවුරුද්දකට වන අලි 350ක් විතර මැරිලා තිබෙනවා කියන එකයි.

ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ නිලධාරීන් වැඩි කිරීමටත්, ඒ නිලධාරීන්ගේ සේවය පිළිබඳව සොයා බැලීමටත් - ඒ සේවය හරියට වෙනවාද කියන එක සොයා බලන්නත් - ඔබතුමා කඩිනම් වැඩ පිළිවෙළක් යොදලා තිබෙනවාද?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ඔව්, ගරු මන්ත්‍රීතුමනි. අපි මේ අය වැයෙනුත් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වැඩිපුර වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව කොයි තරම් සේවක ප්‍රමාණයක් හිඟද, මොනවාද තිබෙන අඩුපාඩු කියන එක ගැන සාකච්ඡා කරලා ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයෙන් බැට කන්නේ ජනතාව සහ අලින්. විශේෂයෙන්ම අලි වැට වාගේම spring gates තිබෙනවා. මම හොයලා බලපුවාම මෙතැන තිබෙන ඉතාම වැදගත් කාරණය තමයි මේ අලි ගැවසෙන ගම්මානවල ජීවත් වන ජනතාවගේ දැනුවත්භාවය මදිකම. මොකද, ජනතාවගේ චර්යා මේ අලි ගැටුම් එක්ක බද්ධ වෙනවා. පවුලක පස්දෙනෙක් ඉන්නවා නම්, ඒ පස්දෙනාගේ තිබෙන්නේ චර්යා පහක්. පාසල් දරුවන් සමාජයේ යන්නේ එන්නේ, ගැවසෙන්නේ එක විධියකට. මව ගැවසෙන්නේ එක විධියකට. පුරුෂයා ගැවසෙන්නේ තව විධියකට. මේ චර්යා එක්ක වැදගත් වෙන්නේ, රූපවාහිනී වැඩසටහන්වලට වඩා එහාට ගිහින් අලි ගැටුම් පිළිබඳව, එහෙම නැත්නම් අලි එක්ක තිබෙන මේ ගනුදෙනුව පිළිබඳව දැනුවත් කිරීමයි. පවුලක් විධියටත් වඩා එතැනින් පහළට ගිහින් පුද්ගලයන් විධියට, පවුලේ පස්දෙනෙක් ඉන්නවා නම් ඒ පස්දෙනාගේ චර්යා පහක් තිබෙන නිසා දැනුවත් කිරීම් පහක් සිදු වෙන්න ඕනෑ. ඔබතුමන්ලා මේ විධියට මේ ඉන්න

නිලධාරින්, කාර්ය මණ්ඩලය, තවත් කණ්ඩායම් යොදාගෙන ජනතාව දැනුවත් කිරීම, විශේෂයෙන්ම මේ අලි ගැවසෙන ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීම හරහා අලි මරණත්, මිනිස් මරණත් අඩු කරගන්න පුළුවන් කියන එක තමයි මම හොයලා බැලුවාම දැනගත්ත කාරණය. ඒ නිසා මේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන්න ඕනෑ. විශේෂයෙන්ම ඔබතුමන්ලාට ඉන්නවා නේ හොඳ cadre එකක්. ඔබතුමන්ලාගේ cadre එකේ ලක්ෂ තුන හතරක් ඉන්නවා, මම දන්නා විධියට. ඒ cadre එකටත් පන්තියක් පැවැත්වුවා නම් අලි වර්යා manage කරන්නේ කොහොමද කියලා, ඒ අයටත් මේ වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරන්න පුළුවන්. හෙට අනිද්දා ඡන්දය වෙනුවෙන් ගෙයින් ගෙට යන්න තිබෙන නිසා ඔවුන්ට මේ වෙනුවෙන් හොඳ කාර්යභාරයක් ඉටු කරන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. මම මේ විහිළු කරනවා නොවෙයි. මේ ජනතාව දැනුවත් කිරීම ඉතාම වැදගත් කාර්යභාරයක් විධියට මම දකිනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා ඉල්ලමින්, ඒ වෙනුවෙන් ඔබතුමන්ලා යම් දැනුවත් කිරීමේ වැඩසටහනක් සැලසුම් කරලා තිබෙනවාද, නැත්නම් වැඩසටහනක් සැලසුම් කරන්න කටයුතු කරනවාද කියන ප්‍රශ්නයට මම ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අදහස් වැදගත්. අපි ඒවා ගැන සලකා බලනවා. ඔබතුමා කිව්වා වාගේ මේ ප්‍රශ්නය විසඳීම සඳහා අපි දෙපාර්තමේන්තුවක් හැටියටත්, අමාත්‍යාංශයක් හැටියටත් මැදිහත් වෙනවා. මේ ප්‍රශ්නයට පුළුල් ලෙස මැදිහත් වෙන්න ඕනෑ කොහොමද කියන කාරණය පිළිබඳව සාකච්ඡා කරමින්, විශේෂයෙන් ඒ ප්‍රදේශවල ඉන්න මන්ත්‍රීවරුන්ගේ, ඒ සම්බන්ධයෙන් විශේෂඥතාව තිබෙන පරිසරවේදීන්ගේ - ඒ සියලු දෙනාගේ - අදහස් ලබාගෙන මැදිහත් වෙමින් ඉන්නවා. අපි විශ්වාස කරනවා, ඉතාම කෙටි කාලයක් තුළ මේ ගැටුම අවම කරන්න පුළුවන් වෙවි කියලා. ඒ සඳහා අපි මැදිහත් වෙනවා. ඔබතුමා ඉදිරිපත් කළ අදහසුත් අපි සැලකිල්ලට ලක් කරන්න සූදානම්. අපි විශ්වාස කරනවා, මේක ජාතික වශයෙන් අපි කවුරුත් මුහුණ පා තිබෙන ගැටලුවක් බව. එක පැත්තකින් අලි සංරක්ෂණයත් අනෙක් පැත්තෙන් ඒ ප්‍රදේශවල ජීවත් වෙන මිනිසුන්ගේ ජන ජීවිතය අවුල් වීමත් කියන කරුණු ලොකු ගැටලුවක් හැටියට තිබෙනවා. මෙතෙක් අනුගමනය කළ ක්‍රමවලට වඩා පුළුල් ක්‍රමයක් අනුගමනය කරමින්, ජනතාවත් සම්බන්ධ කරගනිමින් මෙම ප්‍රශ්නය විසඳාගන්න අපි මැදිහත් වෙනවා.

මඩකලපුව "මජ්මා නගර්" සුසාන භූමිය: විස්තර

மட்டக்களப்பு 'மஜ்மா நகர்' மயானம்: விபரம்
"MAJMA NAGAR" CEMETERY, BATTICALOA: DETAILS

291/2024

4. ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "කොවිඩ්-19" වසංගත රෝගය වැලදීම හේතුවෙන් මියගිය පුද්ගලයන් භූමදානය කිරීම සඳහා සුදුසු ස්ථානය ලෙස හඳුනාගන්නා ලද මඩකලපුව "මජ්මා නගර්" සුසාන භූමිය, සුසාන භූමි ආඥාපනත අනුව අයත් වන පළාත් පාලන ආයතනය කවරේද;

(ii) එම සුසාන භූමියේ විශාලත්වය කොපමණද;

(iii) එම ඉඩම රජය සතු වන්නේද;

(iv) එසේ නම්, එම ඉඩම නීත්‍යානුකූල ලෙස අත්පත් කර ගන්නා ලද ගැසට් පත්‍රය ඉදිරිපත් කරන්නේද;

(v) එම අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සුසාන භූමියේ සංවර්ධන කටයුතු සඳහා රජය විසින් වෙන් කරන ලද මුදල් සහ පෞද්ගලික පාර්ශ්වවලින් පරිත්‍යාග ලෙස ලැබූ මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික පාර්ශ්ව විසින් ලබා දෙන ලද යන්ත්‍රෝපකරණ ඇතුළු වෙනත් දේපළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "கொவிட்-19" பெருந்தொற்றால் உயிரிழந்தவர்களை நல்லடக்கம் செய்வதற்குப் பொருத்தமான இடமாக அடையாளம் காணப்பட்ட மட்டக்களப்பு "மஜ்மா நகர்" மயானமானது இடுகாடுகள், சுடுகாடுகள் கட்டளைச் சட்டத்தின் பிரகாரம் உரித்தாகும் உள்ளூராட்சி நிறுவனம் யாது;

(ii) மேற்குறிப்பிட்ட மயானத்தின் பரப்பளவு யாது;

(iii) மேற்குறிப்பிட்ட காணி அரசாங்கத்துக்கு உரித்தானதா;

(iv) ஆமெனில், மேற்படி காணி சட்டரீதியாகச் சுவீகரிக்கப்பட்டுள்ள வர்த்தமானி அறிவித்தலைச் சமர்ப்பிப்பாரா?

(v) மேற்படி சுவீகரிப்புக்கான நட்டஈடு செலுத்தப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி மயானத்தின் அபிவிருத்தி நடவடிக்கைகளுக்காக அரசாங்கம் ஒதுக்கீடு செய்துள்ள நிதித் தொகை மற்றும் தனிப்பட்ட தரப்பினர்களிடமிருந்து நன்கொடையாகக் கிடைக்கப்பெற்றுள்ள நிதித் தொகை வெவ்வேறாக யாது;

(ii) மேற்படி அபிவிருத்தி நடவடிக்கைகளுக்காக தனியார் தரப்பினரால் வழங்கப்பட்டுள்ள இயந்திர சாதனங்கள் உள்ளிட்ட ஏனைய சொத்துக்கள் யாவை?

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the name of the local government institution to which the "Majma Nagar" Cemetery in Batticaloa, which was identified as a suitable place for the burial of the dead bodies of the COVID-19 victims, belongs in terms of the Cemeteries and Burial Grounds Ordinance;

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

(ii) the extent of the said cemetery;
(iii) whether the said land is a State-owned land;
(iv) if so, whether the Gazette Notification, by which the said land was acquired legally, be presented; and
(v) whether compensation has been paid for the acquired land?

(b) Will he also inform this House -
(i) the amount of money allocated by the Government for the development of the aforesaid cemetery and the amount received as donations from private parties, separately?
(ii) the machinery and other assets provided by private parties for the said development activities?

(c) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කෝරලයිපත්තු බටහිර ඔඩ්ඩමාවඩි ප්‍රාදේශීය සභාව

(ii) අක්කර 10කි.

(iii) ඔව්.

(iv) කෝරලයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාවට මෙම ඉඩම් පවරා දෙන ලෙස වන ඉල්ලීම නැඟෙනහිර පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය සමඟ කෝරලයිපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදී අත්පත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(v) නැත.

(ආ) (i)
- සුසාන භූමියේ සංවර්ධන කටයුතු සඳහා මධ්‍යම රජයෙන් අරමුදල් ලැබී නොමැති නමුත්, ප්‍රාදේශීය සභා අරමුදලින් සුසාන භූමියේ නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ.
- 2021.03.05 සිට 2022.03.05 දක්වා කාලය තුළ කොවිඩ් වින්දිතයන්ගේ මළ සිරුරු 3,634ක් මෙහි භූමදාන කරන ලද අතර, එම භූමදාන කටයුතු සඳහා පෞද්ගලිකව ලැබූ පරිත්‍යාග මුදල රුපියල් 3,427,500කි.

(ii)
- රාජගිරිය, කොළඹ ලිපිනයේ පිහිටි NIDA පදනම නම් රාජ්‍ය නොවන සංවිධානය විසින් ආරක්ෂිත තාප්පය ඉදිකිරීම සඳහා මිලිමීටර් 10 වානේ බාර් 2,350ක්, මිලිමීටර් 12 වානේ බාර් 25ක් සහ බන්ධන වයර් කිලෝග්‍රෑම් 75ක් පරිත්‍යාග කර ඇත.
- දිනපතා රටේ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන අමුත්තන් විශාල සංඛ්‍යාවක් තම ආදරණීයයන්ගේ සොහොන් ගෙවල් නැරඹීමට පැමිණෙන බැවින්, ඔවුන් සඳහා මූලික පහසුකම් සහිත බහුකාර්ය ගොඩනැගිල්ලක් බෙරුවල වයිනා ෆෝර්ට්හි පදිංචි ජවාහිර් හාජියාර් යන අයගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදිකර ඇත.
- සුසාන භූමිය වටා අලි වැටක් සහ විදුලිබල සැපයුම කොළඹ අත්සාල් මරයික්කාර් මහතාගේ ධන පරිත්‍යාගයෙන් ස්ථාපනය කර ඇත.
- මහනුවර මුස්ලිම් පල්ලියේ සම්මේලනය විසින් කැණීම් කටයුතු සඳහා JCB යන්ත්‍රයක් ලබා දුන් නමුත්, ගැඹුරු කැණීම් සඳහා එම යන්ත්‍රය භාවිතයට ගත නොහැකි වූ බැවින්, ඔවුන් එම යන්ත්‍රය ඉවත් කර ගන්නා ලද අතර, ඉන් අනතුරුව ප්‍රාදේශීය සභාවේ JCB යන්ත්‍රය හා අනෙකුත් යන්ත්‍රෝපකරණ භාවිතයෙන් එම කටයුතු පවත්වා ගෙන යන ලදී.

(ඇ) අදාළ නොවේ.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමා කියා සිටියා, කොවිඩ් වැලඳීමෙන් මරණයට පත් වුණු 3,000කට වැඩි පිරිසකගේ මළ සිරුරු මේ සුසාන භූමියේ වළ දමා තිබෙන බව. එතුමා දන්නවා, විශේෂයෙන්ම මේ ප්‍රශ්නය පිළිබඳව මම විටින් විට සෞඛ්‍ය ඇමතිතුමාගෙනුත් අසා තිබෙන බව. අවිද්‍යානුකූල තීරණයක් මත, භූගත ජලය ඉතාම ගැඹුරින් තිබෙන ප්‍රදේශයකට මේ දේහ ගෙන යා යුතුයි කියලා ගත් ඒ වැරදි තීරණය මත විශාල ජනකායක් අසීරුතාවලට, පීඩනවලට පත් වුණා තමන්ගේ ඥාති-මිත්‍රාදීන්ට අවසන් ගෞරව දැක්වීමට කිසිම අවස්ථාවක් නැතිව. මොකද, ඒ මළ සිරුරු දුර බැහැර ප්‍රදේශයකට ගෙන යන්න සිදු වුණා.

දැන් මගේ ප්‍රශ්නය වන්නේ මේකයි. විශේෂයෙන්ම ඔඩ්ඩමාවඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මජ්මා නගර් කියන මේ ප්‍රදේශය ඉතාම දුෂ්කර ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ ඉතාම දිළිඳු පවුල් 300ක් පමණ ජීවත් වෙනවා. එම ප්‍රදේශයේ වගා කටයුතු කරගෙන ආපු බලපත්‍රලාභීන් කිහිප දෙනෙකුටත් අසාධාරණයක් වෙලා තිබෙනවා, මෙම ඉඩම අත්පත් කර ගැනීම උඩ. එම බලපත්‍රලාභීන්ගෙන් 10දෙනෙක් විතර ඉල්ලීම් කරලාත් තිබෙනවා, තමන්ට විකල්ප ඉඩම් ලබා දිය යුතුයි කියලා.

විකල්ප ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් සංවර්ධන කමිටුවේදීත් සාකච්ඡා වෙලා තිබෙනවා. ඒ අනුව බලපත්‍ර අහිමි වුණු ඒ ඉඩම්ලාභීන්ට රජයේ ඉඩම් තිබෙන යාබද ප්‍රදේශවලින් ඉඩම් ලබා දීමට ඔබතුමා කටයුතු කරනවාද?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, මෙම ඉඩම රජයේ ඉඩමක් හැටියටයි තිබුණේ. නමුත්, යම් පිරිසක් විසින් එය ගොඩ භෝග වගාව සඳහා පෞද්ගලිකව යොදා ගෙන තිබුණා. ඒ ඉඩම තමයි ඒ සුසාන භූමිය සඳහා අරගෙන තිබෙන්නේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට, ඔවුන්ට විකල්ප ඉඩම් ලබා දෙන්න බාධාවක් නැහැ.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීම සඳහා ගරු මොහොමඩ් සාලි නලීම් මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
ගරු ඇමතිතුමනි, මෙම්මා නගර් වටා කිලෝමීටර 21ක අලි වැටක් ඉදිකරන්න ඕනෑ. හැබැයි, DCC meetingsවලදී කිව්වා, කිලෝමීටර 6ක අලි වැටක් ඉදිකරන්න පුළුවන් කියලා. මෙම්මා නගරය වටේ සම්පූර්ණයෙන්ම වට කරනවා නම් කිලෝමීටර 21ක්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අදාළ අතුරු ප්‍රශ්නය අහන්න.*[බාධා කිරීමක්]* අලි වැටක් ගැන අහන්න.

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
අලි වැට සම්බන්ධයෙන් තමයි ගරු කථානායකතුමනි, මේ අතුරු ප්‍රශ්නය මම අහන්නේ. අලි වැට සම්පූර්ණයෙන්ම **ඉදි කරනවා** නම් ඒ සඳහා කිලෝමීටර් 21ක් ඕනෑ. කිලෝමීටර 6ක් මදි, මෙම්මා නගර්වලට. අනෙක් කාරණය තමයි, **ඒ ප්‍රදේශයේ** ජාති හතරේම මිනිස්සු භූමිදානය කරන්න තිබෙන්නේ ඒ ඉඩම. ඒ පාරවල් -කිලෝමීටර 3ක්- හදන්නත් තිබෙනවා. ත්‍රිකුණාමලය, ගාල්ල, කොළඹ, නුවර ප්‍රදේශවල familiesවල අය ඔක්කොම මෙම්මා නගර්වලට එනවා. ඒ නිසා ඒ ප්‍රදේශයේ කිලෝමීටර තුනහමාරක පාර හදන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ගැනත් concentrate කරන්න.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, අපට තිබෙන වාර්තා අනුව සුසාන භූමියට අක්කර 10ක් වෙන් කර තිබෙනවා. ඊට අදාළ අලි වැට සකස් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණයට අදාළව පරිසර ඇමතිතුමාගේත් මැදිහත් වීමෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්න පුළුවන්කම තිබෙනවා.

ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් : විස්තර
ஊவா மாகாண பகிரங்க சேவை ஆணைக்குழுவின் அங்கத்தவர்கள்: விபரம்
MEMBERS OF PUBLIC SERVICE COMMISSION, UVA PROVINCE: DETAILS

389/2025

5. ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) සභාපතිවරයාද ඇතුළුව වර්තමාන ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පත් කර ඇති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) සභාපතිවරයාද ඇතුළුව එම එක් එක් සාමාජිකයාගේ නම, ඊට පෙර සේවය කර ඇති ආයතනය, දරා ඇති තනතුර සහ සමාජීය වශයෙන් සිදු කර ඇති කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සභාපතිවරයාට සහ සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඊට පෙර පැවති කොමිෂන් සභාවට පත් කර සිටි සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தலைவர் உள்ளடங்கலாக, தற்போதைய ஊவா மாகாண பகிரங்க சேவை ஆணைக்குழுவில் நியமிக்கப்பட்டுள்ள அங்கத்தவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தலைவர் உள்ளடங்கலாக அத்தகைய ஒவ்வோர் அங்கத்தவரினதும் பெயர், இதற்கு முன்னர் பணியாற்றிய நிறுவனம், வகித்த பதவி மற்றும் நிறைவேற்றிய சமூகப் பணிப்பொறுப்பு என்பன வெவ்வேறாக யாதென்பதையும்;

(iii) தலைவருக்கும் மற்றைய அங்கத்தவர்களுக்கும் செலுத்தப்படும் கொடுப்பனவுகள் வெவ்வேறாக யாதென்பதையும்;

(iv) இதற்கு முன்னர் இயங்கிய ஆணைக்குழுவுக்கு நியமிக்கப்பட்டிருந்த அங்கத்தவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House the -

(i) number of members appointed to the present Provincial Public Service Commission, Uva Province including the Chairman;

(ii) name of each of the members including the Chairman, the institution they previously served in, the position held and the social work they have performed, separately;

(iii) amount paid as allowance to the Chairman and each member, separately; and

(iv) number of members appointed to the previously existed Commission?

(b) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සාමාජිකයන් 10කි.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(ii) ඇමුණුම 01 මගින් දැක්වේ.

ඇමුණුම 01

අ.අ.	නම	තනතුර	පෙර සේවා ස්ථානය	දරා ඇති තනතුර	සාමාජිය වශයෙන් සිදුකර ඇති කාර්යභාරය
1	එච්.එම්.ආරියනන්ද හෙන්නායක මහතා	සභාපති	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහියංගණය	ප්‍රාදේශීය ලේකම්	තනතුරට අදාළ රාජකාරී කටයුතු
2	සාලි මොහම්මදු ෆාරුක් මහතා	සාමාජික	නගර සභාව, හපුතලේ	පරිපාලන නිලධාරී	තනතුරට අදාළ රාජකාරී කටයුතු
3	ආර්.එම්. උබේවංශ මහතා	සාමාජික	ජාතික විගණන කාර්යාලය (විගණකාධිපති දෙපාර්තමේන්තුව)	විගණන අධිකාරී	තනතුරට අදාළ රාජකාරී කටයුතු
4	ඩී.එම්.ගාමිණී ප්‍රේමරත්න රඹකැන්පුර මහතා	සාමාජික	දිසා මහේස්ත්‍රාත් අධිකරණය, මහියංගණය	නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්	තනතුරට අදාළ රාජකාරී කටයුතු
5	එස්.පී.දයානන්ද මහතා	සාමාජික	කලාප අධ්‍යාපන කාර්යාලය, බදුල්ල	සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ	තනතුරට අදාළ රාජකාරී කටයුතු
6	තක්ෂිලා කුමාරි සූරියආරච්චි මහත්මිය	සාමාජික	දිසා අධිකරණය, මොණරාගල මහේස්ත්‍රාත් අධිකරණය, බිබිල	නීතිඥ	තනතුරට අදාළ රාජකාරී කටයුතු
7	එස්.කේ.හෙට්ටිආරච්චි මහතා	සාමාසික	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මොනරාගල	ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු	තනතුරට අදාළ රාජකාරී කටයුතු
8	බී.එම්.මුණසිංහ දසනායක බණ්ඩා මහතා	සාමාසික	පොලිස් ස්ථානය, බණ්ඩාරවෙල	ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	තනතුරට අදාළ රාජකාරී කටයුතු
9	ඒ.මෝහනදාස් මහතා	සාමාසික	බදුල්ල උසාවිය	නීතිඥ	තනතුරට අදාළ රාජකාරී කටයුතු
10	ජී.බී.හරිත් ලක්ෂිත ද සිල්වා මහතා	සාමාසික	මහේස්ත්‍රාත් අධිකරණය, බණ්ඩාරවෙල	නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්	තනතුරට අදාළ රාජකාරී කටයුතු

(iii) ඇමුණුම 02 මගින් දැක්වේ.

ඇමුණුම 02

අනු අංකය	නම	ලබා ගන්නා දීමනා	
1	එච්.එම්. ආරියනන්ද හෙන්නායක මහතා	මාසික දීමනාව	රු. 35,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
2	සාලි මොහම්මදු ෆාරුක් මහතා	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
3	ආර්.එම්. උබේවංශ මහතා	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
4	ඩී.එම්.ගාමිණී ප්‍රේමරත්න රඹකැන්පුර මහතා	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
5	එස්.පී. දයානන්ද මහතා	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
6	තක්ෂිලා කුමාරි සූරියආරච්චි මහත්මිය	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
7	එස්.කේ. හෙට්ටිආරච්චි මහතා	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
8	බී.එම්. මුණසිංහ දසනායක බණ්ඩා මහතා	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
9	ඒ. මෝහනදාස් මහතා	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00
10	ජී.බී. හරිත් ලක්ෂිත ද සිල්වා මහතා	මාසික දීමනාව	රු. 20,000.00
		දුරකථන දීමනාව	රු. 4,000.00

(iv) සභාපති ඇතුළුව 08දෙනෙකි.

(ආ) අදාළ නොවේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මීට කලින් උෟව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉඳලා තිබෙන්නේ සාමාජිකයින් හයදෙනායි. ඔබතුමන්ලාගේ කාලය තුළ, ඊයේ-පෙරේදා උෟව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට 10දෙනෙක් පත් කරලා තිබෙනවා. එතකොට හතරදෙනෙක් වැඩියි. වියදම වැඩියි. ඔබතුමන්ලා වියදම අඩු කරනවා කියලා තමයි පටන් ගත්තේ. උෟව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පසු ගිය කාලයේ පවත්වා ගෙන ගියේ, සාමාජිකයින් හයදෙනෙකුගෙන්; සභාපති සහ සාමාජිකයින් හයදෙනායි. වර්තමාන උෟව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තමයි වැඩිම සාමාජිකයින් ගණන වන සභාපති ඇතුළුව දහදෙනෙක් ඉන්නේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමා මොනවාද කියන්නේ?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, උෟව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මීට කලිනුත් සභාපති ඇතුළුව සාමාජිකයින් අටදෙනෙක් ඉඳලා තිබෙනවා. මෙවර දහදෙනෙක් පත් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවක සාමාජික සංඛ්‍යාව ලෙස අවමය තුන්දෙනෙක් ඉන්න ඕනෑ, උපරිම සීමාවක් නිශ්චය කරලා නැහැ. ඒ අනුව තමයි, මේ දහදෙනෙකු නම් කරලා තිබෙන්නේ. වියදම් අඩු කිරීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණයට අපිත් එකඟයි. නමුත්, මේ වියදම්වලට වඩා විශාල වියදම් ප්‍රමාණයක් අපි වෙනත් ක්‍රමවලින් අඩු කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා උෟව පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පත් කර ඇති සභාපති සහ සභිකයින් සඳහා යන වියදම අඩු කර ගන්න පුළුවන් නම් හොඳයි. නමුත්, ඒක දශම ගණනක් කියලායි මම හිතන්නේ. ඊට වඩා විශාල වශයෙන් අපි රජයේ මුදල් ඉතිරි කරන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, අවම තුන්දෙනායි, උපරිමය සීමාවක් නැතුව පත් කරන්න පුළුවන්. දහයක් නොවෙයි, විස්සක් වුණත් පත් කරන්න පුළුවන්. මම මහ ඇමති කාලයේ හයයි පත් කරලා තිබුණේ. නමුත්, සීමාවක් නැතුව පත් කරගෙන, පත් කරගෙන යන්න පුළුවන්. ඒක උත්තරයක් නොවෙයි. ඊළඟ එක තමයි, සාමාජිකයින්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මොනවත් ඉතිරි කරන්න බැහැ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මුදල් ඉතිරි කරන්න බැහැ.

අපට ඒක පිළිගන්න වෙනවා. කමක් නැහැ, ඔබතුමා ඒකට මැදිහත් වෙන්න. ඕනෑවට වඩා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පුරවන්න එපා. ඒක ආණ්ඩුවටත් හොඳ නැහැ; අපිටත් හොඳ නැහැ; කාටවත් හොඳ නැහැ. ඒක තමයි මගේ පළමු අතුරු ප්‍රශ්නය.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. අද පළාත් නවයෙන්ම ඌව පළාත් සභාවේ තමයි වැඩියෙන්ම නිලධාරීන්ගෙන් පළි ගන්නේ. ආණ්ඩුකාරවරයෙක් පත් කරලා තිබෙනවා. නමුත්, ආණ්ඩුකාරතුමා වැඩක් නැහැ. ආණ්ඩුකාරතුමා නොවෙයි, පාලනය කරන්නේ. දෙන්නෙක් අනුයුක්ත කරලා තිබෙනවා. විහාරමහා දේවි විද්‍යාලයේ ගුරුවරයෙක් සහ හාලිඇල, විද්‍යා විද්‍යාලයේ ගුරුවරයෙක් අනුයුක්ත කරලා තිබෙනවා. දේශපාලනය කරන්න බැහැ, ආණ්ඩුකාරවරයාට. ඒගොල්ලන්ට දේශපාලනය කරන්න ඕනෑ නම්, ඊළඟ පළාත් සභා මැතිවරණයෙන් පළාත් සභාවේ මන්ත්‍රී වෙලා, ඇමති වෙලා; මහ ඇමති වෙලා දේශපාලනය කරන්න කියන්න. මොකද, පළාත් සභාව පාලනය කරන්නේ දැන් ආණ්ඩුකාර කාර්යාලයේ ඉඳන්. මේ වෙනකොට ප්‍රධාන ලේකම් මාරු කළා. කමක් නැහැ, අලුත් ප්‍රධාන ලේකම් කෙනෙක් ඔය ගොල්ලන් - ජනාධිපතිතුමා - පත් කළා. එක්කෝ ඒ අලුත් ප්‍රධාන ලේකම්ට වැඩ කරන්න දෙන්න ඕනෑ. එක්කෝ ආණ්ඩුකාරවරයාට වැඩ කරන්න දෙන්න ඕනෑ. දෙන්නාටම වැඩ කරන්න දෙන්නේ නැහැ. ගුරුවරු හිතුමතේ මාරු කරනවා, නිලධාරීන් මාරු කරනවා. Facebook ඇතුළු ඔක්කෝම සමාජ මාධ්‍යවල මේවා පළ වෙනවා. ලංකාවේ අනෙක් පළාත් සභාවල මෙහෙම ප්‍රශ්නයක් නැහැ. ඌව පළාත් සභාවේ විතරක් මේක ලොකු ප්‍රශ්නයක්. අධි ශ්‍රේණියේ නිලධාරීන් මාරු කරනවා. පෙන්ෂන් යන්න මාස තුනක් තිබිය දී අධ්‍යාපන ලේකම්ව, කොමිෂන් සභාවේ ලේකම් කරනවා. මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේක හරි නැහැ, ආණ්ඩුවට. ඔබතුමන්ලා ආණ්ඩුව හැටියට ඒ ගැන සොයා බලන්න වෙයි.

ගරු කථානායකතුමනි, අනෙක් කරුණ මෙයයි. දැන් පළාත් සභාවල උපාධිධාරීන්ව register කරනවා. එම register කරන උපාධිධාරීන්ට රැකියා ලබා දෙයි කියලා ඒ අය තුළ ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ ගැනත් මම මේ වෙලාවේ දී අහනවා.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කළ පළමු ප්‍රශ්නයට අදාළව නැවතත් කියන්න තිබෙන්නේ මෙයයි. මීට කලින් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් 8දෙනෙක් ඉඳලා තිබෙනවා, සභාපතිතුමාත් ඇතුළත්ව. *[බාධා කිරීමක්]* ඔව, 6දෙනා නොවෙයි. ගුරුවරු දෙන්නෙක් පත් කරලා තිබෙනවා කිව්වා. නමුත්, මට ලැබී තිබෙන තොරතුරු අනුව එතැන කිසිම ගුරුවරයෙක් නැහැ. ඔක්කෝම වෙනත් නිලධාරීන් තමයි, -

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගුරුවරු දෙන්නෙක් ආණ්ඩුකාර කාර්යාලයට අනුයුක්ත කරලා තිබෙනවා.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

උපාධිධාරීන් සම්බන්ධව අහපු ප්‍රශ්නය ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නැහැ. ඒ නිසා මා එම ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් වැළකී සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය. විපක්ෂ නායක, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සහ අපරාධ මැඩලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
தேசிய பாதுகாப்பை உறுதிப்படுத்தவும் குற்றங்களைக் கட்டுப்படுத்தவும் எடுக்கப்பட்ட நடவடிக்கைகள்
MEASURES TAKEN TO ENSURE NATIONAL SECURITY AND CONTROL OF CRIMES

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ "නීතිය මත පාලනයක් - සම්ප්‍රවේශී අධිකරණ පද්ධතියක්" යන තේමාවෙන් යුතුව,

I. සාධාරණව හා සමානව නීතිය රැකවරණය
II. විනිවිදභාවය හා කාර්යක්ෂමතාවය
III. ස්වාධීනත්වය හා ජනතා විශ්වාසය

යන මූලධර්ම තුන මත පදනම්ව කටයුතු කරන බව රජය මහජනතාවට පොරොන්දු වී ඇත.

නමුත් වර්තමාන තත්ත්වය දෙස බලන විට සංවිධානාත්මක අපරාධ කල්ලි හිස එසවීමත්, අධිකරණය තුළ සිදු වූ මනුෂ්‍ය ඝාතනයත්, මහජනතාව ආරක්ෂක වටපිටාවක ජීවත් නොවන බවට වන පුරවැසි හැඟීමක් ජනිත කර ඇත. 2025 වසරේ මුල් මාස දෙක තුළදී පමණක් වෙඩි තැබීම් 17ක් වාර්තා වීම මේ තත්ත්වය තවත් අසතුටුදායක තත්ත්වයකට පත් කර ඇත. එවැනි පසුබිමක් තුළ පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරන අතර, ඒ සඳහා නිවැරදි පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් අපේක්ෂා කරමි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

1. දිගින් දිගටම සිදුවන වෙඩි තැබීම් හා මනුෂ්‍ය ඝාතන සාමාන්‍ය ජන ජීවිතය නොසන්සුන් කර ඇති බව රජය පිළිගන්නේ ද? මේ පිළිබඳ රජයේ ස්ථාවරය කුමක් ද? මෙම තත්ත්වයන් සමනය කිරීමට රජය මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය කවරේ ද?

2. ආයුධ පෙන්වීමට ගොස් මරා දැමීම නැවත නැවතත් සිදුවන අතර, අපරාධ සාක්ෂි වසන් කිරීම සඳහා ඝාතන රැළි සිදුවන බවට ද මහජන මතයක් ගොඩනැගී ඇත. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 205හි, "පොලිස් ස්ථානයකින් අපරාධකරුවෙකු යම් කාරණයක් සඳහා පිටතට රැගෙන යන්නේ නම් එම සැකකරුවන්ගේ ජීවිතය ආරක්ෂා වන ආකාරයේ විධිමත් ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීම" යනුවෙන් සඳහන් කර ඇත. මෙම ප්‍රතිපත්තිය අනුව මේ වන විට රජය ක්‍රියාත්මක වන්නේ ද? එසේ නොමැති නම් ක්‍රියාත්මක වන්නේ කවදා සිට ද? ඒ සම්බන්ධව වන මාර්ගෝපදේශ සභාගත කරන්නේ ද? ඒ සම්බන්ධයෙන් පොලීසිය අනුගමනය කරන වෙනත් මහ පෙන්වීම්, චක්‍රලේඛ හෝ නඩු තීන්දු මොනවාද? ඒවා සභාගත කරන්නේ ද?

3. අපරාධ ඝාතනකරුවන් හඹා ගොස් අත්අඩංගුවට ගැනීම්වලදී සිදුවන සංදර්ශනාත්මක මාධ්‍ය භාවිතයන් හා පසු වාර්තාකරණයන් සම්බන්ධ ආණ්ඩුවේ නව නිර්ණායකයන් මොනවාද? එම මාර්ගෝපදේශ සභාගත කරන්නේ ද? පසුගිය කාලයේ සිදුවී ඇති සිදුවීම්වලදී අපරාධකරුවන් උත්කර්ෂයට නැංවීම මෙන්ම අත්අඩංගුවට ගන්නා නිලධාරීන් කෙරෙහි මහජන වෛරයක් හට ගන්නා අයුරින් වාර්තා පළ වූ බව පිළිගන්නේ ද? මේ පිළිබඳව රජයේ ස්ථාවරය කුමක්ද?

4. ඝාතනයන් සිදු වූ පසු අපරාධකරුවන් පසුපස හඹා ගොස් අත්අඩංගුවට ගැනීම් හැර අපරාධ වැළැක්වීම සඳහා ද රජය සතු නිශ්චිත වැඩ පිළිවෙළක් තිබේ ද?

   පොලිස්පතිතුමා සහ පොලිස් කොමිසම අතර ගැටුමක් ඇති බවට ඇතැම් පුවත් වාර්තා වීම සත්‍යයක්ද? පොලීසිය සම්බන්ධයෙන් ස්වාධීන කොමිෂන් සභාවක ක්‍රියාකාරිත්වය ඉදිරියටත් පවත්වාගෙන යාම රජයට ගැටලුවක් වී තිබේද?

5. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ "උසස් ජාතික ආරක්ෂාවක් - සුරක්ෂිත රාජ්‍යයක්" යන තේමාව යටතේ පිටු අංක 225හි සඳහන් ජාතික ආරක්ෂාව සඳහා වගකීම සහ වගවීම සහතික කරමින් ජාතික ආරක්ෂක කවුන්සලය ශක්තිමත් කිරීම සඳහා රජය මේ වන විට ගෙන ඇති වැඩ පිළිවෙළ කුමක්ද? දැනට එහි සාමාජිකත්වය දරන්නේ කවුරුන්ද? එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව රජය සෑහීමකට පත් වන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

ගරු කථානායකතුමනි, ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමියගේ අවධානයට මම මේ කාරණයත් යොමු කරනවා. සියයට 15ක සේවා අපනයන බද්දක් පනවලා අද ඩිජිටල්කරණයට සහ ඩිජිටල් ආර්ථිකයට බරපතළ පහරක් එල්ල වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ඔබතුමිය කැමැතියි නේ, මේකට උත්තර දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අගමැතිතුමියනි, ඔබතුමියට පුළුවන් නේ, මේකට උත්තර දෙන්න. *[බාධා කිරීමක්]* හරි, ගරු ඇමතිතුමා උත්තර ලබා දේවි. එතුමා කැමැතියි, මේ ප්‍රශ්නය අහනවාට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේච්චර වෙලා කාලය ගත්තේ මම නොවෙයි, ගරු කථානායකතුමනි. මට විනාඩියක් දෙන්න. ගරු අමාත්‍යතුමා එකඟ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේ මම අහන්න කැමැතියි, සියයට 15ක සේවා අපනයන බද්දක් පැනවීම ඇත්ත වශයෙන්ම මේ රටේ -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා එකඟ වෙලා තිබෙන්නේත්, එතුමා ලැහැස්ති වෙලා ඇවිල්ලා තිබෙන්නේත් විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ ලිඛිතව ඉදිරිපත් කරපු ප්‍රශ්නයට උත්තර දෙන්නයි. එතුමා ඒකට උත්තර දෙන්න ලැහැස්ති වෙලා ඉන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා ඔබතුමා ඒ අනුව කටයුතු කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා අසුන්ගන්න. [බාධා කිරීමක්] ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුරු සපයන්න. [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමා එකඟයි. මට අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
බදු සම්බන්ධ ප්‍රශ්නය නේ. *[බාධා කිරීමක්]* ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට පිළිතුරු සපයන්නේ ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරපු ප්‍රශ්නයට මම පිළිතුරු සපයනවා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව එහි සඳහන්, "නීතිය මත පාලනයක් - සම ප්‍රවේශීය අධිකරණ පද්ධතියක්" යන තේමාවෙන් යුතුව සාධාරණව හා සමානව නීතියේ රැකවරණය, විනිවිදභාවය හා කාර්යක්ෂමතාව, ස්වාධීනත්වය හා ජනතා විශ්වාසය කියන මූලධර්ම තුන මත තමයි අපි කටයුතු කරන්නේ.

1.
- පසුගිය දින කීපය තුළ තැන තැන සිදු වූ වෙඩි තැබීම්, මනුෂ්‍ය ඝාතන සාමාන්‍ය ජන ජීවිතය නොසන්සුන් කිරීමට හේතුවක් හැටියට අපි පිළිගන්නේ නැහැ.
- අපරාධ සම්බන්ධයෙන් වාර්තා වන දත්ත අනුව අපරාධවල විශේෂ වර්ධනයක් දකින්න ලැබෙන්නේ නැහැ. නිදසුනක් වශයෙන්, 2016 වර්ෂයේ මුල් මාස දෙක ඇතුළත වෙඩි තැබීම් 12ක්ද, 2018 වර්ෂයේ පළමු මාස දෙක ඇතුළත වෙඩි තැබීම් 12ක්ද, 2024 වර්ෂයේ පළමු මාස දෙක ඇතුළත වෙඩි තැබීම් 14ක්ද වාර්තා වී ඇති අතර, 2025 වර්ෂයේ සිද්ධීන් 14ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ අනුව 2024 වර්ෂයේ මුල් මාස දෙක තුළත් මේ හා සමාන තත්ත්වයක් තමයි වාර්තා වෙලා තිබෙන්නේ.
- මේ තත්ත්වය සමනය කිරීමට රජය මේ වනකොට ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ශ්‍රී ලංකා පොලිසිය විසින් සංවිධානාත්මක අපරාධකරුවන් සහ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් සිදු කරනු ලබන මනුෂ්‍ය ඝාතන මැඩපැවැත්වීම සඳහා දිවයින පුරා පොලිස් ස්ථාන මඟින් ක්‍රියාත්මක වන ජංගම සංචාර, මාර්ග බාධක රාජකාරි, ක්ෂණික මාර්ග බාධක රාජකාරි, ත්‍රිවිධ හමුදාව සහ පොලිස් විශේෂ කාර්ය බලකාය මඟින් සිදු කරනු ලබන මෙහෙයුම්, ක්ෂණික ප්‍රතිචාර යතුරු පැදි ඒකක ද යොදවා ඇති අතර බුද්ධි හා ආවේක්ෂණ රාජකාරි ද දිවයින පුරාම ක්‍රියාත්මක කර තිබෙනවා.

2.
- අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන්ගේ ජීවිත අරක්ෂා වන ආකාරයේ විධිමත් ක්‍රියාපටිපාටියක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ සම්බන්ධව වන මාර්ගෝපදේශ මම සභාගත කරන්නම්.
- ඒ සම්බන්ධයෙන් පොලිසිය අනුගමනය කරනු ලබන වෙනත් මහ පෙන්වීම්, චක්‍රලේඛ, නඩු තීන්දු තිබෙනවා, ගරු කථානායකතුමනි. ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් 398/2008 නඩු තීන්දුව ප්‍රකාරව 2023 මාර්තු 25 දිනැති පොලිස්පති චක්‍රලේඛ 2747/2023, අපරාධ චක්‍රලේඛ 02/2023 නිකුත් කර ශ්‍රී ලංකා පොලිසියේ සියලුම පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමට ඒ අනුව කටයුතු කර තිබෙනවා. මාර්ගෝපදේශ ඇතුළත් ඒ සියල්ල ඇමුණුම 02 ලෙස මම **සභාගත*** කරනවා.

3. විශේෂයෙන් සමහර සැකකරුවන් අත්අඩංගුවට ගන්නා මොහොතේදී බාහිර පාර්ශ්වකරුවන් සිටින අවස්ථාවල ඡායාරූප මාධ්‍යවල පූර්වයෙන් ප්‍රචාරය වෙලා තිබෙනවා. මාධ්‍ය සදාචාරය පවත්වාගෙන යෑමේ වගකීම එම එක් එක් මාධ්‍ය සතු අතර, මාධ්‍ය වෙත වාරණ නිකුත් කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ මඟින් ප්‍රකාශිත තොරතුරු දැන ගැනීමේ අයිතියට බාධා පැමිණවීමට ආණ්ඩුව අපේක්ෂා කරන්නේ නැහැ.

4.
- ඝාතන සිදු වූ පසු ඝාතකයන් -අපරාධකරුවන්- පසුපස හඹා ගොස් අත්අඩංගුවට ගැනීම් හැර අපරාධ වැළැක්වීම සඳහා රජය සතු වැඩ පිළිවෙළක් මේ වනකොට යොදා තිබෙනවා.
- අපරාධ වැළැක්වීම සඳහා දිවයින පුරා පොලිස් ස්ථාන මඟින් ක්‍රියාත්මක වන ජංගම සංචාර, මාර්ග බාධක රාජකාරි, ක්ෂණික මාර්ග බාධක රාජකාරි, ත්‍රිවිධ හමුදාව සහ පොලිස් විශේෂ කාර්ය බලකාය මඟින් සිදු කරනු ලබන මෙහෙයුම්, ක්ෂණික ප්‍රතිචාර යතුරුපැදි ඒකක ද යොදවා ඇති අතර, බුද්ධි හා අවේක්ෂණ රාජකාරි ද දිවයින පුරා ක්‍රියාත්මක කර තිබෙනවා. මීට අමතරව සියලුම පොලිස් ස්ථාන මඟින් අපරාධකරුවන් ලෙස හඳුනාගෙන ලියාපදිංචි කරගෙන ඇති අය සම්බන්ධයෙන් සුපරීක්ෂාව සහ පසුවිපරම් කිරීම සිදු කරනවා. ඒ වාගේම ප්‍රජා පොලිස් කමිටු මඟින් පොලිසිය සහ මහජනතාව අතර කිට්ටු සබඳතාවක් ගොඩනඟමින් අපරාධ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම හා අපරාධකරුවන් සම්බන්ධ තොරතුරු පොලිසිය වෙත ලබා දීම දිරිමත් කිරීම සඳහා කටයුතු කරමින් තිබෙනවා.

තවද, අපරාධ මර්දනය සහ අපරාධ වැළැක්වීම සඳහා නව වැඩ පිළිවෙළක් ලෙස මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය ස්ථාපිත කර ඇත. එසේම, විදේශගතව සිට අපරාධ මෙහෙයවනු ලබන සංවිධානාත්මක අපරාධකරුවන් මෙරටට ගෙන ඒම සඳහා ජාත්‍යන්තර පොලිසියේ ශ්‍රී ලංකා ශාඛාව මඟින් රතු නිවේදන නිකුත් කර, තත්කාලයේ බල පවත්නා උදර්පණ නීති සහ සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ නීතිය යටතේ කටයුතු කරනු ලබනවා. තවද, අපරාධ වැළැක්වීමට අදාළව පොලිස්පති චක්‍රලේඛ ගණනාවක් නිකුත් කර තිබෙනවා. එයින් 2024.11.18 දිනැති අපරාධ වැළැක්වීම සඳහා අපරාධකරුවන් පිළිබඳ පොලිස් පරිපාලනය විධිමත් කිරීම සම්බන්ධව පොලිස්පති චක්‍රලේඛ 2763/2023(I) පිටපත ඇමුණුම 03 ලෙස හා අපරාධකරුවන් පිළිබඳ ප්‍රාදේශීය පරිපාලකගේ කාර්යභාරය සහ අපරාධකරුවන් පරීක්ෂා කිරීම සම්බන්ධ අංක 1,948 දරන 2016.01.06 දිනැති ශ්‍රී ලංකා පොලිස් ගැසට් පත්‍රය - II වැනි කොටස ඇමුණුම 04 ලෙස **සභාගත*** කරනවා.

- පොලිස්පතිතුමා හා පොලිස් කොමිසම අතර කිසිදු ගැටුමක් නැත.
- පොලිසිය සම්බන්ධයෙන් ස්වාධීන කොමිෂන් සභාවක ක්‍රියාකාරිත්වය ඉදිරියටත් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් රජයට කිසිදු ගැටලුවක් මතු වී නැත.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආනන්ද විජේපාල මහතා]

5. • රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ "උසස් ජාතික ආරක්ෂාවක් - සුරක්ෂිත රාජ්‍යයක්" යන තේමාව යටතේ 225 පිටුවෙහි සඳහන් ජාතික ආරක්ෂාව සඳහා වගකීම සහ වගවීම සහතික කරමින් ජාතික ආරක්ෂක කවුන්සලය ශක්තිමත් කිරීමට රජය මේ වන විට පියවර ගෙන තිබෙනවා.

• රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ "උසස් ජාතික ආරක්ෂාවක් - සුරක්ෂිත රාජ්‍යයක්" යන තේමාව යටතේ පෙන්වා දී ඇති පරිදිම, ජාතික ආරක්ෂාව ප්‍රධානතම ප්‍රමුඛතාවක් ලෙස රජය විසින් හඳුනාගෙන ඇති අතර, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති සම්පාදනය, මූලෝපායයන් නිර්මාණය කිරීම, උපක්‍රම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම යන අංශයන් යටතේ කාලානුරූපීව හඳුනාගනු ලැබූ වෙනස්කම් සිදු කරමින් පවතිනවා, ගරු කථානායකතුමනි. වගකීම සහ වගවීම පිළිබඳව මීට පෙර තත්ත්වයන් තුළ තිබූ ගැටලු නිසා මෙරට ජාතික ආරක්ෂාවට ඇති කරන ලද අහිතකර බලපෑම් මෑත ඉතිහාසය තුළදී අප අත්දැක ඇති අතර, ඒ පිළිබඳව මනා වැටහීමකින් එම අඩු පාඩු මහහරවා ගනිමින් වර්තමාන රජය කටයුතු කරමින් ඉන්නවා.

• ජාතික ආරක්ෂාව පිළිබඳව ඉදුරාම වගකිව යුතු ආයතන, අමාත්‍යවරුන් හා රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත ජාතික ආරක්ෂක කවුන්සලය සෑම දෙසතියකටම වරක් නියත වශයෙන්ම රැස්වන අතර, ජාතික ආරක්ෂක කවුන්සලයේ නිත්‍ය සාමාජිකයින් පහත සඳහන් පරිදි වේ.

දේශපාලන අධිකාරිය නියෝජනය කරමින්:

(අ) ගරු ජනාධිපතිතුමා -සේනාධිනායක, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන්-

(ආ) ගරු අග්‍රාමාත්‍යතුමිය

(ඇ) ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

(ඈ) ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

(ඉ) ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

රාජ්‍ය නිලධාරීන් වශයෙන්:

(අ) ජනාධිපති ලේකම්තුමා

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා

(ඇ) මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා

(ඈ) විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්තුමිය

(ඉ) මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමා

(ඊ) යුද්ධ හමුදාපති

(උ) නාවික හමුදාපති

(ඌ) ගුවන් හමුදාපති

(එ) පොලිස්පති

(ඒ) ජාතික බුද්ධි ප්‍රධානි

(ඔ) අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය බුද්ධි සේවය

(ඕ) අධ්‍යක්ෂ ජනරාල්, යුද්ධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය

• මෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව රජය සෑහීමකට පත් වෙනවා.

• ජාතික ආරක්ෂක කවුන්සලය තුළදී සාකච්ඡාවට බඳුන් වන එක් එක් කරුණුවලට අදාළ අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හෝ ඊට අදාළ දෙපාර්තමේන්තු, ආයතන නියෝජනය වන පරිදි වගකිව යුතු නිලධාරීන් අවස්ථානුකූලව සහභාගි වන අතර, ජාතික ආරක්ෂාව සම්බන්ධව ගත යුතු හදිසි තීරණ ගැනීම සඳහා ජාතික ආරක්ෂක කවුන්සලයට ගරු ජනාධිපතිතුමන්ගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී කෙටි දැනුම් දීමකින් රැස්වීමට හැකියාව තිබෙනවා. එහිදී ගනු ලබන තීන්දු තීරණ අදාළ අමාත්‍යාංශ හෝ ආයතන ප්‍රධානීන් වෙත පැහැදිලි උපදෙස් ලෙස ලබා දීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන අතර, එම තීරණ ක්‍රියාත්මක වීම සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය විසින් කාලීනව පසු විපරම් සිදුකර එම ක්‍රියාවලියෙහි ප්‍රගතිය පිළිබඳව වරින් වර ජාතික ආරක්ෂක කවුන්සලය දැනුවත් කරනු ලබයි.

• රජය විසින් ජාතික ආරක්ෂාව සම්බන්ධව දැනට ගෙන යනු ලබන ක්‍රියාවලිය සහ ජාතික ආරක්ෂක කවුන්සලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව රජයක් වශයෙන් අපි සෑහීමකට පත්වන අතර, කිසි විටෙකත් මෙම ක්‍රියාවලිය සම්බන්ධව අධිතක්සේරුවක නොසිට, කාලය හා තාක්ෂණය සමඟ වර්ධනය වන සහ ස්වරූපය වෙනස් වන නව්‍ය තර්ජනයන්ට අනුරූපව හැඩ ගැසිය යුතුය යන අවබෝධය තුළ සිටිමින් ඉදිරියටත් ක්‍රියා කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ස්ථාවර නියෝග 27(2) කියවා ගන්න. ගරු අමාත්‍යතුමා විසින් කරුණු පැහැදිලි කිරීමක් කරනු ලැබුවා. කරුණාකර ඔබතුමා අසුන් ගන්න.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1 ordered to stand part of the Bill.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු සභාපතිතුමනි, ගරු මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම, 1 වන උපලේඛනය, 2 වන උපලේඛනය සහ 3 වන උපලේඛනය සලකා බලන තෙක්, 2 වන වගන්තියේ සිට 12 වන වගන්තිය දක්වා සලකා බැලීම කල් තැබිය යුතුයැයි යෝජනා කර සිටිනවා.

2 සිට 12 තෙක් වගන්ති උපලේඛන සලකා බැලීමෙන් පසු ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
2ஆம் வாசகத்திலிருந்து 12ஆம் வாசகம் வரை அட்டவணைகள் பரிசீலிக்கப்படும் வரை ஒத்திவைக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 2 to 12 ordered to be postponed until after consideration of the Schedules.

පළමුවන උපලේඛනය
පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්
முதலாம் அட்டவணை
பொதுச் சேவைகளுக்குக் கொடுக்கத்தக்க தொகைகள்
FIRST SCHEDULE
SUMS PAYABLE FOR GENERAL SERVICES

1 වන ශීර්ෂය.- අතිගරු ජනාධිපති
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,518,980,000
තලෙප්පු 1.- අதிமேதகு சனாதிபதி
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,518,980,000
HEAD 1. - HIS EXCELLENCY THE PRESIDENT
Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 2,518,980,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය - විශේෂ වියදම් ඒකක - ශීර්ෂ අංක 1, 2, 4 සිට 11 දක්වා ද, ශීර්ෂ 13, 16 සිට ශීර්ෂ 25 දක්වා ද අද දින සාකච්ඡාවට ගැනෙනවා.

අතිගරු ජනාධිපති, අග්‍රාමාත්‍ය කාර්යාලය, උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, අධිකරණ සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභා කාර්යාලය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය, පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය, මැතිවරණ කොමිෂන් සභාව, ජාතික විගණන කාර්යාලය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය, විගණන සේවා කොමිෂන් සභාව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, සීමා නිර්ණය කොමිෂන් සභාව යන ආයතනවල වැය ශීර්ෂ අද දින සාකච්ඡාවට භාජන කරනු ලබනවා.

විවාදය පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා පැවැත්වෙනවා.

කපා හැරීමේ යෝජනාව, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.52]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින, එනම් 2025.02.27වන බ්‍රහස්පතින්දා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලින්, අදාළ අංක 1, 2, 4, 5, 6, 7, 8, 9, 10, 11, 13, 16, 17, 18, 19, 20, 21, 22, 23, 24 සහ 25 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහනෙහි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මෙම නව ආණ්ඩුවේ ජනාධිපතිතුමා යටතේ තිබෙන ස්වාධීන ආයතන කිහිපයක වැය ශීර්ෂ සහ පාර්ලිමේන්තුව ඇතුළු තවත් ආයතන කිහිපයක වැය ශීර්ෂ පිළිබඳ විවාදය අද දින පැවැත්වීමට නියමිතයි. මගේ කථාවට පිවිසෙන්නට පෙර සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. මීට පෙර සම්ප්‍රදායානුකූලව මේ සභා ගර්භය තුළ අපි දැක්ක ක්‍රියාදාමයට පටහැනි දෙයක් මුල් වතාවට අය වැය දෙවන වර කියවීමේ විවාදය අවසානයේ සිදු වුණා. මම අවුරුදු 30ක් තිස්සේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. පුරා අවුරුදු 30ක් තිස්සේම අය වැය දෙවන වර කියවීමේ විවාදය අවසානයේ විශේෂයෙන්ම මුදල් අමාත්‍යතුමා හෝ එතුමාගේ නියෝජ්‍ය අමාත්‍යවරයා තමයි පිළිතුරු කථාව කළේ. යම් හේතුවක් නිසා මුදල් අමාත්‍යවරයා රටින් බැහැරව හිටියා නම් හෝ වෙනත් කාරණාවක් නිසා යම් බාධාවක් තිබුණා නම් නියෝජ්‍ය ඇමතිතුමා ඒ කථාව කරනවා. මොකද, පසුගිය අභිහරුවාදා අපට ලොකු අසාධාරණයක් වුණා. අය වැය පිළිබඳව තිබුණු නොයෙකුත් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමේ කථාව කළේ ගරු සභානායකතුමා. එය සම්ප්‍රදායට පටහැනි වෙන්න පුළුවන්. ඒකට මම දැන් කාරණා එකතු කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම කියන්නේ මේකයි. එතුමා සභාව පිනවීමට, නැත්නම් අත්පුඩි ගසා ගැනීමට සම්පූර්ණයෙන්ම දේශපාලන කථාවක් කළා. ඒක සම්ප්‍රදායට පටහැනියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු සභාපතිතුමනි, මගේ පිළිතුරු කථාවට පෙර කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා විනාඩි 40ක් කථා කරමින් අසන ලද ප්‍රශ්නවලට සම්පූර්ණයෙන් පිළිතුරු ලබා දුන්නා.

[ගරු බිමල් රත්නායක මහතා]

පළමුවැනි වතාවට ඓතිහාසිකවම අපි මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ කාරක සභා අවස්ථාවේ විවාදය සඳහා දින දෙකක් ලබා දී තිබෙනවා. ඒකත් historical. ඔබතුමාගේ 30 අවුරුදු ඉතිහාසය තුළ එහෙම දින දෙකක් ලබා දීලා තිබෙනවාද කියලා අපි දැනගන්න කැමැතියි, ගරු මන්ත්‍රීතුමා. ඒ විවාදයේදී පුළුවන්, ඔබතුමාට ඒ ගැන දැනගන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
හොඳයි.

ගරු සභාපතිතුමනි, මම මගේ කථාවට ඒමට පෙර කාලීන වැදගත්කමකින් යුතු, විශේෂයෙන්ම ජනාධිපතිතුමාටත් අදාළ වන කාරණයක් කියන්න ඕනෑ. ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ පූර්විකාවේ සඳහන් කොටසක් මම උපුටා දක්වන්න කැමතියි. එහි මෙසේ සඳහන් වනවා:

"අනතුරුව, ජනවරම විකෘති කරපු තාවකාලික ආණ්ඩුවක් පිහිටුවනු ලැබුවා. මෙම තාවකාලික රජය දූෂිතයන් ආරක්ෂා කිරීම, දූෂණයේ යෙදීම, මහජන මුදල් නාස්ති කිරීම, ජනතා මර්දනය පෙර පරිදිම සිදු කළා. ඒ නිසාම සමාජ, ආර්ථික හා දේශපාලන පරිවර්තනයක් සඳහා වූ ජනතා අභිලාෂයන් ඉටු වුණේ නැහැ. 2023 වසරේ මාර්තු මාසයේ පැවැත්වීමට නියමිතව තිබුණු පළාත් පාලන මැතිවරණය කල් දැමීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ද ජනතාවගේ අභිලාෂයන් බිඳ දැමුවා."

විශේෂයෙන්ම ජනතා මර්දනය පෙර පරිදිම සිදු කළාය කියනවා. ඒ කාරණාවට අදාළව මම අද පත්තරවල පළ වෙලා තිබෙන අරගළකරුවන්ගේ ප්‍රශ්නයක් පිළිබඳව කියන්න කැමතියි. අරගළය පාදක කරගෙන තමයි මේ ආණ්ඩුවත් විශාල ජන ප්‍රසාදයක් ලබාගෙන දැන් බලයට පත්වෙලා ඉන්නේ. ආණ්ඩුවෙන් මේ අරගළකරුවන් කරන විශේෂ ඉල්ලීමක් අද පත්තරවල පළ වෙලා තිබෙනවා. මේ පිළිබඳව මම හිතන විධියට ජනාධිපතිතුමාත්, සභානායකතුමාත්, අනෙකුත් අයත් මීට කලින් පොරොන්දු දීලා තිබෙනවා. අද දින "The Morning" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

"The politicised and arbitrary actions of the Police were unmistakably retaliatory. The laws deployed for the above arrests were the Penal Code, the Police Ordinance, the Offences against Public Property Act, the Antiquities Ordinance, the Public Security Ordinance, the Judicature Act, the National Thoroughfares Act, the Prevention of Terrorism (Temporary Provisions) Act, and the Computer Crime Act. "

මේ වාගේ නොයෙකුත් පනත් පාවිච්චි කරමින් අරගළකරුවන් මර්දනය කිරීම සඳහා නඩු පවරලා තිබෙනවා. ඒ නඩුවට පෙනී හිටපු නීතිඥවරුනුත් අමාත්‍යවරුන් හැටියට දැන් මේ සභාවේ ඉන්නවා. මේ පිළිබඳව රජය වහාම කටයුතු කළ යුතුයි. මේ ගැන නීතිපතිතුමාට දැනුම් දෙන්න. එක්කෝ, මේ නඩු ටික ඉල්ලා අස්කර ගන්න.

ඒ සමයේ තමන්ට මුහුණ දෙන්න බැරි පීඩනයට රජයෙන් පිළිතුරක් ඉල්ලමින් 3,000කට, 4,000කට වැඩි අහිංසක පිරිසක් අරගළය වෙනුවෙන් පාරට බැහැලා, දැන් ඔවුන් උසාවිවල රස්තියාදු වෙනවා. ඒ චිත්‍රක් නොවෙයි. ඔවුන්ට විදේශ ගමන් බලපත්‍ර තහනම්. විදේශ රැකියාවලට යන්න බැහැ. ඔවුන් නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දෙනවා. පවුල්වලත් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මේක විශාල ප්‍රශ්නයක්. එබැවින්, මම ඉල්ලා සිටිනවා, අද පිළිතුරු කථාවේදී හෝ මේ පිළිබඳව යම් ප්‍රකාශයක් කරන්න කියලා. ඒ අයට යම් සාධාරණයක් ඉටු කරන්න කියලා මම මුලින්ම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පත්තරවල ඊයේ පළවෙලා තිබුණා, අපේ විදේශ කටයුතු අමාත්‍යතුමා ජිනීවාහිදී කරපු කථාවේ නොයෙකුත් කොටස්. "Sri Lanka's Legislature most inclusive to date" කියලා පළවෙලා තිබෙනවා. ගරු සභානායකතුමා දන්නවා, මේක inclusiveද, නැද්ද කියන එක. විපක්ෂය ගැන කථා කළා නම්, ඒ inclusivity එක ගැන අපි නිතර නිතර ඉල්ලන කාරණාවක් තිබෙනවා. අද පෙර වරු 11.00 වෙන කොට ඔබතුමා නැවත වාරයක් Parliamentary Business Committee එක කැඳවලා තිබෙනවා. අපේ පක්ෂ නායකවරු කිහිප දෙනෙකුට Parliamentary Business Committee එකේ ලබා දෙන ඉඩ අහිමි වෙලා තිබෙනවා. ඒක වුවමනාවෙන්ම අහිමි කරලා තිබෙනවා කියලා මම කියනවා. ඊයේ මම ඡන්දය දීමට පෙර කියපු කථාවක් උපුටා ගෙන සභානායකතුමා කේන්තියෙන් නැඟිට ගෙන ගියා, "ආ, ඔයගොල්ලන්ට දෙන්නේ නැහැ" කියලා. ඒ වාගේ ඒකාධිකාරීව කටයුතු කරන්න එපා. මම ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, එතුමා ඉතා සාවද්‍ය ප්‍රකාශයක් කළා. එක්කෝ, එතුමා ඒ ප්‍රකාශය අයින් කර ගන්න ඕනෑ. නැත්නම් ඔබතුමා කියන්න ඕනෑ, ඒක ඉවත් කරන්න කියලා. අපි ඉතා පැහැදිලිව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට අපේ ස්ථාවරය දැනුම් දීලා තිබෙනවා. මම එහෙම කිසිම ප්‍රකාශයක් කළේ නැහැ. අපි අපේ ස්ථාවරය ලිඛිතව දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා අපි විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට කියන්න කැමැතියි, මේ පිළිබඳව ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය කියන්න කියලා. ඔබතුමන්ලා දිගටම යන ක්‍රමය මේක නම්, අපි ඔබතුමන්ලාට වැඩි කරන්න දුන්නු ප්‍රමාණයන් ගැන වුණත්, -ඒක තේරුමක් නැහැ නේ, මේක නම් දිගටම යන්නේ. ගරු සභාපතිතුමනි, අපි යම්කිසි-

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මගේ වේලාව, ගරු සභාපතිතුමනි. Let me speak.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මා සම්බන්ධව පැහැදිලි විවේචනයක් කළා. ගරු සභාපතිතුමනි, මගේ නම කියලා, මගේ තනතුර කියලා විවේචනයක් කළා. ඒක අසත්‍යයක්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

එහෙම එකක් නැහැ. පාර්ලිමේන්තුවේ පොදු වෙලාව යන්නේ. *[බාධා කිරීමක්]* ඒ නිසා ඒක අසත්‍යයක්. *[බාධා කිරීමක්]* ඔබතුමා වග කියන්න ඕනෑ, ඔබතුමන්ලාගේ ස්ථාවරයට.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

මම සාවද්‍ය ප්‍රකාශයක් කරනවා නොවෙයි. ගිය වර ආරක්ෂක අමාත්‍යාංශයේ Ministerial Consultative Committee Meeting එකට ජනාධිපතිතුමා පැමිණෙන කොටම- [බාධා කිරීමක්] මම කියන්නම්. පොඩ්ඩක් අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, මම තර්ජනාත්මකව මොකක්ද කිව්වා කියලා. අන්න ඒක අසත්‍යයක්. එක්කෝ, ඔබතුමා ඒක ඉල්ලා අස් කරගන්න. නැත්නම් ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ ගැන සොයා බලා ඒ කථාව හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මම ඒ ගැන සොයා බලා ඇත්තටම එවැනි දෙයක් තිබෙනවා නම් ඉවත් කිරීමට කටයුතු කරනවා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම එක දෙයක් කියන්නම්. ජනාධිපතිතුමා ආරක්ෂක අමාත්‍යාංශයේ Ministerial Consultative Committee Meeting එකට ආපු වෙලාවේ, වාඩි වෙලා හිටපු මගේ ළඟින් එතුමා යද්දී මගේ ළඟට ඇවිල්ලා මට පොරොන්දු වෙලා ගියා, "අන්න රවුෆ් ඔබතුමා ඉල්ලපු පරිදි අපි Parliamentary Business Committee එකට ඔබතුමා එකතු කරන්න තීරණය කරලා තිබෙනවා" කියලා. ජනාධිපතිතුමා එහෙම කියලා ගියා. අහන්න ගිහිල්ලා. එතුමා එහෙම කිව්වත් ඔබතුමා තනි මතයට, ජනාධිපතිතුමා මට කියපු ඒ කාරණාවට විරුද්ධ යමින් Parliamentary Business Committee එකෙන් අපිව ඉවත් කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඕනෑ නම් ජනාධිපතිතුමාගෙන් ගිහිල්ලා අහන්න. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. එතුමා සානුකම්පිතව ඒ පිළිබඳව සලකා බලයි. කේන්ති ගන්න එපා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ වීය.

අතන්පිටකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Hon. Chairman, though I sounded a little too angry, I hope the Hon. Leader of the House would not take it very personal. In fact, this has affected me because I am a Member of Parliament who have been in this House for 30 years without a break and I have five Members of Parliament under my purview. Last time, the JVP had just three Members, but I, as a Party Leader with so many years of experience, have been denied my place in the Parliamentary Business Committee because of this rule the Hon. Leader of the House is insisting on. I am only asking the Hon. Prime Minister and the Hon. Leader of the House, because you are the leader of this Chamber, to reconsider that. We all are there to critique you in a very responsible manner and the space in the Parliamentary Business Committee for Party Leaders should not be denied in this fashion; this is not a good example. I hope the Hon. Leader of the House would not take it very personal and would resolve this issue without much difficulty and causing unnecessary harassment to us, Party Leaders in this House.

Having said that, may I now come to a very important statement made by the Hon. Minister of Foreign Affairs because it is the first time that this Government has placed its policies and programmes before the international community. Particularly, I refer to the Statement made by the Hon. Minister of Foreign Affairs before the Human Rights Commission. I would like to say that the decision of the Government to dispatch a Ministerial delegation to Geneva to engage with the Human Rights Council, its membership and the Office of the High Commissioner for Human Rights must be welcomed. What is more positive is, unlike the abrasive and ill-considered statements made by the previous Governments in 2020, 2021, 2022 and 2024, the statement made by the Hon. Minister Vijitha Herath has refrained from directly reiterating Sri Lanka's withdrawal from HRC processes and in particular, its Resolutions. Rather, it spoke about engaging with the Council and taking actions to make progress in the human rights arena supplemented by technical assistance, upon request, from the Office of the High Commissioner for Human Rights. So, that, I am praising; it is a good thing to engage with the Human Rights Council unlike the previous Government, which disengaged and refused to abide by the Human Rights Council's directives or requirements. It is not a very strict procedure. There is a way in which the Human Rights Council functions: there are periodic peer reviews by other nations interested in maintaining human rights standards in this country.

When your party was being seriously impacted by actions of State terror, of course, you all took up arms to achieve your political objectives. But, what happened then? There were serious actions taken and several thousands were killed. Those days, when the Hon. Mahinda Rajapaksa and the Hon. Vasudeva Nanayakkara were going to the UN Human Rights Commission - you know that history - to appear against the murderous actions by the then UNP administration, they were detained; their documents were confiscated. There were human rights cases filed in the Supreme Court. So, engaging with the UN Human Rights Council is very important, and this Government is doing the right thing.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

I would like to critique some of the areas as well. It does not need to be overstated that dedication to constructive dialogue and cooperation with the international community is a must for any government, certainly a must for a country still reeling from the aftermath of economic instability. To impress the human rights community with the recent efforts towards reconciliation, including infrastructure development in the Northern Province, consideration of recruitment of Tamil-speaking youth to join the police service and the Budgetary Proposal to make significant financial allocations for upgrading libraries, including the historical Jaffna Library are all symbolic actions, Hon. Prime Minister. You have to go beyond symbolism. These are things that previous governments, too, talked about, but, in action, you have to prove that you are not going to be partial in your attitude and that you would try to be inclusive in your approach. That has to be proven by your conduct, not just by these symbolic actions.

The Government has often declared that efforts would continue towards a people-led and people-centric national transformation under the President's stewardship. There are significant deviations from promises made in the Manifesto as well as in the speeches of Government leaders during and after the elections. It would do well not to play the words "people-led" and "people-centred" in the context of envisaged national transformation too much in the international arena since in the absence of definitive and well-meaning action, they may risk falling into the category of much-discredited "home-grown solution". That was the term used by the previous administrations. They used to say, "We will solve the human right issues with our own home-grown solutions." I can see this Government, too, is slowly moving towards certain attitudes. Some elements in the bureaucracy and the establishment are trying to misdirect you, give you wrong advice to use nationalistic, high-sounding words and be very patriotic. In the name of patriotism, sometimes, genuine reconciliation is denied. Please do not go down that path. You have taken the right decision to abide by the UN Human Rights Council's recommendations and to engage with them. But, in engaging with them, you have to be more realistic.

The Hon. Minister of Foreign Affairs, in his Geneva Statement, has mentioned the importance of strengthening domestic institutions such as the Office on Missing Persons, Office for Reparations, Office for National Unity and Reconciliation as well as establishing a Truth and Reconciliation Commission. But, it is important to clarify to the victim community and other stakeholders, most importantly to this august Assembly, what practical and meaningful measures are being envisaged or initiated to establish sound policy and legal frameworks that could lead to strengthening these institutions. Much more has to be shared about the truth and reconciliation mechanism the Government has showed renewed interest in.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rauff Hakeem, you have one more minute.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Chairman, most of my time has been taken by unnecessary cross talks.

Since, time is limited, let me move onto this other matter. Hon. Prime Minister, I read somewhere that the Hon. Minister of Foreign Affairs had said a few days ago that they are discussing the drafting of a new Constitution and putting it to a Referendum. You all have given an election promise about a new Constitution. Yesterday, we were at a discussion summoned by Mr. Karu Jayasuriya on behalf of the National Movement for Social Justice. The late Ven. Maduluwawe Sobitha Thero initiated the National Movement for Social Justice. At that discussion, there were several legal luminaries and even former President Chandrika Bandaranaike Kumaratunga participated.

There, Dr. Nihal Jayawickrama pointed out that if the entire Constitution is to be overhauled, there is no need to submit it to a Referendum. That may be a moot point when it comes to the entrenched provisions of the Constitution. But, still, Dr. Nihal Jayawickrama has repeatedly held that position. Prof. Savitri Goonesekere was also there. She was also talking about the salient features, particularly about the immunity of the President and various other provisions being removed. Particularly, the Executive Presidency is a moot point. There have been several promises made regarding that. Well, I hold a different point of view.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rauff Hakeem, can you please wind up? Your time is over.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Okay, Hon. Chairman.

Therefore, some clarity has to be given to the Constitution-making process. That has to be an inclusive process; that cannot be done unilaterally by the Government. You have to engage with the Opposition; you have to engage with the public; there has to be public sittings. There had been several attempts earlier. Therefore, Constitution-making has to be an inclusive process. The Hon. Minister of Foreign Affairs has said about it in Geneva and has talked about the inclusiveness of the Government. But, inclusivity has to start from this House, giving due place to the Party Leaders in the Committee on Parliamentary Business. I hope the Hon. Prime Minister would bring saner counsel to prevail and see that our due place is assured to us in important Committees. Thank you.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next Speaker is the Hon. Prime Minsiter. You have 18 minutes.

[පූ.භා. 11.11]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු සභාපතිතුමනි, 2025 විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ කාරක සභා අවස්ථාවේදී අද දින විවාදයට ගනු ලබන්නේ විශේෂ වියදම් ඒකක ගණනාවක්. අතිගරු ජනාධිපති, අග්‍රාමාත්‍ය කාර්යාලය, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, ස්වාධීන කොමිෂන් සභා, පාර්ලිමේන්තුව ආදී වශයෙන් වියදම් ඒකක ගණනාවක් ඒවා අතර තිබෙනවා. මේ සියල්ල පිළිබඳව අප සලකා බලන්නේ අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය ආරම්භ වන අද දිනයේදීයි.

ගරු සභාපතිතුමනි, මේ අලුත් තත්ත්වයන් තුළ, මේ අලුත් පාර්ලිමේන්තුව තුළ විපක්ෂය තමන්ගේ කාර්ය භාරය මොකක්ද කියන එක ගැන යම්කිසි අපැහැදිලිතාවකින් ඉන්නවාදෝ කියන සැකය විශේෂයෙන් ඔවුන්ගේ කථාවලට ඇහුම් කන් දෙන කොට මට බොහෝ අවස්ථාවල ඇති වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව ආරම්භ කර තිබෙන ක්‍රියා මාර්ග ගණනාවක් ගැන ඔවුන් බොහෝ වෙලාවට කථා කරන්නේ අවසන් තීරණයකට හෝ තීන්දුවකට ඇවිල්ලා හා සමානවයි. මේක අපේ මංගල අය වැය. මේ මංගල අය වැය තුළ අපි ආරම්භයක් තමයි ලබාගෙන තිබෙන්නේ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අපි ආරම්භ කරලායි තිබෙන්නේ. එය ආරම්භ කිරීමේදී ගත යුතු ක්‍රියා මාර්ග ප්‍රමාණයක් තමයි අප මේ වෙලාවේ ගන්නේ.

මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැනත් කථා කළා; ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගැනත්, අලුත් ව්‍යවස්ථාවක් ගැනත් කථා කළා. අපි ඉතා පැහැදිලිව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ කියලා තිබෙන්නේ, "ඒක සහභාගිත්වයෙන් කළ යුතු දෙයක්" කියන එකයි. විශේෂයෙන්ම ජන සහභාගිත්වය තිබිය යුතුයි කියන එක අපි අනිවාර්යයෙන් ප්‍රකාශ කරලා තිබෙනවා. It is a consultative process. A consultative process should not involve only the Members of the Parliament as it should be a citizen's Constitution. This is something that we have very clearly said. It is a process. It is not a done deal; but a process and that process will be initiated. ඒ බවත් මා දැනුම් දෙන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අද අපට කථා කරන්න තිබෙන්නේ විශේෂ වියදම් ඒකක පිළිබඳවයි. මෙහිදී මම අවස්ථාවක් කර ගන්නවා, අපේ අලුත් දේශපාලන සංස්කෘතිය ගැනත් කියන්න. මොකද, අද අප කථා කිරීමට නියමිත කාරණා දිහා බලන කොට ඉතා හොඳින් පැහැදිලි වන දෙයක් තිබෙනවා. මේ විශේෂ වියදම් ඒකක සම්බන්ධව තිබෙන සාකච්ඡාව, ඇත්ත වශයෙන්ම අපේ ආණ්ඩුව උත්සාහ කරමින් තිබෙන අලුත් දේශපාලන සංස්කෘතිය නිර්මාණය කිරීම අප කරමින් තිබෙන්නේ කොහොමද කියන එක ප්‍රායෝගිකව අපට පෙන්නුම් කරන්න පුළුවන් හොඳ අවස්ථාවක්. ඒ දේශපාලන සංස්කෘතියේ වෙනස ගැන අපි කියන්න ඕනෑ. මොකද, විපක්ෂය බොහෝ වෙලාවට එය සාකච්ඡාවට ගන්නේ තැන් තැන්වලින් අල්ලා ගෙනයි. "අපි වාහන පාවිච්චි කරනවාද, නැද්ද, අපි වාහන කීයක් පාවිච්චි කරනවාද, හෙලිකොප්ටර් එකෙන් යනවාද නැද්ද" වැනි එක් එක් කරුණු සම්බන්ධ කර ගනිමින් කථා කරන්න විපක්ෂය උත්සාහ කරනවා. නමුත් ගරු සභාපතිතුමනි, අප ගෙනෙන්න හදන අලුත් දේශපාලන සංස්කෘතිය තුළ අඩංගු සංකල්පයක් තිබෙනවා. ඒක තුළ අඩංගු දේශපාලන දැක්මක් තිබෙනවා. ඒ දේශපාලන දැක්මත් එක්ක තමයි අපේ ආණ්ඩුවේ ප්‍රධාන වැඩකටයුතු සිදු වන විධියත්, ආයතන, ඒකක පවත්වාගෙන යන විධියත් අප ක්‍රියාත්මක කරන්නේ.

ඒ දේශපාලන සංස්කෘතියේ ප්‍රධාන වෙනස තමයි අපි ආණ්ඩුවක් හැටියට ජනතාවට බරක් නොවීම. මේක අපට අතිශයින්ම වැදගත් දෙයක්. මොකද, මෙතෙක් කල් හිටපු ආණ්ඩු ජනතාවට බරක් සේ හැඟිලා තිබෙනවා; බරක් ලෙස ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ බර අඩු කිරීම අපට අතිශයින්ම වැදගත්. ඒ බර තිබෙන්නේ රාජ්‍ය සේවයෙන් විතරක් නොවෙයි. මේ රටට බරක් වෙලා තිබෙන්නේ රාජ්‍ය සේවය විතරක් නොවෙයි. අපේ රටේ ආණ්ඩුත් මේ රටට බරක් වෙලා තිබෙනවා. මන්ත්‍රීවරු, ඇමතිවරු, ජනාධිපතිවරු, අග්‍රාමාත්‍යවරු මේ රටට බරක් වෙලා තිබෙනවා. ඒ බර අඩු කිරීම අපට වැදගත් වෙලා තිබෙනවා. ඒ කාර්යාලවල, ඒ ඒකකවල වියදම ගැන අපි ඉතාම පරිස්සම් වෙන්නේත්, ඒ පිළිබඳව අපි විශේෂ අවධානයක් දෙන්නේත් අන්න ඒ හේතුව නිසායි. අපි ඒ බර අඩු කරන්න ඕනෑ. ඒ බර අඩු කිරීමට මේ මොහොතේ අපට සුවිශේෂී වගකීමක් තිබෙනවා කියන එකත් අපි දන්නවා.

ගරු සභාපතිතුමනි, අපේ රට මේ වෙලාවේ දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් ඒකෙන් ගොඩ එන්න උත්සාහ කරන මොහොතක තිබෙන්නේ. ඒ ආර්ථික අර්බුදයේදී විශාල බරක්, විශාල පීඩාවක් මේ රටේ ජනතාවට දරන්න සිද්ධ වුණා. ඒ අර්බුදයෙන් එළියට එන්න ගත්ත ක්‍රියා මාර්ග නිසාත්, ඒ අර්බුදය නිසාත් විශාල බරක් මේ රටේ ජනතාවට දරන්න සිද්ධ වුණා. එවැනි මොහොතක කිසිසේත්ම ජනතාව විසින් පත් කරපු ආණ්ඩුවකට නැවත වතාවක් ඒ ජනතාවට බරක් වෙන්න බැහැ. ඒ ආණ්ඩුව පවත්වාගෙන යෑමේ බර ජනතාවට දැනෙන්න ඉඩ තියන්න බැහැ. ඒක කෙසේ හෝ කළමනාකරණය කිරීම අතිශයින්ම වැදගත්. මොකද, ජනතාව කොහොමටත් විශාල බරක් මේ වෙලාවේ දරන නිසා. ඒ වාගේම, ඒ ආණ්ඩුව පවත්වාගෙන යෑමට යන වියදම එන්නේ අනිවාර්යයෙන්ම අපේ ජනතාව ගෙවන බදු හරහා. එතකොට ඒ හැම රුපියලක් ගැනම, හැම සතයක් ගැනම අපි සියදහස් වාරයක් කල්පනා කරන්නේ, ජනතාව විසින් එකතු කරන බදු තුළින් අපි සියලුදෙනාගේම පැවැත්ම තීරණය වෙන නිසා. මේක විශාල වගකීමක්. ඍජු බදු ගෙවන අය පමණක් නොවෙයි ගරු සභාපතිතුමනි, මේ රටේ සෑම පුරවැසියෙකුගෙන්ම අය වෙන direct සහ indirect taxesවලින් තමයි ආණ්ඩුව පවත්වාගෙන යන්නේ. අපේ අලුත් දේශපාලන සංස්කෘතිය තුළ ජනතාවට බරක් නොවන ආණ්ඩුවක් පවත්වාගෙන යෑමේ වුවමනාව අපි ප්‍රකාශයට පත් කරන විශේෂ තැනක් තමයි, මේ ඒකක පවත්වාගෙන යෑමට අදාළව තිබෙන ඒ මුදල් පාලනය කිරීම සහ ඒ මුදල් පිළිබඳව අපි නිවැරදි කළමනාකරණයකට යෑම. ඒ පළමුවැනි කාරණය.

ගරු සභාපතිතුමනි, දෙවැනි කාරණය ටිකක් ඊටත් එහා ගිය දෙයක්. ගරු සභාපතිතුමනි, අපි තේරුම් අරගෙන තිබෙන දෙයක් තිබෙනවා. ඒ තමයි, තිබෙන බලයත් එක්ක සහ ඒ දේශපාලන තනතුරුවලට දෙන වරප්‍රසාද එක්ක එන්න පුළුවන් දෙයක් තමයි, ඒ වරප්‍රසාද අයිතියක් ලෙස දැනෙන්න පටන් ගන්න එක - sense of entitlement. ඒ වරප්‍රසාදය තනතුරත් එක්ක තිබෙන දෙයක් නොවෙයි, ඒ වරප්‍රසාදය තනතුරට අයිති දෙයක් නොවෙයි, ඒක පුද්ගලයාට අයිති දෙයක් ලෙස, ඒක පුද්ගලබද්ධ දෙයක් ලෙස දැනෙන්න පටන් ගන්න එක අතිශයින්ම භයානකයි; අතිශයින්ම භයානකයි. මොකද, ඒක තනතුරට දෙන වරප්‍රසාදයක් වෙනුවට, ඒක පෞද්ගලික වරප්‍රසාදයක්, අයිතියක් හැටියට දැනෙන්න යන එක තුළින් තමයි බලය හරහා දූෂණයට පාර කැපෙන්නේ කියන

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහතා]

එක අපි තදින් විශ්වාස කරන දෙයක්. ඉතින් ඒ වරප්‍රසාද තනතුරට සම්බන්ධ දෙයක් මිස, පුද්ගලයාට අදාළ දෙයක් නොවන විධියට අපේ හැසිරීමෙන් සහ භාවිතාවෙන් තේරුම් අරගෙන ඒ තනතුරු බාර ගන්න එකත් අතිශයින්ම වැදගත්.

ඒක පිළිබඳව හරිම පරිස්සම් විය යුතුයි. උදාහරණයක් හැටියට කිව්වොත්, අපට ඒ තනතුරත් එක්ක තිබෙන ආරක්ෂාව අපි පිළිගන්නා අතර, ඒක ඒ තනතුරට එහා යන එකක් නොවෙයි. ඒක පුද්ගලයාට දෙන එකක් කියලා අපි හිතන්න ගත්තොත්, ඒක අතිශයින් භයානකයි. අපි මේ රටේ පුරවැසියෙකුට වඩා වටිනවා කියලා දැනෙන්න පටන් ගත්තොත් අතිශයින්ම භයානකයි. අපි විශේෂිතයි, අපේ වටිනාකම ඉහළයි කියලා හිතන්න පටන් ගත්තාම තමයි අර sense of entitlement එක එන්නේ. ඒක දේශපාලනඥයන්ට විතරක් නොවෙයි, සමහර වෙලාවට වෙන අයටත් එන්න පුළුවන්. යම් කිසි status එකක් සමාජය තුළ දැනුණාම ඒ entitlement එකත් එක්ක එන අහංකාරකම - ඒ arrogance එක - ජනතාවගෙන් ඈත්වන බව වෙනස් විය යුතුයි කියලා අපි හිතනවා. ඒක වෙනස් කිරීමත් අපි උත්සාහ කරන මේ දේශපාලන සංස්කෘතිය තුළ තිබෙන දෙයක්. ඒ නිසා තමයි අපි අතිශයින්ම පරිස්සම් වෙන්නේ, අපේ වියදම පිළිබඳව සහ අපේ තනතුරත් එක්ක එන වරප්‍රසාද පාවිච්චි කරන විධිය ගැන.

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද හරහා එන ඒ අවභාවිතාව ගැන යම් කිසි අදහසක් ලබා දෙන්න මම මේ වෙලාවේ උදාහරණයකට ගන්නවා, විශේෂයෙන්ම ජනාධිපතිවරුන්ගේ විදේශ සංචාර පිළිබඳව. මට ලැබිලා තිබෙන කාලය තුළ මම බලාපොරොත්තු වෙන්නේ ඒ පිළිබඳව කථා කරන්න. ඇත්ත වශයෙන්ම විදේශ සංචාර කියන්නේ ජනාධිපතිවරු, අග්‍රාමාත්‍යවරු, මැති ඇමතිවරු රට වෙනුවෙන් කරන්න ඕනෑ දෙයක්. ඒක අපි කිසිසේත්ම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. නමුත්, අපේ රටේ පැවතුණු දේශපාලන සංස්කෘතිය තුළ විදේශ සංචාර අවභාවිත වෙලා තිබෙනවා. ඒක අපට පිළිගන්න වෙනවා. ඒ පිළිබඳ උදාහරණ කිහිපයක් මම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි සහ අපි ඒක වෙනස් කරන්න උත්සාහ කරන විධියත් පොඩි අදහසක් දෙන්න මම උත්සාහ කරනවා.

ගරු සභාපතිතුමනි, මා අත තිබෙනවා යම් සංඛ්‍යාලේඛන කිහිපයක්. 2010 සිට 2014 දක්වා කාලය තුළ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා වෙනුවෙන් විදේශ ගමන් සඳහා දරා ඇති වියදම රුපියල් මිලියන 3,572යි. අවුරුදු 4ක් තුළදී රුපියල් මිලියන 3,572ක් වියදම් වෙලා තිබෙනවා. 2015 සිට 2019 දක්වා කාලය තුළ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා වෙනුවෙන් විදේශ ගමන් සඳහා දරා ඇති වියදම රුපියල් මිලියන 384යි. 2020 සිට 2022 දක්වා අවුරුදු දෙකක කාලය තුළ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා වෙනුවෙන් විදේශ ගමන් සඳහා දරා ඇති වියදම රුපියල් මිලියන 126යි. ඒක ටිකක් අඩුයි, සාපේක්ෂව. 2023 සහ 2024 දක්වා කාලය තුළ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා වෙනුවෙන් විදේශ ගමන් සඳහා දරා ඇති වියදම රුපියල් මිලියන 533යි. 2024 සැප්තැම්බර් සිට 2025 පෙබරවාරි දක්වා කාලය තුළ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා -අපේ ජනාධිපතිවරයා- වෙනුවෙන් විදේශ ගමන් සඳහා දරා ඇති වියදම රුපියල් මිලියන 1.8යි.

ඒ කියන්නේ, අපිත් වැඩ කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. අපිත් විදේශ සංචාර ගිහින් තිබෙනවා. අපිත් ජනතාව වෙනුවෙන් වැඩ කරලා තිබෙනවා, මේ රට නියෝජනය කරලා තිබෙනවා. නමුත්, ඒ සඳහා ජනතාවට බරක් නොවී, ජනතා මුදල් කළමනාකරණය කරමින් මේවා කරන්නේ කොහොමද කියන එක අපි වචනවලින් නොවෙයි ක්‍රියාවෙන්ම පෙන්වා තිබෙනවා. මෙතැන කථා කරද්දී අපට කිව්වා නේ symbolic වෙන්න එපා, කථාවෙන් විතරක් නොවෙයි, ක්‍රියාවෙන් පෙන්වන්න කියලා. මෙන්න, අපි ක්‍රියාවෙන් පෙන්වා තිබෙනවා. අපි ක්‍රියාවෙන් පෙන්වා තිබෙනවා කොහොමද මේවා කරන්නේ කියලා. 2010 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වැඩිම වියදම දරා ඇත්තේ 2013දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසිනි. එය රුපියල් මිලියන 1,144ක්.

ඒ කියන්නේ, එක අවුරුද්දකට -එක වර්ෂයකට- වියදම් කරලා තිබෙන මුදල් ප්‍රමාණය. ගරු සභාපතිතුමනි, මේක පෙන්නුම් කරන්න අපට තව සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න පුළුවන්. කොහොමද මේච්චර වියදමක් ගියේ? ඇයි මේවගර වියදමක් ගියේ? සමහර වෙලාවට එකම රටට තමයි අපි දෙගොල්ලන්ම ගිහිල්ලා තිබෙන්නේ. එක ජනාධිපතිවරයෙකුට මේච්චර ලොකු වියදමක් සිදු වෙන්නත්, තව කෙනෙකුට මේච්චර අඩුවෙන් වියදම් වෙන්නත් හේතුව මොකක්ද කියලා අපි පොඩ්ඩක් කල්පනා කළොත්, ඒ ගැන පැහැදිලි වෙනවා.

රනිල් වික්‍රමසිංහ නිටපු ජනාධිපතිවරයා විදේශ සංචාර 33ක් ගිහිල්ලා තිබෙනවා. ඒ විදේශ සංචාර 33ට පුද්ගලයන් 154 දෙනෙක් සහභාගි වෙලා තිබෙනවා. අපේ ජනාධිපතිතුමා විදේශ සංචාර තුනක් ගිහිල්ලා තිබෙනවා. ඒ සඳහා සහභාගි වෙලා තිබෙන පිරිස 11යි. ජනාධිපති කෙනෙක් විදේශ සංචාරවලට යනකොට අදාළ පුද්ගලයන් යා යුතුයි කියා මම නැවත වතාවක් කියනවා. ඒක ගැන කිසිම විවාදයක් නැහැ. අදාළ පුද්ගලයන් යන්න ඕනෑ. ජනාධිපතිවරයා විතරක් නොවෙයි, ඇමතිවරයෙක් ගියත්; කවුරු ගියත් අදාළ කණ්ඩායම - අදාළ පිරිස - යන්න ඕනෑ. ඒක ගැන කිසිම තර්කයක් නැහැ නේ. නමුත් මෙතැන මොකක්ද මේ සිද්ධ වෙලා තිබෙන්නේ? මෙතැන අදාළ අයද ගිහිල්ලා තිබෙන්නේ කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Harini Amarasuriya, you have only two more minutes.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Thank you.

අදාළ අයද ගිහිල්ලා තිබෙන්නේ කියන එක ගැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. උදාහරණයක් හැටියට රනිල් වික්‍රමසිංහ නිටපු ජනාධිපතිවරයා විදේශ සංචාරවලට යනකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගෙනිච්චා - අල්ලස් ලබා දීමක් හැටියට. දැන් මෙතැන සිටින මන්ත්‍රීවරුත් ගිහිල්ලා තිබෙනවා. දැන් මෙතැන නැති මන්ත්‍රීවරුත් ගිහිල්ලා තිබෙනවා. මේ විධියට විදේශ සංචාර අවභාවිත වෙලා තිබෙන විධිය ඉතාම පැහැදිලියි. මේ ලැයිස්තුව බලන්න, ගරු සභාපතිතුමනි. United Kingdomවලට එක සංචාරයක් ගිහිල්ලා තිබෙනවා to attend the state funeral of Her Late Majesty Queen Elizabeth II. එතකොට යන්නේ funeral එකකට නේ. මේ අවමංගල උත්සවයට - funeral එකට - ඔහුත් සමඟ දස දෙනෙක් ගිහිල්ලා තිබෙනවා. State funeral of the former Prime Minister of Japan -එකට 18 දෙනෙක් ගිහිල්ලා තිබෙනවා. Twelve people have gone for the coronation of His Majesty King Charles III in the United Kingdom in 2023. Former President Ranil Wickremesinghe was accompanied by 23 people during

his official visit to India. Our President also went on an official trip to India and was accompanied by only five people. Did he not do the same amount of work? Did he not engage in the same high-level discussions and enter into extremely important agreements with the Indian Government? But, look at the difference! ඒවා මේ තනතුර එක්ක තිබෙන වරප්‍රසාද තමයි. තනතුර හරියට ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දෙන සහාය මීට පෙර අවභාවිත වෙලා තිබෙන විධිය තමයි මේ.

ගරු සභාපතිතුමනි, මම මේ කාරණයත් කියලා අවසන් කරන්නම්. දේශපාලන සංස්කෘතියක් ගැන කථා කරනකොට, එහි වෙනසක් ගැන කථා කරනකොට මම එක කාරණයක් ගැන පමණයි කථා කළේ. ජනතා මුදල් අවභාවිත කරමින්, එය තමන්ගේ වරප්‍රසාදයක්, අයිතියක් හැටියට කිසිම ගානක් නැතිව වියදම් කරලා තිබෙනවා. දැන් ඒ සංස්කෘතිය වෙනස් වෙලා තිබෙනවා. එම සංස්කෘතියත්, ජනතාවගේ බදු මුදල් රැක ගැනීම අපේ පරම යුතුකමක් හැටියට භාර ගත්තාට පසුව කටයුතු සිදු වන විධියත්, අතර වෙනස මේ ජනාධිපතිතුමාගේ විදේශ සංචාර ගැන පමණක් මම දුන් තොරතුරු හරහා හොඳින්ම ඔප්පු වෙනවාය කියන එක අපි විශ්වාස කරනවා. මට කාලය ලබා දීම පිළිබඳ ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Dilith Jayaweera. You have 14 minutes.

[පූ.භා. 11.30]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතියි. අද දින කාරක සභා අවස්ථාවේ විවාදයට ගනු ලබන විශේෂ වියදම් ඒකක සම්බන්ධව සහ අනෙකුත් වියදම් හා ආදායම් ගැනත් කථා කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ගරු සභාපතිතුමනි, මම මීට කලින් කළ කථාවකදීත් -ඒ ලැබුණු සුළු අවකාශය තුළ; කාලය තුළ- මේ සම්බන්ධව කරුණු දක්වන්නට උත්සාහ කළා. මෙම අය වැය තුළ අපි නොදකින්නේ මේ රට කිනම් දිශානතියකට ගෙන යනවාද කියන කාරණයයි; මේ අය වැය තුළ අපි නොදකින්නේ මේ රට පිළිබඳව මේ රජයට ඇති දර්ශනයයි.

ආණ්ඩු පක්ෂය පැත්තෙන් දිගින් දිගටම සිදු කළ කථා අහගෙන සිටිද්දී, මට දැනී ගිය; තේරුම් ගිය ආකාරයට ඔවුන් කරුණු 3ක් ගැන කථා කළා. පසුගිය රජයන් විසින් කරන ලද වැරදි, අවභාවිතයන් පිළිබඳව ඔවුන් කථා කළා. ඊළඟට, මේ අය වැය යෝජනාවල තිබෙන සමාජ සුබසාධන ලක්ෂණ ටික ගැන ඔවුන් කථා කළා. ඊළඟට, ඔවුන් සංවාදයට ලක් කරන තුන් වැනි කාරණය හැටියට මට තේරුම් ගියේ, මේ අය වැය ප්‍රගතිශීලී අය වැයක් යැයි පෙනෙන්නේ කොහොමද කියන කාරණයයි.

මේ ගෙනැල්ලා තිබෙන්නේ සමාජවාදී ආණ්ඩුවක් කියලා අපේ ගම්වල මිනිස්සු හිතාගෙන ඉන්නවා. ගරු අගමැතිතුමියනි, අපේ ගම්වල මිනිස්සු ඒ කාලයේ කිව්වේ, අපේ සටන් පාඨය වුණේ - අපේ පරණ සටන් සගයින් දන්නවා- "කොළඹට කිරි-ගමට කැකිරි" කියලායි. දැන් මේ කිරි-කැකිරි ආර්ථිකය තුළ තිබෙන, තවදුරටත් කියනවා නම් මේ නියෝ-ලිබරල් ප්‍රජාතාන්ත්‍රික ආර්ථිකකරණය තුළ තිබෙන, මේ අය වැයේ මේ වචන අස්සේ තිබෙන මොන දෙයින්ද, ගමේ අහිංසක මිනිහාට යමක් ලැබුණේ? නැවත නැවතත් මම මේ ප්‍රශ්නය අහනවා. ඔවුන්ගේ සමාජ සුබසාධනය සඳහා රුපියල් 1,000-1,500ක් වැය කිරීම ගැන නොවෙයි, මම අහන්නේ. ගමේ මනුෂ්‍යයා, අපේ නිර්ධන පාන්තිකයා, අපි උඩට ගන්නේ කොහොමද? එසේ ඔවුන් උඩට ගැනීම සඳහා මේ අය වැය තුළ තිබෙන්නේ කිනම් වැඩ පිළිවෙළක්ද කියන එක කොහේවත් සාකච්ඡා නොවෙන නිසායි මම ඒ ගැන අහන්නේ. මේ අහිංසක පුරවැසියා පව්; හරිම පව්.

මේ රටේ ඉතිහාසයේ දේශපාලනය තුළ සිදු වුණු ඒ අවභාවිත නිවැරදි වෙන්නට ඕනෑ; ඉතිහාසයේ දේශපාලනය තුළ සිදු වුණු ඒ වැරදුණු තැන් නිවැරදි වෙන්නට ඕනෑ කියන එක මම පිළිගන්නවා. ඒක මිනිස්සුත් විශ්වාස කළ නිසා තමයි මිනිස්සු මෙවැනි තීරණයක් ගත්තේ. හැබැයි, එතැනදී මිනිස්සුන්ට බලාපොරොත්තු තබා ගන්න අයිතියක් තිබෙනවා, ඒගොල්ලන් ප්‍රාර්ථනා කරපු වෙනස සම්බන්ධව. ඒගොල්ලන්ට ඕනෑ, ඒගොල්ලන්ගේ දරුවන් දියුණු වෙනවා දකින්නටයි. ඒගොල්ලන්ට ඕනෑ, ඒගොල්ලන්ගේ දරුවන් පොඩි කාර් එකක හෝ යනවා දකින්නටයි. මේ රටේ තාරුණ්‍යයට ඕනෑ, ඒ අයගේ සිහින ඉටු කරගන්නටයි. දැන් මේ අය වැයෙන් යෝජනා කර තිබෙන වැඩ පිළිවෙළ තුළ කොයි මිනිහාගේ මොන සිහිනයටද පණ ලැබුණේ, තිබෙන සිහින ටිකත් බිඳ වැටුණා හැරෙන්නට?

ගරු සභාපතිතුමනි, මම නිතරම කියන විධියට සාධනීය හා ප්‍රශස්ත දේශපාලනයක් තුළ සර්වජන බලය හැටියට අපට ඕනෑ, මේ ආණ්ඩු පක්ෂයට නිවැරදි මාර්ගයක යන්න උදව් කරන්නයි. නමුත්, අද අපි පිළිගන්නා බරපතළ බලපෑම් බොහොමයක් යටතේ ඔබ ඉදිරිපත් කළ මේ අය වැය නිවැරදි කර ගැනීමට ඔබට අවංක චේතනාවක් තිබුණා නම්, IMF එක කොයි විධියට බෙල්ල මිරිකුවත් මේ අය වැයෙන් අහිංසක මිනිස්සු තුළ ඇති කරපු බලාපොරොත්තු, මේ රටේ තාරුණ්‍යයට පණ දෙන්න පුළුවන්කම තිබුණු අවස්ථා බොහොමයක් ඒ ඒ අයිතම යටතේ පැහැර හැර ඇති බව පැහැදිලියි.

විශේෂයෙන්ම අපි යෝජනා කළ, ඔබතුමන්ලා අපෙන් පැහැර ගත්, ඒ ව්‍යවසායකත්ව සංකල්පයට පණ දෙන්න, ඒ මිය ගිය ව්‍යවසායකත්වය ගොඩ ගන්නට ලැබුණු මේ අවස්ථාව ඔබ පැහැර හරිනවා. ලක්ෂ 3කට ආසන්න සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් බලාපොරොත්තු වුණා, මේ රජය මේ අය වැය තුළින් ඔවුන්ගේ ඒ වැටුණු ව්‍යවසායයන් ගොඩ ගන්නට ඍජු වැඩ පිළිවෙළක්, දැනෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරයි කියලා. ඒකට සූක්ෂ්තර මූක්ෂ්තර අස්සේ හංගලා මිනිස්සුන්ට තේරෙන්නේ නැති දෙයක් කියලා වැඩක් නැහැ. මිනිස්සු කල්පනා කරන්නේ, තමන්ගේ වැටුණු ව්‍යාපාරය - බැංකුවෙන් ගන්න ඔන්න මෙන්න බලාගෙන ඉන්න ඒ ව්‍යාපාරය - කොහොමද බේරා ගන්නේ කියලායි. ඔවුන්ගේ වරදකින් නොවුණත්, වෙනත් හේතු නිසා ඔවුන්ට අහිමි වුණු ඒ ව්‍යවසායක අවස්ථාව නැවත නිර්මාණය කර දීම මේ අය වැයෙන් දැනුවත්වම පැහැර හැර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, වෙන කිසිම කෙනෙකුට වඩා මේ රටේ තාරුණ්‍ය ඔවුන්ගේ ජීවිත පිළිබඳව විශාල වෙනසක් අපේක්ෂා කළා. අඩු මිලට කාර් ගන්න හිටියා පමණක් නොවෙයි, ඔවුන්ට දියුණු වෙන්න පුළුවන් පරිසරයක් මේ රටේ ඇති වෙයි කියලා ඔවුන් හිතුවා. ඔවුන් මේ දේශපාලන සංස්කෘතිය තුළ වෙනසක් බලාපොරොත්තු වුණේ සද්භාවයෙන්. නමුත්, අවාසනාවකට වාගේ මේ රජය -මේ ආණ්ඩුව- නියුක්ත වෙන්නේ, ඒ පරණ පුරුදු ගුප්ත දේශපාලනයේයි. ඒ තුළ තිබෙන සැහවුණු දේශපාලනය දේශීයව හා විදේශීයව භාවිත වන තත්ත්වය හමුවේ මේ රට ඉදිරියට යන්නේ නැහැ. හැබැයි, මිනිස්සුන්ගේ අපේක්ෂා ඉතා ඉහළ තලයකට ඔසවා තැබූ ඔබට විශාල වගකීමක් තිබෙනවා,

[ගරු දිලිත් ජයවීර මහතා]

අපේක්ෂා භංගත්වයට පත් වුණු ශ්‍රී ලාංකික ජනතාව සනසන්නට. ඔබ ජනතාවට පොරොන්දු වුණා, අහස උසට දේවල් දෙන්න. හැබැයි, ඔබතුමන්ලා අද ඔවුන් ඇද දාලා තිබෙනවා, පොළොවෙනුත් පහළට.

ඒ ඒ ශීර්ෂ යටතේ ගත්තොත්, ඔවුන්ගේ වැටුප් සම්බන්ධයෙන් ගත්තොත්, මේ රටේ ඉන්න දුගී-දුප්පතාගේ පැත්තෙන් ගත්තොත්, මේ රටේ ඉන්න ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ පැත්තෙන් ගත්තොත්, මේ රටේ ආනයන අපනයන කටයුතුවල යෙදෙන ව්‍යාපාරිකයන්ගේ පැත්තෙන් ගත්තොත්, සංචාරක ව්‍යාපාරයේ යෙදෙන අයගේ පැත්තෙන් ගත්තොත්, beach එකේ ඉන්න මාර්ගෝපදේශ සපයන්නන්ගේ -guidesලාගේ- ඉඳලා පොඩි restaurants කරන, ලොකු restaurants කරන මිනිස්සුන්ගේ පැත්තෙන් ගත්තොත්, ඔවුන් කොච්චර දේවල් බලාපොරොත්තු වුණාද? ඔවුන් හිතුවා, විශාල වෙනසක් වෙයි කියලා. හැබැයි, මොකක්ද වුණේ? කිසිම දෙයක් වුණේ නැහැ. ඒක මම නැවතත් කියනවා. එහෙම වුණේ දර්ශනයක් නොතිබුණු නිසා පමණක් නොවෙයි, සද්භාවය නොමැති වීම නිසායි, අවංකකම නැති නිසායි, ඔබත් දේශපාලනයේ පැවැත්ම සඳහා පමණක් කටයුතු කරන නිසායි.

ගරු සභාපතිතුමනි, මේ විශේෂ වියදම් ඒකක යටතේ යම් සේ යම් දෙයක් සඳහන් වුවද, සමස්තය ලෙස ගත් කළ අපට අවශ්‍ය වන්නේ, මේ හුදු දේශපාලන සංස්කෘතිය වෙනස් වෙනවා කියලා වියදම් අඩු කිරීම නොවෙයි.

ඒක ගැන මිනිස්සු හිතන්නේ නැහැ. වියදම් අඩු කිරීම හොඳ වෙන්න පුළුවන්. අපේ ගරු අගමැතිතුමිය කරපු ප්‍රකාශයෙන් මටත් තේරුණා, මුදල් අවභාවිත වෙලා තිබෙන බව. ඒක ඇත්ත. ඒ අවභාවිත වෙලා තිබෙන නිසා, දැන් වියදම් අඩු කළ පමණින් මේ රට ගොඩ යන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. අපි ධනය නිර්මාණය කරන්නට ඕනෑ. ධනය නිර්මාණය කරන්නට නම්, අපි ප්‍රාග්ධනය යොදවන්නට ඕනෑ. ප්‍රාග්ධනය යෙදවීමේදී මානව ප්‍රාග්ධනය සහ භෞතික ප්‍රාග්ධනය යන දෙකම එකට එකතු කරලා යොදවන්න ඕනෑ. ඒ සඳහා ලංකාවේ මිනිස්සු අභිප්‍රේරණය කරන්නට ඕනෑ, motivate කරන්නට ඕනෑ. ප්‍රාග්ධන යෙදවීමකින් තොරව හුදු වියදම් අඩු කිරීම, නාස්තිය අඩු කිරීම කියන එකෙන් පමණක් මේ රට ඉස්සරහට යන්නේ නැහැ.

ඒකට හොඳම උදාහරණය තමයි, දැන් ගරු අගමැතිතුමිය කියපු පිටරට යන එක අඩු කළා කියන එක. මම දන්නේ නැහැ, රුපියල් මිලියනයක් වියදම් කරලා රටවල් තුනකට ගියේ කොහොමද කියලා. කොහොම ගියත්, footboard එකේ එල්ලිලා ගියත්, ඒ ගමනට වියදම් කළ මුදල අඩු කළේ කොහොමද කියලා මම දන්නේ නැහැ. මමත් දැනගන්න කැමැතියි, එච්චර අඩු වියදමකින් කොහොමද රටවල් තුනකට යන්නේ කියලා. කොහොම වුණත් ඒ වියදම් අඩු කිරීමෙන්ම ලාභය හට ගන්නේ නැහැ. රජයක් හැටියට ඉස්සරහට යනවා නම්, අපි මේ සමස්තය තේරුම් අරගෙන, මේ රටේ ධනය නිර්මාණය කරන්නට කටයුතු කරන්නේ කොහොමද, අපි මේ රටේ ජනතාව නිවැරදි මාර්ගයට අරගෙන, ඔවුන් සහභාගි කරවාගෙන, අපේ සියලු කර්මාන්තවලට පණ දෙන්න ඕනෑ කොහොමද කියලා බලන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, එහෙම නැත්නම් අපි කොහොමද මේ විශාල අය වැය පරතරය පියවා ගන්නේ? එහෙම නැත්නම් අපි කොහොමද අපට ගෙවන්න තිබෙන ණය ගෙවන්නේ? ගරු සභාපතිතුමනි, කිසිසේත්ම අපි අපට බොරු කර ගන්නට නරකයි. මේ රට වැටී තිබෙන අගාධයෙන් ගොඩ ගන්නට අපට අවශ්‍ය නම්, අපි විවෘත සංවාදයක් තුළ මේ කරුණු සාකච්ඡා කරන්න ඕනෑ. එකිනෙකා රවටා ගැනීමෙන්, අහිංසක මිනිස්සු රැවටීමෙන් වැළකී අපි ඇත්ත කියලා ඉස්සරහට යන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා, NPP මැතිවරණ වේදිකාවේදී තාරුණ්‍යයට විශාල අපේක්ෂාවක් දුන් බව. විශේෂයෙන්ම මේ රටට ඇමෙරිකානු ඩොලර් ගෙන එන ඒ තාරුණ්‍යයට අවශ්‍ය පහසුකම් සියල්ල සලසා දීලා, සියලු අවස්ථා සලසා දීලා, ඒ තාරුණ්‍යයේ නිර්මාණශීලිත්වයට පණ දෙනවා කිව්වා.

හැබැයි, මොකක්ද වුණේ? පසුගිය 21වැනි දා රෑ හොරෙන් බද්දක් ගැහුවා, Inland Revenue Department එකෙන්. සියයට 15ක බද්දක් අය කරනවා. ඒ තාරුණ්‍යයට - තාරුණ්‍යයේ නිර්මාණශීලිත්වයට නොතිබුණු බද්දක් ගැහුවා. ඒ තාරුණ්‍යයේ සිහින, ඒ මල්වන් සිහින එක අතට අරගෙන, එක මිටට ගුළි කරලා, ඔවුන්ගේ සිහින එක මොහොතක බිඳලා දැම්මා, ගරු සභාපතිතුමනි. අද ඔවුන් අන්තිම අසරණයි. අද ඔවුන්ගේ නිර්මාණශීලිත්වයෙන් උපයන මුදලට, Fiverr වැනි මෘදුකාංග භාවිත කරලා ඔවුන් කරන ඒ නිර්මාණවලින් ලැබෙන ආදායමටත් බද්දක් අය කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dilith Jayaweera, you have exhausted your time.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Give me one minute, please. ගරු සභාපතිතුමනි, ඒ නිර්මාණශීලිත්වය බිඳ දමා ඇති ආකාරය ගැන අපි කනගාටු වෙන්නට ඕනෑ. ගරු සභාපතිතුමනි, ඔවුන්ට බලාපොරොත්තු ඇති කරන්න කියා මම මේ රජයට ආරාධනා කර සිටිනවා. ඒ සඳහා මේ තාරුණ්‍ය දෙස බලා විකල්ප යෝජනාවලියක් ඉදිරිපත් කරන්න. විකල්ප විධියට ඔවුන්ට යම් අවකාශයක් දෙන්න. විශේෂයෙන්ම මේ රට ඩොලර් අර්බුදයක වැටී ඇති අවස්ථාවක ඔවුන්ටත් මේ රට වෙනුවෙන් දායකත්වය ලබා දෙන්න අවස්ථාව දෙන්න. Thank you very much, Hon. Chairman.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 16 minutes.

[11.46 a.m.]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Chairman, actually, it is a very important Committee Stage Discussion that we have today because a lot of the institutions under discussion cover governance issues in this country. Parliament also comes under the institutions discussed today.

Parliament's main role, I believe, is legislation. And, this Government had a mandate to bring in a new Constitution. If I am not mistaken, that was an election promise, that a new Constitution would be enacted and the Government would abolish Executive Presidency. But, however, we are yet to hear anything in that regard from the Government. When we met the President, we

were told that a new Constitutional process would be started. I do not know, but there is so much ambiguity behind that as well. Whether it would happen within three years or start after three years, we still do not know. But, I saw that the Cabinet Spokesperson had mentioned that the priority for the Government is to, first, work on the economy and that the constitutional changes could happen later. Very recently, after the Foreign Minister's speech in Geneva, there was an engagement with some international groups. When they asked me about the Constitution, all I had to say was that the Leader of the House had said that the Hon. Sajith Premadasa's name will be included as the Leader of the Opposition permanently in the Constitution. That is the only thing that this Government has said about the new Constitution. But, the mandate given to you and the promise made was to come up with a new Constitution.

අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව මේ රජයෙන් පොරොන්දු දුන්නා, මොකක්ද මේ ගැන ඔබතුමන්ලා දැනට ගන්න බලාපොරොත්තු වන පියවර කියලා පසුගිය සභයේ මගෙන් ජාත්‍යන්තර ආයතන කිහිපයක් ඇහුවා. මම කිව්වා, අපිට දැනට කියන්න තිබෙන්නේ මේකයි, සභානායකතුමා කියලා තිබෙනවා, විපක්ෂ නායකතුමාගේ නම අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විපක්ෂ නායකකමටම තියනවාය කියලා! ඒ නිසා කරුණාකරලා මේ වාගේ විහිළු සපයන්න එපා. ඔබතුමන්ලාට - මේ රජයට - මේ රට තුළ විශාල වගකීමක් පැවරිලා තිබෙනවා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාය කිව්වා. දැන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාද, නැද්ද? ඒක අහෝසි කරනවා නම් කවදාද ඒක පටන් ගන්නේ? අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවාද, නැද්ද? අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවා නම් ඒ පිළිබඳව වැඩ පටන් ගන්නේ කවදාද?

මම මේ අවස්ථාවේදී වැදගත් කාරණයක් කියන්න ඕනෑ. රට තුළ විශාල මතයක් ගොඩනැඟුවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් මේ පාර්ලිමේන්තුවට විශාල පාඩුවක් වෙනවාය කියලා. අද වනවිට ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. අපි මන්ත්‍රීවරයෙකුගේ අවම වැටුප රුපියල් ලක්ෂ දෙකක් කියලා ගනිමු. ඒ වැටුප මන්ත්‍රීවරු ජීවත් වන දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වෙනවා. දුර ඉඳන් එන මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂ තුනක් විතර ලැබෙනවා. එහෙම ගෙවීමක් කරනවා, fuel allowance ආදිය එක්ක. මන්ත්‍රීවරයෙකුගේ අවම වැටුප රුපියල් ලක්ෂ දෙකක් කියලා ගත්තොත්, 159, රුපියල් ලක්ෂ දෙකෙන් වැඩි කළොත් NPP මන්ත්‍රීවරුන්ට වැටුප් ගෙවන්න මාසයකට රුපියල් මිලියන 31ක් වැය වනවා. අවුරුද්දකට රුපියල් මිලියන 381ක් වැය වනවා. අවුරුදු 5ම බැලුවොත්, රුපියල් බිලියන 1.9ක් වැය වෙනවා, NPP මන්ත්‍රීවරුන්ට වැටුප් ගෙවන්න. NPP එකේ මන්ත්‍රීවරුන්ම අපිට කියලා තිබෙනවා, චෙක් පොතක කොළ 60ම අපෙන් අත්සන් කරලා ගත්තාය කියලා. මේ විධියට රටේ මුදල් ඉතුරු කරනවා නම්, ඒ වැටුප ගන්නේ නැතිව ජනතාවට ආපහු මේ මුදල දෙන්නකෝ.

මම හිතන විධියට, "අස්වැසුම" වැඩසටහන වෙනුවෙන් අවුරුද්දටම වැය වන්නේ රුපියල් බිලියන 2.3යි. ඒ අවුරුද්දටම; රටටම. හැබැයි, NPP එකේ මන්ත්‍රීවරුන්ගේ වැටුප අවුරුදු 5ටම රුපියල් බිලියන 1.9ක්. "රටේ ජනතාවගේ සල්ලි ඉතුරු කරනවා, අපි බදු මුදල් ඉතුරු කරනවා" කියලා ආපු මේ ආණ්ඩුව ඇයි මේ වැටුප් අරගෙන පක්ෂයට දෙන්නේ? එහෙම නම් ඒ වැටුප ගමේ තිබෙන පන්සලකට, ගමේ තිබෙන ඉස්කෝලෙකට දෙන්නකෝ. මේ විධියට රට තුළ ව්‍යාජ මතයක් සමාජගත කරලා තමයි මෙතුමන්ලා බලයට ආවේ.

ගරු සභාපතිතුමනි, අද දවසේ ගොඩක් දේවල් කථා කරන්න තිබෙනවා. National Police Commission එක ගැන කථා කරනකොට මම කියන්න කැමතියි, දැන් ආණ්ඩුව සියලු බලතල - බලයේ තිබෙන සියලු අංශ - තමන් භාරයේ තියා ගන්න මෙහෙවරක් අරගෙන තිබෙන බව. The Government wants to keep every single institution under its control. In that sense, the National Police Commission is under an enormous amount of pressure. මම දන්නා විධියට දැනට ඉන්න වැඩබලන පොලිස්පතිතුමා මාස කිහිපයකට පෙර ජාතික පොලිස් කොමිසමට ලියලා තිබෙනවා, පොලීසියේ transfers කරන එක සම්බන්ධව අපිට ඒ වගකීම භාර දෙන්න, ඒ වගකීම අපට delegate කරන්න කියලා. මහජන ආරක්ෂක ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ස්වාධීන කොමිසමක බලය එහෙම එක පුද්ගලයෙකුට දෙන්න බැහැ. මේ ලියුම ලියපු දවසේ ඉඳන් අද වනතුරු පොලීසියයි, National Police Commission එකයි අතර විශාල ගැටලුවක් තිබෙනවා. පසුගිය සභයේ අපි දැක්කා, OICsලා, පොලීසියේ නිලධාරීන් 190ක් මාරු කරන්න කියනවා. ඒකෙන් 140ක් අනුමත කළා. ඉතුරු 50දෙනා පිළිබඳව යම් යම් ගැටලු තිබෙන නිසා ඒවා කරලා නැහැ. බලන්න, මේ NPP එකට සම්බන්ධ සමාජ මාධ්‍ය ඔස්සේ ඒ National Police Commission එකේ ඉන්න membersලාට විශාල පහරදීමක් වෙනවා. You all are using your mud-slinging machinery to attack an independent Commission in this country. It is a serious governance issue. You all came in with the promise of cleaning this situation. "අපි රටේ quality up කරනවා" කියලා සභානායකතුමා කියලා තිබෙනවා මම දැක්කා. දැන් up කරන quality එක, National Police Commission එකට pressure කරන තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. National Police Commission එක පැත්තකින් තියන්න. Bribery Commission එක ගත්තොත් එහෙම, මම හිතන විධියට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා Bribery Commission එකට පත් කරපු එක නිලධාරියෙක් - judicial officer කෙනෙක් - සම්බන්ධව තව පුද්ගලයෙක් "මේ officerට Bribery Commission එකේ ඉන්න බැහැ" කියලා උසාවියට ගිහිල්ලා, උසාවියෙන් leave to proceed දුන්නු නිසා එතුමා ඉල්ලා අස් වුණා. දැන් නැවත වාරයක් Constitutional Council එකත් යම්කිසි විධියකින් නොමඟ යවලා, Governorsලා දෙන්නෙකුගේ recommendations එක්ක - Constitutional Council එකේ වැඩියෙන්ම ලකුණු හම්බ වුණේ මාධව තෙන්නකෝන්ට - මාධව තෙන්නකෝන්ට දෙන්නේ නැතිව රංග දිසානායකට දීලා තිබෙනවා. එතුමා judicial officer කෙනෙක්. මට එතුමා පිළිබඳ ගැටලුවක් නැහැ. මම හිතන විධියට අද ඒ නඩුව ගන්නවා. ඒකට විරුද්ධව නඩුවක් ගොනු කරලා, අද ඒ නඩුව පැවැත්වෙනවා.

නමුත් නඩුවක් යන නිසා, ඒක ඇතුළේ මා දන්නා තව ගොඩක් කරුණු තිබුණත් ඒවා ගැන සඳහන් කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැබැයි, අද Constitutional Council එකත් අපේ අතට ගන්න ඕනෑ කියන මතයේ තමයි ආණ්ඩුව ඉන්නේ. වැඩි ලකුණු හම්බ වුණු මාධව තෙන්නකෝන්ට දෙන්නේ නැතුව රංග දිසානායක මහත්තයාට දීලා, දැන් නැවත වාරයක් උසාවියට ගිහිල්ලා තිබෙනවා judicial officer කෙනෙකුට Bribery Commission එකේ ඉන්න බැහැ කියලා. දැන් එතුමාටත් ඉල්ලා අස් වෙන්න වෙනවා. Constitutional Council එක හරහා Bribery Commission එකේ තිබෙන ස්වාධීනත්වයත් නැති කරන තත්ත්වයක් මේ තිබෙන්නේ. මෙහෙමයි, රට තුළ කරන හොඳ, නරක දේවල් අපට අදාළ නැහැ. හැබැයි, procedure එකක් තිබෙනවා නම් ඒක follow කරන්න ඕනෑ. මේ NPP ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් තිබෙන නිසා ඒක අපි follow කරන්න ඕනෑ කියලා කාටවත් කියන්න බැහැ.

[ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ඊළඟට, මැතිවරණ කොමිසම - Election Commission එක - ගැනත් මම කියන්න කැමතියි. The Election Commission is also under enormous pressure from the Government. Why? I saw that the Chairman of the Election Commission has issued a statement saying that the Government is exerting pressure on them to hold the Local Government Elections immediately; වහාම මැතිවරණය පවත්වන්න කියලා. ස්වාධීන මැතිවරණ කොමිසමක් තිබුණාම එහි වගකීම තමයි ස්වාධීන ලෙස එහි දිනය නියම කිරීම. විපක්ෂයේ මන්ත්‍රීවරු ගිහිල්ලා මැතිවරණ කොමිසමට කිව්වේ, අය වැය විවාදය පැවැත්වෙන කාලයේ, මැතිවරණ දිනය කියන්න එපා කියලායි. පළාත් පාලන මැතිවරණය පවත්වන දිනය හදිසියේවත් announce කළොත් එහෙම ඊළඟට පාර්ලිමේන්තුවේ තිබෙන Discussionවලදී අපට කථා කරන්න බැහැ. ඇයි, ඒ? අපි පළාත් පාලන මැතිවරණයේ nominations බලන්න ගමේ ඉන්න ඕනෑ. ආණ්ඩුවට වුවමනා ඒකද දන්නේ නැහැ. ඒ නිසා අය වැය විවාදයෙන් පස්සේ මේ පිළිබඳව තීන්දු කරන්න කියන ඉල්ලීමයි අපි කළේ. හැබැයි, රජය පැත්තෙන් දැන් අපට දැනගන්න ලැබිලා තිබෙනවා, වහාම මේ මැතිවරණය පවත්වන්න කියලා Election Commission එකට විශාල pressure එකක් දෙනවාය කියලා. පනතේ තිබෙන්නේ මාස තුනක් ඇතුළත මැතිවරණය පවත්වන්න කියායි. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. ඒ නිසා අද, on the governance aspect also, this Government is following the same path that every other government which had been there before followed; there is no difference. On the Constitution, there is nothing, and you all are also exerting pressure, trying to destabilize the independent institutions of this country.

එතැනින් එහාට ගියාම මට විශාල ගැටලුවක් තිබෙනවා. මම හිතන විධියට, Human Rights Commission එකත් අද මේ විවාදයට ඇතුළත්. පසුගිය සතියේ අපි දැක්කා, විදේශ කටයුතු ඇමතිතුමා ජිනීවාහි කථාවක් පවත්වනවා. ජිනීවාහි කළ කථාවේදී එතුමා කියූ දේවල් සහ මේ සභාව තුළ දැන් ඉන්න නීතිය පිළිබඳව කටයුතු කරන ඇමතිතුමා කියූ දේවල් අතර විශාල පරතරයක් තිබෙනවා. මම දන්නේ නැහැ, ඒක JVP සහ NPP අතර තිබෙන වෙනසක් ද කියලා.

මොකද, මම දැක්කා, that the Hon. Minister of Justice and National Integration - නීතිය පිළිබඳ අමාත්‍යතුමා ,- had issued a press statement last week saying that he is going to set up a Public Prosecutor's Office, that everything is in order to set that up. A week before that, -

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Minister, please respond after my speech.

I also saw another statement which said that the Hon. Minister has received Cabinet approval to amend, change or replace the PTA. The Minister in charge of justice and national integration, the Hon. Prime Minister and most Members of the NPP or the JVP, whichever that may be now, were of the view that the PTA must be repealed, not replaced. I was told by my most senior Members that, at one point, some of them were even willing to discuss what an alternative - the CTA or the ATA - may look like, but the JVP/ NPP was of the view that the PTA must go, that there should be no replacement of the law. But today, the Hon. Minister is saying that they have received Cabinet approval to repeal the PTA or to replace it.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
They refused to take part in the meeting.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
The Hon. Ponnambalam says that you all even refused to take part in a meeting to discuss the replacement of this law; Hon. Prime Minister, you all have refused to take part in a meeting to discuss the replacement of this law. But, now, how can you be a part of a Cabinet that discusses something to replace this? Not only that, the PTA had been repeatedly used on three occasions since President Anura Kumara Dissanayake came to power, if I am not mistaken. The first occasion was, when there was an incident in Arugam Bay. That whole incident is also a big problem. In the interest of time, I cannot mention that here today. I think the second occasion was around the *Maarveerar Naal* over a social media post and the third one, I think, was when the people involved in the incident of "Ganemulle Sanjeewa" had been detained. You spoke about a moratorium for the PTA, rather the previous Government did. So, what is the difference between you all and them? Are you all succumbing to the pressure that is exerted on you by the forces, the deep state? Are you all falling into the trap of the deep state to continue with this law?

When the Hon. Vijitha Herath went to Geneva, I was expecting him to say something about the repeal of the PTA. Nothing! I thought he would speak about accountability and setting up the Public Prosecutor's Office. Nothing! Hon. Minister, is there a difference of opinion between you all? You can respond to that also after my speech because I only have a few minutes.

Then, as the Minister of Justice and National Integration, tell us about the new Constitution. Are you all going to bring in a new Constitution now or are you all going to just stick to putting the Hon. Sajith Premadasa's name as the Leader of the Opposition? Is that the only concern you have right now regarding the Constitution?

Even with regard to accountability issues, there is nothing about the people who had been subjected to enforced disappearances. You all have said about the OMP, the ONUR and all those mechanisms are rejected by the victim community. At least, on the accountability side, have you even considered a domestic judicial mechanism? Have you even discussed that in your Cabinet? I do not think so because if you did, Geneva would be the forum where the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism would have mentioned that.

வெளிநாட்டலுவல்கள் அமைச்சர் அண்மையிலே ஜெனீவாவிற்குச் சென்று பல விடயங்களைச் சொல்லி யிருக்கிறார். ஆனால், மிக முக்கியமான விடயமான 'பொறுப்புக்கூறல்' தொடர்பாக கௌரவ அமைச்சரவர்கள் கடந்த காலத்திலே சொல்லப்பட்ட விடயங்களைவிட புதிய அரசாங்கத்தினுடைய புதிய முன்மொழிவாக எதுவும் சொல்லவில்லை. எங்களுடைய வடக்கு, கிழக்கு மக்கள் 'பொறுப்புக்கூறல்' விடயத்திலே மிகக் கரிசனையோடு இருக்கிறார்கள்; கொல்லப்பட்ட மக்களுக்கு நீதி கிடைக்க வேண்டுமென்பதிலே உறுதியாக இருக்கிறார்கள்; கொலை செய்தவர்கள் தண்டிக்கப்பட வேண்டுமென்பதிலே உறுதியாக இருக்கிறார்கள். ஆனால், கடந்த காலத்திலே மாறி மாறி இந்த நாட்டில் ஆட்சிசெய்த அனைத்து அரசாங்கங்களும் செய்த அதேவேலையைத்தான் நீங்களும் செய்யப்போகின்றீர்கள் என்பதுதான் தெட்டத்தெளிவாகத் தெரிகிறது. அமைச்சரவர்கள் ஜெனீவா அமர்வுக்குச் சென்றபொழுது, காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் - OMP மற்றும் Office for Reparations போன்ற விடயங்களைப் பற்றிச் சொல்லி யிருந்தாலும்கூட, இவையனைத்தும் பாதிக்கப்பட்ட தமிழ் மக்கள் முழுமையாக நிராகரித்த பொறிமுறைகள். அதைவிட, வடக்கு மக்கள் உங்களுக்குத் தங்களுடைய வாக்குகளைத் தந்திருக்கிறார்கள். உங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்திலே புதிய அரசியலமைப்பைப் பற்றி நீங்கள் மிகத் தெளிவாகச் சொல்லியிருந்தீர்கள். ஆனால், ஆட்சிக்கு வந்தபின் இன்று வரைக்கும் புதிய அரசியலமைப்பைப் பற்றி ஒரு வார்த்தைகூட நீங்கள் சொல்லவில்லை.

கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்களும் சபைக்கு வருகை தருகின்றார். கௌரவ அமைச்சர் அவர்களே, வடக்குத் தமிழ் மக்கள் புதிய அரசியலமைப்பு பற்றி எதிர்பார்ப்போடு இருக்கிறார்கள். அதிகாரப் பகிர்வைப் பற்றி அந்த மக்களுக்கு நீங்கள் என்ன சொல்லப் போகின்றீர்கள்? சரி, அதிகாரப் பகிர்வைப் பற்றிச் சொல்லாவிட்டாலும், புதிய அரசியலமைப்பு வருமா, வராதா? வந்தால் அதில் உள்ளடக்கம் என்ன? என்பது பற்றிக் கூறுங்கள்! 'பொறுப்புக்கூறல்' விடயத்திலே எந்த முன்னேற்றமும் இல்லை. இன்று நான் இந்த விடயத்தைப் பேசுவதற்கான காரணம், இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவினுடைய ஒதுக்கீடுகள் பற்றியும் இன்றைய வரவு செலவுத்திட்ட விவாதத்தில் விவாதிக்கப் படுவதனாலாகும்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rasamanickam, you have exhausted your allotted time.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

அந்த வகையில், தமிழ் மக்களுடைய அடிப்படைப் பிரச்சினைகளிலே 'பொறுப்புக் கூறல்' விடயமென்பது மிகப் பிரதானமான விடயம். இந்த விடயம் தொடர்பாக வெளிநாட்டலுவல்கள் அமைச்சர் சாதகமான எந்தப் பதிலும் சொல்லவில்லை. இதற்கான பதிலடியை எதிர்வரும் தேர்தலிலே மக்கள் உங்களுக்கு வழங்குவார்கள் என்பதைக் கூறி, அமர்கின்றேன். நன்றி!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Darmapriya Wijesinghe, you have 18 minutes.

[අ.භා. 12.02]

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මම, විපක්ෂයේ මන්ත්‍රීවරුන් වෙතින් ඉදිරිපත් වුණු කරුණු කිහිපයක් පිළිබඳව කථා කරන්න ඕනෑ. මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා විශේෂ ප්‍රකාශයක් කළා, මෙවර පළාත් පාලන මැතිවරණය ආණ්ඩුවට ඕනෑ දිනයේ පවත්වන්න කියලා ආණ්ඩුව මැතිවරණ කොමිසමට බලපෑම් කරනවාය කියලා. මම ඒ මන්ත්‍රීතුමාට යෝජනා කරනවා, ඒකට විරුද්ධව ආණ්ඩුවට චෝදනා කළා වාගේම එවැනි ප්‍රකාශයක් කිරීමට අදාළ තොරතුරු තිබෙනවා නම් පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
පත්තරේ තිබෙනවා.

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
පත්තරවල තිබෙන ඒවා කියන්න පුළුවන් ඕනෑ කෙනෙකුට, මෙතැන තිබෙන වරප්‍රසාද පාවිච්චි කරලා. නමුත් තොරතුරු මත කථා කරනවා නම් හොඳයි කියලා මම හිතනවා.

ඊළඟ කාරණය, මෙතෙක් ආණ්ඩු කරලා, ඒ ආණ්ඩුවලට උදව් කරලා, ජනතාව විසින් විපක්ෂයේ වාඩි කරපු මන්ත්‍රීවරු ජනතාවගේ අභිංසකකම ගැන කථා කරමින්, "ජනතාව වෙනුවෙන් මේ අය වැය තුළ මොනවත් නැහැ, ආණ්ඩුව ජනතාව වෙනුවෙන් වැඩ කරන්න" කියලා යෝජනා කරනවා.

මේ ආණ්ඩුව හැදුවේම ජනතාව. ඔබතුමන්ලා අභිංසකයි කියලා නාමකරණය කරපු, ඔබතුමන්ලා අත්හැරපු ජනතාව තමයි මේ ආණ්ඩුව හැදුවේ. ඔබතුමන්ලා අභිංසකකමට ඇදලා දම්පු ජනතාව තමයි මේ ආණ්ඩුව හැදුවේ. මේ අය වැය සම්පූර්ණයෙන්ම ඉදිරිපත් වෙලා තිබෙන්නේ ඒ ජනතාව වෙනුවෙන්. මේක ඒ ජනතාවගේ ජීවිත නහාසිටුවීම වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැයක්. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියනවා, ජනතාව හදපු ජනතාවාදී ආණ්ඩුව, ජනතාව වෙනුවෙන් පත්වූ ආණ්ඩුව මේ වසර පහ අවසන් වෙනකොට මේ ඉන්න තැනින් අඩියක්, දෙකක් හෝ තුනක් ඉදිරියට ජනතාව නහා සිටුවන බව. ඒ වුවමනාව සහිතව තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, වසර පහෙන්. පළමු වසරේදීත් අපි ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරනවා.

ගරු සභාපතිතුමනි, අද අය වැය කාරක සභා අවස්ථාවේ ආරම්භක දිනය. අද දින සාකච්ඡා කරනු ලබනවා, ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය පිළිබඳවත්. ඒ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරද්දී, ඒ පිළිබඳව මම වෙනස් විධියකට කථා කරන්න හිතුවා. අපේ රටේ ජනතාවගෙන් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් සුදුසු නිවසක් නැතුව; හිසට සෙවණක් නැතුවයි ජීවත් වෙන්නේ. ජනතාවගෙන් සියයට 0.73ක් තවමත් තල් අතු නිවාසවල ජීවත් වෙනවා; ලක්ෂ 60ක් වන පවුල්වලින් සියයට 0.73ක් තවමත් තල් අතු සෙවිලි කළ පැල්පත්වල ජීවත් වෙනවා. ඒ වාගේම පවුල්වලින් සියයට 4.36ක් තාවකාලිකව ඉදිකරන ලද, ජීවත් වීමට නුසුදුසු නිවාසවල ජීවත් වෙනවා. ඒ වාගේම සියයට 20.14ක ප්‍රමාණයක් අවසන් නොකළ ඉදිකිරීම් තුළ ජීවත් වෙනවා. ඒ වාගේම ඒ ජනතාවගෙන් සියයට 7.25ක් තවමත් තමන්ගේ ගෙදර වහලට සෙවිලි කරලා තිබෙන්නේ ටකරන්. මේ, විපක්ෂයේ මන්ත්‍රීවරු කියන අභිංසක ජනතාව. මේ, ඔවුන් ඒ ජනතාව ඇදලා දම්පු තැන.

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

අපේ රටේ ජනතාවගෙන් සියයට 3.55ක් ජීවත් වීමට කිසිදු ස්ථානයක් නැතුව ජීවත් වෙනවා. ඔවුන්ට ජීවත් වීම සඳහා ඉඩමකුත් නැහැ, නිවසකුත් නැහැ. නිවසක් තබා ඉඩමක්වත් නැහැ, ජීවත් වෙන්න. ඔවුන් තමයි රාත්‍රී කාලයේ බැලුවොත් කොළඹ නගරයේ තැන් තැන්වල, පදික වේදිකාවල, කඩවල කොරිඩෝවල ජීවත් වෙන්නේ. එවැනි ජනතාවක් ඉන්නවා. ඒ ටික එකතු වුණාම පවුල්වලින් සියයට 36ක්, ජනගහනයෙන් සියයට 36ක්. මේ, විපක්ෂය අභිංසකයි කියලා කියන ජනතාව; විපක්ෂය අභිංසකකමට ඇදලා දමපු ජනතාව. 76 වසරක්, දශක හතකට වැඩි කාලයක් රට පාලනය කරලා ජනතාව ඇදලා දමපු තැන ඒක.

එහෙව් රටක ඒ ජනතාවගෙන් ඡන්දය අරගෙන ආපු ජනාධිපතිවරු තමන් වෙනුවෙන් රට පුරා මන්දිර හදාගෙන තිබුණා, අධික ධනයක් විනාශ කරමින්; අධික ධනයක් නාස්ති කරමින්. ඒ ජනතාව වෙනුවෙන් වියදම් කරන්න තිබුණු, ඒ ජනතාවගේ ජීවිත නහා සිටුවන්න තිබුණු, අවම වශයෙන් ජනතාවට හිසට සෙවණක් ලබා දෙන්න තිබුණු ඒ මුදල් නාස්ති කරලා නාස්තිකාර ලෙස මන්දිර ගණනාවක් පවත්වාගෙන ගියා, ජනාධිපතිවරයා පමණක්. අධික ලෙස මුදල් වියදම් කරමින්, නාස්ති කරමින් මන්දිර ගණනාවක් පවත්වාගෙන ගියා ජනාධිපතිවරයා පමණක්. මන්දිර 10ක්; ජනාධිපති මන්දිර 10ක් රට පුරා පවත්වාගෙන ගියා. කොළඹ කොටුව ජනාධිපති මන්දිරය එකක්, මහනුවර ජනාධිපති මන්දිරය තව එකක්, පැජට් පාරේ නිල නිවස තව එකක්, කතරගම ජනාධිපති මන්දිරය තව එකක්, නුවරඑළිය ජනාධිපති මන්දිරය තව එකක්, මහියංගනය ජනාධිපති මන්දිරය තව එකක්, ඇඹිලිපිටිය ජනාධිපති මන්දිරය තව එකක්, බෙන්තොට ජනාධිපති මන්දිරය තව එකක්, අනුරාධපුරය ජනාධිපති මන්දිරය තව එකක්, යාපනය ජනාධිපති මන්දිරය තව එකක්. පසුගිය කාලයේ යාපනය සහ ඇඹිලිපිටිය ජනාධිපති මන්දිර දෙකෙන් එකක් නාවික හමුදාවටත් අනෙක් එක යුධ හමුදාවටත් බාර දුන්නා. තව ජනාධිපති මන්දිර 8ක් තිබෙනවා. ඒ ජනාධිපති මන්දිර 8 නඩත්තු කිරීම සඳහා අධික වියදමක්; අධික වැය බරක් දරනවා.

මම ඉන් එක ජනාධිපති මන්දිරයක වැය බර කියන්නම්, ජනාධිපතිවරයා එයට ගිය අවස්ථා ගණනත් එක්ක. එතකොට හිතා ගන්න පුළුවන්, ඒ නාස්ති කරපු වියදම කොච්චරද කියලා. නුවරඑළිය ජනාධිපති මන්දිරයට 2015 සිට 2024 වනකල් වසර 10ක් අවස්ථා 7යි ගිහිල්ලා තිබෙන්නේ. එක අවුරුද්දකට එක වතාවක් ගිහිල්ලා නැහැ. එක අවුරුද්දකට අවම වශයෙන් එක වතාවක්වත් ගොඩ වුණේ නැති ජනාධිපති මන්දිරයේ වියදම කොපමණ ද? එහි මසක මෙහෙයුම් වියදම තිබෙනවා, රුපියල් ලක්ෂ 70කට වඩා. ඒ වාගේ මන්දිර 8ක් තිබෙනවා. ඒ මන්දිර 8න් කීපයක් භාවිත කරනවා. ඉතිරි මන්දිර ටික මෙවැනි නාස්තිකාර වියදම් ඇතුළේ ජනතාවගේ මුදල් කාබාසිනියා කරනවා. එක් මන්දිරයකට මේ වසර 10ට රුපියල් මිලියන 66ක් වියදම් කර තිබෙනවා, අවස්ථා 7ක් ගොඩ වෙලා එන්න. නුවරඑළිය ජනාධිපති මන්දිරයට අවස්ථා 7ක් ගොඩ වෙලා එන්න ජනතාවගේ මුදල් කාබාසිනියා කරලා තිබෙනවා, රුපියල් මිලියන 66ක්. ඒ, එක පුද්ගලයෙකු වෙනුවෙන්. තව තව දේවලට ඒවා පාවිච්චි කරලා තිබෙනවා. ජනාධිපතිවරුන්ගේ බිරින්දෑවරුන්ට තමන්ගේ සුඛ විහරණය සඳහා, එහෙම නැත්නම් බිරින්දෑවරුන්ට තමන්ගේ මනදොළ පුරවා ගැනීම සඳහා ඒ මන්දිර පාවිච්චි වෙලා තිබෙනවා; දරුවන්ට උපන් දින උත්සව - birthday parties - ගන්න ඒ මන්දිර පාවිච්චි වෙලා තිබෙනවා. හැබැයි, ජනාධිපතිවරයා ඒවා පාවිච්චි කරලා නැහැ. ජනාධිපතිවරයා අවම වශයෙන් වසරකට එක වතාවක්වත් පාවිච්චි කරපු නැති මන්දිර වෙනුවෙන් වියදම් කර තිබෙනවා, රුපියල් මිලියන 66.6ක්. එවැනි නාස්තිකාර මුදලක් වියදම් කරලා ජනතාවගේ මුදල් කාබාසිනියා කරපු ජනාධිපතිවරු හිටියා. ඒ ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව තමයි අපි අද කථා කරන්නේ.

අපි කොහොමද කරන්නේ? වර්තමාන ජනාධිපතිවරයා කොහොමද කරන්නේ? NPP ආණ්ඩුව ගැන කථා කළා නේ. NPP ආණ්ඩුව කොහොමද ඒක කළේ? අපේ ජනාධිපතිවරයා ජනාධිපති ධුරයට පත් වෙන්න පෙර, ආණ්ඩු බලය ගන්න පෙර අපි ප්‍රකාශ කළා, අමතරව තිබෙන සියලු මන්දිර, ජනතාවට ඉහළින් ඉදිමින් ජනතාවට වඩා වැඩිපුර භුක්ති විඳින සියලු වරප්‍රසාද දේශපාලකයන්ගෙන් අයින් කරනවා කියලා.

ඒ කිව්වා වාගේම අපි අයින් කළා. ජනාධිපතිවරයා වෙනුවෙන් මන්දිර 8ක් තිබුණා. ඒ අටෙන් දෙකක් තබාගෙන අනික් මන්දිර නිදහස් කළා. ඒකත් අපි භාවිත කරන්නේ නැහැ. ඒකත් භාවිත කරන්නේ විශේෂ අවශ්‍යතා සඳහා පමණයි. රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනු සඳහා පමණයි. ඒ, කොළඹ ජනාධිපති මන්දිරය. තව එකක් තිබෙනවා, නුවර. නුවර ජනාධිපති මන්දිරයත් අපි ඉවත් කරන්න යද්දී, සංස්කෘතික අවශ්‍යතාව මත ඒ ජනාධිපති මන්දිරය තබා ගත යුතු නිසා ඒ ජනාධිපති මන්දිරයත්, කොළඹ ජනාධිපති මන්දිරයත් පමණක් තබා ගෙන ඉතිරි මන්දිර සියල්ල රාජ්‍යයේ පොදු අවශ්‍යතා වෙනුවෙන්, ජනතාවගේ පොදු අවශ්‍යතා වෙනුවෙන් නිදහස් කරන්න තීරණය කළා. අපි එහෙව් ආණ්ඩුවක්. එහෙමයි අපි වැඩ පටන් ගත්තේ. ඒකට, ජනාධිපති මන්දිර අයින් කළාට, වැය ශීර්ෂ අඩු කළාට, රුපියල් මිලියන ගණන් ඉතිරි කළාට පොදුවේ ගත් කළ මේ ආණ්ඩුව ජනතාවට සහයෝගය දෙන්නේ නැහැ වාගේ අදෝනා විපක්ෂයේ තිබෙනවා. ඉතින් ඒවා අපි ගණන් ගත යුතු නැති කාරණා. අපි ආණ්ඩු බලය ගත්තා; ආණ්ඩුව පිහිටෙව්වා; ආණ්ඩුව වැඩ කරගෙන යනවා, මේ ජනතාවගේ වුවමනා, මේ ජනතාවගේ අපේක්ෂා ඉෂ්ට කරන්න අපි උපරිම මැදිහත්වීම් කරනවා. ඒ අරමුණ සහිතව තමයි අපි අද මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් ඉස්සරහට යන්නේ.

ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය ගැන කථා කරන අද දිනයේ මම තව කාරණයක් සඳහන් කරන්න ඕනෑ, මන්දිර ගැන කථා කරද්දී. මේ මහත්වරු කොහොමද මේ රටේ ජනතාවගේ මුදල් කාබාසිනියා කළේ කියලා හොඳ උදාහරණයක් තිබෙනවා. ඒ මෙයයි. කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් මිලදී ගන්නවා, 2016 වසරේ පෞද්ගලික නිවසක්. මට මතක හැටියට, මහල් 9කින් යුත් පෞද්ගලික නිවසක්. එහි මාසික කුලිය රුපියල් ලක්ෂ 210ක්.

මාසික කුලිය රුපියල් ලක්ෂ 210ක් වියදම් කරලා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගන්නවා. අවම වශයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයවත් ඒ තැනට ගෙනියන්නේ නැහැ. ඒවා තමන්ගේ හිත මිතුරන් වෙනුවෙන්, ගජ මිතුරන් වෙනුවෙන් ජනතා මුදල් ලබා දීම සඳහා හදපු වැඩ පිළිවෙළ, හදපු සැලසුම්. එහෙම තමයි පසුගිය ආණ්ඩු මේ රට පාලනය කළේ. ඒ කුලියට ගත්ත නිවස නැවත දෙනවා. හැබැයි, ආපහු දුන්නාට, ඒ කුලියට ගත්ත නිවස වෙනුවෙන් අත්තිකාරම් මුදල වශයෙන් ලබා දුන් මිලියන 660 තවමත් ආණ්ඩුවට ගෙවලා නැහැ. ඒක අයකර ගැනීම සඳහා කටයුතු කර නැහැ. ඒක අලුත් ආණ්ඩුව කළ යුතු වැඩක් විධියට තිබෙනවා. ඒ විධියට තමයි ඒගොල්ලන් ජනතාවගේ අපේක්ෂා බොඳ කරමින්, ජනතාවගේ මුදල් කාබාසිනියා කරමින්, නාස්ති කරමින් මේ රටේ ජනතාව මේ තත්ත්වයට ඇදලා දැම්මේ. එහෙම මහත්වරු තමයි ඇවිල්ලා කියන්නේ, මේක අභිංසක ජනතාව වෙනුවෙන් මොකුත් නොකරපු අය වැයක්, ජනතාවට ජීවත් වීම සඳහා ආදායම් උපයන්න වැඩ පිළිවෙළක් නොහදපු අය වැයක්, ව්‍යවසායකයන් නහා සිටුවීම සඳහා වැඩ පිළිවෙළක් නොහදපු අය වැයක් කියලා. ඒ මහත්වරු බිමට ඇදලා දමපු රට අලුත් ආකාරයකින් ගොඩ නැඟීම සඳහා වන අලුත් පියවර තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුව තබලා තිබෙන්නේ.

වර්තමාන ජනාධිපති, ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රට භාර ගන්නකොට මේ රට බංකොලොත් වෙච්ච රටක්; බංකොලොත්භාවයට ඇද දමපු රටක්. මේ රට විනාශයෙන්

විනාශයට රැගෙන යෑම සඳහා වන වැඩ පිළිවෙළ දියත් වූ රටක්. බංකොලොත් රටක් බාර අරගෙන අවම වශයෙන් මාස 2ක් යනකොට රට ස්ථාවර කරන්න සමත් වුණු පාලනයක් තමයි, වර්තමාන ජනාධිපතිවරයා ප්‍රමුඛ ජාතික ජන බලවේගයේ පාලනය කියන්නේ. බංකොලොත් වෙච්ච රට ලෝකයේ විශ්වාසය දිනා ගත්තු තැනට ගෙනෙන්න පුළුවන් වෙච්ච ආණ්ඩුව තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කියන්නේ. ඒ නිසා අපි පටන් ගත්ත මේ ගමන ජනතා අපේක්ෂා, ජනතා බලාපොරොත්තු ඉෂ්ට කර මිස අවසන් නොකරන බවට මේ අය වැය පිළිබඳව කථා කරන වෙලාවේ අපි සහතික වෙනවා.

ගරු සභාපතිතුමනි, අය වැය පිළිබඳ කථාවලදී විපක්ෂයේ මන්ත්‍රීවරු දිගින් දිගටම මතු කළ කාරණයක් තිබෙනවා. විශේෂයෙන් සජබ මන්ත්‍රීවරු, සජිත් ප්‍රේමදාස මහත්මයාගේ - විපක්ෂ නායකතුමාගේ- නායකත්වය යටතේ සිටින සජබ මන්ත්‍රීවරු නිරන්තරව ජාතික ජන බලවේගය ආණ්ඩුව ඉදිරිපත් කළ අය වැය සහ රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉදිරිපත් කළ අය වැය සන්සන්දනය කළා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉදිරිපත් කරපු අය වැයමයි මේ තිබෙන්නේ කිව්වා. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ අය වැය හා සන්සන්දනය කරමින් තමයි අපේ අය වැය පිළිබඳව එතුමන්ලා කථා කළේ. කිසිදු තැනක කිසිදු මන්ත්‍රීවරයෙකු සාකච්ඡා කරනවා අපි දැක්කේ නැහැ, එතුමන්ලාගේ අය වැයේ තිබුණේ මෙහෙමයි, මේ අය වැයේ තිබෙන්නේ මෙහෙමයි කියලා. ඒ නිසා මේ අය වැයට මේ රට ගොඩ නහන්න බැහැ කියලා, එතුමන්ලාගේ අය වැය පිළිබඳව කථා කරනවා කොහේදීවත් අපි දැක්කේ නැහැ. එතුමන්ලාට තිබුණා අය වැයක්. ඒ, "The Blueprint" එක. ඒ "The Blueprint" එකේ තිබෙන කරුණු පිළිබඳව කථා කරන්න එතුමන්ලා සමත් වුණේ නැහැ. ඒකට හේතුවක් තිබෙනවා. හේතුව මොකක්ද? එතුමන්ලාගේ "The Blueprint" එකයි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැයයි කියන දෙකම එකයි; දෙකක් නොව එකක්.

ඇත්තටම ගත්තොත්, Blueprint එක නොවෙයි, ඒක photocopy එකක්. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැයයි, Blueprint එකයි කියන්නේ දෙකක් නොවෙයි එකක්. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැය photocopy එකක්; වචන වෙනස් කරලා හදපු එකක්. ඒ නිසා තමයි එතුමන්ලාට එතුමන්ලාගේ අය වැය අමතක වුණේ. ඒකයි photocopy එකට වඩා original එක ගැන කථා කළේ. එතුමන්ලා හැම විටම සංසන්දනය කළේ, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැය සහ ජාතික ජන බලවේගයේ නව අය වැය.

විපක්ෂයේ මන්ත්‍රීවරු මොනවා කිව්වත් අපි ජනතාවට එක දෙයක් ප්‍රකාශ කළ යුතුයි. අපි ඔබ වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවට පැමිණියා, ආණ්ඩු බලය පිහිටෙව්වා, ජනාධිපති ධුරය භාර ගත්තා. ඒ ජනාධිපති ධුරය භාර ගන්න පෙර ඔබ ඉදිරියට පැමිණ අපි ඔබ සමඟ කථිකා කළා, සාකච්ඡා කළා, මේ රටේ ඔබ ඉන්න තැනින් ඉස්සරහට ගෙන යන්නේ කොහොමද කියලා. අප ඔබ වෙත සපථ කරන ලද අපේ ඒ ප්‍රකාශය අපි එලෙසම ඉෂ්ට කරනවාය කියන ප්‍රකාශය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Amila Prasad. You have 15 minutes.

[අ.භා. 12.20]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

බොහොම ස්තූතියි, ගරු සභාපතිතුමනි. අද ඉතා වැදගත් වැය ශීර්ෂ ගණනාවක් සාකච්ඡාවට ගනු ලබන දවසක්. ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයේ සිට ලංකාවේ පරිපාලන කටයුතු බොහොමයක් මෙහෙයවන ආයතන සමූහයක වැය ශීර්ෂ පිළිබඳව කෙරෙන සාකච්ඡාවක්.

පළමුව මම ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයෙන්ම කථාව ආරම්භ කළොත්, ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය මේ රටේ මහත් ආන්දෝලනයක් ගෙන දෙන වැය ශීර්ෂයක් වෙනවා. මේ රටේ බහුතරයක් මහජනතාව හිතාගෙන ඉන්නවා, ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය කියන්නේ ජනාධිපතිවරයාගේ පෞද්ගලික වියදම්වලට ගනු ලබන මුදල් ප්‍රමාණය කියලා. පළමුව නිවැරදි කරගත යුත්තේ, එය වැරදි කථාවක් සහ දේශපාලන ව්‍යාපාරයක් විසින් මේ රටේ මිනිසුන්ගේ ඔළුවලට දැමූ පට්ටපල්, අමූලික බොරුවක් කියන එකයි.

ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය කියන්නේ, ජනාධිපතිවරයා පෞද්ගලිකව වියදම් කරන මුදල් ප්‍රමාණය නොවෙයි. ඇත්තටම ජනාධිපතිවරයාගේ වියදම් ප්‍රමාණය බොහොම සොච්චමයි. එතුමා යටතේ පවතින අමාත්‍යාංශ සහ වෙනත් ආයතන ඇතුළු සියල්ලේම වියදම් සමූහයම පවතින්නේ ජනාධිපති වැය ශීර්ෂය යටතේයි. ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය අඩු වීම මැජික් එකක් නොවෙයි. එතුමාගේ ආයතන ප්‍රමාණය අඩු වෙනකොට අනිවාර්යයෙන්ම ඒ වියදම් ප්‍රමාණයත් අඩු වෙනවා. එම නිසා ජනාධිපති වැය ශීර්ෂය අඩු වීම අලුත් කථාවක් හෝ අලුත් බලාපොරොත්තුවක් ගෙන දෙන දෙයක් නොවෙයි.

හැබැයි, වර්තමාන ජනාධිපතිවරයාද ඇතුළුව ජනාධිපතිවරයෙකුට යම් පෞද්ගලික වියදම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ වෙනුවෙන් අපි විරුද්ධ නැහැ. ජනාධිපතිවරයාට අනිවාර්යයෙන්ම පහසුකම් තිබෙන්නට ඕනෑ. ශාරීරික පහසුකම් තිබෙන්නට ඕනෑ, මානසික පහසුකම් තිබෙන්නට ඕනෑ. ඒ වෙනුවෙන් අවශ්‍ය මුදල් ප්‍රමාණය වියදම් කරන්න රාජ්‍යයක් විධියට සහ පුරවැසියන් ලෙස අපි බැඳී සිටින්නට ඕනෑ. හේතුව, ජනාධිපතිවරයාගේ එක විනාඩියක් අපේ විනාඩියකට සමාන වෙන්නේ නැහැ. ජනාධිපතිවරයා ගනු ලබන එක තීරණයක් මේ රටේ සමස්ත ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම වෙනස් කරන තීරණයක් බවට පත් වෙනවා. එම නිසා ජනාධිපතිවරයාට මානසික සහ ශාරීරික සුවපහසුව අත්‍යවශ්‍යයි. ජනාධිපති තනතුර දරන පුද්ගලයා කෙරෙහි වෛරය නිර්මාණය කරලා රටකට කවදාවත් ඉස්සරහට යන්නට බැහැ. වෛරයෙන් වෛරය සංසිඳෙන්නේ නැහැ. අපි ලෑස්තියි, ජනාධිපතිවරයාගේ මෙම වැය ශීර්ෂය ඇතුළේ ජනාධිපතිවරයා පහසුකම් අරගෙන, ඒ ගනු ලබන පහසුකම්වලින් මානසික හයිය අරගෙන මේ රට ඉදිරියට ගෙන යෑම සඳහා තීරණ ගන්න එකට.

එම නිසා ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයේ එතුමාගේ පෞද්ගලික වැඩවලට ගන්නා සියලු මුදල් ටික - විශේෂයෙන්ම ප්‍රවාහන කටයුතුවලදී ආණ්ඩුවෙන් ඇති කරපු ලොකු කථාවක් තමයි හෙලිකොප්ටර් භාවිතය කියන කාරණය. මම නැවත කියනවා, ජනාධිපතිවරයා අනිවාර්යයෙන්ම හෙලිකොප්ටර් භාවිතා කරන්න අවශ්‍යයි. මේ රට ඇතුළේ පැය ගණනක් පයින්, එහෙම නැත්නම් වාහනවලින් සැරිසරමින් ජනාධිපතිවරයාගේ කාර්යයන් ඉෂ්ට කරන්න ගියොත් විශාල කාලයක් නාස්ති වෙනවා. එම නිසා ජනාධිපතිවරයාගේ කාර්යයන්වලදී සුවපහසු ආකාරයට ගමන්

[ගරු අමිල ප්‍රසාද් මහතා]

බිමන් යෑම සඳහා සහ කාලය ඉතිරි කර ගැනීම සඳහා ජනාධිපතිවරයා විසින් අදාළ ක්‍රම භාවිත කළ යුතුමයි. එම නිසා ජනාධිපතිවරයාගේ පෞද්ගලික වියදම් පිළිබඳව විපක්ෂයක් ලෙස අපි විවේචනාත්මකව වෛරී අදහස් ඉදිරිපත් කරන්න අපේක්ෂා කරන්නේ නැහැ. ඒ වෙනුවට මෛත්‍රී සහගතව මේ රටට එතුමාගෙන් ලබාගත හැකි ඉහළ කාර්යක්ෂම සේවය ලබාගත හැකි ආකාරයේ සහයෝගයක් ඔබතුමන්ලා ලබා දිය යුතුයැයි අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය ඇතුළේ මාසයකට රුපියල් දෙකෝටි විසිපන් ලක්ෂයක් වියදම් වුණත්, එක පුරවැසියෙකුගෙන් යන්නේ රුපියලයි. එම නිසා ජනාධිපති තනතුර පිළිබඳව අපි ඕනෑවටත් වඩා සැලකිලිමත් වෙනවා. හේතුව, එම තනතුර ඇතුළේ සිටින පුද්ගලයා ගනු ලබන තීරණ තමයි මේ රටේ අනාගතය කවර දිශානතියකට යනවාද කියන එක තීරණය වෙන්නේ. සමහර විට එක තීරණයකින් මේ රට සම්පූර්ණයෙන්ම ආපස්සට හැරෙන්න පුළුවන්. එම නිසා ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව අපට විවේචන නැහැ.

ඒ වාගේම තමයි අග්‍රාමාත්‍ය වැය ශීර්ෂයත්. ඔබතුමන්ලාගේම අදහසින් කියනවා නම්, අග්‍රාමාත්‍ය වැය ශීර්ෂය ටිකක් වැඩිවෙලා. ඒකේ තේරුම ඔබේ වචනවලින් කියනවා නම්, අග්‍රාමාත්‍යතුමිය ජනාධිපතිවරයා තරම් අරපිරිමැස්මෙන් කටයුතු කරන්නේ නැහැ කියන එකයි. නමුත් අපි එහෙම කියන්නේ නැහැ.

ඔබේම වචන ඔබේ පැත්තට. අග්‍රාමාත්‍යතුමියගේ වැය ශීර්ෂය වැඩි වෙනවා කියන්නේ එතුමිය අල්පේච්ඡ ජීවිතයක් ගෙවන්නේ නැහැ කියන එක නොවෙයි. එතැන තිබෙන්නේත් අර කලින් කියපු තාක්ෂණික කාරණාවමයි. එතුමියට පැවරෙන වගකීම් ප්‍රමාණය අනුව අග්‍රාමාත්‍ය වැය ශීර්ෂය ඉහළ යාම, පහළ යෑම තීරණය වෙනවා. හැබැයි අග්‍රාමාත්‍යතුමිය විධියට, අධ්‍යාපන අමාත්‍යවරිය විධියට එතුමිය පත් වන්නේ ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් වෙන් කරනවා කියලා. මා දන්නා තරමින්, - මම මේ අය වැය වාර්තාව කියෙව්වාට පස්සේ තමයි දැක්කේ. - දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1ක විතර ප්‍රමාණයක් තමයි වෙන් කරලා තිබෙන්නේ. අන්න ඒක ගැනයි අපි ප්‍රශ්න කළ යුත්තේ. තමන් මැතිවරණයට ඉදිරිපත් වෙනවා; දේශපාලනයට එනවා, මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් සියයට 6ක් වෙන් කරනවා කියලා, ඒ වෙනුවෙන් උද්ඝෝෂණ කළා. පාරට බැහැලා leaflets බෙදුවා. අවසානයේ තනතුර ලබාගෙන වගකීම් භාර ගත්තාට පස්සේ, ඔබතුමියලාගේ අදහසින්ම කියනවා නම් සියයට 1ක් වාගේ කුඩා මුදල් ප්‍රමාණයක් තමයි වෙන් කරලා තිබෙන්නේ. අන්න ඒක ගැන තමයි අපි ප්‍රශ්න කළ යුත්තේ. එහෙම නැතුව අග්‍රාමාත්‍යතුමියගේ වැය ශීර්ෂය වැඩි වීම පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. කරන කාර්ය භාරය සහ පෙනී සිටි මතවාදය වෙනුවෙන් තමන්ගේ ප්‍රායෝගික ක්‍රියාවලිය සිදු කරනවාද කියන එක තමයි අපට වැදගත් වෙන්නේ.

ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යතුමිය තමයි මේ රටේ පාලනය මෙහෙයවන ප්‍රධාන තනතුරු දෙක. ඒ දෙදෙනාටම පැවරෙන ප්‍රධාන වගකීමක් තිබෙනවා. එතුමන්ලා මේ මැතිවරණ ජයග්‍රහණය ලබා ගනිද්දී ජනතාව තුළ අලුත් බලාපොරොත්තු, සිතුම් පැතුම් ඇති කළා. විශේෂයෙන්ම මේ රට මෙතැනට වැටිලා තිබෙන්නේ නාස්තිය, හොරකම, වංචාව, දූෂණය නිසා කිව්වා. නාස්තිය, දූෂණය, වංචාව, හොරකමට දඩුවම් කරනවා කිව්වා. අන්න ඒ දේවල් වෙනුවෙන් ඔබ දෙපොළ මේ රාජ්‍ය බදු මුදල් වියදම් කරලා; පරිහරණය කරලා, සුව පහසු කලාපයක ඉඳිමින් කොතෙක් දුරට සාර්ථක ක්‍රියාකාරකම් කරනවද කියන එක තමයි රටේ ජනතාව බලාගෙන ඉන්නේ.

මහ බැංකු බැඳුම්කර වංචාවට අවුරුදු 10යි. අර්ජුන මහේන්ද්‍රන්ව ගතවෙන පළමුවෙනි අවස්ථාවේම මේ රටට අරගෙන එනවා කිව්වා. නමුත්, තවම ඒ ක්‍රියාවලිය කර ගන්න බැරි වුණා. පාර්ලිමේන්තුවේ 225ම හොරු කිව්වා. ඒ 225ම හොරු නම් ඒ හොරු විසින් එකතු කර ගත් ධනය මේ රාජ්‍ය ආදායම ඇතුළට ගේන විධිය ගැන ඔබතුමන්ලා කවදාවත් කථා කරන්නේ නැහැ.

ඊළඟ කාරණය තමයි, මේ රටේ විශාල ධනස්කන්ධයක්, ඩොලර් බිලියන 10ක්, 15 රටෙන් එළියට ගියා කියලා මිනිස්සුන්ට කිව්වේ ඔබතුමන්ලා. ඒවා ගෙනැල්ලා දෙනවා කිව්වේ ඔබතුමන්ලා. තවමත් ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා, ඒ ඩොලර් බිලියන 10 හෝ 15 මේ රටට ගෙන ඒම සඳහා අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. අන්න ප්‍රශ්න කළ යුතු තැන. ජධිපතිවරයාට, අග්‍රාමාත්‍යතුමියට වැය කරන මුදල් ප්‍රමාණය නොවෙයි. ඒ හරහා මේ රටට සිද්ධ කළ යුතු කාර්ය භාරය කොතෙක් දුරට ඉෂ්ට කරනවාද කියන එක පිළිබඳවයි මේ රටේ ජනතාව ප්‍රශ්න කළ යුත්තේ; විපක්ෂය වශයෙන් අප ප්‍රශ්න කළ යුත්තේ. ඒ වගකීම කවර ආකාරයෙන්, කවර ප්‍රතිශතයකින් ඉෂ්ට කරලා තිබෙනවාද, ඉෂ්ට කරන්න බලාපොරොත්තු වෙනවාද කියන එක පිළිබඳව තමයි අපි ප්‍රශ්න කළ යුත්තේ; ජනතාවගේ පැත්තෙන් හිටගෙන අපි ඇසිය යුත්තේ. මේවා අපේ ප්‍රශ්නම නොවෙයි.

අය වැය වාර්තාව ඉදිරිපත් කිරීමේදී පුරවැසියන්ගෙන් අදහස් ගන්න ඕනෑ කිව්වා. අපි ඒ සඳහා අවස්ථාව දුන්නා. මේ රටේ මහ ජනතාව පුරවැසි අදහස් ටික එවලා තිබෙනවා. මම මේ අවස්ථාවේදී "අයවැය 2025 - පුරවැසි අදහස්" නමැති වාර්තාව **සභාගත*** කරනවා.

මේ වාර්තාව ඉදිරි කාලයේදී භාවිතයට ගන්න පුළුවන්. පුරවැසි අදහස් වෙනුවෙන් හඬක් නඟන්න තමයි විපක්ෂය ඉන්නේ. එහෙම නැතුව විපක්ෂය කියලා කියන්නේ ඔබතුමන්ලාගේ ප්‍රතිවාදී කණ්ඩායම නොවෙයි. ඔබ, ඔබගේ විපක්ෂ අදහසින් මේ වාර්තාව දිහා බලන්න එපා. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න වෙලාවේ ඔබතුමන්ලා කටයුතු කළ ආකාරය සහ අපි විපක්ෂයේ සිටියදී අපි කටයුතු කරන ආකාරය අතර වෙනසක් තිබෙනවා. ඔබතුමන්ලා එදා හැමවිටම ආණ්ඩුවට විරුද්ධ විපක්ෂයක්. අපි ආණ්ඩුව හරහා මේ රට ගොඩනඟා ගන්න බලාපොරොත්තු වෙන විපක්ෂයක්. ඒක තමයි ඔබතුමන්ලාට පෙනෙන්නේ නැති වෙනස.

මේ සාකච්ඡාවේදී අපි අල්ලස් කොමිෂන් සභාව ගැනත් කථා කළ යුතුයි. ඇයි? නාස්තිය, දූෂණය, වංචාව නවත්වන්න නම් අල්ලස් කොමිසම අනිවාර්යයෙන්ම ශක්තිමත් කළ යුතුයි. මේ රටේ දේශපාලන පක්ෂ, විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂය විගණනයට ලක් කිරීමේ වගකීමක් ඔබතුමන්ලාට තිබෙනවා. ඔබතුමන්ලාට පුළුවන් මේ රටට අලුත් ආදර්ශයක් ලබා දෙන්න. ඒ තමයි ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂය මාස තුනකට වතාවක් විගණනයට ලක් කරලා මේ රටේ මිනිස්සුන්ට පෙන්වනවා, මේ මාස තුනේ සල්ලි ආවේ මෙහෙමයි කියලා. එතකොට අනෙක් සෑම දේශපාලන පක්ෂයකටම ඒක ඉෂ්ට කරන්න සිද්ධ වෙනවා, ආණ්ඩුව ඒක කළොත්. ඔන්න ඔබට පැවරෙන වගකීම්, ඔන්න මේ රට ඉස්සරහට ගෙන යන විධිය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට අවශ්‍ය පහසුකම් දෙන්න ඕනෑ. පසුගිය ආණ්ඩුවලින් එම කොමිසමට අවශ්‍ය පහසුකම් ලබා නොදුන්නේ ඔවුන් හොරු නිසා කියලා ඔබතුමන්ලා කිව්වා. හොරු, හොරුන්ව අල්ලන්න එම කොමිසමට

** ප්‍රස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

පහසුකම් දෙන්නේ නැහැ කිව්වා. දැන් හොරු නොවන ආණ්ඩුව අල්ලස් කොමිසම වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 130ක් විතර කියලා මම හිතනවා. ගිය අවුරුද්දට සාපේක්ෂව ඒක විශාල වැඩිවීමක් නොවෙයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ කාර්යාල එයි කියලා, අල්ලස් කොමසාරිස්වරු පත් කරයි කියලා මම හිතුවා. තුනෙන් දෙකකට එහා ගිය බලයක් තිබෙන නිසා ඒ අවශ්‍ය නීති අණපනත් ගෙනෙයි කියලා හිතුවා. දේශපාලන පක්ෂ පමණක් නොවෙයි, ප්‍රාදේශීය සභාවේ ඉඳලා සෑම රාජ්‍ය ආයතනයක්ම අල්ලස් කොමිසම විසින් පරීක්ෂා කරන තත්ත්වයට ගෙනෙයි කියලා මම බලාපොරොත්තු වුණා. ආයතන 44ක් විතර ප්‍රමාණයක් අල්ලස් කොමිසමත් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ, සෑම මාස තුනකට වතාවක් රැස්වීම් තියන්න ඕනෑ කියලා කිව්වා. හැබැයි මේ මොහොතේ පවා අල්ලස් කොමිසම කාර්යාලය පවත්වාගෙන යන්න ඕනෑ කරන පිරිස් බලය, ඊට අමතරව අවශ්‍ය කරන පහසුකම් නැතිව සිටින ආයතනයක්. ඒ ආයතනය ප්‍රතිව්‍යුහගත නොකර, ඒ පහසුකම් වැඩි නොකර තවත් රැස්වීම් ප්‍රමාණයක් දැම්මොත් දවසකට තව අලුත් රැස්වීමක් වැඩි වෙනවා. ආණ්ඩුව විධියට ප්‍රායෝගිකව මේ කටයුතු පිළිබඳව අවධානය යොමු කරනු ඇතැයි මම හිතනවා.

මේ රට හොරකම් නැති රටක් බවට පත් කරන්න අපට අවශ්‍යයි. ඔබතුමන්ලා හඳන පොහොසත් රටේ, 2029 වර්ෂයේදී හොරකම් නැති රටක අලුත් දේශපාලන ගමනක් යන්න අපි අපේක්ෂාවෙන් ඉන්නවා. හැබැයි, ඒ හොරකම් නැවැත්වීම සඳහා ඔබතුමන්ලා කරනු ලබන දායකත්වය, ඔබතුමන්ලාගේ වේගය ප්‍රමාණවත් නොවීම තමයි මේ මොහොතේ අපට තිබෙන අර්බුදය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ශක්තිමත් කරන්න කියලා අපි කියනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට නීතිපති කාර්යාලය සම්බන්ධ කරන්න. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කරන්න. නඩු ඉක්මන් කරන්න. ඒ සියල්ල වෙනුවෙන් කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු සභාපතිතුමනි, -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Wasantha Samarasinghe?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම ඔබතුමාට උත්තරයක් හැටියට කියන්නම්. අමාත්‍යවරුන්ගේ නිවාසවලින් එකක් මේ වනවිට ලබා දීලා තිබෙනවා. ඔබතුමාගේ අවබෝධයට මම මේක කිව්වේ.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
බොහොම ස්තුතියි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ කාර්යක්ෂමතාව වැඩි කරන්න එක නිවාසයක් දීලා මදි. මම කිව්වේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට එක බැගින් දාන්න කියලා. එකක් හරි දාපු එකට බොහොම ස්තුතියි. හැබැයි, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම එකක් දාන්න කියලා; සෑම ප්‍රාදේශීය සභාවකටම එකක් දාන්න කියලා තමයි මම යෝජනා කළේ. අල්ලස, දූෂණය, නාස්තිය නම් මේ රටේ ප්‍රශ්නය, ඉස්සෙල්ලා ඒක නැවැත්වුවොත් සියයට 50කින් මේ රට දියුණු වෙනවා කියලා කිව්වේ ඔබතුමන්ලා. ඒක නිසා ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා, එක කාර්යාලයක් වෙනුවට කාර්යාල දහස් ගණනක් දාලා හරි මේ රටේ හොරකම නතර කරලා ඒ වෙනුවෙන් දඩුවම් ක්‍රියාත්මක කරන්න.

ඊළඟ කාරණාව තමයි, පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳව විශාල විවේචන තිබුණු පක්ෂයක් තමයි අද ආණ්ඩුව මෙහෙයවන්නේ. එක අවස්ථාවක පාර්ලිමේන්තුවට ප්‍රහාරයක් එල්ල කළා. පසුගිය කාලයේ පාර්ලිමේන්තුව වටලන්න, ගිනිතියන්න උත්සාහ කරපු මිනිස්සු, ඒ පාර්ලිමේන්තුව වට කරලා පාර්ලිමේන්තුවේ බලය අල්ලන්න හිතපු මිනිස්සු පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරුන් ලෙස ඉන්න එක දැකීම පවා ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහණයක්. හැබැයි, පාර්ලිමේන්තුවට ඔබ පැමිණීම පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. මේ පාර්ලිමේන්තු ක්‍රමය ඇතුළේ තිබුණා, පසුගිය කාලයේ අමාරුවෙන් දිනා ගත් අධීක්ෂණ කාරක සභා. මේ වෙද්දී ඒක අකාර්යක්ෂම වෙලා තිබෙනවා; ඒක නතර වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්නවා, දක්ෂ මිනිස්සු. මන්ත්‍රීවරුන් 158දෙනෙක් ඉන්නවා. ඒ ලොකු පිරිසක්. එතැන හොඳ උගත් අය ඉන්නවා. හොරට උගත්කම ගත්තු අයත් ඉන්නවා. මිනිස්සු රවට්ටලා එහෙම ආපු අයත් ඉන්නවා. ඇත්තටම උගත් මිනිස්සු ඉන්නවා. තරුණ දේශපාලකයෝ ඉන්නවා. ඒ සියලු දෙනා ආවේ, මේ රටට සේවය කරන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Amila Prasad, you have only two more minutes.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මේ රාජ්‍ය ක්‍රියාවලිය පවත්වාගෙන යාමේදී ඔවුන්ගේ දායකත්වය ලබා ගන්න තිබෙන හොඳම තැන තමයි අධීක්ෂණ කාරක සභා. පසුගිය පාර්ලිමේන්තුවේ හිටපු රුවන්වැල්ල මන්ත්‍රීතුමිය -ඩොක්ටර් තුසිතා විජේමාන්න මහත්මිය - එම අධීක්ෂණ කාරක සභාවල කාර්ය භාරයේ වැදගත්කම පිළිබඳව විශාල වශයෙන් පෙනී සිටි කෙනෙක්. එතුමිය මාත් එක්ක කිව්වා, ඒවා අකර්මන්‍ය වීම රට ඉදිරියට ගෙන යාම සඳහා විශාල අවාසියක් කියලා. ඔබතුමන්ලාගේ වගකීම තමයි ඒ වෙනුවෙන් මුදල් වෙන් කරන එක. එහෙම කළා කියලා පාඩුවක් නැහැ. පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය මදි නම්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලය ගන්න එකේ වරදක් නැහැ. ඒ හරහා මේ රට ඉදිරියට ගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ සිටින අයත්, විපක්ෂයේ සිටින අපි වාගේ අයත් සම්බන්ධ කරගෙන මේ කාර්ය භාරය වඩා හොඳින් කරගෙන යාමේ අවස්ථාව තිබෙනවා. ඒ පිළිබඳව ඔබේ අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරනවා.

ඒ වාගේම තමයි පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වය; Parliamentary Staff එක. මේ රටේ රාජ්‍ය සේවකයන් බහුතරයක් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ වැඩ කරන්න කැමැතියි. ඒ අය හිතාගෙන ඉන්නවා, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ වැඩ කිරීම අභිමානයක් කියලා. ඇත්ත. හැබැයි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය ඒ කටයුතු කරන්නේ බොහොම අපහසුතා මැද්දේ. තවම විශාල කඩදාසි ප්‍රමාණයක් පුරවනවා. අපට මන්ත්‍රීවරුන්

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ලෙස ලබා දී තිබෙන ID එක හොඳ මට්ටමේ එකක් නොවෙයි. ඔබතුමන්ලාට ඩිජිටල්කරණ ක්‍රියාවලිය පාර්ලිමේන්තුව ඇතුළෙන් පටන් ගන්න පුළුවන්. පරිගණක ගත කරන්න පුළුවන්. එහෙම නැතුව අපි කරන කථා record කරගෙන, අතින් ලියලා, type කරලා හැන්සාඩ් වාර්තාගත කරන ක්‍රමයක් තමයි තවමත් තිබෙන්නේ. ඒ වෙනුවට software එකක් ඔබතුමන්ලාට හඳුන්වා දෙන්න පුළුවන්. පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වය ඒ අයට පහසුවෙන් කර ගෙන යන්න, අභිමානවත් රාජ්‍ය සේවයක් ඇති කරන්න ආරම්භයක් ගන්න ඔබතුමන්ලාට මේ පාර්ලිමේන්තුවෙන් පුළුවන්. ඇයි මම එහෙම කියන්නේ? දෙස්, විදෙස් නායකයන්, තානාපතිවරුන් මේ පාරලිමේන්තුවට ආවාම මේ පවතින සාම්ප්‍රදායික යල් පැන ගිය රාජ්‍ය සේවයේ ක්‍රියාකාරිත්වය දකිද්දී ඒ අයට අපේ රට පිළිබඳව මැවෙන චිත්‍රය ඒ තරම් හොඳ නැහැ. ඒක නිසා ඩිජිටල්කරණය පිළිබඳව විශ්වාසය තිබෙන ආණ්ඩුවක් විධියට මේ පාර්ලිමේන්තුවේ කාර්යභාරය මීට වඩා කාර්යක්ෂම කරලා, ඒ වැඩ කරන අයට මීට වඩා පහසුවෙන් ඒ වැඩේ කරන්න අවස්ථාවක් ලබා දෙන්න ඔබතුමන්ලාට පුළුවන්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, can you please wind up now? You have exhausted your time.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Thank you.

Order, please! The Sittings is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Amila Prasad, you can have two minutes to conclude your speech.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි. අපි කථා කරමින් හිටියේ පාර්ලිමේන්තු කාර්ය භාරය පිළිබඳව සහ පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරිත්වය තවදුරටත් ඉහළ තත්ත්වයකට ගෙන ඒම පිළිබඳවයි. ඒ කාර්ය භාරය ඉටු කරන අයට මෙය මහඟු සහායක් කියා මා හිතනවා. ඒ වාගේම තමයි, මැතිවරණ කොමිෂන් සභාව. විශේෂයෙන්ම මැතිවරණ කොමිසම පසුගිය කාල සීමාවේ මේ රටේ මැතිවරණ ව්‍යාපාරය අතිශය සාර්ථක විධියට සහ අපක්ෂපාතී ලෙස පවත්වාගෙන ගියා, පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වෙනුවෙන් දැඩි ක්‍රියාමාර්ග ගත්තා. ඒ හරහා සාධාරණ මැතිවරණයක් පසුගිය කාල සීමාවේදීත් පැවැත්වුණා. නමුත්, පසුගිය කාල සීමාවේ පැවති ඒ මැතිවරණ ක්‍රියාවලියේ යම් යම් වෙනස්කම් සිදු වෙමින්, සමුපකාර ඡන්ද ක්‍රමය හරහා එක එක කණ්ඩායම් අතර පොඩි පොඩි ගැටලු ඇති වෙමින් පවතිනවා. ඒ වාගේම මැතිවරණ කොමිසම ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී ඒ වෙනුවෙන් කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ආණ්ඩුවක් විධියට ඔබ ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙයි කියන අපේක්ෂාවත් අපට තිබෙනවා.

පසුගිය දිනවල මානව හිමිකම් පිළිබඳ අර්බුදයක් ආවා. පොලිස් කොමිසම සහ පොලිස්පතිවරයා අතර පැවති ගැටුමක් පිළිබඳ අදහසක් අපි දැක්කා. කොමිෂන් සභා පත් කිරීම සාධාරණ රටක්, සාමකාමී රටක් නිර්මාණය කර ගැනීම සඳහා වූ ඉතාම යහපත් දෙයක්. එම නිසා ඒ ස්වාධීන කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය තවදුරටත් ඉහළට ගෙන යෑම අත්‍යවශ්‍යයි. මේ මොහොතේදී පොලිස් කොමිසම සහ පොලිස්පතිවරයා අතර ඇතිවෙලා තිබෙන අර්බුදය ව්‍යවස්ථාපිත අර්බුදයක් ද කියා අපි දන්නේ නැහැ. විශේෂයෙන්ම මම දැකපු ආකාරයට මම නිවැරදි නම්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් සිටියදී ඒ කොමිසම සඳහා ඉතාම කැත පත්වීම් කිහිපයක් කර තිබෙන බව මම දැක්කා. එතුමාගේ හිතවත් අය පත් කිරීම හරහා තමයි ඒ කාලයේ මේ කටයුතු සිදු කළේ. ඔබට පුළුවන් තුනෙන් දෙකක බලය භාවිත කරලා ඒ ස්වාධීන කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය තවදුරටත් සාර්ථකව කරගෙන යන්න, පොලිස්පතිවරයා සහ පොලිස් කොමිසම අතර තිබෙන අර්බුදය අවසන් කරන්න. ඒ හරහා අනාගතයේදී මේ රටේ ඇති විය හැකි අර්බුදවලට උත්තර හොයන්නත් පුළුවන් වේවි. විශේෂයෙන්ම පොලිස් අත්අඩංගුවේ සිටින විට පසුගිය දවස්වල මිය ගිය සැකකරුවන්ගේ මානව හිමිකම්, අනාගත කාල සීමාවේදී මේ රටේ පුරවැසියන්ගේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ඒ කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය තවතවත් ඉහළට ගෙනයන්නත් ඒ තුළින් හැකි වෙනවා. පසුගිය කාල සීමාවේ ඒ කොමිෂන් සභා නිර්මාණය කරපු තැන පටන් ඒවා තවත් ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය තවදුරටත් ආණ්ඩුව ලබා දෙනු ඇතැයි අපි අපේක්ෂා කරනවා.

ඔබේ ආණ්ඩුව බොහොම නිරවුල්, සුදු, කිසිම ආකාරයක වංචා දූෂණවලට ලක් නොවන ආණ්ඩුවක් බවට ජනතාව තුළ විශ්වාසයක් තිබෙනවා. නමුත්, මම මේ කරුණ මීට කලිනුත් මතු කර තිබෙනවා. මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඒ වාගේ රාජ්‍යයකට, ඒ වාගේ රජයකට අත්‍යවශ්‍යයි. පසුගිය කාල සීමාවේදී මේ රටේ බලාගාර පිළිබඳ අදහස ආපු වෙලාවේ, ඊට අදාළ ටෙන්ඩරයක් දෙවතාවක් ප්‍රතික්ෂේප වෙච්ච කණ්ඩායමකට ඔබේ ආණ්ඩුව විසින් ඒ බලාගාර ඉදිකිරීම සඳහා අවස්ථාව ලබා දී තිබෙනවා. එතැන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ වාගේම තමයි, වරායෙන් නිදහස් කර තිබෙන කන්ටේනර් තුන්සිය ගණනක් කාගේද කියලා තවම දන්නේ නැහැ. ගෙවල් ගිනි තියපු අයගේ නාම ලේඛනය ඔබතුමන්ලා දුන්නා; ජනාධිපති අරමුදලින් මුදල් ගත් අයගේ නාම ලේඛනය දුන්නා. නමුත්, මූල්‍ය පරිපාලනය කරන පාර්ලිමේන්තුවේ තවදුරටත් අපි ප්‍රශ්න කරමින් ඉන්නවා, ටෙන්ඩර් පිළිබඳ කාරණාවට අමතරව අර බහලුම්වල අයිතිකරුවන් කවුද; ඒවා ගෙනාවේ කවුද; ඒවා ගෙන ඒම සඳහා කටයුතු කර තිබෙන්නේ කෙසේද; ඒවා ඇතුළේ තිබුණේ මොනවාද කියලා මේ පාර්ලිමේන්තුවට කියන්න කියලා. ඒ පිළිබඳව ඔබේ අවධානය යොමු කරලා, ඒ බහලුම් release කරන්න හේතු වුණු තීරණය ගත්තේ කවුද කියලා මේ පාර්ලිමේන්තුවට කියන්න.

විශේෂයෙන්ම මම දැක්කා, මේ නිලධාරීන් පසුගිය ආණ්ඩුවලදී කරපු වැරදි පිළිබඳව ඔබතුමන්ලා COPE එකේදීත් මතු කළ ආකාරය. මේ පිළිබඳ කාරණාවලදීත්, ඒ නිලධාරීන් කටයුතු කරන ආකාරය පිළිබඳවත් අපි පරීක්ෂාවෙන් ඉන්නවා. ඒ වාගේම ඔබටත් වගකීමක් තිබෙනවා, ඔබ හොරකම් නොකරන, දූෂණයට විරුද්ධ ආණ්ඩුවක් නිසා මේ වාගේ කුඩා ආකාරයේ චෝදනාවක් හෝ ආවාම එයට උත්තර ලබා දීමට. එය ඔබේ වගකීමක් කියා මම විශ්වාස කරනවා. මම එහෙම කියන්නේ ඇයි? අපට අවශ්‍ය කරන්නේ නිරන්තරයෙන්ම මේ රටේ යහපත් ආණ්ඩුකරණයක්. සහචරවාදය වෙන්න පුළුවන් - පසුගිය කාලයේ ව්‍යාපාරිකයෙක් ආණ්ඩුව පැත්තට කථා කළොත් ඔබ නිර්මාණය කරපු විවේචනය තමයි, ආණ්ඩුවයි ව්‍යාපාරිකයනුයි අතර සහයෝගී සබඳතාවක් ඇති කරගෙන මාෆියාවක් පවත්වාගෙන යනවා කියන එක. නමුත්, අපි එහෙම කියන්න ලැහැස්ති නැහැ. හේතුව, මේ රට ගොඩනඟන්න නම් පෞද්ගලික ව්‍යාපාරිකයන් තවතවත් ශක්තිමත් වෙන්න ඕනෑ. මම එහෙම කියන්න හේතුවක් තිබෙනවා. මම දැක්කා, එදා ඔබේ ප්‍රහාරය එල්ල වූ ව්‍යාපාරිකයන් අද ආණ්ඩුව බේරාගන්න ඔවුන්ගේ ප්‍රකාශන නිකුත් කරන ආකාරය.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Member, could you please wind up? We have to economize on time.

ගරු අමිල ප්‍රසාද් මහතා
(මාණ්පුමිකු අමිල පිරසාත්)
(The Hon. Amila Prasad)
එම ක්‍රියාව මම සතුටින් අගය කරනවා. හේතුව, ආණ්ඩුව වෙළෙඳ පොළ ක්‍රමය විශ්වාස කරනවා නම්, වෙළෙඳ පොළට නිදහසේ සැරිසරන්න ඉඩ දෙනවා නම්, අනිවාර්යයෙන්ම මේ රටේ ව්‍යාපාරිකයන්ට ඒ සඳහා අවස්ථාව දෙන්න ඕනෑ. ඔවුන් මාෆියාකාරයන්, ඔවුන් හොරු, ඔවුන් මේ රටේ ධනය මංකොල්ල කන මිනිස්සු හැටියට හිතනවා නම්, මේ රට කවදාවත් ආර්ථික වශයෙන් ඉස්සරහට ගෙන යන්න බැහැ. හැබැයි, රාජ්‍ය ව්‍යවස්ථාව කිරීම පිළිබඳව ඔබේ අවධානය තවමත් යොමු වී නැති බවක් අපි දකිනවා.

අපි ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය ගත්තොත්, රුපියල් කෝටි 30,000ක් විතර පාඩුයි. ඔබම සමහර තැන්වල කියලා තිබෙන විධියට, දවසකට කෝටියක් විතර පාඩුයි. රුපියල් කෝටි 30,000ක් විතර පාඩු ලබන ආයතනයකට ගුවන් යානා ගන්නත් නොවෙයි, ණය ගෙවන්න රුපියල් කෝටි 20,000ක් වෙන් කරනවා. එවැනි ආයතනයකට එච්චර මුදලක් එලෙස වෙන් කරන අතරතුර මේ රටේ ඉඳලා සමහර විට logo එකක් හදලා, එහෙම නැත්නම් data entry කරලා, එහෙම නැත්නම් මොකක් හෝ advertisement එකක් හදලා අන්තර්ජාල පහසුකම් හරහා ඩොලර් උත්පාදනය කරන තරුණ තරුණියන්ගෙන් ඔබ සියයට 15ක tax එකක් ගන්න බලාපොරොත්තු වෙනවා. ප්‍රශ්නය මෙයයි. ආණ්ඩුවක් විධියට ඔවුන්ට ඩිජිටල් පහසුකම් ටික, එහෙමත් නැත්නම් signal ටික හදලා දෙන්නේත් නැත්නම්, එහෙම නැත්නම් ඔවුන්ට ඕනෑ කරන internet speed එක හදලා දෙන්නේත් නැත්නම්, ඒ අයගෙන් බදු අය කිරීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඔබ අය කරන සියයට 15ක බද්ද භාවිත කරන්නේ ඒ අයගේ යහපත උදෙසා නම් ඒ ක්ෂේත්‍රවලට තවතවත් අය යොමු වෙයි. ඒ යොමු වීමත් එක්කම මේ රටට ඩොලර් ලැබේවි. ඔබ බදු අය කරනවා නම්, ඒ අයගේ යහපත උදෙසාම එය යොදවන්න.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Member, you have far exceeded your time. Can you please wind up?

ගරු අමිල ප්‍රසාද් මහතා
(මාණ්පුමිකු අමිල පිරසාත්)
(The Hon. Amila Prasad)
අවසන් වශයෙන් මම එක දෙයක් කියනවා. ඔබ බලයට ආවේ, මේ රට භාර ගත්තේ, මෙය හොරකම, නාස්තිය, දූෂණය හා වංචාව ඉහවහා ගිය රටක්, ඔබ ආපු ගමන් ඒ ටික නතර කරනවා කියලා නේ. ඒ ටික නතර කළා නම්, ඒ ටික නතර වුණා නම්, ඒක නම් ඇත්ත හේතුව, මම විශ්වාස කරනවා, ඔබ බදු අය කරන්න ඕනෑ නැහැ කියලා. ඒ, ඇයි? හොරකම් නතර වුණාම සල්ලිත් ඉතුරු වෙනවා, නාස්ති වෙන්නේත් නැහැ, අරපිරිමැස්මෙන් කටයුතු කරනවා. හැබැයි, දැනුත් තවතවත් බදු අය කරනවා. ඒකේ අදහස තමයි, එක්කෝ මේ රටේ තවමත් හොරකම් සිදු වෙමින් තිබෙනවා. එහෙම නැත්නම් ඔබ කිව්වේ බොරු.

දිගින් දිගටම ඔබ මේ මොහොතේ කියන, කරන හැම දෙයකටම ප්‍රතිවිරුද්ධ කථාවක් සහ ක්‍රියාවක් ඔබ ආණ්ඩු බලය ගැනීමට පෙර කරලා තිබෙනවා. ඒ නිසා ඔබේ විපක්ෂය ඔබම බවට පත් වෙමින් ඔබ ආණ්ඩුවත් කරගෙන යනවා. අපි විස්තර විචාරකයන් විධියට ඔබේ ආණ්ඩුකරණය දිහා බලාගෙන ඉන්නවා. ඔබේ විපක්ෂය ඔබම බවට පත් වෙමින්, ඔබේ ප්‍රතිවාදියා ඔබම බවට පත් වෙමින් අමාරු ආණ්ඩුකරණයක් පහසු කර ගැනීමේ අවස්ථාව ඉදිරි කාලයේදී ඔබට ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
The Hon. Harshana Nanayakkara. You have 19 minutes.

[අ.භා. 1.07]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු සභාපතිතුමනි, මෙම අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ විවාදය අද ආරම්භ වුණා. මෙම කාරක සභා අවස්ථාවේදීත් අපි සුපුරුදු රටාවක් දකිනවා. අප රජය විසින් අය වැයක් ඉදිරිපත් කළා. අපේ ආර්ථිකය සම්බන්ධව ඉතා ගැඹුරින් ගරු අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් කරුණු ඉදිරිපත් කළත්, විපක්ෂය විසින් දිගින් දිගටම ඒ ගැඹුරු අර්ථය තේරුම් නොගෙන හෝ හිතාමතා එය මඟ හැරලා එතුමන්ලාගේ කථාවලදී ආර්ථික නොවන කරුණුවලට මුල් තැන දෙනවා. බොහෝ වෙලාවට ඒ අය එදා උදේට පත්තරයක තිබෙන යමක් කියවලා ඇවිල්ලා, අය වැය විවාදය පැත්තක තබලා ඒ කරුණු මෙතැන කියන්න පටන් ගන්නවා. ගරු සභාපතිතුමනි, ඒ හැමෝම නොවෙයි. මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් ඉන්නවා, උනන්දුවෙන්ම මේ විවාදයට සහභාගි වන. නමුත් විපක්ෂයේ බහුතරයක් එහෙම නැහැ. පාලක පක්ෂයක් හැටියට අපි අවංකව කැමැතියි, හොඳ විපක්ෂයක් ඉන්නවා නම්. මොකද, ඒ අයටත් මේ රට හදන, මේ රට ගොඩනඟන යෝජනාවලට සාධනීයව දායක වෙන්න පුළුවන්. ඒත් අපට වැඩිහරියක් ඇහෙන්නේ උස් හඬින් මර ළතෝනි දෙන එකයි, උස්

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

හඬින් අසත්‍ය හා නොමඟ යවනසුළු කරුණු කියන එකයි. ඒ නිසා මගේ කථාව වුණත් මට ආරම්භ කරන්න සිදු වන්නේ අය වැය සම්බන්ධයෙන් නොවූ එවැනි කරුණු-කාරණා කිහිපයක් පැහැදිලි කර දෙමිනුයි.

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරයෙකු අදත් සුපුරුදු පරිදි මාතෘකාවෙන් පිට කාරණා කිහිපයක් සඳහන් කරන්නට යෙදුණා. අපි මැතිවරණ කාලයේ ලබා දුන් පොරොන්දු ඉටු නොකරන, මැතිවරණ කාලයේදී කියපු දේවල් වෙනස් කරන පුද්ගලයන් යැයි හන්වඩු ගසන්නට එතුමා ඒ කරුණු යොදා ගත්තා වෙන්න පුළුවන්. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් දක්වපු කරුණුවලට මට පැහැදිලිව කියන්න තිබෙන්නේ මෙයයි. ඔව්, ජාතික ජන බලවේගය මැතිවරණයට පෙරත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන බව කිව්වා. රනිල් වික්‍රමසිංහ රජය විසින් ගෙනාපු anti-terrorism law එකටත් විරුද්ධ වෙච්ච පක්ෂයක් අපි. එය සම්මතව තිබුණත්, මේ වන විට අපි රජය භාරගෙන මාස තුනක් ගත වන මොහොතේදී සංශෝධනවලට යටත්ව අපි ඒ වෙනුවට අලුතින්ම නීතියක් ගෙනෙන්න ජනාධිපති නීතිඥ රියෙන්සි අර්සකුලරත්න මහතා ප්‍රමුඛ කමිටුවක් පත් කරලා තිබෙනවා. එම කමිටුව විසින් මේ සමස්ත පරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතත්, අලුතින් ගෙනාපු anti-terrorism law එකත් සමාලෝචනය කරනවා. ඒ සමාලෝචනය කිරීමෙන් අපි අදහස් කරන්නේ කුමක්ද? මේක, මේ ඊළඟ මැතිවරණය වෙනකල් ඇදගෙන යන ක්‍රියාවලියක් නොවෙයි. නමුත්, ඉතා ඉක්මනින් ගෝලීය ත්‍රස්තවාදයට, ගෝලීය නූතන අභියෝගයන්ට මුහුණ දිය හැකි ආකාරයෙන් ත්‍රස්තවාදයට එරෙහි වීමේ පනතක් තමයි අපි සකස් කරන්න ආරම්භ කරන්නේ. හැබැයි, එතැනදී ගෝලීයව පිළිගත්ත මානව හිමිකම් මූලධර්මයන්ට යටත් වෙමින් තමයි ඒ පනත සකස් වෙන්නේ. එම නිසා ඒ පනත සකස් වූ වහාම අනිවාර්යයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි වන බව කිව යුතුයි. ඒ පිළිබඳව කවුරුත් සැකයක් තබා ගන්නට හොඳ නැහැ.

ඒ වාගේම විපක්ෂය විසින් තව කරුණක් නිර්මාණය කරන්න උත්සාහ කරනවා. ඒ, මොකක්ද? ආණ්ඩුවේ පුද්ගලයින් අතර ගැටුම් තිබෙනවා, JVP-NPP අතර ගැටුම් තිබෙනවා, ආණ්ඩුවත්-නීතිපතිත් අතර ගැටුම් තිබෙනවා කියලා පෙන්වන්න උත්සාහ කරනවා. මේ බංකොලොත් වෙච්ච විපක්ෂයේ ලොකුම ප්‍රශ්නය තමයි ඔවුන්ට, ඔවුන්ගේම කියලා කියා ගන්න දෙයක් නැතිව මොනවා හෝ කෑල්ලක් හැලෙන කල් බලාගෙන ඉන්න එක.

මේ කථාව අහන ජනතාවට මා මතක් කරන්න කැමතියි, මහ මැතිවරණයට කලින් හරිනියි, අනුරයි -ජනාධිපතිතුමායි- අතර අපේක්ෂකත්වයට ගැටුමක් තිබෙනවාය කිව්ව බව. ඒ වාගේම, සමහර චීවරධාරීන් කිව්වා, අපි බලයට ආවාම දළඳා පෙරහැර තහනම් කරනවා, පන්සලට දානය නවතිනවා, ගෙවල් ගිනි තියනවා, පෞද්ගලික දේපළ පවරා ගන්නවාය කියලා. මේ අවතාර මැවීමක්. විපක්ෂයට මම කියනවා, මේ අවතාර මැවීමේ ක්‍රියාවලියෙන් ඔබතුමන්ලා ඉතා දරුණු ලෙස පරාජයට පත් වූ කට්ටියක්, ඒ නිසා ඔය පරණ ජරා පාරේ යන්න එපා කියලා. ඒ පාරෙන් ගිහින් ඔබට එන්න පාරක් නැහැ. දැන් නීතිපතිතුමා සහ අපි අතර ගැටුම් තිබෙනවා කියලා පෙන්වන්න මොකක්ද ඔවුන් ගෙනෙන්න හදන්නේ? නීතිපතිතුමා විශ්වාස නැති නිසා රජය විසින් අභිචෝදක කාර්යාලයක් පිහිටුවන්න හදනවාය කියනවා. මම හිතන්නේ ඒක කියපු මහත්මයාත් අනිවාර්යයෙන්ම රටේ, ලෝකයේ දේවල් දන්නා කෙනෙක්. ඔහු දන්නවා, එංගලන්තය වාගේ රටකත් Crown Prosecution Service එකක් තිබෙනවාය කියලා. ඕස්ට්‍රේලියාවේත් Federal Prosecution Service එකක් තිබෙනවා. ඒක නීතිපතිවරයා එක්ක තරහට ගෙනෙන එකක් නොවෙයි. නීතිපතිවරයාගේ කාර්යභාරය සහ අපරාධ නඩු මෙහෙය වීමේ කාර්යභාරය ස්වාධීන ආයතනයකට පැවරීම, ඒ හරහා efficiency එක වැඩි කිරීම - because there is a perception. There is a perception of conflict of interest because the Attorney-General plays a couple of roles. On the one hand, he is the adviser to the State and attends to constitutional matters and on the other, he is the prosecutor. So, even civil organizations working in these areas have suggested to us that it is democratically suitable to establish a separate institution for public prosecution. Therefore, it is for that purpose, Hon. Chairman, that, keeping in line with our promise - if anyone looks at our Manifesto, he would see that we have promised an independent Prosecutor's Office; we have promised it - we hope to establish it. The Opposition kept on saying that we are not doing what is in the Manifesto, but the truth is anything but. So, it is in our Manifesto and we are establishing it, not because we are angry with the Attorney-General or we do not trust him, but it is a matter of policy for efficient prosecution and to do justice to people.

Sir, those two things, I touched upon simply because those are the misinformation they raised in Parliament with their high voices. There are many other allegations, which I will not go into because I need to save my time to participate in this Committee Stage Discussion.

ගරු සභාපතිතුමනි, ඉතිහාසගත වන මෙම අය වැය, ජනතා අය වැයක්. අපි ඇති තරම් පැහැදිලි කළා, මෙම අය වැය තුළින් රටේ සාමාන්‍ය ජනතාවට, දරුවන්ට, අඩු ආදායම්ලාභීන්ට ලැබෙන්නා වූ ප්‍රයෝජන, ප්‍රතිඵල සහ ප්‍රතිලාභ පිළිබඳව. ඒ වාගේම, මෙය රට මෙහෙයවන ආර්ථික දිශානතිය පෙන්වන අය වැයක්. හැබැයි, ගරු සභාපතිතුමනි, රට කොපමණ සංවර්ධනය කළත්, රටට කොපමණ ආයෝජන ගෙනාවත්, භාණ්ඩාගාරයට එන සල්ලි කවුරු හෝ නාස්ති කරනවා නම්, ඒවා හොරා කනවා නම්, කොච්චර සල්ලි උත්පාදනය කරන ආයෝජන මේ රටට ගෙනාවත් වැඩක් වෙන්නේ නැහැ. අන්න එහෙම දේශපාලන සංස්කෘතියක් තමයි අපේ රජයට කලින් මෙතැන තිබුණේ. භාණ්ඩාගාරයට යකෙක් වහලා වාගේ තිබුණා. ලැබෙන ශත පහක්වත් ඉතුරු වුණේ නැහැ, නාස්ති වුණා. අප රජය යටතේ වංචාව, දූෂණය සහමුලින්ම නවත්වා තිබෙනවා. මෙම රජය පත් වෙලා මාස 3ක් වෙනවා. කාටවත් ඇහෙනවාද, ඇමතිවරයා ඔහුගේ බලයෙන් ඉඩම් අල්ලාගෙන, මන්ත්‍රීවරයා ඔහුගේ බලයෙන් තව කාට හෝ හිරිහැරයක් කරලා, ඇමති බිරිය සමඟ රට සවාරි ගිහින් ආණ්ඩුවට කෝටි ගණන් බිල් දාලා. එහෙම මුකුත් ඇහෙන්නේ නැහැ. මොකක්ද ඔබතුමන්ලාගේ වෙනස, මොනවාද ඔබතුමන්ලා කළේ කියලා අපෙන් හැමෝම අහනකොට මම කියන්න කැමතියි, ඔන්න ඕක තමයි අපි ඉස්සර වෙලාම කළේ කියන එක. රටේ නාස්තිය නැවැත්වූවා. රටේ පාලකයාත් නීතියට යටත් කියන කාරණාව අපි පෙන්නුවා. ඒක තමයි මේ පළමු මාස තුන තුළ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම අපි ජනතාවට පොරොන්දුවක් දුන්නා; අපි හැම වේදිකාවකම කිව්වා, අපි රජයේ මුදල් ශත පහක්වත් අපේ පෞද්ගලික ප්‍රයෝජනයට ගන්නේ නැහැ කියලා. අපි කිව්වා, රජයේ දේපළ නාස්ති කරන්නේ නැහැ කියලා. අපේ ජනාධිපතිතුමා නිතර කියපු දෙයක් තමයි අප මේ රජයේ මුදල් සාංඝික දේපළ සේ ආරක්ෂා කරන බව; ජනතා බදු මුදල් අපරිස්සමින් පාවිච්චි කරන බව. අපි විපක්ෂයේ ඉන්නකොටත් දිගින් දිගටම විවේචන කළා, සමහර නාස්තිකාර වියදම් පිළිබඳව.

වංචා, දූෂණවලට එරෙහිව කොහොමත් අපි පෙනී සිටියා. තව සමහර නාස්තිකාර වියදම් අපි එළිපිටම ප්‍රතික්ෂේප කරනු ලැබුවා. සමහර වියදම් තිබෙනවා, ඒවා නීත්‍යානුකූල වෙන්න පුළුවන්. නමුත් ඒවා සදාචාර විරෝධියි. බංකොලොත් වෙච්ච මේ රටේ මිනිස්සු ගෑස් පෝලිම්වල සිටියදී, අම්මලා දරුවන්ට දෙන්න කෑම ටිකක් ගන්න විධියක් නැතිව සිටියදී, ඉස්පිරිතාලවල බෙහෙත් හේත් නැතිව ජනතාව දුක් විඳිද්දී, රටේ ආහාර උද්ධමනය සියයට 70ක් දක්වා වැඩි වෙලා රට විනාශ වෙලා තිබුණු අවස්ථාවේදීත් අපි දැක්කේ මොකක්ද? බලයේ හිටපු උදවිය තමන්ගේ වරප්‍රසාද කිසිවක් අඩු කළේ නැහැ; පෙට්‍රල් ලීටරයක්වත් අඩු කළේ නැහැ; කැප කිරීමක් කළේ නැහැ. ඔවුන් දිගින් දිගටම ජනතාවට කිව්වා, "ඔබලා පටි තද කරගන්න" කියලා. නමුත් ඔවුන් ජනතාවට දීපු සහනයක් නැහැ. හැබැයි, අපි බලයට එනකොට කිව්වා, "පාලකයන් වශයෙන් ජනතාවට නැති ප්‍රතිලාභ කිසිවක් අපි ලබා ගන්නේ නැහැ. අපිත් ඔබලාගෙන් කොටසක්" කියලා. අන්න එහෙම කථා කරපු නිසා තමයි අපට මේ අනෙක් මාතෘකාවලට එන්න පුළුවන් වෙන්නේ.

අද ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව විවාද කරනවා. සමගි ජන බලවේගය, එක්සත් ජාතික පක්ෂය බලය නැතිව ජීවත් වෙන්න පුරුදු වෙච්ච කට්ටියක් නොවෙයි කියලා අපි දන්නවා. මොකද, ඒගොල්ලන්ට කොහෙන් හරි ආණ්ඩුවේ සල්ලි ටිකක් ඕනෑ, ජීවත් වෙන්න. ආණ්ඩුවේ සල්ලි නාස්ති කරන එක තමයි ඒගොල්ලන්ගේ ප්‍රධාන විනෝදාංශය. තමන්ගේ දරු පවුල නඩත්තු කර ගන්න, තමන්ගේ හිතවතුන් නඩත්තු කරගන්න භාණ්ඩාගාරයේ මුදල් පාවිච්චි කරන එක තමයි මේගොල්ලන්ගේ විනෝදාංශය. එහෙම නැතිව ඔවුන්ට බැහැ.

අපි දන්නවා, 2019 අවුරුද්දේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ජයග්‍රහණයෙන් පස්සේ එක්සත් ජාතික පක්ෂය සම්පූර්ණයෙන් විනාශ වුණු බව. ඊට පස්සේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා අඩිච්චක් අල්ලපු නිසා රනිල් වික්‍රමසිංහට පුළුවන් වුණා, පිටුපස දොරෙන් පිනට ජනාධිපති වෙන්න. පිනට ජනාධිපති වෙච්ච රනිල් වික්‍රමසිංහ ගැන හැමෝම කිව්වේ මොකක්ද? "අම්මේ! He dresses up well, he speaks good English, he is a democrat and a liberal". මම නම් කියනවා, ඔහු තනිකර හොරෙක් සහ හිහන්නෙක් කියලා. මම පැහැදිලි කරන්නම්, මම එහෙම කියන්නේ ඇයි කියලා. මම නිකම් එහෙම කියන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ පින් ජනාධිපති; පත් කළ ජනාධිපති. ඔහුට හිටියා, ජනාධිපති උපදේශකවරු 39දෙනෙක්. ජනාධිපතිවරයෙකුට උපදේශකයෙක් ඉන්න එකේ ප්‍රශ්නයක් නැහැ. මොකද, ජනාධිපතිතුමා හැම දෙයම දන්නේ නැති හින්දා. නමුත් 39දෙනෙක් තියා ගන්න වෙන්නේ ඔහු මෙලෝ දෙයක් දන්නේ නැති නිසා වෙන්න ඕනෑ. මොකද, තමන් නොදන්නා විෂයයක් ගැන අහගන්න කවුරු හරි ඉන්න එක හරි. නමුත් 39දෙනෙක් තියා ගන්නවා කියන්නේ ඔහු මුකුත් දන්නේ නැහැ කියන එකයි. ඒ කියන්නේ ආසියාවේ ලොකු මොළයක් තිබෙන කෙනෙක් එහෙම වෙන්න බැහැ. එහෙම තියාගන්න තනිකර මැටි කඳක් වෙන්න ඕනෑ. එහෙම උපදේශකවරු ගත්තත් කමක් නැහැ. හැබැයි, ඔවුන් වෙනුවෙන් දරපු වියදම් ටික අපි පොඩ්ඩක් බලමු. මම ඔක්කොම කියන්නේ නැහැ. ජනාධිපති උපදේශකවරු 39යි. වෙනත්, වෙනත් නම්වලින් එන්නේ. මාධ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වැනි එක එක අධ්‍යක්ෂ තනතුරු දමලා තිබෙන්නේ. මේ තනතුරු ඔක්කොම රනිල්ගේ කාලයට පමණක් බලපවත්වන තාවකාලික තනතුරු. ඔක්කොම 67යි, ජනාධිපති උපදේශකවරු ඇතුළුව. ඒගොල්ලන් සඳහා කරලා තිබෙන වියදම ගැන කියන්න කලින් මම ඒගොල්ලන්ගේ වාහන ගැන කියන්නම්. අපි මේ වාහන ජනාධිපති කාර්යාලයට ගත්තා. මාර්තු මාසයේ මේ වාහන විකුණලා ඒ මුදල් ටිකත් භාණ්ඩාගාරයට දෙන්න ඕනෑ.

සුනන්ද මද්දුමබණ්ඩාර මහතාට Nissan Sylphy car එකක් ලබා දීලා තිබෙනවා. ඒක නම් කමක් නැහැ කියමුකෝ. සමන් රත්නප්‍රිය සිල්වා මහතාට KI- 3156, Mitsubishi Montero jeep එකක් ලබා දීලා තිබෙනවා. මම හිතන විධියට අද මොකක් හරි strike එකකුත් කරනවා නේද? මේවා නැති වුණාම දුක හිතෙනවා නේ. ඒ නිසා strike කරන්න ඕනෑ. Strike කරන්න එපා යැ. මේවා නැතිව ජීවත් වෙන්න බැහැ. වැටුප මදි. කොඩිතුවක්කු මහතාට Land Rover Defender jeep එකක් ලබා දීලා තිබෙනවා. දයාරත්න මහතාට Mitsubishi Montero jeep එකක් ලබා දීලා තිබෙනවා. රංජිත් කීර්ති තෙන්නකෝන් මහතාට - අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රජා කටයුතු) - Toyota Land Cruiser එකක් ලබා දීලා තිබෙනවා. වැඩේ කියන්නේ, මෙච්චර විෂයයන් දමලා තිබෙනවා නේ. කේ.පී. දයාරත්න මහතාට Mitsubishi Montero jeep එකක් ලබා දීලා තිබෙනවා. මේවා අධික වියදම් සහිත වාහන. ඊළඟට තිබෙනවා, ගරු පී. හැරිසන්, ප්‍රධාන සම්බන්ධීකරණ, ඉඩම් හිමිකම් වැඩසටහන. මේ titles අරගෙන බැලුවොත් සාමාන්‍ය අමාත්‍යාංශයක ලේකම්වරයෙකුට කරන්න පුළුවන් වැඩවලට තමයි මේ උපදේශකයින් පත් කරගෙන නිකම් වැටුප් ගෙවලා තිබෙන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
දීපු උපදෙස් මොනවාද දන්නේ නැහැ.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
දීපු උපදෙස් සොයන්න මම ජනාධිපති කාර්යාලයට ගිහින් මේගොල්ලන් කරපු වැඩවලට අදාළ ලිපිගොනුවක්වත් තිබෙනවාද කියලා බැලුවා. සමහරු වැඩ කළා කියලා තිබෙනවා. නමුත්, කරපු වැඩ මෙලෝ දෙයක් නැහැ. හොඳම එක මේකයි. බර්නඩ්න් රෝස් සේනානායක මහත්මියට වේයෝ කාපු Porsche එකක් එතකොට තිබුණා. එතුමියත් ජනාධිපති උපදේශක.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද ඒ?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
රෝසි සේනානායක. වෙන කවුද? සම්පූර්ණ නම බර්නඩ්න් රෝස් සේනානායක. එතුමිය ජනාධිපති උපදේශක (පළාත් පාලන). Porsche, වේයෝ කෑවා කියපු වාහනය. සමන් කුමාර අතාවුදහෙට්ටි මහතාට Mazda එකක් ලබා දීලා තිබුණා. ඒ වාගේම මහාචාර්ය චන්ද්‍රජිත් ආශුබෝධ මාරසිංහ මහතාට Toyota Land Cruiser එකක් ලබා දීලා තිබුණා. ඔහු ජනාධිපති උපදේශක (පාර්ලිමේන්තු කටයුතු) වශයෙන් කටයුතු කරලා තිබෙනවා. මම හිතන විධියට ආශු මාරසිංහ මහත්තයා ඉස්කෝලේ යන කාලයේත් රනිල් වික්‍රමසිංහ මහත්තයා හිටියේ පාර්ලිමේන්තුවේ. ඉතින් පාර්ලිමේන්තුව ගැන රනිල්ට උගන්වන්න ආශු මාරසිංහට ගෙවනවා කියන්නේ තනිකර මුදල් නාස්තියක් වෙන්න එපා යැ. මට හිතෙන විධිය මේ.

තවත් එවැනි වියදම් තිබෙනවා. ගරු වඩිවේල් සුරේෂ් මහතාට කරලා තිබෙන ගෙවීම ගනිමු. මට මේකේ මාතෘකාව තේරුණේත් නැහැ. මොකක්ද? ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක, කඳුරට දමිළ ජනතාව ශ්‍රී ලාංකීය සමාජය තුළට ඒකීයකරණය කිරීම. *[බාධා කිරීමක්]* ඒකීයකරණය කිරීම. ඔහුට ලබා දී තිබෙනවා Land

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

Rover Defender එකක්, ඒකීයකරණය කිරීම වෙනුවෙන්. මේ ගැන ගොනුවක්වත් හොයා ගන්න බැහැ, ඒකීයකරණය කියලා මලයගම් ජනතාවට කරපු දේ ගැන.

ඊළඟට, අකිල විරාජ් කාරියවසම් මහතා - ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක, විමධ්‍යගත පරිපාලන - ඔහුට ලබා දී තිබෙනවා, Toyota Land Cruiser එකක්. ඊළඟට, සාගල රත්නායක - කාර්ය මණ්ඩල ප්‍රධානී, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක - ජාතික ආරක්ෂාව. මම දන්නේ නැහැ, සාගල රත්නායක මහත්තයාට ජාතික ආරක්ෂාව ගැන තිබෙන අවබෝධය සහ දැනුම මොකක්ද කියලා. ප්‍රශ්නයක් නැහැ, ඉතින් තමන්ගේ හිතවතුන්ට ලබා දුන් දේවල් තමයි මම මේ පෙන්වන්න උත්සාහ කරන්නේ. ඔහුටත් ලබා දීලා තිබෙනවා, Toyota Land Cruiser එකක්. ඊට වඩා දේවල් දීලා ඇති. මෙතැන තිබෙන්නේ මේ වාහනය ගැන විතරයි.

කෙසේ හෝ වේවා, මම පෙන්නුම් කළේ මේ පුද්ගලයන් සඳහා සමස්ත වශයෙන්ම ජනාධිපති වැය ශීර්ෂයෙන් වෙන් කර තිබුණු දේවල්. වාහනවලට අමතරව මුදල්වලින්, allowances වලින් ගත්තොත්, මෙහි සඳහන් කර තිබෙනවා, "designation, basic, one-fourth allowance, transport allowance, fuel allowance, telephone allowance and other allowances" කියලා. ඒ යටතේ නම් ලැයිස්තුවක් තිබෙනවා. මම එයින් එකක් දෙකක් විතරක් කියන්නම්. බී.එම්.එස්. බටගොඩ මහතාට රුපියල් ලක්ෂ 26ක් ගෙවා තිබෙනවා. ඒක නම් ඒ තරම් අවුලක් නැහැ. නමුත් සාගල රත්නායක මහත්මයාට ආරක්ෂක උපදෙස් ලබා දීම වෙනුවෙන් ගෙවා තිබෙනවා, මිලියන 7.4ක්. ඒ වාගේම මද්දුම බණ්ඩාර මහතා, Adviser to the President, වෙනුවෙන් මාස කිහිපයකට ගිය වියදම කීයද? ලක්ෂ 43ක්. මම මේ පෙන්නුම් කරන්න උත්සාහ කරන්නේ මාස ගණනද, අවුරුදු ගණනද කියන එක නොවෙයි, මහත්මයා. දැන් අපි කල්පනා කරමු - *[බාධා කිරීමක්]* සමාවෙන්න, සමාවෙන්න. දැන් මම මේ එකක්-දෙකක් තමයි කිව්වේ. සමස්තයක් වශයෙන් ගත්තාම රුපියල් මිලියන 59ක වියදම් දරා තිබෙනවා.

අපි කිව්වා නේ, අපි වියදම් අඩු කරනවා කියලා. මේ area එක මම ගත්තේ, මට ගණන් ඒ තරම් ගණන් බැහැ. ගණන් බැරි හින්දා මම බැලුවා සසඳන්න ලෙහෙසි අංක දෙකක්. දැන් මේ එක පැත්තක තිබෙන මිලියන 59 සසඳන්න ලෙහෙසියි, වර්තමාන ජනාධිපතිවරයාගේ වියදම් එක්ක. අපි දැන් වර්තමාන ජනාධිපතිවරයාගේ වියදම බලමුකෝ. ඒක හරිම ලෙහෙසියි, නේද? Grade one ළමුන්ටත් ඒ ගණන කියන්න පුළුවන්. මෙන්න, උපදේශකවරු සංඛ්‍යාව තුන්දෙනායි; වියදම් එකතුව බින්දුවයි. ඕනෑ නම් මම මෙය සභාගත කරන්නම්. That is zero expenditure because all three of them are volunteering their services to the State, to the President. අන්න එහෙමයි රටේ මිනිස්සුන්ගේ සල්ලි ආරක්ෂා කරන්නේ. එක පැත්තක මිලියන 59යි; අනෙක් පැත්තේ බින්දුව.

මම මේ අවස්ථාවේ පැහැදිලිව කිව යුතු තවත් කාරණයක් තිබෙනවා. කලින් මන්ත්‍රීවරයෙක් කියන්නට යෙදුණා නේද, අපි වැටුප අරගෙන පක්ෂයට දෙනවා, අපෙන් බලෙන් ගන්නවා වාගේ කරුණු? අපේ වැටුප එන්නේ අපේ ගිණුමට. මගේ වැටුප එන්නේ මගේ ගිණුමට. අපි ස්වේච්ඡාවෙන් එය පොදු අරමුදලට යොදනවා. අපි කවුරුවත් අපේ වැටුප පෞද්ගලිකව පාවිච්චි කරන්නේ නැහැ. මොකද, අපි වාගේම අපේ ව්‍යාපාරය නඩත්තු කරන්න උදේ හවස බයිසිකල් පදින, වැස්සේ තෙමෙන, පෝස්ටර් ඔසවා ගෙන යන සහෝදර-සහෝදරියන් ඉන්නවා. අපි පොදුවේ එකිනෙකා බලා ගැනීමේ අරමුණකින් ඒ මුදල් එක තැනකට ගෙනෙනවා.

අපි මෙතැනට ආවේ සමාජ සේවයක් කරන්න. මම හර්ෂණ නානායක්කාර, මම නීතිඥයෙක්, අවුරුදු 25ක් වෘත්තියේ සිටියා. ඒ හම්බ කරපු ඒවායෙන් මම අද ජීවත් වෙනවා. මම කාටවත් අතපාන්නේ නැහැ. හැබැයි, අපට දොස් කිව්වේ මොකක් කියලාද? "මේගොල්ලන් ෂර්ට් ඉල්ලා ගන්නවා, මේගොල්ලන් කෑම ඉල්ලා ගන්නවා, මේගොල්ලන් හිහන්නෝ" කිව්වා. අන්න එහෙම නේ, අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරුන්ට කට්ටිය කිව්වේ. අපි හිහන්නෝ නොවෙයි, ගරු සභාපතිතුමනි. අපි ඉතාම වැදගත්, දියුණු සංස්කෘතියක් තිබෙන කට්ටිය; සහෝදරයෙක්ව බලාගන්න කට්ටිය; සල්ලිවලට විකිණෙන්නේ නැති කට්ටිය. ඔයගොල්ලන් හිහන්නෝ කියන්න ඕනෑ, මංකොල්ලකාරයෝ කියන්න ඕනෑ කලින් හිටපු ජනාධිපතිවරුන් කරපු වැඩවලට.

අපි සන්තෝෂ වෙනවා, ඒ සාමූහිකත්වය හරහා අද අපි මෙතැන ඉන්නවා. හෙට මට කරදරයක් වුණොත්, මගේ පක්ෂයට ඒ ගැන කිව්වොත්, "මට කරදරයක්. මාව බලාගන්න" කියලා, මාව බලා ගන්නවා. මේ දියුණු සංස්කෘතිය තේරෙන්න නම්, ඒ තැනට දියුණු වෙන්න ඕනෑ. එහෙම නැතුව ඉතින් ඒක තේරුම් ගන්න බැහැ. කක්කුස්සි වළේ ජීවත් වෙන හාදයා මී පැණි ගැන දන්නේ නැහැ නේ. අපිට ඒකට කරන්න දේකුත් නැහැ. ඒක නිසා අපේ වැටුප ගැන අපි බලා ගන්නම්. හැබැයි, අපි කවදාවත් ජනතාවගේ මුදල් ශත පහක් හොරා කාලත් නැහැ, ආණ්ඩුවේ සල්ලිවලින් යාළුවන්ටයි, එක්සත් ජාතික පක්ෂයේ අයටයි ආතල් දීලාත් නැහැ.

ගරු සභාපතිතුමනි, මම ඉතාම ඉක්මනින් මේ ටිකත් කියන්නට ඕනෑ. රටක දූෂණය, වංචාව, නාස්තිය නවත්වා ගන්න පුළුවන් වෙන්නේ හැම විටම උඩින් දෙන ආදර්ශයෙන්. ඒ උඩින් දෙන ආදර්ශය අපේ ජනාධිපතිතුමා දුන්නා.

දැන් අපි කථා කරමු, අපේ අග්‍රාමාත්‍යතුමියගේ වැය ශීර්ෂය ගැන. ඒකෙනුත් ඔබට අවබෝධයක් ඒවි. අග්‍රාමාත්‍ය කාර්යාලයේ අය වැය ඇස්තමේන්තුව අනුව ගරු අග්‍රාමාත්‍යතුමියගේ කටයුතු සඳහාත් අග්‍රාමාත්‍ය කාර්යාලයේ වැඩසටහන් හා අනෙකුත් පරිපාලන කටයුතු සඳහාත් වශයෙන් වැඩසටහන් 2ක් තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Harshana Nanayakkara, you have only two more minutes.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Sir, I will finish up very fast. Thank you.

2025 අය වැය ඇස්තමේන්තුව තිබෙනවා. මට මේ ඔක්කොම කියන්න බැරි නිසා අවශ්‍ය නම් මා මෙය සභාගත කරන්නම්. 2024 වර්ෂයට අදාළව අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඇස්තමේන්තුව තිබුණේ රුපියල් මිලියන 630ක්. මෙවර රුපියල් මිලියන 350යි. ඒ අනුව මේ වසරේ අගමැතිතුමිය විසින් සියයට 44ක ඉතිරියක් කරනවා. ඒ කියන්නේ, රුපියල් මිලියන 350ක ඉතිරියක් කර තිබෙනවා. 2025 වර්ෂයේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ සමස්ත අය වැය ඇස්තමේන්තුව 2024 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 10.6කින් අඩු කරලා තිබෙනවා.

ඒ වාගේම ඉන්ධන වියදම ගත්තොත්, 2024 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රභූ නිල රථ සඳහා සාමාන්‍යයෙන් මාසයක ඉන්ධන වියදම රුපියල් මිලියන 3.24ක් වූ අතර -ලක්ෂ 32ක්- නව අග්‍රාමාත්‍යතුමිය පත්වීමත් සමඟ ප්‍රභූ නිල

රථ සංඛ්‍යාව අඩු කිරීම හේතුවෙන් 2024 ඔක්තෝබර් මස 28 සිට 2025 ජනවාරි මස දක්වා සාමාන්‍යයෙන් මාසයක ඉන්ධන වියදම රුපියල් මිලියන 0.33යි. ඒ කියන්නේ 330,000යි. කලින් මිලියන 3යි.

වෙඩි නොවදින රථ රක්ෂණ වියදමේ ඉතිරිය ගත්තොත්, අග්‍රාමාත්‍ය ආරක්ෂක රථ පෙළ සඳහා අනුයුක්ත කර තිබූ වෙඩි නොවදින රථ රක්ෂණය කිරීම සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 37.61ක් පමණ වැය වූ අතර, නව අග්‍රාමාත්‍යතුමිය පත්වීමත් සමඟ අදාළ වෙඩි නොවදින රථ ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දීමට කටයුතු කළ හෙයින් වාර්ෂිකව රුපියල් මිලියන 37.61ක ඉතිරියකුත්, වෙඩි නොවදින රථ වාහන නඩත්තුව සඳහා 2024 වර්ෂයේ වැය වූ රුපියල් මිලියන 16.15කුත් මේ වන විට සම්පූර්ණයෙන්ම ඉතිරි කරගන්න අපට හැකියාව ලැබී තිබෙනවා.

පෞද්ගලික කාර්ය මණ්ඩලය පැත්තෙනුත් අපි ඉතිරි කරලා තිබෙනවා. අගමැතිතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ අනුමත cadre එක 65යි. නමුත්, එතුමිය සත්‍ය වශයෙන්ම භාවිත කරන්නේ, 7දෙනායි. එතුමියගේ පෞද්ගලික මාධ්‍ය අංශයේ අනුමත cadre එක 47යි. හැබැයි, එතුමිය පාවිච්චි කරන්නේ 10දෙනායි. අන්න එහෙම තමයි ගරු සභාපතිතුමනි, අපි ජනතාවගේ මුදල් ඉතිරි කරලා තිබෙන්නේ; අරපරිස්සමෙන් භාවිත කර තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මේ කාරණාවත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. අපි කරන ඉතිරි කිරීම් ගැන කිව්වොත්, අගමැති කාර්යාලයේ ඉන්ධන වියදම් ඉතිරිය රුපියල් මිලියන 34යි. වෙඩි නොවදින රථ රක්ෂණ වියදම් කපා හැරීම නිසා ඉතිරිය මිලියන 37යි. සංග්‍රහ කටයුතු වියදම් ඉතිරිය මිලියන 15යි. පෞද්ගලික කාර්ය මණ්ඩලයේ වියදම් ඉතිරිය; වැටුප්, දීමනා හා අතිකාල දීමනා ඉතිරිය මිලියන 22යි. අග්‍රාමාත්‍ය වෛද්‍ය ඒකකයේ වියදම කපා හැරීමේ ඉතිරිය මිලියන 4යි. වෙඩි නොවදින රථ වාහන භාවිත නොකිරීම නිසා ඉතිරිය මිලියන 16යි. මෙන්න මෙහෙමයි අපි මේ රටේ මිනිස්සුන්ගේ මුදල් ඉතිරි කර තිබෙන්නේ. ඔබතුමන්ලාට ඕනෑ දෙයක් අපට කියන්න. ඕනෑ බොරුවක් කියන්න. හැබැයි, එක දෙයක් කියන්න එපා. ඒක මිනිස්සු පිළිගන්නේ නැහැ. ඒ මොකක්ද? අපි මේ රටේ මිනිස්සුන්ගේ බදු මුදල් සතයක්වත් නාස්ති කරන්නේ නැහැ. සතයක්වත් වංචා කරන්නේ නැහැ. මේ රට ගොඩ දාලා මිසක් අපි ආපහු හැරෙන්නේත් නැහැ. හර්ෂණ නානායක්කාර කියන මම අද තනි පුද්ගලයෙක් නොවෙයි. මම ආඩම්බර වෙනවා, මේ වාගේ ආණ්ඩුවක් සමඟ ඉන්න පුළුවන් වීම ගැන. ගරු සභාපතිතුමනි, ලබා දුන්නු කාලයට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Rohitha Abeygunawardhana. You have 20 minutes.

[අ.භා. 1.30]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු සභාපතිතුමනි, 2025 අය වැය පිළිබඳව කාරක සභා අවස්ථාවේ විවාදය ආරම්භ කරන දවස අද. ගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අද කරුණු පැහැදිලි කළා. විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ඇතුළු තවත් වැය ශීර්ෂ ගණනාවක් පිළිබඳව අද අපි සාකච්ඡා කරනවා.

ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ගැන කථා කළොත්, එතුමා දක්ෂ ජනාධිපතිවරයෙක් කියන එක නිර්ලෝභීව කියන්න ඕනෑ. ඇයි ඒ? එතුමා ජනතා විමුක්ති පෙරමුණේ නායකයා හැටියට සියයට 3ක ජනතාවගේ කැමැත්ත තිබුණු ඒ පක්ෂය අද ආණ්ඩුවක් පිහිටවපු තැනට ගෙනැල්ලා තිබෙනවා. දක්ෂයාට දක්ෂයා කියන්න එපායැ. ඒ වගකීම එතුමා ඉටු කරලා තිබෙනවා. එතුමා ඒ වගකීම ඉටු කරලා එතුමාගේ මංගල අය වැය 2025 වර්ෂයට අදාළව ඉදිරිපත් කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි.

අප බලන්නේ, ඒ මංගල අය වැයෙන් ජනතාවට දුන් පොරොන්දු ටික ඉටු කරන්නේ කොහොමද කියන එකයි. යම් විධියකින්, ජනතාව බලාපොරොත්තු වෙච්ච විධියටම ඒ පොරොන්දු ටික ඉටු වුණොත්, ජනතාවගේ ප්‍රසාදය ජනාධිපතිතුමාටත්, ආණ්ඩුවටත් ලැබෙනවා. හැබැයි, යම් විධියකින් ඒ දීපු පොරොන්දු ඉටු කර ගන්න බැරි වුණොත්, ජනාධිපතිතුමාටත්, ආණ්ඩුවටත් තමන්ගේ අප්‍රසාදය, විරෝධය ජනතාව ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, 2025 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන මේ අය වැය සාරාංශයක් හැටියට ගත්තොත්, අප බලාපොරොත්තු වන ආදායම රුපියල් බිලියන 4,990යි; අපේ වියදම රුපියල් බිලියන 7,190යි. අපි රුපියල් බිලියන 4,990ක් හම්බ කරන්න අපේක්ෂා කරනවා. නමුත්, රුපියල් බිලියන 7,190ක් වියදම් කරන්න තිබෙනවා. අය වැය හිඟය රුපියල් බිලියන 2,200යි. ඒ අය වැය හිඟය රුපියල් බිලියන 2,200 පැත්තක තියමු. 2025 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31වැනි දා වන කොට බලාපොරොත්තු වෙච්ච මේ රුපියල් බිලියන 4,990 සොයා දෙයි ද? ඒ කියන රාජ්‍ය ආයතනවලින් මේ මුදල් ටික එකතු කරලා භාණ්ඩාගාරයට දෙයි ද? ඒක භාණ්ඩාගාරයට දුන්නොත් තමයි, අර කියපු වියදම් ටික කරන්න පුළුවන් වෙන්නේ, ගරු සභාපතිතුමනි. ඒ කියපු වියදම් ටික කළොත් තමයි, ජනතාවගේ ප්‍රසාදය ලබා ගන්න පුළුවන් වෙන්නේ. එහෙම කරන්න බැරි වුණොත්, මොකක්ද වෙන්නේ? එහෙම කරන්න බැරි වුණොත්, ජනතාවගේ අප්‍රසාදය හිමි වෙනවා. ඒ කියපු වියදම් ටික කරන්න උත්සාහ කරන්න. ඒක කළොත් තමයි, අර මා කියපු විධියට දක්ෂ ජනාධිපතිවරයෙකු බවට පත් වන්නේ.

මම මේක කියන්න හේතුවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ආණ්ඩුවට අභියෝගයක් තිබෙනවා. ගරු ජනාධිපතිතුමාටත්, මේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයටත්, ආණ්ඩුවටත් ලොකු අභියෝගයක් තිබෙනවා. ඒ අභියෝගය මොකක් ද? ඒ, දුන්නු පොරොන්දු ටික ඉටු කරන අභියෝගයයි. දැන් ඒ සඳහා මුදල් සොයා ගන්නේ මොන විධියට ද? අපි දන්නවා, රජයට මුදල් සොයා ගන්නා ආයතන ගණනාවක් තිබෙන බව. ඒ ආදායමෙන් සියයට 60ක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, ඒ වාගේම ශ්‍රී ලංකා රේගුව වාගේ ආයතනවලින් තමයි ලැබෙන්නේ. ඒ ආයතනවලින් තමයි, ඒ ආදායම සොයා ගන්න තිබෙන්නේ.

දැන් ඒ ආදායම් සොයා ගන්න බැරි වුණොත් මොකද වෙන්නේ? ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා මේ ගරු සභාවේ කථා කරමින්, "මෙන්න අපි වියදම් අඩු කරන විධිය" කියලා කාරණා ගණනාවක් ඉදිරිපත් කළා. හැබැයි මම බලාපොරොත්තුවෙන් හිටියා බාර් පර්මිට් සම්බන්ධයෙන් එතුමාගෙන් කරුණු එළියට එයි කියලා. පසු ගිය රජය කාලයේ බාර් පර්මිට් 300 ගණනක් දීලා තිබුණා. මම මේ පාර්ලිමේන්තුවේදී ඇහුවා, ඒ බාර් පර්මිට් අනුමත කළේ කවුද කියලා. ඒවා කවුරු හරි නිර්දේශ කරන්න එපායැ. ඒ අයගේ ලැයිස්තුවත් ඉදිරිපත් කරයි කියලා මම බලාපොරොත්තුවෙන් හිටියා. ඒවා අනුමත කරලා

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

තිබෙන්නේ මන්ත්‍රීවරයෙක් ද, ඇමතිවරයෙක් ද, එහෙම නැත්නම් වෙනත් කෙනෙක් ද, ලේකම්වරයෙක් ද, ව්‍යාපාරිකයෙක් ද, කවුද කියලා කියන්න ඕනෑ. නමුත්, ඒක කියැවුණේ නැහැ. එහෙම නම්, ආදායම වැඩි කර ගන්න බලාපොරොත්තු වන්නේ කොහොමද? සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ඒ බලාපොරොත්තු වන ආදායම එන්නේ නැත්නම් මොකද කරන්නේ? ආණ්ඩුව ජනතාවට කියන්නද, තවත් වැඩියෙන් බොන්න කියලා? සුරාබදු දෙපාර්තමේන්තුවට තිබෙන බාර් සංඛ්‍යාවෙන් විකිණෙන අරක්කුවලින් ඒ ආදායම, බදු ටික එන්නේ නැත්නම්, "කරුණාකරලා වැඩියෙන් බොන්න, වැඩියෙන් බොන්න" කියලා ජනතාවට කියන්න ආණ්ඩුවට සිද්ධ වෙනවා. ඒ ආදායම අඩු වෙනවා නම්, ආණ්ඩුව marketing කරන්න එපායැ. එතකොට බලෙන් හරි අල්ලලා මිනිසුන්ට වැඩියෙන් පොවන්න ඕනෑ. මොකද, මේ බලාපොරොත්තු වන ආදායම ගන්න මොනවා හරි කරන්න එපායැ. ඒ කියන ආදායම සොයා ගත්තේ නැති වුණොත් ආණ්ඩුවට අභියෝගයකට මුහුණ දෙන්න සිදු වෙනවා. ගරු සභාපතිතුමනි, මේ දෙන පොරොන්දු සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය මෙකයි. ගරු සභාපතිතුමනි, අය වැයෙන් දීපු පොරොන්දු ටික අපි පැත්තකින් තියමු. අය වැයෙන් දීපු පොරොන්දු ටික පැත්තක තියලා, මේ ආණ්ඩුව බලයට පත් කරන්න ඉස්සෙල්ලා අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාත්, මේ ආණ්ඩුවේ අයත් දීපු පොරොන්දු ටික ගනිමු. මේ අය වැය ලේඛනයට ඉස්සෙල්ලා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කළා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් දීපු පොරොන්දු තිබෙනවා. මම ඒ ඔක්කෝම ගන්නේ නැහැ. ඒවායෙන් සාමාන්‍ය මිනිසුන්ට දැනෙන ඒවා ටිකක් ගනිමු. ගරු සභාපතිතුමනි, මේ රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් නේ ඉන්ධන ප්‍රශ්නය. ඉන්ධන මිල ඉහළ ගිහින් තිබෙනවා. එදා ඒ සම්බන්ධයෙන් මොකක්ද කිව්වේ, ගරු සභාපතිතුමනි. ඉන්ධනවලින් රජයට ගන්නා බදු අයින් කරනවා කිව්වා. ඩීසල් ලීටරයකින් රුපියල් 165ක් අඩු කරනවා කිව්වා. ඒ වාගේම පෙට්‍රල් ලීටරයකින් රුපියල් 165ක් අඩු කරනවා කිව්වා. ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමනි, මෙන්න එක පොරොන්දුවක්. කෝ, දැන් එය ඉටු කළා ද? මම මේ කියන්නේ ඔබතුමන්ලා දීපු පොරොන්දු ගැනයි. ඒක අය වැයෙන් දීපු පොරොන්දුවක් නොවෙයි. ඒක ඉටු කරලා නැහැ.

ඊට පස්සේ මොකක්ද කිව්වේ? විදුලි බිලෙන් තුනෙන් එකක් අඩු කරනවා කිව්වා. විදුලි බිලෙන් තුනෙන් එකක් අඩු කරන්න නොවෙයි, දැන් කොකා පෙන්නන්නයි හදන්නේ. දැන් කියනවා, වර්ෂාව නැහැ. විදුලි බිල වැඩි කරන්න සිද්ධ වෙනවා, කියලා. ඒ කියන්නේ, වේලාසනින් වැට පනිනවා. අපි දැන් බලාගෙන ඉන්නවා විදුලි බිලෙන් තුනෙන් එකක් අඩු කරන කල්. ඒකත් අය වැයේ පොරොන්දුවක් නොවෙයි. ඒකත් අර වේලාසනින් ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණු එකක්. ඊට පස්සේ මොකක්ද කිව්වේ? ඊට පස්සේ කිව්වා "අස්වැසුම" ප්‍රතිලාභ ලබන මිනිසුන්ට, ඒ ජනතාවට, ඒ පවුල්වලට රුපියල් 10,000ක් දෙනවා කියලා, ඒක මදි කිව්වොත් රුපියල් 15,000ක් දෙනවා කියලා. රුපියල් 10,000ක් දෙනවා කිව්වා, අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුලකට. ඒකත් මදි නම් රුපියල් 15,000ක් දෙනවා කිව්වා. හැබැයි, ඒවා මේ අය වැයේ නැත; ඉටු වෙලාත් නැත. මම මේ කියන්නේ අය වැයට පෙර දීපු පොරොන්දු ගැනයි. මිනිස්සු මේ පොරොන්දු අතේ තියාගෙන බලාගෙන ඉන්නවා, ඉටු කරන කල්.

ඊට අමතරව, තවත් දේවල් කිව්වා. සාමාන්‍යයෙන් ගම්වල තරුණ ජන්ද ඔක්කොම දුන්නේ මාලිමාවට. ඒ මොකද? අනේ, ඒ අය බලාපොරොත්තුවෙන් හිටියා, ව්‍යාපාරයක් කරන්න. ව්‍යාපාරයක් කරන්න හැකියාව තිබුණාට ඒ අයට අවශ්‍ය කරන මූලික මුදල නැහැ. ඇපකරයක් නැතුව රුපියල් මිලියන 10ක් ලබා දෙනවා කිව්වා. දැන් ගම්වල ඉන්න කෙල්ලෝ කොල්ලෝ බොහෝ අය බලා ගෙන ඉන්නවා, ඒ රුපියල් මිලියන 10 කොයි බැංකුවෙන් ද -ලංකා බැංකුවෙන් ද, මහජන බැංකුවෙන් ද, ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ද- ගන්නේ කියලා. ඉතින් ඒ දේවල් ජනතාවට දීපු පොරොන්දු. මම මේ කිව්වේ අන්න ඒ පොරොන්දු ටික ගැනයි. මහා මැතිවරණයට පෙර දීපු පොරොන්දුත්, අය වැය ලේඛනයේ පොරොන්දුත් ඉටු කළොත් ගරු ජනාධිපතිතුමාට ඉදිරි ගමන යන්න පුළුවන් වෙයි. නැත්නම් ජනතාව ඒ වෙනුවෙන් තම අප්‍රසාදය ප්‍රකාශ කරාවි.

ගරු සභාපතිතුමනි, පසුගිය මහා මැතිවරණයෙන් මන්ත්‍රී ධුර 159ක් සහිතව මේ ආණ්ඩුව තුනෙන් දෙකකට එහා ගිය බලයක් ලබා ගත්තා. මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන් ප්‍රකාශ කරන යම් යම් ප්‍රකාශ අපි රූපවාහිනියේ -TV එකේ- දකිනවා. නියෝජ්‍ය ඇමතිවරයෙක් කියනවා මම දැක්කා, "අවුරුදු විස්සකින් මෙහා ආපහු ආණ්ඩුව දෙන්නේ නැහැ" කියලා. ඔන්න, එක ප්‍රකාශයක්. තවත් කෙනෙක් කිව්වා, "අපි ආණ්ඩුව ගත්තේ ආපහු දෙන්න නම් නොවෙයි" කියලා. තවත් එක්කෙනෙක් කිව්වා, "මේ ආණ්ඩුව හොල්ලන්න දෙන්නේ නැහැ" කියලා. මේවා තමයි ආණ්ඩුවේ අය කරන ප්‍රකාශ. මම නම් කියන්නේ මේකයි. "ආණ්ඩුව අවුරුදු විස්සකින් දෙන්නේ නැහැ, ආණ්ඩුව හොල්ලන්න දෙන්නේ නැහැ, අපි ආණ්ඩුව ගත්තේ දෙන්න නොවෙයි" කියලා කියනවා නම්, මේක ඒ කියන මන්ත්‍රීවරයාගේ, ඇමතිවරයාගේ තාත්තාගෙන් හම්බ වුණු ඔප්පුවක් වෙන්න ඕනෑ. එතුමන්ලාට තාත්තා ලියා දීපු ඔප්පුවක් නම්, හොල්ලන්න බැහැ. එය එක්කෝ උගස් තියන්න ඕනෑ; එහෙම නැත්නම් විකුණන්න ඕනෑ. මේක එහෙම ඔප්පුවක් නෙවෙයි නේ. ඔය වාගේ කථා කියලා වැරදිච්ච තැන් ඉතිහාසයේ තිබෙනවා. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුව ගත්තු වෙලාවේ අපේ උන්නැහේලත් කිව්වා, "අවුරුදු විස්සකට දෙන්නෙ නැහැ" කියලා. ඔහොම තමයි අපේ අයත් කිව්වේ. "ආණ්ඩුව ජීවිතේට දෙන්නේ නැහැ" කිව්වා. ඒවා තමයි කිව්වේ. *[බාධා කිරීමක්]* මම තමුන්නාන්සේලාට වඩා ජොෂ්ඨයි නේ. ඒ නිසා හොඳයි නේ, මම මේ කියන දේවල් හොඳට අහගන්න තරමට. *[බාධා කිරීමක්]* කියලා නේන්නම් වැරදුණේ. කියලා වැරදිච්චි එක පිළිගන්න තරම් මම නිහතමානියි නේ. දැන් වැරදිච්ච එක කියනකොට අහගෙන ඉන්න බැහැ නේ දෙයි හාමුදුරුවනේ! ලජ්ජා නැතුව, "කියලා වැරදුණා" කියලත් කියනවා. නමුත් ඒක පිළිගන්නත් කැමැති නැහැ නේ. මාර වැඩක්නේ මේක. ඉතින් පිළිගන්න කෝ. මේවා ගලේ කොටලා නැහැ. සමහරු කියනවා, හොල්ලන්න බැරි ලු. සමහර ඒවා හෙල්ලෙනවා. සමහර ඒවා හෙල්ලෙනවා තමයි. *[බාධා කිරීමක්]* හෙල්ලෙන්නේ නැති ඒවාත් සමහර වෙලාවට හෙල්ලෙනවා. හැබැයි, සමහරු හිතාගෙන ඉන්නවා එහෙම නැහැ කියලා. සමහර වෙලාවට පොල් ගසේ තිබෙන වේලිච්ච පොල් ගෙඩි හෙල්ලි හෙල්ලි තියෙනවා. දැන් වැටෙයි, දැන් වැටෙයි කියනවා. හැබැයි, ඊට ඉස්සෙල්ලා කුරුම්බැට්ටි වැටෙනවා. අර වේලිච්ච පොල් ගෙඩිය එහෙමම හෙල්ලි හෙල්ලි තිබෙනවා. හෙල්ලිච්ච ඔක්කෝම වැටුණෙත් නැහැ තමයි. සමහර ඒවා අපට පෙනෙනවා හෙල්ලි හෙල්ලි තිබෙනවා, වැටෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, සමහරු හිතාගෙන ඉන්නවා නම් ඔබතුමන්ලාගේ මේ ආණ්ඩුව සදාකාලිකයි කියලා, එහෙම නම් වැරදි මතයක ඉන්නේ. මේක තාවකාලිකයි. ඔබතුමන්ලා දැන් මේකේ අයිතිකාරයෝ වෙලා ඉන්නේ. ඔතුමන්ලා මේකේ අයිතිකාරයෝ වෙන්න එපා, භාරකරුවෝ වෙන්න. ඔබතුමන්ලා භාරකරුවෝ. අයිතිකාරයෝ වෙච්ච හැම කෙනෙකුටම අවසානයේ උන් හිටි තැන් නැති වුණා. ඒකයි මම කිව්වේ. තව අවුරුදු 20කින් දෙන කථා, අපි දෙන්නේ නැහැ කියන කථා. එහෙම නේ කිව්වේ. අනික් එක තමයි ඔබතුමන්ලාට පුළුවන් ලෙස සතුටු කරන්න.

මම ඔබතුමන්ලාට මතක් කරලා දෙන්නම් ඉතිහාසය. 1970-1977 ගැන. නේද, ගරු රවි කරුණානායක මා මිත්‍ර මන්ත්‍රීතුමා? සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය දේශීය ආර්ථිකයක් ගොඩනගපු නායිකාවක්. දේශීය ආර්ථිකයක්. මේ රටේ කඩදාසි සංස්ථාව, පිහන් සංස්ථාව, වානේ සංස්ථාව හැදුවා. ඒ වාගේම වාහන හදන ඉතිහාසයක් තිබුණා, සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනියගේ කාලයේ. දේශීය ආර්ථිකයක් ගෙනාවා. මිනිස්සු මොනවාද කළේ? වගා කෙරුවා. පුළුවන් හැම තැනම වගා කෙරුවා. ගෙදර මල් පැළය ගලවලා මල් පෝච්චියේ මාළු මිරිස් පැළය හැදුවා, මිරිස් පැළය හැදුවා, වම්බටු පැළය හැදුවා. මේ විධියට ආර්ථිකය කරගෙන ගියා. නමුත් ගරු සභාපතිතුමනි, මොකක්ද සිද්ධ වුණේ ? ඔබතුමාත් දන්නවා ඒ ඉතිහාසය. මොකක්ද, වුණේ? බඩට වැදුණා. ආර්ථිකය හොඳයි; වැඩපිළිවෙළ හොඳයි. නමුත් බඩට වැදුණා. බඩට වැදුණා. බඩ තද කරගෙන හිටියා. බඩ තද කරගෙන ඉඳලා ඉඳලා මොකද කළේ? 1977 ආසන 8යි ගත්තේ. ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරමින් සිරිමාවෝ මැතිනිය ආසන 8ට පැරැද්දුවා. ඇයි? බඩට වැදුණ නිසා. බඩට ගහලා, බඩට වැද්දුවාම අර කියන සුරංගනා කථා මොකුත් ඇහුවේ නැහැ. මිනිස්සු බඩට වැදිච්ච ගමන් අනික් පැත්ත හැරිලා ආපසු ගහනවා. ඒකට return එක දෙනවා. එහෙම return එක දීලා තමයි එදා ඒ ආණ්ඩුව පෙරළුවේ.

ගරු සභාපතිතුමනි, මේ අය වැය - Budget - එක ඉවර වෙන්න ආසන්නව, මාර්තු 1වෙනි දායින් පසුව මේ රටේ මුස්ලිම් ජනතාවගේ රාමසාන් උත්සවය එනවා. ඒ අතරතුරම එනවා සිංහල අලුත් අවුරුද්ද. ගරු සභාපතිතුමනි, මේ දෙකම එනකොට මොනවාද මිනිස්සුන්ට ඕනෑ වැඩිපුරම? වැඩිපුර මොනවාද අත්‍යවශ්‍ය වෙන භාණ්ඩ? සහල්. මුස්ලිම් ජනතාවගෙන් වැඩි බහුතරයක් නැති බැරි මිනිස්සුන්ට අපේ හජ්ජියාර් මහත්තයලා හාල් අරගෙන බෙදනවා. ගම්වල එහෙම නේ. එහෙම නේද මන්ත්‍රීතුමා? අපේ ගම්වල මුස්ලිම් ජනතාවට ඒවා බෙදනවා. දැන් බෙදන්න පුළුවන්ද? හාල් කීයටද ගන්න තිබෙන්නේ? බෙදන්නත් හාල් ගන්න තිබෙන්නේ රුපියල් 300න් එහා පැත්තේ. එහෙම ගන්නත් හාල් නැහැ. සොයා ගන්න හාල් නැහැ, ගිහිල්ලා බලන්න. *[බාධා කිරීමක්]* පොළොවේ පය ගහලා - ගිහිල්ලා බලන්න. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, වැඩි ලෙස කෝප වන්න එපා, එය හෘදයාබාධයකට තුඩු දිය හැක. වැඩි ලෙස ඔබට කේන්ති යන්නේ නම්, ඔබ විකෘති වෙනවා. ඒ වාගේම තමයි ඔබ පැහැදිලි ලෙස හෘදයාබාධයකින් පෙළෙන්න පුළුවන්. ඒ නිසා බොහොම ඉවසිලිවන්තව අහගෙන ඉන්න. හාල් නැහැ කියන්නේ හාල් නැති හින්දා. නැතුව ජොලියට හාල් නැහැ කියනවා නොවෙයි. එතකොට ගරු සභාපතිතුමනි, හාල් වැඩිපුර ඕනෑ කරනවා. මොකද, සිංහල අවුරුද්දටත් මිනිස්සු කනවා. රාමසාන් කාලයටත් කෑම බීම ගන්නවා. මේවා පරිභෝජනය වැඩි වෙනවා. ඒවා අත්‍යවශ්‍ය භාණ්ඩ.

තව අත්‍යවශ්‍ය භාණ්ඩ මොනවාද? පොල්. පොල් තිබෙනවා නේ. චූටිටං ඒවා. සමහර පොල් තිබෙනවා ඒ පොල් ගාන්න අලුත් හිරමණ හදන්න ඕනෑ. හිරමණයට බෑය දමන්න බැහැ. එහෙම පොලුත් තිබෙනවා. කවුරු හරි වැරැද්දක් කරලා මේ වැඩේ වෙලා තිබෙනවා. ඒ නිසා මේවාට පිළියම් යොදන්න. ඒකයි මම කියන්නේ. සිංහල අලුත් අවුරුද්ද කාලයේ, රාමසාන් කාලයේ මිනිස්සු බඩ ගින්නේ හිටියොත් වෙන්නේ මොකක්ද? ඒ නිසා 1970-1977දී වෙච්ච දේ ගැන අවබෝධයක් ඇති කර ගන්න. තමුනාන්සේලාට මේවා කියන්නේ හැදෙන්න. හොඳ උගත්, බුද්ධිමත් ආචාර්යවරු, මහාචාර්යවරු ගොඩක් මේ සභාවේ ඉන්නවා. හැබැයි මේ පාර්ලිමේන්තු ක්‍රමය ගැන ඔබතුමන්ලාගේ පොඩි ආධුනික බවක් තිබෙනවා. ඉතින් අපි කරන්නේ මොකක්ද, ආධුනික ඔබට ජ්‍යෙෂ්ඨයෝ හැටියට අපි මේ ගැන කියලා දෙනවා. සාමාන්‍යයෙන් එහෙම කියලා දෙන එක අහගන්න. පොඩි ළමයින්ගෙනුත් අහගන්න දේවල් තිබෙනවා නේ. ඒ නිසා බඩු මිලත් එක්ක මිනිසුන්ගේ බඩට වැදුණොත්, ඒ ගැන අවබෝධයක් ඇති කර ගන්න කියලා මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, අද මේ පාර්ලිමේන්තුවේ වැය ශීර්ෂයන් විවාදයට ගන්නවා. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. ඔබතුමන්ලාගෙන් 159ක් සහ අපෙන් 66ක්. ඒ ඔක්කෝම පාර්ලිමේන්තුව නියෝජනය කරන අය. එතකොට ඒ 225දෙනා තෝරා ගන්නේ කොහොමද? මේ රටේ පාර්ලිමේන්තු ඡන්දයක් තිබෙනවා. මිලියන 22ක ජනතාව ඡන්දය පාවිච්චි කරලා තමයි මේ 225දෙනා තෝරා ගන්නේ. ජාතික ලැයිස්තුව පැත්තකින් තියමු. ගම්වලින් තේරිලා එන තමුන්නාන්සේලා අපි වාගේ මන්ත්‍රීවරු තෝරා ගන්න වෙනවා. එතකොට මේ 225දෙනාගේ වරප්‍රසාද ගැන කියලා බුදු අම්මේ පසුගිය කාලයේ කථා කරපු හැටි. ඉවරම කෙරුවා නේ. පාර්ලිමේන්තුවේ කන කෑමට හෙණ හත ඉල්ලුවා නේ, මිනිස්සු. හෙණ හත ඉල්ලුවා. මොකද හේතුව? මේ මුළු පාර්ලිමේන්තුවේම කෑමට යන වියදම 225න් බෙදුවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න නිලධාරීන්ගේ, සේවකයන්ගේ, පොලිසියේ ඔක්කෝටම කෑමට යන ගණන 225න් බෙදලා කිව්වාට පස්සේ හෙණ ඉල්ලන්නේ නැද්ද මිනිස්සු? දැන් මොකද වෙලා තිබෙන්නේ? දැනුත් බෙදන්න ඒක ඒ විධියටම.

වරප්‍රසාද භාවිත කරලා ජනතාවට වැරදි මතයක් දෙන එක නොවෙයි කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් අපි ආරක්ෂා කරන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. ඒක ඔබතුමාගේත් වගකීමක්. අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න හුඟක් මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව නැති කරලා තිබෙනවා. ආරක්ෂාව ඕනෑ. ඇයි? මොකද, විශේෂයෙන් දේශපාලනය කරනකොට තරහකාරයෝ ඇති වෙනවා. වැඩිපුර තරහකාරයෝ ඉන්නේ තමුන් ඉන්න පක්ෂය ඇතුළේමයි, ගරු සභාපතිතුමනි. මේවා තිත්තයි. ඇයි? ඊළඟ කෙනා බලාගෙන ඉන්නවා. එක්කෙනෙක් මරා ගත්තාම ලැයිස්තුවේ ඊළඟට ඉන්න කෙනා නේ පත් වෙන්නේ. නැද්ද මම කියන්නේ? බොරු නොවෙයි නේ. දැන් ඉන්න කෙනා පාතාලයෙන් හරි කොහෙන් හරි මරා දැම්මාට පස්සේ ලැයිස්තුවේ ඊළඟට ඉන්න මනුස්සයා මළ ගෙදරත් ඇවිල්ලා අඬලා ගිහිල්ලා පාටියකුත් දමනවා. ඒ නිසා ආරක්ෂා කර ගන්න. යම් විධියකින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට, ඇමතිවරයෙකුට ප්‍රශ්නයක් වුණොත්, කරදරයක් වුණොත් ඒක නරකට බලපාන්න පුළුවන්.

මම දැක්කා, තමුන්නාන්සේලාගේ පක්ෂයේ ඇමතිවරු යනකොට මිනිස්සු ප්‍රශ්න අහනවා. මම දැක්කා, ධීවර ඇමතිතුමා යනකොට ඇහුවා, "කෝ, අර 165 අඩු කළාද" කියලා. පස්සෙන් එළව එළවා අහනවා. හුඟක් ඇමතිවරුන්ට මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rohitha Abeygunawardhana, your time is up.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
අපේ පොලිසිය භාර නියෝජ්‍ය ඇමතිවරයාට එදා එතුමාගේ රියදුරා හොයා ගන්න බැරි වුණා. එතුමා මොකක්ද වචනයක් කියලා බැන්නා. ඒක වෙනම කථාවක්. ඇයි එහෙම වෙන්නේ? ඒ ගැන බලන්න ඕනෑ. ඒවාට ආරක්ෂකයෙක් අවශ්‍යයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාත් මේ ගැන අවධානය යොමු කරන්න.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, මේ අය වැය සුබවාදී අය වැයක් බවට පත් කරන්න. ඒකයි බලාපොරොත්තුව. මොකද හේතුව, අපි විපක්ෂයක් හැටියට කාලකණ්ණි සතුටක් ලබන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි විපක්ෂයක් හැටියට ඔබ වැටෙනකල් ඉන්න බලාපොරොත්තුවක් නැහැ. විපක්ෂයක් හැටියට අපි ඔබ වෙනුවෙන් බලාපොරොත්තු වෙන්නේ -ඡන්දය දීපු මිනිස්සු විතරක් නොවෙයි, ඡන්දය නොදීපු මිනිස්සුත්- ඔබ සුබවාදී ගමනක් යයි කියලායි. ඔබ ඒ සුබවාදී ගමන ගියොත් ඔබට හොඳයි. හැබැයි සුබවාදී ගමන නොගියොත් අපට වාගේම ඔබතුමන්ලාට ලැබෙයි. අපට වැඩිය හොඳේ. අපට ආවේ යන්තම්. සුනාමිය එන්න ගත්තොත් අනෙක් පැත්තට එන්නේ කොහොමද දන්නවාද? හොයා ගන්න බැරි වෙන්න. අපිත් ජීවිත බේරා ගත්තේ බොහොම අමාරුවෙන්. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න. ලෝකයේ ප්‍රවණතාවක් තිබෙනවා, අරගළ කරනවා වැඩියි දැන්. ඒ නිසා බඩට වැදුණොත්, දීපු පොරොන්දු ඉටු නොකළොත්, ජනතාව අරගළ කරන තත්ත්වයට පත්වෙයි. ඒ නිසා හොඳ වැඩ පිළිවෙළක් දියත් කරන්න කියලා ජනාධිපතිතුමාටත්, රජයටත් යෝජනා කරනවා.

මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Chanaka Madugoda. You have 11 minutes.

Order, please! Before he starts, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne will take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

[අ.භා. 1.51]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වත්මන් ආණ්ඩුවේ ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව විවාද කරන අද දවසේ, ජනාධිපති වැය ශීර්ෂයේ තිබෙන කාරණා පිළිබඳව මේ සභාව තුළ හරියට විවාද වුණාද කියන ප්‍රශ්නාර්ථය තිබෙනවා. අද අපි කථා කළේ, කවුද අඩුවෙන්ම වැය ශීර්ෂය භාවිත කළේ, කවුද වැඩියෙන්ම වැය ශීර්ෂය භාවිත කළේ, කවුද වැඩියෙන්ම වැය ශීර්ෂය අවභාවිත කළේ කියන කාරණා ගැන වැඩි අවධානය යොමු කරමිනුයි. අපි ඒ පිළිබඳව කථා කරන්න උත්සාහ ගත්තොත්, අපි මේ පාර්ලිමේන්තුවේ කරන විවාද තුළින් ජනතාව බලාපොරොත්තු වන දේ ඉෂ්ට වෙනවාද කියන කාරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කථාව මෙහෙම ආරම්භ කළොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. මම කථාව ආරම්භ කරන්න හිතපු විධියට නොවෙයි මට කථාව පටන් ගන්න සිද්ධ වෙන්නේ. අද දවසේ කරපු කථා අහගෙන ඉඳපු වෙලාවේ මට කියන්න හිතුණු කාරණයක් තිබෙනවා. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා මීට අවුරුදු කීපයකට පෙර තිස්සමහාරාම, දෙබරවැව, පොළ භූමියේ ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව කළ කථාව අපට මතකයි. එතුමන්ලාගේ ආණ්ඩුවක් යටතේ ජනාධිපති වැය ශීර්ෂය සියයට 90කින් කපා හරිනවා කියලා එතුමා එදා තිස්සමහාරාමයේදී ප්‍රකාශ කළා. මම කියන්න උත්සාහ ගන්නේ, ජනාධිපති වැය ශීර්ෂය අඩු කරන ප්‍රමාණය පිළිබඳව කාරණයට වඩා, ජනාධිපති වැය ශීර්ෂය ඇතුළේ මේ රටට සිදු වෙන ක්‍රියාවලිය තුළ ජනාධිපති වැය ශීර්ෂයට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරන්නේ නැතුව අපිට ජනාධිපති වැය ශීර්ෂය සාර්ථක කරගන්න හැකියාව ලැබෙන්නේ නැහැ කියන එකයි.

එදා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා 2022දී රුපියල් බිලියන 2.8ක් ජනාධිපති වැය ශීර්ෂය වෙනුවෙන් වෙන් කරගත්තා අපිට මතකයි. අඩුම වැය ශීර්ෂය ඉදිරිපත් කරපු ජනාධිපතිවරයා විධියට අද මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ගැනයි. හැබැයි එය නිවැරදි වෙන්න ඕනෑ. එදා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වෙලා තම වැය ශීර්ෂය සඳහා රුපියල් බිලියන 2.78ක් වෙන් කරගන්නකොට අද අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා රුපියල් බිලියන 2.99ක් තම වැය ශීර්ෂය වෙනුවෙන් වෙන් කරගෙන තිබෙනවා. හැබැයි මම කියන්න උත්සාහ ගන්නේ වැය ශීර්ෂයට වෙන් කරගත්ත මුදල අඩුද, වැඩිද කියන කාරණයට වඩා වැදගත් වෙන්නේ ඒ වැය ශීර්ෂයට වෙන් කර ගන්න මුදලින් මේ රටේ ජනතාවට අත් වෙන වාසිය, මේ රටේ ජනතාවට අත් වෙන ප්‍රයෝජනය පිළිබඳවයි. විශේෂයෙන්ම ජනාධිපතිවරයා යම් යම් අනවශ්‍ය වියදම් කප්පාදු කරලා ඒ ආදර්ශය ලබා දීලා තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. ඒක විය යුත්තක්. විපක්ෂයක් විධියට අපි එය අගය කරනවා. ඒ වාගේම, මේ ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය අඩු කිරීම තුළින් ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය ඇතුළේ තිබෙන විමධ්‍යගත ප්‍රතිපාදන; ජනාධිපති අරමුදලෙන් ලබා දෙන විවිධ ප්‍රතිලාභ ජනතාව අතරට බෙදී යෑමේ අඩුවක් තිබෙනවාද කියන ප්‍රශ්නාර්ථයත් අපිට තිබෙනවා.

ජනාධිපති වැය ශීර්ෂය තුළින් මේ රටේ ජනතාවට රෝගාබාධ වෙනුවෙන් ලැබෙන රෝගාධාර දීමනාව මේ රටේ සුවහසක් ජනතාවට ලබා දෙන විශාල වරප්‍රසාදයක් කියා මා විශ්වාස කරනවා. මේ රටේ වෛද්‍යාධාර අවශ්‍ය තවත් අහිංසක ජනතාවට ඒ ප්‍රතිපාදන ලබාදීමට ජනාධිපති වැය ශීර්ෂය යටතේ එය තවත් පුළුල් කරන්න පුළුවන් නම් වටිනවාය කියන කාරණය විශේෂයෙන්ම මම සිහිපත් කරනවා. ඒ වාගේම, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදල, අ.පොෂ. සාමාන්‍ය පෙළ ළමයින්ට ලබා දෙන ශිෂ්‍යාධාර, ආගමික ප්‍රතිසංස්කරණ කටයුතුවලට ලබා දෙන මුදල් ප්‍රතිපාදන මේ වැය ශීර්ෂය ඇතුළේදී තවත් ශක්තිමත් කරලා ඉදිරියට ගෙන යන්න පුළුවන් නම් වටිනවාය කියන කාරණයත් විශේෂයෙන්ම සිහිපත් කරනවා. මේ ජනාධිපති වැය ශීර්ෂය ඇතුළේදී අද දවසේ රටේ ජනතාවට ලැබෙන යම් යම් මුදල් කප්පාදුවකට ලක් කරලා තිබෙනවාද කියන කාරණය අපට දැනගන්න අවශ්‍යයි.

ජනාධිපති වැය ශීර්ෂය යටතේ මුදල් වෙන් කර ඇති ආකාරය පිළිබඳව අද දවසේ අපි කථා කරනවා. ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩල දීමනා වියදම්, ජනාධිපති ලේකම් කාර්යාලයේ වියදම්, ස්වාධීන කොමිෂන් සභා ඇතුළු විවිධ කොමිෂන් සභා, ජනාධිපති විමර්ශන ඒකකය ඇතුළු විවිධ ආයතන රාශියක් වෙනුවෙන් මේ ජනාධිපති වැය ශීර්ෂය යටතේ මුදල් වෙන් කර තිබෙනවා.

ඒ නිසා, එම ආයතනවල පරිපාලන ව්‍යුහය, එම ආයතන තුළ කරන කාර්යභාරයන් ඉතා විනිවිදව කරන්න පුළුවන් ආකාරයට එම අවශ්‍යතා වෙනුවෙන් මේ මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා නම් එය වටිනවා කියන කාරණයත් මතක් කරනවා. මේ මොහොතේ අපේ විවාදය පාවිච්චි කළ යුත්තේ, ජනාධිපති වැය ශීර්ෂය අඩු කරනවාද කියන කාරණයට වඩා, ජනාධිපති වැය ශීර්ෂයෙන් මේ රටේ ජනතාවට, මේ රටේ විවිධ ආයතනවලට ලැබෙන වරප්‍රසාද, ලැබෙන ප්‍රයෝජනය තවත් ශක්තිමත් කිරීමටයි කියන කාරණයත් විශේෂයෙන් සිහිපත් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනාධිපති වැය ශීර්ෂය ගැන කථා කරද්දි අපි ඉල්ලීමක් කරන්න ඕනෑ. අද ආණ්ඩුකාරතුමන්ලා තමයි විවිධ පළාත් නියෝජනය කරමින් ජනාධිපතිවරයාගේ නියෝජිතයන් විධියට කටයුතු කරන්නේ. එදා පළාත් සභාව සක්‍රියව තිබෙනකොට ක්‍රීඩා අරමුදලින් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් විවිධ කාර්යභාරයන් වෙනුවෙන් වෙන් කළ මුදලින් වෙන්න පුළුවන්, පළාත් සභා මන්ත්‍රීවරයෙක් ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් කළ බව අපි දන්නවා. විශේෂයෙන්ම එදා අපි ක්‍රීඩා අරමුදලින් ලක්ෂ 8ක්, 9ක්, 10ක් විතර ගම් ප්‍රදේශවල සිටින ආදරණීය ක්‍රීඩකයන්ට වෙන් කර දුන්නා. නිවාස ආධාර වෙන්න පුළුවන්, රියදුරු පුහුණුව වෙන්න පුළුවන්, කුඩා කර්මාන්ත කරන ව්‍යාපාරවලට වෙන්න පුළුවන්, ඒ විවිධ කාරණා වෙනුවෙන් එදා අපි පළාත් සභාව තුළින් මුදල් ප්‍රතිපාදන වෙන් කර දුන්නා. මම කියන්න උත්සාහ කළේ මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එදා අපි පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට පක්ෂ, විපක්ෂ වශයෙන් හැම දාම ඒ කාර්යභාරය කළා. හැබැයි, අද ඒ පළාත්වල ඒ දේවල් නැවතිලා තිබෙනවා. ජනාධිපතිවරයාගේ විශේෂ නියෝජිතයා විධියට කටයුතු කරන්නේ ආණ්ඩුකාරතුමා. ඒ නිසා, දරුවෙක් තමන්ගේ පාසල, රට නියෝජනය කරමින් ක්‍රීඩාව වෙනුවෙන් තවත් රටකට යනකොට, ආණ්ඩුකාරතුමන්ලා හරහා ඔවුන්ට යම් ප්‍රතිපාදනයක් වෙන් කර දෙන්න පුළුවන් නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා. එදා අපි පළාත් සභාව නියෝජනය කරනකොට දුප්පත් දරුවන්ට උදවු කළා. නමුත් ඒ දුප්පත් දරුවන්ට දැනට අවුරුදු 8කින්, 9කින් උදවු කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා සහාය දිය යුතු එම දරුවන්ට ප්‍රතිපාදන වෙන් කර දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ජනාධිපතිවරයා නියෝජනය කරන ආණ්ඩුකාරතුමන්ලා හරහා සකස් කරන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් විශේෂයෙන්ම ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව කථා කරන මේ වෙලාවේ මම සිහිපත් කරන්න කැමැතියි.

මීට පෙර කථා කළ අපේ ඇමතිතුමාගේ කථාවේදී වාහන පිළිබඳව කියැවුණා. විශාල මිල ගණන් සහිත වාහන ජනාධිපති කාර්යාලය හරහා ඉදිරියේදී වෙන්දේසි කරනවාය කියන කාරණය එතුමා සඳහන් කළා. අපටත් යෝජනාවක් කරන්න තිබෙනවා. ජනාධිපතිතුමාව නියෝජනය කරන දකුණු පළාතේ ආණ්ඩුකාරතුමා සුඛෝපභෝගී වාහනයක් අද පාවිච්චි කරනවා. ඒ වාගේම නිල නිවාස ගැන කථා කළා. ගාල්ලේ තිබෙන ඉතා වැදගත්ම තැනක තමයි ආණ්ඩුකාර නිල නිවාසය තිබෙන්නේ. අපි කථා කරනකොට ජනාධිපතිවරයාගෙන් පහළට යන ව්‍යුහය තුළ තිබෙන එවැනි කාරණා සම්බන්ධයෙනුත් මේ සභාවේ අවධානය යොමු කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. වාහන ගැන කථා කරනකොට, ඉතා සුඛෝපභෝගී ස්ථාන ගැන කථා කරනකොට, ගාල්ලේ තිබෙන වැදගත්ම තැනක තමයි ආණ්ඩුකාරතුමාගේ නිල නිවස තිබෙන්නේ. ඒක අපට සංචාරක ව්‍යාපාරයට යොමු කරන්න පුළුවන් නම් වටිනවා. අද එවැනි මාතෘකා සම්බන්ධයෙන් මේ සමාජය තුළ කථා වනවා. ඒ නිසා, එවැනි කාරණා වෙනුවෙන් අපට කටයුතු කරන්න පුළුවන් නම් වටිනවා කියලා මම විශ්වාස කරනවා.

ගාල්ල ප්‍රදේශයේ තිබෙන තවත් දැවෙන ප්‍රශ්නයක් මේ සභාව හමුවේ තබන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ගාල්ල වරායේ බෝ ගසක් රෝපණය කිරීම සම්බන්ධයෙන් ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු 3කදී ඉල්ලීමක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හැබැයි අපි සම්බන්ධීකරණ කමිටු 3කින් ඉල්ලීම් කළත්, අපට ගාල්ල වරාය තුළ බෝ ගසක් රෝපණය කිරීමේ ඉඩකඩ අහිමි කර තිබෙනවා. ඒ ඉඩකඩ අහිමි කර තිබෙන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්. ඒ නිසා මම මේ ගරු සභාවෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. අපට සම්බන්ධීකරණ කමිටුවකින් එවැනි සුළු ප්‍රශ්නයක් විසඳා ගත නොහැකි තත්ත්වයකට, ගාල්ල වරාය ඇතුළේ තිබෙන පොදු තැනක බෝ ගසක් රෝපණය කරන්න නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එම නිසා ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියාත් ඉල්ලා සිටිනවා.

ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව කථා කරනකොට, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වැය ශීර්ෂය අඩු කරන්න ගත්ත සමහර තීන්දු-තීරණ අද අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාත් ඉදිරියට ගෙන යමින් කටයුතු කරනවා. අපි ඒ පිළිබඳව සිහිපත් කරන්න ඕනෑ. එදා ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා තමන්ගේ කාර්ය මණ්ඩලය දෙදහසකින් පමණ අඩු කර ගත්තා. එතුමා එදා ජනාධිපති නිල නිවස භාවිත කළේ නැහැ. මිරිහානේ නිවස තමයි එදා භාවිත කළේ. ඒ විතරක් නොවෙයි. එතුමා එදා විදේශ සංචාරවලට යන වියදම අඩු කර ගත්තා, පරිවාර රථ අඩු කළා. එතුමා එදා එවැනි ආදර්ශයක් ලබා දුන්නා. එසේ ලබා දුන් ආදර්ශය අද අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ඉදිරියට ගෙන යමින් කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එම නිසා ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳව කථා කරන වෙලාවේ මම විශේෂයෙන්ම සිහිපත් කළ යුතු කාරණයක් තිබෙනවා. මේ වෙලාවේ අපි විවිධ ජනාධිපතිවරුන්ට චෝදනා කරමින්, විවිධ ජනාධිපතිවරුන් පාවිච්චි කරපු, විවිධ ජනාධිපතිවරුන්ගේ වැය ශීර්ෂවලින් වෙන් කර ගත් දේවල් ගැන පමණක් කථා කරමින් තවදුරටත් කාලය වැය කරනවාද, එහෙම නැත්නම් ජනාධිපති වැය ශීර්ෂයේ ප්‍රතිපාදන අපේ රටේ ආදරණීය ජනතාවට, අපේ රටේ ආදරණීය ජනතාවගේ සේවාවන් වෙනුවෙන් පාවිච්චි කරන්නේ කොහොමද කියන කාරණය ගැන කථා කරනවාද? ජනතාවගේ සේවාවන් වෙනුවෙන් මේ මුදල් පාවිච්චි කරන ආකාරය ගැනයි අපි මේ මොහොතේ කථා කළ යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වත්මන් ආණ්ඩුව, වත්මන් ආණ්ඩුවේ ජනාධිපතිවරයා රටේ නායකයා විධියට ඒ ආදර්ශය ලබා දෙමින් කටයුතු කරනවා කියලා අපි විශ්වාස කරනවා. ඒ ආදර්ශය ඒ විධියටම පහළ තැන්වලටත් අරගෙන ගිහින්, මේ ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනයේ ජනාධිපති වැය ශීර්ෂය තුළින් විවිධ අංග වෙනුවෙන්, සුවිශේෂී වැඩසටහන් වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රතිපාදන ඒ කටයුතු වෙනුවෙන්ම යොදවයි කියන විශ්වාසය සහ ඒ සඳහා ඉඩ කඩ තිබෙනවාය කියන විශ්වාසය අප තුළ තහවුරු කර ගනිමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 18ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.02]

ගරු රාමලිංගම් චන්ද්‍රශේකර් මහතා (වීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)

(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)

(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சனாதிபதிக்கான நிதியொதுக்கீடு சம்பந்தமாக இன்று இடம்பெற்றுக்கொண்டிருக்கும் இந்த விவாதத்தில் ஒருசில கருத்துகளைக் கூறுவதற்கு எனக்குச் சந்தர்ப்பத்தை அளித்த உங்களுக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று நாட்டில் புதிய அத்தியாயம் ஒன்று உருவாகியிருக்கின்றதென்பது எங்கள் எல்லோருக்குமே தெரியும்; அது முழு நாட்டு மக்களும் ஏற்றுக்கொள்ளுகின்ற ஓர் உண்மை. அந்த வகையில், இந்த நாட்டில் கடந்த 6 மாதங்களுக்கு முன்பிருந்த நிலைமைகளை மாற்றி, ஒரு புதிய அரசாங்கம் அல்லது மாற்றத்தை எதிர்பார்க்கின்ற மக்களுக்கு மாற்றத்தைக் கொண்டுவருவதற்கான அரசாங்கம் ஒன்று உருவானது. தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் முன்வைத்த கொள்கைப் பிரகடனத்தை எடுத்துக்கொண்டாலும் சரி, அன்றைய காலகட்டங்களில் எங்களுடைய பேச்சுக்களை எடுத்துக்கொண்டாலும் சரி, விசேடமாக இந்த நாட்டு மக்கள் மத்தியில் அதுபற்றிக் கூடுதலாகப் பேசப்பட்டு வந்தது. அதுபோல, முன்பிருந்த அரசியல்வாதிகள் தொடர்பாக, அரசாங்கங்கள் தொடர்பாக, அவர்களால் பின்பற்றப்படுகின்ற அரசியல் கலாசாரம் தொடர்பாகப் பாரியளவான விமர்சனங்கள் மற்றும் மிகவும் எரிச்சலூட்டுகின்ற கருத்துகளே மக்கள் மத்தியில் கூடுதலாகப் பேசப்பட்ட விடயமாக இருந்தது. அந்த வகையில்தான் இந்த நாட்டில் உண்மையிலே புதிய அரசியல் கலாசாரமொன்று உருவாக வேண்டுமென்ற விருப்பம் மக்கள் மத்தியில் ஏற்பட்டது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அதுநாள் வரை இந்த நாட்டில் இருந்த அரசியல் கலாசாரத்தை எடுத்துப்பார்க்கும்பொழுது, குறிப்பாக அரசியல்வாதிகளை எடுத்துக்கொண்டால் - சனாதிபதியை எடுத்துக்கொண்டாலும் சரி, Cabinet அமைச்சர்களை எடுத்துக்கொண்டலும் சரி - இவர்கள் எல்லோரும் இந்த நாட்டு மக்களைப் பொருட்படுத்தாது தாங்கள்தான் எல்லோருக்கும் மேலானவர்கள், தாங்கள்தான் இந்த நாட்டின் மன்னர்கள் என எண்ணி வாழ்ந்த காலம் ஒன்று இருந்தது. அப்பொழுது, சட்டம், நீதி மற்றும் ஏனைய நிறுவனங்களுக்குப் பிரதிநிதிகளை நியமிப்பது போன்ற எல்லாவகையான அதிகாரங்களும் அவர்கள் கையிலேயே இருந்தது. அந்த வகையில், இவர்களின் நடவடிக்கைகள் தொடர்பாக நாட்டு மக்கள் மத்தியில் வெறுப்புணர்வு ஏற்பட்டிருந்தது. அதன் காரணமாகவே, கடந்த வருடம் செப்ரெம்பர் மாதம் மக்கள் இந்த நாட்டின் ஜனாதிபதியாக மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களைத் தெரிவு செய்திருந்தார்கள். அதுநாள் வரைக்கும் இந்த நாட்டில் அரசாண்டவர்களை எடுத்துக்கொண்டாலும் சரி, ஜனாதிபதியாக இருந்தவர்களை எடுத்துக்கொண்டாலும் சரி, அவர்கள் ராஜாக்களாகவும் பரம்பரைச் சொத்துடையவர் களாகவுமே காணப்பட்டார்கள். அத்தோடு, தந்தைமார் ஜனாதிபதியாக, மாமன்மார் ஜனாதிபதியாக இருந்த நபர்களே, மீண்டும் ஜனாதிபதித் தேர்தலில் போட்டியிட்டிருந்தார்கள் என்பது எங்கள் எல்லோருக்கும் தெரியும்.

ஆனால், அநுர குமார திஸாநாயக்க அவர்கள் ஏழைக் குடும்பத்தில் பிறந்து வளர்ந்து, சாதாரண ஒரு குடிமகனாக, பல்வேறு இன்னல்களைச் சந்தித்து, கல்வி கற்பதில்கூட பல்வேறு நெருக்கடிகளைச் சந்தித்து, ஒரு பட்டதாரியாகி, அரசியலில் ஈடுபட்டவர். அவரின் விடாமுயற்சியால் இன்று அவர் ஜனாதிபதியாகத் தெரிவு செய்யப்பட்டிருக்கின்றார். இன்றைக்கு முழு நாட்டு மக்களும் ஆரத்தழுவிக்கொள்கின்ற நபராக அநுர குமார திஸாநாயக்க அவர்கள் மாறி யிருக்கின்றார். வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு, என்றில்லாமல் அனைத்து மக்கள் மத்தியிலும் அவர்மீது நல்ல அபிப்பிராயம் உருவாகியிருக்கின்றது. இங்கு மாத்திரமல்ல, உலகளாவிய ரீதியில் வாழ்கின்ற மக்கள் மத்தியிலும் அந்நாடுகளின் அரசியல் தலைவர்கள் மத்தியிலும் புதிய ஜனாதிபதி பற்றி அவ்வாறான ஒரு கருத்தே உருவாகி யிருக்கின்றது.

2022ஆம் ஆண்டு எமது நாட்டில் ஒரு தீர்மானகரமான நிலைமை ஏற்பட்டிருந்தது. 2022 ஏப்பிரல் மாதம் 12ஆம் திகதி எமது நாடு வங்குரோத்தடைந்த நாடு என அறிவிக்கப்பட்டது. 2024ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் ஆட்சி அதிகாரம் எங்களிடம் வந்தபோது, உண்மையிலே எங்களுக்குக் கிடைத்தது வங்குரோத்தடைந்த ஒரு நாடாகும். அந்த வங்குரோத்து நிலையிலிருந்து நாட்டைக் கட்டியெழுப்ப வேண்டிய தேவை எங்களுக்கு இருந்தது. அந்த வகையில், பொதுத் தேர்தலில் முழு நாட்டு மக்களும் எங்களை ஏகமனதாக ஆதரித்தார்கள். அதன் வெளிப்பாடாகவே அவர்கள் தங்களின் ஆணையை வழங்கி 159 பேரைத் தெரிவு செய்திருந்தார்கள். யார் எங்களை விமர்ச்சித்தாலும் சரி, ஏசினாலும் சரி, எங்கள்மீது எவ்வாறான குற்றச்சாட்டுகளை முன்வைத்தாலும் சரி, எங்களுடைய மனசாட்சிக்கு விரோதம் இல்லாது நடப்பவர்கள் நாங்கள் என்றவகையில் எங்களுக்கு ஒரு கடப்பாடு இருக்கின்றது. ஏனென்றால், எங்களுடைய உறுப்பினர்கள் இந்த அரசியலுக்குள் வந்தது, அரசியலைத் தேர்ந்தெடுத்தது, தங்களுடைய மடியை மாத்திரம் நினைத்து அல்ல. எங்களுக்கு முதலாவதும், இரண்டாவதும், மூன்றாவதும் எண்ணம் இந்த நாட்டு மக்கள்! மக்கள்! மக்கள்! என்பதுதான். அவர்களுடைய வாழ்வே எங்களுடைய வாழ்க்கையாகும்.

அந்த வகையில், மக்களுடைய வாழ்க்கையை முன்னேற்று கின்ற திசையிலேயே எங்களுடைய அரசாங்கம் இன்று சென்று கொண்டிருக்கின்றது. நாங்கள் நேர்மையாக நடந்துகொள்ளும் பட்சத்தில் இந்த நாட்டில் இருக்கின்ற மக்கள் எங்களை ஆரத் தழுவுவதற்குத் தயாராக இருக்கின்றார்கள் என்பதை எங்களுடைய மனசாட்சி எங்களுக்குச் சொல்லுகின்றது. இன்றைக்கு நாடு முழுவதும் இருக்கின்ற எல்லா மக்கள் மத்தியிலும், அரசாங்கத்தின்மீது நல்ல அபிப்பிராயங்களே உருவாகி வருகின்றது. கடந்த காலத்தின் அரசியல் என்ன என்பது எல்லோருக்கும் தெரியும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டின் கடந்த கால அரசியலைத் திரும்பிப் பார்த்தால், இந்த நாட்டைக் கொள்ளையடித்த, நாட்டைச் சூறையாடிய, நாட்டு மக்களை ஏமாற்றிய நபர்களுடைய அரசாங்கங்களே ஆட்சியில் இருந்தது. அதுமட்டுமல்ல, தமிழ் மொழி பேசுகின்ற மக்கள் என்ற வகையில் சதா காலமும் தமிழர்கள் - அது மலையகமானாலும் சரி, வடக்கு, கிழக்கை எடுத்துக் கொண்டாலும் சரி - எல்லா வகையிலும் அவர்கள் ஒடுக்கப் பட்ட, நசுக்கப்பட்ட, ஏமாற்றப்பட்ட, வஞ்சிக்கப்பட்ட மக்களாகவே இருந்திருக்கின்றார்கள்.

அதனால் அந்த மக்கள் மத்தியில் மாற்றத்திற்கான ஒரு தேவையிருந்தது. இந்த நிலைமையில் மாற்றத்தை ஏற்படுத்தி உண்மையிலே அந்த மக்களின் நம்பிக்கையை

வென்றெடுப்பது எப்படியென்ற சவால் கடந்த காலங்களில் எங்களுக்கும் இருந்தது. யாழ்ப்பாணத்தை எடுத்துப் பார்க்கின்றபோதும் சரி, வன்னி மாவட்டத்தை எடுத்துக் கொண்டாலும் சரி, நுவரெலியா மாவட்டத்தை எடுத்துக் கொண்டாலும் சரி, இந்தப் பிரதேசங்களில் வாழுகின்ற அனைத்து மக்களும் ஏகமனதாக முதலாவது கட்சியாக தேசிய மக்கள் சக்தியைத் தெரிவு செய்திருக்கிறார்கள். அதற்கான முக்கிய காரணம் வேறெதுவுமல்ல, இந்த நாட்டில் ஓர் அரசியல் மாற்றத்தை உருவாக்க வேண்டுமென்று நாங்கள் முன்வைத்த கொள்கைப் பிரகடனம்தான். இந்த நாட்டில் ஓர் அரசியல் மாற்றத்தை - system change ஒன்றை ஏற்படுத்த வேண்டுமென்பது எங்களுடைய குறிக்கோளாக இருந்தது. அந்த வகையில், நாட்டிலிருக்கின்ற மக்கள் மத்தியில் ஒரு நம்பகமான நிலைமை ஏற்பட்டது. அந்த நம்பகத்தன்மையின் அடிப்படையிலேயே இன்றைக்கு எங்களிடம் இந்த அதிகாரத்தை மக்கள் கொடுத்திருக்கிறார்கள்.

பல்வேறு சவால்களுக்கு மத்தியில், வங்குரோத்தடைந்த நிலையில் இருந்த நாட்டைப் பொறுப்பேற்றபோதும், எங்களுடைய ஜனாதிபதி அவர்களின் தலைமையிலான அரசாங்கத்தின் முகாமைத்துவத்தின்கீழ் இன்று நாடு ஓரளவுக்கு நிமிர்ந்து பெருமூச்சு விடுகின்ற நிலைமையை நோக்கி நகர்ந்துகொண்டிருக்கின்றது. பொருளாதார ரீதியிலும் ஓரளவு ஸ்திரமான நிலைமை உருவாகியிருக்கின்றது. மறுபுறத்தில், இன்றைக்கு டொலரின் பெறுமதியை எடுத்துக் கொண்டாலும் சரி, ரூபாயின் மதிப்பிறக்கத்தை எடுத்துக் கொண்டாலும் சரி, அதேபோன்று பங்குச் சந்தையை எடுத்துக்கொண்டாலும் சரி, அனைத்துமே ஒரு stable - நிலையான - ஸ்திரமான நிலையை நோக்கி நகர்ந்து கொண்டிருப்பதை நாங்கள் பார்க்க முடியும். அதுமாத்திரமல்ல, இதுநாள் வரைக்கும் தளம்பல் நிலையிலே காணப்பட்ட வங்கிகள் இன்றைக்கு ஒரு ஸ்திரமான நிலைக்கு வந்திருக்கின்றது. அதுமட்டுமல்லாமல், இந்த நாட்டிலே முதலீடு செய்ய வருவதற்கு முதலீட்டாளர்கள் அஞ்சினார்கள் அல்லது சந்தேகக் கண்கொண்டு பார்த்தார்கள். ஆனால், இன்றைக்கு முதலீட்டாளர்கள் வருவதற்கான ஒரு நாடு இருக்கின்றது என்று சிந்திக்கும் நிலைக்கு அவர்கள் மாறியிருக்கிறார்கள். அந்த வகையில், இன்றைக்கு எல்லா வகையிலும் ஒரு ஸ்திரமான நிலைமை தோற்றம் பெற்றிருக்கின்றது.

நாங்கள் விரும்பினாலும் விரும்பாவிட்டாலும்கூட, கடந்த 76 வருடங்களாக நடந்தவை என்ன? அந்தக் காலகட்டத்தின் சாபக்கேடுகள் என்ன? என்பதை மீண்டும் மீண்டும் பேசவேண்டிய தேவை இருக்கின்றது. ஏனென்றால், இந்த நெருக்கடி என்பது இன்றைக்கு ஒரு நாள் - இரண்டு நாள் - ஒரு வருடம் - இரண்டு வருடத்தில் தோன்றியவை அல்ல என்பது எங்கள் எல்லோருக்கும் தெரியும். இந்த நாட்டுக்கு என்றைக்குச் சுதந்திரம் கிடைத்ததோ, அந்தக் காலகட்டத்திலிருந்து நாட்டை ஆட்சி செய்தவர்களால் முன்னெடுக்கப்பட்ட அரசியல் ரீதியான முகாமைத்துவம், நிர்வாக முகாமைத்துவம், பொருளாதாரக் கொள்கைகள் போன்ற அனைத்து நடவடிக்கைகளுமே இன்றைக்கு மக்கள் இந்நிலைமைக்குத் தள்ளப்பட்டிருப்பதற்குக் காரணங்களாக இருக்கின்றன.

இந்த நிலைமை எங்களுக்கும் ஒரு சவாலானதாக இருந்தது. அந்தச் சவாலான நிலைமையைக் கடந்து வருகின்றபோது முன்வைக்கப்பட்டிருக்கின்ற எமது அரசாங்கத்தின் முதலாவது வரவு செலவுத்திட்டம் - கன்னி வரவு செலவுத்திட்டம் சம்பந்தமாகப் பேசுகின்றபோது, கடந்த காலத்தில் நடந்தவை சம்பந்தமாக ஓரளவு ஒப்பீடுகளையும் பார்க்க வேண்டிய தேவை இருக்கின்றது. கடந்த காலங்களில் இந்த நாட்டில் இருந்த அமைச்சர்களை எடுத்துக்கொண்டாலும் சரி, ஜனாதிபதிகளை எடுத்துக்கொண்டாலும் சரி, அவர்கள் வாழ்ந்த வீடுகளை எடுத்துக்கொண்டாலும் சரி, மாளிகைகளை எடுத்துக்கொண்டாலும் சரி, அவர்கள் மன்னர்கள்போல வாழ்ந்தார்கள் என்பதில் எந்த மாற்றுக் கருத்துக்கும் இடமில்லை. இன்றைக்கு அந்த நிலைமைகள் மாறியிருப்பதைப் பார்க்க முடிகின்றது.

இன்று காலையில் இந்த விவாதத்தில் உரையாற்றிய பலர் எங்கள்மீது பாரிய விமர்சனங்களை முன்வைத்தார்கள். நாங்கள் விமர்சனங்களை வெகுவாக ஏற்றுக்கொள்கின்ற ஒரு கட்சி. ஆனால், அவ்வாறு எங்கள்மீது விமர்சனங்களை முன்வைக்கின்றவர்கள் தங்களுடைய மனச்சாட்சியைத் தொட்டுக் கேட்டுப் பார்க்க வேண்டும், இந்த வரவு செலவுத்திட்டம் நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் நன்மை பயத்திருக்கின்றதா, இல்லையா? என்று. இதுநாள்வரைக்கும் கைவிடப்பட்ட மக்கள் அரவணைக்கப்பட்டு இருக்கின்றார்களா, இல்லையா? என்பதற்கு ஒரு சான்றாக இதை நாங்கள் பார்க்கலாம். விசேடமாக, வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்ட நிதி போதுமானதல்ல என்றும், நிதி ஒதுக்கப்படவில்லை என்றும் பல்வேறுபட்ட குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டன. கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, யாழ்ப்பாணம், கிளிநொச்சி, மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களை எடுத்துக் கொண்டாலும் சரி, திருகோணமலை, மட்டக்களப்பு மாவட்டங்களை எடுத்துக்கொண்டாலும் சரி, அவை கூடுதலாகத் தமிழர்கள் வாழ்கின்ற பிரதேசங்கள். இன்றைக்கு காலையிலும் இதற்கு முன்னரும் பேசிய ஒரு சில உறுப்பினர்கள் அது தொடர்பாக ஆராயாது, தூரநோக்கோடு பார்க்காது, வெறுமனே குற்றச்சாட்டுக்களை மாத்திரம் முன்வைப்பவர்களாக இருக்கின்றார்கள். அந்த வகையில், என்னிடம் இருக்கின்ற ஆவணத்தை நான் சபைக்குச் சமர்ப்பிக்க எதிர்பார்க்கின்றேன். இதில் பல்வேறு வேலைத்திட்டங்கள் முன்மொழியப்பட்டிருப்பதுடன், குறித்த சில வேலைத் திட்டங்களை முன்னெடுப்பதற்கான நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட்டுள்ளது.

மேலும், இதற்கு முன்னர் இருந்த சனாதிபதிகளுக்குரிய செலவு தொடர்பாக நாங்கள் பார்க்கின்றபோது, கடந்த ஆண்டிலே இருந்த சனாதிபதிக்கு கிட்டத்தட்ட 38,600 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளதை அவதானிக்கலாம். 2025ஆம் ஆண்டில் எங்களுடைய சனாதிபதிக்கு ஒதுக்கப் பட்டிருப்பது 3,000 மில்லியன் ரூபாய் மாத்திரமே! பெரிய மாற்றம் நிகழ்ந்திருக்கின்றது. முன்னர் இருந்த சனாதிபதியினுடைய ஆலோசகர்களாக 139 பேர் இருந்ததும் அதற்குக் காரணம் எனக் கூறப்படுகின்றது. அவர்களைப் பராமரிப்பதற்காகவே இந்தப் பணம் ஒதுக்கப்பட்டுள்ளது. மக்களுடைய வரிப்பணத்தில் வாழ்ந்து சொகுசு கண்டவர்களே முன்னைய ஆலோசகர்களாக இருந்தவர்கள் என்பது தெரியவருகின்றது.

இங்கு பொலிஸ் ஆணைக்குழு, இலஞ்ச ஊழல் ஆணைக்குழு, மனித உரிமைகள் ஆணைக்குழு எனப் பல சுயாதீன ஆணைக்குழுக்கள் இருக்கின்றன. இன்று காலையிலும்கூட இங்கு பேசிய சிலர் "இந்த அரசாங்கம் மனித உரிமைகள் ஆணைக்குழுவை இல்லாமல் செய்யப்

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

පෝකින්‌රතු, ආණෙක්‌කුලුක්‌කළුනුක්‌කු පල්‌වේරු නෙරුක්‌කඩිකළ් ඒර්‌පඩප් පෝකින්‌රතු" එන්‌රු පල්‌වේරු කුර්‌රච්චාට්‌ටුක්‌කළෙ මුන්‌වෛත්‌තාර්‌කළ්. කෞරව තලෛමෛතාඞ්‌කුම් උරුප්‌පිනර් අවර්‌කළේ, Bribery Commissionක්‌කු කඩන්‌ත 2024ආම් ආණ්‌ටු 950 මිල්‌ලියන් රූපාය් ඔදුක්‌කප්‌පට්‌ටිරුන්‌තදු. එංකළුඩෙය අරසාඞ්‌කම් 2025ආම් ආණ්‌ටිල් 1,374 මිල්‌ලියන් රූපායෛ ඔදුක්‌කි, අදනෛප් පලප්‌පඩුත්‌ති, අදන් සුයාදීනච් චෙයර්‌පාට්‌ටුක්‌කු ආදරවු අළිත්‌තිරුක්‌කින්‌රදේ තවිර, අදනෛ ඉල්‌ලාදු ඔළිප්‌පදර්‌කාන නඩවඩික්‌කෛයෛ එඩුක්‌කවිල්‌ලෛ.

ඉන්‌ත නාට්‌කළිල් මනිත උරිමෛකළ් ආණෛක්‌කුලු පර්‌රික් කූඩුදලාකප් පේසප්‌පඩුකින්‌රදු. අම්‌මෛයිල්‌කූඩ එමදු වෙළිනාට්‌ටු අලුවල්‌කළ්, වෙළිනාට්‌ටු වේලෛවාය්‌ප්‌පු මර්‌රුම් සුර්‌රුලාත්‌තුරෛ අමෛච්‌චර් විජිත හේරත් අවර්‌කළ් වෙළිනාඩුකළුක්‌කුච් චෙන්‌රපෝදු මනිත උරිමෛකළ් සම්‌පන්‌තමාකප් පේසියිරුන්‌තාර්. අදු සම්‌පන්‌තමාකවුම් ඉන්‌රෛක්‌කුප් පල්‌වේරු කරුත්‌තුකළ් කූරප්‌පඩුකින්‌රන. අදු මාත්‌තිරමල්‌ල, මනිත උරිමෛකළ් ආණෛක්‌කුලුවෛ නාඞ්‌කළ් චෙයලිළක්‌කච් චෙය්‌දු, අරසියල් තලෛයීඩු චෙය්‌යප් පෝවතාකවුම්, ආණෛයාළරෛ නියමිප්‌පදිල්‌කූඩ අරසියල් තලෛයීඩු ඉරුප්‌පතාකවුම් කූරප්‌පට්‌ටු වරුකින්‌රදු. අදිල් එන්‌තවිතමාන උණ්‌මෛයුම් කිටෛයාදු! ඒනෙන්‌රාල්, ඉතර්‌කු මුන්‌නර් ඉරුන්‌ත අරසාඞ්‌කම් අතර්‌කු ඔදුක්‌කිය නිති කිට්‌ටත්‌තට්‌ට 398 මිල්‌ලියන්. එමදු අරසාඞ්‌කම් ඉම්‌මුරෛ 449 මිල්‌ලියනෛ ඔදුක්‌කීඩු චෙය්‌තිරුප්‌පදන්‌මූලම් මනිත උරිමෛකළ් ආණෛක්‌කුලුවෛ මේලුම් පලප්‌පඩුත්‌තුකින්‌ර, අදන් සුයාදීනත්‌තෛප් පාදුකාක්‌කින්‌ර නඩවඩික්‌කෛ එඩුක්‌කප් පට්‌ටිරුක්‌කින්‌රදු.

අදුපෝන්‌රු, දේසිය පොලිස් ආණෛක්‌කුලුවින්‌මූලම් පොලිසාරින් ඉඩමාර්‌රඞ්‌කළ් නෂෛපෙරුකින්‌රන.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්‌පුමිකු තලෛමෛතාඞ්‌කුම් උරුප්‌පිනර් අවර්‌කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසන්.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(මාණ්‌පුමිකු රාමලිංගම් සන්‌දිරසේකර්)
(The Hon. Ramalingam Chandrasekar)
මට තව තත්‌පරයක් දෙන්න.

ඉදෙල්‌ලාම් අරසියල් තලෛයීට්‌ටින්‌කීළ් අල්‌ලදු දේසිය මක්‌කළ් සක්‌දි අරසාඞ්‌කත්‌තින් MPමාරුදෛය තේවෛයෛප් පූර්‌ත්‌දි චෙය්‌යුම් විදමාකවේ නෂෛපෙරුකිරදු එන්‌ර කුර්‌රච්චාට්‌ටුකළ්කූඩ මුන්‌වෛක්‌කප්‌පඩුකින්‌රන. අදිලුම් එන්‌තවිතමාන උණ්‌මෛයුම් කිටෛයාදු. ඒනෙන්‌රාල්, පොලිස් ආණෛක්‌කුලුවුක්‌කු කඩන්‌ත වරුඩම් සුමාර් 207 මිල්‌ලියන් රූපාය් ඔදුක්‌කප්‌පට්‌ටිරුකින්‌රදු. ඉව්‌වරුඩම් සුමාර් 245 මිල්‌ලියන් රූපාය් ඔදුක්‌කීඩු චෙය්‌යප්‌පට්‌ටිරුක්‌කින්‌රදු.

කෞරව තලෛමෛතාඞ්‌කුම් උරුප්‌පිනර් අවර්‌කළේ, නාඞ්‌කළ් ඉම්‌මුරෛ වරවු චෙලවුත්‌තිට්‌ටත්‌තින් මූලමාක මුඩියුමානවරෛ ඉන්‌ත ආණෛක්‌කුලුක්‌කළින් සුයාදීනත් තන්‌මෛයෛප් පාදුකාත්‌තිරුක්‌කින්‌රෝම්. නාට්‌ටු මක්‌කළුක්‌කු එංකළුඩෙය අර්‌ප්‌පණිප්‌පුකළෛ වෙළික්‌කාට්‌ටි යිරුක්‌කින්‌රෝම්. එංකළුඩෙය චෙලවුකළෛක් කුරෛප් පදර්‌කාන සරියාන මුකාමෛත්‌තුවත්‌තෛච් චෙය්‌තිරුක්‌කින්‌රෝම්. අදේපෝන්‌රු, ඉන්‌ත නාට්‌ටිල් ඉල්‌ලාදු පෝයිරුක්‌කින්‌ර දේසිය ඔර්‌රුමෛයෛ වලුප්‌පඩුත්‌තුවදර්‌කාන වරවු චෙලවුත්‌තිට්‌ටමාකවේ ඉදෛ නාඞ්‌කළ් පාර්‌ක්‌කිරෝම්. විසේසමාක, යුද්‌දත්‌තාල් පාදික්‌කප්‌පට්‌ට මක්‌කළුඩෙය වාළ්‌ක්‌කෛයෛ මේන්‌මෛප්‌පඩුත්‌තුවදර්‌කාක වඩක්‌කු, කිළක්‌කිර්‌රුක් කූඩුදලාන නිති ඔදුක්‌කීඩුකළ් චෙය්‌යප් පට්‌ටිරුක්‌කින්‌රදු. අන්‌ත නිලෛමෛකළෛ මක්‌කළ් පුරින්‌දු කොළ්‌වාර්‌කළ් එන්‌රු නාඞ්‌කළ් එදිර්‌පාර්‌ක්‌කින්‌රෝම්. නන්‌රි, වණක්‌කම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්‌පුමිකු තලෛමෛතාඞ්‌කුම් උරුප්‌පිනර් අවර්‌කළ්)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.21]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්‌පුමිකු හර්ෂණ රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම සතුටු වෙනවා මේ අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව.

විශේෂයෙන් අද දෙපැත්තේම මන්ත්‍රීවරු සාකච්ඡා කළා, අදහස් දැක්වූවා ජනාධිපති වැය ශීර්ෂයෙන් සෑහෙන මුදලක් අඩු කරන්න පසුගිය ගෝඨාභය රජපක්ෂ ජනාධිපතිවරයාත්, ඊට පස්සේ අනුර කුමාර දිසානායක මැතිතුමාත් කටයුතු කර තිබෙනවා කියලා; ඒ විධියට මුදල් කප්පාදුවක් කරලා රටේ මුදල් ඉතුරු කර තිබෙනවා කියලා. මුදල් ඉතුරු කරනවා වාගේම ඉතාම වැදගත් කාරණයක් තමයි ජනාධිපතිවරයා හැටියටත්, ජනාධිපති කාර්ය මණ්ඩලය හැටියටත්, ජනාධිපති ලේකම් කාර්යාලය හැටියටත්, ජනාධිපති අරමුදල හැටියටත්, ඒ සෑම ආයතනයකින්ම ජනතාවට ඉටු කරන සේවාව. කෝටි ගානක් මුදල් ඉතුරු කළාට වැඩක් නැහැ එතැනින් ඒ සේවාවත් එහෙමම නතර වෙලා තිබෙනවා නම්. එම නිසා මම ඉතා ඕනෑකමින් කියන්න කැමැතියි, ජනාධිපතිවරයෙකුගෙන් වන සේවාව වඩා පුළුල් කරන්න යම් මුදලක් වැය කළාට ප්‍රශ්නයක් නැහැ සහ එවැනි යම් මුදලක් වැය කරලා ජනතාවට වැඩි සේවාවක් ඉටු කරන්න කටයුතු කරන්න ඕනෑ කියන එක.

දැන් ජනාධිපති නිල නිවාස ගැන කථා කරනවා. ජනාධිපතිවරයාට රට පුරා නිල නිවාස කිහිපයක් තිබෙනවා. මම හිතන විධියට, කුහක නොවී අපි ඒ කාරණය ගැන බලන්න ඕනෑ. ජනාධිපතිවරයෙකුට සාමාන්‍ය හෝටලයකට ගිහින් ඇඳුම් මාරු කර ගන්නවත්, එහෙම නැත්නම් ජනාධිපතිවරයාගේ කාර්යභාරය ඉටු කරන්නවත් බැහැ, ඒක අපහසුයි. ඒ නිසා යම් නිල නිවාස ප්‍රමාණයක් තබා ගත යුතුයි, එම වරප්‍රසාදයෙන් අයුතු ප්‍රයෝජනයක් නොගෙන. හැම දිස්ත්‍රික්කයේම, හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම නිල නිවාස තියා ගන්නවා නම් ඒක මානසික රෝගයක් වෙන්න ඕනෑ. හැබැයි යම් ප්‍රදේශ කිහිපයක යම් නිල නිවාස ප්‍රමාණයක් තිබීමේ ගැටලුවක් නැහැ. නමුත් ඒවා පිළිබඳව වැඩි මුදලක් වැය නොවන ආකාරයට ස්වයං පාලනයක් තිබිය යුතුයි. එහෙම ස්වයං පාලනයක් නැතිව, තමන්ට ඕනෑ විධියට සැප සම්පත් අරගෙන කටයුතු කරන්න බැහැ.

කාලයක් තිබුණා ජනාධිපතිවරයාට වෙනම නිල වශයෙන් plane එකකුත් තබා ගන්න සිහින මවපු. ඇමෙරිකාවේ ජනාධිපතිට Air Force One, වෙනම ගුවන් යානාවක්, තිබෙනවා වාගේ එහෙම ගුවන් යානා තියා ගන්න ආසාවන් ආපු අය හිටපු

කාලයකුත් තිබුණා. හැබැයි, ඒවා වැරදියි. ඒ වාගේ දෙයක් හිතනවා නම් මම හිතන විධියට ඒක ඉතා පැහැදිලිව මානසික රෝගී තත්ත්වයකට පත්වීමක් තමයි. හැබැයි, යම් ප්‍රමාණයේ වරප්‍රසාදයක් ජනාධිපතිවරයෙකුට තිබිය යුතුයි. අපි මේක කියන්නේ විපක්ෂයේ ඉඳගෙන, දැන් අපේ ජනාධිපතිවරයෙක් නොවෙයි ඉන්නේ.

අපේ ජනාධිපතිවරයෙක් ඉන්නකොට මම මෙහෙම කිව්වා නම්, ඔබතුමන්ලාට කියන්න පුළුවන්, "තමන්ගේ ජනාධිපතිවරයාට සැප පහසුකම් ලබා දෙන්න තමයි මෙහෙම කියන්නේ" කියලා. නමුත් අපි විපක්ෂයේ ඉඳගෙන වුණත් කියනවා, රටේ ජනාධිපතිවරයාට, අගමැතිවරයාට යම් වරප්‍රසාද ප්‍රමාණයක්, යම් පහසුකම් ටිකක් ලබාදිය යුතුයි කියලා.

ඒ වාගේම හිටපු ජනාධිපතිවරු ගැන කථා කළොත්, ඔවුන්ට නිල නිවාස ලබා නොදීම සුදුසුයි කියලා මම හිතනවා. ඔවුන්ට නිල නිවාස ලබා දෙන්න අවශ්‍ය නැහැ. මොකද, ජනාධිපතිවරයෙක් හැටියට වර්ෂ ගණනාවක් සේවය කරලා විශ්‍රාම ගියාට පසු ඔවුන් මහජන මුදලින් නඩත්තු කරන්න අවශ්‍ය නැහැ. එවැනි යම් අවශ්‍යතාවක් තිබෙනවා නම්, හිටපු යම් ජනාධිපතිවරයෙකුට නිවසක් නැත්නම් ඒ ගැන සැලකුවාට කමක් නැහැ. එහෙම නැතිව කොළඹ නිවාස තියාගෙන, ඒවා කුලියට දීලා, එහෙම නැත්නම් ඒවායින් වෙනත් ආදායම් ලබාගෙන රජයේ නිවාසවල ඉන්නවා නම් ඒක සුදුසු නැහැ. මොකද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටත් බස්නාහිර පළාත තුළ නිවසක් තිබෙනවා නම්, නිල නිවසක් ලබා ගන්න බැහැ. එම නිසා හිටපු ජනාධිපතිවරයෙකුටත් පෞද්ගලික නිවාස තිබෙනවා නම්, අනවශ්‍ය විධියට රජයෙන් නිවසක් ලබා දෙන්න අවශ්‍ය නැහැ. නමුත් තමන්ට, තමන්ගේ දරුවෙකුට හෝ නිවසක් නැත්නම් රජයෙන් නිවසක් ලබා දීම සුදුසුයි, ඒක වගකීමක්. හැබැයි, හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව ගැන වැඩිපුර හිතන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හිටපු ජනාධිපතිවරුන්ටත් ඒ සුදුසු ආරක්ෂාවක් ලබා දෙන්න ඕනෑ, නිසි ආකාරයෙන් තක්සේරු කිරීමක් එක්ක. හැබැයි, මේ ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව අඩු කරනකොට ඒ නිසි තක්සේරුව සිදු වුණාද කියන සැකය අපට තිබෙනවා. මොකද, හැම ජනාධිපතිවරයකුටම ආරක්ෂාව සඳහා එකම ප්‍රමාණයක් තමයි ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ හින්දා නිසි තක්සේරුවක් කරන්නේ නැතුව එය ප්‍රසිද්ධ කාරණාවක් කරගන්න, "අපි ආරක්ෂකයින් මෙච්චර ගණනක් අයින් කළා, එසේ අයින් කරලා අපට මෙච්චර මුදලක් ඉතිරි කර ගන්න පුළුවන් වුණා" කියලා කථාවක් ගොතන්න උත්සාහ කළා කියා අපට පෙනෙනවා. ඒ නිසා, නිසි තක්සේරුවක් ඇතිව ආරක්ෂාව අඩු විය යුතුයි. මම කලින් කිව්වා වාගේ, හිටපු ජනාධිපතිවරුන්ට නිල නිවාසවල අවශ්‍යතාවක් නැත්නම් ඒවා ලබා දෙන්න අවශ්‍ය නැහැ කියලා අපි විශ්වාස කරනවා. නමුත්, ඔවුන්ගේ ආරක්ෂාව ගැන වැඩිපුර හිතන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, ආණ්ඩුව බලයට ආපු ගමන් ජනාධිපති ලේකම් කාර්යාලයේ, ගෝල්ෆේස් එකේ වාහන සංදර්ශනයක් පවත්වනවා අපි දැක්කා. වාහන සිය ගණනක් ප්‍රදර්ශනය කළා. එක පාරටම ඒ වාහන නැති වුණා. දැන් අපට දකින්න තිබෙනවා, ඒවා මේ පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේලාගේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට බෙදා දීලා තිබෙන ආකාරය. අපේ මන්ත්‍රීවරු වීඩියෝ කරගෙනත් තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිල නිවාස ඉස්සරහා ඒ වාහන නවත්වලා තිබෙන ආකාරය. එදා ප්‍රදර්ශනය කරපු වාහන අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා ද? ඒ පිළිබඳව ගරු අගමැතිතුමියගෙන් ඇහුවාම එතුමිය පාර්ලිමේන්තුවට කියනවා, එහෙම නිල වශයෙන් දීලා නැහැ කියලා. හැබැයි, නිල වශයෙන් දුන්නේ නැති වුණාට නොනිල වශයෙන් හරි ඒ අයට ඒවා ලැබිලා තිබෙනවා. ඒ වාහනවලට මොකක්ද වෙලා තිබෙන්නේ?

මේ රජය ඉතා පැහැදිලිව ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා නේ. දැන් මහා ලොකුවට කියනවා නේ, vehicle permit එක cancel කළා කියලා. Vehicle permit එක cancel කරනවා විතරක් නොවෙයි, මන්ත්‍රීවරුන් 225දෙනාට වාහන දෙන්නේ නැහැ කියලාත් කිව්වා. රජයේ වාහන මන්ත්‍රීවරුන් 225දෙනාට දෙන්නේ නැහැ කිව්වාට විශාල පිරිසකට වාහන ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. එම නිසා ඉතා පැහැදිලිව -

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි, රජයේ වාහන එහෙම ලබා දීලා තිබෙනවා නම්, ඒවා කොහේද නතර කරලා තිබෙන්නේ කියලා අංකයත් එක්ක අපට කියන ලෙස. අපි ඒ ගැන සොයා බලා පාර්ලිමේන්තුවට, ඔබතුමන්ලාට හරියටම කියන්නම්. "එහෙන් මෙහෙන් වාහනයක් තිබුණා. අතැන නතර කරලා තිබුණා, මෙතැන නතර කරලා තිබුණා. ෆේස්බුක් එකේ තිබුණා" කියලා කියන්න එපා. හරියට කියන්න, වාහනයේ අංකයත් එක්ක. එතකොට අපි කියන්නම්.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, වෙනත් දේවලට නම් සමාජ මාධ්‍ය බලලාත් අගේට නඩු දාන්න ඔබතුමන්ලාට පුළුවන්. බදුල්ලේ වත්තක වාහනයක් ගෙනිච්ච එක තමුන්නාන්සේ සමාජ මාධ්‍යවලින් දැක්කේ නැද්ද කියලා මට සැකයි. තමුන්නාන්සේ ඔහොම කියනවා නම්, තමුන්නාන්සේලාට පොලීසියක් ඕනෑ නැහැ නේ. එහෙම නම් අපට පොලීසිය භාර දෙන්න, නලින්ද ඇමතිතුමා. පොලීසිය අපට භාර දුන්නා නම් අපි ඉතුරු ටික කරන්නම්. තමුන්නාන්සේලාට පොලීසියක් තිබෙන්නේ, වැරදි කරන අය අල්ලන්න. ඒක නිසා ඒකෙන් බේරෙන්න බොරුවට කියන්න එපා "අපට ඒක හොයලා දෙන්න. අනේ, අපට කිව්වොතින් අපි කරන්නම්. අපට නිල වශයෙන් දෙන්න, ලිඛිතව දෙන්න" කියලා. ඒ කථා, ඒ බයිලා එපා.

තමුන්නාන්සේට මම එක දෙයක් කියන්නම්, ගරු ඇමතිතුමා. තමුන්නාන්සේ යන්න අද හවසට මාදිවෙල නිල නිවාසවලට. මාදිවෙල නිල නිවාසවලට ගිහිල්ලා ආණ්ඩුවේ තිබෙන වාහන ටික බලලා එන්න. තමුන්නාන්සේට තිබෙන්නේ අන්න ඒක කරන්නයි. මට ටෝක් දාලා, මගෙන් ප්‍රශ්න අහන එක නොවෙයි කරන්න තිබෙන්නේ. එහෙම කරන්න ඕනෑ නම් තමුන්නාන්සේ ඔය විමර්ශන කටයුතු අපට භාර දෙන්න. ඔබතුමන්ලාට දැන් කරන්න තිබෙන්නේ මොකක්ද? ගරු ඇමතිතුමා, ඔතැන ඉන්න සහායකතුමා එක්ක මාදිවෙලට යන්න. මාදිවෙලට ගිහිල්ලා මාදිවෙල තිබෙන ඒ වාහන ටිකේ ෆොටෝ අරගෙන තමුන්නාන්සේලාම පරීක්ෂණය කරන්න. *[බාධා කිරීමක්]* මට එහේ යන්න වුවමනාවක් නැහැ. මට මාදිවෙල ගෙදරක් නැහැ. මට මාදිවෙල ගෙදරක් තිබෙනවා නම් මම යනවා. මම යනවා මගේ ගෙදර. තමුන්නාන්සේ යන්න මාදිවෙලට. මම මගේ ගෙදරට යන්නම්. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, මම කිව්වාට අද යන්න එපා. ඒ මොකද දන්නවා ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඔහොම නිකම් කියන්න එපා. ඔබතුමන්ලා අපට එන්න කියනවා, අපිත් එක්ක යන්න බැහැ කියනවා. අපි එහෙම ගිහිල්ලා බලමු. චෝදනාවක් කරනවා නම්, "මෙන්න අහවල් වාහනය. මෙන්න නොම්මරය. මේක අහවල් තැන තිබුණා" කියලා කියන්න. ඔහොම නිකම් කියලා වැඩක් නැහැ. නැත්නම් ඔබතුමා මාත් එක්ක යන්න එන්න. මමත් කියන්නම් වෙලාවක්. අපි දෙදෙනා ගිහිල්ලා බලමු, ගරු මන්ත්‍රීතුමා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා ඔය මොන කථා කිව්වත් අද නම් එතැනට යන්න එපා. මොකද, අද ඒ වාහන ඔක්කෝම හංගලා තියා ගනීවි. ඒක නිසා අද යන්න එපා. ඔබතුමා මටත් නොකියා යන්නකෝ. දක්ෂ විධියට යන්න. ගිහිල්ලා ඒ ටික ගැන බලන්න. මොකද, තමුන්නාන්සේලාට පාලනයක් කරන්න තිබෙනවා නේ. අපේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ම ඉතා පැහැදිලිවම එය වීඩියෝ කරලා තිබෙනවා. මම ඒ වීඩියෝ ටික තමුන්නාන්සේට ලැබෙන්න සලස්වන්නම්. ඒක කරන්නම්. ඒකෙ කිසි ගැටලුවක් නැහැ. ඒ කටයුත්ත කරන්නම්. ඒවා හොයන එකත් අපට භාර දෙන්න එපා. දැන්වත් තේරුම් ගන්නකෝ, අපි නොවෙයි ආණ්ඩුවේ ඉන්නේ තමුන්නාන්සේලායි කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

තමුන්නාන්සේලා නේ ආණ්ඩුවේ ඉන්නේ. තමුන්නාන්සේලා තවමත් හිතාගෙන ඉන්නේ විපක්ෂයේ කියලායි. අපටමයි කියන්නේ, අරක කරන්නකෝ, මේක කරන්නකෝ කියලා.

අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. මාදිවෙල ගැන කථා කරනවා නේ; නිල නිවාස ගැන කථා කරනවා නේ. ගරු ඇමතිතුමා, ඔබතුමන්ලා අමාත්‍යවරුන්ගේ නිල නිවාසවලට යන්නේ නැති ලු. දැන් ඒ නිල නිවාසවලට මොනවාද කරන්නේ? තමුන්නාන්සේලා ඒ නිල නිවාසවලට යන්නේ නැත්නම්, ඒක තමුන්නාන්සේලාගේ රජයේ ප්‍රතිපත්තිය නම්, ඒක හරි. කෝටි ප්‍රකෝටි ගණනක් වටිනා ඒ නිල නිවාස ටික රජයේ ප්‍රතිපත්තියට අනුව වසා දමලා තිබුණාම ඒ නිල නිවාසවල පදිංචි වෙලා ඉන්න කොට යන වියදමට වඩා වැඩි වියදමක් යනවා, ඒවා අලුත්වැඩියා කරන්න. නිකමට කල්පනා කරලා බලන්න, ගෙයක් මාස හතරක්, පහක්, අවුරුද්දක් පාවිච්චි නොකර වසා දමලා තිබෙන කොට ඒවා නඩත්තු වෙනවාද කියලා. වසා දමා තිබුණාම ඒවා නඩත්තු වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා ඒවාට යන්නේ නැත්නම්, ඒක හරි. ඒකේ කිසි ගැටලුවක් නැහැ. ඒක තමුන්නාන්සේලාගේ කැමැත්ත. නමුත් ඒවා නිකම් වහලා දාලා, විනාශ වෙන මට්ටමට කටයුතු කරන්න එපා කියලායි අප කියන්නේ. තමුන්නාන්සේලා කියන්න එපා, අපට යන්න ආශාවක් තිබෙන හින්දා අපි ඊර්ෂ්‍යාවට මෙහෙම කියනවා කියලා. තමුන්නාන්සේලා ඒ නිල නිවාසවලට යනවා නම් යන්න. නොයනවා නම් ඒවාට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒ නිල නිවාසවලට මොකක්ද කරන්න යන්නේ? වෙලාවකට කියනවා, සංචාරකයන්ට දෙනවා කියලා. තව වෙලාවකට කියනවා, ප්‍රධාන ව්‍යාපාරිකයන්ට වෙන්දේසි කරනවා කියලා. නොයෙක් ආකාරයේ කථා කියනවා. දැන් මාස හතරක් වෙනවා, ඒවා නිකම්ම නිකම් වහලා දාලා. අපි ඒක අපරාධයක් හැටියට දකිනවා. ඒවා රජයේ දේපළ වුණත් වටිනා සම්පත්. ඒක නිසා කරුණාකර, එම වටිනා සම්පත් ආරක්ෂා කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් යොදන්න. ඇමතිවරුන්ට වෙන් කරපු නිල නිවාසවල ඉන්නේ නැති ජනතා විමුක්ති පෙරමුණු ආණ්ඩුවේ ඇමතිවරු-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වුණු කාලය අවසානයි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාට වෙන් කළ වෙලාවත් ලබා දීලා තිබෙනවා. කරුණාකර එයත් ලබා දෙන්න කටයුතු කරන්න.

මම මේ වෙලාවේ විශේෂයෙන්ම කියන්නේ මේකයි. ගරු ඇමතිතුමනි, දැන් තමුන්නාන්සේලා කියනවා, ඇමතිවරුන්ට නිල නිවාස ගන්නේ නැහැ කියලා. ඇමතිවරුන්ට නිල නිවාස ගන්නේ නැහැ කියන මේ ආණ්ඩුව මන්ත්‍රීවරුන්ට නිල නිවාස ගන්නවා. මොකක්ද මේ දෙබිඩි පිළිවෙත? ඒක පුදුම කථාවක් නේ! එහෙම නම්, මාදිවෙල නිල නිවාසවලත් ඉන්න එපා. එතකොට ඒවායේ ඉන්නේ කොහොමද? ඒවායේ ඉන්න එක හොඳ ද? ඒකේ කිසි ගැටලුවක් නැද්ද? ඇමතිවරුන්ගේ නිල නිවාසවල ඉන්න එක නරකයි. එහෙම වෙන්නේ කොහොමද? දැන් මාදිවෙල නිල නිවාසවල සියයට 95ක්ම තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු නේ ඉන්නේ. ඒක නිසා වෙන්න ඇති ඒකේ හිටියාට කමක් නැත්තේ. ගරු ඇමතිතුමා, මේ මොන විහිළු කථා ද? එහෙම නම්, ඒ නිල නිවාසවල ඉන්නත් එපා. ඒවායෙනුත් අයින් කරන්න. ජනතා සේවයට කියලා තමුන්නාන්සේලා ඒවායේත් ග්‍රාම නිලධාරි මහත්වරුන් පිරිසක් හෝ පදිංචි කරවන්න. නැත්නම් මොකක්ද මේකේ තේරුම? බොරු විකාර නේ මේ කරන්නේ. මේ ඔක්කෝම ප්‍රසිද්ධියට කරන්නේ. තමුන්නාන්සේලා ප්‍රසිද්ධියට යට වෙලා, මේ හැම දෙයක්ම ප්‍රසිද්ධියට කරනවා. ප්‍රසිද්ධියට කරන එක නොවෙයි වෙන්න ඕනෑ. කිසිම ගැටලුවක් නැහැ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිල නිවාස ලබා දුන්නාට. මට පෞද්ගලිකව නිල නිවසක් ඕනෑ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මට නිල නිවසක් අවශ්‍ය නැහැ. මොකද, මට කොළඹ නිවසක් තිබෙනවා. ඒ හින්දා මම ඉල්ලීමක් කරලාත් නැහැ. මම කවදාවත් නිල නිවසක ඉඳලාත් නැහැ. *[බාධා කිරීම්]* මට කොළඹ නිවසක් තිබෙනවා. ඒක පෞද්ගලික නිවසක්. *[බාධා කිරීම්]* මට පෞද්ගලික නිවසක් තිබෙනවා. ආණ්ඩුවේ නිවාස මට අවශ්‍ය නැහැ. ඒක නිසා ඒකේ කිසි ගැටලුවක් නැහැ නේ. ඒක පෞද්ගලික නිවසක් නේ. ඒක ආණ්ඩුවෙන් ගත්තු එකක් නොවෙයි නේ. පෞද්ගලිකව ගත්තු නිවසක් තිබෙන නිසා මට නිල නිවසක අවශ්‍යතාවක් නැහැ. නමුත්, සමහර මන්ත්‍රීවරුන්ට නිල නිවසක් අවශ්‍යයි. ඒ හින්දා ඔය බොරුව කරන්න එපා. පොලිස් ස්ථානාධිපතිවරයෙකුට නිල නිවසක් ලැබෙනවා නම්, MOH මහත්මයාට නිල නිවසක් ලැබෙනවා නම්, ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලාටත් එහෙම නිල නිවසක් ලබා දුන්නාට කමක් නැහැ. හැබැයි වැඩේ කියන්නේ, මන්ත්‍රී නිල නිවාස ගැන කථා කරන්නේ නැහැ; ඇමතිවරුන්ගේ නිල නිවාස ගැන කථා කරනවා. මොකද, ඇමතිවරුන්ගේ නිල නිවාස ගැන කථා කළොත් ඒකට ඊට වඩා ප්‍රසිද්ධියක් ගන්න පුළුවන් නේ.

වාහන පර්මිට් කථාවත් ඕකම නේ. වාහන පර්මිට් කථාවත් වෛරය පතුරුවන්න කරපු කථාවක්. ඇත්තටම වාහන පර්මිට් එකක් දෙන එක තමයි වාහනයක් දෙනවාට වඩා ආණ්ඩුවට ලාභ.

ඇත්ත කථාව කිව්වොත්, ආණ්ඩුවට ලාභ ඒකයි. ආණ්ඩුවට ඒකට වියදමක් යන්නේ නැහැ. හැබැයි, මිනිසුන්ට විකුණන්න හොඳයි ඒ කාරණාව. මොකද, වෛරය පතුරවන්න හොඳ කාරණාවක්, වාහන පර්මිට් එක දෙන්නේ නැහැ කියන එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත අමතර කාලයත් දැන් අවසානයි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒක නිසා වාහන ඕනෑ නැහැ. නැත්නම් ඒකටත් ගහයි, වාහන ඉල්ලුවා කියලා. ඒ නිසා වාහන ඕනේ නැහැ. තමුන්නාන්සේලා දෙන්නේ නැහැ කිව්වා නේ. Vehicle permits දෙන්නේත් නැහැ කිව්වා. තමුන්නාන්සේලා හිතුවාද අපි වාහනයකට නැමෙනවා කියලා? ඒ ඔය පැත්තේ ඉන්න අය වෙන්න ඇති. අපි නම් වාහනයකට නැමෙන්නේ නැහැ. ඒ නිසා ඒකේ ගැටලුවක් නැහැ. තමුන්නාන්සේලා ප්‍රසිද්ධියට - populist - තීන්දු-තීරණ ගන්නේ නැතිව, කරුණාකරලා මේ රටේ ජනතාවට සේවය කරන්න අවශ්‍ය කටයුතු ටික කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා. දැන් කථාව අවසන් කරන්න.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට වැඩිපුර ලබා දුන් කාලයත් අවසන් ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාගේ විනාඩි 3ක කාලයකුත් අමතරව ලබාදී තිබෙනවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි 5ක් මට දෙනවා කව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට වැඩිපුර විනාඩි 3ක කාලයක් තමයි ලබා දීලා තිබෙන්නේ. ඒ විනාඩි 3ත් දැන් අවසානයි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
හොඳයි. එහෙම නම් මම කථාව අවසන් කරන්නම්. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.39]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී අද පහත සඳහන් වැය ශීර්ෂ පිළිබඳ අවධානය යොමු කර තිබෙනවා. ඒවා තමයි, අතිගරු ජනාධිපති, අග්‍රාමාත්‍ය කාර්යාලය, උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, අධිකරණ සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභා කාර්යාලය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය, පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය, මැතිවරණ කොමිෂන් සභාව, ජාතික විගණන කාර්යාලය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය, විගණන සේවා කොමිෂන් සභාව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ සීමා නිර්ණය කොමිෂන් සභාව. මේ වැය ශීර්ෂ 21 පිළිබඳව තමයි අපි අද විවාද කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අමාත්‍යාංශයක් වුණාම ඒ අමාත්‍යාංශයේ ඇමතිවරයා ඉන්නවා. ඒකත් එක්ක මහජනතාව සමඟ විශාල සම්බන්ධතාවක් හැදෙනවා. එතකොට මන්ත්‍රීවරු වුණත් උනන්දුයි, ඒ ඇමතිතුමාගේ විෂයයට අදාළ විවාදයට සම්බන්ධ වෙන්න. නමුත්, මෙතැන තිබෙන ආයතන ගත්තොත්, ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරිය හැරුණාම, ඉතා විශාල කාර්යභාරයක් කරන ආයතන රාශියක් තිබෙනවා. ඒ ආයතන එතරම්ම ජනතාවගේ අවධානයට යොමු වෙන්නේ නැහැ. මම හිතන විධියට මන්ත්‍රීවරුන්ගේ අවධානයත් ඒ තරම්ම යොමු කරන බවක් පෙනෙන්නේ නැහැ. මම වේලාව අරගෙන මේ ගැන කියන්න හිතුවේ ඒකයි. අපි අද වාද කරන්නේ සල්ලි වෙන් කර තිබෙන ආයතන පිළිබඳව. ඒ නිසා තමයි මා ඒ ආයතන සඳහන් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මුලින්ම ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමාට කථා කරන්න තිබුණු අවස්ථාව මට ලබා දීම පිළිබඳව. ඒ වාගේම, මම කථාව ආරම්භයේදී ස්තුති කරන්න කැමැතියි, සභානායක කාර්යාලයේ සභානායක ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට. ඒ අය විශාල මහන්සියක් දරනවා. අපි පාර්ලිමේන්තුවේ මොනවා හරි හොඳ දෙයක් කරනවා නම් එහි ඇත්ත ගරුත්වය යා යුතු වන්නේ ඒ කණ්ඩායමට. ඒ වාගේම, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ නිලධාරි මණ්ඩලයටත්, පාර්ලිමේන්තුවේ පොදු කාර්ය මණ්ඩලයටත් ස්තුති කරන්න අපි මේක අවස්ථාවක් කර ගන්නවා. මොකද, මේ දේවල් අපට තනියම කරන්න බැහැ. අපි ආණ්ඩුවක් විධියට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය පැත්තෙන් ඉල්ලපු සමහර ඉල්ලීම් ලබාදී තිබෙනවා. එම ඉල්ලීම්වලින් දැනට එකක් විතරයි pending තිබෙන්නේ. ඒ leave encashment එක. නමුත්, ඒ අය ඉල්ලපු අනෙක් ඉල්ලීම් ලබා දෙන්න පොදුවේ පුළුවන් වෙලා තිබීම ගැන අපි මෙතැනදී සඳහන් කරන්න කැමැතියි.

[ගරු බිමල් රත්නායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කියන්න කැමැතියි, මෙවර අය වැයෙන් විශේෂයෙන්ම වැඩිපුර අවධානයට ලක් නොවන කොමිෂන් සභා ඇතුළු අනෙකුත් ආයතන සෑම එකකටම අවශ්‍ය මුදල් වෙන් කර තිබෙන බව. මේ ආයතනවලින් සුවිශාල කාර්යභාරයක් රටට සිදු විය යුතු වෙනවා. මේ ආයතන හැම එකක් ගැනම අපිට කියන්න බැරි වුණත්, සමහර ආයතනවලින්,- මම වේලාව ගන්නේ නැහැ, ඒ මොනවාද කියන්න- නමුත්, ඇත්තටම හරියාකාරව ඒ සේවය වෙන්නේ නැහැ. ඒවායින් අවශ්‍ය කරන දේ කාර්යක්ෂමව, proactive විධියට සමහර සේවා වෙන්නේ නැහැ. අපි දැකපු උදාහරණයක් කියන්නම්. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වුණත්,- මම කියන්නේ නැහැ, ඒක ඒ ඉන්න නිලධාරි මහත්වරුන්ගේ සම්පූර්ණ වරදක් කියලා. නමුත්, තිබ්බිච්ච දේශපාලන ආශිර්වාදය මදිකමත් ඕනෑම ආයතනයකට බලපානවා. නමුත්, අපි දැක්කා පසුගිය කාලයේ සිදු වෙච්ච සිදුවීම්. රට බංකොලොත් වෙනකම් අල්ලස් ගත්ත රටක් මේක. රට වැටෙනකම් අල්ලස් ගත්ත, පගා ගත්ත රටක, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පසුගිය කාලවලදී සිද්ධ වුණේ, ඇත්තටම නිකම් පොඩි පොඩි මිනිස්සුන්ට නඩු දමන්න විතරයි. ඒ වාගේම, විවිධ තාක්ෂණික හේතු මතත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉස්සරහට යන්න බැරි වුණා.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම කියන්නේත් මහජනතාවට වග කියන ආයතනයක්. ඒකට පැහැදිලිවම මහජනයාගේ බදු මුදල් තමයි යොදවන්නේ; මේ රටේ පුංචි මිනිසුන්ගේ, කවමදාකවත් පගාවක් අරගෙන නැති -ඉස්පිරිතාලේ ඉන්න ලෙඩ වෙච්ච දරුවා බලන්න යන්න පවා සමහරවිට security guardට රුපියල් 50ක් අල්ලස් දීලා යන්නේ- මිනිසුන්ගේ බදු මුදල්වලින් තමයි අල්ලස් කොමිසම දුවන්නේ. ඒ කොමිසමට අපේ කිසිම බලපෑමක් නැහැ. නමුත්, මේ mandate එකට අනුව ජනතා අභිලාෂයක් තිබෙනවා. ජනතා අභිලාෂයට උඩින් කවුරුත් නැහැ. ඒ නිසා අපි එම කොමිසමේ සියලු නිලධාරි මහත්වරුන්ගෙන් ඉල්ලා සිටිනවා තමන්ගේ කාර්යභාරය මහජනතාව වෙනුවෙන් කරන්න කියලා. මොකද, මේ කොමිෂන් සභා ස්වාධීන කළේම, ඒ වෙනුවෙන්. ඒවා ස්වාධීන කරන්න කරපු අරගළයත් මහජන අරගළයක්; අවුරුදු ගණනක අතිවිශාල අරගළයක්.

ඒ වාගේම තමයි විගණන සේවා කොමිසම. මම හිතනවා මේ කාරණාව මම මතක් කළ යුතුයි කියලා. විගණන සේවා කොමිසම ආරම්භ කිරීමට මායාදුන්න මහත්මයා වාගේ හිටපු විගණකාධිපතිවරු සුවිශාල උත්සාහයක් ගත්තා. මම හිතන විධියට, ස්වාධීන විගණන කොමිසමක් ඇති කිරීම වෙනුවෙන් එතුමා අපේ පක්ෂ කාර්යාලයට ඇවිල්ලා ඇති සිය වතාවකට වඩා. වෙනත් පක්ෂ කාර්යාලවලටත් එතුමා ගිහිල්ලා ඇති දැනුවත් කරන්න. *[බාධා කිරීමක්]* නැහැ, එහෙම නොවෙයි මම කියන්නේ. ඊට පස්සේ එතුමා අපිත් එක්ක යම් ප්‍රමාණයකට දේශපාලනයත් කළා. ඒක ඇත්ත. නමුත්, මම කියන්නේ ඒ වාගේ මිනිස්සු ගත්ත උත්සාහයක ප්‍රතිඵලයක් විධියට තමයි විගණන සේවා කොමිෂන් සභාව බිහි වුණේ. අද ගත්තොත්, මම ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය භාරව කටයුතු කරන්නේ. මම හිතන විධියට මහාමාර්ග අමාත්‍යාංශය කියන්නේ ලංකාව බංකොලොත් වෙන්න වැඩිම වැඩ කොටසක් කරපු අමාත්‍යාංශයක්. ඒකෙන් එන Cabinet Papersවලට අත්සන් කරනකොට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම බය හිතෙනවා. ඒ කියන්නේ, විශාල වශයෙන්, රට බංකොලොත් වන ප්‍රමාණයට බිලියන ගණනින් ඒවායේ වංචා, දූෂණ සිද්ධ වෙලා තිබෙනවා. කවදාවත් මහාමාර්ග අමාත්‍යාංශයට එන්නේ නැහැ මිලියන 10ක, 50ක, 250ක, 500ක ව්‍යාපෘති. ඒ ඔක්කොම බිලියන 10න්, 15න්, 20න්, 25න් එහා ඒවා එන්නේ. ඒ නිසා මහජන මුදල් ගන්න තැනක් විධියට විගණන කාර්යාලයට ලොකු වගකීමක් තිබෙනවා, විශේෂයෙන්ම මෙන්න මේ වාගේ දේවල් පිළිබඳව ඒ ආයතනවලට ප්‍රමිති හදලා දෙන්න. මම ඒ ගැන කියන්න වෙලාව ගන්නේ නැහැ.

අපේ මහාමාර්ග අමාත්‍යාංශය මුහුණ දෙන අත්දැකීමක් තමයි, agreements මොනවා තිබුණත්, මහාමාර්ග අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවලට අදාළව claiming industry එකක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ කියන්නේ, ඒවායේ බිල් හදන්න වෙනම සමාගම් තිබෙනවා; බොරු claims හදන සමාගම් තිබෙනවා. ඔවුන් බිලියන 10, 15ගේ claims හදනවා. ඒවා තමයි ඊට පසුව ගෙනැල්ලා කැබිනට් මණ්ඩලයට, අරවාට, මේවාට ඉදිරිපත් කරන්නේ. ඉතින්, නොකරපු වැඩකට බිලියන 10ක claim එකක් ඉල්ලුවාම, අවුරුදු තුන හතරක් තිස්සේ ඒක අඩු කරලා, අඩු කරලා, බිලියන 3කට අඩු කරලා දුන්නා කියලා ෂේප් වෙනවා. ඉතින්, ඒ බිලියන 3 කියන්නේත් වංචාවක්. අපි හිතනවා විගණන සේවා කොමිසම මේ වාගේ ඒවාට නිවැරදි ප්‍රමිති හදලා දෙන්න ඕනෑ කියලා. ඒ කටයුතුවලදී නියමිත ක්‍රම අනුගමනය කරලා තිබෙනවාද කියලා බලන්න ඕනෑ. අනික් එක තමයි, විගණන සේවා කොමිසමෙන් අපි බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම financial audit එකක් විතරක් නොවෙයි - අපි දන්නවා එතුමන්ලා මේවා කරනවා කියලා - management audit එකක් කරන එක.

අපි පසුගිය කාලයේ COPE එකේ ඉන්නකොට යෝජනා කළා මේ ආයතනවල කටයුතු සොයා බැලිය යුතුයි කියලා. දැන් අපි කැබිනට් අනුකමිටුවක් දාලා තිබෙනවා ඒ පිළිබඳව. දැන් එකම දේ කරන ආයතන ගොඩක් තිබෙනවා, සේවකයන් වැඩි ආයතන තිබෙනවා, සේවකයන් නැති ආයතන තිබෙනවා. මේ management පැත්ත ගැන බලලා අනිවාර්යයෙන්ම විගණන සේවා කොමිසම පැත්තෙන් යෝජනා කරන්න ඕනෑ, මෙන්න මේ මේ දුර්වලතා තිබෙනවා කියලා. ඔබතුමන්ලා බැලුවොත් සමහර රාජ්‍ය දෙපාර්තමේන්තු, ඒවායේ තිබෙන්නේ cubicles විතරයි. ඒවා cubiclesවලින් පිරිලා තිබෙන්නේ. අතිවිශාල වියදමක් කරගෙන අර "administrating ourselves" කියන එක තමයි තිබෙන්නේ. ඒවායේ කරන්න තිබෙන්නේ වෙන වැඩක්, කරන්නේ තමන්ට වුවමනා එක නොවෙයි.

අපි හිතනවා, ඒවා විගණන සේවා කොමිසම පැත්තෙන් ටිකක් බලසම්පන්න විධියකට පෙන්වා දීලා වෙනස් කරන්න ඕනෑ කියලා. සමහර ආයතන තිබෙනවා, Heads of departments ඉන්නවා අතිවිශාල ප්‍රමාණයක්. මොකද, එහෙම "Director" කියලා දාගත්තාට පස්සේ තමයි එක එක දේවල් ලැබෙන්නේ. ඒ නිසා වැඩ කරගන්න බැරි තරම් ඒවායේ ප්‍රශ්න ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමිය හරහා මේ සභාවට කියන්න කැමැතියි, ඇත්තටම මේ ආයතනවලට management audit එකක් අවශ්‍යයි කියලා.

ඒ වාගේම විශේෂයෙන්ම අපි විගණන සේවා කොමිසමෙන් ඉල්ලා සිටිනවා අඩු ගණනේ බිලියන එකකට, දෙකකට වැඩි ව්‍යාපෘති ගැනවත් -අමාත්‍යාංශවලින් ඒ කටයුතු කෙරෙන විධිය ගැන- කරුණාකරලා බලන්න කියලා. මොකද, අපට අවශ්‍යයි oversight එකක්. අපි හොරකම් කරන්නේ නැති, නාස්ති කරන්නේ නැති ආණ්ඩුවක්. අපට කතරගම දෙයියන්ට වාගේ ඇස් 12ක් නැහැ.

ඒ නිසා අදූෂිත විපක්ෂයක්, අදූෂිත විගණන කොමිසමක්, අදූෂිත නිලධාරි පද්ධතියක් අපට අවශ්‍යයි, අපේ mandate එක ක්‍රියාත්මක කරන්න. අපට හැම දෙයක්ම තේරෙන්නේ නැහැ.

ඒකයි අපි විගණන කොමිසමෙන්, අල්ලස් කොමිසමෙන් ඒවා බලාපොරොත්තු වෙන්නේ. ඒ වාගේම National Procurement Commission එක තිබෙනවා. එතුමන්ලා ඡන්දය ඉල්ලුවේ නැති වුණාට ජන වරමක් තිබෙනවා. ජන වරමට වඩා උඩින් කවුරුත් නැහැ. අපි මේ Commissionsවලින් බලාපොරොත්තු වෙන්නේ ඒකයි. ඒක අධිකරණයට වුණත් අදාළයි. Election Commission එකට වුණත් අදාළයි. ඒක ඕනෑම Commission එකකට අදාළයි. National Police Commission එකට වෙන්න පුළුවන්, ඕනෑම කොමිෂන් එකකට අදාළයි. "My car, my petrol" වාගේ ඉන්න බැහැ. මොකද, අද මිනිස්සු හැම දෙයක්ම ප්‍රශ්න කරනවා. ඒක ඇත්ත. මිනිසුන්ට ප්‍රශ්න කරන්න අයිතියක් තිබෙනවා. මොකද, මේක ඒගොල්ලන්ගේ රට. ඒගොල්ලන්ගේ රට; ඒගොල්ලන් තමයි බදු ගෙවන්නේ. අපි 225 දෙනා ගෙවන බදු ප්‍රමාණය බොහොම අඩු ප්‍රමාණයක්. ඉතාම වැදගත් ආයතන පද්ධතියක් ගැන තමයි අපි කථා කරන්නේ. මේ ආයතන තමන්ම ජනතාවට වග කියන ආයතන බවට පත් විය යුතුයි කියා අපි හිතනවා. මේ ළඟදී ගරු කථානායකතුමා Constitutional Affairs Committee එක පිහිටෙව්වා. මේ ආයතන ගෙන්වලා, මොනවාද තිබෙන ප්‍රශ්න, මොනවාද ඔබතුමන්ලා කරන්නේ කියලා ඒගොල්ලන් එක්ක සුභද මට්ටමින් කථා කරන්න අපට පුළුවන්. නමුත් මේ ආයතනවලටත් වගකීමක් තිබෙනවා. මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහජනතාවට වග වෙන විධියට තමන්ගේ වැඩ රටාව හදාගන්න ඕනෑ. ඒක අතිශය වැදගත්. මොනවා වුණත් මන්ත්‍රීවරු බැණුම් අහනවා, මඩ කනවා, විවේචනයට ලක් වෙනවා. අඩු ගණනේ අවුරුදු පහකට සැරයක් ඒ අය මිනිස්සු ඉදිරියට යනවා. හැබැයි, මේ ආයතනවලට පත් වෙන සමහර නිලධාරීන් එහෙම නොවෙයි. පත් වුණාට පස්සේ ඔවුන් අවුරුදු තිහ, හතළිහ එක දිගට එකම තැන ඉන්නවා. ඇත්තෙන්ම ඒගොල්ලොත් වග වෙන්න ඕනෑ. අපි මේ ආයතනවලට උපරිම ස්වාධීනත්වය, අවශ්‍ය කරන සම්පත්, අවශ්‍ය කරන ගරුත්වය සහ පිළිගැනීම ලබා දෙනවා. ජනාධිපතිතුමාගේ පැත්තෙන් ගත්තත්, අගමැතිනියගේ පැත්තෙන් ගත්තත් ඒ respect එක, අවශ්‍ය කරන සම්පත් අපි ලබා දෙනවා. ඒ වාගේම ඒ අදාළ මහජන සේවය, mandate එක තේරුම් අරගෙන කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අන්න ඒ කාරණය තමයි අපි වැඩිපුරම ඉදිරිපත් කරන්න හිතුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ප්‍රතිපත්තිවලට සහමුලින්ම විරුද්ධ අය අපේ ප්‍රතිපත්ති ගැන විවේචන කරනවා. විවේචනයක් කරනවා නම් කරන්න ඕනෑ තමන් ඒ ප්‍රතිපත්තිය දරනවා නම් විතරයි. තමන්ගේ පාලන කාලවලදී ඇති තරම් නිල නිවාස භාවිත කරලා, ඇති තරම් වංචා, දූෂණ කරලා, ඇති තරම් සම්පත් නාස්ති කරලා - ඒ ඔක්කොම කරලා - තිබෙනවා.

ජනතාවට වගකියන පිරිසක් විධියට රට බංකොලොත් වෙලා තිබෙන අවස්ථාවක අපේ වුවමනාව මත අපි ගත්ත තීරණ ප්‍රමාණයක් තිබෙනවා. අපි අධි සුඛෝපභෝගී වාහන පාවිච්චි කරන්නේ නැහැ කියලා කියන්නේ අපට ඒවායේ යන්න බැරිකමක් නිසා නොවෙයි. අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. පෞද්ගලිකව එහෙම යාන වාහන තිබෙන මන්ත්‍රීවරුත් අපේ ඉන්නවා. ඒක ප්‍රශ්නයක් නැහැ. අපට ඒක මාර නැහැ; අපට වාහන ඉදිරියේ ඉඳන් ෆොටෝ ගහලා පෞරුෂයක් හදාගන්න ඕනෑ නැහැ. අපි එච්චර lost නැහැ. තිබෙන ලොකුම මර්සිඩීස් සීරිස් එක ඉස්සරහා ඉඳන් ෆොටෝ එකක් ගහගන්න, BMW 7 Series එකක් ඉදිරියේ ඉඳන් ෆොටෝ එකක් ගහගන්න අපට පිස්සු නැහැ. ඒ නිසා අපට ඒවා මාර නැහැ. අපට ඒවා තිබුණත් එකයි, නැතත් එකයි. නමුත් අපි දැන් හදාගත්ත ප්‍රතිපත්තිවලට **අනුව කටයුතු කරනකොට** කියනවා, "ඔය ගොල්ලන් මාදිවෙලත් ඉන්න එපා, මන්ත්‍රීවරුන්ටත් නිල නිවාස ඕනෑ නැහැ" කියලා. කවුද මේ කියන්නේ? *[බාධා කිරීමක්]* එතුමාට නිල නිවාසයක් තිබෙනවා කිව්වා නේද? අපි දන්නවා, විපක්ෂ නායකතුමාට නිල නිවාසයක් තිබෙනවා කියලා. *[බාධා කිරීමක්]* රාජපක්ෂ පවුලේ එකක්ද? *[බාධා කිරීමක්]* රාජපක්ෂ පවුලට මොකක් හරි එකක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි කරන කැපවීමට වඩා වැඩි කැප කිරීමක් කරන කෙනෙකුගේ විවේචනය භාර ගන්න අපි කැමතියි. හැබැයි, කරන්න තිබෙන හැම නාස්තියම කරලා, හැම විනාශයම කරලා දැන් ඇවිත් මෙහෙම කියනවා. අපේ මන්ත්‍රීවරුන්ට, අපේ ඇමතිවරුන්ට නිල නිවාසවල ඉන්න බැරිකමක් නැහැ. ඒගොල්ලන්, most suitable. ඇයි? ඒගොල්ලන් බොහොම අවංක විධියට, genuine විධියට දේශපාලනය කරලා ආපු කට්ටිය.

අපි දන්නවා, කොළඹ කිරුළපනේ ගෙවල් තිබෙන ඇමතිවරු ගැන. මම ඉඩම් නියෝජ්‍ය ඇමති හැටියට සිටි කාලයේ,- නම කියන්න හොඳ නැහැ, ඒ ඇමතිතුමා තවම ඉන්න නිසා. එතුමා හිටපු තැපැල් ඇමති කෙනෙක්. කිරුළපනේ ගෙදර තිබෙනවා. ඔහු නිල නිවාසයක් ගත්තා. 2003, 2004 කාලයේ රුපියල් ලක්ෂයක්ද කොහේද දුන්නා ඇමති කෙනෙකුට නිල නිවාසය ලැබෙනකම්. මොකක්ද වුණේ? තමන්ට නිල නිවස ලැබුණේ මාස තුනක් පරක්කු වෙලා කියලා තමන් හිටපු ගෙදරටත් රුපියල් ලක්ෂය ගණනේ ගත්තා. ඒ වාගේ තුට්ටු දෙකේ කට්ටිය ඔයගොල්ලන් එක්ක ඉන්නවා. ඔක්කෝම එහෙම නොවෙන්න පුළුවන්. *[බාධා කිරීම්]* ඔක්කෝම නොවෙන්න පුළුවන්. *[බාධා කිරීම්]* මම ඒක කියනවා නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔයගොල්ලන් - [බාධා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔයගොල්ලන් එක්ක ඉන්නවා. ඒක කියන්න මම බය නැහැ. ඒක කියන්න බය නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔයගොල්ලන් එක්කත් ඉන්නවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපිත් එක්ක නැහැ. අපිත් එක්ක එහෙම ඉන්න බැහැ. මම කියන්න හැදුවේ මේකයි. මාදිවෙල නිවාස සංකීර්ණය සම්බන්ධව අපි කථානායකතුමාටත් කිව්වා. *[බාධා කිරීම්]* මාදිවෙල නිවාස සංකීර්ණය සම්බන්ධව අපි කථානායකතුමාටත් කිව්වා. ඒ නිවාස ඇත්තටම අලුත්වැඩියා විය යුතුයි. මම කියන්න හැදුවේ මේකයි. අපි කරන කැපවීමට කෝවොක් කර කර මොනවාද මේ කියන්නේ? ඒ කියන්නේ මට තේරෙනවා, ඒ mentality එක මොකක්ද කියලා. "එයාට නම් නිල නිවාසයක් තිබෙනවා, එයාට නම් කොළඹ ගොඩක් ගෙවල් තිබෙනවා" එහෙම හිතනවා නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට කියන්න තිබෙන්නේ මේකයි. අපි කරන කැප කිරීමේ පරමාර්ථය දන්නේ අපියි. ඒක තේරුම් ගන්න බැරි එක මෙතුමන්ලාගේ ප්‍රශ්නයක්. හැබැයි, ඒක joke එකට අරගෙන කියනවා, අපි ඒක ප්‍රචාරයට කරන දෙයක් කියලා. නැහැ, එහෙම නම් 1994 ඉඳලාම කළ දේවල් සිදු කළේ

[ගරු බිමල් රත්නායක මහතා]

ප්‍රචාරයට වෙන්න ඕනෑ. මනුස්සයෙක් තමන්ගේ ජීවිත කාලය පුරාම දෙයක් කරනවා නම්, ඒක ප්‍රචාරයට වෙන්න බැහැ නේ. අද ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඔබතුමන්ලා පිළිගන්නේ, ඔබතුමන්ලා කරමින් සිටින දේවල්ම තමයි. ඔබතුමන්ලා කැමැති දේවල් තමයි, ඔබතුමන්ලා අපට විවේචනයක් විධියට කරන්නේ. එහෙම නැතුව ඇත්තටම අදාළව නොවෙයි.

අපිට නම් ලජ්ජාවක් තිබෙනවා, මහජන මුදල් නාස්ති කිරීම සම්බන්ධයෙන්. Staff Advisory Committee එකේදී ගරු කථානායකතුමා යෝජනාවක් කළා. මොකද, ඔක්කෝටම වඩා පාර්ලිමේන්තුව වග කියන්න ඕනෑ, ජනතාවට. මම හිතන විධියට අපි 225දෙනා විතර ජනතාවට වග කියන්නේ නැහැ, වෙන කවුරුවත්. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ වුණත් මුදල් පරිපාලනය හරියාකාරව සිද්ධ වෙනවාද කියන එක බලන්න ඕනෑ. ඒ නිසා අපි Staff Advisory Committee එකේදී decision එකක් ගත්තා, audit එකක් කරන්න. මම හිතන විධියට දැන් ඒ audit එක කරගෙන යනවා. අපි කථානායකතුමාගෙන් ලිඛිතව ඉල්ලුවා, - ඕනෑම කෙනෙකුට ඒක ඉල්ලා ගන්න පුළුවන් - පසුගිය කාලයේ හිටපු කථානායකතුමන්ලා ඔවුන්ගේ වියහියදම් කළේ කොහොමද කියන විස්තර. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තුව ආදර්ශවත් නොවී අපි රට ආදර්ශවත් කරන්නේ කොහොමද? සමහර ටෙලිවිෂන් නාළිකාවල මේක පෙන්වන්නේ රට හදන තැන කියලා නේ.

මට ලබා දී තිබෙන වෙලාව අවසන් වන නිසා, මම ඉක්මනින් මේ තොරතුරු ඉදිරිපත් කරන්නම්. කථානායක නිල නිවස තිබෙනවා. ඒක හරියාකාරව, ආරක්ෂිතව නඩත්තු කරනවා. මොකද, එය කථානායකවරයාට තිබෙන නිල නිවස. නමුත් අපේ වර්තමාන කථානායකතුමා ඒ නිල නිවසේ ඉන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2024 නොවැම්බර් දක්වා එම නිල නිවසේ staff එක විධියට 70ක් ඉඳලා තිබෙනවා. 70ක් ඉඳලා තිබෙනවා, ඒ bungalow එක විතරක් බලාගෙන. ඒ වියදම් සම්බන්ධ සියලු වාර්තා audit එකෙන් දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය බලන්න. මේ වාර්තා මම **සභාගත*** කරනවා.

හිටපු කථානායකතුමා, හිටපු නියෝජ්‍ය කථානායකතුමා සහ ඕනෑම කෙනෙකුට මෙම විස්තර අවශ්‍ය නම් ඉල්ලා ගන්න පුළුවන්. මේ, audit එකෙන් දීපු විස්තර. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හිටපු කථානායකතුමා 2024 ජනවාරි 01 වැනි දා ඉඳලා 2024 සැප්තැම්බර් 24 වැනි දා දක්වා වාහන 9ක් පාවිච්චි කර තිබෙනවා. ඒ මාස 9 තුළ එතුමාගේ fuel cost එක විතරක් රුපියල් මිලියන 33යි, මාස 9ට රුපියල් ලක්ෂ 334යි. ඒ කියන්නේ සාමාන්‍යයෙන් එක මාසයකට ලක්ෂ 40කට ආසන්න මුදලක් එතුමා වාහනවලට තෙල් ගහන්න වියදම් කර තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු 2ක කාලයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හිටපු නියෝජ්‍ය කථානායකතුමා වාහන 6ක් පාවිච්චි කරලා තිබෙනවා. මාස 9ට එතුමාගේ තෙල් බිල ලක්ෂ 135යි. හිටපු DCC වාහන 4ක් පාවිච්චි කර තිබෙනවා. මාස 9ට තෙල් බිල ලක්ෂ 72යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ තමයි ඉන්ධනවලට කර තිබෙන වියදම. 2023දීත් මේ විධියටම තමයි සිදු වෙලා තිබෙන්නේ. මේ විධියට තමයි ඒගොල්ලන් මේවා පාවිච්චි කර තිබෙන්නේ.

අපි වර්තමාන කථානායකතුමාගේ, නියෝජ්‍ය කථානායකතුමාගේ සහ නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ ඉන්ධන වියදම් ගෙන බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2025 ජනවාරි 01වන දා ඉඳලා ජනවාරි 31වන දා දක්වා වර්තමාන කථානායකතුමාගේ තෙල් වියදම රුපියල් 218,000යි. හිටපු කථානායකවරයා සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ 40කට ආසන්න ප්‍රමාණයක් මාසයකට වියදම් කර තිබෙනවා, ඉන්ධනවලට. වර්තමාන කථානායකතුමා වියදම් කර තිබෙන්නේ රුපියල් 218,000යි.

වර්තමාන නියෝජ්‍ය කථානායකතුමා කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. එතුමාගේ තෙල් වියදම රුපියල් 23,000යි. වර්තමාන නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ තෙල් වියදම රුපියල් 81,000යි. ඉතින්, හිටපු අය පෙට්‍රල් ෂෙඩ් එකක් කළාද කියලා තමයි දැන් හොයන්න වෙන්නේ. ගරු ජගත් විතාන මන්ත්‍රීතුමාගේ බස්වලටත් තෙල් ටිකක් ගහගන්න තිබුණා. මෙන්න මෙහෙම තමයි ඒගොල්ලන්ගේ වියහියදම් ලැයිස්තුව තිබෙන්නේ. අපට කිසිම අත්ථකිලමතානුයෝගයක් නැහැ. අපට පුළුවන්, අපේ සල්ලිවලින් විනෝද වෙන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ. ලංකාවේ මිනිස්සු තමන්ගේ සල්ලිවලින් ඕනෑම වාහනයක් ගත්තාම අපට මොකද? මම මේ කාරණා කියන්න හිතුවේ නැහැ. අපේ රටේ ජනතාවගෙන් සියයට 56ක් ඉන්නේ, ආර්ථික වශයෙන් අසරණ වෙච්ච දුප්පත් මිනිස්සු. එහෙම රටක නේ මාස 9කට රුපියල් ලක්ෂ 337ක තෙල් ගහන්නේ. මේගොල්ලන් ඉන්නේ full suit gentlemen වාගේයි. හැබැයි, හැම දෙයක්ම කරන්නේ - කන්නේ, බොන්නේ, ගෙදරට ගෙනියන්නේ- මිනිස්සුන්ගේ සල්ලිවලින්. මේ තිබෙන්නේ, Monthly Food Items Cost - Hon. Speaker's Official Account - 2023 and 2024 විස්තරය. මේ අවස්ථාවේදී එම ලේඛනය මම **සභාගත*** කරනවා.

බලන්න, bungalow එකේ කෑම වියදමට රුපියල් ලක්ෂ 26යි. ඒ, 2023 වර්ෂයේ. 2024 වර්ෂයේ රුපියල් ලක්ෂ 32යි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ඉන්න සමහර සේවක මහත්වරු දන්නවා, පාර්ලිමේන්තුවට අයිති කෑම, ඒ ඒ අමුද්‍රව්‍ය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පවා ඉතාම නින්දිත ආකාරයට බිල් දාලා හිටපු ලොක්කෝ -හිටපු කථානායකවරු, හිටපු නියෝජ්‍ය කථානායකවරු- ගෙවල්වල ගෙනියපු බව. ඒ තරම් third class. හැබැයි, අපේ වර්තමාන කථානායකතුමාගේ තත්ත්වය මොකක්ද? ජනවාරි මාසයේ සම්පූර්ණ වියදම රුපියල් 33,000යි. අපි පෙන්වා තිබෙනවා, අපි දේශපාලන වශයෙන් හිහන්නෝ නොවෙයි කියන එක. අපට නම් ලජ්ජයි, මහජන ධනය මෙහෙම පාවිච්චි කරන්න. ඒකෙන් කියවෙන්නේ නැහැ, අපි මේක සම්පූර්ණයෙන්ම සියෙරා ලියෝන් level එකට ගේන්න හදනවා කියලා. එහෙම නැහැ. ආර්ථිකයේ දියුණුවත් එක්ක අනිවාර්යයෙන්ම මන්ත්‍රීවරුන්ට, නිලධාරීන්ට, සෑම කෙනාටම මීට වඩා හොඳ පහසුකම් දෙන්න පුළුවන් නම් අපි දෙනවා. හැබැයි, ලංකාව දුප්පත් වෙලා තිබෙද්දී කථානායකලා, නියෝජ්‍ය කථානායකලා, ඇමතිලා, හිටපු ජනාධිපතිලා මෙහෙම සල්ලි නාස්ති කරපු එක වැරදියි. ඒ නිසා තමයි අපි ජන වරමට අනුව මේ කරුණු ඉදිරිපත් කළේ. අපි ඒකට භය වෙන්නේ නැහැ. අපි පොඩ්ඩක්වත් භය වෙන්නේ නැහැ, ජන වරම ක්‍රියාත්මක කරද්දී කරන jokeවලට. ඒ jokeවලට අපි jokeවලින්ම මෙතැනදී උත්තර දීලා ප්‍රායෝගිකව, අපේ භාවිතයෙන් මහජන මුදල් ඉතිරි කරලා මහජනතාවට සේවය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Mano Ganesan. You have fifteen minutes.

[අ.භා. 3.02]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු බිමල් රත්නායක ඇමතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කේන්තිය, කෝපය, තරහ, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති මට අවබෝධ කරගන්න පුළුවන්. ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මම ඉල්ලීමක් කරන්න කැමැතියි. මෙතැනදී කලිනුත් ඒ ඉල්ලීම කළා. නමුත් ගරු ඇමතිතුමනි, සමස්තයක් හැටියට කථා කරන්න එපා. Do not generalize. ඔබතුමා ඒ අය නම් කරන්න. හිටපු කථානායකද, හිටපු ඇමතිද, හිටපු මන්ත්‍රීද කියලා ඒ අය නම් කරන්න. ඒකට පොඩ්ඩක් සාධාරණ වෙන්න. සාධාරණ ඉල්ලීමක් නේ මම කරන්නේ. මේ කථා කරන මම ඔය දේවල්වලට සම්බන්ධ වෙලා නැහැ, හොරකම් කරලා නැහැ. දූෂණයට අපි සම්බන්ධ වෙලා නැහැ. අපි රජයේ මුදල් අවභාවිත කරලා නැහැ. හැබැයි, ඔබතුමා අත දික් කරලා කියනවා, "ඔබතුමන්ලා" කියලා. එතකොට මමත් මෙතැන ඉන්නවා නේ. අනේ, බිමල් රත්නායක ඇමතිතුමනි, මම කියන එක පොඩ්ඩක් අහගන්න. හොඳ නැහැ නේ, එහෙම කථා කරන එක. එහෙම කියන්න එපා. ඒ අය නම් කරන්න. Do not generalize. මම ඉතාම උනන්දුවෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. Generalize කරන්න එපා. ඔබතුමා අත දික් කරලා කියනවා නේ, "ඔබතුමන්ලා" කියලා. ඉතින්, අපිත් මෙතැන ඉන්නවා නේ. එහෙම හොඳ නැහැ නේ. එහෙම කියනකොට අපේ හිත රිදෙනවා. ඒ නිසා එහෙම කරන්න එපා. ඒ අය නම් කරන්න. You have all the right to do that - නම් කරන්න. ඔබතුමන්ලාගේ රජයේ ප්‍රතිපත්ති මම අවබෝධ කරගෙන ඉන්නවා. මම දන්නවා, ඒවා හොඳයි. ඒවා කරන්න. හැබැයි, නම් කරන්න. හිටපු ජනාධිපති කියනවා, හිටපු අගමැති කියනවා. හිටපු අය කීප දෙනෙක් ඉන්නවා නේ. හිටපු කථානායකවරු කීප දෙනෙක් ඉන්නවා නේ. හිටපු ඇමතිවරු කීප දෙනෙක් ඉන්නවා නේ.

ඒ නිසා කවුද කියලා නම් කරන්න. නම් කරලා කියන්න. ඔබතුමන්ලා ලැයිස්තු කිහිපයක් ඉදිරිපත් කළා නේ. ඒ කොයි ලැයිස්තුවේවත් මගේ නම නැහැ නේ. ඒ නිසා අපි වාගේ අය ඉන්නකොට, අපට රිදෙනවා. Unsuspecting, innocent people may believe or come to an understanding that we are also part of the jokers, part of the corrupt. ඒ නිසා එහෙම කරන්න එපා. ඒක වැරදියි. මම ඒ ඉල්ලීම කරනවා. එච්චරයි මම කියන්නේ. *[බාධා කිරීමක්]* එහෙම නොවෙයි නේ. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමා සභානායකතුමා නේ. එහෙම මඩ ගහන්නේ නැහැ. අපි සාධාරණව එකට කථා කරමු. අපි ගෞරවනීය විධියට සාකච්ඡා කරමු, සංවාද කරමු. ප්‍රශ්නයක් නැහැ නේ. ඒක හොඳයි නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව තිබෙනවා. ඒක බලවත් ආණ්ඩුවක්. මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. හොඳයි නේ ඒක. ඔබතුමන්ලාට ජන වරමක් තිබෙනවා. ඒක අපි අවබෝධ කරගෙන ඉන්නවා. ඔබතුමන්ලා නිකම් ආවේ නැහැ නේ. උඩ ඉඳන් වැටුණේ නැහැ නේ. ජන වරමෙන් නේ ආවේ. වැඩ කරගෙන යන්න, ප්‍රශ්නයක් නැහැ. ඒක කරන්න. අපි විපක්ෂයේ ඉඳගෙන අපට පුළුවන් තරම් යෝජනා ඉදිරිපත් කරනවා, තීරණ ගන්නේ ඔබතුමන්ලා. අපි නොවෙයි නේ, ඔබතුමන්ලාගේ නේ ආණ්ඩුව. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා Government mode එකට එන්න ඕනෑ. ඔබතුමන්ලා තවම විපක්ෂයේ mode එකේ ඉන්නේ. තවමත් ඉන්නේ එහෙම තමයි. ඒ mode එක වෙනස් කරගෙන ඇවිල්ලා කථා කරන්න.

මම ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා ඉන්න නිසා එතුමාගේ අවධානයට මේ කරුණ කියන්න ඕනෑ. ගිය වරත් මම දකුණු පළාතේ පොලීසියක ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඔබතුමා ඒ ගැන දන්නවා ඇති. ඔබතුමා එදා දුන් උත්තරය හොඳයි. හැබැයි, මම එච්චර සෑහීමකට පත් වෙන්නේ නැහැ. මොකද, මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වුණේ, පාර්ලිමේන්තුවට වාර්තා කිරීම විතරක් නොවෙයි. ඔබතුමා OICට කථා කළා, ASPට කථා කළා, තොරතුරු ලබා දුන්නා. ඒක නොවෙයි, මම බලාපොරොත්තු වෙන්නේ. එතැනදී දකුණු පළාතේ වතුවල ජීවත්වන කඳුකර දෙමළ ජනයාට ඒ නිසා අසාධාරණයක් වෙනවා.

මම ඒ ගැන ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය එක්කත් සාකච්ඡා කළා. එහෙම වෙලා තිබෙනවා කියලා එතුමියත් පෞද්ගලිකව පිළිගත්තා. එතැන පොඩි වහල්භාවයක් තිබෙනවා. වතුවල ඉන්න managersලා, administratorsලා ඉතාම නින්දිත විධියට ඒ ජනතාවට සලකන්නේ. පොලීසියේ අයත් ඒගොල්ලන් එක්ක වැඩ කරනවා. පොලීසියත් ඒ managersලා එක්ක එකට වැඩ කරන කණ්ඩායමක්. එහෙම සංස්කෘතියක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබතුමා ඒ පැත්තේ DIG, ASPලා, SSPලා කැඳවා මේවා ගැන විශේෂ අවධානය යොමු කරන්න කියන්න. වතුවල ජීවත් වන අහිංසක සාමාන්‍ය ජනතාවට අසාධාරණයක් වෙන්නේ නැති විධියට වගබලාගන්න කියලා ඔබතුමා උපදෙස් දෙන්න.

ඊයේ-පෙරේදා දවසක පල්ලේගම, Sirisily A Estate එකේ සන්දන් මාරියන් කියන අවුරුදු 76ක පුද්ගලයෙක් Deniyaya Police Station එකෙන් අත්අඩංගුවට ගත්තා. ඒ වයසක මිනිහා බිමට දාලා පයින් ගහලා තුවාල වෙලා තිබුණා. මම දන්නා විධියට ඊට පස්සේ පොලීසියේ උපදෙස් මත ඒ මිනිහාට ගහපු මිනිහාත් ගිහිල්ලා ඉස්පිරිතාලයේ admit වුණා. එහෙම වෙනවා. ඒක අපි දන්නවා. අපිත් දන්නවා නේ මොනවාද වෙන්නේ කියලා. ඒ නිසා

[ගරු මනෝ ගනේසන් මහතා]

මේ ගැන පොලීසියට උපදෙස් දෙන්න. පොලීසියට වෙනස් වෙන්න කියන්න. කරුණාකරලා පොලීසිය වෙනස් කරන්න. අපට ඕනෑ ඒකයි. මොකද, මේ ජනතාව අහිංසකයි. මේවා ඔවුන්ට කියන්න තැනක් නැහැ, කථා කරන්න තැනක් නැහැ, මොනවත් දන්නේ නැහැ, අහිංසක මිනිස්සු. ඒ නිසා තමයි මම එදා ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඒක කිව්වේ. මධ්‍යම පළාතේ, බස්නාහිර පළාතේ, සබරගමුව පළාතේ, ඌව පළාතේ ඒ තරමට තත්ත්වය බරපතළ නැහැ. දකුණු පළාතේ තත්ත්වය බරපතළයි. ගාල්ල දිස්ත්‍රික්කයේ, මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය වාගේ ප්‍රදේශවල තිබෙන වතුවල හැමදාම වාගේ විශාල අපරාධ වෙනවා. කාන්තාවන්ට, තරුණ ගැහැනු ළමයින්ටත් අසාධාරණකම් වෙනවා. මට ඒවා ප්‍රසිද්ධියේ මෙතැන කියන්න බැහැ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා විෂය භාර ඇමතිවරයා විධියට මේ ගැන පොඩ්ඩක් අවධානය යොමු කරන්න කියන එක තමයි කියන්න තිබෙන්නේ.

කෞරව තලෛමතාංකුම උරුප්පිනර් අවර්කළේ, ඉංකු සිරිතු නේරත්තුක්කු මුන්නර්, JVPඉන් සිරේෂ්ට උරුප්පිනරාන නණ්පර් රාමලිංකම් සන්තිරසේකර් අවර්කළ් උරෙයාට්රිච් සෙන්රාර්. අවර් සර්රු මුන්නර් ඉන්තච් සපෙයිල් ඉරුන්තාර්; ඉප්පෝතු ඉල්ලෛ. අවරතු උරෙයෛ නාන් කේට්ටුක්කොණ්ටු ඉරුන්තේන්. ඉන්ත නාට්ටිල් පුතිය අත්තියායමොන්රු උරුවාක්කප්පට්ටු ඉරුප්පතාක අවර් කූරිනාර්. ආම්! නානුම් අප්පටිත්තාන් නිනෛක්කින්රේන්. අන්ත අටිප්පටෛයිල්තාන් මක්කළ් උංකළුක්කු ආණෛ වළංකියිරුක්කිරාර්කළ්.

ඉලංකෛයිල් පිරපල්යමාන පත්තිරිකෛයාන 'වීරකේසරි' ඉල් නේර්රු වෙළිවන්ත ආසිරියර් තලෛයංකත්තින් සිරුපකුතියෛ නාන් ඉංකු වාසිත්තුක්කාට්ට විරුම්පුකින්රේන්.

"පුතිය අරසියලමෛප්පු උරුවාක්කප්පටුම්වරෛ අරසියලමෛප්පින් 13ආවතු තිරුත්තම් මාර්රමින්රි අමුල්පටුත්තප්පටුම්. වාය්ප්පුක් කිටෛක්කුම් සන්තර්ප්පත්තිල් පොතුජන අපිප්පිරාය්ත්තුක්කුප් පෝතුමාන කාල අවකාසම් වළංකප්පට්ටු පාරාළුමන්රත්තිල් විරිවාන කලන්තුරෛයාටලුටන් පුතිය අරසියලමෛප්පෛ උරුවාක්කත් තයාරාක උള්ළෝම්. ඉතර්කු මුන්නර් පොරුළාතාරත්තෛ ස්තිරප්පටුත්තික්කොළ්ළ වේණ්ටුමෙන්රු අමෛච්චරවෛයින් පේච්චාළරුම් ආළුම් තරප්පින් පිරතම කොරටාවුම් සුකාතාර අමෛච්චරුමාන නළින්ත ජයතිස්ස තෙරිවිත්තිරුක්කිරාර්."

එන්රු අතිල් කුරිප්පිටප්පට්ටු ඉරුක්කින්රතු. මේලුම් අතිල්,

"පුතිය අරසියලමෛප්පු උරුවාක්කප්පටුම්වරෛ අරසියලමෛප්පින් 13ආවතු තිරුත්තම් අතිකරික්කප්පටාමලුම් කුරෛක්කප්පටාමලුම් එව්විත මාර්රමුම් ඉල්ලාත වකෛයිල් චෙයර්පටුත්තප්පටුම්."

එන්රු චොල්ලප්පට්ටු ඉරුක්කින්රතු.

"වටක්කු-කිළක්කු තමිළ් මක්කළින් පිරච්චිනෛකළුක්කුම් තීර්වු කාණප්පටුම් එන්රුම් ඉනප්පිරච්චිනෛක්කු පුතිය අරසියමෛප්පිනෛ උරුවාක්කුවතන්මූලම් අරසියල් තීර්වු කාණප්පටුම් එනවුම් තේසිය මක්කළ් සක්ති වාක්කුරුති වළංකියිරුන්තතු. ආනාල්, තර්පෝතු ඉන්ත අරසාංකම් ආට්සික්කු වන්තු 4 මාතංකළුක්කු මේලාකිවිට්ටපෝතිලුම් ඉන්නමුම් ඉනප්පිරච්චිනෛක්කාන අරසියල් තීර්වු තොටර්පිල් පේච්සුවාර්ත්තෛකළ් නටත්තප්පටවිල්ලෛ. පුතිය අරසියලමෛප්පුත් තොටර්පිලුම් එත්තකෛය කලන්තුරෛයාටල්කළුම් නටෛපෙරවිල්ලෛ. පුතිය අරසියලමෛප්පු උරුවාක්කම් තොටර්පිල් අරසාංකත්තිල් අංකම්වකික්කුම් තලෛවර්කළ් මුරණ්පට්ට වකෛයිල් කරුත්තුක්කළෛත් තෙරිවිත්තු වරුකින්රනර්.

කටන්ත ටිසම්පර් මාතම් පුතිය අරසියලමෛප්පු විවාකාරම් තොටර්පිල් කරුත්තුත් තෙරිවිත්ත නීති අමෛච්චර් හර්ෂන නාණායක්කාර, සනවරි මාතමළවිල් පුතිය අරසියමෛප්පෛ උරුවාක්කුවතර්කාන මුයර්චි මේර්කොළ්ළප්පටුම් එන්රු උරුති වළංකියිරුන්තාර්. ඉතර්කුච් චිල මාතංකළුක්කු මුන්නර් කරුත්තුත් තෙරිවිත්ත අමෛච්චරවෛයින් පේච්චාළර් නළින්ත ජයතිස්ස, ඉන්නමුම් 3 වරුටංකළින් පින්නරේ පුතිය අරසියලමෛප්පුත් තොටර්පාන යෝචනෛ මක්කළින් අපිප්පිරාය්ත්තුක්කාක මුන්වෛක්කප්පටුම් එන්රු කූරියිරුන්තාර්."

ඉව්වාරු අන්ත ආසිරියර් තලෛයංකම් තොටර්කින්රතු. තර්පෝතු ඉංකු කෞරව නළින්ත ජයතිස්ස අවර්කළ් ඉල්ලෛ. අවරුක්කු ඉතු විළංකුමෙන නිනෛක්කින්රේන්. මේලුම් අතිල්,

"නල්ලාට්චි අරසාංක කාලත්තිල් පුතිය අරසියලමෛප්පෛ උරුවාක්ක නටවටික්කෛ එටුක්කප්පට්ටිරුන්තතු. මුන්නාළ් පිරතමර් රණිල් වික්කිරමසිංහ තලෛමෛයිල් වළිනටත්තල් කුළු අමෛක්කප්පට්ටු, කලන්තුරෛයාටල්කළුම් මුන්නෙටුක්කප්පට්ටන. අරසියල් තීර්වුක්කාන ඉටෛක්කාල අරික්කෛයුම් පාරාළුමන්රත්තිල් චමර්ප්පික්කප්පට්ටු විවාතික්කප්පට්ටිරුන්තතු. ආනාලුම්, අන්ත මුයර්චි ඉටෛනටුවිල් කෛවිටප්පට්ටතු.

අන්ත කෛවිටප්පට්ට මුයර්චියෛත් තොටර්ന්තු මුන්නෙටුත්තු, අතනෛ මුළුමෛප්පටුත්තුවතන්මූලම් පුතිය අරසියලමෛප්පු උරුවාක්කප්පටුම් එන්රේ තේසිය මක්කළ් චක්ති චනාතිපතිත් තේර්තලින්පෝතු වාක්කුරුති අළිත්තිරුන්තතු. තේර්තල් විඥාපනත්තිලුම් අතනෛක් කුරිප්පිට්ටිරුන්තතු."

එනක් කුරිප්පිටප්පට්ටු ඉරුක්කින්රතු. වළිනටත්තල් කුළුවිල් නානුම් ඉරුන්තේන්; නණ්පර් අනුර කුමාර තිසානායක්කවුම් ඉරුන්තාර්. අතු රණිල් වික්කිරමසිංහ අවර්කළින් චෙයර්පාටු අල්ල. අරසාංකත්තින් චෙයර්පාටු!

"උණ්මෛයිලේයේ පුතිය අරසියලමෛප්පෛ උරුවාක්කුවතර්කු අරසාංකම් ඉතයසුත්තියුටන් ඉරුක්කින්රතෙන්රාල්, අන්ත නටවටික්කෛ උටනටියාක ආරම්පික්කප්පට වේණ්ටුම්. කාලම් තාළ්ත්තාතු අන්ත මුයර්චියෛ මුන්නෙටුක්ක වේණ්ටුම්. ඉතනෛ විටුත්තු, පොරුළාතාර අපිවිරුත්තියෛක් කණ්ට පින්නර්තාන් අරසියලමෛප්පු උරුවාක්කම් එනක් කූරුවතු ඒර්රුක්කොළ්ළත්තක්ක චෙයර්පාටල්ල. ඉන්ත විටයම් තොටර්පිල් ආළමාක අරසාංකම් චින්තික්ක වේණ්ටුම් එන්රු කോරුකින්රോම්"

එන්රුම් අතිල් කුරිප්පිටප්පට්ටු ඉරුක්කින්රතු.

අතේනේරත්තිල්, 'තමිළන්' පත්තිරිකෛ මර්රුම් වටක්කු, කිළක්කිල් වෙළිවරක්කූටිය ඒනෛය තමිළ් පත්තිරිකෛකළුම් ඉතු පර්රික් කූරියිරුක්කින්රන. එනවේ, ඉතෛක් කවනත්තිල් එටුක්ක වේණ්ටුම්. පුතිය අරසියලමෛප්පු ඔන්රු එංකළුක්කුත් තේවෛ. අතන්මූලමාකත්තාන් ඉන්ත නාට්ටිලුළ්ළ ඉනප් පිරච්චිනෛක්කුත් තීර්වුකාණ මුටියුම්. පොරුළාතාරප් පිරච්චිනෛක්කුත් තීර්වු කණ්ටපිරකුතාන් අරසියල්

பிரச்சினைக்குத் தீர்வுகாண முடியுமெனக் கூறுவது ஏற்றுக்கொள்ளக்கூடிய விடயமல்ல என்பதை நான் இங்கு கூறிவைக்க விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் இங்கு பேசும்போது, 'சாபக்கேடு' பற்றிக் குறிப்பிட்டார். அவர் சொல்வது உண்மைதான்! மலையக மக்களின் சாபக்கேடு 76 வருடகால சாபக்கேடல்ல; 200 வருடகால சாபக்கேடு என்பது உங்களுக்கு நன்றாகத் தெரியும்! முதல் 125 வருடங்கள் வெள்ளையர்கள் சாபக்கேடாக இருந்தனர். அதற்குப் பிறகு, கறுப்பு - வெள்ளையர்கள் சாபக்கேடாக இருந்துகொண்டு இருக்கின்றார்கள். மலையகத்தின் இன்றைய நிலைமை என்னவென்று எல்லோருக்கும் தெரியும்! அது பற்றி கௌரவ அமைச்சர் அவர்களும் பேசும்போது சொன்னார். அங்குள்ள முறைமையை - systemஐ - மாற்ற வேண்டும். அதைவிடுத்து, கடந்த காலங்களில் மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்திய கட்சிகளை, அமைச்சர்களை, MPsஐ, அரசியல்வாதிகளை, தொழிற்சங்கங்களைத் தொடர்ச்சியாக குறைசொல்லிக்கொண்டு இருப்பதில் பிரயோசனம் இல்லை. அது முறையுமல்ல! எல்லோரும் சேர்ந்து அங்குள்ள systemஐ மாற்றுவோம். மக்கள் ஆணைமூலம் ஆட்சிக்கு வந்திருக்கின்ற நீங்கள் அதை மாற்றுங்கள்! நாங்கள் உங்களுக்கு கைகொடுப்பதற்குத் தயாராக இருக்கின்றோம்.

நான் கடந்த திங்கட்கிழமை கேட்ட கேள்விக்கு, நேற்று முன்தினம் பிரதி அமைச்சர் அவர்கள் பதில் அளித்திருந்தார். மலையக வீடமைப்புத் தொடர்பான உங்களுடைய கொள்கை என்ன? அங்கு அமைக்கப்பட இருப்பது கோடி வீடா, மாடி வீடா? என்பதைச் சொல்லுமாறு நான் கேட்டிருந்தேன். அதற்கு அவர், "அங்கு அமைக்க இருப்பது கோடி வீடுமில்லை; மாடி வீடுமில்லை" என்று சொல்லியிருந்தார். நல்ல விஷயம்! துறைசார்ந்த அமைச்சர் கௌரவ சமந்த வித்யாரத்ன அவர்கள் தனது சமூக ஊடகத்தில், நாங்கள் மலையகத்தில் தொடர்மாடி வீடுகளைக் கட்டப்போவதாகக் குறிப்பிட்டிருந்தார். பிறகு, அந்தக் கருத்து மாற்றப்பட்டதாக நான் அறிந்தேன். அதுமட்டுமல்ல, இந்த விடயத்துக்குப் பொறுப்பான அமைச்சின் செயலாளர்கூட, மலையகத்தில் மாடி வீடுகளைக் கட்டப்போவதாக ஒரு முறை சொல்லியிருந்தார். இப்படி முரண்பாடான கருத்துகள் வந்ததனால்தான் நான் அந்தக் கேள்வியைக் கேட்டேனே ஒழிய, 'சும்மா' கேட்கவில்லை.

எனவே, அவர் ஆவேசப்படத் தேவையில்லை; ஆத்திரப்படத் தேவையில்லை; கோபப்படத் தேவையில்லை; பதற்றப்படத் தேவையில்லை. அமைதியாகப் பதில் சொல்லலாம். *[இடையீடு]* நீங்கள் சொல்வது சரி! அதற்காக அவர் பதற்றப்படத் தேவையில்லை; ஆவேசப்படத் தேவையில்லை. அரச தரப்பிலிருந்து முரண்பாடான கருத்துகள் வந்ததனால்தான் நான் இந்தக் கேள்வியைக் கேட்டேன். அங்கு மாடிவீடு அமைப்பது பற்றி துறைசார்ந்த அமைச்சரும் சொல்லியிருக்கிறார்; அமைச்சின் செயலாளரும் சொல்லியிருக்கிறார். அந்தப் பிரதி அமைச்சர்மீது எனக்கு மரியாதை இருக்கிறது. நம்மவர் ஒருவர் அரச தரப்பில் இருப்பது சந்தோஷமாக இருக்கிறது. ஆனாலும், அதற்கான பதிலை கௌரவ அமைச்சர் அவர்கள் சொல்ல வேண்டுமென நான் எதிர்பார்க்கின்றேன். இந்த வரவு செலவுத்திட்ட விவாதக் காலப்பகுதி முடிவடைவதற்குள் அமைச்சர் பதில் சொல்வார் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. அதற்கான தேவைப்பாடும் இருக்கின்றது.

அதுமட்டுமல்ல, வீடு கட்டுவதற்கு எத்தனை பேர்ச்சஸ் காணி வழங்கப்படும்? அது ஏழு பேர்ச்சஸா, பத்து பேர்ச்சஸா? என்பதைச் சொல்ல வேண்டும். அது இன்னும் எங்களுக்குத் தெளிவாகச் சொல்லப்படவில்லை. ஏனெனில், நாங்கள் இந்தப் பயணத்தை ஆரம்பித்து விட்டோம்; புதிதாக ஆரம்பிக்க வேண்டிய தேவையில்லை. நாங்கள் போராடித்தான் அதனைப் பெற்றோம். இது உங்களுக்கும் தெரியும்! மலையக மக்களைப் பொறுத்தவரையில், அவர்களுக்கு வீடு கட்டுவதற்காக இருக்கலாம் அல்லது வாழ்வாதாரத்துக்காக இருக்கலாம். அங்கு ஒரு பேர்ச்சஸ் காணியைப் பெறுவதே பெரும் போராட்டம்! அது எனக்குத் தெரியும். நான் அனுபவ ரீதியாகத்தான் சொல்கின்றேன். 'மலையக மக்களுக்கு ஏழு பேர்ச்சஸ் காணி' என்பதை நாங்கள் 'நல்லாட்சி' அரசாங்க காலத்தில் அமைச்சரவைப் பத்திரம் சமர்ப்பித்து உறுதிப்படுத்தி இருக்கிறோம். கடந்த அரசாங்க காலத்தில் அது 10 பேர்ச்சஸ் வரை சென்று, கொள்கை ரீதியாக உறுதிப்படுத்தப்பட்டு இருக்கின்றது. எனவே, இது தொடர்பில் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Two minutes? I had 15 minutes. හරි, හරි. I can borrow some minutes from the Hon. Bimal Rathnayake. හැහැ, කමක් නැහැ. මම අවසන් කරන්නම්.

அடுத்து, அரசியலமைப்பு சம்பந்தமாகச் சொல்ல வேண்டும். *[இடையீடு]* நான் பேச வேண்டும். எனக்கு time இல்லை. மாகாண சபை, பதின்மூன்றாவது திருத்தம் என்பன ஒன்றுடன் ஒன்று சம்பந்தப்பட்ட விடயங்களாக இருக்கின்றதல்லவா? அவை பற்றி முரண்பட்ட கருத்துகளும் இருக்கின்றதல்லவா? அரசியலமைப்பு பற்றி உங்களுடைய கட்சியின் பொதுச் செயலாளர் ரில்வின் சில்வா அவர்கள் ஒரு கருத்தைச் சொன்னார். அமைச்சர் ஒருவர் இன்னொரு கருத்தைச் சொன்னார். அதனால்தான் கேள்வி எழுகின்றது. அவ்வாறு சொல்லாவிட்டால், ஏன் நாங்கள் கேள்வி கேட்க வேண்டும். அரசியலமைப்பாக இருக்கலாம், மாகாண சபையாக இருக்கலாம், மாகாண சபை தேர்தலாக இருக்கலாம், பதின்மூன்றாவது திருத்தமாக இருக்கலாம், மலையக மக்களுக்கான ஏழு பேர்ச்சஸ் காணியாக இருக்கலாம் அல்லது 10 பேர்ச்சஸ் காணியாக இருக்கலாம், மாடி வீடாக இருக்கலாம் அல்லது கோடி வீடாக இருக்கலாம்!

ஏன் நாங்கள் இவை பற்றிக் கேள்வி கேட்கிறோம் என்றால், அரசாங்கத்துக்குள் இருந்து முரண்பாடான கருத்துகள் வருவதனாலாகும். வேறு காரணம் கிடையாது. அதற்காக நீங்கள் கோபப்படத் தேவையில்லை; ஆத்திரப்படத் தேவையில்லை. நாங்கள் எதிர்க்கட்சி; நீங்கள் ஆளும் கட்சி! ஆளும் கட்சியில் இருக்கின்ற நீங்கள்தானே முடிவு எடுக்க வேண்டும். ஆகவே, பதிலைச் சொல்லுங்கள்! இந்த வரவு செலவுத்திட்ட விவாதம் முடிவடைவதற்குள் மலையக மக்களுக்கு ஏழு பேர்ச்சஸ் காணியா, பத்து பேர்ச்சஸ் காணியா? அவர்களுக்குத் தனிவீடா, இல்லையா? என்பதைத் தெளிவாகச் சொல்ல வேண்டுமென நான் கோரிக்கை விடுக்கின்றேன். காரணம் என்னவென்றால், நாங்கள் மலையகத்தில் இதற்கான பயணத்தை ஆரம்பித்துவிட்டோம்.

நாங்கள் போராடித்தான் இந்தப் பயணத்தை ஆரம்பித்தோம். எங்களுக்கு எதுவும் 'சும்மா' கிடைக்கவில்லை.

[ගරු මනෝ ගනේසන් මහතා]

රණිල් වික්‌කිරමසිංහවගේ අරසාඟකත්තිල් නානුම් නණ්බර්කළාන තිකාම්පරමුම් ඉරාතාකිරුෂ්ණනුම් පෝරාටිත්තාන් ඔව්වොන්රෙයුම් පෙට්‌රෝම්. 'සුම්මා' යාරුම් කොටුක්කවිල්ලෙ; අප්පටික් කොටුක්කවුම් මාට්ටාර්කළ්. අන්රු නාංකළ් ආළුම් කට්චියිල් ඉරුන්තාලුම්, එතිර්ක්කට්චියිනර් පෝන්රුතාන් ඉරුන්තෝම්. එනවේ, ඉන්තප් පයණත්තෙ මුන්කොණ්ටු සෙල්ලුංකළ්! යාරුම් පුතිතාක ආරම්පික්කත් තේවෙයිල්ලෙ. ඉන්තප් පයණත්තෙත් තොටර්න්තාලේ පෝතුම්. තයවුසෙය්තු, ඉතෙත් තොටර්න්තු සෙය්යුංකළ්! අරසියලමෛප්පු විටයමුම් අප්පටිත්තාන්. වටක්කු, කිළක්කිලුළ්ළ මක්කළ්, ඊළත් තමිළ් සකෝතරර්කළ් උංකළෙ නම්පි වාක්කළිත්තු ඉරුක්කිරාර්කළ්. අතු නල්ල විටයම්තානේ! ආකවේ, නීංකළ් අවර්කළින් නම්පික්කෙයෛක් කාප්පාත්රුංකළ්! කුරිප්පාක, අරසියලමෛප්පිල් ඉරුක්කින්ර මාකාණ සපෛකළුක්කුරිය තේර්තලෛ නටාත්ති, අතිකාරප් පකිර්වෛච් සෙය්යුංකළ්! අතු ආරම්පප් පුළ්ළියාක ඉරුක්කට්ටුම් එනක් කූරික්කොණ්ටු, ඉවෛ මාණ්පුමිකු සනාතිපතියින් කවනත්තුක්කුච් සෙල්ලුම් එන්ර එතිර්පාර්ප්පුටන් විටෛපෙරුකින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාඞුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ වීය.

අතන්පිරකු, මාණ්පුමිකු (කලානිති) (සෙල්වි) කෞෂල්‍යා ආරියරත්න අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු සඤ්ජීව රණසිංහ අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[අ.භා. 3.16]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජයවේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය පිළිබඳව වැදගත් කරුණු-කාරණා ගණනාවක් කථා කරන්න තමයි මම බලාපොරොත්තු වෙන්නේ. මූලික වශයෙන් ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය ගත්තොත් එදා ජනාධිපතිවරු පාවිච්චි කරපු වාහන, ආරක්ෂාව, මන්දිර වර්තමාන ජනාධිපතිතුමා භාවිත නොකිරීම ගැන අපි සන්තෝෂ වන අතරේ, අපි එතුමාට ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මොකද, එවැනි අලුත් culture එකක් ජනාධිපතිවරයෙක් හදන එක ගැන අපට ලොකු සන්තෝෂයක් තිබෙනවා. ඒ ගැන එතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා අපිත් එක්ක විපක්ෂයේ අවුරුදු ගණනාවක් සිටිමින් මේ ගැන කථා කළා.

ඒ වාගේම පසුගිය සතියේ එතුමා දළදා ප්‍රදර්ශනයක් පවත්වන්න කියලා මහානායක මාහිම්පාණන් වහන්සේලාගෙන් ඉල්ලීමක් කළා. දළදා මාළිගාවට පහර දුන්නේ 1989 පෙබරවාරි මාසයේ 08වැනි දා. එතුමන්ලා දළදා මාළිගාවට පහර දුන් අය; පොලිස් මුර පොළවල්වලට පහර දුන් අය. එතුමන්ලා මේ අවුරුද්දේ මාර්තු මාසය වනකොට අපේ ගෞරවනීය නායක මාහිම්පාණන් වහන්සේලාට ආරාධනා කරනවා, දළදා ප්‍රදර්ශනයක් පවත්වන්න කියලා. 1989 පෙබරවාරි මාසයේ 08වැනි දා තමයි දළදා මාළිගාවේ මුර පොළවල් පහට පහර දුන්නේ. එහෙම පහර දුන් අයම ගිහිල්ලා නායක මාහිම්පාණන් වහන්සේලාට ආරාධනා කරනවා, දළදා වහන්සේ ප්‍රදර්ශනය කරන්න කියලා. අපේ මුදුන් මල්කඩට පහර දුන් අයටම දෛවයේ සරදමක් වාගේ සිද්ධ වෙනවා, ඒ අයගේ ආණ්ඩුවක් යටතේ දළදා මාළිගාවේ වැඩ සිටින දළදා වහන්සේ ප්‍රදර්ශනය කරන්නට. ඒ පහර දීමේදී ටී - 81 රයිෆල් තුවක්කු 9ක්, ටී - 56 ගිනි අවි 2ක් ඇතුළු ගිනි අවි 17ක් පැහැර ගත්තා. කණ්ඩායම් 5කට අයිති 43දෙනෙක් ඊට සහභාගි වුණා. තරුණියන් 12දෙනෙක් එක්ක ඇවිල්ලා තමයි පහර දුන්නේ.

මේ කාරණය මම කිව්වේ වෙන දෙයක් හින්දා නම් නොවෙයි. විශේෂයෙන්ම මම අද කියන්න කැමැතියි, ජාතික ආරක්ෂාව පිළිබඳව මේ රටේ දැන් කථා වෙමින් තිබෙන බව. සමහර අය ජාතික ආරක්ෂාව ගැන Google කරලා, විකිපීඩියා එකෙන් සොයා බලා මේ ගරු සභාවට ඇවිල්ලා කියනවා මම දැක්කා. ජාතික ආරක්ෂාව කියන එකේ මූලික කාරණය ගන්න තිබෙන්නේ මේ අමාත්‍යාංශ විෂය බෙදීම පිළිබඳ ගැසට් එකෙන්. එහි තිබෙනවා, ජාතික ආරක්ෂාව පිළිබඳව. එය කියවලා බැලුවොත් ලේසියි, Googleවලට යනවාට වැඩිය. ඒ ගැසට් එකේ බොහොම පැහැදිලිව තිබෙනවා, "ජාතික ආරක්ෂාව තහවුරු කිරීම, අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යෑම ආරක්ෂක අමාත්‍යාංශයේ මූලික කාර්යභාරයක්" කියලා. ඒක තමයි මේ කඩා වැටිලා තිබෙන්නේ. ඒ කියන්නේ මහජන ආරක්ෂාව.

අපි කල්පනා කරලා බැලුවා, මේ මහජන ආරක්ෂාව කඩා වැටුණේ කොහොමද කියලා. මම එදා නැඟිටලා මේ කාරණය ගැන අහන්න හැදුවාම බිමල් රත්නායක ඇමතිතුමා දිගින් දිගටම මට බාධා කළා. ඊට පස්සේ අපේ වෛද්‍ය නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් කථා කරලා කිව්වා, ඔළුවේ අමාරුවක් කියලා. අපට ඔළුවේ අමාරු නැහැ. ඔළුවේ අමාරු තිබෙන අයට තමයි ගිහිල්ලා ඒවා හොඳ කර ගන්න වෙන්නේ. මොකද, එදා මම මේ කාරණය මතු කරන්න හැදුවේ මේකයි. උසාවියේ අංක 9 අධිකරණ ශාලාවට උදේ පාන්දර බුස්සේ ඉඳලා පුද්ගලයෙක් අරගෙන ආවා. අංක 9 අධිකරණ ශාලාව කියන්නේ fully packed උසාවියක්. එතැන Weapon එකක් උස්සන්න, ඇද ගන්න බැහැ. එහෙම තිබියදී, ඒ උසාවියේ මහෙස්ත්‍රාත්වරයා හෝ මහෙස්ත්‍රාත්වරිය එදා ඉවත් වෙලා නැත්නම් එදා එන්නේ නැතුව ඉඳලා අංක 5 අධිකරණ ශාලාවට ඒ පුද්ගලයා ගේන්න කටයුතු කරලා තිබෙනවා. අංක 5 අධිකරණ ශාලාවේ ගන්නේ විශේෂයෙන් පාරිභෝගික ආරක්ෂණය - consumer affairs - සම්බන්ධ නඩු. එහි පොඩි පිරිසක් ඉන්නේ. ඕනෑ තරම් ඉඩ තිබෙනවා, weapon එකක් ඇදලා අරගෙන වෙඩි තියන්න. ඒ පුද්ගලයා ඒකට ගෙනාවේ කොහොමද? ඇයි, එදා හිටපු මහෙස්ත්‍රාත්තුමා හෝ මහෙස්ත්‍රාත්තුමිය එතැනින් ඉවත් වුණේ? ඒකට හේතුව මොකක්ද? අංක 5 අධිකරණ ශාලාවට ගෙනාපුවාම මහෙස්ත්‍රාත්තුමිය "ඇයි මෙයා ගෙනාවේ" කියලා අහන්නේ කොහොමද? මේ සියල්ල මට කියන්න වුවමනා වුණේ වෙන හේතුවක් නිසා නොවෙයි. එක පැත්තකින් මහෙස්ත්‍රාත්තුමිය හෝ මහෙස්ත්‍රාත්තුමා මේකට සම්බන්ධයි කියලා මම පිළිගන්නේ නැහැ. නමුත් මේකට අධිකරණ ක්ෂේත්‍රයේත් යම් සම්බන්ධයක් කොතැනින් හරි තිබිලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් බන්ධනාගාරය, අනෙක් පැත්තෙන් පොලීසිය. මේ ඔක්කෝම එකතු වෙලා තමයි වැඩේ කරන්නේ. මෙච්චර කාලයක් සාමාන්‍යයෙන් පොලීසිය, බුද්ධි අංශය ගිහිල්ලා

පාතාලය අස්සට රිංගන එක. නමුත් දැන් වෙලා තිබෙන්නේ පාතාලය පොලීසිය අස්සට රිංගලා. ඒකයි මේ තිබෙන ප්‍රශ්නය. අද ආරක්ෂක කලාපවල ඇති වෙලා තිබෙන තත්ත්වය ඒකයි. මේ ගැන කථා කරන්න ගත්තාම තමයි අපට කථා කරන්න දුන්නේ නැත්තේ. මේවා විහිළු කථා නොවෙයි. අපි මේ රටේ ප්‍රශ්නයක් ගැන කථා කරන්නේ. අපට ඇත්තටම වේදනාවක් ආවා. මොකද, මහෙස්ත්‍රාත්තුමිය හිටියේ එතුමියගේ මෙසය අස්සේ. මොකද එතැන වෙඩි තැබීමක් සිදු වුණේ? ඒ අය සාක්ෂි දෙනවා. ආරක්ෂකයෝ, පොලීසියේ අය හෙව්වාම මහෙස්ත්‍රාත්තුමිය, විනිශ්චය ලබා දෙන මහෙස්ත්‍රාත්තුමියක් මේසය අස්සට රිංගනවා ජීවිතය බේරා ගන්න. මේකයි ඇති වෙලා තිබෙන තත්ත්වය. මේ ගැනයි අපි කථා කෙරුවේ.

ජාතික ආරක්ෂාව තිබෙනවා කිව්වාට හරි යන්නේ නැහැ. මහජන ආරක්ෂාවයි, ජාතික ආරක්ෂාවයි කියලා දෙකක් නැහැ, ඔක්කෝම එකයි. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය ආරක්ෂාවේ අන්තිම තැනකට පත් වෙනවා නම්, ඒක අනිවාර්යයෙන් ජාතික ආරක්ෂාවේ කාරණයක් බවට පත් වෙනවා. නමුත් මෙතැන ඇවිල්ලා කියනවා, ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් නැහැ ලු.

ඊළඟට මම තව කාරණයක් කියන්න කැමැතියි. මේ කාරණය ඉතා වැදගත් කාරණයක්. ජාතික ආරක්ෂාව කඩා වැටිලා තිබෙන හේතුව මම කියන්නම්. තමුන්නාන්සේලා අපි කවුරුත් දන්නවා මේ රටේ අවුරුදු 30ක යුද්ධයක් තිබුණා කියලා. ඒ යුද්ධයේදී එල්ටීටීඊ එක අවි ආයුධ පාවිච්චි කළා. ඊළඟට ඒ අයත් එක්ක අතුරු හමුදා ගණනාවක් හිටියා. ඒවා EROS, PLOTE, TELO, EPRLF යන නම්වලින් තිබුණා. ඒවා අතර අවි ආයුධ ගැවසුණා. ඒවා අතර ගැවසුණු අවි ආයුධ මේ වනතුරු භාර දීලා තිබෙනවාද? එල්ටීටීඊ එක භාවිත කරපු අවි ආයුධ භාර දීලා තිබෙනවාද? මේ මන්ත්‍රීතුමන්ලා අවි ආයුධ පාවිච්චි කරනවා කියලා මම කියන්නේ නැහැ. මම කියන්නේ ඒක නොවෙයි. ඒ අය භාර දුන්නු අවි ආයුධ පිළිබඳව ආණ්ඩුවට යම් කිසි ලේඛනයක් තිබෙනවාද මෙච්චර භාර දුන්නා කියලා?

අනෙක් කාරණය තමයි, ජනතා විමුක්ති පෙරමුණ තුළත් අවි ආයුධ විශාල සංඛ්‍යාවක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධර්මන් චික්‍රමරත්න මහත්තයා විසින් රචනා කර තිබෙනවා "ජවිපෙ 2වැනි කැරැල්ල" නමින් ග්‍රන්ථයක්. 1987, 1989 නිමාවෙන් පසුව, 1990 මාර්තු වෙනකොට ආරක්ෂක අංශවලින් සහ ජනතාවගෙන් පැහැර ගන්නා ලද ජනතා විමුක්ති පෙරමුණේ ගිනි අවි ගත්තොත්, ටී 56 ගිනි අවි 172ක්, එස්එම්ජී අවි 02ක්, රිපීටර් තුවක්කු 162ක්, පතරොම් තුවක්කු 250ක්, ගල්කටස් 1,257ක්, පිස්තෝල 63ක්, රිවෝල්වර් 54ක් සොයා ගත් බව ප්‍රකාශ වෙලා තිබෙනවා.

ආරක්ෂක අමාත්‍යාංශයේ තොරතුරු අනුව කැරලිකරුවන් විසින් පැහැර ගත්ත, 1990 අවසානය වන විට හොයා ගන්න නොහැකි වූ අවි ප්‍රමාණය ටී 56 ගිනි අවි 78ක්, එස්එල්ආර් අවි 60ක්, ආයුධ 84ක්, අවි 36ක්, එස්එම්ජී අවි 3ක්, එස්ඒආර් 4ක්, පිස්තෝල 2ක්, රිවෝල්වර් 31ක්, 22 රයිපල් 11ක්, රයිපල් 360ක්, රිපීටර් 305ක්, ෂොට්ගන් 223ක්. සමස්තයක් වශයෙන් ගත්තාම ජනතා විමුක්ති පෙරමුණ භාර නොදුන් අවි 2,136ක් තිබෙනවා. ඊට අමතරව කියන්න කැමතියි,-

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඔබතුමා කරුණාකර ඉඳගන්නකෝ. ඔබතුමා මේක අදාළ කර ගන්න එපා. ඊළඟට වැදගත් කාරණය තමයි, මේකත් එක්ක ජනතා විමුක්ති පෙරමුණේ අය ඝාතනය කිරීම, ඔවුන් මර්දනය කිරීම සඳහා ආණ්ඩුව පාවිච්චි කළා විවිධ අය. ඒවාට "ප්‍රා" කියයි, කළු බළල්ලු කියයි, කහ බළල්ලු කියයි, ගෝනුස්සා කියයි. මේ විධියේ විවිධ අය. අපට මතකයි අපි විශ්වවිද්‍යාලයේ ඉන්න කාලයේ ඇවිල්ලා ඝාතනය කරන්න මිනිස්සු හොයපු අවස්ථා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අය ළඟ තිබුණු අවි භාර දුන්නාද, නැද්ද කියලා අපි දැන ගන්න කැමැතියි. මොකද, ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක්නේ දැන් තිබෙන්නේ. ඉතින් ඒ අයට පුළුවන් ඒ අයගේ අවි ආයුධ ටික දැන් භාර දෙන්න, එහෙම තියෙනවා නම්.

එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක් තිබෙන නිසා ඒ අයට පුළුවන් දැන් හොයලා බලන්න මේ කියන කට්ටිය -ප්‍රා, කළු බළල්ලු කහ බළල්ලු- ළඟ තිබ්බිව්ව බඩු ගෙනැල්ලා දීලා තිබෙනවාද කියලා. නැත්නම් ඒ අවි ආයුධද දැන් මේ පාවිච්චි කරමින් ඉන්නේ? කාගේද ඒ අවි ආයුධ? ඒ අවි ආයුධ අරගෙනද මිනිස්සු මරන්නේ? පාතාලයෙන් මරා ගන්න ඒවා ගැන අපට හොයා බලන්න විධියක් නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, පාතාලය හරහා මැරෙන්නේ අහිංසක මිනිස්සු. අහිංසක දරුවෝ දෙදෙනෙක් මැරුණා, තාත්තා කරපු වැරදිවලට. ඒක වෙනම කාරණයක්. හැබැයි අහිංසක කුඩා දරුවෝ දෙන්නෙක් වෙඩි තියලා මැරුවා. අන්තිමට ශ්‍රී ලංකාව පාතාලයේ අයගේ රටක් බවට දැන් පත්වෙලා තිබෙනවා. ඒ ගැනයි අපි කථා කරන්නේ. දැන් තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක්. ඔබතුමන්ලාගේ අවි ආයුධ 2,136ක් භාර දීලා නැහැ. කරුණාකරලා ඒ අවි ආයුධ 2,136 කොහේද තිබෙන්නේ කියලා අපට කියන්න. ඒ වාගේම කවුරු හරි අතේ තිබෙනවා නම්, කරුණාකරලා ඒවා භාර දෙන්න. දෙවනුව, අර කිව්වා වාගේ කහ බළල්ලුද, කළු බළල්ලුද මම දන්නේ නැහැ, ඒ අයගේ ඒවා ටිකත් හොයන්න. මේවා ගැන අපි හොයා බලන්න ඕනෑ. මොකද හේතුව, මේක වැදගත් අවස්ථාවක්. මොකද, ඒවාට වග කියන්න ඕනෑ අය තමයි දැන් බලය දරන්නේ.

ඊළඟට අනෙක් විශේෂ කාරණය මේකයි. දැන් මේ පාර්ලිමේන්තුවේ කෑම ගැන කථා කරනවා. මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගැහුවා. ඇත්තටම මේ පාර්ලිමේන්තුවේ සේවකයන් ඉස්සර කෑම එකක් අරගෙන තමයි සේවයට ආවේ. ඇයි, පාර්ලිමේන්තු සේවකයන්ට කෑම ගෙනෙන්න එපා කිව්වේ? මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගැහුවා. පහළට ගිහිල්ලා බලන්න තමුන්නාන්සේලා. අංක එක දරන Committee Room එකේ බෝම්බ ගහපු ස්ථානය තිබෙනවා.

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා.

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ தலைமைதாங்கும் ஊறுப்பினர் அவர்களே, கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்கள் -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Point එක මොකක්ද කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்கள், தமிழீழ விடுதலை இயக்கம் - TELO - ஆயுதங்களை முழுமையாக ஒப்படைக்கவில்லை எனச் சொன்னார். எங்களிடம் ஆயுதம் இல்லை. அந்த இயக்கம் பயங்கரவாதத்துக்கு எந்தச் சந்தர்ப்பத்திலும் துணைபோகவில்லை. அதுமாத்திரமின்றி, பாதாள உலகக் கோஷ்டிகளுடனும் எந்தத் தொடர்பும் இல்லை. தயவுசெய்து, அந்த வசனத்தை -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලියි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමාට හානියක් වුණා නම්, ඒකට මම සමාව ඉල්ලා සිටිනවා. ඒ ගැන ගැටලුවක් නැහැ.

මම කිව්වේ, කෑම එකේ තමයි අජිත් කුමාර බෝම්බ අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. දවස ගණනේ අරගෙන ඇවිල්ලා එකතු කරලා බෝම්බය ගැහුවා. ගැහුවාම, කීර්ති අබේවික්‍රම මහත්මයා මැරුණා. මගේ ළඟ තිබෙනවා, ඒ පිළිබඳ වන නිහාල් සෙනෙවිරත්න මැතිතුමාගේ වාර්තාවක්. එතුමා මොකක්ද කියන්නේ? "It later transpired that a few weeks after getting clearance from Police screening and having joined the staff of Parliament, the JVP had secretly recruited him."

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
JVP!

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Yes.

"Since the JVP was then very vociferously against the Indo-Sri Lanka Pact signed by the President, they had found in Ajith Kumara working in Parliament the best possible person to assassinate the President,..."

ජනාධිපති මරන්න පුළුවන් හොඳම කෙනා කවුද කියලා බලනකොට අජිත් කුමාර තමයි හොයා ගත්තේ, ජේවීපී එකෙන්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ජේවීපී එකෙන්!

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්.

ගෙනැල්ලා ගැහුවා බෝම්බය. එදායින් පස්සේ තමයි මේ පාර්ලිමේන්තුවට කෑම ගෙනෙන්න දෙන්නේ නැත්තේ. ඒ නිසා අපි තින්දුවක් ගනිමු. ඔක්කෝටම කෑම ගෙනෙන්න ඉඩ දෙන්න. අපිත් බත් එකක් බැඳගෙන එන්නම්. ඔය රුපියල් 1,200, රුපියල් 2,000, රුපියල් 3,000 කරන්න එපා. අපි ඔක්කෝම කෑම ගෙනැල්ලා කාලා පාඩුවේ ගෙදර යමු. ඉතින් මේක අඩු කළාය, මේක වැඩි කළාය කියලා මහා ලොකු කයියක් ගහනවා, අච්චරයි මෙච්චරයි කියලා. ඇත්තටම අපට කෑම ඕනෑ නැහැ. කරුණාකරලා කෑම වේලක් ඔතාගෙන එන්න දෙන්න.

අනෙක් කාරණය, අනුර දිසානායක මහත්මයා තමයි වැඩියෙන්ම පාර්ලිමේන්තුවේ සේවකයන් ගැන කථා කළේ. අපට මතකයි නේ. අද පාර්ලිමේන්තු සේවකයන්ගේ තත්ත්වය මොකක්ද? දැන් මේ පාර්ලිමේන්තුව මාසයක් තිස්සේ රැස් වෙනවා. ඒ අයගේ නිවාඩු දීමනාව දෙන්නේ, වැඩ වශයෙන් සේවයට වාර්තා කිරීම අවශ්‍ය නිසා. ඒ මිනිස්සු මෙතැන එහාට දුවනවා, මෙහාට දුවනවා; විශාල කැපවීමක් කරනවා. ඒ අයගේ නිවාඩු දීමනාව දෙන්න කියලා කැබිනට් පත්‍රිකාවක් දැම්මා. ඒ කැබිනට් පත්‍රිකාව ප්‍රතික්ෂේප කළා, දෙවතාවක්. මම ඉල්ලා සිටිනවා අද ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය නිසා, කරුණාකරලා මේ අයගේ නිවාඩු දීමනාව දෙන්න කියලා.

ඊළඟට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ කවදාවත් Secretary General කෙනෙක් CID එකට අරගෙන ගියේ නැහැ. හොර උපාධි පට්ටම් තිබෙන අය, හොර ආචාර්ය පට්ටම් තිබෙන අය, හොර ඉංජිනේරුවෝ මෙතැන ඇවිල්ලා කථා කරනවා. අද තවම හොයා ගන්න බැහැ, හිටපු කථානායකගේ ආචාර්ය උපාධිය; හොර උපාධිය. ඒකට ජපානයට ගියා. ජපානයේත් හොයා ගන්න නැහැ. දැන් ජපානයේ පාරවල් දිගේ හොයනවා, ආචාර්ය උපාධිය; තවම හොයා ගන්න බැහැ. හැබැයි මොකද වුණේ? පාර්ලිමේන්තුවේ නිලධාරීන් අරගෙන යනවා, CID එකෙන් ප්‍රශ්න කරනවා, කොහොමද එහෙම වුණේ කියලා. අන්තිමට බලනකොට සභානායක කාර්යාලයෙන් තමයි යවලා තිබෙන්නේ, "ආචාර්ය" කියලා සඳහන් කරලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඉතින් කවුද වග කියන්න ඕනෑ, අවසානයේදී? මේවා ඉතාම වැරදි සහගත කාරණා විධියටයි අපි දකින්නේ.

අනෙක් කාරණය තමයි, නඩු පිළිබඳව තිබෙන ප්‍රමාදය. තමුන්නාන්සේලා දන්නවා, යසන්ත කෝදාගොඩ මැතිතුමා

පිළිගන්න පවත්වපු උත්සවය ගැන. ජනතාවගෙන් මිලියනයකට සිටින විනිසුරුවන් සංඛ්‍යාව ගනිමු. ඇමෙරිකාවේ ජනතාවගෙන් මිලියනයකට විනිසුරුවන් 107ක් ඉන්නවා; කැනඩාවේ 75ක් ඉන්නවා; එංගලන්තයේ 51ක් ඉන්නවා; ඉන්දියාවේ 20ක් ඉන්නවා. ඉන්දියාවේ මෙය සියයට 50 කරන්න කියලා පනත් කෙටුම්පතක් ගේන්න දැන් වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. 2015දී අපේ ආණ්ඩුව ලංකාවේ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව විශාල ප්‍රමාණයකින් වැඩි කළා. ඒ වාගේම, අපි නීතිපති දෙපාර්තමේන්තුවේත් නිලධාරීන් විශාල ප්‍රමාණයක් වැඩි කළා. ඔවුන්ගේ පඩිය තුන්ගුණයකින් වැඩි කළා. ඒ නිසා අපි කියන්න කැමැතියි, මේ සියල්ල හඳන වැඩ පිළිවෙළ අලුතින් සකස් කරන්න කියලා. මොකද, 1978 ජනගහනය මිලියන 14.5ක් තිබියදී හිටපු විනිසුරු සංඛ්‍යාවම තමයි අද -2025- වන කොටත් ඉන්නේ.

අපි දන්නවා, ශ්‍රේෂ්ඨාධිකරණයට Fundamental rights cases විශාල සංඛ්‍යාවක් එනවා කියලා. නඩු 500ක් විතර අවුරුද්දකට එනවා. සාමාන්‍යයෙන් ඒවා මාස තුනෙන් අහලා ඉවර කරන්න ඕනෑ. අද සමහර Fundamental rights cases සාමාන්‍යයෙන් අවුරුද්දක්, දෙකක්, තුනක් යනවා. තව සමහර ඒවා වෙලාවට විභාගයට ගන්නේ නැහැ. අරගෙන dates දෙනවා, ලබන නොවැම්බර් මාසයට ආදි වශයෙන්. මේ පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126වැනි ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙනවා. හැබැයි අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඒක ක්‍රියාත්මක කරන්න විධියක් නැහැ. මොකද, මේවාට role එකක් වෙනම නැහැ. මේ ඔක්කෝම ගේන්නේ එකම තැනකට. අභියාචනාධිකරණයෙන් එන එකත් ගේන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට. පළාත්බද මහාධිකරණයෙන් ගෙනෙන ඒවාත් ඔක්කෝම ශ්‍රේෂ්ඨාධිකරණයට. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණයට වැඩ වැඩියි. එහි විශාල වැඩ ප්‍රමාණයක් හිර වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ වෙනුවෙන් වහාම විකල්පයක් ගේන්න කියලා මම විශේෂයෙන් ඉල්ලා සිටින්න කැමැතියි.

ඒ වාගේම, මෙතැන අපේ විෂය භාර ඇමතිතුමාත් ඉන්න නිසා විශේෂයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. දැන් බලන්න, අද මේ කරගෙන තිබෙන පටලැවිල්ල. දැන් පොලිස්පතියි, පොලිස් කොමිසමයි ගහ ගන්නවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(උ) ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව සඳහන්ව තිබෙනවා, පොලිස් කොමිසම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සියලු බලතල පිළිබඳව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පොලිස් කොමිසමට බලතල දීලා තිබියදී මොකක්ද කළේ? ඒවායෙන් යම් ප්‍රමාණයක් පවරා දුන්නා. පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ සිට ඉහළ නිලධාරීන් සම්බන්ධයෙන් වැඩ කරන්න පොලිස් කොමිසම භාර ගන්නවා කිව්වා, ඉතුරු ටික අනෙක් පැත්තෙන් ගන්නම් කිව්වා. දැන් මොකක්ද කළේ? මේ ආණ්ඩුව ආපු ගමන් හෝ ගාලා, දඩ බඩ ගාලා SSPලා 14දෙනෙක් මාරු කළා. දැන් මොකද වුණේ? ඊට පස්සේ ඒ ගැන විස්තර ඉල්ලන කොට බුද්ධි අංශ තොරතුරු ගැන කිව්වා. බුද්ධි අංශ තොරතුරු නොවෙයි, ඒ ගොල්ලෝ බොහොම පැහැදිලිව මේ විස්තර දිගටම ඉල්ලුවා. මොකද, ඒ ගොල්ලන්ට උසාවි යන්න වෙන නිසා. 2022දී ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නඩු දැම්මා, මූලස්ථාන පොලිස් පරීක්ෂකවරු. මොකද වුණේ? සමස්ත ක්ෂේත්‍රයම කඩාගෙන වැටුණා, කටයුතු කර ගන්න හම්බ වුණේ නැහැ. මේ පාරත් ඒක තමයි වෙන්නේ. දැන් මොකක්ද, පොලිස්පති කියන්නේ? "මට වැඩ කරන්න දෙන්නේ නැහැ" කියනවා. පොලිස්පතිට ඒ කියන බලයක් නැහැ. මතක නියාගන්න, එතුමාත් lawyer කෙනෙක් කියලා. එතුමා අපේ junior batch එකේ හිටපු සහෝදරයෙක්. දැන් මොකද වෙලා තිබෙන්නේ? ඔහු දැන ගන්න ඕනෑ, තමන්ගේ බලය මොකක්ද කියලා. දැන් ඔහු පොලිස් කොමිසමත් එක්ක රණ්ඩු වෙනවා. පොලිස් කොමිසමයි, පොලිස්පතියි රණ්ඩු වෙනවා. ඒ රණ්ඩුව දැන් ගිහිල්ලා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට -CC එකට - දැන් එතැනින් තෝරා ගන්න වෙලා තිබෙනවා මොකක්ද මේකට කරන්නේ කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව සඳහන්ව තිබෙනවා, පොලිස් කොමිසමට තිබෙන බලතල මොනවාද කියලා. ඊට අමතරව ගැසට් එකක් ගහලා තිබෙනවා. එහි අංකය තමයි 2341/51. එහි බොහොම පැහැදිලිව සඳහන්ව තිබෙනවා, පවරා තිබෙන බලතල මොනවාද කියලා. ඒ නිසා කරුණාකර මේ වැඩේ කරන්න හදන්න එපා. තමුන්නාන්සේලාට ප්‍රශ්නයක් තිබෙනවා, මේ රටේ පොලිස් ස්ථානාධිපතිවරුන් ගැන. තමුන්නාන්සේලා ඒ අයගෙන් පනස්දෙදෙනෙකු මාරු කරලා තිබෙනවා, සාමාන්‍ය පොලිසිවල රාජකාරිවලට. ඒ අය පොලිස් ස්ථානාධිපතිවරු. ඒ ගොල්ලන්ට test එකක් තිබ්බා. ඒකෙන් ලකුණු අරගෙන තමයි වැඩ කටයුතු කරගෙන ගියේ. ඒ නිසා කරුණාකර මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ටික කරන්න කියා ඉල්ලා සිටිමින්, මට වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய குழுநிலை விவாதத்திலே முக்கியமான சில விடயங்களைக் கூறலாமென்று நினைக்கின்றேன்.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මතු කරපු කාරණයක් පිළිබඳව පැහැදිලි කරන්න අවශ්‍යයි. පසුගිය දිනවල සිදු වූ කිසිදු පොලිස් නිලධාරි ස්ථාන මාරුවීමක් පොලිස් කොමිසමේ අවසරයකින් තොරව සිදු වෙලා නැහැ. පොලිස් කොමිසමට තිබෙන පොලිස් නිලධරයන් පත් කිරීම, ස්ථාන මාරු කිරීම, විනය පාලනය, සේවයෙන් පහකිරීම ආදි බලතල පිළිබඳව අවබෝධයක් සහිතව අපි කටයුතු කරනවා.

[ගරු ආනන්ද විජේපාල මහතා]

ඔවුන්ට තමයි ඒ බලතල තිබෙන්නේ. පසුගිය දිනවල සිදු වූ සියලු පොලිස් නිලධාරී ස්ථාන මාරුවීම් සඳහා පොලිස් කොමිසම අනුමැතිය ලබා දී තිබෙනවා. හැබැයි ඔය කියන විධියේ දෙයක් ගැන අපි දන්නේ නැහැ. පසුගිය කාලයේ හිටපු පොලිස්පතිවරයෙක් තමයි කිව්වේ පොලිස් OICලා 182ක් පත් කළේ දේශපාලන වුවමනාව අනුවයි, ඒවා දේශපාලන පත්වීම් කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, එතකොටත් පොලිස් කොමිසම තිබුණා. අපි පොලිස් කොමිසමට පරිබාහිරව ගිහිල්ලා කිසිදු නිලධාරියෙකු මාරු කරලාත් නැහැ, පත් කරලාත් නැහැ. ඒ හින්දා මේ සභාව නොමඟ යවන ආකාරයෙන් ප්‍රකාශ කරන්න එපා. අපි හැම පත්වීමක්ම, මාරුවීමක්ම කරලා තිබෙන්නේ පොලිස් කොමිසමේ අනුමැතිය ඇතුව.

ඉදිරියටත් ජාතික පොලිස් කොමිෂන් සභාවත් එක්ක සුහදව වැඩ කරන්න අපි සූදානම්. අපි සියලු දේ කරන්නේ මේ රටේ ව්‍යවස්ථාවට, නීතියට එකඟවයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම සඳහන් කරපු නිසා-

ගරු ආනන්ද විජේපාල මහතා
(මාණ්පුමිකු ආනන්ද විජේපාල)
(The Hon. Ananda Wijepala)
නැහැ, නම සඳහන් කළේ නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ නම කිව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
නම සඳහන් කළේ නැහැ වාගෙයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නම සඳහන් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඉක්මනින් කියලා අවසන් කරන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කලබල වෙන්න එපා. පසුගිය කාලයේ ජාතික පොලිස් කොමිසමේ හිටපු අය, පසුගිය කාලයේ හිටපු අය ගැන නොවෙයි මම කථා කළේ. කරුණාකර ඔබතුමා මේ රණ්ඩුව බේරන්න. මොකද, මේක රටටත් හොඳ නැහැ; ජාත්‍යන්තරවත් හොඳ නැහැ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, ස්වාධීන කොමිෂන් සභා පත් කරන්න වැඩිපුරම මහන්සි වුණේ ජනතා විමුක්ති පෙරමුණ. ඒ බව අපි කියන්න ඕනෑ. දැන් කොමිෂන් සභාවලට පාට දාලා හරි යන්නේ නැහැ. බිමල් රත්නායක ඇමතිතුමාත් හෙණ පාට එකක් නේ දැම්මේ. "කොමිසම දැන ගන්න ඕනෑ අපට බලය තිබෙනවා කියලා, ඒ ගොල්ලන් දැන ගන්න ඕනෑ වැඩ කරන හැටි" කියලා; උගන්වන්න හදනවා. වැරදියි ඒවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[ප.ව. 3.36]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(මාණ්පුමිකු කවීන්දිරන් කෝඩීස්වරන්)
(The Hon. Kaveenthiran Kodeeswaran)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ජාතික නාදුකළ් මනිත උරිමෛකළ් පේරවෛයින් 58වදු කූට්ටත්තොටර් නටෛපෙට්රුක්කොණ්ටිරුක්කින්ර ඉන්ත නේරත්තිලේ, වලින්දු කාණාමල් ආක්කප්පට්ට තමදු උරවුකළ් කිටෛප්පාර්කළ් එන්ර නම්පික්කෛයිල් අවර්කළදු උරවුකළ් 3,200ක්කුම් මේර්පට්ට නාට්කළාකප් පෝරාට්ටත්තිල් ඊටුපට්ටු වරුකින්රාර්කළ්. ඉලංකෛ වරලාර්රිලේ 3,000 නාට්කළුක්කුම් මේල් තංකළදු උරවුකළෛත් තේටි නටෛපෙරුකින්ර ඉන්තප් පෝරාට්ටත්තිනෛ නාංකළ් මතික්ක වේණ්ටුම්. පෙර්රෝර් තංකළදු පිළ්ළෛකළෛ ඉරාණුවත්තිනරිටමුම් අරස චාර්පුක් කුළුක්කළිටමුම් ඔප්පටෛත්තිරුන්තාර්කළ්. ආනාල්, ඉන්රුවරෛ අවර්කළුක්කාන නීතියානදු ඔරු කේල්වික්කුරියාකත්තාන් ඉරුක්කින්රදු. අවර්කළුක්කාන නීතියෛ නාංකළ් වේණ්ටි නිර්කින්රෝම්.

අතුමට්ටුමල්ල, ඉන්ත නාට්ටිල් නටෛපෙර්ර ඉරුති යුත්තත්තිලේ 150,000ක්කුම් මේර්පට්ට තමිළ් මක්කළ් පටුකොලෛ සෙය්යප්පට්ටු ඔර් ඉනප්පටුකොලෛයානදු අරංකේරියිරුක්කින්රදු. අන්තප් පටුකොලෛයානදු ඉනම් චාර්න්ත රීතියිල් මට්ටුමල්ලාදු, එංකළදු මොළි, කලෛ, කලාචාරම් චාර්න්ත රීතියිලුම් එංකළදු ඉටම් චාර්න්ත රීතියිලුම් එංකළදු අටෛයාළම් චාර්න්ත රීතියිලුම් කටන්තකාල අරචාංකත්තිනාලුම් අරචියල්වාතිකළාලුම් ඒනෛය ඉනවාතිකළාලුම් තොටර්ච්චියාක මේට්කොළ්ළප්පට්ටුවන්ත ඔන්රාක ඉරුක්කින්රදු. අතට්කාන නීතියෛ නාංකළ් වේණ්ටි නිර්කින්රෝම්. තමිළින අළිප්පුක්කු, එංකළදු කලාචාර අළිප්පුක්කුක් කාරණකර්ත්තාක්කළාක ඉරුන්තවර්කළ් නිච්චයමාකත් තණ්ටික්කප්පට වේණ්ටියවර්කළ්. අදු උළ්නාට්ටුප් පොරිමුරෛ ऊටාකවෝ අල්ලදු කලප්පුප් පොරිමුරෛ ऊටාකවෝ නටෛපෙරුමෙන්පතිල් එංකළුක්කු නම්පික්කෛයිල්ලෛ. අන්තක් කුට්රච්චෙයලෛ මේට්කොණ්ටවර්කළෛච් චර්වතේච කුට්රවියල් නීතිමන්රිල් ඔප්පටෛක්කුම්පෝතුතාන් එංකළුක්කාන චරියාන නීති කිටෛක්කුම්. ඉක්කිය නාදුකළ් මනිත උරිමෛකළ් පේරවෛයින් 58වදු කූට්ටත්තොටර් නටෛපෙට්රුක්කොණ්ටිරුක්කින්ර ඉන්ත නේරත්තිල් නාංකළ් අවර්කළිටම් ඉන්ත වේණ්ටුකෝලෛ විටුක්කින්රෝම්.

තමිළ් මක්කළ්මීතාන පටුකොලෛ එන්පදු තොටර්ච්චියාක නටෛපෙට්රු වරුකින්ර ඔන්රාක ඉරුක්කින්රදු. කාණාමල් ආක්කප්පට්ට උරවුකළ් ඉරාණුවත්තිටමුම් ඒනෛය අරච

சார்புக் குழுக்களிடமும் ஒப்படைக்கப்பட்டவர்களாக இருக்கின்றனர். அதைவிட, அவர்களை வலுக்கட்டாயமாகப் பிடித்தவர்கள் இன்றும் உயிரோடிருக்கிறார்கள்; சுதந்திரமாக நடமாடிக் கொண்டிருக்கிறார்கள். அவர்களுக்கான தகுந்த தண்டனை இன்றுவரை நிறைவேற்றப்படவில்லை. இப்பொழுது வந்திருக்கின்ற இந்த அரசாங்கம் பற்பல விடயங்களைச் சொல்லியிருந்தாலும், இந்த விடயத்தையும் கருத்திற்கொண்டு சிறந்த நீதியைத் தர வேண்டும். காணாமல் ஆக்கப்பட்டவர்கள் தொடர்பாக OMP அலுவலகம் மற்றும் ONUR போன்ற அலுவலகங்கள் அமைக்கப்பட்டாலும்கூட எமது மக்கள் நம்பிக்கை இழந்தவர்களாகத்தான் இருக்கின்றார்கள். ஏனென்றால், அவற்றின் மூலமாகவும் சரியான முறையில் நீதி கிடைக்கவில்லை. எமது மக்களுக்கு இழைக்கப்பட்ட அநீதிக்கான நீதி கிடைக்கும்வரை அவர்கள் நிச்சயமாகப் போராடிக்கொண்டுதான் இருப்பார்கள்.

இன்று நல்லிணக்கம், சமத்துவம் பற்றிப் பேசிக்கொண்டிருக்கின்றோம்; நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டுமென்று பேசிக்கொண்டிருக்கின்றோம். ஆனால், இலங்கையின் அரசியலமைப்பு சிறந்த முறையில் உருவாக்கப்படவில்லை. அரசியலமைப்பின் 13வது திருத்தத்துக்கு மேலாக அதிகாரங்களைப் பகிர்வதன்மூலம் எங்களுக்கான நியாயம் கிடைக்க வேண்டும். எங்களுக்கான அதிகாரம் தொடர்ச்சியாக மறுக்கப்பட்ட ஒன்றாகவே காணப்படுகின்றது. அதுமட்டுமல்ல, எல்லை நிர்ணய விடயத்திலும் பாகுபாடு காட்டப்பட்டு இருக்கின்றது. எல்லை நிர்ணயமானது நியாயமான முறையில் மேற்கொள்ளப்படவில்லை. சில மாகாண, மாவட்டப் பிரிப்புகளின்போதும் வட்டாரப் பிரிப்புகளின்போதும் நியாயமான முறையில் எல்லை நிர்ணயம் செய்யப்படவில்லை. சில வட்டாரங்களில் அதிகூடிய மக்கள் தொகையும் சில வட்டாரங்களிலே குறைந்த மக்கள் தொகையும் காணப்படுகின்றது. 6,000 பேருக்கும் ஒரு வட்டாரம், 500 பேருக்கும் ஒரு வட்டாரம் எனப் பிரிக்கப்படுகின்றபோது, சமத்துவமற்ற நிலை காணப்படுகின்றது. இதனால், அந்த இனம், தமிழ்மொழி பேசுகின்ற ஒரு சமூகம் பாதிக்கப்பட்டிருக்கின்றது.

ஆகவே, சரியான முறையிலே வட்டாரங்களைப் பிரித்து உள்ளூராட்சிச் சபைகளை நடத்தும்போதுதான் ஒரு சரியான, சமத்துவமான தேர்தலை நாங்கள் கண்டுகொள்ள முடியும். அதற்கான வழிவகைகளை இந்த அரசு செய்ய வேண்டும். மூன்றிலிரண்டு பெரும்பான்மையோடு இந்த அரசு இருக்கின்றபடியால், மீண்டும் எல்லைகளை மீள் நிர்ணயம் செய்து, புதிய வட்டாரங்களைச் சமத்துவமாக உருவாக்கி, தேர்தலை நடத்த வேண்டுமென்றே இந்த உயர் சபையினூடாக நாங்கள் வேண்டுகோள் விடுக்கின்றோம்.

பொலிஸ் ஆணைக்குழு மற்றும் பொலிஸாரின் செயற்பாடுகள் என்பன மக்கள் மத்தியிலே ஓர் அச்ச நிலையைத் தோற்றுவித்திருக்கின்றது. மக்கள் அவற்றின் செயற்பாட்டில் நம்பிக்கை இழந்தவர்களாக இருக்கின்றார்கள். ஏனென்றால், கடந்த காலத்தில் கொள்ளைகள், கொலைகள், பாதாள உலகக் கோஷ்டியினரின் செயற்பாடுகள் என்பன அத்துமீறி நடைபெற்றன. இதனைத் தடுத்து நிறுத்த வேண்டிய கடமைப்பாடு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. இந்தப் பாதாள உலகக் கோஷ்டியினரைத் தடுத்து நிறுத்துவதற்காக அரசாங்கம் என்ன நடவடிக்கை எடுக்க முடியுமோ அத்தனை நடவடிக்கைகளையும் எடுக்க வேண்டும். அவர்களுக்கும் கடத்தல் மற்றும் போதைப்பொருள் விற்பனையாளர்களுக்கும் அதியுச்ச தண்டனையை இந்த அரசு வழங்க வேண்டும். அதற்கான முழு ஒத்துழைப்பையும் நாங்கள் இந்தச் சபையினூடாக வழங்குவோம் என்பதை இந்த இடத்தில் தெரிவித்துக் கொள்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.44]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ ඉල්ලීම පරිදි, ගරුතර අපේ අස්ගිරි, මල්වතු මහ නායක හාමුදුරුවන් වහන්සේලාත්, ඒ වාගේම අස්ගිරි මල්වතු කාරක සංඝ සභාත් මේ රටේ ජනතාව වෙනුවෙන් උතුම් දළදා වහන්සේ ප්‍රදර්ශනය කරන්නට අවස්ථාවක් ලබා දෙන්න තීන්දු කර තිබෙනවා. ඒක මේ රටේ ජනතාව දැන් දන්නවා. ඉතින් මෙක විශේෂ අවස්ථාවක්. ඒ අවස්ථාව ලැබෙන්නේ කලාතුරකින්. මම විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන්න කැමැතියි, ඇහේ ඔඩු දුවන ද්වේෂය, වෛරය, කේන්තිය, කුහකකම ටිකක් අඩු කරගන්නත් එක්ක අප්‍රේල් 18වැනි දා සිට පැවැත්වෙන උතුම් දළදා ප්‍රදර්ශනයට සහභාගි වෙන්න කියලා. ඒක මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා. ඒවාට අවමන් කරන්න යන්න එපා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපි කොහොමත් දළදා වහන්සේ වඳිනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒවාට අවමන් කරන්න යන්න එපා. දැන් මේ කථාවලින් පෙනෙනවා නේ. ඒවාට නිග්‍රහ කරන්න, අවමන් කරන්න තමයි හදන්නේ. ඔබතුමන්ලා පසුගිය මහ මැතිවරණයේදී, ජනාධිපතිවරණයේදී කිය කියා සිටියේ, අපි බලයට ආවොත් දළදා පෙරහැර නොවෙයි, පන්සලේ පෙරහැරක්වත් තියන්න වෙන්නේ නැහැ කියලා නේ. එහෙම ආණ්ඩුවකින් අතිඋතුම් දළදා වහන්සේ ප්‍රදර්ශනය කරනවා කියනකොට ඒක ඉවසා ගන්න බැහැ. ඒක තමයි මේ ප්‍රකාශයට පත් වෙන්නේ.

එක පැත්තකින් අපි මේ අය වැයෙන් මේ රටේ ජනතාවට සහන සලසමින් ඉන්නවා. ජනතාවට ඒ සහන සලසනකොට -මම එදාත් කිව්වා- ගොඩක් අය ප්‍රශ්න කරනවා, මේ මුදල් කලින් අපට දෙන්නේ නැතිව කොහේද තිබුණේ කියලා. අද උදේ ඉඳලා කවුරු හෝ අහගෙන හිටියා නම් පෙනෙනවා ඇති, අපි එක එක වැය ශීර්ෂවලින් -ජනාධිපතිවරයාගේ, අගමැති කාර්යාලයේ, සභානායක කාර්යාලයේ, ආණ්ඩු පක්ෂ කාර්යාලයේ මේ ආදී වැය ශීර්ෂවල- කලින් වියදම් කළ මුදලින් කොතරම් ප්‍රමාණයක් අඩු කරමින්, ඒ නාස්තිය අවම කරමින් කටයුතු කරනවාද කියන එක.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මම දැන් කටයුතු කරන්නේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක හැටියට. 159ක් වන අපේ ආණ්ඩු පක්ෂ කණ්ඩායමේ සංවිධාන කටයුතු වෙනුවෙන් නියෝජ්‍ය සංවිධායකවරු දෙදෙනෙකු පත් කරගෙන තිබෙනවා. අපේ ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී, ධර්මප්‍රිය විජේසිංහ සහ පුත්තලම් දිස්ත්‍රික් මන්ත්‍රී එච්.එම්. ගයාන් ජනක මැතිතුමන්ලා නියෝජ්‍ය සංවිධායකවරුන් හැටියට පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම සහකාර සංවිධායක හැටියට මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා පත් කරගෙන තිබෙනවා. මම කියන්න කැමැතියි, මේ නියෝජ්‍ය සංවිධායකවරු දෙදෙනා, සහකාර සංවිධායකවරයා සහ මම -අපි හතර දෙනාම- සංවිධායක ධුර සඳහා මේ පාර්ලිමේන්තුවේ හිටපු කලින් අය ලබා ගත් වාහන හෝ ඉන්ධන දීමනා හෝ කිසිදු වරප්‍රසාදයක් ලබා නොගෙන තමයි කටයුතු කරන්නේ කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක කොතරම් දෙයක් ද කියලා තේරුණේ මේ අය වැයට කරුණු ටිකක් එකතු කරන්න ගත්තාට පස්සේ. මට කලින් ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ධුරයේ ප්‍රසන්න රණතුංග මැතිතුමා හිටියා. ඒ කාලයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායකවරු දෙදෙනෙකු ඉඳලා තිබෙනවා. ඒ තමයි, සාගර කාරියවසම්, -පොහොට්ටුවේ ලේකම්- ජයන්ත කැටගොඩ. සහකාර ප්‍රධාන සංවිධායකවරු තුන්දෙනෙකු විධියට කෝකිලා හර්ෂණි ගුණවර්ධන, ජානක තිසකුට්ටි ආරච්චි, මධුර විතානගේ යන අය පත් කරගෙන තිබෙනවා. එතකොට ඔක්කොම හයදෙනෙක් ඉඳලා තිබෙනවා.

මේ අය 2016 ඉඳලා යෝජනා සම්මත කරගෙන තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකට,- සාමාන්‍යයෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කියලා කියන්නේම කැබිනට් අමාත්‍යවරයෙක්; සභානායක කියන්නේ කැබිනට් අමාත්‍යවරයෙක්. ඒ කැබිනට් අමාත්‍යවරයාට ඒ අමාත්‍යාංශය මඟින් වාහනයක්, යම් ඉන්ධන ප්‍රමාණයක් සහ වැටුපක් ලබා දෙනවා. එහෙම තිබියදී ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකට අමතර මාසික දීමනාවක් හැටියට රුපියල් 16,250ක් ලබා දෙනවා. මෝටර් රථයක් වාගේම, ඉන්ධන දීමනාව හැටියට මාසිකව ඉන්ධන ලීටර් 600ක් ලබා දෙනවා. ඊට අමතරව නියෝජ්‍ය සංවිධායකවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හා සමාන පහසුකම් ලබා දෙනවා. සහකාර සංවිධායකවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට ලබා දෙනවා සමාන පෞද්ගලික කාර්ය මණ්ඩලක් සහ ඊට සමාන වරප්‍රසාද. ඒ අනුව නියෝජ්‍ය සංවිධායකවරයෙකුගේ කාර්ය මණ්ඩලය විධියට 15දෙනෙක් ගන්න පුළුවන්. පෞද්ගලික ලේකම් විධියට එක්කෙනායි, සම්බන්ධීකරණ ලේකම්වරු දෙදෙනායි, මාධ්‍ය ලේකම් විධියට එක්කෙනායි, මහජන සම්බන්ධතා නිලධාරින් එක්කෙනායි, පෞද්ගලික සහකාර වශයෙන් එක්කෙනායි, කළමනාකාර සහකාර 5දෙනායි, කාර්යාල කාර්ය සහායක වශයෙන් දෙදෙනායි, රියදුරු හැර ආරක්ෂාවට දෙදෙනායි වශයෙන් ඔක්කෝම 15දෙනෙක් ඉන්නවා. එතකොට, කලින් ආණ්ඩුවේ හිටපු නියෝජ්‍ය සංවිධායකවරු දෙදෙනා 30දෙනෙකුගේ කාර්ය මණ්ඩලයක් අරගෙන තිබෙනවා. එක් සහකාර සංවිධායකවරයෙකුට පෞද්ගලික සහකාර වශයෙන් එක්කෙනායි, කළමනාකාර සහකාර 6දෙනායි, කාර්යාල කාර්ය සහායකයන් 3දෙනායි විධියට කාර්ය මණ්ඩලය 10දෙනායි. ඒ අනුව තුන්දෙනාට 30යි. සහකාර සංවිධායකවරු තුන්දෙනාට අමතර කාර්ය මණ්ඩල වශයෙන් 30දෙනෙක් පත්කරගෙන තිබුණා. මම මේ කියන්නේ, පාර්ලිමේන්තුවේ දැනට සිටින කාර්ය මණ්ඩලයට අමතරව. හැමදාම ඉන්න සාමාන්‍ය කාර්ය මණ්ඩලයක් ඉන්නවා නේ. ඒ අයට අමතරව පත් කරගෙන තිබූ අය ගැන මම කිව්වේ. නියෝජ්‍ය සංවිධායකවරු දෙදෙනාටත් කාර්ය මණ්ඩලය 30යි. මේ පාර්ලිමේන්තුවේ අවුරුදු ගණනක් වැඩ කරපු අපේ කාර්ය මණ්ඩලයෙන් මම අහන්න කැමැතියි, මේ තිහේ කණ්ඩායම් දෙක ඔබ කවදා හෝ මේක ඇතුළෙදී දැක්කාද? ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ අමතර 60දෙනෙකුට ඉන්න තරම් ඉඩ පහසුකම්වත් නැහැ. මම අද උදේ අහනකොට කිව්වා, ඒ කාලය තුළ බඳවා ගත්ත සමහර අය දැකලාවත් නැහැ කියලා. ඔවුන් වෙනුවෙන් කොපමණ මුදල් ප්‍රමාණයක් වෙන් වෙනවාද? සාමාන්‍යයෙන් ගත්තොත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක වෙනුවෙන් සමස්ත කාර්ය මණ්ඩලයත් එක්ක මාසයකට රුපියල් 697,423ක් වෙන් වෙනවා. එක් නියෝජ්‍ය සංවිධායකවරයෙක් වෙනුවෙන් මාසයකට රුපියල් 1,235,912ක් වෙන් වෙනවා. ඒ අනුව, නියෝජ්‍ය සංවිධායකවරු සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය ඔක්කෝම ගත්තාට පස්සේ මාසිකව රුපියල් 4,505,793ක මුදලක් වෙන් කරලා අරගෙන තිබෙනවා. සහකාර සංවිධායකවරු තුන්දෙනාටම රුපියල් 2,234,038ක් වැය වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරු 6දෙනා ගත්තොත්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලයටත් එක්ක මාසයකට රුපියල් 7,437,255ක්. දළ වශයෙන් රුපියල් ලක්ෂ 75ක් වැය වෙලා තිබෙනවා. හැබැයි, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා හිටපු මුල් කාලයේ මේ විධියටම අරගෙන නැහැ.

ඒ වාගේම තිබෙන වාහන මදිවෙලා කුලියටත් අරගෙන තිබෙනවා. 2024 වර්ෂයේ එක් නියෝජ්‍ය සංවිධායකවරයෙක් සඳහා කුලී පදනම මත ලබා ගත් වාහන වෙනුවෙන් මාසයකට රුපියල් 255,000 ගණනේ 2023 දෙසැම්බර් සිට 2024 සැප්තැම්බර් දක්වා රුපියල් 2,490,500ක් ගෙවා තිබෙනවා. කුලියටත් වාහන අරගෙන! එතකොට ඔබට පෙනෙනවා නේ, මේ නියෝජ්‍ය සංවිධායකකම්, සහකාර සංවිධායකකම් දීලා තිබෙන්නේ මොකටද කියලා. මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් තමයි ඒවා දීලා තිබෙන්නේ. තමන්ගේ පක්ෂයේ කැබිනට් ඇමතිකමක් දෙන්න බැරි වෙච්ච කෙනෙක් ඉන්න පුළුවන්, ඒ කාලයේ රාජ්‍ය ඇමතිකමක් දෙන්න බැරි වෙච්ච කෙනෙක් ඉන්න පුළුවන්. ඒ අය වෙනුවෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය හරහා විවිධ තනතුරු ලබා දීලා පාර්ලිමේන්තුවෙන් අත දිගහැරලා වියදම් කරලා තිබෙනවා. මේ ගණන් හැදීම අනුව ගත්තොත්, ගෝඨාභය රාජපක්ෂ සහ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරු දෙදෙනා හිටපු මාස 49ක කාලය තුළ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය වෙනුවෙන් විතරක් දළ වශයෙන් රුපියල් ලක්ෂ 3,773ක් වියදම් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමැතියි, පසුගිය ජනවාරි මාසයේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ අපේ වියදම රුපියල් 180,000ක් බව. මේ ප්‍රමාණය ලක්ෂ 5කට වැඩි වුණා කියන්නකෝ. ඒත් කලින් වියදම කොච්චර වැඩිද? ඒගොල්ලන්ගේ කාර්ය මණ්ඩලයේ වියදම සඳහා විතරක් රුපියල් ලක්ෂ 75යි. ඉතින් පේනවා නේ, මේ රටේ බදු මුදල්වලට කරලා තිබෙන්නේ මොකක්ද කියලා. මෙහෙම තමයි කටයුතු කරලා තිබෙන්නේ. මේ කියන්නේ, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාල ගැන පමණයි.

දැන් අපි යමු, ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළු වැය ශීර්ෂ කිහිපයකට. පසුගිය කාලයේ මේ රටේ ජනතාව යම්කිසි ආකාරයක උද්ඝෝෂණයක් කළොත්, නැත්නම් ජනතාව යම්කිසි ප්‍රශ්නයක් ගැන වැඩිපුර කථා කරන්න ගත්තොත්, ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කරනවා, විශේෂයෙන් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා. එතුමා අගමැති කාලයේත් එහෙමයි.

මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයාත් සම්බන්ධ කරගෙන කළේත් ඒකම තමයි. ඒක ඒ කාලයේ විහිළුවක් වෙලා තිබුණා. ජනාධිපති විමර්ශන කොමිෂන් පත් කරනවා. අන්තිමට කොමිසම දානවා විතරයි, ඒක තමයි නිවිස් එක. ඒ කොමිෂන්වලට වෙච්ච දෙයක් නැහැ.

2016 ඉඳලා ජනාධිපති විමර්ශන කොමිෂන් 14ක් පත් කරලා තිබෙනවා. ඒවායේ නම් කියන්න ගියොත් වේලාව යනවා. ඒ නිසා එකක් දෙකක් කියන්නම්. එකක්, බරපතළ වංචා දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිසම. තව එකක්, රාජ්‍ය දේපොළ අවභාවිත කිරීම පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසම. ඒකට වියදම් වෙලා තිබෙනවා රුපියල් ලක්ෂ 662.34ක්. රාජ්‍ය දේපොළ අවභාවිතාව ගැන ජනාධිපති විමර්ශන කොමිෂන් එකක් පත් කරලා ලක්ෂ 662.34ක් වියදම් කරලා තිබෙනවා. අන්තිමට ඒකත් ඉවරයි, ඒකට වෙච්ච දේකුත් නැහැ. ඒකත් අවභාවිත වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, හිටියා නම් දානවා. හොඳ වෙලාවට ගෙදර යැව්වේ දෙන්නම.

ඊළඟට අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විභාග කිරීමේ ජනාධිපති කොමිසම ට වියදම් කරලා තිබෙනවා ලක්ෂ 144.56ක්. ඒකත් අතුරුදහන්, වාර්තා මොකුත් නැහැ. මේ ආදී වශයෙන් මම කිහිපයක් කියන්නම්. මේ තිබෙන්නේ, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත්කළ කොමිෂන් සභා වාර්තාව; වියදම රුපියල් ලක්ෂ 1,063යි. දූෂණ විරෝධී කාර්යාලයේ කටයුතු පරීක්ෂා කිරීමේ කොමිසම; වියදම රුපියල් ලක්ෂ 350යි. 2015, 2016, 2017, 2018, 2019 දේශපාලන පළිගැනීම් කමිටු වාර්තා සඳහා රුපියල් ලක්ෂ 842යි. රේගුවට එල්ල වූ චෝදනා පරීක්ෂා කිරීමේ ජනාධිපති කොමිසම; වියදම රුපියල් ලක්ෂ 318යි.

සමස්තයක් ලෙස ජනාධිපති කොමිෂන් සභා 14 වෙනුවෙන් වියදම් කරලා තිබෙනවා, රුපියල් ලක්ෂ 5,301ක්. ලක්ෂ 5,301ක් වියදම් කරලා කොමිෂන් සභා වාර්තා හදලා තිබෙනවා. අපරාදේ කියන්න බැහැ, මේ 14න් වෙගවත්වම ක්‍රියාකාරී වුණේ එකයි. ඒ තමයි 2022දී පත් කළ, 2022 මාර්තු 31 දින සිට 2022 මැයි 15 දින දක්වා වාර්තා වූ ප්‍රචණ්ඩ සිදුවීම්වලින් විපතට පත් වූ පුද්ගලයන්ට සහන සැලසීමේ පියවර තීරණය කිරීම සඳහා වන පරීක්ෂණ කොමිෂන් සභාව. අර 13වෙනි එක. අර වන්දි ගෙවපු එක. වන්දි ගෙවපු එක විතරයි මේවායින් හරියට වේගයෙන් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. මම කලිනුත් කිව්වා. ඒක ක්‍රියාත්මක කරලා මන්ත්‍රීවරුන්ට සහ අමාත්‍යවරුන්ට වන්දි දීලා තිබෙනවා, රුපියල් මිලියන 1,221ක්. එදා මම කිව්වේ නැහැ, ඉතිරි අයට දීපු ටික. ඒ කියන්නේ ඔබතුමන්ලාගේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ට, සභාපතිවරුන්ට, නගරාධිපතිවරුන්ට, හිතවතුන්ට, ආධාරකරුවන්ට, ආරක්ෂකයන්ට සහ වෙනත් අයට දීපු ඒවා. ඒ ගොල්ලන්ට දීලා තිබෙනවා රුපියල් මිලියන 1,125ක්.

එතකොට බලන්න, කොමිෂන් 14ක් පත් කරලා කොමිෂන්වලට වියදම් කරලා තිබෙනවා, රුපියල් ලක්ෂ 5,301ක්. එම කොමිෂන් 14න් වන්දි දෙන වාර්තාව විතරයි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට රුපියල් මිලියන 1,221කුත්, හිතවතුන්ට රුපියල් මිලියන 1,125කුත් වියදම් කරලා තිබෙනවා වන්දි දෙන්න. ඒ ලේඛනය ටිකක් දිගයි. ඒ නිසා අද මට ඒක කියවන්න වේලාව නැහැ. ඒකේ තිබෙනවා, හුරු පුරුදු නම් කිහිපයක්. මම පස්සේ වෙලාවක අය වැය කාරක සභා අවස්ථාවේදී මේ සම්පූර්ණ ලේඛනය කියවන්නම්. ලක්ෂ්මන් පෙරේරා, නගරාධිපති කැස්බෑව; අරගෙන තිබෙන වන්දිය රුපියල් ලක්ෂ 696යි. සමන් ලාල් ප්‍රනාන්දු, මොරටුව නගරාධිපති; රුපියල් 7,344,000යි. ඒ නගරාධිපතිගේ පුතා රමේෂ් චානක ප්‍රනාන්දු; රුපියල් 1,888,300යි. *[බාධා කිරීමක්]* පොඩි ලැයිස්තු වුණත් ගාණ පොඩි නැහැ බලනකොට. මේ ලැයිස්තුව ගොඩක් දිගයි. මම තව එක නමක් විතරක් කියන්නම් ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි. නොම්මර 246, ඉසුරුපුර, නිදහස් මාවත, අනුරාධපුරය. මේ තමයි දේවාලය. ඩබ්ලිව්. එම්. ඥාණවතී. *[බාධා කිරීම්]*

රතු තුල් බැඳගෙන හිටපු කටිටිය. රුපියල් ලක්ෂ 280යි, ඥානා අක්කාට දීපු වන්දිය. මේ ලේඛනය පසුව කියවන්නම්. *[බාධා කිරීමක්]* ඩබ්ලිව්.එම්. ඥානවතී, ඉසුරුපුර, නිදහස් මාවත. මෙහෙම තමයි කොමිෂන් සභා දාලා වියදම් කරලා තිබෙන්නේ. අවසානයේ ඒක විතරයි කරලා තිබෙන්නේ. මේ රටේ ජනතාවට වැදගත් වන පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන හරි, රාජ්‍ය මුදල් අවභාවිතය ගැන හරි -මේ දේවල් ගැන- හොයන්න කොමිෂන් දාලා තිබෙන්නේ මොකටද? ඒ මොහොතේ පැන නඟින දේශපාලන උද්ඝෝෂණ යට කරන්න මිසක්, ඇත්ත වුවමනාවකට නොවෙයි. ඒකටත් රුපියල් ලක්ෂ 5,000කට වඩා වියදම් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැය ශීර්ෂය යටතේ තමයි අපට කථා කරන්න වෙන්නේ, අපේ රටේ හිටපු ජනාධිපතිවරු නඩත්තු කිරීම ගැන. ඒකත් මේ රටේ ජනාධිපති ලේකම් කාර්යාලයට තමයි බරක් වෙන්නේ. හිටපු ජනාධිපතිවරුන්ට කරපු වියදම් ගැන කියනකොට මම කිව්වා, එක්කෙනෙකුගේ ගෙදර ගැන සහ ඒ දේපළ ගැන. පසුගිය 2024 අවුරුද්දේ හිටපු ජනාධිපතිවරු වෙනුවෙන් භාණ්ඩාගාරය වියදම් කරලා තිබෙනවා, මෙන්න මෙහෙම. රනිල් වික්‍රමසිංහ මහතාට රුපියල් මිලියන 2.53යි. ගෝඨාභය රාජපක්ෂ මහතාට රුපියල් මිලියන 11.02යි. මේ 2024 අවුරුද්දට විතරයි. මෛත්‍රීපාල සිරිසේන මහතාට රුපියල් මිලියන 18.57යි. හේමා ප්‍රේමදාස මහත්මියට රුපියල් මිලියන 3.04යි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට රුපියල් මිලියන 13.69යි. මහින්ද රාජපක්ෂ මහතාට රුපියල් මිලියන 61.66යි. ඒ අනුව, 2024 අවුරුද්දේ මේ හයදෙනාටම වියදම් කරපු මුදල්වලින් සියයට 56ක්ම වියදම් කරලා තිබෙන්නේ, මහින්ද රාජපක්ෂ මහතා නඩත්තු කරගන්න. ප්‍රාග්ධන වියදම් ගත්තාම සියයට 77ක් වැය කරලා තිබෙන්නේ, එතුමාට. 2024 අවුරුද්දේ විතරක් රුපියල් මිලියන 110.5ක් මේ රටේ භාණ්ඩාගාරයෙන් වියදම් කරනවා, හිටපු ජනාධිපතිවරු බලාකියා ගන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔක්කෝම දාන්න කෝ එළියට.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔක්කෝම ටික දානවා. පොඩ්ඩක් ඉන්න. දිනයත් ඕනෑ නම් පස්සේ කියන්නම්. *[බාධා කිරීමක්]* පුළුවන් නේද? රුපියල් 100 ගණනේ එකතු කරලා දෙනවා කිව්වා. සමහරු කිව්වා, අපි බලාගන්නම් කියලා. ඒ ගොල්ලන්ගේ ගෙදරට එන්න කිව්වා. හැබැයි, යන්න බැරි වුණා. ඒ අය කියන්න ඇති ගෙන්වා ගන්න එපා කියලා. *[බාධා කිරීමක්]* ඒවා ඔක්කෝම කරලා දෙන්නම්. තව තුන්දෙනයි ඉන්නේ. ඔබතුමන්ලාගේත් යාළුවෝ නේ. ලියුම එන්න කලින් යන්න කියන්න. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාගේ යාළුවෝ නේ. ළඟදිත් කථා කළා නේ. *[බාධා කිරීම්]* අයියෝ! *[බාධා කිරීම්]*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

අපි කොහොමද අපේ ජනාධිපතිවරයාගේ වියදම් අඩු කරලා තිබෙන්නේ? *[බාධා කිරීම්]* හේමා ප්‍රේමදාසට ලක්ෂ 30යි. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, හේමා ප්‍රේමදාසට තවම ලක්ෂ 30ක් වියදම් කරනවා. බැරිද එයා බලාගන්න? බලාගන්න කෝ, පොඩ්ඩක්. පව් නේ. එකතු කරලා කීයක් හරි දෙන්න කෝ. ජගත් විතාන මන්ත්‍රීතුමාට කිව්වා නම් හරි. එතුමාට පුළුවන්. *[බාධා කිරීමක්]* 2024 වර්ෂයේ. සපෝට් කරලා එකතු කරලා දෙන්න, ලක්ෂ 30යි නේ.

ඊළඟට, අපි දැන් ජනාධිපති ලේකම් කාර්යාලයේ වියදම් අඩු කරගෙන, අඩු කරගෙන යනවා. ගරු මන්ත්‍රීවරුනි, ඒක නිසා අපි මේ ආදර්ශය ලබා දෙනවා, ජනාධිපතිතුමාගේ පැත්තේ ඉඳලාම. අපේ අගමැතිතුමියත් උදේ මේ ගැන කිව්වා. 2024 අගෝස්තු මාසයයි, 2024 නොවැම්බර් මාසයයි ඒ ගොල්ලන් ඉන්න එක මාසයකුත්, අපි ආපු මාසයකුයි සංසන්දනය කළාම, වැටුප්වලින් පමණක් ලක්ෂ 151ක් මේ ජනාධිපතිතුමා ආවාට පස්සේ අපි එක මාසයකට අඩු කරගෙන තිබෙනවා. ඒ වාගේම අපි ගමන් වියදම්වලින් ලක්ෂ 30කට වඩා අඩු කරගෙන තිබෙනවා. ඉන්ධනලින් ලක්ෂ 46 ගණනේ දෙකක් අඩු කරගෙන තිබෙනවා. මාසයකට යන වියදම්වලින් මම මේ කියන්නේ. වාහන නඩත්තුවෙන් ලක්ෂ 356ක් අඩු කරගෙන තිබෙනවා. වතුර, විදුලි බිල්වලින් ලක්ෂ 155ක් අඩු කරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාර්ය මණ්ඩලයත් යම්කිසි ආකාරයකට සීමා කරලා මේ වියදම් අඩු කර ගන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඇයි ඒ? අපි මේ රටේ ජනතාවට ඒ ආදර්ශය ලබා දෙන්නට ඕනෑ නිසා.

අපි ආදර්ශයක් දුන්නොත් තමයි රට වැටිලා තිබෙන තැනින් ගොඩගන්නට ජනතාවගේ සහයෝගය ගන්න පුළුවන්කම ලැබෙන්නේ. එම නිසා ජනාධිපතිවරයාගේ හා අගමැති කාර්යාලයේ ඉඳලා, පාර්ලිමේන්තුව සහ අප නියෝජනය කරන සියලු ආයතන දක්වා අපි හැකි පමණින් වියදම් අඩු කරගෙන ආදර්ශයක් ලබා දීලා තිබෙනවා. එම නිසා මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්න කැමැතියි, කරුණාකරලා පාර්ලිමේන්තුවේ කාලය අරගෙන අර අහිමි වුණු වරප්‍රසාද ගැන දුක්, අදෝනා තියන්න එපා කියලා. නිල නිවාස නැති වුණු එක ගැන, වාහන පර්මිට් නැති වුණු එක ගැන, ආරක්ෂකයෝ නැති වුණු එක ගැන කිය-කියා ඉන්න එපා.

දැන් අපට පෙනෙනවා, පාතාලයේ මොන යම් හෝ සිදුවීමක් වනකොටම ඔබතුමන්ලා කියනවා, ඔබතුමන්ලාට අරක්ෂාව නැහැ කියලා. ප්‍රශ්නය තිබෙන්නේ පාතාල ගැටුම් පිළිබඳව. හැබැයි, ඔබතුමන්ලා තමයි ඉස්සෙල්ලාම කෑ ගහලා ආරක්ෂාව ඉල්ලන්නේ. අපි බලමු, කාටද තර්ජන තිබෙන්නේ කියලා. තර්ජන තිබෙන ප්‍රමාණයට ආරක්ෂාව ලබා දෙන්නම්. ඒ නිසා ඒවාට කලබල වෙන්න එපා. තමන්ට යම් යම් දේවල් අහිමි වනකොට කේන්ති එන එක සාධාරණයි. ඒක දැන් අපට පෙනෙනවා නේ. මේ රටේ ජනතාව අමාරුවෙන් බදු ටික එකතු කරලා භාණ්ඩාගාරයට දුන්නාට පස්සේ ඒවා තම තමන්ට ඕනෑ ඕනෑ හැටියට වියදම් කරගෙන ගිහින් තිබෙනවා. පසුගිය ආණ්ඩුව ඒවා එකක්වත් හෙළිදරව් කළේත් නැහැ, අඩු කළේත් නැහැ. නමුත් අපි ඒවා හෙළිදරව් කරලා, වියදම් අඩු කරගෙන යනකොට ඔබතුමන්ලාට කේන්ති එන එක සාධාරණයි. හැබැයි, අපි මේ ආදර්ශය දිගටම ලබා දෙනවා. ඒ වෙනුවෙන් ජනතාව මේ ආණ්ඩුවත් එක්ක ඉස්සරහට යනවා කියන එකත් මම කියන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව රටටම නීති හදනවා. හැබැයි, පාර්ලිමේන්තුව පාලනය කරන්න අවශ්‍ය නීති අපි යාවත්කාලීන කරගෙන නැහැ. පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳව තිබෙන නීතිය 1953 මාර්තු මාසයේ 14වන දා පනවපු බොහොම යල් පැන ගිය නීතියක්. මේ නීතිය කොච්චර යල් පැන ගිහිල්ලා තිබෙනවාද කිව්වොත්, ඊට පසුව සිදු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධන සමඟ එය ගළපා නැහැ. ඒ වාගේම ඊට පසුව මේ රටේ පාර්ලිමේන්තුව සමඟ ගොඩනැඟුණු අලුත් නීතිවලින් පාර්ලිමේන්තුවට ලැබුණු බලය සමඟත් එය ගළපා නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය, පාර්ලිමේන්තුවේ පරිපාලනය පිළිබඳව අද තිබෙන මේ නීතිය යල් පැන ගිය නීතියක් වශයෙන් සලකන්න ඕනෑ.

මේ ප්‍රශ්නය ඉතාම බරපතළ තත්ත්වයකට පත් වන්නේ ස්වාධීන ආයතනයක් වන, ස්වාධීනත්වය රැකිය යුතු ආයතනයක් වන, ස්වාධීනත්වය ආරක්ෂා කළ යුතු ආයතනයක් වන පාර්ලිමේන්තුවේ කටයුතු සඳහා විධායකය බලපෑම් කරන අවස්ථාවලදී හෝ විධායකයේ සහයෝගය නොලැබෙන අවස්ථාවලදීයි. ඒක වෙන්න පුළුවන්, ජනාධිපතිවරයා එක පක්ෂයක වෙලා පාර්ලිමේන්තුවේ බලය තවත් පක්ෂයකට ගියොත්. එහෙම නැත්නම්, පාර්ලිමේන්තුවේ බහුතරයකගේ අදහස් එක්ක ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය අතර ගැටුම් ඇති වුණොත්. ඒ වාගේම පාර්ලිමේන්තුවේ ක්‍රියාදාමය පිළිබඳව, පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය පිළිබඳව යම් අවස්ථාවක ගැටලුවක් ඇති වුණොත් එවැනි වෙලාවක පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරිත්වයට, ස්වාධීනත්වයට ශක්තියත් ලබා දීම සඳහා තිබෙන නීතිය තමයි, Parliamentary Staffs Act එක. නමුත්, මේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය ශක්තිමත් කිරීම සඳහා තත්කාලීන, නවීන නීතියක අවශ්‍යතාව තිබෙනවා.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමන්ලා ගොඩක් දේවල් වෙනස් කරන බව කියනවා. ගරු අගමැතිතුමියනි, ඔබතුමියන්ලා ගොඩක් දේවල් වෙනස් කරන බව කියනවා. මේ පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය සහ පාර්ලිමේන්තුවේ අභ්‍යන්තර පරිපාලනය පිළිබඳව පවතින 1953දී හදපු යල් පැන ගිය නීතිය යාවත්කාලීන කිරීම පිළිබඳව කටයුතු ආරම්භ කරන්න. ඒකට අපේත් සහයෝගය ලබා දෙන්නම්. තිබෙන අඩුපාඩු අපි හදමු. මොකද, මේ සඳහා අලුත් නීතියක අවශ්‍යතාව තිබෙනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ යහපත් කටයුතු උදෙසා. නාස්ති කරන්න නොවෙයි, අපිත් නාස්තියට විරුද්ධයි. අයථා ලෙස කටයුතු කරනවාට අපිත් විරුද්ධයි. හැබැයි, පාර්ලිමේන්තුවේ කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යෑමට අවශ්‍ය මූල්‍ය ස්වාධීනත්වය ඇති කළ යුතුයි. මතයක් තිබෙනවා, පාර්ලිමේන්තුවේ සියලු කටයුතු පිළිබඳ මූල්‍ය පාලනය භාණ්ඩාගාරය විසින් දරනවා කියලා. නමුත්, ඒක එහෙම නොවෙයි.

1978 දෙසැම්බර් 22වෙනි දා, එවකට මුදල් ඇමති රොනී ද මැල් මැතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, "පාර්ලිමේන්තුවේ අභ්‍යන්තර කටයුතු පිළිබඳව ගන්නා වූ තීරණවලට මූල්‍ය ප්‍රතිපාදන සැපයීම ආණ්ඩුවේ වගකීමක්. ඒ පිළිබඳව පාලනය කිරීමේ බලයත් වෙනත් ආයතනවලට ලබා දීම නුසුදුසුයි. ඒ නිසා පාර්ලිමේන්තුවේ කටයුතු උපරිම මට්ටමින් යහපත් ලෙස පවත්වාගෙන යෑම සඳහා වූ මූල්‍ය පිළිබඳ ස්වාධීන බලයක් පාර්ලිමේන්තුවට ලබාදීමත්

අවශ්‍ය වෙනවා." කියලා. ඒක පිළිගත් දෙයක්; සම්ප්‍රදායක්. ඒ නිසා පාර්ලිමේන්තුව ආයතනයක් විධියට ඉහළ මට්ටමින් පවත්වාගෙන යෑම සඳහා ඒ අවශ්‍ය සහයෝගය ලබා දීම අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ විවාදයේදී ස්වාධීන කොමිෂන් සභා පිළිබඳව සාකච්ඡා වෙනවා. මේ සෑම ස්වාධීන කොමිෂන් සභාවකටම ස්වාධීනත්වය පිළිබඳව අවශ්‍ය ප්‍රතිපාදන සලසා අවසානයට කියනවා, "කෙසේ වෙතත්, ඒ ස්වාධීන කොමිෂන් සභාවල කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට වගකිව යුතුයි" කියලා. පාර්ලිමේන්තුවට කොමිෂන් සභාවක් වග කියනවා කියන්නේ ඒකේ කාර්යය ඉටු කිරීම ගැන, ඒකේ කාර්යක්ෂමතාව ගැන, ඒවායේ මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තුවට වගකීමක් තිබෙනවා, පාර්ලිමේන්තුවට උත්තර දිය යුතුයි කියන එකයි. නමුත්, මේ පාර්ලිමේන්තුවට වගකීම හුදු වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් ඔබ්බට ගිය ක්‍රියාදාමයක් බව අපි තේරුම් ගත යුතුයි. මමත් සාමාජිකයෙක් වෙච්ච පාර්ලිමේන්තුවේ වර්තමාන ස්ථාවර කාරක සභා කෙටුම්පත් සම්පාදක මණ්ඩලය මේ පිළිබඳව අවධානය යොමු කළා. එසේ යොමු කරලා මේ ස්වාධීන කොමිෂන් සභා එකින් එක පිළිබඳව කරුණු සොයා බලන්න, නැත්නම් ඒ ස්වාධීන කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගවීම, වගකීම පිළිබඳ කාරණා යථාර්ථවත් කරන්න කමිටුවක් හදලා තිබෙනවා. ඒ තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව. ස්ථාවර නියෝග 126හි මේ පිළිබඳව ප්‍රතිපාදන සලසා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 126(3)හි මෙසේ සඳහන් වනවා:

> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ) ව්‍යවස්ථාවේ උපලේඛනය යටතේ පිහිටුවන ලද සියලුම ස්වාධීන කොමිෂන් සභා, සිය බලය ක්‍රියාත්මක කිරීම සහ කාර්යය හා කර්තව්‍යයන් පිළිබඳ කාර්ය සාධනය ඇතුළත්ව ස්වකීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් එක් එක් ලිත් වර්ෂයක් සඳහා වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය."

ඒ වාගේම ස්ථාවර නියෝග 126(4)හි මෙසේ සඳහන් වනවා.

> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව විසින් වාර්ෂික වාර්තා සලකා බලනු ලැබිය යුතු අතර කාරක සභාව විසින් එකී කර්තව්‍ය ඉටුකිරීමේදී කොමිෂන් සභාවල සභාපතිවරයන්, සාමාජිකයන් හා නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට බලය තිබිය යුත්තේ ය."

දැන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආරම්භ කර තිබෙන කටයුතු හැර, අනෙක් සෑම කොමිෂන් සභාවක් පිළිබඳවම සොයා බැලීමේ වගකීම අපට තිබෙනවා. ගරු අගමැතිතුමියනි, අපි මේ වගකීම ඉෂ්ට කරලා නැහැ. මේ පිළිබඳව ඇති වුණු සාකච්ඡාවකින් පස්සේ මේ කමිටුව පත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. මොකද, මතක තබා ගත යුතුයි මෙන්ම, මේ ස්වාධීන කොමිෂන් සභාවල ස්වාධීනත්වය තිබිය යුතුයි, නීතියෙන් පැවරී තිබෙන ඒ ස්වාධීනත්වය ආරක්ෂා විය යුතුයි කියන අතරම, මේ ස්වාධීන කොමිෂන් සභා දැනගත යුතුයි, තමන් පාර්ලිමේන්තුවට වග කිවයුතු බව; නීතියට වගකිව යුතු බව.

පසුගිය දිනවල පොලිස්පතිවරයාත්, පොලිස් කොමිෂන් සභාවත් අතර තිබෙන අරගළය අපි දැක්කා. ප්‍රවෘත්ති සාකච්ඡාවකට ඇවිල්ලා වැඩබලන පොලිස්පතිතුමා පොලිස් කොමිෂන් සභාවේ බලතල ඉල්ලා සිටියා. ඒක පුදුම ක්‍රමයක්. ඒ නිලධාරියා ගැන පෞද්ගලිකව අපට ගැටලුවක් නැහැ. එතුමා දක්ෂ නිලධාරියෙක්. හැබැයි, වැඩබලන පොලිස්පතිකමට පත් වුණාට පස්සේ ස්වාධීන කොමිෂන් සභාවක තිබෙන බලය මොකක්ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කොමිෂන් සභාවට දී තිබෙන බලතල මොනවාද කියලා එතුමා දැනගන්න ඕනෑ. ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම් ජනාධිපතිතුමා සමඟ, විෂය භාර ඇමතිවරුන් සමඟ සාකච්ඡා කරලා, කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් සමඟ සුහදව සාකච්ඡාවෙන්, සම්මුතියෙන් කටයුතු කරලා යම් අවබෝධයක් ඇති කර ගත යුතුයි. ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියලා කොමිෂන් සභාවට අභියෝග කරන්නට වැඩබලන පොලිස්පතිවරයාට අවස්ථාව දෙනවා නම්, ඒ පොලිස්පතිවරයා තමන්ගේ වගකීම ඉටු නොකරන කෙනෙක්. කොච්චර දක්ෂයෙක් වුණත්, කොච්චර උගත් කෙනෙක් වුණත් ඔහු තමන්ගේ වගකීම ඉටු නොකරන කෙනෙක්.

හැබැයි, වැඩබලන පොලිස්පතිවරයා කිව්වේ ජනාධිපතිට ඕනෑ දේ නම්, වැඩබලන පොලිස්පතිවරයා කිව්වේ විෂය භාර ඇමතිවරයාට ඕනෑ දේ නම් ඒක වෙනම කථාවක්. අපට පෙනෙන්නේ නම් ඒ වාගේ දෙයක්. පොලිස් කොමිසමට පාඩමක් උගන්වන්න, තර්ජනය කරන්න බැහැ. ජනාධිපතිවරයාත් කිව්වා නේ, අපට පොලිස් කොමිසම ගැන ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒක කිව්වේ ප්‍රසිද්ධියේ නේ. ඒක කිව්වේ කළුතර රැස්වීමකට ඇවිල්ලා. දැන් මෙකත් ඒකෙම දිගුවක් ද කියලා අපට හිතෙනවා. ඒ නිසා පොලිස්පතිවරයාගේ ඒ කථාව නොකළ යුතු දෙයක් වාගේම, එවැනි ගැටලු තිබෙනවා නම් ඒවා විසඳා ගත යුතුයි. ඒ වාගේම කොමිෂන් සභාවල කාර්යක්ෂමතාව ගැන, ඔවුන්ගේ වගකීම ඉෂ්ට කිරීම ගැන ගැටලුවක් තිබෙනවා නම්, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හරහා ඒ වගකීම ඉටු කිරීමට කටයුතු කළ යුතුයි. මොකද, ඒ සියලුදෙනාම නීතියටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් වග කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව ඉතා වැදගත් දෙයක් තිබෙනවා. මම හිතුවා, අද දවසේ මේ සාකච්ඡාව යද්දී අපේ සභානායකතුමා කියයි කියලා, මේ තමයි විධායක ජනාධිපතිවරයෙකුගේ අන්තිම වැය ශීර්ෂය කියලා.

අපි ඊළඟ වාරයේ අලුත් ව්‍යවස්ථාවක් හදනවා, ඒ අලුත් ව්‍යවස්ථාව හදලා විධායක ජනාධිපති ක්‍රමය නැති කරනවා, මේ පාර්ලිමේන්තුවට බලය ලබා දෙනවා, පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය ස්ථාපනය කරනවා, මේක තමයි අවසාන විධායක ජනාධිපති වැය ශීර්ෂය කියලා ප්‍රකාශ කරයි කියා අපි හිතුවා. නමුත් ආණ්ඩු පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් එහෙම කිව්වේ නැහැ; සභානායකතුමා එහෙම කිව්වේ නැහැ; ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එහෙම කිව්වේ නැහැ. නමුත්, ජනතා වරම තිබෙන්නේ ඔබතුමන්ලාට නිසා, ජනතා වරම තිබෙන්නේ වර්තමාන රජයට නිසා, ජනතාව අනුමත කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය ජනතාවට අමතක වුණාට අපට අමතක නැති බව කියන්න අවශ්‍යයි.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 194හි මොකක්ද කියන්නේ? එහි මෙසේ සඳහන් වනවා:

> "නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු ලබන අතර එය මහජනතාව වෙත ඉදිරිපත් කර, සංවාදයකින් අනතුරුව අවශ්‍ය වෙනස්කම් සිදුකොට ජනමත විචාරණයක්ද සමඟ සම්මත කර ගනු ඇත."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණය හොඳින් දන්නවා. ඒකේ හැඩ රුව ගැනත් තිබෙනවා. ඔබතුමාත් මැතිවරණ කාලයේ කියනවා මම දැක්කා, අපි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එනවා, රටට හිතකර, විධායක ජනාධිපති ක්‍රමය නැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එනවා කියලා.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 194හි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

"විධායක ජනාධිපති ආණ්ඩු ක්‍රමය අහෝසිකොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත් කිරීම."

අපිත් ඒකට එකඟයි. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ මැතිවරණ ප්‍රකාශයේත් ඒකම තමයි තිබුණේ. එතකොට මේ රටම වාගේ ඒකට එකඟයි. සියයට සියයක් එකඟ වෙන්න අවශ්‍ය නැහැ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර 159ක බලයක් ඔබතුමන්ලාට තිබෙනවා. අපට 45දෙනෙකුගේ බලය තිබෙනවා. ප්‍රධාන පක්ෂ දෙකම -ආණ්ඩු පක්ෂයත්, ප්‍රධාන විපක්ෂයත්- ඒකට එකඟයි. ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය අවසන් කරන්න පුළුවන්. ආයතන දෙකක් පවත්වාගෙන යනකොට තමයි මේ වියදම් පිළිබඳ ප්‍රශ්නය එන්නේ කියලා අපි දන්නවා. මේ වියදම් පිළිබඳ, නාස්තිය පිළිබඳ ප්‍රශ්නය වැදගත් කාරණයක්. විධායක ජනාධිපති කෙනෙක් සහ වෙනම පාර්ලිමේන්තු ක්‍රමයක් කියා දෙකක් අවශ්‍ය නැහැ. මේ රටට අවශ්‍ය එකයි. හැබැයි, ඔබතුමන්ලා ඒක අමතක කරලා තිබෙනවා.

ඒ වාගේම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 194හි මෙසේ ද සඳහන් වනවා:

"නව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන සමානුපාතික මැතිවරණ ක්‍රමයේ තිබෙන අඩුපාඩුකම් වාගේම මනාප ඡන්ද ක්‍රමයේ තිබෙන අඩුපාඩුකම් ගැන අපි දන්නවා. මේ රටේ ජනතාව මේ ප්‍රතිපත්තිය ඒකමතිකව සම්මත කරලා තිබෙනවා. මන්ත්‍රී ධුර 159ක -සියයට 60ක- බලයක් ආණ්ඩුවට ලැබී තිබෙනවා. ඒ වාගේම, විපක්ෂයත් ඒකට එකඟයි. එහෙනම්, මොකක්ද ඒකට තිබෙන ප්‍රශ්නය? ගරු ජනාධිපතිතුමා නිදහස් දවසේවත් මේ ගැන කිව්වේ නැහැ. ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට දෙතෙවක් ඇවිල්ලා කථා කළා. නමුත්, ඒ අවස්ථාවලදීවත් මේ ගැන කිව්වේ නැහැ. ඒ වාගේම, මේ සභාවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා 159න් කවුරුවත් දැන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ගැන, පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් පිහිටුවීම ගැන, වෙස්ට්මින්ස්ටර් ක්‍රමය ගැන, නාමික ජනාධිපතිවරයෙක් පත් කිරීම ගැන, ඒ වාගේම උතුරු-නැඟෙනහිර ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවට ඔවුන්ගේ පාලනයක් පිළිබඳව, මේ රටේ බලය විමධ්‍යගත කිරීම පිළිබඳව තිබෙන ඒ අදහස් ගැන කථා කරන්නේ නැහැ. මැතිවරණ කාලයේ කියපු දේවල් දැන් කථා කරන්නේ නැහැ. මේ බලය විමධ්‍යගත කිරීම අවශ්‍ය වන්නේ ජනවාර්ගික ප්‍රශ්නයට විතරක් නොවෙයි. සංවර්ධනය උදෙසාත් මේ බලය විමධ්‍යගත කිරීම අවශ්‍යයි. කොළඹ කේන්ද්‍රගත වෙලා තිබෙන සංවර්ධනය වෙනුවට රට පුරා එක හා සමානව විහිදෙන සංවර්ධනයක් උදෙසා බලය විමධ්‍යගත කිරීම අවශ්‍යයි. එතකොට මූලධර්ම පිළිබඳ එකඟතාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇයි මේක අයින් කරන්නේ නැත්තේ? විධායක ජනාධිපති ක්‍රමය රහ වැටුණා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියා ජනතාවට පොරොන්දු වුණා; ජනතාව පත් කළා; නමුත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළේ නැහැ. මහින්ද රාජපක්ෂ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියා ජනතාවට පොරොන්දු වුණා; ඒත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියා පොරොන්දු වුණා; කොටසක් අඩු කළා; සම්පූර්ණයෙන් අහෝසි කළේ නැහැ. අනුර කුමාර දිසානායකත් එතැනටම වැටෙන්නයි යන්නේ. බලය ලැබුණාම ඒ බලයට මත් වෙනවා; ආසා වෙනවා. හැබැයි, මතක තබා ගන්න ඕනෑ, ඉතිහාසයේ ජරාජීර්ණ වෙච්ච සංශෝධන විශාල ගණනකින් විකෘතිතාවට පත් වෙච්ච මේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා, මේ රට සිංහල, දෙමළ හැමෝටම එක රටක් කියලා හිතෙන, ඒ වාගේම බල කේන්ද්‍ර දෙකක් නැතිව එක කේන්ද්‍රයක් ඇති කරන, සාධාරණ, ව්‍යදම් අඩු මැතිවරණ ක්‍රමයක් ඇති කරන නව ක්‍රමයකට යන්න මීට වඩා අවස්ථාවක් නැහැ.

පාලක පක්ෂයට විධායක ජනාධිපතිකම වාගේම පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර 159ක බලය ලැබී තිබෙනවා. ඒක හොරෙන් ගත්ත එකක් නොවෙයි. අපි දන්නවා, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවටත් තුනෙන් දෙකක බලයක් තිබුණු බව. ඒ තුනෙන් දෙකක බලය හොරෙන් ගත්ත එකක්; කප්පම් දීලා ගත්ත එකක්. හැබැයි, අද එහෙම නොවෙයි. ඔබතුමන්ලාට මේ ආණ්ඩුව පටන් ගන්නකොටම මන්ත්‍රී ධුර 159ක් ලැබුණා. ඒ නිසා මේ ව්‍යවස්ථා සංශෝධනය අරගෙන එනවා නම්, ඒක පළමු සැසි වාරය තුළ පටන් අරගෙන අඩුම ගණනේ දෙවැනි සැසි වාරය තුළ අවසන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී එක දෙයක් කියන්න ඕනෑ. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන, මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම ගැන අවංක වුවමනාවක් තිබෙනවා නම් ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ පදනම තමයි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්; ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ පදනම තමයි අලුත් මැතිවරණ ක්‍රමයක්. ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ වුවමනාව තිබෙනවා නම් කළ යුතු වන්නේ වහාම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා වූ වැඩ පිළිවෙළ ආරම්භ කිරීමයි. එසේ නොකිරීම ද්‍රෝහිකමක්. එසේ නොකිරීම වරදක්. එසේ නොකිරීම ජන වරම පාවා දීමක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[4.18 p.m.]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I wish to make a few comments on the Human Rights Commission as its Head - Head 13 - is taken up for debate under today's Committee Stage Discussion.

You might be aware, Sir, that during the last Parliament, I took part in the Committee Stage Discussion on this very same Head and raised certain issues with regard to the functioning and the credibility of the Human Rights Commission because the Chairperson of the Commission along with some members had visited the Northern Province and met with members of the families of the disappeared, who had been protesting for years. Subsequently, when she and the rest of the members came to Colombo, they issued a statement that after the members of the Commission spoke to those victim communities, they had apparently agreed to compensation, which was completely untrue. I condemned that statement and very clearly stated on record that it was a falsehood. I made this point even in

2023, during the previous Budget. When we have doubts with regard to the police and how they work, we expect the Human Rights Commission's intervention. We believe that the police, especially in the North and the East, is heavily militarized, works on a counter-insurgency mode and therefore, is very hostile to the local population. And, the truth of the matter, Sir, is that most of the senior police officers and even juniors in the North and the East are on punishment transfers. So, their attitude towards the other people is very hostile. They do not speak the language and are heavily influenced by political forces. So, we rely entirely on the Human Rights Commission to put things right, to inquire into the misdeeds of the police; we expect them to intervene. That is the only hope we have in a domestic scenario. So, when the Human Rights Commission behaved in that manner during the previous Government, we raised those issues.

During the previous Government, when our party members and a few people were protesting in a place called Thaiyiddy, the police tried to get a ban against that protest. They went to the Magistrate's Court and the Magistrate refused to give a ban. But, the Magistrate laid down certain conditions with regard to how protests must be done and we were very strictly observing those conditions. Despite that, the Palaly Police, under the directions of the OIC, went ahead and arrested members of our party, the public, journalists and lawyers who, when they heard that despite the Magistrate not giving a ban on the protest, the police were arresting people, came there. The lawyer who represented us in court came to that spot and he was arrested. Sir, eight complaints had been made to the Human Rights Commission. I will give you the numbers: HRC/ JA/ 165 to 172 in the year 2023.

On the day of this incident, we called the Human Rights Commission Representative in Jaffna and he came to the site, but the police refused him to interview the victims who were in sight. The police were literally sieging those protestors. When the Human Rights Commission's official in Jaffna wanted to meet the victims and find out information for himself, the police refused and threatened to arrest him also. Then, subsequently, after some of these protesters were produced in court and bailed out, they made complaints to the Human Rights Commission, but to date, there has been no inquiry. When we searched as to what was going on, we were informed by the Office in Jaffna that there were complaints made by the Palaly Police to the Human Rights Commission at that time saying that the Representative of the Commission in Jaffna was being influenced by us and therefore, the file was sent to Colombo. Fine, let the file go to Colombo. But, still, no inquiry at all! This Commission is very important, Hon. Presiding Member, because that is the only avenue we have. If we are questioning the legitimacy and the genuinity of the police or any government institution and we feel that we have been wronged by them, the only place we have to go to is the Commission. If the Commission is not behaving in that independent way, where they must intervene regardless of who it is, it is a problem. You must have that inquiry and if you are not having that inquiry, then it becomes a problem. That happened under the previous Government. Therefore, I urge that this Government must emphasize to the Commission that they have the freedom and, in fact, the legitimacy to make those investigations and that seeing through those investigations is very important. If that does not happen, Sir, then we will have to question every single thing that the Government does with regard to accountability.

The Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism had gone to Geneva and made statements. He had spoken seemingly quite progressively saying that they are very serious about transitional justice, they are going to strengthen the Office on Missing Persons, the Office for Reparations and the Office for National Unity and Reconciliation, that they are also going to create legally a Truth and Reconciliation Commission, which would look into wartime incidents, and will take things forward. Not a word, Sir, not one word about criminal justice! You know that in transitional justice, in criminal justice, criminal investigations and prosecutions are probably the most important part. If that is not there, everything else that the Hon. Minister of Foreign Affairs spoke about in Geneva amounts to a coverup; you are trying to cover up. Without having prosecutions, without prosecuting people who committed genocide, you are trying to cover it up. That is where it is going to end up. I am saying this with utmost responsibility because on the 27th of August in 2024, the current President had publicly said that there will not be one prosecution against wartime atrocities. He had said it in public several times. Then, what are these comments that the Minister of Foreign Affairs is making? What he is saying in reality is that there will never be accountability, that it will be covered up. There will be some Commission, to which people will go, where they will be asked to cry and people will cry and then, they are supposed to hug and kiss and that is it; that is the end of it. So, this is worrisome because this is the same thing that the previous Minister of Foreign Affairs, the Hon. Ali Sabry said. He said that all of these offices, the Truth and Reconciliation Commission, the Office on Missing Persons, ONUR, are to cover up, to make sure that prosecutions never happen, and he bragged about it. He bragged about it! So, surely when you come into power saying there will be a system change, you cannot be saying the same thing. You cannot have the same intentions. Then, what is the system change? The President, whose Vote is being debated today, must intervene, if he is to remain credible.

If the people in the North and the East are to genuinely believe that this Government is going to, in fact, bring that system change, then you have to make sure that you act differently. Surely, you cannot say system change and then do the same thing that the previous Government did! There is something wrong there. So, that has to change.

I also want to mention a few things on the Budget itself, Sir, certain matters I wanted to bring up on the 25th, but could not because I ran out of time. There is a mention of the Government wanting to set up a development bank. I do not know whether that is an actual requirement because there are development banks

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

in Sri Lanka and also a lot of wastage and mismanagement. And, the answer to that is not the setting up of a new bank; I do not think that is the way to go about it. Instead, I think the Government must intervene and must ensure that that wastage is prevented and through preventing such wastage, I think there can be low -interest loan schemes facilitated. Certainly, for the North and the East, that is very important because we have very weak collaterals we can offer. So, I think that would be a recommendation I would like to make.

The second matter, Sir, is the question of microfinance. You know that soon after the war was completed, a previous Central Bank Governor, the respected Dr. Indrajit Coomaraswamy, came public and said that it was daylight crime to allow these microfinance facilities to go into the war-affected areas because it literally got those people who were trying to recover after the war into a debt trap, and he actually recommended that the Government must, in some way, intervene. I strongly urge that this Government looks into that matter. I would certainly suggest that those microfinance loans that were taken be cancelled or at the very least, a 50 per cent waiver be ensured by the Government. I think that is very important, particularly in the North and the East. I think Anuradhapura, outside the North and the East, was also very badly hit by microfinance and it is something you all must get involved in.

The next matter is with regard to IT services. For IT services, in the past, there were a lot of incentives given and the Western Province, especially Colombo, benefitted tremendously from those. IT business outsourcing is an important economic activity which turns in huge foreign exchange. The Western Province, because it was started early, as I said, benefitted the most, but in the North and the East, it is picking up only now. Primarily because of diaspora investments, there is a considerable amount of activity in this sector in the North and the East, but, unfortunately, come this April, all the incentives that were offered come to an end. Therefore, I would like to urge this Government to ensure that those incentives, in fact, continue. If you do not want to give it to the entire country, at least, give it to the North and the East because - I said this at the Second Reading Debate also - you have to look at the North and the East in a separate way since it is a war-affected area and lags about 30 to 40 years behind the rest of the country. So, if you think that certain incentives being given to the entire country is a waste and cannot be afforded, then, at least, the North and the East must be looked at differently. That is one sector which is very actively being looked at by the youth and must certainly be strengthened. Then, one other matter I wish to state, Sir, is with regard to the Withholding Tax.

The Withholding Tax, to my understanding, has increased from 5 per cent to 10 per cent. I do not know how that is going to benefit anyone because the tendency will be not to save. The people who are going to be most affected are the elders, the senior citizens. As you know, they depend entirely on their savings and if the Withholding Tax is increased in this way, with today's cost of living, they will have to struggle, certainly in the North and the East. If their families do not remit money from the foreign countries they are in, I think they will have a difficult time.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Hon. Member, can I make some clarification on that?

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Yes, but do not my time.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Withholding Tax එක පිළිබඳ කාරණයේදී, මාසික ආදායම රුපියල් 150,000ක් දක්වා tax එකෙන් release වෙනවා. ඒ විතරක් නොවෙයි, සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කරපු Withholding Tax එක මේ අයට නැවත ලැබෙනවා. මොකද, Withholding Tax එක අය නොකරන පිරිසක් ඉන්නවා. බදු වැඩි වෙනවා වාගේම, 150,000ක් දක්වා බද්දෙන් නිදහස් කරලාත් තිබෙනවා. ඒ අය 150,000 දක්වා බද්දෙන් නිදහස් වෙනවා.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am quite happy to hear that, but I am just asking you to think, at the very least for senior citizens, in terms of waiving it off. I am raising it with genuine concern and if you think that your answer would satisfy that, I am not convinced. But my view is, at least for senior citizens, you must waive it.

Then, the other matter is with regard to Annexure IV of the President's Budget Speech.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I will wind up, Sir.

Paragraph 6.4 of Annexure IV of the Budget Speech under "Tax Appeals Commission Act, No. 23 of 2011" states, I quote:

"An appeal to the TAC....."

That is, the Tax Appeals Commission.

> "..... will not be permitted unless, a cash deposit of a sum equivalent to 25% of the disputed amount of assessment of tax, penalty and interest, is deposited in a special account opened by the CGIR."

That is, the Commissioner General of Inland Revenue. That sounds quite frightening. It effectively prevents anybody from making an appeal. That means, whatever that is assessed cannot effectively be called into question at all. Once again, I do not know whether this is the correct way to go about it. I do realize that in the past, people, at the slightest thing, tended to go and appeal, but to make it almost impossible for a person to appeal is unfair in a scenario where you really want investors to come into this country. They will have to pay taxes, but, if they think that something unfair has happened and if you give the impression that it is going to be difficult or impossible for them to query that, then I think it is going to have the complete opposite effect. So, that, I think, is something you should also look at.

I also want to refer to paragraph 6.8 of the same Annexure. I think these are all amendments that you all are thinking in terms of bringing in. It states, I quote:

> "Submission of any evidence that was not previously submitted to the CGIR during the assessment or the administrative review process and taking up new issues which were not taken/disputed during the assessment or the administrative review process, during hearing of Appeal, will not be allowed."

That sounds ridiculous, that you cannot, from the initial stage or at any stage, think in terms of introducing new evidence. I think it is in breach of our own Constitution. When a determination has already been made and new evidence, which was not previously available, becomes available, that new evidence has to be taken into account and the whole determination has to be reversed. So, if you are just trying to say that you cannot do it, then I think there is something wrong. That is definitely against the notions of natural justice. Therefore, I think that is also something you have to look at because these are all things which will actually make investors go away. Actually, if this paragrpah 6.8 of Annexure IV prevails, it will make sure that corruption and fraud get worse because you will go directly to the person at the very instance and try to get him to do things you want and it will actually breed corruption. So, I think, you need to relook at that.

Sir, I certainly want to re-emphasize that this Government cannot go down the path that the previous governments went. That was my main point with regard to the Budget when we voted against it. Our concern is that we have been wronged in the past; there are serious issues. Your Government itself says that in the last 77 years, there was racism. We, the minorities, especially the Tamils, are victims of racism. And, you cannot do the same thing; you cannot tell us that your approach to the issues of the North and the East is going to be the same as that of the previous governments and that is what, unfortunately, today's scenario seems to be.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.38]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමියගේත්, තවත් ආයතන කිහිපයකත්, කොමිෂන් සභා කිහිපයකත් වැය ශීර්ෂ ගැන කථා කරද්දී පළමුවෙන්ම මම මේ කාරණය ඉදිරිපත් කරනවා. මම හිතන හැටියට ගරු දයාසිරි ජයසේකර මැතිතුමාත් පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ යම් කාරණයක් ඉදිරිපත් කළා. ඒ හා සමානව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව සියලු රාජ්‍ය ආයතනවල තනතුරු සඳහා බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සැලකිල්ලට ගනිමින් තනතුරු, සේවා ප්‍රතිවර්ගීකරණය නැවත කාණ්ඩගත කිරීම සහ ශ්‍රේණිගත උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දෙමින් 2006 වසරේ සිට වැටුප් විෂමතා ඇති වීම වැළැක්වීමට පියවර ගැනීම පිළිබඳව තමයි මේ කාරණය අදාළ වෙන්නේ. කාර්ය මණ්ඩලය 850කට ආසන්න පිරිසක් ඉන්න පාර්ලිමේන්තුවේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ක්‍රියාත්මක කරමින් සාධාරණයක් ඉටු කිරීමට වසර 18ක් තිස්සේ අපොහොසත් වෙලා තිබෙනවා. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාත් මේ සභාවේ ඉන්න නිසා මම එතුමාගේ අවධානය මේ සඳහා යොමු කරවනවා. විශේෂයෙන්ම එතුමා ඒ කාලයේ වැටුප් සම්බන්ධයෙන් විශාල උනන්දුවක් දැක්වූ නිසා එතුමාගේ අවධානය මේකට යොමු කරනවා. *[බාධා කිරීමක්]* හොඳයි, මම මේ ලේඛනයත් table කරන්නම්. ඒ අනුව කටයුතු කරනවා නම් හොඳයි. ඒ කාරණයත් ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. ඒ කාරණයට අදාළ ලේඛනයක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමනි, මේ නිසා විශාල පිරිසක් අසාධාරණයට ලක් වෙලා තිබෙනවා කියලා කියා තිබෙනවා. මේක නිවැරදි කරන්න අපොහොසත් වෙලා තිබෙන බවත් සඳහන් වෙනවා. විශාල කාර්ය මණ්ඩලයක් ඉන්න නිසා ඔවුන්ට සාධාරණයක් අපේක්ෂා කරමින් මේ ඉල්ලීම ඉදිරිපත් කරලා තිබෙනවා.

මීට පෙර මේ ගරු සභාව තුළ ගරු බිමල් රත්නායක ඇමතිතුමා සිටියා. එතුමා මගේ මිත්‍රයා. එතුමාගේ කථාවේ තැනකින් මම කථාව පටන් ගන්නම්. එතුමා පසුගිය දා කිව්වා, - විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලෙස මම ඒක අහගෙන හිටියා- එතුමාගේ ඉස්කෝලේ -ආනන්ද විද්‍යාලයේ- හිටියා ලු, හයියෙන් දුවගෙන ඇවිත් බෝලය දමන ක්‍රීඩකයෙක්. හැබැයි, බෝලය දමන්නේ ඉතාම හෙමින් ලු. එතුමා සඳහන් කළා, මයිකල් හෝල්ඩින්ග් වාගේ දුවගෙන එනවා කියලා. නමුත් අපි බලනකොට එහෙම දුවගෙන ඇවිල්ලා දමපු බෝලයක් අපට පේන්නේ නැහැ, අපේ කණ්ඩායමට. වෙන කණ්ඩායම් ගැන නොවෙයි කියන්නේ. හැබැයි, එතුමා ඒ කිව්ව කථාව මම හොයලා බැලුවා. ඉඳලා හිටලා බොරුවක් දෙකක් කිව්වාට සාමාන්‍යයෙන් එතුමා බොරු කියන්නේ නැහැ කියලා මම විශ්වාස කරනවා. ඒ ගැන හොයලා බලනකොට මට දැනගන්න ලැබුණා, එහෙම බෝල් කරලා තිබෙන්නේ, අපේ බිමල් රත්නායක මැතිතුමා කියලා. එතුමා තමයි හයියෙන් දුවගෙන ඇවිල්ලා හෙමින් බෝලය දාලා තිබෙන්නේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා, ඔබතුමාගේ නම සඳහන් කළා කියලා දැන්නම් නැඟිටින්න එපා. වැටුප් පිළිබඳව ඔබතුමා කිව්ව කාරණයට එන්න කලින් මේ ගැනත් කියන්න ඕනෑ. මම හිතන විධියට, ගරු බිමල් රත්නායක මැතිතුමා ඇමතිතුමා වුණාට පස්සේ ඉස්සර වාගේ එච්චර aggresive නැහැ. ගොඩක් හොඳින් කථා කරලා එක පාරට ෆයර් වෙනවා. නෝනා ඉන්න වෙලාවට එච්චර ෆයර් වෙන්නේ නැහැ. එතුමිය නැති වෙලාවට එතුමා පොඩ්ඩක් ආවේගශීලි වෙනවා. ආවේගශීලි වෙලා මුළු විපක්ෂයටම චෝදනා එල්ල කරනවා.

ඔබතුමන්ලා හොඳට තේරුම් ගන්න ඕනෑ, රාජපක්ෂවරුන්ගේ පාලනය සම්බන්ධයෙන් මේ රටේ විශාල ප්‍රශ්නයක් තිබෙන බව. දූෂණය පිළිබඳව වාගේම පාතාලය පිළිබඳවත් ඒ කාලයේ වැඩියෙන්ම කථා කළේ මම. ඔබතුමන්ලාට කථා අඩු කාලයේ පවා ඒ සම්බන්ධයෙන් විශාල හඬක් නැඟුවේ අපි. අපි දන්නවා ඒක. ඒවා දූෂිතයි. ඔබතුමන්ලා කිව්ව ඒ කාරණා සියල්ල අපි දන්නවා. ඔය අනවශ්‍ය වියදම් ඔක්කොම නැති කරන්න. ගරු බිමල් රත්නායක මැතිතුමා කිව්වා වාගේම, අපි කටයුතු කළ අමාත්‍යාංශ වෙක් කරලා බලන්න. මෙතැන ඉන්නවා, මමයි, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමායි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමායි. අපි වැඩ කරපු විධිය වෙක් කරලා බලන්න. අපි කටයුතු කළ කාලයේ ඒ අමාත්‍යාංශවල අබමල් රේණුවකවත් විනාශයක් කරලා නැහැ. මට මතකයි, ඒ කාලයේ අපි පාර්ලිමේන්තුවේ ඉන්න දවස්වල එක ජේවීපී මන්ත්‍රීවරයෙක්වත් මම කටයුතු කළ අමාත්‍යාංශය පිළිබඳව කිසිම දිනක කිසිම චෝදනාවක් කරලා නැහැ. ඔබතුමන්ලාට මම ඒ ගෞරවය දෙනවා. ඔබතුමන්ලා අභිමානයෙන් කියනවා "හොරකම්, අපේ නැහැ" කියලා. අපිත් එහෙමයි. ඒක අභිමානයෙන් අපටත් කියන්න පුළුවන් හැකියාව තිබෙනවා. අපේත් මන්ත්‍රීවරු විශාල පිරිසක් ඉන්නවා. ඔබතුමන්ලාගේත් ඉන්නවා, නරක අඹ ගෙඩි දෙක තුනක්. ඒ වාගේම අතළොස්සක් අපේත් ඉන්න පුළුවන්. හැබැයි, සමූහයක් වශයෙන් ගත්තොත් අපේ කණ්ඩායම පිරිසිදුයි. ඒ වාගේම කෙළින් වැඩ කරන, දූෂණයට විරුද්ධව කථා කරන කණ්ඩායමක්. ඒ හින්දා ඔය කිව්ව කථා ඔක්කොම අපට අදාළ නැහැ. ඔබතුමන්ලා හැමදාම එක එක ලැයිස්තු දමනවා. ඒ හින්දා නේ, ඔබතුමන්ලාට ජනතාව තුනෙන් දෙකක බලය දුන්නේ. සියයට 3ක් නිබුණු බලයක් මේ රටේ ජනතාව වෙනස් කරලා ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් ලබා දුන්නා. ඔබතුමන්ලා මේ කියපු කාරණා ඇතුළු සියලු දේවල් වෙනස් කරන්න තමයි ඒ බලය දුන්නේ.

ඔබතුමන්ලා හැමදාම ඒක කිය කියා ඉන්නවා. ඔබතුමන්ලා ඔය කියන ඔක්කොම හොර මැරකම්වලට සම්බන්ධ අය බලයට ගේන්න වැඩියෙන්ම සහයෝගය දුන්නේ ඔබතුමන්ලා. මහින්ද රාජපක්ෂ මහත්මයා හෝ ඔය කවුරුවත් බලයට ගේන්න අපි කවදාවත් කිසිම සහයෝගයක් දීලා නැහැ. අපි විරුද්ධව වැඩ කළේ. අපි ඔවුන් පරාජය කරන්න, 2015දී දූෂණය සම්බන්ධයෙන් විශාල සටනක් දියත් කළා මට මතකයි. ඒ නිසා ඔබතුමන්ලා තමයි, ඔය කියන හැම දූෂණයක් සම්බන්ධයෙන්ම ඔය ඇඟිල්ල දිගු කරන පිරිසට විශාලම සහයෝගය ලබා දුන්නේ. ඒ මැතිවරණයේදී ඔබතුමන්ලා තලු මර මර මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන කථා කළේ. හැම එක්කෙනාගේම වීඩියෝ තිබෙනවා. ඒ, අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් තරුණ කාලයේ. ඒ කාලයේ ගොඩක් තරුණයි. ඉතාම ආදරයෙන් කියනවා, එදා ගරු කේ.ඩී. ලාල් කාන්ත මහත්මයා, ගරු බිමල් රත්නායක මහත්මයා, ගරු සුනිල් හඳුන්නෙත්ති මහත්මයා, ගරු විජිත හේරත් මහත්මයා, ගරු අනුර කුමාර දිසානායක මහත්මයා - මේ ඔක්කොම අය- තලු මර මර රාජපක්ෂලාගේ ගුණ ගායනා කළේ. ඒ ගුණ ගායනා කරලා ගෙනාපු පාලනය තමයි, ඔබතුමන්ලා මේ විවේචනය කරන්නේ. ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කරන්න, ඒ අදාළ සියලු දේවල් කරන්න. ඒකම කිය කියා මේ ජනතාව වෛරයෙන් උන්මාදයට පත් කරලා මේ රට අපට දිගටම ගෙනියන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධනය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අපට මෙහෙම හැමදාම වෛරයෙන් මේ රට ගෙනියන්න බැහැ. මම මේ ගරු බිමල් රත්නායක ඇමතිතුමාට කියන්නේ, එතුමා දුවගෙන දුවගෙන ඇවිල්ලා මම හිතන හැටියට බෝලය දැම්මෙත් නැහැ, බෝලය හංගා ගත්තා, කාල් ලුවිස්ටත් වැඩිය හයියෙන් ඇවිල්ලා, උසේන් බෝල්ට්ටත් වැඩිය හයියෙන් ඇවිල්ලා. ඔබතුමන්ලා කියපු දේවල් බලන්නකෝ. ඔබතුමන්ලා රනිල් වික්‍රමසිංහ මහත්මයාට බැණ බැණ, සල්ලි ඉතුරු කරපු ටික කියන්නකෝ. ඉතුරු කරපු එක හොඳයි. කවුරු හරි කෙනෙක් නිල නිවසක ඉන්නවා නම්, අපි අත්සන් කරලා දෙන්නම් ඉවත් කරන්න. අපි දේශපාලන ජීවිතයේ කිසිම දිනක මුදල් අවභාවිත කරලා නැහැ. අපි ඒක කරන්න ඉඩ දෙන්නෙත් නැහැ. ඔබතුමන්ලාට ඔය කියන ලියුම යවන්න බැරි නම්, අපි ඒක ලියලා දෙන්නම්. යවන්න, ගෙදර. කවුරු හරි මුදල් අවභාවිත කරනවා නම්, විශාල මුදලක් වියදම් වෙනවා නම්, රුපියල් 30,000ක් 40,000ක් නොවෙයි නම් වියදම් වෙන්නේ, ඊට වඩා කෝටි ගණන් වියදම් වෙනවා නම්, අපි ඒ ලියුම හදලා දෙන්නම්. ඒක ඉක්මනින් ක්‍රියාත්මක කරන්න. ඒවා හොඳ නැහැ තමයි. මේක දුප්පත් රටක්. මේ රටේ මිනිස්සු ජීවත් වෙන්නේ අමාරුවෙන්. මිනිස්සු රුපියල් 35,000යි, 40,000යි වැටුප් ගන්නේ. ඒ වාගේ රටක මේ වාගේ විනාශ ලෙස කරන වියදම් හොඳ නැහැ කියලා අපි දිගටම කථා කළා. ඔබතුමන්ලාට කලින් අපි ඒක කථා කළා. ඔබතුමන්ලා දැන් මේ ආණ්ඩුවත් අරගෙනයි ඒක කථා කරන්නේ. අපි ඒ කාලයේ කථා කළා. ඔබතුමන්ලා මගේ කථා අරගෙන බලන්න. 2015, 2016, 2017 වර්ෂවල මගේ කථා බලන්න. ඔබතුමන්ලාගේ සමහර මන්ත්‍රීවරුන් ඒ කාලයේ කථා කරන්න භය වුණා. එහෙන් ලේකම් ගෝඨාභය රාජපක්ෂ, මෙහෙන් බැසිල් රාජපක්ෂ, එහෙන් මහින්ද රාජපක්ෂ, ත්‍රිවිධ හමුදාව ඒගොල්ලන්ගේ. ඒ කාලයේ ඒ ගැන කථා කළේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒවා ඒ කාලයේ ඉඳන් කිව්වා.

ඔබතුමන්ලා දැන් බලන්නේ, ඔබතුමන්ලාගේ හා අපේ ක්‍රියා කලාපය. දැන් ඔබතුමන්ලා දුවගෙන ඇවිල්ලා දමන බෝලය ගැන ඔබතුමන්ලා බලන්න. ගරු විජිත හේරත් ඇමතිතුමා, ඒ වාගේම ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා පාතාලය ගැන කිව්ව දේ බලන්න. "මේ රටේ මහ දවල් මිනිස්සු මරනවා නම්, කොහොමද, මේ රට ජාත්‍යන්තරයත් එක්ක ගනුදෙනු කරන්නේ?" කියලා ඇහුවා. "මහ දවල් මිනිස්සු මරනවා නම් මොන රටක්ද?" කියලා ඇහුවා. අමාරු වැඩක් තමයි, පාතාලයේ ප්‍රශ්න තිබෙනවා තමයි. හැබැයි, ඔබතුමන්ලා අද වෙන දිවකින් නේ කථා කරන්නේ. වෙන දෙයක් නේ ඔබතුමන්ලා කියන්නේ. ඔබතුමන්ලා කියනවා, මේක සාමාන්‍ය දෙයක් කියලා. ජාතික ආරක්ෂාව කියන්නේ, පිටරට හමුදාවක් ඇවිල්ලා අපට ගහන එක නොවෙයි. ඇමෙරිකාවේ අධිකරණයක් මැදට පාතාලයෙන් කවුරු හරි ඇවිල්ලා කෙනෙක් මැරුවා කිව්වොත්, ඇමෙරිකාවට තිබෙන තත්ත්වය බලන්න. අපට මේවා පුරුදු ඒවා වෙන්න පුළුවන්. හැබැයි, පිටරටවල් මේවා දිහා බලන්නේ ඉතාම පිළිකුල්සහගත ලෙසයි. මේකෙන් අපේ රටේ තත්ත්වය පහත වැටෙනවා. මේක වුණේ ඔබතුමන්ලාගේ වරදින් කියලා, මම ඔබතුමන්ලාට ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. හැබැයි, ඔබතුමන්ලා ඒ වෙලාවේ කියපු කථා බලන්න. මේ රටේ එහෙම දෙයක් කර ගන්න බැරි නම්, ඒ ආණ්ඩුව ගෙදර යන්න ඕනෑ කියලා ඔබතුමන්ලා කිව්වා.

ඒ වාගේම, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා වැටුප් ගැන කිව්වා. පෞද්ගලික අංශයේ වැටුප් සියයට 40කින්

අනිවාර්යයෙන්ම වැඩි කරන්න ඕනෑ කිව්වා. හැබැයි, එහෙම වැඩි වෙලා නැහැ. ඒක කරන්න අමාරුයි, අපි දන්නවා. හැබැයි, ඔබතුමන්ලා ඒ කාලයේ සටන් කළේ, අනිවාර්යයෙන්ම වැඩි කරන්න කියලායි. ඔබතුමන්ලා ආවාට පස්සේ ඒක වැඩි කරනවා කිව්වා.

ඊළඟට හාල් මාෆියාව ගන්න. *[බාධා කිරීමක්]* හරි. ඔබතුමාට මම අවස්ථාව දෙන්නම්. මම ඒකයි මේ මාස පහ, හයම හිටියේ. ඔබතුමන්ලාට මම මාස හයක් දුන්නා. තව මාස දෙක, තුනක් දෙන්නම්. හාල් මාෆියාව ගැන කථා කළා. හාල් මාෆියාව දැන් control කරන්නම බැහැ නේ. ඩඩ්ලි මහත්මයලා, ඒ කට්ටිය කවුරුවත් control කරන්න ඕනෑ කියලා මම කියන්නේ නැහැ. මම කියන්නේ හාල් මිල control කරන්න කියලා. එක පැන් පහරින් ගෙදර යවනවා කිව්වා. තවම ඒක කර ගන්න හැකියාවක් නැහැ නේ. ඒ වාගේම පෙට්ල්, ඩීසල්වලින් පගා ගන්නවා කිව්වා, ඇමතිවරු රුපියල් 125ක් ගහනවා කිව්වා. ඒක ඉවත් කරනවා කිව්වා, ඒක ඉවත් කළේ නැහැ. විදුලි බිල සියයට 35කින් අනිවාර්යයෙන්ම අඩු කරන්න පුළුවන් කියලා ඔබතුමන්ලා කිව්වා. ඒක අඩු කර ගන්න බැරි වුණා. ඒ වාගේම මට මතකයි, ජනාධිපතිතුමා කිව්වා, මීනිරන් ග්‍රැෆයිට් කරනවා කියලා. එහෙම නොවෙයි, මම හිතන විධියට එතැන වැරදුණා. එතුමා කිව්වා, ග්‍රැෆයිට්, ග්‍රැෆීන් කරලා මේ රට ධනවත් රටක් බවට පත් කරන්න පුළුවන් කියලා.

දැන් කරන්න පුළුවන් නේ. තුනෙන් දෙකක බලයක් තිබෙනවා, එතුමා තමයි ජනාධිපති. ග්‍රැෆයිට්, ග්‍රැෆීන් කරන්න කියන තරම් ලේසි නැහැ. ඒකට ඩොලර් බිලියන 4කට වැඩි ආයෝජනයක් අවශ්‍යයි. මමත් ඔය අමාත්‍යාංශයේ හිටියා. මම සියලුදෙනා ගෙන්වලා මේ පිළිබඳව කථා කළා. අපි මේ සඳහා ඔබතුමාට සහයෝගය දෙන්නම්. කරන්නත් පුළුවන්. හැබැයි, අමාරුයි. අපේ රටේ තිබෙන විදුලි බිලත් එක්ක ඩොලර් බිලියන 3ක්, 4ක් ආයෝජනය කරන්න කවුරුවත් එන්නේ නැහැ. එතැන ප්‍රශ්නයක් තිබෙනවා.

ඒ වාගේම ණය සම්බන්ධයෙනුත් කථා කළා. ඇප නැතිව ණය දෙනවා කිව්වා. පොලී නැතිව ණය දෙනවා කිව්වා. නමුත් මේවා කරන්න බැහැ. ඉල්ලුම සැපයුම අනුව ක්‍රියාත්මක වෙන මේ ලෝකයේ ඇප නැතිව ණය දෙන්න බැහැ. මම කාන්තාවන් වෙනුවෙන් වැඩසටහනක් කළා. මම කොළඹ දිස්ත්‍රික්කයේ කාන්තාවන්ට මහන මැෂින් දීලා 10,000කට වැඩි ප්‍රමාණයක් පුහුණු කළා. මමත් හිතුවා, කාන්තාවන්ට ණයට දුන්නාම ආපසු ගෙවයි කියලා. මම ඇප නැතිව මහන මැෂින් දුන්නා. ඇප නැති වුණේ මට! මහන මැෂින් 200ක් විතර දුන්නා. සිංගර් එකෙන් අරගෙන දුන්නේ. කවුරුවත් ණය ගෙව්වේ නැහැ. ගෙවයි කියලා හිතලා පළමුවැනි අත්තිකාරම මම ගෙව්වා. මම ඒ ගැන study කළා. Finance කරලා කාන්තාවන්ට දුන්නොත් ගෙවයි කියලා මගේ කාර්ය මණ්ඩලයත් කිව්වා. ඒ නිසා මහන මැෂින් 200ක් දුන්නා. රුපියල් 10,000 ගානේ මම ගෙව්වා. ඊට පස්සේ ඔක්කොම මුදල් ටික මට ගෙවන්න වුණා. ඒ නිසා මම කියන්නේ මේවා ප්‍රායෝගික නැහැ කියන එකයි. ඇප නැතිව දුන්නොත් කිසිම පුද්ගලයෙක් ගෙවන්නේ නැහැ. බැරි නිසා නොවෙයි. ගෙවන්න බැරි නිසා වෙන්නත් පුළුවන්. ඒ දෙකම වෙන්නත් පුළුවන්. ඒ ගෙවීම සිදු වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා කරන්න බැරි දේවල් කියන්න එපා. ඇප නැතිව, පොලී නැතිව ණය දෙන ලෝකයේ කිසිම රටක් නැහැ. ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවා සමාජවාදී රටවල ක්‍රියාත්මක වෙනවා. නමුත් ඔබතුමන්ලා එහෙම සමාජවාදී රටක නොවෙයි, දැන් ඉන්නේ.

විකුණන එකට දැන් ඔබතුමන්ලා කියනවා, අභිලාෂය කැඳවීම කියලා. වචන වෙනස් කරනවා. දැන් ලාල් කාන්ත ඇමතිතුමා කියනවා, රජය මේකට එකතු කරගෙන රජයෙන් පාලනය වෙන්නේ කියලා. එතකොට ජනාධිපතිතුමා කියනවා, "අලාභ ලබන සියලු ආයතන කොටස් වෙළෙඳ පොළට දමනවා, නැත්නම් පෞද්ගලීකරණය කරනවා, නැත්නම් වසා දමනවා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලීකරණය සඳහා යන්න ඕනෑ කියලා එතුමා පිළිගන්නවා. විශේෂයෙන් රාජ්‍ය ආයතන බංකොලොත් වෙනවා. මම ඔබතුමන්ලාට මේ කරණය කියනවා. තව අවුරුදු දෙකක් යද්දී ඔබතුමන්ලාට තේරෙයි, ශ්‍රීලන්කන් ගුවන් සමාගම නිසා මේ ආණ්ඩුව කොච්චර පාඩුවක් ලබයිද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොරොච්චෝලේ බලාගාරය සම්බන්ධයෙන් විවේචන තිබුණා. ඒ වාගේම පිට රට තිබෙන හොරකම් කරපු සල්ලි බිලියන 18,000ක් ගේන්න පුළුවන් කියලා ඔබතුමන්ලා කිව්වා. ඒ වාගේම කිව්වා, ඩොලර් 500 ගණනේ පිට රට රැකියා කරන අපේ පුද්ගලයන් මේ රටට එවයි කියලා. මේ වෙනකොට අපට ඒ සම්බන්ධයෙන් කිසිම ප්‍රවෘත්තියක් ලැබිලා නැහැ. එහෙම දෙයක් කළා කියලාවත්, එහෙම දෙයකට උත්සාහ කළා කියලාවත් අපට දකින්න ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිෂ්පාදනය සම්බන්ධයෙන් මේ අය වැයේ කිසිම දෙයක් සඳහන් වෙන්නේ නැහැ. මම ඔබතුමන්ලාගේ අය වැය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්නම්. 2023 trade, industries, energy and economic servicesවලට බිලියන 0.7ක් වෙන් වෙනවා. 2025ට වෙන් වෙන්නේ බිලියන 0.4යි. නිෂ්පාදනය සම්බන්ධයෙන් කිසිම වැඩ පිළිවෙළක් නැහැ. අපට ඩොලර් බිලියන 12ට වැඩිය ඕනෑ. ණය ගෙවන්න අවශ්‍ය වෙනවා, ඩොලර් බිලියන 4 ½ ක්, නැත්නම් ඩොලර් බිලියන 5ක්. 2028දී ණය ගෙවන්නේ නැතිව අපේ අය වැය පරතරය විතරක් ඩොලර් බිලියන 7.2ක් වාගේ ප්‍රමාණයක් වෙනවා. අපි ඩොලර් බිලියන 12ක් හොයන්න ඕනෑ. ඔබතුමන්ලා කියලා තිබෙනවා, අපනයන ඩොලර් බිලියන 13 සිට 19 දක්වා අරගෙන යනවා කියලා. නමුත් එහෙම සැලසුමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මහ බැංකුවේ අධිපතිතුමාත් කිව්වා, දැන් ක්‍රියාත්මක කරන monetary policiesවල ප්‍රතිඵල එන්නේ මාස 15කට පසුව කියලා. ඔබතුමන්ලාට යම් මුදලක් තිබෙනවා නම්, ඒකත් ලොකු මුදලක් නොවෙයි. අය වැය ෂේප් කර ගන්න හරි මුදලක් තිබෙනවා නම්, ඒ මීට මාස 15කට කලින් ගත්ත තීන්දුවල ප්‍රතිඵල. ඔබතුමන්ලා ගත්ත තීන්දුවල ප්‍රතිඵල එන්නේ තව මාස 10කින්, තව මාස 15කින්. ඒ වෙනකොට අපි මේ රටේ නිෂ්පාදන පටන් ගත්තේ නැත්නම්, කර්මාන්ත පටන් ගත්තේ නැත්නම්, අඩුම ගණනේ factories 500ක්, නැත්නම් 1,000ක් ආරම්භ කළේ නැත්නම් ඉතා විශාල ආර්ථික අගාධයකට යන්න අපට සිදු වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් මොහොතකට කලින් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, දළදා වහන්සේ ප්‍රදර්ශනය කරනවාට අපි කලබල වෙලා කියලා. ඒ වාගේම අපි බය වෙලා වාගේ කිව්වා. අපට බය තිබුණේ අද නොවෙයි, ගරු අගමැතිතුමියනි.

මම හිතන විධියට ඔබතුමිය එතකොට ලංකාවේ හිටියේ නැහැ. ඒ කියන්නේ 88-89 කාලයේ ඔබතුමිය විදේශගතව ඉගෙන ගත්ත කාලයේ. එදා ඒ අයට යන්න හම්බ වුණේ දළදා මාලිගාවේ පහත මාලයට විතරයි. තර්ජනයක් තිබෙන බව දැනගෙන ඊට කලින් මල්වතු-අස්ගිරි මාහිමිපාණන් වහන්සේලා, ඒ වාගේම එවකට හිටපු දියවඩන නිලමේතුමා අපේ දන්ත ධාතූන් වහන්සේ ආරක්ෂිත තැනක සඟවා තිබ්බේ නැත්නම්, වැරදිලාවත් ඒ අය උඩ මහලට ගියා නම්, අද ඔයගොල්ලන්ට ප්‍රදර්ශනය කරන්න දළදා වහන්සේ නමක් අපේ රටේ ඉතුරු වෙයිද කියන එක පිළිබඳවත් සැකයක් තිබෙනවා. ඒ නිසා මේ වතාවේ දළදා වඳිනකොට, එදා කරපු පාප කර්මයට සමාව ගැනීම සඳහා පසඟ පිහිටුවා වඳින්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

2015දී කොමිෂන් සභා පිහිටුවන්නට පාර්ලිමේන්තුව තුළදී ජනතා විමුක්ති පෙරමුණ විශාල දායකත්වයක් දැරුවා. එදා අප සමඟ එකට හිටපු අනුර කුමාර දිසානායක මැතිතුමා, නලින්ද ජයතිස්ස මැතිතුමා, බිමල් රත්නායක මැතිතුමා අද ඒ කොමිෂන් සභා මර්දනය කරන්නට, ඒවාට අර ගමේ භාෂාවෙන් කියන විධියට "තග" දමනකොට, තර්ජනය කරනකොට, ඔබතුමන්ලා මතක් කරගන්න එදා යහපාලන රජය බිඳ වැටෙන්නට ප්‍රධාන හේතුවක් වුණේත් ඒ කියන කොමිෂන් සභාවලට යම් යම් බලපෑම් සිද්ධ කරන්න ගිය නිසාය කියන කාරණය. ඒ ගැනත් මම මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම මම දැක්කා, අලුත් බද්දක් ගැන. මොකක්ද? උණ්ඩියල් ක්‍රමය මඟ බැංකුවේ ලියාපදිංචි කරලා බදු ගහන යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා. ඒක හරියට කසිප්පුකාරයෝ ටික ලියාපදිංචි කරලා සුරාබදු දෙපාර්තමේන්තුවෙන් බදු ගහනවා වාගේ වැඩක්. එහෙම නැත්නම් පාතාලය ලියාපදිංචි කරලා ජයරත්න එකෙන් හෝ රේමන්ඩ් එකෙන් හෝ බදු ගන්නවා වාගේ වැඩක්. ඒ නිසා අපි මීට වඩා බුද්ධිමත්ව මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ කියලා මම කියා සිටිනවා.

ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයෙන් එතුමා ඇතැම් වියදම් ඉවත් කර තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. හොඳ දේට හොඳයි කියන්න ඕනෑ. හැබැයි අපි දැක්කා, ඇතැම් වියදම් වෙනත් අමාත්‍යාංශවලට දමා වියදම අඩුයි කියලා පෙන්වපු බවක්. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා ඒ ගැන කථා කරපු නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ. ඒ නිසා මම කියනවා, ඒක තනිකරම ඇස් බැන්දුමක් බව. ගිණුම්කරණ හා පරිපාලන මූලිකාංග පාවිච්චි කරලා, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල තීරු වෙනස් කරලා, පොත balance කර තිබෙනවා වාගේ තමයි පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ අය වැය තුළ අපි දකිනවා, අගය අමතක කරලා වටිනාකමට ඉලක්කම් දමා වියදම් කපා තිබෙන බවක්. ඒකෙන් වෙන්නේ මිල කළ නොහැකි ජාතික උරුමයන් රටට අහිමි වෙලා යන්න තිබෙන ඉඩකඩ වැඩිවීමයි කියන එකත් මතක් කරන්න ඕනෑ. මොකද, මේ මන්දිර අවුරුදු 200කට වඩා පැරණි ගොඩනැගිලි. මේවා ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති දේවල්. ඒවායේ තිබෙන ගෘහ නිර්මාණ ශිල්පය, ඒවායේ තිබෙන ලේඛන වාගේ දේවල්වල විශාල වටිනාකමක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේවා සම්බන්ධව නිසි අයුරින් කටයුතු නොකළොත්, මේ ජාතික උරුමයන් අනාගතයේදී දරුවන්ට දකින්නවත් නැති වේවි. ඒ නිසා මේවා නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය කාරණයක් හැටියට මම දකිනවා.

ඊළඟට, විගණන සේවා කොමිෂන් සභාව ගැනත්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ගැනත් වචනයක් කියන්න ඕනෑ. ජාතික තරුණ සේවා සභාවේ සිද්ධියක් සම්බන්ධයෙන් කථා කරන අවස්ථාවක COPE එකේ මේවා ගැන කථා වෙනවා මම දැක්කා. වරදක් වෙලා තිබෙනවා නම්, අනිවාර්යයෙන්ම ඒවා විමර්ශනය කරන්න ඕනෑ; දඬුවම් ලැබෙන්න ඕනෑ. හැබැයි, මම රාජ්‍ය සේවයේ සියලු දෙනාටම කියනවා, සැපයුම්කරුවෝ ලියාපදිංචි වෙලා නැත්නම්, Technical Evaluation Committee එකක් නැත්නම්, ප්‍රසම්පාදන කමිටුවක් නැත්නම් රුපියල් 1,000කටවත් අත්සන් කරන්න එපා කියලා.

මොකද, මේ නාට්‍ය පෙන්වීම තුළ ඔබටත්, ඔබගේ පවුලේ අයටත් පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයකට පත් වේවි කියලා මම හිතනවා. මොකද, අනතුරු ඇඟවීමේ නිලධාරීන් දැන් ගෙවල්වලට එනවා. තැන් තැන්වල අපටත් අනතුරු අඟවලා තිබෙනවා. එවැනි නිලධාරීන් ආවොත් ඔබත්, ඔබගේ දරුවනුත් අපහසුතාවට පත් වේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, දැන් මොහොතකට කලින් කථා කරපු ජනාධිපති අරමුදල ගැනත් කථා කරන්න ඕනෑ. එදා ලසන්ත වික්‍රමතුංග ගැන සමාජයේ කථා වෙනකොට එක නම් ලැයිස්තුවක් දැම්මා. දළදා වහන්සේට ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් සමාජයේ කථා වෙනකොට ඉතිරි නම් ලැයිස්තුව දැම්මා. මම කියනවා, ඊට එහා ගිහිල්ලා මේවා ගැන කථා කරන්න කියලා.

2024 වර්ෂය වාගේ වන විට අපි දැක්කා, දින තුනක් යනකොට ජනාධිපති අරමුදලට ලැබුණු අයදුම් පත්‍රවලින් සියයට 50කට පමණ ප්‍රතිචාර දැක්වූ බව. ඒ වාගේම දින පහක් යනකොට, ලැබුණු ඒ අයදුම් පත්‍රවලින් සියයට 85කට ප්‍රතිචාර දක්වා තිබෙනවා. ඒ නිසා මම කියනවා, මේ වෙනකොට සති තුනක් ගිහිල්ලාත් උත්තරයක් නැති අයදුම් පත්‍ර තිබෙන බව. ඒ නිසා මෙන්න මේවායේ කාර්යක්ෂමතාව ගැන සොයා බලන්න කියන එක මම ඒ අයට කියන්න ඕනෑ. ඒ වාගේම කිව්වා, ජනාධිපති අරමුදල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට ගෙනියනවා කියලා. මේ වෙනකොට නියමු ව්‍යාපෘති 8ක් ක්‍රියාත්මක වෙනවා. ඉස්සර දින 5න් ඒ ආයතනවලට මුදල් ලැබුණා. දැන් මාසයකින්වත් මුදල් ලැබෙන්නේ නැහැ කියලා ඒ අය කියනවා. ඒ නිසා මේවා ගැනත් හොයා බලන්න කියා මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම ජනාධිපති අරමුදලෙන් මුදල් ලැබුණු අය ගැනත් කියන්න ඕනෑ. අපට ජාතික සම්පත් තිබෙනවා. ඒවා මානව සම්පත් වෙන්න පුළුවන්, භෞතික සම්පත් වෙන්නත් පුළුවන්. "හෙළයේ මහා නිළි රැජින" වන මාලනී ෆොන්සේකා මහත්මියව අපි දන්නවා. මාලනී ෆොන්සේකාලා දෙන්නෙක් නැහැ, ඉන්නේ එක්කෙනායි. එතුමියට අසනීප වුණාම රුපියල් ලක්ෂ 50ක මුදලක් දීලා තිබෙනවා. ඒ මුදල ගැන දැන් ප්‍රශ්න කරනවා. මේ, "හෙළයේ මහා නිළි රැජින". ඉන්දියාව ගත්තොත්, ලතා මංගේෂ්කාර්, රවි ශංකර්, අමිතාබ් බච්චන්, ෂාරුක් ඛාන් කියන මේ සියලුදෙනා ජාතික වස්තු හැටියට සලකන්නේ. හැබැයි, කලාකරුවන් විශාල පිරිසක් ජාතික

ජන බලවේගයට සහයෝගය දක්වනකොට, ඔබතුමන්ලා මේ සිද්ධිය සම්බන්ධයෙන් හැසිරෙන හැටි ගැන මට හරි කනගාටුවක් හිතෙනවා. ඒ මුදල ලබා දුන් නිසායි එතුමියගේ ජීවිතය බේරෙන්නේ. ඒ වාගේම පාසල් සිසුවියකට මුදල් ලබා දීලා ඇයගේ ජීවිතය බේරා දුන් එක ගැනත් මේ වන විට විමර්ශන කෙරෙනවා. ඇත්තටම මේවා ගැන කථා කරන්නත් ලජ්ජාවක් තිබෙනවා. ඒ නිසා මේවා ගැන මීට වඩා සංවේදීව කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්වරුන්ට, ගණකාධිකාරිවරුන්ට, සහාය කාර්ය මණ්ඩලවලට මම කියනවා, මෙහෙම ගියොත් ජනාධිපති අරමුදල සම්බන්ධව ඔබ කරන හැම අත්සනකටම ඔබට උත්තර දිදී ඉන්න වේවි කියලා. ඒ නිසා මේ රජයේ සේවකයන් දංගෙඩියට ගෙනියන එක නවත්වන්න කියන එකත් මම මේ රජයෙන් ඉල්ලා සිටිනවා. එහෙම නොවුණොත් වෙන්නේ මේ කිසිම ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් රජයේ සේවකයෝ තීන්දු තීරණ ගන්නට මැළි වෙන එකයි කියලා මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ කථා කරන්නේ විශේෂ වියදම් ඒකක යටතේ වන ආයතන 21ක් ගැන. මේ ආයතන 21 තමයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැක ගන්නට මූලිකවම කටයුතු කරන්නේ. මට මතක් වෙනවා, ප්‍රංශ ජාතික දේශපාලන විද්‍යාඥ වාල්ස් මොන්ටෙස්කියු බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කරමින් කියා තිබෙනවා, "යම් පුද්ගලයෙකු තම බලය ඒක රාශි වන විට එම බලයට සීමා පනවන තුරු එම බලය අයථා ලෙස ක්‍රියා කිරීම නතර නොකරන බව." ඒ වාගේම, "බලය මර්දනය කළ යුත්තේ බලය මඟින්ම බවත්, ඒ අනුව බලය ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය අතර බෙදී යා යුතු බවත්" එතුමා පවසනවා. අද මේ කථා කරන ආයතන 21ම මා අර ඉහත කිව්ව අංශ තුන ඇතුළේ තිබෙන ආයතන. ඒ නිසා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගොඩනැඟිලා තිබෙන්නේත් ඔය මම කිව්ව කුලුනු තුන මත. ඒ කියන්නේ ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය මත. මේවා මඟින් මේ රටේ පාලනය සිද්ධ වෙනකොට ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියන එකට කොයි තරම් වගකීමක්, වටිනාකමක් තිබෙනවාද කියන එකට මට යම් උදාහරණයක් මතක් වෙනවා. අපි බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය තමයි භාවිත කරන්නේ. ඒ සම්ප්‍රදායය තුළ ආණ්ඩු පක්ෂය හඳුන්වන්නේ "රජුගේ හෝ රැජිනගේ ආණ්ඩු පක්ෂය" කියලා.

ඒ වාගේම විපක්ෂය හඳුන්වන්නේත්, "රජුගේ හෝ රැජිනගේ විපක්ෂය" කියලා. එතකොට මේකෙන් පෙනෙනවා, මේ දෙගොල්ලන්ම රටක ප්‍රජාතන්ත්‍රවාදයට වැදගත් කියලා. මොන විධියකින් හෝ විධායකය විසින් ව්‍යවස්ථාදායකය යටපත් කරන්න හදනවා නම්, එහෙම නැත්නම් ව්‍යවස්ථාදායකය විසින් විධායකය යටපත් කරන්න හදනවා නම්, එහෙමත් නැත්නම් විධායකය සහ ව්‍යවස්ථාදායකය විසින් අධිකරණය යටපත් කරන්න හදනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම එතැනදී සිද්ධ වෙනවා කියලා මම හිතනවා. ඒ නිසා ආණ්ඩු පක්ෂයට ලැබී තිබෙන බහුතර බලය පාවිච්චි කරලා විපක්ෂය යටපත් කරන්නට උත්සාහ කරනවා නම් මම හිතනවා, එතැනදී මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය රඳා පවතින එකක් නැහැයි කියලා. ඒ වාගේම ඒ පාලනයට අහිතකර තත්ත්වයක් ඇති වෙනවා කියලා මම කියනවා. මොකද, ප්‍රජාතන්ත්‍රවාදය තිබුණොත් එහි ප්‍රතිඵල, ප්‍රතිලාභ ලැබෙන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවට. මම එහෙම කියන්න හේතුව මෙයයි.

අද ඔබේ ආණ්ඩුවට හයෙන් පහකට ආසන්න බලයක් ලැබිලා තිබෙනවා. එහෙම තියාගෙන අද තනි ආණ්ඩුවක්, විපක්ෂයක් නැති තනි ආණ්ඩුවක් ගෙනියන්න දින ගණින අය, ඇඟිලි ගණින අය ඉන්න බව දැන් අපට පෙනෙනවා. එතකොට මේ හඳන්නේ මේ රටේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය වළ දාන්න ද කියන එක අපට අහන්න වෙනවා. මොකද, මේක මා දකින්නේ ප්‍රජාතන්ත්‍රවාදයට කරන අනතුරු ඇඟවීමක් විධියට. ඒ නිසා මේ වැය ශීර්ෂවලට අදාළ සියලු ආයතන ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නට තිබෙන ආයතන බව අපි පිළිගන්න ඕනෑ. ඒ ගැන අවබෝධ කර ගන්න ඕනෑ. ඒ වාගේම යහ පාලන මූලධර්ම අනුව මේ රට පාලනය කර ගන්නට, මෙහෙයවන්නට නම් මේ ආයතන ශක්තිමත් කිරීම අත්‍යවශ්‍යයි කියන එකත් අපි වගකීමෙන් යුතුව කියන්න ඕනෑ. ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය, පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ, පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ, අධිකරණ සේවා කොමිෂන් සභාව යනාදී මේ සියලු ආයතනවල වැය ශීර්ෂ සාකච්ඡා කරන අවස්ථාවේදී ඒවායේ සේවය කරන අයගේ අයිතිවාසිකම් සහ ඒ අයගේ වැඩකටයුතු කර ගෙන යන්නට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම රජයේ වගකීමක් හැටියට මා දකිනවා.

අපි මේ මොහොතේ විශේෂ වියදම් ඒකකයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන විට මේවායේ කාර්යභාරය, ඒ වාගේම ප්‍රජාතාන්ත්‍රික සමාජයක පැවැත්ම ආරක්ෂා කරන්නට, එය තහවුරු කරන්නට වගකීමක් තිබෙන මේ ආයතන ශක්තිමත් කරන්නට අප සියලුදෙනාම වගකීමෙන් යුතුව කටයුතු කරන්න ඕනෑය කියන එකත් මතක් කරමින්, විපක්ෂයක් නැති තැන ඒ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම සිද්ධ වෙන බව නැවත වතාවක් ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට අපරාධකාරයන්ගේ දේශයක් බවට පත් කළ අය අද මෙතැනට ඇවිල්ලා කිඹුල් කඳුළු හෙළනවා. පාතාලයක් නිර්මාණය කරන්න දායක වෙච්ච මිනිස්සු, පාතාලය පෝෂණය කරපු, පාතාලය පවත්වාගෙන ගිය, පාතාලයට ආයුධ සපයපු අය අද පාතාලය ගැන කථා කරනවා. ඒ වාගේම මෙතැනදී කියැවුණා, ජවිපෙ ආයුධ ගැන. අවුරුදු 30ක්, 40ක් මේ රට පාලනය කරලා, මේ රටේ ජනතාව ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ජාතික ජන බලවේගයට ජන වරමක් දුන්නාට පසුව අද මෙතැනට ඇවිල්ලා, ජවිපෙ ආයුධ ගැන කථා කරනවා. මම හිතන විධියට, පාතාලයක් නිර්මාණය කරන්න වටපිටාව සකස් කරපු සමාජ, ආර්ථික, දේශපාලනයක් මේ රටේ නිර්මාණය කරපු පක්ෂ තමයි අද මේ විධියට ඇවිල්ලා කිඹුල් කඳුළු හෙළන්නේ. අපි ජන වරම ලබාගෙන මාස තුනක් යනකොට මේ රට විනාශ කරපු බොහෝ අය අද මෙතැන ඇවිල්ලා වැළලෙන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හින්දා බොහෝ අයගේ ඒ දේවල්වලට උත්තර දෙනවාට වඩා අද දින ජනාධිපති වැය ශීර්ෂයත්, විශේෂයෙන් කොමිෂන් සභා ඇතුළු අනෙකුත් ප්‍රධාන ආයතනවල වැය ශීර්ෂත් පිළිබඳව කථා කිරීම වැදගත් කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන් ස්වාධීන කොමිෂන් සභා ගැන මෙතැනදී කියැවුණා. ස්වාධීන කොමිෂන් සභා වෙනුවෙන් දැවැන්ත සටනක් දියත් කරපු පක්ෂයක් තමයි, අපේ පක්ෂය.

[ගරු ආනන්ද විජේපාල මහතා]

ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කළා වාගේම ඒ ස්වාධීන කොමිෂන් සභාවල නිදහස, ස්වාධීනත්වය වෙනුවෙනුත්, ඔවුන්ගේ බලතල වෙනුවෙනුත් අපි කැප වෙනවා; මැදිහත් වෙනවා. රජය ඒ කොමිෂන් සභාවලට කිසිම බලපෑමක් කරන්න සූදානමක් නැහැ. ඒ වාගේම ඔවුන්ගේ පාර්ශ්වයෙනුත් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ගත යුතු පියවර රාශියක් තිබෙනවා. ඒ වෙනුවෙන් ඔවුන් ඒ පියවර ගනීවි කියලා අපි විශ්වාස කරනවා. මේ රටේ ජනයාගේ අභිලාෂය තේරුම් අරගෙන රාජ්‍ය ආයතන, දේශපාලන අධිකාරිය වාගේම, කොමිෂන් සභාත් කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. අපි මේ වනකොට රජයක් හැටියට අවධානය යොමු කරලා තිබෙනවා, ඒ කොමිෂන් සභා ශක්තිමත් කරන්නත්, ඒවායේ යටිතල පහසුකම් වර්ධනය කරන්නත්, ඒ සඳහා අවශ්‍ය මූල ධනය නැත්නම් ඒවා ලබා දෙන්නත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගත්තොත්, 2025 වර්ෂය සඳහා මූලධන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 454ක් වෙන් කර තිබෙනවා. පුනරාවර්තන වියදම් සඳහා වෙන් කර තිබෙන මුදල රුපියල් මිලියන 2,526යි. එකතුව රුපියල් මිලියන 3,000යි. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා රුපියල් මිලියන 38,600ක් වෙන් කරගෙන තිබුණා. අපි ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය විශාල වශයෙන් අඩු කර ගත්තා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට 2023 වසරේදී වෙන් කළ මුදල රුපියල් මිලියන 644යි. 2024 වසරේදී වෙන් කළ මුදල රුපියල් මිලියන 950යි. මේ අවුරුද්දේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට රුපියල් මිලියන 1,374ක් වෙන් කරලා තිබෙනවා. ඒකේ අදහස මොකක්ද? අපි මේ රටේ ජනයාගේ ජන වරම හොඳින් තේරුම් අරගෙන තිබෙනවා. අල්ලස, දූෂණය සහ වංචාවෙන් තොර රටක් හදන්න ඕනෑ කියලා අපි මේ රටේ ජනයාට කිව්වා. එය යථාර්ථයක් කරන්න මේ අය වැයෙන් පදනම දමලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මෙතැනදී කොමිෂන් සභා ගැන කිව්වා. කොමිෂන් සභා වෙනුවෙන් සමහර අය කිඹුල් කඳුළු හෙළුවා. ජාතික විගණන කාර්යාලය වෙනුවෙන් 2023 වසරේදී රුපියල් මිලියන 2,260ක් වෙන් කරනකොට, 2024 වසරේදී රුපියල් මිලියන 3,254ක් වෙන් කරනකොට, මෙවර අය වැයෙන් ජාතික විගණන කාර්යාලයට රුපියල් මිලියන 4,353ක් වෙන් කරලා තිබෙනවා. එහෙම කරන්න හේතුව මොකක්ද? ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය අඩු කරනකොට අපි මේ රටේ කොමිෂන් සභාවලට, විශේෂයෙන් අල්ලසට, දූෂණයට, වංචාවට එරෙහිව කටයුතු කරන කොමිෂන් සභාවලට වෙන් කළ මුදල් ප්‍රමාණය වැඩි කරලා, ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරලා, ඒ කාර්යයන් වඩා ශක්තිමත්ව කරන්න අවශ්‍ය පදනම දමා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජාතික ප්‍රසම්පාදන කොමිසමට 2023 වසරේදී රුපියල් මිලියන 89යි වෙන් කර තිබුණේ. 2024 වසරේදී රුපියල් මිලියන 129යි වෙන් කර තිබුණේ. මෙවර 2025 අය වැයෙන් ඒ සඳහා රුපියල් මිලියන 222ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව වඩා විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග ශක්තිමත් කරන්න ප්‍රසම්පාදන කමිටුවට අවශ්‍ය වටපිටාව, ශක්තිය මෙවර අය වැය තුළින් ලබා දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන මේ සභාවේදී බොහෝ දේවල් කිව්වා. ඒකාධිපතිත්වයක් ගැන යම් යම් කථා කිව්වා. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට 2023දී රුපියල් මිලියන 274ක් වෙන් කළා. 2025 මෙවර අය වැයෙන් ඒ සඳහා රුපියල් මිලියන 419ක් වෙන් කරලා තිබෙනවා. මේකෙන් අර්ථවත් වෙන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න කටයුතු කරලා තිබෙන ආකාරයයි. කටින් බතල කොළ හිටවනවා වාගේ නොවෙයි, ඇත්ත වශයෙන්ම අපි එය ක්‍රියාවෙන් ඔප්පු කරලා තිබෙනවා. ඒ අනුව ස්වාධීන කොමිෂන් සභා ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අපි 2025 අය වැයෙන් වෙන් කරලා දීලා තිබෙනවා. ඒක තමයි කොමිෂන් සභා ශක්තිමත් කිරීම කියන්නේ. ඒ නිසා තමයි අපි කියන්නේ, මේ රටේ ජනයාගේ අභිප්‍රායයන්, බලාපොරොත්තු, සිහින මල්ඵල ගන්වන රාජ්‍ය ව්‍යුහයක් සකස් කරන්න ස්වාධීන කොමිෂන් සභාවල දායකත්වය අවශ්‍යයි කියලා. ඒක තමයි ජන වරම. ඒක තමයි ජන වරමේ අභිලාෂය.

ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගැන කථා කරනකොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරු ජනාධිපති ලේකම් කාර්යාලය භාවිත කරලා තිබුණේ ලැබෙන මුදල් අවභාවිත කරන මධ්‍යස්ථාන හැටියට. ඔවුන් හිතු-හිතු විධියට නීතියක් රීතියක් නැතුව ඒ මුදල් පාවිච්චි කරලා තිබුණා. තමන්ට කැමැති-කැමැති අයට රැකියා ලබා දීලා ඇති තරම් ඒ මුදල් අවභාවිත කරලා තිබෙනවා. 2024.09.22 දිනට ජනාධිපති ලේකම් කාර්යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලය වශයෙන් 900දෙනෙකුත්, තාවකාලික කාර්ය මණ්ඩලය වශයෙන් 351දෙනෙකුත් වශයෙන් 1,252ක් හිටියා. හැබැයි, වර්තමාන ජනාධිපතිතුමා බලයට පත් වුණාට පස්සේ කාර්ය මණ්ඩලයේ 370ක් අඩු කළා. ඒ විතරක් නොවෙයි. 2024.09.22 වෙනකොට පෞද්ගලික කාර්ය මණ්ඩලය වශයෙන් 65දෙනෙක් හිටියා, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සහ පෞද්ගලික ලේකම් සහිතව.

අද ඉන්නේ ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානියා සහ පෞද්ගලික ලේකම්වරයා ඇතුළු 11දෙනෙක් පමණයි. ඒ විතරක් නොවෙයි. පෞද්ගලික ලේකම්වරයාත්, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානියාත් වැටුප් ගන්නේ නැතුව ස්වේච්ඡාවෙන් රාජකාරි කරන ආයතනයක් බවට අපි ජනාධිපති ලේකම් කාර්යාලය මේ වනවිට පත් කරලා තිබෙනවා. මේ හරහා අපි රජයට විශාල මුදල් ප්‍රමාණයක් ඉතුරු කරලා දීලා තිබෙනවා. ඒ අනුව මේ වෙනකොට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් විතරක් මාසයකට රුපියල් මිලියන 104ක් ඉතුරු කරලා දෙන්න අපි - මේ ආණ්ඩුව - සමත් වෙලා තිබෙනවා. මෙහෙම තමයි මුදල් ඉතුරු කරන්නේ. අල්ලස, දූෂණය, නාස්තිය අවම කරන්න ඕනෑ වාගේම අරපිරිමැස්මෙන් මේ මුදල් පරිහරණය කරන්න තමයි අපි මේ ආකාරයේ තීන්දු-තීරණ අරගෙන තිබෙන්නේ. මේ රටේ ජනයා දුන්නු ජන වරමේ සැබෑ අර්ථය තේරුම් අරගෙන අපි කටයුතු කරනවා විතරක් නොවෙයි, ජනාධිපති ලේකම් කාර්යාලය දවස් පහේම මහ ජනතාව සඳහා විවෘත වූ කාර්යාලයක් බවට පත් කරන්නත් අපි සමත් වෙලා තිබෙනවා. ඒ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය ජනතාවාදී කාර්යාලයක් බවට අපි පත් කරලා තිබෙනවා. ඒක කාටත් සන්තෝෂ වෙන්න පුළුවන් කාරණයක්.

ඒ විතරක් නොවෙයි. ජනාධිපති අරමුදල ගැනත් බොහෝ කථා මේ ගරු සභාවේදී කියැවුණා. 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ අරමුණු හැටියට තිබෙන්නේ, දරිද්‍රතාවට සහන සැලසීම, අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම, ආගමික කටයුතු ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම, ජාතිය වෙනුවෙන් සේවය කර ඇති අයට ප්‍රදානයන් ලබා දීම සහ ජනාධිපතිවරයාගේ සහ මණ්ඩලයේ මතය අනුව ජනතා සුබසිද්ධියට හේතු වන කරුණු වෙනුවෙන් ඒ මුදල් පාවිච්චි කිරීමයි.

නමුත් පසුගිය කාලයේ ජනාධිපති අරමුදලේ මුදල් භාවිත වුණේ මොන කාරණා වෙනුවෙන්ද කියලා මේ සභාව දැනටමත්

දන්නවා. ඔබතුමන්ලා දන්නවා, පසුගිය කාලයේ - විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ - මේ මුදල් භාවිත වුණේ රජයේ මැති-ඇමතිවරුන්ට වරදාන දෙන්න, නැත්නම් තමන්ගේ දේශපාලන බලය පවත්වාගෙන යන්න කියන එක. ඒ අනුව තමයි එම අරමුදලෙන් කෙහෙළිය රඹුක්වැල්ල මහත්මයාට රුපියල් ලක්ෂ 109ක්, දි.මු. ජයරත්න මහත්මයාට රුපියල් ලක්ෂ 298ක්, විදුර වික්‍රමනායක මහත්මයාට රුපියල් ලක්ෂ 15ක්, ජේ.ඒ.ඊ. අමරතුංග මහත්මයාට රුපියල් ලක්ෂ 40ක්, රාජිත සේනාරත්න මහත්මයාට රුපියල් ලක්ෂ 100ක් - රුපියල් කෝටියක් - දුන්නේ. තමන්ගේ දේශපාලන බලය පවත්වාගෙන යෑම සඳහා මේ රටේ මහ ජනයාගේ මුදල් නාස්ති කරපු ආකාරය තමයි, ඒ. එහෙම තමයි, මේ කාර්යාල මුදල් අවභාවිත කළේ. එහෙම මුදල් අවභාවිත කරපු මිනිස්සු තමයි මාස තුනක් ගියාට පස්සේ අපි සියලුදෙනා මේ සියලු දේ කළා වාගේ ඒ චෝදනා ටික ආණ්ඩු පක්ෂයට යොමු කරන්න දැන් කටයුතු කරමින් ඉන්නේ. මේ සියලු මූල්‍ය අවභාවිතයට සම්බන්ධ පිරිස් අදත් මම හිතන හැටියට මේවා පිළිබඳව කිඹුල් කඳුළු හෙළනවා, මේ සියල්ල ජාතික ජන බලවේගයේ ආණ්ඩුවකට බැර කරන්න උත්සාහ දරමින්. අවුරුදු 76ක් තිස්සේ ඔවුන් අනුගමනය කරපු සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රමය අවසානයේ ජනතාවට පීඩා ගෙන දෙන සමාජයක් ගෙනාපු, සමස්ත පද්ධතියම, සෑම සමාජ තීරුවක්ම පරිහානිය දක්වා ගෙනාපු මේ පාලකයෝ මාස තුනක් ගියාට පස්සේ අද වනකොට ඒ සියල්ල අප පිට පටවන්න උත්සාහ දරන බවක් මෙතැනදී නිරන්තරයෙන් පෙනෙන්න තිබෙනවා.

විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුව මේ වනකොට වියදම් අඩු කරගෙන, නාස්තිය අවම කරගෙන ආදායම් උත්පාදනය කර ගැනීම සඳහා - ආදායම් එකතු කර ගැනීම සඳහා - විශේෂ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ආදායම් කළමනාකරණය සඳහා ඉතා ශක්තිමත්ව කටයුතු කරමින් ඉන්නවා. එහි ප්‍රතිඵලයක් හැටියට අවසන් කාර්තුවේ රුපියල් බිලියන 191කින් බදු ආදායම වැඩි කරගෙන තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව අවසන් කාර්තුව වෙනුවෙන් පමණක් ආදායම රුපියල් බිලියන 191කින් වැඩි කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. නාස්තිය අවම කර ගැනීමෙනුත් මුදල් ඉතුරු කරනවා. ආදායම් එකතු කර ගැනීමෙන්, කළමනාකරණය කර ගැනීමෙන් මුදල් එකතු කරනවා. මේ රටේ අනාගත පරපුර වෙනුවෙන් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කරගන්නත්, මේ රටේ අනාගත පරපුරට ඉදිරි දැක්මක්, ඉදිරි ගමන් මඟක් සහිතව හොඳ අනාගතයක්, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදන වැඩ පිළිවෙළක් වෙනුවෙන් මැදිහත් වෙන්නත් ඒ මුදල් උපයෝගි කරගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, මේ තත්ත්වය හරහා මේ රටේ දේශපාලන ස්ථාවරත්වය ගොඩනඟලා, ආයෝජකයන්ට අපේ රටට එන්න අවශ්‍ය වටපිටාව සකස් කර දීලා තිබෙනවා කියලා.

ඒ වාගේම, සුවිශේෂී වශයෙන් සඳහන් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. ජාතික ජන බලවේග ආණ්ඩුවේ කිසි කෙනෙක් දූෂිත අල්ලස් ගනුදෙනු සඳහා කිසිම ආකාරයකින් සම්බන්ධ වෙන්නේ නැති දේශපාලන සංස්කෘතියක් මේ රටට හඳුන්වා දීලා තිබෙනවා. පරිහානියට පත් වෙච්ච මේ දේශපාලන සංස්කෘතිය පිටුදැකලා නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරන්න අපි මැදිහත් වෙලා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් කටයුතු කර තිබෙනවා. පසුගිය මාස 3 ඇතුළත ඇති තරම් එවැනි ආදර්ශ මේ සමාජයට අපි ලබා දීලා තිබෙනවා. ඒක ජනාධිපතිවරයාගෙන් පටන් ගෙන මේ වනකොාට ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, මන්ත්‍රීවරු දක්වා මේ රටට, මේ සමාජයට ලබා දෙන්න කටයුතු කර තිබෙනවා.

රුපියල් බිලියන 232ක් වැය වනවා, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න. ඔවුන්ට කාර්යක්ෂමව වැඩ කරන්න අවශ්‍ය වටපිටාව ස්වාධීන කොමිෂන් හරහා ලබා ගන්නත්, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ස්ථාපිත කරන්නත්, අභිප්‍රේරණයක් සහිතව වැඩ කරන්නත්, ඔවුන්ගේ ගැටලු විසඳාගන්නත් අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීම සඳහා තීන්දු-තීරණ අරගෙන තිබෙනවා. විශේෂයෙන් අභිප්‍රේරණය සහිත රාජ්‍ය සේවයක් ඒ හරහා නිර්මාණය කර ගන්න තමයි ඔවුන්ගේ වැටුප් කෙරෙහි සහ මූලික වැටුප හා බද්ධ වන තීන්දු තීරණ රාශියක් ගෙන තිබෙන්නේ. ඒක තමයි මේ රටේ ජනයා බලාපොරොත්තු වන දේ.

විශේෂයෙන් ජනතාවට කාර්යක්ෂම රාජ්‍ය සේවයක අවශ්‍යතාව නිරන්තරයෙන් දැනෙනවා. මොකද, අපි මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හදලා දෙනවා, ජනතාවාදී රාජ්‍ය සේවයක් හදලා දෙනවා, ජනතා මිතුරු රාජ්‍ය සේවයක් හදලා දෙනවා කියලා. ඒ වෙනුවෙන් තමයි අපේ කැපවීම. ඒ සඳහා තමයි අපි මේ ඉතිරි කරන මුදල්, ආදායම් හරහා උපයා ගන්න මුදල් විශාල වශයෙන් යොමු කරන්නේ. රාජ්‍ය සේවයේ විශාල පිරිසක් ඉතා අවංකව, මැදිහත්වීමක් සහිතව රාජකාරි කරනවා. නමුත් මම නිරන්තරයෙන් කියන කාරණය මේකයි. සමස්තයක් හැටියට බොහෝ අය රාජ්‍ය සේවය දෙස බලන්නේ, දූෂිත සහ අකාර්යක්ෂම සේවාවක් හැටියට. එහෙම වෙලා තිබෙන්නේ ජනතාවට තිබෙන දැවෙන ප්‍රශ්නවලට රාජ්‍ය සේවයේ විසඳුම් නොමැති තත්ත්වයක් පැවති නිසායි. ඒ හින්දා අපි හිතනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුවක් යටතේ අනාගතයේ රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂම වෙයි, වඩාත් ශක්තිමත් වෙයි, ජනතාවට වඩාත් සේවා සපයන මහජන මිතුරු රාජ්‍ය සේවයක් බවට පරිවර්තනය වෙයි කියලා. එය රටේ අනාගත ආර්ථික සංවර්ධනය කෙරෙහි බෙහෙවින් ඉවහල් වෙයි කියන පරමාර්ථයෙන් තමයි අපි ඔවුන්ට වැටුප් වැඩි කිරීම ඇතුළු අනෙකුත් සේවා, යටිතල පහසුකම් ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නේ.

තවත් ප්‍රධාන කාරණයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් සඳහන් කළ විධියට පසුගිය කාලයේ ජනාධිපති කොමිෂන් සභා 14ක් ක්‍රියාත්මක වුණා. මේ ජනාධිපති කොමිෂන් සභා 14 සඳහා රජයේ මුදල් විශාල වශයෙන් වැය කර තිබෙනවා. මෙයින් කොමිෂන් සභා දෙකක් හැරුණු කොට බොහෝ කොමිෂන් සභා වාර්තා හමස් පෙට්ටියට ගිහිල්ලා තිබෙනවා. ඒ කොාමිෂන් සභා වාර්තාවලින් කිසිදු ප්‍රයෝජනයක් නැහැ. ඒ වාගේම ඒ කොමිෂන් සභා පිළිබඳව බරපතළ ප්‍රශ්න මතු වෙලා තිබෙනවා.

ඒ එක කොමිෂන් සභාවක් තමයි, කවුරුත් දන්නා උපාලි අබේරත්න කොමිසම. මේ කොමිසම හරහා අවුරුද්දකට ආසන්න කාලයක් විමර්ශන කටයුතු කළා. මේ කොමිසමට වියදම් දරලා තිබෙනවා, තුන්කෝටි පනස්ලක්ෂ අනූදහස් එකසියයක මුදලක්. මේ කොමිසමේ සිද්ධ වුණේ මොකක්ද? දේශපාලන පළිගැනීම් යැයි සඳහන් කරමින් දූෂිත පුද්ගලයන්ගේ පැමිණිලි භාරගෙන රජයේ නිලධාරීන් විධියට කටයුතු කළ අය කොමිසම ඉදිරියට ගෙනැවිත් ඒ නිලධාරීන්ට විරුද්ධව කටයුතු කිරීමේ කර්තව්‍යය තමයි මේ කොමිසමට පැවරිලා තිබුණේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා තමයි මේ කොමිසම පත් කළේ. මේ කොමිසම යම් යම් නිර්දේශ රාශියක් ඉදිරිපත් කළා. ඒ විතරක් නොවෙයි, මේ අපකීර්තිමත් කොමිසම -උපාලි අබේරත්න කොමිසම- මහාධිකරණයේ තිබෙන නඩු පවා ඉවත් කරන්න තීන්දු තීරණ දුන්නා. මේ කොමිසමේ නිර්දේශවලට එරෙහිව බොහෝ අය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණය මේ කොමිසමේ නිර්දේශ සියල්ල අහෝසි කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

[ගරු ආනන්ද විජේපාල මහතා]

මේ කොමිසමේ සියලු නිර්දේශ අහෝසි කර තිබෙන තත්ත්වයක් යටතේ, මේ වැය වෙච්ච තුන්කෝටි පනස්ලක්ෂයක් වූ මහජනයාගේ මුදල්වලට -මේවා මහජනයාගේ මුදල්- වග කියන්නේ කවුද සහ මේ මුදලේ ප්‍රයෝජනය පිළිබඳ වගකීම දරන්නේ කවුද? ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මේ කොමිසම පත් කරපු නිසා එතුමා තුන්කෝටි පනස්ලක්ෂයක මුදල ආපහු ආණ්ඩුවට ගෙවනවාද? එහෙම නැත්නම්, උපාලි අබේරත්න ඇතුළු ඒ කොමිසමේ තිදෙනා ආණ්ඩුවට මේ මුදල් ගෙවනවාද? මොකද, ඒ නිර්දේශ සියල්ල නීතිවිරෝධී බව ප්‍රකාශ වෙලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඒවා අහෝසි කර තිබෙනවා. මෙවැනි කොමිසම් විශාල ප්‍රමාණයක් තමයි පසුගිය කාලයේ දේශපාලනඥයෝ තමන්ගේ පැවැත්ම වෙනුවෙන් ජනතාව රවටන්න භාවිත කළේ.

මෙවැනි කොමිෂන් සභා නිර්දේශ තමයි සමහර අය දේශපාලන මතවාද නිර්මාණය කරන්න පාවිච්චි කර ගත්තේ. ඒක අපි මේ රටේ ජනතාවට කියනවා. එම නිසා අපි මේ වෙලාවේ ගරු ජනාධිපතිතුමාටත් යෝජනා කරනවා, මෙම කොමිසම පිළිබඳව නැවත සොයා බැලීමක්, විශේෂ විමර්ශනයක් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. මේ වෙනකොට අපි ජනාධිපති ලේකම් කාර්යාලය තුළ ජනාධිපති විමර්ශන අංශයක් ස්ථාපිත කර තිබෙනවා. ඒ හරහා මේ රටේ සිදු වුණු බොහෝ දූෂණ ගනුදෙනු පිළිබඳ විමර්ශන කර්තව්‍යය ආරම්භ වෙලා තිබෙනවා. මේ කෙටි කාලය තුළ එම විමර්ශන ඒකකයට පැමිණිලි 700ක් පමණ ලැබී තිබෙනවා. අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් යටතේ තමයි එම ඒකකය ක්‍රියාත්මක වෙන්නේ. මේ රටේ ජනතාව අපට ලබා දුන් ජනවරමේ අභිලාෂය තේරුම් අරන් කටයුතු කරන්න අපි අනිවාර්යයෙන්ම සැදී පැහැදී ඉන්නවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ජනාධිපතිතුමාගේ කාර්යාලය හා තවත් ආයතන ගණනාවකට අදාළ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡාවට ගැනෙන අය වැය කාරක සභා අවස්ථාවේ කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, සභානායකතුමා, අගමැතිතුමිය ඇතුළු සියලුදෙනාම අද විවාදය අතරතුර විවිධ ලැයිස්තු ඉදිරිපත් කරනවා අපි දැක්කා. ඉදිරිපත් කළ එම ලැයිස්තුවලින් සියයට 99ක්ම මහින්ද රාජපක්ෂ පාලන කාලයේ සිදු වූ අයථා වියදම්, අනවශ්‍ය වියදම්වලට සම්බන්ධ ඒවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ලැයිස්තු ඉදිරිපත් කරපු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, සභානායකතුමා, ඒ වාගේම සමහර ඇමතිවරු ගත්තොත්, එතුමන්ලා 2005දී මේ රටට ලොකු අපරාධයක් කළා. ඒ අපරාධය ඒගොල්ලන් අද පිළිගන්නවා. මොකද, 2005දී රාජපක්ෂලා බලයට එනකොට මම හිටියේ රාජපක්ෂලාට විරුද්ධ කඳවුරේ. මම හිටියේ රාජපක්ෂලා පරාජය කරන්න ඕනෑය කියපු වේදිකාවේ. නමුත් අද ඇවිල්ලා රාජපක්ෂලා මෙච්චර මුදල් වියදම් කරලා තිබෙනවා, මේ රටේ මිනිසුන්ගේ ධනය කාලා තිබෙනවා කියලා ලොකු අඳෝනා නඟන මහත්වරු ටික එදා සිටියේ "මහින්ද රාජපක්ෂ තමයි පොර" කියලා කිව්ව වේදිකාවේ. නමුත් අපි ඒ වේදිකාවේ සිටියේ නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒවා පරණ කථා.

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ඒවා පරණ කථා ලු. *[බාධා කිරීමක්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමන්ලාත් දැන් ඇවිල්ලා පරණ දේවල් තමයි කථා කරන්නේ. අපි නොවෙයි. එදා ඔබතුමන්ලා දේශපාලනමය වශයෙන් ගත් වැරදි තීන්දුවේ ප්‍රතිඵල අද ඔබතුමන්ලාටම කියවන්න වෙලා තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව. ඔබතුමන්ලාම තමයි වැරදි තීන්දුව ගත්තේ. ඒ කියන්නේ, රාජපක්ෂලා හොරු කියලා දැනගෙන බලයට ගෙනාවා. එදා මහින්ද රාජපක්ෂ අගමැති වශයෙන් ඉන්නකොට තමයි "Helping Hambantota" ආවේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එතකොට මහ බැංකු වංචාව?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
මහ බැංකුව වංචාවට රනිල් වික්‍රමසිංහ අල්ලලා හිරේට දමන්න. ඒක කරන්නේත් නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එතකොට, සල්ලි ගත්ත කට්ටිය?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ඇමතිතුමා, මට පොඩ්ඩක් කථා කරන්න දෙන්නකෝ. ඔබතුමා හොඳට ටයි බයි ගහගෙන දැන් ලස්සනට ඉන්නවා. පොඩ්ඩක් මේක අහගෙන ඉන්නකෝ. ඔබතුමන්ලා කැප කිරීම් කළා කියනවා නේ. ඔබතුමන්ලාගේ සභානායකතුමා කිව්වා, "අපි කැප කිරීම් කළා" කියලා. කැප කිරීම් නොවෙයි, ඔබතුමන්ලා බලය ගන්න දුක් විඳලා තිබෙනවා. ඒක හරි. ඒ දුක් විඳපු එකේ ප්‍රයෝජනය අද ලැබිලා තිබෙනවා. අද හොඳට කොණ්ඩය හදලා,

පවුඩර් දමාගෙන, ලස්සනට ටයි ගහගෙන, ඇබා සින්දු අහගෙන හොඳට ඉන්නවා. ඒක හොඳයි. කැප කිරීම් කළා තමුන්නාන්සේලාගේ 1988-1989 කාලයේ අය. 1971 අයත් කැප කිරීම් කළා. ඒගොල්ලෝ කැප කිරීමක් කළා. ඒක ඇත්ත. ලෙනින් කියන ආණ්ඩුවක් හදන්න කැප කිරීම් කළා. තමුන්නාන්සේලා හැදුවේ ඒ ආණ්ඩුව නොවෙයි. තමුන්නාන්සේලා දුක් විඳලා, කටට කාලා බලය ගත්තා. ඒක හරි. නමුත් හැදුවේ ලෙනින් කියපු ආණ්ඩුව නොවෙයි, 1988-1989 කාලයේ, ඒ වාගේම 1971 මැරුණු උදවිය කියපු ආණ්ඩුව නොවෙයි. ඔබතුමන්ලා හැදුවේ අපි කියන, මේ පැත්තේ සිටින සමහි ජන බලවේගය කථා කරන විධියේ ආණ්ඩුවක්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එහෙම නම් ඇයි විරුද්ධ වෙන්නේ?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අපි විරුද්ධ නැහැ, අපි එකඟයි. අපි විරුද්ධ නැහැ. අපි මේ කියන්නේ තමුන්නාන්සේලා කොළේ වහලා කථා කරන එක ගැන. ඒකයි අපි කියන්නේ. තමුන්නාන්සේලා ඇත්තම කථා කරන්න, "ඔව්, අපි දැන් දැකැත්තයි, මිටියයි අතහැරලා ඉවරයි, අපි දැන් කාල් මාක්ස් අදහන්නේ නැහැ, අපි දැන් ලෙනින් අදහන්නේ නැහැ, අපි දැන් එංගල්ස් අදහන්නේ නැහැ" කියලා තමුන්නාන්සේලා කෙළින්ම කිව්වා නම් ප්‍රශ්නය ඉවරයි.

එතකොට මමත් ඇවිල්ලා එකතු වෙනවා. ප්‍රශ්නය ඉවරයි. එතකොට මමත් එනවා ඔය පැත්තට. දැන් තමුන්නාන්සේලා ඒක කියන්නේ නැහැ නේ. තමුන්නාන්සේලා තවම ලෙනින්ගේ ෆොටෝ එක ගහගෙන, තවම දැකැත්තයි, මිටියයි ගහගෙන කියනවා, "කැප කිරීම්, කැප කිරීම්" කියලා. එහෙම කැප කිරීමක් නැහැ. ඒකයි අපි කියන්නේ. අද ඔය හැමෝම හොඳට ඉන්නවා. ඒක හොඳයි. කාලයක් කැප කිරීම් කළා දේශපාලන මතවාදයක් වෙනුවෙන්. ඒ, 1971, 1988 කාලවල හිටපු උදවිය. තමුන්නාන්සේලා කටට කෑවා, ආණ්ඩුවක් ගන්න. දැන් අපිත් කටට කනවා නේ විපක්ෂයේ ඉඳගෙන. අපිත් කටට කනවා. අපි 2019 ඉඳන් 2024 වනකල්ම කටට කෑවා, දැන් 2024 ඉඳලාත් කටට කනවා. ඔබතුමන්ලා ඊළඟ ඡන්දය තියන කල්. *[බාධා කිරීමක්]* එහෙම කියන්න බැහැ නේ. අපි ඒක ඉස්සරහට බලමු. කොච්චර කාලයක් අපට කටට කන්න වෙයිද කියලා අපි බලමු. කරන්න දෙයක් නැහැ. ඔබතුමන්ලාට මේ රටේ මිනිස්සු බලය ලබා දුන්නා. ඔව්, අපි ඒක පිළිගන්නවා. මන්ත්‍රී ධුර 159ක ආණ්ඩුවක් දීලා තිබෙනවා. ඔබතුමන්ලා ආණ්ඩුව කරන්න, අපි ඉන්නේ විපක්ෂයේ. හැබැයි, අපට බණින්න එපා. අපි විපක්ෂයේ ඉඳගෙන කරන්නේ ඔබතුමන්ලා වරද්දන තැන් තිබෙනවා නම්, ඔබතුමන්ලා mistakes කරන තැන් තිබෙනවා නම් ඒවා පෙන්වා දෙන එක. ඒවා හොඳයි නම් පිළිගන්න. අපි කියන ඒවා හරි නම් පිළිගන්න, නැත්නම් පිළිගන්න එපා. මොකද, ජනතාව අප එවලා තිබෙන්නේ විපක්ෂයේ ඉන්න. ඔබතුමන්ලාට බලය දීලා තිබෙන්නේ ආණ්ඩුව කරන්න. ඉතින් ඔබතුමන්ලා ආණ්ඩුව කරන්න, අපි විපක්ෂයේ රාජකාරිය කරන්නම්. ඒ හින්දා අපි දිහා ඔරවලා බලන්න එපා. රාජපක්ෂලා හොරකම් කරපු ඒවා කියන කොට අපේ මුහුණු දිහා බලාගෙන කියන්න එපා. එහෙම කියන්න එපා. ඔබතුමන්ලාම බලයට ගෙනාපු මිනිස්සු, ඒ. මම ඒකයි කිව්වේ ඔබතුමන්ලා 2005දී ගත්තු වැරදි දේශපාලන තීන්දුවට මේ රටේ ජනතාව වන්දි ගෙවනවා කියලා. ඔබතුමන්ලා ඒක ගැන කියන්නේ නැහැ. 2005දී ඔබතුමන්ලා තනිවම ඡන්දය ඉල්ලුවා නම්, මහින්ද රාජපක්ෂ පරාදයි. මහින්ද රාජපක්ෂ දිනුවේ ඡන්ද 180,000කින්. එදා ඔබතුමන්ලා තනිවම ඉල්ලුවා නම් එතුමා පරාදයි. එතුමා පරාද වුණා නම් රාජපක්ෂ පවුල ගැන අපි දෙගොල්ලන්ටම අද කථා කරන්න වෙන්නේ නැහැ. එහෙම නම් අපට අද වෙනත් දේවල් ගැන තමයි කථා කරන්න තිබෙන්නේ. එහෙම වුණා නම් අද මේ රට ඇත්තටම ගව් ගාණක් ඉස්සහට ගිහිල්ලා. 2005න් පස්සේ තමයි මේ රටේ දූෂණ දේශපාලන සංස්කෘතිය, පවුල්වාදය, පාතාලය ආදි හැම එකක්ම ආවේ. කවුද ඒ අය බලයට ගෙනාවේ? අපි ද ගෙනාවේ? නැහැ. අපි හිටියේ එතුමා ගේන්න එපා කියන තැන. එදා එතුමා අගමැතිවරයා වෙලා ඉන්න කොට ගරු කබීර් හෂීම් මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා "Helping Hambantota" නඩුව දැම්මා. තමුන්නාන්සේලා මහින්ද රාජපක්ෂ "Helping Hambantota" නඩුවට සම්බන්ධ වෙලා තිබෙනවා කියලා දැනගෙනත් එතුමා ජනාධිපති කළා. තමුන්නාන්සේලා ඒවා දැනගෙනත් එතුමා ජනාධිපති කළා. එදා ජනාධිපති campaign එක යන කොට එතුමාට "Helping Hambantota" චෝදනාව තිබුණා. කොහොමද තමුන්නාන්සේලා කියන්නේ ඒක දන්නේ නැහැ කියලා. එතකොට එතුමා ඒකට සම්බන්ධ වෙලා ඉවරයි. අපේ කබීර් හෂීම් මැතිතුමා ඒකට උසාවි ගියා. ඒ හින්දා තමුන්නාන්සේලාටත් එහි යම් කොටසකට වග කියන්න තිබෙනවා. ඒ කොටස මග හැරලා යන්න එපා. රාජපක්ෂලා හොරකම් කළ ඒවා කියන කොට අපේ මුහුණු බලන්න එපා. අඩුම ගානේ රාජපක්ෂලාගේ පොටෝ එකක් හරි ගෙනැල්ලා තියාගෙන ඒවා කියන්න. ඒවා ගැන කියන කොට අපේ මුහුණු දිහා බලන්න එපා. මොකද, අපි රාජපක්ෂලා බලයට ගෙනාවේ නැහැ. අපි රාජපක්ෂලාට ඡන්දය දෙන්න කිව්වේත් නැහැ. මම මගේ මේ පොඩි ඇඟිල්ල රාජපක්ෂලාට ඡන්දය දෙන්න පාට කරවාගෙනත් නැහැ. ජනාධිපතිතුමා ඇතුළු මේ ඉස්සරහ පේළියේ ඉන්න තමුන්නාන්සේලාගේ මැති ඇමතිවරු බොහෝදෙනෙක් ඒ කාලයේ රාජපක්ෂලාට ඡන්දය දෙන්න ඔය පොඩි ඇඟිලි පාට කරවාගෙන තිබෙනවා. නමුත් අපි නම් නැහැ. ඒක හොඳට තේරුම් කර ගන්න.

මේ අය වැයේ ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය අරගෙන බලමු. ජනාධිපතිතුමා යටතේ තිබෙනවා, ආයතන 94ක්. ඒ ආයතන 94ම ගැන අද කථා කරන්නේ නැහැ. අපි ඉදිරි කාලවලදී ඒවා ගැන කථා කරනවා. ජනාධිපතිතුමා යටතේ ආයතන 94ක් තිබෙනවා. අය වැයෙන් සියයට 27ක් ඒ ආයතන 94ට වෙන් කරගෙන තිබෙනවා. ඒ කියන්නේ, අය වැයෙන් තුනෙන් එකක් ජනාධිපතිතුමා යටතට ගිහින් තිබෙනවා. ඔය විධියටම තමයි පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරුන් වැඩ කළේ. අපේ වර්තමාන ජනාධිපතිතුමා විපක්ෂයේ ඉන්න කොට හිටියේ මට ඉස්සරහ පේළියේ. එතුමා මේ වැය ශීර්ෂය පටට ගහලා තිබෙනවා ඇයි මෙච්චර මුදල් වෙන් කරන්නේ, ඇයි මෙච්චර ආයතන, ඇයි බලය අතේ තියාගෙන ඉන්නේ කියලා. විධායක ජනාධිපති ක්‍රමය හදපු ජේ.ආර්. ජයවර්ධන මහත්මයා අතේ තිබුණේත් ආරක්ෂක ඇමතිකම විතරයි. එතුමා නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයෙකුත් පත් කර ගත්තා. එතුමා, විධායක ජනාධිපති ක්‍රමය හදුන්වා දීපු කෙනා. නමුත්, එතුමා යටතේ කිසිම ආයතනයක් තියාගත්තේ නැහැ.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ඉල්ලා අස්වීමේ ලියුම් ටික තියා ගත්තා!

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, ඉල්ලා අස්වීමේ ලියුම් ටික තියා ගත්තා. මොකද, එහෙම කළේ නැත්නම්, ඔබතුමන්ලා වාගේ කට්ටිය හිටියොත් එහෙම, වෙන ගේම් ගහන්න පුළුවන් නේ. ඒ හින්දා ඉල්ලා අස්වීමේ ලියුම් ටික තියා ගත්තා. ඒක හරි.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් පස්සේ ආපු හැම ජනාධිපතිවරයාම -අනුර කුමාර දිසානායක මහත්මයා දක්වාම- මේ තරම් විශාල ආයතන ප්‍රමාණයක් අතේ තියාගෙන හිටියා. දැන් ඒකද, system change එක? System change එක මොකක් ද? දැන් මෙතැනදී කථා කළා, වියදම අඩු කිරීම තමයි system change එක කියලා. ඒක හොඳයි. වියදම අඩු කරන්න තමයි ඕනෑ. අනවශ්‍ය වියදම් කපා හරින්න ඕනෑ. මොකද, මේ ඔක්කෝම අපේ රටේ බදු ගෙවන ජනතාවගේ මුදල්. ඔබතුමන්ලා system change කියලා කියන්නේ වියදම අඩු කිරීම විතර ද?

ඔබතුමන්ලා මැතිවරණ වේදිකාවේ කථා කළා, රාජ්‍ය සේවයේ විනිවිදභාවය ගැන. රාජ්‍ය සේවයට දක්ෂ අය පත් කරන්න ඕනෑ කිව්වා. රාජ්‍ය සේවයට සුදුසු අයට ඉඩ දෙන්න ඕනෑ කිව්වා. ඒ පත් කිරීම් දේශපාලනයෙන් තොර වෙන්න ඕනෑ කියලාත් කිව්වා. දැන් ඒ system change එක වෙලා ද කියලා මට කියන්නකෝ. ඔබතුමන්ලා ඒ system change එක කළා ද? ජනාධිපතිතුමාගේ ලේකම්වරයා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ හිටපු උසස් නිලධාරියෙක්. එතුමාට වඩා SLAS සුදුසුකම් තියෙන අය හිටියා. නමුත්, ඒ අය ගත්තේ නැහැ නේ. අපි හිතමු, ජනාධිපතිතුමාට විශ්වාස හින්දා එතුමා පත් කර ගත්තා කියලා. එතකොට ආරක්ෂක ලේකම්තුමා? තමුන්නාන්සේලාගේ පක්ෂයේ තිබෙන, ත්‍රිවිධ හමුදා - *[බාධා කිරීමක්]* එම සංගමයේ සභාපතිතුමා.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
එහෙම කෙනෙක් නැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නැත්තේ මොකද? [බාධා කිරීමක්]

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
පක්ෂයේ ත්‍රිවිධ හමුදාවක් කොහේද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ආරක්ෂක ලේකම්තුමා. ඔය විධියට ලේකම්වරු හැම කෙනාම දේශපාලන පත්වීම් හැටියට පත් කළා. පැවැති තත්ත්වය වෙනස් වුණේ නැහැ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පත් කරපු උදව්යත් එහෙමයි. ඒ හැම පත් කිරීමකම තමුන්නාන්සේලා පසුගිය කාලයේ අවසාන වශයෙන් කථා කරපු ඒ විනිවිදභාවය තිබුණේ නැහැ.

තානාපති කාර්යාලවලට අටදෙනෙක් පත් කරලා තිබෙනවා. මගේ ළඟ ඒ විස්තර තිබෙනවා. ඒ අටදෙනාම විදේශ සේවයේ නියුක්ත අය නොවෙයි. නමුත්, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව කියා තිබෙනවා, තානාපති කාර්යාල සඳහා විදේශ අමාත්‍යාංශයේ සේවයේ නියුතු අය පත් කරනවා කියලා. හැබැයි, මේ පත් කරලා තිබෙන අටදෙනාම මේ රටේ වෙන වෙන ක්ෂේත්‍රවල හිටපු අය. ඒ අයගෙන් එක්කෙනෙක් මැතිවරණයේදී තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයට තරග කරපු කෙනෙක්. ඔහු කියුබාවේ ශ්‍රී ලංකා තානාපති විධියට පත් කරලා තිබෙන්නේ. කෝ, system change එක?

System change කියන්නේ මුදල් නාස්තිය නතර කිරීම විතරක් නොවෙයි. ඒක විතරක් නොවෙයි, ජනතාව බලාපොරොත්තු වුණේ. ජනතාව තමුන්නාන්සේලාගෙන් බලාපොරොත්තු වුණා, රාජ්‍ය පාලනයේ විනිවිදභාවය; රාජ්‍ය පාලනයට නිලධාරීන් පත් කිරීමේදී විනිවිදභාවයකින් පත් කිරීම. ඔබතුමන්ලා චෝදනා කළා, ඒ කාලයේ හිටපු දේශපාලන නායකයන්ට, ඒ දේශපාලන නායකයෝ තමන්ගේ හිතවතුන් ඔක්කෝම සංස්ථාවල, වෙනත් ආයතනවල තනතුරුවලට පත් කරගෙන ඉන්නවා කියලා. ඔබතුමන්ලා එදා ඒ ගැන විශාල චෝදනාවක් කළා. ඒක ඇත්ත තමයි. ඒ චෝදනාව නිවැරැදි කරන්න තමයි තමුන්නාන්සේලා කථා කළේ. දැන් ඒක නිවැරැදි වෙලා නැහැ. අර ආපු සාම්ප්‍රදායික ක්‍රමයම තමයි මේ යන්නේත්. ඒ හින්දා නේ තානාපති සේවයට අටදෙනාම එළියෙන් පත් කරලා තිබෙන්නේ. එළියෙන් පත් කරපු ඒ අයගේ සම්බන්ධකම් මම හරියටම දන්නේ නැහැ. නමුත්, ඒ අයගෙන් එක්කෙනෙක් තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයට තරග කරලා පරාද වෙච්ච කෙනෙක්. එහෙම පරාද වෙච්ච අයට පත් වීම් දීලා තිබෙනවා.

අපට පෙනෙන්න තිබෙනවා, තමුන්නාන්සේලා එදා කථා කරපු system change එක වෙලා නැහැ කියලා. මුදල් නාස්තිය අඩු කර ගත්තු එක විතරයි තමුන්නාන්සේලා නිතර නිතර මතු කරන්නේ. අනෙක් සියල්ලම සාම්ප්‍රදායික විධියට ආපු දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසාන කරන්න කලින් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ ගරු සභානායකතුමා ඊයේ පෙරේදා දවසක අපට කිව්වා, බෝලය දාන හැටි. එතුමා කිව්වා, මයිකල් හෝල්ඩින්ග් තමයි වේගවත්ම පන්දු යවන්නා කියලා. එතුමා දන්නේ නැහැ, ඒ කාලයේම මයිකල් හෝල්ඩින්ග්ට වඩා වේගවත්ව පන්දු යවන කෙනෙක් හිටියා කියලා. එයා තමයි, ඕස්ට්‍රේලියානු ටීම් එකේ හිටපු ජෙෆ් තොම්සන්. එයා මයිකල් හෝල්ඩින්ග්ට වඩා හයියෙන් පන්දු යැව්වා. මයිකල් හෝල්ඩින්ග් වඩා හයියෙන් පන්දු යවපු ජෙෆ් තොම්සන්ලා වාගේ තමයි තමුන්නාන්සේලා ආණ්ඩුව හැදුවේ. ඒ තරම් හයියෙන් ඇවිල්ලා තමයි ආණ්ඩුව හැදුවේ. එදා මොනවාද කිව්වේ? අර්ජුන මහේන්ද්‍රන් ගෙනෙනවා කිව්වා. රනිල් වික්‍රමසිංහ හිරේ දානවා කිව්වා. මොනවාද නොකිව්වේ? ඒ හැම දේම කිව්වා.

අන්තිමට මොකද වුණේ? ඔබතුමන්ලා අපට පෙන්වන්න ආවේ, "සිංහබාහු." සිංහබාහු බලන්න තමයි ලක්ෂ 68ක් ඔබතුමන්ලාගෙන් ටිකට් ගත්තේ. සිංහබාහු පෙන්වන්න ආපු අය දැන් අපට "අන්දරේලා" පෙන්වනවා. විදුලිය ගියාම කියනවා, ට්‍රාන්ස්ෆෝමර් එකට වදුරෙක් පැන්නා කියලා. එක්කෙනෙක් කියනවා, පොල් කන්න එපා; පොල් කෑවම පොල් හිහ වෙනවා කියලා. ජනාධිපතිතුමා කිව්වා, සුරතල් සතුන් වැඩිපුර හාල් කනවා; ඒකත් බලපානවා කියලා හාල් අඩු වෙන්න. කුකුල්ලු එහෙම හාල් කනවා කිව්වා. කුකුළන්ට හාල් දෙන්නේ නැතුව "ටිපි ටිප්" දෙන්නද? වී තමයි දෙන්න ඕනෑ. "ටිපි ටිප්" දෙන්න බැහැ නේ. කුකුළා "ටිපි ටිප්" කන්නේ නැහැ නේ. මතක තියා ගන්න අද වනකොට ඔබතුමන්ලා විහින්ම-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා නියමිත කාලය අවසන්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය කියලා අවසන් කරන්නම්.

ජනතාව තමුන්නාන්සේලා විශ්වාස කරලා, තමුන්නාන්සේලා කථා කරපු දේවල්, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන දේවල් බලලා, අහලා විශාල පරිවර්තනයකට තමුන්නාන්සේලාට බලය දුන්නා. අපට බලය දුන්නේ නැහැ. අපට කිව්වා, "විපක්ෂයේ හිටපං" කියලා. අපි විපක්ෂයේ ඉන්නවා. දැන් තමුන්නාන්සේලාට බලය දුන්නා කරන්න. නමුත්, තමුන්නාන්සේලා අද වනකොට ඒ ජනතා බලාපොරොත්තු, ඒ අභිලාෂ ඉෂ්ට කරන්න අපොහොසත් වෙලා තිබෙනවා කියන කාරණය මතක් කරමින්, මේ කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින්, මා නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.40]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරයාගේ, අග්‍රාමාත්‍ය කාර්යාලය ඇතුළු ආයතන ගණනාවක වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී අදහස් දක්වන්න අවස්ථාව දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මම මුලින්ම කියන්න ඕනෑ, විපක්ෂයේ මන්ත්‍රීවරුන් මෙම විවාදයට අදාළව වුවත්, නැතත් අදහස් ඉදිරිපත් කරද්දී නිවැරැදි නොවන අදහස් ඉදිරිපත් කරන බව. අපට ජනවරමක් ලැබුණා. එම ජනවරම අනුව අපි වැඩ කරනවා. එම ජනවරම ලබා දුන් රටේ ජනතාව අප විශ්වාස කරමින් අපත් එක්ක ඉන්නවාද, නැද්ද කියලා ඔබතුමන්ලාට බලා ගන්න පුළුවන් ඉදිරියේදී එන පළාත් පාලන මැතිවරණයේදී. දැන් ඔබතුමන්ලාට වෙලා තිබෙන්නේ, අන්දරේ බලන්න ගිහිල්ලා ඉඳගත්තු හෝල් එකේ ඉඳගෙන "සිංහබාහු" ගැන කථා කරන්න වීමක්. ඒකයි වැඩේ. බලන්න ගියේ "අන්දරේ" තමයි. නමුත් ගිහිල්ලා වාඩි වෙලා ඉන්නේ වෙන හෝල් එකක. ඒකයි මෙතැන තිබෙන වැඩේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කවිරත්න මන්ත්‍රීතුමිය මේ වෙලාවේ ගරු සභාවේ නැති වුණත් මට යම් නිවැරැදි කිරීමක් කරන්න ඕනෑ. එතුමිය කියන්න උත්සාහ කළා, ජනාධිපති අරමුදලේ ක්‍රියාවලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමට අරගෙන යනවා; ඒ ආපු ඇප්ලිකේෂන් දැන් ගොඩ ගැහිලා කියලා. නමුත්, එහෙම වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, average එකක් විධියට ගත්තාම මසකට applications එන්නේ 200ක් විතර. සාමාන්‍යයෙන් මාසයකට එන්නේ 200ක්. අපි ඒ applications භාර ගන්න වැඩේ පෙබරවාරි මාසයේ 7වැනි දා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට විමධ්‍යගත කළාට පස්සේ, මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට 110කට වැඩි applications ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. ජනාධිපති අරමුදලේ මූලස්ථානයට applications 142ක් ලැබිලා තිබෙනවා. වෙන දා මාසයකට 200ක් ලැබෙන applications දැන් දවස් 20ට, 252ක් ලැබිලා තිබෙනවා. එතුමන්ලා කළේ, ජනාධිපති අරමුදල් තමතමන් බෙදා ගත්ත එක. ජනතාව අපි හොයාගෙන එනවා වෙනුවට අපි ජනතාව ළඟට යන්න ඕනෑ කියන සංකල්පය අනුව තමයි අපේ අනුර දිසානායක ජනාධිපතිවරයා ඒ විමධ්‍යගත කිරීම කළේ. ඒ අනුව දවස් 20ට, ඇප්ලිකේෂන් 252ක් ලැබිලා තිබෙනවා. ජනාධිපති අරමුදලේ පහසුකම ගැනීමේ පහසුව ආවාට පස්සේ, ජනතාව ඒක භුක්ති විඳිනවා කියන කාරණය කියන්න ඕනෑ. අපේ වැඩ පිළිවෙළ පටන් අරගෙන දැන් මාස එකහමාරක් දෙකක් වෙන්නේ. ජනාධිපති අරමුදලේ මේ විමධ්‍යගත ක්‍රියාවලිය අපි පටන් අරගෙන දවස් 20යි. නමුත් මේවා ගැන ටිකක් ඉවසාගෙන බලාගෙන ඉන්නේ නැහැ. ඉතින් මේවා ගැන කථා කරනකොට තව බොහෝ දේවල් කියන්න තිබෙනවා.

අද තව ආයතන ගණනාවක වැය ශීර්ෂ පිළිබඳව අපට සාකච්ඡා කරන්න තිබෙනවා. විශේෂ වියදම් එකක යටතේ තිබෙන ආයතන ගණනාව අතර මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, විගණන සේවා කොමිෂන් සභාව හා ජාතික විගණන කාර්යාලය කියන ආයතනත් තිබෙනවා. මේ ආයතන අපේ රටේ විශාල කාර්යභාරයකට සම්බන්ධ වෙන ආයතන නිසා මේ ආයතන පිළිබඳ රජයේ ක්‍රියාවලිය සහ රජයේ දැක්මත් යම් ප්‍රමාණයකට කිව්වොත් හොඳයි කියලා හිතුණා. ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය ගැන කියන්න යනකොට පත් කිරීම් පිළිබඳව, තනතුරු පිළිබඳව බොහෝ දේවල් කියන්න විපක්ෂය උත්සාහ කළා. මම ඒ ගැනත් පසුව කියනවා. විශේෂයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය වර්තමාන කටයුතුවලට ගැළපෙන ලෙස වහාම සංශෝධනය විය යුතු තත්ත්වයක දැන් තිබෙන්නේ. මොකද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළේ තමයි අපේ රටේ සංවර්ධනයට යම් බාධා ඇති වෙන්නේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව වැඩ කිරීමේදී අපට සැලකිය යුතු ක්‍රියාවලියකට ප්‍රවේශ වෙන්න වෙනවා. එම නිසා යම් ප්‍රමාදයක් ඇති වෙනවා.

ඒ නිසා මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කරන්න ඕනෑ වාගේම, එහි විනිවිදභාවයක් තිබෙන්නට ඕනෑ. ඒ බවත් අපි මේ සභාවට දැනුම් දෙන්න කැමැතියි. මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තිබෙන මේ දුර්වලතා, ගැටලු සියල්ල අවසන් කරලා ඉතා ඉක්මනින් මේ ප්‍රසම්පාදන වැඩ පිළිවෙළ digitalize කරන්න, තාක්ෂණය එකතු කරලා, තමන්ගේ bid එක, තමන් දාපු tender එක කොහේ ඉඳන් කොයි ආකාරයටද වුණේ කියලා දැනගන්න පුළුවන් ආකාරයට කටයුතු කරන්න අපේ අමාත්‍යාංශය හරහා වැඩ කරමින් තිබෙනවා. ඒ නිසා මේ ප්‍රසම්පාදන කොමිසමේ ක්‍රියාවලිය වාගේම, කොමිසමේ කාර්යභාරයත් සක්‍රිය කරන්න අපි ඉදිරියේදී කටයුතු කරනවා.

ඒ වාගේම, මේ විගණන කාර්යාලය සම්බන්ධයෙනුත් මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපේ රටේ මේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන කමිටු දෙකක් තිබෙනවා. ඒ තමයි, COPE එක සහ COPA එක. COPA එක දෙපාර්තමේන්තු බලනවා; COPE එක අනෙකුත් රාජ්‍ය ආයතන පද්ධතිය බලනවා. මේ ආයතන පිළිබඳ විගණන වාර්තා එනවා. ඒ විගණන වාර්තා විමර්ශනය කරනවා; පරීක්ෂා කරනවා. හැබැයි, අවසානයේදී ඒවාට මොකද වෙන්නේ කියලා අදහසක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මට හොඳ අත්දැකීමක් තිබෙනවා. ඔබතුමාට මතක ඇති, 2004 ඉඳන් VAT වංචාව පිළිබඳ දැවැන්ත සාකච්ඡාවක් තිබුණා. ඒ කාලයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොම්පියුටර් පවා හොරු අරගෙන ගිහිල්ලා තිබුණේ. ඒ පිළිබඳව විමර්ශනය කළා. ඒ විමර්ශනය කරපු වෙලාවේ COPA එකේ සභාපති විධියට හිටියේ ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඒ විමර්ශනය අවසන් කරලා අපි

[ගරු වසන්ත සමරසිංහ මහතා]

අවුරුදු දෙකකට පස්සේ වාර්තාව දුන්නා. නමුත් අද වෙනකම් මේ බදු වංචනිකයන්ට අදාළව ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ. සමහර වංචනිකයන් රටිනුත් එළියේ ඉන්නේ. ඒ නිසා මේ විගණන ක්‍රියාවලිය ඇතුළේ අපේ රට ඉන්න තැන දෙස බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණන ක්‍රියාවලිය ඇතුළේ මූල්‍ය විගණනය වාගේම, කාර්ය සාධන විගණනයක් තිබෙන්න ඕනෑ. අපේ රටේ ඉදිරිපත් කරන සමහර විගණන වාර්තා අවුරුදු දෙක, තුනක් පරණයි. අපට ඒවායේ පශ්චාත් මරණ පරීක්ෂණය තමයි කරන්න වෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම විගණනයේ කාර්ය සාධනය පැත්තෙන් වැඩි දෙයක් කරන්න තමයි අපි දැන් අදහස් යොමු කරන්න ඕනෑ; අපේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ කාර්ය සාධනය වැඩි කරලා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයට ආපු වෙලාවේ මගේ කථාවේ ඉතිරි කොටස ඉදිරිපත් කිරීමට ලැබීම සතුටක්. ගරු සභාපතිතුමනි, මම කථා කරමින් හිටියේ විගණනය වෙනුවෙන් Audit Service Commission එකත් සම්බන්ධයෙන්. ලෝකයේ දැන් තිබෙන්නේ විගණනවල මූල්‍ය විගණනය සියයට 20යි, කාර්ය සාධන විගණනය සියයට 80යි. හැබැයි, කාර්ය සාධන විගණනය ගත්තාම අපි ඉන්නේ ඉතාම පහළ මට්ටමක. ඒ නිසා කාර්ය සාධනය විගණනය ශක්තිමත් කරන්න, විගණන කාර්යාලයට, විගණන කොමිසමට අවශ්‍ය පහසුකම් ලබාදීලා මේ විගණනය ශක්තිමත් කරන්න අවශ්‍ය දේ කරන්න අපේ ආණ්ඩුව කටයුතු කරමින් තිබෙනවා. මහජනතාවට තේරෙන භාෂාවෙන් තමයි මේ විගණනය පිළිබඳව අදහස් හා වාර්තා ඉදිරිපත් වෙන්න ඕනෑ. මොකද, ඕනෑම විගණන වාර්තාවක් පිළිබඳව විගණන කොමිසම, විගණන දෙපාර්තමේන්තුව තමන්ගේ මතය කියනවා. හිතකර මතය කියනවා; අහිතකර මතය කියනවා; යටත් මතය කියනවා; කොන්දේසි සහිත මතය කියනවා. ඉතින් කාටද මේක තේරෙන්නේ? අවසානයේදී විගණන වාර්තා මේ කියන අදාළ නිර්දේශ 4 යටතේ ඉදිරිපත් වෙනවා. අවසානයේදී ජනතාව කාර්ය සාධනය බැලුවාම, කාර්ය සාධනය තිබෙන්නේ ඉතාම පහළ මට්ටමක. ඒ නිසා විගණන කොමිසමත්, විගණන දෙපාර්තමේන්තුවේත් කාර්ය සාධනය පිළිබඳව කථා කරන්න අපි කටයුතු කරමින් තිබෙනවා. අපි මේ පිළිබඳව ඉදිරියේදී බලනවා.

ඒ වාගේම, මේක විශේෂ එකක්. ඒ තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව. මේ මොහොතේ සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගොඩක් දෙනෙක් නොහිටියත් මේක කියන්නත් ඕනෑ. විපක්ෂයේ උදවිය හිටියා නම් තමයි හොඳ. මොකද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පසුගිය කාලයේ බරපතළ ප්‍රශ්න තිබුණා. ගරු සභාපතිතුමනි, මම මේ කියන සිදුවීම ඔබතුමාටත් මතක ඇති. එක කාලයක එක්තරා ඇමතිවරයෙකුට විමර්ශනයක් සඳහා එන්න කිව්වාම, ඒ ඇමතිවරයා අමාත්‍යාංශ කාර්යාලයේදී නයා කෑවා කිව්වා. ඊට පහුවෙනිදාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්වරයා ත්‍රිකුණාමලය අධිකරණයට මාරු කර යැව්වා. මේ තමයි අපේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දේශපාලනය මැදිහත් වෙච්ච ආකාරය. ඒ කාලයේ අපේ රටේ ජනාධිපතිවරයා විධියට හිටියේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. මම මේ තොරතුරු කියන්නේ මේ හේතුව මතයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කරන්න, අවශ්‍ය නිලධාරීන් ලබා දෙන්න, අවශ්‍ය ඉඩකඩ වැඩි කරන්න, අවශ්‍ය භූමියක් ලබා දෙන්න, ගොඩනැඟිලි ලබා දෙන්න අපේ ආණ්ඩුව කටයුතු කරමින් සිටිනවා. ඒ නිසා ජනතාව අපේක්ෂාවෙන් ඉන්නවා, විශ්වාසයෙන් ඉන්නවා, වංචාව, දූෂණය, නාස්තිය නවත්වලා රටේ ජනතාවගේ පැත්තෙන් මේ විමර්ශන ශක්තිමත්ව ඉදිරියට යයි කියලා. 2021 අවුරුද්දේ අවසන් කළ එවැනි නඩු තිබෙන්නේ 69යි, ගරු සභාපතිතුමනි. 2022 අවුරුද්දේ අවසන් කළ නඩු තිබෙන්නේ නඩු 89යි.

වැඩේ තිබෙන්නේ, 2021දී අවසන් කළ නඩු 69න්, 40ක්, සියයට 58ක් ඉල්ලා අස් කරගෙන. ඒ වාගේම 2022දී අවසන් කළ නඩු 89න්, 45ක් -සියයට 49ක්- ඉල්ලා අස් කරගෙන. මේ තිබෙන්නේ අපේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් පවරපු නඩු. නැවත නඩු පැවරීම් බැලුවොත්, ඉල්ලා අස් කරගැනීම් 85න් 20ක් 2022.12.30 වෙනකොට නැවත පවරා තිබෙනවා. 85න්, 20යි නැවත පවරා තිබෙන්නේ. ඒවායින් නඩු 11ක, 11 දෙනෙක් වැරදිකරුවන් බවට පත් වෙලා තිබෙනවා. පවරපු නඩුවලින් 18ක් නිදහස්. ඒ නිසා පරීක්ෂණ ක්‍රියාවලිය, විමර්ශන ක්‍රියාවලිය වාගේම, මේ පිළිබඳව ඇවිල්ලා තිබෙන පැමිණිලි ගත්තාම අපි ඉන්නේ ටිකක් හොඳ තැනක නොවෙයි. ලෝකයේ රටවල් 180ක් සැලකුවාම, අපි ඉන්නේ 115 වැනි තැන. අල්ලස හෝ දූෂණය පිළිබඳව පසුගිය කාලයේ අපේ රට කප් ගහලා හිටියේ. මහ බැංකුව කඩලා, මහජන අරමුදල් කොල්ල කාලා තිබුණේ. ඒ නිසා අපි මේවා නිවැරදි කරන්න අවශ්‍ය කටයුතු කරනවා. ඒ වාගේම මේ සමහර ඉල්ලා අස් කරගත් නඩු නැවත පවරන්නත්, ඒ ආයතනයට අවශ්‍ය ශක්තිය, අවශ්‍ය අරමුදල්, අවශ්‍ය කාර්ය මණ්ඩලය වැනි පහසුකම් ලබා දෙමින් මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳ තිබුණු චිත්‍රය නිවැරදි කරලා රටේ ජනතාව විශ්වාසය තබන ආයතනයක් බවට පත් කරන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම එම ආයතනයටත්, එම ආයතනයේ සේවය කරන නිලධාරීන්ටත් ඒ වගකීම අරගෙන ඉදිරියේදී වැඩ කරන්න වෙනවා.

මම මේ විවාදය තුළ විශේෂයෙන් අවධානයට යොමු කරන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. සමහර කථා ඇතුළේ කිව්වා, -මම හිතන විධියට මට කලින් කථා කළ මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් කියන්න ගත්තා- අපි පරාද වෙච්ච අය විවිධ තනතුරුවලට සහ අමාත්‍යාංශ ලේකම්වරුන් වශයෙන් පත් කළා කියලා. ඒ පත් කරපු අය හොඳ නැද්ද කියලා අපි අහනවා. අපි දේශපාලන පත් කිරීම් කියලා පවුලේ ඥාතීන්, නෝනලා, දරුවෝ පත් කළේ නැහැ. සමහර ආණ්ඩුවලින් යවපු, සමහර අයගේ දරුවෝ තවමත් තානාපති කාර්යාලවල ඉන්නවා. දැන් අපේ විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා පියවරින් පියවර ඒ අය ගෙන්වන්න කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා, මේ පත් කිරීම් පිළිබඳව ප්‍රශ්න කරමින් මේ කියන්න හදන්නේ පැවතුණු ආණ්ඩුව සහ මේ ආණ්ඩුව සමානයි කියලාද? නැහැ, අපි ඒකට අවශ්‍ය කරන ආදර්ශ විශාල ප්‍රමාණයක් සපයලා තිබෙනවා. අද පැවති විවාදයේදී අපේ අගමැතිතුමිය, අපේ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් ඇතුළු කථා කරපු සියලුදෙනා මේ ගැන තොරතුරු කිව්වා. ඒ නිසා අපේ ජනාධිපතිවරයා, ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය,

සභානායක කාර්යාලය, ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය ඇතුළු මේ ආයතන මැදිහත් වෙමින් කරපු කාර්යයන් තුළ විශාල මුදලක් අපි ඉතිරි කරලා තිබෙනවා කියන එකත් විශේෂයෙන් කියන්නට ඕනෑ. වංචාව, දූෂණය නවත්වන එක විතරක් නොවෙයි, නාස්තියත් නවත්වා තිබෙනවා. අපි අරපිරිමැස්ම පුරුදු කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි මැදිහත් වෙලා තිබෙනවා.

විශේෂයෙන් කියන්න ඕනෑ, පසුගිය කාලය පුරාවට අපි ඉතිරි කරපු දේවල් ගත්තාම අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ කාර්ය මණ්ඩල, ගොඩනැඟිලි, වාහන, අරමුදල් පාවිච්චි කරපුවා ගත්තාම අපි දැන් ඇති තරමට ඒ ගැන කථා කරලා තිබෙනවා; කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන් කියන්න ඕනෑ, මේ ගොඩනැඟිලි හා විදුලි බිල්පත් වාගේ ඒවා ගැන. හිටපු ජනාධිපතිවරු 2024 වර්ෂය තුළ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවලින් ගොඩනැඟිලි 18ක් කුලියට අරගෙන තිබුණා. අපි ඒවා අඩු කළා. අඩු කරලා රුපියල් මිලියන 117ක් අඩු කළා. ඒවායේ විදුලි බිල් සහ වතුර බිල්වල එකතුව රුපියල් මිලියන 41යි. ජනාධිපති කාර්යාලය යටතේ තිබෙන ගොඩනැඟිලි කුලීවලින් අපි රුපියල් මිලියන 158ක් ඉතිරි කරලා තිබෙනවා. අපි මේ ඉතිරි කිරීම් කරලා තිබෙනවා. අපි නාස්තිකාර ව්‍යයදම්වලට ගියේ නැහැ. ඔබතුමන්ලා මේවාත් දකිනවා නම් තමයි හොඳ. මේවා දකින්නේ නැතිව තමයි අප ඒ කාලයට සමාන කරන්න හදන්නේ. එහෙම කොහොමද අප සමාන කරන්න හදන්නේ?

ජනාධිපති කාර්යාලය සහ ජනාධිපති කාර්යාලය සතුව පවතින ක්‍රියාවලිය පිළිබඳවත් වචනයක් කියන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. විශේෂයෙන් වාහන පාවිච්චිය ගැන කියන්න ඕනෑ. පසුගිය කාලයේ වාහන පිළිබඳව ආන්දෝලනයක් තිබුණා. ඇත්තටම සමහර වාහන තවමත් ආගිය තැනක් නැහැ. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඒක තමයි තිබෙන ප්‍රශ්නය. වාහන ගියා විතරයි ඇවිල්ලා නැහැ. සමහර ඒවා සුඛෝපභෝගී වාහන. මේ වාහන ඔක්කොම තිබුණා 814ක්. ඒ වාහන 814න් අපි මේ වෙනකොට වාහන 249ක් රටේ අවශ්‍ය ආයතනවලට ලබා දීලා තිබෙනවා. ජනාධිපති කාර්යාලයේ තිබුණු වාහන පසුගිය කාලයේ පාවිච්චි කළේ කවුද? තමන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල, උපදේශකයන්, තමන්ගේ ගෙවල්වල අය තමයි මේ වාහන පාවිච්චි කළේ. එහෙම වාහන 249ක් රාජ්‍ය ආයතනවල ප්‍රයෝජනයට ගන්න අපි කටයුතු කරලා තිබෙනවා කියන කාරණයත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. අපි එහෙමයි මේ නාස්තිය නතර කරන්නේ. අපි එහෙමයි ඉතිරි කරන්න කටයුතු කරන්නේ.

ඒ විතරක් නොවෙයි. මේ වාහන 814 අතර සුඛෝපභෝගී වාහන 288ක් තිබුණා. ඒ සුඛෝපභෝගී වාහන 288න් වාහන 160ක් ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබුණේ. වෙනත් අමාත්‍යාංශ හා ආයතන සතුව වාහන 128ක් තිබුණා. මේ වාහන 128න් පහක් ගන්න දෙයක් නැතිව අයින් කරලා තිබෙනවා. ඒවා පාවිච්චි කරන්න තියා විකුණන්නවත් බැරි තරමට විනාශ වෙලා තිබෙන්නේ. තව පහක් තිබෙනවා. ඒවා ආ ගිය අතක් සොයා ගන්න නැහැ. දැන් සොයනවා, මේ වාහන පහ කොහේද ගියේ කියලා. මොකද, සමහර අය පසුගිය කාලයේ වාහන ගෙනිහින් ගෙවල්වල ගරාජ් ඇතුළේ දමලා වහලා තිබෙනවා. හැබැයි, මේවා තව කොච්චර කල් තියාගෙන ඉන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ. වාහන පහක් ආ ගිය අතක් නැහැ. අපි මේ වාහන 288න් නැතිවෙච්ච වාහන 10 හැර ඉතිරි වාහන ටික රජයේ බැහැර කිරීමේ ක්‍රියාලිය යටතේ මාර්තු මාසයේ 31වැනි දා වෙනකොට විකුණලා අවසන් කරන්න ඕනෑ. මේ සුඛෝපභෝගී වාහන පාවිච්චිය රටට බරක්; ජනතාවට බරක්. ඒ නිසා ආණ්ඩුව වෙච්ච පොරොන්දුව ඉෂ්ට කරමින් ඒ වාහන සියල්ල විකුණලා ඒ මුදල් භාණ්ඩාගාරයට ගන්න කටයුතු කරනවාය කියන කාරණය අපි මේ වෙලාවේ මතක් කර දෙන්න ඕනෑ. අපි එහෙමයි වැඩ කරන්නේ, මුජිබුර් මන්ත්‍රීතුමා. මේ වාහන පිළිබඳ කථාව යද්දී මේ වාහන ගත්ත අය මෙතැන ඉන්නවාද කියලා මම බැලුවේ. ඒ අය පෙනෙන්න නැහැ.

ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩල, පෞද්ගලික කාර්ය මණ්ඩල ගැන අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමාත් කරුණු කිව්වා. සමහර අය උපදේශකයන් කියලා හැට ගණනක් පත් කරගෙන සිටියා. නිල වශයෙන් පත් කරපු තිස් ගණනක් හිටියා. තව 80ක් විතර නොනිල ලෙස පත් කරපු අය හිටියා. ඒ ගත්ත උපදෙස් තිබුණා නම්, අපට ඒ උපදෙස් මොනවාද කියලා බලා ගන්න තිබුණා. එදා ජනාධිපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට වාහන 68ක් දීලා තිබුණා. මම බැලුවා, කවුද මේ වාහන 68 අරගෙන තිබෙන්නේ කියලා. ගරු සභාපතිතුමනි, පෞද්ගලික කාර්ය මණ්ඩලයට ගත්ත වාහන බැලුවාම පොඩි ප්‍රමාණයක් නොවෙයි, වාහන ලිස්ට් එකක්ම අරගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස් වේ.

ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.
அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.
Accordingly, Parliament resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දිනට නියමිත කටයුතු අවසන් වනතුරු කාලය ලබා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී.-
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பட்டது.-
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee. -
[THE HON. SPEAKER in the Chair.]

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු සභාපතිතුමනි, මම කියන්න හැදුවේ පෞද්ගලික කාර්ය මණ්ඩල පාවිච්චි කරපු වාහන ගැන. ඊළඟට, පඩි නඩි ගැන කිව්වා, විවිධ දීමනා ගැන කිව්වා, තෙල් ගහපුවා ගැන කිව්වා. මා ළඟ මේ වාහන ලිස්ට් එක තිබෙනවා. මේ ලිස්ට් එකේ අපූරු අය ඉන්නවා. මේ ලිස්ට් එක අනුව ව්‍යක්තීය සමීති උපදේශක කියලා කෙනෙක් පත් කරලා තිබෙනවා. ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ලෙස හිටපු මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර කියන මාධ්‍යවේදියා පත් කරලා තිබෙනවා. ඒ වාගේම ව්‍යක්තීය සමීති අධ්‍යක්ෂ, සමන් රත්නප්‍රිය පත් කරලා තිබෙනවා. ඒ පාවිච්චි කරපු වාහනයත් එක්ක විස්තර තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමාගේ යාළුවා නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ඔබතුමාගේත් යාළුවා නේ. යාළුවා වුණත් කරලා තිබෙන වැඩේ වැරදියි නේ. ඔය ගොල්ලොත් එක්ක පාර්ලිමේන්තුවේ එක දවසක් ඉඳලා වාහන පර්මිට් එකකුත් අරගෙන ගිහිල්ලා අවසානයේ කරපු වැඩේ තමයි මේ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒ අයගේ නම් කියන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ඒක තමයි මේ කියන්නේ. ඒක නේ මේ නම් කියන්නේ. මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, නම් හැටියට තමයි මේ කියන්නේ. *[බාධා කිරීමක්]* ආ, ඒක හරි. *[බාධා කිරීමක්]* වාහනයේ number එක සොයාගෙන බැහැ නේ, මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඉස්සෙල්ලා නම සොයා ගන්න එපායැ. මොකද, මනෝ ගනේසන් මන්ත්‍රීතුමා *[බාධා කිරීමක්]* ගෙදර ප්‍රශ්නයක් වුණා නම් පස්සේ කථා කරන්න තිබුණා, බේරාගන්න තිබුණා. ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා කියනවා වාගේ නම් කරලාම තමයි මේ කියන්නේ. මේ ලිස්ට් එකේ නම් 68ක් තිබෙනවා. මේ 68 ගැනම කියන්න ගියොත් දැන් පාර්ලිමේන්තුවේ දීර්ඝ කර ගත්ත කාලයත් මදි වෙයි. ඒ නිසා මගේ කථාව අවසන් කරන්නයි මම හදන්නේ. මම නම් කිහිපයක් කියන්නම්. බී.කේ. තිලකරත්න මහත්මයා, ජනාධිපති උපදේශක - නීති කටයුතු - ලෙස පත් කරලා තිබෙනවා. ආචාර්ය එම්.එච්.එස්. බටගොඩ මහත්මයා. මේ අය ජනාධිපති උපදේශකයන් ලෙස පත් කරලා වාහන දීලා තිබෙනවා. බර්නඩීන් රෝස් සේනානායක මහත්මිය. මේ ඔබතුමන්ලා අඳුරන අය වෙන්න ඇති, සමහරවිට. ඊට පස්සේ ආර්. පාස්කරලිංගම් මහත්මයා පත් කරලා තිබෙනවා. පාස්කරලිංගම් මහත්මයාටත් වාහනයක් දීලා තිබෙනවා.

මේ අය වාහන නැතුව හිටියා වාගේ නේ. මේ අයට තමයි ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වාහන දීලා තිබෙන්නේ. ඒ වාගේම සමන් කුමාර අතාවුදහෙට්ටි මහත්මයා එක ආයතනයක සභාපති හැටියටත් ඉඳලා තිබෙනවා, ජනාධිපති ලේකම් කාර්යාලයෙනුත් වාහනයක් අරගෙන තිබෙනවා. ඊළඟට, ප්‍රියානි විජේසේකර මහත්මිය. එතුමිය හිටපු පාර්ලිමේන්තු මහ ලේකම්වරියක්. ඊළඟට, මහාචාර්ය චන්ද්‍රජීත් ආශු මාරසිංහ. මේ තිබෙන්නේ ඒ විධියට වාහන දීපු අයගේ නම් ටික. මම මේ නම් කියන්නේ මේ ලැයිස්තුව් තැනින් තැනින්. ඊළඟට, වඩිවේල් සුරේෂ්. ඒ, අපේ යාළුවෙක්. එතුමාත් වාහනයක් අරගෙන තිබෙනවා, ජනාධිපති ලේකම් කාර්යාලයෙන්. අපේ තොන්ඩමන් මන්ත්‍රීතුමාත් එතුමා දන්නවා නේ. මේ තමයි වාහන අරගෙන තිබුණු අයගෙන් කොටසක්. තව කාටද මේ වාහන දීලා තිබෙන්නේ? ඊළඟට ඉන්නවා, අකිල විරාජ් කාරියවසම්, සාගල රත්නායක, ආර්.බී. විදානගමගේ, පාලිත වික්‍රමසිංහ, ආචාර්ය ආනන්ද ලේනවතන්ත්‍රි. මේ ආදී වශයෙන් වූ පුද්ගලයන්ට වාහන 64ක් දීලා තිබුණා, ගරු සභාපතිතුමනි. ඒ අනුව වාහන 64ක් පාවිච්චි කරන්න දීලා තිබුණා, උපදේශකයන්ට සහ හිතවතුන්ට. මේ විධියට තමයි ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබුණු වාහන ටික පාවිච්චි කරලා ජනතාවට බරක් වෙලා සිටියේ. හැබැයි, අද පෞද්ගලික කාර්ය මණ්ඩලය ඇතුළු ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ තිබෙන්නේ වාහන 11යි. මෙහෙම තමයි අපි මේ දේවල් වෙනස් කළේ. මේ වැඩිපුර වාහන තිබෙන්නේ ආරක්ෂක අංශවලට. වාහන 200ක් තිබෙනවා, transport එකේ. තවත් වාහන 250කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා, ආරක්ෂක අංශ සතුව. ආරක්ෂක අංශවලට තමයි මෝටර් බයිසිකල්, ත්‍රී-වීලර්වල සිට අනෙකුත් වාහන වැඩියෙන් දීලා තිබෙන්නේ.

අපි මේ ආණ්ඩුව භාර අරගෙන ජනතාව අප කෙරෙහි තැබූ විශ්වාසය ආරක්ෂා කරමින් තමයි කටයුතු කරන්නේ. ඒ නිසා ජනාධිපතිවරයා, අගමැතිවරිය, ඇමති මණ්ඩලය, මන්ත්‍රීවරුන් වාගේම මේ පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය ඇතුළු මේ ආයතන පද්ධති සියල්ල ඒ තිබුණු තත්ත්වයෙන් එළියට ගෙනැල්ලා මේ රටේ ජනතාව තැබූ විශ්වාසය රකිමින්, ජනතාවට දීපු පොරොන්දු ආරක්ෂා කරමින් අපි කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා තමයි පසුගිය අවුරුද්දේ වියදමට වඩා මේ අවුරුද්දේ වියදම අඩු කරගෙන තිබෙන්නේ. එසේ අඩු කර ගත්තේ කොහොමද? අර වාගේ නාස්තිකාර වියදම් නවත්වා තිබෙන නිසායි. වාහන නඩත්තු කිරීම්, ගෙවල්-ඉඩම් කුලියට ගැනීම් වාගේ කාරණාවලදී රජයට දරන්න වන වියදම් අඩු කරලා තමයි අපි මේ කටයුත්ත කරලා තිබෙන්නේ. ඒක දරාගන්න බැරිව මාස 3ක් ගත වෙච්ච අපේ ආණ්ඩුව පිළිබඳව විවිධ අවලාද, මුසාවාද -බොරු- කියන්න පටන්ගෙන තිබෙනවා. ඒ නිසා අපි ඒ අයට කිව යුතු දෙයක් තිබෙනවා. ඔබතුමන්ලා කියන්න උත්සාහ කළේ මොකක්ද? අර මුජිබුර් මන්ත්‍රීතුමාත් කිව්වා, එතුමන්ලා කරන්න හදපු වැඩේ තමයි අපි කරන්න හැදුවේ කියලා. එහෙම නම් මේකට පක්ෂ වෙන්න නේ තිබුණේ. පක්ෂ වෙලා කියන්න තිබුණා නේ, "අපියි, ඔයගොල්ලොයි දෙගොල්ලම එකයි" කියලා. ඇයි, එහෙම කරන්නේ නැත්තේ? එතුමන්ලා මේ අය වැයට විරුද්ධ වෙනවා. විපක්ෂය නිසාම විරුද්ධ වෙන්න ඕනෑ කියලා එකක් තිබෙනවාද? නැහැ. අර භාවිතාව ඇතුළේ එවැන්නක් පෙන්වන්න ඕනෑකම මිසක්, අපි ජනතාවත් එක්ක එකතු වෙලා වැඩ කරනවා කියන ඇත්ත -යථාර්ථය- ඒ අය දන්නවා.

ඔබතුමන්ලා වැටුප් ගැනත් කිව්වා. ඔව්, ලංකා ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩිවීම ලබා දීලා තිබෙන්නේ මේ අවුරුද්දේ අය වැයෙන් තමයි. රාජ්‍ය සේවකයා, පෞද්ගලික අංශයේ සේවකයා කියන ඒ සියලුදෙනාට අවශ්‍ය වැටුප් වැඩි කිරීමට මැදිහත් වුණේ, ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩිවීම ලබා දුන්නේ මේ අය වැයෙන් තමයි. ඒ නිසා රටේ ජනතාවට වුණු පොරොන්දුව ඉටු කරමින් ජනාධිපතිවරයාත්, ආණ්ඩුවත් ඉදිරිපත් කරපු අය වැයක් තමයි මේ අය වැය. ඉතින් මේ අය වැය දිහා බලා විපක්ෂයේ කාර්යභාරය හැටියට කරන්නේ මේකට විරුද්ධ වීම නම්, ඔබතුමන්ලා ඒ වාගේ ලයින් එකක නම් යන්නේ, ඔව්, අපි ඒකට okay, අපි ඒකත් ඉවසාගෙන යමු. හැබැයි අපි ඔබතුමන්ලාට කියන්න ඕනෑ, අපි ආණ්ඩුව ගත්තේ මේ රට හදන්න බව. හොරකම, වංචාව, දූෂණය, නාස්තිය සිදු කර මේ රට ගොඩගන්න බැරි තැනකට වටලා, බංකොලොත් කරපු රටක් තමයි අපට භාර දුන්නේ. අපි ඒ රට ගත්තේ හදන්න. ඒ නිසා අපි පැහැදිලි කරලා ඔබතුමන්ලාට කියන්න ඕනෑ, ඔබතුමන්ලාටත් මේ තුළ ඉඩ තිබෙන බව. ප්‍රමාද වෙන්න එපා. ජාතික ජන බලවේගය මේ රට ගොඩනඟන එක සහතිකයි. ආපසු හරවන්න බැරි විධියට අපි මේ රට ගොඩනඟනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. චාමර වීරසිංහ කියන අපේ රටේ ඉන්න ප්‍රසිද්ධ ගායකයා ලස්සන සින්දුවක් කියා තිබෙනවා. ඒ සින්දුවේ මුල් කොටසේ තිබෙන්නේ, "සඳට සඳ එළියට - මලට මල් පොකුරට, කවියෝ කවි ලීවට - වෙනස් වේවිද මේ මිනිසුන්ගේ සිත" යනුවෙන්. මට කියන්න තිබෙන්නේ, අපි මේ මොනවා කිව්වත්, "සඳට සඳ එළියට - මලට මල් පොකුරට, කවියෝ කවි ලීවට - වෙනස් වේවිද මේ විපක්ෂය, වෙනස් වේවිද මේ විපක්ෂය" කියලායි. ඒ බව කියමින් මම නවතිනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(මාණ්ඩලික තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, විශේෂ වියදම් ඒකක ශීර්ෂ 1, 2, 4 සිට 11 දක්වා සහ ශීර්ෂ 13, 16 සිට 25 දක්වා සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු අග්‍රාමාත්‍යතුමිය.

ශීර්ෂ 1-25 විශේෂ වියදම් ඒකක - මූලධන වියදම් - රු.3,487,000,000

தலைப்பு 1 - 25 விசேட செலவினக் கூறுகள் - மூலதனச் செலவினம் - ரூபாய் 3,487,000,000

HEADS 1-25 SPECIAL SPENDING UNITS - CAPITAL EXPENDITURE - RS. 3,487,000,000

පුනරාවර්තන	35,944,020,000
මූලධන	3,487,000,000

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(මාණ්ඩලික (කලානිති) හරිනි අමරසූරිය)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, ශීර්ෂ අංක 1 - 25 විශේෂ වියදම් ඒකක යටතේ මූලධන වියදම සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"7වන පිටුවේ, 3වන ඡේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'මූලධන රු. 9,487,000,000' "

ගරු සභාපතිතුමා
(මාණ්ඩලික තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්ඩලික උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

"ශීර්ෂ 1 - 25 විශේෂ වියදම් ඒකක යටතේ, මූලධන වියදම සඳහා රු. 9,487,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂ 1 - 25 විශේෂ වියදම් ඒකක යටතේ, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 1 - 25 விசேட செலவினக் கூறுகளின்கீழ், மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 9,487,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1 - 25 விசேட செலவினக் கூறுகளின்கீழ், மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 9,487,000,000, for Heads 1-25 under Special Spending Units, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Heads 1-25 under Special Spending Units, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"1 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,518,980,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 354,000,000

"1 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 354,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,518,980,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 354,000,000

"தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 354,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,518,980,000, for Head 1, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 1, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 354,000,000

Question, "That the sum of Rs. 354,000,000, for Head 1, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 1, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 20,000,000; මූලධන වියදම, රු. 100,000,000

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 20,000,000; மூலதனச் செலவு, ரூபாய் 100,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 20,000,000; Capital Expenditure , Rs. 100,000,000

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(මාණ්ඩලික (කලානිති) හරිනි අමරසූරිය)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, 1 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමා
(මාණ්ඩලික තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්ඩලික උපදේශකයින්)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
තීරණය කරන ලදී:
Resolved:

"7වන පිටුවේ, 7වන ජේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන 20,000,000 6,100,000,000' "

[මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ වැය ශීර්ෂ අංක 1 සඳහා අයවැය යෝජනා අංක 07 සහ 19 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු. 6,000,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"1 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 20,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"1 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 6,100,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

1 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 20,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 6,100,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 1, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 20,000,000, for Head 1, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 1, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 6,100,000,000, for Head 1, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 1, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

2 වන ශීර්ෂය.- අග්‍රාමාත්‍ය කාර්යාලය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,099,000,000

"2 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,099,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

2 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 71,000,000

"2 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 71,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

2 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4 වන ශීර්ෂය.- උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 451,500,000

"4 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 451,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

4 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 30,500,000

"4 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 30,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

4 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5 වන ශීර්ෂය.- අමාත්‍ය මණ්ඩල කාර්යාලය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 205,250,000

"5 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 205,250,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

5 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 25,750,000

"5 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 25,750,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

5 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6 වන ශීර්ෂය.- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 319,240,000

"6 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 319,240,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

6 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 16,000,000

"6 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 16,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

6 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

7 වන ශීර්ෂය.- අධිකරණ සේවා කොමිෂන් සභාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 158,200,000

"7 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 158,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

7 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 4,100,000

"7 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 4,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

7 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

8 වන ශීර්ෂය.- ජාතික පොලිස් කොමිෂන් සභාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 224,400,000

"8 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 224,400,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

8 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 12,500,000

"8 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 12,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

8 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

9 වන ශීර්ෂය.- පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 48,600,000

"9 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 48,600,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

9 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 900,000

"9 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

9 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10 වන ශීර්ෂය.- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 945,700,000

"10 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 945,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

10 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 411,500,000

"10 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 411,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

10 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11 වන ශීර්ෂය.- මුදල් කොමිෂන් සභා කාර්යාලය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 132,200,000

"11 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 132,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

11 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 800,000

"11 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

11 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

13 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 358,500,000

"13 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 358,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

13 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 90,500,000

"13 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 90,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

13 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

16 වන ශීර්ෂය.- පාර්ලිමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 4,208,300,000

"16 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,208,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

16 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 940,200,000

"16 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 940,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

16 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

17 වන ශීර්ෂය.- පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 73,500,000

"17 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 73,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

17 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 4,500,000

"17 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 4,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

17 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

18 වන ශීර්ෂය.- පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 86,100,000

"18 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 86,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

18 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 2,400,000

"18 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,400,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

18 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

19 වන ශීර්ෂය.- පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 321,050,000

"19 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 321,050,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

19 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 9,950,000

"19 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 9,950,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

19 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

20 වන ශීර්ෂය.- මැතිවරණ කොමිෂන් සභාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 21,272,000,000

"20 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 21,272,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

20 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 209,000,000

"20 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 209,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

20 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

21 වන ශීර්ෂය.- ජාතික විගණන කාර්යාලය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,288,800,000

"21 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,288,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

21 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 1,062,000,000

சகோதரர் ஜீவன் தொண்டமான் அவர்கள் சொன்னதுபோல தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினை தொடர்பில் எந்தவொரு தெளிவான நிலைப்பாடும் இல்லை. கம்பனி முதலாளிமார் சம்மேளனம் இது தொடர்பில் எந்தவோர் இணக்கமும் இல்லையென்று சொல்லியிருக்கின்றது. மாண்புமிகு ஜனாதிபதி அவர்களின் உரையிலே அடிப்படைச் சம்பளம் 1,700 ரூபாய் என்று சொல்லப்பட்டிருக்கின்றது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is up.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

ஆளும் கட்சியைச் சேர்ந்த மலையக உறுப்பினர்களுக்கு அந்த மக்கள் அதிகமான வாக்குகளைத் தந்து பாராளுமன்றத்துக்கு அனுப்பியது, அவர்கள் வெறும் signal lightஆக இங்கு இருப்பதற்கல்ல. சிவப்பு light போட்டால், நிற்பதும், பச்சை light போட்டால் ஓடுவதும்போல, கௌரவ சபாநாயகர் சொல்வதை மட்டும் செய்வதற்கு அந்த மக்கள் உங்களைத் தெரிவு செய்யவில்லை; அவர்களின் பிரச்சினைகளுக்குக் குரல் கொடுப்பதற்கே தெரிவு செய்தார்கள். ஆகவே, மிகவும் முக்கியமான இந்தப் பிரதேச செயலக விவகாரத்தை உடனடியாகக் கவனத்திலெடுத்து, உரிய நடவடிக்கை எடுப்பதுடன், இதுபற்றிய தீர்மானம் ஒரு முன்மொழிவாக மட்டுமே இருக்கவேண்டுமென்பதை இந்தச் சபையிலே நான் வலியுறுத்துகிறேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. (Prof.) A.H.M.H. Abayarathna. You have seven minutes.

[අ.භා. 6.28]

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. එතුමා සඳහන් කළ ආකාරයටම නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ තිබුණු නුවරඑළිය, අඹගමුව, කොත්මලේ, වලපනේ සහ හඟුරන්කෙත වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහක් 1992දී ගැසට් නිවේදනයක් මඟින් ස්ථාපිත කර තිබුණා. 2019.10.29 දිනැති අංක 2147/28 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක් ලෙස ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණා. ඒ අනුව තමයි පෙර පැවැති අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අඹගමුව සහ නෝර්වුඩ් නමින් නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් හැටියට සංශෝධනය වෙලා තිබුණේ.

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට ඒ සීමා නිවැරදියි. ඒ කියපු කාරණය නිවැරදියි. කොහොම වුණත්, නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ අලුතින් ස්ථාපනය වූ නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි අවම කාර්යාල පහසුකම් යටතේ වුවද නිලධාරීන් පත්කර ඒවා ක්‍රියාත්මක කිරීම මේ වන විටත් සිදු කරමින් පවතිනවා. ඒ අනුව නෝර්වුඩ් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කාර්යාලයක ඉඩ පහසුකම් උපයෝගී කර ගනිමින් 2023 වර්ෂයේදී නව කාර්යාලය ආරම්භ කිරීමට කටයුතු කරලා තිබෙනවා.

දැනට ලක්ෂ දෙකකට අධික මහ ජනතාවකට සේවය සපයනු ලබන එම කාර්යාලය වර්ග අඩි 1,500ක පමණ කුඩා ඉඩ ප්‍රමාණයකයි පිහිටා තිබෙන්නේ. මේ කියන විධියට, අඩි 40 x 40ටත් වඩා අඩු ඉඩ කඩක් තමයි වර්ග අඩි 1,500ක් කියන කොට තිබෙන්නේ. එම කාර්යාලයේ කාර්ය මණ්ඩලය හැටියට 110 දෙනෙක් සේවය කරනවා. හැටන් නගරයේ ඉඳලා එම කාර්යාලයට කිලෝමීටර 6ක පමණ දුර ප්‍රමාණයක් තිබෙනවා. එම කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් හා දෛනිකව සේවය ලබා ගැනීමට පැමිණෙන මහ ජනයා කාර්යාලයේ පවතින අවම ඉඩ කඩ නිසා පීඩාවට පත් වී ඇති බැවින්, එම කාර්යාලය හැටන් නගරය වෙත ගෙන යෑමට යෝජනාවක් නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර තිබෙනවා, 2025 ජනවාරි 30 වෙනි දා. හැටන් නගරයේ, දුම්රිය දෙපාර්තමේන්තුවට අයත්, 2016 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර 2020 වර්ෂයේදී අවසන් කර ඇති ගොඩනැගිල්ල සඳහා රුපියල් මිලියන 400ක පමණ මුදලක් යොදවා තිබෙනවා. 2020 වර්ෂයේදී බිම් මහලෙහි පමණක් වැඩ අවසන් කර ඇති නමුත්, මේ දක්වා එම ගොඩනැගිල්ල භාවිතයට ගෙන නැහැ. එය වසා දමා ඇති බව පෙන්වා දී තිබෙනවා. පළමු සහ දෙවන මහල කියන දෙකේ කොන්ක්‍රීට් සැකිල්ල හා වහලය නිම කරලා තිබෙනවා. වැඩ අවසන් කර දමා වසා දමා ඇති බිම් මහල වර්ග අඩි 7,000ක් පමණ වන බවට වාර්තා වනවා. ඒ නිසා වර්ග අඩි 1,500ක් තිබෙන ග්‍රාම නිලධාරී කාර්යාලය වෙනුවට වර්ග අඩි 7,000ක පමණ ඉඩ කඩ ඇති එම බිම් මහලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සියලු පහසුකම් සහිතව පවත්වා ගෙන යෑමට හැකි බව තමයි පෙන්වා දී තිබෙන්නේ. වර්ග අඩි 7,000ක් තිබෙන එම ගොඩනැගිල්ල භාවිත කිරීම මඟින් මහ ජනතාවට හා කාර්ය මණ්ඩලයට වඩා යහපත් සේවා පරිසරයක් ඇති කිරීමට හැකි වන අතර, දැනට භාවිත නොවන එම ගොඩනැගිල්ල ඵලදායීව භාවිත කිරීමට ද හැකියාවක් ලැබෙනවා.

ඒ වාගේම එම ගොඩනැගිල්ලේ පහළ මහල ඌන උපයෝජිතව පවතින බව හා රාජ්‍ය ආයතනයක් සඳහා ලබා දීමට අපේක්ෂා කරන බව නානුඔය දුම්රිය ස්ථානාධිපති විසින් ප්‍රකාශ කර තිබෙන බැවින්, දිස්ත්‍රික් ලේකම්වරයා අදාළ යෝජනාව සලකා බැලීම සඳහා එය අපේ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබෙනවා. නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අඩු ඉඩ ප්‍රමාණයක, අඩු පහසුකම් සහිතව පවත්වාගෙන යන අතර, ඒ

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

නිසාවෙන් සේවාලාභීන් මෙන්ම කාර්ය මණ්ඩලය ද මහත් අපහසුතාවට පත්ව ඇති බවට කරුණු වාර්තා වනවා. එම නිසා ඒ පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡාවට භාජන කරලා, දිස්ත්‍රික් ලේකම් විසින් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති යෝජනාව සහ වෙනත් විකල්ප යෝජනා අධ්‍යයනය කරන්නට අපි සූදානම්. ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, වෙනත් විකල්ප යෝජනා තිබෙනවා නම්, ඒ විකල්ප යෝජනාත් අධ්‍යයනය කරන්න, සැලකිල්ලට භාජනය කරන්න සූදානම්. විවිධ පාර්ශ්වයන්ගෙන් අදහස් විමසා කාර්ය මණ්ඩලය හා සේවාලාභීන් යන දෙපාර්ශ්වයටම එකඟ විය හැකි ප්‍රශස්ත විසඳුමකට එළඹීමට අපි අදහස් කරනවා. මේ සම්බන්ධව අවසාන තීරණයක් ගෙන නැහැ. යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා. බැලූ බැල්මට ඒ යෝජනාවේ යම් සාධාරණ බවකුත් පෙනෙනවා. නමුත්, එයින් අදහස් කරන්නේ නැහැ, අවසාන තීරණයක් ගන්නා බව. අවසාන තීරණය ගැනීම සඳහා තවදුරටත් සාකච්ඡාවට විවෘතයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ ආකාරයට, රහසිගතව තීරණයක් ගෙන තිබෙනවා වාගේ කාරණයක් තමයි කියැවුණේ. නමුත් මම සඳහන් කරන්න ඕනෑ, මෙය රහසිගතව ගත්තු තීරණයක් නොවන බව.

2025 ජනවාරි 30 පැවැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තමයි, එනම් ගරු සභාපති මංජුල සුරවීර ආරච්චි, ගරු මධ්‍යම පළාත් ආණ්ඩුකාර සරත් බී. අබේකෝන්, ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය මධුර දහම් සෙනෙවිරත්න, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීනි අනුෂ්කා දර්ශණී තිලකරත්න මැතිතුමිය, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීනි ක්‍රිෂ්ණන් කලෙයිවෙල්වි මැතිතුමිය, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වී.එස්. රාධක්‍රිෂ්ණන් මැතිතුමා, මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු හැමෝම සම්බන්ධ වූ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තමයි මේ යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේකේ රහසිගත බවක් පෙනෙන්නේ නැහැ. එබැවින් මෙය විවෘතව ප්‍රසිද්ධ ස්ථානයකදී ආපු යෝජනාවක් කියලා තමයි කියන්න තිබෙන්නේ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු කථානායකතුමනි, නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා එදා එයට සහභාගි වුණා. නමුත්, මේ තීරණය ගන්නා අවස්ථාවේදී එතුමා හිටියේ නැහැ.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ඒක ගැන දන්නේ නැහැ. වාර්තාවේ තිබෙන විධියට ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා සහභාගි වෙලා තිබෙනවා. මේ වාර්තාවේ ඉතිරි කොටසේ නැහැ, එතුමා ඒ වෙලාවේ නැගිටලා ගියා කියලා. නමුත් වාර්තාවේ තිබෙන්නේ එතුමා සහභාගි වුණු බවයි.

මහජන නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පැවැති ප්‍රසිද්ධ රැස්වීමකදී තමයි මේ යෝජනාව ඇවිල්ලා තිබෙන්නේ. එසේ වුවත්, ඒ යෝජනාවේ ජනතාවට අහිතකර යමක් තිබෙනවා නම්, ඒ පිළිබඳව සලකා බලා වඩා සාධනීය තීරණයකට එන්න අපි සූදානම්. බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 6.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.34ට, 2025 පෙබරවාරි 21 වන දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 28වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.34க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 பெப்ருவரி 28, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.34 p.m. until 9.30 a.m. on Friday, 28th February, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 318 - இல. 02
Volume 318 - No. 02

2025 පෙබරවාරි 28 වන සිකුරාදා
2025 பெப்ருவரி 28, வெள்ளிக்கிழமை
Friday, 28th February, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 පෙබරවාරි 28 වන සිකුරාදා
2025 பெப்ருவரி 28, வெள்ளிக்கிழமை
Friday, 28th February, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය: නැවත ස්ථාපනය කිරීම [පිටුව 201]

විගණකාධිපතිවරයාගේ වාර්තාව [පිටුව 201]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 204-218]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
මන්නාරම දිස්ත්‍රික්කයේ ක්‍රීඩා පිටිවල ඉදිකිරීම් කටයුතු [පිටුව 219]
දමිළ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම [පිටුව 220]

පාසල් ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය සහ දහම් පාසල් ගුරුවරුන්ගේ දීමනාව:
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය[පිටුව 222]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 – [නවවන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 103, 222-224, 304, 320, 325 (ආරක්ෂක); ශීර්ෂ 189, 225, 226 (මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු)] - කාරක සභාවේදී සලකා බලන ලදී [පිටු 227– 382]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
மாற்றுத்திறனாளிகளுக்கான பாராளுமன்ற ஒன்றியம்: மீளத் தாபித்தல் [ப: 201]

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 201]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 204-218]

தனி அறிவித்தல் மூல வினா:
மன்னார் மாவட்டத்தில் விளையாட்டு மைதானப் பணிகள் [ப: 219]
தமிழ் அரசியல் கைதிகளின் விடுதலை [ப: 220]

பாடசாலைகளுக்கு ஆசிரியர்களை ஆட்சேர்ப்புச் செய்யும் செயன்முறையும் அறநெறிப் பாடசாலை ஆசிரியர்களுக்கான கொடுப்பனவுகளும்:
பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 222]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட ஒன்பதாம் நாள்]:
[தலைப்புக்கள் 103, 222 - 224, 304, 320, 325 (பாதுகாப்பு); தலைப்புக்கள் 189, 225, 226 (பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள்)] – குழுவில் ஆராயப்பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Parliamentary Caucus for Persons with Disabilities: Re-establishment [Col. 201]

AUDITOR-GENERAL'S REPORT [Col. 201]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 204-218]

QUESTION BY PRIVATE NOTICE:
Construction Work of Playgrounds in Mannar District [Col. 219]
Release of Tamil Political Prisoners [Col. 220]

RECRUITMENT PROCEDURE OF SCHOOL TEACHERS AND ALLOWANCE PAID TO DHAMMA SCHOOL TEACHERS:
Statement by Hon. Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 222]

APPROPRIATION BILL, 2025 – [Ninth Allotted Day]:
Considered in Committee- [Heads 103, 222-224, 304, 320, 325 (Defence); Heads 189, 225, 226 (Public Security and Parliamentary Affairs)][Cols.227- 382]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 පෙබරවාරි 28වන සිකුරාදා
2025 பெப்ருவரி 28, வெள்ளிக்கிழமை
Friday, 28th February, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය: නැවත ස්ථාපනය කිරීම
மாற்றுத்திறனாளிகளுக்கான பாராளுமன்ற ஒன்றியம்: மீளத் தாபித்தல்
PARLIAMENTARY CAUCUS FOR PERSONS WITH DISABILITIES: RE - ESTABLISHMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය" දසවැනි පාර්ලිමේන්තුව සඳහා නැවත ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාවට 2025 පෙබරවාරි 27 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමතිය හිමි වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXVI කොටස මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) පේරවැල්ල, රහුලගදෝව, රණවිරු මාවත යන ලිපිනයෙහි පදිංචි ඒ.පී.ඩී. සිරිපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බණ්ඩාරවෙල, කහත්තේවල, පිටවත්ත යන ලිපිනයෙහි පදිංචි බී.එම්. ඉන්ද්‍රානි ගුණරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) අඹගස්දෝව, හිඹිලියාගහමඩිත්ත, 'රෙසඳරා' යන ලිපිනයෙහි පදිංචි එස්.එම්.ඕ. ඉසංක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) බණ්ඩාරවෙල, සුමදුරගම, 32 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. අනුලාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ටී.බී. සරත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු කථානායකතුමනි, කරන්දෙණිය, බාන්වැල්ගොඩ යන ලිපිනයෙහි පදිංචි එච්.ජී. මෛත්‍රිසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පහළ බියගම, බියගම, අංක 2/1 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ආර්.එන්.ඩී.එච්. කුමාරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගම්පොල, මහඋඩගම, හුණුකොටුගම යන ලිපිනයෙහි පදිංචි ජේ.බී. මන්තිලක ආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

ගරු කථානායකතුමනි, ගණේමුල්ල, හොරගොල්ල, අංක 243/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඩී. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, වෙන්නප්පුව බටහිර, සුසේ පාර, 'සුසිත්' යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.එම්.ඒ.එස්. එඩිවඩ් ජයන්ති මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

ගරු කථානායකතුමනි, අගලවත්ත, බෙල්ලන පාර, ජාතික නිවාස 05, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඩී. චන්ද්‍රලතා දයාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) විජිතපුර, උස්ගල හන්දිය, 04 කණුව, අංක 7/ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ.සී.ඒ. ජයලත් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ඉපලෝගම පොලිස් වසම, මහඉලුප්පල්ලම, මහමීගැස්සෑගම, අංක 43 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩබ්ලිව්.එස්.කේ. රන්දෙණිය මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -258/2024- (1), ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

කොළඹ නගරය තුළ ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම්: ආයෝජන ව්‍යාපෘති
கொழும்பில் நகர அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான காணிகள்: முதலீட்டுக் கருத்திட்டங்கள்
LANDS BELONGING TO URBAN DEVELOPMENT AUTHORITY WITHIN COLOMBO CITY: INVESTMENT PROJECTS

273/2024

2. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කොළඹ නගරය තුළ ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් මුළු ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(ii) එම ඉඩම් අතරින් ආයෝජන ව්‍යාපෘති සඳහා භාවිත කිරීමට අපේක්ෂිත ඉඩම් කවරේද;

(iii) එම එක් එක් ඉඩමේ සිදු කිරීමට අපේක්ෂිත ආයෝජන ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு நகரில் நகர அபிவிருத்தி அதிகார சபைக்குச் சொந்தமான மொத்தக் காணியின் அளவு வெவ்வேறாக அடையாளம் காணப் பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி காணிகளுள் முதலீட்டு கருத்திட்டங் களுக்குப் பயன்படுத்துவதற்கு எதிர்பார்க்கப்படும் காணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு காணியிலும் மேற் கொள்வதற்கு எதிர்பார்க்கப்படும் முதலீட்டுக் கருத்திட்டங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether the extents of lands belonging to the Urban Development Authority within the City of Colombo have been identified, separately in respect of each land;

(ii) the lands expected to be used for investment projects out of the lands concerned ; and

(iii) the investment projects expected to be undertaken in each of the lands, separately?

(b) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන ව්‍යාපෘති සඳහා කොළඹ නගරය තුළින් 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව හා රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය යටතේ මෙන්ම 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වන වගන්තිය යටතේ පවතින විධිවිධාන ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්කර/පවරා ගත් ඉඩම් කොටස් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය සතුව කොළඹ නගරය තුළ (කොළඹ හා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ) 2020 වර්ෂය වන විට හෙක්ටෙයාර 125.9ක පමණ ඉඩම් ප්‍රමාණයක් අත්කර/පවරා ගැනීමට කටයුතු කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත.

(ii) ඉහත කී ඉඩම් කොටස් අතුරින් මේ වන විට යෝජිත සංවර්ධන කටයුතුවලට අදාළව ආයෝජන ව්‍යාපෘති සඳහා භාවිත කිරීමට අපේක්ෂා කරනු ලබන ඉඩම් කොටස් පිළිබඳ විස්තර ඇමුණුමේ පළමු තීරයේ සඳහන් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

ඉඩම් 20ක් සම්බන්ධයෙන් වන තොරතුරු ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව සභාගත කළ ලේඛනයේ තිබෙන මුල් ව්‍යාපෘති දෙක විතරක් මම කියන්නම්.

කොළඹ කොටුවේ හෙක්ටෙයාර 3.9ක පිහිටි Chalmers Granaries land ව්‍යාපෘතිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා තමයි වෙන්වෙලා තිබෙන්නේ. ඒ වාගේම, කොළඹ Chatham Street එකේ අංක 125 දරන ස්ථානයේ හෙක්ටෙයාර 0.2ක ඉඩමත් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා වෙන්වෙලා තිබෙනවා. මේ ආදී වශයෙන් ඉඩම් 20ක් පිළිබඳ තොරතුරු සභාගත කළ ලේඛනයේ සඳහන් කර තිබෙනවා. එම එක් එක් ඉඩමේ ලිපිනය, හෙක්ටෙයාර ගණන සහ අදාළ යෝජිත ව්‍යාපෘති මොනවාද කියන විස්තර සඳහන් කර තිබෙනවා.

(iii) ඇමුණුමේ දක්වා ඇති වගුවෙහි තෙවන තීරයෙන් එම ඉඩම් කොටස් තුළ සිදු කිරීමට අපේක්ෂිත ආයෝජන ව්‍යාපෘති දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, කොළඹ නගර සීමාව තුළ ඇති ඉඩම් ප්‍රමාණය පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තොරතුරු දීලා තිබෙන්නේ, එම ප්‍රමාණය හෙක්ටෙයාර 125.9යි කියලා. මගේ දැනීමේ හැටියට නම් UDA එකට අයිති ඉඩම් කොළඹ නගර සීමාව තුළ ඊට වැඩිය තිබෙනවා. ඒගොල්ලෝ ලබාදෙන තොරතුරුම ගන්න එපා, ඔබතුමා පොඩ්ඩක් හොයලා බලන්න. ඉහතින් සඳහන් කර තිබෙන හෙක්ටෙයාර 125.9න් හෙක්ටෙයාර 15කට, 20කට ආසන්න ප්‍රමාණයක් තුළ කරනු ලබන development projects 20ක් පිළිබඳව තමයි සඳහන් කරලා තිබෙන්නේ. එතකොට, ඉතිරි හෙක්ටෙයාර 100ක විතර ප්‍රමාණයකට මොනවාද කරන්නේ කියලා ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වෙලා නැහැ. එතකොට වර්තමාන රජය වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද, සකස් කරමින් යනවාද මේ ඉඩම්වලට මොනවාද කරන්නේ කියලා?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

2020 වෙනකොට තිබෙන තොරතුරු තමයි හෙක්ටෙයාර 125.9ක් විධියට සඳහන් වෙලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඊට පස්සේත් යම් ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබෙනවා නාගරික සංවර්ධන අධිකාරියට. ඒ වාගේම මේ ඉදිරිපත් කළ විස්තර අනුව දැනටමත් අපි සමහර තොරතුරු සකස් කරගෙන යනවා විවිධ ආයෝජන ව්‍යාපෘති සඳහා. සාමාන්‍යයෙන් ඉඩම් හදුනා ගන්නකොටම අපි නාගරික සංවර්ධන අධිකාරියේ සැලැස්ම අනුව හඳුනා ගන්නවා, මොන වාගේ ව්‍යාපෘතියක් සඳහාද ඒ ඉඩම් අත්පත් කර ගන්නේ කියලා. උදාහරණයක් හැටියට ඔබතුමා අතේ තිබෙන ලැයිස්තුවේ අංක 14 දරන ඉඩම් තිබෙන්නේ වැල්ලවත්ත මයුර පෙදෙසේ. ඒක නේවාසික ප්‍රදේශයක් සඳහා සුදුසුයි කියලා තමයි හඳුනාගෙන තිබෙන්නේ. ඒ විධියට එක් එක් ඉඩම් හඳුනා ගන්නවා මොන වාගේ ව්‍යාපෘතියක් සඳහාද සුදුසු කියලා. ඒ අනුව අදාළ ආයෝජන කැඳවලා ඒ ඉඩම් බදු පදනමින් ලබා දෙන්න කටයුතු කරනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට අදහසක් තිබෙනවාද මේ දීලා තිබෙන ඉඩම් 20 තුළ ඔක්කොම ව්‍යාපෘති පටන් අරගෙනද, කොටසක් පමණක් පටන් අරගෙනද කියලා? එහෙම විස්තරයක් තිබෙනවාද?

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මේ ඉඩම් හඳුනාගෙන තිබෙනවා මොන වාගේ ව්‍යාපෘතිවලටද සුදුසු කියලා. මේ ඉඩම් සඳහා ආයෝජන ගෙන එන්න අපි සාමාන්‍යයෙන් කරන්නේ විවෘත ටෙන්ඩර් කැඳවන එක.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මම අහන්නේ පටන් ගත්ත ඒවා ගැන, ගරු ඇමතිතුමනි.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මේ විස්තර දීලා තිබෙන ඉඩම් 20 ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළයි. ඔබතුමාගේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ, "ඉඩම් ආයෝජන ව්‍යාපෘති සඳහා අපේක්ෂිත ඉඩම් කවරේද?" කියලා. ඒ ප්‍රශ්නයට අනුව තමයි මේ පිළිතුරු දීලා තිබෙන්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ඒවායේ පටන් අරගත්ත ව්‍යාපෘති තිබෙනවාද කියලා මම අහන්නේ.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

නැහැ, මෙතැන අපේක්ෂිත ඒවා තමයි තිබෙන්නේ. හැබැයි මේ වෙනකොට සමහර යෝජනා සකස් වෙමින් පවතිනවා; RFPs call කරන්න සකස් වෙමින් පවතිනවා.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් සංස්ථාගත කරන ලද සමාගම්: විස්තර
கம்பனிகள் பதிவாளர் திணைக்களத்தால் கூட்டிணைக்கப்பட்ட கம்பனிகள்: விபரம்
COMPANIES INCORPORATED BY DEPARTMENT OF THE REGISTRAR OF COMPANIES: DETAILS

303/2024

3.ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වත්මන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ නම කුමක්ද;

(ii) 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරු හෙබවූ තැනැත්තන්ගේ නම් කවරේද;

(iii) මේ දක්වා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් සංස්ථාගත කරන ලද මුළු සමාගම් සංඛ්‍යාව කොපමණද;

(iv) 2010, 2015, 2020, 2021, 2022, 2023 හා 2024 යන එක් එක් වර්ෂය තුළ සහ 2025 වර්ෂය තුළ මේ දක්වා සංස්ථාගත කරන ලද මුළු සමාගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සමාගමක් සංස්ථාගත කිරීමට ගන්නා ලද සාමාන්‍ය කාලය කොපමණද;

(vi) ඉහත (iii) අනුව සමාගම් සංස්ථාගත කිරීමෙන් දෙපාර්තමේන්තුව උපයා ඇති මුළු ආදායම කොපමණද;

(vii) ඉහත (iii) අනුව වර්තමානයේ ක්‍රියාත්මකව ඇති සක්‍රිය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(viii) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වර්ත්තක, වාණිප, උණවුප් පාදුකාප්පු මර්റුම් කූට්ටුරවු අපිවිරුත්දි අමైච්සරైක් කේට්ට වినා:

(அ) (i) தற்போதைய கம்பனிகள் பதிவாளரின் பெயரையும்;

(ii) 2015 முதல் 2024 வரையில் கம்பனிகள் பதிவாளர் பதவியை வகித்தவர்களின் பெயர் களையும்;

(iii) இற்றைவரையில் கம்பனிகள் பதிவாளர் திணைக்களத்தால் கூட்டிணைக்கப்பட்ட கம்பனி களின் மொத்த எண்ணிக்கையையும்;

(iv) 2010, 2015, 2020, 2021, 2022, 2023 மற்றும் 2024ஆம் ஆண்டுகள் ஒவ்வொன்றிலும், மேலும் 2025ஆம் ஆண்டில் இற்றைவரையில் ஒருங்கிணைக்கப்பட்ட கம்பனிகளின் எண்ணிக்கையை வெவ்வேறாகவும்;

(v) ஒரு கம்பனியைக் கூட்டிணைப்பதற்கு எடுக்கும் சராசரிக் காலத்தையும்;

(vi) மேலே (iii)க்கு அமைவாக கம்பனிகளின் கூட்டிணைப்புமூலம் திணைக்களத்தால் ஈட்டப் பட்ட மொத்த வருமானத்தையும்;

(vii) மேலே (iii)க்கு அமைவாக தற்போது இயங்கும் செயல்முனைப்பான கம்பனிகளின் எண்ணிக்கையையும்;

(viii) கம்பனிகள் பதிவாளர் திணைக்களம் முழுவதும் தன்னியக்கமாக்கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறியத் தருவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the name of the present Registrar of Companies;

(ii) the names of individuals who have held the post of Registrar of Companies from 2015 to 2024;

(iii) the total number of companies incorporated by the Department of the Registrar of Companies to date;

(iv) the number of companies incorporated in each of the following years, 2010, 2015, 2020, 2021, 2022, 2023, 2024 and 2025 up-to-date, separately;

(v) the average time taken to incorporate a company;

(vi) the total revenue earned by the Department from incorporation of companies as per (iii) above;

(vii) the number of active companies currently operating as per (iii) above; and

(viii) whether the Department of the Registrar of Companies has been fully automated?

(b) If not, why?

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කේ.ඒ.පී. ද සිල්වා මහත්මිය (වැඩ බලන සමාගම් රෙජිස්ට්‍රාර්)

(ii) 01. කේ.ඒ.පී. ද සිල්වා මහත්මිය -
2024.12.30 සිට මේ දක්වා
(සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ වැඩ බැලීම)

02. පුරප්පාඩු වී පැවතුණි. -
2024.11.21 සිට 2024.12.29 දක්වා

03. එස්.ඒ.එම්.එල්. ගුණතිලක මහතා -
2024.07.09 සිට 2024.11.20 දක්වා
(සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ වැඩ බැලීම)

04. සංජීව දිසානායක මහතා -
2021.07.08 සිට 2024.07.01 දක්වා
(සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්)

05. ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා -
2021.01.03 සිට 2021.07.01 දක්වා
(සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ වැඩ බැලීම)

06. ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා -
2015.01.01 සිට 2015.12.31 දක්වා
(සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ රාජකාරී ඉටු කිරීම)
- 2016.01.01 සිට 2018.12.31 දක්වා
(සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ වැඩ බැලීම)
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් -
2019.01.03 සිට 2021.01.02 දක්වා

(iii) මුළු සමාගම් සංඛ්‍යාව 223,383 - 2007.05.05 සිට 2025.01.31 දක්වා (ඇමුණුම 01)

සීමාසහිත පෞද්ගලික සමාගම්	-	212,055
සීමාසහිත පොදු සමාගම්	-	4,540
සංගම් (34 වගන්තිය)	-	3,658
ඇපයෙන් සීමිත සමාගම් (32 වගන්තිය)	-	1,229
විදේශීය සමාගම්	-	537
අක් වෙරළ සමාගම්	-	107
පොදු ලැයිස්තුගත සමාගම්	-	254
සීමා රහිත සමාගම්	-	03

(iv)

වර්ෂය	සංස්ථාගත කරන ලද මුළු සමාගම් සංඛ්‍යාව
2010	6,341
2015	7,766
2020	13,619
2021	18,434
2022	17,819
2023	22,376
2024	27,133
2025.01.31 දක්වා	2,461

(ඇමුණුම 02 බලන්න.)

(v) වැඩ කරන දින 2 - 4 අතර ලියාපදිංචිය ලබා දීමට අපි කටයුතු කරනවා.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

(vi) රුපියල් මිලියන 9,906.74යි. 2003 වර්ෂයේ සිට 2024 දක්වා සමාගම් සංස්ථාගත කිරීමෙන් දෙපාර්තමේන්තුව උපයා ඇති මුළු ආදායම. (ඇමුණුම 03 බලන්න.) ඇමුණුම් 01, 02, 03 **සභාගත*** කරමි.

(vii) සක්‍රිය සමාගම් ගණන - 202,426

(viii) නැත.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් පූර්ණ වශයෙන් ස්වයංක්‍රිය කර නොමැත. එහෙත් අංක 07/2007 සමාගම් පනතෙන් ආවරණය වන සමාගමක් සම්බන්ධ සියලු කටයුතු පූර්ණ වශයෙන් මාර්ගගතව - online - කිරීමට හැකි වන පරිදි පරිගණකගත කොට ඇත. එනයින් මුද්‍රිත ලේඛන භාවිතය 2021 ජුනි මස සිට නවතා ඇති අතර, සියලු ලේඛන හා ක්‍රියාදාම පරිගණක ගතකොට ඇත.

(ආ) අදාළ නැත.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම ගැන ස්තුතියි.

ගරු කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුර වශයෙන් දීලා තිබෙනවා, 205,000ක පමණ companies ප්‍රමාණයක් ලියාපදිංචි වෙලා තිබෙනවා කියලා. මම කියන්නේ, ඒ 205,000ම පරිගණකගත කරලා හැම දෙයක්ම online මඟින් කරන්න කියලා. මොකද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට tax ගෙවන්නේ companies 23,800යි.

ගරු ඇමතිතුමාටත් පෙනෙනවා ඇති, ඒ සම්බන්ධයෙන් විෂමතාවක් තිබෙන බව. අපට මෙය ඒකාබද්ධ කිරීම තමයි තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, සමාගමක් ලියාපදිංචි කරන්න ගියාම සියලුම දේවල් නිවැරදිව තිබෙනවා නම් ඒ සඳහා ගත වන්නේ වැඩ කරන දවස් දෙකක් හෝ දවස් හතරක් ඇතුළත කාලයක් කියලා ඔබතුමා කිව්වා. මේ සම්බන්ධයෙන් online වැඩ කිරීම සඳහා ඉතා දක්ෂ නිලධාරීන් සිටිනවා. පිටින් ගෙනෙන්නේ නැතිව එහෙන්ම කරගන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාට කියන්නේ මෙයයි. වැඩ කරන ඇමතිවරයෙක් වශයෙන් ඔබතුමා කරුණාකරලා මේක ක්ෂණිකව දවසකින් register කරන්න පුළුවන් අවස්ථාව ඇති කරලා, මේ සමාගම් 202,426ටම බදු ගෙවන්න පුළුවන් ක්‍රමයක් ඇති කරන්න. කරුණාකරලා ඒ සංකල්පය ගෙනැල්ලා දෙන්න කියලායි අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා අහපු පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. ඔබතුමා කියන කාරණය නිවැරදියි. සමාගම් 202,426ක් තිබුණාට, සක්‍රිය සමාගම් තිබෙන්නේ 65,000ක් විතරයි. ඒකෙන් සමාගම් 25,000ක්, 27,000ක් පමණ ප්‍රමාණයක් තමයි බදු ගෙවන සමාගම් හැටියට තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ඉතාම වේගයෙන් පරිගණකගත කිරීමේ ක්‍රියාවලියකට අනුව කටයුතු කරන්න අපි සූදානම් වෙලා තිබෙනවා. මේකේ සමාගම් රෙජිස්ට්‍රාර් ලෙස ඉන්නේත් වැඩබලන කෙනෙක්. අපි මේ තනතුරටත් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන තිබෙනවා. බඳවා ගැනීමේ පටිපාටිය සකස් කරලා කඩිනමින්,-*[බාධා කිරීමක්]* ජ්‍යෙෂ්ඨ අයත් ඉන්නවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පිටින් ගෙනෙන්නේ නැතිව එතැනින්ම කාන්තා නිලධාරිනියක් ගන්න පුළුවන්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මේකට බඳවා ගැනීමේ පටිපාටියක් හදලා නැහැ, ගරු මන්ත්‍රීතුමා. මේ පුරප්පාඩු වෙන ඒවාට බඳවා ගැනීමේ පටිපාටියක් තිබෙනවා. බඳවා ගැනීමේ පටිපාටිය හදලා කෙනෙක් බඳවා ගන්න. එතකොට ඇතුළේ ඉන්න අය හෝ, පිට ඉන්න අය හෝ සුදුසුකම් තිබෙන කෙනෙකුට එන්න පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ඒ වැඩේ කරනවා. පරිගණකගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රශ්නයක් තිබුණා. පසුගිය කාලයේම ප්‍රශ්නයක් තිබුණා. අදාළ පහසුකම් සපයපු සමාගම ගෙනැල්ලා අපි කථා කළා. ආයතනයත්, මේ සමාගමත් අතර යම් ගැටුමක් තිබුණා. මේ පරිගණකගත කරලා තිබුණු KPMG සමාගමත් එක්ක අවුරුදු 15කට වැඩි කාලයක් තිස්සේ ඉඳන් මේ ගනුදෙනුව සිද්ධ වෙලා තිබෙනවා. ඒ අයත් එක්ක සාකච්ඡා කළා. ගැටලුවක් නොවන ආකාරයට මේ කටයුත්ත කරගෙන යන්න අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඒ අය එකඟයි. අපි ඒ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරමින් තිබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් කරගෙන යනවා ද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්. අපි ඒ අයත් එක්ක සාකච්ඡා කරමින් යනවා. මේ කටයුත්ත කඩිනම් කරන්න අවශ්‍ය පියවර අපි ගන්නවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් කොම්පැනියක් ලියාපදිංචි කරන්න අඩු ගණනේ රුපියල් 35,000ත්, 50,000ත් අතර මුදලක් වැය වෙනවා. දැන් සාමාන්‍ය සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්, තරුණ ව්‍යවසායකයින් වැනි අයට කොම්පැනියක් ලියාපදිංචි කරලා ඉදිරියට ගෙනයන්න අවශ්‍ය නම්, - මා හිතන විධියට මේකේ කොම්පැනි කොටස් 3ක් තිබෙනවා. එකක්, හවුල් ව්‍යාපාර. නමුත්, නෛතිකභාවය ඇති කරන්න පුළුවන් කොම්පැනියක් ඇති කළොත්, මේකේ ප්‍රාග්ධනය රුපියල් ලක්ෂ 2ක් හරි, ලක්ෂ 5ක් තිබෙන කොම්පැනියක් අලුතෙන් ඔබතුමාට ඉදිරිපත් කරන්න පුළුවන් නම්, ඒ තරුණ ව්‍යවසායකයින්ට, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට මේක ලොකු රුකුලක් වේවි

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කියලා මම හිතනවා. ඒ සම්බන්ධයෙන් අලුත් සංකල්පයක් ඉදිරිපත් කරන්න ඔබතුමාට පුළුවන්ද? ඒ කියන්නේ, small companies. මේක ඉතාම සාර්ථකව බ්‍රිතාන්‍යයේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඊට පසුව ඒකෙන් graduate වෙන්න පුළුවන්, ඊට වඩා ලොකු කොම්පැනියකට. ඒ අදහස පිළිබඳව ඔබතුමාට අවධානය යොමු කරන්න පුළුවන් නම්, පීඩනයට ලක් වෙලා සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහ අලුතින් පත් කරන්න හදන ව්‍යවසායකයන්ට එය ලොකු රුකුලක් වේවි කියලා මම හිතනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමා, වර්තමානය වන විට සමාගම් ලියාපදිංචි කිරීම වේගවත් වෙලා තිබෙනවා. විශේෂයෙන් මේ අලුත් generation එක ගත්තාම, ඒගොල්ලන් වේගයෙන් යම් සමාගම් ලියාපදිංචියකට; තනි පුද්ගල සමාගම්වල සිට හවුල් ව්‍යාපාර දක්වා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන්ට මැදිහත් වෙලා තිබෙනවා. ඒ අයගෙන් ප්‍රාග්ධනය මත ගාස්තු අය කරනවාද, එහෙම නැත්නම් මේ ගාස්තු අය කිරීමේ ක්‍රියාවලියේ සංශෝධනයක් පිළිබඳවත් සාකච්ඡාවක් තිබෙනවා. මොකද, මේ සමහර ගාස්තු සහ සමහර ක්‍රියාවලීන්ට අය කරන chargesවල වෙනස්කම් කළ යුතුයි කියා අදහසක් තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ, අපි මේ ගැන ඉදිරියේදී කටයුතු කරලා ඉතාම පහසුවෙන් සමාගමක් ලියාපදිංචි කරන්න අවශ්‍ය කටයුතු කරන බව.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අද තිබෙන කොම්පැනියක සාමාන්‍යයෙන් directorsලා එක් කෙනෙක් එක්ක, ඒකේ ප්‍රාග්ධනය,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙක අසා අවසන්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දෙවැනි අතුරු ප්‍රශ්නයට අදාළව පැහැදිලි කර ගැනීමක් මම කරන්නේ. - *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

අපි ඒ සම්බන්ධයෙන් සමාගම් පනතට අදාළව තිබෙන අවශ්‍යතා සහ,- *[බාධා කිරීමක්]* නැහැ, ඒක තමයි.

දැනට සමාගම් මැදුර ක්‍රියාත්මක කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය පාවිච්චි කරනවා වාගේම අපි ඉදිරියට ඔබතුමා කියනවා වාගේ ප්‍රාග්ධනය අඩු කරලා සමාගමක් ලියාපදිංචි කිරීමට තිබෙන අවශ්‍යතාව පිළිබඳව සලකා බලනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -426/2025- (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -432/2025- (1), ගරු අජිත් ගිහාන් මහතා.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ගාලු වරාය ප්‍රදේශයේ යෝජිත "වරාය නගරය" ව්‍යාපෘතිය: පරිසරය සහ ප්‍රජාවට වන බලපෑම

காலி துறைமுகப் பிரதேசத்தில் உத்தேச "துறைமுக நகரம்" கருத்திட்டம்: சுற்றாடல் மற்றும் சமூகத்தின் மீதான தாக்கம்

PROPOSED "PORT CITY " PROJECT IN GALLE PORT AREA: IMPACT ON ENVIRONMENT AND COMMUNITY

258/2024

1. ගරු අජිත් ගිහාන් මහතා (ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා වෙනුවට)
(மாண்புமிகு அஜித் கிஹான் - மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர சார்பாக)
(The Hon. Ajith Gihan on behalf of the Hon. (Dr.) Nishantha Samaraweera)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල වරාය ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති `වරාය නගරය' ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ප්‍රතිලාභ කවරේද;

(ii) එම ව්‍යාපෘතිය හේතුවෙන් සිදු වන පරිසර බලපෑම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) මීට පෙර සිදු කර ඇති මහජන විරෝධතාවල ප්‍රතිඵලයක් ලෙස ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කර ඇති වෙනස්කම් කවරේද;

(iv) යෝජිත ව්‍යාපෘතිය හේතුවෙන් ජන ජීවිතයට සිදු වන බලපෑම සැලකිල්ලට ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி துறைமுகப் பிரதேசத்தை அண்மித்ததாக நடைமுறைப்படுத்த உத்தேசிக்கப்பட்டுள்ள 'துறைமுக நகரம்' கருத்திட்டத்தின் ஊடாக எதிர்பார்க்கப்படும் நன்மைகள் யாவை;

[ගරු අජිත් ගිහාන් මහතා]

(ii) මේ‍ප්‍රකාර කරුත්තිට්ටත්තාල් ඒර්පටුම් සූළල් තාක්කම් කුරිත්තු සාත්තියවළ ආය්වු මේර් කොළ්ළප්පට්ටුළ්ළතා;

(iii) ඉතර්කු මුන්නර් පොතුමක්කළාල් මුන්නෙටුක්කප් පට්ටිරුන්ත එතිර්ප්පින් විළෙවාක මේර්පටි කරුත්තිට්ටත්තිල් සෙය්යප්පට්ටුළ්ළ මාර්රංකළ් යාවෛ;

(iv) උත්තේස කරුත්තිට්ටම් කාරණමාක මක්කළතු වාළ්ක්කෙයිල් ඒර්පටුම් තාක්කම් කුරිත්තු කරුත්තිර් කොළ්ළප්පට්ටුළ්ළතා;

එන්පතෛ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the benefits expected from the "Port City" Project proposed to be implemented in the area associated with the Galle Port;

(ii) whether a feasibility study has been conducted in relation to the impacts caused to the environment by that project;

(iii) the changes that have been made relating to the project as a result of the public outcry raised previously; and

(iv) whether the impact of this proposed project on the life of the community has been taken into consideration?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ පහත පරිදි වේ.

- දියඹේ දියකඩන දෙකක් ඉදිකිරීම මඟින් ගාල්ල බොක්ක ප්‍රදේශයේ විශාල නිසල ජල ප්‍රදේශයක් නිර්මාණය වන අතර එමඟින්,
  - සැඩ රළ පහරින් ගාලු කොටුව ආරක්ෂා වීම.
  - සැඩ රළ පහරින් ගාලු පාර ආරක්ෂා වීම.
  - කුණාටු ඇතිවන අවස්ථාවලදී දකුණු පළතේ ධීවරයින්/ධීවර බෝට්ටු සඳහා ආරක්ෂිත තොටුපළක් නිර්මාණය වීම.
- විශාල මගී නෞකා මෙහෙයවීමට පහසුකම් සලසමින්, ඒ සඳහාම වෙන් වූ මගී පර්යන්තයක් නිර්මාණය කිරීමත් සමඟ කලාපීය සංචාරක කර්මාන්තය සඳහා ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය දායකත්වය දක්වනු ඇත.
- දෙවැට වෙරළ අසල ඉඩම ගොඩකර ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රදේශයේ මිශ්‍ර සංවර්ධන කටයුතු මඟින් දේශීය හා විදේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම.
- මෙම සංවර්ධනය හරහා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා වර්ධනය කිරීම.

(ii) 2000 වර්ෂයේ මුල් භාගයේ දී දියකඩනය ඉදිකිරීම, මගී පර්යන්තය සමඟ රැඳවුම් බැම්ම ඉදිකිරීම, වරාය දෝණිය හැරීමේ කටයුතු සහ නාවික කටයුතුවලට ආධාර කිරීම සඳහා පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව අවසන් කර ඇත.දෙවැට වෙරළ යාබදව ඉඩම් ගොඩකර ප්‍රතිසංස්කරණ කිරීම සඳහා පරිපූරක පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව උපදේශකවරයකු විසින් අවසන් කර ඇති අතර, -මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය- මෙම පරිපූරක පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව 2025.01.09 දින අවසන් කර ඇත.

(iii) 2024.11.28 සිට 2025.01.09 දක්වා පරිපූරක පාරිසරික බලපෑම පිළිබඳ අධ්‍යයනයේ කොටසක් ලෙස සිදු කරන ලද මහජන මතය විමසීමේ ක්‍රියාවලියේ දී ඉදිරිපත් කරන ලද අදහස් මේ වන විට උපදේශකවරයා විසින් ඇගයුම් කරනු ලැබේ.

(iv) මෙම ව්‍යාපෘතියට අදාළව පාර්ශ්වකරුවන්ගේ දායකත්වය ලබාගෙන ඇති අතර ඒ පිළිබඳව ඇති විය හැකි සමාජීය බලපෑම් හා එම බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත.

(ஆ) පැන නොනඟී.

කින්නියාහි ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය: වර්තමාන තත්ත්වය
கிண்ணியாவிலுள்ள தேசிய இளைஞர் படையணிப் பயிற்சி நிலையம்: தற்போதைய நிலை
NATIONAL YOUTH CORPS TRAINING CENTRE, KINNIYA: CURRENT STATUS

426/2025

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ඉම්රාන් මහරූෆ් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு இம்ரான் மஹ்ரூப் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Imran Maharoof)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති, ජාතික යොවුන් සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කොපමණද;

(ii) කින්නියා ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ පුහුණු මධ්‍යස්ථානය වසා දමා ඇති අතර එය වෙනත් ප්‍රදේශයක ස්ථාපිත කර ඇති බව දන්නේද;

(iii) එම පුහුණු මධ්‍යස්ථානය වසා දැමීමට හේතු කවරේද;

(iv) එය වෙනත් ප්‍රදේශයක ස්ථාපිත කිරීමට හේතු කවරේද;

(v) එම පුහුණු මධ්‍යස්ථානය නැවත විවෘත කිරීම සඳහා බාධාවක් තිබේද;

(vi) නොඑසේ නම්, එම පුහුණු මධ්‍යස්ථානය නැවත විවෘත කිරීමට පියවර ගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ஆ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தில் நிறுவப் பட்டுள்ள, தேசிய இளைஞர் படையணிப் பயிற்சி நிலையங்களின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கமைவாக எத்தனை;

(ii) கிண்ணியா பிரதேசத்தில் நிறுவப்பட்டிருந்த பயிற்சி நிலையம் மூடப்பட்டுள்ளதுடன், அது வேறொரு பிரதேசத்தில் நிறுவப்பட்டுள்ளதை அறிவாரா;

(iii) மேற்படி பயிற்சி நிலையம் மூடப்படுவதற்கான காரணங்கள் யாவை;

(iv) அதனை வேறொரு பிரதேசத்தில் நிறுவுவதற் கான காரணங்கள் யாவை;

(v) மேற்படி பயிற்சி நிலையத்தை மீளத் திறப்பதில் தடையேதும் உள்ளதா;

(vi) இன்றேல், மேற்படி பயிற்சி நிலையத்தை மீளத் திறப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா;

(vii) ஆமெனில், அதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) the number of National Youth Corps training centres established in each of the Divisional Secretaries' Divisions of the Trincomalee District, separately;

(ii) whether he is aware that the training centre that was established in Kinniya area has been closed down and relocated to another area;

(iii) the reasons for closing down the training centre concerned;

(iv) the reasons for relocating it in another area;

(v) whether there is any obstacle to reopening the training centre concerned;

(vi) if not, whether steps will be taken to reopen the training centre concerned; and

(vii) if so, the steps that have been taken in that regard?

(b) If not, why?

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මධ්‍යස්ථාන සංඛ්‍යාව 04කි.

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	පුහුණු මධ්‍යස්ථාන ගණන	මධ්‍යස්ථානයේ නම
01	ත්‍රිකුණාමලය නගර හා කඩවත්	01	ත්‍රිකුණාමලය ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය
02	ගෝමරන්කඩවල	01	ගෝමරන්කඩවල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය
03	සේරුවිල	01	සේරුවිල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය
04	කුච්චවෙලි	01	කුච්චවෙලි ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය

(ii) වෙනත් ප්‍රදේශයක ස්ථාපිත කර නොමැත.

(iii) මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා ත්‍රී/කින්/අල් රවුලා විද්‍යාලය විසින් ලබා දී තිබූ පරිශ්‍රයේ පහසුකම් ප්‍රමාණවත් නොවීම හා එම පරිශ්‍රය ආපසු විද්‍යාලය වෙත ලබා දෙන ලෙස නැඟෙනහිර පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ අධ්‍යාපන, පෙර පාසල් අධ්‍යාපන, ක්‍රීඩා, සංස්කෘතික කටයුතු, යෞවන කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් විසින් කරන ලද ඉල්ලීම හේතුවෙන් ජාතික යොවුන් සේනාංකය සතු බඩුබාහිරාදිය ඉවත් කර ගැනීමෙන් පසු ගොඩනැඟිල්ල එම විද්‍යාලය වෙත නැවත භාර දී පුහුණු මධ්‍යස්ථානය වසා දමා ඇත.

(iv) වෙනත් ප්‍රදේශයක ස්ථාපිත කර නොමැත.

(v), (vi), (vii) මධ්‍යස්ථානය පවත්වාගෙන යන ලද පරිශ්‍රය ආපසු ත්‍රී/කින්/අල් රවුලා විද්‍යාලය වෙත ආපසු භාර දී ඇති බැවින්, නැවත විවෘත කිරීමක් සිදු කළ නොහැකි අතර, කින්නියා ප්‍රදේශයට ආසන්නයෙන් දැනට ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන දෙකක් - ත්‍රිකුණාමලය, සේරුවිල- ක්‍රියාත්මක වන බැවින් අලුතින් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට විශාල මුදලක් වැය කිරීම එලදායී නොවේ.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

මන්නාරම දිස්ත්‍රික්කයේ ක්‍රීඩා පිටිවල ඉදිකිරීම් කටයුතු
மன்னார் மாவட்டத்தில் விளையாட்டு மைதானப் பணிகள்
CONSTRUCTION WORK OF PLAYGROUNDS IN MANNAR DISTRICT

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத் துறை அமைச்சர் கௌரவ சுனில் குமார கமகே அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்தமைக்கு நன்றி!

மன்னார் மாவட்டத்திலுள்ள பள்ளிமுனை, எமில் நகர், நறுவிலிக்குளம் ஆகிய மூன்று கிராமங்களில் விளையாட்டு மைதானம் அமைப்பதற்கு நிதி ஒதுக்கப்பட்டாலும், அதற்கான வேலைகள் நடைபெறவில்லை. அதில் ஊழல் நடைபெற்றுள்ள தாக நாங்கள் சந்தேகப்படுகின்றோம்.

1. பள்ளிமுனை, புனித லூசியா விளையாட்டு மைதானத்தின் பணிகள் வட மாகாண நகர அபிவிருத்தி அமைச்சின்கீழ் 2013இல் ஆரம்பிக்கப் பட்டது. அதன் முதற்கட்ட வேலையான மண் நிரப்புதல் முடிவடைந்துள்ளது. எனினும், பார்வை யாளர் அரங்கு அமைத்தல் மற்றும் புல் பதித்தல் வேலைகள் தோல்வி அடைந்துள்ளன. 2022ம் ஆண்டு மூன்றாம் கட்ட வேலைக்காக ஒதுக்கப்பட்ட 51 மில்லியன் ரூபாய் பயன்படுத்தப்படவில்லை. அது மீள அளிக்கப்பட்டு இருக்கிறது.

2. எமில் நகர் கிராமத்தில் விளையாட்டு மைதானம் அமைப்பதற்காக மணல் நிரப்புதல், வடிகாலமைப்பை ஏற்படுத்துதல் மற்றும் அரங்கு அமைத்தல் ஆகிய பணிகளுக்காக சுமார் 49 மில்லியன் ரூபாய் செலவிடப்பட்டு, முற்றுப்பெற்றுவிட்டதாகக் கூறப் பட்டபோதிலும், அவற்றில் ஒரு வேலையும் நடைபெற வில்லை. கிணறு காணாமல் போனதுபோல, இதில் பாரிய ஊழல் நடந்திருக்கிறது. இந்த நிதி செலவிடப்பட்டு இருக்கிறது. ஆனால், வேலைகள் நடைபெறவில்லை. ஆகவே, இது தொடர்பில் அமைச்சு உடனடியாகக் கவனம் செலுத்த வேண்டு மென இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

3. நறுவிலிக்குளம் கிராமத்தில் விளையாட்டு மைதான கட்டுமானத்தின் நிலைப்பாட்டு ஆய்வு அறிக்கையின் பிரகாரம், நீச்சல் தடாகம், உட்புற அரங்கம் மற்றும் அரங்கம், 400 மீற்றர் ஓட்டப்பாதை மற்றும் வெளிப்புற வேலைகள் முறையே 60%, 27%, 90% முடிவடைந்துள்ளதாகக் கூறப்பட்டுள்ளது. 374,707 மில்லியன் ரூபாய் ஒதுக்கீட்டுத் தொகையில் 143.7 மில்லியன் ரூபாய் செலவிடப்பட்டுள்ளதாகச் சொல்லப் படுகிறது. இதில் முக்கிய கவனத்தைச் செலுத்தி, அந்த மைதான வேலைகளை நிறைவுசெய்யுமாறு இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

4. பாடசாலை கிரிக்கெட் மேம்பாட்டுத் திட்டத்தின்கீழ், பக்கவிக்கெட் கட்டுமானம் 7உம், பாடசாலை விளையாட்டு மைதானக் கட்டுமானத் திட்டங்கள் 5உம் அனுமதிக்கப்பட்டுள்ளன. பக்கவிக்கட் கட்டுமானம் 7உம் 90% முடிவடைந்துள்ள நிலையில், பாடசாலை விளையாட்டு மைதானக் கட்டுமான வேலைகள் பல்வேறு காரணங்களால் முடிக்கப் படாமல் இருக்கின்றன. இதனை கௌரவ அமைச்சர் அவர்கள் கவனத்தில் எடுத்து, ஒதுக்கப்பட்ட நிதியை மீளப் பெற்றுக்கொடுத்து, இவற்றை நிறைவுசெய்து தருமாறு கோருகின்றேன்.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු කථානායකතුමනි, ඒ ගැටලුව අප වෙත යොමු වුණා. ඒ සඳහා ඉදිරි දිනකදී පිළිතුරු ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

II

දමිළ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම
தமிழ் அரசியல் கைதிகளின் விடுதலை
RELEASE OF TAMIL POLITICAL PRISONERS

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்தமைக்கு நன்றி!

தமிழ் இளைஞர்கள் பலர் இலங்கையின் சிறைச்சாலை களில் நீண்ட காலமாக அரசியல் கைதிகளாகத் தடுத்து வைக்கப்பட்டுள்ளனர். அவர்களின் குடும்பத்தினர் கண்ணீருடனும் கவலையுடனும் அவர்களின் வரவுக்காக காத்திருக்கின்றனர். தாயை இழந்த நிலையில், தந்தை பல ஆண்டுகளாகச் சிறையில் இருக்க, தாய், தந்தை இருவரதும் அரவணைப்பு இல்லாமலேயே பிள்ளைகள் பலர் தமது பெற்றோரின் விடுதலைக்காகத் தவமிருக்கிறார்கள். 'இந்த நாட்டின் இன ஒற்றுமை', 'மாற்றம்வேண்டிய புதிய சிந்தனை', 'சுத்தமான இலங்கை' உள்ளிட்ட மகுட வாசகங்களுள் 'சிறைக்கைதிகளும் மனிதர்களே' என்ற மகுட வாசகத்தை மனதில் வைத்தாவது பல ஆண்டுகளாகச் சிறையில் வாடும் தமிழ் அரசியல் கைதிகளை விடுவிக்குமாறு அவர்தம் உறவுகள் நீண்ட காலமாக எம்மிடம் கோரி வருகின்றனர். அதன் அடிப்படையில், நான் பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்.

1. தற்போது எத்தனை தமிழ் அரசியல் கைதிகள் சிறையில் உள்ளனர்?

2. அவர்கள் எந்தெந்த சிறைச்சாலைகளில் தடுத்து வைக்கப்பட்டுள்ளனர்?

3. அவர்கள் எப்போது விடுதலை செய்யப்படுவார்கள்?

4. அவர்களை மனிதாபிமான அடிப்படையிலோ, சனாதிபதியின் பொதுமன்னிப்பின் அடிப்படையிலோ விடுதலை செய்ய முடியுமா?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉතා කාලෝචිත සහ වැදගත් ප්‍රශ්නයක්. ඒ නිසා මා උත්සාහ කළා, අද දිනයේදීම ඔබතුමාට පිළිතුරු ලබා දෙන්න. කෙසේ වෙතත්, ඊයේ මේ ප්‍රශ්නය ලැබුණු නිසා දත්ත එකතු කර ගන්න කාලය මදි වුණා. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය හෙට දිනයේ විවාදයට ගන්නා නිසා මගේ කාර්ය මණ්ඩලයට වැඩ අධික වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මා මේ සඳහා සම්පූර්ණ පිළිතුරක් අනිවාර්යයෙන්ම ලබා දෙන්නම්. ඒ සඳහා මට සතියක කාලයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய கோரிக்கைக்கு நான் தலைசாய்க்கிறேன். நான் இதில் மேலதிகமாக ஒரு விடயத்தைச் சேர்க்க விரும்புகின்றேன். கதிர்காமத்தம்பி சிவகுமார், விக்கினேஸ்வரநாதன் பார்த்தீபன், கிருஷ்ணசாமி ராமச்சந்திரன், சண்முகலிங்கம் சூரியகுமார், ஜோன்சன் கொலின் வலன்ரினோ, சச்சிதானந்தம் ஆனந்தசுதாகர், ஏ.எச். உமர் கத்தாப், தங்கவேலு நிமலன், செல்வராஜா கிருவாகரன், தம்பையா பிரகாஷ் ஆகியோர் நீண்ட காலமாகச் சிறையில் இருக்கிறார்கள். இவர்களில் இரண்டு பேர் 30 வருடங்களாகவும், மூன்று பேர் 17 வருடங்களாகவும், ஒருவர் 22 வருடங்களாகவும், நான்கு பேர் 16 வருடங்களாகவும் சிறையில் இருக்கிறார்கள். தயவுசெய்து, இந்த விடயத்தை மனிதாபிமான அடிப்படையில் நோக்கி, இவர்களுடைய விடுதலை தொடர்பில் அதிக கரிசனை செலுத்தி, உங்களது விடையைத் தருமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, ඒ නම් ටික මට අද දිනයේ දී ලැබෙන්න සැලසුවොත් මම ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරලා පිළිතුරක් ලබා දෙන්නම්.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நீண்ட காலம் சிறையிலிருக்கின்ற அரசியல் கைதிகளுடைய அந்தப் பெயர்ப் பட்டியலையும், அவர்களின் விடுதலை தொடர்பில் 'குரலற்றவர்களின் குரல்' என்ற அமைப்பு மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு எழுதிய கடிதத்தின் பிரதியையும் நான் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்காக ***சபாபீடத்துக்குச்** சமர்ப்பிக்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පාසල් ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය සහ දහම් පාසල් ගුරුවරුන්ගේ දීමනාව: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

பாடசாலைகளுக்கு ஆசிரியர்களை ஆட்சேர்ப்பு செய்யும் செயன்முறையும் அறநெறிப் பாடசாலை ஆசிரியர்களுக்கான கொடுப்பனவுகளும்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

RECRUITMENT PROCEDURE OF SCHOOL TEACHERS AND ALLOWANCE PAID TO DHAMMA SCHOOL TEACHERS: MINISTERIAL STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා විසින් 2025.02.25වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. අංක 1885/38 හා 2014.10.23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන අනුව ගුරුවරුන් බඳවා ගැනීම සිදු කරනු ලබයි.

ඒ අනුව, එහි 7.2.2.1 වගන්තියෙහි සඳහන් පරිදි ගුරු සේවයට බඳවා ගැනීමේ අවම සුදුසුකම් 3-II ශ්‍රේණියට බඳවා ගැනීමේදී සලකා බලනු ලබන අපොස (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම වේ.

02. දැනට ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව දිස්ත්‍රික්ක වශයෙන් ඇමුණුම 01 මඟින් ද, පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව දිස්ත්‍රික්ක වශයෙන් ඇමුණුම 02 මඟින් ද ඉදිරිපත් කර ඇත.

ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු	- 2,652
පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු	- 40,621
එකතුව	- 43,273

[ගරු හරිනි අමරසූරිය]

ඇමුණුම 01 පහත පරිදි වේ.

Teacher vacancies in National Schools by District as at 31.01.2025

Province	District	Sinhala medium	Tamil medium	English medium	Total
Western Province	Colombo	449	57	130	636
	Gampaha	0	27	2	29
	Kalutara	155	40	23	218
Central Province	Kandy	60	75	42	177
	Matale	25	59	36	120
	Nuwara Eliya	33	17	4	54
Southern Province	Galle	318	13	7	338
	Matara	104	40	0	144
	Hambantota	137	17	0	154
Northern Province	Jaffna	0	0	0	0
	Mannar	0	0	0	0
	Vavuniya	6	0	11	17
	Mullaitivu	12	11	0	23
	Kilinochchi	0	3	0	3
Eastern Province	Batticaloa	0	9	2	11
	Ampara	59	0	33	92
	Trincomalee	74	46	3	123
North-western Province	Kurunegala	82	71	0	153
	Puttalam	68	2	22	92
North-central	Anuradhapura	0	0	0	0
	Polonnnaruwa	108	8	9	125
Uva Province	Badulla	0	21	1	22
	Monaragala	4	0	13	17
Sabaragamuwa Province	Ratnapura	0	54	25	79
	Kegalle	0	0	25	25
Total		**1694**	**570**	**388**	**2652**

ඇ ඇමුණුම 02 පහත පරිදි වේ.

Teacher vacancies in Provincial Schools by District as at 31.01.2025

Province	District	Number of Vacancies
Western Province	Colombo	1321
	Gampaha	1872
	Kalutara	1102
Central Province	Kandy	3718
	Matale	1635
	Nuwara Eliya	2676
Southern Province	Galle	1120
	Matara	626
	Hambantota	786
Northern Province	Jaffna	1477
	Mannar	655
	Vavuniya	509
	Mullaitivu	481
	Kilinochchi	376
Eastern Province	Batticaloa	1946
	Ampara	2405
	Trincomalee	2013
North-western Province	Kurunegala	2481
	Puttalam	1347
North-central Province	Anuradhapura	1658
	Polonnnaruwa	916
Uva Province	Badulla	1948
	Monaragala	1492
Sabaragamuwa Province	Ratnapura	3464
	Kegalle	2597
Total		40,621

03. (i) ධර්මාචාර්ය සමතුන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අංක 2087 හා 2018.08.31 දරන ගැසට් නිවේදනය නිකුත් කර ඇති අතර ගැසට් නිවේදනය ප්‍රකාරව බඳවා ගැනීමේ තරග විභාගය 2019.05.25 දින පවත්වා ඇත.

නමුත් එම විභාගය පැවැත්වීමෙන් පසුව 2020 වර්ෂයේ සිට රටේ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් බඳවා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කෙරී නැත. ඉන්පසු රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳව 2022.04.26 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය අය වැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදු කර තිබුණ ද, මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තැබීමේ නිර්දේශ යටතේ නැවත වරක් මෙම බඳවා ගැනීම තාවකාලිකව නවතා ඇත.

(ii) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා හදාරා විද්‍යාපීඨවලින් වාර්ෂිකව ගුරු සේවය සඳහාම පිටවන ශික්ෂණ ඩිප්ලෝමාධාරීන්ගෙන් ගුරු පත්වීම් ලබාදීම අනිවාර්යයෙන් කළ යුතු බැවින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වාර්ෂිකව ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන්ට එම ආගමික විෂයයන් සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ පත්වීම් ලබා දී ඇත.

ඉහත කරුණු අනුව, ආගමික විෂයයන් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට අදාළව නිකුත් කරන ලද අංක 2087 හා 2018.08.31 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව අදාළ බඳවා ගැනීම් එම කාල වකවානුව තුළ සිදු කිරීමට නොහැකි වීම මත හා මේ වකවානුවේදී සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් නොමැති වීම මතත් මේ වන විට පවතින සීමිත පුරප්පාඩු ප්‍රමාණයද 2025 මාර්තු මස විද්‍යාපීඨවලින් පිටවන ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් වෙත වෙන් කර තැබීමට සිදුවීමත් හේතුවෙන් ධර්මාචාර්ය සමතුන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා 2019.05.25 පවත්වනු ලැබූ තරග විභාගයේ ප්‍රතිඵල මත ආගමික විෂයයන් සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් 2024.09.25 දිනැතිව උපදෙස් විමසා යවා ඇත. ඒ අනුව එම කොමිෂන් සභාවෙන් ලැබෙන උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදහස් කරන බව කාරුණිකව දන්වමි.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

04. <u>පිරිවෙන්</u>

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වැටුප් ලබන පිරිවෙන් ආචාර්යවරු සංඛ්‍යාව - 7,358

ලියාපදිංචි පිරිවෙන් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව - 825

- පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය සඳහා නිසි වැඩ පිළිවෙළක් ඇත.
- පසුගාමී පිරිවෙන් අධ්‍යාපන ආයතන හඳුනාගෙන ඒවා යළි නඟාසිටුවීම අරමුණු කරගත් ප්‍රත්‍යාවලෝකන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ යටතේ පිරිවෙන් අධ්‍යාපන විෂය මාලාව සංශෝධනය කිරීම (නිදසුන්: පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ ත්‍රිපිටක ධර්මය විෂය සඳහා ප්‍රායෝගික පරීක්ෂණ විෂය හඳුන්වා දීම.)
- පෙළ පොත්, නිල ඇඳුම්, පාවහන්, තිළිණපත් ලබා දීම සහ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීම. (නිදසුන්: ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 800ක් සඳහා නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 60ක් වෙන් කිරීම.)
- පිරිවෙන් අධ්‍යාපනය ඩිජිටල්කරණය කිරීම සඳහා සුහුරු පන්තිකාමර ඇතුළු තොරතුරු තාක්ෂණ උපකරණ හඳුනාගත් පිරිවෙන් 342ක් වෙත ලබා දීමට රුපියල් මිලියන 400ක් වෙන් කිරීම.
- පිරිවෙන් අධ්‍යාපන ආයතනවල භෞතික හා මානව සම්පත් සංවර්ධනය, ගුරු ධාරිතා සංවර්ධනය සිදු කිරීම, පරිපාලන හා ආයතනික ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සහ පිරිවෙන් ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීම පිණිස විශේෂ වැඩසටහන් හඳුන්වා දීම.

<u>දහම් පාසල්</u>

දහම් පාසල් ගුරුවරු සංඛ්‍යාව - 123,931

ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාව - 10,646

අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය සඳහා නිසි වැඩ පිළිවෙළක් ඇත.

- දහම් පාසල් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කුසලතා වර්ධනය සඳහා ගුරු අභිමානී සම්පත්දායක පුහුණුව පැවැත්වීම. මේ වන විට මෙම ගුරු අභිමානී සම්පත්දායක පුහුණුව දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය කර ඇත.
- දහම් පාසල් ගුරුවරුන්ගේ දහම් දැනුම වර්ධනය කර ගැනීම සඳහා දහම් සරසවිය වැඩසටහන පැවැත්වීම. (මෙම වැඩසටහන සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා පාලි බෞද්ධ විශ්වවිද්‍යාලය සම්පත් දායකත්වය සපයයි.)
- දහම් පාසල් ගුරු විභාගය පැවැත්වීම. (අධ්‍යාපන පහසුකම් අඩු ගුරු භවතුන් සුදුසුකම් ලත් ගුරු භවතුන් කිරීම හා දහම් පාසල් ගුරු සේවයට අභිමානයක් ලබා දීම සඳහා මෙම ගුරු විභාගය සෑම වර්ෂයකම පවත්වනු ලැබේ.)
- දහම් පාසල් ගුරු භවතුන්ගේ ධර්මඥානය වර්ධනය කිරීම සඳහා වාර්ෂිකව පුස්තකාල දීමනාවක් හා ගමන් වියදම් දීමනාවක් ලබා දීම. වසරක සේවා කාලයක් සපුරන ගුරු භවතුන්ට රුපියල් 5,000ක් හා වසර තුනක සේවා කාලයක් සපුරන ගුරු භවතුන්ට රුපියල් 2,500ක දහම් පාසල් නිල ඇඳුම් දීමනාවක් ලබා දීම.

(i) නැත.

පුස්තකාල හා ප්‍රවාහන දීමනාව ලෙස රුපියල් 5,000ක් ද, 2025 වර්ෂයේ සිට වසර තුනක සේවා කාලයක් සපුරන ගුරු භවතුන්ට නිල ඇඳුම් දීමනාව ලෙස රුපියල් 2,500ක දීමනාවක් ද ගෙවනු ලබයි.

(ii) ඉහත සඳහන් කළ පරිදි 2025 වර්ෂයට වසර තුනක සේවා කාලයක් සපුරන ගුරු භවතුන්ට රු. 2,500ක නිල ඇඳුම් දීමනාව අනුමතයි.

(iii) මෙහිදී දීමනාව සම්බන්ධව අසා තිබෙනවා.

ගරු කථානායකතුමනි, දහම් පාසල් ගුරුවරුන් ස්වේච්ඡා සේවයක් කරන්නේ. මේක ගරු දීමනාවක්. ඒ ගරු කටයුත්තට දෙන දීමනාවක් මිසක් වැටුපක් හැටියට අපි සලකන්නේ නැහැ. බොහෝ අය මේක ස්වේච්ඡාවෙන් කරන දෙයක්. ඒ ස්වේච්ඡා සේවාව අපි අගය කරන නිසා මෙය මිලක් දාලා වටිනාකමක් දෙන්න පුළුවන් සේවාවක් නොවෙයි. අපි හිතනවා, ඒ ස්වේච්ඡා

[ගරු හරිනි අමරසූරිය]

සංස්කෘතියත් අගය කළ යුතුයි සහ රැක ගත යුතුයි කියලා. ඒක ගුරුවරයෙකුගේ වැටුපක් හැටියට සලකන එක එච්චර සුදුසු නැහැ කියලාත් අපි හිතනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2025 - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: පෙබරවාරි 27]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ වීය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: பெப்ருவரி 27]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee.- [Progress: 27th February]
[HON. SPEAKER in the Chair.]

103 වන ශීර්ෂය.- ආරක්ෂක අමාත්‍යාවරයා
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 8,087,000,000
තලෙප්පු 103.- පාතුකාප්පු අමෛච්චර්
නිකළ්ච්චිත්තිට්ටම් 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 8,087,000,000

HEAD 103.- MINISTER OF DEFENCE
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 8,087,000,000

189 වන ශීර්ෂය.- මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාවරයා
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 17,100,000,000
தலைப்பு 189.- பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 17,100,000,000

HEAD 189.- MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 17,100,000,000

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, ආරක්ෂක අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 103, 222 සිට 224, 304, 320 සහ 325; මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 189, 225 සහ 226.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.07]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.02.28 සිකුරාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 103, 222 සිට 224, 304, 320, 325, 189, 225 සහ 226 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මේ රටේ අද තිබෙන ආරක්ෂක වාතාවරණය, පාතාලය ක්‍රියාත්මක වීම ගැන කල්පනා කරන කොට, මේ රටේ ජාතික ආරක්ෂාව භාර ආරක්ෂක අමාත්‍යාංශයට වාගේම මහජන ආරක්ෂක අමාත්‍යාංශයට විශේෂ වගකීමක් තිබෙනවා. ඒත්මන් NPP - JVP ආණ්ඩුව බලයට පත් වුණේ මේ රටේ වංචාව, දූෂණය, හොරකම පිටුදකිනවා කියලා; හොරුන්ට දඬුවම් දෙනවා කියලා. හොරකම් කරපු දේපළ, මුදල් නැවත ලබා ගැනීම තමයි මේ ආණ්ඩුවේ ප්‍රධාන පොරොන්දුව වුණේ. මට මතකයි, ෆයිල් 300ක්, 400ක් වේදිකාවට ගෙන ගිහින් ජනාධිපතිවරයා එදා කිව්වා, අපේ ළඟ මේ ෆයිල් ටික තිබෙනවා, අපි මේවාට සම්බන්ධ අය අල්ලන්න ඉතා ඉක්මනින් කටයුතු කරනවා කියලා. අපි දැන ගන්න ඕනෑ ඒ ගැන. ඒ සඳහා අවශ්‍ය නීති රීති ගෙනෙන්න ඕනෑ.

සමගි ජන බලවේගය නියෝජනය කරමින් එදා විපක්ෂයේ ඉඳගෙන පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට දූෂණ විරෝධී පනත් කෙටුම්පත මේ සභාවට ගෙන එන්න මට පුළුවන්කම ලැබුණා. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. පසුගිය ආණ්ඩුව 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත විධියට ඒ පනතම වාගේ එකක් ගෙන ආවා. නමුත් ඒක තවම ක්‍රියාත්මක වෙනවාද කියන එක අද අපට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ වාගේම සමගි ජන බලවේගය විධියට අපට පුළුවන්කම ලැබුණා - එහි ලේකම්වරයා විධියට මට පුළුවන්කම ලැබුණා - පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට, සොරකම් කළ වත්කම් ප්‍රතිසාදනයට අදාළ පනත් කෙටුම්පතක් මේ සභාවට ගෙන එන්න. රජය කිව්වා නම් හොරකම් කරපු මුදල් ගේනවා කියලා, ඒක කරන්න ඕනෑ. මේ වන විට මේ රජයට දින 158යි. රජයේ ආයු කාලයෙන් දැන් සියයට 10ක් ගත වෙලා. අඩු තරමින් ඒ මුදල් ගේන්න මේ කියපු පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නවත් රජයට හැකියාව තිබුණේ නැත්තේ මොකද කියලා අපි අහනවා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳ හොඳ සෙල්ලම් එළි වෙන ජාමෙට කියනවා නේ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
බොහොම හොඳයි. අපිත් බොහොම කැමැතියි, ඒ හොරකම් අල්ලන එකට. මේ රට බංකොලොත් වුණේ, මිනිසුන් දුක් විඳින්නේ එක් කොටසක් කරපු හොරකම් නිසා බව අපි දන්නවා. ඒ හොරකම් සිදු කරපු අය අල්ලන්න අපට පුළුවන් හැම සහයෝගයක්ම අපි දෙනවා. අපි රජයට කියනවා, ඒවාට අවශ්‍ය නීති රීති ගෙනෙන්න කියලා. විපක්ෂය විධියට, සමගි ජන බලවේගය විධියට අපි ඒවාට අත උස්සනවා. මට මතකයි, තමුන්නාන්සේලාගේ ජනාධිපතිවරයා එදා ෆයිල් 400ක් ගැන

කිව්වා. යහ පාලන ආණ්ඩුවේ දූෂණ විරෝධී කමිටුවේ ලේකම් වශයෙන් සිටියේ වත්මන් අණ්ඩුවේ මහජන ආරක්ෂක ඇමතිවරයා. එදා CID එකේ DIG වශයෙන් හිටියේ අද වත්මන් ආණ්ඩුවේ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා. එහෙම නම් ඉක්මනින් ක්‍රියාත්මක වෙලා මේ සම්බන්ධයෙන් ඉක්මනින් කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා. අද රටේ ජනතාව ඒ දිහා බලාගෙන ඉන්නවා. හිටපු ගමන් ආරක්ෂක ඇමතිවරයාත් කියනවා, අධිකරණ ඇමතිවරයාත් කියනවා, "ඔන්න හෙට නඩු මෙච්චර ප්‍රමාණයක් දමනවා" කියලා. මම දන්නේ නැහැ, අධිකරණ ඇමති එම නඩු දමනවා ද කියලා. අපි දන්නේ නැහැ තවම එය ක්‍රියාත්මක වෙනවා ද කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමන්ලාත් සහයෝගය දෙන්න.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි සහයෝගය දෙනවා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපි සහයෝගය දෙනවා.

මහ බැංකුවේ මුදල් වංචාව ගැන තමුන්නාන්සේලා එදා දිගින් දිගටම කථා කළා. දැන් එහි පරීක්ෂණ යද්දී ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක නලින්ද ජයතිස්ස මහත්මයා රනිල් වික්‍රමසිංහ මහත්මයාට කියනවා, අර්ජුන මහේන්ද්‍රන් ගෙන්වා දෙන්න කියලා. ඊට වඩා හොඳයි නේ, අර්ජුන මහේන්ද්‍රන්ටම එන්න කියලා කිව්වා නම්.

ඒ කාරණයෙන්ම පටන් ගන්න. මම අහන්නේ, තමුන්නාන්සේලා හොරකම් අල්ලන්න කටයුතු කරන්නේ මෙහෙමද කියලායි. පාතාලයේ කට්ටිය ලංකාවට ගේන්න ඒ රටවල් එක්ක සාකච්ඡා කරනවා. ඇයි, අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට ගේන්න සිංගප්පූරුව රජයත් එක්ක සාකච්ඡා කරන්න බැරි? අපි තමුන්නාන්සේලාට ඒ කාරණය කියනවා. මම දන්නේ නැහැ, ඒවා කරන දේවල් ද, නොකරන දේවල් ද කියලා. ඒක තමුන්නාන්සේලාගේ ප්‍රධාන පොරොන්දුවක්. මේ රටේම ජනතාව බලාගෙන ඉන්නවා, කොහොමද ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ කියලා. තමුන්නාන්සේලා FCID කියලා විශේෂ ඒකකයකුත් පිහිටුවා තිබෙනවා. කරුණාකර මෙහි වත්මන් ප්‍රගතිය මොකක්ද කියන ප්‍රශ්නයට අදාළ උත්තරය දෙන්න කියලා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ රටේ ජනතාවත්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුත් කැමැතියි, මෙහි වත්මන් ප්‍රගතිය ගැන දැන ගන්න. තමුන්නාන්සේලා කියනවා "හොරු අල්ලනවා, හොරු අල්ලනවා!" කියලා. ලසන්ත වික්‍රමතුංග ඝාතනය, තාජුඩීන් ඝාතනය, ප්‍රගීත් එක්නැලිගොඩ ඝාතනය, ධර්මරත්නම් සිවරාම් ඝාතනය, පෝද්දල ජයන්තගේ කකුල් කැඩීම ආදි සිදුවීම් ගණනාවක් තිබෙනවා. මම දන්නේ නැහැ මේවා ගැන තමුන්නාන්සේලා කරගෙන යන පරීක්ෂණවල තත්ත්වය මොකක්ද කියලා. අපට ආරංචියි තාජුඩීන් ඝාතනය ගැන පරීක්ෂණ නොමග යැවූ නිලධාරියෙක් මහජන ආරක්ෂක ඇමතිතුමාගේ උපදේශක විධියට ඉන්නවා කියලා. ඉතින් කොහොමද අපි තාජුඩීන් ඝාතනය ගැන සාධාරණයක් බලාපොරොත්තු වෙන්නේ? ඒ නිලධාරියාගේ නම සඳහන් වෙලා තිබෙනවා. මම නම කියන්නේ නැහැ, එතුමා නිලධාරියෙකු වන නිසා. ඉතින්, කොහොමද මේ පරීක්ෂණ ගැන අපි සාධාරණයක් බලාපොරොත්තු වෙන්නේ?

තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට තවත් පොරොන්දුවක් දුන්නා, පාස්කු ඉරිදා සිද්ධිය ගැන වහාම කටයුතු කරනවා කියලා. ඒ සම්බන්ධව කමිටු තුනක් පත් කළා. එකක් තමයි මලල්ගොඩ කමිටුව. අනෙක, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව. අනෙක, ජනාධිපති පරීක්ෂණ කොමිසම. මා දන්නා විධියට යහ පාලන ආණ්ඩුව කාලයේ මේ සම්බන්ධයෙන් 700කට වඩා සැකකරුවන් අත්අඩංගුවට ගත්තා. පාස්කු ඉරිදා සිද්ධියේ ප්‍රධාන චිත්තිකාරයින්ගේ පියා තමුන්නාන්සේලාගේ ජාතික ලැයිස්තුවේ අපේක්ෂකයෙක් වුණා. ඉතින් මම දන්නේ නැහැ මේ පරීක්ෂණ ගැන කටයුතු කරන්නේ කොහොමද කියලා. එතුමා විතරයි දැන් ජීවත් වෙලා ඉන්නේ. අනෙක් ඔක්කොම මැරිලා. ජනතාව බලාගෙන ඉන්නවා ආණ්ඩුව දිහා. එම ප්‍රහාරයෙන් කතෝලික ජනතාවගේ ජීවිත 300ක් විතර අහිමි වුණා. මුස්ලිම් ජනතාව එහි චිත්තිකාරයෝ වුණා. අපට මැතිවරණ දෙකක් අහිමි වුණා. මේ රටේ කතෝලික ජනතාව බලාගෙන ඉන්නවා මේ ආණ්ඩුව මේ වැඩේ කොහොමද කරන්නේ කියලා. ඒ පරීක්ෂණ කළ නිලධාරීන් දැන් තමුන්නාන්සේලා යටතේ ඉන්නවා. පෙන්ෂන් ගියත් තමුන්නාන්සේලා ඒ අය ගෙන්නලා තනතුරුවල ස්ථාපිත කරලා තිබෙනවා; අපට ප්‍රශ්නයක් නැහැ. අපට ඕනෑ මේ රටේ ජනතාව වෙනුවෙන් මේවාට සාධාරණයක් ඉෂ්ට වෙන්නයි. අපි දන්නේ නැහැ මේවා මෙච්චර පරක්කු වෙන්නේ කොහොමද කියලා.

පසුගිය කාලයේ කථා වුණා මේකේ මහ මොළකරු අහවලා කියලා. දැන් මහ මොළකරු තවම නිදැල්ලේ ඉන්නවා. *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මහ මොළකරුත් එක්ක ආණ්ඩුවක් හදන්න යනවා නේ-

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම අහන්නේ මහ මොළකරු කවුද කියලායි. අපිත් කැමැතියි ඒක දැනගන්න. මොකද, ඒ සිද්ධියෙන් දේශපාලන වශයෙන් වැඩිම පාඩුව වුණේ අපේ පක්ෂයට.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මහ මොළකරු එක්ක සන්ධානගත වෙන්නේ නැද්ද කියන්න.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි සන්ධානගත වෙන්නේ නැහැ. බය වෙන්න එපා. අපි සන්ධානගත වෙන්නේ නැහැ. මම අහනවා තමුන්නාන්සේලාගෙන්- *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මහ මොළකරු සමඟ සන්ධානගත වෙන්නේ නැහැ නේද, මන්ත්‍රීතුමා?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මහ මොළකරු කවුද කියලා කියන්නකෝ ඉස්සෙල්ලාම. කියන්නකෝ, කියන්නකෝ. *[බාධා කිරීමක්]* කියන්න, කියන්න. තමුන්නාන්සේලාගේ ආරක්ෂක උපදේශක ද දන්නේ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා තමයි මහ මොළකරු ගැන කිව්වේ. ඒකයි අපි ඔබතුමාගෙන් ඇහුවේ. ඔබතුමා තමයි දැන් නම කියන්න ඕනෑ. *[බාධා කිරීමක්]* දැන් ඔබතුමා තමයි ඒ නම කියන්න ඕනෑ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔබතුමන්ලා කිව්වා. ඒ නිලධාරීන් කිව්වා. අපි අහනවා, තවම ඒ අය අත්අඩංගුවට ගත්තේ නැද්ද? අපි නොවෙයි, තමුන්නාන්සේලා නේ ඒවා කිව්වේ. තමුන්නාන්සේලා තමයි ඒවා කියලා ඡන්ද ගත්තේ. දැන් බලය තිබෙන්නේ තමුන්නාන්සේලාට, අපට නොවෙයි, ඊට සම්බන්ධ එක්කෙනෙක්වත් අත්අඩංගුවට ගන්න කටයුතු කරනවා කියලාවත් කියනවා අපි දැක්කේ නැහැ. යහ පාලන ආණ්ඩුව කාලයේ අත්අඩංගුවට ගත්ත හත්සිය ගණන විතරයි. මම අහන්නේ, තමුන්නාන්සේ ද උපදෙස් දෙන්නේ, ආනන්ද විජේපාල ඇමතිතුමා ද උපදෙස් දෙන්නේ, ජනාධිපතිවරයා ද උපදෙස් දෙන්නේ කියලා. අපි දන්නේ නැහැ කවුද උපදෙස් දෙන්නේ කියලා. ජනතාව බලාගෙන ඉන්නවා, කරුණාකරලා ක්‍රියාමාර්ගයක් ගන්න. දැන් බලයට ඇවිල්ලා දින 158යි. මේ ගැන තමුන්නාන්සේලා තවම කථා කරනවා විතරයි, ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මේ රටේ කතෝලික ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න කියලා අපි කියනවා.

ඊළඟට, මම පොලීසිය ගැනත් වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. අද ජාතික පොලිස් කොමිසමත්, ජනාධිපතිවරයාත්, පොලිස්පතිවරයාත් අතර ප්‍රශ්නයක්. අපි අහනවා තමුන්නාන්සේලාගෙන්, ජාතික පොලිස් කොමිසම ඇයි පත් කළේ? ජාතික පොලිස් කොමිසම පත් කළේ ගරු සභාපතිතුමනි, මේ රටේ පොලීසියේ ස්වාධීනත්වය රකින්න, පොලීසිය දේශපාලනීකරණයෙන් වළක්වන්න. ඒ ස්වාධීන කොමිෂන් සභා ස්වාධීනව නොවෙයි, ජනාධිපතිවරයා යටතේ තිබෙන්නේ. ඒ ගැන පාර්ලිමේන්තුවටත් වගකීමක් තිබෙනවා. මොකද, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යටතේ තිබෙන්නේ. පොලීසියේ ස්ථාන මාරු කිරීම් කරන්න යනකොට ජාතික පොලිස් කොමිසමෙන් ඒවාට අවසර දුන්නේ නැහැ කියලා ජනාධිපතිවරයා පොලිස් කොමිසම නිසා වැඩ කරන්න බැරි විත්තිය කියලා තිබෙනවා. මෙන්න වැඩබලන පොලිස්පති කියලා තිබෙනවා, "ජාතික පොලිස් කොමිසම වැරදි තැනකට ඇවිල්ලා" කියලා. මේ රටේ පොලීසිය ස්වාධීනව ගෙන යන්න, රටේ නීතියේ ස්වාධීනත්වය රකින්න ජාතික පොලිස් කොමිසම වැඩ කළාම වැඩබලන පොලිස්පතිවරයා කියනවා, "ජාතික පොලිස් කොමිසම වැරදි තැනකට ගිහිල්ලා" කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඊළඟට මැතිවරණ කොමිසමටත් එහෙම කියයිද දන්නේ නැහැ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම හිතන්නේ නැහැ, මැතිවරණ කොමිසමටත් එහෙම වෙයි කියලා. මොකද, එය හොඳ කොමිසමක්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම කියයි ද දන්නේ නැහැ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්, එහෙම කියයිද දන්නේ නැහැ.

"ජාතික පොලිස් කොමිසම වැරදි තැනකට ගිහිල්ලා" කියලා වැඩබලන පොලිස්පතිවරයා කියන්නේ. මම අහන්නේ එය කොච්චර ප්‍රජාතන්ත්‍ර විරෝධී කටයුත්තක්ද, විනය විරෝධී කථාවක්ද? වැඩ බලන පොලිස්පතිවරයා එක්ක අපට පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. අපි තමුන්නාන්සේලාගෙන් අහන්නේ, ජනාධිපතිවරයාත්, වැඩබලන පොලිස්පතිවරයාත්, ජාතික පොලිස් කොමිසම ගැන එහෙම කියනවා නම් මේ රටේ ස්වාධීනත්වය ගැන, ප්‍රජාතන්ත්‍රවාදය ගැන තව මොනවාද කථා කරන්නේ? තමුන්නාසේලා බලයට ආවේ ඒ ආයතනවලට ස්වාධීනත්වය දෙනවා කියලා. නමුත්, අද ක්‍රියාත්මක කරන්නේ වෙනස් විධියකට. පොලීසියේ ස්ථාන මාරුවීම් 139ක් එකවර කරලා තිබෙනවා. ඒ්, පොලිස් ඉතිහාසයේ එකවර කරපු වැඩිම ස්ථාන මාරුවීම් ටික. පොලිස් ස්ථානාධිපතිවරු 52ක් සාමාන්‍ය රාජකාරි සඳහා වෙන වෙන තැන්වලට යවලා තිබෙනවා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
සමහර උදවිය pool එකේ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්, සමහර අය pool එකේ.

ගරු සභාපතිතුමනි, මට මතකයි ඉස්සර පොලිස් ස්ථානාධිපතිවරු පත් කළේ කොහොමද කියලා. පොලිස්පතිතුමායි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු දෙදෙනෙකුයි සම්මුඛ පරීක්ෂණ තියලා, චෝදනා නැති දක්ෂ අය තෝරාගෙන ඒ අය තමයි පොලිස් ස්ථානාධිපතිවරු හැටියට පත් කළේ. අපට ආරංචියි, හෙට-අනිද්දා තවත් පොලිස් ස්ථානාධිපතිරු 160ක් පත් කරන්න යනවා කියලා, දේශපාලනයෙන්. පොලිස් සේවය දේශපාලනීකරණය කිරීමක් නේද මේ කරන්නේ? කරුණාකරලා මේ පොලිස් සේවයේ කටයුතු තමුන්නාන්සේලාට ඕනෑ විධියට නොවෙයි, ඒ කටයුතු ස්වාධීනව කරන්න අයිතිය දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි, අද පොලීසියේ නිලධාරීන් 20,000ක් අඩුයි. ආණ්ඩුවෙන් අපි අහනවා, මේ නිලධාරීන් 20,000 බඳවා ගන්න කටයුතු කරනවා ද, ඒ වෙනුවෙන් ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා. අය වැය ලේඛනයේ තිබෙන්නේ රාජ්‍ය සේවයට 30,000ක් බඳවා ගන්නවා කියලායි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ රාජ්‍ය සේවයට 30,000ක් බඳවා ගන්නවා කියනවා. හැබැයි, පොලිස් දෙපාර්තමේන්තුවේ 20,000ක් අඩුයි. මේ 20,000 බඳවා ගන්න අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද? පොලීසියේ රාළහාමිලාට, එ් නිලධාරීන්ට ඔබතුමන්ලා වැටුප් වැඩි කරලා තිබෙනවාද? මට මතකයි, පොලීසියේ අඩුම නිලධාරියාගේ රුපියල් 14,280ක්ව තිබුණු මූලික වැටුප අපේ ආණ්ඩුව යටතේ අපි රුපියල් 29,540ක් දක්වා වැඩි

කළා. අපි සියයට 107කින් වැටුප වැඩි කළා. පොලිසියේ මේ නිලධාරින් දවසේ පැය 8ක් නොවෙයි, පැය 24ම වැඩ කරන අය ඉන්නවා. අපි මොකක්ද එදා කළේ? අපි එදා ආණ්ඩුවක් විධියට මේ පොලිස් නිලධාරින්ගේ ජීවන වියදම් දීමනා හැර, සියයට 40ක විශේෂ දීමනාවක් දුන්නා. පොලීසියේ රාළහාමිගේ ඉඳලා IGP වෙනකම් ඒ දීමනාව දුන්නා. මොකක්ද තමුන්නාන්සේලා මේ අය වැයෙන් කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලා මේ අය වැයෙන් කරලා තිබෙන්නේ, ඒ සියයට 40න්, සියයට 18ක් කපා හැර තිබෙන එකයි. ඒ විශේෂ දීමනාවෙන් සියයට 22යි දැන් දෙන්න තීරණය කරලා තිබෙන්නේ. ඒක තමුන්නාන්සේලාගේ මේ අය වැය වාර්තාවේ තිබෙනවා. ඒ කියන්නේ, මේ රටේ සියලු පොලිස් නිලධාරින්ගේ ඒ විශේෂ දීමනාව සියයට 18කින් කපා හැර තිබෙනවා. පොලිස් දෙපාර්තමේන්තුවේ ලක්ෂයක් විතර ඉන්න ඕනෑ තැන පොලිස් නිලධාරිනුත්, STF එකත් ඇතුළුව 70,000ක් විතර තමයි වැඩ කරන්නේ. වැඩියෙන් වැඩ කරන නිසා මේ රාළහාමිලාට අපි විශේෂ දීමනාවක් දුන්නා. ඒකෙන් දැන් සියයට 18ක් කපනවා. පොලීසියේ පහළම නිලධාරියාට මේ දීමනාව හරහා රුපියල් 11,816ක් හම්බ වුණා. දැන් ඒකෙන් රුපියල් 5,317ක් තමුන්නාන්සේලා කපලා තිබෙනවා. දැන් කියනවා, වැටුප් වැඩි කළා කියලා. අපේ කාලයේ පොලිස් අධිකාරිවරයෙකුගේ වැටුප රුපියල් 36,755යි. අපි ඒක රුපියල් 76,175 දක්වා වැඩි කළා. පහළ නිලධාරියාගෙන් රුපියල් 5,000යි කැපෙන්නේ, වැටුප අනුව ඒ සියයට 40ක දීමනාවෙන්. SP කෙනෙකුගේ වැටුපෙන් රුපියල් 15,000ක්, 20,000ක් අඩු වෙනවා. මේ රටේ නීතිය හා සාමය රකින, පාතාලය මර්දනය කරන පොලීසියේ අයට තමුන්නාන්සේලා සලකන්නේ මෙහෙමද කියලා අපි අහනවා. කරුණාකරලා ඒ පොලීසියේ අයට මීට වඩා සලකන්න. මෙහෙන් කියනවා වැටුප් වැඩි කළා කියලා, රුපියල් 5,950ක්. ඒකෙනුත් රනිල් වික්‍රමසිංහ මහත්මයා දුන්නා රුපියල් 5,000ක්. රුපියල් 950යි එතකොට වැඩිවෙලා තිබෙන්නේ. දැන් මේකෙනුත් රුපියල් පන්දහස් ගණනක් කපලා දාලා තිබෙනවා, පහළම නිලධාරියාගෙන්. ඉහළට යන්න යන්න රුපියල් 10,000ක්, 15,000ක්, 20,000ක් වාගේ ප්‍රමාණයක් අඩු වෙනවා.

මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන සේවකයන්ට එදා ඉඳලා - රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඉඳලා - තුනෙන් එකක විශේෂ දීමනාවක් දෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් දැන් ඒ දීමනාව හතරෙන් එක දක්වා අඩු කරලා තිබෙනවා.

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

නැහැ, මගේ කථාව මැද කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ. කරුණාකර වාඩිවෙන්න. තමුන්නාන්සේ වාඩිවෙන්න. තමුන්නාන්සේගේ වෙලාවේදී කථා කරන්න. මම ඉඩ දෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි.

ඒ විතරක් නොවෙයි, පොලීසියේ රාළහාමිලාට පසුගිය ජනාධිපතිවරණයේදී, මහ මැතිවරණයේදී විශේෂ රාජකාරී සඳහා බටා එකක් දුන්නා. මොනවාද දැන් කරලා තිබෙන්නේ? සාමාන්‍ය සේවා සඳහා දුන් බටාවලින් ඒක අඩු කරලා තිබෙනවා. හරි නම්, මැතිවරණය වෙලාවක මැතිවරණ රාජකාරිවලට වෙනම රුපියල් බිලියන 10ක් විතර වෙන් කරනවා, ඒකෙන් පොලීසියේ අයට ගෙවනවා. ඒක දැන් සාමාන්‍ය රාජකාරී දීමනාවලින් අඩු කරලා තිබෙනවා. මෙහෙමයි පොලීසියේ අයට සලකා තිබෙන්නේ. මේ නිලධාරින්ට චිත්ත ධෛර්යය තිබෙන්න ඕනෑ, ඕනෑකම තිබෙන්න ඕනෑ මේ පාතාලය මර්දනය කරන්න. අපි දන්නවා සමහර අය ජීවිතක්ෂයට පත් කරලා තිබෙනවා. රටක නීතිය, සාමය තිබෙන්නේ ඇමතිවරයා නිසාවත්, රජය නිසාවත් නොවෙයි, වැඩ කරන නිලධාරින් නිසා. ඒ නිසා මේ අයට සලකන්න කියලා ඉල්ලා සිටිනවා. මේ දේශපාලනීකරණය කිරීම නවත්වන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have only two more minutes.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මට තව වැඩිපුර වෙලාවක් ලබා දෙන්න පුළුවන්ද, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි? විනාඩි 5ක් විතර.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, එතුමාට තව විනාඩි 5ක් ලබා දෙනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ඒ විතරක් නොවෙයි, අපට MSD එක ඕනෑ නැහැ කිව්වා. MSD එකේ 2,000ක් විතර ඉන්නවා. PMSD එකේ 1,500ක් විතර ඉන්නවා. මේ ඔක්කොම දැන් දාලා තිබෙනවා පොලීසියට. මම දන්නේ නැහැ, පොලීසියේ මොන රාජකාරී කරන්නද ඔවුන් යොදවා තිබෙන්නේ කියලා. දැන් අපි ගමනක් යන්න ගියොත්, පස්පොළක විතර නවත්වනවා. වාහන නවත්වන එක හොඳයි, අනතුරු වළක්වන්න. නමුත් ඊට වඩා කරදරයක් වෙලා තිබෙනවා, පස්පොළක විතර නවත්වන එක. මම තමුන්නාන්සේලාගෙන් අහනවා, පාතාලය මර්දනය කරන්න මේ ගොල්ලන්ව යොදවන එක ඊට වැඩිය හොඳයි නේද කියලා. මේ ගොල්ලන්ව යොදවන්න ඕනෑ, පාතාලය මර්දනය කරන්න, නේද? දැන් පාතාලය නැඟිටලා තිබෙනවා. මේ පුවත් පතේ පොලිස්පතිවරයා කියනවා, "2023, 2024, 2025 වසරවල අපරාධවල වැඩිවීමක් පවතින බව මම පිළිගන්නා බව..." කියලා. මේ, පත්තරේ තිබෙන්නේ. පොලිස් ඇමති කියනවා, අපරාධවල වැඩිවීමක් නැහැ කියලා. අපි විශ්වාස කරන්න ඕනෑ, පොලිස් ඇමති කියන එකද, පොලිස්පති කියන එකද කියලා අපි අහනවා. කරුණාකරලා මේ කාරණය පිළිගන්න. මේ රටේ ඉතිහාසයේ ප්‍රථම වරට පාතාල ක්‍රියාකාරකම් නිසා පොඩි ළමයින් දෙදෙනෙක් මැරුණා. මෙහි වගකීම ගන්න ඕනෑ, මේ රට පාලනය කරන අයයි. මේ මාස දෙකට 18දෙනෙක් මැරිලා තිබෙනවා. මේවා සම්බන්ධව ක්‍රියාමාර්ග ගන්නේ නැතිව, පොලිස් නිලධාරින්ගේ දීමනා ඔක්කොම කප්පාදු කරන එක හරිද කියලා මම අහනවා. ඒ විතරක් නොවෙයි. අපි ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් වහාම විශේෂ අධිකරණයක් හෝ පිහිටුවන්න. පොලිස්පතිම කියනවා පාතාල කණ්ඩායම් 58ක් ඉන්නවා, පාතාලයේ සාමාජිකයන් 1,400ක් ඉන්නවා කියලා. මේවා මර්දනය කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ජනාධිපතිතුමා ඊයේ පෙරේදා ඇවිල්ලා කිව්වා, අපි මේක මර්දනය කරනවා කියලා. එතුමා හාල් මෝල් හිමියන් මර්දනය කරනවා කියලා කිව්වේත් ඔය විධියටම තමයි. මෙසෙට ගහලා රුපියල් 10කින් හාල් කිලෝව වැඩි කළා. මම දන්නේ නැහැ, එතුමාගේ තර්ජනය කොච්චර දුරට හරියයිද කියලා.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

ඒ විතරක් නොවෙයි. බලන්න, පොලිස් නිලධාරීන් මුහුණ දෙන ගැටලු. ඉසුරුපාය ළඟ විරෝධතාවක් තිබුණා. පොලීසියේ නිලධාරීන්ව තුන් දෙනෙක් කැපුවා. තලංගම පොලීසිය අධිකරණයට ගිහින් කියනවා, හමුදා බුද්ධි අංශයේ නිලධරියෙක් තමයි මේ වැඩේ කළේ කියලා. කොහොමද රටේ ආරක්ෂාව තිබෙන්නේ කියලා මම අහනවා. පොලීසියෙන් ගිහින් කියනවා, හමුදාවේ බුද්ධි අංශයේ කෙනෙක් කැපුවා කියලා. හමුදාවයි, පොලීසියයි එකතු වෙලා ගන්න ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද කියලා අපට අහන්න වෙනවා. මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන්න නම්, තමුන්නාන්සේලාට ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න සිද්ධ වෙනවා.

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කළාට පස්සේ තවම මොකුත් කරලා නැහැ. මේ රටේ ගම්වලට ගියාම ජේනවා, දැන් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වෙලා කියලා. මත්ද්‍රව්‍යවලින් සියයට 90ක් එන්නේ මුහුදෙන්. සියයට 10ක් එන්නේ ගුවන් මඟින්. මේවා මර්දනය කරන්න තිබෙන විශේෂ වැඩ පිළිවෙළ මොකක්ද කියලා අපි අහනවා. අපට ඒක ප්‍රකාශ කරන්න. ඊයේ පෙරේදා කන්ටේනර් 323ක් පරීක්ෂාවකින් තොරව එළියට දැම්මා. ඒ හරහා මත්ද්‍රව්‍ය එළියට ආවාද කියලා ජනතාව කල්පනා කරනවා. ආණ්ඩුවක් කටයුතු කරන්නේ මෙහෙමද කියලා මම අහනවා. දැන් රට තුළ මත්ද්‍රව්‍ය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ කටයුතු මැඩ පවත්වන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා අපි කියනවා.

මට ලැබී තිබෙන කෙටි කාලය ඇතුළත හමුදාව ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිවරයා ටියුෂන් දෙන්න ඕනෑ නැහැ. බංකුයි, පුටුයි අරගෙන ඇවිත් ඒ ගැන ටියුෂන් ගන්න ඕනෑ නැහැ. මම දැක්කා, නියෝජ්‍ය ඇමතිවරයා කියා තිබෙනවා, "බංකුවක්, පුටුවක් අරගෙන ආවොත් මම ටියුෂන් දෙන්නම්" කියලා. කළ යුත්තේ ඒක නොවෙයි. ජාතික ආරක්ෂාව තහවුරු කරන්න කියලා මම නියෝජ්‍ය ඇමතිවරයාට කියනවා. අද හමුදාවේ කාණ්ඩ - යුද හමුදාවේ, ගුවන් හමුදාවේ, නාවික හමුදාවේ අය - සේවය අතහැර යනවා. මොකක්ද, ආණ්ඩුව තුළ ඒකට තිබෙන තීන්දුව? මොකක්ද, ක්‍රියාමාර්ගය? ඒ අයගේ පාස්පෝට් තහනම් කරන එකද? ඒක නොවෙයි කළ යුත්තේ. පශ්චාත් යුද සමයක මේ අයව පුනරුත්ථාපනය කරන්න. මේ අය පුරුදු වෙලා තිබෙන්නේ තුවක්කු අරගෙන ගිහිල්ලා යුද්ධ කරන්න. ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, මේ අය සුබවාදී විධියට සමාජගත වෙන විධියට කටයුතු ක්‍රියාත්මක කරන්න කියලා. එහෙම නැත්නම් මොකක්ද වෙන්නේ? අද පාතාලය තුළ කෝටි ගණන්, ප්‍රකෝටි ගණන් සල්ලි තිබෙනවා. ඒ මුදල් යොදා ගෙන මේ අය එක එක කටයුතුවලට පාවිච්චි කරනවා. අපි දන්නවා, පසුගිය කාලයේ සිදු වුණු ඝාතනවලින් වැඩි කොටසකට මේ අය සම්බන්ධ බව.

අද වනවිට හමුදාවේ ගොඩක් අය සේවය හැර යනවා. ඇයි, ඒ? පසුගිය කාලයේ ඒ අයට හමුදාවේ සේවය කරලා රුපියල් 50,000ක්, 60,000ක් අරගෙන ජීවත් වෙන්න පුළුවන් වුණාට, අද ඒ වාගේ මුදලක් අරගෙන ජීවත් වෙන්න බැහැ. අද වනවිට හමුදාවේ අයට උදේට දෙන කිරි කෝප්පයත් නැහැ. දැන් දෙන්නේ කහට එකක්. කෑමත් දැන් නරකයි කියලා තමයි කියන්නේ. ආදේශ ලු තිබෙන්නේ. කුකුළු මස්වලට ආදේශ ලු තිබෙන්නේ. හරක් මස්වලට ආදේශ ලු තිබෙන්නේ. අපි කියන්නේ මේකයි. රණ විරුවන්ගේ චිත්ත ධෛර්යය වැඩි වෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ රටේ රණ විරුවන් යුද්ධ කාලයේවත් හමුදා සේවය හැර ගියේ නැහැ. දැන් ඒ අය හමුදාව හැර යනවා. රණ විරුවන්ට වැටුප, විශ්‍රාම වැටුප, ආබාධිත වැටුප දෙනවා. ආබාධිත රණ විරුවන්ගේ මේ දේවල් පෙන්ෂන් ගියාට පසුවත් ඒ අයට දෙන්න කියලායි අපි ඉල්ලන්නේ. ඒගොල්ලන් ඉල්ලුවා. මොකද, ඒ අය හැඩ ගැසී තිබෙන්නේ ඒ මුදලේ ප්‍රමාණයෙන් ජීවත් වෙන්න. කොටසකට එය හම්බ වෙලා තිබෙනවා. ඉතුරු අයටත් එය ලබා දෙන්න කියලා මම ආරක්ෂක ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා, රට තුළ හොඳට බෙහෙත් තිබෙනවා කියලා. නමුත් හමුදා රෝහලෙන් බෙහෙත් ගන්න එන යුද්ධ කාලයේ ආබාධිත වූ සාමාජිකයෝ කියනවා, හමුදා රෝහලේ බෙහෙත් නැහැ කියලා. මොනරාගලින්, අනුරාධපුරයෙන්, අම්පාරෙන් එන අය දෙතුන් සැරයක් එන්න ඕනෑ, බෙහෙත් ගන්න. යුද්ධ කරලා රට දිනපු මේ වීර සෙබළුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමට කරුණාකරලා කටයුතු කරන්න.

ඒ එක්කම මම කියන්නට ඕනෑ, 1988-89 කාලයට ඉස්සෙල්ලා මේ රටේ එක මන්ත්‍රීවරයෙකුට, ඇමතිවරයෙකුට ආරක්ෂාව දීලා තිබුණේ නැති බව.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over now.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම විනාඩියකින් අවසන් කරන්නම්.

තුවක්කුවෙන් මේ රට අල්ලන්න ගිය අය නිසා, මන්ත්‍රීවරුන් මරපු නිසා, පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු නිසා තමයි මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දෙන්න වුණේ. 1989ට ඉස්සෙල්ලා මන්ත්‍රීවරයෙකුට එක පොලිස් රාළහාමි කෙනෙක්වත් ආරක්ෂාවට දීලා තිබුණේ නැහැ. එසේ ආරක්ෂාව දෙන්න කටයුතු කරන්න වුණේ ජනතා විමුක්ති පෙරමුණ ක්‍රියාත්මක කළ ඒ භීෂණය නිසායි.

මට වැඩිදුර කථා කරන්න වෙලාව නැති නිසා, මම ඉල්ලීමක් කරනවා. ජාතික ආරක්ෂාවට බාධා වෙච්ච උදව්යගෙන්, 1971, 1988-89 කාලවල පාතාලය පටන් ගත්ත උදව්යගෙන් - ඒ ගොල්ලනුත් හැංගිලා නේ වෙඩි තිබ්බේ. මේ පාතාලය වාගේමයි නේ. - මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරලා ජනතාවට නිදහසේ ජීවත් වෙන්න කටයුතු සලසන්න කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Ananda Wijepala. You have ten minutes.

[පූ.භා. 10.32]

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු සභාපතිතුමනි, විශේෂයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කරන මේ මොහොතේ මම මුලින්ම

මේ කාරණය කියන්න කැමැතියි. විශේෂයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය හැටියට මේ වෙනකොට ශ්‍රී ලංකා පොලිස් සේවය සම්බන්ධයෙන් අපි ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙනවා. පළමු කාරණය තමයි, ශ්‍රී ලංකා පොලීසිය දේශපාලනීකරණයෙන් නිදහස් කිරීම. ඒක තමයි අපි ආරම්භයේදීම සිදු කළේ. පොලීසිය පමණක් නොවෙයි, සමස්ත රාජ්‍ය සේවයම දේශපාලනීකරණයෙන් නිදහස් කිරීමේ කර්තව්‍යය අපි කරලා අවසානයි; අපි ඒක උඩින්ම කරලා ඉවරයි. ඒ සඳහා අවශ්‍ය ආදර්ශය ගරු ජනාධිපතිතුමා වාගේම ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් දීලා තිබෙනවා. කිසිම හේතුවක් මතවත් දේශපාලන සම්බන්ධතාවලට පත්වීම් ලබා දෙන ක්‍රමය අපි අහෝසි කරලා තිබෙනවා. එහෙම ස්ථාන මාරු කරන්නේත් නැහැ. පත්වීම් දෙන්නේත් නැහැ. ඒ කාරණාවන් දේශපාලන වුවමනාවන් අනුව කරන්නේ නැහැ. ඒවා ස්වාධීන කොමිෂන් සභා සතු කාර්යයන්. ඒවා ඒ ආකාරයෙන් සිදු වෙනවා. මහජන ආරක්ෂක ඇමතිවරයා හැටියටත්, අමාත්‍යාංශයේ කාර්යභාරය මෙහෙයවන ප්‍රධාන නිලධාරියා හැටියටත් ඔවුන් සියලු දෙනාට මම උපදෙස් දීලා තිබෙන්නේ දේශපාලනීකරණයෙන් තොරව මේ අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන මෙහෙයවන්න කියලා. ඒ වාගේම රජයක් හැටියට සමස්ත රාජ්‍ය සේවය දේශපාලනීකරණයෙන් ඉවත් කරලා ස්වාධීන, නිදහස් ඒ වාගේම අභිප්‍රේරණයක් සහිත, කැපවීමක් සහිතව වැඩ කරන්න අවශ්‍ය වට පිටාවක් හදලා දීම තමයි අපේ කාර්යභාරය. ඒ සඳහා යටිතල පහසුකම් සකස් කරලා දීම මෙම අය වැයෙන් ඉතා මැනවින් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා.

රංජිත් මද්දුම බණ්ඩාර හිටපු ඇමතිතුමා කිව්වා, අපි දේශපාලනීකරණය කරලා පොලිස් ස්ථානාධිපතිවරුන්ට පත්වීම් දෙනවා කියලා. එතුමා දන්නවා, පසුගිය කාලයේ තමයි එහෙම දේවල් කළේ කියලා. හිටපු පොලිස්පතිවරයෙක් -වික්‍රමරත්න මහත්තයා- කිව්වා, OICsලා 184ක් පත් කරපු වෙලාවේ 182කටම දේශපාලන පත්වීම් දුන්නා කියලා. *[බාධා කිරීම්]* රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, පසුගිය ආණ්ඩුව කියන්නේ ඔබතුමාගේ කලින් නායකයාගේ ආණ්ඩුව. *[බාධා කිරීම්]* අපට නොවෙයි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට නම් ආණ්ඩුවක් හොයා ගන්නත් බැහැ. තැනින් තැන හිටියා. මොන ආණ්ඩුවේද හිටියේ, මොන ආණ්ඩුවේද හිටියේ නැත්තේ කියලා හිතාගන්නත් බැහැ. *[බාධා කිරීම්]*

කෑ ගහන්නේ නැතුව පොඩ්ඩක් ඉන්නකෝ. පොඩ්ඩක් ඇහුම්කන් දෙන්නකෝ. *[බාධා කිරීම්]* රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කලින් නායකයාගේ,- *[බාධා කිරීම්]* ගරු සභාපතිතුමනි, දේශපාලනීකරණය වූ පොලීසිය අපි දේශපාලනීකරණයෙන් නිදහස් කර තිබෙනවා. පොලීසියට නිදහසේ වැඩ කරන්න අවශ්‍ය වටපිටාව අපි සකස් කර දී තිබෙනවා. ඔවුන් ධෛර්යය සම්පන්නව, ශක්ති සම්පන්නව මේ වෙනකොට වැඩ කරනවා. අපරාධ විමර්ශන කටයුතු ශක්ති සම්පන්නව ඉතා මැනවින් ඉෂ්ට කරනවා. දැන් පාතාලයේ වෙඩි තැබීමක් හෝ වෙනත් සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකමක් සිදු වූ වහාම ඉතා දක්ෂ ලෙස පොලීසිය ක්‍රියාත්මක වෙනවා. පසුගිය කාලයේ යම් යම් සිදුවීම් කිහිපයක් වුණා, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේ අවස්ථාවල පොලීසිය අපරාධ විමර්ශන කටයුතු මැනවින් ඉෂ්ට කළා. පසුගිය දිනක උසාවිය ඇතුළත සිදු වූ වෙඩි තැබීමේ සිද්ධියේ ප්‍රධාන සැකකරු පැය 8ක් ගත වන විට අත්අඩංගුවට ගන්න පොලීසිය සමත් වුණා. අපි දැන් අපරාධ විමර්ශන කටයුතු කඩිනම් කරලා තිබෙනවා. ඉතාම දක්ෂ ලෙස එම නිලධාරීන් ඒවා ඉෂ්ට කරමින් තිබෙනවා. හැබැයි, පසුගිය කාලයේ -දශක දෙක තුනක් තිස්සේ- සිද්ධ වෙච්ච බොහෝ අපරාධ හිටපු දේශපාලනඥයෝ විසින් කාලයේ වැලි තලාවට යටපත් වෙන්න ඉඩ හැරියා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාත් නියෝජනය කරපු යහ පාලන ආණ්ඩුව කාලයේදී තමයි දූෂණ මර්දන ලේකම් කාර්යාලය ස්ථාපිත කළේ. ඒ කාලයේ මම දූෂණ මර්දන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා වශයෙන් වැඩ කළා. එතැනට ආපු ලිපි ගොනු 1,200න්, 500ක් අල්ලස් කොමිසමට, FCID එකට, CID එකට භාර දුන්නා, විමර්ශන කටයුතු සඳහා. ජනතාවගෙන් ලැබුණු පැමිණිලි, දේශපාලන පක්ෂවලින් ලැබුණු පැමිණිලි, විවිධ ආයතනවලින් ලැබුණු පැමිණිලි විභාග කිරීම සඳහා එලෙස භාර දුන්නා. එම නිලධාරීන් දක්ෂ ලෙස ඒවා විභාග කරන්න පටන් ගත්තා; විමර්ශනය කරන්න පටන් ගත්තා. හැබැයි, ටිකක් කල් යනකොට ඔබතුමාගේ එවකට නායකයන් වූ රනිල් වික්‍රමසිංහ මහත්මයාත්, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් එකතු වෙලා ඩීල් දාලා ඒ කටයුතු නතර කළා. ඒවා උසාවිවලින් විමර්ශනය කරන්න බැරි වෙන විධියට කටයුතු කළා. ඒ හින්දා ඒ කටයුතු අඩපණ වුණා. ඒ සියලු විමර්ශන අපි නැවත ආරම්භ කරලා තිබෙනවා. අපි FCID එක ස්ථාපිත කරලා තිබෙනවා. පොලීසියේ ව්‍යූහාත්මක වෙනස්කම් රාශියකට අපි දැන් පදනම දමා තිබෙනවා. මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය ස්ථාපිත කිරීමේ කටයුතු මේ දවස්වල කෙරෙමින් පවතිනවා. ඒ අනුව සෑම පළාතකටම අපරාධ විමර්ශන කොට්ඨාසයක් ස්ථාපිත වෙනවා. ඒ වාගේම FCID එක ස්ථාපිත කරලා එහි කටයුතු මේ වෙනකොට ආරම්භ කර තිබෙනවා. පසුගිය යහ පාලන ආණ්ඩුවෙනුත්, පොහොට්ටු-රනිල් ඒකාබද්ධ ආණ්ඩුවෙනුත් යටපත් කරපු සියලු විමර්ශන අපි නැවත ආරම්භ කර තිබෙනවා.

මම ඔබතුමන්ලාට දැනගන්න තවත් කරුණු කිහිපයක් කියන්නම්. සිදු කරනු ලබන විමර්ශනවලට අදාළව පහත සඳහන් පරිදි රුපියල් මිලියන 6,601ක සමස්ත වටිනාකමකින් යුත් දේපළ රාජ සන්තක කිරීමට, එහෙම නැත්නම් cease කිරීමට අපි කටයුතු කර තිබෙනවා. මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මැඩ පැවැත්වීම සඳහා ඔවුන් විසින් නීති විරෝධීව උපයා ගත් රුපියල් මිලියන 4,524ක වටිනාකමකින් යුත් දේපළ රාජ සන්තක කර තිබෙනවා. පිරමීඩාකාර ගනුදෙනු සිදු කරමින් මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනවලදී ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකම්වලින් උපයා ගත් රුපියල් මිලියන 2,867ක වටිනාකමින් යුතු දේපළ සහ මුදල් රාජ සන්තක කරලා තිබෙනවා. මූල්‍ය අපරාධ සිදු කර එමඟින් උපයා ගත් රුපියල් මිලියන 1,054ක වටිනාකමින් යුත් දේපළ සහ මුදල් රාජ සන්තක කරලා තිබෙනවා. 2025 වර්ෂයේ මත් ද්‍රව්‍ය ජාවාරම්වලින් උපයා ගත් දේපළ රුපියල් මිලියන 152.8ක මුදලක් රාජ සන්තක කර ඇති අතර, රුපියල් මිලියන 188.3ක දඩ මුදලක් අධිකරණය විසින් සැකකරුවන්ට නියම කරලා තිබෙනවා. අපරාධ මැඩලීම සඳහා 2024.09.21 දිනෙන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සමස්ත සැකකරුවන් 680ක් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. 2025 වර්ෂයේ විශේෂ පරිගණක අපරාධ සම්බන්ධයෙන් ලද පැමිණිලි 14කට අදාළව දේශීය හා විදේශීය සැකකරුවන් 297ක් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම 2025 වර්ෂයේ සංවිධානාත්මක අපරාධ මැඩලීම සම්බන්ධයෙන් සැකකරුවන් 8දෙනෙකු විදේශයන්හි සිට මෙරටට ගෙන්වා අධිකරණවලට ඉදිරිපත් කරලා තිබෙනවා. ඉන් සැකකරුවන් 5දෙනෙකු රතු නිවේදන මත ශ්‍රී ලංකාවට ගෙන්වා ගෙන තිබෙනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබෙන පැමිණිලි කඩිනමින් විමර්ශනය කර අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත උප ඒකක මේ වෙනකොට ස්ථාපිත කරලා තිබෙනවා.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, එහෙම නැත්නම් CID එකේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සැලැස්ම හඳුන්වා දීලා තිබෙනවා. විමර්ශන කටයුතු සඳහා අනෙකුත්

[ගරු ආනන්ද විජේපාල මහතා]

ආයතනවල සභාය කඩිනමින් ලබා ගැනීම සඳහා හඳුනා ගත් ආයතන 38ක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට සැලසුම් කරලා තිබෙනවා. ඉන් අවබෝධතා ගිවිසුම් පහක් මේ වෙනකොටත් අත්සන් කරලා තිබෙනවා. ඒ වාගේ දැවැන්ත කාර්යභාරයක් මේ මාස දෙක, තුන ඇතුළත අපි සිදු කරලා තිබෙනවා. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවත්, පොලිස් දෙපාර්තමේන්තුව යටතේ ඇති සියලු ආයතන, විශේෂයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ අපි ඒ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ නිසා කාටවත් කියන්න බැහැ, පසුගිය මාස තුන ඇතුළත අපි මොකුත් කරලා නැහැ කියලා. අවුරුදු 15ක්, 20ක් පාතාලය, එහෙම නැත්නම් සංවිධානාත්මක අපරාධ වර්ධනය වෙන්න ඉඩ හැරලා, ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් හදපු දේශපාලකයෝ මේ රටේ ඕනෑ තරම් ඉන්නවා. මේ රටේ මහජනතාව ඒවා ගැන දන්නවා. වර්ධනය කරපු පාතාලය, නිර්මාණය කරපු පාතාලය, පෝෂණය කරපු පාතාලය, පවත්වා ගෙන ගිය පාතාලය මාස තුනකින් මර්දනය කළාද කියලා බොහෝ අය ඇවිල්ලා දැන් මෙතැනදී අහනවා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා තවත් ප්‍රශ්නයක් ඇහුවා, පොලිස් නිලධාරීන්ගේ වැටුප් පිළිබඳව. අපි කිසිවෙකුගේ වැටුප් අඩු කරන්න කටයුතු කරලා නැහැ. දීමනා සියල්ල මූලික වැටුපට එකතු වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු ගණනාවකට පස්සේ පළමුවැනි වතාවට අපි මූලික වැටුප වැඩි කරන්න කටයුතු කළා. මූලික වැටුප වැඩි කිරීම යනු, බොහෝ ප්‍රතිලාභ සැලසෙන කාර්ය භාරයක්. මූලික වැටුපට අනෙකුත් දීමනා එකතු කරලා තිබෙනවා. පොලිස් දෙපාර්තමේන්තුවේ විතරක් නොවෙයි, රාජ්‍ය සේවයේ කිසිදු නිලධාරියෙකුගේ වැටුප් අඩුවීමක් වෙන්නේ නැහැ, වැටුප් වැඩිවීමක් ස්ථිර වශයෙන්ම වෙනවා. ඒ සඳහා තමයි රුපියල් බිලියන 232ක් වෙන් කරලා තිබෙන්නේ. වැටුප් වැඩි වෙන්නේ නැත්නම් මුදල් වෙන් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. සමස්ත වැටුප් වැඩිවීම සඳහා අමතර වශයෙන් රුපියල් බිලියන 1,240ක් වැය වෙනවා. මේ අවුරුද්දේ සමස්ත වැටුප් වැඩිවීම සඳහා රුපියල් බිලියන 110ක් වැය වෙනවා.

අපි අදහස් කරලා තිබෙනවා, පොලිස් දෙපාර්තමේන්තුව සඳහා වෙනම වැටුප් ව්‍යුහයක් නිර්මාණය කරන්න. ඒක අපි ඊළඟ අය වැයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ සඳහා අවශ්‍ය වටපිටාව අපි දැන් හදලා තිබෙනවා; සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි.,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is over.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න. තව කාරණයක් කියන්න තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව කොච්චර කාලය අවශ්‍යද?

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු සභානායකතුමනි, මට විනාඩි තුනක් ලබා දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ කාලයෙන් විනාඩි තුනක් එතුමාට ලබා දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔබතුමා පිළිතුරු කථාවේදී ඔය කාරණා ඉදිරිපත් කරන්න, අපේ වෙලාව යනවා, ඇමතිතුමනි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
හරි, මම ඒක කරන්නම්.

රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා තවත් කාරණයක් මතු කළා. පසුගිය දවසක පැලවත්ත, ඉසුරුපාය ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවත්වුණා. ඒ උද්ඝෝෂණයේදී පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට තියුණු ආයුධයකින් තුවාල සිද්ධ කරලා තිබුණා. එයින් එක පොලිස් නිලධාරියෙකු දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලැබුවා. තවත් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු රෝහල්ගත කර තිබුණා. ඒ අවස්ථාවේදී පොලීසිය යම් විමර්ශනයක් කරලා, බුද්ධි අංශ නිලධාරියෙකුත් අත්අඩංගුවට ගත්තා, ප්‍රශ්න කිරීම සඳහා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ගරු සභාව නොමඟ යවන්න එපා, කිසිවිටෙකත් පොලීසිය අධිකරණයට වාර්තා කළේ නැහැ, බුද්ධි නිලධාරියෙක් මේ තුවාල සිදු කිරීමට සම්බන්ධයි කියලා. පොලීසිය දිගින් දිගටම මේ සිද්ධිය සම්බන්ධව විමර්ශනය කළා. විමර්ශනය කරලා අදාළ සැකකරු අත්අඩංගුවට ගත්තා. ඔහු මාතර ප්‍රදේශයේ සංවර්ධන නිලධාරියෙක්. ඔහු සති කිහිපයකට පස්සේයි අත්අඩංගුවට ගත්තේ. කිසි විටෙකත් හමුදාවේ බුද්ධි අංශ නිලධාරීන් මේකට සම්බන්ධයි කියලා පොලීසිය අධිකරණයට වාර්තා කළේත් නැහැ, එවැනි සම්බන්ධයක් තිබුණේත් නැහැ.

එදා සිද්ධිය වුණු අවස්ථාවේ සැක කටයුතු ලෙස අත්අඩංගුවට ගත් පිරිස අතර හමුදාවේ බුද්ධි අංශ නිලධාරියෙක් හිටියා. ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත්තා. මම හිතන විධියට, ඒ තලංගම පොලීසියේ නිලධාරීන් වෙන්න ඕනෑ. ඒ ප්‍රකාශය සටහන් කරගෙන ඔහුව නිදහස් කළා. එම සිද්ධිය පමණයි වුණේ. හැබැයි, කිසිම අවස්ථාවක පොලීසිය මෙවැන්නක් අධිකරණයට වාර්තා කළේ නැහැ. අත්අඩංගුවට ගැනීමක් පමණයි පොලීසිය සිදු කළේ. අධිකරණයට එහෙම වාර්තා කිරීමක් සිදු වෙලා නැහැ. අපි ඒ පිළිබඳව සොයා බැලුවා. ඇත්ත, සැකකරු අපි අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි විමර්ශන අවසන් කරලා මේ වෙනකොට ඔහුට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්න කටයුතු කරමින් සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම තව දෙයක් කියන්න ඕනෑ. පොලීසියට මේ වෙනකොට තමන්ගේ කාර්යභාරය සක්‍රීයව මැනවින් ඉටු කරන්න හැකිවන වටපිටාවක් හදන්න අපි සමත් වුණා. දේශපාලනීකරණයෙන් නිදහස් කරලා ඔවුන්ට තමන්ගේ රාජකාරිය හොඳින් කරන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්න -ජාතික ජන බලවේගය බලයට පත් වුණාට පස්සේ මේ මාස තුන ඇතුළත, නැත්නම් පසුගිය නොවැම්බර් 21වෙනි දා ඉඳලා මේ කර්තව්‍යය ඉෂ්ට කර ගන්න- අපට හැකියාව ලැබුණා. මේ මාස තුනේ මොනවාද කළේ, පොලීසියේ ක්‍රියාකාරකම් අඩපණ වෙලා, ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙලා කියලා කවුරුන් හෝ කියනවා නම්, ඒක පට්ටපල් බොරුවක්. යම් යම්

සිද්ධීන් වෙනවා. නමුත්, අපි ඒවා ඉතා කඩිනමින් විමර්ශනය කරලා මේ රටේ සියලු ජනයාගේ ආරක්ෂාව තහවුරු කරනවා; ජාතික ආරක්ෂාව තහවුරු කරනවා. ඒ පිළිබඳව කිසිදු සැකයක් නැහැ, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Sivagnanam Shritharan. You have 14 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[மு.ப. 10.45]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தவிசாளர் அவர்களே, பாதுகாப்பு அமைச்சினூடாக இந்த நாட்டில் பல்வேறு நெருக்கடிகளைச் சந்திக்கின்ற ஒரு தேசிய இனமாகத் தமிழ் தேசிய இனம் இருக்கிறது. நான் நினைக்கின்றேன், இந்த நாட்டில் இருக்கின்ற மொத்தப் படையினரில் நான்கில் மூன்று பகுதியினர் வடக்கு, கிழக்குப் பகுதிகளில் குவிக்கப்பட்டு இருக்கின்றார்களென்று. குறிப்பாக, நாட்டில் 317,000 படையினர் இருப்பதாகப் புள்ளிவிபரங்கள் குறிப்பிடுகின்றன. ஆனால், இலங்கையில் இருக்கின்ற மக்கள் தொகை 22,181,000 ஆகும். கிட்டதட்ட 22,200,000 மக்கள் வாழுகின்ற இந்த நாட்டில் 317,000 படையினர் உண்டு. அந்த வகையில், இந்த நாட்டில் பதினான்கு பேருக்கு ஒருவர் என்ற ரீதியில் அதன் ratio காணப்படுவதாகக் கணக்கிடப்பட்டிருக்கின்றது. இதிலே நான்கில் மூன்று பகுதியினர் வடக்கு, கிழக்குப் பகுதிகளில் குவிக்கப்பட்டிருக்கின்றார்கள்.

கௌரவ தவிசாளர் அவர்களே, இலங்கையின் வடக்கு, கிழக்குப் பகுதிகளுக்கு நீங்கள் சென்று பார்த்தால், அங்கு ஏனைய எந்த மாவட்டத்திலும் இல்லாத வகையில் இவ்வாறு இராணுவம் குவிக்கப்பட்டிருப்பதைக் காணமுடியும். இராணுவ அடக்குமுறைக்கு உள்ளாக்கப்பட்ட இடமாகக் காணப்படுகின்ற வடக்கிலும் கிழக்கிலும் உள்ள அனைத்துப் பாதைகளின் அருகிலும் இராணுவ முகாங்களும் இராணுவச் சின்னங்களும் அமைக்கப்பட்டு, தமிழர்கள் இன்றும் இராணுவக் கெடுபிடிக்குள், திறந்தவெளிச் சிறைச்சாலைக்குள் வாழ்ந்து கொண்டிருக்கின்ற நிலைதான் காணப்படுகின்றது. லித்துவேனியா, கிறீஸ், வெனிசுலா, ரஷ்யா போன்ற நாடுகளில் 1.2 வீதம் - 12 பேருக்கு ஒரு படைவீரன் என்ற விகிதாசாரம்தான் இருக்கின்றது. அதேபோன்று இலங்கையில் 14 பேருக்கு ஒரு படைவீரன் என்ற ratio காணப்படுகின்றது. இது மிகவும் கவனிக்கப்பட வேண்டிய விடயம். யுத்தம் இல்லாத ஒரு நாட்டுக்கு இவ்வளவு படையினர் ஏன்? இந்த வரவு செலவுத்திட்டத்திலே படைகளுக்கான செலவாக 4,218.2 பில்லியன் ரூபாய் எனக் குறிப்பிடப்பட்டிருக்கின்றது. இந்தத் தொகையில் 2,898.1 பில்லியன் ரூபாய் நடைமுறைச் செலவுகளுக்காக - மீண்டெழும் செலவுகளுக்காக வழங்கப்படுகிறது. அந்தச் செலவில் பெரும்பகுதி சம்பளங்களாக வழங்கப்படுகின்றது. இந்தச் சம்பளங்களிலே பெரும்பகுதியை விழுங்கிக்கொள்பவர்கள் இந்தப் படையினராகவே இருக்கிறார்கள்.

இந்த நாட்டிலே 43,000 ஆசிரியர்களுக்கான பற்றாக்குறை காணப்படுவதாகச் சற்று முன்னர் கௌரவ பிரதம அமைச்சர் அவர்கள் சொன்னார். தேசியப் பாடசாலைகளில் கிட்டத்தட்ட 2,000 பேருக்கான வெற்றிடமும், மாகாணப் பாடசாலைகளில் மிகுதி 41,000 பேருக்கான வெற்றிடமும் இருப்பதாக அவர் குறிப்பிட்டிருந்தார். அந்த வகையில், இங்கு கல்வித்துறை பாரிய பற்றாக்குறையோடு இருக்கும்போது, யுத்தம் இல்லாத இந்த நாட்டில் படையினர் குவிக்கப்பட்டிருக்கிறார்கள்; இவர்களுக்கான சம்பளம் வழங்கப்படுகிறது. வடக்கை எடுத்துக்கொண்டால், அங்குள்ள படையினருக்கு இவ்வளவு சம்பளம் வழங்கப்படுகிறது; எத்தனையோ இராணுவ முகாம்களை வைத்திருக்கின்றீர்கள்; இவர்களை வைத்தே வடக்கிலும் கிழக்கிலும் திறந்தவெளிச் சிறைச்சாலையை நடைமுறைப்படுத்துகின்றீர்கள். படையினர் அங்கு தோட்டம் செய்கிறார்கள். பலாலி இராணுவ முகாமைச் சுற்றியுள்ள தோட்டங்களில் படையினரால் உற்பத்தி செய்யப்பட்ட உணவுப் பொருட்கள், மரக்கறி வகைகள் யாழ்ப்பாணத்தில் உள்ள சந்தைகளில் விற்பனைக்கு வருகின்றது. அதேபோல, படையினர் அங்கு 'சலூன்' நடாத்துகிறார்கள். கௌரவ தவிசாளர் அவர்களே, உலகத்தில் பல நாடுகளின் படையினர் 'சலூன்' வைத்திருக்கிறார்கள். அது படையினருக்குரிய சிகையலங்காரத்துக்கானதாகத்தான் இருக்குமே தவிர, அவர்கள் பணம் சம்பாதிப்பதற்கல்ல. ஆனால், மக்களிடம் பணம் அறவிட்டுச் சிகையலங்காரம் செய்யும் 'சலூன்'களைப் படையினர் வைத்திருக்கின்ற நாடு இலங்கையாகத்தான் இருக்க முடியுமென நான் நினைக்கிறேன்.

அதேபோல, உணவகங்களையும் நடாத்துகிறார்கள். பல உணவங்களிலே குறிப்பாக, மக்களுக்கு ஒவ்வாத, பொருத்தமில்லாத உணவுகள் வழங்கப்படுகின்றன. அண்மையிலே நான் யாழ்ப்பாணம், வல்வெட்டித்துறையிலுள்ள எள்ளங்குளம் கிராமத்திற்குச் சென்றிருந்தேன். அந்தக் கிராமத்திலே உள்ள மாவீரர் துயிலும் இல்லத்தில் இருக்கின்ற இராணுவ முகாமிலே ஓர் உணவகம் இருக்கின்றது. மதிய நேரத்தில் அங்கு உணவு வழங்கப்படுகின்றது. அந்த முகாமிலே உள்ள சில இளைஞர்களுக்கு மது பானங்களும் போதைவஸ்துகளும்கூட வழங்கப்படுகின்றன. அந்த உணவகத்திலே சில இளைஞர்கள் மேலாடைகள் எதுவும் இல்லாமல் உள்ளாடையோடு இருந்ததை என்னால் பார்க்க முடிந்தது. ஏன் அந்த நிலைமை? எவ்வளவு மக்கள் அங்கே இருக்கிறார்கள்! எவ்வளவு தனியார் தங்களுடைய தொழில்களைச் செய்கிறார்கள்! ஆனால், இராணுவம் தங்களுடைய முகாமிலே உணவகம் நடாத்தி, தமிழ் இளைஞர்களை இவ்வாறு தவறான வழிக்குக் கொண்டு செல்லுதல் என்பது எவ்வளவு மோசமான காரியம்! தயவுசெய்து சிந்தியுங்கள்! இந்த நாட்டிலே ஒரு பகுதி இனம் திட்டமிட்டு ஏதோவொரு வகையிலே அழிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. தயவுசெய்து இந்த விடயத்திலே அதிகமான கவனம் எடுக்கப்பட வேண்டும்.

நேற்று முன்தினம்கூட ஜெனிவாவிலே எங்களுடைய வெளிநாட்டலுவல்களுக்குப் பொறுப்பான அமைச்சர் விஜித ஹேரத் அவர்கள் உரையாற்றுகின்றபோது, "நாங்கள் உள்நாட்டுப் பொறிமுறையைப் பின்பற்றித் தீர்வைக்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

காண்போம்" என்று சொன்னார். இது கடந்த 15 ஆண்டுகளுக்கும் மேலாக இந்த நாட்டிலே மாறி மாறி வந்த அரசாங்கங்கள் சொல்லிவந்த விடயம். ஆனால், உள்நாட்டுப் பொறிமுறை சம்பந்தமாக 2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் அப்பொழுது வெளிநாட்டலுவல்கள் அமைச்சராக இருந்த மங்கள சமரவீர சொன்னார், "நாங்கள் எல்லாவற்றையும் ஏற்றுக்கொண்டு இந்தப் பிரச்சினைக்கான தீர்வை எட்டுவோம்" என்று. ஆனால், இந்த அரசாங்கம் சென்ற ஆண்டு செப்ரெம்பர் மாதத்திலே "நாங்கள் அதனை ஏற்றுக்கொள்ள மாட்டோம்" என்று சொல்லியிருந்தது. இப்போது நீங்கள் உள்ளகப் பொறிமுறை என்கிறீர்கள்! ஆகவே, இந்த நாட்டிலே தமிழர்களுக்கு நடந்த அநீதி குறித்தும், தமிழர்களுக்கு நடந்த நியாயமற்ற விடயங்கள் குறித்தும் ஆராய்வதென்பது ஒரு நீதியான முறையில் கையாளப்பட முடியாமல் இருக்கின்றது, தடுக்கப்படுகின்றது என்பதைத்தான் இது குறிப்பிடுகின்றது.

இங்கே பாதுகாப்பு அமைச்சுக்காக 2023ஆம் ஆண்டிலே 375 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது; 2024ஆம் ஆண்டில் 425 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது; 2025ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்திலே 437 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இது படிப்படியாகக் கூடிக்கொண்டு செல்கின்றதே தவிர, இந்தத் தொகை குறைக்கப்பட்டதும் இல்லை; பாதுகாப்புப் படைகள் குறைக்கப்பட்டதும் இல்லை. இந்த நாட்டிலே தொடர்ந்தும் யுத்தம் நடைபெறுகின்றதா? இந்த நாடு ஒரு யுத்த சூழலுக்குள் இருக்கின்றதா? அப்படி இல்லையென்றால் ஏன் இவ்வளவு நிதி படைகளுக்காக ஒதுக்கப்பட வேண்டும்?

அதேநேரம் சமூக நலன்புரித் திட்டங்களுக்காக ஒதுக்கப்பட்ட நிதி, 2023ஆம் ஆண்டில் 161 பில்லியன்; அதற்கு 2024இல் 78 பில்லியன்; 2025இலே ஒதுக்கப்பட்டிருப்பது 43 பில்லியன். இது வரவர எவ்வளவு குறைந்திருக்கின்றது! சமூக நலன்புரித் திட்டங்களுக்கான ஒதுக்கீடு குறைந்துகொண்டு செல்கின்ற அதேநேரம், படைகளுக்காக ஒதுக்கப்படுகின்ற நிதி அதிகரித்துக்கொண்டு செல்கின்றது. கௌரவ தவிசாளர் அவர்களே, இந்த நாட்டில் புரையோடிப்போயிருக்கின்ற பிரச்சினையை இனங்கண்டு நீதியான ஒரு விசாரணையை மேற்கொண்டு ஒரு தீர்வை வழங்காமல், இந்த நாட்டிலேயிருக்கின்ற மக்களுடைய எண்ணங்களைப் புரிந்துகொள்ளாமல், தொடர்ந்தும் ஒவ்வொரு வரவு செலவுத்திட்டங்களிலும் யுத்தத்திற்கு ஒதுக்குவதுபோல இவ்வாறு பெருமளவிலே நிதியை ஒதுக்கிக்கொண்டிருந்தால், படையினரைக் காப்பாற்றிக் கொண்டிருந்தால், இந்த நாட்டினுடைய பொருளாதாரத்தை எவ்வாறு நீங்கள் கட்டியெழுப்பப் போகிறீர்கள்? எவ்வாறு நாட்டை முன்னேற்றிச் செல்லப் போகிறீர்கள்?

ஏற்கனவே நான் குறிப்பிட்டேன், இங்கே மூலதனச் செலவினத்திற்காக ஒதுக்கப்பட்டது வெறுமனே 1,320 பில்லியன்தான். நாட்டிலே சரியாக மூலதன முதலீடுகள் இடம்பெறவில்லையென்றால், தொழிற்றுறைகள் இல்லை, வருமானங்கள் இல்லை. முதலீடுகளுக்கு ஊடாக வருமானம் வரவில்லையென்றால், எவ்வாறு நாட்டினுடைய பொருளாதாரத்தை நீங்கள் அபிவிருத்தியடையச் செய்ய முடியும்? இங்கே காட்டப்பட்டுள்ள மொத்தச் செலவின ஒதுக்கீடு 4,218 பில்லியனில் 2,898 பில்லியனை நீங்கள் சம்பளமாக வழங்கப்போகிறீர்கள்; 1,320 பில்லியன்தான் மூலதனச் செலவுக்காக ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆகவே, மூலதனச் செலவினத்திற்கு ஒதுக்கப்பட்ட நிதி மிகமிகக் குறைவு. இந்த நிலைமைகள் மாற்றப்பட வேண்டுமானால், முதலில் இந்த நாட்டிலிருக்கின்றவர்களின் மனநிலைகள் மாற வேண்டும். அவ்வாறு மாறுகின்றபோதுதான் மக்களுக்கான தேவைகளை, அவர்களுடைய எண்ணங்களைப் புரிந்துகொள்ள முடியும்.

யாழ்ப்பாண மாவட்டத்திலே வலிகாமம் வடக்கு பிரதேச செயலாளர் பிரிவில் 13 கிராம அலுவலர் பிரிவுகளிலுள்ள கிட்டத்தட்ட 2,700 ஏக்கர் காணிகள் இப்பொழுதும் இராணுவத்தின் வசம் இருக்கின்றது. 'உயர் பாதுகாப்பு வலயம்' என்ற சொல்லுக்குள் அடக்கப்பட்டு, அந்த இடங்களில் இராணுவம் குவிக்கப்பட்டிருக்கின்றது. அங்கிருந்த மக்கள் இப்பொழுதும் அகதிகளாக இருக்கிறார்கள். அவர்களை அந்த இடங்களிலே குடியேற்றுங்கள் என்று கேட்டால், "நாங்கள் மாற்றுத் திட்டம் பற்றி யோசிக்கிறோம், மாடிகளைக் கட்டுவதைப் பற்றி யோசிக்கிறோம்" என்று மாறி மாறி வருகின்ற அரசுகள் கதை சொல்லுகின்றனவே தவிர, அந்த மக்களுடைய காணிகளை ஏன் இன்னும் விட முடியவில்லை? 1948இல் இலங்கை சுதந்திரம் பெற்றது. அதற்குப் பிற்பாடு, 1983ஆம் மற்றும் 1990ஆம் ஆண்டு காலப்பகுதியில் இடம்பெற்ற மிகப்பெரிய இனக் கலவரங்கள் காரணமாகத் தொடர்ச்சியாக இடம்பெயர்ந்து, சொந்த நாட்டுக்குள்ளேயே அகதிகளாக வாழ்ந்துகொண்டிருக்கின்ற தமிழ் மக்களுடைய நிலங்களை இன்னும் விடுவிப்பதற்கான சரியானதொரு நேர்த்தியான வேலைத்திட்டத்தை எந்த அரசாங்கமும் இதுவரை செய்யவில்லை என்பதுதான் மிகவும் கவலைக்குரியது.

கௌரவ தவிசாளர் அவர்களே, நான் ஒன்றைச் சொல்ல விரும்புகிறேன். அதாவது, வலிகாமம் வடக்கிலே பலாலி விமானப் படைத் தளத்தை விஸ்தீரணம் செய்வதற்கென 1980களிலே அங்கிருந்த மக்களுடைய காணிகள் கபளீகரம் செய்யப்பட்டன; அது சுவீகரிக்கப்பட்டதென்று சொல்லப்பட்டது. அந்தக் காணிகளைப் பறித்தெடுத்தார்கள்; அந்த மக்களை அந்த இடங்களிலிருந்து எழுப்பிக் கலைத்தார்கள். ஆனால், இதுவரை அவர்களுக்கான நட்டஈடு வழங்கப்படவில்லை. தங்களுடைய எத்தனையோ ஏக்கர் காணிகளை இழந்துபோன அந்த மக்கள் தங்களுக்கான நட்டஈடு கிடைக்குமென்று இன்றும் காத்திருக்கிறார்கள். ஆனால், இப்பொழுதும் மீண்டும் அங்கிருக்கின்ற ஓடுபாதையை அகலிக்க வேண்டுமென்பதற்காக மேலும் காணிகளைச் சுவீகரிக்க வேண்டுமென்ற செய்திதான் வெளியிடப்படுகிறது. தயவுசெய்து ஒன்றைப் புரிந்து கொள்ளுங்கள்! நாட்டின் ஒரு பகுதி மக்கள் கண்ணீரோடு வாழுகிறார்கள்; அவர்களுடைய வாழ்க்கையில் சரியான முன்னேற்றங்கள் மேம்படுத்தப்படவில்லை. அவர்களுக்கான நீதி வழங்கப்படாமல், இந்த நாட்டிலே பாதுகாப்பு என்ற போர்வையிலே நீங்கள் இவ்வளவு நிதியை ஒதுக்குவதென்பது ஒரு நீதியான செயற்பாடாக இருக்க முடியாது.

இங்கே கௌரவ பிரதமர் அவர்கள் இருக்கின்றார்; ஏனைய உறுப்பினர்கள் இருக்கின்றீர்கள். கிளிநொச்சி நகரப் பகுதியிலே பல இடங்கள் - 39 சதவீதமான நிலப்பகுதி - இப்பொழுதும் இராணுவத்தின் வசம் இருக்கிறது. கிளிநொச்சி மாவட்டத்தினுடைய நகரப் பகுதிகள் பலவற்றிலே இராணுவம்தான் குடியிருக்கிறது. கிளிநொச்சி மாவட்டச் செயலகத்திற்குள் இருக்கின்ற 2 ஏக்கர் காணியை இராணுவம் வலுக்கட்டாயமாகப் பறித்தெடுத்து முகாம் அமைத்திருக்கிறது. இலங்கையிலே வேறு எங்காவது ஓர் அரச மாவட்டச் செயலகத்திற்குள் இராணுவ முகாம் இருக்கின்றதா? என நான் கேட்கிறேன். அந்த இடங்களிலே உள்ள மக்களின் காணிகள்

இன்னும் அந்த மக்களுக்கு வழங்கப்படவில்லை. அரச காணிகள் அரச நிறுவனங்களுக்கு வழங்கப்படவில்லை. கிளிநொச்சி மகா வித்தியாலய மாணவர்கள் அங்கிருக்கின்ற தங்களுடைய விளையாட்டு மைதானத்திற்குச் செல்வதற்கு, கிட்டத்தட்ட ஒன்றரைக் கிலோ மீற்றர் தூரம் சுற்றிச் செல்கிறார்கள். அதாவது, நூறு மீற்றர் தூரத்தில் நடந்துசெல்லக்கூடிய பாதை கண்ணுக்கு முன்னால் இருக்கின்றபொழுதே, அவர்கள் ஒன்றரைக் கிலோ மீற்றர் தூரம் சுற்றி நடந்து செல்ல வேண்டிய ஒரு நிலைமை இருக்கிறது. அந்த மாவட்டத்தில் மட்டுமல்ல, பல மாவட்டங்களில் தமிழர் வாழுகின்ற பிரதேசங்களில் படையினரை வைத்துக்கொண்டு இதுபோன்ற செயற்பாடுகள் முன்னெடுக்கப்படுகின்றன; பாதுகாப்பு என்ற போர்வையில் இப்படியான செயற்பாடுகள் நடத்தப்படுகின்றன. ஆகவே, தயவுசெய்து இதற்கான ஒரு நீதி கிடைக்க வேண்டும்; அந்த மக்களுடைய நிலங்கள் விடுவிக்கப்பட வேண்டும். அந்த மக்களுடைய நிலங்களை விடுவிக்காமல், பாதுகாப்பு என்ற போர்வையில் தொடர்ந்தும் நீங்கள் இவ்வாறு நிலங்களை அபகரித்துக்கொண்டிருப்பது, இந்த நாட்டை மிக ஆபத்தான ஒரு சூழலுக்குள் கொண்டு செல்கிறது என்பதை நான் இந்த இடத்திலே பதிவிட விரும்புகிறேன்.

அடுத்து, பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரும் இங்கே இருக்கின்றவேளையில் நான் இன்னுமொரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, அண்மைக் காலங்களிலே பலர் விசாரணைக்கு அழைக்கப்படுகிறார்கள். அண்மையில் கிளிநொச்சி மாவட்டத்திலே உள்ள கனகபுரம் மாவீரர் துயிலும் இல்லத்தின் பணிக்குழு பாதுகாப்புக்காக அங்கு ஒரு வேலியை அமைத்திருந்தது உங்களுக்குத் தெரிந்திருக்கும். அந்த வேலியை அமைத்ததற்காக அந்தப் பணிக்குழுவின் செயலாளர் உட்படப் பலர் விசாரணைக்காக அழைக்கப்பட்டிருக்கிறார்கள். அதுபோல, தையிட்டி விகாரையிலே நடைபெற்ற ஒரு போராட்டம் தொடர்பாக 2 ஊடகவியலாளர்கள் உட்பட மதவாதியாக இருக்கின்ற வேலன் சுவாமிகளும், முன்னாள் பாராளுமன்ற உறுப்பினர் செல்வராஜா கஜேந்திரன் அவர்களும்கூட விசாரணைக்கு அழைக்கப்பட்டிருக்கிறார்கள். அங்குள்ள மக்கள் தங்கள் ஜனநாயக உரிமைகளை வெளிப்படுத்த முடியாதளவுக்குப் பாதுகாப்பு என்ற விடயம் எவ்வளவுதூரம் இந்த நாட்டிலே அவர்களைக் கிடுக்குப் பிடிக்குள் வைத்திருக்கின்றது! பாதுகாப்பு என்ற போர்வையில் எவ்வளவுதூரம் அவர்கள் அடக்கப்படுகின்றார்கள்!

மேலும், அண்மைய நாட்களாக பல பாடசாலைகளிலும் இல்ல விளையாட்டுப் போட்டிகள் நடைபெற்று வருகின்றன. ஆனால், சாதாரணமாக அங்குள்ள பாடசாலை மாணவர்கள் தமது இல்ல விளையாட்டுப் போட்டிக்காகத் தங்களுடைய உள்ளத்தில் எழுகின்ற சிந்தனையின் அடிப்படையில் ஒரு கார்த்திகைப் பூவின் வடிவத்தில் ஒரு விளையாட்டு இல்லத்தை அமைக்கக்கூட முடியாமல் இருக்கிறார்கள். கார்த்திகைப் பூ என்பது பாடப் புத்தகங்களில் உள்ள ஒரு விடயம்; அது இலங்கையிலே தடை செய்யப்பட்ட ஒரு விடயம் அல்ல. இருந்தும் அந்தப் பிள்ளைகள் தங்களுடைய பாடப் புத்தகத்திலுள்ளதை அல்லது தங்களுடைய பாரம்பரியமான விடயங்களைத் தங்களுடைய இல்லங்களில் ஒரு சோடனையாக மேற்கொள்ள முடியாதுள்ளது. அவ்வாறு செய்தால், அதற்குப் பொறுப்பான ஆசிரியருக்கு எதிராக விசாரணை! அதிபருக்கு எதிராக விசாரணை! இது அங்கு தொடர்ச்சியாக நடைபெறுகின்றது. இது இலங்கையிலே இல்லாத ஒன்றாக இருந்தால், பாடப் புத்தகங்களில் இல்லாமல் இருந்திருந்தால், தயவுசெய்து நீங்கள் அதைத் தடை செய்யுங்கள்! அப்படியில்லையென்றால் அதை ஏன் தடை செய்ய வேண்டும்? இந்த நாட்டில் என்ன நடைபெறுகின்றது? பாதுகாப்பு என்ற பெயரில் நடைபெறுகின்ற இந்த அநீதிகளுக்கு ஒரு நீதி வேண்டும்.

இந்த நாட்டில் நீங்கள் எல்லோரையும் சகோதரத்துவத்தோடு பார்க்கிறீர்களா? சம உரிமையோடு பார்க்கிறீர்களா? அந்த மக்களுக்கான நீதி வேண்டுமென்று சொல்கிறீர்களா? இறந்தவர்களை நினைவுகூர்ந்து வணக்கம் செலுத்துவதற்கும், அவர்கள் தங்களுடைய மாவீரர் துயிலும் இல்ல இடங்களுக்குள் சென்று துப்புரவு செய்வதற்கும் நிலைமாறுகால நீதிப் பொறிமுறையின் அடிப்படையில் உரிமை இருப்பதாக 2015 செப்ரெம்பரில் இலங்கை அரசாங்கம் மனித உரிமைகள் ஆணையகத்தில் ஏற்றுக் கொண்டது. அந்த அரசாங்கத்தில் இருந்தவர்கள் மாறியிருக்கலாம். ஆனால், இதை இலங்கை அரசாங்கம் ஏற்றுக் கொண்டது. ஆனால், இன்றைக்கும் மாவீரர் துயிலும் இல்லங்களுக்குச் சென்றால், அவர்கள் பொலிஸாரால் விசாரணைக்கு உட்படுத்தப்படுகின்றார்கள்.

கௌரவ தவிசாளர் அவர்களே, இந்த நாட்டிலே நாங்கள் நீண்ட நெடும் யுத்தத்திற்குள் வாழ்ந்த ஓர் இனம். ஒரு காலத்திலே அரசாங்கத்தால் ஏற்படுத்தப்பட்ட பொருளாதாரத் தடையால் தமிழ் மக்கள் எவ்வளவு பாதிக்கப்பட்டார்கள் என்று உங்களுக்குத் தெரியும். இன்றைக்கு இயல்பாக ஏற்பட்ட சர்வதேசப் பொருளாதார நெருக்கடிக்குள் இலங்கை சிக்கித் தத்தளிக்கின்றது. ஆனால், இலங்கையால் விதிக்கப்பட்ட பொருளாதாரத் தடையால் பனங்களியால் உடுப்புத் துவைத்தவர்கள் தமிழர்கள்! அவர்கள் சைக்கிள் சில்லைச் சுற்றி 'மோட்டர்' மூலமாக வானொலிச் செய்திகளைக் கேட்டிருந்தார்கள். அவர்கள் எப்படியெல்லாம் கஷ்ட நிலையில் வாழ்ந்தார்கள் என்று அந்தக் காலத்தை யோசித்துப் பாருங்கள்! அந்தக் காலத்தில் அவர்கள் பெற்றோலைக் கண்டதில்லை; அத்தியாவசிய உணவுப் பொருட்கள்கூட அனுப்பப்படாமல் இருந்தது. மிகப்பெரிய நெருக்கடிகளோடு அவர்கள் வாழ்ந்தார்கள். அந்த நெருக்கடிகளிலிருந்து மீண்டு வந்தவர்கள்தான் தமிழர்கள்! ஆனால், அந்த வடுக்களோடும் நெருக்கடிகளோடும் வாழுகின்றவர்கள் தொடர்ந்தும் படையினரின் ஆக்கிரமிப்புக்குள்ளேயே வாழவேண்டியுள்ளது.

குறிப்பாக, இலங்கையிலே 14 பேருக்கு ஒருவர் என்றளவில் படையினர் இருக்கிறார்கள் என்று நான் சொன்னேன். ஆனால், வடக்கிலும் கிழக்கிலும் 3/4 பகுதி படையினரை நிறுத்திவைத்திருக்கின்ற நிலையில், அங்கு கிட்டத்தட்ட 6 தமிழர்களுக்கு ஒருவர் என்ற அடிப்படையில் படையினர் குவிக்கப்பட்டுள்ளார்கள். முதலிலே இதைக் குறையுங்கள்! படையினர் முன்பள்ளி நடாத்துவதை நிறுத்துங்கள்! 'சலூன்' நடத்துவதை நிறுத்துங்கள்! அங்கு விவசாயத்தை மேற்கொள்கின்ற விவசாயிகளின் தலையிலே மண்ணை அள்ளிப் போடாமல், அவர்களுடைய உற்பத்திகளுக்கு முன்னுரிமை கொடுங்கள்! தயவுசெய்து பாதுகாப்புக்கு ஒதுக்கப்பட்ட நிதியை வைத்துக்கொண்டு, படையினரை வளப்படுத்துவதென்ற பெயரில் மக்களுடைய வாழ்க்கைக்கு நீங்கள் குந்தகம் செய்ய வேண்டாம் என்பதை வலியுறுத்தி, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Major General (Rtd.) Aruna Jayasekera. You have 10 minutes.

[පූ.භා. 11.02]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු සභාපතිතුමනි, 2025 අය වැය කාරක සභා අවස්ථාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගෙන තිබෙන වෙලාවේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. ආරක්ෂක අමාත්‍යාංශයට වැය ශීර්ෂ 7ක් යටතේ මුදල් වෙන් කිරීම සිද්ධ කරලා තිබෙනවා. ඒකට අරමුදල් දෙකක් අයිති වෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයට ත්‍රිවිධ හමුදාව සමඟ තව ආයතන රාශියක් තිබෙනවා. මම ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරන්න ප්‍රථම කෙටියෙන් හැඳින්වීමක් කරන්න බලාපොරොත්තු වෙනවා, ආරක්ෂක අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන විෂය පථයන් සමඟ ඒ තිබෙන ආයතනවල කාර්යභාරය සහ වැදගත්කම පිළිබඳව.

ඇත්තටම රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට අපි පත් වෙන්න කලින් තිබුණු තත්ත්වය ගැන අප ඔබ සියලු දෙනාම ඉතාම හොඳින් දන්නවා. පුනරුද දැක්මකින් බලාපොරොත්තු රාශියක් ඇතුව සමස්ත සමාජීය පරිවර්තනයක් තුළින් මහජන හිතෛෂී ආණ්ඩුවක් අපි පත් කර ගත්තා. අපි දැන් ඉන්නේ මහජනයාගේ යහපත් අරමුණු සහ බලාපොරොත්තු ඉෂ්ට කිරීම සඳහා දැවැන්ත මහජන මැදිහත්වීමකින් රට ගොඩනැඟීමටයි. අපි ජාති භේදයකින් තොරව උතුරු, නැඟෙනහිර, කඳුකරයේ සහ සමස්ත ජනතාවගේම මැදිහත්වීමකින් තමයි මේ රට ගොඩනැඟීමේ ව්‍යාපාරයට අවතීර්ණ වෙලා තිබෙන්නේ.

අපට විශාල ජන බලයක් ලැබුණා. එහි කියැවීමේ තිබෙන්නේ සමස්ත ජනතාවගේම බලාපොරොත්තුව. ඒ බලාපොරොත්තු සමඟ, එහෙම නැත්නම් ජන මතයත් සමඟ අපට විහිළු කරන්න බැහැ. අපි බැඳී සිටිනවා, ඒ වගකීම් සියල්ලක්ම ඉෂ්ට කරන්න. ඒ නිසා ඉතාම පැහැදිලිව, සාධාරණව ඒ බලාපොරොත්තු සැලකිල්ලට අරගෙන, කරුණු කාරණා ඉතාම හොඳට අවබෝධ කරගෙන, අධ්‍යයනය කරලා තමයි මේ අය වැය යෝජනා රජයක් හැටියට අපේ ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළේ. ඉතින් ඒ ඇති වූ යහපත් සමාජ පරිවර්තනයෙන් හොඳ දේශපාලන පරිවර්තනයක්, ආරම්භයක් අපි අරගෙන දුන්නා. ඒකෙන් මහා ප්‍රසාදයක් අපට ලැබුණා, දේශීය වශයෙන් විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත්.

රට තුළ පැවැති ඒ දැවැන්ත ආර්ථික අර්බුදය හමුවේ අපි දේශපාලන පරිවර්තනයක් ලබා ගත්තාට සැලකිය යුතු ආර්ථික පරිවර්තනයක් අපට ලැබුණේ නැහැ. ඒ බව අපි සියලුදෙනාම දන්නවා. එහෙම වෙන්න හේතුව තමයි, ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන්, දේශපාලනමය වශයෙන් සමස්ත පද්ධතියේම සිදු වී තිබූ කඩා වැටීම. ගරු සභාපතිතුමනි, it is not only an economic and a political crisis, but also a crisis of collapsed democracy, governance and moral values. ඒ සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් අපට තිබෙනවා. ඒ අනුව තමයි ඒ කරුණු සැලකිල්ලට ගෙන අපි මේ මහා ජන බලවේගයත් සමඟ ඉදිරියට යමින් ඉන්නේ. මහ ජනයාට වග කියන රජයක් හැටියට පසුගිය කාලයේ දේශපාලකයන් විසින් භුක්ති විඳින ලද සැප පහසුකම් සියල්ල අත් හැර දාලා, වරප්‍රසාද ඉවත් කරලා කටයුතු කිරීම අපි ආරම්භ කර තිබෙනවා. එය මේ අය වැයෙන් ඉතා පැහැදිලි ලෙස අර්ථකථනය කර තිබෙනවා.

මමත් මේ ව්‍යාපාරයට සම්බන්ධ වන්නේ, පසුගිය වකවානුවල රටේ ඇති වෙච්ච මහා ජාතික අර්බුදය හමුවේයි. රණවිරු ප්‍රජාව හමුදාවල සේවය කරලා මේ දැය වෙනුවෙන් මහත් කැප කිරීමක් කරපු මහා ප්‍රජාවක්. මීට දශක ගණනකට පෙරත් අපි ඉදිරිපත් වුණා, රට මුහුණ දීපු ඒ මහා අර්බුදයෙන් රට ගොඩ ගන්න. මේ අර්බුදයේදීත් අපට බලාගෙන ඉන්න බැරි වුණා. වග කියන, වග විය යුතු පුරවැසියන් හැටියට අපි නැවතත් ඉදිරිපත් වුණා, මේ අර්බුදයෙන් රට ගොඩ ගන්න. ඒ නිසා තමයි සමස්ත විශ්‍රාමික රණවිරු ප්‍රජාවක් හැටියට අප ඉදිරිපත් වුණේ.

What has happened to our country? Hon. Chairman, the rulers made it economically bankrupt and allowed it to be infested with massives crimes. The rule of law had been completely collapsed when we came to power and even before that. The Judiciary had been badly challenged by the Executive. Suspicion, anger and mistrust grew among the communities, including in the North and the East or whatever we may call it. There was no food and medicine in hospitals. Bad policies led the State to severe corruption. The worst that could happen to a country had happened.

ඒ හේතුව නිසා තමයි අපි ඉදිරිපත් වුණේ. අද දින අය වැය කාරක සභා අවස්ථාවේදී සලකා බැලෙන අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් විශේෂයෙන් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් ද ඇතුළුව මහ ජනයාගෙන් වැඩි පිරිසක් හිතන දෙයක් තිබෙනවා. මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මුදල් වෙන් කරද්දී වැඩි දෙනෙකු හිතන්නේ මහා විශාල මුදලක් යුද්ධ, ගුවන්, නාවික යන ත්‍රිවිධ හමුදාවට පමණක් වෙන් කරනවා කියලායි. එහෙම නොවෙයි. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ආයතන 25ක් තිබෙනවා. යුද්ධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, රාජ්‍ය බුද්ධි සේවාව, මේ රට වෙනුවෙන් විශාල මෙහෙවරක් කරපු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ජාතික ශිෂ්‍ය හට බලකාය, රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, ආරක්ෂක සේවා විද්‍යාලය, ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය, ජාතික ආරක්ෂක විද්‍යාලය - we call it the National Defence College - රක්නා ආරක්ෂක ලංකා සමාගම, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යනු ඒවායෙන් කිහිපයක්. ශ්‍රී ලංකාව ආපදාවන්ට බහුලව මුහුණ දෙන රටක් වන නිසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවා තිබෙනවා; ආපදා කළමනාකරණ යන්ත්‍රණයක් ද තිබෙනවා. ඒ යටතේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ව්‍යසන කළමනාකරණ සඳහා වන ජාතික සභාව, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය යනාදී වශයෙන් ආයතන 25කින් සමන්විතයි, ගරු සභාපතිතුමනි. ඒ නිසා තමයි විශාල වැය ශීර්ෂයක් එම අමාත්‍යාංශයට වෙන් වන්නේ.

සාමාන්‍යයෙන් රටේ යම්කිසි කලබලයක් ඇති වුණාම, අර්බුදයක් ඇති වුණාම, අවිනිශ්චිතතාවක් ඇති වුණාම ඊළඟට ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද, අප ආරක්ෂිතද කියලා සෑම පුරවැසියෙක්ම ඇස් යොමු කරන්නේ, ත්‍රිවිධ හමුදාව දිහාවටයි. අපි දන්නවා, මීට දශක කීපයකට උඩදී අපේ රට මහා අර්බුදයකට මුහුණ දුන් බව. රණවිරු ප්‍රජාව ඒ වෙනුවෙන් විශාල කැප කිරීමක් කළා.

රණවිරුවෝ සුනාමි ව්‍යසනයේදීත් මහා දායකත්වයක් දැක්වූවා. කොවිඩ් වසංගතය වෙලාවේදීත් ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බලඇණිය විශේෂ වැඩකටයුතු රාශියක් කළා. පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වූ අවස්ථාවේ වාගේම රටෙහි ඇති වූ ආර්ථික අර්බුදය හමුවේත් මහ ජනයා වෙනුවෙන්

විශේෂිත වූ දායකත්වයක් දැක්වූවා. රණ විරුවන් වෙනුවෙන්, ආබාධිත රණ විරුවන් වෙනුවෙන්, මිය ගිය හා අතුරුදහන් වූවන්ගේ පවුල්වල සියලු දෙනා වෙනුවෙන් කළ සේවයට ගරු ජනාධිපතිතුමාට -ආරක්ෂක අමාත්‍යතුමාට- මම මගේ ප්‍රණාමය විශේෂයෙන් පුද කරනවා.

උතුරු පළාත නියෝජනය කරන අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කරුණු ඉදිරිපත් කළා, උතුරු, නැගෙනහිර කඳවුරු සහ ඉඩම් අපේ ආරක්ෂක හමුදාව විසින් පාවිච්චි කිරීම සම්බන්ධයෙන්. පසු ගිය සතියේ අදාළ අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේදීත් මේ සම්බන්ධව කථා කළා. අපි විශේෂ වැඩ පිළිවෙළක් ඉදිරියේදී යොදා ගෙන තිබෙනවා, ඒ අත්‍යවශ්‍ය ඉඩම් පමණක් තියා නිදහස් කිරීම් කරන්න. ඒ වාගේම, අවුරුදු ගණනක් වහලා තිබුණු පලාලි - අච්චුවේලි පාර අපි විවෘත කළා අවුරුදු 35කට පසුව. එක කලේ මේ රජය පත් වුණාට පසුවයි. ඒ වාගේම පලාලි ගුවන් පථය සංවර්ධනය කිරීම පිළිබඳවත්, ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීම පිළිබඳවත් ඉදිරියේ දී කටයුතු කරන්න අපි සැලසුම් කර තිබෙනවා.

කිලිනොච්චිය මහා විද්‍යාලය ගැනත් මම කියන්න ඕනෑ. කිලිනොච්චිය Primary School එකේයි, High School එකේයි දෙකේම ඉන්නවා, ළමයි 3,400ක් විතර. පසුගිය සතියේදී විදුහල්පතිතුමා සහ පාසල් සංවර්ධන සමිතියේ සභාපතිතුමා ඇවිල්ලා මාව හමු වුණා. එම ක්‍රීඩා පිටියට කිලෝමීටර එකහමාරක දුරක යන්න තිබෙනවා. ඒ ළමයින්ට පහසු වන විධියට, එහි ක්‍රීඩා කරන්න පුළුවන් වන විධියට අපි හෙට අනිද්දාම වැඩකටයුතු සලස්වනවා. ඒ ගැනත් දැනුම් දෙනවා.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ 317,000ක් හට පිරිස් උතුරු නැගෙනහිර නැහැ. සමස්ත ත්‍රිවිධ හමුදාවේම දැනට ඉන්නේ ලක්ෂ 2කට වඩා අඩු ප්‍රමාණයක්. සුළු ප්‍රමාණයක් තමයි දැනට ඉන්නේ. මොකද, ලංකාව පුරා ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව, පොලිසිය, සිවිල් ආරක්ෂක බලඇණි සහ අනෙකුත් සියලු ආයතන අපි ස්ථානගත කර තිබෙනවා.

ජාතික ආරක්ෂාව වෙනුවෙන් මහඟු සේවයක් කරන ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලඇණි සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන සඳහා මුදල් වෙන් කිරීම සාධාරණීකරණය කරන්න අපි කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම අපිත් එක්ක සිටින අනෙකුත් මන්ත්‍රීවරුනුත් ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනවා. ඒ වාගේම අද දිනය අවසාන වීමට ප්‍රථම තවත් කරුණු ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබෙන බවත් පවසමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chamara Sampath Dasanayake. You have 17 minutes.

[පූ.භා. 11.12]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, ආරක්ෂක අමාත්‍යාංශයත්, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයත් කියන්නේ, මේ දිනවල කථා බහට ලක් වන අමාත්‍යාංශ දෙකක්. ඒ අමාත්‍යාංශවලට අදාළ වැය ශීර්ෂ ගැනයි අද මේ කථා කරන්නේ.

පළමුවෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. රටේ ජනාධිපතිතුමාත්, ඇමතිවරුත් නිතර දෙවේලේ කියනවා, මහජන ආරක්ෂාවට කිසිම බාධාවක් නැහැ, පාතාලයේ අය අතරයි ගැටුමක් තිබෙන්නේ කියලා. මේක පිළිගන්න බැහැ. මොකද, උස්වැටකෙයියාව මුහුදු වෙරළේදී පුද්ගලයෙකු දණ ගස්වා මැරුවා; උසාවියේදී නඩුකාරතුමිය ඉදිරිපිටදී ම පුද්ගලයෙකුට වෙඩි තැබුවා; ඊට අමතරව, ළමයි දෙදෙනායි, තාත්තායි එක විට මරා දැමුවා. මේවා මහජන ආරක්ෂාවට බාධාවක් නොවෙයි කියලා කියනවා නම්, විහිළුවක්. මොකද, අද සංචාරකයන්ගෙන් තමයි ඔබතුමන්ලායි, අපයි දෙගොල්ලන්ම යැපෙන්නේ. 2022 අවුරුද්දේදී අන්තිම සුද්දාත් මේ රට දාලා ගියා. ඒක හොඳට මතක තබා ගන්න. දැන් නැවත සංචාරක ව්‍යාපාරය පණ ගැන්විලා තිබෙනවා. සංචාරකයන්ට මේ සිදුවීම්වල වීඩියෝ ගිහිල්ලා තිබෙනවා. ලෝකයා වෙත ඒවා යනවා. ඒ අය එම දර්ශන බලනවා. ඒවා බැලුවාම අවසානයේදී වෙන්නේ, සුද්දෝ නැත්නම් සංචාරකයෝ ලංකාවට එන එක නතර වන එකයි. මේක රටේ මහජන ආරක්ෂාවට බාධාවක් නොවෙයි කියලා හිතන්න එපා. රටේ සෑම දෙයකටම බාධාවක් වෙනවා, මෙහෙම තැන් තැන්වල මිනී මරන්න ගියොත්. ඒ නිසා මේක විහිළුවට ගන්න එපා, සුළුවට ගන්න එපා.

මීට සුළු මොහොතකට කලින් කථා කළ මගේ පළාතේ සහෝදර නියෝජ්‍ය ඇමතිතුමා කිව්වේ මොකක්ද? ඒ සිදුවීම් විහිළුවකට ගණන් ගන්න බැහැ. මේ ආණ්ඩුව ගන්න කලින් කිව්වේ, ටියුෂන් දෙනවා, පෝය දෙකෙන් පාතාලය ඉවර කරනවා, ඒක කරන හැටි කියලා දෙන්න desk එකකුයි, පුටුවකුයි අරගෙන එන්න කියලායි. Desk එකයි, පුටුවයි අරගෙන එතුමා ළඟට නොවෙයි අපට දැන් යන්න වෙලා තිබෙන්නේ, ඉෂාරා සෙව්වන්දි ළඟටයි. ගේම දීලා දවස් ගණනක් -දවස් 10ක්- වෙනවා. ඉෂාරා සෙව්වන්දි ඉන්න තැනක්වත් අපට සොයා ගන්න බැරි වුණා. ඇය ඉන්න තැනක් දන්නේත් නැහැ. හරි නම් ගිහිල්ලා ඉෂාරා සෙව්වන්දිගෙන් තමයි අපට ටියුෂන් ගන්න වෙන්නේ. ඒක තමයි ඇත්ත කථාව.

පොලීසිය භාර ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, පොලිස් නිලධාරීන් පිළිබඳව. ඔබතුමා පොලීසියේ සිටියා කියලා මම අහලා තිබෙනවා. නමුත්, මම ඒක හරියටම දන්නේ නැහැ. පොලිස් නිලධාරීන්ට arduous duty allowance එක, batta එක ලැබුණා. 2015දී පොලිස් නිලධාරීන්ට සියයට 40ක දීමනාව දෙන්න හේතුව මේකයි. Army එකේ rank එකට සමානව පොලිස් නිලධාරීන්ගේ වැටුප හදා ගන්න ඕනෑ නිසා තමයි 2015දී එන්.කේ. ඉලංගකෝන් පොලිස්පතිතුමා ඒ නිලයට ගැළපෙන විධියට වැටුපට සියයට 40ක දීමනාවක් දුන්නේ. හැබැයි, ඒ සියයට 40 දීමනාවත් එක්ක තමයි හමුදා සොල්දාදුවෙකුගේ, හමුදාවේ මේජර් කෙනෙකුගේ, හමුදාවේ කැප්ටන් කෙනෙකුගේ, පොලීසියේ CI කෙනෙකුගේ, SI කෙනෙකුගේ, ASP කෙනෙකුගේ, පොලීසියේ SP කෙනෙකුගේ වැටුප සමාන කළේ. ඒක ඔබතුමා පිළිගන්න. Arduous duty allowance කලින් ආපු ඒවා නේ.

මම මේ වෙලාවේ මේ කාරණයත් මේ ගරු සභාවට කියන්න ඕනෑ. වැටුප වැඩි වෙලා නැහැ, ගරු ඇමතිතුමා. වැටුප වැඩි වෙලා තිබෙනවා නම් බොහොම හොඳයි. සියයට 40 එකතු වෙලා නැහැ. සියයට 22යි එකතු වෙලා තිබෙන්නේ. පොලිස් නිලධාරීන්ට සියයට 22 හොඳයි පෙන්ෂන් යන කොට. පෙන්ෂන් යන්න කලින් දැන් සේවයේ ඉන්න කොට කාලා බීලා ඉන්න ඕනෑ. පෙන්ෂන් ගිහිල්ලා කාලා බීලා ඉඳලා වැඩක් නැහැ. සේවයේ ඉන්න කොට කන්න බොන්න දෙන්න ඕනෑ. සියයට 22 එකතු වුණොත් මූලික වැටුපට සියයට 18ක් එකතු වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒ ගැන ඔබතුමා හොඳට සොයා බලන්න. ඔබතුමා head; ඔබතුමා ජනාධිපතිතුමාගේ දෙවැනියා. අගමැතිතුමිය තමයි රටේ දෙවැනි

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

පුරවැසියා. නමුත් මා හිතන්නේ, දැන් ඔබතුමා දෙවැනියා කියලායි. මොකද, හැම තැනටම අරගෙන යන්නේ, හැම කෙනාම තනතුරු දෙන්නේ ඔබතුමාට. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. උත්තරය මට පසුව දෙන්න, ගරු ඇමතිතුමා. පොලිස් නිලධාරින්ට දීමනාව දෙනවා නම් මම සතුටු වෙනවා. මොකද, බොරු පැමිණිලි හරි හදලා අපව ඇතුළට දාන්න ඉන්නේ CID එක නේ. CID එක, STF එක වාගේම පොලීසිය ලොකු වැඩක් කරනවා නේ, ඔබතුමන්ලා වෙනුවෙන්.

ඒ නිසා පොලීසිය තියාගන්න. පොලීසියට දීමනා දීලා පොලීසිය තියා ගන්න. මොකද, ඒ ගොල්ලන්ගෙන් නේ වැඩේ කරගන්න වෙන්නේ ඉස්සරහට. ඒ නිසා පොලීසිය- *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමා, ඔබතුමායි මමයි එක කාලයේ. ඒක ගැන අපි දෙන්නා පස්සේ එළියේදී කථා කරමු. බැඳිව්ව කාලෙයි- *[බාධා කිරීමක්]* උත්තරේ දෙන්න ඔබතුමා. වැටුප් වැඩි කරනවා නම් උත්තරේ දෙන්න.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
වැඩි කරනවා. දැන් දෙන්නම් උත්තරේ. ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි. දැනට මූලික වැටුප,-

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මගේ වෙලාවෙන් ගන්න බැහැ.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
හරි, හරි.

දැනට පොලිස් කොස්තාපල්වරයෙකුගේ මූලික වැටුප රුපියල් 29,540යි. ඒක මේ අවුරුද්දේ රුපියල් 44,293ක් වෙනවා. ඒ අනුව පොලිස් කොස්තාපල්වරයෙකුට මේ අවුරුද්දේ වැඩි වෙනවා, රුපියල් 6,182ක්. පොලිස් සාජන්වරයෙකුට රුපියල් 6,441.54ක්, SI කෙනෙකුට රුපියල් 6,551.72ක්, IP කෙනෙකුට රුපියල් 7,040.24ක්, CI කෙනෙකුට රුපියල් 7,655.75ක්, ASP කෙනෙකුට රුපියල් 8,244.11ක්, SSP කෙනෙකුට රුපියල් 9,925ක්, DIG, Senior DIG කෙනෙකුට රුපියල් 11,118ක්, IGPට රුපියල් 13,223ක් වැඩි වෙනවා. ඊට අමතරව දැනට රුපියල් 29,540ක් වන පොලිස් කොස්තාපල්වරයෙකුගේ මූලික වැටුප 2025දී -මේ අවුරුද්දේදී- රුපියල් 44,293ක් වෙනවා; 2026දී රුපියල් 46,92ක් වෙනවා; 2027දී රුපියල් 49,550ක් වෙනවා. එතකොට අද රුපියල් 29,540ක මූලික වැටුපක් ලබන කෙනෙකුට චාමර දසනායක මන්ත්‍රීතුමනි, 2027 වෙනකොට රුපියල් 49,550ක මූලික වැටුපක් ලැබෙනවා. ඒ වාගේම ඒකට අදාළව අනෙකුත් දීමනාත් වැඩි වෙනවා. ඊට අමතරව ඔබතුමා යම් කාරණයක් මතු කරන්න උත්සාහ කළා. අපි දැනට සාකච්ඡාවක නිරත වෙලා ඉන්නවා, පොලිස් සේවයට වෙනම වැටුප් ව්‍යුහයක් සකස් කරන්න. එතකොට බොහෝ දේවල් කරගන්න පුළුවන්. ඔබතුමා කිව්වා වැටුප් වැඩි වෙලා නැහැ කියලා. ඒක වැරදියි.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම වැරදි දෙයක් කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. පොලීසිය භාර ඇමතිතුමා, දැන් ඔබතුමාට වෙලාව දුන්නා. මම පාඩුවේ අහගෙනත් හිටියා. මම වැරදි මතයක් නොවෙයි ඉදිරිපත් කළේ. අය වැය ඉදිරිපත් කරපු වෙලාවේ මම කිව්වා, රෝහල් සේවකයන් එළියට බහිනවා කියලා; පළමුවැනි දවසේම මම කිව්වා. රෝහල් සේවකයන් එළියට බැස්සා. වෛද්‍යවරු එළියට බැස්සා, nurseලා එළියට බැස්සා. මම පළමුවැනි දවසේම කිව්වා, එහෙම එකක් වෙනවාය කියලා. ඒ වාගේම ඔබතුමා මේ වැටුප් දෙනවා නම් පොලීසිය වැඩ කරයි. හැබැයි මම පොලිසියේ අයටත් කියනවා, ඇමතිතුමා මෙන්න මේ විධියට කිව්වා, මෙච්චරක් වැඩි වෙනවා, ඒ නිසා අප්‍රේල් මාසයේ වැටුප ගත්තාට පස්සේ මෙන්න මෙච්චරයි වැඩි වුණේ කියලා අපට පොඩ්ඩක් කියන්න කියලා. පොලිස් නිලධාරින් අපට කියයි. ඒ නිසා ඔබතුමා හොඳට දුන්නොත් හොඳට වැඩ කරයි. ඒගොල්ලන් හිතේ සතුට තියාගෙන වැඩ කරයි. අඩුවෙන් දුන්නොත් පොඩ්ඩක් පස්ස ගහයි. ඒකත් ඔබතුමා බලාගන්න. ඒක දැන් ඉවරයි.

ඊළඟ කාරණය තමයි අපේ අතිගරු ජනාධිපතිතුමා- "අපේ අතිගරු ජනාධිපතිතුමා" කියලා මම කියන්නේ. මොකද, රටේ ජනාධිපති. අපේ අතිගරු ජනාධිපතිතුමා 2025 අය වැය පොත ඉදිරිපත් කළා. ඉදිරිපත් කරලා ලස්සනට කිව්වේ කොහොමද? එතුමා 2022 ආර්ථික අර්බුදයෙන් කථාව පටන් ගත්තා. ඊට පස්සේ 2024 සැප්තැම්බර් 21වැනි දායින් පස්සේ ආයෙත් කථාව පටන් ගත්තා. එතකොට, මේ 2025 අය වැය පොතේ හැටියට අවුරුදු දෙකක් කවුරුවත් මේ රට පාලනය කරලා නැහැ. ඒ අවුරුදු දෙක කවුද දන්නේ නැහැ, මේ රට පාලනය කළේ. ඒ මොනවත් කතන්දර මේ පොතේ නැහැ. ඒක තමයි කතන්දරය. මොකක්ද කතන්දරේ? ආර්ථික අර්බුදය ආවා. ආර්ථික අර්බුදයේදී රට වැටුණා. වැටුණු තැන ගැන කිව්වා. ඊට පස්සේ 2024 සැප්තැම්බර් 21වැනි දා ජනාධිපතිතුමා ජයග්‍රහණය කරපු දවසේ ඉඳලා ආයෙත් කිව්වා. එතකොට මේ පොතේ හැටියට කලින් අවුරුදු දෙකේදී කවුරුවත් මේ රට කරලාත් නැහැ, සියඹලා ගෙනැල්ලාත් නැහැ, මේ රටේ කවුරුවත් ඉඳලාත් නැහැ. මම කියන්නම්. 2022දී රනිල් වික්‍රමසිංහ මහත්මයා රට භාර අරගෙන 2024 සැප්තැම්බර් 21වැනි දා -පැරදිව්ව දවසේ රු 12 වෙනකොට පරාදයි. රු 12 වෙනකොට ප්‍රතිඵල ටික ටික නිකුත් වුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයා සැප්තැම්බර් 21වැනි දා රු 12ට පරාදයි. පරාද වෙනකොට ඩොලර් එක රුපියල් 305යි. රනිල් වික්‍රමසිංහ මහත්මයා සැප්තැම්බර් 21වැනි දා පරාද වෙනකොට ඩොලර් එක රුපියල් 305යි. අද? අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා රට භාර ගත්තාට පස්සේ අද ඩොලර් එක රුපියල් 300යි. අපි සතුටු වෙනවා, එදාට වඩා රුපියල් 5ක් අඩුවෙන් රුපියල් 300ට ඩොලර් එක තියාගෙන ඉන්න එක ගැන. *[බාධා කිරීමක්]* ඉන්න පොඩ්ඩක්. ඩොලර් එක රුපියල් 300ට තියාගෙන ඉන්නවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා පැරදිව්ව දවසේ රුපියල් 305යි, අද රුපියල් 300යි. ඒක මම පිළිගන්නවා. එතකොට අද රටේ මහ බැංකුවේ විදේශ සංචිතවල තත්ත්වය කොහොමද?

රනිල් වික්‍රමසිංහ පැරදුණු දවසේ -21වැනි දා- මහ බැංකුවේ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6යි; මහ බැංකු වාර්තාවට අනුව ඇමෙරිකානු ඩොලර් බිලියන 6යි. අද එය ඩොලර් බිලියන 5.7ට බැහැලා. ඩොලර් බිලියන දශම 3ක් අඩුයි. අද check කරලා බලන්න, ඔබතුමන්ලා ඩොලර් බිලියන දශම 3ක් අඩු කරගෙන තිබෙනවා. හැබැයි, අද රුපියල් 300ක් විධියට තිබෙන ඩොලර් එක, ඒ කියන්නේ රනිල් වික්‍රමසිංහ පැරදුණු දවසේ රුපියල් 305ක්ව තිබුණු ඩොලර් එක, 2025 අප්‍රේල් මාසයේ 10වන දා වෙනකොට රුපියල් 307ට යනවා. මම චාමර සම්පත්. මම මෙතැනදී කියන්නේ, එදාට ඩොලර් එක රුපියල් 310 පණිනවා. ඔබතුමන්ලා ලියලා තියාගෙන අප්‍රේල් මාසයේ 10වැනි දා පාර්ලිමේන්තු රැස්වීම් තිබුණොත් මගෙන් අහන්න, ඩොලර් එක රුපියල් 310ට යනවා. ඩොලර් බිලියන 5.7ක් විධියට තිබෙන විදේශ සංචිත ප්‍රමාණය තව මාස දෙකක් යනකොට ඩොලර්

බිලියන දෙකකින්වත් අඩු වෙනවා, අඩු වෙනවාමයි. ඔබතුමන්ලා මේ අය වැය ලේඛනය හරහා මහා ලොකුවට කයිවාරු ගහලා බොරු කිව්වාට කමක් නැහැ, අනිත් මිනිස්සු කරපු දේවල් ගැනත් කියන්න. රනිල් වික්‍රමසිංහ අවුරුදු 2ක් මොනවත්ම කළේ නැති විධියට කථා කරන්න එපා. මහ බැංකුවෙන් හරියටම තොරතුරු අරගෙන ඩොලර් එක තිබුණු ගණන, විදේශ සංචිත තිබුණු ගණන ගැන තර්කානුකූලවයි මම මේ කථා කරන්නේ. ඒක නිසා ඒවා අමතක කරලා කථා කරන්න එපා.

ඊළඟ කාරණය විධියට අපි පොලීසිය ගනිමුකෝ. පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ පොලිස් ස්ථාන අලුතින් දමාගෙන, දමාගෙන ගියා. පොලීසිය භාර ඇමතිතුමනි, දැන් ඒ පොලිස් ස්ථාන ඔක්කෝම තිබෙන්නේ කුලියට ගත් තැන්වල. බදුල්ල දිස්ත්‍රික්කයේ අලුතින් ස්ථාපිත කරපු පොලීසි 12ක් තිබෙනවා. හැබැයි, රජයේ ගොඩනැඟිලි නැහැ, කුලියට ඉන්නේ. එක පොලිස් ස්ථානයකටවත් ගොඩනැඟිල්ලක් නැහැ. එකකට රුපියල් ලක්ෂය ගණනේ කුලිය ගෙවනවා. එක එක තැන්වලට රුපියල් ලක්ෂය, රුපියල් 75,000 වාගේ කුලී මුදල් ගෙවලා තමයි පොලිස් ස්ථාන පවත්වාගෙන යන්නේ. බදුල්ල දිස්ත්‍රික්කයේ ඒ අලුත් පොලිස් ස්ථාන ටික මම කියාගෙන යන්නම්. අඹගස්දෝව, ලියන්ගහවෙල, හල්දුම්මුල්ල, කන්දෙගෙදර, කහටරුප්ප, බෝගහකුඹුර, කැප්පෙටිපොල, ගලඋඩ, අරාව, මහියංගනය. මේවා අලුතින් දමාගෙන, දමාගෙන ගිය පොලිස් ස්ථාන. හැබැයි, දැන් ඒවා අමාරුවෙන් තමයි පවත්වාගෙන යන්නේ. ඒවාට අය වැයෙන් ශත 50ක් වෙන් කරලා නැහැ. ඒක නිසා මේවා ගැනත් බලන්න. කුලියට ගත් තැන්වල පවත්වාගෙන යන නිසා ඒ පොලිස් ස්ථාන අන්තිම අමාරුවේ වැටිලා තිබෙන්නේ. මම මේ වෙලාවේ ඒකත් කියන්න ඕනෑ.

ඒ වාගේම, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" හදන්න රුපියල් මිලියන 300යි. මිලියන 300න් රටකට පොහොසත් වෙන්න පුළුවන්ද අනේ? ඒකට රුපියල් මිලියන 300ක් වෙන් කරනවා කියලා මේ අය වැය පොතේ තිබෙනවා. මිලියන 300න් කොහොමද අනේ පොහොසත් රටක් හදන්නේ? ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පොතේ 40වැනි පිටුව බලන්න. ඒකට රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. මිලියන 300න් පොහොසත් රටක් හදන්න පුළුවන්ද? එක දිනයක් වෙන් කරගෙන, ඒ දිනයේදී දැනුවත් කිරීමේ වැඩසටහන්, අරවා මේවා කරන්න රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. ඒක මේ පොතේ තිබෙනවා. මිලියන 300න් පොහොසත් රටක් හදන්න බැහැ, ගරු ඇමතිතුමා. ඒක පිළිගන්න. මිලියන 300න් හැරෙන්නවත් බැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒකට කීයක් යයිද?

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
කීයක් යයිද කියලා හරියට ඇස්තමේන්තු හදලා ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාට කියවන්න කියන්න. "පොහොසත් රටක්" කියලා දාලා තිබෙනවා නම්, ඒ සඳහා කීයක් යනවාද කියලා හරියට ඇස්තමේන්තු කරලා කියන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
"ශ්‍රී ලාංකික දිනය" කියලා දිනයක් වෙන් කරලා, ඒ දිනය සඳහා තමයි රුපියල් මිලියන 300 වෙන් කරලා තිබෙන්නේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ශ්‍රී ලංකා දිනයටද, මොන දිනයටද කියලා අපි දන්නේ නැහැ. රුපියල් මිලියන 300කින් පොහොසත් රටක් කරන්න බැහැ. අගමැතිතුමිය ඊයේ ලැයිස්තුවක් කියෙව්වා, හිටපු ජනාධිපතිවරුන්ගේ විදේශ ගමන් වියදම් ගැන. වර්තමාන ජනාධිපතිතුමා රුපියල් මිලියන 1.8කට 11දෙනෙකුත් එක්ක රටවල් තුනකට ගියා ලු. හැබැයි ගරු අගමැතිතුමියනි, භාගෙ ටිකට්වලින්ද දන්නේ නැහැ ගියේ? මොකද, රුපියල් මිලියන 1.8යි කියන්නේ ලක්ෂ 18යි. ලක්ෂ 18කින් 11දෙනෙකුට යන්න බැහැ. ජනාධිපතිතුමා පොඩ්ඩක් පොඩියි, කොටයි නිසා භාගෙ ටිකට් කඩනවාද දන්නේ නැහැ. මට නම් භාගෙ ටිකට් එකකින් යන්න බැහැ, මම මහත වැඩියි නේ. ජනාධිපතිවරයා ඇතුළු 11දෙනෙක් රුපියල් මිලියන 1.8කින් චීනයටයි, ඉන්දියාවටයි, ඩුබායිවලටයි ගිය විධිය අපට කියන්න. එච්චර ලාබෙට යන්න පුළුවන් නම්, විපක්ෂයේ මන්ත්‍රීවරු ඔක්කෝම කට්ටිය එකතුවෙලා අපි යමු. රුපියල් මිලියන 1.8කින් රටවල් තුනකට යන්න පුළුවන්. ඒක මරු. අනික් හිටපු ජනාධිපතිවරු විදෙස් සංචාරවලට රුපියල් මිලියන 500යි, 1,000යි වියදම් කරලා තිබෙනවා. ඒක හරි. 33 වතාවක්, 20 වතාවක් ගිහිල්ලා තිබෙනවා ලු. ඒක අපි පිළිගන්නවා. හැබැයි, රුපියල් මිලියන 1.8ට ගිය විධිය අපි දන්නේ නැහැ. ඒ ගැන පොඩ්ඩක් අපට කියලා දෙන්න.

බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මගේ සහෝදර මහජන ආරක්ෂක ඇමතිතුමනි, මම දැන් තවත් කාරණයක් කියන්නම්. අපේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා කලින් හමුදාපති වෙන්නත් බලාගෙන සිටියා. ඔබතුමාත් ඒක දන්නවා.

මම තමයි එතුමාගේ ලියුම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ළඟට අරගෙන ගියේ. එතකොට දයාසිරි ජයසේකර මහත්මයා තමයි අපේ ලේකම්. දයා මතක නේ? අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා, ඌව පළාතේ කෙනෙක් හමුදාපති වෙනවා නම් පළමුවෙනි කැමැත්ත තිබුණේ මගේ. ඔබතුමා ඒක දන්නවා. නීතීඥ සුජීව ජයසිංහයි, ඔබතුමායි ඇවිල්ලා තමයි මාව හම්බ වුණේ. මම ඒ ලියුම මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට දුන්නා. ඔබතුමාට ඒ වෙලාවේ සලකපු නැති එක මගේ වැඩක් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා තමයි සැලකුවේ නැත්තේ. *[බාධා කිරීමක්]* ඒ වුණාට මම මගේ වැඩේ කළා. අරුණ ජයසේකර අපේ බදුල්ල ඉස්කෝලේ - Badulla Central College - කෙනෙක් නිසා අපි එතුමාට සලකනවා.

මම එක කාරණයක් ගැන කියන්න ඕනෑ. ඔබතුමා උතුර ගැන කිව්වා. ඩයස්පෝරාවට හරි, මොන එකකට හරි කමක් නැහැ, උතුරේ හමුදා කඳවුරු අයින් කරලා ඒ ඉඩම් දෙන්න. අපි එපා කියන්නේ නැහැ. හැබැයි ඒ ඔක්කෝම කඳවුරු දියතලාවට ගෙනැල්ලා දියතලාවේ කරගෙන යන වැඩකටයුතුවලට බාධා කරන්න එපා. දැන් දියතලාවේ කඳු එකක්වත් නැහැ, අභිංසක මිනිස්සුන්ට එළවලු හදන්න තැනක් නැහැ. නරියා කන්ද, මැණික් කන්ද, කහගොල්ල වාගේ එළවලු හදපු තැන්වල අර හමුදා කඳවුරු ගෙනැල්ලා ගහනවා. ඔබතුමන්ලා අර SLTB ගොඩනැඟිල්ලටත් ඇරියා. හමුදාව කහගොල්ලේ SLTB එකටත් ඇරියා. හමුදාව කහගොල්ලේ වැඩපොළටත් ඇරලා තිබෙන්නේ. හමුදා කඳවුරු උතුරෙන් අයින් කර ගන්න. උඩරට, බදුල්ලේ, දියතලාවේ ඉන්නේ සුද්දන් නිසා අසරණ වුණු මිනිස්සු. ඔක්කෝම units, කඳවුරු කඳුවල ගහනවා. ඒ units ගහන්න ඕනෑ නිසා එළවලු ගොවියෝ එළවනවා. බලන්න බණ්ඩාරවෙලින් එහා පැත්තේ වැලිමඩ පාරේ යනකොට පේනවා, කඳු ඔක්කෝම ඉවරයි. කඳවුරු ටික කඳුවලට ගෙනැල්ලා එළවලු ගොවියෝ ටික එයින් ඉවත් කරනවා. දියතලාව කඳවුරුවලින් පුරවනවා. යාපනයට සාධාරණය කරන්න; යාපනයේ මිනිස්සුන්ට ඉඩම් දෙන්න; ඔබතුමන්ලා කඳවුරු ඉවත්

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කර ගන්න. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. බදුල්ල දිස්ත්‍රික්කයේ දියතලාව කියලා කියන්නේ සුද්දන්ගේ කාලයේ ඉඳලා තිබුණු කඳවුරක් තමයි. හැබැයි අපේ මිනිස්සුන්ටත් සාධාරණය ඉෂ්ට කරන්න. අපේ මිනිස්සු ජීවත් වෙන්න එළවලු හදාගෙන හිටපු ඉඩම් තමයි කඳවුරුවලට දෙන්න සිදු වෙලා තිබෙන්නේ. ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන මේ අවස්ථාවේ දී මම ඒ කාරණයත් මතක් කරන්න ඕනෑ. හමුදා කඳවුරු අයින් කරගෙන ඒ ඉඩම් ටික භාර දෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මතින් තොර සමාජයක් බිහි කිරීමට මේ Budget එකෙන් රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. මේ මිලියන 500න් මතින් තොර සමාජයක් හදන්න, ඒ මොනවත් කරන්න බැහැ. මතින් තොර සමාජයක් හදනවා නම් ඔය මත්ද්‍රව්‍ය ගෙනෙන මිනිස්සු, මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයෝ, බිස්නස්කාරයෝ ටික අයින් කරන්න. මේ මිලියන 500 වෙන් කළා කියලා මතින් තොර රටක් හදන්න බැහැ. මේ අය වැය පොතේ තිබෙනවා, මතින් තොර රටක් හදන්න රුපියල් මිලියන 500 වෙන් කරනවා කියලා. බොරු කිව්වාට කමක් නැහැ, බොරු කියන්න. නමුත් ඔබතුමන්ලා බොරු හිටවනවා. බොරු කියනවා විතරක් නොවෙයි බොරු හිටෙව්වා. මේ රටේ හොරකමට වඩා භයානකයි ඔබතුමන්ලාගේ බොරුව. ඔබතුමන්ලා කිව්වා වාහනයක් ලක්ෂ 12ට එනවා කියලා. ගෙදරකට වාහන දෙකක් ගන්න ඕනෑ කිව්වා. තව පැය කීයද දුක් විඳින්නේ, තෙල් අඩු කරනවා කිව්වා. රුපියල් 100කින් තෙල් අඩු වෙනවා කිව්වා. තව පැය කීයද දුක් විඳින්න තිබෙන්නේ කියලා කිව්වා. මොනවාද කිව්වේ නැත්තේ? වැටුප ඩබල් වෙනවා කිව්වා. රුපියල් 25,000කින් වැටුප් වැඩි වෙනවා කිව්වා. මොන තරම් බොරු කිව්වාද? ඔබතුමන්ලා බොරු කියලා මිනිසුන්ගේ මනස විනාශ කළා. හොරකමට වඩා අපරාධයක් ඔබතුමන්ලා මේ රටේ මිනිසුන්ට කරලා තිබෙනවා, බොරු කියලා. මේ ජනතාව බලාපොරොත්තු කීයක් තියාගෙන හිටියාද? අද ඒ ජනතාව බලාපොරොත්තු සුන් වෙලා ඉන්නවා. ඔබතුමන්ලා ආණ්ඩුවක් හැටියට ඒ ගැනත් වග බලා ගන්න ඕනෑ. මේ වෙලාවේදී වගකීමක් ඇතිවයි මම මේ කාරණා කියන්නේ.

මේ රටේ හොඳම අමාත්‍යාංශය තමයි අද අපේ කථාබහට ලක් වෙලා තිබෙන්නේ. මෙවැනි කටයුතු නතර වුණේ නැත්නම් මේ රට අඩියෙන් අඩිය වැටෙනවා. අඩියෙන් අඩිය වැටිලා මේ රට කරගෙන යනන් බැරි වුණොත්, රට අර්බුදයකට වැටුණොත් මිනිස්සු නැවතත් එළියට බහින්න පටන් ගන්නවා. ආණ්ඩුව හොඳට කරයි කියලා ජනතාව දැන් ඔබතුමන්ලා දිහා බලාගෙන ඉන්නවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chamara Sampath Dasanayake, your time is up now.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒ නිසා, ඔබතුමන්ලා කරන වැඩේ හරියට කරන්න. හරියට කරන්නේ නැතිව මේ වැඩේ අනාගන්න එපා. අනාගත්තොත් ඔබතුමන්ලාට වෙන්නෙත් 2022දී වෙච්ච දේම තමයි. මට කාලය ලබා දුන්නාට ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Major General (Rtd.) G.D. Sooriyabandara. You have 11 minutes.

[පූ.භා. 11.32]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
ගරු සභාපතිතුමනි, ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත්, ඒ වාගේම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත් පිළිබඳව විවාදයට ගැනෙන අද දිනයේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මගේ අදහස් එක් කරන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, මිට ප්‍රථම විපක්ෂයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා උත්සාහයක් ගත්තා, පාතාලයේ සිටුවන හුදෙකලා සිද්ධීන්, මිනීමැරුම් ආදිය ජාතික ආරක්ෂාවට ලඝු කරන්න. ඇත්තටම ජාතික ආරක්ෂාව කියන සංකල්පය පිළිබඳව කිසිම අවබෝධයක් නැතුව කරන කථාවලට පිළිතුරු ලබා දීමට මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒක පෘථුල, සංකීර්ණ විෂය පථයක්. ඔවුන් කියන්න උත්සාහ කරනවා, ශ්‍රී ලංකාවේ පමණයි මෙවැනි මිනීමැරුම්, පාතාලයේ සිටුවීම් සිදු වෙන්නේ කියලා. මම ඒ පාතාල ක්‍රියාකාරකම් අනුමත කරනවා නොවෙයි. අපි අනිවාර්යයෙන්ම ඒවා නවත්වන්න ඕනෑ. පසුගිය කාල සීමාව තුළ දියුණු රටවලත්, විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේත්, පාසල් සිසුන් ඝාතනයට ලක් වෙනවා අපි දැක්කා. අපේ රටේ සිදුවන එවැනි සිද්ධීන් වළක්වා ගැනීමට අවශ්‍යයි. අපි රජයක් විධියට අනිවාර්යයෙන්ම ඒ කාර්යභාරය ඉටු කරනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

යහපාලන රජයේ පොලීසිය භාරව හිටපු ගරු අමාත්‍යතුමා පාස්කු ඉරුදින ඇති වුණු ප්‍රහාරය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළා. යහපාලන රජය කාලයේ සිදු වුණු පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් හොයන්න පරීක්ෂණ මණ්ඩල කිහිපයක් තිබුණා. අධිකරණයේ නඩු විභාග වුණා. නමුත් හිටපු ජනාධිපතිවරයාවත්, හිටපු අග්‍රාමාත්‍යවරයාවත්, ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයාවත්, පොලිස්පතිවරයාවත්, එහෙම නැත්නම් මහජන ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාවත් ඒ වගකීම භාර ගත්තේ නැහැ. මේක ඔවුන්ගේ වගකීමක් නොවෙයි කියලා හැමෝම ඇහ බේරා ගත්තා. නමුත් මම පැහැදිලිව කියන්න අවශ්‍යයි, පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණයක් ඉටු කරනවා වාගේම ඒ සම්බන්ධව ක්‍රියා කරපු මහමොළකරුවන් නීතිය ඉදිරියට පමුණුවන්නත් අපේ රජය යටතේ අනිවාර්යයෙන්ම ක්‍රියා කරනවා කියලා අපි තීන්දුවක් අරගෙන තිබෙන බව. ඒ වාගේම තවත් කොටියාසයක් වින්දිතයන් බවට පත් වුණා. ඒ, අපේ අහිංසක මුස්ලිම් වැසියන්. අපේ ජාතික සමඟිය විශාල බිඳ වැටීමකට ලක් වුණා. ඔවුන්ට චෝදනා කළා. නමුත් ඔවුන්ටත් අපි සාධාරණය ඉටු කරන්න බලාපොරොත්තු වෙනවා. එම නඩු විභාගය අවසානයේ මහ මොළකරුවන්ට අවශ්‍ය දඬුවම් ලබා දීමෙන් පසුව වින්දිතයන්ට සාධාරණය ඉටු වෙනවා.

මම තව කාරණයක් කියන්න ඕනෑ. අද දින විවාදය ආරම්භයේ ප්‍රථමයෙන් මේ සභාව ආමන්ත්‍රණය කරපු අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා දත්ත වගයක් ඉදිරිපත් කළා, "හමුදාවට ආහාර නැහැ. ආදේශ ලබා දෙනවා" කියලා. ඔව්, ඒ දත්ත ගිය ආණ්ඩුව කාලයේ නිකුත් කරපු දත්ත වෙන්න ඕනෑ. නමුත් අපේ රජය කාලයේ එවැනි ආකාරයේ ආහාර හිඟයක් හෝ ආදේශන ලබා දීමක් සිදු වන්නේ නැහැ කියන එකත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, උතුරු පළාතෙන් පත් වෙලා ආපු අපේ ගරු මන්ත්‍රීතුමා හමුදාව සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. ඇත්තටම ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය ඒක තමයි. එදා ඉඳලාම හමුදාව ඒ ප්‍රදේශයෙන් ඉවත් කරන්න ඕනෑ කියන එක

තමයි ඔවුන්ගේ ආකල්පය. මමත් හමුදාවේ වසර 35ක කාල සීමාවක් සේවය කළා. ඒ වාගේම වැඩිම කාල සීමාවක් උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල රාජකාරි කළා. අවසානයේ මම රාජකාරි කළේ මුලතිව් ප්‍රදේශයේ. හමුදාවේ අය ඒ ප්‍රදේශවල සිවිල් ජනතාවට විශාල සේවාවක් ඉටු කරනවා. සිවිල් සම්බන්ධීකරණ කටයුතුවලදී ඒ වාගේම රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කරලා ඒ ප්‍රදේශ දියුණු කරන්න කටයුතු කරනවා. ඔය කියන ආකාරයේ විරෝධතාවක් මිනිසුන් අතර නැහැ. නමුත් ඒ දේශපාලනඥයන් අපේක්ෂා කරනවා, මේ ප්‍රශ්නය තවදුරටත් ව්‍යාප්ත කරලා ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාරය කරගෙන යන්න, එහෙම නැත්නම් ඡන්ද පදනම හදා ගන්න. නමුත් අපි පසුගිය මැතිවරණයෙන් එම දේශපාලනඥයන්ගේ අපේක්ෂාවන් බොඳ කළාය කියන එකත් මතක් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, නිදහසින් පස්සේ අපේ දේශපාලකයන්ගේ වැරැදි තීන්දු-තීරණ නිසා අපේ රට විනාශකාරී යුද්ධයක පැටලුණා. ඒ යුද්ධය හරහා අපට අහිංසක ජීවිත විශාල ප්‍රමාණයක් නැති වුණා.

උතුරේ සහ දකුණේ තරුණයන් විශාල සංඛ්‍යාවක් මිය ගියා. ජීවිත වාගේම, දේපළත් විනාශ වුණා. ඒ වාගේම අපේ ආර්ථිකයටත් ඒ තුළින් විශාල බලපෑමක් ඇති වුණා. මේ මොහොතේත් උතුර, දකුණ ඇතුළුව අපේ රටේ හැම පළාතකම ජනතාවට තමුන්ගේ ආදරණීයයන් අහිමි වීමේ වේදනාව තිබෙනවා. අපි රජයක් වශයෙන් නැවත වතාවක් අපේ රටේ එවැනි ප්‍රශ්නයක් ඇති නොවීමට වග බලා ගන්නවා. ඒ සඳහා අපි ජාතික ආරක්ෂාවට මුල් තැන දීලා කටයුතු කරනවා කියන එකත් මේ වෙලාවේ මා ප්‍රකාශ කරන්න කැමැතියි.

අපට 2009 වර්ෂයේදී විනාශකාරී යුද්ධය අවසන් කරන්නට හැකියාව ලැබුණා. මට විශේෂයෙන්ම ඒ ත්‍රිවිධ හමුදාව ගැනත්, ඔවුන් කළ කාර්ය භාරය ගැනත් කථා කරන්න අවශ්‍යයි. ඉතා හොඳ, දක්ෂ හා එඩිතර සාමාජික පිරිසක් ත්‍රිවිධ හමුදාව තුළ රාජකාරි කරනවා. යුද කාල සීමාවේදී ඔවුන් විශාල කැප කිරීමක් කළා. නමුත්, අවාසනාවකට 2009 වර්ෂයේදී යුද්ධය අවසාන වුණාට පසුව අපේ ත්‍රිවිධ හමුදාව ක්‍රමානුකූලව දේශපාලනීකරණයට ලක් කරන්න දේශපාලකයන් කටයුතු කළා. දේශපාලන මතවාද වශයෙන් අපි එකඟ නොවුණත්, මේ යුද්ධය අවසන් කරන්න නායකත්වය දුන් හිටපු යුද්ධ හමුදාපතිවරයෙකු වූ ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතාව අවමන් වන ආකාරයට, ලජ්ජාවට පත්වන ආකාරයට අත්අඩංගුවට අරගෙන සිරගත කිරීමෙන් තමයි ඒකේ ආරම්භය සිදු වුණේ.

රටේ පැවති යුද්ධය අවසන් කරන්න නායකත්වය ලබා දුන් ත්‍රිවිධ හමුදාවට රජයක් වශයෙන් ලබා දිය යුතු ගෞරවය අපි ලබා දෙනවා. අපි දේශපාලනයට අවතීර්ණ වුණේ ජාතික ජන බලවේගයේ "අදිටන" විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමූහිකය හරහා මේ රටේ පවතින දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්නයි. අපි හමුදාව තුළ රාජකාරි කරනකොට කිසිදු දේශපාලන කටයුත්තක නියැළුණේ නැහැ, අපේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් විධියට තමයි, විශ්‍රාම ගියාට පසුව දේශපාලන කටයුතුවල නියැළෙන්නේ. නමුත් කියන්න කනගාටුයි, අපි ජාතික ජන බලවේගය එක්ක එක්වීම නිසා හිටපු හමුදාපතිවරුන් ත්‍රිවිධ හමුදාවේ අපේ සාමාජිකයන් සියලුදෙනාටම වාගේ විශාල වශයෙන් බලපෑම් කළා. රජයේ නිලධාරීන් රැඳී සිටින කුටියේ ඉන්නවා, වත්මන් ආරක්ෂක ලේකම්තුමා. එතුමාවත් Air Force එකෙන් blacklist කරලා තිබුණා. ඒ වාගේම යුද හමුදාවේ කඳවුරු තුළට අප ඇතුළු කර ගැනීමත් වළක්වා තිබුණා. ඇත්තෙන්ම අපේ රජය බලයට පත් වූ වහාම බොහෝදෙනෙක් බලාපොරොත්තු වුණා, හිටපු ත්‍රිවිධ හමුදාපතිවරුන් ඉවත් කරලා, අපට පක්ෂපාතී, හිතවත් පිරිස් බඳවා ගනීවි කියලා. නමුත්, ඇත්තටම අපි ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කළා. එහෙම නැති වුණොත් වැරදි මතයක් ගොඩනැඟෙනවා, අපි දේශපාලන පළිගැනීම් කරනවා කියලා. අපි කවදාවත් ඔවුන්ව එම ධුරවලින් ඉවත් කරන්න ගියේ නැහැ. ඔවුන්ගේ කාල සීමාව අවසන් වනතෙක් ඉන්න දීලා, දක්ෂ, හැකියාව තිබෙන, කුසලතාව තිබෙන පිරිසක් අපි ත්‍රිවිධ හමුදාපතිවරුන් වශයෙන් පත් කරලා තිබෙනවා. මම දන්නවා, ඔවුන් දේශපාලනීකරණයෙන් තොරව වෘත්තීමය හමුදාවක් වශයෙන් ඒ කටයුතු කරගෙන යයි කියලා.

ගරු සභාපතිතුමනි, ඇත්තටම ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අපි මොනවාද කරන්න බලාපොරොත්තු වෙන්නේ කියන එක ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි, මට ලැබී තිබෙන සීමිත කාල සීමාව තුළ. රටේ සන්නද්ධ සේවාවල නායකයා වශයෙන් ජනාධිපතිතුමා දැනුම් දීලා තිබෙනවා, අපි කොයි ආකාරයෙන්ද ජාතික ආරක්ෂාව තහවුරු කරන්නේ කියලා. අපි ප්‍රධාන වශයෙන්ම බලාපොරොත්තු වනවා, ත්‍රිවිධ හමුදාව දේශපාලනීකරණය වීම වළක්වන්න. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා වාගේම අපි ඊට අවශ්‍ය දේශපාලන නායකත්වයත් ලබා දෙනවා. ත්‍රිවිධ හමුදාපතිවරුන්ට අපි නිදහස ලබා දෙනවා, ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කරන්න.

අපි නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා. එහිදී අපි බලාපොරොත්තු වනවා, විශේෂයෙන්ම බාහිර බලපෑම්වලින් අපේ රටට ඇති වන තර්ජන, බලපෑම් අවම කර ගන්නත්, නැති කර ගන්නත්. දැන් ලෝකයේ තිබෙන ප්‍රවණතාව තමයි, පිරිස් බලයට වඩා නවීන තාක්ෂණය භාවිත කිරීම. අපි දකිනවා, රුසියාව සහ යුක්‍රේනය අතර පවතින යුද්ධයේදීත් තාක්ෂණය කොයි ආකාරයෙන් යොදා ගන්නවාද කියන එක. අපේ බලාපොරොත්තුවත් ඉදිරියේදී අපේ ත්‍රිවිධ හමුදාව තාක්ෂණයෙන් සන්නද්ධ කරලා වෘත්තීමය හමුදාවක් බවට පත් කිරීමයි. ඉදිරියේදී අපට ඒ වාගේ විශාල වැඩ කොටසක් කරන්න තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මේ කාරණය කෙරෙහි ආරක්ෂක අමාත්‍යතුමා වශයෙන් අපේ ජනාධිපතිතුමාගේත්, ඒ වාගේම ගරු නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමාගේත් අවධානය යොමු කරවන්න මා කැමැතියි.

අපි අද දිනයේ ජාතික ආරක්ෂාව ගැන කථා කරනකොට, අපේ සමාජයේ ඉතාම නිහඬ සේවයක් සිදු කරමින් මේ සම්බන්ධයෙන් අපට සහයෝගය දෙන තවත් පිරිසක් ඉන්නවා. ඒ තමයි, ප්‍රාදේශීය වශයෙන් ආරක්ෂක කටයුතුවල නියැළෙන අපේ පෞද්ගලික ආරක්ෂක සමාගම්වල සිටින ආරක්ෂක නියාමකයින්. අපේ රටේ තිබෙන මර්මස්ථාන, පාසල්, නොයෙක් ආකාරයේ සංචාරක ව්‍යාපාරික ස්ථාන වැනි ස්ථාන ආරක්ෂා කරන්න දවසේ පැය 24 පුරාම ඔවුන් කටයුතු කරනවා. නමුත්, ඔවුන් දක්වන කැප කිරීම වෙනුවෙන්, ශ්‍රමය වෙනුවෙන් අද ඔවුන්ට නිසි වැටුපක් ලැබෙනවාද කියන එක ඇත්තටම අපට ප්‍රශ්න සහගතයි. මම මේ කථා කරන්නේ ඇවන්ට් ගාර්ඩ් වෙනුවෙන් නොවෙයි. නමුත්, අපි ඇවන්ට් ගාර්ඩ් එකත් නියාමනයකට ලක් කරන්න අවශ්‍ය වෙනවා. එවැනි කුඩා security කණ්ඩායම් තිබෙන ආයතන බොහොමයක් තිබෙනවා. ඒ සියල්ලත් ඇත්තටම අපි නියාමනයකට ලක් කළ යුතුයි කියලා මම යෝජනා කරනවා. ඒ හරහා රාජකාරියේ යෙදිලා ඉන්න විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට අවශ්‍ය නිසි වැටුපක් ලබා දීමටත් කටයුතු කළ යුතුයි කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. G.D. Sooriyabandara, your time is up.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු සභාපතිතුමනි, මම තව විනාඩියකින් කථාව අවසන් කරන්නම්.

ඒ වාගේම අපේ ත්‍රිවිධ හමුදාව නවීකරණය කිරීමේදී අපට කරන්න විශාල වැඩ කොටසක් තිබෙනවා. මම කලින් කිව්වා වාගේ විශේෂයෙන්ම අපේ ත්‍රිවිධ හමුදාව නවීන තාක්ෂණයෙන් සන්නද්ධ කිරීම අවශ්‍යයි. පසුගිය කාලයේ අපට එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ රාජකාරි සඳහා යෑමේ අවස්ථාව මහ හැරුණේ, පසුගිය ආණ්ඩු ත්‍රිවිධ හමුදාව සඳහා පත් කළ යම් යම් නිලධාරීන් හේතුවෙන් නිසා බව අපි දන්නවා. නමුත්, අපි ඒ අවස්ථාව නැවතත් ලබා ගන්න අවශ්‍යයි. ඒ වාගේම අපට ඒ තුළින් විදේශ විනිමය උපයා ගන්න හැකියාව තිබෙනවා. ඊට අමතරව, අපේ හමුදා සාමාජිකයන්ට ජාත්‍යන්තර අත්දැකීම් ලබා ගන්නත් මේ තුළින් හැකි වෙනවා. ඒ වාගේම ඔවුන්ගේ ආර්ථික තත්ත්වය දියුණු කර ගැනීමේ හැකියාවත් මේ තුළින් ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, ජාතික ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරනවා කියන එක රජයක පමණක් වගකීමක් නොවෙයි. රටක ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් රජය තමයි විශාල පංගුව ගන්නේ. අපි රජයක් විධියට ඒ වගකීම ගන්නවා. ඒ වාගේම මේ රටේ ජීවත් වන අපේ ආදරණීය සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් පුරවැසියන්ටත් අපේ රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. ඒ නිසා අප සියලුදෙනාම එකමුතුව මේ කටයුත්ත කරමු. අපි ඔවුන්ටත් කියනවා, අවධානයෙන් ඉඳලා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන්ගේ දායකත්වය ලබා දීලා මේ රට සුරක්ෂිත රටක් කරන්න දායක වෙන්න කියලා. ඒ අනුව අපි හැමෝම එකතු වෙලා අපේ රට සුරක්ෂිත රටක් බවට පත් කරමු කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Dilith Jayaweera. You have 11 minutes.

[පූ.භා. 11.42]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු සභාපතිතුමනි, මට ලබා දී තිබෙන්නේ ඉතාම සුළු කාලයක් නිසා ඒ කාලය මම ප්‍රයෝජනයට ගන්න කැමැතියි, කරුණු කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. මේ අය වැය ප්‍රකාශනය හා සබැඳුණු සියලුම විවාද, ජාතියේ ප්‍රකාශන හැටියට සහ ජාතියේ දිශානතිය තීරණය කරන ඉතාම වැදගත් ප්‍රකාශන හැටියටයි මම සලකන්නේ. මේ අය වැය, ජාතික ජන බලවේගය රජය විසින් ඉදිරිපත් කළ මංගල අය වැයයි. මම දැනගන්න කැමැතියි, මේ අය වැය තුළින් ඒ ඒ විෂයයන් අලළා ඉදිරිපත් කර තිබෙන රජයේ ප්‍රතිපත්තිමය විකාශය කුමක් ද; ප්‍රතිපත්තිමය පදනම කුමක්ද කියලා. අවසානයවකට මෙන් අපේ ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ කිසිම තැනක කිසිම සඳහනක් නැහැ, අපේ රටේ ජාතික ආරක්ෂාව කියන වචනය ගැන - ඒ මාතෘකාව ගැන. මට මේකෙන් හැඟීමක් ඇති වුණා, අපේ රටේ ජාතික ආරක්ෂාව කියන දේ පිළිබඳව මේ රජයේ ඇති උනන්දුව, කැපවීම කුමක්ද කියන එක සොයා බලන්නට. කොහොම වුණත්, මට කියන්නට තිබෙන්නේ මෙයයි.

ගරු සභාපතිතුමනි, දේහයක හිස වාගේ තමයි, රටකට ජාතික ආරක්ෂාව. එම නිසා ඒ දේහයේ හිස රැක ගන්නේ නැතිව කිසි දෙයක් කරන්නට බැරි බව අපි වටහා ගත යුතුයි. මම මේ රජයට මේක බොහොම සෙනෙහසින් කියන්නේ; මේක තේරුම් ගන්න කියලායි මම කියන්නේ. මේ රජය ආධුනික රජයක්. මේ ආධුනික ආණ්ඩුවේ ජනාධිපතිතුමා, අගමැතිතුමිය, විදේශ ඇමතිතුමා, නියෝජ්‍ය ඇමති අපේ ජෙනරාල් අරුණ ජයසේකර මැතිතුමා, හමුදාපතිවරුන් තිදෙනාම, ආරක්ෂක ලේකම්තුමා ඇතුළු මේ උදවිය තමයි ආරක්ෂක කවුන්සලයේ ඉන්නේ. අවාසනාවකට වාගේ මේ සියලුදෙනාම පළමුවැනි වතාවට තමයි ආරක්ෂක කවුන්සලයේ වාඩිවෙන්නේ. මේ සියලුදෙනාම පළමුවැනි වතාවට නම් ආරක්ෂක කවුන්සලයේ වාඩිවෙලා මේ රටේ ආරක්ෂාව ගැන කථා කරන්නේ, ඇත්තටම අපේ රටේ ආරක්ෂාව සම්බන්ධව විශාල ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, මීට පෙර කවදාවත් මෙහෙම දෙයක් වෙලා නැහැ.

ඒකට හේතුව තමයි, මීට කලින් හිටපු ජනාධිපතිවරු අවම වශයෙන් අගමැතිවරු වෙලා ඉඳලා තිබෙනවා, එහෙම නැත්නම් ආරක්ෂක ලේකම් වෙලා ඉඳලා තිබෙනවා, එහෙමත් නැත්නම් ඒ හා සමාන්තරව ජ්‍යෙෂ්ඨව හිටපු හමුදාපතිවරු, කාලයක් කටයුතු කරපු හමුදාපතිවරු ඉඳලා තිබෙනවා. මෙවර එවැනි කිසි කෙනෙක් මේ ආරක්ෂක කවුන්සලයේ නැහැ. මේක ආධුනික ආරක්ෂක කවුන්සලයක් නිසා මම කියා සිටින්නේ මේ ගැන සැලකිල්ලට ගන්න කියන එකයි. මොකද, මේක ඉතාම වැදගත් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන්. කොහොම වුණත් මම කියන්න ඕනෑ, අපේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කියලා තනතුරක් තිබුණු බව. දැන් ඒ තනතුර තාවකාලිකව නැති කරලා. දැන් ඒ පුද්ගලයාත් නැහැ. මේ රටේ ආරක්ෂාව පිළිබඳව සති පතා රැස්වන රැස්වීමට කිසිම ජ්‍යෙෂ්ඨයෙක් නැති බවයි මගේ නිරීක්ෂණය.

ඒ වාගේම, මේ දේහයේ ශීර්ෂය -හිස- ජාතික ආරක්ෂාව නම්, මේ දේහයට පණිවුඩ ගෙන එන ස්නායු පද්ධතිය තමයි මේ බුද්ධි තොරතුරු. ගරු සභාපතිතුමනි, අද මේ බුද්ධි සමාලෝචන රැස්වීමට සහභාගි වෙන්නේ කවුද කියලා බලන්න. බුද්ධි සමාලෝචන රැස්වීමට - මම මේ කියන්නේ weekly intelligence brief එක ගැන - සහභාගි වන ආරක්ෂක ලේකම්තුමා, මහජන ආරක්ෂක ලේකම්තුමා, හමුදාපතිවරු තුන්දෙනා, වැඩබලන පොලිස්පතිතුමා, CNI - Chief of National Intelligence, DIG - CID, Director - SIS, Director- CID කියන මේ සියලුදෙනාම බුද්ධි තොරතුරු සමාලෝචනය සඳහා පළමු වතාවට තමයි වාඩි වෙන්නේ. මේගොල්ලන් අත්දැකීම් ඇති අය නොවෙයි. මේ වෙච්ච තත්ත්වයේ බරපතළකම අපි උදාහරණයකට ගනිමු. හමුදා බුද්ධි අංශ ප්‍රධානීන් ගත්තොත්, බ්‍රිගේඩියර් වන්දික මහතන්නිල හමුදා බුද්ධි අංශ ප්‍රධානියා දැන් අස් කරලා. අස් කරලා කියන්නේ, ඔහු දැන් එතැන නැහැ. බ්‍රිගේඩියර් ප්‍රබෝධ සිරිවර්ධන දෙවැනියට සිටියා. ඔහුත් දැන් නැහැ. ඊළඟට, කර්නල්වරු පස්දෙනෙක් සිටියා. ඒගොල්ලනුත් නැහැ. බ්‍රිගේඩියර් දීප්ත ආරියසේන -මම හිතනවා මේක පෞද්ගලිකව නොගත යුතුයි කියලා- තමයි දැන් පත් කර තිබෙන්නේ. ඔහු කවුද? යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ හිටපු කෙනෙක්. ඒ කියන්නේ Infantry Regiment එකක හිටපු කෙනෙක්. ඔහුට courses කරලා intelligence ගැන අවබෝධයක් නැහැ. එතුමා ඇත්තටම බුද්ධි බලකායට අයිති නැති කෙනෙක්. එතුමා අද හමුදා බුද්ධි බලකායේ ප්‍රධානියා.

ගරු සභාපතිතුමනි, මට ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. කලිනුත් කිව්වා වාගේ ප්‍රජාතන්ත්‍රවාදය දැන් හමුදාවලට තිබෙනවා නම්, ඒක මට ප්‍රශ්නයක් නැහැ. එතුමා ජනතා විමුක්ති පෙරමුණේ posts share කළා, සේවයේ යෙදී සිටියදී. ඔහුට ඒ පිළිබඳ විනය ක්‍රියා මාර්ගයක් අරගෙන තිබුණා. ඇත්තටම එතුමා ජනතා විමුක්ති පෙරමුණට ඉතා සමීපව කටයුතු කරන කෙනෙක්. එතුමාගේ

බිරියත් එහෙමයි. හැබැයි, මේක දේශපාලනීකරණය කරලා. මේ, අපේ රටේ වැදගත්ම ස්නායු පද්ධතිය. මේ රටේ අපට කන්න බොන්නවත්, ඔය කියන ලස්සන රට හදන්නටවත්, කිසි දෙයක් කරන්නට බැහැ, අපේ බුද්ධි තොරතුරු පද්ධතිය කඩාගෙන වැටුණොත්. මම ඉතාම අනුකම්පාවෙන් මේ රටේ මිනිසුන් වෙනුවෙන් ඉල්ලා සිටින්නේ මේකයි. අපි දැක්කා, යහ පාලන සමයේදී මේ බුද්ධි තොරතුරු - intelligence information - නැති වුණාම අපේ රටට වෙච්ච දේ. අදටත් අපි දුක් විඳින්නේ සහරාන්ගේ Easter attack එකත් එක්ක වෙච්ච දේ නිසායි. ඒක වුණේ බුද්ධි තොරතුරු කඩා වැටීමේ ප්‍රතිඵලයක් හැටියට. ඉන්දියාවෙන් තමයි අපට දැනගන්න ලැබුණේ අපේ රටේ පල්ලිවලට ගහනවා කියලා. මෙවැනි තත්ත්වයක් නැවත උදා වීමේ හැකියාවක් තිබෙනවා. මම මේ කියන්නේ අපේ රටේ ආරක්ෂාව පිළිබඳව මීට වඩා උනන්දු වෙන්න කියායි. එහෙම නොවුණොත් නැවත වරක් අපි විශාල අමාරුවක වැටෙනවා.

ඒ වාගේම, මම කියන්න ඕනෑ, ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 225හි ජාතික ආරක්ෂක උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කරන්න යෝජනා කරලා තිබෙන බව. දැන් ජාතික ආරක්ෂක උපදේශක මණ්ඩලයක් සිටියා නම් ඇත්තටම මේ ප්‍රශ්නයෙන් විශාල ප්‍රමාණයක් විසඳෙන බව මම පිළිගන්නවා. හැබැයි, එහෙම එකක් ස්ථාපිත කරලා නැහැ නේ. ඊළඟට, ඔබ යෝජනා කර තිබෙනවා, ජාලගත ආරක්ෂිත තොරතුරු ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කරනවා කියලා; ඒකත් ක්‍රියාත්මක කරලා නැහැ. අධීක්ෂණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කරලා විධිමත් කරනවාය කියලා තිබෙනවා; ඒකත් කරලා නැහැ. Hon. Chairman, if these precautions have been taken, we could relax a bit. But, unfortunately, I do not see that the Government is taking this seriously. අපේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාටත් දැන් මේ විධියට ලොකු ප්‍රශ්නයක් උදා වෙනවා. එතුමා හමුදාව පිළිබඳ ලොකු අවබෝධයක් ඇති පුද්ගලයෙක්.

එතුමා දන්නවා, බුද්ධි තොරතුරු රැස් කිරීම, ඒවා සමාලෝචනය කිරීම, National Security Council එකට ගෙනියන්නට ඕනෑ කියන එක. එතුමා නැඟෙනහිර පළාතේ ආඥාපති විධියට හමුදාවේ හිටියේ. එතුමාටත් විශාල පරිපාලන අත්දැකීම් නැහැ. එතුමා දැන් නියෝජ්‍ය අමාත්‍යවරයා. එතුමාට තමයි දැන් මේ තත්ත්වයට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. එතුමාට ඉහළින් ගොඩක් නිලධාරිනුත් ඉන්නවා. ඒ කාරණාව අපි පැත්තකින් තැබුවත්, මේ තත්ත්වයට මුහුණ දීමට හැකියාවක් නැහැ. අපේ මිතුරා, ආරක්ෂක ලේකම්තුමා සම්බන්ධයෙන් මට පෞද්ගලිකව ප්‍රශ්නයක් නැහැ. නමුත්, මම කියන්නේ එතුමාත් පරිපාලන අත්දැකීම් තිබුණු කෙනෙක් නොවෙයි කියන එකයි.

මේ කාරණය ඉතා වැදගත් නිසා මේ තත්ත්වයට විසඳුමක් ලෙස මධ්‍යම බුද්ධි තොරතුරු කාර්යාංශයක් පිහිටුවන්න කියලා අපේ වැඩ පිළිවෙළ තුළින් අපි යෝජනා කළා. ඒ වාගේම මධ්‍යම බුද්ධි තොරතුරු කාර්යාංශයක් යටතේ ජාතික ආරක්ෂක උපදේශක තනතුර බලාත්මක කරන්න; මේ රටට NSA කෙනෙක් පත් කරන්න. ඔය දේශපාලනීකරණයෙන් වැළැකිලා, සුදුසු පුද්ගලයෙක් සොයලා ඒ සඳහා පත් කරන්න. ඔය දේශපාලනය පැත්තකින් තබන්න. ඒවා පරණ වැඩ. තමන්ට උදව් කරපු මිනිස්සු හමුදාවල තනතුරුවලට පත් කරන එක පරණ වැඩක්. ඒක නිසා තමයි ඒකට විරුද්ධව ඡන්දය දුන්නේ. ඒ නිසා වෙන රටවල වාගේ හොඳ NSA කෙනෙක් පත් කරන්න. එහෙම NSA කෙනෙක් පත් කරලා, ජාතික මධ්‍යම බුද්ධි තොරතුරු කාර්යාංශයක් පිහිටුවලා, ඉහළ මට්ටමේ දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඒ මඟින් තීරණ ගැනීම ඉතා වැදගත්. අපිට බුද්ධි තොරතුරු තිබුණත් වැඩක් නැහැ, ඒ බුද්ධි තොරතුරු විශ්ලේෂණය කර ගන්නට බැරි නම්. ඒ සඳහා අවශ්‍ය දැනීම, අත්දැකීම් නැත්නම් වැඩක් නැහැ. මම කියන්නේ අද අත් වෙලා තිබෙන ප්‍රතිඵලය මේකයි කියන එකයි. ඒ නිසා අපි ආරාධනා කර සිටිනවා, කුහකකමින් තොරව මේ ගැන බලන්න කියලා.

අපි මේ ඉදිරිපත් කරලා තිබෙන වැඩ පිළිවෙළ තුළ අන්තර් නියෝජිත ආයතන සහයෝගිතාව, තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා උසස්, බුද්ධි තාක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා දෙමින් යටිතල පහසුකම් වර්ධනය කිරීම ඇතුළත් වෙනවා. එම නිසා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. මම දිගින් දිගටම ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මම කියන්නට කැමැතියි, මේ ජාතික ආරක්ෂාව කියන එක විහිළුවට ගන්න එපා, ජාතික ආරක්ෂාව තුළින් දේශපාලනය කරන්නට එපා කියලා.

However much you are tempted to put your own people - your political supporters and your cadres - into those positions, please do not think about doing that because public security is a very serious matter, as we have experienced. Sir, today, there are all these issues including the economic troubles we are going through with about 300,000 entrepreneurs suffering. Why? Because after the Easter attack, we have still not been able to stand up. We do not have the energy, the resources or anything to face another situation like this.

ඒ නිසා ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවලියේ සමස්තය තුළ මම සම්පිණ්ඩනය කිරීමට උත්සාහ ගන්නේ මෙයයි. අද මේ රට ජාතික ආරක්ෂාව පිළිබඳ විශාල අභියෝගයකට මුහුණ දෙමින් සිටිනවා. මේ සියලු කරුණු නිරීක්ෂණය කළාම එය යථාර්ථයක්. ඒ නිසා එය විසඳීම සඳහා මේ රජය ගන්නා වැඩ පිළිවෙළ කුමක් දැයි ජනතාව විමසිල්ලෙන් ඉන්නවා. මම යෝජනා කර සිටිනවා, ගරු ජනාධිපතිතුමාගේ සිට මේ රජයේ සියලුදෙනාට, විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට බැඳිලා ඉන්න සියලුදෙනා මේ පිළිබඳ සංවේදී වෙමින්, තාර්කිකව, විද්‍යාත්මකව හිතලා, අද අපිට දේශීයව හා විදේශීයව, භූගෝලීය දේශපාලනය තුළ එල්ල වෙන තර්ජන නිවැරැදිව විශ්ලේෂණය කරලා, එයට මුහුණදීමට නිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. අපේ රටේ ආර්ථිකය ගොඩ ගන්නට, මේ රට ඉදිරියට ගෙනියන්නට, අපේ මව්බිම අපි බලාපොරොත්තු වෙන තැනට ඔසවා තබන්නට නම්, ජාතික ආරක්ෂාව පිළිබඳ තවත් කිසිදු තර්ජනයකට අපි මුහුණ නොදෙන පරිසරයක් නිර්මාණය කර ගන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණය කියන්නට කැමැතියි. ඉතිහාසයේ වැරැදි කරලා තිබුණු පළියට, ඉතිහාසයේ වැරැදීම් සිදු වුණු පළියට, අපිට හැමදාම ඒක ගැන කථා කර කර ඉන්නට බැහැ. එය නිවැරැදි විය යුතුයි. මම විපක්ෂය වෙනුවෙන් ආදරයෙන් ඉල්ලා සිටින්නේ, හැමදාම ඔය පරණ කථාව කියමින් ඉන්නේ නැතුව, ශාපයක් ගැනම කථා කරමින්, ඒ වැරැදි ගැනම කථා කරමින් ඉන්නේ නැතුව, ඔබතුමන්ලා කරන වැඩේ කියන්න කියලායි.

මම කියන්නට ඕනෑ, මේ අය වැය ඇස්තමේන්තුවෙන් බුද්ධි තොරතුරුවලට අදාළ තාක්ෂණයට වියදම් කරන්න සත පහක්වත් වෙන් කරලා නැහැ කියන එක. මේකේ ඉරි කැල්ලක් ගහලා තිබෙන්නේ. ඉරි කැලි ගහලා හරි යන්නේ නැහැ, මේ ජාතික ආරක්ෂාවට. ඉරි කැලි ගහලා හරි යන්නේ නැහැ. මගේ අවසාන ආදරණීය ඉල්ලීම තමයි, මේ Budget එකේ අදාළ තැන්වලට ඔබේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන කොටස් තුනත් දාලා, අපි යෝජනා කරපු ඒ මධ්‍යම බුද්ධි තොරතුරු කාර්යාංශයත් හදන්න වහ වහා යුහුසුළු වෙන්න කියන එක. ඒ තුළින්ම පමණයි අපේ මව්බිම රැක ගනිමින්, අපේ ජනතාවත් එක්ක ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ. බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Sunil Watagala. You have 15 minutes.

[පූ.භා. 11.57]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම පොඩි පිළිතුරු කිහිපයක් දීගෙනම කථාව ආරම්භ කළොත් හොඳයි කියලා හිතුවා.

ආරක්ෂක කවුන්සලයේ පොඩි අනාරක්ෂිතභාවයක් පිළිබඳව, අත්දැකීම් අඩු බවක් පිළිබඳව මා මිත්‍ර දිලිත් ජයවීර මහත්මයා කිව්වා. මෙහෙමයි. ලොකු අත්දැකීමක් සහිත ආරක්ෂක කවුන්සලයට පාස්කු ප්‍රහාරය පිළිබඳ තොරතුරු ආවාට පස්සේ අපට ලැබුණු අභාවාවක අත්දැකීම පිළිබඳව දිලිත් ජයවීර මහත්මයාට අලුතින් කියන්න ඕනෑ නැහැ. හොඳ අත්දැකීමක් සහිත මහත්වරුන් සිටියදී තමයි එවැනි ප්‍රහාරයක් එල්ල වුණේ. මම තවත් පුදුම වුණේ, ප්‍රාදේශීය සභාවකවත් හිටපු මහත්මයෙක් මේක කිව්වා නම්, අපට මේක ටිකක් සැරෙන් භාර ගන්න තිබුණා. ඒ වාගේම experienced කට්ටියගෙන් ගත්ත අත්දැකීම් නිසා නේ කාලයක් තිස්සේ ඇවිල්ලා ඇවිල්ලා අවුරුදු 77කට පස්සේ මේ රට බංකොලොත් කියන ලේබලය ගහගත්තේ. ඒ නිසා මීට වඩා වෙන කියවීමක් කියවා ගත්තා නම් දිලිත් ජයවීර මන්ත්‍රීතුමාට හොඳයි.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
There is no point of Order in that. It is just a reference to that matter.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, he mentioned my name.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
There is no point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, Hon. Dilith Jayaweera, please make it short. We are economizing on time.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
There is no point of Order. - *[Interruption.]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Deputy Minister is not allowing you. You may bring it up after he finishes.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, he mentioned my name.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
නමක් පාවිච්චි කරපු පළියට, a point of Order cannot be raised.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dilith Jayaweera, please make it short.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
I can answer that. - *[Interruption.]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dilith Jayaweera, please state it in one minute.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, please give me the mike just to say that I love him.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Dilith Jayaweera.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු සභාපතිතුමනි, එතුමා මගේ ආදරණීය මිත්‍රයා, අපි අවුරුදු බර ගණනක් එකට විශ්වවිද්‍යාලයේ හිටියේ. එතුමා දන්නවා මගේ capabilities ගැන.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Would you come to the point of Order, please?

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු සභාපතිතුමනි, මම ප්‍රාදේශීය සභාවක නොහිටියාට, එතුමාම දන්නවා මගේ capabilities ගැන. ඒ වුණාට එතුමාට මම කියන්නට ඕනෑ, ප්‍රාදේශීය සභාවකවත් හිටපු නැති, ගොඩක් වල් පැළ - 159න්, 150ක් විතර - මෙතැන පැළ වුණු බව. ඉතින් මාවත් ඒ ගණයටම දමන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, Hon. Dilith Jayaweera, you have made your point clear.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, I also want to say that I love him.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sunil Watagala, you may continue, please.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
කොච්චර capabilities තිබෙනවාද කියනවා නම්, එතුමා කාලයකදී හැංගුණා. එතුමා බොරුවට හැංගුවා. - *[බාධා කිරීමක්]*

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Anyway, he did not name you. - *[Interruption.]*

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මම මගේ කථාවට අවතීර්ණ වෙන්නම්. ඇත්තෙන්ම-

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Dilith Jayaweera?

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, he cannot say that. That is a serious allegation.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශය ගත්තාම,- *[බාධා කිරීමක්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! Hon. Members, could we get to back the Discussion, please? We have to economize on time. There is a very important Discussion going on here at the Committee Stage now. Let us make use of this time. - *[Interruption.]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Leader of the House.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, ඔබතුමා ඒ මන්ත්‍රීතුමාට රීති ප්‍රශ්නය නහන්න අවස්ථාව දුන්නා. එතුමා රීති ප්‍රශ්නයක් හරි මොකක් හරි ඒක ඉදිරිපත් කළා. දැන් ඒක ඉවරයි. එතුමාට ඊට වැඩිය දෙයක් කියන්න තිබෙනවා නම්, ඔබතුමාව හමුවෙලා ඒ serious හෝ too serious allegation එක ඉදිරිපත් කරන්න කියන්න. මෙතැන කෝලම් මඩුවක් කරගන්න බැහැ. මේක "නයි දෙරණ" නොවෙයි.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මෙතැන මඩ ගහන්න පුළුවන්ද?

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, වැය ශීර්ෂ පිළිබඳ විවාදයට මම යොමු වෙනවා. *[බාධා කිරීම්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sunil Watagala, would you please continue?

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කරන මෙම විවාදයේදී විපක්ෂයේ මහත්වරුන්ගෙන් ආපු යම් විවේචනත් එක්ක මම මුලින්ම පිළිතුරක් දෙන්න කැමැතියි, විශේෂයෙන් පොලිස් නිලධාරීන්ගේ වැටුප් ගැටලුවට අදාළව. අපි සහතික කරලා කියනවා, ගරු ජනාධිපතිතුමාත් නැවතත් අවධාරණය කළා, සාමාන්‍ය පොලිස් නිලධාරියාගේ සිට ඉහළ IGP දක්වා, පොලිස්පතිවරයා දක්වා ආපු වැටුප් සමාලෝචනයක් තිබෙනවා කියන එක.

ඒ තුළ ඔවුන්ගේ වැටුප් වැඩිවීමක් සිදු වෙනවා. මූලික වැටුප වැඩිවීමට අදාළව වැටුප් සාරාංශයක් අපි ළඟ තිබෙනවා. අපි යළිත් සහතිකයක් දෙනවා, උසස් ජීවන තත්ත්වයක් ඇති වන ආකාරයෙන් පහළ පොලිස් නිලධාරියාගේ සිට IGP දක්වා වන වැටුප් තල සමාලෝචනයකට ලක් කර, ඒ තුළින් ඉහළ තත්ත්වයක් ඇති කරනවාය කියලා.

[ගරු සුනිල් වටගල මහතා]

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පහළ පොලිස් නිලධාරින්ගෙන් ඉල්ලීමක් ආවා, පහළ පොලිස් නිලධාරින්ට යම් උපාධියක් තිබෙනවා නම් ඔවුන්ට ASP විභාගය directly ලියන්න අවස්ථාවක් දෙන්නය කියලා. ඒ අවස්ථාවත් ලබා දීමට අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කර ඊට අදාළ මැදිහත්වීම කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අපේ අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය සම්බන්ධවත් මේ මොහොතේ කථා කරන නිසා පොලීසිය පිළිබඳව මම යළිත් මේ සභාවේ අවධානය යොමු කරවනවා. ගරු සභාපතිතුමනි, පොලිස් දෙපාර්තමේන්තුවේ පරමාර්ථ ඇතුළේ තිබෙන ප්‍රධාන පරමාර්ථයක් තමයි, ජන ජීවිතය පවත්වා ගෙන යාමට හැකි වන පරිදි අන්තවාදය, ත්‍රස්තවාදී කටයුතු, කොල්ලකෑම්, මිනීමැරුම්, පාතාල ක්‍රියා, මත්ද්‍රව්‍ය උවදුර විනාශ කිරීමට හැකි වන පරිදි ශ්‍රී ලංකා පොලීසිය මෙහෙයවීම කියන එක. ඒක අපේ පොලිස් දෙපාර්තමේන්තුවේ මූලික අරමුණක්. ගරු සභාපතිතුමනි, එම අරමුණට සාපේක්ෂව අපි වත්මන් පොලිස්පතිවරයා යටතේ හරියටම පොලිස් දෙපාර්තමේන්තුව මෙහෙයවා තිබෙනවා. අපි බලයට පත් වුණාට පසුව මේ දක්වා සිදු කළ වැටලීම්වල සාරාංශයක් තිබෙනවා; සිද්ධි සාරාංශයක් තිබෙනවා. ඒකට අනුව ගත්තොත්, 2024.09.21වැනි දින සිට 2025.02.26වැනි දින දක්වා වෙඩි තැබීම් 44ක් සිද්ධ වෙලා තිබෙනවා; මනුෂ්‍ය ඝාතන 23ක් සිද්ධ වෙලා තිබෙනවා; කපා කොටා මනුෂ්‍ය ඝාතන 12ක් සිදු කර තිබෙනවා; ඊට අමතරව මනුෂ්‍ය ඝාතන 8ක් සිද්ධ වෙලා තිබෙනවා.

මෙම සිදුවීම්වලට සාපේක්ෂව වත්මන් පොලිස් දෙපාර්තමේන්තුව නිකම් හිටියේ නැහැ. කලින් කියැවුණා, බුද්ධි තොරතුරු වාර්තා පිළිබඳ ගැටලුවක් ගැන. නැහැ, වත්මන් පොලිස් දෙපාර්තමේන්තුව තුළ හොඳ බුද්ධි තොරතුරු ඒකකයක් තිබෙනවා. ඒ අනුව පසු ගිය කාලයේ සිදු වුණු සිද්ධිවලට අදාළ ඇත්ත වගඋත්තරකරුවන් අත්අඩංගුවට ගැනීමට අපේ පොලිස් දෙපාර්තමේන්තුවට පුළුවන්කම ලැබුණා.

උසාවියේ වුණු සිදුවීමට අදාළව ගත්තොත්, අදාළ සැකකරු පැය 8ක් ඇතුළත අත්අඩංගුවට ගත්තා. කොටහේනේ සිද්ධියට අදාළ පුද්ගලයන් පැය 5ක් වාගේ කාලයක් ඇතුළත අත්අඩංගුවට ගත්තා. ඊට අමතරව මීගමුව ප්‍රදේශයේ මුහුදු වෙරළේ ඇති වුණු සිද්ධියට අදාළ වගඋත්තරකරුවන් පැය 10ක් වැනි කාලයක් ඇතුළත අත්අඩංගුවට ගන්න පුළුවන් වුණා. ඒ ආකාරයට තමයි පොලිස් දෙපාර්තමේන්තුව අද වනවිට තමන්ගේ සක්‍රිය සේවය විහිදුවා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, 2024.09.21 වැනි දින සිට 2025.02.26 වැනි දින දක්වා කාල රාමුව තුළ ටී 56 වර්ගයේ අවි 14ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා; පිස්තෝල 21ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා; බෝර 12 ගිනි අවි 78ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා; රිවෝල්වර 17ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා; තුවක්කු 840ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා; වෙනත් 24යි. සමස්ත වශයෙන් මේ කාල රාමුව තුළ ආයුධ 994ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. මෙන්න මෙහෙම තමයි පොලිස් දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම අද දවස වනවිට හරියටම සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ විවාදය තුළදී ගොඩක් සිදු කළේ, ජාතික ආරක්ෂාවට අදාළ කතිකාව. මේ ගරු සභාව තුළදී එම කතිකාව පාතාලයත් එක්ක සම්බන්ධ කර ගත් ක්‍රියාවලියකට ගෙන යන්න හැදුවා. අපි කියන්නේ මේකයි. යම් කිසි සිද්ධි දාමයක් සිද්ධ වුණා. විශේෂයෙන්ම මේ පාතාල ක්‍රියා සිද්ධ වෙන්නේ අතීතයේ කිසියම් දේශපාලනික කාරණාවක් පදනම් කරගෙනයි. අපි දැක්කා, අතීතයේ සිද්ධි දාමයන් ගත්තාට පස්සේ ඒ පාතාලයේ ක්‍රියාකාරකම් මෙන්ම විශේෂයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධ වෙලා තිබුණේ දේශපාලනයටයි.

ගරු සභාපතිතුමනි, දේශපාලන හස්තයක් එක්ක තමයි ඒ අදාළ ක්‍රියාකාරිකයන් ක්‍රියාත්මක වුණේ. වත්මන් පොලිස්පතිවරයා පැහැදිලිව ප්‍රකාශයක් කර තිබෙනවා, තමන් පොලිස් සේවය විධියට දේශපාලන මැදිහත් වීමකින් තොරව අත්දැකීම් ලබන්නේ අද තමයි කියලා.

අපි දන්නවා, මීට කලින් තිබුණු තත්ත්වය. පාතාලය තනිකරම නඩත්තු කළේ දේශපාලන බල අධිකාරියයි. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ඉඳන් පහළට ගෙන බලන්නකෝ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කාවද නඩත්තු කළේ? "ගෝනවල සුනිල්." හිරේ හිටපු ගෝනවල සුනිල්ව එළියට අරගෙන දිවයිනටම සාම විනිසුරු කරලා ඒ මිනිහාම ලවා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගල් ගැස්සෙව්වා. අන්න, එදා පාතාලය නඩත්තු කරපු විධිය. ඊට පස්සේ ආර්. ප්‍රේමදාස මහත්මයාගේ කාලයේදී වෙව්ව දේ අපි දැක්කා. රිවඩ් ද සොයිසා විසින් "මේ කවුද, මොනවාද කරන්නේ" කියලා නාට්‍යයක් නිර්මාණය කළාට පසුව ඔහුව අරගෙන ගිහිල්ලා ඝාතනය කළ ආකාරය අපි දැක්කා. ඒ කාලයේ ඒගොල්ලන් පාතාලය නඩත්තු කළේ එහෙමයි.

ඔන්න මේ දවස්වල චිත්‍රපටයක් ඇවිල්ලා තිබෙනවා, "රානි" කියලා. "රානි" කියන චිත්‍රපටයෙන් පෙන්නන්නේ රිවඩ් ද සොයිසාගේ පැහැර ගැනීම සහ ඒ ඝාතනයයි. ඉතින් අපි සජිත් ප්‍රේමදාස මහත්මයාට කියනවා, ඒ චිත්‍රපටය ප්‍රසිද්ධියේ බලන්න බැරි නම්, හොරෙන් ගිහිල්ලා හරි බලන්න, තාත්තා කරපු වැඩ ටික බලා ගන්න පුළුවන් කියලා. ඒ වාගේම තමයි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ කාලය. එදා පාතාල ක්‍රියාකාරකම් තනිකරම කළේ නාවල නිහාල්ලා හරහා. ඒ විතරක් නොවෙයි. මහින්ද රාජපක්ෂගේ කාලයේත් එහෙමයි. "වම්බොට්ටා" නඩත්තු කළේ, "ජුලම්පිටියේ අමරේ" නඩත්තු කළේ වෙන කවුරුවත් නොවෙයි; රාජපක්ෂලා. තංගල්ල බන්ධනාගාරයේ සිද්ධියක් ඇති වුණාම එම බන්ධනාගාරයට ගියාට පසුව කිව්වා ලු, "අමරේ, පොඩ්ඩක් ඕක නවත්වන්න. මහින්ද ඇවිල්ලා තියෙන්නේ" කියලා. ඒ කියන්නේ, බන්ධනාගාරයක් ඇතුළේ සිදු වන ක්‍රියාකාරකම් පවා control කරන්න මහින්ද රාජපක්ෂලාට පුළුවන් වුණා, තමන්ගේ අතේ හිටපු පාතාලය නිසා. "වම්බොට්ටා" කියන්නේ පාතාලයේ ක්‍රියාකාරිකයෙක්. ඔවුන් තමයි එයාව නඩත්තු කළේ. ජුලම්පිටියේ අමරේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ bodyguard ලෙසයි හිටියේ. Bodyguard වෙලා සිටිද්දී අපේ නලින්ද ජයතිස්ස සහෝදරයා හිටපු රැස්වීමකට වෙඩි තියලා තුන්දෙනෙක් ඝාතනය කළා, ජුලම්පිටියේ අමරේ. ඒකට තමයි දැන් ඔහු හිරේ ඉන්නේ. එහෙම තමයි ඒ ගොල්ලන් පාතාලය නඩත්තු කළේ. ගරු සභාපතිතුමනි, පාතාලය නඩත්තු කරලා, පාතාලයට කිරි පොවලා, පාතාලයත් එක්ක ඉස්සරහට ඇවිල්ලා දින 91 ආණ්ඩුවට අද ඇඟිල්ල දිගු කරලා කියනවා, "මාර වැඩේ නේ. පාතාලය මර්දනයක් නැහැ නේ" කියලා. ගරු සභාපතිතුමනි, ඒගොල්ලන් තමයි මේ ප්‍රශ්නය ඇති කළේ. මේ ප්‍රශ්නය මත් ද්‍රව්‍යයත් එක්ක බෝ කරලා, මේ ප්‍රශ්නය පාතාලයට අරගෙන ඇවිල්ලා පාතාලයත් එක්ක ජීවත් වෙන මහත්වරු අපට ඇඟිල්ල දිගු කරලා කියනවා, "මාර වැඩේ නේ. ඔයගොල්ලන් මේ පාතාලය control කරන්නේ නැහැ නේ" කියලා.

ගරු සභාපතිතුමනි, දැන් කල්ලි, කණ්ඩායම් කිහිපයක් බිහි වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ පිළිබඳව පොලිස් අංශ අපට දැනුම් දීලා තිබෙනවා. පොලිස් වාර්තාවල ඒ විස්තර තිබෙනවා. "කුඩු අංජු", "රත්ගම විදුර", "කොස්ගොඩ සුජී", "කුඩු සළිඳු",

"ලොකු පැටී", "කෙහෙල්බද්දර පද්මේ", "බඩෝවිට අසංක", ලලිත් කන්නංගර ආදි කල්ලි කණ්ඩායම් ටිකක් දැන් බිහි වෙලා තිබෙනවා. ඒක ඇත්ත. වෙන දා ඒගොල්ලන්ව නඩත්තු කළේ දේශපාලන අධිකාරියයි. පොලිස් අංශ සොයා ගෙන යනවා තවමත් ඒවායේ ඉඟි බිඟි තිබෙනවා ද කියලා.

අපට සතුටුයි කියන්න, ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ කල්ලි, කණ්ඩායම් නඩත්තු කරන්නේ නැති දේශපාලන ව්‍යාපාරයක් හැදිලා තිබෙනවා. ඒ තමයි, ජාතික ජන බලවේගයේ අපි. අන්න, පොලිස් දෙපාර්තමේන්තුව සතුටු වෙන්න ඕනෑ. ඒක තමයි වත්මන් පොලිස්පතිවරයා ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියලා කිව්වේ, දේශපාලනයෙන් තොර පොලිස් සේවයක් ඉටු කරන්න තමන්ට දැන් පුළුවන් වෙලා තිබෙනවා කියලා. සී.ඩී. වික්‍රමරත්න හිටපු පොලිස්පතිවරයා මොකක්ද කිව්වේ? පොලිස් පත්වීම් දෙසීය ගණනෙන් 183ක් දේශපාලන පත්වීම් යැයි කිව්වා. විපක්ෂය දැන් පොලිස් කොමිසම ගැන කථා කරනවා. පොලිස් කොමිසමට ස්වාධීනව යන්න දෙන්න කියනවා. පොලිස් කොමිසම පිහිටෙව්වේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ ව්‍යවස්ථාව යටතේ නේ. ඇයි, පොලිස් කොමිසමට අත තියන්නේ කියලා අහනවා. අපි අත තියන්නේ නැහැ. පොලිස් කොමිසම ස්වාධීනව යනවා. ඒගොල්ලන් තමයි පොලිස් කොමිසමට එදා අත තිබ්බේ. ඒගොල්ලන්ගේ කාලයේ තමයි පොලිස් කොමිසමට අත තියලා, පොලිස් කොමිසම පැත්තකින් තියලා ක්‍රියා කළේ. පොලිස් කොමිසමයි තමනුයි අතර ගැටුමක් තිබෙනවා කියලා පොලිස්පතිවරයා අද දවසේ නිවේදනයක් නිකුත් කර තිබෙනවා කියා විපක්ෂය කියනවා. අපට නම් එහෙම ගැටුමක් පෙනෙන්න නැහැ. පොලිස් කොමිසම ස්වාධීනව ක්‍රියාත්මක වෙනවා වාගේම අදාළ ස්ථාන මාරුවීම් ටික ඒ විධියට සිදු වෙනවා.

ගරු සභාපතිතුමනි, කථාව අවසන් කරන්න කලින් තව කරුණු කීපයක් කියන්න ඕනෑ. අපට දැන් අකමැත්තෙන් වුවත් පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා, මේ කියපු සියලු ක්‍රියා පිටුපස, හමුදා සේවය අතහැර ගිහිපු, පොලිස් සේවය අතහැර ගිහිපු, සමහර විට සක්‍රිය සේවයේ ඉන්න උදවියත් ඉන්නවා කියලා; ඒ අය මේ පාතාල ක්‍රියා එක්ක සම්බන්ධ වෙලා විවිධ ක්‍රියාවලට සම්බන්ධ වෙලා තිබෙනවා කියලා. ඒ නිසා තමයි ආරක්ෂක ලේකම්වරයා නිශ්චිත තීන්දු තීරණ දෙකක් අරගෙන තිබෙන්නේ. ඒවා ඉතා හොඳ තීන්දු තීරණ දෙකක්. එකක් තමයි, මේ වන කොට ලබා දී තිබෙන සියලු පිස්තෝල, ගිනි අවි භාර දෙන්න, ඊට පසුව threat assessment එකක් තුළින් යළි ලබා දෙන්නම් කියන තීන්දුව. අපි දන්නවා ඒ කාලයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ඉඳලා අමාත්‍යවරයා දක්වා පිස්තෝල බෙදුවා කියලා. ඒ පිස්තෝල තමයි ඔය දවල්ට, රෑට ඇවිද ඇවිද තිබෙන්නේ. ඒ නිසා ආරක්ෂක ලේකම්වරයා එවැනි පියවරක් ගත්තු එක හොඳයි. මම කලිනුත් කිව්වා වාගේ ආරක්ෂක අංශය හැර ගිහිපු නිලධාරින් මේවාට සම්බන්ධ ද කියලා බලන්න ඕනෑ. ඒ අනුව නීති විරෝධී ලෙස හමුදාව හැර ගිහිපු සියලු දෙනා අත්අඩංගුවට ගන්න කියලා ආරක්ෂක ලේකම්වරයා නියෝගයක් කර තිබෙනවා. ඒක හොඳ නියෝගයක්.

ගරු සභාපතිතුමනි, දේශපාලන ව්‍යාපාරයක් වශයෙන්, දේශපාලනික වශයෙන් අපි ඒ ස්වාධීන ආයතනවලට මැදිහත් වෙන්නේ නැහැ. ඒ ස්වාධීන ආයතන ස්වාධීනව කටයුතු කරමින් අද මත් ද්‍රව්‍යවලට සහ පාතාලයට විරුද්ධව කටයුතු කරන්න සෘජුව මැදිහත් වෙමින් තිබෙනවා. ලසන්ත වික්‍රමතුංග ඝාතනය කරලා මේ වන කොට අවුරුදු 17ක් වෙනවා. තවමත් ඇත්ත වගඋත්තරකරු නිදැල්ලේ. තවමත් ඊට සම්බන්ධ තොරතුරු සොයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඇයි ඒ? ඒවාට සම්බන්ධ දේශපාලනඥයෝ සාක්ෂි මදය ගලවලා. නමුත්, දැන් අලුතින් සිදු වන සියලු අපරාධ රැල්ල වත්මන් පොලිස්පතිවරයා යටතේ සාර්ථකව මැඩ පැවැත්වීමට ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා; ඊට අදාළ මැදිහත්වීම් වෙනවා. ඔන්න ඕකයි වෙනස. ඔන්න ඕකයි දේශපාලනයේ වෙනස. ලසන්ත වික්‍රමතුංග ඝාතනය, තාජුඩීන් ඝාතනය, එක්නැලිගොඩ පැහැරගෙන යෑම ආදි සියලු සිදුවීම්වල සාක්ෂි මදය මරලා. සාක්ෂි මරලා තිබෙන්නේ කොහොමද? දේශපාලනයට සම්බන්ධ වන කොට සාක්ෂි මදය පැත්තකට යනවා.

ගරු සභාපතිතුමනි, අද දවසේ අපරාධ සිද්ධීන් යම්කිසි ප්‍රමාණයක් සිද්ධ වෙනවා. සමහරු ඒක ජාතික ආරක්ෂාවට ලඝු කරලා ඒක පලිහක් කර ගනිමින් බලනවා, පොලිස් නිලධාරින් දෙන්නෙකු, තුන්දෙනෙකු තමන් ළඟට ගන්න ක්‍රමයක් තිබෙනවාද කියලා. ඒගොල්ලන්ගේ පාලන කාලවල පාතාලය ක්‍රියාකාරී වන කොට නම්, ඒක ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවෙයි. දැන් සිද්ධියක් වෙන කොට ඒක ජාතික ආරක්ෂාවට තර්ජනයක් වූ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Deputy Minister, your time is up.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, කාරණය හරි පැහැදිලියි. අපි මේ කාරණයට අදාළව සක්‍රිය පොලිස් දෙපාර්තමේන්තුවක් යටතේ සක්‍රිය මැදිහත් වීමක් කරලා තිබෙනවා. මීට අදාළ සියලු ක්‍රියා මර්දනය කරන්න දේශපාලනයෙන් තොරව අපි මැදිහත් වෙලා තිබෙනවා. ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Gayantha Karunathilleka. You have 13 minutes.

[අ.භා. 12.16]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, රටටත්, ජනතාවටත් බෙහෙවින් බලපාන, විශේෂයෙන් මේ දිනවල බොහෝ දෙනෙකු කථා බහට ලක් කරන අමාත්‍යාංශ දෙකක් ගැන විවාද කරද්දී මට ලැබුණු කෙටි වෙලාව තුළ මහ ජනතාවට අතිශයින් සමීප සේවාවක් ඉෂ්ට කරන පොලිස් දෙපාර්තමේන්තුව ගැන, ඒ නිලධාරින්ට බලපාන කරුණු කිහිපයක් ගැන විතරක් අවධානය යොමු කරන්න මම කල්පනා කරනවා.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ පොලීසිය ඉතාම කීර්තිමත්, වසර 158ක පමණ අභිමානවත් ඉතිහාසයකට හිමිකම් කියනවා. මේ වන කොට පොලිස්පතිවරුන් 36දෙනෙකු යටතේ පොලීසිය පැවතිලා තිබෙනවා. වර්තමානය වන විට වැඩ බලන පොලිස්පතිවරයෙක් ඒ සඳහා නායකත්වය දෙනවා. ගරු සභාපතිතුමනි, වැඩ බලන පොලිස්පතිවරුන් යටතේ දීර්ඝ කාලයක් පොලීසිය තිබුණේ මේ මෑත කාලයේදී කියලා මම හිතනවා. අද වනකොට සක්‍රිය පොලිස් සේවයේ නිලධාරින් 83,000ක් විතර සේවය කරනවා. මා අහලා තිබෙන විධියට 20,000ක් විතර පුරප්පාඩු ද පවතිනවා. අද පොලීසිය ගැන කථා කරන කොට, අනෙක් ආයතනවල අයට වාගේම පොලිස් නිලධාරින්ටත් ලොකු ප්‍රහේලිකාවක් තිබෙනවා, වැටුප් වැඩි වීම

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කොහොමද වුණේ කියලා. කවදා ද වැඩි වෙන්නේ, කොහොමද වැඩි වෙන්නේ කියන ප්‍රශ්නය ඒ අයට තිබෙනවා. දැන් ගරු ඇමතිතුමාත් පැහැදිලි කිරීමක් කළා. පොලිස් නිලධාරීන්ට හෙට අනිද්දා වන කොට බලා ගන්න පුළුවන් වෙයි, කොහොමද වැටුප් වැඩි වෙන්නේ කියලා. ඔවුන් කැමතියි තනතුරුවලට අනුව වැටුප් කොපමණ වැඩි වුණා ද කියලා දැන ගන්න. අහන අහන පොලිස් නිලධාරීන් කියන්නේ, "මේ දේවල් වෙන්නේ කොහොමද කියලා අපි තවම දන්නේ නැහැ" කියලායි. ඒක තමයි ඇත්ත කථාව.

ඒ වාගේම, තමුන්නාන්සේලා නිතර කියපු කථාවක් තමයි පොලිස් නිලධාරීන් ඉන්න ස්ථානයේ සිට වෙනත් පොලිස් කොට්ඨාසවල විශේෂ රාජකාරිවලට යොදවන එක නතර කරනවා කිව්වා. සෑහෙන ප්‍රමාණයකින් ඒකේ අඩුවක් තිබෙනවා. විශේෂයෙන්ම කිව්වා, බෑග් එල්ලාගෙන තැනින් තැන යන විශේෂ රාජකාරිවලට යොදවන එක තමුන්නාන්සේලාගේ පාලනයක් යටතේ සම්පූර්ණයෙන් නතර කරනවා කියලා. නමුත් මම කියන්න කැමැතියි, මේ පාර්ලිමේන්තු කොට්ඨාසයේ විශේෂ රාජකාරි සඳහා වෙනත් කොට්ඨාසවල නිලධාරීන් සහ නිලධාරිනියන් තවමත් සම්බන්ධ කරන බව.

ඒ වාගේම, පොලීසියේ පුරප්පාඩු 20,000ක් විතර තිබෙනවා. කොතෙක් කලකින් ඒ බඳවා ගැනීම් කරන්න සැලසුම් කරලා තිබෙනවාද කියන එකත් දැන ගැනීම වැදගත්. ඒ බඳවා ගැනීම් කරනකොට නිලධාරීන් පිළිබඳ පසුබිම් වාර්තා ලබා ගැනීම අත්‍යවශ්‍යයි. සාමාන්‍යයෙන් ඉස්සර නම් හතර වරිගයම ගැන හොයලා බලනවා. කාගේ හරි කවුරුන් හෝ මොකක් හරි අපරාධයකට ගෑවිලා තිබෙනවා නම්, ඒක වාර්තා කරනවා. මම හිතන හැටියට ඒක ඉතාම හොඳින් කළ යුතුව තිබෙනවා. මොකද, අද බොහෝ අපරාධකරුවන්ගේ ඥාති සම්බන්ධකම් පොලිස් නිලධාරීන්ට ගෑවිලා තිබෙනවා. ඒක පොලීසියේ කීර්තිනාමයට නරකක් නිසා ඒ ගැන විශේෂයෙන් අවධානය යොමු කළොත් හොඳයි.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, රජයේ සේවකයෙක් වැඩ කරන්නේ සාමාන්‍යයෙන් පැය 8ක වාගේ රාජකාරි කාලයක්. පොලිස් නිලධාරියෙක් පැය 12 රාජකාරි කරන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට පැය 12න් නතර වෙන්නෙත් නැහැ. සමහර පොලිස් නිලධාරීන් පැය 12 රාජකාරි කරලා අවසන් වෙනකොට ඒ උසස් නිලධාරීන් තව තව රාජකාරිවලට ඔවුන් යොමු කරවනවා. වරෙන්තු මෙහෙයුම් කියලා යවනවා, ගව මෙහෙයුම් කියලා යවනවා, ක්ෂණික මාර්ග බාධකවලට යවනවා, විශේෂ මෙහෙයුම් වැනි රාජකාරිවලට යවනවා. ඒක නිසා පොලිස් නිලධාරීන්ට සමහර වෙලාවට සේවයේ තෘප්තිය නැති වෙලා තිබෙනවා. ඒ සමහරුන්ට සේවය එපා වෙලා තිබෙනවා. සමහර පොලිස් නිලධාරීන් මේ හේතු නිසා ලෙඩ වෙලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා අපි රජයෙන් ඉල්ලනවා.

ගරු සභාපතිතුමනි, මේ දිනවල පවතින මේ ඝාතන රැල්ලත් එක්ක බලනකොට හැම එකකම කෙළවරක පොලිස් නිලධාරියෙකුත් ඉන්න බව සමහර වෙලාවට අපි දකිනවා. අවුරුදු 158ක අභිමානවත් පොලිස් සේවාවේ බරපතළ ගැටලුවක් ඒ හරහා මතු වෙලා තිබෙනවා. සමහර වෙලාවට පොලිස් දෙපාර්තමේන්තුව ගැන තිබෙන මහජන විශ්වාසය නැතුව යනවා. ඒ කීර්තිනාමය ආරක්ෂා කර ගන්න නම්, මේ කරුණු පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුයි කියන එක මම කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් පොලීසිය ගැන කථා කරනකොට ඉස්සර ඉඳලා තිබුණු කථාවක් තමයි ඇතැම් නිලධාරීන් -හැමෝම නොවෙයි- අතරින් පතර හරි පොඩි පොඩි අල්ලසක් දෙකක් ගන්නවා කියන එක. එහෙම වාර්තා වෙනවා. නමුත් අද තිබෙන තත්ත්වය ඊට වඩා භයානකයි. අද පොඩි අල්ලසක් නොවෙයි, දැන් දරුණු අපරාධවලට සම්බන්ධ වෙනවා; කොන්ත්‍රාත් භාර ගන්නවා. මේක භයානක තත්ත්වයක්. මේකට හේතු සොයා බැලිය යුතුව තිබෙනවා. රාජකාරියෙන් ඉවත් වෙලා, ව්‍යාපාර පටන් ගන්න සැලසුම් කරලා තමයි මේවාට අත ගහන්නේ. මෙවැනි තත්ත්වයක් ඇති වෙන එක බොහොම භයානකයි. ඒ නිසා ඔවුන්ගේ රැකියාවේ තෘප්තිමත්භාවය ඇති කිරීම සඳහාත්, මෙවැනි තත්ත්ව නැති කිරීම සඳහාත් රජය විශේෂ අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, සක්‍රිය සේවයේ පොලිස් නිලධාරීන් 83,000ක් විතර ඉන්නවා. තව කොටසක් ඉන්නවා, පොලිස් නිලධාරීන් හැටියට ඉඳලා විශ්‍රාම ගිය අය. රාජකාරියේ යෙදී ඉන්න නිලධාරීන්ගේ පවුල්වල සාමාජිකයන් විශාල ප්‍රමාණයක් අපේ රටේ ජීවත් වෙනවා. මේ පොලිස් නිලධාරීන්ටත් පවුලේ උදවියටත් තිබෙන වරප්‍රසාදයක් තමයි පොලිස් රෝහල්වලින් නොමිලේ ප්‍රතිකාර ගන්න ලැබෙන එක. විශ්‍රාමිකයන්ටත් ඒ අවස්ථාව තිබෙනවා. මේ සඳහා නාරාහේන්පිට රෝහල සහ යාපනය, මහනුවර රෝහල් තමයි තිබෙන්නේ. අනුරාධපුරය, කුරුණෑගල, ගාල්ල, මාතර වාගේ පළාත් හැම එකකම පොලිස් නිලධාරීන් බහුලව ඉන්නවා. ඒ නිසා පුළුවන් නම් ඔවුන් වෙනුවෙන් තව රෝහලක් දෙකක් වැඩි කරලා ඒ විශ්‍රාමිකයන්ටත්, පවුල්වල අයටත්, පොලිස් නිලධාරීන්ටත් අසනීප අවස්ථාවලදී ප්‍රතිකාර ගන්න පුළුවන් පහසුකමක් ඇති කළොත් හොඳයි කියලා මා යෝජනා කරන්න කැමැතියි.

ඊළඟට ගරු සභාපතිතුමනි, පොලිස් නිලධාරීන්ගේ උසස්වීම් ගැන කථා කළොත්, පහළ නිලධාරීන්ට එක විධියක්; ඉහළ නිලධාරීන්ට තව විධියක්.

මම අහලා තිබෙන දෙයක් එක උදාහරණයක් හැටියට කියන්නම්. අපේ දේශබන්දු තෙන්නකෝන් මහත්මයා ගැන බැලුවොත්, එතුමා සහකාර පොලිස් අධිකාරි වශයෙන් පුහුණුවක් ලබලා විසිර යෑමේ උත්සවයට සම්බන්ධ වෙනකොට තව කෙනෙක් පොලිස් කොස්තාපල්වරයකු ලෙස පුහුණුවක් ලබලා දෙදෙනාම එකම දවසේ විසිර යෑමේ උත්සවයට සම්බන්ධ වෙලා තිබෙනවා. නමුත් ඉහළ මට්ටමේ අයට අවස්ථාව ලැබුණා, පොඩ්ඩෙන් පොඩ්ඩ ටක් ටක් ගාලා උඩට එන්න. තෙන්නකෝන් මහත්මයා ගත්තොත්, ASP හැටියට ඇවිල්ලා SP වුණා, SSP වුණා, DIG වුණා, Senior DIG වුණා, වැඩබලන IGP වුණා. පුහුණුව ලබලා එකම දවසේ විසිර ගිය සාමාන්‍ය පොලිස් කොස්තාපල්වරයාට තවමත් යන්න පුළුවන් වෙලා තිබෙන්නේ සැරයන් තනතුරකට විතරයි. ඒ නිසා මෙතැන විෂමතාවක් තිබෙනවා. ඒ නිසා පොඩි මිනිස්සුන්ටත් දක්ෂතාව, හැකියාව මත ඉහළට යන්න පුළුවන් ක්‍රමයක් ඇති කළොත් හොඳයි කියලා මම කියන්න කැමැතියි.

ඊළඟට ගරු සභාපතිතුමනි, බන්ධනාගාර නිලධාරීන්ට ගෙවනවා අවදානම් දීමනාවක් කියලා එකක්. ඒක ඇත්ත වශයෙන්ම ගෙවිය යුතුයි. ඒ මිනින්සු අවදානමක ඉන්නේ. හැබැයි පොලිස් නිලධාරියාටත් ඒ අවදානම් දීමනාව දිය යුතුයි. පොලිස් නිලධාරියා තමයි වැරදිකරුවන් හඹා ගිහිල්ලා, අත්අඩංගුවට ගන්නේ. බොහොම අවදානමක්, ඒක. ඒ අත්අඩංගුවට ගත්ත වෙලාවේ ඉඳලා අධිකරණයට ඉදිරිපත් කරනකම් ඒ අවදානම ගන්නේ පොලිස් නිලධාරීන්. ඒ නිසා බන්ධනාගාර නිලධාරීන්ගේ වාගේම අවදානමක් තමයි පොලිස් නිලධාරීන්ගේ රාජකාරියේදීත් තිබෙන්නේ. ඒ නිසා එවැනි අවදානම් දීමනාවක් පොලිස් නිලධාරීන්ටත් ලබාදීම අනිශයින්ම අවශ්‍යයි කියලා මම කල්පනා කරනවා.

ඊළඟට පොලිස් නිලධාරීන් මුහුණ දෙන තවත් ප්‍රශ්නයක් තමයි, දුර බැහැර පළාත්වල ඉඳලා යමක් කරගන්න පොලිස් මූලස්ථානයට ආවොත් මුහුණ දෙන ප්‍රශ්නය. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ඔවුන් විශ්‍රාම වැටුප හදාගන්න වාගේ දේකට ආවත් එක තැනකින් ඒක කරගන්න බැහැ. යන්න වෙනවා, තැන් ගණනාවකට. සුබසාධන කොටියාසයට ගිහිල්ලා වැඩක් කරගන්න කිව්වොත්, ග්‍රැන්පාස්වලට යන්න ඕනෑ. පිරිස් පාලන ඒකකයට සම්බන්ධ වෙලා වැඩක් කරගන්න වුණොත්, ආපහු එයා යන්න ඕනෑ ඉබ්බන්වල හන්දියට. මේ වාගේ තැනින් තැනට ඒ තමයි කටයුතුවලට යන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා එක වහලක් යටට, පොලිස් මූලස්ථානය වාගේ තැනකින් ඒ සියලු වැඩ කටයුතු කරගන්න පහසුකම් ලබා දුන්නොත් හොඳයි කියන එකත් මම කියන්න කැමැතියි.

ඒ වාගේම, ගරු සභාපතිතුමනි, උසස්වීම් සඳහා අවුරුදු 5කට වරක් තරග විභාග තිබෙන ක්‍රමයක් පොලිස් දෙපාර්තමේන්තුවේ තිබුණා, මීට කලකට පෙර. නමුත් ඒක සෑහෙන කාලයක් ක්‍රියාත්මක වුණේ නැහැ. මෑතකදී යළි එම තරග විභාගය පවත්වනවා කියලා නිලධාරීන්ට දැනුම් දීමක් කරලා තිබුණත්, එවැනි තරග විභාගයක් පොලීසිය තවමත් පවත්වලා නැහැ. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරලා, කනිෂ්ඨ පොලිස් නිලධාරීන්ටත් දක්ෂතාව, හැකියාව මත පියවරින් පියවර ඉදිරියට යන්න, තරග විභාගවලට මුහුණ දෙන්න අවශ්‍ය කටයුතු කරදෙන හැටියට අපි ඉල්ලා සිටින්න කැමැතියි.

ඒ වාගේම තමයි මම දැක්කා, නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේ කියැවුණු යමක්. එතුමාගේ කථාවේ අපි බලාපොරොත්තු වුණු දේවල්වලට වඩා එතුමා කිව්වේ "අර කාලයේ මෙහෙම වුණා, මේ කාලයේ මෙහෙම වුණා, මේක මෙහෙම වුණා" කියලා. මම හිතාගෙන හිටියේ 1988/1989 ගැනත් එතුමා කියයි කියලා. අර කොටිකාවත්තේ සද්ධාතිස්ස නායක හාමුදුරුවෝ වාගේ මහා විචිත්‍ර ධර්ම කථිකයන් වහන්සේලාට වෙච්ච අපරාධය ගැන වාගේම, විජය කුමාරතුංගලා ගැන වාගේ ලැයිස්තුවක් තිබෙනවා, කියනවා නම්. එදා තේවිස් ගුරුගේලා ඒ වාගේම අපේ ගම්වල අහිංසක මිනිස්සු මොනතරම් අපරාධවලට ලක් වුණාද? අදත් ඒ මිනිස්සුන්ගේ ජීවිත, පවුල්වල ජීවිත සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබෙන්නේ ඒ නිසා. මම කැමති නැහැ, ඒ ගණයට වැටෙන්න. මම ඊට වඩා ඒ ගැන කථා කරන්නේ නැහැ.

එතුමාගේ කථාවේදී කිව්වා, උපාධිධාරී පොලිස් නිලධාරීන්ට සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීමට අවස්ථාවක් ඉල්ලලා තිබෙනවා, ඒ ගැන අවධානය යොමු වෙලා තිබෙනවා කියලා. අද වෙලා තිබෙන්නේ මේකයි. දැන් පවතින ක්‍රමය යටතේ සක්‍රිය පොලිස් සේවයේ යෙදී සිටින පහළ තනතුරුවල රාජකාරි කරන පොලිස් නිලධාරීන්ට සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් වෙන්න ඉඩක් දෙන්නේ නැහැ. හැබැයි පිටස්තර ඉන්න උපාධිධාරීන්ට පුළුවන්, ඒ තනතුරුවලට ඉදිරිපත් වෙන්න. ඒ නිසා රාජකාරියේ ඉන්න අයට ඒකෙන් වෙන අසාධාරණය ගැන අවධානය යොමු කළොත් හොඳයි කියන එකත් මම කියන්න කැමැතියි.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියනවා, ගරු සභාපතිතුමනි. මට තව විනාඩි දෙකක් වාගේ නේද තිබෙන්නේ? එහෙනම් මම කථාව අවසන් කළ යුතුව තිබෙනවා.

මේ පාර්ලිමේන්තු පොලීසියේ රාජකාරි කරන උදවිය ගැන අවධානය යොමු කළ යුතුව තිබෙනවා. අපි හැමෝටම මේ දවස්වල උදේ ඉඳලා රෑ වනකල් ආරක්ෂාව සපයනවා. ඒ අයත් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. පාර්ලිමේන්තු කොටියාසයේ නිලධාරීන් දැනට අවුරුදු 5කට පමණ ඉහතදී ඇමති ආරක්ෂක කොටියාසයට අනුයුක්ත කළා. ඒ කියන්නේ, MSD එකට අනුයුක්ත කළා. හැබැයි, අදටත් ඒ අය ඇමති ආරක්ෂක කොටියාසයට -MSD එකට- අනුයුක්තව තමයි රාජකාරි කරන්නේ. නමුත්, තිබෙන ප්‍රශ්නය මේකයි. එකම රාජකාරිය කරන; එකම කොටියාසය වුණාට, මෙතෙක් කල් ඇමති ආරක්ෂක කොටියාසයට ගෙවපු තුනෙන් එකේ දීමනාව ලැබෙන්නේ කොටසකට විතරයි. ඇමති ආරක්ෂක අංශයට ලැබෙන තුනෙන් එකේ දීමනාව, අවුරුදු පහක් එම කොටියාසයට අනුයුක්ත කරලා මේ පාර්ලිමේන්තුවේ සේවය කරන පොලිස් නිලධාරීන්ට ලැබෙන්නේ නැහැ. පසුගිය ආණ්ඩුව තිබෙනකොටත් මම මේ කාරණය ගැන සඳහන් කළා මට මතකයි. දැන් JVP-NPP ආණ්ඩුව ආපුවාමත් මේ කාරණය නැවත මතක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ අය ගැන විශේෂ ඇල්මක් බැල්මක් යොදලා මේ අසාධාරණය ඉවත් කර දුන්නොත් හොඳයි කියලා මම හිතනවා.

ගරු සභාපතිතුමනි, මම මීට වඩා කථා කරන්න කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. දිවා ආහාරයට සභාවේ කටයුතු තාවකාලිකව නතර කරන්න වෙලාව ඇවිල්ලා තිබෙනවා. ගරු සභාපතිතුමාට කරදර කරන්න බැහැ, තව කාලය ඉල්ලලා. මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය පුද කර සිටිනවා. පොලිස් නිලධාරීන් වෙනුවෙන් සඳහන් කළ කාරණා ගැනත් අවධානය යොමු කරන්න කියා ඉල්ලනවා. මේ පිළිබඳ දේශපාලන කෝණයෙන් බලන්න එපා කියලාත් මම ඉල්ලනවා. විශේෂයෙන්ම පොලිස් නිලධාරීන් විශාල පිරිසක් තමුන්නාන්සේලා කෙරෙහි තමයි මේ මැතිවරණයේදී විශ්වාසය තැබුවේ. ඒ අයට හොඳ සේවාවක් කරන්න, හොඳ මානසිකත්වයකින් වැඩ කරන්න පුළුවන් පසුබිමක් ඇති කරයි කියලා බලාපොරොත්තු වුණා. අද ඊටත් වඩා අන්තයි කියලා තමයි මිනිස්සු කියන්නේ. හිටියාටත් වඩා අමාරු තත්ත්වයක ඉන්නේ කියලා කියනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. (Prof.) Anil Jayantha?

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

ගරු සභාපතිතුමනි, විපක්ෂයෙන් මතු කළ කාරණයක් නිවැරදි කරන්න ඕනෑ. විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ඡන්දය පැරදිලා ඉවත්ව යන වෙලාවේදී මහ බැංකුවේ තිබුණු සංචිත පිළිබඳවත්, දැන් තිබෙන සංචිත පිළිබඳවත් දත්ත ඉදිරිපත් කළා. එතකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 6,000කට ආසන්න ප්‍රමාණයක් - ඩොලර් බිලියන 6ක් - තිබිලා දැන් ඩොලර් මිලියන 5,700කට අඩු වෙලා තිබෙනවා කියලා කිව්වා. ඒ දත්ත වැරදියි. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගන්නා ලද අවසාන දත්ත අනුව 2024 දෙසැම්බර් 31 වනකොට සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.12ක් වනවා. ඒ වාගේම ජනවාරි මාසය අවසාන වනකොට ඩොලර් බිලියන 6.065ක් වනවා. පෙබරවාරි මාසය අවසන් වනකොටත් ඒ මට්ටමේම තිබෙනවා. එතකොට ඒ දත්තය වැරදියි කියන කාරණය පෙන්වා දෙන්න ඕනෑ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, ඒකෙන් පාවිච්චි කරන්න පුළුවන් ගණන කීයද?

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(මාණ්පුමිකු (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
පාවිච්චි කරන්න පුළුවන් ගණනත් කලින් ඉඳාලම ඒක ඇතුළේ තිබුණා, the People's Bank of Chinaවලින්. ඒක මෙතැනට විතරක් අදාළ එකක් නොවෙයි. කලින් ඉඳලාම දිගට වෙච්ච දෙයක්. රනිල් වික්‍රමසිංහගේ කාලයේ the People's Bank of Chinaවලින් තිබුණු ඩොලර් මිලියන 6,000 පොදු variable එකක්. ඒ වාගේම සංචිත පිළිබඳව සඳහන් කළ යුතු වනවා. සංචිත කියන්නේ, ඉතුරු කරලා තිබෙන දෙයක්. ඒක අඛණ්ඩව ගොඩනඟා ගැනීම තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒක ඉහළ යන්න පුළුවන්, පහළ යන්න පුළුවන්. සමහර වෙලාවට හිතාමතා තාවකාලිකව ආනයනය නැවැත්තුවොත්, ණය ගෙවන්නේ නැත්නම්, සංචිත වැඩි වෙනවා. නමුත්, ඉදිරියේදී අපේ තත්ත්වය වෙනස් වෙනවා. ආනයන ක්‍රමයෙන් වැඩි වෙනවා, ණය ගෙවීම් සිද්ධ වනවා. එවැනි තත්ත්වකදී අපි විශේෂයෙන්ම අපනයන ප්‍රවර්ධනය හා සේවා අපනයනත්, ඒ වාගේම විදේශීය ආයෝජන වැඩි කිරීම හරහාත් ක්‍රමිකව මේ සංචිත ගොඩ නැඟීමට බලාපොරොත්තු වනවා, ඩොලර් බිලියන 15ක ඉලක්කයක් සඳහා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Sitting is suspended till 1.30 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(මාණ්පුමිකු லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2025 වර්ෂයේ අය වැය විවාදයේදී ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජාතික ආරක්ෂක උපාය මාර්ග ක්‍රියාත්මක කරමින් දේශය වෙනුවෙන් භෞමික අඛණ්ඩතාවෙන් යුතු සුරක්ෂිත, ස්වෛරී රටක් තහවුරු කිරීම උදෙසා උපාය මාර්ගික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම හරහා සුරක්ෂිත ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේ කර්තව්‍යයට දායක වන ප්‍රධානම පාර්ශ්වකරුවා වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයයි. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා යුද හමුදාවට, ශ්‍රී ලංකා නාවික හමුදාවට, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ව්‍යෘත්තීය නිපුණත්වයක් සහිත හමුදාපතිවරුන් තිදෙනෙකු නායකත්වය දෙනවා. ඒ වාගේම ව්‍යෘත්තීය නිපුණත්වයක් තිබෙන, විනයගරුක, ඉතා ශක්තිමත් ත්‍රිවිධ හමුදාවක් අප රට තුළ සිටින බව අප කවුරුත් දන්නවා.

ඒ එක්කම අපි දන්නවා, මේ වන විට ලෝකය පුරා විශාල යුද්ධ ගණනාවක් පවතින බව. රුසියාව සහ යුක්‍රේනය අතර, ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර පවතින යුද්ධ ඒ අතරින් ප්‍රධාන තැනක් ගන්නවා. ඒ වාගේම එම යුද ගැටුම්වල දර්ශන අපි ගෙදර තිබෙන රූපවාහිනියෙන් නිරන්තරයෙන් දකිනවා. එහිදී මිනිස් ජීවිත විනාශ වෙනවා අපි දකිනවා. එහෙම දකිද්දී මේ රටේ සිටින කෙළෙහි ගුණ දන්නා මිනිසුන්ට මතක් වෙනවා, අපේ රටෙත් දශක තුනක යුද්ධයක් පැවති බව. එම යුද්ධය පැවතියේ උතුරු නැහෙනහිර වුණත් මුළු රටෙම -උතුරේ, දකුණේ, නැහෙනහිර, බටහිර, මධ්‍යම කඳුකරයේ වාගේම හැම තැනම- ජනතාව ඒ කාලයේ හිටියේ බියෙන් හා සැකයෙන්. ඒ, යම් කිසි තැනක බෝම්බයක් පුපුරයිද, මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් වෙයිද කියලා. ඒ තිස් වසරක යුද්ධය නිමා කරන්නට පුළුවන් වුණු ශක්තිවන්ත, චිත්ත ධෛර්යයක් තිබෙන, අභියෝග ජය ගන්න පුළුවන් ත්‍රිවිධ හමුදාවක්, පොලීසියක් සහ සිවිල් ආරක්ෂක බලකායක් අපට රට තුළ හිටියා. අදටත් එවැනිම ශක්තිවන්ත, විනයගරුක, කුසලතාවලින් පිරි, ව්‍යෘත්තීය නිපුණතාවකින් යුතු පිරිසක් අපේ රටේ යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතනයන්හි ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධිතව සිටිනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක බලකාය තමයි අපේ රටේ හැමදාම හැම ව්‍යසනයකදීම මුදා ගැනීමේ කටයුතුවලට, රට මුදා ගැනීමේ කටයුතුවලට දායකත්වය දැක්වූයේ. යුද්ධ පැවති අවස්ථාවේදීත්, ජාතික අර්බුද ඇති වුණු අවස්ථාවලදීත්, සුනාමිය අවස්ථාවේදීත්, ගංවතුර වැනි ව්‍යසන අවස්ථාවලදීත්, නාය යාම් අවස්ථාවලදීත් ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය තමන්ගේ රාජකාරිවලට අමතරව එම රාජකාරි ඉටු කිරීම සඳහා ඉතා කැපවීමෙන් කටයුතු කළා; ව්‍යෘත්තීය නිපුණතාවකින් යුතුව, විනයක් සහිතව ඒ හැම අවස්ථාවකටම දායකත්වය දැක්වූවා.

දස මාසයක් කුසේ තියාගෙන ඉඳලා මෙලොවට බිහි කරලා ලේ කිරි කරලා පොවලා උස් මහත් කළ තමන්ගේ දරුවා මේ රට ආක්‍රමණය කරන අයට විරුද්ධව සටන් කරන්න දන් දෙන්න කොයි අම්මාවත් කැමැති වෙන්නේ නැහැ. නමුත් දේශයේ අවශ්‍යතාව, දේශය සුරක්ෂිත කිරීම, ලක් මෑණියන් ආරක්ෂා කර ගැනීම සඳහා ඒ සටන්වලට, ත්‍රිවිධ හමුදාවට එදා අම්මලා තමන්ගේ දරුවන් භාර දුන්නා. ඒ වාගේම ලක් මාතාවගේ දරුවන් විශාල සංඛ්‍යාවක් මව් බිම වෙනුවෙන් තම ජීවිත පූජා කළා; ඇස්, ඉස්, මස්, ලේ දන් දුන්නා; අංගවිකලභාවයට පත් වුණා; ජීවිතයේ හොඳම තරුණ කාලය මාතෘ භූමියේ නිදහස වෙනුවෙන් කැප කළා. ඒ නිසා ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය කියන්නේ අභිමානවත් යුග පුරුෂයන්ගෙන් සැදුම්ලත් ක්ෂේත්‍ර.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ශ්‍රී ලංකාව තුළ සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්, මැලේ ආදී විවිධ ජන කණ්ඩායම් සිටිනවා වාගේම, විවිධ සංස්කෘතීන් තිබෙන, භාෂා දෙකක් කථා කරන ජනතාවක් සිටිනවා. එම ජන කණ්ඩායම් අතර තිබෙන, ඒ ජන

කණ්ඩායම් අතර නිර්මාණය වන සමගිය මත තමයි අපේ රටේ ජාතික ආරක්ෂාව රඳා පවතින්නේ. ඒ ආරක්ෂාව මතම තමයි රට තුළ සමගිය නිර්මාණය වෙන්නේ. ඒ නිසාම තමයි ජාතික ජන බලවේග රජය විධියට අපි හැම තිස්සේම කියන්නේ, "ශ්‍රී ලාංකික ජාතිය" නිර්මාණය කර ගන්නට ඕනෑය කියලා. ආගම් භේද, ජාති භේද තවදුරටත් මේ භූමිය තුළ තිබෙන්නට අවශ්‍ය නැහැ. නමුත්, බොරු කීමම රැකියාව කරගත් මිනිස්සු අද මේ සභා ගර්භය තුළ ජාතික ආරක්ෂාව ගැන කිඹුල් කඳුළු හෙළනවා. මීලේනියම් සිටි වාගේ තැන්වල ස්ථානගත කර තිබුණු බුද්ධි අංශ නිසි සොයා බැලීමකින් තොරව සමාජයට විවර කරලා ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති කරපු අයම තමයි ඒවා ගැන කිඹුල් කඳුළු හෙළන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම අපේ රටේ පැවති තිස් වසරක යුද්ධය -දශක තුනක යුද්ධය- ඕපපාතිකව ඇති වුණු එකක් නොවෙයි. අපේ රටේ දේශපාලනඥයන් විසින් විටින් විට බලය අත් පත් කර ගැනීම සඳහා උතුරේත්, දකුණේත් ජාතිවාදය වපුරපු නිසා සහ එම ජාතිවාදය මැතිවරණය වෙනුවෙන්, තමන්ගේ දේශපාලනික කටයුතු වෙනුවෙන් වපුරපු නිසා තමයි ඒ යුද්ධය ඇති වුණේ. එහෙම නැතිව උතුරේ සිටින සහෝදරයාට, අම්මාට, තාත්තාට, ඒ වාගේම දකුණේ සිටින සහෝදරයාට, අම්මාට, තාත්තාට ඒ කාටවත් ජාති භේදයක්, ආගම් භේදයක් අවශ්‍ය නැහැ. මේවා දේශපාලනිකවම ඇති කරපු දේවල්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ශ්‍රී ලංකාව කියන්නේ, මුහුදෙන් වට වුණු දූපතක්. මේ වාගේ දූපත් රාජ්‍යයක හමුදාවක් ගත්තාම, ඇත්තටම ඒ හමුදාව ප්‍රමාණාත්මක ගණනට වඩා ගුණාත්මක අගයකින් වැඩිදියුණු කිරීම තමයි අපට අවශ්‍ය වෙන්නේ. එහෙම ගත්තාම, විශේෂයෙන්ම සමුද්‍රීය ගුවන් බලකායක අවශ්‍යතාව ශ්‍රී ලංකාවට තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මත් ද්‍රව්‍ය ජාවාරම් මැඩලීම සඳහා නාවික යාත්‍රා නිරන්තයෙන් යෙදවීම සිදු කර තිබෙනවා. එම එක් යාත්‍රාවක් එක් තැනක ස්ථානගත කර තිබියදී අවට මුහුදු කලාපය කුඩා ගුවන් යානයකින් නිරීක්ෂණය කරන්නට පුළුවන් නම් ඒ තුළින් අපට විශාල සමුද්‍රීය වපසරියක් නිරීක්ෂණය කිරීමට හැකියාව තිබෙනවා. ඒත් එක්කම විශාල නෞකාවක් මුහුදේ එහා මෙහා ගමන් කරනවාට - move වෙනවාට - වැඩිය අඩු කාලයකින් හා අඩු වියදමකින් අපට ඒ ප්‍රදේශ නිරීක්ෂණය කරලා සැක කටයුතු දේවල් පිළිබඳව එම නෞකාවට දැනුම් දීලා අවශ්‍ය පියවර ගැනීමට සමුද්‍රීය ගුවන් ආරක්ෂක පද්ධතියක් තිබීමත් ඉතා වැදගත් වෙනවා. එතකොට ඒ නිශ්චිත අවශ්‍යතාව සඳහා පමණයි එම නෞකාව ගමන් කළ යුතු වෙන්නේ. 1999-2000 වාගේ කාලය වෙද්දී නාවික-ගුවන් බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය හැකියාව ඇති "සයුර" වාගේ නෞකා නාවික හමුදාව සතු කර ගත්තා. නමුත්, නෞකාවක් සඳහා අවශ්‍ය Chetak වැනි ගුවන් යානයක් මීලඟට ගැනීම සිදු වුණේ නැහැ. එම ගුවන් යානය මීලඟට ගැනීම සඳහා අවශ්‍ය සියලුම වටපිටාව සකස් වුවද, ඊට අවශ්‍ය යාත්‍රාව තිබුණද, එම යානය මීලඟට නොගත්තේ ඇත්තටම ඒ දිනවල තිබුණු දේශපාලන මැදිහත් වීම නිසායි. මොකද, ඒ අවධියේ හමුදාවන් දැඩි ලෙස දේශපාලනීකරණයට ලක් කරලා තිබුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම මේ වෙද්දි අපේ රට තුළ කුඩා ගුවන් යානා හැසිරවීමට හැකි යාත්‍රා විශාල සංඛ්‍යාවක් තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, ගජබාහු, විජයබාහු, සිදුරළ, සයුරළ වැනි යාත්‍රාවලට සැහැල්ලු ගුවන් යානයක් එම යාත්‍රාව මත තබාගෙන එය හැසිරවීම කරන්න පුළුවන්. ඒ වාගේම නාවික හමුදාව සතුව තිබෙන සමුදුර, සාගර වැනි නෞකාවන්ටත් ගුවන් යානයක් හැසිරවීමේ හැකියාව තිබෙනවා. මේ වාගේ යාත්‍රාවලට ඒ විධියට කටයුතු කරන්නට නොහැකි වුණේ, ඇත්තටම පසුගිය කාලයේ ත්‍රිවිධ හමුදාවන් තුළට සිදු කළ අසීමිත දේශපාලන ඇඟිලි ගැසීම් නිසායි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජාතික ජන බලවේග රජයක් තුළ කිසිම දූෂණයක්, වංචාවක්, නාස්තියක් හෝ අවභාවිතාවක් සිදු නොවන පරිසරයක් තුළ, විශේෂයෙන්ම හමුදාව තුළට දේශපාලනික ඇඟිලි ගැසීම් සිදු නොවන නිසා ඉදිරියේදී තාක්ෂණයෙන් දියුණු, ඒ වාගේම ප්‍රබල ලෙස ශක්තිමත් තාක්ෂණික දැනුමක් සහිත ත්‍රිවිධ හමුදාවක් නිර්මාණය කර ගන්න අපට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඇත්තටම ශ්‍රී ලංකාව වාගේ 26 ගුණයක් විශාල සාගර කලාපයක් තුළ search and rescue operations - SARs - කරන්න, ඒ කලාපය තුළ අවශ්‍ය කරන මුදා ගැනීමේ - ගලවා ගැනීමේ - කටයුතු coordinate කරන්න අපට වගකීම පැවරිලා තිබෙනවා. ඒ කටයුතු කරන්න හමුදාවන් තාක්ෂණිකව ශක්තිමත් කිරීම ඇත්තටම අවශ්‍ය වෙනවා. ඒ වාගේම අපට ශ්‍රී ලංකාව වාගේ හත් ගුණයක් විශාල අනන්‍ය ආර්ථික කලාපයක් - exclusive economic zone එකක් - තිබෙනවා. ඒ අනන්‍ය ආර්ථික කලාපය තුළ තිබෙන සාගර සම්පත් ආරක්ෂා කරන එක අපට පැවරුණු රාජකාරියක්. මොකද, ඒ සාගර සම්පත්වල අයිතිය තිබෙන්නේ ශ්‍රී ලංකාවට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

සාගර කලාපයේ ආරක්ෂාව තහවුරු කිරීමට, "Wave Rider" වැනි බෝට්ටු නිර්මාණය කිරීමට, medium speed patrol boats නිර්මාණය කිරීමට වාගේම ශ්‍රී ලංකා නාවික හමුදාව සතු නෞකාවල අලුත්වැඩියා කටයුතු කිරීමට, Y-12 වැනි ගුවන් යානා මිලදී ගැනීමට, ඇමෙරිකාවේ නිෂ්පාදිත වෙරළාරක්ෂක යාත්‍රා ලබා ගැනීමට, ජාතික ආරක්ෂාව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වැඩකටයුතු ත්‍රිවිධ හමුදාව තුළම සිදු කිරීමට අවශ්‍ය කරන මුදල් 2025 වර්ෂයේ අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා. මේ අනුව අබමල් රොනකින්වත් ජාතික ආරක්ෂාව කඩාගෙන වැටෙන්නේ නැති රටක් අපි හදනවා; ඒ රට අපි හදලා තිබෙනවා. ඒ නිසා ජාතික ආරක්ෂාවට කිසිම ගැටලුවක් වෙන්නේ නැහැ කියන කාරණය කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.42]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද බොහෝදෙනෙකුගේ අවධානය යොමු වෙලා තිබෙන විෂයයක් තමයි විවාදයට ගැනෙන්නේ. එදා අපට ප්‍රකාශ කළේ බංකුවක වාඩි කරවලා විපක්ෂයේ ඉන්න අයටත්, රටේ ජනතාවටත් ජාතික ආරක්ෂාව ගැන ටියුෂන් දෙනවාය කියායි. හැබැයි, අද යථාර්ථයක් බවට පත් වෙලා තිබෙන්නේ, විපක්ෂයේ අයගේ ටියුෂන් එක එතුමන්ලාට අහගෙන ඉන්න වෙලා තිබෙන එකයි. අද බොහෝ අය මේ ජාතික ආරක්ෂාව කියන කාරණය දේශපාලනීකරණය කරන්න උත්සාහ කරනවා. ඔබතුමන්ලා ඒක කරන්න උත්සාහ කරන්නේම අපට ඇඟිල්ල දිගු කරමින්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, හැබැයි ජාතික ආරක්ෂාව කියන කාරණය බැඳී පවතින්නේ ජාතික ආර්ථිකය එක්කයි. රටේ තිරසාර සංවර්ධනයක් නැත්නම් එතැන ජාතික ආරක්ෂාව නැහැ. දකුණේ තරුණයන් අතර කලබල ඇති වුණා. ඒකට වග කිව යුත්තේ කවුද, නැත්තේ කවුද කියන කාරණය පිළිබඳව මම මේ වෙලාවේදී සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. දැන් අපි එහි යථාර්ථය පිළිබඳව කථා කරමු. උතුරේ තරුණයන්ගේ අරගළය තුස්තවාදයක් බවට පරිවර්තනය වුණා. ඒ හැම අවස්ථාවකදීම අපි දැක්ක පොදු කාරණය තමයි, තිරසාර සංවර්ධනයක් රටක නොමැති අවස්ථාවක ඒ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් එල්ල වීම. හැබැයි, තිරසාර සංවර්ධනයක් තිබෙනකොට ජාතික ආරක්ෂාව තහවුරු වෙනවා. එතකොට ආර්ථිකමය වශයෙන් රට ස්ථාවර වෙන්න ඕනෑ; මහ ජනයාගේ ආරක්ෂාව තහවුරු වෙන්න ඕනෑ. පරිසරය, සෞඛ්‍ය වාගේම අනික් පැත්තෙන් අපි හැම දාම පොදුවේ කථා කරන military එක - ත්‍රිවිධ හමුදාව, පොලීසිය -, බලශක්තිය කියන මේ කාරණාවලින් ස්වයංපෝෂිත වුණොත් පමණයි අපට රටේ ජාතික ආරක්ෂාව තහවුරු කර ගන්න හැකියාව ලැබෙන්නේ. එහෙම නැතිව වදුරෙක් හරි, රිළවෙක් හරි පැන්නාම රටේම විදුලි බලය විසන්ධි වෙනවා නම් ජාතික ආරක්ෂාව ගැන අපි වෙනම විවාද කරලා එලක් වෙන්නේ නැහැ. ඒක විදුලිබල මණ්ඩලය සහ බලශක්ති අමාත්‍යාංශය වෙනම project එකක් විධියට දකිනවා ඇති. හැබැයි, ඔබතුමන්ලා, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම දරන අය ඒක ප්‍රධාන වශයෙන් සැලකිය යුතු කාරණයක්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

පසුගිය කාල සීමාව තුළ අපි දැක්කා, ආයුධ සන්නද්ධ කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය. අපි ඒවා පාතාලය; ආයුධ සන්නද්ධ කණ්ඩායම්; දෙපිරිසක් අතර ඇති වෙච්ච අර්බුදයක් කියලා හඳුන්වනවා. නොයෙක් අය නොයෙක් විධියට ඒවාට අර්ථ කථන දෙනවා. හැබැයි, මේ හැම කාරණයක් තුළම ගැබ් වුණු කාරණය මොකක්ද? යම්කිසි අවධානයක් යොමු කළ යුතු, වගකීම් දරන පුද්ගලයන්ගේ අවධානය යොමු කළ යුතු, deep analysis එකක් කළ යුතු, එහෙම නැත්නම් ඒ පිළිබඳව විශාල වශයෙන් අධ්‍යයනය කළ යුතු යම් කාරණයක් සිද්ධ වෙනවා කියන එක.

පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ මහ මොළකරු ගැන අදටත් කථා කරනවා අපි දකිනවා. දේශපාලන මැදිහත්වීම ගැන කථා කරනවා.

ඒ කාලයේ පොලීසිවල හිටපු ප්‍රධාන නිලධාරීන් තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවල අදටත් සේවය කරන්නේ. හැබැයි, එදා අපි දැක්කේ මොකක්ද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2017.03.10 දින කාත්තන්කුඩි අලියාර් හන්දියේ ගැටුම, 2019.04.16 දින තාලංකුඩා ප්‍රදේශයේ යතුරු පැදියක් පුපුරුවා හැරීම, පුත්තලමෙන් කිලෝ 100ක විතර පුපුරණ ද්‍රව්‍ය හමු වීම, මාවනැල්ල බුදු පිළිම විනාශ කිරීම වාගේ සිදුවීම් වුණා. ඒ වාගේම සමහර අය ඒ පිළිබඳව තොරතුරු දුන්නාම - ඔත්තු දුන්නාම - තුවක්කුව කටට තියලා වෙඩි තැබුවා. මේ සිදුවීම් ධාරාව තුළ එදා හිටපු ආණ්ඩුව මොකක්ද කිව්වේ? මේ හැම එකක්ම හුදෙකලා සිදුවීම් විධියටයි හැඳින්වූයේ. "නැහැ, මේ එක සිදුවීමක්. අපි ඒ ගැන හොයනවා. බුදු පිළිම කැඩීම එක සිදුවීමක්. අන්තවාදී කණ්ඩායමක් විසින් කරපු සිදුවීමක්. දේශපාලනික වශයෙන් මේක මෙහෙයවන්න උත්සාහ කරනවා" කියලා එදා මේක වෙන පැත්තකට හැරෙව්වා. අවසානයේ මොකක්ද සිදු වුණේ? පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වුණා. අද වෙනකල් ඒක වගකිව යුතු පුද්ගලයෙකු නැති සිද්ධියක් බවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ තත්ත්වයට අද අපේ රට පත් වෙලා තිබෙනවා.

හැබැයි, එදා සිදු වුණු පළමුවැනි සිද්ධියත් එක්කම ජාතික ආරක්ෂාව හසුරුවපු අය ඒ පිළිබඳව අවධානයෙන් කටයුතු කරලා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා නම්, මේ හැම සිද්ධි දාමයක් තුළම එකිනෙකාට තිබෙන බැඳීම් පිළිබඳව අධ්‍යයනය කළා නම්, ඒ බුද්ධි අංශ වාර්තාවලට අනුකූලව ආණ්ඩුව ක්‍රියාත්මක වුණා නම් ඒවා ලේසියෙන්ම වළක්වා ගන්න තිබුණාය කියලා මම අදටත් හිතනවා. හැබැයි, එදාත් කළේ මොකක්ද? එදා හිටපු ආණ්ඩුවත්, එදා හිටපු නිලධාරිනුත් ඒ හැම සිදුවීමක් සම්බන්ධවම නොයෙක් දේශපාලන පක්ෂ හෝ පාර්ශ්වවලට ඇඟිල්ල දිගු කරලා, චෝදනාව එක පැත්තකට දැමීමා. අවසානයේ ජාතික ආරක්ෂාව කඩාගෙන වැටුණා.

අපි දන්නවා, Golden Triangle එක ඇතුළේ තමයි synthetic drugs වැඩිපුර නිෂ්පාදනය වෙන්නේ කියලා. අයිස් වැනි මත්ද්‍රව්‍ය ඉන්දියානු සාගරයෙන් දකුණු ආසියාව හරහා තමයි ලෝකයට ප්‍රවාහනය වෙන්නේ. ඇෆ්ගනිස්ථානය කේන්ද්‍ර කරගෙන තමයි හෙරොයින් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ සියල්ලම දකුණු ආසියාව කේන්ද්‍ර කරගෙන තමයි ලෝකයට බෙදා හැරෙන්නේ. ලංකාව නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත් කරනකොට හැම නිස්සේම අපි තේරුම් ගත යුතු කාරණයක් තිබෙනවා. අපි සද්භාවයෙන් අපේ රට නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත් කරලා transshipment hub එකක් බවට පත් කළත්, අපේ කලාපයේ තිබෙන සමහර tribal areasවල පවත්නා ආණ්ඩුවලටවත්, පරිපාලන ව්‍යුහයටවත් මැදිහත් වෙන්න බැරි කලාප කේන්ද්‍ර කරගත් පුද්ගලයන්, කණ්ඩායම්, මාෆියාවන්, drug mafiaවන් තවත් තිබෙනවා. මේ කලාපයේ මත්ද්‍රව්‍ය හසුරුවන වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒකේ කේන්ද්‍රස්ථානය විධියට ලංකාව පත් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම ලංකාව අද ලොකු market එකක් බවට පත් වෙලා තිබෙනවා. පසුගිය අවුරුදු දහයක කාලයේ හෙරොයින්, අයිස් වැනි මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වෙලා තිබෙනවා. ඒ තුළ මේ රට ඇතුළේ නොයෙකුත් කල්ලි බිහි වෙනවා. ඒ කල්ලි කණ්ඩායම් අතර ආරාවුල් ඇති වෙනවා, තමන්ගේ market cap එක බෙරා ගන්න; රට ඇතුළේ තිබෙන තමන්ගේ market එක කියා ගන්න. ඒ තුළ දකුණු ආසියාවේ මත්ද්‍රව්‍ය බෙදා හරින කේන්ද්‍රස්ථානයක් බවට නිරායාසයෙන්ම අපේ රට පරිවර්තනය වෙනවා. මේකට අපි මුහුණ දෙන්න ඕනෑ.

අධිකරණ භූමිය තුළ සිදුවුණු සිදුවීමක් දේශපාලනීකරණය කරන්න, තවත් තැනක වෙච්ච සිදුවීමක් දේශපාලනීකරණය කරන්න යෑම තුළ මේ කාරණයට කිසි දවසක සාධාරණයක් සිදු වන්නේ නැහැ. එක සැරේට OICලා 130ක්, 150ක් මාරු කළා කියලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ හින්දා අපි ආණ්ඩුවෙන් ඉල්ලන්නේ, මේවා හුදෙකලා සිදුවීම් විධියට දකින්න එපා කියන එකයි, ගරු ඇමතිතුමනි. මේක සංවිධානාත්මක ගෝලීය drug mafiaවත් එක්ක බද්ධ වෙච්ච දැවැන්ත ව්‍යාපාරයක්. ඒක සංවිධානාත්මක විධියට ලංකාවට පමණක් ආවේණික වුණු කාරණයක් විධියට දැක්කොත් අවසානයේ පාස්කු ඉරුදින ප්‍රහාරය වාගේ තව කාලයක් යනකොට මේක යම් තැනකට පරිවර්තනය වනවා. එහෙම වුණාම නැවත වතාවක් අපට චෝදනා කරලා ඵලක් වෙන්නේ නැහැ.

එදාත් අපි දැක්කා පොලිස්පතිවරයා, ආණ්ඩුව, ජනාධිපතිවරයා, අගමැතිවරයා අතර අර්බුදයක් තිබෙනවා. අදත් අපි දකිනවා, පොලිස්පතිවරයා හා පොලිස් කොමිසම අතර යම් ගැටීමක් තිබෙනවා. මේ ගැටීම් ඇතිවීම තුළ අවසානයේ මොකක්ද වෙන්නේ? එක පැත්තකින් බුද්ධි අංශ ක්‍රියාත්මක වෙන එකක් නැහැ. තවත් පැත්තකින් ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් එනවා. ඒ කාරණා ඇති වනකොට ඒක ජාතික ආර්ථිකයට බලපානවා. ජාතික ආර්ථිකයට එය බලපෑම තුළින් ආයෝජකයින් වාගේම සංචාරක ව්‍යාපාරය කඩාගෙන වැටෙනවා. අවසානයේ සමස්ත ආර්ථිකයම කඩාගෙන වැටෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු විෂය භාර අමාත්‍යවරුනි, ඊළඟ අවුරුදු පහේ ඔබතුමන්ලාට සහ මේ රටට මුහුණ දෙන්න සිදු වන සුවිශේෂ අභියෝග කිහිපයක් තිබෙනවා.

එකක් තමයි, අන්තවාදය. කලාපය ගත්තත්, අන්තවාදය පිළිබඳව විශාල අවධානයක් යොමු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමුන්නාන්සේලා සැහැල්ලුවෙන් බලන්න එපා. ඒක දේශපාලන කාරණයක් නොවෙයි. අන්තවාදය ව්‍යාප්ත වීම මේ කලාපය තුළ වාගේම ලෝකයේ අද විශාල අභියෝගයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒකට මුහුණ දෙන්න අපි සූදානම් වෙන්න ඕනෑ. තවත් පැත්තකින්, අන්තවාදය පසුකාලීනව ත්‍රස්තවාදය බවට පරිවර්තනය වෙන්න පුළුවන්. ත්‍රස්තවාදය බවට පරිවර්තනය වීම තුළ නැවත වතාවක් අපේ රට ත්‍රස්තවාදී අර්බුදයකට මුහුණ දෙන තැනට පරිවර්තනය වෙන්න පුළුවන්.

ඒ වාගේම තමයි සංවිධානාත්මක අපරාධ. භූගෝලීය වශයෙන් අපේ පිහිටීම නිසා නාවික කේන්ද්‍රස්ථානයක් බවට අපේ රට පරිවර්තනයක් වනකොට, ඇෆ්ගනිස්ථානයේ වාගේම Golden Triangle එකේ - තායිලන්තයේ, මියන්මාරයේ, ලාඕසයේ - නිෂ්පාදනය කරන්නා වූ synthetic drugs ටික Indian Ocean එක හරහා transship වනකොට, අපේ සාගරය හරහා යනකොට, ලංකාව එක කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙනවා. ලංකාව කේන්ද්‍රස්ථානයක් බවට පත් වනවා වාගේම තමයි අද ලංකාව ඔවුන්ට වෙළෙඳ ව්‍යාපාර සඳහා -ඔවුන්ගේ ව්‍යාපාරය සඳහා- ලොකු මාර්කට් එකක් බවට පත් වෙලා තිබෙනවා. ඒ කාරණාවේදී මම හිතනවා, ආණ්ඩුව සංවිධානාත්මක අපරාධ පිළිබඳව මීටත් වඩා අවධානය යොමු කළ යුතුයි වාගේම, එය එක හුදෙකලා සිදුවීමක් හෝ එක සිද්ධියක් විධියට දකින්නේ නැතුව සමස්ත ජාලයක් විධියට දැකිය යුතුයි කියලා.

ඊළඟට, cyber security. අද අතිගරු ජනාධිපතිතුමා ඩිජිටල්කරණය ගැන කථා කරනවා. ඔව්, ලෝකය ඩිජිටල් ආර්ථිකයකට පරිවර්තනය වනවා. පසුගිය කාල සීමාව තුළම පිරමීඩ ජාලයක් හරහා ලංකාවේ මුදල් වංචා කිරීම් සිදු වුණ බව අපි දැක්කා. පිරමීඩයක් ඩොලර් මිලියන 100ක් බවට පරිවර්තනය වන කල් ඉඳලා ඒක නැවැත්වූවා කියලා සාධාරණයක් කාටවත් වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම තමයි cyber attacks, cyber security සම්බන්ධයෙන්; මේ රටේ අන්තර්ජාල පද්ධතිය වාගේම ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් මීට වඩා ආණ්ඩුව සූදානම් වෙන්න ඕනෑ. මොකක්ද අපට තිබෙන සැලැස්ම? විෂය භාර ගරු අමාත්‍යවරයාගෙන් අපි ඒ ගැන දැන ගන්න කැමැතියි. Cyber security සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ plan එක මොකක්ද, රටට එවැනි ප්‍රහාරයක් එල්ල වෙන්න තිබෙනවා නම් ඒ සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග මොනවාද කියලා ගරු සභාව දැනුවත් කරන්න කියන ඉල්ලීමත් මා කරනවා.

ඊළඟට, මහජන කැලඹීම - public unrest. අපි දැක්කා, ලංකාවේ අරගළයක් ඇති වුණා. ඒ වාගේම බංග්ලාදේශයේ සහ පාකිස්තානයේත් ඇති වුණා. මේ ගෝලීය ආර්ථිකයත් එක්ක, අද ලෝකයේ තිබෙන භූගෝලීය දේශපාලන වෙනස්වීම් එක්ක එවැනි අර්බුදවලට, අරගළවලට අපට නිරන්තරයෙන් මුහුණ දෙන්න සිදු වනවා. ඒ සඳහා ආණ්ඩුවක් විධියට අපි සූදානම් වනවා ද? ඔව්, ලංකාවේ අරගළය ඇති වුණේ බලශක්ති සුරක්ෂිතතාව - energy security - එක්ක, තෙල් ප්‍රශ්නයත් එක්ක. එහෙම නම් මේ හැම කාරණයක්ම එකට එක බැඳිලා තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමන්ලා අවබෝධයෙන් කටයුතු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. මේවා සඳහා තිබෙන ජාතික සැලැස්ම මොකක්ද? එන හැම ප්‍රශ්නයකදීම පසුගිය ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන එක නොවෙයි, කළ යුත්තේ. මම දැක්කා, වටගල නියෝජ්‍ය ඇමතිතුමා කියලා තිබුණා, නාමල් රාජපක්ෂගේ ආරක්ෂාවටත් පාතාලයෙන් ඉඳලා තිබෙනවා කියලා. ඉතින් එහෙම ආරක්ෂාව තියාගෙන හිටියා නම් ගිහිල්ලා කියන්න, රැස්වීමක, වේදිකාවක ගනිපු පින්තූරයක් පෙන්වලා ඒ පින්තූරයේ ඉන්න කෙනා තමයි මෙයාගේ ආරක්ෂිතයා කියනවා වෙනුවට. ඔබතුමුන්නාන්සේලා අලුත් දේශපාලන සංස්කෘතියක් හදනවා නම්, ඇයි ඔබතුමුන්නාන්සේලාට කරුණු කාරණා එක්ක ඒ පිළිබඳව සාධනීය විධියට බලන්න බැරි? පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා මෙතැන ඕනෑ බොරුවක් කියලා මහ ජනතාව නොමඟ යවන්නේ ඇයි?

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම ගරු සභාවට යෝජනාවක් කරනවා. ඔබතුමන්ලා මන්ත්‍රී වරප්‍රසාද ඇයින් කරනවා නේ. බොහොම හොඳයි. ඔබතුමන්ලා vehicle permit එක ඇයින් කළා නේද? ඇයින් කළා නොවෙයි, දෙන්නේ නැහැ කිව්වා. පසුගිය ආණ්ඩුවේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා දුන්නෙත් නැහැ, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා දුන්නෙත් නැහැ. දැන් මේ ආණ්ඩුවෙන් දෙන්නෙත් නැහැ. ඒ වාගේම insurance එකත් අඩු කළා. ඉතින් අපි ඔක්කෝම එකතු වෙලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ බොරු කියන්න තිබෙන වරප්‍රසාදයත් අයින් කරමුකෝ. අපි ඒක අයින් කරමු. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා පාර්ලිමේන්තුවේ ඉන්න, නොසිටින ඕනෑම කෙනෙක් පිළිබඳව කියන්න තිබෙන අයිතිය අපි අයින් කරමු. එක්කෝ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට අපි එම යෝජනාව ගෙනෙන්නම්. නැත්නම් ආණ්ඩුව හැටියට ඔබතුමුන්නාන්සේලා ඒක ගෙනෙන්න. ගෙනැල්ලා අපි ඒ වරප්‍රසාදය අයින් කරලා සද්භාවයෙන් කටයුතු කරමු. එහෙම නැත්නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, හැම දාම මේ වරප්‍රසාදවලට මුවා වෙලා එහෙන් එක බොරුවක් කියනකොට මෙහෙන් ඒක වහන්න තව කථාවක් කියනවා. මෙහෙන් බොරුවක් කිව්වොත් එහෙන් කියනවා. පසුගිය අවුරුදු ගණනාව තුළම මොකක්ද වෙලා තිබෙන්නේ?

එම නිසා අපි යෝජනා කරනවා, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා මන්ත්‍රීවරුන්ට බොරු කියන්න තිබෙන අයිතියත් අයින් කරන්න. වරප්‍රසාද කමිටුවට තව බලතල දෙන්න. එවැනි දෙයක් කරලා තිබෙනවා නම් වරප්‍රසාද කමිටුවෙන් ක්‍රියාත්මක වෙන්න.

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

එහෙම නැත්නම්, අඩුම ගානේ උසාවි යන්න, සිවිල් නීතිය යටතේ දඩුවම් දෙන්න. Criminal defamation ගෙනෙන්න පුළුවන් නම් හොඳයි. හැබැයි, ඒකට බොහෝ අය කැමැති වෙන්නේ නැහැ. හැබැයි අඩුම ගණනේ සිවිල් නඩුවකට යන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම විනාඩියෙන් අවසන් කරනවා.

නැත්නම් ජාතික ආරක්ෂාව ගැන කථා කළත් එහෙන් එක කථාවක් කියනවා, අනෙක් පැත්තෙන් තව කථාවක් කියනවා. පසුගිය කාලයේ කථා කිය කියා කාලය මරනවා. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නෙත්, ඒ කාරණය කරන්න කියලා.

ඒ වාගේම මේ ජාතික ආරක්ෂාව පිළිබඳව විහිළුවට ගන්න එපා. ජාතික ආරක්ෂාව පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න.

මේක එක් හුදෙකලා සිදුවීමක් නොවෙයි. මේක holistic approach එකක්, සමස්ත වැඩ පිළිවෙළක් එක්ක, තිරසර සංවර්ධනයත් එක්ක, sustainability එකත් එක්ක මේ පිළිබඳ අවධානය යොමු කරන්න කියන ගෞරවනීය ඉල්ලීමත් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.55]

ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙනුත්, ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙනුත් අද දවසේ කරුණු දක්වනවා. පසුගිය කාලයේ මේ භූමිය ඇතුළේ ජාතිවාදය පට්ට ගහලා, බොරු වපුරලා, ඒ පිළිබඳ මුළු සමාජයක්ම අනික් පැත්තට හැරෙව්වාට පස්සේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට දැන් මතක් වෙලා තිබෙනවා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හෝ ගෙනැල්ලා බොරු කියන එක නතර කරන්න. ඔව්, අපි ඒක නතර කරමු. අපි ඒකට මැදිහත් වෙමු. ඒ වාගේම, විපක්ෂයට මම කියනවා, විනාඩි පහේ බොරු කියලා යන්න එපා කියලා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අහගෙන ඉඳලා යන්න.

ගරු එරංග ගුණසේකර මහතා
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
විපක්ෂයේ සිටින මන්ත්‍රීවරයෙක් මීට ඉස්සරවෙලා ඇවිල්ලා කථා කළා, රුපියල් මිලියන 300කින් කොහොමද පොහොසත් රටක් ලස්සන ජීවිතයක් නිර්මාණය කරන්නේ කියලා. දැන් මේ මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි? මේ වෙන්නේ පිට කවරය බලනවා, ඇතුළත පිටු බලන්නේ නැහැ. එතකොට මේ මොකක්ද තිබෙන්නේ?

මා දන්නා විධියට ඒ මන්ත්‍රීතුමාට research කරන්න දෙදෙනෙක් ඉන්නවා. එක්කෝ, ඒ research කරන දෙදෙනා මේ මන්ත්‍රීතුමාව හැම දාම අමාරුවේ දමනවා. එහෙම නැත්නම්, අර research කරන දෙදෙනා දෙන තොරතුරු මේ මන්ත්‍රීතුමා හරියට කියවන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා මම මේ සභාවට ඉදිරිපත් කරනවා අනුර දිසානායක සහෝදරයා ඉදිරිපත් කරපු ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පුරවැසි අය වැයේ සඳහන් මේ ප්‍රකාශය මොකක්ද කියලා. මොකක්ද, මේකේ තිබෙන්නේ? මේකේ තිබෙන්නේ "ශ්‍රී ලාංකික දිනය" පිළිබඳව. ඒ ගරු මන්ත්‍රීතුමාට මම කියනවා, ශ්‍රී ලාංකික දිනයක් පවත්වන්න යන එක ගැනයි මේ තිබෙන්නේ. මේකේ මාතෘකාව බැලුවා, නමුත් එතුමා ඒ යටතේ තිබෙන කරුණු කියවා බැලුවේ නැහැ. මේක පටන් ගන්නවා, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියලා. අවසානයේ තිබෙනවා, රුපියල් මිලියන 300ක් වෙන් කරනවා කියලා. ඔන්න, ඒ මන්ත්‍රීවරයාගේ තරම. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන මාතෘකාව තිබෙනවා පටන් ගන්නා තැන, පහළින් තිබෙනවා රුපියල් මිලියන 300ක් වෙන් කරනවා කියලා. මෙතැන ඇවිල්ලා අහනවා, රුපියල් මිලියන 300න් කොහොමද පොහොසත් රටක් ලස්සන ජීවිතයක් හදන්නේ කියලා. මොනවාද මේ විනාඩි පහේ බොරු? මේ අය වැය ඇතුළේ රුපියල් බිලියන 8,835ක මුදල් ප්‍රමාණයක් මේ රටේ ජනතාව වෙනුවෙන් වෙන් කර තිබෙනවා. පොහොසත් රටක් ලස්සන ජීවිතයක් හදන්න යන්නේ රුපියල් මිලියන 300න් නොවෙයි. ඉතින් මේ වාගේ විනාඩි පහේ බොරු කියන මහත්වරු තමයි මේ විපක්ෂය ඇතුළේ ඉන්නේ.

ඒ විතරක් නොවෙයි. විපක්ෂයේ පිරිස දැන් ඇවිල්ලා කරුණු මතු කරනවා ජාතික ආරක්ෂාව පිළිබඳව. පාස්කු ප්‍රහාරය පිළිබඳවත් ඉතාම සංවේදීව විවිධ කරුණු දක්වනවා. මීට පොඩ්ඩකට ඉස්සරවෙලා කථා කරපු ඒ මන්ත්‍රීවරයාගේ පැත්තෙන් විශේෂයෙන්ම පාස්කු ප්‍රහාරය පාවිච්චි කරලා, ඒක කරේ තබාගෙන තමයි මීට පෙර දැවැන්ත පාර්ලිමේන්තුවක් හැදුවේ. ඒ ආණ්ඩුව වසර දෙකක් තිබුණා. හැබැයි, ඒ වසර දෙක තුළ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් වන නිවැරදි මැදිහත් වීම ඒ මන්ත්‍රීවරයාත්, ඒ ජනාධිපතිවරයාත්, ඒ අමාත්‍ය මණ්ඩලයත් කළේ නැහැ. ඒ කිසිවක් නොකර තමයි අද ඇවිල්ලා මේක පිළිබඳ මැදිහත් වීම ගැන කථා කරන්නේ.

අප මොකක්ද කරමින් තිබෙන්නේ? ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පැත්තෙන් ඒ පාස්කු ප්‍රහාරය පිළිබඳ නිවැරදි මැදිහත් වීම කරමින්, පියවරෙන් පියවර, පියවරෙන් පියවර දැන් ඒ පිළිබඳ කරුණු හෙළිදරව් කරගන්න අදාළ විමර්ශන කණ්ඩායම මැදිහත් වෙමින් ඉන්නවා. මේක එක දවසින් හෙළිවෙන්නේ නැහැ. දැන් බලන්න පුළුවන් ඒ මන්ත්‍රීවරුන්ට, විපක්ෂයේ ඉඳගෙන ගෙනෙන සංවාදය තුළද, අපි දැන් මේ ආණ්ඩු පක්ෂය ඇතුළේ කරන මැදිහත් වීම තුළද පාස්කු ප්‍රහාරයේ ඇත්ත සටන, ඒ පාස්කු ප්‍රහාරය කරපු ක්‍රියාවලිය හෙළිදරව් කරන්න පුළුවන් වෙන්නේ කියන එක.

ඒ වාගේම, එතුමාගේ පැත්තෙන් මතු කළා, විශේෂයෙන්ම synthetic drugs පිළිබඳව. අපට හිනාත් යනවා ඒවා කියද්දී. මොකක්ද හේතුව? ඔව්, අපි දන්නවා, අපේ විමර්ශන කණ්ඩායම්

දන්නවා, අපේ රටේ පාතාලය සහ මත්ද්‍රව්‍ය කියන දේ එකිනෙකට සම්බන්ධයි. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේවාත් එක්ක දේශපාලනයත් සම්බන්ධයි. ඒ නිසා තමයි පසුගිය කාලයේ Police Narcotics Bureau එක ගිහිල්ලා මත්ද්‍රව්‍ය අත්පත් කර ගත්තාම ඒ මන්ත්‍රීතුමාගේ තාත්තා ඒ ඇමතිවරයාගේ ගෙදරට හෙළිකොප්ටරයෙන් ගිහින් බැහැලා ඒක අල්ලන්න එපා කියලා signal එක දුන්නේ.

එහෙම කරපු තාත්තාගේ පුතාලා අද ඇවිල්ලා synthetic drugs ගැන කියවනවා. එදා ඒ ආණ්ඩුවේම හිටපු දෙවැනි පුරවැසියා වූ අග්‍රාමාත්‍යවරයා මොකද කළේ. කුඩු කන්ටේනර් එකක් එළියට යද්දී ඒ කුඩු කන්ටේනර් එක වෙක් කරන්න එපා කියලා විටි එකක් දීලා කිව්වා. එහෙම කරපු ආණ්ඩුවල අය අද ඇවිත් දේශනා කරනවා.

හැබැයි, අපි මොකක්ද කරමින් ඉන්නේ? මේ පුරවැසි අය වැය ඇතුළේත්, මේ ජනතාවාදී ආණ්ඩුව ඇතුළේත් අපි කරමින් ඉන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලංකාවේ පළමුවැනි වතාවට මත් ද්‍රව්‍යයත්, පාතාලයත් සම්බන්ධ කරන දේශපාලන හිස දැන් ගළවා තිබෙනවා. ඒ නිසා මේ ක්‍රියා කිසිවකට දැන් දේශපාලනය මැදිහත් වන්නේ නැහැ. ඒ හින්දා තමයි අපේ පොලීසිය, ආරක්ෂක හමුදාව, බුද්ධි අංශ මැදිහත් වෙලා, දක්ෂ විමර්ශන කණ්ඩායම් මැදිහත් වෙලා වේගයෙන් අදාළ තොරතුරු සොයා ගනිමින් මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට මැදිහත් වෙන්නේ. මේ ආකාරයට අප මෙයට නිසි පරිදි මැදිහත් වෙමින් සිටිනවා. ඒ විතරක් නොවෙයි. පසුගිය දවස් ටිකේ මේ ගරු සභාව ඇතුළේ විපක්ෂයේ මන්ත්‍රීවරු මැරෙන්න හැදුවා, කන්ටේනර් වගයක් එළියට ගියා කියලා, ඒවායේ මත් ද්‍රව්‍යයත් තිබුණා කියලා. කෝ, දැන් ඒවා? ඒවා විනාඩි පහේ බොරු. ඔයිට ඉස්සෙල්ලාත් කන්ටේනර් වගයක් එළියට ගියා කිව්වා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට අයිති කාර්යයක් තමයි පාස්පෝට් නිකුත් කිරීම. පාස්පෝට් නිකුත් කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. මොකක්ද වුණේ? පෙර පැවැති ආණ්ඩුව කාලයේ වෙච්ච සිදු වීම් ප්‍රමාණයක් තිබෙන බව අපි දන්නවා. එහි අඛණ්ඩතාවේ බිඳවැටීමක් තිබුණා. දැන් අපි ආණ්ඩුව අරගෙන තිබෙන්නේ ඒ ප්‍රශ්න විසඳන්නයි. අපි මොකක්ද කළේ? අදාළ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, කාර්ය මණ්ඩලය වෙහෙසිලා, මැදිහත් වෙලා තිබුණු තත්ත්වය දැන් වෙනස් කරලා තිබෙනවා. මා දන්නා විධියට මුලින් 1,200කට, එහෙම නැත්නම් 2,500කට වඩා වැඩි ප්‍රමාණයක් තමයි පාස්පෝට් දෙන්න පුළුවන් වුණේ. දැන් දවසේ පැය 24 පුරා විවෘත කරලා 4,000කට වඩා වැඩි ප්‍රමාණයක් පාස්පෝට් දෙන්න පටන් ගෙන තිබෙනවා. එහෙම තමයි ප්‍රශ්න විසඳන්නේ. පරණ කට්ටියට බැණ බැණ, පරණ කට්ටියට දේශනා දීදී ඉන්නේ නැහැ, අපි. ප්‍රශ්නවලට බොක්කෙන්ම මැදිහත් වෙලා, නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා, ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, කාර්ය මණ්ඩලය මැදිහත් වෙලා ඒ ප්‍රශ්න විසඳනවා. ඒක තමයි කරන්න තිබෙන්නේ. ආණ්ඩුව විපක්ෂයට ප්‍රශ්න කිය කියා ඉන්නේ නැහැ. විපක්ෂය මොනවා කළත්, අවුරුදු 76ක් තිස්සේ දේශපාලනය කෙසේ තිබුණත් අපේ වගකීම තමයි පියවරෙන් පියවර මේ ප්‍රශ්න විසඳීම. අපි එයට මැදිහත් වෙමින් ඉන්නවා.

ඒ විතරක් නොවෙයි. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන ආපදා කළමනාකරණය කියන විෂය සම්බන්ධයෙනුත් මම කරුණු දක්වන්න කැමැතියි. සාමාන්‍යයෙන් අපේ රටේ ආපදා කළමනාකරණය කියන්නේ මොකක්ද කියලා ඔබතුමන්ලා දන්නවා. යම් සිදුවීමක් වුණාට පස්සේ ක්‍රියාත්මක වීමයි බොහෝ විට කරන්නේ. මම මෙහිදී ආරක්ෂක අංශවලට චෝදනාවක් කරන්නේ නැහැ. හැබැයි, හැම දාම වුණේ යම් සිදුවීමක් වුණාට පස්සේ ඒ සිදුවීමට මැදිහත් වීමයි. ගංවතුර ආවාට පස්සේ, වැහි වතුර ආවාට පස්සේ, නාය ගියාට පස්සේ ඒ නිශ්චිත මොහොතට තමයි වැඩිපුර අවධානය දෙන්නේ. හැබැයි, ආපදා කළමනාකරණය කියන්නේ ඒක නොවෙයි. අප නොදන්නා, අපේ වාගේ රටක් පසුගිය කාලයේ අධ්‍යයනය නොකළ සුනාමි වාගේ තත්ත්වයකදී මේක කරන්න බැරි වෙන්න පුළුවන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. හැබැයි, අපි දන්නවා අපේ රටේ ජනතාව වැඩිපුරම පීඩාවට පත් වන්නේ වැසි ජලයෙන්, ගංවතුරෙන් සහ නාය යෑමෙන් බව. අපට දැන් තිබෙන්න ඕනෑ, මේවා පිළිබඳ යම් විමර්ශනාත්මක මැදිහත්වීමක්; යම් තාක්ෂණික මැදිහත් වීමක්. හැබැයි, ඒ තත්ත්වය නොවෙයි අපේ රටේ තිබෙන්නේ.

ආපදා කළමනාකරණයේ පළමුවැනි අංශය තමයි ආපදාවට පෙර එය කළමනාකරණයට මැදිහත් වීම. දැන් අදාළ අමාත්‍යාංශ ඒ වෙනුවෙන් මැදිහත් වෙමින් තිබෙනවා. දෙවැනි කරුණ මේකයි. ආපදාවක් වුණාට පස්සේ රටක් විධියට අපට අයිති වන්නේ මිනිසුන් විතරක් නොවෙයි. අපේ රටේ සොබා දහම, අපේ රටේ සතුන් ආදි සියල්ල බේරා ගැනීම වෙනුවෙන් තමයි අපේ වැඩ පිළිවෙළ සකස් විය යුතුව තිබෙන්නේ; අපේ මැදිහත් වීම විය යුතුව තිබෙන්නේ. ආරක්ෂක අමාත්‍යාංශය දැන් ඒ වෙනුවෙන් මැදිහත් වෙමින් සිටිනවා. තුන්වැනි කරුණ මොකක්ද? තුන්වැනි එක තමයි ආපදාව කළමනාකරණය කිරීම. හතරවැනි කරුණ තමයි ඒ ආපදාව නැවත ඇති නොවන තත්ත්වයට එය කළමනාකරණය කිරීම. එහෙම නැතිව ගංවතුර ඇති වුණාට පස්සේ කෑම ටිකක් බෙදන එක, ගෙදර ඉන්න මනුස්සයා වෙන කොහේට හරි ගිහින් දමන එක විතරක් නොවෙයි ආපදා කළමනාකරණය කියන්නේ. දේශපාලන මැදිහත් වීම ඇතුළේ දැන් ඒ සඳහා සූදානම් වෙමින් සිටිනවා. දැන් ආරක්ෂක අමාත්‍යාංශය ආපදා කළමනාකරණය කියන විෂය ප්‍රතිසංවිධානය කරලා නව තාක්ෂණය ඇතුළේ, නව දැනුම ඇතුළේ මේ රටේ මිනිසුන් ආපදාවලින් මුදා ගැනීමේ ක්‍රියාවලියට මැදිහත් වෙන්න කල්පනා කරමින් සිටිනවා.

සංඛ්‍යාලේඛන අනුව 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පවුල් 416,257ක් පීඩාවට පත් වෙලා තිබෙනවා. පුද්ගලයන් වශයෙන් ගත්තාම ලක්ෂ 14කට වැඩි පිරිසක් මේ නිසා පීඩාවට පත් වෙලා ඉන්නවා. පූර්ණ අලාභ හානි වූ නිවාස ප්‍රමාණය 543යි. මරණ 127ක් සිදු වෙලා තිබෙනවා.

ආපදා කළමනාකරණය කියන්නේ දැවැන්ත විෂයයක්. විශේෂයෙන්ම මේ තත්ත්වය තේරුම් ගෙන අපට පුළුවන්කම ලැබී තිබෙනවා, ආරක්ෂක අමාත්‍යාංශය විධියට නිසි මැදිහත් වීමක් කරන්න. පසුගිය ආණ්ඩුව කාලයේ ආපදා කළමනාකරණය සඳහා වෙන් කර තිබුණේ රුපියල් මිලියන 2,430ක මුදල් ප්‍රමාණයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු එරංග ගුණසේකර මහතා
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
හොඳමයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ආපදා කළමනාකරණය නිසි පරිදි කරන්න ඕනෑ නිසා, මේ විෂය පථයන් වෙනස් කරන්න ඕනෑ නිසා, මෙය නැවත අධ්‍යයනය කර ගත යුතු නිසා මෙය වඩාත් කළමනාකරණය කර ගැනීම වෙනුවෙන් මෙවර අය වැයෙන් ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 8,950කට වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

[ගරු එරංග ගුණසේකර මහතා]

ඒ විතරක් නොවෙයි, පසුගිය කාලයේ අපේ රටේ ආපදා කමිටු කියලා එකක් හදා තිබුණා. අපි දන්නවා, වැසි වතුර, ගංවතුර, සුළි සුළං, නායයෑම් වාගේ තත්ත්වයන් එක වර වෙනස් කරන්න බැරි බව. උදාහරණයක් විධියට, කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත් සාමාන්‍යයෙන් අප්‍රේල් අන්තිම වෙද්දී, මැයි වෙද්දී වර්ෂාපතනය ලැබෙනවා. එවිට එම ජනතාව වැසි වතුරෙන්, ගංවතුරෙන් නැවත පීඩාවට පත් වෙනවා. මේක ක්‍රියාවලියක ප්‍රතිඵලයක්. එම නිසා මේ තත්ත්වය එක රැයකින්, පැය 24න්, අවුරුද්දෙන් වෙනස් කරන්න බැහැ. හැබැයි, දැන් අපේ ආණ්ඩුව විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමියගේ මැදිහත් වීම සහිතව, ආරක්ෂක අමාත්‍යාංශයේ මැදිහත් වීම සහිතව, ඒ වාගේම අනෙකුත් කණ්ඩායම් එකතු කරගෙන එසේ ගංවතුරෙන්, වැසි වතුරෙන් ආපදාවට ලක් වන ප්‍රධාන දිස්ත්‍රික්කවල එම ආපදා තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ කෙරෙහි මේ ආණ්ඩුව අවධානය යොමු කර තිබෙනවා. ඒ අනුව දැනට අපි අවධානය යොමු කර තිබෙනවා, විශේෂයෙන්ම ගම් මට්ටමින් පැවැති ආපදා කමිටු ප්‍රතිසංවිධානය කිරීමට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ආපදා කළමනාකරණය පසුගිය කාලයේ ග්‍රාම නිලධාරි මහත්මයාගේ, එහෙම නැත්නම් එවැනි කිහිප දෙනෙකුගේ විෂයයක් බවට පත් වෙලා තිබුණා. නමුත්, ආපදාවක් කළමනාකරණය කරන්න රජයට විතරක් බැහැ. ආපදා කළමනාකරණයට රජය මැදිහත් වෙනවා; රජයේ ආයතන මැදිහත් වෙනවා. ඒ වාගේම, ප්‍රජාවත් ඒ සඳහා නිශ්චිතව මැදිහත් කර ගන්න ඕනෑ; ස්වේච්ඡා සංවිධානවලට නිශ්චිත මඟ පෙන්වීම කරන්න ඕනෑ. ඒ නිසා වර්තමාන රජය දැන් සූදානම් වෙනවා, විශේෂයෙන්ම ආපදා කමිටු ප්‍රතිසංවිධානය සඳහා මැදිහත් වෙන්න.

ආරක්ෂක අමාත්‍යාංශයත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයත් පුරවැසියාගේ -මහ ජනතාවගේ- ආරක්ෂාව වෙනුවෙන් මැදිහත් වෙනවා කියන පණිවිඩයත්, එය නැවත නැවතත් සහතික කරන්න මැදිහත් වෙනවා කියන පණිවිඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.08]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ආරක්ෂක අමාත්‍යාංශයේත්, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී මා ආණ්ඩු පක්ෂයේ සිටින ඇමතිතුමන්ලාගේ, මන්ත්‍රීවරුන්ගේ අවධානය විශේෂ කරුණක් කෙරෙහි යොමු කරවනවා. අපි සියලු දෙනා දන්නවා, මේ රටේ සිටින රාජ්‍ය නිලධාරීන් විශාල කැප කිරීම් කරලා, අවංකභාවයෙන් යුතුව තම අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල කටයුතු කරන බව.

පසුගිය කාලයේ අපේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව තුළ ගුවන් ගමන් බලපත්‍ර සම්බන්ධ ප්‍රශ්නයක් මතු වුණා. ඒ, ගිය අවුරුද්දේ මැද භාගය වන විටයි. අපි අදටත් එතැනට ගියාම පෙනෙනවා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ජනතාවට තම සේවය ලබා දීම සඳහා විශාල උත්සාහයක් දරන බව. ඔවුන් විශාල කැපවීමකින් ඒ වැඩේ කරනවා. ඔවුන්ට විශාල පීඩනයක් එල්ල වෙලා තිබෙනවා. මොකද, ඇත පළාත්වලින් පැමිණෙන විශාල ජනතාවක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ලේ බිම වාඩි වෙලා, පඩි පෙළවල වාඩි වෙලා, එහේ මෙහේ විසිරිලා ඉන්නවා. එතැනට ගියාම අපට ඒ බව පෙනෙනවා. ඉතාම දුක්ඛිත තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. එවැනි තත්ත්වයක් ඇති වෙන්න නොයෙක් කරුණු කාරණා බලපා තිබෙනවා.

රාජ්‍ය සේවයේ නියුතු අයගෙන් සියයට 80ක් තමුන්නාන්සේලාට ඡන්දය දුන්නා. එසේ ඡන්දය දීපු අයම දැන් සමහර දේවල් ගැන මහත් කලකිරීමට පත් වෙලා ඉන්නේ. එසේ කලකිරීමට පත් වෙලා සිටින නිසාම ඔවුන් අපට කථා කරලා යම් යම් දේවල් කියනවා, "මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තුවේදී මේවා මතු කරන්න" කියලා.

මොකද, තමුන්නාන්සේලා ගැන තිබෙන විශ්වාසය ටිකෙන් ටික අඩු වේගෙන යන ස්වභාවයක් අද රාජ්‍ය සේවය තුළ දකින්න තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය ආණ්ඩුවේ ඇති වෙලා තිබුණු තත්ත්වයත් එක්ක අද වෙනකොට ගුවන් ගමන් බලපත්‍ර නිකුත් කිරීම විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මේ මන්ත්‍රීවරු කිව්වා, දැන් දවසකට පාස්පෝට් 4,000ක් දෙනවා කියලා. 4,000ක් දුන්නත් එතැනට ගිහිල්ලා බැලුවාම අපට පෙනෙනවා පාස්පෝට් එකක් ගන්න ජනතාව කොයි තරම් දුක් විඳිනවාද කියලා. මම කියන්නේ නැහැ, ඒක තමුන්නාන්සේලා ඇති කළා කියලා. ඒක ඇති කළේ ගිය ආණ්ඩුවෙන්. නමුත්, තවමත් ඒක continue වෙනවා. ඒක තමයි ප්‍රශ්නය. මාස 5ක් වෙනවා, මේ ආණ්ඩුව ඇවිල්ලා. තමුන්නාන්සේලා ආණ්ඩුව හදපු ගමන් කිව්වා, මේ ප්‍රශ්නය විසඳනවා කියලා. අවුරුදු 24ක් තිස්සේ මේ රටේ කිසිම ටෙන්ඩර් එකක් නැතුව කලින් තිබුණු ආයතනයක් පාස්පෝට් නිකුත් කළා. ඒ අවුරුදු 24 පුරාම කිසිම ටෙන්ඩර් කැඳවීමක් කරලා තිබුණේ නැහැ. ඒ අවුරුදු 24 පුරා හිටපු හැම ආණ්ඩුවක්ම පාස්පෝට් නිකුත් කරන්න ඒ ආයතනයට ලබා දීලා තිබෙනවා. මම දන්නේ නැහැ එදා හිටපු Controller General, එදා හිටපු අමාත්‍යාංශ ලේකම්වරු කොහොමද ඒක දුන්නේ කියලා. ඔබතුමන්ලා ඒ ගැන හොයලා බැලුවාද කියලාත් අපි තවම දන්නේ නැහැ. ගිය අවුරුද්දේ මැයි මාසයේ ටෙන්ඩර් එකක් කැඳෙව්වා, e-පාස්පෝට් නිකුත් කරන්න. ඒ ටෙන්ඩර් එක ලබා දුන්නා, මැයි මාසය වෙනකොට. මැයි මාසය වෙනකොට ටෙන්ඩර් එක ලබා දෙන්නේ, එක කොන්දේසියක් මත. ඒ තමයි, මාස 8ක් ඇතුළත e-පාස්පෝට් මිලියන 5ක් ලබා දෙන්න ඕනෑය කියන එකඟතාව. ඒ එකඟතාව උඩ ටෙන්ඩර් එක ලබා දුන්නත් ඒ එකඟතාව සිද්ධ වෙන්නේ නැහැ. ඒ එකඟතාව කඩ වෙලා. ඒ ආයතනය කියනවා, e-පාස්පෝට් මිලියන 5ක් ලබා දෙන්න අපට පුළුවන් වෙන්නේ 2025 ජූනි මාසයේ කියලා. එතකොට එවකට තිබුණු ආණ්ඩුව නැවත වතාවක් කැබිනට් අනුමැතිය අරගෙන තිබෙනවා, Machine-readable passports ලක්ෂ හතහමාරක් ගන්න. අපි කියනවා ඒකට MRP කියලා. අපි දැන් මේ පාවිච්චි කරන පාස්පෝට් ලක්ෂ හතහමාරක් issue කරන්න කැබිනට් අනුමැතිය දීලා තිබෙනවා, එදා තිබුණු ආණ්ඩුව. ඒ කැබිනට් අනුමැතිය උඩ මේ වැඩේ පටන් ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සාමාන්‍යයෙන් පාස්පෝට් එකක් issue කරන්න අද වෙනකොට cost වෙනවා, ඩොලර් 6.42ක්. ඒ කියන්නේ, පාස්පෝට් එකකට ආණ්ඩුවට cost වෙන්නේ, ලංකාවේ මුදලින් රුපියල් 1,926යි. කලින් තිබ්බ ඒ ආයතනය තමයි තවම අර personalized data page එක කරන්නේ. අපේ පාස්පෝට් එක කොම්පැනි 2ක් handle කරනවා. එක කොම්පැනියක් අපට පාස්පෝට් එක supply කරනවා. ඒකට අපි ඩොලර් 4.97ක් ගෙවනවා. අනෙක්

කොම්පැනියට දෙනවා, personalized data page එක හදන්න. ඒ කියන්නේ, මේ passport එකේ තිබෙන personalized data page එක හදන්න ඩොලර් 1.45ක් දෙනවා. ඒ කොම්පැනිය තමයි අවුරුදු 24ක් තිස්සේ ටෙන්ඩර් නැතුව අපේ රටේ පාස්පෝට් නිකුත් කරලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒකේ නම මොකක්ද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒගොල්ලන් තමයි ඩොලර් 1.45ට තවමත් මේ page එක හදන්නේ. දැන් cost එක වෙනවා, රුපියල් 1,920ක්. කලින් කළේ ඩොලර් 5.89ට. මේ රතු පාස්පෝට් එක. ඒ කියන්නේ "N Series" පාස්පෝට් එක. මේ "N Series" පාස්පෝට් එක කලින් දුන්නේ ඩොලර් 5.89ට. එකම වැඩේ දැන් කොම්පැනි දෙකක් කරන නිසා ඩොලර් ශත 53ක් ආණ්ඩුව වැඩි පුර ගෙවනවා. මොකද, එකම වැඩේ කොම්පැනි දෙකක් කරනවා. ඒකට ඩොලර් ශත 53ක් ආණ්ඩුව වැඩිපුර ගෙවනවා. ඒ කියන්නේ, පාස්පෝට් ලක්ෂ හතහමාරකට ඇමෙරිකානු ඩොලර් 397,000ක් වැඩිපුර ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි හරියට ඒ ගණන බැලුවොත්, ලක්ෂ 1,190ක් ආණ්ඩුවට පාඩු වෙනවා. මම දන්නේ නැහැ තමුන්නාන්සේලා ඒ ගණන් හදලා තිබෙනවාද කියලා. කලින් මේ වැඩේ කළේ එක්කෙනයි. දැන් එක කොම්පැනියක් පාස්පෝට් එක දෙනවා. අනෙක් කොම්පැනිය ඒකේ personalized data page එක හදනවා. ඒ වියදම් දෙකම එකතු කළාම පාස්පෝට් එකක් හදන්න ඩොලර් 6.42ක් ආණ්ඩුව වියදම් කරනවා. ඒක එක කාරණයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දැන් අපි රුපියල් 20,000ක් ගෙවනවා පාස්පෝට් එකක් ගන්න.

කාලයක් තිස්සේ රුපියල් 20,000ක් ගන්නවා. අපි කලින් රුපියල් 20,000ක් ගෙවලා ගත්තේ මේ රතු පාස්පෝට් එක. ඒකේ පිටු 64ක් තිබෙනවා. දැන් මේ නිල් පාස්පෝට් එකේ තිබෙන්නේ පිටු 48යි. පිටු 16ක් අඩු වෙලා තිබෙනවා. මිනිස්සු ඒකටත් රුපියල් 20,000ක් ගෙවනවා. ඒ කියන්නේ, පිටු 68ක් තිබෙන පාස්පෝට් එක ගන්නත් රුපියල් 20,000ක් ගෙවනවා. පිටු 48ක් තිබෙන පාස්පෝට් එක ගන්නත් රුපියල් 20,000ක් ගෙවනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ කියන්නේ අපේ රටේ මිනිස්සු පිටු 16කට වැඩිපුර ගෙවනවා. ඒ කියන්නේ පිටු 16ක් අඩුවෙන් පිටු 48ක් තිබෙන පාස්පෝට් එක ගන්න එක්කෙනෙක් රුපියල් 6,667ක් වැඩිපුර ගෙවනවා. බලන්න, කොයි තරම් අපරාධයක් ද කියලා. මේ අපේ රටේ ජනතාවට වෙච්ච පාඩුව. ඒ පාස්පෝට් ලක්ෂ හතහමාර අපේ ජනතාව ගන්නකොට value loss එක රුපියල් බිලියන 5යි. ඒ ගැන තමයි අහන්න ඕනෑ. රුපියල් බිලියන 5ක් value loss එක. පිටු 16ක් අඩුයි මේ පාස්පෝට් එකේ. ඒත් මිනිස්සු රුපියල් 6,697ක් වැඩිපුර ගෙවනවා. තවම තමුන්නාන්සේලාට බැරි වුණා ඒක විසඳා ගන්න. ගිය ආණ්ඩුවෙන් තමයි ඒක වුණේ. ඒක තමයි මම මේ කියන්නේ. ගිය ආණ්ඩුවෙන් කරපු ඒවා තමයි මේ තවම යන්නේ. හැබැයි, තමුන්නාන්සේලාට තවමත් නතර කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒකයි මම අර විදුලි බලාගාරය ගැනත් කිව්වේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඉන්දියාව ගන්නකෝ. ඉන්දියාවේ පාස්පෝට් එකක් expedite කරන්න ඒගොල්ලෝ ගන්නේ ලංකාවේ මුදලින් රුපියල් 13,560යි. ඒකේ පිටු 60ක් තිබෙනවා. බංග්ලාදේශයේ දෙන්නේ e-පාස්පෝට් එක. ඒක පිටු 64ක් තිබෙන e-පාස්පෝට් එකක්. අවුරුදු 10ක් valid. ලංකාවේ මුදලින් රුපියල් 3,895යි ඒකට ගන්නේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අන්න, වැඩ!

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අන්න වැඩ! ඒ, e-පාස්පෝට් එක. පිටු කීයද? පිටු 64යි; අවුරුදු 10ක් valid. රුපියල් 3,895යි, බංග්ලාදේශයේ ඒකට ගන්නේ. පාකිස්තානයේ? පාකිස්තානයේ ගන්නේ ලංකාවේ සල්ලිවලින් රුපියල් 12,000යි. ඒකේ පිටු 100ක් තිබෙනවා. අවුරුදු 5ක් valid. One-day service එකට ගන්නේ රුපියල් 12,000යි. අපේ රටේ සියයට 80ක් මිනිස්සු පාස්පෝට් ගන්නේ one-day service එකෙන්. එතකොට මේ කටයුත්ත ඇයි එහෙම වෙන්නේ. එහෙම වෙන්නේ ඇයි? දැන් පෙනෙනවා අපේ රටේ මිනිස්සු රුපියල් 6,667ක් වැඩිපුර ගෙවනවා කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊළඟට ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. දැන් ලෝකයේ පාස්පෝට්වල ප්‍රමිතියක් තිබෙනවා. International Civil Aviation Organization එක නිර්දේශ වගයක් දීලා තිබෙනවා. ඒ නිර්දේශ අනුව තමයි පාස්පෝට් issue කරන්න ඕනෑ. අපට ඕනෑ ඕනෑ විධියට පාස්පෝට් issue කරන්න බැහැ. මොකද, ඒක තමයි ජාත්‍යන්තර පිළිගැනීම. ඒ පිළිගැනීමට අනුව බැලුවොත් මෙහෙමයි. දැන් මේ පරණ පාස්පෝට් එක මගේ අතේ තිබෙනවා. මේ පරණ පාස්පෝට් එකේ පළමු පිටුවේම passport number එක තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ පාස්පෝට් එක print කරලා එනකොටම තමයි මේ number එක එන්නේ. ඒක ultraviolet තාක්ෂණය අනුව print කර තිබෙන්නේ. ඒ number එක light එකට ඇල්ලුවාම රතු වෙනවා; ඒක ආරක්ෂණ පියවරක්. ඒ පාස්පෝට් එක ආරක්ෂිතයි කියලා ඒක ආරක්ෂා කර ගන්න ක්‍රමයක් තමයි ඒ. මෙන්න, නිල් පාස්පෝට් එක. මේකේ පළමු page එකේ අර ආරක්ෂණ අංකය නැහැ. දැන් මේ පොත හදුනා ගන්නේ කොහොමද? මේ පොත හඳුනා ගන්න වෙන්නේ මෙහෙමයි. Personalized data page එකේ තමයි ඒ අංකය තිබෙන්නේ. මේ පොතේ අර සිදුරුවලින් ලකුණු කරන අංකය තිබෙනවා. ඒක ගහන්නේ ලංකාවේ. එතකොට මේ page එක මාරු කරන්න පුළුවන්. ඕනෑම කෙනෙකුට මේ page එක ගලවලා වෙන page එකක් දාන්න පුළුවන්. ඒ කියන්නේ වෙනත් page එකක් අරගෙන මේ number එක ගහ ගන්න පුළුවන්. මොකද, පළමු පිටුවේ තිබෙන number එක print කරලා එන්නේ නැහැ. මේ නිල් පොතේ ඒ number එක නැහැ. ඒක ඉතා බැරෑරුම් ප්‍රශ්නයක්, මේ පාස්පෝට්වල තිබෙන ආරක්ෂණය පිළිබඳ. එහෙම වුණේ කොහොමද? මේක කලින් හිටපු Controller Generalලා දැක්කේ නැද්ද? කෝ, කලින් හිටපු ලේකම්තුමා? එයාගේ නම වියානි. මට ආරංචියි එයා රටෙත් නැහැ කියලා.

මේක බරපතළ කාරණයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා දන්නා විධියට මේ පිළිබඳව කවුරු හරි අධිකරණයට ගියොත්, මේ පාස්පෝට් අවලංගු කරන්න පුළුවන්. එතකොට ආණ්ඩුවට සිද්ධ වෙනවා, නැවත මේ පාස්පෝට් කැඳවලා අලුතෙන් issue කරන්න. මොකද, මේ අලුත් පාස්පෝට් එක ජාත්‍යන්තර මට්ටමේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අරගෙන බලන්න. මේ අලුත් පාස්පෝට් එකේ "All Countries" කියලා සඳහන් කරලා නැහැ. පරණ පාස්පෝට් එකේ "All Countries" කියලා සඳහන් කර තිබෙනවා. නමුත් මේ අලුත් එකේ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

"All Countries" කියලා සඳහන් කරලා නැහැ. ඒ වාගේම ජාතික අවශ්‍යතා උඩ පිටු ටිකක් වෙන් කරලා තිබෙනවා. මොනවාද, ඒ පිටු? වෙනස් කිරීම නිරීක්ෂණය කරන පිටු තුනක් තිබෙනවා, පරණ පාස්පෝට් එකේ. "Alterations and Observations" කියලා. ඊළඟට, විදේශ රැකියා ලියාපදිංචි කිරීමේ සටහන් - Endorsements for Foreign Employment Registration - පිටු තුනක් තිබුණා. ඒ වාගේම, විදේශ විනිමය - Foreign Exchange - සටහන් කරන්නත් පිටු තුනක් තිබුණා. ඒ එක පිටුවක්වත් මේ අලුත් පාස්පෝට් එකේ නැහැ. මිනිස්සු මේ සඳහා රුපියල් 20,000ක් ගෙවනවා. නමුත් මේ පිටු අලුත් පාස්පෝට් එකේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම spelling mistakes තිබෙනවා. අපි ගිහිල්ලා පිටරටකට බැස්සාම Immigration and Emigration Department එකකට ගිහිල්ලා මේ අලුත් පාස්පෝට් එක දුන්නාම, ඉස්සෙල්ලාම ඒ මිනිස්සු අපේ පාස්පෝට් එකෙන් තමයි රට මනින්නේ; අපේ රටේ අභිමානය. නමුත් මේ අලුත් පාස්පෝට් එකේ පිටු අංක 30 බලන්න. "යහපහුව" කියලා නමක් ගහලා තිබෙනවා. එය ඉංග්‍රීසියෙන් කියවන්නත් බැහැ. *[බාධා කිරීමක්]* ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා, ඔයගොල්ලන්ගේ ගම, අරගෙන බලන්න. ඔබතුමාත් බලලා නැහැ නේ. "යහපහුව" කියලා වෙන නමක් ගහලා තිබෙනවා. ඊළඟට, පිටු අංක 31, තලෙයිමන්නාරමටත් වෙන නමක් තිබෙන්නේ. ඉංග්‍රීසියෙන් spellings වැරදියි. ඉතින් අපි මේ පාස්පෝට් එක අරගෙන යනවා, පිටරටවලට. මොන ලජ්ජාවක්ද, ගරු ඇමතිතුමනි? ලජ්ජයි! ඔයගොල්ලෝ මාස 5ක් ගිහිල්ලාත් මේක බැලුවේ නැහැ. දැන් ඔයගොල්ලන්ට "දන්නේ නැහැ" කියලා කියන්න බැහැ. එහෙමත් නැත්නම් ඔයගොල්ලෝ මේක නොදැක්කා වාගේ හිටියා ද? එහෙමත් නැත්නම් ඔයගොල්ලොත් පරණ ඒ සෙල්ලමේම යනවා ද? ඒකයි තිබෙන ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊළඟට අපි අරගෙන බලමුකෝ, මේකේ thickness එක. මෙන්න මේ page එකේ thickness එක බලන්න. මේ page එකේ අර Immigration and Emigration Department එකේ ගහන සීල් එක ගැහුවොත්, ඒකේ තීන්ත ටික අනෙක් පිටුවෙන් මතු වෙනවා. මේක ඒ තරම් low-quality passport එකක්. මිනිස්සු මේ සඳහා රුපියල් 20,000ක් ගෙවනවා.

මේ රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නත් එක්ක මිනිස්සු රට යන්න තමන්ගේ ළමයින්ගේ කරාබු උකස් තියලා, මුදු උකස් තියලා, පොලියට සල්ලි අරගෙන තමයි පාස්පෝට් ගන්න ඔය කන්තෝරුවට එන්නේ. තමුන්නාන්සේලා ඒ අදෝනාව ගැන අපටත් වැඩිය දන්නවා; ඒ දුක දන්නවා. තමුන්නාන්සේලා ඒ දුක, වේදනාව ගැන පසුගිය කාලයේම කථා කළා. ඒ දුක, වේදනාව තමුන්නාන්සේලා මාර්කට් කළා. තමුන්නාන්සේලා ඒක වික්කා. විකුණලා තමයි මේ ආණ්ඩුවක් හැදුවේ. ඒ දුක, වේදනාව විකුණාගෙන ආවාට, ඒ මිනිස්සුන්ගේ දුකට, වේදනාවට, අදෝනාවට සහ මේ මාෆියාවන් කරන දේවල් සම්බන්ධයෙන් උත්තර සොයන්න මාස පහක් ගිහිල්ලාත් තමුන්නාන්සේලාට තවම බැරි වුණා. ඒක බරපතළ ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා තමයි අපි මෙහෙම කියන්නේ. ඒ වාගේම තමුන්නාන්සේලා නැවතත් ලක්ෂ 11ක් පාස්පෝට් ගන්න කැබිනට් පත්‍රිකාවක් දාලා අනුමැතිය අරගෙන තිබෙනවා කියලාත් තොරතුරු වාර්තා වෙනවා. මම ඒ ගැන දන්නේ නැහැ. මම වැරදි නම් නිවැරදි කරන්න. ලක්ෂ 11ක්. ඒ කියන්නේ මේ වැරදි පාස්පෝට් එක රුපියල් 20,000ට දෙන්නේ රුපියල් 1,920 ගාණක් cost වෙනකොට. ඒ පාස්පෝට් එකෙන් තව ලක්ෂ 11ක් ගන්න තමුන්නාන්සේලා කොහොමද ඉස්සරහට යන්නේ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි.

කොහොමද එහෙම යන්නේ? එහෙම යන්න බැහැ. පසුගිය අවුරුදු 25ක කාලයම ගත්තොත්, කිසිම ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් නැතුව අවුරුදු 24ක් එක් කෙනෙක් මේක කරලා තිබෙනවා. එයාට අවුරුදු 24ම දීලා තිබෙනවා. එයා කොහොම කළාද කියන්න අපි දන්නේ නැහැ. එන එන හැම ආණ්ඩුවක්ම අල්ලා ගත්තා. දැන් ගිය අවුරුද්දේ අලුතෙන් දීපු එක්කෙනා සම්පූර්ණයෙන්ම මේ පාස්පෝට් එක වණ කරලයි තිබෙන්නේ. එතකොට දැන් ඒගොල්ලෝ ගැන ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? පුළුවන් නම් තමුන්නාන්සේලා මේ පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන්න කියා මම යෝජනා කරනවා. මොකද, මේ මාෆියාවල් කඩන්න ඕනෑ. මිනිස්සුන්ගේ මුදල් එක්ක, මිනිස්සුන්ගේ ජීවිත එක්ක සෙල්ලම් කරන්න දෙන්න බැහැ. ගිහිල්ලා බලන්න, ඔබතුමාගේ අමාත්‍යාංශයේ පළමුවැනි තට්ටුවට ගියාම ඔය උඩ තිබෙන 9වන තට්ටුවට වෙනකම්ම මිනිස්සු පඩිපෙළවල නිදි, ළමයින් තියාගෙන. ඔවුන් බඩගින්නේ, ඉතාම අසරණ වෙලා ඉන්නවා.

නමුත් මේක මාෆියාවක් හැටියට අපට පෙනෙනවා. ඒ මාෆියාව, එක එක ආණ්ඩු ආවාම එක එක ඇමතිවරු අල්ලගන්නවා, එක එක අමාත්‍යාංශවල ලේකම්වරු අල්ලගන්නවා, එක එක නිලධාරින්ව අල්ලගන්නවා, තැරැවිකරුවෝ අල්ලගන්නවා. අල්ලාගෙන ඇවිල්ලා ඔවුන්ගේ ව්‍යාපාරය ඉස්සරහට ගෙනයන්න අපේ රටේ අභිංසක මිනිස්සුන්ගේ මුදල් ටික සූරාගෙන කනවා. මේ මාස පහ ඇතුළත ඔබතුමන්ලා ගත්ත ක්‍රියාමාර්ග රටට කියන්න. මේ පාස්පෝට් එක හරිද, වැරදිද කියලා කියන්න. මේ පාස්පෝට් එකේ අඩුපාඩු තිබෙනවාද, නැද්ද කියන්න. එහෙම තිබෙනවා නම් ඒකට ක්‍රියාමාර්ග ගන්න තමුන්නාන්සේලාට වගකීමක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඇමතිතුමාගේ ගම යාපහුව කියලා ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කියනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ගමේ නම වැරදියි. "යහපහුව" කියලා ඒකේ ගහලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේක බැලුවාද කියලා මම දන්නේ නැහැ. අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. දැන් තමුන්නාන්සේලා බලයට පත් වෙලා මාස 5ක් වෙනවා. මේ මාස 5 ඇතුළත තමුන්නාන්සේලාගේ ක්‍රියාකාරකම් මත දැන් එක එක දේවල් මතුවෙන්න පටන් අරගෙන තිබෙනවා. ඒක ඒ තරම් හොඳ දෙයක් නොවෙයි. තමුන්නාන්සේලාට විශාල ජන වරමක් දුන්නා. ජනතාව විශාල බලාපොරොත්තුත් එක්ක විශාල විශ්වාසයක් ගොඩනඟාගෙන තමයි තමුන්නාන්සේලාට ඒ ජන වරම දුන්නේ. නමුත් මේ මාස 5 ඇතුළත තමුන්නාන්සේලාට ඒ ජන වරම දීපු ජනතාවට සාධාරණය ඉෂ්ට කරගන්න බැරි වෙලා තිබෙනවා. මේ රටේ සිටින ත්‍රාඩ වෙළෙඳ මාෆියාවල් නැවත තමුන්නාන්සේලාගේ ආණ්ඩුවත් අල්ලාගෙන ඉන්නවා කියන එක තමයි මේවාට තීන්දු නොගැනීම මත අපිට පෙනෙන්න තිබෙන්නේ. එසේ කියමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මතු කරපු පාස්පෝට් ප්‍රශ්නය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මගේ ගම නම් යහපහුව නොවෙයි. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ පරණ නායකයා "යහපහුව" කියලා දානකොට ඒක *[බාධා කිරීමක්]* නිවැරදි කරගන්න අපොහොසත් වුණා කියලා තමයි - *[බාධා කිරීමක්]* ඔබතුමා දැන් කිව්වා, පාස්පෝට් ප්‍රශ්නයට අවුරුදු 22යි, 24යි කියලා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඔබතුමන්ලාත් ඒ ආණ්ඩුවල හිටියා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාත් ඒ ආණ්ඩුවල හිටියා. යහපාලන ආණ්ඩුව කාලයේ ඔබතුමන්ලාට මේ ප්‍රශ්නය නිවැරදි කරන්න තිබුණා නේ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මහින්ද රජපක්ෂ කාලයේ, රනිල් රාජපක්ෂ කාලයේ -

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඒ කාලයේ ඉඳලා; අවුරුදු 24ක් තිස්සේ තිබුණු පාස්පෝට් ප්‍රශ්නයට - *[බාධා කිරීම්]* ඔබතුමාගේ නායකයාගේ; පරණ ලොක්කාගේ කාලයේ ඉඳලා මේක තිබුණා. ඒ නිසා මේවා නිවැරදි කරන්න ඇති තරමක් අවස්ථාව තිබුණා. මේ එකක්වත් අපේ ආණ්ඩුව කාලයේ ඇති වෙච්ච දේවල් නොවෙයි. මේ පාස්පෝට් ප්‍රශ්නය *[බාධා කිරීම්]* ඔබතුමන්ලා *[බාධා කිරීම්]* පොහොට්ටු, සජබ, යූඑන්පී ආණ්ඩු කාලයේ ඇති කරපු ප්‍රශ්නයක්. *[බාධා කිරීම්]* දැන් මෙතැන ඇවිල්ලා කෑ ගහන්න එපා. මේක ඔබතුමන්ලා ඇති කරපු ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නිවැරදිව කිව්වා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා මේකේ කොටස්කාරයෝ. ඔබතුමන්ලා කොටස්කාරයෝ. යහ පාලන ආණ්ඩුව කාලයේත් මේ පාස්පෝට් ප්‍රශ්නය තිබුණා. *[බාධා කිරීම්]* මෙහෙමයි. මේක අවුරුදු 22ක් තිබුණු පාස්පෝට් එකක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ "N" series පාස්පෝට් එක අවුරුදු 22ක් තිබුණා. ඒ පාස්පෝට් එක නිකුත් කරපු කොම්පැනිය ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරලා තිබුණේ නැහැ. දිගටම පාස්පෝට් නිකුත් කළා. ඒ නිසා ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියපු එක හරි. මම කියන්නේ ඔබතුමන්ලා මීට පෙර මේ පිළිබඳව සාකච්ඡා කරලා 2015දී මේක නිවැරදි කරන්න තිබුණා කියලායි. එහෙම කරලාත් නැහැ. ඊට පස්සේ අපි මේක භාරගන්නකොටත් පාස්පෝට් අර්බුදයක් නිර්මාණය කරලා තමයි අපිට මේක භාරදුන්නේ. පාස්පෝට් පෝලිම කිලෝමීටර 3යි.

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, පාස්පෝට් එකක් ගහකින් ගෙඩියක් කඩාගන්නවා වාගේ ගන්න බැහැ. මේ process එකට අඩුම වශයෙන් මාස 10ක් ගතවනවා. අපි එනකොට මේක අතිශය අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය කරලා තිබුණා. ඔබතුමා කිව්වා වාගේම e-පාස්පෝට් එකට ටෙන්ඩරය ගිහිල්ලා තිබුණා. e-පාස්පෝට් ටෙන්ඩරය සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතිනවා. ඒ නඩුව අදටත් තිබෙනවා. ඒ නිසා එම ටෙන්ඩරයට වාරණයක් තිබුණා. ඒ නඩුව තවමත් තිබෙනවා. එහෙම නඩුවක් තිබෙද්දි, ඔබතුමා කිව්වා වාගේ අර පරණ කැබිනට් මණ්ඩලය ලක්ෂ 7 1/2කට එම ටෙන්ඩරය මිලදී ගන්න තීන්දු කරලා තිබුණා. ඒක machine-readable passport එකක්. "N" series එක වෙනුවට ඊට පස්සේ "P" series එක ආවා. "P" series එක තමයි දැන් දෙන්නේ. ඒක machine-readable passport එකක්. හැබැයි ඒ වෙනුවෙන් මේක print කරන, නැත්නම් මේකේ software එකේ security features හදපු සමාගම මේ සඳහා ඩොලර් 1.45ක් ඉල්ලනවා.

දීර්ඝ කාලයක් තිස්සේ ආ ඒ ක්‍රමවේදය අපි අනුගමනය කරලා නැහැ. එතුමා කිව්වාට, අපි ගෙවලා නැහැ. පරණ කැබිනට් මණ්ඩලය මේ සම්බන්ධව තීන්දුවක් අරන් තිබෙනවා. ඊට පස්සේ මැතකදී උසාවියේ පැවති නඩුවේදී එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, "P" series එක machine-readable විධියට දෙන්නත්, ඒක print කරලා දෙන සමාගමට යම් මුදලක් ගෙවීමටත්. එතැනදී යම් එකඟතාවක් ඇවිල්ලා නීතිපතිතුමා දැන් ගිවිසුමක් කෙටුම්පත් කර තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් තවම රුපියලක්වත් ඒ සමාගමට ගෙවලා නැහැ. මොකද, කාගේවත් පව්වලට කර ගහන්න අපි සූදානම් නැහැ. නමුත්, මේ process එක නිසා මහජනයාට මේ විධියට දුක් විඳින්න අපි ඉඩ දෙන්නේ නැහැ. පාස්පෝට් 125,000ක backlog එකක් තිබුණා. අපි වහාම පැය 24 සේවාව දියත් කර තිබෙනවා.

අපි පාස්පෝට් ඔෆිස් එකේ - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ - සියලුම නිලධාරීන්ට කෘතවේදිත්වය පුද කරනවා; ස්තුතිය පුද කරනවා. ඔවුන් දැන් දවසේ පැය 24 පුරාම අඛණ්ඩව රාජකාරි කරනවා. පාස්පෝට් 4,000ක් දෙනවා. පාස්පෝට් 4,000ක් දෙනකොට 4,000ක පිරිසක් කාර්යාලවලට පැමිණීම වැළැක්වීමේ හැකියාවක් නැහැ. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යාල 4ක් තිබෙනවා. ඒ, කුරුණෑගල, නුවර, වවුනියාව සහ මාතර ප්‍රදේශ. මේ කාර්යාල හතරේ දැනට 75 බැගින් ලබා දෙන පාස්පෝට් ප්‍රමාණය 200 දක්වා වැඩි කරලා, ඒ එන පිරිසට යම් සහනයක් සලසන්නත් අපි කටයුතු කර තිබෙනවා. ඒ නිසා මේ පාස්පෝට් ගැටලුවට අපේ කිසිම මැදිහත්වීමක් නැහැ. පසුගිය කැබිනට් මණ්ඩලයට මේ ප්‍රශ්නය යොමු වුණාම අපි තීන්දුවක් ගත්තා, මේ පිළිබඳව සොයා බැලීම සඳහා විද්වත් කමිටුවක් පත් කරන්න. ඒ සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ පරිගණක විශේෂඥ මහාචාර්යවරුන් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක ක්ෂේත්‍රයට සම්බන්ධ විශේෂඥයන්ගෙන් යුත් කමිටුවක් පත් කළා. අලුත් පාස්පෝට් එක නිකුත් කිරීමේ ක්‍රමවේදයට යන්න අපි ලැස්ති වෙලා හිටියේ. අලුත් ටෙන්ඩර් එකත් සූදානම් කර තිබුණා. ඔවුන්, ඔවුන්ගේ මතය පළ කළා. "N" series එක අවුරුදු 22න් ඉවර වුණා. ඊට පස්සේ දැන් ඇවිල්ලා තිබෙන්නේ "P" series එක. ආයෙත් ටෙන්ඩර් එකකට ගියොත් series එක වෙනස් වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා වරින් වර මේ විධියට පාස්පෝට්වල series වෙනස් කරන එක සුදුසු නැහැ. මේ "P" series එකේම පාස්පෝට් එකක් ආයෙත් අලුත් ටෙන්ඩර් එකෙන් ගන්න බැහැ කියන මතය ඔවුන් පළ කළා. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අපි මේ වෙලාවේ මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයට මේ විද්වත් කමිටු වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ. මේ විද්වත් කමිටු වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්න තමයි අපි සැලසුම් කරන්නේ.

[ගරු ආනන්ද විජේපාල මහතා]

අපි මේ සභාවට පොරොන්දු වෙනවා, නඩුව අවසන් වූ වහාම ඉතාම කඩිනමින් e-පාස්පෝට් එකේ කටයුතු අවසන් කරලා, අපි මේ පාස්පෝට් එක ඔබ කියන විධියේ වඩාත් ගුණාත්මකභාවයකින් යුතු ඉහළ e-පාස්පෝට් එකකට සූදානම් කරනවා කියලා. ඒක තමයි දැනට තිබෙන තත්ත්වය. ඒ නිසා මම මේ කරුණ නැවතත් කියන්න ඕනෑ. පසුගිය කාලයේ තිබුණු ආණ්ඩු විසින් නිර්මාණය කරලා, ඒ ආණ්ඩු විසින්ම අවුරුදු 22ක් පවත්වාගෙන ඇවිල්ලා, ඒ ආණ්ඩුම නිර්මාණය කරපු දේවල් ගැන දැන් ඒ අයම කිඹුල් කඳුළු හෙළනවා. පාස්පෝට් පෝලිමේ ඉන්න අපේ රටේ මහජනතාව වෙනුවෙන් අද ඒ අයම කිඹුල් කඳුළු හෙළනවා. ඒ නිසා මහ ජනතාවට සහතිකයක් දෙනවා, මහ ජනතාවට බලපා තිබෙන මේ ප්‍රශ්නය විසඳන්න අපි මැදිහත් වෙනවා කියලා. ඒ මැදිහත්වීම අපි ඉදිරියටත් දිගටම කරනවා. ඉතාම පහසුවෙන් පාස්පෝට් එකක් ගන්න පුළුවන් ක්‍රමවේදයක් අපි මේ වෙලාවේ නිර්මාණය කර තිබෙනවා.

අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මේ සම්බන්ධව විවාදයකට යන්න අවශ්‍ය නැහැ, ගරු මන්ත්‍රීතුමා. අපට කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

මීළඟට, ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු ඇමතිතුමා කියපු දේට උත්තරයක් දෙන්න මට අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]* එහෙම කරන්න එපා. ඇමතිතුමා මට නේ ඒ උත්තරය දුන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමා උත්තර ඉල්ලපු නිසායි ගරු ඇමතිතුමා උත්තර දුන්නේ. නැවත විවාදයකට යන්න එපා, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එහෙම කරන්න එපා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මට කථා කරන්න අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]* මේක අසාධාරණයි නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නවලටයි ගරු ඇමතිතුමා උත්තර දුන්නේ. *[බාධා කිරීමක්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට පැහැදිලි කර ගැනීමක් වෙනුවෙන් අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
එතකොට අද ඔය කථාව විතරයි කරන්න වෙන්නේ. *[බාධා කිරීමක්]* හොඳයි ගරු මන්ත්‍රීතුමා, තත්පර 30කින් කියලා අවසන් කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අපි නිකම් බොරුවට කාලය ඉල්ලන්නේ නැහැ. ගරු ඇමතිතුමා මට උත්තර නොදී හිටියා නම් මම කාලය ඉල්ලන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිගන්නවා ද, දැන් මේ තිබෙන නිල් පාස්පෝට් එක හා ඊට කලින් පාස්පෝට් issue කරපු ඒ වකවානුව තුළ විශාල ලෙස දූෂණ, වංචා සිද්ධ වෙලා තිබෙනවා කියන එක? ඒ පිළිබඳව ඔබතුමන්ලා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නවා ද? ඒක කියන්න.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඇත්ත වශයෙන්ම දූෂණ ක්‍රියා සිද්ධ වෙච්ච නිසා තමයි උසාවියට ගිහිල්ලා ඒ විමර්ශන කටයුතු සිද්ධ වෙන්නේ. *[බාධා කිරීමක්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒක වෙන එකක්. [බාධා කිරීමක්]

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඒක වෙන එකක් නොවෙයි. ඒක තමයි, - *[බාධා කිරීමක්]* මොකක්ද, ආරවුල? *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාගේ කාලයේ තිබුණු processවල, proceduresවල තිබුණු වංචා සම්බන්ධයෙන්. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ගරු ඇමතිතුමනි, මගේ වෙලාව. *[බාධා කිරීම්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ නඩුව වෙනයි. ඒක private නඩුවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීවරුන් නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]* ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 2.36]

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ආරක්ෂක අමාත්‍යාංශයේ හා මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් වවන කිහිපයක්, අදහස් කිහිපයක් පළ කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මම හිතන විධියට අපේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා යම් ඉල්ලීමක් තමයි කළේ. අවුරුදු 24ක් තිස්සේ වැරැද්දක් වෙලා තිබෙනවා නම්, ඒ වැරැද්ද දැන්වත් නිවැරදි කරන්න කියන යෝජනාව තමයි එතුමා කළේ. කෙසේ වෙතත් ඔබතුමන්ලා ඉක්මනින්ම ඒ සඳහා පියවර ගනීවි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජාතික ආරක්ෂාව කිව්වාම මේ රටේ බොහෝදෙනෙක් හිතන්නේ මහජන ආරක්ෂාව පිළිබඳව විතරයි. නමුත්, ජාතික ආරක්ෂාව කියන එක පුළුල් විෂයයක්. මේ රටේ ජාතික ආරක්ෂාව සංස්ථාපනය කිරීම සඳහා ආහාර සුරක්ෂිතභාවය, අධ්‍යාපනය, සෞඛ්‍යය, බලශක්තිය, පරිසරය, ආර්ථික සහ විද්‍යා හා තාක්ෂණ සුරක්ෂිතභාවය කියන මේ හැම එකක්ම දායක වෙනවා. ඒ සඳහා දෙන්න පුළුවන් හොඳම උදාහරණය මෙයයි. මේ රටේ ආර්ථික අර්බුදය ඇති වෙච්ච 2022 වර්ෂයේදී අපි දැක්කා, මේ රටේ ඉන්ධන නැති වුණා, ගෑස් නැති වුණා, ඒ වාගේම විදුලිය නැති වුණා කියලා. ඒ වෙලාවේදී මේ රට කඩාගෙන වැටිලා, මේ රටේ ජනතාව පාරට බැහැලා, හිටපු පාලකයෝ ගෙදර යවන්න උත්සාහ කළා. ඒකෙන් අපට පිළිබිඹු වෙනවා, ජාතික ආරක්ෂාව කියනකොට හුදෙක් මහජන ආරක්ෂාව විතරක් නොවෙයි, මේ සියලු විෂයයන් එකිනෙකට බැඳිලා තිබෙන බව.

මේ රජය පත් වෙද්දී වැඩිපුරම කථා කරපු විෂයයක් තමයි, ඩිජිටල්කරණය කියන එක. ඒ ඩිජිටල්කරණය කියන විෂයය ජාතික ආරක්ෂාවට බොහොම සම්බන්ධතාවක් තිබෙන විෂයයක් කියලා මා හිතනවා. එතැනදී ප්‍රධාන වශයෙන්ම මේ අය වැයේ මම දැක්කේ නැති කාරණයක් තිබෙනවා. මොකද, මේ රජය පත් වෙන්න කලින් ඩිජිටල්කරණය කියන විෂයය සම්බන්ධයෙන් ලොකු දැනුවත් කිරීම් කළා. ඒ වාගේම මේ රජයට ඒ විෂයයට සම්බන්ධ අයගෙන් විශාල සහයෝගයකුත් ලැබුණා. ඒ වාගේම තරුණ පරම්පරාවේ ඡන්ද බොහෝ ප්‍රමාණයක් මාලිමා රජයට ලැබුණා. ඉදිරියේදී ඇතිවන තාක්ෂණයේ දියුණුවත් එක්ක, අන්තර්ජාලයට සම්බන්ධ වන පිරිසත් වැඩිවනවා. නමුත්, මේ අය වැය තුළ cyber security සහ කෘත්‍රිම බුද්ධිය - AI තාක්ෂණය - සම්බන්ධයෙන් බොහොම අඩුවෙන් කථා කරලා තිබෙන බව අපි පැහැදිලිව කියන්න ඕනෑ. හරියට බැලුවාම මේ අය වැය තුළ ඒ විෂයය නැති තරම්. අනාගතයේදී අපට ප්‍රධාන අර්බුද දෙකකට මුහුණ දෙන්න තිබෙනවා. එකක්, cyber security පැත්තෙන්. අනෙක් එක, AI තාක්ෂණය පැත්තෙන්. AI තාක්ෂණය දියුණුවීම හරහා හොඳ පැත්තක් වාගේම නරක පැත්තකුත් තිබෙනවා. එතැනදී ජාතික ආරක්ෂාව කියන දේ ප්‍රධාන කාරණාවක් බවට පත් වෙනවා.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, පසුගිය රජයේ මොන අඩු පාඩු තිබුණත්, මේ රටේ National AI Centre එකක් ස්ථාපිත කරන්න අවසාන අය වැයෙන් රුපියල් බිලියන 1.5ක් ඒ පැවති රජය වෙන් කර තිබුණු බව. ඒක කළාද, නැද්ද කියන එක වෙනම කථාවක්. නමුත්, ඒ අය වැයෙන් රුපියල් බිලියන 1.5ක් වෙන් කර තිබුණා. ඊට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලය හරහා කමිටුවක් පත් කරලා තිබෙනවා, National AI Strategy එක සම්බන්ධයෙන් draft එකක් හදන්න. ඒ වාගේ පියවර පසුගිය රජයෙන් අරගෙන තිබුණත්, වර්තමාන රජය ඒ විෂයයන් සම්බන්ධයෙන් පියවරක් අරගෙන නැහැ කියන කාරණාව තමයි අපට දකින්න තිබෙන්නේ. යම් කිසි කෙනෙක් කියන්න පුළුවන්, මේක Digital Economy Ministry එක සම්බන්ධ කාරණාවක් කියලා. මම ඒ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත් බැලුවා. හැබැයි, ඒ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේවත් අඩුම තරමින් cyber security සහ AI සම්බන්ධයෙන් කිසිම සඳහනක් නැහැ. මේ අය වැයේ තිබෙන ලොකුම අඩු පාඩුවක් විධියට තමයි, මම ඒ කාරණාව හුවා දක්වන්නේ.

බොහෝදෙනෙක් ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියලා හිතන්නේ බෝම්බ පිපිරෙන එක, එහෙම නැත්නම් කොහේ හරි නැනක වෙඩි තබා ගැනීමක් වාගේ කාරණාවක්. ඔබ තමුන්නාන්සේලාගේ ප්‍රධාන ව්‍යාපෘතියක් වන විද්‍යුත් ජාතික හැඳුනුම්පත් - e-NIC - ව්‍යාපෘතිය ගත්තොත්, ලංකාවේ සියලු ජනතාවගේ biometric data ටික collect කරන කථාවක් ඒ ව්‍යාපෘතිය තුළ තිබෙනවා. එතකොට ඒ තොරතුරුවල backend එක, කොහේද ඒවා store වෙන්නේ කියන කාරණාව ගැන තවම රජය හරි තීන්දුවක් අරගෙන නැහැ. විශේෂයෙන්ම ජනාධිපතිතුමා සභාගි වන Digital Economy Ministry එකේ කාරක සභාවේදීත් මම ඒ ගැන වරින් වර ඇහුවා. එතැනදීත් ඒ ව්‍යාපෘතිය භාර දීලා තිබෙන Dr. Hans Wijayasuriya පවා කිව්වේ, සංවේදී තොරතුරු නම් ඒ සම්බන්ධව ඒ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන එක. ඒ තොරතුරු නම් කරලා කියන්න ඕනෑ නැහැ. ඇත්තටම ඒවා සංවේදී තොරතුරු. ඒ නිසා රජයක් විධියට මේ ගැන දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑය කියලා මම හිතනවා. මොකද රටක දත්ත කියන්නේ, ඒ රටට තිබෙන ලොකු ම සම්පතක්.

හැබැයි, මේ කාරණාව සම්බන්ධයෙන් බොහෝදෙනෙකුට අඩු දැනුවත්භාවයක් තිබෙන්නේ; අඩු වටිනාකමක් දෙන්නේ. මේ තොරතුරුවල වැදගත්කම කොච්චරද කියන කාරණාව පැහැදිලි කරන්න මට උදාහරණයක් කියන්න පුළුවන්. මගේ විශ්වවිද්‍යාල මිතුරෙක් ඉන්නවා, සුජීව් රාජකුමේන්ද්‍රන් කියලා. ඔහු දමිළ සහෝදරයෙක්. ඔහුට අද මෘදුකාංග ආයතනයක් තිබෙනවා. එක්තරා අවස්ථාවකදී ඔහුට විදේශ සමාගමක interview එකක් සිංගප්පූරුවේ තිබුණා. සිංගප්පූරුවේ තිබුණු ඒ interview එකේදී ඔහුට offer එකක් දෙනවා. ඒ අනුව ඕනෑම item එකක්, ඕනෑම භාණ්ඩයක් ඩොලර් එකකට ඔහුට දෙනවා, ඔහුට සුදුසු මිලකට මේ රට තුළ විකුණන්න පුළුවන්. හැබැයි, ඔවුන් ඉල්ලන එකම කොන්දෙසිය තමයි ඒ සියලුම data ටික ඒ අදාළ ආයතනයට ඕනෑ කියන එක. එතකොට ඔබතුමන්ලා කල්පනා කර බලන්න, ඔහු දමිළ සහෝදරයෙක් වුණත්, විශේෂයෙන්ම මේ විෂය සම්බන්ධව දැනුමක් තිබෙන පුද්ගලයෙක් නිසා, ඒ offer එක ඔහු reject කළා; ඔහු අත්හැරලා දැම්මා. මොකද, මේකෙන් රටට වෙන්න තිබෙන හානිය ගැන ඔහුට අවබෝධයක් තිබුණා. හැබැයි, අපි දන්නේ නැහැ, මේ වනකොට ඒ offer එක වෙන කවුරු හරි අරගෙන තිබෙනවාද කියලා. නමුත්, ඒ තුළින් වෙන්න තිබුණු හානිය එදා ඔහු නැවැත්වූවා. අපි දන්නේ නැහැ, මේ වනකොට ඒක තවවුරටත් ක්‍රියාත්මක වනවාද කියලා. මම මේ කියන්න උත්සාහ කළේ රටක දත්ත කියන කාරණාව සම්බන්ධයෙන් කොච්චර වටිනාකමක් තිබෙනවාද කියන එක පෙන්වා දෙන්නයි. හිතන්න කෝ, අඩුම මුදලකට ඔහුට ඒ අවස්ථාව ලැබෙනවා නම් ඔහු වටා තමයි රටේම මිනිස්සු එකතු වෙන්නේ. එතකොට ඒ හරහා තමයි ඔවුන් තොරතුරු එකතු කරන්නේ. මේ රටේ ඉතිහාසයේ වෙච්ච දේවල්වලින් මේකට දෙන්න පුළුවන් උදාහරණ කිහිපයක් තිබෙනවා.

[ගරු චතුර ගලප්පත්ති මහතා]

උදාහරණයක් වශයෙන් ගත්තොත්, පසුගිය අර්බුදය සමයේදී ඉන්ධන පෝලිම්වල ඉන්නකොට ඒකට විසඳුමක් විධියට ඉන්ධන සඳහා කෝටා එකක් දෙනවා අපි දැක්කා. ඒ සඳහා QR කේතයක් දුන්නා. ඒ QR කේතය හරහා අපෙන් ගන්න අපේ data ටික කොහේද store වෙලා තිබෙන්නේ කියලා මම මේ රජයෙන් අහනවා. මේ රටේ මිනිස්සුන්ගේ තොරතුරු ටික මොන රටක, මොන server එකකද data store වෙලා තිබෙන්නේ? ඒ ප්‍රශ්නයට විසඳුමකුත් දුන් එක ඇත්ත. හැබැයි, මේකෙන් වෙනත් ප්‍රයෝජන ගන්නේ කවුද කියන කාරණාව හොයලා බලන්න ඕනෑ. විශේෂයෙන්ම කොරෝනා සමයේ එන්නත්කරණ අවස්ථාවේදී අපේ තොරතුරු ලබා ගත්තා. ඒ තොරතුරු ටික කොහේද තිබෙන්නේ කියන එක අද හොයලා බලන්න වෙලා තිබෙනවා.

ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය ගැනත් කියන්න ඕනෑ. පසුගිය රජය කාලයේ විශේෂයෙන්ම එක්තරා නිලධාරියෙකුට වුවමනා වුණා, දරුවන් සම්බන්ධයෙන් තොරතුරු පද්ධතියක් හදන්න. ඒක එක්තරා ආයතනයකට ටෙන්ඩර් දීලා අන්තිමට ටෙන්ඩර් පට්ටපාටිය නැතිව ඉන්ෂුවරන්ස් සමාගමකට දුන්නා. මේ රටේ සියලුම දරුවන්ගේ තොරතුරු ටික insurance company එකකට කුණුකොල්ලෙට දෙන්නේ. එතකොට කල්පනා කර බලන්න, ඒ insurance company එකට කොච්චර වටිනාකමක් තිබෙන - මිලියන ගණනක් නොවෙයි, බිලියන ගණනක් වටිනා - තොරතුරු ටිකද කුණුකොල්ලෙට දීලා තිබෙන්නේ කියලා. ඒකෙන් තේරෙන්නේ මොකක්ද? ඒ නිලධාරින්ට මේ පිළිබඳ කිසිම දැනුමක් නොමැතිකම.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම NMRA දත්ත මගඩිය ගැනත් මම කථා කරන්න ඕනෑ. තමුන්නාන්සේලා පාස්කු ඉරු දින ප්‍රහාරය ගැන කථා කරනවා. ඒ පාස්කු ඉරු දින ප්‍රහාරය තමයි, පසුගිය ඉතිහාසයේ වෙච්ච ලොකුම බේදවාචකය. හැබැයි, ජාතික ආරක්ෂාව පිළිබඳව අපි කථා කරද්දී NMRA දත්ත මගඩිය ගැනත් තොරතුරු හොයන්න කියලා මම රජයට අවධාරණය කරනවා. කලින් ගරු මන්ත්‍රීවරයෙකු කිව්වා වාගේ බෝම්බ පිපිරෙන ඒවා, වෙඩි තැබීම් ගැන විතරයි කථා කරන්නේ. හැබැයි, NMRA දත්ත මගඩිය කියන්නේ, මේ රටේ අපි සියලුදෙනාගේම සංවේදී තොරතුරු තිබෙන Lanka Government Cloud එකට access කිරීමක් කළේ. ඒක ජාතික ආරක්ෂාවට වෙච්ච ප්‍රධාන තර්ජනයක්. අද තමුන්නාන්සේලාගේ රජයක් තිබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියන ගමන්ම අවසාන වශයෙන් මම එක යෝජනාවක් කරනවා. මොකද, අපි විවේචනය කරන්න විතරක් නොවෙයි ඉන්නේ. ඔබතුමන්ලාට යෝජනාවක් විධියට මේ කාරණාව මම ඉදිරිපත් කරනවා. එදා ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේදීත් මම අතිගරු ජනාධිපතිතුමාට මේ පිළිබඳව යෝජනා කළා.

අපේ රටට අනාගතයේදී data centres අවශ්‍යයි. Data centre එකක් ගෙනියන්න තනි රටක් විධියට අපට හැකියාවක් නැහැ. ඒකට විශාල මුදලක් දරන්න වෙනවා. හැබැයි, data centre එකකට අපට වියදම් දරන්න බැරි වුණාට ලංකාවේ වාසනාවකට wind power ව්‍යාපෘතිය තිබෙනවා. ඒ wind power ව්‍යාපෘතිය හරහා අපට විදුලිය නිෂ්පාදනය කරන්න හැකියාවක් තිබෙනවා. යම් ආයෝජකයෙකුට ඒ wind power ව්‍යාපෘතිය දෙනවා නම්, ඒකේ එක කාරණාවක් විධියට ඇතුළත් කරන්න, ශ්‍රී ලංකාවට data centre එකක් දෙන්න කියන එක. මොකද, එක ගලෙන් කුරුල්ලෝ දෙදෙනෙක් අල්ලා ගන්න තිබෙන අවස්ථාවක් සහ රටට විශාල මුදලක් අරගෙන ලංකාවේ තොරතුරු ටික සංරක්ෂිතව තබා ගැනීම ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ගන්න පුළුවන් එක් පියවරක් විධියට මම යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[ප.ව. 2.45]

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்த ஆண்டுக்குப் பாதுகாப்பு அமைச்சுக்கான மொத்த ஒதுக்கீடு 442 பில்லியன் ரூபாயாகக் காணப்படுகின்றது. இந்தத் தொகையானது கடந்த ஆண்டைவிட 12 பில்லியன் ரூபாய் அதிகரித்துக் காணப்படு கின்றது. இது 3 சதவீத அதிகரிப்பாகும். தற்போது அரச படைகளுக்கு வழங்கப்படுகின்ற சம்பள அதிகரிப்பின் காரணமாகத்தான் இந்தச் செலவானது அதிகரித்துச் சென்றுள்ளது என்பதை இந்தச் சபையிலே தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். உண்மையிலேயே ஒரு நாட்டின் தேசியப் பாதுகாப்பு உறுதிப்படுத்தப்பட்டால்தான் அந்த நாட்டின் அபிவிருத்தியைச் சிறந்த முறையிலே மேற்கொள்ள முடியும். எமது ஆட்சிக் காலத்திலே இப்பாதுகாப்பு உறுதிப்படுத்தப்பட்டதன் காரணமாகப் பங்குச் சந்தையில் வளர்ச்சி காணப்படுகின்றது. அதேநேரம் சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கை இந்த ஆண்டிலே அதிகரித்துக் காணப்படுவது சுற்றுலாத்துறையின் வளர்ச்சியைக் காட்டுகின்றது.

பாதுகாப்பு அமைச்சின் கீழ் 25 திணைக்களங்கள் காணப்படுகின்றன. அதாவது, இலங்கைத் தரைப்படை, இலங்கை கடற்படை, இலங்கை வான்படை, சிவில் பாதுகாப்புத் திணைக்களம், இலங்கை கரையோரப் பாதுகாப்புத் திணைக்களம், வளிமண்டலவியல் திணைக்களம் ஆகிய 6 திணைக்களங்களும், 19 நியதிச் சட்ட சபைகளும் நிதியங்களும் காணப்படுகின்றன. அவற்றிலே அனர்த்த முகாமைத்துவ மத்திய நிலையம், அனர்த்த முகாமைத்துவ தேசிய மன்றம், சேர். ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழகம், தேசிய கட்டிடங்கள் ஆராய்ச்சி அமைப்பு போன்றன மிகவும் முக்கியமான நிறுவனங்களாகக் காணப்படு கின்றன. தரைப்படைக்கு ரூபாய் 225,525 மில்லியனும், கடற்படைக்கு ரூபாய் 92,563 மில்லியனும், வான்படைக்கு ரூபாய் 72,175 மில்லியனும், சிவில் பாதுகாப்புத் திணைக்களத்திற்கு 22,430 மில்லியனும், நிலச் சரிவுகளைத் தணித்தலுக்கு 4,105 மில்லியனும், அனர்த்த நிவாரணத்திற்கு ரூபாய் 2,531 மில்லியனும் அனர்த்தத் தணிப்பிற்கு ரூபாய் 678 மில்லியனும் அபிவிருத்திச் செயற்பாடுகளுக்காக ரூபாய் 13,251 மில்லியனும் ஒதுக்கப்பட்டுள்ளது.

அபிவிருத்திக்கான நிதியில், ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழகத்துக்கு கிட்டத்தட்ட 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. 1981ஆம் ஆண்டு பாதுகாப்புக் கழகமாக ஆரம்பிக்கப்பட்ட இந்த நிறுவனம், 1988ஆம் ஆண்டு பல்கலைக்கழக அந்தஸ்துக்குத் தரமுயர்த்தப்பட்டதோடு, 2007ஆம் ஆண்டில் பாதுகாப்பு அமைச்சின்கீழ்க் கொண்டுவரப்பட்டது. தற்போது இது பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவின்கீழும் உள்ளடக்கப்பட்டுள்ளது. தற்போது இங்கு இரண்டு வளாகங்களும், 15 துறைகளும் காணப்படுகின்றன. இந்த அரசாங்கத்தினால் குருநாகல், தம்புள்ள ஆகிய இடங்களில் புதிய வளாகங்கள் ஆரம்பிக்கப்படவுள்ளன என்பதையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். குறித்த பல்கலைக்

கழகத்திற்குரிய வைத்தியசாலையானது 7 தீவிர சிகிச்சைப் பிரிவுகளுடன், 889 நோயாளர்களுக்கான கட்டில்களோடு மிகச் சிறந்த முறையில் இயங்கிவருகின்றது.

அதேபோல், வடக்கு மாகாணத்தில் முப்படைகளின் பயன்பாட்டிற்கென ஒதுக்கப்பட்டுள்ள காணிகள் மற்றும் நிலங்கள் தற்போது படிப்படியாக விடுவிக்கப்பட்டு வருகின்றன. உதாரணமாக, முல்லைத்தீவு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள மொத்தம் 47,000 குடும்பங்களில் தற்போது 272 குடும்பங்களின் காணிகள் மட்டும் கையகப்படுத்தப்பட்டுள்ளன. அங்குள்ள ஐந்து பிரதேச செயலாளர் பிரிவுகளிலுமாக படையினர் வசமுள்ள காணிகளின் மொத்தம் 1,494 ஏக்கராகும். இதில் அரச மற்றும் தனியார் காணிகள் உள்ளடங்குகின்றன என்பதைத் தொிவித்துக் கொள்கின்றேன். அதாவது, மருதையன்பற்று பிரதேச செயலாளர் பிரிவில் 744.33 ஏக்கர், புதுக்குடியிருப்பு பிரதேச செயலாளர் பிரிவில் 156.22 ஏக்கர், ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவில் 140.13 ஏக்கர், துணுக்காய் பிரதேச செயலாளர் பிரிவில் 433.50 ஏக்கர், மாந்தை கிழக்கு பிரதேச செயலாளர் பிரிவில் 20 ஏக்கர் காணிகள் படையினர் வசம் காணப்படுகின்றன. எங்களது ஆட்சியில் இந்தக் காணிகள் மக்களின் பாவனைக்காக மிக விரைவில் வழங்கப்படும் என்பதை இந்த உயரிய சபையில் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.51]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
විනාඩි 14ක් තිබෙන බව කිව්වා. දැන් ඒකත් අඩු වෙලා!

Hon. Deputy Chairperson, in the 2025 Budget, for defence, there has been an allocation of Rs. 434 billion, which is a 3 per cent increase from the previous year, and for public security and Parliamentary affairs, a further Rs. 175 billion has been allocated. As far as I am concerned and certainly as far as the North and the East is concerned, Madam, the police behave very much on the instructions of the military and we do not differentiate between the two. So, I would like to include that figure with defence for my analysis.

The Budget also provides for a significant salary hike for military personnel ranging from 27 per cent to 33 per cent. Why that becomes relevant, Madam, is that it shows that the Government has prioritized the defence establishment to a point where they want to enhance the defence forces. That is in a scenario where there is no war and where the war had come to an end over 16 to17 years ago, but despite that, there is that intention to enhance the sector. That is also despite the Budget deficit reaching 6.7 per cent of GDP, whilst the target set by the IMF, if I am not mistaken, is 5.2 per cent. So, none of this is helping; it is actually making things worse. Further, the Government must increase its revenue collection to 15.1 per cent of GDP to remain eligible for the next IMF tranche of a bailout package. So, all of this is increasing the burden very severely.

Now, defence, very clearly, has been prioritized over social welfare. I mean, the figures are quite staggering, Madam! Social welfare has been slashed, slashed, to Rs. 43 billion. That is, slashed by Rs. 35 billion compared to last year at a time when the most vulnerable sections of this country are struggling because of the economic crisis and the increasing prices. But, you all are slashing all the sectors which actually need to be enhanced; when the most vulnerable need to be protected and in some way strengthened, they are doing the opposite. In fact, the IMF recommendation was that social welfare must be enhanced and there was even criticism of the previous Government that there was not adequate support given to social welfare. So, this would terribly affect the very vulnerable sections, not just in the North and East - certainly, in the North and the East because if you take the GDP, the Northern Province is the last out of all the provinces - but in the entire country. So, we are right at the bottom and are affected very really by these slashes.

What is important, Madam, is that all the speakers who spoke before me spoke with regard to the need to strengthen the defence establishment because of Sri Lanka's locality, because it is an island, because of drugs and various other problems that face this region.

Let us take it at face value, that it has no sinister motive, that it is a genuine question of strengthening security to ensure that the whole Island is secure. But, if that is the case, how do you account for what I am going to now place on record? There is a ratio, Madam, of 1.5 soldiers to every 100 civilians. That is the ratio of Sri Lanka's defence establishment - 1.5: 100. What I just told you is the ratio for the whole Island . But, if you take Mullaitivu, there is a minimum of one solider for every two civilians! If you take the military, there are 20 divisions and 16 of those divisions are based in the North and the East. So, how do you look at this security picture? I can understand you making the argument that Sri Lanka must look into its security and for that, you must strengthen the defence establishment. But, what does this mean? What are the demographies of the regions where you have placed your entire military? It is the Tamil-speaking areas, areas that we represent. What is the message you are giving? Who is the enemy? When you talk of defence, Madam, who do you consider the enemy? I can understand previous Governments doing it, but this Government itself admitted that they were all racist, but that same policy is being pursued today. Surely, that cannot be right. You came into power saying that you are going to get rid of racism. You are asking us, our party and the people who represent the North and the East, to forget about the past because you are now in power and that you will ensure that there would not be racism and hostility towards us. I am asking you, Madam, how on earth can you justify the 1:2 ratio in a place called Mullaitivu? Do you not feel that that is suffocating? Do the Tamils not get the feeling "you are the enemy"? That is what the county feels; the country feels "you are an enemy". That is what you are telling the Tamils because that is the reality.

Now, I am tired, Madam, of raising this repeatedly. Actually, there is a young gentleman who covers Parliamentary affairs and who has been good enough to cover my speeches. He made a comment. He said, "Sir, I

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

quite appreciate how strongly you bring out the cause of your people". But, honestly, I am tired of constantly having to bring out only my people's problems, that I cannot feel that I can contribute to the rest of the country because that is the burden you have been placing on us. In every field, we feel that we are scraping the barrel, and no other field drives through the message so strongly than the Defence Ministry and the Ministry of Public Security. Considering the way in which those under the two Ministries behave in the North and the East and the policies of not just the previous Governments, but even of this Government, we see no change. Therefore, the allocation to the Ministry of Defence alone is enough for us to oppose this Budget; that is the way we feel. And, if this Government feels that they need to change this, that they need to be genuine with regard to this system change they promised, then that must be the first thing they look at with regard to the North and the East.

The speaker who spoke before me represents the Vanni Electoral District and the poor Hon. Member tried very hard to justify the allocations for defence and to play it down. Representing the Vanni, he also represents Mullaitivu; he being a Member of the Vanni means that Mullaitivu is a part of his Electorate. He should feel ashamed that he has to justify that 1:2 ratio!

I honestly ask you, do you not feel claustrophobic? Do you not feel suffocated? Would you accept that in your areas? Would you?

And, what else does the defence establishment do? The teachers of the defence establishment are teaching in preschools. I mentioned this even during the Budget Debate. The Defence establishment employs preschool teachers. The Ministry of Education employs preschool teachers for Rs. 6,000 while the defence establishment employs them for Rs. 30,000! In an area where you have had 35 years of war and where their economy is scraping the barrel, when you are given a choice between Rs. 6,000 and Rs. 30,000 or Rs. 40,000, which section of preschools would you want to get employed in? Are you not deliberately, by keeping that difference, militarizing education in the North and the East? What is the intention then? Therefore, is it a post-war feeling that you get when you listen to these figures? So, this has to change. Madam, I am **tabling*** two reports. One is a report by the Citizen Fact Check on this 1:2 ratio and the other is by Adayaalam Centre for Policy Research.

If you take the entire Northern Province, Madam, that ratio is 1:10. In Mullaitivu, it is 1:2 and in Killinochchi, 1:4. But, if you take the Northern Province, overall, it is 1:10. When it comes to the entire country, it is 1.5:100. So, who is the enemy? You all should feel ashamed; the Hon. Members seated opposite should feel ashamed! If you want to get rid of racism, the first thing you should have done is to begin to change this. Then, you would have had us believe that there is actually a chance of things happening differently. But, you have not done that; you have increased the Budgetary allocation instead. Despite the fact that we have been raising these issues at the Consultative Committee as well as on the Floor of this House, you have not done anything concrete to change that. On dividual instances - the Hon. Mano Ganesan brought up a few - we have brought this up, but you have not changed. Nothing has changed. So, this has to change, Madam. Without changing that, to simply tell us that you will get rid of racism is just hogwash; it means nothing.

Therefore, we will be calling for a Division and will be voting against the Heads of both the Ministry of Defence and the Ministry of Public Security.

Thank you.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබී තිබෙනවා.

[අ.භා. 3.05]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ කථාව මම සෑහෙන්න වෙලාවක් අහගෙන සිටියා. එතුමා තුන්හතර වතාවක් කිව්වා, "feel ashamed" - ලජ්ජයි - කියලා.

තමුන්නාන්සේලාගේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු අද උතුරෙන්, නැහෙනහිරින් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. මිනිස්සු ජාති භේදයක් සැලකුවේ නැහැ. වෙනදා හැමදාම දෙමළ දේශපාලන පක්ෂවලට, ප්‍රාදේශීය දේශපාලන පක්ෂවලට ඡන්දය ලබා දුන් අය මෙවර තමුන්නාන්සේලා වෙනුවෙන් තම ඡන්දය පාවිච්චි කරලා තිබෙනවා. උතුර වෙනුවෙන් සහ නැහෙනහිර වෙනුවෙන්, විශේෂයෙන් අපේ දමිළ සහ මුස්ලිම් ජනතාව වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා, මාර්ගයක්, දෙකක් ඇරලා show එක දාලා, පහුවදා පත්තරේ දාන වැඩේ නම් කරන්න ලැස්ති වෙන්න එපා, කරුණාකර එම ජනතාව වෙනුවෙන් තමුන්නාන්සේලාගේ යුතුකම් කොටස ඉෂ්ට කරන්න කියලා. විශේෂයෙන්ම වතුකරය සම්බන්ධයෙනුත් මේ වාගේම තත්ත්වයක් තිබෙන්නේ. වතු යටිතල පහසුකම් ගැන මම වෙනම කථා කරන්නම්.

විශේෂයෙන්ම පාතාලය ගැනත් මම මෙහිදී කියන්න ඕනෑ. මම පාතාලය ගැන පාර්ලිමේන්තුවේදී ඇති තරම් කථා කරලා තිබෙනවා. පාතාලය ඇතුළු ඒ ක්‍රියාදාමයන් සියල්ල මර්දනය කරන්න පුළුවන් ක්‍රම දෙකක් අපට තිබෙනවා. මම හිතනවා, තමුන්නාන්සේලා ඒවා ගැන අවබෝධයක් ලබාගෙන ඇති කියලා. හැබැයි, ඒ වෙනුවෙන් තවමත් වැඩ පිළිවෙළක් හැදිලා නැති බවත් අපි කියනවා. විශේෂයෙන්ම දරුණු ගණයේ සියලු අපරාධකරුවන් බූස්ස බන්ධනාගාරයට ගෙන ගිහින් දැම්මේ, බූස්ස බන්ධනාගාරය යම්කිසි මට්ටමකට develop කරලා එතැනම නඩු අහන තත්ත්වයට පත් කරන්නයි. නමුත් ඒ ක්‍රියාදාමය තවමත් ඉෂ්ට

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වෙලා නැහැ. විශේෂයෙන්ම වර්තමාන අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ සිටින නිසා මම ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ කටයුත්ත සම්බන්ධයෙන් ඉක්මනින් මැදිහත් වෙන්න කියලා. මොකද, තව කොයි තරම් පිරිසක් මැරෙයිද කියලා අපට කියන්න බැහැ. දැන් විනිශ්චයකාරවරු බයයි ඇප දෙන්න තියා වෙන කිසිම දේකට අපරාධකාරයෙකු උසාවියකට ගේන්න. මේ ප්‍රශ්නය දැන් ඒ තැනට තල්ලු වෙලායි තිබෙන්නේ. මොකද, දැන් පොලීසිය ගැන විශ්වාසයකුත් නැහැ, බන්ධනාගාර ගැන විශ්වාසයකුත් නැහැ, ඇතුළේ ඉන්න staff එක ගැන විශ්වාසයකුත් නැහැ. අධිකරණයේ judgesලා ගැන නොවෙයි මම මේ කියන්නේ. මම ඊයේත් මේ ගැන කිව්වා. ගනේමුල්ලේ සංජීව Court No. 9වලට ගේන්න හදන කොට මොකද වෙන්නේ? ඒ විනිශ්චයකාරතුමා නිවාඩු ගන්නවා. ගනේමුල්ල සංජීව එතැනට ගෙන යනවා; ඔහු ගෙනිහින් Court No. 5වලට දමනවා; එහි ඉඩ කඩ හොඳට තිබෙන බවත්, Court No. 9වල ඉඩ කඩ අඩු බවත් කියනවා; පසුව ඒ පුද්ගලයාට වෙඩි තියනවා. මේ සියල්ලටම ඒ අය වග කියන්න ඕනෑ කියන තැන තමයි මම අදත් ඉන්නේ. මට දැන ගන්න තිබෙන විධියට computersවලින්, නැත්නම් Zoom හරහා අපරාධකරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කරන වැඩ පිළිවෙළක් තවමත් හැදිලා නැහැ. ඒකට කමිටුවක්වත් පත් කරලා නැහැ. මම දන්නා කාලයේ ඉඳන් තත්ත්වය ඒකයි. එම නිසා මම කියනවා කරුණාකර ඒ සම්බන්ධයෙන් නිසි වැඩ පිළිවෙළක් හදන්න කියලා. මොකද, 1994 සිට මමත් අධිකරණ අමාත්‍යාංශයේ ඉඳලා තියෙනවා. ඒ නිසායි මම ඒ ගැන කියන්නේ.

1970ට කලින් දකින්න තිබුණේ කොළඹට ආවොත් පික්පොකට් ගහන එකයි. ඒ කාලයේ වෙච්ච, "නෙයිනගේ සූදුව" කියලා එකක් ගැන අපි අහලා තිබෙනවා. ඒ කාලයේ එක්කෝ සූදු පොළවල් තිබුණා, නැත්නම් පික්පොකට් ගැහිල්ල තිබුණා. 1971දී තමයි පළමුවැනි වතාවට weapons අරගෙන මිනී මරන මානසිකත්වයක් තරුණයින්ගේ ඔළුවල ඇති කළේ. ඒ පාතලය තමයි අනෙක් ආණ්ඩු ර්ට පසුව පාවිච්චි කළේ. ඒ අය තමයි ඒ පාතාලය රැක්කේ. 1988-1989 කාලයේ තමයි ඒක තවත් වැඩි වුණේ. පිල්ලෙයාන් ර්යේ කියලා තිබෙනවා මම දැක්කා, ඒ අයට අවි ආයුධ ගන්න පුරුදු කළේ JVP එකයි කියලා. මම දන්නේ නැහැ, ඒක කොයි විධියට ද වෙලා තිබෙන්නේ කියලා. කොහොම හරි, ඒ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. එම නිසා ඉතිහාසයේ එක එක්කෙනාට බණිමින් ඉන්න එක නොවෙයි අප කරන්න ඕනෑ; සියලුදෙනා එකතු වෙලා පාතාලය මර්දනය සඳහා අවශ්‍ය කරන ශක්තිය දීමයි කරන්න ඕනෑ. පාතාලය මර්දනය කිරීම සඳහා අපේ පැත්තෙන් අපට දෙන්න පුළුවන් උපරිම සහයෝගය, ශක්තිය ලබා දෙනවා වාගේම, ඕනෑම මිනිහෙකුට නිදහසේ ගමන් කිරීම සඳහා තිබෙන අයිතිය වෙනුවෙන් ද අපි පෙනී සිටිනවා.

විශේෂයෙන්ම අලි වැට සම්බන්ධ ප්‍රශ්නය ගැනත් මම කියන්න කැමැතියි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ 4,500කට වැඩි සේවකයින් පිරිසක් ඉන්නවා. ඔවුන් ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ බඳවා ගත් අය. රාජ්‍ය සේවයට 30,000ක් බඳවා ගන්න කොට මෙම දෙපාර්තමේන්තුවටත් බඳවා ගත්තා. මමත් දන්නවා, ඒ වාගේම අපේ ගරු ඇමතිතුමාත් දන්නවා, ඒ අය ස්ථිර කරන්න කටයුතු කරපු නැති නිසා පසුගිය ඡන්දයේදී ගල්ගමුව ප්‍රදේශයේ අතිවිශාල පිරිසක් ඔබතුමන්ලාට සහයෝගය දුන්නා කියලා.

මම සමහර අයගෙන් ඇහුවාම කිව්වා, "සර් දෙන්නේ නැහැ ඡන්දේ, අපි ස්ථිර කරනකල්" කියලා. රුපියල් 22,500ට ඒ මිනිස්සු වැඩ කරන්නේ. මම පිළිගන්නවා, පරණ ආණ්ඩුවේ කරුමයක් තමයි ඔබතුමන්ලාගේ ඔළුවට ඇවිල්ලා තිබෙන්නේ. මම ගෞරවයෙන් ඉල්ලනවා, කරුණාකරලා ඒ අය ස්ථිර සේවකයන් හැටියට පත් කරන්න. මොකද, ඒ අය පැය 24ම වැඩ කරනවා, ගරු ඇමතිතුමනි. ඔබතුමා දන්නවා. ඒ අය පැය 24ම වැඩ කරනවා. කිලෝමීටර 10ක් දීලා තිබෙනවා නඩත්තු කරන්න, පස්දෙනෙකුට හෝ දහදෙනෙකුට. කිලෝමීටර 10ක් අලි වැට නඩත්තු කරන්න ඕනෑ ඒගොල්ලන්. සුද්ධ කරන්න ඕනෑ, වළවල් කපන්න ඕනෑ, තිබෙන ප්‍රශ්න ටික බේරන්න ඕනෑ. ඒ නිසා ඒ අයගේ ප්‍රශ්නය විසඳන්න කියලා ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලනවා. ඒ අයට කැලෑ කපන්න, අනෙකුත් අවශේෂ වැඩ සියල්ල කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සඳහා මැදිහත් වෙන්න කියන ඉල්ලීම මම කරනවා.

අනෙක් කාරණය, පොලීසියේ inspections. SSPලා එනවා පොලීසියට. Inspections කරනවා. මම දැක්කා ර්යේ පෙරේදා එක පොලීසියක් පාට ගාලා, සුද්ධ කරලා, බල්බ් දාලා ඔක්කෝම කරලා තිබෙනවා. කවුද ඒවා කරන්නේ? ඒවාට කොහෙන්ද සල්ලි එකතු කරන්නේ? ඒවාට සල්ලි එකතු කරන්නේ ගමේ ඉන්න කසිප්පුකාරයාගෙන්; ගමේ ඉන්න වැලි අදින මිනිහාගෙන්; නැත්නම් මුදලාලිගෙන්. ගමේ ඉන්න අයගෙන් සල්ලි ටික එකතු කරලා තමයි පොලීසියේ OIC මහත්මයා ඒවා කරන්නේ. දවල්ට කෑම දෙන්නත් ඕනෑ. මම කියන්නම් උදාහරණයක්, ඕනෑ නම් නම් ගම් පිටින්. ඔබතුමාට මම වෙනම කියන්නම්, පෞද්ගලිකව හම්බ වුණාම. මම මේ කියන්නේ මේකට ක්‍රමයක් හදන්න කියලා. මොකද, පොලීසියට සල්ලි නැහැ නේ. පොලීසියේ OIC අතින් දමන්නේ නැහැ නේ ඒවාට. මොකද කරන්නේ? මම දැක්කා. ඒ පොලීසියේ පිරිලා හිටියා එදා වැලි අදින අය ඔක්කෝම. ඒ වාගේම කසිප්පු මුදලාලිලා ටික. මොකද, ඒගොල්ලන් තමයි ඒවාට සල්ලි දෙන්නේ. පොලීසිය පාට කරන්න ඕනෑ, SSP මහත්මයාට දවල්ට කෑම දෙන්න ඕනෑ, ර්ට බෝතල් ටිකකුත් දෙන්න ඕනෑ. ඒ සියල්ල බලාගන්න ඕනෑ. ඉතින් මම කියන්නේ, මේ inspection වැඩේ මොකක් හරි විධියකට හදන්න කියලායි. අපේ වටගල මැතිතුමාට තේරෙනවා. අපි දන්නවා, ඒවා සාමාන්‍ය කාරණා. අපි ඒවා නිකම්ම කියනවා නොවෙයි, ඒ ගැන බලන්න. *[බාධා කිරීමක්]* නවත්වලා නොවෙයි. මම ගිය සතියේ දැකපු දේ මම මේ කියන්නේ. බොරු කියන්න ඕනෑ නැහැ. මම ඔබතුමාට ඒ නම කියන්නම්. මම කැමැති නැහැ, හොඳ නැහැ නේ. OIC මහත්වරු ර්ට පස්සේ අපිත් එක්ක upset වෙනවා. ර්ට පස්සේ කියාවි, "සර් තමයි මෙක කිව්වේ" කියලා. *[බාධා කිරීමක්]* නම කියන්නම්. ප්‍රසිද්ධියේ කියන්න හොඳ නැහැ නේ. අපි ඔබතුමන්ලා වාගේ වැඩ කරන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා ඒ ගැන බලන්න.

ඊළඟට, තමුන්නාන්සේලා අලුත් ගැසට් එකක් ගහලා තිබෙනවා. හමුදාවේ කාන්තාවන් මෙච්චර කාලයක් වැඩ කළේ අවුරුදු 15යි. අවුරුදු 15ක් වැඩ කරලා ඒ අය විශ්‍රාම ගියා. දැන් මොකද වෙලා තිබෙන්නේ? පිරිමි අවුරුදු 22ක් වැඩ කරන්න ඕනෑ. කාන්තාවෝත් දැන් අවුරුදු 22ක් වැඩ කරන්න ඕනෑ කියලා තිබෙනවා. එතකොට කාන්තාවන් අවුරුදු 22ක් හමුදාවේ වැඩ කරන්න ඕනෑ. වෙන දා අවුරුදු 15ක් තමයි වැඩ කරන්න තිබුණේ. තමුන්නාන්සේලා එම ගැසට් එක ගහලා තිබෙනවා. ඒ ගැසට් එකේ බොහොම පැහැදිලිව තිබෙනවා, ඒ වැඩ කරන්න ඕනෑ කාල වකවානු ගැන. එතකොට ඇත්ත වශයෙන්ම හමුදාවේ වැඩ කරලා අවුරුදු 15කින් විශ්‍රාම ගිය කාන්තාවන්ට දැන් තවත් අවුරුදු 7ක් - අවුරුදු 55ත් පහුවෙනතුරු- හමුදාවේ වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මම දන්නේ නැහැ කවුරු ඒක කළාද කියලා. තමුන්නාන්සේලා ඒ ගැන හිතන්න. මොකද, මේ රටේ කාන්තාවන් ඇත්තටම අවුරුදු 15ක් සේවය කරලා විශ්‍රාම ගියාට පස්සේ තමන්ගේ දරුවන් ටික බලාගන්න පුළුවන්, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කැප වෙන්න පුළුවන්. ඒවා තමයි අම්මලා වශයෙන් ඒ අය විශ්‍රාම ගිහිල්ලා කරන්නේ. හමුදාවේ වැඩ කරලා ගිහිල්ලා ඒ කටයුතු ටික තමයි කරන්නේ. ඒ නිසා ඒ ගැන විශේෂයෙන් කල්පනා කරන්න. ඒ නීතිය මේ රටේ කාන්තාවන්ට,

[ගරු දයාසිරි ජයසේකර මහතා]

වැඩ කරපු අයට කරන යම් කිසි විධියේ අසාධාරණයක් කියලායි මම කල්පනා කරන්නේ. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා කියනවා.

ඊළඟට, පාස්කු ප්‍රහාරය ගැන දැන් විශාල සාකච්ඡාවක් සිද්ධ වෙමින් තිබෙනවා. දැනට ඒ සම්බන්ධයෙන් 747දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉතා හොඳට වැඩ කරපු අපේ රවි සෙනෙවිරත්න මැතිතුමා, ශානි අබේසේකර මැතිතුමා තමුන්නාන්සේලා වෙනුවෙන් වැඩ කරලා අද හමුදා සාමූහිකයේ නායකයන් බවට පත්වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආරක්ෂක ලේකම් පවා හමුදා සාමූහිකයේ ප්‍රධානියෙක්. පොලීසිය භාර අමාත්‍යාංශයේ ලේකම්තුමාත් ඒ වාගේ එක්කෙනෙක්. තමුන්නාන්සේලා ඔක්කෝම ටික දේශපාලනයෙන් දැම්මා. වෙන දා කවදාවත් අපි එහෙම දැම්මේ නැහැ. මට කියන්න, කවුරු හරි එහෙම දාලා තිබෙනවාද කියලා ඉතිහාසයේ? ආරක්ෂක ලේකම් පවා එහෙම දමාගෙන ඉන්නවා. ගැටලුවක් නැහැ. නමුත් මම කියන්න ඕනෑ, මෙන්න මේ ගැන. ඔබතුමන්ලා පොරොන්දුවක් දුන්නා නේ කාදිනල්තුමාට. බුද්ධි අංශයේ ඉන්නවා, SI බණ්ඩාර කියලා කෙනෙක්. ඒ අයගෙන් තමුන්නාන්සේලා කටඋත්තර අරගෙන තිබෙනවාද?

දැන් "සොනික් සොනික්" කියන පුද්ගලයා කවුද කියලා තමුන්නාන්සේලා දන්නවා. මම හිතන විධියට, ඔය SI බණ්ඩාර මහත්තයාට තමයි ඒක කියන්නේ. එතකොට අසාද් මවුලානා-

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩි 12ක් තිබෙනවා කියලා නේ කිව්වේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විනාඩි 10ක් ඉවරයි, තව දෙකක් තිබෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම කොහොමද වෙන්නේ? එහෙම වෙන්න විධියක් නැහැ. බොරු කියන්න එපා. මේවා කියාගෙන එනකොට බොරු කියන්න එපා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
3.04ට නේ ඔබතුමා කථාව ආරම්භ කළේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ. මගේ වේලාව අඩු කරලා. හොර වැඩක් මේක. මම පිළිගන්නේ නැහැ, ඒක.

ඊළඟට, රෑමී අසීස්, දැන් ඔහු මනෝවිද්‍යා උපදේශකයකු විධියට වැඩ කරගෙන යනවා. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කිව්වා, -මම දන්නේ නැහැ එතුමා කොයි විධියට කිව්වාද කියලා- මහ මොළකරු හඳුනනවා කියලා. රවි සෙනෙවිරත්න මහත්මයා කොමිසමට ගිහිල්ලා, කොළයක ලියලා දුන්නා සභාපති ජනක් ද සිල්වා මැතිතුමාට, මෙන්න මෙයා තමයි මහ මොළකරු කියලා. කරුණාකරලා එතුමාගෙන් අහන්න කවුද ඔය මහ මොළකාරයා කියලා. අපෙන් අහන්න දෙයක් නැහැ. එතුමා කොළයක ලියලා දුන්නා ජනක් ද සිල්වා මහත්තයාට, -කොමිෂන් සභාවේ සභාපතිට - ප්‍රසිද්ධියේ කියන්න බැහැයි කියලා, මෙයා තමයි පුද්ගලයා කියලා. දැන් ඉතින් එතුමාගෙන් අහන්න පුළුවන්.

සහරාන්ගේ බිරිඳ, හාදියා දැන් ඉන්නේ කොහේද? ඇය දැන් ලංකාවේ නොවෙයි ඉන්නේ ඉන්දියාවේ. දැන් ඇය ගෙනැල්ලා ප්‍රශ්න කරන්න. විශේෂඥයකු ලෙස සාක්ෂි දුන්න අසංක අබේගුණසේකර මහත්මයා ගෙනැල්ලා තමුන්නාන්සේලා සාක්ෂි අහන්න. සාරා ජස්මින්ගේ DNA පරීක්ෂා කළ නිලධාරියා තවම ඉන්නවා. එයා ගෙනැල්ලා අහන්න, ඒ කවුද කියලා. ඒ විතරක් නොවෙයි, හොඳම එක්කෙනා ඉන්නවා මේ සභාවේ ඉස්සරහා, දවස ගානේ ලැයිස්තු දාන නලින්ද ජයතිස්ස ඇමතිතුමා. එතුමා කෙළින්ම කිව්වා මේක ඉන්දියාවේ වැඩක් කියලා. මා ළඟ තිබෙනවා, ඕනෑ නම් මම ඒ recording එක දාලා පෙන්වන්නම්. එතුමා තමයි කිව්වේ. එතුමා ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රකාශක. ඒ විතරක් නොවෙයි, ආණ්ඩුවේ ප්‍රධාන සංවිධායක. හැම දාම මොකක් හරි කවල් එකක් ගියොත් නම් ලැයිස්තුවක් දානවා. අද එහෙම ලැයිස්තුවක් නැහැ නේද? *[බාධා කිරීමක්]* මොනවා හරි එකක් ආවොත් දානවා නම් ලැයිස්තුවක්. එතුමා තමයි කිව්වේ කෙළින්ම ඉන්දියාව සම්බන්ධයි කියලා. ශානි අබේසේකර මහත්තයෝ, කරුණාකරලා මෙතුමා ගෙන්වලා අහන්න, කොහොමද ඉන්දියාව සම්බන්ධ වුණේ කියලා. අපි කිව්වා නම් මෙලහකට අපි අත්අඩංගුවේ. හැබැයි මේවා කියන්නේ එතුමා. ඒ නිසා කරුණාකරලා ඒක සොයා ගන්න කියලා ආදරයෙන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තව විනාඩියක් කථා කරලා නතර කරන්නම්.

විශේෂයෙන්ම මම ඊයේත් දළදා මාළිගාව සම්බන්ධයෙන් කථා කළා. ලබන 02වෙනි දා ජනාධිපතිතුමා දළදා මාළිගාවට යනවා නේ.

අනෙක් කාරණය තමයි විජේවීර සහෝදරයාගේ ඝාතනය. ඒ ඝාතනය කරපු මේජර් ජෙනරාල් තෝරදෙණිය මැතිතුමා ඔබතුමන්ලාගේ "එතෙර අපි" සංවිධානයේ රැස්වීමකට ඇවිල්ලා පොල්තෙල් පහන දල්වනවා. ඒ, විජේවීර සහෝදරයා ඝාතනය කළ ඝාතකයා කියලා කියපු එක්කෙනා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සංවිධායකතුමා ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොහොම ස්තුතියි.

ඒ රැස්වීමට මාලදිවයිනට යනවා අපේ හඳුන්නෙත්ති මහත්තයා. ගිහිල්ලා පොල්තෙල් පහන දල්වනවා, තමන්ගේ නායකයා මරපු මිනීමරුවත් එක්ක.

1989 නොවැම්බර් 13 දින විජේවීර මහත්තයා අත්අඩංගුවට ගන්නේ මේජර් ජෙනරාල් ජානක පෙරේරා ඇතුළු කණ්ඩායමක්. ඊට පස්සේ Operation Combine එකට ගෙන්වනවා. එතැනට සිසිර වෛද්‍යරත්න මැතිතුමා ඇතුළු 25ක් එනවා. අයිවන් දසනායක තමයි යුද හමුදා පොලීසියේ ප්‍රධාන අණ දෙන නිලධාරියා විධියට හිටියේ. මේ අය ඔක්කෝම ජීවත් වෙලා ඉන්නවා. ඊළඟට, golf ground එකට අරගෙන ගිහිල්ලා වෙඩි තියනවා. ඒ ආදාහනාගාරය බාරකරු දැන් මහණ වෙලා ඉන්න භික්ෂුවක්. ඒ විතරක් නොවෙයි මේක කියපු ඉන්ද්‍රානන්ද ද සිල්වා මහත්මයා තවම ජීවතුන් අතර ඉන්නවා. මීට එපිට සතියේත් එතුමා අභියෝග කළා මේ කරුණු එළියට දාන්න කියලා. එතුමා ඇවිල්ලා සාක්ෂි දෙන්න ලෑස්තියි.

දැන් තිබෙන්නේ JVP එකේ ආණ්ඩුවක්. මේ සභාවේ ඉන්නවා ඉතිහාසයේ ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ලේදී එකට හම්බ වෙච්ච කට්ටිය. සමහර අය ඉන්නවා හාමුදුරුවරු වෙලා ඉඳලා ඒකට බඩු අරගෙන ගිය කට්ටිය. සමහර අය ඉන්නවා, දළදා මාළිගාවට පහර දුන්නු අය. දළදා මාළිගාවට පහර දෙන්න ආපු කට්ටිය කවුද, පහර දුන්නේ ඇයි, ඒ සිද්ධ වුණ විනාශයට වග කියන්න ඕනෑ කවුද කියලා තමුන්නාන්සේලා කරුණාකර පරීක්ෂණයක් කරන්න. අපේ නායක හාමුදුරුවරුන්ට 02වෙනි දා ගිහිල්ලා කියන්න, මම මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් සකස් කරනවා කියලා. එතැනින් පස්සේ තමයි එල්ටීටීඊ එක දළදා මාළිගාවට ගැහුවේ. ඒ නිසා ඒවායින් ගැලවෙන්න බැහැ. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. දැන් JVP ආණ්ඩුවක් තිබෙන්නේ. විජේවීර සහෝදරයා මරලා දාලා තිබෙනවා. එහෙම මරලා දාපු එක ගැන අපි එදාත් විරුද්ධයි, අදත් විරුද්ධයි.*[බාධා කිරීම්]* මේ ඔබතුමන්ලාගේ නායකයා ගැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩි දෙකක් ඕනෑ. *[බාධා කිරීමක්]* ඒ, JVP එකේ ඔබතුමන්ලාගේ නායකයා. මතක නැද්ද එහෙම නායකයෙක් හිටියා කියලා? *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාට එහෙම නායකයෙක් හිටියා කියලා මතක නැද්ද?

ජනතා විමුක්ති පෙරමුණේ නායකයා රෝහණ විජේවීර කියලා මතක නැතුවද ඔය විධියට කෑ ගහන්නේ? මම කියන්නේ එතුමාගේ මරණය ගැන පරීක්ෂණයක් කරන්න කියලායි. මාලිමාවට ගියාට පස්සේ ඔබතුමන්ලාට ඒක තේරෙන්නේ නැතුව ඇති. ඒ, තමුන්නාන්සේලාගේ නායකයා.

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
හරි, හරි. අපි ඒක බලාගන්නම්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
රුවන් විජේවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා ජේවීපී නොවෙයිද? ඔබතුමා වෙන එක්කෙනෙක්ද? මාලිමාවේ කට්ටිය කෑ ගහන්න එපා. ජේවීපී එකේ කට්ටියට මම මේක කියන්නේ. ජනතා විමුක්ති පෙරමුණෙන් මම ඉල්ලනවා, විජේවීර සහෝදරයා ඝාතනය කිරීම පිළිබඳව පුළුල් විමර්ශනයක් ආරම්භ කරන්න කියලා. ඒ අය තවම ජීවතුන් අතර ඉන්නවා: මේජර් ජනරාල් තෝරදෙණිය ඉන්නවා; photographer ඉන්ද්‍රානන්ද ද සිල්වා ඉන්නවා; විජේවීර සහෝදරයාගේ මිනිය අරගෙන ගිහිල්ලා දෙපැත්තට පද්දලා දාපුවාම එතැන හිටපු සහෝදරයා කිව්වා මෙතැන මේක පුච්චන්න බැහැ කියලා. ඔහුගේ ඔළුවට තුවක්කුව තියලා කිව්වා, "උඹව මරනවා. අයින් වෙයන්" කියලා. ඒ සහෝදරයා දැන් භික්ෂූන් වහන්සේ නමක් විධියට ඉන්නවා. කරුණාකරලා විජේවීර සහෝදරයා ඝාතනය කරපු අයව අත්අඩංගුවට ගන්න. අත්අඩංගුවට අරගෙන ප්‍රශ්න කරලා දැන ගන්න, කවුද විජේවීර සහෝදරයා ඝාතනය කළේ කියලා. තමුන්නාන්සේලාට වගකීමක් නැද්ද? අවුරුදු ගණනාවකට පස්සේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තියෙන්නේ. ඒ මනුස්සයා වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කරන්න.

තමුන්නාන්සේලා නොවෙයි, කැප කිරීම් කරලා තිබෙන්නේ. කැපකිරීම් කරපු මිනිසුන්ගේ මිනිය උඩින් පැනලා තමයි තමුන්නාන්සේලා අද බලය අරගෙන තිබෙන්නේ. මෙතැනට ආවාම හිනා වෙනවා, "අපි ඒවා බලාගන්නම්" කියලා. තමුන්නාන්සේලා නොවෙයි කැපකිරීම් කළේ. කැපකිරීම් කරපු මිනිස්සු මැරිලා ඉවරයි. විජේවීර සහෝදරයාත් එක්ක ඒ මිනිස්සු ඝාතනය වුණා. තරුණ සහෝදරයෝ ඝාතනය වුණා. අපිත් එක්ක ඉගෙන ගත්තු සහෝදරයෝ මරලා දැම්මා. මතක තියාගන්න, අපි ඒ අය වෙනුවෙන් එදාත් කථා කෙරුවා; අදත් කථා කරනවා. ඒකට කෑ ගහන්න එපා. තරහා ගන්න එපා. *[බාධා කිරීමක්]* රුවන් විජේවීර මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මාලිමාවේද, ජේවීපී ද? කරුණාකරලා මේ සම්බන්ධව කොමිෂන් සභාවක් පත් කරන්න. පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන සොයනවා කියලා කාදිනල් උන්වහන්සේට පොරොන්දු වුණා වාගේ, විජේවීර සහෝදරයාගේ ඝාතනය ගැනත් හොයන්න. තමුන්නාන්සේලාගේ නායකයා වෙනුවෙන් පවත්වන ඉල් මහවිරු සමරුව ගිය වර පැවැත්වුණේත් කාමරයක් ඇතුළේ. මේ පාර ඉල් මහවිරු සමරුව තමුන්නාන්සේලාට කරන්න පුළුවන් වන්නේ, ඒ පාපකාරයන් ටික හොයලා ඒ අයව අධිකරණයට ගෙන ඒමෙන් පමණයි කියන එකත් මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.22]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙලා, ඒ මොහොතේ මේ රට වෙනුවෙන් දේශප්‍රේමී හැඟීමෙන් කටයුතු කරලා ඒ ආණ්ඩුව විසින් ඝාතනය කරන ලද

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

අයට අපි සාධාරණය කරන්නම්. ඒ සාතකයෝ එක්ක එකතු වෙලා, ඒ සාතනය කරපු පුද්ගලයන් බලයට පත් කරන්න; ඒ පවුල්වල අය ජනාධිපති කරන්න කටයුතු කරපු අය කිඹුල් කඳුළු හෙළන එක තේරුමක් නැහැ. අපට ඒ කථාවේ තිබෙන වේදනාව, ද්වේෂය, කෝපය, කලකිරීම තේරුම් ගන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ ඉඩක් දුන්නාට කමක් නැහැ, ඒවා පිට කරගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහජන ආරක්ෂක අමාත්‍යාංශය ගැන කථා කරන වෙලාවේ එක මන්ත්‍රීවරයෙක් - රාජපක්ෂ පවුලෙන් ඉතුරු වෙලා ඉන්න පාර්ලිමේන්තුවේ එකම එක්කෙනා- කියනවා මම අහගෙන සිටියා, පාස්කු ඉරුදින ප්‍රහාරයේ සමහර සිදුවීම් ගත්තාම, ඒ එකිනෙක සිදුවීම් අතර සම්බන්ධයක් තිබෙනවා කියලා. ඔව්, ඒක ඇත්ත. 2017 මාර්තු මාසයේ අලියාර් හන්දියේ සිදු වූ ගැටුමේ සිට 2019 අප්‍රේල් 17වැනි දා තාලංකුඩාහි සිදු වෙච්ච මෝටර් සයිකල් බෝම්බය පිපිරීම දක්වා ක්‍රියාවලියේ යම් යම් අන්තර් සම්බන්ධකම් තිබෙනවා. පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධව විමර්ශනය කරනවා කියන්නේ, ඒ පුරුක් ටික ගැට ගහන එක. එහෙම අන්තර් සම්බන්ධය හොයාගෙන යනවා වාගේම අපේ පොලීසිය, බුද්ධි අංශ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ කාලයේ පාතාලය නමින් කෙරෙන සාතන සම්බන්ධයෙනුත් ඒවායේ අන්තර් සම්බන්ධයත් හොයාගෙන යනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මිද්දෙනියේ පුද්ගලයෙකු සහ දරුවෝ දෙන්නෙක් සාතනය කිරීම ඇතුළුව, අලුත්කඩේ, කොටහේනේ, මීගමුවේ සමහර තැන්වල වූ සිදුවීම්වල තිබෙන සම්බන්ධය මොකක්ද? ජූලම්පිටියේ අමරේගෙන් පෞද්ගලික ආරක්ෂාව ගත් අය, ජූලම්පිටියේ අමරේ තංගල්ලේ බන්ධනාගාරයේ ඉන්න කොට කථා කරලා, "අමරේ මම ආවා" කියලා අමරේ එළියට ගන්න පුළුවන් අය ඉන්න රටක්, මේ. එහෙම ඉතිහාසයක් පසු කරගෙන ආපු රටක මේ මේ සිදුවීම් අතර සම්බන්ධයක් තිබෙනවාද කියලා හොයන එක තමයි අපේ පොලීසියේ ප්‍රමුඛ කාර්යභාරයක් බවට පත් වෙන්නේ. ජාතික ආරක්ෂාව වෙනුවෙන් අන්න ඒක සෙවිය යුතුමයි. ඒක නිසා මම ඒ ගැන වැඩිය කථා කරන්න යන්නේ නැහැ.

මේ පාර්ලිමේන්තුවේ අදත්, ඊයේත් කථා බහ කරලා තිබුණා, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ජනාධිපතිවරු සඳහා වෙන් කරන ලද විදෙස් සංචාරවල වියදම් පිළිබඳව. මේ තිබෙන්නේ ඊයේ කියපු කථාවේ සාරාංශය. මහින්ද රාජපක්ෂට වසර පහට රුපියල් මිලියන 3,572යි. මෛත්‍රීපාල සිරිසේනට වසර හතරට රුපියල් මිලියන 384යි; ගෝඨාභය රාජපක්ෂට වසර දෙකට රුපියල් මිලියන 126යි; රනිල් වික්‍රමසිංහට වසර දෙකට රුපියල් මිලියන 533යි; අනුර දිසානායකට මාස පහට රුපියල් මිලියන 1.8යි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සාමාන්‍යයෙන් රාජ්‍ය නායකයෙකුට ලැබෙන සංචාර වර්ග කිහිපයක් තිබෙනවා. එකක් රාජ්‍ය සංචාර. අනෙක් එක, රාජකාරීමය සංචාර - duty visits. ඊළඟ එක, ආරාධනා මත ලැබෙන සංචාර සහ පෞද්ගලික සංචාර. මේ පාර්ලිමේන්තුවේ සමහර අයට අපේ ජනාධිපතිතුමා පසුගිය මාස පහට ගිය සංචාර තුනට රුපියල් මිලියන 1.8ක් පමණක් වියදම් කළේ කොහොමද කියන එක ගැන තේරුම් ගන්න බැහැ. හැබැයි ඒ අයට ප්‍රශ්නයක් නැතුව තේරුම් ගන්න පුළුවන්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා රුපියල් මිලියන 3,572ක් වියදම් කරපු එක. හරි නම් ප්‍රශ්න කරන්න ඕනෑ මොකක්ද? විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ප්‍රශ්න කරන්න ඕනෑ ඒ තරම් මුදලක් වියදම් කළේ කොහොමද, මේ තරම් ටිකට්වලට ගියේ කොහොමද, කොපමණ පිරිසක් ගියාද, මොන හෝටල්වලටද ගියේ, ඒ රටෙන් රාජ්‍ය සංචාරවලට නොමිලේ ටිකට් ලැබුණේ නැද්ද, ඊට වඩා අඩුවෙන් වියදම් කරන්න හැකියාවක් තිබුණේ නැද්ද කියලා. අනෙක් එක මතක තබා ගන්න, අපි මේ ඉදිරිපත් කළේ ඒ අය වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වියදම් කරපු මුදල් විතරයි. ඒ සංචාරවලදී රුපියල් මිලියන 3,572ට අමතරව ඒ ගොල්ලොත් එක්ක ගිය අය තම තමන්ගේ අමාත්‍යාංශවලිනුත් වියදම් කරලා තිබෙනවා. ඒවා ගැන අමාත්‍යාංශයෙන් අමාත්‍යාංශයට අපි පසුව කියන්නම්. මේ තිබෙන්නේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වියදම් කරපු මුදල.

එක අතකින් මම පුදුම වෙන්නෙත් නැහැ. එක්කෙනෙකුට quotation එකයි, voucher එකයි අතර වෙනස තේරුම් ගන්න බැහැ. AI generated video එකක් කියන්නේ මොකක්ද කියලා තේරුම් ගන්න බැහැ. එහෙම කෙනෙක් ගියේ ටිකට් එකෙන්ද, භාගේ ටිකට් එකෙන්ද කියලා අහනකොට මට තේරුම් ගන්න පුළුවන්, එයාට මේක තේරුම් ගන්න බැහැ කියලා. ඊළඟට, අපේ ජනාධිපතිතුමා ගියේ footboard එකේද කියලා අහනකොට එයාට ඒක තේරුම් ගන්න බැරි බව මට තේරුම් ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩියක කාලයක් පමණයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම තව විනාඩි තුනක කාලයක් ගන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
හොඳයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එයාට ප්ලාස්ටික් බෝතලය පලාගෙන නයා ආවේ කොහොමද කියලා තේරුම් ගන්නත් බැහැ නේ. ඒ නිසා තේරුම් ගන්න බැරි අයට මම ඉදිරිපත් කරන්නම්, අපට වියදම් වුණේ කොහොමද කියලා.

පළමු සංචාරය, 2024 දෙසැම්බර් මාසයේ 15 - 17 අතර ඉන්දියාවට. ඒක රාජ්‍ය සංචාරයක්. අපට ටිකට් එකට වියදම් වෙලා තිබෙනවා රුපියල් 312,350ක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ සංචාරයට සම්පූර්ණයෙන් ගිහිල්ලා තිබෙන්නේ රුපියල් 1,220,000යි. ඒ කියන්නේ, ගුවන් ටිකට් පත් මිලදී ගැනීම ඇතුළු තවත් රාජ්‍ය තාන්ත්‍රික සිහිවටන, තෑගි ලබා දීමේ ඉඳලා ඉන්දියානු සංචාරයට රුපියල් 1,220,000යි වියදම් වෙලා තිබෙන්නේ. ගුවන් ටිකට් පතේ ගණන කිව්වා.

දෙවැනි සංචාරය, 2025 ජනවාරි මස 12 - 17 අතර චීනයට. ඒකෙදී ජනාධිපතිතුමාට ගුවන් ටිකට් පත්වලට සත පහක්වත් වියදම් වුණේ නැහැ. ඒක අපට චීනයෙන් ලැබුණේ. එම සංචාරයේ දී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සම්පූර්ණයෙන් වියදම් කරලා තිබෙන්නේ රුපියල් 386,000ක් පමණයි. තුන්වන සංචාරය, 2025 පෙබරවාරි මස 10 - 13 අතර ඛ්‍රබායිවලට. ඒකට ගුවන් ටිකට් පත් ලැබුණා. ඒකට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සම්පූර්ණයෙන් වියදම් කරලා තිබෙන්නේ රුපියල් 279,971ක් විතරයි.

එපමණක් නොවෙයි. සාමාන්‍යයෙන් ජනාධිපතිවරයාට සහ අනෙක් අයට; විශේෂයෙන් ජනාධිපතිවරයාට, එවැනි ගමනක් යනකොට දෛනික දීමනාවක් - per diem එකක් - හම්බ වනවා. දෛනික දීමනා ලෙස චීන සංචාරයට ජනාධිපතිවරයාට හම්බ වුණා, ඩොලර් 2,055ක්. ඒ ඩොලර් 2,055ම ජනාධිපති ලේකම් කාර්යාලයට නැවත ගෙනැල්ලා භාර දුන්නා. මීට කලින් කවුද එහෙම කරලා තිබෙන්නේ? මහින්ද රජපක්ෂගෙන්, ගෝඨාභයගෙන්, රනිල් වික්‍රමසිංහගෙන් හා මෛත්‍රීපාල සිරිසේනගෙන් අහන්නකෝ, එහෙම සතයක් ගෙනැල්ලා දීලා තිබෙනවාද කියලා. ඛුබායි සංචාරයට ලැබුණා ඩොලර් 960ක්. ඒ ඩොලර් 960ම නැවත ගෙනැල්ලා භාර දුන්නා, ජනාධිපති ලේකම් කාර්යාලයට. අන්න එහෙමයි අපි කටයුතු කළේ. තේරුම් ගන්න බැරි අයට මම මේ කියන්නේ, මිලියන 1.8 අපි වියදම් කළේ කොහොමද කියලා. ගුවන් ටිකට් පත් ලැබිලා තිබෙනවා, per diem එක වියදම් නොකර ගෙනැල්ලා දීලා තිබෙනවා. අපි හිතනවා, සමහර විට ඉන්දියානු සංචාරයෙනුත් තව refund එකක් ලැබෙන්න පුළුවන් කියලා.

මෙන්න මෙහෙමයි අපි කටයුතු කරලා තිබෙන්නේ. ඇත්තටම පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරන්න ඕනෑ වන්නේ, මිලියන 3,572ක් වියදම් කරලා ඒ අය ගිය විධිය මිසක්, මේ රටේ මහජන මුදල් මිලියන 1.8ක් වියදම් කරලා, මිලියන මෙච්චර ප්‍රමාණයක් ඉතුරු කළේ කෙහොමද කියන එක නොවෙයි. ඉතුරු කිරීමයි වටින්නේ. වියදම් කරපු ප්‍රමාණය ගැන තමයි ප්‍රශ්න කරන්න ඕනෑකම තිබුණේ. නමුත්, අවාසනාවකට ඒ සංස්කෘතියේම ජීවත් වන අයට, ඒ වළේම ලගින අයට තේරුම් ගන්න බැහැ, මහජන මුදල් අවභාවිතයකින් තොරව අත්‍යවශ්‍යම කටයුත්තකට පමණක් වියදම් කරලා, රට වෙනුවෙන් වැඩ කරන්නේ කොහොමද කියන එක.

ඒ ගොල්ලන් හිතනවා, ජනතාවගේ බදු මුදල්වලින් පිනුම් ගහමින්; පිහිනමින් හිටපු සංස්කෘතිය, ඒ ජීවත් වෙච්ච පරිසරය තමයි ඒ ගොල්ලන්ගේ පැවැත්ම කියලා. ඒ ගොල්ලන් හිතනවා, උත්පත්තියේ ඉඳලාම මහජන මුදල් අවභාවිත කරන එක තමයි දේශපාලන සංස්කෘතිය කියලා. නැහැ, එහෙම එකක් නොවෙයි. අපි මේ reverse කරමින් යන්නේ ඒක. අන්න එතකොට, රුපියල් මිලියන 3,500 ගණනක් වියදම් කරමින් විදෙස් සංචාර ගිය අයට, රුපියල් මිලියන 1.8කින් මේ වැඩේ කරන්නේ කොහොමද කියන එක ටොකු ඇනලා තමයි කියා දෙන්න වෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු සඤ්ජීව රණසිංහ අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[பி.ப. 3.30]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, "வளமான நாடு - அழகான வாழ்க்கை" என்ற கொள்கையோடு, புதிய அரசானது Clean Sri Lanka என்ற திட்டத்தை உருவாக்கி, அதை நடைமுறைப்படுத்தி வருவதை நாம் முற்றுமுழுதாக வரவேற்கின்றோம். தற்போது, இந்த நாட்டின் அனைத்துப் பகுதிகளிலும் போதைப்பொருள் பாவனை தலைவிரித்தாடுகின்றது. அதிகரித்துள்ள போதைப்பொருள் பாவனையாலும், போதைப்பொருள் ஊடுருவலாலும் முழு நாடும் தள்ளாடுகின்றது. எங்களுடைய வடக்கு, கிழக்கில் 2009ஆம் ஆண்டுக்கு முன்பு இவ்வாறான நிலைமைகள் இருந்ததில்லை. வடக்கில் மிகக் கட்டுப்பாடாக இருந்த போதைப்பொருள் பாவனை, இப்போது மிக அதிகமாகி Clean Sri Lanka என்ற செயற்பாட்டுக்கு எதிரான வகையில் உள்ளது.

நான் முல்லைத்தீவு மாவட்டத்தைச் சேர்ந்தவன்; வன்னித் தேர்தல் மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துபவன். வன்னியில் கசிப்பு, கஞ்சா, 'ஐஸ்', ஹெரோயின், இன்னும் பல பெயர்களில் சட்டவிரோத மதுபான உற்பத்திகள் தாராளமாகக் கிடைக்கின்றன. முல்லைத்தீவில் படையினர் மிக அதிகம் உள்ளதாகப் புள்ளிவிபரங்கள் சுட்டிக்காட்டுகின்றன. இவற்றுக்கு மத்தியில் அங்கு போதைப்பொருளும் அளவுக்கதிகமாக உலா வருகின்றன. பொது மக்களைப் பாதுகாக்கும் நாட்டைத் தூய்மைப்படுத்தும் பணியில் ஈடுபடும் பாதுகாப்புத் தரப்பினரால் ஏன் இதனைக் கட்டுப்படுத்த முடியாதுள்ளது? குறிப்பாக, 'கசிப்பு' என்ற சட்டவிரோத போதைப்பொருள் மிக அதிகமாகப் பாவனையில் உள்ளதாகவும், அதனை உற்பத்தி செய்யும் சட்டவிரோத உற்பத்தியாளர்கள் பல்வேறு நவீன வழிகளைக் கையாள்வதாகவும் மக்கள் தெரிவிக்கின்றனர். சில கசிப்பு உற்பத்தியாளர்களின் வீடுகளில் குடிநீர் குழாயைத் திறக்கும்போது கசிப்பு வருவதாக மக்கள் சொல்கின்றார்கள். இவ்வாறு ஓர் இடத்தில் நடந்து பிடிபட்டது. இவ்வாறு சூட்சுமமான முறைகள் மேற்கொள்ளப்படுகின்றன. வீடுகளுக்குள் சுரங்கம் தோண்டி, அதற்குள்ளும் கசிப்பு உற்பத்தி மேற்கொள்ளப்படுகின்றது.

நான் கிராமங்கள் தோறும் மக்கள் குறைகேள் சந்திப்புகளை நடாத்தி வருகின்றேன். அந்த வகையில், கடந்த மாதம் புதுக்குடியிருப்புப் பிரதேசத்தில் வெள்ளப்பள்ளம் என்ற கிராமத்தில் மக்கள் சந்திப்பை நடத்தினேன். அதில் பெருமளவு பொதுமக்கள் கலந்துகொண்டார்கள். போதைப்பொருள் பாவனையால் தங்களுடைய குடும்பங்கள் சீரழிவதாகவும், அதனைக் கட்டுப்படுத்துமாறும், அது பற்றி சனாதிபதியிடமும் பாராளுமன்றத்திலும் சொல்லுமாறும் அவர்கள் என்னிடம் கைகூப்பி வேண்டினார்கள்; சிலர் அழுதார்கள். மேலும், தங்களுடைய கிராமத்தில் கசிப்பு, கஞ்சா போன்ற சட்டவிரோத மதுபானத்தால் இதுவரை 13 பேர் இறந்துவிட்டதாகவும், சிலர் இறக்கும் நிலையில் இருப்பதாகவும் தெரிவித்தனர். அதேபோல் பாரதிபுரம், வள்ளுவர்புரம், இளங்கோபுரம், தேராவில் பகுதிகளில் இதுவரை 42 பேர் மாண்டுவிட்டதாகவும் இன்னும் சிலர் இறக்கும் நிலையில் இருப்பதாகவும் சொல்லி, தங்களுடைய குடும்பங்களைக் காப்பாற்றும்படியும் வேண்டினார்கள். இந்த நிலைமை பல கிராமங்களில் உள்ளது. கசிப்பு உற்பத்தி மேற்கொள்ளப்படும் சில இடங்களைத் தாங்களே காட்டுவதாக மக்கள் சொல்கின்றார்கள். தற்போதைய பொருளாதார வீழ்ச்சியால் மக்கள் தமது அன்றாட வாழ்க்கையை நடாத்திச் செல்வதில் பலத்த இடர்பாடுகள் இருக்கும்போது, இந்தப் பிரச்சினையும் மிக மோசமாக இருக்கின்றது.

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

නාන් ඉඟුරු ඔරු සම්පවත්තෙක් කූර වේණ්ටුම්. ඔර් අම්මාවුම් අවරුටෙය මකළුම් එනතු අළුවලකත්තුක්කු වන්තු අළුතාර්කළ්. කණවනින් කසිප්පුප් පාවනෙයාල් වීට්ටිල් ඔව්වොරු නාළුම් පිරච්සිනෙ එනවුම්, වීට්ටිලුළ්ළ වයතු වන්ත මූන්රු පිළ්ළෙකළුම් තර්කොලෙ සෙය්යප් පෝවතාකච් සොල්කින්රාර්කළ් එනවුම් අළුතාර්කළ්. ඉවර්කළින් නිලෙමෙයෛච් සර්රු එණ්ණිප් පාරුංකළ්! ඒන්, පොලිසාර් පාර්ත්තුක්කොණ්ටු ඉරුක්කිරාර්කළ්? ඒන් අවර්කළාල් පෝතෛප්පොරුළ් පාවනෙයෛයෛක් කට්ටුප්පටුත්ත මුටියවිල්ලෛ? අවර්කළිලුම් සිලර් ඉතර්කු උටන්තෛයෙන මක්කළ් මුරෙයිටුකින්රාර්කළ්. තමිළීළ විටුතලෛප් පුලිකළ් ඉරුන්ත කාලත්තිල්, Clean Sri Lanka එන නාටු මුළුවතුම් ඉල්ලාවිට්ටාලුම්, අවර්කළුටෙය කට්ටුප්පාට්ටිල් ඉරුන්ත සිල ඉටංකළ් cleanආක ඉරුන්තන. පෝතෛප්පොරුළ් පාවනෙ ඉල්ලාත ඔරු පකුතියාක අතු ඉරුන්තතු. අතනෙ යාරුම් මරුක්ක මුටියාතු. මික අතිකමාන පොලිසාරුම් පටෙයිනරුම් ඉරුක්කුම් නිලෙයිල්, අතනෛක් කට්ටුප්පටුත්තාමල් කසිප්පු උර්පත්ති කට්ටවිළ්ත්තු විටප්පට්ටුළ්ළතෙන මක්කළ් සොල්කින්රාර්කළ්.

පෝතෛප්පොරුළ් ඌටුරුවලාල් පල කුටුම්පංකළ් පසි පට්ටිනියුටන් කාණප්පටුම් අවලම්, තිරුට්ටුච් සම්පවංකළ් ඉටම්පෙරුම් නිලෙමෙ, ඔරු තොකුති ඉළෛඥර් කුලාම් පෝතෛක්කු අටිමෙයාකි මරණික්කුම් නිලෙමෙ, අතිකරික්කුම් සමූකච් සීර්කෝටුකළ් එනත් තුන්පියලාන ඔරු නිලෛමෛක්කුළ් පොතුමක්කළ් පලර් තළ්ළප්පට්ටුළ්ළනර්. ඉතෛවිට, වන්නිප් පකුතියිල් කාටුකළ් අළික්කප්පට්ටු, මරක් කටත්තලුම් ඉටම්පෙරුකින්රතු. සිල ඉටංකළිල් මණල් කොළ්ළෛ, කිරවල් අකළ්වු පෝන්ර සට්ටවිරෝතච් සෙයර්පාටුකළිල් ඈටුපටුකින්රවර්කළිල් පෝතෛක්කු අටිමෙයානවර්කළ් අතිකම් උළ්ළතාක අරියක්කූටියතාක ඉරුක්කින්රතු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෛරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)
Sir, give me one more minute, please.

ඉන්නුමොරු සම්පවත්තෛක් කූරුකින්රේන්. අම්මෙයිල් මුල්ලෛත්තීවු මල්ලාවිප් පකුතියිල් අමෙන්තුළ්ළ යෝකපුරම් පාටසාලෛක්කුළ් සිවිල් උටෙයිල් මතුපෝතෛයිල් නුළෛන්ත පොලිස් උත්තියෝකත්තර් ඔරුවර් පාටසාලෛ මාණවිකළුටන් මුරෙයර්ර විතත්තිල් නටන්තුළ්ළාර්. පොලිස් නිලෛයත්තිල් මුරෛප්පාටු සෙය්තතර්කු අමෙය, අවර් කෛතුසෙය්යප්පට්ටු එතිර්වරුම් 5ආම් තිකතිවරෛ විළක්කමරියලිල් වෛක්කප්පට්ටුළ්ළාර්. ඒර්කෙනවේ නාංකළ් ඉතු පර්රි පොතුමක්කළ් පාතුකාප්පු අමෛච්සරිටමුම් තෙරිවිත්තිරුක්කිරෝම්. ඔරු කාලත්තිල් මුල්ලෛත්තීවිල් පෙන්කළ් ඉරවු නේරත්තිල්කූටි, තනියාකච් සෙල්ලක්කූටිය සුතන්තිරම් ඉරුන්තතු. ආනාල්, ඉප්පෝතු අප්පටි ඉල්ලෛ. කුප්පෛකළෛ මට්ටුම් අකර්රි Clean Sri Lankaආක නාට්ටෛ ආක්ක මුටියාතු. සට්ටමුම් ඔළුංකුම් නිලෛනාට්ටප්පට වේණ්ටුම්. සට්ටවිරෝත මතුපාන උර්පත්ති, මරක්කටත්තල්, සට්ටවිරෝත මණල් මර්රුම් කිරවල් අකළ්වු, කාල්නටෛ කටත්තල් එන ඒරාළමාක ඉරුක්කුම් කුර්රච්සෙයල්කළුම් කළෛයප්පට වේණ්ටුම්. අප්පෝතුතාන් මක්කළ් මනතිල් ඉටම්පිටික්ක මුටියුම්. නාටුම් Clean Sri Lanka ආකුම් එනක්කූරි, නිර්රෛවුසෙය්කින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.37]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි අර්ජූන සුජීව සේනසිංහ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දවසේ ආරක්ෂක අමාත්‍යාංශයත්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ගැනත් සාකච්ඡා වෙනවා. එහිදී ශ්‍රී ලංකා පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක් ගැන සාකච්ඡා වෙනවා. විශේෂයෙන් පාර්ලිමේන්තුවේ රාජකාරි කරන අපේ පොලිසියේ මහත්වරුන් විශාල කාර්ය භාරයක් කරමින් අපට ලොකු සහයෝගයක් ලබා දෙනවා. ඔවුන්ට සිද්ධ වන අඩු පාඩුවක් සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. මීට කලිනුත් ඒ සම්බන්ධයෙන් කථා කළා. ඔවුන්ගේ දීමනාවක් සම්බන්ධයෙන් තමයි මම කියන්නේ. එම පොලිසියේ මහත්වරු MSD එකට අයත් වන බවත්, ඔවුන්ගෙන් යම් පිරිසකට යම් දීමනාවක් නොලැබෙන බවටත් අපට කරුණු ලැබී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගේත්, අදාළ අමාත්‍යාංශයේත් අවධානයට යොමු කරවන්න මම කැමැතියි. එහෙම අසාධාරණයක් වෙනවා නම් එය නිවැරදි කරන්න කියලාත් මම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආරක්ෂාව ගැන කථා කරද්දී මේ දවස්වල වැඩියෙන්ම කථා වෙන්නේ යම් පාතාල සිදුවීමක් සම්බන්ධයෙන්. එහිදී ඔබතුමාගේ අවධානය එම සිදුවීම සම්බන්ධයෙන් යොමු කරවන්න මා කැමැතියි. ගරු ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමා කිහිප අවස්ථාවකදීම පැවසුවා, මේක රටේ ආරක්ෂාවට ප්‍රශ්නයක් නොවෙයි කියලා. හැබැයි, නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඒක රටේ ආරක්ෂාවට බරපතළ ප්‍රශ්නයක් ලෙස සැලකුවා. ඒ වාගේම අධිකරණ ඇමතිතුමා මේ සභාවේ හිටියා නම්, එතුමාත් ඒ සම්බන්ධයෙන් එවැනිම ආකල්පයක් දරාවි. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. අධි ආරක්ෂිත කලාපයක, ඇපැල් අධිකරණය ඉස්සරහ, ශ්‍රේෂ්ඨාධිකරණය ඉස්සරහ, STF එකේ 25කට, 30කට අධික පිරිසක් එළියේ සිටියදී තමයි මේ අධිකරණ භූමිය තුළ මේ සිදුවීම වුණේ. මගේ මිත්‍ර නීතිඥ ගරු අධිකරණ ඇමතිතුමා දැන් සභාවට එනවා. එතුමාත් මේ ගැන දන්නවා. ගරු ඇමතිතුමනි, මෙතැනදී මම ඔබතුමාට ඇඟිල්ල දික් කරනවා නොවෙයි. ඕනෑම පාලනයක් යටතේ මේ තිබෙන තත්ත්වය අනුව මෙවැනි දෙයක් වෙන්න පුළුවන්. හැබැයි, මේ සිදුවීම ඉතා බරපතළ සිදුවීමක් ලෙස ගන්න ඕනෑ. නියෝජ්‍ය ඇමතිවරයා නීතිඥවරයෙක් වශයෙන් ඒ අවස්ථාවේදී මුහුණ දුන් ඒ කාරණය සාමාන්‍ය දෙයක් කියලා අපට ගන්න බැහැ. එය සාමාන්‍ය දෙයක් කියලා අපි ගත්තොත්, අපේ ego එක, අපේ පෞද්ගලික මතය මේකට එකතු කර ගත්තොත්, මේක රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් බවට පත් වෙනවා.

දැන් ඔබතුමා හිතන්න, පාර්ලිමේන්තුව ඇතුළට කවුරු හරි ඇවිල්ලා වෙඩි තියලා ගියොත්, ඒක සාමාන්‍ය සිදුවීමක්ද, සාමාන්‍ය වෙඩි තැබීමක්ද කියා. හැබැයි, මේ රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් එවැනි සිදුවීමක් වුණොත් එය විශාල ප්‍රශ්නයක් බවට පත් වෙනවා. අපි ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. ඒක අනිවාර්යයෙන්ම ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක්. ඔබතුමන්ලාගේ අවධානය යොමු වන තැන සම්බන්ධයෙනුයි මම මේ කියන්නේ.

මට සිදු වූ අසාධාරණයක් සම්බන්ධයෙන් මම කථා කරන්න කැමැති නැහැ, විශේෂයෙන්ම අධිකරණයේ නඩුකාරතුමන්ලාට තිබෙන ගෞරවය නිසා. හැබැයි, වාහනයක ලයිසන් එකක් හොයන්න ආපු අවස්ථාවේ - ඔබතුමා CID එක භාරව සිටියේ නැහැ; මම ඔබතුමා මත ඒක පටවන්නේ නැහැ; මොකද, ඔබතුමා ඇමති වශයෙන් ඉන්නකොට නොවෙයි එය සිදු වුණේ - LTTE සංවිධානයට අයත් ඇඳුම් තිබෙනවා කියලා වලාන දුෂණ විමර්ශන අංශයේ නිලධාරීන් 15දෙනෙකුට වැඩි ප්‍රමාණයක් දවස් 30කට වැඩිය මගේ නිවසට ආවා, සුජීව සේනසිංහ කොහොම හරි අත්අඩංගුවට ගන්න කියා. ඔබතුමන්ලා මේ විධියට මේ පාතාලයේ සිදුවීම සම්බන්ධයෙන්, විශේෂයෙන් මේ ඝාතනයට සම්බන්ධ තැනැත්තිය සම්බන්ධයෙන් සොයන්න ශ්‍රමය යෙදුවා නම් හොඳයි. මම එතැනින් එහාට ඒ ගැන කථා කරන්නේ නැහැ. සමාවෙන්න, මම ඒ ටිකවත් කථා කළේ ඔබතුමන්ලාගේ අවධානය වෙනත් පැත්තකට යොමු කරන්නයි. මම හිතන්නේ දේශපාලන පළිගැනීමකට වැය කළ ශ්‍රම පැය ගණන ගත්තොත් පැය 1,000කට වැඩියි. මට විරුද්ධව එවැනි කිසිම චෝදනාවක් නැහැ. මම දැන් ඇපැල් අධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ, ඒ වාගේම දිසා අධිකරණයේ නඩු පවරා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, පින්පුර දේවගේ ඉෂාරා සෙව්වන්දි කියන තැනැත්තිය සම්බන්ධයෙන්. මම වැරදි නම් නිවැරදි කරන්න. මම සාමාන්‍යයෙන් දේශපාලනයේ වුවමනාවට අසාධාරණ ලෙස විවේචනය කරන්නේ නැහැ. මේ තැනැත්තිය සම්බන්ධයෙන් State Intelligence Service එකට කලින් තොරතුරු ලැබිලා තිබුණා කියලා අපට ආරංචි වෙලා තිබෙනවා. මෙම සංජීව කියන පුද්ගලයා ඝාතනය කරන්න මෙම තැනැත්තිය සූදානම් වෙමින් සිටි බවට තොරතුරු ලැබී තිබුණා කියලා අපට ආරංචි වෙලා තිබෙනවා.

ඔබතුමන්ලා පාස්කු ප්‍රහාරය ගැන කථා කරනවා. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙනුත්, විශාල අපරාධ ප්‍රමාණයකට සම්බන්ධ සහරාන් සම්බන්ධයෙනුත් තොරතුරු විශාල ප්‍රමාණයක් ලැබිලා තිබියදී සහරාන් අත්අඩංගුවට ගන්න කිව්වත් ඔහුව අත්අඩංගුවට ගන්න බැරිවෙලා තිබෙනවා. එවැනි සිද්ධි හැම රටකම සිදු වෙනවා. අතපසුවීම් සිදු වෙනවා. එහෙම නැහැ කියලා මම කියන්නේ නැහැ. ඇමෙරිකාව, බෙල්ජියම, එංගලන්තය, ජර්මනිය වාගේ රටවලටත් ත්‍රස්තවාදීන් ප්‍රහාර එල්ල කරලා තිබෙනවා. හැබැයි, අතපසුවීම් සිදු වෙලා තිබෙනවා නම් ඒවා මහහැර ගන්න ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ උපරිම ශ්‍රමය යොදන්න ඕනෑ.

මොකද, අපි විශේෂයෙන්ම මේ විවේචනය කරන්නේ අනුර කුමාර දිසානායක මැතිතුමා, විජිත හේරත් මැතිතුමා විපක්ෂයේ ඉන්නකොට - ඒ වාගේම, ඇමතිතුමා කියනවා මම දැක්කා, විපක්ෂයේ ඉන්නකොට ඔබතුමන්ලා එක විධියකට ගන්නවාලු, ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට තව විධියකට ගන්නවාලු කියලා. නැහැ, අපි ආණ්ඩු පක්ෂයේ ඉන්නකොටත් ඒක ආරක්ෂාවට විශාල පහරක් කියන එක පිළිගත්තා. හැබැයි, මොකක්ද අනුර කුමාර දිසානායක මහත්මයා සහ විජිත හේරත් මහත්මයා කිව්වේ? මෙවැනි වෙඩි තැබීමක් සිදු වුණොත් ඒ රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් කථා කරලා වැඩක් නැහැ කිව්වා. හැබැයි, ඇමතිවරයා වශයෙන් ඔබතුමා මීට වඩා වගකීමෙන් මේ ගැන සඳහන් කළා නම් හොඳයි. මේක ප්‍රශ්නයක් තමයි; මේක ආරක්ෂාවට යම් ප්‍රශ්නයක්; බරපතළ තත්ත්වයක්; හැබැයි, මේක සමනය කරන්න අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග අපි ගන්නවා කියලා කිව්වා නම් ඊට වඩා හොඳයි. එහෙම වුණා නම්, රටේ වග කියන ඇමතිවරයෙක් වශයෙන් ඔබතුමා සම්බන්ධයෙන් තිබෙන අපේ විශ්වාසය වැඩි වෙන්න තිබුණා.

හැබැයි, ඔබතුමාට වඩා වෙනස් මතයක් මම හිතන්නේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාට තිබුණා. එතුමා කියන සියලු දෙයට මම එකඟ වෙන්නේ නැහැ. හැබැයි, ඒ කාරණය සම්බන්ධයෙන් එතුමා දැක්වූ ඒ ප්‍රතිචාරයට මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒක රටට හොඳයි; රටේ ඉදිරි අනාගතයට හොඳයි. හැබැයි, මම නියෝජ්‍ය ඇමතිවරයාගෙන් බලාපොරොත්තු වුණේ නැහැ, පසුගිය කාලයේ හිටපු දේශපාලන නායකයින්ගේ තිබෙන පාතාල සම්බන්ධකම් ගැන සඳහන් කරයි කියලා. ඒවා වෙනත් කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් සඳහන් කළාට කමක් නැහැ. හැබැයි, ඔබතුමාට අපි කියන්න ඕනෑ, එහෙම සම්බන්ධකම් සජිත් ප්‍රේමදාස මහත්මයාගේ, මගේ හෝ දයාසිරි ජයසේකර මැතිතුමාගේ, හර්ෂ ද සිල්වා මැතිතුමාගේ, රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ, නලින් බණ්ඩාර මැතිතුමාගේ -අපේ කාගේවත්- නැහැ. මම 1988-89 ගැන කථා කරන්නේ නැහැ. මම ඒවා ගැන මැතිවරණ වේදිකාවේ කථා කළේත් නැහැ. සමහර ජවිපෙ සහෝදරයන්ට සහ ක්‍රියාකාරීන්ට මාත් එක්ක ලොකු තරහක් තිබුණාට මම කිසි තැනක පෞද්ගලික ලෙස කාටවත් මඩ ගැහුවේ නැහැ.

මම කිව්වේ නොහැකියාව ගැන. මම 1988-89 ගැන කථා කළේත් නැහැ; 1971 ගැන කථා කළේත් නැහැ. හැබැයි අපි දකිනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සහ ඇමතිවරු දිගින් දිගටම අවුරුදු 77ක ශාපයක් ගැන කථා කරනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන කථා කරනවා. මම මීට කලින් කළ කථාවේදීත් මේ ගැන කිව්වා. ජනතා විමුක්ති පෙරමුණේ නායකයින් තමයි මහින්ද රාජපක්ෂ මහත්මයා බලයට ගේන්න උපරිම සහයෝගය ලබා දුන්නේ. එතුමාගේ හොඳම යාළුවෙක්. අපේ යාළුවෙක් නොවෙයි, මහින්ද රාජපක්ෂ මහත්මයා. එතුමා අපේ විරුද්ධවාදියෙක්. එතුමාගේ පාලනයේ දූෂිත ක්‍රියා කලාපය ගැන එතුමාට විරුද්ධව වැඩියෙන්ම හඬ නැඟුවේ අපි. ඒ දවස්වල - 2010, 2011, 2013- අපි භය නැතිව කථා කළා. එහෙන් ආරක්ෂක ලේකම් මල්ලි. මෙහෙන් පුතාලා, බාප්පලා, තාත්තලා -ආණ්ඩුව- රටම භය කරගෙන හිටපු අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් විරුද්ධ වුණේ අපි. හැබැයි, ඔබතුමන්ලා තමයි එතුමන්ලාව බලයට ගෙනාවේ. "මහින්ද අයියා" කියලා කිව්වේ. ගෙදර ගිහිල්ලා හිටියේ. ඒ නිසා ඔබතුමන්ලා, ඔබතුමන්ලාටම ඇහිල්ල දිගු කරගන්න. ඔය 77 ශාපය ගැන කථා කරනකොට මම කියන්න කැමතියි, මිනී මරන්න, ගහන්න, තළන්න, පෙළන්න, දේශපාලන බලු වැඩ කරන්න -ඔය එකකටවත්- අපි සම්බන්ධ වෙලා නැහැ කියන එක. ඒ නිසා අපට භය නැතිව මේ සම්බන්ධයෙන් කථා කරන්න පුළුවන්. අපි කිසිම දූෂණයකට, හොරකමකට එකතු වෙලා නැහැ. අපි හිටපු අමාත්‍යාංශවල අපට විරුද්ධව චෝදනා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් ඇමතිවරයාගෙන් ඉල්ලා සිටිනවා, දේශපාලනයට සම්බන්ධ නිලධාරීන් පොලීසියේ උසස් තනතුරුවලට පත් කර ගන්න එපා කියලා. Then, they would be biased because they have a political ideology. එතකොට ඔවුන් බලනවා, දේශපාලන වශයෙන් ලකුණු දමා ගන්න, තනතුරු ගන්න, උසස්වීම් ගන්න, ඒ තනතුරුවල තවදුරටත් ඉන්න, දේශපාලන වශයෙන් කාගෙන් හෝ පළිගන්න. එතකොට ඔවුන් අවධානය යොමු කරන්නේ නැහැ, සොරකම්වලට, මැරකම්වලට, දූෂණවලට. ඔබතුමන්ලා වැඩියෙන්ම ගහන්නේ, තළා පෙළන්නේ ඔබතුමන්ලාව විවේචනය කරන කට්ටියව. ඔබතුමන්ලාගේ යහළුවන්ව, ඔබතුමන්ලා ආරක්ෂා කරනවා. ඔබතුමන්ලාට support එකට කථා කරනවා නම් ඔබතුමන්ලාගේ මාර යාළුකමක් ඇති වෙන්නේ ඒ හොරුන් එක්ක. ඔවුන්ට ගහන්නේ නැහැ. හැබැයි, ඔබතුමන්ලාව විවේචනය කළොත් ඔබතුමන්ලාට මල පනිනවා. අපි නිකම් හරි ඔබතුමන්ලාව දේශපාලන වශයෙන් විවේචනය කළොත් ඔහු තමයි තරහකාරයා. ඔහුට තමයි වැඩේ දෙන්න

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

බලාගෙන ඉන්නේ. හැබැයි, කොච්චර හොරකම් කළත් ඔබතුමන්ලාට සහයෝගය දෙනවා නම්, ඔබතුමන්ලා ඒ පිරිසත් එක්ක යාළුකම් පවත්වනවා. කිසිම නීතියක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

දැන් මම ඔබතුමාගේ අවධානය VFS ගනුදෙනුව කෙරෙහි යොමු කරවනවා. මට පෙන්වන්න, ඔබතුමන්ලා ඒ වෙනුවෙන් මොකක්ද ගත්ත ක්‍රියාමාර්ගය කියලා. ට්‍රිලියනයක -බිලියන දහසක - වංචාවක්. *[බාධා කිරීමක්]* ඒ පුද්ගලයා හිරේ, වෙන කවුද public interest සම්බන්ධ නඩුවක් දමලා. ඔබතුමන්ලාගෙන් මම ඉල්ලන්නේ ඔබතුමන්ලා කරපු පරීක්ෂණය පෙන්වන්න කියායි. මම ඕනෑ ඔට්ටුවක් අල්ලනවා. ඔබතුමන්ලාට පුළුවන් නම් පරීක්ෂණයක් පටන් අරගෙන මාසයකින් අවසන් කරන්න. මාස හයක් දෙන්නම්; අවුරුද්දක් දෙන්නම්; අවුරුදු දෙකක් දෙන්නම්. ඔබතුමන්ලා ඒක කරන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයාට බණිනවා. මලික් සමරවික්‍රම මහත්මයාගේ හොඳම යාළුවා. ඔබතුමන්ලාගේ උපදේශකලා. රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව හිටියේ මම, පක්ෂය ඇතුළේ ඉඳලා. ඒ, එතුමාත් එක්ක පෞද්ගලික තරහකට නොවෙයි. එතුමාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් තිබුණා. අපි කෙළින් හිටගත්තා, තරුණ මන්ත්‍රීවරු වශයෙන් පක්ෂය ඇතුළේ. ඒ අපට තනතුරු ගන්න නොවෙයි, අපේ සියල්ල පරිත්‍යාග කළා. ඔබතුමන්ලා ඕනෑම පුද්ගලයෙකුට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කරන්න. මම පළමුවෙන් අත්සන් කරන්නම්, වරදක් තිබෙනවා නම්. හැබැයි, ඔබතුමන්ලා ඒවාට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමන්ලා යාළුවන්ට එක විධියක්; විරුද්ධවාදීන්ට තව විධියක්. ඒකට පොලීසිය පාවිච්චි කරන්න එපා කියලා මම ඇමතිවරයාගෙන් ඉල්ලා සිටිනවා. මම ඇමතිවරයා සම්බන්ධයෙන් වැඩිය දන්නේ නැහැ. මට එතුමාගේ වැඩි වරදක් පේන්න නැහැ. එතුමා හිටියේත් නැහැ, යම් යම් වැරැදි වෙනකොට. මම ඒවා ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේත් නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, සාධාරණය ක්‍රියාත්මක කරන්න, හොරු අල්ලන්න, පාතාලය අල්ලන්න, දූෂණයට විරුද්ධව ක්‍රියාත්මක වෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් පාස්කු ප්‍රහාරය ගැන කථා කළා. මේවා මඩේ දම-දමා නම් හෝදන්න එපා, ඇමතිතුමනි. සමහර කරුණු සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්න, නීතියෙන් පරීක්ෂණ පවත්වලා දඬුවම් කරන්න අමාරුයි. මම නීතිඥවරයෙක් වශයෙන් ඒ ගැන දන්නවා. ඒ නිසා කරන්න පුළුවන් වැඩ ටික ජනතාවට ඉදිරිපත් කරන්න. කරන්න බැරි වැඩ ටික අයින් කරන්න. "පාස්කු ප්‍රහාරය, පාස්කු ප්‍රහාරය" කියමින් දිගින් දිගටම මඩේ දදා හෝද - හෝදා එන එන ආණ්ඩු, එන එන පොලිස්පතිවරු මේකට එක එක විධියට ඇඳුම් අන්දනවා.

මේක සරල ප්‍රශ්නයක්. පාස්කු ප්‍රහාරය සිදු වුණු කාලයේ ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොකළේ මොන නිලධාරින්ද, තමන්ගේ රැකියාව හරියට නොකළේ කවුද කියන එක ඔබතුමන්ලා පරීක්ෂා කර බලන්න. මෙය ඉතාම සියුම් කාරණයක්. එම සිදුවීමට අදාළව මහ මොළකරුවෙක් හිටියාද, නැද්ද කියන කාරණය ඉතා ඉක්මනින් සොයා බලා එම කටයුතු අවසන් කරන්න. සාක්ෂි නිර්මාණය කරලා කාටවත් ඇඟිල්ල දිගු කරලා කවුරුවත් වරදකරු කරලා හරියන්නේ නැහැ. සාධාරණය ඉටු කරන්න. කවුරු හරි ඒකට සම්බන්ධ නම් ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කර එම කටයුතු අවසන් කරන්න. අපේ කාදිනල්තුමාත් හැම වෙලාවේම දිගින් දිගටම ඒ සම්බන්ධව කථා කරනවා. එතුමා එක එක පැත්ත ගන්නවා. එක පැත්තක් ඉවර වෙනකොට, තව පැත්තක් ගන්නවා. ආයෙත් ඊළඟ පැත්ත ගන්නවා. ළඟදී තව පැත්තක් ගන්න යන බවට ආරංචියකුත් තිබෙනවා. ඔබතුමන්ලාත් ඒ ප්‍රහාරයට ලක් වෙන්න පුළුවන්. ඒ නිසා ඉක්මනට එම කටයුතු අවසන් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා, පොන්නම්බලම් මහත්මයාත් ත්‍රිවිධ හමුදාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් දැක්වුවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. ගොඩක් වෙලාවට එතුමා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා. ඊට අදාළ අමාත්‍යාවරයාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ ත්‍රිවිධ හමුදාව ධනාත්මක පැත්තට යොදා ගන්න කියලා. අධිකරණ ඇමතිතුමා මෙතැන ඉන්නවා. අධිකරණ ඇමතිතුමනි, මම හෙට ඔබතුමාගේ අමාත්‍යාංශය සම්බන්ධව කථා කරන්නම්. හර්ෂණ ඇමතිතුමනි, - අධිකරණ ඇමතිතුමාගේ අවධානය මම පොඩ්ඩක් ඉල්ලනවා. හර්ෂණ ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට කාරණයක් යොමු කරනවා. ඊයේ මම සිර ගෙදරට ගියා. ඔබතුමාත් එනවා කියලා කිව්වා. එතැන කර්මාන්ත දෙකක් ක්‍රියාත්මක වෙනවා. ඉතා හොඳට, ලස්සනට chips වගයක් හදනවා, ඇතුළේ ඉන්නා අය. මම මේ ධනාත්මක පැත්තක් ඔබතුමාට කියන්න යන්නේ. ගිහිල්ලා පරීක්ෂා කර බැලුවාම ඉතාම *-[බාධා කිරීමක්]* It is a good thing. I am going to compliment and ask you to continue it.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

අපි මෙම Budget එකෙනුත් මිලියන 100ක් වෙන් කරනවා, සිරකරුවන්ගේ නිපුණතා සංවර්ධනය සඳහා. ඒකට අවශ්‍ය ව්‍යාපෘති කෙරෙනවා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

We will talk about it tomorrow. Thank you very much. මම අදාළ ඇමතිවරයාට කියනවා, හමුදාවටත් එවැනි වැඩ කටයුත්තක් ක්‍රියාත්මක කරන්න කියලා. හමුදාවේ සිටින අය යොදවා කර්මාන්ත 30ක්-40ක් පමණ ක්‍රියාත්මක කරන්න පුළුවන්. මොකද, ඒ අය වෙනුවෙන් විශාල මුදලක් වැය කරනවා. අපිට ඒ අය ඉවත් කරන්නත් බැහැ. ඇත්තටම අර සිරකරුවන් සිදු කරනවා වාගේ කටයුත්තක් හමුදාවේ අයත් යොදවා පටන් ගන්න පුළුවන් නම් හොඳයි. ඒ සිරකරුවන් ඉතාම සාර්ථකව ACsවලට chip එකක් හදනවා. සිරකරුවන් 20ක්-30ක් වාගේ ප්‍රමාණයක් ඒ කටයුත්ත කරන්නේ. ඒ විධියට හමුදාවත් යොදා ගෙන කර්මාන්ත 30ක්- 40ක් පටන් ගන්න පුළුවන් නම්, ඔබතුමන්ලා බලාපොරොත්තු වන සංවර්ධනය මේ රට තුළ ඇති කරන්න පුළුවන්. මොකද, ඒ ගොඩක් හමුදා නිලධාරින් ඉන්නේ ඔවුන්ට වෙන් කරපු වැඩක් නොමැතිව. ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරී කටයුතු කරනවා ඇති. හැබැයි, ඒ පිරිසත් අර වාගේ කටයුත්තකට යොදවන්න කියා මා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මීට කලින් වතාවකත් මම මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා. ඔවුන්ගේ ශ්‍රමය පාවිච්චි කරලා, ඒ සඳහා යම් මුදලක් ගෙවා එවැනි කර්මාන්ත ආරම්භ කරන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මුනීර් මුලාෆර් මන්ත්‍රීතුමා -

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
Hon. Presiding Member,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් කාරණා කිහිපයක් මතු කළා. මීට පෙරත් මේ සභාවේ ඒ සම්බන්ධයෙන් කරුණු මතු කළා. ඒ වාගේම අපේ අමාත්‍යාංශ ලේකම්තුමා ගැනත් මෙතැන කථා බහක් ඇති වුණා. මම හිතන විධියට අපේ අමාත්‍යාංශ ලේකම්තුමාත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මහත්මයාත් පාස්කු ඉරිදා එල්ල වුණු ප්‍රහාරය සම්බන්ධයෙන් දිගින් දිගටම අවංකව විමර්ශන කටයුතු සිදු කරනු ලැබුවා, ඔවුන්ගේ රාජකාරි අවධියේදී. දැනට රවී සෙනෙවිරත්න මහත්මයා අපේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට කටයුතු කරනවා. මේ සභාව තුළදී ඔවුන් සම්බන්ධයෙන් දෝෂාරෝපණ ඉදිරිපත් කිරීම සුදුසු නැහැ කියලා මම විශ්වාස කරනවා. ඇත්තටම ඔවුන් අවංකව සහ ඉතා දක්ෂ ලෙස තමන්ගේ රාජකාරිය ඉෂ්ට කරපු නිලධාරීන්. මම මේ සභාවට පොරොන්දු වෙනවා, පාස්කු ප්‍රහාරය පිළිබඳව වන විමර්ශන ඉතා හොඳින් කෙරී ගෙන යන බවට. ඒ පිළිබඳව කවුරුවත් සැකයක් තබා ගන්න අවශ්‍ය නැහැ. පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් කවුද කියලා කඩිනමින් රටට හෙළි කරගන්න හැකියාව ලැබෙයි කියා මම විශ්වාස කරනවා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, conflict of interest එකක් තිබෙනවා නම් ඒ කට්ටිය මේකට සම්බන්ධ කරගන්න එපා කියා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා එක්ක argument එකක් නොවෙයි, මේ. මම කියන්නේ ඒ සම්බන්ධයෙන් කොහේ හරි conflict of interest එකක් තිබෙනවා නම්, ඔවුන් කවුරුවත් සම්බන්ධ කරන්න එපා කියන එකයි. සාධාරණ පරීක්ෂණයකට ඒක බාධාවක්. It is only a request.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අතර conflict of interest එකක් නැහැ. මොකද, ඔවුන් කලිනුත් මේ පිළිබඳව විමර්ශනය කරලා තිබෙනවා. අමාත්‍යාංශ ලේකම්වරයා විධියට ඔහු විමර්ශනවලට සම්බන්ධ වීමක් නැහැ. මම හිතන විධියට, නිලධාරීන් හැටියට තමයි ඔවුන් කටයුතු කරන්නේ. නිලධාරීන් හැටියට කටයුතු කිරීම, -ඔවුන් පාර්ශ්වකරුවන් නොවෙයි. *[බාධා කිරීමක්]* මේක මින්පසුව අධිකරණයට යන්න ඕනෑ කාරණයක්. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඒක ඉදිරිපත් කළොත්,-

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඔව්, ඔබතුමා ඉදිරිපත් කරන්න. ඒ පිළිබඳව එවැනි දෙයක් අපට හැඟී යනවා නම්, අපි බලන්නම්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගැන කථා වුණු නිසා සහ ගරු ඇමතිතුමාත් ඉන්න නිසා මම මේ කාරණය මතු කරන්නේ. මේ තිබෙන්නේ, "Report of the Committee on Public Finance on Outsourcing Online Visa and Passport Application Services between the Consortium and the Department of Immigration and Emigration of Sri Lanka". ගිය පාර්ලිමේන්තුවේදීත් අපි මේක table කළා. නමුත් මේ පාර්ලිමේන්තුවේදීත් මම මෙය **table*** කරනවා.

ගරු ඇමතිතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ තිබිච්ච වාර්තාවක් ප්‍රකාරව තමයි නඩුවක් ගියේ. හැබැයි, contempt of court නිසා තමයි මම හිතන විධියට හර්ෂ ඉලුක්පිටිය මැතිතුමාත් මාස ගණනක් තිස්සේ හිරේ ඉන්නේ. මේ සම්බන්ධයෙන් මේ අලුත් පාර්ලිමේන්තුවේ කිසිම වැඩ පිළිවෙළක් නැහැ. මේ සම්බන්ධයෙන් forensic audit එකක් කරන්න කියලා Auditor-Generalගෙන් අපි ඉල්ලා තිබෙනවා. මම හිතන විධියට, එතුමා ඒ කටයුත්ත බොහෝදුරට අවසන් කරලා තිබෙනවා. මම යෝජනා කරනවා, ඒ කටයුත්ත අවසන් වෙච්ච වහාම මේ පිළිබඳව මේ පාර්ලිමේන්තුවෙන් ගත යුතු පියවර ක්‍රියාත්මක කරන්න කියලා. ඒ වාගේම මේ කටයුත්ත ඉදිරියට අරගෙන යන්න පොලීසියට සහ අවශ්‍ය නිලධාරීන්ට අවශ්‍ය නියෝග ලබා දෙන්න කියලාත් ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුනීර් මුලාෆර් මහතා]

අද දිනය තුළ අපි මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන විවිධ ආයතන පිළිබඳව සාකච්ඡා කරනවා. එම සාකච්ඡාව හරහා අපි බලාපොරොත්තු වෙන්නේ, මේ ආයතන තවත් දියුණු කරලා රටට ඵලදායීතාව රැගෙන එමින් ඒ ඔස්සේ මේ රටේ ජනතාවට යහපත් සේවාවක් ලබා දීමයි. හැබැයි අවසානයකට, අදත් උදේ ඉඳලා, මෙහි වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර ගැන වාගේම එකතු කළ යුතු කරුණු කාරණා ඉදිරිපත් කිරීම වෙනුවට හැමදාම වාගේම එදා වේලේ කරුණු කාරණා පිළිබඳව විතරක් අදහස් දක්වන තත්ත්වයක් තිබුණා.

රටක් ලෙස ඉදිරියට යන්න අපට ආර්ථික ස්ථාවරභාවය අත්‍යවශ්‍යයි, පරිසරය පිළිබඳව සංවේදී වීමත් අත්‍යවශ්‍ය කාරණාවක්. ඒ වාගේම සමාජ යහ පැවැත්ම සහ යහපාලනය කියන මේ කරුණු කාරණා රටක් ලෙස ඉදිරියට යන්න අත්‍යවශ්‍ය සාධක වනවා. මේ කරුණු 4ම ඉදිරියට අරගෙන යන්න නම් ඒ සඳහා පොලීසියේ සහයෝගය, ඔවුන්ගේ කැපවීම අපට අත්‍යවශ්‍යයි.

බොහෝදුරට අපි ඉගෙන ගෙන තිබෙන්නේ, කෙනෙකු දැඩි ලෙස විවේචනය කරනවාට වඩා -අඩු පාඩු තිබෙනවා නම් විවේචනය කරනවා වාගේම- ඔවුන්ගෙන් රටට වෙන සේවය පිළිබඳව ඇගැයීමක් -අගය කිරීමක්- අත්‍යවශ්‍යයි කියලායි. අපි දන්නවා, පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳව. ඒ ආයතනය රටේ සුවිශේෂී කාර්යභාරයක් කරන ආයතනයක්. මහජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විතරක් නොවෙයි, මහජනතාවගේ අවශ්‍යතාවලදී සෑම විටම අපත් සමඟ හිට ගන්නා සුවිශේෂී කාර්යභාරයක් කරන පිරිසක් තමයි එහි ඉන්නේ.

ඔවුන් මහ ජනතාවට හිරිහැර ඇති වන සෑම අවස්ථාවකදීම නොපැකිළව ඉදිරියට පැමිණ ඒ වෙනුවෙන් විශාල කැප කිරීමක් කරන පිරිසක්. ඒ ආයතනයේ දියුණුව වෙනුවෙන්, ඔවුන්ගේ පහසුකම් වෙනුවෙන්, රජයක් ලෙස කටයුතු කිරීම අත්‍යවශ්‍ය කාරණාවක්.

ගමත් එක්ක එකතු වෙලා පොලීසියට වැඩ කරන්න "ප්‍රජා පොලිස් ඒකකය" කියලා විශේෂ ඒකකයක් අපේ රටේ තිබුණා. බොහෝ දුරට වයස්ගත පිරිස් තමයි එවැනි කමිටුවලට, එවැනි ආයතනවලට සම්බන්ධ වෙලා ඉන්නවා දැක්කේ. මහජන ආරක්ෂක කමිටු නිර්මාණය කරලා, ඒ හරහා ගමේ තරුණයන් පොලීසිය සමඟ සක්‍රියව එකතු කරලා, ගමේ දියුණුව වෙනුවෙන් ගමේ ආරක්ෂාව වෙනුවෙන් වැඩ කරන්න පුළුවන් විධිවිධාන අපි සාදා තිබෙනවා.

පොලීසියේ පුරප්පාඩු පිළිබඳවත් අද මේ ගරු සභාව තුළ සාකච්ඡා වුණා. 20,000ක පුරප්පාඩු සංඛ්‍යාවක් පිළිබඳව විශේෂයෙන් කියැවුණා. අපි රජයක් ලෙස මේ අවුරුද්ද තුළ ඒ පුරප්පාඩුවලින් අඩක් පුරවා අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

පාස්කු ප්‍රහාරය පිළිබඳවත්, ජාතිවාදය පිළිබඳවත්, ජනතා පීඩාව පිළිබඳවත් මේ ගරු සභාවේදී විශාල ලෙස සාකච්ඡා වුණා. ඔබතුමන්ලා දන්නවා, තමන්ට සේවා සැපයෙන ස්ථානයකට ගියාම තමන්ගේ භාෂාවෙන් එම කටයුතු කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් නොලැබී යෑම රටේ ජාතිවාදී හැඟීම් ඇති වෙන්න, එහෙම නැත්නම් ජාතිවාදී ලෙස සිතන්න පෙලඹෙන එක්තරා අවස්ථාවක් බව. උතුරු පළාත නියෝජනය කරමින් ආපු මන්ත්‍රීවරුන් ඒ කරුණු කාරණා මතු කරන ආකාරය අපි මෙහිදී දැක්කා. ඉදිරියේදී අපි -පොලිස් දෙපාර්තමේන්තුවට- ද්විඛ භාෂාව දන්නා නිලධාරීන් ඒකරාශි කරමින්, එවැනි සංවේදී ස්ථාන පිළිබඳව අවධානය යොමු කරමින්, ඒ කරුණු කාරණා පිළිබඳව සොයා බලා ඊට අවශ්‍ය පිළියම් යොදන්න බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බඳවාගැනීම්?

ගරු මුනීර් මුලාෆර් මහතා
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
අපි ඒ බඳවා ගැනීම් කරගෙන යනවා.

මත් ද්‍රව්‍ය පිළිබඳව මේ ගරු සභාව තුළ විශාල ලෙස සාකච්ඡා වුණා. මත් ද්‍රව්‍ය පිළිබඳ කරුණු කාරණා සාකච්ඡා කරන කොට විශේෂයෙන් කිව යුතු දෙයක් තිබෙනවා. ඒ supply chain එක විනාශ කරන්න නම්, නැති කරන්න නම් ඒ සඳහා පොලීසියට කරන්න විශාල වැඩ කොටසක් තිබෙනවා. ඒ වාගේම ඒකේ demand එක අඩු කරන්න නම්, ඒවා පිළිබඳව දැනුවත් කරන්න ඕනෑ; සමාජ අවබෝධයක් ලබා දෙන්න ඕනෑ. ඒ හරහා එය කරන්න අපට පුළුවන්.

මේ අවස්ථාවේදී මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන නිසා, ඒ පිළිබඳව සාකච්ඡා කරන නිසා මෙන්න මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්න මම කැමැතියි. ජාතික පොලිස් අභ්‍යාස ආයතනය හා පොලිස් සේවස්ථ පුහුණු ඒකක මඟින් 2025 ඉලක්කගත වර්ෂය සඳහා අපි පහත කරුණු කාරණා සැලසුම් කරලා තිබෙනවා. පොලීසියට ලබා දෙන තාක්ෂණික පුහුණුව වැඩි දියුණු කිරීම සඳහා අපි වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. මට ඒ සම්බන්ධයෙන් කරුණක් සඳහන් කරන්න පුළුවන්. පරිගණක පුහුණු ධාරිතාව වරකට 135 සිට 200 දක්වා වැඩි කිරීමට අපි ක්‍රියා කරනවා. ඒ වාගේම, ඒ ක්ෂේත්‍රය වැඩි දියුණු කරන්න අපි තවත් දේවල් එකතු කර තිබෙනවා. භාෂා පුහුණුව පිළිබඳවත් මෙතැනදී මතක් කළ යුතුයි. උතුරු හා නැඟෙනහිර පළාත්වල සේවය කරන පොලිස් නිලධාරීන් ඇතුළුව නිලධරයන් 5,100ක් සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හරහා පිළිගත් දෙමළ භාෂා පුහුණුවක් ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා.

ඔබතුමන්ලා දන්නවා, අපි කුඩා කාලයේ අපේ ගමට පොලීසියෙන් ආවේ බොහෝදුරට හොඳ ජපන් මෝටර් රථයකින් බව. හැබැයි, අද අපරාධ පිළිබඳව, පාතාලය පිළිබඳව කථා කරන, ඒ අපරාධකරුවන් එක්ක සම්බන්ධ වෙච්ච අය අවසානයේදී අපේ රටේ පොලීසිය ත්‍රීවිල් එකෙන් ගමට එන අවාසනාවන්ත තත්ත්වයකට පත් කළා. නමුත්, අපේ රජය යටතේ අපි බලාපොරොත්තු වෙනවා, ඉන්දියානු ආධාර යටතේ උතුරු පළාතේ පොලිස් ස්ථාන 80කට single cabs ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් විශේෂ කාරණාව මේකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු මුනීර් මුලාෆර් මහතා
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
මට තවත් විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2025 වසර තුළ ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මඟින් නිලධාරීන් 7,118ක් ද, පොලිස් සේවා ස්ථාන පුහුණුව මඟින් නිලධාරීන් 27,547ක් ද-

මා හිතන්නේ විවේචන ඉදිරිපත් කරනවාට වඩා අප මේ ආයතන වැඩි දියුණු කිරීමයි කළ යුතු වන්නේ. අප සියලුදෙනා බලාපොරොත්තු වන පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් සඳහා මේ ආයතනය තුළින් ලැබෙන සහයෝගය අත්‍යවශ්‍යයි. ඒ වෙනුවෙන් මේ රජය සූදානම් කියන කාරණාව මතක් කරමින් මා නතර වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.06]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රටේ ආරක්ෂාව අපට ඉතාම වැදගත්. මොකද, ලෝකයේ ඕනෑම රටක ජීවත් වන ජනතාව වාගේම, මේ රටේ ජනතාවත් සුරක්ෂිත රටක ජීවත් වෙන්න කැමැතියි. හැබැයි, අද අපේ රටේ ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් ඇති වෙලා තිබෙන බව පැහැදිලියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකට හොඳම උදාහරණය තමයි ඉතාම කෙටි කාලයක් තුළ පාතාලය බොහෝ සෙයින් හිස ඔසවා තිබීම. ඒ කොයි තරමිද කිව්වොත්, ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රකාශවලදී අපට ඒ සම්බන්ධව දිගින් දිගටම අහන්න, දකින්න ලැබුණා. එක පැත්තකින් කියනවා, හමුදාවේ ආයුධ පාතාලයේ ක්‍රියාකාරකම් සඳහා යොමු වෙලා තිබෙන බව. ඒ වාගේම හමුදාවේ නිලධාරියකු ගැනත් කියනවා.

අපි ඉස්සර අහලා තිබුණේ හමුදාවේ ඇතැම් අය රැකියාවෙන් absent වෙලා ගිහින් පාතාලයත් එක්ක එකතු වෙලා මීනී මැරුම්වලට, මං කොල්ලකෑම්වලට සම්බන්ධ වෙලා තිබෙනවා කියලායි. හැබැයි, මේ ළඟදී ඉදිරිපත් කෙරුණු මාධ්‍ය ප්‍රකාශනයකදී කිව්වා, හමුදාවේ සේවය කරන නිලධාරියෙකුත් මේ කණ්ඩායම් එක්ක එකතු වෙලා කටයුතු කර තිබෙනවා කියලා. ගනේමුල්ල සංජීවගේ ඝාතනයේ ඉඳන්, හම්බන්තොට ත්‍රිත්ව ඝාතනය දක්වා කටයුතුවලදී පොලීසියේ නිලධාරිනුත් දිගින් දිගටම සැකපිට අත් අඩංගුවට පත් වෙනවා අපි දැක්කා. මේ ගැන කල්පනා කරලා බලන්න. අපේ මිනිස්සු පොලීසියට හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයකට යන්නේ යුක්තිය හා සාධාරණය බලාපොරොත්තුවෙන්. එවැනි අවස්ථාවක පාතාල කණ්ඩායම් එක්ක මේ අයගේත් සම්බන්ධතා තිබෙනවා කියලා අපට සැකයක් මතු වෙනවා නම්, රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් නැද්ද කියලා අපි අහනවා.

ඒ වාගේම බුද්ධි අංශ ගැනත් අපි කිව යුතුයි. හැම පොලීසියකටම බුද්ධි අංශ ඉන්නවා. හැබැයි, ඒ පොලීසිවල ඉන්න බුද්ධි අංශ නිලධාරින් ගැන ගමේම මිනිස්සු දන්නවා. "අන්න අර නිලධාරියා බුද්ධි අංශයේ කෙනෙක්" කියලා කියන අවස්ථා මමත් දැකලා තිබෙනවා. අපි දන්නා විධියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ - CID එකේ - එහෙම නැත්නම් බුද්ධි අංශවල නිලධාරින් සාමාන්‍යයෙන් අනන්‍යතාව හෙළිදරව් කරන්නේ නැහැ. නමුත්, පොලීසියේ ඉන්න නිලධාරින්ගේ අනන්‍යතාව අද ප්‍රසිද්ධියේ හෙළිදරව් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකත් ප්‍රශ්නයක්. අපි ඉල්ලීමක් කරනවා මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සංවිධානාත්මක අපරාධකරුවන්ට සංවිධානාත්මක විධියට මුහුණ දෙන්න පුළුවන් ආකාරයට නිර්මාණය කරන්න කියලා.

අපි තවදුරටත් අවුරුදු 75ක් ගැන කථා කරලා වැඩක් නැහැ. ඒ අවුරුදු 75 ගැන කථාව නතර කරලා අලුත් බලාපොරොත්තුවක් එක්ක අලුත් රටක් ගොඩ නඟන්න තමයි මේ ආණ්ඩුවට ජනවරමක් ලබා දුන්නේ. මේ ආණ්ඩුව දිගින් දිගටම කිව්වා, මේ පාතාලයත් එක්ක දේශපාලනඥයන්ගේ සම්බන්ධතා තිබෙනවා කියලා. අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, පාතාලයත් එක්ක සම්බන්ධතා තිබෙන දේශපාලනඥයන් ඉන්නවා නම්, වහාම ඒ අය හෙළිදරව් කරලා නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. ඒ වාගේම, හිටපු දේශපාලනඥයන් අතර එවැනි අය ඉන්නවා නම් ඒත් ඒ ආකාරයෙන්ම නීතිය ක්‍රියාත්මක කරන්න. මොකද, එක පැත්තකින් අහිංසක මිනිසුන් මරලා දානවා. අවුරුදු තුනක් සහ හයක් වන අහිංසක කිරි සප්පයෝ දෙන්නෙක් මරා දමා තිබෙනවා අපි දැක්කා. මහ පාරේ ඒ වාගේ වෙඩි තියන කොට misfire එකක් වෙලාත් අහිංසක මිනිස්සු මැරෙන්න පුළුවන්. එහෙම වෙලා තිබෙනවා. අපි පැහැදිලිව කියන්නේ මේකයි. ඒක එක පැත්තකින් ජීවිත විනාශයක්. අනෙක් පැත්තෙන්, මේ රටට මත්ද්‍රව්‍ය ගෙනැල්ලා මේ විනාශ කරන්නේ මේ රටේ ඉන්න අහිංසක දරුවන්ගේ අනාගතයයි, මේ රටේ අනාගතයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ කාරණය විශේෂයෙන් මතක් කර දෙනවා.

ඒ වාගේම මේ ගරු සභාවට අපි කියන්න ඕනෑ, තව දින කිහිපයකින් මාර්තු 05වෙනිදා අළු බදාදා දිනය ආරම්භ කරන බව. කතෝලික ජනතාව වතාරික කාලය ආරම්භ කරනවා. දින 45ක් අපේ කතෝලික ජනතාව එක්වරුව අල්ලනවා; පාස්කුව ආරම්භ කරමින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුද්දේ අප්‍රේල් 21වෙනි දා වෙනකොට පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයට මේ රටේ අහිංසක ජනතාව ගොදුරු වෙලා අවුරුදු 6ක් වෙනවා. මේ ආණ්ඩුව බලයට ආවේත් පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයට ලක් වෙච්ච ජනතාවට යුක්තිය හා සාධාරණය ඉෂ්ට කරනවා කියලා. හැබැයි, අපට තවම පෙනෙන්නේ නැහැ, විනිවිදභාවයකින් ඒ ගැන සිද්ධ වෙන පරීක්ෂණ. ඒවා කොයි ආකාරයෙන්ද වෙන්නේ, කවුද අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ, ඒ පරීක්ෂණ කොයි පැත්තටද යන්නේ කියන එක අපට පෙනෙන්න දකින්න තවමත් නැහැ.

මම ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා, 2023.10.09වෙනි දා National Catholic Committee for Justice to Easter Sunday Attack Victims විසින් හිටපු ආණ්ඩුවට ලියපු මේ ලියුම. මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

අපට ගිය ආණ්ඩුවලින් යුක්තිය ඉෂ්ට නොවුණා. හැබැයි, මේ ලියුමට අත්සන් කරලා තිබෙනවා, අති උතුම් කාදිනල් හිමිපාණන් ඇතුළු සමස්ත කතෝලික ජනතාව නියෝජනය කරන බිෂොප් උන්නාන්සේලා සහ නීතිඥවරු ඇතුළු කණ්ඩායමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණු පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම කරනවා.

මෙම ලිපියේ 02.01 කොටසේ තිබෙනවා, ඇමෙරිකාවේ FBI බුද්ධි අංශය විසින් අපගේ CID නිලධාරින්ට, සහරාන් සමඟ නිතරම කථා බහ කළ පුද්ගලයකු IP address එකක් ලබාදීලා තිබෙනවා කියලා. මේ අය අත් අඩංගුවට අරගෙන ප්‍රශ්න කරනකොට හමුදා බුද්ධි අංශයේ බ්‍රිගේඩියර් වූලා කොඩිතුවක්කු කියන පුද්ගලයා, මේක රාජ්‍ය ආරක්ෂක වැඩ පිළිවෙළක්, ඒ අනුව මේ පුද්ගලයන් නිදහස් කරන්න කියන ඉල්ලීම කරලා තිබෙනවා. මෙම ලිපියේ සටහන් වෙනවා, ශානි අබේසේකර විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කර ඇති මානව හිමිකම් පෙත්සම, අංක 59 කියලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කවින්ද භේෂාන් ජයවර්ධන මහතා]

එතකොට දැන් ශානි අබේසේකර මහත්තයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා. දැන් එතුමාට පුළුවන් ඒ කණ්ඩායම් නැවත කැඳවලා මේ පිළිබඳව ප්‍රශ්න කරන්න. මොකද, FBI ආයතනය මා දන්නා විධියට සහරාන්ගේ ලැප්ටොප් එක, දුරකථන ඇතුළු මේ සියල්ලක්ම පරිශීලනය කළා. ඒ අයට තොරතුරු තිබුණා, සහරාන් එක්ක සම්බන්ධතා තිබුණේ කවුද කියන එක පිළිබඳව. දැන් මේ මහ මොළකරු අල්ලන්න කටයුතු කරනවා නම්, සහරාන්ට උපදෙස් දුන්නේ, සහරාන් පාලනය කළේ කවුද කියන එක හෙළිදරවු කරන්න ඕනෑ.

ඒ වාගේම, මෙම ලිපියේ 02.02 ඡේදයේ පැහැදිලිව සඳහන් වෙනවා, මාතලේ සහරාන් හෙවත් පොඩි සහරාන් කියන පුද්ගලයාගේ තිබුණු සම්බන්ධතා ගැන. මේ පිළිබඳවත් හෙළිදරවු කරලා තිබෙන්නේ ශානි අබේසේකර මහත්තයා විසින් ගොනු කරන ලද අංක 60-63 කියන මානව හිමිකම් පෙත්සමෙන්.

අපි පැහැදිලිව ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව රටට කියන්න කියලා. සවස ප්‍රවෘත්ති බලනකොට අපි දකිනවා, "කජ්ජා මැරුවේ මෙහෙමයි; එයත් එක්ක සම්බන්ධතා තිබුණේ අරහෙමයි; ගණේමුල්ල සංජීවත් එක්ක සබඳතා පැවැත්වූයේ මෙහෙමයි" කියලා කියනවා, නේද? අර කාන්තාව පැනලා ගියේ එහෙමයි කියලා ප්‍රවෘත්තිවලින් හෙළිදරවු කරනවා. මේවා ඉතින් මාධ්‍යයට නිකම් ලැබෙන්නේ නැහැ. එතකොට මෙච්චර මිලේච්ඡ ත්‍රස්තවාදීන් අපේ අහිංසක මිනිස්සු මැරුවා. ඒ මිනිස්සු මරපු අයට නීතිය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, වහාම මේ ඉදිරිපත් කරලා තිබෙන කරුණු අනුව මේ පරීක්ෂණ කොහොමද සිදු වෙන්නේ කියන එක අවම වශයෙන් මේ පාර්ලිමේන්තුවටත් දැනුවත් කරන්න කියලා. මම මේ ලිපිය සභාගත කළා. මම ඉල්ලා සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ආණ්ඩුවට ලබා දෙන්න කියලා. මේ තමයි, අති උතුම් කාදිනල් රංජිත් මැල්කම් උතුමාණන් ඇතුළු බිෂොප් උන්නාන්සේලාගේ අත්සනින් එවකට ආණ්ඩුවට ලබා දුන් ලිපිය. මා දන්නා තරමට අවම වශයෙන් මේකට ප්‍රතිචාරයක්වත් දැක්වූයේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Channel 4 නාළිකාවෙන් අසාද් මව්ලානා කියන පුද්ගලයා හෙළිදරව් ගණනාවක් කළා. ඔහු මේ රටට ගෙනෙනවා කිව්වා. මට බය හිතුණා අර්ජුන මහේන්ද්‍රන් ගෙන්වා ගන්න බැරිව මේ ආණ්ඩුව තටමනකොට, ඒ විධියටම අසාද් මව්ලානාත් ගෙන්වා ගන්න බැරි තත්ත්වයට පත් වෙයි ද කියලා. මොකද, ඔහු ඒ හෙළිදරව් කරපු කරුණු පැහැදිලිවම අපි නොදන්නා කරුණු බවට පත් වෙලා තිබෙන්නේ. එහෙම නම් යුක්තිය හා සාධාරණය උදෙසා අපි සටන් කරනකොට මේ දේවල් හෙළිදරව් කරන්න ඕනෑ. ඒක ආණ්ඩුවේ වගකීමක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මතක තියා ගන්න, අප්‍රේල් 21 වෙනි දාට මේ ආණ්ඩුවට හැංගෙන්න විධියක් නැහැ. ඒ නිසා මේ කරුණු හෙළිදරව් කරන්න ඕනෑ කියලා මතක් කරනවා.

ඒ වාගේම, ජමීල් සහ හමුදා බුද්ධි අංශය අතර තිබුණු සම්බන්ධය ගැනත් සොයන්න ඕනෑ. ඒ වාගේම සාරා ජස්මින්ගේ DNA පරීක්ෂණ කිහිප වතාවක් කළා, ඇය මරණයට පත් වුණා කියලා තහවුරු වෙනතෙක්. මේ පිළිබඳව ආණ්ඩුව ක්‍රියාත්මක කරන පරීක්ෂණ මොනවාද කියන එක මේ ආණ්ඩුව හෙළිදරව් කරන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේමයි අප්‍රේල් 5වෙනි දා ගැලනිගම සිදුවීමත්. පැහැදිලිවම මේ ලිපියේ තිබෙනවා, ගැලනිගම පිවිසුමට ආවේ බෝම්බ සහිත වෑන් එකක්, එහෙම නැත්නම් ලොරියක්, ඒක නවත්වා ගත්තා, එවකට හිටපු DIG දේශබන්දු තෙන්නකෝන් කථා කරලා මේ ලොරිය නිදහස් කළා කියලා. එහෙම නම් ඒ පිළිබඳව ආණ්ඩුව අරගෙන තිබෙන ක්‍රියාදාමය මොකක්ද කියලා අපි අහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිගින් දිගටම පාස්පෝට් ගැන කථා කළා, e-visa ගැන කථා කළා. මේ වංචා, දූෂණ හා අක්‍රමිකතා නතර කරන්න ආපු ආණ්ඩුව, එහෙම නැත්නම් මේවා හෙළිදරව් කරලා දඬුවම් දෙන්න ආපු ආණ්ඩුව අද නිහඬයි කියලා මේ සභාවේ දී බොහෝ දෙනා කථා වුණා. මේ රටේ ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා දවසකට මම හිතන්නේ 40ක්, 60ක් විතර ෆයිල් ලැබෙනවා. මාස තුනක් තිස්සේ මේ ෆයිල් ගොඩගැහිලා දැනට 2800කට ආසන්න ෆයිල් ප්‍රමාණයක් තිබෙනවා. මිනිස්සු 5000කට ආසන්න ප්‍රමාණයක් ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා බලාපොරොත්තුවෙන් සිටිනවා. ඒ සඳහා එක පුද්ගලයෙක් ඩොලර් 5000ක් සහ ඒ පුද්ගලයාගේ පවුලේ කෙනෙකුට ඩොලර් 500ක ගෙවීමක් කරන්න ඕනෑ. මේ කටයුතු නැවතීම නිසා එක පැත්තකින් ආණ්ඩුවට ලැබෙන්න තිබෙන ආදායමක් අඩු වෙනවා වාගේම, මේ රටේ ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා බලාපොරොත්තුවෙන් ඉන්න ජනතාවට ඒ අවකාශය නැති වෙන එකත් සිදු වෙනවා, වාගේම ඒක කල් යනවා. ඒ නිසා ඒ කෙරෙහි ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයකට පිළිතුරක් ලබා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම එතුමා විසින් මතු කරන්න යෙදුණා, පාතාල ක්‍රියා පිටුපස සක්‍රිය සේවයේ සිටින, එහෙම නැත්නම් විශ්‍රාම ගිය හමුදාවේ සහ පොලිසියේ උදවිය සම්බන්ධයි කියලා. ඒක රහසක් නොවෙයි. පසුගිය කාලය තුළ ඇති වෙච්ච අපරාධ ක්‍රියා පිටුපස ඔවුන් සිටින බව පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ආරක්ෂක ලේකම්වරයා මේ වෙලාවේ කාරණා දෙකක් සම්බන්ධයෙන් පියවර අරගෙන තිබෙන්නේ. ඒ තමයි, හමුදාවෙන් පලා ගිය සියලු තැනැත්තන් අත්අඩංගුවට ගන්නත්, ඒ වාගේම පසුගිය ආණ්ඩුවෙන් ලබා දුන් සියලු ගිනි අවි යළි කැඳවන්නත්. Threat assessment එකක් ඇතුළේ තමයි යළි ඒවා ලබා දෙන්නේ. ඒවා සම්බන්ධයෙන් පියවර අරගෙන තිබෙනවා.

පොලිසියෙන් නිර්දේශයක් එවලා තිබෙනවා, අදාළ වෙඩි තැබීම් සිද්ධි සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීමේදී එම අපරාධ සඳහා හිටපු සහ සේවයේ යෙදී සිටින ආරක්ෂක අංශ සාමාජිකයන් බොහොමයක් සම්බන්ධ වී ඇති බව අනාවරණය වෙන බව. ඒ වාගේම, ආරක්ෂක අංශ සාමාජිකයන් අවි පුහුණුව ලබා ඇති පසුබිම යටතේ අත්අඩංගුවට පත් ආරක්ෂක අංශ සාමාජිකයන් ද අවි පුහුණුව ලබා ඇති බැවින් හා ඔවුන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් බැවින් මෙම අපරාධ සඳහා යොමු වී ඇති බව නිරීක්ෂණය වෙනවා. ඒවා අමාත්‍යාංශය විධියට අපට නිරීක්ෂණය වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ආරක්ෂක ලේකම්වරයා දැනටමත් අදාළ පියවර කිහිපයක් අරගෙන තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධයෙන් වන කටයුතු කඩිනම් කිරීමට අදාළ කටයුතු කරගෙන යනවා. ඔබතුමා ඇහුවා, මේවා පිටුපස දේශපාලනඥයන් සිටිනවාද කියලා කියන්න කියලා. ඉතා නොබෝ දිනකින් බලාපොරොත්තු වෙන්න, විශේෂයෙන් මිද්දෙනිය ප්‍රදේශයේ සිදු වූ ඝාතන පිටුපස ඉන්න දේශපාලනඥයන් කවුද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.21]

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் நடைபெறுகின்ற பாதுகாப்பு அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு பல விடயங்களை எடுத்துச் சொல்லலாமென நினைக்கின்றேன். ஆட்சிக்கு வருகின்ற ஒவ்வோர் அரசாங்கமும் முப்படைக்குக் கூடுதலான நிதியை ஒதுக்குவது வழமையான ஒன்றாகிவிட்டது. இப்பொழுது இருக்கின்ற புதிய அரசாங்கம்கூட, முப்படைக்குக் கூடுதலான நிதியை ஒதுக்கியிருக்கிறது. இது தேசியப் பாதுகாப்புச் சம்பந்தமான விடயங்களைக் கையாள்வதற்கு ஒதுக்கப்பட்டதா? என்ற கேள்வியை நான் கேட்கின்றேன். போர் இடம்பெற்ற காலத்தில் வடக்கு, கிழக்கில் முப்படையினர் குவிக்கப்பட்டார்கள். தற்போது போர் இல்லாத சூழலில், துப்பாக்கிச் சத்தங்கள் இல்லாத சூழலில், அங்குள்ள முப்படையினர் என்ன செய்கின்றார்கள் என்றால், பொது மக்களுடைய காணிகளை அபகரித்து, அவற்றில் விவசாயம் செய்கின்றார்கள்; அம்மக்களுடைய கால்நடைகளில் பால் கறக்கின்றார்கள்.

இது உலக நாடுகளில் எங்கேயும் இல்லாத ஒரு விடயமாகும். அதுமாத்திரமன்றி, இவற்றின்மூலம் பெறப்படுகின்ற உற்பத்திப் பொருட்களை வெளியில் விற்கின்றார்கள். ஏ-9 பாதையால் போகும்போது அல்லது வடக்கு, கிழக்கில் எங்கு போனாலும், இராணுவத்தின் உணவுச்சாலை - canteen - இல்லாத இடங்கள் இல்லை என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஏன் எங்களுடைய பிரதேசத்தில் முப்படையினர் குவிக்கப்பட்டு இருக்கிறார்கள்? ஏன் அவர்கள் எங்களுடைய மக்களின் காணிகளைப் பிடித்திருக்கிறார்கள்? என்ற கேள்விகளை இந்த அரசாங்கத்திடம் கேட்க வேண்டும். இராணுவம் பிடித்து வைத்திருக்கின்ற பொது மக்களுடைய காணிகளை விடுவிப்பதாக மாண்புமிகு சனாதிபதி அவர்கள் சொன்னார். ஆனால், இற்றைவரை அது நடைபெறவில்லை.

இன்று மக்கள் உங்கள்மீது நம்பிக்கை வைத்திருக்கிறார்கள். நான் இந்த வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் வாசிப்புமீது நடைபெற்ற வாக்கெடுப்பில் ஆதரவாக வாக்களித்ததன் நோக்கம் என்னவென்றால், எங்களுடைய வன்னித் தேர்தல் மாவட்டத்தில் இன்றைக்கும் மனதில் வடுக்களைச் சுமந்து திரிகின்ற எங்களுடைய மக்களின் வாழ்வாதாரத்தை முன்னேற்றக்கூடிய வகையில், அவர்களுடைய எதிர்காலத்தைச் சிறப்பிக்கக்கூடிய வகையில், அவர்கள் சுதந்திரமாக நடமாடக்கூடிய வகையில் இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கப்பட்டு இருப்பதனால்தான். ஆனால், பாதுகாப்பு அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான வாக்கெடுப்பில் என்னுடைய வாக்கு எதிராகத்தான் இருக்கும் என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இன்றைக்கு எங்களுடைய பகுதியில் எத்தனையோ ஏக்கர் காணிகளை முப்படையினர் அபகரித்து வைத்திருக்கிறார்கள். வவுனியாவை எடுத்துக்கொண்டால், அங்கு ஈச்சங்குளம் இராணுவமுகாம் அமைந்துள்ள காணி பொது மக்களுடையது. அதேபோல், பேயாடிக்கூழாங்குளம் இராணுவமுகாம் அமைந்துள்ள காணியும் பொது மக்களுடையது. வவுனியா சிரேஷ்ட பொலிஸ் அத்தியட்சகர் இருக்கின்ற காணி உட்பட ஏ -9 வீதியில் பிடித்திருக்கின்ற சுமார் 200 ஏக்கர் காணியும் பொது மக்களுடையது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மன்னாரை எடுத்துக்கொண்டால், அங்குள்ள தேவாலயங்கள், கோயில்கள் அத்தனையும் முப்படையினரின் கட்டுப்பாட்டில்தான் இருக்கின்றன. பொது மக்கள் வழிபடுவதற்கான நேரங்களை ஒதுக்கி, அவர்களைப் பரிசோதனை செய்துதான் உள்ளே அனுப்புகிறார்கள். உதாரணத்துக்கு, தலைமன்னார் pierஇல் இருக்கின்ற தேவாலயம் Sri Lanka Navyயின் கட்டுப்பாட்டிலேயே இருக்கின்றது. திருவிழாக் காலங்களில் அங்கு மக்கள் வழிபடுவதற்கு அனுமதிக்கப்படுகின்றார்கள். ஏற்கெனவே முள்ளிக்குளப் பிரதேசம் - அங்குள்ள விவசாய நிலங்கள் உட்பட ஏனைய நிலங்கள் - விடுவிக்கப்பட்டதாகச் சொல்லப்பட்டாலும், இன்னும் அது விடுவிக்கப்படவில்லை. அது கடற்படையின் கண்காணிப்பிலேயே இருக்கின்றது. மன்னாரின் சன்னார் பிரதேசத்தில் பொது மக்களுடைய பல ஏக்கர் காணிகளை பயிற்சி முகாமுக்கென இராணுவம் பிடித்து வைத்திருக்கிறது. முல்லைத்தீவில் படையினரும் பொலிஸாரும் 1,494 ஏக்கர் காணியை அபகரித்து வைத்திருக்கிறார்கள். மாண்புமிகு சனாதிபதி அவர்கள் தேர்தல் காலத்திலும் அதற்குப் பின்னரும் முப்படையினர் பிடித்து வைத்திருக்கின்ற பொது மக்களுடைய காணிகளை விடுவிப்பதாகச் சொன்னார். அது நடைமுறைப்படுத்தப்பட வேண்டுமென நான் இந்தச் சபையில் கேட்டுக்கொள்கின்றேன்.

ஏன் வடக்கில் கூடுதலான முப்படையினர் நிறுத்தப்பட்டு இருக்கிறார்கள்? இங்கு சிறிது நேரத்துக்கு முன்னர் பேசிய வன்னித் தேர்தல் மாவட்ட நாடாளுமன்ற உறுப்பினர் கௌரவ ரவிகரன் அவர்கள் சொன்னதுபோல, வடக்கில் பெருமளவான முப்படையினர் இருக்கும் நிலையில், அங்கு போதைவஸ்துக்கான வழி திறக்கப்பட்டு இருக்கின்றதென்றால், அதற்கு என்ன காரணமென நான் கேட்க விரும்புகின்றேன். அதற்கு அவர்களும் உடந்தையா? என்ற கேள்வியை நான் எழுப்ப விரும்புகின்றேன். இந்த விடயத்தில் அரசாங்கம் கூடிய கவனம் எடுக்க வேண்டும். அங்கு கடல் மார்க்கமாக ரோந்து செல்ல கடற்படை இருக்கிறது; பல ஏக்கர் காணியில் இராணுவம் இருக்கிறது; சோதனைச் சாவடிகள் இருக்கின்றன. இவை எல்லாம் இருக்கையில், எப்படி இந்த மாற்றத்துக்கான நிலை உண்டுபண்ணப்பட்டு இருக்கின்றது? அங்கு எப்படி போதைவஸ்துகள் கடத்தப்படுகின்றன? அதில் கடற்படை கவனத்தைச் செலுத்தவில்லையா? ஏன் வடக்கில் முப்படையினர் கூடுதலான காணிகளைப் பிடித்து முகாமிட்டு இருக்கிறார்கள்? இந்தியா இலங்கைமீது போர் தொடுக்கும் என்ற அச்சமா? அல்லது உங்களுடைய சிந்தனையில் இருக்கின்ற 'மீள் உருவாக்கமா'? என நான் கேட்கின்றேன். என்னைப் பொறுத்தமட்டில், எங்களுடைய மக்கள் இந்த விடயத்தில் நிதானமாகத்தான் இருக்கிறார்கள். அதை மையமாக வைத்து அங்கு நீங்கள் முப்படையினரைக் குவித்துவைத்திருப்பது தவறு என்று நான் சொல்கின்றேன்.

அண்மைக் காலமாகத் தென்னிலங்கையில் பல துப்பாக்கிச் சூட்டுச் சம்பவங்கள் நடந்து வருகின்றன. வடக்கிலுள்ள முப்படையினரை தென்னிலங்கைக்கு அனுப்புங்கள்!

[ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා]

වටක්කිලුන්ල මුප්පටෙයිනරෙ මුලුමෙයාක එටුක්ක වේන්ටුමෙන නාන් සොල්ල වරවිල්ලෙ. අංකිරුක්කින්ර පටෙයිනරෙක් කුරෙක්කුමාරුතාන් සොල්කින්රේන්. උංකළාල් පෝතෙවස්තු කටත්තලෙත් තටුක්ක මුටියවිල්ලෙ එන්රාල්, එතර්කාක අංකු ඉරාණුවත්තෙක් කුවිත්තු වෙත්තිරුක්කිරීර්කළ්? පයංකරවාතත් තටෙච් චට්ටත්තෙප් පයන්පටුත්ති අප්පාවිප් පත්තිරිකෙයාළර්කළෙයුම් විටුතලෙප් පෝරාට්ටම් චම්පන්තමාන පටංකළෙත් තංකළතු කෙයටක්කත් තොලෙපේසිකළිලුම් computersඇලුම් වෙත්තිරුප්පවර්කළෙයුම්තාන් නීංකළ් කෙතු සෙය්කින්රීර්කළ්.

තේසියප් පාතුකාප්පු එනුම්පෝතු, අප්පාවිත් තමිල් මක්කළුම් පෝරාට්ට වීරර්කළෙත් තංකළතු මනංකළිල් චුමන්තිරුක්කින්රවර්කළුම්තාන් උංකළුක්කු එතිරියාකත් තෙරිකින්රාර්කළා? ඉතර්කාකත්තාන් නීංකළ් වටක්කිල් කූටුතලාන මුප්පටෙයිනරෙක් කුවිත්තුවෙත්තු ඉරුක්කින්රීර්කළා? ඉතර්කාකත්තාන් නීංකළ් කූටුතලාන නිතියෙ ඔතුක්කි ඉරුක්කින්රීර්කළා? එන්ර කේල්වියෙ නාන් කේට්කින්රේන්. ඉන්රු එංකළුතෙය මක්කළ් අච්චප්පටු කිරාර්කළ්. අවර්කළ් උංකළෙ නම්පි වාක්කළිත්තු ඉරුක්කිරාර්කළ්. වටක්කිල් NPPක්කු කූටුතලාන වාක්කුකළ් අළික්කප්පට්ටු, අක්කට්චි චාර්පිල් පලර් නාටාළුමන්ර උරුප්පිනර්කළාකත් තෙරිවුචෙය්යප්පට්ටු ඉරුක්කිරාර්කළ්. ඉන්ත අරචාංකත්තින් මීතුළ්ළ පයත්තිනාලෝ තෙරියවිල්ලෙ, චිල නේරංකළිල් අවර්කළුම් අන්ත උණර්වුකළෙ මරන්තු පේසුකින්ර නිලෙ කාණප්පටුකින්රතු. එංකළෙප් පොරුත්ත මට්ටිල්, මුප්පටෙක්කු ඔතුක්කප්පටුකින්ර නිති කුරෙක්කප්පට වේන්ටුම්. අප්පෝතුතාන් එංකළාල් උණ්මෙයාන නල්ලිණක්කත්තෙ අටෙය මුටියුම්. පාතුකාප්පු එන්ර පෝර්වෙයිල්, එංකළුතෙය පත්තිරිකෙයාළර්කළෙයුම් ඉළෙඤර්කළෙයුම් කෙතුචෙය්වතු මට්টුම් තේසියප් පාතුකාප්පාක ඉරුක්කාතු එන්පතෙ ඉන්තච් චන්තර්ප්පත්තිල් කූරි, නිරෙවුචෙය්කින්රේන්. නන්රි. වණක්කම්!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(මාණ්පුමිකු චනාතිපති චට්ටත්තරණි එම්. නිචාම් කාරියප්පර්)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනට යෙදී තිබෙන කාරක සභා විවාදයේදී මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු යන කාරණා දෙක සම්බන්ධයෙන් වැදගත් කාරණා කිහිපයක් පුළුවන්තරම් ඉක්මනින් කෙටියෙන් ඉදිරිපත් කිරීමට මේ අවස්ථාවේ මා අවසර පතනවා.

කෞරව තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඒර්කනවේ කටන්ත පෙප්රුවරි 6ආම් තිකති එන්නාල් වාය්මූල විටෙක්කාන විනාවොන්රු එළුප්පප්පට්ටිරුන්තතු. අතාවතු, ඉස්ලාමියක් කිරන්තංකළෙ ඉලංකෙක්කුක් කොණ්ටුවරුවතිල් උළ්ළ චිල කට්ටුප්පාටුකළ් පට්රි නාන් අතන්පෝතු කේට්ටිරුන්තේන්. අතර්කු උරිය පිරති අමෙච්චර් පතිලළිත්තාර්. උණ්මෙයාකවේ අප්පොළුතු අවර් පාවිත්ත වචනම් 'අන්තවාදී ග්‍රන්ථ නියාමනය කිරීම සඳහා' එන්පතුතාන්. අතාවතු, තීවිරවාතක් කිරන්තංකළෙක් කණ්කාණික්ක වේන්ටුම් එන්ර කාරණත්තිනාල්තාන් තාංකළ් අත්තටෙකළෙක් කොණ්ටුවන්තතාකච් චොල්ලිවිට්ටු, 48 මණිත්තියාලත්තිර්කුළ් අවර්රෙ විටුවිප්පතාකවුම් promise කොටුත්තිරුන්තාර්. ආනාල්, නටන්තතු වේරු විටයම්. මුක්කියමාක අතෙ නාන් ඉංකු චොල්ලියාක වේන්ටුම්. ඒනෙන්රාල්, චිලවේළෙ ඉංකිරුක්කුම් මුස්ලිම් පාරාළුමන්ර උරුප්පිනර්කළුක්කුක්කූට ඉතෙප්පට්රි තෙරියුමා එන්රු තෙරියවිල්ලෙ. අතාවතු, 2024ආම් ආණ්ටු මේ මාතමළවිල් චවුතියිල් ඉරුන්තු මුස්ලිම් චමය, පණ්පාට්ටලුවල්කළ් තිණෙක්කළත්තිර්කු නන්කොටෙයාක අනුප්පප්පට්ට චිංකළ, තමිල් මොළිකළිල් මොළිපෙයර්ක්කප්පට්ට තප්චීර් කුර්ආන් පිරතිකළ්, 'අන්තවාදී ග්‍රන්ථ' - 'තීවිරවාත කිරන්තම්' එන්ර අටිප්පටෙයිල් ඉන්රුම් තටෙයිල් ඉරුක්කින්රන. වේන්ටුමානාල් අතර්කුරිය ආවණත්තෙ නාන් ඉංකු වාචිත්තුක්කාට්ට මුටියුම්. අන්තච් චිංකළ, තමිල් තප්චීර්කළ් - කුර්ආන් translations - ඉන්රුම් අංකුළ්ළ storeroomඉල් මුටක්කි වෙක්කප්පට්ටුළ්ළ පරිතාපමාන නිලෙ කාණප්පටුකිරතු. නාන් ඉතෙ ඉංකු උංකළුක්කුච් චුට්ටික්කාට්ටියාක වේන්ටුම්. නීංකළ් කුර්ආනෙ තීවිරවාත කිරන්තමාකක් කරුතුකිරීර්කළා? එන්පතෙ නාන් උංකළිටම් කේට්ක විරුම්පුකිරේන්.

ඊට අමතරව, මම කියන්න බලාපොරොත්තු වන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ යම් යම් කාරණා සම්බන්ධයෙන් මුළු සභාවේම එකඟතාවක් ඇතැයි කියලා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉදිරිපිට තිබෙනවා, Lenovo laptops. මම හිතන්නේ ඒවා ලැබුණේ 2017දී -

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) නළින්ත ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) නළින්ත ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා ආණ්ඩුවෙන් නිශ්චිත ප්‍රශ්නයක් ඇහුවා, කුරානය අන්තවාදී ග්‍රන්ථයක් හැටියට සලකනවාද කියලා. අපි එහෙම සලකන්නේ නැහැ.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(මාණ්පුමිකු චනාතිපති චට්ටත්තරණි එම්. නිචාම් කාරියප්පර්)
(The Hon. M. Nizam Kariapper, PC)
ඔබතුමා දන්නවාද දන්නේ නැහැ, සවුදි අරාබියෙන් ගෙන්වූ Tafsir - ඒ කියන්නේ සිංහල සහ දෙමළ translations - ග්‍රන්ථ 3,000ක් පමණ තවමත් නියාමන කමිටුව යටතේ තිබෙන බව.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) නළින්ත ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවෙන් පත් කරන ලද විශේෂ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට ඔබතුමන්ලාගේ නායකයාත් හිටියා. ඒ කමිටුවෙන් ගත්ත

තින්දුවක් තිබෙනවා, ඕනෑම අන්තවාදී ග්‍රන්ථයක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරන්න. මම හිතන්නේ, ඒ තීන්දුව තමයි අමාත්‍යාංශය තවමත් ක්‍රියාත්මක කරමින් ඉන්නේ.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ඔබතුමන්ලාට මට අත දික් කරන්න සදාචාරාත්මක අයිතියක් නැති බව මම දන්නවා. මේක 2024 වර්ෂයේ ජූලි මස සිදු වූ දෙයක්. ඇත්තටම මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? I am so happy, මේ පිළිබඳව ඔබතුමා මගෙන් ප්‍රශ්න කරපු එක ගැන.

ආගම ඇතුළේ යම් යම් මතභේද තිබෙනවා. ඒක හැම ආගමේම තිබෙනවා. අවාසනාවකට එවකට තිබුණු ආණ්ඩුව සමඟ හිටපු බහුතර මතවාද දරන යම් කිසි කණ්ඩායමක් ඔය කමිටුවට රිංගලා සවුදි අරාබිය විසින් කරන ලද දෙමළ සහ සිංහල පරිවර්තනය ඔවුන්ගේ මතවලට එකඟ නැති නිසා, ඔවුන්ට පක්ෂ නොවන නිසා එය අන්තවාදී ග්‍රන්ථයක් ලෙස සලකුණු කර තබා තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් වූ shipments එක්ක විස්තර ටික ඔබතුමාට ලබා දෙන්නම්. කරුණාකර ඒ සම්බන්ධයෙන් බලන්න. Thank you for answering that question.

ඊළඟට, මම මේ පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ විස්තර ටිකක් කියන්නම්. මේ Lenovo laptop එක විශාල කරදරයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මමත් ආපු දවස්වල ඉඳලා පුදුම උත්සාහයක් දරනවා, 2017දී ලබා දුන් මේ පරණ laptop එක කොහොම හරි විවෘත කරගෙන ප්‍රයෝජනයට ගන්න. අප විසින් පැසසුමට ලක් කළ මේ ආණ්ඩුවේ විශේෂ දෙයක් තමයි, ඩිජිටල්කරණය. කිලෝග්‍රෑම් 2ක් විතර බර හැන්සාඩ් වාර්තා ටිකක් අදත් ලැබිලා තිබෙනවා.

ඇත්ත වශයෙන්ම මම ඉල්ලීමක් කරන්න බලාපොාරොත්තු වෙනවා, හැන්සාඩ් දෙපාර්තමේන්තුවෙන්. මට hard copies දෙන්න එපා. මොකද, digital copies මෙතැන තිබෙනවා. ඊට අමතරව, අපට web portal එකෙනුත් මේ දේවල් හොයාගන්න පුළුවන්. දැන් DPN එකත් අරගෙන දීලා තිබෙනවා. මම හිතන්නේ, අලුතින් පැමිණි මන්ත්‍රීවරුන්ගෙන් සියයට 90කට වඩා මේවා භාවිත කිරීමේ හැකියාව හොඳින් තිබෙනවා කියලායි. විපක්ෂය පැත්තේත් ඉන්නවා, සෑහෙන්න අලුත් මන්ත්‍රීවරු. මාස එක හමාරක් වාගේ කාලයක් තුළ ලැබුණු හැන්සාඩ් වාර්තා කිලෝ ගණනක් බරයි. ඔබතුමන්ලාගේ නාස්තිය වැළැක්වීමේ පදනම් යටතේ, hard copies ඉල්ලන අවස්ථාවක හැරෙන්නට, මට හැන්සාඩ් වාර්තා ලබා නොදීම හොඳයි. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ Lenovo laptop එක පොඩ්ඩක් modernize කරන්න වෙයි. මොකද, මේවා 2017දී දුන් laptops. මම හිතන්නේ, මේවාත් යම් කිසි ආධාර ක්‍රමයක් යටතේ ලැබුණු laptops වෙන්න ඕනෑ. අපට pop-up screens සහිතව, මේ මේසය යටින් සවි කරලා එය ඇදලා පාවිච්චි කරන්න පුළුවන් විධියේ keyboard එකක් සහිත උපකරණ ලබා දෙන්න පුළුවන් නම් ඒ හරහා ගොඩක් දේවල් කර ගන්න පුළුවන්.

උදාහරණයක් හැටියට ගත්තොත්, මේ පාර්ලිමේන්තුවේ හැම දාම වාගේ කාරක සභා පැවැත්වෙනවා. මෙතැන ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කැමැතියි, ඒවාටත් සහභාගි වෙන්න. අපට ටිකක් modernized, a pop-up screen with a keyboard දීලා, පාර්ලිමේන්තු විවාද තිබෙන අතරතුර, ඊට සමාන්තරව එකම අවස්ථාවක Committee Roomsවල පවතින කාරක සභාවලටත් සම්බන්ධ වෙන්න පුළුවන් ක්‍රමයක් හදලා දෙන්න. ඒක ලොකු දෙයක්. ඒක පළමුවැන්න. I think it comes under the Ministry of Public Security and Parliamentary Affairs, subject to correction.

දෙවැන්න තමයි, අපි පාර්ලිමේන්තු කැන්ටිමෙන් කන බොන දේවල්වලට පමණක් මුදල් ලබා ගැනීමේ ක්‍රමයක් හදන්න කියන එක. We must pay for what we eat and drink. උදාහරණයක් හැටියට මම එක කාරණයක් කියන්නම්. එතැනට ගියාම Sri Lankan spread එකක් තිබෙනවා. ඒ වාගේම grills එහෙමත් තිබෙනවා. බත් කන අය ඒ වාගේ ඒවා කන එකක් නැහැ. සමහර කෙනෙක් කන දේවල් තවත් කෙනෙක් කන්නේ නැති වෙන්න පුළුවන්. සලාද කන මනුස්සයා බලාගෙන ඉඳලා කියනවා, "මේ මිනිස්සු කන බත්වලටත් අපි ගෙවන්න ඕනෑ" කියලා. විදේශ රටවල IKEA showroomsවල ක්‍රමවේදයක් තිබෙනවා, අපි යන ගමන් ගන්න එළවලු සහ කැමවලට ඒ වෙලාවේම බිල් කරලා ලබා ගැනීමේ. එතකොට ඒක ගොඩක් හොඳයි.

තව එක දෙයක් මම ඔබතුමන්ලාට යෝජනා කරන්න ඕනෑ. මම නවකයෙක් වුණාට, please try to consider this also with seriousness. අපට හවස තේ එක මෙතැනදි ලබා දෙන්න බැරිද? සල්ලි ගෙවන්නම්, ප්‍රශ්නයක් නැහැ. මොකද, අපට එතැනට යන්න විනාඩි 5ක් පමණ ගතවනවා. ගිහිල්ලා ආපහු මෙතැනට එන්නත් තව විනාඩි 5ක් පමණ ගතවනවා. එතකොට ඒකට විනාඩි 10කට වැඩිය කාලය යනවා. ඒ නිසා අපට මුදලක් ගෙවලා ඒක මෙතැනින්ම ලබා දෙන්න පුළුවන් නම් ලොකු දෙයක්. That will make our participation in the Parliamentary Proceedings very efficient. ඔබතුමන්ලා සමහර විට කල්පනා කරනවා ඇති, ඒ කාරණා දෙක අපට අදාළ කමිටුවට ඉදිරිපත් කරන්න තිබුණා කියලා. මම ඒ කමිටුවේ සාමාජිකයෙක් නොවෙයි. ඒ නිසා මම මේ සම්බන්ධයෙනුත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා.

ඊට අමතරව මහජන ආරක්ෂක ඇමතිතුමාට තවත් පොඩි කාරණයක් මට කියන්න තිබෙනවා. ඒ, වෙන මොකක්වත් නොවෙයි. මම හිතන්නේ පාර්ලිමේන්තුවට අනුයුක්ත වෙලා සිටින පොලිස් නිලධාරීන් MSD එකට අනුයුක්ත කරපු පොලිස් නිලධාරීන් කියලායි. ඔවුන්ගේ ලොකු ඉල්ලීමක් තිබෙනවා, තුනෙන් එකේ දීමනාව අවුරුදු 5ක් තිස්සේ ඔවුන්ට නොලැබුණු නිසා ඒක ලබා දෙන්න කියලා. ඇත්තටම ඒ පිළිබඳව මට වැඩි අවබෝධයක් නැහැ. නමුත් ඒ අය එවැනි ඉල්ලීමක් කරපු නිසායි මම මේ කාරණය කියන්නේ. අපි නවක මන්ත්‍රීවරු. අපි ආවාම ඔවුන් හිනාවෙලා අප පිළිගන්නවා. අපි වැරදි තැන්වලට ගියාම නිවැරදි තැනට යන්න ඔවුන් අපට මඟ පෙන්වනවා. ඒ තැනැත්තන් සමඟ අපි පවත්වාගෙන යන හිතවත්කම මත ඒ නිලධාරීන් කිව්වා, "මන්ත්‍රීතුමනි, පුළුවන් නම් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කරන්න" කියලා. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා.

මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් මට කියන්න තව කාරණා කිහිපයක්ම තිබෙනවා. මට ලැබී තිබෙන කාලය තුළ මට අද දින ඒ කාරණා ගැන කථා කරලා අවසන් කරන්න බැරි වුණොත්, හෙට දින අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මට ලබා දෙන කාල වේලාව තුළ ඒ ගැන නැවත කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ-පෙරේදා ලොකුම ප්‍රශ්නයක් වෙලා තිබුණා, අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවේ ඉඳලා මෙහාට ගේන එක සම්බන්ධව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංගප්පූරු Extradition Act එක යටතේ අර්ජුන මහේන්ද්‍රන් මේ රටට ගෙන ඒම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගයේ තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි, ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර extradition treaty එකක්, උදර්පණ ගිවිසුමක් නැති එක. උදර්පණ ගිවිසුමක් නැත්නම් - මම හිතන්නේ අධිකරණ ඇමතිතුමාත් ඒ ගැන දන්නවා ඇති - as a matter of right, you cannot demand for extradition; උදර්පණ ගිවිසුමක් නැත්නම් අයිතියක් වශයෙන් ඒක ඉල්ලන්න

[ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා]

බැහැ. එතකොට එන ප්‍රශ්නයක් තමයි, they will consider it, case by case. ඒ ඒ ඉල්ලීම් මත ඔවුන් වෙන වෙනම ඒක ගැන හොයලා බලනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි අවස්ථාවක වෙන්නේ මේකයි. ඒ ඉල්ලීම සලකා බැලීමේදී අවසාන තීන්දුව ගැනීමට තිබෙන අයිතිය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ සිංගප්පූරුවේ සිටින විදේශ ඇමතිතුමාට, again, subject to correction.

ඒ විදේශ ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් සලකා බලන විශේෂ කාරණයක් තිබෙනවා, ගරු සභානායකතුමනි. ඒ තමයි, තමන් යවන සිංගප්පූරු පුරවැසියාට මෙහේ ආරක්ෂාව තිබේද කියන එක. එතකොට ඒක ලොකු ප්‍රශ්නයක්. මොකද, the request for his extradition is as a suspect, not as a convict. දැනටමත් වරදකරු වූ පුද්ගලයෙක් නොවෙයි අපි ඉල්ලන්නේ; සැකකරුවෙකු මෙහාට ගෙනෙන්නයි ඉල්ලන්නේ. එතකොට ඒගොල්ලන් ඉස්සෙල්ලාම බලනවා, සැකකරුවෙක් නම් ඒ සැකකරුට ඒ රටේ නීති පද්ධතියේ, අධිකරණයේ මුහුණ දීම සඳහා වූ වාතාවරණයක් තිබේද කියලා. තමාගේ පුරවැසියා - citizen - බියක් නැතුව ඒ රටට යවන්න පුළුවන්ද කියලා බලනවා.

ඔබතුමන්ලා දැන් කල්පනා කරනවා ඇති, ඇයි මේ වෙලාවේ දිගින් දිගටම මේ වාගේ සිද්ධි වෙන්නේ කියලා. Is there a conspiracy behind it? I also feel there is. සංජීවගේ ඝාතකයා තවමත් suspect. ඒ සිද්ධිය වෙලා දවසකින් හෝ දවස් දෙකකින් පොලීසියේ හිටපු සැකකරුවන් දෙදෙනෙක් ගෙනැල්ලා මරනවා, වෙරළ ආඝන්නයේ. So, what is the message you are giving to the international community? This country is not safe for a suspect extradited. සිංහල කියමනක් තිබෙනවා නේ, "දඩමස් ටික උස්සාගෙන යනකොට තුවක්කු බැන්දේ කවුද කියලා තේරෙනවා" කියලා. Who are the beneficiaries of this series of incidents?

මම හිතන්නේ මේක අලුත් දෙයක් නොවෙයි. ඉන්දියාවේ ප්‍රසිද්ධ Tamil teledrama එකක් තිබෙනවා. එතැනත් chief minister කෙනෙකුව prosecute කරනවා තවත් ප්‍රාන්තයක. ඒ ප්‍රාන්තයේ, ඒ chief ministerට ආරක්ෂාවක් නැහැ කියන පදනම තමයි ගෙනෙන්නේ, ඒ නඩුව දමන්න. මට මේ ගැන පැහැදිලි සාක්ෂියක් නැහැ; it is only my guess. කාට හරි ඕනෑ වුණොත් මේ වකවානුව තුළ තම රටින් පිටුවහල් කර ගැනීම නවත්වා ගැනීමට මේක පාවිච්චි කරන්න පුළුවන්.

So, what I finally want to say on the question of Arjuna Mahendran is - මම හිතන්නේ අධිකරණ ඇමතිතුමා දන්නවා ඇති *in absentia* prosecution කියලා එකක් තිබෙනවා, අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ සැකකරුවෙකු නොමැතිවම නඩු විභාගයට ගන්න පුළුවන් - සැකකරු මෙහේට ගෙනෙන තුරු අපි ඉන්න ඕනෑ නැහැ. සැකකරු නොමැතිව නඩුව විභාගයට අරගෙන ඔහු වරදකරු වුණොත් ඊට පස්සේ ඔහු ගෙන්වා ගැනීම කළ හැකියි. ඒක මම හිතන හැටියට ලේසියි. ඒක, එක aspect එකක්. මොකද, දීර්ඝ කාලයක් ඒක සිදු වුණේ නැහැ. තව එක කාරණයක් ඒකට එකතු කරන්න ඕනෑ, මගේ කථාව අවසන් කරන්න ඉස්සෙල්ලා. Then, I will wind up.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I am going to wind up, Sir.

මෙහිදී තව කරුණක් බලනවා. අපි මේ ගැන කථා නොකරන තරමට හොඳයි. They will not assist a political persecution. දේශපාලන කාරණාවක් මත යම්කිසි නඩුකරයක් සම්බන්ධයෙන් සැකකරුවෙක් පිටින් ගෙනෙන්න යන අවස්ථාවකදී, තමන්ගේ දේශපාලන අරමුණ ඉෂ්ට කර ගැනීම සඳහා උදර්පන පනත යටතේ පුරවැසියෙක් ලබා ගන්නා අවස්ථාවකදී, ඒ රටේ ඉන්න ඇමතිතුමාට පුළුවන්, "නැහැ, මෙහෙම කරන්නේ වෙන මොකවත් සඳහා නොවෙයි, this is not a *bona fide* request for extradition, but in order to project political purposes" කියලා කියන්න. ඒ අනුව, මේ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු මම හෙට කථා කිරීමට බලාපොරොත්තු වෙනවා.

Thank you very much, Sir, for giving me this opportunity.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.46]

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කථා කරමින් ඉන්නේ පුරවැසි අය වැයක් සම්බන්ධයෙන්. මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ ශීර්ෂය යටතේ කාන්තාවන් සහ දරුවන් සම්බන්ධයෙන් අවධානය යොමු වුණේ නැහැ කියන එක. හැබැයි, එක තැනකදී ඒ සම්බන්ධයෙන් අවධානය යොමු වුණා. මම හිතන්නේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා හිටියේ වැරදි අවබෝධයක. එහෙම නැත්නම් සාමාන්‍යයෙන් හැම දෙයක් ගැනම වරදවා හිතලා හරි වරදවා දක්වන්න උත්සාහ කරන නිසා හරි වෙන්න ඇති එතුමා කිව්වා, හමුදාවට බඳවා ගන්නා කාන්තාවන් අවුරුදු 15යි වැඩ කරන්නේ, පිරිමින් අවුරුදු 22ක් වැඩ කරනවා, දැන් කාන්තාවන්ටත් අවුරුදු 22ක් වැඩ කරන්න සිද්ධ වෙලා කියලා. කාන්තාවන්ටත් අවුරුදු 22ක් වැඩ කරන්න සිද්ධ වෙලා නොවෙයි, ඒක දීර්ඝ කාලයක් තිස්සේ ඒ කාන්තාවන් කරපු ඍත්තීය සටනක, එහෙම නැත්නම් අරගළයක, එහෙමත් නැත්නම් ඒ නිලධාරිනියන්ටත්, පිරිමි නිලධාරීන් හා සමානව අවුරුදු 22ක සේවා කාලයක් ලබා දෙන්න කියන ඉල්ලීමේ ප්‍රතිඵලයක් හැටියට දිනා ගත්ත දෙයක්.

මට මතකයි, මේ මැතිවරණයට කලිනුත් ඒ අය අප මුණගැහෙන්න ඇවිල්ලා කාන්තාවන් හැටියට ඉල්ලීම් කළා, ඒ අයටත් ඒ අවස්ථාව ලබා දෙන්න කියලා. ඉතින් මම විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, ඒ වැරදි අවබෝධය දුරු කර ගන්න කියලා. ඒක ඒ අයට ලබා දුන් දඬුවමක් නොවෙයි, එය ඔවුන්ගේ ඉල්ලීමක් දිනා ගැනීමක්; ඒ අයගේ ජයග්‍රහණයක්.

කාන්තාවන් සහ දරුවන් සම්බන්ධයෙන් කථා කරනකොට අපරාධවලට ලක්වන කාන්තාවන් සම්බන්ධයෙනුත් අපට කථා කරන්න සිද්ධ වෙනවා. විශේෂයෙන්ම අපරාධවලට ලක්වන

දරුවන් මෙන්ම, අපරාධවලට චෝදනා ලබන දරුවනුත් ඉන්නවා. ජනාධිපතිතුමා අය වැය කථාව ආරම්භයේදීම කිව්වා, අපරාධවලට චෝදනා ලබන දරුවන් සිරකරුවන් සමඟ එකම බස් රථයේ ප්‍රවාහනය කරනවා, අපි ඒකටත් විසඳුමක් සොයනවා කියලා. ඇත්තටම මේවා තමයි අපි මේ පුරවැසි අය වැය මඟින් ආමන්ත්‍රණය කළ යුතු ගැටලු. අපි පැහැදිලිවම කියනවා, මෙවැනි අවදානම් සහිත දරුවන් හඳුනා ගැනීමේ ක්‍රමයක් අපි මේ යටතේ හඳුන්වා දී තිබෙනවා කියලා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමාරක්ෂක නිලධාරීන් සහ ප්‍රදේශයේ පරිවාස නිලධාරීන් එක්ක එකතුවෙලා පොලිස් ස්ථාන මඟින් එම දරුවන් හඳුනාගෙන, ඒ දරුවන් සම්බන්ධ වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරනවා. දෙමව්පියන්ගෙන් එහෙම නැත්නම් වැඩිහිටි භාරකාරත්වයෙන් අත්හැරුණු දරුවෝ ඉන්නවා නම්, ඒ අයට සුදුසු භාරකාරත්වයක් සපයා දීම සහ එසේ කළ නොහැකි විට දරුවාගේ උපරිම යහපත තකා ඒ දරුවා රජයේ සුදුසු ස්ථානයක ස්ථානගත කරවීමේ භාරකාරත්වය ලබා ගැනීමේ ඉතා ප්‍රශස්ත වැඩසටහනක් අපි ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම හැම තිස්සේම කාන්තා නිලධාරීන් පොලිස් ස්ථානයක සේවයේ යොදවන්න බලාපොරොත්තු වෙනවා. ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය Hotline Number 109 යටතේ ක්‍රියාත්මක වෙනවා. මේ හරහා ඕනෑම අවස්ථාවක පැමිණිලි කරන්න හැකියාව ලැබී තිබෙනවා. ඇයි, අපි සෑම පොලිස් ස්ථානයකම කාන්තා නිලධාරීන් ඉන්න ඕනෑ කියලා කියන්නේ? ඇත්තටම දැන් කාන්තා නිලධාරීන් පොලිස් ස්ථානවල සේවයේ යෙදී ඉන්නවා අඩුයි. ඒ කියන්නේ, පොලිස් නිලධාරිනියන්ගේ භිඟයක් තිබෙනවා. කාන්තාවකට පොලීසියකට ගිහිල්ලා කාන්තාවන්ටම සුවිශේෂී වූ ඇතැම් ගැටලු පිරිමි නිලධාරියෙකුට කියන්න අපහසුයි. එවැනි තත්ත්ව ඇතැම් ස්ථානවල සිදුවෙලාත් තිබෙනවා. පැමිණිල්ලක් කරන්න ගියාම පැමිණිල්ල ලියපු මහත්මයා ඒ පැමිණිල්ල ලියාගෙන telephone number එකත් ලියා ගන්නවා. ඊට පස්සේ හැන්දෑවේ ඒ කාන්තාවට කථා කරනවා. එහෙම නැත්නම් ගෙදරට එනවා. ඒ, ඇයි? කාන්තාව පොලීසියට යන්නේ තම පුරුෂයාට එරෙහිව නැත්නම් පුරුෂයාගේ හැරයෑමක් වැනි දෙයකට පැමිණිලි කරන්න වෙන්න පුළුවන්. ඒ වාගේ පැමිණිල්ලක් කරන්න කාන්තාවක් පොලීසියට ගියාම අර වාගේ දේවල් නිසා ඒ කාන්තාව නැවත අනාරක්ෂිත තත්ත්වයකට පත් වන එක වළක්වන්න අපි ක්‍රියා කරනවා. ඒ සඳහා කාන්තා නිලධාරීන් බඳවා ගන්නවා වාගේම, Hotline Number 109 ශක්තිමත් කරනවා.

ඒ වාගේම, දැනට පවතින ආකාරයට කාන්තා නිලධාරීන් පොලිස් ස්ථානයේ නොමැති අවස්ථා තිබෙනවා. අපි පසුගිය කාලයේම දැක්කා, ඇතැම් වෙලාවට එක් නිලධාරිනියක් තමයි පොලිස් ස්ථානයක රැඳී ඉන්නේ කියන එක. එකම නිලධාරිනිය රැඳී සිටින අවස්ථාවකදී අපි දන්නේ නැහැ, කොයි විධියේ දෙයක් ඒ ස්ථානයේ සිද්ධ වෙන්න පුළුවන්ද කියලා. පොලීසියේ ප්‍රධාන නිලධාරී මහත්මයා - OIC මහත්මයා - හිතනවා, අද පොලිස් ස්ථානයේ නිලධාරිනියක් ඉන්නවා, ඒ නිසා අනෙක් නිලධාරිනියන් වෙනත් කටයුතුවලට යොදවන්න හෝ ඔවුන්ට නිවාඩු දෙන්න හෝ පුළුවන් කියලා. අපි මෙහෙම හිතමු කෝ. ඒ, එකම නිලධාරිනිය ඉන්න වෙලාවේ ගරු අධිකරණයේ මහෙස්ත්‍රාත්තුමා නිවාඩු යනවා. ඊට පස්සේ මණ්ඩලයෙන් වැඩබලන මහෙස්ත්‍රාත්වරියක් පත් වෙනවා. ඒ ප්‍රදේශයේ හදිසි මරණයක් හෝ මිනී මැරුමක් සිද්ධ වුණාම වැඩබලන මහෙස්ත්‍රාත්වරිය ඒ මරණය හෝ මිනී මැරුම සිදු වුණු තැනට යන්න ඕනෑ. මරණයට පත් වූ කෙනාගේ දේහය ගඟක අත්තක එල්ලෙමින් හරි, ඇළක දොළක පාවෙවී හරි තියන්නට බැහැ. ඒ නිසා වහාම එතැනට යන්න ඕනෑ. එතකොට, කවුද එතැනට යවන්නේ? පොලිස් ස්ථානයේ සිටින අර එකම නිලධාරිනියට තමයි මහෙස්ත්‍රාත්තුමිය සමඟ එතැනට යන්න සිද්ධ වෙන්නේ. එහෙම වුණාම එම පොලිස් ස්ථානය තුළ කිසිම නිලධාරිනියක් නැති වෙනවා. එහෙම වෙලාවක ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වෙලා හෝ වෙනත් හදිසි තත්ත්වයක් ඇතිවෙලා පොලිස් නිලධාරිනියක් සොයාගෙන එන කාන්තාවකට පොලීසියට ඇවිල්ලා පැමිණිල්ල කරන්න නොහැකි වෙනවා. අන්න ඒ නිසායි අපි කියන්නේ, නිලධාරිනියන් යොදා ගන්නම අවශ්‍යයි කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair and HON. SPEAKER took the Chair.

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

පොලිස් ස්ථානයකට අවමය තුන්දෙනකු බැගින් වන ලෙස මේ වර්ෂයේ නිලධාරිනියන් 2,600ක් බඳවා ගැනීමට අපි යෝජනා කරලා තිබෙනවා. ඒ සඳහා ක්‍රියා කරමින් යනවා.

ඒ වාගේම කාන්තාවන් සහ ළමුන් අපරාධවලට ගොදුරු වීමෙන් පසු නැවත නැවතත් විඳිතභාවයට පත්වීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ පොලිස් ස්ථාන 604ක් තුළ කාන්තාවන් සහ ළමුන් සම්බන්ධ අපරාධ සොයා බැලීම වෙනුවෙන් වෙනම අංශයක් සහ වෙනම පිවිසුමක් ස්ථාපිත කරලා, ස්වාධීනව කටයුතු කිරීම ආරම්භ කරනවා. ඒ වාගේම වැදගත් දෙයක් ලෙස සියලු ළමා හා කාන්තා කාර්යාංශ ප්‍රතිසංවිධානය කර, ළමා හා කාන්තා කාර්යාංශ 604ක් පිහිටුවන්න අපි කටයුතු කරලා තිබෙනවා.

අපි කියන්නේ මෙන්න මේකයි ගරු සභාපතිතුමනි. වැදගත් වන්නේ අපරාධවලට දඬුවම් දීම කියන එකම නොවෙයි. අපරාධ සිද්ධ වෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුත් කිව්වා රටවල අපරාධ සිද්ධ වෙනවා කියලා. ඔව්, රටවල අපරාධ සිද්ධ වනවා. අපරාධ වැළැක්වීමට ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද, වැළැක්වීමට අවංකව වුවමනාවක් තිබෙනවාද කියා අපෙන් ඇහුවා. අපි කියනවා, ඔව්, අපට තිබෙනවා අවංක වුවමනාවක්. ඒවාට අදාළ කාගේවත් අක්මුල් අපට ගැවිලා නැහැ. වෙනත් ව්‍යාපාර හෝ ඔය කියන පාතාලය හෝ -ඒ කවුරුවත්- රකින්න අපට අවශ්‍ය නැහැ. රකින්න කිසි කෙනෙක් නැති අපි අපරාධ වළක්වන්න ක්‍රියා කරනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලාට මතක ඇති කුරාම ෂයික් ඝාතනය. ඒ ඝාතනය කළ තංගල්ලේ ඒ ප්‍රාදේශීය දේශපාලනඥයා, ඒ අවස්ථාවේ කුරාම ෂයික්ගේ පෙම්වතිය දූෂණය කළා. මේ බරපතළ අපරාධය සිද්ධ වුණාට පස්සේ අපේ රටේ මව්වරුන් භය වුණා තරුණ දියණිවරු අරගෙන විනෝද චාරිකා යන්න; හෝටල්වල නවතින්න. අපි එහෙම යුගයක් පසු කළා. ඇයි? දේශපාලන රැකවරණ තිබුණා ඒ සැකකරුවන්ට. දේශපාලන රැකවරණ ලැබූ සැකකරුවන් හිටපු කාලය අපි දැන් නිමා කරලා තිබෙනවා ගරු සභාපතිතුමනි. තවදුරටත් ඒ දේවල් සිද්ධ වෙන්නේ නැහැ.

[ගරු තුෂාරි ජයසිංහ මහත්මිය]

අපෙන් ඇහුවා මේ ආණ්ඩුව කරගෙන යන්න තිබෙන නිපුණතාව ගැන. ඔව්, අපි නිපුණතාව සහිත පිරිසක්, වෘත්තීයමයභාවය සහිත පිරිසක් විධියට තමයි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පත් වෙලා සිටින්නේ. පළපුරුද්ද තිබෙනවා, නිපුණතාව තිබෙනවා. අපි ඒ අනුව කටයුතු කරනවා, අනිවාර්යයෙන්ම අපි ඒ කටයුතු කරනවා කියන ප්‍රකාශය කරමින් මම කතාව අවසන් කරනවා.

ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මේජර් ජෙනරාල් අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක් තිබෙනවා.

[අ.භා. 4.55]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
ගරු සභාපතිතුමනි, ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කරුණු කාරණා රාශියක් උදේ වරුවේ මම ගෙනහැර දැක්වූවා. විශේෂයෙන් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙනුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් විවිධ අදහස් පළ වුණා.

[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]
[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]
[At this stage, Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]

අපට සිටින්නේ මේ ආසියාවේ අත්දැකීම්වලින් බහුල, විනයගරුක සහ වෘත්තීයමය මට්ටමින් උසස් හමුදාවක්. මමත් යුද හමුදාවේ අවුරුදු 35කට ආසන්න කාලයක් සේවය කළා. ඒ නිසා මම දන්නවා එහි වෘත්තීය මට්ටම, හැකියාව සහ විශිෂ්ටත්වය ගැන. ඒ නිසා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිම සැකයක් තියා ගන්න එපා. අපි ඒ පිළිබඳව සියයට 100ක් මේ සභාවට සහතික වෙනවා. ඒක අනිවාර්යයි; විශේෂයි. විශිෂ්ටම හමුදාවක් අප සතුව සිටින්නේ. හමුදාවක විශිෂ්ටත්වය, වෘත්තීයභාවය, එහෙම නැත්නම් professionalism මනින්නේ බල සංඛ්‍යාවෙන් නොවෙයි. විශිෂ්ටත්වයෙන් සහ වෘත්තීය මට්ටමෙන් උසස් හමුදාවක් කියන්නේ, නවීන විද්‍යාව, තාක්ෂණය, නවෝත්පාදනය වාගේම ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධනය තුළින් කටයුතු කරන හමුදාවක්. අවශ්‍ය සියලු නවීන දේ අන්තර්ගත කරගෙන, ජාතික ආරක්ෂාව පිළිබඳ දැනුම ඒකාබද්ධ කරගනිමින් ආරක්ෂක අංශයේ විශිෂ්ටත්වය ඉහළ නැංවීම තමයි රජයක් හැටියට අපේ බලාපොරොත්තුව.

ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මුදල් වෙන් කර තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන ඒ ඒ ආයතනවලට නිසියාකාරව යොමු කිරීම සඳහායි.

අද උදේ ඉඳලා අදහස් කිහිපයක් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත් වුණා. විශේෂයෙන් ජාතික ආරක්ෂක උපදේශක තනතුර පිළිබඳව අදහස් ඉදිරිපත් වුණා. අපේ ප්‍රතිපත්ති මාලාවේත් විශේෂයෙන්ම දක්වා තිබෙනවා, ජාතික ආරක්ෂක උපදේශක මණ්ඩලයක් අපි ස්ථාපිත කරනවා කියලා. ඉදිරියේදී අපි ඒ කටයුතු කරනවා, පනතක් හැටියටත් ගෙනැල්ලා. මොකද, ඒක අත්‍යවශ්‍ය කාරණයක්.

ඒ වාගේම, රාජ්‍ය බුද්ධි සේවාව සම්බන්ධවත් කරුණු ගෙනහැර දැක්වූවා. පසුගිය ජනාධිපතිවරණයෙන් පස්සේ අරුගම්බේ ඇති වෙච්ච සිද්ධියේදී ඒ අවශ්‍ය කටයුතු ඉතාම විශ්වසනීය ලෙස, උසස් මට්ටමින් අපි කළමනාකරණය කළා. ඒකෙන්ම තේරෙනවා අපේ රාජ්‍ය බුද්ධි සේවාව කොයි තරම් විශිෂ්ට එකක්ද කියලා. හමුදා තුනේම බුද්ධි සේවා එකතු වෙලා ඒ කරන ලද කර්තව්‍යය විශේෂිතයි. ඒ නිසා රාජ්‍ය බුද්ධි සේවාව එහෙම නැත්නම් ජාතික බුද්ධි සේවාව විසින් විශිෂ්ට දායකත්වයක් ලබා දෙනවා, අපේ ජාතික ආරක්ෂාවට.

ඒ වාගේම, cyber security පිළිබඳවත් අපේ ගරු මන්ත්‍රීතුමා කරුණු ගෙනහැර දැක්වූවා. විශේෂයෙන් cyber security පිළිබඳ පනත අපි ඉදිරියේදී ගෙන එන්න බලාපොරොත්තු වෙනවා. අපේ Digital Economy Ministry එකෙන් Cyber security Act එක ඉදිරියේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ජාතික ආරක්ෂාව පිළිබඳ කාරණයේදී අවශ්‍යතාව අනුව අපි ඒක පිළිපදිනවා.

ඒ එක්කම, ආපදා කළමනාකරණය පිළිබඳවත් කරුණු කාරණා ගෙනහැර දැක්වූවා. අපට අවශ්‍යතාවක්ව තිබුණු ජාතික ආපදා කළමනාකරණ කවුන්සලය 2018න් පස්සේ කැඳවා නැහැ. ඒ නිසා අපි ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික ආපදා කළමනාකරණ කවුන්සලය කැඳවලා ඉදිරියේදී ආපදා කළමනාකරණ ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ කාරණයත් මේ වෙලාවේ අපි ගෙනහැර දක්වන්න ඕනෑ.

අපට තිබෙන්නේ මහා සාගර කලාපයක්. ලෝකයේ ඉතා හොඳ ස්ථානයකයි අපේ රට පිහිටා තිබෙන්නේ. අපේ අනන්‍ය ආර්ථික කලාපය ඇතුළේ තිබෙන සියලු සාගර සම්පත්, වටිනා සාගර සම්පත් මෙන්ම සාගර පරිසරය ආරක්ෂා කිරීමට උදේ, දවල්, රෑ නාවික හමුදාව විශේෂ කාර්යභාරයක් ඉටු කරනවා. නාවික හමුදාව ඉතාම අන්තරාදායක ලෙස මෙහෙයුම් දියත් කරනවා, උතුරු මුහුදේ නීති විරෝධී මසුන් ඇල්ලීම් සම්බන්ධයෙන්. ඒ සඳහා කටයුතු කිරීමට නාවික හමුදාවට තිබෙන යාත්‍රා, උපකරණ ඉතා පැරණියි. අපේ අධිතාක්ෂණය ඇතුළත් කරලා ඒ යාත්‍රා නවීකරණය කරන්න තිබෙනවා. සමුද්‍ර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහාත් නාවික හමුදාව විශේෂයෙන් දායක වෙනවා. ඒ නිසා නාවික හමුදාවට දැනට තිබෙන ආම්පන්න, උපකරණ, ඒ යන්ත්‍රණය නවීකරණය කරලා, නවීන ක්‍රමයක් අපි ඉදිරියේදී ආරම්භ කරන්න සාකච්ඡා කරලා තිබෙනවා. ඒ සඳහා විශේෂ වියදමකුත් යනවා.

අපේ සාගර කලාපයයේ, ගොඩබිමේ සහ පියාසර කලාපයේ ආරක්ෂාවට විශේෂ දායකත්වයක් දක්වනවා ගුවන් හමුදාව. ගුවන් හමුදාවේ තිබෙන යානා සහ හෙලිකොප්ටර් ගොඩක් පරණයි. ඒවා නවීකරණය කරන්නත් විශාල මුදලක් වැය වෙනවා. භූමිය, සාගරය, අහස කියන ඒ තුනම ඒකාබද්ධ කරගෙන විශේෂ වැඩසටහනක් ඉදිරියේදී ආරම්භ කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒකටත් විශාල මුදලක් අවශ්‍ය වෙනවා.

ඒ වාගේම වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව මහ මුහුදේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ දායකත්වයක් ලබා දෙන නිසා ඒ කෙරෙහිත් අපි විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. ඒකෙනුත් විශාල වැඩ කටයුතු රාශියක් කරනවා. නව

තර්ජන හමුවේ ජාත්‍යන්තරයේ ආරක්ෂාව, මේ කලාපයේ ආරක්ෂාව හරහා ලෝක සාමය සඳහා අපේ ත්‍රිවිධ හමුදාව කටයුතු කරනවා. ඒ සඳහා අපේ හමුදා නවීකරණය කිරීම තමයි අපේ බලාපොරොත්තුව. ඔබතුමන්ලා දන්නවා, පසුගිය දශක දෙකක කාලය තුළ අසම්මතික, සාම්ප්‍රදායික නොවන තර්ජනවලට අපි නිතරම මුහුණ දුන් බව. ඒවාට මුහුණ දෙන්න ව්‍යක්තීය මට්ටමින් ඉතා උසස්, විශිෂ්ටත්වයෙන් උසස්, දැනුමෙන් උසස්, ශක්තිමත් ත්‍රිවිධ හමුදාවක් අපට අවශ්‍යයි.

ඒ වෙනුවෙන් අපි විශේෂ වැඩ කටයුතු රාශියක් සැලසුම් කරලා තිබෙනවා. ඒ අනුව අපේ රටේ සමාජ හා ආර්ථික ක්‍රියාකාරකම් සඳහා නිපුණතා, නවීන තාක්ෂණය වර්ධනය සඳහා අපි කටයුතු කරනවා. ජාතික ආරක්ෂාවට බලපෑමක් නොවන විධියට අපේ සමාජ හා ආර්ථික අරමුණු ඉටු කිරීමට දායකත්වය ලබා දීමේ වගකීම ආරක්ෂක අමාත්‍යාංශය සතු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි Clean Sri Lanka කියන වැඩසටහනේ කාර්ය සාධක බලකායේ උඩින්ම ත්‍රිවිධ හමුදාව ඉන්නේ. ගරු සභාපතිතුමනි, Clean Sri Lanka වැඩසටහනට අදාළව විශාල මෙහෙවරක් කිරීමට විශේෂයෙන් යුද, ගුවන්, නාවික සහ සිවිල් ආරක්ෂක බලඇණිය ඇතුළුව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන ඒ ආයතන 25ටම වගකීම් රාශියක් දීලා තිබෙනවා. Clean Sri Lanka වැඩ පිළිවෙළ යටතේ විශේෂිත වූ වැඩසටහන් රාශියකට එම ආයතන දායක වෙනවා. විශේෂයෙන්ම පාසල් දියුණු කිරීම ඒවායෙන් එකක්. එය මේ සමාජයට කරන ලොකු මෙහෙවරක්. Clean Sri Lanka වැඩසටහනට ත්‍රිවිධ හමුදාවේ ලොකු දායකත්වයක් ලැබෙනවා.

අපේ ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය -National Hydrographic Office- ගිවිසුමක් අත්සන් කළා. ශ්‍රී ලංකාව ලෝකයේ පවතින කාර්ය බහුල මුහුදු ගමන් මාර්ගයක ඉතාම ආසන්නයේ පිහිටි ස්ථානයක්. වසරකට නැව් 40,000ක් පමණ අපේ මුහුදු මාර්ගයේ ගමන් කරනවා. ඒ නිසා ඒකට අවශ්‍ය ඉලෙක්ට්‍රෝනික නාවික සිතියම් නිෂ්පාදනය කිරීම ජාතික ජලශාස්ත්‍රීය ඒකකය විසින් කරනු ලබනවා. අපේ මුහුදු ගමන් මාර්ගය හරහා යන නැව්වලට electronic navigational charts විකිණීමෙන් විශාල මුදලක් ලබා ගන්න අපට පුළුවන්. ඒ National Hydrographic Office එක තවත් සංවර්ධනය කිරීම සඳහා අපට විශාල මුදලක් වැය කරන්න වෙනවා. අපි ඒ ගැනත් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

අපේ ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් ලක්ෂ 2කට වඩා අඩු ප්‍රමාණයක් ඉන්නේ. අපේ උතුරු නැගෙනහිර නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් ඒ පිළිබඳ අදහස් කිහිපයක් ඉදිරිපත් වුණා. නමුත්, ඉතාම අඩු ප්‍රමාණයක් තමයි එම පළාත්වල යොදවා තිබෙන්නේ. ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලා අවශ්‍ය කටයුතු කරනවා. අත්‍යවශ්‍ය ස්ථානවල අපේ යුද හමුදාව රඳවාගෙන ඉතිරි පිරිස අනෙක් අවශ්‍ය ස්ථානවලට යොමු කරන්න කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වේලාව දුන්නාට ඔබතුමාට ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 10 minutes.

[5.06 p.m.]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Chairman, today, as we discuss the Votes of the Ministry of Defence at the Committee Stage Discussion of the Appropriation Bill, still, there are serious issues with regard to accountability within this country. I am glad that the Hon. President is also in the House when I speak. On the accountability front - Hon. President, this is related to the Ministry of Defence as well - we still have not seen anything progressive or received any comments from the Government. Whether you all are going to continue with a domestic process or go for an international process and whether there is going to be any accountability in this country still remain a huge question. So, since you are in this House, Hon. President, I would like if you could clarify that in your speech.

In addition to that, ජනාධිපතිතුමනි, Tripoli platoon එක හරහා සිදු වෙච්ච ඝාතන පිළිබඳව විශේෂ ප්‍රකාශ කිහිපයක්ම මම පසුගිය කාලයේ දිගින් දිගටම මේ පාර්ලිමේන්තුව තුළ සිදු කළා. Tripoli platoon එක හරහා සිදු කළ ඒ දේවල් පිළිබඳව අදටත් කිසිදු පරීක්ෂණයක් පටන් ගෙන නැහැ. රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරීන් ඒ හා සම්බන්ධව ක්‍රියා කළා කියන එක ඉතා පැහැදිලිව අපි කියලා තිබෙනවා. පසුගිය සතියට පෙර සිදු වූ ගනේමුල්ල සංජීවගේ ඝාතනයත් එක්ක මේ සාක්ෂිකරුවන් විශාල පිරිසක් අපට විශාල ලෙස බලපෑම් කරනවා, "මේ සාක්ෂි තොරතුරු ඔබතුමන්ලාට දීලා, ඔබතුමන්ලා ඒවා පාර්ලිමේන්තුවේ හෙළි කරලා, ඊළඟට අපටත් මේක ද වෙන්නේ?" කියලා.

ඕනෑ නම් මම තව කාරණයක් දැන් කියන්නම්. 2009 කාලයෙන් පස්සේ -යුද්ධයෙන් පස්සේ- මැණික් ෆාම්වල හිටපු තරුණයන් 27දෙනෙක් කාත්තන්කුඩිවලට ගෙනැල්ලා කාත්තන්කුඩිවලදී ඝාතනය කරලා මුහුදට දැම්මා කියලා, ඒකට සම්බන්ධ වෙච්ච බුද්ධි අංශයේ එවකට හිටපු van driver කෙනෙකුගේ සාක්ෂියක් - වීඩියෝ එකක් - මගේ mobile phone එකේ දැන් තිබෙනවා. මේවා පිළිබඳව ප්‍රශ්න කරන්නේ නැත්තේ ඇයි? මේ ආණ්ඩුව පසුගිය කාලයේ නිබුණු කුමන්ත්‍රණකරුවන්ගේ කල්ලිවලට භය වෙලා ද ඉන්නේ? මේ ආණ්ඩුව මේවා වසන් කරන්න උත්සාහ කරනවා ද? අපට ඒ ගැන පැහැදිලි සැකයක් ඇති වෙනවා. පාස්කු ප්‍රහාරය පිළිබඳ පරීක්ෂණ කරගෙන යනවා කියලා එක පැත්තකින් කියනවා. ඒ පරීක්ෂණ හොඳින් සිදු වෙනවා නම් අපට සතුටුයි. නමුත් මේ වනතුරු කිසිදු පුද්ගලයෙකුගෙන්වත් එක ප්‍රකාශයක්වත් සටහන් කරගෙන නැති බව මම ඉතා පැහැදිලිව වගකීමෙන් කියනවා, ගරු ජනාධිපතිතුමනි. Accountability පැත්තෙන් ගත්තාම විශාල ප්‍රශ්නයක් තිබෙනවා. TRC එක ගේනවා ද, නැත්නම් රට තුළ අතුරුදන් වෙච්ච පුද්ගලයන් සම්බන්ධයෙන් මොනවා හරි ක්‍රියාමාර්ගයක් ගන්නවා ද, එහෙම නැත්නම් ඒ කරපු ඝාතන ගැන පරීක්ෂණ පවත්වනවා ද? ඒ කිසිම දෙයක් නැහැ. ජනාධිපතිතුමාට විශේෂ mandate එකක් මේ පාර උතුරේ ජනතාව දුන්නා. මඩකලපුව දිස්ත්‍රික්කයේ නම් mandate එකක් දුන්නේ නැහැ. මටයි ඒක දුන්නේ. උතුරේ ජනතාව ජනාධිපතිතුමාට mandate එකක් දුන්නා. මේවා ගැන හොයා බලන්න තමයි ජනාධිපතිතුමාට ඒ mandate එක දුන්නේ.

මේ පාර Defence Ministry එකේ වැය ශීර්ෂයට අදාළ සංඛ්‍යාලේඛන අනුව බලන කොට විශාල ගැටලුවක් තිබෙන බව පෙනෙනවා. මේ අවුරුද්දේ රුපියල් බිලියන 135ක මුදලක් defence sector budgetary line එකේ තිබෙනවා. මම හිතන විධියට diets and uniformsවලට රුපියල් බිලියන 135ක මුදලක් මේ අවුරුද්දේ වෙන් වෙලා තිබෙනවා. ඒක 2023 අවුරුද්දේ රුපියල් බිලියන 70යි; 2024දී රුපියල් බිලියන 101යි; 2025දී රුපියල් බිලියන 135යි. මේ අවුරුද්දේ සියයට 33කින් වැඩි වෙලා තිබෙනවා, diets and uniforms සඳහා. පසුගිය කාලයේ ඔබතුමාත් විපක්ෂයේ ඉන්න කොට විපක්ෂයේ අපි කිව්වා ශවේන්ද්‍ර සිල්වා uniforms මහන්න ගෙනාවේ, ප්‍රංශයේ ඉඳන්

[ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් මහතා]

කියලා. Minister of Defence හැටියට ඔබතුමා එහි ඇත්ත තත්ත්වය අපට දැන් කියන්න. මොකක්ද මේ budgetary line එකේ තිබෙන්නේ? එහෙම නැත්නම් defence වියදම් ගැන කියන කථා ඇත්ත ද, බොරු ද කියන එක රටේ ජනතාවට පැහැදිලි කරන්න.

අපි පසුගිය කාලයේ දිගින් දිගටම කිව්වා, ලංකාව වැනි කුඩා රටක් තුළ defence වියදම් පාලනය කර ගන්නේ නැතිව මේ ආර්ථිකය හදන්න අමාරුයි කියලා. ගෝඨාභය රාජපක්ෂගේ කාලයේ අපි දැක්කා, හමුදාවේ කටිටිය දාලා බිල්ඩින් හදනවා, අනම් මනම් කරනවා. දැන් මේ ආණ්ඩුවත් Clean Sri Lanka වැඩසටහන යටතේ පාසල් 1,000ක් හදන්න, මේස, පුටු, බංකු හදන්න Sri Lanka Army එක භාවිත කරනවා. මේස, පුටු, බංකු හදන්න Sri Lanka Army එක භාවිත කරනවා ද? ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියා තිබෙනවා, ක්‍රමානුකූලව අපේ රටේ හමුදාව හදනවා කියලා. හැබැයි, දැනටත් ඒ කණ්ඩායම් මේස, පුටු, බංකු හදන්න භාවිත කරනවා. විශේෂයෙන්ම පසුගිය Ministerial Consultative Committee on Defenceහිදීත් අපි කිව්වා, උතුර සහ නැඟෙනහිර තිබෙන Army, Navy, Air Force camps සඳහා පාසල්, markets වැනි දේවල් සඳහා යොදා ගත්තු තැන් දැනටත් තිබෙනවා කියලා. එවැනි තැන් දැනටත් Sri Lanka Air Force එක භාරයේ තිබෙනවා; Sri Lanka Navy එක භාරයේ තිබෙනවා. ඒවා නිදහස් කරනවා කියලා පසුගිය සතියේ මම පාර්ලිමේන්තුවේ කිව්වාම, අපේ හිතවත් ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා කිව්වා, ඔබතුමා නිදහස් කළා කියපු අක්කර 7ක ඉඩමවත් තවම නිදහස් වෙලා නැහැ කියලා. මෙවන් තත්ත්වයක් තුළ ඔබතුමාට දීලා තිබෙන mandate එක තේරුම් අරගෙන, ඔබතුමා මේ වගකීම අරගෙන අපට සාධාරණයක් ඉෂ්ට කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා, ගරු ජනාධිපතිතුමනි.

මම මේ කාරණයත් අහන්න ඕනෑ. ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 194හි සඳහන් වෙනවා, වහාම අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනැල්ලා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියලා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා විතරක් නොවෙයි, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වහාම ගේනවා කියලාත් කිව්වා. හැබැයි, මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන එක ගැන අද වනකල් අපට කතිකාවක් දකින්න නැහැ. ආණ්ඩුවේ ජනප්‍රියභාවය තිබෙන කොට මේ දේවල් කරන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාගේ ජනප්‍රියභාවය තිබෙන විට මේවා කරන්න ඕනෑ. එහෙම නැතිව කල් දාන්න, කල් දාන්න මේවා කරන්න පුළුවන් වැඩ නොවෙයි. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන අපේ සභානායකතුමාගෙන් අපට දැනගන්න ලැබුණේ, සජිත් ප්‍රේමදාස මහත්මයාගේ නම permanent විපක්ෂ නායක හැටියට දමනවා කියන එක විතරයි. දැනට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් අපට දැනගන්න තිබෙන්නේ එච්චරයි. වෙන මොකුත් අපි දන්නේ නැහැ. එච්චරයි කියලා තිබෙන්නේ. ගරු ජනාධිපතිතුමනි, මේ පිළිබඳව ඉතා වගකීමෙන් ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

මේ කාරණය නම් මම දන්නේ නැහැ, ඔබතුමාට පුළුවන් නම් මේ ගැන පැහැදිලි කරන්න. බුද්ධි අංශයේ colonel rank එකෙන් උඩ ඉන්න සියලුදෙනාම ඉවත් කරලා තිබෙනවා කියලා පොඩි නිවුස් එකක් යනවා. දැනට ඒ බුද්ධි අංශයේ ඉහළ පෙළේ කටිටිය මෙහෙයවන්නේ මැතිවරණ සමයේදී NPP එකට උදව් කරපු බුද්ධි අංශයේ නිලධාරියෙක් කියලා ලොකු කතිකාවක් යනවා. මේ පිළිබඳවත් ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා. එහෙම නැත්නම් සාමාන්‍ය විධියට, "මේක රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක්, ඒ නිසා පිළිතුරු දෙන්න බැහැ" කිව්වත් එකයි. අපට අහලා, අහලා දැන් ඒවා පුරුදුයිනේ.

මට සමහර වෙලාවට ජනාධිපතිතුමා ගැන දුකත් හිතෙනවා. මොකද, ජනාධිපතිතුමා ලංකාව වටේ ගිහින්, විශාල මෙහෙවරක් කරලා, ජන මතයක් අරගෙන, තුනෙන් දෙකක බලයකුත් මේ පාර්ලිමේන්තුවට අරගෙන දුන්නා. හැබැයි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න සමහර ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාකලාපය බලද්දී ජනාධිපතිතුමා පව් කියලා හිතෙනවා. ජනාධිපතිතුමා රැට පැලවත්තේ ඉන්නකොට ඔළුවේ අත තියාගෙන ඉන්නවා ඇති සමහර වෙලාවට, අනේ, මොකක්ද මම මේ කරන්නේ කියලා. මොකද, සමහර අයගේ කථා එහෙම තමයි. අපේ සභානායකතුමා කිව්වා, පාර්ලිමේන්තුවේ quality එක up කරනවා කියලා. සභානායකතුමනි, පාර්ලිමේන්තුවේ quality එක up කරනවා කියන්නේ, මම දැක්කා ඊයේ කියපු කථාවක්. වෙන ඇමති කෙනෙක් නම් කමක් නැහැ, රටේ නීතිය පිළිබඳ ඇමති කියනවා කක්කුස්සි වළේ ඉන්න කෙනා මී පැණිවල මොකක්ද එකක් දන්නවාද කියලා. මට නම් පෙනෙන්නේ ජනාධිපතිතුමා මී වදයක් කඩාගෙන ඇවිල්ලා කක්කුස්සි වළට දීලා තිබෙන්නේ. කක්කුස්සි වළේ අසූචි කනවාද, මී පැණි කනවාද කියලා දන්නේ නැති මිනිස්සු කක්කුස්සි වළේ ඉඳගෙන කථා කියනවා. ඉතින්, පාර්ලිමේන්තුවේ quality එක up කරනවා කියන්නේ මෙකද කියලා ඉතා පැහැදිලිව අපට අහන්න වෙනවා. ඒක නිසායි ජනාධිපතිතුමා ඇත්තටම පව් කියලා මම කියන්නේ. පසුගිය මැතිවරණ කාලයේ කියපු දේවලුයි, දැන් සිදුවන දේවලුයි බැලුවාම එහෙම හිතෙනවා.

උගන්ඩාවේ හංගපු සල්ලි ගේනවා කියලා එදා කිව්වා. VFS ගනුදෙනුව ගැන මේ වෙනකල් මොනවා හෝ ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද? පාස්පෝට් ගනුදෙනුව ගැන මොනවා හෝ ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද? සීනි බදු වංචාව ගැන ඔබතුමා තමයි මෙතැන ඉඳගෙන මතු කළේ. ඒ ගැන යම් ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද? පොල්තෙල් වංචාව ගැන මොනවා හෝ ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද? ඇවන්ට්ගාඩ් සම්බන්ධව මොනවා හෝ ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද? අපට ඇවන්ට්ගාඩ් එක පිළිබඳවත් ගොඩක් තොරතුරු එනවා මේ දවස්වල. ඒවා අපි ඉදිරියේදී හෙළි කරන්නම්. Bond scam එක ගැන අපි කලින් ඉඳලාම දන්නවා, Extradition Law එක අනුව එයා ගෙන්වන්න බැහැ කියලා. නමුත්, අපි ටක් ගාලා ගේනවා කිව්වා. දැන් කියනවා, Extradition Law එක යටතේ ගෙන්වන්න බැහැ කියලා. ඉතින්, ජනතාව හොරු අල්ලන්න දුන්න mandate එක අනුව හොරු අල්ලනවාද, නැද්ද කියන එක පිළිබඳව අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, රටේ Minister of Justice and National Integration කියනවා, Independent Prosecutor's Office එකක් ස්ථාපනය කරනවා කියලා. හැබැයි, විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා ජිනීවා නගරයට ගිහිල්ලා ඒ ගැන accountability පැත්තෙන් කථා කරන්න ඕනෑ තැන වචනයක්වත් කියන්නේ නැහැ. එතුමා ආපසු ලංකාවට එනවා. එතැනින් එහාට ගියාම, "ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන්න ඕනෑ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම හැර, ඒක replace කරන්න පනතක් ගෙනෙන්න අපි කිසිසේත්ම එකඟ නැහැ" කිව්වා. දැන් නීතිය පිළිබඳ ඇමතිතුමා කියනවා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට අලුත් පනතක් ගෙනෙන්න කැබිනට් අනුමැතිය ලැබිලා තිබෙනවා කියලා. ඉතින් දේශපාලන වේදිකාවල කියපු ඒවායි, දැන් සිදුවන ඒවායි ගත්තාම, ඒවා පරස්පර විරෝධියි.

ඒ වාගේම ජනාධිපතිතුමනි, ඔබතුමා මුදල් ඇමතිතුමා වශයෙන් කටයුතු කරනවා. මම දිගින් දිගටම මේ කාරණය මේ සභාවේ මතු කළා. පසුගිය කාලයේ රුපියල් බිලියන 966ක් බදු සහන දුන්නා. IMF එකත් ඒකට විරුද්ධයි. රුපියල් බිලියන 966ක් බදු සහන දුන් ඒවා ඇයි මේ ආණ්ඩුව ආපසු අය කරගත්තේ නැත්තේ? දැන් 2025ත් ඒ රුපියල් බිලියන 966ක බදු සහනය දෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir.

කෝටිපති ව්‍යාපාරිකයන්ට රුපියල් බිලියන 966ක බදු සහන මේ ආණ්ඩුවෙනුත් දෙනවා. හැබැයි, පොඩි මිනිහාට තවදුරටත් බදු පටවනවා.

ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා කෙරෙහි රටේ ජනතාව තවම විශ්වාසය තබාගෙන ඉන්නවා. ඔබතුමා කඩාගෙන ආපු මී වදය කක්කුස්සි වළේ ඉන්න සමහර ඇමතිවරු, මන්ත්‍රීවරු හරියට කන්න දන්නේ නැහැ. ඒ නිසා කරුණාකර, මේ ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට ඔබතුමාගේ නම කෙළෙසන්න එපා කියලා tuition class එකකුත් පවත්වන්න කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Nalin Bandara Jayamaha. You have 20 minutes.

[අ.භා. 5.16]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි, මම සතුටු වෙනවා, ගරු ජනාධිපතිතුමා - ආරක්ෂක ඇමතිතුමා - මේ සභාවේ ඉන්න වෙලාවක අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන.

ගරු ජනාධිපතිතුමනි, විශේෂයෙන්ම වර්තමානයේ අපේ ජාතික ආරක්ෂාව, ඒ වාගේම රටේ නීතිය හා සාමය පිළිබඳව කථා කරද්දී අපට පොලීසිය ගැන වැඩි අවධානයක් යොමු කරන්න සිදු වෙලා තිබෙනවා. පසුගිය දිනවල අපි දැක්කා, පාතාලය ඔළුව උස්සලා තිබෙනවා. මහ දවල් අධිකරණය ඇතුළේ, මහ පාරේ අහිංසක මිනිස්සු ඉන්න තැන්වල කුඩා දරුවන් පවා ඝාතනය වුණු අවස්ථා, පුද්ගලයෙකුට විශ්වාසයෙන් අධිකරණය තුළට ගිහිල්ලා අධිකරණ කටයුත්තකට සහභාගි වෙන්න බැරි අවස්ථා අපි දැක්කා.

මෙහෙම වෙන්න හේතුව ආණ්ඩුවයි කියලා මම ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. නමුත් ආණ්ඩුවටත් වගකීමක් තිබෙනවා. මම 2013 තමයි මේ පාර්ලිමේන්තුවට ආවේ. අපි විපක්ෂයේ ඉද්දී ඔබතුමා මේවා විවේචනය කරපු විධිය, ඔබතුමා මේවා දැකපු විධිය අපට මතකයි. ඒ නිසා විශේෂයෙන්ම පොලීසිය ස්වාධීන විය යුතුයි කියන එක ඔබතුමාත්, අපිත් -කවුරුත්- පිළිගන්න කාරණයක්. හැබැයි, පසුගිය ටිකේ පොලීසියේ විශාල පිරිසක් ස්ථාන මාරුවීම් වුණා. මේ ස්ථාන මාරුවීම් මෙම සිදුවීම්වලට යම් මට්ටමකට බලපෑවාද කියලා මට සැකයක් තිබෙනවා. ඒකට හේතුව තමයි මේ ස්ථාන මාරුවීම් බහුතරයක් නිවැරදි ක්‍රමයට, නිසි ක්‍රමයට වෙච්ච දේවල් නොවීම. ඒ පොලිස් නිලධාරීන් මාරු කරන්න සාධාරණ හේතුවක් තිබුණේ නැහැ. Special unit එකක් දමලා බුද්ධි තොරතුරු මත මාරු කළා කියනවා. හැබැයි, charge sheet එකක්වත් නැතිව තමයි බහුතරයක් ස්ථානාධිපතිවරු මාරු වුණේ. සමහර ස්ථානාධිපතිවරු පිළිබඳව ඔහුගේ උසස් නිලධාරියා වන ASP මහත්මයා, නැත්නම් ඊළඟට ඉන්න උසස් නිලධාරියා වන SSP හෝ SP හොඳ recommendations දීලා තිබෙනවා; DIG හොඳ recommendations දීලා තිබෙනවා. නමුත් ඉල්ලීම මත - ඒක රජයේ ඉල්ලීමක් වෙන්න පුළුවන්, පොලිස් ඇමතිවරයාගේ ඉල්ලීමක් වෙන්න පුළුවන්, වැඩ බලන පොලිස්පතිවරයාගේ ඉල්ලීම මත වෙන්න පුළුවන් - මේ දේ වෙලා තිබෙනවා. එතැනින් එහා යම් recommendation එකක් මත තමයි ගොඩක් අය මාරු වෙලා තිබුණේ.

පොලිස් නිලධාරීන්ට ඔවුන්ගේ සේවය පිළිබඳව තෘප්තියක් තිබුණේ නැහැ. ඔවුන් motivate කළේ නැහැ. ඒ වෙනුවට පාතාලය motivate වුණා. ඔවුන් භය නැතිව ඉදිරියට ඇවිත් ඔවුන්ගේ අනෙක් කල්ලිත් එක්ක තිබුණු ගැටුම් වැඩි කරගත්තා. ඒ නිසා මේ ස්ථාන මාරුවීම් පිළිබඳ බරපතළ ගැටලුවක් තිබෙනවා. පොලිස් නිලධාරීන් මාරු කිරීමට යොදා ගත්ත ක්‍රමය අපි දැක්කා. සමහර පොලිස් නිලධාරීන්ට දමලා තිබෙනවා, ඔවුන් raid කරන්න ගිහින් නැහැ, එහෙම නැත්නම් ඔවුන් සෘජුවම සමහර රාජකාරිවලට සම්බන්ධ වුණේ නැහැ කියලා. මම හිතන විධියට පොලිස් ස්ථානාධිපතිවරුන්ට raid කරන්න යන්න විධියක් නැහැ. එහෙම නැත්නම් සිතාසි දෙන්න යන්න විධියක් නැහැ. ඒ වාගේ බොහොම ප්‍රාථමික කරුණු කාරණා පදනම් කරගෙන තමයි පොලිස් නිලධාරීන් මාරු කරලා තිබුණේ. ඒ නිසා පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ confidence එක නැතිවීම හරහා පාතාලයේ confidence එක වැඩි වුණා කියන එක තමයි අපේ විශ්වාසය.

ඒ වාගේම ඔබතුමා STF ගැන දන්නවා. පොලිස් ස්ථානාධිපතිවරු යම් මට්ටමකට හෝ දේශපාලනඥයන් සමඟ සම්බන්ධ වෙනවා; ගැටෙනවා; මහජන නියෝජිතයොත් එක්ක කථා කරනවා. හැබැයි, STF එක ඊට එහා තැනක්. STF එක දේශපාලනඥයන් සමඟ සම්බන්ධ වෙනවා ඉතාම අඩුයි. මම දන්න විධියට සම්බන්ධ වෙනවා ඉතාම අඩුයි. හැබැයි, STF එකේ අයත් විශාල වශයෙන් ස්ථාන මාරු කරලා, ඒ නිලධාරීන් එහාට මෙහාට විසි කරලා, STF එකත් සීසීකඩ දැමීම පාතාලයේ හිස එසවීමට බරපතළ විධියට බලපෑවා කියලා මතයක් තිබෙනවා, විශ්වාසයක් තිබෙනවා ගරු ජනාධිපතිතුමනි. STF එක කියන්නේ වෙනම හැකියාවක් තිබෙන වෙනම කොට්ඨාසයක්. STF එක පාතාලය මර්දනය කරන්න, කුඩු ජාවාරම මර්දනය කරන්න, වෙනත් ජාවාරම් මර්දනය කරන්න විශාල දායකත්වයක් දුන්න කණ්ඩායමක්. නමුත් අද STF එකේ දායකත්වය ගොඩක් වෙලාවට අකර්මණ්‍ය වෙලා තිබෙනවා. මම දන්න විධියට STF එකට වැඩ බලන commandant කෙනෙක් තමයි දාලා තිබෙන්නේ. වැඩ බලන කෙනෙක්. මේකත් පාතාලයේ හිස එසවීමට බලපෑවා කියලා අපට බොහොම පැහැදිලියි.

පසුගිය මාස එකහමාරක කාලය අරගෙන බලන්න. අඩුම ගණනේ මත් කුඩු කිලෝ 5ක්වත් අල්ලපු පොලිස් ස්ථානයක් සොයා ගන්න නැහැ. ඒ නිසා මේ කටයුත්ත පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කළොත් හොඳයි. මට ආරංචි වුණු විධියට කඩුවෙල පොලිස් ස්ථානාධිපතිවරයා මාරු කර තිබෙන්නේ, එම පොලිස් වසමේ වෙඩි තැබීම් 2ක් සිදු වුණා කියලා. වෙඩි තැබීම් 2ක් සිදුවීම පොලිස් ස්ථානාධිපතිවරයා මාරු කරන්න හේතුවක් නම්, ඒ විධියේ පොලිස් ස්ථාන ගණනාවක පොලිස් ස්ථානාධිපතිවරුන් ඉන්නවා. ඒ නිසා යම් කෙනෙක් මාරු කරන්න ඕනෑ වුණාම, ඒකට හේතුවක් විධියට මේ වාගේ කාරණයක් උපුටා ගැනීම බොහොම අසාධාරණයි. මම විශ්වාස කරනවා, මේ පොලිස් ස්ථානවල ඉන්න අතිබහුතරයක් නිලධාරීන් දේශපාලනයට ගැනී වෙලා නැහැ කියලා.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මෙම ගරු සභාවේ රාජ්‍ය නිලධාරි මැදිරිය තුළ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වන රවී සෙනෙවිරත්න මහත්මයා ඇති කියලා මම හිතනවා. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාත්, මමත් දින 52 කුමන්ත්‍රණයට කලින් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ඇමතිවරයා සහ නියෝජ්‍ය ඇමතිවරයා විධියට කටයුතු කළා. අපි මේ හැම නිලධාරියෙකු දෙසම දේශපාලන කෝණයකින් බැලුවේ නැහැ. දක්ෂ නිලධාරීන් ඕනෑ තරම් ඉන්නවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ හිටපු දක්ෂ නිලධාරීන් 2015න් පසු අපි එක්කත් වැඩ කළා. අපි ඒ අය දිහා සැකෙන් බැලුවේ නැහැ. අපි ඒ අය දිහා වෛරයෙන් බැලුවේ නැහැ. ඒ දක්ෂ නිලධාරීන් ඉස්සරහට ගියා. ඕනෑම නිලධාරියෙකුට පවතින රාජ්‍ය යන්ත්‍රණයත් එක්ක වැඩ කරන්න සිද්ධ වෙනවා. ඔබතුමන්ලා බලයට එන්න කලින් තිබුණු රාජ්‍ය යන්ත්‍රණයත් එක්ක වැඩ කරපු අය තමයි මේ නිලධාරීන්. හැබැයි, ඒ තුළ සියයට 3ක්, 5ක්, 7ක් විතර දූෂිත අය ඉන්න පුළුවන්, අකාර්යක්ෂම අය ඉන්න පුළුවන්. හැබැයි, සියල්ල දිහා සැකෙන් බැලීම මම හිතන විධියට ඔබතුමන්ලාගේ රජයට එච්චර සුබදායක නැහැ. ඒ නිසා සියල්ල දිහා සැකෙන් බලන්න එපා. දක්ෂයෝ ඉන්නවා. ඒ දක්ෂ කණ්ඩායම් එක්ක ඉස්සරහට යන්න අවශ්‍ය කටයුතු ඔබතුමන්ලා කරන්න.

රවී සෙනෙවිරත්න මැතිතුමා, ශානි අබේසේකර මැතිතුමා එක්ක අපි වැඩ කර තිබෙනවා. අපි දන්නවා, එතුමන්ලා දක්ෂයෝ. එතුමන්ලා විශාල පළිගැනීමකට, අසාධාරණයකට ලක් වුණා. හැබැයි, එතුමන්ලාගෙන් පළිගත්තේ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ කට්ටිය නොවෙයි නේ. එතුමන්ලාගෙන් පළිගත්තේ හිටපු ආණ්ඩු. හිටපු ආණ්ඩු එතුමන්ලාගෙන් පළිගත්තා කියලා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ සිටින අය දිහා සැකයෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් බලනවා නම්, එය විය යුත්තක් නොවෙයි කියලායි මම දකින්නේ ගරු සභාපතිතුමනි. ඒක විය යුත්තක් නොවෙයි.

පාස්කු ප්‍රහාරය ගැන කථා කරනකොට කියන්න ඕනෑ, ඒ පාස්කු ප්‍රහාරයත් ඔබතුමන්ලාට මේ වාගේ දැවැන්ත ජනමතයක් ලැබෙන්න විශාල හයියක්, ශක්තියක්, පිටුවහලක් වුණාය කියන එක. ඒ ජනතාව පාස්කු ප්‍රහාරයට ලක්වූවන්ට සාධාරණයක් ඉෂ්ට වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. රාසමාණික්කම් මැතිතුමා කිව්වා වාගේ Tripoli platoon එක, ඒ සන්නද්ධ කල්ලි මෙහෙය වූවේ කවුද? ඒ වාගේම නැහෙනහිරින් තමයි පාස්කු ප්‍රහාරයේ මූල බීජය ආරම්භ වුණේ. වවුනතිව් ප්‍රහාර, ඒ වාගේම සහරාන්ගේ සංවිධානය සූදානම් වීම යනාදී සිදුවීම් එක්ක.

මට මතකයි, මම නියෝජ්‍ය ඇමතිවරයා විධියට සිටියදී අර නාමල් කුමාර කියන හාදයායි, මෛත්‍රීපාල සිරිසේන මහත්තයායි මොකක්ද බොරු කාරණයක් මතු කරලා නාලක සිල්වා මහත්තයා අත්අඩංගුවට ගත්තා. මම හිතන විධියට වර්තමාන ආරක්ෂක නියෝජ්‍ය ඇමති අරුණ ජයසේකර මහතා එතකොට නැහෙනහිර ආඥාපතිවරයා විධියට තමයි කටයුතු කළේ. ඒ නිසා එතුමාටත් ලොකු හයියක් දෙන්න පුළුවන්, මේ පාස්කු ප්‍රහාරයට අදාළ විමර්ශන කටයුතු අවසන් කරන්න. පාස්කු ප්‍රහාරයට ලක්වූවන්ට කඩිනමින් සාධාරණයක් වෙන එක තමයි රටේ බලාපොරොත්තුව. කාදිනල් උන්නාන්සේ, ඒ වාගේම කතෝලික සභාව, කතෝලික ජනතාව සහ සමස්ත රටේ ජනතාව බලාපොරොත්තු වුණා, පාස්කු ප්‍රහාරයට ලක්වූවන්ට ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තුළින් කඩිනමින් සාධාරණයක් වෙයි කියලා. කිසි දෙයක් හංගන්නේ නැතුව ඉතාම කඩිනමින් ඒ සාධාරණය ඉෂ්ට වෙයි කියන බලාපොරොත්තුව රටේ ජනතාව තුළ තිබෙනවා, ගරු සභාපතිතුමනි.

අපේ රණ විරුවෝ, අපේ රටේ හමුදාව යුද්ධය අවසන් කරන්න විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. ඒ රණ විරුවන් ඔබතුමන්ලාගේ "අදිටන" සංවිධානය හරහා ඔබතුමන්ලාගේ ආණ්ඩුවට, ඔබතුමන්ලාගේ රජයට, ඔබතුමන්ලාගේ පක්ෂයට ශක්තිය ලබා දුන්නා. ඒ අයටත් සාධාරණයක් ඉෂ්ට කරන්න. හමුදාවේ අයගේ ඉල්ලීමක් තමයි "One Rank, One Pension" කියන එක. මම හිතන විධියට ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත් "One Rank, One Pension" කියන එක සඳහන් කර තිබුණා. නමුත් ඒක තවම ක්‍රියාත්මක වෙලා නැහැ. ජනාධිපතිතුමා මේ අවස්ථාවේ හිස වනනවා. 2025 තෙක් pension ගිය සියලු අයට ඒ "One Rank, One Pension" කියන වැඩ පිළිවෙළ - සියලු නිලතලවලට එක pension එකක්, pension යන දිනයක්, කාල වකවානුවක් නැතුව - සාධාරණ විධියට ක්‍රියාත්මක කරන්න කටයුතු කරයි කියලා අප විශ්වාස කරනවා.

පොලිස් කාන්තාවන් ගැන කථා කළොත්, මට ලැබී තිබෙන ආරංචි අනුව කාලෙකින් සපත්තු කුට්ටමවත් ඔවුන්ට ලැබිලා නැහැ. ඒ ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. මම මේ ඔබතුමන්ලාට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. නමුත්, සාධාරණය ඉෂ්ට කරන්න. පොලිස් කාන්තාවන්ට සහ පොලීසියේ නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කරන්න.

පාස්පෝට් ගනුදෙනුව සම්බන්ධයෙනුත් මෙතැන කථා වුණා. අපට ආරංචියි ඔබතුමන්ලා පාස්පෝට් 750,000ක් මිලදී ගැනීම සඳහා වර්තමාන ආයතනයටම ඇණවුම් භාර දෙන්න කටයුතු කර තිබෙන බව. ඒ වාගේම ඊයේ පෙරේදා Cabinet Paper එකක් ඉදිරිපත් කරලා තිබෙනවා, තවත් පාස්පෝට් ලක්ෂ 11ක් මිලදී ගන්න. එතකොට බරපතළ ගැටලුවක් තිබෙනවා. චෝදනාවක් තිබෙනකොට, අක්‍රමිකතා සිදු වෙලා තිබෙද්දී ඔබතුමන්ලා නැවතත් අලුතින් පාස්පෝට් ලක්ෂ 11ක් මිලදී ගැනීමට එම ආයතනයට ඇණවුම් ලබා දුන්නාද, ලබා දෙන්න Cabinet Paper එකක් ඉදිරිපත් කරලා තිබෙනවාද? ආනන්ද විජේපාල ඇමතිතුමාත් මේ ගරු සභාව තුළ ඉන්නවා, ජනාධිපතිතුමාත් ඉන්නවා; සියලුදෙනාම ඉන්නවා. එහෙම වෙලා තිබෙනවා ද කියලා මම ඔබතුමන්ලාගෙන් අහනවා. ඒකට උත්තරයක් ලබා දුන්නොත් ඒක වටිනවා. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි, එහෙම දීලා තිබෙනවාද? *[බාධා කිරීමක්]* අවසන් තීන්දුවක් අරගෙන නැහැ? හැබැයි, අවසන් තීන්දුවක් අරගෙන නැත්නම් විනිවිදභාවයකින් යුතුව - අපි දන්නවා, රටේ ජනතාවට පාස්පෝට් ලබා දෙන්න ඕනෑ බව. දවසකට විශාල පිරිසක් පාස්පෝට් පෝලිමේ ඉන්නවා. ඒ ජනතාවට සාධාරණයක් වෙන්න ඕනෑ වාගේම, අක්‍රමිකතාවක් සිදු වෙලා තිබෙනවා නම් අක්‍රමිකතාවකින් තොරව විනිවිදභාවයකින් යුතුව නිවැරදි ආයතනයට ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න අවසර ලබා දිය යුතුයි.

ඇත්තටම, මමත් දැනුයි දැක්කේ. ඒ පාස්පෝට් එකේ මුද්‍රණ දෝෂ බොහොමයක් තිබෙනවා. අඩු පිටු ප්‍රමාණයක් තිබෙන්නේ. මෙහි "යාපහුව" කියන වචනය වෙනුවට තිබෙන්නේ වෙන නමක්. "යාපහූනද, යාපාහූවද" මොකක්ද දාලා තිබෙනවා. "යාපහූනා" වගේ තමයි මම දැක්කේ. ඒ නිසා ඒවා නිවැරදි කරන්න කටයුතු කළ යුතුයි. ඒ පාස්පෝට් එක තුළ අපේ රටේ අභිමානය තිබෙනවා. ඒ අභිමානය තහවුරු වෙන ආකාරයෙන් සහ ලැබෙන මුදලට සාධාරණයක් වෙන ආකාරයෙන්, නියමිත පිටු ප්‍රමාණයක් සහිතව එයට වටිනාකමක් ලැබෙන ආකාරයකින් පාස්පෝට් එක ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියන එකත් ගරු ජනාධිපතිතුමාට විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

රටේ ජාතික ආරක්ෂාව ගැන කථා කරද්දී, උතුරු නැහෙනහිර අපට අමතක කරන්න බැහැ. මෙතැනදීත් මන්ත්‍රීවරු ගණනාවක් ඒ පිළිබඳව කථා කළා. උතුරු නැහෙනහිර විශාල ඉඩම් ප්‍රමාණයක්

තිබෙනවා. ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉඩම් දැනට හමුදාව විසින් හමුදා කඳවුරු, හමුදා භූමි විධියට පවත්වා ගෙන යනවා. මම හිතන විධියට උතුරු නැඟෙනහිර ජනතාව ඉතිහාසයේ ප්‍රථම වතාවට දකුණේ පක්ෂයකට ජන වරමක් ලබා දීලා තිබෙනවා. ඔවුන් දකුණේ පක්ෂයක් ගැන විශ්වාස කරනවා. ගරු ජනාධිපතිතුමනි, ගරු සභාපතිතුමනි, ඒවා උතුරු නැඟෙනහිර ජනතාවගේ ඉඩම්. මම කියන්නේ නැහැ, ඒ සියලු හමුදා කඳවුරු ටික උතුරු නැඟෙනහිරින් ඉවත් කරලා මෙහේට ගෙනෙන්න කියලා. ඔබතුමන්ලාත් එහෙම කියන්නේ නැහැ කියලා මම විශ්වාස කරනවා, ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා එහෙම බලාපොරොත්තු වෙන්නේ නැහැ නේ. ඒ පාරම්පරික ගොවි බිම්. හැබැයි, ඒ හමුදා කඳවුරු වෙන ස්ථානවල ස්ථානගත කරලා ඒ ඉඩම් ටික උතුරු නැඟෙනහිර ජනතාවට ලබා දෙන්න කටයුතු කරන්න. ඒක අවුරුදු 30ක් යුද්ධයෙන් බැට කාපු උතුරු නැඟෙනහිර ජනතාවට කරන සාධාරණයක් විධියට අපි දකිනවා. ඔබතුමන්ලා ඒ පොරොන්දුව දුන්නා. ඒ පොරොන්දුව එම ජනතාව විශ්වාස කළා. ඒ විතරක් නොවෙයි.

ගරු සභාපතිතුමනි, ජාතික ආරක්ෂාවට වැදගත්ම දෙයක් තමයි ඒ ජනතාව බලාපොරොත්තු වෙන වෙනස; ජාතික ආරක්ෂාවට අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීම. ඔබතුමන්ලා පොරොන්දුවක් දුන්නා. ගරු ජනාධිපතිතුමනි, ජනාධිපතිවරණ ව්‍යාපාරයේදී ඔබතුමන්ලා කිව්වා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියලා. අගමැති ක්‍රමය සහිත ව්‍යවස්ථාදායකය ශක්තිමත් කරන අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙනවා කිව්වා. එහෙම කියපු ගොඩක් අය,- *[බාධා කිරීමක්]* මට කට වහන්න කිව්වේ නැහැ නේ. මම හිතුවා, ජනාධිපතිතුමා මගේ කට වැහුවා කියලා.

එහෙම කියපු ගොඩක් අය අපේ රටේ ජනතාව ඇන්දුවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක නෝනා අලුත් ව්‍යවස්ථාවක් ගේනවා කිව්වා. හැබැයි, අවුරුදු 6ක් නොවෙයි 12කට ආසන්න කාලයක් හිටියා; රටේ ජනතාව රැවැට්ටුවා. මහින්ද රාජපක්ෂ මහත්තයාත් ඒකම තමයි කළේ. ගරු ජනාධිපතිතුමනි, උතුරු නැඟෙනහිර ඇතුළු රටේ ජනතාවට ඔබතුමන්ලා දුන් පොරොන්දුවක් තිබෙනවා. ඒ තමයි අලුත් ව්‍යවස්ථාවක් ගෙන ඒම. ඒ අලුත් ව්‍යවස්ථාව තුළිනුත් මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරන්න පුළුවන්. අලුත් ව්‍යවස්ථාව තුළින් මේ රට ඉස්සරහට අරගෙන යන්න පුළුවන්. ඒ ජනවරම ඔබතුමන්ලාට ලැබිලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා අලුත් ව්‍යවස්ථාවක් කරා යයි කියලා මම විශ්වාස කරනවා. ඔබතුමා විධායක ජනාධිපති ක්‍රමයට ලොල් කෙනෙක් කියලා මම හිතන්නේ නැහැ. ඔබතුමා බලය බදා ගෙන ඉන්න කෙනෙක් නොවෙයි. ඊට එහා ගිය, මේ රටේ ජනතාව ගැන හිතන නායකයකු විධියට මේ රටට අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න, උතුරු නැඟෙනහිර ජනතාව තුළ විශ්වාසයක් ඇති කරන්න ඔබතුමා කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම පාතාලයේ බහුතරයක් ඉන්නේ බස්නාහිර පළාතේ සහ දකුණු පළාතේ. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි, හොඳ වෙලාවට වයඹ පළාතේ නම් පාතාලය ඉතා අඩුයි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
බිංගිරියේ ඉන්නවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බිංගිරියේ ඉන්නේ පාතාලේ ඇලා විතරයි. එහේ පාතාලයේ වෙන අය නැහැ.

ගරු ඇමතිතුමනි, මම හිතනවා, බස්නාහිර සහ දකුණු පළාත්වල පාතාලය මර්දනය කරන්න, ඔබතුමාට හමුදාව යොදා ගන්න පුළුවන් කියලා. ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, මේවා කියද්දී පාතාලයේ අය අපි දිහාත් TV එකෙන් බලාගෙන ඉන්නවා ඇති. හරි භයානකයි, තත්ත්වය. කමක් නැහැ, අපි කථා කරන්න භය නැහැ. මේ පාතාලය මර්දනය කළ යුතුමයි. ඔබතුමන්ලා ඒක කරන්න පුළුවන් කණ්ඩායමක්. ඒ සඳහා හමුදාව යොදා ගන්න.

උතුරු, නැඟෙනහිර පළාත්වල කඳවුරුගත කරලා ඉන්න හමුදා නිලධාරීන් දකුණට ගේන්න, බස්නාහිරට ගේන්න. අර කලින් මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ උතුරු, නැඟෙනහිර මිනිස්සු රට දෙකඩ කරන්න, එහෙම නැත්නම් බලය බෙදන්න ආයෙත් තුවක්කුව අතට ගන්න බලාපොරොත්තුවකින් නැහැ කියලා. හැබැයි, අපි අනාගතයේ හෝ ඒක නොවන තැනට ඒගොල්ලන්ට අවශ්‍ය අවස්ථාව දෙන්න ඕනෑ. මම ගිය සතියේත් පාර්ලිමේන්තුවේදී ඒක කිව්වා. පළාත් සභාවලට බලය දෙන්න ඕනෑ. ඔවුන්ට බලතල දෙන්න ඕනෑ. ඒ ස්ථාවරයේ අපි ඉන්නවා. ආණ්ඩුවට විරුද්ධව මේ පැත්තේ ඉන්න අය වෙන දා නම් කියන්නේ බලය දෙන්න එපා කියලා. වෙන දා විපක්ෂයේ අය එහෙමයි. වෙන දා ආණ්ඩුවට තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි, විපක්ෂය. ගරු සභාපතිතුමනි, මොනවා හරි කරන්න යනවා නම්, ඒකට විරුද්ධව තමයි වෙන දා විපක්ෂය අදහස් දැක්වූයේ. රට බෙදනවා, රට කඩනවා කියලායි කිව්වේ. හැබැයි, අපි අද එහෙම නොවෙයි. අපි මේ ස්ථාවරයේ ඉන්නවා. අපේ ගරු අගමැතිතුමියත් ඒකට ඔළුව වනනවා, බොහොම හොඳයි. අද එහෙම විපක්ෂයක් ඉන්න වෙලාවක ඔබතුමන්ලාට මේ වැඩේ කරන්න පහසුයි. අපි රට ගිනි තියන්නේ නැහැ. සමගි ජන බලවේගයේ අපි ජාතිවාදී නැහැ.

අපට මතකයි නේ, 88-89 කාලයේ රට ගිනි ගත්තේ පළාත් සභා ක්‍රමයට විරුද්ධව කියන එක. මම මේ නැවත අතීතයට යනවා නොවෙයි. අද ඊට එහා ගිය දියුණු දේශපාලන සංස්කෘතියක් ඔබතුමන්ලා මෙතැනට ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා 88-89ට, 70-71ට බැණ බැණ ඉන්න ඕනෑ නැහැ. අපි විශ්වාස කරනවා, ඔබතුමන්ලාට මේ පාර්ලිමේන්තුව ඇතුළේ මේක කරන්න පුළුවන් කියලා. ඒකට ඔබතුමන්ලාට මන්ත්‍රීවරුන් 159දෙනෙක් ඉන්නවා. අපි බාධා කරන්නේ නැත්නම්, ඔබතුමන්ලාගේ මතයට මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න පුළුවන්. උතුරු නැඟෙනහිර ජනතාවට බලය දෙන්න පුළුවන්. ඔබතුමන්ලාට ඕනෑම හොඳ දෙයක් කරන්න පුළුවන් වාගේම, ඕනෑම නරක දෙයකුත් කරන්න පුළුවන්. මම හිතන්නේ නැහැ, ඔබතුමන්ලා එහෙම කරයි කියලා. ඒ නිසා ඔබතුමන්ලා කරන ඕනෑම හොඳ දෙයකට අපි සහාය දෙනවා. අපි රට ගිනි තියන්නේ නැහැ කියන පොරොන්දුව විපක්ෂය විධියට දෙනවා. ඔබතුමන්ලා දෙයක් කරද්දී අපි ගිහිල්ලා රට ගිනි තියන්නේ නැහැ. උතුරට, නැඟෙනහිරට ගිහිල්ලා ඒ ජනතාව අවුස්සන්නේ නැහැ. දකුණු පළාතේ ගාල්ලට, මාතරට ගිහිල්ලා ඒ ජනතාවගේ ලේ කුපිත කරවලා, සිංහල රට ඉවරයි, බෞද්ධ රට ඉවරයි කියලා කවදාවත් සමගි ජන බලවේගය රට ගිනි තියන්නේ නැහැ. ඒ විශ්වාසය අපි ඔබතුමන්ලාට දෙනවා.

ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වග කියන ඇමතිවරයා. ඒ වාගේම රටේ නායකයා විධියටත් ඔබතුමා ඒකට වග කියනවා. ඒ නිසා මේ රටේ ප්‍රශ්නය විසඳන්න. ද්‍රවිඩ ජනතාවට, රටේ සමස්ත ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න තිබෙන අවස්ථාව අරගෙන මේ රට නිවැරැදි තැනට අරගෙන යන්න. එතකොට අපටත් දේශපාලනය කරන්න පුළුවන්, අපටත් මේ රටේ සතුටින් ඉන්න පුළුවන් කියන එක මතක් කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔව්, ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Good afternoon, Hon. President and Hon. Prime Minister!

Hon. Chairman, thank you for giving me this opportunity. As the Hon. Nalin Bandara Jayamaha mentioned, we are from the North and we do not want another division in this country. We want to live together with the Sinhalese people as friends and as a core part of this country. So, on this occasion, we would like to hear from the Hon. President that we would get a new Constitution and equal rights.

Thank you very much.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජනාධිපතිතුමා.

[අ.භා. 5.35]

ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

ගරු සභාපතිතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේත්, ඒ වාගේම ආරක්ෂක අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ විවාදයට ලක් කරන මේ අවස්ථාවේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා බෙහෙවින්ම සතුටු වෙනවා.

අද පමණක් නොවෙයි, දවස් කිහිපයක් මුළුල්ලේ මම දැක්කා, ජාතික ආරක්ෂාවට විශාල තර්ජනයක් ඇති වී තිබෙන බවත්, ජනතාව විශාල බියකින් ජීවත් වන බවත් සඳහන් කරමින් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අදහස් දැක්වූ ආකාරය. මා දැක්කා සමහරු යෝජනා කරලා තිබුණා, අපි ඉල්ලා අස් වී ආණ්ඩුව වෙනත් අයට භාර දිය යුතු බවටත්. ඒ වාගේ ප්‍රශ්නයක් දැන් ගොඩනැහෙමින් තිබෙනවා.

මේ ප්‍රශ්නය කොහොමද පැන නහින්නේ කියලා අපි බැලුවොත් ඔබට මතක ඇති, අපි ආණ්ඩුව අරගෙන, ඒ කියන්නේ අපි ජනාධිපතිවරණය ජයග්‍රහණය කළාට පස්සේ පටන්ගත් ව්‍යාපෘතිය තමයි, අපට මහ මැතිවරණයේදී ශක්තිමත් බලයක් සහිත ආණ්ඩුවක් හදාගන්න හම්බ වෙන්නේ නැහැ; මහ මැතිවරණයේදී ඔබතුමන්ලා ආණ්ඩුවක් හදනවා කියන එක. මම හිතන විධියට අගමැති ධුරයත්, ඇමති ධුරත් බෙදාගෙන හිටියේ. ඒක මතකද දන්නේ නැහැ.

හැබැයි, මහ මැතිවරණයේදී මොකක්ද වුණේ? ජනාධිපතිවරණයේ ජයග්‍රහණය ආපසු හැරවීමට මහ මැතිවරණයේදී පුළුවන් කියලා අපේක්ෂා කළත්, ඊටත් වඩා ප්‍රබල ශක්තිමත් ජයග්‍රහණයක් මහ මැතිවරණයේදී අපට ලැබුණා. ඊට පසුව විශාල සාකච්ඡාවක් ගොඩනැඟුවා, මාර්තු මාසය විතර වෙනකොට ආර්ථිකය විශාල අර්බුදයකට පත් වෙනවා, එම ආර්ථික අර්බුදය හේතුකොටගෙන මාර්තු මාසයේදී යළි ආණ්ඩුව ලබාගන්න පුළුවන් කියලා. බොහෝ අය එවැනි ප්‍රවෘත්ති නිර්මාණය කරන්න පටන් ගත්තා.

හැබැයි, අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයට අපේ තුන්වන සමාලෝචන වාර්තාව ඉදිරිපත් කරනවා. මම හිතන්නේ ඉතාම සුබදායී ප්‍රතිඵලයක් ලැබේවි. ඒ නිසා ආර්ථිකයේ ඉතාම ශක්තිමත් ස්ථාවරයකට අපි ගමන් කරමින් තිබෙනවා. ඊට පසුව ඒ හා බැඳිලා නිර්මාණය කරන්න පටන් ගත්තා, වාහන ආනයනය විවෘත කළාට පසු විශාල ලෙස ඩොලරයට තෙරපුමක් එයි, ඒ තෙරපුම හරහා ඩොලරය රටට දරාගන්න බැරි තරමේ ඉහළ යෑමකට ලක් වේවි කියලා. එවැනි බලාපොරොත්තුවක් ඔබට තිබුණා. ආසන්න වශයෙන් ගත්තොත්, මේ වන විට ඩොලර් මිලියන 117ක පමණ LCs open වෙලා තිබෙනවා. නමුත් ඩොලරයේ අගය තිබුණාටත් වඩා අඩු වෙමින් තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද? තමුන්නාන්සේලා කල්පනා කරනවා නම්, ආර්ථිකයේ ඇති වන අර්බුදයක් හරහා බලය ඩැහැ ගන්න පුළුවන් කියලා, ඒකත් දැන් අවසන්. ඒකත් මතක තබාගන්න.

අපේ රටේ ආණ්ඩු පෙරළිච්ච ඉතිහාසය බැලුවොත්, ඒ ඉතිහාසවල විවිධ අවස්ථා අපි හඳුනා ගන්නවා. එකක්, ආර්ථික අර්බුද විසින් ආණ්ඩුව පෙරළනු ලැබුවා. නමුත්, ඔබට ඒ අවස්ථාවත් ලැබෙන්නේ නැහැ, මතක තබාගන්න. ආර්ථික අර්බුදයක් හේතුකොටගෙන මේ ආණ්ඩුව වට්ටන්න සිහින දකිනවා නම්, ඒවා සිහිනම විතරයි, හොඳේ. ඒවා කියන්න වචන, කාලය නාස්ති කරන්න එපා. මොකද, ඒක වෙන්නේ නැහැ. ඊළඟට, අපේ රටේ ආණ්ඩු වැටිච්ච ඉතිහාසයක් තිබෙනවා, පක්ෂ ඇතුළේ අර්බුද නිර්මාණය කරලා. 2001දී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව බිඳ වැටෙන්න ප්‍රධාන හේතුව වුණේ, ඒ ආණ්ඩුවේ හිටපු පිරිසක් එහා පැත්තට ගිහිල්ලා වාඩි වෙලා ආණ්ඩුවේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා හේතුකොටගෙන ආණ්ඩු වැටුණු අවස්ථාව. හැබැයි ඔබ හිතන්න, මේ ආණ්ඩුව එවැනි කිසිදු අභ්‍යන්තර ප්‍රතිවිරෝධයක් නිර්මාණය නොවන ආණ්ඩුවක් බව. එයත් මතක තබාගන්න. මා දන්නවා සමහර අය උත්සාහ කරනවා, මා ඔසවා තබා පාර්ලිමේන්තුවේ සිටින අපේ අනික් අය පහත් කියලා කියන්නට. ඒ උගුලට අපි අහුවෙන්නේ නැහැ. බොහොම ස්තුතියි. "ජනාධිපති නම් හොඳයි, අනික් අය නරකයි" කිව්වාට අපි අහුවෙන්නේ නැහැ. ඒවා උගුල්, හොඳේ. ඒ උගුල්වලට අපි අහුවෙන්නේ නැහැ. මම නිකම් රැට ගිහිල්ලා, පාර්ලිමේන්තුවේ කරපු කථා දිහා දුක හිතමින් බලන බව සමහරුන් කියනවා. නැහැ, මම ඒවා බලන්නේ සතුටු වෙමින්. ඒ නිසා ඔයගොල්ලෝ හිතනවා නම්, අභ්‍යන්තර අර්බුදයක් හරහා මේ ආණ්ඩුව වට්ටන්න පුළුවන් කියා, එහෙම එකක් ඇති වෙන්නේත් නැහැ.

ඊළඟට ඔයගොල්ලෝ කල්පනා කරනවා, ජාතික ආරක්ෂාවේ මහා බරපතළ තර්ජනයක් ඇති වෙලා මේ ආණ්ඩුව බිඳ වැටෙවි කියා. එහෙම වෙන්නේ නැහැ. එහෙම වෙන්නේ නැහැ, මතක තියාගන්න. ඒ නිසා ඔබතුමන්ලා අලුත් තුරුම්පු කොළ ටිකක් සොයන්න, research එකක් කරලා. නිකම් ඔහේ කවුරු හරි

ගෙනැත් දෙන කොළයක් කියවමින්, නිකම් ඔහේ පුරුදු විධියට ආණ්ඩුව ඇතුළේ අර්බුද ඇති වෙයි, ආර්ථිකය හෙට වැටෙයි, ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති වෙලා, ජාතික ආරක්ෂාව අනතුරේ නිසා ජනතාව පාරට බහීවි වාගේ දේවල් ඔබ හිතනවා. නමුත් ඒවා මොකුත් වෙන්නේ නැහැ.

ඊළඟට, ආණ්ඩු වැටිච්ච තව අවස්ථා තිබෙනවා. මෑත ඉතිහාසයේ ජනතාව පාරට බැහැලා උද්ඝෝෂණය කරලා පාලකයෝ පලවා හැරියා. ඔබට මාධ්‍ය සාකච්ඡා හරහා ආණ්ඩුවට යමක් කියනවා හැරුණුකොට, මේ පාර්ලිමේන්තු සභා ගර්භයේ සිට ආණ්ඩුවට යමක් කියනවා හැරුණුකොට මම හිතන්නේ නැහැ, සෙනහ එකතු කරලා යමක් කියන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා මහජනයාගේ නැඟිටීමක්, මහජනයාගේ විරෝධයක් හරහා ආණ්ඩුව පලවා හැරීම පිළිබඳව කල්පනා කරනවා නම්, ඒකත් අසාර්ථකයි. මේ සියල්ල අසාර්ථකයි.

ඊළඟට, අලුතින්ම මතු වී තිබෙන්නේ මොකක්ද? ජාතික ආරක්ෂාව පිළිබඳව තර්ජනයක් තිබෙනවා, ජනතාවගේ ජීවිත විශාල අනාරක්ෂිත තත්ත්වයකට පත් වී තිබෙනවා, ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගන්න අසමත් වී තිබෙනවා, ඒ නිසා පාලනය වෙනස් විය යුතුයි වාගේ චිත්‍රයක් දැන් ගොඩනඟන්න හදනවා.

අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? කිසිදු සාමාන්‍ය පුරවැසියෙක් මේ පාතාල ගැටුමෙන් හිංසාවකට පත් වී නැහැ. නමුත් ඒ පාතාල ගැටුම නිසා සමාජය තුළ යම් ප්‍රමාණයකට යම් භීතියක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. භීතියක් තිබෙනවා. නමුත් මේ නිසා කිසිදු සාමාන්‍ය පුරවැසියෙකුට තමන්ගේ දෛනික කටයුතු පවත්වාගෙන යෑම සඳහා කිසිදු බාධාවක් හෝ තර්ජනයක් මතු වී නැහැ.

අපි මේ ජාතික ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් මතුවිය හැකි ආකාර දෙකක් හඳුනාගෙන තිබෙනවා. අපේ ඉතිහාසය බැලුවත්, මේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙන එක අන්තයක් තමයි ජාතිවාදය සහ අන්තවාදය. දීර්ඝ කාලීන යුද්ධයේදීත් ජාතික ආරක්ෂාවට තර්ජනයක් තිබුණා නම් ඒක පතුළේ තිබුණේත් ජාතිවාදය සහ අන්තවාදය. පාස්කු ප්‍රහාරය අපේ ජාතික ආරක්ෂාව තර්ජනයට ලක් කළා නම් ඒක පතුළේ තිබුණේත් ජාතිවාදය සහ අන්තවාදය. ඒ දෙක තමයි එම ප්‍රහාර සඳහා උපයෝගී කරගනු ලැබුවේ. ඒ නිසා ජාතික ආරක්ෂාවට ප්‍රබල තර්ජනයක් ගෙන ආ හැකි එක් ක්ෂේත්‍රයක් තමයි ජාතිවාදය සහ අන්තවාදය. අපි යළි අපේ රටේ ජාතිවාදය සහ අන්තවාදය හිස ඔසවන්න කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳවත් අද කිව්වා. අපේ ස්ථාවරය ඒක අහෝසි කරනවා කියන එකයි. නමුත් අපට අවශ්‍ය වී තිබෙනවා, සංවිධානාත්මක අපරාධ සහ අන්තවාදී ප්‍රවණතා මර්දනය සඳහා නීතිමය රාමුවක්. එහෙම නැතුව සංවිධානාත්මක අපරාධ කල්ලිවලට නිදැල්ලේ වර්ධනය වෙන්න ඉඩ නොදී, ඒ කියන්නේ සාමාන්‍ය නීතිය අපට උපයෝගී කර ගත හැකි සාමාන්‍ය තත්ත්වයකදී සංවිධානාත්මක අපරාධ කල්ලි හැසිරෙනවා නම් ඒ සඳහා සාමාන්‍ය නීතිය අබිබවා යන අලුත් තත්ත්වයක්; අලුත් නීතියක් අවශ්‍යයි.

අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතුයි කියන ස්ථාවරයේ ඉන්නේ අද විතරක් නොවෙයි. අපි 1978දී එම පනත ආරම්භ කරපු දවසේම කළු කොඩි දාපු මිනිස්සු. උතුරේ සමහර නායකයෝත් එදා කළු කොඩි දාන්න සම්බන්ධ වුණා. එම නිසා අපි ඒ ප්‍රතිපත්තිය වෙනස් කරලා නැහැ. නමුත් අපේ ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් ගෙන දිය හැකි සංවිධානාත්මක අපරාධ කල්ලි හා ජාතිවාදී, අන්තවාදී ප්‍රවණතා ඇති විය හැකි අනතුරක් තිබෙනවා නම්, ඒවාට සාමාන්‍ය නීතිය ප්‍රමාණවත් වන්නේ නැත්නම් ඒ සඳහා නව නීති අවශ්‍යයි. එම නිසා ඒ සඳහා අවශ්‍ය වන නව නීති රාමුවක් හරහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන්න අපි සූදානම්. ඒ සඳහා අපි කමිටුවක් පත් කරලා තිබෙනවා; ඒ ගැන අධ්‍යයනය කරමින් තිබෙනවා. මේක මම හිතන හැටියට දශක ගණනාවක් මේ රටේ ජනතාවගේ වුවමනාවක් බවට පත් වෙලා තිබුණා. ඒ වුවමනාව යථාර්ථයක් බවට පත් කරන්නේ අපේ ආණ්ඩුව විතරයි. හැබැයි, මම යළි කියනවා, ජාතිවාදය සහ අන්තවාදය අපේ රටේ යළි හිස ඔසවන්න අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ කියලා.

අපි මුහුණ දෙන ඊළඟ තර්ජනය තමයි, මේ සංවිධානාත්මක අපරාධ කල්ලි. මේ සංවිධානාත්මක අපරාධ කල්ලි හුදු අපරාධකරුවන්ගේ එකතුවක්ම විතරක් නොවෙයි. අනික් අයත් අපරාධකරුවෝ තමයි. නමුත් මේක අපරාධකරුවන්ගේ එකතුවක් විතරක් නොවෙයි. මේ සංවිධානාත්මක අපරාධ කල්ලි කාලයක් මුළුල්ලේ ඉතා නිදැල්ලේ දේශපාලන රැකවරණ සහිතව වර්ධනය වෙන්න ඉඩ දුන්නා. ඔබතුමන්ලා නැඟිටලා අපට අපරාධකරුවෙකුගේ නමක් කිව්වොත්, ඒ නම හා සබැඳි දේශපාලකයා කවුද කියලා මට කියන්න පුළුවන්. ඔබතුමන්ලා කියන්න එක නමක්. මම කියන්නම්, ඒ පුද්ගලයා පිටුපස ඉන්න දේශපාලකයා කවුද කියලා. ඒක නේ, ඇත්ත. මේක සැහවුණු රහසක් නොවෙයි. අද මේ රටේ ජනතාව විවෘතව දන්නවා, මේ මේ අපරාධ කල්ලි පෝෂණය වුණේ කවර දේශපාලන නායකත්වය යටතේද කියලා. මේ සංවිධානාත්මක අපරාධ කල්ලි මේ දක්වා වර්ධනය වෙන්න බලපෑවේ එම දේශපාලන නායකත්වයන් මේවා පෝෂණය කළ නිසායි.

ඒ නිසා තමයි "අමරේ කලබල වෙන්න එපා මම ඇවිල්ලා ඉන්නේ" කියලා කියනකොට අමරේ නිහඬ වෙන්නේ. ඇයි, ඒ? අමරේ කටහඬින් අඳුරනවා ආවේ කවුද කියන්න. එහෙමයි. එතැනට ආවේ කවුද කියලා නම කිව්වේ නැහැ. අමරේ ඉන්නේ දුරක. ඒ පුද්ගලයා යන්නේ තව දුරකින්. පුද්ගලයා කෑ ගහලා කියනවා, "අමරේ මම ඇවිල්ලා ඉන්නේ. නිහඬ වෙන්න" කියලා. එතකොට මොකක්ද එතැන තිබෙන්නේ? හඬින් පවා අමරේ දන්නවා, තමන්ගේ නායකයා කවුද කියන්න. එහෙමයි මේ අපරාධ කල්ලි වර්ධනය වුණේ. අද කවුද, මේ අපරාධ කල්ලිවල වර්ධනය පිළිබඳ කිඹුල් කඳුළු හෙළන්නේ? කවුද? කවුද ඒවාට ආරක්ෂාව දුන්නේ, කවුද ඒවා පෝෂණය කළේ, කවුද ඒවා වර්ධනය කළේ? ඒ තමයි මේ දේශපාලන අධිකාරිය.

ඒ නිසා මේ අපරාධ කල්ලි වර්ධනය සඳහා දේශපාලන අධිකාරිය ඒ පිටුපස හිටියා. ඒකට තිබුණු ආශීර්වාදය නිසාම සියලු බියජනක තත්ත්ව අපරාධ කල්ලිවලින් නිදහස් වුණා. ඒ නිසා අපරාධ මැඩ පැවැත්වීම සඳහා තිබෙන ආයතන ද එහි යම් යම් කුඩා පිරිස් ද අපරාධ කල්ලි එක්ක එකට ගැට ගැහෙන්න පටන් ගත්තා. ඔබතුමන්ලා දන්නවා, මිද්දෙණියේදී සිදු වූ වීරකැටිය ප්‍රදේශයේ පදිංචි දරුවන් දෙදෙනාගේ සහ එම පුද්ගලයාගේ ඝාතනය පිළිබඳව. එහිදී අපි අත්අඩංගුවට ගත්ත අය අතර පොලිස් කොස්තාපල් මහත්මයෙක් ඉන්නවා.

ඊළඟට, උසාවියේ වෙඩි තැබීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් අය අතර පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඉන්නවා. ගල්කිස්ස පොලීසියේ ටී - 56 අවිය පැහැර ගෙන ගිහිල්ලා පාතාලයට දෙනවා. එවැනි පොලිස් නිලධාරීන් ඉන්නවා. ඒ කියන්නේ මොකක්ද? දේශපාලන යන්ත්‍රණයේ ආරක්ෂාව ඒ අයට තිබුණා. පොලීසියේ යම් යම් කණ්ඩායම් මේ අපරාධ කල්ලි එක්ක සහසබඳතා තිබෙනවා. හොඳට තේරුම් ගන්න, මේ තත්ත්වය. මේක හුදු දඩයක්කාරයෙකුගේ ප්‍රශ්නයක් නොවෙයි. තුවක්කුවක් කරේ තබාගෙන ගිහිල්ලා දඩයමක් පස්සේ හඹාගෙන යන

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

අපරාධකරුවෙක් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි සමාජයේ තිබෙන්නේ. දේශපාලන රැකවරණ සහිතව, අපරාධ මැඩ පැවැත්වීම සඳහා තිබෙන ආයතනවලට ද සබඳතා සහිතව මේ අපරාධ කල්ලි නිදැල්ලේ වර්ධනය වුණා. ඒ අනුව තමයි, එක් හමුදා කඳවුරකින් ටී - 56 ගිනි අවි 73ක් පාතාල කල්ලි ළඟට ගියේ. රජයේ අවි ආයුධ පාතාල කල්ලි වෙත ගලාගෙන එනවා. මෙහෙමයි තත්ත්වය. එයින් 35ක් දැනට අත්අඩංගුවට ගෙන තිබෙනවා. තව 38ක් අත්අඩංගුවට ගැනීමට නියමිතව තිබෙනවා. මේ අවි ආයුධ එළියට ආවේ අපේ කාලයේ නොවෙයි, ඊට පෙර. හැබැයි, මීට පෙරත් පරීක්ෂණයක් දියත් වුණා. රජයේ ඉහළම නිලධාරීන්ගේ අනුහස් සහිතව මේ ගිනි අවි කඳවුරුවලින් එළියට ආපු එක ගැන තිබුණු පරීක්ෂණය නතර කරන්න නියෝග කළා. එහෙමයි සිද්ධ වුණේ. නිදැල්ලේ අවි ආයුධ ගලාගෙන යන්න ඉඩ දුන්නා.

බලපත්‍ර සහිත තුවක්කු සමහර ජනාධිපතිවරුන්ගේ දරුවන්ට ලබා දී තිබෙනවා. එක්කෙනෙකුට ගිනි අවි 7ක් ලබා දීලා තිබෙනවා, ආණ්ඩුවෙන්. මම දන්නේ නැහැ, මේගොල්ලන් ජීවත් වුණේ මොන තැනකද කියලා. රජයේ නිල ලේඛනවලට අනුව ජනාධිපතිවරයෙකුගේ මද්දුම පුතාට -මතක තබා ගන්න- බලපත්‍ර සහිත ගිනි අවි 7ක් දෙනවා, ආණ්ඩුවෙන්. කොහේද මේගොල්ලන් ජීවත් වුණේ? මොකද, ගෙදර ත්‍රස්තවාදී ගැටුමක් තිබුණාද? මම ඒක දැනගන්න කැමැතියි. ගෙදර යුද්ධයක්ද? මොකක්ද මේ වෙලා තිබෙන්නේ? ඒ වාගේම දැනට භාර දුන් අවි ආයුධ -නීත්‍යානුකූලව දුන් අවි ආයුධ- හරියට හොයා ගෙන නැහැ. සමහර ඒවා Army එකට භාර දීලා. සමහර ඒවා ආරක්ෂක අමාත්‍යාංශයෙන් - MOD එකෙන් - අරගෙන පොලීසියට දීලා තිබෙනවා. සමහර ඒවා පොලිස් දෙපාර්තමේන්තුවෙන් අරගෙන MOD එකට දීලා තිබෙනවා. මොකක්ද මේ කියන්නේ? ඒ කියන්නේ, ආරක්ෂාව පිළිබඳව, සංවිධානයක, රාජ්‍යයක පැවැත්ම පිළිබඳව කිසිදු වගකීමක් නැති වගකීම් විරහිත පාලනයක් අපේ රටේ තිබුණා කියන එක. එක මතක තබා ගන්න.

අදත් අපි කටුගස්තොටදී පිස්තෝලයක් අත්අඩංගුවට ගත්තා. මේ වනකොටත් ගිනි අවි විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ කල්ලිවලට මේවා ආවේ කොහොමද? ඒ නිසා අපරාධ රාජ්‍යයක, යටි බිම්ගත අපරාධ රාජ්‍යයක ස්වභාවයකට මේ රට පත් වුණා. අපට එළියේ ලෝකය පෙනෙනවා. පොලීසිය තිබෙනවා; හමුදාවක් ඉන්නවා; දේශපාලන අධිකාරිය තිබෙනවා; අධිකරණ පද්ධතියක් තිබෙනවා; නීතිඥවරු ඉන්නවා. ඒ, එළියේ ලෝකය. හැබැයි, මේ එළියේ ලෝකයට යටින් සන්නද්ධ අවි කණ්ඩායම් ඉන්නවා. ඒකට අනුගත වන පොලිස් නිලධාරීන් ඉන්නවා, ඒකට අනුගත වන හමුදා නිලධාරීන් ඉන්නවා, ඒකට අනුගත වන අධිකරණ නිලධාරීන් ඉන්නවා. මම විවෘතව මේවා කියන්නේ. ඒකට අනුගත වන නීතිඥවරුන් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා. එහෙම නොවෙයිද? අපරාධකරුවෝ උසාවියෙන් නිදහස් වුණාට පස්සේ සාමාන්‍යයෙන් නීතිඥ මහත්වරු ඊළඟ නඩුවට යනවා. හැබැයි, වර්තමානයේ අපරාධකරුවෙක් නිදහස් වුණොත් ජීප් එකේ නැහලා ඒ අපරාධකරුවාගේ ගෙදරට ගිහිල්ලා භාර දෙනවා.

දැකලා නැද්ද? මොකක්ද මේ නීතිය? සාමාන්‍යයෙන් කවුරු හරි නීතිඥ මහත්මයෙක් අපරාධකරුවෙක් වෙනුවෙන් පෙනී හිටියොත් මොකක්ද වෙන්නේ? නඩුව ඉවර වුණාම ඊළඟ නඩුවට යනවා ඒ නීතිඥ මහත්මයා. හැබැයි වර්තමානයේ අපරාධකරුවෙකු නිදහස් වුණොත්, ඇප ලැබුණොත්, වාහනවල නැහලා අපරාධකරුවාත් එක්ක ගෙදර යනවා. මෙහෙමයි මේ ජාලය තිබෙන්නේ. ඒ නිසා මේ උඩ තිබෙන නීත්‍යානුකූල රාජ්‍යයට ඒ සමාන බරින් නොවුණත්, ඒ ප්‍රමාණයෙන් නොවුණත්, ඊට සරිලන යටිබිම්ගත අපරාධ රාජ්‍යයක් තිබෙනවා. ඒක ඇත්ත. මොකක්ද මේකට කරන්න පුළුවන්? අපට ක්‍රියාමාර්ග දෙකකට යන්න පුළුවන්. එක්කෝ ඒ යටිබිම්ගත අපරාධ රාජ්‍යයත් එක්ක අනුගත වෙලා අපට වැඩ කරන්න පුළුවන්. එහෙම නේ කවුරුත් කළේ. කවුරුත් මේකට අතගහන්න ගියේ නැහැ. හැමදෙනාම මොකද කළේ? යටිබිම්ගත අපරාධ කල්ලියත් එක්ක අනුගතවෙලා වැඩේ කරගෙන ගියා. මතක තියා ගන්න, ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව මේ යටිබිම්ගත අපරාධ කල්ලිත් එක්ක හැප්පිලා ඒවා අපේ රටින් අවසන් කරනවා. මතක තියා ගන්න. ඒක කරන්න ඕනෑ නැද්ද? මම අහන්නේ එච්චරයි.

ඒ සංවිධානාත්මක අපරාධ කල්ලි ඉතාම නිදැල්ලේ පෝෂණය වෙමින්, වර්ධනය වෙමින් තිබුණා. අද ඔබට මම ඉතා වගකීමෙන් කියනවා, ආණ්ඩුවේ කසිදු කෙනෙකුගෙන් සංවිධානාත්මක අපරාධ කල්ලියකට හෝ කල්ලියේ සාමාජිකයෙකුට කිසිදු රැකවරණයක් සහ ආරක්ෂාවක්, අනුශාසනාවක් ලැබෙන්නේ නැහැ. එච්චරයි. ඒක නේ අපේ වගකීම.

ඊළඟට, පොලිස් දෙපාර්තමේන්තුව. මම දන්නවා, අපේ වර්තමාන වැඩබලන පොලිස්පතිතුමා විශාල කාර්යයක් කරමින් සිටිනවා. පසුගිය කාලයේ පොලීසිය විශාල වශයෙන් අපරාධකරුවන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා; අවි ආයුධ අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ වාගේම විවිධාකාරයේ අපරාධවලට සම්බන්ධ පොලිස් නිලධාරී මහත්වරුත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඇයි ඒ? මේ link එක කඩන්න ඕනෑ. අපරාධකරුවා හුදු අපරාධයේ කොටසක් විතරක් කරන්න ඕනෑ, මේ ජාලයේ කොටසින් ගලවන්න ඕනෑ. ඒ නිසා අපි මේ ජාලයේ එකින් එක ගලව ගලවා යනවා. අපි ඒක ගලවනවා. හොඳද? එතකොට කාටහරි කියන්න පුළුවන්, දේශපාලන මාරුවීම් කියලා. ඒ කිසිවක් දේශපාලන මාරුවීම් නොවෙයි. මම පසුව කියන්නම් ඒ ගැන. මට හෝ අපේ කිසිවෙකුට අවශ්‍ය නැහැ, අපට ඕනෑ OIC කෙනෙක් පත්කර ගන්න, අපට ඕනෑ පොලිස්පතිවරයෙක් පත්කර ගන්න. ඒවා අපේ ලෝකයේ නැහැ. මම ඒක පසුව කියන්නම්.

අපි මොකක්ද කරන්නේ? මේ අපරාධ කල්ලි මැඩ පැවැත්වීම සඳහා යන ගමනේදී, "යම් යම් අපරාධ කල්ලිවලට ආරක්ෂාව දුන්නා, අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තේ නැහැ" කියලා යම් යම් බුද්ධි තොරතුරු අපට වාර්තා වෙනවා නම්, "අපි අපරාධයක් පිළිබඳව පොලීසියට ගිහිල්ලා කිව්වාම පොලීසියෙන් ඒක නැවත අපරාධකාරයා වෙත ගිහිල්ලා තිබෙනවා" කියා මහජනයාගෙන් අදහසක් එනවා නම්, එහෙම තත්ත්වයක් නම් තිබෙන්නේ ඒ පොලීසිය වෙනස් කරන්න ඕනෑ නැද්ද? කවුද කියන්නේ ඒවා දේශපාලන මාරුවීම් කියලා? ඒක කිසිදු දේශපාලන පළිගැනීමක් හෝ දේශපාලන මාරුවීමක් නොවෙයි. අපරාධ කල්ලියක දේශපාලන ජාලය බිඳිනවා වාගේම, ඒ නිලධාරී යන්ත්‍රණයත් අපි බිඳින්න ඕනෑ. අපි ඒ සඳහා කටයුතු කරමින් තිබෙනවා. අපේ රටේ පොදු ජනතාවගේ වුවමනාවක් තිබෙනවා, මේ සන්නද්ධ, සංවිධානාත්මක අපරාධ කල්ලි මැඩ පවත්වන්න ඕනෑ කියලා. ඒ මැඩ පවත්වන එකම ආණ්ඩුව ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බව මතක තබා ගන්න.

හැබැයි, දැන් අපට සාධාරණ සැකයක් තිබෙන තැනක් තිබෙනවා. මෑත කාලයේ සිදුවීම් කිහිපයක් අපි විශ්ලේෂණය කළා. එක, මිද්දෙණියේ පුද්ගලයෙක් සහ දරුවන් දෙදෙනෙකුගේ ඝාතනය. දෙවැනි එක, අලුත්කඩේ උසාවියේ සිදු වුණු ඝාතනය. ඊළඟට, කොටහේන ඝාතනය, උස්වැටකෙයියාවේ ඝාතනය, ගල්කිස්ස පොලීසියේ අවි පැහැරගෙන සංවිධානාත්මක අපරාධ කල්ලි වෙත භාර දීම. ඒ වාගේම ඊයේ සිදු වුණු මිනුවන්ගොඩ වෙඩි තැබීම. මේ, මෑත කාලයේ සිදුවීම් හයක්. මේ සිදුවීම් හය

ගත්තොත් දැනට මිනුවන්ගොඩ අපරාධය හැරුණුකොට අනෙක් පහම කල්ලි පහක වැඩක්. හරිද? සමහර විට එකක් විසින් අනෙක් එකට පහර දීලා, කල්ලි දෙකක් අතර ගැටුමක් වෙනවා. මිනුවන්ගොඩ සිදුවීම හැර. ඒකට තවත් පරීක්ෂණ කරන්න ඕනෑ, කවුද කල්ලිය කියලා හොයන්න. ඒ මම කියපු සිදුවීම් පහ ගත්තොත්, ඒවා කල්ලි පහක වැඩ. එහෙම නම් ඒකෙන් කියන්නේ මොකක්ද? සන්නද්ධමය, සංවිධානාත්මක අපරාධ කල්ලි ටික එක විට සක්‍රීයභාවයකට ඇවිල්ලා තිබෙනවා. ඒකයි විශේෂය.

මෙවැනි සන්නද්ධ සක්‍රියතාවකට ආ හැකි තවත් තැන් දෙකක් අපි හඳුනාගෙන තිබෙනවා. එකක්, මඩකලපුව. මඩකලපුව කියන්නේ එවැනි තත්ත්වයකට පත්විය හැකි තැනක්. තව තැනක් තමයි උතුර. ඒ ඇයි? සමහර අය විසින් තමන්ට මෙහෙයවිය හැකි සන්නද්ධ කණ්ඩායම් ගොඩනහලා තිබෙනවා. මඩකලපුවේ එවැනි සංවිධානයක් තිබෙනවා. ඒක මෙහයවිය හැකියි. යාපනයේ එවැනි කල්ලි ගොඩනැඟුවා. ඒවා මෙහෙයවිය හැකියි. ඒ නිසා අපි හිතනවා, මේවා එකවිට සක්‍රියතාවට ගෙන ඒම පිටුපස යම් සැලසුම්සහගත කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා. ඒ ඇයි? මේ කුමන්ත්‍රණය දියත් වෙන්නේ නිකම්ම නොවෙයි.

මෙතැනදී බොහෝ අය අපට කිව්වා, පසුගිය සාතන පිළිබඳව, වංචා දූෂණ පිළිබඳව පරීක්ෂණ කෙරෙන්නේ නැහැ, සිදුවන පරීක්ෂණ, -පරීක්ෂණ අවධිය- පිළිබඳව අපි ඔබතුමන්ලාට කියන්නේ නැහැ කියලා. මම දැක්කා, එක මන්ත්‍රීවරයෙක් කියනවා, "අපට දැන් පරීක්ෂණයේ තත්ත්වය කියන්න" කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.
அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.
Accordingly, Parliament resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින සභාවේ කටයුතු අවසන් වන තෙක් අවශ්‍ය කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී -
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பட்டது. -
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee. -
[THE HON.SPEAKER in the Chair.]

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ගරු සභාපතිතුමනි, මම කියමින් සිටියේ, ආර්ථිකය කඩා වැටීම පිළිබඳ අපේක්ෂාව බිඳ වැටෙනකොට, ආණ්ඩුව තුළ අර්බුදයක් ඇතිවෙලා ආණ්ඩුව කඩා වැටෙයි කියන අපේක්ෂාව බිඳ වැටෙනකොට, මහජනයාගේ විරෝධයක් හරහා ආණ්ඩුව කඩා වැටෙයි කියන අපේක්ෂාව බිඳ වැටෙනකොට දැන් එක එක සන්නද්ධ කල්ලි, එක එක අපරාධ කල්ලි සැලසුම්සහගතව වෙන වෙනම ක්‍රියාත්මක වෙනවා. හැබැයි, ඒ සියල්ල එක හස්තයකින් හසුරුවනවාද කියන සාධාරණ සැකය අප ඉදිරිපිට තිබෙනවා. ඒ සඳහා සමහර වාර්තා ලැබී තිබෙනවා. අපි ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වනවා. මේවා එක තැනකින් රට තුළ යම් අස්ථාවරත්වයක් පිළිබඳ මතය නිර්මාණය කිරීම සඳහා කරන මෙහෙයුම්ද? ඇයි, ඒ මෙහෙයුම්වලට තදියම්භාවයක් අවශ්‍ය වෙලා තිබෙන්නේ?

අපි දන්නවා, වංචා දූෂණ පිළිබඳව පරීක්ෂණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ආදී ආයතන විසින් කරනවා. පරීක්ෂණ විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඊළඟට, ඒ පරීක්ෂණය මත අධිකරණ පද්ධතියට "B" වාර්තා ඉදිරිපත් කරලා, අවශ්‍ය නම් රිමාන්ඩ් භාරයට ගන්න පුළුවන්. හැබැයි, අපරාධයක් පිළිබඳ ප්‍රශ්නයකදී ඒක ප්‍රමාණවත් වෙන්නේ නැහැ. එහෙම නම් මොකක්ද වැදගත්ම දේ? එම පරීක්ෂණය නිසි පරිදි අවසන් කරලා මහාධිකරණය වෙත අධිචෝදනා පත්‍ර භාර දීම. ඒක තමයි ඕනෑම අපරාධයක් පිළිබඳව රජය පාර්ශ්වයෙන් ඇති අවසාන ක්‍රියාව. ඊට පස්සේ අධිකරණය තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව සහ අපරාධකරුවන්, ඒ නීතිඥයන් අතර සංවාදය අධිකරණයේදී යනවා. එච්චරයිනේ. එහෙම නම් අපේ වැඩ කොටස මොකක්ද? ඒවා පිළිබඳව පරීක්ෂණ කරලා, අධිචෝදනා නඟලා මහාධිකරණයේ නඩුව ගොනු කිරීම. හරිනේ?

මෑත කාලයේ අපි එවැනි නඩු විශාල ප්‍රමාණයක් ගොනු කරමින් ඉන්නවා. මේ වෙනකොට ක්‍රිෂ් ගනුදෙනුව පිළිබඳ නඩුව මහාධිකරණයේ ගොනු කරලා තිබෙනවා. ඒ වාගේම, ශ්‍රීලංකන් එයාර්ලයින් සම්බන්ධයෙන් වන නඩුවට අදාළ චෝදනා පත්‍ර ඉතා ඉක්මනින්ම මහාධිකරණයේ ගොඩනැඟේවි. ඒ වාගේම කීත් නොයාර් පිළිබඳ නඩුව ඉතා ඉක්මනින්ම මහාධිකරණයට එනවා. මතක තියාගන්න.

ඒ වාගේම ගොඩක් අය පාස්කු ප්‍රහාරය පිළිබඳව කථා කළා. ඔව්, අපිත් ඒ ගැන සංවේදීයි. ඒ පිළිබඳව පරීක්ෂණ සිදු වෙනවා, භය වෙන්න එපා. හැබැයි, ඒ පරීක්ෂණ කිසිවක් අපි මාධ්‍ය සාකච්ඡා පවත්වා හෝ පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන්නේ හෝ නැහැ. ඒ පරීක්ෂණවල තත්ත්වය අපි අධිකරණයට වාර්තා කරනවා. ඒක තමයි අපේ බැඳීම. පරීක්ෂණවල තත්ත්වය මොකටද අපි කියන්නේ? ඉස්සර මේක සම්ප්‍රදායයක් බවට පත්වෙලා තිබුණා. පරීක්ෂණවල මට්ටම, පරීක්ෂණවල අදියර, පරීක්ෂණවල ප්‍රමාණය මාධ්‍ය හරහා කිව්වා. ඒ කියන්නේ මොකක්ද? චූදිතයාට සැඟවීම සඳහා සහ පරීක්ෂණයෙන් ගැලවීම සඳහා අනියම් ආකාරයකින් වාර්තා ඉදිරිපත් කරනවා. ඒවා සන්දර්ශන පරීක්ෂණ. හැබැයි, අපි සන්දර්ශන පරීක්ෂණ තියන්නේ නැහැ. දැන් දකිනවානේ?

ඒ වාගේම අරුගම්බේ සිද්ධියත් ඔබට මතක ඇති. අරුගම්බේ සිදුවීම ඇති වෙන්න හේතු වුණේ ලංකාව ඇතුළේ මතු වුණු අර්බුදයක් නොවෙයි. ජාත්‍යන්තර වශයෙන් මතු වුණු ගැටලුවක් පාදක කරගෙනයි එම සිද්ධිය වුණේ.

අරුගම්බේ ප්‍රදේශයේ ඊශ්‍රායල ජාතිකයන් ඉලක්ක කරගෙන ප්‍රහාරයක් එල්ල විය හැකි බව බුද්ධි අංශ අපට වාර්තා කළා. අපි මොකක්ද කළේ? අපි මාධ්‍යයට කිව්වේ නැහැ, බුද්ධි අංශ මෙහෙම වාර්තා කරලා තිබෙනවා කියලා. අපේ වගකීම මොකක් ද? සමාජයත් සංසුන්භාවයෙන් තියාගෙනම, මහ ජනයාට ආරක්ෂාව පිළිබඳව සහතිකයක් ලබා දෙමින් අරුගම්බේ පිළිබඳ පරීක්ෂණ කිරීම තමයි අපේ පියවර. අපේ කිසිම ඇමතිවරයෙක්, මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේදී හෝ මාධ්‍ය සාකච්ඡාවකදී හෝ රූපවාහිනියේදී හෝ අරුගම්බේ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරලා නැහැ. එහෙම ඉදිරිපත් කළ යුතු ද? ඒවා පරීක්ෂණ; අපරාධයක් වළක්වා ගැනීම සඳහා යන ගමන. ව්‍යක්තීයභාවයෙන් තමයි ආණ්ඩුවක් හැටියට අපි හැසිරෙන්නේ. ඒක මතක තබා ගන්න.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

අපට තොරතුරු ඇවිල්ලා දවස් දෙකක් යන්න කලින් අපි තිදෙනෙකු අත්අඩංගුවට ගත්තා. අවසානයේදී අපි හයදෙනෙකු අත්අඩංගුවට ගත්තා. අපි පරීක්ෂණය දියත් කරලා, කිහිපදෙනෙකු අත්අඩංගුවට ගත්තාට පස්සේ තමයි ඇමෙරිකානු එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් ඒ රටේ පුරවැසියන්ට ලංකාවේ සංචාරය කිරීම සම්බන්ධව අවදානමක් පිළිබඳව ප්‍රකාශයක් කළේ. එතකොට අපි පරීක්ෂණය කරමින් කිහිපදෙනෙකු අත්අඩංගුවට අරගෙන. ඒ, සති දෙකකට විතර පස්සේ. අපි එහෙමයි වැඩ කරලා තිබෙන්නේ. හයදෙනෙකු අත්අඩංගුවට ගත්තා. අපි ඒ කලාපයේ සංචාරක කර්මාන්තය බිඳ වැටෙන්න ඉඩ දුන්නේ නැහැ, මහජනයා අතර සන්සුන්තාව බිඳෙන්න ඉඩ දුන්නේ නැහැ, ආර්ථිකයට බලපෑමක් ඇති වෙන්න ඉඩ දුන්නේ නැහැ. හැබැයි, අරුගම්බේ ප්‍රහාරය වළක්වාගෙන, ඒ සඳහා සැලසුම් කළ අය අත්අඩංගුවට අරගෙන ඉතා කෙටි කාලයක් ඇතුළත එක්සත් ජනපදය විසින් ප්‍රකාශ කළා අවදානම් තත්ත්වය පහ වුණා කියලා. අපි ඔවුන්ට ගිහිල්ලා කිව්වා, මේකයි දැන් තත්ත්වය, මේ තත්ත්වය අපි ජයග්‍රහණය කරලා තිබෙනවා, මෙතැනට අපි ඇවිල්ලා තිබෙනවා කියලා. එහෙම නොවෙයිද ආණ්ඩුවක් කටයුතු කරන්න ඕනෑ?

අපි දැනුත් මේ අපරාධ පිළිබඳව පරීක්ෂණ කරමින් සිටිනවා. හැබැයි ඔබම හිතන්න, ලසන්ත වික්‍රමතුංග ඝාතනය වෙන්නේ 2009 ජනවාරි මාසයේ 08 වන දා. මේ, 2025. අවුරුදු 16ක් ගිහින්. අපේ ඇස් ඉදිරිපිට පෙනෙන්න තිබෙනවා, ඝාතනයක් තමයි සිදු වුණේ කියලා. අපරාධකරුවන් සොයා ගන්න බැරි ඝාතනයක් මහ දවල් සිදු වී තිබෙනවා. එය සිදු වුණේ කොහොමද කියලා දළ අදහසක් පොදු සමාජයට තිබෙනවා. හැබැයි, අධිකරණ පද්ධතියට දළ අදහස වැඩක් නැහැ. අධිකරණ පද්ධතියට අවශ්‍යයි සැකයෙන් ඔබ්බට තහවුරු කිරීමක්. එහෙම නේ ඕනෑ? ඒ කියන්නේ සැකයෙන් තොර තහවුරු කිරීමක් නොව, එතැනින් ඔබ්බට තහවුරු කිරීමක් අවශ්‍යයි. එහෙම නම්, ඉතා වැදගත් සාධක අවශ්‍යයි. වැදගත් සාධක අවුරුදු 16කට පසුව අපි එක් රැස් කර ගන්න ඕනෑ. ඒක සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි; ඊයේ ඝාතනයක් වෙලා අද පරීක්ෂණයක් කරනවා වාගේ නොවෙයි. අවුරුදු 16කට පසු ඒ පරීක්ෂණ අසීරුයි. ඒත් අපි කරනවා. මතක තියා ගන්න, අසීරුයි, ඒත් අපි කරනවා.

මම කියන්නම් තමුන්නාන්සේලාට, මේ කාරණයත්. මේ අපරාධකරුවන්ට දඬුවම් ලබා දීම සඳහා මහඟු අවස්ථාව තිබුණේ 2015දී. පරීක්ෂණ නැවුම්, අවස්ථාව නැවුම්, සිදුවීම් අලුත්. නමුත්, කළේ නැහැ. පාවා දුන්නා ඒ මහ ජනයාගේ මතය. මාධ්‍යවේදීන්ට පහර දීම්, ඝාතනය කිරීම්, මේ සියල්ල විසඳීම සඳහා හොඳම අවස්ථාව තිබුණේ 2015දී. අද වන කොට 2015න් පසුව අවුරුදු 10ක් ගිහින්. ඔබතුමන්ලා හිතනවාද අපරාධකරුවන් අපරාධ කරලා, ඒ අපරාධ එසේ හෙළිදරව් වෙන්න ඉඩ දෙමින් අවුරුදු 10ක් ඉඳිවි කියලා? අවුරුදු 10ක් ඉන්නේ නැහැ.

පරීක්ෂණ කොහොමද දියත් වුණේ? අපි තෙල් සංස්ථාවේ එක පරීක්ෂණයක් පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට ලිපි ගොනුව යවන්නේ 2015 ඔක්තෝබර්වල. උත්තරය එන්නේ 2025 ජනවාරි මාසයේ, අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා. අවුරුදු 10ක්. ඇයි ඒ? නීතිපති දෙපාර්තමේන්තුවට ෆයිල් එකක් ගිහින් ඒකට උත්තරයක් එන්න අවුරුදු 10ක් ගත වුණේ මොකක් නිසා ද? එය නීතිපති දෙපාර්තමේන්තුවේ වැරැද්ද නොවෙයි. ඒ පිළිබඳ දේශපාලන අධිකාරියට තිබුණු වුවමනාවයි, ඒ. අවුරුදු 5ක් තමුන්නාන්සේලා ෆයිල් එක වහගෙන ඉන්නවා. ඊළඟ අවුරුදු 5 අපරාධකාරයෝ වහගෙන ඉන්නවා. මේකයි ඇත්ත. මේ සත්‍යය තමුන්නාන්සේලා පිළිගන්න සූදානම් නැද්ද? අවුරුදු 10කට පසුව තමයි ඒ පරීක්ෂණය පිළිබඳ වාර්තාව එන්නේ.

ඊට පස්සේ අත්අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කළාම තමුන්නාන්සේලාත් කෑ ගැහුවා. මට පුදුමයි. ඇයි එහෙම කරන්නේ? දැන් මෙතැන ඉන්නේ රට අවුස්සන විපක්ෂයක් නොවුණා වුණාට, සිදු වන සැබෑ සිදුවීම් පිළිබඳව සැබෑ හැඟීමකින් කටයුතු කරන්නේ නැහැ නේ. අත්අඩංගුවට ගත්තාම අහනවා, "ඇයි රෑ ගිහිල්ලා ගත්තේ? ඇයි බිරිඳත් එක්ක ගත්තේ?" කියලා. ඒක අපේ වැඩක් නොවෙයි. ඒක පොලිස් දෙපාර්තමේන්තුවේ වැඩක්. ඒ වන කොටත් පොලිස් දෙපාර්තමේන්තුවට ඒ පිළිබඳ අත්දැකීම් තිබුණා. සමහර අය හැංගුණා. දැනුත් හැංගිලා ඉන්නවා. අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු ඉදිරිපත් කරපු දෙදෙනෙක් ඉන්නවා. මීට මාස දෙකකට විතර පෙර නේද, ආනන්ද විජේපාල අමාත්‍යතුමා?

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඔව්.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ඒ අය හැංගුණා. එහෙම නම්, පොලීසිය මොකක්ද කරන්න ඕනෑ? හැංගෙන්න ඉඩ දෙන්න බැහැ.

අත්අඩංගුවට ගැනීම සඳහා ප්‍රධාන කෙනෙකුට අදත් අධිකරණයෙන් නියෝගයක් ඇවිල්ලා තිබෙනවා. එයා හැංගිලා. PSOත් ගෙදර තියලා ඊයේ රෑ ගිහිල්ලා තිබෙන්නේ. අපි දන්නවා. අපි හිතනවා, අඩුම තරමින් හෙට භාර වෙයි කියලා. ඉතින්, මෙහෙම නේ සිද්ධ වෙන්නේ.

අපි අපරාධකරුවන්ට රිසි සේ කටයුතු කරන්න අවස්ථාව දෙන්නේ නැහැ. අපට ජන වරමක් තිබෙනවා. මේ අපරාධ ඉතිහාසයේ කාලයේ වැලි තලාවෙන් යට වෙන්න ඉඩ නොදීමේ සහ ඒ අපරාධවල විත්දිතයන්ටත්, මේ රටේ පුරවැසියන්ටත් සාධාරණය සහ යුක්තිය ඉටු කිරීමේ වගකීම අපට තිබෙනවා. ඒ වගකීම උරට අරගෙන තමයි අපි කටයුතු කරන්නේ. අපි කිසි අත් වැරැදීමක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. ඒක තමයි, වගකීම. ඔබතුමන්ලා කවුරු හරි හිතනවා නම් අපි මේ අපරාධකරුවන් ආරක්ෂා කරන්න, දුෂිතයන් ආරක්ෂා කරන්න කටයුතු කරනවා කියලා, කවදාවත් අපි ගැන එහෙම හිතන්න එපා. ඒක වෙන්නේ නැහැ.

තමුන්නාන්සේලාගේ නායකයන්ට වඩා අපේ නායකයන් විශ්වාස කරන්න. මම ඒකයි කියන්නේ. ඔබතුමන්ලාගේ නායකයන්ට වඩා අපේ නායකයන් විශ්වාස කරන්න. එහෙමයි වැඩ කරන්නේ. ඒක නිසා ඒකට සහායයි අවශ්‍යව තිබෙන්නේ. ඡන්දයේදී ඡන්දය කරන්න. හැබැයි, මේ රටේ අපරාධ, මේ රටේ අල්ලස, දූෂණය මැඩ පැවැත්වීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග අපි ඉදිරියට ගෙන යා යුතුයි. ඒ පිළිබඳව අපි ඉතා වගකීමෙනුයි වැඩ කටයුතු කරමින් ඉන්නේ. අන්න එතකොට තමයි ඒ පරීක්ෂණ එල්ල වෙලා තිබෙන්නේ කවර දිශාවට ද, ඒ පරීක්ෂණ ගමන් කරමින් තිබෙන්නේ කවර දිශාවට ද කියලා අපරාධකරුවන්ට හැඟෙන්නේ. ඒ පරීක්ෂණවල ඉලක්ක බවට පත් වන අපරාධකරුවන් නම් දන්නවා, මෙතැන ඉන්න ඔබතුමන්ලාට වඩා ඒ අපරාධකරුවන් දන්නවා, තමන්ගේ දිශාවට පරීක්ෂණය එමින් තිබෙන බව. සමහර විට මම දන්නේත් නැහැ. හැබැයි, අපරාධකරුවා දන්නවා. කීත් නොයාර්ගේ පරීක්ෂණ ඉදිරියට යන කොට අපරාධකරුවා දන්නවා, තමන්ගේ දිශාවට පරීක්ෂණයේ හස්තය දියත් වෙමින් එන බව. පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ

පරීක්ෂණය දියත් වෙන කොට අපරාධකරුවා දන්නවා, පරීක්ෂණයේ හස්තය තමන්ගේ දිශාවට එල්ල වෙමින් තිබෙන බව. එයාර්ලංකා ගනුදෙනුවේ පරීක්ෂණය ඉදිරියට යන කොට දූෂිතයා දන්නවා, තමන්ගේ දිශාවට පරීක්ෂණය එල්ල වෙමින් එන බව. එතකොට මොකක්ද කරන්නේ? අන්න එතකොට, ඒ අපරාධකරුවන් ඉතා සැලසුම් සහගතව මෙවැනි අස්ථාවරත්වයක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කරනවාද කියන සාධාරණ සැකය අපට තිබෙනවා. එහෙම නැතුව කල්ලි පහක්, හයක් එක විට මෙහෙයවිය හැක්කේ කාට ද? එහෙම මෙහෙයවන්න පුළුවන් කණ්ඩායම් ඉන්නවා. විශේෂයෙන් අපි පොලිස්පතිතුමාටත්, බුද්ධි අංශවලටත් දැනුම් දුන්නා, ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන්න කියලා. එවැනි වුවමනාවක් නම් තිබෙන්නේ, ඒ වුවමනාව දියත් කර ගැනීම සඳහා තව කවර කවර ආකාරයේ සිදුවීම් සිදු විය හැකි ද කියලා අපි හඳුනාගෙන තිබෙනවා. ඒක තමයි අපේ වගකීම. අපි ඒ වගකීම ඉටු කරමින් සිටිනවා. ඒ නිසා ඔබ කිසිවෙක් සැකයක් තියාගන්න එපා. ජාතික ආරක්ෂාව පිළිබඳ තර්ජනයක්, මහජන ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. මෙතැන හුදු සංවිධානාත්මක අපරාධ කල්ලිවල ක්ෂණික නැඟී සිටීමක් තිබෙනවා. අපි ඒවා ඉතා ඉක්මනින්ම මැඩ පවත්වමින් තිබෙනවා. ඒ, පළමුවැනි කාරණය.

දෙවැනි කරුණ ගනිමු. මම දැක්කා බොහෝ අය කියනවා, අපි අලුත් ආරක්ෂක මණ්ඩලයක් හදලා තිබෙනවා කියලා. ඔව්, එය අලුත්. ඔක්කෝම අලුත්; මතක තියා ගන්න. කැබිනට් මණ්ඩලයේ, ඔක්කෝම අලුත්. පාර්ලිමේන්තුවේ, බහුතරය අලුත්. ආරක්ෂක මණ්ඩලය, අලුත්. හමුදාපතිවරු, අලුත්. බුද්ධි අංශ ප්‍රධානින්, අලුත්. ඇයි? පරණ ගමන යන්න පුළුවන් පරණ අයත් එක්ක. අලුත් ගමනක් යන්න නම් අලුත් අය අවශ්‍යයි.

ඔව්, අලුත්. මොකක්ද ප්‍රශ්නය? ඒ ගැන කාට හරි ප්‍රශ්නයක් තිබෙනවාද? පරණ යාළුකම් තිබෙන්න පුළුවන්, මිත්‍රකම් තිබෙන්න පුළුවන්. Telephone call එකක් ගන්න පුළුවන්. ඕනෑ නම් රෑට අඩියක් ගහන්න එකතු වෙන්න පුළුවන්. මම කිව්වේ, ඒගොල්ලන්ට. මම දැක්කා කථා කරපු පරණ කෙනෙක්. අපි එහෙම නොවෙයි. අපි ඒ ඔක්කෝම වෘත්තීමය හමුදාවක් බවට පරිවර්තනය කරනවා. අපට අවශ්‍යයි එහෙම. මම කියන්නම් තමුන්නාන්සේලාට දැන ගන්න.

ඊළඟට, අපේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි - CDS - තනතුර. මොකක්ද වෙලා තිබෙන්නේ? සේවා දිගු 7ක් දීලා තිබෙනවා. මොකක් වෙනුවෙන්ද? එයා තියාගෙන ඉන්නේ රාජ්‍ය ආරක්ෂාවටද? නැහැ. එයා තියාගෙන ඉන්නේ තමන්ගේ ගෝලයන් ලෙස. මේ කිසිදු පත්වීමක්, මගේ ගෝලයෝ හෝ අපගේ ගෝලයෝ නොවෙයි. මේ කිසිදු පත්වීමක්, මගේ මිතුරන් නොවෙයි. මේ කිසිදු පත්වීමක්, මගේ යටත් වැසියන් නොවෙයි. එහෙම අය නොවෙයි. අපට වෘත්තීමයභාවයක් අවශ්‍යයි. අපි පත් කිරීම් කරලා තිබෙන්නේ ඒ අනුව. අපේ රටේ පොලිස් දෙපාර්තමේන්තුවට, අපේ රටේ ත්‍රිවිධ හමුදාවට යළි වෘත්තීමය තත්ත්වයක් එන තැනට අපි ස්ථාපිත කරන්න ඕනෑ. හැබැයි, ඒවා වෘත්තීමය මට්ටමේ තිබුණේ නැහැ. ඒවා තිබුණේ කොතැනද? ඒවා තිබුණේ, මෙහෙමයි. ජනාධිපතිතුමාගේ ගෝලයා තමයි CDS. එහෙම නේ තිබුණේ. එහෙම නොවෙයිද? කාට හරි කියන්න පුළුවන්ද එහෙම නොවෙයි කියලා? තවත් වෙලාවක තිබුණා, ජනාධිපතිවරයාගෙන් පසු අනුප්‍රාප්තික ජනාධිපතිවරයා CDS එකෙන් හදනවා කියලා. එහෙම කථාවක් තිබුණා නේ. තව විටෙක තිබුණා, ජනාධිපතිවරයා යනකොට ජනාධිපතිවරයා එයා අගමැති ධුරයට පත් කරයි කියලා. තිබුණේ නැද්ද? කොහොමද ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි, ජනාධිපතිවරයාගෙන් පසුව අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙක් බවට ස්ථානගත වෙන්නේ? ජනාධිපතිවරයා ඔහු අගමැති ධුරයට පත් කරයි කියලා විශ්වාසයක් ඇති වෙන්නේ කොහොමද? ඒ කියන්නේ මොකක්ද? වෘත්තීමයභාවයෙන් නොවෙයි ඒ කටයුතු කරලා තිබෙන්නේ, ගෝලකම මත. අපි ගෝලබාලයින්ගේ හමුදාවක් හදන්නේ නැහැ; ප්‍රධානින් හදන්නේ නැහැ. ඒක මතක තබා ගන්න. CDSට සේවා දිගු 7ක් දීලා තිබෙනවා. මට කියන්නේ තව අවුරුද්දක් දෙන්න කියලාද?

ඊළඟට, රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියාට දීලා තිබෙනවා සේවා දිගු 2ක්. නැවත කැඳවීම් 2ක් දීලා තිබෙනවා. මාරු කළාම නැවත කැඳවලා තිබෙනවා අවස්ථා දෙකක. මට කියන්නේ නැවත දෙන්න කියලාද? එහෙම කරන්නේ ගෝලයන් බුද්ධි අංශවල තියා ගන්න ඕනෑ වුණාම. ඊළඟට CNIට. ඔහු මාරු කළාම නැවත කැඳවලා - recall කරලා - සේවා දිගු 6ක් දීලා තිබෙනවා. වෘත්තීමය හමුදාවල මෙහෙම තිබෙනවාද? වෘත්තීමය බුද්ධි සේවා මේ විධියට පවතිනවාද? CDSට සේවා දිගු 7යි; CNIට නැවත කැඳවීම් සහ සේවා දිගු 6යි. ඊළඟට, SIS එකේ ප්‍රධානියාට නැවත කැඳවීම් සහ සේවා දිගු 2යි. මෙහෙම සේවා දිගු දෙන්න පුළුවන්ද වෘත්තීමය හමුදාවකට? මේ වෘත්තීමය හමුදාවක් නොවෙයි.

ඊළඟට, හමුදාපතිවරයාට සේවා දිගු 2යි. නාවික හමුදාපතිවරයාට සේවා දිගු 2යි. ගුවන් හමුදාපතිවරයාට එක සේවා දිගුවයි. ඔබතුමන්ලා කියන්නේ මටත් එහෙම දෙන්න කියලාද? නැහැ. ඒ අවස්ථා ඔක්කෝම අපේ රටේ බුද්ධි සේවා, අපේ රටේ හමුදා වෘත්තීමයභාවයෙන් එහාට ගෙන ගිය අවස්ථා. ඒ නිසා අපේ ප්‍රයත්නය මොකක්ද? හමුදාව සහ පොලිසිය වෘත්තීමය ස්වභාවයකට ගෙන ඒම. ඒක තමයි ජාතික ජන බලවේග ආණ්ඩුවේ අපේක්ෂාව. ඒ මට පක්ෂපාති ද? නැහැ, මට නොවෙයි, රජයට පක්ෂපාති. හමුදා හැදුවේ කොහොමද? බුද්ධි සේවා හැදුවේ කොහොමද? එයාට පක්ෂපාතීව. පුද්ගලයන්ට පක්ෂපාතීව. පුද්ගලයන්ට පක්ෂපාති හමුදාවකින් වැඩක් තිබෙනවාද? පුද්ගලයන්ට පක්ෂපාති, දේශපාලකයාට පක්ෂපාති හමුදාවක් නොවෙයි අප හදන්නේ රාජ්‍යයට පක්ෂපාති හමුදාවක්. වෘත්තීමය හමුදාවක් අපි හදනවා.

මම දැක්කා ආරක්ෂක වියදම් ගැන කියලා තිබුණා. තව වියදම් කළ යුතුයි. හේතුව මම කියන්නම්. අපි 2030 වනකොට අපේ යුද හමුදාව 100,000කට සීමා කරනවා. ගුවන් හමුදාව 18,000ක සීමාවකට එනවා. නාවික හමුදාව 40,000ක සීමාවකට එනවා. යුද හමුදාව 100,000යි, නාවික හමුදාව 40,000යි, ගුවන් හමුදාව 18,000යි. ප්‍රමාණයෙන් අඩු වනවා. හැබැයි, තාක්ෂණික වශයෙන් උසස් හමුදාවක් බවට අපේ හමුදා පරිවර්තනය කිරීම සඳහා අපි වැඩ කරනවා. අද තිබෙන ගුවන් යානා විශාල ප්‍රමාණයක් කල් ඉකුත් වීමට කිට්ටු වෙමින් තිබෙනවා. අද තිබෙන ගොඩක් යුද අවි කල් ඉකුත් වීමට කාලය එළඹිලා තිබෙනවා. නාවික හමුදාවේ නැවියන් අපට කියනවා, "අපේ නාවික හමුදාව සතුව තිබෙන සමහර බෝට්ටු, සමහර යාත්‍රාවල යන්න සාමාන්‍යයෙන් නාවික හමුදාවේ පුහුණුවට වඩා වෙන පුහුණුවකුත් ඕනෑ" කියලා. එහෙම අබලන් තත්ත්වයක තිබෙන්නේ. ඒක රටකට හිතකර නැහැ. ඒ නිසා අපි තාක්ෂණික වශයෙන් දියුණු උපකරණ ලබා දෙමින් ඉතා තියුණු මනසක් සහිත වෘත්තීමය හමුදාවක් බවට අපේ හමුදාව පරිවර්තනය කිරීම තමයි අපේ ඉලක්කය. ඔවුන් රාජ්‍යයට පක්ෂපාති හමුදාවක්. පුද්ගලයන්ට පක්ෂපාති හමුදාවක් නොවෙයි. තනතුරු වෙනස් කරන්න සිද්ධ වන්නේ කුමක් නිසාද? රාජ්‍යයට පක්ෂපාති හමුදා ක්ෂේත්‍ර ගොඩනැඟුවා නම් තනතුරු වෙනස් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. හැබැයි, ගොඩනඟලා තිබෙන්නේ පුද්ගලයන්ට පක්ෂපාති හමුදා.

අපි දෙසැම්බර් මාසයේ 30 වාගේ තමයි මේ තීන්දුව ගත්තේ. අපි ජයග්‍රහණය කරලා මාස 4ක වාගේ කාලයක් ගත්තා මේ තීන්දුව ගන්න. තිබෙන තත්ත්වය අවබෝධ කරගෙන, තිබෙන තත්ත්වයට අනුගත වෙමින් තමයි අපි ඒ අය ඉවත් කරන්න ඕනෑ කියලා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ඒ මාස 4 තුළත් වැඩියෙන්ම ආපු චෝදනා මොනවාද? "තාමත් මෙයා තියාගෙන යනවා ද? මෙයා තියාගෙන ආරක්ෂාව පිළිබඳව සහතිකයක් දෙන්නේ කොහොමද? මෙයාත් එක්ක ආරක්ෂක මණ්ඩලය කැඳවන්නේ කොහොමද?" එහෙමයි අපෙන් ඇහුවේ. අපි ඒත් කලබල වුණේ නැහැ. සමහර අය හිතුවා, අපි එනකොටම ඒ අය ඉවත් කරයි කියලා. අපි එනකොටම ඒ අය ඉවත් කළේත් නැහැ. අපි ක්‍රමානුකූලව ඒ තිබෙන අත්දැකීම් උකහා ගනිමින්, ඒ තිබෙන යන්ත්‍රණය අඩපණ වෙන්න ඉඩ නොදී, ඒ යන්ත්‍රණයත් සක්‍රියභාවයට ගෙන එමින්, ඒකට අවශ්‍ය වන replace කිරීම තමයි කර තිබෙන්නේ. ඒක විධිමත්. අපි කලබල වෙලා නැහැ. ඒක තේරුම් ගන්න. අපි කවුරුවත් එළවලා නැහැ. අපි අවිධිමත් විධියට වැඩ කරලා නැහැ. අපි ආරක්ෂක යාන්ත්‍රණය කඩා වැටෙන්න ඉඩ දීලා නැහැ. විපක්ෂයේ ඔබතුමන්ලා කිව්වා, අපේ රටේ පාතාලය නැඟිටීම ආරක්ෂක අංශවල මාරුවීමේ ප්‍රතිඵලයක් ද කියලා. ඒක එහෙම නොවෙයි. ඒ කිසිවක් අඩපණ වෙන්න ඉඩ නොදී අපි ක්‍රමානුකූලව රෝදය කැරකෙන ගමන් රෝදයේ තිබෙන nuts ඉවත් කරමින් අලුත් nuts සවි කළා. එහෙම නොවෙයි ද කරන්න ඕනෑ? මැෂින් එක කැරකෙන ගමන් මැෂින් එකේ තිබෙන සමහර දේවල් අපි වෙනස් කර තිබෙනවා. හැබැයි, මැෂින් එක ඉතා හොඳින් කැරකෙනවා. අපි හදන්නේ ව්‍යක්තීමය හමුදාවක්. 2021 සිට අපේ හමුදා විදෙස් පුහුණුව සඳහා යනකොට ලබාදීපු දීමනාව අඩු කර තිබුණා. 2021දී ඒ තීරණයට ඇවිත් තිබෙන්නේ ඩොලර් හිඟය නිසා. අපි නැවතත් ඒක සැලකිල්ලට භාජන කරලා අවශ්‍ය විදෙස් පුහුණුව ලබාදීම සඳහා වුවමනා කරන මුදල් වැය කරන්න ලෑස්ති වෙලා තිබෙනවා. ඒ වාගේම, අපි විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා, අපේ කඩා වැටී තිබෙන ගුවන් යානා සහ හෙලිකොප්ටර් අලුත්වැඩියා කිරීම වෙනුවෙන්. අපේ ගුවන් යානා සහ හෙලිකොප්ටර් විශාල ප්‍රමාණයක් පොළොවේ තිබෙන්නේ, උඩ යන්නේ නැහැ. ඒක විශාල ජාතික අපරාධයක්. ඒ නිසා ඒවා අලුත්වැඩියා කරන්න අපි විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ඒ නිසා ව්‍යක්තීමය සහ තාක්ෂණික වශයෙන් දියුණු ශක්තිමත් හමුදා යන්ත්‍රණයක් ගොඩ නැගීම ඉලක්ක කරගෙන අපි වැඩ කරනවා. එය පුද්ගලාරෝපිත, පුද්ගලයන්ට බද්ධ හමුදාවක් නොවෙයි, රාජ්‍යයට පක්ෂපාතී හමුදාවක් අපි නිර්මාණය කරනවා. ඒ නිසා ඒ සඳහා සැලකිය යුතු මුදලක් වෙන් කළ යුතුයි. අපි භය නැතිව ඒ මුදල් වෙන් කරනවා. වෙන් කරන හේතුවත් අපි කියනවා.

ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය පොලිසිය. පොලිසියේ මහත්වරු විශාල කාර්යයක් කරමින් තිබෙනවා. එක දවසක් පොලිසිය නැහැ කියලා ඔබ හිතුවොත් රට කොතැනට පත් වේවිද? ඒ නිසා පොලිසිය වඩාත් සක්‍රිය පුහුණුවක් සහිත, පොලිස් ආරක්ෂාව සහිත හොඳ දෙපාර්තමේන්තුවක් බවට පත් කිරීමේ අපේක්ෂාවක් අපට තිබෙනවා. ඒ අපේක්ෂාව සහිතව අපි සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. පොලිසියට වාහනවල හිඟයක් තිබෙනවා. අපි වාහන ප්‍රමාණයක් ලබා දෙන්න සැලසුම් කර තිබෙනවා. පොලිසියේ traffic රාජකාරි කරන නිලධාරියෙකුට, දඩයක් සඳහා දෙන දීමනාව සියයට 25කින් වැඩි කරන්න සූදානම් කර තිබෙනවා. පොලිස් ස්ථානවල තිබෙන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අපි මේ වසරේ රුපියල් මිලියන 1,000ක් වැය කරන්න අපේක්ෂා කරනවා. ඔවුන්ගේ වැසිකිළි පද්ධතිය, ඔවුන්ගේ නාන කාමර, ඔවුන්ගේ සාමාන්‍ය විවේක කාමර, මේ ඔක්කෝම කඩා වැටිලා තිබෙන්නේ. ඒවා භාවිත කරමින් ඉතා හොඳ මනසකින් යුතුව සේවාවක් කරන්න පොලිස් දෙපාර්තමේන්තුවට බැහැ. එම නිසා අපි ඒ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කරනවා. මේ කියන ස්ථාන නැවත ඉතා හොඳින් අලුත්වැඩියා කරලා, හොඳ නිදහස් මනසකින් යුතුව රාජකාරිය කරන්න පුළුවන් ප්‍රමාණයේ පොලිස් දෙපාර්තමේන්තුවක් බවට පත් කරන්න අපි සැලසුම් කරමින් තිබෙනවා. දැනට පොලිසියේ 21,000ක හිඟයක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, පාර්ලිමේන්තුවේ රාජකාරි කරන පොලිස් මහත්වරුන්ගෙන් ඇහුවොත් දැන ගන්න පුළුවන්, මේ අය වැය කාලයේ පැය 12යි ඔවුන්ගේ duty එක. නැවත හෙටත් පැය 12ක duty පටන් ගන්න ඕනෑ. ඉතා අසීරු ලෙස මේ පොලිස් නිලධාරි මහත්වරු වැඩ කරනවා. ඒකට හේතුව පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විශාල හිඟයක් පැවතීම. දැනට ගණනය කර තිබෙන විධියට පොලිස් දෙපාර්තමේන්තුවේ 21,000ක හිඟයක් තිබෙනවා. දැනට අපේ කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා, 10,000ක් අලුතින් පොලීසියට බඳවා ගන්න. අපි බඳවා ගන්නවා. අපි ගුවන් හමුදාවට 4,000ක් බඳවා ගන්න අනුමැතිය දීලා තිබෙනවා. ගුවන් හමුදාව ඒ බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා. Navy එකට බඳවා ගැනීම් සඳහා අපි අවසර දීලා තිබෙනවා. 2030 වෙනකොට අපි අපේක්ෂා කරන ලද හමුදා සංචිත නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන බඳවා ගැනීම්වලට අපි කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, අපේ රට අශිෂ්ට රාජ්‍යයක සිට ශිෂ්ටත්වයට පත් වෙමින් තිබෙන බව.

තනි පුද්ගලයන් මෙහෙයවන ආණ්ඩු, අශිෂ්ටයි. තමන්ගේ ගෝල්බාලයන් හරහා මෙහෙයවන ආණ්ඩු, අශිෂ්ටයි. තමන්ගේ යහළු මිත්‍රයන් හරහා මෙහෙයවන ආරක්ෂාව, අශිෂ්ටයි. ඒ අශිෂ්ට යුගයේ පැවති ආයතන අපි ශිෂ්ටත්වයට ගේනවා. අපි මේ සියලු ආයතන පද්ධති ශිෂ්ටත්වයට ගේනවා. ශිෂ්ටත්වය එන්නේ කොහොමද? ආරක්ෂාව පිළිබඳව, ඒ හා බැඳී තිබෙන ආයතන ඒ කාර්යය ඉටු කිරීම, ශිෂ්ටත්වයයි. මහජනයාගේ සාමය පිළිබඳව, ඒ සඳහා වගකීම් තිබෙන ආයතන ඒ කාර්යය ඉටු කිරීම, ශිෂ්ටත්වයයි.

එම නිසා යළි අපේ රටේ ආයතනවලට පණ දෙමින්, ඒ ආයතනවලට පැවරී තිබෙන වගකීම් ඉටු කරමින්, ඒ වගකීම් ඉටු කිරීම සඳහා තිබෙන අණ පනත් ප්‍රමාණවත් නැත්නම් තවත් අණ පනත් ශක්තිමත් කර ගනිමින්, අපි මේ යන්ත්‍රණයට පණ පොවනවා. සමාජයක් අපේක්ෂා කරන්න ඕනෑ පුද්ගලයන්ගෙන් නොවෙයි. පොලිස්පති කවුද කියන එකේ නොවෙයි වැදගත්කම තිබෙන්නේ. හැබැයි, කාලයක් මොකක්ද වුණේ? පොලිස්පති කවුද කියන එක මත තමයි පොලීසිය හොඳද, නරකද කියලා තීරණය වුණේ. බුද්ධි අංශයේ ප්‍රධානියා කවුද, ඔහු මත තමයි බුද්ධිය හොඳද, නැද්ද කියලා තීරණය වුණේ. හමුදාවේ ප්‍රධානියා කවුද, ඔහු මත තමයි හමුදාව හොඳද, නැද්ද කියලා තීරණය වුණේ. ඒක අශිෂ්ටත්වය. ශිෂ්ටත්වය කියන්නේ ඒක නොවෙයි, එම ව්‍යුහයන් කෙරෙහි විශ්වාසය තබන එකයි. පොලිස්පතිවරයා අද ඉන්න පුළුවන්, හෙට අලුත් පොලිස්පතිවරයෙක් එන්න පුළුවන්. හැබැයි, ජනතාවට පොලීසිය පිළිබඳ තිබෙන විශ්වාසය බිඳ නොවැටී තිබෙන්න ඕනෑ. බුද්ධි අංශ ප්‍රධානියා වශයෙන් අද සිටින කෙනා ඉවත් වෙලා හෙට අලුත් කෙනෙක් එන්න පුළුවන්. ජනතාව තුළ බුද්ධි අංශය කෙරෙහි තිබෙන විශ්වාසය ගොඩනඟන්න ඕනෑ. හැබැයි, අපේ රටේ විශ්වාසය ගොඩනඟලා තිබුණේ එහෙම නොවෙයි, පුද්ගලයන් කෙරෙහියි. අශිෂ්ට ලෝකයක් ඒක. අශිෂ්ට ක්‍රමයක් ඒක. ශිෂ්ට ක්‍රමය තමයි යළි මේ ආයතන පද්ධතිය කෙරෙහි විශ්වාසය තබන විධියට ඒවා ගොඩනැඟීම. පොලීසිය කෙරෙහි මහජනයාගේ ඇති විශ්වාසය, පොලිස්පතිවරයා කවුද කියන භේදයකින් තොරව ඇති වීම. ඒ නිසා අපි උත්සාහ කරමින් සිටින්නේ මේ අශිෂ්ටත්වයේ කඩඉමට ගමන් කරලා තිබෙන රාජ්‍යය ශිෂ්ටත්වය කරා ගෙන ඒමටයි. ඒ අශිෂ්ට රාජ්‍යය තුළ පාතාලය එක්ක දේශපාලනඥයින් ගනුදෙනු කරනවා. පාතාලය එක්ක ආරක්ෂක නිලධාරීන් ගනුදෙනු කරනවා. ආණ්ඩුවේ තිබෙන අවි ආයුධ එළියට යනවා. ආණ්ඩුවේ තිබෙන අවි ආයුධ බලපත්‍රවලින් අරගෙන සිතු සිතු සේ වෙඩි තබා තබා යනවා. අශිෂ්ට රාජ්‍යයක්. අපි උත්සාහ කරමින් සිටින්නේ

කුමකටද? මේ අශිෂ්ටත්වයේ පතුළටම ගිලී තිබෙන රාජ්‍යය යළි ශිෂ්ටත්වය කරා කැඳවාගෙන ඒමටයි. මා හැම දෙනාටම ආරාධනා කරන්නේ, "ශිෂ්ටත්වය විශ්වාස කරන්න, අශිෂ්ටත්වය ප්‍රතික්ෂේප කරන්න" කියායි. කිසිවෙකු හෝ ශිෂ්ටත්වය ප්‍රතික්ෂේප කරනවා නම් ඔවුන්, අපි මේ ගොඩනඟන නව දේශපාලන සංස්කෘතිය විසින් අනිවාර්යයෙන් ඉතිහාසයේ දේශපාලනය කුණු කූඩයට තල්ලු වෙනවා.

අනාගතයේ ඔබට දේශපාලනයේ රඳා පවතින්න අපි නිර්ණායක පද්ධතියක් හදනවා. අපි ආණ්ඩු කරයිද, ඔබ ආණ්ඩු කරයිද? ඒක වෙනම දෙයක්. හැබැයි, අපි සමාජ නිර්ණායක පද්ධතියක් හදනවා, පාර්ලිමේන්තුවට මෙන්න මෙහෙම නිර්ණායක පද්ධතියක්; පොලීසියට මෙන්න මෙහෙම නිර්ණායක පද්ධතියක්; හමුදාවට, රාජ්‍ය ආයතනවලට මෙවැනි නිර්ණායක පද්ධතියක් කියලා. අන්න, අපි සකස් කරන්නේ එවැනි නිර්ණායක පද්ධතියක්. මතක තබාගන්න, ලංකාවේ ඉතිහාස ගණනාවක අශිෂ්ටත්වය මත පදනම් කර ගත් දේශපාලනයක් තිබුණා නම්; සංවිධාන යන්ත්‍රණ, ආයතන ව්‍යුහය මුළුමනින්ම පොඩිපට්ටම් කරගෙන යන දේශපාලන සංස්කෘතියක් තිබුණා නම්, අපේ රටේ වංචාව, දූෂණය නීතිගත කරන ලද දේශපාලනයක් තිබුණා නම්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ පාලනයෙන් පසුව ලංකාව යළි එවැනි දේශපාලනයකට විවෘත වන්නේ නැහැ. මේක තමයි හැරවුම.

මම ඔබට ආරාධනා කරනවා, ඔබට ආණ්ඩු බලය ගන්න අවශ්‍ය නම්, අපිව පළවා හරින්න නම් අපට වඩා ශිෂ්ටත්වයෙන් උඩට යන්න. එච්චරයි. පහළ දේශපාලනය අවසන්. තවදුරටත් මේ රටේ ප්‍රබුද්ධ ජනතාව එකිනෙකා කොටවන දේශපාලනය, යටි කුමන්ත්‍රණ දේශපාලනය පිළිගන්නේ නැහැ. අපි කිසි කුමන්ත්‍රණයක් කරලා බලයට ආවේ නැහැ. මම දන්නවා, දැන් කෙනෙක් කියනවා, ඔහු ඔක්තෝබර්වල පාර්ලිමේන්තුවට එනවා ලු. පව්! මම ඔහුට කියනවා, හීනෙන් හරි කමක් නැහැ පාර්ලිමේන්තුවක් හදාගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කියලා ජීවත් වෙන්න කියලා. මොකද, 1977 සිට ඔහු පාර්ලිමේන්තු එනවා. මිනිස්සු පුරුද්දට ඇබ්බැහි වෙනවා නේ. ඔහුත් පුරුද්දට ඇබ්බැහි වෙලා තිබෙන්නේ. මම කියන්නේ මේකයි. කුමන්ත්‍රණවලින් ආණ්ඩු බලය හුවමාරු කරපු යුගය අවසන්. ජාතිවාදයෙන් ආණ්ඩු බලය මාරු කරපු යුගය අවසන්. ඉදිරියේදී දේශපාලන වේදිකාව අපි මේ ගොඩනඟා තිබෙන ශිෂ්ටත්වයට වඩා උතුම් ශිෂ්ටත්වයක් ද කියන එක තමයි දේශපාලන සංවාදය. මීට වඩා උඩින් ද? එච්චරයි. එහෙම නැතුව යළි මේ රටේ මෙතැනට වඩා පහළ දේශපාලනයකට ඉඩක් විවෘත වෙන්නේ නැහැ. කොහේද, විවෘත වෙන්න පුළුවන්කම තිබෙන්නේ? අපි පොදු නිර්ණායක පද්ධතියක්; සමාජයට පිළිගත හැකි යහපත් නිර්ණායක පද්ධතියක් ගෙනෙනවා, පාර්ලිමේන්තුව කොහොමද; පොලීසිය කොහොමද; දේශපාලකයා කොහොමද; ජනාධිපතිවරයා කොහොමද; ඇමතිවරයා කොහොමද කියලා. ඒවා ගුණ යහපත් සංස්කෘතීන්. මම දැක්කා, එක් ජනාධිපතිවරයෙක් රුපියල් මිලියන පන්සිය ගණනක් වියදම් කරලා තිබෙනවා රට යන්න. ඒක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. හැබැයි, රුපියල් මිලියන 1.8කින් ගියේ කොහොමද කියන එක ප්‍රශ්නයක් වෙනවා. *[බාධා කිරීමක්]* ආ! රුපියල් මිලියන 3,500කින්. ප්‍රශ්නය වෙන්න ඕනෑ කොහොමද? මේ ජනාධිපතිවරයා රුපියල් මිලියන 3,500ක් වියදම් කළේ කොහොමද කියලා අහන්න එපා යැ. හැබැයි, අහන්නේ රුපියල් මිලියන 1.8න් ගියේ කොහොමද කියලා.

අලුත් වෙන්න ලැහැස්ති නැහැ. තමුන්නාන්සේලා පරණ විධියටම තමයි යන්න හදන්නේ. කූඩැල්ලා මෙට්ටේ තිබ්බාට හරියන්නේ නැහැ නේ. ආයෙත් මඩට යනවා. මම කියන්නේ ඕකයි. තමුන්නාන්සේලා අලුත් වෙන්න. තමුන්නාන්සේලා කියන්න, "ඔව්. මිලියන 1.8ත් වැඩියි. අපි ආවොත් මිලියන එකට යනවා" කියලා. අන්න එතකොට අලුත්. මොකක්ද මේ? මම තමුන්නාන්සේලාට කියන්නේ පැරණි, සාම්ප්‍රදායික, ගතානුගතික, අසාර්ථක දේශපාලන සාකච්ඡාවෙන් එළියට එන්න කියලායි. මේ, දේශපාලන පොසිල. අනාගතයේ අපේ දේශපාලන පුරාවිද්‍යාඥයින්ට කැණීම් කරලා සොයා ගන්න පුළුවන්, ඔය වාගේ අශිෂ්ටත්වයේ මිනිසුන්. මම මේ අවංකව කියන්නේ. අපේ රටේ දේශපාලනය වෙන තැනකට ගෙනෙන්න මීට වඩා අලුත් සංවාදයකට එන්න. අපි එතැනට එමු. එතැනට අපි විවෘත කරමු. අපි ලැහැස්තියි, ඒ සංවාදයට. තමුන්නාන්සේලා ඒ පැත්තෙන් අපට පෙන්වන්න; ඒ පැත්තෙන් කරුණු කියන්න. අපි ඕනෑම හොඳ දෙයක් උකහාගන්න ලැහැස්ති මිනිස්සු. මම අවසාන වශයෙන් මේ කාරණය කියනවා. ලංකා දේශපාලනයේ මෙතෙක් අශිෂ්ටත්වයේ ගමනක් තිබුණා නම්, ජාතික ජන බලවේගයේ මම අද ඔබට සහතිකයක් දෙන්නම්, අශිෂ්ටත්වයේ ඒ ගමන අවසන් කරපු පාලනය බවට මේ පාලනය පත් වෙනවා කියලා. ඒ පිළිබඳ සැකයක් තියාගන්න එපා.

අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අපේ ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්, අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමන්ලා ඇතුළු නිලධාරීන් විශාල ප්‍රමාණයක් දිවා රෑ නොබලා වැඩ කරනවා. පසුගිය දින කිහිපය තුළ අපි ඔවුන්ව දිගටම හමුවුණා; ඔවුන් එක්ක සාකච්ඡා කළා. මේ අය වැය ලේඛනයෙන් අපි විශාල මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපට මාස අටක කාලයක් තිබෙන්නේ. මේ මාස අටක කාලය ඇතුළත මේ මුදල් ප්‍රතිපාදනවලින් අපේක්ෂා කරන ඉලක්කවලට ඒ ආයතන මෙහෙයවීමේ කාර්යය කරන්න අපි ඔවුන් එක්ක සාකච්ඡා කරනවා. ඔවුන් ඒ සඳහා විශාල උනන්දුවක් දක්වමින් වැඩ කරනවා. ඒ සඳහා දක්වන උනන්දුවට අපේ අමාත්‍යාංශ නිලධාරීන්ට, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීන්ට අපි ස්තුතිවන්ත වෙනවා. දැන් විශාලම අභියෝගයක් තිබෙන්නේ අපේ පොලිස් දෙපාර්තමේන්තුවටයි. ඔවුන්ට විශාල වැඩකොටසක් තිබෙනවා. අභ්‍යන්තර අභියෝගයක් තිබෙනවා, පොලිස් දෙපාර්තමේන්තුවට. මොකද, අභ්‍යන්තරවත් සමහර දේවල් බේරාගෙන යන්න ඕනෑකම තිබෙනවා. ඒ වාගේම එළියෙන් විශාල අභියෝගයක් තිබෙනවා. මාධ්‍යවලින් ඇති කරන සමහර අභියෝග, පරාජිත දේශපාලන කඳවුරු විසින් එල්ල කරන තර්ජන, අපරාධකරුවන් සැඟවීමට දරන ප්‍රයත්න යනාදි වශයෙන් විශාල අභියෝග ප්‍රමාණයක් තිබෙනවා. අපේ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් රවි සෙනෙවිරත්න මැතිතුමා, අපේ පොලිස්පතිතුමා ඇතුළු පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් විශාල වෙහෙසක් දරනවා, මේ ප්‍රශ්න විසඳන්න. ඒ නිසා ඔවුන්ටත් ස්තුතිවන්ත වෙමින්, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. අපි අශිෂ්ටත්වයේ යුගය අවසන් කරලා ශිෂ්ටත්වයට පාර කපලා තිබෙනවා. අපි ඔබ සියලු දෙනාට ආරාධනා කරනවා, අශිෂ්ටත්වයේ පාරෙන් බැහැර වෙලා ශිෂ්ටත්වයේ පාරේ ගමන් කරන්න, පුළුවන් නම් අපිව අබිබවා යන්න කියලා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ආරක්ෂක අමාත්‍යාංශය, ශීර්ෂ අංක 103 කාරක සභාව එකඟද?

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Chairman, I am calling for a Division. I will call for a physical Division only once. But, may it be recorded that I am calling for a Division and we will be opposing Heads 103, 222, 223, 224, 320, 325 and 225.

So, I will call for a physical Division only for Head 103, but may it be recorded that the Division will apply to all those Heads.

Thank you.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தவிசாளர் அவர்களே, நானும் வாக்கெடுப்பைக் கோருகின்றேன்.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ශීර්ෂ අංක 103 සංශෝධන රහිතව සම්මත කිරීමට පක්ෂ නම් කොළ පාටත්, විරුද්ධ නම් රතු පාටත්, ඡන්දය දීමෙන් වැළකී සිටිනවා නම් කහ පාටත් භාවිත කළ හැකියි.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

මගේ වම් අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කවුරුවත් නැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සහ ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද ඒමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 88; විරුද්ධව 10; වැළකී සිටී 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 88; எதிராக 10; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 88; Noes 10; Abstain 0.

G 001. K.V. Samantha Viddyarathna	Yes
G 003. K.D. Lal Kantha	Yes
G 005. Nalinda Jayathissa	Yes
G 006. Bimal Rathnayake	Yes
G 007. Harini Amarasuriya	Yes
G 009. Ramalingam Chandrasekarn	Yes
G 010. Wasantha Samarasinghe	Yes
G 011. A.H.M.H. Abayarathna	Yes
G 012. Chrishantha Abeysena	Yes
G 013. Anil Jayantha	Yes
G 014. Harshana Nanayakkara	Yes
G 016. Saroja Savithri Paulraj	Yes
G 017. Ananda Wijepala	Yes
G 019. Sunil Kumara Gamage	Yes
G 020. Kumara Jayakody	Yes
G 021. Rizvie Salih	Yes
G 022. Anura Karunathilaka	Yes
G 023. Upali Pannilage	Yes
G 030. Sunil Watagala	Yes
G 031. Rathna Gamage	Yes
G 032. Mahinda Jayasinghe	Yes
G 034. Eranga Gunasekara	Yes
G 036. T.B. Sarath	Yes
G 037. Nalin Hewage	Yes
G 039. Anton Jayakody	Yes
G 041. Hemali Weerasekara	Yes
G 043. Muneer Mulaffer	Yes
G 044. Susil Ranasinghe	Yes
G 045. Hansaka Wijemuni	Yes
G 046. Eranga Weeraratne	Yes
G 049. Madhura Senevirathna	Yes
G 051. Janitha Ruwan Kodithuwakku	Yes
G 052. Aruna Jayasekera	Yes
G 053. Sugath Thilakaratne	Yes
G 054. Harshana Suriyapperuma	Yes
G 061. Samanmali Gunasingha	Yes
G 062. Gayan Janaka	Yes
G 066. U. P. Abeywickrama	Yes
G 069. Kaushalya Ariyarathne	Yes
G 070. Asitha Niroshana Egoda Vithana	Yes
G 072. Oshani Umanga	Yes
G 075. Wasantha Pushpa Kumara	Yes
G 076. Chaminda Lalith Kumara	Yes
G 077. Sarath Kumara	Yes
G 078. Nilanthi Kottahachchi	Yes
G 084. Ajith Gihan	Yes

G 085. Jagath Gunawardana	Yes
G 087. Ruwanthilaka Jayakody	Yes
G 088. Kosala Nuwan Jayaweera	Yes
G 089. Thushari Jayasingha	Yes
G 090. T.K. Jayasundara	Yes
G 091. Mayilvaganam Jegatheeswaran	Yes
G 093. Sellaththamby Thilaganathan	Yes
G 097. Sugath Wasantha de Silva	Yes
G 100. Susantha Dodawatta	Yes
G 101. Susantha Kumara Nawarathna	Yes
G 103. Nandana Pathmakumara	Yes
G 104. Aruna Panagoda	Yes
G 105. Nimal Palihena	Yes
G 107. Stepni Fernando	Yes
G 108. Kanthasamy Prabu	Yes
G 110. Nanda Bandara	Yes
G 111. Padmasiri Bandara	Yes
G 112. Ravindra Bandara	Yes
G 114. Sri Bavanandarajah	Yes
G 116. Wijesiri Basnayake	Yes
O 014. Amirthanathan Adaikkalanathan	No
O 015. G.G. Ponnambalam	No
O 016. Ramanathan Archchuna	No
O 019. Sivagnanam Shritharan	No
O 020. Shanakiyan Rajaputhran Rasamanickam	No
O 039. Kaveenthiran Kodeeswaran	No
O 040. Gnanamuththu Srineshan	No
O 060. Thurairasa Ravikaran	No
O 067. Prageeth Madhuranga	Yes
O 068. Jagath Manuwarna	Yes
O 069. Ruwan Mapalagama	Yes
O 070. Nanadana Millagala	Yes
O 072. Danushka Ranganath	Yes
O 079. Elayathamby Srinath	No
O 080. Pathmanathan Sathiyalingam	No
O 081. Sanjeewa Ranasingha	Yes
O 082. Sunil Rathnasiri	Yes
O 086. Sunil Rajapaksha	Yes
O 087. Hasara Liyanage	Yes
O 090. R. G. Wijerathna	Yes
O 093. Ruwan Wijeweera	Yes
O 094. Darmapriya Wijesinghe	Yes
O 098. Dinindu Saman	Yes
O 099. Thilina Samarakoon	Yes
O 100. Ambika Samivel	Yes
O 101. Dewananda Suraweera	Yes
O 102. Chandana Sooriyaarachchi	Yes
O 103. Sooriyabandara	Yes
O 106. Janaka Senarathna	Yes
O 107. Chandima Hettiaratchi	Yes
O 114. Najith Indika	Yes
O 115. Lakmali Hemachandra	Yes

Electronic Voting Results:

Participants:

Present	98

Votes:

Yes	88
No	10
Abstain	0

ගරු සභාපතිතුමා

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව ශීර්ෂ අංක 103 සංශෝධන රහිතව සම්මත කිරීමට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 88යි; විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 10යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

ඒ අනුව, ශීර්ෂ අංක 103 සංශෝධන රහිතව වැඩි ඡන්ද 78කින් සම්මත වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

"103 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 8,087,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

103 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 5,831,000,000

"103 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 5,831,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

103 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 6,687,000,000

"103 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 6,687,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

103 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 6,564,000,000

"103 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 6,564,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

103 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 8,087,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 5,831,000,000

“தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 5,831,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 6,687,000,000

"தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 6,687,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 6,564,000,000

"தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 6,564,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 8,087,000,000, for Head 103, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 103, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 5,831,000,000

Question, "That the sum of Rs. 5,831,000,000, for Head 103, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 103, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 6,687,000,000

Question, "That the sum of Rs. 6,687,000,000, for Head 103, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 103, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 6,564,000,000

Question, "That the sum of Rs. 6,564,000,000, for Head 103, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 103, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

222 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා යුද හමුදාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 220,090,000,000

"222 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 220,090,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

222 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 5,435,000,000

"222 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 5,435,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

222 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 222.- இலங்கை தரைப்படை

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 220,090,000,000

"தலைப்பு 222, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 220,090,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 222, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 5,435,000,000

"தலைப்பு 222, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 5,435,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 222, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 222. - SRI LANKA ARMY

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 220,090,000,000

Question, "That the sum of Rs. 220,090,000,000, for Head 222, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 222, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 5,435,000,000

Question, "That the sum of Rs. 5,435,000,000, for Head 222, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 222, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ශීර්ෂ අංක 222 සඳහා ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ විරෝධතාව සටහන් කර ගන්නවා.

223 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා නාවික හමුදාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 73,210,000,000

"223 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 73,210,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

223 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 19,353,000,000

"223 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 19,353,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

223 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 223.- இலங்கை கடற்படை

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 73,210,000,000

"தலைப்பு 223, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 73,210,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 223, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 19,353,000,000

"தலைப்பு 223, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 19,353,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 223, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 223. - SRI LANKA NAVY

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 73,210,000,000

Question, "That the sum of Rs. 73,210,000,000, for Head 223, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 223, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 19,353,000,000

Question, "That the sum of Rs. 19,353,000,000, for Head 223, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 223, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ශීර්ෂ අංක 223 සඳහා ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ විරෝධතාව සටහන් කර ගන්නවා.

224 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා ගුවන් හමුදාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 50,784,000,000

"224 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 50,784,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

224 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 21,391,000,000

"224 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 21,391,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

224 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 224.- இலங்கை வான்படை

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 50,784,000,000

"தலைப்பு 224, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 50,784,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 224, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 21,391,000,000

"தலைப்பு 224, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 21,391,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 224, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 224. - SRI LANKA AIR FORCE

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 50,784,000,000

Question, "That the sum of Rs. 50,784,000,000, for Head 224, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 224, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, R s. 21,391,000,000

Question, "That the sum of Rs. 21,391,000,000, for Head 224, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 224, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ශීර්ෂ අංක 224 සඳහා ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ විරෝධතාව සටහන් කර ගන්නවා.

304 වන ශීර්ෂය.- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 477,000,000

"304 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 477,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

304 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,019,000,000

"304 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,019,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

304 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 304.- வளிமண்டலவியல் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 477,000,000

"தலைப்பு 304, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 477,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 304, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 1,019,000,000

"தலைப்பு 304, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 1,019,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 304, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 304.- DEPARTMENT OF METEOROLOGY

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 477,000,000

Question, "That the sum of Rs. 477,000,000, for Head 304, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 304, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,019,000,000

Question, "That the sum of Rs. 1,019,000,000, for Head 304, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 304, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

320 වන ශීර්ෂය.- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 22,273,000,000

"320 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 22,273,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

320 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 157,000,000

"320 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 157,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

320 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 320.- சிவில் பாதுகாப்புத் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 22,273,000,000

"தலைப்பு 320, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 22,273,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 320, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 157,000,000

"தலைப்பு 320, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 157,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 320, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 320. - DEPARTMENT OF CIVIL SECURITY

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 22,273,000,000

Question, "That the sum of Rs. 22,273,000,000, for Head 320, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 320, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 157,000,000

Question, "That the sum of Rs. 157,000,000, for Head 320, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 320, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ශීර්ෂ අංක 320 සඳහා ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ විරෝධතාව සටහන් කර ගන්නවා.

325 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 392,000,000

"325 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 392,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

325 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 250,000,000

"325 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 250,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

325 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 325.- இலங்கை கரையோரப் பாதுகாப்புத் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 392,000,000

"தலைப்பு 325, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 392,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 325, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 250,000,000

"தலைப்பு 325, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 250,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 325, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 325.- DEPARTMENT OF SRI LANKA COAST GUARD

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 392,000,000

Question, "That the sum of Rs. 392,000,000, for Head 325, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 325, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 250,000,000

Question, "That the sum of Rs. 250,000,000, for Head 325, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 325, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ශීර්ෂ අංක 325 සඳහා ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ විරෝධතාව සටහන් කර ගන්නවා.

මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு
MINISTRY OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

පුනරාවර්තන රු. 159,000,000,000

මූලධන රු. 16,445,000,000

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"29 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'මූලධන රු. 16,945,000,000' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"මූලධන වියදම සඳහා රු. 16,945,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධනච් සෙලවුක්කාන අදිකරික්කප්පට්ට රූපාය් 16,945,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් වින විටුක්කප්පට්ටු එර්රුක්කොළ්ළප්පට්ටදු.

මූලධනච් සෙලවු තිරුත්තප්පට්ටවාරු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, "That the increased sum of Rs. 16,945,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

189 වන ශීර්ෂය.- මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 17,100,000,000; මූලධන වියදම, රු. 2,045,000,000

தலைப்பு 189.- பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 17,100,000,000; மூலதனச் செலவு, ரூபாய் 2,045,000,000

HEAD 189.- MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 17,100,000,000; Capital Expenditure, Rs. 2,045,000,000

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, 189 වන වැය ශීර්ෂය සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"29 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන රු. 17,100,000,000
රු. 2,545,000,000' "

[ගරු ආනන්ද විජේපාල මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ වැය ශීර්ෂ අංක 189 සඳහා අයවැය යෝජනා අංක 31 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු. 500,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"189 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 17,100,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

189 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"189 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,545,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

189 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලෙප්පු 189, නිකුළ්ච්සිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඥ් සෙලවුක්කාන රූපාය් 17,100,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප් පඩුමාක" එණුම් විණා විඩුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 189, නිකුළ්ච්සිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඥ් සෙලවු අට්ටවණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

"තලෙප්පු 189, නිකුළ්ච්සිත්තිට්ටම් 01, මූලතනච් සෙලවුක්කාන අතිකරික්කප්පට්ට රූපාය් 2,545,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පඩුමාක" එණුම් විණා විඩුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 189, නිකුළ්ච්සිත්තිට්ටම් 01, මූලතනච් සෙලවු තිරුත්තප්පට්ටවාරු අට්ටවණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 17,100,000, 000, for Head 189, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 189, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 2,545,000,000, for Head 189, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 189, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

225 වන ශීර්ෂය.- පොලිස් දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 136,100,000,000

"225 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 136,100,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

225 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 8,200,000,000

"225 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 8,200,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

225 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

තලෙප්පු 225.- පොලිස් තිණෙක්කළම්

නිකුළ්ච්සිත්තිට්ටම් 01.- සෙයල්මුරෙච් සෙයර්පාටුකළ් - මීණ්ඩුවරුඥ් සෙලවු, රූපාය් 136,100,000,000

"තලෙප්පු 225, නිකුළ්ච්සිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඥ් සෙලවුක්කාන රූපාය් 136,100,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප් පඩුමාක" එණුම් විණා විඩුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 225, නිකුළ්ච්සිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඥ් සෙලවු අට්ටවණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

නිකුළ්ච්සිත්තිට්ටම් 01.- සෙයල්මුරෙච් සෙයර්පාටුකළ් - මූලතනච් සෙලවු, රූපාය් 8,200,000,000

"තලෙප්පු 225, නිකුළ්ච්සිත්තිට්ටම් 01, මූලතනච් සෙලවුක්කාන රූපාය් 8,200,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පඩුමාක" එණුම් විණා විඩුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 225, නිකුළ්ච්සිත්තිට්ටම් 01, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

HEAD 225.- DEPARTMENT OF POLICE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 136,100,000,000

Question, "That the sum of Rs. 136,100,000,000, for Head 225, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 225, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 8,200,000,000

Question, "That the sum of Rs. 8,200,000,000, for Head 225, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 225, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ශීර්ෂ අංක 225 සඳහා ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ විරෝධතාව සටහන් කර ගන්නවා.

226 වන ශීර්ෂය.- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 5,800,000,000

"226 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 5,800,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

226 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 6,200,000,000

"226 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 6,200,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

226 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 226.- குடிவரவு குடியகல்வுத் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 5,800,000,000

"தலைப்பு 226, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 5,800,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 226, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 6,200,000,000

"தலைப்பு 226, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 6,200,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 226, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 226.- DEPARTMENT OF IMMIGRATION AND EMIGRATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 5,800,000,000

Question, "That the sum of Rs. 5,800,000,000, for Head 226, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 226, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 6,200,000,000

Question, "That the sum of Rs. 6,200,000,000, for Head 226, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 226, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

අ.භා. 6.44ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 01වන සෙනසුරාදා.

பி.ப. 6.44 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 மார்ச் 01, சனிக்கிழமை.

At 6.44 p.m., the Chairman left the Chair to report Progress.

Committee report Progress; to sit again on Saturday, 01st March, 2025.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගීර්ෂ අංක 189 සංශෝධන සහිතවද, ගීර්ෂ අංක 103, 222 සිට 224 දක්වා ද, ගීර්ෂ අංක 304, 320, 325 සහ ගීර්ෂ අංක 225, 226 සංශෝධන රහිතවද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

මීළඟට, සභාව කල් තැබීම.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඊට පෙර ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා, මේ කාරණය ඉදිරිපත් කරන්න. අපි Parliamentary Business Committee එකේදී එකඟ වුණා, විරුද්ධ පක්ෂයෙන් ඡන්දයක් ඉල්ලනවා නම්, ඒ පිළිබඳව ඊට කලින් දිනයේදී දැනුවත් කරන්න කියලා. නමුත්, එය මේ අවස්ථාවේ සිදු වුණේ නැති නිසා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 158දෙනාටම ඡන්දයට සහභාගි වීමට දුෂ්කරතාවක් ඇති වුණා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, විරුද්ධ පක්ෂයෙන් ඡන්දයක් ඉල්ලනවා නම් අපගේ එම අයිතිය රැක දෙන්න කියලා.

එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.45ට, 2025 පෙබරවාරි 21වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 01වන සෙනසුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி, பி.ப. 6.45க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 01, சனிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 6.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.45 p.m until 9.30 a.m. on Saturday, 01st March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 318 - இல. 3
Volume 318 - No. 3

2025 මාර්තු 01වන සෙනසුරාදා
2025 மார்ச் 01, சனிக்கிழமை
Saturday, 01st March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 01වන සෙනසුරාදා
2025 மார்ச் 01, சனிக்கிழமை
Saturday, 01st March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 385-404]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
තිරසර හා පිරිවැය-ඵලදායී බලශක්ති උත්පාදනයේ අවශ්‍යතාව [පිටුව 404]

2025 අය වැයෙන් යෝජිත හෙද හෙදියන් සඳහා වන වැටුප් වැඩිවීම:
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 435]

වරප්‍රසාද:
රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත්කිරීම පිළිබඳව ඇසූ අතුරු ප්‍රශ්නයට පිළිතුර [පිටුව 439]

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [පිටුව 444]

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [පිටුව 444]

අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [පිටුව 445]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 – [දහවන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 110, 228-236, 326 (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා)] කාරක සභාවේදී සලකා බලන ලදී [පිටු 445-572]

කල්තැබීමේ යෝජනාව:
යුක්තිය පසිඳලීම පිළිබඳව විශේෂ කාරක සභාවක් පිහිටුවීම [පිටු 573-584]

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 385-404]

தனி அறிவித்தல் மூல வினா:
நிலையான மற்றும் செலவு குறைந்த - வினைத்திறனான வலுசக்தி உற்பத்திக்கான தேவை [ப: 404]

2025 பாதீட்டில் முன்மொழியப்பட்டுள்ள தாதியர்களுக்கான சம்பள அதிகரிப்பு:
சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று [ப: 435]

சிறப்புரிமை:
ரஜரட்டை பல்கலைக்கழகத்தின் துணைவேந்தர் நியமனம் தொடர்பில் கேட்கப்பட்ட மேலதிக வினாவுக்கான விடை [ப: 439]

சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 444]

உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 444]

குற்றச் செயல்களின் வரும்படிகள் சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 445]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட பத்தாம் நாள்]:
[தலைப்புக்கள் 110, 228-236, 326 (நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு)] – குழுவில் ஆராயப்பட்டது [ப: 445-572]

ஒத்திவைப்புப் பிரேரணை:
நீதி நிருவாகம் பற்றிய விசேட குழுவொன்றைத் தாபித்தல் [ப: 573-584]

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Cols. 385-404]

QUESTION BY PRIVATE NOTICE:
Need for Sustainable and Cost-Effective Energy Generation [Col. 404]

SALARY INCREASE PROPOSED FOR NURSES IN BUDGET, 2025:
Statement by Minister of Health and Mass Media [Col. 435]

PRIVILEGE:
Reply to Supplementary Question on Appointment of Vice-Chancellor, Rajarata University [Col. 439]

VALUE ADDED TAX (AMENDMENT) BILL:
Read the First time [Col. 444]

INLAND REVENUE (AMENDMENT) BILL:
Read the First time [Col. 444]

PROCEEDS OF CRIME BILL:
Read the First time [Col. 445]

APPROPRIATION BILL, 2025 – [Tenth Allotted Day]:
Considered in Committee - [Heads 110, 228-236, 326 (Justice and National Integration)] [Cols. 445-572]

ADJOURNMENT MOTION:
Establishment of Select Committee on Administration of Justice [Cols. 573-584]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 01වන සෙනසුරාදා
2025 மார்ச் 01, சனிக்கிழமை
Saturday, 01st March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

පාරාළුමන්‍රම மු.ப. 9.30 மණිக්குக් கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) ගාල්ල, මාගාල්ල, මාතර පාර, අංක 420/සී දරන ස්ථානයෙහි පදිංචි ඊ්.ජේ.ඒ.පී. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගාල්ල, ඇතුමලේ, මාපලගම, හැදිල්ල ගොඩවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.බී. චම්පිකා ජයසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ගිණිමැල්ලගහ, තෙලිකඩ, බොරළුකඩවත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.කේ.එස්. රුක්ෂාන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) වක්වැල්ල, හපුගල, බංගලාවත්ත, අංක 157/26 දරන ස්ථානයෙහි පදිංචි ජී.එච්.ඩී. ජගත් පණ්ඩිත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හපුගල, බටුවන්තුඩාව පාර, යුනිවර්සල් සිටි, අංක 225 දරන ස්ථානයෙහි පදිංචි කේ.වී.වී.සී.කේ. විතානගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ගාල්ල, කිතුලම්පිටිය, ආනන්ද මාවත, ගමගේ වත්ත, අංක 272/ඒ දරන ස්ථානයෙහි පදිංචි පී.එච්.ඒ. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ඉතාම වැදගත් කාරණාවක් පිළිබඳව රජයේ ස්ථාවරය දැන ගන්නට කැමැතියි. ඊයේ සිට රට පුරාම ඉන්ධන පිරවුම්හල් අභියස ලොකු පෝලිමක් දකින්න ලැබෙනවා. ජනතාව බලාපොරොත්තු වන්නේ නැහැ, මෙවැනි තත්ත්වයක්. මේ තත්ත්වය ඇති වුණේ මොකක් නිසා ද, මෙය වළක්වා ගන්න ගත්තු පියවර මොකක් ද කියන එක ගැන රජය වෙතින් දැන ගන්න කැමැතියි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ප්‍රශ්නය වැදගත්. අද ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ගරු රවි කරුණානායක මැතිතුමා බලශක්ති

[ගරු බිමල් රත්නායක මහතා]

අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර තිබෙනවා. ඒ අවස්ථාවේදී බලශක්ති අමාත්‍යතුමාගෙනුත්, මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමාගෙනුත් අපි බලාපොරොත්තු වෙනවා, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරයි කියලා. ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කළාට පස්සේ ඒ කෙටි සාකච්ඡාවට අවසර ලබා දෙන්න කියලා.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ධීවර වරායන් සංවර්ධනය කිරීම සහ එක්දින හා බහුදින ධීවර යාත්‍රා: විස්තර
மீன்பிடித் துறைமுகங்களின் அபிவிருத்தி மற்றும் ஒரு நாள், பன்னாள் மீன்பிடிப் படகுகள்: விபரம்
DEVELOPMENT OF FISHERY HARBOURS AND ONE-DAY AND MULTI-DAY FISHING VESSELS : DETAILS

380/2025

1. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ධීවර වරාය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වරාය සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව, මේ වන විට ධීවර කටයුතුවල නිරත වන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව සහ මේ වන විට ධීවර කටයුතුවල නිරත නොවන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඇති එක්දින ධීවර යාත්‍රා සංඛ්‍යාව, මේ වන විට ධීවර කටයුතුවල නිරත වන එක්දින ධීවර යාත්‍රා සංඛ්‍යාව සහ මේ වන විට ධීවර කටයුතුවල නිරත නොවන එක්දින ධීවර යාත්‍රා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කටපොතිල්, නීරියල් මත්‍රුම් කඩල් වළංකල් අමෛච්චර් කේට්ට විනා:

(අ) (i) ඇලංකෙයිලුළ්ළ මීන්පිඩිත්තුරෙමුකංකළ්ක්කු එණ්ණික්කෙ යාදෙන්බදෙයුම්;

(ii) මේර්පඩි මීන්පිඩිත්තුරෙමුකංකළෙ අපිවිරුත්ති සෙය්වදර්කාක මේර්කොළ්ළප්පඩුම් නඩවඩික්කෙකළ් යාවෙයෙන්බදෙයුම්;

(iii) ඇලංකෙයිලුළ්ළ පන්නාල් මීන්පිඩික් කලංකළින් එණ්ණික්කෙ, ඉන්රළවිල් කඩර්තොළිල් නඩවඩික්කෙකළිල් ඊඩුපට්ටුළ්ළ පන්නාල් මීන්පිඩික් කලංකළින් එණ්ණික්කෙ මර්රුම් ඉන්රළවිල් කඩර්තොළිල් නඩවඩික්කෙකළිල් ඊඩුපඩාද පන්නාල් කලංකළින් එණ්ණික්කෙ වෙව්වේරාක යාදෙන්බදෙයුම්;

(iv) ඇලංකෙයිලුළ්ළ ඔරු නාළ් කලංකළින් එණ්ණික්කෙ, ඉන්රළවිල් කඩර්තොළිල් නඩවඩික්කෙකළිල් ඊඩුපට්ටුළ්ළ ඔරු නාළ් කලංකළින් එණ්ණික්කෙ මර්රුම් තර්පෝදු කඩර්තොළිල් නඩවඩික්කෙකළිල් ඊඩුපඩාද ඔරු නාළ් කලංකළින් එණ්ණික්කෙ වෙව්වේරාක යාදෙන්බදෙයුම්;

(iv) කඩර්තොළිලෙ මේම්පඩුත්තුවදර්කාක ඉන්ර ළවිල් මේර්කොළ්ළප්පට්ටුළ්ළ නඩවඩික්කෙකළ් යාවෙයෙන්බදෙයුම්;

අවර් ඉච්චෙයික්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House the -

(i) number of fishery harbours in Sri Lanka;

(ii) measures taken to develop those fishery harbours;

(iii) number of multi-day fishing vessels in Sri Lanka, the number of such multi-day fishing vessels engaged in fishing activities and the number of those that are not engaged in fishing activities at present, separately;

(iv) number of one-day fishing vessels in Sri Lanka, the number of such one-day fishing vessels engaged in fishing activities and the number of those that are not engaged in fishing activities at present, separately; and

(v) measures that have been taken to develop the fishing industry by now?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) වරායන් 24කි.

(ii)

අංකය	සිවිල් වැඩ		යාන්ත්‍රික කටයුතු
1	පවතින දියකඩනය, තොටුපළ බැම්ම, බැමි ආදිය ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම	1	ලීටර් 90/110 ධාරිතාවකින් යුත් ඉන්ධන බෙදා හරින ඒකක 10ක් සහ මිනුම් කෑන් සැපයීම, බෙදා හැරීම, ස්ථාපනය කිරීම සහ නළ මාර්ග එළීම සහ අනෙකුත් ඉදි කිරීම් කටයුතු
2	යෝජිත මායිම් බිත්තිය සහ ඩයමන්ඩ් වැට	2	සියලුම වරායන්හි ඉන්ධන බෙදා හැරීමේ ඒකකය අලුත්වැඩියා කිරීම/ නඩත්තු කිරීම
3	සියලුම වරායවල ජල විද්‍යාත්මක සමීක්ෂණ කටයුතු අධීක්ෂණය කිරීම (CAHS)	3	සියලුම වරායන් සඳහා වේග වළක්වන (ජැටියෙහි බෝට්ටු වැදීම වැළැක්වීමට දමා ඇති ටයර්), දම්වැල්, D- විලංගු, I බෝල්ට්, ටයර් සහ අනෙකුත් නැංගුරම් උපාංග ප්‍රතිසංස්කරණය කිරීම
4	බෝට්ටු අංගනයේ සහ අනෙකුත් ප්‍රදේශවල බිම් සැකසීම	4	සියලුම වරායන් සඳහා කුඩා පරිමාණ වැඩමුළු අයිතම සහ අනෙකුත් අවශ්‍ය උපකරණ මිල දී ගැනීම
5	පවතින ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කිරීම	5	LED ෆ්ලැෂ් ලයිට් සහ කෝඩරා ලාම්පු මිල දී ගැනීම පැනල් පුවරු අලුත්වැඩියාව සහ සේවා කිරීම
6	පවතින සනීපාරක්ෂක පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම	6	ගිල්විය හැකි PTO පොම්ප මිල දී ගැනීම, අලුත්වැඩියා සේවාව සහ නඩත්තුව
7	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ කටයුතු	7	බීකන් ලාම්පු මිල දී ගැනීම, අලුත්වැඩියා සේවාව සහ නඩත්තුව
		8	සියලුම වාහනවල සැලසුම්ගත අලුත්වැඩියා කටයුතු
යෝජිත ප්‍රතිපාදන - රු.150,349,400.00			යෝජිත ප්‍රතිපාදන - රු. 357,594,250.00

(iii) ධීවර කටයුතුවල නිරත වන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව - 5,488

ධීවර කටයුතුවල නිරත නොවන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව - 182
(වර්ෂයක් ඇතුළත)

(iv) මේ වන විට ශ්‍රී ලංකාවේ ඇති එක්දින ධීවර යාත්‍රා සංඛ්‍යාව - 929

ධීවර කටයුතු වල නිරත නොවන එක්දින ධීවර යාත්‍රා සංඛ්‍යාව - 24
(වර්ෂයක් ඇතුළත)

(v) * **ආර්ථික අර්බුදය හේතු කොට ගෙන ධීවර කර්මාන්තයට ඇති වී ඇති බලපෑම අවම කර ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහන - 2024**

මෙම වැඩසටහන යටතේ ඉන්ධන වශයෙන් ඩීසල් භාවිත කරන එක්දින (IDAY) හා බහුදින (IMUL) ධීවර යාත්‍රා 6,500ක් පමණ ද, ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරන කුඩා යාත්‍රා (OFRP, MTRB) 32,000ක් පමණ ප්‍රමාණයක් සඳහා "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාව" ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරන ධීවරයින් සඳහා දිනකට භූමිතෙල් ලීටර 15ක් හා මසකට දින 25ක උපරිමයකට යටත්ව රැකියාවේ නිරත වන දින සඳහා පමණක් ලීටරයකට රුපියල් 25ක "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාවක්" ලබා දීමට යෝජනා වී ඇති අතර, ඒ අනුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, සක්‍රියව ධීවර කර්මාන්තයේ නියැළෙන MTRB හා OFRP ධීවර යාත්‍රා හිමිකරුවන් විසින් මිල දී ගන්නා භූමිතෙල් සඳහා දිනකට ලීටර් 15ක උපරිමයකට යටත්ව ධීවර කර්මාන්තයේ යෙදෙන දින 25ක් සඳහා මසකට රුපියල් 9,375ක මුදලක් ප්‍රතිපූරණය කරනු ලබයි.

ඉන්ධන වශයෙන් ඩීසල් භාවිත කරන බහුදින හා එක්දින ධීවර යාත්‍රා හිමියන් මිලදී ගන්නා එක් ඩීසල් ලීටරයකට රුපියල් 25ක මුදලක් ලැබෙන සේ එම ධීවරයන් සඳහාද "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත්කිරීමේ දීමනාවක්" අදාළ ධීවර යාත්‍රා වර්ගය හා මෙහෙයුම් කරන දින ගණන පදනම්ව ලබාදීමට යෝජනා වී ඇති අතර ඒ අනුව ඉන්ධන වශයෙන් ඩීසල් භාවිත කරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, සක්‍රියව ධීවර කර්මාන්තයේ නියැළෙන IMUL හා IDAY ධීවර යාත්‍රා සඳහා මිලදී ගන්නා ඩීසල් ලීටරයකට රුපියල් 25 බැගින් මුදලක් ප්‍රතිපූරණය කරනු ලබයි. එසේ වුවද, එක් ගමන් වාරයක් සඳහා ප්‍රතිලාභ ප්‍රතිපූරණය කරනු ලබන ඉන්ධන ප්‍රමාණය එම යාත්‍රාවේ ඉන්ධන ටැංකි ධාරිතාව ඉක්මවා නොයා යුතු අතර, එක් මාසයක් සඳහා රුපියල් 300,000ක උපරිමයකට යටත්ව මුදල් ප්‍රතිපූරණය කරනු ලබයි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

❖ **ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරන ධීවර යාත්‍රා වන පිටත එන්ජිම සහිත කුඩා යාත්‍රා (OFRP) හා පාරම්පරික යාන්ත්‍රික යාත්‍රා (MTRB) සඳහා වීන සමූහාණ්ඩු ආධාර යටතේ භූමිතෙල් ලබාදීමේ වැඩසටහන - 2023**

පළමු අදියර යටතේ එක් යාත්‍රාවකට ලීටර් 75 බැගින් වෙරළ ආසන්නයේ ක්‍රියාත්මක වන පිටත එන්ජිම සහිත කුඩා යාත්‍රා -OFRP- හා MTRB යාත්‍රා 28,424ක් සඳහා භූමිතෙල් ලීටර් 2,131,800ක් නිකුත් කරන ලදී.

දෙවන අදියර යටතේ එක් යාත්‍රාවකට ලීටර් 78 බැගින් OFRP හා MTRB යාත්‍රා 28,108ක් සඳහා භූමිතෙල් ලීටර් 2,192,424ක් නිකුත් කරන ලදී.

❖ **උතුරු හා නැඟෙනහිර පළාත්වල ධීවර පවුල් සඳහා වීන සමූහාණ්ඩු ආධාර යටතේ මත්ස්‍ය දැල් 75,000ක් ලබා දීමේ වැඩසටහන - 2024**

වීන සමූහාණ්ඩු ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 500ක වටිනාකමකින් යුත් මත්ස්‍ය දැල් 75,000ක් පරිත්‍යාග කර ඇති අතර, එම මත්ස්‍ය දැල් යාපනය, කිලිනොච්චිය, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්‍රික්ක තුළ සක්‍රිය ධීවර කර්මාන්තයේ නියැළෙන ධීවර කාර්මිකයන් 12,500ක් සඳහා බෙදා දීමට කටයුතු කරනු ලබයි.

❖ **වෙරළාශ්‍රිත මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩි කිරීම සඳහා මත්ස්‍ය ඇටවුම් යෙදවීමේ ව්‍යාපෘතිය**

ධීවර ක්ෂේත්‍රයට අදාළව වෙරළාසන්න සමුද්‍රීය පරිසර පද්ධතියේ සමුද්‍රීය ජෛව විවිධත්වය ඉහළ නැංවීම සඳහා වෙරළාසන්න මුහුදු පත්ලෙහි කෘත්‍රිම උපස්ථර මත මත්ස්‍ය අභිජනන ස්ථාන ඇති කිරීම තුළින් වෙරළට ආසන්නයේ මත්ස්‍ය සම්පත ඉහළ නැංවීම අරමුණු කරගෙන 2021, 2022, 2023 සහ 2024 වර්ෂවල භාවිතයෙන් ඉවත්කළ බහුදින ධීවර යාත්‍රා, බස්රථ සැකිලි හා මත්ස්‍ය ඒක රාශි උපකරණ විශාල ප්‍රමාණයක් පරිසරයට හානියක් නොවන සේ ආසන්නයේ තෝරාගත් ස්ථානවල තැන්පත් කර කෘත්‍රිම උපස්ථර ස්ථාපනය කරන ලදී.

❖ **Bulbous bows සවි කිරීම, වැඩිදියුණු කරන ලද ශීතාගාර පහසුකම් හා රුවල හඳුන්වාදීම හා ගැඹුරු මරුවැල් පන්නය මඟින් ඇස්ගෙඩි කෙලවල්ලන් අස්වැන්න නෙළා ගැනීමේ නියමු ව්‍යාපෘතිය**

බහුදින ධීවර යාත්‍රාවල ඉන්ධන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හා පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තාක්ෂණික සහාය මත බහුදින යාත්‍රාවකට bulbous bows සවි කිරීම, වැඩිදියුණු කරන ලද ශීතාගාර පහසුකම් හා රුවල හඳුන්වාදීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.

ගැඹුරු මුහුදේ වඩාත් ගැඹුරට මරුවැල් පන්නය යොදා ගනිමින් ඇස්ගෙඩි කෙලවල්ලන් අස්වැන්න නෙළා ගැනීමේ නියමු ව්‍යාපෘතියක් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තාක්ෂණික සහාය මත ක්‍රියාත්මක කරන ලදී.

❖ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා ලියාපදිංචිය, මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම, යාත්‍රා පිටත්වීම හා ආපසු පැමිණීම අධීක්ෂණය මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකිරීම තුළින් ධීවර ප්‍රජාව වෙත කාර්යක්ෂම සේවාවක් ලබාදීමට කටයුතු යොදා ඇත.

බහුදින යාත්‍රා සඳහා VMS උපකරණ සවිකිරීම තුළින් සුළි කුණාටු වැනි හදිසි ආපදා අවස්ථාවකදී හා යාත්‍රාවක් අනතුරට ලක්වූ අවස්ථාවකදී එම යාත්‍රාව පිහිටි ස්ථානය VMS උපකරණය මඟින් හඳුනාගෙන යාත්‍රාව හා ගැනියන් ගලවා ගැනීමේ මෙහෙයුම්වලදී උපයෝගි කර ගැනීමට කටයුතු කිරීම.

❖ සෑම ධීවරයෙකුම මුහුදු ගමන සඳහා සෞඛ්‍යමය වශයෙන් සුරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සෑම ධීවර වරායක් ආශ්‍රිතව පිහිටා ඇති රජයේ රෝහල් මඟින් සියලු ධීවරයන් සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂණයන්ට ලක්කර වෛද්‍ය සහතිකයක් ලබා දීම.

ධීවර රැකියාවේ යෙදෙන ධීවර යාත්‍රාවක ධීවරයන් අතුරින් යම් ධීවරයෙකු හට හදිසියේ ඇතිවන සෞඛ්‍යමය ගැටලුවකදී හදිසි ප්‍රථමාධාර ලබා දීම සඳහා සියලු ධීවරයන් සඳහා ප්‍රථමාධාර පිළිබඳ පුහුණුවක් ලබා දී සහතිකයක් නිකුත් කිරීම ශ්‍රී ලංකා නාවික හමුදාවේ වෛද්‍ය බලකාය හා සම්බන්ධීකරණයෙන් සිදු කරනු ලබයි.

❖ කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපොළේ ස්ථානගත කර ඇති තත්ත්ව පාලන අංශයේ ඒකකයක් පිහිටුවීමෙන් හා එහි සේවා පුළුල් කිරීමෙන් මත්ස්‍ය නිෂ්පාදන අපනයනයේදී අපනයනකරුවන් සඳහා වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමට කටයුතු කිරීම.

❖ වැඩි ප්‍රතිලාභ සහිත ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් ධීවර ප්‍රජාව වෙත හඳුන්වාදීමේ වැඩ පිළිවෙළක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හා ඒකාබද්ධව නුදුරු දිනයකදී ක්‍රියාත්මක කිරීම.

(ආ) පැන නොනඟී.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, විෂය භාර ඇමතිතුමා හිටියා නම් තමයි හොඳ. නමුත් මම එතුමාට යොමු කිරීම සඳහා අතුරු ප්‍රශ්න දෙක ඔබතුමාට යොමු කරනවා.

පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ඔබතුමා පැහැදිලි කළා, බහුදින ධීවර යාත්‍රා 182ක් තමයි දැනට රැකියාවේ නිරත නොවෙන්නේ කියලා. ගරු ඇමතිතුමනි, බේරුවල ධීවර වරාය ගත්තොත්, මේ වන විට රැකියාවේ නිරත නොවන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව 97 දක්වා වැඩි වෙලා තිබෙනවා. එක ධීවර වරායක් ගැන මම මේ කියන්නේ. මේ සම්බන්ධයෙන් සොයා බලන එක ලොකු වගකීමක්.

ගරු ඇමතිතුමනි, දෙවැනි කාරණය මෙකයි. මේ ධීවරයින්ගේ බහුදින යාත්‍රාවලට ඉන්ධන ලීටරයක් සඳහා රුපියල් 25ක සහනාධාරයක් ලබා දෙනවා. මේ වන විට 2024 ඔක්තෝබර් මාසය සඳහාත් එම රුපියල් 25ක සහනාධාරය නොලැබුණු ධීවරයන් ඉන්නවා, ගරු ඇමතිතුමනි. සමහරුන්ට නොවැම්බර් මාසයේ ඉන්ධන සහනාධාරය ලැබිලා තිබෙනවා. ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි, ඊට පස්සේ පෙබරවාරි මාසයත් ඉවරවෙලා දැන් මාර්තු මාසයත් ඇවිල්ලා තිබෙනවා. ඔබතුමා

විෂය භාර ඇමතිවරයා නොවුණත්, මේ සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක පොඩ්ඩක් පැහැදිලි කරලා, මේ ගැන ඇමතිතුමාවත් දැනුවත් කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, මෙම සහනාධාරය ලබා දුන් පළමුවැනි මොහොතේ අදාළ ක්‍රමවේදයට අනුව ධීවරයන්ට ඉන්ධන ලබා ගැනීමේදී යම් ගැටලුවක් තිබුණා. ඒ නිසා තමයි එම ක්‍රමවේදය වෙනස් කරලා ඔවුන්ට යම් මුදලක් ලබා දීම සඳහා කටයුතු කළේ. එම සහනාධාර මුදල් යවලා තිබෙනවා. නමුත් සමහර තැන්වල ප්‍රමාදයක් තිබෙන බව වාර්තා වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඇමතිතුමාවත් දැනුවත් කරන්නම්. එතුමා අසනීප තත්ත්වයෙන් පසුවන නිසා තමයි අද පාර්ලිමේන්තුවට ආවේ නැත්තේ.

ඒ ප්‍රශ්නයත් එක්ක ඔබතුමා බේරුවල ධීවර වරාය සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් ඇහුවා. ඇත්තටම එතැන තිබෙන ප්‍රශ්නය අපි දන්නවා. එම වරායේ ධාරිතාවට වඩා වැඩි බෝට්ටු ප්‍රමාණයක් එතැනට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, ගොඩ තිබෙන බෝට්ටු අනූ ගණනට අමතරව. එම නිසා බේරුවල ධීවර වරාය සංවර්ධනය කිරීම සඳහා අපි විශේෂ අවධානයක් යොමු කරනවා. ධීවර වරාය සංවර්ධනය කිරීම පැත්තෙන් එම වරායට ලංකාවේ ප්‍රමුඛ පෙළේ, වැදගත් ධීවර වරායක් ලෙස අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්නට අපි අවධානය යොමු කරනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අද උදේ ධීවර රස්සාවට යන්න තිබුණු බෝට්ටු ගණනාවකට රැකියාව සඳහා යන්න බැරි වුණා. හේතුව, බේරුවල ධීවර වරාය ගත්තත්, අනෙකුත් ධීවර වරායන් ගත්තත්, ඒවායේ තිබෙන පෙට්‍රල් ෂෙඩ්වල ඉතාම අඩු ඉන්ධන ධාරිතාවක් තිබෙන්නේ. සාමාන්‍යයෙන් ධීවර යාත්‍රාවකට ඉන්ධන ලීටර් 5,000ක්, උපරිමය ලීටර් 12,000ක් ගහන්න පුළුවන්.

එහි තිබෙන අයිස් කැට ප්‍රමාණයත් එක්ක තමයි තෙල් ප්‍රමාණය තීරණය වෙන්නේ. ඊයේ සිට ෂෙඩ්වල ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මත මේ වෙනකොට යාත්‍රාවලට රැකියාවට යා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ තත්ත්වය දිගින් දිගට වර්ධනය වුණොත්, තෙල් ටික ගන්න බැරි වුණොත් ලොකු ප්‍රශ්නයක් මතු වෙනවා. ධීවර යාත්‍රාවලට රස්සාවේ යන්න බැරි වෙනවා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

දෙවැනි කාරණය මෙයයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා VMS උපකරණය ගැන මතක් කළා. ගරු ඇමතිතුමනි, මේ VMS උපකරණය අද ලංකාවට ආනයනය කරන්න දීලා තිබෙන්නේ එකම එක පෞද්ගලික ආයතනයකට විතරයි. එම ආයතනයේ නම කියන්න මම කැමැති නැහැ, ඒක සදාචාර විරෝධී වැඩක් නිසා. මේ උපකරණය ගන්න ගියාම සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ 9,1/2ක්, 10ක්, 11ක් පමණ වැය වෙනවා. ගරු ඇමතිතුමනි, මීට අවුරුද්දකට විතර ඉස්සෙල්ලා -පසුගිය රජය කාලයේ- මේ උපකරණය සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ 4,1/2කට, 5කට වාගේ මිලකට තමයි තිබුණේ. හැබැයි, ඒ මිලට අදත් ගන්න පුළුවන්. ධීවර යාත්‍රා හිමියාටත් මේක ආනයනය කරන්න පුළුවන්. හැබැයි, ඒකට අවස්ථාවක් දෙන්නේ නැහැ. මෙන්න මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා, මේ තිබෙන ඒකාධිකාරය නැති කරන්න පුළුවන්ද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

VMS උපකරණ ගැන ප්‍රශ්නයටත්, ඔබතුමා කලින් අහපු ප්‍රශ්නයේ මගෙන් ආවරණය නොවූ කොටසටත් ධීවර ඇමතිතුමා ආවාට පසුව උත්තරයක් ලබා දෙයි.

ඇත්තටම තෙල් ප්‍රශ්නය ගැන විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාත් මතු කළා. අපි ඊළඟට ඒ සම්බන්ධව ආණ්ඩුවේ ස්ථාවරය පැහැදිලි කරන්නම්, උසාවි නියෝග කඩ කරලා ජනතාව පීඩාවට පත් වෙන ආකාරයට සමහර කණ්ඩායම් හැසිරෙන්නේ කොහොමද කියන එක ගැන. ඒ වාගේම ඊයේ රාත්‍රියේ තිබුණු ප්‍රශ්නය මේ වෙනකොට සැලකිය යුතු මට්ටමකට සමහන් වෙලා තිබෙනවා. අපි ඒ ගැන අවධානය යොමු කරලා, ආණ්ඩුව පැත්තෙන් අපේ අදහස ඉදිරිපත් කරන්නම්.

ප්‍රජා ජල ව්‍යාපෘති: රත්නපුර දිස්ත්‍රික්කය
சமுதாய நீர் வழங்கல் திட்டங்கள்: இரத்தினபுரி மாவட்டம்
COMMUNITY WATER SUPPLY PROJECTS: RATNAPURA DISTRICT

385/2025

2. ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස රැසක උග්‍ර පානීය ජල හිඟයක් පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල පදිංචි ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට සහ සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දී ඇති බවත්;

(iii) නිසි ජල සම්පාදන ක්‍රමවේදයන් නොමැති වීමෙන් පානීය ජල හිඟය උග්‍රවී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ජල හිඟයට විසඳුමක් ලෙස ක්‍රියාත්මක කරන ලද ''විසල් රත්නපුර ජල ව්‍යාපෘතියේ" 2 වන අදියරට අදාළ වැඩකටයුතු අවසන් කර ඇති ප්‍රමාණය කොපමණද;

(ii) දෙවන අදියර නිම කිරීමෙන් පසු එමඟින් ආවරණය නොවන ප්‍රදේශවලට ජල පහසුකම් සැපයීම සඳහා නව ජල ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iii) රත්නපුර දිස්ත්‍රික්කයේ මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iv) නව ප්‍රජා ජල ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු වරුණ ලියනගේ මහතා]

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தின் பெரும்பாலான பிரதேச செயலாளர் பிரிவுகளில் கடுமையான குடிநீர்ப் பற்றாக்குறை நிலவுகிறது என்பதையும்;

(ii) இதன் காரணமாக அந்தப் பகுதிகளில் வசிக்கும் மக்கள் கடும் சிரமங்களையும் சுகாதார சீர்கேடு களையும் எதிர்கொண்டுள்ளனர் என்பதையும்;

(iii) முறையான நீர் வழங்கலுக்கான வழிமுறைகள் இன்மையால் குடிநீர்ப் பற்றாக்குறை அதிகரித்துள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இந்த நீர்ப் பற்றாக்குறைக்குத் தீர்வாக நடைமுறைப்படுத்தப்பட்ட "விசல் இரத்தினபுரி நீர் வழங்கல் திட்டத்தின்" 2ஆம் கட்டப் பணிகள் எந்தளவில் நிறைவுசெய்யப்பட்டுள்ளன என்பதையும்;

(ii) இரண்டாம் கட்டப் பணிகள் நிறைவுசெய்யப் பட்டதன் பின்னர், அதற்குள் அடங்காத பகுதிகளுக்கு நீர் வசதிகளை வழங்குவதற்கு புதிய நீர் வழங்கல் திட்டங்களை ஆரம்பிப்பதற் கான நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iii) இரத்தினபுரி மாவட்டத்தில் தற்போது நடைமுறைப்படுத்தப்பட்டு வருகின்ற சமுதாய நீர் வழங்கல் திட்டங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) புதிய சமுதாய நீர் வழங்கல் திட்டங்களை ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Is he aware that -

(i) there is an acute shortage of drinking water in many Divisional Secretaries' Divisions of the Ratnapura District;

(ii) the people living in those areas have faced severe hardships and health problems, as a result; and

(iii) lack of proper water supply systems in those areas has aggravated the scarcity of drinking water?

(b) Will he inform this House -

(i) the extent of work of Phase 2 of the "Visal Ratnapura Water Supply Project", which is implemented as a solution to the said scarcity of water, that has been completed by now;

(ii) whether new water supply projects will be initiated to provide water to the areas that have not been covered by Phase 2 of the said project after the completion of Phase 2; and

(iii) the number of community water supply projects currently being implemented in the Ratnapura District; and

(iv) whether steps will be taken to initiate new community water supply projects?

(c) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)

(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)

(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යොමු වෙන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ පානීය ජල හිඟයක් පවතිනවාය කියන කාරණය සම්බන්ධයෙන්. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i), (ii), (iii)

සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18ක මුළු ග්‍රාම නිලධාරී වසම් 575ක් තිබෙනවා. එම ග්‍රාම නිලධාරී වසම් 575 අතුරින් ග්‍රාම නිලධාරී වසම් 373ක් සඳහා පූර්ණ සහ අර්ධ වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල ආවරණය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘති ගණන 12ක්. ඒ මඟින් ගෘහස්ථ ජල සම්බන්ධතා 87,000කට ආසන්න ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. මීට අමතරව රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඇති ප්‍රජා මූල ජල සම්පාදන ක්‍රම මඟින් ද සැලකිය යුතු ප්‍රතිශතයකට පානීය ජලය ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව ප්‍රජා ජල සම්පාදන ක්‍රම මඟින් දිස්ත්‍රික්කය තුළ මුළු ජනගහනයෙන් සියයට 23කට ජලය සැපයෙනවා. ඒ වාගේම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් සියයට 25.7කට ආසන්න ප්‍රමාණයකට ජලය සැපයෙනවා. සාමාන්‍යයෙන් ලංකාවේම ගත්තොත්, මේක සියයට 62ක විතර ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ අනුව බැලුවාම රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සියයට 48කට ආසන්න ප්‍රමාණයක් සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරනවා. මීට අමතරව විසල් රත්නපුර ජල ව්‍යාපෘතියේ අදියර I යටතේ ජල ව්‍යාපෘති ගණනාවක් වැඩිදියුණු කරලා තිබෙනවා. ඒ අනුව කොලොන්න ජල නළ දිගු කිරීමේ ව්‍යාපෘතිය, කහවත්ත අතිරික්ත ජලය පැල්මඩුල්ලට ගෙන යන ව්‍යාපෘතිය වශයෙන් ව්‍යාපෘති ගණනාවක් මේ කාලය තුළ ක්‍රියාත්මක වෙනවා.

මෙයට අමතරව 2025 - 2029 කාලය සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සාමූහික සැලැස්මක් ක්‍රියාත්මක කරනවා.

ඒ සාමූහික සැලැස්ම යටතේ ඇහැලියගොඩ ජලසම්පාදන ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති ගණනාවක් සැලසුම් කරලා තිබෙනවා. එම

සැලසුම් පිළිබඳ විස්තර ඇමුණුම 01හි දක්වා තිබෙනවා.

(ආ) (i) "විසල් රත්නපුර ජල ව්‍යාපෘතිය" දෙවන අදියර කියලා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නමුත්, විසල් රත්නපුර පළමු අදියර යටතේම බෙදා හැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් ලෙස යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,528ක් ඇස්තමේන්තුගත කරලා, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරලා තිබෙනවා. එම ව්‍යාපෘතිය පිළිබඳ විස්තරත් ඇමුණුම 02හි දක්වා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, එම ව්‍යාපෘතිය මඟින් රත්නපුර සිට පරකඩුව දක්වා - A4 ප්‍රධාන මාර්ගය සහ දෙපස අතුරු මාර්ග, රත්නපුර-මොරගහයට හන්දියේ සිට පානදුර මාර්ගයේ කිලෝමීටර 10ක දුරක් සහ දෙපස අතුරු මාර්ග ආවරණය කිරීමට කටයුතු කරනවා.

එම ව්‍යාපෘතිය මඟින් කිලෝමීටර 178ක බෙදා හැරීමේ ජල නළ පද්ධතියක් එළා නිම කිරීමට යෝජිතයි. එය දැන් ක්‍රියාත්මක වනවා. එමඟින් තවත් පවුල් 7,000කට ආසන්න ප්‍රමාණයකට පානීය ජල අවශ්‍යතාව සපුරා දීමට පුළුවන් වනවා.

(ii) මම කලින් සඳහන් කළා වාගේ, ඇමුණුම 1 යටතේ සඳහන් වන ජල ව්‍යාපෘති 21ක් සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. එම ව්‍යාපෘති ආරම්භ කරලා මේ වෙනකොට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඊට අමතරව 2025-2029 සාමූහික සැලැස්ම යටතේ තවත් නව ජල ව්‍යාපෘති ගණනාවක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න සැලසුම් කර තිබෙනවා.

(iii) රත්නපුර දිස්ත්‍රික්කයේ පානීය ජල හිඟය පවතින ප්‍රදේශවල, විශේෂයෙන්ම National Water Supply and Drainage Board එකෙන් ජලය සපයන්නේ නැති ප්‍රදේශවල, මේ වන විට ජල ව්‍යාපෘති 21ක් ඉදිකරමින් පවතිනවා.

ඊට අමතරව දැනටමත් පානීය ප්‍රජා ජල ව්‍යාපෘති 490ක් ක්‍රියාත්මක වෙනවා. එමඟින් පවුල් 82,900කට පානීය ජලය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. එම ව්‍යාපෘතිය පිළිබඳ විස්තරත් ඇමුණුම 03හි දක්වා තිබෙනවා.

(iv) 2021දී ආරම්භ කරන ලද "ප්‍රජා ජල අභිමානී" වැඩසටහන යටතේ තුන් අවුරුදු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගැනීම සඳහා වාර්ෂික අය වැයෙන් ලැබෙන ප්‍රතිපාදන අනුව දැනටමත් සැලසුම් කර තිබෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ව්‍යාපෘති පිළිබඳ විස්තර මාගේ පිළිතුරෙහි ඇතුළත් වනවා.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් 01, 02, 03 සහ මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියා සිටියා, රත්නපුර දිස්ත්‍රික්කය ගත්තාම පවුල් 81,000කට පමණයි National Water Supply and Drainage Board එක හරහා ජලය ලබා දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියලා. ප්‍රජා ජල ව්‍යාපෘතිවලින් තවත් පවුල් 80,000කට විතර ජලය දෙන්න පුළුවන් කියලා අපි කල්පනා කරනවා.

දැන්, අපේ දිස්ත්‍රික්කයේ තිබෙන ගැටලුව මෙයයි. අපට National Water Supply and Drainage Board එක හරහා පානීය ජලය ලබා දෙන්න අපොහොසත් වුණු ලක්ෂ 10කට ආසන්න පිරිසක් ඉන්නවා. ඔබතුමා කිව්වා, දැනට ක්‍රියාත්මක ප්‍රජා ජල ව්‍යාපෘති 490ක් තිබෙනවා කියලා. ඒ ප්‍රජා ජල ව්‍යාපෘති 490න්, 300කට විතර water treatment plants නැහැ. ඒ නිසා, ඒවා මඟින් පානීය ජලය ලබා දීමට සුදුසු වාතාවරණයක් නැහැ කියන එකයි මගේ අදහස. මේ අය වැයෙන් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙනවා, ප්‍රජා ජල වැඩසටහන් යටතේ පානීය ජලය ලබා දෙන්න. ඒ වාගේම තව ජල ව්‍යාපෘති 21ක් අපට ආරම්භ කරන්න තිබෙනවා. මේ ජල ව්‍යාපෘති 21 සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ඔබතුමා කොපමණ මුදල් ප්‍රමාණයක් අපට දෙන්න බලාපොරොත්තු වෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඇත්තටම ප්‍රජා ජල ව්‍යාපෘතියක treatment plant එකක් නැතිවෙන්න බැහැ, මට තිබෙන අවබෝධයේ හැටියට. ඔබතුමා නිශ්චිතව සඳහන් කරනවා නම් මෙන්න මේ තුන්සිය ගණනට treatment plants නැහැ කියලා, මම ඒ පිළිබඳව සොයා බලන්නම්. සාමාන්‍යයෙන් අවශ්‍ය නිර්ණායක අනුව ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන කිසිම ප්‍රජා ජල ව්‍යාපෘතියක එහෙම treatment plant එකක් නැතිවෙන්න බැහැ. පිරිසිදු පානීය ජලය අනිවාර්යයෙන්ම සපයනවා, treatment plants තිබෙනවා. හැබැයි, ඔබතුමා නිශ්චිත වශයෙන් සඳහන් කරනවා නම්, මම ඒ පිළිබඳව සොයා බැලීමක් කරන්නම්. *[බාධා කිරීමක්]*

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ඇත්තටම අපි ජල මූලාශ්‍ර හොයාගෙන තමයි treatment plants ස්ථාපිත කරලා තිබෙන්නේ. මේ වෙලාවේ ඔබතුමාට ප්‍රශ්න ගණනාවක් ඇවිල්ලා ඇති ඌරු උණ ප්‍රශ්නයත් එක්ක. අපේ ප්‍රදේශවල මේ ජල මූලාශ්‍ර ආශ්‍රිතව ඌරු උණ වැලඳුණු ඌරන් මිය යෑම නිසා මේ ප්‍රදේශවල ජලය පරිභෝජනය කරන ජනතාව විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙනවා.

ඒකයි මම කිව්වේ, treatment plants අනාගතයේදීත් අවශ්‍ය වෙයි කියලා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, "විසල් රත්නපුර" ජල ව්‍යාපෘතියේ 2වන අදියරක් නැහැ කියලා. හැබැයි, අපි පසුගිය කාල සීමාව තුළ සම්බන්ධීකරණ කටයුතුවලදී දැනුවත් වෙලා

[ගරු වරුණ ලියනගේ මහතා]

තිබෙන්නේ එහි 2වන අදියරක් තිබෙනවා කියායි. මොකද, පසුගිය කාල සීමාවේදී මේ "විසල් රත්නපුර" ජල ව්‍යාපෘතියට මුදල් නැතිවීම නිසා National Water Supply and Drainage Board එක හරහා තමයි ඉදිරි වැඩකටයුතු ටික කරගෙන ගියේ. එහි 2වන අදියර විධියට අපි නිතාගෙන හිටියා, කොහොම හරි ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ජලය ලබා දෙන්න. ඒ කියන්නේ තව කිලෝමීටර පහක් විතර තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්. මොකද, මේ ජල ව්‍යාපෘතිය සඳහා ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් තමයි වතුර ගන්නේ. හැබැයි, අපට තවම ඇලපාතට වතුර දෙන්න බැරි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වර්ෂයකට දෙවරක් යට වෙනවා. මේ වනකොට අපට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට වතුර දීගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ "විසල් රත්නපුර" ව්‍යාපෘතියට අය වැයෙන් යම් මුදලක් වෙන් කරලා දෙන්න ඔබතුමාට පුළුවන් නම් හොඳයි. මොකද, අපේ දිස්ත්‍රික්කය නොවෙයි පෙන්නුවේ. දිස්ත්‍රික්ක ගණනාවකට මුදල් වෙන් කරනවාය කියලා තිබුණා. "විසල් රත්නපුර" ව්‍යාපෘතිය සඳහා යම් මුදලක් ලබා දී ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටත් වතුර ලබා දෙන්න අදහසක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ප්‍රශ්නයේ සඳහන්, " 'විසල් රත්නපුර ජල ව්‍යාපෘතියේ' 2වන අදියර" කියලා සඳහන් වන එක තමයි මම නිවැරදි කළේ. "විසල් රත්නපුර ව්‍යාපෘතිය" 1වන අදියර යටතේ වන extension එකක් හැටියට තමයි මෙය ක්‍රියාත්මක වෙන්නේ. එහෙම නැතිව මෙම ව්‍යාපෘතියේ 2වන අදියර කියලා ව්‍යාපෘතියක් නැහැ. ඒක තමයි මම සඳහන් කළේ.

ඒ වාගේම දැනට ගොඩනැහෙමින් පවතින ව්‍යාපෘති 21හි කටයුතු මේ වනකොට සියයට 61කට ආසන්න ප්‍රමාණයකින් අවසන් කර තිබෙනවා. ඔබතුමා සඳහන් කළා වාගේ, මේ අය වැයෙන් ලැබෙන ප්‍රතිපාදනවලින් ඉදිරියේදී මේවා සම්පූර්ණ කරන්න පුළුවන්. රත්නපුරයටත් ඒකෙන් කොටසක් අනිවාර්යයෙන්ම ලැබෙනවා නේ. ඒ අනුව එම ව්‍යාපෘති සම්පූර්ණ කරන්න පුළුවන්. ඒ වාගේම අපේ සැලසුමට අනුව සහ ඉදිරියේදී ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව අලුත් ව්‍යාපෘති ආරම්භ කරන්න පුළුවන්.

ඔබතුමා සඳහන් කළ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සම්බන්ධයෙන් ඇත්තටම මෙතැන තොරතුරු නැහැ. මට ඒ පිළිබඳව සොයා බලන්න පුළුවන්. ඒ පිළිබඳව සොයා බලා ඔබතුමාට පෞද්ගලිකව දැනුම් දෙන්නම්. ඒ වාගේම ඔබතුමා පෙන්වූ සියලු කරුණු සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරන්නම්. පොදුවේ ගත්තාම රුපියල් මිලියන 2,000ක් වැනි විශාල මුදල් ප්‍රමාණයක් පානීය ජල සැපයුම් වෙනුවෙන් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ මුදල් පාවිච්චි කර අවශ්‍යතාව අනුව අනිවාර්යයෙන්ම සියලු දිස්ත්‍රික්කවලට පානීය ජල පහසුකම් ලබා දීමට කටයුතු කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -387/2025- (1), ගරු වානක මාදුගොඩ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

පිටිපන, මාහේනවත්ත LRC ඉඩම: විකිණීම
பிட்டிப்பன, மாஹேனவத்தவிலுள்ள LRC காணிகள்: விற்பனை
LRC LAND IN MAHENAWATTA, PITIPANA: SALE

418/2025

4. ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පිටිපන, මාහේනවත්ත ප්‍රදේශයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් මීට පෙර තිබුණේද;

(ii) නොඑසේ නම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් එම ප්‍රදේශයේ තිබේද;

(iii) එම ඉඩම, කිසියම් පාර්ශ්වයකට විකුණා තිබේද;

(iv) නොඑසේ නම්, විකිණීමේ සූදානමක් තිබේද;

(v) එම ඉඩම විකුණා ඇත්නම්, විකුණන ලද මුළු මුදල කොපමණද;

(vi) එම ඉඩමේ පර්චසයක වටිනාකම කොපමණද;

(vii) රජයේ කටයුතු සඳහා ඉඩම් අවශ්‍යව තිබියදී, එම ඉඩම බාහිර පාර්ශ්වයකට විකිණීමට හේතු කවරේද;

(viii) එම ඉඩම නැවත රජයට පවරා ගැනීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பிட்டிப்பன, மாஹேனவத்த பிரதேசத்தில் காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான காணியொன்று இதற்கு முன்னர் இருந்ததா என்பதையும்;

(ii) இன்றேல், காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான காணியொன்று அப்பிரதேசத்தில் உள்ளதா என்பதையும்;

(iii) அக்காணியானது எவரேனுமொரு தரப்பினருக்கு விற்பனை செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iv) இன்றேல், அதனை விற்பனை செய்வதற்கான ஏதேனும் ஏற்பாடு உள்ளதா என்பதையும்;

(v) அக்காணி விற்பனை செய்யப்பட்டிருப்பின், விற்பனை செய்யப்பட்ட மொத்தப் பணத் தொகை யாதென்பதையும்;

(vi) மேற்படி காணியின் பேர்ச்சஸ் ஒன்றின் பெறுமதி யாதென்பதையும்;

(vii) அரசின் நடவடிக்கைகளுக்குக் காணிகள் தேவையாக இருக்கும் நிலையில், அக்காணியை ஒரு வெளித் தரப்புக்கு விற்பனை செய்வதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(viii) அக்காணியை மீண்டும் அரசாங்கத்துக்குச் சுவீகரிப்பதற்கான நடவடிக்கைகளை மேற் கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether there had been a land that belonged to the Land Reform Commission in Mahenawatta area in Pitipana;

(ii) or else, whether there is a land that belongs to the Land Reform Commission in that area;

(iii) whether that land has been sold to any party;

(iv) if not, whether there is a plan to sell that land;

(v) if the land has been sold, the total amount it has been sold;

(vi) the value of a perch of that land;

(vii) the reasons for selling that land to an external party in a situation where lands are needed for Government activities; and

(viii) whether action will be taken to acquire that land back to the Government?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

ඉඩමේ නම - පිටිපන වත්ත නොහොත් මාහේන වත්ත.

(ii) අදාළ නොවේ.

(iii) ඔව්. එය පහත පරිදි බැහැර කර ඇත.

- නාගරික සංවර්ධන අධිකාරිය වෙත -අක්කර: 124 රූඩ් 1 පර්චස් 17.87
- ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත - අක්කර: 00 රූඩ් 1 පර්චස් 16.85
- සේවක සුබසාධන පදනම මත විකිණීමෙන් බැහැර කර ඇත - පර්චස් 20

(iv) බැහැර කර අවසන්.

(v) රාජ්‍ය ආයතන සඳහා අත්පත් ක්‍රියාවලිය යටතේ අත්පත් කර ගැනීමට කටයුතු කර ඇති අතර, විකිණීමෙන් බැහැර කර ඇති කොටස සේවක සුබසාධන පදනම යටතේ ඉඩම් ලබා දීමේ පිළිවෙතට අනුව පර්චස් 1ක් සඳහා රුපියල් 1,000 බැගින් රුපියල් 20,000ක මුදලක් අය කර බැහැර කිරීම් සිදු කර ඇත.

(vi) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් තක්සේරු කැඳවීමක් සිදු කර නොමැත.

(vii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වී ඇති ප්‍රමාණයෙන් රජයේ සංවර්ධන කටයුතු සඳහා ඉල්ලා තිබූ ඉහත අනු අංක (iii)හි සඳහන් පරිදි ඉඩම් ලබා දී එයට අමතරව තිබූ පර්චස් 20ක ප්‍රමාණයක් විකුණුම්කරයක් මඟින් ලබා දී ඇත.

(viii) රාජ්‍ය ආයතන වන නාගරික සංවර්ධන අධිකාරිය හා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත බැහැර කර ඇති බැවින් නැවත රජයට පවරා ගැනීමක් අවශ්‍ය නොවන අතර, සේවක සුබසාධන පදනම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් විකුණුම්කරයක් මඟින් බැහැර කරන ලද ඉඩම රජයේ කාර්යයකට අවශ්‍ය වන්නේ නම් රජයට අත්පත් කිරීමක් මඟින් පවරා ගත හැක.

(ආ) (viii) පිළිතුර අදාළ වේ.

ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි, ඒ ඉඩම විකුණලා තිබෙන්නේ මොන වර්ෂයේද, කාටද කියන එක.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඇත්තටම නිශ්චිතව වර්ෂය අහලා නැති නිසා මට ඒ සඳහා දැනට නිශ්චිත උත්තරයක් දෙන්න බැහැ. නමුත්, 2023.12.31 දින වනවිට බැහැර කරන ලද ඉඩම් සම්බන්ධයෙන් තමයි මෙහි සඳහන් වෙන්නේ.

ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු කථානායකතුමනි, පර්චස් 20ක වපසරියක් ඇති මෙම ඉඩම රුපියල් 20,000ට විකුණා තිබෙනවා කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා.

මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. පසුගිය කාලයේ අපේ රටේ ඉඩම්වලට වෙච්ච නස්පැත්තිය තමයි මේ ඉඩමටත් වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද ඔබතුමා ගිහිල්ලා තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගෙන මේ ඉඩම තක්සේරු කරලා බැලුවොත් පෙනේවි, එතැන පර්චස් එකක් රුපියල් ලක්ෂ 15කට වඩා වැඩි බව. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 300ක් වන ඉඩම තමයි රුපියල් 20,000ට පසුගිය කාලයේ විකුණලා තිබෙන්නේ. ඒක විශාල ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, මාහේනවත්ත ඒ ප්‍රදේශය විශාල වශයෙන් ජනාකීර්ණ ප්‍රදේශයක්. එතැන රජයේ ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. NSBM එක තිබෙනවා; මහින්ද රාජපක්ෂ විද්‍යාලය තිබෙනවා; ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨයක් තිබෙනවා; නැනෝ තාක්ෂණ ආයතනය තිබෙනවා; කිරුම් මිණුම් ඒකකය තිබෙනවා; SLT එක තිබෙනවා. මේ වාගේ රාජ්‍ය ආයතන ගණනාවක්

[ගරු අරුණ පනාගොඩ මහතා]

තිබෙන, ජනාකීර්ණ ප්‍රදේශයක පර්චස් එකක් රුපියල් 1,000කට විකුණනවා. කාටද මේක පිළිගන්න පුළුවන්?

පසුගිය කාලයේ කිසිම වග විභාගයකින් තොරව කටයුතු කරපු නිසා රජයේ ඉඩම්වලට වෙලා තිබෙන නස්පැත්තිය මේක. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ඉඩමේ වටිනාකම රුපියල් ලක්ෂ 300ක් වෙනවා. රුපියල් 20,000ටයි විකුණලා තිබෙන්නේ. එතැන විශාල ගැටලුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එච්චර නාගරික ප්‍රදේශයකට පොලීසියක් අවශ්‍ය වෙලා තිබෙනවා. දැන් පොලීසිය හදන්න ඉඩමක් නැහැ. තිබුණු එකම ඉඩම, ඉස්සරහම තිබෙන ඒකට වැදගත්ම ඉඩම තමයි මේ රුපියල් 20,000කට විකුණලා තිබෙන්නේ.

මම විශේෂයෙන් මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ ඉඩම නැවත පවරා ගන්න. ආරක්ෂක අමාත්‍යාංශයට දීලා ඒ ඉඩමේ පොලීසිය හදන්න කටයුතු කර දෙන්න. මේ වෙලාවේ අවධානයට යොමු කරන්න ඕනෑ වෙලා තිබුණේ මේකයි. ඒ නිසා පුද්ගලයාගේ නම හෝ කාලය නොවෙයි මට වැදගත් වෙන්නේ.

රජයේ අවශ්‍යතාවක් තිබෙනවා මෙතැනදී. අපි පැහැදිලිවම පසුගිය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කළා. ඒ නිසා මේ කාරණාව සම්බන්ධයෙන් නැවත වතාවක් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, හෝමාගම, පිටිපන නගරය ආසන්නයේ වාණිජ වශයෙන් වටිනා ඉඩමක් -පර්චස් 20ක්- පර්චස් එක රුපියල් 1,000 බැගින් රුපියල් 20,000කට විකුණා තිබෙනවා. මේක සිද්ධ වෙන්නේ මෙන්න මේ කාරණය නිසා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදනයක් තිබෙනවා, "කොමිෂන් සභාව විසින් සේවයේ යොදවා සිටින තැනැත්තන් සඳහා නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩ සැපයීම..." කියලා. මේක වාසි විධියට අර්ථ දක්වමින් සේවකයන් සඳහා ඉඩම් බැහැර කිරීමක් සිද්ධ වෙලා තිබෙනවා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන්. සේවකයන්ට නිවසක් සඳහා ඉඩමක් ලබා දීම සම්බන්ධයෙන් අපේ විරෝධතාවක් නැහැ. කවුරුවත් ඒකට විරුද්ධ වෙන එකක් නැහැ. නමුත් මම ආරංචි කරලා බැලුවාම මේ වන විට සේවකයෝ 392ක් සඳහා ඉඩම් බැහැර කරලා තිබෙනවා. පොරොත්තු ලේඛනයේ තවත් 157දෙනෙක් ඉන්නවා.

මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි, ඒ සේවකයන්ගෙන් ඉහළ අධිකාරියත් සමඟ ගනුදෙනු කරන, හැකියාව තිබෙන, දේශපාලන සම්බන්ධතා තිබෙන සුළු පිරිසක්, -අතළොස්සක්- ඉහළ වාණිජ වටිනාකම් තිබෙන ඉඩම් මේ විධියට අඩු මුදලකට අත් පත් කර ගන්නවා. එහෙම දෙයක් තමයි මේ වෙලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමාට මම දැනුම් දෙන්න කැමැතියි, මේ කාරණයත්. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් සකස් කරලා තිබෙන පිළිතුරේ තිබෙනවා, "ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් විකුණුම්කරයක් මඟින් බැහැර කරන ලද ඉඩම රජයේ කාර්යයකට අවශ්‍ය වන්නේ නම් රජයට අත් පත් කිරීමක් මඟින් පවරා ගත හැක" කියලා. මේ ඉඩම නැවත රජයේ කාර්යයක් සඳහා අත් පත් කර ගන්න වුවමනාවක් තිබෙනවා නම්, ඒක අත් පත් කර ගන්න පුළුවන් කියලා පිළිතුරේම සඳහන් වෙනවා. ඒ නිසා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙන් තීරණය කරනවා නම්, ඒ අනුව කටයුතු කරන්න පුළුවන් කියන නීතිමය ප්‍රතිපාදන තමයි මේ තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5-452/2025-(1),ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ගාලු වරාය පරිශ්‍රය තුළ බෝ පැළයක් රෝපණය කිරීම: බාධා

காலி துறைமுக வளவில் அரச மரக்கன்றை நடுதல்: தடைகள்

PLANTING OF A BO SAPLING IN GALLE PORT PREMISES: OBSTACLES

387/2025

3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චානක මාදුගොඩ මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சானக மாதுகொட சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Chanaka Madugoda)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාලු වරාය පරිශ්‍රයේ තිබූ බෝ ගස විනාශයට පත්වීම හේතුවෙන් ඒ වෙනුවට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් රෝපණය කිරීම සම්බන්ධයෙන් ගාලු වරායේ සේවකයන් සහ පාලන අධිකාරිය අතර ඇති මත භේදාත්මක තත්ත්වය පිළිබඳව දැනුවත්වී තිබේද;

(ii) එම බෝ පැළය ගාලු වරාය පරිශ්‍රය තුළ රෝපණය කිරීමට ඇති බාධා කවරේද;

(iii) ගාලු වරාය පරිශ්‍රය තුළ එම බෝ පැළය රෝපණය කිරීමට පියවර ගන්නේද;

(iv) ඉහත සඳහන් මත භේදාත්මක තත්ත්වය නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி துறைமுக வளவில் காணப்பட்ட அரச மரம் அழிவடைந்ததன் காரணமாக அதற்குப் பதிலாக புனித ஜயஸ்ரீ மகா போதி மரக்கன்று ஒன்றை நடுவது குறித்து துறைமுக ஊழியர்கள் மற்றும் நிருவாகத்தினருக்கு இடையே தோன்றியுள்ள கருத்து வேறுபாடு பற்றி அறிவாரா என்பதையும்;

(ii) மேற்படி அரச மரக்கன்றை காலி துறைமுக வளவில் நடுவதிலுள்ள தடைகள் யாவை என்பதையும்;

(iii) காலி துறைமுக வளவில் மேற்படி அரச மரக்கன்றை நடுவதற்கு நடவடிக்கை மேற் கொள்ளப்படுமா;

(iv) மேற்படி கருத்து வேறுபாட்டைத் தீர்க்க மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation :

(a) Will he inform this House -

(i) whether he is aware of the dispute between the employees and the top management of the Galle Port over planting a Bo sapling of the Sacred Jaya Sri Maha Bodhi to replace the destroyed Bo tree situated within the Galle Port premises;

(ii) the existing obstacles to plant the Bo sapling referred to above within the Galle Port premises;

(iii) whether steps will be taken to plant the Bo sapling referred to above within the Galle Port premises; and

(iv) the actions that will be taken to resolve the dispute referred to above?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් රෝපණය කිරීම සම්බන්ධයෙන් වරායේ පාලන අධිකාරිය සහ සේවකයන් අතර මතභේදාත්මක තත්ත්වයක් නොමැත.

(ii)

- වරාය තුළ නැවත බෝධි අංකුරයක් සිටුවීම සඳහා නිසි අවසරයක් නොමැතිවීම.
- කරදිය පැමිණීම - (මෙයට පෙර තිබුණා යැයි කියනු ලබන බෝධිය වරාය තුළට කරදිය ඒම හේතුවෙන් විනාශ වී ඇත.)
- සෑම පෝය දිනකටම බෝධි පූජාවක් පවත්වා එයට සේවකයින් කාණ්ඩ කර පැමිණීම අනිවාර්ය කිරීම නිසා එයට පිරිසක් විරුද්ධ වීම.

(iii) වරාය සේවක පිරිසක් යැයි සඳහන් කරමින් ඉහළ කළමනාකාරිත්වයට යොමු කරන ලද ඉල්ලීමක් පිළිබඳව සලකා බලා ඉහළ කළමනාකාරීත්ව කමිටුව මඟින් වරාය භූමිය තුළ නැවත වතාවක් බෝධියක් අපවත්වීම වැළැක්වීම සඳහා ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් රෝපණය කිරීමට එකඟතාව ලබා නොදීමට තීරණය කර ඇත.

(iv) මෙම කරුණු සම්බන්ධයෙන් සේවක පිරිස දැනුවත් කර ඇති අතර ගාල්ල වරායේ ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සැලසුම් පිළිබඳව ද වරාය තුළට ලවණ ජලය පැමිණීම පිළිබඳවද නිසි අධ්‍යයනයක් සිදු කොට ඉදිරියේදී නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

තිරසර හා පිරිවැය-ඵලදායී බලශක්ති උත්පාදනයේ අවශ්‍යතාව
நிலையான மற்றும் செலவு குறைந்த-வினைத்திறனான வலுசக்தி உற்பத்திக்கான தேவை
NEED FOR SUSTAINABLE AND COST-EFFECTIVE ENERGY GENERATION

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා මෙම ප්‍රශ්නය බලශක්ති අමාත්‍යවරයාගෙන් විමසීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකාවේ බලශක්ති අර්බුදය ලංකා විදුලිබල මණ්ඩලයේ ඉහළ යන මෙහෙයුම් පිරිවැය නිසා වඩාත් උග්‍ර වෙමින් පවතින අතර, ජල විදුලි බලය ජනනය අඩුවීම සහ මිල අධික තාප බලශක්ති ප්‍රභවයන් මත වැඩි වශයෙන් රඳා පැවැත්ම හේතුකොට එය තවත් උත්සන්න වී ඇත. තිරසර හා පිරිවැය ඵලදායී විදුලිබල ජනනයක් කරා සංක්‍රමණය වීමේ හදිසි අවශ්‍යතාවක් පැවතියදීත්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය - NCRE - ජාතික පද්ධතියට ඒකාබද්ධ කිරීමට නොකඩවා විරෝධය පළ කරමින් සිටී. ලංකා විදුලිබල මණ්ඩලය විසින් පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ට ගෙවන ගාස්තු අඩු කිරීම, කර්මාන්තයේ පෞද්ගලික අංශයේ ආයෝජන අධෛර්යවත් කිරීම සහ නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අනුමැතිය ප්‍රමාද කිරීම මඟින් මෙම විරෝධය තවදුරටත් පෙන්නුම් කෙරේ. මෙම ක්‍රියාමාර්ග රටේ බලශක්ති අංශයේ මූල්‍ය පීඩනය වර්ධනය කිරීමට පමණක් නොව, 2030 වන විට පුනර්ජනනීය බලශක්ති කොටස සියයට 70ක් බවට පත් කර ගැනීමේ ජාතික ඉලක්කයට පටහැනි වේ.

[ගරු රවී කරුණානායක මහතා]

තවද, බරපතළ දෝෂ සහ ජාතික බලශක්ති ප්‍රතිපත්ති සමඟ පවත්නා නොගැළපීම් පෙන්වා දෙමින් ලංකා විදුලිබල මණ්ඩලයෙහි යෝජිත 2025-2030 අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - PUCSL - විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. Sir, I **table*** the Public Utilities Commission's letter regarding that Draft Long-term Generation Plan of the Ceylon Electricity Board.

මෙම අවදානම්සහගත වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, රජයෙන් පහත ප්‍රශ්න විමසමි.

1. පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය තුළ ඇති විරෝධය විසඳීමට සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින් සඳහා සාධාරණ, විනිවිදභාවයකින් යුතු සහ තරගකාරී ගාස්තු ව්‍යුහයක් සහතික කිරීමට ගනු ලබන පියවර කවරේ ද?

2. වත්මන් නියාමන රාමුව විසින් ආයෝජක විශ්වාසය අධෛර්යවත් කරන තත්ත්වයක, මෙම ක්ෂේත්‍රයේ ලාභදායී ලෙස රැකියා කරන විශාල පිරිස සැලකිල්ලට ගනිමින්, විශේෂයෙන් මෙගාවොට් 10ට අඩු ව්‍යාපෘති සහ වහල මත සූර්ය උත්පාදන ව්‍යාපෘති සඳහා පුනර්ජනනීය බලශක්තිය විෂයයෙහි අත්‍යවශ්‍ය පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට රජය අදහස් කරන්නේ කවරාකාරයෙන් ද?

3. ලංකා විදුලිබල මණ්ඩලයට ඊළඟ අවුරුදු 15 තුළ තාප බලශක්ති ජනනය මත බෙහෙවින් රඳා පැවැත්මට සිදු වේ. මේ තුළ සාමාන්‍ය ඒකක පිරිවැය ශ්‍රී ලංකා රුපියල් 45 -මේ කියන මොහොතේ සියයට 35ක් hydropowerවලින් විදුලිය ජනනය කරනවා- ඉක්මවනු ඇත. තව ද, මෙම පුනර්ජනනීය බලශක්තිය සියයට 100ක් දේශීයව නිපදවන අතර, කිසිදු විදේශ විනිමය බැහැර වීමක් සිදු නොවේ. එසේ නම්, පුනර්ජනනීය බලශක්ති ඒකක මිල ගණන් මෙතරම් අධෛර්යවත් කරනසුලු මට්ටමකට පහත හෙළීමේ පවත්නා තාර්කිකත්වය කුමක් ද?

4. ලංකා විදුලිබල මණ්ඩලයෙහි ජනන සැලැස්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලද තත්ත්වය සැලකිල්ලට ගෙන, පුනර්ජනනීය බලශක්තිය සඳහා ප්‍රමුඛතාවක් ලබා දෙන තාප බලශක්තිය මත රඳා පැවැත්ම අඩු කරන සහ අංශය තුළ තවදුරටත් මූල්‍ය අස්ථාවරත්වය වැළැක්වීම සඳහා සංශෝධිත තිරසර සහ ආර්ථිකමය වශයෙන් ශක්‍ය බලශක්ති උපාය මාර්ගයක් සැකසීමට ගනු ලබන කඩිනම් පියවර කවරේ ද?

   ගරු කථානායකතුමනි, මා මේ මොහොතේ සඳහන් කරනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" පොතේ අංක 163 පිටුවේ මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා බොහොම පැහැදිලිව කියා තිබෙන කාරණයට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලය ගමන් කිරීම පිළිබඳව. මා හිතන විධියට, ගරු ඇමතිතුමා ඒක පිළිගනීවි.

5. ශ්‍රී ලංකාව දැඩි විදේශ විනිමය අර්බුදයකට මුහුණ දෙමින් සිටින බැවින් දේශීය මූලාශ්‍රයන්ගෙන් ලබාගත් පුනර්ජනනීය බලශක්තිය කරා සංක්‍රමණය ඉක්මන් කිරීම වෙනුවට විදේශ සංචිත හීන වීමට දායක වන මිල අධික පොසිල ඉන්ධන පාදක කරගත් විදුලි බල ජනනය මත නොකඩවා රඳා පැවතීම රජය සාධාරණීකරණය කරන්නේ කෙසේ ද?

6. මෙම සැලසුම් මඟින් ශ්‍රී ලංකාව අත්සන් කර ඇති පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සහ දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා වන ජාතික සහ ජාත්‍යන්තර බැඳීම් සපුරාලීමට කවර නම් දායකත්වයක් ලබා දෙනු ඇද්ද?

7. 2025 වසර සඳහා අපේක්ෂිත සාමාන්‍ය ජනන පිරිවැය සඳහන් කරන්න. ඉහත පිරිවැය ගණනය කිරීමේදී ජලය, තාපය සහ පුනර්ජනනීය බලශක්තිය මත ප්‍රතිශතාත්මක රඳා පැවැත්ම කවරාකාර වේද?

8. ඉදිරි වසර 10 සඳහා විදුලිබල ඉල්ලුමේ වාර්ෂික වර්ධනය කවරාකාර වේද සහ එය වසරින් වසර පදනමින් දක්වන්නේද?

9. ලංකා විදුලිබල මණ්ඩලය නැවත වරක් හදිසි විදුලිබල මිල දී ගැනීම් සඳහා යොමු වීමට අදහස් කරන බවට විශ්වසනීය තොරතුරු පවතී. එය නිවැරදි ද?

10. ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෑත කාලීනව ඉතා ඉහළ විදුලි ගාස්තු ක්‍රමයක් අනුගමනය කරනු ලැබ 2024 වසරේදී රුපියල් බිලියන 200ක සැලකිය යුතු ලාභයක් උපයා ඇත. ආයතනයේ ප්‍රකාශිත අරමුණ අඛණ්ඩ විදුලිය සැපයුමක් ලබා දීමයි. මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය අධික මිල ගණන් අය කරන හා ලාභදායක තත්ත්වයකට පත්ව ඇති බැවින් සැලසුම් නොකළ විදුලි කප්පාදු සිදු වන සෑම අවස්ථාවකම ලංකා විදුලිබල මණ්ඩලය පාරිභෝගිකයන් වෙත වන්දි ගෙවනු ලබන්නේ ද?

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය දැන්නාට පසුව ඊයේ ඉන්ධන පිළිබඳ අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඉන්ධන පිරවුම්හල් හිමියන්ට ඉන්ධන ලීටරයකට ලබා දුන් සියයට 3ක වට්ටම සියයට 1 1/2 දක්වා අඩු කරපු එක ඊයේ ලොකු ප්‍රශ්නයකට තුඩු දුන්නා. අපේ ගරු විදුලිබල ඇමතිතුමා කරුණාකර ඒ සම්බන්ධයෙනුත් අවංක උත්තරයක් දීලා මේ ප්‍රශ්නය සඳහටම විසඳන්න කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. අපේ ආණ්ඩුවේ බලශක්ති ප්‍රතිපත්තිය අනුව, 2030 වන විට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සියයට 70ක උත්පාදනයක් ලබා ගැනීම අරමුණු කර ගනිමින්, පවතින ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව ලංකා විදුලිබල මණ්ඩලය දිගුකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලසුම් සකස් කර තිබෙනවා. වහල මත සූර්ය බලශක්තිය සහ මෙගාවොට් 10ට අඩු ධාරිතාවක් සහිත ව්‍යාපෘති සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්ට සාධාරණ ගාස්තුවක් - standard tariff එකක් - ලබා දෙනවා. ඊට අමතරව, කොටස්කරුවන් සමඟ සාකච්ඡා කර අනුමත ක්‍රියා පටිපාටියක් මත පදනම්ව ගාස්තු තීරණය කරනු ලබන අතර, ගණනය කිරීම බලශක්ති අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවක් විසින් සිදු කරනු ලබනවා. කමිටුව බලශක්ති අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි සාමාජිකයන්ගෙන් සමන්විත වනවා.

** ප්‍රශ්නකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඊට අමතරව, ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා තරගකාරී ප්‍රසම්පාදනයන් හරහා ලංකා විදුලිබල මණ්ඩලය අනාගත සංවර්ධකයින්ට ආරාධනා කරනවා.

2. විශේෂයෙන් මෙගාවොට් 10 ව්‍යාපෘති සහ වහල මත ඉදිකළ සූර්ය පැනල හරහා විදුලිය උත්පාදන ව්‍යාපෘති සඳහා මෙම අංශයේ ලාභදායී ලෙස සේවය කරන විශාල පිරිසක් ගැන වුවමනාවෙන් සලකා බලා කටයුතු කරනවා.

එහිදී අප ඒ හැම එකකටම අදාළව cost එක include කරගෙන තමයි tariff calculations සිදු කරන්නේ. ඒ කියන්නේ, ඒ සඳහා වන සේවකයන්ට සහ අනෙක් ඒවාට අදාළ පිරිවැය ඇතුළත්වයි.

වහල මත සහ මෙගාවොට් 10ට අඩු ව්‍යාපෘතිවල ගාස්තු වරින් වර සමාලෝචනය කරනවා. උපකරණවල ප්‍රාග්ධන පිරිවැය, මෙහෙයුම් සහ නඩත්තු වියදම්, මූල්‍ය පිරිවැය යනාදී සියලු අදාළ පරාමිතීන් - impact parameters - තීරුබදු, tariffs ගණනය කිරීමේදී සලකා බලනු ලබන අතර සාධාරණ ගාස්තුවක් හරහා අංශයේ -ක්ෂේත්‍රයේ- තිරසරභාවය සහතික කරනු ලබනවා.

ආයෝජකයන් සලකා බැලීමෙන් පමණක් නොව, ප්‍රතිලාභ මේ රටේ ජනතාවට ලබා දීම සහතික කිරීම උදෙසා ද රජය විසින් තීරණ ගනු ලබනවා. ඊට අමතරව, ඉල්ලුම් නොකළ යෝජනා - unsolicited bids - පිළිගැනීමට වඩා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් අපි දිරිමත් කරනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මට මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන් ද? මෙගාවොට් 10ට අඩු ව්‍යාපෘති සම්බන්ධවත් තරගකාරී තත්ත්වයක් ඇති කරනවා ද? මොකද, මෙහිදී දිරිගැන්වීමක් සිදු කරලායි තිබුණේ. ඒකත් වෙනස් කරනවා ද කියන එක දැනගන්න කැමැතියි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

අපි ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කර තිබෙනවා. අපි ඒ වාර්තාව අනුව ඒ කටයුතු කරනවා.

3. ලංකා විදුලිබල මණ්ඩලයේ දිගුකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලැස්මට අනුව අනාගත විදුලිබල උත්පාදනය ප්‍රධාන වශයෙන් පුනර්ජනනීය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2030 වන විට සියයට 70ක පුනර්ජනනීය බලශක්තිය සහ 2050 වන විට කාබන් උදාසීනත්වය - carbon zero තත්ත්වය - ළඟා කර ගැනීම ඉලක්ක කර ගනිමින් අපි වැඩ කරගෙන යනවා.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කරන ලද 2025-2044 සඳහා වූ නවතම දිගුකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලැස්මේ පහත සඳහන් ධාරිතාව එකතු කිරීම හඳුනාගෙන ඇත.

Grid connected solar	-	1,434 MW
Rooftop solar	-	1,045 MW
Wind - සුළං	-	860 MW
Biomass	-	105 MW
Mini hydro	-	90 MW

4. ලංකා විදුලිබල මණ්ඩලයේ දිගුකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලැස්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - PUCSL - විසින් ප්‍රතික්ෂේප කර නොමැත. කෙසේ වෙතත්, සැලසුම් අධ්‍යයනවල සමස්ත ප්‍රතිඵල කෙරෙහි සැලකිය යුතු ලෙස බලපාන්නේ නැති ඇතැම් ආදාන පරාමිතීන් - input parameters - පිළිබඳව PUCSL කනස්සල්ල පළ කර ඇත. මෙම කරුණු විසඳීම සඳහා PUCSL සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී.

5. විදුලිබල උත්පාදන මිශ්‍රණයේ පුනර්ජනනීය දායකත්වය වැඩි කිරීමට අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කරමින් සිටී. ඉන්දියාවේ NTPC සහ ලංකා විදුලිබල මණ්ඩලය ඒකාබද්ධ ව්‍යාපාරයක් වන ත්‍රිකුණාමල විදුලිබල සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙගාවොට් 120ක සාමූහික සූර්ය බලශක්ති ව්‍යාපෘතියේ ඉදිකිරීම් අප්‍රේල් මාසයේදී ආරම්භ කෙරේ. ජාත්‍යන්තර තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා පැමිණි මන්නාරමේ මෙගාවොට් 50ක සුළං බලශක්ති ව්‍යාපෘතියේ ඉදිකිරීම්ද අප්‍රේල් මාසයේදී ආරම්භ කෙරේ. මන්නාරමේ මුල්ලිකුලම් ප්‍රදේශයේ මෙගාවොට් 100ක සුළං බලශක්ති ව්‍යාපෘතියක් සඳහා වන ප්‍රසම්පාදන කටයුතු අප්‍රේල් මාසයේදී ආරම්භ කෙරේ.

6. ලංකා විදුලිබල මණ්ඩලයේ දිගුකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලැස්ම, පුනර්ජනනීය බලශක්තිය සහ දේශගුණික විපර්යාස අවම කිරීම සම්බන්ධ ජාතික සහ ජාත්‍යන්තර කැපවීම් සමඟ සමපාත වේ.

7. Budgeted Direct Generation Cost - 2025

Description	Budget - 2025					
	Units (GWh)	Mix (%)	Energy Charge (Rs. Mn)	Capacity Charge (Rs. Mn)	Total Cost (Rs. Mn)	Avg. Cost (Rs./ kWh)
CEB - Hydro	4,780	27%	-	13,945	13,945	2.92
CEB Thermal - Oil	2,195	13%	105,319	10,242	115,561	52.65
CEB Thermal - Coal	5,591	32%	109,027	25,457	134,483	24.05
CEB - Wind	370	2%	-	4,036	4,036	10.91
IPP - Thermal	1,084	6%	59,231	27,190	86,421	79.75
NCRE	2,137	12%	36,110	-	36,110	16.90
Solar Rooftop - Net Acct/ Net Plus	1,396	8%	26,513	-	26,513	18.99
Cost at Generation Point	**17,553**	**100%**	**336,200**	**80,869**	**417,069**	**23.76**

08. ඉදිරි වසර 10 සඳහා වාර්ෂික සාමාන්‍ය විදුලි ඉල්ලුමේ වර්ධන වේගය ආසන්න වශයෙන් සියට 5ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

09. ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදු කරන ලද නවතම සැලසුම් අධ්‍යයන මත පදනම්ව නුදුරු අනාගතයේදී අතිරේක (හදිසි) විදුලිබල අවශ්‍යතා අපේක්ෂා නොකෙරේ.

10. ලංකා විදුලිබල මණ්ඩලය සෑම මාස හයකට වරක් සංශෝධනය කෙරෙන පිරිවැය පිළිබිඹු කරන තීරුබදු ව්‍යුහයක් - tariff structure එකක් - අනුගමනය කරයි. මෑත අවස්ථාවලදී විදුලිය පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ ලබා දීම සඳහා තීරුබදු - tariff - අඩු කර ඇති අවස්ථා තිබේ.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමා ස්ථාවර නියෝග කියවලා බලන්න. ස්ථාවර නියෝග 27(2) යටතේ අහපු ප්‍රශ්නයට උත්තර ලබා දුන් පසු අතුරු ප්‍රශ්න අහන්න බැහැ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මොකක්ද ඒක අලුත් සම්ප්‍රදායක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ තමයි අමාත්‍යාංශයේද සම්බන්ධතාව ඇතිව රජයෙන් පිළිතුරක් ලබාගත හැකි හොඳම අවස්ථාව. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ගැන නොවෙයි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඉන්ධන ප්‍රශ්නය සම්බන්ධයෙන් වූ සාකච්ඡාවක් පිළිබඳව ඇහුවා. ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඇහුවාට පස්සේ ඒ පිළිබඳ සාකච්ඡාව ගන්න පුළුවන්, යම් කාලයක් අරගෙන එය සාකච්ඡාවට ගැනීමට ආණ්ඩු පක්ෂයත් බලාපොරොත්තු වෙනවා කියලා අපි කිව්වා. ඒ අවසරය අපට ලැබෙයි කියලා බලාපොරොත්තු වෙනවා, ගරු කථානායකතුමනි. ඒ පිළිබඳව පැහැදිලි කරන්න ගරු මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමාත් සූදානම් වෙලා ඉන්නවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් ලබා දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුර අනුව ඔබතුමාට පෙනෙනවා ඇති, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා දුන්න පිළිතුර තුළ අපට පෙනෙනවා රජයේ ප්‍රතිපත්තියයි, ඇමතිතුමාගේ ප්‍රකාශයයි, ලංකා විදුලිබල මණ්ඩලයේ හැසිරීමයි තුන් ආකාරයකටයි කටයුතු කරන්නේ කියලා. නිෂ්පාදනය කරන ඒකකයක අද තිබෙන මිල රුපියල් 23යි කියලා ප්‍රකාශ කරනකොට, මේ ජනනය සියයට 27ක රඳා පවතින්නේ අපේ hydropower generation තුළ. මේ ජනනය සාමාන්‍යයෙන් මීට අවුරුදු 15කට විතර පෙර තිබුණේ සියයට 15ක විතර ප්‍රමාණයක. මේක නැවත සංශෝධනය කරන්න අවශ්‍යයි රුපියල් 40කට විතර. ඒ සම්බන්ධයෙන් තමයි මම අහන්නේ. රුපියල් 30ට තිබුණු පුනර්ජනනීය බලශක්ති ඒකකයක් රුපියල් 18ට, 20ට අඩු කරලා, ඒ ව්‍යාපාරිකයන් අධෛර්යවත් කරන්නේ ඇයි? එ්කට උත්තරයක් ලැබුණේ නැහැ. තිබෙන තත්ත්වයයි ගරු ඇතිතුමා ඉදිරිපත් කළේ. මම දන්නවා ඔබතුමා වෑයමක් දරනවා මේක ඇතුළේ වෙනස් කරන්න. මමත් බලශක්ති අමාත්‍යවරයෙකු ලෙස සිටි නිසා දන්නවා, මේ ප්‍රශ්නය එදා ඉදලාම තිබෙන බව. කිසිම වෙනසක් වෙන්නේ නැහැ විදුලිබල මණ්ඩලයේ. පාරිභෝගිකයන් තමයි වෙනස් වෙන්න ඕනෑ. ලංකා විදුලිබල මණ්ඩලයේ තීරණය ඒකම තමයි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඒකට කෙටියෙන් උත්තරයක් දෙන්නම්. රුපියල් 18.99 කියන්නේ average එකක්. මෙතැන ගොඩක් තිබෙන්නේ competitive biddingවලින් ගත්ත ඒවා. රුපියල් 15ට අඩුවටත් ගොඩක් ඒවා ඇවිල්ලා තිබෙනවා, දැනට පාවිච්චි වෙන ඒවා. ඒ හින්දා තමයි මේ ගණන වැඩි වෙලා තිබෙන්නේ. දැනට ගොඩක් කට්ටියට ගෙවන්නේ රුපියල් 22, 27 වාගේ. 37, 43 ගෙවන අයත් ඉන්නවා. ඒක අඩු කරලා නොවෙයි මේ තිබෙන්නේ. මේ average එක එනකොට, competitive biddingවලින් ලොකු projectsවලට ගන්නකොට ඇත්තටම ඒකකයක් රුපියල් 15ට අඩු, 15ට කිට්ටුව, සහ 20ට පල්ලෙහායින් තමයි ගොඩක් ඒවා එන්නේ. එ්ක නිසා තමයි average එක ඔය ගාණට ඇවිල්ලා තිබෙන්නේ. අපි competitive biddingවලට යනකොට ඉදිරියේදී අනිවාර්යයෙන් average එක තව අඩු වෙනවා, මේ මිලත් එක්ක.

ඔබතුමා අමතරව අහපු ඉන්ධන ප්‍රශ්නය ගැනත් මම කියන්න ඕනෑ. මොකද, අපි රජයක් විධියට බැඳිලා ඉන්නවා ජනතාවගේ මුදල් අනිතිකිව නොයැවීම පිළිබඳ වගකීම ඉටු කරන්න. මෙව්වර කල්, 2019 ඉඳලා ඒකට අදාළ හේතු සාධක අනීතිකව තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. අපි ඒක නිවැරදි කිරීමේ කාර්යයේ යෙදිලා ඉන්නවා. ඒක ඍජුවම බදුවලට සම්බන්ධයි. රටේ ජනතාවට එන්න ඕනෑ බදු මුදල්වලට සම්බන්ධ ඍජු ප්‍රශ්නයක් එතැන තිබෙන්නේ. මම හිතනවා අපේ මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් පැහැදිලි කරයි කියලා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඉන්න, මම විනාඩියයි ගන්නේ.

ගරු කථානායකතුමනි, මේ කාරණය මම උදේම ගරු සභාවේ අවධානයට යොමු කළා. මේ වෙනකොට රට පුරාම ඉන්ධන පිරවුම්හල් ඉස්සරහා ලොකු පෝලිම් දකින්න තිබෙනවා.

ජන ජීවිතයට මේක විශාල වශයෙන් බලපානවා. මේක රටටම බලපාන කාරණයක්. ඒක නිසා මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙයිද, එහෙම නැත්නම් මේ තත්ත්වය දිගටම පවතීද කියලා දැනගන්න ජනතාව බලාපොරොත්තු වෙනවා. ඒ සම්බන්ධයෙන් රජය ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා ජනතාවගේ පැත්තෙන් අපි අහනවා.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මම ඒ පිළිබඳව අදහස් දැක්වීම සහ රජයේ ස්ථාවරය පිළිබඳව දැනුම් දීමක් සිදු කරනවා. ඇත්තටම පෙට්‍රල් ෂෙඩ් අසල පෝලිමක් නිර්මාණය වුණාම සමාජයේ මතයක් හදනවා, ඉන්ධන හිඟයක් කියලා. මේක ඉන්ධන හිඟයක් සම්බන්ධ කථාවක් නොවෙයි. මේකට දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. විශේෂයෙන් අපේ ගරු මන්ත්‍රීතුමා දන්නවා, ඉන්ධන මිල කිරීමේදී profit margin එකක් add කරන්නේ මොකටද කියලා. ලාභාන්තිකයක් - profit margin එකක් - එකතු කරන්නේ නිෂ්පාදන පිරිවැයට. අතීතයේදී මේ ලාභාන්තික එකතු කිරීමේදී - ඉන්ධන ආනයනය කරන කොට; වරායට ලැබෙන කොට, ප්‍රවාහනයට එකතු වෙන විවිධ බදු වර්ග නිසා ඒ බදුත් එක්ක තමයි ඒ සියයට තුනේ ආන්තිකය එකතු කරලා තිබෙන්නේ. මේ සියයට තුනේ ආන්තිකය බදුත් එක්ක තිබුණත්, ඉන්ධන මිල එච්චර වැඩි නොවුණු නිසා සමාජය ලොකු ගැටලුවක් විධියට ඒ ගැන සාකච්ඡා කරලා තිබුණේ නැහැ. හැබැයි, ක්‍රමක්‍රමයෙන් ඉන්ධන මිල ඉහළ යන කොට Ceylon Petroleum Corporation එක මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. විශේෂයෙන් 2019දී මේ ගණනය කිරීම කරලා ඒගොල්ලන් උපරිම යන්න පුළුවන් ආන්තිකය සියයට තුන තිබෙන ගමන් cap එකක් දීලා තිබෙනවා, රුපියල් 162කටත්, lower flow එකක් දීලා තිබෙනවා, රුපියල් 100කටත්. මිල අනුව ඒ අතර දෝලනය වෙන්න ඉඩ අරිනවා. හැබැයි, boundaries දෙක පනිනවා නම් ඒ අනුව කටයුතු කරනවා. රුපියල් 162 පනිනවා නම්, රුපියල් 162 cap කරලා තිබෙනවා. එහෙම හදලා ගණනය කරලා තිබෙනවා. හැබැයි, කුමක් හෝ හේතුවක් නිසා - දේශපාලන හෝ වෙනත් මැදිහත් වීමක් නිසා - ඒක ක්‍රියාත්මක කරලාත් නැහැ; බෙදුම්කරුවන්ට දැනුම් දීලාත් නැහැ. කෙසේ වෙතත්, 2022 වෙනකොට ඉන්ධන මිල ඉහළ යාමත් එක්ක ඒ පිළිබඳව බෙදුම්කරුවන්ට දැනුම් දීමක් කරලා තිබෙනවා. ඒ දැනුම් දීම කරද්දී බෙදුම්කරුවන්ගේ යම් විරෝධතා පැන නැඟුණා. ඒත් එක්කම ජාතික විගණනය කාර්යාලය මේ පිළිබඳව විගණනය කරලා තිබෙනවා. එම විගණනයේ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, මේ සම්බන්ධයෙන් විශාල අලාභයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වෙනවා කියලා. මොකද බදු මත ලාභයක් ඒගොල්ලන් ගන්නවා. "පෙට්‍රල් ලීටරයක් රුපියල් 162ට cap කළා නම් යන්න තිබෙන්නේ රුපියල් 8.86ක ගණනකට. නමුත් පෙට්‍රල් ගත්තාම ඒකට රුපියල් 9ත්, 10ත් අතර ප්‍රමාණයක් යනවා" කියලා වාර්තාවක් ලබා දීලා තිබෙනවා. ඒ වාර්තාවට අනුව කටයුතු කරන්න Ceylon Petroleum Corporation එක සූදානම් වෙන කොට තමයි බෙදුම්කරුවෝ උසාවියට ගිහිල්ලා injunction එකක් ගන්නේ. ඒ අතරතුරේදී Ceylon Petroleum Corporation එක දැනුම් දෙනවා, එවැනි ක්‍රියාමාර්ග ගන්න කලින් තව අධ්‍යයනය කිරීමක් කරනවා කියලා. ඒක කරන අතරතුරේදී ඔවුන් National Audit Office එකෙන් දුන් report එකත්, පිරිවැය පිළිබඳවත් අධ්‍යයනය කරනවා.

ඒ තොරතුරු ලබා ගන්නේ බෙදුම්කරුවන්ගෙන්. බෙදුම්කරුවන් තමන් විකුණන loads ප්‍රමාණය කොපමණද, සේවකයන්ට කොච්චර පඩිනඩි ගෙවනවාද, overheads කොච්චරද කියන ඒ තොරතුරු සියල්ල CPC එකට ලබා දීලා තිබෙනවා. ඒ අනුව ඔවුන් ගණනය කිරීමක් කරලා කියලා තිබෙනවා. දැන් ඒ නියෝගය ක්‍රියාත්මක කරන්න යනවාය කිව්වාම නැවත වතාවක් බෙදුම්කරුවෝ Court of Appeal එකට ගිහිල්ලා මේකට විරෝධතා ප්‍රකාශ කරලා තිබෙනවා. Court of Appeal එකෙන් 2024 අගෝස්තු මාසයේ මේක clear කරලා දෙනවා, ඒ undertaking එක තවදුරටත් වලංගු නැහැ කියලා. ඒ කියන්නේ, අපේ ආණ්ඩුවට කලින් ආණ්ඩුව. හැබැයි, එතැනදී CPC එක නියෝගය ක්‍රියාත්මක කරන්න ගිහින් නැහැ. අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ මේ තත්ත්වය සලකා බලා දැන් අපට ඉඩකඩ තිබෙනවා, මේ නිවැරදි කිරීම කරන්න. අන්න ඒ නිවැරදි කිරීම කරනවාය කියන දැනුම් දීම අපි කරලා තිබෙනවා. ඒ දැනුම් දීම කළාට පසුව, ඒ නඩුව යන අතරතුරේදී පෙබරවාරි 25වැනි දා තමයි, අපි "ඒක අය කරනවා" කියන දැනුම් දීම කරන්නේ. එතකොට Court of Appeal එකේ තිබුණු නඩුව කැඳවනවා, පෙබරවාරි 28වැනි දා. පෙබරවාරි 25වැනි දා අපි දැනුම් දෙනවා, මෙන්න මේ ආකාරයට ගණනය කිරීම කරනවා කියලා. පෙබරවාරි 28වැනි දා නඩුව කැඳෙව්වාම, නඩුවේදී බෙදුම්කරුවෝ ඒකට කිසිම විරෝධතාවක් ප්‍රකාශ කරලා නැහැ. ඒ පිළිබඳව අදහස් දක්වලා නැහැ. ඒ වාගේම CPC එකට දැනුම් දීමක් කරලාත් නැහැ, සද්ද නැතුව ඉඳලා තිබෙනවා. එතකොට අපට එය ක්‍රියාත්මක කිරීමේ බලය තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. බෙදුම්කරුවෝ පසුගිය දවස් දෙක තුනේදීම නිසි පරිදි CPC එකෙන් තෙල් ඇණවුම් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් දවසකට ඇණවුම් 1,100ක්, 1,200ක් වාගේ ප්‍රමාණයක් එනවා. මේ කියන දවස් දෙක තුනේ ඊටත් වඩා ඇණවුම් කරලා තිබෙනවා. ඇණවුම් කළාට, බෙදුම්කරුවන් යම් ප්‍රමාණයක් ඒකපාක්ෂිකව නීන්දුවක් අරගෙන තිබෙනවා, ඒගොල්ලෝ ඉන්ධන බෙදා හරින්නේ නැහැ කියලා. හැබැයි, එය නිල වශයෙන්වත් දැනුම් දීලා නැහැ. සමාජ මාධ්‍ය හරහා මිනිසුන් කලබල කිරීමක්, panic කිරීමක්, නොමඟ යැවීමක් තමයි ඒ තුළ තිබෙන්නේ. එය හිතාමතාම සුළු කණ්ඩායමක් විසින් ඇති කරන ලද්දක් බවයි අපට පෙනෙන්නේ. මේක, පෝලිම් යුගයක් එනවා කියලා මේ මොහොතේදී රට තුළ යම් අසහනකාරී තත්ත්වයක්, කලබල කිරීමේ වුවමනාවෙන් කරපු දෙයක්. කෙසේ වෙතත් මම සඳහන් කරන්න කැමැතියි, CPC එක ගණනය කරපු formula එකේදී - ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, සියයට තුනක margin එකක් තිබෙනවා, දැන් අලාභාන්තිකය සියයට 1.5 දක්වා අඩු වනවා කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ලාභය.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

ඔව්, සියයට 3 ලාභයක් තිබෙනවා. ඒ තිබෙන්නේ බදුත් එක්ක. ඇත්තටම දැන් Ceylon Petroleum Corporation එක ගණන් හදලා පෙන්වලා තිබෙනවා. ඒ අය විවිධ තත්ත්වයන් සලකලා දැනුම් දීලා තිබෙනවා. මොනවාද ඒ තත්ත්වයන්? සමහර පෙට්‍රල් ෂෙඩ්වලට ඉතා සුළු loads ප්‍රමාණයක් එන්නේ. සමහර ඒවායේ විශාල ප්‍රමාණයක්.

සමහර පෙට්‍රල් ෂෙඩ්වල පිහිටීම සහ ප්‍රවාහනය යන කාරණා සැලකිල්ලට භාජන කළාට පස්සේ සාමාන්‍යය - average එක - රුපියල් 6.96කට cap කරලා තිබෙනවා. එතකොට අපේ නිෂ්පාදන පිරිවැය පැත්තෙන් ගත්තාම මෙය සියයට 3.5ක ලාභයක්. ඒ කියන්නේ, කලින් තිබිච්ච තත්ත්වයටත් වඩා සාධාරණ එකක්. ඒ අනුව, ඒ loads ප්‍රමාණය අනුවත් ගත්තාම loads 15ක් තමයි අවමය යන තත්ත්වයේ තිබෙන්නේ. Loads 15ක් යන කෙනාට සියයට 3.5ක ලාභයකුත්, ඒ වාගේම රුපියල් 250,000ක ලාභයකුත් ලැබෙනවා. ඒ විධියට scenarios 5ක් හදලා තිබෙනවා, loads 30, 60, 90 සහ 120 ආදී වශයෙන්. එතැනට යනකොටත් අර කියපු ලාභ ආන්තිකයම රඳවාගෙන තිබෙනවා. ඒ නිසා මෙතැනදී ලාභ ආන්තිකයේ කිසිම අඩුවක් වෙලා නැහැ. ඒ වාගේම, ඈත දුෂ්කර ප්‍රදේශවලට ගියාම - ඒ අය නේ ටිකක් අමාරුවෙන් ගේන්නේ - ඒ අයට නිෂ්පාදන පිරිවැය වැඩියි. එයාලාට දෙන ලාභ කොටස රුපියල් 8.45ක්. ඒ කියන්නේ, කිලෝමීටර 15කට එහා තිබෙන,- රුපියල් 8.45ක් කියලා කියන්නේ ලාභ ආන්තිකයක් විධියට, ප්‍රතිශතයක් විධියට සියයට 4.5ක්. ඒ නිසා මූල්‍යමය පැත්තෙන්, ලාභය පැත්තෙන් ගත්තාම කිසිම අසාධාරණයක් සිදු වෙලා නැහැ කියලා අපි දන්නවා. මම හිතන විධියට මෙතැන තිබෙන්නේ වෙන ප්‍රශ්නයක්. ඒ නිසා අපි ඉතාම ඕනෑකමින් කියනවා, වෙළෙඳ පොළ තුළ මේ විධියේ අනවශ්‍ය තත්ත්වයක් නිර්මාණය කරන්න එපා කියලා. නැති ගැටුමකට යන්න එපා. රජය පැත්තෙන් මෙය අත්‍යවශ්‍ය භාණ්ඩයක්. මෙය ලබාදීම සඳහා උපරිම මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා යම් පැහැදිලි කිරීමක් කළා. රටේ ජනතාවගේ පැත්තෙන් හිතලා අපි මේ කාරණය අහනවා. ගරු ඇමතිතුමනි, බෙදුම්කරුවන් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා ද; පෝලිම් නැති වෙයිද කියලා. ජනතාවගේ පැත්තෙන් දෙන පණිවුඩය මොකක්ද කියලා ආණ්ඩුවේ ස්ථාවරය කියන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, සමහර විට හෙට වෙනකොට ඔබතුමාගේ වාහනයටත් තෙල් නැති වෙන්න පුළුවන්. මම මේ අහන්නේ, එවැනි සිදුවීමක් ඇතිවීම නවත්වන්න පුළුවන් විධියේ ප්‍රායෝගික දෙයක්. සියයට 14ක බද්දක් තිබෙන එක සියයට 36කුත් වෙලා තිබෙනවා. ඔය ගණනය කරනකොට රුපියල් 6.96, ඒ සම්බන්ධයෙන් කිසිසේත්ම වෙනසක් ඇති වෙලා නැහැ. මොකද, අවුරුදු 11ක් තිස්සේ ඒ ගණන තිබුණාට, අද සියයට 150කින් විතර පිරිවැය වැඩි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කිසිම ගණනය කිරීමක් කරලා නැහැ, ඇමතිතුමා. ඒ CPC එකේ අයගේ ප්‍රායෝගික පැත්ත බලන්නේ නැතිව ඔබතුමන්ලා බලලා තිබෙන්නේ න්‍යායාත්මක මට්ටමට බව මම දන්නවා. නමුත්, ඔබතුමා කරුණාකරලා බලන්න, මේක සාධාරණ ක්‍රමයක් නොවෙයි කියලා වැඩිකල් යන්න ඉස්සෙල්ලා පෙනේවි. ඒක ගැන විතරයි මට උත්තරයක් අවශ්‍ය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මටත් කාරණයක් අහන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අදාළ ප්‍රශ්නය ඇහුවා නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

එතුමා ප්‍රශ්න කිහිපයක් ඇහුවා. අපිටත් කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එක අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මට අවශ්‍ය නැහැ ඔබතුමාගේ,- *[බාධා කිරීමක්]* ඕනෑ නැහැ. මොකද දන්නවාද? අපට දැන් අහන්න වෙලා තිබෙන්නේ සභානායකතුමාගෙන්. කථානායකතුමාගෙන් වෙලාවක් ගන්න බැහැ. ගරු සභානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙනවාද කියලා ඔබතුමාගෙන් තමයි ඉස්සරවෙලා අහන්න ඕනෑ. ඔබතුමා අපට වෙලාවක් දෙන්න. දැන් සභානායකතුමාගෙන් අහලා තමයි මම යන්තම් වෙලාවක් ගත්තේ. ඒ නිසා ඔබතුමා මට ඉඩක් දෙන්න. ගරු සභානායකතුමනි, ඔබතුමා මට වෙලාව දුන්නා නේ. ඒකට ඔබතුමාට බොහොම ස්තුතියි. මොකද, කථානායකතුමාගෙන් අහලා වැඩක් නැහැ. කථානායකතුමාගෙන් මම අහන්නේ නැහැ. ඔබතුමා මට වෙලාව දුන්නාට, thank you.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ decision එකට කලින් decision එකක් අරගෙන තිබෙනවා, මේ cap එක 640 දක්වා ගෙන යන්න. මා ළඟ ඒ Board paper එක තිබෙනවා. මම ඒක

ඔබතුමාට WhatsApp කරලා එවන්නම්. ඒක 640ට ගිහිල්ලා තිබෙනවා. දැන් අභියාචනාධිකරණයෙන් මේ සම්බන්ධව දුන් තීරණයත් එක්ක තමයි ඔබතුමන්ලා සාකච්ඡා කරලා තිබෙන්නේ. තවම මේකට කිසිම තීන්දුවක් ඇවිල්ලා නැහැ. මම දන්නේ නැහැ, ඔබතුමාට කවුරු මේ තොරතුරු දෙනවාද කියලා. ඊයේ තිබුණු රැස්වීමට මේ බෙදුම්කරුවෝ සියලුදෙනා ඇවිල්ලා හිටියා. ඒගොල්ලන් ඔක්කොම මේකට අත ඔසවලා එකඟ වුණා, ගන්නේ නැහැයි කියලා. ඔබතුමාට මම කියන්නම්, ගරු ඇමතිතුමනි. ඇත්ත වශයෙන්ම මේ QR code එක දැම්මාට පසුව මේක යම් ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා. ඉස්සර දෛනික පෙට්‍රල් පරිභෝජනය මෙට්‍රික්ටොන් 4,500ක් විතර තිබුණා. දැන් ඒක අඩුවෙලා තිබෙනවා. ඊටත් වඩා විශාල ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා. ඊයේ වෙනකොට, ඒ කියන්නේ 27 වැනිදා අරගෙන තිබෙන ප්‍රමාණය අනුව විශාල ප්‍රමාණයක් අඩුවෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ කියන්නේ, ඊයේ ඔක්ටේන් 92 පෙට්‍රල් අරගෙන තිබෙන්නේ මෙට්‍රික්ටොන් 1,900යි. ලංකා ඔටෝ ඩීසල් අරගෙන තිබෙන්නේ මෙට්‍රික්ටොන් 2,100යි, 2,200යි අතර ප්‍රමාණයක්. මම මේ කියන්නේ 27.02.2025 දින ඉන්ධන හල් ඇණවුම් කරලා තිබෙන ප්‍රමාණය. මා ළඟ තිබෙන ඇණවුම් සහතිකයේ තොරතුරු එක්ක මම මේ ඔබතුමාට කියන්නේ. QR code එක දාපු වෙලාවේ ඔක්ටේන් 92 පෙට්‍රල් අරගෙන තිබෙනවා මෙට්‍රික්ටොන් 4,500ක්, ලංකා ඔටෝ ඩීසල් අරගෙන තිබෙනවා මෙට්‍රික්ටොන් 5,500ක්, කලින්ම තිබුණු අවස්ථාවේ. දැන් මේක තවත් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට කියනවා, කරුණාකරලා මේ අයත් එක්ක සාකච්ඡා කරන්න. අපට කිසිම අවශ්‍යතාවක් නැහැ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න. වෙනත් කාරණාවකට නොවෙයි මම මේක කියන්නේ. ඇත්ත වශයෙන් මේ ගැන සාකච්ඡා කරන්න. ඔබතුමන්ලා මේ තීන්දුව ගන්න කලින්,- මොකද, ඒගොල්ලන් මෙතැනින් නතර වෙන්නේ නැහැ. ඒගොල්ලන් හෙට අනිද්දා වෙනකොට තව රිට් එකකට යනවා. එතකොට මේක උසාවියේ නතර වෙන්නේ. ඒ නිසා ඔබතුමාට මම බොහොම ගෞරවයෙන් කියනවා, මේ අයත් එක්ක සාකච්ඡා කරලා මේ තීන්දුවට එන්න කියලා. ඒ ආදරණීය ඉල්ලීම මම කරනවා. එච්චරයි මට කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මම පළමුකොටම කියන්නට ඕනෑ, කිසිදු තෙල් භිඟයක් නැති බව.

අපේ ආණ්ඩුව යටතේ එහෙම තෙල් භිඟයක් ඇති වෙන්න දෙන්නේත් නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, පෝලිම් තිබෙනවා. ඒවා නිර්මාණය කරගත් පෝලිම් ටිකක්. ඒකයි මම පැහැදිලි කරලා කිව්වේ, කිසිම තෙල් භිඟයක් නැහැ කියලා. ඒ වාගේම සාකච්ඡා කියන කාරණයේදී, අපි නිතරම සාකච්ඡාවලට සූදානම්. දැන් මේ බෙදුම්කරුවන් Ceylon Petroleum Corporation එකත් එක්ක සම්බන්ධතාවෙන් වැඩ කරනවා; සාකච්ඡා කරනවා; තොරතුරු දෙනවා. මම දන්නේ නැහැ, එතුමා කියපු ඇණවුම් පිළිබඳ සංඛ්‍යා ගැන. සාමාන්‍යයෙන් දවසකට ඇණවුම් 1,100ක්, 1,200ක් වාගේ තමයි ලැබෙන්නේ. මේ දවස් දෙක තුන ඇතුළේ ඇණවුම් 1,800ක් විතර ලැබිලා තිබෙනවා. අපි දන්නේ නැහැ, බෙදුම්කරුවන් වැඩිපුර විකුණුම් කරලා ක්ෂණිකව ලාභ ලබා ගැනීමේ පරමාර්ථයෙන් කටයුතු කරනවාද කියලා. හැබැයි, ඇණවුම් කරලා තිබෙනවා. තෙල් විකිණීමත් සිද්ධ කරනවා. නමුත්, ඔවුන් ඉන්ධන බෙදා හරින්නේ නැහැ කියන ප්‍රවෘත්තිය තමයි යම් වෘත්තීය සමිතියක් සමාජ මාධ්‍යවලට මුදා හැරලා තිබෙන්නේ. තෙල් සංස්ථාව සහ බෙදුම්කරුවන් අතර තනි තනිව සම්බන්ධතා පවත්වා ගෙන යනවා; සාකච්ඡා පවත්වනවා; තොරතුරු හුවමාරු කරනවා. එහෙම නැතිව වෘත්තීය සමිතියක් විධියට හැදිලා Ceylon Petroleum Corporation එකත් එක්ක ගනුදෙනු කරන්නේවත්, තොරතුරු බෙදාගන්නේවත්, ඇණවුම් කරන්නේවත් නැහැ. ඒක වැරදියි. එළියට ගිහින් කිසියම් පුංචි කණ්ඩායමක් කියනවා, අපි මේවා ඇණවුම් කරන්නේ නැහැ කියලා. අපි හැම තිස්සේම සාකච්ඡා කරනවා; සාකච්ඡා කරමින් සිටිනවා; තොරතුරු බෙදා ගන්නවා. ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ.

ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයට අදාළව කිව්වොත්, නව මිල සූත්‍රය ගණනය කිරීම කළේ හුදෙක් තාක්ෂණික කරුණු විතරක් පදනම් කරගෙන නොවෙයි. ඒ කියන්නේ මෙහිදී අපට මිල පිළිබඳ තාක්ෂණික කරුණු ගන්න වෙනවා - CIF value එක ගන්න වෙනවා; tax rates ගන්න වෙනවා. දිගු කාලයක් පුරා CPC එක කරපු වැඩවලට අමතරව අපි ආණ්ඩුව ගත්තාට පස්සේ බෙදුම්කරුවන් එක්ක වේගයෙන් තොරතුරු සාකච්ඡා කළා. ඒකයි මම කිව්වේ විවිධ scenarios පහක් යටතේයි මෙය ඉදිරිපත් කළේ කියලා. ඔවුන් කොපමණ load ප්‍රමාණයක් ගන්නවාද, විකුණනවාද, පිරිවැය කොච්චරද කියන කාරණා ඇතුළත් කරලා කිසිම කෙනෙකුට අසාධාරණයක් නොවන විධියට කලින් තිබුණු ලාභ ප්‍රතිශතයටත් වඩා වැඩි ප්‍රතිශතයක් පිරිවැය මත ලැබෙන විධියටයි මෙය සකස් කරලා තිබෙන්නේ. මම හිතනවා, ඒ පැත්තෙන් ගත්තාම ඒක ඉතාම සාධාරණයි කියලා. මේ තත්ත්වය පදනම් කරගෙන වෙළෙඳ පොළේ භිඟයක් මවලා යම්කිසි අනවශ්‍ය තත්ත්වයක් නිර්මාණය කරන්න හදනවා නම්, මේ පිටුපස කඩාකප්පල්කාරී, කුමන්ත්‍රණකාරී හෝ දේශපාලන බලවේගයක් තිබෙන්න පුළුවන් කියන එක අපි කියන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා, මේ ආණ්ඩුව රට ඉදිරියට අරගෙන යනකොට ආණ්ඩුවේ මේ ගමන ආපස්සට හරවන්න විවිධ වූ උපක්‍රම භාවිත කරනවා කියලා. එවැනි දේවල් අපි අනිවාර්යයෙන්ම නැති කරනවා.

දැන් උසාවිය පිළිබඳ කථාවක් මතු කළා. ඇත්තටම 28වැනි දා නඩුව කැඳවපු අවස්ථාවේ ඒගොල්ලන් උසාවියට කරුණු ඉදිරිපත් කරලා නැහැ. එතැනදී ඒගොල්ලන්ට ඉදිරිපත් කරන්න කරුණු තිබුණා නම් ඉදිරිපත් කරන්න තිබුණා. නමුත්, ඉදිරිපත් කළේ නැහැ. මොකද, ඒගොල්ලන්ට මේක සාධාරණීකරණයට කිසිම තොරතුරක් නැහැ. ඔබතුමාත් දන්නවා, බදු මත ලාභාන්තික ගන්න පුළුවන්ද, බැරිද කියන එක. එහෙම ගන්න බැහැ. ඒක අසාධාරණයි. ඒ නිසා මේ නිර්මාණය කරලා තිබෙන්නේ අසාධාරණ තත්ත්වයක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම හිතන විධියට ආණ්ඩු පක්ෂය ලෙස අපිත් මෙහිදී අවස්ථාවක් ලබා ගත යුතුයි. මොකද, මේක සංවාදයක්. ගරු ඇමතිවරුන් දෙදෙනා මේ සම්බන්ධව කථා කළා. විපක්ෂයේ ඔබතුමන්ලාට ලැබෙන අවස්ථාවකදී ඔබතුමන්ලා අවශ්‍ය නම් මේ සම්බන්ධව කල් තැබීමේ විවාදයක් ඉල්ලන්න.

අපිත් ජන වරම නියෝජනය කරනවා. තෙල් පෝලිම් තිබෙනවා නම්, ඒ පෝලිම්වල වැඩිපුර ඉන්නේ අපට ඡන්දය දුන් මිනිස්සු. ඒ නිසා අපටත් අයිතියක් තිබෙනවා, ඒ ගැන කථා කරන්න, පෝලිම් තිබෙනවා නම්. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, පළමු කාරණය මෙයයි. අපි එදා මෙතැනදී විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සමඟ යම්කිසි එකඟතාවකට ආවා. *[බාධා කිරීම්]* අර වැඩිපුර කථා කරන්න ඕනෑ කරන මන්ත්‍රීවරයෙක් ඉන්නවා, උදේ වරුවේ. එතුමාට විපක්ෂයේ ලොබිය තුළ කැමරා එකක් සහ මයික් එකක් සවි කරලා දෙන්න කියලා අපි කිව්වා. ඒ විධියට ඒවා සවි කර දෙන්න කියලා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. එහෙම කරලා අපිව මේ කරදරයෙන් බේරාගන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි ළඟ මානසික ප්‍රශ්නවලට උත්තර නැහැ. *[බාධා කිරීමක්]* ආවේශ වෙලා වාගේ හැම වෙලාවේම කථානායකතුමාට, අගමැතිතුමියට - *[බාධා කිරීමක්]* අපට නම් ප්‍රශ්නයක් නැහැ. අපට පුරුදුයි. අපි ඕවා ශත පහකට ගණන් ගන්නේත් නැහැ. අපි විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට කියන්න කැමැතියි, කරුණාකර මයික් එකකුයි, කැමරා එකකුයි සවි කර දෙන්න කියලා. *[බාධා කිරීම්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නම කියන්න. [බාධා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නම කියන්නේ වැදගත් නම් විතරයි.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය මෙයයි. මෙතැන කිසිම වැදගත් ප්‍රශ්නයක් කථා කරන්න බැහැ නේ. දැන් මේක කෝලම් මඩුවක් කරගන්න තමයි ඕනෑ වෙලා තිබෙන්නේ. මෙතැන පක්ෂ නායකවරු ඉන්නවා. ඒ අය මේ ගැන කථා කළා. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා උදේ ඉතාම පිළිවෙළට, කෙටියෙන් media-crazy වෙන්නේ නැතුව එතුමාගේ අදහස ඉදිරිපත් කළා. අපි එතුමාට කිව්වා, මේක ජාතික වශයෙන් වැදගත් කරුණක් කියන එක. අපිත් බලාපොරොත්තු වෙනවා, මෙම ගැටලුව විසඳන්න. ඔබතුමන්ලා අතර පක්ෂ නායකයන් ඉන්නවා. අපි අවස්ථාව දුන්නා. තව පක්ෂ නායකයෙක් ඉන්නවා නම් කමක් නැහැ. *[බාධා කිරීම්]* මොකද, පාර්ලිමේන්තුවේ කටයුතු කරගෙන යන්න ඕනෑ. ඒ නිසා තමයි අපි මේ සංවාදයට ඉඩ දුන්නේ. *[බාධා කිරීම්]* ඒ නිසා ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මාර වැඩක් නේ. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි ඔබතුමාට කියන්න කැමැතියි, *[බාධා කිරීම්]* සභානායකගේ භූමිකාව තමයි ඒක. *[බාධා කිරීම්]* සභානායකගේ භූමිකාව තමයි ඒක. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව - *[බාධා කිරීම්]* ඔබතුමාත් දන්නවා, මේ ප්‍රශ්නය සම්බන්ධව උසාවිය මඟින් තීරණයක් දීපු බව. *[බාධා කිරීම්]* ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා. *[බාධා කිරීම්]* මේක කෝලම් මඩුවක් කරන්න බැහැ. *[බාධා කිරීම්]* මෙතුමාට මොකක්ද තිබෙන අයිතිය? *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, කරුණාකර ඉඳගන්න. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපේ විනය ගරුකකම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අවස්ථාවක් කර ගන්න එපා. *[බාධා කිරීම්]* අපේ විනය ගරුකකම, අපේ decency එක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අවස්ථාවක් කරගන්න දෙන්න එපා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]* මෙතුමා medically check කරපු කෙනෙක්. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපට අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] අපට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

දැන් මේ අවස්ථාවේදී විපක්ෂයෙන් තුන්දෙනෙක් කථා කළා. ගරු කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථා කළා, මෙතැන ඉන්න එක්සත් ජාතික පක්ෂයේ නායකයා කථා කළා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කළා. එතකොට තව කාටද අවස්ථාව දෙන්න ඕනෑ? එහෙම නම් 159දෙනාටම ඔබතුමා අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]* එක්කෝ, මේ පක්ෂ නායකයෝ තමන්ගේ කොන්ද පාවිච්චි කරලා මෙතුමන්ලාව නිහඬ කරවන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අපට මේ තත්ත්වය පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න ඕනෑ. *[බාධා කිරීම්]* අපට පැහැදිලි කරන්න දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ අයව නිහඬ කරවලා දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන,- *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා මේ අයව නිහඬ කරවලා දෙන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තමුන්නාන්සේ මොකක්ද මේ කරන්නේ? *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! - *[Interruption.]* Order, please! Order, please!!

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
"Order, please" කියලා වැඩක් නැහැ. තමුන්නාන්සේ කෙළින් කථා කරන්න. තමුන්නාන්සේ මොකක්ද මේ කරන්නේ? *[බාධා කිරීම්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පක්ෂග්‍රාහී වෙන්න එපා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! *[Interruption.]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීම්]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලාට අවස්ථාව දීලා මේ කාරණය අවසන් කරන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ඉන්ධන මිල සම්බන්ධයෙන්, - *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
සභානායකතුමාට මයික් එක දීලා, අපට බණින්න පුළුවන්. අපට කථා කරන්න දෙන්නේ නැහැ. අපට අයිතිවාසිකමක් නැහැ. *[බාධා කිරීම්]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලාට අවස්ථාව දීලා මේ කාරණය අවසන් කරමු. ගරු කථානායකතුමනි, අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]* සුළු වේලාවක් දෙන්න. තව වෙලාව තිබෙනවා නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අනෙක් මන්ත්‍රීවරුන්ටත් අයිතිවාසිකමක් තිබෙනවා. මොකක්ද මේ කරන්නේ? *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හැම දාම නැහිටිට ගමන් මයික් එක දෙනවා. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් රටේ ජාතික වැදගත්කමක් තිබෙන ප්‍රශ්නයක් ගැන කථා කරනවා. *[බාධා කිරීම්]* ඒ සම්බන්ධයෙන් පක්ෂයකින් මන්ත්‍රීවරු ප්‍රශ්න ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකට උත්තර දෙන්නයි මේ අවස්ථාව නොදෙන්නේ. ඔබතුමන්ලා භයයිද, ඒ උත්තරයට? *[බාධා කිරීම්]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔහොම කෑගැහුවාම මට ඇහෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමිඳ්ත ඛිජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, අපේ ස්ථාවර නියෝග පොතේ සඳහන් ආකාරයට ස්ථාවර නියෝග 91 යටතේ, ඔබතුමාට හිසනමා ආචාර කරලා, අපිට කථා කරන්න අවස්ථාව ඉල්ලන්න පුළුවන්. ඒක තමයි අපට තිබෙන අයිතිය. මම ස්ථාවර නියෝග 91 යටතේ ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලලා, ස්ථාවර නියෝග 92(2)හි රීති ප්‍රශ්න යටතේ තිබෙන (අ) හා (ආ) පහදා දීමටත්, ස්ථාවර නියෝග 27(2) පැහැදිලි කරදීමටත් අවසර ඉල්ලනවා. එතකොට එහෙම ඉල්ලුවාම, ඔබතුමා මට විනාඩි තුනක් කථා කිරීමට අවසර දෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* විනාඩියයි. ගරු සභානායකතුමනි, රීති ප්‍රශ්න තුනයි. රීති ප්‍රශ්න තුනක් තිබෙනවා. එකකට විනාඩි තුනක් ඕනෑ. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක් තිබෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමිඳ්ත ඛිජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, දැන් ඔබතුමා ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාට කිව්වා, ස්ථාවර නියෝග 27(2) යටතේ අහන ලද ප්‍රශ්නයට පිළිතුරු දුන්නාට පස්සේ අතුරු ප්‍රශ්න අහන්න බැහැ කියලා. මම ස්ථාවර නියෝගවල සඳහන් වන ආකාරය කියවන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක් තිබෙනවා, කථා කරන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමිඳ්ත ඛිජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, විනාඩි තුනයි. මට රීති තුනක් ගැන කියන්න තිබෙනවා. මම ඒ රීති තුනම කියවන්න වෙලාව ඔබතුමාට කියලා තමයි ඉල්ලන්නේ. දැන් ඔබතුමා රවී කරුණානායක මන්ත්‍රීතුමාව නොමහ යැව්වා, එතුමාට රීති ප්‍රශ්න අහන්න බැහැ කියලා. ඔබතුමා කියවන්න, ස්ථාවර නියෝග 27(2). එහි මෙසේ සඳහන් වෙනවා:

> "..... එසේ වුවද, ප්‍රශ්න අවසානයේ දී පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම්දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂයක නායකවරයෙකු විසින් අසනු ලැබිය හැකි ය."

ඇයි, ගරු කථානායකතුමනි, ඔබතුමා සභානායක වෙන්නේ? ඔබතුමා ගරු රවී කරුණානායක පක්ෂ නායකයා වාඩි කළා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ තමයි, ස්ථාවර නියෝග 27(2).

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමිඳ්ත ඛිජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

හරි, ඔබතුමා කියනවා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඇහුවාට පසුව අතුරු ප්‍රශ්න අහන්න බැහැ කියලා. හැබැයි, මේක කියවන්න. මේකේ තිබෙන්නේ මොකක්ද කියලා ඔබතුමාට කියවන්න පුළුවන් නේ. හැබැයි, ඔබතුමා එතුමා වාඩි කරවනවා. වැරැදියි. ඇයි, ඔබතුමාව remote control එකකින් මෙහෙයවන්නේ. ඔහොම තමයි, ඉතිහාසයේ කථානායකලා ඔතැන වැඩ කළේ. ඒක නිසා සභානායක, කථානායක වෙන්න යන්න එපා. ඒකයි අපි කියන්නේ.

ඊළඟ කාරණය මේකයි. ගරු කථානායකතුමනි, ඔබතුමා තමයි මේ ගරු සභාවේ ප්‍රධානියා, සභානායකතුමා නොවෙයි. ඔබතුමා ස්ථාවර නියෝග 146 කියවන්න. ඔබතුමන්ලා ගන්න න්‍යාය පත්‍රයෙන් බැහැර වෙනවා නම්, ඒ බැහැරවීමේ අයිතිය තිබෙන්නේ තමුන්නාන්සේට, මේ සභානායකතුමාට නොවෙයි. ඒක තමයි ඔබතුමාගේ බලය. හැබැයි, ඔබතුමාගේ බලය සභානායකතුමාට දීලා, එතුමා ඇවිල්ලා අපිට මඩ ගහනවා. මහත්තයෝ, අපේ කොන්ද ගැන අපි දන්නවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

ඔබතුමා නෝනාත් එක්ක පාර්ලිමේන්තු ඇවිල්ලා තිබෙන්නේ, පරම්පරාවම අරගෙන. දරුවෝ දාලා තිබෙන්නේ රස්සාවට. *[බාධා කිරීම්]* ඒ නිසා අපේ කොන්ද ගැන කථා කරන්න එපා, සභානායකතුමා.

මේ ස්ථාවර නියෝග අනුව යනවා නම් යමු. නැත්නම් තමුන්නාන්සේලා දෙදෙනා පාර්ලිමේන්තුව කැඳවලා, උදේ සාකච්ඡාවට,- *[බාධා කිරීම්]* අපි ජනතා නියෝජිතයෝ. අපිට ඡන්දය දුන්නේ ඔබතුමන්ලා කියන විධියට ප්‍රශ්න අහලා ගෙදර යන්න නොවෙයි. අපි ඡන්දය ඉල්ලලා ආවේ. මේ පාර්ලිමේන්තුවෙන් අයින් වෙලා ගිහිල්ලා ආයෙත් ආවේ මිනිස්සු අපිට ඡන්දය දුන්නු නිසා. ඒ නිසා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

නම්, ගරු කථානායකතුමනි, අපි කථානායකතුමා කියලා ආමන්ත්‍රණය කරන්නේ නැහැ, සභානායකතුමා කියලා ආමන්ත්‍රණය කරලා අවසර ගන්නම්.

ඒ නිසා ඕනෑම වෙලාවක, ඕනෑම මොහොතක මේ මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න අහන්න පුළුවන්, ස්ථාවර නියෝග 92(2)හි රීති ප්‍රශ්න (ආ) යටතේ. ගරු මන්ත්‍රීවරයෙකුට නැඟිටලා ප්‍රශ්නයක් අහන්න පුළුවන් අවස්ථාව මේ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල රීති ප්‍රශ්න යටතේ තිබියදී සභානායකතුමා හිතනවා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

කියලා, එහෙම වෙන්න දෙන්න එපා. ඔබතුමා හැමෝගේම කථානායක; මන්ත්‍රීවරුන් 225දෙනාගේම කථානායක. ඔබතුමා ආපු වෙලාවේ මධ්‍යස්ථව හිටියා. දැන් ඔබතුමා බලන්නේ දකුණු පැත්ත විතරයි. අපේ පැත්තත් බලන්න. ඒ නිසා ඔබතුමා අර කලින් කථානායකලා වාගේ රූකඩ නොවී, මේ ස්ථාවර නියෝග අපි කියවනකොට ඒකට ඇහුම්කන් දීලා, මේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න අහන්න අවසර දෙන්න; ප්‍රශ්න අහන්න දෙන්න. අපි දැන් උදෙන්ම එන්නේ නැත්තේ ඇයි? අපි ආවම එතුමාට mike එක දෙනවා. එතුමා ඇවිල්ලා එතුමාගේ වැඩ ටික කියනවා. ඒ නිසා අපි උදෙන්ම එන්නේ නැහැ. *[බාධා කිරීම්]* මට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන් ගණනාවක් කැමැතියි, මේ ගැන අදහස් දක්වන්න. ඒ අවස්ථාව අපි ගන්නවා. මම මෙහෙම පටන් ගන්න කැමැතියි. ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ මෙසේ සඳහන් වනවා:

> "රීති ප්‍රශ්නයක් මතු කිරීමේ දී, මන්ත්‍රීවරයෙකුට මිනිත්තු එකකට වඩා කථා කරනු ලැබිය නොහැකි අතර, සැලකිල්ලට භාජනය කරනු ලබමින් තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව කථා කරනු ලැබිය නොහැකි වන්නේ ය....."

එතැනදී විනාඩියයි තිබෙන්නේ, ගරු කථානායකතුමනි. මම මේ ප්‍රශ්නය පිළිබඳව කියන්න කැමැතියි. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කළාට පස්සේ, ගරු ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකතුමා සමඟ අපි තමයි මේ පිළිබඳව සංවාදයක් කරනවා කියලා පොරොන්දු වුණේ. එහෙම පොරොන්දු වෙලා තිබියදීත්, පක්ෂයේ මන්ත්‍රීවරුන් තිදෙනෙක් කථා කළා. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාටත් අවස්ථා ගණනාවක් ලබා දුන්නා. අපි පාර්ලිමේන්තුව යම්කිසි ක්‍රමයකට කරගෙන යන්න අවශ්‍යයි. ඒක තමයි මට දිලා තිබෙන වගකීම; අපි කණ්ඩායමටම. ඒක අපි හරියට කරනවා. ඒකට පුරුදු වෙන්න බැරි අය සම්බන්ධයෙන් මට කරන්න දෙයක් නැහැ.

ඒ වාගේම ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි, දැන් මේ ඇති වෙලා තිබෙන තෙල් ප්‍රශ්නය පිළිබඳවත්. පසු ගිය සතියේම අපි දැක්කා, පාතාලයේ වෙඩි තැබීම් පිළිබඳ ප්‍රශ්නය ජාතික ආරක්ෂාව පිළිබඳ ඝෝෂාවක් බවට පත් කර ගත්තා. දැන් අපි පිළිගන්නවා, තෙල් සම්බන්ධව ගැටලුවක් ඇවිල්ලා තිබෙන බව. ඒ ගැටලුව ඇති වෙලා තිබෙන්නේ බලශක්ති අමාත්‍යාංශයේ හෝ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රශ්නයක් නිසා නොවෙයි.

ඒක උසාවියෙන් දීපු නියෝගයක්. උසාවිය තුළ තිබුණු කරුණක්.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
උසාවියෙන් නියෝගයක් දීලා නැහැ නේ. ඒක වැරැදියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට කථා කරන්න දෙන්න, ගරු මන්ත්‍රීතුමා.

උසාවිය තුළ තමයි මේ ප්‍රශ්නය තිබුණේ. උසාවියෙන් තමයි මේ පිළිබඳව අදාළ කරන තීරණය ලැබිලා තිබෙන්නේ. ඒ නිසා උසාවි තීරණයකට අදාළව මෙහෙම කටයුතු කිරීම උසාවියට අගෞරව කිරීමක් කියලා තමයි අපි හිතන්නේ. ඒක තමයි, පළමුවන කාරණය.

තෙල් පෝලිම් ඇති කරන අය වෙනුවෙන් උසාවි ගියාට අපිට කමක් නැහැ. අපි කියන්නේ උසාවිය තුළ තමයි මේ ප්‍රශ්නය තිබුණේ කියන එකයි. ගරු කථානායකතුමනි, සරලව ගත්තොත්, මේ මොකක්ද? මම ඉලක්කම්වලින් කියන්නේ නැතිව ඒ ගැන තේරෙන විධියට කියන්නම්. අපේ ගරු මහාචාර්ය අනිල් ජයන්ත නියෝජ්‍ය ඇමතිතුමා මේ කාරණය ඉතා විද්‍යානුකූලව පැහැදිලි කළා. මම ජනතාවට තේරෙන අර්ථයෙන් කිව්වොත්, මෙන්න මේකයි වෙලා තිබෙන්නේ. අපි පිට රටකින් තෙල් ගෙනෙනකොට ඒ තෙල් නැවට ගෙනැල්ලා, නැවෙන් කොළඹ වරායට ගෙනැල්ලා, කොළඹ වරායෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙනෙන්න යන වියදමක් තිබෙනවා. පිරිපහදු සහ බෙදා හැරීම් කටයුතු සඳහා ඛනිජ තෙල් සංස්ථාව වියදමක් දරනවා. ඔවුන් ලාභයකුත් උපයනවා. ඒ ලාභයත් එකතු කරනවා, මේ වියදමට. ඒක තමයි වැය වුණු වියදම. ඒ වියදමට තමයි ගරු කථානායකතුමනි, බෙදා හැරීම් කණ්ඩායමට, පෙට්‍රල් ෂෙඩ් හිමිකරුවන්ට ලාභයක් -commission එකක්- ගණනය කරන්නේ. එලෙස ඛනිජ තෙල් සංස්ථාව දක්වා තෙල් පැමිණීම වෙනුවෙන් යන වියදමට තමයි ලාභයක් එකතු කරන්නේ. නමුත් දැන් වෙලා තිබෙන දේ මේකයි. මගේ දැනීමේ හැටියට 2019 සිට අපේ රටේ පැවැති හැම ආණ්ඩුවක්ම ජනතාවගේ අධ්‍යාපන කටයුතු, සෞඛ්‍ය කටයුතු කියන මේ සියල්ල වෙනුවෙන් ඛනිජ තෙල් වෙළෙඳාම මත බද්දක් අය කරනවා. ඊට අමතරව ඛනිජ තෙල් සංස්ථාවෙන් ආණ්ඩුව විශාල ණය ප්‍රමාණයක් පවරාගෙන තිබෙනවා. ඒ, අපේ ආණ්ඩුව නොවෙයි කලින් පැවැති ආණ්ඩු පවරා ගත්ත ණය. ඒ ණය ගෙවන්නත් ඛනිජ තෙල් සංස්ථාවෙන් යම්කිසි මුදලක් රාජ්‍ය භාණ්ඩාගාරයට දිය යුතුයි. අතිවිශාල මුදල් නාස්තියක් ඛනිජ තෙල් සංස්ථාව මීට කලින් කරලා තිබෙනවා.

ඛනිජ තෙල් සංස්ථාවේ ලාභය හා වියදම් ටික එකතු කළාට පස්සේ,- අපි උදාහරණයක් ලෙස ඩීසල් ගනිමු. ඒ වියදම රුපියල් 120 නම් අන්න ඒ රුපියල් 120ට තමයි බෙදුම්කරුවන්ට ලාභය ගණනය කළ යුතු වන්නේ, ගරු කථානායකතුමනි. නමුත් අවුරුදු ගණනක් තිස්සේ සිදු වන දේ තමයි ඒ රුපියල් 120ට ඛනිජ තෙල් සංස්ථාව ආණ්ඩුවට ගෙවන බදු එකතු වීම. ඛනිජ තෙල් සංස්ථාව ඔය ණය වෙනුවෙන් Treasury එකට ගෙවිය යුතු ගණනක් තිබෙනවා. මේ හැම ඩීසල් ලීටරයකටම බද්දක් එකතු වෙනවා. ඒ මුදලත් එකතු වුණාට පස්සේ රුපියල් 120ට තිබෙන එක සමහර විට රුපියල් 250ක්, රුපියල් 300ක් විතර වෙනවා. 2009 ඉඳන් මේ වනතුරු වෙලා තිබෙන දේ මොකක්ද? අන්න ඒ බද්දත් එකතු කරලා තමයි මේ බෙදුම්කරුවන්ට ඔවුන්ගේ ලාභය ගණනය කරන්න ප්‍රතිශතය හදන්නේ. ඔබතුමා දන්නවා, රුපියල් 120න් සියයට 3යි, රුපියල් 300න් සියයට 3යි කියන්නේ දෙකක් බව.

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සංස්ථාව කියන්නේ ලංකාව සතු ආයතනයක්. ඒ සල්ලි තමයි නැවත හම්බ වෙන්නේ පාරවල් හදන්න, ඉස්කෝල හදන්න, ඉස්පිරිතාල හදන්න යනාදී ඒ ඔක්කෝටම. ඛනිජ තෙල් සංස්ථාවේ ලාභය ලංකාවෙන් එළියට යන්නේ නැහැ. ගරු කථානායකතුමනි, එහි ලාභය ජනතාවටම තමයි පෙරළා හම්බ වෙන්නේ. මෙතැනදී ඛනිජ තෙල් සංස්ථාව සම්බන්ධයෙන් තිබුණු විවාදය මොකක්ද? අපිට කලින් හිටපු ඇමතිවරු වාගේම ඛනිජ තෙල් සංස්ථාව මේ කාරණය හඳුනාගෙන ඔවුන් කියලා තිබෙනවා, ඒ වියදම මත තමයි ලාභය - commission එක - ගණනය කළ යුතු වෙන්නේ, ආණ්ඩුව බදු එකතු කළාට පස්සේ නොවෙයි කියලා. ඒ පිළිබඳව තීන්දුව ක්‍රියාත්මක වුණේ නැහැ. එම තීන්දුව ඒ බෙදුම්කරුවන් උසාවි ගෙනිච්චා. උසාවි තීන්දුව ක්‍රියාත්මක වෙන්න ඕනෑ බෙදුම්කරුවන්ට පක්ෂපාතී නම් විතරයිද? අපි විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් අහන්න කැමතියි, ආණ්ඩුව ඛනිජ තෙල් සංස්ථාව මත බදු ගැහුවාට පස්සේ ගණනය කරන ලාභයත් බෙදුම්කරුට දෙන්න ඕනෑ කියන පදනම මතද දැන් ඔබතුමන්ලා ඉන්නේ කියලා. ඒ කියන්නේ සරලව ගත්තොත් ඒක කිසිම මූලධර්මයක් තිබෙන දෙයක් නොවෙයි. ව්‍යාපාර කරන අය දන්නවා, බදු මත ලාභය ගණනය කරන්න බැරි බව. ඒක වැරදියි.

[ගරු බිමල් රත්නායක මහතා]

ඒ නිසා අද මේ තීන්දුව හෝ මහ පෙන්වීම හෝ මොකක් හෝ ආවත් මොකක්ද මේකේ සාරය හැටියට තිබෙන්නේ? මේ තීන්දුව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙන සාරය මේකයි. ඕනෑම දෙයක content එකක් තිබෙනවා නේ. මේ අදහසේ සාරය මොකක්ද? රජයට ගෙවන බදු මත ලාභ ගණනය කරන්න එපා කියන එක. ඒක තමයි අද වෙලා තිබෙන්නේ. ඒකෙන් ලංකාවේ කර්මාන්තවලට, ව්‍යාපාරවලට, පොදු ජනතාවට - හැම කෙනාටම - වාසියක් වෙනවා. ඔබතුමන්ලා කලින් කිව්වා, විදුලිබල මණ්ඩලයේ PUCSL එකෙන් විදුලි බිල අඩු කළාම ඔබතුමන්ලා ජනතාව වෙනුවෙන් සතුටු වුණා කියලා. ඒක හොඳයි නේ.

දැන් ඇයි, මේකෙදි එහෙම වෙන්නේ නැත්තේ? ගරු කථානායකතුමනි, මේ සුළු පිරිසකගේ ව්‍යාපාරික වුවමනාවන් වෙනුවෙන් ජන වරමක් තිබෙන ආණ්ඩුවක් දණ ගස්සන්න කියලා ද කියන්නේ?

ඒ නිසා අපි පැහැදිලිව ඉන්න තැන මේකයි. අපි ඒ බෙදුම්කරුවන් ඔක්කෝටම හරි, නැත්නම් කැමැති සුළු කණ්ඩායමට හරි කියන්න කැමැතියි, ආණ්ඩුවක් විධියට අපි මේ ප්‍රශ්නයේදී උසාවියෙන් ආපු මහ පෙන්වීම මත තමයි කටයුතු කරන්නේ කියන එක. අපි කිසිසේත්ම මේ වැරදි ක්‍රමය යන්න දෙන්නේ නැහැ. මොකද, අපි පමණක් නොවෙයි, කලින් හිටපු ඇමතිවරු පවා හඳුනා ගත්ත වැරැද්දක් මේක. ඒ නිසා තමයි තෙල් මිල රුපියල් 162ට වඩා වැඩි වෙනකොට, ඒ 162ට වඩා වැඩි වන ප්‍රමාණය මත පදනම් වෙලා ලාභය ගණනය කළ යුතු නැහැ කියලා මීට වසර ගණනාවකට පෙර තීන්දු කරලා තිබෙන්නේ. මේවා මූලධාර්මික වැරදි. ජනතාව සූරා කන, මංකොල්ලකාරීත්වයක් මේ තියෙන්නේ. මේක මංකොල්ලයක්. මෙහෙම කරන්න බැහැ, කිසිම ආර්ථික විද්‍යාවකට අනුව. ඒකයි අපි කියන්නේ.

ඒ නිසා ආණ්ඩුවක් විධියට අපි සිටින ස්ථාවරය අනුව, ජනතාවගේ පැත්තේ සහ මේ විද්‍යාත්මක කරුණු මත පදනම් වෙලා තමයි අපි කටයුතු කරන්නේ. අපි කිසිසේත්ම එකඟ වෙන්නේ නැහැ, අද මේ තෙල් භිඟයක් ඇති කරන්න දරන උත්සාහයට. ඒ නිසා ඒ අයත් එක්ක සාකච්ඡා කරලා හරි, අධිකරණ ක්‍රියාමාර්ගවලින් හරි, නීතිමය වශයෙන් හරි ඒ සම්බන්ධයෙන් ඇමතිවරයා සහ අදාළ සංස්ථාව කටයුතු කරයි. නමුත් ආණ්ඩුවේ ස්ථාවරය මේකයි. ජනතාවට අපි කියන්න කැමැතියි, තෙල් භිඟයක් නැහැ; තෙල් බෙදා හැරලා තිබෙනවා කියන එක. අපි කැමැතියි, මේ සම්බන්ධයෙන් අනික් ඇමතිවරුන්ගේත් අදහස් දක්වනවාට. ඒක අපට අවශ්‍යයි. *[බාධා කිරීමක්]* නැහැ, දැන් කථා කරන්නේ අපි. *[බාධා කිරීම්]*

ඒ නිසා ගරු කථානායකතුමනි, අපි කියන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය මොකක්ද කියලා. ආණ්ඩුවේ ස්ථාවරය වෙන්නේ, අපේ මෙම ක්‍රියාමාර්ගයට එකඟ නැහැ බෙදුම්කරුවන්, ඒ නිසා ඒ වෙනුවෙන් අපි නීත්‍යානුකූලවත්, පරිපාලන වශයෙනුත් ගන්න පුළුවන් පියවර ගන්නවා කියන එකයි. *[බාධා කිරීම්]* ඒ නිසා ගරු කථානායකතුමාගෙන්,-

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ඩි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩියක් ලබා දෙනවා.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ඩි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
ගරු කථානායකතුමනි, මම හිටපු රාජ්‍ය ඇමතිතුමා විධියට කථා කරන්නේ. අපේ සභානායකතුමා කියන කාරණාවලට - සියයට 90කට විතර- මමත් එකඟ වෙනවා, . හැබැයි, අපේ කාලය තුළ එකතු වෙච්ච බදු, එනම් තෙල්වලට වැටි එක එකතු වුණාම, ඒ බද්දට සියයට 3 ඔවුන්ට ලබා දුන්නේ නැහැ. ඒ කියන්නේ පෙට්‍රල් ෂෙඩ් ownersලාට. අපි ඒක අයින් කළා. ඒක නොවෙයි, ප්‍රශ්නය. ප්‍රශ්නය තමයි ගරු කථානායකතුමනි, මේක ගැන ඇත්තටම විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා තමයි පැහැදිලි කරන්න ඕනෑ. මොකද, රටේ තෙල් ප්‍රශ්නයක් නැහැ; තෙල් stocks තිබෙනවා. හැබැයි, ප්‍රශ්නය තමයි රටේ තෙල් පෝලිමක් panic buying හින්දා හරි ඇති වුණොත්, ඒක දවසක් දෙකක් ඇදෙන්න පුළුවන්. ඒක හින්දා විශේෂයෙන්ම අද දවස තීරණාත්මකයි. මොකද, ඉරිදා දවසේ CPSTL එකෙන් තෙල් බෙදන්නේ නැහැ. ඒක හින්දා ඇමතිතුමා පැහැදිලි කරන්න, අද දවසේ කොච්චර තෙල් ගෙනිච්චාද, මේකට ගන්න ක්‍රියාමාර්ගයක් විධියට හෙට දවසේ තෙල් ටික බෙදනවාද කියලා. එහෙම නැත්නම් ජනාධිපතිතුමාට බලය තිබෙනවා, මේ සම්බන්ධව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

මෙවැනි strikes කලිනුත් ඇති වෙන්න ගියා. හැබැයි, අපේ කාලය තුළ අපි ඒවා ඇති වෙන්න දුන්නේ නැහැ. මොකද, මේක අත්‍යවශ්‍ය සේවාවක්. ඒ නිසා මේ පැහැදිලි කිරීම ඇමතිතුමාගෙන් තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. අද දවසේ තෙල් කොච්චර ගියාද, හෙට දවසේ තෙල් බෙදනවාද, ඒ වාගේම මේ ප්‍රශ්නය විසඳන්න ඔබතුමන්ලා ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් මාසයක් විතර වෙනවා. මම දිගටම බලාගෙන හිටියා, මෙහි සිදුවන සිදුවීම් දෙස. සභානායකතුමාට යම් අයිතියක් තිබෙනවා, සභාව හසුරුවන්න. හැබැයි, ගරු කථානායකතුමනි, එතුමාට අනික් පැත්තේ මන්ත්‍රීවරුන්ට අපහාස කරන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක්ද?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔව්, රීති ප්‍රශ්නය ස්ථාවර නියෝග 92 (2) යටතේ, ගරු කථානායකතුමනි. මට කියන්න දෙන්න. *[බාධා කිරීම්]* එතුමා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් කළා. මට එතුමාට කියන්න තිබෙන්නේ මේකයි. හැමදාම එතුමා පන්තියක ලොකු monitor කෙනෙක් වාගේ ඔබතුමාව හසුරුවනවා. ඔබතුමා තමයි

තින්දුව ගන්න ඕනෑ, මන්ත්‍රීවරු කවුද කථා කරන්නේ, පක්ෂ නායකවරු කවුද කථා කරන්නේ කියන එක සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ නිසා තමයි ඔබතුමාට මම අවස්ථාව දුන්නේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔබතුමා අහගෙන ඉන්නවා, විනාඩි 10ක් විතර එතුමාගේ දේශනය. ඊට පස්සේ ඔබතුමා ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්නවා. නමුත් ඔබතුමා තමයි ඒ දේශනය අපට කරන්න ඕනෑ. එතුමා නොවෙයි. හැමදාම එතුමා ඉතාම තදබල ලෙස අපි නිකම් පන්තියක ළමයින් වාගේ සලකා "කෝලම් මඩුවක් කර ගන්න එපා, කොන්ද පණ නැහැ විපක්ෂයේ නායකවරුන්ට" ආදී වශයෙන් එහෙම අපව අමතන්න බැහැ. මොකද, අපිත් එතුමා වාගේ ඉතාම සාධාරණව තමයි කටයුතු කරන්නේ. අපි කවුරුවත් disturb කරන්නේ නැහැ. මම අගය කරනවා, මේ පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තුව කලින් පාර්ලිමේන්තුව වාගේ නොවෙයි, disturb කරන අය අඩුයි. ඒ සම්බන්ධයෙන් සියලු මන්ත්‍රීවරුන්ට අගය දෙන ගමන් මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එතුමා ගොඩක් වෙලාවට හොඳයි. හැබැයි, ඉඳලා හිටලා "ෆයර්" වෙලා මේ පැත්තේ මන්ත්‍රීවරුන්ට විශාල ප්‍රහාරයක් එල්ල කරනවා. එතකොට ගරු කථානායකතුමනි, අපට ඒක දරා ගෙන ඉන්න බැහැ. *[බාධා කිරීම්]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විනාඩියක් ඉන්න, ගරු මන්ත්‍රීතුමනි. මම තත්පරයෙන් අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, හැම දාම මේ විධියට විවාද ඇති වෙන්න ප්‍රධානම හේතුව තමයි, ස්ථාවර නියෝග 92(2)(අ) වගන්තිය ක්‍රියාත්මක නොවීම. එය ක්‍රියාත්මක වෙනවා නම් මේ ප්‍රශ්න හුඟක් අඩු වෙනවා. ස්ථාවර නියෝග 92(2)(අ)හි මෙසේ සඳහන් වෙනවා:

> "ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේ ද හෝ කරනු ලබමින් තිබේ ද යන්න පිළිබඳව මන්ත්‍රීවරයකු විසින් ප්‍රශ්න කරනු ලැබිය හැකි වන්නේ ය."

92(2)(අ) වගන්තිය. *[බාධා කිරීමක්]* ඔබතුමා හැමෝටම විනාඩියක් හරි සවන් දෙනවා නම්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රීති ප්‍රශ්නයක් මතු කිරීමට මන්ත්‍රීවරයෙකුට එක විනාඩියක් ලැබෙනවා. *[බාධා කිරීම්]* ඔබතුමා හුඟක් ඉල්ලුවා නේ. වැරදියි නේ?*[බාධා කිරීම්]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඒක නොදෙනකොට තමයි මේ ප්‍රශ්න ඇති වෙන්නේ. *[බාධා කිරීම්]* ඔබතුමා මීට පස්සේ හැමෝටම එක විනාඩියක් අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, මම අවස්ථාව ඉල්ලුවා- *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා කථා කළාට පස්සේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, මම ඉස්සෙල්ලාම කියන්න ඕනෑ, මේක ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට ගත්ත පරිපාලන තීන්දුවක් හෝ වෙනත් හේතුවක් නිසා හෝ ඇති වෙච්ච ප්‍රශ්නයක් නොවෙයි කියන එක. මේ ප්‍රශ්නයට අතීතයක් තිබෙනවා. ඒ අතීතය ගැන සභානායකතුමාත්, මුදල් නියෝජ්‍ය ඇමතිවරයාත් පැහැදිලි ප්‍රකාශයක් කළා.

ඒ වාගේම මම අවධාරණය කරන්න කැමැතියි, බනිජ තෙල් තොග සම්බන්ධයෙන් මේ වෙනකොට කිසිම ගැටලුවක් නැති බව. ඊයේ රාත්‍රියේදී සමහර ස්ථානවල යම් පෝලිමක් තිබුණා. හැබැයි අද උදේ වෙනකොට ඒ ප්‍රදේශවල පෝලිම් සෑහෙන දුරට අවසන් වෙලා තිබෙනවා කියන එක තමයි දැන් දැනගන්න ලැබිලා තිබෙන්නේ. ඒ වාගේම, මම මේ වෙලාවේ කථා කළා, Ceylon Petroleum Corporation එකේ සභාපතිතුමාත් එක්ක. ඒ සභාපතිතුමා සංඛ්‍යාත්මක අගයන් දුන්නේ නැති වුණත්, මේ වෙනකොට සැලකිය යුතු තොග ප්‍රමාණයක් මුදා හරිමින් පවතින බව ප්‍රකාශ කළා. ඒ නිසා අපි මේ රටේ මහ ජනතාවට කියන්න කැමැතියි, ඉදිරියේදී මේ කාරණය සම්බන්ධයෙන් ජනතාවට ප්‍රශ්නයක් ඇති නොවන ආකාරයට, බනිජ තෙල්වල හිඟයක් ඇති නොවන විධියට Ceylon Petroleum Corporation එක වගකීමෙන් කටයුතු කරනවා කියලා.

ඒ වාගේම, මෙතැන තිබෙන අනික් ප්‍රශ්නය වන්නේ, ජනතාවට ගහන බදු මත ලැබෙන කොමිස් මුදලක් වෙනත් කෙනෙකුට දෙන්න පුළුවන්ද, බැරිද කියන එක. ඒ සම්බන්ධයෙන් විගණන වාර්තා තිබෙනවා. ඒ වාගේම, උසාවියේ යම් කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ මත උසාවිය පවා පිළිගෙන තිබෙනවා, මේ වාගේ අවසාන මීලට කොමිස් මුදලක් ලබා දීම වැරදියි කියලා. ඒ හින්දා මූලධාර්මිකව මෙතැන කිසි වැරැද්දක් නැහැ. මේ පිළිබඳව කථා කරන අයගෙන් අපි අහන්න කැමැතියි, මේ පෙනී සිටින්නේ මිනිස්සුන්ගෙන් ගන්න බදු මුදලෙන් තවත් පාර්ශ්වයකට කොමිස් මුදලක් අත්පත් කර ගැනීම සඳහාද කියලා. එහෙම නොවෙනවා නම් කමක් නැහැ. මිනිස්සුන්ට සාධාරණ ප්‍රශ්නයක් තිබෙනකොට ඒ ප්‍රශ්නය වෙනුවෙන් කථා කරන එක

[ගරු අනුර කරුණාතිලක මහතා]

අපිට තේරුම් ගන්න පුළුවන්. හැබැයි ප්‍රශ්නයක් දඩමීමා කරගෙන අනවශ්‍ය විධියට ජනතාව අතර කැලඹීමක් ඇති කරන විධියේ සැලසුමක් නම් තිබෙන්නේ, ඒ වාගේ උත්සාහයක් නම් තිබෙන්නේ ඒක අපිට පිළිගන්න පුළුවන් එකක් නොවෙයි.

ගරු කථානායකතුමනි, ඒ නිසා අවසාන වශයෙන් මේ රටේ පොදු ජනතාවට අපි කියන්න කැමැතියි, ඉදිරි දින දෙක, තුන තුළදී හෝ ඉදිරියේදී ඛනිජ තෙල් බෙදා හැරීම හා ජනතාවට ඛනිජ තෙල් ලබා ගැනීම සම්බන්ධයෙන් ගැටලුවක් පැන නඟින්නේ නැහැ කියලා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ ඉන්නේ අපි 66දෙනායි. මේ විපක්ෂයට ඕනෑ නැහැ ආණ්ඩුව බංකොලොත් කරන්න. අපි ආණ්ඩුව බංකොලොත් කරන්න යන්නේ නැහැ. ආණ්ඩු බංකොලොත් කරන්නේ විපක්ෂයේ මිනිස්සු. පාර්ලිමේන්තුවට එන්න තිබෙන පිටුපස gate එක ඉස්සරහා තිබෙන පෙට්‍රල් ෂෙඩ් එකේ පෝලිම දැන් ගිහිල්ලා බලන්න. ඊයේ රු. 12.00ට මම තෙල් ගහගත්තා, Super Diesel හින්දා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. අපි ආණ්ඩුව බංකොලොත් කරන්නේ නැහැ. ආණ්ඩුව දැනගන්න ඕනෑ, හෙට ඉරිදා බව. ඇල්ල ප්‍රදේශයට තිබෙන්නේ එක පෙට්‍රල් ෂෙඩ් එකයි. අද ඇල්ලේ සංචාරකයන්ට තෙල් ගහගන්න විධියක් නැහැ. *[බාධා කිරීම්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 91 (උ) යටතේ තමයි මේ ප්‍රශ්නය අහන්නේ. මේක ප්‍රශ්නයක් විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, මම මේ පාර්ලිමේන්තුවට ආවේ 2015 අපේ යහපාලන ආණ්ඩුව යටතේ. අපි පසුපෙළ මන්ත්‍රීවරු හැටියට පිටිපස්සේ හිටියේ. එතකොට මේ ඉන්න සභානායකතුමාත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඇතුළු එතුමන්ලාගේ මන්ත්‍රීවරු හයදෙනකු විපක්ෂයේ වාඩි වෙලා හිටියා. ඒ, අපි ආණ්ඩු කරන කාලයේ.

ඊට පස්සේ 2019දී අපි විපක්ෂයට ආවා. එතකොටත් එතුමන්ලාගේ අද ඉන්න ජනාධිපතිතුමායි, අගමැතිතුමියයි, විජිත හේරත් ඇමතිතුමායි විපක්ෂයේ හිටියා. එතකොට මෙතුමන්ලාගේ ජනාධිපතිතුමා විපක්ෂයේ පළමුවැනි පේළියේ ඉස්සරහා වාඩි වෙලා හිටියේ. ඒ කාලයේත් උදේට ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ඇහුවා.

ඒ කාලයේත් මන්ත්‍රීවරයෙකු නැඟිටලා එහෙම ප්‍රශ්නයක් ඇහුවාම ඒ කාලයේ පැවැති ආණ්ඩු ඒකට ඉඩ දුන්නා. මේ පාර්ලිමේන්තුවට නොහොඹිනා දේවල් බොහෝ සෙයින් කරපු ආණ්ඩුව -ගරු කථානායකතුමාගේ ආසනයට වතුර වත් කරපු ආණ්ඩුව, මයික් කඩපු ආණ්ඩුව- පවා ඒ කාලයේ අප නැඟිටලා ප්‍රශ්නයක් අහන කොට යම් අවබෝධයක් මත ඉඩ කඩ ලබා දුන්නා. අපට මතකයි, එත්මන් ජනාධිපතිතුමා විටින් විට නැඟිටලා ඒ කාලයේ හිටපු ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න අහපු හැටි. *[බාධා කිරීමක්]* මට පැහැදිලි කරන්න ඉඩ දෙන්න. සම්ප්‍රදාය ගැනයි මම මේ කියන්නේ, ගරු කථානායකතුමනි. මම ඉක්මනින් අවසන් කරන්නම්. එදා එහෙම ඉඩ දුන්නා; කවුරුවත් මෙහෙම බලහත්කාරයෙන් වාඩි කරවුයේ නැහැ. එවැනි අවබෝධයකින් කටයුතු කරගෙන ගියේ. ගරු කථානායකතුමනි, අපි කවුරුවත් මේ කටයුතු කඩාකප්පල් කරන්න ඇවිල්ලා නැහැ. පාර්ලිමේන්තුව කඩාකප්පල් කරපු කට්ටිය අද ඉන්නේ ගෙදර.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මීට පෙර පාර්ලිමේන්තුවල ප්‍රධාන වැඩකටයුතු පටන් ගෙන තිබෙන්නේ දිවා ආහාරයෙනුත් පසුවයි. ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට යන්න ගියොත් මේ සභාවේ වැඩකටයුතු කරගෙන යන්න වෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, මා කියාගෙන ආපු කාරණය අවසන් කරන්න ඉඩ දෙන්නකෝ. ඒකට ඉඩ දෙන්නේත් නැහැ නේ. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා. *[බාධා කිරීම්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ කාරණය අවසන් කරන්න දෙන්නකෝ. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමා, කියපු කාරණය අවසන් කරන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හරි, හරි, අහගෙන හිටියා. දැන් ඇති. *[බාධා කිරීම්]* ප්‍රශ්නය තේරුණා. *[බාධා කිරීම්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ කාරණය අවසන් කරන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අසුන් ගන්න. *[බාධා කිරීම්]* ඔබතුමා අසුන් ගන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, කරුණාකර අසුන් ගන්න. *[බාධා කිරීම්]*

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අවසන් කරන්න ඉඩ දෙන්න.*[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩියක් කථා කළා. කරුණාකර අසුන් ගන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට ඒ කාරණය අවසන් කරන්න දුන්නේ නැහැ, ගරු කථානායකතුමනි. එහෙම කරන්න එපා. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමාට එය අවසන් කරන්න දෙන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
අපි කඩාකප්පල්කාරයෝ නොවෙයි නේ. මම කියාගෙන ආපු කාරණය අවසන් කරන්න දෙන්න. *[බාධා කිරීම්]* තත්පර 10ක් දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අවසන් කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, ඔබතුමාට අපි පැහැදිලිව කියනවා, ප්‍රධාන විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් කවුරුවත් මේ පාර්ලිමේන්තුව කඩාකප්පල් කරන්න ඇවිල්ලා නැති බව. කඩාකප්පල් කරන්න හිටපු කට්ටිය ජනතාව ප්‍රතික්ෂේප කළා. අපි දැන් සහයෝගයෙන්, අන්‍යෝන්‍ය අවබෝධයෙන් මේ පාර්ලිමේන්තුව ගෙන යමු. අපි ඒකට විරුද්ධ නැහැ. අපේ මන්ත්‍රීවරුන්ට ඉඩ කඩ දෙන්න. අපි ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා ආපු අය. ඔබතුමා ඒකට ගෞරවය දෙන්න. අපි ජාතික ලැයිස්තුවෙන් ආවේ නැහැ. අපි ජනතාවගෙන් ඡන්දය ඉල්ලලා ආවේ. ඒක මතක තබා ගන්න. ඒ නිසා අපි නැඟිට්ටාම ඒ ගෞරවය දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. අසුන් ගන්න.

අමාත්‍යාංශ නිවේදන, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා,

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කරන්න කලින් මම මේ ප්‍රශ්නයට ඉතාම කෙටියෙන් උත්තරයක් දෙන්නම්.

ඔබතුමන්ලාත් අපිත් දැක්කා, ඊයේ දවසේ යම් යම් තැන්වල තෙල් පෝලිම් තිබුණු බව. ඒක ඇත්ත. එය පෙන්වා දීම ගැනත් විපක්ෂයේ ඔබතුමන්ලාට ස්තුතියි. අපේ පැත්තෙනුත් ඒ ගැන ප්‍රකාශයක් කළා. ඔබතුමන්ලා දන්නවා, සාමාන්‍යයෙන් හරි හෝ වැරදි පණිවුඩයක් ගියාම යම් බෙදා හැරීම් ජාලයක ප්‍රශ්නයක් තිබෙනවා කියලා, ජනතාව panic buyingවලට යනවා. ඒක තමයි ඊයේ සිද්ධ වුණේ.

ගරු කථානායකතුමනි, මේ වන කොට තෙල් ලීටර් මිලියන 19ක් ඇණවුම් කර තිබෙනවා. ඇත්තටම මේ බෙදුම්කරුවන් විසින් සාමාන්‍ය තත්ත්වයට වඩා වැඩිපුර තෙල් ප්‍රමාණයක් තමයි ඇණවුම් කරලා තිබෙන්නේ. සාමාන්‍ය දවසක උදේ 7.00න් පස්සේ ඇණවුම් භාර ගන්නේ නැහැ. ඊයේ ඇති වෙච්ච ප්‍රශ්නයේදී ජනතාව වැඩියෙන් තෙල් මිල දී ගැනීම නිසා මේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයට උත්තරයක් හැටියට අද දවස ඇතුළත ඇණවුම් භාර ගන්නවා. ඒ වාගේම, අද හවස් වන කොට මේ පිළිබඳ තක්සේරු කරලා මේ තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඉරිදාත් ඇණවුම් භාර ගන්න අපි කටයුතු කරනවා. සාමාන්‍යයෙන් ඉරිදා දවසේ ඇණවුම් භාර ගන්නේ නැහැ.

කෙසේ නමුත්, තෙල් භිඟයක් නැති බව මම මේ වෙලාවේ කියන්න ඕනෑ. ඒ නිසා පෝලිම්වල ඉඳලා තමන්ගේ වාහනයට වැඩිපුර, අමතර තෙල් ප්‍රමාණයක් ගහගන්න එක තේරුමක් නැහැ. තෙල් තිබෙනවා. බෙදුම්කරුවන් තෙල් ඇණවුම් කරලායි තිබෙන්නේ. ඒවා බෙදා හරින්න CPC එක කටයුතු කරනවා. ඒ නිසා කලබල වෙන්න එපා කියලා මම කියනවා. විශේෂයෙන් සංචාරක ව්‍යාපාරයේ යෙදෙන අයත්, අනික් හැම ක්ෂේත්‍රයකම අයත් කලබලයක් නැතිව ඉන්න. බෙදුම්කරුවන් ඉතා සීමිත ප්‍රමාණයක් විතරයි ඔය කියපු ක්‍රියාදාමයේ නිරත වෙලා ඉන්නේ. අනෙක් අය තෙල් ඇණවුම් කරලා බෙදා හැරීම සඳහා අරගෙන යනවා. එම නිසා ජනතාවට පෝලිමක් නැතිව තෙල් ගහගන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මේ පැහැදිලි කිරීමත් මේ වැදගත් ප්‍රශ්නය සම්බන්ධයෙන්මයි. අපට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් තොරතුරු ලැබී තිබෙනවා, අද දින වන විට රට පුරා තෙල් බෙදා හැර තිබෙන්නේ කොහොමද, ඒ orders place වෙලා තිබෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පමණක් නොවෙයි, රටේ ආයතන 4ක් තිබෙනවා, ඛනිජ තෙල් බෙදා හරින. CPC එකෙන් load කරපු orders ප්‍රමාණය 1,869ක්. ඒවායින් loads 1,696ක්ම deliver කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. LIOC එකෙන් loads 480ක් order කරලා, ඒ ordersවලින් 471ක් deliver කර තිබෙනවා.

Sinopec එකෙන් 399ක් order කරලා, 391ක් deliver කරලා තිබෙනවා. RM Parks කියන ආයතනය 377ක් order කරලා තිබෙනවා; 366ක් බෙදා හැරලා තිබෙනවා. එම නිසා තෙල් හිඟයක් ඇති වීමට හේතුවක් නැහැ, ගරු කථානායකතුමනි. තෙල් බෙදා හැරීම් කරලා තිබෙනවා. ඒ වාගේම අප සතුව තිබෙනවා ගරු කථානායකතුමනි, මේ පිළිබඳව High Court of Civil Appeal මහින් දෙන ලද තීන්දුව. මේ සභාවේ දැන ගැනීම සඳහා මා එය **සභාගත*** කරනවා.

ඒකේ "Conclusion" එක විතරක් මම කියවන්නම්, ජනතාවගේ අවබෝධය සඳහා. මේක ආණ්ඩුවේ තීරණයක් නොවෙයි. මේක උසාවිය හැම පැත්තම දිහා බලලා ලබා දුන් තීරණයක්. මේ බෙදුම්කරුවන් ඉල්ලා සිටියා, පසුගිය ආණ්ඩුවලින් පවා ගත්තු තීන්දුව අත්හිටුවන්න කියලා. හැබැයි High Court of Civil Appeal තීරණය දැනුම් දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි. කාල වේලාව යන නිසා මම එහි ඔක්කෝම කියවන්නේ නැතුව එක වාක්‍යයක් කියවන්නම්. එතුමන්ලා මෙසේ සඳහන් කර තිබෙනවා:

> "...the Members of the general public are at a disadvantage than the dealers,...."

මේ Judgment එකේ "Conclusion" එකට යද්දී උසාවිය පිළිගන්නවා, dealersලාට වඩා අවාසිදායක තැනක තමයි සාමාන්‍ය ජනතාව ඉන්නේ කියලා. ඒ නිසා ඒ මත පදනම් වෙලා "Conclusion" එක දීලා තිබෙනවා, ඒ ගරු විනිශ්චයකාරතුමා. ඒකේ කරුණු තුනක් තිබෙනවා. ඔබතුමාගේ අවසරය ඇතුව මම ඒවා ඉතා ඉක්මනින් කියවන්නම්.

> "4.1 For the reasons adumbrated by me, I dismiss this appeal with cost of Rs. 31,500/- payable to the Defendant in each case."

මට තේරෙන සිංහලෙන් කිව්වොත්, උසාවිය මේ පැමිණිල්ල කරපු අයට - ඒගොල්ලන් නඩු ගණනාවක් ගොනු කරලා තිබෙනවා - කියලා තිබෙනවා ඒ ගාස්තුත් ගෙවන්න කියලා, රුපියල් 31,500 බැගින්. එහි තවදුරටත් මෙසේ සඳහන් කර තිබෙනවා:

> "4.2 This Judgment should apply to all other connected appeals bearing Nos. WP/HCCA/Col 223/2022/LA, WP/HCCA/Col 224/2022/LA, WP/HCCA/Col 225/2022/LA and WP/HCCA/Col 226/2022/LA."

මෙම තීන්දුව ඒ සෑම නඩුවකටම අදාළ විය යුතුයි කියලා තිබෙනවා.

> "4.3 Registrar of this Court is directed to send a copy of this order to the Registrar of the District Court of Colombo."

ගරු විනිශ්චයකාරතුමා අත්සන් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා සභාගත කළ එම නඩු තීන්දුවට අනුව තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා අප එම ව්‍යාපාරික මහත්වරුන්ගෙන් කරුණාවෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. රටට තවත් අනවශ්‍ය ප්‍රශ්න දරන්න බැහැ. උසාවි නියෝගයක් කඩන්න අපටත් බැහැ; ඔවුන්ටත් බැහැ. ඇල්ල ප්‍රදේශය නියෝජනය කරන අපේ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ සංචාරක ව්‍යාපාරයටත් බාධා වෙන්න පුළුවන්. ඒ නිසා අපි කිසිසේත් ඒවාට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා නඩු තීන්දුවට අනුව කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම මේක විවාදයක් කර ගන්න යනවා නොවෙයි. මම අගය කරනවා, මේ අවස්ථාව ලබා දීලා මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන එක ගැන. අප සියලුදෙනා පාරිභෝගිකයාගේ පැත්තෙන් හිතන්නත් ඕනෑ. පාරිභෝගිකයාගේ පැත්තෙන් මා අහන්නේ, මේ මුදල අඩු කිරීමේ වාසිය පාරිභෝගිකයාට ලබා දෙන්න කටයුතු කරනවාද කියලායි. ඒ ගැන කියන්න පුළුවන්ද, අපේ ගරු ඇමතිතුමනි? අප මේ සටන් කරන්නේ ඒකට නේ. ඒ කියපු සියයට 6 සියයට 3ට අඩු කරනවා නම්, ඒකෙන් එන වාසිය පාරිභෝගිකයාට ලබා දෙනවා කියන විශ්වාසයෙනුයි අප මේ ගැන කථා කරන්න ඕනෑ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. අපි දැන් මේ පිළිබඳව ඇති තරම් සාකච්ඡා කරලා තිබෙනවා කියන එක තමයි අපේ අදහස. ඒ නිසා කරුණාකර අපට ප්‍රධාන විවාදයට යන්න දෙන්න. ජනතාව බිය වෙන නිසා තමයි අප මේ තොරතුරු එකතු කරලා මේ ගරු සභාවට ඉදිරිපත් කළේ. අපි point එකට කථා කරන්නේ. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, මේ ගැන තවත් සාකච්ඡා කරන්න අවශ්‍ය නම්, ඔබතුමන්ලා වෙලාවක් අරගෙන කථා කරන්න. ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කිරීම දැනටත් විනාඩි 45ක් ප්‍රමාද වෙලායි තිබෙන්නේ. ඒ නිසා ප්‍රධාන වැඩකටයුතුවලට අවස්ථාව දෙන්න කියා මා ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, නීතිමය කාරණයක් ගැන කිව්වා. මට ඒකට උත්තරයක් දෙන්න පුළුවන් ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපි න්‍යාය පත්‍රයේ ඊළඟ කාරණයට යමු.

අමාත්‍යාංශ නිවේදන. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

** ප්‍රශ්නකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

2025 අය වැයෙන් යෝජිත හෙද හෙදියන් සඳහා වන වැටුප් වැඩිවීම: සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

2025 பாதீட்டில் முன்மொழியப்பட்டுள்ள தாதியர்களுக்கான சம்பள அதிகரிப்பு: சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று

SALARY INCREASE PROPOSED FOR NURSES IN BUDGET, 2025: STATEMENT BY MINISTER OF HEALTH AND MASS MEDIA

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වෙලාවේ හෙද හෙදියන් ඉතාම සුළු පිරිසක් අතර ඇති වෙලා තිබෙන අනවබෝධය දුරු කරන්නත්, එම ඉතාම සුළු හෙද හෙදියන් කණ්ඩායම භාවිත කරලා යම්කිසි ආකාරයක උද්ඝෝෂණ ක්‍රියාමාර්ගවලට යන්න යම් කණ්ඩායමක් උත්සාහ කරන නිසා ඒ ගැන පැහැදිලි කරන්නත් තමයි මම මේ අවස්ථාව ඉල්ලා ගත්තේ.

ගරු කථානායකතුමනි, අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ලක්ෂ එකහමාරක පමණ කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒ ලක්ෂ එකහමාරෙන් 40,000ක්ම හෙද සේවයේ නිරත වන හෙද හෙදියන්. අපේ රටේ පවතින හෙද ව්‍යවස්ථාව අනුව, සියයට 5යි පිරිමි අය හෙද නිලධාරීන් විධියට සේවයට බඳවා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. එම නිසා හෙද සේවාවේ සාතිශය බහුතරයක් හෙදියන්. ඒ අය රෝහලට ඇවිල්ලා හෙද සේවයේ නිරත වෙනවාට අමතරව, ගෘහිණියන්, බොහෝ දෙනෙක් මව්වරුන්. ඒ වාගේම තමන්ගේ වැඩිහිටි අම්මා, තාත්තා බලාගන්නේත් මේ හෙදියන්. ගරු කථානායකතුමනි, පසුගිය කාලයේදී අපේ සෞඛ්‍ය සේවාව ඉතා හොඳින් පවත්වාගෙන යන්න ඒ අය ඉතා විශාල කැප කිරීමක් කරපු බවත් තමුන්නාන්සේ අත්දැකීම් සහිතවම දන්නවා. විශේෂයෙන් පසුගිය කොවිඩ් වසංගතය පැවැති කාලයේදී, ඒ වාගේම ආර්ථික අර්බුදය තිබුණු කාලයේදී අපේ සෞඛ්‍ය සේවය යම් මට්ටමකට හෝ පවත්වාගෙන යන්න හැකියාව ලැබුණේ 40,000ක් පමණ වන මේ හෙද හෙදියන් නිසා. ආර්ථික අර්බුදය අවස්ථාවේ තෙල් හිඟයක් ඇතිවෙලා දරුණු ලෙස තෙල් පෝලිම් තිබෙනකොට, සමහර කෙනෙකුට සේවයට පැමිණීම දුෂ්කර වෙලා තිබියදී ඔවුන් සේවයට පැමිණියා. සේවය අවසන් වෙලා, විශේෂයෙන් රෑ හතේ වැඩමුරය අවසන් වෙලා ගෙදර යනකොට හෙදියන් අප්‍රමාණ දුෂ්කරතාවලට මුහුණ දුන්නා. දරුවා අසනීප වෙලා සිටියදීත් ඒ දරුවා අම්මාට, තාත්තාට බලාගන්න කියලා මේ අය රාජකාරියට වාර්තා කළා. එම නිසා මේ හෙද හෙදියන්ගේ කාර්යභාරය ගැන රජයට විශාල ඇගැයීමක් තිබෙන අතර, අපේ ආර්ථිකයට ගැළපෙන ආකාරයෙන් ඒ අයට ලබා දිය යුතු පහසුකම්, වැටුප්, දීමනා සහ වරප්‍රසාද හැකි ඉහළම ට්මටමට ලබා දෙන්න රජය කටයුතු කරමින් සිටිනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව මෙවර අය වැයේදී අපි රාජ්‍ය සේවකයන් වෙනුවෙන් දැනෙන මූලික වැටුප් වැඩි වීමක් ලබා දීලා තිබෙනවා. ඒක ඔබතුමා දන්නවා.

හෙද සේවය ගත්තොත්, ප්‍රධාන වශයෙන් කාණ්ඩ 5ක් තිබෙනවා. මෙම කාණ්ඩ 5ට අදාළව හෙද ශ්‍රේණිය III හි MT 7 category එක යටතේ මේ වෙනකොට හෙද හෙදියන් සාමාන්‍යයෙන් 8,200ක් පමණ සේවය කරනවා. මේ තමයි හෙද හෙදියන්ගේ පළමු පත්වීම. ඒ අයගේ මූලික වැටුප විධියට තිබුණේ, රුපියල් 32,525ක් පමණයි. අපි කරපු මූලික වැටුප් වැඩිවීම ඇතුළේ එය රුපියල් 54,920 දක්වා වැඩි කර තිබෙනවා. ඒ අනුව මූලික වැටුපේ වැඩිවීම පමණක් රුපියල් 22,395ක්. කලින් ලබා ගත් රුපියල් 32,525ට මෙවර රුපියල් 22,525ක වැටුප් වැඩි වීමක් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාට, අපට කාටත් තේරෙනවා, රුපියල් 32,525ක මූලික වැටුපක් ලැබුණු කෙනෙකුට අමතර වශයෙන් රුපියල් 22,395ක වැඩි වීමක් ලබා දීලා තිබෙන බව. ඒ අනුව පැයකට රුපියල් 215ක් විධියට තිබුණු ඔවුන්ගේ OT එක රුපියල් 290 දක්වා වැඩිවෙලා තිබෙනවා. එතකොට, OT පැයක් සඳහා ගෙවීම රුපියල් 75කින් වැඩි වෙනවා. රුපියල් 1,084.16ක්ව තිබුණු ඔවුන්ගේ daily allowance එක රුපියල් 1,831 දක්වා වැඩි වෙනවා. මම මේ කියන්නේ, පළමු පත්වීම ලබාගෙන අවුරුදු 5ක් දක්වා වැඩ කරන හෙද හෙදියන්ට ලැබෙන වාසි. මූලික වැටුප ලෙස ඔවුන්ට රුපියල් 54,920ක් ලැබෙන අතරේ, OT පැයක් සඳහා රුපියල් 290කුත්, daily allowance එක විධියට රුපියල් 1,831කුත් ලැබෙනවා. සාමාන්‍යයෙන් වසර 5ක සේවා කාලයක්, ඒ කියන්නේ සේවයට බැඳුණු පළමු දවසේ ඉඳලා වසර 5ක් දක්වා වන මෙම category එකට දළ වැටුප ලෙස මෙතෙක් කල් ලැබුණේ රුපියල් 104,481ක් පමණයි. එය රුපියල් 133,640 දක්වා රුපියල් 29,159කින් වැඩි වෙනවා. ඒ අනුව පළමු වසර 5 තුළ රුපියල් 133,640ක වැටුපක් ලැබෙනවා. ඒ කියන්නේ, හෙද සේවයට බැඳිලා අවුරුදු 5ක service එක තුළ සිටින එම category එකේ 8,200ක් වන ඔක්කෝටම රුපියල් 133,640ක දළ වැටුපක් ලැබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මේ තමයි අඩුම වැටුප් වැඩි වීම. ඔවුන්ගේ වාර්ෂික වැටුප් වර්ධකත් එක්ක අවුරුද්දෙන් අවුරුද්ද ඔවුන්ට ලැබෙන දීමනා මීට වඩා වැඩි වෙනවා. ඒ අනුව දළ වැටුපත් වැඩි වෙනවා. මේ අනුව, පළමු පත්වීම ලබා ගත්ත හෙද හෙදියන්ට 2025 අප්‍රේල් මාසයේ ඉඳලා දළ වැටුප ලෙස අවම වශයෙන් රුපියල් 133,640ක පඩි පතක් ලැබෙනවා.

ඊළඟට, IIවන ශ්‍රේණියේ හෙද හෙදියන් 9,400ක් ඉන්නවා. සාමාන්‍යයෙන් පත්වීම ලබාගෙන අවුරුදු 5කට පස්සේ IIවන ශ්‍රේණියට ඇතුළත් වෙනවා. ඒ අයට මූලික වැටුප ලෙස ලැබුණේ රුපියල් 37,636යි. අපි ඒක වැඩි කරලා තිබෙනවා රුපියල් 64,500 දක්වා. ඒ කියන්නේ, මූලික වැටුප පමණක් රුපියල් 26,864කින් වැඩි කරලා තිබෙනවා.

මේ මූලික වැටුපට සාපේක්ෂව මෙතෙක් පැයකට රුපියල් 255ක්ව තිබුණු OT එක රුපියල් 345 දක්වා රුපියල් 90කින් වැඩි කරනවා. මේ ගොල්ලන්ට 1,881ට තිබුණු දෛනික දීමනාව 2,150 දක්වා වැඩි කරනවා. ගරු කථානායකතුමනි, IIවැනි ශ්‍රේණියේ හෙදියකට, - IIවැනි ශ්‍රේණියේ ඉන්නවා අවුරුදු 5ක් - මූලික වැටුප් වැඩිවීම රුපියල් 64,500යි, පැයකට OT එක රුපියල් 345යි, PH allowance එක රුපියල් 2,150යි, දිනයකට. එතකොට ඒවාත් එක්ක ඒගොල්ලන්ගේ දළ වැටුප සැලකිය යුතු මට්ටමකින් වැඩි වෙනවා. මම කලින් කිව්වා IIIවෙනි ශ්‍රේණියේ දළ වැටුප රුපියල් 133,640ක් වෙනවා කියලා. එතකොට මේගොල්ලන්ටත් විශාල ප්‍රමාණයකින් වැටුප් වැඩි වෙනවා.

Iවන ශ්‍රේණියේ හෙද හෙදියන් දැනට16,000ක් ඉන්නවා. සාමාන්‍යයෙන් සේවයට ඇතුළත් වෙලා අවුරුදු 12කට පස්සේ මේ Iවන ශ්‍රේණියට ඇතුළත් වෙන්න පුළුවන්. ඒ අයගේ දැන් තිබෙන මූලික වැටුප රුපියල් 44,965යි. මේ මූලික වැටුප රුපියල් 77,850 දක්වා වැඩි වෙනවා. 77,850 දක්වා වැඩි වෙනකොට රුපියල් 32,885කින් මූලික වැටුප වැඩි වෙනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව ඒගොල්ලන්ගේ OT පැයකට දැන් ලැබෙන්නේ රුපියල්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

305යි, ඒක රුපියල් 420 දක්වා වැඩි වෙනවා. OT පැයකට රුපියල් 115ක් වැඩි වෙනවා. දෛනික PH allowance එක, රුපියල් 2,248ට තිබෙන එක රුපියල් 2,595 දක්වා වැඩි වෙනවා. ඒ අනුව දළ වැටුප ගණන් හදා ගන්න පුළුවන් ඒගොල්ලන්ට.

අධි ශ්‍රේණියේ හෙද හෙදියන් දැනට 6,000ක් ඉන්නවා. සාමාන්‍යයෙන් සේවයට බැඳිලා අවුරුදු 22ක් ගියාට පස්සේ තමයි ඒ promotion එක හම්බ වෙන්නේ. දැන් තිබෙන මූලික වැටුප රුපියල් 53,035යි. එය රුපියල් 92,460 වෙනකම් වැඩි වෙනවා. 53,035ක මුදල 92,460 වෙනකම් වැඩි වෙනවා. ඒ කියන්නේ මූලික වැටුප 53,035ක් තිබෙන කෙනාට රුපියල් 39,425කින් වැඩි වෙනවා. ඒ අනුව ගණන් හැදුවාට පස්සේ, දැන් තිබෙන්නේ OT පැයක් රුපියල් 350යි, ඒක රුපියල් 500ක් වෙනවා. OT පැයක් රුපියල් 500ක් වෙනවා. දෛනික PH allowance එක, රුපියල් 2,651ක් තිබෙන එක රුපියල් 3,082 දක්වා වැඩි වෙනවා. අමතර දීමනාවක් හැටියට රුපියල් 3,082ක් ලැබෙනවා.

විශේෂ ශ්‍රේණියේ - Special Grade එකේ - හෙද, හෙදියන් සාමාන්‍යයෙන් 415ක් පමණ තමයි ලංකාවේ ඉන්නේ. සේවා කාලය අවුරුදු 27ක් විතර වෙනකොට තමයි මේ ශ්‍රේණියට ඇතුළත් වෙන්න පුළුවන්. ඒ අයට දැන් ලැබෙන්නේ රුපියල් 54,235ක් පමණයි. මේ ගොල්ලෝ ප්‍රතිකාර අංශය, ඉගැන්වීම් අංශය, පරිපාලන අංශය ඇතුළු ක්ෂේත්‍ර කිහිපයකම ඉන්නවා. රුපියල් 54,235ක මූලික වැටුප රුපියල් 94,060 වෙනකම් වැඩි වෙනවා. ඒ වැඩිවීම විතරක් රුපියල් 40,00කට ආසන්නයි. එහෙම තිබියදී ඒගොල්ලන්ට OT පැයකට හම්බ වෙනවා, -දැන් තිබෙන්නේ රුපියල් 395යි- රුපියල් 545ක්. ඒ කියන්නේ OT පැයක් රුපියල් 150කින් වැඩි කරලා තිබෙනවා. OT පැයක් රුපියල් 545ක් බවට පත් වෙනවා. දෛනික PH allowance එක, රුපියල් 2,711ට තිබුණු එක රුපියල් 3,135 වෙනකම් වැඩි වෙනවා.

ගරු කථානායකතුමනි, මේ වෙලාවේ රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව අපි හෙද සේවාව වෙනුවෙන් දැනෙන වැටුප් වැඩිවීමක් කරලා තිබෙනවා. IIIවන ශ්‍රේණියේ ඉන්න කෙනෙකුට රුපියල් 133,640ක් ලැබෙනකොට, Supra Grade එක, Special Grade එක වෙනකොට කොතරම් දළ වැටුපක් ගෙදර අරගෙන යන්න පුළුවන්ද කියන එක ඔබතුමන්ලාට ගණන් හදා ගන්න පුළුවන්. ඒවාට ගණන් හදා ගන්න පුළුවන්. මේ හෙද හෙදියන් 40,000ට ඒ අයගේ සේවා කාලය අනුව මූලික වැටුප් වැඩිවීම, OT වැඩිවීම, PH allowance එක වැඩිවීම, ඒ වාගේම වාර්ෂික වැටුප් වර්ධකය කියන මේ සියල්ල එකතු වුණාට පස්සේ අප්‍රේල් මාසයේදී අතට දැනෙන වැටුපක් ලැබෙනවා අනිවාර්ය වශයෙන්ම ගරු කථානායකතුමනි.

එහෙම තිබියදී, හෙද හෙදියන් 350ක් විතර යොදාගෙන එක්තරා පුද්ගලයෙක් මේ පිළිබඳ වැරදි මතයක් ප්‍රචාරය කරන්න හදනවා සෞඛ්‍ය සේවාව ඇතුළේ. එයා කියලා තිබෙනවා රාජ්‍ය සේවක වැටුපෙන් රුපියල් 20,000ක් වක්‍රාකාරව කප්පාදු කරලා කියලා. ඒ, එක වෘත්තීය සමිති නායකයෙක්. එයා පෙන්වන්න හදනවා, දීමනාවක් හැටියට තිබුණු රුපියල් 7,500 මූලික වැටුපට එකතු වුණාම ඒක වැඩක් නැහැ කියලා. හැබැයි රාජ්‍ය සේවයේ ඉන්න අය දන්නවා දීමනාවක් මූලික වැටුපට එකතු වුණාට පස්සේ ඒකෙන් පැටව් ගහලා ප්‍රතිලාභ එනවා කියලා. රුපියල් 5,000ක් වැඩි කරලා තිබෙනවා, ඒක ඇතුළත් කරලා තිබෙනවා මේ මූලික වැටුප් වැඩිවීම ඇතුළේ. හැබැයි, මේ අය පෙන්වන්න හදනවා මූලික වැටුප් වැඩිවීමට අදාළව OT එක ගණන් හැදෙන්නේ, PH allowance එක ගණන් හැදෙන්නේ, daily allowance එක ගණන් හැදෙන්නේ අප්‍රේල් මාසයේ මූලික වැටුප් වැඩිවීමට පමණයි කියලා.

නැහැ, ගරු කථානායකතුමනි. අපි බොහොම පැහැදිලිව කිව්වා, මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ එක අදියරකින් වැඩි වෙනවා කියලා. ලබන අවුරුද්දේ ජනවාරිවල ක්‍රියාත්මක වෙනවා දෙවැනි අදියර. 2027 ජනවාරිවල තුන්වන අදියර ක්‍රියාත්මක වෙනවා. හැබැයි, ඒ තුන්වන අදියරේ මූලික වැටුප් වැඩි වීමට අදාළව තමයි අප්‍රේල් මාසයේ OT එක හැදෙන්නේ, අප්‍රේල් මාසයේ PH allowance එක හැදෙන්නේ, අප්‍රේල් මාසයේ daily allowance එක හැදෙන්නේ. 2027 ජනවාරිවල මූලික වැටුපට සාපේක්ෂව තමයි ඒ සියලු දේවල් හැදෙන්නේ. එතකොට මේ අයට ලැබෙන මුදල් ප්‍රමාණය වැඩියි. හැබැයි, හෙද හෙදියන් ඉතා සුළු සංඛ්‍යාවක් නොමහ යැවීම සඳහා, ඒ අය අතර කලබලයක් හදන්න වැරදි තොරතුරු ප්‍රමාණයක් මේ අය ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සංඛ්‍යාව උපරිම 350ක් විතර තමයි ඉන්නේ. හැබැයි, ඉතුරු 39,500 හෝ 39,600ට තේරෙන දේ මේ අයට නොතේරන්න විධියක් නැහැ කියලා මම හිතනවා. මේක මෙහෙයවන්නේ ඒ හෙද හෙදියන් 350ට, 400ට අමතර දෙයක් ලබා දෙන්න නොවෙයි. කාට හරි කියන්න පුළුවන්, "එංගලන්තයේ මෙච්චර හම්බ වෙනවා, ඕස්ට්‍රේලියාවේ මෙච්චර හම්බ වෙනවා" කියලා. හැබැයි, ඒ රටවල ආණ්ඩු ඒ රටේ භාණ්ඩාගාරය කොතරම් දුරකට ගෙනැවිත් තිබෙනවාද කියන එක මේ රටේ ජනතාව දන්නවා. ඒවා ශක්තිමත් භාණ්ඩාගාර. ඒ නිසා තමයි එහෙම වැටුපක් හම්බ වෙන්නේ. අපි මේ තිබෙන ආර්ථික තත්ත්වයට සාපේක්ෂව දැනෙන මූලික වැටුපකුත්, දළ වැටුප් වැඩි වීමකුත් ලබා දීලා තිබෙනවා. ඒක නිසා, කරුණාකරලා ඒ නොමහ යැවීමට අර පොඩි කණ්ඩායමට අහු වෙන්න එපා කියලා තමයි අපි කියන්නේ.

මේ තිබෙන්නේ වෙන මොකක්වත් නොවෙයි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ පිං ජනාධිපතිකමට පිං සිදු වෙන්න, ජනාධිපති ලේකම් කාර්යාලයට කෙනෙක් රිංගුවා. එහි වරප්‍රසාද ඔක්කෝම භුක්ති වින්දා. හර්ෂණ නානායක්කාර ඇමතිතුමාගේ කථාවේදී නම කියලාම කියනවා මම දැක්කා, ඔහු වාහන පාවිච්චි කළේ, ඉන්ධන පාවිච්චි කළේ, වරප්‍රසාද පාවිච්චි කළේ කොහොමද කියලා. ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබුණු වරප්‍රසාද පාවිච්චි කරලා හෙදියෝ සිංගප්පූරු යවන්නත් මැදිහත් වෙලා තිබෙනවා, ඒ ඔක්කෝම කරන අතරේ. හෙද හෙදියන්ට සාධාරණයක් කරන්න නොවෙයි, ඒ තමන්ගේ පැවැත්ම වෙනුවෙන් .

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නම කියන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
නම කියන්නත් ඕනෑ නැහැ. තේරුමක් නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කියන්නකෝ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ වෘත්තීය සමිති අධ්‍යක්ෂ ජනරාල් හැටියට පත්වීමක් ලබා ගෙන පාර්ලිමේන්තුවට දවස් හතක් පමණක් ඇවිල්ලා, වාහන පර්මිට් එකත් අරගෙන ඉන්න කෙනා. මම නම කියන්න ඕනෑ නැහැ.තේරුමක් නැහැ, නම කියන එකේ. හෙද හෙදියන් 40,000ක් ඉන්න තැනක 350ක් පාරට බස්සන කෙනෙකුගේ නම කියලා වැඩක් නැහැ. මම අන්න ඒ 350ක් වන හෙද හෙදියන්ටයි මේ කියන්නේ, ඒ නොමහ යැවීමට

අහුවෙන්න එපා. මේක තමන්ට තිබුණු වරප්‍රසාද කප්පාදුවීමේ වේදනාවට කෝපයට, ද්වේෂයට කරන වැඩක් විතරයි. 40,000ටම දැනෙන වැටුපක් අප්‍රේල් මාසයේදී ලැබෙනවා කියන එක මම මේ වෙලාවේ සහතික කරලා කියන්න කැමැතියි.

මට වෙලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා.

වරප්‍රසාද: රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත්කිරීම පිළිබඳව ඇසූ අතුරු ප්‍රශ්නයට පිළිතුර
சிறப்புரிமை: ரஜரட்டை பல்கலைக்கழகத்தின் துணைவேந்தர் நியமனம் தொடர்பில் கேட்கப்பட்ட மேலதிக வினாவுக்கான விடை
PRIVILEGE: REPLY TO SUPPLEMENTARY QUESTION ON APPOINTMENT OF VICE-CHANCELLOR, RAJARATA UNIVERSITY

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයකු ලෙස මාගේ වරප්‍රසාද උල්ලංඝනය වීම සම්බන්ධයෙනුයි මේ ප්‍රශ්නය යොමු කරන්නේ.

ගරු කථානායකතුමනි, මා විසින් 2025.02.27වැනි දින ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ලද වාචික ප්‍රශ්නයට අමතරව අසන ලද දෙවන අතුරු ප්‍රශ්නය අනුව රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා පත් කිරීම පිළිබඳව අසන ලද ප්‍රශ්නයට ගරු අග්‍රාමාත්‍යතුමිය ලබා දුන් පිළිතුර එතුමිය දැනුවත් හෝ නොදැනුවත්ව මෙම ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අසත්‍ය තොරතුරු වේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මා අසන ලද ප්‍රශ්නයකට මෙවැනි අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මෙම උත්තරීතර සභාව නොමහ යැවීමක් වන අතර මාගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමකි.

2024 වසරේ රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර වෙනුවෙන් එහි පාලක සභාවේ තීරණය අනුව මහාචාර්ය ගිනිගද්දර, ආචාර්ය රාජපක්ෂ සහ මහාචාර්ය පර්සි විජේවර්ධන යන අය නම් කර තිබෙන බවත්, ඒ වෙනුවට නැවත පාලක සභාවක් පත් කර නැවත ඒ සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම පිළිබඳව එතුමියගෙන් විමසන ලදී. එතුමිය විසින් පවසන ලද්දේ එම නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් ප්‍රතික්ෂේප කර ඇති බැවින්, නැවත තෝරා ගැනීම සිදු කිරීමට සිදුව ඇති බවයි. මෙම තොරතුරු ඉතා සාවද්‍ය වන අතර අග්‍රාමාත්‍යතුමිය පාර්ලිමේන්තුවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර මෙම උත්තරීතර සභාව නොමඟ යැවීම බරපතළ කාරණයකි. එම තොරතුරු අසත්‍ය තොරතුරු බව ඔප්පු කිරීමට මා මේ අවස්ථාවේ 2025.01.06වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ලේකම් ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා විසින් රජරට විශ්වවිද්‍යාලයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යවන ලද ලිපිය **සභාගත*** කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමනි, එම ලිපිය අනුව බොහොම පැහැදිලිව මේ කාරණය පෙනෙන්නට තිබෙනවා. "Appointment of the Vice-Chancellor, Rajarata University of Sri Lanka (RUSL)" ලිපි ශීර්ෂය යටතේ මෙය ලියා තිබෙනවා. මේක ලියන්නේ 2025 ජනවාරි 06වැනි දා. එහි මෙසේ සඳහන් වෙනවා:

> "Please be noted that, the Secretary to the President has informed to the Secretary of the Ministry of Education, Higher Education and Vocational Education….."

ඒ කියන්නේ ජනාධිපති ලේකම්තුමා විසින් උසස් අධ්‍යාපන සහ වෘත්තිය පුහුණු අමාත්‍යාංශයේ ලේකම්තුමාට දැනුම් දෙනවා,

> ".... to instruct the University Grants Commission to reinitiate the application process, adhere to the prescribed procedures and submit a suitable nomination for the post of Vice-Chancellor of RUSL in compliance with the provisions of Section 34 of the Universities Act No. 16 of 1978."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එය සභාගත කරන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එම ලිපිය මම සභාගත කළා, ගරු කථානායකතුමනි.

එම ලිපියේ අඩංගු කරුණු අනුව ජනාධිපති ලේකම්වරයා විසින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලබා දුන් උපදෙස් අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම නැවත මෙම රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය සඳහා අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය ආරම්භ කර, සුදුසු නාමයෝජනා නැවත එවන ලෙස දැනුම් දී ඇති බව සඳහන් කර තිබෙනවා. ඒ අනුව ගරු අග්‍රාමාත්‍යතුමිය ගරු සභාවට ප්‍රකාශ කළ පරිදි, මෙම කලින් ඉදිරිපත් කළ නම් තුන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම ප්‍රතික්ෂේප කළ බව පැවසීම අතිශයින්ම සාවද්‍යයි. සාමාන්‍යයෙන් සිදු වන කාර්යභාරය වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට කිසියම් පාලක සභාවක් නම් තුනක් ඉදිරිපත් කළාට පසුව එම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම එයින් එක් නමක් ගරු ජනාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලැබීමයි. එම තෝරා ගැනීමේදී යම් පරස්පරයක් ඇත්නම් එය සාමාන්‍යයෙන් නැවත නිවැරදි කිරීම සඳහා අදාළ පාලක සභාවට යැවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම ක්‍රියා කරනු ලබයි. නමුත්, ඉහත මා ඉදිරිපත් කළ ලිපිය අනුව මෙම සම්මුඛ පරීක්ෂණය නැවත කැඳවීමට උපදෙස් දෙනු ලබන්නේ ජනාධිපති ලේකම්වරයා විසින් බව ඉතා පැහැදිලි වේ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් යම් නිරීක්ෂකයෙක් පාලක සභාවෙන් උපකුලපතිවරයා තේරීමේ වැඩ පිළිවෙළට සම්බන්ධ වනවා. අපි බොහොම පැහැදිලිව කියන්නේ, ජනාධිපති ලේකම්වරයා විසින් තමයි ඒක ප්‍රතික්ෂේප කර තිබෙන්නේ. ඒ ලකුණු දෙන ක්‍රමය වෙනස් වෙලා නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව කරුණු දෙකක් කියන්න තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ලිඛිතව ලබා දුන් ප්‍රකාශය කියවන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හොඳයි.

ඒකෙත් මේ ලකුණු දෙන ක්‍රමය ගැන තමයි කියන්න තිබෙන්නේ. ගරු කථානායකතුමනි, වැරැද්දක් තිබුණා නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම එය නිවැරදි කළ යුතුයි. මොකද, හත්දෙනෙක් එතැන ඉන්නවා. ඒ පිරිස එකතු වෙලා කථා කරන්න ඕනෑ. ඒක සිදු වෙලා නැහැ, ගරු කථානායකතුමනි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පාලක සභාවේ තීරණය ප්‍රතික්ෂේප කර ඇත්නම්, ගරු අග්‍රාමාත්‍යතුමිය සතුව එවැනි ලිපියක් තිබේ නම් එම ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන්න කියලා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මම ඉල්ලා සිටිනවා. මොකද, එතුමිය කියන විධියට කොමිෂන් සභාව මේක ප්‍රතික්ෂේප කර තිබෙනවා නම් මේ සම්බන්ධව ඇති එම ලිපිය ඉදිරිපත් කරන ලෙස තමයි මම ඉල්ලන්නේ.

මෙම ආණ්ඩුව පත්වීමෙන් අනතුරුව වාචික පිළිතුරුවලට ලබා දී තිබෙන පිළිතුරුවලදී මීට පෙර බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද වැරදි තොරතුරු පිළිබඳව මා වරප්‍රසාද කමිටුව හමුවේ කරුණු ඉදිරිපත් කරන ලදී. මෙම තත්ත්වය ඉතාම බරපතළ වන්නේ ගරු අග්‍රාමාත්‍යතුමියද මෙවැනි අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමයි. එබැවින් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට මෙය යොමු කරන මෙන් මම කාරුණිකව ඉල්ලා සිටිමි.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමිය.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, මේ සිද්ධියට අදාළ කරුණු මම පැහැදිලිව ඉදිරිපත් කරන්නම්.

මම ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ලබා දුන් තොරතුරුවල කිසිම සාවද්‍ය තොරතුරක් නැහැ. මම ඉදිරිපත් කරලා තිබෙන්නේ සත්‍ය තොරතුරු. ඒකේ යම් ඉතිහාසයක් තිබෙනවා. රජරට විශ්වවිද්‍යාලයට උපකුලපතිවරයා පත් වීම ආරම්භ වෙන්නේ ආණ්ඩු මාරුව යන අතරතුර. ඒ කියන්නේ, අපි තුන්දෙනාගේ ආණ්ඩුව පත් වනකොට තමයි ඒක සිදු වුණේ. ඒ වනකොටත් - 2024 සැප්තැම්බර් 12වන දා වනකොට - UGC එක හිටපු ජනාධිපතිට නම් තුනක් ඉදිරිපත් කරලා දැනුම් දෙනවා, මේ තමයි ඉදිරියෙන් ඉන්න තුන්දෙනාගේ order of average marks කියලා. ඊට පසුව 2024 සැප්තැම්බර් 24වන දා observations වගයකුත් ඉදිරිපත් කරනවා. ඒ observationsවල මෙසේ සඳහන් වනවා:

> "2. There was a significant discrepancy in the marks given to applicants by several Council members.
>
> 3. Three candidates who participated in the above interview from the same University and other Institutions have made a complaint to the UGC by a letter dated 26th August 2024 on 'Alleged Fraudulent Manipulation by the Council of the RUSL in the Evaluation Process of the Position of the Vice Chancellor.' "

ගරු කථානායකතුමනි, එම නිරීක්ෂණ ඇතුළත් ලේඛනයත් මම **සභාගත*** කරනවා.

මාළඟ තිබෙනවා ඒ සම්බන්ධව ආපු complaints. මම ඒ ඔක්කෝම ඉදිරිපත් කරන්නේ නැහැ. මොකද, මේ අවස්ථාවේ කාලය ගොඩක් යන නිසා.

මේ අතරතුර අලුත් Commission එකක් පත් වෙනවා; UGC එකට අලුත් Chairman කෙනෙකුත් පත් වෙනවා. එතැනදී අර ආපු තොරතුරු මත මේ ලිපිය අනුව මම කියා සිටිනවා, මේ ලකුණු නැවත analyse කරලා එවන්න කියලා; නැවත analyse කරලා recommendation එකක් කරන්න කියලා UGC එකෙන් මම ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, මට තිබෙනවා extract එකක්, UGC Minutesවල 20th November, 2024. එම Minute එකේ මෙසේ සඳහන් වෙනවා:

> "Therefore, the Commission having considered the above discrepancy in the marks given to applicants by several council members, decided not to recommend any of the names to be appointed as the Vice-Chancellor/RUSL to the Hon. President. Further, the Commission decided to send all the required documents and specific records as to why the Commission is not recommending any applicant to the post of Vice-Chancellor/ RUSL"

ගරු කථානායකතුමනි, මේ ලිපියත් මම **සභාගත*** කරනවා.

ඒ අනුව තවත් විස්තරාත්මකව University Grants Commission එක ජනාධිපතිතුමාට ලියුමක් යවනවා. එහි මේක නැවත වතාවක් කියලා, මෙවැනි දෙයක් කියනවා. I quote:

> "* three (03) applicants who applied for the post of Vice-Chancellor/RUSL made a written complaint to the UGC regarding alleged manipulation by the Council/ ...."
>
> *the composite mark sheet and individual mark sheets of each of the candidates, that there exist discrepancies in marks give to certain candidates.
>
> * the candidate who became the first at the previous Vice-Chancellor selection (not appointed by him by the former President) has not been selected among the three names recommended ...."
>
> "Accordingly, the Commission having considered the above discrepancy in the marks given to applicants by several Council members, decided not to recommend any of the names to be appointed as the Vice-Chancellor/RUSL to the Hon. President."

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමනි, Senior Professor Kapila Seneviratne, Chairman මේ ලිපිය එවන්නේ 2024 නොවැම්බර් 28වන දා.

ඒ අනුව, ජනාධිපති ලේකම් 2024 දෙසැම්බර් 30වන දා ලිපියක් යවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"As per the letter number HE/UD/Rajarata/Appoint, dated December 04, 2024 of Chairman, University Grants Commission submitted along with the above letter, the present University Grants Commission has not recommended any of the names proposed by the Council of Rajarata University….."

"Consequently, the requirements stipulated under section 34 (1)(a) of the Universities Act, No. 16 of 1978 remain unfulfilled."

ඔය ලියුම තමයි ගරු මන්ත්‍රීතුමාට ඇවිල්ලා තිබෙන්නේ. අර ක්‍රියාවලියේ අවසාන ලියුම, 2024 දෙසැම්බර් 30වන දා එක. ඒ ලියුම ජනාධිපති කාර්යාලයෙන් එවන්නේ UGC recommendation එකක් නැති නිසායි. කරුණාකරලා මේ ක්‍රියාවලිය නැවත වතාවක් ආරම්භ කරන්න කියන ඉල්ලීම එහි තිබෙන්නේ UGC එකෙන් ආපු තොරතුරු මතයි. ඒ අනුව, ජනවාරි 06වැනි දා ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර UGC Secretary, Rajarata University එකට දැනුම් දෙනවා, මේ ක්‍රියාවලිය නැවත වතාවක් recall කරලා ක්‍රියාත්මක කරන්න කියලා. ජනවාරි 6 දිනැති ඒ ලියුම තමයි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්නේ. මේ ලියුම පිටුපස දිග කතන්දරයක් තිබෙනවා. සැප්තැම්බර් මාසයේ ඉඳන් UGC එක, - පරණ UGC එකත් discrepancy එකක් තිබෙනවා කියනවා. ඒ අනුව අලුත් Commission එක නැවත වතාවක් ලකුණු බලලා සහ ආපු complaints සියල්ල මත නැවත වතාවක් කියනවා, මෙතැන discrepancy එකක් තිබෙන නිසා recommendation එකක් කරන්න බැහැ කියලා. ඒ බව ජනාධිපතිතුමාටත් දැනුම් දෙනවා. ඒ දැනුම්දීම මත ජනාධිපති ලේකම් කියනවා, අවශ්‍ය ඊළඟ ක්‍රියාවලියට යන්න, මේක re-advertise කරන්න කියලා. ඒක මත තමයි UGC එක මේ process එක නැවත වතාවක් ආරම්භ කරන්නේ. ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කළේ කිසිසේත්ම සාවද්‍ය තොරතුරක් නොවෙයි.

දැන් එතුමා කිව්වා, UGC එකෙන් මේක recommend නොකළා නම් ඒ තොරතුරු ඉදිරිපත් කරන්න කියලා. මම ඒ තොරතුරු සියල්ලම දැන් ඉදිරිපත් කරලා තිබෙනවා. UGC එකෙන් එක් වරක් නොවෙයි, දෙවරක්ම මේ marksවල discrepancy එකක් තිබෙනවා කියලා ලිඛිතව දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව තමයි අපි ක්‍රියාත්මක වුණේ.

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියනවා, අපේ ආණ්ඩුවේ ඕනෑම කෙනෙක් මේ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරනකොට ඒ කරුණු ඉදිරිපත් කරන්නේ වගකීමක් ඇතුව, තොරතුරු හොයලා බලලා කියන එක. අපට කිසි කෙනෙක් එක්ක පෞද්ගලික ප්‍රශ්න නැහැ. අපි කාගේවත් පෞද්ගලික දෙයක් වෙනුවෙන් නොවෙයි පෙනී සිටින්නේ. ඊයේ ජනාධිපතිතුමාගේ කථාවේදීත් කිව්වා වාගේ අපි ශිෂ්ටත්වයෙන් වැඩ කරන ආණ්ඩුකරණයක් හදන්නයි සූදානම් වෙන්නේ. අපි දැන් එය සැලසුම් කරගෙනයි යන්නේ. ඒ නිසා අපි කිසිම පුද්ගලයෙක් වෙනුවෙන් නොවෙයි, ක්‍රියාවලියක් වෙනුවෙන්; අප පත් කරපු ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ. ඒ නිසා අපට සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරලා කාටවත් හානියක් කරන්නවත්, කවුරුවත් රැක ගන්නවත් වුවමනාවක් නැහැ. අපි ඉදිරිපත් කරන සියලුම දේ වෙනුවෙන් ඒ procedures අනුව, ඒ තොරතුරු අනුව වගකීමක් අරගෙන තමයි, අපි ඉදිරිපත් වෙලා තිබෙන්නේ; අපි කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. ඒ නිසා ඒ කියමන මම තරයේ ප්‍රතික්ෂේප කරනවා. මම අසත්‍යයක් නොවෙයි කිව්වේ. මම පදනමක් ඇතිව තමයි එතුමාට ඒ වෙලාවේ පිළිතුර ලබා දුන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, කාලය ලබා දීම පිළිබඳව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරි කටයුතු සඳහා යොමු කරනවා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත
சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்
VALUE ADDED TAX (AMENDMENT) BILL

"2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.

2025 මාර්තු 15වන සෙනසුරාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2025 மார்ச் 15, சனிக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Harini Amarasuriya, on behalf of the Minister of Finance, Planning and Economic Development; to be read a Second time upon Saturday, 15th March, 2025
and to be printed; and to be referred to the Committee on Public Finance.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත
உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்
INLAND REVENUE (AMENDMENT) BILL

"2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.

2025 මාර්තු 15වන සෙනසුරාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2025 மார்ச் 15, சனிக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Harini Amarasuriya, on behalf of the Minister of Finance, Planning and Economic Development; to be read a Second time upon Saturday, 15th March, 2025
and to be printed; and to be referred to the Committee on Public Finance.

අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත
குற்றச் செயல்களின் வரும்படிகள் சட்டமூலம்
PROCEEDS OF CRIME BILL

"අපරාධයකින් උත්පාදිත දේ ආපසු ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද; අපරාධයකින් උත්පාදිත දේ විමර්ශනය කිරීම, තහනම් කිරීම, රජය සතු කිරීම සහ බැහැර කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; තහනමට ගන්නා ලද අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ද; අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය පිහිටුවීම සඳහා ද; අපරාධයකින් උත්පාදිත දේ අය කර ගැනීමට අදාළව අන්තර් නියෝජ්‍යායතන සහයෝගිතාව සහ ජාත්‍යන්තර සහයෝගිතාව සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසිනි.

2025 මාර්තු 15වන සෙනසුරාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

නීති මත්‍රුම් තේසිය ඔරුමෙප්පාට්ටු අමෙච්චර් මාණ්පුමිකු චට්ටත්තරණි හර්ෂණ නාණායක්කාර අවර්කළාල් සමර්ප්පික්කප් පට්ටතු.

2025 මාර්ච් 15, සනික්කිළමෙ මූන්‍රාම් මුරෙ මතිප්පිටප්පට වේණ්ඩුමෙනවුම් අච්චිටප්පට වේණ්ඩුමෙනවුම් උරිය අමෙච්චුසාර් ආලෝසනෙක් කුළුවුක්කු ආට්‍රුප්පටුත්තප්පට වේණ්ඩුමෙනවුම් කට්ටළෙයිටප්පට්ටතු.

Presented by the Hon. Harshana Nanayakkara, Attorney-at-Law, Minister of Justice and National Integration; to be read a Second time upon Saturday, 15th March, 2025
and to be printed; and to be referred to the relevant Ministerial Consultative Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, දසවැනි වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: පෙබරවාරි 28]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.-
[தேர்ச்சி: பெப்ருவரி 28]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress:28th February]
[HON. SPEAKER in the Chair.]

110 වන ශීර්ෂය-අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාවරයා

01 වන වැඩසටහන - මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 6,872,800,000

தலைப்பு 110.- நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 6,872,800,000

HEAD 110.- MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 6,872,800,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 110, 228 සිට 236 දක්වා සහ 326. සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.45]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු සභාපතිතුමනි, දිවා විවේකයට පෙර, දවසේ ප්‍රධාන කටයුතුවලට එන්නට අවස්ථාව ලැබීම ගැන සතුට ප්‍රකාශ කරමින්, I send greetings to my good Friend, Minister, සහෝදරයා, the Hon. Harshana Nanayakkara, through you, Sir.

Hon. Chairman, I move,

"That a sum of Rs. 10 be cut from all the Recurrent Expenditure and Capital Expenditure in each Programme, as per the tradition, out of the Heads of Expenditure Nos. 110, 228 to 236 and 326 pertaining to the Ministry and other departments and institutions coming under it debated today, Saturday, 01st March, 2025, under the Committee Stage Discussion of the Appropriation Bill, 2025."

ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේදී මම ඔබතුමාට මතක් කරන්න ඕනෑ, ඔබතුමා දරන මේ අමාත්‍යාංශය විශාල වැදගත්කමක් තිබෙන අමාත්‍යාංශයක් බව. ඔබතුමා ඒක අවබෝධ කරගෙන ඉන්නවා කියලා මම හිතනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව දිනපතා ලැයිස්තු ඉදිරිපත් කරනවා අපි දකිනවා. දවසක් සහානායකතුමා ලැයිස්තුවක් ඉදිරිපත් කරනවා. ඊට පසු දිනක ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා ලැයිස්තුවක් ඉදිරිපත් කරනවා. ඉන්පසුව අගමැතිතුමිය ලැයිස්තුවක් ඉදිරිපත් කරනවා. ඊට පසුව නැවත තව කෙනෙකුට ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න turn එක එනවා. ඒක හොඳයි. වරද්දා ගන්න එපා. ඒ ලැයිස්තුවලින් ඉදිරිපත් කරපු කරුණු ටිකට අපි එකඟයි. දූෂණයට, රාජ්‍ය දේපළ අවභාවිත කිරීමට අපි විරුද්ධයි. මේ ගරු සභාවේ ඉන්න වැඩි පිරිසක් එහෙම අය තමයි. අපි පසුගිය ආණ්ඩුවේ කටයුතු කළ අය නොවෙයි. අපි ඒ කාලයේ විපක්ෂයේ හිටපු අය. ඒ කාලයේ ජනාධිපති සහෝදරයා -අනුර කුමාර දිසානායක- විපක්ෂයේ ඉදිරි පෙළ ආසනයක හිටියා. මම එතුමා ළඟ ආසනයක හිටියා. අපි ඔක්කොම විපක්ෂයේ හිටියා. අපි ඔක්කොම විපක්ෂය හැටියට තමයි ඒ කාලයේ සටන් කළේ. කලින් තිබුණු ආණ්ඩුව ගැන මම ඊයේත් මතක් කළා. ගරු සහානායකතුමාට මම කියන්න කැමතියි, අත දිගු කරලා කියන්න එපා, කවුද කියලා නම් කරන්න කියලා. එහෙම නැතුව නිකම් අත දිගු කරලා පෙන්වන්න එපා. දූෂණය, භීෂණය සහ රාජ්‍ය දේපළ අවභාවිත කිරීම ගැන ලැයිස්තු පිට ලැයිස්තු ආවා. ඒ කොතැනකවත් මගේ නම සඳහන් වෙන්නේ නැහැ. අපේ නම්

නැහැ. අපි කිහිපදෙනෙකුගේ නම් නැහැ. අපි පිරිසිදු මිනිස්සු. අපි එහෙමයි ඉන්නේ, එහෙමයි යන්නේ. ප්‍රශ්නයක් නැහැ. එහෙම කරන්න. නමුත්, ඒ කටයුත්ත පමණක් ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ප්‍රධාන කටයුත්ත කරගන්න එපා. ඒක වෙනස් කර ගන්න. මොකද, එක පැත්තකින් ආර්ථික වශයෙන් රට ගොඩනැඟීමට - economic rebuilding - තිබෙනවා. ඒ වාගේම තව දෙයක් කරන්න තිබෙනවා. ඒ තමයි, ජාතික ඒකාබද්ධතාව - social justice and equality. ඒක ඔබතුමාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන කටයුත්ත. ජාතිය ගොඩනැඟීම කරන්න තිබෙනවා. ඒ දෙකම එක සමානව යන්න ඕනෑ. නමුත් එහෙම දෙයක් මට පෙනෙන්න නැහැ. ළඟදී ප්‍රධාන ඇමතිවරුන්ගේ හඬට මට ඇහුම්කන් දෙන්න පුළුවන් වුණා. අපි අලුත් ව්‍යවස්ථාවක් ගේන්නේ නැහැ, කල් දමනවා, දැන් අපි කරන්න යන්නේ economic rebuilding කියලා කිව්වා. දැන් බැලුවාම ඒකත් වෙන්නේ නැහැ. ඒකත් වෙන්නේ නැතුව දැන් ලැයිස්තු පිට ලැයිස්තු ඉදිරිපත් කිරීම තමයි කරන්නේ. එච්චරයි වෙන්නේ.

අදානි සමාගම මන්නාරම පැත්තට ආවා. නමුත්, දාලා ගියා. ඔබතුමන්ලා පැන්නුවේ නැහැ. නමුත් ඔවුන් දාලා ගියා. ඒකෙන් යන පණිවුඩය මොකක්ද කියලා බලන්න. ළඟදී අපේ ජනාධිපතිතුමා UAE ගිහිල්ලා ආවා. ඒ අවස්ථාවේදී මොනවාද වුණේ? මැද පෙරදිග - UAE - වේවා, යුරෝපය වේවා foreign direct investments මේ රටට ඉන්දියාව මහ හැරලා එන්නේ නැහැ. ඉන්දියාවත් සමඟ කථා කරගෙන තමයි එන්නේ. ඉන්දියාවේ කැමැත්ත අරගෙන තමයි මෙහාට එන්නේ. එහෙම නැතිව එන්නේ නැහැ. ඒක තේරුම් ගන්න. අදානි offer කරපු ගණනේ පොඩි වැරැද්දක්, ප්‍රශ්නයක් තිබෙන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අමතක කරන්න එපා, අදානිගේ plan එක තිබුණේ වෙන මොකුත් නොවෙයි, ලංකාවේ excessive energy produced ඉන්දියාවට විකිණීමයි, Grid එකට සම්බන්ධ කිරීමයි කියන එක. ඒක වෙන කාටවත් කරන්න බැහැ; only he can do it. ඒක සලකා බලා ඒ වැඩේ කරන්න කියලා ඒ කමිටුවේ කථා කරන්නේ නැහැ.

මම දැන් ඔබතුමාගේ subject එකට එන්නම්, ගරු ඇමතිතුමනි. ඔබතුමාගේ subject එක, economic rebuilding වාගේම national integration, මේ දෙකම සමාන්තරව යන්න ඕනෑ. මේක ඒ කාලයේ මගේ අමාත්‍යාංශය. ඒ කාලයේ "අධිකරණ" කියන කොටස මට තිබුණේ නැහැ. අනෙක් කොටස් ටික මට තිබුණා. සභානායකතුමා නැඟිටිනවා. මට මුකුත් කියන්නද දන්නේ නැහැ. නැහැ නේද? හරි. හරි. ඔබතුමා නැඟිටිනකොට මම භය වුණා. දැක්කාම අපි භය වෙනවා. වෙන මුකුත් නැහැ. *[බාධා කිරීම්]* කමක් නැහැ, කමක් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා භය වෙන්න එපා. භය වෙන්න ඕනෑ අය ඉන්නවා.

ගරු මනෝ ගනේසන් මහතා
(මාණ්පුමිකු මනෝ කණේසන්)
(The Hon. Mano Ganesan)

දැන් අපට පෙනෙනවා, අලුත් ව්‍යවස්ථාව ගැන කථා කරනවා. ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් අපේ යාපනය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අනික් කට්ටියත් ඉන්නවා. සමගි ජන බලවේගය හැටියට, සමගි ජන සන්ධානය හැටියට අපේ මැතිවරණ ප්‍රකාශයේ කියලා තිබුණා, මේ රටේ දේශපාලන බලය බෙදීම සම්බන්ධයෙන් අපි වැඩ කරනවා කියලා. පවතින දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ශක්තිමත් කරලා, ඉදිරියට යනවාය කියලා අපි කිව්වා. ඒ වාගේම සමගි ජන බලවේගයේ තව කථාවක් තිබුණා. මොකක්ද, ඒ? යහ පාලන කාලයේ අපි ඔක්කොම අලුත් ව්‍යවස්ථාවක් සකස් කිරීමේ කටයුත්ත පටන් අරගෙන කරගෙන ගියා. ඒකට මෙහෙයුම් කමිටුවක් තිබුණා. ඒ කමිටුවේ ජනාධිපති සහෝදරයාත් අපිත් එක්ක හිටියා. එතුමා මගේ සීට් එකට අල්ලපු සීට් එකේ වාඩි වෙලා හිටියේ. අපි දෙදෙනාම කථා කරමින් අවුරුදු දෙකක් ඒ වෙනුවෙන් වැඩ කළා. ඒකේ රවුම් හකිම් මැතිතුමා හිටියා; නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමාගේ නායකයා හිටියා; අපි ඔක්කොම හිටියා. අපි වැඩ කළා. දැන් ඒ කටයුත්ත ඉදිරියට අරගෙන යනවා කියලා තමයි ඔබතුමන්ලා පොරොන්දු දුන්නේ. යාපනයට, විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර ජනතාවට ඒ පොරොන්දුව ලබා දුන්නා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා පිළිගන්නේ නැහැ.

නමුත් බලය බෙදීම කියන මාතෘකාව අවශ්‍යයි. ඒක ප්‍රධාන කටයුත්තක් වෙන්න ඕනෑ. ඒ නිසා ඒක භාර ගෙන කරන්න. මොකද, අපිට සැකයක් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ ඔබතුමන්ලාගේ ප්‍රධාන පක්ෂය; කොටස්කාර පක්ෂය. ඒ පක්ෂයේ ඉතිහාසය දෙස බලන්න. ඔබතුමන්ලා හැම දාම බලය බෙදීමට විරුද්ධ වුණු පක්ෂයක්. 1988-89 කාලයේ මේ රටේ ව්‍යවස්ථාවට දහතුන්වන සංශෝධනය ගෙනෙනකොට ඔබතුමන්ලා විශාල කලබලයක් කළා; කෝලාහලයක් කළා. සිදු වුණු දේවල් අපි දන්නවා නේ. ඒ අවස්ථාවේ බලය බෙදීම වෙනුවෙන් පෙනී සිටි කෙනා තමයි මම ගරු කරන නායකයෙක් වන විජය කුමාරණතුංග මහත්මයා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටතු, මාණ්පුමිකු சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු මනෝ ගනේසන් මහතා
(මාණ්පුමිකු මනෝ කණේසන්)
(The Hon. Mano Ganesan)

With due respect to you, Sir, I must say that I thought the Hon. Speaker would remain until I finished my speech. කමක් නැහැ, ප්‍රශ්නයක් නැහැ. Obviously, I respect you, Sir.

විජය කුමාරණතුංග මැතිතුමා තමයි ඒ කාලයේ බලය බෙදීම වෙනුවෙන් පෙනී සිටි කෙනා. එපමණක් නොවෙයි, එතුමා දකුණේ සිට උතුරට ගියා. ජේ.ආර්. ජයවර්ධන මහතාගේ කාල පරිච්ඡේදයේදී එතුමා උතුරට ගිහිල්ලා එල්ටීටීඊ සංවිධානය සමඟ සාකච්ඡා කළා. රට තුළ යුද්ධය තිබුණු කාලයේදීම ඒකාබද්ධතාව ඇති වෙන්න ඕනෑ, සමගිය ඇති වෙන්න ඕනෑ කියලා භය නැතුව එතුමා වැඩ කළා. නමුත් එතුමා මරා දැම්මා, 1988දී. කවුද? ඔබතුමන්ලා. අපි දැන් ඒක දන්නවා. එහෙම වුණා. ඒක අපි දන්නවා. එතැනින් පටන් ගත්තේ. ඒ නිසා ඔබතුමන්ලා ගැන රටේ ජනතාව තුළ සැකයක් තිබෙනවා; හැමෝටම සැකයක් තිබෙනවා. මොකද, ඔබතුමන්ලාගේ පක්ෂය බලය බෙදීම ගැන දැන් මොනවා කිව්වත්, පසුව බලය බෙදීම වෙනුවෙන් පෙනී සිටිවිද දන්නේ

[ගරු මනෝ ගනේසන් මහතා]

නැහැ කියලා සැකයක් තිබෙනවා; සාධාරණ සැකයක් තිබෙනවා. ඒ සැකය නැති කරන්න, "නැහැ, එහෙම නැහැ. අපි වෙනස් වෙලා." කියලා. දැන් ආර්ථික වශයෙන් වෙනස් වෙලා වාගේ අපට පෙනෙනවා නේ. ඒ වාගේම මේ කාරණය සම්බන්ධවත් වෙනස් වෙලා කියලා ඔප්පු කරන්න ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා. ඒක කරන්න කියලා අපි කාරුණික ඉල්ලීමක් ඔබතුමන්ලාගෙන් කරනවා.

අනෙක් කාරණය මේකයි. 1983 කාලයේ, Hon. Chairman, we were living in Havelock Town. අපේ නිවස තිබුණේ එහේ ඒ කාලයේ; කෝලාහල පැවැති කාලයේ මගේ නිවස ගිනි තිබ්බා. අපේ වාහන ගිනි තිබ්බා. අපිට compensation මොකුත් ලැබුණේ නැහැ. ඒ ලැයිස්තුවල අපේ නම් තිබුණේත් නැහැ. ඒ මොනවත් අපට ලැබුණේත් නැහැ. අපේ ඥාතීන් මරා දැම්මා. Havelock Town එකේ තිබුණු අපේ නිවස ගිනි තියන්න මිනිත්තු 5කට පමණ පෙර telephone call එකක් ආවා. එතකොට mobile phones එච්චර භාවිතයේ තිබුණේ නැහැ, මම දන්නා විධියට. එදා කථා කළේ විජය කුමාරණතුංග. එතුමා අපේ තාත්තාගේ මිත්‍රයා because they all were actors in the film industry. එතුමා කථා කරලා මිනිත්තු 5කට විතර පස්සේ එක්කෙනෙක් ඇවිල්ලා ඔහුගේ වාහනයෙන් මමත්, මගේ අම්මාත්, තාත්තාත්, මගේ සහෝදරයන් සියලුදෙනාත් එක්කගෙන ගියා. කවුද ඔහු? ඔහුගේ නම යසපාලිත නානායක්කාර, your father, Hon. Harshana Nanayakkara. එච්චරයි වුණේ; ඒක තමයි කළේ. ඒ අය අපිව අරගෙන ගිහිල්ලා බේරා ගත්තා. අපි යනකොටම කණ්ඩායමක් අපේ ගේ ගිනි තියන්න ආවා. අපිව මරන්න ආවේ. නමුත් අපිව බේරා ගෙන ගියා. ඒ නිසා I trust you. බලය බෙදීම කරන්න. ඒ කටයුත්ත කරයි කියලා අපි විශ්වාස කරනවා. ඒක ඕනෑ අපට.

මට ඕනෑ නොබෙදුණු ශ්‍රී ලංකාවක්, එකමුතු ශ්‍රී ලංකාවක්. එකමුතු ශ්‍රී ලංකාවක් තුළ අපි හැමෝම ජීවත් විය යුතුයි. අපි හැමෝම එකතු වෙන්න ඕනෑ. එච්චරයි. ඒ වගකීම ඔබතුමාට පැවරී තිබෙනවා, ගරු ඇමතිතුමනි. එම නිසා ඔබතුමා ඒ කටයුත්ත කරන්න. මොකද, මම හැම දාම කියනවා වාගේ ශ්‍රී ලංකාව සිංහල, බෞද්ධ රටක් කියලා, ඒ තැනට සීමා කරන්න එපා. මේක, සිංහල, දමිළ, මුස්ලිම් ජනතාව ජීවත් වන රට. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික ආගම් අදහන ජනතාව ජීවත් වෙන රට මේක. ඒ වාගේම සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂාව භාවිත වෙන රටක් මේක. බහුභාෂා කථා කරන ජනතාවක් ඉන්නා රටක්, මේක. ඒ හැමෝම ආරක්ෂා කිරීමේ වගකීම ඔබතුමාට පැවරී තිබෙනවා. ඔබතුමා ඒ කටයුත්ත කරන්න. ඔබතුමා කවුරුවත් කියපු පලියට, ව්‍යවස්ථාව ලබන අවුරුද්දේ ගෙනෙන්නම්, ඊට පසුව ගෙනෙන්නම් කියන්න එපා. දැනුත් පරක්කු වැඩියි නේද, නිසාම මන්ත්‍රීතුමා? පරක්කු වැඩියි. දැන් ගෙනෙන්න. පරක්කු වුණොත් ඊට පසුව ගෙනෙන්න බැරි වෙනවා. ඒ නිසා අලුත් ව්‍යවස්ථාව දැන්ම ගෙනෙන්න ඕනෑ. දැන් ඒ කටයුතු පටන් ගන්න. ජනාධිපතිතුමාට කියන්න. ජනාධිපතිතුමා මේ කථා අහගෙන ඉන්නවා ඇති කියලා මම හිතනවා. කරුණාකර ඒ කටයුතු පටන් ගන්න. එක පැත්තකින් economic rebuilding කරන ගමන් අනෙක් පැත්තෙන් nation building කරන්න. නැත්නම් ඒවා කරන්න බැහැ. ඒවා කෙරෙන්න ඕනෑ. ඔබතුමාගේ මේ අමාත්‍යාංශය වග කියන අමාත්‍යාංශයක් බව මම කියනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ආයතන කිහිපයක් තිබෙනවා. මට මතක හැටියට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව තිබෙනවා; the National Institute of Language Education and Training - NILET එක තිබෙනවා. ඒ වාගේ වැදගත් ආයතන තුනක් තිබෙනවා. මේ ආයතන තුනට ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ මුදල් කොච්චරද, වෙන් කර තිබෙන්නේ? ඒ ගැන මම කථා කරන්නේ නැහැ.

ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒකේ vision එක මොකක්ද කියලා බලන්න. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, National Institute of Language Education and Training - NILET- කියන ආයතන තුන පාවිච්චි කරලා මේ රටේ භාෂාව හරහා සමගිය ඇති කරන්න පුළුවන්. ඒකට මම උත්සාහ කළා. උත්සාහ කළා කියලා ඒක අවුරුදු දෙකෙන් ඉවර කරන්න බැහැ. අවුරුදු 75ක සාපය කියලා නේ ඔබතුමන්ලා කියන්නේ. අපේ සාපය අවුරුදු 200ක සාපය. ඒ සාපය අවුරුදු දෙකෙන් ඉවර කරන්න බැහැ. නමුත්, අපි උත්සාහ කළා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වෙනි Chapter එකේ language එක ගැන සඳහන් වෙනවා. මොකක්ද කියන්නේ? සිංහල, දමිළ භාෂා දෙකම මේ රටේ රාජ්‍ය භාෂා. ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොහොමද තිබෙන්නේ? 18(1) ව්‍යවස්ථාව යටතේ සඳහන් වනවා, සිංහල භාෂාව මේ රටේ රාජ්‍ය භාෂාව විය යුතුයි කියලා. Article 18 (1) of the Constitution states, “The Official Language of Sri Lanka shall be Sinhala.” Then, Article 18 (2) states, “Tamil shall also be an official language.” ඇයි “also” කියන්නේ? දැන් ඒක සංශෝධනය කරගන්න, ඔබතුමන්ලාගේ 159දෙනෙක් ඉන්නවා නේ. අපිත් සන්තෝෂ වෙනවා නේ. තිබෙන්න ඕනෑ “Sinhala and Tamil shall be Official Languages of Sri Lanka” කියලායි. හරි නේ. ඒක කරන්න.

හැබැයි, තවත් තිබෙනවා. ඒ මොකක්ද? මේ රටේ දකුණේ ඉන්න කවුරු හරි කෙනෙක් -සිංහල භාෂාව පමණක් දන්න කෙනෙක්- උතුරට ගියා නම්, රජයේ කාර්යාලයකට ගියා නම් තමුන්ට සිංහල භාෂාවෙන් වාචිකව හෝ ලිඛිතව ප්‍රතිචාර ලබා ගන්න පුළුවන් වෙන්න ඕනෑ. ව්‍යවස්ථාවේ ඒක තිබෙනවා. ඒ වාගේම උතුරේ ඉඳලා, නැත්නම් මධ්‍යම කඳුකරයේ ඉඳලා දකුණට කවුරු හරි යනවා නම්, සිංහල ගම්මානයකට යනවා නම්, රජයේ කාර්යාලයකට යනවා නම් තමුන්ගේ මව් භාෂාවෙන් - දෙමළ භාෂාවෙන්- ප්‍රතිචාර ලබා ගන්න අයිතිය තිබෙනවා. ඒ ඔක්කොම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. අපට සියයට 100ක් හොඳ ව්‍යවස්ථාවක් තිබෙනවා. නමුත්, ක්‍රියාත්මක වෙලා නැහැ. කොහොමද කරන්නේ? රාජ්‍ය නිලධාරීන්ට භාෂාව උගන්වන්න ඕනෑ. හැබැයි, භාෂාව ඉගෙන ගන්නේ නැහැ. ඉගෙන ගෙන පුරුදු වෙන්න ඕනෑ, ඒක පාවිච්චි කරන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Mano Ganesan, you have two more minutes.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Please have mercy on me, Sir.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
We are highly strangulated for time because we started one hour or 45 minutes late today.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
බලය බෙදීමේ කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට ගේන්න පෙර -ඔයගොල්ලන් ඒකට අදි මදි කරනවා නේ- මේක කරන්නකෝ. භාෂාව පදනම් කරගෙන රටේ ඒකාබද්ධතාව ඇති

කරන්න. ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා, ඒක කරන්න. මට අවශ්‍ය වන්නේ මේකයි. ශ්‍රී ලංකා පුරවැසියෙකු කොතැන හෝ රාජ්‍ය කාර්යාලයකට ගියා නම්, ඔහුට සිංහල හෝ දෙමළ භාෂාවෙන් ප්‍රතිචාර ලබා ගන්න පුළුවන් වෙන්න ඕනෑ. වාචිකව හෝ ලිඛිතව ප්‍රතිචාර ලබා දෙන්න ඕනෑ. එහෙම වුණා නම් මේ රටේ ජාතික ප්‍රශ්නයෙන් සියයට 51ක් අවසන් වෙනවා. ඔබතුමන්ලා ඒක දන්නවා. ඒක කරන්න. ඒක වෙලා නැහැ.

National Institute of Language Education and Training - NILET- කියලා ආයතනයක් තිබෙනවා. ඒකේ vision එකක් තිබෙනවා. හැබැයි, ඒ vision එක දැනගෙන නැහැ; අවබෝධ කරගෙන නැහැ. National Institute of Language Education and Training Act එක බලන්න. ඒකේ තිබෙනවා, "Language trainers can be trained and put into service by the NILET" කියලා. Act එක අරගෙන බලන්න, එහෙම තිබෙනවා. මේ සම්බන්ධ වැඩ පිළිවෙළක් අපේ කාලයේ මම පටන් ගන්නකොට අධ්‍යාපන ඇමතිතුමා මා එක්ක සටනට ආවා කැබිනට් එකේදී. මම කිව්වා, "නැහැ, නැහැ. Act එක අරගෙන බලන්න. Act එකේ ඒ අයිතිය තිබෙනවා" කියලා. සිංහල ගුරුවරු දමිළ පාසල්වලට දමන්න, දමිළ ගුරුවරු සිංහල පාසල්වලට දමන්න, ඉංග්‍රීසි ගුරුවරුන් දමන්න අයිතිය තිබෙනවා. Act එකෙන් අයිතිය තිබෙනවා. ඒක පාවිච්චි කරන්න. පාවිච්චි කරලා විශේෂ programme එකක් හදාගෙන ඔයගොල්ලන් ඒක කරන්න. ඒක මම පටන් ගත්තා. එහි පළමුවෙනි අදියර හැටියට ගුරුවරු 1,300ක් අරගෙන එයින් දමිළ ගුරුවරු 800ක් සිංහල පාසල්වලටත්, සිංහල ගුරුවරු 300ක් දමිළ පාසල්වලටත්, ඉංග්‍රීසි ගුරුවරු 100ක ප්‍රමාණයකුත් පාසල්වලට අනුයුක්ත කරන වැඩ පිළිවෙළ පටන් ගත්තා. හැබැයි අපේ ආණ්ඩුව ගිහිල්ලා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ආපු ගමන් ඒ වැඩ පිළිවෙළ පළමුවෙනි අදියරේ සිටම නවත්වා දැම්මා. ඒ ගැන එතුමාට වුවමනාවක් තිබුණේ නැහැ. මොකද, එතුමා සිංහල ජනාධිපති කෙනෙක් නේ. රුවන්වැලි මහා සෑය ළඟදී කිව්වේ ඒක නේ, "මම සිංහල ජනාධිපති කෙනෙක්" කියලා නේ කිව්වේ. ඒ වැඩ පිළිවෙළ එතුමා නැවැත්තුවා. සිංහලකම, දෙමළකම එපා. අපි ශ්‍රී ලාංකිකයන් විධියට යමු. ප්‍රශ්නයක් නැහැ. එහෙම නම් භාෂා අයිතිය ලබා දෙන්න. ඔබතුමන්ලාට අයිතිය තිබෙනවා, ඒක කරන්න. කරුණාකර Act එක අරගෙන බලන්න. ඒකේ මේ ගැන සඳහන්ව තිබෙනවා. මම පටන් ගත්ත දේ කරන්න. අපි පටන් ගත්තා කියලා ඒවා අහක දමන්න එපා. හොඳ දෙයක් නම් ඉදිරියට කරගෙන යන්න. එච්චරයි මම කියන්නේ. වෙන මොනවත් නැහැ. ඒ නිසා ඒක කරන්න.

ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමාගේ පියා බලය බෙදීම වෙනුවෙන් පෙනී සිටි කෙනෙක්. යසපාලිත නානායක්කාර මහතා කලාකරුවෙක් පමණක් නොවෙයි, එතුමා පළාත් සභාවෙන් හිටියා. මම ඒක දන්නවා. විජය කුමාරණතුංගයි, මමයි හිටියා. මම දන්නවා. ඒ අය සිංහල ජනතාව අතර අපි ගරු කරන නායකයන්. ඒගොල්ලන්ට වුවමනා වුණේ, රට ඒකාබද්ධ කරන්න. කොහොමද ඒකාබද්ධ කරන්නේ? බලය බෙදීම අවශ්‍යයි. ඒ නිසා අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන එක කල්දමන්න එපා. ඒ වැඩ පිළිවෙළ දිගටම අරගෙන යන්න. අලුත් ව්‍යවස්ථාවක් ගේන්න. ඒක කල් තියන්න කල් තියන්න අපට සැකයක් ඇති වෙනවා. මොකද, ඔයගොල්ලන්ගේ ඉතිහාසයත් එහෙම නේ. කළු ඉතිහාසයක් ඔයගොල්ලන්ට තිබෙනවා නේ. ඔයගොල්ලන් බලය බෙදීම වෙනුවෙන් පෙනී සිටපු අයව මරලා දැම්මා. එහෙම වුණා නේ. ඝාතනය කළා නේ. විජය කුමාරණතුංගගේ සිට ඒ ඔක්කොම ඝාතනය කළා නේ. 1987-1989 වකවානුවේ මේ රටේ කෝලාහලයක් වුණා නේ. ඉන්දියානු ආක්‍රමණයක් එනවා නම් අපිත් පාරට බහින්නම්.

ඉන්දියාවට මේ රට ආක්‍රමණය කරන්න දෙන්න බැහැ, මේක අපේ රට. ඒ අයට ආක්‍රමණය කරන්න දෙන්නේ නැහැ. හැබැයි, ඒ තුළ ආවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, පළාත් සභා ක්‍රමය. ඒක ආරක්ෂා කර ගන්න. ඉස්සෙල්ලාම Thirteen plus දෙන්න එපා. Thirteenth Amendment to the Constitution ක්‍රියාත්මක කරන්න, පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කරන්න. පළාත් පාලන මැතිවරණය පවත්වන්න. ඒක කරන්න. එහෙම නැත්නම් ඒ වැඩේ වෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා වගකීම භාර ගන්න. ඔබතුමා අධිකරණ ඇමතිතුමා පමණක් නොවෙයි, ජාතික ඒකාබද්ධතා ඇමතිවරයා ලෙසත් කටයුතු කරනවා නේ. ඒ අමාත්‍යාංශයේ තිබෙන විධියට ජාතිය ගොඩ නැඟීම, ආර්ථිකය ගොඩ නැඟීමට සමානයි. ඒ දෙකම වෙන්න ඕනෑ; සමාන්තරව වෙන්න ඕනෑ; parallely යන්න ඕනෑ. They should go parallely. Otherwise, it will not work. නැත්නම් රට හදන්න බැහැ. අපි දන්නවා ඒක. ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ලැයිස්තු පිට ලැයිස්තු ඉදිරිපත් කරනවා නේ. අපි ඒක දන්නවා. අදත් ලැයිස්තුවක් ආවාද?

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අද නැහැ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
අද ආවේ නැහැ. හෙට එයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Mano Ganesan, you have exhausted your allotted time.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
හවස් වෙලා එයි, කමක් නැහැ. ඒකට වඩා මේක කරන්න කියලා ඉල්ලීමක් කරමින්, ගරු ඇමතිතුමාට ස්තුති කරනවා. Hon. Harshana Nanayakkara, once again, I send my greetings to you.

Thank you very much, Hon. Chairman.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Harshana Nanayakkara. You have 21 minutes.

[12.03. p.m.]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
Hon. Chairman, I will use up 15 minutes at the beginning and keep the rest to be used later .

First of all, I would like to thank the Hon. Mano Ganesan for reminding me of the bond we had then and that bond, we will tend to continue. When it comes to national integration and reconciliation, peace between races and the chance for all of us to live in a dignified manner is my vision and my dream and that was what my

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

late father also wanted. That is what you also want and it will be done. So, thank you very much for mentioning that.

I must also say that when it comes to the law-making process, we do not consider all of you who are sitting in the Opposition benches as our opponents, but as our partners who work together in progress. At election times, we may be opponents, but right now, we all work for the betterment of the country.

National unity and reconciliation, peacebuilding, friendship-making are inherent in our programme. So, thank you very much, Hon. Mano Ganesan. Your observations are taken very positively.

ගරු සභාපතිතුමනි, සෑම ක්ෂේත්‍රයකම පරිවර්තනයක් සිදු කිරීම උදෙසා අප නව රජය 2025 වර්ෂය වෙනුවෙන් ඓතිහාසික අය වැය ලේඛනයක් ඉදිරිපත් කර තිබෙන මෙවැනි අවස්ථාවක, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට සම්බන්ධ වීම සඳහා ලැබෙන මේ අවස්ථාව ඉතා සුවිශේෂී අවස්ථාවක් ලෙසට මා සලකනවා.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගොඩනැඟීමේ ක්‍රියාදාමයේ අත්‍යවශ්‍යම අංගයක් තමයි, සෑම පුරවැසියෙකුටම නීතියට සම ප්‍රවේශය සහතික කරන, නීතියේ ආධිපත්‍යය සුරැකි, සමානාත්මතාව රජයන සමාජයක් බිහි කිරීම. වංචාව, දූෂණය, අල්ලස, ජනතා මුදල් නාස්තිය තුරන් කර රට තුළ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමකින් තොරව පොහොසත් රටක් බිහි කිරීමේ අභිලාෂය යථාර්ථයක් බවට පත් වෙන්නේ නැහැ. මේ බව වඩාත් හොඳින් තේරුම් ගත් වර්තමාන රජය පවතින අතිශය ආර්ථික අභියෝගකාරී තත්ත්වයක වුවද, රුපියල් බිලියන 24ක් මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂය සඳහා වෙන් කොට තිබෙනවා.

ඒ වාගේම, ඉතා අවිධිමත්ව තිබූ අමාත්‍යාංශ අතර කාර්යයන් බෙදීම, විද්‍යාත්මක පදනමට අනුව වර්තමාන රජය විසින් සකස් කර ඇති අතර, එහිදී ඉතා වැදගත් දෙපාර්තමේන්තු සහ ආයතන 24ක වගකීම මෙම අමාත්‍යාංශය වෙත පවරා තිබෙනවා. ඒ අනුව ජනතාව අප කෙරෙහි තැබූ විශ්වාසය සුරක්ෂිත කරමින්, මනා සැලැස්මකට අනුව අපගේ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය මෙන්ම, අප යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන වෙත නිසි මහ පෙන්වීම මගේ අපේක්ෂාවයි.

අමාත්‍යාංශය භාර ගැනීමෙන් පසුව, මා සියලු දෙපාර්තමේන්තු හා ආයතන 24 සමඟම ගැඹුරින් සාකච්ඡා කළා. එහිදී අප හඳුනා ගත් ප්‍රධානම ගැටලුව වන්නේ, මානව සම්පත් හිඟයයි. අවිධිමත් ලෙස රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සිදු කිරීම සහ සේවයේ අවශ්‍යතාවලට ඔවුන් නිසි ලෙස අනුයුක්ත නොකිරීම මෙහිදී කැපී පෙනුණු ලක්ෂණය වුණා.

ගරු සභාපතිතුමනි, අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනයේදී අප විසින් හඳුනා ගනු ලැබූ ප්‍රධානම ගැටලුව වූයේ යුක්තිය පසිඳලීමේදී පවතින අධික ප්‍රමාදයයි. 2024 අවුරුද්දේ ජුනි මස 30 වන විට රැස් කළ දත්ත අනුව, අධිකරණ පද්ධතිය තුළ විසඳීමට ඇති නඩු සංඛ්‍යාව ලක්ෂ 11 ඉක්මවනවා. ඒ, ශ්‍රේෂ්ඨාධිකරණයේ සිට මහෙස්ත්‍රාත් අධිකරණය දක්වා. මේ එකවර ඇති වෙච්ච තත්ත්වයක් නොවෙයි. මා කිසිවෙකුට ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. මෙය එකවර ඇති වූ තත්ත්වයක් නොවන බවයි අපේ නිරීක්ෂණය. නිසි පිළියම් නොයෙදීමෙන් වසර ගණනාවක් තුළ නිර්මාණය වූ තත්ත්වයක් තමයි මෙය. මේ ප්‍රමාදයේ ප්‍රතිඵලය වෙන්නේ, නඩුවක් අවසන්වීමට විශාල කාලයක් ගත වීමයි. ඒ නිසා අධිකරණ ක්‍රියාවලිය ජනතාවට ඉතා මිල අධික ක්‍රියාවලියක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, නීති කෘත්‍යවලට සම්බන්ධ දේපළ ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීමේ අපහසුව තිබෙනවා. ඒ හැර අධිකරණ ක්‍රියාවලියට විශාල කාලයක් ගතවීමද ආයෝජන අධෛර්යවත් කිරීමට තුඩු දෙන තවත් හේතුවක්.

Justice delayed is justice denied. යුක්තිය පසිඳලීමේදී ඇති ප්‍රමාදය ඉතාම බරපතළ ගැටලුවක් ලෙස සලකනවා. නීතියේ පවතින මෙම ප්‍රමාදය හුදෙකලා සාධකයක් නොවන අතර, එය සෘජුව ආර්ථික සංවර්ධනය හා බැඳී පවතිනවා. ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකයේ - Ease of Doing Business Index එකේ - රටවල් 190ක් අතුරින් ලංකාවට හිමිව ඇත්තේ 99වැනි ස්ථානයයි. ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ දර්ශකයේ - Enforcement of Contract Index එකේ - රටවල් 189ක් අතුරින් ලංකාවට හිමි වන්නේ 164වන ස්ථානයයි. එසේම ශ්‍රී ලංකාව තුළ ගිවිසුමක් බලාත්මක කර ගැනීමට ගත වන කාලය දින 1,318ක් ලෙස ලෝක බැංකුවේ වෙබ් අඩවිය ප්‍රකාශ කරනවා. මේ තත්ත්වය වෙනස් කරන්න අපි ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වාගේම, මෙම ජාත්‍යන්තර දර්ශකවල ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයකට ඔසවා තැබීමට කටයුතු කිරීමත්, අපේ රජයේ මුඛ්‍ය පරමාර්ථය වෙනවා.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි, අප රජය විසින් මූලධර්ම තුනක් මත නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කරනවා. ඒ තමයි, සාධාරණව හා සමානව නීතියේ රැකවරණය, විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව, ස්වාධීනත්වය හා ජනතා විශ්වාසය කියන ඒවා.

එසේ නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කරනු ලබන අවස්ථාවක අධිකරණ සඳහා යටිතල පහසුකම් මෙන්ම ප්‍රමාණවත් අධිකරණ කාර්ය මණ්ඩලයක් ද සැපයිය යුතු වෙනවා. යටිතල පහසුකම් අධිකරණවලට සැපයීමේ දී ගොඩනැඟිලි ඉදි කිරීම සිදු වෙනවා. පසුගිය කාලය තුළ අධිකරණ ගොඩනැඟිලි ඉදි කිරීම විශාල වශයෙන් ආරම්භ කර තිබෙනවා. නමුත්, ආර්ථික අර්බුදයත් සමඟ ඉදි කිරීම් කටයුතු නතර කරන්න සිදු වෙච්ච ගොඩනැඟිලි 23ක් රට පුරා පවතිනවා. අපි ඒවා ඉදි කිරීමට මූලිකත්වය ලබා දෙනවා, මේ වසරේදී. මොකද, ඒ සඳහා මුදල් වෙන් වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ගොඩනැඟිලි පමණක් ඉදි කර නව අධිකරණ ආරම්භ කරන්න හැකියාවක් නැහැ. මා කලින් සඳහන් කළ පරිදි අධිකරණය මානව සම්පත් සහ කාර්යාලයීය උපකරණවලින් සම්පූර්ණ වෙන්නට ඕනෑ. නමුත්, අධිකරණ සහ අධිකරණ අමාත්‍යාංශයට අයත් සියලු දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල මෙන්ම මෙම අමාත්‍යාංශයේ ද පවතින සම්පූර්ණ කාර්ය මණ්ඩල හිඟය මේ වන විට 6,026ක් වීම, සැමට අප්‍රමාදව යුක්තිය ඉටු කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අභියෝගය බවට පත් වී තිබෙනවා. ඒ කියන්නේ, අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ තිබෙන ආයතන සහ දෙපාර්තමේන්තුවල සම්පූර්ණ කාර්ය මණ්ඩලවල හිඟය ගැනයි. රාජ්‍ය සේවකයින් බඳවා ගැනීමේ සමාලෝචන කමිටුවට මෙම අවශ්‍යතාව අප විසින් මේ වන විටත් ඉදිරිපත් කර ඇති අතර, ඔවුන්ගේ තීරණය ලද පසු මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හැකි වෙනැයි අපි අපේක්ෂා කරනවා.

මුල් අවස්ථා අධිකරණවල පමණක් විනිසුරුවරුන්ගේ පුරප්පාඩු 75ක් පවතිනවා. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් මිලියනයකට ඉන්න විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව දැනට 19ක්. නමුත්, දියුණු නීති පද්ධතියක් තිබෙන රටවල මෙම දර්ශකය ඉහළ අගයක් ගන්නවා. එසේම, අධිකරණ නොවන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 2,294ක ප්‍රමාණයක් පවතිනවා. මෙය අධිකරණ පද්ධතිය කාර්යක්ෂමව පවත්වා ගෙන යෑම අපහසු කරන

තත්ත්වයක්. මේ වන විටත් අධිකරණ නිලධාරීන් 50 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් පවතිනවා. ඒ, මහෙස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් යනාදී වශයෙන්. එසේම අධිකරණ කාර්ය මණ්ඩලයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු 753ක් ඉතා ඉක්මනින් සම්පූර්ණ කිරීමට අනුමැතිය සහ ප්‍රතිපාදන අපේක්ෂාවෙන් අපි සිටිනවා. අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන බහුතරයක් තිබෙන්නේ කුලී ගොඩනැඟිලිවලයි. අධිකරණ අමාත්‍යාංශය තිබෙන්නේත් පෞද්ගලික ගොඩනැඟිල්ලක. මාසික කුලිය රුපියල් ලක්ෂ දෙකක් පමණ වෙනවා. ඒ නිසා ප්‍රමුඛ අවශ්‍යතාවක් ලෙස සලකා රජය විසින් අපට BCC ඉඩමේ අධිකරණ අමාත්‍යාංශය සඳහා ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර, එහි දෙවැනි අදියරේ ඉදි කිරීම් කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 3,500ක වටිනාකමට පසුගිය මාසයේ 17වෙනි දා ප්‍රදානය කරනු ලැබුවා. මෙම ගොඩනැඟිල්ල ලබන වසර තුළ ඉදි කර අවසන් කිරීමට අපි සැලසුම් කර තිබෙනවා. දැනට කුලී ගොඩනැඟිලිවල පවත්වා ගෙන යන අධිකරණ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන ද මෙම ගොඩනැඟිල්ල තුළට ගෙන ඒමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව දැනට කුලී වශයෙන් ගෙවන රජයේ විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට අපි අපේක්ෂා කරනවා.

ඒ වාගේම, අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛතා හඳුනා ගත් රජය විසින් අමාත්‍යාංශ ගොඩනැඟිලි ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 7,200ක මුදලක් 2025 වර්ෂයේ දී වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා. සැලැස්මකට අනුව යටිතල පහසුකම් සහ මානව සම්පත් සැපයීමෙන් පසු අධිකරණ සංඛ්‍යාව ක්‍රමානුකූලව වැඩි කිරීමට අපි කටයුතු කරනවා. සුහුරු අධිකරණ ශාලා - smart courthouses - ද ක්‍රමානුකූලව ස්ථාපිත කිරීම අපගේ තවත් අපේක්ෂාවක්.

2023 අංක 29 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනතින් දිසා අධිකරණ සඳහා පූර්ව නඩු විභාග අධිකරණ පිහිටුවීමට නීතිමය ප්‍රතිපාදන සපයා තිබුණ ද තවමත් පූර්ව නඩු විභාග අධිකරණ පිහිටුවා නැහැ. මෙසේ පූර්ව නඩු විභාගවලින් තමයි නඩු ඉක්මන් කිරීමට, පමාවන් වැළැක්වීමට යම් හැකියාවක් ඇති වන්නේ. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා මේ බව දන්නවා. ඉදිරියේ දී විශාල නඩු සංඛ්‍යාවක් පවතින දිසා අධිකරණ තෝරා ගෙන මේ සංකල්පය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. දිසා අධිකරණවල පවතින මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 38කට ආසන්න ප්‍රමාණයක් මුදල් සම්බන්ධ ආරාවුල්. ඒවා රුපියල් මිලියන 2ට වඩා අඩු ඒවායි. රුපියල් මිලියන 2ට වඩා අඩු මුදල් නඩු කඩිනමින් අවසන් කිරීම සඳහා 2022 අංක 33 දරන සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත සම්මත වුණත්, මෙතෙක් සුළු හිමිකම් අධිකරණය ස්ථාපිත කරලා තිබෙන්නේ මහනුවර සහ මාතර පමණයි. ඉදිරියේ දී, අධිකරණයේ පවත්වාගෙන යන මුදල් ආරාවුල් නඩු සංඛ්‍යාව අධ්‍යයනය කරලා, තවත් සුළු හිමිකම් අධිකරණ ස්ථාපිත කරන්න කටයුතු කරනවා.

ඒ වාගේම, 2021 වර්ෂයේ සමයවර්ධන මහත්මයාගේ වාර්තාවක් අනුව නව අධිකරණ ස්ථාපිත කිරීමට යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව ඉබ්බාගමුව, ලාහුගල, වත්තේගම, තලවකැලේ, මොරවැව, ජයපුරම්, මුරුක්කන්, පුලියන්කුලම්, වෙට්ටිකුලම් වැනි දුෂ්කර ප්‍රදේශවල නව අධිකරණ ස්ථාපිත කිරීමට යෝජනා කර තිබෙනවා. ඉදිරියේදී පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය ස්ථානවල ජනතාවගේ පහසුව උදෙසා නව අධිකරණ ස්ථාපිත කරනවා.

ගරු සභාපතිතුමනි, අධිකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා ඩිජිටල්කරණය කිරීම මූලික අවශ්‍යතාවක් ලෙස අධ්‍යයන රැසකින් ම හඳුනා ගෙන තිබෙනවා. මේ වන විට බොහෝ රටවල ලේඛන නඩත්තු නොකරන - paperless - ඩිජිටල් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වෙනවා. අපේ රජයේ ප්‍රධාන කාර්යයක් වන්නේ පුරවැසියන්ට කාර්යක්ෂම, පහසු සේවයක් සැපයීම උදෙසා ඩිජිටල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමයි. නවීන තාක්ෂණයෙන් පිරිපුන් අධිකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් Rapid Digital Strategy ව්‍යාපෘතිය ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු අර්ජුන ඔබේසේකර මැතිඳුන්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් විසින් දැනටමත් පියවර ගනිමින් සිටිනවා. ආරම්භයේදී නියමු ව්‍යාපෘතියක් ලෙසට මහනුවර සහ මීගමුව අධිකරණ සංකීර්ණ තෝරා ගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, නීතිපතිවරයා රජයේ නීති උපදේශකවරයායි. ඔහු විසින් සිවිල් හා අපරාධ නඩු සම්බන්ධයෙන් රජයට මෙන්ම රජයට අයත් දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට ද උපදෙස් දෙනු ලබනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමත නීති නිලධාරීන් - State Counsels - සංඛ්‍යාව 459ක් වන නමුත් නීති කාර්ය මණ්ඩලයේ ඉන්නේ නිලධාරීන් 209ක් විතරයි. අපරාධ නඩු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුවේ අපරාධ අංශයට අනුයුක්ත නිලධාරීන් විසින්. එහි ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින්නේ නිලධාරීන් 93 දෙනෙක් පමණයි. ඒ නිසා ඉදිරියේදී නීතිපති දෙපාර්තමේන්තුවේ මෙම කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් සපයා නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමට අපි විශේෂයෙන් කටයුතු කරනවා.

ඒ වාගේම අපරාධ නඩු පැවරීම සඳහා අභිචෝදක කාර්යාල පිහිටුවීම සලකා බැලීමේ මූලික පියවර මේ වන විට ගනිමින් පවතිනවා. So, there may be a new recruitment drive, when the new mechanism is in place.

ගරු සභාපතිතුමනි, බන්ධනාගාරවල තත්ත්වය බැලුවොත්, 10,395ක් රඳවා තබන්න පුළුවන් ප්‍රමාණයට තමයි බන්ධනාගාරවල space එක තිබෙන්නේ. නමුත් 30,000කට ආසන්න ප්‍රමාණයක් රඳවා තිබෙනවා. මේක රැඳවියන්ටත් අපහසුවක්. රජයටත් විශාල පිරිවැයක්. මා කමිටුවක් පත් කර තිබෙනවා. මේ කමිටුවේ නිර්දේශ අනුව -ඔවුන්ගේ යෝජනා හා නිර්දේශ අනුව- බන්ධනාගාර තදබදය ඉවත් කිරීමට කටයුතු කරනවා. දැනටමත් ඒ කමිටුව වැඩ කටයුතු කරනවා.

ඒ වාගේම අපි දන්නවා, රස පරීක්ෂක වාර්තාවල පමාවක් තිබෙන බව. 2024 වර්ෂයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට වාර්තා සැපයීම සඳහා නඩු 64,524ක් යොමු වෙලා තිබෙනවා. හැබැයි, එම වාර්තා විශ්ලේෂණ මට්ටමේ නිලධාරීන් ඉන්නේ 78දෙනෙකු පමණයි. එක් විද්‍යාත්මක නිලධාරියෙකුට වසරකට 800කට වැඩි වාර්තා ප්‍රමාණයක් විශ්ලේෂණය කරන්න සිදු වී තිබෙනවා. ගිය වසරේ ලැබුණු නඩුවලින් සියයට 54ක්, එනම් නඩු භාණ්ඩ 35,044ක ප්‍රමාණයක් පදනම් වූයේ මත්ද්‍රව්‍ය මත. එකී මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම අපේ ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා ඒ සඳහා අපි සියලු දෙනා කැප වී සිටිනවා. ඉදිරියේදී එම ආයතනයේ වාර්තා නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා අපි මේ වන විටත් පියවර ගනිමින් සිටිනවා. ඒ වාගේම තවත් පුද්ගලයන් බඳවා ගන්නත් -විද්‍යාත්මක නිලධාරීන් බඳවා ගන්නත්- කටයුතු කරමින් ඉන්නවා.

සිරගත වූවන් යළි සමාජ ගත කිරීම කෙරෙහි අප රජයේ විශේෂ අවධානය යොමු වී තිබෙනවා. බන්ධනාගාරගත වූවන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කර ඔවුන්ට යහපත් පවුල් ජීවිතයක් උරුම කර දීමයි, අපේ පරමාර්ථය. ඒ අනුව බන්ධනාගාර

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

රැඳවියන්ගේ වෘත්තීය පුහුණුව වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා අය වැය යෝජනා තුළ රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා.

අපි මේ අධිකරණයේ ගොඩ ගැසී ඇති නඩු ප්‍රමාණය අඩු කිරීමට කටයුතු කරනවා මෙන්ම විකල්ප ආරාවුල් විසඳීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට ද කටයුතු කරනවා. සමථ මණ්ඩල වෙත වර්ෂයකට ආරාවුල් ලක්ෂ 2කට වැඩි ප්‍රමාණයක් වාර්තා වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Harshana Nanyakkara, you have only two minutes left, out of the 15 minutes you requested to speak.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Thank you, Hon. Chairman.

සමථ මණ්ඩල ශක්තිමත් කිරීම හරහා මෙම විකල්ප ආරාවුල් විසඳීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතු වෙනවා. මෙම ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මඟින් අධිකරණය තුළ ගොඩගැසී තිබෙන තවත් නඩු ලක්ෂ 2ක් පමණ වසරකදී එමඟින් අඩු කරවා ගැනීමට අපේක්ෂා කරනවා. සමථ මණ්ඩල ශක්තිමත් කර දැනට දිස්ත්‍රික්ක 16ක පිහිටුවා ඇති ඉඩම් ආරාවුල් පිළිබඳ විශේෂ සමථ මණ්ඩල ඉතිරි දිස්ත්‍රික්ක 6හිත් පිහිටුවීමට කටයුතු කරනවා. එසේම අධිකරණයට යොමු වන මූල්‍ය ආරාවුල් ප්‍රමාණය අඩු කිරීම සඳහා මූල්‍ය ආරාවුල් පිළිබඳ විශේෂ සමථ මණ්ඩල අපි හඳුන්වා දෙනවා. පළමු අදියර විධියට කොළඹ, ගම්පහ, අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, මොනරාගල යන දිස්ත්‍රික්ක 6හි විශේෂ මූල්‍ය ආරාවුල් පිළිබඳ සමථ මණ්ඩල පිහිටුවීමට මේ වන විටත් කටයුතු කරමින් පවතිනවා.

There must be a judicial system with equal access to justice. මෙම අමාත්‍යාංශයට පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා නීති ප්‍රතිසංස්කරණය කිරීමේ භාරදූර වගකීම පැවරී තිබෙනවා. එහිදී අප සිදු කරන නීති ප්‍රතිසංස්කරණයේ ගුණාත්මකභාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනවා. තනි මතයන්ට නීති සංශෝධනය කිරීමෙන් ඒවායේ අඩු පාඩු ඇති වන අතර, ඇතැම් විට වියවුල් තත්ත්වයන් ද නිර්මාණය වෙනවා. ඒ නිසා අප ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි නීති විශේෂඥ කමිටුවක් මඟින් පවතින නීති සමාලෝචනය කොට අවශ්‍ය නීති සංශෝධනය කිරීමට කටයුතු කරනවා.

අපරාධ සහ නීති විරෝධී ක්‍රියා මඟින් ඇතැමුන් කෝටි ප්‍රකෝටි ගණනින් ධනය එක් රැස් කරගෙන තිබෙනවා. අපි මේ වත්කම් නියත වශයෙන්ම ආපසු ලබා ගන්නවා. අපරාධ සිදු කිරීම තුළින් උපයා ගත් වත්කම් යළි ලබා ගැනීම සහ රාජසන්තක කිරීම සඳහා නීති ප්‍රතිපාදන ඇතුළත් පනත් කෙටුම්පත මා විසින් අද දින උදෑසන ඉදිරිපත් කරනු ලැබුවා.

බරපතළ අපරාධකරුවන් අධිකරණ වෙත ප්‍රවාහනය කිරීමේදී ඉතා අවදානම් සහගත තත්ත්වයක් තිබෙනවා. අපි මේ වන විට දිවයින පුරා පිහිටි 34ක් වූ මහාධිකරණවලින් 24කටම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය හරහා සාක්ෂි ලබා ගැනීම සඳහා අවශ්‍ය වීඩියෝ ඇමතුම් තාක්ෂණ කට්ටල ලබා දීලා තිබෙනවා. තවද මහෙස්ත්‍රාත් අධිකරණ 20කටත් මෙවැනි තාක්ෂණ මෙවලම් ලබා දී තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ වාගේම ප්‍රධාන වශයෙන් ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම් වස් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය හරහා සාක්ෂි ලබා ගැනීමට අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීමට කටයුතු කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Harshana Nanyakkara, your time is up.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
I will take one more minute and finish my speech, Hon. Chairman.

අපි Civil Procedure Code එක amend කරලා- දැනට ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රමයට සාක්ෂි මාර්ගගතව ලබාගත හැක්කේ තර්ජනයක් තිබෙන බවට හඳුනා ගන්නා අයගෙන් පමණයි. නමුත්, මේ කියපු පනත ආවාට පස්සේ හැමෝටම මාර්ගගත ක්‍රමයට සාක්ෂි දෙන්න පුළුවන්. ඒ අනුව අධිකරණයේ සිදු වුණු අර අවාසනාවන්ත තත්ත්වයන් මහ හරවා ගන්නට පුළුවන් වේ යැයි අපේක්ෂා කරනවා. That is all, Sir. Thank you.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. M. Nizam Kariapper. You have 15 minutes.

[12.17 p.m.]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Chairman, I am starting at 12.18 p.m. and will take the whole 15 minutes allotted to me.

Sir, before I proceed, I must take this opportunity to extend my congratulations to the Hon. Leader of the Opposition on two remarkable achievements of his. Firstly, after a long time, he has managed to unite the entire Opposition to oppose the Budget, an accomplishment that no other Leader of the Opposition in the recent history has been able to achieve. Perhaps with just one exception, he has orchestrated a rare moment of consensus across all the Opposition Parties. Secondly, I must commend him on his eloquent and meticulously timed 45-minute speech, which compellingly outlined why this Budget is a failure. Perhaps, his speech was so impressive that the Hon. Leader of the House wished to make him the permanent Leader of the Opposition through constitutional means! Or is it, rather, that the Hon. Leader of the House desires to make his own party the permanent governing party through constitutional means and that is why he made these remarks, I wonder? But, Sir, this is not the first time in the history that a Government in power has dreamt of keeping the particular Opposition Leader in that role indefinitely, perhaps out of a desire to maintain their own grip on power permanently.

This political manoeuvring is not new. History reminds us that similar tactics were first deployed by President J.R. Jayewardene, who, despite commanding an overwhelming five-sixth majority, which was 83 per cent unlike the 71 per cent majority in Parliament you have, to neutralize the Opposition. He enacted the Sixth Amendment to the Constitution, effectively forcing the main Opposition out of Parliament. Not stopping at that, he went on to strip the main Opposition Leader of her civic rights so that he could remain in power and contest the next election. Then, decades later, we saw the Hon. Mahinda Rajapaksa attempting a similar strategy, floating the idea of making the Hon. Ranil Wickremesinghe the constitutionally guaranteed, lifelong Leader of the Opposition. I distinctly remember an article in "The Sunday Times" at that time, its very popular "5th Column", discussing this very idea. And, now, Sir, we see the echoes of the same political ambition in the present Government. In a winding up speech of the Hon. Leader of the House, we heard similar sentiments. Perhaps, he is revealing the desire for perpetual power. But, let me caution the Hon. Leader of the House that history does not favour those who take the people for granted.

Sir, let me list some of the failures of this Government in the administration of justice since it took control of the State machinery. First, bringing the conspirators of the Easter Sunday attack before court. The Minister in charge of public security stated that a large amount of witnesses' evidence including the testimonies from the Batticaloa Prison authorities were recorded and forwarded to the Colombo Magistrate as far back as 24th November, 2024. It has now been nearly three months since then, Hon. Minister of Justice. One needs no further hint to understand where the investigation is pointing. As the Hon. President stated last evening, the culprits know that the investigation is closing in on them. They are not going to just sit idly by. By now, the forces must be engaged in diversionary tactic. I think you all are well aware of that. So, should the authorities not act swiftly? Whether we like it or not, the Prevention of Terrorism Act is being used in this investigation. It has been used to detain thousands of Muslims for years and the vast majority of them were released, admitting that there is no evidence against them. I am sure the authorities will apply the same law to investigate and prosecute the conspirators of the Easter attack. So, why hesitate to name the accused when the evidence is more compelling? Now, it is three months since the last "B"' Report has been produced in the Magistrate's Court of Colombo.

Let me now say a few words about the daylight murder of Mr. Lasantha Wickrematunge. I appreciate that the Hon. President has finally acknowledged the *bona fide* of the Attorney-General's role in this case when the truth has been distorted on social media through misinformation and unprofessional speculations. However, I must also acknowledge that there are some highly knowledgeable and professional YouTubers - I do not want to mention the names as they will say I am trying to advertise them - who provide insight and credible analysis.

Next, the long-forgotten murder of Dinesh Schaffter - we all have forgotten that - a crime shrouded in mystery but clearly falling into the category of organized crime. We have forgotten the murder of Dinesh Schaffter. Sir, yet, to date, no suspects have been identified.

Then, the infamous Central Bank Bond scam. I addressed that yesterday, but let me reiterate it. The authorities must proceed with the trial *in absentia* - I know the Minister of Justice knows about it - under the provisions of the Code of Criminal Procedure. We cannot wait till Arjuna Mahendran is sent here; it must start off *in absentia*. Extraditing a suspect is an unachievable task in the current state of the justice system because we are in a hell of a mess today. This has been deliberately undermined. However, I am confident that once the suspect is convicted, the Singaporean authorities would find it difficult to refuse his extradition.

And then, the recent series of killings clearly point to organized crimes. It seems that the people behind these murders are deciding who should be arrested and who should not be. In the murder of "Ganemulle Sanjeewa", look at how easily the shooter was arrested. Yet, the woman who coordinated the attack, who is in the centre of all the key players in that Hollywood-style shooting, remains untouched. Is she, perhaps, the Sarah Jasmin of this killing? And, we know what happened to Sarah Jasmin. Sir, I am wondering whether the same thing would happen to this lady also.

The President spoke last evening in this august Assembly, stating that these were five well-coordinated killings, hinting that they were orchestrated by an invisible hand. Does that not remind us of the meticulously planned Easter Sunday attack, Hon.Minister of Justice? I know, we all are facing a serious challenge in upholding people's confidence in our judicial system. In fact, I was shocked - I was shocked, Sir - at what the President said while delivering his speech in Parliament last evening. Unfortunately, I went and sat where our leader, the Hon. Rauff Hakeem sits. While delivering his speech, looking straight at my eyes, this is what the Hon. President said: "සන්නද්ධ අවි කණ්ඩායම් ඉන්නවා. ඒකට අනුගත වන පොලිස් නිලධාරීන් ඉන්නවා. ඒකට අනුගත වන හමුදා නිලධාරීන් ඉන්නවා. ඒකට අනුගත වන අධිකරණ නිලධාරීන් ඉන්නවා. මම කියනවා විවෘතව". That is what he said. "ඒකට අනුගත වන නීතිඥවරු ඉන්නවා" කියලා මගේ මූණ බලලා කිව්වා, ගරු සභාපතිතුමනි. - *[බාධා කිරීමක්]* ගරු ජනාධිපතිතුමා එහෙම කිව්වා, ඊයේ හවස. ඔබතුමා ඒක දන්නවා. - *[බාධා කිරීමක්]* Not to me, but to my profession and your profession, Hon. Minister. In fact, the President was looking straight at me twice when he questioned the role of a lawyer. Then, he continued to say, Hon. Minister of Justice, "වර්තමාන අපරාධකරුවන් නිදහස් වුණොත්..." - මම වචනෙන් වචනය කියවලා ලියාගෙන ආවේ, වරද්දගන්න හොඳ නැති නිසා - "....නීතිඥවරු ජීප් එකට නැඟලා අපරාධකරුවන්ගේ නිවසට යනවා". I was shocked, Sir! That was what he said yesterday. He further asked, "මොකක්ද මේ නීතිය?" Then, he ended up saying, "මේක අපරාධ රාජ්‍යයක්". Sir, for a moment, I was shocked and speechless as a senior member of the legal profession with my exposure to the official and unofficial bars and having taken a special oath as a President's Counsel - we take a special oath, Sir - to make my services available to the State! But, I do not

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

think this Government is going to take my service. I am not even called upon to serve as a member of the Panel of Chairs, leave alone taking my service for the State. That does not matter. But, when I am called upon to defend the country and its integrity, I wondered how I should respond to the President's statement. So, leave alone the public, Hon. Minister of Justice, the President himself has lost confidence in the system of administration of justice! Please take a note of that fact. He did not spare anybody; police officers, officers of the forces, judicial officers and lawyers are being accused of creating a අපරාධ රාජ්‍යයක්. That is a very serious matter. My only consolation is that the Hon. Minister of Justice, being a senior lawyer - though you are not a President's Counsel, I feel you are entitled it to be conferred on with your experience, both in the official and unofficial bar - would be able to put things into proper perspective and dispel any misconceptions about our profession.

Sir, I want to conclude because I have a very limited time, following the new trend set by the Hon. Wasantha Samarasinghe. He wound up his speech with the words of a song.

ගරු සභාපතිතුමනි, "හදවතේ ගායකයා" නමින් හඳුන්වන, චාමර වීරසිංහ කියලා ගායකයෙක් ඉන්නවා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
චාමර සම්පත් නොවෙයි නේ.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
චාමර සම්පත් නොවෙයි, අනිවාර්යයෙන්.

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා ඒ ගායකයාගේ ගීතයක් කිව්වා, "සඳට සඳ එළියට...". Sorry, I must now sing that. ඒ පදය කියනකොට තනුව නිකම්ම එනවා, ගරු සභාපතිතුමනි. "මලට මල් පොකුරට, කවියෝ කවි ලීවට, වෙනස් වේවිද ..." කියන තැනට පොඩි twist එකක් දාලා, "මේ මිනිසුන්ගේ සිත" කියන එකට "විපක්ෂය" කියලා කිව්වා. අපි පොඩ්ඩක් ඒකේ ඊළඟ පද ටිකටත් යමුකෝ. "උමතුවෙන් මත් වෙලා, රාගයට ලොල් වෙලා, මනස වීදෝ මුළා. සුමුදු මල් පරවෙලා. "දැන් ඉතින් 159දෙනෙක් ඉන්නවා නේ. ඒ නිසා රාගයෙන් මත්වෙන්න එපා. ඊළඟ පද ටිකත් මම කියන්නම්. "අපරාධ ලොව රජ වෙලා, මිනිස් සිත් බය වෙලා, රටම වී මුළා ..." ඒ ගීතයේම තව කොටසක් තිබෙනවා, "දහම ඇත සැහවිලා" කියලා. ගරු සභාපතිතුමනි, එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ, සදාචාරය පිරිහිලා.

කාගම සිරිනන්ද හිමියන්ගේ බණ දේශනාවක් මට මතක් වුණා, ගරු සභාපතිතුමනි. උන්වහන්සේ ලස්සනට බණ කියනවා. පුළුවන් වෙලාවක අහන්න. ඊයේ පෙරේදා උන්වහන්සේ කියනවා, "හිර මැදිරි පිරිලා, පුනරුත්ථාපන කඳවුරු පිරිලා, ළමා නිවාස පිරිලා, මහලු නිවාස පිරිලා" කියලා. උන්වහන්සේ ඒක කියනකොට හරි ලස්සනයි. මට එහෙම කියන්න බැහැ. "වීදි දරුවෝ බෝ වෙලා, අපරාධකරුවන් බෝ වෙලා, හොරකම්, මැරකම්වලින් ගහන වෙලා, කුඩුකාරයන්ගෙන් පිරිලා" කියලාත් උන්වහන්සේ කියනවා. ඊට පස්සේ උන්වහන්සේ මේ වචන ටිකත් කියනවා. "මංමුළා වෙච්ච ලෝකයක, හිහන මට්ටමට රජයේ රජ්ජුරුවොත් වැටිලා නම් ආයිත් කවර කථාවක්ද පුතා." උන්වහන්සේයි මෙහෙම කියන්නේ. උන්වහන්සේ මම හරි ආසා කරන ස්වාමීන් වහන්සේ කෙනෙක්. මම YouTube channelsවල උන්වහන්සේගේ බණ අහනවා. අපි ධර්මානුකූලව ගිහිල්ලා තිබෙන බව පේනවාද කියලාත් උන්වහන්සේ අහනවා. අර සින්දුව මට අවසන් කරන්න තිබෙන්නේ මෙහෙමයි. "අපේ ජනපතිත් අසරණ වෙලා..."

අනේ, අපි එහෙම වෙන්න දෙන්නේ නැහැ. අපේ ශක්තියෙන් අපට දිය හැකි සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. නීතිඥ මහත්මයෙක් හැටියට; ජනාධිපති නීතිඥ මහත්මයෙක් හැටියට මමත්, විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුනුත් අනිවාර්යයෙන්ම ආණ්ඩුවට සහයෝගය ලබා දෙනවා. ඒ ගැන කිසිම සැකයක් තබා ගන්න එපා.

මට තව එක කාරණයක් විතරක් කියන්න මිනිත්තුවක් දෙන්න, ගරු සභාපතිතුමනි. ඒකත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. "විපක්ෂය වෙනස් වේ දෝ.." කියලා ඇහුවා. අපේ විපක්ෂ නායකතුමාගේ නම් අමුතුවෙන් හිත වෙනස් කරන්න අවශ්‍යතාවක්,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Kariapper, you have only two more minutes.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you, Sir, but I am going to finish my speech in one minute since everybody is hungry.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
අපි වෙනස් කරන්න දෙන්නේ නැහැ.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ඒක තමයි මම කියන්නේ, ඒ වෙනස් කථාව. ඔබතුමා ඔය කාලය ගන්න හදන්නේ. මම දන්නවා, මොකටද යන්නේ කියලා.

"විපක්ෂයේ හිත වෙනස් වී දෝ.." කියලා තමයි එතුමා ඇහුවේ. ඒ සින්දුව පොඩ්ඩක් අහන්න. ලස්සනයි. විපක්ෂ නායකතුමා කවදාවත් හිත වෙනස් කර ගන්න අවශ්‍ය පුද්ගලයෙක් නෙවෙයි. එතුමා වෙනත් සිතක් තිබෙන පුද්ගලයෙක්. ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ. මම දන්නා තරමින් පන්සිල් පද රකින එකම දේශපාලන පක්ෂ නායකයා එතුමා. ඒවාට මේ ජනතාව marks දෙන්නේ නැහැ නේ. නමුත්, මම අද කියන්නම්, මේ කාරණයත්. මේ යන ප්‍රවණතාව යටතේ සදාචාරයට ආදර්ශයක් වන නායකයන් අපේ ජනතාවට අවශ්‍ය වන අවස්ථාව දැන් උදා වී තිබෙනවා. ඒ ස්ථානය එතුමා අනිවාර්යයෙන් පුරවනවා කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි. I kept to my time limit, Sir.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Harshana Nanayakkara?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
කාගම සිරිනන්ද ස්වාමීන් වහන්සේ ඔය කථාව කිව්වේ රනිල්ගේ ආණ්ඩුව තිබෙන කාලයේ; දැන් නොවෙයි. අලුතින් post කරලා ඇති.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
නැහැ, නැහැ. උන්වහන්සේ ඒ දේශනාව පැවැත්වූයේ පාතාලයේ මේ ප්‍රශ්නයට පස්සේ, ඊයේ පෙරේදා. මම පෙන්වන්නම්. මා ළඟ ඒක තිබෙනවා. I speak with responsibility, you take my word.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Sittings is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. U.P. Abeywickrama. You have eight minutes.

[අ.භා. 1.00]

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, අද දින පවත්වනු ලබන අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී පළමුවෙන්ම මම මේ කාරණාව ඉදිරිපත් කරන්න කැමැතියි. මේ සභා ගර්භයේදී මීට පෙර කථා කළ මන්ත්‍රීවරයෙකු ප්‍රකාශ කළා, විජය කුමාරණතුංග මහතාගේ ඝාතනය පිළිබඳව. විජය කුමාරණතුංග මහතාගේ ආදරණීය බිරිඳ හැටියට චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය එක් අවස්ථාවක ප්‍රකාශ කරනවා, මේ ඝාතනය සම්බන්ධයෙන් 1995දී පත් කරන ලද කොමිෂන් සභාව ඉදිරිපත් කළ වාර්තාවෙන් හෙළිදරව් වුණා කියලා, මෙම ඝාතනයට වග කියන්න ඕනෑ, මෙම ඝාතනය පිටුපස හිටියේ, එක්සත් ජාතික පක්ෂයයි කියලා. මම දන්නේ නැහැ, අපි විශ්වාස කරන්න ඕනෑ විජය කුමාරණතුංග මහතාගේ ආදරණීය බිරිඳ කියන කථාවද, එහෙම නැත්නම් මනෝ ගනේසන් මන්ත්‍රීවරයා කියන කථාවද කියලා.

අපට -ජාතික ජන බලවේගයට- ලැබුණු ජන වරම අනුව අපි අධිකරණ ක්ෂේත්‍රය විතරක් නොවෙයි, මේ රටේ සියලු ක්ෂේත්‍ර නව පරිවර්තනයකට ලක් කිරීමේ මූලික පියවරක් හැටියට තමයි, 2025 අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන්නේ සහ ආරම්භය සනිටුහන් කරලා තිබෙන්නේ.

මෙහිදී මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මෙතෙක් කල් මේ රටේ හැම ක්ෂේත්‍රයකම ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ඒ ඒ අවස්ථාවල බලය හොබවපු පාලකයන් අත්තනෝමතික ලෙස, එහෙම නැත්නම් තමන්ට හිතුණු හිතුණු ආකාරයට කටයුතු කර තිබෙන බව.

මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ අධිකරණ 7ක් තිබෙනවා. ඒ අධිකරණ 7න්, ගම්පහ අධිකරණ සංකීර්ණය කියන්නේ අලුත්කඩේ අධිකරණ සංකීර්ණයට පසුව තිබෙන විශාලම අධිකරණ සංකීර්ණයක්. පසුගිය කාලය පුරාම ජනතාවට හොඳ සේවාවක් ලබා දීමට අවශ්‍ය පහසුකම් ඒ අධිකරණ සංකීර්ණයේ දකින්න ලැබුණේ නැහැ. ඒ අනුව සියලුම අධිකරණවල පවතින අඩුපාඩු නිවැරදි කරලා හැම කෙනෙකුටම සමප්‍රවේශී අධිකරණයක් පිහිටුවන්නත්, නීතියේ පාලනය මත ක්‍රියාත්මක වෙන රටක් බවට මේ රට පත් කරන්නත් කටයුතු කරන්න ඕනෑ. හැම කෙනෙකුටම යුක්තිය හා සාධාරණත්වය සමානව ලබා ගන්න පුළුවන් අවස්ථාවක් නිර්මාණය කිරීම තමයි අපේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් පදනම වෙලා තිබෙන්නේ.

අවුරුදු 5කට වැඩි කාලයක් තිස්සේ පූගොඩ අධිකරණය පවත්වාගෙන යන්නේ අධිකරණයක් පවත්වාගෙන යාමට සුදුසු ස්ථානයක -පරිශ්‍රයක- නොවෙයි. එය නීතිඥවරුන්ට වාගේම විනිශ්චයකාරතුමන්ලාටත් කටයුතු කිරීමට අපහසු, අධිකරණයට පැමිණෙන ජනතාවටත් ඉතාම දුෂ්කර ස්ථානයක්. ඒ නිසා අපි මෙවර අය වැය මඟින් පූගොඩ අධිකරණයේ කටයුතු ඉතා ඉක්මනින් අවසන් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. පසුගිය කාලයේ ඒ අධිකරණ පරිශ්‍රයේ කටයුතු අඩපණ වෙලා තිබුණා. දැන් ඒ කටයුතු නැවත සක්‍රිය කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, ඒ කාලයේ අධිකරණ කලාප පිහිටුවීමේදී හෝ පොලිස් ස්ථාන පිහිටුවීමේදී හෝ -ඒ හැම කටයුත්තකදීම- විද්‍යාත්මක පදනමක් මත නොවෙයි කටයුතු කළේ කියලා. ඒ ප්‍රදේශයේ දේශපාලනඥයන්ට, එහෙම නැත්නම් බලවත් දේශපාලනඥයෙකුට අවශ්‍ය නම් ඔහුගේ කලාපය තුළ පොලීසියක් ස්ථාපිත කළා; ඔහුගේ කලාපය තුළ අධිකරණයක් ස්ථාපිත කළා. ඒවාට කිසිම විද්‍යාත්මක පදනමක් තිබුණේ නැහැ. ඒ වාගේම තමයි නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදීත් ඒ ඒ අවස්ථාවල හිටපු අධිකරණ අමාත්‍යවරුන්ගේ, එහෙම නැත්නම් එක එක පුද්ගලයන්ගේ අභිමතයට තමයි ඒ කටයුතු සිද්ධ වුණේ.

විශේෂයෙන්ම මට මතකයි, එදා 2024 අංක 43 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත ගෙනාවා. ඒ සංශෝධනයෙන් චිත්තිකරුවන් පදිංචි ප්‍රදේශයේ නඩු පැවරීමට තිබුණු අවස්ථාව පුළුල් කරනු ලැබුවා වාගේම පැමිණිලිකරුවන් පදිංචි ප්‍රදේශයේ නඩු පැවරීමටත් අවස්ථාව ලබා දුන්නා. නමුත් පසුකාලීනව අපි දැක්කා, විශාල ව්‍යාකූලතා මතු කිරීමට ඒ වාගේ කාරණා හේතු වුණු බව. ඒ නිසා තමයි ආණ්ඩුවක් හැටියටත්, විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ අපේ මූලධර්මවල හැටියටත් අපි පිළිගන්නේ, සාධාරණව, සමානව නීතියේ රැකවරණය, විනිවිදභාවය, කාර්යක්ෂමතාව, ස්වාධීනත්වය හා

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

ජනතා විශ්වාසය මත පදනම්ව අධිකරණ ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න ඕනෑ, නව පරිවර්තනයකට ලක් කරන්න ඕනෑ කියලා. ඒ අනුව තමයි නීති විශේෂඥයන්ගෙන් යුක්ත කමිටුවක් පත් කරලා ක්ෂේත්‍රයට අවශ්‍ය විශේෂ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙන්නේ. අපි දන්නවා, නූතන ලෝකයට ගැළපෙන, නූතන තත්ත්වයට ගැළපෙන, ඒ වාගේම අපේ රටේ සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වයන්ට ගැළපෙන ආකාරයට මේ නීති ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු බව. ඒ වාගේම නව ලෝකයට ගැළපෙන, නූතන ආර්ථික, සමාජ, දේශපාලන තත්ත්වයන්ට ගැළපෙන ආකාරයට ඒ පරිවර්තන, ප්‍රතිසංස්කරණ සිද්ධ කළ යුතුයි.

අධිකරණ ක්‍රියාවලියට නවීන තාක්ෂණය හඳුන්වා දීමට පියවර ගැනීම, ඒ වාගේම සුහුරු අධිකරණ ශාලා - smart courthouses - පිහිටුවීම, විශේෂයෙන්ම අධිකරණයේ කටයුතුවලදී ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ සහාය සඳහා පර්යේෂණ නිලධාරීන් ලබා දීම වැනි කටයුතු සඳහා අපි යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම ඔබ දන්නවා, සමථකරණය සඳහා සහ ජාත්‍යන්තර බේරුම්කරණය සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීමටත් අපි කටයුතු කරන බව. ඒ වාගේම අපරාධ නීතිය හා බැඳුණු නඩු භාණ්ඩ මේ වෙනකොට අධිකරණ පරිශ්‍රවල විශාල වශයෙන් ගොඩ ගැහිලා තිබෙන නිසා එම ස්ථානවල ඉතාම අනාරක්ෂිත තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා වාගේම, ඒ තැන්වලට ඒ සඳහා පහසුකම් නැති තත්ත්වයකුත් දකින්න තිබෙනවා. එම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ කථා බහ කරලා ඒවාට අවශ්‍ය පිළියම් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ රඳවා තබා තිබෙන නඩු භාණ්ඩවලින් අනවශ්‍ය නඩු භාණ්ඩ මුදා හරින්නත්, ඉදිරි නඩුවලට අවශ්‍ය නඩු භාණ්ඩ පමණක් අධිකරණ පරිශ්‍රය තුළ රඳවා තබා ගන්නත් ඒ අනුව කටයුතු කරනවා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Member, you have exhausted your allotted time. You may please conclude.

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි යූ.පී. අපේවික්‍රම)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
Give me one more minute, please.

ඇප නීතියේ හා ඇප දීමේ ක්‍රියාවලියේ ඇති ගැටලු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත්, ප්‍රතිසංස්කරණ සිදු කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ රටේ පොදු මහ ජනතාවට නීතිමය කටයුතු සඳහා අවශ්‍ය සේවා ලබා ගැනීමේදී ඉතා අධික මිලක් ගෙවන්න සිද්ධවෙලා තිබෙන බවත් අපි දන්නවා. මේ හැම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ම මහ ජනතාවට සම්ප්‍රවේශී තත්ත්වයක් ලබා දෙන්නත්, ඒ වාගේම නීති ක්ෂේත්‍රය තුළ සමාන අවස්ථා ලබා දීමටත් අපේ ආණ්ඩුව ඉදිරියේදී කටයුතු කරන්න අපේක්ෂා කරන බවත් මා ප්‍රකාශ කරනවා. 2025 වසරට අදාළව අපි ඉදිරිපත් කර තිබෙන මෙම අය වැය ඒ සඳහා වන ප්‍රවේශයක් පමණයි. ඉදිරි වසරවලදී මේ තත්ත්වය වඩා හොඳින් අධ්‍යයනය කරලා, වඩා හොඳ ප්‍රතිකර්ම යෙදීමට අවස්ථාව ලැබෙයි කියා අපි බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. කාලය ලබා දුන්නාට ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
The Hon. (Dr.) Elayathamby Srinath. You have eight minutes.

[ප.ව. 1.10]

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) ඉළෙයතම්පි සිරිනාත්)
(The Hon. (Dr.) Elayathamby Srinath)
කෞරව තවිසාළර් අවර්කළේ, සුතන්ත්‍රිර ඉලංකෙයින් එළුපත්තු ඔන්පතාවතු වරවු සෙලවුත්තිට්ටත්තිල්, නීති මර්‍රුම් තේසිය ඔරුමෙප්පාට්ටු අමෛච්චින් මීතාන විවාතත්තිලේ කලන්තුකොළ්වතිල් මකිළ්චියටෙකින්රේන්. ඉතිල් චට්ටම්, ඔළුඞ්කු තුරෛක්කු 80.2 පිල්ලියන් රූපාය් නිතියුම්, නීතිත්තුරෛක්කු 16.1 පිල්ලියන් රූපාය් නිතියුම් ඔතුක්කීටු චෙය්යප්පට්ටුළ්ළතු. අතුපෝන්රු පල්වේරුපට්ට අපිවිරුත්තිච් චෙයර්පාටුකළුක්කුම් නිති ඔතුක්කීටුකළ් ඉටම්පෙර්රිරුක්කින්ර නිලෙයිල්, නාන් පිරතිනිතිත්තුවප් පටුත්තුකින්ර මට්ටක්කළප්පු මාවට්ටම් චම්පන්තමාකවුම් පල්වේරු අපිවිරුත්තිත් තිට්ටඞ්කළෛ මුන්නෙටුක්ක වේණ්ටිය තේවෛයිරුප්පතෛ නාන් ඉඞ්කු චුට්ටික්කාට්ට විරුම්පුකිරේන්.

මට්ටක්කළප්පු මාවට්ටත්තිල්, මට්ටක්කළප්පු මාවට්ට නීතිමන්රමුම්, කළුවාඤ්චික්කුටි, වාළෛච්චේනෛ, ඒරාවූර් පෝන්ර ඉටඞ්කළිලේ Magistrate's Court - නීතවාන් නීතිමන්රඞ්කළුම් ඉයඞ්කි වරුකින්රන. ඉවර්රිල් මට්ටක්කළප්පු මාවට්ට නීතිමන්රම්, කළුවාඤ්චික්කුටි Magistrate's Court ආකියවර්රුක්කු මට්ටුමේ නිලෙයාන කට්ටිටඞ්කළ් ඉරුක්කින්රන. වාළෛච්චේනෛ නීතිමන්රම් තර්කාලිකක් කට්ටිටත්තිල් ඉයඞ්කි වරුවතාල්, අතර්කුප් පුතිය කට්ටිටම් අමෛප්පතර්කාන වේලෛත්තිට්ටඞ්කළ් ආරම්පික්කප් පට්ටපෝතුම් අතු මන්තකතියිල් නටෛපෙර්රුක් කොණ්ටිරුක්කිරතු. අන්ත විටයත්තෛ නීති අමෛච්චර් තනතු කවනත්තිල් එටුත්තු, මික විරෛවාක අක්කට්ටිටත්තෛක් කට්ටිමුටිත්තු නීතිමන්රත් තොළිර්පාටුකළෛ ආරම්පික්ක නටවටික්කෛ එටුක්කවේණ්ටිය තේවෛයිරුක්කිරතු.

අතුපෝල්, ඒරාවූර් නීතිමන්රමානතු, 20 වරුටඞ්කළ් පළමෛයාන මිකච් චිරිය කට්ටිටත්තිල් ඉයඞ්කික් කොණ්ටිරුක් කින්රතු. අඞ්කු චාන්රුප් පොරුට්කළෛ වෛප්පතර්කුක්කූට ඉටවචති ඉල්ලාත නිලෙයිල්, අරුකිලුළ්ළ කෝවිල් වළාකත්තිල් අවෛ වෛක්කප්පටුකින්රන. නීතිමන්රච් චෙයර්පාටුකළුම් ඔරු නෙරුක්කටියාන නිලෙයිල් ඉටම්පෙර්රු වරුකිරතු. එනවේ, එතිර්කාලත්තිල් අන්ත නීතිමන්රක් කට්ටිටත්තුක්කු උරිය කාණි ඔතුක්කප්පට්ටු, පුතිය නීතිමන්ර වළාකම් අමෛක්කප්පට වේණ්ටිය තේවෛ ඉරුක්කිරතු.

මේලුම්, වාකරෛප් පිරතේචත්තිල් නිලෙයාන නීතිමන්ර මොන්රු ඉල්ලෛ. ඔරු චුර්රුලා නීතිමන්රමානතු මාතත්තින් මුතලාම්, මූන්රාම් පුතන්කිළමෛකළිල් ඉයඞ්කිවරුකිරතු. අතු පාතුකාප්පර්ර ඔරු කට්ටිටත්තිල් තර්කාලිකමාක ඉයඞ්කි වරුවතුටන්, අන්තක් කට්ටිටත්තිල් චිතෛවුකළුම් ඒර්පට්ටිරුප් පතෛක් කාණක්කූටියතාක ඉරුක්කිරතු. අඞ්කු කුටිනීර් මර්‍රුම් මලචලකූට වතිකළ් ඉල්ලෛ එන්පතුටන්, නීතිපතිකළ්කූට කුටිප්පතර්කුත් තණ්ණීරෛක් කොණ්ටුචෙල්ල වේණ්ටිය නිලෛ ඉරුක්කිරතු. ඉන්ත නිලෛමෛකළ් මාර්රියමෛක්කප්පට වේණ්ටිය තේවෛ ඉරුක්කින්රතු.

மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தளவில், அதுவொரு பாரிய நிலப் பிரதேசமாக இருப்பதனால், தூரப்பிரதேசங்களில் இருந்து வருகின்ற மக்களுக்கான சேவைகளை வழங்குவதற்கு ஏற்றவகையில், நீதி அமைச்சர் அவர்கள் இந்த விடயங்களைக் கவனத்திற்கொண்டு உரிய நடவடிக்கை எடுக்க வேண்டும்.

அதற்கப்பால், அங்கு ஆளணிப் பற்றாக்குறை மிகப் பாரியளவில் இருக்கிறது. மட்டக்களப்பு மாவட்ட நீதிமன்றப் பதிவாளர் ஓய்வுபெற்றுச் செல்ல இருக்கிறார்.. இன்னுமொரு மாவட்ட நீதிமன்றத்தில் பதிவாளர் இல்லை. வாழைச்சேனை, ஏறாவூர் நீதிமன்றங்களில் பதிவாளர்கள் தற்காலிக அடிப்படையில் கடமையாற்றிக் கொண்டிருக்கின்றார்கள். தேவையான ஆளணி வளம் இல்லாமல் நீதிமன்றச் செயற்பாடுகளைக் கிரமமாக முன்னெடுப்பது பாரிய பிரச்சினையாக இருக்கின்றது. இதனால் அந்த மக்கள் அவதிக்குள்ளாக வேண்டியிருக்கின்றது. கௌரவ நீதி அமைச்சர் அவர்கள் இந்த வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் வாசிப்பின்மீதான விவாதத்தின்போது, நீதிமன்றக் கட்டட நிர்மாணப் பணிகள் மற்றும் ஆளணிப் பற்றாக் குறையை நிவர்த்தி செய்வதற்கான நடவடிக்கைகளை எடுப்பதாகக் குறிப்பிட்டிருந்தார். இதில் மட்டக்களப்பு மாவட்டத்தையும் கருத்திற்கொண்டு அதற்கான செயற் பாடுகளை முன்னெடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். கடந்தமுறை எமது மாவட்ட அபிவிருத்திக் கூட்டத்திலும் இது சம்பந்தமாக அமைச்சரிடம் உரையாடி யிருந்தோம்.

அடுத்து, மட்டக்களப்பு சிறைச்சாலையில் பாரிய இட நெருக்கடியான சூழ்நிலை காணப்படுகின்றது. அங்கு 300 சிறைக்கைதிகள் இருக்கக்கூடிய இடத்தில் 700க்கும் மேற்பட்டவர்கள் இருக்கின்றார்கள். கழிவு முகாமைத்துவ விடயத்திலும் பாரிய பிரச்சினை காணப்படுகின்றது. அங்கிருந்து கழிவு நீர் வாவிக்குள் விடப்படுகின்றது. கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயம் தொடர்பில் நடவடிக்கை எடுப்பதாக உறுதியாகக் கூறியிருந்தாலும், நீண்டகால அடிப்படையில் அந்த இடத்தை மாற்றியமைத்துத் தரவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். மாநகர எல்லைக்குள் அதற்கென 15 ஏக்கர் காணி ஒதுக்கப்பட்டு இருக்கின்றது. அதன் அருகில் மட்டக்களப்பு போதனா வைத்தியசாலையும் இருக்கின்றது. இந்த விடயத்தைக் கருத்திற்கொண்டு எதிர்காலத்தில் அதற்கான நடவடிக்கையை முன்னெடுக்க வேண்டிய தேவை இருக்கின்றது. அதனோடு இணைந்ததாக, "சிறைக்கைதிகளும் மனிதர்கள்" என்ற அடிப்படையில் தேவையான சிறைச்சாலை உத்தியோகத்தர் களை உள்வாங்கி, அவர்களுக்குரிய அடிப்படைக் கட்டமைப்பு வசதிகளை ஏற்படுத்திக் கொடுக்க நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

இதற்கு அப்பால், கடந்த வாரம் வாகரைப் பிரதேசத்தில் நடந்த முக்கியமான ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். வாகரைப் பிரதேசத்தில் மக்கள் சேனைப் பயிர் செய்திருந்த பிரதேசங்களுக்குள் வன இலாகாவினர் சென்று - அது அவர்களுடைய எல்லைக்குட்பட்ட பிரதேசங்களாகக் குறிப்பிடப்பட்டிருந்தாலும் - மக்களின் குடிசைகளை எரித்து, சொத்துக்களை அழித்து, மனிதாபிமானமற்ற முறையில் மிக மூர்க்கத்தனமாக நடந்திருக்கின்றார்கள். அத்தோடு, அவர்களிடமிருந்து சோளம், தேன், கடலை போன்றவற்றையும் கைப்பற்றிச் சென்றிருக்கின்றார்கள். இது சம்பந்தமாக நியாயம் கேட்கச் சென்றவர்கள் ஆயுத முனையிலே மிரட்டப் பட்டிருந்தார்கள். அடுத்த நாள் இந்த விடயம் தொடர்பில் பொலிசில் முறைப்பாடு செய்யப்பட்டிருக்கின்றது; நாம் பிரதேச செயலாளருக்கும் அறிவித்திருந்தோம். அது சம்பந்தமான கூட்டமொன்றும் அங்கு நடைபெற்றிருக்கின்றது. ஆகவே, வன இலாகா அதிகாரிகள் சட்டத்தைத் தங்கள் கையில் எடுத்துக்கொண்டு காட்டுமிராண்டித்தனமாக நடந்து கொண்டது தொடர்பில் முறையான விசாரணை நடத்தப்பட்டு, அந்த அதிகாரிகள் தண்டிக்கப்பட வேண்டுமென்றும் அநீதி இழைக்கப்பட்ட அந்த மக்களுக்கு நீதி வழங்கப்பட வேண்டுமென்றும் நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகிறேன்.

மாண்புமிகு ஜனாதிபதி அவர்கள்கூட விவசாய உற்பத்தியைப் பெருக்குவதற்காக, கையகப்படுத்தப்பட்ட காணிகளை மக்களிடம் கொடுப்பது சம்பந்தமாக வரவு செலவுத்திட்டத்தின்போது உரையாற்றியிருந்தார். இங்கே சோள உற்பத்தி போதியளவு இல்லையென்று கடந்த கூட்டத்தில்கூட விவாதிக்கப்பட்டது. இவ்வாறான நிலைமையில், தங்கள் வாழ்வாதாரத்திற்காகப் பயிர்ச் செய்கையில் ஈடுபடுகின்ற மக்கள் அதிகாரிகளினால் மிக மோசமாக, மனிதாபிமானமற்ற முறையிலே நடத்தப்பட்ட விடயத்தை நீதியான முறையில் அணுக வேண்டும்.

அடுத்து, தேசிய ஒருமைப்பாடு என்ற அடிப்படையில், எமது தமிழ் பேசும் இனத்துக்கு யுத்த காலத்தில் ஏற்பட்ட அநீதிகளுக்காக ஒரு நீதிப் பொறிமுறைமையின் ஊடாக நியாயத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும். வலிந்து காணாமல் ஆக்கப்பட்டோர் மற்றும் அரசியல் கைதிகள் தொடர்பில் உரிய நீதி விசாரணை மேற்கொள்ளப்பட வேண்டும். இவ்வாறான விடயங்களைச் செய்வதன்மூலம் தமிழ்ச் சமூகத்தையும் இந்த நாட்டின் அபிவிருத்தியில் இணைத்துக்கொள்ள முடியும். வடக்கு, கிழக்கிலுள்ள தமிழ் பேசும் சமூகத்துக்கு ஓர் அதிகாரப் பகிர்வினை வழங்கி, தேசிய ரீதியில் நீதியான அரசியல் உரிமைகளையும் பொருளாதார உரிமைகளையும் கொடுப்பதன்மூலம் இந்த நாட்டின் அபிவிருத்தி நடவடிக்கையில் அவர்களையும் இணைத்துக் கொள்வதனூடாகவே எதிர்காலத்திலே ஒரு சுபிட்சமான நாட்டைக் கட்டியெழுப்ப முடியும்.

தேசிய ஒருமைப்பாடு என்ற விடயத்தில், சக பாராளுமன்ற உறுப்பினர் கூறியதுபோன்று, மொழி அமுலாக்கல் சம்பந்தமாகவும் மிகக் கூடிய கவனம் செலுத்த வேண்டிய தேவை இருக்கின்றது. தற்போது பல்வேறு திணைக்களங்களாலும் வெளியிடப்படுகின்ற Circulars சிங்கள மொழியில் மட்டுமே இருப்பதாகப் பல இடங்களிலிருந்து எங்களுக்கு முறைப்பாடுகள் கிடைக்கின்றன. தமிழ் மொழியும் அரசகருமமொழி என்ற வகையில் அந்தந்தத் திணைக்களங்களில் அல்லது அமைச்சுக்களில் இருக்கின்ற அதிகாரிகள் இந்த விடயத்தில் கவனமெடுத்து, அதன் அமுலாக்கத்தைக் கைக்கொள்ள வேண்டுமென்று மிக விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, ஆட்சேர்ப்பு நடவடிக்கைகளில் பாரபட்சம் இடம்பெறுகின்றது. அண்மையில் பொலிஸ் ASP பதவிக்காக 262 பேர் உள்வாங்கப்பட்டிருக்கின்றார்கள். ஆனால், அதில் ஒரு தமிழர்கூட உள்வாங்கப்படவில்லை என்பது பாரிய பிரச்சினையாக உள்ளது. அது merit order முறையில் செய்யப்பட்டாலும்கூட, தகைமையான தமிழ்ப் பொலிஸ் அதிகாரி ஒருவர்கூட இல்லையா? என்ற சந்தேகம் எழுகின்றது. ஆகவே, எதிர்காலத்தில் தேசிய ஒருமைப்பாட்டைப் பேணும்வகையிலும் நீதி நிலைநாட்டப்படும் வகையிலும் இவ்வாறான விடயங்களில் அரசு மிகக் கவனமாகவும் பொறுப்புடனும் செயற்பட வேண்டுமென்று விநயமாகக் கேட்டுக்கொண்டு, எனது உரையை முடித்துக் கொள்கிறேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have eight minutes.

[අ.භා. 1.10]

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු සභාපතිතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරන අද දවසේ මම කැමැතියි ගොඩක් විට අපට මඟ හැරෙන කණ්ඩායමක්, අපි කථා නොකරන කණ්ඩායමක් ගැන ඔබේ අවධානය යොමු කරවන්න.

මම පටන් ගන්නම් මෙන්න මෙහෙම. කැමරූන් ජාතික දේශපාලන දාර්ශනිකයෙකු වන Achille Mbembe කියනවා, මේ necropolitics කියන සංකල්පය ගැන. Necropolitics කියන්නේ, සරලව සිංහලෙන් ගත්තොත්, "මරණයේ දේශපාලනය" කියන එක. සරලව කිව්වොත්, ජීවත් වෙන්නේ කවුද, මැරෙන්නේ කවුද කියන එක තවදුරටත් තීරණය කරන්නේ අපි නොවෙයි රාජ්‍යය විසින්.

ශ්‍රී ලංකාව රටක් විධියට යටත් විජිතයක්ව සිටි කාලයේ ඒ පාලකයින් විසින් necropolitics සංකල්පය manage කළා, මරණ දේශපාලනය ගෙන ගියා. ඊටපස්සේ පාලනයට ආව පාලක පන්තිය, නිදහසින් පස්සේ ආපු ප්‍රභූ පාලක පන්තිය විසින් මරණ දේශපාලනය අරගෙන ගියා. ඉන්පසුව ආගමික සහ වාර්ගික අන්තවාදයන් විසින් යම් යම් කණ්ඩායම් ජීවත් විය යුතු කණ්ඩායම් නොවන බවට හංවඩු ගැහුවා. ඊට පස්සේ අපට එනවා නව ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ. ග්‍රම සූරා කෑම සහ වැඩකරන පන්තියේ ජනතාව මිය යා යුතුයි කියන තැන ඒ අය සිටියා. අපි කියනවා, livable life and grievable death කියලා. ජීවත් වෙන්න සුදුසු ජීවිතද මිනිසුන් ගත කරන්නේ? ඒ මිනිසුන් මැරුණාම කවුරුත් වැලපෙනවාද? මම හිතන විධියට මෙන්න මේක තමයි අපේ අය වැයේ ප්‍රතිපත්තියක් හැටියට, සම්පූර්ණයෙන් සංඛ්‍යා දත්තවලට එහා ගිය තර්කනය එහෙම නැත්නම් - මම ඒකට කියන්නේ, rationale එක කියලා - rationale එක වන්නේ. මෙන්න මේ මරණ දේශපාලනය විසින් බැහැර කරන ලද, මිය යා යුතුයි, තවදුරටත් සමාජයේ කණ්ඩායම් නොවිය යුතුයි කියලා කියන කණ්ඩායම් ඇතුළත් කර ගැනීමේ තර්කනය තමයි අපේ අය වැය පුරාම තිබෙන්නේ.

ලංකාවේ බන්ධනාගාර ගැන මම කථා කරන්නේ අන්න ඒ තැන ඉඳගෙන. ලංකාවේ බන්ධනාගාර ගැන කථා කරන්න කලින් මම දත්ත කිහිපයක් කියන්නම්. ලංකාවේ බන්ධනාගාර සහ ඒ ආශ්‍රිත ආයතන 60ක් තිබෙනවා, වරදකරුවන් රඳවා තබන ආවරණීය සිර මැදිරි 4ක්, රිමාන්ඩ් බන්ධනාගාර 18ක්, වැඩ කඳවුරු 16ක්, එළිමහන් සිර කඳවුරු 2ක්, තරුණ රැඳවියන් සඳහා වන විශෝධන මධ්‍යස්ථාන 2ක්, පුහුණු මධ්‍යස්ථාන 1ක් සහ අනෙකුත් සැකකරුවන් රඳවා තබන lock-ups 23ක් විධියට.

2025 පෙබරවාරි 27වෙනි දා ලබා ගත් දත්ත අනුව රිමාන්ඩ් රැඳවියන් ඉන්නවා 20,307ක්, දඬුවම් ලැබූ - convicted - prisonersලා ඉන්නවා 9,158ක්. ඒ අනුව මුළු සංඛ්‍යාව 29,465ක්. ගරු සභාපතිතුමනි, අමතක කරන්න එපා මව්වරුන් සමඟ සිටින පුංචි දරුවෝ 47ක් මේ අතර සිටින බව. ඒ අතරින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට 14,640ක් සිරගත වෙලා ඉන්නවා. ඒ විතරක් නොවෙයි. එයින් සියයට 62ක් වයස අවුරුදු 40ට අඩු, වැඩ කරන්න පුළුවන් තරුණ පිරිස.

ඒ වාගේම අපි මතක තියා ගන්න ඕනෑ කාරණය තමයි, වරදකරුවන් වූ රැඳවියන්ගෙන් සියයට 92ක්ම අපොස සාමාන්‍ය පෙළ හෝ ඊට අඩු අධ්‍යාපනයක් ලැබූ අය. මේ රැඳවියන් ලෙස අපි හඳුනා ගන්නා කණ්ඩායමේ සමාජ පන්තිය ගැන වැදගත් පණිවුඩයක් ඒකෙන් අපට කියනවා.

අපි මේ සැරේ මේ අය වැය හරහා මොකක්ද කරන්න යන්නේ? අපි පක්ෂයක් හැටියට මැතිවරණයට කලින් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 208 සහ 209 පිටුවල කියනවා, බන්ධනාගාර සම්බන්ධව අපේ පැහැදිලි අදහස, ප්‍රතිපත්තිය. ඒකේ මාතෘකාව තමයි, "මනුෂ්‍යත්ව පාදක බන්ධනාගාරයක් - යුක්තිගරුක රැඳවුම් දිවියක්" කියන එක.

මම කරුණු තුනක් යටතේ කථා කරන්න කැමැතියි, මට ලැබී ඇති සීමිත කාලය තුළ. මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමාත් කිව්වා බන්ධනාගාර පද්ධතියට ඔරොත්තු නොදෙන තරම් වන අධික රැඳවියන් සංඛ්‍යාවක් ඉන්නවා කියලා. අපේ capacity එක තිබෙන්නේ 10,395දෙනෙකු සඳහා පමණයි. නමුත් 29,000ක් ඉන්නවා. එය සියයට 275ක ප්‍රමාණයක වැඩි රඳවා තැබීමක්. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිය සහ අපේ වැඩ පිළිවෙළට පාදක වෙන්නේ, සිරකරුවන්ට සැලකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන් - ඒවාට අපි Nelson Mandela Rules කියලා කියනවා - අනුව වර්ගීකරණය කර රඳවා තැබීම.

මෙවර අය වැයෙන් පල්ලෙකැලේ බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීමට රුපියල් බිලියන 0.9ක්, ඒ වාගේම බස්නාහිර පළාතේ බන්ධනාගාර ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් බිලියන 0.22ක්, බන්ධනාගාර මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීමට රුපියල් බිලියන 0.1ක් සහ බන්ධනාගාර රැඳවියන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට රුපියල් බිලියන 0.4ක් වෙන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒකත් එක්කම මම තවත් කාරණයක් මතක් කරන්න කැමැතියි. අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධන පනත් කෙටුම්පත අපි දැනට ගැසට් කරන්න යොමු කරලා තිබෙනවා. විශේෂයෙන්ම එය බන්ධනාගාර රැඳවියන්ගේ ආරක්ෂාව සඳහා ගෙනාපු සංශෝධනයක්. ඒ කියන්නේ, බන්ධනාගාරයට භෞතිකව පැමිණෙන්නේ නැතුව ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධ්‍යයෙන් සාක්ෂි දෙන්න රැඳවියන්ට අවස්ථාව ලබා දෙනවා. විශේෂයෙන්ම එය රැඳවියන්ගේ ආරක්ෂාව සඳහා අරගෙන තිබෙන තීරණයක්.

ඒ වාගේම සුළු වැරදි සහ දඩ මුදල් නොගෙවීම නිසා බන්ධනාගාරගතව සිටින තැනැත්තන් ප්‍රමාණය අඩු කරන්න ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියකට යොමු කිරීම සඳහා මේ අවුරුද්දේ ප්‍රජා පාදන විශෝධන දෙපාර්තමේන්තුවට නියෝගලාභීන් 1,000ක් අලුතින් බඳවා ගන්න අපි යෝජනා කරනවා. ඒ වාගේම, බන්ධනාගාරයේ පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය කියලා එකක් තිබෙනවා. කවුරුත් නොදන්නවා වුණාට එය බන්ධනාගාරය සතු සම්පතක්. මම කොළඹ විශ්වවිද්‍යාලයේ වැඩ කරපු 2012 සහ 2013 කාලයේ එම ආයතනයත් එක්ක එකතුවෙලා කරපු පර්යේෂණවලදී, මේ පුනරුත්ථාපනය කියන එක මෙච්චර කාලයකට අසාර්ථක වෙලා තිබෙන්නේ කොහොමද කියලා විශේෂ පර්යේෂණ දෙකක් කරලා තිබෙනවා. මේක දිගින් දිගටම කථා කරපු මාතෘකාවක්. බන්ධනාගාර රැඳවියන්ට හොඳ වෘත්තීය පුහුණුවක් ලබා දෙන්න අපි මෙවර රුපියල් මිලියන 100ක් වැඩි කර තිබෙනවා.

බන්ධනාගාර කාර්ය මණ්ඩලය පිළිබඳව තමයි මම දෙවැනි කාරණය විධියට කථා කරන්නේ. අපි දන්නවා, මේකත් හරිම බරපතළ ප්‍රශ්නයක් බව.

බන්ධනාගාර කාර්ය මණ්ඩලයට තිබෙන්නේ, සීමිත දීමනා සහ පඩි නඩි. නිලධාරින්ගේ පඩි නඩි සහ දීමනා සඳහා රුපියල් බිලියන 6.92ක්, ආහාර සහ නිල ඇඳුම් සඳහා රුපියල් බිලියන 6.5ක් වෙන් කරලා තිබෙනවා. 2025 ජනවාරි මාසයේදී බන්ධනාගාර නිලධාරින් 142ක් අලුතින් බඳවා ගෙන තිබෙනවා. තවත් 205ක් මේ වර්ෂයේදී බඳවා ගැනීමට අපේක්ෂා කරනවා.

ඒ වාගේම වැදගත්ම කාරණය මෙයයි. අපි දේශපාලන මැදිහත් වීමකින් තොරව බන්ධනාගාර නිලධාරින්ට ස්වාධීනව වැඩ කරන්න පුළුවන් ඉඩක් හදලා තිබෙනවා. ඒ වාගේම මානව හිමිකම් පාදක කරගත් බන්ධනාගාර පරිපාලනයක් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හදාගෙන යනවා. කාලය නොමැති නිසා මේ කාරණා ටික මම ඉතා ඉක්මනින් කියන්නම්.

අපි විශේෂ තීරණයක් අරගෙන තිබෙනවා. වුදිත ළමුන් බන්ධනාගාරවල ඉඳලා උසාවිය දක්වා ප්‍රවාහනය කරද්දී මෙච්චර කල් තිබුණේ වැඩිහිටියන් සමඟ ප්‍රවාහනය කරන ක්‍රමයක්. ඒ සඳහා අලුත් වාහන ගන්න රුපියල් මිලියන 250ක් වෙන් කරලා තිබෙනවා. පරිවාස - පුනරුත්ථාපන ආයතනවල, සහතිකලත් පාසල්වල, රිමාන්ඩ් භාරයේ සහ ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින ළමුන් වෙනුවෙන් රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ දරුවන් සහ යෞවනයන් එළියට එනකොට ඔවුන්ට රුපියල් මිලියනයක නිවාස ආධාරයක් ලබා දීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට NVQ Level 3 or 4 මට්ටමේ කුසලතා පුහුණුව ලබා දෙන්න අලුත් වැඩසටහන් ඇතුළුව වැඩසටහන් 205ක් යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම නැවත සමාජගත වීම පිළිබඳ අපි පැහැදිලි ප්‍රතිපත්තියක් ඒ කියන්නේ, ඒ දරුවන්ට නැවත රැකියා හොයා ගන්නේ කොහොමද, ඒගොල්ලන්ගේ පාසල් අධ්‍යාපනය බිඳ වැටිලා නම් ඒ වෙනුවට යොමු කරන්න පුළුවන් අධ්‍යාපන මාර්ග මොනවාද කියන එක ගැන ඉතා හොඳ සැලැසුමක් සහ වැඩ පිළිවෙළක් අපි මේ වන කොට සකස් කරමින් යනවා.

ගරු සභාපතිතුමනි, මෙච්චර කාලයක් සමාජයෙන් කොන් වෙලා, සමාජයේ ජීවත් නොවිය යුතු, සමාජයේ පිළිගැනීමකට ලක් නොවුණු පිරිසක් වුණු -තාප්පයේ විතරක් "සිරකරුවෝද මනුෂ්‍යයෝ ය" කියන එක ගහගෙන හිටියාට- ඒ රැඳවියන් හොඳ පුරවැසියන් ලෙස පුනරුත්ථාපනය කර එළියට ගන්න ක්‍රමයක් හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ වෙනුවට බන්ධනාගාර ක්‍රියාත්මක වුණේ, අපරාධවලට තවත් උඩගෙඩි දෙන, අපරාධවලට උදව් කරන ස්ථානයක් ලෙස. ඒ සඳහා දේශපාලනය හේතු වුණා. ඇත්තටම කිව්වොත් ඒක සම්පූර්ණයෙන්ම දේශපාලන සංස්කෘතිය අනුව තමයි තීරණය වෙලා තිබුණේ. ඒ වෙනුවට අපි බන්ධනාගාර නිලධාරින්ටත් හොඳ යහපත් මානසිකත්වයෙන් නිදහසේ වැඩ කරන්න පුළුවන් අවස්ථාවක් හදලා දෙන ගමන්ම බන්ධනාගාරවල ඉන්න රැඳවියන් හුදු අපරාධකරුවන් නොවේ යැයි සලකා, ඔවුන් නැවත පුනරුත්ථාපනය වී සමාජයට වැඩදායක කරගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ඒ ප්‍රතිපත්ති වෙනුවෙන් අය වැයේ ඒ වෙන් කිරීම් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. අපරාධවලට මූල හේතුව වන සමාජ අසාධාරණත්වය නැති කරන, විශේෂයෙන් ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන අය වැයක් අපි ගෙනැල්ලා තිබෙන්නේ, මෙන්න මේ මූල හේතුවට ආමන්ත්‍රණය කරන්න. අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ කවදාහරි රට සංවර්ධනයට යනකොට බන්ධනාගාර තව වැඩි වෙන්න ඕනෑ කියලා. ඒ වෙනුවට විය යුත්තේ අපරාධ අඩු කරලා, බන්ධනාගාර ප්‍රමාණය අඩු කරලා, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියන එක හරහා අපරාධවලට මූල හේතුව වෙලා තිබෙන ප්‍රශ්නයට ආමන්ත්‍රණය කරන එක. ඒ නිසා මම නැවතත් මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, අය වැයෙහි තිබෙන හුදු සංඛ්‍යා දත්තවලට එහා ගිහින්, අය වැයේ තිබෙන rationale එක -අය වැය පිටිපස්සේ තිබෙන තර්කය- ගැන අවධානය යොමු කරන්න කියලා. බොහොම ස්තුතියි, මට කාලය ලබා දීම සම්බන්ධයෙන්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Anuradha Jayaratne. You have nine minutes.

[අ.භා. 1.30]

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා වෙන වෙලාවේදී කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව.

විශේෂයෙන් පසුගිය 2022 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ ඉඳලා අධිකරණ විෂයයට අදාළව රාජ්‍ය ඇමතිවරයෙක් හැටියට මමත් කටයුතු කළා, ගරු සභාපතිතුමනි. ඊට පෙර මම ඇමති ධුර දරපු කෘෂිකර්ම, මහවැලි වැනි අමාත්‍යාංශ සියල්ල ජනතාව එක්ක කෙළින්ම සම්බන්ධ වෙන අමාත්‍යාංශ. හැබැයි, 2022 වර්ෂයේදී රටේ තිබුණු මූල්‍ය අර්බුද, ප්‍රශ්න එක්ක ඒ අණපනත් ටික ගෙනෙන්න අපේ සහයෝගය එකතු කරන්න කියලා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ අමාත්‍යාංශය භාර ගන්න කියපු වෙලාවේදී මම ඒ අමාත්‍යාංශය භාර ගත්තා.

ගරු සභාපතිතුමනි, ඒ අනුව 2022, 2023 සහ 2024 කියන වර්ෂවලදී අණ පනත් ගණනාවක් ගෙන එන්න අපට හැකි වුණා. ඒ සම්බන්ධයෙන් අපි එක පැත්තකින් සතුටු වෙනවා. මම ඊට අදාළ සංඛ්‍යාලේඛන ටික ගෙන බැලුවා. 2022 වර්ෂයේදී පාර්ලිමේන්තුවේදී අණ පනත් පමණක් 14ක් සම්මත කරන්න අපට පුළුවන්කම ලැබුණා; ඒ වාගේම, රීති, නියම, රෙගුලාසි 2ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබුණා. 2023 වර්ෂයේදී අණ පනත් 11ක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න පුළුවන් වුණා. ඒ වාගේම, රීති, නියම, රෙගුලාසි 6ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. 2024 වර්ෂයේදී අණ පනත් 11ක් සහ රීති, නියම, රෙගුලාසි 5ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබුණා. එම කාරණාව සඳහන් කරන ගමන් අප එම වගකීම භාර ගන්න කලින් අධිකරණ අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු ජනාධිපති නීතිඥ ගරු අලි සබ්‍රි මැතිතුමාටත්, හිටපු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාටත් අපි අපේ ගෞරවය පුද කරනවා. මොකද, ඒ pipeline එකේ හිර වෙච්ච අණ පනත් ගණනාවක් එම කාලය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගන්න පුළුවන් වුණා. ඉතිහාසයේ කිසිම දවසක අවුරුදු දෙකක් ඇතුළත අණ පනත් 36ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කරලා නැහැ, ගරු සභාපතිතුමනි. මට මතක විධියට තවත් අණ පනත් 90ක් විතර ප්‍රමාණයක් නීතිපති දෙපාර්තමේන්තුවේ හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ විවිධ කමිටු යටතේ කෙටුම්පත් කරමින් තිබුණා. මම විශ්වාස කරනවා, අපේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු වන වත්මන් ගරු අධිකරණ අමාත්‍යතුමා එම පනත් කෙටුම්පත් වඩාත් කාර්යක්ෂමව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා රටට අත්‍යවශ්‍ය වෙච්ච සංශෝධන ටික හඳුන්වා දෙන්න කටයුතු කරයි කියලා. ඒ කටයුත්ත කරන්න ඔබතුමාට

[ගරු අනුරාධ ජයරත්න මහතා]

හැකියාව ලැබේවා කියාත් අපි ප්‍රාර්ථනා කරනවා, ගරු ඇමතිතුමනි. ඔබතුමා ඒ කටයුත්ත කරයි කියලාත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ ගෙන ආ අණ පනත් අතර අදත් අප කථා කරන GSP Plus, IMF ක්‍රියාවලිය හා සම්බන්ධ වූ, කෙළින්ම අධිකරණ අමාත්‍යාංශයට අදාළ නොවුණාට මහ බැංකුව ස්වාධීන කිරීම සඳහා වූ අණ පනත් ටික තිබුණා; දූෂණ විරෝධී පනත, මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ආදි පනත් තිබුණා.

අද අපි Ease of Doing Business Index එකේ ශුභවාදී තැනක නොවෙයි ඉන්නේ කියලා අද උදේත් අපේ ගරු ඇමතිතුමා කියනවා මා අහගෙන හිටියා. හැබැයි ඒ පනත් ටික මේ රටට ගෙනාවේ නැත්නම් අප බලාපොරොත්තු වන ඉලක්කයට මේ රට ගෙන යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අපි එම අණ පනත් ටික ගෙනාවා හා සමානව කළ යුතු දෙයක් තිබෙනවා. දූෂණ විරෝධී පනතේ කොච්චර දේවල් බලාත්මක වෙලා ද කියන එක පිළිබඳව අද වන කොට ප්‍රශ්නයක් තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. එම පනතේ යම් යම් සංශෝධන කළ යුතු බවට කථා වෙනවා, සාකච්ඡා වෙනවා අපි දැක්කා. අවශ්‍ය සංශෝධන තිබෙනවා නම් ඒ සංශෝධන ටිකත් කරලා, ගෙනෙන්න තිබෙන පනත් කෙටුම්පත් ටිකත් හැකි ඉක්මනින් ගෙනැල්ලා අද අප බලාපොරොත්තු වන ඉලක්කයට මේ රට ඔසවා තබන්න අධිකරණ අමාත්‍යාංශයට සුවිශේෂී වූ වගකීමක් පැවරෙනවා.

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම තවත් කරුණු කිහිපයක් විශේෂයෙන් සිහිපත් කරන්න කැමැතියි. ගරු අලි සබ්‍රි මැතිතුමා අධිකරණ අමාත්‍යවරයා හැටියට ඉන්න කොට මුළු උසාවි සංකීර්ණයම digitalize කරන්න එතුමා වැඩ පිළිවෙළක් සකස් කර තිබුණා. මට මතක විධියට එම වැඩ පිළිවෙළ යටතේ සමස්ත අධිකරණ පද්ධතියම digitalize කරන්න රුපියල් බිලියන 3.2ක විශාල මුදලක් වියදම් වෙනවා. මේ වෙලාවේ රජයට ඒ සියලු දේවල් එකවර කරන්න, ඒ මුදල් ප්‍රමාණය එක වර ආයෝජනය කරන්න පුළුවන්කමක් නැති බව මම දන්නවා. හැබැයි ගරු අමාත්‍යතුමනි, module එක module එක හෝ මෙහිදී digitalize කර ගන්න පුළුවන් වුණොත්, අපට පුළුවන් විධියට එක එක add කරගෙන එම කටයුත්ත අවසන් කරන්න පුළුවන්. උදාහරණයක් ගත්තොත්, calling date එකක් SMS එකකින් ඒ ඒ පුද්ගලයාට යවන්න පුළුවන්. ඊට පසුව Record Room එක digitalize කරන්න අපට පුළුවන්.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඒක පටන් අරගෙන තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. නැවතිලා තිබුණු එක පටන් ගත්තා.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ඒක හොඳයි. මොකද, එතකොට අපට module එකෙන් module එකට හෝ යන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, අඩුම ගණනේ අධිකරණයේ දඩයක් ගෙවන්න POS machine එකක්වත් තිබුණේ නැහැ. ගිය අවුරුද්දේ තමයි POS machines ටික හදුන්වා දුන්නේ. එතෙක් මුදල්වලින් තමයි ගෙවන්න සිදු වුණේ. අඩුම ගණනේ ඒ modules ටික හදුන්වා දුන්නොත් ඒ එක එක add කරගෙන සමස්ත පද්ධතියම digitize කරන්න අපට පුළුවන්කම ලැබෙයි. එහෙම නැත්නම් record room එකට ගියාම, proceedings ගන්න ගියාම මිනිසුන් පුදුම දුකක් විඳිනවා, ගරු අමාත්‍යතුමනි. එම නිසා, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඒක කඩිනම් වෙනවා නම් අපි ඒ පිළිබඳව සතුටු වෙනවා.

ගරු අමාත්‍යතුමනි, අපේ ආණ්ඩුව තිබෙන විට, නිවාස අඩස්සියේ රඳවා තැබීම - house arrest - පිළිබඳව අවශ්‍ය කෙටුම්පත් කිරීම කළා. මා හිතන විධියට ඒ draft එක දැනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ තිබෙන්න ඕනෑ. අපි house arrestsවලට අදාළ සංකල්පය හඳුන්වා දුන්නොත් හොඳයි, ගරු අමාත්‍යතුමනි. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමියත් ඒ ගැන සඳහන් කරනවා මම දැක්කා. අද රිමාන්ඩ් බන්ධනාගාරයේ රැඳවියන්ගෙන් තුනෙන් දෙකක් විතර ඉන්නවා. ඒ කියන්නේ, 30,000කට ආසන්න ප්‍රමාණයක් රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉන්නවා. ඒ, මුළු චූදිතයන් ඇතුළුව දෙගොල්ලන්ගේම එකතුවයි. අපට house arrest concept එක හඳුන්වා දෙන්න පුළුවන් වුණොත් හොඳයි. අඩුම ගණනේ මුලදී civil offencesවලට විතරක් apply කරමු කියන කාරණය තමයි අප කිව්වේ. එහෙම කරලා house arrest සඳහා ගියොත් බන්ධනාගාර තදබදයටත් එය එක් විසඳුමක් වනවා. ඒ concept එක රටක් හැටියටත් තිබෙන්න ඕනෑ කියලායි මා විශ්වාස කරන්නේ. මොකද, චේතනාවකින් තොරව වෙච්ච දේකට හොඳ සිවිල් පුරවැසියෙකු දවස් තුනහතරක් හෝ බන්ධනාගාරගත කරනවා කියන එක සුදුසු දෙයක් නොවෙයි, ගරු අමාත්‍යතුමනි. ඒ නිසා මා එම කාරණය ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම, අපි 2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2024 මැයි මාසයේ සම්මත කළා, ගරු අමාත්‍යතුමනි. ඒ අනුව චිත්තිකරුවෙකුට යම් දඬුවමක් නියම කරනවා නම්, ඔහු රිමාන්ඩ් බන්ධනාගාරගත වූ කාලයත් ඒ දඬුවම් කාලයට එකතු කිරීම සඳහා වන නීති අපි හඳුන්වා දුන්නා. ඒ වාගේම, අභියාචනාවක් ඉදිරිපත් කළා නම්, ඒ අභියාචනාවට යන කාලයත් දඬුවම් කාලයට එකතු කළ යුතුය කියන සංශෝධනයත් අපි කළා. ඒ පනත් කෙටුම්පත මැයි මාසයේදී සම්මත කරලා නීතියක් බවට පත් කරන්න පුළුවන්කම ලැබුණා. හැබැයි, ගරු අමාත්‍යතුමනි, ජූලි 01වැනි දාට කලින් දඬුවම් කරපු උදවියට අදාළව එය ක්‍රියාත්මක වන්නේ කොහොමද කියන ප්‍රශ්නය තිබුණා. ඒ නිසා එවකට අධිකරණ ඇමතිතුමා හැටියට කටයුතු කළ ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ජූලි 01වන දා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා අනුමත කරවා ගත්තා, පෙර කණ්ඩායමටත් බලාත්මක වන විධියට අවශ්‍ය නව සංශෝධනයක් මේකට එකතු කරන්න. ඒ සංශෝධනය සිදු කළොත් බන්ධනාගාරයේ සිටින 1,900කට වැඩි සැකකරුවන් පිරිසක් -මට හරියටම සංඛ්‍යාලේඛන මතක නැහැ- එළියට දමන්න ඔබතුමන්ලාට පුළුවන්කම ලැබෙනවා. හැබැයි, ඒ කණ්ඩායම එළියට දැම්මා කියලා සමාජයේ වැරදි විධියට අර්ථකථනය වන්නේ නැහැ, ගරු අමාත්‍යතුමනි. මොකද, ඒ සමහරුන්ගේ වයස අවුරුදු 80යි, සමහරුන්ට අවුරුදු 80ටත් වැඩියි. ඔබතුමා ගියා නම් දකින්න ඇති, ඒ සමහර අයට dialysis කරනවා. අප බලා ගන්නවා කියා කියන්නවත් පුළුවන් තත්ත්වයක නොවෙයි ඔවුන් ඉන්නේ. ඒ කණ්ඩායම බලා ගැනීම තුළ බන්ධනාගාර නිලධාරීන් ලොකු දුකක් විඳිනවා. ඒ නිසා අපි ඒ පිරිස සම්බන්ධව අධිකරණ වෛද්‍ය වාර්තා පවා කැඳෙව්වා. ඒ අය වෙනත් ක්‍රමවේදයකින්, අපේ Prison Ordinance එක යටතේ හෝ එළියට දමන්න පුළුවන් ද කියා අපි සොයා බැලුවා. හැබැයි ගරු අමාත්‍යතුමනි, මේ නීතිය සංශෝධනය කරන එක තමයි ඒකට කරන්න තිබෙන්නේ. ඒ නිසා මම ඒ කාරණය ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා.

ගරු අමාත්‍යතුමනි, මගේ කථාවට ඉතිරිව තිබෙන කාලය සීමිත නිසා අවසාන වශයෙන් මම ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා අපේ මහනුවර නීතිඥ සංකීර්ණය වෙනුවෙන් ලබා දීපු ඉඩම පිළිබඳව, එහි හැදෙන නීතිඥ සංකීර්ණය පිළිබඳව. මම ඒ

සම්බන්ධයෙන් ඔබතුමාට එක් කාරණාවක් විශේෂයෙන් සිහිපත් කරනවා. 1990දී නාගරික සංවර්ධන අධිකාරිය අක්කර හතරහමාරක ඒ සමස්ත භූමිය අත්පත් කර ගත්තේ අධිකරණය සහ බන්ධනාගාරය ස්ථාපිත කරන්නයි. ඒකේ කොටසක තමයි අධිකරණය හදලා නීතිඥ කාර්යාලයට ලබා දී තිබෙන්නේ. එහි ඉතිරි කොටස නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තබාගෙන සිටියා, බන්ධනාගාරය පල්ලෙකැලේට ගෙන ගිය නිසා. ඉන් අනතුරුව, අලුතින් එන නීතිඥවරුන්ට එහි කොටසක් දෙන්න අපි යෝජනාවක් කළා. එය 1990 ඉඳලා Master Plan එකේ තිබුණේ අධිකරණ අමාත්‍යාංශය යටතේ- අධිකරණ කටයුතුවලට අවශ්‍ය කාරණා වෙනුවෙන් තමයි ප්‍රාදේශීය ලේකම් හරහා නාගරික සංවර්ධන අධිකාරිය ඒ ඉඩම අත්පත් කර ගත්තේ. හැබැයි, ගරු අමාත්‍යතුමනි, අවසානයේ නාගරික සංවර්ධන අධිකාරිය ඒ ඉඩමේ තට්ටු 20ක, 30ක high-rise building එකක් හදන්න ගියා. ඒක කුඹුරු ඉඩමක්, ඒ සඳහා වියදම වැඩියි; rafting සහ piling එක්ක ගත්තාම ඒක ප්‍රායෝගික නැහැ කියලා, මුල්ගල් තියපු ඒ ව්‍යාපෘතියත් අවසානයේදී නතර කරලා දැම්මා. ඊට පස්සේ ඒ ඉඩමෙන් පර්චස් 40ක් දුන්නා ලංකා විදුලිබල මණ්ඩලයට. මා අධිකරණ රාජ්‍ය ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ මම කථා කරලා, ඒගොල්ලන්ට ඊට පිටුපස තිබෙන ඉඩම් කොටස දීලා අර පර්චස් 40 නැවත නීතිඥ සංකීර්ණය හදන්න ලබා දෙන්න එකඟතාව අරගෙන දුන්නා. ඊට අදාළ ලිපියත් ඔබතුමාගේ දැනගැනීම සඳහා මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ගරු අමාත්‍යතුමනි, එහිදී ඇති වුණු එකම එකඟතාව තමයි, ගෙවීම් කරන කොට 1990දී නාගරික සංවර්ධන අධිකාරිය මුලින්ම ඉඩම අත්පත් කරගත් වටිනාකමට නීතිඥ සංකීර්ණයට දෙන්න කියන එක. මා එම කරුණ ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරන්න හේතුව මෙකයි. ගරු අමාත්‍යතුමනි, ඔය විධියටම තමයි අපි දැනට තිබෙන නීතිඥ සංකීර්ණය නුවර හදලා තිබෙන්නේ. ඒක තිබෙන්නේත් තවම අධිකරණ අමාත්‍යාංශය යටතේ. එකම නීතිඥවරයෙක්වත් තවම ඉඩමට සල්ලි ගෙවලා නැහැ. මම කියන්නේ නැහැ ඔබතුමාට එතැනට යන්න කියලා. අඩුම ගණනේ 1990දී ගත්තු මිලටවත් අපේ නවක නීතිඥවරුන්ට දුන්නොත්, ඔවුන්ට ඒක යම් විධියකින් සහනයක් වෙයි. මොකද, ඔවුන්ට ඔය කියන විධියට ලොකු මුදල් ප්‍රමාණයක් දැනට ආයෝජනය කරලා කටයුතු කරගෙන යන්න පුළුවන්කමක් නැහැ, ගරු අමාත්‍යතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
Sir, give me one more minute, please.

මාතර වැලිගම ප්‍රාදේශීය ලේකම්වරයා අත්පත් කරගත් ඉඩමත් ඒ විධියමයි. රත්නපුර අධිකරණ සංකීර්ණය ගැනත් මම ඔබතුමාට මතක් කරනවා. ගම්පොළ ප්‍රාදේශීය ලේකම්ගේ ඉඩමක තමයි ඔය නීතිඥ සංකීර්ණය හදලා තිබෙන්නේ. මේ කියපු සියලු දේවල් උදාහරණයි. එහෙම නැත්නම් මේ කියන එකක්වත් ඉදි වෙන්නේ නැහැ, ගරු අමාත්‍යතුමනි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. නාගරික සංවර්ධන අධිකාරියත් එකඟතාව ලබා දීපු ආකාරයට අත්පත් කරගත් වටිනාකමටම ඒ අයට ලබා දීලා මේ අධිකරණ සංකීර්ණය හැදුවොත් තවත් නවක නීතිඥවරු 200කට විතර මහනුවර දිස්ත්‍රික්කයේ නීතිඥ කටයුතු කිරීම සඳහා අවස්ථාව ලැබෙනවා. මේ කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, රටට, ලෝකයට ගැළපෙන විධියට තවත් වැඩි පනත් ප්‍රමාණයක් ගෙනෙන්න; මේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය සංශෝධන ගෙනෙන්න ඔබතුමා ඇතුළු අමාත්‍යාංශයේ කණ්ඩායමට හැකි වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම, අප අමාත්‍යාංශය භාරව සිටින විට හිටපු අපේ අමාත්‍යාංශයේ ලේකම්වරුන්, අතිරේක ලේකම්වරුන්, නීති කෙටුම්පත් සම්පාදක ඇතුළු නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු සියලු දෙනා බොහොම කාර්යක්ෂමව කටයුතු කළා. එහෙම නොවුණා නම්, ඒ කාලය තුළ අණ පනත් 36ක් ගෙන එන්නට අපට බැරි වෙනවා, ගරු අමාත්‍යතුමනි. ඒ සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Thank you, Hon. Member, for those valuable ideas that you gave. We will take them positively.

ගරු මන්ත්‍රීතුමනි, නුවර අධිකරණ සංකීර්ණය සම්බන්ධයෙන් කණ්ඩායම් දෙකක් මා මුණ ගැහුණා. මේ අවස්ථාවේ ඔවුන්ට අවශ්‍ය සියලු සහාය ලබා දෙන්න මම කටයුතු කරනවා. තවම අවසානය කොහොම වෙලා ද දන්නේ නැහැ. නමුත්, මම ඒක ගැන සොයා බලනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Muneer Mulaffer. You have ten minutes.

[අ.භා. 1.41]

ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දින අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

අපි හැම කෙනාම දන්නවා, ජාතික සමගිය කියන එක රටට, අපට, අපි හැමකෙනාටම ඉතාම වැදගත් දෙයක් බව. ඒ වාගේම, පසුගිය අවුරුදු කිහිපය තුළ මේ රටේ ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වුණු බවත් අපි දන්නවා. අපේ රටේ ජනතාව පීඩාවට පත් වෙන්න හේතුව දවසකින් දෙකකින් ඇති වෙච්ච කාරණා නොවෙයි. විශේෂයෙන්ම අපි දන්නවා, මේ තත්ත්වට පත් වෙන්න හේතුව, අපි කාලයක් තිස්සේ රටේ අනුගමනය කරපු වැරදි පිළිවෙත් බව. ඒ වාගේම, අපේ රටේ ඇති වුණු ගැටුම් එයට විශාල ලෙස බලපෑවා. වර්ගවාදී ගැටුම්, ජාතිවාදී ගැටුම්, ආගමික ගැටුම්, භාෂාමය ගැටුම් මේ අර්බුදයට විශාල ලෙස බලපෑවා. මේ ආකාරයට සමාජය කොටස්වලට බෙදිලා ජාතික සමගිය නැති වෙච්ච සෑම අවස්ථාවකදීම රටේ සෑම අංශයක්ම කඩා වැටුණා. නීතියේ ආධිපත්‍යය කඩා වැටුණා; ආර්ථිකය කඩා වැටුණා; සමාජ තත්ත්වය සහ සංස්කෘතිය පිරිහුණා. ඒ තත්ත්වය තුළ අපේ රටේ ජාතික සමගිය කියන එක මේ අවස්ථාව වෙනකොටත් අත්‍යවශ්‍යම මානෘකාවක් බවට පත්වෙලා තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුනීර් මුලාෆර් මහතා]

අපි හැම කෙනාම දන්නවා, විශේෂයෙන්ම පසුගිය කාලයේ බලයට පත්වීම සඳහා බොහෝ උදවිය තමන්ට පහසුම මාර්ගය ලෙස තෝරා ගත්තේ බොහෝ දුරට ජාතිවාදය ඇවිස්සීම බව. විශේෂයෙන් අපි පිළිගත යුතුයි, මේ රටේ සිංහල ජනතාව ජාතිවාදයට කැමැති නැති බව. ඔවුන් හැමදාමත් ජාතිවාදයට විරුද්ධයි. මේ රටේ ද්‍රවිඩ ජනතාවත් එසේමයි. ඒ වාගේම, මේ රටේ වෙසෙන මුස්ලිම් ජනතාවත් ජාතිවාදයට විරුද්ධයි. අපට ජාතිවාදය මින් ඉදිරියට අවශ්‍ය නැහැ කියන පණිවුඩය පසුගිය ජනාධිපතිවරණයේදී සහ මහ මැතිවරණයේදී මේ රටට ලබා දුන්නා. නිදහසින් පස්සේ වෙනත් කිසිම දේශපාලන ව්‍යාපාරයකට අත් කර ගන්න බැරි වූ ඒ සුවිශේෂී අවස්ථාව ජාතික ජන බලවේගය ලෙස අපට අත් කර ගන්න පුළුවන් වුණා. රටේ සියලු ප්‍රදේශවලින් අපට ඒ ජයග්‍රහණය ලබා දුන්නා. මේ රටේ වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජාතීන් ආගමික වශයෙන් ගත්තත්, උතුර නැඟෙනහිර, කඳුකරය සහ දකුණේ වෙසෙන සියලුදෙනාම ගත්තත්, ඔවුන් ලබාදීපු පණිවුඩය තමයි, "අපට සාමය අවශ්‍යයි. අපට ශ්‍රී ලාංකික අනන්‍යතාව අවශ්‍යයි. ඒ මතින් අප මේ ගමන යා යුතුයි" කියන එක.

රටේ තිබුණු තත්ත්වයත් එක්ක 2015දී ONUR ආයතනය ස්ථාපිත කරලා, රටේ සමගිය ගොඩ නඟන්න ඒ ආයතනය හරහා කටයුතු කළ බව ඔබ කවුරුත් දන්නවා. විශේෂයෙන්ම ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස මම එම අමාත්‍යාංශයේ වැඩ බාර ගන්න ගියාම මම දැකපු දේ අනුව පසුගිය රජයන් කටයුතු කර තිබෙන ආකාරය ගැන මට හරි පුදුමයි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බලය ලබා ගන්නකොට පළමුවෙන්ම කරපු දේ තමයි සමගිය කියන කාරණාව බැහැර කරපු එක. ඒක නොසලකා හැරියා. ඉතාම අත්තනෝමතික ලෙස ඔහු කළ ප්‍රකාශය රටක් ලෙස අපි හැම කෙනාම දන්නවා. හැබැයි, ඒ රජය තුළත් ඔවුන් ආයතනයක් ලෙස පවත්වාගෙන යන්න උත්සාහ කර තිබෙනවා, ජාතික ඒකාබද්ධතාව කියන කාරණාව. අපි දැකපු විශේෂ කාරණාවක් තිබුණා. ඒ තමයි, ඒගොල්ලන් එක පැත්තකින් වෛරී ප්‍රකාශන කරන අයට මාධ්‍යයෙන් වැඩි ඉඩකඩක් දීලා තිබුණු එක. රාජ්‍ය මාධ්‍ය හරහාත්, පෞද්ගලික මාධ්‍ය හරහාත් සමාජය තුළ වෛරී ප්‍රකාශ කරන විවිධ පාර්ශ්වයන්ට අවස්ථාව ලබා දී තිබුණා. ඒ අස්සේ ජාතික සමගිය පිළිබඳව ආයතනයකුත් පවත්වාගෙන යෑම විහිලුසහගත තත්ත්වයක් කියන එක අපි කියන්න කැමැතියි. ඒ වාගේම තමයි, සමහර අවස්ථාවලදී වෛරී ප්‍රකාශ කරන අයට මාධ්‍ය අවකාශයක් පමණක් නොවෙයි, සමහර විට සුඛෝපභෝගී වාහන ලබා දීලා ඒවා නඩත්තු කරන තත්ත්වයකට ඒ රජයන් පත් වුණා. හැබැයි, මේ රටේ ආදරණීය ජනතාව, මේ රටේ ආදරණීය පුරවැසියන්, එවැනි තත්ත්වයක් රට තුළ නැවත ඇති නොවිය යුතුයි, අපි හැම කෙනාටම සාමකාමී රාජ්‍යයක් අවශ්‍යයි කියන පණිවුඩය ලබා දෙමින්, මේ රට වෙනස් කරන්න අපට ඡන්දය ලබාදී තිබෙනවා.

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයාත්, මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් යම් කාරණාවක් මතු කළා. පසුගිය කාලයේ සමගිය බිඳ වැටෙන්නත්, රට තුළ සාමය නැති වෙන්නත් බලපෑ ප්‍රධාන කරුණු කාරණා පිළිබඳ සොයා බලන්න ජාත්‍යන්තර ආයතනයක් විසින් පර්යේෂණයක් කරනු ලැබුවා. අපේ රටේ සාමය කඩ වීමට සහ සාමය බිඳ වැටීමට හේතු සාධක වෙච්ච කරුණු කරණා පිළිබඳ පර්යේෂණය කළ ඒ ජාත්‍යන්තර ආයතනය ඔවුන්ගේ පර්යේෂණය අවසානයේ ප්‍රධානම කාරණාවක් සඳහන් කරලා තිබෙනවා. අපේ රටේ සමගිය, ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය නැති වෙන්නට බලපෑ ප්‍රධානම හේතුව බවට පත් වුණේ දේශපාලනය කියන එක එහි සඳහන් කරලා තිබෙනවා. ඒකේ දෙවන කාරණාව ලෙස සඳහන් කරලා තිබුණේ භාෂාමය ගැටලුව. මේ උත්තරීතර සභාව තුළත් භාෂාව පිළිබඳ කරුණු කාරණා මතු කළා. මේ රටේ පුරවැසියෙකුට ගැටලුවක් ඇති වුණාම පොලීසියට, රාජ්‍ය ආයතනයකට ගිහින් තමන්ගේ අර්බුදය පිළිබඳ -ගැටලුව පිළිබඳ- තමන් දන්නා භාෂාවෙන් පැහැදිලි කරන්න බැරි වෙනවා නම්, ඒ පුරවැසියා පත් වෙන අසරණභාවය රජයක් ලෙස අපි හැම දෙනාටම දැනෙනවා. පසුගිය ආණ්ඩු කාලය තුළ සමගිය සඳහා වූ ආයතනය එක පැත්තකත්, භාෂාව සඳහා වූ ආයතන තවත් පැතිවලත් විසිරිලා තිබුණා. හැබැයි, අපි රජයක් ලෙස ඒ සියලු ආයතන එක තැනකට ගෙනැල්ලා රටේ සමගිය ගොඩ නඟනවා නම්, විශේෂයෙන් අපේ සමාජය තුළ, අපේ රට තුළ සමගිය ගොඩ නැඟීමේ කාර්යයේදී අනිවාර්යයෙන්ම භාෂාවට ඉතා වැදගත් තැනක්, මුල් තැනක් ලැබෙනවා. ඒ නිසා අපි රජයක් ලෙස තීරණය කරලා තිබෙනවා, දෙමළ භාෂාව දන්න පොලිස් නිලධාරීන් බඳවා ගැනීමට. ඒ වාගේම pool එකක් හදලා රජයේ විවිධ ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වන භාෂා පරිවර්තකයන් සැපයීමට කටයුතු කරමින් සිටිනවා. සේවා සපයන ස්ථානවලදී ඒ ඒ අයගේ භාෂාවෙන් සේවාව ලබා ගැනීමේ අවස්ථාව උදා කිරීම සඳහා රජයක් ලෙස අපි මේ අවුරුද්ද තුළ කටයුතු කරමින් සිටිනවා. ඒ විතරක් නොවෙයි. ජාත්‍යන්තරව සිටින සමහර අය කථා කරලා අපට අදහස් ලබා දී තිබෙනවා, අපට යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. භාෂාව කියන එක බොහෝ දුරට නූතන තාක්ෂණය පාවිච්චි කරලා ප්‍රවර්ධනය කරන්න පුළුවන්. තරුණයන් ඇතුළු හැම කෙනාටම භාෂාව පිළිබඳ දැනුම ලබා දීලා මේ තිබෙන අර්බුදය විසඳන්න අපි අනිවාර්යයෙන්ම උත්සාහ කරනවා. ඒක ඉලක්ක කරගෙන ශ්‍රී ලාංකිකයන් ලෙස අපි හැම කෙනාටම එකතු වෙලා සංස්කෘතික අත්දැකීමක් බෙදා ගැනීම සඳහා "ශ්‍රී ලාංකික දිනයක්" පිළිබඳ යෝජනා කරලා තිබෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ යුද්ධයක් පැවතුණු රටක් තමයි දකුණු අප්‍රිකානු රාජ්‍යය. ඔබතුමන්ලා ඒ ගැන දන්නවා. ඔවුන් දෙසැම්බර් මාසය තුළ ඒ සංහිඳියා දිනය සමරනවා.

ඒ වාගේම මම තවත් කාරණාවක් මතක් කළ යුතුයි. අපි බලයට පත් වුණාට පස්සේ පැරදුණු සමහර පිරිස් නැවත වතාවක් සමාජය තුළ වෛරය වපුරමින්, වෛරය උද්දීපනය කරගෙන ජාතිවාදය අවුස්සන්න උත්සාහ කරනවා. හැබැයි, වගකීමක් සහිත රජයක් ලෙස අපි කිසිම අවස්ථාවක රාජ්‍ය මාධ්‍ය තුළින් ඔවුන් ලොකු කර පෙන්වලා මෙය සමාජ අර්බුදයක් බවට පත් කරන්න උත්සාහ කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, සිමෙන්තිවලට පුළුවන් බිත්ති බඳින්න. ඒ බිත්ති මඟින් කරන්නේ බෙදා වෙන් කරන එක. හැබැයි, ඒ සිමෙන්තිවලටම පුළුවන් පාලම් හදන්න. ඒ පාලම් තුළින් එගොඩත්, මෙගොඩත් යා වෙනවා. ඒ තුළින් අපටත් අදහස්, සංස්කෘතිය, විවිධ දේවල් හුවමාරු කරගන්න පුළුවන්.

මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරයෙක් මේ රටේ අපරාධකරුවන්, කුඩුකාරයන්, ඝාතකයන් වැඩිවීම පිළිබඳව කථා කළා. මම ඒ මන්ත්‍රීවරයාට යම් කාරණයක් කියන්න කැමතියි. කාලයක් තිස්සේ ඔබගේ නායකයන් විසින්, ඇමතිවරුන් ලෙස කටයුතු කරපු අය විසින්, ඒ රජයන් විසින් පෝෂණය කරපු අය තමයි අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මමත් ආශාවෙන් මේ රටේ එක එක ස්වාමීන් වහන්සේලාගේ ධර්ම දේශනා ශ්‍රවණය කරනවා. ඒ අතර පූජ්‍ය කාගම සිරිනන්ද ස්වාමීන් වහන්සේ ඉතාම විශේෂයි. උන් වහන්සේ එක්තරා දේශනාවකදී මේ රටේ සිටි පාලකයන් පිළිබඳව, ඔවුන් මේ රටට කළ විනාශය පිළිබඳව සඳහන් කරමින් කියපු දෙයක් මෙතැනදී මතක් කිරීම ඉතාම වටිනවා කියලා මම හිතනවා. උන්වහන්සේ දේශනා කළේ මොකක්ද? අවුරුදු කිහිපයකට කලින් තමයි උන්වහන්සේ ඒ ගැන සඳහන් කළේ.

උන්වහන්සේ එදා සඳහන් කළා, "මේ පාලකයන්ට කලා වැව හදන්න දුන්නා නම්, කලා වැව වාගේ ඔවුන්ගේ ගෙවල් හදා ගනියි. පොල් කට්ටක් තරම් කලා වැවක් අපට ඉතුරු වේවි" කියලා. එහෙම තමයි එදා උන්වහන්සේ සඳහන් කළේ. මොන පාලකයා පිළිබඳවද එසේ සඳහන් කළේ කියන කාරණාවත් මෙහිදී මම මකත් කළ යුතුයි, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම පන්සිල් රකින නායකයන් පිළිබඳව මතක් කරපු අර මන්ත්‍රීවරයාට මම කියන්න කැමැතියි, අරාබි භාෂාවේ තිබෙන වචනයක්. ඒ තමයි "ලා තුසක්කි අන්ලා" කියන එක. මම හිතන විධියට කවුරුත් තමන් සුදනෙක් බවට පවසා ගන්නා තත්ත්වයකට පත් වෙන්න හොඳ නැහැ, එහෙම කරන්න එපා. ඒ නිසා මම විශේෂයෙන්ම ඒ මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා, පන්සිල් රැකීම පිළිබඳව තවදුරටත් හරි විධියට කියවා බලන්න කියා. "අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි" කියන සිල් පදයේ තේරුම බලන්න. පන්සිල් රකින නායකයා හොරකම් කරන්නේ නැත්නම්, ඔහු වටා ඉන්නා පිරිසත් එයට අනුබල නොදී ඉතාම යහපත් මාර්ගයේ කටයුතු කරාවි. එවැනි රටක් අපට අවශ්‍යයි. ජාතික සමගියෙන් පිරුණු, ඒ වාගේම ශ්‍රී ලාංකිකයන් ලෙස අභිමානයෙන් අපට කථා කරන්න පුළුවන් හොඳ රටක් අපට අවශ්‍යයි. ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට පමණක් ඒ කාර්යය කළ නොහැකියි. *[බාධා කිරීමක්]* පුරවැසියන් ලෙස අපි හැම කෙනාම එකමුතුවෙන් ඒ කටයුත්ත කරමු කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Ajith P. Perera. You have 15 minutes.

[අ.භා. 1.52]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමනි, ජාතික ඒකාබද්ධතාව ඇති කරන්නත්, අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරන්නත් ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලෙස බලය සාධාරණ විධියට බෙදා දෙන්නත්, සංවර්ධනය උදෙසා වූ උපාය මාර්ගයක් හැටියට බලය විමධ්‍යගත කරන්නත්, විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන අඩුපාඩුකම් නැති කරන්න; විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නත්, මනාප ඡන්ද ක්‍රමය ඉවත් කරලා නැවත පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක් ඇති කරන්නත් අපි හැමෝම එකඟයි.

ඔබගේ පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත්, ගරු ජනාධිපතිතුමාගේ ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත්, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් ඒ බව සඳහන් කළා. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාට විශේෂ වගකීමක් තිබෙනවා, මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න. මොකක්ද? අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න. අධිකරණ ඇමතිතුමා හැටියට, ජාතික ඒකාබද්ධතා ඇමතිතුමා හැටියට ඒ සඳහා ඔබතුමාට වගකීමක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගන්න හොඳ පරිසරයක් දැන් තිබෙනවා. මොකද, බැලූ බැල්මට 2/3ක බලයක් ඔබට තිබෙනවා. අපිට වගකීමෙන් කියන්න පුළුවන්, විපක්ෂයේ සිටින 45දෙනෙකුත් ඔබට සහයෝගය ලබා දෙන්න සූදානම් බව. ඒ නිසා ඉක්මනින්, ඒ කියන්නේ පළමුවැනි සභාවාරය තුළදී, පළමුවෙනි අවුරුද්ද තුළදී එය සිදු කළොත්, ජනමත විචාරණයකින් අනුමත කර ගන්නත් පුළුවන්. දැන් මේ රටේ ඉතිහාසයේ කවදාවත් නොනිබුණු ආකාරයේ හොඳ දේශපාලන වාතාවරණයක් තිබෙනවා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනැල්ලා මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න.

මම අධිකරණ ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා වූ මාර්ග සිතියම -road map එකක්ද කියලා. ඊයේ ගරු ජනාධිපතිතුමා ඉදිරියේ මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙක් මේ ප්‍රශ්නය විමසුවා; නලින් බණ්ඩාර මැතිතුමාත්, රාසමාණික්කම් මැතිතුමාත් ඒ ගැන විමසුවා. ජනාධිපතිතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ නැහැ. ජනාධිපතිතුමා මුලසුනේ සිට මේ පාර්ලිමේන්තුව දෙවරක් ඇමතුවා. ඒ අවස්ථා දෙකේදීම ප්‍රකාශ කළේත් නැහැ. නිදහස් දවසේත් ජනාධිපතිතුමා බොහෝ ප්‍රශ්න ගැන කථා කළා. නමුත් මේ අලුත් දේශපාලන සංස්කෘතිය ඇති කරන්න පදනම වන, ප්‍රශ්න බොහොමයකට පදනම වන, යල්පැන ගිය සංශෝධන ගණනාවක් තිබෙන මේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම පිළිබඳව අවධානය යොමු කළේ නැහැ. ඔබතුමා විෂය භාර ඇමතිතුමා වශයෙන් ඒ සම්බන්ධයෙන් පිළිතුරක් දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම තවත් විශේෂ කාරණයක් මම කියන්න ඕනෑ. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 2024 අංක 43 දරන සංශෝධනය මඟින් සිවිල් නඩු විධාන සංග්‍රහය තුළ ප්‍රාදේශීය අධිකරණ බලය පිළිබඳ සඳහන් වන ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (අ) ඡේදය සංශෝධනය කළා. මේ සංශෝධනය බොහොම අභිංසක එකක් බවයි පෙනෙන්නේ. මොකක්ද කළේ? 9 වන වගන්තියේ (අ) ඡේදය තුළ කලින් තිබුණේ විත්තිකරුගේ පදිංචිය අනුව අධිකරණ බලය තෝරා ගන්න පුළුවන් කියන එකයි. ගිය වසරේ එය සංශෝධනය කළේ, පැමිණිලිකරුගේ සහ විත්තිකරුගේ කියන දෙදෙනාගේම පදිංචිය අනුව තෝරා ගන්න පුළුවන් කියලායි.

ගරු ඇමතිතුමනි, ඒ නිසා කොළඹ මූලික වෙච්ච සියලුම මූල්‍ය සමාගම්වලට, කොළඹ ලියාපදිංචි කාර්යාලය තිබෙන ඕනෑම සමාගමකට, බැංකුවකට තමන් පාර්ශ්වකරුවෙක් වෙන සියලුම නඩු කොළඹ දිසා අධිකරණයේ පැවරීමට හැකියාව තිබෙනවා. මේකේ ප්‍රතිඵලයක් හැටියට පානදුර දිසා අධිකරණයේ අලුතෙන් මුදල් නඩු පැවරීම නැති වෙලා තිබෙනවා. අඩු වෙලා නොවෙයි, නැති වෙලා තිබෙනවා. අනෙක් අධිකරණවලත් ඒ තත්ත්වය ඇති වෙයි කියලා මම විශ්වාස කරනවා. කොළඹට නඩු ගොඩයි. පළාත්බදව මුදල් නඩු අඩුයි. මම තව උදාහරණයක් කියන්නම්. කළුතර දිසා අධිකරණ බල ප්‍රදේශයේ පැල්පොළ කියන ගමේ තිබෙන ඉඩමක මායිම් ආරවුලක් සම්බන්ධයෙන් ත්‍රිකුණාමලයේ නඩුවක් දැම්මා. පැමිණිලිකරු ත්‍රිකුණාමලයේ පදිංචියි කියලායි නඩුව දැම්මේ. මායිම් ආරවුලේ පාර්ශ්වකරුවන්ට ත්‍රිකුණාමලයට යන එනකොටම වැඩේ ඉවරයි. කළුතර අධිකරණ බල ප්‍රදේශයේ ඔය කියන ගමේම තිබෙන තවත් ඉඩමක බුක්තියට බාධා කිරීමක් ගැන කඩුවෙල අධිකරණයේ නඩු දැම්මා. ප්‍රවාහන ප්‍රශ්න අනුව කඩුවෙලත් දුරයි. ඒ නිසා දැන් මුදල් පිළිබඳ නඩු කොළඹට එකතු වෙනවා. නීතියේ ප්‍රමාදය වැඩි වෙනවා. වියදම වැඩි වෙනවා. මේක අසාධාරණයි, ගරු ඇමතිතුමනි. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, මෙයට කඩිනමින් විසඳුම් ලබා දෙන්න කියලා. මොකද, කොළඹ අධිකරණයක නඩු පැවරුවාට පස්සේ ඒවා ආපහු යවන්න බැහැ. මේක පානදුරේ විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි, මුළු රටේම තිබෙන ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන පළමුවෙනි පුද්ගලයා මම වෙන්න ඇති. මම මේ පිළිබඳව පානදුර නීතිඥ සංගමයේත් අවධානය යොමු කළා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා සමඟ සාකච්ඡා කරන්න කියලාත් කිව්වා. අපේ මිත්‍රත්වයත් තිබෙන නිසා ඔබතුමා අවබෝධ කර ගනීවි මේක සත්‍ය ප්‍රශ්නයක් බව.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, කරුණාකර ඒක ඉදිරිපත් කරන්න. අපි ඒ ගැන සාකච්ඡා කරමු.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)

බොහොම ස්තුතියි. මම උපදෙස් දෙන්නම්, ඔබතුමා සමඟ කථා කරන්න කියලා.

ඒත් එක්කම ඔබතුමා සඳහන් කළා, යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයට විසඳුම් වශයෙන් සමයවර්ධන වාර්තාව ක්‍රියාත්මක කිරීම ගැන. එම වාර්තාවේ එක යෝජනාවක් තිබෙනවා, මමත්, ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමියත් නියෝජනය කරන පානදුර ප්‍රදේශයේ පළාත්බද මහාධිකරණයක් ඇති කරන්න. මේ සඳහා පරිපාලන වශයෙන් අවශ්‍ය මූලික කටයුතු කෙරිලාත් තිබෙනවා. නමුත්, වැඩේ කෙරිලා නැහැ. ඔබතුමාත් පානදුර ප්‍රදේශය ගැන හොඳින් දන්නා නිසා ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම රටේ අනෙක් අධිකරණවලත් ඒ විධියටම කටයුතු ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

තව විශේෂ කාරණයක් කියන්න තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ තමයි අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම පිළිබඳව. මේ පිළිබඳව ඔබතුමා පිළිතුරු දෙනවා මම දැක්කා. මේ පිළිබඳව මට විශේෂ අවබෝධයක් තිබෙනවා. 2017දී තමයි මේ යෝජනාව මුලින්ම සාකච්ඡාවට ආවේ. නමුත්, ඒක හෙමින් ක්‍රියාත්මක වුණේ. 2018දී මම ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ කැබිනට් නොවන ඇමතිවරයා වුණා. එවකට අධිකරණ අමාත්‍ය ගරු තලතා අතුකෝරල මැතිනිය සමඟ එකතු වෙලා අපි වැඩ කළා, මේ කටයුත්ත යථාර්ථයක් කරගන්න. මොකද, අපේ කලාපයේ බොහොමයක් රටවල නීතිය පසිඳලීමේ ප්‍රමාදය අවම කරගෙන තිබෙන්නේ ඩිජිටල්කරණය, court automation හරහා පමණයි. අධිකරණ ක්ෂේත්‍රයේ තිබෙනවා, නරක පුරුදු බොහොමයක්. ඒවාට සමහර නීතිඥවරු, පාර්ශ්වකරුවන් වාගේම සමහර දූෂිත තැනැත්තන්, අකාර්යක්ෂම විනිශ්චයකාරවරු ද වගකිවයුතුයි. ඒ සියලුදෙනාම මේවාට දායක වෙනවා. සමහර තැන්වල අධිකරණ කාර්යාලත් ඉතාම අකාර්යක්ෂමයි. මේවා වළක්වා ගන්න court automation අවශ්‍යයි. ලෝකයේ හැම තැනම ඒක සාර්ථක වෙලා තිබෙනවා. මලයාසියාවේ අධිකරණ පද්ධතිය පිළිබඳව මම පෞද්ගලිකවම අධ්‍යයනය කළා. ඒ රටේ අග්‍ර විනිශ්චයකාරතුමා සමඟත් සාකච්ඡා කළා. ඔබතුමා හොඳාකාරවම දන්නවා, අපේ අධිකරණ පද්ධතියත් මලයාසියාවේ අධිකරණ පද්ධතියත් ගොඩක් සමාන බව. ඒ කියන්නේ අපරාධ නීතියත් එක වාගේ. සිවිල් නීතියත් සෑහෙන දුරට එක වාගේ. අධිකරණ තේරාවලියත් එක වාගේ. නීතිඥවරුන්ගේ පුහුණුව සහ ඒ දේවල් හුඟක් එක වාගේ. අපට ගොඩක් ගැළපෙනවා. අපට මලයාසියාවත් එක්ක සම්බන්ධයක් නැහැ. නමුත්, ඒ අත්දැකීම අරගෙන තලතා අතුකෝරල මැතිනිය අංක 19/0265/120/011 කියන කැබිනට් පත්‍රිකාව 2019.01.08 වැනි දින ඉදිරිපත් කළා. ඒ ගැන අපේ පාර්ලිමේන්තුවේ නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාකච්ඡා කළා. ඉන්පසුව අපට පුළුවන්කම ලැබුණා, ICTA ආයතනය, ඩිජිටල් අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය ඇතුළු අදාළ සියලු ආයතන එක්ක එකතු වෙලා කටයුතු කරන්න. ඒ වෙනකොට අපි Ernst & Young ආයතනය හරහා audit එකක් කරලා තිබුණා, මුළු රටේම අධිකරණ පද්ධතිය පිළිබඳව. එය පුළුල් එකක්. ඒ සියලුම අත්දැකීම් අරගෙන අපි වැඩ කළා. මම පසුගිය වතාවේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ඒ කාලය තුළ මම ශ්‍රී ලංකා නීතිඥ සගමයේ court automation පිළිබඳ කමිටුවේ සභාපති හැටියට කටයුතු කළා. අලි සබ්‍රි ඇමතිතුමා මට ආරාධනා කළා, එම කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කරන්න කියලා. අපි සුභදව කටයුතු කරලා ඒ court automation project එක mature project එකක් බවට පත් කළා. නමුත් අවාසනාවකට වාගේ අලි සබ්‍රි මැතිතුමාගෙන් පසුව හිටපු ගරු අධිකරණ ඇමතිතුමා court automation ගැන එච්චර උනන්දු කෙනෙක් නොවෙයි.

එතුමා ඒක අතහැරියා. රටේ මුදල් ප්‍රශ්නයකුත් ආවා. හැබැයි, මට මතක හැටියට එවකට මේ automation project එකට යන සම්පූර්ණ මුදල රුපියල් බිලියන පහයි. ඒ කියන්නේ, highway කිලෝමීටරයක්, එහෙම නැත්නම් ලොකු පාලමක් හදන්න යන වියදම. අද වෙනකොට අපේ රටේ ඩිජිටල්කරණය හා සම්බන්ධ පද්ධතිවල තිබෙන දියුණුවත් එක්ක ඉස්සර තරම් වියදමක් මේ දේවල්වලට වැය වෙන්නේ නැහැ. ඒ නිසා මේක සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒක තිබෙන්නේ පියවර කිහිපයකින්. ඒකට සැලැස්මක් තිබෙනවා. පක්ෂ, පාට භේදයක් නැහැ. තාක්ෂණය පිළිබඳ විශේෂඥයෝ සම්බන්ධ වෙලා තිබෙනවා. ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ ඉඳලා මේවා අනුමත කරලා තිබෙනවා. ඒ නිසා කොන් අල්ලා ගන්නේ නැතුව කටයුතු කරන්න. ගරු අධිකරණ ඇමතිතුමනි, මම ඔබතුමාට තිබෙන හිතවත්කමටත්, රටට තිබෙන ආදරය නිසාත් තමයි මේ දේවල් කියන්නේ. ඒ වාගේම අපේ ජීවිත ගොඩනැඟිලා තිබෙන්නේත් මේ අධිකරණ පද්ධතිය හරහායි. මේ දේවල් ලැබුණාම අපේ අලුත් පරම්පරාවට වැඩ කරන්න ලෙහෙසියි. අපේ පරම්පරාවේ මිනිස්සු ගැන හිතන්න එපා. අපිත් කොහොම හරි ඒක ඉගෙන ගන්නම්. හැබැයි තරුණ පරම්පරාවට, තරුණ නීතිඥයන්ට, තරුණ විනිශ්චයකාරවරුන්ට, අලුත් පරම්පරාවට නීතියේ ප්‍රමාදය පිළිබඳව තිබෙන ප්‍රශ්නයත්, ගුණාත්මකභාවය වැඩි කිරීම පිළිබඳ ප්‍රශ්නයත් අවසන් කර ගැනීම සඳහා සුදුසුම පිළිවෙළ තමයි, මේ court automation ක්‍රියාමාර්ගය. එය පියවර තුනකින් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ වාගේම වසර දෙකක් ඇතුළත අවසන් කරන්නත් පුළුවන්. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය ඒ කෙරෙහි යොමු කරන්න. ඒ වාගේම මෙහි කෙරෙන නොකෙරෙන කාරණා ගැන මටත් යම් අත්දැකීම් තිබෙනවා. ඔබතුමා මට පෞද්ගලිකව හෝ නිල වශයෙන් ආරාධනා කළොත්, මම ඇවිල්ලා සහභාගි වෙන්නම්. ඒ පිළිබඳව අපට තිබෙන අත්දැකීමත් එක්ක මම ඒ සඳහා උපරිම සහයෝගය ලබා දෙන්න කැමැතියි. මේ රටේ අධිකරණ පද්ධතියේ තිබෙන ප්‍රමාදය වැළැක්වීම සඳහා එකම විසඳුම තමයි, court automation කියන්නේ. ඒ සමඟ දූෂණය නැති වෙනවා, කාර්යක්ෂමතාව ඇති වෙනවා, ගුණාත්මකභාවය වැඩි වෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා වෛද්‍යවරයෙක් වුණත් ඔබතුමාත් අහලා ඇති, අපේ රටේ නීතිය වාර්තා කරන, සංගෘහීත කරන ක්‍රමවේදය තමයි, ශ්‍රී ලංකා නීති වාර්තා - Sri Lanka Law Reports, SLRs. ඒවා පරිපූර්ණ වෙලා, මුද්‍රණය වෙලා, ජනතාවට පරිහරණය කරන්න එන්න ලොකු ප්‍රමාදයක් තිබෙනවා. දැන් අධිකරණවල විනිශ්චයකාරවරුන් විසින් සෑහෙන නඩු තීන්දු ලබා දෙනවා. ඒ අතර බොහොම වැදගත් නඩු තීන්දුත් ලබා දෙනවා. නමුත් වැදගත් නඩු තීන්දු තිබෙනවා, unreported; ඒවා වාර්තා වෙලා නැහැ. එහෙම වුණාම ඒ පිළිබඳව කරුණු දැනගන්න, අපට පියවරෙන් පියවර පිටපත් ලබා ගැනීමට සිද්ධ වෙනවා. ඒක දුෂ්කර දෙයක්, පරිහරණය අමාරුයි. ඒ නිසා ශ්‍රී ලංකා නීති වාර්තා ලේඛනගත වීම කඩිනම් කිරීමත්, ඒකේ ප්‍රමාණය වැඩි කිරීමත් කරන්න ඕනෑ. Volumes ගණන වැඩි කරන්න ඕනෑ. ඉස්සර තිබුණේ volume එකයි, දෙකයි. දැන් ඊට වඩා නඩු තීන්දු ප්‍රමාණයක් එළියට එනවා. අද ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ලබා දෙන නඩු තීන්දු සංගෘහීතවීම වැදගත්. මොකද, අපේ රට ශත වර්ෂයකට එහා ගිය නීති සංස්කෘතියක් තිබෙන රටක්. හැමෝම ඒක විවේචනය කළාට, මේ රටේ උරුමය, මේ රටේ වටිනාකම තිබෙන තැනක් තමයි, අධිකරණ පද්ධතිය. මේ අධිකරණ පද්ධතියේ අසාර්ථක තැන් තිබෙනවා වුණාට, වටිනාකම් ගොඩකුත් තිබෙනවා. ඒ වටිනාකම් අපි ඉදිරියට ගෙන යන්න නම්, අපේ නීතිය, විශේෂයෙන්ම උපරිමාධිකරණ නඩු තීන්දු සංගෘහීත කිරීම අවශ්‍යයි. ඒ වෙනුවෙන්

විශේෂිත ඒකකයක් ඇති කරන්න. දැනට තිබෙන ක්‍රමය දුර්වලයි. ඒ පිළිබඳව වග කියන මහත්වරුන්ට, මගේ මිත්‍රයන්ට ඉමහත් ගෞරව සහිතවයි මම මේ කරුණ කියන්නේ. ඊට වඩා වැඩි පිරිසක් ඒවා සංස්කරණයට එන්න ඕනෑ. ඊට වඩා වැඩි මුදලක් ආයෝජනය වෙන්න ඕනෑ. ඒ සඳහා තාක්ෂණිකව පියවර කිහිපයක් ඉදිරියට යන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ නිසා ශ්‍රී ලංකා නීති වාර්තා සංගෘහිත කිරීම සහ ඩිජිටල්කරණය ආශ්‍රිතව ඒකේ availability එක ඇති කරන එක ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඒක වෙනම වැඩක්, වැදගත්ම වැඩක්.

ගරු සභාපතිතුමනි, අපට තවත් ප්‍රශ්නයක් වෙන තැනක් තිබෙනවා. ඒ තමයි, විදේශ රටවල නඩු තීන්දු. ලංකාවේ විවාහ වෙච්ච කෙනෙක් ඕස්ට්‍රේලියාවේදී දික්කසාද තීන්දුවක් ගත්තොත්, ඒ තීන්දුව පිළිගන්න අපේ රටේ අධිකරණ පද්ධතිය තවමත් ඇලිමැළි වෙනවා. ඒ වාගේම විදේශ රටක නඩු තීන්දු, - ඒක දික්කසාද තීන්දුවක් වෙන්න පුළුවන්, වෙනත් තීන්දුවක් වෙන්න පුළුවන් - අපේ රටේ භාවිත කිරීම පිළිබඳව තිබෙන බාධා නැති කර ගන්නත්, ඒ නඩු තීන්දු මේ රටේ ක්‍රියාත්මක කරන්නත්, 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත ගෙනාවා.

ගරු ඇමතිතුමනි, එහි 2. (1) (අ) (ii) වගන්තිය අනුව තිබෙනවා, නියමිත දිනය - appointed date - තීරණය කරන්න තිබෙන්නේ ඔබතුමාට බව. මගේ දැනීමේ හැටියට තවමත් ඔබතුමා ඊට අදාළ ගැසට් පත්‍රය නිකුත් කරලා නැහැ. ඔබතුමා කාර්යබහුල නිසාත්, ගොඩක් වැඩකටයුතු තිබෙන නිසාත් ඒක අතපසු වෙන්න ඇති. නමුත්, කරුණාකරලා ඒක backdate කරලාම නිකුත් කරන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, එය අතපසු වුණේ නැහැ. පානදුර නීතිඥ සංගමය විසින්ම ඒ ගැන මගේ අවධානයට යොමු කරලා, මා දැන් ඒ කටයුත්ත කඩිනම් කරලා තිබෙනවා. ඉතා ඉක්මනින් ඒ ගැසට් පත්‍රය ලැබෙන්න සලස්වනවා. ඒ රටවල් ටික ලැයිස්තුගත කිරීමයි, මේ මොහොතේ කරන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බොහොම ස්තුතියි. ඒක ගැසට් කරද්දී ඒ පනත සම්මත වෙච්ච දවසේ ඉඳලාම බලපැවැත්වෙන පරිදි ගැසට් කරන්න කටයුතු කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඒක ගැසට් නොකරපු බව දන්නේ නැතුව, ලංකාවේ අධිකරණ ගණනාවකම එම පනත යටතේ නඩු තීන්දු ලබා ගෙන තිබෙනවා.

මේක ඉදිරියේදී ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ නිසා ඔබතුමාට ඒ අඩුපාඩුව නිවැරදි කරන්න පුළුවන්. ඒක ඔබතුමාගේ වරදක් නොවෙයි. ඒ ප්‍රශ්නය නිවැරදි කරන්න පුළුවන්, පනත සම්මත කළ දවසේ ඉඳලා නියමිත දිනය ප්‍රකාශ කිරීම මඟින්. ඒක වැදගත් එකක්.

ගරු සභාපතිතුමනි, තවත් වැදගත් ක්ෂේත්‍රයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, දැනටමත් ඔබතුමා භාරයේ තිබෙන බන්ධනාගාර ක්ෂේත්‍රය පිළිබඳව. අපේ රටේ බන්ධනාගාරවල තත්ත්වය ඉතාම බේදනීයයි. කොළඹ තිබෙන බන්ධනාගාර ඉවත් කරනවා. ඒ ඉඩම් විකුණලා වෙනත් ව්‍යාපෘති කරනවා කියන පදනම මත කොළඹ තිබෙන බන්ධනාගාර එකක්වත් සංවර්ධනය කරලා නැහැ, පසුගිය කාලයේ කිසිම ආයෝජනයක් ඒ සඳහා කරලා නැහැ. මොකද, යෝජනාවක් ආපු හැම වෙලාවේම කියන්නේ, ඔය ඉඩම shopping complex එකකට දෙනවා, නැත්නම් වෙනත් ව්‍යාපෘතියකට දෙනවා, නැත්නම් මේ බන්ධනාගාරය ඈතට අරගෙන යනවා, ඒ නිසා මෙතැන ආයෝජනය කරන්න එපා කියලායි. කොළඹ-බොරැල්ලේ තිබෙන වටිනාම ඉඩමක් සුදුසු මොකටද කියලා ඔබතුමන්ලා තීරණය කරන්න.

ගරු අමාත්‍යතුමනි, කළුතර බන්ධනාගාරය ගත්තොත්, ඔබතුමන්ලාට ඊළඟ බේදවාචකය ඇහෙන්නේ එතැනින්. එහි තිබෙන ගොඩනැඟිලි හොඳටම දිරාපත්වෙලා, සනීපාරක්ෂක පහසුකම් අන්තිමයි. විශේෂයෙන් කාන්තාවන්ට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම්වල තත්ත්වය අන්තිමයි. ඒ ගොඩනැඟිලි ඕනෑම වෙලාවක කඩා වැටෙන්න පුළුවන්. සිටිය යුතු ප්‍රමාණයට වඩා හිරකාරයෝ තුන් ගුණයක් විතර ඉන්නවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය කළුතර බන්ධනාගාරය වෙත යොමු කරන්න, ගරු අමාත්‍යතුමනි. "සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" කියලා කිව්වාට, ඔවුන් කෙරෙහි අපට තිබෙන අවධානය බොහොම අඩුයි.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තවත් වැදගත් දෙයක් තිබෙනවා. ඒ, 2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධන පනත. එහිදී දඬුවම් ලබා දීමේ දී අභියාචනාධිකරණයට සහ පහළ අධිකරණවලට රක්ෂණ භාරයේ සිටි කාලය සහ අභියාචනයට යටත්ව රක්ෂණ භාරයේ සිටි කාලය ගණන් කිරීමට අවකාශය ලැබුණා. ගරු ඇමතිතුමනි, නමුත් යම්කිසි ප්‍රමාද දෝෂයක් නිසා දැනටමත් රක්ෂණ භාරයේ සිරකරුවෝ 1,900ක් විතර ඉන්නවා, pending appeals. මේ 2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත ඒ අයට අදාළ වෙන්නේ නැහැ. මේ නිසා 2024.07.01වෙනි දා අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගත්තා, තවත් විශේෂ විධිවිධාන පනතක් - special provisions Act එකක් - ගෙන එන්න. ඒ, කැබිනට් පත්‍රිකා අංක 24/1131/614/048 යටතේ. එය ගෙනාවේ කලින් වරදකරු වෙලා, අභියාචනය කරලා, දැනටමත් බන්ධනාගාරයේ ඉන්න අයටත් මේ සහනය දෙන්න. ඒක වැදගත් එකක්. මොකද අපි ප්‍රතිපත්තිය පිළිගන්නවා නම්, 2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත අනුව මේ වන විට ඉන්න 1,900ක් තරම් විශාල පිරිසකට මේ සහනය ලබා දෙන එක කිසි වරදක් නැහැ. ඒක යුක්තිය, සාධාරණය ඉෂ්ටවීමට හේතුවක් වෙනවා.

ගරු සභාපතිතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව 2020.02.18වෙනි දා ක්ෂේත්‍ර තුනක් පිළිබඳව පරීක්ෂණ කරලා ඒ පිළිබඳව එකඟතාවලට ආවා. පාර්ලිමේන්තුවට ඒ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා, 2020.02.18වෙනි දා. ඒ වාර්තාව අනුව ළමා විවාහ නැති කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ කියන්නේ විවාහ වීමේ අවම වයස හැම පුරවැසියෙකුටම අවුරුදු 18ක් කරන්නත්, ඒ වාගේම නඩත්තු පනතේ තිබෙන අඩුපාඩු නැති කරන්නත්, ඒ වාගේම විවාහ වෙලා ද, නැද්ද කියන කාරණය මත උපදින දරුවන් අසමානතාවකට ලක් කිරීම වැළැක්වීම සඳහාත් නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. මේවා ඉතා වැදගත් නිර්දේශ. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ 2020.02.18 දිනැති වාර්තාවට. ඒ නිර්දේශ ක්‍රියාත්මක කරන එක අසීරු දෙයක් නොවෙයි, ගරු ඇමතිතුමනි. ඒවා හැමෝම පොදුවේ එකඟ වෙච්ච දේවල්. මට වෙලාව නැති නිසා මම ඒවා වෙන වෙනම කියන්නේ නැහැ. මේවා වැදගත් සමාජමය කාරණා.

ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරන ගමන් තවත් එක දෙයක් කියන්නම්. ඔබතුමාගේ විෂයට අයත් වෙනවා,

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

සමථ මණ්ඩල. මේ සමථ මණ්ඩල සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. සියයට 60ක්, 70ක් අතර ප්‍රමාණයක ආරවුල් සමථ මණ්ඩලයේදී විසඳනවා. අපි මේ කටයුත්ත ප්‍රවර්ධනය කරන්න ඕනෑ. අධිකරණවලට යොමුවන නඩු සංඛ්‍යාව අඩු කරන්නත්, මිනිස්සු අතර සුහදතාව ඇති කරන්නත් ඒවා අවශ්‍යයි. මේක වැදගත්ම ක්ෂේත්‍රයක්.

හැබැයි, මෙතැන බාධාවක් තිබෙනවා. සමථ මණ්ඩලය පවත්වන තැන, සමථ මණ්ඩලයට පැමිණිල්ල භාර දෙන තැන, සමථ මණ්ඩල පරීක්ෂණය කරන තැන ගැන ලොකු ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, සෑම සමථ මණ්ඩලයක් සඳහාම කාර්යාලයක් අවශ්‍යයි කියන එක. ඒ කාර්යාලයට අවශ්‍ය වන්නේ ලිපිකරුවෙක් පමණයි. ඒ කියන්නේ සෑම සමථ මූල මණ්ඩලයකටම, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම මේසයක්, පුටුවක් දීලා රජයේ නිලධාරියෙක් පත් කරන්න, පැමිණිලි භාර ගැනීමටත්, ඒ පිළිබඳව ලේඛන සකස් කිරීමට සහ ඒවා නිකුත් කිරීමටත්. එතකොට අධිකරණ කටයුතුවලට පහසුයි, පරිපාලන කටයුතුවලට පහසුයි, ඒ වාගේම ඕනෑම පුරවැසියෙකුට තමන්ගේ පැමිණිල්ල භාර දෙන්නත් පුළුවන්.

ගරු සභාපතිතුමනි, අද වෙලා තිබෙන්නේ මේකයි. සමථ මණ්ඩලයට පැමිණිල්ලක් යොමු කරන්න යා යුත්තේ මොන පන්සලටද, මොන පල්ලියටද, කාගේ ගෙදරට ද කියලා කවුරුවත් දන්නේ නැහැ. තොරතුරු අහගෙන යන්න ඕනෑ. ඒක ලොකු ප්‍රශ්නයක්. සමථ මණ්ඩලය පිළිබඳව වගකියන නිලධාරියෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්නවා නම්, එම නිලධාරියාට පැමිණිල්ල භාර දෙන්න පුළුවන්. ඒ වාගේම සමථ මණ්ඩලයේ පරීක්ෂණ අවසන් වුණාම, ඒ ලිපිගොනු පවත්වාගෙන යන්නත් පුළුවන්. සමහර නඩු කටයුතුවල දී සමථ මණ්ඩලයට ගියා ද, නැද්ද කියන එක වැදගත් දෙයක් වනවා. නමුත් ඒ පිළිබඳව ප්‍රශ්න කරන අවස්ථාවලදී ඒ පැරණි ලිපිගොනු පවත්වාගෙන යන්නේ නැති බව තමයි උත්තරය වශයෙන් ලැබෙන්නේ.

ඒ නිසා හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සමථ මූල මණ්ඩලයකට එක නිලධාරියෙක් බැගින් පත් කරලා, සමථ මණ්ඩල සක්‍රිය කිරීමට කටයුතු කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම සහෝදර නීතිඥවරයෙක් වශයෙනුත්, වැදගත්ම ක්ෂේත්‍රයක් භාරව ඉන්න ඇමතිවරයෙක් වශයෙනුත් ඔබතුමාගේ කටයුතු සාර්ථක වේවා කියාත් මම ප්‍රාර්ථනා කරනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, මූලිකවම enforcement of foreign judgments සම්බන්ධයෙන් අපි රටවල ලැයිස්තු හදලා නීතිපතිවරයාගේ අවසරයට යැව්වා. ඔවුන් නිරීක්ෂණ එවලා තිබෙනවා. ඒ හින්දා ඉතා ඉක්මනින් ඒක ගැසට් කරන්න පුළුවන්. එතැනදී ඔබ කියපු යෝජනාව සාධනීය ලෙස සලකා බැලිය හැකියි. ඒ වාගේම කළුතර prison එකේ buildings තුනෙන් එකක් condemn කරලා තිබෙන්නේ. ඒක demolish කරලා අලුතෙන් හදන්න අපි මේ අවුරුද්දේ ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. මූලිකවම ඔබතුමා කියූ කරුණුවලට අදාළව අපි ඒ කටයුතු ආරම්භ කරලා, විශේෂයෙන් court automation project එක පටන් ගත්තා. ඔබතුමා කියපු එක හරි. ඒ කියන්නේ, ඒක නැවතිලා තිබුණේ. නැවතිලා තිබ්බිව්ව එක අපි ආරම්භ කළා. මම සඳුදා එහි තවත් රැස්වීමක් කැඳවනවා. අපි දැනටමත් ඒ කටයුතු කරන්න පටන් අරගෙන තිබෙනවා; නැවතුණු කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. (Mrs.) Nilanthi Kottahachchi. You have eight minutes.

Before she starts, the Hon. Deputy Chairperson of Committees will take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

[අ.භා. 2.13]

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු අධිකරණ ඇමතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් පී. පෙරේරා මැතිතුමාගේ බොහෝ ගැටලුවලට පිළිතුරු ලබා දුන්නා. කොහොම වුණත්, ඔබතුමාත්, මමත් එකම අධිකරණ සංකීර්ණයේ රාජකාරි කරන නිසා ඔබතුමා කරපු යෝජනාව ගැන මමත් පෞද්ගලිකව සතුටු වෙනවා, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි. කොහොම නමුත්, විපක්ෂය නියෝජනය කරමින් ඔබතුමාත්, ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් මමත් එකම අධිකරණ සංකීර්ණයක සේවය කළත් මම හිතන විධියට ප්‍රමුඛතා පදනම මත පානදුරේ නව අධිකරණය සම්බන්ධයෙන් සලකා බලන්න අපට අවස්ථාවක් ලැබේවි. අපි ඒ ගැන සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජෝන් ඇඩම්ස් කියන නීතිවේදියා පවසනවා, ජනතා ආණ්ඩුවක් කියන්නේ "නීතියේ අධිරාජ්‍යයක්" කියලා. අපිට මේ රටේ බහුතර ජනතාවක් විශාල ජන වරමක් දීලා ජනතා ආණ්ඩුවක් නිර්මාණය කරන්න අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. මේ ජනතා ආණ්ඩුව කියලා කියන්නේ නීතියේ අධිරාජ්‍යයක් බව අපි පුන පුනා කියන්න කැමැතියි. ඒකට හේතුව මේකයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. පසුගිය දශක ගණනාව අවධානයට ලක් කරලා බැලුවොත්, මේ රටේ මහ ජනතාවට නීතියේ ආධිපත්‍යය, නීතියේ විධානය පිළිබඳව තිබුණු විශ්වාසය ඉතා බරපතළ ලෙස බිඳ වැටිලා, ඒක තිබුණේ ඉතාම බිම් මට්ටමක බව අපි දන්නවා. හැබැයි, මේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂයත්, ආණ්ඩු පක්ෂය විධියට අපිත් ඉතා දීර්ඝ කාලයක් විවාද කරලා, වාද පවත්වලා නීති සම්මත කර ගැනීමෙන් පමණක් නීතියේ ආධිපත්‍ය ආරක්ෂා වෙන්නේ නැති බව අපි දන්නවා. ඒ වෙනුවෙන් මේ රටේ උත්තරීතර අධිකරණ පද්ධතිය, ඒ අධිකරණවල අපක්ෂපාතී කාර්යයක නිරත වෙන උගත් විනිශ්චයකාරවරුන්, ඒ වාගේම අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ තිබෙන සියලු ආයතනත්, ඒ ආයතනවල ඉතාම කාර්යශූර ලෙස සේවය කරන කාර්ය මණ්ඩලත් කරන මෙහෙවර මේ රටේ නීතිය පිළිබඳව නැවත වතාවක් මේ රටේ ජනතාවගේ බිඳ වැටුණු විශ්වාසය ගොඩනංවන්න විශාල උත්සාහයක් මේ මොහොතේදීත් දරමින් තිබෙනවා. ජනතාවාදී ආණ්ඩුවක් විධියට අපි උත්සාහ කරනවා, මේ රටේ ජනතාවගෙන් ගිලිහිච්ච ඒ යුක්තිය පිළිබඳව සාධාරණත්වය, නීතිය පිළිබඳව තිබෙන විශ්වාසය නැවත නැවතත්

ඇති කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12වන ව්‍යවස්ථාව තුළ නීතිය ඉදිරියේ සියලුදෙනා සමානයි; සැමට නීතියේ සමාන රැකවරණය ලැබිය යුතුයි කියලා කිව්වාට අපි දන්නවා, ප්‍රායෝගිකව මහ පොළොවේ ඒක එලෙසම සිද්ධ වෙන්නේ නැති බව. අපි දකිනවා, එදිනෙදා ජීවිතයේ නීති ගැටලුවකදී උපදෙස් ලබා ගන්න ගියාම, අධිකරණ කටයුත්තකට නීතිඥවරයෙකුගේ සහායක් ලබා ගන්න ගියාම ඒක ඉතාම මිල අධික කටයුත්තක් බව. මේ රටේ මහ ජනතාවට තමන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටින්න නීතිඥයෙකුගේ සහාය ලබා ගන්න නීතිඥයෙක් ළඟට ගියාම ඒ වෙනුවෙන් විශාල ගාස්තුවක් ගෙවන්න සිදු වන අවස්ථා අපි දැකලා තිබෙනවා.

කෙනෙකුට තමන් වෙනුවෙන් නීතිඥ සහායක් ලබා ගන්න බැරි වන අවස්ථාවලදී රජය ඒ සම්බන්ධයෙන් සහාය ලබා දෙන්න යම් උත්සාහයක් දරලා තිබෙනවා. ඒ අනුව 1978 අංක 27 දරන නීති ආධාර පනත සම්මත කරලා, 1978 සිට මේ රටේ නීති ආධාර කොමිෂන් සභාව පිහිටුවා තිබෙනවා. අද වනකොට මේ නීති ආධාර කොමිෂන් සභාව ආයතන 77ක් විධියට; කාර්යාල 77ක් විධියට මුළු දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන විධියට බොහොම සක්‍රියව ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අපි දන්නවා, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ නීති ආධාරයක් ලබා ගන්න මනුෂ්‍යයෙකුට තිබෙන අයිතිය මානුෂීය අයිතියක් ලෙස පිළිගෙන තිබෙන බව. මේක අපරානුමත කරපු ලංකාවේ පනතේ 4වැනි වගන්තියේ පැහැදිලිව කියා තිබෙනවා, "අපරාධ චෝදනාවක් ගොනු කර ඇති පුද්ගලයෙකුට නීතිඥවරයෙකුගේ සහාය ලබා ගන්න පුළුවන්" කියලා. ඒ වාගේම, එහිම 5වැනි වගන්තියේ ඉතාම හොඳින් පැහැදිලි කරලා තිබෙනවා, දරුවෙක්, එහෙම නැත්නම් ළමයෙක් සාක්ෂිකාරයෙක් වුණත්, චූදිතයෙක් වුණත්, විත්දිතයෙක් වුණත් නඩුකරයකදී කිසිදු වෙනස්කමක් කරන්නේ නැතුව රජය පූර්ණ අනුග්‍රහය සහිතව ඒ දරුවාට විශේෂ වරප්‍රසාද ලබා දෙන්න ඕනෑ කියලා. අපි දන්නවා, මහාධිකරණයක අපරාධ චෝදනා ගොනු කෙරෙනකොට නීතිඥයෙකුගේ සහායක් ලබා ගන්න බැරි වුණාම රජය ඒ තැනැත්තා වෙනුවෙන් රජයේ වියදමින් ආදේශිත නීතිඥවරයෙක් පත් කරන බව. ඒ අනුව එම නඩු කටයුත්ත ඔහුට භාර දෙනවා. ඇයි, ඒ? ඒ, මේ රටේ මිනිස්සුන්ට යම්කිසි නෛතික ගැටලුවකදී ඒ වෙනුවෙන් නීතිඥ නියෝජනයක් සහිතව තමන් වෙනුවෙන් යුක්තිය සොයා ගන්න, සාධාරණත්වය ඉෂ්ට කරගන්න අවස්ථාවක් ලැබිය යුතු නිසායි.

හැබැයි, කනගාටුවට කරුණ මෙයයි. අපි දන්නවා, නීති ආධාර කොමිෂන් සභාවේ මේ දක්වා අනුමත සේවක සංඛ්‍යාව 360ක් වුණත්, මේ වෙද්දි සේවයේ නිරත වෙලා ඉන්නේ 267දෙනෙක් විතරයි කියන එක. ඒ අනුව 93දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා. ඒ වාගේම ඉතා සීමිත ඉඩකඩක තමයි මේ කාර්යාල තිබෙන්නේ. කළුතර දිස්ත්‍රික්කය ගත්තොත් මතුගම, කළුතර, හොරණ, පානදුර යන ප්‍රදේශවල ඉතාම කුඩා බිම්කඩක; කුඩා කාර්යාලයක තමයි මේ නීති ආධාර කොමිෂන් සභාව යටතේ තිබෙන කාර්යාල පවත්වාගෙන යන්නේ. ඉතා අවම පහසුකම් සහිතව නමුත් ඉතාම හොඳින් ජනතාව වෙනුවෙන් මේ සේවය ලබා දීමට; නීති ආධාර ලබා දීමට ඔවුන් ඇපකැප වී ඉන්නවා. අපි ආණ්ඩුවක් විධියට බලාපොරොත්තු වෙනවා, මේ නීති ආධාර කොමිෂන් සභා ජාලය තව ටිකක් ව්‍යාප්ත කරන්න. විශේෂයෙන්ම බිබිල, කයිට්ස්, ආණමඩුව, වලපනේ, ගම්පොල, රුවන්වැල්ල යන ප්‍රදේශවල පිහිටි අධිකරණවලට මේ නීති ආධාර මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අපි උත්සාහයක් දරනවා.

ඒ වාගේම අපි දන්නවා, දුප්පත්කම, නූගත්කම සහ සමාජ අසමානතාව තමයි රටක අපරාධ සහ අත්හරින්න බැරි සමහර ඇබ්බැහිවීම්වලට හේතු වෙලා තිබෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමීයනි, යම් රාජ්‍යයක් ඒ රටේ ජීවත් වන ජනතාවට අවම වැටුපක් නම් ප්‍රදානය කරන්නේ, මිනී මැරුමක් කරන පුද්ගලයෙකු සිදු කරන ඒ අපරාධයට වඩා දරුණු අපරාධයක් තමයි ඒ කරන්නේ කියලා මම හිතනවා. අපි රජයක් විධියට මෙවර අය වැයෙන් රාජ්‍ය සේවකයන්ට ඉතිහාසයේ වැඩිම වැටුප් වර්ධකය ලබා දෙන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමීයනි, සුපිරි අවන්හල්වල සේවය කරන සමහර සේවකයෝ ඉන්නවා. හැබැයි, තමන්ගේ දරුවාට ඒ අවන්හලෙන් ආහාර වේලක් ලබා දෙන්න තරම් ඔවුන්ට වත්කමක් නැහැ, තමන් ඒ අවන්හලේ සේවය කළා කියලා. තමන්ට තමන් පිළිබඳව ඇති වන කම්පාව, සමාජය තුළින් ඔවුන්ට සිද්ධ වන අසාධාරණකම් සහ අසමානතාව හරහා ඔවුන්ව නැවත නැවතත් අපරාධ කරන්න, යම්කිසි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන්න සහ සමාජ දුරාචාරයන්ට පෙලඹෙන්න ඇති කරන මූලය හොයාගෙන ඒ මූලයන්ට ප්‍රතිකාර කිරීම තමයි ආණ්ඩුවක් විධියට අපි මේ ජනතාවාදී අය වැය ඉදිරිපත් කිරීම තුළින් බලාපොරොත්තු වෙන්නේ. මම හිතන විධියට, මේ අපරාධ සංඛ්‍යාව දිනෙන් දින වැඩි වෙනවා නම් අපිට ඒවායේ යම් මර්දනයක් කරගන්න පුළුවන් බන්ධනාගාර ඉදි කිරීමෙන්වත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන ජාලය විවෘත කිරීමෙන්වත් නොවෙයි. මේවායේ හේතුව හොයාගෙන ඒ ආර්ථික විෂමතාවට, ඒ අසමානතාවන්ට පිළිතුරු සෙවිය යුතුයි කියන තැනක අපි ඉන්නවා. ඒ අවබෝධය ඇති නිසා තමයි අපි මෙවර අය වැයෙන් කිසිදු ආණ්ඩුවක් මෙතෙක් ඉතිහාසයේ අවධානයට ලක් නොකරපු ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරලා තිබෙන්නේ.

නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා සඳහන් කළා, "සමහර නීතිඥයන් අපරාධවලදී යම් යම් සහයෝගයන් ලබා දෙනවා" කියලා, ජනාධිපතිතුමා ඊයේ සිදු කළ කථාවේදී ඒ මන්ත්‍රීතුමාගේ මුහුණ දිහා බලාගෙන කිව්වාය කියලා.

මම කියන්න කැමැතියි, ජනාධිපතිතුමා මුහුණ බලාගෙන එතුමා ඉලක්ක කරගෙන එහෙම කථාවක් ප්‍රකාශ කළේ නැති බව. මේ කථා කළේ සමස්ත නීතිඥවරුන් ගැන නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමීය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමීයනි.

මේ කථා කළේ සමස්ත නීතිඥ ප්‍රජාව ගැන නොවෙයි. ඒක විශේෂයෙන් මේ මොහොතේදී පාර්ලිමේන්තුවේ අවධාරණය කරන්න ඕනෑ, මමත් නීතිඥවරියක් විධියට. මේ ලෝගුවේ ගෞරවය ආරක්ෂා කරන නීතිඥ වෘත්තිකයන් ඕනෑ තරම් මේ රටේ ඉන්නවා. හැබැයි, ඒ ගෞරවය ආරක්ෂා කර ගන්න බැරි වෙච්ච නීතිඥවරුනුත් මේ රටේ ඕනෑ තරම් ඉන්න බවටත් වූ දැනුම, අවබෝධය සහිතව තමයි ජනාධිපතිතුමා ඒ ප්‍රකාශය කළේ. ඒ බව මතක් කරමින් මම මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය සභාපතිතුමීය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார*)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඉතා වැදගත් අදහස් ගොඩක් ඉදිරිපත් කළ නිසා මම ඒ කාරණා පිළිබඳ සොයා බැලුවා. ගරු මන්ත්‍රීතුමනි, 2024 අංක 2 දරන සමඵ මණ්ඩල (සංශෝධන) පනත දැන් බලාත්මකයි. එහි 3 (1අ) හි සඳහන් වන කොටසක් මම කියවන්නම්. මොකද, ඔබතුමා නඟපු ප්‍රශ්නයට එතැන පිළිතුරක් තිබෙන නිසා.

සමඵ මණ්ඩල (සංශෝධන) පනතේ 3(1අ) හි මෙසේ සඳහන් වනවා:

> "අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කරනු ලැබිය යුතු, එක් එක් සමඵ මණ්ඩල ප්‍රදේශයක් පවරනු ලැබ ඇති යම් නිලධරයකු සිටිය යුතු ය. එකී නිලධරයා විසින්, එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති යම් සමඵ මණ්ඩල ප්‍රදේශයක් සඳහා පත් කරනු ලැබ ඇති සමඵකාරවරුන්ගේ මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක් භාරගනු ලැබිය යුතු ය..."

ඒ කියන්නේ මේ ඉල්ලීම් භාර දෙන්න,- මේක ක්‍රියාව හරහා තව වැඩිදියුණු කරන්න පුළුවන්. නමුත්, දැනටමත් පනතේ ප්‍රතිපාදන තිබෙනවා, ඔවුන්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ස්ථානගත කරන්න. නමුත්, ඔබතුමා කියපු ගැටලු තිබෙනවා. ඒවා විසඳා ගන්න මේ පනත බලාත්මකයි. ඒ අනුව කටයුතු කරන්න පුළුවන්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුවේ, නෛතික කටයුතු සම්බන්ධයෙන් වන ආංශික අධීක්ෂණ කාරක සභාවේ යෝජනාවක් අනුව තමයි එය ක්‍රියාත්මක වුණේ. මට අමතක වුණා පනත තිබෙන බව කියන්න. දැන් කරන්න ඕනෑ ප්‍රායෝගිකව මේක යථාර්ථවත් කිරීමට අවශ්‍ය දේ ඔබතුමා පරීක්ෂා කර බලන්න, හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම එහෙම තිබෙනවාද කියන කාරණය. එහෙම තිබෙනවා නම් සහ ඒ අයට අවශ්‍ය පහසුකම් තිබෙනවා නම් හරි. නමුත්, අපේ අවබෝධය තමයි හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම එහෙම වෙන්නේ නැහැ කියන එක.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார*)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

පහසුකම් නැත්නම් පහසුකම් ඇති කරමු. නමුත්, පනත අපි බලාත්මක කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.23]

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන තුන්වැනි දිනය අද. අද අපි කථා කරන්නේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි. මෙම විවාදයට එකතු වෙන්න ලැබීම ගැන මම සතුටු වනවා. හැම නීතිඥයෙකුම එක වාගේ නෙවෙයි. ඒ වාගේම හැම නීතිඥයෙකුම කරන කාර්යය පිළිබඳව කථා කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, බොරුවක් බව දැනගෙන එය ඇත්තක් විධියට කියන්නත්, ඇත්ත බොරුවක් විධියට කියන්නත් නීතිඥයන් කටයුතු කරන සමාජයක අපි ඉන්නේ. මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමියට මම කියන්න කැමැතියි, බොරු කීම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් කියන කාරණය මේ සමාජයට අලුතින් එකතු කරපු නීතිඥ මහත්ම මහත්මීන් ඉන්න බව අපි අමතක කළ යුතු නැති බව.

ඊයේ හවස් වරුවේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාළු ගෙයි වළං බින්දා. සාමාන්‍යයෙන් ඒක එතුමාගේ හැටි. ඉතිහාසයෙත් එහෙම තමයි. නීතිඥවරු වාහනවල යනවා කිව්වා, ආණ්ඩු ගන්න. අද අධිකරණ ඇමතිතුමා දිහා බැලුවාම යම් දෙයක් මට මතක් වෙනවා. අරගළ කාලයේ සමාජ මාධ්‍ය තුළින් මම දැක්කා, රැවුල වවාගෙන හද්ද පිටිසරින් ආපු අරගළකරුවෙකු බෑග් එකක් කරේ එල්ලා ගෙන මේ පාර්ලිමේන්තු වටරවුමේ ලාල් කාන්ත මහත්මයාත් එක්ක පාර්ලිමේන්තුව ගිනි තියන්න එන්න කියන කථාව. ඒ කථාව ඇහෙන්න සලස්වන්න දෙනවා නම් ඒක මරු කථාව. "හැමෝම එන්න, අවසාන සටන, අවසාන අරගළය, අපි මේ පාර්ලිමේන්තුව වටලන්න යන්නේ" එහෙම තමයි කියන්නේ. මට සැකයක් තිබෙනවා, ඒ අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ද කියලා. මොකද, ඒ වාගේමයි. ඒ තරම් ඒ අරගළයට පණ පොවලා, ඒ අරගළය හරහා ගිනි තැබීම් කරලා, පාර්ලිමේන්තුව ගිනි තියන්න ආපු උදවියත් ආණ්ඩුව ලබා ගන්න කටයුතු කළා කියලා ජනාධිපතිතුමාට පොඩ්ඩක් මතක් කරන්න හිතුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ කාලයේ එහෙම රහපෑවා තමන්ට ආණ්ඩුව ගන්න. අදත් ඒක නේ වෙන්නේ.

බලය ගන්න අසත්‍ය කිව්වා, දැනගෙන අසත්‍ය කිව්වා. අද ඔබතුමන්ලාට බොරු කරන්න බැහැ. මොකද, අද ඔබතුමන්ලා බලයේ ඉන්නේ. මේ ආණ්ඩුවේ ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා 2023.06.04වන දා නවසීලන්තයේදී කියපු කථාවක් තිබෙනවා. ඒ කථාව මා ළඟ තිබෙනවා. පාර්ලිමේන්තුවේ අවසරය දෙනවා ඒක දමන්න පුළුවන්.

එතුමා කියනවා, "අපි ආණ්ඩුව භාර අරගෙන සතියක් ඇතුළත 60ක්, 70ක් ඇතුළට දමනවා" කියලා. මේ අමාත්‍යාංශය මත තමයි මේ ආණ්ඩුව පවතින්නේ; හොඳට මතක තබා ගන්න. මේ අමාත්‍යාංශය තුළින් ඉටු විය යුත්තේ සමාජ සාධාරණත්වය. මේ රටේ නිවැරදි දේශපාලන සංස්කෘතියක්, නීතියක්, නීතියට සාධාරණත්වයක් බලාපොරොත්තුවෙන් මේ රටේ බහුතර පිරිසක් ඔබතුමන්ලාට ඡන්දය දීලා තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ පැවැත්ම තිබෙන්නේ වෙන කොතැනකවත් නොවෙයි, මේ අමාත්‍යාංශය මත. මේ කථා කරන අපේ බලාපොරොත්තුවත් ඒක.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා එදා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට ෆයිල් 400ක් එතුමාගේ ඩබල් කැබ් එකේ පිටුපස තියාගෙන හිටියා. ඒක ඔබතුමන්ලාට අලුතෙන් කියන්න දෙයක් නැහැ නේ. අපට කියන්න, ඔබතුමාගේ පිළිතුරු කථාවේදී හරි, ඒ ෆයිල් 400 ඇතුළේ තිබෙන හොරකම් ඇත්තද, ඒවා කරපු උදවිය කවුද කියලා. දැන් දින 60, 70 ගැන කථාව පැත්තක දමන්න. ඉදිරි කාලයේදී මේ රටේ නීතිය භාර ඇමතිවරයා හැටියට නීතිය හරියට ක්‍රියාත්මක කරලා කටයුතු කරන්න. ඒ හොරකම් කරපු ජාවාරම්කාර ආණ්ඩුවල හිටපු මැති ඇමතිවරුන්ගේ නම් ගම් කියලා, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා එදා විපක්ෂයේ ඉඳගෙන කථා කළා. එහෙම නම් ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා. ඔබතුමන්ලා බලයට ගෙන එන්න ජාති ආගම්, කුල, පක්ෂ පාට

භේද අමතක කරලා ඡන්දය දීපු උදවිය බලාගෙන ඉන්නවා, මේ රට බංකොලොත් කරපු උදවිය කවුද කියන කාරණය දැන ගන්න. ඒ අය නීතිය හමුවට ගෙනැල්ලා දඬුවම් දෙනකල් බලාගෙන ඉන්නවා.

අපිත් එහෙමයි. සමගි ජන බලවේගය හැදෙනකොට අපි අත් දෙකම ඔසවලා ගිහිල්ලා එතැන වාඩි වුණේ ඇයි? අපටත් ඉන්න තිබුණා, රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක. රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා -එදා අපේ පක්ෂයේ නායකයා- ආණ්ඩුව භාර අරගෙන මහ බැංකු බැදුම්කර වංචාව සිද්ධ කරනකොට මේ පාර්ලිමේන්තුවේ පසුපෙළ මන්ත්‍රීවරු වශයෙන් ඉඳගෙන අපි තමයි කෑ ගහලා කිව්වේ, ඔවුන්ට දඬුවම් දෙන්න කියලා; කවුද කියලා කියන්න කියලා. ඒකට විවිධාකාරයෙන් සම්බන්ධ වෙච්ච පුද්ගලයන් ඉන්න ඇති. හැබැයි, අපි ගමේ ඉඳලා දේශපාලනය කරලායි ආවේ, මේ NPP ආණ්ඩුවේ ඉන්න NPPකාරයෝ වාගේ, JVPකාරයෝ වාගේ නොවෙයි.

මේ ජාතික ජන බලවේගය කියන පක්ෂය ඇතුළේ ඉන්නවා, අපි වාගේම අවංකව ගමේ රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්න ඕනෑය කියන අදහසේ ඉන්න උදවිය, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අන්න එතැනට තමයි ජනාධිපතිතුමා හැමදාම කථා කරන්නේ. අන්න එතැනට තමයි සභානායකතුමා කථා කරන්නේ. රටේ ජනතාවට ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා මේ මංකොල්ලකාරයෝ, තක්කඩි ටික අල්ලන්න. හැබැයි, රටේ ජනතාව දන්නේ නැහැ, ඒ හොරුත් එක්ක එකට ඉඳගෙන අත්වැල් බැඳගෙන හොරා කාපු උදවිය තමයි JVPකාරයෝ ටික කියලා.

එදා විපක්ෂයේ අර අතන ඉන්නකොට අනුර කුමාර දිසානායක මහත්මයා කෑ ගහගෙන හිටියා, රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති කාලයේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රනිල් වික්‍රමසිංහ මහත්මයා නැඟිටලා එක කථාවයි කිව්වේ අනුර කුමාර මහත්මයාට; අදටත් උත්තර නැහැ. මොකක්ද කිව්වේ? "අනුර කුමාර ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ හැම දේම මම දන්නවා, හැමදේම දැනගෙන කියන්නේ නැහැ, කිව්වොත් ඔබතුමාට පක්ෂයත් නැති වෙයි, රටත් දාලා යන්න වෙයි" කිව්වා. හැන්සාඩ් වාර්තාවල තිබෙනවා. අනුර කුමාර මහත්මයා වාඩි වුණා. ඒ නිසා මේ NPP එක කියලා හදවතින්ම ඇවිල්ලා ඉන්න උගත් වියත් බුද්ධිමතුන්ට අපි කියන්නේ, සටන් කරන්න ඇතුළේ. අපිත් සටන් කළා; අදත් සටන් කරනවා. ඒ හොර ජාවාරම් එක්ක බැඳිච්ච හොරු ඔබතුමන්ලාගේ පක්ෂයේත් ඉන්නවා. හොරා කාලා අත යට ගනුදෙනු කරපු උදවිය ඉන්නවා. ඒ අය ඔබතුමන්ලාගේ අවංකත්වය පාවිච්චි කරන්නේ, මේ රට විනාශ කරන්න. ඒ නිසා කථාවෙන් මේ රට කරන්න බැහැ. කථාවෙන් හොරු අල්ලන්න බැහැ. කථාවෙන් හොරු ඇල්ලෙන්නේත් නැහැ. එහෙම නම් අධිකරණ පද්ධතිය තුළ තිබෙන අර කොලේ වහලා ගහලා, වංගු ගහලා ක්‍රියාත්මක කරන නීති සියල්ල අයින් කරලා, ඔබතුමන්ලා කියපු විධියට ඒ නීතිය මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන්න ගෙන එන්න, චමින්ද විජේසිරි අත් දෙකම ඔසවනවා, හොරකම් කරලා, වංචා දූෂණ කරලා තිබෙන කවුරු වුණත් අල්ලනවා නම්. හැබැයි එහෙම කථා කළාම මොකක්ද කියන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි? අර අශික්ෂිත, මෙතුමන්ලාගේ සම්ප්‍රදාය තුළ කාට හරි මඩක් හදලා, කාටහරි හොරකමක් ගැන කියලා, කාගේ හරි ගනුදෙනුවක් ගැන කියලා කෑ ගහලා, ඒ අවංක වැඩ පිළිවෙළ වහන්න කටයුතු කරනවා.

"කෝපිකඩේ" නාට්‍යයේ ඉන්නවා, "අබිලිං" කියලා චරිතයක්. හැමෝටම මඩ ගහනවා. ඔබතුමන්ලාගේ නායකයා වාගේ - ඔය ඉදිරි පෙළේ ඉන්න මනුස්සයා වාගේ. කථාව විතරයි. හැබැයි ඒක ඔප්පු කරලා පෙන්නන්න තරම් කොන්දක් නැහැ.

ඒවා කියනවා පාර්ලිමේන්තුවට ඇවිල්ලා. හැබැයි, තමුන්නාන්සේලාට බලය තිබෙනවා. විධායක ජනාධිපති තමුන්නාන්සේලාගේ. ඒ වාගේම අධිකරණ ඇමති ඉන්නවා, පොලීසිය භාර ඇමති ඉන්නවා. එක හොරෙක් ඇල්ලුවා ද? ලජ්ජා වෙන්න ඕනෑ. අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා ගේනවා කිව්වා; දවස් 4න් ගේනවා කිව්වා. අප ළඟ ඒ වීඩියෝ පට තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජනතාව ඕවා ඇත්තටම විශ්වාස කළා. NPP එකේ මේ මන්ත්‍රීවරුත් විශ්වාස කරන්න ඇති. අපිත් ඒ කාලයේ අපේ හිටපු නායකයන් කියපු ඒවා අහලා, ඒවා ගමේ ගිහිල්ලා කිව්වා. හැබැයි, ඒ අය යාළුවෝ. ඒ අය එකතු වෙලා අපව පාවිච්චි කරලා ඒ අයගේ දේශපාලන ව්‍යාපාරය කරනවා.

නමුත්, සමඟි ජන බලවේගය ඇතුළේ එහෙම කරන්න ඉඩ නැහැ. එහෙම ඉඩ දෙන්නේත් නැහැ. එහෙම කරනවා නම් අපි ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා. යාළුකම්වලින් -මිත්‍රකම්වලින්- එහා ගිය දේශපාලන ගමනක් යන්න පුළුවන් හොඳ කණ්ඩායමක් අපට ඉන්නවා. හර්ෂ ද සිල්වා මැතිතුමා, අජිත් පී. පෙරේරා මැතිතුමා, කබීර් හෂීම් මැතිතුමා, අපේ නායකතුමා, ගයන්ත කරුණාතිලක මැතිතුමා, මුජිබුර් රහුමාන් මැතිතුමා, එස්.එම්. මරික්කාර් මැතිතුමා ඇතුළු අපි හිටපු පක්ෂයෙන් වෙන් වෙලා සජබය හැදුවේ ඒ හොර නඩය එකට එකතු වෙලා අපේ ආත්ම ගරුත්වය, අපේ දේශපාලනය පාවා දෙන නිසා. ඒ නිසා මම NPP එක ඇතුළේ ඉන්න හැමෝටම ආරාධනාවක් කරනවා. ඔබතුමන්ලාගේ ගෞරවය, ඔබතුමන්ලාගේ දක්ෂතාව, ඔබතුමන්ලාගේ හැකියාව පාවිච්චි කරන්න දෙන්න එපා, මේ ඉදිරි පෙළේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

තමන්ගේ අම්මා, තාත්තා රස්සාව අරගෙන තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාගෙන්. හොයලා බලන්න. උදේ පාන්දර නැඟිටලා ඔය බැන්නාට, කෑ ගැහුවාට ඔය ඉදිරි පෙළේ ඉන්න සමහර ඇමතිවරුන්ගේ අම්මාට රස්සාව දීලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා. නමුත්, කෑ ගහනවා, "රාජපක්ෂලා හොරු" කියලා. මේ ඉදිරි පෙළේ ඉඳන් "රාජපක්ෂලා හොරු, හොරු" කිව්වාට, රාජපක්ෂලා තමයි එයාලාගේ පවුල් පෝෂණය කරලා තිබෙන්නේ; අම්මාට, තාත්තාට රස්සාව දීලා තිබෙන්නේ. ඒවා ඩීල් නොවෙයි ද? එම නිසා මේ ඩීල් සංස්කෘතිය ඔබතුමන්ලා තුළත් තිබෙනවා. එයින් ගැලවෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න.

අද මොකක්ද සමාජය කථා කරන්නේ? ඔබතුමන්ලා ආණ්ඩු බලය ගන්න මේ රට තුළ අරගළ හැදුවා. ඒ අරගළයේ ප්‍රධාන සටන් පාඨය තමයි "උනුත් එකයි, මුනුත් එකයි" කියන එක; "උනුත් එකයි, මුනුත් එකයි. අපට බලය දෙන්න. අපි මේ රට හදන්නම්" කිව්වා. අද මොකක්ද ගරු ඇමතිවරුනි, ගරු මන්ත්‍රීවරුනි, සමාජය කියන්නේ? "උනුත් එකයි, මුනුත් එකයි, තොපිත් එකයි" කියලායි. දැන් ඒකෙ වෙනසක් නැහැ. "උනුත් එකයි, මුනුත් එකයි, තොපිත් එකයි" කියන තැනට අද සමාජය පත් වෙලා තිබෙන්නේ ඇයි? මෙතැන අවංකව වැඩ කරන්න ඕනෑ කියලා හිතන කණ්ඩායමක් ඉන්නවා. ඒ කණ්ඩායමේ අදහස්, උදහස් පැත්තක තියලා මේ දේශපාලන බොර දියේ වාසි ගැනීමේ වැඩ පිළිවෙළ නිවැරැදි කරන්න පුළුවන් හයිය ගරු ඇමතිතුමාගෙන් අද අපි බලාපොරොත්තු වෙනවා. එම නිසා ගරු අධිකරණ ඇමතිතුමනි, ඒ සඳහා අවශ්‍ය වන පරිදි ඔබතුමා මේ නීති පද්ධතිය හදන්න. විගණකාධිපති දෙපාර්තමේන්තුවටයි, මේ පාර්ලිමේන්තුවේ COPE එකේදීයි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදීයි අනාවරණය වන හොරකම්, වංචා, දූෂණ සියල්ල මාධ්‍යයට සීමා වෙනවා නේ, ගරු ඇමතිතුමනි. එතැනින් එහාට කොහේටද යන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි? දැන් ඔබත් එහෙම නේ යන්නේ.

[ගරු චමින්ද විජේසිරි මහතා]

අපි දැක්කා, සුනිල් හඳුන්නෙත්ති මහත්මයාලා පසුගිය කාලයේ විපක්ෂයේ ඉන්න කොට COPE එකේදී විශාල වංචා, දූෂණ පිළිබඳව කථා කළා. ඒවා තමයි ඔබතුමන්ලා ෆයිල් හැටියට හදාගෙන ඉන්නේ. හැබැයි, ඒවා වංචා, දූෂණ කියන කාරණය ඔප්පු කරන්න පුළුවන් හරියාකාර වැඩ පිළිවෙළක් අද මේ මොහොත වනකල්ම හදලා නැහැ. පාර්ලිමේන්තුවේ කාරක සභාවලදී අප නීත්‍යානුකූලව සොයා ගන්නා වැරැදිවලට අදාළ වැරදිකාරයෝ කුදලලා, හිරේ දැමීමට අවශ්‍ය නීති සැදීමේ අයිතිය හැත්තෑභය අවුරුද්දකට පස්සේ තමුන්නාන්සේට භාර වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. අන්න ඒක කරන්න. අපි සහයෝගය දෙන්නම්. ඒකයි අපට ඕනෑ. හැබැයි, ජනතාවට හොරු අල්ලනවා කියලා, වංචා ගැන කියලා, දූෂණ ගැන කියලා, ඒවා මතින් බලයට ඇවිල්ලා තවමත් ඒ ගැනම කියනවා නම්, තවමත් ඒ හොරකම් ගැනම මතක් කරනවා නම්, ඒක ඔබේ නොහැකියාව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunathilleka)
විපක්ෂය පැත්තෙන් මෙතුමාට වැඩිපුර විනාඩියක කාලයක් දෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
එහෙම නම්, ඔබතුමාට තවත් විනාඩි තුනක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
එහෙම නම් ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමන්ලා අද ෆේල් නේ. මීට අවුරුදු තුනකට කලින් පෝලිම් ඇති වුණේ ඇයි? ඩොලර් නැති වීම, හොරා කෑම ඇතුළු අනම්මනම් ඔක්කෝම නිසා කියලා හිතන්න කෝ. "අපට සංචිත නැති වුණා, තෙල් ගේන්න විධියක් නැති වුණා, ඒ නිසා පෝලිම් ඇති වුණා" කියන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඇයි අද පෝලිම් ඇති වෙලා තිබෙන්නේ? ඩීසල් නැති වෙලා ද? සංචිත නැති වෙලා ද? ඉන්ධන නැති වෙලා නැහැ කියලා ඇමතිවරයා කියනවා. ඉන්ධන ඕනෑ තරම් තිබෙනවා, සංචිතත් ඕනෑ තරම් තිබෙනවා. නමුත්, කළමනාකරණය කර ගන්න දන්නේ නැහැ; උද්ධව්වකම වැඩියි. ඔය උද්ධව්වකම නිසා තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ගහලා එළෙව්වේ. ඔය තක්කඩිකම නිසා තමයි පසුගිය ආණ්ඩුවට ගෙදර යන්න සිද්ධ වුණේ. තක්කඩි වෙන්න එපා, මිනිස්සු මහ පාරේ දුක් විඳිනවා. ඒ දුක් විඳින මිනිසුන්ට දුක් නොවිඳ ඉන්න පුළුවන් වන ක්‍රියාමාර්ගය, වැඩ පිළිවෙළ ඔබතුමන්ලා හදන්න.

ඩීසල් නැති වෙයි, භූමිතෙල් නැති වෙයි කියන බයට බොහෝ දෙනා මහ පාරේ පෝලිම්වල ඉන්න ඒ පෝලිම් යුගය අද ඇති වෙලා තිබෙනවා. ඒ, සංචිත නැති නිසා නොවෙයි, ඩොලර් නැති නිසා නොවෙයි, ඉන්ධන නැති නිසා නොවෙයි; ඔබතුමන්ලාගේ අකාර්යක්ෂම බව නිසා, ඔබතුමන්ලාට මේ ගමන යන්න බැරි නිසා. අන්න ඒක තේරුම් අරගෙන, ඔබතුමන්ලාට ඡන්දය දුන් නුදුන් මේ රටේ සියලුදෙනාගේ ආණ්ඩුව හැටියට හොඳ ගමනක් යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න. ඒකට සහයෝගය දෙන්න පුළුවන් මානසිකත්වයක් අපට තිබෙනවා. අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඒ නියෝජනය ලබා දෙනවා. එතුමා එදා රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවටත් ඒ සහයෝගය දුන්නා. ඇයි ඒ? අපි රටට අවංකව ආදරෙයි. එහෙම හැඟීමකින් අපි දේශපාලනය කරන්නේ. අපට එහෙම දේශපාලනය කරන්න පුළුවන්කම තිබෙනවා.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත කියලා පනතක් තිබෙනවා. ඒකත් පසුගිය කාලයේ පාවිච්චි කළේ මොනවාටද කියලා අපේ නියෝජ්‍ය මහ ලේකම්තුමා හොඳින්ම දන්නවා. ඒ ගැනත් අපි දන්නවා. ජනාධිපතිතුමා කියන විධියට මුළු නීති පද්ධතියම, ඒ සියල්ල ආණ්ඩුවට -රජයට- අවශ්‍ය විධියට හදනවා නම්, රජයට ගැළපෙන විධියට හදනවා නම් ඒවා හැදීමේ වගකීම තමයි තමුන්නාන්සේට භාර දීලා තිබෙන්නේ, ගරු අධිකරණ ඇමතිතුමනි.

අද අධිකරණ ක්ෂේත්‍රය දිහා බැලුවාම, උසාවිවලට නඩු ගොනු කළාම ඒ උසාවි තුළ තිබෙන සමහර කාරණාත් එක්ක ඒ නඩුවලට අදාළව සාධාරණය ඉටු වනවා වාගේම අසාධාරණයක් සිද්ධ වෙන්න පුළුවන්. අසාධාරණයක් සිද්ධ වුණා කියලා හැඟෙන කොට ඒක appeal කරලා ඉදිරියට යන කොට නැවත නැවතත් ඒ නඩුවට අදාළව සිදු වන අසාධාරණය පිළිබඳව විවිධ තැන්වල ජනතාව කථා කරනවා. එවැනි වෙලාවක එයට මැදිහත් වෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් තිබෙනවා; ඒ බව අපි දන්නවා. හැබැයි ඒක ප්‍රමාණවත් නැහැ. මීට පෙර කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමියක් ද ඒ ගැන සඳහන් කළා. මොකද, අන්ත දුප්පත්, අසරණ මිනිසුන්ට නඩු කටයුතුවලදී සිදු වන අසාධාරණය වෙනුවෙන් පෙනී සිටීමේදී, මුදල් අය කර ගැනීමේදී තිබෙන අඩු පාඩු මඟ හැරවීම විධිමත්ව කරන්න කියන ඉල්ලීම මම කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම මීට වඩා කාලය ගන්නේ නැහැ. තමුන්නාන්සේලා කියපු විධියට පසුගිය අවුරුදු 76 තිස්සේ අනීතිකව මේ රට බංකොලොත් කරන්න කටයුතු කළ සියලුදෙනා නීතියේ රැහැනට ගේන්න. තමුන්නාන්සේලා එය කරාවි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

මම අවසාන වශයෙනුත් ඉල්ලීමක් කරනවා. සමගි ජන බලවේගයේ අපි මේ රට බංකොලොත් කළා කියන උදවියට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දැම්මා. ගෝඨාභය රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ, අජිත් නිවාඩ් කබ්‍රාල් ඇතුළු සියලුදෙනාම වැරදිකාරයන් හැටියට අපි ඔප්පු කරලා තිබෙනවා. අන්න, ඔබතුමන්ලාට පුළුවන් නම් ඒ කටයුත්ත ඉදිරියට ගෙනිහිල්ලා ඒ බංකොලොත්කාරයන් නීතිය හමුවට ගෙනිහිල්ලා කූඩු කරන්න. අපි ආණ්ඩුවක් තියාගෙන නොවෙයි ඒ අයට දඬුවම් දුන්නේ. ඒක හොඳට මතක තියාගන්න. විපක්ෂයේ, සමගි ජන බලවේගයේ සජිත් ප්‍රේමදාස මැතිතුමා, අජිත් පී. පෙරේරා මැතිතුමා ඇතුළු අපේ විපක්ෂයේ බලය එදා පාවිච්චි කරලා ඒ ආණ්ඩුවේ ඒ බංකොලොත්කාරයන්, ඒ උදවිය රටම විනාශ කළා කියලා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවකින් වැරදිකාරයන් කරලා තිබෙනවා. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, ඒ කටයුත්ත ඉදිරියට ගෙනිහිල්ලා, වැරදිකාරයන් කූඩු කරලා, ඒ බංකොලොත්කාරයන්ගේ සියලු දේවල් රාජසන්තක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න කියලා. අපේ සහයෝගය ඔබතුමන්ලාට දෙන්නම් කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.38]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට විනාඩි 15ක් තිබුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විනාඩි 15 දැන් 10කට අඩු වෙලා තිබෙනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතුමාට තව විනාඩි 2ක කාලයක් දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම අධිකරණයත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවත් ඇතුළු ආයතන අයත් වන අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳ විවාදයට සහභාගි වෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මා අධිකරණ ක්ෂේත්‍රය තුළ අවුරුදු 26ක් කටයුතු කරලා ලැබූ අත්දැකීම් එක්ක තමයි මේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරන්නේ. ඒ අවුරුදු 26 ඇතුළේ අධිකරණ පද්ධතිය තුළ මා හඳුනා ගත් අඩු පාඩු රාශියක් තිබෙනවා. ඒවා ගැන මම පෞද්ගලිකවත් විෂය භාර අමාත්‍යවරයාට කියලා තිබෙනවා. විශේෂයෙන්ම record roomsවල තිබෙන අඩු පාඩුකම්, photocopy machinesවලට අදාළ ප්‍රශ්න ආදි යටිතල පහසුකම්වල ගැටලු ගැන මම එතුමාගේ අවධානයට ලක් කරලා තිබෙනවා. මම විශ්වාස කරනවා මේ අය වැය සම්මත වූ වහාම සමස්ත අධිකරණ පද්ධතිය ඇතුළේ ඇති ඒ අඩු පාඩුකම් ටික යම් පමණකට නිවැරදි කර ගන්න පුළුවන් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම කීප දෙනෙකුගෙන් ආපු යෝජනාවක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මුළු ලෝකයේම විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගන්නා වූ වයසට වඩා අඩු වයසක් තමයි අපේ අධිකරණ පද්ධතියේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගන්නා වයස බවට පත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහාධිකරණයක විනිසුරුතුමෙක් විශ්‍රාම යන වයස අවුරුදු 61යි. අභියාචනාධිකරණයක විනිසුරුතුමෙක් විශ්‍රාම යන වයස 63යි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නම් විශ්‍රාම යන වයස අවුරුදු 65යි. අපට අඩුම තරමින් මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් විශ්‍රාම යන වයස් මට්ටම් එහාට දා ගන්න පුළුවන් හැකියාවක් තිබුණා නම්, වසන්ත ජීනදාස මහත්තයා, සලීම් මර්සූෆ් මහත්තයා, විකුම් කළුආරච්චි මහත්තයා, රුවන් ප්‍රනාන්දු මහත්තයා වාගේ නිර්භීත, විෂය පරිණත විනිශ්චයකරුවන්ගේ සේවය තවදුරටත් තියාගන්න තිබුණා. නමුත් එතුමන්ලාගේ සේවය අපට අහිමි වෙලා ගියා, යම් නිශ්චිත කාලයකට පස්සේ. ඒ නිසා විශේෂයෙන් ඒ වයස් සංශෝධනයක් ඇති කිරීමට හැකියාවක් තිබෙනවා නම්, ඒක තමයි ලොකුම ජයග්‍රහණයක් කියලා අපි හිතන්නේ.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ පැත්තෙන් අපට චෝදනා කිහිපයක්ම එල්ල වුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. විශේෂයෙන් අපි ගාව ගොඩාක් ෆයිල් තිබුණා, ඒ ෆයිල්වලට මොනවාද කරන්නේ කියලා ඇහුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි පැහැදිලිව මේ කාරණය කියනවා. අපි ගාව ෆයිල් තිබ්බා; නිසි තැන්වලට යොමු කළා. තවත් ෆයිල් තිබෙනවා. ප්‍රශ්නයක් නැහැ, ඊට අදාළ නිසි පරීක්ෂණ නිසි ක්‍රමය යටතේ, හරියටම නීත්‍යානුකූල සැලැස්ම යටතේ අපි ඒවා ඉදිරිපත් කරනවා. ඒ විතරක් නොවෙයි. තව එකක් මතක තියා ගන්න. ඇතැම් උදවිය මන්ත්‍රීකම සල්ලිවලට විකුණලා ද කියලාත් අපි පරීක්ෂණ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තව චෝදනාවක් ආවා, අපේ පක්ෂයේ නායකයා "රනිල් වික්‍රමසිංහ කිව්වාම පුටුවේ වාඩි වුණා" කියලා. මම කියන්නේ, වීදුරු ගෙවල්වල ඉඳන් ගල් ගහන්න හොඳ නැහැ. අපේ පක්ෂයේ නායකයා එදා ඇඟිල්ල දිගු කරලා කිව්වා, "ඕනෑම කැබිනට් ඇමතිවරයෙක් නම් කරලා කියන්න, කරපු හොරකම මම කියන්නම්" කියලා. ඒත් කවුරුවත් "මීක්" කිව්වේ නැහැ. එදා හොරු ටික සද්ද නැතුව හිටියා. හොරු ටික සද්ද නැතුව හිටියේ. අද අපට ඇඟිල්ල දිගු කරලා කියනවා, "පාලු ගෙයි වළං බිඳින්න එපා" කියලා. මොන පාළු ගෙයක්ද? ගරු ජනාධිපතිතුමා එතුමාගේ ආසනයේ වාඩි වෙලා හිටියා; කථාවක් කළා. ඕනෑම ප්‍රශ්නයක් අහන්න හැකියාව තිබුණා. ඇතැම් මන්ත්‍රීවරු ප්‍රශ්න ඇහුවේ. ඒක නිසා පාලු ගෙවල්වල වළං බිඳින්න එපා කියලා -

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමාට කියලා දෙන්න රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
එතුමාගේ කථාව අවසන් වුණාම අවස්ථාව දෙන්නම්.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මම කාගේවත් නමක් කිව්වේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ කථාව පිළිබඳ මට පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්. ස්ථාවර නියෝග 86 (ආ) යටතේ රීති ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
I am on my feet. There is no point of Order.

ඊට පස්සේ ගොඩක් ප්‍රශ්න තිබුණා. විශේෂයෙන්ම අපට ඇඟිල්ල දිගු කරන්න ආවා, හොඳ නීති පද්ධතියක් හදන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි ඔබතුමියට මේ කාරණය මතක් කර සිටිනවා. අපේ හර්ෂණ නානායක්කාර මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන අධිකරණය, බන්ධනාගාරය මොන වාගේ එකක්ද කියන කාරණාව අතීතය

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

ස්මරණය කළොත් අපට හොඳට දැන ගන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම, මේ රටේ නීතිඥ ප්‍රජාවට අපි ප්‍රණාමය දක්වන්න ඕනෑ. මේ රටේ නීතිඥ ප්‍රජාව තමයි මේ ස්වාධීන අධිකරණය ලබා ගත්තේ. ඊයේ අපේ ජනාධිපතිතුමා කියපු කථාවකට යම් යම් කරුණු කාරණා මෙතැනින් කියැවුණා.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, විනාඩියෙන් කියන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ඔව්, විනාඩියයි ගන්නේ. මම රීති ප්‍රශ්නය කියන්නම්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා මම කියපු කාරණාව වටහාගෙන නැහැ. මම ඒක නිවැරැදි කරන්නම්. මම කියපු දේ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. මම ඒක පෙන්වන්නම්. මම ඒ වගකීම භාර ගන්නවා. මට ඒ ගැන දිගින් දිගටම කියන්න බැහැ. බූරුවෙක් පිට යන මනුස්සයෙකුට බූරුවා ගැන මීසක් වෙන දෙයක් තේරුම් කරලා දෙන්න බැහැ. ටයිකෝට් දැම්මාට බූරුවෝ පිට යන මිනිස්සු ගැන කවර කථාද, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි? අවලාද කියන්න එපා. එළියේ කියන ඕනෑ දෙයකට අපි සූදානම්. ඔබතුමා මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමති නේ. ඒවා එළියේ කියන්න. එතකොට අපි ඕනෑ දෙයකට සූදානම්.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(*மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல*)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම යළිත් සපථ කරලා කියනවා, මන්ත්‍රීකමක් කවුරු හරි සල්ලිවලට විකුණුවා නම් ඒ විකුණපු මන්ත්‍රීකම පිළිබඳව අපි පරීක්ෂණ පවත්වනවා කියලා. එච්චරයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපට මෙම ආයතනය මේ විධියට ලැබුණේ නිකම් නොවෙයි. අපි අරගළ කරලා තමයි මේ ස්වාධීන අධිකරණය ලබා ගත්තේ. අපි දන්නවා එක්තරා කාලයක් තිබුණා, තාත්තාටයි, බාප්පාටයි ඕනෑ විධියට -ඒ මහත්තයා දැන් මෙතැන නැහැ- අධිකරණ තීන්දු ලියන්නේ නැහැ කියලා, ශිරාණි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමිය එළවා දැම්මා. ඉතිහාසයේ ප්‍රථම වතාවට බැංකු සභාපති කෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරයා කළා. බැංකු සභාපතිවරයෙක්! එහෙම ඉතිහාසයක් තිබෙන්නේ ස්වාධීන අධිකරණයට. ඊට පසුව අරගළයක් කරන්න සිද්ධ වුණා නීතිඥ ප්‍රජාවට, ස්වාධීන අධිකරණයක් ඉල්ලා. එහෙම තමයි අධිකරණයේ ස්වාධීනත්වය ලැබුණේ. ඊට පස්සේ planted ජනාධිපති, භාග ජනාධිපති, පින් ජනාධිපති පත් වුණාට පස්සේ මොකක්ද කළේ? සම්පූර්ණයෙන් අධිකරණය හෑවා; අධිකරණය නැති කළා. එහෙම අධිකරණය නැති කරනකොට යළිත් නීතිඥ ප්‍රජාවත්, මේ රටේ ප්‍රගතිශීලි දේශපාලන ව්‍යාපාරයත් ඉස්සරහට ඇවිල්ලා තමයි අධිකරණය බේර ගත්තේ. අපි දැක්කා එක්තරා වෙලාවක මෙතැනට ඇවිල්ලා ජෝගි දාලා කිව්වා, "තියන්න මැතිවරණයකුත් නැහැ, සල්ලිත් නැහැ" කියලා. එහෙම jokes කළා. දැන් ඔය කෑ ගහන කවුරුත් එදා ඒවාට අත ඉස්සුවා. ඊළඟට මොකක්ද කිව්වේ? අධිකරණ බලය තිබෙන්නේ අධිකරණයට නොවෙයි, පාර්ලිමේන්තුවට කියලා පාර්ලිමේන්තුවෙන් පිටත කථා පවත්වන්න පටන් ගත්තා. එහෙම කිව්වේ, ශ්‍රී ලංකා පොල් සංවර්ධන අධිකාරියේදී. ඊළඟට, මහියංගනයේ තිබුණු රැස්වීමකදී මොකක්ද කිව්වේ? මේ රටේ විනිශ්චයකාරවරුන්ට තර්ජනය කළා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ශ්‍රේෂ්ඨාධිකරණයේ එක්තරා විනිශ්චය මණ්ඩලයකින් නියෝගයක් දුන්නා, පළාත් පාලන මැතිවරණය තියන්න කියලා. තියන්න කියලා තීන්දුව දුන්නාම, මේ සභාවේ හිටපු රනිල් වික්‍රමසිංහගේ කැවර් කෙනෙක් වන ප්‍රේමිනාත් සී. දොලවත්ත Motion එකක් ගෙනැල්ලා මොකක්ද කිව්වේ? කිව්වේ, ඒ විනිශ්චයකාරවරු තිදෙනාම පාර්ලිමේන්තුවට ගෙන්වලා දඬුවම් කරන්න ඕනෑ කියලා. අධිකරණය තිබුණේ අන්න ඒ තැන. ඒ තැන තිබුණු අධිකරණයක් තමයි අද අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පත් වුණාට පස්සේ ස්වාධීනව කටයුතු කරන්නේ. අද අපි ශ්‍රේෂ්ඨාධිකරණයට පත්වීම් කරලා තිබෙනවා; අභියාචනාධිකරණයට පත්වීම් කරලා තිබෙනවා. අද නීතිඥ ප්‍රජාවගෙන්වත්, විනිශ්චයකාර ප්‍රජාවගෙන්වත්, මහ ජනතාවගෙන්වත් අපට චෝදනා නැහැ. අපි සුදුස්සාට සුදුසු තැන අධිකරණය තුළ දීලා තිබෙනවා. ඔන්න ඔහොමයි ස්වාධීන අධිකරණයක් අපට ලැබුණේ.

ඊළඟට, බන්ධනාගාර දෙපාර්තමේන්තුව. අපේ ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට ලැබුණේ මොන වාගේ තත්ත්වයක තිබුණු බන්ධනාගාරයක්ද? විෂය භාර අමාත්‍යවරයා හැටියට හිටපු ලොහාන් රත්වත්තේ බීලා ඇ 12ට ගිහිල්ලා පිස්තෝලේ තියලා සිරකරුවන්ට තර්ජන කරන තත්ත්වයක් තිබුණා. එහෙම තිබුණු බන්ධනාගාර දෙපාර්තමේන්තුවක් තමයි අද මෙතුමාට භාර වෙලා තිබෙන්නේ. දේශපාලන බල අධිකාරය ඒකේ අරක්ගෙන සිටියේ. දේශපාලන බල අධිකාරයට ඕනෑ ඕනෑ විධියට අධිකරණයත්, බන්ධනාගාරයත් තමන්ට ඕනෑ දිශානතියකට ගෙන යන්න ඕනෑකම තිබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ ආයතන දෙක රටේ මහ ජනතාවට විවර කරලා තිබෙනවා, ස්වාධීන ආයතන දෙකක් විධියට. ඒක තමයි අද අපට රටේ මිනිසුන්ට දෙන්න තිබෙන දායාදය.

ඊළඟට, අර්ජුන මහේන්ද්‍රන් ගැන ඇහුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, "කෝ දැන් අර්ජුන මහේන්ද්‍රන්" කිය කියා දැන් අලුතින් සටන් පාඨයක් ඇවිත් තිබෙනවා. මම මතක් කරන්න ඕනෑ, 2021 දෙසැම්බර් මාසේ 24වැනි දා අපේ රටට සිංගප්පූරු රජයෙන් දැනුම් දීලා තිබෙනවා, උදර්පන නීතිය යටතේ ඔහු මේ රටට එවන්න බැහැ කියලා.

එතකොට කවුද හිටියේ? 2021 කියන්නේ ගෝඨාභය රාජපක්ෂ හිටපු සමය. නේද? 2021දී, ඒ කියන්නේ මීට අවුරුදු ගණනකට පෙර ආපු ලිපියක් තමයි දැන් මේ උස්සාගෙන ඉන්නේ. අපි එකක් කියනවා, උදර්පන නීතිය ජාත්‍යන්තර නීතියේ සංකල්පයක්. ඒ උදර්පන නීතියට අනුව අවස්ථා දෙකකදී චිත්තිකාරයෙක් ගෙනෙන්න පුළුවන්. අපි ආණ්ඩුවක් විධියට ආරාධනා කර තිබෙනවා, නඩු විභාගයට ප්‍රථම එන්න කියලා. එහෙම ආවේ නැත්නම් තව අවස්ථාවක් තිබෙනවා. ඒ අවස්ථාව තමයි, අපේ රටේ නඩුව අහලා තීන්දුවක් අරගෙන ඒ තීන්දුව ක්‍රියාත්මක කිරීම. මේ වෙනකොට අර්ජුන් මහේන්ද්‍රන්ට එරෙහිව අධිකරණයේ නඩුවක් විභාග වෙමින් තිබෙනවා. එතකොට අපට ප්‍රථම අවස්ථාව ගිලිහුණොත්, අපි දෙවැනි අවස්ථාව පාවිච්චි කරලා මේ වැඩේ කරන්න ඕනෑ. මේ වැඩේ කරන්න තිබෙන අරමුණ ආණ්ඩුවක් විධියට අපෙන් ගිලිහිලා නැහැ. ඒක අපි කරනවා. කිව්වොත් කරනවා. ඒක, ඒ මට්ටමේ තිබෙන්නේ. ඒ නිසා කාටවත් කියන්න දෙයක් නැහැ, අරවා ඇල්ලුවේ නැහැ මේවා

ඇල්ලුවේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පැමිණිලි විභාග වෙන්නේ නැහැ, අදාළ ක්‍රියාමාර්ග සිදු වෙන්නේ නැහැ කියලා දැන් චෝදනාවක් ආවා. නමුත් සමහර දේවල්වලට කලබල වෙලා බැහැ. මොකද, සමහර ඒවායේ proceedings ගොඩක් තිබෙනවා. ඒ තිබෙන ක්‍රියාවලිය ඇතුළේ තමයි මේ කටයුතු සිද්ධ වෙන්නේ. ඒ ක්‍රියාවලියට time ගන්න ඕනෑ. අපි නීතිපති දෙපාර්තමේන්තුවට time එකක් දුන්නොත් ඒ අය කලබල වෙනවා. ඒ නිසා ඒගොල්ලන්ට ස්වාධීනව ඒ වැඩේ කරගෙන යන්න අවස්ථාව දෙන්න ඕනෑ. දැන් යස අගේට අධිකරණයට නඩු එකින් එක එනවා නේ. මේ රටේ මහජන මුදල් වංචා කරපු චූදිතයන් දැන් අධිකරණයට එනවා නේ. නීතිපති දෙපාර්තමේන්තුව ඒ වැඩේ හරියට කරයි. පොලිස් දෙපාර්තමේන්තුවට අපි ස්වාධීනත්වය දීලා තිබෙනවා. මහා චූදිතයෙක්, මේ රටේ පොලිස් දෙපාර්තමේන්තුව පාවා දීලා, මේ රටේ පොලිස්පතිකම කොන්ත්‍රාත්තුවලට යට කරපු මහත්මයෙක් දැන් හැංගිලා ඉන්නවා. මාතර මහෙස්ත්‍රාත් අධිකරණයෙන් දැන් ඔහු අත්අඩංගුවට ගන්න නියෝග කර තිබෙනවා. අපේ රටේ ස්වාධීන අධිකරණයකින් එවැනි නියෝගයක් දීලා තිබෙනවා. දැන් හිටපු පොලිස්පතිවරයා හැංගිලා. එවැනි අය හොයන්න පොලිස් දෙපාර්තමේන්තුව ස්වාධීනව වැඩ කරගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා අපි විපක්ෂයට කියනවා, "ඇඟිල්ල දිගු කරන්නේ බලාගෙන" කියලා. වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා. අපේ පැත්තට ඇඟිල්ලක් දිගු කළොත් තමන්ගේ පැත්තට ඇඟිලි 4ක් දිගු වෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. මේ ගෙවුණු කාලය තුළ අපි මහජන මුදල් වංචා කර තිබෙනවා, අපි දූෂිතයෝ කියලා කවුරු හරි ඔප්පු කරලා පෙන්නුවොත් අපි එදාට මේ දේශපාලනයෙන් සමු ගන්නවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එවන් චරිතයක් තිබෙන 159දෙනෙක් තමයි මේ වැඩකටයුතු කරමින් ඉන්නේ. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු තුරෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.53]

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். தேசிய மக்கள் சக்தி அரசாங்கம் இதுவரை இனவாதம் பேசவில்லை. அதை நாம் வரவேற்கின்றோம். தமிழர்கள் இந்த நாட்டில் ஒரு பலமான சக்தி! அதை அனைவரும் முழுமனதோடு ஏற்றுக் கொள்ள வேண்டும். நாம் நீதி கேட்கின்றோம். பயங்கரவாதத் தடைச் சட்டம் நீக்கப்படுதல் வேண்டும். இது பற்றி நேற்றைய தினம் மாண்புமிகு சனாதிபதி அவர்களும் கௌரவ நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் அவர்களும் குறிப்பிட்டிருந்தார்கள். அவை நடந்தால் வரவேற்கின்றோம்.

அடுத்து, காணாமல் ஆக்கப்பட்டோரின் உறவுகளுக்கு நீதி கிடைக்க வேண்டும். நான் சொல்வதெல்லாம் உண்மை; உண்மையைத் தவிர வேறொன்றுமில்லை. யுத்தம் மௌனிக்கப்பட்டபோது, எமது மக்கள் தமது உறவுகளை - கணவரை மனைவியும், மகன், மகளை பெற்றோரும் - வட்டுவாகல் சப்தகன்னிமார் ஆலய முன்றலில் இராணுவத்திடம் ஒப்படைத்தார்கள். அதுமாத்திரமன்றி, தடுப்பு முகாம்கள், கடல் எனப் பல இடங்களிலும் சரணடைந்தார்கள். வட்டுவாகலில் ஒப்படைக்கப்பட்டவர்கள் கொக்குத் தொடுவாய் நோக்கியும், கேப்பாப்புலவு நோக்கியும், வட்டுவாகல் கடற்கரை நோக்கிய பாதையிலும் பஸ்களில் கொண்டு செல்லப்பட்டார்கள். "இலங்கைப் படையினரிடம் தான் ஒப்படைத்தோம்; இன்னமும் அவர்களைக் காணவில்லை; அவர்கள் எங்கே?" என்று காணாமல் ஆக்கப் பட்டவர்களின் உறவுகள் புலம்புகின்றார்கள்; தேடுகின்றார்கள். கௌரவ நீதி அமைச்சர் அவர்களே, நியாயப்படி நடந்துகொள்ளுங்கள்! வட்டுவாகல் கடற்கரைப் பாதை நோக்கி பஸ்ஸில் ஏற்றிக்கொண்டு சென்றவர்களை விட்டுவிட்டு, பஸ் மட்டும் திரும்பி வந்ததாக மக்கள் சொல்கின்றார்கள்.

வட்டுவாகல் என்பது, தனித் தமிழ் சைவக் கிராமமாகும். இப்போது பௌத்தர்கள் இல்லாத அந்த இடத்தில் ஒரு பெரிய விகாரை அமைக்கப்பட்டு இருக்கிறது. இப்பகுதியில் கொண்டு செல்லப்பட்ட சரணடைந்தவர்களைக் கொன்று புதைத்து விட்டு, பெரிய விகாரையை அதற்குமேல் அமைத்துவிட்டதாக மக்கள் சொல்கின்றார்கள். உங்களின் மடியில் கனமில்லை என்றால், இதனை நிரூபியுங்கள்! விகாரையை அகற்றி ஆழமாகத் தோண்டுங்கள்! அல்லது புதிய தொழில்நுட்ப முறையில் ஆழத்தில் இருப்பவற்றை அறியக்கூடியதான நவீன கருவிகளைப் பயன்படுத்தி உண்மையை வெளிப்படுத்துங்கள்! கொக்குத்தொடுவாய் மனிதப் புதைகுழி தொடர்பில் பாதிக்கப் பட்டவர்களுக்கு நீதியைப் பெற்றுத்தாருங்கள்! கௌரவ நீதி அமைச்சர் அவர்களே, தயவுசெய்து இந்த விடயத்தில் கவனமெடுங்கள்! சிலவேளை நீங்கள் நீதியைத் தர, நீதிபதி சரவணராஜாவுக்குக் கிடைத்ததுபோல்தான் உங்களுக்கும் நீதி கிடைக்குமோ தெரியாது? நாங்கள் இன்றைய அரசை நம்புகிறோம். நீங்கள் இந்த விடயத்தில் நீதியைப் பெற்றுத்தர வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

அடுத்து, சிறையில் வாடும் கைதிகள் பற்றிச் சொல்ல வேண்டும். 2008ஆம் ஆண்டு பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு தடுத்து வைக்கப்பட்டுள்ள இரண்டு பிள்ளைகளின் தந்தையான ஆனந்தசுதாகர் கிளிநொச்சி மருத நகரைச் சேர்ந்தவர். அவர் ஆயுள் தண்டனைக் கைதியாக கொழும்பு மகசின் சிறைச்சாலையில் தடுத்து வைக்கப்பட்டுள்ளார். அவரின் மனைவி 2018.03.18இல் உயிரிழந்தார். மனைவியின் இறுதிக் கிரியைக்கு கடும் பாதுகாப்புக்கு மத்தியில் சிறைச்சாலை அதிகாரிகளால் அவர் அழைத்து வரப்பட்டார். இறுதிக் கிரியை முடிந்து, அவர் சிறைச்சாலைப் பேருந்தில் ஏறச் சென்றவேளை, அவரது பிள்ளைகள் அவரின் கையைப் பிடித்துப் பேருந்தில் ஏறிய சம்பவம் அனைவரது மனங்களையும் கலங்கவைத்தது. கௌரவ நீதி அமைச்சர் அவர்களே, நீதியைப் பெற்றுத் தாருங்கள்! அத்தோடு, சிறையில் 'அரசியல் கைதிகள்' என்ற போர்வையில் உள்ளவர்களுக்கும் விடுதலையைப் பெற்றுக்கொடுங்கள்!

அடுத்து, காணிகள் சம்பந்தமாகக் கூற வேண்டும். 2009ஆம் ஆண்டுக்கு முன்னர், முல்லைத்தீவில் அடர்ந்த காடுகள் உட்பட 222,006 ஏக்கர் காணிதான் வன இலாகாவிடம் இருந்தது. 2009ஆம் ஆண்டுக்குப் பின்னர், 432,121 ஏக்கர் காணி வன இலாகாவிடம் உள்ளது. மக்களுடைய பயன்பாட்டில் இருந்த சிறுதானியப் பயிர்செய்கைக் காணிகள், தோட்டப் பயிர்செய்கைக் காணிகள் மற்றும் நெற்செய்கைக் காணிகளை கிராம அலுவலர், காணி உரிமையாளர்கள்,

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

பிரதேச செயலாளர், மாவட்டச் செயலாளர் என எவரிடமும் கேட்காது, எல்லைக் கற்களையிட்டு தங்களுடைய கட்டுப் பாட்டுக்குள் வன இலாகாவினர் கொண்டுவந்துள்ளனர். இந்த விடயத்தில் நீங்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நிச்சயமாக இந்தக் காணிகளை -

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Madam, please give me one minute.

தங்களுடைய வாழ்வாதாரத்துக்குரிய பயன்பாட்டில் இருந்த காணிகள் இல்லாமல் மக்கள் படும் துன்பங்கள் ஏராளம்! நான் குறிப்பிடும் விடயங்கள் முல்லைத்தீவில் மட்டுமல்ல, மன்னாரிலும் வவுனியாவிலும் காணப்படுகின்றன. தயவு செய்து, இந்தக் காணிகளை மக்களுக்கு வழங்குவதற்கான வாய்ப்பை ஏற்படுத்துங்கள்! மேலும், முல்லைத்தீவில் படையினர் நூற்றுக்கும் மேற்பட்ட முகாம்களில் இருக்கிறார்கள். அங்கிருக்கும் மக்கள் தொகையின் அரைவாசி அளவு படையினர் இருக்கிறார்கள். அதாவது, இரண்டு பேருக்கு ஒரு படைவீரன் என்ற அடிப்படையில் இருக்கிறார்கள். கிட்டத்தட்ட 35,000 ஏக்கர் காணி படையினரிடம் உள்ளது. அதில் பெரும்பகுதி மக்களுடைய வாழ்வாதாரக் காணிகளும் குடியிருப்புக் காணிகளுமாகும். நிலைமை இப்படி இருக்க, நாங்கள் எப்படி பாதுகாப்பு அமைச்சின் நிதி ஒதுக்கீட்டின் மீதான வாக்கெடுப்பில் ஆதரவாக வாக்களிக்க முடியும்? தயவுசெய்து, எங்களுடைய மக்களின் பயிர்ச்செய்கைக் காணிகளை விடுவியுங்கள்! அதன்பின்னர், நாங்கள் உங்களுடன் இணங்கிப் போவோம். நன்றி!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[3.00 p.m.]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Deputy Chairperson, I wish to start by taking up the Government's thinking of an Independent Prosecutor's Office. In the North and the East, there had been several cases of *habeas corpus* filed in the Provincial High Court in Vavuniya and those had been sent to the Mullaitivu Magistrate for inquiry and after inquiry, the High Court had given an Order in favour of the petitioners, that is, holding the military, the Army, responsible for the enforced disappearance of certain individuals. Now, the Attorney-General's Department which appeared on behalf of the Army has decided to appeal the case. So, at the moment, it is before the Court of Appeal. But my point here, Madam, is - I am glad that the Hon. Minister is present - that if the Court of Appeal holds with the petitioners, then again it falls on the Attorney-General's Department to prosecute those officials, and it is the view of all those professional lawyers, counsels who have been appearing for similar cases, that there is a major conflict of interest, where the Attorney-General's Department, that is the primary lawyer for the State, for the armed forces, is asked to go against the State in cases such as this. So, very obviously, there is a conflict of interest and in that case, the whole credibility of these proceedings comes into question.

So, if the Government is thinking in terms of rectifying this by creating an Independent Prosecutor's Office, then that would be welcomed. But, very clearly, such an office has to be equipped with adequate infrastructure and resources, and the officials should have the power to directly get involved in investigations, give directions to the police, supervise the police and other investigatory bodies and also the power to directly institute proceedings against the offenders. I think those are the basic qualities that will have to be considered and it must be completely independent as well. I think the key test would be to ensure that such an office does not go down the way of the Attorney-General's Department with regard to this conflict of interest. I, by no means, wish to cast any aspersions on the Department. Since I personally also have been in the profession - I am qualified as a lawyer although I do not practise - I know that the Department has some tremendous talent. But, nonetheless, when you are asked to do a particular job in defending the State or take the side of the State on a vast majority of cases and then to be asked to suddenly turn round and prosecute State officials, I think there is a genuine issue. So, certainly in the the North and the East, with regard to the *habeas corpus* cases and such, there is, definitely, a problem of credibility.

The second point I wish to raise, Madam, is the question of mass graves. In the North and the East, there had been instances where mass graves had been found. One was found in the Sathosa Building in Kokkuthoduvai and another in Mannar, just beyond the bridge, the causeway. Then, as of two weeks ago, in the cemetery in Chemmani, Jaffna, there had been skeletal remains found.

In fact, I personally went and had a look. At that time when I went and had a look, the police had not taken any action; the Magistrate had not been informed. It was one of our party members, who also happens to be in the committee of the cemetery, whom I asked to make a formal complaint to the police. Thereafter, the Magistrate got involved and the matter is now being looked into. But, with the question of mass graves, Hon. Minister, there is no protocol. To my knowledge, there is no clear protocol to handle mass graves. As a result, there is a severe shortage of funds and it is almost always the case where the Government Agent is asked to get involved. The OMP, I think, has a little bit of funds, but nowhere close to the sort of resources required for the work that has to be done by the Department of Government Analyst and the courts to have this matter looked into as a matter of urgency. As a result, because of things getting dragged on, both in Kokkuthoduvai in Mannar and now, in Chemmani, Jaffna, evidence can get destroyed or tampered with. These are questions of mass graves and

you know that the major accusation with regard to the Chemmani case is that over 600 people - civilians - were killed and buried in that vicinity. Then, there were accusations during the Chandrika Bandaranaike's Government that overnight, there were excavations being done. So, the suspicion is that the bodies from the Chemmani mass graves had been removed and dumped in this cemetery. So, that is a suspicion. If you do not have the sort of resources primarily to protect that area and to ensure that the evidence is not lost, a grave injustice is likely to happen. So, that is another area that the Hon. Minister has to look into.

Our Party's position is that because of the system that we have here and because of the nature of the ethnic conflict that had taken place and the way in which the conflict took place with Tamil people fighting against the State, asking for justice from the State - there is a polarization and the system has been pitted against a particular ethnic group - the Office of the United Nations High Commissioner for Human Rights - I think if I am not mistaken, it was High Commissioner Prince Zeid who made the comment - is of the view that an internal inquiry is not feasible in Sri Lanka for the simple reason that the system has, unfortunately, been prejudiced and is no longer in a position to carry out an impartial intervention in this matter.

So, it is in that context I am raising these issues and as far as I am concerned, the evidence must be protected. You must, at least, try and protect that evidence. With regard to how these issues are to be looked at, you all have been suggesting an internal mechanism. My view is that that is just a non-starter. So, at the very least, if you could ensure that this evidence is protected and is recorded in a credible manner, I think that is the best you could do under these circumstances. I, for one, am not going to ask you to actually investigate it. I wish Sri Lanka was different; I wish we, as victims, could have said that we have credibility, that we look upon the system with credibility, but we do not. Nothing has happened so far to suggest that that situation will change. So, my request to you is that you intervene and ensure that adequate funds, adequate resources are given to protect the evidence in the mass graves so that at one point, when there is some agreement with regard to how to proceed on the question of accountability with the victims, then, this evidence could properly be used.

Madam, the other matter is with regard to another conflict of interest. If you take the current matters that are sensitive, there have been ancient worship sites that are contested in the North and the East. One is Kurunthur Malai; the other one is Vedukkunaari Malai and then, there is the matter of the Thaiyiddy Temple, which is not an ancient one. In the first two, that is, in Kurunthur Malai and Vedukkunaari Malai, the Department of Archaeology gets involved. And when the Department of Archaeology gets involved - the police are with the Department of Archaeology - it goes before the magistrate and the magistrate gives certain orders according to law. According to law, he had said that it is an archaeological site, it must be preserved and no new buildings must come up without the permission of the court. But, despite those orders being given, there are construction works that have taken place with the police's and the military's help and the Department of Archaeology fully sanctions that; it is on the instructions of the Department of Archaeology that it is happening. The Attorney-General's Department takes the side of these government departments. Despite the Magistrate giving Orders, this has been happening. And when Mullaitivu Magistrate T. Saravanaraja had been informed that in violation of his own Orders, there had been various things happening at those sites and he had gone to visit the sites, he was threatened. The information that came public from that Judge was that the Attorney-General himself called him and effectively threatened him to a point where he had to leave the country. He had fled the country. So, there is something here that you need to look at. The Department is asked to appear for the military, the police, for government departments and when there are sensitive cases and there is a clash, the whole system collapses. Certainly, that is our experience and that should not happen. So, for that matter also, you must have a look at this.

Hon. Minister, it is in this backdrop that several senior officials from the Attorney-General's Department are preferred to be appointed to the apex courts. Currently - correct me if I am wrong - in the Supreme Court, out of the 17 judges, except for four, all the others are from the Attorney-General's Department.

Then, if you take the Court of Appeal, out of the 15, eight are from the Attorney-General's Department. The nature of their work - they are heavily tilting towards the State - is to defend the State interests. So, for them to be appointed in these numbers to those apex courts calls into question the credibility of the structure of the courts. Therefore, Hon. Minister, my advice is that you must resort to the earlier practice, where, except for the Attorney-General and the Solicitor General, I do not think anybody else should be considered to the apex court, which is the Supreme Court and the Court of Appeal. The other members of the Department can be considered to the High Court and let them come up after that, but, certainly, not in the numbers and the way in which they are being appointed right now to the apex court because it is terribly prejudicial to career judges. The career judges work so hard and after 20 years of work, they can only aspire, in realistic terms, to come up to the Court of Appeal and that also, maybe, for one year or two years, maximum; that is the practice today. If you take Tamil judges, I think Justice C. V. Vigneswaran was probably the last Supreme Court Judge - or whether there is someone else now, I do not know - who came up as a career judge. I have personal knowledge of that. That is why I am mentioning it. I am certain the case is the same with regard to the Sinhalese judges. So, it is terribly unfair for a career judge to work so hard, to be transferred all over the country to the detriment of his family, to the detriment of his children and sometimes, to their education and then to find that they cannot get the reward, despite being true to their work, to reach the highest positions in their field.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am winding up, Madam.

Criminal justice, as far as the North and the East is concerned, is the most fundamental issue today. It is because of mass atrocities and the need for justice and accountability for the crimes that were committed during the war. Hon. Minister, your Government says that an internal inquiry is what you would consider in that regard. But, your Government has not said one word as to whether mass crimes like the crime of genocide, the war crimes and crimes against humanity would be brought into law. Without the Rome Statute being agreed upon and being made into law in this country, you cannot even think in terms of having an internal inquiry. That is just the beginning. You do not have the legal will to prosecute mass crimes because you do not have the infrastructure to do it and quite honestly, you will never do it. And, your Government has said on numerous occasions, including the President himself, that he is not prepared to have one case brought before a court of law, which means there is no will. In that backdrop, if what you saying is that you are going to have an internal mechanism, it can only mean that you are going to try and ensure that the victims agree to something that does not involve criminal justice, and that is a cover up. That certainly tantamount to a cover up and you must not do that. If you are going to do that, it is going down the same way as the previous governments did for the last 16 and 17 years and it makes no difference at all to the Tamils.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Hon. Ponnambalam, I will reply to you more in my winding up speech. But, for the time being, regarding the mass graves you referred to, I must say that we have allocated funds for the Kokkuthoduvai grave in two stages, Rs. 5.6 million and Rs. 9.6 million, and for the one in Mannar, we have allocated Rs. 2.88 lakhs only. In Colombo also, as you know, there was a mass grave, for which we have allocated Rs. 8.1 lakhs and Rs. 19 lakhs. The grave in Chemmani is a fairly recent one. So, we will definitely look into it and attend to the matter. We are going to protect all the evidence because we believe justice is for everyone, not just for the South or the North. On how we are going to approach it, we may have differences of opinion, but justice will be done to everybody, to all Sri Lankan citizens. I will reply more at the end.

Thank you.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.19]

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී ඒ වෙනුවෙන් කථා කරන්න මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට මම ස්තුතිවන්ත වෙනවා. අධිකරණ ඇමතිතුමාගේ මුල් කථාවේදීත් එතුමා පැහැදිලි කළා, මෙවර ජාතික ජන බලවේගයේ අය වැය හරහා ශ්‍රී ලංකාව තුළ ස්වාධීන, අපක්ෂපාතී, ජනතා විශ්වාසය දිනූ අධිකරණ පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා පියවර රාශියක් ගෙන තිබෙනවාය කියලා. කාර්යක්ෂම අධිකරණයක් සහ අධිකරණ ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට අධිකරණය සහ ඒ හා බැඳුණු අනෙකුත් ආයතන ඩිජිටල්කරණය කිරීමේ වැඩ පිළිවෙළ දැනටමත් ආරම්භ වෙලා තිබෙනවා. ඒ වාගේම, යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් රුපියල් මිලියන 7,200ක මුදලකුත්, අවසන් නොවූ ව්‍යාපෘති සහ අලුත් ව්‍යාපෘති 30ක් සඳහා මුදලුත් මේ අය වැය හරහා වෙන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ආණ්ඩු පක්ෂයේ කථිකයන් කිහිපදෙනෙක්ම කථා කරද්දී කිව්වා, රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින රැඳවියන් සම්බන්ධයෙන්. රිමාන්ඩ් බන්ධනාගාරයේ 20,000කට අධික රිමාන්ඩ් රැඳවියන් ප්‍රමාණයක් ඉන්නවා. මේක මේ රටේ ආර්ථික, සමාජයීය සහ දේශපාලන වශයෙන් විශාල අහිතකර බලපෑමක් ඇති කරන තත්ත්වයක්. ඒ නිසා මම හිතනවා, මේ කාරණය මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ අවධානයට ලක් කළ යුතුයි කියලා. පසුගිය රජය මහින් විෂවර්ග, අබිං හා අන්තරායදායක ඖෂධ වර්ග පනත යටතේ අන්තරායදායක ඖෂධයක ශුද්ධ බර ග්‍රෑම් 10කට වැඩි ප්‍රමාණයක් සම්බන්ධයෙන් වන චෝදනාවකට අත්අඩංගුවට ගන්නා පුද්ගලයෙකුට ඇප ලබා දීමට මහාධිකරණය සතුව තිබූ බලය අභියාචනාධිකරණය දක්වා වෙනස් වුණා. ඒ හරහා මේ රටේ කොතැනකදී හෝ අන්තරායදායක ඖෂධ ග්‍රෑම් 10කට අධික ප්‍රමාණයක් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වන තැනැත්තෙකුට ඇප ලබා ගන්නට කොළඹ අභියාචනාධිකරණය දක්වා පැමිණෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ තුළින් සමාජයට ආර්ථිකමය වශයෙන් බලපෑමක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අපි උදාහරණයක් විධියට ගත්තොත්, යාපනයේ පදිංචි තැනැත්තෙකුට ඒ වෙනුවෙන් කොළඹට එන්න සිද්ධ වෙනවා; භාෂාමය ප්‍රශ්න මතු වෙනවා. ඒ වාගේම, බන්ධනාගාර තුළ තිබෙන තදබදය සඳහාත් මේ කාරණය විශාල වශයෙන් බලපා තිබෙනවා. මොකද, අපේ බන්ධනාගාරවල සිටින රිමාන්ඩ් රැඳවියන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඉන්නේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වෙච්ච අය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ වෙලාවේ විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, අප විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයට සංශෝධනයක් අරගෙන ඇවිල්ලා, මේ වනවිටත් එය කෙටුම්පත් කරලා, රජයේ මුද්‍රණාලයට යවා තිබෙන බව. Online හරහා සාක්ෂි විමසීමේ හැකියාව මීට පෙර තිබුණේ තෝරා ගත් නඩු සහ තෝරා ගත් පුද්ගලයන් සම්බන්ධයෙන් විතරයි. නමුත්, ඕනෑම පුද්ගලයෙකුට online මාර්ගයෙන් සාක්ෂි ලබා දීමේ හැකියාව අලුත් සංශෝධනය හරහා ලැබෙනවා. මෑත කාලයේ සිද්ධ වෙච්ච සිදුවීම් ගත්තාම, ඒ හරහා විශේෂයෙන්ම අවදානම් සහගත රැඳවියන්ට වාගේම විදේශගත පුද්ගලයන්ට සාක්ෂි ලබා දීමේ හැකියාව ලැබෙනවා. එමෙන්ම, මේ හරහා නැවත අධිකරණයේ කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීමේ හැකියාව අපට ලැබෙනවා. ඒ වාගේම කියන්න ඕනෑ, මහෙස්ත්‍රාත් අධිකරණවල පවතින අත්‍යවශ්‍ය නොවන නඩු භාණ්ඩ බැහැර කිරීම සහ විනාශ කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර මේ වනවිට අපි ගනිමින් සිටින බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධිකරණයකට හෝ අධිකරණ පද්ධතියකට භෞතික සම්පත් ලැබුණු පමණින්, මානව සම්පත් තිබුණු පමණින් එය කාර්යක්ෂම හෝ ස්වාධීන ආයතනයක් බවට පත් වෙන්නේ නැහැ.

මම මේ වෙලාවේ යම් කාරණයක් වෙත මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි. පසුගිය පාලන කාලවලදී හිජාස් හිස්බුල්ලා නඩුව, ශක්තික සත්කුමාර නඩුව, නතාෂා එදිරිසූරිය නඩුව වැනි නඩුවලදී ICCPR පනත අවභාවිත කරලා පුද්ගලයන් අත්අඩංගුවට ගත්ත අවස්ථා අපි දැක්කා. එතකොට අපට ප්‍රශ්නයක් මතු වෙනවා, ඒ අවස්ථාවලදී අධිකරණය ස්වාධීන ලෙස කටයුතු කළාද කියලා. යහපත්, අපක්ෂපාතී, ජනතා විශ්වාසය දිනාගත්ත අධිකරණ පද්ධතියක් ඇති වෙන්න නම් අධිකරණ නිලධාරින් පවා තමන්ගේ පෞද්ගලික, දේශපාලනික, ආගමික හෝ වෙනත් නැමියාවන් සම්බන්ධයෙන් පක්ෂපාති ලෙස ක්‍රියා නොකර අධිකරණමය මනසකින් තමන් ඉදිරියට එන නඩු දිහා බැලිය යුතු වෙනවා.

මම මේ කාරණාව කියන්නේ ඇයි? මෙවර ජාතික ජන බලවේගයේ අය වැය හරහා විශේෂයෙන් ලංකාවේ විනිශ්චයකාරවරුන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මුදල් වෙන් කරලා තිබෙනවා. අපේ රටට යහපත් අධිකරණ පද්ධතියක් ඇතිකර ගැනීම සඳහා පුළුල් දැක්මක් සහිත, අධිකරණමය මනසකින් තමන් ඉදිරියට එන නඩු දිහා බලන විනිශ්චයකාරවරු අවශ්‍ය වෙනවා කියා මම නැවතත් කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ නීති පද්ධතිය ඇතුළේ අවධානයට ලක් නොවුණු කොටසක් තමයි නීති ක්ෂේත්‍රයට සම්බන්ධ පර්යේෂකයන්. ඒ අය විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් විසින් එක් එක් නිශ්චිත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පර්යේෂණ කරලා පර්යේෂණ පත්‍රිකා එළි දක්වලා තිබෙනවා. හැබැයි, ඒවා පර්යේෂණ පත්‍රිකාවලට පමණක් සීමා වෙලා තිබෙනවා. ඒවා මේ රටේ නීතියේ ප්‍රගමනය සඳහා භාවිත කිරීමේ, උකහා ගැනීමේ ක්‍රියාවලිය ඉතාම දුර්වල මට්ටමක තමයි පසුගිය කාලයේ පැවතිලා තිබෙන්නේ. ඒ නිසා මෙවර ජාතික ජන බලවේගයේ අය වැය හරහා යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව හරහා එවැනි පර්යේෂණ තුළින් ලැබෙන ප්‍රතිඵල මේ රටේ අනාගත නීති පද්ධතියේ අභිවෘද්ධිය සඳහා භාවිත කිරීමේ හැකියාව ලබාගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලංකාවේ මෑත කාලීන ඉතිහාසය සලකා බැලුවොත් මුල් වතාවට දේශපාලන අතපෙවීම්වලින් තොර අධිකරණ පද්ධතියක් ජාතික ජන බලවේගය හරහා නිර්මාණය වෙමින් තිබෙනවා කියන එක පෙනෙන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මම මේ වෙලාවේ විශේෂයෙන් එක කාරණයක් මතක් කරනවා. ඒ ගැන මේ ගරු සභාවේ ඉන්න අය දන්නවා. ඒ තමයි 2012 වසරේ "Helping Hambantota" නඩුව සම්බන්ධයෙන් හිටපු අග්‍රවිනිශ්චයකාර සරත් එන්. සිල්වා මහත්මයා කළ ප්‍රකාශය. එතුමා කිව්වා, "එදා මම අධිකරණයේ හරි තීන්දුව ගත්තා නම්, මහින්ද රාජපක්ෂ නැවත ජනාධිපති ධුරයට පත් වෙන්නේ නැහැ" කියලා. ඒ කියන්නේ, මේ රටේ අධිකරණයට දේශපාලන අතපෙවීම් ඉතිහාසය පුරා දකින්න තිබුණා. මේ ජාතික ජන බලවේගය රජය හරහා මේ රටේ අධිකරණ පද්ධතිය දේශපාලන අතපෙවීම්වලින් තොර, ස්වාධීන ආයතනයක් බවට පත් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. මේ රටේ ඉන්න යම් විනිසුරුවරයෙක් සම්බන්ධයෙන් චෝදනාවක් තිබෙනවා නම්, ඒවාට එරෙහිව අවශ්‍ය පියවර ගන්න අපි මේ රජය හරහා JSC එකට ඉතාම හොඳ ස්වාධීනත්වයක් ලබා දීලා තිබෙනවා. ඒ සඳහා රජයක් විධියට අපට දෙන්න පුළුවන් සහාය ලබා දෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ රටේ අධිකරණ පද්ධතියට අදාළව යටිතල පහසුකම් සංවර්ධනය කරමින්, දැනට තිබෙන පුරප්පාඩු පූරණය කරලා, ඩිජිටල්කරණය හරහා කටයුතු කරලා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා ස්වාධීන, කාර්යක්ෂම, නීතියේ ආධිපත්‍යය තිබෙන අධිකරණ පද්ධතියක් නිර්මාණය කරලා නීති ගරුක පුරවැසියෙක් නිර්මාණය කිරීමේ කාර්ය භාරය ජාතික ජන බලවේගයේ රජය හරහා ක්‍රියාත්මක කරනවා කියන ප්‍රකාශය කරමින්, ලබා දුන් කාලයට ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[3.28 p.m.]

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
Hon. Deputy Chairperson, first of all, I would like to thank you for giving me time to express my views on the Votes of the Ministry of Justice and National Integration, which has approximately 24 institutions under its purview, at this very important Discussion. The Ministry of Justice and National Integration also plays a crucial role in the country in ensuring fair and impartial administration of justice and upholding the rule of law.

Madam Chairperson, William E Gladstone, a former British Prime Minister, in the late 1800s famously said, “Justice delayed is justice denied”. I think the Hon. Minister of Justice also mentioned that in his speech. That legal maxim means, if legal redress or equitable relief available to a litigant is not forthcoming, then it is the same as there being no remedy at all. If you look at the position in Sri Lanka, I think we all would agree that there are so many delays in our legal system, which has a

[ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය]

huge social impact, on the lives and livelihoods of our people. Sometimes, people have to wait for generations to get some sort of redress from the judicial system.

At a research done by the Judicial Service Commission, it has been revealed that approximately 1.1 million cases are in a state of delay: in the Supreme Court, 5,600 cases, in the Court of Appeal, 6, 100 cases, in the Civil Appellate Court, 28,000 cases, in the High Court, 254,000 cases and in the Magistrate's Court, 791,000 cases.

The Hon. Minister of Justice and National Integration also mentioned in his opening speech about the delays in our legal system and as I mentioned before, this definitely has a huge social impact on the accused, the defendant and all the parties concerned. A person, until proven guilty, is deemed innocent. Most people accused of serious crimes often lose their jobs and would have to face hardships in their personal relationships. Also, the cost incurred by both the accused and the aggrieved party is immense. Therefore, like I said before, we have to take steps to hasten the process.

Successive governments discussed about law's delays, but there has been no affirmative action taken in that regard. It not only has a social impact, but also an impact on foreign investments coming into the country. Again, the Hon. Minister of Justice and National Integration mentioned it in his speech. Usually, any foreign investor, before he invests in a country, conducts due diligence and a market research and often looks at the World Bank's Ease of Doing Business Index. So, when you look at that Index, you will see that Sri Lanka ranks very low mainly because the time taken for contract enforcement is very long. Just to give you an example, Sri Lanka takes approximately three-and-a-half years to enforce a contract. Sri Lanka stands at 164, out of 190 countries in that Index. When you compare this time span with that of New Zealand, which tops the list, they take only six months to enforce a contract. So, if we want more investors to come into our country, we definitely need to speed up our judicial process so that it would be an incentive for foreign investors to come into Sri Lanka and invest.

So, how can we speed up the process? I would like to make a few suggestions since the Hon. Minister of Justice and National Integration has just come back to the House. One suggestion is to create an administrative tribunal because, as we know, in the Supreme Court, there are a lot of fundamental right cases with regard to teacher transfers and school admissions, by which a significant amount of court time is consumed. Therefore, I would like to suggest an administrative tribunal be established so that these courts can be staffed by retired judges since we know that, in Sri Lanka, the retirement age for judges is 65 years. Then, definitely there would be another ten to fifteen years' time during which they could provide a service to our judicial system. Also, the cases can be taken up on a regional basis so that the number which come up to the Supreme Court could somewhat be minimized.

Another suggestion is the digitization of the judicial system. The digitization of the judicial system was spoken of by the Hon. Minister of Justice and National Integration as well as the Hon. Ajith P. Perera, Member of Parliament. I know that in 2017, the ICTA together with the Ministry of Justice embarked on a court automation project and subsequently, several steps were taken to digitize the judicial process. But, I do not think it has been successfully done. For example, in High Court No. 01 in Kandy, there is just a TV and that is all. There is no system in place for virtual courtrooms. Therefore, I would request the Hon. Minister to look into that. When I talk of digitization, it is not only to have virtual court hearings, but we must also consider the digitization of the registration process. For example, for submission of documents and payment of court fees. We know that in Sri Lanka, usually, if you submit a 100-page document to a five-judge bench, you need to provide five copies of it. Depending on the number of accused-petitioners, more copies may need to be printed. So, digitization will also reduce the cost of litigation and at the same time, help speed up the process. I think, earlier, the Hon. Minister mentioned this matter as well.

Another suggestion I would like to make is, empowering judges to impose realistic costs. As you know, at the moment, judges in our legal system do not seem to award high costs and as a result, we see a lot of frivolous actions being instituted against people. Therefore, if we have some sort of guidelines in place by updating the relevant gazettes, the judges could award higher costs, which would also help speed up the process.

As a Member of Parliament representing the Kandy District, I would now like to talk about a few matters pertaining to the Kandy Bar. The Kandy Court Complex was built in the early 2000s at the request of my father, who was a Member of Parliament at that time together with the Hon. (Prof.) G. L. Peiris. Actually, it has been close to 25 years since it was built and lot of repairs are now needed to upkeep that courthouse. Therefore, I would request the Hon. Minister to visit the Kandy Court Complex in the near future and then, maybe, we can look at how we can improve that complex. The Kandy Bar is the second largest Bar Association in Sri Lanka. We have about approximately 1,000 lawyers in the Kandy Bar. However, there are only 129 offices for the lawyers and during the previous Government, Cabinet approval was given to construct a new office for the lawyers. Actually, at the very last stage, a UDA property was allocated to build a further 129 offices.

I would request the Hon. Minister to help us in this process as the lawyers are willing to use their own funds and contribute towards the building. However, the only problem is that the cost per lawyer is Rs. 3.5 million and they would like to be given a period of five to ten years to pay that amount. As you know, these contributions will be made mostly by new, young lawyers and Rs. 3.5 million is a large sum of money, especially for those in the outstation Bars. So, I would request you to consider giving at least a period of five to ten years for those lawyers to pay that amount back to the Government.

Madam, let me raise just one more matter. Usually, commercial matters exceeding Rs. 50 million are referred to the Commercial High Court, Colombo. Once again, I would request the Hon. Minister - I think you would definitely agree with me, as we are both members of the Honourable Society of Lincoln's Inn - that a part-time Commercial High Court be instituted to hear commercial matters exceeding Rs. 50 million. Then, it would be easier for the lawyers in Kandy since, otherwise, they would have to travel all the way to Colombo for the hearings of those cases.

Finally, I would like to wish the Hon. Harshana Nanayakkara all the best! We would also like to extend our assistance to solve any legal issues which we may have to face in Sri Lanka.

Thank you.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Hon. (Mrs.) Kiriella, the Kandy lawyers' matter, I have attended to. Two groups of lawyers came to meet me. It is a UDA land and I assisted them. However, if things are not yet solved, please lead them to me and I will attend to the matter. I fully understand.

Also, you will be happy to note that we have started a rapid court digitalization programme. As I said, Justice Arjuna Obeysekera's Committee is considering it and one of the model courts we are going to use for that purpose will be the Kandy Court. Therefore, you should be getting digitalization a little earlier than the rest of the country. So, we will be attending to that.

Thank you very much.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

මීළඟට, ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.

අනන්තරව, මාණ්ඩලික කටයුතු පිළිබඳ නියෝජ්‍ය කාරක සභාපතිතුමිය (කලානිති) (සෙල්වි) කෞෂල්‍යා ආරියරත්න මහත්මිය මූලාසනාරූඪ විය.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

[3.40 p.m.]

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

Hon. Presiding Member, thank you very much for offering me this opportunity to speak.

2025ஆம் ஆண்டுக்கான நீதி மற்றும் தேசிய ஒருமைப் பாட்டு அமைச்சின் வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்தில் எனது கருத்துகளையும் முன்வைக்கச் சந்தர்ப்ப மளித்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த நாட்டிலே வாழும் சகல மக்களினதும், குறிப்பாகச் சிறுபான்மையின மக்களின் நிம்மதியான வாழ்வுக்கு வழிசெய்யக்கூடிய அமைச்சுகளில் முக்கியமான பங்கு வகிப்பது இந்த நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சாகும். எனவே, இந்த அமைச்சைச் சரியாக நடைமுறைப்படுத்துவதன்மூலம் எமது அரசின் கொள்கைகளை இந்த நாட்டிலே நிலைநிறுத்தக்கூடியதாக இருக்கும். இந்த நாடு சுதந்திரமடைந்த நாளிலிருந்து நீதி, தேசிய ஒருமைப்பாடு, நல்லிணக்கம் என்று காலங்காலமாகப் பேசப்பட்டு வந்திருக்கின்றதேயொழிய, எதுவுமே செயலில் இடம்பெறவில்லை. பதிலாக, இனங்களுக்கிடையில் ஒருமைப்பாடு அழிக்கப்பட்டு, முரண்பாடுகளே வளர்க்கப் பட்டிருக்கின்றன. இதனால் நாடே சின்னாபின்ன மாக்கப்பட்டு, இறுதியில் வங்குரோத்து நிலையை அடையக் காரணமாக இருந்ததும் இதுதான்.

எமது அரசு இனவாத, மொழிவாத, சமயவாத சிந்தனை களைக் களைந்து நாட்டை முன்னேற்றப் பாதையில் கொண்டுசெல்லத் திடசங்கற்பம் பூண்டுள்ளது. சட்டத்தின் முன் அனைவரும் சமமாக மதிக்கப்படல் வேண்டும். ஆனால், இந்த நாட்டில் 75 ஆண்டுகளுக்கும் மேல் ஆட்சி செய்த ஆட்சியாளர்கள் இவற்றையெல்லாம் மதிக்காது நாட்டு மக்களை, குறிப்பாக சிறுபான்மையின மக்களைக் குறிவைத்துப் பயங்கரவாதத் தடைச் சட்டம் போன்ற பல சட்டங்களை இயற்றினார்கள். இதனால், எமது மக்கள் குறிப்பாக தமிழ் பேசும் மக்கள் சொல்லொணாத் துன்பங்களை அனுபவித்ததை நாம் நன்கு அறிவோம். இந்த நிலைமைகள் இனிமேலும் தொடர தேசிய மக்கள் சக்தி அரசாங்கம் அனுமதிக்காது என்பதை, நான் இந்த உயரிய சபைக்கு என்னை அனுப்பிய மக்களுக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன். அத்துடன், இவ்வாறாகப் பாதிக்கப்பட்ட மக்களுக்குச் சரியான பரிகாரத்தை வழங்க வேண்டிய பொறுப்பு சம்பந்தப்பட்ட அனைத்து அமைச்சுகளுக்கும் உண்டென்பதை நான் தெரிவித்துக்கொள்ள விரும்புவதோடு, இதற்காக எதிர்க்கட்சி உறுப்பினர்கள் உட்பட அனைத்து மக்களின் ஒத்துழைப்பையும் நாங்கள் நாடி நிற்கின்றோம்.

இன்றும்கூட எமது சமூகத்தில் பலர் - கணவனை இழந்த மனைவி, பிள்ளைகளைப் பிரிந்த தாய், உறவுகளைப் பிரிந்து வாழும் உறவுகள் - நீதிக்காக ஏங்கி நிற்கிறார்கள். காணாமலாக்கப்பட்டவர்களைத் தேடிச் சிறைச்சாலை வாசல்களிலும் வீதியோரங்களிலும் தினமும் ஏங்கி நிற்கும் அந்த மக்களுக்குத் தெளிவான ஒரு பதிலை வழங்க வேண்டிய தேவை இன்று எங்களுக்கு இருக்கின்றது. காணாமலாக்கப் பட்டவர்கள் தொடர்பான விசாரணைகளை மேற்கொள்வதற் காகப் பல இலட்சம் ரூபாய் செலவு செய்து ஓர் ஆணைக்குழு உருவாக்கப்பட்டது. இன்று அதன் அறிக்கைகூட காணாமல் போயிருக்கின்றது. எனவே, அது தொடர்பாகவும் எமது மக்களுக்குச் சிறந்த ஒரு தீர்வை வழங்க வேண்டுமென்று நான் இந்த அரசாங்கத்தின் நீதி அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இதுதவிர, எந்தவொரு குற்றமும் செய்யாது சந்தேகத்தின் பேரில் கைதுசெய்யப்பட்டு வருடக்கணக்காக - சிலர் 30 வருடங்களாகக்கூட - சிறையில் வாடும் அரசியல் கைதிகளின் வழக்குகளைத் துரிதப்படுத்தி நீதியை வழங்கி, அல்லது அவர்களுக்குப் பொது மன்னிப்பை வழங்கி, அவர்களின் எஞ்சிய வாழ்க்கைக் காலத்தையாவது சமூகத்துடன் இணைந்து வாழச் செய்ய வேண்டியது எமது கடமை. அதை நாங்கள்

[ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා]

නිරවේවැරිරියේ දීරුවෝම් එන්බතෙ නාන් ඉංකු උරුතියාකක් කූර විරුම්පුකින්රේන්. පල් කලාචාරම්, පන්මොළි කොන්ට ඉන්ත නාට්ටෙ වළමාන නාටාක උරුවාක්කවුම් මක්කළ් අළකිය වාළ්ක්කෙ වාළක්කූටිය වකෙයිල් මක්කළිටෙයේ නල්ලිණක්කමුම් ඔරුමෙප්පාටුම් එර්පටවුම් වළිචමෙප්පතු එමතු එල්ලෝරතුම් කටමෙයාකුම්.

කෙළරව නීති අමෙච්චර් අවර්කළේ, උංකළ් අමෙච්චුටන් තොටර්පුටෙය පල තිණෙක්කළංකළ් ඉරුන්තාලුම් එමතු මාවට්ටත්තිල් පල කුරෙපාටුකළුම් කාණප්පටුකින්රන. යාළ්. චිරෙච්චාලෙයිල් චුමාර් 1,000 කෙතිකළ් උළ්ළනර්. අංකු ඉරුක්ක වේන්ටිය අළුවලර්කළ් 194; ඉප්පොළුතු 129 පේර් මට්ටුමේ කටමෙ පුරිකින්රනර්. එනවේ, ඉන්ත වෙර්රිටංකළෙ නිරප්ප ආවන චෙය්වතෝටු, අවර්කළතු ඉටමාර්රංකළෙයුම් චර්රුත් තාමතමාක මේර්කොණ්ටාල්, අතුවුම් අච්චේවෛක්කු උතවියාක ඉරුක්කුම්. අත්තුටන්, අංකිරුක්කින්ර චිරෙච්චාලෙ වෛත්තියචාලෙයිල් වෛත්තියර් ඉරුන්තාලුම් මරුන්තාළර්කළ් ඉල්ලාමලිරුප්පතු මිකවුම් චිරමමාක ඉරුක්කින්රතු. එනවේ, අවර්කළෙයුම් නීංකළ් පණික්කමර්ත්ත වේන්ටුමෙන්රු කේට්ටුක්කොළ්ළ විරුම්පුකින්රේන්.

මේලුම්, මල්ලාකම් නීතවාන් නීතිමන්රම්, 10ක්කුම් මේර්පට්ට පොලිස් නිලෙයප් පකුතිකළුක්කුච් චේවෙයාර්රුකින්රතු. ආනාල්, අංකු ඔරු නීතවාන් මට්ටුමේ චේවෙයිල් ඉරුප්පතාල්, පණිච් චුමෙයුම් මේලතික තාමතමුම් එර්පටුකින්රතු. එනවේ, ඉතනෙයුම් කවනත්තිල් එටුත්තු, මල්ලාකම් නීතවාන් නීතිමන්රත්තිර්කු මේලතික නීතවාන් ඔරුවරෙ නියමිත්තුත් තරුමාරුම් කේට්ටුක් කොළ්කින්රේන්. ඉන්රු නාටු මුළුවතුම් චුමාර් 1,100,000 වළක්කුකළ් නිලුවෙයිල් ඉරුප්පතාකත් තෙරියවරුකින්රතු. එනවේ, ඉවර්රෙ විරෙවාක නටාත්ති, මක්කළුක්කුත් තීර්වෛප් පෙර්රුක්කොටුක්ක වේන්ටිය තේවෙයුම් ඉන්රු එංකළුක්කු උළ්ළතු.

අත්තුටන්, නීතිමන්රංකළිල් මොළිපෙයර්ප්පාළර්කළ් පර්රාක්කුරෙයාකක් කාණප්පටුවතනාල් වළක්කු විචාරණෙකළ් මිකත් තාමතමාකින්රන. ඉන්තත් තාමතත්තිනාල් නීතිමන්ර නටවටික්කෙකළිල් මක්කළ් අතිරුප්ති අටෙන්තවර් කළාක ඉරුක්කින්රාර්කළ්. එනවේ, අවර්රෙ නිවර්ත්ති චෙය්යුම්පොරුට්ටු අංකු තේවෙයාන නීතිමන්ර මොළිපෙයර්ප්පාළර්කළෛච් චේවෙයිල් අමර්ත්ත වේන්ටුමෙන්රුම් නීතිමන්ර මොළිපෙයර්ප්පාළර්කළින් චේවෛප් පිරමාණක් කුර්රිප්පෙ වෙළියිට්ටු, අවර්කළින් චේවෙ තරමාකවුම් විරෙවාකවුම් කිටෙක්ක ආවන චෙය්යවේන්ටුමෙන්රුම් කේට්ටුක්කොළ්කිරේන්. අත්තෝටු, තිටීර් මරණ විචාරණෙ අතිකාරිකළ් මර්රුම් චමාතාන නීතවාන්කළ් පෝන්රවර්කළෙයුම් නියමික්කවේන්ටිය තේවෙ ඉරුක්කින්රතු.

අටුත්තු, එමතු යාළ්. මාවට්ටත්තිල් පෝතෛප්පොරුළ් පාවනෙයාළර්කළුක්කුම් චිරෙයිලිරුන්තු මීන්ටවර්කළුක්කු මාන පුනර්වාළ්වළිප්පු මෛයම් ඔන්රෙ අමෛක්ක වේන්ටියිරුක්කින්රතු. අත්තුටන්, එමතු පකුතිකළිල් පෝතෛප් පොරුළ් පාවනෙයෛක් කට්ටුප්පටුත්ත වේන්ටිය මුක්කිය තේවෙ ඉරුක්කින්රතු. එනවේ, යාළ්. මාවට්ටත්තිල් අතිකරිත්තුච් චෙල්ලුම් පෝතෛප්පොරුළ් පාවනෙ, කුළු මෝතල්කළ් එන්පවර්රෛක් කට්ටුප්පටුත්තුවතර්කාන නටවටික්කෙකළෛ නීතිත්තුරෙයුටන් තොටර්පුටෙය නිරුවනංකළ් මිකත් තුරිතමාක මුන්නෙටුක්ක වේන්ටුම්. පොලිසාර්, මුප්පටෙයිනරින් ඔත්තුළෛප්පෝටු අතෛ විරෛන්තු නටෙමුරෛප්පටුත්ත වේන්ටිය තේවෛ ඉරුක්කින්රතු. අත්තෝටු, එමතු පකුතිකළිල් පොලිසාර් චිලර් තාංකළේ කෙළරව නීතිපතිකළ් පෝල ඉරුන්තු පක්කච්චාර්පාක නීති වළංකුම් තේවෙයර්ර නටවටික්කෙයෛ උටනේ නිරුත්තවේන්ටුමෙන්රු නාන් කෙළරව අමෙච්චර් අවර්කළෛක් කේට්ටුක්කොළ්ළ විරුම්පුකිරේන්.

ඉනංකළුක්කිටෙයිල් නල්ලිණක්කත්තෛ ඒර්පටුත්ත වේන්ටුමායින්, ඉන්රු අරච පටෛකළිනාල් කෙයකප් පටුත්තප්පට්ටිරුක්කින්ර මක්කළින් චොන්තක් කාණිකළෛ අවර්කළිටම් කෙයළිික්ක වේන්ටුම්. කුරිප්පාක, පලාලි, මයිලිට්ටි, කට්ටුවාන් පකුතිකළිල් පල වීතිකළ් මූටප් පට්ටුළ්ළන. අවර්රෛත් තිරන්තු මක්කළ් පාවනෛක්කාක විටුවිත්තු, නල්ලිණක්කත්තෛ ඒර්පටුත්ත වේන්ටුමෙන්රු නාන් කේට්ටුක් කොළ්කිරේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) එස්. ශ්‍රී පවානන්තරාජා)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
Madam, give me one more minute, please.

එමතු පකුතිකළිල් කාලත්තුක්කුක් කාලම් කණ්ටුපිටික්කප්පටුම් පුතෛකුළිකළ් පර්රිය විචාරණෙක්කු මුන්නුරිමෛ කොටුත්තු, අතන් උණ්මෛකළ් වෙළික්කොණරප්පට වේන්ටුම්. අණ්මෛයිල් යාළ්ප්පාණප් පකුතියිලුම් පුතෛකුළියොන්රු කණ්ටුපිටික්කප්පට්ටමෛ කුරිප්පිටත්තක්කතු. එනවේ, නාන් කුරිප්පිට්ටවර්රෛච් චෙය්තු තර වේන්ටුමෙන්රු කෙළරව අමෙච්චර් අවර්කළෛක් කේට්ටු, විටෛපෙරුකිරේන්. නන්රි, වණක්කම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ජනක් චිත්‍රාල් ප්‍රනාන්දු මහතා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.48]

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි චිත්‍රාල් පර්නාන්තු)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වවන ස්වල්පයක් කථා කිරීමටත්, ඒ වාගේම ඒ පිළිබඳ සාධනීය යෝජනා යම් ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මම ගරු අධිකරණ අමාත්‍යතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබුණා, අධිකරණයේ නඩු පමාව සහ නඩු ගොඩ ගැසීම පිළිබඳව. ඒ සඳහා උපදේශක කාරක සභාවේදී යම් පිළිතුරක් ලැබුණා. අපි ඒ ගැන කථා කළා. හැබැයි, ඒ පිළිතුරත් සමඟ, මේ වෙනකොට ලක්ෂ 11ක පමණ නඩු ප්‍රමාණයක් විසඳීමට තිබෙනවා කියන කාරණයත් මතු වුණා. ඒක විශාල ගණනක්. ඒ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම කටයුතු කළ යුතු වෙනවා. මොකද, ඒ නඩු ප්‍රමාණය විසඳුවේ නැත්නම් රටේ ජනතාවට යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී විශාල පාඩුවක්, හානියක්, බාධාවක් සිද්ධ වෙනවා.

Hon. Minister, now I would like to draw your attention to the "Technical Assistance Report - Governance Diagnostic Assessment, September 2023" of the International Monetary Fund. I am sure that you have laid your eyes on it by now. මේ තිබෙන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ Technical Assistance Report එක. 2023දී තමයි මේක හදලා තිබෙන්නේ. මම හිතන්නේ ඔබතුමන්ලා පැල් බැඳගෙන IMF එකට ගහන කාලයේ තමයි මේක හැදුවේ. අද වෙනකොට ඔබතුමන්ලා මේක බොහොම ආදරයෙන් වැළඳගෙන තිබෙනවා. ඒකත් මම මතක් කරන්න කැමැතියි.

මෙහි "Section IX: Rule of Law: The effectiveness of the Judiciary - (a) Case Backlog" යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "The perception of international investors and the financial sector is that it is unattractive to do business in Sri Lanka, citing absence of a functioning judiciary as the key sticking point."

මම හිතන හැටියට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් මූල්‍ය ප්‍රශ්නය සම්බන්ධයෙනුත් අධිකරණය ඇදාගෙන විශාල ප්‍රශ්නයක් තිබෙන බව ඒ වෙලාවේදීත් සිහිපත් කර තිබුණා. ඒ නිසා විශේෂයෙන්ම මම ඒ කාරණය මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම මම කියන්න කැමැතියි, විනිසුරුවරුන්ට තිබෙන workload එක ගැන. ඒ ගැනත් IMF එකේ මේ Technical Assistance Report එකේ "Section IX: Rule of Law: The effectiveness of the Judiciary - (b) Court process delays due to caseload and lack of effective judicial administration" යටතේ මෙන්න මේ විධියට සඳහන් කරලා තිබෙනවා:

> "The heavy workload of judges is increased by heavy court administration procedures."

ගරු ඇමතිතුමනි, මේ administration procedure එක අපි නීති විද්‍යාලයේ ඉගෙන ගන්න කාලයේ ඉඳන් කථා වුණු දෙයක්. කැඳවීමේ නඩු සඳහා විනිසුරුවරයෙක් දවසක් ගත කරනකොට, අධිකරණයේ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ඇති වන තත්ත්වය ගැන අපි කථා වුණා. මේක administration part එකක් කියලා නීති විද්‍යාලයේ සිටි කාලයේ මම අහලා තිබෙනවා. ඔබතුමන්ලාත් දන්නා පරිදි අපි පොඩි කාලයේ ඉඳලා ඒ ගැන අහලා තිබෙනවා. හැබැයි අද වෙනකලුත් ඒක ක්‍රියාත්මකයි. ඒ නිසා අනිවාර්යයෙන්ම ඒකට විසඳුමක් සොයා ගත යුතුයි.

එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "The lack of resources in the judiciary is clear with the Ministry of Justice (MoJ) citing the ratio of approximately 15 judges per million population."

This was in 2023. The situation has worsened now.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
No, in 2019.-

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
All right, that was from 2015 to 2019. Thank you, Hon. Minister. එම ඉලක්කයට යෑම සඳහා ඔබතුමා මේ වෙනකොට වැඩ කරගෙන යනවා ඇති කියලා මම හිතනවා. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "In addition to the case load, judges are also being consumed with running administrative matters at court which could be managed by court administration personnel so that judges can focus on adjudication."

මම කථා කරන දේ සම්බන්ධයෙන් තමයි මේ කියන්නේ.

මම මේ වාර්තාවේ කොටසක් **සභාගත*** කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙනුත්, එහි කටයුතුවල පමාව සම්බන්ධයෙනුත් විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය මම යොමු කරනවා. 2017දී බී.පී. අළුවිහාරේ වාර්තාව ඉදිරිපත් කරලා තිබුණා. එහි විශේෂයෙන්ම සඳහන් වෙනවා, වරද සිදු කළ දිනයේ සිට අධිචෝදනා මහාධිකරණයට ගොනු කිරීම අතර සාමාන්‍ය කාලය වසර 4යි මාස7ක් කියලා. ඒ, 2017දී. ඔබතුමා කිව්වා වාගේ මම හිතනවා දැන් ඒක හොඳ අතට හැරිලා ඇති කියලා. ඒ වාගේම අධි චෝදනා ගොනු කරන දිනයේ සිට සත්‍ය ලෙසම අදාළ නඩු විභාගය ආරම්භ වන දින අතර කාලය සාමාන්‍යයෙන් වසර 3යි මාස7ක්. මහාධිකරණ නඩුවේ සාක්ෂි විභාගය ආරම්භ වීම සහ නඩුවේ තීන්දුව අතර කාලය සාමාන්‍යයෙන් වසර 1යි මාස 8ක්. එහෙම බැලුවාම, නඩුව මහාධිකරණයේ විභාග කොට අවසන් වන දිනය අතර සාමාන්‍ය කාලය වසර 10 යි මාස 2ක්.

ඒක විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒක නිසා තමයි අපි ඒ ගැන මතක් කරන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය ඒ ගැන යොමු කරලා, ඒක සාධනීය යෝජනාවක් හැටියට පිළිගෙන කටයුතු කරන්න. අපි ඔබතුමාට ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, අද උදේ ඔබතුමාගේ කථාවේදී කුලියට අරගෙන තිබෙන ගොඩනැඟිලි පිළිබඳ යම් ප්‍රකාශයක් කළා. මා පසුගිය වර්ෂයේ ප්‍රගති වාර්තාව අරගෙන බැලුවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා අධිකරණ අමාත්‍යාංශය සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ දෙකක ප්‍රමාණයක්, - *[බාධා කිරීමක්]* වැරැදුණා නේද? ඒක තමයි. මේ වාර්තාවේ තිබෙනවා, මාසයකට රුපියල් 7,254,908ක්. ප්‍රමාණය හරි නේද?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔව්, මට වැරැදුණා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
Thank you.

මම මේ එකක්, දෙකක් ගැන විතරයි කියන්නේ. ඒ වාගේම, පුනරුත්ථාපන කාර්යාංශය සඳහා මාසයකට රුපියල් ලක්ෂ 19ක්, කොළඹ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය සඳහා මාසයකට රුපියල් ලක්ෂ 7.80ක් කියලා තිබෙනවා. මේ ඔක්කොම මාසයකට යන ගණන්. මම ඒ ඔක්කොම එකතු කරලා බැලුවා. එතකොට මාසයකට රුපියල් දෙකෝටි දහතුන්ලක්ෂ අනුභයදහස් හයසිය පනස්හතරයි.

ගරු අගමැතිතුමියනි, මේ රුපියල් ලක්ෂ 72ක් කියන්නේ ජනාධිපතිවරයාටයි, තව එකොළොස්දෙනෙකුටයි මේ අවුරුදු පහම රට යන්න තිබෙන සල්ලි. ගරු අගමැතිතුමිය හිනා වෙන්නේත් නැහැ. මම විහිළුවක් කළේ. මම මේ කියන්නේ, ඔබතුමන්ලාගේ වියදම් කපා හැරීම දෙස බැලුවාම මේක විශාල ප්‍රමාණයක්.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ කාර්යාල ස්ථාපිත කිරීමට රුපියල් ලක්ෂ 14ක කුලියක් තිබෙනවා. මේවා ප්‍රාග්ධන වියදම් නොවෙයි, කුලියක් වශයෙන් මාසිකව ගෙවන්නට තිබෙන දේවල්. ඒක නිසා මට නම් තේරෙන විධියට ඔබතුමන්ලාගේ ගමන් මාර්ගය අනුව මේක විශාල වියදමක් සහ නාස්තියක්.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරි. ඔබතුමා දන්නවා, මේවා අපි බලයට ඇවිල්ලා මාස තුනකදී අත්සන් කරලා දීපු කොන්ත්‍රාත් නොවෙයි කියන එක. නමුත්, අපි මේ වියදම් අඩු කර ගන්න එපායැ. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා BCC නොවෙයි, අධිකරණ අමාත්‍යාංශය සඳහා ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට Budget එකෙන් රුපියල් මිලියන 3,500ක් අපි අනුමත කර ගෙන තිබෙනවා. ඒක නිසා ලබන අවුරුද්ද වන විට ඉතා ඉක්මනින් මේ recurring expenditure අපට නවත්වන්න පුළුවන්.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ඉතා ඉක්මනින් නවත්වන්න. මේවා ඔබතුමා ගත්ත තීරණ නොවෙයි. මම ඒක දන්නවා. හැබැයි, 2024.12.31වැනි දාට එහි කාලය අවසානයි. එතකොට ඒ තිබෙන විධියට, තවත් වසරකින් දීර්ඝ කිරීමට මේ වෙනකොට අනුමැතිය ලැබිලා තිබෙනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ අමාත්‍යාංශය ගෙන යන්න තව තැනක් නැහැ නේ. ඒක නේ දීර්ඝ කළේ.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

නමුත් මම නැවත මතක් කරන්න කැමැතියි, ජනාධිපතිවරයාට හා තවත් එකොළොස්දෙනෙකුට රටවල් තුනකට යන්න ගිහිල්ලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 18යි. එතකොට, මාසයකට රුපියල් ලක්ෂ 72ක් මේ සඳහා වියදම් කරන එක වැඩියි. ඒ නිසා ඒකට ඉතා ඉක්මනින් පිළිතුරක් සොයා ගන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මම පිළිගන්නවා. ඒ වෙලාවේ තිබුණු තත්ත්වය යටතේ වෙන බිල්ඩින් එකක් සොයා ගන්න බැරි නිසා ඒක කළේ. නමුත්, දිගින් දිගටම එහෙම කරන්න ඕනෑ නැති නිසා තමයි, අපි Adikarana Piyasa Project එකට මුදල් වෙන් කරගෙන තිබෙන්නේ. ඒ නිසා අපි මේ මුදල් හිතා මතා නාස්ති කරනවා නොවෙයි. අපේ දෙපාර්තමේන්තු සියල්ල එක තැනකට ගෙනාවාම, මේ recurring expenditure නවත්වන්න පුළුවන්. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි පටන් ගෙන තිබෙනවා. මේ ගණන් වැඩි බව මම දන්නවා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ඔබතුමාට රුපියල් ලක්ෂ දෙකක් කියලා කියැවුණේ, මම හිතන්නේ ඒ ගණන ඔළුවේ නැති නිසා වෙන්න ඇති.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මට වැරැදුණා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

හරි, ස්තුතියි. ඔව්වර ගණනක් කියලා ඔළුවේ තිබුණා නම්, ඒක වරදින්න බැහැ. ඒකයි මම කිව්වේ. I accept your answer. Thank you, Hon. Minister.

මේ ගණන කිව්වේ, විනිසුරුවරුන්ගේ නිල නිවාස සඳහා තිබෙන කුලිය නැතුවයි. එතැනත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම හිතන විධියට 416ක අවශ්‍යතාවක් තිබෙනවා, දැනට තිබෙන්නේ 140යි. අනෙක් සියල්ල සඳහා අපට මේ වෙනකොටත් කුලිය ගෙවන්න වෙනවා.

ඒ වාගේම, මම මේ වෙලාවේදී තව කාරණයක් මතක් කරන්න කැමැතියි. 2024 ප්‍රගති වාර්තාව මේ වෙනකොටත් Library එකට ඇවිල්ලා තිබුණේ නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ පෞද්ගලික ලේකම් ළඟිරු මහතාටත් කථා කළා. එතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මේ තොරතුරු ලබා දුන්නාට ශාන් අමරසේකර මහතාටත් ස්තුතිවන්ත වෙනවා. මම NPP එකේ මන්ත්‍රීවරයෙක් කියලා හිතුවාද දන්නේ නැහැ. හැබැයි, මට ඒවා දුන්නා. *[බාධා කිරීමක්]*

ඒ වාගේම, පුරප්පාඩු පිළිබඳවත් විශාල ප්‍රශ්නයක් දැන් ඇති වෙලා තිබෙන බව මම කියන්න කැමැතියි. ඒකත් අපි ගණන් හිලව් එක්ක බැලුවා. නීතිපති දෙපාර්තමේන්තුවේ 606ක විතර පුරප්පාඩු තිබෙනවා. ඒ වාගේම සහකාර රජයේ අධිනීතිඥවරුන් - පරිවාස - මේ ප්‍රමාණයේත් ගණන් වැරදිලාද කියලා මම දන්නේ නැහැ. මට මේකට උත්තරයක් අවශ්‍යත් නැහැ. නමුත්, cadre එක 130ක් අනුමත වෙලා තිබෙනවා. ඒ වාගේම, 130ක් පුරප්පාඩුයි කියලා මේ පොතේ පෙන්වනවා. මම හිතන විධියට, ඒක යම් කිසි වැරැදීමක් වෙන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම අවුරුදු 30කට වඩා අත් දැකීම් තිබෙන සොලිසිටර් ජනරාල්වරු හයදෙනෙක් මේ අවුරුද්දේ විශ්‍රාම යන්නට නියමිතයි. ඒ පුරප්පාඩු පුරවන්නට ඉතා ඉක්මනින් කටයුතු කළ යුතුයි. මම හිතන විධියට අර කියපු අලුවිහාරේ වාර්තාවත් එක්ක බැලුවාම, නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය cadre එක, අවශ්‍ය පුහුණුව තිබෙන අය නැති වුණොත් මේ ප්‍රශ්නය නැවත ඇති වෙන්න පුළුවන්.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ මේ වෙනකොට පුරප්පාඩු 1,820ක් පවතිනවා. පුනරුත්ථාපන කාර්යාංශයේ පුරප්පාඩු 204ක් විතර පවතිනවා. මම ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාගෙන් ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ කාරණා කෙරෙහිත් අවධානය යොමු කරන්න කියලා.

ගොඩනැඟිලි කුලී ගෙවීම පිළිබඳව කථා කරද්දී මට කියන්න අමතක වූ තව කාරණයක් තිබෙනවා. කුලියක් ගෙවන අතරේ අධිකරණ ශාලාවලින් යම් කිසි මුදලක් අය කරගන්නත් මේ වෙනකොට කටයුතු කරමින් තිබෙනවා. ඒක ඔබතුමා ගත් තීරණයක් නොවෙයි කියන එක මම නැවතත් කියනවා. මම හිතන විධියට ඒක කලින් හිටපු අමාත්‍යවරයෙක් ගත්ත තීරණයක්. අධිකරණවල තිබෙන ආපන ශාලාවලට අදාළ ටෙන්ඩර් කැඳවීමක් ගැනත් මට තොරතුරු ලැබුණා. මට කුලියාපිටියේ නීතිඥ සංගමයෙන් 2025.02.07වැනි දා එවා තිබෙනවා, එවැනි ලංසු

කැඳවීමක් ගැන විස්තරයක්. එම ආපන ශාලාව හැදුවේ අනුර ප්‍රියදර්ශන යාපා හිටපු මන්ත්‍රීතුමාට ලැබුණු රජයේ ප්‍රතිපාදනවලින්. එතුමාට ලැබුණු මුදල්වලින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් හදා තිබෙනවා. ඊට පසු නීතිඥවරුන් විසින් ඒකට අවශ්‍ය පුටු ටිකක්, fridge එකක් එහෙම අරගත්තා. නීතිඥවරුන් කිහිපදෙනායි එතැනින් කෑම ගන්න ඉන්නේ. ඉතාම අමාරුවෙන් තමයි ඒ කැන්ටීම කරන මිනිස්සු එතැන තියාගෙන ඉන්නේත්. හැබැයි, නැවත ලංසු කැඳවා තිබෙනවා, රුපියල් 20,000කටද, 25,000කටද ඒ කැන්ටීම දෙන්න. ඒ මිනිස්සු රුපියල් 25,000ක් දීලා ඒක ගන්නේ නැහැ, ඇමතිතුමනි. මොකද, ඒ අලුත්කඩේ නොවෙයිනේ. එතැන නීතිඥවරුන් කිහිපදෙනෙක් තමයි ඉන්නේ. ඒ නිසා මම කියන්න කැමැතියි, සල්ලි හම්බ කළ යුත්තේ ඒ විධියට නොවෙයි කියන එක. තමන්ගේ වියදම් කප්පාදු කරන්නයි කටයුතු කළ යුත්තේ. ඒ නිසා ඒවා පිළිබඳව සොයා බලා කටයුතු කරන්න කියා මම ඉතාම ආදරයෙන් ඔබතුමාට මතක් කරන්නට කැමැතියි.

ජනාධිපතිතුමා ඊයේ එතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරද්දී නීතිය සම්බන්ධයෙන්, නීතිඥවරුන් සම්බන්ධයෙන්, අධිකරණ නිලධාරීන් -මම හිතන විධියට ඒකෙන් අදහස් කළේ, විනිසුරුවරුන් වෙන්න ඕනෑ- සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් කළා. මම දැක්කා, ජනාධිපති නීතිඥ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමාත් උදේ වරුවේ ඒ ගැන සඳහන් කළා. මම හිතන විධියට නීතිඥවරුන් විශාල පිරිසක් මෙතැන ඉන්නවා. ජනාධිපතිතුමාට නීතිඥවරුන් සම්බන්ධයෙන්, නීති වෘත්තිය සම්බන්ධයෙන්, නීතියේ මූලධර්ම සම්බන්ධයෙන් පොඩි හඳුන්වා දීමක් කරන්න වෙයි කියලා මම විශ්වාස කරනවා. මොකද එතුමා කියනවා, සන්නද්ධ කල්ලි එක්ක ඉන්නවා කියලා අධිකරණ නිලධාරීන්, නීතිඥවරුන්, හමුදාවේ අය, පොලීසියේ අය. එතුමා ඉතාම පැහැදිලිව එය ප්‍රකාශ කළා. මට කියන්නට තිබෙන්නේ මෙකයි. අපේ නීතිඥ මහත්මයෙක් තමයි දැන් මේ ආණ්ඩු පක්ෂය පැත්තෙන් නැඟිටලා ඉන්නේ. එතුමාත් දන්නවා, ඒ මූලධර්මය මොකක්ද කියලා. ඒ කියන විධියට සැකකරුවෙක් සමඟ නීතිඥවරයෙකුට කථා කරන්නවත් හම්බ වෙන්නේ නැහැ. විනිසුරුවරයෙක් සැකකරුවෙකු සමඟ සම්බන්ධතා පවත්වනවා නම් ඒක තනිකරම නීති විරෝධී, ආචාර ධර්ම විරෝධී දඩුවම් කළ හැකි වැරැද්දක්. හැබැයි, නීතිඥවරයෙකුට එහෙම දෙයක් නැහැ. සැකකරුවෙක් කියන්නේ, සැකකරුවෙක් until he is proven guilty. මේ කියන විධියට කවුරු හරි සැකකාරයෙක් සමඟ ජීප් එකේ නැඟලා ගියා නම්, ඒක ජනාධිපතිවරයා මෙතැනට ඇවිල්ලා කථා කළ යුතු දෙයක් නොවෙයි. ඒ ආචාර ධර්ම සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක ජනාධිපතිවරයා හෝ මේ පාර්ලිමේන්තුවෙන් හෝ නීති හදලා විසඳන්න පුළුවන් දෙයක් නොවෙයි. ජාතික ජන බලවේගයේ මේ 159දෙනා අතර නීතිඥවරු විශාල පිරිසක් ඉන්නවා. මේ නීතිඥවරු පෙනී හිටපු අපරාධ නඩු ඔක්කෝගෙන්ම ඒ සැකකරුවන් නිදොස්කොට නිදහස් වුණාද? එහෙම වෙලා නැහැ. සැකකාරයෝ වැරදිකරුවන් වූ නඩුත් ඇති. එහෙම නම් ඒ අය වෙනුවෙන් කථා කරපු එකත් වැරදියිනේ. ඒ නීතිඥවරයා ඒ අය වෙනුවෙන් පෙනී හිටපු එකත් වැරදියිනේ.

ඒ නිසා ජනාධිපතිවරයෙක් මෙතැනට ඇවිල්ලා නීතිඥ වෘත්තියට ඒ විධියට බලපෑම් කරන්න කථා කරපු එක මම ඉතා දැඩි ලෙස හෙළා දකිනවා. සැකකරුවන් වෙනුවෙන් පෙනී ඉන්න එක අපේ වගකීම. අපි ඒකට බැඳී ඉන්නවා. ඒ නිසා එහෙම කථා කරපු එක ඉතාම වැරදියි. As a member of the official and unofficial bar - you have been in both - Hon. Minister, you know what are the- ඔබතුමාත් දන්නවා, ඒක. විනිසුරුවරයෙකුට සැකකරුවෙකු සමඟ සම්බන්ධයක් තිබුණා නම් එතැන ප්‍රශ්නයක් තිබෙන බව අපට තේරුම් ගන්න පුළුවන්. නමුත් නීතිඥවරයෙක් සැකකාරයෙකු සමඟ එහෙම කටයුතු කරන එකට බාධා කරන්න, නීතිඥ වෘත්තිය කරගෙන යන්න බාධා කරන්න එපා කියා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මට තව ඉතිරි වී තිබෙන්නේ විනාඩියක කාලයක්. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාට ගරු කරනවා. ඔබතුමා අපේ වෘත්තිය තුළ සිටින ජ්‍යෝෂ්ඨයෙක්. අධිකරණ අමාත්‍යාංශය සම්බන්ධයෙන් අපි දැන් මේ දේවල් ගැන කථා කරන්න කලින් ඔබතුමා සියලු දේ කිව්වා. ඒ කියන්නේ ඔබතුමා දැනුමක් අරගෙන තිබෙනවා, මේ තිබෙන ප්‍රශ්න විසඳන්න ඕනෑ කියලා. ඒ වෙනුවෙන් අපි ඔබතුමාට ගරු කරනවා. අපේ චමින්ද්‍රාණී මන්ත්‍රීතුමිය කිව්වා වාගේ අපිත් ඒ සඳහා උදව් කරන්නට ඉතාම කැමැත්තෙන් ඉන්නවා. හැබැයි, මට දුක හිතුණු එක කාරණයක් ගැනත් මේ අවස්ථාවේ සඳහන් කළ යුතුයි.

පසුගිය දවසක ඔබතුමා අපේ හිටපු රාජ්‍ය නායකයෙකුට කථා කරපු විධිය නිසා මට පොඩ්ඩක් දුක හිතුණා, because you are better than that, Hon. Minister. You are better than that.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව තත්ත්පර 30ක් දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා එහෙම කථා කරද්දී මට මතක් වුණු දෙයක් තිබෙනවා. ජාතික ජන බලවේගය හඳපු මුල්ම පාර්ශ්වකරුවන් අතර ඔබතුමා ඉන්නවා. ඒ කාලයේ ඉඳලා අපි ඔබතුමා දැක්කා. ඔබතුමාගේ ඒ දේශපාලන ගමනත් අපි බලාගෙන හිටියා. ඔබතුමාගේ ඥාති හිතමිත්‍රාදීන් සමඟ අපි දේශපාලනයත් කරලා තිබෙනවා.

ඉතින් මට හිතුණේ ඔබතුමා ජාතික ජන බලවේගය හදන්න මුල්ගල් තියලා මෙතැනට ආවාට පස්සේ තාපසාරාමයට යන්නේ නැතිව හොරු රැළට වැටිච්ච ගිරවාට වෙච්ච වැඩේ වෙලා ද කියලායි. මොකද, you are very much better than that, Hon. Minister. We did not expect something like that from you. මම ඔබතුමාට මතක් කරනවා, keep your calmness. ඔබතුමා බොහොම නිස්කලංකව මේ වැඩේ කරගෙන යන්න. එහෙම නැතිව ගියොත්, ඔබතුමාගේ මාමා වාගේ පාර්ලිමේන්තුවෙන් යන දවසට මොන සිංහල වචනයක් කියලා මෙතැනින් යන්න වෙයිද දන්නේ නැහැ. ඒකත් ඔබතුමාට මතක් කරමින් මම නිහඬ වනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට පැහැදිලි කරන්න මූලික කාරණා කිහිපයක් තිබෙනවා. එකක්, ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට ජනාධිපතිතුමා කොයි අවස්ථාවකවත් අපරාධ වෙනුවෙන් කථා කරන නීතිඥයෙකුට සැකකරුවන් -තමන්ගේ සේවාදායකයන්- එක්ක කථා කරන්න එපා කිව්වේ නැහැ. මම අවුරුදු 25ක් තිස්සේ නීතිඥ වෘත්තියේ ඉන්නවා. මම කළේත් අපරාධ නීතිය. අපි හැම විටම අපේ සේවාදායකයාත් සමඟ කථා කරනවා. හිර ගෙවල්වලට ගිහිල්ලාත් කථා කරනවා. ඒ ගැන ජනාධිපතිතුමා මොකුත් කිව්වේ නැහැ. නමුත් ඔබතුමාත් දන්නවා, මමත් දන්නවා, අපේ වෘත්තිය තුළ සමහරු ඉන්නවා, තමන්ගේ සීමාව ඉක්මවා යන අවස්ථා තිබෙන. Wining and dining with a client is your choice, but you must know which client you are going to wine and dine with. I can tell you for sure, the President never tried to regulate or intimidate any attorney-at-law who was doing his job. So, I want to clarify that matter first.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

Secondly, මා ගැන දක්වන අනුකම්පාව නේද? ගණන් ගන්න එපා. මම ඉන්නේ හොඳම තැන. මගේ වටේ ඉන්න අය මට විශ්වාසයි; හොරු නැහැ, වංචනිකයෝ නැහැ. And, I am very sorry if I have hurt you by talking about that particular gentleman. But, I am only apologizing for hurting you, not for what I said.

Thank you.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

Hon. Minister, I was not hurt because you mentioned that name, but by the way you spoke about him. I did not expect something like that from a gentleman like you. That is all that bothered me, nothing else.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

I thank you very much for your kindness; it is very much appreciated. But, I know where my politics lies. Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජී.ඩී. සූරියබණ්ඩාර මහතා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.06]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී මගේ අදහස් දක්වන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මේ වැය ශීර්ෂය යටතේ මම අද කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ සංහිඳියාව සම්බන්ධයෙන්. මොකද, හමුදාවේ හිටපු කාලයේ උතුරු-නැහෙනහිර පළාත් තුළදී මා ලැබූ අත්දැකීම් එක්ක යම් යම් කාරණා පිළිබඳ අවධාරණය කරන්න හැකියාව ලැබෙයි කියලා මම හිතුවා. ඒ අනුව, ලැබී තිබෙන මේ කෙටි කාල සීමාව තුළ අදහස් ප්‍රකාශ කරන්නට මා උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊට පෙර මම යම් කරුණක් කියන්න කැමැතියි. මේ ගරු සභාවේ මීට ප්‍රථම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙකු කථා කරලා ගරු සභාවට නීතිඥවරුන්ගේ සහ විනිසුරුවරුන්ගේ ක්‍රියාකලාපය පිළිබඳ කරුණු ඉදිරිපත් කළා. අපේ ගරු අධිකරණ අමාත්‍යාතුමා නීතිඥවරුන් සම්බන්ධයෙන් මතුවුණු ඒ ගැටලුවට පිළිතුරු ලබා දුන්නා. විනිසුරුවරුන් සම්බන්ධයෙන් යම් කිසි ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ ගැන අධිකරණ ඇමතිතුමාගේ අවධානයටත් ලක් කරන්න මම කැමැතියි. මේක මම ඊයේ දැක්කේ YouTube නාළිකාවක. භාරත තෙන්නකෝන් කියන්නේ නිදහස් මත දරන මාධ්‍යවේදියෙක්. ඔහුගේ වැඩසටහනක් තුළ අධිකරණයේ ගරුත්වය සම්බන්ධයෙන් යම් කිසි කාරණාවක් මතු කරලා තිබුණා. ඒකට හේතු පාදක වෙලා තිබුණේ මේ ළඟදී මේ උත්තරීතර සභාව නියෝජනය කරන විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට අදාළව කුප්‍රකට ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඉදිරිපත් වුණු ඒ නඩුව විභාග කරන විනිසුරුවරයා සම්බන්ධ දෙයක්. ඉතින් එතැන දැන් ළඟැදියාව අතර ගැටුමක් - conflict of interest - ඇති වෙලා තිබෙනවා. ඒ කරුණු අනාවරණ කරනකොට ප්‍රකාශ කළා, ඒ විනිසුරුවරයා සමඟ මන්ත්‍රීවරයාගේ පවුලේ සමීප සම්බන්ධතාවක් තිබෙන බව. ඒ මන්ත්‍රීවරයාගේ මංගල උත්සවයට එම විනිසුරුවරයා සහභාගි වුණු බව කියනවා. එම නිසා ළඟැදියාවන් අතර ගැටුමක් නිර්මාණය වෙලා තිබෙනවා නම්, ඒ විනිසුරුවරයාගේ ගරුත්වය, සියලු විනිසුරුවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කරගෙන එම නඩුවෙන් එම විනිසුරුවරයා ඉවත් විය යුතුයි කියා මම හිතනවා. මම ගරු අධිකරණ අමාත්‍යාතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිසම හරහා හෝ විමර්ශනයක් කරලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න, ඒ වාගේම එහි සත්‍ය අසත්‍යතාව සොයා බලන්න කියලා.

ඇත්තටම සංහිඳියාව සම්බන්ධයෙන් කථා කරන්නට මම ප්‍රවේශයක් වශයෙන් ගන්නවා, මා 2014 සිට 2017 වර්ෂයේ රාජකාරී කරපු කිලිනොච්චිය ප්‍රදේශයේ වූ සිදුවීමක්. මම ඒ ප්‍රදේශයේ බලසේනාධිපතිවරයකු වශයෙන් රාජකාරී කළා. ඒ කාල සීමාව තුළ මට දැනුණු සංවේදී කථාවක් තිබෙනවා. මගේ බලප්‍රදේශයේ දමිළ විදුහල්පතිතුමියක් සේවය කළා. ඇය මා හමු වෙන්න ආවා. එතුමියට කිහිප වතාවක් මා ළඟට එන්න සිද්ධ වුණා. මොකද, ඒ පාසලට එන චක්‍රලේඛ සහ උපදෙස් ඔවුන්ගේ භාෂාවෙන් ලැබෙන්නේ නැති නිසා. දමිළ භාෂාවෙන් ඒවා ලැබෙන්නේ නැහැ. ඒවා ලැබෙන්නේ සිංහල භාෂාවෙන්. එතුමිය මා හමු වෙන්න ආවේ, ඒ චක්‍රලේඛ සහ උපදෙස් දමිළ භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ගන්නයි. මම ඒ අවශ්‍ය කාරණය එතුමියට ඉටු කරලා දුන්නා. නමුත් 2009 වර්ෂයේ යුද්ධය අවසන් වෙලාත් -අද වෙනකොට අවුරුදු 16ක් පමණ වෙනවා- පසුගිය රජයන්වලට ඇත්තටම අවංක වුවමනාවක් තිබුණාද, මේ ජාතික ගැටලුවට විසඳුමක් ලබා දෙන්න? මේ ජාතික ගැටලුවට හේතු පාදක වුණු භාෂා ප්‍රශ්නයට නිසි විසඳුමක් ලබා දෙන්න වුවමනාවක් තිබුණාද?

ඇත්තටම අද වනවිට දකුණ සහ උතුරු නැහෙනහිර සම්බන්ධ වන පාලම් බවට පත් වෙලා තිබෙන්නේ විශේෂයෙන්ම යුද හමුදාව. මා රාජකාරී කරපු ඒ කාල සීමාව ගත්තොත්, අපි ඔවුන් සමඟ සන්නිවේදනය කරනකොට නොයෙකුත් දුෂ්කරතා තිබුණා. අපි භාෂා පරිවර්තකයෙකු තියාගෙන තමයි ඔවුන් සමඟ සන්නිවේදන කටයුතු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සිද්ධ වෙලා තිබෙනවා, මේකට අලුත් ප්‍රවේශයක් ගන්න. ඇත්තටම මගේ පෞද්ගලික මතය නම්, 1956 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ අපි සම්මත කර ගත්ත "සිංහල පමණයි" කියන පනත තමයි මේ ප්‍රශ්නයේ ආරම්භයට හේතු වුණේ. එය මගේ පෞද්ගලික මතය. ඒ කාල සීමාව තුළ ඉංග්‍රීසි භාෂාව පසුපසට ගිහිල්ලා අපේ ස්වදේශීය භාෂාව කරළියට ආපු එකයි වුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

නමුත් ඒ පනත තුළින් සිද්ධ වුණේ ඇත්තටම සිංහල සමාජයේත්, දමිළ සමාජයේත් පන්ති දෙක බැඟින් නිර්මාණය වීමයි. Elite class එක, එක කණ්ඩායමක්. ඔවුන් පාලන කටයුතුවලට හවුල් වුණු පිරිසක්. අනික් අය තමයි සිංහල භාෂාව නැත්නම් දමිළ භාෂාව කථා කරන සාමාන්‍ය පුරවැසියන්. අපි අද දකිනවා, ඇත්තටම මේ සාමාන්‍ය ජනතාව අද ඉංග්‍රීසි භාෂාවේ වටිනාකම අවබෝධ කරගෙන තිබෙන බව. මම හිතනවා, එදා ඉංග්‍රීසි භාෂාව ප්‍රමුඛස්ථානයේ තිබුණා නම්, ජාතීන් අතර සන්නිවේදන කටයුතුවලට එය ඉතාම පහසුවක් වෙනවා. එහෙම නම් මෙවැනි ගැටලුවක් අද වනවිටත් නිර්මාණය වෙන්නේ නැහැ. සාමාන්‍ය ජනතාව විධියට අපි ඉංග්‍රීසි භාෂාවේ වටිනාකම අවබෝධ කරගෙන, අපේ දරුවන් විදේශ අධ්‍යාපනයට යවනකොට අපි ඒ වෙනුවෙන් විශාල මහන්සියක් දරනවා. අපේ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙන්න විශාල වියදමක් දරලා, ඒ පරීක්ෂණවලට සහභාගි කරවලා ඔවුන් විදේශ රටවලට යවන්න සිද්ධ වෙලා තිබෙනවා. මම හිතන්නේ elite class එකට ඒ ගැටලුව ඇති වුණේ නැහැ. මොකද, ඔවුන්ට ඒ නැඹුරුව තිබුණු නිසා.

එම නිසා සංහිඳියාව වෙනුවෙන් අපි ප්‍රායෝගික වැඩ කටයුත්තක් කළ යුතුයි. ඒකට අපේ රජයට උත්තේජනයක් ලැබිලා තිබෙනවා, පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී. පසුගිය මැතිවරණ ප්‍රතිඵලය ගත්තොත්, ඒ සියලු ජනතාව අපි කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා. අපේ රජයේ ප්‍රතිපත්තියත් ඒකයි. අපි ජාතික සමගිය, ආගමික සමගිය ඇති කරලා මේ රට ශ්‍රී ලාංකික පුරවැසියන් ජීවත් වන රටක් බවට පත් කරන්න අවශ්‍යයි.

Madam, when we talk about the Sri Lankan culture, I find that there is no Sri Lankan culture as such. As of now, we have only sub-cultures in terms of ethnicity such as Sinhala, Tamil, Muslim and some other ethnicities and also other sub-cultures in terms of religion. ඒ නිසා තමයි අපේ ගරු ජනාධිපතිතුමා මෙවර අය වැයේදී ශ්‍රී ලාංකික අනන්‍යතාවක්, සංස්කෘතියක් නිර්මාණය කරන්නට අවශ්‍ය ආරම්භය අරගෙන තිබෙන්නේ. ඒ වෙනුවෙන් තමයි, පොදුවේ සංස්කෘතික උත්සවයක්, ශ්‍රී ලාංකික දිනයක් නම් කරලා තිබෙන්නේ.

මම හිතන්නේ ඒක ඉතා සාධනීය කාරණයක්. ඒක තමයි අවශ්‍යතාව. මේ රටේ සංහිඳියාව ඇති කරන්න අපට අනිවාර්යයෙන්ම ඒක ලොකු උදව්වක් වෙනවා කියන එක ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක් තිබෙනවා.

[අ.භා. 4.14]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද විවාදයට ගන්නේ මට ආවේණික මාතෘකාවක්. මුලින්ම මම සුබ පතනවා, මගේ මිත්‍ර හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට. තරුණ දේශපාලනඥයකු වන එතුමාට අධිකරණ ඇමති වශයෙන් පත්වීමට ලැබීමත් භාග්‍යයක්. ඒ කටයුත්ත හොඳින් කරගෙන යන්න එතුමාට ශක්තිය හා ධෛර්යය ලැබෙන්න කියාත් මම ප්‍රාර්ථනා කරනවා. එතුමා දකිද්දි මට යම් කාරණයක් මතක් වුණා. අපි පක්ෂ දෙකක හිටියත්, මීට අවුරුදු 15කට විතර ඉස්සර කැන්ටීන් එකේදී එතුමායි, මමයි - අපි දෙදෙනා - දේශපාලන වශයෙන් රටේ අනාගතය කොයි ආකාරයෙන් ඉදිරියට යා යුතුද කියලා පොඩි සාකච්ඡාවක නිරත වුණා. සාධාරණත්වය ඇති කිරීම සහ හොරකම, දූෂණය නැති කිරීම යන දේවල් පිළිබඳව එතුමායි, මමයි කථා වුණා, අපි පක්ෂ දෙකක හිටියත්. මමත් මීට අවුරුදු 10කට කලින් මෙම අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත් වුණා. අපට පක්ෂ, පාට භේදයෙන් තොරව ධනාත්මක ලෙස මේවා ගැන සාකච්ඡා කරන්න පුළුවන් නම් ඒක තමයි රටවැසියන් අපෙන් බලාපොරොත්තු වෙන්නේ.

අධිකරණය සම්බන්ධයෙන් මම ඔබතුමාගේ අවධානයට ලක් කරනවා, ගරු ඇමතිතුමනි. මම ආඩම්බරයෙන් කියනවා, අධිකරණයේ ස්වාධීනත්වය ගත්තාම, වෙන රටවලට සාපේක්ෂව අපි ඉතා උසස් තැනක ඉන්නවා කියලා. Unbiasedness කියන කාරණාව ගත්තොත්, අපේ මන්ත්‍රීතුමෙක් ළඟදියාව කියන කාරණය ගැන කථා කරනවා මම දැක්කා. ඒ වාගේ අවස්ථාවක අනිවාර්යයෙන්ම ඒක ගැන අධිකරණයට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. එසේ ඉදිරිපත් කරන අවස්ථාවක විනිසුරුවරයා අනිවාර්යයෙන්ම ඒ නඩුව වෙනත් අධිකරණයකට මාරු කිරීමේ, නැත්නම් එතුමා ඒ නඩුවෙන් ඉවත් වෙන ක්‍රමයක් ලංකාවේ තිබෙනවා. මගේ දේශපාලන ඉතිහාසය ගත්තොත්, මම බොහෝ වෙලාවට බලවත් ආණ්ඩු පක්ෂයට වාගේ ප්‍රහාර එල්ල කරද්දි, පසුගිය ආණ්ඩුවක සිටි බැසිල් රාජපක්ෂ මැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අවස්ථා කීපයකදීම දේශපාලන වශයෙන් පළි ගැනීමට අප නිකරුණේ හිරේ දාන්න සූදානම් වුණා. ඒ අවස්ථාවේ අධිකරණයේ සහාය තමයි අපි පැතුවේ. මේ අවස්ථාවේදීත් මට වූ හිරිහැරය වෙනුවෙන් අධිකරණයේ සහාය පතන්න තමයි සිදු වුණේ.

ඒ හින්දා අධිකරණය ස්වාධීනව ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යෑම සඳහා කරන කැප කිරීම වෙනුවෙන් විනිසුරුතුමන්ලාටත්, කාර්ය මණ්ඩලයටත්, අධිකරණ අමාත්‍යාංශයේ සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පිරිනමනවා. අපේ රට තුන්වන ලෝකයේ රටක් වුණත්, ඉහළ මට්ටමේ රටක වාගේ අපේ අධිකරණ පද්ධතිය ක්‍රියාත්මක වීම ගැන මම ආඩම්බර වෙනවා. මගේ පියා වාගේම මිත්තණියත්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු වශයෙන් මගේ සහෝදරයාගේ මාමණ්ඩියත් යන සියලුදෙනාම නීති වෘත්තියට සම්බන්ධ වීමත්, ඒ වෘත්තියේම නියැළෙමින් මටත් අද ඒ ගමන යෑමට අවස්ථාව ලැබීම ගැනත් මම ආඩම්බර වෙනවා.

මම හිතන හැටියට නීතිපතිතුමාටත් යම් ආකාරයක බලපෑමක් ඇති වුණා. ජනාධිපතිතුමාගෙනුත් ඒ සම්බන්ධයෙන් අදහස් කීපයක් පළ වුණා. මම හිතන විධියට එතුමා නීතිඥවරයෙක් නොවෙයි. නීතිපතිතුමාටත් කටයුතු කරන්න පුළුවන් යම් සීමාවක් තිබෙනවා. එතුමාගේ පියාත් අපි ගරු කරන ප්‍රසිද්ධ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමෙක්. ඒ හින්දා නීති වෘත්තියේ ගෞරවය ඉදිරියට අරගෙන යමින් එතුමා ක්‍රියා කරන ආකාරය පිළිබඳව අපට ආඩම්බර වෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මම හිතන විධියට ඔබතුමාත් නීතිපති දෙපාර්තමේන්තුවේ හිටියේ. නීතිපති දෙපාර්තමේන්තුව පවත්වාගෙන යෑම පිළිබඳවත් අපි මේ අවස්ථාවේදී ස්තුතිය පළ කරනවා. දේශපාලනයෙන් වෙන් වෙලා, දේශපාලනය වෘත්තියට ගාවාගන්නේ නැතුව ස්වාධීනව කටයුතු කිරීම ගැන අපි නීතිපති දෙපාර්තමේන්තුවේ සියලුදෙනාටත් මේ අවස්ථාවේදී ස්තුතිය පිරිනමනවා.

ගරු ඇමතිතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 20කට ආසන්න ප්‍රමාණයක් ඉවත් වෙලා තිබෙනවා, මේ රටේ

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

තිබෙන තත්ත්වය මත. ඒ වාගේම, අය කරන ඉහළ බදු ප්‍රමාණය හින්දා ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතයට විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ඒ හින්දා ඉදිරියටත් මම හිතන විධියට තව තවත් පිරිස් ඉවත් වෙන්න පුළුවන්. ඒ නිසා මේ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ දක්ෂ පිරිස රැක ගැනීම ඔබතුමන්ලාගේ වගකීම.

එහෙම නැත්නම් ඔබතුමන්ලා ඔය බලාපොරොත්තු වන කාරණාවලට යන්න බැරි වෙනවා. ෆයිල් 400, 500 තිබුණත් පොලීසියේ තිබෙන අඩු පාඩු මත තමයි බොහෝ වෙලාවට නීතිපති දෙපාර්තමේන්තුවට ක්‍රියාත්මක වෙන්න බැරි; ගොඩක් අය වැරදිකරුවන් බවට පත් කරන්න බැරි. ඒ හින්දා නීතිපති දෙපාර්තමේන්තුවේ දක්ෂ නිලධාරීන් රැක ගැනීම ඔබතුමන්ලාගේත් අපේත් යුතුකම බව මේ අවස්ථාවේදී මම ඔබතුමාට මතක් කරනවා.

ඒ වාගේම, ඔබතුමා එක්ක මම කලිනුත් කථා කළා about digitalizing the legal system. මේ කටයුත්ත ඉතා ඉක්මනින් අපට කරන්න පුළුවන් නම් හොඳයි. ඇපැල් අධිකරණයේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු හතරක් විතර ගොනු කරන්න වුණා මට ආපු කරදරය නිසා. නීතිඥවරුන්ට ගෙවන්නේ නැතිව, ලියවිලිවලට විතරක් යනවා රුපියල් 60,000ක්, 70,000ක්. වගඋත්තරකරුවෝ 14ක්, 15ක් විතර ඉන්නකොට පිටු 120ක, 130ක නඩු ලියවිල්ලක් හදනකොට, ඒක අධිකරණයටත් අමාරුයි. ඒ නිසා මේවා digitalize කරන්න පුළුවන් නම් වටිනවා. සාමාන්‍ය මනුෂ්‍යයෙකුට නම් ඇත්තටම මොන කරදරය ආවත් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා ගන්න බැහැ. සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ දෙකහමාරක් තුනක් නැතිව නඩුවක් ලේසියෙන් පවරා ගන්න බැහැ. අසාධාරණ ලෙස පීඩාවට පත් වනවා නම් සාමාන්‍ය මනුස්සයෙකුට ඒ පිළිබඳ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරීමට පුළුවන්කමක් නැහැ, මේ තිබෙන වියදම් අනුව. ඒ නිසා මේ ගැන ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඉතා ඉක්මනින්, very aggressively you have to do this because I was also there. මේවාට ගොඩක් බාධක එනවා. හැබැයි, ඔබතුමාගේ ධෛර්ය, ශක්තිය පාවිච්චි කළොත් ඔබතුමාට මේ කටයුතු ටික කර ගන්න පුළුවන්.

ඒ වාගේමයි, delays of the law. ගරු ඇමතිතුමනි, මම defamation case එකක් පවරා තිබෙනවා. මම හිතන්නේ, දැන් ඒකට අවුරුදු 10කට වැඩියි. අපි මැරිලා තියේවි ඒ නඩුව ඉවර වෙද්දී. ඒ Case එකේ භාගයක්වත් තවම අරගෙන නැහැ. උදාහරණයක් විතරයි මම මේ කිව්වේ. මම ඊයේ අම්මා කෙනෙකුට කථා කළා. ඒක බෙදුම් නඩුවක්. එයාගේ තාත්තලාගේ කාලයේ දමපු නඩුවක්. තවම ඒ නඩුව යනවා. එතකොට දැනට අවුරුදු 30ක්, 40ක්, 50ක් විතර ගිහිල්ලා. ගරු ඇමතිතුමනි, අපි මේ වෘත්තියේ ඉන්න නිසා ඔබතුමා ඒ ගැන දන්නවා. එතුමිය ඇවිල්ලා කියවනවා කියවනවා. පැයක් විතර මට කිව්වේ නඩුව ගැන විතරයි. මම ඇහුවා දැන් මේ දේපොළින්මද ජීවත් වෙන්නේ කියලා. මේ දේපොළින්මයි ජීවත් වෙන්නේ, දරුවෝත් බලාපොරොත්තු වනවා මේකේ යම් ප්‍රතිඵලයක් කියලා කිව්වා. ඒ උදවිය විශාල ලෙස පීඩාවට පත් වෙලා.

අධිකරණයේ මේ තිබෙන ක්‍රමය ඔබතුමාගේත්, මගේත් වැරැද්දක් නොවෙයි. ඒ නිසා කෙසේ හෝ අපි අවුරුදු එකහමාරකින් නඩු අසන ක්‍රමයක් සකසන්න ඕනෑ. ඒකට අපිත් ඔබතුමාට සහයෝගය දෙන්නම්. මම අමාත්‍යාංශය භාරව කටයුතු කරන කොටත් ඒකට උත්සාහ කළා. හැබැයි, යම් යම් technical difficulties නිසා අපට ඒක කරගන්න හැකියාව ලැබුණේ නහැ. නමුත්, ඒ සඳහා ඔබතුමාට අපගේ උපරිම සහාය ලබා දෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මට ඉතා කෙටි කාලයක් තිබෙන නිසා එක් එක් කරුණු ඉක්මනින් ප්‍රකාශ කරන්නම්. මම හිටපු අධිකරණ නියෝජ්‍ය අමාත්‍යවරයා වාගේම මට භාරව තිබුණා බන්ධනාගාරය. ඊයේ පෙරේදා දවසක මම බන්ධනාගාරයට ගිහිල්ලා පොඩ්ඩක් ඇවිදලා කථා බහ කරලා ආවා. මම ඔබතුමා ගැනත් කිව්වා, හොඳ දක්ෂ ඇමතිවරයෙක් ඉන්නවා කියලා. ඇත්තටම මේ පිරිසට කවුරුත් උදවු කරන්නේ නැහැ. ඔබතුමාට මම ඔවුන්ගේ අදෝනාවක් කියන්නම්. එතැන හිටියා කුඩු ග්‍රෑම් 6කට අවුරුදු 28ක්, 30ක් හිරේ ඉන්න පුද්ගලයන්. පාතාලයේ ක්‍රියාකාරකම් කරන, හොරකම් කරන දේශපාලකයන්, විශාල වශයෙන් -කිලෝ ගණන්, ටොන් ගණන්- කුඩු ගෙනෙන මිනිස්සු එළියේ ඉන්නවා. ඉතා සුළු ප්‍රමාණයක් වන ග්‍රෑම් 6කට අවුරුදු ගණන් හිරේ ගිය පුද්ගලයන් ඉන්නවා.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් හදලා තිබෙනවා යම් යෝජනාවක්. මම අධිකරණ අමාත්‍යාංශය භාරව කටයුතු කරනකොටත් මේකට උත්සාහයක් ගත්තා. මරණ දඬුවම නියම කර තිබෙන පුද්ගලයා අවුරුදු 5ක් හොඳ චර්යාවෙන් හිටියොත්, ඒ දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් බවට අඩු කරන්නත්, අවුරුදු 12ක් ඉන්නකොට සිර දඬුවම අවුරුදු 20 දක්වා අඩු කරන්නත්, කල්ක්‍රියාව හොඳ නම් අවුරුදු 24කින් වාගේ ඔවුන්ට නිදහස් වෙන්න පුළුවන් ක්‍රමයක් යෝජනා කර තිබෙනවා. ඒක ඉතා හොඳ දෙයක්, ගරු ඇමතිතුමනි.

ඒ කාලයේ මම අධ්‍යයනයක් කර බැලුවා. සාමාන්‍යයෙන් අවුරුදු 10ක්, 15ක් හිරේ ඉන්න පුද්ගලයෙක් නැවත වැරදි කරන්න තිබෙන අවස්ථාව ඉතාම අඩුයි. ගොඩක් දුප්පත් මිනිස්සු තමයි හිරේට යොමු වන්නේ. ගොඩක් වෙලාවට පොහොසත් මිනිස්සු හිරේට යන්නේ නැහැ, අපේ තිබෙන ක්‍රමය අනුව. ඒක සම්පූර්ණයෙන්ම අපට නිවැරදි කරන්න බැරි වුණත්, හිරේට යොමු වන පිරිසට යම් සහනයක් ලබා දෙන්න අපි උත්සාහ කරන්න ඕනෑ. ඒ වාගේම මෙමඟින් බන්ධනාගාරවල තිබෙන තදබදය අපට විශාල ලෙස අඩු කර ගන්න පුළුවන්.

ඒ වාගේම යම් පුද්ගලයෙකුට අවුරුදු 60දී ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් නැත්නම් මරණ දණ්ඩනය හිමි වුණොත්, අවුරුදු 10ක් ගියාට පස්සේ අවුරුදු 70දී වාගේ එළියට එන්න පුළුවන්. යම් පුද්ගලයෙකුට අවුරුදු 65දී ඒ දඬුවම ලැබුණොත් අවුරුදු 75දී වාගේ එළියට එන්න පුළුවන්.

මම හිතන්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

ඒ වාගේම තව කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කළා. මම කලිනුත් මේ ගැන කථා කළා. මම හිතන්නේ මේ කාරණය පසුගිය කාලයේ කැබිනට් මණ්ඩලයෙන් සම්මත වෙලා තිබෙනවා. ඒ තමයි රිමාන්ඩ් භාරයේ හිටියා නම්, අච්චු වුණාට පස්සේ ඒ කාලය අච්චු කාලයෙන් අඩු කරන්න කියන එක. ඒක ඉතා සාධාරණ ඉල්ලීමක්. මොකද, ගරු ඇමතිතුමනි, පිට රටවල, ගොඩක් රටවල ඒ ක්‍රමය තිබෙනවා. අපි හිතමු අවුරුදු 10ක් අච්චු වුණා කියලා. ඒ පුද්ගලයා අවුරුදු 5ක් රිමාන්ඩ් භාරයේ සිටියා නම්, appeal එක විභාග වෙද්දීත් අවුරුදු 3ක් හෝ 5ක් රිමාන්ඩ් භාරයේ සිටියා නම්, ඒ කාලය අච්චු කාලයෙන් අඩු කරන්න පුළුවන් ක්‍රමයක් පිට රටවල තිබෙනවා.

මම හිතන්නේ ලංකාවේත් ගිය අවුරුද්දේ මැයි මාසයෙන් පස්සේ,- මට ලැබිලා තිබෙනවා, යම් ලියවිල්ලක්. මම ඒ ලියවිල්ල සභාගත කරන්නම්. ඔබතුමාටත් ඒ ලියවිල්ල ඉදිරිපත් කරන්නම්. මම ඒක හොයාගෙන සිටියේ. මේක පසුගිය කාලයට - retrospectively - බලපාන ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, සිරකරුවන් 3,500ක්, 4,000ක් වාගේ සංඛ්‍යාවක් බන්ධනාගාරවලින් ඉවත් කරගන්න පුළුවන්. එතකොට ඔබතුමන්ලා දරන වියදම් -කෑම සඳහා යන සහ අනෙක් සියලු වියදම්- අඩුකර ගන්නත් පුළුවන්. දඩුවම් කරන්නේ හරි මගට ගන්න නේ. ඒ පුද්ගලයන් හරි මගට ගන්න පුළුවන් නම්, ඒ පුද්ගලයන්ගෙන් හානියක් වෙන්නේ නැත්නම් එහෙම කළාට ප්‍රශ්නයක් නැහැ. මොකද, ඊට වඩා වැරදි කරන පුද්ගලයන් සියයට 100කටත් වැඩි ප්‍රමාණයක් එළියේ ඉන්නවා. ඊට වඩා බරපතළ වැරදි කරන පුද්ගලයන් එළියේ සිටියදී තමයි ඒ පිරිස බන්ධනාගාරගතව ඉන්නේ. අනිවාර්යයෙන්ම වරදක් කරලා තිබෙන්න පුළුවන් වුණත්, ගොඩක් වෙලාවට ඔවුන් බන්ධනාගාරගතව ඉන්නේ, ඔවුන්ට දඩය ගෙවන්න තිබෙන නොහැකියාව, දුප්පත්කම නිසායි. ඒ නිසා ඔවුන්ට අපි අනුකම්පා කරන්න ඕනෑ. මම ගිහිල්ලා සාකච්ඡා කළාම ඔවුන් සඳහන් කළා, සමහර අය අවුරුදු 28ක්, 30ක් තිස්සේ බන්ධනාගාරයේ ඉන්න බව. අවුරුදු 28ක්, 30ක් කියන්නේ ගරු ඇමතිතුමනි, ඉතාම දීර්ඝ කාලයක්. සුළු වැරදිවලට ඒ පිරිස ඇතුළේ ඉන්නේ. ඉතාම දුක්ඛිත ජීවිත ඔවුන් ගත කරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමාට තවත් මිනිත්තු තුනක කාලයක් ලබා දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමනි, මට ලැබුණු මේ තොරතුරු ටික මම ඔබතුමාට යොමු කරන්නම්. ඒ යෝජනාව මම හිතන හැටියට පසුගිය ආණ්ඩුව කාලයේ කැබිනට් මණ්ඩලයට යොමු වෙලා සම්මත වුණා. ඔබතුමන්ලා නැවත ඒක කැබිනට් මණ්ඩලයට යොමු කරලා, ගැසට් කරලා, පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න ඕනෑ, මේක මැයි මාසයෙන් එහා කාලයට යොමු කරගන්න අවශ්‍යතාව තිබෙනවා නම්.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, තවත් කාරණයක් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මම මේ පිළිබඳව වැලිකඩ බන්ධනාගාරයේ අධ්‍යයනයක් කළා. ඇත්තටම කියන්න සතුටුයි, ඒ නිලධාරීන්ටත් ස්තුතිය පිරිනමන්න ඕනෑ, සමහර තැන් gardens වාගේ ඉතාම ලස්සනට, පිළිවෙළට, පිරිසිදුව පවත්වාගෙන යනවා. *Ad hoc* visit එකක් මම කළේ. ඒ අවස්ථාවේදී මට දැක ගන්න ලැබුණා, කාන්තා සහ පිරිමි දෙපාර්ශ්වයම ඒක ඉතාම ලස්සනට ක්‍රියාත්මක කරගෙන යනවා. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ඒ laundry එක සම්බන්ධව. ඉංග්‍රීසීන්ගේ කාලයේ ගෙනාපු පරණ යන්ත්‍රෝපකරණ තමයි තවමත් තිබෙන්නේ. ඒ යන්ත්‍ර දෙකක් තවමත් ක්‍රියාත්මක වෙනවා. තවත් හතරක් තිබෙනවා. ඒවාත් ක්‍රියාත්මක කර ගන්න පුළුවන් නම් හොඳයි. Spare parts ටිකක් තමයි ඕනෑ වෙන්නේ. ඒක කරලා දෙන්න පුළුවන් නම්, කොළඹ ඉස්පිරිතාලවල රෙදි ටික හෝදලා පිරිසිදු කරන්න හැකියාව තිබෙන බව ඔවුන් පැවසුවා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, ඉතාම වැදගත් කාර්යයක් තිබෙනවා. Factories දෙකකට අදාළව ඒ අය කටයුතු කරනවා. P.G. Martin ආයතනයට අදාළව කටයුතු කරනවා වාගේම, තවත් chip එකක් ඒගොල්ලන් හදනවා. ඉතාම ලස්සනට ඒ කටයුතු කරනවා. මම හිතන්නේ ඒ සිරකරුවන් මුළු දවසම එතැන වැඩ කරනවා. මම යනකොට 20ක් විතර වැඩ කළා, ඒ chip එක හදන තැන. ඒ වාගේම P.G. Martin එකට අදාළ වැඩ කරන අයත් මම හිතන හැටියට 40ක් විතර හිටියා. ඉතින් ඇත්තටම අපට ඒ වාගේ තවත් කර්මාන්ත 20ක් විතර හදා ගන්න පුළුවන්. මොකද, එතකොට ඒ කර්මාන්තවලට වියදම් කරන්න වෙන ප්‍රමාණයත් අඩුයි. ඔවුන්ට විශාල ලාභයකුත් ලැබෙනවා. ඒ වාගේම සිරකරුවන්ටත් ඒකෙන් විශාල ආදායමක් ලැබෙනවා. ඔවුන්ගෙන් බැංකු ගිණුම්වල සමහර වෙලාවට රුපියල් ලක්ෂ 5ක, 6ක මුදලක් තිබෙන බව ඔවුන් පැවසුවා. ඒක හරි වැදගත් ගරු ඇමතිතුමනි. සමහර සිරකරුවන් රුපියල් 1,500ක, 2,000ක දඩ මුදල ගෙවා ගන්න බැරුව අවුරුදු 4ක්, 5ක් හිර ගෙදර ඇතුළේ ඉන්නවා.

මම අවස්ථා කිහිපයකදීම ඒ මුදල් ලබා දීලා ඔවුන් එළියට ගන්න දායකත්වය ලබා දුන්නා. මම ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. සමහර වෙලාවට රුපියල් 1,500ක්, රුපියල් 5,000ක්, නැත්නම් රුපියල් 10,000ට අඩු මුදලක් ගෙවා ගන්න බැරුව විශාල පිරිසක් ඉන්නවා. ඔවුන්ගේ පවුල්වලවත් කවුරුවත් නැහැ. ඒ අය අවුරුදු 3ක, 4ක වාගේ කාලයක් ඇතුළේ ඉන්නවා. ඔබතුමන්ලාට පුළුවන් නම්, ව්‍යාපාරිකයන් සම්බන්ධ කරගෙන CSR project එකක් ක්‍රියාත්මක කරලා "මෙන්න මේ වාගේ පිරිසක් ඉන්නවා, ඔවුන්ට මෙන්න මේ වාගේ දඩ මුදලක් ගෙවන්න තිබෙනවා" කියලා කිව්වොත්, ඒ මුදල ගෙවලා ඒ පිරිස release කර ගන්න විශාල පිරිසක් ඉදිරිපත් වෙන්න පුළුවන්.

මම අවසාන වශයෙන් මෙන්න මේ කාරණයටත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. සියලු සිර ගෙවල් පිරිසිදුව පවත්වාගෙන යනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් පෞද්ගලික අංශය එකතු කරගෙන හැම සිර ගෙදරකම කර්මාන්ත 10ක්, 15ක්, 20ක් වාගේ ප්‍රමාණයක් පටන් ගන්න. එතකොට, අපට ලොකු බරක්ව තිබෙන සිරකරුවන්ට කන්න දෙන එකට, ඒ වාගේම ඔවුන්ගේ ඇඳුම්වලට, අනෙකුත් වියදම්වලට, විදුලි බිල ගෙවන්න, ඒ සියලු දේවල්වලට යන වියදම් පියවා ගන්න එම කර්මාන්තවලින් අපට විශාල උදව්වක් ලබා ගන්න පුළුවන්.

ඒ වාගේම, වැලිකඩ බන්ධනාගාරයේ drainage system එක ගැනත් මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒක අයිති වෙන්නේ නගර සභාවට. නාගරික කොමසාරිස්තුමාට කියලා ඒක හොඳ තත්ත්වයට පිළිසකර කරලා නැහැ. නමුත්, සිර ගෙදරින් විශාල බදු ප්‍රමාණයක් ගෙවනවා. හැබැයි, අවුරුදු ගණනාවක් තිස්සේ එය පිළිසකර කරලා නැහැයි කියන කාරණාවත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම මම ඔබතුමාට සුබ පතනවා. මොකද, අනෙක් සමහර ඇමතිවරු වාගේ නොවෙයි, ඔබතුමා ඒ කටයුතු භාර අරගෙන බොහොම නිහතමානීව වැඩකටයුතු කරගෙන යනවා. ඒ නින්දා ඉදිරියටත් ඔබතුමාගේ වැඩකටයුතු සාර්ථක කර ගන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have five minutes.

[பி.ப. 4.30]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சுத் தொடர்பான இன்றைய விவாதத்திலே பலர் பயங்கரவாதத் தடைச் சட்டம் - Prevention of Terrorism Act சம்பந்தமாகப் பேசியிருந் தார்கள். நேற்று இங்கு உரையாற்றிய சனாதிபதியவர்கள் அது தொடர்பான தன்னுடைய கருத்தை இந்தச் சபையிலே கூறியிருந்தார். இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தினூடாகக் கைதுசெய்யப்பட்ட பலர் இப்போதும் தாங்கள் செய்த குற்றங்களுக்கான தண்டனைக் காலத்திற்கும் மேலதிகமாகப் பல ஆண்டுகளாகச் சிறைவைக்கப் பட்டிருக்கின்றார்கள். நாங்கள் சனாதிபதியவர்களைச் சந்தித்தபோதுகூட அவர்களைப் பிணையில் விடுவிக்குமாறு கேட்டிருந்தோம்; அதற்கான நடவடிக்கையை எடுப்பதாக அவர் கூறியிருந்தார். அந்த வகையில், அந்தக் கைதிகள் தொடர்பான நடவடிக்கையை விரைந்து எடுக்கவேண்டிய தேவை யிருக்கிறது.

தற்போதைய அரசாங்கத்திலுள்ள நீங்களும் முன்னர் எதிர்க்கட்சியிலிருந்தபோது இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்திற்கு எதிராகச் செயற்பட்டிருந்தீர்கள். இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்கி, Anti-Terrorism Bill கொண்டுவருவதற்குக் கடந்த அரசாங்கங்கள் முற்பட்டபோது, உங்களுடைய இன்றைய இரண்டு பாராளுமன்ற உறுப்பினர்கள் அப்போது challenge பண்ணினார்கள். இந்தப் பயங்கரவாதத் தடைச் சட்டம் தொடர்பாக நேற்று மாண்புமிகு சனாதிபதியவர்கள் பேசும்போது, ஒழுங்குபடுத்தப்பட்ட குற்றங்களுக்கெதிராக இப்போது இந்தப் பயங்கரவாதத் தடைச் சட்டம் பயன்படுத்தப்பட்டாலும், அந்த ஒழுங்குபடுத்தப்பட்ட குற்றங்களுக்கெதிராக ஒரு சட்டம் கொண்டுவரப்பட வேண்டும்; அதுவரை இந்தச் சட்டத்தைப் பயன்படுத்தலா மென்ற தொனியில் கருத்துக் கூறியிருந்தார். ஆனால், பயங்கரவாதத் தடைச் சட்டத்திற்கு மாற்றீடாக, ஒழுங்குபடுத்தப்பட்ட குற்றங்களுக்கென ஒரு சட்டத்தைக் கொண்டுவரவேண்டிய அல்லது அப்படிக் காட்டப்பட வேண்டிய தேவையிருப்பதாக நான் கருதவில்லை.

இச்சந்தர்ப்பத்தில் நான் தேசிய நல்லிணக்கம் தொடர்பாக இந்த அரசாங்கம் எடுத்துக்கொண்டிருக்கின்ற நடவடிக்கைகள் தொடர்பாக ஒருசில விடயங்களைக் குறிப்பிடலாமென்று நினைக்கின்றேன். தேசிய நல்லிணக்கம் இந்த நாட்டினுடைய பொருளாதார அபிவிருத்திக்கு மிகவும் முக்கியமானது. இந்த நாடு முன்நோக்கிச் செல்ல வேண்டுமாகவிருந்தால், இந்த நாட்டிலே அமைதி ஏற்படவேண்டும்; தேசிய நல்லிணக்கம் ஏற்படவேண்டும். ஆனால், தேசிய நல்லிணக்கம் என்ற பெயரில் எதனை இந்த அரசாங்கம் செய்யப்போகிறதென்பதை நாங்கள் அவதானத்தோடு, ஆவலோடு பார்த்துக் கொண்டிருக்கின்றோம். உண்மையில் தேசிய நல்லிணக்கத்திற் காகப் பல விடயங்கள் செய்யப்பட வேண்டியிருக்கிறது. இந்த நல்லிணக்கம் என்பது மனமாற்றத்துடன் ஏற்படுத்தப்பட வேண்டியது. எங்களுடைய attitudeஇல் change வரவேண்டும்; அது மேல்மட்டத்திலிருந்து ஆரம்பிக்கப்பட வேண்டுமென்று நான் நினைக்கின்றேன்.

யுத்தம் முடிந்த 2009ஆம் ஆண்டு நல்லிணக்கம் செய்வதாகக் கருதியோ என்னவோ, யுத்த வெற்றியைக் கொண்டாடிய இராணுவத்தினர், எங்களுடைய வீடுகளுக்குத் தேசியக் கொடியைக் கொண்டுவந்து தந்தார்கள். அதை gateஇல் கட்டச்சொல்லி பலவந்தப்படுத்தினார்கள். அதை அவர்கள் அந்த நேரத்தில் தேசிய நல்லிணக்கமாகக் கருதினார்கள். அப்படி அந்தத் தேசியக் கொடியை gateஇல் கட்ட விரும்பாதவர்களைத் தாக்கவும் முற்பட்டார்கள். இது தேசிய நல்லிணக்கத்திற்கு மாறாக, எங்களுடைய மக்களின் மனங்களிலே வக்கிரத் தன்மையைக் கொண்டுவரும்! ஆகவே, தேசிய நல்லிணக்கம் தொடர்பான அந்த வேலைத்திட்டத்தை நீங்கள் மிகவும் அவதானமாக முன்னெடுக்கவேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கிறேன்.

இம்முறை Budgetஇல் காணாமற்போனோர்களுக்கான அலுவலகம் - OMP மற்றும் Office for Reparations ஆகியவற்றுக்கு எவ்வளவு காசு ஒதுக்கப்பட்டிருக்கின்றது என்பதைத் தெளிவாக நீங்கள் கூற வேண்டும். இந்த OMPஐ தமிழ் மக்கள் முற்றுமுழுதாக நிராகரித்திருக்கிறார்கள். இருந்தபோதும், இந்த OMP மூலம் உள்நாட்டுப் பொறிமுறைக்கூடாக நடவடிக்கை எடுப்பதற்கு முயற்சி செய்கின்ற அரசாங்கம், அந்தத் திட்டத்திற்குப் போதுமான நிதியை ஒதுக்கவில்லையென்பது முக்கியமான ஒரு விஷயம்.

அடுத்து, ஜெனீவா தீர்மானம் பற்றிய விடயத்தை எடுத்துக்கொண்டால், promoting accountability and reconciliation என்பதுதான் அந்தத் தீர்மானம். ஆனால், எங்களுடைய வெளிநாட்டலுவல்கள் அமைச்சர் ஜெனீவா விற்குச் சென்று அறிக்கை சமர்ப்பிக்கின்றபோது, accountability தொடர்பாகவோ reconciliation தொடர் பாகவோ தன்னுடைய அவதானத்தைச் செலுத்தவில்லை என்பது எங்களுக்கு ஏமாற்றமளிக்கின்ற விடயமாக இருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Please, give me one more minute, Hon. Presiding Member.

நல்லிணக்கம், பொறுப்புக்கூறல், மீள்நிகழாமை ஆகிய விடயங்கள் நடைபெற வேண்டுமாகவிருந்தால், இந்த நாட்டுக்குப் புதிய அரசியலமைப்பொன்று உருவாக்கப்பட வேண்டும். அந்த வகையில் நான் நினைக்கின்றேன், மறைந்த கௌரவ மங்கள சமரவீர அவர்கள் அமைச்சராக இருக்கும்போது இந்த பொறுப்புக்கூறல், promoting reconciliation and accountability என்பதை அடிப்படையாக வைத்துக்கொண்டுதான் ஒரு புதிய அரசியல் யாப்பினைக் கொண்டுவருவதற்கான செயற்பாட்டை முன்னெடுத்திருந்தார். தற்போதைய அரசாங்கம், தாங்கள் புதிய அரசியலமைப்பைக் கொண்டுவருவதாகச் சென்னாலும்கூட, இப்பொழுது தங்களது முழுக் கவனமும் பொருளாதாரத்தை மீட்டெடுப்பதில்தான் செலுத்தப்படுகின்றது என்ற அடிப்படையில் உங்களது உறுப்பினர்கள் மீண்டும் மீண்டும் கருத்துகளை முன்வைத்துக்

කොණ්ඩිරුක්කිරාර්කළ්. නාට්ටින් පොරුළාතාරම් මේම්පට වේණ්ඩුමායින්, නාට්ටිල් මිකවුම් අඩිප්පඩෛප් පිරච්සිනෙයාකවුළ්ළ දේසිය ඉනප්පිරච්සිනෙ තීර්ක්කප්පට වේණ්ඩුම්. ඔරු පුතිය අරසියලමෛප්පිනූටාක මට්ටුමේ අතනෛච් සෙය්ය මුඩියුම් එන්පතෛ ඉන්තච් සන්තර්ප්පත්තිල් වලියුරුත්තික්කූර විරුම්පුකින්රේන්.

අතේපෝන්රු, ඉන්ත නල්ලිණක්කම් තොටර්පාක මොළික්කොළ්කෛ මුරෛයාකප් පින්පර්රප්පට වේණ්ඩියතු අවසියම්. ආනාල්, තර්පොළුතු ආළුම්කට්සි උරුප්පිනර් ඔරුවර් කුරිප්පිට්ටතෛප් පෝන්රු ඉංකු මොළික්කොළ්කෛ මුරෛයාකප් පින්පර්රප්පටවිල්ලෛ එන්පතෛ නීංකළ් කවනත්තිර්කොළ්ළ වේණ්ඩුම්. එංකළුටෛය අරස පෝක්කුවරත්තුච් සේවෛකළිල්කූට පල පිළෛකළෝටු name boards පෝටප්පට්ටිරුප්පතෛක් කාණ මුඩිකිරතු. උතාරණමාකච් සොන්නාල්, කණ්ටික්කු පෝකින්ර පස්සිල් 'ක' එන්ර එළුත්තුක්කුප් පතිලාක වේරෝර් එළුත්තු එළුතප්පට්ටිරුක්කිරතු; අතු පාරතූරමාන ඔරු සොල්ලෛක් කුරික්කිරතු. ආකවේ, නිච්සයමාක ඉන්ත මොළික් කොළ්කෛ එන්පතෛ නල්ලිණක්කත්තින් මුතර්පඩියාකක් කවනත්තිල් කොණ්ටු උടනටියාකච් සරියාක අමුල්පටුත්ත වේණ්ටුම්.

මේලුම්, කාණාමල් ආක්කප්පට්ටවර්කළ් තොටර්පාක ඔරු විටයත්තෛච් සොල්ලි එනතු පේච්සෛ මුටික්කිරේන්. කාණාමර්පෝන උරවුකළෛත්තේටි අවර්කළතු පෙර්රෝර්කළ් පල වරුටංකළාක roadඉල් වාළ්න්තු කොණ්ටිරුක්කිරාර්කළ්. කෞරව අමෛච්සර් අවර්කළ් මුක්කියමාක අතු තොටර්පිල් කවනම් සෙලුත්ත වේණ්ටුමෙන්රු කේට්ටුක්කොණ්ටු, උරෛයාර්රුවතර්කුච් සන්තර්ප්පම් වළංකියමෛක්කු නන්රිකූර්ි, විටෛපෙරුකින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.38]

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(මාණ්පුමිකු එම්.කේ.එම්. අස්ලම්)
(The Hon. M.K.M. Aslam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද අප පවත්වන්නේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයයි. මම විශ්වාස කරනවා, අධිකරණ අමාත්‍යාංශය වාගේම ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයත් අපේ රටට විශේෂයි කියලා. ඒ ඇයි? අපේ රට සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී ජාතීන් කිහිපයක්ම ජීවත් වන රටක්. ඒ වාගේම තව විශේෂයක් තිබෙනවා. තිස් අවුරුදු ඊළම් යුද්ධය සහ අවුරුදු 13ක, 14ක මුස්ලිම් විරෝධයක් තිබුණු රටක් මෙක. එම නිසා අපි ජාතික ඒකාබද්ධතාව වැඩි සැලකිල්ලට භාජන කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1948 ලංකාවට නිදහස ලැබුණා. ඒ වාගේම, 2009දී අපි ඊළම් යුද්ධය ජයග්‍රහණය කළා. නමුත්, අපට බැරි වුණා ඒ අවස්ථා දෙකේදීම ශ්‍රී ලාංකික ජාතිය ගොඩ නඟන්න. ඉතින්, අපේ රජයේ ප්‍රමුඛ කාර්යභාරය වෙන්නේ ශ්‍රී ලාංකික ජාතිය ගොඩ නැඟීමයි. ජාතික ජන බලවේගය රජය යටතේ අපි ඒ කර්තව්‍යය අනිවාර්යයෙන්ම ඉෂ්ට සිද්ධ කරන බව ප්‍රතිපත්තිමය වශයෙන් අපි කියලා තිබෙනවා. අපේ පාලන කාලය තුළ අපි ඒක අනිවාර්යයෙන් ඉෂ්ට කරනවා.

අපේ තවත් ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවා, ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ තිබෙන දෙපාර්තමේන්තුවලට කොපමණ මුදලක් ද වෙන් කරලා තිබෙන්නේ කියලා. ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ආයතන 6ක් තිබෙනවා.

ONUR, OR, OMP, DOL, OLC සහ NILET. ONURවලට මේ වසරේ අය වැයෙන් රුපියල් මිලියන 139ක් වෙන් කරලා තිබෙනවා. ORවලට මිලියන 2,353ක් වෙන් කරලා තිබෙනවා. OMPවලට මිලියන 126යි, DOLවලට 226යි, OLCවලට 49.5ක් අපි වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ පාලකයෝ ජාතික ඒකාබද්ධතාව ඇති කළ යුතු තැන, ජාතීන් අතර විරසක ඇති කරපු කාල තිබුණා. මෙම අමාත්‍යාංශය පාවිච්චි කරලා ජාතීන් අතර වෙනස්කම් ඇති කළා, වෙන් කළා, විවිධ තැන්වල ජාතීන් අතර ප්‍රශ්න ඇති කළා. ඉතින්, රජයක් හැටියට අපට සහතිකයක් ලැබිලා තිබෙනවා උතුර, නැඟෙනහිර සහ දකුණේ ජනතාව අප පිළිගන්නවා කියලා. ඒ සිංහල, මුස්ලිම්, දමිළ ජන කොටස් අප පිළිගන්නවා කියලා තිබෙනවා. ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය හරහා ජාතීන් අතර එකඟතාවක් ඇති කරගෙන, එක ජාතියක් ගොඩනඟන කාර්යභාරයට ඉතාම සුදුසු ආණ්ඩුවක් හැටියට මුළු ලෝකයම, මුළු ලංකාවම අප පිළිගෙන තිබෙනවා.

ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට අපි වෙන් කරලා තිබෙනවා මිලියන 2,895.5ක්. ජාතියක් වශයෙන් ලංකාවට ඉස්සරහට යන්න බැහැ, මේ ජාතික ප්‍රශ්නය විසඳන්නේ නැතිව. අපේ රජය පිළිගන්නවා ලංකාව දියුණු කරනවා නම්, ජාතීන් අතර සමගිය ඇති කරන්න ඕනෑ, දූෂණ, වංචා නැති කරන්න ඕනෑ, නාස්තිය නැති කරන්න ඕනෑ කියලා. ඒ සඳහා තීන්දු තීරණ අරගෙන ප්‍රතිපත්ති හදපු ආණ්ඩුවක් අපි. අද අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන් අවුරුදු 59කින් පසුවයි මේ අදහස මේ මහ පොළොවේ පැළ කරලා තිබෙන්නේ කියලා. අපි ඒ අදහස ගැන අවුරුදු 59ක්ම මේ පාර්ලිමේන්තුවෙන් පිටදී කථා කළා. අපේ රටේ ජනතාව පිළිගත්තා අනුර සහෝදරයා ජනාධිපතිවරයා ලෙස පත් වුණොත් ආයේ මේ රටේ ජාතිවාදී කෝලාහල ඇති වෙන්නේ නැහැ කියලා. සාමාන්‍යයෙන් ජනාධිපතිවරයෙක් පත් වුණු විගසම ධුරය අහිමි වෙන්නේ නැහැ. හැබැයි, පසුගිය කාලයේ එහෙම වුණා. කොහොමද ඒ අදහස-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(මාණ්පුමිකු එම්.කේ.එම්. අස්ලම්)
(The Hon. M.K.M. Aslam)
ඉතින් විශේෂයෙන් මම කියන්න කැමතියි,

ඉන්ත මුරෛ Budgetඇල් ඔතුක්කියුළ්ළ නිතියිල්, යුත්තම් කාරණමාක සොත්තුක්කළ් සේතමටෛන්ත 1,350 පේරුක්කු නාංකළ් නිතියුතවි වළංකුවතර්කුත් තිට්ටමිට්ටුළ්ළෝම් එන්පතෛ වටක්කු, කිළක්කිල් වාළක්කූටිය එංකළුටෛය අන්පුක්කුරිය තමිළ් මක්කළුක්කුච් සොල්ල වේණ්ටුම්. අතේ පෝන්රු, කාණාමලාක්කප්පට්ට 5,000 පේරින් කුටුම්පඞ් කළුක්කු නිතියුතවි වළංකුවතර්කුම් නාංකළ් තිට්ට මිට්ටුළ්ළෝම්. මේලුම්, 'ඈස්ටර්' කුණ්ටුත් තාක්කුතලිල් පාතික්කප්පට්ට මක්කළුක්කුම් අතන්පෝතු සේතමටෛන්ත සොත්තුක්කළුක්කු නප්ටඊටු වළංකුවතර්කුම් නාංකළ් ඉන්ත Budgetඇල් නිතියොතුක්කි උළ්ළෝම්. නීති මර්රුම් තේසිය

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

ஒருமைப்பாட்டு அமைச்சினூடாக இந்த நாட்டில் நீதியை நிலைநாட்டி, மக்கள் மத்தியில் ஒற்றுமையை உருவாக்கக்கூடிய மிகப் பொருத்தமான ஓர் அரசாங்கமாக இன்று நாங்கள் திகழ்கின்றோம் என்பதை உறுதியாகச் சொல்ல முடியும். மாண்புமிகு சனாதிபதியும் சரி, அமைச்சர்களும் சரி, பாராளுமன்ற உறுப்பினர்களும் சரி, திட்டமிட்ட அடிப்படையில் நாங்கள் ஏற்றுக்கொண்ட பொறுப்புகளை நிச்சயமாகச் செய்து முடிப்போம் என்பதை உறுதியுடன் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.44]

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයට ලක්වෙන මේ මොහොතේ මම කැමතියි ඉතාම වැදගත් කරුණු කීපයක් මතු කරන්නට. රටක් සාධාරණ ලෙස පවත්වාගෙන යන්න නම් මූලික වශයෙන්ම සෑම ක්ෂේත්‍රයකම යුක්තිය ඉටු වෙන්නට ඕනෑ, සාධාරණත්වය තිබෙන්නට ඕනෑ. ඒ වාගේම, යුක්තිය ඉටු වන බව පෙනෙන්නට තිබෙන්නත් ඕනෑ; justice must not only be done, but must be seen to be done. ඒක නීතියේ මූලධර්මයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහෙම නොවුණොතින් ඕනෑම ආයතනයක්, ඕනෑම රටක් බිඳ වැටෙනවා. 2022 වර්ෂය තුළ සිද්ධ වුණේ ඒක. එදා ජනතා දේපොළ අවභාවිත කළා, ජනතා මුදල් නාස්ති කළා. එහෙම කරලා ඒවා සාධාරණීකරණය කළා. ඒ නිසා ජනතාව පාරට බැහැලා පල් හොරු පන්නලා දැම්මා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ තත්ත්වය වෙනස් කරන්න ජනතාව තීන්දුවක් ගත්තා. දැන් ජනතාව අලුත් ජන වරමක්, fresh mandate එකක් මේ ආණ්ඩුවට, මේ පාලනයට ලබා දීලා තිබෙනවා.

ඒකට පදනම් වෙච්ච පදනම් මූලධර්ම ටිකක් තිබෙනවා. ඒ තමයි, සාධාරණව හා සමානව නීතියේ රැකවරණය, විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව, ස්වාධීනත්වය සහ ජනතා විශ්වාසය ගොඩ නැඟීම කියන කාරණා. මේවා මත පදනම් වෙලා තමයි ඒ ජනවරම අපි ලබා ගත්තේ. ඒක තමයි අපේ පොරොන්දුව. ඒ වෙනුවෙන් අපි මොකක්ද කරමින් ඉන්නේ? අපි ඒ වෙනුවෙන් අලුත් නීති සම්පාදනය කරන්න සූදානම් වෙලා ඉන්නවා. The Exchange of Information between State Institutions Act, the Investment Protection Act, the State Business Enterprises Management Act, the Public-Private Partnership Investment Management Act, the Statistics Act, the Valuation Act, the Public Asset Management Act, the Public Procurement Law, Microfinance and Credit Regulatory Authority Act, Strengthening of Anti-Money Laundering and Combating the Financing of Terrorism (AML/CFT) Framework and the Paddy Marketing Board Act යනාදිය තමයි අපි ජනවරමට සාධාරණත්වය ඉෂ්ට කරන්න බලාපොරොත්තු වන අලුතින් ගෙන එන නීති, වෙනස් කරන්න බලාපොරොත්තුවන නීති.

අපි ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත ගෙනෙන්න වාගේම, විශේෂයෙන් අපරාධ තුළින් උපයන වත්කම් යළි ලබා ගැනීම සහ රාජසන්තක කිරීම සඳහා වන නීති පනවන්න කටයුතු සූදානම් කරමින්, මැදිහත් වෙමින් ඉන්නවා. ඒ තමයි අපි ජනවරමට සිදු කරන සාධාරණත්වය. විශේෂයෙන්ම මහජන දේපළ කොල්ල කාපු රටක, සාධාරණත්වය සහ යුක්තිය ඉෂ්ට කරන්න නම් එවැනි නීති සම්පාදනය කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැය තුළ ඇති ඉලක්ක සාර්ථක කර ගන්න රුපියල් බිලියන 80.2ක් වෙන් කරලා තිබෙනවා. ඒ මොනවාටද? ඒ නීතිය හා සාමය වෙනුවෙන්. නීතිය තමයි රටක මූලික පදනම සකස් කරන්නේ, යුක්තියේ පදනම සකස් කරන්නේ. ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. බිම් මට්ටමේ යුක්තිය පසිඳලීම වෙනුවෙන් සමථ මණ්ඩල සේවා ක්‍රියාත්මක කරන්න රුපියල් බිලියන 1.4ක් වෙන් කරලා තිබෙනවා. ඒක තමයි ජනතාව වෙත නීතියේ සාධාරණත්වය, යුක්තිය අරගෙන යන්න මේ අය වැය යොදා ගෙන තිබෙන මාර්ගය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි නීතිය, නීතියේ විධානය, නීතියේ ආධිපත්‍ය සුරක්ෂා කරන්න, ඒ මඟින් මහජන දේපළ සුරකින්න, එලදායීව ඒවා යොදා ගන්න, ආර්ථික වර්ධනය වේගවත් කරන්න නීතියේ ප්‍රතිසංස්කරණ සකස් කරමින් යනවා. අවසාන වශයෙන්, මහජන දේපළ මංකොල්ල කාපු, මහ බැංකුව කොල්ල කාපු, කුලුනු උලා කාපු හොරු, මැණික් මලුවලට බැහැලා හිටපු බහිරවයෝ අපි අල්ලන්න ඕනෑ. අයථා ලෙස උපයා ගත් මහජන දේපළ මහජනතාව වෙනුවෙන් නැවත පවරා ගන්න ඕනෑ; යළි පවරා ගන්න ඕනෑ. ඒවා ජනතාව වෙනුවෙන් යොදා ගන්න ඕනෑ. ඒක නිශ්චිතයි. අපි ඒක කළ යුතුවම තිබෙනවා. මේ අය වැය කියන්නේ, යුක්තියේ අය වැය. මේ අය වැය කියන්නේ, සාධාරණත්වයේ අය වැය. ඒ නිසා මේ අය වැය තුළින් ජනතාවගේ අභිප්‍රාය වඩාත් නිවැරැදි ලෙස, වඩාත් නීත්‍යානුකූල ලෙස, වඩාත් යුක්තිගරුක ලෙස, වඩාත් සාධාරණ ලෙස නිරූපණය කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[4.49 p.m.]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Presiding Member, as much as I am a Parliamentarian, I am a practising lawyer and a President's Counsel. So, I will be able to look at things in different perspectives. Madam, I rose to bring to the attention of this House certain critical matters concerning the system of justice in Sri Lanka, issues that demand urgent and meaningful reforms.

One of the most pressing concerns is the process of promoting career judges, particularly their appointments to the Court of Appeal and to the Supreme Court. While it is customary for promotions to follow the principle of seniority, it is not uncommon, Hon. Minister, for senior judges to be overlooked. Yet, in many instances, the

reasons remain unknown. Other Public Service employees enjoy strong legal protections when it comes to promotions. Every public officer, if he is not promoted or there is disciplinary action against him, is aware of it. But, unfortunately, judicial officers are a muted lot, especially when it comes to promotions to the Court of Appeal or to the Supreme Court. If their legitimate expectations are infringed, they have a right to be given reasons. If their seniority is denied as a punitive measure, it must be after a proper hearing, where they are informed of the charges against them and afforded due process. Unfortunately, due process applies to all, except to judges. So, for judges, there are no such protections. When they are overlooked, they are left in the dark with no opportunity to address any allegations against them. This is an unfortunate and unacceptable state of affair. The legitimate aspirations of judges must be safeguarded, Hon. Minister, and a transparent system must be established to ensure fair and accountable promotions.

Furthermore, judges must be protected from unwarranted attacks in Parliament. In the recent past, we have seen Privileges being utilized in the House to attack various persons including judges. So, if any Member wants to attack another, not only judges, using Privileges, he has to be cautious. If you use Privileges to attack somebody, you are a coward because you are taking protection of your Privileges in Parliament.

The independence of the Judiciary is a cornerstone of our democracy and it must remain untarnished and free from undue attack. In today's era of social media, attacks on judges made on the Floor of the House can have far-reaching consequences, eroding public confidence in the Judiciary. So, it is not only against a person, but also against the system. Judges, by virtue of their role, cannot respond to the allegations; you make statements against a person who is muted. I say that it is a cowardly act. I am not suggesting that Parliament should avoid addressing concerns regarding judges, they should. But, our Standing Orders should be amended to ensure that such matters are first examined through a structured process. Hon. Minister of justice, if you would look at the Standing Orders, you would notice that especially with regard to judges, there is a process to be followed before a Member comes to Parliament and makes various statements attacking them.

You are a young and dynamic Minister and I am sure you will take these concerns very seriously. We have a mechanism with regard to the lower judiciary - the Judicial Service Commission - and with regard to the apex court, we have the process of impeaching a judge. So, there is a mechanism in place. But, unfortunately, without resorting to that mechanism, you see them being tarnished in this House, where they have no defence. Therefore, I believe that such cowardly acts of attacking judges in this House should not be tolerated by the House itself.

Another critical procedural issue that requires immediate attention is the lack of recorded reasons when leave or notice is not granted. Hon. Minister, you had been a practising lawyer before you took this high office. You go to court, argue a case in the Court of Appeal or the Supreme Court and there is no obligation to grant reasons for refusing leave or notice. This creates a perception that the lower court's order has the approval of the Supreme Court. When you argue a case in the Supreme Court, due to some procedural fault, leave is refused. But, the perception is that the lower court's judgment has been approved. So, it is a very dangerous road. But, I think, if amendments could be brought in for reasons to be given when notice or leave is refused, that would help the lawyers and the litigants. The current practice leaves litigants frustrated and more than the litigants, the lawyers have to answer the clients without knowing what the reasons are. I think the lawyers are more frustrated than the litigants. As practising lawyers, both the Hon. Minister and the Hon. Deputy Minister go to court and when the client asks you, "සර්, මොනවාද වුණේ?", එතකොට කියන්න වෙන්නේ, "අපිත් දන්නේ නැහැ" කියන එකයි. So, it is a very serious issue. Therefore, there should be legislation introduced to mandate that the court provides reasons when refusing leave or notice. That is something which should be taken seriously.

Madam, another issue that requires urgent attention is the Supreme Court. It is overburdened with work. Several factors have contributed to that, the Supreme Court being the sole forum for hearing fundamental rights jurisdiction. That also has to be reconsidered, whether the Court of Appeal should be given that jurisdiction. Then, direct civil appeals from the provincial courts - earlier, those appeals go from the District Court to the Court of Appeal and then, to the Supreme Court - has further burdened the Supreme Court. Also, appeals from the Commercial High Court go directly to the Supreme Court. Then, there is transfer of writ jurisdiction to the Supreme Court under various laws. When the 1978 Constitution was introduced, the fundamental rights jurisdiction of the Supreme Court was limited and the Court focused on cases of public importance. However, today, on matters relating to the National Police Commission, the Public Service Commission and even the Monetary Board, if you want to file a writ, you have to file it in the Supreme Court. It has burdened the Supreme Court further. Sometimes, in relation to the Public Service Commission and the other commissions, the Supreme Court acts as a glorified labour tribunal because it adjudicates transfers, promotions and dismissals. So, the Court is burdened. Therefore, this heavy caseload results in severe delays and prevents the Supreme Court from dedicating its full attention to matters of significant legal and public interest.

Given the expansion of fundamental rights jurisdiction, it is time to consider allocating the fundamental rights jurisdiction to the Court of Appeal, and that would allow a second appeal. Today, the Supreme Court is the final appeal court and if you give the litigant the opportunity or the right for two appeals, that would further strengthen the judicial process. Some might argue saying that there would be law's delays, but, Hon. Minister of Justice, you take consideration of this fact.

Moreover, the bypassing of the Court of Appeal diminishes its jurisprudence. As you know, in the Civil

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

Appellate Court, jurisprudence is created, but when it is the Court of Appeal, it is taken more seriously. One Civil Appellate Court would give one judgment and another would give some other judgment, but if it is the Court of Appeal, it would be taken more seriously. All SLRs are based on the judgments of the Court of Appeal and the Supreme Court. With regard to civil jurisdiction, because the right is straightaway to the Supreme Court, judgments of Provincial High Courts are not reported. Therefore, in exceptional circumstances, the Supreme Court should serve primarily as an appellate court rather than a court of first instance. The Government must introduce legal reforms to distribute the caseload more equitably between the Supreme Court and the Court of Appeal, ensuring a more efficient justice system which protects litigants' right of appeal.

The Supreme Court Judges with relevant expertise should be assigned to hear cases relating to fields they are specialized in. You could create benches such as civil benches, criminal benches and benches related to public law. Today, if you take our Supreme Court Judges, they have expertise and great experience; they are jurists and they have great knowledge in various fields. Today, in the legal profession, you cannot excel in all fields. That is why, Hon. Minister of Justice, you opted to do criminal law and I opted to do civil law, because you cannot know everything. The same applies to judges. So, if we could create separate benches, their knowledge could be utilized better. So, I humbly beg the Hon. Minister of Justice to consider this aspect as well, the creation of separate benches in the Supreme Court with regard to specialized areas. Complex cases of commercial nature are sometimes heard by judges who have no civil experiences at all. And also, judges who have, in their entire career, done only civil matters are called upon to adjudicate criminal matters. That is a very serious issue. While judges are capable of applying the law, the Supreme Court, the highest court in the land, should not be a place for learning by trial and error. Therefore, it is time to establish special benches with subject matter expertise and experience to ensure informed and consistent legal precedents.

Madam, if you take the recent laws which were brought in with regard to remand prisoners, there was an Amendment brought in 2024, under which, the period they were in remand was considered a part of their sentence and they could be released consequent to that; if they served a particular period in remand, that is also taken into consideration.

However, before May, 2024, there was an issue. I think you brought in a Cabinet Paper to invoke Article 34 by an Advisory Panel. Hon. Minister, I saw the Cabinet Paper and please expedite that because there are so many prisoners who are in their 70s languishing in prison. Obviously any law applies to the future. So, if this could be considered and a pardon process be invoked under Article 34, then, I am sure that would help them. And also, there is a law with regard to doing community service, where in lieu of being sent to a jail, you can ask to be sent to do community service. There is a law, I believe, brought in the 90s. So, if those provisions can be invoked, I am sure it will ease the congestion in prisons.

Then, I saw that over 30 per cent of the Budget has been allocated for prison and prison reforms.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Please give me one minute, Madam.

If you could shift the Magazine Prison, those resources could be used. You do not have to have prisons in urban areas. If you could create more prisons in other areas, the facilities could be given. If you take the conditions of the prisoners today, they do not have even the basic needs such as water and sanitation. Some prisoners, when they are locked up, keep a bottle in the cell in night because they cannot go to the toilet.

I respectfully urge you, Hon. Minister of Justice, to look at the suggestions I made, which, I am sure, would strengthen the legal process in this country. You are trying to create a better society and prisoners are sent to prisons so that they would reform. But, unfortunately, what is happening today is the converse. So, if you could give priority to continuous legal education and training them in various skills, we could make a great change with regard to how the prisoners are dealt with.

Madam, I thank you once again for giving me the opportunity of speaking a few words.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 07ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් වූ විවාදයේදී අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා වාගේම, සතුටු වනවා.

අද දිනයේ අධිකරණය සහ අධිකරණ ක්‍රියාවලියත්, ජාතික ඒකාබද්ධතාව පවත්වා ගනිමින් අධිකරණ පද්ධතිය දියුණු කිරීම පිළිබඳවත් විවිධ කෝණවලින් අදහස් දැක්වීම් සිදු වුණා. ඒ වාගේම ගරු අමාත්‍යතුමන් විසින් අධිකරණ පද්ධතිය දියුණු කිරීම සම්බන්ධයෙන් සංඛ්‍යා දත්ත සහිතව පැහැදිලි කිරීම් කිහිපයක් සිදු කළා. විපක්ෂය පැත්තෙනුත් පැහැදිලි කිරීම් වාගේම, යම් යම් සාධනීය යෝජනා සහ විවේචනත් සිදු වුණා. ඒ පිළිබඳවත් අදහස් දක්වමින් මගේ කථාවට ප්‍රවේශය ලබා ගැනීමට කල්පනා කරනවා.

අධිකරණ පද්ධතිය ගත්තොත්, අධිකරණ අමාත්‍යාංශයේම දැක්ම වෙලා තිබෙන්නේ, මහජනතාව විශ්වාස කරන නීති පද්ධතියක් හැදීමත්, සාධාරණ ශ්‍රී ලංකාවක් ගොඩනැඟීමත්, කාර්යක්ෂම අධිකරණ සේවයක් ලබා දීමත් කියන කාරණායි. අද විවාදයේදී ඒ සඳහා සාධනීය යෝජනා බොහොමයක් ඉදිරිපත් වුණා. අධිකරණ අමාත්‍යාංශය සහ වෙනත් අමාත්‍යාංශවල නියෝජ්‍ය අමාත්‍ය ධුර දරපු, ඒ වාගේම නොයෙක් අමාත්‍යාංශවල වැදගත් තනතුරු හොබවපු බොහෝ පිරිසක් ඒ සම්බන්ධ අදහස් ප්‍රකාශ කළා. නමුත් අවාසනාව තමයි, ඒ කිසිදු අදහසක් ඒ ඒ රජයන් යටතේ ක්‍රියාත්මක නොවීම. ඒ කොහොම වුණත්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ශක්තිමත්, ඒ වාගේම කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් පිහිටුවීමේ වුවමනාව දැඩිව පිළිගත් ආණ්ඩුවක්. මේ අවස්ථාවේදී අපි ඒ වෙනුවෙන් කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙහිදී ගරු සභාව තේරුම් ගත යුතු කාරණයක් තිබෙනවා. අධිකරණ පද්ධතියක ශක්තිමත්භාවය කියන්නේ මොකක්ද? අධිකරණය ශක්තිමත්ව තිබෙනවා, ඉක්මනින් නඩු ටික අහලා ඉවර කරනවා, අපරාධකරුවන්ට ඉක්මනින් දඬුවම් කරනවා වාගේ ක්‍රියාවලියකින් විතරක් අධිකරණ පද්ධතියේ අපේක්ෂා, අරමුණු ඉෂ්ට වෙන්නේ නැහැ. ඊට උදාහරණයක් විධියට ගත්තොත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශේෂ මහාධිකරණයක් තිබෙනවා. මම හිතනවා, වෙන කොහේවත් දිස්ත්‍රික්කයක එවැනි විශේෂ මහාධිකරණයක් නැහැ කියලා. එම විශේෂ මහාධිකරණයේ කාර්යය වන්නේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ අවුරුදු 16ට අඩු දරුවන්ට සිදුවන ලිංගික අපරාධ සම්බන්ධයෙන් වන නඩු අහලා ඒ අපරාධකරුවන්ට ඉක්මනින් දඬුවම් කරන එක. ඒ සඳහා තමයි විශේෂ අධිකරණයක් පිහිටුවා, කාර්ය මණ්ඩලයක් ද පත් කරලා තිබෙන්නේ. ඒ අනුව එම ක්‍රියාවලිය සිදු වෙනවා. අපරාධකරුවන්ට ඉක්මනින් දඬුවම් දෙනවා. හැබැයි ප්‍රශ්නය වන්නේ, ඉක්මනින් දඬුවම් දුන්නත්, ඉක්මනින්ම තවත් අපරාධකරුවන් බිහිවීමයි. ඒ කියන්නේ, අද කාර්යක්ෂමව යුක්තිය ඉෂ්ට කරලා අපරාධකරුවන්ට ඉක්මනින් දඬුවම් දුන්නාට වැඩක් නැහැ, හෙට දිනයේත් ඒ වාගේ අපරාධයක් සිදු වනවා නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධිකරණ ක්ෂේත්‍රයත් එක්ක සමස්ත සමාජයම ගැට ගැහිලා තිබෙන්නේ. මේ වන විට අධිකරණය කෙරෙහි ජනතාව තුළ තිබෙන විශ්වාසය කඩා වැටිලා තිබෙන්නේ. එම නිසා පද්ධතියක් විධියට අධිකරණ පද්ධතිය විතරක් ශක්තිමත් වෙලා පමණක් ජනතාව තුළ ඒ විශ්වාසය නැවත ගොඩනඟන්නත්, ඒ වාගේම මිනිසුන් ඉදිරියේ තිබෙන යුක්තිය ඉෂ්ට කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත්ව පවත්වාගෙන යන්නත් බැහැ. අපි ඊට හේතුව හොයාගෙන ගියා. මේ ගරු සභාවේත් සාකච්ඡා වුණු අන්දමට, මේ වන විට අවසන් නොවූ නඩු විශාල සංඛ්‍යාවක් අධිකරණවල හිර වෙලා තිබෙනවා. ඒ අනුව අහලා ඉවර කර ගන්න බැරි මට්ටමක, ලක්ෂ 11කටත් වඩා අධික නඩු ප්‍රමාණයක් අධිකරණවල හිර වෙලා තිබෙනවා.

අපි තේරුම් ගන්න ඕනෑ, මෙච්චර නඩු ප්‍රමාණයක් නිකම් ආවා නොවෙයි කියන එක. මේක අධිකරණ පද්ධතියේ තිබෙන දුර්වලතාව, අකාර්යක්ෂමතාව හේතු කරගෙනම සිද්ධ වුණා නොවෙයි. සමාජයක් විධියට දියුණු වෙගෙන එද්දී අධිකරණ පද්ධතියේ දියුණුවේ අඩුවක් තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ එක්කම සාපේක්ෂව ගත්තොත්, සමාජයක් විධියටත් කඩා වැටීම ප්‍රබල වෙලා තිබෙනවා. සමාජයක් විධියට කඩා වැටීමේ ප්‍රබලතාව තමයි අධිකරණ පද්ධතිය ඇතුළේ අපට පෙන්නුම් කරමින් තිබෙන්නේ. ඒ නිසා අධිකරණ පද්ධතිය ගැන විතරක් තනිව සාකච්ඡා කරලා මේ සංවාදය අවසන් කළ යුතු නැහැ කියන එකයි මා විශ්වාස කරන්නේ. ඊට හේතුව විධියට අධිකරණය ගැන සමාජයේ අනෙක් කාරණා එක්ක බද්ධ කරලා කල්පනා කර බලන්න ඕනෑ. මා නිරන්තරයෙන් කියන කථාවක් තමයි, අපරාධකාරයෙක් අධිකරණය ඉදිරියට එද්දී ඇතැම් විට ඒ අපරාධකරු නැත්නම් සැකකරු ඊට පෙර වෙනත් අවස්ථාවකදී සමහර විට,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන්පිறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you may please continue.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ඔබතුමා ඉදිරියේ අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, අධිකරණ පද්ධතිය විතරක් ගොඩනඟලා, සමාජයේ ඉතිරි ප්‍රශ්න ටික ගැන කල්පනා නොකර මේ වැඩේ කරන්න බැහැ. මොකද, පද්ධතියක් විධියට මේ සියල්ල එකට ගැටගැහිලා ගොඩනැඟිලා තිබෙන්නේ. මීට පෙර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් අධිකරණය පිළිබඳව අදහසක් ඉදිරිපත් කළා. එතුමා පසුගිය කාලයේ අමාත්‍යාංශයක නියෝජ්‍ය ඇමතිවරයකු විධියටත් හිටපු කථාවක් මට ඇහුණා. එතුමා කියනවා, "ඔව්, අපි දන්නවා, දුප්පත් මිනිස්සු තමයි හිරේ යන්නේ. පොහොසත් මිනිස්සු හිරේ යන්නේ නැහැ." කියලා. පසුගිය කාලයේ මේ රට පාලනය කරපු ආණ්ඩුවක හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක් තමයි එහෙම කියන්නේ. එතුමා කියනවා, "දුප්පත් මිනිස්සු හිරේ යනවා, පොහොසත් මිනිස්සු හිරේ යන්නේ නැහැ." කියලා. එවැනි කාරණයක් මේ සභාවේ කියන්න හිතුණු එකටත් එතුමා ලජ්ජා වෙන්න ඕනෑ. ලජ්ජා නැතිව එවැනි කාරණයක් කියන්න පුළුවන් වූ එකත් ඇත්තටම පුදුමයි. කොහොම හරි එතුමා එහෙම කිව්වා. ඒ කාරණය ගැන ආපස්සට හොයාගෙන ගියාම, ආයේමත් මේ කථාව නවතින්නේ අර කැත දේශපාලන සංස්කෘතිය ළඟමයි. ඒ නිසා මේ සභාවේ කොහෙන් සාකච්ඡාවක් පටන් ගත්තත් අවසානයට ගිහිල්ලා නවතින්නේ කැත දේශපාලන සංස්කෘතිය ළඟ.

අපි මේ කරුණු ඔක්කෝම කැටි කරලා ගත්තොත්, අධිකරණ ක්ෂේත්‍රය දියුණු කිරීම කියන කාරණය ඇතුළේම තිබෙනවා, අපි නිර්මාණය කරපු යහපත් දේශපාලන සංස්කෘතිය. ඒ නිසා තමයි ඒ මන්ත්‍රීවරයාටත් එහෙම කියන්න හිතෙන්නේ. ඒ වාගේම, අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳවත්, නීතිය පිළිබඳවත් මහ ජනතාවට තිබෙන්නේ අර කිව්වා වාගේ සමාන අදහසක් තමයි. එයට හේතුව, කාලාන්තරයක් තිස්සේ අපේ රට පාලනය කරපු කණ්ඩායම් සහ ඔය කියන ආකාරයේ ඇතැම් පිරිස් මේ සමාජයට දෙමින් තිබූ පූර්වාදර්ශය ඒක තමයි. අපි ආණ්ඩු බලය ලබාගෙන ඉතාම කෙටි කාලයකින් ඒ පූර්වාදර්ශ නැති කරලා තිබෙනවා. අපි ඊට වඩා යහපත් දේශපාලන සංස්කෘතියක් ගොඩනඟලා

[ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා]

තිබෙනවා. ඒ යහපත් දේශපාලන සංස්කෘතිය ඇතුළේ අපි කොයි පැත්තට මේ ගැන කථා කරලා බැලුවත්, ඒ යහපත් දේශපාලන සංස්කෘතිය පවත්වාගෙන යන තාක්කල් අපට මේ අධිකරණ පද්ධතිය දියුණු කරන්නත්, ජාතික ඒකාබද්ධතාව දියුණු කරන්නත් පුළුවන්. මේ හැම කාරණයක්ම නිරන්තරයෙන් මේ ගරු සභාවටත් බද්ධ වෙනවා. ඒ වාගේම, මේ ගරු සභාව කාලයක් තිස්සේ නියෝජනය කරන ලද මන්ත්‍රීවරුන්, මේ රට පාලනය කරපු පිරිස් අපේ රටේ ගොඩනඟන ලද සංස්කෘතියටත් එය බද්ධ වෙනවා. ඒ නිසා කියන්න සතුටුයි, අධිකරණ පද්ධතිය දියුණු වෙන්න පටන් අරගෙන තිබෙන බව.

විශේෂයෙන්ම ඩිජිටල්කරණය සම්බන්ධයෙන් කිව්වා. ඩිජිටල්කරණය සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී විපක්ෂයෙනුත් අදහස් ඉදිරිපත් කළා. එතුමන්ලා ඒ අදහස් ඉදිරිපත් කිරීම ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේ සාධනීය අදහස් ඉදිරිපත් කිරීම ගැන අපි සතුටුයි. ඒ ඉදිරිපත් කරන ලද බොහෝ යෝජනා සම්බන්ධයෙන් මේ වනවිටත් අවශ්‍ය පියවර අරගෙන තිබෙන බව අධිකරණ ඇමතිතුමා විසින් පැහැදිලි කළා. විපක්ෂයෙන් යෝජනා කරන බොහෝ යෝජනා අපි මේ වනවිටත් තීරණ විධියට අරගෙන ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබෙනවා. අධිකරණ ක්ෂේත්‍රයේ විශ්වසනීයත්වය වඩා දියුණු කිරීම සඳහා පාවිච්චි කරන්න පුළුවන් හොඳම මෙවලමක් තමයි ඩිජිටල්කරණය. හැබැයි, අධිකරණ ක්ෂේත්‍රයේ නැත්තේම ඩිජිටල්කරණය. ඒ වාගේම, විද්‍යාව හා තාක්ෂණය පාවිච්චි නොකෙරෙන්නේම අධිකරණ ක්ෂේත්‍රය තුළ කියලා තමයි මට බොහෝ වෙලාවට හිතෙන්නේ. නඩු ප්‍රමාදවීමටත් එය බලපානවා. බොහෝ අපරාධ නඩුවලදී චිත්තිකරුවන් ඇතැම් අවස්ථාවලදී නිදහස් වන්නේ නීතිඥවරුන්ගේ දක්ෂතාව නිසාම නොවෙයි. පරීක්ෂණ නිසි ආකාරයෙන් සිදු නොවීමත්, ඇතැම් අවස්ථාවලදී නඩුව මෙහෙයවන ආකාරයෙනුත් මේ කාරණය වෙනස් වෙන්න පුළුවන්. බොහෝ අවස්ථාවලදී අධිකරණ ක්ෂේත්‍රය තුළ අපි එය අත්දකිනවා. ඒ වාගේම, විශේෂයෙන් පරීක්ෂණ පවත්වන නිලධාරීන්ගේ තිබෙන දුර්වලතා, විද්‍යාව සහ තාක්ෂණය පාවිච්චි නොකිරීම, නිශ්චිත දත්ත පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් තමයි අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳ එක්තරා ආකාරයක අවිනිශ්චිතභාවයක් ඇතිවෙලා, එහි තිබෙන විශ්වසනීයත්වයත් පසුගිය කාලයේ බිඳ වැටිලා තිබෙන්නේ. නමුත්, මම කලිනුත් කිව්වා වාගේ මේ ඔක්කොම ගිහින් අවසානයේදී නතර වන්නේ යහපත් දේශපාලන සංස්කෘතියක් ඇතුළේ. ඒ නිසා මේ පද්ධතිය දියුණු කිරීම සඳහා අපට හැකියාව තිබෙනවා. ඒ සඳහා ශක්‍යතා තිබෙන පිරිසක් අපිත් එක්ක වැඩ කරනවා. එවැනි පිරිසක් අපිත් එක්ක එකතුවෙලා ඉන්න බව කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Mujibur Rahuman. You have 15 minutes.

[අ.භා. 5.15]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Thank you, Hon. Chairman.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වාගේම, අධිකරණය, නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණ සේවා කොමිෂන් සභාව, ඒ හා සම්බන්ධව තිබෙන අනෙකුත් සියලු ආයතන පිළිබඳවත් මේ විවාදයේදී අදහස් දක්වන්නට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම රාජපක්ෂ පාලන කාලය තුළදී මේ රටේ නීතිය අවභාවිත වුණාය කියන එක අපි සියලුදෙනාම දන්නවා. ඒකට අපි සියලුදෙනාම එකඟයි. ඒ වාගේම, නීතියට පිටින් ගිහිල්ලා මේ රටේ වෙච්ච සිදුවීම් රාශියක් තිබෙනවා. මේ රටේ නීතියට පටහැනිව, නීති විරෝධී ලෙස කරපු කරුණු කාරණාත් අපි පසුගිය කාලයේ දැක තිබෙනවා. ඒ ඇති වෙච්ච පීඩනය නිසා රාජපක්ෂ පාලනයට විරුද්ධව ඇති වූ අරගළයත් එක්ක 2022දී අපේ රටේ විශාල දේශපාලන නැඟිටීමක් සිද්ධ වුණා.

ඔබතුමන්ලා, අපි සියලුදෙනාම ඒ නැඟිටීම සාධාරණය කළා. ඔබතුමන්ලා වෙන දේශපාලන මතයක හිටියත්, අපි වෙන දේශපාලන මතයක සිටියත් 2022දී මේ රටේ ජනතාවගේ නැඟිටීම, ජනතාවට තිබෙන ඒ අයිතිය අපි සියලුදෙනාම පිළිගත්තා. අපි එදා ඒ වෙනුවෙන් අපේ සහයෝගයත් ලබා දුන්නා. 2024ට කලින් පැවතුණු ආණ්ඩු, එදා ඒ අරගළයේ නියමුවන් හැටියට වැඩ කරපු සිවිල් ක්‍රියාකාරී නායකයන්ට, ත්‍රස්තීය සමීනි නායකයන්ට විරුද්ධව නඩු ගොනු කරලා තිබුණා. එදා දමපු ඒ නඩු තවම ඉවර වෙලා නැහැ. දැන් අලුත් ආණ්ඩුවක් බලයට පත් වෙලා තිබෙන්නේ. ඒ අරගළයෙන් ඇති වෙච්ච පිබිදීම, ඒ අරගළයෙන් ඇති වෙච්ච ජනතා නැඟිටීම තමුන්නාන්සේලාගේ ජයග්‍රහණයට විශාල ලෙස ඉවහල් වුණා කිව්වොත් නිවැරදියි. හුඟක් සිවිල් ක්‍රියාකාරීන්ට නඩු දමලා තිබෙන්නේ 2021, 2022, 2024 වැනි කාල සීමාවලදී. ළඟිරුට නඩු 22ක් දාලා තිබෙනවා. වසන්ත මුදලිගේට නඩු 20ක් විතර තිබෙනවා. ගරු සභාපතිතුමනි, 2022 ඔක්තෝබර් 09වැනි දා අරගළයේදී මිය ගිය අය සැමරුවා කියලා කොටුව පොලීසියෙන් යම් පිරිසකට නඩු ගොනු කළා. ඒක කළේ 2022 ඔක්තෝබර් 09වැනි දා. තමුන්නාන්සේලා බලයට ආවාට පස්සේ 2025 පෙබරවාරි මාසයේ 05වැනි දා තව හතරදෙනෙකුට සිතාසි නිකුත් කළා. ජෝසප් ස්ටාලින්, ජීවන්ත පියතුමා, ළඟිරු, මොරින් නූර් කියන මේ හතරදෙනාට සිතාසි නිකුත් කරලා, ඒගොල්ලන්වත් නඩුවට සම්බන්ධ වෙලා තිබෙනවා.

අපි ඔක්කොම විශ්වාස කළේ ඔබතුමන්ලා ආවාට පස්සේ මේ නඩු ටික ඉක්මනට අයින් කරලා, ඒගොල්ලන්ට නිදහස ලබා දෙයි කියායි. මොකද, පසුගිය කාලයේ දේශපාලන පළිගැනීම් හැටියට තමයි මේ නඩු ටික පැවරුවේ කියලා අපි දන්නවා. ඒ නඩු පැවරුවා මදිවාට, දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇවිල්ලා තවත් කට්ටිය ඒ නඩුවලට එකතු කරනවා. අපි දන්නේ නැහැ, කොහොමද එහෙම වුණේ කියලා. මේ පිළිබඳව තීන්දුවක් ගන්න තමුන්නාන්සේලා මේ තරම් ප්‍රමාද ඇයි? මේවා පසුගිය කාලයේ තිබුණු ආණ්ඩුව විසින් හිතාමතාම පවරපු නඩු. ඇයි මේ නඩු ටික අයින් කර ගන්නේ නැත්තේ? මේගොල්ලන් සමඟවිට ඔබතුමන්ලාට ප්‍රතිවිරුද්ධ දේශපාලන අදහස් දරන අය වෙන්න පුළුවන්. ඒක වෙන කථාවක්. නමුත් මේ සියලුදෙනා, අපි, ඔබතුමන්ලා එදා ඒ අරගළයට සහයෝගය දීපු උදවිය. ඒ හින්දා අපි ඉල්ලා සිටිනවා, වහාම මේ නඩු ටික අයින් කරගන්න කියලා. ඒක තවත් ප්‍රමාද කරන්න එපා. මේ මිනිසුන්ට රස්සාවකට යන්න පොලිස් සහතිකයක් ගන්න විධියක් නැහැ. මේ මිනිසුන්ට රස්සාවකට යන්න විධියක් නැහැ, හැම දාම උසාවියේ පෙනී ඉන්න වෙලා තිබෙනවා. ඒ හින්දා අපි අධිකරණ ඇමතිතුමාට කියනවා, ඔබතුමා මැදිහත් වෙලා මේ මිනිසුන්ට සාධාරණය ඉෂ්ට කරන්න කියලා.

දැන් තමුන්නාන්සේලා පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය ගැන සොයන්නත් අලුත් විමර්ශන පටන් අරගෙන තිබෙනවා. අපි දන්නවා, 2020-2024 කාලය තුළ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සම්බන්ධව "මහ මොළකරු" කියලා නොයෙක් අය නඩුවලට

පැටලුවා කියලා. මේ ගරු සභාවේ ඉන්න රිසාඩ් බදියුදීන් මැතිතුමාත් පැටලුවා. ඒ වාගේ හුහක් අය පැටලුවා, මේගොල්ලන් තමයි මහ මොළකරු කියලා. එදා තමුන්නාන්සේලාත් මේ කවුරුවත් මහ මොළකරු කියලා පිළිගත්තේ නැහැ. ඒකයි ඇත්ත. අපි ඔක්කොම දන්නවා, එදා ගෝඨාභය මහත්මයාගේ ආණ්ඩුව සැලසුම්සහගතව තමයි මේ නඩුව දැම්මේ කියලා. 2020දී නීතිඥ හිජාස් හිස්බුල්ලා මහත්මයා අත්අඩංගුවට ගත්තා. හිජාස් හිස්බුල්ලා අත්අඩංගුවට ගත්තේත් මහ මොළකරු කියලා තමයි. එදා මෙතැන හිටපු සරත් වීරසේකර ඇතුළු ආණ්ඩුවේ ඇමතිවරු අපි එක්ක ඒ ගැන වාද විවාද කළා. අපි සියලුදෙනාම දන්නවා, හිජාස් හිස්බුල්ලා මේකට කිසිදු ආකාරයේ සම්බන්ධතාවක් නැහැ කියලා. නමුත් එවකට ආණ්ඩුවේ හිටපු යම් කණ්ඩායමකට -යම් පිරිසකට- ඕනෑ වුණා, හිජාස් හිස්බුල්ලාත් මේකට පටලවා ගන්න. ඒ නිසා ඔහු අත්අඩංගුවට අරගෙන අවුරුද්දකට වැඩි කාලයක් PTA එක යටතේ තියාගෙන හිටියා. 2021 මාර්තු මාසයේ ඔහුට අධිචෝදනා ගොනු කළා. ඒ නඩුවට සාක්ෂිකරුවන් දෙදෙනෙක් ඉදිරිපත් කළා. එක සාක්ෂිකාරයෙක් සාක්ෂිවලදී බොරු කිව්වා කියලා රිමාන්ඩ් කළා.

මේ නඩුව දැන් යන්නේ නැහැ. දැන් ඒ නඩුව නැවතිලා තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් හැම දාම ඇවිල්ලා දින අරගෙන යනවා; කොළඹ සිට පුත්තලමට යනවා ඩීසල් ගහගෙන. එහෙම ගිහින් දිනයක් අරගෙන ආපසු එනවා. දැන් ඒ නඩුව අහන එක නැවතිලා තිබෙන්නේ. මොකද, නඩුව ඉස්සරහට ගෙන යන්න බැහැ. දන්නවා, එතුමාව පැටලුවේ බොරු නඩුවකට කියලා. තමුන්නාන්සේලාගේ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් රවී සෙනෙවිරත්න මැතිතුමාත් දන්නවා මේක බොරු නඩුවක් කියලා. ශානි අබේසේකර මහත්මයාත් දන්නවා මේක බොරු නඩුවක් කියලා. නමුත්, තවම මේ නඩුව ඉවර වෙන්නේ නැහැ. අපි දන්නේ නැහැ, ඇයි කියලා. හිජාස් හිස්බුල්ලාව පැටලුවේ බොරු නඩුවකට කියලා ඔබතුමන්ලාත් පිළිගන්නවා, අපිත් පිළිගන්නවා. ඇයි, දැන් එහෙම නම් මේ නඩුව අයින් කරගන්නේ නැත්තේ? අපට තිබෙන ප්‍රශ්නය තමයි මේ නඩුව තවමත් දිගටම ගෙනයන්නේ ඇයි කියන එක. මේවා පසුගිය ආණ්ඩු කාලයේ තමන්ගේ දේශපාලන වුවමනා වෙනුවෙන් ගොනු කරපු නඩු. මේ නඩු තව තවත් ඉස්සරහට ගෙන යන්නේ ඇයි? අපි අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, වහාම මැදිහත් වෙලා මේකත් අවසානයකට ගෙන එන්න කියලා.

ඊළඟට ඔබතුමන්ලා දන්නවා, විශේෂයෙන්ම ක්‍රිෂ් නඩුව, ඩෙසි ආචිවිගේ නඩුව ආදිය ගැන. ඒවාට දැන් අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා ඔක්කොම 2019 වර්ෂයේ විමර්ශන කටයුතු අවසන් වෙච්ච නඩු. 2020-2024 කාලය තුළ ඒ නඩු ගොනු කළේ නැහැ. දැන් තමුන්නාන්සේලා බලයට ඇවිත් ඒ සම්බන්ධයෙන් නඩු ගොනු කරලා තිබෙනවා. ඒක හොඳ දෙයක්. ඒ වාගේම, පසුගිය කාලයේ අපි පැමිණිලි ඉදිරිපත් කරපු තව දේවල් තිබෙනවා. ඒවා විමර්ශනය වෙන්නේ නැහැ. VFS ගනුදෙනුව පිළිබඳව විමර්ශනය වෙන්නේ නැහැ. ඊයේ අපි කථා කළා පාස්පෝට් නිකුත් කිරීම සම්බන්ධයෙන් සිදු වුණු දූෂණ, වංචා පිළිබඳව. ඒවා ගැන විමර්ශනය වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියනවා, ඒවාත් ඉතා ඉක්මනින් විමර්ශනය කරන්න කියලා.

ඒ වාගේම අපි ඔක්කොම පිළිගන්නවා, මේ රටේ නීතියේ ආධිපත්‍යය තිබෙන්න ඕනෑ බව. නීතියේ ආධිපත්‍යය තමයි අපේ රටේ තිබෙන වැදගත්ම දේ. නීතියේ ආධිපත්‍යය තිබෙන රටක් හදන්න ඔබතුමන්ලාත් කථා කළා, අපිත් කථා කළා. අපිත් ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. අපි දැක්කා, පසුගිය දා අභියාචනාධිකරණයේ සභාපතිතුමා ගැන ප්‍රශ්නයක් ආවා. අභියාචනාධිකරණයේ සභාපතිතුමාට තමුන්නාන්සේලා දෝෂාභියෝගයක් ගෙනෙන්න ගියා. ඒ ගැන කිව්වා. දෝෂාභියෝගයක් ගෙනෙන්න, ඒකට අපිත් උදවු කරනවා කියලා අපි කිව්වා. අපි දැක්කා, ඒ අභියාචනාධිකරණයේ සභාපතිතුමා පෙබරවාරි මාසයේ විශ්‍රාම පූර්ව නිවාඩු ලබාගෙන තිබෙනවා. එතුමා එහෙම විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගත්තේ ඇයි? ඇයි, දෝෂාභියෝගය නැවතුණේ? අපි දැකපු දේ තමයි, දෝෂාභියෝගය ගෙනෙනවා කියලා ගෙනාවේ නැහැ, ඒක හකුළා ගත්තා. ඒක හකුළා ගන්නේ මේ සභාපතිතුමා විශ්‍රාම පූර්ව නිවාඩු යන නිසා. ඒ වාගේම අපි දැක්කා, ජනාධිපතිතුමා මාධ්‍ය සාකච්ඡාවකට ඇවිල්ලා කිව්වා, බන්දුල කරුණාරත්න විනිශ්චයකාරතුමා එතුමාව හමු වුණා කියලා. මොකක්ද, දැන් මේ වෙලා තිබෙන්නේ? බන්දුල කරුණාරත්න මැතිතුමා ජනාධිපතිතුමාව හමු වෙනවා, හමු වුණාට පස්සේ එකඟතාවකට එනවා, "ඔව්, මම විශ්‍රාම පූර්ව නිවාඩු යනවා, ඒ නිසා දෝෂාභියෝගය ගෙනෙන්න එපා" කියලා. ඒක ඩීල් එකක්. "ඩීල්"එකකින් තමයි එතුමා අයින් වුණේ. අධිකරණ ක්ෂේත්‍රයට ඔහොම "ඩීල්" දාන එක අධිකරණයේ ස්වාධීනත්වයට ප්‍රශ්නයක් වෙනවා. ඕක නොවෙයි ඔබතුමන්ලා කිව්වේ. ජනාධිපතිතුමා මාධ්‍යයට ප්‍රසිද්ධියේ කිව්වා, එතුමාව හමු වුණා කියලා. හමු වුණාම කිව්වා, "ඔබතුමා අයින් වෙනවා නම් අපි දෝෂාභියෝගය ගෙනෙන්නේ නැහැ" කියලා. ඒකයි දෝෂාභියෝගය ගෙනාවේ නැත්තේ. එතුමා අයින් වුණා.

ගරු සභාපතිතුමනි, නීත්‍යානුකූල ක්‍රමවේදයකට මේ කටයුත්ත කරගෙන යන්න තිබුණා. එවැනි නීත්‍යානුකූල ක්‍රමවේදයක් තමයි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරලා මේ කාරණය විමර්ශනයට ලක් කරලා, එතුමාට එල්ල වී තිබෙන චෝදනා ගැන උත්තර දෙන්න එතුමාටත් අවස්ථාවක් දෙන එක. එවැනි ක්‍රමවේදයට මේක යන්න තිබුණා. නමුත්, තමුන්නාන්සේලා ක්‍රමවේදයට පිටින් ගිහින් තිබෙනවා. ඒ කියන්නේ, වැරදිකාරයාට වැරදි විධියට දඬුවම් දීලා තිබෙනවා. අර පාතාල ලෝකයේ මිනිමැරුම්වලට සම්බන්ධ අය තුවක්කු පෙන්වන්න අරගෙන ගිහින් වෙඩි තියලා මරලා දමන්නේ. අන්න ඒ ක්‍රමය තමයි දැන් මේ පාවිච්චි වෙලා තිබෙන්නේ.

මේක වැරදි පූර්වාදර්ශයක්. අපි දන්නවා, මේ පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්න බව. මේ පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේලාට තනි පක්ෂයක් හැටියට ආසන 159ක් තිබෙනවා. කාගේවත් සහයෝගයක් ඕනෑ නැහැ, තමුන්නාන්සේලාට මේ පාර්ලිමේන්තුවේ ඕනෑ දෙයක් කරන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ ඉන්න අනෙක් කිසිම පක්ෂයක මන්ත්‍රී කෙනෙකුගේ සහයෝගය ඔබතුමන්ලාට අවශ්‍ය නැහැ. එහෙම අවශ්‍යතාවකුත් නැතිව 159දෙනෙක් තමුන්නාන්සේලාට ඉන්නවා නම්, ක්‍රමවේදයට අනුව කටයුතු කරන්න පුළුවන්කම තිබියදී ඇයි, මේ ක්‍රමවේදයෙන් පිට යන්නේ? ක්‍රමවේදයෙන් පිට යාම වැරදි පූර්වාදර්ශයක් වෙනවා විතරක් නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණවල ඉන්නා හොඳ විනිශ්චයකාරවරුන්ටත් පණිවුඩයක් දෙන්න පුළුවන්, "අපි කියන විධියට ඉන්න. එහෙම නැත්නම් දෝෂාභියෝගයක් ගෙනෙනවා" කියලා. ඒක අධිකරණ ක්ෂේත්‍රයට, නීතියට ඒ තරම් හොඳ දෙයක් නොවෙයි. ඔබතුමන්ලා දැන් ඒකට වෙන වෙන උත්තර දෙයි. නමුත් ඒක නොවෙයි ඇත්ත කථාව වුණේ. ජනාධිපතිතුමාම පිළිගත්තා, එතුමා හම්බ වුණා කියලා. එතුමා හම්බ වුණු එකම වැරදියි. මොකද, තමුන්නාන්සේලා දෝෂාභියෝගයක් ගෙනෙන්න හිටපු කෙනෙක්ව; විනිශ්චයකාරවරයෙක්ව ජනාධිපතිතුමා මුණ ගැසුණේ මොකටද? ඇයි, ඒ දෝෂාභියෝගය ගෙනෙන එක නැවතුණේ? එහෙම නැවතුණේ, එතුමා කිව්වා, "මම අයින් වෙනවා" කියලා. එහෙම කියලා එතුමා විශ්‍රාම පූර්ව නිවාඩු යනවා. එහෙම නම් දෝෂාභියෝගයක් ඕනෑ නැහැ කියලා ඒක අයින් කළා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු සභාපතිතුමනි, මම මේ කාරණය කියන්න කැමැතියි. විශේෂයෙන්ම තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩුව සහ අපි -සියලු දෙනාම- පිළිගන්නවා, මේ රටේ නීතියේ ආධිපත්‍යය හදන්න ඕනෑ, අධිකරණයේ ස්වාධීනත්වය තියා ගන්න ඕනෑ, විනිශ්චයකාරවරුන්ට කිසිදු ආකාරයක බලපෑමක් කිරීම මේ රටින් තුරන් වෙන්න ඕනෑය කියන එක. අපි සියලු දෙනාම ඒ මූලධර්මය පිළිගන්නා උදවිය. අපි ඒ වෙනස තමයි බලාපොරොත්තු වෙන්නේ. තමුන්නාන්සේලා පසුගිය කාලයේම ඒ වෙනස ගැන තමයි කථා කළේ. ඒ system change එක ගැන කථා කරපු තමුන්නාන්සේලා අන්තිමට system එකට පිටින් ගිහිල්ලා, තිබෙන system එකෙන් එළියට පැනලා එසේ කටයුතු කිරීම මම නම් හිතන්නේ නැහැ, අධිකරණ ක්ෂේත්‍රයට දුන් හොඳ පූර්වාදර්ශයක් කියලා. ඒක වැරදි පූර්වාදර්ශයක්.

විශේෂයෙන් පසුගිය අරගළ කාලයේ මේ රට තුළ සිදුවුණු ඒ නැඟිටීමත් එක්ක ඒවාට නායකත්වය දුන් උදවියට, ඒ අවස්ථාවේ ඉදිරියෙන් සිටිමින් ක්‍රියා කළ උදවියට නඩු විශාල ප්‍රමාණයක් ඒ කාලයේ පැවැති ආණ්ඩුව දමා තිබෙනවා. ඒ නිසා ඒ නඩු සම්බන්ධව තමුන්නාන්සේලා වහාම දේශපාලනික තීන්දුවක් ගන්න. ඒ තීන්දුව ගැනීම තව ප්‍රමාද කරන්න එපා.

ඊළඟට, පාස්කු දින එල්ල වුණු බෝම්බ ප්‍රහාරය සම්බන්ධව එවකට හිටපු ආණ්ඩුව නොයෙකුත් අයට බොරු චෝදනා දමා පවරපු නඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම කියපු හිජාස් හිස්බුල්ලා එක්කෙනෙක් විතරයි. ඒ වාගේ තව පුද්ගලයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. දේශපාලන පළිගැනීම් මත තමන්ට අවශ්‍ය අයව දඩයම් කිරීමට දමපු නඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. අන්න ඒ නඩු ඉතා ඉක්මනින් අවසන් කරන්න කියලාත් අපි අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින්, මට කාලය ලබා දුන්නාට ගරු සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Nalinda Jayatissa.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද උදෑසන ඉඳලා අපි කථා කරමින් සිටියා, තෙල් බෙදා හැරීමේ ප්‍රශ්නය පිළිබඳව. මම මේ වෙලාව යොදා ගන්නවා, ඒ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් කියන්න. අපිට සහතික වශයෙන් කියන්න පුළුවන් ජනතාවට බිය නැතුව ඉන්න, panic buyingවලට යන්න අවශ්‍ය නැහැ කියලා. ඊයේ දවසේදී ලංකා ඔටෝ ඩීසල් කිලෝලීටර් 5,175ක් නිකුත් කර තිබෙනවා. ඒ කියන්නේ ලෝඩ් 784ක්. ඒ වාගේම ඔක්ටෙන් 92 පෙට්‍රල් ලෝඩ් 664ක් - කිලෝලීටර් 4,372ක් - නිකුත් කර තිබෙනවා. අද හවස 5.00 වෙනකොට ලංකා ඔටෝ ඩීසල් ලෝඩ් 1,093ක් - කිලෝලීටර් 7,218ක් - නිදහස් කර තිබෙනවා. ඒ වාගේම ලංකා සුපර් ඩීසල් ලෝඩ් 25ක් - කිලෝලීටර් 168ක් - නිකුත් කර තිබෙනවා. ඒ අනුව කිලෝලීටර් 7,386ක් අද හවස 5.00 වෙනකොට නිකුත් කරලායි තිබෙන්නේ.

ඒ වාගේම ඔක්ටෙන් 92 පෙට්‍රල් ලෝඩ් 1,150ක් - කිලෝලීටර් 7,524ක් - නිකුත් කර තිබෙනවා. ඊළඟට, ඔක්ටෙන් 95 පෙට්‍රල් ලෝඩ් 37ක් - කිලෝලීටර් 247.5ක් - නිකුත් කර තිබෙනවා. ඒ අනුව පෙට්‍රල් කිලෝලීටර් 7,777ක් මේ වෙනකොට නිදහස් කරලායි තිබෙන්නේ. ඒ නිසා මේ වෙනකොට ඩීසල් සහ පෙට්‍රල් අවශ්‍ය තරම් ලෝඩ් ප්‍රමාණයක් එළියට ගිහින් තිබෙන බව මම කියන්න කැමැතියි.

වැඩිමනත් වශයෙන් කියනවා නම්, බෙදුම්කරුවන්ගේ සංගමය හැටියට වර්ජනයක් දියත් කරන්න කියපු සන්දනායක මහත්මයා ඩීසල් ලීටර් 6,600ක්; ඒ කියන්නේ එක ලෝඩ් එකක් කොළොන්නාවෙන් අද අරගෙන ගිහින් තිබෙනවා.

ත්‍රිකුණාමලයෙන් පෙට්‍රල් load 3ක් - ලීටර් 19,800ක් - අරගෙන ගිහිල්ලා තිබෙනවා. මේ voice-cut එක දීපු ශාන්ත සිල්වා මහත්මයාත් කොළොන්නාවෙන් ලීටර් 13,200ක් - load 2ක් - අරගෙන ගිහිල්ලා තිබෙනවා. ත්‍රිකුණාමලයෙන් ඔක්ටෙන් 92 පෙට්‍රල් ලීටර් 13,200ක් - loads 2ක් - අරගෙන ගිහිල්ලා තිබෙනවා. තවත් Petrol 92 Octane loads 5කට - ලීටර් 33,000කට - එතුමා ඉල්ලුම් කරලා සල්ලිත් බැඳලායි තිබෙන්නේ. ඒ නිසා බය වෙන්න දෙයක් නැහැ. පෝලිම්වල ඉන්න ඕනෑ නැහැ. Panic buyingවලට යන්න අවශ්‍යතාවක් නැහැ. අවශ්‍ය ප්‍රමාණයට තෙල් නිකුත් කරනවා. සාමාන්‍යයෙන්, දවසකට නිකුත් කරන ප්‍රමාණයටත් වඩා වැඩියෙන් ඒ තැන්වල දැන් තෙල් නිදහස් කරනවා කියලා මම මේ වෙලාවේ කියන්න කැමැතියි. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have eight minutes.

[අ.භා. 5.32]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you, Hon. Chairman.

ගරු සභාපතිතුමනි, මගේ කථාවට යෑමට පෙර තෙල් ප්‍රශ්නය ගැන කියන්න ඕනෑ. මා හිතන විධියට, තෙල්වල ගැටලුවක් නැහැ කියලා ඊයේ සිට ආණ්ඩුව පාර්ශ්වයේ කැබිනට් ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු කියන පස්වෙනි, නැත්නම් දහවෙනි පාර, මේ. හැබැයි, මිනිස්සු පෝලිම්වල. පෝලිම් දිගු වෙන එක තමයි වෙන්නේ.

දැන් කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා එහෙම කිව්වට මිනිස්සු තව තවත් පෝලිම්වලට යනවා. ඒ කියන්නේ, මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය බිඳ වැටිලා. ඇමතිතුමන්ලා කොච්චර කිව්වත් මිනිස්සු ඒක පිළිගන්නේ නැතිව පෝලිමට යනවා. කැබිනට් ඇමතිවරු සිය පාරක් කිව්වත් එහෙමයි. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ජනාධිපතිතුමාට Facebook live ඇවිල්ලා කියන්න කියන්න, "තෙල් ප්‍රශ්නයක් නැහැ" කියලා. එතකොට සමහර විට මිනිස්සු විශ්වාස කරයි. කැබිනට් මාධ්‍ය ප්‍රකාශක විතරක් නෙවෙයි, ඇමතිවරුත් දිගින් දිගටම කිව්වාට "තෙල් තියෙනවා. බය වෙන්න එපා" කියලා, මිනිස්සු පෝලිම්වල. මම දැන් එනකොටත් තිබුණා, ලොකු traffic එකක්. පාර්ලිමේන්තුවට එන්න විධියක් නැහැ, එච්චරටම පෝලිමක් තිබෙනවා. Panic buying කොච්චර කරන්න එපා කිව්වත් මිනිස්සු කරනවා. මොකද, විශ්වාසයක් නැහැ.

Anyway, let me get to the topic at hand today. The Hon. Minister of Justice is present here. I believe some of the questions I have to raise seem to be above your pay grade. I do not think you will be able to respond to that as even the President was unable to respond. So, maybe, you might have to get your politburo together and agree on something for them to come up with answers. I have repeatedly asked you all about the new Constitution. There is no response. I have repeatedly asked about the Truth and Reconciliation Commission and the statement made by the Hon. Vijitha Herath, but there is no response. So, I believe these things are above your pay grade. මම ඊයේ දවසේත් ඒ ගැන ප්‍රශ්න රාශියක් ඇහුවා. මම හිතන විධියට, ඒ ප්‍රශ්න එකකටවත් උත්තර නැහැ. ගරු ජනාධිපතිතුමා ළඟත් උත්තරයක් නැත්නම් නීතිය පිළිබඳ ඇමතිතුමා අපහසුතාවට පත් කරන්න හොඳ නැහැ. මොකද, එතුමාට ගෙවන වැටුපට වඩා ලොකු රස්සාවක් මේක. ජාතික ජන බලවේගයේ, එහෙම නැත්නම් JVP එකේ politburo එකේ වාඩි වෙලා තීරණය කරලා ඇවිල්ලා ඒ ගැන අපට කියන්න. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන ඊයේ ප්‍රශ්න කළා. වචනයක් නැහැ; "මීක්" සද්දයක් නැහැ. අහපු අනෙක් ප්‍රශ්න ඔක්කොටම ජනාධිපතිතුමා උත්තර දුන්නා. ගරු අගමැතිතුමියනි, පුළුවන් නම් ඔබතුමිය හරි ඒ ගැන කියන්න. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන වචනයක්වත් නැහැ. ඊයේ ඇහුවා, තවත් ගොඩක් දේවල් ගැන. ඒ කිසිම දෙයක් ගැන වචනයක්වත් කිව්වේ නැහැ. මට ජේනවා, ගරු අගමැතිතුමිය දැන් ඇවිදගෙන එනවා. දැන් එතුමිය කියයි, මෙහෙම කියන්න කියලා. හැබැයි, කාරණය පැහැදිලියි. ජනාධිපතිතුමා ළඟත් උත්තරයක් නැත්නම් වැඩක් නැහැ. උත්තරයක් දුන්නේ, එකම එක දෙයටයි. "ජාතික ජන බලවේගය සහ ජනාධිපතිතුමා වෙන් කරන්න අවශ්‍යතාවක් නැහැ, අපි ඔක්කොම එකයි, ආ, එහෙම මාව උස්සලා තියන,- *[බාධා කිරීමක්]* මම හිතන විධියට ඒක ඊයේ ජනාධිපතිතුමාටත් පොඩ්ඩක් වැදුණා. ඒ කියපු කාරණයේ සත්‍යයක් තිබෙන නිසා ඒකට විතරක් උත්තරය දුන්නා. අඩුම ගානේ ඒවාට හරි උත්තර දෙනවා.

Anyway, let me get to the matter at hand. Photocopy machine එකක් පිළිබඳව ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා ඇහුවාම ඒ ගැන නම් උත්තර දුන්නා, ගරු ඇමතිතුමා. මම හිතන විධියට, ඒ මට්ටමේ තමයි ඇමතිවරයාගේ බලතල තිබෙන්නේ. ඉතිරි ඔක්කොම පක්ෂයේ politburo එක යටතේ තමයි තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, accountability පැත්තෙන් අද මට ගොඩක් ප්‍රශ්න අහන්න තිබෙනවා. මම ඒවා අතරින් සමහර ප්‍රශ්න ඉතිරි කර ගන්නම් විදෙස් කටයුතු ඇමතිතුමාගෙන් අහන්න. මොකද, එතුමා ජිනීවා ගියා නේ. ගරු අධිකරණ ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් ඉතා පැහැදිලිවම අහන්න ප්‍රශ්න තිබෙනවා. මේ රට තුළ emblematic cases තිබෙනවා. ඒ කියන්නේ, රට තුළ සිදු වෙච්ච මිනී මැරීම් පිළිබඳව සංකේතාත්මක cases වගයක් තෝරා ගත්තා. ඒවා අතරින් පළමුවෙනි එක, the murder of Mylvaganam Nimalarajan. He was a journalist. 2000 අවුරුද්දේයි මැරුවේ. Then, "Trinco 5", the murder of five students. 2006දියි මැරුවේ. ඔබතුමා දන්නවා, මේ cases ගැන. මේවාට යුක්තිය ඉෂ්ට වෙන්න ඕනෑ කියලා පසුගිය කාලයේ බොහෝ සෙයින් හඬ නඟපු කෙනෙක්, ඔබතුමාත්. Then, the killing of ACF aid workers. 2006දියි මැරුවේ. ඊට පස්සේ, the "Missing 11". ඒ කියන්නේ, 11 දෙනෙක් abduct කරලා 2008-2009 කාලයේදී මරපු එක. කීත් නොයාර්ට පහර දීම, 2008දී. ලසන්ත වික්‍රමතුංග ඝාතනය, 2009දී. ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම, 2010දී. ලසන්ත වික්‍රමතුංග ඝාතනය ගැන විස්තර විතරක් දැන් අපට මාධ්‍යයෙන් දැක ගන්න පුළුවන්. මම හිතන විධියට, අගමැතිතුමියටත් ලියුමක් එවා තිබුණා, අභිමිසා වික්‍රමතුංග. ඒ ලියුම පිළිබඳවත් සඳහන් කර තිබුණා. මීට දවස් 6කට පෙර, 23වැනි දාළ "The Island" පත්තරයේ article එකක් publish කරලා තිබෙනවා, "The Murder of a Journalist" කියලා. ඒකේ තිබෙනවා, ලසන්ත වික්‍රමතුංගගේ ඝාතකයන් release කරන්න කියපු එක, ඒ ගොල්ලන් නිදහස් කරන්න කියපු එක, දැනට suspend කරන්න කියලා. ඒ කියන්නේ, Attorney-General's Department එකෙන් මේ නිර්දේශය දුන්නාට, ඒක හදිසි වෙලා ක්‍රියාත්මක කරන්න එපා, ඒක suspend කරන්න කියලා කියා තිබෙනවා. දැන් කියන්නේ, "අපි interfere කරන්නේ නැහැ මොකකටවත්" කියලායි. හැබැයි දැන් ඒක suspend කරන්න කියලා තිබෙනවා. නවත්වලා නැහැ, suspend කරන්න කියලායි තිබෙන්නේ. එතකොට, ලසන්ත වික්‍රමතුංගගේ සිද්ධිය ගැන යම්කිසි දෙයක් තිබෙනවා.

අනෙක් cases ගැන ඔබතුමන්ලාගේ රජයේ ස්ථාවරය මොකක් ද? ජනාධිපතිවරයා බලයට ඇවිල්ලා මාස පහක් ගිහිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, සාමාන්‍යයෙන් ජනාධිපතිවරයාගේ ධුර කාලයෙන් දහයෙන් එකක් දැන් ඉවරයි. එතකොට "තව කල් ඕනෑ, තව කල් ඕනෑ" කිය කියා ඉන්න බැහැ.

ගරු අධිකරණ ඇමතිතුමනි, පසු ගිය කාලයේ පැවැති තත්ත්වය සම්බන්ධයෙන් අප දන්නා දේ මම ඔබතුමාට කියන්නම්. මේවා emblematic cases. ඔබතුමන්ලා වැඩ භාර අරගෙන ජාත්‍යන්තරයට පොරොන්දුවක් දුන්නා. මේ cases ගැන අපි සංකේතාත්මකව සොයා බලා කියන්නම් කිව්වා. නමුත්, cases දහස් ගණනක් තිබෙනවා. දැන් මේ emblematic cases හය සම්බන්ධයෙන්වත් ඇමතිතුමාගේ රාජකාරි අනුව එතුමා කටයුතු කරලා තිබෙනවාද කියලා අපි බලමු. එතුමාගේ පිළිතුරු කථාවේදී ඒකටවත් උත්තර දෙයි ද කියලා බලමු.

අපිට අවසාන වශයෙන් දැන ගන්න ලැබුණු දේ මම කියන්නම්. ලංකාව තුළ ඉතිහාසයක් තිබෙනවා, Commission of Investigation appoint කරන එකට. අපි දන්නවා, "Trinco 5" case එක. 2006දී ඒ murder එක කරපු suspectsලා ගැන Udalagama Commission එක 2007දී video link එකක් හරහා witnessesලාගෙන් ප්‍රශ්න කරලා, record කරගෙන තිබෙනවා; ඒකට කවුද සම්බන්ධ, වසන්ත කරන්නාගොඩ ද සම්බන්ධ, මොකක්ද වුණේ කියලා video link එකක් හරහා ප්‍රශ්න කරලා record කරගෙන තිබෙනවා. ඊට පස්සේ 2009 වෙන කොට මේ witnessesලා overseas කියලා, ඒ case එක ආපහු stall වෙලා තිබෙනවා. ඊට අමතරව, 2020දී ගෝඨාභය රාජපක්ෂ බලයට ආවාට පස්සේ Commission of Inquiry on Political Victimization දැම්මා. ඒ යටතේ ඒගොල්ලන්ගේ නඩු ටික ඔක්කොම වහ ගන්න අවශ්‍ය කටයුතු කළා. මේ අවස්ථාවේදී අපි පෙනී සිටින්නේ, ගෝඨාභය රාජපක්ෂගේ පොහොට්ටුව පක්ෂය වෙනුවෙන් නොවෙයි. මේ සාධාරණ ප්‍රශ්නයක් අහන්නේ. රට තුළ යුක්තිය ඉටුවීම පිළිබඳව තිබෙන සැකය නිසායි මම මේ ප්‍රශ්නය අහන්නේ. එතකොට Commission of Inquiry on Political Victimization හරහා recommendation එකක් දීලා තිබෙනවා, වසන්ත කරන්නාගොඩ ඇතුළු ඒ පුද්ගලයින් සියලුදෙනා ඒ නඩුවලින් නිදහස් කරන්න කියලා. ඒ නිදහස් කරන්න කියලා තිබෙන නඩු තමයි, රවිරාජ් මන්ත්‍රීතුමාගේ ඝාතනය, ජෝසප් පරරාජසිංහම්ගේ ඝාතනය, වසීම් තාජුඩීන්ගේ ඝාතනය, වැලිකඩ බන්ධනාගාරයේ ඝාතනය, ප්‍රගීත් එක්නැළිගොඩගේ සිදුවීම හා කීත් නොයාර්ගේ සිදුවීම ආදියට අදාළ නඩු. අලුත් ආණ්ඩුව බලයට ආවාට පස්සේ ඒවා පිළිබඳව අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවා ද?

[ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ඊයේ ජනාධිපතිතුමාත් ලස්සනට කිව්වා, අපි voice-cuts දෙන්නේ නැහැ, අපි මේවා ගැන කියන්නේ නැහැ කියලා. අද ඊයේ වෙච්ච දේවල් ගැන කියන්නේ නැති එක වෙනම දෙයක්. නමුත්, මේවා අවුරුදු 20ක් විතර පරණ cases. කියන්නේ නැහැ කිව්වාට, මේවා ගැන update එකක් තිබෙනවාද, නැද්ද? මේවා ගැන සොයනවා ද, නැද්ද? නැත්නම්, ඇයි හොයන්නේ නැත්තේ? මේවා හා සම්බන්ධ පුද්ගලයින් කවුද? පසු ගිය කාලයේ කවුරු කොච්චර නැහැ කිව්වත්, මේවා දේශපාලන බලපෑම් නිසා යට ගහපු දේවල්.

ඊට අමතරව, මේ ලේඛනයේ case-by-case තිබෙනවා. ගරු අධිකරණ අමාත්‍යතුමාට අවශ්‍ය නම් මම ඒ ටික එවන්නම්.

2004ආම් ආණ්ඩුලිරුන්දු 2009ආම් ආණ්ඩු වරෙ කොල්ලප්පට්ට තමිල්, මුස්ලිම්, සිංහල ඌටකවියලාරාර්කළ් 34 පේරින් පෙයර්ප්පට්ටියල් ඉලංකෙ තමිල්ච් සංගත්තිනාල් වෙළියිටප්පට්ටු ඉරුක්කින්‍රතු. අදිල් තමිල් ඌටකවියලාරාර්කළ්තාන් අදිකමාක ඉරුක්කිරාර්කළ්. අන්දප් පට්ටියලිල්, ඉයාත්තුරෙ ඒ. නඩේසන්, කන්දසාමි ඉයර් බාලනඩරාජ්, ලංකා ජෙයසුන්දර, තර්මරට්ණම් සිවරාම්, කණ්ණමුත්තු අරසකුමාර්, රේලංකි සෙල්වරාජා, ටි. සෙල්වරට්ණම්, යෝකකුමාර් කිරුෂ්ණපිල්ළෙ, එල්.එම්. පලීල්, කේ. නවරට්ණම්, සුප්පිරමණියම් සුකිර්තරාජන්, එස්.ඈ. කණනාතන්, පෙස්ටියන් ජෝර්ජ් සකායතාස්, ඉරාජරට්ණම් රඤ්චිත්කුමාර්, සම්පත් ලක්මාල් ත සිල්වා, මරියතාසන් මනෝජන්රාජ්, පත්මනාතන් විස්මානන්තන්, සතාසිවම් පාස්කරන්, චින්නත්තම්පි සිවමකරාජා, එස්. රවීන්තිරන්, සුප්පිරමණියම් ඉරාමච්චන්තිරන්, චන්තිරපෝස් සුතාකර්, සෙල්වරාසා රජීවර්මන්, සකාදේවන් නීලකෂන්, අන්තෝනිප්පිල්ළෙ ෂෙරින් චිත්තිරඤ්ජන්, වඩිවේල් නිමලරාජා, ඉසෛවිළි චෙම්පියන් (සුපාජිනී), සුරේෂ් ලිම්පියෝ, ඈ. තර්මලිංගම්, පරණිරූපසිංගම් දේවකුමාර්, රෂ්මි මොහමට්, ලසන්ත වික්කිරමතුංග, පුණ්ණියමූර්ත්ති චත්තියමූර්ත්ති, චසි මතන් ආකියෝරින් පෙයර්කළ් උළ්ළන.

කෞරව නීති අමෙච්චර් අවර්කළේ, නීංකළ් කුරිප්පිට්ට චිල විටයංකළ් පර්රි ආරාය්වතාකච් චර්වදේච චමූකත්තුටන් ඉණංකිනීර්කළ්. අදිල් මික මුක්කියමාක තිරුකෝණමලෙයිල් කටත්තප්පට්ටුක් කොල්ලප්පට්ටවර්කළ්, ACF aid workers එන 6-7 විටයංකළෛ නීංකළ් කුරිප්පිට්ටුච් චොන්නීර්කළ්. එල්ලා විටයංකළෛයුම් ඔරේයටියාක ආරාය්වතු කෂ්ටම් එන්පතාල්, මුතලිල් ඉන්ත විටයංකළ් පර්රි ආරාය්න්තු පතිල් චොල්වතාකච් චොන්නීර්කළ්. ඉව්වාරු 2015ආම් ආණ්ටු අරචාංකත්තිලුම් චොල්ලප්පට්ටතු.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිචාරර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Shanakiyan Rasamanickam, your time is up.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් ඉරාචමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

ආනාල්, කටන්ත කෝට්ටපාය රාජපක්ෂවින් අරචාංකත්තිල් Commission of Inquiry on Political Victimizationඉ නියමිත්තු, ඉන්ත අනෙත්තු විටයංකළෛයුම් මූඩිමරෙප්පතර්කු නටවටික්කෛ එටුක්කප්පට්ටතු. ඌළලර්ර, නේර්මෙයාන ඔර් අරචාංකම් එන්ර අඩිප්පටෛයිල්, මක්කළ් උංකළුක්කු ආණෛ වළංකි ඉරුක්කිරාර්කළ්. තයවුචෙය්තු, අතෛක් කාප්පාර්රුංකළ්! අතෛක් කාප්පාර්රුවතාක ඉරුන්තාල්, ආකක් කුරෙන්තතු නාන් ඉංකු කේට්ට විටයංකළුක්කාවතු පතිල් අළියුංකළ්! අවර්රුක්කු උංකළාල් පතිලළික්ක මුටියුමා එනප් පාර්ප්පෝම්! නේර්රෙය තිනම්කූට චනාතිපති අවර්කළිටම් අරචියලමෙප්පු පර්රික් කේට්ට පොළුතු, පතිලළික්කාතු තප්පිච් චෙන්රු විට්ටාර්. අතේපෝල්, කාණාමල් ආක්කප්පට්ටවර්කළ් පර්රික් කේට්ටපෝතුම් තප්පිච් චෙන්රු විට්ටාර්.

කෞරව අමෙච්චර් අවර්කළේ, නාන් උංකළිටම් මුතලාවතාක "TRC" එන ඔන්රු ඉරුක්කිරතා? එනක් කේට්ටපෝතු, අතු තන්නුටෙය තුරෙ ඉල්ලෙයෙනක් කූරිනීර්කළ්. Truth and Reconciliation Commissionඉ නාංකළ් නිරාකරිත්තු ඉරුක්කිරෝම්. අතු තොටර්පිල් උංකළුටෙය නිලෛප්පාටුතාන් එන්න? ඉන්ත වරුටම් කාණාමල් පෝනෝර් පර්රිය අලුවලකත්තුක්කුම් Office for Reparations එනප්පටුකින්‍ර ඉළප්පීටුකළුක්කාන අලුවලකත්තුක්කුම් උංකළාල් ඔතුක්කප්පට්ට නිති ඔතුක්කීටු කටන්ත වරුටම් පෝලතාන් ඉරුක්කින්‍රතු. කටන්ත කාලත්තිල් ඔතුක්කප්පට්ට නිතියෙ වෛත්තුච් චිල විටයංකළෛච් චෙය්ය මුටියාත කාරණත්තිනාල්තාන් වේලෛකළ් නටක්කවිල්ලෛ එන්පතු උංකළුක්කුම් තෙරියුම්! නාංකළ් ඉන්ත නිරුවනංකළෛ ඒර්රුක්කොළ්ළාවිට්ටාලුම්කූට, අතුතාන් අරචාංකත්තිනුටෙය මුන්මොළිවු! ඉවර්රුක්කු කටන්ත වරුටත්තෛවිට ඉන්ත වරුටම් 5 මිල්ලියන් රූපාය් කුරෛවාකවේ ඔතුක්කප්පට්ටු ඉරුක්කින්‍රතු. කෞරව නීති අමෙච්චර් අවර්කළේ, උංකළුටෙය චම්පළත්තෛවිට අතිකමාන, උයර්වාන කේළ්විකළෛ නාන් කේට්ටිරුක්කිරේන්. උංකළුටෙය politburoඉක්කූට්ටි, කතෛත්තු ආරාය්න්තාවතු පතිල් අළික්කුමාරු කේට්ටුක් කොළ්කින්රේන්. නන්රි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිචාරර් අවර්කළ්)
(The Hon. Chairman)
The Hon. (Ms.) Lakmali Hemachandra. You have seven minutes.

[අ.භා. 5.42]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(මාණ්පුමිකු චට්ටත්තරණි (චෙල්වි) ලක්මාලි හේමචන්තිර)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, අද දවස පුරාවටම පාර්ලිමේන්තුවේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් වරින් වර ප්‍රකාශ කළා, ලංකාවේ තෙල් සැපයුම සම්බන්ධව කිසිම ප්‍රශ්නයක් නැහැ, තෙල් භීතියක් රට ඇතුළේ නැහැ, ඒක නිසා ජනතාව පෝලිම්වල රැඳී සිටිය යුතු නැහැ කියන කාරණය. මේ අවස්ථාවේදී සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාත් බොහොම පැහැදිලිව මේ සභාවට දැනුම් දුන්නා, කොච්චර තෙල් සැපයුමක් කරලා තිබෙනවාද, බෙදා හැරීමක් කරලා තිබෙනවාද කියන එක. එහෙම තිබියදීත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් ආයෙත් උත්සාහ කරනවා, රජය සහ ජනතාව අතර විශ්වාසයක් නැහැ වාගේ බොරු මතයක් සමාජගත කරන්නට. ගරු සභාපතිතුමනි, විපක්ෂයේ මේ irresponsible හැසිරීම ගැන මම කියන්න ඕනෑ.

Sir, the irresponsible behaviour of the Opposition is the main reason for the people's unrest. Sir, there was panic buying last night because of the media, and now the Opposition is trying to recreate the same panic in Parliament. The Government is much more responsible, and we owe a duty to the people - to come here, or to go

anywhere else - and explain it over and over again, if it is required, that there is no need to be in queues.

පෝලිම්වල ඉන්න කිසිම හේතුවක් නැහැ. රටේ තෙල් සැපයුම බොහොම සාර්ථකව, කිසිදු කඩාකප්පල්වීමකින් තොරව සිද්ධ වෙනවා. රජයක් හැටියට ඒක අපේ වගකීම. අපි ඒක කරනවා. එක පාරක් නොවෙයි, දහ පාරක් කියන්න වුණත් ජනතාව වෙනුවෙන් අපි ඒක කරනවා. ගරු සභාපතිතුමනි, අපට ජනතාවට උත්තර දීමේ කිසිදු ප්‍රශ්නයක් නැහැ. දහ පාරක් වුණත් අපි ඒක කරනවා.

ගරු සභාපතිතුමනි, මෙතැනදී තවත් කාරණයක් මතු වුණා. අද දවසේ කාරණාවට එන්නට පෙර මම මේක කියන්න ඕනෑ. ඒ තමයි, අපේ ගරු අධිකරණ අමාත්‍යතුමාගේ gentlemanly conduct එක ගැන. හිටපු ජනාධිපතිවරයාට මොකක්ද කිව්වා කියලා එතුමාගේ gentlemanly conduct එක question කරන්න පටන් අරගෙන තිබෙනවා. Hon. Minister, I think, there is no question about your gentlemanly conduct. You are standing on the right side of history, and you are doing the right thing. That is the only gentlemanly conduct required at the moment, and you are doing that. We have no question about that.

අනෙක් එක, the only complaint I have of you is, that you called the former President "හිඟන්නා." That is an insult to beggars, because they do not steal public funds; but the former President has done that. ඒ නිසා, මොකක් හරි වැරැද්දක් වුණා නම් ඇත්තටම සිද්ධ වුණේ හිඟන්නන්ට. වෙනත් කාටවත් වැරැද්දක් වෙලා නැහැ.

Moving on to the subject at hand, Sir, මේ අය වැය තුළින් justice, ඒ කියන්නේ යුක්තිය සඳහා ප්‍රවේශය පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුයි. අපි හැමෝම දන්නවා මේ අය වැය සකස් කරලා තිබෙන්නේ ඉතාම tight financing තත්ත්වයක් තුළ කියලා. ඒ කියන්නේ මූල්‍යමය තත්ත්වය බොහොම තද තත්ත්වයක් තුළ තමයි අය වැය සකස් කරලා තිබෙන්නේ. අපට සීමා තිබෙනවා. ඒ සීමා තුළ පවා අපට පෙනෙනවා රජය බොහොම උත්සාහයක් දරලා තිබෙන බව යුක්තියට ඇති ප්‍රවේශය පුළුල් කිරීමට. අද උදේ ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය පැහැදිලි කළා, කොහොමද නීති ආධාර කොමිෂන් සභාව -Legal Aid Commission- තිබෙන එක වැදගත් වෙන්නේ කියලා, අඩු ආදායම්ලාභී පහළ පාන්තික ජනතාවට යුක්තියේ ප්‍රවේශය ලබා ගැනීමට, අධිකරණ පද්ධතියේ ප්‍රවේශය ලබා ගන්නට. මම මතක් කරන්නත් ඕනෑ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය -නිලධාරීන්- පුද්ගලිකවම මම දැකලා තිබෙනවා අධිකරණය තුළ ඉතා භාරදූර කාර්යයක් ඉෂ්ට කරනවා, පහළ පාන්තික අඩු ආදායම්ලාභී ජනතාවට නීති ආධාර ලබා දීමට. මේ අවුරුද්දේ අපිට වැඩිපුර මුදලක් නීති ආධාර කොමිෂන් සභාවට වෙන් කිරීමට නොහැකි වුණත් ගරු ඇමතිතුමනි, ඉදිරි අවුරුදුවලදී පහළ පාන්තික ජනතාවට නීති ආධාර ලබා දීම සම්බන්ධයෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යයි කියලා මම හිතනවා. විශේෂයෙන්ම නීති ආධාර කොමිෂන් සභාවේ අරමුණක් හැටියටම තිබෙනවා කම්කරු ජනතාවට, වෙළෙඳ කලාප ආශ්‍රිත ජනතාවට නීති ආධාර ලබා දීම. ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරනවා නම් හොඳයි කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

ඒ වාගේම, අපි මෙතැනදී කථා කරන්න ඕනෑ හොඳම කාරණාවක් තමයි, alternative dispute resolution. විකල්ප ආරාවුල් නිරාකරණය කිරීමේ ක්‍රම සම්බන්ධයෙන් මේ අය වැය තුළ කරලා තිබෙන වියදම. එහිදී ප්‍රධාන වශයෙන් ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුව වැදගත්. ගොඩක් දෙනා දන්නෙත් නැහැ එහෙම එකක් තිබෙනවාද කියලා. Department of Debt Conciliation Board කියලා එකක් ලංකාවේ තිබෙනවා. Immovable properties පිළිබඳව තිබෙන ආරාවුල් තමයි මේකෙන් විසඳන්නේ. ණය ලබා දීලා, උගස් කරලා - mortgages -, ඇප කරලා ණය අරගෙන තිබෙනවා නම්, ඒ properties සම්බන්ධයෙන් තිබෙන ආරාවුල් විසඳා ගැනීමට ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුව ලොකු වැඩක් කරනවා. ඒ ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුවට කරන වියදම මේ අවුරුද්දට -2025 වර්ෂයට- සියයට 30කින් වැඩි කරලා තිබෙනවා. රජයේ ප්‍රතිපත්පතියක් මත, ගරු අමාත්‍යවරයාගේ ප්‍රතිපත්තිමය තීරණයක් මත, ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුවේ ශාඛා දෙකක් අමතරව පිහිටුවන්නටත් අය වැය යෝජනා මඟින් කරලා තිබෙනවා. මම හිතන විධියට ඉතාම අගය කළ යුතු තීරණයක් තමයි ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුව - Department of Debt Conciliation Board - පුළුල් කිරීමට ගන්නා තීරණය.

ඒ වාගේම සමථ මණ්ඩලය පිළිබඳවත් කිහිප වතාවක් කථා වුණා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Ms.) Lakmali Hemachandra, you have two more minutes.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Thank you, Hon. Chairman.

සමථ මණ්ඩලය කියන්නේ විකල්ප ආරාවුල් නිරාකරණය කිරීමේදී - alternative dispute resolution - ඉතා වැදගත් වන ආයතනයක්.

පසුගිය කාලය තුළ ලංකාවේ සමාජයේ ආර්ථික අර්බුදය විසින් විශාල සිවිල් ආරාවුල් ප්‍රමාණයක් ඇති කරලා තිබෙනවා. ණයගැතිභාවය ඉහළ දාලා තිබෙනවා. ඒ වාගේම ජනතාව තුළ අවිනිශ්චිතතාවක් ඇති කරලා තිබෙනවා. පසුගිය අවුරුදු දෙක තුන ඇතුළත කොවිඩ් අර්බුදයේ සිටම ගත්තොත්, සිවිල් ආරාවුල් ප්‍රමාණය ඉහළ ගිහින් තිබෙනවා. එතකොට පවුල් ආරාවුල් වැඩි වෙලා තිබෙනවා. මේවා සම්බන්ධව සමථ මණ්ඩල විසින් විශාල කාර්යභාරයක් ඉෂ්ට කරනවා. ඒ නිසා සමථ මණ්ඩල සඳහා කරන වියදම 2025 අය වැය තුළ සියයට 118කින් වැඩි කරලා තිබෙනවා. ඒ කියන්නේ ඩබල් කරලා තිබෙනවා. ඩබල් කරලා, ඊටත් වඩා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම විශේෂ මූල්‍ය සමථ මණ්ඩල පිහිටුවීමට කටයුතු කරලා තිබෙනවා. මම හිතන විධියට ඒක ඉතාම වැදගත් තීරණයක්. මූල්‍ය ආරාවුල් සම්බන්ධයෙන් වන විශේෂ සමථ මණ්ඩල පිහිටුවන්නට ගරු ඇමතිතුමාගේ ප්‍රතිපත්තිමය තීරණයක් මත කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව කොළඹ, ගම්පහ, මහනුවර, මොනරාගල, පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල විශේෂ මූල්‍ය සමථ මණ්ඩල පිහිටුවීමට කටයුතු කර තිබෙනවා. අපි දන්නවා, මේ ප්‍රදේශ ණයගැතිභාවය නිසා ඉතාම පීඩා විඳින, මූල්‍ය ආරාවුල් නිසා පීඩා විඳින ජනතාව ජීවත් වන ප්‍රදේශ බව. එවැනි බොහොමයක් ප්‍රදේශ මේකට ඇතුළත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සමථ මණ්ඩල පිහිටුවීම ඉතාම වැදගත්. මේවා පුළුල් කරන්න පුළුවන් නම්, සමථ මණ්ඩලවල සේවාව තවත් පුළුල් කරන්න පුළුවන් නම්, එය ඊටත් වඩා වැදගත් කියලා මම හිතනවා.

Winding up, Sir, I want to say that - අපේ රටේ තවත් ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඉදිරි අය වැය තුළින් සහ රජයේ

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

කටයුතුවලින් address කරන්න ඕනෑ කාරණයක් තමයි silent epidemic එකක් හැටියට තිබෙන crimes against women and children. This has become a silent epidemic in the country. මේකට අධිකරණ පද්ධතිය -justice system- තුළ නිසි උත්තරයක් ලබාදිය යුතුයි. මොකද, නීතිඥවරයන් හැටියට කටයුතු කරද්දී, අපි බොහොම පැහැදිලිව දන්නා දෙයක් තමයි, ගෘහස්ථ හිංසනයට ලක්වන කාන්තාවන් සඳහා අපේ නීතිය තුළ බොහොම හොඳ ප්‍රතිපාදන තිබෙන බව. නීතිය තිබෙනවා. නමුත් මේ නීතිය ශක්තිමත්ව ක්‍රියාත්මක වීමේදී බලපෑම්සහගත ක්‍රියාත්මකවීමේ යම් යම් අඩුපාඩු අධිකරණ පද්ධතිය තුළ සහ නීති පද්ධතිය තුළ තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Ms.) Lakmali Hemachandra, your time is up now.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Okay, Sir. I will wind up.

ඒක නිසා මේ domestic violence, කාන්තාවන් සහ ළමුන් සම්බන්ධයෙන් වන අපරාධ - crimes against women and children - ගැන කටයුතු කිරීමට ලංකාවේ අධිකරණ පද්ධතිය සහ නීතිය පසිඳලන කටයුත්ත මීට වඩා කාර්යක්ෂම සහ සංවේදීව කරන්නට ඕනෑ කියලා මම යෝජනා කරනවා. ඉදිරියේදී අපි ඒ සඳහා මුදල් වෙන් කිරීමටත් අවශ්‍යයි කියන යෝජනාව කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමනි, මට කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Hector Appuhamy. You have 13 minutes.

[අ.භා. 5.51]

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ස්තුතියි, ගරු සභාපතිතුමනි.

විශේෂයෙන්ම අද ඉතාම සංවේදී අමාත්‍යාංශයක වැය ශීර්ෂය පිළිබඳවයි අපි විවාද කරන්නේ. එනම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි අද විවාද කරන්නේ. මේ අමාත්‍යාංශයේ ඇමතිතුමා හොඳ දක්ෂ පුද්ගලයෙක්. ඒ නිසා ඇමතිතුමාට මොනවත් කියන්න බැහැ, කිව්වොත් අපේ මන්ත්‍රීතුමියන්ට තරහ යනවා. එතකොට තව මොනවා හරි මටත් කියයි.

කථාව ආරම්භ කරන්න පෙර කියන්න ඕනෑ, මම එදා අය වැය දෙවැනි වර කියැවීමට ඡන්දය දෙන්න ආවේ නැහැ කියලා. මොකද, මම ටැන්සානියාවේ විශේෂ වැඩමුළුවකට සහභාගි වුණා. අප්‍රිකානු රටවල් 16ක පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ අමාත්‍යවරු ඒ වැඩමුළුවට සම්බන්ධ වුණා. විශේෂයෙන්ම ටැන්සානියා පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමියගේ ප්‍රධානත්වයෙන් තමයි එය පැවැත්වුණේ. එතැනදී විශේෂයෙන්ම ඔබතුමාගේ අමාත්‍යාංශයට සම්බන්ධ බොහෝ දේවල් ගැන කථා කළා. ඒවා අපට වඩා ගොඩක් වෙනස්. ඒ වෙනස්වීම ගැන කථා කරන්න ඕනෑ.

ඊට පෙර මම හිතුවා, ඊයේ ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කරපු ප්‍රකාශය ගැන වචනයක් කියන්න ඕනෑ කියලා. සාමාන්‍යයෙන් අපේ ගම්වල සිද්ධ වෙන දෙයක් තමයි රාත්‍රියට මීනී පිට්ටනි ළඟින් යනකොට කෑ ගහලා, කුණුහරුප කියාගෙන යන එක. මොකද, මීනී පිට්ටනි ළඟින් යන්න බයයි. ඉතින් ජනාධිපතිතුමාගේ කථාවේදී අපි දැක්කේ, එතුමා කවුරු හරි බය කරලා තිබෙනවා වාගෙයි, කවුරු හරි කුමන්ත්‍රණයක් කරලා මේ ආණ්ඩුව උදුරා ගන්න යනවා කියලා. අපි කාගේවත් ළඟ කුමන්ත්‍රණයක් නැහැ. අපි කාටවත් ආණ්ඩුව උදුරා ගන්න අවශ්‍ය නැහැ. හැබැයි, බුදුහාමුදුරුවෝ දේශනා කරලා තිබෙනවා, ලෝකයේ සියලු දේ අනිත්‍යයි කියලා. ඔයගොල්ලන්ගේ කාල්මාක්ස් මහත්තයාත් කියලා තිබෙනවා, ලෝකයේ සියලු දේ අනිත්‍යයි කියලා. ඒ නිසා මේක බදාගෙන ඉන්න සූදානම් වෙන්න එපා. මේක බදාගෙන හිටියත් ඊට පස්සේ අතහැරලා යන්න වෙනවා. ඒ නිසා තාවකාලික භාරකරු වෙන්න. බය වෙන්න එපා, අපි කවුරුවත් එහෙම කුමන්ත්‍රණ කරන අය නොවෙයි. කාටවත් වෙඩි තියන, තුවක්කු ගන්න, ගෙවල් ගිනි තියන කණ්ඩායමක් අපේ ළඟ නැහැ. එහෙම කණ්ඩායමක් නැති නිසා ඒ ගැන හිතන්න එපා කියලා මතක් කරන්න කැමැතියි.

මගේ කථාව පටන් ගනිද්දීම මේ කාරණය මම කියන්න ඕනෑ. මන්ත්‍රීවරයෙක් හොරට විභාගය ලිව්වා කියලා ඔබතුමන්ලා හැම දාම නීති විද්‍යාලය ගැන කථා කළා. මම ගරු අමාත්‍යතුමාට යෝජනාවක් කරනවා. මම හිතන විධියට මේක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණාවක්. නීති විද්‍යාලයේ විදුහල්පතිතුමා පත් කිරීම ගැන whatnews.lk එකේ යම්කිසි කාරණාවක් සඳහන් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව හැටියට, ඔබතුමන්ලා කරන ක්‍රියාකාරකම්වල හැටියට ඔබතුමන්ලා කියන්නේ හැම දේම හරි විධියට කරනවා නම්, ඔබතුමා whatnews.lk එකේ සඳහන් කරලා තිබෙන මේ කාරණාව සම්බන්ධව හරියට හොයලා බලලා ඒ වෙනුවෙන් මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගනීවි කියලා මම විශ්වාස කරනවා.

සියලුදෙනාම අධිකරණය ගැන කථා කරනවා මම දැක්කා. අපට අධිකරණය ගැන කථා කරනවාට වඩා සිර කඳවුරු, හිර ගෙවල් ගැන කථා කරන්න තිබෙනවා. හැබැයි මේ රටේ කිසිම කෙනෙකුට එකපාර දඬුවම් දෙකක් දෙන්න බැහැ. හැබැයි අපි "සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" කියලා බෝඩ් එකේ ගහලා දඬුවම් එකක් නොවෙයි දෙක, තුනක් දෙනවා. ගරු අමාත්‍යතුමනි, මෙතැනදි විශේෂයෙන්ම මම මතක් කරන්න හදන්නේ මේ රටේ දරුවන් සහ කාන්තාවන් සම්බන්ධයෙන්. මම හිරුණිකා ප්‍රේමචන්ද්‍ර බලන්න වැලිකඩ බන්ධනාගාරයට ගියා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The House resumes.

ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.
அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.
Accordingly, Parliament resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Does the House agree to extend the time to complete the Business of the House today?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී -
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பட்டது. -
[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee. -
[THE HON. DEPUTY SPEAKER in the Chair.]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Hector Appuhamy, please continue.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, වෙලාව ගත්ත නිසා මට ටිකක් වැඩියෙන් වෙලාව දෙයි කියලා මම හිතනවා.

ඒ ගිය වෙලාවේදී මම දැක්කා, බන්ධනාගාරයට එහා පැත්තේ පාරේ ඉඳලා දවස ගානේ ගල්වල බැඳලා කුඩු පැකට් ඇතුළට විසි කරනවා. එක අවස්ථාවක එහෙම විසි කරද්දි ඇතුළේ සිටි කෙනෙකුගේ ඔළුවට ගලක් වැදිලා ඔළුවත් පැලුණා කියලා නිලධාරියෙක් අපට කිව්වා. ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. අපි බොහෝ වෙලාවට සිද්ධියක් වුණාට පස්සේ තමයි සියලු කටයුතු කරන්නේ. අපේ රටේ සියල්ල සිද්ධ වෙන්නේ ඒ විධියට. පරිපාලන සේවයේ විතරක් නොවෙයි, ගෙවල්වලත් එහෙමයි. ප්‍රශ්නයක් වුණාට පස්සේ තමයි ප්‍රශ්නයට විසඳුම් හොයන්නේ. ඒ නිසා සෑම ග්‍රාම නිලධාරි වසමකම වැරදි කරලා නීතියෙන් දඬුවම් විඳින සහ නීතියේ සැකකරුවන් හැටියට ඉන්න අය ගැන හොඳ සමීක්ෂණයක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒකට මුදල් වෙන් කරගන්න. විශේෂයෙන්ම මේ රටේ දරුවන් සහ කාන්තාවන් වෙනුවෙන් මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. එසේ මුදල් වෙන් කරලා කරුණු හොයලා, ඒ ගොල්ලෝ වැරදි කරලා තිබෙන්නේ කොයි විධියටද, ඒ කාරණා ආර්ථිකයට බලපාන කාරණාද, සමාජයට බලපාන කාරණාද, පවුලට බලපාන කාරණාද, ඒ අධ්‍යාපන කාරණාද, හැදියාව සම්බන්ධයෙන් බලපාන කාරණාද කියන දේවල් සම්බන්ධයෙන් යම්කිසි අදහසකට එන්න. විශේෂයෙන්ම ඒ පිළිබඳ සමීක්ෂණයක් කරලා, වාර්තාවක් සකස් කරලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා. මේ රටේ තීන්දු-තීරණ ගන්න ඒක ඉතා වැදගත් වෙයි. නීතිය සම්බන්ධයෙන්, අධිකරණය සම්බන්ධයෙන්, හිර ගෙවල් සම්බන්ධයෙන් විතරක් නොවෙයි, ආර්ථිකය ගොඩනහන්නත් ඒක විශේෂයෙන් ප්‍රයෝජන වෙයි.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගැනෙන අවස්ථාවේ අපි කාන්තාවන් ගැන කථා කරන්නම්. ඔබතුමන්ලා කාන්තාවන් ශක්තිමත් කරන්න, ඒ ගොල්ලන්ගේ ආදායම් තත්ත්වය වැඩි කරන්න අවශ්‍ය වැඩසටහනට මුදල් වෙන් කරලා නැහැ. හිර ගෙදරට යන කාන්තාවන්ට සමහර වෙලාවට මේක විශේෂ බලපෑමක් වෙනවා. මත්ද්‍රව්‍ය ප්‍රශ්නය ගත්තාම, අද බොහෝ වෙලාවට ඒවාට කාන්තාවනුත් සම්බන්ධ කරගෙන තිබෙනවා; දරුවනුත් සම්බන්ධ කරගෙන තිබෙනවා.

හැබැයි, මතක තබාගන්න, අධිකරණයේ විත්ති කූඩුව ඇතුළේ සිටි පුද්ගලයෙක් ඝාතනය කළ මේ රටේ පාතාලයට විරුද්ධව ඔබතුමන්ලාට හරියට නැඟී සිටින්න බැරි වුණා. ඔබතුමන්ලා ඒකෙන් අසමත් වුණා. ඒ විතරක් නොවෙයි. අධිකරණයේදී ඒ එල්ල කරපු තුවක්කුව බැරි වෙලාවත් අනෙක් පැත්තට හරවලා විනිසුරුවරියටත් එල්ල කළා නම් අද ඇති වන තත්ත්වය මොකක්ද? අද මොකක්ද මේ රටට වෙන්නේ? එතකොට ලෝකය මේ රට ගැන මොනවාද හිතන්නේ? මේ රටට එයිද කවුරුවත්? ඊට පස්සේ මේ රටේ මිනිස්සු කොයි විධියට හැසිරෙයිද? මතක තබාගන්න, මේ රටේ වගකීමසහගත, ඉතා භාරදූර රාජකාරියක් කරන්නේ විනිසුරුවරියන්, විනිසුරුවරුන් බව. ඒ විතරක් නොවෙයි. ඒ ඒ අධිකරණවල කටයුතු කරන අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සියලුදෙනා මේ වන විට බරපතළ ප්‍රශ්නයක ඉන්නේ. හිතන්න එපා, මේක පොලිස් නිලධාරීන්ට සහ ආරක්ෂක අංශයේ අනෙකුත් අයට විතරක් බලපානවා කියලා. ඒ නිසා මෙවැනි දේවල් ගැන හරියට වගකීමෙන් තීන්දු-තීරණ ගන්න ඕනෑ. අපි දන්නවා, අපේ රටේ වගකීමෙන් තීන්දු-තීරණ ගන්න, හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන අය වැඩි බව. ඒ අයට ආරක්ෂාව සැපයීම රටේ ආණ්ඩුවේ වගකීමක්.

ඒ වගකීම නිවැරදිව ඉෂ්ට කරන්න. ඔබතුමන්ලා පළමුවෙනි එකෙන් අසමත් වුණා. තව කීයකින් අසමත් වෙයිද දන්නේ නැහැ. අද දවස ගානේ මිනිස්සු කපලා මරනවා, පොල්ලෙන් ගහලා මරනවා, වෙඩි තියලා මරනවා. මේ දේවල් කියන්න-කියන්න තව තව ඇවිල්ලා වෙඩි තියලා මරනවා. හැබැයි, එදා උසාවියේදී පුද්ගලයෙක් ඝාතනය කිරීමට ආධාර අනුබල දුන් ගැහැනු කෙනා තවම අල්ලා ගන්න බැරි වුණා. ඒ නිසා මේ ගැන අපි මොන කතන්දර කිව්වත් වැඩක් නැහැ. මොකද, අපි යම් විධියක වැඩ පිළිවෙළක් ඔබතුමන්ලාගෙන් දකින්නේ නැහැ.

මම ටැන්සානියාවේ ඉන්නකොට හවස් වරුවේ ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ කළ කථා Facebook හරහා බැලුවා. ඒ රටේ ඉන්න බොහෝදෙනෙක් එක්ක එදා අපි කථා කළේ ඒ රටවල තරුණ ජීවිත ආරක්ෂා කර ගන්නේ කොහොමද, දරුවෝ ආරක්ෂා කර ගන්නේ කොහොමද, කාන්තාවෝ ආරක්ෂා කරන්නේ කොහොමද කියලායි. ඒ රටවල අය තමන්ගේ අය ගැන කැක්කුමෙන් කථා කරනකොට, එදා හවසම අපේ පාර්ලිමේන්තුවේ විකාශනය වන දේවල් බලනකොට මම දැක්කේ, තමුන්නාන්සේලා කාගේ හෝ කුණු ටිකක් එකතු කරලා list එකක් දාන, එහෙම නැත්නම් කාට හෝ බණින, කාට හෝ අපහාස කරන ආකාරය. තමුන්නාන්සේලා මේ අය වැය විවාදයෙන් පස්සේ හැන්සාඩ් වාර්තා අරගෙන බලන්න, මොනවාද කථා කරලා තිබෙන්නේ කියලා. තමුන්නාන්සේලා කථා කරපු ඒවායෙන් සියයට 80ක් තිබෙන්නේ කාට හෝ බණින එක, එක්කෝ කාට හෝ මඩ ගහන එක, එහෙම නැත්නම් ලැයිස්තු ඉදිරිපත් කරන එක. තමුන්නාන්සේලාට ලැයිස්තු ඉදිරිපත් කරන්න තිබෙන්නේ මේ අය වැය වෙනුවෙන්.

අධිකරණය සම්බන්ධයෙන් අපට බරපතළ ප්‍රශ්න තිබෙනවා, අඩු පාඩු සම්බන්ධව, ආයතනයක් වශයෙන්. ඒ විතරක් නොවෙයි. සිර කඳවුරු පිළිබඳවත් අපට ප්‍රශ්න තිබෙනවා. ඉතාලිය ගත්තාම, ඒ රටේ සිරකරුවෝ වර්ග කිහිපයකට නම් කර තිබෙනවා. ඒ එක වර්ගයක් රිමාන්ඩ් භාරයේ ඉන්න අය වෙන්න පුළුවන්. ඒ අයට ආණ්ඩුව වියදම් කරන්නේ නැතිව GPS හරහා belt එකක් සවි කරලා -ඒ belt එකට කියන්නේ "ඉන්ටොලෙන්තො" කියලා- ඒ පුද්ගලයා ගෙදර තියනවා. ආණ්ඩුවෙන් ශත පහක් වියදම් කරන්නේ නැහැ. වියදම් කරන්නේ කවුද? ඒ පුද්ගලයා. වැරැද්දක් කළා; ඒ පුද්ගලයා සැකකරුවෙක්. ඒ පුද්ගලයා ගෙදර ඉඳගෙන සියලු වියදම් දරා ගන්නවා. ගෙදර විතරයි ඉන්නේ. එළියට යන්න බැහැ. එළියට ගියොත් GPS හරහා ළඟම පොලීසිය ඒ සම්බන්ධව දැනුවත් වෙලා, ඒ වෙලාවේම ඇවිල්ලා පොලීසියෙන් ඔහු අල්ලා ගන්නවා. එතකොට ඔහුගේ දඬුවම වෙනස් කරනවා. එතැනදී ශත පහක්වත් රජයට වැය වෙන්නේ නැහැ. ඒ අයට කන්න අඳින්න

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

දෙන්න අවශ්‍ය නැහැ, බෙහෙත් හේත් දෙන්න අවශ්‍ය නැහැ, වතුර දෙන්න අවශ්‍ය නැහැ, විදුලිය දෙන්න අවශ්‍ය නැහැ. ඒ කිසිම දෙයකට වියදමක් නැහැ. ඒගොල්ලන් ඒ ක්‍රම දියුණු කර තිබෙනවා.

ඒ නිසා තමුන්නාන්සේලාත් යෝජනා කරන්න ඕනෑ, අපේ තිබෙන ක්‍රම දියුණු කරන්නයි. හිර ගෙදර toilet එකක් හදන්න, හිර ගෙදර තවත් විශාල කරලා හදන්න මේවාට තමයි ඔබතුමන්ලා සල්ලි වියදම් කරන්නේ. කොළඹ අධිකරණ සංකීර්ණයට ගියාම බලන්න කෝ, ඒ buildings මොන වාගේද කියලා. කොළඹ තිබෙන පෙට්ටි කඩ වාගේම නේ. එතැන සෙනඟ පිරිලා ඉන්නවා. අඩු ගානේ එතැන නඩු ටිකවත් අහන්න පුළුවන් විධියට සකස් කරලා, ඒ අයට අවශ්‍ය පහසුකම් සපයන්න යම් කිසි ක්‍රමයක් හදන්න ඕනෑ. විනිසුරුතුමා නඩු අහන තැනට නීතිඥ මහත්වරුන් එකතු වුණාම වෙන කාටවත් එතැන ඉන්නවත් ඉඩක් නැහැ. සමහර බිත්ති දිහා බැලුවාම, ඒවා ගරා වැටිලා, toilets ගරා වැටිලා. ඒ තැන් එහෙම තියන්න අවශ්‍ය නැහැ.

ඒ විතරක් නොවෙයි. මම ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් හදන වැඩසටහන් ගැන. අපි දන්නවා, අවුරුදු 5ට අඩු දරුවන් අම්මලාත් එක්ක හිර ගෙවල්වල ඉන්න බව.

හැබැයි, අපට ඕනෑ නම් ඒ අය වෙනත් තැනක රඳවා තැබිය හැකි වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්. ඒ සඳහා ඕනෑ තරම් donorsලා හොයා ගන්නත් පුළුවන්. ඒ සඳහා ආණ්ඩුවේ සල්ලි වියදම් කරන්න අවශ්‍ය නැහැ. ලෝකයේ ඕනෑ තරම් ආයතන තිබෙනවා, ඒ වාගේ දේවල්වලට උදව් කරන. එහෙම වැඩසටහන් හදන්න. හදලා කාන්තා පරපුරයි, ළමා පරපුරයි හරි මහට ගන්න. මොකද, අර ළමයා අවුරුදු 5ක් යනකල් දකින්නේ, අර හිර ගේ අස්සේ හිර වෙලා ඉන්න වැරදි කරපු කණ්ඩායම්. ඒ ළමයා ඒ කණ්ඩායම්වල ආභාසය තමයි ලබන්නේ. එතකොට ඒ ළමයා එළියට ගිහිල්ලා මොකක්ද කරන්නේ? මොනවාද ඒ ළමයා ලෝකය ගැන දකින්නේ? ඒ ළමයා ලෝකය දකින්නේත්, හිර ගෙදර ඇතුළේ තිබෙන තත්ත්වයත් එක්ක සංසන්දනය කරලායි. එතකොට අපි එතැනින් බිහි කරන්නේ කවුද? අම්මා වැරැද්දක් කළාට, ඒ දරුවාත් මේ රටේ වැරදිකරුවෙකු හැටියට නිර්මාණය කරන්නේ අපිමයි.

එහෙම නම් මේ ආණ්ඩුවෙන් කළ යුත්තේ, ඒ තත්ත්වය වෙනස් කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. දරුවන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම නවත්වන්න වැඩ පිළිවෙළක් හදන්න. ඒක කරන්න, තමුන්නාන්සේලා දේශපාලනය කරන්න ගම්වල සංවිධාන ටික හැදුවා වාගේ. අන්න ඒ සංවිධාන සහ අපි ඔක්කෝම එකට වාඩි කරන්න කෝ, මේ මත් ද්‍රව්‍ය උවදුර වළක්වන වැඩසහන වෙනුවෙන්. කණ්ඩායමක් විධියට අපි ඔක්කෝම එකට වාඩි වෙලා මේ උවදුර ඉවර කරමු. ඇයි, ඒක ඉවර කරන්න බැරි? තමුන්නාන්සේලා අපිත් එක්ක මරාගන්න අවශ්‍ය නැහැ. තමුන්නාන්සේලා අපට යෝජනා ඉදිරිපත් කරන්න. මේ වාගේ දේවල් මේ යෝජනාවල නැති වුණාට, කොළයක ලියලා නැති වුණාට, එවැනි වැඩසටහනක් හදලා අපට ඒවා යෝජනා කරන්න. අපි සූදානම් ඒකට උදව් කරන්න. අපට අවශ්‍ය කරන්නේත් මේ රට හදන්න; මේ රටේ ජනතාව හදන්න.

සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ රටේ විපක්ෂ නායක හැටියට මෙතැන වාඩිවෙලා මේ හැම විෂයයක් ගැනම කරන අධ්‍යයනය ඔබතුමන්ලා සැහැල්ලුවට හිතන්න එපා. අපි කාටවත් ඒ අධ්‍යයනය කරන්න බැහැ. එතුමා හැම විෂයයක්ම ඉතාම හොඳින් අධ්‍යයනය කරනවා. යම් දෙයක් පටන් ගත්තේ කොතැනින්ද, ඒකේ වැරදි තැන් මොනවාද, ඒවා නිවැරදි කළ යුත්තේ කොයි ආකාරයෙන්ද, අනාගත සැලසුම් හදන්න ඕනෑ කොයි විධියටද, ඒ ආරම්භය කොතැනද, ඒවා වෙනස් කළ යුතුද, නැද්ද, තියාගත යුතුද, එහෙම නැත්නම් අලුතින් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුද යනාදී වශයෙන් එතුමා සියලු කරුණු-කාරණා එකින් එක පෙළ ගස්වනවා. අපටත් හැම තිස්සේම ඇඟිල්ල දික් කරලා කියන්නේ, රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරන්න සූදානම් වෙයල්ලා කියලායි. අපි යන්නේ ඒ ගමන් මඟේ. අපි ඉන්නේ මේ රට හදන්න. අපි ඉන්නේ තමුන්නාන්සේලා විනාශ කරලා මේ ආණ්ඩුව අරගන්න නොවෙයි; කුමන්ත්‍රණ කරලා මේ ආණ්ඩුව උදුරා ගන්න නොවෙයි; තමුන්නාන්සේලාට මඩ ගහන්න නොවෙයි. කියනවා නම්, අපට තොරුතුරු ගොඩක් ඇවිල්ලා තිබෙනවා. හැබැයි අපි එහෙම පිස්සු විධියට වැඩ කරන්න සූදානම් නැහැ.

මන්ත්‍රීවරු 159ක් පත්කරලා තමුන්නාන්සේලාට බලය දීලා ඉවරයි. ඒ බලය පාවිච්චි කරලා අවශ්‍ය වැඩසටහන් ටික කරන්න. ඒ කරද්දී අපි යෝජනා කරන දේවල්වලට තරහ ගියත් ඒක හිතේ තියාගෙන, වෙනම දෙයක් කරන්න. ඒකට බැණලා වැඩක් නැහැ. ඒකට බැන්නා කියලා ලැබෙන දෙයක් නැහැ. ඒ නිසා රට හදන්න නම් නිහතමානීව, ඉතාම හොඳින් සැලසුම් සහගතව හිතන්න. අපි ඉදිරි කාලයේදී අනෙක් විෂයයන් පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්නම්. පැහැදිලිවම අපට පෙනෙනවා, තමුන්නාන්සේලා බොහෝ වෙලාවට වැරදි නිලධාරීන් ළඟ තියාගෙන, වැරදිවලට ඇහුම්කන් දීගෙන, ඒක හොඳයි කියන වැඩසටහන් ගොඩක් කරන බව. ඒවා අපි තමුන්නාන්සේලාට පෙන්වා දෙන්නම්, නිවැරදි කර ගන්න. ඒවා නිවැරදි කර ගත්තේ නැත්නම්, තමුන්නාන්සේලාට කිසිසේත්ම ඉස්සරහට යන්න බැහැ. ඒකයි තමුන්නාන්සේලාට එන බලපෑම. ඒක අපේ කුමන්ත්‍රණයක් නොවෙයි.

ඔබතුමන්ලා තෙල් ගැන කිව්වාට Facebook එකේ මේ වෙලාවේ ඒගොල්ලන්ගේ මාධ්‍ය සාකච්ඡා ටික සම්පූර්ණයෙන් යනවා, ෂෙඩ් තිබෙන අය එක්කෙනෙක්වත් අද රාත්‍රියේ ඉඳලා තෙල් ඇණවුම් කරන්නේ නැහැ කියලා. *[බාධා කිරීමක්]* ඒ ගැන මම සන්තෝෂ වෙනවා නොවෙයි. මම කියන්නේ, අඩු ගණනේ එහෙම නම් ඒක නවත්වන්න කියලායි. මොකද, ඒක ඉතාම භයානකයි. ඒ ගැන හිතන්න. ඒක භයානකයි. එහෙම නම් ඒක නවත්වන. ඒක නවත්වන්න වැඩසටහනක් කරන්න. මොකද, ඒක තමයි ජනතාව බලන්නේ. දැන් මම එද්දීත් පෝලිමේ ඉඳලා තමයි මගේ වාහනේටත් තෙල් ගහගෙන ආවේ, නිකම් නොවෙයි. හැබැයි වාහන හතරයි පහයි පෝලිමේ තිබුණේ. ගොඩක් තිබුණේ නැහැ. ඒකත් කියන්න ඕනෑ. ඔබතුමන්ලා හැප්පෙන්න යන්න එපා. අපිත් එක්ක නොවෙයි හැප්පෙන්න වෙන්නේ. ඔබතුමන්ලාට හැප්පෙන්න වෙන්නේ, මේ රටේ ඔබතුමන්ලාට ඡන්දය දුන් ජනතාව සහ නිලධාරී මහත්වරුන් එක්ක බව අවසාන වශයෙන් මතක් කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 6.07]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු සභාපතිතුමනි, මම ඉස්සර වෙලාම අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එහි ලේකම්තුමිය ඇතුළු සියලු දෙපාර්තමේන්තු සහ ආයතනවල

ප්‍රධානින් සහ කාර්ය මණ්ඩලයේ සියලුදෙනා ඉතාම කැපවීමෙන් සති ගණනාවක් වැඩ කළා, අද මේ අය වැය විවාදයට අවශ්‍ය කරුණු එකතු කරන්න; ඒවා අපට ලබා දෙන්න. ඒ කැපවීම වෙනුවෙන් නැවත වතාවක් ලේකම්තුමිය ඇතුළු සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම අද මෙම විවාදය පැවැත්වෙන අවස්ථාවේ මම දැකපු වැදගත් දෙයක් තිබුණා. ඒ තමයි, අපේ අධිකරණ පද්ධතිය ගොඩනඟන්න, නඩු පමාව අවම කරන්න විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු ඉතා වැදගත් හා සාධනීය අදහස්, යෝජනා ගොඩක් ඉදිරිපත් කළා. මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ නීති සෑදීමේ කාර්යයේදී, රටේ අධිකරණ පද්ධතිය පිරිසිදු කරගෙන හරියට ක්‍රියාත්මක කරගෙන යනකොට අපට පක්ෂ විපක්ෂ භේදයක් තිබෙන්නට බැහැ. උතුර, දකුණ එහෙම නැත්නම් යූඑන්පී, ශ්‍රී ලංකා කියලා වෙනස් වෙන්න බැහැ නේ. යුක්තිය අපි හැමෝටම අවශ්‍යයි. මන්ත්‍රීවරු එක්කෙනෙක්, දෙදෙනෙක් හැරෙන්න අනෙක් සියලුදෙනාම සාධනීය ලෙස කරුණු දක්වමින් මෙම විවාදයට සම්බන්ධ වුණා. ඒ ගැන මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. තව සමහරු ඉතා ද්වේෂසහගතව කථා කළා. සමහරු කථා කරනකොට සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාට අධිකරණ ඇමති කියලා කථා කළා. ඒ කියන්නේ, අධිකරණ ඇමතිවරයා කවුද කියලා හඳුනා ගන්න බැරි අය, අය වැය විවාදයේදී අධිකරණය ගැන කථා කළේ කොහොමද කියන එක නම් මට ගැටලුවක්. නමුත්, එහෙමත් වුණා. ඒ කෙසේවෙතත්, මට ඒ සියලු ප්‍රශ්නවලට උත්තර දෙන්න වේලාව නැති නිසා, පොදු තේමා කිහිපයකට උත්තර දෙන්න යොමු වෙන්නම්.

ඊළඟට, අධිකරණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා පෙර පාර්ලිමේන්තුවේ හිටපු අධිකරණ ඇමතිවරයෙක් මේ රටේ අධිකරණවලින් තමන්ට අවශ්‍ය නඩු තීන්දු ගන්න බැරි වුණාම එක් අවස්ථාවක පාර්ලිමේන්තුවේදී විනිශ්චකාරවරුන් විවේචනය කළේ කොහොමද කියලා. ඒ වාගේම මට තව කාරණයක් මතක් වෙනවා. මම මේ වෙලාවේ ඒකත් කියන්න ඕනෑ. ඒ තමයි, හිටපු ජනාධිපතිවරයාගේ නිවසට පහර දෙන්න කණ්ඩායමක් ආවා කියලා අසාධාරණ ලෙස, නීති විරෝධී ලෙස පුද්ගලයන් පනස් ගණනක් අත් අඩංගුවට අරගෙන නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ වෙලාවේ එවකට හිටපු මහෙස්ත්‍රාත්වරයා ක්‍රියා කරපු ආකාරය. හෘදය සාක්ෂියක් සහිතව සැබෑ අධිකරණමය මනසකින් ඒ දිහා බලලා මුල් අවස්ථාවේදීම ඇප ලබා දීමට එතුමා කටයුතු කළා. ඒ තමයි අධිකරණයේ ස්වාධීනත්වය. හැබැයි, ඊට පසුව අපි දැක්කා ඒ පාර්ශ්වවල අය ඒ විනිශ්චයකාරවරුන්ට සැලකුවේ කොහොමද කියලා. අසත්‍ය චෝදනා ගෙනැල්ලා පාර්ලිමේන්තුව ඇතුළේ අධිකරණයේ කාර්යභාරය විවේචනය කළා; පළිගැනීම් කළා. හැබැයි, අද තත්ත්වය මොකක්ද? අද ජාතික ජන බලවේගය මේ රටේ ස්වාධීන, අපක්ෂපාතී අධිකරණ පද්ධතියක්, අධිකරණ ක්‍රියාවලියක් නිර්මාණය කිරීම වෙනුවෙන් වැඩ කරමින් ඉන්නවා. එම නිසා මා හිතන්නේ මේ කාලයේ තරම් මේ රටේ අධිකරණය පිළිබඳ විශ්වාසයක් ජනතාවට ඇති වෙච්ච කාලයක් මීට පෙර තිබිලා නැහැ කියලා. මෙවැනි අවස්ථාවකයි මේ සභාව කල්තැබීමේ යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ.

මේ යෝජනාවේ තිබෙන කාරණාවල සත්‍යභාවය කෙසේ වෙතත්, මේ කරුණු සම්බන්ධයෙන් අපි මේ වන විටත් අවධානය යොමු කරලා තිබෙනවා. ඒවා වෙනුවෙන් ගත යුතු ක්‍රියා මාර්ග මොනවා ද කියන එක සාකච්ඡා කරලා තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් ඉන්න අවස්ථාවක, ඒ සඳහා තවත් විශේෂ කාරක සභාවක් අවශ්‍ය නැහැ කියන එක තමයි මා විශ්වාස කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Harshana Nanayakkara. You have seven minutes.

[අ.භා. 6.40]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
Thank you, Sir.

ගරු නිසාම් කාරියප්පර් මැතිතුමනි, as for the content of your intention, yes, I applaud. That is very true. අපි කාටත් අවශ්‍යයි, නඩු ඉක්මනින් ඉවර කරන්න. මිනිසුන්ට හොඳ customer service එකක් අධිකරණවලින් ලැබෙනවා නම් අපි කැමැතියි. It is not to have a case right along, dragging through your life, hanging over you like a sword of Damocles and you do not know what to do with your life. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඔබතුමා යෝජනා කළා, මේ සඳහා jury trials තිබුණු ආකාරය. What you and I both know is that if you opt for a jury trial, even today, it will be finished in five days. But nobody opts for jury trials. - *[Interruption.]* Yes, true. අපි එතැනටත් එමු. මම මේ නිකම් කථාවට මේ කථාව කියන්නේ. අපි හරකෙක් කරත්තෙට බැඳලා, ඌ කරත්තේ අදින්නේ නැත්නම් ඌට ගහන්න කලින් අපි බලන්න ඕනෑ අපි ඌට කන්න දීලා තිබෙනවා ද කියලා. Because when an animal is starving, it is not going to pull the cart.

නඩු දමන හැටි අපි ගරු නීතිපතිවරයාට කියා දෙන්න ඕනෑ නැහැ. ඒක අවුරුදු 100කට, 200කට ආසන්න පරණ ආයතනයක්. But they are overloaded with work. ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනයේ පුරප්පාඩු 606ක් තිබෙනවා. නීති නිලධාරීන්ම 250දෙනෙක් නැහැ. Criminal side එකේ prosecute කරන්න,- You know the amount of work they do. I will read out just a little list of things. I mean, you and I both did these things. - *[Interruption.]* Of course! Now, if you take the challenges, the Attorney General's Department functions with half cadre vacancies despite all difficulties. So, we must respect them.

නීතිපතිවරයා කෙරෙහි, අධිකරණය කෙරෙහි විශ්වාසය නැති වෙන්න හේතුව තමයි, මේ දේශපාලන ඇඟිලි ගැසීම්. අපේ නීතිඥ සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා කිව්වා වාගේ තමන්ට අවශ්‍ය විධියට තීන්දු ගන්න බැරි වෙච්ච අධිකරණ ඇමතිවරු මෙතැනට ඇවිල්ලා නඩුකාරතුමන්ලා හම ගහපුවාම, රටේ ජනතාව අධිකරණය විශ්වාස කරන්නේ නැහැ. මේ මෑතකදී සමාජ මාධ්‍ය හරහා, මුහුණු පොතේ යම් කථාවක් ගියා. තමන් වෙනුවෙන් මාධ්‍ය ප්‍රකාශයක් කරන්න නීතිපතිට බැහැ. එතුමා මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරන්නේ නැහැ. පසුගිය කාලයේ එතුමා සම්බන්ධයෙන් කොච්චර අසත්‍ය තොරතුරු ප්‍රකාශ කළාද? තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන්, අධිකරණය සම්බන්ධයෙන්, නීතිපතිවරයා සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු ප්‍රකාශ කරමින් දශක ගණනාවක් තිස්සේ ඒවාට ගහන්න ගන්නකොට, මේ ආයතන කෙරෙහි තිබෙන විශ්වාසය නැති වෙනවා.

So, Hon. Deputy Speaker, it is the duty of the National People's Power to bring back credibility to the Hon. Attorney-General, the system of justice and all actors involved. We, as a Government, are aware of the massive challenges ahead of the Attorney-General. There are 97 officers assigned to the Criminal Division. However, there are only 93 officers in active service. Accordingly, 66 officers are engaged in criminal prosecutions in High Courts and only 27 senior officers are allocated with duties of supervisors. These officers are attending to the advice sought by the investigative agencies while making appearances in court on a daily basis. Supervising officers are required to attend daily court appearances, do supervision of junior officers and give instructions to various investigation agencies. Similarly, the junior officers are engaged in prolonged and complicated trials in High Courts on a daily basis. Similarly, they are required to submit reports recommending charges or discharges with regard to investigative materials.

The Attorney-General's Department perform a professional duty, which is not a mechanical process - you and I both know that - and such process warrants dedicating

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

time and resources. Almost every officer attends to their duties even during weekends and public holidays. Even I did it; I am sure you, too, did. - *[Interruption.]* The State Counsels assigned to outstation High Courts do not have staff except for their office assistants. එහෙම නම්, කාරක සභා පත් කරන්න කලින් අපි මෙවැනි දේවල් ටිකක් කල්පනා කර ගන්න ඕනෑ. That is, to fill all cadre vacancies in all levels of the Department, consider granting special allowances for officers and staff who attend to work during weekends and public holidays and consider having joint training sessions with foreign prosecutors to gain knowledge and expertise required to prosecute different offences. Therefore, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිපතිවරයාට ගෙනෙන මේ විවේචන වෙනුවට, අපි එතුමාට සහයෝගය දෙනවා නම් වටිනවා කියලා මම හිතනවා. එය මා යටතේ තිබෙන දෙපාර්තමේන්තුවක්. නීතිපතිතුමා ස්වාධීනයි; එතුමාට නීති උපදෙස් දෙන්න මට බැහැ. එතුමා නඩු පවරන්නේ ස්වාධීනව. නමුත්, එතුමාගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම අවශ්‍යයි. Then, those officers who work at the Attorney-General's Department, too, have family lives, but they are hardly getting time to spend with families; there is no quality time for them. -*[Interruption.]* Thank you. Therefore, මම විශ්වාස කරනවා, මේ තිබෙන පුරප්පාඩු පුරවලා නීතිපතිවරයාට අවශ්‍ය සහාය අපි ලබා දෙන්නේ නම්, ඒක වැදගත්. රජයක් වශයෙන්, අධිකරණ ඇමතිවරයා වශයෙන් මගේ වගකීම වන්නේ ඒක. එහෙම වුණොත් නීතිපතිවරයා කාර්යක්ෂම කරලා මේ නඩු ඉක්මනට ගේන්න පුළුවන්. හැබැයි, එතැනින් එහාට ගියාම, අධිකරණ පද්ධතියේ නඩු අහන්න යන කාලය ගැනත් ගැටලුවක් තිබෙනවා.

As I was telling earlier, we are taking all the steps necessary.To prevent Government Analyst's Department's delays, we are recruiting more. They are also struggling without staff. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අවුරුදු දෙකේ කිසිදු recruitment එකක් කරලා නැහැ. ඒ වාගේම, මේ salary structure එක අරගෙන බැලුවොත් - දැන් නම් වැටුප් වැඩි වෙච්ච නිසා ටිකක් හරි හොඳයි - to be honest, we cannot retain talent with this level of salaries. So, we have to consider the judicial service as well as the Attorney-General's Department as a special category. අපේ ආණ්ඩුවේ ප්‍රධාන පොරොන්දුවක් වෙන්නේ මොකක්ද? දූෂණයේ වර්ධනය නවත්වන්න ඕනෑ, නීතියේ විධාන ආධිපත්‍යය ගේන්න ඕනෑ. එහෙම නම් මේ ආයතන ශක්තිමත් කිරීමේ වගකීමයි අපට තිබෙන්නේ.

Now, I am a Minister in charge of two departments which I have no control of; they are independent. One of them is the Judicial Service Commission and the other one is the Attorney-General's Department. And, they should be independent and I will continue to fight for their independence and will not let any politician intervene in it, whether they be in the Opposition or the Government, because that is our Holy Grail, so to speak; that is our temple of justice. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුව මේ ආයතනවලට එහෙම ඇඟිලි ගහන්නේ නැහැ. හැබැයි, මාධ්‍ය විසින් කරන වාර්තාකරණයේදී ඉතාම දරුණු අසාධාරණයක් මේ ආයතනවලට සිද්ධ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම, මම පැහැදිලි කළ යුතු තවත් කරුණු රාශියක් තිබෙනවා. Specially, we have to be in touch with the Judicial Service Commission and get their guidance because they have plans. මේ Judicial Service Commission එකේ ඉන්න නඩුකාරතුමන්ලා, නීතිපති දෙපාර්තමේන්තුවේ ඉන්න නිලධාරීන්, උසාවිවල වැඩ කරන නිලධාරි මහත්ම මහත්මීන්ගේ උනන්දුව නැත්නම් මේ යන්ත්‍රණය එහෙම පිටින්ම කඩා වැටිලා. මොකද, මේ තිබෙන සම්පත්වලින් මේ ආයතන දුවන්න බැහැ. නමුත්, ඒ මිනිසුන්ගේ වුවමනාව, උනන්දුව නිසා මේ ටික කෙරෙනවා. ඒ නිසා අපි මේ සඳහා ඉදිරියේදී අවශ්‍ය පියවර ගන්නවා. අධිකරණ සේවා කොමිෂන් සභාවත්, නීතිපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා මේ නඩු පමාවීම මහ හරින්නේ කොහොමද, ඔවුන්ට තිබෙන ප්‍රශ්න විසඳන්නේ කොහොමද කියලා සාකච්ඡා කරන්න ඕනෑ. මේක ඇවිල්ලා දිරපු රටක්. මේ රටේ දිරපු අධිකරණ පද්ධතියක් තිබෙන්න බැහැ. ඒ මිනිසුන්ට මේ විධියට වැඩ කරන්න බැහැ. But, we are not going to criticize any judicial officer, any officer in the Attorney-General's Department or in government service without giving our full support because we are in one team, මේ ඔක්කොම රජයේ ආයතන වන බැවින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, you know that we are bringing in an Amendment for the Criminal Procedure Code. අධිකරණවලදී නඩු කල් යන්න මූලික හේතුවක් වෙන්නේ මොකක්ද? සාක්ෂිකරුවන් වෙලාවට එන්නේ නැති එක, එක්කෝ සාක්ෂිකරුවන් නැති එක. ඒ වාගේම අපි දන්නවා, පෙබරවාරි 19වැනි දා සිද්ධිය වුණේ අධිකරණය තුළ තිබුණු ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් නිසා. අපි මේ ගෙනෙන සංශෝධන හරහා ඕනෑම කෙනෙකුට ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයන්ගෙන් - audio visual links - හරහා - තමන් සිටින ස්ථානයේ සිට සාක්ෂි දෙන්න, තමන් සිටින ප්‍රදේශයේ සිට සාක්ෂි දෙන්න හැකි වෙන්න අපි නීතියක් ගෙනෙනවා. ඒ හරහා අනිවාර්යයෙන්ම අපට විශාල හැකියාවක් මතු වෙනවා නඩු පමාවීම, කල් යෑම වළක්වන්න. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, fast-tracking of investigating indictments, ensuring prompt investigation without an undue delay so that available evidence would not be erased. This is entirely the duty of investigators and observations should be called from the Department of Police.

මගේ අවසාන මතය වෙන්නේ මේකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු කාරියප්පර් මැතිතුමාගේ අදහස් බොහොම හොඳයි. අපි ප්‍රතිපත්තියක් වශයෙන් ඒවා පිළිගන්නවා. But, as my Colleague, the Hon. (Ms.) Lakmali Hemachandra, said, this maybe a little premature at the moment. So, let us feed the system because we have identified the shortages. Believe me, the professionals who are involved in this work - the judges, the Attorney-General and other court staff - know their job. They just need help. No Government has helped them genuinely. Therefore, we are going to give them that material and resource help first. Thereafter, after about a year or two, if you still feel that things are not moving, we can resort to further measures. Everybody is talking about, I am not blaming anybody, the Judiciary in the UK, how it happens in Australia and Singapore. Please give us a Treasury like Singapore; please give us a Treasury like England and I promise you a Judiciary like England. අපිත් මේ තිබෙන සීමිත ඉඩ,- *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Nizam Kariapper?

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I have also proposed establishing provincial-level prosecuting offices.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Yes, thank you. I will address that.

We had the first discussion with His Lordship Justice Yasantha Kodagoda attending and guiding us very well. We are now putting a Cabinet Paper to appoint a committee for the establishment of an independent Prosecutor's Office. It is a serious business, departing from the traditional system, although we had it earlier. I am not going to sit here and tell you exactly how it is going to happen. Then, what that committee is for, if the Minister has decided everything? That committee will attend to it. So, there will be new recruitments, changes of laws, but one thing I told the committee at the beginning was that in our policy document, we had a vision. Our vision is to decentralize prosecution to provinces.

Not only that, what about the Government Analyst's Department, decentralizing the Department to the provinces? Basically, some certain administrative delays may have to be attended to. So, we, on a policy basis, have proposed that, but I am going to leave it ultimately in the hands of the experts. The only reason why the Judiciary is malfunctioning, if at all, is when politicians without the subject knowledge are trying to be heroes and to make decisions. That is where the problem is. So, let the professionals handle it.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
And some YouTubers.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Yes, some YouTubers.

I present some papers to the Cabinet. When I go through those files, I look at where the committee recommendation is and who had said so. When I inquire my staff first, it is shameful.

Therefore, we - this Government - are hell-bent on protecting the independence of the Judiciary, the Attorney-General, the JSC and we want to establish the rule of law. Therefore, we will definitely look into all those matters.

Sir, I will finish off by saying this. I think the best thing would be to talk about the matter further at our Ministerial Consultative Committee and if there is any issue, then will take it up from there. Okay?

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you very much.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Thank you, Sir.

*එකල්හි වේලාව අ.භා. **6.30** පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. **6.52**ට, **2025** පෙබරවාරි **21** වන දින සභා සම්මතිය අනුව, **2025** මාර්තු **03** වන සඳුදා පූ.භා. **9.30** වන තෙක් කල් ගියේය.*

அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.52க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 03, திங்கட்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.52 p.m. until 9.30 a.m. on Monday, 03rd March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 04 වන කලාපය
தொகுதி 318 - இல. 04
Volume 318 - No. 04

2025 මාර්තු 03 වන සඳුදා
2025 மார்ச் 03, திங்கட்கிழமை
Monday, 03rd March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 03 වන සඳුදා
2025 மார்ச் 03, திங்கட்கிழமை
Monday, 03rd March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව [*පිටුව* 585]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [*පිටුව* 586]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [*පිටු* 587-607]

වරප්‍රසාද:
2025.03.02 දින "සති අග අරුණ" පුවත් පත් වාර්තාව [*පිටුව* 608]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [එකොළොස්වන වෙන් කළ දිනය]:
[ශීර්ෂය 119 (බලශක්ති)] කාරක සභාවේදී සලකා බලන ලදී [*පිටු* 609-763]

කල්තැබීමේ යෝජනාව:
ජාතික තරුණ සේවා සභාව ප්‍රතිසංවිධානය කිරීම [*පිටු* 764-768]

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 585]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 586]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 587-607]

சிறப்புரிமை:
2025.03.02ஆம் திகதிய “சதி அக அருண” பத்திரிகை அறிக்கை [ப: 608]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட பதினோராம் நாள்]:
[தலைப்பு 119 (வலுசக்தி)] – குழுவில் ஆராயப்பட்டது [ப: 609-763]

ஒத்திவைப்புப் பிரேரணை:
தேசிய இளைஞர் சேவைகள் மன்றத்தை மீளமைத்தல் [ப: 764-768]

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT [Col. 585]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 586]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 587-607]

PRIVILEGE:
News Report in "Sathi Aga Aruna" Newspaper of 02.03.2025 [Col. 608]

APPROPRIATION BILL, 2025 – [Eleventh Allotted Day]:
Considered in Committee - [Head 119 (Energy)] [Cols. 609-763]

ADJOURNMENT MOTION:
Reorganization of National Youth Services Council [Cols. 764-768]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 03 වන සඳුදා
2025 மார்ச் 03, திங்கட்கிழமை
Monday, 03rd March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIX කොටස;
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LIX කොටස සහ තෙවැනි කාණ්ඩයේ XXVI කොටස; සහ
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXVII කොටස

මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2019 සහ 2021 වර්ෂ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා;

(ii) 2020 සහ 2022 වර්ෂ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා;

(iii) 2023 වර්ෂය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2023 වර්ෂය සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, හිඟුරාන, සීනි කම්හල් පෙදෙස, අංක 54/බී දරන ස්ථානයෙහි පදිංචි එස්.එච්.එන්.ආර්. සමරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මුල්ඇඹියාවල, දම්පහළ ගෙදර, අංක 1147 දරන ස්ථානයෙහි පදිංචි එම්. ගුණපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) තුංකම අක්කර 100, අංක 351 දරන ස්ථානයෙහි පදිංචි නන්දදාස ජයවීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) උඩවලව, දකුණු ඇළ, සුසිල් මාවත, අංක 511 දරන ස්ථානයෙහි පදිංචි රුවන්පතිරණගේ විජයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුදත් බලගල්ල මහතා
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

ගරු කථානායකතුමනි, බණ්ඩාරවෙල, බදුල්ල පාර, අංක 232/3 යන ලිපිනයෙහි පදිංචි ජේ.එම්. ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු කථානායකතුමනි, රක්වාන හරහා, බොරලුවගේ අයින, පන්සල පාර යන ලිපිනයෙහි පදිංචි පී.ජී. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2020 සිට 2024 දක්වා නිකුත් කරන ලද මැණික් පතල් බලපත්‍ර: බදුල්ල දිස්ත්‍රික්කය
2020 தொடக்கம் 2024 வரை வழங்கப்பட்டுள்ள இரத்தினக்கல் சுரங்க அனுமதிப்பத்திரங்கள்: பதுளை மாவட்டம்
GEM-MINING PERMITS ISSUED FROM 2020 TO 2024: BADULLA DISTRICT

434/2025

1. ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு தினிந்து சமன்)
(The Hon. Dinindu Saman)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2020 සිට 2024 දක්වා නිකුත් කරන ලද මුළු මැණික් පතල් බලපත්‍ර සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම කාලය තුළදී බලපත්‍ර නිකුත් කරන ලද බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටි මැණික් පතල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මැණික් පතල් අතරින් වැඩ අවසන් කිරීමෙන් පසු නිසි ප්‍රමිතියට අනුව වසා දමා ඇති මැණික් පතල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මැණික් පතල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කෛත්තොෂිල් මත්‍රුම් තොෂිල් මුයර්චියාණ්මෛ අපිවිරුත්‍ති අමෛච්චරෛක් කේට්ට වින්නා:

(අ) (i) 2020ආම් ආණ්ඩු තොටක්කම් 2024ආම් ආණ්ඩු වරෛ වළංගප්පට්ටුළ්ළ ඉරත්තිනක්කල් සුරංග අනුමතිප්පත්තිරංගළින් මොත්ත එණ්ණික්කෛ ආණ්ඩුවාරියාක යාතෙන්පතෛයුම්;

(ii) මේර්පඩි කාලප්පකුතියිනුළ් අනුමතිප් පත්තිරංගළ් වළංගප්පට්ටුළ්ළතුම් පතුළෛ මාවට්ටත්තිල් අමෛන්තුළ්ළතුමාන ඉරත් තිනක්කල් සුරංගංගළින් එණ්ණික්කෛ ඔව්වොරු පිරතේච සෙයලාළර් පිරිවු වාරියාක වෙව්වේරාක යාතෙන්පතෛයුම්;

(iii) මේර්පඩි ඉරත්තිනක්කල් සුරංගංගළිල්, අකළ්වු මුඩින්ත පින්නර් උරිය නියමත්තින්පඩි මූඩප්පට්ට ඉරත්තිනක්කල් සුරංගංගළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(iv) අත්තකෛය ඉරත්තිනක්කල් සුරංගංගළ් යාවෛයෙන්පතෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -

(i) the total number of gem-mining permits issued from 2020 to 2024, in relation to each year;

(ii) the number of gem mines located in the Badulla District for which licences were issued during that period, in relation to each Divisional Secretary's Division, separately;

(iii) out of those gem mines, the number of those which have been backfilled in accordance with proper standards after ending the operations; and

(iv) what those gem mines are?

(b) If not, why?

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) වර්ෂ 2020 සිට 2024 දක්වා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය මඟින් නිකුත් කළ මැණික් පතල් බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි ඉදිරිපත් කරමි.

වර්ෂය	බලපත්‍ර සංඛ්‍යාව
2020	4,665
2021	4,434
2022	5,322
2023	8,286
2024	7,897

(ii)

		වර්ෂය					
	ප්‍රා.ලේ කොට්ඨාසය	2020	2021	2022	2023	2024	එකතුව
01	බදුල්ල		4	8	5	7	24
02	ලුණුගල		53	107	134	120	414
03	බණ්ඩාරවෙල		5	4	12	12	33
04	ඇල්ල		1	2	8	4	15
05	හල්දුම්මුල්ල		37	89	85	75	286
06	රිදීමාලියද්ද		16	42	26	30	114
07	හාලිඇල		1	4	4	8	17
08	සොරණතොට		4	2	3	4	13
09	හපුතලේ		8	9	21	22	60
10	මහියංගනය		1	4	5	2	12
11	මීගහකිවුල		11	17	25	24	77
12	පස්සර		38	65	106	111	320
13	ඌව පරණගම		-	-	1	2	3
14	වැලිමඩ		1	10	11	12	34
15	කන්දෙකැටිය		1	2	4	1	8
	එකතුව	120	181	365	450	434	


- 2020 වසරේ පැරණි පරිගණක ජාල පද්ධතිය පැවති බැවින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට වෙන වෙනම බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව ගැනීමට නොහැක.

  ගරු කථානායකතුමනි, 2021 වනකොට මේ ප්‍රදේශයේ පතල් 181කුත්, 2024 අවසානය වනකොට පතල් 434කුත් පවතිනවා. ලුණුගල, හල්දුම්මුල්ල සහ පස්සර කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තමයි මේ පතල් කැණීම් වැඩිම ප්‍රමාණයක් සිද්ධ වෙන්නේ.

(iii) මැණික් පතල් 41කි.

(iv) 2020-2021 බදුල්ල දිස්ත්‍රික්කයේ මැණික් පතල් අතරින් වැඩ අවසන් කිරීමෙන් පසු නිසි ප්‍රමිතිය අනුව වසා දමා ඇති මැණික් පතල් පිළිබඳ විස්තර:

අනු අංකය	බලපත්‍රධාරියාගේ විස්තර	ලිපිගොනු අංකය
01	එස්.එච්. බුලේගොඩ	MOP 6532
02	කේ.ජී. පොඩි අප්පුහාමි	MOG 4059
03	එච්.ඒ. ධනපාල	MOG 4135
04	කේ.එච්. අබේරත්න	MOP 6293
05	ඩී.එම්.සී.ටී. කුමාර	MOG 3984
06	ඩී.එම්. ජයතිලක	MOG 4215
07	එස්.ඒ. ගුණසේන	MOP 6485
08	ජේ.පී. ශාන්ත කුමාර	MOG 4230



2022 – 2024- බදුල්ල දිස්ත්‍රික්කයේ මැණික් පතල් අතරින් වැඩ අවසන් කිරීමෙන් පසු නිසි ප්‍රමිතිය අනුව වසා දමා ඇති මැණික් පතල් විස්තර

අනු අංකය	බලපත්‍රධාරියාගේ විස්තර	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉඩමේ නම	ලිපිගොනු අංකය
01	K.D.ජයසුමනාවතී 4 කණුව ,නොලබෝවත්ත ,ගමේවෙල,පස්සර.	පස්සර.	සුවර්ණගහ පිටිය වත්ත.	MOP 6866
02	R.M.දයාලතා සිසිර නිවස, මාවුස්සගොල්ල ,පස්සර.	පස්සර.	පිල්ලුව කුඹුර PN4262 ලොට් 01.	MOP6803
03	S.J.M.සුදු ඒණ්ඩා 44,පල්ලේ පංගුව,ලුණුගල.	ලුණුගල.	අත්තනගහ කුඹුරේ පාඹුල PN12287 හි ලොට් 01.	MOP6429
04	W.M.J.කුමාරි නොං16,මඩමෙගොඩ පාර,අත්තනගොල්ල, ලුණුගල.	ලුණුගල.	මැදපොලේ කුඹුර PN4316 LOT 01.	MOP6673
05	R.M.C.රත්නායක ජයන්ති සෙවන,හල්දෙන ,බදුල්ල.	මීගහකිවුල.	අලුත් ගෙදර වත්ත.	MOP 7096
06.	යූ එන් අත්තනායක, එස් ඉ ඒ එස් ද සිල්වා, ඩබ් එම් පී එස් ධර්මරත්න නොං 60 රතුපස්කැටිය මීගිල	ලුණුගල	ගන්නිලේ කුඹුර අඹගස්දෝව කුඹුර තුම්පැල කුඹුර කඩාපලේ කුඩා ඒකාබද්ධ පී අ 3125 ලොට් ඒ	MOP6829
07.	එස් එම් වන්දාවති පිටකොලගම මිල්ලබැද්ද හොස්ටන්	ලුණුගල	කුඩුගලඇත්න පහත	MOG4256
08.	පී ජී පී කුමාරි සේනාරත්න 54 පල්ලේ පංගුව ලුණුගල	ලුණුගල	නුගඟහවත්ත	MOP6641
09.	ඩී ලක්ෂාන් අංක 100 මඩකලපුව පාර පස්සර	ලුණුගල	ලිද කුඹුර පී අ 2312 ලොට් 01	MOP7394
10.	කේ එම් ජයවීර කැන්නේපිටිය වත්ත ලුණුගල	ලුණුගල	කැන්නපිටිය වත්ත ඉඩම	MOP7733
11.	ආර් ඩබ් ඩබ් වීජේරත්න රේඟල් කඩේ 21 කණුව හොස්ටන්	ලුණුගල	මහල ගෙදර වත්ත	MOP7416
12.	ඩබ් ඒ කමලාවති ජනකාපුර වැදිවෙල	ලුණුගල	මහපලේ කුඹුර	MOP7500
13.	ඒ එම් පී අත්තනායක මලිකිපිටිය පිස්සගම හොස්ටන්	ලුණුගල	541/194 රජයේ ඉඩම	MOG3724
14.	ඩබ් එම් කරුණාදාස මිඩුගෙවත්ත 17 කණුව බලගොල්ල මීගහකිවුල	පීදීමාලියද්ද	වැල්ලේයාය පී අ 2450 ලොට් 01	MOP7010

[ගරු චතුරංග අබේසිංහ මහතා]

අනු අංකය	බලපත්‍රධාරියාගේ විස්තර	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉඩමේ නම	ලිපිගොනු අංකය
15.	එස් එන් එම් එල් ජේ බණ්ඩාර 8 කණුව නාරං අක්ෂේයාය පිදිමාලියද්ද	පිදිමාලියද්ද	ඕකලාන වත්ත ඉඩම	MOP7750
16.	විජය කුමාරි, පෞන්ඩියන් ගල්ගොඩ අරාච්, පලාගොල්ල පස්සර	පස්සර	හීන්ඔලගොඩ පුරාණ ඉඩම පි අ 3346 ලොට් 01	MOP6374
17.	එච් එම් ජී විමලසිරි මාලිගානැන්න මැදඔවලගම පස්සර	පස්සර	මඩුකන්දේ උගොඩ අරාච්	MOP7519
18.	එම් එන් එම් නලීර් අංක 21/19 පරාක්‍රම මාවත පස්සර	පස්සර	කොරගොල්ල කුඹුර පි අ 1628 ලොට් 01	MOP5861
19.	ඒ එච් එල් අයි ඉසිලාන් අංක 16/2 මාලිගාහේන මඩිරුවල	පස්සර	කොක්කාර මහලියද්දේ පි අ 1624 ලොට් 01	MOP6655
20.	එස් ඒ ගුණසේන රන්වත්ගුහාව කිරිවානගම හල්දුම්මුල්ල	හල්දුම්මුල්ල	මැදඉරවෙල	MOP6484
21.	එස් ජේ එම් සුදුබණ්ඩා 44 පල්ලේ පංතුව ලුණුගල	ලුණුගල	අත්තනගහ කුඹුරේ පාමුල් පි අ 12287 හි ලොට් 01 ඉඩම	MOP6429
22.	ඩබ්. එම් ජේ කුමාර නොං 16 ඔඩමෙගොඩ පාර අත්තනගොල්ල ලුණුගල	ලුණුගල	මැදපොලේ කුඹුර පි අ 4316 ලොට් 01	MOP6429
23.	W.M.සිතා රංජනී ඉරුම්ඔඩ,දියගොබල,බිබිලේ.	පිදිමාලියද්ද.	89/දිය/227 ඉඩම	MOG4478
24.	H.G.W.සන්දනායක මැදිරිය,නක්කල,මොණරාගල.	ලුණුගල.	ඔඩවලඹුල්ල ඉඩම	MOP6845
25.	W.P.සුමනාවතී අංක 02,සුබුදු ගම, ලුණුගල.	ලුණුගල.	පොලන්ඩ වත්ත ඉඩම	MOP7704
26.	R.M.A.රත්නායක 20 කණුව,ඇහැල්වත්,ලුණුගල.	ලුණුගල.	2998 හි ලොට් 01	MOG4890
27.	W.M.විජේසිංහ විජය නිවස ,විහාර කැලේ,දියකලාව.	හපුතලේ.	දණිගහ උල්පත කුඹුර	MOP7760
28.	සංඝදාස ගජනායක එම්පා නිවස,01 කණුව,ආරාමහාර,මීගහකිවුල.	මීගහකිවුල.	කෝමාරිකය මඩ ඉඩම	MOP5027
29.	M.A.A.D.කුමාර, ජයලංකා මඩම හංදිය,ඔඩල්කුඹුර	මීගහකිවුල.	පල්ලේ අස්වැද්දුම,PN2007/70 හි ලොට් 01	MOP6789
30.	R.M. ගුණතිලක, උඩ මිහෙලගම ,මිඩිගස්තලාව	හල්දුම්මුල්ල	බදු/ප්‍ර41010 රශයේ ඉඩම	MOG2979
31.	R.M.ප්‍රේමරත්න, පිත්ගම,ඇහැල්වත්	පස්සර	බදු/ප්‍ර 48591	MOG5139
32.	ආර් ඒ ප්‍රේමදාස ප්‍රසංගා ෂොපිත්ස් ඔෂන්වර් අල්පිටිය ඔඩඩකවෙල	ලුණුගල	අස්වැද්දුමේ කුඹුර පි අ 3485 ලොට් 01	MOP6209
33.	සාලාවක්ගේ විමලවංශ හිමි රජමහාවිහාරය පල්ලේගම පස්සර	පස්සර	පපලේ කුඹුර පි අ 4349 හි ලොට් 01	MOP6850

(ආ) අදාළ නොවේ.

ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு திணிந்து சமன்)
(The Hon. Dinindu Saman)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මා අසන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පසු ගිය කාලයට අදාළව රටේ තිබුණු දේශපාලන පරිහානිය සියලු ක්ෂේත්‍ර තුළ වාගේම ඔය කියන ක්ෂේත්‍රයේත් අපි දැක තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කය ගත් විට, බදුල්ල දිස්ත්‍රික්කය තුළ පතල් කැණීම් සම්බන්ධව විධිමත් සහ අවිධිමත් පතල්, එනම් අවසර ගත් පතල් සහ අවසර නොගත් පතල් අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කය තුළ ඒවා සම්බන්ධයෙන් දේශපාලන අධිකාරිය සෘජුව කළ මැදිහත්වීම්, කළ බලපෑම් බොහොමයක් තිබෙනවා. මේ හේතුවෙන් විශාල පරිසර හායනයක් සිදු වී තිබෙනවා. ඒ වාගේම, ගම් ඇතුළේ තිබුණු සාමකාමී තත්ත්වයට පවා බාධා වන විධියට සමහර තැන්වල පතල් කැණීම් සිදු වෙලා තිබෙනවා. අප ඒ ගැන සාකච්ඡා කරන කොට මතු වුණු බරපතළ ගැටලුවක් තමයි, ගමේ සමහර තැන්වල තිබෙන පතල් සම්බන්ධයෙන් -ඒ පතල නීත්‍යානුකූලව කරන පතලක් ද, එහෙම නැත්නම් බලපත්‍ර රහිතව කරන පතලක් ද යන්න සම්බන්ධයෙන්- ග්‍රාම නිලධාරිවරයා නොදැන සිටීම. ඒ ගැන කරුණු සොයා බලන කොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී මතු වූ අදහස තමයි, ඒ ප්‍රදේශයේ ඉන්න ප්‍රාදේශීය ලේකම්වරයාටවත් ඒ පතල් නිල ඒවා ද, එහෙම නැත්නම් බලපත්‍ර රහිතව කරන ඒවා ද කියන එක පිළිබඳව නිශ්චිත අවබෝධයක් නැහැ කියන කාරණය. මීට ඉස්සර කෙරුණු පොලිසියේ මැදිහත්වීම් සියල්ල දේශපාලන අධිකාරියේ මැදිහත්වීම් මත තමයි සිදු වුණේ. පතල් කැණීම් සම්බන්ධයෙන් විධිමත් නිර්දේශයක් ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලබා ගෙන, ඉදිරියේදී පතල් කැණීම් කටයුතු සඳහා මැදිහත් කර ගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ සඳහා අමාත්‍යාංශයට කුමක් හෝ වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, පතල් කර්මාන්තය ආශ්‍රිතව ලංකාවේ බරපතළ ගැටලු රැසක් මතු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මීට කලින් පැවති දේශපාලන අධිකාරිය හිතු මතයට තමන්ගේ දේශපාලන බලය පතල් කැණීමේ, එහෙම නැත්නම් මැණික් ගැරීමේ ක්‍රියාවලියට යොමු කිරීම නිසා එම ගැටලු පැන නැඟී තිබෙනවා.

විධිමත්භාවයේ ගැටලු, නීතිමය ගැටලු, අයිතිවාසිකම් පිළිබඳ ගැටලු ආදී ගැටලු රාශියක් ඒ පතල් ආශ්‍රිතව තිබෙනවා. වර්ග කිහිපයක් ලෙසයි පතල් කරගෙන යන්නේ. ඒවා තමයි, කුඩා පතල්, යන්ත්‍ර සූත්‍ර මඟින් කරන පතල් සහ විශාල පතල්. මෙහිදී වන පරිසර හානිය ගත්තොත්, කුඩාම පතලකට රුපියල් 10,000ක වාගේ ඇප තැන්පතුවක් තමයි තිබෙන්නේ. ඉතින් අපට අධීක්ෂණය වෙලා තිබෙනවා, විශේෂයෙන් කුඩා පතල් හිමියන් මේ ආරක්ෂිත ඇප මුදල තැන්පත් කරන්න - security deposit එක කරන්න - එන්නේ නැහැ කියලා. ඒ නිසා අධිකාරිය 2024 වර්ෂයේදීත් රුපියල් මිලියන 11ක මුදලක් වියදම් කරලා තමයි ඒ පතල් වහලා තිබෙන්නේ. මේ පිළිබඳ කටයුතු කරන්න දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ සහ එතැනින් පහළට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට විහිදෙන විධියට විශේෂ යන්ත්‍රණයක් ස්ථාපිත කරන්නත්, විශේෂයෙන් නීති ආධාර සඳහා වෙනම කමිටුවක්, එහෙමත් නැත්නම් කණ්ඩායමක් අධිකාරිය යටතේ පත් කරන්නත් මේ වන කොට වැඩකටයුතු කරමින් පවතිනවා.

ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு திணிந்து சமன்)
(The Hon. Dinindu Saman)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුරෙන් මතු වෙච්ච කාරණයත් එක්ක ගත්තාම, පතල් වැසීම සම්බන්ධයෙන් පරිසර පද්ධතියටම බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන බව අපි දන්නවා. බදුල්ල දිස්ත්‍රික්කය ගත්තොත්, ලුණුගල ප්‍රදේශයේ නායයෑම්වලට පවා බලපා තිබෙනවා, ඒ අවිධිමත් පතල් කැණීම්. එක පැත්තකින්, ඒ අවිධිමත් පතල් කැණීම් විධිමත් කර ගන්න සහ කර්මාන්තයක් විධියට මෙම කර්මාන්තය දියුණු කර ගන්න ඕනෑ. ඒකට අදාළ කරන නීති රීති සම්පාදනය කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය අමාත්‍යාංශයක් විධියට යොමු වෙලා තිබෙනවා ද, දැන් එහි තත්ත්වය මොකක් ද කියන එක සම්බන්ධයෙන් අදහසක් දැන ගන්න මම කැමැතියි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මෙහිදී පරිසරය ආශ්‍රිත බලපෑම ගත්තොත්, එහි කොටස් දෙකක් තිබෙනවා. නාය යෑම් අවදානමට ලක් වන ප්‍රදේශ; ගංවතුරට ලක් වන ප්‍රදේශ සහ ගංවතුරට යට නොවන ප්‍රදේශ කියලා. පරිසරය පිළිබඳව පරිසර අමාත්‍යාංශයත්, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියත්, විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශයත් මේ වන කොට මේ පිළිබඳව තිබෙන කරුණු අධ්‍යයනය කරමින් ඉන්නවා. නමුත්, මේ සම්බන්ධයෙන් සමස්ත වැඩ පිළිවෙළක් මේ දක්වා ඉදිරිපත් කරලා නැහැ, පරිසරයත් ආරක්ෂා කරගෙන ඒ කර්මාන්තය කරගෙන යන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. Standard එකක් තිබීම වැදගත්. ඒ කර්මාන්තය කරනවා නම්, ඒ සඳහා සුදුසු සම්මතයන් මොනවාද, ඒ වාගේම දැනට තිබෙන සම්මතයන් වෙනස් විය යුතු ද, තිබෙන සම්මතයන් අනුව නොකරන ඒවාට අදාළව නීතිය වේගයෙන් ක්‍රියාත්මක කරන්නේ කොහොමද සහ ඒ අවසර පත්‍ර අධීක්ෂණය කරන්නේ කොහොමද කියන ඒවාට අදාළ වැඩ පිළිවෙළ නිර්මාණය කරමිනුයි යන්නේ. නොබෝ දිනකින් එය ජාතික වශයෙන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඇල්පිටිය, ගොලුවාමුල්ල ප්‍රදේශයේ පිහිටි කර්මාන්තපුරය: විස්තර

எல்பிட்டிய, கொலுவமுல்ல கைத்தொழிற்பேட்டை: விபரம்

INDUSTRIAL PARK IN GOLUWAMULLA, ELPITIYA: DETAILS

439/2025

2. ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 29, ගොලුවාමුල්ල ග්‍රාම නිලධාරී වසමේ කර්මාන්තපුරයක් ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එම කර්මාන්තපුරයේ සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) එම ප්‍රමාණයෙන් මේ වන විට සංවර්ධනය කර ඇති භූමි ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම සංවර්ධන කටයුතු සිදු කර ඇති ආයතනය කවරේද;

(v) එම කර්මාන්තපුරයේ මේ වන විට ස්ථාපිත කර ඇති කර්මාන්ත සහ ඉදිරියේදී ස්ථාපිත කිරීමට නියමිත කර්මාන්ත වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කෛත්තොෂිල් මට්‍රුම් තොෂිල් මුයට්සියාණ්මෛ අමෛච්චරෛක් කේට්ට විනා:

(අ) (i) එල්පිට්ටිය පිරදේස සෙයලාළර් පිරිවිල් ඉලක්කම 29, කොලුවමුල්ල කිරාම අලුවලර් පිරිවිල් කෛත්තොෂිර්පේට්ටෛ ඔන්රු අමෛක්කප්පට්ටුල්ළදා එන්පතෙයුම්;

(ii) ආමෙනිල්, මේර්පඩි කෛත්තොෂිර්පේට්ටෛයින් මොත්ත නිලප්පරප්පු එත්තනෛ ඒක්කර් එන්පතෙයුම්;

(iii) මේර්පඩි නිලප්පරප්පිල් ඉන්රළවිල් එත්තනෛ ඒක්කර් අපිවිරුත්ති සෙය්යප්පට්ටුල්ළදු එන්පතෙයුම්;

(iv) මේර්පඩි අපිවිරුත්ති නටවඩික්කෛකළෛ මේර්කොණ්ටුල්ළ නිරුවනම් යාතෙන්පතෙයුම්;

(v) මේර්පඩි කෛත්තොෂිර්පේට්ටෛයිල් ඉන්රළවිල් ආරම්පික්කප්පට්ටුල්ළ කෛත් තොෂිල්කළ් මර්රුම් එතිර්කාලත්තිල් ආරම්පික්කප් පටවුල්ළ කෛත්තොෂිල්කළ් වෙව්වේරාක යාවෛයෙන්පතෙයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -

(i) whether an industrial park has been established in Grama Niladhari Division No. 29-Goluwamulla within the Elpitiya Divisional Secretary's Division;

(ii) if so, the total extent of land of the industrial park concerned in acres;

(iii) the extent of land which has already been developed by now in acres, out of the aforementioned extent of land;

(iv) the name of the organization that has carried out the development activities in it; and

(v) the industries that have already been established in the industrial park concerned and the industries to be established in future, separately;

(b) If not, why?

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන කර්මාන්ත පුරයක් සම්බන්ධයෙන්. මේ කර්මාන්තපුරය විශේෂයෙන් Industrial Development Board එක හරහා තමයි ක්‍රියාත්මක වන්නේ.

(අ) (i) ඔව්.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් ඇල්පිටිය කාර්මික ජනපදය ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 29, ගොලුවාමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ස්ථාපිත කර තිබේ.

(ii) ඇල්පිටිය කාර්මික ජනපදයේ සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර 65කි. එය ප්‍රථම අදියර අක්කර 21ක් ලෙසත්, දෙවන අදියර අක්කර 44ක් ලෙසත් සංවර්ධනය කරමින් පවතී.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

(iii) ඇල්පිටිය කාර්මික ජනපදයේ පළමු අදියර අක්කර 21ක් වන අතර එම කලාපය ආහාර හා කෘෂි ආශ්‍රිත නිෂ්පාදන කාර්මික ජනපදයක් ලෙස ස්ථාපිත කර ඇත. එම කලාපයේ මේ වන විට යටිතල පහසුකම් සංවර්ධනය කර අදාළ රාජ්‍ය ආයතන (මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) මඟින් අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඇත.

ඇල්පිටිය කාර්මික ජනපදයේ දෙවන අදියර අක්කර 44ක් වන අතර එම කලාපයේ අභ්‍යන්තර මාර්ග සකස් කර (කාපට් කර නොමැත) අවසන් කර ඇති අතර එම කලාපය සඳහා විදුලිය හා ජල පහසුකම් ලබාදීම සිදු කරමින් පවතිනවා. මීට අමතරව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වාර්තාව කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සකසමින් පවතී. කඩිනමින් මේ සඳහා අවසර ලබා ගැනීම සහ අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

(iv) පළමු අදියර - අක්කර 21

- විදුලිය - කාර්මික ජනපද සඳහා වෙන් වූ ප්‍රතිපාදන මඟින් විදුලිබල මණ්ඩලයෙන් විදුලිය ලබාගෙන ඇත.
- කාර්මික ජනපදය සඳහා අවශ්‍ය ජලය -කාර්මික ජනපද සඳහා වෙන් වූ ප්‍රතිපාදනවලින් පෞද්ගලික ආයතන මඟින් නළ ළිං හා ජල ටැංකිය ඉදිකර ඇත.
- අභ්‍යන්තර මාර්ග පහසුකම - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත.
- ආරක්ෂක මුරකුටිය හා ගේට්ටුව - කාර්මික ජනපද සඳහා වෙන් වූ ප්‍රතිපාදන මඟින් පෞද්ගලික ආයතනයක් හරහා ඉදිකිරීමට කටයුතු සිදු කර ඇත.

දෙවන අදියර - අක්කර 44

- අභ්‍යන්තර මාර්ග පද්ධතිය - කර්මාන්ත ජනපද සඳහා වෙන් වූ ප්‍රතිපාදන මඟින් පෞද්ගලික ආයතන හරහා අභ්‍යන්තර මාර්ග සකස් කර ඇත. (කාපට් කර නොමැත)
- කර්මාන්ත සඳහා අවශ්‍ය ජල පහසුකම් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් නළ ළිං 5ක් සවි කර ඇත.
- කාර්මික ජනපදය සඳහා අවශ්‍ය විදුලිය - විදුලිබල මණ්ඩලය මඟින් ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු ඉල්ලුම් කර ඇත.

(v) ඇල්පිටිය කාර්මික ජනපදයේ පළමු අදියර යටතේ ආහාර හා කෘෂි ආශ්‍රිත නිෂ්පාදන කොාටසින් - ඒ කියන්නේ, agricultural productions සඳහා වෙන් කර තිබෙන අක්කර 21- දැනට කර්මාන්තකරුවන් 10දෙනෙකුට බිම් කොාටස් ලබා දී ඇති අතර, ඔවුන්ගෙන් 4දෙනෙකු මේ වන විට කර්මාන්ත ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

ඇල්පිටිය කාර්මික ජනපදයේ දෙවෙනි අදියර යටතේ විවිධ නිෂ්පාදන -multi-product- කර්මාන්ත කලාපයක් විධියට දිවෙන අතර, එම කලාපය තුළ ඉඩම් කොටස් ලබා දුන් කර්මාන්ත හිමියන් 9දෙනෙකු වන අතර, තවත් කර්මාන්ත හිමියන් 3දෙනෙකුට පමණ ප්‍රමාණයකට ඉඩ පහසුකම් පවතී. එම කර්මාන්ත කලාපය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව කර්මාන්ත හිමියන්ට කර්මාන්ත ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමේ හැකියාව පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ කර්මාන්තපුරය සංවර්ධනය කිරීමේදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අධීක්ෂණය කරන්නේ කුමන ආයතනයක්ද, ඒකට මුදල් කොච්චර ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දෙවැනි අදියර යටතේ මාර්ග පුළුල් කිරීම වාගේ කටයුතු ඉතාම අවිධිමත් විධියට තමයි සිද්ධ වෙන්නේ. ඒවා අධීක්ෂණය කරන්නේ කවුද කියලාවත් විස්තර නැහැ. ඒ නිසා විශාල සැකයක් ඇතිවෙලා තිබෙනවා. විශාල මුදල් නාස්තියක් සිද්ධ වෙනවා. කිසිදු ප්‍රමිතියකින් තොරව තමයි ඒ කටයුතු සිද්ධ වෙන්නේ. ඒ නිසා ඒ ආයතනය මොකක්ද, ඒ කටයුතු අධීක්ෂණය කරන්නේ කවුද කියන එකත් දැනගන්න කැමැතියි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ඇත්තටම නව රජය බලයට පත් වුණාට පස්සේ අපි මූලික වශයෙන් කර්මාන්තපුර පිළිබඳ අධ්‍යයනයක් කළා. ඒ අධ්‍යයනය කිරීමේදී ඇල්පිටිය කාර්මික ජනපදයට අදාළව විශාල මුදල් භාවිතයක් වාගේම අවභාවිතයක්, නැත්නම් නාස්තියක් සිද්ධ වෙන බව නිරීක්ෂණය වෙලා තිබෙනවා. නව සභාපතිතුමා දැන් ඒ මුදල් ඵලදායී විධියට භාවිත කරන්න, පිරිවැය අඩු කරමින් නව වැඩ පිළිවෙළක් සකස් කරමින් යනවා. එය දැනට අධීක්ෂණය වෙන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ. ඒ සභාපතිතුමා යටතේ තමයි අධීක්ෂණය වෙන්නේ. එහි ඉදිරි වැඩකටයුතු කර්මාන්ත අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයටත් ලක් වෙනවා. මීට කලින් කළ සංවර්ධන කටයුතුවලදී තිබුණු අඩුපාඩුකම් සහ සැපයුම්කරුවන් එක්ක තිබුණු ගැටලු විසඳා ගන්නත්, ඉදිරියේදී ඉදිකිරීම් සඳහා ලබා දෙන කොන්ත්‍රාත් සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරලා අවම පිරිවැයෙන් යුතුව කටයුතු කරන්නත් තමයි මේ වෙනකොට කටයුතු සූදානම් කරලා තිබෙන්නේ.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පළමුවන අදියරේ කර්මාන්ත ඉදිකිරීම පටන් අරගෙන අවසන් කරන්න නිශ්චිත ගිවිසුමක් තිබෙනවාද?

මොකද, කර්මාන්ත විශාල ප්‍රමාණයක් සඳහා දැන් මෙම කර්මාන්තපුර භූමියේ ඉඩම් කොටස් වෙන් කරගෙන තිබෙනවා. හැබැයි, සමහර තැන්වල foundation එක දාලාත් නැහැ, කිසිම දෙයක් කරලාත් නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සමහර ව්‍යවසායකයින්ගේ ඉල්ලීම් තිබෙනවා. හැබැයි, ඒ ප්‍රදේශයේ සමාජය ඇතුළේ මතයක් හැදිලා තිබෙනවා, කර්මාන්ත හදනවා කියලා නිකම් බොරුවට ඉඩම් කෑලි ටික වෙන් කරගෙන බෝඩ් ගහගෙන ඉන්නවා කියලා. එම භූමිය

අධීක්ෂණය කරන්න මම ගියා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සමහර කර්මාන්තවල ඉදිකිරීම් ආරම්භ කරලා තිබෙනවා, සමහර ඒවායේ කිසිම දෙයක් කරලා නැහැ. ඒ නිසා කර්මාන්තකරුවන් තුළ, ව්‍යවසායකයින් තුළ මතයක් හැදිලා තිබෙනවා, එම ඉඩම් නිකම් අරගෙන තිබෙනවා, ගත්ත අයත් වැඩක් කරන්නේ නැහැ, නිකම් බෝඩ් ගහගෙන ඉන්නවා කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම නිසා ඇත්තටම එහි කර්මාන්ත කරන්න අවශ්‍ය කර්මාන්තකරුවන්ට ලොකු අසාධාරණයක් සිදු වෙනවා කියලා ඔවුන්ගේ පැත්තෙන් කියනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම කර්මාන්තපුරය පටන් අරගෙන තිබෙන්නේ කවදාද, එහි යෝජිත කර්මාන්ත අවසන් කරන්න ගිවිසුම්ගත කාලයක් තිබෙනවාද කියන එක තමයි මම දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔය ප්‍රශ්නය එම කර්මාන්තපුරයේ විතරක් නොවෙයි, අනෙක් කර්මාන්තපුරවලත් තිබෙන ගැටලුවක්. ඇත්තටම, මෙය කර්මාන්තපුරවල අර්බුදයක් බවට පත්වෙලා තිබෙන්නේ පසුගිය කාලයේ විවිධ ප්‍රදේශවල "කර්මාන්තපුර" කියලා නම් කරලා ජාතික සැලැස්මකින් තොරව සහ විශේෂයෙන්ම කිසිදු සැලැස්මකින් තොරව එවැනි ඉඩම් සඳහා allocations වෙන් කරගෙන තිබීමයි. විශේෂයෙන්ම ඒ හැම කර්මාන්තපුරයකටම කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුව මඟින් තමයි, ආයෝජකයා කවුද, මොන ආයෝජකයාටද කර්මාන්ත සඳහා ඉඩම් ලබා දෙන්නේ කියලා තීරණය කරන්නේ. ඔය කියන ඉඩම් කොටස් වෙන් කිරීම කරලා තිබෙන්නේත් ඒ අනුවයි.

විශේෂයෙන්ම කර්මාන්තශාලා ඉදිකරපු නැති, එහෙම නැත්නම් ඒ සඳහා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා නැති අයට එළැඹෙන මාස 6 ඇතුළත, නැත්නම් දැනුම් දීමෙන් මාස 6ක් ඇතුළත ඒ වැඩ පටන් ගන්න හෝ ඒ වැඩ පටන් ගන්නා ආකාරය කමිටුවට ඉදිරිපත් කරන්න කියලා අපි දැන් දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව ඒ කමිටුව සෑහීමකට පත් වෙනවා නම් යම්කිසි සාධාරණ කාලයක් ලබා දෙන්න සූදානම්. එහෙම නැත්නම් ගිවිසුම් ප්‍රකාරව ඒ ඉඩකඩම් භාවිත නොවීම කියන condition එක යටතේ, ගිවිසුමේ ඇතුළත් ක්‍රියාවලිය අනුව නැවත වෙනත් පාර්ශ්වයකට කර්මාන්ත කිරීම සඳහා එම ඉඩම් පවරා දීමට නෛතික හැකියාවක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මටත් පොඩි වෙලාවක් දෙන්න, මේ කාරණය ගැන කියන්න. මේ ප්‍රශ්නයටම සම්බන්ධ කාරණයක් නිසා මම මේ ගැන කියන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ මැතිවරණ බල ප්‍රදේශයේ ඉතාම වටිනා ඉඩමක් තිබෙනවා. ඒක ඇල්පිටිය නගරයටත් වැඩි දුරක් නැති ඉතාම වටිනා ඉඩමක්. මේක LRC එකෙනුත් සැහවිලා තිබුණු ඉඩමක්; LRC එකවත් දැනගෙන හිටියේ නැහැ එහෙම ඉඩමක් තිබෙන බව. මේ අක්කර 60 ගණන මම ඉඩම් ඇමති කාලයේ සොයා ගත්තේ. ඒ කාලයේ දයා ගමගේ ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් ඒ පිළිබඳව යම් වැඩ පිළිවෙළක් සූදානම් වුණා. නමුත්, ආණ්ඩුව වෙනස් වුණා. ඊට පසුව පසුගිය රජයත් ඔය කියන බෝඩ් ගහලා ලැහැස්ති වෙලා තිබෙනවා. ඔබතුමාත් ගිහිල්ලා මේක බලන්න. මොකද, ඒක ඒ තරම් වටිනා ඉඩමක්. ඒ ව්‍යාපෘතිය කෙරෙන්නේ නැත්නම් මොකක් හරි ඵලදායී දෙයකට හෝ ඒ ඉඩම යොදවනවා නම් ඉතාම වටිනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම පසුගිය කාලයේ වෙව්ව පව් තමා මේ තිබෙන්නේ. අපේ සභාපතිතුමා visit එකක් කරලා මේ සඳහා ඍජු මැදිහත්වීමක් කරලා තිබෙනවා. අපි පළමුවෙනි project එක විධියට ගත්තේ ඇල්පිටිය, - මොකද, මේ සඳහා allocate කරලා තිබෙන මුදල් මෙන්ම මේ ඉඩමේ ප්‍රමාණයත් ගත්තාම මේකට ලොකු ඉල්ලුමකුත් තිබෙනවා, නැත්තේ නැහැ.

ඒ නිසා අපි අලුතින් කර්මාන්තපුර ඉදිකරන්න මේ අවුරුද්දේ කටයුතු කරනවා. ඊට කලින් ඇල්පිටිය සහ විශේෂයෙන් කළුතර ප්‍රදේශයේ තිබෙන කර්මාන්තපුර දෙකෙහි කටයුතු අවසන් කිරීම තමයි අපේ බලාපොරොත්තුව. මේ වනකොට ඒ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 - 448/2025 - (1), ගරු රුවන් විජේවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 - 450/2025 - (1), ගරු පද්මසිරි බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ශ්‍රී ලංකාවේ ඇති කර්මාන්තපුර: වර්තමාන තත්ත්වය
இலங்கையிலுள்ள கைத்தொழிற்பேட்டைகள்: தற்போதைய நிலை
INDUSTRIAL PARKS IN SRI LANKA: CURRENT STATUS

454/2025

5. ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති කර්මාන්තපුර තුළ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්ත සංඛ්‍යාව, ඒවායේ නිෂ්පාදනය සහ අයත් වන ව්‍යාපාර ක්ෂේත්‍රය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) කර්මාන්තපුර තුළ ක්‍රියාත්මක වූ, එහෙත් මේ වනවිට වැසී ගොස් ඇති කර්මාන්ත සංඛ්‍යාව කොපමණද;

(iii) කර්මාන්තපුර උපරිම ධාරිතාවෙන් මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(iv) එම කර්මාන්තපුර තුළ නව කර්මාන්ත ඇරඹීම සඳහා අවකාශ තිබේද;

(v) ශ්‍රී ලංකාවේ ඇති කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව සම්බන්ධයෙන් සංගණනයක් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නව කර්මාන්තපුර ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

(iii) ඒ සඳහා ප්‍රාග්ධනය සපයා ගැනීමට අපේක්ෂා කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

කෛත්තොழිල් மற்றும் தொழில் முயற்சியாண்மை அபිවිරුත්தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள கைத்தொழிற்பேட்டைகளில் தற்போது தொழிற்படு நிலையிலுள்ள கைத்தொழில்களின் எண்ணிக்கை, அவற்றில் மேற்கொள்ளப்படுகின்ற உற்பத்திகள் மற்றும் அவற்றுக்குரிய வணிகத்துறைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) கைத்தொழிற்பேட்டைகளில் தொழிற்பட்ட, தற்போது மூடப்பட்டுள்ள கைத்தொழில்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) தற்போது கைத்தொழிற்பேட்டைகள் அதிகபட்ச இயலளவுடன் இயங்குகின்றனவா என்பதையும்;

(iv) மேற்படி கைத்தொழிற்பேட்டைகளில் புதிய கைத்தொழில்களை தொடங்குவதற்கான வாய்ப்புகள் உள்ளனவா என்பதையும்;

(v) இலங்கையிலுள்ள சிறிய மற்றும் நடுத்தர அளவிலான கைத்தொழில்களின் எண்ணிக்கை பற்றிய கணக்கெடுப்பு நடத்தப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) புதிய கைத்தொழிற்பேட்டைகளை ஆரம்பிக்கத் திட்டமிடப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அத்திட்டங்கள் யாவை என்பதையும்;

(iii) அதற்கான மூலதனத்தைப் பெற்றுக்கொள்ள எதிர்பார்க்கப்படும் வழிமுறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -

(i) the number of industries currently operating in the industrial parks in Sri Lanka, their production and the business type they belong to, separately;

(ii) the number of industries that have been operated in the industrial parks, but have been closed down now;

(iii) whether industrial parks are currently operating at their maximum capacity;

(iv) whether there is space in the said industrial parks for starting new industries; and

(v) whether a census has been conducted regarding the number of small and medium-scale industries operating in Sri Lanka?

(b) Will he also inform this House -

(i) whether it has been planned to start new industrial parks;

(ii) if so, the plans that have been made for that; and

(iii) the expected way of raising capital for the above purpose?

(c) If not, why?

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවට මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

කර්මාන්තපුර ගැන තමයි අද ප්‍රශ්න සියල්ලම ඉදිරිපත් වුණේ. ලංකාවට ඉතාම අඩුපාඩුවක්ව පවතින, නැත්නම් අපේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟන්න තිබෙන ප්‍රධානම බාධාවක් තමයි කර්මාන්තකරණයට අවශ්‍ය කරන ඉඩකඩම් නොමැති වීම. කර්මාන්ත අමාත්‍යාංශය යටතේත් කර්මාන්තපුර තිබෙනවා. Industrial Development Board -IDB- එක යටතේත් කර්මාන්තපුර තිබෙනවා. BOI එක යටතේත් කර්මාන්තපුර තිබෙනවා. පළාත් සභා යටතේත් කර්මාන්තපුර තිබෙනවා. අපේ රටේ කර්මාන්තපුර කිව්වාම, ඒවා යම්කිසි විහිළුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා කාරණා දෙකක් තිබෙනවා. විශේෂයෙන් BOI එකේ කර්මාන්තපුර විධිමත්ව ක්‍රියාත්මක වෙනවා. මොකද ඒවා අපනයන ප්‍රමුඛ කර්මාන්ත සහ ඒවාට යටිතල පහසුකම් ඉතා ඉහළ ආකාරයෙන් සපයා තිබෙන නිසා. නමුත් අනෙක් කර්මාන්ත ගත්තාම ඒ දේ සිද්ධ වෙලා නැහැ.

(අ) (i) කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාව පුරා ඇති කර්මාන්තපුර තුළ මේ වන විට ක්‍රියාත්මක වන කර්මාන්ත සංඛ්‍යාව 527කි. කර්මාන්ත පුරයන්ට අදාළ කර්මාන්ත හා ඒවායේ නිෂ්පාදනය වෙන් වෙන්ව ඇමුණුම් අංක i සිට ix දක්වා තිබෙනවා. එම ඇමුණුම් මා **සභාගත*** කරනවා.

(ii) 2024.12.31 දිනට මෙම අමාත්‍යාංශය යටතේ ඇති කර්මාන්තපුර තුළ ක්‍රියාත්මක වූ, එහෙත් වැසී ගිය කර්මාන්ත සංඛ්‍යාව 40කි.

(iii) මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින කර්මාන්තපුර 33 අතරින් කර්මාන්තපුර 14ක් උපරිම ධාරිතාවෙන් යුක්තව ක්‍රියාත්මක වේ. ඒ කියන්නේ, සම්පූර්ණයෙන් එහි capacity එක fill වෙලා තිබෙන්නේ.

(iv) අවකාශ තිබේ.

(v) මෙම අමාත්‍යාංශය මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සම්බන්ධයෙන් සංගණනයක් මෙතෙක් සිදු කර නොමැත. එම data එකතු කර ගන්නා research එක දැනටමත් සිදු වෙමින් පවතිනවා. මීට අමතරව කාර්මික සංවර්ධන මණ්ඩලය - IDB - යටතේත් කර්මාන්තපුර 17ක් ක්‍රියාත්මක වනවා.

(ආ) (i) නව කර්මාන්තපුර ආරම්භ කිරීමට සැලසුමක් තිබෙනවා.

(ii) එය ජාතික සැලසුමක්. ඒක ක්‍රියාත්මක කරන්නේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයද, BOI එකද, IDB එකද කියන එකට එහා ගිය ජාතික සැලසුමක්.

ආරම්භ කිරීමට සැලසුම් කර ඇති නව කර්මාන්තපුර ලෙස ඉංගිරිය, රයිගම, මිල්ලනිය - අදියර II-, පරන්තන්, වාලච්චේන, පුලියන්කුලම, ආරච්චිකට්ටුව, තිහගොඩ, මාවතගම, ඇළයාපත්තුව සහ බිංගිරිය යන ප්‍රදේශ ආවරණය කරමින් අක්කර 570ක භූමි ප්‍රමාණයකින් යුතුව

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ජාතික වශයෙන් කර්මාන්තකරණය සඳහා නව කර්මාන්තපුර 10ක යටිතල පහසුකම් සංවර්ධන කටයුතු මෙම වසරේ ආරම්භ කිරීමට නියමිතයි. එය ජාතික වැඩ පිළිවෙළක් යටතේ සිදු වන දෙයක්. එම නිසා මොන ආයතනයද මෙම වැඩ පිළිවෙළේදී මූලිකත්වය ගන්නේ, මොන ආකාරයෙන්ද එම කර්මාන්තපුර සංවර්ධනය කරන්නේ කියන එක මෙහිදී අපි සොයා බලනවා.

විශේෂයෙන්ම මෙහිදී අපි බලාපොරොත්තු වෙනවා, එක් එක් ක්ෂේත්‍ර සඳහා කර්මාන්තපුර වෙන් කරන්න. එතකොට ඒවායේ ඵලදායිතාව වැඩි කර ගන්න පුළුවන්. මේ සැලැස්ම ඉදිරියේදී රටට ඉදිරිපත් කරනවා. එතකොට කර්මාන්තකරුවන්ට ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගන්න පුළුවන්.

(iii) ප්‍රාග්ධනය සපයා ගන්න මේ දක්වා ජාතික අය වැය මඟින් රුපියල් බිලියන 1.5ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම මේ කර්මාන්තපුර නිර්මාණය කිරීමේදී පෞද්ගලික අංශය, එහෙම නැත්නම් පොද්ගලික කර්මාන්තපුර විධියටත් අපට ඒවා ආරම්භ කිරීමට අවස්ථාවක් තිබෙනවා. ආයෝජකයන් ඉන්නවා නම්, ඒ කර්මාන්තපුරයට අවශ්‍ය භූමිය රජය මඟින් ලබා දෙනවා. Public-private partnership එකක් යටතේ කර්මාන්තපුරය build කරලා, නිර්මාණය කරලා, ඒ සේවාවන් සැපයීමේ හැකියාව පෞද්ගලික අංශයටත් තිබෙනවා. ඒ නිසා ප්‍රාග්ධනය පෞද්ගලික සහ රාජ්‍ය කියන ආකාර දෙකෙන්ම මේ කර්මාන්තපුර ගොඩනැඟීමට යොමු වෙනවා.

(ඇ) පැන නොනඟී.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කර්මාන්තපුරවල ඌන උපයෝජිත ඉඩම් පිළිබඳව සංගණනයක් කර තිබෙනවා ද? එහෙම හඳුනාගෙන තිබෙනවා නම් ඒ කර්මාන්තපුරවල ඌන උපයෝජිත ඉඩම් හඳුනා ගත් ආයෝජකයන්ට ලබා දීමට වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා ද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ කර්මාන්තපුරවල භාවිතය පිළිබඳව දැවැන්ත ගැටලුවක් තිබෙනවා. පළමුවැනි දේ තමයි, අපේ කර්මාන්තපුර සඳහා, කර්මාන්ත සඳහා තිබෙන ඉඩකඩම් ඉතාම සීමිත වීම. සමස්තයක් විධියට ගත්තාම, අක්කරයකින් රටට ලැබෙන ඵලදායිතාව ගණනය කළොත් ඉතාම වෙනස් ආකාරයක චිත්‍රයක් තමයි මැවෙන්නේ.

නමුත්, මේ දක්වා ලබා දී තිබෙන ඉඩම් සහ පවත්වාගෙන යන කර්මාන්තවලට අපට ලොකු බලපෑමක් කරන්න බැහැ. ඔවුන්ගේ ඵලදායිතාව වැඩි කර ගැනීම සහ නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගැනීම සඳහා ඒ ආයෝජකයින් එක්ක එකතු වෙලා කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරියේදී දැවැන්ත වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා.

ඊළඟට, කර්මාන්තපුරවලට ලබා දී තිබෙන තවත් ඉඩම් සම්බන්ධව ගත්තොත්, ඒ භූමියේ ඵලදායිතාව ඔවුන් උපරිමයෙන් ලබාගෙන නැහැ. ඒ සඳහාත් යම්කිසි සාකච්ඡාවක් සිදු කරන්න අවශ්‍යයි, ඒ භාවිත නොකර ඇති භූමිය, ඉදිකිරීම් නොකර තිබෙන භූමිය භාවිත කරන්නේ කොහොමද කියලා. තුන්වැනි කාරණය තමයි, ඉඩම වෙන් කරගෙන එහි කිසිම කර්මාන්තයක් සිදු නොකරන හෝ වසා දැමූ කර්මාන්තයක් සහිත ඉඩමෙහි භුක්තිය ඉල්ලමින් ජනතාව ඒ භූමියෙන් ඉවත් නොවන ගැටලු පැවතීම. කර්මාන්ත අමාත්‍යාංශය විධියට මේ සියලුදෙනාට ලිඛිතව දැනුම් දීලා තිබෙනවා, ඒ ස්ථානවලින් vacate වෙන්න, ඉවත් වෙන්න කියලා. එහෙම නොවුණොත් අපි තව මාස 3ක් ඇතුළත ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු වීමට සූදානමින් සිටිනවා. අපි ඒ කර්මාන්තකරුවන්ට -ඉඩම තිබෙන, ව්‍යාපාරය පවත්වාගෙන නොයන කර්මාන්තකරුවන්ට- ලිඛිතව දැනුම් දීලා තිබෙනවා, තමන්ගේ වැඩ පිළිවෙළ ඒ කර්මාන්තපුරයට අදාළ කම්ටුවට වහාම ඉදිරිපත් කරන්න කියලා. ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන අයගේ ඉඩම් පවරාගෙන නැවතත් කර්මාන්තකරණයට යොමු කිරීමටත්, යෝජනා ඉදිරිපත් කරන අයට සාධනීයව සහාය දීලා ඒ කර්මාන්ත නැවත ආරම්භ කිරීමටත් තමයි අපි සැලසුම් කරලා තිබෙන්නේ.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පැවසුවා, 2024.12.31 දින වන විට කර්මාන්තපුරවල තිබුණු වැසී ගිය කර්මාන්ත සංඛ්‍යාව 40ක් කියලා. මේ කර්මාන්ත වැසී යාමට හේතු මොනවාද යන්න සම්බන්ධයෙන් ඔබතුමන්ලා යම් විශ්ලේෂණයක් කරලා තිබෙනවාද?

මොකද, පසුගිය කාලය පුරාවටම රට ආර්ථික වශයෙන් බංකොලොත්භාවයට පත් වුණා. කොරෝනා වසංගතය හමුවේ ආයෝජකයින්ට ව්‍යාපාර පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් උද්ගත වෙලා තිබුණා. රජය පහසුකම් සලස්වන්නෙකු ලෙස මේ වැසී ගිය ව්‍යාපාරවලට මැදිහත් වීමක් කරලා ඒවා නැවත ස්ථාපිත කිරීමට කර්මාන්ත අමාත්‍යාංශය විධියට මැදිහත් වීමක් කරලා තිබෙනවාද කියලා මම දැනගන්න කැමතියි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු මන්ත්‍රීතුමියනි, වැසී ගිය කර්මාන්ත පිළිබඳව ඒ කම්ටුව හරහා කර්මාන්ත අමාත්‍යාංශය හොඳ අවබෝධයක සිටිනවා. නැවත ගොඩනඟා ගත හැකි කර්මාන්ත සඳහා මූල්‍ය වශයෙන් සහ තාක්ෂණික වශයෙන් දෙන්න පුළුවන් උපරිම සහාය ලබා දීමට කර්මාන්ත අමාත්‍යාංශය මැදිහත් වෙමින් තිබෙනවා. ඔබතුමිය ඇසුවා නේ, මේ කර්මාන්ත 40 වැසී යෑමට හේතුව ගැන විශ්ලේෂණයක් කරලා තිබෙනවාද කියලා. ඒ පිළිබඳව තවමත් ඒ පාර්ශ්වයෙන්, එහෙම නැත්නම් ඒ වසා දැමූ කර්මාන්තවලින් අපට නව සැලසුම් සම්පූර්ණ වශයෙන් ලැබිලා නැහැ. ඒ recovery plan එක ලැබුණාම තමයි අපට පුළුවන් වෙන්නේ, ඉදිරියට උදව් කරන්නේ කොහොමද කියන සාකච්ඡාවට එළඹෙන්න. බහුතරයක් තිබෙන්නේ වසා දමන ලද කර්මාන්ත. ඒවාට ඉදිරි සැලසුමක් සකස් කිරීම පිළිබඳ සාකච්ඡාවක් අවශ්‍ය ප්‍රමාණයෙන් සිද්ධ වෙලා නැහැ. අපි ඒ කර්මාන්තකරුවන්ගෙනුත් ඉල්ලා සිටිනවා, වහාම ඒ කර්මාන්තය නහාසිටුවීමට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්න කියලා. බැංකු ක්ෂේත්‍රයෙන්, මූල්‍ය ක්ෂේත්‍රයෙන් සහ මෙවර අය වැයෙන් ලබා දීලා තිබෙන ප්‍රතිපාදනත් එක්ක අපි උපරිම උත්සාහ ගන්නවා, වෙන අයට පවරා දීමට පෙර මේ කර්මාන්ත ආරම්භ කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

අලි-මිනිස් ගැටුම පාලනය: ගෙන ඇති ක්‍රියාමාර්ග

යානෙ-මනිත මෝතලෙක් කට්ටුප්පටුත්තල්:
நடவடிக்கை
CONTROL OF HUMAN-ELEPHANT CONFLICT: MEASURES TAKEN

448/2025

3. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු රුවන් විජේවීර මහතා වෙනුවට)
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு ருவன் விஜேவீர சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Ruwan Wijeweera)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින මුළු වනඇලි සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2020 සිට 2024 දක්වා අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මියගිය වනඇලි සහ වනඇතුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අලි-මිනිස් ගැටුමට බලපා ඇති මූලික හේතු සාධක කවරේද;

(iv) අලි-මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள காட்டு யானைகளின் மொத்த எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை யானை-மனித மோதல்கள் காரணமாக உயிரிழந்துள்ள காட்டு யானைகள் மற்றும் கொம்பன் யானைகளின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) யானை-மனித மோதல் ஏற்படுவதற்கான அடிப்படை காரணிகள் யாவை என்பதையும்;

(iv) யானை-மனித மோதலை முகாமைத்துவம் செய்வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House the -
(i) total number of wild elephants living in Sri Lanka;
(ii) number of wild elephants and wild tuskers that were killed due to the human-elephant conflict in each of the years from 2020 to 2024, separately;
(iii) key factors that have contributed to the human-elephant conflict; and
(iv) measures that have been taken to control the human-elephant conflict?

(b) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2011 දීප ව්‍යාප්ත වනඇලි සමීක්ෂණ වාර්තාව අනුව 5,879යි.

(ii)

වර්ෂය	මියගිය වනඇලි සංඛ්‍යාව	මිය ගිය ඇතුන් සංඛ්‍යාව
2020	328	04
2021	375	-
2022	439	10
2023	488	22
2024	388	17

(iii) වනඇලි ගැවසෙන ප්‍රදේශවල හා අවට ගම්මානවල සිදු කරන ඉඩම් පරිහරණ හේතුවෙන් විශේෂයෙන්ම හේන් වගා කිරීම, ගවයින් වනයට ඇතුළු කිරීම හා ගම්වාසීන් විසින් නීති විරෝධී ලෙස වනයට ඇතුළු වීම වැනි අවස්ථාවන්හිදී වනඇලි පහර දීම හේතුවෙන් වාර්ෂිකව සිදු වන මිනිස් මරණවලින් සියයට 50ක් පමණ මිනිසුන්ගේ නොසැලකිලිමත් බවෙන් සිදු වන මරණ බව පැහැදිලි වේ. තවද, රක්ෂිත ප්‍රදේශ ආසන්නයේ සිදු කරන වගා සඳහා අලින්ගේ ආකර්ෂණය හේතුවෙන් හා නිවාසවල වී ගබඩා කිරීම වැනි කරුණු නිසා දේපළ හානි හා ශාරීරික හානි වර්ධනය වී ඇති බව පැහැදිලි වේ.

(iv)
- වනඇලි විසින් සිදු කරන වගා හානි, දේපළ හානි, ජීවිත හානි අවම කිරීම සඳහා 2024 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර විදුලි වැට ඉදිකිරීමේ කටයුතු මේ වන තෙක් කිලෝමීටර 5,612ක ඉදිකර ඇති අතර, වනජීවී කලාප දකුණ, ඌව, නැගෙනහිර, මධ්‍යම, වයඹ, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, වවුනියාව, කිලිනොච්චිය හා පොළොන්නරුව ආවරණය වන පරිදි කිලෝමීටර 588ක් ඉදි කරමින් පවතී.
- දැනට ඉදිකර ඇති විදුලි වැට නඩත්තුව හා ආරක්ෂා කිරීම සඳහා සිවිල් ආරක්ෂක භටයින් 4,005ක් යොදවා ඇත.
- වනඇලි හානි බහුලව සිදු වන ස්ථානවල වනඇලි පලවා හැරීම සඳහා මුරපොළවල් ස්ථාපිත කර සිවිල් ආරක්ෂක භටයින් 737ක් යොදවා ඇත.
- විදුලි වැට නඩත්තු කටයුතු හා ආරක්ෂාව සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් 3,647ක් දිවා රාත්‍රී අඛණ්ඩව විදුලි වැට නඩත්තුව හා ආරක්ෂා කිරීමේ කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.
- වනජීවී කලාපවල වනඇලි විසින් සිදු කරන වගා හානි අවම කිරීමටත්, දෛනිකව වනඇලි පලවා හැරීමේ කටයුතු සඳහාත් වාර්ෂිකව 1,620,000ක් අලි වෙඩි මිලදී ගෙන බෙදා හැරීමට කටයුතු කර ඇති අතර, ඒ සඳහා වියදම රුපියල් මිලියන 350කි.
- වනඇලි විසින් සිදු කරන ජීවිත හානි, දේපළ හානි වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා 2023 වර්ෂයේ රුපියල් මිලියන 380ක් හා 2024 වර්ෂයට අදාළව මේ දක්වා ලබා දී ඇති තොරතුරු අනුව රුපියල් මිලියන 372ක් ද ලබා දී ඇත.
- වනඇලින්ගේ සංචරණ රටාවන් හඳුනා ගැනීම සඳහා GPS කරපටි යොදවා විද්‍යාත්මක පර්යේෂණ සිදුකර ඇති අතර, මෙම දත්ත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශවල භාවිත කරමින් පවතී.

- හානිදායක වශයෙන් හඳුනා ගත් වනඅලි අල්ලා ඉවත් කිරීම සිදුකොට ඇත.

- වනඅලින්ගේ සංචරණවලට වන බාධා ඉවත් කිරීම සඳහා වනඅලි සංක්‍රමණ මාර්ග (අලිමංකඩ) හඳුනා ගැනීම හා ඒවායේ වනඅලින්ගේ සංක්‍රමණවලට සිදු වන බාධා ඉවත් කිරීමට හා ආරක්ෂා කිරීමට කටයුතු කරමින් පවති.

- 2023 වර්ෂයේ සිට වනඅලින්ගෙන් සිදු වන ජීවිත හානි අවම කිරීම සඳහා කළමනාකරණ ක්‍රමවේද කලාප මට්ටමින් ප්‍රායෝගිකව අනුගමනය කර ගනිමින් වනඅලි විසින් ජීවිත හානි සිදු කරන ග්‍රාම නිලධාරී වසම් හඳුනා ගෙන ගම්වාසීන්, ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් හා අදාළ ප්‍රාදේශීය සභා සම්බන්ධ කර ගනිමින් ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර, වනඅලි සැරිසරන අතුරු මාර්ගයේ වනඅලි දර්ශනය වන අයුරින් යටි පඳුරු ඉවත් කිරීම හා අතුරු මාර්ගවල අඳුරු සහිත ස්ථානවල වීදි ලාම්පු සවි කිරීමට කටයුතු කර ඇත.

- වාසස්ථාන සුපෝෂණ කටයුතු 2023-2024

වර්ෂය	ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම (හෙක්ටෙයාර)	තෘණ භූමි කළමනාකරණය (හෙක්ටෙයාර)	මාර්ග දෙපස යටි රෝපණ ඉවත් කිරීම (හෙක්ටෙයාර)	ජල මූලාශ වැඩිදියුණු කිරීම (සංඛ්‍යාව)
2023	386.9	258.27	118.64	9
2024	105	222	365	5

- වනඅලි හානි අවම කිරීම සඳහා සාර්ථක හා අසාර්ථකභාවය අධ්‍යයනය සඳහා පහත සඳහන් නව තාක්ෂණය යොදා ගැනීම අත්හදා බලා ඇත.

1. ලංකාවේ දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද energizers භාවිත කරමින් උඩවලව, අම්පාර, පුත්තලම යන ප්‍රදේශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

2. අලින්ට අප්‍රිය පරිදි තරංග නිකුත් කරන උපකරණ භාවිත කරමින් අම්පාර, ගල්ගමුව, පොළොන්නරුව වනජීවී කලාපවල වනඅලි පලවා හැරීම හා වනඅලි ගම්මානවලට ඇතුළු වීම වැළැක්වීම සඳහා මෙම උපකරණ යොදා ගනිමින් අත්හදා බැලීම් සිදු කර ඇත.

3. නාවික හා ගුවන් හමුදාවන් සම්බන්ධ කරගෙන ඩ්‍රෝන යාත්‍රාවන් යොදා ගනිමින් වනඅලි පලවා හැරීමේ කටයුත්ත පුත්තලම, අනුරාධපුර, දකුණ යන වනජීවී කලාපවල සිදුකර ඇත.

4. මීමැසි පාලනය උපයෝගී කරගෙන මී මැස්සන්ගේ ශබ්ද තරංග භාවිත කරමින් මාදුරුඔය, අම්පාර කලාපවල මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

5. කළුතෙල් කලවම් කර කඹ පිළිස්සීමෙන් ඇති වන දුම උපයෝගී කරගෙන වනඅලි විකර්ෂණය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදුකර ඇත.

6. උඩවලව ජාතික උද්‍යානයේ ප්‍රධාන විදුලි වැට කඩා බිඳිමින් ගම්මානවලට පැමිණෙන මාර්ග හඳුනා ගෙන එම ස්ථානවල කොන්ක්‍රීට් තැටි සකස් කර බිම ඇනිරීමෙන් අධ්‍යයනයක් සිදුකර ඇත.

7. ඖෂධ ගැල් වූ හඳුන්කුරු වර්ගයකින් නිකුත් වන දුම උපයෝගී කරගෙන වනඅලි විකර්ෂණය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදුකර ඇත.

8. දැනට භාවිත කරන විදුලි වැට ව්‍යූහයේ වැඩිදියුණු කිරීම් සිදුකර ඒවායේ කාර්යක්ෂමතාව ඉහළ දැමීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ආ) අදාළ නොවේ.

බැස්ටියන් මාවත, කඩ කාමර විවෘත කිරීමේ උත්සවය: මාධ්‍ය ආවරණය

பெஸ்டியன் வீதியில் அமைந்துள்ள கடைகளின் திறப்பு விழா: செய்தி சேகரிப்பு

OPENING CEREMONY OF SHOPS AT BASTION MAWATHA: MEDIA COVERAGE

450/2025

4. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු පද්මසිරි බණ්ඩාර මහතා වෙනුවට)
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு பத்மசிறி பண்டார சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Padmasiri Bandara)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පිටකොටුව, බැස්ටියන් මාවතේ, කඩ 42ක් විවෘත කිරීමේ උත්සවයේ මාධ්‍ය ආවරණය කිරීම සඳහා සම්පූර්ණ වියදම වන රු. 19,301,403.61ක මුදලෙන් අත්තිකාරම් ලෙස රු. 17,639,938.86ක මුදලක් ටී.ආර්.අයි.ඒ.ඩී. ආයතනය වෙත ලබා දී තිබේද;

(ii) ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තිබේද;

(iii) ඉහත අත්තිකාරම් මුදල ගෙවීම අනුමත කිරීම සඳහා බලය තිබෙන්නේ කවුරුන් වෙතද;

(iv) එම මාධ්‍ය ආවරණය වෙනුවෙන් ඉහත සඳහන් පරිදි විශාල මුදලක් වියදම් කිරීමේ අරමුණ කවරේද;

(v) ඉහත උත්සවය සම්බන්ධයෙන් මාධ්‍ය ආවරණයක් සිදු කරනු ලැබුවේ නම්, එම මාධ්‍ය ආවරණය රජයේ මාධ්‍ය ආයතනයක් මඟින් සිදු නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புறக்கோட்டை, பெஸ்டியன் வீதியில் அமைந்துள்ள 42 கடைகளின் திறப்புவிழா சார்ந்த செய்தி சேகரிப்புக்கான மொத்தச் செலவாகிய ரூ. 19,301,403.61 தொகையிலிருந்து ரூ. 17,639,938.86 தொகை டி.ஆர்.ஐ.ஏ.டீ. நிறுவனத்துக்கு முற்பணமாகச் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இவ்விடயத்தில் பெறுகை நடைமுறை பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி முற்பணத் தொகையை செலுத்துவதற்கு அங்கீகாரம் வழங்கும் அதிகாரத்தை கொண்டிருப்பவர் யாரென்பதையும்;

(iv) மேற்படி ஊடக பிரசித்தப்படுத்தலுக்கு மேலே குறிப்பிடப்பட்டுள்ளவாறு பெருமளவு பணத் தொகை செலவு செய்யப்பட்டதன் நோக்கம் யாதென்பதையும்;

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

(v) මේ‍ප්‍රකාර විගණනයකට යටත් කිරීම සිදු නොකිරීමට හේතු කවරේද?

(ආ) ඉන්‍රේල්, ඒන්?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether an advance payment of Rs. 17,639,938.86 had been made to TRIAD Company, out of the total expenditure of Rs. 19,301,403.61 for the media coverage of the opening ceremony of 42 shops at Bastion Mawatha, Pettah;

(ii) whether the procurement process had been followed in that regard;

(iii) the person who has the authority to approve the aforesaid advance payment;

(iv) the purpose of spending such a large amount of money for the media coverage, as aforementioned;

(v) the reason for not providing the aforesaid media coverage through a government media institution, if any media coverage was provided for the aforesaid ceremony?

(b) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඒ බව තහවුරු කර ඇත.

(ii) ප්‍රසම්පාදන අනුමැතිය ලබා ගැනීමට යටත්ව එවකට අධිකාරියේ සිටි සභාපතිවරයා විසින් ගෙවීම අනුමත කර ඇති නමුත් ප්‍රසම්පාදන අනුමැතිය ලබා ගත් බවට නිරීක්ෂණය නොවේ.

(iii) මූල්‍ය ක්‍රියාවලිය අනුව මෙම බලය හිමිව ඇත්තේ ප්‍රසම්පාදන කමිටුවට බව වාර්තා කෙරේ.

(iv) එවකට කොළඹ ප්‍රදේශයේ සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති විවෘත කිරීමේ උත්සව ආකර්ෂණීය ලෙස පැවැත්වීම සඳහා ලබා දී තිබූ නියෝගවලට අනුව ක්‍රියා කරන ලද බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇති අතර, මෙම වාණිජ ඉදිකිරීම් බදු දීම සඳහා ප්‍රචාරණය ද මෙමඟින් අපේක්ෂා කර ඇත.

(v) ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කළේ නම් ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයම ඉදිරිපත් වීමට අවස්ථාව ලැබෙන අතර ඒ අනුව රජයට උපරිම වාසි සැලසෙන ආයතනයක් තෝරා ගැනීමට තිබුණි. එහෙත් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම හේතුවෙන් එම අවස්ථාව මහහැරී තිබුණු බව නිරීක්ෂණය කෙරේ.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු මහාචාර්ය අනිල් ජයන්ත මැතිතුමා.

වරප්‍රසාද: 2025.03.02 දින "සති අග අරුණ" පුවත් පත් වාර්තාව
சிறப்புரிமை: 2025.03.02ஆம் திகதிய "சதி அக அருண" பத்திரிகை அறிக்கை
PRIVILEGE: NEWS REPORT IN "SATHI AGA ARUNA" NEWSPAPER OF 02.03.2025

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මෙම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

2025 වසර සඳහා විසර්ජන පනත් කෙටුම්පත මේ වනවිට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එය දැනට කාරක සභා විවාදයට බඳුන්කොට තිබෙනවා.

තවද, පැවති ආදායම් බදු ජනතාවට වඩාත් හිතකර පරිදි සංශෝධනය කිරීම පිණිස 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පත ද 2025.02.21 දින ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති අතර, 2025.03.01 දින පාර්ලිමේන්තුවේ පළමුවර කියවීම සිදුකොට ඇත.

විදේශගත ශ්‍රමිකයන් විසින් ප්‍රේෂණය කරනු ලබන මුදල්වලින් කිසිදු ආදායම් බද්දක් අය නොකරන බවට පාර්ලිමේන්තුවේදී සහ මාධ්‍ය ප්‍රකාශ මඟින් ප්‍රසිද්ධියට පත්කොට තිබියදී, 2025 මාර්තු 02වන ඉරිදා "සති අග අරුණ" නමැති පුවත් පතෙහි ප්‍රධාන සිරස්තලය ලෙස සාලිය කුමාර ගුණසේකර නැමැත්තා විසින් "විදෙස් ශ්‍රමිකයන්ටත් 15%ක බද්දක්" යනුවෙන් ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස මාගේ කීර්ති නාමයට හානිකර මෙන්ම මා ඇතුළු ආණ්ඩු පක්ෂය නියෝජනය කරනු ලබන සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය වන ආකාරයේ පුවතක් පළකොට ඇත. මේ හරහා මන්ත්‍රී වරප්‍රසාද උල්ලංඝනය වන අතරම විදෙස්ගත ශ්‍රමිකයන්ට සිය ආදායම් නීත්‍යානුකූල ආකාරයෙන් ප්‍රේෂණය කිරීම අධෛර්යයට පත් කිරීමටත්, නීති විරෝධී ක්‍රම ප්‍රවර්ධනයටත්, ජනතාව කුපිත කිරීමටත්, රට තුළ අස්ථාවර තත්ත්වයක් නිර්මාණය කිරීමටත් උත්සාහ කර ඇති බව මාගේ නිරීක්ෂණයයි.

ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රී වරප්‍රසාද උල්ලංඝනය වන මෙම පුවත පළ කිරීමට අදාළ සියලුදෙනා කඩිනමින් ආවාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව හමුවට කැඳවා නීත්‍යානුකූල පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරනවා.

ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, එකොළොස්වන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතියි: මාර්තු 01]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ වීය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 01]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 01st March]
[HON. SPEAKER in the Chair.]

119 වන ශීර්ෂය.- බලශක්ති අමාත්‍යාංශය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්,

රු. 598,000,000

තලෙප්පු 119.- வலுசக்தி அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 598,000,000

HEAD 119.- MINISTER OF ENERGY
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 598,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, බලශක්ති අමාත්‍යාංශය - වැය ශීර්ෂය අංක 119. සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 10.06]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින විවාදයට ගැනෙන අමාත්‍යාංශයට අදාළ අංක 119 දරන වැය ශීර්ෂයෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අපේ රටේ ආර්ථිකයෙන් ලොකුම පංගුවක් - ආර්ථිකයේ සම්පූර්ණ ධාරිතාවෙන් තුනෙන් පංගුවකට වඩා - තිබෙන ක්ෂේත්‍රය තමයි විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය. මේ ක්ෂේත්‍රය පිළිබඳවත් එහි ප්‍රතිසංස්කරණ පිළිබඳවත් අපි දක්වන අවධානය මේ රටේ අනාගත ගමන් මග තීරණය කරනවා. අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම ගැන අපි කවුරුත් කථා කරනවා. ඒ ගැන වාදයක් නැහැ. නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම සඳහා තිබෙන ප්‍රධානම බාධා තමයි බලශක්ති මිල අධික වීම, බලශක්තියේ විශ්වාසදායක බව ගුණාත්මක බව පිළිබඳව තිබෙන ප්‍රශ්නය. මේවාට අපි වහාම පිළිතුරු සෙව්වේ නැත්නම් අපේ රටේ ආර්ථිකය නැවත ගොඩ නැඟීමේ අභියෝගය අපට ජය ගන්න බැරි වෙනවා. ඒ නිසා අද දින කාරක සභා අවස්ථාවේ විවාදයට ගැනෙන බලශක්ති අමාත්‍යාංශය යටතේ තිබෙන විදුලිය, පෙට්‍රෝලියම්, ගෑස් ඇතුළු සියලුම ක්ෂේත්‍ර සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ අත්‍යාවශ්‍යයි. ඒවා නිවැරදි මහකට යා යුතුයි. ඒ පිළිබඳව සමගි ජන බලවේගය හැටියට අපි ඉතා පැහැදිලි ප්‍රතිපත්තියක ඉන්නවා. පසුගිය ජනාධිපතිවරණය සඳහා අපි ඉදිරිපත් කරපු ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත් ඒ පිළිබඳව විස්තරාත්මකව කරුණු සඳහන් කරලා තිබෙනවා. ප්‍රතිපත්තිමය වශයෙන් වෙනසකට අපි සූදානම්. ඒ සඳහා සියලුදෙනාම රටක් වශයෙන් වැඩ කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, 2024 ජුනි මාසයේ මේ පාර්ලිමේන්තුව අලුත් විදුලිබල පනතක් සම්මත කරගත්තා. ඒ විදුලිබල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙච්ච වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගිහිල්ලා ඒ පනතේ සුදුසු නුසුදුසුභාවය පිළිබඳව, ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව ජනාධිපති නීතිඥ වරුන්ගේ සහාය ලබාගෙන ඉතා බරපතළ විධියට තර්ක කරපු පක්ෂය තමයි සමගි ජන බලවේගය.

අපි ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ කියා සිටි කරුණු නිසා මේ රටේ බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳව පුරවැසියාට තිබෙන අයිතිය තහවුරු කර ගැනීම ගැන ශ්‍රේෂ්ඨාධිකරණය අවධානය යොමු කළා. ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා බරපතළ සංශෝධන ගණනාවක් ඉදිරිපත් කළා. ඒ නිසා 2024දී සම්මත කරපු ඒ පනතේ තිබුණු අඩුපාඩුකම් රාශියක් විසඳුණා. නමුත්, තවදුරටත් එහි අඩුපාඩුකම් තිබුණා. ඒ නිසා වහකිව යුතු විපක්ෂයක් හැටියට සමගි ජන බලවේගය විසින් මේ පාර්ලිමේන්තුවට යෝජිත සංශෝධන ඉදිරිපත් කළා.

හුදු විවේචනයට පමණක් යන්නේ නැතුව, ආණ්ඩු බලයක් අපේක්ෂාවෙන් තරග කරන කණ්ඩායමක් හැටියට අපිට වගකීමක් තිබුණා, රට වෙනුවෙන් කළ යුතු දේ ගැන විකල්ප යෝජනා ඉදිරිපත් කරන්න. නමුත්, අපේ යෝජනා පිළිගත්තේ නැහැ. අපි ඒ ගැන කනගාටු වෙනවා. ඒ නිසා ප්‍රතිපත්තිමය කාරණාවලට මැදිහත්වීමට ශ්‍රේෂ්ඨාධිකරණයට තිබෙන සීමිත සීමා තුළ, ඒ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මඟින් දීපු නිර්දේශ හැරෙන්නට වෙන සංශෝධන සිද්ධ වුණේ නැහැ. ඒ නිසා තමයි, ඔබතුමන්ලා ජනාධිපතිවරණයේදී කිව්වේ, ඔබතුමන්ලාගේ රජය යටතේ අලුත්ම පනතක් අරගෙන එනවා කියලා. නමුත්, ඊට පසුව ඒ පනත සංශෝධනය කරන බවට රජයේ ස්ථාවරය වෙනස් වෙලා තිබෙනවා. ඒ සංශෝධන ක්‍රියාදාමය, විනිවිදභාවයකින් කරන බව, ඒ වාගේම අදාළ ක්ෂේත්‍ර සමඟ, විද්වතුන් සමඟ, ආයතන සමඟ නිසි සාකච්ඡාවකින් කරන බව ඔබතුමන්ලා ජනාධිපතිවරණයේදී ප්‍රතිපත්ති ප්‍රකාශනයේම සඳහන් කළා.

නමුත් ගරු සභාපතිතුමනි, අවාසනාවකට, මේ රටේ හදවත වාගේ තිබෙන බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධව, ඒ අඩු පාඩු සහිතව සම්මත වෙච්ච පනතේ, අඩු පාඩු හදන්න ඉදිරිපත් කරලා තිබෙන

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

යෝජනා, මේ රට ඉදිරියට යනවා වෙනුවට, මේ රටේ බලශක්ති ක්ෂේත්‍රය ආපසු හරවන යෝජනා බවට පත් වෙලා තිබෙනවා. සමහර වෙලාවට ඒ යෝජනා ඉදිරිපත් කරන අය හිතනවා ඇති, අපි මේ කරන්නේ අවංකව, රටට ආදරයට, අපේ දැනුමේ පමණට කියලා. නමුත්, අවාසනාවකට මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවලින් වෙන්නේ, මේ රටේ බලශක්තිය නිෂ්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම කියන ක්ෂේත්‍ර තුනටම, විශේෂයෙන්ම විදුලිබල ක්ෂේත්‍රයේ දේශීය සහ විදේශීය පෞද්ගලික ආයෝජන සීමාවීමයි.

මෙහි තිබෙන විශේෂත්වය මේකයි, ගරු සභාපතිතුමනි. ඔබතුමා පුදුම වෙයි, වර්තමාන ගරු ඇමතිතුමා Cabinet Paper එකක් ඉදිරිපත් කරනවා, 2025 ජනවාරි මාසයේ 23වැනි දා. ඒ සමඟ ඉදිරිපත් කරනවා, සංකල්පනාත්මක පත්‍රිකාවක්. ඒකේ දිනය 2025.01.20වන දා. මේ පිළිබඳ යෝජනාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් වුණා. එනම්, නව සංශෝධනය සඳහා මේ සංකල්ප පත්‍රිකාව මත කෙටුම්පත් කළ යුතුයි, කියන යෝජනාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් වුණා. වැදගත් කාරණය මේකයි, ගරු සභාපතිතුමනි. ඒ වන විට මේ ක්ෂේත්‍රයේ ඉන්න stakeholdersලා සමඟ සාකච්ඡා කරන්නේ නැතුවයි මේක කළේ. අපි දන්නවා, ඊට පස්සේ වැඩිපුර කල් ලබා දීමක් කළ බව. තවමත් ඒ සංකල්පනාත්මක යෝජනා නිසි ලෙස සලකා බැලීමක් නැහැ. එහෙම යෝජනා ඉදිරිපත් කරපු, පෞද්ගලිකව මමත් නියෝජනය කරන ආයතනයක් තිබෙනවා. මේ රටේ තිබෙන බලශක්තිය ක්ෂේත්‍රය පිළිබඳව මැදිහත් වන, think tank එකක් හැටියට අපි වැඩ කරනවා. ඒ, ව්‍යාපාර ක්ෂේත්‍රය වශයෙන් නොවෙයි, මේ ක්ෂේත්‍රයට මැදිහත් වෙන්න අවශ්‍ය නිසා.

දැන් මේ යෝජනාව ඉදිරිපත් වුණාම, අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් වෙනවා, මුදල් අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ 2025.02.03 වන දින දරන අමාත්‍යාංශ යෝජනා. මම ඒ කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කරනවා. ඒ වාගේම මුදල් අමාත්‍යාතුමාගේ 2025.02.03 දිනැති observations ද ඉදිරිපත් කරනවා. මේ observations සමඟ ඇමුණුම 1 කියලා ලේඛනයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. අනුර කුමාර දිසානායක මැතිතුමාගේ අත්සනින් ඉදිරිපත් කරලා තිබෙන මේ සංකල්ප පත්‍රිකාවේ ඉතා පැහැදිලිව තිබෙනවා, මේ දැනට ඉදිරිපත් කරලා තිබෙන සංකල්ප පත්‍රිකාව සම්පූර්ණයෙන් වැරදි බව, ආපසු යන බව, මේ රටේ අනාගතයේ විදුලිබල ක්ෂේත්‍රයට දේශීය හා පෞද්ගලික ආයෝජන ලබා ගැනීම නොහැකි තත්ත්වයක් මතු වන බව, ඒ වාගේම අප සමඟ කටයුතු කරන ජාත්‍යන්තර ආයතන සමඟ ඇති කර ගෙන තිබෙන එකඟතාවලට වෙනස් බව.

ඒ නිසා ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, බලශක්ති ක්ෂේත්‍රයේ මේ ප්‍රශ්නය සම්බන්ධව දැන් ඔබතුමන්ලාගේ රජය ඇතුළේම තිබෙන්නේ බරපතළ පරස්පරයක්. බලශක්ති අමාත්‍යාතුමා එතුමා පත් කරපු කමිටුවක නිර්දේශ මත විශ්වාසය තියලා නීති කෙටුම්පත් සම්පාදකට යවන්න කියලා කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න තරම් බරපතළ තත්ත්වයකට පත් වුණාට පස්සේ ඒ කාරණය ගැන මුදල් ඇමතිතුමා හැටියට ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනා සම්පූර්ණයෙන් එකිනෙකට පරස්පරයි. විෂයභාර අමාත්‍යවරයෙක් යමක් ඉදිරිපත් කළාම මුදල් අමාත්‍යාංශය බොහෝ විට යම් යම් වෙනස්කම් යෝජනා කරනවා. ඒක සාමාන්‍ය දෙයක්. හැබැයි, මෙතැන සංකල්ප පත්‍රිකා, ඒ කියන්නේ බලශක්ති අමාත්‍යාංශයේ සංකල්පයයි, අනුර කුමාර දිසානායක මහත්තයාගේ මුදල් අමාත්‍යාංශයේ සංකල්පයයි සපුරා පරස්පරයි. මේක බරපතළ තත්ත්වයක්. මේ විධියට පරස්පරතාවකින් ආණ්ඩුව කටයුතු කළොත් එකක්, රටට හොඳ නැහැ. දෙවැනි එක, ඔබතුමන්ලාගේ ආණ්ඩුවට හොඳ නැහැ. තුන්වැනි කාරණය, මේ රටේ බලශක්ති ක්ෂේත්‍රයේ අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණ ප්‍රමාණවත් ලෙස ඉක්මනින් ලබා ගන්න නොහැකි වුණොත්, ප්‍රමාද වුණොත්, පටලැවිලි වුණොත්, නඩුහබවලට යන්න වුණොත්, අධිකරණය හරහා අත්හිටවූ නියෝග ඇවිල්ලා එකිනෙකට පරස්පර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා අවුල් සහගත තත්ත්වයකට පත් වුණොත් මේ රටේ සංවර්ධනය ආපසු හැරවෙනවා.

ගරු සභාපතිතුමනි, ගරු මුදල් ඇමතිතුමාගේ observations ඇතුළත් 2025.02.03 දිනැති ලේඛනය ඇතුළු සියලු ලේඛන මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ තිබෙන බරපතළ පරස්පරතාව, මේ තිබෙන ප්‍රතිපත්තිමය පරස්පරතාව විසඳා ගත යුතුයි. ඒ නිසා අපි ඉතා වගකීමෙන් ඉල්ලා සිටින්නේ මෙකයි. අපි සහයෝගය දෙන්න කැමැතියි, උදව් කරන්න කැමැතියි, පක්ෂ, පාට භේදයක් නැතිව බලශක්ති ක්ෂේත්‍රයේ අවශ්‍ය කරන යාවත්කාලීන කිරීම් කරන්න, මේ තිබෙන ප්‍රතිපත්ති පරස්පරතා වෙනස් කර ගන්න. එම නිසා අපි හොඳ හිතින් ඉදිරිපත් කරන යෝජනා ගැන සලකා බලන්න. බලශක්ති ක්ෂේත්‍රය වාගේ අතිශය වැදගත් මර්මස්ථානයක මේ තරම් පරස්පරතා ඇති වෙනවා නම් ඒක ලොකු ප්‍රශ්නයක්; බරපතළ ප්‍රශ්නයක්. ඒ බරපතළ ප්‍රශ්නය තුළ අපේ රට ඉදිරියට යාම නිසැක ලෙසම අඩාළ වෙනවා. ඔබතුමන්ලා පෞද්ගලිකව හෝ කථා කරලා මේ පරස්පරතාව පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්න.

ගරු සභාපතිතුමනි, අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ නිෂ්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම කියන මේ කොටස් තුනෙන් සම්ප්‍රේෂණය - transmission - ගැන, ඒ වාගේම බෙදා හැරීම - distribution - ගැන අපේ අවධානය අඩුවෙන් තමයි ලබා දුන්නේ. හැම වෙලාවේම කථා කළේ නිෂ්පාදනය ගැනයි. අද වනවිට තිබෙන තත්ත්වය මොකක්ද? අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රයේ, විශේෂයෙන්ම සූර්යබල සංග්‍රාමය හරහා 2016.09.06වන දා මගේ මූලිකත්වයෙන් ආරම්භ කරපු ඒ වැඩ පිළිවෙළ අද වන විට සාර්ථක වෙලා මෙගාවොට් 1,400ක් සූර්ය බලය අපේ පද්ධතියේ තිබෙනවා. දැන් මොකද කියන්නේ? ඒ පද්ධතිය තුළ තිබෙන මෙගාවොට් 1,400 පාලනය කර ගන්න බැරි බවයි කියන්නේ; පද්ධතිය කළමනාකරණය කර ගන්න බැරි බවයි කියන්නේ. මොනවාද, තිබෙන ගැටලු? Transmission සහ distribution ප්‍රශ්න. එතකොට දැන් තිබෙන ප්‍රශ්නය තමයි, නිෂ්පාදන ධාරිතාව වැඩි වෙලා. තවදුරටත් වැඩි වෙමින් තිබෙනවා. එහෙම කළ යුතුයි. මේ රටේ අනාගතයේ දී විදුලි මිල අඩු කරන්නට, මේ රට ගොඩනඟන්නට අපට තිබෙන වටිනාම සම්පත තමයි අපිට තිබෙන වටිනා සුළං බලය, වටිනා සූර්ය බලය. වෙනත් රටවලට නැති අන්දමේ වටිනා සම්පතක් අපිට තිබෙනවා. ඒ කාලයේ මැදපෙරදිගට තෙල් හම්බ වුණාම අපි කිව්වා, black gold කියලා. අපිට තිබෙන නූතන black gold එක තමයි අපේ සුළං බල සම්පත.

ලෝකයේ තිබෙන විශිෂ්ටතම සුළං බල සම්පත අපේ උතුරු මුහුදේ සහ ගොඩබිමෙහි තිබෙනවා. එමඟින් අපේ රට පොහොසත් කරන්න පුළුවන්. එමඟින් උත්පාදනය කරන විදුලිය අපනයනය කරන්න අපට පුළුවන්. ඒ වාගේම, සූර්ය බලයෙන් විදුලිය ජනනය කිරීමේ තාක්ෂණය අද බෙහෙවින් දියුණු වෙලා තිබෙනවා. සූර්ය බලය මෙගාවොට් 1,400ක් අද පද්ධතියේ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තිබෙනවා. ඉතාම ඉක්මනින් අපට අවශ්‍ය ඉලක්කවලට යන්න පුළුවන්. ඒ නිසා මේ පද්ධතිය දියුණු කර ගන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, අපට තිබෙන ප්‍රධානම ගැටලුව තමයි transmission. ලොකුම ආයෝජනය ඕනෑ කරන්නේ, සම්ප්‍රේෂණය - transmission - සඳහායි. අපට අවශ්‍යයි, කිලිනොච්චිය-හබරණ 400 KV transmission line එක හදා ගන්න. අදානි සමාගම ඒ සඳහා යෝජනා ඉදිරිපත් කර තිබුණා. අදානි සමාගම ලංකාවෙන් ඉවත්ව ගිය නිසා අපට තරගකාරී සාධාරණ මිලකට ආයෝජකයන් සොයා ගන්න සිද්ධ වෙනවා. ඒ වාගේම හබරණ-කප්පල්තුරේ 400 KV transmission line එක AIIB සමඟ මූල්‍ය පහසුකම් ලබාගෙන අපි ගොඩනඟනවා. එය දැන් ගොඩනැඟෙමින් තිබෙනවා. ඒ වාගේම, හබරණ-වික්ටෝරියා, කිරිඳිවැල 400 KV transmission line එක සඳහා අපට ආයෝජකයන් සොයා ගන්න ඕනෑ. එය විශාලම පද්ධතියයි. ඒ පද්ධතියට තමයි අප අරණායක ඉදි කරන pumped storage බලාගාරය සකස් වෙන්නේ. ඒක විශාල පද්ධතියක්. විශාල මුදලක් වැය වන කටයුත්තක්. සමහර වෙලාවට ඩොලර් බිලියනයක් විතර වැය වෙන්න පුළුවන්. ඒ සඳහා අපට ආයෝජකයන් අවශ්‍යයි. ඒ වාගේම හම්බන්තොට-මොනරාගල 400 KV transmission line එකත් හදා ගන්න අවශ්‍යයි. ඒ හතර හදා ගත්තොත්, ඊළඟ අවුරුදු 20ට, 30ට මේ රටේ විදුලි බලය සම්ප්‍රේෂණය - transmission - සම්බන්ධයෙන් අපට තිබෙන ගැටලු ගොඩක් විසඳෙනවා. ඒ වාගේම අපට අවශ්‍යයි, අපේ පද්ධතිය ශක්තිමත් කරන්න. ගොඩක් දෙනෙක් අපේ පද්ධතියේ තිබෙන සමතුලිතතාව පිළිබඳ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළේ නැහැ. හැමදාම කථා කළේ, generation ගැන.

දිගින් දිගටම දුර්වල වෙච්ච අපේ විදුලිබල පද්ධතියේ දුර්වලකම අර පානදුරේ වඳුරාට පින් සිද්ධ වෙන්න හදුනා ගත්තා. මොකද, ඒ වඳුරා ඒ පද්ධතියේ දුර්වලකම පෙන්වා දුන්නා. පානදුරේ වඳුරාට වහ වහා නිවන් සැප ලැබෙන්න ඕනෑ, ඒ කෙරෙහි අවධානය යොමු කරවා දුන්නාට. මා මිත්‍ර නලින්ද ජයතිස්ස මැතිතුමා දන්නවා, පානදුරේ වඳුරන් නරක නැති බව. කොහේ වඳුරොත් එකයි. හැබැයි, පානදුරේ වඳුරා මේ රටේ ඉතිහාසයට එකතු වෙනවා, අපේ විදුලිබල පද්ධතියේ තිබුණු දුර්වලකම ජීවිත පරිත්‍යාගයෙන් පෙන්වා දුන්නු වඳුරා හැටියට. අපේ විදුලිබල පද්ධතියේ දුර්වලකම පෙන්වා දුන්නාට පානදුරේ මාලමුල්ලේ Panadura Grid Substation එකට පැනලා ජීවිතය පරිත්‍යාග කළ ඒ වඳුරාට නිවන් සැප ලැබේවා!

එම විදුලිබල පද්ධතියේ තිබෙන දුර්වලකම මකාලන්නට විසඳුම් කීපයක් තිබෙනවා. අපි හබරණ ඉදි කරන්න ඕනෑ මෙගාවොට් 200ක battery storage එකක්, හම්බන්තොට ඉදි කරන්න ඕනෑ මෙගාවොට් 200ක battery storage එකක්, කොළොන්නාවේ ඉදි කරන්න ඕනෑ තවත් මෙගාවොට් 100ක battery storage එකක්. ඒවා ඉදි කරන්නේ අපි අරණායක ඉදි කරන pumped storage එකට අමතරවයි. ඊට අමතරව තවත් තාක්ෂණික විසඳුම් තිබෙනවා. අද තිබෙන ජාතික විදුලිබල පද්ධති පාලන මධ්‍යස්ථානය 2015 වන කොට ඉදි කරන්න බැරුව අසරණ වෙලා එහි ඉදි කිරීම් අත්තිවාරමෙන් නතර වෙලා තිබුණේ. 2016දී ඒ පිළිබඳ වගකීම පෞද්ගලිකවම භාරගෙන 2018 වන කොට අද තිබෙන නවීන ජාතික විදුලිබල පද්ධති පාලන මධ්‍යස්ථානය ඉදි කරන්න මූලික වෙච්ච කෙනා හැටියට මම ආඩම්බරයෙන් මේවා ගැන කියන්නේ. අපේ තවත් විදුලිබල පද්ධති පාලන මධ්‍යස්ථානයක් නවීකරණය කරන්න තිබෙනවා, දැනට ලැබිලා තිබෙන, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරවලට අමතරව තවත් පහසුකම් ලබාගෙන. ඒ විදුලිබල පද්ධති පාලන මධ්‍යස්ථානය නොතිබුණා නම් අද මීටත් වඩා අමාරු තත්ත්වයකයි අප ඉන්නේ. "මොකුත් වුණේ නැහැ, කිසි දෙයක් වෙලා නැහැ, ඔයගොල්ලෝ මොනවාද කළේ?" කියලා අහන කට්ටියට අප කියන්නේ, අපි දැන් "සූර්යබල සංග්‍රාමය" සංකල්පය හරහා ජාතික විදුලිබල පද්ධතියට සූර්ය විදුලි බලය ප්‍රමාණවත් තරම් එකතු කරමින් තිබෙනවා කියලායි. සූර්ය විදුලි බලය තවත් ඕනෑ. සුළං විදුලි බලයත් තවත් ඕනෑ. අපි නවීන විදුලිබල පද්ධති පාලන මධ්‍යස්ථානයක් හදලා තිබෙනවා. මේවා කිව්වේ නැත්නම් අන්තිමට අහනවා නේ, "ඔයගොල්ලන්ගේ කාලයේ මොනවා ද කළේ?" කියලා. හැබැයි අපට හැම දේම කරලා ඉවර කරන්න බැරි වුණා. මොකද, අපට ආණ්ඩු බලය නැති වුණා. අපි දැන් නැවත ඉන්නේ විපක්ෂයේ. අපි ආණ්ඩුවට සහයෝගය දෙන්න කැමැතියි, අපේ අත්දැකීම් හරහා.

මම තවත් එක දෙයක් කියන්න ඕනෑ, ගරු විදුලිබල ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ. මා මෙම විෂය භාරව හිටපු කාලයේ මගේ අවධානයට ලක් වුණා, වික්ටෝරියා-රන්දෙනිගල ආශ්‍රයෙන් pumped storage එකක් ඉදි කිරීමේ හැකියාව ගැන. අද වන කොට වික්ටෝරියා ජල විදුලි බලාගාරයෙන් මෙගාවොට් 210ක විදුලි බලයක් උත්පාදනය කරනවා. හැබැයි, ඒ බලාගාරය සැලසුම් කරපු වෙලාවේ තවත් මෙගාවොට් 120ක උත්පාදනයකට ඉඩ කඩ තියලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඒ සඳහා වන උමං පද්ධතිය හදලා තිබෙනවා. ඒ වේල්ලට අදාළ වියදම් සියල්ල කරලා තිබෙන්නේ. නමුත්, ඒ අමතර විදුලිය මෙගාවොට් 120 උත්පාදනයට අදාළ යන්ත්‍ර සවි කරන්න අපට බැරි වුණා. මොකද, ඒ කාල සීමාවේදී වඟින එක අඩු වුණා. ඒ වාගේම, වික්ටෝරියා ජල විදුලි බලාගාරයේ ධාරිතාව අඩු වුණා. වික්ටෝරියා සහ රන්දෙනිගල ජලාශ ගත්තාම, ඒ කියන්නේ upper pond එක වික්ටෝරියා හැටියටත්, lower pond එක රන්දෙනිගල හැටියටත් පාවිච්චි කරලා pumped storage එකක් ඇති කරන්න ලොකු විභවයක් තිබෙනවා. ඒ වාගේම ඒකට floating solar system එකක් සම්බන්ධ කරනවා නම් සාපේක්ෂව ඉතා අඩු වියදමකට ඒ ව්‍යාපෘතිය කරන්න පුළුවන්. ඒ වාගේම, එය පෞද්ගලික ආයෝජකයන්ට ආයෝජන අවස්ථා ළඟා කර ගන්න පුළුවන් විධියේ ඇඟට පේන පැහැදිලි තැනක්. මොකද, ඉඩම් අත් පත් කර ගන්න අවශ්‍ය නැහැ. අනෙකුත් පහසුකම් සියල්ල එතැන තිබෙනවා. Grid එක, ආසන්නයේ තිබෙනවා. ඒ වාගේම විදුලි බලය සම්ප්‍රේෂණය කිරීමට අවශ්‍ය පහසුකම් එතැනම තිබෙනවා. ඒ නිසා ඒක අඩු වියදමකින් සකස් කරන්න පුළුවන් pumped storage එකක්. මම අරණායක ව්‍යාපෘතියට විරුද්ධව නොවෙයි මෙහෙම කියන්නේ. අරණායක ව්‍යාපෘතිය කරගෙන යන ගමන් ඊට සමාන්තරව මෙම වික්ටෝරියා-රන්දෙනිගල pumped storage එක ගැනත් බලන්න; ඒ ගැන අවධානය යොමු කරන්න.

මේ සියල්ලම කරන්න ඩොලර් බිලියන 6ක පමණ ආයෝජන අවශ්‍යයි, ගරු සභාපතිතුමනි. තවත් අවුරුදු 20කින් නොවෙයි, ඊළඟ අවුරුදු 2, 3 ඇතුළත ඩොලර් බිලියන 6ක ආයෝජන අවශ්‍යයි. ඩොලර් බිලියන 6ක් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන්න තනි ආයෝජකයෙකුට බැහැ. මේ සඳහා අපට විදේශීය ආයෝජකයන් අවශ්‍යයි. එක රටකින් නොවෙයි, රටවල් ගණනාවකින් ආයෝජකයන් අවශ්‍යයි. මේ සඳහා අපට දේශීය ආයෝජකයන් ද අවශ්‍යයි. මොකද, ලංකාවේ භූමියේ තත්ත්වය, ලංකාවේ විදුලිබල පද්ධතියේ තත්ත්වය දන්නා ආයෝජකයන්ගේ සහාය ලබා ගැනීම අවශ්‍යයි. ගරු සභාපතිතුමනි, ඩොලර් බිලියන 6ක ආයෝජන අපේක්ෂා කරනවා නම් අද තිබෙන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව මේක කරන්න බැහැ. ඒ වාගේම හදලා තිබෙන කෙටුම්පත අනුව කරන්නත් බැහැ. කරුණාකර අනාගතය ගැන හිතලා රටට අහිතකර නොවන, නමුත් win-win විසඳුමක් ඇති වන; රටටත් ජයග්‍රහණයක්, ආයෝජකයාටත් ජයග්‍රහණයක් ලැබෙන විධියට, දේශීය සහ විදේශීය ආයෝජකයන් දිරිමත් කරන ආකාරයට අපේ විදුලිබල පද්ධතිය දියුණු කරන්න අවශ්‍ය ආයෝජන වහාම ගෙන ඒමට කටයුතු කරන්න. ඒ සඳහා අවශ්‍ය වන නීතිමය රාමුවයි අප මේ හදන්න යන්නේ. ඒ නිසා බරපතළ ලෙස මේක සලකන්න. මේක දේශපාලන පක්ෂයක ප්‍රශ්නයක් නොවෙයි. අප හැමෝගේම අනාගතය පිළිබඳ ප්‍රශ්නයක්.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු සභාපතිතුමනි, අපේ රටේ විදුලි බලය, ගෑස්, පෙට්‍රෝලියම් ආදී සියල්ල පිළිබඳව තිබෙන ප්‍රතිපත්තිය තමයි, ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග. මේ ප්‍රතිපත්තිය සකස් කර ගන්න බොහොම අසීරු වී තිබිලා, 2019 අගෝස්තු මාසයේ 09වැනි දා අංක 2135/61 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග රටේ නීතිය බවට පත් කළා. ඒක දිගු ක්‍රියාදාමයක්. ඒක මම තනිවම කරපු දෙයක් නොවෙයි. ඒ පිළිබඳ සියලු ක්ෂේත්‍රවල විද්වතුන් තමයි එය සකස් කළේ. අවසානයේ අපේ රජය යටතේම අපේ ඇමතිවරයා විසින් එය ගැසට් කරනු ලැබුවා. මේ රටේ බලශක්තිය පිළිබඳ එක එක ඇමතිවරයා සැරින් සැරේට හිතෙන දේ කියන්නේ නැතිව ඉන්න. ජනාධිපතිතුමා එකක්, ඇමතිතුමා තව එකක්, මන්ත්‍රීවරු තවත් එකක්, ආයතනවල විශේෂඥයෝ තවත් එකක් කියන්නේ නැතිව කරුණාකර එක දෙයක් කියන්න. මේක 2019දී හදපු ප්‍රතිපත්තියක්. අද වන විට අවුරුදු 6ක් වෙනවා. මේක මේ රටේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග සම්බන්ධ නීත්‍යානුකූල ලියවිල්ලක්. මේක බලගතු ලියවිල්ලක්, මේක අධිකරණයේ බලාත්මක ලියවිල්ලක්. ඒ ආකාරයට අලුත් ප්‍රතිපත්තිය සකස් කර ගන්න. ඒ අවශ්‍ය සහයෝගය ලබා දෙන්න රජය තුළ වාගේම පෞද්ගලික අංශයේ ඉන්න විශේෂඥයෝ සූදානමින් ඉන්නවා. ඒක අවශ්‍ය දෙයක්. මොකද, ජාතික ප්‍රතිපත්තියක් නැතිව ඉදිරියට යන්න බැහැ.

හිටපු ගමන් කියනවා සියයට 70යි කියලා. අපි කියනවා ඒක හොඳයි කියලා. තව වෙලාවක කියනවා සියයට 60යි කියලා. අපිත් කියනවා හොඳයි කියලා. නමුත් එහෙම නොවෙයි වෙන්න ඕනෑ. විශේෂයෙන්ම අද පෙට්‍රෝලියම් ක්ෂේත්‍රය, ගෑස් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් බොහොම කනගාටුදායක තත්ත්වයක් ඇතිවෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය තමයි මේ රටේ ජනතාව ඉතා ඉහළින් අනුමත කළේ. මැතිවරණ දෙකකදී ඉතාම ඉහළින් එය අනුමත කළා. මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ බලශක්තිය පිළිබඳ යෝජනා තිබෙනවා 41ක්. ඔබතුමා පුදුම වෙයි, අපේ සභානායකතුමා පුදුම වෙයි, ඒ යෝජනා 41න් 4යි මෙවර අය වැය යෝජනාවල සඳහන් කරලා තිබෙන්නේ. ඒ ඔක්කෝම කියන්න ඕනෑත් නැහැ. මේ හැම එකකටම මුදල් යන්නේත් නැහැ. සමහර ඒවායේ අදාළ ක්‍රියාදාමය පටන් ගන්නයි තිබෙන්නේ. මොකද, ඒවා සමාන්තරව ක්‍රියාත්මක කරන්න පුළුවන් නිසා. එකකට පස්සේ නොවෙයි, බොහොමයක් ඒවා සමාන්තරව ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ යෝජනා 41කින් 4යි අය වැය යෝජනාවල තිබෙන්නේ. විෂයය දන්නා කෙනෙක් ඒ ගැන කියන්න. මේක බරපතළ තත්ත්වයක්. අපි ඉන්නේ අමාරු තත්ත්වයක. අපේ ආර්ථිකය තිබෙන්නේ ගැටලුවක. අපි දුෂ්කර තත්ත්වයක ඉන්නේ. ඒ නිසා අපි ඉක්මනින් විසඳුම්වලට යන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ශක්තිමත් ආණ්ඩුවක්. ඔබතුමන්ලාට මේ ප්‍රතිසංස්කරණ කරන්න බැරි නම් කාටද කරන්න පුළුවන්? අපි බලයේ ඉන්නකොට අපට ගැටලු තිබුණා, අපේ ආණ්ඩු ශක්තිමත් නැති නිසා; පරස්පර අදහස් තිබුණු නිසා; නායකයන් පක්ෂ දෙකක හිටපු නිසා. අද එහෙම නොවෙයි නේ. නායකයා එකම පක්ෂයේ; එකම පක්ෂයට පාර්ලිමේන්තුවේ බලය; තුනෙන් දෙකක බලයක් තිබෙනවා. තුනෙන් දෙකක බලයක් තිබෙනවා කියලා හැමදේම කරන්න යන්නත් එපා. නමුත් විෂයානුබද්ධ විශේෂඥයන් සමඟ කටයුතු කරලා, කරුණාකරලා මේ ක්ෂේත්‍රයට මැදිහත් වෙන්න. මේ ක්ෂේත්‍රය ගැන කිසිම දුෂණ චෝදනාවක් ජීවිතේට එල්ල නොවුණු, මේ වගකීම් දරපු කාලයේ කිසිම නඩුවකට මුහුණ නොදුන්නු, වගකීමෙන් වැඩ කරපු අමාත්‍යවරයකු හැටියටයි මම මේ කාරණා කියන්නේ. අපි වැඩත් කළා. ඒ වාගේම කිසිම දුෂණයක් නොමැතිවත් ඒ කටයුතු කළා. අපේ කාලයේ බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අඩු ගණනේ දුෂණ චෝදනාවක්වත් තිබුණේ නැහැ. එක නඩුවක්වත් අපට විරුද්ධව පැවරුවේත් නැහැ; ඒ අවුරුදු පහටම එක නඩුවක්වත් පැවරුවේ නැහැ. සමහරු බොරුවටත් නඩු පවරනවා නේ. අපට විරුද්ධව බොරුවටවත් නඩුවක් තිබුණේ නැහැ. ඒක තමයි අපි වැඩ කරපු විධිය. ඒ නිසා මම ඔබතුමන්ලාට කියන්නේ, ඔබතුමන්ලා එකඟ වෙච්ච ප්‍රතිපත්ති ටික ක්‍රියාත්මක කරන්න කියලායි.

ඒ වාගේම, අපේ රටේ අනාගතයට ඉතා වැදගත් ක්ෂේත්‍රයක් තමයි හයිඩ්‍රජන් බලශක්තිය. ලෝකයේ කාටවත් නැති විධියේ සුළං සම්පතක් අපට තිබෙනවා. Plant factor එක සියයට 40කට වැඩියි හැම තැනම, අපේ උතුරු සීමාවේ. අපේ රටට අවශ්‍ය විදුලි ධාරිතාවට වඩා සිය ගුණයක් විතර සුළං සහ සූර්ය බලයෙන් අපට විදුලිය නිෂ්පාදනය කර ගන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, අපට තිබෙන විශාලම වාසිය තමයි, අද ලෝකයේ green hydrogen, නැත්නම් blue hydrogen වශයෙන් හයිඩ්‍රජන් බලශක්තිය දියුණු වෙන එක.

අනාගතයේ ලෝකයේ විශාල නැව් ක්‍රියාත්මක වෙන්නේ හයිඩ්‍රජන්වලින්. අනාගතයේ නොවෙයි, දැනුත් ක්‍රියාත්මක වෙනවා, ඒවා convert කරමින් යනවා. ඒ වාගේම සමහර රටවල ගෘහස්ථවල natural gas වෙනුවට LNG, එහෙම නැත්නම් LPG වෙනුවට අද පාවිච්චි වෙන්නේ හයිඩ්‍රජන්. ඔවුන් දැන් ඒ සඳහා යොමු වෙමින් ඉන්නවා. සමහර රටවල ජනතාවට ෂෙඩ් එකට ගිහිල්ලා තමන්ගේ මෝටර් රථයට හයිඩ්‍රජන් ගහගන්න පුළුවන් තත්ත්වය දැන් ඇතිවෙලා තිබෙනවා. ලෝකයේ අනාගතය හයිඩ්‍රජන්. ඒක blue hydrogen වෙන්න පුළුවන්, green hydrogen වෙන්න පුළුවන්. අපට ඇති පදමට පුනර්ජනනීය බලශක්තිය තිබෙනවා. අපේ රටේ තිබෙන ජලය හයිඩ්‍රජන් බවට පරිවර්තනය කර ගන්න පුළුවන්. අපට ජලය ප්‍රමාණවත් ලෙස තිබෙනවා වාගේම අපට පුනර්ජනනීය බලශක්තියත් තිබෙනවා. එම නිසා දැනට තිබෙන සම්පූර්ණ ධාරිතාව ජාතික පද්ධතියට එදිනෙදා අවශ්‍ය නොවුණත්, පෙට්‍රෝලියම් වෙනුවට -ඩීසල් වෙනුවට හෝ පෙට්‍රල් වෙනුවට- එහෙම නැත්නම් LPG වෙනුවට අපට හයිඩ්‍රජන් පාවිච්චි කරන්න පුළුවන්.

ලෝකයේ තාක්ෂණය අපට එක්වරම අනුගත කර ගන්න බැහැ. ඒ සඳහා පර්යේෂණ ක්‍රියාමාර්ග අවශ්‍යයි. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත්, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත් දෙකෙන්ම කිව්වා, ලංකාවේ green hydrogen දියුණු කිරීම සඳහා කැප වෙනවා කියලා. ඔබතුමන්ලාත් ඒ මතය පිළිගෙන තිබෙනවා, විපක්ෂයේ අපේ මතයත් ඒකයි. නමුත් මම පුදුම වුණා, "ලෝකයේ නවීනතම බලශක්ති විකල්පය වන හයිඩ්‍රජන් පිළිබඳ පර්යේෂණ ආරම්භ කරමින් ඒ වෙනුවෙන් අපි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට රුපියල් මිලියන මෙච්චර ප්‍රමාණයක් වෙන් කරමි" කියලා සංකේතාත්මක ප්‍රකාශයවත් මෙතැන නොමැතිවීම පිළිඳව. මොකද, මුල් අදියරේදී මේ අවුරුද්දේ ඉදිරි මාස 9ට ඒකට රුපියල් බිලියනයක් අවශ්‍ය වෙන්නේ නැහැ. එම නිසා මම නැවතත් ඉල්ලන්නේ මේකයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ශක්තිමත් කරන්න. මේ රට ගොඩනඟන ප්‍රධානතම ආයතනය, අනාගතයේ මේ රට පොහොසත් කරන ප්‍රධානතම ආයතනය, මේ රටේ අනාගතය වෙනුවෙන් බලශක්ති ක්ෂේත්‍රය නවීකරණය කරන ආයතනය තමයි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය. මම දන්නවා, සමහර වෙලාවට ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කෙරෙහි ඒ තරම් හොඳ ආකල්පයක්

නැහැ, බාධා කරනවා කියලා කියනවා. සමහර විශේෂඥයෝ සමහර වෙලාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ඉතිහාස අත්දැකීම් ගැන හිතලා අඩු පාඩුකම් කියනවා. හැබැයි, මේ රටේ සූර්ය විදුලිබලය ප්‍රවර්ධනයට, මේ රටේ සුළං විදුලිබලය ප්‍රවර්ධනයට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය දැක්වූ දායකත්වය අතිවිශිෂ්ටයි. මේ රටේ මන්නාරම් ප්‍රදේශයේ සුළං බලය පිළිබඳව සමීක්ෂණ කරලා, ජාත්‍යන්තර ප්‍රමිතියට ඒවා එකතු කරලා, අද මෙගාවොට් 104ක විශිෂ්ටතම බලාගාරයක් ඉදිකරලා තිබෙන්නේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ශක්තියෙන්. ඒ වාගේම අද වෙනකොට පෞද්ගලික අංශය තවත් මෙගාවොට 200කට වැඩි ධාරිතාවක් සහිත සුළං විදුලි බලාගාර ඉදිකරලා තිබෙනවා. ඒවාට පදනම දැම්මේත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය. ඒ වාගේම අපි ඉදිරිපත් කළ මුල් කැබිනට් පත්‍රිකාව අනුව පුනරින්වල තිබෙන විභව ශක්තිය හඳුනාගෙන එම ප්‍රදේශයේ විතරක් මෙගාවොට් දහසකට වඩා වැඩි, ඒ කියන්නේ මෙගාවොට් 1,040ක බලාගාර -සුළං විදුලි බලය මෙගාවොට් 240යි, සූර්ය විදුලි බලය මෙගාවොට් 800යි- පුනරින්වල විතරක් ඉදි කරන්න පුළුවන්.

හැබැයි, ඒ සඳහා අවශ්‍ය backbone එක අපි හදන්න ඕනෑ, ඒ backbone transmission line එක අපි හදන්න ඕනෑ. ඊට යටත්ව විශිෂ්ටතම සුළං විභයක් ගොඩබිම තිබෙනවා. අපි මුහුදට යනවා නම් ඒ තිබෙන බලය ඊටත් වඩා ශක්තිමත්. ඒ නිසා මේ රටේ අනාගතය ගොඩ නහන වටිනාම සම්පත තමයි සුනිත්‍ය බල ශක්ති ක්ෂේත්‍රය. ඒ සඳහා නීතියෙන් බලය තිබෙන, අත්දැකීම් තිබෙන, සෑහෙන පමණකට සාර්ථක වෙච්ච ආයතනය තමයි සුනිත්‍ය බලශක්ති අධිකාරිය. ඉතින් එය ශක්තිමත් කිරීම වගකීමක් මෙන්ම එය ශක්තිමත් කිරීමට අවශ්‍ය පහසුකම් දීම වගකීමක්. ඒ සඳහා නවීන දැනුම ඇති, ලෝකයේ වෙනත් රටවල අත්දැකීම් ඇති, විශේෂඥතාව සහිත ඉංජිනේරුවන් බඳවා ගන්න ඕනෑ. ගරු බිමල් රත්නායක මැතිතුමනි, ඔබතුමාත් ඉංජිනේරු ශිෂ්‍යයෙක් වශයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්තා. ඔබතුමාත් එක්ක ඉගෙන ගත්ත විශේෂඥතාව තිබෙන, දක්ෂයක් බොහෝ දෙනෙක් අද ඕස්ට්‍රේලියාවට හෝ වෙනත් රටවලට යනවා. ඒ රටවලට ගිහිල්ලා මොකක්ද කරන්නේ? ලංකාවෙන් මූලික දැනුම ලබාගෙන ඒ රටවල බොහොම ඉහළ තනතුරුවලට යනවා; වගකීම් දරනවා. අපට අපේ රටේ මේ ක්ෂේත්‍රයට විශේෂඥයන් බඳවා ගන්න අවශ්‍යයි. ඒ සඳහා සුදුසු වැටුප් තලයක් හෝ යම් පහසුකම් ලබාදීමක් කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ ජාත්‍යන්තර අත්දැකීම් තිබෙන අය අපට බඳවා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා.

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා සති කිහිපයකට කලින් මම ප්‍රශ්න කළ වෙලාවක කිව්වා, සූර්ය විදුලි බලය ජාතික පද්ධතියට එකතු කර ගැනීම සීමා කරලා නැහැ කියලා. ඔබතුමා ඒ ප්‍රකාශය කළ දවසට කලින් ඉරිදා ඒක සීමා කරලා තිබුණා. අද තිබෙන ගැටලුව මොකක්ද? තරගකාරී මිල අනුව, මෙගාවොට් 1x60, 1x90, මෙගාවොට් 150 යනාදී වශයෙන් ව්‍යාපෘති පටන් අරගෙන තරගකාරී මිලට, අඩුම මිල ගණන්වලට අපි පද්ධතියට විදුලිය ගත්තා. ඒ පුංචි සමාගම් අපේ රටේ සාමාන්‍ය ව්‍යාපාරිකයෝ. ඒ සමාගම්වලට අපි ඒ කාලයේ ලාභය ගණන් හැදුවේ return on investment ක්‍රමයට, උපරිමය සියයට 16යි, සියයට 20යි වාගේ. දැන් ඉරිදා දවස්වල විදුලිය මිලදී ගන්නේ නැහැ සූර්ය බලාගාරවලින්. ඒ නිසා ඉරිදා දවස්වලට බරපතළ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. දවස් 7න් එකක් විදුලිය මිලදී ගන්නේ නැති වුණාම, ඒක නතර කළාම ඒ ව්‍යාපාරිකයන්ට කීයද ඉතුරු වෙන්නේ? ඒ අයට බැංකු වාරික ගෙවා ගන්නත් බැරි තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා, කරුණාකරලා අපි සූර්ය බලාගාරවලින් curtail කරනවා කියන තැනට ගිහිල්ලා ඔක්කෝම නතර කරලා Grid එක බේරා ගනිමු කියන තැන වෙනුවට, සුදුසු තාක්ෂණික විසඳුම්වලට යන්න, මේ මොහොතට ඒ කපා හැරීම් අත්‍යවශ්‍ය නම් සාධාරණ ලෙස ඒ කපා දැමීම් කරන්න කියලා. මොකද, අද අපට පේනවා දුක් ගැනවිලි තිබෙනවා. එදා තරග කරලා තරගකාරී මිලට සුළු ලාභයක් තබාගෙන ජාතික පද්ධතියට විදුලිය සපයපු ඒ ව්‍යාපාරිකයෝ අද අසරණ වෙලා තිබෙනවා ජාතික පද්ධතියට සූර්ය විදුලි බලාගාරවලින් විදුලිය එකතු කර නොගැනීම නිසා.

ගරු සභාපතිතුමනි, මට තිබෙන්නේ සීමිත වෙලාවක් නිසා මම මේ කාරණයත් කෙටියෙන් කියන්නම්. මේ විදුලි පද්ධතිය ශක්තිමත් කරන්න, ඒ වාගේම අපේ රටේ පෙට්‍රෝලියම් ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න අවශ්‍ය ක්ෂේත්‍ර ගණනාවක නවීකරණයන් සිදු විය යුතුයි. එක පැත්තකින් මේ පිරිපහදු කිරීමේ කටයුතු සඳහා අපි ගන්නා පියවර ගැන කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හම්බන්තොට පිරිපහදුවක් සඳහා පසුගිය රජය ගිවිසුමක් අත්සන් කළා. තවමත් එහි වැඩ පටන් අරගෙන නැහැ. කරුණාකරලා ඒක ඉක්මන් කරන්න අවශ්‍ය බලපෑම් කරන්න. මොකද ඒක අපට අවශ්‍ය වන නිසා. අපේ දැනට තිබෙන පිරිපහදුව ගැන අපි බලන්න ඕනෑ. ඒක අලුත්වැඩියා කරන්න පුළුවන්ද? ඒක හුඟක් යල් පැන ගිහිල්ලා. අපේ වයසටත් වඩා පරණ එකක්. අපි අලුත් පිරිපහදුවක් හදනවාද? හදන්නේ නැත්නම්, "හදන්නේ නැහැ" කියන තැනට ගිහිල්ලා ඒ අනුව කටයුතු කරන්න. මොකක්ද කරන්නේ කියන එක ගැන දෙපැත්තක් ගැන හිත හිතා ඉන්න එපා. ඒ තීරණය ඉක්මනින් ගත යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ වාගේම අපේ පුරවැසියාට ශක්තිය ලබා ගැනීම සඳහා අපේ Grid එක smart grid එකක් බවට පත් කරන්න ඕනෑ. එහෙම smart grid එකක් බවට පත් කළාම පාරිභෝගිකයා ගෙවන මිල අඩු වෙනවා; විදුලි බිල අඩු වෙනවා; කාර්යක්ෂමතාව ඇති වෙනවා; පාලනය කිරීම පහසු වෙනවා. ඒක නිසා අපේ විදුලිබල පද්ධතිය smart grid එකක් බවට පත් කරන්න අපි එකඟ වෙලා තිබෙනවා. ඒක ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබෙනවා; අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබෙනවා. Smart grid එකක් බවට පත් කරන්න අවශ්‍ය ආයෝජනය කරන්න. ඒක distribution සඳහා කරන ආයෝජනයක්. ඒ වාගේම අපේ transmision සඳහා කරන ආයෝජනයක්. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Kumara Jayakody. You have 12 minutes.

[පූ.භා. 10.37]

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු සභාපතිතුමනි, වැය ශීර්ෂ 119 යටතේ බලශක්ති අමාත්‍යාංශය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 21.14ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් බිලියන 20.07ක් ද මෙම අය වැය මඟින් වෙන් කර තිබෙනවා. මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. 2024දී වෙන් කරපු ප්‍රමාණයන් එක්ක ගත්තොත්, පුනරාවර්තන වියදම් සියයට 43ක අඩු කිරීමක් සිදු වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ තමයි මේ පුනරාවර්තන වියදම් වෙන් කරලා තිබෙන්නේ. ඊට අමතරව ප්‍රාග්ධන වියදම් විධියට ගත්තාම අයිතම හතක් යටතේ අපි වැය ඉදිරිපත් කරලා තිබෙනවා.

එහි අයිතම අංක 1 යටතේ තිබෙනවා, ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාලය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය. ඒ යටතේ පැකේජ් 4ක් විධියට වැඩකටයුතු ක්‍රියාත්මක කරන්න කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. පැකේජ් අංක 1 විධියට තිබෙනවා, ගම්පහ, කොළඹ හා කුරුණෑගල සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම. එය 2025 දෙසැම්බර් මාසයේ අවසන් කිරීමට නියමිතයි. ඒකට මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන 14,623ක් වෙනවා. ඒක JICA සහ රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වනවා. පැකේජ් අංක 2, ගම්පහ, කොළඹ, මහනුවර හා කෑගල්ල සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම. ඒකට මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන 8,531ක්. ඒක JICA සහ GoSL fundsවලින් ක්‍රියාත්මක වනවා. ඒකත් 2025 දෙසැම්බර් මාසයේ අවසන් කිරීමට නියමිතයි. පැකේජ් අංක 3, අනුරාධපුර, මාතලේ, මහනුවර, කෑගල්ල සහ නුවරඑළිය සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම. ඒකට මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන 11,253යි. ඒකත් JICA සහ GoSL fundsවලින් ක්‍රියාත්මක වනවා. එය 2026 දෙසැම්බර් වනකොට අවසන් කිරීමට නියමිතයි. පැකේජ් අංක 4 මඟින්, කොළඹ නගරයේ කේබල් මඟින් බෙදාහැරීම් ආවරණය කරනවා. ඒකට මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන 7,183යි. ඒකත් JICA සහ රජයේ අරමුදල් මඟින් තමයි ක්‍රියාත්මක වන්නේ. එය 2026 දෙසැම්බර් වනකොට අවසන් කරන්න කටයුතු කරනවා.

ඊළඟට, අයිතම අංක 2 යටතේ, කොළඹ රැස්වන අපද්‍රව්‍ය බලශක්ති බවට පරිවර්තනය කිරීමේ මෙගාවොට් 10ක බලාගාරයක් ඉදිකිරීම සඳහා රුපියල් බිලියන 1.2ක් වෙන් කරලා තිබෙනවා. අයිතම අංක 3 යටතේ තිබෙනවා, රජයේ ගොඩනැඟිලි, අඩු ආදායම්ලාභීන්ගේ නිවාස, ආගමික ස්ථාන සහ ජල පිරිපහදු මධ්‍යස්ථාන සඳහා වහල මත සවිකරන සූර්ය කෝෂ පහසුකම් සැපයීම. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 290ක් වෙන් කරලා තිබෙනවා. අයිතම අංක 4 යටතේ, උතුරු ප්‍රදේශයේ ඩෙල්ෆ්ට්, අනතිවූ හා හයිනතිවූ කියන කුඩා දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය විදුලි බලශක්ති පද්ධතිය ඉදිකරන්න රුපියල් බිලියන 3ක් වෙන් කරලා තිබෙනවා. දැනටමත් එහි construction ආරම්භ කරලා ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

අයිතම අංක 5 විධියට තිබෙනවා, ශ්‍රී ලංකාවේ බලශක්ති වැඩසටහන, ලංකා විදුලිබල මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය. ඒ සඳහා රුපියල් බිලියන 290ක් වෙන් කරලා තිබෙනවා. අයිතම අංක 6 යටතේ, රුපියල් බිලියන 0.16ක් ශ්‍රී ලංකා පරමාණු බලශක්ති මණ්ඩලයේ ධාරිතාව පුළුල් කිරීමට වෙන් කර තිබෙනවා.

විශේෂයෙන්ම මෙම වැඩසටහන යටතේ ප්‍රධාන අරමුණු වන්නේ තිරසර, විශ්වාසනීය, ස්ථාවර සහ පරිසර හිතකාමී බලශක්ති ජනනය කිරීම උදෙසා න්‍යෂ්ටික බලය මඟින් විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා න්‍යෂ්ටික තාක්ෂණය යොදා ගැනීමේදී අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට රජයට සහාය ලබාදීමයි.

අයිතම අංක 7 යටතේ තිබෙනවා, කෙරවලපිටිය සිට කොළඹ වරාය දක්වා කිලෝවොට් 220ක දෙවන සම්ප්‍රේෂණ මාර්ගය ස්ථාපනය කිරීම. ඒ සඳහා රුපියල් මිලියන 7,000ක් වෙන් කර තිබෙනවා. අය වැය හරහා අපි මේ මුදල් ප්‍රමාණය වෙන් කළත්, මීට වඩා ගොඩක් ව්‍යාපෘති අපි ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කරලා ඒවා කරමින් පවතිනවා. විශේෂයෙන්ම විදුලිබල උත්පාදනය පැත්තෙන් ගත්තොත්, ප්‍රධාන ජල විදුලි ව්‍යාපෘති විධියට මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය මේ වසරේ දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිතයි. ඒක මෙගාවොට් 30.5ක් විධියට එකතු වෙනවා. ඒ වාගේම, කුඩා ජල විදුලි ව්‍යාපෘති තිබෙනවා. සීතාවක ජල විදුලි බලාගාරය මෙගාවොට් 14ක්. එහි මෙගාවොට් 7 බැගින් units දෙකක් යනවා. ඒකත් 2026 දෙසැම්බර් අවසන් කිරීමට කටයුතු කරනවා. ඊට අමතරව 2024 දෙසැම්බර් වන විට ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන ලද සමුච්චිත කුඩා ජල විදුලි ධාරිතාව මෙගාවොට් 422.4ක් විධියට තමයි දැනට තිබෙන්නේ.

ඊට අමතරව දැන් වැඩිම කථාබහට ලක් වන සූර්ය බලශක්ති ව්‍යාපෘති සම්බන්ධයෙන් ගත්තොත්, මේවා ඇත්තටම Budget එක යටතේ නොවුණාට අපි ආයෝජකයන් කැඳවලා ඒවායින් තමයි මේක සංවර්ධනය කරන්නේ. ඒකේදී සියඹලාණ්ඩුව ප්‍රදේශයේ තිබෙනවා, භූමිය මත ඉදිකරන සූර්ය පැනල උද්‍යානය, එතැන මෙගාවොට් 100ක්. එයත් 2026දී අවසන් කිරීමට නියමිතයි. ඊළඟට හම්බන්තොට ප්‍රදේශයේ මෙගාවොට් 150ක් සහ තවත් මෙගාවොට් 200ක් ඇතුළුව මෙගාවොට් 350ක් ඉදිකිරීමට යෝජිතයි. සාම්පූර් ප්‍රදේශයේ මෙගාවොට් 120ක් ඉදිකිරීමට යෝජිතයි. එහි පළමුවැනි අදියර මෙගාවොට් 50ක් විධියට අප්‍රේල් මාසයේ ආරම්භ කරනවා. ඊට පස්සේ දෙවැනි අදියරේදී තවත් මෙගාවොට් 70ක් එනවා. ඒකත් 2026දී අවසන් කිරීමට නියමිතයි. ඊට පස්සේ වාලච්චේන ප්‍රදේශයේ ව්‍යාපෘති දෙකක් තිබෙනවා. ඒක මෙගාවොට් 100 බැගින් වූ ව්‍යාපෘති දෙකක්. එතැන මෙගාවොට් 200ක් සම්පූර්ණයෙන් ස්ථාපනය කරනවා. ඇඹිලිපිටිය මෙගාවොට් 60ක්; ත්‍රිකුණාමලය මෙගාවොට් 100ක්; පුත්තලම මෙගාවොට් 70ක් වශයෙන් ව්‍යාපෘති ඉදිකිරීමට යෝජිතයි. පුත්තලමේ මේ මෙගාවොට් 70ට අමතරව ව්‍යාපෘති සඳහා තවදුරටත් ඉඩම් හඳුනා ගනිමින් පවතිනවා.

කිලිනොච්චිය මෙගාවොට් 150ක්, මොනරාගල මෙගාවොට් 108ක්, කප්පල්තුරේ මෙගාවොට් 100ක් නිපදවීම සඳහා දැනට හඳුනාගෙන මූලික වැඩකටයුතු ආරම්භ කරපු ව්‍යාපෘති විධියට තිබෙනවා. එතැනදී ඇත්තටම සූර්ය බලාගාරවලින් මෙගාවොට් 1,358ක් නිපදවීම තමයි අපේ සැලැස්මේ තිබෙන්නේ.

ජලය මතුපිට පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති ගත්තොත්, දකුණු කොරියානු ප්‍රදානයක් මත මේ අවුරුද්දේ අපි ඇඹිලිපිටියේ චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන්ආර වැව මතුපිට මෙගාවොට් එක බැගින් නිපදවිය හැකි ව්‍යාපෘති දෙකක් ආරම්භ කළා. ඒක දැනට ක්‍රියාත්මක වෙනවා. එතැනින් මෙගාවොට් දෙකක් නිපදවෙනවා. ඊට අමතරව, කුරුණෑගල දැදුරු ඔය ජලාශය මතුපිට මෙගාවොට් 100ක්ද, හම්බන්තොට රිදියගම ජලාශය මතුපිට මෙගාවොට් 50ක්ද සඳහා සූර්ය පැනල සවිකිරීමට අවශ්‍ය ශක්‍යතා අධ්‍යයනය සිදු කෙරෙමින් පවතින අතර, පාරිසරික බලපෑම් ඇගැයීම් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. ඊට අමතරව, ඉරක්කමාම් ප්‍රදේශයේ මෙගාවොට් 50ක්ද, කාසල්රී ජලාශයේ මෙගාවොට් 34ක්ද වශයෙන් ජලය මතුපිට මෙගාවොට් 234ක ව්‍යාපෘති අපි ඉදිරියට කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් වන සුළං විදුලි බලාගාර ගත්තොත් මන්නාරම, "තම්බපවනී" දෙවන අදියරේ මෙගාවොට් 50ක ව්‍යාපෘතිය 2027දී අවසන් කිරීමට නියමිතයි. එහි පළමු අදියරේ මෙගාවොට් 100ක් දැනටත් ක්‍රියාත්මක වෙනවා. ඊළඟට, මුල්ලිකුලම්හි මෙගාවොට් 50 ව්‍යාපෘති දෙකක් යනවා. ඒකට ඇස්තමේන්තු කරලා තිබෙනවා, රුපියල් මිලියන 284ක්. එහි මූලික කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. ඊට පස්සේ කිලිනොච්චියේ, වෙරවිල් සහ කරච්චි කියන ප්‍රදේශවල මෙගාවොට් 210ක් සම්බන්ධව පාරිසරික බලපෑම් තක්සේරුව මේ දවස්වල කරගෙන යනවා. ඊට පසු ආලන්කුලම කුඩා සුළං ව්‍යාපෘතිය මෙගාවොට් 10ක්, මුල්ලිපුරම සුළං ව්‍යාපෘතිය මෙගාවොට් 10ක්, මන්නාරම මෙගාවොට් 5 බැගින් 4ක් - මෙගාවොට් 20ක් -, මාදම්පේ මෙගාවොට් 5 බැගින් 2ක් - මෙගාවොට් 10ක් -, මාන්තායි බටහිර මෙගාවොට් 300ක් විධියට මෙගාවොට් 710ක සුළං විදුලි බලාගාර ඉදි කරන්න අපි කටයුතු කරමින් සිටිනවා.

ඇත්තටම ඒවා කරන්නේ Budget එකෙන් නොවෙයි. අපි donor agencies හරහා මුදල් ලබාගෙන ඒ කටයුතු ඉදිරියට ගෙන යනවා. මූලික වශයෙන් මෙගාවොට් 300ක, 400ක ධාරිතාවෙන් යුත් න්‍යෂ්ටික බලාගාරයක් හරහා විදුලිය ජනනය කිරීමට අපි උත්සාහ කරනවා. මේ සඳහා අන්තර්ජාතික පරමාණු බලශක්ති නියෝජිතායතනයේ හා බලශක්ති අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව ඒකාබද්ධව කටයුතු කරනවා. පුනර්ජනනීය බලශක්තිය පැත්තෙන් ගත්තොත්, මේ අවුරුදු දෙක ඇතුළත මෙගාවොට් 1,972ක ඉලක්කයක් අපි හඹාගෙන යනවා. ඊටත් වැඩියෙන් කරන්නයි අපි උත්සාහ කරන්නේ. ඊට අමතරව combined-cycle power plant එකක් කෙරවලපිටියේ ඉදිකරලා අවසන් වුණා. ඒක මේ වසරේ ක්‍රියාත්මක වුණා. මෙගාවොට් 650ක තව එකක් ඉදි කෙරෙනවා. එවැනි තත්ත්වයක් තමයි ඒ සම්බන්ධයෙන් තිබෙන්නේ.

ඛනිජ තෙල් අංශය ගත්තොත්, ගොඩක් සංවර්ධන යෝජනා ක්‍රම plan කරලා ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒවා ඔක්කෝම ආයතනයේ මුදල්වලින් සහ investorsලා හරහා තමයි කෙරෙන්නේ. Budget එකෙන් ඒ සඳහා මුදල් වෙන් කෙරෙන්නේ නැහැ. එහිදී Trincomalee Oil Tank Farm එක, සපුගස්කන්දේ refinery එක සංවර්ධනය කිරීම සහ අලුත් refinery එකක් සඳහා යෝජනා කැඳවන්න අපි වැඩ කටයුතු සකස් කරනවා. ඒ විධියට තමයි අපේ වැඩ පිළිවෙළ තිබෙන්නේ. පිළිතුරු කථාවේදී මම ඉතිරි කරුණු ටික ඉදිරිපත් කරන්නම්.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have ten minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ වීය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිණින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්පුමිකු (වෛද්‍යර්) රිස්වි සාලි] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Nalin Bandara Jayamaha?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමාගෙන් මම පොඩි කාරණයක් දැනගන්න කැමැතියි. ඔබතුමා කිව්වා, transmission lines upgrade කරනවා, grid substations upgrade කරනවා කියලා. හැබැයි, මේවාට මුදල් ලැබෙන්නේ කොහෙන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ මුදල විදුලිබල මණ්ඩලයෙන් දරනවාද, එහෙම නැත්නම් ආයෝජකයන්ගෙන් ගන්නවාද කියලා පොඩ්ඩක් පැහැදිලි කරන්න.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඇත්තටම එක අයිතමයක් හැරෙන්න අනෙක් ඒවා අපි donor agenciesවලින් තමයි ගන්නේ. Donor agencies, ඒ කියන්නේ ණය ලබා දෙන විදේශීය ආයතන හරහා තමයි අපි ගන්නේ. ඒක ගෙවීමත් විදුලිබල මණ්ඩලයෙන්ම තමයි කෙරෙන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Sathiyalingam, you may start your speech now.

[மு.ப. 10.51]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தவிசாளர் அவர்களே, இம்முறை பாதீட்டில் வலுசக்தி அமைச்சுக்கு மூலதனச் செலவினமாக 20,081 மில்லியனும், மீண்டெழும் செலவினமாக 1,061 மில்லியனும் ஒதுக்கப்பட்டிருக்கிறது. நாட்டினுடைய பொருளாதாரத் துறையின் வளர்ச்சிக்கு இந்த வலுசக்தித் துறை மிகவும் முக்கியமானது. மாண்புமிகு சனாதிபதியவர்கள் தன்னுடைய உரையிலே, மீள்புதுப்பிக்கத்தக்க வலுசக்தியில் கவனம் செலுத்துதல் மற்றும் உட்கட்டமைப்பை நவீனமயமாக்குதல் என்பவற்றுக்கு முக்கியத்துவம் அளித்து இந்தப் பாதீட்டில் கூடியளவு பணம் ஒதுக்கப்பட்டிருப்பதாகச் சொல்லியிருந்தார். அத்தோடு, 2030ஆம் ஆண்டளவிலே வலுசக்தியின் 70 சதவீதத்தை மீள்புதுப்பிக்கத்தக்க சக்திமூலங்களிலிருந்து பெறவேண்டுமென்ற தங்களுடைய திட்டத்தையும் சொல்லியிருந்தார். இதற்காக வெளிநாட்டு, உள்நாட்டு முதலீட்டாளர்களை வரவேற்கும் அதேநேரத்திலே இதற்கான ஒழுங்குபடுத்தல் சட்டங்களை ஆக்குவதாகவும் சனாதிபதி அவர்கள் குறிப்பிட்டிருந்தார்.

குறிப்பாக, வலுசக்தி என்ற வகையிலே, காற்றாலை மின்னுற்பத்தித் திட்டமானது எங்களுடைய நாட்டிலே,

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களிலே மிகவும் பாதுகாப்பான மீள்புதுப்பிக்கத்தக்க வலுசக்தி உற்பத்தி முறையொன்றாகக் காணப்படுகிறது. இந்தக் காற்றாலை மின் உற்பத்திக்கான செலவு மிகவும் குறைந்ததாக இருப்பதுடன், அதன்மூலமான சுற்றுச்சூழல் பாதிப்பும் மிகவும் குறைந்தளவிலே காணப்படுகிறது. அந்த வகையில், எங்களுடைய வடக்கு மாகாணத்திலே ஏற்கெனவே இந்தக் காற்றாலை மின்னுற்பத்தித் திட்டம் ஆரம்பிக்கப்பட்டு வெற்றிகரமாக இயங்குகின்றது. ஆனால், மன்னார் மாவட்டத்திலே இந்தக் காற்றாலை மின்னுற்பத்தித் திட்டத்தின் முதலாம் கட்டம் நிறைவுற்று, அதன் இரண்டாம் கட்டம் ஆரம்பிக்கும் நிலையில், அத்திட்டம் தொடர்பாக மக்கள் பாரிய சந்தேகத்தைக் கொண்டிருப்பதோடு, அதற்குத் தங்களுடைய எதிர்ப்பையும் வெளிப்படுத்தி வருகிறார்கள். இதற்கு மிகவும் முக்கியமான காரணம் என்னவென்றால், அந்த வலுசக்தித் திட்டத்திலே முதலீடு செய்த நிறுவனத்தினுடைய செயற்பாடாகும். அந்நிறுவனத்தினர் தங்களுடைய முதலாம் கட்டத் திட்டத்தை நடைமுறைப்படுத்தும்போது, அந்த மக்களுடன் வெளிப்படையாகச் செயற்படவில்லை என்பது ஒரு குற்றச்சாட்டாக இருக்கிறது.

அதுமாத்திரமல்ல, அவர்கள் ஒருசில தனியாரை வெவ்வேறு வகையிலே திருப்திப்படுத்தி இந்தத் திட்டத்தை முன்னெடுத்துச் செல்வதற்கான செயற்பாடுகளிலே ஈடுபட்டபடியினாலே மக்கள் பாரிய சந்தேகத்தைக் கொண்டிருக்கின்ற அதேநேரம், அதற்கு எதிர்ப்பையும் வெளிப்படுத்துகிறார்கள். குறிப்பாக, மன்னாரில் இதன் முதலாம் கட்டத் திட்டத்தின்போது ஏற்படுத்தப்பட்ட கட்டுமானங்கள் முறையற்ற விதத்தில் மேற்கொள்ளப்பட்டிருந்ததனால் இந்த முறை மழைகாலத்தில் அந்தப் பிரசேதத்தில் பாரிய வெள்ள அனர்த்தம் ஏற்பட்டது. வெள்ள நீர் கடலுக்குள் வழிந்தோடக்கூடிய இடங்கள் எல்லாம் தடுக்கப்பட்டமையால், மழை குறைந்து 3 - 4 மாதங்கள் வரையும் அந்த இடங்கள் வெள்ளக்காடாகக் காணப்பட்டது. இவ்வாறான பல பிரச்சினைகள் அங்கிருக்கிறது. கௌரவ அமைச்சர் அவர்கள் இது தொடர்பாகக் கவனத்தில் கொள்ளுமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

அது மாத்திரமல்ல, இந்தத் திட்டம் நாட்டுக்குப் பயன்தரக் கூடியதாக இருந்தாலும்கூட, அந்தப் பிரதேசத்தில் வாழும் மக்களுக்கு -local population- இதன்மூலமான பயன்கள் கிடைக்கவில்லை. குறிப்பாக, corporate social responsibility ஊடான பங்களிப்பு அந்த சமூகத்தில் முறையற்ற விதத்தில் பகிரப்படுவதாகப் பாரிய குற்றச்சாட்டு முன்வைக்கப்பட்டது. அங்கு மீளக்குடியேறிய உள்ளூர் மக்களுக்கு இந்த corporate social responsibility ஊடாகப் பல வேலைவாய்ப்புகளை வழங்கியிருக்கலாம். இந்த நிதிக்கூடாக அந்த மக்களுடைய அன்றாடப் பிரச்சினைகளுக்குப் பயன்களைப் பெற்றுக் கொடுத்திருக்கலாம். இவ்வாறான பல விடயங்கள் செய்யப்படாமையே மக்கள் அதற்கு எதிர்ப்புத் தெரிவிப்பதற்கு முக்கியமான காரணமாக இருக்கிறது. இது தொடர்பாக கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்தை நான் கோருகின்றேன்.

அதேபோல, கூரைமீது பொருத்தப்படுகின்ற சூரிய மின்கலத்தின்மூலம் உற்பத்தி செய்யப்படுகின்ற மின் உற்பத்தி தொடர்பிலும் பிரச்சினைகள் காணப்படுகிறன. சூரிய மின்சக்திமூலம் அதிகமான மின்சாரத்தைப் பெறக்கூடிய பெரும் வாய்ப்புகளைக் கொண்டதாக எமது வடக்கு, கிழக்கு மாகாணங்கள் காணப்படுகிறது. அங்கு பயிர் செய்ய முடியாத, அரசாங்கத்துக்குச் சொந்தமான பல வெற்றுக் காணிகள் காணப்படுகின்றன. அங்கு solar farms அமைப்பதனூடாக, பெரிய solar திட்டங்களுக்கான முதலீட்டினைச் செய்வதனூடாக, உள்ளூரில் வாழுகின்ற மக்கள் தொழில் வாய்ப்புகளைப் பெறுவது மாத்திரமல்லாமல், நாட்டுக்குத் தேவையான மின்சக்தியைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்பும் இருக்கிறது. இந்த அரசாங்கம் அதற்குரிய நடவடிக்கையை நிச்சயமாக எடுக்குமென்று நான் நம்புகின்றேன்.

மேலும், எங்களுடைய பிரதேசங்களில் வீட்டுக் கூரையின் மீது பொருத்தப்படுகின்ற சூரிய மின்கலத் திட்டம் இப்பொழுது நிறுத்தப்பட்டுள்ளது; அதற்குப் பல காரணங்கள் சொல்லப் படுகின்றன. மக்கள் தங்களுடைய வீட்டுக் கூரையில் சூரிய மின்கலத்தை பொருத்துவதற்கு மிகவும் ஆவலாக இருக்கிறார்கள். அதன்மூலம் அவர்கள் ஒரு நிரந்தரமான வருமானத்தைப் பெற்றுக் கொள்ளக்கூடியதாக இருக்கும்; மின்சாரத்துக்காகச் செலுத்துகின்ற நிதியை மீதப்படுத்தக் கூடியதாகவும் இருக்கும். இவ்வாறான சந்தர்ப்பம் இருக்கின்றமையால், அந்தத் திட்டங்களை வேண்டி மின்சார சபைக்குச் செல்லும் மக்களுக்கு அதற்கான அனுமதி மறுக்கப்படுவது பெரும் குறையாக இருக்கிறது. மக்கள் தமது வீட்டுக் கூரைகளில் மின்னுற்பத்தி செய்வதற்கான சாதனங் களைப் பொருத்துவதற்கு விரும்பி முன்வருகின்ற வேளையில், நிச்சயமாக transformer capacity போதாது என்ற காரணத்தைச் சொல்லி இலகுவாக மறுத்துவிட முடியாது.

அதுபோல், grid capacity போதாது என்று சொல்லப் படுவதும் இன்னுமொரு முக்கிய பிரச்சினையாகக் காணப்படுகிறது. வடக்கு மாகாணத்தில் சுன்னாகம், கிளிநொச்சி, மன்னார், வவுனியா போன்ற நான்கு இடங்களில் அதற்கான கட்டமைப்பு காணப்படுகிறது. ஆனால், அந்த grid capacity போதாதென்று சொல்லப்படுகிறது. இம்முறை வரவு செலவுத்திட்டத்தில் குறை வருமானக் குடும்பங்கள், மத ஸ்தலங்கள் மற்றும் நீர் சுத்திகரிப்புப் பொறிகள் போன்ற 3 பிரிவின்கீழ் இந்த rooftop solar system - கூரை சூரிய மின்சக்தி வசதியை நிறுவுவதற்கு 290 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. ஆனால், transformer capacity போதாது என்றும், வட மாகாணத்தில் நான்கு இடங்களிலும் உள்ள grid capacity போதாது என்றும் காரணங்களைச் சொன்னால் இந்த வரவு செலவுத்திட்ட முன்மொழிவை நடைமுறைப்படுத்துவதில் பாரிய பின்னடைவு ஏற்படும். ஆகவே, கௌரவ வலுசக்தி அமைச்சர் அவர்கள் அங்கு grid capacity இனை அதிகரிப்பதற்கான செயற்பாட்டை மேற்கொள்ள வேண்டும்.

அதேபோல நிறையப் பொதுவான பிரச்சினைகள் காணப்படுகின்றன. இப்போது எங்களுடைய பிரதேசங்களில் குறைந்த வருமானம்பெறும் குடும்பங்கள் ஒரு மின்னிணைப் பைப் பெற்றுக்கொள்வதற்கு 40,000 ரூபாய் செலுத்த வேண்டியிருக்கின்றது. ஆகவே, மிகக் குறைந்த வருமானம் பெறும் குடும்பங்கள், பெண் தலைமைத்துவக் குடும்பங்கள், விசேட தேவைக்குட்பட்டவர்களுக்கு இலவச மின்சார இணைப்பு வழங்கப்பட வேண்டும் என்பது என்னுடைய வேண்டுகோளாகும். கௌரவ அமைச்சர் அவர்கள் இது தொடர்பாக நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, குறைந்த கட்டண மின் விநியோகம் அல்லது மானிய அடிப்படையிலான மின் விநியோகம் வழங்குவது பற்றிச் சிந்திக்க வேண்டும். குறிப்பாக, குடிசைக் கைத்தொழில்

செய்பவர்களுக்கு, சிறு உற்பத்தியாளர்களுக்கு, சிறு விலங்குப் பண்ணையாளர்களுக்கு, சிறு விவசாயம் செய்பவர்களுக்கு மானிய அடிப்படையிலே மின்சாரத்தை வழங்கக்கூடிய ஏற்பாடுகளைக் கௌரவ அமைச்சர் அவர்கள் செய்ய வேண்டுமென்றும் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், விவசாயம் மற்றும் மீன்பிடிக்குக் கடந்த காலங்களிலே நடைமுறைப்படுத்தப்பட்ட மானிய அடிப்படை யிலான எரிபொருள் வழங்கும் செயற்பாட்டுக்கு இந்த வரவு செலவுத்திட்டத்திலே நிதி ஒதுக்கப்பட்டிருப்பதாகத் தொிய வில்லை. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, மீளக்குடியேறிய மக்கள், யுத்ததத்தால் பாதிக்கப்பட்ட மக்கள் செய்கின்ற விவசாயம், மீன்பிடி இரண்டுக்கும் மானிய அடிப்படையிலே எரிபொருளை வழங்குகின்ற செயற்பாட்டுக்கு நிதி ஒதுக்க வேண்டுமென்று இங்கு கேட்டுக் கொள்கின்றேன்.

இறுதியாக, மனிதவளப் பற்றாக்குறை என்பது - இது நாட்டுக்குப் பொதுவான ஒரு விடயமாக இருந்தாலும்கூட- எங்களுடைய பிரதேசங்களில் மிகவும் மோசமாகக் காணப்படுகின்றது. இந்த வலுசக்தி அமைச்சிலும் இந்தப் பிரச்சினை காணப்படுகின்றது. உதாரணமாக எங்களுடைய கிளிநொச்சி மாவட்டத்தில் மின்சார சபைக்குரிய எந்திரி இல்லை. யாழ்ப்பாணத்திலுள்ள எந்திரிதான் கிளிநொச்சி மாவட்டத்தையும் பார்த்துக் கொள்கின்றார். அதனால் அங்கே பாரிய இடர்பாடுகள் ஏற்படுகின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் அங்கே பாரிய திட்டங்களைச் செயற்படுத்த நினைக்கின்றோம். குறிப்பாக, வடக்கு, கிழக்கிலே மீள் புதுப்பிக்கத்தக்க மின்சக்தி - வலுசக்திச் செயற்பாடுகளுக்குத் திட்டமிடப்பட்டுள்ளது.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up. Could you please wind up?

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Okay, Sir.

ஆகவே, groundஇல் இருக்கின்ற இவ்வாறான செயற் பாடுகள் -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Leader of the House?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ වෙලාවේ සභාවේ Tamil to English interpretation එක නැහැ, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
There seems to be no interpretation, as informed by the Hon. Leader of the House.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்தச் செயற்பாடு களைக் கவனத்தில் எடுத்து, நடைமுறைப்படுத்த வேண்டு மென்று கேட்டு, நன்றி கூறி விடைபெறுகின்றேன்.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පැවැති අවස්ථාවේදීත් අපිට දෙමළ-ඉංග්‍රීසි සහ දෙමළ-සිංහල interpret-ersලා හිටියේ නැති බව. මගේ දැනීමේ හැටියට ඒ අය ඉතා සීමිත ප්‍රමාණයක් ඉන්නේ. ඒ ඉන්නා අයට කරගන්න බැරි තරම් work-load එකක් තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, Sinhala to English සහ Sinhala to Tamil පරිවර්තකයන් වැඩි ප්‍රමාණයක් ඉක්මනින් බඳවා ගැනීමට පාර්ලිමේන්තුව විධියට කටයුතු කරන්නය කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Leader of the House, I will bring it to the notice of the Secretary-General of Parliament and the Hon. Speaker.

Hon. Chamara Sampath Dasanayake, you may please start your speech.

[ප.භා. 11.02]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, අද වනවිට මේ රටේ කථා බහට ලක් වී තිබෙන බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා මේ අවස්ථාවේදී මම මුලින්ම මේ කාරණය කියන්න කැමැතියි. පසුගිය සිකුරාදා මම කථා කළ අවස්ථාවේදී ඇහුවා, රුපියල් ලක්ෂ 18කින්, 11දෙනෙක් රටවල් 3කට ගියේ කොහොමද කියලා. මොකද, අගමැතිතුමියගේ කථාව තුළ කියැවුණේ නැහැ, අරහෙන් ටිකට් දුන්නා, මෙහෙන් ටිකට් දුන්නා කියලා කථාවක්. ඒ විධියට කිව්වා නම් අපි ඒකට උත්තර අහන්නේ නැහැ. ජනාධිපතිතුමා රුපියල් කෝටි 18ක් වියදම් කරලා රට ගියත් අපට ප්‍රශ්නයක් නැහැ. අපි අහන්නේ අපේ රටේ ජනාධිපති සම්බන්ධව කියපු නිසායි. එහෙම වැරදි විධියට තොරතුරු ලබා දුන් නිසා තමයි රටේ මිනිස්සු අහන්නේ රුපියල් ලක්ෂ 18කින් 11දෙනෙක් එක්ක රට ගියේ කොහොමද කියලා. ඒ, එක කාරණයක්.

ඊළඟ කාරණය මෙකයි. මම AI තාක්ෂණය ගැන දන්නේ නැහැ කියලා ඇමතිතුමා කිව්වා. මම දන්නවා. අර photo එක දිහා බලන්න, ඇමතිතුමා. හිනා වෙලා ඉන්නා photo එක බලන්න, පොලිසිය භාර ඇමතිතුමා. එතුමාත් පොලිසියේ හිටපු SI මහත්තයෙක් නේ. එතුමාගෙන් අහන්නකෝ ඒ දමා තිබෙන

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

photo එක ගැන. ඒ ගැන මම වැඩිපුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, මට ලැබී තිබෙන්නේ විනාඩි 16ක් නිසා.

බලශක්ති ඇමතිතුමනි, ඔබතුමා අපිව වටේ ඇරියා; රවුමේ ඇරියා. ඔබතුමාට ඒක පිළිගන්න වෙනවා. අර තොප්පි වෙළෙන්දාගේ කථාව වාගේ තමයි වඳුරාගේ කථාවත් ලෝකයටම ගියේ. ඔබතුමා පිළිගනීවිද, නැද්ද මම දන්නේ නැහැ, එදා ඔබතුමා හිටියේ හඳපාන්ගොඩ, වෙලහියලගෙදර; ඔබතුමාගේ ගෙදර හිටියේ. ඔය සිද්ධිය වෙනකොට ඔබතුමා හිටියේ එහේ. වජීර සන්දනායක කියන ඔබතුමාගේ යාළුවාත් එක්ක හිටියේ. තවත් කට්ටිය ඔබතුමාත් එක්ක එතැන හිටියා. උඩ තට්ටුවේ හිටියේ. ඔබතුමාට ඔය news එක එනකොට; වඳුරාගේ කථාවේ news එක එනකොට ඔබතුමා මොනවා කළාද කියලා මම කියන්නේ නැහැ. ඒ ගැන මම මෙතැනදී කියන්න කැමැතිත් නැහැ. හැබැයි, ඔබතුමා හොයන්නේ බලන්නේ නැතුව තමයි වඳුරාගේ කථාව කිව්වේ. එහෙම උත්තර දෙන්න එපා, රජයේ වගකිව යුතු ඇමති කෙනෙක්. මොකද, මුළු රටේම, මුළු ලෝකයේම මිනිස්සු ඒ ගැන බලාගෙන ඉන්නවා. ඒක තමයි ඊට පසුව නීතිය බවට පත් වෙන්නේ. එහෙම නැතුව එක එක්කෙනා කියන දේවල් නොවෙයි.

ඊට පසුව 18වැනි දා විදුලිබල මණ්ඩලය මාධ්‍ය නිවේදනයක් නිකුත් කර තිබෙනවා, වඳුරෙක් හින්දා නොවෙයි ඒක සිද්ධ වුණේ කියලා. බලන්න, මගේ අතේ මේ තිබෙන්නේ ඒ මාධ්‍ය නිවේදනය. ඒක පෙන්වන්න ඕනෑ. මම මේ මාධ්‍ය නිවේදනය සභාගත කරන්නම්. මේක මාස 6ක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. මොකද, ඉරිදාට load එක වැඩි වෙනවා. ඉරිදාට load එක වැඩි වෙන්න හේතුවක් තිබෙනවා. ගිය අවුරුද්දේ solar powerවලින් විදුලිය මෙගාවොට් 600ක් නිපදවනු ලැබුවා. මේ රටේ solar power භාවිතයෙන් දැන් විදුලිය මෙගාවොට් 1,450ක් නිපදවා තිබෙනවා. සුනිත්‍ය බලශක්ති අධිකාරියත්, අනෙක් සියලුදෙනාත් ඉරිදාට ඇති වන ප්‍රශ්නය සම්බන්ධව මාස 6ක් තිස්සේ කථා කර තිබෙනවා. ඉරිදාට load එක වැඩි වෙනවා. ඉරිදාට load එක වැඩි වෙන්න හේතුව එදාට කර්මාන්තශාලා වසා තිබීමයි. ඒ නිසා තමයි ඉරිදාට load එක වැඩි වෙන්නේ. මේගොල්ලන් ඒකට උත්තරයක් දුන්නේ නැහැ. LECO එකයි, සුනිත්‍ය බලශක්ති අධිකාරියයි, විදුලිබල මණ්ඩලයයි මේ ගැන මාස 6ක් තිස්සේ කථා කරලා තිබෙනවා. ඔබතුමා ඒ ගැන නොදන්නවා ඇති.

Load එක වැඩි වුණා. Load එක වැඩි වෙන්න හේතුව මේකයි. ජල විදුලි බලාගාරවල විදුලියත් එනවා, නොරොච්චෝලේ බලාගාරයේ විදුලියත් එනවා, solar powerත් එක්ක එකතු වුණාම load එක වැඩි වෙනවා. ඒකට උත්තරයක් තිබුණේ නැහැ. ඒ නිසා ඒකට උත්තරයක් හොයා ගන්න වෙනවා. එක්කෝ, ඉරිදාට කර්මාන්තශාලාවලට සහනයක් දීලා වැඩ කරන්න අවස්ථාව දෙන්න. පායන්නේ නැති කාලයට ජල විදුලි බලාගාරවලින් විදුලිය උත්පාදනය වෙනවා නම්, ඒ තියෙන වෙලාවට load එක අඩු කරගන්න, කර්මාන්තශාලාවලට වැඩ කරන්න කියන්න. ඉරිදා දවසට කර්මාන්තශාලාවලට සහනයක් දෙන්න. මේකත් තිබුණු එක ප්‍රශ්නයක්.

ඊළඟ කාරණය මේකයි. ආණ්ඩු පක්ෂයේ ඉන්නවා 159දෙනෙක්. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඉන්නවා. සිද්ධියක් වුණාම අපහසුතාවට පත් වෙන්නේ ආණ්ඩුව නියෝජනය කරන 159දෙනා ඇතුළු මේ 225දෙනාම. ඔය ඉන්න සභාපතිවරු ඉන්නත් පුළුවන්, යන්නත් පුළුවන්. සභාපතිවරුන්ට ඕනෑ විධියට මේ රට පාලනය කරන්න බැහැ. සභාපතිවරු ඒවි, ඇවිල්ලා ඒගොල්ලන් හිතුවක්කාර විධියට කටයුතු කරාවි. මේ කියන සභාපති කවුද? මේ සභාපතිට තිබෙනවා, උපදේශන සේවා සමාගමක්. උපදේශන සමාගමක් තිබෙන, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න කෙනෙක්. ඒ තමයි, Resource Management Associates (Pvt.) Limited කියන උපදේශන සේවා සමාගම. එතුමා තමයි විදුලිබල මණ්ඩලයට උපදේශන දෙන්නේ. මේකේ එයාගේ නෝනාත් ඉන්නවා. විදුලි බලාගාරයක උපදේශන දෙනවා. උපදේශන දෙන සමාගමක සභාපති කෙනෙක් විදුලිබල මණ්ඩලයට උපදේශන දීලා, සල්ලි හම්බ කරන මනුෂ්‍යයෙක් සභාපති පුටුවේ වාඩි වෙලා, දැන් solar power සම්පූර්ණයෙන් නවත්වලා තිබෙනවා.

PPAs කීයක් අත්සන් නොකර තිබෙනවාද, solarවල? Solarවල PPAs බර ගණනක් අත්සන් නොකර තියාගෙන ඉන්නවා. ඒකට හේතුව මොකක්ද? සමහරු කැමැති නැහැ. LNG පටන් ගන්න කියන්නේ ඇයි? LNG පටන් ගන්නත් උපදේශන දෙන්නේ මේ සභාපතිතුමාගේ සමාගම. ඒකේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එතුමාගේ නෝනා ඉන්නවා. මේ තොරතුරු මම සභාගත කරන්නම්. සමාගමක සභාපති කෙනෙක් මේ පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ දේවල් නතර කරගන්න. අද solarවලින් මෙගාවොට් 1,450ක් රටට දෙන්න පුළුවන් වුණා කියන්නේ මේ රටේ ආර්ථිකයට කොච්චර හොඳයිද? දැන් කීදාහක් වැඩ කරනවාද, කීදාහකට රස්සා හම්බ වෙලා තිබෙනවාද?

මේ වාගේ දේවල් සිද්ධ වෙනවා. විදුලිබල මණ්ඩලය තුළ මාෆියාව තිබෙනවා. නැත්තේ නැහැ. PPAs අත්සන් කරන්නේ නැත්තේ ඒකයි. ඒක පිළිගන්න වෙනවා. ඒ කාරණයත් මම මේ වෙලාවේදී කියන්න ඕනෑ, විදුලිබල ඇමතිතුමාට. මේ සම්බන්ධව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ තොරතුරු සභාගත කරන්නම්.

ඊළඟ කාරණය මෙයයි. මේ සභාපතිතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ලිපියක් භාර දීලා තිබෙනවා. ඒ ලිපියේ මෙසේ සඳහන් වෙනවා:

> "නිලක් සියඹලාපිටිය මහතා වසර ගණනාවක් තිස්සේම තමා අධ්‍යක්ෂකවරයකුව සිටි උපදේශන සේවා සපයන සමාගම මඟින් ලංකා විදුලිබල මණ්ඩලයට විවිධ උපදේශන සේවා ලබා දී තිබේ. ඒ සඳහා සැලකිය යුතු වෘත්තීය ගාස්තු ද අය කර තිබේ. මෙයට අමතරව ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ශ්‍රී ලංකා ආණ්ඩුව මෙන්ම මහජන උපයෝගිතා කොමිසම යන ආයතනවලට ද සේවා සපයා තිබේ."

මේ, විදුලිබල මණ්ඩලයේ වර්තමාන සභාපති සියඹලාපිටිය. විදුලිබල මණ්ඩලය හදනවා නම්, විදුලිබල මණ්ඩලයට උදව් කරනවා නම් මේවා ගැනත් කල්පනාවෙන් වැඩ කරන්න වෙයි.

මේ ලිපියත්, ඒ වාගේම, විදුලිය බිඳ වැටීම වඳුරෙකු නිසා සිදුවුණු දෙයක් නොවෙයි කියලා සඳහන් වෙන මාධ්‍ය නිවේදනයත්, Resource Management Associates (Pvt.) Limited එකට අදාළ ලිපියත් මම මේ වෙලාවේ **සභාගත*** කරනවා.

විදුලිබල මණ්ඩලයේ දැනට තිබෙන ධාරිතාව හදාගෙන ගියොත් ඒක වැදගත්. මේ රටට solar powerවලින් ලොකු දායකත්වයක් ලැබිලා තිබෙනවා. ගිය අවුරුද්දේ solar powerවලින් මෙගාවොට් 600ක් ගත්තා කියන්නේ ලේසි ප්‍රමාණයක් නොවෙයි නේ. ඒකෙන් ලොකු දායකත්වයක් අපේ රටට ලැබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දැන් සමහරු කියනවා, LNG සැපයීම ඉන්දියානු සමාගමකට දීලා ඉන්දියාවට අපේ රටෙන් විදුලිය දෙන කථාවක්. ඉන්දියාව අපේ රටෙන් විදුලිය ගන්නේ නැහැ. ඉන්දියාවේ විදුලිය ගණන් අපට වඩා අඩුයි. දැන් මොකද වුණේ? Solar විදුලි ඒකකයකට ගෙව්වේ, රුපියල් 47යි. ඒක පහළ දැම්මා. දැන් රුපියල් 27යි නේ ගෙවන්නේ. එපා කරවනවා. බැංකු ණය දෙන්නේ නැහැ solar හදන්න. solarවල සමහර ඒවාට ගෙවීම් වෙන්නේ නැහැ. එතකොට solarවලට තිබෙන කැමැත්ත නැති වෙනවා. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. Solarවලට තිබෙන කැමැත්ත අඩු වෙනවා.

අපේ රට විදුලිය නැතුව කොච්චර අමාරුවෙන් ගෙනියපු රටක්ද? හැබැයි, අද අපි සතුටු වෙන්න ඕනෑ. උමා ඔයෙන් ජල විදුලි බලාගාරවලට මෙගාවොට් 100ක් ලැබුණා. ඒකටත් අපි සතුටු වෙන්න ඕනෑ. මේ වාගේ දේවල් තිබියදී මේ ඕනෑ නැති වැඩ කරලා, විදුලිබල මණ්ඩලයේ සමහර අය බලාපොරොත්තු වෙන දේවල් කරන්න ගියොත්, මේ රටේ ප්‍රශ්න ඇති වෙනවා. ඒක එක කාරණයක්.

ඊළඟ කාරණය තමයි, ඔබතුමන්ලා අද තිබෙන තත්ත්වය දන්නවා. මම සෞඛ්‍ය අමාත්‍යතුමා -ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා- එක්ක පෞද්ගලිකව කථා කළා. ගරු ඇමතිතුමනි, නියපොත්තෙන් කඩන්න තිබෙන එක පොරොවෙන් කපන තත්ත්වයට පත් කර ගන්න එපා. නියපොත්තෙන් කඩන්න තිබෙන එක නියපොත්තෙන් කඩලා අයින් කර ගන්න.

2022දී ආණ්ඩුව වැටෙන්න පළමුවැනි හේතුව මොකක්ද? අපි මාදිවෙල ඉන්නේ. අපිට ඕවා ගැන news එනවා. ඇමෙරිකානු තානාපති එක්ක කථා කරන්න රෑට රෑට යන්නේ කවුද, හමු වෙන්නේ කවුද කියලා අපිට news එනවා. අපි ඒවා නොදන්නවාද? රෑට රෑට meetings තිබ්බේ කවුද කියලා අපිට news එනවා. හැබැයි, 2022දී ගෝඨාභයගේ ආණ්ඩුව නැති වෙන්න පළමුවැනි හේතුව මොකක්ද? තව සතියකට විතරයි තෙල් තිබෙන්නේ, කියලා හිටපු විදුලිබල ඇමතිවරයා කිව්වා. "තව සතියකට විතරයි රටේ තෙල් තිබෙන්නේ" කියලා කිව්ව ගමන් මොකද වුණේ? මිනිස්සු බැරල් ගණන් තෙල් ගැහුවා. මිනිස්සු බැරල් අරගෙන ගිහිල්ලා තෙල් ගෙනාවා. ඒ ආණ්ඩුව වට්ටන්න, ගෝඨාභයගේ රජය වට්ටන්න, පළමුවැනි දේ කළේ ඒ ආණ්ඩුවම නියෝජනය කරපු ඇමතිවරයෙක්. මම ඒ ඇමතිවරයාගේ නම මෙතැනදී කියන්නේ නැහැ. ඒ ඇමතිවරයා මමත් එක්ක සටන් කළා. අද ඒ ඇමතිවරයා ගෙදර. එදා චාමර ඔය පැත්තේ මන්ත්‍රීවරයෙක්. -මම එතකොට මන්ත්‍රීවරයෙක්- අද ඒ ඇමතිවරයා ගෙදර, මම අද මන්ත්‍රීවරයෙක්. හැබැයි, එදා ඒ ඇමතිවරයා තව සතියකට විතරයි තෙල් තිබෙන්නේ කියනකොට, රටේ සල්ලි ඉවර වනතුරු තෙල් ගෙනැල්ලාත් ආණ්ඩුවට පිරිමහන්න බැරි වුණා. අන්න ඒක තමයි, අද වෙන්නේත්.

සමහර පෙට්‍රල් ෂෙඩ් වහන්න වෙනවා මේ ක්‍රමය තුළ. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා දන්නවා, මීගහකිවුල පෙට්‍රල් ෂෙඩ් එක, කන්දකාට්ටේ පෙට්‍රල් ෂෙඩ් එක ගැන. සමහර පෙට්‍රල් ෂෙඩ් වහන්න වෙනවා. මොකද, මීගහකිවුල පෙට්‍රල් ෂෙඩ් එකේ බවුසර් නවයයි විකුණන්නේ. හැබැයි, මීගහකිවුල බවුසර් නවය විකුණන පෙට්‍රල් ෂෙඩ් එක නැති වුණොත්, මිනිස්සුන්ට තෙල් ගහ ගන්න බවුල්ලට එන්න වෙනවා. මීගහකිවුල පෙට්‍රල් ෂෙඩ් එකෙන් තෙල් ගහන්නේ, පිටමාරුව වාගේ දුෂ්කර ප්‍රදේශවල මිනිස්සු. අන්න ඒ වාගේ පෙට්‍රල් ෂෙඩ් වලට ඔබතුමන්ලාගේ ඔය අලුත් ක්‍රමයෙන් පාඩු වෙනවා. මිනිස්සු අත පිහදාගන්න නොවෙයි නේ බිස්නස් කරන්නේ. නෙළුම් පොකුණ ඉස්සරහා පෙට්‍රල් ෂෙඩ් එකක් තිබෙනවා. පර්වසය රුපියල් කෝටි දෙකයි. නෙළුම් පොකුණ ඉස්සරහා තිබෙන පෙට්‍රල් ෂෙඩ් එකේ පර්වසය රුපියල් කෝටි දෙකයි, එතැන පර්වස් 40ක් තිබෙනවා. එතකොට රුපියල් කෝටි 80යි, පෙට්‍රල් ෂෙඩ් එක හදන්න කෝටි 10යි, එතකොට කෝටි 90යි. කෝටි 90ක් වියදම් කරපු පෙට්‍රල් ෂෙඩ් එකක අයිතිකාරයෙක්, රුපියල් ලක්ෂ 10ක බිස්නස් කරලා, බලාගෙන ඉදීද්? ඔහු ඒක විකුණලා ඕස්ට්‍රේලියාවට යයි, එහෙම නැත්නම් ඩුබායි යයි.

බණ්ඩාරවෙල තිබෙන ආරියදාස පෙට්‍රල් ෂෙඩ් එකේ පර්වසය ලක්ෂ 50යි. පර්වස් 45ක් තිබෙනවා. එතැන රුපියල් කෝටි විසිදෙකහමාරයි. හැබැයි, තව කෝටි විස්සක් වියදම් වුණාම රුපියල් කෝටි 40යි. කෝටි 40ක් වියදම් කරලා පෙට්‍රල් ෂෙඩ් එකක් හදපු මනුෂ්‍යයෙක් රුපියල් ලක්ෂ 10ක්, 15ක් ලාභ ගන්න බිස්නස් කරන්නේ නැහැ. ඔය කියන සභාපතිතුමා කියලා තිබෙනවා, "ඔවුන් ප්‍රාඩෝ පදිනවා, ඉන්ටර්කූලර් පදිනවා" කියලා. ඉතින්, ඒකට කරන්න දෙයක් නැහැ. අපි කැබි එකේ ගියත්, කරත්තයේ ගියත්, ව්‍යාපාරිකයෝ ඒවායේ යනවා. ව්‍යාපාරිකයෝ ඒවාට පුරුදු වෙලා ඉන්නවා. ව්‍යාපාරිකයෝ එහෙම යන එක අපිට නවත්වන්න බැහැ. ඒ නිසා හැම දෙයකට සාකච්ඡාවක් දෙන්න. අඩියක් පස්සට ගන්න ඕනෑ තැනදී ආණ්ඩුව අඩියක් පස්සට ගන්න. සාධාරණව, දෙපාර්ශ්වය කථා කරලා, සත 50කින් වැඩි කරනවාද, රුපියල් 3.50ටම යනවාද, රුපියල් 2.50ට යනවාද, රුපියල් 2.00ට යනවාද කියන එක තීරණය කරමු. අපි සාධාරණ වෙන්න ඕනෑ. සාධාරණ නොවී, සාකච්ඡාවක්වත් නොදී, ආණ්ඩුව හිතුවක්කාර වෙන්න ගියොත් මේ ප්‍රශ්න අපිට නොවෙයි බලපාන්නේ. අපි කැමැතියි, තව අවුරුදු තුනක් ආණ්ඩුව තිබෙනවා නම්. අවුරුදු පහක්ම තිබුණෙදෙන්.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා අසත්‍ය කාරණයක් කිව්වා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මොකක්ද අසත්‍ය කාරණය?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
පෙබරවාරි 09වැනි දා cut-off එක වෙච්ච වෙලාවේ ඇත්තටම මම හිටියේ ජනාධිපති ලේකම් කාර්යාලයේ. එදා විශේෂ කැබිනට් මණ්ඩල රැස්වීමක් තිබුණා. මධ්‍යාහ්න 12.00 වෙනකොටත් මම එතැන හිටියේ. කැබිනට් මණ්ඩල රැස්වීම ඉවර වෙලා ජනාධිපතිතුමා එක්ක යම් සාකච්ඡාවකට මම සහභාගී වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා උදේම බොරුවක් ගෙනැල්ලා පත්තු කරනවා. ඇත්තටම තේරුමක් නැහැ. හැමදාම වාගේ ඒක පුරුද්දක්. මට හිතෙන විධියට, පොඩි ආතල් එකක් ගන්නවා වාගේ. *[බාධා කිරීමක්]* ගෙය තිබෙන තැන හරි වෙන්න පුළුවන්. මම 3.30, 3.45 වනතුරු-*[බාධා කිරීමක්]* මෙහෙමයි. ඔබතුමාට ලණු දෙනවා. ඔය නම්, ගම්, තැන් හරි වෙන්න පුළුවන්. හැබැයි, මම 3.30, 3.45 විතර වනතුරු පැලවත්තේ system control office එකේ හිටියේ. CCTV තිබෙනවා. පුළුවන් නම් ඔබතුමා ගිහිල්ලා check කරන්න.

මම හවස 3.30, 3.45 විතර වනකල් එතැන රැඳිලා system එක okay වනකොට තමයි එතැනින් ගියේ. අනෙක් එක තමයි ඔය බෙදුම්කරුවන්,-

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේකයි වැඩේ. මට අසත්‍යයක් කියන්න වුවමනාවක් නැහැ. මම හඳපාන්ගොඩ නොවෙයි. මම බදුල්ලේ. මම බදුල්ලේ. මෙතුමාගේ පස්සෙන් ගිහිල්ලා වජිර සඳනායක කවුද, මෙතුමා හිටිය තැන කොහේද, මෙතුමා කෑවේ, බිව්වේ කොහේද කියලා කියන්න මට වුවමනාවක් නැහැ. ඒ වාගේ තැන්වල ඉඳන් මෙතුමන්ලා හැසිරෙන දිහා බලලා මිනිස්සු කථා කරලා ඒ ගැන කියනවා. ඒ තැන්වල ඉඳන් කථා කරලා අපට පණිවිඩ දෙනවා, "මේං ඉන්නවා, මෙතැන" කියලා. *[බාධා කිරීමක්]* ඒක නිසා මේ,- *[බාධා කිරීමක්]*

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
පැලවත්ත National System Control Centre එකේ මම හිටියේ. ඔබතුමා හොඳට හොයලා බලන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු ඇමතිතුමා, වාඩි වෙන්න. අපට තවත් දේවල් කියන්න පුළුවන්. ඔබතුමා 2015දී පොහොර සංස්ථාවේ ඉඳලා වෙච්ච දේවලුත් කියන්න අපට පුළුවන්. අපි ඒවා කිව්වොත් ඔබතුමා අපහසුතාවට පත් වෙනවා. අපි ඔබතුමා අපහසුතාවට පත් කරන්න කැමති නැහැ. අපි එහෙම කියන්නේත් නැහැ. *[බාධා කිරීමක්]* ඒක කියන්න අපට සුදුසුත් නැති හින්දායි අපි නොකියා ඉන්නේ. අපි ඒවා මෙච්චර කල් කිව්වේ නැහැ.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
අසත්‍ය දේවල් කියන්න එපා, ගරු මන්ත්‍රීතුමා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අපි අසත්‍ය කියන්නේ නැහැ. ඇත්ත කියන්නේ. ඔබතුමාගේ ඉන්න ව්‍යාපාරිකයෝත් එක්ක එකතු වෙලා,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order please! Hon. Member, just a reminder, could we please refrain from personal attacks and stick to the topic under discussion?

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
එතුමා නැඟිටපු හින්දා personal attack එක කළේ. එහෙම නැත්නම් මම personal attacks කළා ද?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Stick to the topic under discussion please. - *[Intteruption.]* Let us continue with the topic under discussion.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
What is the personal attack? මම මොකක්ද කරපු personal attack එක? මම personal attack එකක් කළේ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, let us continue with the topic under discussion. -*[Intteruption.]*

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම personal attack එකක් දුන්නේ නැහැ. මට කියපු එකයි මම හරියට කිව්වේ. මම බදුල්ලේ මිනිහා. මම යනවා ද හඳපාන්ගොඩ? මම යනවා ද වෙනත් තැන්වල? මම හොයාගෙන යන්නේ නැහැ, කොහේවත්. අපට අසත්‍ය කියන්න ඕනෑ නැහැ. මේවා අසත්‍ය දේවල් නොවෙයි. අපට තවත් දේවල් කියන්න පුළුවන්, සාක්ෂිත් එක්ක. 2015දී පොහොර සංස්ථාවේ හිටියේ කොහොම ද, වුණේ මොකක්ද, ඒ ඔක්කෝම අපට කියන්න පුළුවන්. අපි ඒවා කියන්න යන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඒක මගේ වැඩක් නේ. වාඩි වෙන්න,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඔබතුමා කට වහගෙන ඉන්න. ඔබතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අන්න පුනාගල ඉන්නවා, බලා ගන්න. ඔබතුමා එනවා මට කථා කරන්න තවත්! ඒ නිසා- *[බාධා කිරීමක්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order please! Hon. Members, could we please stay within the scope of the Discussion? - *[Interruption.]*

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
வாய் மூடிட்டு இருங்க. உங்கள தெரியாத ஆளா நாங்க.

[බාධා කිරීමක්] ගරු සභාපතිතුමා, සභාව පාලනය කරන්න. මේ කොහේවත් නැති මනුස්සයෙක් කථා කරන්නේ. තණකොළ ඇදලා කැබ් එක ගෙනිච්චා කිව්වාම- *[බාධා කිරීමක්]* තණකොළ ඇදලා කැබ් එක ගෙනිච්චා කියලා අපි කිව්වාම- *[බාධා කිරීමක්]* අපි කාරණා නොදැන නොවෙයි කථා කළේ. අපි කථා කළේ ඇත්ත. අපි පෙන්නුවා ෆොටෝ එක්කම. *[බාධා කිරීමක්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order please! Hon. Members, could we stay within the scope of the Discussion?

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, could you control the House? - [*Interruption.*]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අපි කථා කරන ඒවා ඇත්ත. අපි ඇත්ත කිව්වා. අපි අසත්‍ය කියන්නේ නැහැ නේ. අපි ආණ්ඩුවට විරුද්ධව කිව්වේ නැහැ නේ. වඳුරෙකුගේ කථාව අපි ද කිව්වේ? ඒක මුළු රටටම, ලෝකයටම ගියා නේ. ඒකෙන් අපට ද හානි වුණේ?

කෘෂිකර්ම ඇමතිතුමා අපට දැන් කියන්නේ මොකක්ද? විනාඩි 5ට වඳුරන් ටික අල්ලන්න ඕනෑ ලු, මොනරු ටික අල්ලන්න ඕනෑ ලු. විනාඩි පහට ගණන් කරලා කියන්න ඕනෑ ලු.

විනාඩි 5ට එහෙම ගණන් කරන්න පුළුවන්ද? අර රාවණා ඇල්ලේ, ඇල්ල පල්ලෙහා ඉන්නවා, වඳුරෝ 5,000ක් විතර. එතකොට රාවණා ඇල්ලේ වනජීවී කලාපයේ පාරවල් දිගේ වඳුරෝ 5,000ක් විතර ඉන්නවා. උන්ව ගණන් කරන්න පුළුවන්ද විනාඩි 5ට? *[බාධා කිරීම්]*

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
කොහොමද දැක්කේ 5,000යි කියලා? *[බාධා කිරීම්]*

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
රාවණා ඇල්ලේ දිගටම ඉන්නවා, වඳුරෝ 5,000ක් විතර. *[බාධා කිරීම්]* දඩ බඩ ගාලා ගණන් කරන්න පුළුවන්ද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා ගණන කිව්වා නේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අපි ගණන් කළේ නැහැ. 5,000 නොවෙයි, ලක්ෂ 5ක් විතර ඉන්න පුළුවන්. *[බාධා කිරීම්]* අපි ගණන් කළේ නැහැ. ඕවා ගණන් කරන්න පුළුවන්ද? *[බාධා කිරීම්]* ඔය කථා කියන්න එපා අප්පා! ඔය වාගේ කථා නොකියා ඉන්න, කට වහගෙන. අන්න, ලාල් ඇමතිතුමා වාගේ කට වහගෙන ඉන්න ඉන්න ඡන්ද ටික හැදෙනවා. ලාල් ඇමතිතුමා ඉන්නේ ඔය ලස්සනට. එතුමා කොහේවත් යන්නේ නැහැ. අපි වචනයක් කියන්නේ නැහැ. අපි ලාල් ඇමතිතුමා ගැනත් දන්නවා. මොකද, මම හිටියේ D-16. එතුමා හිටියේ D-10. අපි කවදාවත් එතුමාට මොකුත් කියලා නැහැ නේ. අපි ආණ්ඩුවේ ඉඳිද්දීවත් කිව්වාද? නැහැ, අපි එතුමාව දන්නවා. අපි බොරු කිව්වා නම්, ආණ්ඩුවේ කට්ටිය එහෙන් මෙහෙන් ඒවා ගැන සොයා බලයි; අපි බොරු ද කියන්නේ, ඇත්තද කියන්නේ කියලා සොයා බලයි. ගරු සභාපතිතුමනි, මේවා කියන කොට කට්ටියට රිදෙන්න පුළුවන්. නමුත් විනාඩි 5ට නම් වඳුරෝ අල්ලන්න වෙන්නේත් නැහැ, අලි අල්ලන්න වෙන්නේත් නැහැ, මොකෙක්වත් අල්ලන්න වෙන්නේ නැහැ. ඔය අපේ ඉන්න නිලධාරීන් විනාඩි 5ට ඕක කරයි, ලස්සනට! එක වසමකට ඉන්නවා, නිලධාරීන් 6 දෙනෙක්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chamara Sampath Dasanayake, you have exhausted your alloted time. Could you please wind up?

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒ නිසා විනාඩි 5ට ඒක කර ගන්න බැහැ. ඒක හොඳටම බලලා, කර ගන්න පුළුවන් නම් ලාල් ඇමතිතුමා හෝ මැදිහත් වෙලා ඒ කටයුත්ත හරියට කරන්න. විනාඩි 5ට ඔය වාගේ ඒවා කරන්න බැහැ. අපි ඉතින් ඇත්ත කියන්නේ. මේ ආණ්ඩුව පෙරළන්නවත්, ආණ්ඩුව විවේචනය කරන්නවත් නොවෙයි, ආණ්ඩුවේ තිබෙන අඩු පාඩු හදා ගන්නයි මේවා කියන්නේ. මොකද, විදුලිබල මණ්ඩලයෙන් කියනවා එක කථාවක්. ඇමතිතුමා කියනවා වඳුරෙක් පැන්නා කියලා. ඉතින් ඒකට අපි ද වැරදි? අපට දොස් කියන්නේ ඇයි? අපට දොස් කියලා වැඩක් නැහැ. ඒ නිසා මේ අය වැය විවාදයේදී,-

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔබතුමා ඔය මාධ්‍ය නිවේදනය කියවලා බලන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම ආයේ කියව කියවා ඉන්න ඕනෑ නැහැ, ඔබතුමා කියවා ගන්න. ආ, මෙන්න මේක එතුමාට ගිහින් දෙන්න. මට මේක කියව කියවා ඉන්න වේලාව දෙනවා නම්, මම කියවන්නම්. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ වෙලාව දෙනවා නම්, මම මේක කියවන්නම්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chamara Sampath Dasanayake, could you please conclude? You have far exceeded the alloted time.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විදුලිබල මණ්ඩලය නොවෙයි- *[බාධා කිරීමක්]* අද තිබෙන, හෙට තිබෙන ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. ජනාධිපතිතුමා ගාවට අද ගිහිල්ලා ඉන්නවා ඒ අය. ජනාධිපතිතුමාට හැම දෙයක්ම පවරන්න එපා. ඇමතිතුමා, සභාපතිතුමා හිතුවක්කාර වෙලා ජනාධිපතිතුමාම මේ ප්‍රශ්නවලට මැදි කරන්න එපා. පසුගිය කාලයේත් වුණේ ඕකයි. හිටපු ජනාධිපතිවරුන් ළඟටම ඔක්කෝම ප්‍රශ්න අරගෙන ගියා. ගෝඨාභය මහත්තයා ළඟට ඔක්කෝම ගියා. ඒ වාගේ මේ ජනාධිපතිවරයාටත් වදයක් වෙන්න එපා. කෙටියෙන්ම මම කිව්වේ ඒකයි, නියපොත්තෙන් කඩන්න තිබෙන දේ පොරොවෙන් කඩන්න වෙන්නේ නැති වෙන්න ඔබතුමන්ලා ඒවා විසඳන්න කියලා. එතකොට රටේ ඔය ප්‍රශ්නය විසඳන්න අනික් ඇමතිවරු මැදිහත් වෙන්නේ නැති වෙයි. අනික් ඇමතිවරුන්ට ඔය ප්‍රශ්නය නොවෙයි, ඒ ඇමතිවරුන්ගේ අමාත්‍යාංශවල වැඩ තිබෙනවා. ඒ මිනිස්සු ඒ ඒ අමාත්‍යාංශවල වැඩ කරයි. ඔබතුමාගේ අමාත්‍යාංශය ඔබතුමා හරියට කරන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chamara Sampath Dasanayake, could you please conclude?

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Thank you.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු සභාපතිතුමනි,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Kumara Jayakody?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු සභාපතිතුමනි, 2025 පෙබරවාරි 18වන දා නිකුත් කළ ලංකා විදුලිබල මණ්ඩලයේ මාධ්‍ය නිවේදනය මගේ අතේ තිබෙනවා. හැබැයි ඒක ඉංග්‍රීසියෙන් තිබෙන්නේ. එතුමාට ඒක තේරුණාද කියලා මට සැකයි.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම ඉංග්‍රීසි බැහැ කියලා කියා තිබෙනවා, සිය පාරක්.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
නැහැ, නැහැ, ඒක තමයි ඉතින්. නොමඟ යනවා නේ, ඔබතුමා මේක කියන කොට. *[බාධා කිරීමක්]* මම ඔබතුමාට අභියෝග කරනවා, වදුරෙක් පැන්නේ නැහැ කියලා මේ මාධ්‍ය නිවේදනයේ තිබෙන්නේ කොහේද කියලා පෙන්වන ලෙස.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු ඇමතිතුමා, පැන්නේ වදුරෙක් කියලා ඕකෙ කොහේ හරි තිබෙනවාද?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
නැහැ, නැහැ, මෙහෙමයි. මෙහි කියන්නේ මෙහෙම නේ. මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීමයි, සාමාන්‍ය ප්‍රකාශයක් කිරීමයි දෙකක් නේ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාත් හිටපු නියෝජ්‍ය ඇමතිතුමෙක් නේද? මේ මාධ්‍ය නිවේදනයේ කෙළින්ම තිබෙන්නේ, "A system-wide failure was triggered by a disturbance..." ඒක වක්‍රාකාරයෙන් තිබෙන්නේ. හේතුව හරියටම කියලා නැහැ. ඒ විධියට කියලා තිබෙන්නේ. ඔබතුමාට කියන්න බැහැ, වදුරෙක් පැන්නේ නැහැ කියලා මෙය බලලා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
එහෙම නම්, වදුරෙක් පැන්නා ද?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
අනිවාර්යෙන්ම. ඒකේ videos ඔක්කෝම තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් ඒවා දෙන්නම්. ඒවා මාධ්‍යවලත් ගියා. *[බාධා කිරීම්]*

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, මා ළඟ තිබුණු මාධ්‍ය නිවේදනය මම මීට පෙර සභාගත කළා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මම හිතන්නේ ඔබතුමාට අර වචනය - "triggered" කිව්වාම - මොකක්ද කියලා සොයා ගන්න බැරි වෙන්න ඇති. ඒකයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Anura Karunathilaka. You have 18 minutes.

[පූ.භා. 11.23]

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් ලෝකයේ බලශක්ති ඉල්ලුම ශීඝ්‍රයෙන් වැඩි වෙනවා, කර්මාන්ත අවශ්‍යතා සහ අනිකුත් අවශ්‍යතා එක්ක. මේ අවශ්‍යතාව ශීඝ්‍රයෙන් වැඩි වෙනවාත් එක්කම ඒ පිළිබඳ විශාල අවධානයක් යොමු වෙනවා. විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් පර්යේෂණ ගණනාවක් සිද්ධ වෙමින් පවතිනවා. එහි ප්‍රතිඵලයක් හැටියට බලශක්ති ප්‍රභව පිළිබඳ, විශේෂයෙන් විකල්ප බලශක්ති ප්‍රභව පිළිබඳ විශාල අවධානයකින් කටයුතු කරනවා.

විශේෂයෙන් ඒකත් එක්ක යම් යම් ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා එනවා. Clean energy සහ Net Zero Policy වැනි විවිධ ප්‍රතිපත්ති සාකච්ඡාවට එනවා. අප ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය ගැන සාකච්ඡා කරන කොට මෙන්න මේ සංදර්භය සහ ඒ වටපිටාව අමතක කරලා සාකච්ඡා කරන්න බැහැ. සාමාන්‍යයෙන් ලෝකයේ පොසිල ඉන්ධන, එහෙම නැත්නම් ඛනිජ තෙල් සඳහා මේ වන කොට ඉල්ලුමක් තිබෙනවා. නමුත් 2025, 2030 කාලය වන කොට මේක ක්‍රමක්‍රමයෙන් අඩු වෙලා ගිහින් ඊටත් පසුව ක්‍රමක්‍රමයෙන් තවත් අඩු වෙගෙන යයි කියලා තමයි පුරෝකථනය කරන්නේ. දැනටමත් ප්‍රකාශ කරලා තිබෙන විධියට විශේෂයෙන් net zero ප්‍රතිපත්තිය නිසා 2050 විතර වන කොට පොසිල ඉන්ධන සඳහා තිබෙන ඉල්ලුම සෑහෙන දුරට අඩු වෙන්න පුළුවන්. ඒ වාගේම දැනටමත් බොහෝ රටවල් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා, පොසිල ඉන්ධන භාවිතයෙන් ඉවත් වෙනවා කියලා. උදාහරණයක් වශයෙන් නෝර්වේ රාජ්‍යය 2025දී ඉවත් වන බව ප්‍රකාශ කරලා තිබෙනවා. එක්සත් රාජධානිය, කැනඩාව, USA වාගේ රටවල් 2030 සහ 3035 වන කොට පෙට්‍රල් සහ ඩීසල් භාවිත කරන වාහන අලුතින් භාවිතයට එකතු කරන්නේ නැහැ කියන ප්‍රතිපත්තිමය තීරණය මේ වන කොටත් ගෙන තිබෙනවා. ඒ වාගේම Costa Rica, France, Ireland සහ New Zealand වැනි රටවල් අලුතින් තෙල් ගවේෂණය කරන්නේ නැහැ කියන ප්‍රතිපත්තිමය තීරණය ගෙන තිබෙනවා. එම නිසා පොසිල ඉන්ධන සඳහා තිබෙන වෙළෙඳ පොළ ක්‍රමක්‍රමයෙන් හැකිළෙමින් යනවා.

ඒ වාගේම, බොහෝ රටවල් 2040 වන කොට ගල් අඟුරුවලින් බලශක්තිය නිපදවීම සීමා කිරීම සම්බන්ධයෙන්

සාකච්ඡා කරනවා. සමහර අය දැනටමත් ඒ සම්බන්ධයෙන් වන තීරණය අරගෙන තිබෙනවා. ඒ වාගේම 2035න් පස්සේ ස්වාභාවික වායු - LNG - සඳහා වැඩි අවධානයක් යොමු වෙනවා. ඒකත් ක්‍රමක්‍රමයෙන් අඩු වෙයි කියන එක තමයි සමහර පර්යේෂකයන් කියන්නේ.

මේකට ප්‍රධාන හේතුව තමයි, හයිඩ්‍රජන් සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ අවධානය සහ ඒ සම්බන්ධයෙන් තිබෙන පර්යේෂණ වැඩි වෙලා ඒ පර්යේෂණවලින් නව ප්‍රතිඵල අත්වීමත් එක්ක මේ අලුත් විකල්ප බලශක්ති ප්‍රභව පිළිබඳව ලෝකයේ අවධානය විශාල වශයෙන් යොමු වීම. මෙතැන සාකච්ඡා වුණා වාගේ ලංකාවේ සුළං බලයෙන් විදුලිය නිපදවීම ගත්තොත්, විශේෂයෙන් උතුරු මුහුදු වෙරළ තීරයේත්, මුහුදේත්, ආසන්න offshore එකේත් සාමාන්‍යයෙන් ගිගාවොට් 30ත්, 50ත් අතර ප්‍රමාණයක විශාල විභවයක් ලංකාව තුළ ඒ සඳහා තිබෙනවා කියන එක තමයි කරපු feasibility studies අනුව අදාළ පර්යේෂකයන් කියන්නේ. ඒ වාගේම, සූර්ය බලයෙන් විදුලිය නිපදවීම සම්බන්ධයෙන් ගත්තොත්, දැනටමත් ප්‍රකාශ වුණා වාගේ විදුලිය මෙගාවොට් 1,400කට විතර ආසන්න ප්‍රමාණයක් දැන් ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ අපි සඳහන් කළා, ඒක මෙගාවොට් 2,000ක් දක්වා වැඩි කරන්න ඕනෑ කියලා. දැන් අපට දැනෙනවා, මීට වඩා වැඩි ප්‍රමාණයකින් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙනවා කියලා. එතැනදි වහල මත සවි කරන සූර්ය පැනලවලින් වාගේම solar farmsවලින් විදුලිය නිපදවීම සම්බන්ධයෙන් තමයි අවධානය යොමු කළේ. ඒ සඳහා දැනටමත් පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා හැටියට කරපු අය වැය කථාවේදීත් ඒ පිළිබඳ අවධානය යොමු කරලා කටයුතු කරන බව සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම, ඊට අදාළ කැබිනට් තීරණත් මේ වෙනකොට අරගෙන තිබෙනවා.

මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, අනෙක් ප්‍රභවයන්ට සාපේක්ෂව ගත්තාම solarවලින් විදුලිය ජනනය කිරීමේ වියදම අඩු බව. සමහර ව්‍යාපෘති අපට ඇවිල්ලා තිබෙනවා, විදුලිය ඒකකයක් ඩොලර් ශත 4.65 වාගේ අඩු අගයකට. අපි සූර්ය පැනල භාවිතයෙන් විදුලි ජනනය සඳහා කාලයක් තිස්සේ අවධානය යොමු කළත්, එතැනදී පැන නැඟුණු ගැටලුවක් තමයි, ඒ පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කරන්න වාගේම සමතුලිතතාව ආරක්ෂා කරන්න ප්‍රමාණවත් අවධානයක් යොමු වෙලා තිබුණේ නැති එක. ඒ නිසා සූර්ය බලයෙන් විදුලිය ජනනය වීම යම් ප්‍රමාණයකට වැඩි වෙච්ච අවස්ථාවක කිසියම් බිඳ වැටීමක් අවොත් නැවත ස්ථායී තත්ත්වයකට පත් කිරීම සෑහෙන්න අපහසු කාර්යයක් වෙනවා. නමුත් දැනට ලංකා විදුලිබල මණ්ඩලය මේ පිළිබඳව අවධානය යොමු කරලා ඒ සඳහා පියවර ගනිමින් ඉන්නවා.

මම අර කලින් කිව්වා වාගේ සාමාන්‍යයෙන් ලෝකය බලශක්තිය සම්බන්ධයෙන් විකල්ප පුනර්ජනනීය බලශක්තිය පැත්තට ගියාට, ආසියානු කලාපය ඒ තත්ත්වයට යන්න තව සෑහෙන කාලයක් යයි, අපේ ආර්ථික හා සමාජ වටපිටාව අනුව. එතැනදී ලෝකයේ බලශක්ති වෙළෙඳ පොළේ කේන්ද්‍රස්ථානයක් විධියට භාවිත කරන්න පුළුවන් අපේ ලංකාවේ උපායමාර්ගික පිහිටීම අපි බොහෝ වෙලාවට භාවිත කරලා තිබුණේ නැහැ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටු අංක 167හි සඳහන් වෙනවා, අපේ ලංකාවේ තිබෙන උපායමාර්ගික පිහිටීම භාවිත කරලා ලෝකය තුළ, විශේෂයෙන් මේ කලාපය තුළ බලශක්ති වෙළෙඳ පොළේ කේන්ද්‍රස්ථානයක් නිර්මාණය කරන්න කටයුතු කරන බව. මෙවැනි බොහෝ ප්‍රකාශ අපි අහලා තිබෙනවා. Knowledge hubs හදනවා කියලා තිබුණා. තව වෙනත් සංකල්පත් තිබුණා. නමුත් ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනුණේ නැහැ, ගරු සභාපතිතුමනි. අපේ ලංකාවේ උපායමාර්ගික පිහිටීම භාවිත කරලා ලෝකයේ බලශක්ති වෙළෙඳ පොළ තුළ, විශේෂයෙන් මේ කලාපයේ බලශක්ති වෙළෙඳ පොළ තුළ අපේ රට කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්න අපි මෙතැනදිත් බලාපොරොත්තු වෙනවා නම්, අපි ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සකස් කරන්න ඕනෑ. එතැනදී ප්‍රධාන වශයෙන් වැදගත් වෙන එකක් තමයි, තෙල් පිරිපහදුව. ඔව්. අපි දැනටමත් දන්නා විධියට හම්බන්තොට ප්‍රදේශයේ චීන ආයෝජනයක් හැටියට තෙල් පිරිපහදුවක් ආරම්භ කරන්න කටයුතු කරමින් ඉන්නවා. ප්‍රධාන වශයෙන් මේකට යොමු වෙන්නේ අපනයනය ඉලක්ක කරගෙන. ඒ වාගේම, සපුගස්කන්ද තෙල් පිරිපහදුව පිළිබඳවත් කාලයක් තිස්සේ සාකච්ඡාවක් ආවා. මට මතක හැටියට, 2007දී ඒකට මුල් ගලක් තැබුවා. හැබැයි ශක්‍යතා අධ්‍යයනයක් කරන්නේ නැතුව තමයි ඒ මුල්ගල තැබුවේ. මම දන්නේ නැහැ, ඒ වාගේ වෙන එකක් ගැන. ශක්‍යතා අධ්‍යයනයක් කරන්නේ නැතුව මුල් ගලක් තියපු පිරිපහදුවක් ගැන සඳහන් වෙනවා නම් මම අහලා තිබෙන්නේ අන්න ඒ සපුගස්කන්ද තෙල් පිරිපහදුව ගැන තමයි. 2010දී තමයි මේ ශක්‍යතා අධ්‍යයනයක් කළේ. අඩුම ගානේ කැබිනට් අනුමැතියකින්වත් තොරව තමයි ඒ මුල් ගල තැබුවේ. හැබැයි එතැනින් එහාට ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණේ නැහැ.

නැවත වතාවක් 2022දී මේ සම්බන්ධයෙන් කරපු ශක්‍යතා අධ්‍යයනයකින් පස්සේ අපට කටයුතු ආරම්භ කරන්න පුළුවන්කම ලැබුණා. ඒ අනුව, දැනට සපුගස්කන්ද තෙල් පිරිපහදුව ආශ්‍රිතව තෙල් පිරිපහදුවක් ඉදි කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා. 2022දී කරපු ඒ ශක්‍යතා අධ්‍යයනය අනුව දැන් EoIs call කරලා තිබෙනවා. දැනට සාමාන්‍යයෙන් දවසකට බැරල් 50,000ක් විතර ප්‍රමාණයක පිරිපහදුවක් තිබෙන්නේ. ඒක දවසකට බැරල් 150,000ක් දක්වා වැඩිදියුණු කරන්න අවශ්‍ය පිරිපහදුවක් ඉදිකිරීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

මෙතැනදී වැදගත් කාරණයක් තමයි, ලෝකයේ අනෙක් කලාපයට සාපේක්ෂව අපි අපනයනය සඳහා තෙල් පාවිච්චි කළොත් ඇතිවන තත්ත්වය. දැන් ලෝකයේ තෙල් වෙළෙඳ පොළේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් වෙන්නේ සිංගප්පූරුව. මැද පෙරදිග කලාපය ආශ්‍රිතව තමයි බොහෝ තෙල් නිෂ්පාදන සිද්ධ වෙන්නේ. මැද පෙරදිග කලාපයේ ඉඳලා සිංගප්පූරුව හරහා තමයි බොහෝ තෙල් බෙදා හැරීම් සිද්ධ වෙන්නේ. මේ තෙල් පිරිපහදුව ආරම්භ කිරීමෙන් ලංකාවට මේ කේන්ද්‍රස්ථානය ගත්තොත්, නැව් ගමනාගමනය සඳහා තිබෙන ගාස්තු අඩුවීමත් එක්ක වෙළෙඳ පොළේ සැලකිය යුතු පංගුවක් අත්පත් කර ගැනීමට ලංකාවට අවස්ථාව ලැබෙනවා.

ඒ වාගේම තෙල් පිරිපහදුවත් එක්ක බොහෝ අතුරු නිෂ්පාදන එනවා. දැනට කරපු ගණනය කිරීම් එක්ක සල්ෆර් මෙට්‍රික්ටොන් 440ක් නිෂ්පාදනය කරන්න පුළුවන් වෙයි කියලා ගණන් හදලා තිබෙනවා. මේ සල්ෆර් පාවිච්චි කරලා සල්ෆියුරික් අම්ලය නිෂ්පාදනය කරන්න පුළුවන්. අපේ rock phosphate නිධියක් තිබෙනවා. Triple superphosphate නිෂ්පාදනය කරන්න අපට මේ සල්ෆියුරික් අම්ලය භාවිත කරන්න පුළුවන්. එතකොට අපේ රටේ ගොවියාගේ පොහොර ප්‍රශ්නයට යම් පමණකට උත්තරයක් මෙතැනිනුත් හොයා ගන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, මේ නිපදවන සල්ෆර් සහ සල්ෆියුරික් අම්ලය අනෙකුත් කර්මාන්ත සඳහාත් අවශ්‍ය වන බව අපි හොඳටම දන්නවා. බොහෝ වෙලාවට අපි ඉන්දියාවෙන් ගෙනැල්ලා තමයි අපේ සල්ෆර් අවශ්‍යතාව ඉෂ්ට කර ගන්නේ. දැනට ඉන්දියාවෙන් ගෙනෙන ප්‍රමාණය අපි ලංකාවේ නිෂ්පාදනය කර ගත්තාට පස්සේ විදේශ විනිමය සැලකිය යුතු ප්‍රමාණයක් ලංකාව තුළ ඉතුරු කර ගන්න හැකියාව තිබෙනවා.

[ගරු අනුර කරුණාතිලක මහතා]

ත්‍රිකුණාමලය සම්බන්ධයෙන් කථා කරන්නේ නැතිව අපේ බලශක්ති ක්ෂේත්‍රය ගැන කථා කරන්න බැහැ. අපි දන්නවා, ත්‍රිකුණාමලය ආශ්‍රිතව තෙල් ටැංකි ගණනාවක් තිබෙන බව. එතැන තෙල් ටැංකි 15ක් ඉන්දියාවට තිබෙනවා, Lower Tank Farm එකේ. ඒ වාගේම IOC එකේයි, CPC එකේයි joint venture එකක් හැටියට Upper Tank Farm එකේ තවත් තෙල් ටැංකි 61ක් තිබෙනවා. එතැනින් සියයට 49ක් IOC එකට අයිතියි. සියයට 51ක් TPTL එකට අයිතියි. සමහර විට ඔබට මතක ඇති, හිටපු බලශක්ති ඇමතිවරයා තමයි ඉන්දියාවට මේ තෙල් ටැංකි 15 ලබාදෙන joint venture එකට ගිහිල්ලා තිබෙන්නේ. නමුත්, අපි හරියට කටයුතු කළොත් මේ තිබෙන තෙල් ටැංකි ටික, විශේෂයෙන් joint venture එකක් හැටියට තිබෙන තෙල් ටැංකි 61 ජාත්‍යන්තර තෙල් ගබඩාවක් හැටියට භාවිත කරන්න පුළුවන්. දැන් මේ ගැන අපි කථා කරනකොට සමහර අය කියනවා, ඉස්සර කියපු දේ නොවෙයි දැන් කියන්නේ කියලා. එතැනදී මට මතක් වෙන කාරණයක් තිබෙනවා.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "ත්‍රිකුණාමලයේ ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් මෙතෙක් එළඹ ඇති ගිවිසුම් නැවත සලකා බලන අතර තෙල් සංස්ථාව සතු ටැංකි 24 සහ හවුල් සමාගම සතු ටැංකි 61 සඳහා ජාතික ආර්ථිකයට වාසිදායක ව්‍යාපාර ආකෘතියක් සැකසීම" කියලා. ඒ කටයුතු දැනටමත් ආරම්භ වෙලා තිබෙනවා. ඒ අනුව CPC එකට අයිති තෙල් ටැංකි 24ක් තිබෙනවා. එයින් හතරක නවීකරණ කටයුතු දැනටමත් සම්පූර්ණ කරලා තිබෙනවා. මෙතැනත් ජාත්‍යන්තර ගබඩාවක් හැටියට මේ තෙල් ටැංකි පාවිච්චි කිරීම සඳහා දැනට ජාත්‍යන්තර ආයතනත් එක්ක, ආයෝජකයන් එක්ක අපි සාකච්ඡා කර තිබෙනවා.

ඒ අනුව ප්‍රංශය, ජපානය වාගේ රටවල ආයෝජන සමාගම් මේ සම්බන්ධයෙන් කැමැත්ත පළ කරලා තිබෙනවා. අදියර කිහිපයක් යටතේ ඒ අය එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව- අපි කවුරුත් දන්නා විධියට ත්‍රිකුණාමලය වරාය තමයි ලෝකයේ දෙවන ගැඹුරුම වරාය. ලෝකයේ ඕනෑම විශාල නැවක් ඇතුළු කරන්න පුළුවන් පහසුකම් ත්‍රිකුණාමලය වරාය සතුව තිබෙනවා. ඒ උපාය මාර්ගික සහ ස්වාභාවික පිහිටීම පාවිච්චි කරලා ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව LNG මධ්‍යස්ථානයක් හැටියට දියුණු කරන්න කටයුතු කරමින් ඉන්නවා. LNG සඳහා වන වෙළෙඳ මධ්‍යස්ථානයක් ත්‍රිකුණාමලයේ ආරම්භ කරන්න Ceylon Petroleum Corporation එක දැනටමත් කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම අපේ වෙළෙඳ පොළ සම්බන්ධයෙන් කථා කරනකොට බලශක්තියට විතරක් සීමා වෙලා කටයුතු කරන්න බැහැ. අනිවාර්යයෙන්ම අපේ ආර්ථික උපාය මාර්ගය තුළ, පොදු සංවර්ධන සැලැස්ම තුළ බලශක්තිය කේන්ද්‍රගත කළ යුත්තේ කොහේද කියන එක සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් තමයි අපි කටයුතු කරන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරය අපේ ආර්ථිකය ඉදිරියට ගෙන යාම සඳහා ගතිකත්වයක් ලබා දෙන්න පුළුවන් ක්ෂේත්‍රයක් හැටියට අපි හඳුනාගෙන තිබෙනවා. අපි දන්නවා, 2040 වන විට සංචාරකයන් විශාල ප්‍රමාණයක් ලංකාවට එන බව. ඒ වාගේම ගුවන් යානාත් ලංකාවට එන්න පටන් ගන්නවා. එතකොට, ඒ සඳහා අවශ්‍ය වන ගුවන් යානා ඉන්ධන සැපයීම සඳහා අපට අවස්ථාවක් තිබෙනවා. දැනට සාමාන්‍යයෙන් අපි කොළොන්නාවේ ඉඳලා කෝච්චියෙන්, එහෙම නැත්නම් බවුසර්වලින් ගුවන් යානා තෙල් කටුනායකට ගෙන ගිහිල්ලා තමයි ඉන්ධන බෙදා හැරීම කරන්නේ. එතකොට ඉදිරියේදී ගුවන් යානා ඉන්ධන සඳහා ඇති වන ඉල්ලුම සපුරාලන්න ඒක ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ අනුව අපි දැනටමත් මුතුරාජවෙල ඉඳලා කටුනායකට ගුවන් යානා ඉන්ධන සැපයීම ආරම්භ කරලා තිබෙනවා. කොරියානු සමාගමකට දුන් පහසුකම් පසුගිය ආණ්ඩුවෙන් නතර කළා. දැන් තෙල් සංස්ථාවේ ආයෝජනයක් හැටියට මේ නළ ඉදිකිරීම සඳහා දැනටමත් කටයුතු කරලා තිබෙනවා. ඉදිරියේදී එම ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවන්න බලාපොරොත්තු වෙනවා.

අපි බොහෝදෙනෙක් දන්නා කාරණයක් තමයි කොළොන්නාවේ සිට වරාය දක්වා තිබෙන නළ පද්ධතියෙන් තමයි තෙල් නැව්වල ඉඳලා ගබඩාව දක්වා තෙල් යොමු කරන්නේ කියන එක. සාමාන්‍යයෙන් ප්‍රධාන නළ හතක් තිබුණත් පසුගිය කාලයේ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම නිසා භාවිත කළ හැකි නළ ප්‍රමාණය හතරකට අඩු වෙලා තිබෙනවා. ඒ නඩත්තු කටයුතු හරියට නොකිරීම නිසා, ඒ වාගේම ඒ හතම භාවිත කරන්න බැරි වීම නිසා සාමාන්‍යයෙන් ඩොලර් මිලියන 5ත්, 10ත් අතර ප්‍රමාණයක් එතැනින් අහිමි වෙනවා. ඒකට හේතුව මොකක්ද? ලෝකයේ තෙල් නැව් ලංකාවට එනකොට දන්නවා, අඩුම ගණනේ දවස් 4ක්, 5ක් තෙල් ගහන්න නැවතිලා ඉන්න වෙනවාය කියලා. එතකොට ඒ අය නැව් ගාස්තුව ගණනය කරනකොට ඒ ඉන්න දවස් 4-5 සඳහා වන මුදලත් එක්ක තමයි තමන්ගේ freight charge එක calculate කරන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Anura Karunathilaka, you have only two more minutes.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

එතකොට අපි හරියට මේ තෙල් නළ ටික නඩත්තු කටයුතු කළොත් ඒ ගතවන කාලය දින දෙකකට අඩු කරන්න පුළුවන්. එයින් විශාල මුදලක් ඉතුරු කර ගන්න අපට පුළුවන්. ඒ වාගේම මේ නළ පද්ධතිය නවීකරණය කරන්න දැනටමත් වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. මම අර කලින් කිව්වා වාගේ Ceylon Petroleum Corporation - CPC - එක CPSTL එකට දෙන ණයකින් තමයි ඒක කරන්නේ. එතකොට අපට පුළුවන්කම තිබෙනවා, මේ ඩොලර් මිලියන 5ත්, 10ත් අතර මුදල ලංකාව තුළ රඳවා ගන්න. ඒ වාගේම කාර්යක්ෂම තෙල් ගොඩබෑමේ පද්ධතියක් ඇති කරන්නත් අපට පුළුවන්කම ලැබෙනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම ලිහිසි තෙල් - lubricant - market එක ගැනත් මම වචනයක් සඳහන් කරන්න ඕනෑ. පැවැති රජය අපේ ඉන්ධන පෙරහුම්වලට වෙනත් සමාගම්වලින් නිෂ්පාදනය කරන ලිහිසි තෙල් නිෂ්පාදන විකුණන්න පුළුවන් කියලා ගිවිසුම්ගත වෙලා තිබුණා.

හැබැයි, අනෙකුත් සමාගම්වලට අයත් පෙට්‍රල් ෂෙඩ්වල අපේ නිෂ්පාදන විකුණන්න බැහැ. අනෙක් අයගේ ලිහිසි තෙල් CPC එකට අයත් තැන්වල විකුණනවා, හැබැයි CPC එක නිෂ්පාදනය කරන ලිහිසි තෙල් අනෙක් සමාගම්වලට අයත් ෂෙඩ්වල විකුණන්න බැහැ. මේ තත්ත්වය ඇති වෙන්න හේතු වුණු එක ප්‍රධාන කරුණකුත් මතක් කරලා මම ඊට හේතුව පැහැදිලි කරන්නම්. ඒ සඳහා ප්‍රධාන හේතුවක් තිබුණා. ලිහිසි තෙල් ලංකාවට ගෙනෙන සමාගම් ගණනාවක දේශීය නියෝජිතයා හැටියට හිටපු කෙනෙකුගේ දුවෙක් එක්ක, හිටපු විදුලිබල හා

බලශක්ති ඇමතිවරයාගේ සම්බන්ධකමක් තිබුණා. මම දන්නේ නැහැ, දැන් විවාහ වෙලාද නැද්ද කියලා. කොහොම වුණත්, ජාතික ජන බලවේග ආණ්ඩුව - අලුත් ආණ්ඩුව - ආවාට පස්සේ Ceylon Petroleum Corporation එකට පත් වුණු අලුත් සභාපතිවරයා එහි සියලුම පැරණි ගිවිසුම් අහෝසි කරලා CPC එකේ ලිහිසි තෙල් වෙළෙඳාම දෙගුණයක් කරන්න සමත්වෙලා තිබෙනවා. මෙතැනදී මම පොඩි කරුණක් මතක් කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් ලිහිසි තෙල්වල ජාත්‍යන්තර ප්‍රමිතිය තීරණය කරන එක් තත්ත්ව සහතිකයක් තමයි, American Petroleum Institute -API- තත්ත්ව සහතිකය. මේ වෙනකොට ලංකාවේ ලිහිසි තෙල් වෙළෙඳ පොළ තුළ API තත්ත්ව සහතිකය තිබෙන එකම නිෂ්පාදනය CPC එක නිෂ්පාදනය කරන ලිහිසි තෙල් කියන කාරණය මම මේ අවස්ථාවේ අවධාරණය කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, මට බොහෝ දේවල් කථා කරන්න තිබුණත්, ඔබතුමා කාලය අවසන් කියලා කියපු නිසා මම තව එක කරුණක් පිළිබඳව සඳහන් කරලා මගේ කථාව අවසන් කරන්නම්.

රාජ්‍ය ආයතනවලට බඳවා ගැනීම් කරනකොට, ඒ වාගේම රාජ්‍ය ආයතනවල කටයුතු කරනකොට එම ආයතනයේ දියුණුව සඳහා හැකියාව තිබෙන, දක්ෂතාව තිබෙන පුද්ගලයන් අනිවාර්යයෙන්ම බඳවාගන්න ඕනෑ කියන එක අපි දන්නවා. ඒ වාගේම ඔවුන් බඳවාගෙන කටයුතු කරනකොට ආයතනයේ දියුණුව වෙනුවෙන් අනිවාර්යයෙන්ම ඔවුන්ගේ ක්‍රියා කලාපයත් හේතු වෙන්නට ඕනෑ. නමුත් සමහර අවස්ථාවලදී, විශේෂයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය තුළ සිදු වූ දේවල් දිහා බැලුවාම අපට පෙනෙන කාරණයක් තමයි, ඒ කටයුතු ඒ විධියටම සිද්ධ වුණේ නැහැ කියන එක. තමන්ගේ දේශපාලන හිතවතුන්ට, ආධාරකරුවන්ට රැකියා සපයන මධ්‍යස්ථාන හැටියට තමයි එම ආයතන පාවිච්චි කරලා තිබෙන්නේ.

මම එක කරුණක් කියන්නම්. Ceylon Petroleum Corporation එකේ එක් පුද්ගලයෙක් සිටියා, ඔහු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් හැටියට පත් කළා. සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් හැටියට පත් කරනකොට කිසියම් විධියක අධ්‍යාපන සුදුසුකමක්, ක්ෂේත්‍රය පිළිබඳව වෘත්තීය හැකියාවක් තිබෙන පුද්ගලයෙක් තමයි පත් කරන්න ඕනෑ. නමුත් අවාසනාවකට මම මේ කියන පුද්ගලයා තෙල් පිරවුම්කරුවෙක් හැටියට තමයි කටයුතු කරලා තිබෙන්නේ. තෙල් පිරවුම්කරුවෙක් හැටියට හිටපු කෙනෙක් පසුගිය කාලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හැටියට පත් කරලා තිබුණා. ඒක කමක් නැහැ කියලා හිතමුකෝ. හැබැයි, ඒ පුද්ගලයා වෘත්තීය සමිතියක නායකයෙක්. සාමාන්‍යයෙන් වෘත්තීය සමිතිවල නීතියක් තමයි, යම් කෙනෙක් පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතුවලට මුදා හරිනවා නම්, එම වෘත්තීය සමිතිය තුළ අඩුම ගණනේ සාමාජිකයින් 1,000කට වඩා ඉන්න ඕනෑ කියන එක. හැබැයි, මේ පුද්ගලයා 2015 ජනවාරි මාසයේ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදා හරිනකොට ඔහු සම්බන්ධ වුණු වෘත්තීය සමිතියේ සිටියේ සාමාජිකයින් 650ක් විතරයි. එතකොට, අනිත්කව තමයි ඒ පුද්ගලයා මුදා හැරලා තිබෙන්නේ. ඒකත් කමක් නැහැ කියලා හිතමුකෝ. නීති විරෝධියි, කමක් නැහැ. ඔහු වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව මුදා හැරියා විතරක් නොවෙයි, ඔහුට අතිකාල දීමනාත් ලබා දීලා තිබෙනවා. මම දන්නේ නැහැ, වෘත්තීය සමිතියක වැඩකටයුතු කරනකොට ඔහුට අතිකාල දීමනා ලබා දෙන්නේ කොහොමද කියලා. ඒ කාලය ඇතුළත අතිකාල දීමනා විධියට විතරක් ඔහුට රුපියල් 3,111,601ක මුදලක් ලබා දී තිබෙනවා. වෘත්තීය සමිති කටයුතු සඳහා ඔහු පූර්ණ කාලීනව මුදා හරිනවා, හැබැයි Ceylon Petroleum Corporation එකෙන් අතිකාල ගෙවනවා. මේක කොයිතරම් දුරට සාධාරණද කියන එක, කොයිතරම් දුරට සදාචාරාත්මකද කියන එක මේ ගරු සභාවට කල්පනා කරන්නට ඕනෑ. අවශ්‍ය නම් මේ පුද්ගලයා ගැන සොයන්න පුළුවන්. මේ, සමහර කෘත්‍යාධිකාරී මණ්ඩලවල සිටින කෙනෙක්.

තොරතුරු සොයාගන්න එක එච්චර අමාරු වැඩක් නොවෙයි. සොයලා බලන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඔව්, ඕනෑ නම් මම නම කියන්නම්. ඒ පුද්ගලයා මේ සභාවේ නැති නිසා උත්තර දෙන්න බැරි වුණත්. ඒ, ආනන්ද පාලිත. මේ කියන පුද්ගලයා සේවයෙන් මුදා හරිනකොට ඉඳලා තිබෙන්නේ ජාතික සේවක සංගමයේ. දැන් වෙනත් දේශපාලන පක්ෂයක කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙකු හැටියට ඉන්නවා කියලා තමයි අපට ආරංචි වෙලා තිබෙන්නේ. ඔන්න ඔය වාගේ සදාචාරාත්මක භාවිතයක් තිබෙන අය එක පැත්තකින් Ceylon Petroleum Corporation එකේ වැඩ කරනවා. දැන් ඔහු දේශපාලන පක්ෂයක කෘත්‍යාධිකාරී මණ්ඩලයේ කටයුතු කරනවා. අර තිබුණු සදාචාරයම, මව් පක්ෂයේ තිබුණු දේශපාලන සදාචාරයම අනෙක් තැනට අරගෙන යනවා. තමුන්නාන්සේලා මේ පිළිබඳව සොයා බලා කටයුතු කරනවා නම් හොඳයි. මෙවන් පුද්ගලයන් ළං කරගෙන තමන්ගේ දේශපාලන සදාචාරය සහ මිනිස්සු බලාපොරොත්තු වෙන දේශපාලනය ලබා දෙන්න පුළුවන්ද කියන එක ගැන ටිකක් seriously කල්පනා කරලා බලනවා නම් හොඳයි.

තව එක කරුණක් සඳහන් කරලා මම කථාව අවසන් කරන්නම්. මේ සභාවේදී කියැවුණා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ බලශක්තිය පිළිබඳව තිබෙන ක්‍රියාමාර්ග 41න් 4කට විතරයි අපි මේ වෙනකොට අත ගහලා තිබෙන්නේ කියලා. ඇත්තටම මම එතැනින් පස්සේ බැලුවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ බලශක්තිය පිළිබඳව සඳහන් වෙන 162 සිට 168 දක්වා පිටු. ඔව්, අපි කරුණු 42ක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්තටම මේ කාලය තුළ -මාස තුනකට පොඩ්ඩක් වැඩි කාලයක් තුළ- මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ බලශක්තිය පිළිබඳව සඳහන් වන කරුණු 41න් 10ක් සම්පූර්ණ කරන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ වෙනකොට කටයුතු කරලා තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ 10 කියන්න.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඔව්, අනිවාර්යයෙන් මම කියන්නම්. කාලය ලබා දෙනවා නම් මම ඒ ගැන පැහැදිලි කරන්නම්. අපි මේ වෙනකොට ක්‍රියාමාර්ග 10කට අත ගහලා තිබෙනවා. ඔබතුමා පෞද්ගලිකව මුණ ගැහුණොත් හෝ මට කාලය ලබා දුන්නොත් මම ඒ ගැන කියන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව කොපමණ කාලය අවශ්‍යද?

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
විනාඩි 3ක් හෝ 4ක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, එතුමාට තව විනාඩි 4ක් ලබා දෙන්න.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 165වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"සූර්ය බලය මඟින් මෙගාවොට් දෙදහක් (2,000MW) ක්‍රමිකව ජාතික පද්ධතියට එක් කර ගැනීම"

ගරු සභාපතිතුමනි, - *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
දැන් ඔබතුමන්ලා ප්‍රතිපත්තියක් හැදුවාද? උත්තරයක් දෙන්න.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙන්නේ- *[බාධා කිරීමක්]* ඔබතුමා අහගෙන ඉන්න. ඔබතුමා කථා කරනකොට මම බාධා කළේ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ajith P. Perera, let the Hon. Minister continue and finish up.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
එතකොට ඒ සඳහා අවශ්‍ය වන ඉඩම්, අනෙකුත් ආයෝජන අවස්ථා ලබා ගැනීම සඳහා අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එම පිටුවේම තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"සුළං බල විභවය දේශීය හා විදේශීය විදුලිබල වෙළෙඳපොළට නිසි තරඟකාරී ආයෝජන ගෙන ඒම"

ඒ සඳහා කටයුතු කරනවා කියන එක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙනවා. ඒ අනුව, 166වෙනි පිටුවේ මෙසේ සඳහන් වනවා:

"සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම හෝ නව පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන කටයුතු කඩිනම් කිරීම"

ශක්‍යතා අධ්‍යයනයක් විතරක් නොවෙයි, එතැනින් ඉස්සරහට ගිහිල්ලා ඒ අයෝජන කැඳවා ගැනීම සඳහා ආයෝජකයන් සමඟ සාකච්ඡා කිරීමත් අපි දැන් ආරම්භ කරලා තිබෙනවා. මම කලිනුත් සඳහන් කළා වාගේ, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් ජාතික ආර්ථිකයට වාසිදායක ව්‍යාපාර ආකෘතියක් සකසනවා කියන එකත් අපි ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ සඳහන් කරලා තිබෙනවා. එම පිටුවේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"අඛණ්ඩ සැපයුමක් සහතික කෙරෙන පරිදි ඉන්ධන ගබඩා හා බෙදාහැරීම් යටිතල පද්ධතිය නවීකරණය කිරීම"

මේ සම්බන්ධවත් අපි කටයුතු කරනවා. ඒ වාගේම දැනට අබලන්ව පවතින කොළඹ වරාය හා කොළොන්නාව පර්යන්තය අතර නළ පද්ධතිය ගැන මම කලිනුත් සඳහන් කළා. ඒ ගැන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 166හි සඳහන් වෙනවා. ඒ සම්බන්ධව අපි දැනටමත් ක්‍රියාමාර්ග ආරම්භ කරලා තිබෙනවා.

ඒ වාගේම 167වෙනි පිටුවේ මෙසේ සඳහන් වනවා:

"විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය තුළ අනිවාර්යයෙන් සිදුවිය යුතු ප්‍රතිව්‍යුහගත කිරීම්, අදාළ පාර්ශ්වකරුවන් සහ මහජන මත විමසීම් මත සහ විශේෂඥ නිර්දේශ මත සිදුකිරීම"

අපි දැන් ඒ සම්බන්ධයෙන් වූ සාකච්ඡාව ආරම්භ කරලා තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, let the Hon. Minister complete his ten points. I will give you time later.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
එම පිටුවේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"රජයේ පාසැල්, රෝහල් හා ආගමික ස්ථාන සඳහා සූර්යබල පද්ධති සහිතව බලශක්ති සංරක්ෂණය දිරිමත් කෙරෙන ක්‍රමවේදයක්."

අපි කලිනුත් ඒ කටයුතු ආරම්භ කරලා තිබුණා. ඒ අනුව පාසල් සහ ආගමික ස්ථාන සඳහා සූර්ය බල පද්ධති, සූර්ය පැනල ලබා දීමේ කටයුතු අපි වේගවත් කරලා තිබෙනවා.

එම පිටුවේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සහ බලශක්ති ජාත්‍යන්තර වෙළඳාම් කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස (energy trading hub) ලංකාව තුළ ස්ථාපිත කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම"

උපාය මාර්ගික සැලැස්මක් සකස් කරලා විතරක් නොවෙයි, මම විස්තර සටහන් කළා වාගේ ඒ සම්බන්ධ කටයුතුත් මෙතැනදී ආරම්භ කරලා තිබෙනවා. ඇත්තටම මේ මාස තුනක කාලය තුළ අපි කියපු දේවල්වලින් කොච්චර ප්‍රමාණයක් ඉෂ්ට කරලා තිබෙනවාද? අපි කියපු දේවල් 41න් 10ක් කරන්න පටන් අරගෙන තිබෙනවා කියන්නේ සියයට 22ක් අපි ඉෂ්ට කර තිබෙනවා කියන එකයි. මහජනතාව අවුරුදු පහකට අපට බලය දුන්නා. අපේ කර්තව්‍යය කරගෙන යන විධිය අනුව අපි විශ්වාස කරනවා, එතැනිනුත් එහාට අපට බලය ලැබෙයි කියලා. අවුරුදු පහට ඉටු කරන්න තිබෙන්නේ සියයට 6යි. බලශක්තිය සම්බන්ධයෙන් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන කරුණුවලින් දැනටත් සියයට 22ක් සාක්ෂාත් කරගන්න අපි කටයුතු කරනවා. අපට ඉදිරියට තව බොහෝ කාලයක් තිබෙනවා. ඒ කාලය තුළ ඉතිරි කටයුතුත් සාර්ථක කරගන්න අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා.

තව එක කරුණක් විතරක් සඳහන් කරලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි. 2022දී කරපු ප්‍රකාශයක් අපේ ගරු මන්ත්‍රීතුමෙකු සඳහන් කළා. සතියකට විතරක් තෙල් තිබෙන බව කිව්වා, එතැනින් පස්සේ තමයි මිනිස්සු panic වෙලා තෙල් මිලදී ගන්න පෝලිම් හැදුණේ කියලා එතුමා කිව්වා. පසුගිය සිකුරාදාත් ඇති වුණේ ඔන්න ඔය වාගේ තත්ත්වයක්ද කියන එක අපට

පොඩ්ඩක් කල්පනා කරලා බලන්න වෙනවා. සමහර ෂෙඩ්වල තෙල් තිබුණා. නාළිකා දෙකක විතරක් තෙල් තිබුණේ නැහැ. ඒ වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුනුත් හිතුවා, තෙල් තිබුණේ නැහැ කියලා. හැබැයි, පෝලිම් ඇති වුණා. පෝලිම් ඇති වුණේ බෙදා හැරීමේ හෝ තොගවල හිඟකමක් නිසා නොවෙයි. සමාජය තුළ අනවශ්‍ය කලබගෑනියක් ඇති කිරීමට හිතාමතාම හෝ ඇති වෙච්ච යම්කිසි සිදුවීමක් නිසා තමයි තෙල් පෝලිම් ඇති වුණේ. ඒකට හේතු වුණු පසුබිමකුත් තිබුණා. ඒ පසුබිම පිළිබඳව අපි ඇති තරම් මේ සභාව තුළ සාකච්ඡා කළා. ඒ වාගේම තමයි අදාළ පාර්ශ්ව එක්ක මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න තිබෙන විවෘතභාවය අපි තවමත් අමතක කරන්නේ නැහැ. මේ 28වැනි දාත් සාකච්ඡාවක් තිබෙනවා කියලා අපට දැනගන්න ලැබිලා තිබෙනවා. එළඹෙන ඕනෑම ප්‍රශ්නයක් ජනතාවට හිතකර වන විධියට, ජනතාවට වඩාත් වාසිදායක වන විධියට සාකච්ඡා කරන්න, ඒ සාකච්ඡාවල සම්මුතියෙන් කටයුතු කරලා, අවසාන තීරණයකට එන්න තිබෙන අපේ පෙළඹුම කොයි විධියකටවත් අපි අමතක කරන්නේ නැහැ. ඒ වෙනුවෙන් කටයුතු කරනවා කියන කාරණය සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. කාලය ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Ajith P. Perera, what is your point of Order?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා මම කියපු කාරණයකට පිළිතුරක් දුන්නා. එතුමාගේ අවධානය මම යොමු කරනවා, ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ 21වැනි පිටුවට. 21වැනි පිටුවේ ලිඛිතව තිබෙනවා, මොනවාද කරන්න යන්නේ කියලා. තිබෙන්නේ 4යි. ගරු ඇමතිතුමනි, ඔබතුමා 10ක් කිව්වා. දැන් energy hub එක හදලාද තිබෙන්නේ? Energy hub එකේ ප්‍රතිපත්ති සකස් කරලා තිබෙනවාද? මම හදපු "සූර්ය බල සංග්‍රාමය" ප්‍රතිපත්තිය සහ පසුගිය ආණ්ඩුව මෙගාවොට් 1,400ක් එකතු කිරීම මිසක් අලුතෙන් මොනවාද කරලා තිබෙන්නේ? ඒ නිසා නොකරපු දේවල් කථා කරන්න ඕනෑ නැහැ. ලජ්ජා වෙන්න ඕනෑත් නැහැ. අපි කියන්නේ, මේ මාස තුනට අවසන් කරන්න ඕනෑ නැහැ, නමුත් මේවා පටන් ගන්න කියලා. අසත්‍ය කියන්න එපා. ඔය කියපු කරුණු 10 ක්‍රියාත්මක කරලා නැහැ.

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
ගරු සභාපතිතුමනි, මම විනාඩියක් විතරක් ගන්නම්. මගේ කථාව තුළ ඉතාම හොඳින් පැහැදිලි කළා, සමහර දේවල් ආරම්භ කරන්න තමයි පුළුවන්කම තිබෙන්නේ කියලා. සමහර විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය අධ්‍යයන කරන්න තිබෙනවා, තවත් සමහර විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය අධ්‍යයනවලින් ඔබ්බට ගිහිල්ලා එම කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ අපි කියපු කාරණා 10ක කටයුතු මේ වන විට ආරම්භ කරලා ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
Energy hub එක?

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
Energy hub එක ගැන මගේ කථාවේදී පැහැදිලිව කිව්වා. ත්‍රිකුණාමලය වරාය කොහොමද භාවිත කරන්නේ, ඒ වාගේම කොළඹ වරාය ආශ්‍රිතව අපි කොහොමද ඒ දේ කරන්නේ කියන එක ගැන මම කිව්වා. අලුත් තෙල් පිරිපහදුවක් ආරම්භ කරන්න කොහොමද කටයුතු කරන්නේ කියන එක සම්බන්ධවත් මගේ කථාවේදී පැහැදිලි කරලා කිව්වා. ඔබතුමා සාවධානව අහගෙන හිටියා නම් ඒක තේරෙනවා. සාමාන්‍යයෙන් අපි සමහර දේවල් අහගෙන ඉන්නවා, දැනගන්න. සමහර දේවල් අහගෙන ඉන්නවා, වෙනත් විධියකට. දැනගන්න අහගෙන හිටියා නම්, ඔබතුමා පැහැදිලිව තේරුම් ගන්න ඇති, කරුණු 10ක් සම්බන්ධයෙන් අපි ඉස්සරහට ගිහිල්ලා තිබෙන බව. ඒ සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ එච්චරයි, ගරු සභාපතිතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Ajith P. Perera, could you make your comment short, please.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, එතුමා උගත් ඇමති කෙනෙක්. අපට අහගෙන ඉඳලා පුරුදුයි. විෂයයත් දන්නවා. අකුරක් නෑර කියවලාත් තිබෙනවා. ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේවත් නොකියපු, ජනාධිපතිතුමාගේ අය වැය කථාවේවත් නොකියපු දෙයක් එතුමා කියන්නේ. ඇත්ත වශයෙන්ම ඔය අමාත්‍යාංශයේ වෙන හැම දෙයක්ම අපි දන්නවා. මොකුත් වෙලා නැහැ. කරුණාකරලා ඔබතුමා හරි හොයලා බලන්න.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
The next speaker is the Hon. Sajith Premadasa. You have seven minutes.

[ප.භා. 11.55]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(මාණ්පුමිකු සජිත් පිරේමදාස - එදිර්ක්කට්සි මුදල්වර්)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු සභාපතිතුමනි, අපේ බලශක්ති ඇමතිතුමාට මම සරල ප්‍රශ්න කිහිපයක් යොමු කරනවා. ඒවාට නිශ්චිත පිළිතුරු මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. ඔබතුමාට මතක ඇති, ජනාධිපතිවරණ ව්‍යාපාරයේදීත්, මහ මැතිවරණ ව්‍යාපාරයේදීත් වර්තමාන ජනාධිපතිතුමා ප්‍රමුඛ මාලිමාවේ සහ ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම් බොහොම පැහැදිලිව රටට කිව්වා, තෙල් මිල සෑහෙන ප්‍රමාණයකින් අඩු කරනවා කියලා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

තෙල් මිල අඩු කරන්න පුළුවන් හේතූත් කිව්වා. වර්තමාන ජනාධිපතිතුමාම කියනවා, "තෙල් මිල අඩු කරන්න පුළුවන්. තෙල්වලට රුපියල් 50ක බද්දක් ගහනවා අමතරව. තව බදු ගොඩක් තිබෙනවා. සියයට වැඩිය බද්දක් තිබෙනවා. තෙල් සංස්ථාවේ ණය පවරා ගත්තා භාණ්ඩාගාරයට. දැන් තෙල් සංස්ථාව ණය නැහැ. දැන් මොකද කරන්නේ? දැන් හැම ලීටරයකටම රුපියල් 50ක බද්දක් ගන්නවා භාණ්ඩාගාරයේ ණයට හිලව් වෙන්න. මරු වැඩේ!" කියලා. ඔන්න, ජනාධිපතිතුමාගේම වචන. එතුමා එහෙම කියලා රටටම කියනවා, "මේ බදු සියල්ලක්ම ඉවත් කරලා, මේ රටේ පාරිභෝගික ප්‍රජාවට ඉතාම සහන මිලට තෙල් ලබා දෙනවා" කියලා. අද මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා, එදා මැතිවරණ වේදිකාවේ ඒ කරපු ප්‍රකාශය රජය ක්‍රියාවට නංවන කල්. මේ රටේ ජනතාවට එහෙම කිව්වා නම් ඇයි එය ඉටු නොකරන්නේ? එය ඉටු නොකරන්න හේතුව මොකක්ද? තිබෙන ගැටලුව මොකක්ද? බලශක්ති අමාත්‍යවරයාගෙන් මේ ගැටලුවට බොහොම ස්ථිර පිළිතුරක් මම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපට මතකයි, වර්තමාන ජනාධිපතිතුමා වේදිකාවල කිව්වා, "විදුලි බිල අඩු කරනවා. රුපියල් 9,000 බිල රුපියල් 6,000ක් කරනවා. රුපියල් 3,000 බිල රුපියල් 2,000 කරනවා. හැමෝගේම විදුලි බිල සියයට 33කින් අඩු කරනවා" කියලා. මම පිළිගන්නවා, සාමාන්‍ය වශයෙන් දැනට සියයට 20කින් විදුලි බිල අඩු කරලා තිබෙන බව. හැබැයි, ඒ අඩු කළේ රජයේ වුවමනාවට නොවෙයි, මහජන උපයෝගිතා කොමිසම හරහා මේ රටේ විවිධ සිවිල් ප්‍රජාව, ජනතාව ඉදිරිපත් වීම නිසා. ලොකු අරගළයක් කළා. සාමාන්‍ය වශයෙන් ගත්තොත්, ලංකා විදුලිබල මණ්ඩලය ලබන ලාභය පාරිභෝගික ප්‍රජාවට සියයට 20ක අඩු කිරීමක් කරලා දුන්නා. මම ගරු බලශක්ති ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, ඉතුරු සියයට 13 ඇයි අඩු නොකළේ කියා.

ඔය විදුලි බිල අඩු කිරීමක් ගැන සාකච්ඡාවට මුළු රටම යොමු වනකොට ඔබතුමන්ලා කිව්වේ මොකක්ද? මාස 6කට විදුලි බිල අඩු කරන්නේ නැහැ කිව්වා; අඩු කරන්නේම නැහැ කිව්වා; ඊට පස්සේ මහජන උපයෝගිතා කොමිසම තීන්දුව දුන්නාට පස්සේ මහා භාණ්ඩාගාරයෙන් අහන්න ඕනෑය කිව්වා; ඇමතිවරයාගේ අනුමැතිය අවශ්‍යයි කිව්වා. මේ වෙලාවේ මම පැහැදිලිව අහන්න කැමැතියි, මේ රටේ සමස්ත විදුලි පාරිභෝගික ජනතාවට ඉතුරු සියයට 13ක ඒ සහනය අඩු මිලක් හරහා ලබා දෙන්නට කටයුතු කරන්නේ කවදාද කියලා.

ඊළඟට, මේ සභාවේ සාකච්ඡා වුණා, මුළු රටම විදුලිය ඇනහිටීමකට මුහුණ දීම පිළිබඳව. විවාදයක් ඇති වුණා, ඒක වඳුරෙක් නිසා සිදු වුණාද, රිළවෙක් නිසා සිදු වුණාද එහෙමත් නැත්නම් සූර්ය බලශක්තියේ තිබුණු අවශ්‍යතාවට, බලශක්ති ව්‍යුහයට විසඳුමක් ලබා දෙන්නට බැරි නිසා මේක සිද්ධ වුණා ද කියලා. මම එක දෙයක් ඇමතිතුමාට කියන්න කැමැතියි. ඔබතුමා දන්නවා ද, මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මාධ්‍ය මොකක්ද කිව්වේ කියලා? ඔබතුමා පොඩ්ඩක් බලන්න, CNN, BBC, Al Jazeera මොනවාද කිව්වේ කියලා. ඒ මාධ්‍ය මොකක්ද කිව්වේ? ලෝකයේම headline එක වුණේ වඳුරෙක් නිසා රටේම විදුලි පද්ධතිය කඩාගෙන වැටුණා කියායි. වඳුරෙක් නිසා අපේ රටේ විදුලි පද්ධතිය කඩාගෙන වැටුණා කියලා ලෝකයම වාර්තා කරනකොට, පොඩ්ඩක් කියන්න බලන්න ඍජු විදේශ ආයෝජන අපේ රටට එන එක වැඩි වෙනවා ද කියලා. මේ රටට සම්පත් ගෙන එන්නට බලාගෙන ඉන්න ඒ කණ්ඩායම් මුදල් රැගෙන එනවාද? මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, මේ සභාවේ සාකච්ඡා වුණු ආකාරයට යම්කිසි ප්‍රශ්නයක් උද්ගත වනකොට එයට පැහැදිලි, විනිවිදභාවයෙන් යුක්ත වූ පිළිතුරු සපයන්නට ඇත්ත වශයෙන්ම ඔබතුමා බැඳී සිටින බව. එය ඉටු නොකිරීම තුළ විදුලි පාරිභෝගික ප්‍රජාවට අසහනයක්, පීඩනයක් ඇති වෙනවා පමණක් නොවෙයි, මුළු රටේම සමස්ත ජනතාව සහ කර්මාන්ත පද්ධතිය ඇතුළුව සියල්ල අපහසුතාවට පත් වෙනවා. එපමණක් නොවෙයි, රට බලාපොරොත්තු වන ආර්ථික සංවර්ධන ඉලක්ක කරා යන්නට මේ රටට අවශ්‍ය ඍජු විදේශ ආයෝජනවලටත් ඒ තුළින් ඉතාම බරපතළ ලෙස ඍණාත්මක බලපෑමක් සිද්ධ වෙන බව හොඳට මතක තියා ගන්න.

මේකත් අමතක කරන්න එපා. 2028දී ණය ආපසු ගෙවන්නට නම් අපට ආර්ථික සංවර්ධන ඉලක්කයක්; ආර්ථික වර්ධන ඉලක්කයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපට රාජ්‍ය ආදායම් ඉලක්කයක් තිබෙනවා. මේ දෙක සම්පූර්ණ කර ගන්නට බැරි වුණොත් අපේ රටට බරපතළ තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා සාරාංශගතව මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මැතිවරණ වේදිකාවේ පොරොන්දු වුණු තෙල් මත පටවන බදු ටික ඉවත් කරලා මේ රටේ පාරිභෝගික ප්‍රජාවට තෙල් මිල අඩු කරන්නේ කවදාද කියලා. ඒ වාගේම, තුනෙන් එකකින් විදුලි බිල අඩු කරන්නේ කවදාද? ඉතුරු සියයට 13ක අඩු කිරීම සාමාන්‍යයක් වශයෙන් මේ රටේ විදුලි පාරිභෝගික ප්‍රජාවට ලබා දෙන්නේ කවදාද? ඒ වාගේම මම කියන්න කැමැතියි, තෙල් සහනාධාර මිලකට ලබා දීමේ ක්‍රමවේදයත්, ඒක ඉලක්කගතව ක්‍රියාත්මක කිරීම ගැනත් අපේ විරෝධතාවක් නැති බව. එය ඇත්ත වශයෙන්ම සිද්ධ වෙන්නට ඕනෑ, මේ රටේ දුක් විඳින ජනතාවට. එහෙම නැතිව කෝටිපතියන්ට, සුපිරි ධනවතුන්ට නොවෙයි. ඒ කාරණා අපි පිළිගන්නවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් අහන්න කැමැතියි. මේ නිර්මාණය වී තිබෙන මිල සූත්‍ර මේ රජය අනුමත කරනවාද? වේදිකාවක් වේදිකාවක් පාසා කිව්වා, මේ මිල සූත්‍ර වැරදියි, මේවා වෙනස් කරනවා කියලා. එහෙම නම් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අලුත් සූත්‍රය මොකක්ද කියලා. එහෙම නැත්නම් ඔබතුමන්ලා තවදුරටත් IMF එක කියන පදයට නටමින් සිටිනවා ද කියන එකත් මම අහන්න කැමැතියි.

ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. D.V. Chanaka. You have 12 minutes.

[අ.භා. 12.03]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද දින විවාදයට ගැනෙන වැය ශීර්ෂය ඉතාම විශේෂයි. මොකද, බලශක්ති අමාත්‍යාංශය කියන්නේ රටේ ආණ්ඩු පෙරළපු අමාත්‍යාංශයක්, රටේ සම්පූර්ණ වෙනසක් ඇති කරන්න මුල් වුණු අමාත්‍යාංශයක්. මොකද, මේ අමාත්‍යාංශයට ආණ්ඩු තබාගන්නත් පුළුවන්, ගෙදර යවන්නත් පුළුවන්. ඒකට හොඳම උදාහරණයක් මම කියන්නම්. කංචන විජේසේකර මැතිතුමා විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වශයෙන් වැඩ භාරගෙන - මම ඒ වෙලාවේ විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේ - ඒ මාසයේ විදුලි කප්පාදුව නැති කරද්දී, තෙල් පෝලිම් නැති කරද්දී ඒ පාවිච්චි කරපු ඩොලර් ප්‍රමාණයයි, රටේ තෙල් පෝලිම තිබුණු වෙලාවේ පාවිච්චි කරපු ඩොලර් ප්‍රමාණයයි ගත්තාම තෙල් පෝලිම් තිබුණු වෙලාවේ වැඩිපුර ඩොලර් වැය වෙලා තිබෙනවා.

කළමනාකරණය තුළින් තමයි ඒ ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳාගන්න පුළුවන් වුණේ. ඒක අභියෝගකාරී අවුරුදු දෙකක්. ඒ වෙලාවේ කවුරුත් අමාත්‍යාංශය භාර ගත්තේ නැහැ. අපේ කුමාර ජයකොඩි අමාත්‍යතුමා මේ අමාත්‍යාංශය භාරගත් අවස්ථාවේ තිබුණු විධියට නොවෙයි එදා මේ අමාත්‍යාංශය තිබුණේ. කංචන විජේසේකර අමාත්‍යතුමා අමාත්‍යාංශය භාරගෙන දවස් දෙකකට පස්සේ රටේ තෙල් පෝලිම් කියලා එතුමාගේ ගෙදර වට කළා. අමාත්‍යාංශය භාරගෙන දවස් දෙකෙන් එතුමාට වග කියන්න වෙනවා, රටේ තිබෙන තෙල් පෝලිම්වලට. හැබැයි, මාස දෙකක් යනකොට රටේ තිබුණු තෙල් පෝලිම් නතර වුණා.

බලශක්ති අමාත්‍යාංශය ගැන කථා කරන්න කලින් මම මේ කාරණය කියන්න කැමැතියි. මම දැක්කා, ඊයේ නලින්ද ජයතිස්ස මැතිතුමා කිව්වා, දැන් අලුතෙන් man-made අර්බුදයක් ඇති වෙලා තිබෙනවා, මේක රටේ අර්බුදයක් නොවෙයි, රටේ තෙල් ප්‍රශ්නයක් නැහැ, මම එදාත් කිව්වා රටේ අවශ්‍ය ප්‍රමාණයට තෙල් තිබෙනවා කියලා. හැබැයි, මේ ප්‍රශ්නය ඇති වුණේ කලින් ආණ්ඩුව කාලයේ - අපි ඉන්න කාලයේ- උසාවියෙන් තීන්දුවක් දීලා තිබෙනවා, ඒ තීන්දුව ක්‍රියාත්මක කළේ නැහැ, මොකද, ඇමතිවරුන්ට පෙට්‍රල් ෂෙඩ් තිබෙන නිසාය කියලා.

ගරු සභාපතිතුමා

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

Order, please! The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

ගරු ඩී.වී. චානක මහතා

(மாண்புமிகு டி.வீ. சானக)

(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අවස්ථාවේදී පසුගිය ආණ්ඩුවෙන් මේක අය කළේ නැහැ කියලා කිව්වා. හැබැයි, ගරු ඇමතිතුමනි, මම හිතනවා ඔබතුමා මීට වඩා මේ ගැන පැහැදිලි කළොත් හොඳයි කියලා. මොකද, ඇත්ත තත්ත්වය තමයි, මේක COPE එකේදි ගත්ත තීන්දුවක්. ඔය formula එකයි, ඔය නඩුවයි අතර සම්බන්ධයක් නැහැ. COPE එක තීන්දුවක් ගත්තා. මොකද, මේ තෙල්වල තිබුණා upper cap එකක්. මේ සියයට 3 ගෙනයන උපරිම මිලක් තිබුණා. මේ upper cap එකට උඩින් අපි එන්නත් කලින් යම්කිසි කාලයක් වැඩිපුර ගෙවලා තිබුණා, රුපියල් බිලියන 37ක්. ඊට පසු COPE එක නිර්දේශ කරනවා මේක නැවත අය කරගන්න කියලා. ඊට පස්සේ අපි -මම ඒ වෙලාවේ රාජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටියේ. කංචන විජේසේකර මැතිතුමා තමයි අමාත්‍යවරයා වශයෙන් සිටියේ - මේක අය කරගන්න අවශ්‍ය කටයුතු කරනවා. එසේ කරපු ගමන් ඒ වෙලාවේ මේ සංගමය ගියා දිසා අධිකරණයට. දිසා අධිකරණයේදී ඒ නඩුව CPC එක ජයග්‍රහණය කරනවා. ඊට පසුව ඔවුන් අභියාචනාධිකරණයට යනවා. ඊට පසු ඒක නවත්වලා රිට් එකක් ගන්නවා. මේ සම්බන්ධ අභියාචනාධිකරණ නඩුවේ තීන්දුව ලැබෙන්නේ සැප්තැම්බර් 08වැනි දා. ඒ කියන්නේ, ජනාධිපතිවරණයට දවස් 12ක්, 13ක් තිබියදී තමයි මේ තීන්දුව ලැබෙන්නේ. ඒ අවස්ථාවේදී කංචන විජේසේකර ඇමතිතුමා නිර්දේශ ලබා දී තිබුණා ඒක අය කරගන්න. ඒ නිසා අපි කොයි වෙලාවකවත් කිසිම පෙට්‍රල් ෂෙඩ් එකක් - ඔය කියන අමාත්‍යවරුන්ගේ පෙට්‍රල් ෂෙඩ් වත් - ආරක්ෂා කරන්න දේශපාලනය වෙනුවෙන් අපි අමාත්‍යාංශයේ කටයුතු කරලා නැහැ.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සාක්ෂි දරයි, පසුගිය අවුරුදු දෙකට එක දේශපාලන පත්වීමක් අපි කරලා නැහැ. ඕනෑ නම්, ලංකා විදුලිබල මණ්ඩලයේ පත්වීම් 8,000ක් ලබා දෙන්න හැකියාව තිබුණා. හැබැයි, අපි එක පත්වීමක්වත් දුන්නේ නැහැ. ඕනෑ නම්, Ceylon Petroleum Coporation එකේ දේශපාලන පත්වීම් 2,000ක් පමණ දෙන්න පුළුවන්කම තිබුණා. අපි ඒවා කළේ නැතුව තමයි ඒ කටයුතු කළේ.

ඊළඟ කාරණය තමයි, ඔය වදුරාගේ ප්‍රශ්නය. ඒක ඇත්තටම වදුරෙක් පැනලාද, සිද්ධ වුණේ? මම දැක්කා, security officer මහත්මයෙක් එකක් කියනවා, අමාත්‍යතුමා තව එකක් කියනවා. හැබැයි, හිටපු රාජ්‍ය ඇමතිවරයා වශයෙන් - මම බැලුවේ Ceylon Petroleum Coporation එක - මගේ මතය තමයි ඇමතිතුමනි, ඔබතුමා ඒක නොකියා ඉන්න තිබුණා කියන එක. ඇත්තටම disturbance එක ඇති වුණේ වදුරෙක් පැනලා හරි, එහෙම නැත්නම් වෙන දෙයක් වෙලා හරි වුණත් ඔබතුමා ඒක නොකියා ඉන්න තිබුණා. මොකද, විදුලිබල මණ්ඩලයේ මාධ්‍ය ප්‍රකාශනයේ ඒ ගැන ලස්සනට සඳහන් කරලා තිබෙනවා.

ඒකේ තිබෙනවා, "ඒ වෙලාවේ solar power වලින් 800ක් ගියා. ලක්විජය එකෙන් 470ක් ගියා. Hydro powerවලින් 130ක් ගියා. Disturbance එකත් එක්ක මේක ඇති වුණා" කියලා. හැබැයි ඔබතුමා කියනවා, වදුරෙක් හින්දා මේක වුණාය කියලා. අපේ සජිත් ප්‍රේමදාස මහත්මයා කිව්වා වාගේ, මේ වදුරාගේ ප්‍රශ්නය world media ගත්තාම ලංකාවට investments එයිද? මේක තමයි ලංකාවට ආයෝජන ගේන්න තිබෙන හොඳම වෙලාව. මේ ප්‍රශ්නයේදී වදුරෙක් ගැන කිව්වාම, මේක BBC, CNN වාර්තා කළාම ලංකාවට ආයෝජන එයිද? එන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා ඊළඟ අවස්ථාවේවත් මාධ්‍ය ප්‍රකාශ කරද්දී,- ඇත්ත වුණත්, සමහර දේවල් කියද්දී- පොඩ්ඩක් පරිස්සම් වෙන්න කියලා මම කියන්න කැමැතියි.

ඊළඟට, අපේ අනුර කරුණාතිලක අමාත්‍යතුමා තව ප්‍රකාශයක් කළා, පන්සල්වලට solar panels ලබා දෙනවා කියලා. පන්සල්වලට විතරක් නොවෙයි, ආගමික සිද්ධස්ථාන -පන්සල්, පල්ලි, කෝවිල්- 5,000කට solar panels ලබා දෙන්න අපි Indian Credit Line එක හරහා ටෙන්ඩර් කැඳවලා, සමාගමක් තෝරාගෙන, අවශ්‍ය solar panels ටික ගෙනාවා. ගෙනැල්ලා අපි ඒවා බෙදලා දීලාත් තිබෙනවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවාසනාවන්ත කාරණය මේකයි. මේවා install කරලා දැන් මාස තුනක් වෙනවා. කිලෝවොට් 5 ගණනේ 5,000ක්. මෙතැන පැයක වැඩක් තිබෙන්නේ. අද වෙනකම් connection දෙන්න විදුලිබල මණ්ඩලය ගිහිල්ලා නැහැ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තත්ත්වය මම දන්නවා. මම පසුගිය ඉරිදා හම්බන්තොට දිස්ත්‍රික්කයේ අපේ පන්සල්වල නායක හාමුදුරුවන් හමුවුණු වෙලාවේ කියනවා, "මහත්තයා මේක සවි කරලා දැන් මාස තුනයි. හැබැයි, විදුලිබල මණ්ඩලයෙන් ඇවිල්ලා connection එක දුන්නේ නැහැ" කියලා.

මේ solarවලින් එක පැත්තකින් පන්සලේ විදුලි බිල අඩු වෙනවා. එහෙම නැත්නම් බින්දුවට යනවා. අනෙක් පැත්තෙන් විදුලි බල මණ්ඩලයට විශාල ලාභයක් එනවා. ඒකයි අපි කියන්නේ. අපි පන්සල්වල විදුලි බිල් ගෙන්වාගෙන බැලුවාම දැකපු දෙයක් තමයි, සාමාන්‍යයෙන් පොඩි පන්සල්වල විදුලි බිල රුපියල් 1,500යි, 2,000යි. සාමාන්‍යයෙන් එක කිලෝවොට් එකකින් units 110ක් මාසයකට හදනවා. එතකොට කිලෝවොට්

[ගරු ඩී.වී. චානක මහතා]

5ක් කියන්නේ, units 550ක්. මේ units 550, 5,000න් වැඩි කළොත් ආසන්න වශයෙන් විදුලිබල මණ්ඩලයට ලෙහෙසියෙන් ලක්ෂ 1,000ක ඉතුරුවක් කර ගැනීමේ හැකියාව තිබෙනවා. හැබැයි අවාසනාවට, - මේකේ Indian Credit Line එකත් ඔබතුමාට ගෙවන්න වෙනවා. විදුලිබල මණ්ඩලයට ගෙවන්න වෙනවා. හැබැයි එහෙම තත්ත්වයක් තිබියදී, මේක සවි කරලා තිබියදී connection එක දෙන්නේ නැත්තේ ඇයි? පන්සල්වල විදුලි බිල අඩු වෙනවාට අකැමැතිද, එහෙම නැත්නම් විදුලිබල මණ්ඩලයට ලාභයක් එනවාට අකැමැතිද කියන එක අමාත්‍යාතුමාගේ පිළිතුරු කථාවේදී සඳහන් කළොත් හොඳයි. ඒ, එක කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ අමාත්‍යාංශය භාර ගන්නකොට තිබුණු තත්ත්වය ගත්තොත්, Ceylon Petroleum Corporation එක - CPC එක - බිලියන 360ක් පාඩු ලැබුවා. පෞද්ගලික අංශයේ සමාගම බිලියන 36ක් ලාභ ලබනවා. Ceylon Petroleum Corporation එක බිලියන 360ක් පාඩු ලබනවා. පෞද්ගලික සමාගම බිලියන 36ක් ලාභ ලබද්දී තමයි අපි භාර ගත්තේ. හැබැයි, අපි මේ ආයතනය භාරගෙන අවුරුද්දක් යනකොට Ceylon Petroleum Corporation එක බිලියන 110ක් ලාභ ලබනකොට අර පෞද්ගලික සමාගමේ ලාභය බිලියන 36 සිට බිලියන 12 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ විධියට තමයි අපි ආයතනවල ප්‍රශ්න විසඳුවේ.

අපි භාරගන්න වෙලාවේ ලංකාවේ LCs තිබුණේ නැහැ. ඒ වාගේම අවුරුදු 25ක් ප්‍රමාද ගාස්තු ගෙවලා තිබුණා. හැබැයි LCs නැතිව, ප්‍රමාද ගාස්තු අවුරුදු 25ක් ගෙවපු එකට, අපි අලුත් ක්‍රමවේදයක් හඳුන්වලා දීලා, එහෙම නැත්නම් storage modality එකක් හඳුන්වලා දීලා කටයුතු කළා. වෙනදා තෙල් නැව ගේන්න කලින් LC එක open කරනවා. එහෙම නැත්නම් තෙල් නැව එන්න කලින් සියයට 30ක advance payment එකක් කරන්න ඕනෑ. හැබැයි, අපි අලුත් ක්‍රමවේදයක් ටෙන්ඩර්වලට හඳුන්වා දුන්වා. මේ තෙල් නැව ලංකාවට ආවාම අපේ storage එකේ unload කරන්න ඕනෑ. Unload කළාම අපේ අතේ තිබෙන ඩොලර්වලට දිනපතා අපි මුදල් දීලා, එහෙම නැත්නම් දවස් තුනකට සැරයක් මුදල් ලබා දීලා තමයි අපි මේ තෙල් ගත්තේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ගරු ඝාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි පහක කාලයක් ලබා ගන්නවා.

අපි ඒ අවස්ථාවේදී මේ අලුත් ක්‍රමවේදය හරහා අවුරුදු 25ක් තිබ්බ ප්‍රමාද ගාස්තු නැති කළා. LCs නැතිව 34ට තිබුණු premium එක තුනත්, දෙකත් අතරට අඩු කරගන්න අවශ්‍ය කටයුතු කළා. ඒ, Ceylon Petroleum Corporation එක පැත්තෙන්.

TPTL එක ගැනත්, Trincomalee Oil Tank Farm එක ගැනත් මෙහිදී කථා කළ යුතුයි. අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා ඒ කාලයේ විපක්ෂයේ සිටියදී හරි දත්ත අරගෙන දශමයට තමයි කථා කළේ. හැබැයි, එතුමා ඉන්දියාවේ ගිහින් ආපු ගමන්ම කිව්වා, "අපි ඉන්දියාවත් එක්ක සාකච්ඡා කළා. මම IOC එකට 10ක් දෙනවා. CPC එකට 24ක් තියාගන්න කියනවා. TPTL එකට ඉතුරු ටික දීලා අපි ඉන්දියාවයි ලංකාවයි එකතු කරලා අලුතින් සමාගමක් හදලා මේක වැඩිදියුණු කරනවා" කියලා. මේ සභාව තුළ recordings දමන්න බැහැ. පුළුවන් වුණා නම් මට ඒ හඬ පටය ඔබතුමන්ලාට ඇසෙන්න සලස්වන්න තිබුණා. හැබැයි, උදය ගම්මන්පිල මහතා අමාත්‍යවරයා වශයෙන් සිටියදී 2021 වර්ෂයේදී මේ දේම කරන්න හදපු වෙලාවේ හිටපු කථානායක රන්වල මහත්මයා, අනුර කුමාර දිසානායක මහත්මයා ඇතුළු ඔක්කෝම පාරට ආවා. ඇවිල්ලා කිව්වා, මේක විකුණන්න එපා කියලා. හැබැයි, අද එතුමාම ඇවිල්ලා කියන්නේ මොකක්ද? ඒ කරපු දේ එතුමා සාධාරණීකරණය කරනවා විතරක් නොවෙයි, එතුමා එළියේදී කියනවා, "අපි මේක කරනවා" කියලා. මේක කරලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ නිරීක්ෂණ චාරිකාවකට ගිහිල්ලා තෙල් ටැංකි ඇතුළටත් ගිහින් බලනවා මම දැක්කා. ඒක හොඳයි. ඒක ඉතාම හොඳ දෙයක්. ඉංජිනේරු මහත්මයෙකු වශයෙන් මෙතුමා ටැංකි ඇතුළටත් ගිහින් බැලුවා. මෙතුමා ඒ ටැංකි ඇතුළට ගිහින් බැලුවාට, මෙතුමා මාධ්‍ය ප්‍රකාශ නිකුත් කළේ නැහැ. හැබැයි, මෙතුමන්ලාගේ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයන් සමාජ මාධ්‍ය හරහා කියන්න පටන් ගත්තා, "අත්හැර දමපු Trincomalee oil tanks ටික ඔන්න අපි පටන් ගත්තා" කියලා. ඇත්තටම එහෙමද වුණේ? නැහැ. 2023දී අපියි ඒ වැඩේ පටන් ගත්තේ. 2023දී ටැංකි 24න් ටැංකි 5ක වැඩ ආරම්භ කළා. ටැංකි 2ක වැඩ දැන් අවසන් වෙමින් යන්නේ. ජයකොඩි ඇමතිතුමනි, ඕනෑ නම් ඔබතුමාට ඒ සම්බන්ධව උත්තර දෙන්න පුළුවන්. ඔබතුමා ගිහින් බැලුවේ වැඩ කෙරෙමින් පවතින එකක් ද? එහෙම නැත්නම්, ඒ වැඩ ඔබතුමා පටන් ගත්තා ද? වැඩ කරගෙන යන එකක් නේ ඔබතුමා බැලුවේ. ඒ වැඩකටයුතු ඉස්සරහට කරගෙන යන එක හොඳයි.

ඒ වාගේම, තමයි TPTL එකේ ටැංකි ගත්තත්. TPTL එකේ ටැංකි 60 සංවර්ධනය කරන්න අපි 2024දී EoIs - Expressions of Interest - call කළා. එහිදී සමාගම් 7ක් ඉදිරිපත් වුණා. මා හිතන විධියට ඒ සමාගම් 7ට දැන් RFPs issue කරනවා. මේවා අපි කරපු වැඩ. ඔබතුමන්ලා ඉස්සර කිව්වේ මේවා හොඳ නැහැ කියලා. ඔබතුමන්ලා ඉස්සර විවේචනය කරපු ඒවාම තමයි ඔබතුමන්ලා දැන් මේ කරන්නේ. ඒ දේවල් එහෙම කරන ගමන්ම අනෙක් පැත්තට කියනවා, තමන් ඒවා පටන් ගත්තා කියලා.

ඊළඟට මම Hambantota Refinery එක ගැනත් සඳහන් කළ යුතුයි. විජිත හේරත් මහත්මයා කියනවා අපි දැක්කා, "මේ ගැන 2002 ඉඳලා කථා වෙනවා. හැබැයි, කර ගන්න බැරි වුණා. අපේ අනුර කුමාර දිසානායක මහත්මයා චීනයට ගිහිල්ලා ඒ වැඩේ කරගෙන ආවා" කියලා. ඇත්ත ඒක ද? ඇත්ත ඒක නොවෙයි. ඒක 2023දී කැඳවපු ටෙන්ඩර් එකක්. ඒක අභිලාෂ - EoIs - කැඳවීමක්. අපි Hambantota Refinery එකක් සම්බන්ධව අභිලාෂ කැඳෙව්වා; EoIs කැඳෙව්වා. හම්බන්තොට්ටින් අක්කර 1,000ක් පවරාගෙන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය වැනි ආයතන එක්ක සාකච්ඡා කරලා අපි Expressions of Interest කැඳෙව්වා. ඒකට සමාගම් 7ක් ඉදිරිපත් වුණා. ඒ සමාගම් 7 ආපු වෙලාවේ විජිත හේරත් මහත්මයා මේ විපක්ෂය පැත්තේ ඉඳන්ම කියපු දේවල් මට මතකයි. ඒ වෙලාවේ එතුමා ඇහුවා, "මේවා companies ද?" කියලා. මේවාට refinery එක හදන්න පුළුවන් ද කියලා ඇහුවා. එදා මේ විපක්ෂය පැත්තේ -අපි දැන් මේ ඉන්න පැත්තේ- ඉඳන් තමයි එතුමා එහෙම ඇහුවේ. හැබැයි, අන්තිමට මොකක්ද වුණේ? ඊට පසුව ඒ සමාගම් 7න්

සමාගම් 2ක් shortlist වුණා. ඒ සමාගම් 2ට අපි RFPs issue කරලා අන්තිමට ඔවුන් එක්ක negotiations පටන් ගත්තා. ඒකෙන් නෝරා ගත්තු සමාගම තමයි Sinopec සමාගම. එහෙම නැතුව ඒ ව්‍යාපෘතිය වත්මන් ජනාධිපතිතුමා චීනයට ගිය වෙලාවේ ලැබුණු එකක් නොවෙයි. ඒකට EoIs call කළේ අපේ කාලයේ. හැබැයි, ඔබතුමන්ලා ඒ වැඩ කටයුතු ඉස්සරහට කරගෙන යන එක හොඳයි. ඒ අවස්ථාවේ අන්තිම මොහොතේ අපට ප්‍රශ්නයක් මතු වුණා. ඔවුන්ගෙන් ඉල්ලීමක් ආවා. ඔවුන් Strategic Development Project status ඉල්ලුවා. ඒ status දීම පිළිබඳව අපට ගැටලුවක් තිබුණා. මොකද, IMF conditionsවල තිබෙනවා, Strategic Development Projects කරන්න බැහැ කියලා. නමුත්, අනෙක් පැත්තෙන් අරගොල්ලන් ඒක ඉල්ලීමක් වශයෙන් කළා. අනෙක් අතට අපට තවත් ප්‍රශ්නයක් තිබුණා. අපි Expression of Interest එකේ; EoI එකේ කොහේවත් සඳහන් කර තිබුණේ නැහැ, SDP status දෙනවා කියලා. එහෙම දෙන එක අපට ප්‍රශ්නයක්. මොකද, අනෙක් සමාගමක් මේ සම්බන්ධව උසාවියේදී challenge කළා නම්, තිබුණේ නැති condition එකක් දුන්නේ කොහොමද කියලා, ඒ කටයුත්ත එතැනම නැවතීමේ අවදානමක් තිබුණා. ඒ නිසා තමයි අපි ඔවුන් එක්ක සාකච්ඡා කළේ. "එහෙම නොවෙයි, මේ tax පිළිබඳව BOI Act එකේ Section 16 සහ Section 17 යටතේ බලලා අපට ලබා දෙන්න පුළුවන්" කියලා අපි ඔවුන් එක්ක සාකච්ඡා කළා. ඒ විධියට තමයි ඒ කටයුතු සිදු වුණේ. අපි විශ්වාස කරනවා, ඔබතුමන්ලාට ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යන්න පුළුවන් වෙයි කියලා.

විදුලිබල ක්ෂේත්‍රය දෙස බැලුවාම අපි දන්නවා, විශේෂයෙන්ම ඉරිදා දවස්වලදී - Sundaysවල - Grid එකේ ප්‍රශ්නයක් තිබෙන බව. ගරු අමාත්‍යතුමනි, අපි කලින් ඒ සම්බන්ධයෙන් යෝජනාවක් කර තිබුණා. ලංකා ඉතිහාසය තුළ solar powerවලින් වැඩිම මෙගාවොට් ප්‍රමාණයක් නිපදවුයේ ගිය අවුරුද්දේ.

ඒ, මෙගාවොට් 600ක්. මෙගාවොට් 600ක් ලැබුණා ගිය අවුරුද්දේ. දැනට ලංකාවේ 1,400 MW solar units තිබෙනවා. මේවාට ඕනෑම වෙලාවක Grid එක balance වෙන්න battery systems දාන්න පුළුවන්. විදුලිබල මණ්ඩලයට ඒ වෙලාවේ අපි යෝජනා කළා solar units with batteries සඳහා tariff එකක් දෙන්න කියලා. ඒ කියන්නේ, solar units with batteriesවලට tariff එකක් දෙන්න කියලායි. හැබැයි, ඒ කටයුත්ත අවසන් කර ගන්න බැරි වුණා. ඒකට හොඳ tariff එකක් දුන්නොත් රජයේ මැදිහත් වීමෙන් තොරව immediately මේ Grid එක balance කර ගන්න පුළුවන්. ලංකාවේ ඊට අදාළ සමාගම් 600ක් තිබෙනවා. එහෙම දුන්නොත් ඒගොල්ලන් ක්ෂණිකව batteries ගෙනැල්ලා ඒකටම inverters සවි කරාවි. දැන් hybrid batteries තිබෙනවා, hybrid inverters තිබෙනවා. ඒවා ගෙනැල්ලා ක්ෂණිකව සවි කරන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ ගැන බලන්න වෙන්නේත් නැහැ. ඉහතින් කියපු 1,400ටම අදාළව මාස 6ක් යන කොට ඒවා සවි කරනවා. ඔබතුමාට කරන්න තිබෙන්නේ මෙන්න මේ කියන tariff එක දෙන එක විතරයි. එහෙම වුණොත් ඒ ප්‍රශ්නය අනිවාර්යයෙන් විසඳෙනවා.

මේ වෙද්දී මේවායේ වියදම අරගෙන බලමු. Coal power generation unit cost එක රුපියල් 21යි. Solar power generation වලට ගෙවන unit cost එක රුපියල් 19යි. Batteries එක්ක ගත්තොත්, රුපියල් 20ක්, 25ක්වත් වැඩි කරන්න වෙයි. හැබැයි, බැලූ බැල්මට coalවලට වඩා solar පාඩුයි වගේ පෙනෙන්න පුළුවන්. හේතුව, coal රුපියල් 21යි. ඒකත් firm power source එකක්. ඊට පස්සේ solar battery එක්ක දැම්මත් ඒකත් firm power source එකක්. මෙතිදී සමහරු අහන්න පුළුවන්, ඇයි අපි coalවලින් නැතුව batteriesවලින් යන්නේ කියලා. ඒකට හේතුව තමයි, ගෙවල්වල ඒවා සවි කරන්නේ ගෙහිමියාමයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මට තවත් තත්පර 10ක් විතර දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ අය එක පාරක් solar panel එක ගත්තාම, battery එක ගත්තාම ඩොලර් රටින් එළියට යන එක නවතිනවා. හැබැයි, coalවලින් ඩොලර් ටික හැමදාම එළියට යනවා; furnaceවලින් ඩොලර් ටික එළියට යනවා. නමුත්, ඉහත කී විධියට කළොත් one time තමයි ඩොලර් එළියට යන්නේ. එතකොට පුළුවන්කම තිබෙනවා, ලංකාවේ ඩොලර් ප්‍රශ්නයත් විසඳන්න, ඔය Grid එකේ ප්‍රශ්නයත් විසඳන්න. එහෙම වුණාම වදුරු ප්‍රශ්නත් නැති වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.20]

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැය කාරක සභා අවස්ථාවේදී බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය තමයි අද පැවැත්වෙන්නේ. මෙතිදී අද බොහෝ අදහස් ඉදිරිපත් වුණා. කොයි කවුරුත් දන්නවා, බලශක්ති අමාත්‍යාංශය, බලශක්ති ක්ෂේත්‍රය කියන්නේ අපේ රටේ වැදගත්ම අංශයක් බව. බලශක්ති ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන්න කරපු ගොඩක් වැඩ ගැන අද විපක්ෂයේ අය කථා කළා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ, ඒවා කොයි තරම් උපාය මාර්ගික ලෙස හසුරුවාගෙන තිබෙනවා ද කියන එකයි. අපේ ආණ්ඩුව විධියට අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වන්නේ බලශක්ති ක්ෂේත්‍රයේ ස්ථායීතාව පවත්වා ගැනීමයි. අද ඊයේ නොවෙයි, කාලයක් තිස්සේම බලශක්ති ක්ෂේත්‍රයේ -විශේෂයෙන් විදුලිබල පද්ධතියේ වාගේම ඉන්ධනවල- බිඳ වැටීම්, හිඟතාවන් ඇති වෙමින් ආපු රටක්, මේක. ඉදිරියේදී අපි ඒ තත්ත්වය වළක්වා ගන්න ඕනෑ. බලශක්ති ක්ෂේත්‍රය බිඳ නොවැටී පවත්වා ගෙන යෑම සඳහා අපි උපාය මාර්ගික වැඩ පිළිවෙළකට යා යුතුව තිබෙනවා.

ඊළඟ කාරණය තමයි බලශක්ති වියදම. අපි ඒ මිල අඩු කර ගන්න ඕනෑ. පුනර්ජනනීය බලශක්තිය ගැන අදහස් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වුණාට අපි දන්නවා, පසුගිය කාලයේ එළඹී තිබුණු සමහර ගිවිසුම්වල -සුළං බලාගාර සම්බන්ධ ගිවිසුම්, ඒ වාගේම solar powerවලට අදාළව තිබුණු ගිවිසුම්- ඒකකයක මිල වශයෙන් වැඩි මිලක් සඳහන්ව තිබුණු බව. සාම්පූර් විදුලි බලාගාරයෙන් මිල දී ගන්නා විදුලිය ඒකකයක් සඳහා තිබුණු ඩොලර් ශත 669ක මිල ඩොලර් ශත 597ට අඩු කර ගෙන තිබෙනවා. මෙහෙම අඩු කරන්නේ නැතුව අපට බැහැ අපේ රටේ බලශක්ති පිරිවැය අඩු කර ගන්න. ව්‍යාපෘති කළාටම වැඩක් වෙන්නේ නැහැ. ව්‍යාපෘති කරන එක විතරක්ම නොවෙයි කාරණය. අපේ රටට ගැළපෙන විධියට උපයෝගීතාව බලලා මිල අඩු කිරීමක් කරන්නත් ඕනෑ. එහෙම නැති වුණොත් අපට මේ

[ගරු තනුර දිසානායක මහතා]

කර්මාන්ත දියුණු කරන්නවත්, ඒවා ඉදිරියට පවත්වා ගෙන යන්නවත් හැකියාව ලැබෙන්නේ නැහැ.

ඒ වාගේම තමයි, බලශක්තිය අපනයනය කරන්න බැහැ කියලා එකක් නැහැ. අද ඉන්දියාව ගත්තොත්, ඒගොල්ලන් ex-change එක හදාගෙන තිබෙනවා. ඒගොල්ලන් ප්‍රාන්ත අතර බලශක්තිය හුවමාරු කර ගන්නවා; විකුණනවා. ඒ වාගේම අපේ කලාපයේ ඉදිරි සංවර්ධනය දිහා බැලුවාම පෙනෙනවා, දැන් තිබෙනවාට වඩා විශාල බලශක්ති ප්‍රමාණයක් මේ කලාපයට -අපේ ආසියානු කලාපයට- ඕනෑ බව. අපට තිබෙන සම්පත් අනුව ගත්තාම, අපේ පුනර්ජනනීය බලශක්තිය ප්‍රමාණවත්; අපට අවශ්‍ය ප්‍රමාණයට වඩා ජනනය කර ගන්න පුළුවන්. ඒ නිසා ඒක ප්‍රමුඛතම හෝ අද හෙටම කළ යුතු කාරණයක් විධියට නොවෙයි මා දකින්නේ. නමුත්, අපි ඉලක්කයක් තියාගන්න ඕනෑ බලශක්තිය අපනයනය කරන්න. හැබැයි, අප එහෙම කරන්න ඕනෑ අපේ බලශක්ති පද්ධතිය ස්ථාවර කර ගන්නා ගමන්. අපේ නිෂ්පාදනය වැඩි කරලා අපි බලශක්තියෙන් ස්වයංපෝෂිත වෙලා මිල අඩු කර ගෙන තමයි අපනයනය ගැන හිතන්න ඕනෑ. මේ වාගේ දෙයක් සම්බන්ධයෙන් දීර්ඝ කාලීන strategic plan එකකට යන්නේ නැතුව "අපි මේ ව්‍යාපෘති ගෙනැල්ලා තිබුණා. අර ව්‍යාපෘති ගෙනැල්ලා තිබුණා" කියලා කිව්වාට විතරක් ඒ වැඩේ වෙන්නේ නැහැ. අපි ආණ්ඩුව භාර ගන්න කොට මීට කලින් ආණ්ඩුවල ඉඳන්ම කර ගෙන ආපු ව්‍යාපෘති තිබුණා. සමහර ඒවා හොඳයි; ගැටලුවක් නැහැ.

අපි ඒවායේ අඩු පාඩු සොයා බලා මොනවා හරි අඩු පාඩු තිබෙනවා නම්, ඒවා සකස් කරලා, නිම කරන්න සූදානම් කරලා තිබෙනවා. ආගමික ස්ථානවල පිහිටුවා තිබෙන සෝලා පද්ධති වෙනුවෙන් අපි මේ අය වැයෙන් යම් මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒක දැන් අවසන් වෙන්න ඕනෑ ව්‍යාපෘතියක්. ඒ නිසා ඉතා නුදුරු කාලයක් ඇතුළත ඒ ව්‍යාපෘතිය අවසන් කරන්න තමයි අපි සූදානම් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම, අපි කොළඹ වරාය දියුණු කරන උපක්‍රමික වැඩ පිළිවෙළක ඉන්නවා. බස්නාහිර පළාතේ කර්මාන්ත විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඉදිරියේදී නිෂ්පාදන ආර්ථිකයකට අපි යන්න ඕනෑ. කොහොමත් නිෂ්පාදන ආර්ථිකයකට යනකොට, විදුලිබල අවශ්‍යතාව තව වැඩි වෙනවා. ඒ අතර කොළඹ වරාය නගරය සංවර්ධනය වෙනවා. කොහොමත් ඉදිරියේදී වරාය නගරයේ ඉදි කිරීම් සිද්ධ වෙනකොට, අපට විශාල විදුලි බලයක් අවශ්‍ය වෙනවා. ඒ නිසා Kerawalapitiya Grid Substation එකේ ඉඳලා වරාය දක්වා යන භූගත රැහැනකට රුපියල් බිලියන 7ක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඉදිරියට එන අවශ්‍යතාවට පද්ධතිය ස්ථායී කරගන්න මේ සම්ප්‍රේෂණ ජාලය අපි ශක්තිමත් කරගන්න ඕනෑ. රට පුරාම අපේ සම්ප්‍රේෂණ ජාලය සම්බන්ධයෙන් විවිධ ගැටලු තිබෙනවා. ඒ නිසා අපේ අය වැය ලේඛනය තුළින්, අමාත්‍යාංශ වියදම් තුළින් ප්‍රාග්ධන වියදම් විධියට සම්ප්‍රේෂණ මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා.

ඊළඟට, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ගැන කථා කළා. මේ ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ගැන තවමත් කථා කරනවා නේ; කාලයක් තිස්සේම කථා කරනවා. ඇත්තටම අපිත් ඒවාට එරෙහි වුණේ, ඇතැම් ගිවිසුම් ඒ නම්වලින් ආවාට, ඒවා ක්‍රියාත්මක වීමේදී රටට තිබුණු ප්‍රශ්න නිසායි. අපට උපරිම වාසියක් අරගෙන තිබුණේ නැති නිසා තමයි, අපි ඒ වෙලාවේ ඒවාට එරෙහි වුණේ. නමුත්, ඒවා අපට වාසිදායක විධියට කරගන්න පුළුවන් නම් හොඳයි. උදාහරණයක් විධියට ගත්තොත්, සාම්පූර් සෝලා ව්‍යාපෘතියත් එහෙම තමයි. අපට වාසිදායක විධියට ඒ මිල අඩු කර ගන්න පුළුවන් නම්, අපි ඒක කරන්න ඕනෑ. ත්‍රිකුණාමලය ගැන කොච්චර කථා කළත්, දශක ගණනාවක් රට කරපු ආණ්ඩු සහ ඒවාට සම්බන්ධ වෙච්ච අය විශාල පිරිසක් ඉන්නවා නේ මේ රටේ. ඒ කාලයේ හිටපු මැති ඇමතිවරු විපක්ෂයේත් ඉන්නවා. ත්‍රිකුණාමලය වරාය අපට ස්වභාව ධර්මයේ දායාදයක් විධියට ලැබිලා තිබෙන්නේ. අපේ ඇමතිවරයාත් ප්‍රකාශ කළා වාගේ මෙට්‍රික්ටොන් 40,000ක නැව් වුණත් ඉතා පහසුවෙන් ත්‍රිකුණාමලය වරායට ගේන්න පුළුවන්. ඒ වෙනුවෙන් ගොඩක් වැඩ පටන් ගෙන තිබුණාට, ඒවා නිසි ඉලක්කයක් සහිතව ඉස්සරහට ගිහිල්ලා තිබුණේ නැහැ. ඒක නිසා අපේ රටේ පාවිච්චි කරන්න පුළුවන් සම්පත්, භූගෝලීය වශයෙන් පිහිටලා තිබෙන උපාය මාර්ගික වැදගත්කම් කියන මේ හැමදෙයක්ම සලකා බලා අපි හොඳ ඒකාබද්ධ වැඩසටහනකට, හොඳ සැලසුම් සහගත වැඩසටහනකට ගියේ නැත්නම් මේවා කතන්දර විතරක් වෙනවා.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට අපි, අපේ රටට අයිති වෙලා තිබෙන තෙල් ටැංකි 24න් -CPC එකට තිබෙන තෙල් ටැංකි 24න්- 4ක් ඉදිරි අනාගතයේදී භාවිත කරන්න සූදානම් කරලා තිබෙනවා. හැබැයි, අපි තවදුරටත් හිතන්න ඕනෑ, ඒක මොන වාගේ දේවල් සඳහා ද පාවිච්චි කරන්නේ කියලා. අපට ඕනෑ නම්, විශාල තෙල් නැව්වලින් තෙල් ගෙන්වලා, කුඩා නැව්වලින් ප්‍රති අපනයනය කරන්න පුළුවන්. එහෙම නැත්නම් මේවා ගබඩා විධියට පාවිච්චි කරන්නත් පුළුවන්. එහෙම නැත්නම් රට තුළට තෙල් බෙදා හැරීමට පාවිච්චි කරනවාද කියන කාරණය ගැන ගොඩක් සාකච්ඡා කරලා, වඩාත්ම උපයෝගිතාවක් තිබෙන කාරණය වෙනුවෙන් එකඟතාවලට එන්න ඕනෑ. ඒ නිසා සමහර දේවල් ගත්තොත්, ඒ පිළිබඳව තවමත් විවෘත අදහසක් තිබෙන්නේ. නමුත්, අපි ඒවා පටන් ගෙන තිබෙනවා. අපට විශාල වශයෙන් රටේ ඉදිරි අනාගතය සඳහා වන වැඩ පිළිවෙළට ඒවා දායක කර ගන්න පුළුවන්.

ඒ වාගේම තමයි, මේ දවස්වල විශේෂයෙන්ම කථා වෙන පෙට්‍රල් ෂෙඩ් ප්‍රශ්නයත්. අපට ආරංචි ලැබෙන විධියට, ඒ වාගේම සමහර අයත් කියනවා, පසු ගිය ආණ්ඩුව යනකොටත් තව පෙට්‍රල් ෂෙඩ් ප්‍රමාණයක් දමන්න එකඟතාව දීලා තිබෙනවා කියලා. ඒගොල්ලෝ අපට නිතරම කථා කරලා කියනවා, අපට කලින් ආණ්ඩුවෙන් කිව්වා පෙට්‍රල් ෂෙඩ් එකක් දමාගන්න පුළුවන්, දැන් ඒක කර ගන්න බැරිද කියලා. නමුත් ප්‍රශ්නය මොකක්ද? පසු ගිය කාලයේ CEYPETCO එකට විතරක් පෙට්‍රල් ෂෙඩ් තිබුණා. ඊට පස්සේ, තවත් සමාගම් කිහිපයක් ආවා. ඒවා පෞද්ගලික සමාගම් සහ විදේශ සමාගම්. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ? මුල් කාලයේ නම් පෙට්‍රල් ෂෙඩ් හිමිකරුවෝත් හිතුවා, පෞද්ගලික සමාගම් ආවාට පස්සේ සෑහෙන්න වාසිදායක තත්ත්වයක් නිර්මාණය වෙයි කියලා. ඒ වාගේම කථාවක් සහ මතයක් හැදුවා, අධික තරගකාරිත්වය නිසා විශාල ලාභයක් ජනතාවට එයි කියලා. නමුත් අද ඒ තත්ත්වය ඇති වෙලා නැහැ. ඒ වාගේම, ළඟ ළඟ පෙට්‍රල් ෂෙඩ් දැම්මාට පස්සේ, ඒ ඉන්ධන පිරවුම්හල් කරගෙන යන්න බැරි වෙනවා. පසු ගිය ආණ්ඩුව සැලසුම් කරලා තිබුණේ තවත් පෙට්‍රල් ෂෙඩ්වලට අවස්ථාව දෙන්න. තවත් පෙට්‍රල් ෂෙඩ්වලට අවස්ථාව දුන්නාට පස්සේ, මේ තිබෙන තත්ත්වය තවත් දරුණු වෙනවා නේ. එතකොට අපි කොහොමද උපාය මාර්ගික වැඩ පිළිවෙළක් ගැන හිතන්නේ? ඇත්තටම සමහර සමාගම් දැන් යනවා කියලා කියන්නේ, ඒගොල්ලන්ට canvassing කරලා පෙට්‍රල් ෂෙඩ් එකක් දිනා ගන්න බැරි නිසා.

එහෙම වෙලා තිබෙන්නේ ආරම්භක අවස්ථාවේ තිබුණු උනන්දුව සහ ආකර්ෂණය පෙට්‍රල් ෂෙඩ් හිමිකරුවන් තුළත් නැති වීමයි. ඉතින් මේ තත්ත්වය හරි පැහැදිලියි. ඒ නිසා අනවශ්‍ය ප්‍රමාණයකට ඉන්ධන පිරවුම්හල් වැඩි කරන්න ගිහිල්ලා ඒ පාඩුව

දරා ගන්න වෙන්නෙත් රටට තමයි. මේ හැම ක්ෂේත්‍රයක් ගැනම හුදෙකලාව හිතලා තැනින් තැන සැලසුම් සකස් කරලා අපට ඉස්සරහට යන්න බැහැ. ඒ නිසා සෑහෙන දුරකට හොඳ සංයුක්ත සැලසුමක් සහිතව තමයි යන්න වෙන්නේ.

අපි විශේෂයෙන්ම ගොඩක් කථා කරපු කාරණාවක් තමයි අපේ විදුලිබල පද්ධතිය පිළිබඳ කාරණාව. විශේෂයෙන්ම ගත්තොත්, විදුලිබල පද්ධතියේ ස්ථායීතාව සහ හදිසි නඩත්තුව. නඩත්තු කිරීම සඳහා විදුලිබල පද්ධතිය සැරින් සැරේ සමහර තැන්වලින් විසන්ධි කරන්න සිද්ධ වෙනවා, ගස් නිසාත්, තවත් විවිධ හේතු නිසාත්. හැබැයි මේවාට හොඳ සැලසුමක් තිබෙන්න ඕනෑ. හදිසි නඩත්තු කටයුතුත් තිබෙනවා, කාලයෙන් කාලයට කරන්න ඕනෑ නඩත්තුත් තිබෙනවා. හදිසි නඩත්තු කිරීම්වලදී විදුලි බලය විසන්ධි වෙන කාලය අඩු කර ගැනීම සඳහා ඉදිරි සැපයුම්වලට අපි යන්න ඕනෑ. ඒ වාගේම සම්ප්‍රේෂණය වැඩිදියුණු කිරීම වාගේම, මනු කියවීම් වාගේ දේවල් පිළිවෙළක් කර ගන්න ඕනෑ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බලශක්ති ක්ෂේත්‍රය කියන්නේ අපේ රටේ සියලු දේ එක්ක බැඳුණු ක්ෂේත්‍රයක්. ඒ වෙනුවෙන් පසුගිය කාලසීමාව තුළ ආරම්භ කරපු ව්‍යාපෘති තිබෙනවා. නමුත් අපි ඉදිරි අනාගතයේ දී වැඩිදියුණු කර ගත යුතු ව්‍යාපෘතිත් තිබෙනවා. ඒ නිසා අපි පළමුවෙන්ම බලන්න ඕනෑ පුළුවන් තරම් අපේ රටේ සම්ප්‍රේෂණ පද්ධතියත් දියුණු කරගෙන, පුනර්ජනනීය බලශක්තියටත් යන ගමන්, රටට වාසිදායක ගිවිසුම්වලට එළැඹෙන්න. අපි කිසිම ආයෝජකයෙකුට එන්න එපා කියලා හෝ ආයෝජකයන් අධෛර්යවත් කරලා නැහැ. නමුත් ඇතැම් ආයෝජකයන් රටින් යන්න පුළුවන්. එවැනි ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඒගොල්ලෝ කලින් ආණ්ඩු එක්කත් එකහ වෙලා තිබෙනවා වැඩි මිලට විදුලිය විකුණන්න. අපි බලයට ආවාට පස්සේ රටට වාසිදායක වන විධියට ඒ ගැන සාකච්ඡා කළාම සමහර විට ඒගොල්ලෝ බලාපොරොත්තු වෙච්ච ලාභය නොලැබෙන්න පුළුවන්. ඒ නිසා සමහර ආයෝජකයන් රටින් ඉවත් වෙලා යන්න පුළුවන්. හැබැයි, දැන් තිබෙන ආණ්ඩුවත් එක්ක වැඩකටයුතු කර ගන්න ඕනෑ මෙහෙමයි කියන අදහස ආවාට පස්සේ ඒගොල්ලෝ වුණත් ආයෙත් එන්න පුළුවන්. ඒ නිසා විදේශ ආයෝජන අධෛර්යවත් කිරීමක් අපි කරලා නැහැ. නමුත් මේ පිළිබඳ විවිධාකාරයේ මතවාද හඳනවා, ආයෝජකයන් යනවා කියලා. රටට ආයෝජකයන් එන එක ගැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ ආයෝජකයන් රටටත්, ඒගොල්ලොන්ටත් ලාභදායී ගිවිසුම්වලට එකහ කර ගන්න අපි සමත් වෙන්න ඕනෑ. පසුගිය මාස කිහිපය ගත්තොත්, විශේෂයෙන්ම මේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළින් රටට වාසිදායක විධියට විදුලි ඒකකයක මිල අඩු කරන්න සමත් වෙලා තිබෙනවා. එහෙම නැති වුණොත් අපි සූර්යබලය පාවිච්චි කළත්, සුළං බලය පාවිච්චි කළත්, අපි මිලදී ගන්න ඒකකයක් සාධාරණ මුදලකට ගන්න බැරි නම් ඔය කියන වාසිය කවදාවත් අත්පත් වෙන්නේ නැහැ. ඔය විධියේ ව්‍යාපෘති කාලයක් තිස්සේ මේ රටේ වෙලා තිබෙනවා නේ. ඒ නිසා මේ වාගේ මූලිකම ප්‍රශ්න - root causes - හඳුනා ගෙන, නිසි සාකච්ඡා කරන්න ඕනෑ. ආයෝජකයෙක් එක්ක කථා කළත්, වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක් එක්ක කථා කළත් අපි කථා කරන්න ඕනෑ රටටත්, ජනතාවටත්, රටේ ඉදිරි අනාගතයටත් යහපතක් වෙන පැත්ත ගැන හිතලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

විශේෂයෙන්ම අපි අවධානය යොමු කරලා තිබෙන්නේ මෙන්න මේ විධියට උපාය මාර්ගිකව සහ ගුණාත්මක විධියට මේ බලශක්ති ක්ෂේත්‍රය පරිවර්තනය කරන්නයි. ඒ සඳහා විශාල පියවර ප්‍රමාණයක් අපි ආරම්භ කරලා තිබෙනවා. මේ විධියට අපි ඉස්සරහට ගියාම මේ බලශක්ති ක්ෂේත්‍රය ස්ථායී කරගෙන, යම් කිසි දවසක අතිරික්ත බලශක්තිය අපනයනය කිරීම දක්වා යන්න පුළුවන්. ඉතින් මේ විධියට තමයි මේ වැඩ පිළිවෙළ හදලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපි මේ ක්ෂේත්‍රයට රුපියල් බිලියන 20.7ක් ප්‍රාග්ධන වියදම් විධියට වෙන් කරලා තිබෙන්නේ. මම හිතන විධියට, අපි අපේ වැඩසටහන හා සැලසුම යොමු කරලා තිබෙන දිශානතිය ඒකයි.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! දිවා ආහාර විවේකය සඳහා පාර්ලිමේන්තුවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටවනු ලැබේ.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.00ට ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி. ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று. மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, THE HON. DEPUTY SPEAKER in the Chair.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Nalin Bandara Jayamaha. You have 25 minutes.

[අ.භා. 1.00]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම වර්තමාන රජයේ පළමු අය වැයේ කාරක සභා අවස්ථාවේදී බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා.

මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරද්දී, වැඩියෙන්ම පාවිච්චි කරපු වචනය තමයි පසුගිය අවුරුදු 76 කියන එක. හැබැයි, මේ අවුරුදු 76 ඇතුළත මේ රටේ විදුලිබල පද්ධතිය දියුණු වෙලා සියයට අනූනවයයි දශම ගණනක්ම electrify වෙච්ච, විදුලිය ලැබිච්ච ජනතාවක් ඉන්න රටක් මේ රට. ඒ වාගේම විදුලිය අපතේ යෑම - network loss එක, transmission loss එක, එහෙම නැත්නම් distribution loss එක - දකුණු ආසියාවේ විතරක් නොවෙයි, ආසියාවේම ඉතාම අවම අගයක් තිබෙන රටක් තමයි 77 වෙනි අවුරුද්දේ ඔබතුමන්ලාට උරුම කරලා දීලා තිබෙන්නේ. විශේෂයෙන්ම 1977-1989 කාල වකවානුව තුළ - ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ සමයේ - Victoria Complex එක කඩිනම් ව්‍යාපෘතියක් විධියට අවසන්

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

කළා. එය අවුරුදු 30කින් වැඩ අවසන් කරන්න නියමිතව තිබුණු ව්‍යාපෘතියක්. වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ, සමනල වැව කියන ඒ පද්ධතියේම වැඩ අවසන් කළා. ඒ තුළින් විදුලිය විතරක් නොවෙයි, කෘෂිකර්මය ඉලක්ක කර ගත්ත දැවැන්ත වාරි පද්ධතියක් හැදුණා. අවුරුදු 76ක සාපලත් යුගය ලෙස ඔබතුමන්ලා හඳුන්වන මේ යුගය ඇතුළත තමයි ඒවා සිද්ධ වුණේ. ඒ වාගේම සමනල වැව හැදුණා. Laxapana Complex එකෙත් බලාගාර කිහිපයක් හැදුණා. ඒ වාගේම මීට වසර 15කට කලින් Upper Kotmale ව්‍යාපෘතිය අවසාන වුණා. ඒ වාගේම කුකුලේ ගඟ ව්‍යාපෘතිය චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ යුගයේ ඉදි වුණා. ඒ වාගේම අද අපේ පද්ධතියට විශාල විදුලියක් ලබා දෙන නොරොච්චෝලේ බලාගාරය -මෙගාවොට් 900ක්- මහින්ද රාජපක්ෂ මහත්මයාගේ සමයේ ඇති වුණා. ඒ නිසා විදුලියෙන් පෝෂිත වෙච්ච රටක් විධියට තමයි අද මේ අවස්ථාවේ අපි මේ අවුරුදු 76 අවසන් කරන්නේ.

විශේෂයෙන් අපි දැක්කා, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මොනවාද තිබෙන්නේ කියලා. ඉස්සෙල්ලා නියෝජ්‍ය ඇමතිවරයෙකුත් සඳහන් කළා. ගරු ඇමතිතුමාත් දැන් සභාවේ ඉන්නවා. හැබැයි, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන්ද, ක්‍රියාත්මක වෙනවාද කියන බරපතළ ප්‍රශ්නය තිබෙනවා. අපි දන්නවා, අපේ විදුලිබල පද්ධතිය තවදුරටත් ශක්තිමත් කරන්න නම්, විශේෂයෙන්ම transmission network එක, grid substations ටික වැඩිදියුණු වෙන්න ඕනෑ බව. අපේ පද්ධතියට තවදුරටත් ජනනය වෙන විදුලිය ලබා ගන්න නම්, මේ network development එක, විශේෂයෙන්ම transmission සහ grid substation development එක අත්‍යවශ්‍ය කාරණයක්. ඉස්සෙල්ලාත් මම ඇමතිවරයාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, ඒවාට මුදල් කෝ කියලා. එතුමා කිව්වා, donorsලාගෙන් ගන්නවා කියලා. හැබැයි, donorsලාගෙන් ගන්න donorsලා ඉන්නවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලාට වෙනත් මූල්‍ය ආයතනවලින් ණය විධියට ගන්න පුළුවන් වෙයි. හැබැයි, එහෙම ගන්නත් ඔබතුමන්ලාට IMF එක කියලා තිබෙන reforms කරන්න සිද්ධ වෙනවා. දැන් ඔබතුමන්ලා කිව්වා, transmission network එක, ඒ වාගේම distribution network එක privatize කරන්නේ නැහැ කියලා. ඒ වෙනුවට ඕනෑ නම් අලුත් transmission network එකක් හදන්න පුළුවන් කියලා කිව්වා. අලුත් grid substations හදනවා නම්, අලුත් පද්ධතියක් හදනවා නම්, ප්‍රශ්නයක් නැහැ කියලා ඔබතුමන්ලා කිව්වා. ගරු ඇමතිතුමනි, ඔබතුමා විදුලිබල ක්ෂේත්‍රයේ ඉංජිනේරුවරයෙක්. ඔබතුමා මට පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්නකෝ, අලුත් පද්ධතියක් හදන්නේ කොහොමද කියලා. මේ තිබෙන system එකට parallel පද්ධතියක්ද? එහෙම නැත්නම් මේ තිබෙන system එකේම යම්කිසි දිගුවක් විධියටද මේක කරන්නේ? මේක ප්‍රායෝගිකව කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඔබතුමා දන්නවා නේ, ටෙලිකොම් එකේ සියයට 49ක් පෞද්ගලීකරණය කළා. මේ distribution network එකයි, transmission network එකයි ඇතුළට ආයෝජකයෝ ගේනවා මිසක් ආයේ අලුතෙන් පද්ධතියක් හදන්න පුළුවන්ද කියන එක ඔබතුමාට හොඳටම තේරෙනවා ඇති කියලා මම හිතනවා. ඒ නිසා මම ඒක පැහැදිලි කරන්න ඕනෑ නැහැ. ඉතින් මේක කිසිසේත්ම කරන්න බැරි වැඩක්. මේ system එක, මේ transmission network එක, මේ තිබෙන පද්ධතිය දියුණු කරන්න නම් ආයෝජකයෝ එන්න ඕනෑ.

එහෙම නැත්නම් රජය හෝ ලංකා විදුලිබල මණ්ඩලය මුදල් වියදම් කරන්න ඕනෑ. හැබැයි රජයට හෝ ලංකා විදුලිබල මණ්ඩලයට මුදල් වියදම් කරන්න විධියක් නැහැ. ආයෝජකයන් ගෙනෙන්න නම් ඔබතුමන්ලාට අනිවාර්යයෙන්ම ඒවා පෞද්ගලීකරණය කරන්න සිද්ධ වෙනවා. ඒක තමයි ඇත්ත කතන්දරය.

ඔබතුමන්ලා මේ දවස්වල කරන්නේ මොනවාද? Factories ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා ඉරිදා අපේ විදුලි පරිභෝජනය අඩු දවසක්. ඉරිදාට කුඩා විදුලි බලාගාර, ඒ වාගේම කුඩා solar farms - ground-mounted ඒවා වෙන්න පුළුවන්, එහෙම නැත්නම්, rooftop ඒවා වෙන්න පුළුවන් - නතර කරන්න කියලා ඔබතුමන්ලා කියලා තිබෙනවා. කළ යුතුව තිබෙන්නේ මේකද? අනෙක් එක, ඒක නීත්‍යානුකූලව කරන්න පුළුවන් දෙයක්ද? ඒගොල්ලෝ legal agreement එකකුත් එක්ක තමයි ඒවා ක්‍රියාත්මක කරන්නේ. හැබැයි, ඔබතුමන්ලා බලහත්කාරයෙන් ඒ power plants shut down කරනවා. ඒක වැරදියි, ගරු ඇමතිතුමනි. ඒක නොවෙයි කරන්න ඕනෑ. Large hydro plantsවලින් මේක manage කරන්න ඔබතුමන්ලාට පුළුවන්. අපි large hydropower plantsවලින් කෘෂිකාර්මික කටයුතුවලට ජලය පාවිච්චි කරනවා. Weekdaysවල, එහෙම නැත්නම් peak එකේ ඒ large hydropower plantsවලින් වැඩකටයුතු කරලා, ඉරිදා දිනවල, weekendsවල මේ කුඩා ජල විදුලි බලාගාර සහ කුඩා solar plantsවලින් වැඩකටයුතු කරන්න ඔබතුමන්ලාට පුළුවන්. ඒගොල්ලන් එක්ක තිබෙන power purchase agreements බලහත්කාරයෙන් violate කරලා ඔබතුමන්ලා මේ වැඩේ කරන්න එපා. මේක වැරදි දෙයක්. අනෙක් එක, ඒ අය අපේ රටේ දේශීය ආයෝජකයෝ, කර්මාන්තකරුවෝ. එදා ඒ කර්මාන්ත ඉහළට ගියා. ඒ කර්මාන්තකරුවෝ අද අපේ රටටත් එහා ගිහිල්ලා දකුණු ආසියාවේ, නැඟෙනහිර අප්‍රිකාවේ ආයෝජකයෝ විධියට අපේ රටට ඩොලර් ගෙනෙන විශාල කර්මාන්ත කරනවා කියලා ඔබතුමා දන්නවා. ඒ නිසා ඉරිදා දවස්වලට කුඩා විදුලි බලාගාර ටික වහලා ඒ නීත්‍යානුකූල නොවන බලහත්කාරකම කරන්න එපා කියන එක ඔබතුමන්ලාට කියනවා.

අපේ Act එකෙත් තිබෙන්නේ least cost එකට විදුලිය ගන්න කියලා. අවුරුදු 20 agreement එක ඉවර වෙලා extend කරපු කුඩා විදුලි බලාගාර තිබෙන බව අපි දන්නවා. ඒවායෙන් රුපියල් 6ට, 8ට, 9ට වාගේ ඉතා අඩුම මුදලට තමයි ලංකා විදුලිබල මණ්ඩලය විදුලිය ගන්නේ. ඔබතුමන්ලා ඒවාත් ඉරිදාට shut down කරනවා. එතකොට වතුර ටික නිකම්ම පහළට ගහගෙන යනවා. ඒ නිසා ඒ දේ කරන්න එපා කියන එක අපි පැහැදිලිවම කියනවා. විදුලිබල ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති කරන්න නම් ඔබතුමන්ලාට අනිවාර්යයෙන් මේ reformsවලට යන්න සිද්ධ වෙනවා.

ගරු ඇමතිතුමනි, මීට වසර කීපයකට කලින් විදුලිය මෙගාවොට් 50ට ආසන්න විදුලි ව්‍යාපෘති ගණනාවකට EoIs call කළ බව ඔබතුමා දන්නවා. ඒවා shortlist කරලා ව්‍යාපෘති 46ක් විතර හඳුනාගෙන තිබෙනවා. අද වෙනකොට ඔබතුමන්ලා අදානිගේ ව්‍යාපෘති විතරක් නොවෙයි නතර කරලා තිබෙන්නේ. ව්‍යාපෘතියක් කරගන්න මට්ටමක නැති, මේ ව්‍යාපෘතියක් approve කරගෙන ඒවා තවත් සමාගමකට විකුණන මට්ටමේ අයත් මේ ව්‍යාපෘති 46 අතර ඇති. හැබැයි මේ අය අතර අපේ රටේ හොඳ දේශීය ආයෝජකයෝ ඉන්නවා, නම් දරපු සමාගම් තිබෙනවා. ඒ සියල්ලක්ම දේශීය සමාගම්. ඔබතුමන්ලා ඒ අයට දෙන අවස්ථාවත් නතර කරලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා අදානිව විතරක් නොවෙයි නවත්වලා තිබෙන්නේ. අපේ රටේ අදානිලාවත් නවත්වලා තිබෙනවා. අපේ රටේ මේ ක්ෂේත්‍රයෙන් ඉදිරියට ගිහිල්ලා අද දකුණු ආසියාවේ සහ දකුණු ඇමෙරිකාවේ රටවලත්, අප්‍රිකාවේ සානාව වාගේ රටවලත් ගිහිල්ලා මේ ව්‍යාපෘතිවල නිරත වෙලා සිටින දේශීය කර්මාන්තකරුවන්ටත් මේක බරපතල ප්‍රශ්නයක් විධියට අපි දකිනවා. ඒ නිසා මේ දේ කරන්න එපා. ඔබතුමන්ලා මේකට ශක්තියක් ලබාදෙන විධියට වැඩ පිළිවෙළක් සකස් කරන්න.

විදුලි බිල අඩු කරන්න ඔබතුමන්ලාට හැකියාව තිබෙන බව අපි දන්නවා. ඔබතුමන්ලාගේ අර පුනරුදයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඔබතුමන්ලා පොරොන්දු වුණු කරුණු කාරණා දැන් අමතක කරලා තිබෙනවා. එයින් පොරොන්දු 4යි ඉටු කරලා තිබෙන්නේ. පොරොන්දු 10ක්ද කොහේද තිබුණා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හතළිස් දෙකයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
හතළිස් ගණනක්ද? අයියෝ! ගරු ඇමතිතුමනි, ඒ පොරොන්දු කෝ? ඔබතුමන්ලා අද ඒවාට යොමු වෙලා තිබෙනවාද? PUCSL එකට අනුව විදුලි බිල සියයට 30කින් තව අඩු කරන්න පුළුවන්. මේ දවස්වල නැප්තා මිල අඩු වෙලා තිබෙන්නේ. පසුගිය ටිකේ ඔබතුමන්ලට වාසිදායක දේවල් ගොඩක් සිදු වුණා. ඔබතුමන්ලා ගල්අඟුරු මත VAT පනවා තිබෙනවා. ගල්අඟුරු කියන්නේ අගය එකතු කරන භාණ්ඩයක් නොවෙයි.

ඔබතුමන්ලා නොරොච්චෝලේ බලාගාරයට ගෙනෙන ගල් අඟුරුවලට අගය එකතු කරලා දාන්නේ නැහැ නේ. ඒ ගල් අඟුරු, ගල් අඟුරු විධියටම තමයි දාන්නේ. හැබැයි, ඒකටත් VAT ගහලා තිබෙනවා. සියයට 18 VAT එක එකතු වුණාම කොච්චර ප්‍රමාණයකින් ගල් අඟුරුවල මිල වැඩි වනවාද කියලා බලන්නකෝ, බලශක්ති ඇමතිතුමනි. හැබැයි, ඔබතුමන්ලා දුන් "පොර ටෝක්" ටික කොහොමද? විදුලි බිල අඩු කරනවා, සහන දෙනවා, ඩීසල් මිල අඩු කරනවා, රුපියල් 150ට, රුපියල් 200ට පෙට්‍රල් ලීටරයක්, ඩීසල් ලීටරයක් දෙනවා කිව්වා. කෝ ඒවා? රුපියල් ලක්ෂ 14ට කාර් දෙනවා කියලාත් කිව්වා නේ. දැන් Alto එක කීයද, ගරු මන්ත්‍රීතුමනි? රුපියල් ලක්ෂ 70කටත් වැඩියි. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දුන් පොරොන්දු අද වන විට කුණු කූඩයට දාලා තිබෙන්නේ. ඒ වෙනුවට ඔබතුමන්ලා IMF එක සහ කලින් ජනාධිපතිවරයා විධියට හිටපු "සීයා"ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, හාමුගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණු කාරණා ටික ඉස්සරහට අරගෙන යනවා කියන එක තමයි අපට පෙනෙන්නේ. ඒ නිසා අපි ඔබතුමන්ලාට මතක් කරනවා, ජනතාවට දුන් පොරොන්දු ටික ඉෂ්ට කරන්න කියලා.

පසුගිය ටිකේ බොහොම ආන්දෝලනයට තුඩු දුන් ටෙන්ඩරයක් පිළිබඳව මේ ගරු සභාවේ සිටින මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා තමයි පාර්ලිමේන්තුවේදී ඉස්සෙල්ලාම ඉස්මතු කළේ. ඒක මෙගාවොට් 50ක සුළං විදුලි බලාගාර ව්‍යාපෘතියක්, මන්නාරම ප්‍රදේශයේ. බොහොම පැහැදිලිවම ඒ tender procedures violate කරලා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ හිතවතෙකුට - ගජ මිතුරෙකුට- මේ ව්‍යාපෘතිය දුන්නා. ඔබතුමන්ලා ඊට සාධාරණයක් කරනවා, ඒකේ ලංසුව ඉදිරිපත් වුණේ ශත ගණනක් අඩුවෙන් කියලා. ඒක නේ, ඒ සාධාරණීකරණයට හේතුව. මීට පස්සේ ඕනෑ කෙනෙකුට මේක කරන්න පුළුවන්. ටෙන්ඩර් එක පැත්තකට දාලා හිතවතෙකුට දීලා කියන්න පුළුවන්, අපි අඩුම ලංසුව ඉදිරිපත් කළ කෙනාට තමයි දුන්නේ කියලා. එහෙම නම්, ටෙන්ඩර් කැඳවන්න ඕනෑ නැහැ නේ, වෙන්දේසි කරන්න පුළුවන් නේ. එහෙම නේ මේ ටෙන්ඩරය දුන්නේ. හැබැයි, පැහැදිලිවම major deviation එකක් විධියට ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප විය හැකි ප්‍රධානම නුසුදුසුකමක් තිබුණු සමාගමකට එම ටෙන්ඩරය ලබා දුන්නා. හැබැයි, දැන් වැඩේ වෙනවාද කියලා මට පොඩ්ඩක් කියන්න, ගරු ඇමතිතුමනි.

දැන් මේ ව්‍යාපෘතිය වෙනවාද? ඔබතුමන්ලා මේ ටෙන්ඩරය එක්තරා සමාගමකට දුන්නා නේ. දැන් මේ ව්‍යාපෘතිය වෙනවාද? ඒ ටෙන්ඩරය දුන්නාට පස්සේ ඒ ව්‍යාපෘතියේ කරන්න මොකුත් අමතර වැඩක් නැහැ. ඉඩම හරි, පරිසර වාර්තා හරි, grid එක හරි, transmission line එක හරි, සේරම හරි. ඔබතුමන්ලාට තිබෙන්නේ wind turbines ටික install කරන්න විතරයි. ඒක install කරන්න පුළුවන් මාස 3කින්. Foundations ටික දාලා මේක install කරන්නයි තිබෙන්නේ. හැබැයි තවම order කරලාවත් නැහැ, මේ සමාගම. මොකක්ද සමාගමේ නම? Fentons. එය Hayleys එකට අනුබද්ධ සමාගමක්. එම සමාගම තවම මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු කරලා නැහැ. තවම financial evaluations ද මොනවාද කර කර ඉන්නවා. ඔබතුමන්ලා මේ සමාගමට මේ ටෙන්ඩරය දුන්නාට එතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ ව්‍යාපෘතිය දුන්නේ dollar rate එකට කරන්න. Dollar rate එකට දුන්නා නම් investment එකත් ඩොලර්වලින් එන්න ඕනෑ; FDI - Foreign Direct Investment - එකක් විධියට එන්න ඕනෑ. හැබැයි අපට පෙනෙන්නේ නැහැ, මේ සමාගම ඒ සඳහා දැන් සූදානම් ද කියලා. එහෙම නම්, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මම දන්නා විධියට bid bond එකේ ප්‍රශ්නයක් කියලා තමයි මේ tender එක cancel වුණේ. මේ සමාගම ව්‍යාපෘතිය නොකළොත් ඔබතුමන්ලා ගන්න තීරණය මොකක්ද? මේ ව්‍යාපෘතිය නොකිරීම සහ අපේ රටේ විදුලිබල පද්ධතියට දිනකට මෙගාවොට් 50ක් එකතු වීම ප්‍රමාද වීම නිසා, -ඔබතුමා calculate කරලා බලන්න units ගණනින් වැඩි කරලා- loss එක කොච්චරක්ද කියලා. මේ ප්‍රමාදය සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? තවම අත තියලා නැහැ, මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න. කිසිදු බාධාවක් නැතිව මෙලහකට පටන් ගන්න තිබුණු ව්‍යාපෘතියක්, මේක; ඔබතුමන්ලා award කරපු දවසට පහුවදා පටන් ගන්න තිබුණු ව්‍යාපෘතියක්. හැබැයි මේ සමාගම සූදානම් නැහැ, මේ ව්‍යාපෘතිය කරන්න. අපට පෙනෙන්නේ නැහැ, මේ සමාගම මේ ව්‍යාපෘතිය කරනවා කියලා. ඔබතුමන්ලා ගජ මිතුරාට ව්‍යාපෘතිය භාර දුන්නාට ගජ මිතුරා මේක කරන පාටක් නැහැ. ඒ නිසා ඒකේ ප්‍රශ්නයක් තිබෙනවා. ජනාධිපතිවරයාත් ටෝක් එක දුන්නා, අපි අඩුම ලංසුව ඉදිරිපත් කළ කෙනාට තමයි දුන්නේ කියලා. අඩුම ලංසුව ඉදිරිපත් කළ කෙනාට දුන්නාට මේක වෙන්නේ නැහැ. මන්නාරම දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. හිටපු ඇමතිතුමනි, ඒ පැත්තේ ඒ ව්‍යාපෘතිය කරන බවක් පෙනෙන්න නැහැ නේද? තවම foundation එකවත් දාලා නැහැ නේද? *[බාධා කිරීමක්]* තවම මොකුත් නැහැයි ලු. ඒ නිසා බොහොම පැහැදිලිව අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, මේ කටයුත්ත කෙරෙනවාද, නැද්ද කියන කාරණාව සම්බන්ධයෙන්.

ඒ වාගේම මේ දවස්වල බනිජ තෙල් සම්බන්ධවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලා දැන් බෙදුම්කරුවෝ එක්ක විශාල fight එකක් කරනවා. මට නම් මෙතැන පෙනුණේ වෙන මොකුත් ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමන්ලා ඒ මිනිස්සු එක්ක හරියට ගනුදෙනු - deal - කළේ නැහැ, සාකච්ඡා කළේ නැහැ. ඔබතුමන්ලා හිතාගෙන ඉන්නවා, ඔබතුමන්ලා පැලවත්තේ ඉඳලා දෙන නියෝග අනුව හැම කෙනාම වැඩ කරන්න ඕනෑය කියලා. එහෙම වැඩ කරන්න බැහැ. ඒ, ව්‍යාපාරිකයෝ. ඒ ව්‍යාපාරිකයෝ අපේ හිතවතුන් නොවෙයි. මම දැක්කා, අපේ මන්ත්‍රීවරුන්ට පෙට්‍රල් ෂෙඩ් තිබෙනවාය කියලා කවුද කිව්වා. ඒ ව්‍යාපාරිකයන්ගෙන් සියයට 75ක්ම ඔබතුමන්ලාට උදව් කළා; ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. ඔබතුමන්ලාගේ පැලවත්ත කාර්යාලයට සල්ලිත් දෙන්න ඇති, මැතිවරණ ව්‍යාපාරයට. හැබැයි, ඔබතුමන්ලා ඒ අය එක්ක සාකච්ඡාවක්වත් කළේ නැහැ. අද ඔබතුමන්ලා ඒ අයට තර්ජනය කරනවා.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

අද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සියලු මාධ්‍ය ආයතන වෙත ලිපියක් යවා තිබෙනවා, "ඉන්ධන බෙදා හැරීම අඩපණ කිරීම සම්බන්ධව ලද පැමිණිල්ලක් පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව" කියන මාතෘකාව පාදක කොටගෙන. මේ අවස්ථාවේදී එම ලිපිය මම **සභාගත*** කරනවා.

දැන් ඔන්න බෙදුම්කරුවන්ව අල්ලාගන්න හදනවා. කඩාකප්පල්කාරී ක්‍රියා කරනවාය කියලා CID එකට මේ පරීක්ෂණය යොමු කරලා තිබෙනවා. දැන් ඒගොල්ලන් ගැන පරීක්ෂණ පවත්වනවා. මේ දේවල් මෙහෙම කරන්න බැහැ. ඔබතුමන්ලා පොඩ්ඩක් මේ දිහා ව්‍යාපාරික කෝණයෙන් බලන්න. අපි කියන්නේ නැහැ, සියයට 3ද කියද කියලා. අපි දන්නේ නැහැ. ඔබතුමන්ලා ඒක සාකච්ඡා කරලා ගණනය කරන්න. හැබැයි, එතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නා විධියට බෙදුම්කරුවෝ අද ඉඳලා තෙල් order කරන එක නතර කරලා තිබෙනවා. ඊට අමතරව අපි හිතමු, order එක ගත්තා කියලා. ඒගොල්ලන්ගේ ඊළඟ step එක මොකක්ද? ඒගොල්ලන් creditවලට තෙල් දෙනවා, පොලීසි, රෝහල් වාගේ රාජ්‍ය ආයතනවලට. ඒ සේරම ණය මත දෙන්නේ. දැන් තෙල් බෙදුවත් ඒගොල්ලන් ණයට තෙල් දෙන්නේ නැහැ. එතකොට පොලීසියේ වාහනවලටත් පෙට්‍රල් ගහන්න වෙන්නේ සල්ලි දීලා. පොලීසියේ වාහනවලට එහෙම පෙට්‍රල් ගහගන්න විධියක් නැහැ. රෝහල්වල වාහනවලටත් පෙට්‍රල් ගහන්න වෙන්නේ සල්ලි දීලා. ඒ වාගේම credit cardsවලට debit cardsවලට ඉන්ධන දෙන්නේ නැහැ කියලාත් තිබෙනවා, ඒගොල්ලන්ට එහෙම කරන්න බැහැ කියනවා. එතකොට credit cards, debit cardsවලට ඉන්ධන දෙන්නේ නැහැ කියන්නේ, අපට ආයෙත් කාසි මිටිය අරගෙන යන්න වෙනවා, පෙට්‍රල් ගහන්න. නමුත් අපි ඉස්සරහට යන්නේ ඉලෙක්ට්‍රොනික් යුගයකට, ඩිජිටල් යුගයකට. ඒ නිසා මේ ප්‍රශ්න මෙහෙම විසඳන්න බැහැ. ඔබතුමන්ලාට මේ ගැන මීට වඩා සාකච්ඡා කරන්න තිබුණා.

දැන් වැඩිපුර අළෙවි කරන තැන්වල ලාභය අඩු කරලා තිබෙනවා. උදාහරණයකට කොළඹ ගන්න. කොළඹ පෙට්‍රල් ෂෙඩ් තිබෙන සමහර ඉඩම් බලන්න. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, එහෙම නම් ඒ මිනිස්සුන්ට පෙට්‍රල් ෂෙඩ් එකක් දමනවාට වඩා හොඳයි, එම ඉඩමේ supermarket එකක් දමන එක. Flower Road එකේ, Rosmead Place එකේ ඉඩම්වලට හොඳ value එකක් තිබෙනවා. Perch එක රුපියල් මිලියන 30යි, 40යි. ඒ නිසා සරල සමීකරණයකින් මේ වැඩේ කරන්න බැහැ. ඒ ඉඩම්වලට asset value එකක් තිබෙනවා. ඒ මිනිස්සුන්ට ඒ ඉඩමට ඊට වඩා ආයෝජනයක් කරන්න පුළුවන්. ඒ නිසා මේවා මෙහෙම සරලව හිතලා කරන්න බැහැ. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාට යම් කිසි සාකච්ඡාවක් කරන්න තිබුණා. ඒ අයත් එක්ක මීට වඩා ලොකු සංවාදයක් කරන්න තිබුණා. එහෙම කරන්නේ නැතුව ඔබතුමන්ලා මේ සම්බන්ධව පැය 24න් තීන්දුවක් ගත්තා. අධිකරණ තීන්දුවක් ලැබිලා තිබෙනවා තමයි. හරි විධියට නම් ඔබතුමන්ලා රුපියල් බිලියන 30ක් ඒගොල්ලන්ගෙන් -පෙට්‍රල් ෂෙඩ් අයිතිකරුවන්ගෙන්- අයකර ගන්නත් ඕනෑ. මොකද, පසුගිය අවුරුදු දෙකේ loss එක අත්පත් කර ගන්න ඕනෑ නේ. ඔබතුමන්ලා දැන් එය අත්පත් කර ගන්නවාද? ඒක කරන්න පුළුවන්ද? හැම දෙයක්ම කටේ හයියෙන්, හිතේ හයියෙන් කරන්න බැහැ. මේවා ඊට වඩා එහා ගිය පුළුල් සාකච්ඡාවකින්, බුද්ධියෙන්, අත්දැකීම්වලින් කරන්න ඕනෑ කටයුතු. ඒ නිසා CID එකට ලියුම් යවලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මට නම් පෙට්‍රල් ෂෙඩ් නැහැ. නැත්නම් හිතාවි, මමත් පෙට්‍රල් ෂෙඩ් අයිතිකාරයෙක්ය කියලා. පැහැදිලිවම ඔබතුමන්ලා මේ සම්බන්ධව සාකච්ඡා කරලා කටයුතු කරන්න, බුද්ධිමත්ව කටයුතු කරන්න කියලා මම මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම LNG plant එක ගැනත් කථා කරන්න ඕනෑ. ඔබතුමන්ලාත් කථා කළා, අපිත් දන්නවා, මුතුරාජවෙල ප්‍රදේශයේ LNG terminal එකක් ඉදිකිරීමට සැලසුම් කරලා තිබුණු බව. දැන් ඒකට මොකද වෙලා තිබෙන්නේ කියලා ගරු ඇමතිතුමා පුළුවන් නම් මට කියන්න. දැන් ඒක කෙරෙනවාද? අපට නම් පෙනෙන්නේ වෙන දෙයක්. අර චීන ආයෝජකයෙක් කලින් ටෙන්ඩර් එකක් දාලා තිබුණා, FSRU - Floating Storage and Regasification Unit - system එකක් සම්බන්ධව. හැබැයි, ඒ චීන ආයෝජකයා ඒ FSRU system එකට developer කෙනෙක් විධියට මිසක් supplier කෙනෙක් විධියට දායක වෙන්නේ නැහැ. ඒකට අවුරුදු හයක් ගතවෙනවා.

හැබැයි, මේ FSRU system එක apply කළොත් මේ මිල තවත් වැඩි වෙනවා කියන එක තමයි විශේෂඥයෝ කියන්නේ. මේක ඉවත දාපු ටෙන්ඩර් එකක්. හැබැයි, ජනාධිපතිතුමා චීනයට ගියාට පස්සේ මේක නැවත සක්‍රිය කරන්න නියෝග කළාද කියන්න මම දන්නේ නැහැ. මොකද, මේ ගැන නැවත සලකා බලනවා කියලා ඔබතුමන්ලාගේ පැත්තෙන් ආරංචියක් ආවා. ඔබතුමන්ලා මීට කලින් යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා, කේරළයේ පෙට්‍රොනෙට් එල්එන්ජී කියන සමාගමෙන් LNG ගේන්න. ඒගොල්ලන් refrigerated containersවලින් ගෙනැල්ලා තමයි ඒ supply එක දෙන්නේ. හැබැයි, ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක්, අවධානයක් යොමු කරලා තිබෙනවාය කියලා අපට පෙනෙන්නේ නැහැ. දැනටමත් හදලා තිබෙන "සොබාදනවි" බලාගාරය වාගේම එතැන හදලා තිබෙන අනික් බලාගාරය ගැන අපි දන්නවා. ඒ බලාගාර දෙකම LNGවලින් ක්‍රියාත්මක කරගෙන යන්න පුළුවන් බලාගාර බව අපි දන්නවා. LNGවලින් ක්‍රියාත්මක කරගෙන යන්න බලාගාර හැදුවාට දැන් LNGවලින් නොවෙයි, furnace oilවලින් තමයි ඒවා ක්‍රියාත්මක කරගෙන යන්නේ. එම නිසා LNG terminal එක සහ LNG supply එක පිළිබඳව ඔබතුමන්ලා දැඩි අවධානයක් යොමු කරලා, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළොත් ඒක ඉතාම වටිනවාය කියන එක මම කියන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලය ගැන කථා කරනකොට මම කියන්න කැමතියි, එහි සේවකයෝ විශාල කාර්යභාරයක් කරන බව. අපි හොයා බැලුවාම අපට දැනගන්න ලැබුණා, මෙගාවොට 900ක් නිෂ්පාදනය කරන නොරොච්චෝලේ බලාගාරයේ ඉංජිනේරු අත්දැකීම් තිබෙන ඉංජිනේරුවරු 42ක් පසුගිය කෙටි කාලය තුළ ඉවත්වෙලා තිබෙනවාය කියලා. සමහරු resign වෙලා තිබෙනවා; සමහරු retire වෙලා තිබෙනවා. එම නිසා අත්දැකීම් තිබෙන ඉංජිනේරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. අපි දන්නවා, නොරොච්චෝලේ supply එක අපේ රටේ විදුලි සැපයුම ස්ථාවර මට්ටමක පවත්වාගෙන යන්න ඉතාම වැදගත් බව. එම නිසා අත්දැකීම් සහිත ඉංජිනේරුවරු රඳවා ගැනීමට ඔබතුමා වැඩි අවධානයක් යොමු කරන්න කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ වාගේම, ඔබතුමන්ලා දුන් පොරොන්දු ගැනත් මම මතක් කරන්නට ඕනෑ. මම ඉස්සෙල්ලා සඳහන් කළ ඔබතුමන්ලාගේ විදුලි බිල අඩු කරන පොරොන්දුව ගැන වාගේම ඉන්ධන මිල අඩු කිරීමේ පොරොන්දුව ගැනත් මතක් කරන්නට ඕනෑ. ඔබතුමන්ලා දැන් ඒ සම්බන්ධයෙන් කථා කරනවා අපට පෙනෙන්නේ නැහැ, මුනිවත රකිනවා විතරයි දකින්නේ. ඔබතුමන්ලා දෙනවා කියපු ගණන්වලට ඩීසල් ටික දෙන්න, පෙට්‍රල් ටික දෙන්න කටයුතු

---

* *පුස්තකාලයේ තබා ඇත.*

* *நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

කළොත්, දැන් ඇතිවෙලා තිබෙන පෙට්‍රල් ෂෙඩ්වල ලාභය පිළිබඳ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. ලීටරයක් රුපියල් 300ට තිබෙනකොට සියයට 3 කියන්නේ, ලීටරයකින් රුපියල් 9ක ලාභයක් තිබෙනවා. ඕකට නේ දැන් ඔබතුමන්ලා හැප්පෙන්නේ. ඊට වඩා හොඳයි නේ, ඉන්ධන මිල රුපියල් 150ට අඩු කළා නම්. ඉන්ධන මිල අඩු කළා නම් ඒ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. හැබැයි, ෂෙඩ්වල ලාභය ගැන කුහකත්වය පෙන්වන ඔබතුමන්ලා, ඒ ලාභය අනෙක් පැත්තෙන් ජනතාවට දෙන්න කටයුතු කරනවාද? ඔබතුමන්ලා පසුගිය 28වැනි දා ඉන්ධන මිල සංශෝධනය කළා නේ. ඉන්ධන මිල සංශෝධනය කරන දවසේ ඒක සංශෝධනය කරලා නැහැ. හැබැයි, තෙල් order කරන බෙදුම්කරුවන්ගේ ලාභය වෙනස්වෙලා තිබෙනවා. ඔබතුමන්ලා තෙල් order කරන බෙදුම්කරුවන්ට වෙන දා ලබා දුන් කොමිස් මුදල මාර්තු මාසයේ 1වැනි දා ඉඳලා සියයට එකහමාර දක්වා අඩු කරලා තිබෙනවා. බලශක්ති ඇමතිතුමනි, ඔබතුමන්ලා ඒ ලාභය ජනතාවට දුන්නාද? ඔබතුමා මුනිවත රකින්නේ නැතුව නැඟිටලා උත්තරයක් දුන්නා නම් පොඩි හයියක් ලැබෙනවා නේ. එහෙම කරන්නේ නැහැ. මුනිවත රකින එක තමයි එතුමා බොහෝ වෙලාවට කරන්නේ. ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුව මේ රටේ ජනතාවට ආදරයක්, කැක්කුමක් තිබෙන බවක් අපට පෙනෙන්නේ නැහැ. බෙදුම්කරුවන්ගේ කොමිස් මුදල සියයට 3 ඉඳලා සියයට එකහමාර දක්වා අඩු කළත්, ඒ ලාභය රටේ ජනතාවගේ පැත්තට තල්ලු කරලා නැහැ. ඒක පැලවත්ත පැත්තට තල්ලු වෙලාද දන්නේ නැහැ. දැන් සේරම පැලවත්ත පැත්තට නේ තල්ලු වෙලා යන්නේ. ගරු සභාපතිතුමනි, එම නිසා ඔබතුමන්ලා මැතිවරණයේදී රටේ ජනතාවට ලබා දුන් පොරොන්දු, බලාපොරොත්තු, සිහින ඉෂ්ට කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කරගෙන යනවා කියලා අපට පෙනෙන්නේ නැහැ.

මම දැක්කා, දුමින්ද නාගමුව මහත්මයා කියලා තිබෙනවා, වලව්වේ වල් හාමු කෙනෙකුගේ කථාවක්. හාමුව මට්ටු කරන්න ගමේ තරුණයෝ ටික කථා වෙලා, අන්තිමට එක තරුණයෙක් ඒ වෙනුවෙන් ඉදිරිපත් වෙලා තිබෙනවා. අවසානයේ සිද්ධවෙලා තිබෙන්නේ ඒ තරුණයා හාමුගේ වලව්වට ගිහිල්ලා හාමුගේ දුව සෙට් කරගෙන බින්න බැහැපු එකයි. දැන් මේ ආණ්ඩුවටත් වෙලා තිබෙන්නේ ඒකම තමයි. හාමුව මට්ටු කරන්න කියලා ඇවිල්ලා අන්තිමට දැන් වලව්ව ඇතුළේ ඉඳලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වාගේ දකිනවා.

වලව්ව ඇතුළේ ඉඳන් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා හිතනවා. දැන් මාස 3යි ගත වුණේ, මාස 4යි ගත වුණේ කියනවා. *[බාධා කිරීමක්]* හාමුත් එක්ක. හාමුගේ ඉඩම් ටික අත්පත් කර ගන්න, හොරකම් කළ ඒවා අල්ලන්න, හොරු ටික අල්ලන්න ගිහින් වලව්වේ දීග කන ගමන් ඒ වැඩේ කරන්න පුළුවන් - ඒ ප්‍රතිපත්තිය ඇතුළේ ඉඳන් ඒ වැඩේ කරන්න පුළුවන් - කියලා හිතනවාය කියා තමයි අද ජේන්නේ. ඒ නිසා අද හාමුගේ,- *[බාධා කිරීමක්]* දුව නොවෙයිද බැඳලා තිබෙන්නේ? හාමුව හාද කරගෙන හාමුත් එක්ක දීග කන තත්ත්වයකට තමයි අද වනකොට පත් වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ පුනරුද ප්‍රකාශනයට අනුව, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව වැඩකටයුතු කරන්න කියන එක මම මතක් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. S.M. Marikkar. You have 15 minutes.

[අ.භා. 1.26]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු සභාපතිතුමනි, ඇත්තටම මම කථාව පටන් ගන්න හිතපු නැතින් නොවෙයි අද කථාව පටන් ගන්නේ. මොකක්ද, ඒකට හේතුව? පසුගිය ටිකේම මේ ආණ්ඩුවේ ඇමතිවරු සිංහල ශබ්දකෝෂයේ තිබෙන වචන ටිකක් අල්ලාගෙන හරඔයක තමයි මේ යෙදෙන්නේ. මම අද මන්ත්‍රීවරයෙක් කථා කරනකොට අහගෙන හිටියා, එතුමා වදුරාගේ කථාව ගැන කියමින් බලශක්ති ඇමතිතුමාට චෝදනා කරනවා. ඒකට බලශක්ති ඇමතිතුමා අපූරු උත්තරයක් දෙනවා. එතුමා කියනවා, "වදුරා පැන්නේ නැහැ කියලා කවුරුවත් කිව්වේ නැහැ ලූ" කියලා. මාර උත්තරයක් නේ. පසුගිය සෙනසුරාදා මම මේ සභාවේ සිටින ඇමතිවරයෙකුගෙන් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක අතුරු ප්‍රශ්නයක් අහනකොට, -මම එතුමාගේ නම කියන්නේ නැහැ, එතුමා නැඟිටින නිසා- එතුමා කියනවා, එතුමා ප්‍රශ්නයට ලූ, උත්තර දෙන්නේ කියලා. අතුරු ප්‍රශ්නය ඇහුවාම අතුරු ප්‍රශ්නයට නේ උත්තර දෙන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, අපි බණිනවාය කියලා. විපක්ෂයේ ඉඳගෙන විවේචන කරන්නේ නැතිව ආවඩන්න කියලාද කියන්නේ? නලින් බණ්ඩාර මැතිතුමා කිව්වා වාගේ ඒගොල්ලන් හාමුලාත් එක්ක එකතු වෙලා ආවඩනවා වාගේ අපටත් ඒගොල්ලන්ට ආවඩන්න කියලාද කියන්නේ? බලශක්ති ඇමතිතුමනි, ඔබතුමාගේ මුහුණ බැලුවාම නම් පොඩ්ඩක් අභිංසක පාටයි. ඒ වුණාට දෙන උත්තර නම් හරි නැහැ, ගරු ඇමතිතුමනි. රටම නැව්වා අර වදුරාගේ කථාව කියලා. මීට පස්සේ දෙවතාවක් කල්පනා කරන්න, ඒ වාගේ උත්තර දෙනකොට.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආචාර්ය, මහාචාර්යවරු එකතු වෙලා හදපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 167හි මෙසේ සඳහන් වනවා:

> "මාසික විදුලි පරිභෝජනය ඒකක 60ට අඩු ගෘහස්ථ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා නව විදුලි සබඳතා ලබා ගැනීමට හෝ විසන්ධි කළ සබඳතා යළි ලබා ගැනීමට වැයවන මූලික පිරිවැය එකවර ගෙවීම වෙනුවට කොටස් වශයෙන් ගෙවීම සඳහා මාසිකව බිල්පතට එකතු කිරීම."

කෝ, ඒක කළාද? ඔබතුමන්ලා ඇවිල්ලා මාස 5යි, පසුගිය 21වෙනි දාට. මේ වාගේම තමයි ජල බිල්පත සම්බන්ධව කිව්වේත්. කෝ, කළාද? උත්තර දෙන්න බැහැ. කළේත් නැහැ; කරන පාටකුත් නැහැ. මේවා කියලා ජනතාව රවටලා තමයි ඡන්දය ගත්තේ.

ඊළඟට, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 165හි මෙසේ සඳහන් වනවා:

> "ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවට පත් කිරීම සඳහා තරඟකාරී ප්‍රසම්පාදන හා මිල කැඳවීම් ක්‍රියාවලිය සක්‍රිය කර, තෙල් මත පදනම් වූ විදුලි ජනනය අඩු මිලැති සූර්ය හා සුළං ප්‍රමුඛ පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම."

කොහේද තිබෙන්නේ? ඒවා කළාද? උත්තර දෙන්න බැහැ. තවම දකුණු ආසියාවේ වැඩිම විදුලි බිල තිබෙන්නේ අපේ රටේ.

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් අපේ රටේ household units 100ක විදුලි බිල රුපියල් 5,280යි. මේ, මම කියන ඒවා නොවෙයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සොයාගෙන තිබෙන ඒවා. දකුණු ආසියාවේ අනෙක් රටවල average එක රුපියල් 2,077.90යි. සියයට 254කින් ලංකාවේ විදුලි බිල වැඩියි. "සීයා"

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

වැඩි කළා; "සියාගේ" ගෝලයෝත් හාමුගේ වලව්වේ ඉඳගෙන ඒ ටිකම කරනවා. Units 200ක මිල දැන් ලංකාවේ රුපියල් 12,960යි; දකුණු ආසියාවේ අනෙක් රටවල ගණන රුපියල් 4,609.20යි; සියයට 281කින් ලංකාවේ විදුලි බිල වැඩියි. Units 300 ගත්තත් එහෙමයි; ලංකාවේ රුපියල් 21,860යි; දකුණු ආසියාවේ අනෙක් රටවල රුපියල් 7,340.40යි; සියයට 298කින් ලංකාවේ විදුලි බිල වැඩියි. කෝ, ඔබතුමන්ලා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියපු ඒවා කරනවාද? දැන් මේගොල්ලන් ඒ එකක්වත් කරන්නේ නැතිව "76 වසරක ශාපය, 76 වසරක ශාපය" කියනවා. ඔකත් කියලා නේ ඡන්දය ගත්තේ. ඔක තවත් මතුර-මතුරා ඉඳලා හරියනවාද?

ගරු සභාපතිතුමනි, මම උදාහරණයක් කියන්නම්. ඔබතුමාත් කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙක් විධියට මේ ගැන දන්නවා. ටික්ටොක් එකේයි, යූටියුබ් එකේයි, "මේ 76 වසරක ශාපය; ඒ කාලය තුළ තමයි හොරකම් කරලා තිබෙන්නේ, ඒ හොරකම් කරපු නිසා තමයි වතුර බිල වැඩි, විදුලි බිල වැඩි, බඩු මිල වැඩි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උපකරණවල මිල වැඩි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ උපකරණවල මිල වැඩි" ආදී වශයෙන් කියනවා.

සාමාන්‍යයෙන් ගෙදරක ස්වාමිපුරුෂයා තමන්ගේ වැටුප අරගෙන ඇවිත් භාර්යාවට දෙනවා. ඇය තමයි වතුර බිල, විදුලිය බිල, බඩු මිල, tuition fees ඔක්කෝම manage කරන්න ඕනෑ. එතකොට මේගොල්ලන් ඒ කාන්තාව ඉලක්ක කරගෙන තමයි ටික්ටොක් එකේ මේ ඔක්කෝම කිව්වේ. විශේෂයෙන්ම ජනාධිපතිතුමා පළමුවැනි අය වැයෙන්ම කිව්වා, ආහාර, සෞඛ්‍ය, අධ්‍යාපනයට පනවා තිබෙන බදු අඩු කරනවා කියලා. ඒක කරලාත් නැහැ. විදුලි බිල මේ විධියට අඩු කරනවා කිව්වා. වතුර බිල මේ විධියට අඩු කරනවා කිව්වා. එතකොට අර යූටියුබ් බලන, ටික්ටොක් බලන කාන්තාව හිතුවා, - මේගොල්ලන් psychological game එකක් ගැහුවේ. මොකද, මම උදාහරණයකුත් කියන්නම්- "ස්වාමි පුරුෂයාට මම විඳින දුක තේරෙන්නේ නැහැ. අවුරුදු 76ක් හොරකම් කරපු නිසා තමයි මේක වුණේ. ඒ නිසා මම අනුර කුමාර දිසානායකට ඡන්දය දෙනවා. එතකොට මාස තුනක් - පෝය තුනක් - යන කොට වතුර බිල අඩු වෙයි, විදුලි බිල අඩු වෙයි, බඩු මිල අඩු වෙයි, බෙහෙත් මිල අඩු වෙයි" කියලා. එහෙම හිතලා දුන්නා. දැන් මාස පහයි. මේ අය psychological game එකක් ගැහුවේ.

ගරු සභාපතිතුමනි, මම මාධ්‍යයේ ඉන්නකොටත් උදේ කාලයේ ගුවන් විදුලි වැඩසටහනක් අංක එක බවට පත් කරන්න මේ වාගේම වැඩක් කළා. ඒක අංක එක වුණා. සියයට 30ක share එක හම්බ වුණා. ඉතින් ඒ game එක ගහලා මිනිස්සු අන්දවලා තිබෙන්නේ. වතුර බිල අඩු වෙන්නේත් නැහැ, විදුලි බිල අඩු වෙන්නේත් නැහැ, මේගොල්ලන්ට අඩු කරන්න වුවමනාවක් තිබෙන පාටකුත් පෙනෙන්නේ නැහැ.

අනෙක් කාරණය මේකයි. ආණ්ඩුවේ අය විපක්ෂයේ ඉන්නකොට ඉංජිනේරු මාෆියාව ගැන ලොකුවට කථා කළා. පසුගිය පාර්ලිමේන්තුවේදී COPE එකේ සාමාජිකයෙක් විධියට මමත් හිටියා. වර්තමාන ජනාධිපතිතුමාත් ඒ කාලයේ COPE එකේ සාමාජිකයෙක් විධියට හිටියා. විදුලිබල මණ්ඩලය COPE එකට ගෙන්වපු දවසේ එතුමාත් හිටියා. මේ ඉංජිනේරු මාෆියාව ගැන ඒගොල්ලන් කථා කෙරුවා.

ඇඹිලිපිටියේ තිබෙනවා එක්තරා power plant එකක්, ගරු ඇමතිතුමනි. අද check කළාම නම් මට කිව්වා, දැන් ඒ ගණන ගෙවන්නේ නැහැ කියලා. හතරවැනි වතාවටත් agreement එක දීර්ඝ කරන කොට පළමුවැනි වතාවේ payment එක තමයි ගෙවන්නේ. සාමාන්‍යයෙන් private purchasing කරන කොට ඒගොල්ලන්ගේ ආයතනයේ ප්‍රාග්ධන වියදමයි, පිරිවැය වියදමයි දෙක එකතු කරලා තමයි පළමුවැනි agreement එකේදී ගෙවන්නේ. දෙවැනි agreement එකේ ඉඳලා ප්‍රාග්ධන වියදම නැහැ, පිරිවැය සහ ලාභය විතරයි දෙන්නේ. හැබැයි, ඒ සමාගමටම දීලා -මම ඔබතුමාට නොවෙයි, චෝදනා කරන්නේ- දැන් හතරවැනි වතාවටත් මේක දීර්ඝ කරලා තිබෙනවා. 2007 අවුරුද්දේ විතර ඒක දාලා තිබුණේ. මම ඒ ආයතනයේ නම කියන්න කැමැති නැහැ. COPE එකේ ඒ ගැන කථා වුණා. අවුරුදු 16ක් ගිහිල්ලාත් හතරවැනි වතාවට දීර්ඝ කරලාත් ගෙවලා තිබුණා, රුපියල් 103ක් වැනි ඉහළ ගණනක්. ඒ නිසා මේ මාෆියාව නවත්වන්නේ නැතුව මේක කරන්න බැහැ. COPE එකට ආවාම මණ්ඩලයේ සභාපතිගෙන් ප්‍රශ්නයක් ඇහුවාම Board එක දිහා බලනවා. GMගෙන් ප්‍රශ්නයක් ඇහුවාම DGM, AGM, engineersලා දිහා බලනවා. කොහොමද ඒ විධියට ප්‍රශ්න විසඳන්නේ?

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කියපු කථාවක් මම කියන්නම්. ඒක මම කියපු එකක් නොවෙයි. මම දැක්කා, ටීවී වැඩසටහනකදී එතුමා කියනවා, "අද රෑට නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය වැඩ කරන්නේ නැති වෙනවා නම් අනිවාර්යයෙන්ම අපි ඒක දන්නවා" කියලා. එතුමා විපක්ෂයේ ඉන්න කොට එහෙම කිව්වා. එතුමාගේ වචනවලින් කියනවා නම්, "නොරොච්චෝලේ බලාගාරය අද රෑට කැඩෙනවා නම්, අපි ඒක දන්නවා. මෙහෙම වුණොත් cooler එක කැඩෙනවා, රත් වෙනවා, හිර වෙනවා, ඒ බව අපි දන්නවා, මේක මාෆියාවක්" කියලා කිව්වා. එතකොට වදුරා පැන්නාට පස්සේ, නොරොච්චෝලේ බලාගාරය කැඩුණේ ඔබතුමා දැනගෙනද? *[බාධා කිරීමක්]* එතකොට සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාට අනුව අපේ විදුලිබල ඇමතිතුමා දන්නවා, එදා රෑට නොරොච්චෝලේ බලාගාරය වැඩ කරන්නේ නැහැ කියලා. ඔබතුමා දැනගෙන තමයි ක්‍රියාමාර්ග අරගෙන නැත්තේ. මට අනුව නොවෙයි, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාට අනුව. ඔබතුමාත් දැනගෙන ක්‍රියාමාර්ග අරගෙන නැහැ. පසුගිය කාලයේ එහෙම නේ, මුසාවාදය පැතිරෙව්වේ; මිනිස්සු ඇන්දුවේ එහෙම නේ. ඒවා පාරා වළල්ලක් වෙමින් එනවා දැන්. තව ඉස්සරහට ගොඩාක් එයි.

ගරු සභාපතිතුමනි, මට ප්‍රශ්නයක් තිබෙනවා, දැන් මේ විධියට කටයුතු කරන්නේ විදුලිබල මාෆියාවට යට වෙලාද කියලා. මොකද හේතුව? දැන් ඒගොල්ලන් කියන්න හදන්නේ මොකක්ද? විදුලිබල මණ්ඩලයම තමයි -අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා දන්නවා- 2016දී ගෙවල් ලක්ෂ 10කින් මෙගාවොට් 1,000ක් බලාපොරොත්තු වෙනවා කියලා campaign එක පටන් ගත්තේ.

අද මොකක්ද තත්ත්වය? ගල් අඟුරු මාෆියාවටයි, ඩීසල් මාෆියාවටයි සම්පූර්ණයෙන් යට වෙන්නයි හදන්නේ. "මේ වනකොට සූර්ය බල පද්ධතියෙන් වැඩි ප්‍රමාණයක් ලැබෙනවා. ඒ නිසා තමයි මේක මෙහෙම වෙන්නේ" කියලා, මේක discourage කරන්න හදනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද කියා මා දන්නේ නැහැ. මම පසුගිය සතියේ අපේ කොට්කාවත්තේ තිබෙන විහාරස්ථානයකට කිලෝවොට් 20ක සූර්ය පැනලයක් සවි කරන්න කථා කළා. සවි කරන්න බැහැ. දැන් full ලූ. ඒකට විකල්පයක් ඇත්තේම නැද්ද? මම නම් ඉංජිනේරුවරයෙක් නොවෙයි. ඒ නිසා මට තේරෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් solar powerවලින් බැලුවාම ඒකකයක මිල - cost එක- වෙන්නේ රුපියල් 27යි. හැබැයි, ඔබතුමන්ලා ඩීසල්වලින් ගත්තොත් ඒකකයකට රුපියල් 75ට වැඩි වියදමක් යනවා. එහෙම නම් මේ මොකක්ද කරන්න යන්නේ? තවදුරටත් සූර්ය බලශක්තිය

encourage කරනවාද, එහෙම නැත්නම් ඒ ටික නැති කරන්නද හදන්නේ? මම හිතනවා ඔබතුමා ඒ කාරණය පිළිබඳව පැහැදිලි උත්තරයක් දෙයි කියලා. මොකද, කොහොම බැලුවත් විදුලිය නිෂ්පාදනයේදී hydropower හැරුණාම සූර්ය බලශක්තිය තමයි ලාභම. එතකොට අපි ඒ බලශක්තිය encourage කරනවාද, discourage කරනවාද? මේ කාරණය සම්බන්ධව ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා යෝජනාවක් කළා. ඒ යෝජනාව හොඳ නම් එය ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, දැන් අපට ආරංචියි තව කාරණයක්. මම ඒකටත් ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වනවා. දැන් නොවෙයි. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී කියන්න.

ගරු ඇමතිතුමනි, ඇමෙරිකානු ඩොලරය රුපියල් 180ට තිබෙනකොට solar power ඒකකයකට දුන්නා රුපියල් 22ක්. ඩොලරය රුපියල් 350 දක්වා ඉහළ යනකොට solar power ඒකකයකට දුන්නා රුපියල් 37ක්. දැන් එය රුපියල් 27ට අඩු කරලා තිබෙනවා. ඒක කමක් නැහැ. හැබැයි, එය රුපියල් 20 දක්වා අඩු කරන්න Cabinet Paper එකක් ඉදිරිපත් කරන්න යනවා කියලා අපට ආරංචියි. Cabinet Paper එකක් ඉදිරිපත් කරනවා නම් ඉදිරිපත් කරන්න වෙන්නේ ඔබතුමාට නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා එයට Cabinet Paper එකක් ඉදිරිපත් කරනවාද, නැද්ද, ඉදිරිපත් කරනවා නම් ඒ ඇයි, මාෂියාවට යට වෙලාද කියන ප්‍රශ්නවලට අපි ඔබතුමාගෙන් උත්තර බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ අපි දැක්කේ මේ කට්ටියගෙන් බහුතරය ගොඩ ඉඳන් උපදෙස් දෙනවා නේ. මේගොල්ලෝ අවුරුදු හතළිස් ගණනක් හැම එකකටම ගොඩ ඉඳන් උපදෙස් දුන්නා. එතකොට හැම එකකටම මේගොල්ලන්ට උත්තර තිබුණා; විසඳුම් තිබුණා. ඒ වාගේම විවේචන තිබුණා. එදා කිව්වේ, "ඩොලර් බිලියන හතළිස් එක කියන්නේ මොකක්ද, ණයක්ද? සිම්පල් නේ. ගෙවලා දාන්නම්" කිව්වා. දැන් තටමනවා, කෙඳිරි ගානවා, හූල්ලනවා. ගොඩ ඉඳන් උපදෙස් දුන්න අය දැන් මඩට ඇවිල්ලා තිබෙන්නේ. දැන් මඩේ ඉඳන් විසඳුම් ටික දෙන්නකෝ. දැන් මඩේ ඉඳන් විසඳුම් දෙන්න හදන විධිය මම කියන්නම්.

දැන් අර පෙට්‍රල් ෂෙඩ්කාරයෝ ටික ගෙනෙනවා ලු, CID එකට. ඒ, බය කරන්න. මට එක පාරට මතක් වුණේ ඒ කාලයේ උද්ඝෝෂණ කරලා, වැඩ වර්ජන කරලා, ආයෝජකයෝ මේ රටෙන් එළවලා මේ රටේ ආර්ථිකය ඝාතනය කරපු මේ අය දැන් එවැනි උද්ඝෝෂණවලදීම එහෙම කටයුතු කරනවා. අවංකවම කිව්වොත්, එක පැත්තකින් අපට පොඩි කාලකණ්ණි සතුටකුත් තිබෙනවා. වෘත්තීය සමිතිවලින්ම බලයට ඇවිල්ලා වෘත්තීය සමිතිවලටම එහෙම කරන එක ගැන.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම මේ කාරණයත් අහන්න කැමැතියි. මෙතුමන්ලාගේ නායකයකු වන ටිල්වින් සිල්වා මැතිතුමා සාම්පූර් බලාගාරය ගැන ඒ කාලයේ ප්‍රකාශයක් කළා. ඒ ගැන දැන් මොකක්ද කියන්නේ කියලා මම අහන්න කැමැතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. S.M. Marikkar, you have only two more minutes.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
I will finish, Sir.

තව ගොඩක් දේවල් තිබෙනවා. නමුත් වෙලාව නැහැ. අවසාන වශයෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. අර බැනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය මහ බැංකුවට පවරා ගත්තා කිව්ව නේ. එම නිසා ජාතික ජන බලවේගය ආණ්ඩුව ආපු ගමන් තෙල්වලට ගහපු රුපියල් 50ක බද්ද වහාම අඩු කරනවා කිව්වා නේ. කෝ, ඇමතිතුමා ඒක? ජනතාව බලාගෙන ඉන්නවා අඩු කරන කල්. ජනතාව බලාගෙන ඉන්නවා ඒ රුපියල් 50ක බද්ද අඩු කරන කල්. මාස තුනක් ගත වෙලාත් තවම රුපියලක්වත් අඩු කර ගන්න බැරිව ඉන්නවා. ඇයි ඒ? සහල් ප්‍රශ්නය වාගේම තමයි. සහල් අනයනය කරනවා. රුපියල් 65ක ආනයන බද්ද අඩු කරන්නේ නැහැ. තෙල් ආනයනය කරනවා. ජනතාවට පොරොන්දු වෙච්ච විධියට රුපියල් එකසිය ගණනක් වන බද්ද අඩු කරන්න කිසිම වුවමනාවක් නැහැ.

ගරු සභාපතිතුමනි, ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි 69 ඉන්දියාවට ලබා දෙන්න හදද්දී කිව්වා, "මාතෘ භූමියේ දේවල් විකුණනවා. ජාතික ආරක්ෂාවට තර්ජනයක්" කියලා. අවාසනාවකට, ඒ ගැන මේ රටේ ජනතාවට තේරුණේ නැහැ. එදා ඒ තෙල් ටැංකි ඉන්දියාවට දුන්නා නම් තෙල් අපනයනයෙන් රටට ආදායමකුත් එනවා. එල්ටීටීඊකාරයන්ට ඒකට ගහන්නත් බැහැ. හැබැයි, ඔන්න අපි දැක්කා පසුගිය ජනාධිපතිවරණ වේදිකාවේ කියනවා, "මේක ලොකු වැඩියි. මේක කලාපයේ තෙල් අපනයන කේන්ද්‍රස්ථානය කරනවා" කියලා. අපි නම් ඒ ගැන සතුටුයි .

ඊළඟට, ඉන්දියාවේ තෙල් බටේ ගැන ඔබතුමන්ලාගේ ආධ්‍යාත්මික නායකයා වන ටිල්වින් සිල්වා මහත්මයා ඒ දවස්වල ලොකු කථාවක් කළා.

දැන් අන්න තෙල් බටෙත් දානවා ද කොහේද. එහෙම නේද, ගරු ඇමතිතුමා? ඒකට අපේ නම් ප්‍රශ්නයක් නැහැ. මොකද, ලෝකයාගෙන් හුදෙකලා වෙලා ජීවත් වෙන්න කියලා අපි කිව්වේ නැහැ. අපි කිව්වේ ලෝකයා එක්ක විවෘත වෙලා ජීවත් වෙන්න කියලායි; වෙළෙඳාම කියන එක ලෝකයා එක්ක සම්බන්ධ වෙන්න පාලමක් බවට පත් කරන්න කියලායි. ඔබතුමන්ලා තමයි ආර්ථිකය සංවෘත කරනවා කිව්වේ. ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159 දෙනාටම මේ පාර්ලිමේන්තුව ඇතුළේ කරලා තිබෙන දේවලුත් පේන්නේ ඒ විධියට තමයි.

අවසාන වශයෙන් මම තව දෙයක් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, පසුගිය ආණ්ඩුව කාලයේ තෙල් සංස්ථාවේ විශාල දූෂණ, වංචා සිද්ධ වුණා. ගරු ඇමතිතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න මේක. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඩුබායි රාජ්‍යයට ගිහිල්ලා G2G Agreement එකට අනුව ඉන්ධන ගේන්න කටයුතු කරනවා නම් අපි ඒක ගැන සතුටුයි; අපි ඒකට හරිම කැමැතියි. ඒකෙන් හොරකම නතර කරන්න පුළුවන්; දූෂණය නතර කරන්න පුළුවන්. අපි ඒකට සහයෝගය ලබා දෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. S.M. Marikkar, your time is up.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, just give me 30 seconds, please.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පසුගිය ආණ්ඩුව කාලයේ පැවැති තෙල් අර්බුදය වෙලාවේ සමහරු හොරකම් කළා, ගරු ඇමතිතුමා. මම මීට පෙර මේ පාර්ලිමේන්තුවේ නම් ගම් සහිතව ඒ ගැන ප්‍රකාශ කළා. NRR කියලා system එකක් ගෙනාවා, මහ බැංකුව, තෙල් සපයන්නන් සහ තෙල් සංස්ථාව එකතු වෙලා. Order එක අඩු ලංසුවට දෙන කොට සියයට 10ක් ගෙවන්න මහ බැංකුවට ඩොලර් තිබුණේ නැහැ. හැබැයි, මාසයකට පස්සේ ඊට වඩා වැඩි ලංසුවට එන එක්කෙනාට ගෙවන්න ඒ වාගේ 10 ගුණයකින් ඩොලර් ආවා. හරිද? තෙල් සංස්ථාව ගාණට rupees ටික load කරලා දෙනවා. අරහෙන් ඩොලර් එනවා. මාසයකට කලින් තෙල් නැවකට ගෙවන්න ඩොලර් මිලියන 5ක් නැති උදව්ය, මාසයකට පස්සේ ඊට වඩා වැඩි ලංසුකාරයෙකුට ඩොලර් මිලියන 55ක් දෙන්න ඩොලර් තිබෙනවා. මෙන්න මේවා ගැන හොයන්න. මේවා ගැන හෙව්වොත් තමයි ගරු නලින් බණ්ඩාර මැතිතුමා කිව්වා වාගේ ඔබතුමන්ලා වලව්වේ හාමුත් එක්ක එකට ලගින්නේ නැහැ කියන එක පිළිගන්න අපට පුළුවන් වෙන්නේ. එහෙම නැත්නම් ඔබතුමන්ලා වලව්වේ හාමුට පාඩම උගන්වනවා කියලා ඇවිල්ලා වලව්වේ හාමුත් එක්ක ලගිනවා කියලා තමයි අපිට තේරෙන්නේ. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Ms.) Lakmali Hemachandra, please. You have 13 minutes.

[අ.භා.1.42]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Thank you, Hon. Chairman.

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ කථා අහගෙන ඉන්න කොට අපට හිතෙන්නේ, එතුමන්ලා හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඇත්තටම බය වෙච්ච බවකුයි. කාල්මාක්ස් කියා තිබෙනවා, "A specter is haunting Europe- the specter of Communism." කියලා. එහි අදහස, "යුරෝපය අවතාරයකට බිය වී ඇත. ඒ කොමියුනිස්ට්වාදයේ අවතාරයයි" යන්නයි. I think, talking about Mr. Ranil Wickremesinghe in relation to Communism, is an extreme disrespect to Communism. I also feel, Hon. Chairman, that the Opposition is scared of the specter of Mr. Ranil Wickremesinghe. They are haunted by the specter of Mr. Ranil Wickremesinghe, and they believe that we are also scared of him, but we are not. ගරු සභාපතිතුමනි, මෙතුමන්ලා හිතාගෙන ඉන්නවා, මෙතුමන්ලා රනිල් වික්‍රමසිංහගේ අවතාරයට භය වෙලා ඉන්නවා වාගේ අපිත් රනිල් වික්‍රමසිංහගේ අවතාරයට භය වෙලා ඉන්නවා කියලා. ඒක හින්දා මෙතැන උදේ ඉඳන් හවස් වනකල් හාමු ගැන කියෙව්වාම, අපිත් ඒකට භය වෙයි කියලා තමයි මේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා හිතාගෙන ඉන්නේ. ඇත්තටම අපට එහෙම ප්‍රශ්නයක් නැහැ.

අද විවාදයට ගැනෙන බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන වාගේම ශ්‍රී ලංකා විදුලිබල පනත ගැනත් උදය වරුවේදී කථා වුණා. ඒ දිහා බැලුවාම අපට බොහොම පැහැදිලිව ජේනවා, අපි බලශක්තිය සම්බන්ධයෙන්, විදුලි බලය සම්බන්ධයෙන් පසුගිය රජයන්ට වඩා වෙනස් ප්‍රතිපත්තියක් අප අනුගමනය කරන්නේ කොහොමද කියලා. ගරු සභාපතිතුමනි, අපි මේවා පැහැදිලි කරගෙන ඉස්සරහට යන්න ඕනෑ. මොකද, හැමදාම එකම දේ කියන්න ගියාම ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් හැටියට අපට ඇත්තටම මහන්සියි. එතුමන්ලාට නම් මහන්සි නැතිව ඇති, එකම ප්‍රශ්නය හැමදාම අහන නිසා. නමුත්, විපක්ෂයට පැහැදිලි කිරීම් කරද්දී හැමදාම එකම දේ කියන්න වෙලා තිබෙනවා. එකම දේ, එකම ස්ථාවරය ගැන හැමදාම කියන්න වෙලා තිබෙනවා.

ගරු විපක්ෂ නායකතුමා උදේ ඇහුවා, IMF එක සම්බන්ධව. IMF එක අත් හරිනවා ද; IMF එකට භය වෙලා ද වාගේ ප්‍රශ්න ඇහුවා. ඇත්තටම අපි මුලින්ම පැහැදිලි කර ගන්න ඕනෑ, IMF එක සම්බන්ධයෙන් සමඟි ජන බලවේගයේ ස්ථාවරය මොකක්ද කියලා. මොකද, ගරු විපක්ෂ නායකතුමා IMF එක අත් හරින්න කථා කරන කොට, විපක්ෂයේ ගරු හර්ෂ ද සිල්වා මහත්මයා බොහොම ආඩම්බරයෙන් කියනවා, තමා කියලා තමයි IMF එක ලංකාවට ආවේ කියලා. එහෙම නම්, ඉස්සෙල්ලාම තමන්ගේ ප්‍රතිවිරෝධතා -contradictions- විසඳා ගන්න. අපි ඔබතුමන්ලා වාගේ රනිල් වික්‍රමසිංහට භයෙන්වත්, රනිල් වික්‍රමසිංහ ගැන හිතහිතාවත් නිරන්තරයෙන් කාලය ගත කරන්නේ නැහැ. පාර්ලිමේන්තුවේත් නැති මනුස්සයෙකු ගැන කිය කියා කාලය නාස්ති කරන්න එපා කියන එක පළමුවෙන්ම කියන්නට ඕනෑ.

මෙතැනදී කථා කළා, Hayles Fentons සමාගමට ලබා දීපු tender එක සම්බන්ධයෙන්. මන්නාරමේ මෙගාවොට් 50ක සුළං විදුලි බලාගාරය සම්බන්ධයෙන් කථා කළා. ඒ සම්බන්ධයෙන් මේ මහත්තුරු කථා කරන්නේ නැති දෙයක් තිබෙනවා. Hayles Fentons සමාගමට ලැබිච්ච tender එක මේ financial evaluation එක සඳහා -මූල්‍ය ඇගයීම සඳහා- නැවත open වෙන්නේ 2024.08.16වැනි දා.

2024.08.16 කියලා කියන්නේ, අපේ ආණ්ඩුව බලයේ හිටපු කාලයක් නොවෙයි. පැවැති රජය යටතේ තමයි ඒ tender එක open කරලා තිබෙන්නේ. මොකද, Hayles Fentons Ltd. කරපු appeal එකකට අදාළව ඒක නැවත open වෙලා, ඊට පස්සේ ඒක ඉස්සරහට ගිහින් තිබෙන්නේ එවකට රජයේ පැවැති appeal board එකක් යටතේ. ඒක අපි පත් කරපු එකක් නොවෙයි. මේ වෙලාවේ ඒක අපේ ආර්ථිකයට, ආණ්ඩුවට මූල්‍ය වශයෙන් වාසිදායක නම් ඒකට එරෙහිව කටයුතු කරන්න අපට විශේෂ හේතුවක් නැහැ. මම දන්නේ නැහැ, Hayles Fentons Ltd. ආයතනයෙන් ඒ tender එක අරගෙන වෙනත් ආයතනයකට ලබා දෙන්න තරම් සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන්ට තිබෙන වුවමනාව මොකක්ද කියලා.

කෙසේ වෙතත්, අදට නියමිත බලශක්ති අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය පිළිබඳ කාරණය ගත්තොත්, අද උදේ වරුවේ කථා කළා Electricity Act එක ගැන. මම මුලිනුත් කිව්වා වාගේ Electricity Act එක සම්බන්ධව අප කරන ප්‍රතිසංස්කරණ බොහොම පැහැදිලි දර්ශකයක්, පැරණි ආණ්ඩුවලින් අප වෙනස් වන්නේ කොහොමද කියන එකට.

Electricity Act එක සම්බන්ධයෙන් කථා කරද්දී අපි note කර ගන්න ඕනෑ; mark කර ගන්න ඕනෑ, විශේෂයෙන් සමගි ජන බලවේගයේ තිබෙන මේ duplicity එක. ඒ ගොල්ලන්ගේ තිබෙනවා double standard එකක්. එකක් කියනවා, හැබැයි තව එකක් කරනවා. ඒ ගොල්ලන්ට IMF එකට විරුද්ධ වෙන්නත් ඕනෑ, රනිල් වික්‍රමසිංහට විරුද්ධ වෙන්නත් ඕනෑ, හැබැයි Electricity Act එක වෙනස් කරනවාට කැමැති නැහැ; විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන්නත් ඕනෑ. ඒක තමයි ඔවුන්ගේ ස්ථාවරය. පසුගිය රජය යටතේ අලුත් විදුලිබල පනතක් ගෙන ආවා. ඒ විදුලිබල පනත යටතේ විදුලිබල මණ්ඩලය කොටස් 12කට කඩලා පෞද්ගලීකරණය කිරීමේ උත්සාහයක්

තමයි තිබුණේ. ඒ පනත යටතේ විශේෂයෙන්ම සම්ප්‍රේෂණය - transmission- සහ බෙදා හැරීම සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් තිබුණේ නැහැ. එය රජයේ හිමිකාරිත්වය යටතේ දිගටම පවත්වාගෙන යනවාද, රජයේ හිමිකාරිත්වය කොපමණද කියන එක සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් එම පනතේ තිබුණේ නැහැ. ඒ කියන්නේ, ඒ පනතේ ඉඩ කඩ විවෘත කර තිබුණා විදුලිය සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම පෞද්ගලික අංශයට පවරා දීමට.

රජයක් හැටියට අපි මුලින්ම මතක් කරන්නට ඕනෑ, අපේ බලශක්තිය සම්බන්ධ ප්‍රතිපත්තිය පක්ෂයක් හැටියට අප ඉදිරිපත් කළේ ජනාධිපතිවරණයට පෙර බව. ඒ අනුව, ජනාධිපතිවරණයේදී අපේ බලශක්ති ප්‍රතිපත්තියට අනුමැතිය ලැබී තිබෙනවා. මහ මැතිවරණයේදී ඒකට අතිවිශාල ජන වරමක් ලැබිලා තිබෙනවා. එහෙම තිබියදී තමයි විදුලිබල පනත සම්බන්ධයෙන් අප stakeholder consultations හරියට කළේ නැහැ කියා උදේ වරුවේ අදහස් පළ වුණේ. නමුත්, අපි ඇත්තටම stakeholder consultations කරලා තිබෙනවා. Stakeholder consultations කරද්දී අපි ඒක බොරුවට කළා නොවෙයි. ඇත්තටම stakeholdersලා මොනවාද කියන්නේ කියලා දැන ගන්න ඔවුන්ට සවන් දෙනවා වාගේම, ඔවුන්ගේ යෝජනා පිළිගන්න අපට නොහැකියාවක් තිබෙනවා නම්, ඒ නොහැකියාව තිබෙන්නේ ඇයි කියන කාරණයත් අපි ඔවුන්ට බොහොම පැහැදිලිව inform කරලා තිබෙනවා; දැනුවත් කරලා තිබෙනවා. එහෙම කරපු ඒ stakeholder consultation එකට සහභාගි වෙච්ච අය අතර බොහෝ පිරිසක් ඉන්නවා. Institution of Engineers Sri Lanka-IESL, Asian Development Bank, Japan International Cooperation Agency-JICA, World Bank Group, Public Utilities Commission of Sri Lanka, Joint Chambers and Associations including the Ceylon Chamber of Commerce, the National Chamber of Commerce of Sri Lanka, Federation of Renewable Energy Developers and Bio Energy Association of Sri Lanka ආදි වශයෙන් stakeholdersලා අතිවිශාල ප්‍රමාණයක් සමඟ, විදුලිබල පනත සම්බන්ධයෙන් කටයුතු කරන, ඒ සම්බන්ධයෙන් උනන්දු පිරිසක් සමඟ සාකච්ඡා කරලා ඔවුන්ගේ අදහස් අරගෙන තමයි අපේ රජය විදුලිබල පනතේ සංශෝධන සිද්ධ කරන්නේ.

විදුලිබල පනතේ සංශෝධන සිද්ධ කරද්දී අපි මූලික වශයෙන් අවධාරණය කරන කාරණයක් තිබෙනවා. පසුගිය රජය යටතේ බලශක්ති ස්වාධිපත්‍යය රටට නැති වන ආකාරයෙන් බලශක්තිය පෞද්ගලීකරණය කිරීමේ දිශාවට එම පනත සංශෝධනය කළා. අපේ රජය යටතේ අපි බලශක්ති ස්වාධිපත්‍යය නැවත රට තුළ ඇති කරමින්, බලශක්ති පෞද්ගලීකරණය නවත්වන ආකාරයට තමයි ඒ පනත නැවත සංශෝධනය කරන්නේ. එතැනදී අපි විශේෂයෙන්ම කොටස් 5ක් යටතේ අවධානය යොමු කරනවා. විදුලිබල මණ්ඩලය unbundle කරන්න ඕනෑ. ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ පාලනය -control- කියන සියල්ලම විදුලිබල මණ්ඩලයෙන් සිද්ධ වෙනවා. ඒක නිසා විදුලිබල මණ්ඩලයේ යම්කිසි අකාර්යක්ෂමතාවක් තිබෙනවා කියන කාරණය අප හැමෝටම පිළිගන්න පුළුවන් කියලායි මා හිතන්නේ. නමුත්, විසඳුම ඒක පෞද්ගලීකරණය කිරීමයි කියලා අපි හිතන්නේ නැහැ. ඒ නිසා තමයි අපි විදුලිබල මණ්ඩලය restructure කිරීම - විදුලිබල මණ්ඩලයෙන් දැනට කරන කාර්යයන් කොටස් 4කට කඩන්න අපේ රජය යටතේත් කටයුතු කරනවා. ඒ අනුව ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ පාලනය වෙන් කරලා ආයතන 5ක් යටතේ කටයුතු කරනවා. හැබැයි, රජයේ හිමිකාරිත්වය යටතේ තමයි ඒ ආයතන 5 හදන්නේ.

විශේෂයෙන්ම ජනනයේදී පෞද්ගලික අංශය ඒකට සම්බන්ධ වෙනවා. දැනටත් සම්බන්ධ වෙනවා. ඒ සම්බන්ධ වීමේ හැකියාව ඉදිරියටත් තිබෙනවා. හැබැයි, රජය සතු බලාගාර හෝ විදුලිබල මණ්ඩලය පෞද්ලීකරණය කිරීමට රජය සූදානම් නැහැ. සම්ප්‍රේෂණය කිරීමේදී සම්පූර්ණයෙන් රජය සතු, සියයට සියයක් රජයට අයිති ආකාරයට තමයි සම්ප්‍රේෂණය කිරීමේ ආයතන සකස් කරන්නේ. හැබැයි, රජයේ උපාය මාර්ගික සැලැස්මට අනුකූලව private sector එකට ඕනෑ නම් Public-Private Partnershipsවලට, එහෙම නැත්නම් privately-owned investmentsවලට යන්න පුළුවන්. හැබැයි, රටේ බලශක්ති ආධිපත්‍යය, බලශක්තිය සම්බන්ධයෙන් රජයේ control එක තිබීම අතිශයින් වැදගත්. ඒක ආරක්ෂා වෙන විධියට තමයි අපි උපාය මාර්ගික ලෙස මේ කටයුත්ත සිද්ධ කරන්නට සූදානම් වෙන්නේ, ගරු සභාපතිතුමනි.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ contradiction එක අනුව ඒ ගොල්ලන් ඇත්තටම රනිල් වික්‍රමසිංහගේ ප්‍රතිපත්තිය වෙනස් කරනවාට - මාරු කරනවාට - විරුද්ධයි. ඒකට විරුද්ධයි. ඒකට බයේ තමයි උදේ ඉඳන් හවස් වෙනකම් කථා කරන්නේ. හැබැයි, ඒක කියන්නේ නැහැ. ඒකට එකඟත්වය පළ කරන්නෙත් නැහැ, ඒක කරන්න දෙන්නෙත් නැහැ. ඒකට විරුද්ධයි. ඒක කියන ගමන් ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නය අපේ ප්‍රශ්නය කරන්නට උත්සාහ කරනවා. ඒක අපි බොහොම පැහැදිලිව තේරුම් ගන්නට ඕනෑ.

අපි විදුලිබල පනත සංශෝධනය කරනවා. රාජ්‍ය හිමිකාරිත්වය ආරක්ෂා වන ආකාරයට සංශෝධනය කරනවා. ඒ වාගේම විදුලිබල මණ්ඩලයේ දැන් තිබෙන burden එක unburden කරලා, unbundle කරලා කාර්යක්ෂමතාව ඉහළ යන ආකාරයට විදුලිබල පනත සංශෝධනය කරනවා. Stakeholder consultations ඇතිව තමයි රජය මේ වෙනකොටත් ඒක කරගෙන යන්නේ කියන කාරණය පළමු වශයෙන්ම අවධාරණය කරගන්නට ඕනෑ.

අනෙක් කාරණය තමයි තෙල් මිල. ඒ සම්බන්ධයෙන් මේ මහත්වරු ආයේත් කථා කරනවා. මම හිතන විධියට මේ මහත්වරුන්ට තිබෙන ප්‍රශ්නය තමයි මේ ගොල්ලන්ට ඔක්කොම ඕනෑ වීම. Petrol shedsවල ලාභය ආරක්ෂා කරන්නත් ඕනෑ, තෙල් මිල අඩු කරන්නත් ඕනෑ. දැන් හාල් මිල සම්බන්ධයෙනුත් එහෙම නේ. ඒ ගොල්ලන්ට මහ impossible වැඩ තිබෙන්නේ. මෙතැනම petrol shed හිමිකරුවන්ගේ ලාභය වෙනුවෙන් කථා කරනවා. Petrol shed හිමිකරුවන් ලාභ ලබනවාට අපි කවුරුවත් අකමැති නැහැ. නමුත් අනීතික ලෙස ලාභයක් ලබනවා නම්, රජයක් හැටියට අපි ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ. මොකද, අපි ඉන්නේ ජනතාවගේ පැත්තේ. අපි ජනතාවගේ පැත්තේ ඉන්නේ. ඒ නිසා ජනතාවගේ බලශක්ති අවශ්‍යතා තමයි අපට වැදගත් වෙන්නේ. ඒ වෙනුවෙන් තමයි සමාගම් හැදිලා තිබෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි සමාගම් කටයුතු කරන්න ඕනෑ. Petrol shed හිමිකරුවන්ගේ ලාභය අනීතිකව ලබා ගන්නේ. ඒ ගොල්ලන්ම කියන ආකාරයට COPE එකෙනුත් තීරණය කරලා තිබෙන, අධිකරණයෙනුත් අනීතිකයි, ආචාර ධාර්මික නැහැ, සදාචාරාත්මක නැහැ කියලා තීරණය කරලා තිබෙන ලාභයක් ලබා ගැනීම වෙනුවෙන් උදේ වරුවේ සිට මේ වෙනකම් සහ මේ දවස් කිහිපය ඇතුළත විපක්ෂයේ මන්ත්‍රීවරු කී දෙනෙක් කථා කළාද?

මහජනතාව මේක අහගෙන ඉන්නවා නම්, ඔවුන් මේක හොඳින් තේරුම් ගන්නට ඕනෑ. විපක්ෂය ජනතාව වෙනුවෙන් පෙනී සිටිනවා කිව්වාට, ජනතාව වෙනුවෙන් ඇත්තටම පෙනී සිටින්නේ ආණ්ඩුව. මෙතැන වෙන කවුරුවත් ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. ජනතාව වෙනුවෙන් ආණ්ඩුව පෙනී සිටිනකොට, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු කවුරු වෙනුවෙන්ද මෙතැන පෙනී සිටින්නේ කියන කාරණය අපටත් හොඳට

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

පෙනෙනවා. මම හිතන විධියට මහජනතාවටත් ඒක හොඳටම පේනවා. ඒක හොඳටම පෙනෙන බව දැනගෙන කටයුතු කරන්නට ඕනෑ.

අනෙක් කාරණය මේකයි. මෙතැනදී කථා කරන ආවේගය සහ කථා කරන විධිය දැක්කාම අපි ඇත්තටම සොයලා බලන්නට අවශ්‍යයි ගරු ඇමතිතුමනි, කාටද මේ petrol sheds ඇත්තටම අයිති කියන කාරණය. මොකද, මෙතැන ජනතාවගේ බලශක්ති අවශ්‍යතාව සම්බන්ධයෙන්, තෙල් සම්බන්ධයෙන් කිසිම කථාවක් සිද්ධ වෙන්නේ නැහැ. ඒකට රජයේ මැදිහත්වීම අවතක්සේරු කිරීමක් තමයි ඇත්තටම සිද්ධ කරන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Ms.) Lakmali Hemachandra, you have two more minutes.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Thank you, Sir.

ඒ නිසා අපි තේරුම් ගන්නට අවශ්‍යයි, විපක්ෂය මේ සිද්ධ කරන කාර්ය. ඇත්තටම දැන් CID එක පරීක්ෂණයක් ආරම්භ කරනවා කියලා තිබෙනවා. මමත් ඒක newsවල දැක්කා, දැන් check කරද්දී. අපි මතක් කරගන්නට ඕනෑ, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු අර්බුද ඇති කරන්න කොච්චර උත්සාහ කළාද කියලා. Petrol shed හිමියන් වෙනුවෙන් පෙනී සිටිමින් උදේ ඉඳන් සවස් වෙනකම් දවස් කිහිපයක් තිස්සේ උත්සාහ කරලා, තවමත් උත්සාහ කරනවා ඒ ප්‍රශ්නය තවත් වැඩි කරන්න. රටේ නැති අර්බුදයක් හදන්නට, තෙල් පෝලිම් හදන්නට උත්සාහ කරනවා. ඒ ගොල්ලන් හිතාගෙන ඉන්නවා, තෙල් පෝලිමක් තිබුණාම මිනිස්සු ඇවිත් ඒ ගොල්ලන්ට ආණ්ඩුව අරගෙන දෙයි කියලා. එහෙම නම් සිද්ධ වෙන්නේ නැහැ. නමුත් රටේ අර්බුද හදන්නට, ජන ජීවිතය කඩා කප්පල් කරන්නට, මිනිසුන් අපහසුතාවට පත් කරන්න තමයි බොහොම උනන්දුවෙන් මේ කෑගහන්නේ. ඒක අපි මතක් කරගන්නට ඕනෑ. මේ මිනිස්සු ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. අපට පාර්ලිමේන්තුවේ කාරක සභාවල අවස්ථාව ලැබෙන්නේ නැහැ; උදේ කථා කරන්න ලැබෙන්නේ නැහැ කියන්නේ ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නටයි. නමුත් ජනතාවගේ ඡන්දය අරගෙන ඇවිත් මෙතැන කවුරු වෙනුවෙන් ද පෙනී සිටින්නේ කියන එක අපට බොහොම පැහැදිලියි.

ගරු සභාපතිතුමනි, අපි නැවතත් අද දින සාකච්ඡා කරන subject එකට එමු. බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරද්දී විශේෂයෙන්ම සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. බලශක්ති අමාත්‍යාංශය මේ වෙනකොට "Women in Energy" සම්බන්ධව, ඒ කියන්නේ බලශක්ති ක්ෂේත්‍රය තුළට කාන්තාවන්ගේ දායකත්වය ලබා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් ඉන්නවා. ඒ සඳහා කාන්තාවන් දායක කර ගන්නේ කොහොමද කියලා මේ වනවිට අමාත්‍යාංශ මට්ටමින් "Women in Energy" policy එකක්; ප්‍රතිපත්තියක් සකස් කරමින් පවතිනවා.

කාන්තාවන් හැටියට අපි හැම තිස්සේම උනන්දුයි, දැන ගන්නට කැමැතියි, රජයේ අය වැය සකස් වෙද්දී ඒ තුළ කාන්තාවන් වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් වෙන්නේ කොහොමද, ප්‍රතිපත්ති සකස් කිරීමේදී කාන්තාවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් වෙන්නේ කොහොමද කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Ms.) Lakmali Hemachandra, your time is up.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Sir, I will wind up in 30 seconds.

"Women in Energy" කියන policy එක යටතේ අපේ රටේ බලශක්ති කළමනාකරුවන් -energy managersලා- හැටියට අතිශයින්ම සම්බන්ධ වෙන්නේ ගෙවල්වල ඉන්නා අපේ අම්මලා, බිරින්දෑවරු, දුවරු. ඒ අය තමයි ඇත්තටම බලශක්තිය manage කරන්නේ. අපේ රටේ factoriesවල වැඩ කරන්නේ බහුතරයක් කාන්තාවන්. බලශක්ති සංරක්ෂණයට -energy conservation සඳහා- කාන්තාවන් සම්බන්ධ කර ගන්නේ කොහොමද කියලා වෙන කවුරුවත් නොකරපු විධියේ ප්‍රතිපත්තියක් "Women in Energy" හැටියට ක්‍රියාත්මක කිරීමට බලශක්ති අමාත්‍යාංශය කටයුතු සූදානම් කරමින් සිටිනවා. මේවා අගය කළ යුතු ප්‍රතිපත්ති. අවාසනාවකට අපේ රටේ විපක්ෂය තුළ කවුරුවත් නැහැ, මේවා අගය කරන්න. එතුමන්ලා හැම තිස්සේම සූදානමින් ඉන්නේ කඩාකප්පල්කාරී කටයුතු කරන්න තමයි. ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. ගරු සභාපතිතුමනි.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 19 minutes.

[අ.භා. 1.56]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you, Sir.

පළමුවෙන් මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමියට මතක් කර දිය යුතු කාරණයක් තිබෙනවා. මන්ත්‍රීතුමියනි, ඔබතුමිය විපක්ෂයේ අපි ඉන්න පැත්තේ පිටුපස පේළියක වාඩි වෙලා සිටියාට, ඔබතුමිය විපක්ෂයේ කෙනෙක් නොවෙයි, ඔබතුමිය ආණ්ඩු පක්ෂයේ කෙනෙක්. විපක්ෂය පැත්තේ වාඩි වෙලා ඉන්න නිසා සමහර වෙලාවට ඔබතුමියට හිතෙනවාද දන්නේ නැහැ, ඔබතුමිය විපක්ෂයේ ඉන්නේ කියලා. මතක තබා ගන්න, ඔබතුමිය ආණ්ඩු පක්ෂයේ කෙනෙක්. ඔබතුමිය කළ කථාව මම අහගෙන හිටියා. මට හිතෙන විධියට ඒ කථාව පහේ පන්තියේ දරුවන්ට නම් ගැළපෙන කථාවක්.

අද අපි විවාද කරන්නේ බලශක්ති අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය ගැන. මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාත් සභාවේ ඉන්න එක හොඳයි. ගරු ඇමතිතුමනි, "The Sunday Morning" පත්තරයේ ඔබතුමාගේ message එකක් තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"Drought to drive up electricity prices? ; Minister hints at possible tariff hike; Next tariff hike expected by 1st June"

දැනට පවතින දේශගුණික තත්ත්වයත් එක්ක මේ අවුරුද්දේ මැද භාගය වෙනකොට විදුලි බලය සපයන්න අමාරු වෙන තත්ත්වයක් ඇති වෙන්න පුළුවන් කියලා ඇමතිතුමා කියා තිබෙනවා. මම දන්නේ නැහැ, "The Sunday Morning" පත්තරයේ තමයි ඒ පුවත තිබෙන්නේ. ඒ වාගේම එහි මේ විධියටත් සඳහන් කර තිබෙනවා:

> "...impact of ongoing dry weather on power generation, CEB Spokesman Eng. Dhammike Wimalaratne..."

Sorry, ඇමතිතුමා නොවෙයි, Engineer Dhammike Wimalaratne තමයි එහෙම කියලා තිබෙන්නේ. ඒ කියන්නේ ආපසු emergency power purchasing agreement එකකට යන්න සූදානමක් තිබෙනවාද දන්නේත් නැහැ.

මීට පෙර හිටපු ගරු කංචන විජේසේකර ඇමතිතුමා ගැනත් මේ අවස්ථාවේ කියන්න ඕනෑ. ඇත්තටම එතුමා නියෝජනය කරන දේශපාලන මතයයි, ඒ කණ්ඩායමයි, අපි නියෝජනය කරන කණ්ඩායමයි වෙනස්. හැබැයි, එතුමා කළ කාර්යභාරය ඇත්තටම අපි අගය කරන්න ඕනෑ. මොකද, පසුගිය රජය සමයේ එතුමා විශාල කාර්යභාරයක් කළා. හැබැයි, එතුමා ඒ කළ කාර්යභාරයත් මේ වෙනකොට කඩාකප්පල් වෙන තත්ත්වයට මේ ආණ්ඩුව කටයුතු කරගෙන යනවා කියන එක මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමියට මම ප්‍රකාශ කරන්න කැමැතියි. මම එහෙම කියන්න ප්‍රධාන හේතුව මේකයි.

අපි ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන්ම - CPC එකෙන්ම - පටන් ගනිමු. මා ළඟ "EconomyNext" කියන වෙබ් අඩවියේ පළ වුණු article එකක් තිබෙනවා. "EconomyNext" stated on Wednesday, 06th November, 2024, I quote:

> "We are compelled to go with the price formula due to previous agreements,"

ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් තිබෙනවා; විධායක ජනාධිපති කෙනෙක් ඉන්නවා. ඒ නිසා පසුගිය ආණ්ඩුවෙන් ඇති කරගත් agreements maintain කරන්න ඕනෑ කියලා කිසිම තැනක නැහැ. ඔබතුමන්ලා ජනතාවාදී නම්, ඔබතුමන්ලා ජනතාව වෙනුවෙන් නම් පෙනී සිටින්නේ, ඒවා කඩලා අලුත් agreementsවලට යන්න පුළුවන්. හැබැයි, එහෙම කරන්නේත් නැහැ. මොකද, මැතිවරණ වේදිකාවල ඔබතුමන්ලා කිව්වේ බොරු. දුන්නේ භාගයට භාගයක් බොරු පොරොන්දු. ඒ බොරු පොරොන්දු එකක්වත් ඉෂ්ට කරන්න බැරි නිසා දැන් කියනවා, පසුගිය රජය ඇති කරගත් agreementsවලටම අපි යනවා කියලා. මේ article එකේ තවදුරටත් මෙසේ කියා තිබෙනවා, I quote:

> "President Anura Dissanayake and his Marxist Janatha Vimukthi Peramuna (JVP) members before the September 21 election, accusing the previous government, said people have been paying higher price for fuel because of exorbitant taxes and some commissions for politicians."

සැප්තැම්බර් 21වන දාට පෙර ජනාධිපතිතුමාගේ පක්ෂයෙන් එවකට පැවති රජයට චෝදනා කර තිබෙනවා, තෙල් මිල අඩු කරන්න පුළුවන් වෙලාවේත් වැඩි මුදලකට තෙල් විකුණනවා කියලා, බදු වැඩිපුර ගහන්න ඕනෑ නිසාත්, දේශපාලනඥයන්ට කොමිස් එන නිසාත් කියලා. ගරු සභාපතිතුමනි, මා ළඟ තිබෙනවා, ජනවාරි මාසයට අදාළ fuel price formula එක.

Petrol price formula එක, Singapore Platts price with taxes අනුව ජනවාරි මාසයේ පෙට්‍රල් මිල රුපියල් 298.85යි. හැබැයි ජනවාරි මාසයේ විකුණලා තිබෙන්නේ, රුපියල් 309ට. රුපියල් 10ක් වැඩියෙන් විකුණලා. ඒ කියන්නේ price formula එකේ එන ප්‍රමාණයටත් වඩා රුපියල් 10ක් වැඩියෙන් විකුණලා තිබෙනවා. ඩීසල් ගත්තාමත් එහෙමයි. රුපියල් 15ක් වැඩියි. රුපියල් 270ට දෙන්න පුළුවන්කම තිබෙද්දී රුපියල් 286ට විකුණලා තිබෙනවා. මේ, price formula එකටත් වඩා වැඩියෙන් දෙන්නේ. එතකොට මේකෙදි හොරකම් කරන්නේ කවුද? ඇමතිතුමාද? මීට පෙර කථා කළ ඇමති කෙනෙක් කිව්වා, "NPP පක්ෂයේ කට්ටිය, NPP පක්ෂයේ කට්ටියව බලා ගන්නවා; පෝස්ටර් ගහන මල්ලිලා, බයිසිකල් එකේ යන කොල්ලෝ ටික බලාගන්නවා; මට ලෙඩක් හැදුණොත් මගේ පක්ෂයෙන් බලාගන්නවා, ඒකයි අපි පඩිය පක්ෂයට දෙන්නේ" කියලා. මෙතැන සිටින නීතිය පිළිබඳ ඇමතිතුමා එහෙම කිව්වා. මට නම් තේරෙන්නේ නැහැ මොකක්ද ඒකේ තිබෙන දියුණු සංස්කෘතිය කියලා. ලෙඩක් හැදුණොත් insurance policy එකක් දාගන්න, බෙහෙත් ගන්න, එහෙම නැත්නම් savings හදාගෙන මාසෙ පඩියෙන් කීයක් හරි දාලා තියාගන්න. පක්ෂෙන් ඇවිල්ලා බෙහෙත් අරගෙන දෙනකල් බලාගෙන ඉන්න එපා. මේ දියුණු සංස්කෘතිය වර්ධනය කරන්නද දන්නේ නැහැ දැනට පෙට්‍රල් මිල අඩු කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙද්දීත්; ඩීසල් මිල අඩු කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙද්දීත්, වැඩි මිලට විකුණන්නේ. ඔය ගොල්ලන්ගේ දියුණු සංස්කෘතිය හරහා ඇමතිවරුන්ට හොරකම් කරන්නද, නැත්නම් පක්ෂය පෝෂණය කරන්නද එහෙම කරන්නේ? පැහැදිලිවම බොරු කියලායි බලයට ආවේ. පැහැදිලිවම බොරුව තිබෙන්නේ. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමියට මම මේ කියන්නේ. විපක්ෂයෙන් ප්‍රශ්න අහන්න හේතුව මෙන්න මේකයි. අපි අහන ප්‍රශ්නවලට උත්තර නැහැ. අහනවා, අහනවා, මට නම් දැන් තිත්ත වෙලායි තිබෙන්නේ.

මම තව ප්‍රශ්නයක් අහන්නම්. කැබිනට් අමාත්‍යවරයා කියලා තිබෙනවා, අනාගතයේදී පෙට්‍රල් මිල අඩු කරන්න පුළුවන් කියලා. හැබැයි, මේ පත්තරේ සඳහන් වෙන විධියට ධම්මික කියන engineer කියා තිබෙනවා, මිල වැඩි කරන්න වෙයි කියලා. එතකොට ඒ කාරණා පරස්පර විරෝධියි නේ. IMF Agreement එක අනුව revenue target ඒක GDP එකෙන් සියයට 15.1ක්.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ඔව්, ගරු ඇමතිතුමා. ගරු සභාපතිතුමනි, බලශක්ති ඇමතිතුමාට වෙලාව දෙන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Kumara Jayakody

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු මන්ත්‍රීතුමනි, කැබිනට් මණ්ඩලයේ මාධ්‍ය ප්‍රකාශක කරපු කථාවයි, Ceylon Petroleum Corporation එකයි ඔබතුමා පටලවා ගන්න එපා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම කිව්වේ, එතුමා ඇවිල්ලා කියා තිබෙනවා,-

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
විදුලි බිල ගැන නේ කියලා තිබෙන්නේ.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
සමාවෙන්න.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
එතුමා විදුලි බිල ගැන වෙන්න ඇති quote කරන්න ඇත්තේ.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
එහෙම නම් පෙට්‍රල් ගැනත් කියන්නකෝ. පෙට්‍රල් ගැන කියන්න. ඇයි ගණන වැඩි කළේ? රුපියල් 298ට විකුණන්න පුළුවන් පෙට්‍රල් ලීටරය ඇයි රුපියල් 309ට වික්කේ? *[බාධා කිරීමක්]*

එතුමා ගැන නොවෙයි, ඇමතිතුමා මෙතැන ඉන්නවා නේ.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඒ calculation එක සභාගත කරන්න. එතකොට මම ඒකට උත්තර දෙන්නම්. රුපියල් 290 කියලා තිබෙන calculation එක සභාගත කරන්න. එතකොට මට උත්තර දෙන්න පුළුවන්.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමා ඒක දැකලා නැද්ද?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
පත්තරවලට බැහැ නේ, ඒ calculation එක කරන්න.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමා දැකලා නැහැ. මේ, මගේ calculation එකක් නොවෙයි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඒක තමයි. අපෙත් නොවෙයි.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමන්ලාගේ නොවෙයි නේ. හරි, හරි.

දැන් අර මන්ත්‍රීතුමියට පැහැදිලි ඇති, ඇයි අපි නැවත නැවත මේ ප්‍රශ්න අහන්නේ කියලා. ගරු ඇමතිතුමා දැන් කිව්වා, "ඒ calculation එක සභාගත කරන්න, මම පිළිතුරු දෙන්නම්" කියලා. මේවා සභාගත කරලා කොයි කාලෙද පිළිතුරු දෙන්නේ? සියයට 15.1ක් revenue target එක තිබෙන්න ඕනෑ කියලා IMF Agreement එකේ තිබෙනකොට, මිල අඩු කරන්නේ කොහොමද? මිල අඩු කරන්න පුළුවන්ද? කරන්න බැහැ. මේ, තනිකර බොරු. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, මේ රජය බොරු කියලා බලයට පැමිණීම. එහෙම නැතුව වෙන ප්‍රශ්නයක් නැහැ.

ගරු කංචන විජේසේකර ඇමතිතුමා ගැන මම මීට පෙර අවස්ථාවේ කිව්වාට, අපටයි ඇමතිතුමාටයි එහෙම හිතවත්කමක්වත් නැහැ. ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. පන්සල්වලට solar panels සවි කිරීමේදී අපිත් ලැයිස්තුවක් දුන්නා. ඒකවත් දැම්මේ නැහැ. හැබැයි, එතුමා යම් ක්‍රමවේදයකට වැඩ කරගෙන ගියා. ඒ නිසා තමයි මේ අවස්ථාවේ අපි මේවා කියන්නේ.

දැන් පෙට්‍රල් ගැන ඇහුව නිසා, ඔබතුමා පසුව කියන්නම් කිව්ව නිසා අපි energy sector එක ගැන කථා කරමු. CEB එක ගැන කථා කළොත්, මම හිතන විධියට 2030 වෙනකොට සියයට 70ක් renewable energyවලට යන්න පුළුවන් work plan එකක් පසුගිය රජය යටතේ හදා ගෙන ගියා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ රජය බලයට පැමිණීමත් සමඟ මේ wind projects සියල්ලම තාවකාලිකව suspend කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒක හරිද වැරදිද කියලා. Wind projects සියල්ලම තාවකාලිකව suspend කරලා තිබෙනවා. ඒ අතර අදානි සමාගමේ project එකත් එකක්. 2030 වෙනකොට addition, - 2024 wind power වලින් 100යි, solar powerවලින් 483යි. 2025 wind power වලින් 100යි, solar powerවලින් 505යි. මා ළඟ ඒ තොරතුරුවලට අදාළ graph එකක් තිබෙනවා. Renewable energy හරහා ලංකාවේ තිබෙන energy sector එකේ නිපදවන energy ප්‍රමාණය වැඩි කරන්න ක්‍රියාමාර්ගයක් ගත්තා. අදානි සමාගමේ project එක නවත්වනවා කිව්වා. අදානි සමාගමේ project එක පැත්තකින් තියන්නකෝ. අදානි සමාගමේ project එක ගත්තාම, ඒකේ environmentalistsලා නඩු දැම්මා. Environmental concerns අපටත් තිබෙනවා. මොකද මන්නාරමේ ජනතාවත් ඒ අවස්ථාවේ යම් යම් තැන්වලට ඒ wind turbines මාරු කරන්න කියලා කිව්වා. අදානි සමාගමේ ටෙන්ඩර් එක cancel කරනවා කියලා මැතිවරණවලදී දුන් පොරොන්දු නිසා අද රටට සිදු වෙලා තිබෙන පාඩුව බලන්න ඕනෑ. අදානි කියන නම අයින් කරලා බලන්න.

ලංකාවට ආපු US Dollars 1 billion investment එකක්. අදානි සමාගමේ එක විතරක් නොවෙයි, මේ වෙනකොට ලංකාව ඇතුළේ private wind projects suspend කරලා තිබෙනවා. ඒ suspend කරපු හැමෝටම ලංකාව තුළින් ඇමෙරිකානු ඩොලර් සොයා ගන්න බැහැ. පිටරටකින් ඒ ඩොලර් ගෙනෙන්න ඕනෑ. ලංකාව තුළ ඉඩම් ඒ අය සොයා ගන්න ඕනෑ. ඒ වාගේම EIA එකේ ඉඳලා ඔක්කොම ඒ private අය සොයා ගන්න ඕනෑ. මෙවන් අවස්ථාවක අපි නිකම් ගණනය කරලා බැලුවොත්, තෙල්වලින් විදුලිය නිපදවීමේදී units 4ක් නිපදවන්න තෙල් ලීටරයක් අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒක පිළිගන්නවාද කියලා මම දන්නේ නැහැ. Units 4ක් නිපදවන්න ලීටරයක් අවශ්‍යයි. හැබැයි, ඒ වාගේම තමයි, ඒ ගණන අනුව බැලුවොත් solar power මෙගාවොට් එකකින් grid එකට units 4,000ක් දවසකට දෙන්න පුළුවන්.

ඒ මෙගාවොට් 100ක එක project එකක් approve කරලා තිබුණා නම්, ගෙවල් - households - ලක්ෂ දෙකකට power supply ගන්න තිබුණා. දැන් මේ යන වියදම එක්ක බැලුවාම

එහෙමයි. මම ලංකා ඛනිජ තෙල් සංස්ථාව භාරව හිටපු ඇමතිවරයාත් නොවෙයි, ලංකා ඛනිජ තෙල් සංස්ථාව භාරව දැනට සිටින ඇමතිවරයාත් නොවෙයි. ඒක නිසා අපි සංඛ්‍යාලේඛන ලියාගෙන ඇවිල්ලා තිබෙන්නේ. On average, one litre of diesel provides 4 units of power through thermal sources and one solar power plant, on average, produces approximately 1.5 million units of power per annum or one megawatt of solar power produces 4,000 units per day. මේ දෙකට යන වියදම බැලුවාම, මොන පදනමක් යටතේද මේවා suspend කළේ කියලා මට නම් හිතා ගන්න බැහැ. පසු ගිය කාලයේ මේ වාගේ agreement එකක් ආණ්ඩුවක් cancel කරනවා නම්, ඉතා පැහැදිලිවම නැවත වරක් කොමිස් පිළිබඳව renegotiate කර ගන්න තමයි එහෙම කරන්නේ. එතකොට ඩොලර් ශත 8කට unit එකක් දෙන්න agree වෙලා තිබියදී එහෙම කළේ ඇයි? මේ agreements ඔක්කොම හදා ගත්තේ CEB එකෙන්. CEB එකේ නිලධාරින් එක්ක ඉඳලා තමයි මේ agreementsවලට ආවේ. අදානි සමාගම ඉවත් වුණා කියන්නේ, US Dollars 1 billion investment එකක් ඉවත් වෙලා තිබෙනවා. ඉතා පැහැදිලිවම, there is a question of transparency. We have those same concerns as well. We raised those concerns about the tender process and about that tender process being followed. But, if you had any doubts or any concerns about the accountability process, those could have been resolved differently. But, because of the promises that you gave on election platforms, you all have suspended these projects without any alternative being provided. මේ නිසා 2030 වර්ෂය වෙනකොට අපේ රටට අවශ්‍ය energy supply එක සොයා ගන්න, renewable energy හරහා එන්න තිබුණු, මම ඉස්සෙල්ලා 2024දී මෙච්චරයි, 2026දී මෙච්චරයි කියපු ප්‍රමාණය ඔබතුමන්ලා වෙන කිසිම ක්‍රමයක් නැතුව අත්හිටෙව්වා. 2024දී wind powerවලින් මෙගාවොට 100යි, solar powerවලින් මෙගාවොට 483යි, 2025 wind powerවලින් මෙගාවොට 100යි, solar powerවලින් මෙගාවොට 505යි. දැන් මේ additions එකක්වත් එන්නේ නැහැ.

එතකොට අනිවාර්යයෙන්ම මේ purchase කරන්න වෙන්නේ මොනවාද? අපිට thermal powerවලට තමයි යන්න වෙන්නේ. අපිට මේ energies නැත්නම්, - drought එකක් තිබෙනවා නම් hydropowerවලින් නැතිව thermal powerවලින් තමයි යන්න වෙන්නේ. නැත්නම් කරන්ට් කපන්න වෙනවා. ඒ දෙකෙන් එකක් කරන්න වෙනවා. එතකොට thermal powerවලින් යනකොට පසුගිය කාලයේ මතු කරපු ප්‍රශ්නය තමයි, ඒවායේ විශාල වංචා හා දූෂණ සිදු වෙනවා කියන එක. එතකොට මම අහන්න කැමැතියි, දැනටත් ඒ වංචා හා දූෂණ එහෙමම සිදු වෙනවාද කියලා. මොකද, මේවා අහන්න අපිට පැහැදිලි සැකයක් ඇති වෙන්න හේතු තිබෙනවා. මම පෞද්ගලිකව කාටවත් මඩ ගහන්න කැමැති නැහැ. ඒක නිසා මම නම සඳහන් කරන්නේ නැහැ. මොකද, පොහොර සංස්ථාවේ වැඩ කරද්දී මූල්‍ය වංචා, දූෂණ කිරීම පිළිබඳව interdict වෙච්ච පුද්ගලයෙක් මේ ඉස්සරහා පේළියේ කැබිනට් ඇමතිවරයෙක් ලෙස වාඩි වෙලා ඉන්නවා. ඒ, පොහොර සංස්ථාවේ වැඩ කරනකොට. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා Minister of Agriculture, Livestock, Lands and Irrigation විධියට සිටියදී එතුමාව ගෙනාවේ. ඊට පස්සේ පොහොර සංස්ථාවේ ඉඳලා මූල්‍ය වංචා, දූෂණ,-

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කවුද ඒ?

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඉදිරි පෙළ වාඩි වෙලා ඉන්නවා. *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නම කියන්න.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හරි නැහැ නේ. මම එහෙම පෞද්ගලිකව මඩ ගහන්න කැමැති නැහැ. මොකද, එතකොට ගරු සභාපතිතුමා කියයි, "Do not resort to personal attacks" කියලා. හැබැයි, ඕනෑ නම් ගරු සභාපතිතුමාට නහයෙන් පෙන්වන්නම්. නම කියන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* ඉන්නවා, ඉන්නවා. ඒ විධියට මූල්‍ය වංචා කරපු කට්ටිය දැන් මේ ගරු සභාව ඇතුළේ වැදගත් තනතුරුවල සිටිද්දී, අපිට පැහැදිලි සැකයක් ඇති වෙන එක ඉතා සාධාරණයි. අපිට ඉතා පැහැදිලිව සැකයක් ඇති වෙනවා. මොකද, මේ wind powerවලින් එන්න තිබෙන additions නවත්වනවා, drought එකක් එනවා කියලා කියනවා. එතකොට අනිවාර්යයෙන්ම emergency power purchase agreement එකකට ගිහිල්ලා කාට හරි හොඳ කුට්ටියක් සොයා ගන්න පුළුවන්. මහජන ආරක්ෂක ඇමතිතුමාත් කිව්වා, ඒගොල්ලන්ගේ දේශපාලන සංස්කෘතිය පක්ෂය පෝෂණය කිරීම කියලා.

ඉතින් පක්ෂයේ මැතිවරණ ව්‍යාපාරය පෝෂණය කරන්න ජනතා සල්ලි හොරකම් කිරීමේ ප්‍රවේශයක් මේ ආණ්ඩුවත් ගන්නවා කියන නිගමනයකට අපට එන්න පුළුවන්. ඒක වැරදි නැහැ. මොකද, ඒ තිබෙන තත්ත්වය අනුවයි මම එහෙම කියන්නේ. Solar panel projects ගත්තාම, 2021දී solar panel projectsවලට EoIs call කරලා අද වෙනකන් power-purchasing agreements sign කරලා නැහැ. පසුගිය රජය කළේත් නැහැ. මේ රජය ඒක කරන්න බලාපොරොත්තු වෙනවාද කියලා දන්නේත් නැහැ. මම දන්නවා, සමහර සමාගම්වල ඩොලර් මිලියන 100ක් අවුරුදු ගණනාවක් බැංකුවල තිබෙන බව. ඒ ඇයි? සල්ලි පෙන්වන්න ඕනෑ, ඉඩම secure කර ගන්න ඕනෑ, agreements sign කර ගන්න ඕනෑ. දැන් agreements sign කරන්නේ නැහැ. මොකක්ද, මේ ප්‍රතිපත්තිය? රජයේ ප්‍රතිපත්තියක් වශයෙන් electricity බිල අඩු කරනවා නම්, මෙන්න ක්‍රමවේද. Solar panelsවලින් නිපදවන විදුලිය ප්‍රමාණය වැඩි කර ගන්න; wind powerවලින් නිපදවන විදුලිය ප්‍රමාණය වැඩි කර ගන්න. නමුත්, එවැනි මොකුත් වැඩ පිළිවෙළක් නැහැ.

මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කයිවාරු ගහන එක තමයි වැඩිපුර කරන්නේ. දැන් 159දෙනෙක් ඇවිල්ලා ඉන්නවා, කයිවාරු ගහන්න. පාර්ලිමේන්තුවේ ඉඳන් කියන්නේ මොනවාද? එක්කෝ විපක්ෂය ගැන කථා කරාවි. මගේ කථාවට පෙර කථාවේදී රනිල් වික්‍රමසිංහ ගැන කථා කළා. මේ අදාළ විෂයයන් ගැන කථා කරන්න, ප්‍රශ්න කරන්න දන්නේ නැද්ද, නැත්නම් politburo එකෙන් ඒ සඳහා permission දීලා නැද්ද කියලා මට හිතාගන්න බැහැ. ගරු ඇමතිතුමා අසරණ කරන්න මම කැමැති නැහැ. සමහර විට මෙය politburo එකේ තීරණයක්ද දන්නේ නැහැ.

Especially about Adani's wind power project and his pulling out from that, the Government is saying all sorts of things. It is Adani who pulled out from that because Adani did not want to do business here. The rate they offered, US Dollars 0.08 cents, was agreed to by the Ceylon Electricity Board. And, Adani did not have the same facilities that were given to the other proposed 50 megawatt wind power project in Mannar. With regard to the Adani project, the Environmental Impact Assessment had already been done; the Bird Migration Report had

[ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

already been done. Adani had to do all that. Also, Adani had to build a jetty in Mannar to bring the wind turbines. Later, the jetty was supposed to be used for fishermen. Then, the rate Adani agreed on was something that the CEB proposed; it was not Adani who imposed that. If we take the transparency of it, whether a tender procedure was followed or not, it is a US Dollars 1 billion investment. So, if you wanted to, you could have renegotiated it. The reason why people went to court against the project earlier was because they had environmental issues. That, we also had. Some people in Mannar had issues with regard to certain locations where the turbines were going to be fixed. We conveyed that to the relevant authorities and they were happy to look into it. But, now, Adani has pulled out. Adani was going to add 488 megawatts to the Grid. It was 488 megawatts! Earlier, I mentioned the number of units a litre of oil could produce; it is 4 litres per unit. So, whatever progressive steps that the previous Government had taken to achieve the target of a 70 per cent renewable energy input into the Grid by 2030, this Government has now destroyed. The Government has no plan. Therefore, our energy sector is again under threat.

கௌரவ தவிசாளர் அவர்களே, எங்களுடைய மாவட்டத்தில் பாரிய சிக்கல்கள் இருக்கின்றன. நீங்கள் solar panelsஐப் பொருத்துவதற்குக் காணி வழங்கும்போது, மிகக் கவனமாக அந்தந்தக் கிராமங்களில் இருக்கின்ற நிலத்தின் அளவைப் பார்த்து வழங்க வேண்டும். Solar panelsமூலமான மின் உற்பத்தி முக்கியம். ஆகையால், அவற்றுக்கு நிலங்களை வழங்கலாம். Solar panelsஐப் பொருத்துவதற்கு நிலங்களை எடுக்கும்போது, அந்தக் கம்பனிகள் சாதாரண கம்பனிகள் கட்டுவதுபோன்று leasing தொகையை மட்டும்தான் கட்டுகின்றன.

வவுணதீவு பிரதேச செயலாளர் பிரிவிலுள்ள ஈச்சந்தீவு கிராமத்தை எடுத்துப்பார்த்தால், அங்கு வெற்று நிலமே இல்லை. அதாவது, அந்தக் கிராமத்தின் வளர்ச்சிக்காக அங்கு இடமே இல்லை. எங்களுடைய மாவட்டத்தின் DCC Chairmanஆகவும் இருக்கின்ற கௌரவ பிரதி அமைச்சர் அருண் ஹேமச்சந்திரா அவர்கள் தற்பொழுது இந்தச் சபையில் இருக்கிறார். நாட்டினுடைய நன்மைக்கு solar panels மூலமான மின் உற்பத்தி அவசியமாக இருந்தாலும்கூட, எதிர்வரும் காலங்களில் அவற்றுக்குக் காணியை ஒதுக்கும்போது, அந்தப் பிரதேசத்தின் நலனைப் பேணுவது அந்தப் பிரதேசத்தைச் சேர்ந்த அரசியல்வாதிகளின் பொறுப்பாகும். அந்த வகையில், மட்டக்களப்பு மாவட்டத்தின் DCC Chairmanஆக இருக்கின்ற நீங்கள் இதையும் கருத்திலெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்றைய விவாதத் தலைப்புடன் சம்பந்தமில்லாத ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். DCC Chairman அவர்களே, நீங்களும் நாங்களும் உட்கார்ந்து எங்களுடைய மாவட்டம் சம்பந்தமாக கடந்த டிசம்பர் மாதம் எடுத்த எந்தவொரு தீர்மானமும் இன்னும் நடைமுறைக்கு வரவில்லை. மட்டக்களப்பு மாவட்டத்தில் மண் அகழ்வு செய்யக்கூடாது என்று நீங்கள் சொன்னீர்கள். ஆனால், இன்றும் அங்கு மண் அகழ்வு நடைபெறுகின்றது. இங்கு கௌரவ உறுப்பினர் ஹிஸ்புல்லாஹ் அவர்கள் இருக்கிறார். அங்கு எடுத்த தீர்மானம் எதுவும் நடைமுறைக்கு வரவில்லை. உதாரணத்துக்கு, மீன்பிடிப் பிரச்சினை சம்பந்தமாகத் தீர்மானம் எடுக்கப்பட்டது. ஆனால், அது நடைமுறைக்கு வரவில்லை. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களுக்குப் பொறுப்புகள் அதிகம் என்பது எனக்குத் தெரியும்! நீங்கள் திருகோணமலை மாவட்டத்தையும் பார்க்க வேண்டும்; மட்டக்களப்பு மாவட்டத்தையும் பார்க்க வேண்டும். வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர் அவர்கள் அடிக்கடி வெளிநாடுகளுக்குப் போவதால், அவருடைய பிரதி அமைச்சராக இருக்கின்ற நீங்கள் acting Ministerஆகப் பணியாற்ற வேண்டும். எங்களுடைய மாவட்டத்தின் பிரச்சினைகளை வீதிக்கு வரும் அளவுக்கு நீங்கள் விடக்கூடாது. இன்று காலையில்கூட, ஆரையம்பதியில் பாரியதொரு போராட்டம் நடந்தது. ஏனெனில், எங்களுடைய பிரதேசத்தில் வாள்வெட்டுக் குழுக்களின் அட்டகாசம் அதிகரித்திருக்கிறது.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rasamanickam, your time is up.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

இரண்டு நாட்களுக்கு முன்னர் நடைபெற்ற பாதுகாப்பு அமைச்சின் குழுநிலை விவாதத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் பதிலுரை ஆற்றும்போது, பாதாள உலகக் குழுக்களின் செயற்பாடுகள் மட்டக்களப்பிலும் யாழ்ப்பாணத்திலும் நடக்கலாமெனச் சொன்னார். இங்கு எங்களுடைய மூத்த அரசியல்வாதிகள் பலர் இருக்கிறார்கள். குறிப்பாக, கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்கள் இருக்கிறார். நான் மூத்த அரசியல்வாதியாக இல்லாவிட்டாலும்கூட, 15 வருடங்களாக அரசியலில் ஈடுபட்டு வருகின்றேன். மட்டக்களப்பு மாவட்டத்தை NPP அரசாங்கத்தால் நிர்வகிக்க முடியாவிட்டால், அந்தப் பொறுப்பை எங்களிடமாவது தாருங்கள்! ஏனெனில், அந்த மாவட்டத்தின் பிரச்சினைகள் வீதிக்கு வரும்வரை எங்களால் வேடிக்கை பார்த்துக் கொண்டிருக்க முடியாது.

මම අහපු ප්‍රශ්නවලින් කුමන හෝ ප්‍රශ්නවලට අද පිළිතුරු හම්බ වේවි. නැත්නම් මට පෙර කථා කළ මන්ත්‍රීතුමිය හෝ ඒ අදාළ ඇමතිතුමන්ලාගෙන් අපි අහපු ප්‍රශ්නවලට පිළිතුරු හොයාගෙන මේ Lobby එකේදී හරි ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න. නැත්නම් මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කිව්වා වාගේ විපක්ෂය ආයෙත් හෙටත් ඇවිල්ලා ඔය ප්‍රශ්නම තමයි අහන්නේ. මොකද, අපි අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. කිව්වේ බොරු. දැන් බොරු කියලා බලයට ඇවිල්ලා බොරුවෙන්ම දිගටම බලය කරගෙන යන්න බැරිව හිරවෙලා ඉන්න නිසා තමයි අපට උත්තර දෙන්න බැරි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Arun Hemachandra. You have 13 minutes.

Order, please! The Hon. Kitnan Selvaraj will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.

[අ.භා. 2.18]

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම හිතුවා, මෙම විවාදය ඉතාම සංවාදශීලි විවාදයක් විධියට කරගෙන යයි කියලා. නමුත් ඉතාම කනගාටුයි, විපක්ෂයට මෙම විවාදය හරියාකාරව කරගෙන යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙන එක ගැන. පසුගිය කාලය තුළ හාල් ප්‍රශ්නය, ලුණු ප්‍රශ්නය ගැන කථා කළා. ඒ වාගේ විවිධ මාතෘකා මවන්න උත්සාහ කළා. දැන් තෙල් මාෆියාවක් නිර්මාණය කරගෙන ඒ හරහා යම්කිසි ආකාරයකින් බලයට පත් වෙන්න පුළුවන් කියලා හීන දකිනවා. නමුත් එක දෙයක් අපි කියන්න කැමැතියි, ඔයගොල්ලන්ගේ හීනය දවල් හීනයක් වෙනවා. නිසැකයෙන්ම මේ රටේ කිසිම අර්බුදයක් ඇති වෙන්න නොදී මේ ආණ්ඩුව වගකීමෙන් යුතුව කටයුතු කරනවා. ජනතාව කිසිසේත්ම භය වෙන්න ඕනෑ නැහැ. අපි මේ සම්බන්ධව හොඳාකාරයෙන් කටයුතු කරනවා කියන එක අපි සහතික වශයෙන් කියන්න කැමැතියි.

මෙවර අය වැය ගත්තොත්, එය ඓතිහාසික අය වැයක්. යළිත් වතාවක් මම කියන්න කැමැතියි, බංකොලොත්භාවයෙන් මේ රට ගොඩ යනකොට ඉදිරිපත් කරන පළමුවෙනි අය වැය තමයි මේ අය වැය. මේක ඓතිහාසිකයි. ඒ වාගේම තමයි පසුගිය කාල වකවානු තුළ ඉදිරිපත් කරපු අය වැය වාගේ නොව විශේෂයෙන් ගත්තොත් ජනතාව ගැනත් කල්පනා කරමින්, ජනතාවට සහනාධාර දෙමින්, ජාතික දේපළ විකුණන එකත් වළක්වමින් හොඳාකාරයෙන්, මේ රටට සුබවාදී, ප්‍රගතිශීලි අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

විශේෂයෙන් ගත්තොත්, බලශක්ති ක්ෂේත්‍රයට අදාළව විවිධ ආන්දෝලනාත්මක කාරණා මවන්න උත්සාහ කළත්, ඒ සියලු දේවල් පුස් වෙඩිල්ලක් බවට අද පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති ක්ෂේත්‍රය කියන්නේ වැදගත් ක්ෂේත්‍රයක්. පසුගිය ආණ්ඩුව පෙරළන්නත් එම ක්ෂේත්‍රය හේතු වුණා. විදුලිය කප්පාදුව වෙන්න පුළුවන්, තෙල් පෝලිම් වෙන්න පුළුවන්, මේ සියලු දේම අද අපි කථා කරන මාතෘකාවට අදාළ දේවල්.

ඒ නිසා අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රයේ සුරක්ෂිතභාවය ඇති කිරීම ඉතාම අත්‍යවශ්‍යයි. අද අපි මේ අය වැය තුළින් මෙම සුරක්ෂිතභාවය ඇති කරලා තිබෙනවා. විශේෂයෙන් අපේ රට තුළ යහපත් බලශක්ති ප්‍රතිපත්තියක් අපි ගොඩනඟනවා. අපි විශ්වාස කරනවා, ඒ තුළින් මේ රට තුළ ඉතාම යහපත් තත්ත්වයක් අපට ගොඩනඟන්න පුළුවන් වෙයි කියා.

ඒ වාගේම මම හිතුවා, විශේෂයෙන් තෙල් ප්‍රශ්නයට අදාළව ලොකු සංවාදයක් අද මේ ගරු සභාව තුළ ගොඩනැඟේවි කියලා. නමුත් මම හිතපු තරම් අද තෙල් ප්‍රශ්නය පිළිබඳව සංවාදයක් මතු වුණේ නැහැ. විශේෂයෙන් පසුගිය දවස් කිහිපය තුළ මාධ්‍ය තුළින් අපි දැක්කා, සමහර මාධ්‍ය බොරු මවපු ආකාරය. සමහර මාධ්‍ය මේ රටේ කැලඹීමක් ඇති කරන්න උත්සාහ කළා. එහෙම තියෙද්දීත්, සමහර මාධ්‍ය ඇත්තටම ජනතාවට ඇත්තත් කිව්වා. එම නිසා ඒ වාගේ මාධ්‍ය ආයතනවලට අපේ හෘදයංගම ස්තුතිය අනිවාර්යයෙන්ම අපි මේ අවස්ථාවේදී පුද කරන්නට ඕනෑ.

විශේෂයෙන් මගේ දිස්ත්‍රික්කය ගත්තොත්, එහි කොතැනකවත් තෙල් අර්බුදයක් මතු වුණේ නැහැ. අපි හැම ෂෙඩ් එකකටම ගිහිල්ලා බැලුවා; ජනතාව එක්ක කථා කළා. හැබැයි, අපි එක කාරණයක් කියන්න කැමැතියි. මේ වතාවේ නම් පසුගිය කාලවල වාගේ ජනතාව අරගළ කරන්නේ ආණ්ඩුවට විරුද්ධව නොවෙයි, විපක්ෂයේ ඔබතුමන්ලාට විරුද්ධවයි. ඒ නිසා ඔබතුමන්ලා බොරු මවනකොටත් ඒවා සීමාසහිතව කරන්න. ඒ වාගේම ඔබතුමන්ලා ඉතාම වගකීමෙන් කටයුතු කරන්න කියාත් අපි කියන්න කැමැතියි. ඒක සැහැල්ලුවට ගන්න එපා. අද සමාජ මාධ්‍ය අරගෙන බැලුවොත් එහෙම ඔබතුමන්ලාට විරුද්ධව එක එක,- ඔබතුමන්ලාට ඇත්තටම තේරෙන්නේ නැහැ නේ, මොන මාතෘකාවද ගන්න ඕනෑ කියලා. එන ඕනෑම මාතෘකාවක් ගන්න. ජනතාව හැසිරෙන විධිය ගත්තොත්, ඇත්තටම ජනතාව දැන් ඉතාම වගකීමෙන් කටයුතු කරන බව තමයි අපට පෙනෙන්නේ. ඒ නිසා ජනතාවටත් අපි ස්තුති කරනවා, මේ ලණු කන්න ලැහැස්ති නොවීම ගැන.

මා ළඟ දැන් වාර්තා තුනක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එකක්, ජාතික විගණන කාර්යාලය - National Audit Office - ඉදිරිපත් කරපු වාර්තාවක්. මේක තමයි තෙල් ප්‍රශ්නයට අදාළ මූලික වාර්තාව. මේ වාර්තාව නිකුත් කරලා තිබෙන්නේ 2022 අගෝස්තු 04වැනි දා.

මේ වාර්තාවට අනුව ඇත්තටම ගත්තොත්, "This audit query is issued in addition to the audit query No. ENR/A/CPC/1/21/AQ/05 dated 05th July, 2022 issued by me regarding the same subject. However, your comments to that query has not yet been received" කියන title එක යටතේ තමයි තිබෙන්නේ. එහි අංක 1 යටතේ මෙසේ සඳහන් වනවා:

> "The accumulated overpayment of dealer commission up to 17 July, 2022 was amounting to Rs. 4,349.93 million. However, audit was unable to verify whether such overpayments had been recovered by the corporation or a basis to recover the overpaid dealers' commission had been established up to date."

මේ වාර්තාවේම අංක 2.2 යටතේ මෙසේ සඳහන් වනවා:

> "Audit was unable to ensure whether, the consent of the board had been obtained by circulation of the decision or even through a virtual meeting with the members of the board over a week up to date."

ඒ කියන්නේ Board decision එකක්වත් නැතුව තමයි මේ තීරණය අරගෙන තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසන් කාරණාවේ මෙසේ සඳහන් වනවා:

> "According to the above analysis, it was observed that the decision to remove approved upper and lower CAP on dealer commission had been taken without proper financial evaluation about the present and future economic condition of the Corporation and proper evaluation of the financial impact of the decision to general public. Therefore, it is observed the necessity of given a due consideration before continuation of decision for long."

ඒ කියන්නේ, මේ වාර්තාවේ ඇත්තටම වැදගත් කාරණා ඉදිරිපත් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ ප්‍රශ්නයේ පසුබිම මේ වාර්තාවේ ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් මෙයත් නොසලකා තමයි කටයුතු කරන්නේ. අපි දන්නවා, COPE එකේ මේ සම්බන්ධව සාකච්ඡා වුණු බව. ඒ සම්බන්ධයෙන් නඩු තීන්දු දෙකක් තිබෙනවා. ඒවා සම්බන්ධවත් නොසලකා තමයි අද ආණ්ඩුවට විරුද්ධව දැවැන්ත මඩ ප්‍රහාර, අවලාද එල්ල කරන්න මේ දේශපාලකයෝ කටයුතු කරන්නේ.

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

ඒ වාගේම පසුගිය කාලයේ සිද්ධ වෙච්ච තවත් දූෂණයක්, වංචාවක් ගැන මම කියන්න කැමැතියි. විශේෂයෙන් අපි දන්නවා, CPSTL කියලා ආයතනයක් තිබෙන බව. ඒ වාගේම අපේ Ceylon Petroleum Corporation එකත් තිබෙනවා. ඒවා මේ අමාත්‍යාංශයට අයත් ආයතන. මේ ආයතන දෙකේම සිද්ධ වෙච්ච දැවැන්ත දූෂණ වංචාවක් ගැන තොරතුරු මම අද කියන්න කැමැතියි. විශේෂයෙන් ඊට අදාළ පස්දෙනෙකු පිළිබඳ තොරතුරු මා ළඟ තිබෙනවා. ඒ තොරතුරු ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ අය තමයි, එස්.එම්.ඩී. විජයගුණරත්න, එම්.ඒ.එස්.වී. නිශාන්ත, එස්.ඩී.ජේ. පරේරගම සහ ඩබ්ලිව්.ඒ.ජේ. ප්‍රේමලාල්. මේ අය නියෝජනය කරන්නේ නිදහස් සේවක සංගමය. තව කෙනෙක් ඉන්නවා. ඔහු තමයි, අද ඔබතුමන්ලා එක්ක සිටින, කලින් එක්සත් සේවක සංගමය නියෝජනය කරපු ආනන්ද පාලිත. ඔහු ඉතා ප්‍රසිද්ධයි. ඔහු වංචාවලට හා මැර ප්‍රහාරවලට සෑහෙන්න සම්බන්ධ වෙච්ච කෙනෙක්. ඔහු සම්බන්ධ පින්තූරත් මා ළඟ තිබෙනවා. ඔබතුමන්ලාගේ මාධ්‍ය සාකච්ඡාවල වාඩි වෙලා, ඔබතුමන්ලාගේ ඡන්ද ලකුණ ඉස්සරහ වාඩි වෙලා මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරන කෙනෙක් තමයි, මේ ආනන්ද පාලිත. අපිට ආරංචි වෙච්ච විධියට ඔබතුමන්ලාගේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේත් සාමාජිකයෙක් කියලා ඔහු කියනවා ලු. ඒ පිළිබඳව පරීක්ෂණ කරලා ඔබතුමන්ලා කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මේ අය ගැන කථා කරන්න හේතුව මෙකයි. අපි දන්නවා, මේ රටේ නීතියක් තිබෙන බව. ව්‍යක්තීය සමිති ක්‍රියාවලියට සම්බන්ධ වන අයට යම්කිසි අයිතියක් තිබෙනවා, රාජකාරී කටයුතුවලින් release එකක් ගන්න.

ඒ release එක අරගෙන ඔවුන්ට ව්‍යක්තීය සමිතිවල වැඩ කරන්න අයිතියක් තිබෙනවා. හැබැයි, ඒ release එක අරගෙන ඔවුන් වැඩ කරන එම කාල වකවානුව තුළ ඔවුන්ට overtime ගන්න කිසිසේත්ම අයිතියක් නැහැ. නමුත් මම ළඟ ඊට අදාළ තොරතුරු තිබෙනවා. ඔවුන් 2015 සිට 2024 දක්වා overtime වැඩ කරලා තිබෙනවා. අතිකාල පැය විධියට ගත්තොත්, විශේෂයෙන්ම විජයගුණරත්න කියන කෙනා 2015 සිට 2024 දක්වා පැය 13,120ක overtime කරලා තිබෙනවා; ඔහු ඒ සඳහා රුපියල් 8,513,793ක මුදලක් අරගෙන තිබෙනවා. ඒ වාගේම, නිශාන්ත කියන කෙනා පැය 2,192ක් OT කරලා, රුපියල් ලක්ෂ 20කට අධික මුදල් ප්‍රමාණයක් OT payment විධියට අරගෙන තිබෙනවා. පරේරගම කියන කෙනා පැය 13,900ක් OT කරලා තිබෙනවා, union වැඩ සඳහා release එක අරගෙන. ඒ අනුව රුපියල් ලක්ෂ 84කට අධික මුදල් ප්‍රමාණයක් ඔහු අරගෙන තිබෙනවා, OT payment විධියට. එමෙන්ම ප්‍රේමලාල් කියන කෙනා පැය 421ක් OT කරලා, රුපියල් ලක්ෂ 2කට අධික මුදල් ප්‍රමාණයක් OT payment විධියට අරගෙන තිබෙනවා.

ඊළඟට, සමගි ජන බලවේගය නියෝජනය කරන union එකේ ඉන්න නියෝජිතවරයා 2015, 2016, 2017, 2018 කියන කාල වකවානු තුළ union එකේ වැඩ සඳහා release එක අරගෙන තිබෙනවා. ඔහු සමස්තයක් විධියට 2015 සිට 2018 සැප්තැම්බර් වනතුරු පැය 6,581ක් අතිකාල පැය විධියට වැඩ කරලා තිබෙනවා කියලා OT අරගෙන තිබෙනවා. සමස්තයක් විධියට ගත්තොත්, ඔහු රුපියල් ලක්ෂ 31කට අධික මුදලක් OT payment විධියට අරගෙන තිබෙනවා. මීට අමතරව ඔහුට විරුද්ධව තවත් චෝදනාවක් තිබෙනවා. ඔහු වාහන දෙකක් පාවිච්චි කරලා තිබෙනවා. ඒ වාගේම ඒ වාහනයට අදාළව මේ ආයතනයට මසකට VAT රහිතව රුපියල් 163,500ක විතර අලාභයක් සිද්ධ වෙලා තිබෙනවා. NB-4690 අංක දරන වාහනය සඳහා 2015 වසරට ඉන්ධන ලීටර් 4,717ක් අරගෙන තිබෙනවා. ඒ වාගේම, 2016 වසරට ඉන්ධන දීමනාව විධියට ඔහු අරගෙන තිබෙනවා, ඉන්ධන ලීටර් 5,255ක්. එම තොරතුරු ඇතුළත් ලේඛනය මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ වාගේම, මේ සම්බන්ධව තවත් හොයාගෙන යද්දී; විපක්ෂය මේ ප්‍රශ්න ගැන ඔච්චර උනන්දු වෙන්නේ ඇයි, ඔච්චර මහන්සි වෙන්නේ ඇයි කියලා බලද්දී මට දැන් ඊට අදාළ ලේඛනයක් ලැබුණා. විපක්ෂයට අදාළ වත්මන් සහ හිටපු මන්ත්‍රීවරුන් සමඟ දේශපාලන සම්බන්ධතා තිබෙන අයගේ විස්තර ඇතුළත් එම ලේඛනයත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

හැම පළාතකටම අදාළ අයගේ විස්තර මේ ලේඛනයේ තිබෙනවා. මේ ලේඛනයේ මුලින්ම තිබෙන්නේ Hitech Carbons (Pvt.) Limited එකට අදාළ විස්තර. අපි මේ ආයතනයට තිබෙන දේශපාලන සම්බන්ධය ගැන හොයලා බලද්දී Mrs. Chandrika Bandaranaike Kumaratunga කියලා මේ ලේඛනයේ සඳහන් වෙනවා. ඒ වාගේම මේ ලේඛනයේ ප්‍රසන්න රණතුංග, වර්මන් ගුණරත්න, හිටපු මන්ත්‍රී කුමාර වෙල්ගම, මයර් කඩුවෙල, හර්ෂණ රාජකරුණා සහ Former President මහින්ද රාජපක්ෂගේ PSO මහත්තයාගේ නමත් තිබෙනවා. පියසේන ගමගේ මහත්තයාගේ පුතාගේ නමට ෂෙඩ් එකක් තිබෙනවාය කියාත් මෙහි සඳහන් වනවා. ඒ වාගේම ගාමිණී සෙනරත් මහත්තයාගේ සහෝදරයා පිළිබඳවත් මේ ලේඛනයේ සඳහන් වෙලා තිබෙනවා. ගයන්ත කරුණාතිලක මහත්තයාගේ සහෝදරයෙකුගේ නමටත් ෂෙඩ් එකක් තිබෙනවාය කියලා තමයි මේ ලේඛනයේ සඳහන්ව තිබෙන්නේ.

මා නියෝජනය කරන දිස්ත්‍රික්කය ගත්තත්, දේශපාලන අධිකාරියට සම්බන්ධ බොහෝ අයගේ නම් මේ ලේඛනයේ තිබෙනවා. ඒ වාගේම අකිල විරාජ් කාරියවසම් හිටපු ඇමතිතුමාගේ නමට වාගේම අපේ පළාත් සභාවේ හිටපු සභාපතිනියගේ නමටත් ෂෙඩ් එකක් තිබෙනවා කියලා මේකේ සඳහන් වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ அருண் ஹேமச்சந்திரா அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் இருக்கின்றன.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම ගත්තොත්, දේශපාලනයට සම්බන්ධ බොහෝ අයගේ නම් මේ ලේඛනයේ සඳහන් වෙලා තිබෙනවා. පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ සහෝදරියකගේ නමටත් ෂෙඩ් එකක් තිබෙනවාය කියලා මේ ලේඛනයේ සඳහන් වනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම තව පෙට්‍රල් ෂෙඩ් එකක් තිබෙනවා, නිලානි ධර්මදාසගේ නමට. සම්බන්ධය ගත්තොත්, රංජිත් මද්දුම බණ්ඩාර මහත්මයාට යම් කිසි සම්බන්ධයක් තිබෙනවා කියලා තමයි මේ ලේඛනයේ තිබෙන්නේ. එහෙම ගත්තොත්, අද මේ විපක්ෂය කුලප්පු වෙන එකත් ඉතා සාධාරණයි. අපි දන්නවා, තමන්ගේ බිස්නස්වලට මොකක් හෝ ආකාරයෙන් ප්‍රශ්න, ගැටලු මතු වනකොට ඒ සම්බන්ධව යම් කිසි ආකාරයකට කුලප්පු වන එක සාධාරණයි කියන එක.

ඒ නිසා කිසිසේත්ම ආණ්ඩුවක් විධියට මේ සම්බන්ධයෙන් අපි සැලෙන්නේ නැහැ. අපේ ගමන අපි ඉස්සරහට යනවා. අපිට තිබෙන සම්මුතිය තමයි, ජනතාවත් එක්ක තිබෙන සම්මුතිය. ඒ සම්මුතිය තුළ ඉතා හොඳ ආකාරයෙන් අපි කටයුතු කරගෙන යනවා. මාස 4ක් තුළ අපි මේ රටට ප්‍රගතිය පෙන්වලා තිබෙනවා. මේ අය වැය ගත්තොත්, මේ ආණ්ඩුව පත් වෙලා මාස 4ක් තුළ ඉදිරිපත් කළ අය වැයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව ලබාදීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. ජනතාවටත් කියන්නේ, කිසිසේත්ම මේ සම්බන්ධව කලබල වෙන්න එපා කියලායි. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.32]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන්න කලින් මම කාරණයක් කියන්න කැමැතියි. උදේ වරුවේ මේ පාර්ලිමේන්තුවේ නීතියට පිටින් ගිය කාරණයක් පූර්වාදර්ශයක් නොවී ඉදිරියට යා යුතු නිසා මම මේක මතක් කරනවා.

අපි දැක්කා, මුදල් නියෝජ්‍ය ඇමතිතුමා පුවත් පත් කතුවරයකු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට ගෙනෙන්න යනවා කියලා. එහෙම ගෙනෙන්න කඩ වෙලා තිබෙන වරප්‍රසාදය මොකක්ද කියලා අපි අහනවා. ඒ කතුවරයා දේශීය ආදායම් පනතේ තිබුණු වගන්තියක් වැරදිලා හෝ වරද්දලා හෝ මොන යම් හෝ ක්‍රමයකට පත්තරේ දාලා තිබෙනවා. ඒක මන්ත්‍රීවරයෙකු, ඇමතිවරයෙකු පාර්ලිමේන්තුවේ හෝ කොහේ හෝ කියපු දෙයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් පුවත් පතක හෝ කොහේ හෝ තැනක වැරදි නිවේදනයක් ගියොත් කරන්න තිබෙන්නේ ඒක නිවැරදි කරන්න කියන ඉල්ලීමයි. එහෙම නැත්නම්, ඇමතිවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒක නිවැරදි කරන එක. හැබැයි, සභානායකතුමනි, ඒක කථානායකතුමාත්, සභානායකතුමාත්, පාර්ලිමේන්තුවේ ඔක්කොමත් බලාගෙන ඉද්දී, "අරුණ" පුවත් පතේ කතුවරයා වරප්‍රසාද පිළිබඳ කමිටුවට ගෙනෙන්න වරප්‍රසාද අයිතියක් නැහැ.

මොකක්ද මේ කරන්න හදන්නේ? මේක තමයි ඔබේ ආණ්ඩුව පිරිහීමේ මූලික ලක්ෂණය. ඉන්ධන බෙදුම්කරුවන් ඒගොල්ලන්ට තිබෙන සැබෑ ප්‍රශ්නය කිව්වා. දැන් CID එකට ගෙනෙන්න යනවා. කොතැනක හෝ වැරැද්දක් සටහන් වෙනකොට මේ පාර්ලිමේන්තුව වරප්‍රසාද අනිසි ලෙස පාවිච්චි කරලා, මාධ්‍ය ආයතන, මාධ්‍යවේදීන්, පුවත් පත් කතුවරුන් ඒ සියලුදෙනා-පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පිළිබඳ කමිටුවට ගෙනෙන්න බැහැ. ඒක නීත්‍යානුකූල නැහැ. ඒක වැරදියි. ඒක වැරදි සම්ප්‍රදායක්. ඒක වැරදි නීතියක්. ඒක තර්ජනය කිරීමක්.

ඔබතුමන්ලාගේ නොහැකියාව වහ ගන්න, ඔබතුමන්ලාගේ බොරු ටික වහගන්න, මාධ්‍යයට අනිසි විධියට කටයුතු කරන්න, මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න දෙන්න බැහැ. එහෙම පාවිච්චි කරන්නේ නැහැ කියලා සපථ කරලා තමයි ඔබතුමන්ලා බලයට ආවේ. ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. ඒවා දන්නේ නැහැ වාගේ තක්කඩි විධියට නීතිවිරෝධී වැඩ කරන්න මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන එක පිළිබඳව පිළිකුල් සහගතව අපි හෙළා දකිනවා. එහෙම වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවන්න කියලා කථානායකවරයාට නියෝග කරන්න බැහැ. කාගේද වරප්‍රසාද කැඩිලා තිබෙන්නේ? ඒක ඇමතිවරයා කරපු ප්‍රකාශයක් නොවෙයි, ඒක මන්ත්‍රීවරයෙක් කරපු ප්‍රකාශයක් නොවෙයි. "අරුණ" පුවත් පතේ තිබෙන කාරණයේ යම් සාධාරණයකුත් තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා දැන් භය වෙලා තිබෙනවා, ඔබතුමන්ලාගේ ඇත්ත තත්ත්වය දකිනකොට. ඒ නිසා ඔබතුමන්ලාගේ පාර්ලිමේන්තු බලය පාවිච්චි කරලා ඒ හැමෝම යටපත් කරන්න හදනවා.

ව්‍යක්තීය සමිති අරගළ කරලා මේ පාර්ලිමේන්තුවට හොර තනතුරුත්, හොර උපාධිත් දාගෙන ඇවිල්ලා නැද්ද? ඒ අය ව්‍යක්තීය සමිති අරගළ හදලා, බනිජ තෙල් සංස්ථාව වට්ටලා ඒ කරපු දේවල්- ඒ අය අද මේ පාර්ලිමේන්තුවේ හිටපු කථානායකවරු, මන්ත්‍රීවරු හැටියට ඉන්නවා. ඔබතුමන්ලා පුරුදු වෙලා තිබෙනවා, මොකක් හරි දෙයක් එනකොට පරණ දේවල් මතක් කර කර ඉන්න. ඒ ඇයි? ඔබතුමන්ලා ආණ්ඩුව නොවේ විධියට මේ රටේ ජනතාවගේ ඒ ප්‍රශ්නය යටපත් කර ගන්න, පරණ හොරකම්, පරණ වංචා සිද්ධ කර තිබෙන ඒවා ගැන කියනවා.

දැන් මොකක්ද ලැයිස්තුවක් කිව්වා. ඒකම තමයි කළේ, බාර් පර්මිට් දීපු වෙලාවේත්. මෙතැන ඇවිල්ලා උජාරුවට කිව්වා. නමුත් cancel කළාද? අනීතිකව අරගෙන තිබෙන ඒවා නම් cancel කරන්නකෝ.

තමුන්නාන්සේලා දැක්කේ නැද්ද දන්නේ නැහැ, මම දැක්කා මාධ්‍යයෙන්, තෙල් බෙදුම්කරුවන්ගේ සංගමය ගිහිල්ලා ජනාධිපති හමු වෙලා කියපු දේ. ඒ අයට ආණ්ඩුව වට්ටන්නවත්, ඔබතුමන්ලා එක්ක තිබෙන ප්‍රශ්නයක් නිසාවත් නොවෙයි; එහෙම අවශ්‍යතාවක් නැහැ කියලා කියනවා. ඒ අයට ලාභ නැති නිසා කරගෙන යන්න බැරි නිසා මේ ඉල්ලීම කරන්නේ. එහෙම නැත්නම් වහලා ගෙදර යනවාය කියනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ නොහැකියාව වහගන්න, ඒක කාටවත් ලඝු කරන්න හදන්න එපා. ඔබතුමන්ලාට වෙලා තිබෙන්නේ අර බළලාට වෙච්ච දේ. ගලේ පහරපු බළලාට වාගේ කරපු දේ වහගන්න බැරි වෙලා තිබෙනවා, NPP ආණ්ඩුවට. ඒ නිසා හැමෝටම හතර අතේ ගහනවා. හතර අතේ ගහලා වැඩ කටයුතු කරන්න උත්සාහ කරනවා.

විදුලිබල ඇමතිතුමා, ඇත්තටම ඔබතුමා අසාර්ථකයි. ඇයි, විවිධ චෝදනා තිබෙනවා. පසුගිය කාලයේ විදුලිය විසන්ධි වුණේ, මේ රට විනාශ වුණේ තමුන්නාන්සේලා කියන ඒ බංකොලොත්කාරයෝ නිසාය කිව්වා. එහෙම නම්, දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට ඇවිල්ලාත් ඔබතුමන්ලාගේ අකාර්යක්ෂමතාව, නොදැනුවත්කම සහ නොහැකියාව නිසා විදුලිය විසන්ධි වීම සිද්ධ වෙලා තිබෙනවා. එහෙම නම් එහෙම වෙලා තිබෙන්නේ ඔබතුමන්ලාගේ නොහැකියාව හරහායි, ඔබතුමන්ලා කියපු විධියට. එහෙම නම් ඔබතුමන්ලා ආණ්ඩුවේ ඉන්නවාද නැද්ද කියන තීන්දුව ගන්න. විවිධ චෝදනාවලට ලක්වෙලා තිබෙනවා නම්, අර කොන්දක් තිබෙනවාය කියලා

[ගරු වම්න්ද විජේසිරි මහතා]

හැමදාම කියන, ඒ කශේරුකාව පිළිබඳව අපි ප්‍රශ්න කරනවා. එහෙම නම් මේ ආණ්ඩුව තුළත් ඉන්නේ හොරු, වංචනිකයන් සහ දූෂිතයන්මයි කියන කාරණය මේ රටේ ඔබතුමන්ලාට ඡන්දය දුන් උදවිය දකිනකොට "අපි ඡන්දය දුන්නේ කාටද" කියලා ඔවුන්ට කනගාටුවක් දැනෙනවා ඇති.

පුදුමය තමයි ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, කංචන විජේසේකර මහත්මයා අද ගෙදර ඉඳගෙනත් කොමිස් ගන්නවා. කංචන විජේසේකර හිටපු විදුලිබල ඇමතිතුමා ඒ කාලයේ - අමාත්‍යාංශය භාරව හිටපු කාලයේ- තෙල්වලින් ගහපු කොමිස් නිසා තමයි මිල ඉහළ යන්නේ. බලයට ආපු ගමන් ඒ කොමිස් ටික අඩු කරලා බදු ටික අඩු කරලා එහි වාසිය මහජනතාවට -ඡන්ද දායකයාට- දෙනවාය කිව්වා. කොමිස් ගහපු අය හිරේ දමනවාය කිව්වා. අද ඒ අය එළියේ ඉඳගෙන ඔබතුමන්ලාට කෝචොක් කරනවා. දිවියධම්මවේදනීය කර්මය! ඔබතුමන්ලා ආණ්ඩුව ගන්න මේ රටේ ජනතාවට කරපු ඒ බොරු මවාපෑම් සියල්ල ඔබතුමන්ලාට දැන් කැරකිලා ඇවිල්ලා තිබෙනවාය කියන කාරණය තේරුම් ගන්න.

අපේ මන්ත්‍රීතුමියක් කිව්වා, හේලීස් එකට දුන්න එක වැරදිද කියලා. නැහැ, ඔබතුමන්ලා දුන්නා නම් ක්‍රමවේදයට; NPP එක කියපු විධියට; අනුර කුමාර ජනාධිපතිතුමා කියපු විධියට. මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ පිරිසිදු ක්‍රමවේදයට දීලා තිබෙනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඔබතුමන්ලා දුන්නේ, ටෙන්ඩර් කැඳවලා, ඒකේ ප්‍රධාන ටෙන්ඩර් එක reject වෙනකොට ඒ ප්‍රධාන ටෙන්ඩර් කොන්දේසියෙන් බැහැර වෙච්ච සමාගමට. ඔබතුමන්ලාගේ පිරිසිදුකම අනුව, ඔබතුමන්ලා කියපු විධියට එහෙම දෙන එක සාධාරණ නැහැ. අන්න ඒකයි අපි කියන්නේ. එතැනත් මොකක්ද සිද්ධ වෙන්නේ? කවුද ඒ ආයතනයේ ප්‍රධානියා? ඔබතුමන්ලාට ඡන්දයට උදව් කරපු උදවිය. එහෙම නම් ඔබතුමන්ලාට ඡන්දයට උදව් කරපු උදවියට අනීතිකව හෝ වංචා සහගතව ඔබතුමන්ලාගේ පැවැත්ම වෙනුවෙන්, දීපු සහයෝගය වෙනුවෙන් පසුගිය ආණ්ඩු කාලයේ වාගේ ඔබතුමන්ලාත් උදව් කරනවාය කියන කාරණය කියන්න අපට අයිතියක් නැද්ද? ඔබතුමන්ලාට විතරද, ඒ අයිතිය තිබෙන්නේ? ඔබතුමන්ලාට විතරද, ඒ හැකියාව තිබෙන්නේ? ඔබතුමන්ලා අද රට අඳුරට ගෙනියනවා. මිනිස්සු කිව්වා, රට අනුරට දෙන්න කියලා. හැබැයි අපි කිව්වා, රට අනුර දෙනකොට රට අඳුරට යනවාය කියලා. ඒක කුමන්ත්‍රණකාරීව වෙන්නේ නැහැ. ඒකට කුමන්ත්‍රණ කරන්න ඕනෑ නැහැ. දිවියධම්මවේදනීය කර්මය අනුව සොබා දහමෙන්ම තමුන්නාන්සේලාට ඒක පඩිසන් දෙන බව මතක් කරනවා.

කාලය නැති නිසා අවසාන වශයෙන් මේ කාරණය කියන්න ඕනෑ. අද එක පැත්තකින් ඔබතුමන්ලා බොරු කියලා ඔබතුමන්ලාගේ ඡන්ද දායකයන් සියලුදෙනා අනාථ කරලා තිබෙනවා. ඔබතුමන්ලාගේ JVP එකේ ප්‍රතිපත්ති සියල්ල සුනු විසුනු කරලා තිබෙනවා. මොකක්ද, ඊළඟ ඡන්ද ප්‍රතිඵලය? ඔබතුමන්ලාට සියයට තුනවත් නැති වෙනවා. මොකද, සැබෑ ජේවීපීකාරයෝ අපට කියනවා, මේ අය ආණ්ඩුව අරගෙන අපේ ප්‍රතිපත්තිය අද කුණු කොල්ලයට විකුණලා විනාශ කරනවාය කියලා. *[බාධා කිරීමක්]* හීනෙන් නොවෙයි මහත්තයෝ. ඇහැරෙන්න. ඔබතුමන්ලා ඉන්නේ නින්දේ. ඔබතුමන්ලා ඇහැරෙනකොට ඔබතුමන්ලාට වෙන්න ඕනෑ හරිය වෙලා ඉවරයි. ඔහොම රහපාපු, ඔහොම කෑ ගහපු, ඔහොම දෙවොල් තියපු, තක්කඩි වාගේ කටයුතු කරපු උදවියට මොකක්ද වුණේ කියලා මතක තියා ගන්න. ඒ නිසා වැඩි ඇතක නැහැ, ඔබතුමන්ලාත් ප්‍රතික්ෂේප කරලා නැවත මේ රට ගොඩ ගන්න පුළුවන් වැඩ පිළිවෙළ, නිවැරදි දිශානතිය මේ රටේ ජනතාව නිවැරදිව තෝරා ගනියි කියන කාරණය මතක් කරමින්, අවස්ථාව ලබා දීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.41]

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. විශේෂයෙන් රටක ආර්ථිකය පිළිබඳව කථා කරන කොට "බලශක්තිය" කියන්නේ වැදගත් ක්ෂේත්‍රයක්. බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී එහි වැදගත්කම, ආර්ථිකයට තිබෙන සම්බන්ධය, ජාතික ආරක්ෂාව, මේ කියන කාරණා පිළිබඳව අපේ අය වැයේ පිළිබිඹුව මොන වගේ ද යන්න සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න මැදිහත් වන ගමන්ම, විශේෂයෙන්ම විපක්ෂය මතු කළ ප්‍රශ්න කිහිපයකට අදාළවත් යම් අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි.

විපක්ෂය බලශක්ති ක්ෂේත්‍රයට අදාළව මතු කළා, අදානි සමාගම හා සම්බන්ධ කථාව. ඇත්තටම ඔවුන් අපට ඒ චෝදනාව ඉදිරිපත් කරන කොට පෙනුණා, ඒ චෝදනාව ඇතුළේම පරස්පරතාවක් තිබෙන බව. කථාව පටන් ගන්න කොටම කිව්වා, "Adani was suspended" කියලා. අපි "අදානි තහනම් කළා" කියලා තමයි කිව්වේ. ඊට පස්සේ කිව්වා, "බියක් නැතුව ආයෝජකයෝ එන්නේ නැහැ, අදානි යනවා, අදානිව එළෙව්වා" වගේ කථාවක්. කථාව අවසානයේ කියනවා, "Adani pulled back" -"අදානි අකුළාගෙන ගියා" කියලා. අපි දන්නේ නැහැ, කොයි එකද හරි කියලා. නමුත්, අපි කියන්නම් හරි එක.

බලශක්තිය විතරක් නොවෙයි, අනෙක් හැම ක්ෂේත්‍රයකම ආයෝජන පුළුල් කිරීම සඳහා ජාතික ජන බලවේගය වැඩ කටයුතු කරනවා. එතැනදී අපට වැදගත් වන්නේ නැහැ, ලැබෙන ඩොලර් ප්‍රමාණය. ලැබෙන්නේ ඩොලර් බිලියන 1 ද, 2 ද කියන එක වැදගත් වන්නේ නැහැ, ආයෝජනය ගේන පුද්ගලයා වැදගත් වන්නේ නැහැ, ආයෝජනය ගෙනෙන රට වැදගත් වන්නේත් නැහැ. ආර්ථිකය තුළ බලශක්ති ක්ෂේත්‍රය තිරසාර ලෙස පවත්වා ගෙන යෑම සහ විශේෂයෙන්ම අනෙකුත් කාරණාවලට අමතරව බලශක්තියේ පිරිවැය තමයි අපට වැදගත් වන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අප ආණ්ඩුව පිහිටුවන්න කලින් ඔවුන් අවුරුදු 20ක විදුලිය මිල දී ගැනීමේ ගිවිසුමකට අත්සන් කරලා තිබුණේ ඒකකයක මිල ඩොලර් ශත 8.26ක් ලෙසයි. එය සාපේක්ෂව වැඩියි. අප ආණ්ඩුව පිහිටුවන්න කලින් ඉන්දියාවේ කරපු සංචාරයකට මමත් සම්බන්ධ වුණා. එහිදී බලශක්තිය පිළිබඳව කථා කරපු වෙලාවේ අපි විදුලිය ඒකකයක මිල පිළිබඳ ප්‍රශ්නය මතු කළා; අදානි සමාගම ඉන්දියානු grid එකට බලශක්තිය දෙන්නේ කීයටද කියලා ඇහුවා. එතකොට ඒ ගොල්ලෝ කිව්වා, ඩොලර් ශත 3.50ට කියලා. ඉන්දියාවට ඩොලර් ශත 3.50ට දෙන ගමන් අපට ඩොලර් ශත 8.26කට දෙන්නේ ඇයි කියලා අපි ඇහුවා. ඒකට හේතු විධියට

"අවදානම" වගේ විවිධ කාරණා ගෙන ආවා. ඉතින්, ඒ විධියට අවදානම වෙනුවෙන් ඩොලර් ශත 5ක් වැඩියෙන් විදුලිය අරගෙන අපේ බලශක්ති ක්ෂේත්‍රය අර්බුදයට යවන්න කැමති නැති නිසා තමයි, ඒ ගිවිසුම ඇති වුණේ කොහොමද කියන එක පිළිබඳව සමාලෝචනයක් කරන්න කැබිනට් මණ්ඩලයට යොමු කළේ. එහෙම නැතුව ඒ ගෝල්ලෝ එළෙව්වේවත්, වෙනත් දෙයක් කළේවත් නැහැ. අදටත් විවෘතයි, ඕනෑම ආයෝජකයෙකුට ඉතාම පාරදෘෂ්‍යව තමන්ගේ ආයෝජන ගෙන එන්නට.

විපක්ෂය තවත් කාරණයක් මතු කළා, ඉන්ධන සම්බන්ධයෙන්. අපි බොරු කියනවා කිව්වා; ඉන්ධන මිල සූත්‍රයෙන් ලැබෙන ගණනට වඩා රුපියල් 10ක් වැඩිපුර අය කරනවා කිව්වා. ඒක ඉතාම වැරදිසහගත චෝදනාවක්. අපි කිසිම විධියකට පිරිවැය ඉක්මවා වැඩිපුර මිල කිරීමක් කරලා නැහැ. අපි අනුගමනය කරන සූත්‍රයට අනුව අවසානයේදී ලැබෙන මිල තමයි නියම කළේ. උදාහරණයක් විධියට ගත්තොත්, මිල සූත්‍රයට අනුව පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 308.89ක් වන නිසා රුපියල් 309ක් වශයෙන් මිල කර තිබෙනවා. එම නිසා අර වාගේ අදහසක් ඉදිරිපත් කිරීම ජනතාව නොමඟ යැවීමක් සහ වැරදි ක්‍රියාවක්.

අපේ මැති ඇමතිවරු වංචාවලට, දූෂණවලට සම්බන්ධයි කියලා කිව්වා; සැක මතු වෙනවා කියලාත් කිව්වා; තවත් එවැනි කාරණා කිව්වා. එවැනි චෝදනා කරන්න පුළුවන්. මන්ත්‍රී වරප්‍රසාදවලට මුවා වෙලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ එවැනි චෝදනා කරන්න ඉඩ කඩ තිබුණත්, ඇත්තටම ඔබතුමන්ලාට නිසි චෝදනාවක් කරන්න ඕනෑ නම් එළියේදී ඒවා ගැන පැමිණිලි කරන්න. ඊට පස්සේ අදාළ ආයතන හරහා ඒවා ගැන පරීක්ෂා කර බලන්න අපි සූදානම්. විශේෂයෙන්ම අපට සැකයක්, ගැටලුවක් පැන නඟිනවා, විපක්ෂය තොරතුරු ඉදිරිපත් කරන කොට authenticated තොරතුරු -විශ්වාසවන්තභාවය තියන්න පුළුවන් තොරතුරු- නොවෙයි නේද වාර්තා කරන්නේ කියලා. කොහේ හෝ පුවත් පතක පළ වූ තොරතුරක්, කවුරු හරි කිව්ව තොරතුරක් තමයි වාර්තා කරන්නේ. විශේෂයෙන් මෙය සඳහන් කරපු පුවත් පතට සම්බන්ධ සිංහල පුවත් පතේ පළ කරපු වාර්තාවක් සම්බන්ධයෙන් තමයි අද උදේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළේ. අපි පාර්ලිමේන්තුවේදීත්, ඉන් පිටතදීත් පැහැදිලිවම කිව්වා, විදේශගත අපේ ශ්‍රමිකයන් පිට රට ඉඳලා ලංකාවට ප්‍රේෂණය කරන කිසිදු මුදලකට බදු අය කරන්නේ නැහැ කියලා. එහෙම බදු අය කරන්නත් බැහැ.

මොකද, ඒ ගොල්ලන් වෙනත් රටක නේවාසික පුද්ගලයන්. එම නිසා ඒක වැරදි ප්‍රවෘත්තියක්. එය වැරදි ප්‍රවෘත්තියක් විතරක් නොවෙයි, ඒ ප්‍රවෘත්තිය මඟින් අනවශ්‍ය කලබලයක්, භයක් ඇති කිරීමේ වුවමනාවක්, ආර්ථිකය අස්ථාවර කිරීමේ වුවමනාවක් තිබුණා ද කියන සැකය මත තමයි ඒ ප්‍රශ්න කිරීම සිදු කරන්න කියලා අපි කිව්වේ.

බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපි ඉතා පැහැදිලිව කරුණු සඳහන් කළා. ජාතික ජන බලවේගයේ අපි බලශක්තිය පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කරද්දී අවුරුදු කීපයක් තිස්සේ තොරතුරු ඒකරාශී කර ගත්තා, සාකච්ඡා කළා, මේ පිළිබඳව ජාත්‍යන්තරව තිබෙන තත්ත්වයන් විමර්ශනයට ලක් කළා. ඒ අනුව අපේ ආර්ථික ප්‍රතිපත්තිය ඉදිරිපත් කරනවාට අමතරව බලශක්තිය සම්බන්ධව වෙනමම ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරලා එහිත් කරුණු කාරණා ගණනාවක්ම ඇතුළත් කළා. දැනට ඉදිරිපත් කරලා තිබෙන National Energy Policy and Strategies of Sri Lanka- August 2019 කියන ප්‍රතිපත්ති රාමුව විශ්ලේෂණය කරලා, අපේ ප්‍රතිපත්තිත් සැලකිල්ලට භාජනය කරලා අපි ඉදිරිපත් කරලා තිබෙනවා, Results Delivery Framework for 2025 and 2026. එනම්, ඒ ප්‍රතිඵල පාදකව ඉදිරියට ප්‍රතිඵල ලබා ගන්නේ කොහොමද කියන කාරණයට අදාළ 2025 සහ 2026 සැලැස්මයි. විශේෂයෙන්ම 2019 ඉදිරිපත් කළ උපායමාර්ගවල ඇත්තටම හොඳ කරුණු කාරණා ගණනාවක්ම තිබෙනවා. නමුත්, එහි නීතිමය පදනමක් තිබුණේ නැහැ. අවුරුදු 6න් කරන්න ඕනෑ බව ඇත්ත. ඒ බව සඳහන් කරලා තිබුණා. Results Delivery Framework එක අවුරුදු 2න් review කරන්න කියලා තිබුණා. නමුත් එවැන්නක් දකින්න තිබුණේ නැහැ.

අපි දැන් සංශෝධනය කරලා ඉදිරිපත් කර තිබෙන framework එක ඇතුළේ ඇති ප්‍රධානම කාරණා කිහිපයක් පමණක් මම highlight කරන්නම්. එකක් තමයි, 2025 වර්ෂය ඇතුළත අපි ඉදිරිපත් කරනවා Energy Transition Act එක. Energy Transition Act එක කියන්නේ, බලශක්තිය සමස්ත ක්ෂේත්‍රයක් විධියට සැලකිල්ලට භාජනය කරගෙන ගෙනෙන එකක්. බලශක්තිය ඇතුළේ විදුලි බලය එකක් පමණයි. මේ වන කොට ලෝකයේ බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳ පරීක්ෂණ පවත්වමින් යනවා. විශේෂයෙන්ම renewable energy සම්බන්ධ කාරණයේදී, පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ කාරණයේදී විවිධ වූ ආයතන ඒ පිළිබඳව තොරතුරු පරීක්ෂා කරනවා. ඒ වාර්තාවලින් අපට ඉතාම-

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Oder එක මොකක් ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 86වෙනි ස්ථාවර නියෝගය යටතේ පැහැදිලි කර ගැනීමක්. ගරු ඇමතිතුමා, මම උදේත් මේ කාරණය සඳහන් කළා, මට පිළිතුරක් ලැබුණේ නැති නිසායි ඔබතුමාගෙන් අහන්නේ. ඒ කාලයේ විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයෙන් අපි ඉදිරිපත් කළා "ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය".

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලි කර ගැනීමක් නම්, එය කළ හැක්කේ ගරු ඇමතිතුමාගේ අවසරය තිබුණොත් විතරයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පැහැදිලි කර ගැනීමක්. එතුමාගේ අවසරය ඇතිවයි එය කරන්නේ. එතුමා මට අවසර දෙයි. මෙය විද්වත් කාරණයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසර තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් ප්‍රශ්නය අහන්න. දීර්ඝ පැහැදිලි කිරීමක් අවශ්‍ය නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බලශක්ති ප්‍රතිපත්තිය, ගැසට් කළ නීත්‍යානුකූල ලේඛනයක්. ඒක යාවත්කාලීන කරනවා ද, නැත්නම් ඒ මත පදනම් වෙලා ඔබතුමන්ලා ඉදිරි වැඩ පිළිවෙළක් සකස් කරනවා ද? ඇත්ත වශයෙන්ම අද අවශ්‍ය වන්නේ එය යාවත්කාලීන කිරීමයි. මොකද, ගොඩක් වෙනස්කම් සිදු වෙලා තිබෙනවා පසුගිය අවුරුදු 6ක කාලයට. ඇයි බලශක්ති ප්‍රතිපත්තිය -සම්පූර්ණ ප්‍රතිපත්තිය- කඩිනමින් යාවත්කාලීන කරන්නේ නැත්තේ?

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
කාරණය පැහැදිලියි. යාවත්කාලීන කිරීමකට වඩා, ඒ තිබුණු තත්ත්වයත්, මේ තිබෙන තත්ත්වයත්, අනෙකුත් තත්ත්වයනුත් සැලකිල්ලට භාජනය කරලා අනාගත දැක්ම, ඒ කියන්නේ බලශක්තිය සම්බන්ධව 2050 ඉලක්ක කර ගනිමින් තමයි මේ වැඩසටහන එන්නේ.

මම එහි කාරණා කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්නම්. ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් ඔස්සේ මේ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. ඒවා තමයි, affordable, secure, cleaner energy supply කියන එක, smart,sensible, people-centric energy කියන එක සහ strategic-global integration in energy sector කියන එක. මා අර කලින් සඳහන් කළ Energy Transition Act එකේ ප්‍රධාන පරමාර්ථය තමයි වැඩ කටයුතු කරද්දී එම කර්මාන්තයේ -එම ක්ෂේත්‍රයේ- ඉන්න විවිධ කණ්ඩායම් එකට සම්බන්ධීකරණය, නීතිමය ආයතනයකට සම්බන්ධීකරණය. උඩින් තිබෙන පනත තමයි, Energy Transition Act එක. ඒ Energy Transition Act එක ඉතාම නුදුරු කාලයේදී අපි ඉදිරිපත් කරනවා, කැබිනට් අනුමැතිය සහිතව ඒ කටයුතු එළියට ගන්න.

දැනට තිබෙන විදුලිබල පනත සම්බන්ධවත් ඒ වාගේම තත්ත්වයක් තිබෙන්නේ, ඒක සංශෝධනය කරනවා ද, කරන්නේ මොනවාද කියන එක ගැන. විශේෂයෙන් මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අදහස් අතර ගැටුමක් තිබෙනවා කියලා කියනවා. ඇත්තටම එහෙම ගැටුමක් නැහැ. ඒ සඳහා පත් කරන ලද විශේෂ කමිටුව ඉදිරිපත් කරලා තිබෙන කාරණාත්, ජනාධිපතිතුමා ඉදිරිපත් කළ කාරණාත් කියන සියල්ලේ තිබෙන්නේ සමතුලිතයක්.

ඒ සමතුලිතයේ එක එක විෂය කාරණා ගත්තාම අපට එකක්, දෙකක් වෙන් වෙන් වශයෙන් අරගෙන පෙන්වන්න පුළුවන්. නමුත් ඒ සියලු කාරණා මම අර කලින් සඳහන් කරපු ක්ෂේත්‍ර තුන යටතට වැටෙනවා. ඒක තමයි අපේ අරමුණ. ඒ ක්ෂේත්‍ර තුන යටතට වැටෙන කොට, අපේ ජාතික ජනබලවේගය ඉදිරිපත් කරපු බලශක්තිය සම්බන්ධ ප්‍රතිපත්තියේ තිබෙන සියලු කාරණා අඩු වැඩි වශයෙන් මෙතැනට ඇතුළත් කරලා තිබෙනවා.

අපි බලශක්තිය ගැන මෙච්චර සැලකිලිමත් වෙන්නේ ඇයි? බලශක්තිය හුදෙක්ම භාණ්ඩයක්ද, සේවයක්ද, මොකක්ද කියන කාරණය ගත්තාම, ඒකේ තිබෙනවා ටිකක් සංකීර්ණත්වයක්. හේතුව, මේක ඇතුළේ භාණ්ඩයක් තිබෙනවා, මේක ඇතුළේ සේවා ගණනාවක් තිබෙනවා. භෞතික භාණ්ඩයක් ලෙස අපි දුරකථනය අරගෙන බලමු. සමාගම් 10කින් හැදුවත්, 20කින් හැදුවත් ඒවාට භාවිත කරන මූලාශ්‍ර අඩු වැඩි වශයෙන් එකයි; ඒ තාක්ෂණය එකයි; ඒ යොදා ගන්නා උපකරණ එකයි. හැබැයි, බලශක්තිය එහෙම නොවෙයි. බලශක්තිය යොදා ගන්නා මූලාශ්‍රය අනුව වෙනස් වෙනවා. පුනර්ජනනීය බලශක්තියට ලැබෙන මූලාශ්‍රයත්, thermal power සඳහා ලැබෙන මූලාශ්‍රයත් වෙනස් වෙනවා. ඒ නිසා පිරිවැය වෙනස් වෙනවා. ඒ පිරිවැය ගණනය කිරීමේදී රටක් වශයෙන් ගන්න කොට, විදුලි පාරිභෝගිකයා ගන්නේ thermal powerවලින් වෙනමද, සුළං බලයෙන් වෙනමද, hydropowerවලින් වෙනමද කියන කාරණය අපට තෝරන්න බැරි වෙනවා. ඒක නිසා තමයි බොහෝ දුරට සාමාන්‍ය - average - මිලකරණයකට යන්නේ. ඒක නිසා අපේ ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධානම අරමුණක් තමයි මෙන්න මේ සාමාන්‍ය මිල පහළට අරගෙන එන එක. මේ තිබෙන සංකීර්ණත්වය සලකලා මේ මිල එකවර පහළට ගෙන එන්න බැහැ. ක්‍රමිකව ඒක පහළට අරගෙන එන්න තමයි අපි අවුරුදු දෙකක්, තුනක් ඇතුළත බලශක්තියේ පිරිවැය තුනෙන් එකකට අඩු කරනවා කියන්නේ.

ඒ වාගේම තිරසාර බලශක්ති මිශ්‍රණයක් අවශ්‍යයි. දැන් ගණන් හදලා බලලා තිබෙන විධියට ලෝකයේ පුනර්ජනනීය බලශක්තියේ ධාරිතාව වසර 2050 වනවිට වේගයෙන් වැඩි වෙනවා. පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති ක්ෂේත්‍රයට සියයට 77ක් එකතු වෙනවා. ඒක නිසා අපේ යෝජනාවේත් තිබෙන්නේ පුනර්ජනනීය බලශක්තිය අපේ බලශක්ති මිශ්‍රණය ඇතුළේ කොහොමද, සියයට 70කට ගෙන එන්නේ කියන කාරණය. ඒ වාගේම, 2050 වෙනකොට net zero emission එක අත්පත් කර ගැනීමේ බලාපොරොත්තුවෙන් මේ වැඩ කටයුත්තට සම්බන්ධ වෙනවා. මේ කටයුතු පහසු කිරීම සඳහා මේවායේ වැඩ කටයුතු කිරීමට ක්ෂේත්‍රයේ digital platforms ක්‍රියාත්මක කිරීමත්, ඒවාට පහසුකම් සැලසීමත්, විශේෂයෙන් ගෙවීම, මිලදී ගැනීම, procurement සහ සම්පත් කළමනාකරණයත් මේ digitalization එක ඇතුළේ කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒකට හේතුව මෙයයි. ලංකාව කුඩා රටක්. අපට සීමාසහිත ඉඩම් ප්‍රමාණයක් තිබෙන්නේ. මේ ඉඩම් වඩාත් ඵලදායී විධියට පරිහරණය කිරීමේ සැලැස්මක්, Land Utilization Policy එකක් රට ඇතුළේ සාකච්ඡා කරන්න තිබෙනවා. ඒක පුළුල්ව ඉදිරියට ගෙන ගොස් ලංකාවේ National Physical Planning Department එකත් එක්ක සම්බන්ධ කරලා ඉදිරියේදී වැඩ කටයුතු කරන්නත් අපි යෝජනා කරලා තිබෙනවා. 2025දී ක්‍රියාත්මක කරන්නට ඕනෑ දේවල් මේ තිබෙන Results Delivery Framework ඇතුළේ තිබෙනවා.

ඒකේ තුන්වැනි කොටස යටතේ තිබෙනවා, Strategic Global Integration in Energy Sector කියලා. ඒකෙදි අපි බලාපොරොත්තු වෙනවා - to establish State Agency for Green Hydrogen, පුනර්ජනනීය පැත්තට යොමු කර ගැනීමට. ඒ වාගේම මේ වැඩ කටයුත්ත පහසු කරගැනීම සඳහා අපි යෝජනා කරනවා, ජාතික මට්ටමේ බලශක්ති ප්‍රතිපත්ති සහ සැලසුම් කිරීමේ කාර්යාලයක් - National Energy Policy Planning Office - ස්ථාපිත කරන්න. ඒ කටයුතුත් මේ වර්ෂයේ මැද වනකොට අපි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

බලශක්තියේ තිබෙන සංකීර්ණතාව සහ ප්‍රසාරණය - පැතිරීම - ගත්තාම සමාජයත් එක්ක සම්බන්ධ වෙනවා. ඒ නිසා පරිසරය, සමාජයීය කාරණා, පාලනය - Environment, Sustainability and Governance - ESG - framework එකකුත් මේක ඇතුළේ අපි යෝජනා කරලා තිබෙනවා. විශේෂයෙන් බලශක්ති ක්ෂේත්‍රයේ දිගින් දිගටම අපි පවත්වාගෙන ආපු ක්‍රමය නිසා ඇති වෙච්ච ගැටලු ගණනාවක් තිබුණා. විශේෂයෙන්ම පරිපාලනය, මූල්‍ය

කළමනාකරණය, මෙහෙයුම් කළමනාකරණයේ සිදු වෙච්ච ගැටලු නිසා අපි කවුරුත් දන්නවා ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවටත්, ලංකා විදුලිබල මණ්ඩලයටත් විශාල ණය බරක හිර වෙන්න සිදු වුණා කියලා. ඒ වාගේම Treasury එක හරහා on-lending කරපු ණයත්, ඍජුව ගත් ණයත් නිසා ණය පොලී වැඩි වීම නිසා විදේශ විනිමය අනුපාතවල ඇති වෙච්ච බලපෑම් නිසාත් ඇත්තටම දරා ගන්න බැරි මට්ටමක පාඩු සිදු වෙලා තිබුණා. මේ මොහොත වන කොට අපි උපක්‍රමශීලීව කටයුතු කරනවා. මේ වෙනුවෙන් කලින් ආණ්ඩු යම් යම් ක්‍රියාමාර්ග ගත්තා. අපි ඒවා නැහැ කියලා කියන්නේ නැහැ. අපි ඒ සියල්ල සැලසුම්සහගතව කරන්න උත්සාහ කරනවා. අනවශ්‍ය ණය බරකින්, පීඩනයකින් හිර වෙලා, දරා ගන්න බැරි පොලී අනුපාතයක් තිබෙන මේ බලශක්ති ක්ෂේත්‍රයේ ආයතන ටික එතැනින් මුදවා ගෙන, නිවැරැදි කළමනාකරණය යටතේ ඔවුන්ට ඒ වැඩ කටයුතු කරගෙන යන්න පහසුකම් සම්පාදනය කිරීමත් මේ වෙනකොට අපි සිදු කරමින් තිබෙනවා.

ඒ අනුව ලංකා බැංකුවට, මහජන බැංකුවට විශාල වැය බරක් දරන්නත් සිදු වෙලා තිබෙනවා, අතීතයෙන් අරගෙන ආපු ණය - legacy debt - පියවීමේ කාරණය නිසා. ඉතින් ඒ තත්ත්වයත් එක්ක අපි බලාපොරොත්තු වෙනවා, තිරසාර ආකාරයට ලංකාවේ බලශක්තිය අනාගතයේදී ක්‍රියාත්මක කරලා, අඩු පිරිවැයකට තිරසාර මට්ටමකට ගෙන එමින් ඒ බලශක්ති සේවා සැපයීමට. ඒ විතරක් නොවෙයි, බලශක්තිය සමස්ත ආර්ථිකය ප්‍රසාරණය කරන මෙවලමක් විධියට පාවිච්චි කරගෙන, අපේ රටට ආවේණික වෙලා තිබෙන සුළං සහ සූර්ය බලශක්තියත් ප්‍රයෝජනයට අරගෙන අනාගතයේදී අපේ රට ඇතුළේ නිෂ්පාදන අවශ්‍යතාවට අවශ්‍ය බලශක්තියෙන් එහා යන නිෂ්පාදනයක් අපට කරන්න පුළුවන් නම් අන්න ඒ සඳහාත්, අපනයනය කිරීමේ උනන්දුවෙනුත් ඕනෑකමිනුත් අපි කටයුතු කරමින් ඉන්නවා.

ඒ සඳහා මේ 2025 වර්ෂයට අපට හැකි පමණින් ඒ මුදල් ආයෝජනය කරලා තිබෙනවා. අපේ මේ අය වැය ඇස්තමේන්තුවල 134වැනි පිටුවේ තිබෙනවා, අපේ රුපියල් බිලියන 20කට ආසන්න මුදල් ප්‍රමාණය වියදම් වෙලා තිබෙන හැටි. ඒක සාරාංශ වශයෙන් ගත්තාම, විශේෂයෙන්ම විදේශීය අරමුදල් පාදක කරගෙන ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවලට වෙන් කරනවා, ඒ සමස්ත වියදමින් සියයට 93ක්. ඒ සමස්ත වියදමින් සියයට 93ක් යන්නේ විදුලිය නිෂ්පාදනයට, සම්ප්‍රේෂණයට සහ බෙදා හැරීමට. ඉන්, අරමුදල් පාදක කරගත් එ්වාට සියයට 39කුත්, කොළඹ නගරයේ අපද්‍රව්‍ය භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය කිරීමට සියයට 6කුත්, කුඩා දුපත්වල හයිබ්‍රිඩ් ක්‍රමයට පුනර්ජනනීය බලශක්තියත් සම්බන්ධ කරගෙන සියයට 15කුත්, කෙරවලපිටිය සම්බන්ධ කරගෙන තිබෙන දෙවන අදියරේ ව්‍යාපෘතිය සඳහා සියයට 35.5කුත් මුදල් වියදම් කරලා තිබෙනවා. ඒ විශේෂයෙන්ම කැපී පෙනෙන වියදම්.

ඊට අමතරව විශේෂයෙන්ම සැලසුම්කරණය - procurement - කියන කාරණය ඉතා වැදගත්. ඒ නිසා විදුලි බල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ලේකම් කාර්යාලයක් පිහිටුවීමටත් රුපියල් මිලියන 108ක් වෙන් කරලා තිබෙනවා.

මගේ අදහස් දැක්වීම මෙතැනින් අවසන් කරන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි බලාපොරොත්තු සහගතව ලංකාවේ ආර්ථිය හැසිරවීමේ ප්‍රධාන බලවේගයක් විධියට බලශක්තියේ හැකියාව අපේ ආණ්ඩුව යටතේ නිසි පරිදි කළමනාකරණය කරමින් අවශ්‍ය පරිදි පෞද්ගලික අංශයත් මේ සඳහා කැඳවමින් Public-Private Partnerships හරහා වඩාත් පාරදෘශ්‍ය ආකාරයට මේ කටයුතු කරනවා කියලා සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.59]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ කථා කරන්න ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. මම අහන්න කැමැතියි මේ බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය කුමක්ද කියලා. ඒ කියන්නේ, එතැන වෙළඳපොළක් නිර්මාණය කරන්නද උත්සාහ කරන්නේ? එහෙමත් නැත්නම් තනි ගැනුම්කරුවෙක් මේ යන විධියටම ඉස්සරහට අරගෙන යන්නද? ඒක තමයි මූලික දේ. මොකක්ද ideology එක? අවුරුදු ගණනක් තිස්සේ වැරැදියට කරපු ආර්ථික ප්‍රතිපත්ති නිසා කඩා වැටුණා කිව්වා. ඒ නිසා වෙනස් කරන්න ඕනෑ කිව්වා. එතකොට බලශක්ති ක්ෂේත්‍රයේ මොකක්ද කරන්න යන වෙනස? අපි දැක්කා, Ceylon Electricity Board එකේ loss එක 2022දී රුපියල් බිලියන 298යි. හැබැයි, අපි පිරිවැයට සාපේක්ෂව tariff එක adjust කරන්න තීරණය කළාට පස්සේ 2023දී profit එක රුපියල් බිලියන 61යි. 2024 ඔක්තෝබර් වෙනකල් profit එකක් තිබෙනවා රුපියල් බිලියන 140ක් වාගේ. එතකොට, ඒ decision එක නිසා මෙච්චර කල් loss-making වෙලා තිබුණු State-owned enterprise එකක් profit -making වෙලා තිබෙනවා. එතකොට දැන් මට තිබෙන ප්‍රශ්නය මේ වෙනස් වීම ඉස්සරහට කොච්චර දුරට කරගෙන යන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවාද, නැද්ද කියන එක.

ගරු ඇමතිතුමා කිව්වා 2024 Electricity Act එක සංශෝධනය කරන්න ඔබතුමන්ලා තීරණය කළා කියලා. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඒක කැබිනට් මණ්ඩලයට දැම්මාම Legal Draftsman වෙත යවන්න, ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට ඒකට සම්පූර්ණයෙන්ම වෙනස් අදහස් ඉදිරිපත් කළා. මට තිබෙන ප්‍රශ්නය මෙයයි. මම කලින් කිව්වා වාගේ පල්ලියේ පූජකතුමා පන්සලේ බණ කියන්න බයිබල් එක අරගෙන ඇවිල්ලාද, නැද්ද? ඒක හොඳ උදාහරණයක් නිසා මම ඒක ගන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 23.01.25 දිනැති Cabinet Memorandum එක මම **සභාගත*** කරනවා.

මෙහි, "…to revisit the Electricity Act .... යනුවෙන් පටන් ගෙන, "(i) to grant approval (a) to carry out an extensive review…" ලෙස සඳහන් වෙනවා.

මෙන්න මේ කොටස වැදගත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහි සඳහන් වෙනවා, "(b) to appoint a Committee comprising of key stakeholders, experts in the electricity sector and energy policies..." යනුවෙන්. ඒ කියන්නේ, ප්‍රධාන පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන්න කියලා තිබෙනවා, මේ amendments ගෙනෙන්න. මාසයක් ඇතුළත

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

report එකක් ගෙනෙන්න කියලා තිබෙනවා. දැන් මෙතැනදී කවුද පත් කළ කමිටුව කියන එක වැදගත් වෙනවා. මේ කමිටුවට පත් කර තිබෙන 9දෙනාම electrical engineersලා. ඒ 9දෙනාගෙන් 6දෙනෙක් විශ්වවිද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරු. ඊළඟට LECO එකෙයි, CEB එකෙයි ප්‍රධානීන් දෙදෙනා පත් කර තිබෙනවා. එතැන ලබැඳියාවන්ගේ ලොකු ගැටලුවක් තිබෙනවා. ඊළඟට, පෞද්ගලික අංශය නියෝජනය කරමින් එක පුද්ගලයෙකු පත් කර තිබෙනවා. මෙතැන නීතිඥවරු කිසි කෙනෙක් නැහැ; මූල්‍ය විශේෂඥයන් කිසි කෙනෙක් නැහැ. ඊළඟට, corporate executivesලා එක්කෙනෙක් ඉන්නවා. ඊට පස්සේ NPP දේශපාලන unionsවලින් 4දෙනෙක් ඉන්නවා.

මේ අය Concept Paper එකක් ඉදිරිපත් කළා. මේ Concept Paper එක තමයි ජනවාරි මාසයේ කැබිනට් මණ්ඩලයට දැම්මේ, අලුත් නීතියක් හැටියට Electricity Act එකට amendments ගෙනෙන්න කියලා. ඒක දැම්මාම මුදල් අමාත්‍යාංශයෙන් ඒ පිළිබඳව ඔවුන්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිරීක්ෂණ ඉදිරිපත් කළාම කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන තිබෙනවා. මෙහිදී කියනවා, "ඔව්, යම් නිරීක්ෂණ වගයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒක නැවතත් මේ කමිටුවට දාලා දින නියමයක් නැතිව කවදා හරි දවසක මේ සංශෝධන පිළිබඳව අලුත් වාර්තාවක් ලබා දෙන්න" කියලා. මම කියන්න කැමැතියි, පළමුවෙන්ම කියලා තිබුණේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සියලුදෙනාගෙන් සමන්විත කියලායි. එතකොට Electricity Act එක වෙනස් කරනකොට,- *[බාධා කිරීමක්]* ඔව්, ඉංජිනේරු අංශයට ලොකු වගකීමක් තිබෙනවා. හැබැයි, ඊට වඩා එහා ගිය ගොඩක් දේවල් තිබෙනවා. මේකේ financial viability එක මොකක්ද, මේකේ legal පැත්ත මොකක්ද, මේකේ investments ගෙනෙන්නේ මොනවාද කියන එක බලන්න ඕනෑ. ඒ නිසා අලුත් කමිටුව පිළිබඳව නැවතත් හිතන්න කියලා මම රජයට කියන්න කැමැතියි.

දැන් මම මූලික වශයෙන් කාරණා 5ක් ගන්නම්, අනුර කුමාර දිසානායක ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට එවා තිබෙන නිරීක්ෂණ. මේකේ පළමුවැනි එක තිබෙන්නේ, "A Committee is proposed to be established in place of the 'National Electricity Advisory Council.' " "However, it is essential to consult all the relevant stakeholders and organizations during the development of the aforesaid policy." "Final recommendations and approvals must be obtained in accordance with existing Government procedures and regulations." මොකක්ද මේ කියන්නේ? ජනාධිපතිතුමා කියනවා, ඒකපාර්ශ්විකව මේක කරන්න බැහැ කියලා. මේකට consultation එකක් ඕනෑ; මහජන උපදේශනයක් ඕනෑ. අපි දැක්කා නේ, මහජන උපදේශන කණ්ඩායම නිසා තමයි අපේ විදුලි බිලේ සංශෝධනයක් කරගන්න පුළුවන් වුණේ කියලා. මොකද, CEB එකේ ඉංජිනේරු මහත්වරු ඇතුළු උදවිය කිව්වේ, "නැහැ, නැහැ අපට සියයට එකකින් විතරයි විදුලි බිල අඩු කරගන්න පුළුවන්" කියලා නේ. නමුත්, විදුලි බිල සියයට විසි ගණනකින් අඩු කරන්න හේතුව වුණේ රට වටා තිබ්බ public consultations නිසායි. දැන් ඔයගොල්ලන් tariff, ඒ කියන්නේ විදුලි මිල තීරණය කරනකොට කලින් කිව්වා, "අපට අඩුම මිලට තමයි තීරණය කරන්න ඕනෑ" කියලා.

මම එක උදාහරණයක් කියන්නම්. මේක තිබෙන්නේ ඔබතුමන්ලාගේ Concept Paper එකේ 28වැනි පිටුවේ, "Present Section" යටතේ. එහි Section 29 (1) ට අදාළව මෙසේ සඳහන් වෙනවා:

> "The national tariff policy shall include the principles to be adopted by the Regulator…"

ඒ කියන්නේ, නියාමන කොමිසම හරහා මේ ප්‍රතිපත්තිය තීරණය වෙන්න ඕනෑ කියලා. එහි "Proposed Amendment" යටතේ දැන් මෙගොල්ලන් කියනවා, "නැහැ, ඒ පමණක් මදි; බලශක්ති අමාත්‍යාංශයත් ඒකට එකතු කළ යුතුයි" කියලා. ඇත්ත වශයෙන්ම මම ඒක පිළිගන්නවා. මොකද, නියාමන කමිටුවට ගිහිල්ලා රජයේ ප්‍රතිපත්තිය ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්න ඕනෑ.

හැබැයි එහි "Present Section" යටතේ 29(2) කොටසට අදාළව මෙසේ සඳහන්ව තිබෙනවා.

> "In setting the tariffs, the Regulator shall ensure financial sustainability including a reasonable return on the investment of the regulated entities."

දැන් එතැන "Proposed Amendment" යටතේ ඔබතුමන්ලා කියනවා, "නැහැ, ඒක අවශ්‍ය නැහැ. 'In setting the tariffs, the Ministry of Energy and the Regulator shall ensure…' " කියලා. එතකොට මේ වෙන්නේ විදුලි බිලේ මිල තීරණය කරන එක දේශපාලනීකරණය කරන්න හදන එකයි. Regulatorව අයින් කරන්න හදනවා; Regulatorට දීලා තිබෙන බලය ඇමතිවරයා ගන්න හදනවා. ඔක තමයි එදා වුණේ.

එදා විදුලි බිල සියයට එකකින් අඩු කරන්නම් කියලා අවසානයේදී සියයට විසි ගණනකින් අඩු කළේ මේ බලය ඇමතිවරයාට නැති නිසායි. ඉතින්, ඇමතිවරයා මොකක්ද මේ කරන්න හදන්නේ? එදා ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා, මේක ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියලා තමයි ඒගොල්ලන් practise කරන්නේ කියලා. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ public consultation කියන එක. ඒක ඉවත් කරන්න කිසිම හැකියාවක් නැහැ. එතකොට මේ tariff එක ගත්තාම, final consumer tariff එක විතරක් නොවෙයි, feed-in tariff එකක් තිබෙනවා, මාස හයෙන් හයට determine වෙන. ඒක කරන්නෙත් ආණ්ඩුවෙන්. ඊට පස්සේ power purchase tariff එකක් තිබෙනවා new generation එකට. ඒකටත් ඇමතිවරයා මැදිහත් වෙනවා. ඇමතිවරයා මොකටද ඒවාට මැදිහත් වෙන්නේ? ඇමතිවරයා මොකටද tariff එක සම්බන්ධයෙන් මැදිහත් වෙන්නේ? ඇමතිවරයාට ඒකේ ක්‍රියාවලියක් නැහැ. ඇමතිවරයා ඉන්නේ ප්‍රතිපත්ති හදන්න. නියාමන ආයතන තමයි ඒ වෙනුවෙන් පෙනී සිටින්නේ. ඒක හරි. ජනාධිපතිතුමා හරියට හරි. මම ජනාධිපතිතුමා එක්ක සියයට 100ක් එකඟයි. ඔයගොල්ලන් කියපු දේ කරන්න බැහැ. ඒක කළ යුතු නැහැ.

ඊළඟට, මේකේ තිබෙනවා මේ procurement ගැන, " .... obtained in accordance with existing Government procedures and procurement" කියලා. දැන් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා දිගින් දිගටම Mannar Wind Power Project එක ගැන කථා කළා. මම හිතන විධියට තවත් කට්ටිය ඒ ගැන කථා කරලා තිබෙනවා, කලින් ඇමෙරිකානු ඩොලර් 4.85ට තිබුණු එක වෙනුවට 4.65ට ගත්තා කියලා. දැන් අහනවා, "ඔව්, දශම 2ක් අඩුයි, ඒ නිසා මොකක්ද ඔයගොල්ලන්ට තිබෙන ප්‍රශ්නය?" කියලා. ප්‍රශ්නය තිබෙන්නේ, ඒක කලින් reject වෙච්ච bid එකක්. Technically qualified නැති bid එකක් කියන එක තමයි මෙතුමා ඉදිරිපත් කරපු තර්කය. එහෙම නම්, ඒක Procurement Guidelines අබිබවා ගිහින් කරපු දෙයක්. එතැනයි ගැටලුව තිබෙන්නේ. එතැන good governance එකක් නැහැ.

තව දෙයක් තිබෙනවා. මේක ඉතාම වැදගත් දෙයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට ඕනෑ අඩුම පිරිවැයට විදුලිය ගන්න කියලා ඇමතිතුමා කිව්වා. මේ Concept Paper එකේ

13වන පිටුවේ දැනට තිබෙන පනතේ 5(3)(ඕ)ට අදාළව තිබෙන්නේ මොකක්ද කියා මා කියන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "…capacity in accordance with the Long Term Power System Developed Plan and least cost to economic dispatch..."

Least cost කියන්නේ අවම පිරිවැයට අනුව ගන්න ඕනෑ කියලා. ඒක නියාමන කොමිෂන් සභාවෙන් හොඳට කිරලා බලලා කියයි මේක තමයි least cost කියලා. දැන් මේක නියාමන කොමිසමෙන් ඇමතිවරයාට ගියාම මොකක්ද වෙන්නේ? ඔබතුමා විශ්වාස කරන්න, මම මේ කියන කථාව. ඔබතුමා බලන්න, 13 වන පිටුවේ, Proposed Amendmentsවල "least cost" කියන එක අයින් කරලා තිබෙනවා, "least cost" කියන එක කපලා තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නෑ!

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
නැත්තේ නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
JVP ආණ්ඩුවක්?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔව්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
JVP ආණ්ඩුවක් එහෙම කරනවාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මේකේ නැහැ.

පනතේ තිබෙන්නේ "…System Development Plan and least cost economic dispatch…" කියලා. මෙතැන තිබෙන්නේ "…System Development Plan and economic dispatch…" කියලා. කෝ, අවම පිරිවැය - least cost - කියන එක? ඇත්තටම ඔයගොල්ලන් මේක කැපුවාද, නැත්නම් වැරදිලා කැපුණාද? ඒ නිසා ඔයගොල්ලන් කියන්න මොකක්ද මේ කරන්න හදන්නේ කියලා. ජනාධිපතිතුමා එතැනත් හරි. ඔයගොල්ලන් වැරදියි. මොකද, ජනාධිපතිතුමා කියන්නේ least cost තිබෙන්න ඕනෑ කියලා.

එතුමා කියන දෙවැනි කාරණාව මොකක්ද? මේකේ කියනවා, "The objective is to support the electricity industry by segregation and separation" කියලා. "Single buyer electricity market is intended as the initial phase before transitioning to a wholesale and retail electricity market, it is essential to establish a definite timeline." අන්න, ජනාධිපතිතුමා කියනවා, "මේක මේ ඔයාට ඕනෑ කවදාහරි දවසක කරන්න බැහැ, definite timeline එකක් දෙන්න, දිනයක් දෙන්න, දින වකවානුවක් දෙන්න, නැතුව කියන්න බැහැ, අපි මේක වෙළෙඳ පොළක් කරන්නේ කවදාහරි දවසක" කියලා. ගරු ඇමතිතුමා, ඔය ගොල්ලන් වෙළෙඳ පොළ පිළිගන්නවා නම් ඒක කරන්න දින වකවානුවක් දෙන්න. නැතුව, කවදාහරි දවසක කරනවා කියලා කියන්න එපා. ජනාධිපතිතුමා නැවතත් හරි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 3ක් දෙන්න පුළුවන්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට තවත් විනාඩි 3ක කාලයක් ලබා දෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මේකේ ඉතාම හොඳින් කියලා තිබෙනවා. ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය වෙළෙඳ පොළක් නිර්මාණය කරන එක. ඔයගොල්ලන්ගේ ප්‍රතිපත්තිය වෙන මොකක්ද එකක්. ඒක ජනාධිපතිතුමා කෙළින්ම පෙන්වා දී තිබෙනවා.

ඊළඟට, තුන්වැනි කාරණාව හැටියට තිබෙනවා, මේ separate successor companies for generations හැදුවාම, මේ consumer tariff එකටත් බලපානවා කියලා. මේකේ තිබෙනවා generation companies වෙනම, transmission companies වෙනම, distribution companies වෙනම හදන්න ඕනෑ කියලා පරණ Act එකේ වාගේම. හැබැයි, වෙනස තමයි මේ සියලුම ආයතනවල සියයට 100ක් සම්පූර්ණ අයිතිය තිබෙන්නේ ආණ්ඩුවට වීම. ශ්‍රී ලංකා රජයට තමයි සියයට 100ක් අයිතිය තිබෙන්නේ. එතකොට, ජනාධිපතිතුමා කියනවා මෙන්න මෙහෙම දෙයක්. "Strengthening the transmission network needs extensive financial investment for maintenance, development and improvement. Hence, it is essential to revisit holding 100 per cent of shares for the above company under the Government and it is crucial to entertain private investments for the above." මොකක්ද, මේ ජනාධිපතිතුමා කියන්නේ?

ජනාධිපතිතුමා අහනවා, ඔයගොල්ලන් මොනවාද මේ කියන්නේ කියලා. ඔයගොල්ලන් කියන්නේ, ඔයගොල්ලන්ගේ මූලික හරය වෙන්නේ, generation assets, transmission assets, distribution assets සියයට සියයක් ආණ්ඩුවේ තිබෙන්න ඕනෑ කියන එක. ජනාධිපතිතුමාගේ submission එකේ තිබෙනවා, එහෙම වෙන්න හැකියාවක් නැහැ කියලා. ඉතින්, මොකක්ද මේ කියන්නේ? මේ බයිබලයද, ත්‍රිපිටකයද, ධම්ම පදයද, කුරානයද, මොකක්ද? මොකක්ද මේ කියන්නේ? ඒක තමයි අපි ඇහුවේ. ඔබතුමන්ලා JVPද, NPPද, මොකක්ද? ජනාධිපතිතුමාද හරි, එහෙම නැත්නම් විදුලිබල ඇමතිද හරි? දෙකෙන් එකක් කියන්න.

ඊළඟට තිබෙනවා, policy-based loans ගන්න reformsවලට ඒගොල්ලන් එකඟ වෙලා තිබෙනවා කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසාන වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම විනාඩියෙන් කථාව අවසන් කරනවා.

ඊළඟට, අර වඳුරාගේ අභාවය වුණාට පස්සේ ඔයගොල්ලන් කිව්වා, pump storage එකක් දමන්න ඕනෑ කියලා. Pump storage එක දමන්න ඩොලර් බිලියන 1.3ක් විතර යනවා කියලාත් කිව්වා. ඔයගොල්ලන් ගිහින් ADB එකට කිව්වා, අපට මේ සල්ලි දෙන්න කියලා. ADB එක ඔබතුමන්ලාට මොකක්ද කිව්වේ, ගරු ඇමතිතුමනි? මොකක්ද කිව්වේ? කිව්වාද සල්ලි දෙන්නම් කියලා? ඒගොල්ලන් කිව්වා, එහෙම සල්ලි දෙන්න බැහැ කියලා. ඔයගොල්ලන්ට සල්ලි ඇත්තේත් නැහැ, ඔයගොල්ලන්ට සියයට 13ක cap එකක් තිබෙන නිසා සල්ලි තිබුණත් වියදම් කරන්නත් බැහැ, අපට ඔයගොල්ලන්ට බිලියන 1.5ක් දෙන්නත් බැහැ, ඒ නිසා private-public enterprise එකක් හදන්න ඕනෑය කියලා කිව්වා. හැබැයි, ඔයගොල්ලන්ගේ නීතිය අනුව ඒක කරන්න බැහැ. Transmission network එකට ඔයගොල්ලන්ට private investments දෙන්න බැහැ. මොකද, ඒක සියයට සියයක් ආණ්ඩුව තියාගෙන ඉන්නවා. ඒ නිසා එක්කෝ රැවුල, නැත්නම් කැඳ. දෙකෙන් එකක් තෝරාගන්න. මොකද, අවශ්‍යතාව ඔයගොල්ලන්ගේ. ඊළඟට උත්තර දෙනකොට කියන්න, අපි මේක පෞද්ගලීකරණය කරන්නම්, එහෙම නැත්නම් කවදා හෝ යම් කොටස් ප්‍රමාණයක් පෞද්ගලික අංශයට ලබා දෙන්න සූදානම්ද, නැද්ද කියන එක. ඒක කෙළින්ම කියන්න.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අදුත්තු, கௌரவ (கலாநிதி) எம்.எல்.ஏ.எம்.ஹிஸ்புல்லாஹ் அவர்கள்! உங்களுக்கு 11 நிமிடங்கள் உள்ளது.

[பி.ப. 3.13]

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற வலுசக்தி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மிகவும் சந்தோசமடைகின்றேன். இந்த அமைச்சானது இந்த நாட்டின் முதுகெலும்பு போன்றது. அதுமாத்திரமன்றி, முக்கிய திணைக்களங்களைக்கொண்ட ஓர் அமைச்சுமாகும். இந்த அமைச்சின் பணிகள் சிறப்பாக அமைய வேண்டுமென நாங்கள் பிரார்த்திக்கின்றோம். நாட்டு மக்களின் நலனையும் நாட்டின் பொருளாதார நிலைமையையும் கருத்திற்கொண்டு, இந்த அமைச்சு செயற்படவேண்டிய தேவையிருக்கிறது. இந்த அமைச்சு ஏனைய அமைச்சுகளைப்போல வெறுமனே ஒரு வியாபார நிறுவனம்போல செயற்படாமல், இந்த நாட்டு மக்களுடைய பொருளாதார நிலைமையை -அவர்களுடைய வருமானத்தை- கருத்திற்கொண்டு, நாட்டின் பொருளாதாரத்தைச் சீர்செய்யக்கூடிய வகையில், தனது பணிகளைச் செய்ய வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த 2-3 நாட்களாக இந்த நாட்டில் எரிபொருள் சம்பந்தமான பாரியதொரு பிரச்சினை ஏற்பட்டிருப்பது உங்கள் எல்லோருக்கும் தெரியும்! வலுசக்தி அமைச்சின்கீழுள்ள Ceylon Petroleum Corporation திடீரென தனது விநியோகஸ்தர்களுக்குக் கொடுத்த 3 per cent commissionஐ உடனடியாக இரத்துச் செய்ய எடுத்த முடிவை எதிர்த்து, அவர்கள் தங்களது நடவடிக்கைகளை நிறுத்திக்கொண்டதால் பாரியதொரு பிரச்சினை நாட்டில் ஏற்பட்டது. நீண்ட காலமாக Ceylon Petroleum Corporation தனது விநியோகஸ்தர்களுக்கு 3 per cent commissionஐக் கொடுத்து வருகிறது என்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும். அந்த 3 per centஇல்தான் அவர்களுடைய மொத்தச் செலவினமும் அடங்குகிறது. அதாவது, அவர்கள் கொழும்பிலிருந்து எரிபொருளை நாடு முழுவதும் கொண்டுசென்று விநியோகிக்கும் வரையுள்ள அனைத்துச் செலவுகளும் உள்ளடங்களலாக- workers' costs, labourers' costs, transport charges and other maintenance charges என்று எல்லாக் கொடுப்பனவுகளும் உள்ளடங்களாக - அவர்களுக்குக் கிடைகின்ற total income அந்த 3 per cent மாத்திரம்தான். Within that three per cent, they have to cover all the expenses. இப்பொழுது CEYPETCO மாத்திரமல்ல, தனியார் கம்பனிகளான Chinese company - Sinopec, Australian company என்பனவும் அந்த 3 per centஐ வழங்குகிறது. Ceylon Petroleum Corporation திடீரென எடுத்த இந்த முடிவு தவறானது. விநியோகஸ்தர்களோடு கலந்துரையாடித்தான் இந்த முடிவை எடுக்க வேண்டும்.

இன்று நாளாந்த வாழ்க்கைச் செலவு அதிகரித்துக்கொண்டு செல்கின்றது. இதனால் ஊழியர்கள் தங்களது salaryஐக் கூட்டுமாறு கோருகின்றார்கள். இந்த situationஇல், அந்த 3 per centஐக் கூட்டுவதா, இல்லையா? என்பதைத் தீர்மானிக்க வேண்டுமே தவிர, அதை 2 per centஆகக் குறைப்பது பொருத்தமானதல்ல. நான் பல petrol shed ownersஉடன் கதைத்தபோது, இது தங்களுக்கு மிகக் கஷ்டமான ஒரு விஷயம் எனவும் அவ்வாறு செய்தால் உண்மையிலேயே தங்களால் அதை நடத்த முடியாதெனவும் அவர்கள் மிகக் கவலையோடு சொன்னார்கள். அதாவது, "We cannot cover the expenses within two per cent" என்று சொன்னார்கள். ஆகவே, You have to understand their problems and difficulties. நீங்கள் அந்த 3 per centஐ continue பண்ண வேண்டும் அல்லது அவர்களுடன் discuss பண்ணி இது சம்பந்தமான ஒரு தீர்மானத்தை எடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் சொல்லிவைக்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை மின்சார சபையின் பணிகளை நாங்கள் பாராட்டுகின்றோம். அது மிகச் சிறப்பாகப் பணிகளைச் செய்கின்ற ஒரு நிறுவனமாகும். கடந்த காலங்களோடு ஒப்பிடும்போது, இப்பொழுது அவர்களுடைய working capacity - workload - அதிகரித்துள்ளபோதும்கூட, அதைப் பொருட்படுத்தாமல், Ceylon Electricity Board மிகச் சிறப்பாகத் தனது பணிகளைச் செய்துகொண்டு இருக்கின்றது; அதனை நாங்கள் பாராட்டுகின்றோம். இப்பொழுது அதிகமான மக்களுடைய தேவைகள் அதிகரித்திருக்கின்ற சூழ்நிலையில், சில பிரதேசங்களில் புதிய connectionஐ வழங்குவதில் தாமதம் நிலவுகின்றது. அதேபோல், solar connectionsஐ வழங்குவதிலும் delay இருக்கின்றது. அதற்கான

உபகரணங்கள் -meters, connectors போன்றவை- shortagesஆக இருப்பதனால், அதனை வழங்குவதில் அண்மைக் காலமாகச் சிறிது தாமதம் நிலவுகின்றது. எனவே, இலங்கை மின்சார சபை அந்தத் தாமதத்தை மிக விரைவாக நீக்க வேண்டும். அதற்குத் தேவையான ஒத்துழைப்பையும் necessary equipmentஐயும் வலுசக்தி அமைச்சு பெற்றுக்கொடுத்து, அச்செயற்பாட்டைத் துரிதப்படுத்த வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், மதஸ்தலங்களுக்கு solar systemமூலம் மின்சாரத்தைப் பெற்றுக்கொடுப்பதற்கு அனுமதி வழங்கப்பட்டது. ஆனால், கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள பள்ளிவாசல்களுக்கும் கிறிஸ்தவ churchesக்கும் அவற்றை வழங்குவதற்கான அனுமதி புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சினூடாக அல்லது வலுசக்தி அமைச்சினூடாக இன்னும் CEBக்குப் போகவில்லை. Indian Credit Line ஊடாக அதற்கான உதவித் திட்டம் இருந்தும் இன்னும் அதைப் பயன்படுத்வில்லை. தங்களது நிதி நிலைமை காரணமாக வணக்கஸ்தலங்கள் மின் கட்டணத்தைச் செலுத்துவதில் கஷ்டப்படுகின்றன. எனவே, வணக்கஸ்தலங்களுக்கான நிதி ஒதுக்கீட்டினூடாக கொடுக்கப்படவேண்டிய மின் உற்பத்தித் திட்டங்களை அவசரமாக வழங்குவதற்குரிய நடவடிக்கைகளை அமைச்சு மேற்கொள்ள வேண்டும். அதனூடாக CEB தனது பணியைத் துரிதமாகச் செய்ய முடியுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

எந்த அரசாங்கமாக இருந்தாலும் solar energyக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும். அதற்கு மாறாக, டீசல்மூலம் ஒரு கிலோவோட் மின்சாரத்தை உற்பத்தி செய்வதென்றால், இன்றைய நிலையில் one-fourth of the total fuel cost எனும்போது, கிட்டத்தட்ட 80 ரூபாய் cost ஆகின்றது. அதே கிலோவோட் மின்சாரத்தை solarமூலம் உற்பத்தி செய்தால் 34-37 ரூபாய்தான் செலவாகும். அதாவது, அரைவாசி costகூட அரசாங்கத்துக்கு ஏற்படாது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, Public Utilities Commission of Sri Lankaஇன் Director General, Acting GM of CEBக்கு "Re: Requesting the Approval for the Revised Rooftop Solar PV Purchase Tariff" எனத் தலைப்பிட்டு, சில மாதங்களுக்கு முன்னர் அனுப்பிய கடிதத்தில் ஒரு விடயத்தை மிகத் தெளிவாகச் சொல்கிறார்கள்.

It states, I quote:

> "As per the General Policy Guideline for Electricity Industry issued by Ministry of Power under Section 5 of Sri Lanka Electricity Act No. 20 of 2009, Sri Lanka's current energy policy has set a goal for renewable energy adoption in the electricity sector; 70 per cent of electricity generation from renewable sources by 2030. Accordingly, the Long-Term Generation Expansion Plan (2023-2042) approved by the Commission, has identified technology specific targets to achieve the above policy goal, including the rooftop/ ground mounted solar capacity to be added to the system in order to achieve the above policy goal.
>
> The Commission has observed that the solar PV (Rooftop and Ground) capacity addition targets of the Long-Term Generation Expansion Plan have not been achieved so far (Target up to 2024 = 1660MW, but only 1167MW achieved so far. Further, target in 2024 = 483MW, but only 261MW achieved so far and target in 2025 = 505MW) with an additional 3508MW of solar PV capacity still required by 2030."

உண்மையிலேயே எங்களால் முடிந்தவரை solar power systemக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும். அதற்கு மாறாக, இன்று அமைச்சு பல்வேறு விதமான கட்டுப்பாடுகளை விதித்துக்கொண்டு இருக்கின்றது. உதாரணத்துக்கு, on Sundays, there is going to be a curtailment of solar power added to the National Grid. இவ்வாறான செயற்பாடுகள்மூலம் solar power systemக்கு முக்கியத்துவம் கொடுக்காத ஒரு சூழ்நிலையை நாங்கள் காண்கின்றோம். எங்களுடைய targetஇல் 50 per centஐகூட, இன்னும் நாங்கள் achieve பண்ணவில்லை. இந்த நிலையில், நாங்கள் solar powerஐ தாமதப்படுத்தினால், அது இன்னும் costஐ அதிகரிக்கும். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இதைப் பற்றிச் சிந்திக்க வேண்டும்.

The Northern and Eastern Provinces, North-central Province, North-western Province, ஊவா மாகாணத்தின் மொனராகலை போன்ற இடங்களில் solar power systemக்கு அதிகளவு முக்கியத்துவம் கொடுக்க வேண்டும்; அதற்குத் தேவையான specialized ஊழியர்களை நியமிக்க வேண்டும்; அதற்குரிய இணைப்பை வழங்குவதற்கான ஒழுங்குகளைச் செய்ய வேண்டும். அதுமாத்திரமன்றி, அந்த connectionஐ வழங்குவதற்குத் தேவையான instrumentஐ - meters, connectors போன்ற உபகரணங்களை - முன்னுரிமை கொடுத்து purchase பண்ண வேண்டும். அப்படிச் செய்தால், இப்பணியைச் சிறப்பாகச் செய்ய முடியும். வெறுமனே coal energy system ஊடாக மாத்திரம் powerஐப் பெற்றுக்கொள்வதென்பது பிரச்சினைக்குரியது. நீங்கள் சொல்வதுபோல் அல்ல. Coal energy systemஇன் total investment அதிகம். More expensive than solar energy. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் முழு முயற்சி எடுத்து, solar power systemக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.25]

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කියන කථාවලට ඇහුම්කන් දෙනකොට අපට පුදුම හිතෙනවා. පසුගිය කාල සීමාවේදී මේ රට පාලනය කළේ අපිද, ඒගොල්ලන්ද කියන සැකය අපට අංක එකට මතු වෙනවා. දැන් බොහොම ලස්සන කතන්දර කිව්වා. ඒ කතන්දර එතුමන්ලාගේ කාලයේ ක්‍රියාත්මක නොවුණේ ඇයිද කියන ප්‍රශ්නය තමයි අපට මූලිකවම අහන්න තිබෙන්නේ. ඒ වාගේම පට්ටපල් බොරු ටිකකුත් කිව්වා. සාක්ෂි සහිතව මම ඒ කාරණා ගැන කියන්නම්.

අපේ රටේ wind power generation ගැන කිව්වා. 2003 අවුරුද්දේ USAID ආධාර සහිතව එමරල්ඩ් ආයතනයෙන් සමීක්ෂණයක් කර තිබෙනවා. ඒ සමීක්ෂණයෙන් යම් යම් නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. ලංකාවේ දැන් total demand එක මෙගාවොට් 5,000ක්, 6,000ක් විතර කියලා අපි හිතමු. එතකොට ලංකාවේ wind powerවලින් ගන්න පුළුවන් ප්‍රමාණය කොපමණද? Land-based wind farmsවලින් මෙගාවොට් 20,000ක්, lagoon-based wind farmsවලින් මෙගාවොට් 4,000ක්, මුහුදු ආශ්‍රිතව - offshore and sea - සිදු කරන ඉතුරු

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ටිකත් ගත්තාම මෙගාවොට් 50,000ක් wind powerවලින් ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ඒ කියන්නේ, සුළං මඟින් විදුලිය නිපදවා අතිරික්තය අපනයනය කරන තැනට පත් කරන්න පුළුවන්. අපි නිෂ්පාදන ආර්ථිකයක් හදලා මේ රටට ආදායම් ගෙනෙනකොට කෘෂි කර්මාන්තයේ දියුණුව ගැන කථා කරනවා; කර්මාන්ත ක්ෂේත්‍රය ගැන කථා කරනවා; සංචාරක ක්ෂේත්‍රය ගැන කථා කරනවා. ඒ සියල්ල ඉස්සරහට යනවා. ඒ අතරතුර අපට power generation පැත්තෙනුත් ඉදිරියට යන්න පුළුවන් අමිල සම්පත් තිබෙනවා. එක පැත්තකින් සුළඟ තිබෙනවා. අනෙක් පැත්තෙන්, සූර්ය ශක්තිය තිබෙනවා. හෙක්ටෙයාර 13,500කින් මුළු ලංකාවේම විදුලි අවශ්‍යතාව සූර්ය ශක්තියෙන් සපුරා ගන්න පුළුවන්. මෙතෙක් කල් මේ රට පාලනය කළ, මෙච්චර වෙලා කථා කරපු මහත්වරුන්ගෙන් අපි අහනවා, ඔබතුමන්ලා මේ දෙකෙන් මොකක්ද දැක්කේ සහ ඒ වෙනුවෙන් සිදු කළ ක්‍රියාත්මක වීම මොකක්ද කියලා.

දැන් නැවතත් මෙහෙම කාරණයක් කිව්වා. අපිට ඔය ප්‍රශ්න මතු වෙනකොට, මොනවා හෝ ගැටලුවක් එනකොට විපක්ෂයේ ගොඩක් අය හරි ආසයි නේ, ඒක විඳින්න. අපි ඒක දැක්කා. තෙල් පෝලිමක් එනවා කිව්වාම, ඒගොල්ලන් හරි සතුටු වුණා. ඒ දවස්වල සමාජ මාධ්‍යවල පළ වුණු ඒවා මේ ගරු සභාවේදී කිව්වා. 8.00ත් පස්සේ තෙල් නැති වෙනවා, කාඩ් එකෙන් ගෙවන්න බැරි වෙනවා වාගේ කථා හරි සතුටෙන් තමයි කිව්වේ. අපේ රටට ඉතුරු වෙන්න ඕනෑ ධනය නාස්ති වෙනවා කියන එක ගැන ඒ අයට ගැටලුවක් නැහැ. ඒකෙන්ම පෙනෙනවා නේ, ඒගොල්ලන්ගේ තිබෙන පරස්පරතාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිය සම්බන්ධයෙන් කථා කරනකොට අපි දන්නවා, දහවල් කාලයේදී solar powerවලින් විදුලිය වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය වන බව. ඒ වාගේම රාත්‍රී කාලයේදී අපේ පරිභෝජනය වැඩියි. නමුත් solar powerවලින් රාත්‍රී කාලයේදී විදුලිය ගන්න බැහැ. එතකොට කියනවා, බැටරි දමන්න ඕනෑ වාගේ කථා. මම කියන්න කැමැතියි, සුළං බලයෙන් විදුලිය නිපදවීම, සූර්ය බලයෙන් විදුලිය නිපදවීම, ඊළඟට solar panelsවල battery system එක, ඒ වාගේම pump storage කියන ඒ ඔක්කෝම දැන් ක්‍රියාත්මක තලයට පැමිණෙමින් තිබෙන බව.

තව කෙනෙක් හයිඩ්‍රජන් ගැන කථා කළා. එතකොට අපට අහන්න වෙනවා, මෙච්චර කල් ඔබතුමන්ලා පොල් ගෑවාද කියලා. මේ බලශක්ති ක්ෂේත්‍රය වාගේම තමයි අනෙක් හැම ක්ෂේත්‍රයක්ම. හාල් මිලේ ප්‍රශ්න ගත්තත්, පොල් ප්‍රශ්නය ගත්තත් ඔබතුමන්ලා කෙටි කාලීනව විඳින්න දේවල් හොයා ගන්නවා නේ. කාලයක් බිත්තරේ එල්ලිලා හිටියා. ඊට පසුව පොල් ප්‍රශ්නය; ඊටත් පසුව හාල් ප්‍රශ්නය. විපක්ෂ නායකතුමාත් කියනවා අපි අහගෙන හිටියා, දැන් ජාතික ආරක්ෂාව ඉවරයි, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් බරපතළ අර්බුදයක් තිබෙනවා, ජාත්‍යන්තරය මේවා දකිවි කියලා. එතුමා ඒකම අදත් කිව්වා නේ. ඊළඟට, විපක්ෂයේ ගොඩක් අයට අර වඳුරාගේ ප්‍රශ්නය තමයි දැන් තිබෙන්නේ, නේද? දැන් ඒ අය කියනවා, ජාත්‍යන්තර ආයෝජකයෝ එනකොට වඳුරෙකුගේ ප්‍රශ්නයක් ගැන කිව්වාම ඒක හොඳ නැහැ කියලා. නමුත් වඳුරෙක් නිසා ඒ විධියට system බිඳ වැටෙන තත්ත්වයට නම් ඔබතුමන්ලා කටයුතු කළේ, ඒ තැනට නම් ඔබතුමන්ලා මේ system එක maintain කළේ ඒකට ලජ්ජා වෙන්න ඕනෑ කවුද? එතකොට වඳුරු කණ්ඩායමක් ගැනයි අපට කියන්න වෙන්නේ. ඒ තත්ත්වය නොදැකපු වඳුරු කණ්ඩායමක් ගැන තමයි අපට ගැටලුව තිබෙන්නේ. එහෙම නැතුව එක වඳුරෙක් ගැන නොවෙයි. ඒක අංක එකට කියන්න ඕනෑ.

මේ system එක stable විධියට තිබෙන්න ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක නේ අපි අහන්න ඕනෑ. ලෝකයේ දියුණු ක්‍රම තිබෙනවා. ඒ ක්‍රම ක්‍රියාත්මක කරන්න මොකක්ද කළේ? දැන් ඔක්කොම ලස්සනට එක එක දේවල් කියනවා. හයිඩ්‍රජන් නිෂ්පාදනය ගැන කියනවා. අපි solar වාගේම wind භාවිත කර, හයිඩ්‍රජන් විතරක් නොවෙයි, ඒකේ අතුරු ඵලයක් විධියට ඇමෝනියා නිපදවා යූරියා නිෂ්පාදනයටත් අත ගහනවා. දැනටමත් ඒකේ strategic plan එක හදාගෙන යනවා. ඒ ආකාරයට තමයි දැන් වැඩ කටයුතු සිද්ධ වෙන්නේ. ඒ නිසා බොහොම ලස්සන කතන්දර කියමින් චෝදනා එල්ල කළාට, ඔබතුමන්ලා විසින් ඇති කරපු ප්‍රශ්න තමයි මේ තිබෙන්නේ කියන එකත් මතක තබා ගන්න.

තව එක මහත්තයෙක් කිව්වා, කැඳත් නැති වෙනවා කියා. රෑවුලයි, කැඳයි දෙකම නැති වෙනවා, මෙවර පැවැත්වෙන පළාත් පාලන මැතිවරණයෙන්. තමුන්නාන්සේලාම නිර්මාණය කරපු ප්‍රශ්න ගැන දැන් මේ ගරු සභාවේදී අපෙන් අහනකොට, අපිට දෙන්න තිබෙන උත්තරය මොකක්ද? ඔබතුමන්ලා මතු කළ සියලු ප්‍රශ්නවලට ස්ථිරසාර විසඳුම් දෙන්න අපි කටයුතු කරනවා. ඒ අනුව 2030 වෙනකොට විදුලි අවශ්‍යතාවෙන් සියයට 70ක් පුනර්ජනනීය බලශක්ති හරහා ලබා ගන්න වාගේම 2050 වෙනකොට කාබන් free වෙන තත්ත්වයක් ඇති කරන්න අවශ්‍ය වැඩකටයුතු මේ වනවිට ක්‍රියාත්මක තලයේ පවතිනවා.

මෙන්න මේ ටිකත් අහගන්න. මට අමතක වෙන්න කලින් තව කාරණයක් කියන්න ඕනෑ. අර වානක ද කවුද කියන මන්ත්‍රීතුමා පට්ටපල් බොරු ටිකක් කිව්වා. කියපු එක බොරුවක් තමයි ඒගොල්ලන්ගේ පාලන කාලයේ solar panels ගෙනාවා කියපු එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, the "Executive Summary" which speaks of National Renewable Energy Laboratory's wind mapping methodology and its application to Sri Lanka සමඟ තවත් ලේඛන කිහිපයක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එම ලේඛනයට අනුව පන්සල්වලට ලබා දීමට ගෙනා solar panels 5,000න්, 4,000ක්ම ගෙනැල්ලා තිබෙන්නේ පසුගිය සැප්තැම්බර් මාසයේ 30වන දායින් පසුව. ඒ නිසා එහෙම බොරු කියන්න එපා. ඒ වාගේම ඒගොල්ලන් පන්සල්වලට solar panels දුන් විධිය ගැනත් මම කියන්නම්. කංචන විජේසේකර හිටපු ඇමතිතුමා ගැන කථා කළා නේ. මේ බලන්න, එතුමාගේ කාලයේ පන්සල්වලට solar panels දීලා තිබෙන විධිය. මාතර දිස්ත්‍රික්කයේ පන්සල් 51කට දීලා තිබෙනවා. එහෙම දෙනකොට බලන්න ඕනෑ, transformer capacity එක තිබෙනවාද කියලා. එහෙම තිබෙනවා නම් විතරයි solar power දෙන්න පුළුවන් වෙන්නේ. මාතර පන්සල් 51කට දීලා තිබෙනවා. එහෙම දෙන්න බැහැ. ඒ කියන්නේ කිසිම පරීක්ෂාවක් කරන්නේ නැතුව ඒවා වහලවල්වල සවි කරලා. එහෙම වහලේ සවි කළාම solar panelsවලින් විදුලිය නිපදවෙලා එනවා කියලා තමයි ඒ හිටපු ඇමතිතුමා හිතන්න ඇත්තේ. මාතර පන්සල් 51කට එහෙම දෙනකොට, සමහර පැතිවල පන්සල් 10කටත් වඩා අඩු ප්‍රමාණයකට තමයි දීලා තිබෙන්නේ. අනුරාධපුරයේත් පන්සල් තිබෙනවා නේද? ඒ පැත්තේ එක පන්සලකටවත් දීලා නැහැ. එතකොට හාමුදුරුවෝත් හිතාගෙන ඉන්නවා, මේවා දෙන්න ඕනෑ; එහෙම නොදීපු එක මේ ආණ්ඩුවේ වැරැද්දක් කියලා. එහෙම තමයි ඔබතුමන්ලාගේ කාලයේ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙන්නේ.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

දැන් අපේ වැඩ පිළිවෙළ ගැන, අපේ policy document එක ගැන කථා කළා. දැනට rooftop solar හරහා විදුලිය මෙගාවොට් 1,453ක් නිපද වෙනවා. මේ අවුරුදු 5 ඇතුළත තව මෙගාවොට් 2,000ක් නිපදවීමට කටයුතු කරනවා. ඒක නිසැකයි. ඒ වාගේම තමයි පුත්තලම-යාපනය මුහුදු තීරයේ wind power plants හරහා විදුලිය මෙගාවොට් 1,000ක් නිපදවන්න කටයුතු කරනවා. මේ වසරේදී ඒකට ටෙන්ඩර් කැඳවනවා. ඒ වාගේම මේ අවුරුදු 5 තුළ තව මෙගාවොට් 2,500ක බැටරි ශක්ති ගබඩා පද්ධතියක්,- ඒකේ වැඩ නිම කරමින් පවතිනවා.

ඔබතුමන්ලා දන්නවා, දශක ගණනාවක් තිස්සේ නොකෙරුණු pumped storage hydropowerහි detailed design එක පටන් ගැනීමට කටයුතු කරනවාය කියන එක. ඒ ඔක්කොටම වඩා වැදගත් දෙයක් මම කියන්නම්.

ඔය දේවල් වාගේම තමයි මේ මාස 5 තුළ corruption එක zero. ඒක හොඳට මතක තියාගන්න. අර එක මන්ත්‍රීතුමෙක් කිව්වා නේ දූෂණ අරවා මේවා ගැන. නමුත් එහෙම නැහැ. ඒ ඔබතුමන්ලාගේ පොතේ තිබෙන ඒවා. ඒවා මේකේ නැහැ. ඒ නිසා මේ වැඩේ මේ විධියට ලස්සනට අපට කරගෙන යන්න පුළුවන්.

තව එක්කෙනෙක් කථා කළා Expression of Interest - EoI- ගැන. ඒ යටතේ 47ක් දීලා තිබෙනවා. ඔබතුමන්ලා එහෙම පටන් අරගෙන -මෙගාවොට් 3,000ක් දෙන්න පටන් අරගෙන- මොකක්ද වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලාම ගෙනාපු Act එකෙන් ඒවා අහෝසි වෙන, විසි වෙන විධියට වැඩ කරලා තිබෙනවා. ඒ නිසා ඒවාට invest කරපු අය අනාථ වෙලා තිබෙනවා. හැබැයි, මතක තියාගන්න, අපි ඒගොල්ලන්ට අනාථ වෙන්න දෙන්නේ නැහැ. ඒ මෙගාවොට් 3,000 ලැබෙන විධියට ඒවා වෙනස් කරමින් අපි ඒ වැඩෙට යනවා. ඒ වාගේම අර පන්සල්වල සවි කර තිබෙන solar panels ගැනත් කථා කළා. ඒ capacity එක වෙනස් කරමින් අපට කරන්න පුළුවන් හැම දේම කරනවා. හැබැයි, ඒවා මාතරට විතරක් දීලා තිබෙන එක ගැන නම් වෙනම ප්‍රශ්නයක් තිබෙනවා.

මතක තියාගන්න, ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ බලශක්ති කේන්ද්‍රස්ථානය කරන්න ඕනෑ. Practically අපි ඒක කරනවා. ඒ අවස්ථාව තමයි දැන් තිබෙන්නේ. අපි දන්නවා, අවුරුද්දෙන් අවුරුද්ද සියයට 5ක් ඉල්ලුම වර්ධනය වෙන බව. එසේ ඉල්ලුම වර්ධනය වෙනකොට යළි කිසි දිනෙක power cut එකක් සිදු නොවෙන තැනට අපි අනාගතය ගැන හිතලායි කටයුතු කරන්නේ. 2030දී කොහොමද, 2050දී කොහොමද කියන එක මතයි අපි ඒක තීරණය කරන්නේ. ඒ කාරණා ඔස්සේ තමයි අපි ලෝකයේ තිබෙන නවීන තාක්ෂණය යොදා ගන්නේ.

සූර්ය විදුලිය ගැන කථා කළොත් අපි දන්නා විධියට, සමහර වෙලාවට වලාකුළක් ආවාම සූර්ය විදුලිය එක පාරටම වෙනස් වෙනවා. ඒවාට AI තාක්ෂණය යොදා ගන්න පුළුවන්. AI තාක්ෂණය යොදා ගෙන ඒවා පුරෝකථනය කරලා AI tools හරහා ඒවා කරන්න පුළුවන්. අන්න එවැනි විද්‍යාත්මක වැඩ පිළිවෙළක් ඔස්සේ තමයි අපි යන්නේ.

ඔබතුමන්ලා අවුරුදු ගණනක් තිස්සේ මේ රට නැති කළා වාගේ මේ ක්ෂේත්‍රයත් නැති කරලා, නැති කරලා දැන් අපෙන් අහනවා, මේ මාස පහේ වැඩ පිළිවෙළ ගැන. මතක තියාගන්න, අප ආදර්ශයට අරගෙන රට හදනවා කියපු සිංගප්පූරුව ඉහළට ගියා. අපිත් එක්ක සම මට්ටමේ හිටපු ජපානයට වඩා පහළට ගියා. මේ ලංකාව අගාධයට ඇදලා දැම්ම මිනිස්සු තමයි දැන් මෙහෙම ප්‍රශ්න කරන්නේ. බලශක්ති ක්ෂේත්‍රය පැත්තෙනුත් ඔයගොල්ලන් තමයි මේ රට අගාධයට දැම්මේ. හැබැයි අපි මේ ප්‍රශ්නය විසඳනවා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එක ජාතික ජන බලවේගය ආණ්ඩුව හරහා අපි ඇති කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.34]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බලශක්තිය සම්බන්ධයෙන් අද මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම කථා කරනවා මම අහගෙන හිටියා. මට ප්‍රථමයෙන් කථා කළ ගරු මන්ත්‍රීතුමාත් කිව්වේ, බොරු කීම හොඳ නැහැ කියන එකයි. මම ඒක පිළිගන්නවා. බොරු කියන එක ලොකුම පාපයක්. පව ගහන එක ඉතාම නරක වැඩක්. දැනගෙන බොරු කියන එක ඊටත් වඩා පාපයක්. ගරු මන්ත්‍රීතුමියක් කිව්වා, "හැම වෙලේම එකම දේ කියනවා. මොකක්ද මේ" කියලා. මට කලින් කථා කළ මන්ත්‍රීතුමාත් කිව්වා, ලොකු බොරු වගයක් කිව්වා කියලා.

මම පොඩ්ඩක් බැලුවා එතුමන්ලා ඡන්ද කාලයේ කළ කථා. එකක් දෙකක් නොවෙයි, ඒ හැම එකක්ම බැලුවොත්, කිව්වේ බොරු. දැන් ඔබතුමන්ලාට පුළුවන් නම් පෙන්වන්න, මගේ අවුරුදු 20ක දේශපාලන ගමන තුළ, පක්ෂ දේශපාලනය තුළ පවා මම මොකක් හරි බොරුවක් කියලා තිබෙනවා නම්. මම මෙන්න මෙහෙම බොරුවක් කියලා තිබෙනවා කියලා ඔබතුමන්ලා පෙන්වන්න. අපි කියන දේවල් ගලේ කෙටුවා වාගේ තිබෙනවා. කවදාවත් බොරු කරන්නේ නැහැ.

මට පෙර කථා කළ මන්ත්‍රීතුමා කිව්ව කාරණය ගොඩක් හොඳයි. ඒක කියනකොට ලස්සනයි. මෙච්චර ප්‍රමාණයක් මෙගාවොට් නිෂ්පාදනය කරනවා. මෙච්චර ප්‍රමාණයක් බැටරිවලින් store කරනවා කිව්වා. ඒ ඔක්කොම ඉතාම ලස්සනයි. එතුමා ඇහුවා, අපි මොනවාද කළේ කියලා. පොල් ගෑවාද කියලා ඇහුවා. මම ඔබතුමන්ලාට එක කාරණයක් විතරක් කියලා කථාව පටන් ගන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, අදටත් අපි ජීවත් වන මේ ලංකාව යම්කිසි මට්ටමක දියුණුවක් ලබා තිබෙනවා නම්, ඒ, මහවැලියට පින්සිද්ධ වෙන්න. 1980 දශකයේ ආසියාව බඩගාන කාලයේ ඒ කරපු ව්‍යාපෘතියේ විදුලි ඒකකයට ගෙවන්නේ රුපියල් 3.50යි. එහෙම වුණේ, ගාමිණී දිසානායක මහත්තයාටයි, ජේ.ආර්. ජයවර්ධන මහත්තයාටයි පින්සිද්ධ වෙන්න. ඇයි මේ කුහකකම? ඒවා නිකමටවත් කටට එන්නේ නැත්තේ ඇයි, ජනතා විමුක්ති පෙරමුණේ, මාලිමාවේ මන්ත්‍රීවරුන්ට. මම නම් හොඳ දේට හොඳයි කියනවා.

මහින්ද රාජපක්ෂ මහත්තයා ගැන මට ගොඩක් විවේචන තිබෙනවා. හැබැයි, මේ රටේ යුද්ධය අවසන් කරන්න එතුමා දායක වුණා. ඒක නොකියා ඉන්න තරම් මම කුහක වෙන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ ගැනත් මට විවේචන බොහොමයි. හැබැයි, වැටිලා තිබුණු ආර්ථිකය භාරගෙන, ඔබතුමන්ලාට මෙහෙම කටයුතු කරන්න පුළුවන් විධියට එතුමා යම් කාර්යභාරයක් කරලා තිබෙනවා. ඒක නැහැ කියලා අපට කියන්න පුළුවන්ද? ඒක නැහැ කියනවා නම්, ඒ අපේ කුහකකම. ජනතා විමුක්ති පෙරමුණ අපිත් එක්ක ඒ දවස්වල දූෂණය නැති කිරීම වෙනුවෙන් සටන් කළා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
යහ පාලන ආණ්ඩුව කාලයේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
යහ පාලන ආණ්ඩුව කාලයේ. අපි පිළිගන්නවා, අපි ආදරෙයි ඒකට. හැබැයි, ඔබතුමන්ලාගේ කට දිව වැඩ කරන්නේ නැහැ නේ, නිකම් හරි කලින් හිටපු මනුස්සයෙකුට හොඳයි කියන්න. ඇයි, ඔව්වර වෛරය? ඇයි, ඔව්වර ඔබතුමන්ලාගේ ඊර්ෂ්‍යාව? ගාමිණී දිසානායක මහත්මයා, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කළ ඒ ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රමාණය මෙගාවොට් 1,750කට වැඩියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකෙන් කොච්චර කර්මාන්ත කරනවාද? රුපියල් 3.50යි, cost එක යන්නේ. තවම තිබෙන්නේ ඒ විදුලිය. තවම මේ රට ගෙනියන්නේ ඒකෙන්; භාගයක්ම ඒකෙන්. ඉතින් නිකම් හරි "මෙහෙම කරලා තිබෙනවා. හොඳයි" කියලාවත් කියන්න බැරිද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මෙතුමන්ලා විදුලි බලාගාර ගිනි තිබ්බා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මම එතැනට යන්නේ නැහැ. මම සාමාන්‍යයෙන් negative politics කථා කරන්නේ නැහැ. ගොඩක් වෙලාවට ඒවා කථා කළාම හිත රිදෙනවා. අපේත් හිත රිදෙනවා. මම දන්නවා අපේත් හිත රිදෙනවා කියලා. ඒ නිසා මම ඒ පැත්ත ගැන කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියපු බොරු බලන්න. ඇමෙරිකානු ඩොලර් 500, 500 පිටරටින් ගේනවා කිව්වා. ජයශාන්ත අයියා ඩොලර් මිලියනයක් ගේනවා කිව්වා. හඳුන්නෙත්ති මහත්මයාගේ යාළුවා ඩොලර් මිලියනයක් ගේනවා කිව්වා. සංගීත්ගේ යාළුවා ඩොලර් මිලියන පහක්ද කොහේද ගේනවා කිව්වා. ඒවා එනකම් අපි බලාගෙන ඉන්නවා. ඊට පස්සේ අනුර කුමාර දිසානායක මහත්මයා කිව්වා, මිනිරන්වලින් ග්‍රැෆයිට් හදනවා කියලා. ඒක එතුමාට වැරැදුණා. ග්‍රැෆයිට්වලින් ග්‍රැෆීන් හදනවා. ඒක හදන්න පටන් ගත්තාද? ජීවිතේට ඒක හදන්න පටන් ගන්න බැහැ. ඒ වාගේම නොයෙකුත් පොරොන්දු දුන්නා. විදුලි බිල අඩු කරනවා කිව්වා.

ගරු ඇමතිතුමනි, අර වදුරාගේ කථාව ගැන නම් මම වැඩිය කියන්න කැමැති නැහැ. හැබැයි, ඔබතුමන්ලා ඒවා කියද්දී ඒ ගැන ඊට වැඩිය හිතන්න ඕනෑ. අපි හිටපු අමාත්‍යාංශ බැලුවොත්, අපි එහෙම responsibility එකක් නැතුව ප්‍රකාශ කරන්නේ නැහැ. මම දන්නේ නැහැ, ඒක ඔබතුමාට කොහෙන්ද ආවේ කියලා. ඔබතුමා ඒක කිව්වාට පස්සේ මම දැක්කා. නමුත් මම එව්වර ඒක පස්සේ ගියේ නැහැ. ඒක ලොකු දෙයක් නොවෙයි. හැබැයි, මේ රටේ ඇති වුණු ප්‍රශ්නයක් ගැන ඔබතුමා එකක් කිව්වා, තව ඇමතිවරයෙක් තව එකක් කිව්වා. එහෙම නොවෙයි කිව්වා. මේ ගැන විශාල ප්‍රශ්නයක් ඇති වුණා. ඒ සම්බන්ධයෙන් එව්වර ප්‍රශ්නයක් ඇති වෙන්න බැහැ, පැහැදිලිව ඒක අවබෝධ කරගෙන කොහොමද ඒක වුණේ කියලා කිව්වා නම්. වදුරෙක්ද, පූසෙක්ද, මොකෙක්ද කියන එක අදාළ වෙන්නේ නැහැ. ඒ වැඩේ එතැනින් ඉවරයි. අපි කියන්නේ ඔබතුමන්ලාට ඒ වගකීම නැහැ, ඒ අත්දැකීම නැහැ කියන එකයි. අමාත්‍යාංශයක වැඩ කරද්දී ඒ අත්දැකීම නැති එකයි තිබෙන ප්‍රශ්නය.

ඒ වාගේම, IMF එක සම්බන්ධයෙන් මොකක්ද කියන්නේ කියලා ඇහුවා. අපි ඉතා ස්ථාවරයි. IMF එක සම්බන්ධයෙන් ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා කිව්වා, අපි ඒ ගිවිසුම සංශෝධනය කර ගන්නවා, කථා කර ගන්නවා, වෙනස් කරනවා කියලා. අපි පීටර් බෲවර් මහත්මයාටත් ඒක කිව්වා. ඒ සාකච්ඡාවලට මමත් ගියා. අපි කිව්වා, අපට අවාසිසහගත දේවල් තිබෙනවා, ඒවා ගැන අපි කථා කරලා සංශෝධනය කර ගන්නවා කියලා. ඒ ගොල්ලෝ කියන කියන විධියට අපි එකඟ වෙන්නේ නැහැ කියන එකත් අපි ඒ ගොල්ලන්ට කිව්වා. ඒ නිසා අපේ ප්‍රතිපත්ති වෙනස් නැහැ. අපි කියන දේ කෙළින් කියනවා. අපේ ආර්ථික ප්‍රතිපත්තිය තමයි, ඔබතුමන්ලා මඩේ දම දමා ගෙන යන්නේ. ජේ.ආර්.ලාගේ, ගාමිණිලාගේ, ප්‍රේමදාසලාගේ විචෘත ආර්ථිකය තමයි ලෝකයේ හැම තැනම ක්‍රියාත්මක වෙන්නේ. බොරු වචන දමනවා, ආණ්ඩුව මේවාට සම්බන්ධයි කියලා. ආණ්ඩුව සම්බන්ධයි තමයි හැම රටකම. එක එක ප්‍රමාණයට, දශම ගණන්වලින් එහාට මෙහාට වෙලා මේ එන්නේ එකම ක්‍රමය තමයි. ඔබතුමන්ලා අන්තිමට ගත්තේ අපේ ක්‍රමය. අපි ඒකට කැමැතියි.

ඒ වාගේම, දූෂණය ගැන කථා කළා. මට මේක තේරෙන්නේ නැහැ. ඒකයි මම මේ අහන්නේ. අපේ ගරු බිමල් රත්නායක සහෝදරයා ඒ දවස්වල අපිත් එක්ක එකට ඉන්න කාලයේ විශාල වශයෙන් දූෂණයට විරුද්ධව සටන් කළා. දැන් මේ හේලීස් සමාගමට ලබා දුන්නු wind power මෙගාවොට් 50 ගැන මම අහන්නේ. මොන ක්‍රමයක්ද ඒක? Technical Evaluation Committee එකෙන් එක වරක් reject වෙලා, ඊට පස්සේ තව වරක් appeal කළාට පස්සේ එවරත් reject වුණා. ඊට පස්සේ ආණ්ඩුව මාරු වෙනකොට ඒ ගැන නඩුවක් තිබුණා. ඒ නඩුව අයින් කර ගන්න කියලා, ඒ නඩුව අයින් කර ගත්තා. ඊට පස්සේ ඒ reject වුණු පුද්ගලයාටම ආපහු ඒක දෙන්න පුළුවන් ක්‍රමය මොකක්ද? ඒ ප්‍රසම්පාදන ක්‍රමය මොකක්ද? ශත ගණනක් අඩුයි. එහෙම නම් ටෙන්ඩර් එක දමන්න ඕනෑ, අඩුම කෙනාට දෙනවා, technical evaluation නැහැ කියලා. මම දන්නේ නැහැ, මොන හේතුවක් මතද ඒක දුන්නේ කියලා. ඉතින් අනිවාර්යයෙන්ම සම්බන්ධයක් තිබෙනවා නේ. යාළුවන්ට දෙන්නේ නැහැ කිව්වාට, ධම්මික පෙරේරා මහත්මයාගෙයි, ඔබතුමන්ලාගේ පක්ෂයයි, ජනාධිපතිතුමාගෙයි හොඳ සම්බන්ධයක් තිබෙනවා. හැබැයි, ඒක වැරැදියි. වැරැදි නම් වැරැදියි. කවුරු දුන්නත් ඒක වැරැදි නම් වැරැදියි. එහෙම නම් මේ සම්බන්ධයෙන් අධිකරණයට අනිවාර්යයෙන්ම වාර්තා කරන්න ඕනෑ. මොකද, එහෙම නම් Technical Evaluation Committee එක වැරැදියි කියන්න ඕනෑ; ඒක ඔප්පු කරන්න ඕනෑ. එහෙම එකක් ඔප්පු වෙලා නැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්.

ඒ වාගේම, කන්ටේනර් 300 ගණනක් කිසිම හැලහොල්මනක් නැතුව එළියට යවද්දී, ඒවායේ තිබුණේ මොනවාද කියලා අපි කොහොමද දන්නේ? ඒ ගැන ලැයිස්තුවක් දුන්නාද? හැමදාම මේ සභාවට ලැයිස්තුවක් ඉදිරිපත් කරනවා. හැබැයි, ඒ ලැයිස්තුව එන්නේ නැහැ. ආඩම්බරයෙන් කියන්න පුළුවන් නේ, මෙන්න ඒ ලැයිස්තුව, මෙන්න මේ කට්ටිය, මෙන්න මේ කට්ටිය කියලා. නමුත් කවදාවත් ඒ ලැයිස්තුව ගැන කථා කරන්නේ නැහැ. ඒවා රතු කන්ටේනර්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, මම ඒ ගැන ගරු බිමල් රත්නායක ඇමතිතුමාට හෝ කාට හරි ඇඟිල්ල දික් කරන්නේ නැහැ නේ.

අපි නිකම් මඩ ගහන්නේ නැහැ. අපි නිකම් බොරුවට කියන්නේ නැහැ, එතැන හොරකමක් වුණා, ඒ කන්ටේනර් කීපයක් මේ කෙනාට අයිතියි, ඒවායේ රත්තරන් තිබුණා, අරවා තිබුණා, මේවා තිබුණා කියලා. අපි ඒවා දන්නේ නැහැ. හැබැයි, අවසර නැතුව, පරීක්ෂා කරන්නේ නැතුව කොහොමද ඒ ටික එළියට ගියේ කියන ප්‍රශ්නය තිබෙනවා. රේගු නිලධාරීන් ඒවා ගැන කියනවා. අපිත් දන්නවා නේ. අපි ඔක්කොම ඒ ගැන දන්නවා.

බාර් ලැයිස්තුව එළියට එන්නේත් නැහැ. මම එකක් කියන්නම්. ආණ්ඩුව වැඩියෙන්ම ගහන්නේ විවේචනය කරන පුද්ගලයාට නේ. නැත්නම්, මම මොන වැරැද්දක් කළාට ද මට ගහන්නේ? විවේචනය කළොත් ගහනවා, කන පැළෙන්න. ඒ අයට ගහන්න CID එකත් පාවිච්චි කරනවා, පොලීසියත් පාවිච්චි කරනවා. කරන්න පුළුවන් බලු වැඩ ඔක්කෝම කරනවා. අර dictatorsලාගේ රටවල ක්‍රියාදාමය මෙහේත් ක්‍රියාත්මක වෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මහින්ද මහත්මයා කරපු ඒවා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(*மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ*)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මහින්ද මහත්මයාවත් මට එහෙම කළේ නැහැ. මම මහින්ද මහත්මයා කොච්චර නම් විවේචනය කළාද. එක පාරක්ද කොහේද බැසිල් මහත්මයා මා හිරේ දාන්න try කළා. ගෝඨාභය මහත්මයාත් එක පාරක් try කළා. ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම අපි දෙන්නාට බැණ්ණා, කැන්ටිමේදී. දයාසිරි මහත්මයා බයත් වුණා; හොල්මන් වෙලා ගියේ. මම කිව්වා, "දයා, කොහොම හරි අපි මේක කථා කරමු" කියලා. රාජපක්ෂලා ආවේශ වෙලා දැහලුවේ මෙතුමායි, මමයි එක්ක. ඒ, අපි ශිරාණි බණ්ඩාරනායක මහත්මියගේ නඩුව ගැන කථා කරන්න file එක අරගෙන ආවා කියලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා අප කපලා දැම්මා. අපට chance එකක් දුන්නේ නැහැ කථා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාළුවන්ට නම් ගහන්නේ නැහැ.

ජනතා විමුක්ති පෙරමුණ දූෂණයට විරුද්ධව විශාල වැඩ කොටසක් කළා, ඒවා ගැන කථා කළා. අපි ඒකට කැමැතියි. හැබැයි, සාධාරණ වෙන්න ඕනෑ. හොරුන්ට ගහන්න ඕනෑ; මගඩි වැඩ කරන උන්ට ගහන්න ඕනෑ; දූෂිතයන්ට ගහන්න ඕනෑ. නමුත්, තමන්ට විරුද්ධ වන අය එක්ක නේ ඔබතුමන්ලා තරහා. හිනා වෙන්නේවත් නැහැ, විරුද්ධ කෙනාත් එක්ක. නමුත්, හොරාත් එක්ක කරට අත දා ගෙන එකට යනවා, කිසි ප්‍රශ්නයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ මේකයි. මේ ආණ්ඩුව පත් වෙලා තවම මාස 5යි නේ. මේ මාස 5ට මේ කාරණා දෙක ඇති. තව එයි තවත් ඉස්සරහට. ඒ නිසා සාධාරණව කටයුතු කරන්න. ඒ සිදුවීම් ගැන පරීක්ෂා කරන්න. CID එකේ අය ඒ කට්ටියගේ ගෙවල්වලට යවන්න. මා හිතන්නේ, මගේ ගෙදරට ඒමට සහ වාහනයේ licence එක ගැන සොයන්න, අවුරුදු 10කට කලින් මට වාහනය transfer කරපු මනුස්සයාගේ අත්සන හරිද කියලා බලන්න, EQD Branch එකට transfer papers යවන්න පැය 1,000කට වැඩි කාලයක්, ලක්ෂ 500කට වැඩි මුදලක් වැය කළා. දැන් ඒවාත් බලලා ඉවරයි. ඒවාත් හරි කියලා දැන් ඔප්පු වෙලා. විවේචනය කරන මිනිසුන්ට ගහන්න එපා. මම අනාවැකි කියන්න හොඳට දන්නවා. අවුරුදු දෙකක් ගිහිල්ලා බලන්න, කවුද හිරේ දාන්නේ කියලා. මම අද කිව්වා කියලා ලියා ගන්න. නීතිය ගැන අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කරන්න. කිය කිය ඉන්න එපා.

ජනාධිපතිතුමා ආපු ගමන් කියන්නේ, "ආණ්ඩුව වට්ටන්න හදනවා. එහෙම වැටෙන්නේ නැහැ" කියලායි. ඇයි එතුමා සැක කරන්නේ ආණ්ඩුව වැටෙනවා කියලා? අපි ආණ්ඩුව වට්ටන්න හදන්නේ නැහැ. ආපු හැම දාම එතුමා කියන්නේ, අරයා ආණ්ඩුව වට්ටන්න හදනවා, මෙයා වට්ටන්න හදනවා, වට්ටලා බලමු කියලායි. එහෙමයි එතුමා කියන්නේ. එතුමාට ඇයි එච්චර සැකයක් ආණ්ඩුව වැටෙයි කියලා? තවම මාස 5යි නේ. ආණ්ඩුව වට්ටන්න අපි කවුරුවත් වැඩ කරන්නේ නැහැ. අපි කැමැතියි ආණ්ඩුව තව ටිකක් ඉන්නවාට. ඒ නිසා ඒ චෝදනාව කරන එක මෙතැනින් ඉවර වෙන්න ඕනෑ.

මම දැක්කා මන්ත්‍රීතුමියක් අවුරුදු 70 ගණනක ඒවා කියනවා. හැම වෙලාවේම කියන්නේ අවුරුදු 70 ගණනක ඒවා. මම අහගෙනයි, "ජූලම්පිටියේ අමරේ" ද කවුද ගැනත් කියනවා. "ජූලම්පිටියේ අමරේ එළියට එන්න" කියලා මොකක්ද කිව්වා ලු. එහෙම කථාවක් ආණ්ඩුව පැත්තෙන් කිව්වා. මම හොයලා බැලුවා කවුද මේ යකා කියලා. දයාසිරි මහත්මයාත් දන්නවා ඇති. බැලින්නම් කවුද ඒ? මම බැලුවා ඒ සිද්ධිය කොයි කාලයේද වුණේ කියලා. ඒ, 2003දී. ඔබතුමන්ලා දන්නවා නේ ජූලම්පිටියේ අමරේ එක්ක මහින්ද රාජපක්ෂ මහත්මයාගේ සම්බන්ධයක් තිබුණා කියලා. නමුත්, 2005දී ඔබතුමන්ලා කාටද සහයෝගය දුන්නේ? තලු මර මරා ජූලම්පිටියේ අමරේගේ ගෝලයාටයි support එක දුන්නේ. අපි සහයෝගය දුන්නේ නැහැ නේ. අපි එහෙම වරදක් කරපු පුද්ගලයෙකු කරේ තියා ගෙන උස්සා ගෙන ගිහින් රාජාසනයේ ඉන්දෙවිවේ නැහැ නේ. 2003දී දන්නේ නැද්ද, ජූලම්පිටියේ අමරේ එක්ක ඒ මනුස්සයාගේ සම්බන්ධයක් තිබෙනවා කියලා? එතකොට හොඳයි. මම ඒකයි කිව්වේ, යාළු නම් ඔබතුමන්ලාට ජූලම්පිටියේ අමරේ නොවෙයි, මරු සිරා හරි කමක් නැහැ කියලා. හැබැයි විවේචනය කරන ඔබතුමන්ලා අයට ගහනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(*மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ*)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
තව කොච්චර කාලයක් තිබෙනවා ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)
තවත් මිනිත්තු දෙකයි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(*மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ*)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
I have got 17 minutes. Have I not?

ගරු මන්ත්‍රීවරයෙක්
(*மாண்புமிகு உறுப்பினர் ஒருவர்*)
(An Hon. Member)
Fourteen minutes.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(*மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ*)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. මම හිතුවේ මට කථා කරන්න තවත් වෙලාව තිබෙනවා කියලායි.

මම දැන් අදානි සම්බන්ධ කාරණයට එන්නම්. අදානි ගිය එක ලොකු පාඩුවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම පෙන්වන්නම්, විදුලි ඒකකයකට අදානිගේ ව්‍යාපෘතියට අදාළ prices සහ අනෙක් ඒවාට අදාළව ගෙවන මිල ගණන්.

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

IPP Thermal Oil සඳහා තීරුබදු ගාස්තුව රුපියල් 93ක් පමණ ගෙවනවා. IPP Solar + Battery (Poonakary Tank) සඳහා රුපියල් 46ක් පමණ ගෙවනවා. IPP Wind (Mannar) සඳහා රුපියල් 33ක් පමණ ගෙවනවා. CEB Wind (Mannar) සඳහා රුපියල් 30ක් පමණ ගෙවනවා. Feed-in-Tariff (Wind) සඳහා රුපියල් 29ක් පමණ ගෙවනවා; CEB Norochcholai (coal) සඳහා රුපියල් 26ක් පමණ ගෙවනවා. Adani Wind (Mannar & Ponneryn) සඳහා යන්නේ රුපියල් 24ක පමණ මුදලක්. එහි වැදගත්කම තිබෙන්නේ, ඒක ලෝකයම පිළිගත්තු ආයතනයක් වීම. මට පෙර කථා කරපු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ මෙගාවොට් 1,000ක් නිෂ්පාදනය කරන්න ටෙන්ඩර් එක දාලා ඉවර වන කොට තවත් අවුරුදු දෙකක් යනවා, ඒක පටන් ගන්න කොට තවත් අවුරුදු 3ක් යනවා. මේක හොඳ price එකක්. මම හැම තැනම check කරලා බැලුවා. ඒ line එක හදනවා.

ඒ වාගේම ඉන්දියාවට විදුලිය අපනයනය කරන්නත් පුළුවන්. මේ රටට ආපු මනුස්සයා නේ ඒ ගියේ. අනෙක් අතට, මේක Marxist Government එකක් කියලා ජාත්‍යන්තරයේ මතයක් තිබෙනවා. මේක හොඳ වෙයි ද, මේ කියන විධියට ආර්ථිකය විවෘත වෙයි ද කියලා ඒ අය බලනවා. ඒ නිසා අදානිම ගෙන්නා ගෙන මේ ව්‍යාපෘතිය පටන් ගත්තා නම් හරි. මෙගාවොට් 500කින් පටන් ගත්තා නම්, තවත් මෙගාවොට් 1,500යි අවශ්‍ය. කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා මෙගාවොට් 50,000ක් ගැන. ලංකාවට අවශ්‍ය කරන්නේ මෙගා වොට් 4,500ක් විතර ප්‍රමාණයක්. දැනට මෙගාවොට් 4,000ක විතර අවශ්‍යතාවක් තිබෙන්නේ. ඉස්සරහට මෙගාවොට් 4,500ක් විතර ඕනෑ වෙයි. මෙගාවොට් 10,000ක් විතර හැදුවොත්, ඉන් මෙගාවොට් 6,000ක් අපනයනය කරන්න අපට පුළුවන්. වැඩේ ලේසි නැහැ. විශාල මුදලක් වැය වෙනවා. සමාන්‍යයෙන් ඩොලර් බිලියන 20ක්, 30ක් යනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසන් වෙනවා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Hon. Presiding Member, please, give me one more minute.

අදානි ගිය එකෙන් මේ රටට විශාල පාඩුවක් වුණේ. ජාත්‍යන්තර වශයෙන් ගත්තොත්, අදානි මෙහෙන් ගිය එකෙන් ඉදිරි අනාගතයට වුණේ විශාල පාඩුවක්. මා හිතන්නේ, ආයෙත් ටෙන්ඩර් දාලා ගන්න ගියොත් නැවත අපට මේ අවස්ථාව ලැබෙන්නේ නැහැ කියලායි.

මම අදානි දන්නේත් නැහැ. මම "අදානි" නම අහලා තිබෙනවා. TV එකෙන් තමයි දැකලා තිබෙන්නේ. ඒ නම, ඒකේ තිබෙන වැදගත්කම කොච්චරක්ද. අදානි ඇවිල්ලා මේ රටේ ඒ ව්‍යාපෘතිය පටන් ගත්තා නම් හොඳයි. මොකද, ඔබතුමන්ලා තමයි මේ ව්‍යාපෘතිය පටන් ගන්නේ. ඔබතුමන්ලාටයි එහි credit එක යන්නේ. රනිල් වික්‍රමසිංහ වෙන්න ඇති එය පටන් ගන්න ඇත්තේ. ඒක පටන් ගත්තා නම් ඉන්දියාවට විදුලිය විකුණන්නත් තිබුණා. මෙගාවොට් 500න් පටන් ගෙන තව මෙගාවොට් 500කුත්, මෙගාවොට් 2,000කුත් ජනනය කළා නම්, තව අවුරුදු දෙකකදී ඔබතුමන්ලා ඔය බලාපොරොත්තු වන අපනයන ආදායම බිලියන 19 දක්වා යන ගමන යන්න පුළුවන්. හැබැයි, දැන් ඔබතුමන්ලාට ඒ ගමන යන්න බැහැ.

රට ගැන හිතලායි අපි කියන්නේ. අපට ඒ ගැන දුකයි. ඉදිරි අනාගතයේ තවත් ඩොලර් බිලියන 5කින්වත් අපනයන ආදායම වැඩි කර ගත්තේ නැත්නම්, තව අවුරුදු 2ක් යන කොට ඔබතුමන්ලාට විශාල අනතුරකට මුහුණ පාන්න සිදු වෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා කලින් තිබූ ආර්ථිකයට යම් ස්ථාවර තත්ත්වයක් ඔබතුමන්ලාට ඇති කර තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා ඉදිරිපත් කරන plans ටික ඉදිරි අනාගතයේදී ක්‍රියාත්මක නොවන පාටක් තමයි මට පෙනෙන්නේ. එහෙම වුණොත් තව අවුරුද්දක් යද්දී, මේ රට විශාල ප්‍රශ්නවලට මුහුණ පාන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7යි.

[අ.භා. 3.49]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන්නේ මේ රටේ ආහාර සුරක්ෂිතභාව වාගේම, ඊළඟට වැඩිම අවශ්‍යතාවක් තිබෙන, ජන ජීවිතයට විශාල බලපෑමක් එල්ල කළ හැකි අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් ගැනයි අද අපි පාර්ලිමේන්තුවේදී කථා කරන්නේ. ඒ බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි.

බලශක්තිය ගැන කථා කරන කොට ඛනිජ තෙල් ගැනත්, විදුලි බලය ගැනත් අපි කථා කරනවා. අද අපේ විදුලිබල පද්ධතිය ගැන කථා කරන්න ගියාම, පසුගිය දවසක මුළු ලංකාවේම විදුලි බලය ඇන හිටි කාරණය ගැන කියන්න වෙනවා. රටේම විදුලි බලය ඇන හිටියාම තමයි අපට ඒ පිළිබඳව දැන ගන්න පුළුවන්කම ලැබුණේ. මොකද, සමාජය තුළ ඒ සම්බන්ධයෙන් කතා ගණනාවක් කරළියට ආවා. හැබැයි, අපි ඒ ගැන සාකච්ඡා කරන කොටයි දැන ගත්තේ, මාස ගණනාවකට පෙර ඉඳලාම ඒ ප්‍රශ්නය ගැන ඒ ඉංජිනේරු මහත්වරුන් රජය සහ වග කිව යුත්තන් දැනුවත් කර තිබෙන බව. නමුත් ඒ පිළිබඳව අවධානය යොමු කරලා ඒ ප්‍රශ්නය විසඳන්න, ඒ තත්ත්වය සමනයට පත් කර ගන්න කටයුතු කරලා නැහැ. ඒ අනුව මේ තත්ත්වය කළමනාකරණය කර ගැනීමට නොහැකි වීම නිසා විදුලි බලය පැය ගණනාවක් ඇන හිටියා.

අවාසනාවට ඒක වදුරෙකුගේ පිටින් ගියා. අපි දැක්කා, රජය පටන් ගත්තු තැන ඉඳලාම වදුරන් එක්ක පොඩි ඇරියස් එකක් තිබෙන බව. මොකද, වදුරෝ තමයි මේ එන ප්‍රශ්නවලට හැමදාම බෙල්ල තියන්නේ. මම දැක්කා, සංජීවගේ ඝාතනය වෙච්ච වෙලාවේත් සැකපිට අල්ලා ගනීවි කියන බයට වදුරෙක් හැංගෙන්න දුවනවා. ඒ වාගේ ලොකු ප්‍රශ්නයක් වදුරන් එක්ක අද තිබෙනවා. හැබැයි, වදුරා අපට ලොකු පණිවිඩයක් දුන්නා. වදුරෙකුට පුළුවන්කම තිබුණා, එක මොහොතකින් මුළු රටේම විදුලිය විසන්ධි කරන්න. එතකොට හිතන්න, අපේ රටේ ජාතික බලශක්තිය මොන තරම් අර්බුදයක ද තිබෙන්නේ කියලා. එක තැනක, එක මොහොතක, එක ජීවියෙකුට මුළු රටම අඩපණ කරන්න පුළුවන් කියන කාරණයට මේ රටේ අවධානය යොමු කරවන්න ඒ වදුරා කටයුතු කළා. අපි මේවා පිළිබඳව කථා කරන්නේ, මේ ප්‍රශ්න ඒ ඒ මොහොතට කාගේ හරි ඇහේ ගහලා බේරෙන්න නොවෙයි, බලශක්තිය මේ රටේ ප්‍රධානම අවශ්‍යතාවක් විධියට සලකලායි.

මේ රටේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ගෙදර වටලන්නට ජනතාව එදා ගියේ ඇයි? මිරිහානේ ගෙදර වටලන්න ගියේ ඇයි? එහෙම කළේ විදුලිය ප්‍රශ්නයත් එක්ක, බලශක්ති අර්බුදයත් එක්ක. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඉස්සෙල්ලාම මිනිස්සු attack කළේ නැහැ. ඒ පිරිස Galle Face එකේයි වාඩි වෙලා හිටියේ. හැබැයි, එතුමාගේ ගෙදරට සෘජුවම ගිහිල්ලා, ගෙදර වටලලා එතුමාට බලපෑම් කරන්න ජනතාව පෙළඹුණේ විදුලිය ඇනහිටීමත් එක්කයි. ඒ නිසා විදුලිය ඇන හිටියාම ඒ ප්‍රශ්නය මේ රටේ සමස්ත ජනතාවට කොයි තරම් බලපානවා ද කියන එක රජයක් විධියට ඔබතුමන්ලා තේරුම් ගත යුතුව තිබෙනවා.

සමකයට ආසන්න රටක් විධියට අපට අඩුම පිරිවැයකින් විදුලි බලය ලබාගත හැකි හොඳම ක්‍රමය තමයි සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කිරීම. විදුලි අර්බුදයත් එක්ක ඒ සඳහා ලොකු උනන්දුවක් අපේ රටේ, සමාජයේ ජනතාවට ඇති වුණා. ඒ සඳහා පසුගිය රජය විවිධ පහසුකම් සහ හොඳ මිලක් ලබා දෙමින් කටයුතු කළා. එහි ප්‍රතිඵලය විධියට අපේ රටේ ජාතික විදුලිබල පද්ධතියට විශාල ධාරිතාවක් දෙන්න පෞද්ගලික අංශය පවා ලොකු උනන්දුවකින් විශාල වශයෙන් ඉදිරිපත් වුණා.

අද වෙනකොට සූර්ය බලශක්ති ඒකකයක් වෙනුවෙන් ලබා දීපු මිල අඩු කරලා රුපියල් 27ට ගේන්න යනවා, රුපියල් 27න් රුපියල් 22ට ගේන්න යනවා. ඊට පස්සේ ඒක රුපියල් 19ට ගේන්න ගියාම මේ සඳහා තිබෙන උන්නදුව අඩු වෙනවා. අපි සමකය ආසන්නයේ ඉන්න හින්දා අපට දවස් 365න් වැඩි කාලයක් සූර්ය බලශක්තිය ලබා ගත හැකිව තිබෙනවා. හැබැයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. අපට මේ පද්ධතිය පවත්වාගෙන යන්න බැරි වෙලා තිබෙන්නේ මේ ශක්තිය store කරගන්න බැරි නිසා. ඒ නිසා අපට දැන් ජල විදුලිය සහ තාප විදුලිය ජනනය කරගන්න සිද්ධ වෙනවා. හැබැයි, ඔබතුමන්ලා දැන් ලොකු ලොකු කතන්දර කියනවා නේ. අපට පුළුවන්කම තිබුණොත්, ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක විතර පෞද්ගලික අංශයේ ආයෝජනත් එක්ක මේ battery storage එකට පහසුකම් ගෙනැල්ලා කටයුතු කරන්න, මේ රටේ විදුලිය අවශ්‍යතාවෙන් සියයට 70ක් සූර්යාගෙන් පිරිමසා ගන්න පුළුවන්. ඔබතුමන්ලා ඒ සඳහා අවධානය යොමු කරලා කටයුතු කරනවා නම් ඒක බොහොම වැදගත්.

ඒ වාගේම, අපේ රටේ ජනතාවට ඊයේ-පෙරේදා දවස්වල නැවත ඇති වෙච්ච ප්‍රශ්නයක් තමයි, ඉන්ධන පිළිබඳ සැකයක් ඇතිවීම. ගිය සතියේ ඇමතිවරු කථා කරද්දි අපට තව ඉන්ධන තිබෙන්නේ සතියකට විතරයි, අහවල් දවසට විතරයි කියලා කියනකොට, තිබෙන මූල්‍ය හැකියාව, store කරගන්න තිබෙන හැකියාව මත ඉන්ධන තැන්පත් කරගෙන දවස් කීපයකට -පුළුවන්තරම් දවසක්- ඒවා පවත්වාගෙන යන්නේ කොහොමද කියලා තමයි ජනතාව බලන්නේ. ඒ නිසා තමයි තරගකාරිත්වයක් ඇති වුණේ. එදා තෙල් බෙදුම්කරුවෝ තෙල් බෙදා හැරීමෙන් නතර වෙනවා කියනකොට රටේ ආපහු පෝලිම් ඇති වෙන තත්ත්වයක් ඇති වුණා. මේ අර්බුදය ගැන අපි දන්නේ නැහැ. මේ අය ලබන ලාභය වැඩිද, මේ අය ලබන ලාභය අඩුද කියන ප්‍රශ්නය ගැන සාකච්ඡා කරලා මේ රටේ ජනතාව අපහසුතාවට පත් කරන්නේ නැතුව මේ කටයුත්ත කරනවා නම් තමයි වටින්නේ. මොකද, මේ ඉන්ධන සැපයුම්කරුවන්ගේ ආයෝජනයට සාපේක්ෂව ලාභයක් ලැබිය යුතුයි. සමහර තැන්වල මේක සේවාවක් විධියටයි පවත්වාගෙන යන්නේ. ඒ අයට ලොකු business එකක් නැහැ. නමුත් ඒ ආයතන කොහොම හරි කළමනාකරණය කරගෙන සේවාවක් විධියට පවත්වාගෙන යනවා.

මේ ඉන්ධන පිරවුම්හල් එක්කම පැවතිච්ච දෙයක් තමයි හුළං පහසුකම් දෙන එක. මාලිමාව රජය බලයට පත් වෙච්ච ගමන්ම මන්ත්‍රීවරියක් හඬ නගනවා අපි දැක්කා, කිලෝමීටර් 25ක දුරකින් මේ රටේ හැම තැනම වැසිකිළි හදනවා කියලා. වැසිකිළි හැදුවාට වැඩක් නැහැ. මොකද, අපේ නගරවල තිබෙන වැසිකිළිවත් පවත්වාගෙන යන්න බැරි තැනට පත් වෙලා තිබෙන නිසා. ඒවා නඩත්තු කරන්නේ නැහැ, පිරිසිදු කරන්නේ නැහැ. හැබැයි මේ හුළං සැපයීමේ පහසුකමට අපේ රටේ petrol shed එක ලඟු කරලා තිබුණාට, ලෝකයේ බොහෝ රටවල සනීපාරක්ෂක පහසුකම් ටික දෙන්නේ petrol shed එකෙන්. ඒ නිසා ඒ අයට ලැබිය යුතු ලාභය ලබාදීලා, හැම ඉන්ධන පිරවුම්හලකින්ම සනීපාරක්ෂක පහසුකම් ටික ලබාදීමේ වැඩ පිළිවෙළක් සඳහා ඒ අය පෙළඹෙව්වා නම්, ඒක අනිවාර්ය කළා නම්, අපේ රටේ තිබෙන ගැටලුවක් විසඳාගැනීමේ හැකියාව අපට තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවට යෝජනා කරනවා, මේ අයට වෙන වෙන චෝදනා කරමින්, ඒ අය එක්ක සාකච්ඡා කරන්නේ නැතුව, සාකච්ඡා කරන්න එනකොට හැංගෙන්නේ නැතුව, මේ රට නිකම් තව අර්බුදයකට පත් කරන්නේ නැතුව ඒ අය ලබන ලාභය තීරණය කරලා, අපේ රටේ සමස්ත ජනතාවට මේ පහසුකම් ටික ලබාදෙන්න කියලා.

මේ වෙනකොට හිතේ සැකයක් නැතුව අපේ රටේ ඉන්ධන ගබඩා කර ගැනීමේ හැකියාව තිබෙන්නේ සම්පූර්ණයෙන් මාසයකට විතරයි. අපි ළඟ ලොකු ඉන්ධන ටැංකි ප්‍රමාණයක් තිබෙනවා. මේවා පෞද්ගලික අංශයට දෙන්න යනවා, ඉන්දියාවට දෙන්න යනවා කියලා පසුගිය කාලයේ ඉන්දියාවට සාප කර කර හිටපු, බැණ බැණ හිටපු කට්ටිය දැන් ඒක හොඳයි කියන තැනට අද පත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා ඒවා කාටහරි දීලා මේ රටේ ප්‍රයෝජනයට යොදාගන්න කටයුතු කරන්න. අපට මේ ඉන්ධන පිළිබඳ තිබෙන අවිනිශ්චිතතාව නැති කරගන්නට මේ සියල්ල යොදා ගන්නවා නම් බොහොම හොඳයි කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, කාලයත් අවසන් වෙච්ච නිසා. ඔබතුමන්ලා මේ රටේ වෙන වෙන කණ්ඩායම්වලට චෝදනා කළත්, අද ඔබතුමන්ලාට වගකීම් හම්බ වෙලා තිබෙනවා. අතීතයේ ඉඳලා කථා කරන්න ගත්තොත්, ඔබතුමන්ලාගේ ඉතිහාසය තුළ මේ රට කඩා වටිටන්න කරපු දේවල් බොහෝ තිබෙන නිසා ඒ ගැන දීර්ඝව කථා කරන්නේ නැහැ. අද ඔබතුමන්ලාට ඒ වගකීම් දීලා තිබෙනවා. අන්දරේ කිව්වා, "ගල උස්සලා දුන්නොත් ගිහිල්ලා දාන්නම්" කියලා. හැබැයි ලංකාවේ මිනිස්සු නියමෙට වැඩේ කළා. ජැක් ගහලා හරි මොනවා හරි කරලා ගල උස්සලා කරේ තිබ්බා, ඔබතුමන්ලාගේ. දැන් දණ හිස් දෙක වෙච්ලා වෙච්ලා ඉඳලා හරියන්නේ නැහැ. ගල කරට ගත්තා නම් ගිහිල්ලා එගොඩට දාන්න ඕනෑ. ඒ නිසා වගකීමෙන් ඒ ගල එගොඩට දාලා, මේ රටේ ජනතාවට අර්බුදයකින් තොරව, හිතේ සැකයකින් තොරව ජීවත් වෙන්න වාගේම, මේ රටේ නැවත ප්‍රශ්න ඇති නොවන විධියට, ආපහු පෝලිම්වල ඉන්න සිදු නොවන විධියට, ආපහු හීෂණයක් වපුරන්න සිදු නොවන විධියට මේ බලශක්ති ක්ෂේත්‍රය කළමනාකරණය කරලා කටයුතු කරන්න කියලා ආණ්ඩුවට මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කෝසල නුවන් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

ගරු කෝසල නුවන් ජයවීර මහතා
(மாண்புமிகு கோசல நுவன் ஜயவீர)
(The Hon. Kosala Nuwan Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි බලශක්ති අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන දවස. අපි උදේ වරුවේ ඉඳලා බලශක්තිය සම්බන්ධවත්, බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධවත් යම් ප්‍රමාණයකට සාකච්ඡා කළා. ඒ අතරින් වැඩි හරියක් කිසිම හරයකට නැති කාරණා තමයි විපක්ෂයෙන් ඉදිරිපත් කළේ. අපේ රටට අවශ්‍යම දෙයක් තමයි බලශක්තිය කියන්නේ. ඒක අපට ඉතා වැදගත් දෙයක්. මොකද, වර්තමාන අපේ ආණ්ඩුව -ජාතික ජන බලවේගයේ ආණ්ඩුව- මේ රටේ නිෂ්පාදන ආර්ථිකය මුල් කරගත් ආර්ථික වැඩ පිළිවෙළක් තමයි සැලසුම් කර තිබෙන්නේ. එ් වැඩ පිළිවෙළ තමයි අපි ජනතාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වැඩ පිළිවෙළ තමයි දැන් ක්‍රියාත්මක කරමින් පවතින්නේ. රටක කර්මාන්ත තුළින් නිෂ්පාදනය ඉහළට නංවන්න නම් ඉතා වැදගත්ම ක්ෂේත්‍රයක් බවට පත් වෙන්නේ බලශක්තිය. නිෂ්පාදනය පුළුල් කිරීම සඳහා අපට බලශක්තිය ඉතාම වැදගත්. ජාතික සම්පත් විකුණන්නේ නැතිව තමයි අපි බලශක්තිය නිෂ්පාදනය කළ යුත්තේ. මේ රටේ පරිසර පද්ධතියත්, මිනිස්සුන්ගේ ජන ජීවිතත් ආරක්ෂා කර ගනිමින් සැලසුම් සහගතව හදපු අය වැයක ශීර්ෂයක් පිළිබඳව තමයි අපි අද කථා කරන්නේ.

බලශක්තියත් එක්ක එකට ගැට ගැහෙන ප්‍රධාන කාරණාවක් තමයි පරිසරය. අපේ රටේ ඉතාම සංවේදී පරිසර පද්ධතියක් තිබෙන්නේ. ජන ජීවිතයත් එක්ක සංවේදී පරිසර පද්ධතියක් තිබෙන්නේ. බලශක්තිය පුළුල් කරනවා සේම, අපට අවශ්‍යයි පරිසරයත්, මිනිසුන්ගේ ජන ජීවිතත් රැක ගන්න. ඒ නිසා තමයි මෙවර අය වැයෙන් අපි පුනර්ජනනීය බලශක්තිය පැත්තෙන් ගත්තාම, සුළං සහ සූර්යබල විදුලි ක්ෂේත්‍රයට වැඩි අවධානයක් යොමු කර තිබෙන්නේ. සූර්යබල විදුලි බලාගාරවලින් අපි අපේක්ෂා කරනවා, මෙගාවොට් 400ක් වාගේ ප්‍රමාණයක් උත්පාදනය කරන්න. ඒ වාගේම සුළං බලයෙන් මෙගාවොට් 1,500ක් වාගේ ප්‍රමාණයක් උත්පාදනය කරගන්නත් අපේ වර්තමාන ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. ඒ වාගේ විකල්ප බලශක්ති ප්‍රභේද, අලුත් ක්‍රම අපි හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම අපේ ගරු ජනාධිපතිතුමා ගිවිසුමක් අත්සන් කළා කියලා අපි දන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த சேனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.

ගරු කෝසල නුවන් ජයවීර මහතා
(மாண்புமிகு கோசல நுவன் ஜயவீர)
(The Hon. Kosala Nuwan Jayaweera)

විශේෂයෙන්ම හම්බන්තොට අලුතින් තෙල් පිරිපහදුවක් ආරම්භ කරන්න ගිවිසුමක් අත්සන් කළා. අපේ රටේ තෙල් අවශ්‍යතාවෙන් සියයට 40ක්වත් පිරිපහදුව තුළින් නිෂ්පාදනය කරන්නේ නැහැ. හම්බන්තොට තෙල් පිරිපහදුව ඉදිකිරීම තුළින් අපේ රට තෙල් විකුණුම් මධ්‍යස්ථානයක් බවට පත් කර ගන්න පුළුවන්. දැනට සිංගප්පූරුවේ තමයි මේ මධ්‍යස්ථානය තිබෙන්නේ. මැද පෙරදිගින් එන තෙල් ටික සිංගප්පූරුව පැත්තට ගෙනියන්න ඕනෑ නැහැ. ඒවා හම්බන්තොට ප්‍රදේශයේ තියලා, අපට එතැනින් රටට විශාල ආයෝජනයක් ගෙනෙන්න පුළුවන්. ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරනකොටත් අපි කිව්වා, නාස්තිකාර මුදල්, කොමිස් මුදල් ලබාදෙන එක නතර කරන්න ඕනෑ කියලා. අපි වැඩ ආරම්භ කළේ නැහැ කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු කියන්න කොච්චර උත්සාහ කළත්, එවැනි කටයුතු අපි පටන් අරගෙනයි තිබෙන්නේ. ඒ වාගේම LNG විකුණුම් මධ්‍යස්ථානයක් ඇති කරන්නත් සැලසුම් හදාගෙන ඊට අවශ්‍ය මූලික පියවර තබමින් තිබෙන්නේ, හම්බන්තොට ප්‍රදේශයේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථා කරනකොට බොරු ලස්සන කථා ටිකක් අපට ඇහුණා. මීට කලිනුත් මන්ත්‍රීවරයෙකු කථා කළා. එක්තරා මන්ත්‍රීවරයෙකු මම බොරු කියන්නේ නැහැ කියලා කථා කළා.

ඒ බොරු කියන්නේ නැති මන්ත්‍රීවරයා තමයි මහ බැංකු බැඳුම්කර වංචාවේ ප්‍රධාන හවුල්කරුවෙකු බවට පත්වෙලා හිටපු අර්ජුන් ඇලෝසියස් මහත්මයාගේ අරක්කු සමාගමෙන් සල්ලි අරගෙන තමන්ගේ ප්‍රචාරණ කටයුතු ටික කරලා ඒක මාට්ටු වුණාට පස්සේ, "මම දැනගෙන හිටියේ නැහැ, මම දන්නේ නැහැ" කිව්වේ. හැබැයි, බැලුවාට පස්සේ චෙක් එක මාරු කරලා තිබෙන්නේත් එතුමා ළඟ හිටපු MSD එකේ කෙනෙක්. ඉතින් හැම වෙලාවකම මෙතැන ඉඳගෙන තමන් සුදනා වෙන්න, "මම හරි හොඳ කෙනෙක්" කියන්න තමයි උත්සාහ කරන්නේ. හැබැයි එතුමාම ප්‍රකාශයක් කරලා තිබුණා, "මම දන්නේ නැතුව තමයි මට ඒ සමාගමෙන් ප්‍රචාරණ කටයුතු සඳහා සල්ලි දුන්නේ" කියලා.

අපි උදේ දැක්කා, අපට බණ කියන මන්ත්‍රීවරයෙක්. අපට මතකයි, ඒ මන්ත්‍රීවරයා පසුගිය කාලයේ මොකක්ද කළේ කියලා. යුද්ධයෙන් පස්සේ නිල් බලකායේත් හිටියා. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව එකට එකතු කරලා ජාතික සමඟිය ගොඩනගන්න තිබුණු අවස්ථාවක එහෙම කරන්නේ නැතුව, එක් අවස්ථාවක රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් ප්‍රතිපාදන රුපියල් මිලියන 500කුත් වෙන් කරගෙන, -එහෙමත් වැඩ කරලා- ඊට පස්සේ ඊළඟ මැතිවරණයේදී සමඟි ජන බලවේගයත් එක්ක එකතු වෙලා වැඩ කරලා මහා සුදනෙක් වෙලා, දැන් අපට කියනවා, සුදනා වෙන්න ලු. දැන් මහා සුදනෙක් වාගේ පෙන්වමින් ජාතික ජන බලවේගයට උපදෙස් දෙන්න පටන් අරගෙන තිබෙනවා. ඉතින් අපි කියනවා, ජාතික ජන බලවේගයේ ඉන්නේ මේ රට ගොඩනඟන්න හොඳ දැක්මක් තිබෙන, ශක්තියක් තිබෙන, ඒ වෙනුවෙන් කැපකිරීම් කරන්න පුළුවන් කණ්ඩායමක් බව.

ඊයේ විපක්ෂයේ ආදරණීය මන්ත්‍රීවරුන්ට note එක හදලා දෙනකොට රංජිත් තෙන්නකෝන් මහත්මයාට අමතක වීමක් සිදු වෙලා තිබෙනවා. මහජන උපයෝගිතා කොමිසම ලු ලයිට් බිල අඩු කළේ. එහෙමයි කියන්නේ. මහජන උපයෝගිතා කොමිසම කියන්නේ මොකක්ද? මහජන උපයෝගිතා කොමිසම කියන්නේ ගරු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන කොමිසමක්. ජනාධිපතිවරයා පත් කරපු කොමිසම තමයි මහජන උපයෝගිතා කොමිසම කියන්නේ. එතකොට මහජන උපයෝගිතා කොමිසමේ job එක මොකක්ද? ඒ ගොල්ලන්ගේ job එක තමයි මේ රටේ තිබෙන තත්ත්වය බලලා, මේ රටේ තිබෙන දේවල් බලලා, ඒ ගැන ගණනය කිරීමක් කරලා, අවශ්‍ය නිර්දේශ පවතින ආණ්ඩුවට ලබා දෙන එක. ඒක තමයි මහජන උපයෝගිතා කොමිසමේ කාර්යභාරය. එතකොට මහජන උපයෝගිතා කොමිසම නිර්දේශයක් දුන්නාට පස්සේ ඒ නිර්දේශය ක්‍රියාත්මක කරනවාද,

නැද්ද කියන එක තීන්දු කරන්නේ කවුද? ඒ නිර්දේශය ක්‍රියාත්මක කරනවාද, නැද්ද කියන එක තීන්දු කරන්නේ ආණ්ඩුව; ඇමතිවරයා. මහජන උපයෝගිතා කොමිසම කිව්වා, දැන් සියයට 20කින් විදුලි බිල අඩු කරන්න පුළුවන් කියලා. ඒක තමයි ඒ ගොල්ලන්ගේ කාර්යභාරය. මහජන උපයෝගිතා කොමිසම සියයට 20කින් විදුලි බිල අඩු කරන්න පුළුවන් කිව්වාම, ඒ වාර්තාව දිහා බලලා තමයි කටයුතු කරන්නේ. නැත්නම් ඉතින් මේ රටේ උපයෝගිතා කොමිසමක් පවත්වාගෙන යන්න ඕනෑ නැහැ නේ. හැබැයි, උදේ ඉඳලා මෙතැන සිටින විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, මහජන උපයෝගිතා කොමිසම ලු ලයිට් බිල අඩු කළේ.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පොරොන්දුවක් දුන්නා, අවුරුදු තුනකින් සියයට 20කින් ලයිට් බිල අඩු කරනවා කියලා. ඒක තමයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණේ. අවුරුදු තුනක් ඇතුළත සියයට 20කින් ලයිට් බිල අඩු කරනවා කියලා තිබුණා. හැබැයි, අපි ඇවිල්ලා මාස තුනක් ගත වෙනකොට දැනටමත් මේ රටේ විදුලි බිල සියයට 20කින් අඩු කරලා තිබෙනවා. අවුරුදු තුනකින් අඩු කරනවා කිව්වත්, මේ වෙනකොටත් අපි සියයට 20කින් අඩු කරලා තිබෙනවා. ඒ නිසා, මේ රටේ ජනතාවට බොරු කියන්න එපා කියලා අපි කියනවා. මේ රටේ ජනතාව මුළා කරන්න එපා. මහජන උපයෝගිතා කොමිසමෙන් දීපු තීන්දුව ක්‍රියාත්මක කළේ, විදුලිබල ඇමතිවරයා ඇතුළු අපේ ආණ්ඩුව. ඒ නිසා මේ රටේ මිනිස්සු මුළා කරන්න එපා කියලා අපි කියනවා.

මේ රටේ නාළිකාවලින් මුළා කරන්න හැදුවාට මේ රටේ මිනිස්සු මුළා වෙන්නේ නැහැ කියන එක තමයි අපි දැක්කේ. රටේ මිනිස්සු නම් දන්නවා, ඒ නාළිකාවල තත්ත්වය. කාලයෙන් කාලයට සතියෙන් සතියට news මවාගෙන ආවා. අපි දැක්කා, පසුගිය කාලයේ හැමදාම කථා කළේ හාල්, පොල් ගැන. දැන් හාල් ප්‍රශ්නයක් නැහැ, රටේ. දැන් කිසි ප්‍රශ්නයක් නැහැ. දැන් අද උදේ ඉඳලා තෙල් ප්‍රශ්නය අල්ලාගෙන දහලනවා. අපි දැක්කා, ඊයේ රාත්‍රියේ එක ජඩ මාධ්‍යයක් news එකක් පළ කළා, රාත්‍රී 8.00න් පස්සේ සියලු ෂෙඩ් ටික වහන්නයි ලෑස්ති වෙන්නේ; වහලා දමනවා කියලා. අපි ගිහිල්ලා බැලුවා, අපි නියෝජනය කරන ප්‍රදේශවල එක ෂෙඩ් එකක්වත් ඒ මිනිස්සු වැහුවේ නැහැ. කිසිම තෙල් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඒ news එක දැකලා හදිස්සි වෙලා ගිහිල්ලා ෂෙඩ් දෙක තුනක පෝලිම් හැදුණාට පස්සේ, ඒ පෝලිම් ටික පෙන්වලා රටේ මිනිස්සු භීතියට පත් කරන්න හැදුවා. හැබැයි මේ රටේ කිසිම මනුස්සයෙක් ඒවාට අහු වෙන්නේ නැහැ. දැන් මේ රටේ මිනිස්සු අහු වෙන්නේ නැහැ. මේ රටේ මිනිස්සු දන්නවා, මේ රටේ මිනිසුන්ට පාවිච්චි කරන්න ඇති තරම් තෙල් මේ රට ඇතුළේ තිබෙනවා, ඒවා නිසි ක්‍රමයක් තුළ හරියට බෙදා හරිනවා, ඒ නිසා කවදාවත් තෙල් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි ආණ්ඩුව විධියට කියනවා, මේ රට තුළ එවැනි තත්ත්වයක් ඇති වීම සඳහා කවදාවත් ඉඩ තියන්නේ නැහැ කියලා. මොකද, මේ රටේ මිනිසුන්ගේ අවශ්‍යතා පිළිබඳව හොඳින් තේරුම් ගන්න පුළුවන්, ඒවා සපුරන්න පුළුවන් ආණ්ඩුවක් තමයි ජාතික ජන බලවේග ආණ්ඩුව කියන්නේ. මේ රටේ ෂෙඩ් අයිතිකාරයෝ කවුද කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා. ඒ ගොල්ලන්ගේ ෂෙඩ්වලට ලැබෙන ලාභය නැති වෙනකොට, ඒ ෂෙඩ්වල අයිතිකාරයෝ විතරයි කෑ ගැහුවේ. අපේ ප්‍රදේශවල තිබෙන ෂෙඩ්වල සහ දුරින් තිබෙන ෂෙඩ්වල වුණත් අයිතිකාරයෝ කවුද කියලා අපි කියන්නම්. ඒ අයගෙන් බහුතරයක් ගත්තොත්, දේශපාලන කණ්ඩායම්වල නියෝජිතයන්ට තමයි ඒවා තිබෙන්නේ. ඒගොල්ලන්ට තමයි ඉන්ධන පිරවුම්හල් විශාල ප්‍රමාණයක් තිබෙන්නේ. ඒගොල්ලන්ගේ ලාභය අඩු වෙනකොට, මේ අය උදේ ඉඳලා පුදුමාකාර ට්‍රයි එකක් දෙනවා, අපේ මේ වැඩ පිළිවෙළ නවත්වන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු කෝසල නුවන් ජයවීර මහතා
(மாண்புமிகு கோசல நுவன் ஜயவீர)
(The Hon. Kosala Nuwan Jayaweera)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මාර තර්කයක් තමයි මේ ගොල්ලෝ ගෙනෙන්නේ. ජනතාවට තෙල් මිල අඩු කරන්නත් ඕනෑ, ඒ ගොල්ලන් කියන ෂෙඩ් හිමියන්ට වැඩි ලාභයක් දෙන්නත් ඕනෑ. ඒක නිසා අපි කියන්නේ, ඔබතුමන්ලා ඔය කියන කථාවත් කලින් කියපු හාල් කථාව වාගේම තමයි. රුපියල් 150ට හාල් දෙන්නත් ඕනෑ, රුපියල් 130ට වී මිලදී ගන්නත් ඕනෑ කිව්වා. ඒ වගේම කථාවක් තමයි මේ විපක්ෂයේ මන්ත්‍රීවරු අදත් කියන්නේ. ඒක නිසා අපි මේ රටේ ජනතාවට කියනවා, රැවටෙන්න එපා කියලා. ඔබතුමන්ලා වී සම්බන්ධ කාරණයෙදීත් කිව්වේ ඒකම තමයි. රුපියල් 130ට වී අරගෙන රුපියල් 150ට හාල් දෙන්න කිව්වා. ඒ වාගේම දැන් කියනවා, තෙල් මිලත් අඩු කරන්නලු, ෂෙඩ් හිමිකරුවන්ගේ ලාභයත් වැඩි කරන්න ලු. නමුත් මේ රටේ ජනතාව බුද්ධිමත්. බුද්ධිමත් ජනතාවක් ඉන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් කළ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු කෝසල නුවන් ජයවීර මහතා
(மாண்புமிகு கோசல நுவன் ஜயவீர)
(The Hon. Kosala Nuwan Jayaweera)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒක නිසා රැවටෙන්න එපා කියලා අපි ජනතාවට කියනවා. මේ ආණ්ඩුව, ජනතාව තේරුම් ගත්ත,මේ රටේ තත්ත්වය තේරුම් ගත්ත ආණ්ඩුවක්. ඒක නිසා අපි කවදාවත් මේ රටේ ජනතාවට ගැටලුවක් හෝ ප්‍රශ්නයක් ඇති වන ආකාරයට, රටේ ජනතාව පීඩාවට පත් වන ආකාරයට වැඩ කරන්නේ නැහැ. ඒ වගකීමේ සහතිකය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.09]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ විදුලි බලය සහ ඛනිජ තෙල් පිළිබඳව වවන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම මා භාග්‍යයක් කොට සලකනවා. මොකද, මෙය ඉතාම වැදගත් ක්ෂේත්‍රයක්. ඒ වාගේම smart cities ගැන කථා කරනකොටත්, අපේ රට නූතන ලෝකයට අරගෙන යන්නත් මෙම ක්ෂේත්‍රය අත්‍යවශ්‍යයි. ඒ විතරක් නොවෙයි, රටේ නිෂ්පාදන

[ගරු රවී කරුණානායක මහතා]

සම්බන්ධයෙන් කටයුතු කරනකොට විදුලියේ මිල ප්‍රමාණය සහ ඉන්ධනවල මිල ප්‍රමාණය ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා අඩු මිලට විකිණීමේ හැකියාව ඇති කරන්න.

රට බංකොලොත් වුණාට පසුව ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 377ක අලාභයක් ලැබුවත්, 2024 වර්ෂයේදී රුපියල් බිලියන 211ක ලාභයක් ලබන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එම මණ්ඩලය කලින් ලැබූ අලාභය විධියට තවම තිබෙන්නේ රුපියල් බිලියන 177යි. ඒ වාගේම රුපියල් බිලියන 352ක අලාභයක් ලැබූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අද රුපියල් බිලියන 115ක ලාභයක් ලබන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ආසියාවේ වැඩිම විදුලි බිල තිබෙන රටක් ලෙස තමයි මේ අවස්ථාවේ ශ්‍රී ලංකාව පත්වෙලා තිබෙන්නේ. නමුත් එය මූල්‍ය විනයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා, කංචන විජේසේකර සහ ඩී.වී. චානකලා ගෙන ගිය නිර්භීත වැඩ පිළිවෙළ නිසා අද එය යම් විධියක මූල්‍ය විනයක් තිබෙන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තවමත් පසුගිය අවුරුදු 76 ගැන කථා කරනවා. මම අහනවා, මේ රට ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියන කාරණයට ඊට වඩා වැඩි කාලයක් මිඩංගු කරන්න හොඳ නැද්ද කියලා.

මම නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා කඩිනම් මහවැලි ව්‍යාපාරය ඇති කළා. ඒ හරහා වික්ටෝරියා, කොත්මලේ, රන්දෙණිගල, මාදුරුඔය, රන්ටැඹේ වාගේ ව්‍යාපෘති ඇති කළා. ඊට ඉස්සෙල්ලා සමනල වැව ව්‍යාපෘතිය කළා. අපේ 2015 ආණ්ඩුව කාලයේ මම මුදල් ඇමති වශයෙන් සිටියදී මොරගහකන්ද ව්‍යාපෘතිය විවෘත කළා. ඒ වාගේම උමා ඔයේ කටයුතු කරගෙන ගියා. මේ ඔක්කෝම කරලා විදුලි බලය ශක්තිමත්ව ලබා දෙන්න කටයුතු කළේ නැද්ද? රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5ක් ලෙස පවත්වාගෙන යන්න කටයුතු කර තිබෙන මේ අවස්ථාවේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකතුවෙලා ඒ අයත් එක්ක ඉදිරියට ගමන් කරන මාර්ගය තමයි දැන් ආණ්ඩුව පිළිගෙන තිබෙන්නේ. මේ වෙලාවේ සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා. මේ අවුරුද්දේ අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදනය රුපියල් ට්‍රිලියන 33කුත්, 2026 වර්ෂයේ අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදනය රුපියල් ට්‍රිලියන 38කුත්, 2027 වර්ෂයේ අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදනය රුපියල් ට්‍රිලියන 44කුත් වෙනකොට විදුලි බලය සහ ඛනිජ තෙල් ඒ සඳහා අත්‍යවශ්‍ය දායකත්වයක් ලබා දෙනවාය කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරන්නට අවශ්‍යයි.

බලශක්ති ඇමතිවරයා සභාවේ සිටින මේ වෙලාවේ මතක් කරන්න අවශ්‍යයි, අද අපේ රට නූතන ලෝකය කරා ගමන් කරන බව. මම මීට දින කිහිපයකට ඉස්සෙල්ලා "Ceylon Today" පත්තරේ දැක්කා, ඉන්දියාව වැඩ කරන ආකාරය. They are going to start new power lines with Singapore and the UAE. ඒ වාගේ ඉදිරියට ගමන් කරන අවස්ථාවක් තිබෙන්නේ. ඉංග්‍රීසියෙන් කියනවා, imagination is the beginning of creation කියලා.

දැන් අපි බොහොම සතුටු වෙනවා, ජනාධිපති අනුර දිසානායක මහතා ඉන්දියාවට ගිය අවස්ථාවේ ඉන්දියාවත් එක්ක grid connectivity එකකට එකතු වෙලා තිබීම ගැන. ඒක රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා යටතේ මම විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන ඇමති විධියට ඉන්නකොට 2018-2019 කාලයේ පටන් ගත්ත එක. ඒක ඉදිරියට ගෙන යන එක අත්‍යවශ්‍යයි; ඒක කළ යුතුයි. හැබැයි, ඉන්දියාව, සිංහප්පූරුව සහ UAE සමඟ කටයුතු කරනවා කියන්නේ, ඔබතුමන්ලා මේ කටයුත්ත කඩිනම් කළ යුතු බවයි. ඊට පස්සේ ඉන්දියාව nuclear power ආශ්‍රයෙන් hydrogen නිෂ්පාදනය කරන්න පටන් ගත්තොත්, ඔවුන් විදුලි බලය අපනයනය කරාවි, ඒකකයක් ඩොලර් ශත 3කට, 4කට, 5කට. දැන් අපේ අනිල් ජයන්ත ඇමතිතුමා කිව්වා, අදානිගෙන් අපි සුළං විදුලිබලය ඒකකයක් ඩොලර් ශත 8කට ගන්නකොට, ඉන්දියාවට ඒක ඩොලර් ශත 3.5කට දෙන එකේ ප්‍රශ්නයක් තිබෙන බව. ඒකෙන් පේන්නේ ඒගොල්ලන්ට ඩොලර් ශත 5ත්, 6ත් අතර මිලකට අපනයනය කරන්න පුළුවන් හැකියාව තිබෙන බව. මේ නිසා අපට grid connectivity එකක් තිබීම අත්‍යවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, oil pipeline එක ගැනත් බලන්න ඕනෑ. ඉන්දියාවෙන් මන්නාරමට ගෙනැල්ලා, මන්නාරමින් ත්‍රිකුණාමලයට ගෙනැල්ලා ඒ ටැංකි 99 යොදාගෙන මෙහෙයුම් කටයුතු කරන එක අත්‍යවශ්‍යයි. ඒක කළ යුතුමයි. මේ අවස්ථාවේ මා සතුව තිබෙනවා, මෝදි අගමැතිතුමායි, සිංගප්පූරුවේ ජනාධිපතිතුමායි ගිවිසුමක් අත්සන් කරන පින්තූරයක්. ඒක ඒ රටවල් ඉදිරියට යන ගමනක්. ඉන්දියාව එහෙම ඉදිරියට යනකොට අපිත් ඒත් එක්කම ඉදිරියෙන් යා යුතුයි කියන එක මේ අවස්ථාවේ මම මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අහනවා, ජූනි 27වන දා ගැන. Power sector reforms සම්බන්ධයෙන් අලුත් පනත් කෙටුම්පත ගේන්න අවශ්‍යයි. ජූනි 27වන දාට තව මාස කීපයක් තමයි තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මේ ගැන ඔබතුමාට කැමැත්තක් තිබෙනවා, ඒ වාගේම ඉදිරි දැක්මක් තිබෙනවා. නමුත් මම හිතන විධියට රජයේ නිලධාරින් නිසා මේ කටයුත්ත හිරවෙලා තිබෙනවා. ඒ නිසා නිර්භීතව මේ කටයුත්ත ඉදිරියට ගෙනයන්න අවශ්‍යයි. මම දන්නා විධියට ඒ සංශෝධන හරහා බෙදා හැරීමේ -සම්ප්‍රේෂණයේ- යම්කිසි විධියක වෙනස්කමක් කරන්න යෝජනා කරලා තිබෙනවා. විදුලිය ජනනය කරන්න IPPs හොඳ නම්, බෙදා හැරීමට - සම්ප්‍රේෂණයට - IPPs සම්බන්ධ කර නොගන්නේ ඇයි? ඒ capital base එක නැති නිසා තමයි ඔය ප්‍රශ්නය තිබෙන්නේ. මේ අය වැයෙන් ප්‍රාථමික වියදම් සඳහා උපරිම සීමාව දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13යි කියනකොට, ඔබතුමන්ලාට තව අවුරුදු පහ හයකින්වත් මේ ක්ෂේත්‍රයට මුදල් වෙන් කරන්න බැහැ. මා මේ අවස්ථාවේදී කියන්නේ power sector reformsවල ඉදිරිපත් කරලා තිබෙන විධියට distribution and transmission පෞද්ගලික අංශයක් සමඟ කරන්න පුළුවන්. එහෙම නැත්නම් රජයට අවශ්‍ය නම් ඒක නොකර ඉන්නත් පුළුවන්. නමුත් නිකරුනේ මේ සඳහා මුදල් වෙන් කරන්න එපා. ඒ වාගේම ආණ්ඩුවේ මේ අවස්ථාවේ තිබෙන parameters සමඟ අනිවාර්යයෙන්ම ප්‍රාග්ධන වියදම්වලට -capital expenditure සඳහා- සියයට 5ක් යොමු කරනකොට කොයි ආකාරයෙන්ද ඔබතුමන්ලාට පුළුවන් වෙන්නේ මේ සඳහා මුදල් වෙන් කරන්න? මම හිතන්නේ ඒ ගැනත් නැවත බලන්න අවශ්‍යයි.

ඉන්දියාව මේ අවස්ථාවේදී බංග්ලාදේශයට විදුලිය ඒකකයක් විකුණනවා, ඩොලර් ශත 7කට. ඒ වාගේම නේපාලයට සහ අවට රටවලටත් ඒ ගාණට විදුලිය විකුණනවා. මේ මොහොතේ අපේ විදුලිය ඒකකයක නිෂ්පාදන වියදම රුපියල් 23යි, 24යි. නමුත් තව මාස දෙකකින් විතර ජල විදුලි බලාගාර තුළින් වන ජනනය කිරීම් අඩු වුණොත්, ඒ ගණන රුපියල් 40කට පමණ වැඩි වෙනවා නේද? ඒ සඳහා අපි යම් විධියක contingent steps ටිකක් ගන්න අවශ්‍යයි. ඒ තුළින් තමයි අපට ඉදිරියට යන්න වෙන්නේ. මේ කථා කරන මොහොතේ ජනනය කරන ජල විදුලිය ඒකකයකට වැය වෙන්නේ රුපියල් 2ක්, 3ක්, පුනර්ජනනීය බලශක්තියෙන් ජනනය කරන විදුලිය ඒකකයකට වැය වෙන්නේ රුපියල් 12ක්, 30ක්, -ඩොලර් ශත 5ත්, 10ත්- ගල් අඟුරුවලින් - coalවලින් -

ඒකකයක් හදන්න රුපියල් 25ක්, 30ක් පමණ වැය වෙනවා. LNG ඒකකයකට රුපියල් 35ක්, 40ක් පමණ වැය වෙනවා. හැබැයි, LNG ගැන මොනවාද වෙන්නේ? තෙල්වලින් සහ IPP හරහා ගනු ලබන ඒකකයකට රුපියල් 70ත්, 80ත් අතර මුදලක් තමයි දැන් යන නිෂ්පාදන වියදම. අපි ජනනය සඳහා public-private partnerships වලට ලෑස්ති වෙනවා නම්, අපි ඒ සම්බන්ධ සියලු දේම සලකා බලන්න අවශ්‍යයි.

LNG සම්බන්ධයෙන් මම යමක් කියන්න අවශ්‍යයි. Public Utility Commission එක ඔබතුමන්ලාගේ ජනනීය plan එක ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඉතින් ඒ ප්‍රතික්ෂේප කිරීම නිසා ඉදිරියේදී ඒ ජනනය කරන්නේ කොහොමද කියලා ප්‍රශ්නයක් ඇති වෙනවා නේද? ඒ ගැනත් මේ අවස්ථාවේදී මම අහනවා. සොබාදනවි බලාගාරයෙන් මෙගාවොට් 350ක් පද්ධතියට එක් කරන්න යනවා නේ. අප්‍රේල් මාසයේදී ඒක commission කරනවා නේ. මම හිතන විධියට thermal power තුළින් මෙගාවොට් 200ක්, ඉතිරි ටික combined cycle විධියට, LNGවලින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් කිසිසේත්ම පෙන්වලා නැහැ, LNGවලින් පටන් ගන්න තිබෙන හැකියාව පිළිබඳව.

FSRU එකක් පටන් ගන්න අඩු ගණනේ අවුරුදු දෙක තුනක කාලයක් ගත වෙනවා. තවම ඒක පටන් ගන්නේ නැති නිසා සොබාදනවි බලාගාරය commission වුණාට පසු මොකද වෙන්නේ? අද මෙගාවොට් 200ක නිෂ්පාදනයේදී එක ඒකකයකට රුපියල් 70ක් වැය වෙනවා. LNG ගෙනාවේ නැත්නම් වියදම වැඩි වේවි. මම අපේ විදුලිබල මණ්ඩලයෙන් අහනවා, ඇයි අපි carbon trading සම්බන්ධයෙන් කටයුතු නොකරන්නේ කියලා. ඔබතුමන්ලා මගෙනුත් ඒ ගැන අහන්න පුළුවන්. මමත් ඒ වෙලාවේ ඇමතිවරයෙක් විධියට හිටියා. බටගොඩ ලේකම්තුමා ඉතාම ඕනෑකමින් වැඩ කරපු නිසා අපි ඒක පටන් ගන්න අනුමැතිය දුන්නා. නමුත්, ඊට පසුව ඒ ගැන උනන්දුවක් ඇති වුණේ නැහැ. මේ මොහොතේ ටොන් එකකින් යූඑස් ඩොලර් 5ක් ගන්න අවස්ථාව තිබෙනවා. පුනර්ජනනීය නිෂ්පාදනයෙන් installed capacity එක මිලියන 3,500ක්, 4,000ක් තිබෙන අවස්ථාවක අපට යූඑස් ඩොලර් මිලියන 100ක් ගන්න පුළුවන්. ඒ කියන්නේ රුපියල් කෝටි 300ක්. අපි මේ සම්බන්ධයෙන් කටයුතු නොකරන්නේ ඇයි කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඒක තමයි Public Utility Commission එකෙනුත් කියලා තිබෙන්නේ. පුනර්ජනනීය බලශක්තිය අධෛර්යවත් කරන්නේ නැතුව, ඒවා ගන්නේ නැහැයි කියන්නේ නැතුව BESS - Battery Energy Storage System - එක ඇයි අපි adopt කරන්නේ නැත්තේ? ඒගොල්ලන් අහලා තිබෙනවා, LNG සම්බන්ධව. ගරු ඇමතිතුමනි, අපි මේ වෙනුවෙන් ඊට වැඩිය ඕනෑකමින් කටයුතු කරන්න අවශ්‍යයි නේද?

මම මේ සඳහා කටයුතු කරන්නේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් සමඟයි. අද වන විට විදුලිය ඒකකයක් රුපියල් 23ට විකුණන එක තව මාස දෙකකින් අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි සමඟ වෙනස් කරන්න ඕනෑ නේද? මම එදා පාර්ලිමේන්තුවේදී ඒ ප්‍රශ්නය ඇහුවේ, ඒ සඳහා ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරන්න අවශ්‍ය නිසායි. ආර්ථික වර්ධන වේගය සියයට 5ක් දක්වා වර්ධනය කරන කොට අපට තිබෙන ලොකුම ප්‍රශ්නය විදුලි බිලේ ප්‍රශ්නයයි. Clay tiles සම්බන්ධයෙන් තිබෙන්න්ත් ඒ ප්‍රශ්නය. අද ඉන්දියාවෙන් ඒ නිෂ්පාදන මේ රටට ගෙනෙන්නේ ඒ ප්‍රශ්නය නිසා. අපි අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධව කටයුතු කරන්න අවශ්‍යයි. සියයට 12ක ඉල්ලුමක් තිබෙන කොට සැපයුම තිබෙන්නේ අද සියයට දෙකයි, තුනයි. ඉදිරි දැක්මක් සහිතව ඔබතුමන්ලාට සියයට පහක වර්ධන වේගයක් අවශ්‍ය නම්, ඒ සඳහා අවශ්‍ය වන විදුලි බලය කොහොමද ලබා ගන්නේ? විදුලිය ජනනයේ ප්‍රශ්නය විසඳුවොත්, තිබෙන්නේ transmission ප්‍රශ්නය. බෙදා හැරීම; සම්ප්‍රේෂණය. අපි කොහොමද ඒ සඳහා කටයුතු කරන්න ඕනෑ කියන ප්‍රශ්නය මේ අවස්ථාවේදී මා අහනවා. පුනර්ජනනීය බලශක්ති වැඩ පිළිවෙළ අධෛර්යවත් කරන්න එපා.

දේශීය නිෂ්පාදකයා ව්‍යවසායකයෙකු බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ, 2015 අය වැයෙන් මම මුදල් ඇමති වශයෙන් ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක වීම නිසායි. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා එදා විෂයය භාර රාජ්‍ය ඇමතිවරයා වශයෙන් ඒ වෙනුවෙන් කටයුතු කළා. එයින් විශාල වාසි ප්‍රමාණයක් ආවා. ඊට පසුව හැම දේම බැලුවේ වපර ඇසින්. නමුත් ඒක සියයට 100ක් ජනනය කරන්නේ ස්වාභාවික සම්පත්වලින්. ප්‍රාග්ධනය ගෙනාවට පසු, අවශ්‍ය සම්පත්වලින් සියයට 100ක් සොයා ගැනීමේ හැකියාව තිබෙන්නේ රට ඇතුළේමයි. එම නිසා feed-in tariff එකට අතගහන්න එපා. Thermal power නිෂ්පාදනය කරනකොට ඒකකයක් රුපියල් 70යි කියලා පාර්ලිමේන්තුව දැනුවත් කළා. IPPsලාගෙන් ගන්න කොට ඒකකයක් රුපියල් 75යි කියලා දැනුවත් කළා. ගල් අඟුරුවලින් නිෂ්පාදනය කරන විදුලිය ඒකකයක් රුපියල් 35ක් නම්, ඇයි මේ තරම් අඩු නිෂ්පාදන පිරිවැයක් සහිත එකක් අපි නැති කරන්න හදන්නේ? ඒකකයකට යන වියදම ඇමෙරිකානු ඩොලර් ශත 6ත්, 7ත් අතර තිබුණා නම්, රුපියල් 12ත්, 20ත්, 25ත් අතර තිබුණා නම්, මම හිතන විධියට එය අධෛර්යවත් වන්නේ නැහැ. දේශීය නිෂ්පාදකයෝ, ව්‍යවසායකයෝ බවට පත් කිරීම තමයි එදා අපේ ඉලක්කය වුණේ. ඔබතුමන්ලා කථා කරනවා, දේශීය නිෂ්පාදනය ගැන. එහෙම නම්, අපි මේ අවස්ථාවේදී කල්පනා කරන්න ඕනෑ, දේශීය නිෂ්පාදන ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි, මම මිනිත්තු දෙක තුනකින් කථාව අවසන් කරන්නම්.

මම බලශක්ති ඇමතිතුමාට කියන්නේ මෙකයි. පානදුරේ ප්‍රශ්නය ගැන කථා කරන කොට කිව්වා, water battery එක ගැන. අදහස හොඳයි. නමුත් ඒක ක්‍රියාත්මක කරන්න අවුරුදු පහක්, හයක් යාවි. ඔබතුමන්ලා තාවකාලික පැලැස්තර අලවන්න එපා. Pumped storage system එක අවුරුදු 10ක්, 15ක් විතර තිබුණා. අලුත් පනතට පුනර්ජීවයක් දෙන්න තිබුණාට, ඒ සම්බන්ධයෙන් practical reality එකක් නැහැ කියන ප්‍රශ්නය තිබුණා. ඒකට අවුරුදු 50ක life එකක් තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් බලන්නේ කොහොමද? ඊට වැඩිය හොඳයි, battery storage සමඟ මේක ප්‍රවලිත කරන එක. ඒ ඒකකයක් ඩොලර් ශත දෙක තුනකට ගන්න පුළුවන්. ඒක එකතු කළොත් පුනර්ජනනීය බලශක්තියෙන් මුළු පද්ධතියට සියයට පහත්, හතත්, අටත් අතර ප්‍රමාණයක් ලැබෙනවා. ශත හතයි, අටයි අතර ප්‍රමාණයකට දෙන්න පුළුවන් නම් එය ඔබතුමන්ලා ලංකාවට කරන වැදගත් ක්‍රියාවක් ලෙසයි මා හිතන්නේ. ගරු ඇමතිතුමනි, මෙහිදී ඔබතුමන්ලා දේශපාලන තීන්දු ගන්න අවශ්‍යයි.

ඒක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය. ප්‍රශ්නයක් ඇති වුණාම ඒක වඳුරෙක් මත දාලා, රිළවෙක් මත දාලා, මොනරෙක් මත දාලා නොවෙයි තීන්දු ගන්න තිබෙන්නේ. කරන්න තිබෙන දේ මේකයි. ඔබතුමන්ලා ඒ තීන්දුව ගන්න.

[ගරු රවී කරුණානායක මහතා]

දැන් බලන්න, පොලී අනුපාතය සම්බන්ධයෙන් සුප්‍රීම් උසාවියෙන් තීන්දුවක් දෙන්න ඕනෑ. මම දන්නවා, ඔබතුමන්ලා ඒක කරන්න හදපු බව. නමුත්, ඊට ඉස්සෙල්ලා උසාවියෙන් තීන්දුවක් දුන්නා.

දැන් මම මේ කථා කරන මොහොතේදීත් ඉන්ධන බෙදා හැරීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. හුහදෙනෙක් ඒ ගැන කථා කරපු නිසා ඒ වෙනුවෙන් කථා කරන්න මම වෙලාව මිඩංගු කරන්නේ නැහැ. ඔබතුමන්ලා ඒක CID එකට භාර දීලා තිබෙනවා. බෙදුම්කරුවන් ගෙන්වලා කථා කරලා ප්‍රශ්නය විසඳුවා නම් මම හිතන විධියට ඔබතුමන්ලාටත් ඒකෙන් ඒ ව්‍යාපාරය ගැන දැනුමක් ලබා ගැනීමට ප්‍රවේශයක් ලැබෙනවා කියන එකයි මට මේ අවස්ථාවේදී කියන්න අවශ්‍ය වන්නේ. මෙතැන තිබෙන්නේ technical and practical කාරණයක්. අනුගමනය කරන එක technically හරි වුණාට, practically ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මම දැක්කා, ඒ සම්බන්ධව හුහක් උත්තර දෙනවා. නමුත්, අපි කොහොමද මේ කටයුතු ඉදිරියට ගෙන යන්නේ? අපි අඩු වියදමකින් විදුලිය නිෂ්පාදනය කරන්න අවශ්‍යයි. එතකොට තමයි අපි තරගකාරී තත්ත්වයක් ඇති කරන්නේ. සියයට 15ත්, සියයට 25ත් අතර පොලී අනුපාතය තියාගෙන අද ව්‍යවසායකයෝ බිහි කිරීම ලේසි කටයුත්තක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් කරන ඉල්ලීම මෙයයි. මේ අවස්ථාවේදී අපි පුළුවන් තරම් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න අවශ්‍යයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ත්‍රිකුණාමලයෙන් තෙල් බෙදා හැරීමට oil pipeline එකක් ස්ථාපනය කිරීමට අත්සන් කරලා තිබෙන එක බොහොම හොඳයි. ඒක ඉදිරියට පවත්වාගෙන යන්න. එම තෙල් ටැංකි 99 සම්බන්ධයෙන් ඉන්දියාවයි, ලංකාවයි එකතු වෙලා සාකච්ඡා කරලා, ඊට පසුව අපේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අනෙක් සියලුදෙනාත් ගෙන්වාගෙන සාකච්ඡා කරලා, මෙය ඛනිජ තෙල් ගබඩා කිරීමේ කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කරන එක අත්‍යවශ්‍යයි කියන එක මේ අවස්ථාවේදී මම කියන්න අවශ්‍යයි. ඒ කාලයේ strike කළාට ප්‍රශ්නයක් නැහැ. අද ඒකේ බැරැරුම්කම තේරුම් අරගෙන ඔබතුමන්ලා ඉදිරියට යන ගමන හරියාකාරව යන්න. මේ ගමන යන්න තමයි එදා එක්සත් ජාතික පක්ෂය කටයුතු කළේ. එදා අපට බැන්නාට ඔබතුමන්ලාට ඒවා අනුගමනය කරමින් තමයි ඉස්සරහට යන්න වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාව අවසන්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩියකින් මේ කාරණයත් කියලා කථාව අවසන් කරනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ, ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු අපි බැලිය යුතු වන්නේ business sense එකකින්. අන්තිමට ඒ public-private partnership එක තමයි පාවිච්චි කරන්න අවශ්‍ය වන්නේ. කවුරු කිව්වත් රජය බිස්නස් කරන්න අදක්ෂයි. අපට අවශ්‍ය වන්නේ ඒ සඳහා නිවැරැදි මාර්ගය පෙන්වීමයි. ඒ නිවැරැදි මාර්ගය පෙන්වලා ඒ තුළට පුළුවන් තරම් ව්‍යවසායකයන් එකතු කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනවිට ලක්ෂ 6, 7කගේ විතර විදුලිය විසන්ධි කරලා තිබෙනවා. ඔබතුමන්ලා කියලා තිබුණේ මේ සඳහා soft loan එකක් දීලා කටයුතු කරනවා කියායි. එම නිසා ඒ ගැනත් බලන්න. කෙනෙකුට විදුලි බිලක් ගෙවා ගන්න බැරිව දවස් 10ක් ගත වනකොට විදුලිය විසන්ධි කරනවා නම්, ඒ සම්බන්ධව මේ අවස්ථාවේදී මම ඉල්ලන්නේ මේකයි. ලංකා විදුලිබල මණ්ඩලය කිසිම දැනුවත් කිරීමක් නැතුව විදුලිය විසන්ධි කළොත්, ඔබතුමන්ලා ඒ විදුලි පාරිභෝගිකයන්ට වන්දියක් ගෙවන්නේ කොහොමද කියලා මම අහනවා. මේ අදහස් ප්‍රයෝජනයට අරගෙන ඔබතුමන්ලා කටයුතු කරන්න. යූඑන්පී එකට බැන්නාට කමක් නැහැ. යූඑන්පී එකෙන් රට හදන මාර්ගය අපි පෙන්වලා තිබෙනවා. අවුරුදු 76ක ශාපයක් නම් වුණේ, අපි දැන් ඉඳන් ඉදිරියට නිවැරැදි මාර්ගයේ යමු කියමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.25]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දවසේ බලශක්තිය පිළිබඳව වන මේ විවාදයට සම්බන්ධ වීම ඇත්තටම සතුටුදායකයි. මක්නිසාද යත්, රටක ආර්ථික දියුණුවට ඒ රටේ මහ ජනතාව, දේශපාලන ව්‍යාපාර සියල්ල ඇතුළත්. ඒක තමයි මේ මොහොතේදී සාකච්ඡාවට ගන්න මාතෘකාව වන්නේ. හැබැයි, මේ රට කවර වේගයකින් ආර්ථික දියුණුවක් ලබා ගන්නවාද, ඒ ආර්ථික දියුණුව කොයි තරම් දුරට ස්ථාවරව පවත්වා ගන්න පුළුවන්ද කියන එක තීරණය වන්නේ බලශක්තිය අතින් අපි කොපමණ ශක්තිමත්ද කියන කාරණාව මත. විශේෂයෙන් විදුලිය පිළිබඳවයි මම පළමුව සඳහන් කරන්න බලාපොරොත්තු වෙන්නේ.

අද බලශක්තිය පිළිබඳව කථා කිරීමේදී මුල ඉඳලා සාකච්ඡාවට ගත්තේ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳවයි. බලශක්තිය කියන කාරණය ගත්තාම, ඒක ප්‍රධාන කොටස් තුනකින් සමන්විතයි. බලශක්තිය නිෂ්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදා හැරීම තමයි ඒ ප්‍රධාන කොටස් තුන. මෙන්න මේ පද්ධති තුන ස්ථාවරව සහ අඛණ්ඩව දවසේ පැය 24ම පවත්වාගෙන යන්න පුළුවන්ද කියන කාරණාව මත මේ රටේ ආර්ථික දියුණුව තීරණය වෙනවා. ඒක නිසා වර්තමාන රජයේ ප්‍රමුඛ කාර්යය විය යුත්තේ බලශක්තියෙන් අපේ රට ස්වයංපෝෂිත කිරීමත්, බලශක්තිය හැකිතාක් අඩු මිලට ලබා දීමත්. විදුලිය අඛණ්ඩව ලබා දීම සඳහා පුනර්ජනනීය බලශක්තිය පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. වර්තමානයේ අපට ජල විදුලිය ගන්න බැහැ. හේතුව, ජල විදුලි බලාගාර දැන් මේ රටේ නිර්මාණය වෙලා ඉවරයි. මම දන්නා තරමින් තවදුරටත් ජල විදුලි බලාගාර නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ස්ථාන ඉතුරු වෙලා නැහැ. එහෙම නම් අපට පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වෙත අවධානය යොමු කරන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම අපි සුළං විදුලි බලාගාර පිළිබඳව අවධානය යොමු කරන්න වෙනවා. ඒ වාගේම, හිරු එළිය භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමු කරන්න රජයට සිද්ධ වෙනවා. මේ ක්‍රියාවලි දෙකටම බලපාන

මූලික ගැටලු දෙකකුත් තිබෙනවා. ඒ තමයි, සාමාන්‍ය තාප විදුලි බලාගාරයකින් හෝ ඉන්ධන විදුලි බලාගාරයකින් වාගේ මෙවායින් අඛණ්ඩව විදුලිය ලබා ගන්න බැරි වීම. එක වෙලාවක සූර්ය රශ්මිය වැඩිපුර පතනය වෙනකොට, තවත් වේලාවක සුළං වැඩි වේගයකින් හමා එනවා. එතකොට අඛණ්ඩව විදුලිය නිෂ්පාදනය වුණාට, අනෙක් අවස්ථාවලදී විදුලිය නිෂ්පාදනය අඛණ්ඩව සිදු වන්නේ නැහැ. උච්චාවචනය වෙච්ච විදුලියක් තමයි එතකොට ඒකෙන් ලැබෙන්නේ. ඒ නිසා සියයට සියයක් පුනර්ජනනීය බලශක්තියෙන් පමණක් අපේ රටේ විදුලිබල අවශ්‍යතාව කවදාවත් සම්පූර්ණ කරන්න බැහැ. හැබැයි, LNG ඇතුළු පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණය වැඩි කරලා, තාප විදුලි බලාගාරවල නිපදවන ප්‍රමාණය අඩු කිරීමේ හැකියාව තිබෙනවා.

මම දකින විධියට ඒකට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම. මෙන්න මේ මැද තිබෙන පද්ධතිය අකාර්යක්ෂමයි. එම නිසා ඒ පද්ධතිය අලුතින් නිර්මාණය කරන්න ඕනෑ. ඒ පද්ධතිය අලුතින් සකස් කිරීම සඳහා කළ යුතු දේ පිළිබඳව මගේ පෞද්ගලික අදහසක් තිබෙනවා. මොකද, මේ වැඩේ සඳහා වෙන් කරන්න අපේ රටට ඒ තරම් විශාල මුදලක් නැහැ. ඒ නිසා රජය පැත්තෙන් ඔබතුමන්ලා ඒ වෙනුවෙන් අලුත් ඉදිරි පියවරක් තියන්න. ඇමතිතුමා කිව්වා වාගේ රාජ්‍ය අංශයත්, පෞද්ගලික අංශයත් එකතුවෙලා හෝ මෙන්න මේ grid එක සකස් කරලා, මේක කොටස්වලට වෙන් කරලා හදා ගත්තේ නැත්නම් කවදාවත් අපට ආර්ථික දියුණුවක් අපේක්ෂා කරන තැනට යන්න බැහැ. ඒ නිසා කවර ආකාරයකින් හෝ ලෝකයේ අනෙක් රටවල ඉන්න ආයෝජකයන්ට අපේ රටේ බලශක්තිය මිලෙන් අඩුයි කියන එක පැහැදිලි කළේ නැත්නම් මේ අය වැයේ තිබෙන ඔබතුමන්ලා අපේක්ෂා කරන එක ඉලක්කයකටවත් යන්න බැරි වෙනවා. ඒ නිසා මම නැවත නැවතත් ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මෙයයි. මේ බලශක්ති ප්‍රභවයන්ට, බලශක්ති ක්ෂේත්‍රයට අනිවාර්යයෙන්ම ඔබේ අවධානය යොමු කරන්න කියන අදහස තමයි මගේ මූලික කරුණු යටතේ මට කියන්න තිබෙන්නේ. මේවා තමයි රටේ ඇත්ත ප්‍රශ්න.

පාර්ලිමේන්තු රැස්වීම් ආරම්භ වුණු වෙලාවේ පටන් අවුරුදු 76ක් තිස්සේ කරපු හොරකම මාතෘකාවක් හැටියට අරගෙන තමයි හැම මන්ත්‍රීවරයෙක්ම වාගේ කථා කරන්නේ. මම ඒ පිළිබඳව කථා නොකරන්නේම මේ රටේ ප්‍රධානම ප්‍රශ්නය හොරකම නොවෙයි කියලා දන්නා නිසායි. ඒ කාරණය මම නැවත වතාවක් කියනවා. හැබැයි, මේ රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්න 10 ලිව්වොත්, ඒ 10න් එකක් තමයි හොරකම. ඒ ප්‍රධාන ප්‍රශ්න 10 අතරින් හොරකමටත් වඩා ඉස්සරහින් තිබෙන ප්‍රශ්නය තමයි මේ බලශක්ති අර්බුදය. බලශක්ති අර්බුදය නිසා අපේ රට වේගයෙන් ඉදිරියට යන්නේ නැහැ. කවුරු හෝ ආයෝජකයෙකු ලෝකයට සේවා සපයන IT company එකක් අපේ රටට අරගෙන ආවා කියලා අපි හිතමු. නමුත්, ඔහුට අවශ්‍ය විදුලි සැපයුම අඛණ්ඩව දෙන්න අපට බැරි නම්, ඔහුට ලෝකයත් එක්ක තරග කරන්න බැරි වෙනවා. ඒ නිසා විදුලි බලය අඛණ්ඩව ලබා දීම සඳහා අනිවාර්යයෙන්ම ඔබතුමන්ලාට අලුත් නීති, අණපනත් ගේන්න සිද්ධ වෙනවා. විශේෂයෙන්ම සූර්ය විදුලි බලාගාර එහෙම නැත්නම් සූර්ය පැනල ප්‍රදේශවල ඉදිකරලා එයින් ලැබෙන විදුලිය අර company එකට ලබා දෙන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් කොතැනක හෝ තිබෙන වැවක ඉහළ ප්‍රදේශයේ සූර්ය කෝෂ නිර්මාණය කරලා, එයින් ලැබෙන විදුලිය ලංකා විදුලිබල මණ්ඩලය හරහා අර ආයතනයට ලබා දෙන්න පුළුවන් විධියට සකස් කරන්න පුළුවන් නම් එය ඉතා වටිනවා. එතකොට ආයෝජකයා එනවා; අවශ්‍ය කොම්පැනිය ආරම්භ කරනවා; අවශ්‍ය විදුලිය තව ආයෝජකයෙක් හරහා ලබා ගන්නවා; ඒ කුලිය විදුලිබල මණ්ඩලය හරහා ලබා ගන්නවා. මෙන්න මේ වාගේ අලුත් අදහස්වලින් මේ රට ඉස්සරහට ගෙනියන්න ඕනෑ කියන යෝජනාව මා කරනවා.

දෙවැනි කාරණාව තමයි, සූර්ය විදුලි බලාගාරවල තිබෙන අර්බුදය. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා කියපු වදුරු කථාවට සම්බන්ධ කරමින් මම මේ ගැන කියන්නම්. එදා සිද්ධ වෙච්ච ප්‍රශ්නය මේකයි. එකවර යම් ස්ථානයක විදුලිය බිඳවැටීමක් සිද්ධ වුණා. සූර්ය කෝෂවලින් ලබා දෙන විදුලිය වැඩියි. අවසානයේදී ගෙවල්වල trip switches ටික off වෙනවා වාගේ දිගින් දිගටම පද්ධතිය කඩාගෙන වැටුණා. එහෙම නම් මේකට කළ හැක්කේ මොකක්ද? සූර්ය විදුලියෙන් එන නිෂ්පාදනය අවම කිරීම වෙනුවට, ලංකාවට බැටරි හඳුන්වා දෙන්න අපට සිද්ධ වෙනවා. විශේෂයෙන්ම ටෙස්ලා සමාගමටත් මේ මොහොතේදී චීන බැටරි එක්ක හැප්පෙන්න බැරිවෙලා තිබෙනවා. සමහර තැන්වල තිබෙනවා මම දැක්කා, අලුත්ම චීන මෝටර් රථවල බැටරිය ඉතාම ඉහළ කාර්යක්ෂමතාවකින් යුක්ත බව. එහෙම නම් ඒකෙන් කියැවෙන කථාව තමයි, චීනයේ බැටරි මේ වෙනකොට ලෝකයේ වෙළෙඳ පොළ තුළට වේගයෙන් එන්න පටන් අරගෙන තිබෙනවා කියන එක. එහෙම නම් අපට අලුත් පියවරක් හැටියට මෙන්න මේ ක්ෂේත්‍රය ගැන අවධානය යොමු කරන්න පුළුවන්. අපේ රටේ නිෂ්පාදනය වන විදුලිය ගබඩා කර ගැනීම සඳහා මේ බැටරි තාක්ෂණය අපේ රටට හඳුන්වා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා මම යෝජනා කරනවා. ඒ හරහා රාත්‍රී කාලයට අවශ්‍ය විදුලිය ලබා ගන්න පුළුවන්. ඒ වාගේම, ඒ හරහා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කරන, විදුලියෙන් ක්‍රියාත්මක වන රථවාහන මේ රටේ ජනප්‍රිය කරන්න පුළුවන්. සූර්ය විදුලිය ගබඩා කර ගන්න බැටරි ටික ගේන්න පුළුවන් නම් අපට ඒ දේවල් කර ගන්න පුළුවන්. මම දැන් කාරණා දෙකක් සඳහන් කළා. එකක්, බැටරි තාක්ෂණය දියුණු කරන එක. අනෙක, විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණය හරහා පෞද්ගලික ආයතනවලට විදුලිය ලබා ගන්න තව තැනක විදුලිය නිෂ්පාදනය කරන්න කියන එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති වෙලාව අවසානයි.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
තව සුළු වෙලාවක් අරගෙන මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රට කෙළවරේ තිබෙනවා ඉන්දියාව. ඉන්දියාව ලෝකයේ වේගයෙන් දියුණු වන රටක්. අපි තවම හිතාගෙන ඉන්නේ මේ රටින් විකුණන්න පුළුවන් තේ, පොල්, රබර්, ශ්‍රමය වාගේ දේවල් විතරයි කියලා. නැහැ, අපට විදුලියත් විකුණන්න පුළුවන්. විදුලිය විකුණන්න පුළුවන් වෙන්නේ කොහොමද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට තව විනාඩි 4ක කාලයක් ලබා දෙන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මේ වෙද්දී අපි දැකලා තිබෙනවා, උතුරු-නැඟෙනහිර කියන්නේ පුනර්ජනනීය බලශක්තියට විශාල විභවයක් තිබෙන ප්‍රදේශයක් කියලා. සුළං විදුලි බලාගාර ලංකාවේ හැම තැනම නිර්මාණය කරන්න බැහැ. නමුත්, උතුරු-නැඟෙනහිර කලාපයේ ඒක කරන්න පුළුවන්. ඔබතුමාට පුළුවන් නම් අදානි ව්‍යාපෘතිය වාගේ තව ව්‍යාපෘති ගෙනෙන්න. ඇයි, එවැනි ව්‍යාපෘති

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ගෙනෙන්න ඕනෑ කියලා කියන්නේ? එවැනි ව්‍යාපෘති ගෙන ඒම හරහා ලංකාව තුළ බලශක්ති අර්බුදයට විසඳුම් ලැබෙනවා. ඒ වාගේම, අපට ඕනෑ තරම් බලශක්තිය තිබෙනවා කියලා ලෝකයේ ඉන්න ආයෝජකයන්ට කියන ගමන්, ආසන්න රට වන ඉන්දියාවට විදුලිය විකුණන්නත් පුළුවන්.

ඉන්දියාවට විදුලිය විකුණන්න නම් අපි පළමුව කළ යුත්තේ කුමක්ද? ඉන්දියාව එක්ක connect වෙන්න ඕනෑමයි. ඔබතුමන්ලාට මන්ත්‍රී ධුර 159ක් ලැබී තිබෙනවා. ජනතාවගේ විශ්වාසය ඔබතුමන්ලාට ලැබී තිබෙනවා. ඒ නිසා බය නැතුව ඒ සම්බන්ධය ඇති කරන්න. ඔබතුමන්ලා විපක්ෂයේ සිටි කාලයේ කළා වාගේ අපි ඒකට විරුද්ධව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි කියන්නේ නැහැ, ඉන්දියාව එක්ක සම්බන්ධ වුණාම ඒක මේ රටේ ස්වෛරීත්වයට බලපානවා, මේ රටට වරදිනවා, මේ රට විනාශ වෙනවා කියලා. ඒ නිසා බය නැතුව ඉන්දියාව එක්ක සම්බන්ධ වෙන්න. මොකද, මේ දශකය තුළ අපි මේ connectivity එක කරගත්තේ නැත්නම් ඊළඟ දශකය තුළ සමහරවිට රවී කරුණානායක මැතිතුමා කිව්වා වාගේ ලෝකයේ වෙනත් ක්‍රමවලින් බලශක්තිය ආවොත් අපට අපේ විදුලිය විකුණාගන්න බැරි වෙනවා. ඒ නිසා ඉන්දියානු ආයෝජකයන්ට බය නැතුව කථා කරන්න. අදානි විතරක් නොවෙයි. වෙනත් ආයෝජකයන්ටත් කථා කරලා කියන්න, ඉන්දියාවට මේ විදුලිය ගන්න කියලා. අපේ විදුලිය නිරපරාදේ ඒ ප්‍රදේශවල තිබෙනවා. පුනර්ජනනීය බලශක්තියේ කේන්ද්‍රස්ථානයක් බවට උතුරු-නැඟෙනහිර පත් කරගත්තොත් අලුත් ආර්ථික කලාපයක් මේ රටේ නිර්මාණය වෙනවා.

ඒ සියල්ල මධ්‍යයේ ආණ්ඩුව ගත යුතු තවත් වැදගත් තීරණයක් තිබෙනවා. ඒ තමයි, මේ රටේ පරිසර සංවිධාන පිළිබඳ ගත යුතු තීරණය. ඇත්තටම මේ රටේ සද්භාවයෙන් කටයුතු කරන පරිසර සංවිධාන තිබෙනවා. නමුත්, මේ වාගේ ව්‍යාපෘති ආරම්භ වෙනකොට අටවා ගන්නා පරිසර සංවිධාන මේ රටේ දියුණුවට බලපෑම් ඇති කරනවා. ජල විදුලි බලාගාරයක් හදන්න ගියොත්, ඒ ප්‍රදේශයට යට වන ගම්මානවල මිනිස්සු ටික අරගෙන ඇවිල්ලා, ගස් ටික යට වෙනවා, සතුන් මැරෙනවා, අනං මනං කියලා ඔන්න එතැනින් කට්ටියක් අවුස්සලා ගන්නවා. සුළං විදුලි බලාගාරයක් හදන්න ගියොත් කුරුල්ලන් මැරෙනවා කියලා ඒකෙන් මිනිස්සු අවුස්සලා ගන්නවා. එහෙම නැත්නම් වෙනත් මොකක් හෝ ව්‍යාපෘතියක් හදන්න ගියොත් ඒකට අදාළ පරිසර සාධක ගෙනැල්ලා බලපෑම් ඇති කරනවා. මේ රටේ ඉන්න මෙලෝ වැඩක් නොකරන අය ගම්වල ඉන්න මිනිස්සු ටිකක් ගෙනැල්ලා, ඒ මිනිස්සු අවුස්සලා, මේ වාගේ ධනය උත්පාදනය කරන, රට ඉදිරියට ගෙනයන්න පුළුවන් ව්‍යාපෘතිවලට බාධා ඇති කිරීම සඳහා අටවාගත් පරිසර සංවිධාන තිබෙනවා. විශේෂයෙන්ම, ඒ පරිසර සංවිධාන අටවන්නේම මේ වෙද්දී පවතින පෞද්ගලික ඉන්ධන බලාගාරවල හිමිකරුවන් විසින් වෙන්න පුළුවන්. ඔවුන්ගේ පංගුව අඩුවෙන්න යනකොට, ඒ පංගුව තව දුරටත් පවත්වාගෙන යන්න මේ වාගේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට බලපෑම් ඇති කරනවා වෙන්න පුළුවන්.

විදුලිබල මණ්ඩලය ගත්තොත්, ලංකාවේ වැඩිම උගතුන් ප්‍රමාණයක් එක තැනක වැඩ කරනවා නම් වැඩ කරන්නේ විදුලිබල මණ්ඩලයේ. නමුත්, ඒ උගතුන් වැඩිම ප්‍රමාණයක් වැඩ කරන විදුලිබල මණ්ඩලයට බැරිවෙලා තිබෙනවා මේ රටේ බලශක්ති අර්බුදයට ස්ථිරසාර සහ අඩු වියදම් ක්‍රමයක් හදුන්වා දෙන්න. දැන් විදුලිබල මණ්ඩලය ලාභ ලබා තිබෙනවා කියනවා. ඇත්ත. හැබැයි, අපි අමතක නොකළ යුතුයි, ගෙවල්වලින්, මිනිස්සුන්ගෙන් අය කරන විදුලි බිල වැඩි කරගෙන තමයි ඒ ලාභ උපයාගත්තේ කියන එක. විදුලි බිල අඩු කරන්න ඕනෑ. විදුලි බිල අඩු කරන්න නම් අනිවාර්යයෙන්ම අඩු මිලට විදුලිය නිෂ්පාදනය කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ඉංජිනේරුවන් ඇතුළු උගතුන් වැඩිම ප්‍රමාණයක් ඉන්න තැන හැටියට විදුලිබල මණ්ඩලයට වගකීමක් තිබෙනවා, කොහොමද මේ රටට අඩු මුදලට, ස්ථාවරව, අඛණ්ඩව විදුලිය ලබා දෙන්නේ, කොහොමද මේ විදුලිය වෙන රටකට විකුණන්නේ කියන කාරණා ගැන මේ රජයේ විදුලිබල ඇමතිතුමා ඇතුළු සියලුදෙනාට උපදෙස් ලබා දෙන්න. ඒක මේ රටේ පුරවැසියන් වෙනුවෙන් විදුලිබල මණ්ඩලය අනුගමනය කළ යුතු ක්‍රියාවලියක් කියා මම විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි, ආණ්ඩුවේ සිටින ඇමතිවරුන්ගේ ක්‍රියාකලාපය. ඔබතුමා එදා වදුරු කථාව නොකියා සිටියා නම් හොඳයි කියලා මම හිතනවා. වගකීම් විරහිත ප්‍රකාශයක් තමයි ඔබතුමා ඒ කළේ. විදුලිය විසන්ධි වීමට හේතුව මේ රටේ මිනිස්සු දැනගන්න ඕනෑ නැහැ. විදුලිය විසන්ධි වුණා; එක් තැනකින් කඩාගෙන වැටුණා; මොනවා හෝ සිදුවීමක් වුණා. ඔබතුමා කරපු ඒ ප්‍රකාශය හරහා සිද්ධ වෙච්ච දේ ඔබතුමා දන්නවාද? ලෝකයේ බොහෝ තැන්වල ඒක විහිළුසහගත ප්‍රවෘත්තියක් බවට පත් වුණා. විහිළුසහගත ප්‍රකාශයක් නොවෙයි ඇමතිතුමා කළේ. නමුත් අපේ රටේ බලශක්ති අර්බුදයක් තිබෙනවා කියලා ලෝකයේ අනෙක් රටවලට ඔබතුමා පණිවුඩයක් යැව්වා. වදුරෙක් පැන්නාට පස්සේ මේ රටේ දවස් ගණනක් විදුලිය නැති වෙනවා නම් මොන ආයෝජකයාද මේ රටට එන්නේ? ඔබතුමා වගකීම් විරහිත කථාවක් ඒ අවස්ථාවේ කිව්වේ. ඔබතුමාට වුවමනාවක් තිබුණේ නැහැ ඒක කියන්න. ඔබතුමාට කියන්න තිබුණා විදුලිය විසන්ධි වීමක් සිද්ධ වුණා, කොහෝ හෝ තැනක බිඳ වැටීමක් වුණා කියලා. ඊට පස්සේ වැඩේ ඉවර වෙනවා; දවස් කිහිපයකින් විදුලිය ලැබෙනවා. ඒ නිසා ඔබතුමා ඒ අවස්ථාවේ කළේ වගකීම් විරහිත ප්‍රකාශයක්.

ඒ වාගේම මම දැක්කා, තව ඇමතිවරයෙක් අදානි වාගේ ව්‍යාපෘති ලංකාවෙන් යනකොට "ඒක ෂෝක්" වාගේ කථාවක් කියනවා. අපි ආයෝජකයන් ධෛර්යවත් කරන්න ඕනෑ. ආයෝජකයන්ගෙන් අපට අලාභ සිදුවන කොටසක් තිබෙනවා නම් ඒ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. හැබැයි, ආයෝජකයන් අපේ තරහකාරයන් වාගේ, ඔවුන් අපට ඕනෑ ඕනෑ විධියට ඇවිල්ලා වැඩ කරන්න ඕනෑ වාගේ උන්මත්තක අදහස්වලින් නම් මේ රට ගොඩනඟන්න උත්සාහ කරන්නේ, මම විශ්වාස කරනවා, අපට ඉදිරි දශකයේත් ඉන්න වෙන්නේ දුප්පත් රටක් විධියට. ඔබතුමන්ලා විශ්වාස කරන 2029දී පොහොසත් රට, 2029න් පසුව අපි ජීවත් වෙන්න බලාපොරොත්තු වන, දේශපාලනය කරන්න බලාපොරොත්තු වන පොහොසත් රට නිර්මාණය කරන්න නම්, වගකීම් සහිතව ලෝකයට සම්බන්ධ වෙමින් කටයුතු කරන්න ඕනෑ. අපට ළඟම රට වන ඉන්දියාව එක්ක connect වෙමින්, පුනර්ජනනීය බලශක්තිය ඉහළ නංවමින්, LNG බලාගාරවලින් විදුලිය නිෂ්පාදනය කරන ප්‍රමාණය අඩු කරමින්, බලශක්තිය අඛණ්ඩව අඩු මිලකට ලබා දුන්නොත් ආයෝජකයන් එයි.

ඒ ආයෝජකයන්ගේ පැමිණීම හරහා අපට ධනය උත්පාදනය වෙයි. එතැනින් ඔබ-අපි ඉන්න මේ රට සාර්ථක රටක් බවට පත් වෙයි. ඔබතුමන්ලා ඔය ගන්න කිසිදු ක්‍රියාමාර්ගයකට සමගි ජන බලවේගය ලෙස අපි විරුද්ධ වෙන්නේ නැහැ. හේතුව, ඔබතුමන්ලා හරහා පමණයි මේ ටික කරගන්න පුළුවන්. ඔබතුමන්ලා විපක්ෂයේ හිටියොත් අපට කවදාවත් මේ ටික කරන්න බැහැ. හේතුව, උමාඔය ජල යෝජනා ක්‍රමයේදී ඔබතුමන්ලාගේ හැසිරීම මේ රටේ මිනිසුන්ට වාගේම අපටත් මතකයි. එවැනි හැසිරීමක් අපි ඔබතුමන්ලාට පෙන්වන්නේ නැහැ. අපට අවස්ථාවාදී දේශපාලනයක් නැහැ. ඔබතුමන්ලාට මේ වැඩේ කරන්න කියලා අපි කියනවා. නැවත නැවතත් කියන්නේ

ඔබතුමන්ලාට මෙක කරන්න පුළුවන් කියලායි. එතැනින් අපි ඊළඟ පිම්ම ගනිමු. ඒ යෝජනාව කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.38]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, අද දවසේ බලශක්ති අමාත්‍යාංශය ගැන කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. බෙදුම්කරුවන් හා තෙල් සංස්ථාව අතර ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ගැන කථා කරමින් මගේ කථාව පටන් ගන්නම්.

මේක අද ඊයේ ඇති වුණු ප්‍රශ්නයක් නොවෙයි. මේක, 2010දී විකුණුම් මිලෙන් ලීටරයකට සියයට 2.5ක් දෙන්න ඕනෑ කියලා ආපු යෝජනාවක්. මේ මුදල 2015, 2016 කාලයේ සියයට 0.5කින් වැඩි කළා. ඒ අනුව ලීටරයකට විකුණුම් මිලෙන් සියයට තුනක් ලබාදෙන වැඩ පිළිවෙළක් ගියා. ඊට පසුවයි 2016 upper cap සහ lower cap කියන කාරණය කථා කළේ. ඩීසල් ලීටරය රුපියල් 121ට තිබූ කාලයේ සියයට 3ක් දුන්නා. ඒ වාගේම පෙට්‍රල් ලීටරය රුපියල් 162ක් වනතුරු සියයට තුනක් දෙන මේ වැඩ පිළිවෙළ ගියා. ඒ කාලයේ ඇත්තටම ඩීසල් ලීටරය රුපියල් 100ට, පෙට්‍රල් ලීටරය රුපියල් 130යි, 135යි අතර තමයි සාමාන්‍යයෙන් විකිණුවේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විධියට මේ පිළිබඳ තීරණයක් ගත්තා. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඒක තමයි මේ ප්‍රශ්නය ඇති වීමට ප්‍රධානම හේතුව. 2016දී ගත්ත මේ ක්‍රියාමාර්ගය වක්‍රලේඛයක් මඟින් නිකුත් කරන්න උපදෙස් දීලා තිබුණත්, ප්‍රධාන නීති නිලධාරි විධියට අදත් කටයුතු කරන ඒ නීති නිලධාරිනිය විසින් මේ ක්‍රියාදාමයට අවශ්‍ය වැඩ පිළිවෙළ නොගැනීම තමයි මේ අර්බුදයට මූලිකම හේතුව බවට පත් වුණේ.

ඊළඟට, 2022දී එක පාරටම පෙට්‍රල් මිල වැඩි වුණා; ඩීසල් මිල වැඩි වුණා. ඒ වාගේම, 2016දී ගත්ත තීරණය ක්‍රියාත්මක කරන්න යනකොට විශාල අර්බුදයක් ඇති වෙලා මේ පිරවුම්හල්කරුවන් ගිහින් දිසා අධිකරණයෙන් තහනම් නියෝගයක් ගත්තා. අපි දන්නවා, ඒ කාලයේ ඩීසල් තුන්සිය ගණනකට, පෙට්‍රල් හාරසිය ගණනකට ගිය තත්ත්වයක් තිබුණේ. මාස හතකට පස්සේ මේ වාරණය ඉවත් කරලා තිබුණා. සංස්ථාව පරණ විධියටම ක්‍රියාත්මක කරන්න උත්සාහ කළාම, බස්නාහිර පළාත්බද සිවිල් අභියාචන මහාධිකරණයට ගිහින් වාරණයක් ගත්තා, මේ බෙදුම්කරුවන්. ඒක නිශ්ප්‍රභ කිරීම ගැන තමයි එදා බිමල් රත්නායක මැතිතුමා ක්ෂ මණ්ඩලය court case එකක් ගැන සඳහන් කරමින් කථා කළේ.

ඒකට විරුද්ධව බෙදුම්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය වාරණ නියෝගය ඉවත් කළාට, නඩුව තවමත් ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වාගේම, 2023 අගෝස්තු මාසයේ තීන්දුවක් ගත්තා, මේක වැඩි කරන්න. මේ සියල්ල වසන් කරලා තමයි දැන් මේ ආණ්ඩුව කථා කරමින් ඉන්නේ. ඒක තමයි අපට මේ ගැන කථා කරන්න තිබෙන ප්‍රධානම කාරණය.

ජනාධිපතිතුමා පත් වෙලා දින ගණනකදී ඉස්සෙල්ලාම පත් කළේ තෙල් සංස්ථාවේ සභාපතිතුමා. එතුමා මේ අය ගෙන්වලා කථා කරලා කිව්වේ මොකක්ද? Immigration Chiefට වුණු වැඩේ මටත් කරන්න තමයි හදන්නේ, ඒ නිසා කරුණාකරලා මම මේක, -ඉරිදා දවසක මේ කාරණය කථා කළේ- සඳුදා 10.30ට මේක නිවැරදි කරලා කථා කරන්නම් කිව්වා. එහෙම කිව්වත්, මහ මැතිවරණය නිසා ක්‍රියාත්මක වුණේ නැහැ. එදා මේක ක්‍රියාත්මක වුණා නම් මේ ආණ්ඩුවට විශාල අර්බුදයක් එනවා. පසුගිය දවස් දෙක තුනේ ඇති වුණා වාගේ විශාල තෙල් හිඟයක් ඇති වෙන්න තිබුණා. ඒ නිසා ඒක කරන්නේ නැතිව ඉඳලා තමයි දැන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න හදන්නේ.

මහ මැතිවරණයෙන් පස්සේ ඛනිජ තෙල් සංස්ථාව විශේෂයෙන් formula එකක් හැදුවා, loads 15ක් විකුණුවොත් වියදම ඇරලා රුපියල් 62,330ක ලාභයක් තිබෙන බවත්, loads 16-30 අතර විකුණුවොත් රුපියල් 130,000ක ලාභයක් තිබෙන බවත් කියලා.

මේ ක්‍රියාදාමය ගැන බෙදුම්කරුවන් එක්ක සාකච්ඡා කරලා, ඒකට අකමැතියි කිව්වාම තමයි මේ වක්‍රලේඛය දැන් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම පළාත්බද මහාධිකරණය මෙය ප්‍රතික්ෂේප කළේ නැහැ. ඒගොල්ලන්ට කිව්වා, දෙගොල්ලන්ම - ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවත්, අනෙක් පැත්තෙන් බෙදුම්කරුවනුත්- සාකච්ඡා කරලා තීන්දුවකට එන්න කියලා. නමුත්, සාකච්ඡා කරලා තීන්දුවකට එන එක පැත්තකින් තියලා තමයි තෙල් සංස්ථාව අද තනිකරම තමන්ට වුවමනා විධියට මේ වැඩේ ක්‍රියාත්මක කරගෙන යන්නේ.

අපි දැක්කා, විශේෂයෙන්ම මේ ක්‍රියාදාමය ආණ්ඩුව සැලකිල්ලට ගත්තේ වෙනත් විධියකට බව. අපි දිගින් දිගටම කියපු කාරණයක් තිබුණා. අපි එදා උදේ මෙතැනදී නැඟිටලා ඒ ගැන කථා කළේ යටි අරමුණක් හින්දා නොවෙයි. පෙට්‍රල් පෝලිම් ඇති කරන්න කුමන්ත්‍රණයක් කරන්න කිසිම වුවමනාවක් අපට නැහැ. ඒ වාගේම පෙට්‍රල් නැතුව මිනිස්සු පාරවල ඇවිදපු යුගය ආපසු ඇති කරන්න වුවමනාවකුත් අපට නැහැ. හැබැයි, ආණ්ඩුව විශාල භීතියකට පත් වෙලා හිටියා, කවුරු හරි එහෙම කළා කියලා. කවුරු හරි එහෙම කළා නම්, ඒක හොයා ගන්න එක ඔබතුමන්ලාගේ වැඩක්. නමුත්, මේ රටේ මොකක් හරි ප්‍රශ්නයක් ඇති වුණාම එයින් අගතියට පත් අය වෙනුවෙන් යම් හඬක් නැගීමට, ඔවුන් වෙනුවෙන් කථා කිරීමට අයිතියක් මේ රටේ විපක්ෂයට තිබෙනවා. ඒ නිසා තමයි අපි ඒ සම්බන්ධව දිගින් දිගටම කථා කරමින්, board papersවල තිබුණු ඒවා ගැන කථා කරමින් කරුණු කිව්වේ. මම එදාත් බොහොම පැහැදිලිව කිව්වා, පෙට්‍රල් අරගෙන ගිහිල්ලා තිබෙන ප්‍රමාණය මෙච්චරයි, ඩීසල් අරගෙන ගිහින් තිබෙන ප්‍රමාණය මෙච්චරයි කියලා. ගණන් හිලව් එක්ක අපි ඒවා ප්‍රකාශ කළා. නමුත්, ආණ්ඩුව දිගින් දිගටම කළේ මොකක්ද? එදා මෙතැනදී බලශක්ති ඇමතිතුමාට කථා කරන්න දුන්නේ නැහැ. බලශක්ති ඇමතිතුමා ඉඳගෙන ඔහේ බලාගෙන හිටියා. කථා කළේ කවුද? බිමල් රත්නායක මහත්මයා කථා කළා. ඊළඟට, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමති කථා කළා. ඊළඟට, නාගරික සංවර්ධන, ඉඳිකිරීම් සහ නිවාස ඇමති කථා කළා. බලශක්ති ඇමති ඉඳගෙන හිටියා. වෙන දා නම් සාමාන්‍යයෙන් මොකක් හරි අමාත්‍යාංශයක ප්‍රශ්නයක් වුණාම ඒ අදාළ අමාත්‍යවරයාට අයිතියක් තිබෙනවා, නැඟිටලා ඒ ගැන කථා කරන්න. අදාළ අමාත්‍යවරයා තමයි කියන්න ඕනෑ, මේකයි සිද්ධ වුණේ කියලා. හැබැයි, මොකද වුණේ?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක එතුමා කළ යුතුයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, එතුමා ඒක කළ යුතුයි. එතුමායි ඒවාට උත්තර දෙන්න ඕනෑ. හැබැයි, එදා බලශක්ති ඇමතිතුමා පාඩුවේ පැත්තක ඉන්දවා තියලා, බිමල් රත්නායක මහත්මයා මෙතැනදී විනාඩි 25ක්, 30ක් අරගෙන කථා කරන්න පටන් ගත්තා, ඒ තුළ තිබුණු දේශපාලන කාරණා ගැන. අපි දේශපාලන කාරණා ගැන නොවෙයි කථා කළේ. අපි බොහොම පැහැදිලි technical points ටිකක් මතු කළේ. නමුත්, ඒවාට උත්තර දෙන්න බලශක්ති ඇමතිතුමාට ඉඩ දුන්නේ නැහැ. ඇමතිතුමා එහෙම පහළට තල්ලු කිරීම ගැන මට ඇත්තටම දුක හිතෙනවා. පව්! එතුමා එදා ඉඳගෙන හිටියා. එතුමා උත්තර දුන්නේ නැහැ. ඇයි, මෙතැන ඉන්නවා නේ වෙන කට්ටිය; නායකයෝ. ඒගොල්ලන් තමයි ඒවාට උත්තර දුන්නේ.

2015දී සිදු වුණු කාරණයක් මම කියන්නම්. ඔය රාජකරුණා මහත්මයලා, රන්වල මහත්මයලා, අපේ ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ සමන් සහෝදරයා, පරවිගම සහෝදරයා ඇතුළු සහෝදරවරු ඔක්කෝම පඩි වැඩි කරවා ගැනීම සඳහා ඒ දවස්වල strike එකක් කළා. ඒක මතක ඇති, තමුන්නාන්සේලාටත්. 2015 වර්ෂයේදී ඒක කරන කොට බෙදුම්කරුවන් ගෙන්වලා කිව්වා ඉන්ධන බෙදන්න එපා කියලා. එතකොට 2015 ආණ්ඩුව බලයට ඇවිල්ලා ටික දවසයි. මතක තබා ගන්න, ආණ්ඩු පෙරළන්න වැඩ කරලා තිබෙන්නේ අපි නොවන බව. ආණ්ඩු පෙරළන්න වැඩ කරලා තිබෙන්නේ, ආණ්ඩු අපහසුතාවට පත් කරන්න වැඩ කරලා තිබෙන්නේ ඒගොල්ලන්ගේ වෘත්තීය සමිති. ඒ වෘත්තීය සමිතිවල හිටපු කට්ටිය තමයි අද මේ ක්ෂේත්‍රවල නායකයන් වෙලා ඉන්නේ. ඒකයි තිබෙන ප්‍රශ්නය. එදා හොරකම් කරපු කට්ටිය අද විවිධ ආයතනවල සභාපතිවරු වෙලා ඉන්නවා. ඒ ආයතනවල Managing Directorsලා වෙලා ඉන්නවා, ඒ කාලයේ මේවා අත් හැර දමා කැනඩාවට පැනලා ගිය අය. අද වෙලා තිබෙන්නේ මොකක්ද? පසුගිය කාලයේ තෙල් සංස්ථාවේ සිදු වූ හොරකම්වලට සම්බන්ධ වුණු, premium වැඩි කරලා රට පැනලා ගිය, SAP dataවලින් එළියට පැනලා ගිය, වෝහාරික විගණනවලට හසු වුණු කට්ටිය, ලංකාව අත් හැරලා පැනලා ගිහින් තමන්ගේ නෝනලා අතේ ඉල්ලා අස්වීම් ලිපි එවපු කට්ටිය මේ ආණ්ඩුව යටතේ අද විවිධ ආයතනවල නිලධාරීන් වශයෙන් ඉන්නවා. දැන් තමුන්නාන්සේලා පැවැති ආණ්ඩුවලට කොයි තරම් බැන්නත් වැඩක් නැහැ. ඒ කාලයේ අපි කෑ ගහලා, "හොරු" කියලා කියපු මිනිස්සු ටික අද තමුන්නාන්සේලා විවිධ ආයතනවල සභාපතිවරු විධියට, managing directorsලා විධියට පත් කරගෙන තිබෙනවා. ඒකයි මේ වෙලා තිබෙන්නේ.

සුමිත් විජේසිංහ මහත්මයා තමයි ඒ කාලයේ බනිජතෙල් නීතිගත සංස්ථාවේ සභාපති. එතුමා රුපියල් ලක්ෂයයි allowance එක හැටියට ගත්තේ, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ නිකුත් කළ චක්‍රලේඛය අනුව. බුද්ධික මඩිහළුවා මහත්මයා ගැනත් කියන්න ඕනෑ. එතුමා වැටුප ගත්තේ නැහැ. අධ්‍යක්ෂ මණ්ඩල දීමනාව විතරයි ගත්තේ. දැන් රාජකරුණා මහත්මයා basic salary එකයි, allowance එකයි දෙකම ගන්නවා. රුපියල් හයලක්ෂ ගණනක්. මම ගිය සතියේත් පාර්ලිමේන්තුවේදී මෙය ඉදිරිපත් කළා. තමුන්නාන්සේලා පුන පුනා කියනවා, "අපි හොරකම් කරන්නේ නැහැ. අපේ කට්ටිය සල්ලි ගන්නේ නැහැ. අපේ කට්ටිය නොමිලේ තමයි වැඩ කරන්නේ. අපේ කට්ටිය හරිම ෂෝක්. ඔය ගොල්ලන් තමයි හොරකම් කරලා තිබෙන්නේ" කියලා. හැබැයි, දැන් මේ චක්‍රලේඛ ඔක්කෝම උල්ලංඝනය කරලායි තිබෙන්නේ. ඒ නිසා කරුණාකර ඉස්සෙල්ලාම ඒවා නිවැරදි කරන්න.

දැන් මේ කරන්න හදන්නේ මොකක්ද? මේ කරන්න හදන වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තුවක කාලයක් තිබෙන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට තව විනාඩි දෙකතුනක් දෙන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩි දෙකතුනක් ලබා දුන්නා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මට තවත් වෙලාව තිබෙනවා. ගැටලුවක් කර ගන්න එපා.

දැන් ඉන්ධන බෙදුම්කරුවන් 1,400ක් ඉන්නවා. Ceylon Petroleum Corporation එකට 236 දෙනෙක් ඉන්නවා. Lanka IOC එකට 100 දෙනෙක් විතර ඉන්නවා. මේ ක්‍රියාදාමය තුළ ආණ්ඩුව මොකක්ද මේ කරන්න හදන්නේ? ඒ බෙදුම්කරුවන් ටික සම්පූර්ණයෙන් විනාශයට පත් කරලා ඒ කටයුතු පෞද්ගලික අංශයටම ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කරන්නයි මේ හදන්නේ. ඒක තමයි මේ කරමින් යන්නේ. ඉතින් ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියනවා, රණ්ඩු කරන්න එපා, පුළුවන් තරම් කල්පනා කරන්න කියලා. අපි මේවා ගැන කථා කරන්නේ strikes හදන්නවත් පාරවල් දිගේ මිනිස්සු ගෙනයන්නවත් නොවෙයි. අපේ යූටියුබ් සහෝදරයෙක් අදත් කියා තිබෙනවා මම දැක්කා, පාරවල් දිගේ ඉන්ධන පෝලිම් ඇති කරන්න හැදුවලු, නමුත් වැඩේ හරි ගියේ නැහැ කියලා. ඒක නොවෙයි අපේ අරමුණ. කරුණාකර ප්‍රශ්නය තේරුම් ගන්න. අන්ධානුකරණයෙන් කටයුතු කරන්න එපා.

ඊළඟට මම කියන්න කැමැතියි, පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ප්‍රශ්නය ගැන. දැන් තමුන්නාන්සේලා මහා ලොකු කථාවක් කියනවා, ලංකාවේ පුනර්ජනනීය බලශක්තිය තවත් මෙගාවොට් 2,000කින් වැඩි කරනවා කියලා. ලංකාවේ පුනර්ජනනීය බලශක්තියට අදාළ projects 75ක් තිබෙනවා. ජනවාරි, පෙබරවාරි මාසවල අනුමැතිය දීලා තිබෙන ව්‍යාපෘති 74ක් තිබෙනවා. ඇත්තටම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ඇතුළු කමිටුවකින් තමයි මේ කටයුත්ත කරන්නේ. ඒ ව්‍යාපෘතියක් සඳහා ආයතන 14කින් විතර අවසර පත් ගන්න තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් අහනවා, ඒ ව්‍යාපෘති 75ට අවසර දෙන්නේ නැත්තේ ඇයි කියලා. ලේකම්වරයා දැන් ලියුමක් යවලා ඒ ලේඛන ටික ගෙන්වා ගන්නවා, ඒවා ගැන නැවත පරීක්ෂණයක් කරන්න අවශ්‍යයි කියලා. එතුමා මොකක්ද කියන්නේ? මේ ගැන පරීක්ෂණයක් කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළට ඒ ටික ආපහු ගේන්න කියලායි කියන්නේ. මාස ගණනක් තිස්සේ තමුන්නාන්සේලා කියනවා, පුනර්ජනනීය බලශක්තියෙන් මෙගාවොට් 2,000ක් නිපදවනවා කියලා. හැබැයි, දින ගණනාවක් ඇතුළත බොහොම අමාරුවෙන් හදපු ඒ ව්‍යාපෘති ටිකට, ආයතන 14කට ගිහිල්ලා අවසර ගත්තු ඒ ව්‍යාපෘතිවලට අදාළ ඒ ලේඛන තමුන්නාන්සේලා දැන් ලාච්චුවේ දමාගෙන ඉන්නවා. මොකද ඒ? ඇයි ඒවා දෙන්නේ

නැත්තේ? එතැන, ව්‍යාපෘති 75ක්. විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියකට අනුව තමයි ඒ ටික ඔක්කොම ගෙන්වා ගන්නේ. ගෙන්වා ගෙන ඒ ටික තියාගෙන ඉන්නවා.

ගරු ඇමතිතුමාට මම කියනවා, තමුන්නාන්සේලාට වුවමනාවක් තිබෙනවා නම් ඒ ටික යවන්න කියලා කරුණාකර ලේකම්තුමාට කථා කරලා කියන ලෙස. මම දන්නේ නැහැ ඔබතුමාගේ නියෝගයක් අනුව ඒවා ගෙන්වා ගත්තා ද, එහෙම නැත්නම් ආණ්ඩුවේ ලොකු කෙනෙකු ලවා ගෙන්වා ගත්තා ද කියලා. කාරණය අපි දන්නවා නේ. අද ධම්මික පෙරේරා මහත්මයාගේ හේලීස් ෆෙන්ටන්ස් කොම්පැනිය මෝදි අගමැතිතුමාට අදානි සමාගම වාගේ තමයි. එතුමා මොනවා හරි දෙයක් තිබෙන කොට අදානි තමයි එවන්නේ. ඒ වාගේ තමයි මෙහේ ධම්මික පෙරේරා තමයි යවන්නේ. අනුර දිසානායකගේ අදානි තමයි ධම්මික පෙරේරා. ධම්මික පෙරේරා මොනවාද කියන්නේ, ඒ ඕනෑම දෙයක් කරනවා. ඩොලර් ශත 4.65ට ටෙන්ඩර් එක දෙන එක -අඩු ගණනකට දෙන එක- නොවෙයි අපට තිබෙන ප්‍රශ්නය. අපට තිබෙන ප්‍රශ්නය major deviation එකක් තිබියදී ඇයි එහෙම දුන්නේ කියන එක. එහි බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා නේ. Major deviation එකක් තිබියදී ඇයි එහෙම දුන්නේ? නමුත් මෙතැනට ඇවිල්ලා කියනවා, "අපි අඩුම ගණනට දුන්නා. අඩුම ගණනට දීලා තිබෙන්නේ" කියලා. එහෙමයි කියන්නේ. එහෙම කියලා හරියන්නේ නැහැ. මේවා කරන්න නොවෙයි තමුන්නාන්සේලාට බලය දුන්නේ. එහෙම නම් ඉතින් ඒ මෙගාවොට් 50 සුළං බලාගාර ව්‍යාපෘතියත් වාහන වෙන්දේසි කරනවා වාගේ වෙන්දේසි කරන්න පුළුවන් නේ. එතකොට අඩුම ලංසුවට දෙන්න පුළුවන්. එහෙම නම්, ප්‍රසම්පාදන කමිටු ආදිය මොකුත් ඕනෑ නැහැ, වෙන්දේසියේ දැම්මා, දුන්නා. කරුණාකර ඒ සම්බන්ධව නිවැරැදිව කටයුතු කරන්න.

මේ ආණ්ඩුව අද බදු වශයෙන් පෙට්‍රල් ලීටරයකින් රුපියල් 120ක් ගන්නවා. ඩීසල් ලීටරයකින් රුපියල් 90ක් ගන්නවා. තමුන්නාන්සේලා කිව්වේ ඒක නොවෙයි. තමුන්නාන්සේලා කිව්වා, "මේ බදු ගැහීම අසාධාරණයි, අපි ඒක සම්පූර්ණයෙන් අඩු කරනවා. තෙල් ලීටරය රුපියල් 50කින් අඩු කරලා දෙනවා" කියලා. කරුණාකර කිව්වා වාගේම ඒක කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ඔබතුමාට බොහොම ස්තුතියි, මට මේ කාලය ලබා දීම වෙනුවෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.51]

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද උදේ ඉඳන් අපේ මැති ඇමතිවරු, මන්ත්‍රීවරු ගොඩක් දෙනෙක් කථා කළා; අදහස් බොහොමයක් ඉදිරිපත් වුණා. මම ඒවා අහගෙන හිටියා. මේ විෂය පුළුල්ව ගත්තොත්, අපි කල්පනා කළ යුතුයි ලෝකයේ බලශක්තිය කොයි දිශානතියට ද යන්නේ කියන එක. අපි දන්නවා, දශක ගණනාවක් තිස්සේ ෆොසිල ඉන්ධන භාවිත කෙරුණු ප්‍රභව මූලික වුණු බව. ඒ ඒ රටවල් ඒ විභව හරහා ඒ අයගේ ආර්ථිකය ගොඩ නහා ගත්තා. නමුත්, කාලයාගේ ඇවෑමෙන්, තාක්ෂණයේ දියුණුව සහ පරිසර තත්ත්ව මත මේ විභව වෙනත් විභව කරා තල්ලු වුණා.

ඒ තල්ලු වෙන එක ශ්‍රී ලංකාව වාගේ රටකට උරා ගන්නේ කොහොමද කියන එක ගැන හොඳ අවබෝධයකට එන්න අවශ්‍යයි. අපේ රට කුඩා රටක් වුණත්, මේ විභව ඉතා වැඩි මට්ටමකට දැන් පත් වෙලා තිබෙනවා. කලින් මන්ත්‍රීවරයෙක් මතු කළා, අපි ලෝකයට අපේ බලශක්තිය නිෂ්පාදනය කරන්නේ කොහොමද කියන කාරණය. අපි බලශක්තියේ පාරිභෝගිකයෙක් වෙලා තිබුණේ. දැන් අපි බලශක්තිය විකුණන්න හදනවා. අපි පරිභෝජනයෙන් එහාට යන්නයි හදන්නේ. එතකොට, අපේ බලශක්ති ප්‍රතිපත්ති මේවාට අනුකූලව හැදිලා තිබුණාද? එහෙම තිබුණේ නැහැ. දැන් අපි ලෝකයත් එක්ක වෙනස් වෙනවා. ඒ අනුව දැන් අපි පාරිභෝජන රටාවෙන් වෙළෙඳ පොළට enter වෙන්න හදන්නේ. ඒක නිසා අපට අලුත් බලශක්ති ප්‍රතිපත්තියක් අවශ්‍ය වෙනවා. ඒක නිසා අපි ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් යටතේ අපේ ප්‍රතිපත්තිය හදනවා. ඒ ප්‍රතිපත්තියේ තිබෙන්නේ කොහොමද? People-centric energy transition කියලා. ඒ කියන්නේ, අපි මෙච්චර වෙලා මතු කරපු ආකාරයට, මහජනතාව විතැන් වෙලා යන බලශක්ති ප්‍රතිපත්තියක් අපි ළඟ නැහැ; ඒක people-centric එකක්.

මේ බලශක්ති ප්‍රතිපත්තිය අපි හදන්නේ ප්‍රධාන කුලුනු තුනක් මත. පළමු කාරණාව, affordable, secure and clean energy. ඒ කියන්නේ, දැරිය හැකි මිලකට, සුරක්ෂිත, පිරිසිදු බලශක්තියක්. මම මේ කාරණා තුන කියන කොට ඔබතුමන්ලාට තේරෙයි ඔබතුමන්ලා කථා කරපු සියලු දේවල් මේ pillars තුනේ තිබෙනවා කියලා. දෙවැනි කාරණාව, smart and sensible people -centric energy. ඒ කියන්නේ, මහජන කේන්ද්‍රීය සුහුරු බලශක්ති ක්ෂේත්‍රයක්. තුන්වන කාරණාව, strategic global integration in energy sector. ඒ කියන්නේ බලශක්ති ක්ෂේත්‍රය ගෝලීය විභව සමඟ උපාය මාර්ගිකව මුසුවීම. අපි මේ මුළු දවසේම කරපු කථා ලඝු කරලා ගත්තොත්, ඒ මුළු කථාවම මෙතැන තිබෙනවා. ඒ මත තමයි, අපි මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති හදලා තිබෙන්නේ. වෙන මොකක්ද? අපි මේවා වේදිකාවල නැහලා කිව්වා. කිව්වා විතරක් නොවෙයි, ලියලා දුන්නා; පොතකුත් ගැහුවා. ඒ පොත ගෙනැල්ලා මේ පාර්ලිමේන්තුවේදී හිටපු බලශක්ති ඇමතිතුමා කථා කළා. බොරු කියනවා නම්, අපි පොතක් ගහලා දෙන්න ඕනෑ නැහැ නේ. අපි ඔය කියන සියලු කාරණා ටික අපේ බලශක්ති ප්‍රතිපත්තිය ඇතුළේ ආවරණය කරලා තිබෙන්නේ.

අපි එතැනින් එහාට යමු. ඊළඟ එක තමයි, පුනර්ජනනීය බලශක්තිය. අපි පුනර්ජනනීය බලශක්තිය ගැන කථා කරනකොට කියන්න ඕනෑ, අපේ රට කුඩා රටක්, අපට තිබෙන ඉඩම් සීමිතයි කියන එක. ඒ නිසා ඒ ඉඩම් කළමනාකරණය කියන එක අත්‍යවශ්‍යයි. අපි ඉඩම් කළමනාකරණය කියන එක මත පදනම් වෙලා, කෘෂිකර්මයට වඩා යහපත් ඉඩම් මොනවාද, කර්මාන්තවලට දෙන්න ඕනෑ ඉඩම් මොනවාද, ජනාවාස ඇති කරන්න ඕනෑ ඉඩම් මොනවාද කියන එක ගැන මූලික අධ්‍යයනයක් කරලා, අපි ප්‍රධාන කලාප තුනකට ලංකාව බෙදා වෙන් කරගෙන තිබෙනවා. පළමුවැනි කලාපය තමයි, පුත්තලමේ සිට යාපනයට. ඒ පළමුවැනි belt එක තුළ අපි මේ අවුරුද්දේ මෙගාවොට් 1,000ක් නිපදවන්න හඳුනා ගෙන තිබෙනවා. ඒ වාගේම, නැඟෙනහිර හා උතුරු පළාත්වල ඉදිරි අවුරුදු පහ ඇතුළත මෙගාවොට් 2,000ක වහල මත සූර්ය බලාගාර අපි ඉදි කරනවා. ඒ වාගේම, මොනරාගල හා හම්බන්තොට කේන්ද්‍ර කොටගෙන සූර්ය සහ සුළං ආධාරයෙන් අපි හයිඩ්‍රජන් සහ

[ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා]

ඇමෝනියා නිෂ්පාදනය කරනවා. අන්න, ඒක අපි විදුලිය විකුණන ක්‍රමයක්. ඒකට cable එකක් එළන්නම ඕනෑ නැහැ. ඒක තමයි අපට ඉදිරි වසර පහ සහ එතැනින් ඉදිරියට තිබෙන සැලසුම.

අපි මොකක්ද මේ මාස තුන ඇතුළත කළේ? මේ මාස තුන ඇතුළත අපට හැකි වුණා, මන්නාරමේ සුළං විදුලි බලාගාර ව්‍යාපෘතියක් ආරම්භ කරන්න. ඒ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ගැන ගොඩක් කථා කියනවා. ඒවා ගැන අපේ ගරු ඇමතිතුමා පැහැදිලි කරයි, ඒවා කොයි විධියටද වෙන්නේ කියලා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ඇතුළේ ප්‍රසම්පාදනය සියයට සියයක් හරියට කරන්න තමයි අපි බැඳිලා ඉන්නේ. අපට හැකියාව ලැබුණා, මේ මෙගාවොට් 50ක් ඒකකයක් ඇමෙරිකානු ඩොලර් ශත 4.65කට දෙන්න. එතෙක් මෙතෙක් ඉතිහාසයේ අඩුම මුදලකට සුළං විදුලි ජනනයක් උත්පාදනය කරපු ටෙන්ඩර් එක තමයි මේක.

ඒ වාගේම සාම්පූර් බලාගාරයේ අදියර දෙකකින් -මෙගාවොට් 50ක සහ මෙගාවොට් 70ක- ඒකකයක් ඇමෙරිකානු ඩොලර් සත 5.97කට ගන්නවා. අපි දැන් ඇමෙරිකානු ඩොලර් සත 5කට ආසන්නයේ තමයි පුනර්ජනනීය විදුලි ඒකකයක් තියා ගෙන යන්නේ. අපි මොකක්ද මේ කරන්න හදන්නේ? ගරු මන්ත්‍රීවරයෙක් සඳහන් කළා ආසියාවේ -අපේ කලාපයේ- තිබෙන වැඩිම විදුලි බිල තිබෙන්නේ අපේ කියලා. ඇත්ත. ඒක අපි පිළිගන්නවා නේ. අපි දැන් ඒකට මොකක්ද කරන්න ඕනෑ. දැනට සාමාන්‍යයෙන් අපේ විදුලි ඒකකයක් තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් සත 13ට. අපේ ඉලක්කය තිබෙන්නේ විදුලි ඒකකයක් ඩොලර් සත 8කට ගෙනෙන්න. හැබැයි, කලින් අත්සන් කළ ගිවිසුම්වල ඊට වඩා ඉහළ අගයකට අත්සන් කරපු ගිවිසුම් තිබෙනවා. ඒවායෙන් අපට විදුලිය මිලදී ගන්න වෙනවා. ඒ වාගේම thermal power plantsවලිනුත් අපට විදුලිය මිලදී ගන්න වෙනවා. එතකොට කරන්න ඕනෑ මොකක්ද? අපි අලුතින් ගන්න සියලු පුනර්ජනනීය බලය ඇමෙරිකානු ඩොලර් සත 5කට ආසන්න අගයකින් ගන්න වෙනවා. ඒක අපි පුන පුනා කියනවා නේ. අපේ විදුලි බිලෙන් සියයට 70ත්, 80ත් අතර ප්‍රමාණයක් අපේ විදුලි ජනනය සඳහා යන පිරිවැය. ඉතින්, පිරිවැය අඩු ජනනය සහිත බලාගාර හදන්නේ නැතිව අපි විදුලි බිල අඩු කරන්නේ කොහොමද? ඔබතුමන්ලා උදේ ඉඳන් ළතෝනි ගහනවා, විදුලි බිල අඩු කරන්න, විදුලි බිල අඩු කරන්න කියලා. මාස තුනෙන් building blocks හදනවා වාගේ බලාගාර හදන්න බැහැ. උදේ මන්ත්‍රීවරයෙක් කිව්වා පහ වසර පන්තියකට කියනවා වාගේ අපට ඒක කියන්න එපා කියලා. ඉතින් මම හිතන්නේ නැහැ මේක තේරුම් ගන්න පහ වසර පන්තියට යන්න ඕනෑ කියලා. අපි ඒක වාර කිහිපයක දී කිව්වා. මමත් දෙපාරක් කිව්වා. ඒක නිසා අපි කරුණාකරලා ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ විවේචන කරන්න, සාධනීය විවේචන කරන්න. අපි ඒවා පිළිගන්න සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුනර්ජනනීය බලය අපේ Grid එකට connect කරන්න තිබෙන ප්‍රධාන බාධාව තමයි storage නැතිකම. මම අර මුලින් කියපු pillars තුනේ තිබෙන කරුණු ටික තමයි මේ විස්තර කරමින් යන්නේ. මේ පුනර්ජනනීය බලය පද්ධතියට එකතු කිරීමේදී අපට පැන නඟින ප්‍රශ්නයට උත්තර තිබෙන්නේ storage batteries වාගේම, ramping batteriesවල. Storage batteriesවලට යන කාලය චුට්ටක් වැඩි නිසා අලුතින් එන solar panels ඔක්කෝටම වාගේ ramping batteries ආදේශ කරන්න කියලා ඉල්ලා තිබෙනවා. ඒක නිසා අපි මේ අවුරුද්ද ඇතුළත megawatt hours 2500ක battery storage එකක් සැලසුම් කරලා තිබෙනවා, ඉදිරි වසර 5 ඇතුළත ක්‍රියාත්මක කරන්න පුළුවන් විධියට. ඊළඟට අපි කෑගල්ල ප්‍රදේශයේ pump storage facility එකත් මේ අවුරුද්ද ඇතුළත පටන් ගන්න සැලසුම් කරලා තිබෙනවා.

ඊළඟට අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි අපේ petroleum products. අපේ බලශක්ති අවශ්‍යතාවෙන් සියයට 44ක් petroleum products. ඒ සියයට 44නුත්, සියයට 80ක් යන්නේ ප්‍රවාහනයට. ප්‍රවාහනය සියයට සියයක්ම petroleum productsවලින් කෙරෙන්නේ. ඒක නිසා 2050දී net zero emissionවලට යන්න නම් ප්‍රවාහනයේ සැලකිය යුතු ප්‍රමාණයක් විදුලිය භාවිතයෙන් කරන උපක්‍රමවලට යන්න අපට සිද්ධ වෙනවා. මේ කටයුතු සම්පාදනය කිරීම සඳහා මේ වෙනකොට බලශක්ති අමාත්‍යාංශය සහ මහාමාර්ග අමාත්‍යාංශය සමඟ එකතු වී ජාතික විදුලි ප්‍රවාහන ලේකම් කාර්යාලයක් -National e-Mobility Secretariat- ස්ථාපිත කරන්න මේ වසර ඇතුළත කටයුතු කරනවා. ඉතින් ඔබතුමන්ලාට පැහැදිලි ඇති, අපි යන්නේ මේ බලශක්තිය ස්ථිරසාර බලශක්තියක්, බලශක්ති සම්ප්‍රේෂණයක් කිරීමේ ගමන් මාර්ගයකට බව. එම ගමන් මාර්ගය අපි ඡන්දයට කලිනුත් පැහැදිලි ලෙස කියලා තිබුණා. අපි බලශක්තිය සම්බන්ධයෙන් එසේ ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒක ඔබතුමන්ලාට අපි ලබා දීලා තිබෙනවා. ඔබතුමන්ලා ඒක කියවලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා මේවාට මීට වඩා යහපත්, constructive විවේචන එල්ල කරයි කියලා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාගේ අවසරය ඇතිව කාරණයක් අහන්නම්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
ඔව්, අහන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, අපේ රටේ බලශක්ති ප්‍රතිපත්තිය සාමාන්‍ය ප්‍රතිපත්තිමය ලියවිල්ලක් නොවෙයි, ගැසට් පත්‍රයේ පළ කරපු ලියවිල්ලක්. 2008දී අපේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය නීතිගත කළා. ඊට පසුව 2019දී නැවත යාවත්කාලීන කරලා අලුත් ප්‍රතිපත්තියක් නීතිගත කළා. ඔබතුමන්ලාගේ රජය අලුත් ප්‍රතිපත්තියක් හඳුන්වා දීලා තිබෙනවා. ඒක බොහොම හොඳයි. හැබැයි, ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා නම්, නීතියේ තිබෙන ඒ කාර්ය පටිපාටියට අනුව සකස් කරලා, කැබිනට් මණ්ඩලයේ අනුමත කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. මම බලශක්ති පිළිබඳ ඒ කාරණා බොහොමයකට එකඟ වෙනවා. අපිත් ඒ සමාන ප්‍රතිපත්ති ඉදිරිපත් කරලා තිබෙනවා.

හැබැයි, අපේ රටට ප්‍රායෝගිකව ආයෝජකයන් කැඳවා ගන්න ඕනෑ නම්, විධිමත් ලෙස රට ඉදිරියට යන්න ඕනෑ නම්, රටේ නීතිය හැටියට බලශක්ති ප්‍රතිපත්තිය ඉදිරිපත් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමන්ලා ඉන්නේ පියවරක් පහළින්. ඔබතුමන්ලාගේ අතේ තිබෙන ලේඛනය මේ රටේ බලශක්ති ප්‍රතිපත්තිය නොවෙයි. ඒක ඔබතුමන්ලාගේ පක්ෂයේ ප්‍රතිපත්තිය. සියලුදෙනාම සම්බන්ධ කරගෙන ඒක ජාතික ප්‍රතිපත්තිය බවට පත් කර ගන්න. එච්චරයි මට කියන්න තිබෙන්නේ. ඒක බොහොම වැදගත් දෙයක් නිසා තමයි මම ඒක කියන්නේ.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
හරි. 2019 ඒ තිබෙන ප්‍රතිපත්තිය අර කියන්නා වාගේ අවුරුදු 6කට වරක්, ඒ කියන්නේ 2025දී අපි ඒක යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඔබතුමා ඒක දන්නවා නේ. ඒක තමයි අපි මේ 2025දී කරන්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බලශක්ති ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු පාර්ශ්ව කැඳවා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාපටිපාටිය ගන්න. තවම ඔබතුමන්ලා කිසිලෙසකින් අලුත් බලශක්ති ප්‍රතිපත්තිය පටන් ගන්න ඒ වැඩේ කරලා නැහැ. කරුණාකරලා මම කියන දේ විශ්වාස කරන්න. මම මේ විෂය භාරව හිටපු කෙනෙක්.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)

ගරු මන්ත්‍රීතුමනි, අපි වග කීමෙන් කියනවා, මේ කාරණය. ඒක පටන් ගෙන තිබෙන්නේ. ඒක ඉවර වෙනවා, මේ මාසය ඇතුළත. ඒක public consultationsවලට ගිහිල්ලා ඉවර වෙලා, කැබිනට් මණ්ඩලයටත් ගිහිල්ලා එළියට එනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔබතුමා කියන ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සම්බන්ධව, ඒ කියන්නේ යාවත්කාලීන කිරීම සම්බන්ධව නියෝජ්‍ය මුදල් ඇමතිතුමා කිව්වා, එහෙම කරන්නේ නැහැ කියලා. ඒකයි මට තිබෙන ප්‍රශ්නය. මම එතුමාගෙන් මේ ප්‍රශ්නයම ඇහුවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැහැ, ඒක policy team එකේ, - *[බාධා කිරීමක්]*

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔබතුමාගේ උගත්කම, උනන්දුව සහ අවංකභාවය ගැන ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ හරි ක්‍රමයට යන්න. මේක ඩොලර් බිලියන ගාණක් ලැබෙන ක්ෂේත්‍රයක්. ඒ නිසා හරි ක්‍රමයට යන්න. අපට ඒක හොඳයි. මා දන්නා තරමින් තවම ඔබතුමන්ලා ඒක පටන් අරගෙන නැහැ. 2019 බලශක්ති ප්‍රතිපත්තිය යාවත්කාලීන කරන්න. මම දන්නේ නැහැ, ඔය වෙන මොකක් හරි ලියවිල්ලක් තමයි හදන්නේ.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)

අපි ඒක පටන් ගෙන තිබෙන්නේ. වගකීමෙන් මේ කියන්නේ. ඒක ඉදිරි කාලයේදී ඔබතුමන්ලාගේ අතට ලැබේවි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉලෙයිතම්බි ශ්‍රීනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු අරවින්ද සෙනරත් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (පේරාසිරියර්) සේන නාණායක්කාර අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. ARAVINDA SENARATH left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[பி.ப. 5.06]

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2025ஆம் ஆண்டின் பாதீட்டிலே வலுசக்தி அமைச்சுத் தொடர்பாக இன்று உரையாற்ற வாய்ப்பளித்தமைக்காக முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். 2025ஆம் ஆண்டுக்காக மீண்டெழும் செலவினமாக 1.06 பில்லியனும், Capital Expenditureஆக 20.08 பில்லியனுமாக மொத்தமாக கிட்டத்தட்ட 21 பில்லியன் ரூபாய் இந்த அமைச்சுக்கு ஒதுக்கப்பட்டிருக்கின்றது. மாண்புமிகு சனாதிபதியவர்கள் தனது வரவு செலவுத்திட்ட உரையிலே 2030ஆம் ஆண்டில் வலுசக்தி உற்பத்தியில் 70 சதவீதத்தை மீள்புதுப்பிக்கத்தக்க சக்திமூலங்களினூடாக அடைந்துகொள்ள எதிர்பார்ப்பதாக உறுதியாக அறிவித்திருந்தார். இந்தப் பாதீட்டிலே அரச கட்டிடங்கள், குறைவாக வருமானம் பெறுகின்ற வீடுகள் மற்றும் மதத் தலங்களுக்கு மேற்கூரை சூரிய மின்சக்தி வசதியை நிறுவுவதற்காக 290 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது.

இந்த விடயத்தில்தான் எங்களுடைய பிரச்சினை தொடங்குகின்றது. எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தளவிலே மிகப் பாரிய பிரச்சினையாக இருக்கின்ற விடயம் அங்கு இவ்வாறான ஒதுக்கீடுகளின்மூலம் செய்யப்படுகின்ற நலன்புரித் திட்டங்கள் சரியான முறையில் சென்றடைவதில்லை என்பதாகும். நான் எனது ஒவ்வோர் உரையிலும் மட்டக்களப்பு மாவட்டத்தைக் குறிப்பிட்டுப் பேசுவதற்குக் காரணம், அந்த மக்களின் வாக்குகளால் தெரிவுசெய்யப்பட்டவன் என்ற அடிப்படையிலே அவர் களுடைய பிரச்சினை குறித்துக் கதைக்கவேண்டிய பொறுப்பு எனக்கு இருப்பதனாலாகும்.

அந்த மாவட்டத்திலே தேவையான அளவு transformer வசதிகள் இல்லை. அங்கு மிக அதிகளவான மக்கள் solar panelsஇனை நிறுவுவதற்காக விண்ணப்பித்துக் காத்திருக்கின் றார்கள். நாங்கள் இதுபற்றி இலங்கை மின்சார சபையுடன் தொடர்புகொண்டு கேட்கின்றபொழுது, அங்கு transformer capacity மிக நிரம்பிய அளவிலே காணப்படுவதாகச் சொல்லப் படுகின்றது. ஆகையால், இவ்வாறாக வரவு செலவுத் திட்டத்தில் ஒதுக்கப்படுகின்ற நிதியானது எந்த வகையிலே அந்த மக்களுக்கு அல்லது மதத் தலங்களுக்கு அல்லது வருமானம் குறைந்த நிலையிலுள்ள மக்களுக்குச் சென்றடையும் என்பதை நாம் உறுதியாகச் சொல்ல முடியாத ஓர் அவலநிலை இருக்கின்றது. நாம் கடந்த காலங்களில் பல விடயங்களில் பாதிக்கப்பட்டிருக்கின்றோம், பல விடயங்களில் பின்தங்கியிருக்கின்றோம், பல விடயங்களில் எமக்கான உரிமைகள், சலுகைகள் கிடைத்திருக்கவில்லை என்ற அடிப்படையில் நான் இந்த விடயத்தைச் சொல்லிக்கொள்ள விரும்புகிறேன். ஆகவே, இவ்வாறு பில்லியன் கணக்கில் நிதிகளை ஒதுக்கி இதுபோன்ற செயற்றிட்டங்களைச் செய்யும்போது, மட்டக்களப்பு மாவட்டத்திற்கு மின்சக்தி - வலுசக்தி சார்பாக எவ்வளவு நிதி ஒதுக்கப் பட்டிருக்கின்றதென்ற கேள்வியை நான் இங்கே முன்வைக்க விரும்புகின்றேன். வருமானம் குறைந்த குடும்பங்களுக்காக ஒதுக்கப்படுகின்ற நிதிகூட இவ்வாறான நெருக்கீடுகள் காரணமாக அந்த மக்களுக்கோ அல்லது ஆலயங்களுக்கோ சென்றடைய முடியாத நிலை இருக்கின்றது.

இலங்கை மின்சார சபை எமது மாவட்டத்தில் மிக அதிகளவான பாவனையாளர்களைக் கொண்டிருக்கின்றது;

[ගරු (වෛද්‍ය) ඉලෙයතම්බි සිරිතොත් මහතා]

තොණ්ණූරිනොන්බු සතවීතමාන මක්කළුක්කු මින්සාර වසතියෙ එර්පටුත්තික් කොටුත්තිරුක්කින්රතු. අන්ත වකෙයිල්, නාම් අතනෙප් පාරාට්ට වේණ්ටුම්. අතේවේළෙ, ඉන්ත මින් ආලෙයෙ අල්ලතු solar වසතියෙ නිරුවුවතර්කාන සේවෙ කළෙප් පෙර්රුක්කොළ්වතිල් නාම් පාරිය පිරච්සිනෙයෙ එතිර්නෝක්ක වේණ්ටියිරුක්කින්රතු. එමතු මාවට්ටත්තිලේ roof-top solar system මූලම් වීට්ටුප් පාවනෙක්කු 5 megawatts අළවිලුම්, වියාපාරත් තේවෙකළුක්කාක 15 megawatts අළවිලුම්, ground-mounted solar system මූලම් 30 mega-watts අළවිලුම් මින්සාරම් පෙර්රුක් කොළ්ළප්පට්ටිරුක් කින්රතු. ආනාලුම් ඉතු 10 සතවීතත්තිර්කුම් කුරෙන්ත තළවිලේයේ කාණප්පටුකින්රතු. ඉතනෙප් පෙරුවතිල් ඉව්වාරාන නෙරුක්කටිකළ් ඉරුක්කින්රපෝතු, මාණ්පුමිකු ජනාතිපති අවර්කළාල් වරවු සෙලවුත්තිට්ට උරෙයිල් සොල්ලප්පට්ට විටයම් එතිර්කාලත්තිල් එව්වාරු සාත්තිය මාකුම් එන්පතු ඔරු කේල්වික්කුරියාකවේ ඉරුක්කින්රතු.

අතුමට්ටුමල්ල, අතනෝටු ඉණෙන්තතාකප් පල්වේරු විටයංකළිල් පාරිය නෙරුක්කටිකළ් ඉරුක්කින්රන. අංකු සිරිය මර්රුම් නටුත්තර අළවු උර්පත්තියාළර්කළ් three-phase මින් ඉණෙප්පෙප් පෙර්රුක්කොළ්වතිලුම් පාරිය නෙරුක්කටි අල්ලතු කාලංකටත්තුම් සෙයර්පාටුකළ් කාණප්පටුකින්රන. ඉතුපර්රි මින්සාර සපෙයිල් අල්ලතු අතන් අලුවලකංකළිල් විසාරික්කුම්පෝතු, අංකු තේවෙයානළවු පොරුට්කළ් ඉල්ලාතිරුප්පතාකවුම් ආළණිප් පර්රාක්කුරෙ ඉරුප්පතාකවුම් සොල්ලප්පටුකිරතු. අංකු සිරිය සිරිය වියාපාර මුයර්සිකළුක්කු මින්සාරත්තෙප් පෙර්රුක්කොළ්වතිල්කූට ඉව්වාරාන නිලෙමෙ ඉරුප්පතනාල්, අන්ත වියාපාරිකළ් තංකළුටෙය වියාපාර නටවටික්කෙකළෙත් තොටර්ච්සියාක වලුප්පටුත්තික් කොළ්වතිල් පිරච්සිනෙකළෙ එතිර්නෝක්කු කිරාර්කළ්.

මට්ටක්කළප්පු මාවට්ටත්තෙ එටුත්තුක්කොණ්ටාල් අංකු ඉරුක්කින්ර මින්සාර සපෙ අලුවලකංකළිල් පාරියළවු ඌලියර් පර්රාක්කුරෙ කාණප්පටුකිරතු. ඉන්ත නිලෙමෙයෙ මාර්රියමෙප්පතර්කාන සෙයර්පිට්ටංකළ් මුන්නෙටුක්කප් පට්ටිරුක්කිරතා, ආට්සේර්ප්පුක්කාන නටවටික්කෙ මේර් කොළ්ළප්පට්ටිරුක්කිරතා? කටන්ත කාලංකළිල් ආට්සේර්ක්කප් පට්ටවර්කළ් - අටිප්පටෙ ඌලියර්කළාන මින්මානි වාසිප්පාළර්කළ්කූට - වෙව්වේරු මාවට්ටංකළිල් ඉරුන්ත් වන්තවර්කළාක ඉරුන්තතනාල් අවර්කළ් මිකක් කුරුකිය කාලත්තිලේයේ මාර්රලාකිච් සෙන්රු විට්ටාර්කළ්. ඉතනාල් අංකු පොරියියලාළර්කළ්, electrical superintendents, field officers, මින්මානි වාසිප්පවර්කළ් පෝන්ර පල්වේරු පතවිකළිලුම් වෙර්රිටංකළ් කාණප්පටුකින්රන. ඉව්වාරාන නිලෙමෙයිල් වලුසක්ති අමෙච්සු එව්වාරු අන්ත මාවට්ටත්තිල් මිකච් සිරප්පාන සේවෙයෙක් කොණ්ටු සෙල්ලුම් එන්පතු පාරිය කේල්වියාක ඉරුක්කිරතු.

පාතීට්ටිල් එමතු මාවට්ටත්තිර්කාන ඔතුක්කීටුකළ් පර්රිත් තෙළිවාන විපරංකළ් ඉරුක්කවිල්ලෙ. කිළක්කු මාකාණ අපිවිරුත්තිත් තිට්ටම් -මුළුමෙයාක ඉල්ලාතුවිට්ටාලුම් පෙරියළවිල්- ඉන්තිය නිතියුතවියුටන් ආරම්පික්කප්පට විරුප්පතාකක් කූරප්පට්ටතු. ඉන්ත නිලෙයිලි ඉන්තියාවිල් මිකප්පෙරිය, වලුවාන වියාපාර අමෙප්පාකවුළ්ළ අතානි කුළුමම් ඉංකිරුන්රු වෙළියේරියිරුක්කින්රතු. ඉව්වාරාන ඔරු සූළ්නිලෙයිල් එතිර්කාලත්තිලේ ඉන්තියාවින් උතවිත් තිට්ටත්තින්මූලම් සෙය්යප්පටුකින්ර අපිවිරුත්තිත් තිට්ටංකළුක්කාන සාත්තියක්කූරුකළ් ඉල්ලාමලිරුක්කින්රතු. ඉන්ත අපිවිරුත්තිත් තිට්ටංකළ් එව්වාරාන නටෙමුරෙකළින් මූලම් මුන්නෙටුක්කප්පටුම් එන්පතු කේල්වික්කුරියාක ඉරුක්කින්රතු. ඉතනාල් එතිර්කාලත්තිලේ සිරිය, නටුත්තර තොළිල්මුයර්සියාළර්කළුක්කාන solar panels පොරුත්තුම් වාය්ප්පුකළ්කූට ඉල්ලාතිරුක්කින්රතු. වටක්කු, කිළක්කුප් පකුතිකළිලේ එර්පාට්ටාළර්කළ් අල්ලතු මූලතන මිටුවෝරුක්කාන සූළ්නිලෙ කාණප්පටවිල්ලෙ. ඉත්තකෙය සූළ්නිලෙ එමක්කුප් පෙරුම් එමාර්රත්තෙයුම් සන්තේකත්තෙයුම් එර්පටුත්තුවතාක ඉරුක්කින්රතු. කටන්ත කාලංකළ් පෝන්රු මට්ටක්කළප්පු මාවට්ටම් මීණ්ටුම් පුරක්කණික්කප්පටුමා? එන්ර විනාවෙයුම් නාන් ඉන්ත ඉටත්තිලේ කේට්ටුක්කොළ්ළ විරුම්පුකින්රේන්. ඒනෙනිල්, එමතු මාවට්ටත්තිල් වලුසක්ති, එරිසක්ති අටිප්පටෙයිලේ පාරිය අළවිලේ මින්සාර වසතිකළ් එර්පටුත්තික්කොළ්ළප්පට්ටාලුම්කූට, උර්පත්තිත්තිරන් අටිප් පටෙයිලේ අතිල් පාරිය පින්නටෙවු ඉරුක්කින්රතු.

අතර්කප්පාල්, අණ්මෙයිල් ඉන්ත එරිපොරුළ් විනියෝකත්තිල් එර්පට්ට නෙරුක්කටි නිලෙ පර්රියුම් ඉංකු සුට්ටික්කාට්ට වේණ්ටුම්. අරසු ඉතනෙච් සරිසෙය්ය මුළු මුයර්සි එටුත්තිරුන්තතු. අතනාල් කටන්ත කාලංකළෙප්පෝන්ර සූළ්නිලෙ එර්පටාතිරුන්තාලුම්කූට, සීරාන එරිපොරුළ් විනියෝකම් නටෙපෙරුවතර්කුම් මක්කළ් කිරමමාන මුරෙයිල් එරිපොරුළෙප් පෙර්රුක්කොළ්වතර්කුමාන උරුතිප්පාටු වළංකප්පට වේණ්ටුම්. සිල ඉටංකළිලේ ඉරවු නේර එරිපොරුළ් විනියෝකම් නිරුත්තප්පට්ටිරුක්කින්රතු; කටනට්ටෙකළ්මූලම් වළංකප්පටුකින්ර විනියෝකම් නිරුත්තප් පට්ටිරුක්කින්රතු. ඉව්වාරාන සූළ්නිලෙකළිල් මක්කළ් කටන්ත කාලත්තෙප්පෝන්රු පාරිය නෙරුක්කටිකළෙ එතිර්කොළ්ළ නෝිටුමෝ එන්ර අච්චත්තිල් ඉරුක්කිරාර්කළ්. එනවේ, ඉන්ත විටයංකළිලේ අරසු මුළුමෙයාන කවනම් සෙලුත්ත වේණ්ටුම්. අත්තුටන්, මාවට්ට අටිප්පටෙයිලුම් මුන්නුරිමෙ වළංකක්කූටිය ඔරු නිලෙමෙයෙ එර්පටුත්ති, එරිපොරුළ් විනියෝක විටයත්තිලුම් සරි, මින්සාර විනියෝක විටයත්තිලුම් සරි, මක්කළුක්කු නියායමාන තීර්වෙප් පෙර්රුක්කොටුක්ක වේණ්ටිය තේවෙ ඉන්ත අරසුක්කු ඉරුක්කින්රතු එන්පතෙක් කූර්, එනතු උරෙයෙ මුටිත්තුක් කොළ්කින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.15]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ - වර්ත්තක, වාණිප, උණවුප් පාතුකාප්පු මර්රුම් කූට්ටුරවු අපිවිරුත්ති අමෙච්සර්)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව අද පැවැත්වෙන අය වැය විවාදය ගොඩනැඟුණේ ලංකා විදුලිබල මණ්ඩලයත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත් පදනම් කරගෙන. අද විවාදයේදී අදහස් දක්වද්දී, මේ විදුලිබල පද්ධතිය ගැන, රටේ විදුලි අවශ්‍යතාව ගැන, බලශක්ති ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන අර්බුදයෙන් ගොඩ ඒම ගැන යම් ප්‍රගතිශීලී අදහස් ඉදිරිපත් කරන්න උත්සාහ කිරීමක් අපි දැක්කා. ඒ වාගේම, පරණ එකම අරගෙන යනවා, පරණ දේවල්ම කරනවා වාගේ කථාවක් කියන්නත් සමහරු උත්සාහ කළා.

ඔබතුමන්ලා ඉදිරිපත් කරපු ප්‍රගතිශීලි අදහස් සහ යෝජනා සැලකිල්ලට ගනිමින් යථාර්ථ නොවන සමහර කාරණා ප්‍රතික්ෂේප කරමින් අපට මේ විවාදය අවසන් කරගන්න වුවමනා වෙලා තිබෙනවා.

ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට පත් වෙලා මහ මැතිවරණයෙන් පස්සේ දින 100කට ආසන්න කාලයක් තමයි අපි ගත කරලා තිබෙන්නේ. ජනාධිපතිවරයා බලයට පත් වීමේ දින සිට මාස 5කට ආසන්න කාලයක් බලශක්ති ක්ෂේත්‍රය ඇතුළේ අපි වැඩ කළා. ඒ නිසා එදා සිට බලශක්ති ක්ෂේත්‍රය ඇතුළේ තිබිච්ච බොහෝ වංචා, දූෂණ, නාස්තිය අවම කිරීමට අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා. ඉදිරි වසර 5 පුරාවටත් අපට තිබෙන ලොකුම අභියෝගය තමයි, දූෂණ, වංචා නැති කිරීමත්, මේ ආයතන දෙක ජනතාවට ප්‍රතිලාභ ලැබෙන තැනට පත් කරන්නේ කොහොමද කියන එකත්. ඒක මේ ක්ෂේත්‍රයට සම්බන්ධ හැමෝම දන්නවා. එක පැත්තකින් රාජ්‍ය පාලනය යටතේ ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා ඇතුළු ඒ අමාත්‍යාංශය භාර වගකිව යුතු අපේ අමාත්‍යවරුන්ගේ, ජනාධිපතිවරයාගේ මහ පෙන්වීම් යන සියල්ල එක්ක අපි වංචා, දූෂණවලට නිත තියලා තිබෙන්නේ. හැබැයි, මේක ඇතුළේ සංවිධානාත්මකව සිදු වන, කාලයක් තිස්සේ ආපු අපි හඳුනා ගත් සමහර දේවල් තිබෙනවා, සැපයුම්කරුවන්, පෞද්ගලික බලාගාර, තෙල් බෙදා හරින්නන් ඇතුළු සියලුදෙනා එක්ක බැඳිච්ච. ඒවා වෙනස් කරමින් තමයි අපි ඉදිරියට යන්නේ. ඒවා වෙනස් කරමින් ඉදිරියට යනකොට විවිධ අවස්ථාවල ප්‍රශ්න මතු වෙනවා කියලා අපට පේනවා.

මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමාත් කිව්වා, සෝලා පද්ධතිය සකස් කරන්න, සෝලාවලට යන්න අපි ඉල්ලා තිබෙනවා, ඒ සඳහා අවස්ථා හදනවා, නමුත් ඒකට ලංකා විදුලිබල මණ්ඩලය පැත්තෙන් ඉඩ නැහැ, සහාය නැහැ වාගේ කථාවක්. ඔව්, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කථාව හරි. මොකද, අපි මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. සමහර තැන්වල මේ පද්ධති පිළිබඳව, ධාරිතාව පිළිබඳව, grid එකට මේවා දෙන්න පුළුවන්ද, බැරිද කියන කරුණු පිළිබඳව නිවැරදිව කඩිනමින් තොරතුරු ආවාට පස්සේ, ඒවාට අදාළ මැදිහත්වීම්වල යම් ප්‍රමාදයක් තිබෙනවා කියලා අපේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු හඳුනාගෙන තිබෙනවා. ඉතාම කෙටි කාලයක් ඇතුළත ඒවා වෙනස් කරන්න අදාළ නීති-රීතිවලත් අරගෙන තිබෙනවා.

ඒ නිසා අපි කියන්න ඕනෑ, රජයක් හැටියට අපට ඉදිරි කාලය තුළ අක්කර 10,000ක විදුලිය මෙගාවොට් 3,200ක් නිෂ්පාදනය කරන්න පුළුවන් කියලා. ඒ අනුව solar panels සවි කරන්න අදාළ ඉඩම් හඳුනා ගැනීම සඳහා කටයුතු කරන්න කියන කාරණය අපි කියලා තිබෙනවා. මොකද, ඉදිරියේදී ජාතික නිෂ්පාදනය වැඩිවීමත්, කර්මාන්තකරණයත්, පරිභෝජනය වැඩිවීමත් කියන කරුණු මත විදුලිබල පද්ධතියට දැන් තිබෙන මෙගාවොට් 4,000ක අවශ්‍යතාව මීට වඩා තව ටිකක් වැඩි වෙන්න පුළුවන්. ඒ නිසා 2028 වර්ෂය විතර වෙනකොට මේ අවශ්‍යතාව දෙගුණ වීමේ යම් ප්‍රවණතාවක් තිබෙනවා. ඒ නිසා ඒකට ගැළපෙන ලෙස පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය නිෂ්පාදනය තමයි අපි වැඩි කරන්න ඕනෑ. ඒ සඳහා නීති සම්පාදනය කරන්න අවශ්‍ය මැදිහත්වීම් කරමින් තමයි අපේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නේ.

ඒ නිසා හදිසියේ මතු වන සමහර ප්‍රශ්න මත, තෙල් සැපයුම්කරුවන්ට නැත්නම් බෙදුම්කරුවන්ට ලැබිච්ච වට්ටම අඩු කළා කියන කාරණය මත තෙල් බෙදා හැරීමේ ක්‍රියාවලියට එකතු වෙන්නේ නැහැ කියන කාරණය කොයිතරම් දුරට සාධාරණද කියන එක ගැන බලන්න ඕනෑ. තරගකාරී මිල ගණන් යටතේ tenders දාලා තෙල් ටික ගෙනැල්ලා බෙදා හැරියාට පස්සේ, ඒ licence එක තිබෙන අයට තෙල් බෙදා හැරීමේ ක්‍රියාවලියේදී තෙල්වලින් ලැබෙන ලාභයෙන් වට්ටමක් දෙන එක හරි. හැබැයි, දැන් බදුවලිනුත් වට්ටම් දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් තෙල් ලීටරයකට තිබෙන බදු ප්‍රමාණයක් තිබෙනවා. ඒ බදුවලිනුත් දැන් වට්ටම් දීලා තිබෙන්නේ. ඒ නිසා මේවා නිවැරදි වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඒවා නිවැරදි වීමේදී කොයිම වෙලාවකවත් ඒ සැපයුම්කරුවන්ට නැත්නම් බෙදුම්කරුවන්ට අලාභයක් වෙන යෝජනාවක් කවුරුවත් ඉදිරිපත් කරලා නැහැ.

එම නිසා ඒ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ මේ වෙලාවේ රටේ පවතින නීති රීති යටතේත්, අධිකරණවල තිබෙන සමහර ක්‍රියාමාර්ග අනුවත් ලැබී ඇති උපදෙස් මතයි. බදුවලටත් වට්ටම් ගෙවනවා කියන කාරණයේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මේවා නිවැරදි කරන්න අවශ්‍ය සැලසුමක් සකස් කරලා තිබෙනවා. ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරන්න සූදානම්. ආණ්ඩුව හැටියට අපි කියනවා, රටේ තෙල් හිඟයක් නැති බව. තෙල් හිඟයක් නැතුව, නොකඩවා තෙල් සැපයුම් කිරීමට අවශ්‍ය මැදිහත්වීම් ආණ්ඩුව හැටියට අපි කරලා තිබෙනවා. බෙදුම්කරුවන්ගේ ගැටලුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා විසඳා ගෙන ඉස්සරහට යන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා කඩිනමින් පැනනැඟුණු, ප්‍රශ්නයක් වාගේ මතු වන මේ තෙල් ප්‍රශ්නය පිළිබඳ කාරණය, කොයිම වේලාවකවත් තෙල් හිඟයක් බවට පත් කරන්න අපි ඉඩ තියන්නේ නැහැ. ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරන්න ආණ්ඩුව කටයුතු කරනවා. ඒ වාගේම ඒ පාරිභෝගිකයන්ට යම් අපහසුතාවක් කෙටි කාලීනව සිදු වෙනවා නම් ඒකත් ඉතාම ඉක්මනින් අවසන් කරන්න අවශ්‍ය කරන මැදිහත්වීම් අපි කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත්තොත්, අතිශය වැදගත් කාරණා ටිකක් තිබෙනවා. මොකද, පසුගිය කාලය දිහා බැලුවාම පෙනෙනවා, සුළං බලාගාරයකින් විදුලිය නිපදවීමේදී අඩුම ටෙන්ඩරය ගන්න පුළුවන් වුණේ අපේ ආණ්ඩුවටයි කියන එක. සුළං බලයෙන් විදුලිය ජනනය කිරීමේ මෙගාවොට් 50ක විදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා වූ ඒ ටෙන්ඩරය, ඒකකයක් ඇමෙරිකානු ඩොලර් ශත 4.65කට අපි ගත්තා. මේක තමයි ඉතිහාසයේ පළමුවන වතාවට සුළං බලාගාරයක් අඩුම ගණනකට විදුලිය නිෂ්පාදනය කරලා අපට දෙන මුදල. ඒකකයක් වෙනුවෙන් ඒ අඩුම ගණන අපට ගන්න පුළුවන් වුණේ අපේ ආණ්ඩුව මැදිහත් වෙච්ච නිසායි. මේ සම්බන්ධයෙන් විවිධ කථා කියන්න හැදුවා, මේ ටෙන්ඩරය අහිමි වෙච්ච යාළුවෝ ටික කථා කරලා තිබෙන නිසා. හැබැයි, මේ ටෙන්ඩරය අහිමි වෙච්ච යාළුවාට මේකේ process එක වැරදි නම් අධිකරණයට යන්න පුළුවන්. නමුත් ඔහු අධිකරණයට යන්නේ නැත්තේ ඇයි? තිබුණු නඩුවත් ඉල්ලා අස් කර ගත්තා. ඒකට කිව්වා, "අපට ලේකම්තුමා කිව්ව නිසා ඉල්ලා අස් කර ගත්තා" කියලා. එහෙම එකක් නැහැ. ලේකම් telephone call එකක් දීපු නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබුණු නඩුවක් ඉල්ලා අස් කර ගත්තා ලු. එතකොට එයාගේ නීතිඥයන්ට මේ කථාව කියන්නේ නැද්ද? නැහැ, ඒවා බොරු. මේ ටෙන්ඩරය ගිය එකෙන් වෙලා තිබෙන්නේ ගන්න තිබිච්ච එකත් නැති වෙච්ච එකයි. ජනතාවට පහසුකම් දෙන්න, අඩුම මිලට විදුලි බලය ලබා දීමට සුළං බලාගාරයක් හදන්නේ අපේ ආණ්ඩුව යටතේ කියන එක අපි මේ වෙලාවේ ඉතාම වගකීමෙන් කියනවා. ඒ, අඩුම මිලට.

ඒ වාගේම සූර්ය බලයෙන් විදුලිය නිපදවීම ගත්තොත්, සාම්පූර් විදුලි බලාගාරයට අදාළ සාකච්ඡාවක් පසුගිය කාලය පුරාවට පැවතුණා. මේ පිළිබඳව ඉන්දියානු රජය අපිත් එක්ක සාකච්ඡා කරනවා. ලංකා විදුලිබල මණ්ඩලය විදුලි අවශ්‍යතාව ඇතුළු මේ සියල්ල ගැන සාකච්ඡා කරලා තිබෙනවා. සූර්ය බලාගාරයකින් විදුලිය නිපදවීමේ ඒකකයක අඩුම ටෙන්ඩරය,

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ඩොලර් ශත 5.97යි. මේකත් අපේ ආණ්ඩුව යටතේ ආපු අඩුම සූර්ය බල නිෂ්පාදන වියදම කියන එක අපි ඉතාම වගකීමෙන් සහ බොහොම ආඩම්බරයෙන් කියනවා. එහෙම වුණේ මේ කටයුතුවලට අපි ආණ්ඩුවක් ලෙස කරන මැදිහත්වීම නිසායි.

මේවා වැඩි මුදලට දීලා තිබුණේ. හැබැයි, අපි ඒවා අඩු ප්‍රමාණයකට ගෙනැල්ලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක රජයක මැදිහත්වීම. ජනතාවට, නිෂ්පාදකයන්ට, පාරිභෝගිකයන්ට වාගේම පොදු පහසුකම් සහිත ස්ථානවලට විදුලිය අඩු මිලට දෙන්න නම් ඒ කටයුත්ත අපි කරන්න ඕනෑ. අපි ඒ කටයුත්ත කරලා තිබෙනවා. ඒ කටයුත්ත කරගෙන යනකොට ක්ෂේත්‍රය ඇතුළේ ප්‍රශ්න ටිකක් තිබෙනවා. අපි ඒවා හඳුනාගෙන තිබෙනවා. අපේ ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා මේ ගැන කරුණු කිව්වා. ක්ෂේත්‍රය ඇතුළේ ප්‍රශ්න ටිකක් තිබෙනවා. මේ ප්‍රශ්න, කෙටි කාලීනව අවසන් කරන්න පුළුවන් ප්‍රශ්න නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති ප්‍රතිපත්තිය කවදාවත් නිසි වෙලාවට ක්‍රියාත්මක වුණේ නැහැ. නිසි වෙලාවට ක්‍රියාත්මක නොවුණු බලශක්ති ප්‍රතිපත්තිය පිළිබඳව අපි ඉදිරි කාලය තුළ සාකච්ඡා කරගෙන යනවා.

වසර දෙකක් පුරාවට වෘත්තිකයන් හා එක්ව සකස් කළ මහජන වරම් ලැබුණු ප්‍රතිපත්ති රාමුවක් තිබෙනවා. ඒ කියන්නේ, පසුගිය වසර දෙකක් පුරාවට මේ පිළිබඳ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ සාකච්ඡා කරලා ගත්ත ක්‍රියාමාර්ග 30කට ආසන්න ප්‍රමාණයක් ඉදිරි දින කිහිපය තුළදී -ඉදිරි සති දෙකක් තුළ- ගැසට් කරන්න ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කරන්න සූදානම් කියන කාරණයත් මේ සභාවට මම කියනවා. අපි ප්‍රතිපත්තිමය ලෙස කරන කටයුතු ගැන කියනවා. කෙනෙකුට ඒවා විශ්වාස නොකර ඉන්න පුළුවන්. හැබැයි, අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කර තිබෙනවා. ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා, ඒ අදාළ උපදේශක කාරක සභාවලට සම්බන්ධ වන මන්ත්‍රීවරුන්ටත් ඒ ගැන දැනගන්න පුළුවන්. දැන් අපි ඒ කටයුතු කරමින් යනවා. විදුලිබල ක්ෂේත්‍රයේ අර්බුදය විසඳන්න අපේ රජය මැදිහත් වනවා.

ඒ වාගේම, අපි 2025දී ගෙනෙන්න අවශ්‍ය අණපනත් තිබෙනවා. ඒ, මොනවාද? මේ වසර අවසන් වීමට පෙර අපි ඒ අණපනත් ගෙනෙනවා. විදුලිබල පනත් සංශෝධනය කිරීම පිළිබඳව අපෙන් විවිධ කථා අහනවා නේ. පසුගිය කාලයේ ලංකා විදුලිබල මණ්ඩලය කොටස් 8කට කඩලා බලාගාර, සම්ප්‍රේෂණ, බෙදා හැරීම් පෞද්ගලීකරණය කරන්න කටයුතු කළා නේ. ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට කිසිදු බලාගාරයක් හෝ සම්ප්‍රේෂණය කිරීමක්, බෙදා හැරීමක් පෞද්ගලීකරණය නොකරන බව බොහොම වගකීමෙන් මේ වෙලාවේ අපි කියනවා. ආණ්ඩුවක් හැටියට තමයි මේ කටයුත්ත අපි කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොටත් නව විදුලිබල පනත අපි සම්පාදනය කරමින් තිබෙන්නේ. මොකද, මේ පනත් සංශෝධනය කරන්න ඕනෑ. සමාගම් 12කට වෙන් කරලා කැඩී යෑමට තිබූ ලංකා විදුලිබල මණ්ඩලය අපි එකතු කරනවා. එලෙස කැඩුණු ඒවා අපි ළං කරනවා; එකතු කරනවා; කඩන්න හදපු ඒවා ආපහු අපි බන්දනවා. කොටස් 5ක් යටතේ විදුලිබලය සම්ප්‍රේෂණය, බෙදා හැරීම ඇතුළු විවිධ ක්‍රියාවලි තිබෙනවා. ඒ ක්‍රියාවලි අපි ඉස්සරහට අරගෙන යනවා. මේ පනත් සංශෝධනයට අවශ්‍ය කටයුතු දැනටමත් අපි අවසන් කරමින් ඉන්නවා. ඉතා ඉක්මනින් නව විදුලිබල පනත සංශෝධනය කරලා අලුත් පනත් කෙටුම්පත අරගෙන එනවා කියන කාරණය අපි මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙනවා. ඒ කටයුතු අපි කරමින් ඉන්නේ. අපි බලාපොරොත්තු වනවා, අප්‍රේල්, මැයි මාස වනකොට පනත් කෙටුම්පත ගෙනැල්ලා අදාළ සංශෝධන කරන්න. විදුලිබල මණ්ඩලය කඩන්න හදපු පනත අපි වෙනස් කරලා, ළං කරලා ලංකා විදුලිබල මණ්ඩලය ශක්තිමත්ව ඉස්සරහට ගෙනයන්න අවශ්‍ය කටයුතු කරනවා. මේ කටයුත්ත අපි කරන්නේ ඇයි? මේවා බෙදලා පෞද්ගලීකරණය කරන්න යෝජනා කරලා, සම්මත කර තිබෙන පනත් අපි නවත්වන්නේ ඇයි? අපි ඒවා නවත්වන්නේ තිරසර විදුලිබල අවශ්‍යතාවක් ඇති කරන්න ඕනෑ නිසායි. පසුගිය කාලය පුරාවට විදුලි බලයේ තිරසර බව අඩු කිරීමට තමයි කටයුතු කර තිබුණේ. ඒ නිසා අපි ඒක හදන්න ඕනෑ. අඛණ්ඩ විදුලි සැපයුමක් ජනතාවට ලබා දෙන්න නම් මිල අඩු කරන්න, නිෂ්පාදන වියදම අඩු කරන්න ඕනෑ. අපනයන වෙළෙඳ පොළට සහනයක් වෙන්නේ නිෂ්පාදන වියදම අඩු වුණාමයි. එම නිසා ඒ කටයුතු ටික කරන්න මැදිහත් වෙන්න තමයි අපි සූදානම් වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සාමාන්‍යයෙන් විදුලි බලය සඳහා යන වියදම අපි ගනිමු. විදුලි බලයේ වැඩිම වියදමක් යන්නේ මොකටද? සියයට 70ත්, සියයට 80ත් අතර ප්‍රමාණයක් වියදම් වෙන්නේ විදුලිය ජනනය කිරීම සඳහා. ඒ නිසා මේ ප්‍රමාණය අඩු කරන්න ඕනෑ. මාස 5කින් අපට බලාගාරයක් හදන්න බැහැ. හැබැයි, මාස 5කින් මිල අඩු කරන්න අවශ්‍ය තීරණ අපි ගත්තා. හදන්න හදන බලාගාරවල මිල අඩු කළා. සූර්යබල, සුළංබල ව්‍යාපෘති සඳහා ආපු ටෙන්ඩර්වල මිල ගණන් අඩු කරලා ජනතාවට සහන දෙන්න අපි කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. දැනටමත් තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ අවශ්‍ය සුළං විදුලි බලාගාර, සූර්ය විදුලි බලාගාර ඇති කිරීමට වාගේම, බලශක්තිය ගබඩා කිරීමේ පද්ධති ඉදිකිරීමට අවශ්‍ය ටෙන්ඩර් ක්‍රියාවලිවලට යන්න දැන් අපි සැලසුම් සකස් කරමින් සිටිනවා.

සූර්ය බලශක්තිය මඟින් නිපදවන විදුලි ඒකකයක් රුපියල් 37.50ට තිබුණේ. අපි ඒ ඒකකයක මිල රුපියල් 18, 15, 20 අතර ප්‍රමාණයකට ගෙනැල්ලා තිබෙනවා. ගෙදරක සවි කර තිබෙන සූර්ය පැනලවලටත් ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ යම් මිලක් නියම කර තිබෙනවා. හැබැයි, රුපියල් 30 ගණන්වලට තිබුණු විදුලි ඒකකයක මිල අපි අඩු කර තිබෙනවා. ඇයි, ඒ? විදුලි ඒකකයක මිල අඩු කළේ නැත්නම් ජනතාවට පහසුකම් දෙන්න බැහැ. මේ අඩු කිරීම් විතරක් නොවෙයි අපි කරලා තිබෙන්නේ. අපි ඒ වෙනුවෙන් ආයෝජනය කළා. ඉස්සරහට යන්න ඕනෑ එහෙමයි. එහෙම නැතුව කටයුතු කරලා වැඩක් නැහැ. දැන් අපි ඒවාට ආයෝජනය කරන්න කටයුතු කර තිබෙනවා. ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, JICA සහ සියලු සංවර්ධන සහයෝගිතා ආයතනත් එක්ක එකතු වෙලා අපි දැන් ඒ කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේම බලශක්ති අමාත්‍යාංශයට ව්‍යාපෘති සඳහා ආධාර ලබා ගැනීම සඳහා දැන් බොහෝ රාජ්‍යයන් වාගේම මූල්‍ය ආයතන එකඟතාව පළ කරලා තිබෙනවා. ඒ අනුව බලශක්ති ක්ෂේත්‍රයේ පවතින ගැටලුව විසඳන්න අපි කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම ADB ආධාර යටතේ ඩොලර් මිලියන 200ක වටිනාකමින්

යුත් සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ පද්ධතියක් සඳහා ප්‍රසම්පාදන කටයුතු පටන් ගන්න අපි දැන් කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රය ඇතුළේ කිසිදු වෙලාවක කඩා වැටීමකට නැත්නම් අඩු වීමකට එහෙමත් නැත්නම් ජනතාවට පහසුකම් නැතිවීමට අපි ඉඩ තියන්නේ නැහැ. ආණ්ඩුවක් හැටියට ඒ සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම අපි කරනවා.

පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය ගත්තාම සූර්ය පැනල සම්බන්ධයෙන් තමයි ගොඩක් අයගේ කථා බහ තිබුණේ. පසුගිය කාලයේදීත් මේ පිළිබඳව කථා බහක් තිබුණා. වහලේ සවි කරන්න බලාපොරොත්තුවෙන් සිටිනවා, හැබැයි grid එකේ ඉඩ නැහැ, වහලේ සවි කළත් connect කරන්න මාස දෙක තුනක් පරක්කු වෙනවා වාගේ කථා තිබුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
තව විනාඩියකින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මේ සූර්ය පැනල සම්බන්ධයෙන් ඇතිවෙලා තිබෙන ප්‍රශ්නය අපි අවසන් කරන්න ඕනෑ. ඒ කටයුත්ත අධෛර්යයට පත් කරන්නේ නැහැ, අපි කිසිම වෙලාවක. ඒක අපට සම්පතක්. ඒ නිසා අපි ඒකෙන් ප්‍රයෝජන ගන්නවා. අපි විශාල සූර්ය පැනල හදනවා නම් ඒවා හදන්න ඕනෑ, බැටරි එක්ක. මොකද, දවල්ට විතරක් විදුලිය අරගෙන රෑට මොකක්ද කරන්නේ? ඒ නිසා දැන් බැටරියත් එක්ක තමයි සූර්ය පැනල හදන්න වෙන්නේ. අන්න ඒ සඳහා තමයි මීළඟට අපේ අවධානය යොමු කරලා තිබෙන්නේ. ඒ සඳහා alternatives තිබෙනවා. ඒ ක්ෂේත්‍ර පිළිබඳවත් අපි අවධානය යොමු කරමින් තිබෙනවා.

මේ කටයුතුත් එක්ක විදුලිබල මණ්ඩලයේ සේවකයන් පසුගිය කාලය පුරාවට ප්‍රශ්නවලට මුහුණ දුන්නා. 70දෙනෙකුගේ රස්සාව නතර කරලා ඔවුන් ගෙදර නවත්වලා තිබුණේ. බලශක්ති ඇමතිතුමා පත් වුණු ගමන් මොකද කළේ? ඒ සියලුදෙනා විදුලිබල මණ්ඩලය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ගත්ත වෘත්තීය ක්‍රියාමාර්ගයක් නිසායි ගෙදර නවත්වලා තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සේවකයන් නඩු කිව්වා. නඩු කියමින් හිටපු සේවකයනුත් නිදහස් කරලා, ඒ සියලුදෙනා නැවත සේවයේ පිහිටුවා ඒ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වුණු රජයක් තමයි අපේ රජය. අපි බලයට ඇවිල්ලා තවම මාස පහයි.

විදුලිබල මණ්ඩලයට බලශක්ති ක්ෂේත්‍රය තුළ විශේෂ තැනක් හිමිව තිබෙනවා. ඒ නිසා විදුලිබලයෙන්, තෙල්වලින් මිල අඩු කරන්න අවශ්‍ය කරන ක්‍රියාවලට වාගේම, ජනතාවට අඩුවකින් තොරව බලශක්ති පහසුකම් ලබා දෙන්නත් අවශ්‍ය කරන මැදිහත්වීමත් අපි කරලා තිබෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරපු යෝජනාවලින් ගත හැකි යෝජනා අපි ගන්නවා. ඒ එක්කම, අර පරණ පුරුදු ගමන යනවාය කියන කථාව අපි කිසිම වෙලාවක පිළිගන්නේ නැහැ. ඒක වෙනස් කරන්න අවශ්‍ය නායකත්වය ජනාධිපතිවරයාගේ සිට කැබිනට් මණ්ඩලය දක්වා - ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා ඇතුළු සියලුදෙනා - ලබා දෙමින් තිබෙනවා. ඒ නිසා අපි සියලුදෙනාට ආරාධනා කරනවා, අපේ රටේ මේ බලශක්ති ක්ෂේත්‍රයට අදාළව තිබෙන ප්‍රශ්නය විසඳන්න යද්දී ඔබතුමන්ලාගේ දැනුමත්, අවබෝධයත් අවශ්‍ය තැනදී ලබා දීලා, ඒ සඳහා එකතු වෙන්න කියලා. ජාතික ජන බලවේගය කිසිම වෙලාවක තෙල්, විදුලිය නැති වෙන්න ඉඩ දෙන්නේ නැහැ, අඛණ්ඩව ඒවා ජනතාවට සපයන්න කටයුතු කරනවාය කියන කාරණය කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.30]

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාව ඉතා අවධානයෙන් බලාගෙන ඉන්න අමාත්‍යාංශයක වැය ශීර්ෂය පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ ජලය, විදුලිය වාගේ මූලික අවශ්‍යතා සම්බන්ධයෙන් පසුගිය කාලයේ විශාල ගැටලු නිර්මාණය වුණා. මිනිසුන්ට ජලය නැති වුණා. ජල සැපයුම හරියට කර ගන්න බැරි වුණා. විදුලිය දෙන්න බැරි වුණා. ඒ වාගේ විශාල ගැටලු නිර්මාණය වෙලා තිබුණා. වත්මන් ආණ්ඩුව බලයට පත්වෙලා තිබෙන මේ මොහොතේදීත් විදුලිය ඒකාකාරීව ලබා දීම පිළිබඳ විශ්වාසය බිඳිලා තිබෙනවා. ජලය ලබා දීම පිළිබඳ විශ්වාසය තහවුරු වෙලා නැහැ. ඒ වාගේම ඩීසල් ටික, පෙට්‍රල් ටික ලබා ගන්න තිබෙන අයිතිය හරියට නියමානුකූලව වෙයිද, නැද්ද කියලා සැකයක් මතුවෙලා තිබෙනවා. මේ වෙලාවේ ජනතාව බලනවා, අද මේ විවාදයට ගැනෙන වැය ශීර්ෂයට අදාළ බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය මොකක්ද, ගැටලු තත්ත්වයක් ආවොත් අමාත්‍යවරයා ගන්න පියවර මොකක්ද කියලා.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියපු කාරණාව හරි සාධාරණයි. මේ රටේ යම්කිසි ප්‍රශ්නයක් ආවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අදාළ විෂය භාර අමාත්‍යවරයා උත්තරයක් දෙන්නේ නැතුව පැනලා ගිහිල්ලා, ඒ ප්‍රශ්නයට උත්තර වෙන වෙන තැන්වලින් එනවා නම්, "කැබිනට් අමාත්‍යවරයා" කියන ගෞරවනීය තනතුර හැල්ලු වෙන එක තමයි වෙන්නේ. මොකද, කැබිනට් ඇමතිවරයාට අමාත්‍යාංශයේ විෂය පථය ඇතුළත එන ගැටලුවකට උත්තරයක් දෙන්න බැරි නම්, ඒ ඇමතිවරයා ඒක දාලා යන්න ඕනෑ. පසුගිය කාලයේ හදිසි විදුලි බිඳ වැටීම ගැන රටේම ප්‍රශ්න ඇති වුණා. කවුරුත් ඒ ගැන ප්‍රශ්න කළා.

ගරු බිමල් රත්නායක ඇමතිතුමා උත්තරයක් දුන්නා. නමුත් විෂය භාර ඇමතිවරයා වචනයක්වත් කියන්නේ නැහැ. මොකක්ද මේ රටේ ජනතාවට තිබෙන,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මුදල් නියෝජ්‍ය ඇමතිතුමා බදු සම්බන්ධයෙන් පැහැදිලි කළා. බලශක්ති ඇමතිතුමා අදාළ විෂය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළා. ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා තමයි බදු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම කළේ. එතුමා ඒක කළා.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

නමුත්, මාධ්‍යවල පළවෙනවානේ. ඒක මම කියන්න අවශ්‍ය නැහැනේ.

මම කියන පළමුවැනි කාරණාව තමයි, මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ කැබිනට් අමාත්‍යවරයෙක් කියන්නේ ඉතාම ගෞරවනීය චරිතයක්. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කැබිනට් මණ්ඩලය ගත්තොත්, ඒ අය කරපු වැඩත් එක්ක එතුමාගේ කැබිනට් මණ්ඩලය අදත් අපට මතක තිබෙනවා. ජල විදුලිය ගැන කථා කරනකොට ඉතිහාසයේ ඊට ලබා දුන් හයිය, ශක්තියත් එක්ක තමයි අදත් අපි මේ රටේ ඒ ක්ෂේත්‍රයේ ඒ කටයුතු ටික හසුරුවාගෙන යන්නේ. එහෙම කටයුත්තක් පසු කාලයේ සහ මේ ආසන්න කාලයේ හිටපු ඇමතිවරු කළේ නැති වෙන්න පුළුවන්. ඉතින් මම හිතනවා, අපටත් ඒ ශක්තිය සහ අයිතිය තිබෙන්නට ඕනෑ කියලා.

පසුගිය කාලයේ ඇමතිවරයා කරපු ප්‍රකාශයක් මම මේ මොහොතේ උදාහරණයක් විධියට ගන්න කැමැතියි. මෙතුමා අහනවා, එතුමා පාර්ලිමේන්තුවේදී එහෙම කථාවක් කළාද කියලා. පාර්ලිමේන්තුවේ කරන හැම ප්‍රකාශයක්ම මාධ්‍යවල යන්නේත් නැහැ, ඒ හැම ප්‍රකාශයක්ම ජනතාව දැනගන්නේත් නැහැ. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරනවා, "අපි කිසිම solar project එකක් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ කරන්න දෙන්නේ නැහැ, කරපු ඒවාත් නතර කරනවා" කියලා. මම දන්නා තරමින් එතුමාට ඒ ප්‍රකාශය කරන්න අයිතියක් නැහැ. ඒක කරන්න ඕනෑ කැබිනට් ඇමතිවරයා. ඒක බරපතළ ප්‍රකාශයක්.

අදානි සමාගම ගියාම "අපි අදානි එළෙව්වා" කියනවා. දැන් නැවත කියනවා, "අපි අදානි බැලන්ස් කරලා ගේනවා" කියලා. ආයෝජකයෝ මේ රටට එනකොට මේ රට ගැන සොයා බලනවා. අපි වුණත් ව්‍යාපාරයක ආයෝජනය කරනකොට, නැත්නම් කොටස් වෙළෙඳ පොළේ සමාගමක කොටස් මිලදී ගන්නකොට පවා ඒ සමාගමේ ඉතිහාසය මොකක්ද, ඒ සමාගමේ පරිපාලනය මොන වාගේද කියලා සොයා බලනවා. ඒ වාගේ තමයි, මේ රටේ ආයෝජනය කරන්න විදේශ ආයෝජකයෙක් එනවා නම්, මේ රටේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා සොයා බලනවා.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාල සීමාවේ මේ රටේ වංචා, දූෂණ, හොර වැඩ සහ අකාර්යක්ෂම පාලනය සිදු වුණා කියන එක අපි පිළිගන්නවා. ඉතිහාසයේ සිදු වුණු ඒ කරුණු කාරණා එක්ක ඒ කාලයේ ගත් තීන්දු තීරණ සියල්ල වෙනස් කරනවා කියන තැනට අපි එනවා නම්, ඒවා අපි එකින් එක කියන්නට ඕනෑ.

මේ දවස්වල solar projects නතර කරන එක ගැන මමත් හොයලා බැලුවා. Solar projects නතර කරන එක ප්‍රධාන ප්‍රශ්නයක්. වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වා, දැන් ඒක ප්‍රධාන මාතෘකාවක් වෙලා තිබෙනවා කියලා. හැබැයි, අපි එතැනට ආවේ ඇයි? 2022 අවුරුද්දේ පැය 10, 12 කලුවරේ ඉන්නකොට ජනතාවට එල්ල වුණු ඒ පීඩාව හරහා solar නොවෙයි, ඩීසල් නොවෙයි, මොන බලාගාරයකින් හෝ විදුලිය දෙන්න කියන තැනට තල්ලු වුණා. රජයට ඒ අවශ්‍යතාව සපුරන්න බැරි වුණා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ගෙදර යන්න සිදු වුණා. හැබැයි, අපි අවුරුදු ගණනාවක් ජල විදුලියත් එක්ක, ඒ වාගේම ඉන්ධන, ගල් අඟුරුත් එක්ක තමයි අපේ Grid එක කළමනාකරණය කරගෙන ගියේ. එතැනින් එහාට ගමනක් යන්න ඕනෑය කියන කාරණාව ගැන පසුගිය රජයයන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තේ නැහැ.

උදාහරණයක් විධියට ගත්තොත් මට මතක විධියට, 2007 අංක 35 දරන පනත යටතේ තමයි සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන්නේ. එතකොට 2007 ඉඳලා මේ සඳහා අවධානය යොමු වෙලා තිබෙනවා, මේ රටේ සර්ම කලාපීය රටක් විධියට, සූර්ය බලය ඉතාම වැඩිපුර ප්‍රයෝජනයට ගන්න පුළුවන් රටක් විධියට. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. හැබැයි, 2021දී විදුලි අර්බුදය ආවට පස්සේ පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කරනවා. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් ඉදිරිපත් කර තිබෙන එම සැලැස්ම කවුරු කළත්, දේශපාලනික වශයෙන් එහි credit එක කාට ගියත්, ඒක මේ රටේ දේශපාලනය කරන, මේ විෂයය ගැන අවබෝධයක් ලබා ගන්න කැමැති කට්ටිය කියවිය යුතු සැලැස්මක්. මොකද, මේක ඇතුළේ සාධනීය කාරණා බොහොමයක් තිබෙනවා. එම නිසා, ඒ කෙරෙහි යම් කිසි අවධානයක් යොමු කරන්න කටයුතු කළ සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා.

මම මේ කියාගෙන එන්නේ මෙයයි. මේ රටේ අර්බුදය තිබුණු අවස්ථාවේ රටේ ජනතාවගේ පීඩනය පාවිච්චි කරලා ඕනෑ ඕනෑ විධියට විදුලිය ලබා දෙන්න කටයුතු කළා.

අපේ රටේ හිටපු සමහර ඇමතිවරු හරිම කැමැතියි, -වත්මන් ඇමතිවරයා එහෙම නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා- ඩීසල් බලාගාර පවත්වාගෙන යන්න. විදුලි අර්බුදය එනකොට සමහර වෙලාවට ඇමතිවරයාට සතුටක් දැනෙන්න ඇති. මම එහෙම කියන්නේ ඇයි? ඉතිහාසය පුරාම හදිසි මිලදී ගැනීම් හරහා විදුලිය ලබාදීමට කටයුතු කළා.

වසන්ත සමරසිංහ ඇමතිවරයා කිව්වා වාගේ මේ රටේ පාරිභෝගිකයාට අඩු මිලට විදුලි ඒකකයක් ලබා දීම ආණ්ඩුවේ අරමුණ නම්, ආණ්ඩුව solar powerවල tariff එක අඩු කරනවා වාගේම, ඩීසල් බලාගාරවලින් හදිසි විදුලිය ලබා ගැනීම නතර කරනවා කියලාත් ප්‍රකාශ කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය වැඩ සටහනක් හදන්න ඕනෑ. හැබැයි, ඒක ගැන කථා නොකර, ඒක ඒ විධියටම යනවා. ඒකේ මිල මොකක්ද කියන එක, ඒකේ tariff එක මොකක්ද කියන එක ගැන හිතා ගන්නවත් බැහැ.

ඇඹිලිපිටියේ මගේ නිවස ආසන්නයේම තිබෙනවා ඔය ආකාරයේ විදුලි බලාගාරයක්, පෞද්ගලික සමාගමක. ඒ විදුලි බලාගාරයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මම හොඳටම දන්නවා. ඒ බලාගාරවලින් ගිනි අව්වේ, මහ දවාලේ විදුලිය ජනනය කරලා Grid එකට එකතු කර ගන්නවා කියන්නේ, එහෙම නම් අපි solar powerවලින් manage කර ගන්න පුළුවන් උපරිමයට ගිහිල්ලා තිබෙන්න ඕනෑ. මම දන්නේ නැහැ, මට තාක්ෂණික දැනුම නැහැ. නමුත් මට තිබෙන දැනුම අනුව මම කල්පනා කරන්නේ, එහෙම නම් මේ කළමනාකරණයේ අවුලක් තිබෙනවා කියායි. එහෙම නැත්නම් මේකේ මාෆියා එකක් තිබෙනවා කියලා මුළු රටම පිළිගන්නවා. එහෙම නැත්නම් ඒ බලාගාර ක්‍රියාත්මක කරන සමාගම් එක්ක ඇමතිවරයාට මොනවා හෝ සබැඳියාවත් තිබෙන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, පසුගිය රජය ඇතුළු පසුගිය රජයන්වල කටයුතු නිසා, -මා ළඟ තිබෙන තොරතුරු අනුව- 2021 ඇති වෙච්ච තත්ත්වය හේතුවෙන් ආණ්ඩුව කලබල වුණා. 2022 සැප්තැම්බර් 24වෙනි දා ගැසට් අංක 2246/24 අනුව පුනර්ජනනීය විදුලි ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයන් උනන්දු කරවීමේ අභිලාෂ කැඳවීමක් කරනවා. මේ හරහා විශාල ආයෝජකයන් ප්‍රමාණයක් ඉල්ලීම් කරනවා. ඒ ආයෝජකයන් අතරින් 49දෙනෙක් තෝරාගෙන, ව්‍යාපෘතිවල වැඩ කරගෙන යනවා. මම වත්මන් ඇමතිවරයාට කියනවා, ඒ තෝරා ගැනීම

වැරදි නම් ඒක රටට කියන්න, ඒක මෙන්න මේ ඇමතිවරු, මේ ආණ්ඩුව කරපු දෙයක් කියලා. නැත්නම් මේ කථාව කිව්වාම කොහේවත් නැති ජල්තර වැඩ කරපු ආණ්ඩු පිරිසිදු වෙයි. ඒ ආණ්ඩුව කළ ඒ වැරැද්ද සමාජගත කරන්න. මේ නිසා මේක දෙන්න බැහැ, මේකේ මහා වංචාවක් වෙලා තිබෙනවා කියලා කියන්න.

CEB එකේ නිලධාරිනුත් රැස්වීම්වලට ඇවිල්ලා තීන්දු තීරණ අරගෙන, tariff එක තීන්දු කරලා, මේ projects ටික කරගෙන යනවා. රටේ විදුලි බලය පිළිබඳ අනාගත ප්‍රශ්නයකට උත්තරයක් මේ මොහොත වනතුරු නැති වෙලාවක, හදිසියේ ඒ ව්‍යාපෘති නතර කරලා තිබෙනවා. සමහර ව්‍යාපෘති පිළිබඳව අපි දන්නවා. ඒ නතර කරලා දාලා තිබෙන්නේ සූර්ය බලය හරහා මේ රටේ grid එකට විදුලිය එකතු කරන ව්‍යාපෘති.

අජිත් පී. පෙරේරා මැතිතුමනි, පසුගිය කාලයේ වව්නියාවේ සිද්ධියකට FR case එකක් ගිහිල්ලා විශාල මුදල් ප්‍රමාණයක් ගෙවන්න වුණා CEB එකෙන්. ඒ සල්ලිත් ගෙවන්න වෙන්නේ මේ රටේ බදු ගෙවන මිනිස්සුන්ට. ලයිට් බිල ගෙවන මිනිස්සුන්ට තමයි විදුලි බල මණ්ඩලයේ ඒ වියදම් ගෙවන්න වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව වෙලාවේදී කියන්න, ඔබතුමා සහනිකයක් දෙනවාද කියලා මේ මිලදී ගැනීම් නතර කිරීම හරහා සත පහක්වත් අපේ රටේ පාරිභෝගිකයාට දරා ගන්න වන විධියේ වන්දි ගෙවීමක් සිදු වෙන්නේ නැති විධියට නතර කරනවා කියලා. ඒ සහනිකය ඔබතුමා දෙනවා නම්, ඔබතුමා මේ වෙනස්කම්වලට යෑම සාධාරණයි.

මොකද අපි දන්නා තරමින් මේ ව්‍යාපෘති- *[බාධා කිරීමක්]* මට බාධා කරන්න දෙන්න එපා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාරණයක් මතු කරන්න තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේදී සඳහන් කළා අපේ ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් කළ ප්‍රකාශයක් ගැන. *[බාධා කිරීමක්]* නැහැ, ඒ ප්‍රකාශය මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ කළාද, එහෙමත් නැත්නම් ඔබතුමා මාධ්‍යවලින් කියවපු වාර්තාවක්ද? පාර්ලිමේන්තුව ඇතුළේ ඔබතුමන්ලාට වැරදි අදහස් කියන්න බැහැ; වැරදි අදහස් කියන්න බැහැ. මේ වෙලාවේ වැරදි අදහසක් ඔබතුමා ඒ කිව්වේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු ඇමතිතුමනි, අපි පාර්ලිමේන්තු සම්ප්‍රදායෙන් පිට කටයුතු කරන්නේ නැහැ. අපි බොරුවට කෑ ගහන්නේ, දඟලන්නේ නැහැ. එහෙම හානියක් වෙලා තිබෙනවා නම් ඒක ඇමතිතුමා කියන්න ඕනෑ, නැත්නම් ඒ අදාළ මන්ත්‍රීතුමා කියන්න ඕනෑ. වෙන නියෝජ්‍ය ඇමතිවරයෙකුට ඒ ගැන කියලා මගේ කථාවට බාධා කරන්න බැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, Standing Orders අනුව එහෙම අහන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමාට නිසි ගෞරව ඇතිව කියන්නේ, ඔබතුමා කිව්වා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී එතුමා කිව්වා කියලා සියලු solar projects නතර කරනවා කියලා. අපි දැනගන්න කැමැතියි, එතුමා ඒක කියන තැන ඔබතුමා හිටියාද, නැත්නම් මාධ්‍යයකින් නම් ඒක දැක්කේ, ඒ මාධ්‍ය මොකක්ද කියලා කියන්න.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමාත් එක්කම තමයි අපේ දිස්ත්‍රික් නායකතුමා දිලිප් වෙදආරච්චි මැතිතුමා ඉන්නේ. මම එතුමාගෙන් ලබා ගත්තේ ඒ තොරතුරු. ඒක වැරදි නම් වැරදියි කියන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක පුවත්පත්වල තිබුණා.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ඔව්, ඒක පුවත්පත් ඇතුළු මාධ්‍යවලත් තිබුණා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ඇමතිතුමාත් එය පිළිගෙන තිබෙනවා. ඒක නැහැ නොවෙයි නේද?

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
නැහැ, නැහැ. ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවෙන් පස්සේ ඔබතුමා කියන්න.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ කථාව කරන්න වෙලාව දෙන්න. පොඩි වෙලාවක් නේ තිබෙන්නේ. විනාඩි 20ක් තිබෙනවා කියපු එකෙනුත් විනාඩි 4ක් අඩු වෙලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

මම ඒක නිහාල් ගලප්පත්ති ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමාට භානියක් වෙන්න කිව්වා නොවෙයි. එතුමා ප්‍රකාශයක් කළා. ඒ හරහා පීඩාවට පත් වන්නේ ආණ්ඩුව නොවෙයි, අපේ රටේ සමස්ත විදුලි පාරිභෝගිකයා. ඔවුන්ටයි ඒකෙන් රිදෙන්නේ. ඒකයි මම ඒ කථාව කිව්වේ. එතුමා අපහසුතාවට පත් කරන්න නොවෙයි කිව්වේ. මම උදාහරණයක් ඒ ගත්තේ. එතුමා මෙතැන නැති හින්දා ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා, ඒක එහෙම නොවෙයි නම් ඒ බව කියන්න. ඒක ගරු ඇමතිතුමා කියයි.

මේ වන කොට මේ රටේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා, සමාගම් 49ක්. ඒ සමාගම් 49 මේ වන කොට ව්‍යාපෘති කරගෙන යනවා නේ. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, මා දන්නා තරමින් මිලියන 50ක්, 100ක් අතර ප්‍රමාණයක් ගෙවන්න ඕනෑ, ඒ project එක ආරම්භ කරන්න. ඉන්දියාවේ වාගේ නම් එවැනි project එකක් කරගෙන යන කොට අවශ්‍ය මූලික පහසුකම් ඉන්දියාව විසින්ම සපයනවා. Grid එකට සැපයුම කරන කොට සමාගමත් එක්ක තිබෙන බැඳීම එහෙමයි. අපේ CEB එකේ ඒ project එක කරගෙන යන්නත් ඕනෑ, ආයෝජකයා. මේ project එකේ සියලු මූලික අවශ්‍යතා ටික, ඒ කියන්නේ grid connection එක දක්වා සියලු දේවල් ටික දරන්න ඕනෑ, ආයෝජකයා. මේ වන කොට යම් දුරක් ගිය ආයෝජකයන්ට එක පාරටම මේ වාගේ රතු එළියක් පත්තු කරන කොට අපේ රටට ආයෝජකයෝ එයි ද? අපේ රටේ විදුලිබලය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයට ඇත්ත උත්තරයක් ලැබෙයි ද? ඔව්, උත්තරයක් එයි. අර මම පෙර කියපු-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මගේ අර අහිමි වෙච්ච කාලයත් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කාලය ඉවත් කරලා තමයි කාලය ලබා දුන්නේ.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියනවා, මේ projects නතර කරන එක ගැන මේ රටට කියන්න කියලා. ගරු ඇමතිතුමනි, මේ රටට කියන්න, ඒවා දීලා තිබෙන විධිය වැරැදියි කියලා. ඒවායේ tariff එකේ අවුලක් තිබෙනවා නම් ගෙනැල්ලා කථා කරන්න. දැන් ඔබතුමන්ලා යෝජනා කරලා තිබෙනවා කියලා ආරංචියි, ඒවා retender කරනවා කියලා. ආයෝජකයා මම නම්, මම ගිහිල්ලා හොයා ගන්නවා කොහේ හරි ඉඩමක්. ඉඩමක් හොයාගෙන ඉවර වෙලා ඒ වැඩේ කරගෙන යන කොට ඒක නවත්වලා කියනවා, retender කරනවා කියලා. Retender කරන කොට මා හොයා ගත්තු ඉඩමේ ඒ කටයුත්ත කිරීමේ අවස්ථාව අනෙක් කෙනාට ඇවිල්ලා tender එකෙන් ඒක ගන්න ඉඩ දෙනවා ද, මම? ඒක කරන්න දෙන්නේ නැහැ. එතකොට ඒක නැති වෙනවා. ඒක නැති වෙලා යනවා. මේවා, සාමාන්‍ය දැනීම.

මට නම් හිතා ගන්න බැහැ, මේවාට උපදෙස් දෙන්නේ කවුද කියලා. උපදේශකවරුත් ඉන්නවා නේ, නොමිලයේ පහසුකම් සපයන. අපි ඉතිහාසයේත් එහෙම අය දැක්කා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ආපු උපදේශකයෝ උපදේශක පඩිය ගත්තේ නැහැ. හැබැයි, ඒ උපදෙස් දීලා මොකක්ද කළේ? Telecommunication සම්බන්ධයෙන් ඔය උපදෙස් දෙන මහත්මයා මේ රටට තරගකාරී කිසි සමාගමකට එන්න දෙන්නේ නැහැ. වර්තමානයේ එතුමා ආරක්ෂා කළ යුතු සමාගම වෙනුවෙන් අනියමින් මේ රටේ අමාත්‍යවරුන්, ජනාධිපතිවරයා රවටටාගෙන අවශ්‍ය තීන්දුව ගන්නවා. අපේ රටේ පාරිභෝගිකයාට අඩු මිලට call එකක් ගන්න තරගකාරී සමාගමකට එන්න දෙන්නේ නැහැ. ඒ, මම උදාහරණයක් ගත්තේ. මෙතැනත් වෙන්නේ ඒකම ද? එහෙම නම්, මේ රටේ විදුලිබලය නැතුව දුක් විඳින මිනිසුන්ට විශාල විශාල පාඩුවක් වෙන්නේ. විදුලිය බිල අඩු කරනවා කියලා ජනාධිපතිතුමා කියපු විධියට අඩු කර ගන්න බැරි තැනට තල්ලු වෙලා තිබෙන වෙලාවේ විශාල විදුලි බල ව්‍යාපෘති ටිකක් නතර කරලා දැමීම හරහා මොකද වෙන්නේ? ආයෝජකයන් එන්නේ නැති ප්‍රශ්නය ආණ්ඩුව විසඳා ගත්තා කියමු. නමුත්, අපේ Grid එකට අඩු මිලට විදුලිය එකතු වෙන්න තිබෙන මේ අවස්ථාව අහිමි වෙනවානේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, නියමිත කාලය අවසානයි.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි කාලයක් දෙන්න. මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

වසන්ත සමරසිංහ ඇමතිතුමාත් කිව්වා වාගේ, rooftop solar panelsවල tariff එක අඩු කරනවා කිව්වා. Rooftop solar panelsවල tariff එක අඩු කළාට කමක් නැහැ, සාධාරණ විධියට. හැබැයි, ඒක හදන මනුස්සයා ණයක් අරගෙන කරන්නේ. Loan එකක් අරගෙන solar panel එක ගහන්නේ. Loan එක අරගෙන solar panel එක ගහන මනුස්සයාට loan payment එක කර ගන්න බැරි වුණාම අලුතින් කෙනෙක් ඒවා වෙනුවෙන් දිරිමත් වෙයි ද?

මට පෙනෙන විධියට වත්මන් ආණ්ඩුවේත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හරහා සූර්යබල ශක්තිය වෙනුවෙන් ආයෝජනය කරන, ඒ වෙනුවෙන් කැමැත්තක් දක්වන පාරිභෝගිකයන් වහල මත සූර්ය පැනල සවි කරන එක අධෛර්යවත් කරලා ඩීසල් බලාගාරවලින් විදුලිය සපයන ඒ මාෆියාවට සහයෝගය දෙන අයට භයිය දෙන්නයි හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්නයි යන්නේ. ටෙන්ඩර් ක්‍රමයට අරගෙන ඒවා ක්‍රියාත්මක නොකර දැන් මේ විධියට කටයුතු කරගෙන යනවා. ඒ ටෙන්ඩර් ටික අරගන්නේත් ඩීසල් බලාගාර අයිතිකාරයෝමයි. මේ හොරකම, වංචාව නවත්වන්න ගරු ඇමතිතුමාට අවශ්‍ය භයිය ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

ස්තුතියි.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොහොතකට පෙර කථා කළ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කළේ වැරැදිසහගත ප්‍රකාශයක්. එම නිසා එතුමාත් වැරැද්දක් කළා. එතුමාට පණිවුඩය කිව්වාය කියපු ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාත් වැරැද්දක් කරලා තිබෙන්නේ. මොකද, අසත්‍යයක් තමයි ඒ ප්‍රකාශ කරලා තිබෙන්නේ. මාධ්‍ය වාර්තා එක්ක අපට ඒ ගැන සාකච්ඡා කරන්න බැහැ. අපේ සම්බන්ධීකරණ කමිටුව මුලින්ම රැස්වුණේ දෙසැම්බර් 23වන දා. දෙසැම්බර් 23වන දා පැවැති සම්බන්ධීකරණ කමිටුවේදී අපි තාවකාලිකව එම ව්‍යාපෘති නතර කළා, ඒ පිළිබඳ සොයා බලන තෙක්. ඒ තුළ තිබෙනවා ඉතා සංවේදී කලාපයක්. එහි මහවැලි ඉඩම්, වනජීවී ඉඩම්, LRC එකේ ඉඩම් තිබෙනවා. එය දැවැන්ත අලි-මිනිස් ගැටුමකට ලක් වෙච්ච ප්‍රදේශයක්. එම නිසා අපි සොයා බැලීම සඳහා කෙටි කාලයකට ව්‍යාපෘති අත්හිටුවලා, ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කළා. ඒ විෂයය පිළිබඳ ප්‍රාමාණිකයන් එක්ක සාකච්ඡා කරලා, ගොවි ජනතාව එක්ක සාකච්ඡා කරලා ඒ solar ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන ආයෝජකයන්ට පහසුකම් සපයන්න, ඉඩම් ටික නිදහස් කරලා දෙන්න කියන තීන්දුව පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගත්තා.

ඔය කථා කරපු, ඔය තොරතුරු සපයපු මහත්වරු ප්‍රකාශ කළේ, සම්බන්ධීකරණ කමිටුවට ඇවිල්ලා ලබා ගන්නා ලද තොරතුරු නොවෙයි. ඒවා ඔය මොකක් හරි පත්තරයක හරි මාධ්‍යයක කියපු දෙයක්. ඒ මාධ්‍ය වාර්තා අනුව වැඩ කරන්න ගියොත් පාර්ලිමේන්තුව නොමඟ යනවා. එම නිසා එතුමාගේ ප්‍රකාශය අපි හෙළා දකිනවා. ජාතික අරමුණක් ඇතිව විදුලිය සැපයීම සඳහා ඒ අවශ්‍ය භූමිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රජාවට හානියක් නොවන්න, ඒ පරිසර පද්ධතියට හානියක් නොවන්න දෙන්න අපි තීන්දු කරලා තිබෙනවා. එම නිසා එතුමාගේ එම ප්‍රකාශය සහමුලින්ම අසත්‍ය, ව්‍යාජ ප්‍රකාශයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර ජයකොඩි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.50]

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මට ලොකු කනගාටුවක් තිබෙනවා මේ ගැන. මේ විපක්ෂයේ මන්ත්‍රීවරු නොයෙක් නොයෙක් විට සභාවට පැමිණෙනවා. ඊට පස්සේ නැහැ. මම උදේ කිව්වා කොහොමද අපි renewable energy develop කරන්නේ, මොන මොන පියවර යටතේද ක්‍රියාත්මක කරන්නේ කියලා. අපේ ප්‍රතිපත්තිය අනුව අවුරුදු පහෙන් renewable energy මෙගාවොට් 2,000ක් නිෂ්පාදනය කරනවා කිව්වාට, අවුරුදු දෙකකින් ඒක කරන්නේ කොහොමද, ඒවාට අදාළ projects මොනවාද, කොයි ප්‍රදේශවල ද සිදු වන්නේ කියන සියලු විස්තර මම උදේ කිව්වා. හැබැයි, හුඟක් අය අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒක TV එකෙන්වත් බලාගෙන ඉඳලා නැහැ. ඒ නිසා නැවත ඇවිල්ලා ඒකම අහනවා. ඒ නිසා ජනතාවගේ සහ පාර්ලිමේන්තුවේ කාලය කා දමන වැඩක් තමයි ඇත්තටම ගොඩක් වෙලාවට වෙන්නේ. එක පැත්තකින් කියනවා, renewable energy මිල අඩු කරන්න එපා කියලා. අනෙක් පැත්තනේ කියනවා, ආසියාවේ වැඩිම විදුලි බිල ලංකාවේ පවතින්නේ; විදුලි බිල අඩු කරන්න කියලා. ඒ තර්කය, ඒකේ අංක ගණිතය මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි, ඒ මහත්වරුන්ගෙන්. ඇත්තටම මුල ඉඳලාම ඒ වාගේ පදනම් විරහිතව තමයි කථා කළේ. උත්තර දෙන්න තරම් ලොකු ප්‍රශ්න ඉදිරිපත් වුණේ නැති හින්දාත්, උදේ ඉන්ධන ගැන අවම වශයෙන් මට කථා කරන්න ලැබුණ නිසාත් ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වනවා.

ඉන්ධන මිල අඩු කිරීම ගැන අපෙන් ප්‍රශ්න කළා. 2024 වසර තුළ වැඩිම ඉන්ධන මිල අඩු කිරීම කරලා තිබෙන්නේ අපේ ආණ්ඩුවෙන්. ඔක්ටෝන් 92 පෙට්‍රල් ලීටරයක් රුපියල් 371 ඉඳන් රුපියල් 309 දක්වා, රුපියල් 62කින් අඩු කරලා තිබෙනවා. ඔක්ටෝන් 95 පෙට්‍රල් ලීටරයක් රුපියල් රුපියල් 464 ඉඳන් රුපියල් 371 දක්වා අඩු කරලා තිබෙනවා. ඔටෝ ඩීසල් ලීටරයක් රුපියල් 363 ඉඳන් රුපියල් 286 දක්වා, රුපියල් 80කින් අඩු කරලා තිබෙනවා. සුපර් ඩීසල් ලීටරයක් රුපියල් 475 ඉඳන් රුපියල් 313 දක්වා, රුපියල් 162කින් අඩු කරලා. භූමිතෙල් ලීටරයක් රුපියල් 262 ඉඳන් රුපියල් 183 දක්වා, රුපියල් 79කින් අඩු කරලා තිබෙනවා. ඇත්තටම ඒ වාගේ අපි මිල අඩු කර තිබෙනවා. අපි බලයට ඇවිල්ලා දැනට මාස තුනයි දවස් ගණනයි ගත වෙලා තිබෙන්නේ. අපි බලය ගත්තේ අවුරුදු පහකට.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුළු විපක්ෂයෙන්ම දැන් සභාවේ ඉන්නේ, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විතරයි. ඒ නිසා අපි විවාදය කරන්න ඕනෑ ද, නැත්නම් ඡන්දය විමසමුද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම ඉන්නවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා රැඳී සිටීම ගැන අපි ගරු කරනවා. නමුත්, කාරක සභා අවස්ථාවේ වෙන් කරන කාල සීමාවෙන් විපක්ෂයට සියයට 60ක් ගන්නවා. අපි පුටුවලට කථා කරන්නද ගරු මන්ත්‍රීතුමා?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සියලු මන්ත්‍රීවරු විවාදයට සහභාගි වුණා. අපේ සියලු කථිකයන් අවසන් වනකල් හිටියා. මමත් Cut එක move කරපු මන්ත්‍රීවරයා විධියට බලාගෙන ඉන්නේ ඇමතිතුමා උත්තර දෙන කල්. මගේ ප්‍රශ්න එතුමාට මදි නම් ඒක වෙන එකක්. එක්කෙනෙක් හිටියත් ඇති.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු 66 දෙනාගෙන් තුන්දෙනෙක් දැන් ගරු සභාවේ ඉන්නවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභානායකතුමනි, ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු 159 දෙනාගෙන් කී දෙනෙක් දැන් සභාවේ ඉන්නවා ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපේ මන්ත්‍රීවරු කොච්චර ඉන්නවාද කියලා ඔබතුමා බලන්නකෝ. *[බාධා කිරීමක්]* මේක විපක්ෂයේ අවස්ථාව. *[බාධා කිරීමක්]*

මේ ගැන ආණ්ඩුවට විවාද කරන්න ඕනෑ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර ජයකොඩි අමාත්‍යතුමා කථා කරන්න.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව මන්ත්‍රීවරයෙක් ප්‍රශ්න කළා, අපේ Ceylon Petroleum Corporation එකේ සභාපතිගේ වේතනය සහ කාර්යභාරය ගැන. එතුමා නොකියන දේවල් තිබෙනවා. ඇත්තටම ගොඩක් බොරු කියනවා. ඒ වාගේම, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඇත්ත නොකියා සිටීමත් හරි ආතල් එකක් කරගෙන තිබෙන්නේ. ඒ කාලයේ සුමිත් එදිරිසිංහ කියන CPC සභාපති රුපියල් ලක්ෂයක වැටුප ගත්තා. CPSTL එකේ සභාපති උවයිස් මොහමඩ් මහත්මයා රුපියල් ලක්ෂ 5කට වැඩි වැටුපක් ලැබුවා. දැනට අපේ සභාපති ආයතන 3ක සභාපති විධියට වැඩ කරනවා. CPC, CPSTL සහ Trinco Petroleum Terminals Limited යන තුනේම සභාපති විධියට එතුමා වැඩ කරනවා. නමුත්, CPSTL එකේ වැටුප විතරයි එතුමා ලබා ගන්නේ. ඒ වාගේම, ගරු මන්ත්‍රීතුමා සීමාරහිත ඉන්ෂුවරන්ස් එකක් ගැන කථා කරලා තිබුණා. ඇත්තටම එවැනි දේවල් ආයතනයේ තිබෙනවා. හැබැයි, එතුමා ඒවායින් ශත 5ක්වත් පාවිච්චි කරලා නැහැ. එතුමාගේ දරුවන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම මෑතකදීත් වුණා. මම ඒක හොඳටම දන්නවා. එතුමා ඒ කටයුතුත් රජයේ රෝහලකින් තමයි කර ගත්තේ. ඒ නිසා අපේ දේශපාලන සංස්කෘතිය ටිකක් වෙනස්. ඒ නිසා හැම කෙනෙක්ම දිහා බලන විධියට අපි දිහාත් බලන්න එපා. ඒ කෝණයෙන් බලන එක පොඩ්ඩක් වෙනස් කර ගත්තොත් හොඳයි කියලා මම හිතනවා. මොකද, ඉදිරියේදී අපි තව ටිකක් පැහැදිලිව අපේ කැප කිරීම් පෙන්වනවා.

ඊළඟට තව මන්ත්‍රීවරයෙක් ඇහුවා, විදුලිබල ක්ෂේත්‍රයේ හබරණ කප්පල්තුරෙයි කිලෝවොට් 220ක සම්ප්‍රේෂණ මාර්ගය ගැන. ඒක ඇත්තටම ඉදිකරන්න ඕනෑ කියලා කිව්වා. දැන් ඒකේ මූලික වැඩ කටයුතු සිදු වෙමින් පවතිනවා. ඒකට අරමුදල් සපයන්නේ AIIB එකෙන්. ඒකේ අනුමත කිරීම් ආදී කටයුතු ප්‍රමාද වෙලා තිබෙනවා. ඒවා වෙනකම් අපි බලාගෙන ඉන්නවා. අපි ඒකේ මූලික කටයුතු දැන් සූදානම් කර තිබෙන්නේ. එ් වාගේම, හබරණ battery storage එක හම්බන්තොට කරන්න කටයුතු ආරම්භ කරගෙන යනවා. ඒ වාගේම, කොලොන්නාවේ මෙගාවොට් 100ක battery storage එකේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කරලා තිබෙන්නේ, ADB ආධාර යටතේ. ඒ වාගේම, වික්ටෝරියා බලාගාරය සංවර්ධනය කිරීම සහ අමතර ටර්බයිනයක් සවි කිරීම පිළිබඳ මූලික අධ්‍යයන කටයුතු කරගෙන යනවා. දැනට අපි මාඔය හරහා වික්ටෝරියා සහ රන්දෙනිගල pumped-storage hydropower plant එකක් පටන් ගන්න design එක මේ දවස්වල කරගෙන යනවා. එහි feasibility study එක කරලා ඉවරයි. වික්ටෝරියා සහ රන්දෙනිගල ගැනත් අපි අවධානය යොමු කර තිබෙනවා.

ඒ වාගේම, තව මන්ත්‍රීවරයෙක් ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය ගැන ප්‍රශ්න කළා. 2025 ජූනි 27වන දා වෙනකොට එය අවසන් කරන්න අවශ්‍ය මූලික කටයුතු අපි සිදු කර තිබෙනවා. ඒ වාගේම, stakeholder consultation සහ public consultation බොහෝ දුරට අවසන් කර තිබෙනවා. මේ දවස්වල ඒවා ටික review කරගෙන final කෙටුම්පත හදාගෙන යනවා. ඒක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, ඊට පස්සේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම ප්‍රශ්න කළා, ඩීසල් විදුලි බලාගාරවලින් විදුලිය මිලට ගැනීම හෝ හදිසි මිලදී ගැනීම්වලට යනවා ද කියලා. මම පසුගිය සෙනසුරාදාත් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අසන ලද මෙවැනිම ප්‍රශ්නයකට උත්තර දුන්නා. මොකද, අපිට එවැනි කිසිම වුවමනාවක් නැහැ හදිසි මිලදී ගැනීම්වලට යන්න. ඒ වාගේම, මේ දවස්වල වුණත් renewable energy මදි වුණාම, අපි පළමුවෙන්ම CEB එකේ හරි ඩීසල් විදුලි බලාගාරයකින් ගන්නවා නම් අපි අඩුම මිල තමයි ගන්නේ. ඒක CEB එකේ වුණත් එහෙමයි. CEB එකේත් ඩීසල්වලින් දුවන විදුලි බලාගාර තිබෙනවා. ඒවායේත් අඩුම මිල හොයලා අපි ඒ විධියට තමයි ගන්නේ. මමත් ඒක දිනපතා monitor කරනවා. මොකද, මමත් මගේ ජංගම දුරකථනයට daily arrangements ටික ගෙන්වා ගන්නවා. ඇත්තටම අපි ඒක බලාගෙනයි ඉදිරියට යන්නේ. ඉස්සර කාලයේ කොහොමද වුණේ කියලා මම දන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමාට ඒ සම්බන්ධයෙන් සැකයක් ඇති. ඒ වුණාට ඒක එහෙම නොවෙන්න අපි වැඩ කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට නියමිතව තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
හොඳයි.

ඇත්තටම solar with battery කියන එක ගැනත් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ මුලින්ම වාගේ තිබෙනවා. අපි policy එකක් විධියට ඒක හඳුනාගෙන තිබෙනවා.

අපි දැන් ඒකට tariff එකක් හදාගෙන යනවා. ඒක බොහොම promotional tariff එකක් වෙයි. ඇත්තටම ඒකට investorsලා එන තරමට අපිත් කැමැතියි. අපි ඒක ඉදිරියෙන්ම ක්‍රියාත්මක

කරනවා. මොකද, invest කරන අයට ලාභදායී විධියට අපි ඒක කරන්න ඉදන්නේ. ඒගොල්ලන් දවල්ට charge කරලා, රාත්‍රියට අපේ Grid එකට දෙන විධියට තමයි සකස් කරන්නේ. ඒ ගොඩක් කටයුතු දැන් අවසන්. ඒකට committee එකක් පත් කරලා තිබෙනවා. ඒකෙන් ඒ කටයුතු කරගෙන යනවා. ඒක finalize කරලා, කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අපි ඒක එළියට දමනවා.

බොහෝ දෙනෙක් කථා කළා, proposals වගයක් ගැන. ඒක 2022 පෙබරවාරිවල සිට තිබෙන දෙයක්. හිටපු නියෝජ්‍ය ඇමතිවරු දන්නවා ඇති, ඒවා ටිකක් පැටලිලි සහගතයි. ඒවා Act එකට විරුද්ධව අරගෙන තිබෙන්නේ. මොකද, මෙගාවොට් 10ට අඩු ඒවා special PPA එකක් හරහා කරන්න තිබෙනවා. ඒ විධියට තමයි නීතියේ තිබෙන්නේ. මෙගාවොට් 10ට වැඩි ඒවා bid කරන්න ඕනෑ. එහෙම තමයි නීතියේ තිබිලා තිබෙන්නේ. හැබැයි, මේ ඔක්කොම එක ගොඩේ අරගෙන තිබෙනවා.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.ඒ. චානක)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් உறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපි පස් වරු 6.00ටම සභාවේ කටයුතු අවසන් කළ යුතුයි. තව තත්පර කිහිපයයි තිබෙන්නේ.

ගරු කුමාර ජයකොඩි මහතා
(මාණ්පුමිකු කුමාර ජයකොඩි)
(The Hon. Kumara Jayakody)
අපි ඒකට කැබිනට් අනුකමිටුවක් පත් කර තිබෙනවා. අපි ඉක්මනින්ම ඒ කටයුතු විසඳනවා. මොකද, අපි බලයට පත් වෙලා තවම මාස 3යි. ඒක අවුරුදු 2ක් පැරණි ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය අපි මත පවරන්න බැහැ. අපටත් ඒක විසඳන්න වුවමනායි. අපටත් ඒක headache එකක් වෙලා තිබෙන්නේ. Investorsලා එතැන හිරවෙලා ඉන්නවා. අපි ඒකට කැමැති නැහැ. Public-private partnershipsවලට අපි බොහොම කැමැතියි. මොකද, මේක ගොඩ දමන්න නම් ඒ investorsලා ඉන්න ඕනෑ. ඒ නිසා අපි ඒවා අනිවාර්යයෙන් කරනවා.

බොහොම ස්තුතියි.

" 119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 598,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 25,000,000

" 119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 25,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 463,000,000

"119 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 463,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 20,056,000,000

" 119 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 20,056,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" තලෛප්පු 119, නිකழ්ච්චිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඞ් සෙලවුක්කාන රූපාය් 598,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප් පඩුමාක" එනුම් විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 119, නිකழ්ච්චිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඞ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

නිකழ්ච්චිත්තිට්ටම් 01.- සෙයල්මුරෛච් සෙයර්පාටුකළ් - මූලතනච් සෙලවු, රූපාය් 25,000,000

" තලෛප්පු 119, නිකழ්ච්චිත්තිට්ටම් 01, මූලතනච් සෙලවුක්කාන රූපාය් 25,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පඩුමාක" එනුම් විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 119, නිකழ්ච්චිත්තිට්ටම් 01, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

නිකழ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් සෙයර්පාටුකළ් - මීණ්ඩුවරුඞ් සෙලවු, රූපාය් 463,000,000

"තලෛප්පු 119, නිකழ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඞ් සෙලවුක්කාන රූපාය් 463,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප් පඩුමාක" එනුම් විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 119, නිකழ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඞ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

නිකழ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් සෙයර්පාටුකළ් - මූලතනච් සෙලවු, රූපාය් 20,056,000,000

"තලෛප්පු 119, නිකழ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් සෙලවුක්කාන රූපාය් 20,056,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පඩුමාක" එනුම් විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 119, නිකழ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 598,000,000, for Head 119, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 25,000,000

Question, "That the sum of Rs. 25,000,000, for Head 119, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 463,000,000

Question, "That the sum of Rs. 463,000,000, for Head 119, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 20,056,000,000

Question, "That the sum of Rs. 20,056,000,000, for Head 119, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 04 වන අඟහරුවාදා.

අප්පොழුது பி. ப. 6.00 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 மார்ச் 04, செவ்வாய்க்கிழமை.

It being 6.00 p.m., the Hon. Presiding Member left the Chair to report Progress.

Committee report Progress; to sit again on Tuesday, 04th March, 2025.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ශීර්ෂ අංක 119 සංශෝධන රහිතව කාරක සභාවේදී සම්මත වූ බව ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එදිත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ජාතික තරුණ සේවා සභාව ප්‍රතිසංවිධානය කිරීම
தேசிய இளைஞர் சேவைகள் மன்றத்தை மீளமைத்தல்
REORGANIZATION OF NATIONAL YOUTH SERVICES COUNCIL

[අ.භා. 6.01]

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ජාතික තරුණ සේවා සභාව, එහි ශාඛා සහ යොවුන් සේනාංකය වැනි ආයතන දැනුම, නිපුණතාව, විනය සහිත ක්‍රියාශීලී නවීන තරුණ නායක නායිකාවන් බිහි කිරීම හා සමායෝජනය කිරීම අරමුණු කොටගෙන රජයට අනුබද්ධව තාරුණ්‍යය වෙනුවෙන් පිහිටුවා ඇති ආයතන වේ.

බලසතු වූ ශ්‍රී ලාංකික තරුණයෙක්' යන දැක්මෙන් හා 'දේශීය හා ජාත්‍යන්තර අවස්ථා උපයෝගීකොටගෙන ජීවිත අභියෝග සඳහා මුහුණ දීමට ශ්‍රී ලාංකීය තාරුණ්‍ය සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම' යන්න මූලික මෙහෙවර කරගනිමින් කටයුතු කරන ජාතික තරුණ සේවා සභාව පසුගිය වකවානුවේ මෙම අරමුණ ඉෂ්ට වන ආකාරයෙන් කටයුතු සිදු කළාද යන ගැටලුව ඇත.

එම නිසා, තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම, ඔවුන්ගේ නායකත්ව කුසලතා වර්ධනය කිරීම, ව්‍යක්තීය පුහුණුව ලබා දීම සහ විවිධ සමාජ සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි කාර්යයන් සිදු කරන ආයතන වන මෙවා වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තාරුණ්‍යය සඳහා අරමුණ කර ගත් 'නෘප්තිමත් තාරුණ්‍යයක් වෙනුවෙන්' කටයුතු කළ හැකි ආකාරයට ප්‍රතිසංවිධානය කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළව කරුණු කිහිපයක් මතු කරන්න මම කැමැතියි. හැම දාම හිටපු පාලකයන් මේ තාරුණ්‍යය අවභාවිත කළා. සමහරු ආවා තරුණ්‍යයට හෙටක් දෙන්න. හැබැයි, තාරුණ්‍යයට හෙටක් දෙන්න ඇවිල්ලා, පොටක් පාදාගෙන රටක් හෑවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරණයට කලින් රුපියල් මිලියන 100ක් තරුණ සේවා සභාවේ ගිණුමට ගෙනැල්ලා, ඒවාට වෙක් ලියලා තමන්ගේ ඡන්ද campaign එකට පාවිච්චි කළා. මේ මුදල් අවභාවිත කළා. අපි කවුරුත් දේශපාලනය කරන්න ඕනෑ. කිසි ගැටලුවක් නැහැ, දේශපාලනය කරන්න ඕනෑ. හැබැයි, දේශපාලනය වෙනුවෙන් ජනතාවගේ මුදල් - මහජන මුදල් - අවභාවිත කරන්න බැහැ.

ඒ නිසා මේවා නැවත වෙනස් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංගප්පූරුවේ 1970 වසරේ මුල Boys' Brigade එක හැදුවා. මොකටද? රටේ සංවර්ධනය සඳහා තරුණ ජවය එකතු කර ගන්න. මේ වෙනකොටත් ලංකා ආණ්ඩුවට එවැනි උපකරණ තිබෙනවා; ආයතන තිබෙනවා. දැන් තරුණ සේවා සභාව තිබෙනවා. කාලයක් තිස්සේ රටේ ක්‍රියාත්මක වෙච්ච එවැනි ආයතන තිබෙනවා. මේ ආණ්ඩුව ඒ වෙනුවෙන් රුපියල් මිලියන 4,000ක් විතර වෙන් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. මේ අය වැය තුළින් ආර්ථික, සේවා හා ව්‍යවසායකත්වය වඩා හොඳ තැනකට අරගෙන එන්න සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හදන්න, තරුණ ව්‍යවසායකයන් හදන්න රුපියල් බිලියන 38.6ක් වාගේ ලොකු මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ ඇයි? මාලිමා ආණ්ඩුවට ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තියේ මූලධර්ම තිබෙනවා. එනම්, තරුණ ප්‍රජාව ආර්ථික ක්‍රියාවලියේ සක්‍රිය පංගුකරුවන් කර ගැනීම, පීඩන, සූරාකෑම් හා වෙනස්කොට සැලකීම්වලින් තොරවීම, තරුණයන් සමාජ අභිවෘද්ධියට දායක කර ගැනීම, විද්‍යාව හා නවීන තාක්ෂණයේ දියුණුව ඒ අයට ලබා දීම, සමාජ අභියෝග ජය ගැනීමේ අභිලාෂය ඇති කිරීම, දේශපාලන, සමාජ හා ආර්ථික ක්‍රියාවලියට නායකත්වය සැපයිය හැකි තරුණ ප්‍රජාවක් නිර්මාණය කිරීම, සංස්කෘතික ජීවිතය හා නිදහස් චින්තනය, ජාතික හා ජාත්‍යන්තර නායකත්වය දැරීමට සමත් සුහුරු කුසලතා සහිත තරුණ ප්‍රජාවක්, සමාජ අසාධාරණය පිටු දකින තරුණ ප්‍රජාවක් හදන්න ඕනෑ කියන අරමුණු මාලිමා ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඇතුළේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම ගෞරවයෙන් මේ සභාවට යෝජනාවක් කරනවා. මේ රටේ නීලකාස හොරු, මහජන මුදල් මංකොල්ල කාපු තක්කඩින් විසින් තරුණයන් වෙනුවෙන් තිබෙන මේ ආයතන විනාශ කරලා තිබෙනවා. ඒ නිසා මේ මහජන ආයතන, තරුණයන්ගේ ආයතන, මහජන මුදලින් නඩත්තු වෙන ආයතන නැවත මහජන සේවය වෙනුවෙන් කැඳවන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යළි මහජන සේවය වෙනුවෙන් කැඳවන්න ඕනෑ. ඔවුන්ගේ දරුවන්ගේ සේවය වෙනුවෙන් කැඳවන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් කැප වෙලා, මහන්සි වෙලා වැඩ කරන්න ඕනෑ. ඒ අරමුණින් තමයි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.06]

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වන්දිම හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ වාගේම මාත් ඒ ගැන පොඩි අදහසක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. අපේ ගරු වන්දිම හෙට්ටිආරච්චි පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට තරුණ සේවා සභාව, එහි ශාඛා, යොවුන් සේනාංකය වැනි ආයතන පිහිටුවා බලාපොරොත්තු වුණු මූලික අරමුණු කිහිපයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අතර, තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම, නායකත්ව කුසලතා වර්ධනය කිරීම, ව්‍යෘත්තීය පුහුණුව ලබා දීම, විවිධ සමාජ සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි කරුණු තිබෙනවා. අපි ආපස්සට හැරිලා බැලුවොත්, තරුණයන් සවිබල ගැන්වීම සඳහා ඉදිරිපත් කරලා තිබෙන මේ යෝජනා සියයට 100ක් සාර්ථක වුණාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. අසාර්ථකම වුණා කියලා අපි කියන්නේ නැහැ. යම් ප්‍රමාණයක් සාර්ථකයි. නමුත් අද ලෝකයේ තාරුණ්‍යය ඉන්න තැනත්, අපේ තාරුණ්‍ය ඉන්න තැනත් බැලුවොත්, අපේ තාරුණ්‍යයේ විශාල පසුබෑමක් තිබෙනවා. අනෙක් පැත්තෙන් අපේ තාරුණ්‍ය කොතැනද ඉන්නේ කියන එක පිළිබඳව අපට විශාල කනගාටුවක් තිබෙනවා. තරුණයා කියන්නේ ලෝකය කලින් දකින, ලෝකය වෙනස් කරන්න පුළුවන් ජවයක්, ශක්තියක් තිබෙන කොටසක්. ඔවුන්ගේ ජවය, ශක්තිය, නිර්මාණශීලිත්වය අපි අපේ රටේ සංවර්ධනය සඳහා යොදා ගත්තාද කියන ප්‍රශ්නය අප ඉදිරියේ තිබෙනවා. මේ මොහොතේ උපරිම ආකාරයට මේ රටේ සංවර්ධනය සඳහා තාරුණ්‍යයේ දායකත්වය ලබාගන්න හොඳ පාලනයක් ගොඩනැඟිලා තිබෙනවා.

අපි මෑත ඉතිහාසය දෙස බැලුවොත්, 1948දී ඩන්කන් වයිට්, 2000දී සුසන්තිකා ජයසිංහ තාරුණ්‍යයේ ජවය සහිතව ලෝකයේ ඔලිම්පික් ක්‍රීඩා උළෙල තුළ යම් ජයග්‍රහණ ගත්තා. ඒ වාගේම අපි 1996දී එක්දින ලෝක කුසලාන තරගාවලියේ, ඒ වාගේම T20 තරගාවලියේ ජයග්‍රහණ ලබා ගත්තා. ඒ හැරෙන්නට අපේ තාරුණ්‍යය ලෝකය තුළ ජයග්‍රහණය කරලා, ලෝකයේ තබා තිබෙන සලකුණ මොකක්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. අපේ තාරුණ්‍යය ලෝකයේ රටවලට ශ්‍රමය විකුණන පිරිසක් බවට පත් වෙලා තිබෙනවා. ටයිල් වැඩට, මේසන් වැඩවලට යන, කෘෂිකාර්මික වැඩවලට යන පිරිසක් බවට අපේ තාරුණ්‍ය පත් වෙලා තිබෙනවා.

ඇයි අපට බැරි, අපේ තරුණ ප්‍රජාව අපේ රට තුළ රඳවා ගෙන, ඔවුන්ගේ නිර්මාණශීලි හැකියාව අපේ රටේ නිෂ්පාදනයට අරගෙන, මේ රටේ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කරන්නට? එහෙම කරලා ලෝකය තුළ අපේ රට පිළිබඳ සලකුණක් තබන්න පුළුවන් ජන කොටසක් නිර්මාණය කරන්න අපට බැරිද? නාසා ආයතනය තුළ ශ්‍රී ලාංකිකයන් විද්‍යාඥයන් විධියට සේවය කරනවා නම්, ශබ්දයේ වේගයටත් වඩා වැඩි වේගයෙන් ගමන් කරන ලෝකයේ තිබෙන කෆිර් වැනි යානා මෙහෙයවන්න පුළුවන් ශක්තිමත් තාරුණ්‍යයක් තිබෙන ගුවන් නියමුවන් බිහි කරන්න අපේ රටට පුළුවන් නම්, ඇයි ඒ තාරුණ්‍යයේ ජවය අපේ රටට ගන්න බැරි?

අපි දැක්කා, පසුගිය කාල වකවානුවල මේ ආයතන පාලනය කරපු පාලකයන් සිදු කර තිබෙන දේවල්. කෝප් එකේදී ඉදිරිපත් වුණු යම් යම් කරුණු තුළිනුත් අපට පෙනී ගියා, මේ රටේ තාරුණ්‍යය වෙනුවෙන් වෙන් කර තිබුණු මුදල් පසුගිය කාලයේ මොන විධියට කාබාසිනියා කර තිබෙනවාද, පසුගිය රජයන් විසින් තමන්ගේ හිතවතුන් වෙනුවෙන්, දේශපාලන ගෝලයන් වෙනුවෙන් ඒ මුදල් භාවිත කර තිබෙන්නේ මොන ආකාරයටද කියා. විශේෂයෙන්ම අපි මේ අය වැය තුළින්, ඒ වාගේම, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" වෙනුවෙන් අප ඉදිරිපත් කරපු ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති මාලාව තුළින් අපේ තාරුණ්‍යයට විශේෂ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ මෙහෙවර වන්නේ, අපේ දැක්ම වන්නේ තෘප්තිමත් තාරුණ්‍යයක් නිර්මාණය කිරීමයි. හැම පැත්තෙන්ම සතුටු වෙන, හැම පැත්තෙන්ම නිර්මාණශීලිත්වයකට අරගෙන යන්න පුළුවන් හොඳ තාරුණ්‍යයක් නිර්මාණය කිරීමයි අපේ වගකීම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද සභාව කල්තබන අවස්ථාවේ ගරු වන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා තාරුණ්‍යය වෙනුවෙන් ඉදිරිපත් කළ මෙම යෝජනාව, කාලීන යෝජනාවක්. විශේෂයෙන්ම අල්ලස, දූෂණය, වංචාව, හොරකම නතර කරලා මේ රටේ තරුණ පිරිසට හොඳ රටක් නිර්මාණය කිරීම මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වගකීමක්. ඒ නිසා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අපි ඉල්ලා සිටිනවා, අපේ රටේ තාරුණ්‍යයට ලෝකය ජය ගන්න පුළුවන් හොඳ තාරුණ්‍යයක් බවට පත් කරන්න අවශ්‍ය මැදිහත්වීම, නායකත්වය ලබා දීමට කටයුතු කරමු කියා. ඒ ආදරණීය,

[ගරු සුජීව දිසානායක මහතා]

ගෞරවනීය ඉල්ලීම කරමින් අපේ ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව කාලීන යෝජනාවක් බව නැවත වතාවක් මතක් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු සුනිල් කුමාර ගමගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 6.10]

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා විසින් ශක්තිමත්, තෘප්තිමත් තාරුණ්‍යයක් වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව මෙහෙයවන්නය කියන කාරණය වෙනුවෙන් ඉදිරිපත් කළ මේ කාලීන යෝජනාව මම හිතන විධියට අද දවසේ අපට සාකච්ඡා කරන්න තිබෙන හොඳ යෝජනාවක්; හොඳ අදහසක්.

විශේෂයෙන්ම මේ වාගේ ආයතනයක් ජාතියේ තරුණයා ගොඩනඟන්න පාවිච්චි කරන්නය කියලා මන්ත්‍රීවරයෙකුට යෝජනාවක් විධියට ඉල්ලන්න වෙලා තිබෙන්නේම, ඉතිහාසය පුරාම මේ ආයතනවල සිද්ධ වුණු දේවල් නිසායි. මේ ආයතන පිහිටුවීමේ මූඛ්‍ය පරමාර්ථය, අරමුණු, මේ අයතනවලින් රටට වෙන්න ඕනෑ සේවය අතීතයේදී නිසි අයුරින් ඉෂ්ට නොවුණු නිසා තමයි මම හිතන විධියට අද අපේ මන්ත්‍රීවරයෙකුට මේ වාගේ ඉල්ලීමක් මේ ආයතනය වෙනුවෙන් කරන්න වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම යොවුන් සේනාංකය කියන්නේ, ජාතික තරුණ සේවා සභාව කියන්නේ ලංකාවේ තාරුණ්‍යය දියුණු කිරීම වෙනුවෙන් පවතින ආයතන දෙකක්. දැක්මක් සහිත නිර්මාණශීලී කුසලතාවෙන් පිරි තරුණ ප්‍රජාව නිර්මාණය කිරීමේ වගකීම තිබෙන ආයතන දෙකක් විධියට පවතින මේ ආයතන දෙකෙන් ඒ රාජකාරිය ඉෂ්ට වුණාද, ඒ වාගේම, මේ ආයතන දෙක තුළින් අපේ රටේ තාරුණ්‍යය ගොඩනැඟුවාද කියන ප්‍රශ්න අදටත් අපට තිබෙනවා. අපි දන්නවා, පසුගිය ආණ්ඩු විසින් මේ ආයතන පාවිච්චි කළේ, තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රවලට අනුකූලව බව. එම න්‍යාය පත්‍ර වෙනුවෙන් වැඩ කිරීම සඳහා තමයි මේ ආයතන බොහොමයක් පාවිච්චි වුණේ. අපේ පළමුවැනි කෝප් රැස්වීමේදීත් අපි දැක්කා, රුපියල් මිලියන පන්සිය ගණනක වියදමක් කරමින් සංගීත සන්දර්ශන ආදිය පවත්වපු කාරණාවක් ගැන සාකච්ඡා වෙනවා. ඒවායෙන් අපට පැහැදිලි වෙනවා, ඒ ආයතන සහ ඒ මුදල් පාවිච්චි කර තිබෙන්නේ මොන වාගේ අරමුණුවලටද කියලා.

ඒ නිසා අතිශයින්ම දේශපාලනීකරණය වෙච්ච ආයතනත්, ඒ ආයතනවලින් රටේ තාරුණ්‍යය බලාපොරොත්තු වෙන අරමුණු ඉෂ්ට නොවීම පිළිබඳවත් අවබෝධ කරගෙන, ඒ ගැන හදරා ඒ වෙනුවෙන් අපි වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. අපි මේ සැලසුම් හදන්නේම ඒ නිසායි. අපි තේරුම් ගත්තා, මේ රාජ්‍යයේ බලය අපි ගන්නකොටම අපේ රටේ තරුණයන් අතර විශාල ප්‍රශ්නයක් තිබෙන බව. ඒ ප්‍රශ්නය ගොඩ නැඟෙන්නේ විවිධ පැතිවලින්. හතර අතින් කඩා වැටුණු රටක් තුළ ආර්ථිකයත් කඩා වැටෙනකොට තරුණයාට ඒක බලපානවා. අධ්‍යාපනය කඩා වැටෙනකොට තරුණයාට ඒක බලපානවා. සංස්කෘතිය බිඳ වැටෙනකොට තරුණයාට ඒක බලපානවා. සෞඛ්‍යය බිඳ වැටෙනකොට තරුණයාට ඒක බලපානවා. මේ සියලු කාරණා බිඳ වැටෙනකොට අපේ රටේ තාරුණ්‍යයට ඒවා විශාල ගැටලු විධියට මතු වෙලා තිබුණා. ඒ නිසා අපි සැලසුම් කරලා තිබෙනවා, මෙන්න මේ හුදෙකලා වුණු තරුණයා නැවත ගොඩ නඟන්නේ කොහොමද කියන කාරණය.

මීට පෙර අපේ රාජ්‍යය තුළ එහෙම සැලසුමක් තිබුණේ නැහැ. තරුණයා සම්පූර්ණයෙන් අමතක කරලායි තිබුණේ. තරුණයන්ගේ දක්ෂතා හඳුනා ගන්න අපට ක්‍රමයක් තිබුණේ නැහැ. ඒ නිසා අපේ ආණ්ඩුවේ, අපේ අමාත්‍යාංශයේ වගකීමක් විධියට මෙන්න මේ හුදෙකලා වෙච්ච තරුණයා නිවැරදිව හඳුනා ගන්නේ කොහොමද, තාරුණ්‍යයට නිසි තැන ලබා දෙන්නේ කොහොමද කියන කාරණාව පිළිබඳව අපි විශාල සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඒ නිසාම තරුණයන් ජාලගත කිරීමේ වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබෙනවා. විශේෂයෙන්ම සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ඉලක්ක කරගෙන අපි ගොඩ නඟන තරුණයන් එකතු කරන මධ්‍යස්ථාන හරහා හෙට දවසේ ඔවුන්ගේ ගැටලු නිරාකරණය කර ගන්න, හුදෙකලාභාවයෙන් මිදෙන්න අවශ්‍ය පියවර අපි මේ වෙනකොටත් සැලසුම් කරලා තිබෙනවා.

ඒ තුළින් අපි තරුණයන්ගේ ව්‍යවසායකත්වය දියුණු කරන්න, ක්‍රීඩා කුසලතා නංවන්න කටයුතු කරනවා. ඒ වාගේම ඔවුන්ගේ දැනුම -විශේෂයෙන්ම ඉංග්‍රීසි භාෂාව, IT දැනුම- වර්ධනය කර ගැනීමේ වැඩ පිළිවෙළක් ද අපි තරුණ සේවා සභාව හරහා හදලා තිබෙනවා, නිර්මාණය කරලා තිබෙනවා. ඒ තුළින් අනාගතයට ශක්තිමත්, ධෛර්යයවත් තරුණයෙක් ගොඩනඟන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම තරුණ සේවා සභාව හරහා ඔවුන්ගේ කලා කුසලතා ඔප්නැංවීම වෙනුවෙන් නොයෙක් සංස්කෘතික වැඩසටහන් අපි නිර්මාණය කරලා තිබෙනවා. මොකද, නිර්මාණශීලි, ක්‍රියාශීලි, ක්‍රීඩාශීලි, දැනුම සහිත, දියුණු සංස්කෘතියක් සහිත තරුණයෙක් නිර්මාණය කිරීමේ සම්පූර්ණ වගකීම අප සතුව තිබෙනවා.

තරුණයා ගොඩ නැඟීමේ කටයුත්ත පැකේජ් එකක් විධියටයි තිබෙන්නේ. ඒ පැකේජ් එක අපි අමාත්‍යාංශයක් විධියට සහ ආයතනයක් විධියට භාරගෙන තිබෙනවා. අපේ රටේ තාරුණ්‍යයට මෙතෙක් අපේ රටේ නොතිබුණු අවස්ථාවක්, තාරුණ්‍ය විඳින්න අවස්ථාවක්, ජීවිතය විඳින්න අවස්ථාවක්, ලස්සන රටක ජීවත් වෙන්න අවස්ථාවක් අපේ සැලසුම් තුළින් උදා කර දෙනවා කියන පොරොන්දුව දෙමින්, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිගනිමින්, ඒ වෙනුවෙන් එකහෙළා අපේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව සපථ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.17ට, 2025 පෙබරවාරි 21 වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 04 වන අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி, பி. ப. 6.17 மணிக்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 04, செவ்வாய்க்கிழமை மு. ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.17 p.m. until 9.30 a.m. on Tuesday, 04th March, 2025 pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 318 - இல. 05
Volume 318 - No. 05

2025 මාර්තු 04වන අඟහරුවාදා
2025 மார்ச் 04, செவ்வாய்க்கிழமை
Tuesday, 04th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 04වන අඟහරුවාදා
2025 மார்ச் 04, செவ்வாய்க்கிழமை
Tuesday, 04th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [පිටුව 770]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 772-786]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සහ ඩිජිටල් සේවා අපනයන මත යෝජිත බදු [පිටුව 786]

මන්නාරම දිස්ත්‍රික්කයේ ක්‍රීඩා පිටිවල ඉදිකිරීම් කටයුතු:
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 797]

2025 අය වැය මඟින් යෝජිත වෛද්‍යවරුන් සඳහා වන වැටුප් සහ දීමනා වැඩි කිරීම:
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 805]

ගරු ගයන්ත කරුණාතිලක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම [පිටුව 811]

ගරු හර්ෂණ රාජකරුණා මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම [පිටුව 812]

ගරු කිංස් නෙල්සන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම [පිටුව 813]

වරප්‍රසාද යෝජනා:
2025.03.02 දින "සති අග අරුණ" පුවත් පත් වාර්තාව [පිටුව 814]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 – [දොළොස්වන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 130, 253-279, 312-319, 321 (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන); ශීර්ෂ 193, 221, 328 (කම්කරු)] - කාරක සභාවේදී සලකා බලන ලදී [පිටු 814-989]

කල්තැබීමේ යෝජනාව:
රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් [පිටු 990-998]

பிரதான உள்ளடக்கம்

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 770]
வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 772-786]
தனி அறிவித்தல் மூல வினா:
நிகழ்நிலை காப்புச் சட்டத்தைத் திருத்துதல் மற்றும் டிஜிட்டல் சேவை ஏற்றுமதி மீதான உத்தேச வரி [ப: 786]
மன்னார் மாவட்டத்தில் விளையாட்டு மைதானப் பணிகள்:
இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரினது கூற்று [ப: 797]
2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்பட்ட வைத்தியர்களின் சம்பளம் மற்றும் கொடுப்பனவுகளின் அதிகரிப்பு:
சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று [ப: 805]
மாண்புமிகு கயந்த கருணாதிலக்கவினது சொந்த விளக்கம் [ப: 811]
மாண்புமிகு ஹர்ஷண ராஜகருணாவினது சொந்த விளக்கம் [ப: 812]
மாண்புமிகு கிங்ஸ் நெல்சனினது சொந்த விளக்கம் [ப: 813]
சிறப்புரிமைப் பிரேரணைகள்:
2025.03.02ஆம் திகதிய “சதி அக அருண” பத்திரிகை அறிக்கை [ப: 814]
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட பன்னிரண்டாம் நாள்]:
[தலைப்புக்கள் 130, 253-279, 312-319, 321(பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி); தலைப்புக்கள் 193, 221, 328 (தொழில்)] - குழுவில் ஆராயப்பட்டது [ப: 814-989]
ஒத்திவைப்புப் பிரேரணை:
இரத்தினபுரி மாவட்டத்தில் வெள்ளப்பெருக்கைக் கட்டுப்படுத்துவதற்கான முறையான நிகழ்ச்சித்திட்டம் [ப: 990-998]

PRINCIPAL CONTENTS

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 770]
ORAL ANSWERS TO QUESTIONS [Cols. 772-786]
QUESTION BY PRIVATE NOTICE:
Amendment of Online Safety Act and Proposed Tax on Digital Service Exports [Col. 786]
CONSTRUCTION WORK OF PLAYGROUNDS IN MANNAR DISTRICT:
Statement by Minister of Youth Affairs and Sports [Col. 797]
INCREASE OF SALARIES AND ALLOWANCES PROPOSED BY BUDGET, 2025 FOR DOCTORS:
Statement by Minister of Health and Mass Media [Col. 805]
PERSONAL EXPLANATION BY HON. GAYANTHA KARUNATHILLEKA [Col. 811]
PERSONAL EXPLANATION BY HON. HARSHANA RAJAKARUNA [Col. 812]
PERSONAL EXPLANATION BY HON. KINS NELSON [Col. 813]
PRIVILEGE MOTIONS:
News Report in "Sathi Aga Aruna" Newspaper of 02.03.2025 [Col. 814]
APPROPRIATION BILL, 2025 – [Twelfth Allotted Day]:
Considered in Committee - [Heads 130, 253-279, 312-319, 321 (Public Administration, Provincial Councils and Local Government); Heads 193, 221, 328 (Labour)] [Cols. 814-989]
ADJOURNMENT MOTION:
Systematic Programme for Flood Mitigation in Ratnapura District [Cols. 990-998]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 04වන අඟහරුවාදා
2025 மார்ச் 04, செவ்வாய்க்கிழமை
Tuesday, 04th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2021/2022 වර්ෂය සඳහා සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2019 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(v) 2023 වර්ෂය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(vi) 2023 වර්ෂය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(vii) 2023 වර්ෂය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(viii) 2019 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු (ආචාර්ය) වී.එස්. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

Hon. Speaker, I present a petition from Mr. T.K.M. Maddumabandara of No. 70, Gemunupura, Magasthota, Nuwara Eliya.

ගරු තිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) යක්කලමුල්ල, නබදව, ඉහළ මුලන යන ලිපිනයෙහි පදිංචි දොඩම්පෙ ගමගේ චන්ද්‍රසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බද්දේගම, ගනේගම උතුර, දීනමුල්ලවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. සිරිල් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) යක්කලමුල්ල, බෙරණගොඩ, ඉමදුව පාර, අංක 239/2 දරන ස්ථානයෙහි පදිංචි එන්.ටී. සුනිල් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) ගාල්ල, මාඉටිපේ, පළමු පටුමග, අංක 64/15 දරන ස්ථානයෙහි පදිංචි එස්.පී. සුමනසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) වාරියපොල, වැව ඉහළ මාවත, 'සුසිල්' සෙවන' යන ලිපිනයෙහි පදිංචි සී.එච්.එම්. පාලිත චන්ද්‍රසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පොල්පිතිගම, හත්පොකුණ, මහයාය යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) වාරියපොල, විලාකටුපොත, කුරුණෑගල පාර යන ලිපිනයෙහි පදිංචි ජේ.ඒ. චන්ද්‍රා අනුර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) කනත්තේවැව, හබරව යන ලිපිනයෙහි පදිංචි වයි.එම්. පුෂ්පානන්ද යාපා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුනිල් බියන්විල මහතා
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)

ගරු කථානායකතුමනි, දඹුල්ල, දඹුලු ඔය, මොරගොල්ලෑව වත්ත, 05වැනි පටුමග, අංක 139/3 දරන ස්ථානයෙහි පදිංචි එන්.එම්. දයාවංශ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු මංජුල සුගත් රත්නායක මහතා
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)

ගරු කථානායකතුමනි, අම්පාර, නවගම්පුර, 09 මාවත, 03 වැනි පටුමග, අංක 15 බී දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්. මද්දුම බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -481/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

කහපොල, රෙජීඩෙල්වත්ත ඉඩමේ ශාක්‍ය රාජධානියේ අනුරුවක් ඉදිකිරීම: වර්තමාන තත්ත්වය
கஹபொல, ரெஜிடேல் தோட்டத்தில் சாக்கிய இராசதானியின் மாதிரி கட்டுமானம்: தற்போதைய நிலை
CONSTRUCTION OF SHAKYA KINGDOM IN REGIDALE ESTATE, KAHAPOLA : CURRENT STATUS

485/2025

2. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) දොන් සයිමන් විජේවික්‍රම සමරකෝන් මහතාට අයත් අක්කර 76ක පමණ විශාලත්වයකින් යුතු කහපොල, `රෙජීඩෙල්වත්ත' නමැති ඉඩම මහා භාරකාරවරයා යටතේ තිබූ බවත්;

(ii) එම ඉඩමේ කොටසක ශාක්‍ය රාජධානියේ අනුරුවක් ඉදිකර, 2017.05.11 වන දින එවකට අග්‍රාමාත්‍යවරයාගේ උපදේශකත්වයෙන් හා එවකට ජනාධිපතිවරයා විසින් විවෘත කරන ලද බවත්;

(iii) "සකල ලෝකවාසී බෞද්ධ ජනයා වෙත අසමසම තිළිණයක්" ලෙස ඊට අදාළ ඵලකයේ සඳහන් කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත ඉදිකිරීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම ඉදිකිරීමේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පුත්තසාසන, සමය මற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தொன் சைமன் விஜேவிக்ரம சமரகோன் அவர்களுக்குச் சொந்தமான சுமார் 76 ஏக்கர் பரப்பளவுகொண்ட கஹபொல, 'ரெஜிடேல்' தோட்டம் பொது நம்பிக்கைப் பொறுப்பாளரின் கீழ் இருந்தது என்பதையும்;

(ii) மேற்படி காணியின் ஒரு பகுதியில் சாக்கிய இராசதானியின் மாதிரி அமைப்பொன்று அப்போதைய பிரதமரின் ஆலோசனையின் பேரில் நிர்மாணிக்கப்பட்டு, 2017.05.11ஆம் திகதி அப்போதைய சனாதிபதியால் திறந்து வைக்கப்பட்டது என்பதையும்;

(iii) "உலகம் முழுவதிலுமுள்ள பௌத்த மக்களுக் கான ஒப்பற்ற பரிசு" என அதற்குரிய நினைவுப் பலகையில் குறிப்பிடப்பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி நிர்மாணத்துக்காகச் செலவிடப்பட்ட மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி நிர்மாணப் பணியின் தற்போதைய நிலை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Is he aware that -

(i) the 76-acre land which had belonged to Mr. Don Simon Wijewickrama Samarakoon named "Regidale Estate" located in Kahapola remained under the Public Trustee;

(ii) a replica of the Shakya Kingdom was constructed in a portion of the land concerned under the instructions of the then Prime Minister and declared open by the then President on 11.05.2017; and

(iii) its inauguration plaque depicts the caption "A Unique Gift to Buddhist People All Over the World"?

(b) Will he inform this House of the -

(i) total amount of money spent on the aforementioned construction; and

(ii) present status of the construction?

(c) If not, why?

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)

(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) එම ඉඩමේ ශාක්‍ය රාජධානිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2017 ජනවාරි මාසයේ එවක ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මුල් ගල් තබා ඇත.

(iii) ඔව්.

(ආ) (i) මෙම ව්‍යාපෘතිය සඳහා රජය විසින් වියදම් දරා නොමැති අතර ඉඩම ලබා දීම පමණක් බුද්ධශාසන අමාත්‍යාංශය විසින් සිදු කර ඇත. අමාත්‍යාංශය හා ලයිට් ඔෆ් ඒෂියා පදනම අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මඟින් අරමුදල් සපයා ගැනීම සහ සමස්ත නිර්මාණය ලයිට් ඔෆ් ඒෂියා පදනමේ වගකීමක් ලෙස දක්වා ඇත.

(ii) අවබෝධතා ගිවිසුමට අනුව ලයිට් ඔෆ් ඒෂියා ආයතනයට අවුරුදු 3ක් තුළ මෙහි ඉදිකිරීම් අවසන් කිරීමට හැකියාවක් නොවූ හෙයින් (වඩා වැදගත් වන්නේ, අවුරුදු 3ක් ඇතුළත එම ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 5යි.) එම අවබෝධතා ගිවිසුම අවලංගු කර ඇති අතර, ව්‍යාපෘතිය නතර වී ඇත.

ඉදිරියේදී මෙම ඉදි කිරීම් ද ඇතුළත් අක්කර 5ක් හා යාබද ඉඩම් කොටස් නීත්‍යානුකූල කර ගැනීමෙන් අනතුරුව ඉල්ලා ඇති ජාත්‍යන්තර බහු සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා පවරා දී ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට දැනට සැලසුම් කර ඇත. ඒ සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමට මේ වන විට අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)

(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ශාක්‍ය ජනපදයේ අනුරුවක් හැටියට නේ ඒක ඉදි කරලා තිබෙන්නේ. කවුරු හරි එතැනට ගියොත් හිතනවා, ශාක්‍ය ජනපදය කියන්නේ ළමා සාහිත්‍යයේ එන ටාසන්ගේ කැලේ වාගේ එකක් කියලා. එහෙම තත්ත්වයක් එතැන තිබෙන්නේ. ඒ නිටපු පාලකයෝ කුමන අරමුණකින් එය ඉදි කරන්න කටයුතු කරලා තිබෙනවාද කියලා වර්තමාන අමාත්‍යතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා

(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)

(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විමසපු කාරණයට ඉතා කෙටියෙන් වුණත් පසුබිම් තොරතුරක් කියන්නට වෙනවා.

මොකද, මා කලින් කෙටි පිළිතුරු පමණයි ලබා දුන්නේ. දොන් සයිමන් විජේවික්‍රම සමරකෝන් මහත්මයාට අයිති අක්කර 76ක පමණ විශාලත්වයෙන් යුතු ඉඩමක් ඒක. කහපොල, "රෙජිඩේල්වත්ත" කියලා තමයි ඒ ඉඩම හඳුන්වන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා හරි. "සකල ලෝකවාසී බෞද්ධ ජනයා වෙත අසමසම තිළිණයක්" ලෙස තමයි එහි සමරු ඵලකයේ සටහන් කර තිබෙන්නේ. දැන් ඒක කැලෑ වැවිලා අත්හැර දමපු ව්‍යාපෘතියක් විධියටයි තිබෙන්නේ. අවුරුදු 3ක් තුළ එහි ප්‍රගතිය සියයට 5යි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ දැන් ඒක දකින කෙනෙකු මුළා වෙන්න පුළුවන්. ඔබතුමා විමසුවා වාගේ අපිත් විමසා බැලුවා, මොකක්ද ඒකට කරන්නේ කියලා. ඒ ඉඩමේ අයිතිය නිරවුල් කිරීම සම්බන්ධව බොහොම දීර්ඝ ඉතිහාසයක් තිබෙන්නේ, ගරු කථානායකතුමනි. කැබිනට් පත්‍රිකා කිහිපයක්ම තිබෙනවා. එහි අයිතිය, මුලින්ම මහා භාරකාර දෙපාර්තමේන්තුවට, ඊට පස්සේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට, ඉන් පස්සේ බුද්ධශාසන අමාත්‍යාංශයට, ඉන් පස්සේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට, නැවත බුද්ධශාසන අමාත්‍යාංශයට වශයෙන් තමයි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, නැවතත් සඳහන් වනවා, "විධිමත් අයිතියක් පවරාගෙන නැත" කියලා. මෙන්න මේ ප්‍රශ්න තමයි දැන් අප ඉදිරියේ තිබෙන්නේ, ඔබ විමසන අතුරු ප්‍රශ්නයට අදාළ කාරණයට බාධක හැටියට. නමුත්, වටහා ගන්න තිබෙන කාරණය මෙකයි. අපට පෙනෙන හැටියට, කොළඹ නගරයට ආසන්නයේ තිබෙන ඒ ඉතා විශාල ඉඩම ශාක්‍ය ජනපදයක් කියන කාරණාවකටයි වෙන් කරලා තිබෙන්නේ. එහි ඉදිකිරීම් කිසිදු පිළිවෙළක් නැතිව, සැලැස්මක් නැතිව කරලා දැන් එය අත්හැර තිබෙන නිසාත්, එම ව්‍යාපෘතියේ

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

ප්‍රගතිය සියයට 5ක මට්ටමක පවතින නිසාත් ඔබතුමා අනුමාන කළා වාගේ දැන් දකින කෙනෙක් හිතන්න ඉඩ තිබෙනවා, "මේක මොකක්ද?" කියලා. ඒ නිසා තමයි 2024.12.20වැනි දා මා විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබුවේ, එහි ඉදිරි කටයුතු නිරවුල් කර ගන්න.

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය: රේඛීය අමාත්‍යාංශ සහ ආරම්භ කරන ලද ව්‍යාපෘති

தேசிய இயந்திர உபகரண நிறுவனம்: நிரல் அமைச்சுகள் மற்றும் ஆரம்பிக்கப்பட்ட கருத்திட்டங்கள்

NATIONAL EQUIPMENT AND MACHINERY ORGANIZATION: LINE MINISTRIES AND PROJECTS UNDERTAKEN

488/2025

3. ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 1992 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා අයත් වී ඇති රේඛීය අමාත්‍යාංශය/අමාත්‍යාංශ කවරේද;

(ii) වර්ෂ 2010 සිට 2015 දක්වා, වර්ෂ 2015 සිට 2019 දක්වා සහ වර්ෂ 2019 සිට 2024 දක්වා යන එක් එක් කාල සීමාවේ පැවති ආණ්ඩුවලදී ඉහත ආයතනය අයත් වූ රේඛීය අමාත්‍යාංශය/ අමාත්‍යාංශ භාරව කටයුතු කරන ලද අමාත්‍යවරයා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් අමාත්‍යවරයා යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ව්‍යාපෘතියේ නම සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත ව්‍යාපෘති අතරින් මේ දක්වා වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නගර අභිවෘද්ධි, නිර්මාණ කටයුතු සහ ගෘහ නිර්මාණ අමාත්‍යතුමා වෙනුවෙන් නගර අභිවෘද්ධි, නිර්මාණ කටයුතු සහ ගෘහ නිර්මාණ අමාත්‍ය ගරු අනුර කරුණාතිලක මහතා:

(අ) (i) 1992ආම් ආණ්ඩු ආරම්භ කරන ලද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා අයත් වී ඇති රේඛීය අමාත්‍යාංශය/අමාත්‍යාංශ කවරේද;

(ii) වර්ෂ 2010 සිට 2015 දක්වා, වර්ෂ 2015 සිට 2019 දක්වා සහ වර්ෂ 2019 සිට 2024 දක්වා යන එක් එක් කාල සීමාවේ පැවති ආණ්ඩුවලදී ඉහත ආයතනය අයත් වූ රේඛීය අමාත්‍යාංශය/ අමාත්‍යාංශ භාරව කටයුතු කරන ලද අමාත්‍යවරයා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් අමාත්‍යවරයා යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ව්‍යාපෘතියේ නම සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත ව්‍යාපෘති අතරින් මේ දක්වා වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

අවසර ඉල්ලා සිටියේ එම ප්‍රශ්න ඉදිරිපත් කිරීමටද?

(ආ) ඔව්, ඒ මන්ද?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House the -

(i) name of the Line Ministry/Ministries under which the National Equipment and Machinery Organization, which was established in 1992, has operated from its commencement up to now;

(ii) Ministers who were in charge of the Line Ministry/Ministries to which the said organization belonged during each of the periods from 2010 to 2015, 2015 to 2019, and 2019 to 2024 under respective Governments, separately;

(iii) number of projects initiated by the National Equipment and Machinery Organization under each of those Ministers, along with the name and value of each project, separately; and

(iv) number of those projects that have not been completed so far out of the projects referred to above?

(b) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, 1992 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සම්බන්ධයෙන් තමයි ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ. එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) 1992 - නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය

1994 - නිවාස, ඉදිකිරීම් හා පොදු පහසුකම් අමාත්‍යාංශය

2001 සැප්තැම්බර් - නාගරික සංවර්ධන, පොදු පහසුකම්, නිවාස හා ක්‍රීඩා අමාත්‍යාංශය

2001 දෙසැම්බර් - නිවාස හා චතු යටිතල පහසුකම් අමාත්‍යාංශය

2004 - නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත, නැගෙනහිර පළාත් අධ්‍යාපන හා වාරිමාර්ග සංවර්ධන අමාත්‍යාංශය

(iii) மேற்படி ஒவ்வோர் அமைச்சரின் கீழும், தேசிய இயந்திர உபகரண நிறுவனத்தால் ஆரம்பிக்கப் பட்ட கருத்திட்டங்களின் எண்ணிக்கை, அவ்வொவ்வொரு கருத்திட்டத்தினதும் பெயர் மற்றும் பெறுமதி என்பன வெவ்வேறாக யாதென்பதையும்;

(iv) மேற்குறிப்பிட்ட கருத்திட்டங்களில், இற்றை வரை பணிகள் நிறைவுசெய்யப்படாமல் இருக்கும் கருத்திட்டங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

2010 - ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය

2015 ජනවාරි - නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය

2015 සැප්තැම්බර් - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

2020 - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

2022 - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

2023 - මුදල්, ආර්ථික ස්ථායිකරණ, ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2024.11.25 දින සිට මේ දක්වා - 2024.11.25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

(ii) වර්ෂ 2010 සිට 2015 - ගරු විමල් වීරවංශ මහතා

වර්ෂ 2015 සිට 2019 - ගරු සජිත් ප්‍රේමදාස මහතා

වර්ෂ 2019 සිට 2024

2020 - ගරු මහින්ද රාජපක්ෂ මහතා

2022 - ගරු ප්‍රසන්න රණතුංග මහතා

2023 - ගරු රනිල් වික්‍රමසිංහ මහතා

2024.11.25 සිට මේ දක්වා - ගරු අනුර කරුණාතිලක මහතා

(iii) ඇමුණුම මගින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

එක් එක් අමාත්‍යවරයා යටතේ ආරම්භ කළ ව්‍යාපෘති මොනවාද, එම ව්‍යාපෘතිවල වටිනාකම කීයද, එම ව්‍යාපෘති සම්පූර්ණ කර තිබේද, අතරමැද නතර කර තිබේද, නිශ්චිත තොරතුරක් නැති ව්‍යාපෘති තිබේද යන කරුණු සම්බන්ධයෙන් වූ විස්තර මම සභාගත කළ ඇමුණුමෙහි ඇතුළත් වෙනවා.

(iv) වැඩ අවසන් නොවූ ව්‍යාපෘති සංඛ්‍යාව -

ඇමුණුමෙහි අංක 215, 231, 252, 295 දරන එක් එක් අමාත්‍යවරයා යටතේ තිබූ ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකර අතරමඟ නතර කර තිබෙනවා. ඉතිරි ව්‍යාපෘති 345 භාරදීම/නතර කිරීම/තීරණයක් නොගැනීම මගින් වැඩ අවසන් කර තිබෙනවා. ඒ පිළිබඳ සවිස්තර තොරතුරු මෙහි ඇතුළත් වෙනවා.

(ආ) අදාළ නොවේ.

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, ඇමතිවරයාගෙන් මම මේ ප්‍රශ්නය අහන්න ප්‍රධාන හේතුවක් තිබෙනවා. අපි දැක්කා, පසුගිය දවස්වල මේ අය වැය විවාදය අතරතුර විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අපට කියනවා, "පසුගිය කාලය පිළිබඳව කථා කරන්න එපා, ඉදිරි කාලය පිළිබඳව කථා කරන්න" කියලා. එතුමන්ලාගේ අදහස්වල නිතරම තිබුණේ, පරණ කාලය ගැන කථා නොකර අලුත් කාලය ගැන කථා කරන්න කියන එක.

විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, අවුරුදු අට, දහය පරණ ව්‍යාපෘතිවල සල්ලි ඉල්ලාගෙන සෑහෙන පිරිසක් කාර්යාලවලට එනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වෙන් වෙන්නේත් රුපියල් මිලියන 10යි. හැබැයි, අවුරුදු අටක, දහයක වාගේ කාලයක් පරණ ව්‍යාපෘතිවලට අදාළ රුපියල් මිලියන 11ක, 12ක වාගේ ප්‍රමාණවලින් සල්ලි ඉල්ලාගෙන එනවා. ඒ වාගේම අතරමඟ නතර වෙච්ච ව්‍යාපෘති පිළිබඳවත් අපට වාර්තා වෙනවා. ඒ ආයතනවලට අදාළ විශාල යන්ත්‍රෝපකරණ සංඛ්‍යාවක් තැන් තැන්වල නතර කරලා තිබෙනවා. විශේෂයෙන් කොලොන්න ප්‍රදේශය ගත්තොත්, මේ වනවිට කෝටි ගණනක යන්ත්‍රෝපකරණ දිරාපත් වෙමින් තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ ඒවා දිරලා යනවා.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. රුපියල් බිලියන ගණන් සල්ලි මේවාට ගෙවන්න ඇති. යන්ත්‍රෝපකරණ විශාල සංඛ්‍යාවක් -සිය ගණනක්- යම් යම් තැන්වල දිරාපත් වෙනවා. මේවා වටිනාකමින් යුත් යන්ත්‍ර. මේ පිළිබඳව දැනට විගණනයක් කරලා තිබෙනවාද? එහෙම නැත්නම් සොයා බැලීමක් කරනවාද? පසුගිය කාලය ඇතුළත මහ නතර කරපු ව්‍යාපෘති සම්බන්ධයෙන් විගණනයක් කරන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේ මේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සම්බන්ධයෙන් ඉතා කනගාටුදායක ඉතිහාසයක් තමයි තිබෙන්නේ. ඒක මුලින් ආරම්භ කරලා තිබෙන්නේ නිවාස සංවර්ධන අධිකාරිය යටතේ. පසුව ඒක රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධ කරලා තිබෙනවා. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය මුලින් තිබුණේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වෙනම ආයතනයක් හැටියට.

නමුත්, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව යටතට ඒකාබද්ධ කරන්න 2021.04.27වැනි දා තීරණයක් අරගෙන තිබෙනවා. නැවතත් 2023 ජනවාරි මාසයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් විධියට ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ හිටපු සේවකයන් විශ්‍රාම ගන්වලා ආයතනය අක්‍රිය කරන්න තීරණයක් අරගෙන තිබෙනවා. ඒ අනුව තමයි, ඒ ආයතනය සතුව තිබුණු යන්ත්‍රෝපකරණ වාගේම, විවිධ ව්‍යාපෘතිවලට භාවිත කරපු යන්ත්‍රෝපකරණ ඒ ගම්වල, ඒ ඒ ප්‍රදේශවල අතහැර දමා තිබෙන්නේ. අපි පසුගිය කාලයේ ඒ පිළිබඳව සොයා බැලීමක් කරලා, ඉස්සෙල්ලාම කරන්න තීරණය කරපු දේ තමයි, ඒ තැන් තැන්වල දාලා තිබුණු යන්ත්‍රෝපකරණ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ එක් එක් yardsවලට එකතු කරන්න කටයුතු කරන එක. එතැනදී අපට ආපු අපහසුතාවක් තමයි සමහර ව්‍යාපෘති සඳහා ගෙවීම් නොකිරීම නිසා යන්ත්‍රෝපකරණ එකතු කර ගැනීමේ අපහසුව. එම කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන්න තිබෙන මුදල්, ඒ ඒ ආයතනවලට තිබුණු ගෙවීම් කරන්න බැරි වුණ නිසා ඒ යන්ත්‍රෝපකරණ එකතු කරන්න ගියාට පස්සේ විරෝධතාවක් ආවා. සමහර යන්ත්‍රෝපකරණ තිබුණේ පන්සල්වල. පන්සල්වල තමයි දාලා ගිහින් තිබුණේ. ඒවා ගන්න ගියාම සමහර වෙලාවට විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේගෙන්, ප්‍රදේශවාසීන්ගෙන් විශාල විරෝධතාවක් ආවා. කොහොම නමුත් අපි උත්සාහ කරමින් ඉන්නවා ඒ පිළිබඳව පැහැදිලි තොරතුරු එකතු කරලා, ඒ යන්ත්‍රෝපකරණ නැවත වතාවක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව භාරයට ගන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුර කරුණාතිලක මහතා]

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ ආකාරයට ඒ තත්ත්වය පැන නඟින්න හේතු වුණු කාරණා සම්බන්ධ විගණනයක් කරන්නත් අපි බලාපොරොත්තු වනවා. ඒ විගණන කටයුතු තවම ආරම්භ කරලා නැහැ. ඒ තිබෙන යන්ත්‍රෝපකරණ සහ ඒ තිබෙන දේවල් සම්බන්ධයෙන් තොරතුරු ඒක රාශි කරන වැඩ පිළිවෙළක තමයි දැනට අපි ඉන්නේ.

ගරු උපුල් කිත්සිරි මහතා
(මාණ්පුමිකු උපුල් කිත්සිරි)
(The Hon. Upul Kithsiri)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලය තුළ අය වැයවලින් මුදල් වෙන් කළත්, මම හිතන විධියට මේ ප්‍රමාණය අවුරුදු ගණනකට ගෙවන්න බැහැ. ඒ වාගේම, මේ කාරණය සම්බන්ධවත් මම ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා. සමහර ව්‍යාපෘති හරහා ඒ ආයතනවලට වෙනම මුදල් ගෙවලා ඉවරයි. නමුත්, සමහර ආයතන ඒ ව්‍යාපෘතිවලට වෙනම මුදලක් නැවතත් මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලනවා. සමහර පරණ ලේඛනවල තිබෙනවා, ඒ මුදල් ගෙවලා කියලා. විශේෂයෙන්ම මේකේ විශාල සේවක සංඛ්‍යාවක් මේ වෙනකොටත් විශ්‍රාම ගන්වලා තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම, සමහර සේවකයන් කාර්යභාරයක් නැතිවත් මේ තැන්වල ඉන්නවා. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය හැටියට විශේෂ අවධානයක් යොමු කරනවාද? මොකද හේතුව, වසර ගණනාවක් තිස්සේ මේ කරපු කාර්යය ඇතුළේ පුද්ගල ශ්‍රමය සහ දේපළවලින් හානි වෙච්ච ප්‍රමාණය අතිවිශාලයි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයේදී වාගේම දෙවැනි අතුරු ප්‍රශ්නයේදීත් අහන්න කැමැතියි, අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් සහ මේ සේවකයන් සම්බන්ධයෙන් ගන්නා වූ පියවර මොකක්ද කියලා. ඉදිරියේදී ඔවුන්ව ඵලදායී කාර්යයක් සඳහා යොදවා ගන්න මේ වන විට වැඩ පිළිවෙළක් සකස් කරමින් සිටිනවාද, ගරු ඇමතිතුමනි?

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, මම කලින් සඳහන් කළා වාගේ, 2023.08.31වැනි දා ක්‍රියාත්මක කරපු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වැඩසටහන යටතේ අදාළ සේවකයන් විශ්‍රාම ගන්වලා, දැන් ආයතනය අක්‍රිය තත්ත්වයේ තිබෙන්නේ. ඔබතුමා සඳහන් කළා වාගේ විවිධ ව්‍යාපෘති සඳහා තිබෙන ගෙවීම් ගණනාවක් තිබෙනවා.

මේක රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධ කරපු නිසා දැන් වගකීම පැවරිලා තිබෙන්නේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට. නමුත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ගත්තොත්, මේ වනකොට ඉතාම දුර්වල තත්ත්වයක තමයි තිබෙන්නේ. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හැකියාවක් නැහැ, මේ ව්‍යාපෘතිවලට මුදල් ගෙවන්න. මේ වෙනකොට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රුපියල් බිලියන 9කට ආසන්න ණයක් තිබෙනවා. ඒ වෙනුවෙන් හැම මාසයකම රුපියල් මිලියන 20ක, 30ක පොලී ගෙවීමක් කරන්න වෙනවා. ඒ අනුව මේකට අදාළ ගෙවීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම, මේ යන්ත්‍රෝපකරණවල වටිනාකම ගත්තොත්, බිලියන ගණනකට ආසන්න වටිනාකමක් තිබෙන යන්ත්‍රෝපකරණ තමයි මේ තැනින් තැන තිබෙන්නේ. මම කලින් සඳහන් කළා වාගේ මේ සම්බන්ධයෙන් විධිමත් විගණනයකින් පසුව අපට කරන්න පුළුවන් දේ සම්බන්ධයෙන් ඉදිරියේ දී තීරණයක් ගන්නවා.

මැණික් පතල් සඳහා නිකුත් කර ඇති බලපත්‍ර: වැල්ලවාය ප්‍රා.ලේ. කොට්ඨාසය
இரத்தினக்கல் அகழ்வுக்கான உரிமப் பத்திரங்கள்: வெள்ளவாய பிரதேச செயலாளர் பிரிவு
LICENCES ISSUED FOR MINING OF GEMSTONES: WELLAWAYA DS DIVISION

489/2025

4. ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 වර්ෂයේදී ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් මැණික් පතල් කැණීම හා ගැරීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මැණික් පතල් කැණීම හා ගැරීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම බලපත්‍ර, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව නිකුත් කරන්නේද;

(iv) පතල් කැණීමේ පවතින අවිධිමත්භාවය හේතුවෙන් සිදු වන පරිසර හානිය වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කෛත්තොழිල් මත්‍රුම් තොழිල්මුයට්සිකළ් අමෛච්සරෛක් කේට්ට වින්නා:

(அ) (i) 2024ஆம் ආණ්ටු තේසිය ඉරත්තිනක්කල් මත්‍රුම් ආපරණ අතිකාරසපෛයාල් ඉරත්තිනක්කල් සුරංක අකළ්වු මත්‍රුම් පිරිත්තෙදුක්කුම් පණිකළුක්කාක වළංගප්පට්ටුළ්ළ උරිමප් පත්තිරංකළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(ii) මොනරාකලෛ මාවට්ටත්තිල්, වෙළ්ළවාය පිරතේස සෙයලාළර් පිරිවිල් ඉරත්තිනක්කල් සුරංක අකළ්වු මත්‍රුම් පිරිත්තෙදුක්කුම් පණිකළුක්කාක වළංගප්පට්ටුළ්ළ උරිමප් පත්තිරංකළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(iii) මේර්පඩි උරිමප් පත්තිරංකළ්, මත්තිය සුර්රාඩල් අතිකාරසපෛයින් විතප්පුරෛකළුක්කු අමෛවාක වළංගප්පඩුකින්රනවා එන්පතෛයුම්;

(iv) සුරංක අකළ්වුප් පණිකළිල් නිලවුම් මුරෛයර්ර තන්මෛ කාරණමාක ඒර්පඩුම් සුර්රාඩල් පාතිප්පෛත් තඩුප්පතර්කාක මේර්කොළ්ළප්පඩුම් නඩවඩික්කෛකළ් යාවෛයෙන්පතෛයුම්;

අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ஆ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -

(i) the number of licences issued by the National Gem and Jewellery Authority for excavating and mining gemstones in year 2024;

(ii) the number of licences issued for excavating and mining gemstones within the Wellawaya Divisional Secretary's Division in the Monaragala District;

(iii) whether those licences are issued subject to the recommendations of the Central Environmental Authority; and

(iv) the measures that will be taken to prevent the environmental damage caused by the irregular nature in mining?

(b) If not, why?

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රශ්නය ඇසුවාට බොහොම ස්තුතියි. ලංකාවේ මැණික් සහ පතල් කර්මාන්තය ගත්තොත්, එය ලංකාවේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට පසුව තිබෙන දැවැන්තම ජාවාරමක්. විපක්ෂයේ මන්ත්‍රීවරු අහන්න ඕනෑ ප්‍රශ්න පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් අහන එකෙන්ම පැවති සංස්කෘතියේ වෙනස් වීම පිළිබඳව පෙන්නුම් කරනවා.

(අ) (i) 2024 වර්ෂයේදී ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් මැණික් පතල් කැණීම් බලපත්‍ර 7,897ක් නිකුත් කර ඇත.

(ii) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බලප්‍රදේශය තුළ 2025.01.11 දිනට වලංගුව පවතින සාමාන්‍ය මැණික් ගැරීම් බලපත්‍ර 101ක් ද, යාන්ත්‍රික කැණීම් අවසර පත්‍ර 6ක් ද නිකුත් කර ඇත.

(iii) නැත.

1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව මැණික් පතල් කැණීම් හා ගැරීමේ බලපත්‍රයක් නිකුත් කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර නිර්දේශයක් ලබා ගැනීමට අත්‍යවශ්‍යතාවක් පෙන්වා දී නොමැත. කෙසේ වුවද, අදාළ කැණීම් බලපත්‍රය ලබා දීමේදී පරිසර නිර්දේශයක් ලබා ගැනීමේ අවශ්‍යතාව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවලදී අදාළ පරිසර වාර්තාව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

සංවේදී පරිසර කලාපවලට මේ බලපත්‍ර ලබා දීමේදී -එහෙම හැකියාවක් තිබුණත්- පරිසර අධිකාරියේ නියාමනයට, නැත්නම් අවසර ලබා ගැනීමකට යටත් වෙලා නැහැ කියන එක ප්‍රායෝගිකව පෙනෙන්න තිබෙන දෙයක්.

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් මැණික් පතල් කැණීමේ හා ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අතර, මෙම බලපත්‍රය සාමාන්‍ය කොන්දේසි 16ක් හා විශේෂ කොන්දේසි 13ක් යටතේ නිකුත් කර ඇත. මෙම කොන්දේසි තුළ පරිසරය ආරක්ෂා වන ආකාරයෙන් කැණීම් කටයුතු සිදු කිරීම, ජලය බැහැර කිරීම, මාර්ග, ඇළ, දොළ, ගංගා නිවාස සඳහා නියමිත රක්ෂිත තැබීම, සේවකයන් යෙදවීම, බලපත්‍රයට අදාළ පාර්ශ්වකරු විසින් මැණික් විකිණීමෙන් පසුව නියමිත ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් නියමයන් පනවා ඇත. බලපත්‍රධාරියෙකු මෙම කොන්දේසි කඩවන ආකාරයෙන් කර්මාන්තය කරගෙන යන්නේ නම් අදාළ බලපත්‍රය යටතේ කැණීම් කටයුතු තාවකාලිකව අත්හිටුවීමට හෝ බලපත්‍රය අවලංගු කිරීමට අධිකාරියට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.

(iv) (1) නිකුත් කරන කැණීම් බලපත්‍රයේ කොන්දේසි තුළ පරිසරය සංරක්ෂණය කිරීමට අදාළ පියවර අනුගමනය කිරීමට උපදෙස් දී ඇත. ඒ අනුව මැණික් පතල් කැණීම හා ගැරීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර කොන්දේසි කඩවන ආකාරයෙන් බලපත්‍රධාරීන් කටයුතු කරයි නම්, එවැනි බලපත්‍ර අත්හිටුවීම හෝ අවලංගු කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.

(2) එසේම මැණික් පතල් කර්මාන්තයට අදාළව සිදුවන අනවසර ක්‍රියා පාලනය සඳහා ශ්‍රී ලංකා පොලීසිය වෙත බලය පවරා ඇති අතර, ඒ අනුව ශ්‍රී ලංකා පොලීසිය මඟින් අනවසර ක්‍රියා පාලනය සඳහා අධිකාරිය වෙත අදාළ සහාය ලබා දෙනවා.

(3) 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 49(1) වගන්තිය අනුව එම පනත යටතේ යම් තැනැත්තෙකු යම් වරදක් කර ඇත්නම්, එම වරද සඳහා යොදා ගන්නා භාණ්ඩ තහනමට ගැනීම සිදු කරනු ඇත.

මෙවැනි නීති රාමුවක් තිබුණාට මේ නීති ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් දැවැන්ත ප්‍රශ්නයක් පසුගිය කාලය පුරාවට ඇති වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමියනි, ඒ පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවා.

(ආ) පැන නොනඟී.

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்காணி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් බලපත්‍ර අරගෙන ඒ බලපත්‍රවල සඳහන් කොන්දේසි විශාල වශයෙන් උල්ලංඝනය කරමින් වැල්ලවාය ප්‍රදේශයේ මේ කටයුතු සිදු කරනවා. බලපත්‍රය අරගෙන තිබෙන්නේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන්. හැබැයි, බරපතළ විධියට කරන්නේ වැලි ජාවාරම.

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

විශේෂයෙන්ම අපට නිරීක්ෂණය වුණා, බලපත්‍රයට අදාළ ඉඩමේවත් අඩුම තරමේ කැණීම් කර නැහැ කියන කාරණය. හැබැයි, එම බලපත්‍ර අවලංගු කරනවා වෙනුවට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් සමථ ගාස්තුවක් අය කර නැවත මේගොල්ලන්ට කැණීම් කරන්න අවස්ථාව උදා කර දීලාත් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම දැනගන්න කැමැතියි, මේ සමථ ගාස්තු අය කරන ක්‍රමවේදය මොකක්ද කියලා.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු මන්ත්‍රීතුමියනි, මේ බලපත්‍රවල සඳහන් කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් තිබෙන 121/8 කියන චක්‍රලේඛයට අනුව රුපියල් 10,000 සිට රුපියල් 333,333ක් දක්වා දඩ ගාස්තු අය කරන්න පුළුවන්. සමථ ක්‍රියාවලිය තුළදී ඇත්තටම සිද්ධ වෙන්නේ අවස්ථා කිහිපයකදී බලපත්‍රවල සඳහන් කොන්දේසි උල්ලංඝනය කළත්, සමථයකට පත් වීම තුළ තවත් අවස්ථාවක් ඒ අයට හිමිවීමයි. මේ සම්බන්ධව නිසි අධීක්ෂණ කටයුත්තක් තමයි කරන්න වෙන්නේ. විශේෂයෙන්ම අණපනත්වල යම් කිසි අඩුපාඩුවක් තිබෙනවා නම් ඒවාත් අපට ඉදිරියේදී සකස් කරගන්න වෙයි. ඒ අධිකාරියට බලය තිබෙනවා, කොන්දේසි උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් සමථයකට පැමිණෙන්න, නැවත එවැන්නක් සිද්ධ වෙන්නේ නැහැ කියන එකඟතාවට - condition එකට - යටත්ව. ඒ අනුව, එවැනි එකඟතාවකට අනුව conditions සහිතව නැවතත් තාවකාලිකව හෝ බලපත්‍රය ලබා දීමේ හැකියාවක් තිබෙනවා.

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்காணி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පතල් කැණීමේදී ගොඩදමන පස් හා වැලි ප්‍රවාහනය කිරීමේදී ඒ සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් අවසර පත්‍රයක් ලබා නොගෙන මහා පරිමාණ විධියට වැලි ජාවාරම සිද්ධ කරනවා. මේ සම්බන්ධයෙන් මහජනතාව දිගින් දිගටම විමසිම් කරනවා. මොකද, මේ හේතුව නිසා ගං ඉවුරු ඇතුළු අවට පරිසරයත් විනාශ වෙනවා. විශේෂයෙන්ම ගංගා ආශ්‍රිතව තමයි මේ කැණීම් සිද්ධ වෙන්නේ. වැල්ලවාය ප්‍රදේශයේත් කිරිඳි ඔය ආශ්‍රිතව තමයි බොහෝදුරට මේ කැණීම් සිද්ධ වෙන්නේ.

වැලි ජාවාරම සිද්ධ වෙනකොට කෝසුවලට, පාලම්වලට දැවැන්ත විධියට හානි සිද්ධ වෙලා තිබෙනවා. ඒ හානි පූරණය කරන්න ආයතනයක් නැහැ. මොකද, ඒගොල්ලන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් අවසරය ලබාගෙන නැහැ. ඒ නිසා මහජනතාව අපහසුතාවට පත් වෙනවා. එතකොට මහජනතාව මෙන්න මේ කියන ආයතනවලින් -මධ්‍යම පරිසර අධිකාරියෙන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන්- විමසිම් කරනවා. හැබැයි, ඒ විමසිම්වලට උත්තර දෙන්න ඒ ආයතන බැඳිලා නැහැ. විශේෂයෙන්ම මධ්‍යම පරිසර අධිකාරිය, ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුව කියන ආයතනවල නිර්දේශවලට යටත්ව ඉදිරියේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් බලපත්‍ර නිකුත් කරන්න ක්‍රියාමාර්ග ගන්නවාද, එහෙම නැත්නම් ඒ සඳහා ගනු ලබන වෙනත් ක්‍රියාමාර්ග මොනවාද කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ඇත්තටම ඒ සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමියනි. අපේ රටේ විවිධ ආයතන තිබුණාට ඒ ආයතන එකිනෙකා සමඟ සාකච්ඡා කරලා භූමියේ ප්‍රශ්න විසඳන්න කවදාවත් ඉදිරිපත් වුණේ නැහැ. මේ වෙනකොට අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සඳහා -විශේෂයෙන්ම මැණික් හා පතල් කර්මාන්තය සඳහා- විශේෂ කමිටු පත් කරමින් තිබෙනවා. ඔබතුමියගේ දිස්ත්‍රික්කයේත් ඒ කමිටු පත් කරන්න අපට පුළුවන්. එතකොට ඒ කමිටු හරහා මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය කියන ආයතන තුනම ඒකාබද්ධව මේ ගැටලුව වෙනුවෙන් මුහුණ දීමට සුදානම් ක්‍රමයක් සකස් කරමින් පවතිනවා. ඒ වාගේම මේ වෙනකොට ලැබී තිබෙන චෝදනා සහ ජනතාවගෙන් ලැබී තිබෙන complaints අධ්‍යයනය කරන්න ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි වෙනම අංශයක් ස්ථාපිත කරමින් තිබෙනවා. එහි කටයුතු අවසන් වෙන්න තව ටික කාලයක් ගත වෙයි. ඒ සඳහා අවශ්‍ය සම්පත් අපි ඉල්ලා තිබෙනවා.

මේ වැලි ගොඩ දැමීම සම්පූර්ණයෙන් අනීතිකයි. වැලි ගොඩ දැමීම හා ප්‍රවාහනය කියන්නේ වරදක්. චක්‍රලේඛ 121/85 යටතේ ඒ සඳහා දැනට තිබෙන්නේ ප්‍රථම අවස්ථාවේදී රුපියල් 95,000කුත්, දෙවන අවස්ථාවේදී රුපියල් 145,000කුත්, තුන්වන අවස්ථාවේදී රුපියල් 180,000කුත් වශයෙන් දඩයක්. නමුත්, මේ කොන්දේසි උල්ලංඝනය කරන අයට නීතිය ක්‍රියාත්මක කිරීමේදී මතුව ඇති ගැටලුව පිළිබඳව ප්‍රාදේශීය මට්ටමින් විධිමත් යන්ත්‍රණයක් ඇති කිරීම තමයි කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ බලාපොරොත්තුව විධියට තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ලියාපදිංචි අරාබි පාසල්: පොදු විෂය මාලාවක් හඳුන්වාදීම
பதிவுசெய்யப்பட்ட அரபுக் கல்லூரிகள்: பொதுப் பாடநெறி அறிமுகம்
REGISTERED ARABIC SCHOOLS: INTRODUCTION OF COMMON CURRICULUM

481/2025

1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති අරාබි විදුහල් කවරේද;

(ii) එම අරාබි විදුහල් සඳහා පොදු පාඨමාලාවක් නොමැති අතර එක් එක් විදුහල විසින් විවිධ පාඨමාලා උගන්වන බව දන්නේද;

(iii) එම අරාබි විදුහල් සඳහා පොදු පාඨමාලාවක් හඳුන්වා දීමට කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද;

(v) එම පොදු පාඨමාලාව සහ කැමති වෙනත් විෂයයක් හැදෑරීමට අවස්ථාව ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முஸ்லிம் சமய மற்றும் பண்பாட்டு அலுவல்கள் திணைக்களத்தின்கீழ் பதிவுசெய்யப்பட்டுள்ள அரபுக் கல்லூரிகள் யாவை என்பதையும்;

(ii) மேற்படி அரபுக் கல்லூரிகளுக்கென பொதுப் பாடநெறியொன்று இல்லாததுடன், ஒவ்வொரு கல்லூரியிலும் வெவ்வேறு பாடநெறிகள் கற்பிக்கப்படுவதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி அரபுக் கல்லூரிகளுக்கென பொதுப் பாடநெறியொன்றை அறிமுகம் செய்வதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், அதற்கான வேலைத்திட்டம் யாதென்பதையும்;

(v) மேற்குறிப்பிட்ட பொதுப் பாடநெறியை மற்றும் விரும்பிய வேறு ஏதேனும் பாடமொன்றைப் பயில்வதற்குச் சந்தர்ப்பம் வழங்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House-

(i) the names of the Arabic schools that have been registered with the Department of Muslim Religious and Cultural Affairs;

(ii) whether he is aware that different curricula are taught by the different Arabic schools as there is no common curriculum for those schools;

(iii) whether measures have been taken to introduce a common curriculum for the Arabic schools referred to above;

(iv) if so, the course of action that is in place in that regard; and

(v) the date from which the opportunity will be given to follow the common curriculum and another subject of their choice?

(b) If not, why?

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) 321ක් ලියාපදිංචි කර ඇත. ඇමුණුම 01** මඟින් දක්වා ඇත.

(ii) අරාබි විදුහල් සඳහා පොදු පාඨමාලාවක් 2013 වසරේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සකස් කර, එම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරන ලද සියලුම අරාබි විදුහල් සඳහා එය ලබා දී ඇත. (පොදු විෂය මාලාවේ පිටපතක් අමුණා ඇත. එය ඇමුණුම 02** මඟින් දක්වා ඇත.) මෙම පොදු පාඨමාලාවට අමතරව අරාබි විදුහල් විසින් වෙනත් පාඨමාලාවන් උගන්වනවා නම් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් දන්වා ඇති අතර, සමහර අරාබි විදුහල් වෙනත් පාඨමාලාවන් උගන්වන බව දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

(iii) ඔව්, 2013 වසරේ හඳුන්වා දුන් පොදු පාඨමාලාව සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(iv) 2020.02.19වන දින පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කමිටුවේ නිර්දේශය අනුව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2022.08.02වන දින විද්වත් කමිටුවක් පත් කර සකස් කරන ලද විෂය නිර්දේශය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

(v) අදාළ දිනය නිශ්චිතව සඳහන් කළ නොහැක.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සමාලෝචනය කර අනුමැතිය ලද පසු ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සහ ඩිජිටල් සේවා අපනයන මත යෝජිත බදු
நிகழ்நிலை காப்புச் சட்டத்தைத் திருத்துதல் மற்றும் டிஜிட்டல் சேவை ஏற்றுமதி மீதான உத்தேச வரி
AMENDMENT OF ONLINE SAFETY ACT AND PROPOSED TAX ON DIGITAL SERVICE EXPORTS

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් මඟින් තහවුරු කර ඇති භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට බාධා වන අයුරින් සම්මත කරන්නට යෙදුණු මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය

*** පුස්තකාලයේ තබා ඇත.*
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

*** පුස්තකාලයේ තබා ඇත.*
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කිරීම වර්තමාන රජයේ මූලික මැතිවරණ සටන් පාඨයක් විය. එසේම නවෝත්පාදන හා උසස් ඩිජිටල් තාක්ෂණය උපයෝගී කර ගනිමින් "ඩිජිටල් ආර්ථිකයක්" හඳුන්වා දීම රජයේ ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළෙහි කොටසක් ලෙස සඳහන් වී ඇති නමුත් යෝජිත ක්‍රියාමාර්ග හරහා එහි මූලික පරමාර්ථ සාධනය නොවන බව පෙනෙන්නට තිබේ. එබැවින් පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරන අතර, ඒ සඳහා නිවැරැදි පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙමි.

1. ශ්‍රී ලංකාවේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත මෙම රජය විසින් සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන්නේ කවදාද?
   මොකද, මේ Online Safety Act එක එවකට විපක්ෂයේ අපි සියලුදෙනා විරුද්ධ වුණු පනතක්. ඒක සංශෝධනය කරන එක මැතිවරණ වේදිකාවේදී පුනපුනා කියනු ලැබුවා. කවදාද ඒක සංශෝධනය කරන්නේ?
   පනත සංශෝධනය කරන තෙක් එය ක්‍රියාත්මකවීම මුළුමනින්ම බලරහිත කරන්නේද?
   ඒකට හේතුව මෙකයි. Online Safety Act එක උපයෝගී කරගෙන විශේෂයෙන්ම මේ රටේ ජනතාවගේ මූලික අයිතිවාසිකමක් වන භාෂණයේ - කථා කිරීමේ - අයිතිය සහමුලින්ම උල්ලංඝනය වෙනවා.
   එය බලරහිත නොකරන්නේ නම් ඒ මන්ද? මෙම පනත සංශෝධනය කිරීමට හෝ මුළුමනින්ම බලරහිත කිරීමට රජය විසින් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

2. මෙම පනත යටතේ මේ වනවිට අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් ගණන කොපමණද? ඒ අතරින් බන්ධනාගාරගත කර ඇති සැකකරුවන් ගණන කොපමණද? අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් අතරින් නීතිය මඟින් දඬුවමට ලක් වී ඇති වැරදිකරුවන් ගණන කොපමණද?

   අපි විශ්වාස කරනවා, මේ පනත ඇත්තවශයෙන්ම මුළුමනින්ම හකුළා ගත යුතු පනතක් බව. මොකද, මේ පනත පාවිච්චි කරලා දේශපාලන පළිගැනීම් සිදුවීම අද දවසේ විතරක් නොවෙයි, පසුගිය කාලයේදීත් ක්‍රියාත්මක වුණා.

3. යෝජිත ආදායම් බදු සංශෝධිත පනත මඟින් තොරතුරු තාක්ෂණය හරහා උපයන විදේශීය විනිමය මත සියයට 15ක බද්දක් අප්‍රේල් මාසයේ සිට පැනවීමට රජය යෝජනා කර ඇති අතර, මෙම බද්ද සේවා අපනයන ක්ෂේත්‍රයේ නියැළෙන අපනයනකරුවන් කී දෙනෙකුට බලපානු ඇතැයි රජය අපේක්ෂා කරන්නේද? එමඟින් වාර්ෂිකව ඉපැයීමට බලාපොරොත්තු වන බදු මුදල් ප්‍රමාණය කොපමණද?

   ගරු කථානායකතුමනි, මේ ගැන විශේෂයෙන්ම පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මේ සභාවේම සිටින කැබිනට් ඇමතිවරයෙක් වන කර්මාන්ත ක්ෂේත්‍රය භාර ඇමතිතුමා බොහොම පැහැදිලිව කියනවා, එතුමා මේ බද්දට විරුද්ධයි කියලා. මම දන්නා විධියට ඒක එතුමා ප්‍රවෘත්ති නාළිකාවකට කියලා තිබෙනවා. ඒකේ visuals ඔක්කොම තිබෙනවා. එතුමා ඒකට විරුද්ධයි. එතකොට අපි දැනගන්න කැමතියි, ක්‍රියාත්මක වෙන්නේ උපයන විදේශීය විනිමය මත සියයට 15ක බද්ද ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්තියද, එහෙම නැත්නම් ඇමතිවරයාගේ විරෝධතාව මත මේක රජය හකුළා ගෙන තිබෙනවාද කියන එක. මොකද, හකුළා ගත්තා නම් ඒක සුබවාදී දෙයක් හැටියටයි අපි දකින්නේ. ඒ ගැන විග්‍රහයක් ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

4. මෙම බදු මුදල් විදේශ ප්‍රේෂණවලින් වෙන් කර හඳුනා ගැනීම සඳහා මේ වනවිට රජය විසින් වැඩ පිළිවෙළක් යෝජනා කර තිබේද? එය කුමක්ද? නොඑසේනම්, ඒ මන්ද?

5. මෙම බද්ද පැනවීම හරහා සමස්තයක් ලෙස ඩිජිටල් ආර්ථිකය කෙරෙහි සහ විකල්ප මුදල් විශුද්ධිකරණ ක්‍රම මත ඇති කරනු ලබන උත්ප්‍රේරණය සම්බන්ධයෙන් රජය විසින් සිදු කර ඇති අධ්‍යයන සභාගත කරන්නේද?

   මොකද, මේ බද්ද තුළින් හවාලා, උණ්ඩියල් වැනි මුදල් විශුද්ධිකරණ ක්‍රමවේදවලට සම්බන්ධ ක්‍රමවේද ප්‍රචලිතවීමක් සිදු වෙනවාය කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම ඉතාම පුංචියට පටන් ගත්ත ව්‍යාපාර ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන්, කර්මාන්තකරුවන් Internet උපයෝගී කරගෙන, විවිධ platforms උපයෝගී කරගෙන ඇත්තවශයෙන්ම ඒ අයගේ සේවාවන් අපනයන කරන ක්‍රියාදාමය බොහොම ශක්තිමත්ව කරනවා. හොඳ ආදායමක් උපයනවා. ඒ නිසා රජයෙන් පිළිතුරු වශයෙන් මම අහන්න කැමැතියි, කරුණාකරලා මේ සියයට 15 බද්ද ඉවත් කරන්නට ඔබ කටයුතු කරනවාද? ඒ වාගේම Online Safety Act එක ක්‍රියාත්මක කිරීම අද දවසේ සිට අත්හිටුවන්නට ක්‍රියාමාර්ග ගන්නවාද, නව නීති රීති පද්ධතියක් ගෙන එනතුරු?

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා විසින් මතු කරන ලද ප්‍රශ්නයට මම පිළිතුරු ලබා දෙනවා.

විශේෂයෙන් රජය ජනතාවගේ භාෂණයේ අයිතිය සුරක්ෂිත කිරීමට හැම විටම කටයුතු කරනවා. ඒ, අපි ලබා දුන් මැතිවරණ ප්‍රකාශනය අනුව ජනතාව එක්ක ඇති කර ගත්ත සම්මුතිය අනුව.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත මෙම රජය විසින් කඩිනමින් සංශෝධනය කිරීමට බලාපොරොත්තු වනවා, ගරු විපක්ෂ නායකතුමනි.

2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතට තවදුරටත් සිදු කළ යුතු සංශෝධන කඩිනමින් හඳුනා ගැනීමට මහජන අදහස් විමසීම මඟින් සහ විශේෂයෙන් ජනමාධ්‍යවේදීන්, සිවිල් ක්‍රියාකාරීන් හා අනිකුත් අදාළ පාර්ශ්වයන් වෙතින් අදහස් හා යෝජනා ලබා ගැනීම මඟින් අවශ්‍ය පියවර ගැනීමට අංක: අමප/25/0201/821/005 හා 2025.02.09 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණය ගෙන තිබෙනවා. ඒ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යන අමාත්‍යාංශ තුන වෙත නියම කරලා තිබෙනවා. ඒ අමාත්‍යාංශ තුනේ සහභාගිත්වයෙන් ඒකාබද්ධ කමිටුවකින් මේ කටයුතු සිද්ධ කරන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

ඒ වාගේම පනත සංශෝධනය කිරීමට සියලු සංශෝධන ඇතුළත්ව පිළියෙළ කරනු ලබන මූලික කෙටුම්පතක්, එහෙම නැත්නම් සංකල්ප පත්‍රිකාවක් සලකා බැලීම පිණිස ඒකාබද්ධ

සංදේශයක් ලෙස අදාළ අමාත්‍යවරුන් මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ඉහත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා 2025.02.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නියම කර තිබෙනවා.

ඊළඟට ගරු විපක්ෂ නායකතුමා විමසා සිටියා, මේ පනත යටතේ කවුරුවත් අත්අඩංගුවට ගෙන තිබෙනවාද කියලා. කිසිවෙකුත් අත්අඩංගුවට ගෙන හෝ කිසිවෙකුත් බන්ධනාගාරගත කරලා නැහැ. ඒ වාගේම මේ පනත යටතේ කිසිවෙකුටත් නඩු පවරලා නැහැ.

මහජන ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ නොවුණත්, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය තුළින් ගරු විපක්ෂ නායකතුමා යෝජිත බදු සංශෝධන පිළිබඳවත් විමසීමක් කරලා තිබුණා. විශේෂයෙන් යෝජිත ආදායම් බදු සංශෝධිත පනත මඟින් තොරතුරු තාක්ෂණය හරහා උපයන විදේශ විනිමය සියයට 15ක බද්ද සම්බන්ධයෙන් තමයි අහලා තිබුණේ.

ඔබතුමා දන්නවා, අපනයන සේවා සම්බන්ධයෙන් පසුගිය රජය -රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව- සියයට 30ක බද්දක් යෝජනා කරලා තිබුණා කියලා. අපි ආණ්ඩුවේ බදු සමාලෝචනයේදී එය සියයට 15ක් දක්වා අඩු කරන්න අපි කටයුතු කළා.

ඒ අනුව සේවා අපනයන ක්ෂේත්‍රයේ විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන සේවාවන් මත අය කිරීමට යෝජිත ආදායම් බද්ද ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් විදේශයට සපයන තොරතුරු තාක්ෂණය ඇතුළු සියලුම සේවාවන්ගේ ලාභ මත අය කරනු ඇත.

සේවා අපනයන ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ගේ පුද්ගල ආදායම් බද්ද සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 1.8ක බදු නිදහස් දීමනාවක් හිමිවන අතර පළමුවැනි රුපියල් මිලියනය සඳහා සියයට 6ක අනුපාතයකටත්, ඉතිරිය සඳහා සියයට 15ක අනුපාතයකටත් බදු අය කරන්න තීන්දු කරලා තිබෙනවා. කෙසේ වෙතත් භාණ්ඩ අපනයනය ඇතුළු අනෙකුත් සේවාවන් සඳහා උපයන ලාභය වැඩිවීම අනුව උපරිමය සියයට 36 දක්වා පුද්ගල ආදායම් බදු අය කරනවා. නමුත් මෙතැනදි එය සියයට 15කට සීමා කරලා තිබෙනවා.

සේවා අපනයන ක්ෂේත්‍රයේ නියැළෙන අපනයනකරුවන් සම්බන්ධයෙන් තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතුව තිබෙනවා. මෙම බද්ද මගින් 2025 වසර සඳහා අපි බලාපොරොත්තු වන ආදායම් ඇස්තමේන්තුව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.04ක් හැටියට තමයි ඇස්තමේන්තු කරලා තිබෙන්නේ.

විශේෂයෙන් වාසිකයන් පමණක් මෙම බද්දට යටත් වන බැවින්, නිර්වාසිකයන් වන විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන විදේශ ප්‍රේෂණ මෙම බද්දට යටත් වෙන්නේ නැහැ.

කිසි ලෙසකින්වත් ඒ ප්‍රේෂණ මෙම බද්දට යටත් වෙන්නේ නැහැ. ඒවාට බදු පැනවීමක් කරලා නැහැ.

මෙම බදු අයකිරීම ස්වයං තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීම යටතේ සිදු කරනු ලබන බැවින් එලෙස බදු මුදල් විදේශ ප්‍රේෂණවලින් වෙන් කර හඳුනා ගැනීම අවශ්‍ය වෙන්නේ නැහැ.

ඒ වාගේම ඩිජිටල් ආර්ථිකය කෙරෙහි සහ විකල්ප මුදල් විශුද්ධිකරණ ක්‍රම මත ඇති කරනු ලබන උත්ප්‍රේරණය සම්බන්ධයෙන් විමසා තිබුණා. විශේෂයෙන් මෙහිදී ඩිජිටල් ආර්ථිකය පිළිබඳ අධ්‍යයනයක් අපි විසින් සිදු කරනු ලබනවා. මෙහිදී බදු ක්‍රමය සාධාරණව පවත්වා ගෙන යන්න, සාධාරණත්වයේ මූලධර්මය මත සකස් කරන ක්‍රමවේදයක් තමයි මේ බදු ප්‍රතිපත්තිය හරහා සිදු කර තිබෙන්නේ.

ගරු විපක්ෂ නායකතුමනි, මේ කාරණා තමයි ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් මට ලබා දෙන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට කරුණක් පැහැදිලි කර ගන්න අවශ්‍යයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කිව්වා, පසුගිය සමයේ මේ බද්ද තිබුණේ සියයට 30ටයි, ඔබතුමන්ලා ඒක සියයට 15ට බැස්සුවා කියලා. අපට දැන ගන්න ලැබුණා, IMF එකත් එක්ක සාකච්ඡා කරලා තමයි මේක කළේ කියලා. මම අහන්න කැමැතියි, IMF එකත් එක්ක සාකච්ඡා කරලා සම්පූර්ණ බද්ද ඉවත් කරන්නට කටයුතු නොකළේ ඇයි කියලා. මොකද, අපනයන සේවා ක්ෂේත්‍රයේ, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ, ඩිජිටල් ක්ෂේත්‍රයේ විශාල ප්‍රමාණයක්, ක්ෂුද්‍ර, මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයන් හොඳ ආදායමක් උපයනවා. ඒක ඇත්තටම අපේ රටට ඩොලර් ආදායම් ඉපැයීමක්. එතකොට මේ ආර්ථික අර්බුදය තුළ මම හිතන විධියට, ඔබ රජයේත්, අපි හැමෝගෙමත් ඉලක්කය වෙලා තිබෙන්නේ ඩොලර් ආදායම වර්ධනය කිරීම. නමුත්, මේ බද්ද පැනවීම ඩොලර් ආදායම වර්ධනය කිරීමට හානියක්.

අපි තවමත් ප්‍රමාද නැහැ. විශේෂයෙන්ම මේ අය වැය යෝජනා සංශෝධනය කිරීමේ අවස්ථාව අපට තවම තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, කරුණාකරලා ජනාධිපතිවරයා ප්‍රමුඛ රජයේ අවධානයට යොමු කරලා, මේ සියයට 15 බද්ද සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට කටයුතු කරන්න කියලා. සියයට 30 සිට සියයට 15ට බද්ද අඩු කළාය කියන එක තුළින් අපනයන ක්ෂේත්‍රයේ අයට යම් සහනයක් ලැබෙයි. ඒක නැහැයි කියලා කියන්නේ නැහැ. නමුත්, කරුණාකර මේක සහමුලින්ම ඉවත් කරලා, අපේ ඩිජිටල් අපනයන ක්ෂේත්‍රයට ලොකු ශක්තියක් ලබා දෙන්නය කියන ඉල්ලීම කරනවා. මොකද, ඩිජිටල් අපනයන ප්‍රවර්ධනය කිරීම ඔබතුමන්ලාගේ රජයේ ප්‍රතිපත්තියයි. මේක කථාවෙන් කියනවා වාගේම මහ පොළොවේ සත්‍යයක් බවට පත් කරන්නට මේ සියයට 15 බද්ද ඉවත් කිරීමේ යෝජනාව රජය තුළ සාකච්ඡා කරලා, ඒක ක්‍රියාත්මක කරන්න කියලා අපි යෝජනා කරනවා.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනිල් ජයන්ත අමාත්‍යතුමා.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මම ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නම්. අපි කවුරුත් දන්නවා IMF වැඩසටහන යටතේ තිබෙන තත්ත්වය. අපනයන සේවා සම්බන්ධයෙන් මුලින්ම තිබුණේ සියයට 30ක බද්දක්. මෙහිදී රජයේ ආදායම සම්බන්ධයෙන් ඇති වන්නේ revenue measures සම්බන්ධ ප්‍රශ්නයයි. අපි කැමැතියි, සියලු බදු අයින් කරන්න පුළුවන් නම්. අපි සාකච්ඡා - negotiate - කරලා අපට පුළුවන් උපරිමය කළා. ඒ වාගේම, අපි negotiate කරලා සම්පූර්ණයෙන්ම අයින් කර ගත්තු ඒවාත් තිබෙනවා. IRIT - Imputed Rental Income Tax - එක අපි සම්පූර්ණයෙන් අයින් කර ගත්තා. ඒ වාගේම, බදු සහන ගැනත් කථා කළා. අපනයන සේවා සම්බන්ධයෙන් තීරණය කර තිබුණු ප්‍රමාණය පහළ ප්‍රමාණයකට -සියයට 15ට- ගෙන එන්නේ හේතුවක් ඇතුවයි. මෙහිදී බදු ගෙවීමේ මූලධර්මය පැහැදිලි කර ගන්න ඕනෑ. ඒ කියන්නේ for fairness, ලංකාවේ සෑම තැනැත්තෙක්ම බදු ගෙවන්න ඕනෑ. ඒකට පුද්ගලයන් අදාළයි; සමාගම් අදාළයි. හැබැයි, බදු නිදහස් සීමාවක් තිබෙනවා. ඒ පුද්ගලයා නේවාසික පුද්ගලයෙක් - a resident person - වෙන්නට ඕනෑ. Resident person කෙනෙකු ලංකාවෙන් හෝ පිට රටකින් උපයන සියල්ල බද්දට යටත් වෙන්න ඕනෑ. මේ කියන බද්ද පනවන්නේ පිට රටට කරන සේවා අපනයනය සම්බන්ධයෙන්. මේක digital කියලා ලඝු කර ගැනීම ගැටලු සහගතයි. සේවා අපනයනය මත බදු අය කිරීමයි මෙහිදී සිදු වන්නේ. මොකද, ජාත්‍යන්තර ගනුදෙනුවලදී දැන් තිබෙන ප්‍රවණතාව තමයි බදු සැඟවීම. Tax evasion and avoidance පිළිබඳව OECD එකෙන් වාර්තාවක් ඉදිරිපත් කරලා Global Minimum Tax එකකුත් යෝජනා කර තිබෙනවා. අපි ඒ කරුණුත් සැලකිල්ලට භාජන කරලා තමයි මේ ඉදිරිපත් කිරීම කරලා තිබෙන්නේ.

අපට ආදායම් තිබෙනවා නම්, අදාළ සීමාවන් යටතේ අපි බදු ගෙවන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා මේ රට ගොඩ යන්න නම් එසේ කරන්න ඕනෑ බව. එතකොට ඒ පුද්ගලයාගේ වගකීම තමයි තමන්ට ලැබෙන ආදායම declare කරලා අදාළ බදු ප්‍රතිශතය ගෙවන එක. කෙසේ වෙතත්, අපනයන සේවා ක්ෂේත්‍රය සැලකිල්ලට භාජන කරලා තමයි සියයට 15 යොදා තිබෙන්නේ. උදාහරණයක් හැටියට, අපි පුද්ගලයන් දෙදෙනෙකු ගනිමු. අපි හිතමු, එක පුද්ගලයෙක් ලංකාව ඇතුළේ රුපියල් ලක්ෂ 5ක ආදායමක් උපයනවා කියලා. අනෙක් පුද්ගලයා රුපියල් ලක්ෂ 5ක ආදායමක් උපයනවා කියාත්, ඔහුට රට ඇතුළේත් ආදායමක් තිබෙනවා සහ ඩිජිටල් සේවාවෙනුත් යම්කිසි කොටසක් එනවා කියාත් හිතමු. ඒ කියන්නේ, සේවා අපනයනයෙනුත් ඔහුට යම්කිසි කොටසක් එනවා. සේවා අපනයනයෙන් යම්කිසි කොටසක් එන්නේ නැතුව ලංකාවේ යම් පුද්ගලයෙකු රුපියල් ලක්ෂ 5ක ආදායමක් ලබා ගත්තා නම්, ඒ පුද්ගලයා බද්දට යටත්. ඒ ආදායමට අදාළව බදු ගෙවන්න ඕනෑ නේ. මාසයකට රුපියල් 150,000ට වැඩියෙන් උපයන ප්‍රමාණයට බද්ද ගෙවන්න ඕනෑ. ඒක අප කාටත් එකයි නේ. ඒක සාධාරණයි නේ. ඒ පුද්ගලයා කොහොමද බදු ගෙවන්න ඕනෑ? ඊළඟ රුපියල් 83,000ට සියයට 6කුත්, ඊළඟ රුපියල් 41,000ට සියයට 18කුත්, ඊළඟට සියයට 24කුත්, සියයට 30කුත්, සියයට 36කුත් වශයෙනුයි ගෙවන්න ඕනෑ. අපි කැමති වුණා හෝ නැති වුණා හෝ ඒක තමයි දැනට තිබෙන සාධාරණ මට්ටම. හැබැයි සේවා අපනයනය කරන කෙනාට විශේෂ වාසියක් ලැබෙනවා. මොකක්ද ඒ වාසිය? ඔහුගේ රුපියල් ලක්ෂ 5 ආදායමෙන් පළමුවෙනි රුපියල් 150,000 නිදහස් වෙනවා. ඊළඟ රුපියල් 83,000ට සියයට 6යි, ඉතුරු ශේෂයටම පැනවෙන්නේ සියයට 15යි. එතකොට ඔහුට විශේෂ වාසියක් එතැනදී ලැබෙනවා. අන්න ඒ වාසිය ලබා ගැනීමට ස්වයං තක්සේරු වාර්තා කිරීම යටතේ තමන්ගේ බදු තක්සේරුව ඉදිරිපත් කරන කොට ඔහු ඔප්පු කරන්න ඕනෑ, තමන් එය සේවා අපනයනය කරලා ලබා ගත්තු ආදායමක් කියලා. ඒ නිසා තමයි බැංකු හරහා ඉදිරිපත් කරන්න ඕනෑ බව කිව්වේ.

මේ වාගේ දේවලට මුවා වෙලා බදු ගෙවිය යුතු අය සමහර විට බදු නොගෙවා ඉන්නවාද කියන එක වෙනම කාරණයක්. ඒ මිස අපි අසාධාරණ බද්දක් පනවලා නැහැ. විශේෂයෙන්ම සාධාරණ බවේ මූලධර්මය රැකීම පදනම් කරගෙන සහ ජාත්‍යන්තරව ගොඩ නැඟෙන ගනුදෙනු හරහා ලෝකයත් සමඟ එකට ගැටගැසී යන නව ප්‍රවණතාවත් එක්කයි මේ වැඩ කටයුත්ත කළේ. එහෙම නැතුව මෙහිදී කිසිම ආකාරයකින් අසාධාරණ බදු පැනවීමක් කරලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Speaker, may I raise a point of Order under Standing Order No. 91 (b), please?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. (Dr.) Harsha de Silva?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, with the agreement of the Deputy Minister, may I seek a simple clarification, please?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, online services export කරන අයගෙනුත් බදු අය කරනවා කිව්වා නේ. ඒක පැත්තකින් තියමුකෝ. Online casinos අරන් බලන්න. ඔබතුමා දැන් phone එක අරගෙන Google search කරලා බලන්න, online casinos කීයක් තිබෙනවාද කියලා. ඒ කට්ටියට ශත 5ක්වත් බදු ගහන්නේ නැහැ නේ. මම ඒවායේ නම් කියන්න අවශ්‍ය නැහැ. ඔබතුමා අන්තර්ජාලයට ගිහිල්ලා බලන්න. "Online casino" කියලා Google එකේ ගහලා බලන්න. එතකොට කැසිනෝ කීයක් එනවාද කියලා බලාගන්න පුළුවන්. ඒ මිනිස්සුන්ගෙන් ශත 5ක්වත් බදු අය කරන්නේ නැත්තේ ඇයි? මේ ආණ්ඩුව ආපු දවසේ ඉඳන් අපි මේ ගැන කිව්වා. පාර්ලිමේන්තුවට ඕනෑ තරම් හදිසි පනත් කෙටුම්පත් ගෙනෙනවා නේ. මේ කියන amendment එකත් එහෙම ගේන්න තිබුණා. ඒ සඳහා ඕනෑ තරම් කාලය තිබුණා. අපි ගිය ආණ්ඩුවටත් මේ ගැන කිව්වා. Online වැඩ කරන කට්ටියගෙන් සියයට 15ක් බදු අය කරන්න පුළුවන් නම්, online casinosවලට බදු ගහන්නේ නැත්තේ ඇයි?

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
ගරු මන්ත්‍රීතුමා, අපේ බදු නීතියට අනුව බදු නොගහන්නේ නැහැ. මම කලිනුත් කිව්වා වාගේ සෑම තැනැත්තෙක්ම මේ බදු නීතියට යටත්; every individual බදු නීතියට යටත්. නමුත්, කවුරුන් හෝ බදු නොගෙවා ඉන්න පුළුවන්. බදු අය කර ගැනීමට අදාළව trace කර ගැනීමේ තාක්ෂණික ගැටලු ගණනාවක් ද තිබෙනවා. අපි ඒ අයගෙනුත් බදු අය නොකරන්නේ නැහැ. ඉදිරියේදී ක්‍රම ක්‍රමයෙන් එය කරනවා. Online යන්නම අවශ්‍ය නැහැ,- *[බාධා කිරීමක්]* අපි කවුරුත් දන්නවා, මේ ව්‍යාපාරික ලෝකයේ,- *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඇයි, ඒ අයගෙන් බදු අය කරන්න ඕනෑ නැද්ද?

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. හැමෝම මේ බදු නීතියට යටත්. බදු නොගෙවා ඉන්න බැහැ. මොකද, ඔවුන් කිසිම තැනකදී බද්දෙන් නිදහස් කරලා නැහැ. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ අය නිදහස් නේ- *[බාධා කිරීම්]*

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
නැහැ, නැහැ. ඒ අය බද්දෙන් නිදහස් කරලා නැහැ. ඒක වැරදි අර්ථකථනයක්. ව්‍යාපාර කරන අය ගත්තොත්, බදු declare කරන්නේ නැතිව ඉන්න අය ඕනෑ තරම් ඉන්නවා. ඒ අය බදු ගෙවන්නේ නැතිව ඉන්නවා. වෙනත් වෘත්තීන් කරන අයත් ඒ අතර ඉන්න පුළුවන්. බදු නොගෙවා සිටීමත්, බදු ගෙවීම පැහැර හැරීමත් කියන එක මේ තුළ තිබෙන යථාර්ථයක්. අපි කරන්න ඕනෑ, ඒ තත්ත්වය අවම කර ගනිමින් ඉදිරියට යන එකයි. මේක එක් වරම කරන්න බැහැ. අපි අනිවාර්යයෙන් ඒවා සැලකිල්ලට භාජනය කරනවා. කැසිනෝ ව්‍යාපාර කරන අය විතරක් නොවෙයි, බදු නොගෙවා ඉන්න තවත් අය ඉන්නවා. සාධාරණ විධියට බදු ගෙවන්න අවස්ථාව හදන්න ඕනෑ. Conveniently ඔහුට ගෙවන්න පුළුවන් වෙන්නත් එපායැ. අපි ගෙවන්න කිව්වාට, සමහර අවස්ථාවල ගෙවන්න බැරි වෙන්න පුළුවන්. ඉදිරියේදී අපි සාධාරණ බව, ගෙවීමේ සරල බව සහ ගෙවීමේ පහසුව ඇති කරන ක්‍රමයකට ඩිජිටල් තාක්ෂණයත් උපයෝගී කරගෙන යනවා. ඒක එකවර කරන්න බැහැ. අපි ඒ සඳහා අනිවාර්යයෙන් මැදිහත් වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, one more point.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බොහොම ස්තුතියි ඔබතුමාගේ පැහැදිලි කිරීමට.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියටත් මම මේ ප්‍රශ්නය ඔබතුමාට යොමු කරනවා. අද නොවෙයි, මේ ප්‍රශ්නය යොමු කළේ. මා කලිනුත් කිව්වා වාගේ ගිය ආණ්ඩුව කාලයේ ඉඳන්ම මේ ප්‍රශ්නය යොමු කළා. ඔවුන් කලින් කිව්වේ, online casinos නැහැ කියලා. හැබැයි, online casinos තිබෙනවා. Offline casinos වාගේම online casinoවලින් දවසකට මිලියන ගණන් -සමහර විට බිලියන ගණන් වෙන්නත් පුළුවන්- ඒ අය හම්බ කරනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හරහා මුදල් අමාත්‍යාංශයට යොමු කළ අපේ නිර්දේශ ඕනෑ තරම් තිබෙනවා. ඒ නිර්දේශ ක්‍රියාත්මක කරන්න. ඒ සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වෙන්න කියන ඉල්ලීම මා කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කළා නේ; කරුණු පැහැදිලි කිරීමක් කළා නේ. දැන් හරි. ඔය ප්‍රශ්නය වෙනත් දවසක අහන්න.

අමාත්‍යාංශ නිවේදන.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, just one minute.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමා ප්‍රශ්නයක් යොමු කළා; කරුණු පැහැදිලි කිරීමක් කළා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට අවස්ථාව දෙන්න බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කෙටි පැහැදිලි කර ගැනීමක්, ගරු කථානායකතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා දැන් ප්‍රශ්නයක් ඇහුවා නේ. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා දැන් ප්‍රශ්නයක් ඇහුවා. ඔබතුමාට බොහොම ගරුත්වයෙන් ඒ කරුණු පැහැදිලි කර ගැනීමට අවස්ථාව දුන්නා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා දුන්නු උත්තරයට අදාළව පොඩි පැහැදිලි කරවා ගැනීමක්. මට විනාඩියකට අවස්ථාව දෙන්න.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු සාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු සාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
කෞරව සභානායකර් අවර්කළේ, නාන් ඉන්දච් සපෙයිල් මික මුක්කියමානතොරු විටයත්තෛක් කූර වේණ්ටුම්. කටන්ත පෙප්රුවරි මාතම් 20ආම් තිකති ආරෙයම්පති පිරදේසච්චිල් වාල්වෙට්ටුච් චම්පවමොන්රු නටන්තතු. අතනෛත් තොටර්න්තු, නේට්රු ඉරවුම් මට්ටක්කළප්පු නකරප් පකුතියිල් වාල්වෙට්ටුක් කුළුවාල් වාල්වෙට්ටුච් චම්පවමොන්රු නටත්තප්පට්ටු ඉරුක්කිරතු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය point of Order එකක් නොවෙයි. ඔබතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට ඒ සඳහා අවස්ථාව ඉල්ලන්න.

අමාත්‍යාංශ නිවේදන. *[බාධා කිරීම්]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු සාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා -

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු සාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Standing Order එක මොකක්ද කියලා කියන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා - *[බාධා කිරීම්]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු සාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Standing Order එක මම කියන්නන්. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔය කාරණය ජාතික වැදගත්කමකින් යුක්ත ප්‍රශ්නයක් නොවෙයි නේ.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු සාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමා mike එක දෙන්න. මම Standing Order එක කියන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කියන්න.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු සාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ මම මේක අහන්නේ. ඔබතුමා එය කියවන්න. මට විනාඩියක කාලයක් තුළ ගැටලුවක් ගැන අහන්න පුළුවන්. ඔබතුමා ඒ ස්ථාවර නියෝගය කියවන්න.

කෞරව අමෛච්චර් අවර්කළේ! පාතාළ උලකක් කුලුක්කළාල් මට්ටක්කළප්පු මාවට්ටත්තිලුම් චිල කුළප්පංකළ් නටක්කලාම් එන්රු අණ්මෛයිල් මාණ්පුමිකු චනාතිපති අවර්කළුම් චොන්නාර්. නේට්රු ඉරවු මට්ටක්කළප්පු නකරප් පකුතියිල් වාල්වෙට්ටුච් චම්පවමොන්රු නටන්තිරුක්කිරතු. අතේපෝල්, ඔරු වාරත්තුක්කු මුන්නර් ආරෙයම්පතියිලුම් නටන්තිරුක්කිරතු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය අදාළ නැහැ. ඔබතුමාට අවස්ථාව ලබා දෙන්න විධියක් නැහැ. *[බාධා කිරීම්]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු සාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඒක හරියට කියවන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය ගරු සුනිල් කුමාර ගමගේ මහතා. *[බාධා කිරීම්]*

මන්නාරම දිස්ත්‍රික්කයේ ක්‍රීඩා පිටිවල ඉදිකිරීම් කටයුතු: තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

மன்னார் மாவட்டத்தில் விளையாட்டு மைதானப் பணிகள் : இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரினது கூற்று

CONSTRUCTION WORK OF PLAYGROUNDS IN MANNAR DISTRICT: STATEMENT BY MINISTER OF YOUTH AFFAIRS AND SPORTS

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා 2025.02.28 දින ඉදිරිපත් කරපු ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයට මම පිළිතුරු ලබා දෙනවා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කාරණය සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට ගෙනෙන්න. එහෙම නැත්නම් ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කරන්න. එහෙම නැතුව දැන් ඒ කාරණය අදාළ වෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* කරුණාකර ගරු අමාත්‍යතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ප්‍රශ්න අංක 1ට පිළිතුර මෙසේයි.

පල්ලිමුණේ ශාන්ත ලුසියා ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් නොවෙයි, කරන්නේ. ඒකට මුදල් සපයා තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරිය. *[බාධා කිරීම්]* පල්ලිමුණේ ශාන්ත ලුසියා ක්‍රීඩා පිටියේ කටයුතු උතුරු පළාත් නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2013 වසරේ ආරම්භ කරන ලද අතර, - පළමු අදියරය වූ පස් පිරවීමේ කටයුතු අවසන් වී ඇත. ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සහ තණ පිඩැලි ඇල්ලීමේ කටයුතු අසාර්ථක වී ඇත - 2022 වසරේ තෙවන අදියරයේ කටයුතු සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 51ක මුදල එවකට රටේ පැවති අසාමාන්‍ය වාතාවරණය හේතුවෙන් භාවිත නොකර වැඩකටයුතු අත් හැර දමන ලද අතර අද දක්වා එම කටයුතු ආරම්භ කර නොමැත. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! ගරු මන්ත්‍රීතුමනි, - *[බාධා කිරීම්]* Order, please! සභාවේ කටයුතුවලට බාධා කරනවා නම් ඔබතුමා එළියට දාන්න සිදු වෙනවා. *[බාධා කිරීම්]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ පසුගිය සතියේ චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට ඔබතුමා අවස්ථාව දුන්නා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට ඔය යෝජනාව ගෙනෙන්න, ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු අමාත්‍යතුමා ඔබතුමාට කථා කරගෙන යන්න පුළුවන්. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) බලන්න. එහි තිබෙනවා, MP කෙනෙකුට වැදගත් ප්‍රශ්නයක් අහන්න පුළුවන් කියලා. අනෙක් එක මම පක්ෂ නායකයෙක්. ඔබතුමාට වගකීමක් තිබෙනවා අපි කියන එක අහන්න. කඩුවක් ගෙනැල්ලා අපේ පැතිවල මිනිස්සු කැලි කැලිවලට කපනවා. ඒවා අපි මෙතැන කියන්නේ නැතුව කොහේ ගිහින් කියන්නද? කරුණාකරලා අපි කියන දේ අහන්න. ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා නැහෙනහිර පාලනය කරනවා. මම උතුර පාලනය කරනවා. වෙන කවුරු හරි නැඟිට්ටා නම්, කථා කරන්න පැය ගණන් දෙනවා නේ. ඇයි අපට දෙන්න බැරි? *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒක කාර්ය පටිපාටියක්.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, ඔබතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අපි නැඟිට්ටාම මයික් එක දෙන්න බැරි ඇයි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

අපි දෙමළෙන් කථා කරන එක, සිංහලෙන් කථා කරන එක ඔබතුමාට අහන්න බැරිද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක procedure එකක්. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, *[බාධා කිරීම්]* බාධා කරන්න එපා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, කථා කරන්න. *[බාධා කිරීම්]*

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු කථානායකතුමනි, මම 2වැනි ප්‍රශ්නයට උත්තර දෙනවා.

එම ක්‍රීඩා පිටිය එවකට සිටි දේශපාලන අධිකාරිය විසින් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමට තෝරා ගෙන තිබෙනවා. 2016 අවුරුද්දේ. මේකේ,- *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, ඒ කාරණය ඔබතුමාට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට ගෙනෙන්න පුළුවන්.

ගරු අමාත්‍යතුමා.*[බාධා කිරීම්]* Order, please! කරුණාකරලා අසුන් ගන්න.

[බාධා කිරීම්] Order, please! කරුණාකර අසුන් ගන්න. *[බාධා කිරීම්]* මන්ත්‍රීවරු කරුණාකර අසුන් ගන්න. *[බාධා කිරීම්]* ගරු සුනිල් කුමාර ගමගේ ඇමතිතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
2016 අවුරුද්දේ මේ ක්‍රීඩා සංකීර්ණය ආරම්භ කිරීමෙන් පස්සේ පස් පිරවීමේ කටයුත්ත කරලා තිබෙනවා. චතුර ගැලීමක් නිසා ක්‍රීඩාගාරය ඉදිකිරීමත්, කාණු පද්ධතිය ඉදිකිරීමත් නවත්වා තිබෙනවා. මේ ප්‍රදේශය වතුරින් යට වෙනවා. ඒ නිසා මෙම ව්‍යාපෘතිය අතරමඟ නතර කරලා මන්නාරම නාෆාට්ටන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නරුවිලික්කුලම් ක්‍රීඩා පිටිය වෙත මාරු කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, කලින් ක්‍රීඩා පිටිය අසාර්ථක වුණාට පස්සේ - එමිල් නගර් ක්‍රීඩා පිටියේ - නරුවිලික්කුලම් ක්‍රීඩා පිටියේ වැඩ 2017 වර්ෂයේ ආරම්භ කර තිබෙනවා. ප්‍රතිපාදන වෙන් කරපු පිහිනුම් තටාකයේ වැඩ ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මෙහි ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම හා මීටර් 400ක ධාවන පථය ඉදිකිරීම සඳහා 2025 වර්ෂයට ප්‍රතිපාදන අපි වෙන් කර තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාට මිනිත්තුවක් අවස්ථාව දීලා මේක ඉවර කරලා දාන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මම පැහැදිලිවම කිව්වා, මේක procedure එකක් කියලා. එම මන්ත්‍රීතුමාට මේ ප්‍රශ්නය ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම නැත්නම්, සභාව කල් තබන අවස්ථාවේදී යෝජනාවක් විධියට ඉදිරිපත් කරන්න පුළුවන්. එසේ තිබෙද්දීත් මේ මන්ත්‍රීවරු මේ සභාවේ හැසිරෙන ආකාරය කිසිසේත්ම ඔබින්නේ නැහැ. කරුණාකර මන්ත්‍රීවරු මීට වඩා වැදගත් විධියට හැසිරෙන්න පුරුදු වුණා නම් හොඳයි. මේ පාර්ලිමේන්තුව ඇතුළේ මාධ්‍ය සංදර්ශන එපා. ගරු සුනිල් කුමාර ගමගේ අමාත්‍යතුමා කථා කරන්න. *[බාධා කිරීම්]* කරුණාකර මන්ත්‍රීතුමා අසුන් ගන්න. *[බාධා කිරීම්]* ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමා මගේ Order එක ක්‍රියාත්මක කරන්න. *[බාධා කිරීම්]*

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා දොස්තර කෙනෙක් නේද? *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් කුමාර ගමගේ අමාත්‍යතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
මේකේ පැති විකට්ටු සහ ක්‍රීඩා පිටි අලුත්වැඩියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා තමයි කරන්නේ. මන්නාරම් දිස්ත්‍රික්කයට අපි පැති විකට්ටු 7ක් සහ ක්‍රීඩා පිටි 5කුත් සංවර්ධනය කරන්න අපි බාරගෙන තිබුණා.

ඒකෙන් පැති විකට්ටු 7 අපි සංවර්ධනය කරලා ඉවරයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිවේදනයට අනුව. නමුත්, ඉතිරි ක්‍රීඩා පිටි පහ 2025 අය වැය ප්‍රතිපාදනවලින් සංවර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මන්නාරම දිස්ත්‍රික්කයේ ඉතිරි ක්‍රීඩාපිටි පහ අපි ප්‍රමුඛතාව මත සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(මාණ්පුමිකු (වෛද්‍යර්) නළින්ද ජයතිස්ස - සුකාතාරම් මර්‍රුම් වෙකුසන ඌටක අමෛච්සරුම් අරසාංගක් කට්සියින් මුතර්කෝලාසානුම්)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම ගැන. *[බාධා කිරීම්]* ඉතා වැදගත් ප්‍රශ්නයක් ගැන කථා කරන්නයි මම බලාපොරොත්තු වන්නේ.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් ඉරාචමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි,-

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) නළින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය ඉදිරිපත් කරලා ඉන්නම්. මම කථාව අවසන් කළාට පසුව ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) ඉරාමනාදන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මටත් විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු චජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු චජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මීට පෙර අවස්ථා ගණනාවකදී ස්ථාවර නියෝග 92 (2) යටතේ ඔබතුමා මේ සභාවේම ගරු මන්ත්‍රීතුමන්ලාට විනාඩියක් තුළ එතුමන්ලාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒකෙන් ඔබතුමා precedent එකක් create කරලා තිබෙනවා; පූර්වාදර්ශයක් දීලා තිබෙනවා. ඒක අනුගමනය කරමින් ප්‍රශ්න ඉදිරිපත් කරන ගරු මන්ත්‍රීවරුන්ට අනෙකුත් මන්ත්‍රීවරුන්ට ලබා දුන්නා සේ විනාඩිය බැගින් ලබා දෙන්න, ස්ථාවර නියෝග 92(2) යටතේ. *[බාධා කිරීමක්]* මේකට පූර්වාදර්ශයක් - precedent එකක් - තිබෙනවා. මන්ත්‍රීවරු පිරිසකට ඒ අවස්ථාව ලබා දීලා මෙතුමන්ලාට ඒ අවස්ථාව අහිමි කළාම, ඒක වැරදියි නේ. ඒකයි මම කියන්නේ. ඒ නිසා කරුණාකර, මේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙපළට අදහස් ඉදිරිපත් කරන්න විනාඩිය බැගින් අවස්ථාව ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, procedure එකක් තිබෙනවා නේ. ෂාණක්කියන් මන්ත්‍රීතුමාට මම කිව්වා, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ලෙස හෝ එහෙම නැත්නම් ස්ථාවර නියෝග 27(2) යටතේ එතුමාගේ කාරණය ඉදිරිපත් කරන්න පුළුවන් කියලා. එතුමා ඒක violate කරලා නේ මේ කථා කරන්නේ. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එකක්,- *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා. *[බාධා කිරීම්]* ඔව්, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් මන්ත්‍රීතුමා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් ඉරාචමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි,-

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමාට කියන්න බැහැ - *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් ඉරාචමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මේක විනාඩියක ප්‍රශ්නයක්. මම පැහැදිලිවම ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලුවා. මම ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ විනාඩියයි ඉල්ලුවේ. මෙතැන ගැටුමක් ඇති කර ගන්න දෙයක් නැහැ. අද උදේ පාර්ලිමේන්තුවේ විනාඩි 20ක් ඔබතුමා නාස්ති කළේ.

කෞරව අමෛච්සර් අවර්කළේ, කටන්ත පෙප්රුවරි මාතම් 20ආම් තිකති මට්ටක්කළප්පිල් වාළ්වෙට්ටුක් කුළුවාල් වාළ්වෙට්ටුච් චම්පවමොන්රු නටත්තප්පට්ටුළ්ළතු. ඉතනාල් මක්කළ් පාරිය අච්චත්තිල් උළ්ළනර්. අතු තොටර්පිල් ඉන්නුම් කෛතුකළ් නටෛපෙරවිල්ලෛයෙන නේර්රෛය තිනම් කාලෛයිල් මක්කළ් ආර්ප්පාට්ටත්තිල් ඊටුපට්ටනර්. නේර්රු ඉරවුම් මට්ටක්කළප්පු නකරිල් වාළ්වෙට්ටුක් කුළුවොන්රු වාළ්වෙට්ටුච් චම්පවමොන්රෛ නිකළ්ත්ති ඉරුක්කිරතු. පාතාළ උලකක් කුළුක්කළාල් මට්ටක්කළප්පිලුම් ඉව්වාරාන විටයඞ්කළ් නටක්කලාමෙන මාණ්පුමිකු චනාතිපති අවර්කළ් චොල්ලියිරුන්තාර්. එනවේ, නීඞ්කළ් ඉන්ත විටයම් තොටර්පිල් කරිචනෛ එටුත්තු, ඉතර්කු ඔරු මුටිවෛ අවචරමාකක් කාණ වේණ්ටුම් එන්රුතාන් නාන් කේට්කින්රේන්.

මෙන්න මේ ටික විතරයි මට අහන්න ඕනෑ වුණේ. ඔබතුමා මේ සභාව ත්‍රිකුණාමලයේ ඉස්පිරිතාලේ MS වාගේ මෙහෙයවන්න යන නිසා තමයි ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, සමාවන්න මම හැසිරුණු විධියට. පළමුවෙන්ම මම සමාව ඉල්ලන්නම්. ඔබතුමන්ලා අපට කථා කරන්න දෙන්නේ නැත්තේ ඇයි? කරුණාකරලා අහන්න. Trincomalee Base Hospital එකේ ඉන්න doctor කෙනෙක් ලෙඩ්ඩුන්ට ගහලා, ඒක වීඩියෝ කරලා මාධ්‍යයට දාලා තිබෙනවා. කරුණාකරලා ඒ ගැන පොඩ්ඩක් බලන්න. ඒ doctor දවස් 7ක් දැන්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඔය ප්‍රශ්නය ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් විධියට හෝ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට ඉදිරිපත් කරන්න. ඒක මේ වෙලාවේ මාතෘකාවට අදාළ කාරණයක් නොවෙයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ තිබෙන කාරණය මම කියවන්නම්.

"රීති ප්‍රශ්නයක් මතු කිරීමේ දී, මන්ත්‍රීවරයකුට මිනිත්තු එකකට වඩා කතා කරනු ලැබිය නොහැකි අතර, සැලකිල්ලට භාජනය කරනු ලබමින් තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව කථා කරනු ලැබිය නොහැකි වන්නේ ය."

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයකුට point of Order එකක් raise කරන්න පුළුවන් ඕනෑ වෙලාවක, ඒක ඇත්ත. අනෙක් ප්‍රශ්නවලට වඩා ඒක ප්‍රමුඛ වෙනවා. හැබැයි ඒක රීති ප්‍රශ්නයක් වෙන්න ඕනෑ. ඒක බස් එක කැඩිලා හරි, පාලම කැඩිලා හරි, කෝච්චිය කැඩිලා හරි, ඒ විධියේ ප්‍රශ්නයක් වෙන්න බැහැ. ඒක තමයි 92(2)(ආ) ස්ථාවර නියෝගයේ තිබෙන්නේ. "රීති ප්‍රශ්න" කියලා තිබෙන්නේ මාතෘකාවේ. රීති ප්‍රශ්න කියන්නේ මොනවාද? මේ සභාවේ ඉන්න 225දෙනාම ඔය විධියට විනාඩිය විනාඩිය points of Order මතු කරන්න ගත්තොත් පාර්ලිමේන්තුව කරගෙන යන්න වෙන්නේ නැහැ නේ. ඒ නිසා අපි කියන්නේ මේක කිසිම discrimination එකක් නොවෙයි. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, අපට කියන්න තිබෙන්නේ මෙච්චරයි. 92(2)(ආ) ස්ථාවර නියෝගය යටතේ රීති ප්‍රශ්නයක් මතු කරන්න තමයි මන්ත්‍රීවරයකුට විනාඩියක් ලැබෙන්නේ. එහෙම නැතිව වෙනත් අවශ්‍යතා ඉටු කර ගන්න නොවෙයි. ඒ සඳහා මන්ත්‍රීතුමන්ලාට ඕනෑ තරම් අවස්ථා Standing Orders අනුව තිබෙනවා. ඒක තමයි ගරු කථානායකතුමා පෙන්වා දුන්නේ. අපි ලේකම් මණ්ඩලයෙනුත් ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ වාගේ අවස්ථාවලදී සභාවට සහ මුලාසනයට අදාළ මග පෙන්වීම කරන්න කියලා.

නැත්නම් මේක දිගට ඇදගෙන, ඇදගෙන යනවා. ගරු කථානායකතුමනි, පෙර වරු 10.30ට Committee Stage Discussion එක පටන් ගන්න අදත් අපට බැරි වෙලා තිබෙනවා. ඒකට විපක්ෂය වගකියන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලිව මේ කාරණාව පිළිබඳව ප්‍රකාශ කරද්දීත් ඒ මන්ත්‍රීවරුන් දෙදෙනා රීතියට අනුකූල නොවන විධියට හැසිරීම පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා, කථා කරන්න. *[බාධා කිරීම්]* කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. නැත්නම්, සභාවේ කටයුතු කරගෙන යන්න බැරි වෙනවා. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හරි, හරි. මගේ කථාවෙන් පසුව ගන්නකෝ.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, කරුණාකරලා සභාව නිශ්ශබ්ද කරලා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]* Hon. Rasamanickam, please sit down! - *[Interruption.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මේක මේ විධියට කරන්න බැහැ, ගරු කථානායකතුමනි. කලින් එක්කෙනායි හිටියේ. දැන් දෙන්නෙක් වෙලා. සභාව විහිළුවක් කරලා තිබුණේ, එක්කෙනෙක් විසින්. දැන් දෙන්නෙක් ඒක කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව තුළ හැසිරීම ඉතාම අශෝභනයි. සභා ගර්භය තුළ විනයගරුකව හැසිරෙන්න.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා, වාඩිවෙන්න. Please sit down!

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, let me -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please sit down!

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමා කිව්වා, point of Order එකක් නොවෙයි කියලා. මට මගේ මේ රීති ප්‍රශ්නය - *[බාධා කිරීමක්]* ස්ථාවර නියෝග 91(2) කියවන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඉස්සෙල්ලාම ස්ථාවර නියෝග 92(1) කියවලා එන්න.

Hon. (Dr.) Nalinda Jayatissa, please make your Statement.

2025 අය වැය මඟින් යෝජිත වෛද්‍යවරුන් සඳහා වන වැටුප් සහ දීමනා වැඩි කිරීම: සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்பட்ட வைத்தியர்களின் சம்பளம் மற்றும் கொடுப்பனவுகளின் அதிகரிப்பு: சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று

INCREASE OF SALARIES AND ALLOWANCES PROPOSED BY BUDGET, 2025 FOR DOCTORS: STATEMENT BY MINISTER OF HEALTH AND MASS MEDIA

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මෙවර අය වැයෙන් තම දීමනා කප්පාදු කරන නිසා මාර්තු 5වැනි දා දීප ව්‍යාප්ත වැඩ වර්ජනයකට යොමු වන බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලේකම්වරයා මාධ්‍යයට ප්‍රකාශ කර තිබුණා. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ද ඒ අය හමුවී තිබුණු බව මාධ්‍ය වාර්තා කළා. ඒ දීමනා කප්පාදුව බරපතළ අසාධාරණයක් බවත්, ඒ නිසා ආණ්ඩුවට එරෙහිව යම් කරුණු කියන බවත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් මාධ්‍යයට කියා තිබෙනවා මම දැක්කා. පසුගිය පෙබරවාරි 17වැනි දා ජනාධිපතිවරයා විසින් අපේ ආණ්ඩුවේ මංගල අය වැය කථාව ඉදිරිපත් කරලා දින දෙක තුනක් ගත වෙන්නටත් මත්තෙන් පෙබරවාරි භය වැනිදා උද්ඝෝෂණයක නිරත වන බව එක්තරා හෙද සංගමයක නායකයෙක් නිවේදනය කළා. ඔහු කවුද කියලා දන්නවා. තමුන්නාන්සේලාත් එක්ක වැඩ කරපු රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයාගේ අධ්‍යක්ෂ ජනරාල් කෙනෙක් විධියට වැඩ කරපු කෙනෙක් තමයි අපි අය වැය කථාව ඉදිරිපත් කරලා දවස් දෙකක් යනකොට මාර්තු භයවැනි දා උද්ඝෝෂණයක් කරනවා කියලා කිව්වේ. හෙදියන්ගේ වැටුප් වැඩි වීම ගැන මම පාර්ලිමේන්තුවට කරුණු වාර්තා කළා. දැන් භය වැනිදාට පෙරදා හා පසුදා - පස්වැනි දා හා හත්වැනි දා - වැඩ වර්ජනයක නිරත වන බවට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලේකම්වරයා පවසා තිබෙනවා.

ගරු කථානායකතුමනි, වෛද්‍යවරුන්ගේ සහ විශේෂඥ වෛද්‍යවරුන්ගේ වැටුප් වැඩිවීම පිළිබඳව මේ පාර්ලිමේන්තුවට යම් කරුණු කිහිපයක් වාර්තා කරන්න මම මේ අවස්ථාව යොදා ගන්න කැමැතියි.

මීට වසර 3කට පෙර පැවැති ආර්ථික අර්බුදයේ දිග, පළල, පරිමාව රටේ සාමාන්‍ය ජනතාව බොහොම හොඳින් දන්නවා. වෛද්‍යවරුන්ද එම කාලයේ සාමාන්‍ය සමාජයේදී හා රෝහල්වලදී මේ අර්බුදය අත්විඳපු අය. ජීවන වියදම ඉහළ යාම, භාණ්ඩ හිඟය, තෙල් හිඟය, තෙල් පෝලිම්වලට අමතරව රෝහල්වලදී රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී ඒ වෛද්‍යවරුන් ඖෂධ හිඟයට මුහුණ දෙමින්, කාර්ය මණ්ඩලයේ ඌනතාවක් ඇතුව, උපකරණ හිඟයට මුහුණ දෙමින් තමන්ගේ සේවාව ඉටු කළා. ඒ වාගේම එම දුෂ්කරතාව දරා ගන්න බැරිව එම රෝහල් වාට්ටුවල වැඩ කළ සමහර වෛද්‍යවරුන් රට හැර යද්දී, ඒ workload එකත් දරා ගෙන මේ අය සැහෙන සේවාවක් මේ රට වෙනුවෙන් සිදු කළා. මේ හේතු නිසාම, පැවති මහජන අරගළයේදීත්; ඉන් පසුව පැවති මැතිවරණ දෙක තුළදීත් අද පවතින දේශපාලන වෙනස උදා කර ගන්නට මේ වෛද්‍ය වෘත්තිකයන්ගෙන් සාතිශය බහුතරයක් සහයෝගය ලබා දුන්නා. ඒ අතරත්, පැවති දූෂිත රෙජීමයට හා දේශපාලන කණ්ඩායම්වලට නියමෙන්, අනියමෙන්, උඩින්, යටින් සහයෝගය ලබා දුන් සමහර පොඩි කණ්ඩායම් නොසිටියාද නොවෙයි.

ගරු කථානායකතුමනි, ඉතිහාසයේ පළමුවැනි වතාවට කිසිවෙකුත් අපේක්ෂා නොකළ ලෙස, පෙර නොවූ විරූ ලෙස වැටුප් වැඩිවීමක් අපේ ආණ්ඩුව සියලුම රජයේ සේවකයන් වෙත ලබා දෙන්න තීන්දු කළා. මීට පෙර මෙවැනි ආකාරයේ වැටුප් වැඩිවීමක් නොවෙයි, මීට වඩා සුළු දීමනා වැඩිවීමක් ගන්නත් දිග ඇදුණු, වෙහෙසකර වෘත්තිය සමිති ක්‍රියාමාර්ගවල නිරත වෙන්න වෘත්තිය සමිතිවලට සිදු වුණා. එහිදී එක පැත්තකින්; සමහර විට වෘත්තිය ක්‍රියාමාර්ගවල නිරත වන අතරේ විවිධ අඩන්තේට්ටම්වලට ලක් වුණා; නිග්‍රහයට, පරිභවයට පත් වුණා. ඒ වාගේම නොසලකා හැරීම් සිදු වුණා. හැබැයි, ඒ මොනවා තිබුණත් ඒ ක්‍රියාමාර්ගවලින් වුණත් දැනෙන මූලික වැටුප් වැඩිවීමක් ගන්න පුළුවන්කමක් ලැබී නැහැ.

2023 පෙබරවාරි මාසයේදී එවකට ජනාධිපති රනිල් වික්‍රමසිංහ හමුවීමට වෛද්‍යවරුන් ඇතුළු කණ්ඩායමක් ගිහින්, ඒගොල්ලන් වැටුප් වැඩිවීමක්, දීමනා වැඩිවීමක් ඉල්ලුවා. හැබැයි, ඒ වෙලාවේ කිව්වේ මොකක්ද? "IMF එකෙන් ඉල්ලා ගන්න, මේ වෙලාවේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

කිසිම වැටුප් වැඩිවීමක්, දීමනා වැඩිවීමක් දෙන්න බැහැ" කියලායි කිව්වේ. රනිල් වික්‍රමසිංහගේ එම උද්ධච්ච ප්‍රකාශයට; වෛද්‍යවරුන්ගේ ගෞරවය, අභිමානය එක තුට්ටුවකට මායිම් නොකර සිදු කළ එම ප්‍රකාශයට එහෙම බරපතළ ප්‍රතිචාරයක් එනවා අපි දැක්කේ නැහැ. කිසිවක් වුණේ නැහැ; කිසිවක්ම වුණේ නැහැ.

වෘත්තිය සමිති අරගළයක් නොමැති තත්ත්වයක් තුළ පවා, ඒ කියන්නේ පසුගිය මාස 3 තුළ මූලික වැටුප් වැඩිවීමක් ඉල්ලා එහෙම වෘත්තිය සමිති අරගළයක් වෙනවා තමුන්නාන්සේලා දැක්කේත් නැහැ නේ.

හැබැයි, එහෙම වෘත්තිය සමිති අරගළයක් නොමැති තත්ත්වයක් ඇතුළේ පවා අපේ ආණ්ඩුව රජයේ සේවකයන් සියලුදෙනාටත්, සමස්ත වෛද්‍යවරුන්ටත් දැනෙන වැටුප් වැඩිවීමක් ලබා දීලා තිබෙනවා. මතක තියාගන්න, මේකේ කොටස් කිහිපයක් තිබෙනවා. එකක් තමයි, අපි මූලික වැටුප වැඩි කරනවා. ඊළඟට, අමතර රාජකාරී - extra duty - දීමනා වැඩි කරනවා. නිවාඩු දින දීමනා වැඩි කරනවා. වාර්ෂික වැටුප් වර්ධකය වැඩි කරනවා. මේ හතරටම අමතරව මේ අයට PAYE Tax එකේ බදු සහනයකුත් ලබා දෙනවා. මේ සියල්ල එකතු වුණාට පස්සේ මේ එක් එක් අයගේ වැටුප් වැඩි වෙන්නේ කොහොමද කියලා මම ඊළඟට කියන්නම්.

මම ඉස්සෙල්ලාම කියන්නම්, මේ මූලික වැටුප් වැඩිවීම වෙන්නේ කොහොමද කියලා. මේ වන විට Preliminary Grade එකේ ඒ කියන්නේ, රාජ්‍ය සේවයට ඇතුළත් වෙන වෛද්‍යවරයෙකුගේ මූලික වැටුප රුපියල් 54,290යි. මේ වැටුප සහ ඊට අමතරව, extra duty එක, PH එක සඳහා ලැබෙන දීමනා ගත්තාම සාමාන්‍යයෙන් වෛද්‍යවරයෙකුට රුපියල් 240,000ක් විතර gross pay එකක් හම්බ වෙනවා. හැබැයි, මේ රුපියල් 54,290 මූලික වැටුප අපි වැඩි කරනවා, රුපියල් 94,150 දක්වා. ඒ, මූලික වැටුප හැටියට. ඒ කියන්නේ, රුපියල් 39,860කින් Preliminary Grade එකේ වෛද්‍යවරයෙකුට මූලික වැටුප් වැඩි වීමක් දෙනවා. මතක තියාගන්න, 1870 මැද භාගයේ සිට මේ රටේ වෛද්‍යවරු බිහි කරමින් ගත වෙච්ච අවුරුදු 154ටම වැඩි කළේ රුපියල් 54,290යි. අපි ඒක වැඩි කරනවා, රුපියල් 94,150 දක්වා, රුපියල් 39,860කින්. එහි පළමුවෙනි අදියර හැටියට මේ අප්‍රේල් මාසයේ මූලික වැටුප් වැඩි වීම විතරක් රුපියල් 15,582ක් වෙනවා. ඒ, මූලික වැටුප් වැඩිවීම.

ඊළඟට, Grade II වෛද්‍යවරයෙකුගේ මූලික වැටුප තිබෙන්නේ, රුපියල් 58,305යි. ඒ රුපියල් 58,305 අපේ ආණ්ඩුවෙන් වැඩි කරනවා, රුපියල් 101,370 දක්වා. ඒ කියන්නේ, මූලික වැටුප් වැඩිවීම රුපියල් 43,065යි. රුපියල් 43,065කින් මූලික වැටුප වැඩි වෙනවා. Grade I වෛද්‍යවරයෙකුට දැන් තිබෙන මූලික වැටුප රුපියල් 71,805යි. ඒක රුපියල් 125,670 දක්වා වැඩි වෙනවා. ඒකේ මූලික වැටුප් වැඩිවීම රුපියල් 53,865යි. Junior Consultant කෙනෙකුට basic salary එක විධියට දැන් හම්බ වෙනවා, රුපියල් 88,000ක්. ඒක වැඩි වෙනවා රුපියල් 156,000 දක්වා. ඒ කියන්නේ මූලික වැටුප් වැඩිවීම විතරක් රුපියල් 68,000ක්. Preliminary Grade එකේ basic increment එක විතරක් රුපියල් 39,860ක් වෙනවා.

Grade IIවල රුපියල් 43,065ක්. Grade Iවල රුපියල් 53,865ක්. Junior consultant කෙනෙකුට රුපියල් 68,000ක් හැටියට මූලික වැටුප් වැඩිවීමක් ලබා දෙනවා. ඒ මූලික වැටුප් වැඩිවීමෙන් දැනෙන කොටසක් මේ අප්‍රේල් මාසයේදී ලැබෙනවා. තවත් කොටසක් 2026 වසරේ ජනවාරි මාසයේදී ලැබෙනවා, ඉතිරි කොටස 2027 වසරේ ජනවාරි මාසයේදී ලැබෙනවා. ඒ කියන්නේ මාස 20ක් ඇතුළතදී රුපියල් 40,000 සිට රුපියල් 68,000ක් දක්වා වන වැටුප් වැඩිවීම ලැබෙනවා, ගරු කථානායකතුමනි.

මම තවත් මේ ගැන කියන්නම්. මොකද, මම මේ එක් එක් gradesවල වැටුප් පිළිබඳව කිව්වාට මේකේ තිබෙනවා, සාමාන්‍යයෙන් අදියර 28ක් විතර. ඒ අදියර 28හි මූලික වැටුප් වැඩිවීම විතරක් මම කියන්නම්. මම මේ තොරතුරු කියන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. සමහර තැන්වල බහුතරයක් වෛද්‍යවරුන් යම් කිසි ආකාරයක අනවබෝධයකට ලක් කරලා තිබුණා, මේ කරුණු සහ ඉලක්කම් නොකියා සිටීම තුළ. ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අය වැය කථාව ඉදිරිපත් කරනකොට, අපි කියන්නේ පහළම ශ්‍රේණියේ සේවකයාගේ වැටුප් වැඩිවීම. ඒක තමයි සාමාන්‍ය ක්‍රමය. අපි කිව්වේ, පහළම ශ්‍රේණියේ වැටුප් වැඩිවීම මෙන්න මෙච්චරයි කියලා. අපි කිව්වේ, සාමාන්‍ය රජයේ සේවකයෙකුට රුපියල් 24,000ක්ව තිබුණු අවම මාසික මූලික වැටුප රුපියල් 40,000ක් දක්වා වැඩි වෙනවා කියලායි. Preliminary Grade එකේ ඉන්න කෙනෙකුගේ වැටුප් වැඩිවීම පිළිබඳව විතරයි අපි කිව්වේ. ඒ අනුව, රුපියල් 54,290ට තිබුණු වැටුප රුපියල් 94,150ක් වෙනවා කිව්වා.

Preliminary Grade එකේ රුපියල් 56,960ක් දැන් මූලික වැටුප ලෙස ලබා ගන්නා වෛද්‍යවරයෙකුට මූලික වැටුප වැඩි වෙනවා, රුපියල් 98,950ක් දක්වා රුපියල් 41,990කින්. MO Grade IIවල දැන් රුපියල් 63,685ක මූලික වැටුපක් ගන්න කෙනෙකුට මූලික වැටුප රුපියල් 111,050ක් දක්වා වැඩි වෙනවා. ඒ කියන්නේ රුපියල් 47,365කින් මූලික වැටුප වැඩි වෙනවා. දැන් Medical Officer Grade II එකේ කෙනෙක් මූලික වැටුප රුපියල් 69,635ක් ගන්නවා නම්, ඒ කෙනාගේ මූලික වැටුප වැඩි වෙනවා, රුපියල් 121,770ක් දක්වා රුපියල් 52,135කින්. MO Grade I එක්කෙනෙක් දැන් රුපියල් 80,485ක මූලික වැටුපක් ගන්නවා නම්, ඒක රුපියල් 141,270ක් දක්වා වැඩි වෙනවා. එතකොට මූලික වැටුප් වැඩිවීම විතරක් රුපියල් 60,785යි. මේ වෙනකොට මූලික වැටුප ලෙස රුපියල් 86,995ක් ගන්නා MO Grade I කෙනෙකුට රුපියල් 152,968ක් දක්වා වැටුප වැඩි වෙනවා. ඒ කියන්නේ වැටුප් වැඩිවීම පමණක් රුපියල් 65,973යි. දැන් මූලික වැටුප රුපියල් 93,505ක් ගන්නා MO Grade I කෙනෙකුට මූලික වැටුප වැඩි වෙනවා, රුපියල් 164,670ක් දක්වා. මූලික වැටුප් වැඩිවීම පමණක් රුපියල් 71,165යි. දැන් රුපියල් 100,015ක මූලික වැටුපක් ගන්නා MO Grade I කෙනෙකුට වැටුප වැඩි වෙනවා, රුපියල් 176,370ක් දක්වා. ඒ කියන්නේ, රුපියල් 76,355ක මූලික වැටුප් වැඩිවීමක් වෙනවා. MO Grade I කෙනෙක්, ඒ කියන්නේ seniorම කෙනෙකුට දැන් රුපියල් 104,355ක මූලික වැටුපක් ලැබෙනවා නම්, ඒක රුපියල් 184,170ක් දක්වා රුපියල් 79,815කින් වැඩි වෙනවා. මෙන්න, මූලික වැටුප් වැඩිවීම. මේ මූලික වැටුප් වැඩිවීම මාස 20ක් ඇතුළත ලබා දෙනවා, අදියර තුනකට.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
OT එක?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
පොඩ්ඩක් ඉන්න. ඊළඟට දෙවැනි කාරණය, අමතර රාජකාරී දීමනාව. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, දැන් මතයක් හදන්න යනවා, අමතර රාජකාරී දීමනාව - extra duty allowance

- අඩු කරලා තිබෙනවා කියලා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. මම කියන්නම්. Preliminary Grade එකේ extra duty allowance එක තිබෙන්නේ රුපියල් 687යි. අපි මේ අප්‍රේල් මාසයේ සිට රුපියල් 765ක් දක්වා එම දීමනාව වැඩි කරනවා. MO Grade IIවල දැන් තිබෙන extra duty allowance එක රුපියල් 796යි. මේ අප්‍රේල් මාසයේ ඉඳන් එම දීමනාව රුපියල් 925ක් දක්වා වැඩි වෙනවා. මේ කියන්නේ පැයකට, මතක තබා ගන්න. පැයකට රුපියල් 925ක් දක්වා වැඩි වෙනවා. දැන් MO Grade I එකේ extra duty allowance පැයක් කියන්නේ රුපියල් 1,101යි. ඒක වැඩි වෙනවා, මේ අප්‍රේල් මාසයේ සිට රුපියල් 1,307ක් දක්වා. Junior consultant කෙනෙකුට දැන් තිබෙන extra duty allowance එක පැයකට රුපියල් 1,302යි. ඒක වැඩි වෙනවා, රුපියල් 1,542ක් දක්වා. ඒ නිසා කාටවත් කියන්න බැහැ, extra duty allowance එක අඩු වෙනවා කියලා. මේ හැම කෙනෙකුටම පැයකට දැන් තිබෙන extra duty allowance එක මීට වඩා වැඩි වෙලා තිබෙනවා, එළඹෙන අප්‍රේල් මාසයේ සිට. සමහර ඒවායේ වැඩිවීම රුපියල් 206යි. එපමණක් නොවෙයි. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, සාමාන්‍යයෙන් වෛද්‍යවරුන්ට නිවාඩු දින දීමනාවක් ලැබෙන බව. ඒ නිවාඩු දින දීමනාව අපි මෙහෙම වැඩි කරලා තිබෙනවා.

මේ, දැන් පවතින නිවාඩු දින දීමනාවයි. Preliminary Grade එකේ නිවාඩු දින දීමනාව රුපියල් 2,714.50යි. ඒ දීමනාව වැඩි වෙනවා, රුපියල් 3,138ක් දක්වා රුපියල් 423.50කින්. MO Grade IIවල දැනට තිබෙන්නේ රුපියල් 2,915යි. ඒක වැඩි වෙනවා, රුපියල් 3,379ක් දක්වා. MO Grade I කෙනෙකුට දැනට තිබෙන නිවාඩු දින දීමනාව රුපියල් 3,590යි. ඒක වැඩි වෙනවා, රුපියල් 4,189ක් දක්වා. Junior consultant කෙනෙකුට දැන් තිබෙන්නේ රුපියල් 4,400යි. ඒක වැඩි වෙනවා, රුපියල් 5,200ක් දක්වා රුපියල් 800කින්. ඒ නිසා නිවාඩු දින දීමනාවත් දැන් තිබෙනවාට වඩා -මාර්තු මාසයට වඩා- අප්‍රේල් මාසයේදී වැඩි වෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු ඇමතිතුමනි, UKවල attendantsලාගේ වැටුප අපේ doctorsලාගේ වැටුපට වඩා වැඩියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හා, UK යන්න.

මම තවත් දෙයක් කියන්නම්. ගරු කථානායකතුමනි, මේ basic salary එක, extra duty allowance එක, නිවාඩු දින දීමනාව ලබා දීලා අපි එතැනින් නතර වෙන්නේ නැහැ. ඊට අමතරව, මේ හැම කෙනාගේම වාර්ෂික වැටුප් වර්ධකයත් වැඩි කරලා තිබෙන්නේ. ජනාධිපතිතුමා කිව්වා, රුපියල් 250 වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 450 දක්වා සියයට 80කින් වැඩි කරනවා කියලා. එතකොට ඒක වෛද්‍යවරුන්ට අදාළ වෙනකොට දැන් තිබෙන රුපියල් 1,335ක වැටුප් වර්ධකය රුපියල් 2,400ක් දක්වා වැඩි වෙනවා. දැන් තිබෙන රුපියල් 1,345ක වැටුප් වර්ධකය රුපියල් 2,420ක් දක්වා වැඩි වෙනවා. දැන් තිබෙන රුපියල් 1,630ක වැටුප් වර්ධකය රුපියල් 2,940ක් දක්වා වැඩි වෙනවා. දැන් තිබෙන රුපියල් 2,170ක වැටුප් වර්ධකය රුපියල් 3,900ක් දක්වා වැඩි වෙනවා. එතකොට දළ වශයෙන් ගණන් හැදුවොත්, මම කියන ගණනට වඩා වැඩිපුර හම්බ වෙන බව කියන්න පුළුවන්.

දැන් Preliminary Grade එකේ රුපියල් 54,290ක මූලික වැටුපක් ගත් කෙනෙකුගේ gross pay එක රුපියල් 240,173ක් ලෙස තිබුණා නම්, මේ වැටුප් වැඩිවීමත් එක්ක ලබන අප්‍රේල් මාසයේදී ඒ කෙනාට රුපියල් 258,887ක් හම්බ වෙනවා. 2027 වසරේ ජනවාරි වෙනකොට ඒ කෙනාට රුපියල් 283,165ක් හම්බ වෙනවා. ඒ කියන්නේ කවුරුන් හෝ extra duty කරලා, PH කරලා මෙතෙක් රුපියල් 240,000ක් අරගෙන ගියා නම්, ඒ මුදල රුපියල් 283,165ක් දක්වා වැඩි වෙනවා. දැනට කවුරුන් හෝ රුපියල් 257,870ක gross pay එකක් ගන්නවා නම්, ඒක දළ වශයෙන් රුපියල් 310,307ක් වෙනකන් වැඩි වෙනවා. දැනට කවුරුන් හෝ රුපියල් 309,995ක් ගන්නවා නම්, ඒක රුපියල් 382,877ක් දක්වා වැඩි වෙනවා. දැනට කවුරුන් හෝ රුපියල් 352,740ක gross pay එකක් ගන්නවා නම්, ඒක රුපියල් 448,400ක් දක්වා වැඩි වෙනවා. මේ වැඩිවීම තවත් වැඩි වෙන්නේ කොහොමද කියලා දන්නවාද?

අපේ ආණ්ඩුව PAYE Tax එකේ සීමාවත් වෙනස් කළා. ගරු කථානායකතුමනි, ඒ PAYE tax එකේ සීමාව වෙනස් කිරීමත් එක්ක කලින් රුපියල් 100,000ත්, රුපියල් 150,000ත් දක්වා බදු ගෙවපු අයට මේ තුළින් සම්පූර්ණ බදු සහනයක් ලැබෙනවා. මේ සමහර වෛද්‍යවරුන් රුපියල් 35,000ක්, රුපියල් 40,000ක් බදු ගෙව්වා. නමුත්, ඔවුන් දැන් එහෙම බදු ගෙවන්න ඕනෑ නැහැ. දැන් රුපියල් 100,000 ඉඳන් රුපියල් 150,000 දක්වා වැටුප් ගත් අයට සියයට-සියයක් බදු නිදහස තිබෙනවා. රුපියල් 200,000 දක්වා වැටුප් ගත් අයට සියයට 72ක බදු නිදහසක් තිබෙනවා. රුපියල් 250,000ක් දක්වා වැටුප් ගත් අයට සියයට 62ක PAYE Tax එකේ නිදහසක් තිබෙනවා. රුපියල් 300,000ක් දක්වා වැටුප් ගත් අයට සියයට 47ක බදු නිදහසක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙහෙම ගත්තාම මේ හැම දෙනාටම දැනෙන වැටුප් වැඩිවීමක් අපි ලබා දීලා තිබෙනවා. ඒ නිසා මම කියන්නේ අපි ආණ්ඩුවක් හැටියට මේ වෙලාවේ දෙන්න පුළුවන් ඉහළ වැටුප් වැඩිවීමක් ලබා දීලා තිබෙන බවයි. මම සෞඛ්‍ය ඇමතිවරයා හැටියට පත්වීම් භාර අරගෙන ඉස්සෙල්ලාම සාකච්ඡා කළේ GMOA එකේ නිලධාරීන් එක්ක. ජනාධිපතිතුමාට මීට දවස් කිහිපයකට කලින් GMOA එකේ නිලධාරීන් ප්‍රශ්නයක් මතු කළාම, ඔවුන් එක්ක පැයයි විනාඩි 40ක් අපි සාකච්ඡා කළා. හැබැයි, එකපාරටම මේ 6වැනි දා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගැනීම පදනම් කරගෙන 5වැනි දා දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් කරන්නත්, 7වැනි දා අඛණ්ඩ වැඩ වර්ජනයක් කරලා රෝගීන්ව අපහසුතාවකට පත් කරන්නත් තීන්දුවක් ගත් බව ඊයේ ප්‍රකාශයට පත් වුණා.

ගරු කථානායකතුමනි, මම කියන්නේ මේකයි. රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව අපි මෙහෙම වැටුප් වැඩිවීමක් ලබා දීලා තිබියදීත්, මේ අය මෙහෙම කටයුතු කරන එක අසාධාරණයි. ඒ අසාධාරණය කරන්න එපා කියලා සියලු වෛද්‍යවරුන්ගෙන් මම ඉල්ලනවා. එපමණක් නොවෙයි. තවත් ප්‍රශ්න තිබෙනවා නම් ඕනෑම කෙනෙක් එක්ක අපි සාකච්ඡාවට ලැහැස්තියි; ඕනෑම සංගමයක් එක්ක සාකච්ඡාවට ලැහැස්තියි. ඒ නිසා ජනතාව පීඩාවට පත් කරමින් අසාධාරණ වෘත්තීය ක්‍රියාමාර්ග ගන්න එපා කියන ඉල්ලීම මම කරනවා, ගරු කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු ගයන්ත කරුණාතිලක මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

மாண்புமிகு கயந்த கருணாதிலக்கவினது சொந்த விளக்கம்

PERSONAL EXPLANATION BY HON. GAYANTHA KARUNATHILLEKA

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මගේ පාර්ලිමේන්තු දිවියේ වසර 25 තුළ පළමුවෙනි වරට පෞද්ගලික කරුණු පැහැදිලි කිරීමක් කරන්න ස්ථාවර නියෝග 27. (8) ප්‍රකාරව මා විසින් කරන ලද ඉල්ලීමට ඔබතුමා අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. වැදගත් විවාදයක් ඉස්සරහට තිබෙන නිසා විනාඩි 3කින් වාගේ මම මේ කාරණය කියා අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු රැස්වීම් ආරම්භයේ සිට අවසන් වනතුරුම සාමාන්‍යයෙන් මම පාර්ලිමේන්තුවේ රැඳී ඉන්නවා. ඊයේ මා සභා ගර්භයේ නැති මොහොතක ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය අමාත්‍යතුමා කරපු ප්‍රකාශයක් උපුටා දක්වමින් පෞද්ගලික රූපවාහිනී නාළිකාවක ප්‍රවෘත්ති ප්‍රකාශයේදී මගේ නමත්, මගේ ඡායාරූපයත් ප්‍රදර්ශනය කළා, "දේශපාලන සම්බන්ධතා මත ඉන්ධන පිරවුම්හල් ලබා ගත් දේශපාලනඥයින්" යනුවෙන්. අද "දිනමිණ" පුවත් පතේ headline එක, "ෂෙඩ් ගත්තු දේශපාලක ලැයිස්තුව මැතිසබයේ දිගහරී" කියන එකයි. මම මාධ්‍යයට දොස් කියන්නේ නැහැ. මොකද, එතුමාගේ කථාවෙන් මාධ්‍යයටත් ගම්‍ය වුණේ, දේශපාලන සම්බන්ධතා මත ෂෙඩ් ගත්ත අය හැටියටයි. මට වුණත් තේරුණේ ඒ විධියටයි.

මම කියන්න කැමැතියි, කිසිම දේශපාලන සම්බන්ධතාවකින් ලබා ගත්ත පිරවුම්හලක් අප සතුව නැති බව. මගේ පවුලේ පිරවුම් හලක් ගැනයි මේ කියලා තිබෙන්නේ. 1955 වසරේ මම උපදින්නත් ඉස්සර -මේ සභාවේ ඉන්න බොහෝ දෙනෙක් උපදින්නත් පෙර, දෙතුන් දෙනෙක් හැරුණුකොට- අවුරුදු 70කට ඉස්සෙල්ලා මගේ පියාගේ, පියා විසින් තමයි මේ පිරවුම්හල ආරම්භ කළේ. එතැන් පටන් අවුරුදු 70ක් තිස්සේ අපේ පවුලේ උදව්ය මේ පිරවුම්හල නීත්‍යානුකූලව පවත්වාගෙන යනවා. මම දන්නේ නැහැ, මොන හේතුවක් නිසා මගේ නම මේකට සම්බන්ධ කළා ද කියලා. මේක මට ප්‍රශ්නයක් නොවෙයි. අපේ පළාතේ ජනතාවගෙන්, ඒ ප්‍රදේශයේ ඕනෑම කෙනෙකුගෙන් ඇහුවොත් මේ ගැන ඉතිහාසය කියයි. මේ ප්‍රවෘත්තිය පළ වුණාට පසුව මට වැඩියෙන්ම කථා කළේ මාලිමාවට ඡන්දය දීපු උදව්ය. ඒ අය කිව්වා, "අපි කනගාටු වෙනවා, මේකට ඔබතුමාව පටලවපු එකට; මොකද, මේක අපි කවුරුත් දන්නා කාරණයක් නිසා මේක පාර්ලිමේන්තුවේ පැහැදිලි කරන්න" කියලා. ඒ අයගෙන් වැඩි දෙනෙක් තමයි මට කිව්වේ, මේ ගැන පාර්ලිමේන්තුවේදී පැහැදිලි කරන්න කියලා.

ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි, මම ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ සභාවට අවුරුදු 25ක් ආපු බව. 7 වතාවක් අපේ දිස්ත්‍රික්කයේ ජනතාව මාව දිනෙව්වා. ඉන් 4 වතාවක් අපේ කණ්ඩායමේ පළමුවෙනියා කළා. වල් පැළ ඉවත් කරන්න කියන සටනක් ගෙනියද්දී, ගාල්ලෙන් පත් වෙච්ච සියලු මන්ත්‍රීවරු පරාජයට පත් වෙද්දී, මාව විතරයි පළමුවෙනියා හැටියට පත් කරලා එව්වේ. අපේ ගෙදර 1977 ඉඳලා මේ දක්වා වසර 48ක් පාර්ලිමේන්තු මන්ත්‍රීකමක් තිබෙන ගෙදරක්. හැබැයි, කවදාවත් අපි රජයෙන් දේශපාලන සබඳතා මත මෙවැනි දේවල් කරලා නැහැ කියන එක මට පැහැදිලිවම කියන්න පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම කාලය ගන්නේ නැතුව අවසාන වශයෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. විෂය භාර ඇමතිතුමාගෙන් එහෙම නැත්නම් ඒ ප්‍රකාශය කරපු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් නොවෙයි මම මේ ඉල්ලීම කරන්නේ. පුළුවන්කමක් තිබෙනවා නම්, සභානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, අවුරුදු 70කට ඉස්සෙල්ලා - මම උපදින්නත් පෙර - ගත්ත ෂෙඩ් එකක් සම්බන්ධව, දේශපාලන සබඳතා මත ගත් ලැයිස්තුවට මගේ නම ඔබපු එක සාධාරණද කියලා සොයා බලන්න. අපි බොහොම පිරිසිදුවයි දේශපාලනය කළේ. ඒ නිසා තමයි අපට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ. කිසිම විපක්ෂයකින්වත් මට චෝදනාවක් මෙතෙක් කල් එල්ල වෙලා නැහැ. ඒ නිසා මම කවදාවත් පෞද්ගලිකව කිසි කෙනෙකුට දේශපාලන වශයෙන් මඩ ගහන කෙනෙකුත් නොවෙයි. අනාගතයේදී එහෙම මඩ ගහන්නේත් නැහැ. ඒක මගේ ප්‍රතිපත්තිය. දේශපාලන ප්‍රතිපත්ති මත විතරයි අපි මේ කටයුතු කරන්නේ. ඒ නිසා කරුණාකරලා මම ඉල්ලනවා, මේ අසාධාරණයෙන් මාව නිදහස් කරන්න කියා. වෙන දෙයක් කියන්නේ නැහැ. අවුරුදු 70ක් තිස්සේ පවත්වාගෙන යන අපේ පවුලේ ෂෙඩ් එකක් තිබෙනවා. මගේ සහෝදරයෙක් ඒක පාලනය කරනවා. දේශපාලන සබඳතා මත ගත්ත ලැයිස්තුවට මේක නැහැ කියන එක පුළුවන් නම් නිවැරදි කරලා දෙන්න. ඒ ගැන සොයා බලා නිවැරදි කරලා දෙන්න, මම කියූ පලියට නැතුව. මේක අපේ පළාත්වල හැමෝම දන්නවා. අග්‍රාමාත්‍යතුමිය මේ ගරු සභාවේ හිටියා නම් ඒ ගැන කියයි. මොකද, එතුමියගේ පියාණන්, එතුමියගේ බාප්පා වාගේ අය මේවා ගැන හොඳටම දන්නවා.

ඒ නිසා මම කියනවා, කරුණාකරලා මේ ලැයිස්තුවේ මගේ නම clear කරලා දෙන්න කියලා. ඒක අසාධාරණයක්. අපේ පළාතේ මිනිස්සු මේක දන්නවා වුණාට පිට පළාත්වල මිනිස්සු හිතන්න පුළුවන්, මෙයාත් එහෙම නම් ෂෙඩ් ගත්ත කෙනෙක් කියලා. ඒ නිසා කරුණාකරලා මාව ඒකෙන් නිදහස් කරන්න. ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, කෙටියෙන් සඳහන් කරන්න.

ගරු හර්ෂණ රාජකරුණා මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

மாண்புமிகு ஹர்ஷண ராஜகருணாவினது சொந்த விளக்கம்

PERSONAL EXPLANATION BY HON. HARSHANA RAJAKARUNA

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි. ඊයේ දිනයේදී නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් මගේ නමත් සඳහන් කරලා තිබෙනවා, දේශපාලන සබඳතා මත පෙට්‍රල් ෂෙඩ් එකක් ලබාගෙන තිබෙනවා කියන කාරණයේදී.

ඉතා පැහැදිලිවම මා කියනවා, එය අසත්‍යයක් බව. මට පෙට්‍රල් ෂෙඩ් එකක් නැහැ. ඒ වාගේම අපේ ගයන්ත කරුණාතිලක

මන්ත්‍රීතුමා කිව්ව ආකාරයටම මම ඉපදෙන්නත් කලින් මගේ සීයාට පෙට්‍රල් ෂෙඩ් එකක් තිබිලා තිබෙනවා. ඒ පෙට්‍රල් ෂෙඩ් එකත් දැන් නැහැ. නමුත් මගේ සීයාට ඒ පෙට්‍රල් ෂෙඩ් එක ලැබිලා තිබෙන්නේ මගේ තාත්තා කසාද බඳින්නත් කලින්; ඒ කියන්නේ අපි ඉපදෙන්නත් කලින්. අපේ ඥාතීන් ව්‍යාපාරිකයන් හැටියට නොයෙක් ව්‍යාපාර කරනවා. ඒකට දේශපාලන සම්බන්ධතා කියලා අපේ නම ගාලා වෛරය පතුරුවන මේ ක්‍රමය කරණාකරලා නතර කරන්න. ඉතා අසාධාරණයි, මේ දේශපාලන සම්බන්ධතා අනුව වරප්‍රසාද ලබාගෙන කටයුතු කරනවා කියලා කියන එක. අපේ ඥාතීන්ට තමන්ට කැමති ව්‍යාපාරයක් කරන්න හැකියාව තිබෙනවා. එහෙම නැතුව දේශපාලන සම්බන්ධතාවලින් කිසිම පෙට්‍රල් ෂෙඩ් එකක් මම අරගෙන නැහැ. එහෙම පෙට්‍රල් ෂෙඩ් එකක් තිබෙනවා නම් කරුණාකරලා මට ඒ ගැන හොයලා දෙන්න. ඒ නිසා ඉතා පැහැදිලිවම කියන්නේ අයුතු ලෙස, අනීතික විධියට අපි හම්බ කරලා නැහැ කියන එකයි.

ඒ වාගේම, මේ වෙලාවේදී මේ කාරණයත් මම පැහැදිලිවම කියන්න ඕනෑ. අපේ වාසගම තිබෙන අයත් ආයතනවල ඉන්නවා. Ceylon Petroleum Corporation එකේ Chairmanනුත් රාජකරුණා කෙනෙක්. දැන් ඒ පුද්ගලයාටත් අස් වෙන්න වෙයිද දන්නේ නැහැ. Ceylon Petroleum Corporation එකේ Chairman රාජකරුණා. ඒ මනුස්සයා මොනවා කරන්නද, මගේ වාසගම තිබුණා කියලා. ඒක හින්දා ගරු කථානායකතුමනි, දේශපාලන සබඳතාවක් එක්ක මට පෙට්‍රල් ෂෙඩ් එකක් නැහැ කියන එක ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. කරුණාකරලා නියෝජ්‍ය ඇමතිවරු වගකීමෙන් තමන්ගේ ප්‍රකාශ කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

ගරු කිංස් නෙල්සන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
மாண்புமிகு கிங்ஸ் நெல்சனினது சொந்த விளக்கம்
PERSONAL EXPLANATION BY HON. KINS NELSON

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතියි. *[බාධාකිරීම්]* මටත් පෙට්‍රල් ෂෙඩ් එකක් තිබෙනවා කියලා මගේ නමත් ප්‍රකාශ වුණා. ඔබතුමාත් මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ. ඒ නිසා ඔබතුමා හොඳටම දන්නවා, මට පෙට්‍රල් ෂෙඩ් එකක් තිබෙනවාද, නැද්ද කියන එක. පොළොන්නරුවේ ඉන්න මගේ ආදරණීය ජනතාව දන්නවා, මට පෙට්‍රල් ෂෙඩ් එකක් නැහැ කියන එක. හැබැයි, මාධ්‍යයේ මේ විධියට ප්‍රකාශ වුණාම ජනතාවට වැරදි අවබෝධයක් යනවා, අපි මේ ගැන කථා කරන්නේ අපිට පෙට්‍රල් ෂෙඩ් එකක් තිබෙන නිසායි කියලා. ඒක නිසා ගරු කථානායකතුමනි, මේක නිවැරදි කරලා දෙන්න කියන එක තමයි මමත් කියන්නේ. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම, ගරු සභානායකතුමා.

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

2025.03.02 දින "සති අග අරුණ" පුවත්පත් වාර්තාව
2025.03.02ஆம் திகதிய "சதி அக அருண" பத்திரிகை அறிக்கை
NEWS REPORT IN "SATHI AGA ARUNA" NEWSPAPER OF 02.03.2025

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 මාර්තු 03 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, දොළොස්වැනි වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: මාර්තු 03]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 03]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 03rd March]
[HON. SPEAKER in the Chair.]

130 වන ශීර්ෂය.- රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,992,000,000

தலைப்பு 130.- பொதுநிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 3,992,000,000

HEAD 130.- MINISTER OF PUBLIC ADMINISTRATION, PROVINCIAL COUNCILS AND LOCAL GOVERNMENT
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 3,992,000,000

193 වන ශීර්ෂය.- කම්කරු අමාත්‍යාවරයා
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 220,000,000

தலைப்பு 193.- தொழில் அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 220,000,000

HEAD 193.- MINISTER OF LABOUR
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 220,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 130, 253 සිට 279, 312 සිට 319 සහ 321; කම්කරු අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 193, 221 සහ 328. සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.05]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.04වැනි අහඹරුවාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ සහ ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 130, 253 සිට 279, 312 සිට 319, 321, 193, 221 සහ 328 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා අවස්ථාවේ විවාදය ආරම්භ කරමින් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වනවා.

විශේෂයෙන්ම අපේ අමාත්‍යවරයාත් අපේ පළාතේ කෙනෙක්. පුත්තලම දිස්ත්‍රික්කයේ, වයඹ පළාතේ. මේ අමාත්‍යාංශය යටතේ අපට කරන්න විශාල කාර්යභාරයක් තිබෙනවා. මේ සඳහා විශාල මුදලක් වෙන් වෙලා තිබෙනවා. 2025 අය වැය ලේඛනයේ ඇස්තමේන්තු වියදම රුපියල් බිලියන 573.5යි. එතකොට මේ මුදල්වලින් වැඩි කොටසක් රාජ්‍ය සේවක වැටුප්, විශ්‍රාම වැටුප් වැනි පරිපාලනමය කාරණාවලට තමයි ගොඩක් වියදම් කරන්න වෙලා තිබෙන්නේ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ "ස්වදේශ කටයුතු" ක්ෂේත්‍රයත් මීට පෙර තිබුණා. දැන් "ස්වදේශ කටයුතු" කියන කොටස නැති වුණත් ඒ හා සම්බන්ධව තිබුණු සියලු ආයතන මේ අමාත්‍යාංශය යටතේම තිබෙනවා. එක පැත්තකින් ස්වදේශ කටයුතු පැත්ත ගත්තාම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල එතැනින් එහාට ග්‍රාම නිලධාරි කාර්යාලය දක්වා ඉන්න නිලධාරීන් සියලුදෙනාම අයිති වෙන්නේ මේ අමාත්‍යාංශයට. ඒ කියන්නේ, රාජ්‍ය සේවයේ ප්‍රාදේශීය මට්ටම, -ගමේ ඉඳලා- දිස්ත්‍රික් මට්ටම, ජාතික මට්ටම දක්වාම මේ අමාත්‍යාංශයෙන් තමයි ඒ කටයුතු ක්‍රියාත්මක වෙන්නේ.

මේ අමාත්‍යාංශය යටතට තමයි පළාත් පාලන ආයතන සහ පළාත් සභා අයිති වෙන්නේත්. අපේ රටේ පළාත් සභා 9ක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම පළාත් පාලන ආයතන 341ක් තිබෙනවා. ඒ, මහනගර සභා 29ක්, නගර සභා 36ක්, ප්‍රාදේශීය සභා 276ක් විධියට. එක පැත්තකින්, මේ සියල්ලම ග්‍රාම නිලධාරි දක්වා රාජ්‍ය අංශයෙන් පරිපාලන කටයුතු සිද්ධ වනවා. අනෙක් පැත්තෙන්, පළාත් සභා, පළාත් පාලන ආයතන, -ග්‍රාමීය මට්ටමේ ඉඳලා තිබෙන දේශපාලන අධිකාරිය- යම් යම් කාරණාවලදී අධීක්ෂණය කරන්න පැවරිලා තිබෙන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයට, ගරු ඇමතිතුමනි.

විශේෂයෙන්ම මම මේ වෙලාවේ මේ කාරණයත් පැහැදිලිව කියන්න ඕනෑ. ඊයේ දිනයේ අපි දැක්කා, පළාත් පාලන ආයතන 341ක් වෙනුවෙන් නාම යෝජනා කැඳවන්න දින නියම වෙලා තිබෙනවා. අපි කවුරුත් කැමැතියි, මේ පළාත් පාලන මැතිවරණය පවත්වන එකට. මේක කල් ගිය මැතිවරණයක්. අධිකරණ තීන්දුවක් තිබෙනවා, මාස 3ක් ඇතුළත මේ මැතිවරණය පවත්වන්න කියලා. මේ මැතිවරණය සඳහා විශාල පිරිසක් ඉදිරිපත් වෙනවා. මම මුලින්ම මේ ගැන කථා කරන්න ඕනෑ. පළාත් පාලන ආයතන 341ට අපේක්ෂකයෝ විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වෙනවා. පළාත් පාලන ආයතනවලට පත් වන සමස්ත මන්ත්‍රී සංඛ්‍යාව 8,355ක්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සභාපතිතුමනි, ඉදිරි දින කිහිපය තුළ දේශපාලනඥයන් හැටියට අප කාටත් පක්ෂ වෙනුවෙන් විශාල වැඩකොටසක් කරන්න සිද්ධ වෙනවා. මේ මැතිවරණය අපට අත්‍යවශ්‍යයි. හැබැයි, මේ අය වැය විවාදය අවසන් වෙලා නාම යෝජනා භාර දෙන්න තිබුණා නම් හොඳයි. මොකද, අප හැම කෙනාටම ඒවාට සම්බන්ධ වෙන්න සිද්ධ වෙනවා. ඒ සම්බන්ධයෙන් අපි මැතිවරණ කොමිසම හමුවෙත් කරුණු කාරණා ඉදිරිපත් කළා. ඒ කොහොම වුණත් දේශපාලනඥයන් හැටියට අප හැම කෙනාටම ඉදිරියේදී එන මේ මැතිවරණය සඳහා සම්බන්ධ වෙන්න වෙනවා.

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය හරහා රටේ ජනතාවට සේවාවන් හැටියට විශාල කාර්යභාරයක් ඉටු වෙනවා. ගමේ ග්‍රාම නිලධාරි කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යන හැම එකක්ම ජනතාවත් එක්ක සම්බන්ධ ආයතන. හැබැයි, අපි බලාපොරොත්තු වෙන ආකාරයෙන් ඒවායින් ජනතාවට සේවයක් ඉටු වෙනවාද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. ඇත්ත කථා කළොත්, අපි දකිනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගියාම, බදාදා දිනයේ හෝ සඳුදා දිනයේ මහජන හමුව දවසට විශාල පිරිසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එන බව. ඒ එන ජනතාවගේ ප්‍රශ්නවලින් කීයක්

විසඳෙනවාද? ඒක දිගින් දිගටම වෙන දෙයක්. ඔබතුමන්ලාට චෝදනා කරනවා නොවෙයි. මේක ආණ්ඩු ගණනාවක් තුළ අපි දැකපු දෙයක්. එතකොට ඒ ජනතා සේවාවන් නිසි ආකාරයෙන් ඉටු නොවෙන්න හේතු ගණනාවක් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා බලයට පත් වෙනකොට මේ රටේ ජනතාව විශාල වෙනසක් බලාපොරොත්තු වුණා. ඒ වෙනස තමයි ඒ ජනතාවට අවශ්‍ය සේවාවන් කාර්යක්ෂමව, නිවැරදිව ඉටු කර ගැනීම. ඒ නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයේ විශාල වෙනස්කම් ගණනාවක් කළ යුතුයි කියන තැන අපි ඉන්නවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමාට හොඳ අවස්ථාවක් අද ලැබිලා තිබෙනවා, ඒ ආයතන කාර්යක්ෂමව, නිසියාකාරයෙන් ජනතාවගේ සේවාවන් ඉටු කරන ආයතන බවට පත් කරන්න.

දැන් දීර්ඝ කාලයක් තිස්සේ පළාත් පාලන මැතිවරණය කල් ගිහිල්ලා තිබෙනවා; පළාත් සභා මැතිවරණය කල් ගිහිල්ලා තිබෙනවා. පළාත් පාලන මැතිවරණය ගත්තාම, පළාත් පාලනයේදී ජනතාවත් එක්ක වැඩ කරන නියෝජිතයන් අවශ්‍යයි. දැන් වසර ගණනාවක් තිස්සේ ඒක අහිමි වෙලා තිබෙනවා. ඒ තුළත් පළාත් පාලන ආයතනවලින් ජනතාවට ඉටු වෙන්න ඕනෑ සේවාවන් නිසියාකාරයෙන් ඉටු වුණේ නැහැ කියන එක අපට පැහැදිලියි. මොකද, ලේකම්වරයෙක්, එහෙම නැත්නම් කොමසාරිස්වරයෙක් යටතේ තමයි වසර ගණනාවක් තිස්සේ ඒ ආයතන පාලනය වුණේ. පළාත් සභා ගත්තත් එහෙමයි; ආණ්ඩුකාරවරයා යටතේ තමයි පාලනය වෙන්නේ. මම හිතන විධියට, පළාත් පාලන මැතිවරණය අවසන් වෙලා කෙටි කාලයක් තුළ කඩිනමින් -ජනාධිපතිතුමාගේ ප්‍රකාශය අනුව- පළාත් සභා මැතිවරණයත් පවත්වනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. මොකද, ඒ මැතිවරණ අනිවාර්යයෙන් පැවැත්විය යුතුයි. මහජන නියෝජිතයන් පත් වෙන්න ඕනෑ ආයතනවල මහජන නියෝජිතයන් සිටිය යුතුයි. එහෙම නැතුව නිලධාරීන් හරහා මේ බලාපොරොත්තු වෙන සියලු කාරණා ඉෂ්ට කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි ඒ ආයතනවලට මහජන නියෝජිතයන් සම්බන්ධ කරගෙන, ජනතාවත් එක්ක ඒ ප්‍රශ්න විසඳන්න පුළුවන් වන විධියට ඒ කටයුතු සකස් කරලා තිබෙන්නේ.

ඊළඟට මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. වැටුප් වැඩි වීම සම්බන්ධයෙන් කථා කළා, අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා. එතුමා කිව්වා, ඉතිහාසයේ කවදාවත් මේ විධියට මූලික වැටුප වැඩි වෙලා නැහැ කියලා. හැබැයි පොඩ්ඩක් කනගාටුයි, ඒ ප්‍රකාශය සම්බන්ධයෙන්. මොකද, 2015 සිට 2020 දක්වා කාලය තුළ මේ රටේ සමස්ත රාජ්‍ය සේවයේ මූලික වැටුප සියයට 107.5කින් වැඩි වුණා. ඒක සියලුම රාජ්‍ය සේවකයන් දන්නවා. දෙගුණයකට එහා මූලික වැටුප වැඩි වුණා. ඒ හරහා ඔවුන්ගේ විශ්‍රාම වැටුප, අනෙකුත් දීමනා ගණනාවක් වැඩි වෙලා තිබෙනවා. හැබැයි සමස්තයක් හැටියට අපි විශ්වාස කරනවා, එහෙම වැඩි වුණා කියලා රාජ්‍ය සේවකයන්ට අද එය ප්‍රමාණවත් නැහැ කියලා. අද මේ රට තුළ ඇති වෙලා තිබෙන ආර්ථික පසුබෑමත් එක්ක, එහෙම නැත්නම් බංකොලොත්භාවයට පත්වීම තුළ ඉතාම අපහසුතාවට පත් වුණු කණ්ඩායමක් තමයි රාජ්‍ය සේවකයන් කියන්නේ. ඒ නිසා 2015-2020 රජය කාලයේ මූලික වැටුප සියයට 107.5කින් වැඩි වුණාය කියලා රාජ්‍ය සේවකයන්ට හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වුණේ නැහැ මේ බංකොලොත්වීමත් එක්ක; ඔවුන් ඉතාම අමාරු තැනකට වැටුණා.

ඒ වාගේම තමයි විශ්‍රාමිකයා. විශ්‍රාමිකයාත් ජීවත් වෙන්න බැරි තැනකට වැටුණා. මොකද, භාණ්ඩ මිල ඉතා ශීඝ්‍රයෙන් ඉහළට ගියා. දැන් බලන්න, ඔබගේ රජය පත් වුණාට පසුවත්, හාල් ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ ගියා. අපි හැමදාම බත් කන කට්ටිය. හාල්වල මිල රුපියල් 100කින් විතර ඉහළ ගිහින් තිබෙනවා. ඇත්තටම ඒ තුළින් රාජ්‍ය සේවකයා සහ විශ්‍රාමිකයා තමයි ගොඩක්ම අමාරුවේ වැටිලා තිබෙන්නේ. ඒ වාගේම තමයි දැන් පොල් ගෙඩියක් ගත්තත්, වෙනත් දෙයක් ගත්තත්. ඒ හැම දෙයකම මිල දවසින් දවස ඉහළට යනවා. නමුත්, වැටුප වැඩි වන ප්‍රමාණය ජීවන වියදම ඉහළ යන ප්‍රමාණයට සරිලන්නේ නැහැ. ඒ නිසා අපි දකිනවා, රාජ්‍ය සේවකයා විශාල පීඩාකාරී තැනකට දිගින් දිගටම ඇදගෙන යන ආකාරයක්. ඒ පීඩාව නිසාම තමයි, ජීවත් වෙන්න බැරි නිසාම තමයි පසුගිය ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් රාජ්‍ය සේවකයන්ගෙන් සියයට 80ක් ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. හැබැයි, අද වැඩි කර තිබෙන වැටුප ගැන කථා කරද්දී අපි දන්නවා, ඒ වැටුප ගණනය කරලා බලන කොට, සත්‍ය වශයෙන්ම සමහර අයගේ වැටුප අඩු වෙලා තිබෙන බව. ගරු ඇමතිතුමා කොහොම කිව්වත්, අපි මොනවා කථා කළත්, වෛද්‍යවරු වැඩ වර්ජනයකට යන්නේ ඔවුන් බලාපොරොත්තු වුණු දේවල් ලැබිලා නැති නිසා. ඔබතුමා කියපු විධියට කාටත් සියයට ගණන්වලින් වැටුප් වැඩි වෙලා තිබෙනවා නම්, වැඩ වර්ජනවලට යන්න අවශ්‍යතාවක් නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පත් කර ගන්න ඒ අය විශාල සහයෝගයක් දුන්නා. ඒක ඔබතුමන්ලා දන්නවා.

විශේෂයෙන්ම රටේ ජනතාව වෙනුවෙන් මේ රජය ඉස්සරහට ගෙන යන එකට අපි බාධා කරන්නේ නැහැ. අපි කිසිම කඩාකප්පල්කාරී වැඩකට සම්බන්ධ වෙන්නේ නැහැ. මම මගේ පළමු කථාවේදීත් කිව්වා, ඔබතුමන්ලා කරන හැම හොඳ දෙයකදීම, ඔබතුමන්ලා කරන හැම හොඳ කාර්යයකදීම, ඔබතුමන්ලා ගන්නා හැම හොඳ තීරණයකටම විපක්ෂයක් හැටියට ගරු විපක්ෂ නායකතුමාත් සමඟ ජනතාව වෙනුවෙන් අපේ සහාය ලබා දෙනවා කියලා. හැබැයි, ඔබතුමන්ලා රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් යම් වැරැද්දක් කරනවා නම් අපි ඒක පෙන්වා දෙනවා. මම දැක්කා, අපේ සමහර මන්ත්‍රීතුමන්ලා එවැනි දේවල් පෙන්වා දෙන කොට ඔබතුමන්ලා ගොඩක් වෙලාවට වෛරයෙන් වාගේ හැසිරෙනවා. ඒක හොඳ දෙයක් නොවෙයි. අපේ විපක්ෂයේ යුතුකම තමයි, රටේ ජනතාව වෙනුවෙන් ඔබතුමන්ලාට කරුණු කාරණා ඉදිරිපත් කරන එක.

අද උදේත් පෙට්‍රල් ෂෙඩ් පිළිබඳ ලැයිස්තුවක් මේ සභාවට ඉදිරිපත් කරපු නිසා මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙකුටම ඒ ගැන කථා කරන්න සිද්ධ වුණා. දැන් බැලුවාම ඒ මන්ත්‍රීතුමා ඉපදිලාත් නැති කාලයේ එතුමාගේ සීයලා, මුත්තලා ගත්තු ඒවා ගැන තමයි ඒ කියලා තිබෙන්නේ. ඉතින් මොකක්ද ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ? එම නිසා අපි ඔබතුමන්ලාට පැහැදිලිවම කියනවා, මෙවැනි දේවල් නොකර රටේ සැබෑ ප්‍රශ්නවලට අපි විසඳුම් ලබා දිය යුතුයි කියලා.

දැන් බලන්න, මේ වන කොට ලක්ෂ 17කට ආසන්න පිරිසක් රාජ්‍ය සේවයේ නිරත වෙලා ඉන්නවා. ඇත්තටම අද රාජ්‍ය සේවකයන් බොහෝ දෙනෙක් තමන්ගේ සේවය ඉටු කර ගන්න බැරි ප්‍රශ්න ගණනාවකට මැදි වෙලා ඉන්නවා. මූලිකම ප්‍රශ්නය තමයි ආර්ථික ප්‍රශ්නය.

අපි 1990 වාගේ කාලයට ගිහිල්ලා බැලුවොත්, රාජ්‍ය සේවයේ හිටියේ ලක්ෂ හයහමාරයි, හතයි. ලක්ෂ හයහමාරක්, හතක් හිටපු රාජ්‍ය සේවය 2005 වර්ෂයෙන් පස්සේ විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒ වැඩි වීමත් එක්ක, ඒ හා සමානව රටේ ජනතාවට කාර්යක්ෂම හා නිවැරදි සේවාවක් ඉටු කරනවාද කියන කාරණයත් ඔබතුමන්ලා දන්නවා. එහෙම වෙලා නැහැ. එහෙම වෙලා නැත්නම්, රාජ්‍ය සේවකයාටත් උසස් තත්ත්වයකින් යුතුව, කාර්යක්ෂම වැඩ කටයුතු කරන්න පුළුවන් වන විධියට රාජ්‍ය සේවය ප්‍රායෝගිකව සකස් කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් රාජ්‍ය සේවය දිගින් දිගටම රටට ලොකු ප්‍රශ්නයක් බවට පත්

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

වෙනවා. රටට විතරක් නොවෙයි, ඒක දැන් රාජ්‍ය සේවකයාටත් ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, ඒ අයගේ වැටුප ජීවත් වෙන්න කිසිසේත් ප්‍රමාණවත් නැති තැනට ඇවිල්ලා තිබෙනවා.

විශේෂයෙන්ම සෞඛ්‍යය, අධ්‍යාපනය, පොලීසිය ආදි සේවාවලට අමතරව, සමහර සේවාවලට කිසිම තේරුමක් නැතුව සේවකයන් බඳවා ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ඔබතුමන්ලාට නොවෙයි චෝදනා කරන්නේ. පසුගිය රජයයන් විසින් යම් යම් අවස්ථාවල ගත් තීන්දු තීරණවල ප්‍රතිඵල අද රටට බරක් බවට පත් වෙලා තිබෙනවා. ඒවා වෙනස් කරන්න තමයි ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දීලා ඔබතුමන්ලා පත් කරලා තිබෙන්නේ.

ඒ අලුත් තත්ත්වය ඇති කරන්න ඕනෑ. රාජ්‍ය සේවකයාට හොඳ ප්‍රතිලාභ ලබා දීලා සතුටින්, කාර්යක්ෂමව වැඩ කරන්න, quality එකක් ඇතුව වැඩ කරන්න පුළුවන් තත්ත්වය හදලා දෙන්න අවශ්‍ය වෙනස්කම් කරනවා නම් ඔබතුමන්ලා දැවැන්ත තීන්දුවලට යා යුතුයි. ඒ වෙනස තමයි රටේ ජනතාව බලාපොරොත්තු වුණේ. වෙනත් ආණ්ඩු ගිය විධියටම ඉස්සරහට යන්න නොවෙයි රටේ ජනතාව මන්ත්‍රීවරුන් 159දෙනෙකු පාර්ලිමේන්තුට පත් කරලා තුනෙන් දෙකකට එහා ගිය බලයක් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ලබා දීලා තිබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු ඕනෑම එකක් වෙනස් කරන්න ඔබතුමන්ලාට බලය දීලා තිබෙනවා. ඕනෑම නීතියක් හදන්න ඔබතුමන්ලාට බලය දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, අද තිබෙනවා හොඳ විපක්ෂයක්. ඔබතුමන්ලා රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් කරන හොඳ දේට, රටට හොඳක් වන විධියට නීති වෙනස් කරනවා නම් ඒවාට, ඔබතුමන්ලා ගෙන යන හොඳ වැඩසටහන්වලට අපේ සහයෝගය දෙන්න අපි ලෑස්ති වෙලා ඉන්නවා. ඒ නිසා ඔබතුමන්ලාට තමයි දැන් හොඳම අවස්ථාව ලැබිලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තවත් පොඩි කාලයක් ඕනෑ වෙයි වාගේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
තවත් කරුණු බොහොමයක් කියන්න තිබෙනවා. විනාඩි පහක්වත් ඕනෑ, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, මෙතුමාට තවත් විනාඩි තුනක් දෙන්න.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සභාපතිතුමනි, ආණ්ඩුවට ඉදිරියේදී කරුණු කාරණා ගණනාවක් ඉෂ්ට කරන්න පුළුවන්. ඔබතුමන්ලා ඒ කෙරෙහි අවධානය යොමු කරලා කටයුතු කරන්න. එහෙම නැතුව එක් එක් කෙනාට බොරුවට මඩ ගහමින්, අවලාද, අපවාද කරමින් තවදුරටත් ඉස්සරහට යන්න පුළුවන් කියලා ඔබතුමන්ලා විශ්වාස කරනවා නම්, ජනතාව බලාපොරොත්තු වුණු ඒ වෙනස මේ රටේ ඇති කරන්න ඔබතුමන්ලාට කාලයක්, වෙලාවක් නැති වෙයි.

ගරු ඇමතිතුමනි, මම මේ කාරණා කිහිපයත් ඔබතුමාට මතක් කරන්න ඕනෑ. ඒ, රාජ්‍ය සේවයේ අද තිබෙන ප්‍රශ්න කිහිපයක් සම්බන්ධයෙනුයි. මට කාල වෙලාව මදි නිසා ඒ කරුණු මුලින් මතක් කරලා, ඊට අදාළ ලේඛන මම සභාගත කරන්නම්.

ගරු ඇමතිතුමනි, පළමුවැනි කාරණාව මෙයයි. "කළමනාකරණ සේවා නිලධාරීන්ගේ වැටුප් විෂමතාව නිවැරදි කර ගැනීමට 2025 අය වැය කාරක සභා අවස්ථාවේදී සංශෝධන සඳහා ඉදිරිපත් කිරීම" කියන මාතෘකාව යටතේ කළමනාකරණ සේවා නිලධාරී ඒකාබද්ධ වෘත්තීය සම්මේලන සන්ධානය යෝජනා ගණනාවක් අප වෙත ඉදිරිපත් කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් මෙය ඉදිරිපත් කර තිබෙනවා, එම වෘත්තීය සම්මේලන සන්ධානය. විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 වැටුප් චක්‍රලේඛය සහ ඊට පසුව වෙනත් සේවාවන්ට අදාළව සිදු කරන ලද වැටුප් සංශෝධන මඟින් කළමනාකරණ සේවා නිලධාරීන්ට සිදු වී ඇති වැටුප් විෂමතාව විසඳා ගැනීම වෙනුවෙන් කළමනාකරණ සේවා නිලධාරී ඒකාබද්ධ වෘත්තීය සම්මේලන සන්ධානය ලෙසත්, වෘත්තීය සම්මේලන ලෙසත් ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා.

ඒ අනුව, මේ ලිපිය සමඟ අමුණා ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් අමතන ලද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ PA/CS/POLICY/ව්‍යවස්ථා සංශෝධන (වෙළුම II) හා 2021.08.11 දිනැති ලිපිය මඟින් නිර්දේශ කර ඇති කළමනාකරණ සේවා නිලධාරීන්ට MN 3 වැටුප් පරිමාණය ලබා දී කළමනාකරණ සේවා නිලධාරීන්ගේ දැනට පවතින වැටුප් විෂමතාව 2025 අයවැය කාරක සභා අවස්ථාවේ ඉදිරිපත් කරන සංශෝධනය මඟින් විසඳීමට ඒ අය යෝජනා කරනවා.

මේ ලිපියෙහි කරුණු කාරණා ගණනාවක් සඳහන්ව තිබෙනවා. මෙහි 01, 02, 03 ආදි වශයෙන් 16 දක්වා කරුණු පැහැදිලි කර තිබෙනවා. අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී මම ඒ යෝජනා සියල්ල ඇතුළත් ලිපිය **සභාගත*** කරනවා.

ඊළඟ කාරණය, ඌන සේවා නියුක්ති උපාධිධාරීන් සම්බන්ධවයි. "ඌන සේවා නියුක්ති උපාධිධාරීන්ට සහන සැලසීමේ රජයේ යෝජනාව ක්‍රියාත්මක කිරීම මඟින් දීර්ඝ කාලයක් නොවිසඳී පවත්නා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ වැටුප් ගැටලුව ස්ථිර ලෙස විසඳීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම" යන මාතෘකාව යටතේ යෝජනා ඇතුළත් කරමින් ඉදිරිපත් කර තිබෙන ලිපියත් -කියවන්න වෙලාව මදි නිසා- මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සභාපතිතුමනි, ඊළඟ කාරණය, රජයේ සේවයේ නියුතු රියැදුරන් සම්බන්ධයයි. මේ වන කොට රජයේ සේවයේ රියැදුරන් 9,000ක් පමණ අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක සේවයේ යෙදිලා ඉන්නවා. ඒ රියැදුරන්ට හරියාකාර තනතුරු නාමයක් පවා ලැබිලා නැහැ. ඒ වාගේම, වෘත්තීමය වශයෙන් ඔවුන්ට ගැටලු ගණනාවක් තිබෙනවා. උසස් වීම්, පඩි වැඩිවීම් ආදි වශයෙන් ඒ අයගේ ගැටලු ගණනාවම යෝජනා මාලාවක් මහින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සියල්ල කියවන්න ගියොත් මට කාල වේලාව බොහෝ සෙයින් මදි වන නිසා ඒ රියැදුරන්ගේ යෝජනා මාලාවත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ගරු සභාපතිතුමනි, මට තවත් පොඩි කාලයක් දෙන්න, රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයන් ගැනත් කථා කරන්න. විශ්‍රාමිකයන් කියන්නේ, අද සමාජයේ ඉතාම අසරණභාවයට පත් වෙලා ඉන්න කණ්ඩායමක්. වෛද්‍ය සේවය, ගුරු සේවය, හමුදා සේවය, කළමනාකරණ සේවය, ලිපිකරු සේවය ආදි විවිධ ක්ෂේත්‍රවල රාජකාරි කරලා විශ්‍රාම ගිය ඒ මහත්ම මහත්මීන්ට අද ඇති වී තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක, ඔවුන්ට ලැබෙන විශ්‍රාම වැටුප බෙහෙත් ටික ගන්නත් මදි තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

විශ්‍රාමිකයන් කියන්නේ අවුරුදු 60ට, 65ට එහා අය. ඒ අය මේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක සමාජයේ අසරණ වෙලා ඉන්න එක කණ්ඩායමක්. ඒ නිසා විශ්‍රාමිකයන් කෙරෙහි තවදුරටත් අවධානය යොමු කළ යුතුයි.

මෙවර අය වැයෙන් ඒ අයට යම් යම් සහන ලබා දීලා තිබෙනවා. නමුත් ඒවා සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙන්න බැහැ. විශේෂයෙන්ම විශ්‍රාමිකයන්ගේ ස්ථාවර තැන්පතුවලට තිබුණු සියයට 15 පොලිය ඔබතුමන්ලා සියයට තුනකින් වැඩි කරලා තිබුණත්, එය වසර කීපයකට පෙර තිබූ සියයට 15 පොලී අනුපාතයට සම වෙන්නේ නැහැ. ඒ වාගේම, විශ්‍රාමිකයන්ගේ වැටුප් හා සම්බන්ධ විෂමතා ගණනාවක් ද තිබෙනවා. ඒ විෂමතාව වැඩි වෙලා තිබෙනවා 2016-2020 දක්වා විශ්‍රාම ගිය අයගේ විශ්‍රාම වැටුප් පමණක් සංශෝධනය කිරීමත් එක්ක. විශ්‍රාමිකයන්ගේ ගැටලු පිළිබඳව සඳහන් කරමින් හිටපු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය කේ.ඒ. තිලකරත්න මහතා විසින් අප වෙත ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කියවීමට කාල වේලාව නොමැති නිසා මේ අවස්ථාවේදී මා එම ලිපියත් **සභාගත*** කරවා.

අපේ කම්කරු නියෝජ්‍ය ඇමතිතුමා මේ ගැන හොඳට දන්නවා එතුමා වෘත්තීය සමිති කටයුතු කරපු නිසා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කාරණා ගැන අවධානය යොමු කරන්න දැන් ඔබතුමන්ලාට අවස්ථාව ලැබිලා තිබෙනවා. මේවා සම්බන්ධයෙන් ඉතාම සානුකම්පිතව හිතලා කටයුතු කරන්න. විශ්‍රාමිකයන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කියන්නේ, රටට විශාල සේවාවක් කරපු කණ්ඩායමක්.

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
එම යෝජනා අය වැයට ඇතුළු කරලා තිබෙනවා.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ඇතුළු කරලා තිබෙනවා. නමුත්, ප්‍රමාණවත් මදි බව තමයි ඒ හැම කෙනාම කියන්නේ. විශේෂයෙන්ම ඒ අයට ලැබෙන විශ්‍රාම වැටුප්වල විෂමතා, පරස්පරතා පුළුල් ලෙස තිබෙනවා. ගොඩක් වෙනස්කම් තිබෙනවා. ඒවා යම් ප්‍රමාණයකට හෝ සමනය කරලා ඒ අයට ඒ සහනය ලබා දෙන්න ඕනෑ. විශ්‍රාම වැටුප් වැඩි වීමේදී සමහර අවස්ථාවල අපි දැකලා තිබෙනවා, සේවයේ නියුතු රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි වන ප්‍රමාණයෙන්, ජීවන වියදම වැඩි වන ප්‍රමාණයෙන් භාගයයි විශ්‍රාමිකයන්ගේ වැඩි වෙන්නේ කියන එක. එය මෙම රජයෙන් විතරක් නොවෙයි, පසුගිය රජයන්වලදීත් සිදු වුණු දෙයක්. විශ්‍රාමිකයාත්, සේවයේ නියුතු රාජ්‍ය සේවකයාත් එකම කඩෙන් තමයි බඩු ගන්නේ. ඒ ගන්න බඩුවල මිලේ වෙනසක් නැහැ. ඔවුන් ගත්තා නම් පොල් ගෙඩියක්, ඔවුන් ගත්තා නම් හාල් කිලෝ එකක්, ඒ හැම එකකටම දෙදෙනාම ගෙවන්නේ එකම මිලක්. නමුත්, ජීවන වියදම් දීමනාව දැනට සේවයේ නියුතු රාජ්‍ය සේවකයාට ලැබෙන ප්‍රමාණයෙන් භාගයයි විශ්‍රාමිකයාට ලැබෙන්නේ. ඒක ලොකු අසාධාරණයක්. ඒ නිසා ඒ අයට යම් සාධාරණයක් ඉෂ්ට කරන්න.

ඔබතුමන්ලා බලයට පත් වෙන්න පෙර පොරොන්දු ගණනාවක් දීලා තිබෙනවා. ඒවා ඔක්කෝම ඉෂ්ට කරන්න බැරි වුණත්, දැනට සේවයේ නියුතු හා විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ට ඉන් යම් කොටසක් හෝ ඉටු කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ අය ප්‍රශ්න ගණනාවක් මා වෙත ඉදිරිපත් කළා. ඒ සියල්ල කියවන්න බැරි නිසා මම ඒවා සභාගත කරලා තිබෙනවා. ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා, ගරු ඇමතිතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මට මේ වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Prof.) A.H.M.H. Abayarathna. You have 10 minutes.

[පූ.භා. 11.28]

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡාවේදී මූලික කරුණු කිහිපයක් පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි.

අපි ශක්තිමත් රාජ්‍ය සේවයක් සඳහා, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා සඳහන් කරපු ආකාරයටම, වෛද්‍යවරුන් ඇතුළු සියලු රාජ්‍ය සේවකයන්ට විශේෂ වැටුප් වැඩි කිරීමක් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම 2016ට පසුව මූලික වැටුප වැඩි වුණේ මේ අවස්ථාවේදීයි. අඩුම වැඩි වීම රුපියල් 6,000ක් පමණ වනවා. පසුගිය කාලයේ වැඩ කරන ජනතාවට සටන් කරලා දිනා ගන්න නොහැකි වුණු වැටුප් වැඩි කිරීමක් මේ අවස්ථාවේදී අපි සටන්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

නොකරම ඔවුන්ට ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. අපට මතකයි, පසුගිය කාලයේ පැවැති ගුරුවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ගය. එම වෘත්තීය ක්‍රියාමාර්ගය පිළිබඳව සලකා බලනකොට මොන තරම් කාලයක් ඔවුන්ගේ අයිතිවාසිකම්වල කොටසක් හෝ දිනා ගැනීම වෙනුවෙන් කැප කරන්න වුණාද කියන කාරණය අපි දැක්කා. අද ඒ කිසිවක් නැතුව අපි වැටුප් වැඩි කරලා තිබෙනවා. 2048 වන කල් වැටුප් වැඩි කිරීමක් අපේක්ෂා කරන්න එපා කියපු රාජ්‍ය සේවකයන්ට අපි 2025 අය වැයේදී සැලකිය යුතු තරම් වැටුප් වැඩි වීමක් ලබා දීලා තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාලයේ රාජ්‍ය සේවය නොසලකා හැර තිබුණ බව. ඒ වාගේම ඔවුන්ගේ දීමනා, වැටුප් වැඩි කිරීම් සම්බන්ධ බරපතල ප්‍රශ්නයක් තිබුණා. කුරුණෑගල ප්‍රදේශයේ ඉන්න මගේ මිත්‍ර වෛද්‍යවරයෙක් අද උදේ මට කථා කළා. ඔහු කිව්වේ, "මොකද උඹලා මේ කරලා තියෙන්නේ, අපේ පඩි කපලා නේද" කියලා. මම ඔහුට පැහැදිලි කළාට පස්සේ තේරුම් ගත්තා. "ඒක අපට කියලා දුන්නේ නැහැ නේ අපේ වෘත්තීය සමිතියෙන්" කියලා, ඊළඟට ඔහු කිව්වා, "අපේ basic salary එකේ නම් පටිට වැඩි වීමක් තිබෙනවා" කියලා. ඒක තමයි ඇත්ත. ඒ නිසා මේ පණිවුඩය හරියට ඔවුන්ට ගිහිල්ලා නැහැ වාගේ තමයි අපට දැනෙන්නේ. මේ විධියට රාජ්‍ය සේවකයන්ට සැලකිය යුතු තරමේ වැටුප් වැඩි වීමක් දෙන අතරම, කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමාත් සඳහන් කළ ආකාරයට විශ්‍රාමිකයන්ට සැලකිය යුතු තරම් විශ්‍රාම වැටුප් වැඩි කිරීමක් අපි දීලා තිබෙනවා. විශේෂයෙන්ම මේ රට ගොඩනහන්න දායක වූ, 90 දශකයේ ඉඳන් විශ්‍රාම ගිහින් ඉන්න ප්‍රජාවට ඉහළ ප්‍රතිලාභ ලැබෙන විධියට අපි විශ්‍රාම වැටුප් වැඩි කර තිබෙනවා. ඒ පිළිබඳව මගේ කථාවේ ඉදිරියේදී මම තව කරුණු දක්වන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, රාජ්‍ය සේවයේ දැවැන්ත ගැටලුවක් තිබුණා, නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධව. මේ වනකොට අපි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. පවත්වපු විභාගවලින් ඒ සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් තෝරා ගැනීමට අපි කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම, පසුගිය කාලයේ කොවිඩ් තත්ත්වය සහ ආර්ථික අර්බුදය නිසා විභාග ප්‍රමාදවීමෙන්, මේ පරිපාලන සේවාවලට අදාළ විභාගවලට වාඩි වීමේදී වයස ගැටලුවක් වූ තරුණ තරුණියන්ගේ වයස් සීමාව අවුරුදු 28 සිට 30 දක්වා දීර්ඝ කිරීමට අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, දීප ව්‍යාප්ත සේවා සඳහා බඳවා ගැනීම් දැන් සිදු කරනවා. මේ වෙනකොට 155දෙනෙක් ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ අවසන් කර තිබෙනවා. සීමිත සහ කුලසතා පදනමිනුත් හතළිස්දෙදෙනා බැගින් මේ වෙනකොට තෝරා ගැනීම සඳහා අපි කටයුතු කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ වන විට ලොකු සාකච්ඡාවක් සමාජයේ තිබෙනවා, රැකියා විරහිත තරුණ තරුණියන්, විශේෂයෙන්ම රැකියා විරහිත උපාධිධාරීන් පිළිබඳව. අපේ අය වැය මඟින් රාජ්‍ය සේවයට අලුතින් තරුණ තරුණියන් 30,000ක් බඳවා ගැනීමට ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. අපි ඒ සඳහා කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම අපි විශ්වවිද්‍යාලවල වැඩ කරපු කාලයේ අපෙන් ඉගෙන ගත්ත විද්‍යාර්ථීන් මේ වෙනකොට රැකියාවක් නැතිව ශ්‍රම වෙළෙඳ පොළේ ඉන්නවා. ඒ වාගේම, විශ්වවිද්‍යාල උපාධිධාරීන් නොවන, වෙනත් සුදුසුකම් සම්පූර්ණ කරපු තරුණ තරුණියන් විශාල පිරිසකුත් ඉන්නවා. අපේ ආර්ථිකය බිඳ වැටිලා තිබෙන තත්ත්වය තුළත්, ඔවුන් රාජ්‍ය සේවයට ඇතුළත් කරගෙන රාජ්‍ය සේවය වඩාත් ශක්තිමත් කරන්න, වඩාත් කාර්යක්ෂම කරන්න, තරුණ ජවය රාජ්‍ය සේවයට එකතු කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම රැකියා විරහිත උපාධිධාරී තරුණ තරුණියන්ට රැකියා දෙන්නේ නැත්තේ ඇයි කියලා අපෙන් අහනවා. ගරු සභාපතිතුමනි, අපේ ආර්ථිකය ප්‍රසාරණය කිරීමට අපි අසමත් වෙලා තිබෙනවා ඒ අයට රැකියා අවස්ථා උත්පාදනය කරගන්න. ඒ නිසා රජයක් හැටියට අපේ සමස්ත අය වැය ඇතුළේ තිබෙන්නේ මේ ආර්ථිකය ප්‍රසාරණය කිරීමේ මෙහෙයුමක්. ඒ ප්‍රසාරණය කිරීමේ මෙහෙයුමේදී අනාගතයේ දේශපාලනඥයන්ගෙන් ලියුමක් ගන්නේ නැතිව, recommendation එකක් නැතිව, හැකියාවට, සුදුසුකම්වලට ගැළපෙන විධියේ රැකියා ලබා ගැනීමේ අවස්ථාව අපි නිර්මාණය කරනවා. උසද, මිටිද, කළුද, සුදුද කියලා බලන්නේ නැතිව සුදුසුකම්වලට රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළක් මේ අය වැය ඇතුළේ අපි යෝජනා කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ වෙනකොට ග්‍රාමීය පරිපාලනය ශක්තිමත් කිරීමට අපි ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, කලින් පැවති විභාගවලින් ලකුණු ලබා ගත් යම් පිරිසකට මේ වන විටත් සම්මුඛ පරීක්ෂණ පවත්වමින් බඳවා ගැනීමේ මෙහෙයුම් ආරම්භ කර තිබෙනවා. බඳවා ගැනීමේ වයස් සීමාවත් අවුරුදු 30 සිට අවුරුදු 32 දක්වා අවුරුදු 2කින් වැඩි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගමේ සියලු කටයුතුවලදී, අපේ අමාත්‍යාංශවලට අදාළව සහ ජනතාවට සේවා සැපයීමේදී මැදිහත් වෙන්නේ ග්‍රාම නිලධාරිවරු. ඔවුන්ගේ පුහුණු දීමනාව 2009 ඉඳලා තිබුණේ රුපියල් 3,000යි. අපි ඒක 2025 ජනවාරි පළමුවැනි දා සිට රුපියල් 17,800 දක්වා වැඩි කිරීමට පියවර අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ග්‍රාම නිලධාරි නිල ඇඳුම් දීමනාව රුපියල් 5,000යි තිබුණේ. අපි ඒක තුන් ගුණයකින් වැඩි කර තිබෙනවා, රුපියල් 15,000 දක්වා. ඔවුන්ගේ කාර්යාල දීමනාව සියයට 100කින් වැඩි කර තිබෙනවා, රුපියල් 1,500 සිට රුපියල් 3,000දක්වා. ඒ වාගේම, 2024 දෙසැම්බර් 31 දිනට පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු 1,881ක් පිරවීම සඳහා තරග විභාගයක් පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව සමඟ දැන් අපි කටයුතු කරමින් සිටිනවා.

ඒ වාගේම, ග්‍රාම නිලධාරීන්ට අනන්‍ය වූ වැටුප් ව්‍යුහයක් සහිතව ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය නැවත සලකා බලා අවශ්‍ය සංශෝධන සිදු කර, 2025 ජූනි පළමුවැනි දා සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු අපි මේ වන විට සිදු කරමින් සිටිනවා. ඒ වාගේම, පරිපාලන ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීමටත් අදාළ විභාග පැවැත්වීම සඳහා අපි කටයුතු කරමින් සිටිනවා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම, e-ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය 2025 වර්ෂය සඳහා දීර්ඝ කර තිබෙනවා. ගෙයින් ගෙට ගිහිල්ලා දත්ත රැස් කිරීම වෙනුවට, විවිධ ආයතන සතු දත්ත ග්‍රාම නිලධාරි භවතුන් හරහා සත්‍යාපනය කරලා මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගන්න අපේක්ෂා කරනවා. එහිදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මැතිවරණ කොමිෂන් සභාව, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වැනි ආයතන සතු තොරතුරු මේ විධියට එකතු කරගෙන ඔවුන්ගේ සේවය කාර්යක්ෂමව පහසුවෙන් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා.

ඒ වාගේම, "නිලසෙවන" ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට අපි ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා කාර්මික නිලධාරීන් අනුමත සංඛ්‍යාව 610යි. නමුත්, දැනට ඉන්නේ 345යි. වැඩක් කරගන්න ගියාම ප්‍රධාන ප්‍රශ්නයක් විධියට මතු වන්නේ මේ කාර්මික නිලධාරීන්ගේ ප්‍රශ්නය.

අපි මේ වන විට ඔවුන් බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඩිජිටල්කරණ නියමු ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙනවා. අපි මේක සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා දියත් කිරීමට අපේක්ෂා කරනවා. ඒ වාගේම ඒකාබද්ධ සේවාවලට කළමනාකරණ සහකාරවරුන් පිරිසක් බඳවා ගෙන ඉන්නවා. ඔවුන්ගේ වැටුප් ගැටලු තිබෙන්න පුළුවන්. ඒ වාගේම තව පිරිසක් බඳවා ගන්න නියමිතයි. ඒ සඳහාත් අපි අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ

වාගේම, බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක සේවක භවතුන් පිරිසක් ස්ථිර කරලා නැතිව ඉන්නවා. ඒ පිරිස ස්ථිර කිරීම සඳහාත් අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ගනිමින් ඉන්නවා.

ඒ වාගේම, රජයේ සංවර්ධන ප්‍රතිපත්තිමය අවශ්‍යතාවන්ට සරිලන පරිදි රාජ්‍ය සේවයට අදාළව පවත්නා නීති-රීති හා රෙගුලාසි සමාලෝචනයට ලක් කර සරල කිරීමේ ක්‍රියාවලිය අපි ආරම්භ කර තිබෙනවා. මේවායින් සමහරක් බ්‍රිතාන්‍ය පාලන කාලයට අයිති ඒවා. අපි විශ්වවිද්‍යාලවලදී දැක්කා, ගමන් වියදම් වවුචරයක් පුරවනකොට අහනවා, ඔබ පැමිණියේ අශ්වයා පිටින් ද කියලා. ඒ වාගේ නීති-රීති තිබුණේ. ඒවා වෙනස් කිරීම සඳහා අපි කටයුතු කරමින් සිටිනවා. ඒ මඟින් මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම, රාජ්‍ය සේවයට අදාළව පවත්නා නීති-රීති හා රෙගුලාසි සමාලෝචනය කරමින් වඩා ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා අපි කටයුතු කරමින් සිටිනවා.

ඊළඟට, පළාත් පාලන මැතිවරණය පිළිබඳව කථා කළා. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා 2022 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබුණු පළාත් පාලන මැතිවරණය එවකට හිටපු ඇමතිවරයා වසරකින් කල් දැමුවා. ඒ වාගේම, 2023දී නාම යෝජනා කැඳවා තිබියදීත් හිටපු ජනාධිපතිවරයා විසින් අත්තනෝමතිකව මැතිවරණය කල් දැමුවා, ඡන්දයට සල්ලිත් නැහැ; සල්ලි තිබුණත් ඡන්දයකුත් නැහැ කියලා. ඒක අපි හැම දෙනාටම මතකයි. ඒ වාගේම එතුමා සඳහන් කළා, සමහර අය මේ ඡන්දය කල් දමන්න කියා තමන්ගෙන් ඉල්ලා සිටි බව. අපි ඒක විශ්වාස කළත්, නොකළත් එතුමා ඒක සඳහන් කළා. ඒ නිසා මෙන්න මේ කල් දැමූ ඡන්දය පවත්වලා ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය සුරක්ෂිත කිරීමට අපගේ රජය මැදිහත් වෙනවා. ගරු සභාපතිතුමනි, දැන් ඡන්දයත් තිබෙනවා, ඡන්දයට සල්ලිත් තිබෙනවා. මැතිවරණ කොමිෂන් සභාව සල්ලි ඉල්ලාගෙන අධිකරණයට යන්නේ නැතිව ඔවුන්ට තමන්ගේ කටයුතු නිදහසේ කිරීම සඳහා අපි අවස්ථාව සලසා දීලා තිබෙනවා. ඒ වාගේම, ඒ ඡන්දයේදී නාම යෝජනා භාර දුන් අපේක්ෂක අපේක්ෂිකාවන්ට යම් යම් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. සමහර අයගේ පෞද්ගලික නිවාඩු අහිමි වුණා. සමහර අයගේ වැටුප් තවම ගෙවලා නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Prof.) A.H.M.H. Abayarathna, your time is up.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
Sir, please give me one more minute.

ඒ වාගේම, මෙහිදී රාජ්‍ය සේවයේ නිරතව සිටි අපේක්ෂක අපේක්ෂිකාවන්ට තමන්ගේ සේවා ස්ථානවලින් දුර බැහැර ස්ථානවලට යන්න සිද්ධ වුණා. සමහර අය සේවයෙන් ඉල්ලා අස්වෙලා තමයි මැතිවරණයට ඉදිරිපත් වුණේ. එවැනි අපහසුතාවලට පත් වුණු රාජ්‍ය සේවයේ නිරත වුණු මෙම අපේක්ෂක අපේක්ෂිකාවන්ට සහන සැලසීම සඳහා අපි කටයුතු කරමින් සිටිනවා, ගරු සභාපතිතුමනි. 2025 වර්ෂයේදී අප විසින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් රාශියක් තිබෙනවා. ඉදිරි අවස්ථාවලදී අපි ඒ කාරණා සඳහන් කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa. You have ten minutes.

[පූ.භා. 11.40]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය තුළ කරුණු කාරණා කිහිපයක් මත අදහස් ඉදිරිපත් කරලා, ඒ ඉදිරිපත් කරන යෝජනාවලට නිසි පිළිතුරු ගරු ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියෙන් II ශ්‍රේණියට සහ II ශ්‍රේණියෙන් I ශ්‍රේණියට සුවිශේෂී කාර්ය සාධනය මත විභාගයකින් වසර 5කින් උසස් වීම සඳහා පැවති ක්‍රමවේදය මේ වන විට වෙනස් කර, එක් එක් ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය සම්පූර්ණ කිරීම යන පදනම යටතේ මේ උසස්වීමේ ක්‍රියාවලිය වෙනස් කරලා තිබෙනවා. ඒ අසාධාරණ වෙනස නිවැරදි කරන්නට කටයුතු කරන්න, පෙර පැවති විභාග ක්‍රමයට මෙය සක්‍රිය කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම කළමනාකරණ සේවා නිලධාරීන් බඳවා ගැනීමේ මූලික සුදුසුකම සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 4කට සම්මාන සාමර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් 6ක් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත් වීම සහ අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් වීම වුවද, මේ සේවයේ බහුතරයක් නිලධාරීන් උපාධිධාරීන්. ඒ නිසා දැනට දීර්ඝ කාලයක සිට නිර්දේශ කර ඇති MN 3 කාණ්ඩයේ වැටුප ලබා දීම අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතුයි කියන එක අපි ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ පරිදි මෙය ඉටු කිරීම අපහසු කාර්යයක් වන්නේ නැහැ.

ඒ වාගේම කළමනාකරණ සේවයට බඳවා ගැනීමේදී, සියයට 70ක් විවෘත තරග විභාගයකින් සහ සියයට 30ක් සීමිත තරග විභාගයකින් බඳවා ගැනීම් කළ යුතු අතර, මේ වන විට අවස්ථා 3කදී සීමිත තරග විභාගවලින් පමණක් බඳවාගෙන තිබේ. ඒක ගැන ගැටලුවක් නැහැ. විශේෂයෙන්ම අපි ඉල්ලීමක් කරනවා. 2020 වසරේදී කළමනාකරණ සේවා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම් පත් කැඳවා තිබෙනවා. මේ වන විටත් විභාගය පවත්වා නැහැ. ඒ නිසා, එම විභාගය පවත්වා සුදුසු ලකුණු ලබා ගන්නා කණ්ඩායම බඳවා ගන්න කටයුතු කරන්නය කියලා අපි මේ අවස්ථාවේ යෝජනා කරනවා.

ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැති කාරණයක් තිබෙනවා. ග්‍රාම නිලධාරී ක්ෂේත්‍රයේ ගැටලු රැසක් තිබෙනවා. විශේෂයෙන්ම නිල ඇඳුම් දීමනාව රුපියල් 15,000ක් කිරීම. ඒ වාගේම මාසික ගමන් වියදම් දීමනාව වැඩි කර දීම. මාසික සන්නිවේදන දීමනාව වැඩි කර දීම - රුපියල් 1,500ක් කිරීම. ගමන් වියදම් දීමනාව ලෙස ඉන්ධන ලීටර් 20කට සමාන දීමනාවක් ලබා දීම. මේ යනාදී වශයෙන් ඉල්ලීම් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ඉල්ලීම්වලින් මේ වන විට වාර්තා වෙන්නේ නිල ඇඳුම් දීමනාව ක්‍රියාත්මක කිරීම අනුමත වෙලා තිබෙනවා කියන කාරණය පමණයි. ඒ නිසා විශේෂයෙන් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ග්‍රාම නිලධාරී ක්ෂේත්‍රය හරහා ග්‍රාම නිලධාරී වසම් 14,022 තුළ ලොකු සේවාවක් බිම් මට්ටමේ ජන ප්‍රජාවට ඉෂ්ට සිද්ධ කරනවා. ඒ වාගේම ග්‍රාම නිලධාරිවරුන්ගේ යම් භීතියකුත් තිබෙනවා. ඒ අය අතෙකුත් ග්‍රාම නිලධාරී වසම්වල වැඩ කටයුතුත් ආවරණය කරන නිසා ඒ අයට ලබා දෙන පහසුකම් වැඩි කරන්නය කියලාත් අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ග්‍රාම නිලධාරිතුමන්ලා බලාපොරොත්තු වුණු, එකඟ වුණු සේවා ව්‍යවස්ථාව ක්‍රියාවට නැංවීම තමයි බරපතළම ගැටලුවක් බවට පත් වෙලා තිබෙන්නේ. පසුගිය රජය කාලයේ සේවා ව්‍යාවස්ථාවක් ක්‍රියාවට නංවන්න උත්සාහයක් දැරුවා. හැබැයි ඒ ග්‍රාම නිලධාරිතුමන්ලා ඉල්ලා සිටි සේවා ව්‍යවස්ථාව නොවෙයි. එවකට ඇමතිවරයා ඇතුළු කිහිපදෙනෙකු එකතු වෙලා ඒ ගොල්ලන්ට ඕනෑ සේවා ව්‍යවස්ථාවක් නිර්මාණය කරලා, දැන් ඒ ප්‍රශ්නය හරි කියලා කිව්වා. ඒ වාගේ අත්තනෝමතික ක්‍රියාවලියකට අපි යා යුතු නැහැ කියලා මම හිතනවා. ඇමතිතුමා විනිවිදභාවයකින් යුක්ත වූ වැඩ පිළිවෙළකට ගිහිල්ලා, ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන් ඉල්ලන සේවා ව්‍යවස්ථාව ලබා දෙන්න කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම උසස්වීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට ලොකු ඉල්ලීමක් තිබෙනවා. ඒ වාගේම සමස්ත ග්‍රාම නිලධාරි ක්ෂේත්‍රයේ වසර ගණනාවක් තුළ නිර්මාණය වී තිබෙන ඌනතාවලට, ප්‍රශ්නවලට, ගැටලුවලට විසඳුම් ලබා දෙන්න කටයුතු කරන්නය කියලාත් මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

මම ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ උපදේශ කාරක සභාවටත් සභාගී වුණා. එම උපදේශක කාරක සභාවේදී යම් ප්‍රශ්නයක් මතු වෙනකොට ඔබතුමාගේ නිලධාරි මණ්ඩලය බොහොම පැහැදිලිව කිව්වා රාජ්‍ය සේවය තුළ මේ රජය යටතේ පළි ගැනීම් සිදු වෙලා නැහැයි කියලා. ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමනි පළි ගැනීම් සිදු වෙලා තිබෙනවා. මම, නම් වශයෙන්ම කියන්නම්. මහින්ද වීරසූරිය, ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව; ඔහුව pool එකට දැම්මා. ඒ දැම්ම තුළ ඔහු retire වුණා. වයඹ ප්‍රධාන ලේකම්තුමිය, දීපිකා ගුණරත්න, pool එකට දැම්මා. ඌව ප්‍රධාන ලේකම්තුමිය, දමයන්ති පරණගම; ඇයව ඉවත් කළා. එපමණක් නොවෙයි. පළාත් ලේකම්වරුන්ගෙන් මේ පළිගැනීම් නතර වෙලා නැහැ. ඒක දැන් දිස්ත්‍රික් ලේකම්ලා දක්වා ගිහිල්ලා තිබෙනවා. නන්දන ගලබොඩ, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් ඉවත් කළා. රත්නපුර දිස්ත්‍රික් ලේකම්, වසන්ත ගුණරත්න ඉවත් කළා. මාතර දිස්ත්‍රික් ලේකම්, ගනේෂ් අමරසිංහ ඉවත් කළා. මම හිතන විධියට ඉතිහාසයේ ලැබුණු වැඩිම රාජ්‍ය සේවක ඡන්ද ප්‍රමාණය ඔබතුමන්ලාට ලැබුණා. ඒ අය වාර්තාගත ඡන්ද ප්‍රමාණයක් ලබා දුන්නේ මේ නිලධාරින්ගෙන් පළිගන්න නොවෙයි. පුදුමයට කාරණාව තමයි හොඳට රාජකාරි කළ නිලධාරින් සහ නිලධාරිනියන් කිසිදු වරදක් කරන්නේ නැතිව, කිසිම චෝදනාවක් නැතිව බෙල්ලෙන් අල්ලලා pool එකට දානවා, තම තමන්ට හිතවත් කණ්ඩායම් පත් කර ගන්න.

එතකොට ඒගොල්ලන්ගේ ආත්ම ගරුත්වයට මොකක්ද සිද්ධ වෙන්නේ? මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ පළිගැනීමේ සංස්කෘතිය ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න එපා කියලා. එදා උපදේශක කාරක සභාවේදී ඔබතුමා ළඟ සිටි නිලධාරින් කිව්වා, මේ වාගේ පළිගැනීම් කරන්නේ නැහැ කියලා. ඒ ගැන නැවත සොයා බලා මේ නිලධාරින්ට සාධාරණත්වය ඉෂ්ට සිද්ධ කරන්න කියා මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ඒ වාගේම මම මේ අවස්ථාවේ ඔබතුමාට විශේෂයෙන් තවත් කරුණක් මතක් කර දෙන්න කැමැතියි.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සමාවෙලා මගේ කථාවෙන් පස්සේ ඔබතුමා උත්තර දෙන්න. *[බාධා කිරීමක්]* මට disturb කරන්න එපා. ඔබතුමා මගේ කථාවෙන් පස්සේ උත්තර දෙන්න. *[බාධා කිරීමක්]* මම බොරු කියන්නේ නැහැ, වසන්ත ඇමතිතුමා, ඔබතුමා දන්නවා නේ මම එහෙම බොරු කියන්නේ නැහැ කියලා. මම මේ ඉදිරිපත් කරපු තොරතුරු, කරුණු-කාරණාවලට මම වගකියනවා. ඔබතුමන්ලාට පුළුවන්, හෙට උදේට Ministerial Statement එකක් ඉදිරිපත් කරලා ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]* හරි, හරි. මම කථා කරන්නේ කරුණු හොයා බලා. ඒ වාගේම මම තවත් කාරණයක් කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sajith Premadasa, you have two more minutes.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I will take enough time since I am the Leader of the Opposition. That is the convention. Thank you.

ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 72 පිටුවේ සඳහන් වෙනවා, උපාධිධාරීන් 20,000ක් ගුරු වෘත්තිය සඳහාත්, විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත - STEM - උපාධිධාරීන් 3,000ක් සහ STEM නොවන උපාධිධාරීන් 9,000ක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයටත්, ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගු දෙපාර්තමේන්තුවට, විදේශ සේවාවට, සංචාරක කර්මාන්තයට තවත් 3,000ක් ලෙස මුළුමනින්ම ගත් කළ උපාධිධාරීන් 35,000ක් බඳවා ගන්නවා කියලා. හැබැයි, අය වැය කථාවේ ඒක හරියාකාරව සඳහන් වෙලා නැහැ. මේ වන විට 35,000ත් 40,0000ත් අතර උපාධිධාරීන් පිරිසක් ඉන්නවා, රැකියා විරහිතව.

මම තවත් කාරණයක් මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. පසුගිය දිනක අනුරාධපුරය දිස්ත්‍රික්කයේදී ඒ උපාධිධාරීන් මා හමුවුණා. ඔවුන් ගරු අග්‍රාමාත්‍යතුමියවත් හමුවන්නට ආවා, එතුමිය අනුරාධපුරයේ සිටින විට. රැකියා විරහිත උපාධිධාරීන් 800ක් පමණ උතුරු මැද පළාතේ ඉන්නවා, ගුරු ක්ෂේත්‍රයේ විභාගය සමත් වෙලා පත්වීම් නැතිව. මේ විධියට හැම පළාතකම රැකියා විරහිත උපාධිධාරීන්ගේ ප්‍රශ්නය තිබෙනවා. අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමාත් මේ ගැන හොඳටම දන්නවා. *[බාධා කිරීමක්]* රැකියා විරහිත එම උපාධිධාරීන් මා හමු වූ අවස්ථාවේදී මා හට ලබා දුන් ලේඛනය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

කොහොම හරි විශාල පිරිසක් ඉන්නවා, තවමත් පත්වීම් නොලබපු. උතුරු මැද පළාතේ පමණක් නොවෙයි, අනෙක් පළාත්වලත් ඉන්නවා. ඔක්කෝම උපාධිධාරීන් 35,000ක් පමණ ඉන්නවා, රැකියා විරහිතව. මම දැන් එනකොට දැක්කා, පොල්දූව හන්දියේත් එවැනි පිරිසක් ඉන්නවා. ඔබතුමන්ලාගේ රජය තුළින් ඒ යුතුකම් හා වගකීම් ඉෂ්ට කරනවා නම්, රැකියා විරහිත උපාධිධාරීන් රැකියා ඉල්ලාගෙන පොල්දූව හන්දියට එන්න ඕනෑ නැහැ නේ.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

"පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වන ආකාරයට උපාධිධාරීන් 35,000කට රැකියා දෙනවා කියලා ජනාධිපතිතුමාගේ අය වැය කථාවේත් පැහැදිලිව සඳහන් වුණා නම්, මේ රැකියා විරහිත උපාධිධාරීන් එය විශ්වාස කරනවා. එහෙම වුණා නම් ඒ විශ්වාසය තුළ පොල්දූව හන්දියට ඒ කවුරුවත් එන්නේ නැහැ, උද්ඝෝෂණ කරන්න. නමුත්, ඒ විශ්වාසය කඩ වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අද ඔබතුමා කරන කථාවේදී මහ පාරට බැහැලා සිටින ඒ උපාධිධාරීන් 35,000 හෝ 40,000 වෙනුවෙන් බොහොම පැහැදිලි ප්‍රකාශයක් කරන්න කියලා. මොකද, උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය වෙනුවෙන් විපක්ෂයේ ඉන්නකොට ඔබතුමන්ලාත් මහ පාරට බැස්සා; විපක්ෂයේ ඉන්නකොට අපිත් මහ පාරට බැස්සා. එදා ඔබතුමන්ලා මහ පාරට බැස්සා සේම අද රාජ්‍ය බලය කියන හස්තය ඔබ සතුව තිබෙන මොහොතක කරුණාකර මේ ප්‍රශ්නයට තිරසර විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් මම තවත් වචනයක් කියන්න කැමැතියි. අපේ ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළා, "ඡන්ද යටපත් කරන සංස්කෘතියක් තිබුණා, ඒ ඡන්ද යටපත් කරන සංස්කෘතිය වෙනුවට ඡන්ද තියන සංස්කෘතියට ඔබතුමන්ලා පණ පෙව්වා" කියලා.

ඒකට බොහොම ස්තුතියි. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා අපිත් නඩු කටයුතුවල නිරත වෙලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන්ම නියෝගයක් ලබා ගත්තා, පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුයි කියන කාරණාවට.

මම මේ අවස්ථාවේදී කරුණු දෙකක් කියන්න කැමැතියි. පළමුවෙනි කාරණාව මෙකයි. අපේ රටේ ජනතාවගේ මානව අයිතිය උල්ලංඝනය කරමින්, විවිධ රාජ්‍ය නිලධාරීන්ට බලපෑම් කරමින්, බොරු කියමින්, රවටමින් වසර ගණනාවක් පළාත් පාලන මැතිවරණය කල් දමන්නට කටයුතු කළ කණ්ඩායම් ගැන ඔබතුමන්ලා ගන්න පියවර මොකක්ද? මම දන්නවා, එක රාජ්‍ය නිලධාරියෙකුට කොච්චර බලපෑම් සිදු වුණාද කිව්වොත්, එදා ඔහුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මාරු කළා. ඔහු අවසානයේ නතර වුණේ ඕස්ට්‍රේලියාවේ. විශ්‍රාම ගිහිල්ලා ඔහු ඕස්ට්‍රේලියාවට ගියා. ඒ වාගේ තත්ත්වයක් තමයි එදා නිර්මාණය වුණේ. මේ මැතිවරණ කල් දැමීමේ කුට කුමන්ත්‍රණයේ මහ මොළකරුවා කවුද කියන එක අපට දැනගන්නට ඕනෑ. ඒ මහ මොළකරුවාත් එක්ක එකතු වෙලා මැතිවරණ කල් දැමීමේ ඒ මහ කුමන්ත්‍රණයට සම්බන්ධ වුණු හවුල්කරුවන්, අතකොළුවන්, ඒ කණ්ඩායම් කවුද කියන එක මේ සභාවට නම් ගම් සහිතව ඉදිරිපත් කරන්න කියලා අපි ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු අමාත්‍යතුමනි, අපට අවශ්‍යයි, මැතිවරණය. සර්ව සාධාරණව මැතිවරණය පැවැත්වීම අවශ්‍යයි. සම බිමක් තුළ සර්ව සාධාරණව මේ මැතිවරණය පවත්වන්නට ඕනෑ. හැබැයි, රාජ්‍ය හස්තය උපයෝගි කරගෙන වෙනත් ක්‍රියාදාම -රාජ්‍ය ක්‍රියාදාම, සංස්කෘතික ක්‍රියාදාම, ආගමික කටයුතු- මේ මැතිවරණ කාලසටහන ඇතුළට දමා මේ මැතිවරණ සමයේ එවන් කටයුතු ක්‍රියාත්මක කිරීම සදාචාර සම්පන්නද? එසේ නොමැතිව මැතිවරණය පවත්වන්නට තිබෙන දිනය ඉක්මවා තව දින කිහිපයක් ගියාට පසුව ඒ විශේෂිත වූ අවස්ථාව - ඒ ආගමික සංස්කෘතික අවස්ථාව - ක්‍රියාත්මක කිරීම සුදුසු බව අපි හිතනවා. මොකද, ඒ සඳහා තව දින කිහිපයයි ගත වෙන්න තිබෙන්නේ. ඒ නිසා ඊට පසු එළඹෙන කාල වකවානුව තුළ ඒ වැදගත් ආගමික ඓතිහාසික කටයුතු; මෑත කාලයේ සිදු නොවුණු වැදගත් කටයුතු ක්‍රියාත්මක කිරීම සුදුසුයි නේද? එය සදාචාර සම්පන්නයි නේද? ඒ වාගේ ක්‍රියාවලියක් මැතිවරණ කාලසටහනක් ඇතුළට ගෙන ඒම තුළින් අනිසි ලෙස ආගම ධර්මය මැතිවරණ ක්‍රියාවලියට උපයෝගි කර ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වීමක්දෝ කියන අදහස බොහෝදෙනාගේ සිත් තුළ නිර්මාණය වන බව ඇත්ත වශයෙන්ම අපි කියන්නට ඕනෑ.

මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, ඒ කටයුත්ත රටේ සාමයට, සෞභාග්‍යයට, ඒ වාගේම රට තුළ, ජන සමාජය තුළ සුචරිතභාවය, විනයගරුකභාවය, ඒ දහම් සුවඳ, ආගම ධර්මය ව්‍යාප්ත වීම අපි මේ වැටී තිබෙන ප්‍රපාතයෙන් ගොඩ එන්නට ඉවහල් වන බව. නමුත් එවන් ආගමික කටයුතු කිසිසේත්ම දේශපාලන ආයුධ බවට පත් කර ගන්න එපා කියන එක අපි කාරුණිකව ඉල්ලා සිටිනවා. මැතිවරණ ක්‍රියාවලියෙන් පසුව; එය අවසන් වූ වහාම එම කටයුත්ත ක්‍රියාත්මක කිරීම වඩාත් සදාචාර සම්පන්නයි කියන එකත් මේ අවස්ථාවේදී මා කියන්න කැමැතියි. දැන් අපි කියපු දේවල් කණපිට හරවන්නට එපා. අපි සත්‍ය වශයෙන්ම අගය කරනවා, විශේෂයෙන්ම එවන් ආගමික කටයුතු ක්‍රියාත්මක කිරීම. නමුත් ඒවා ක්‍රියාත්මක කරන කාල වකවානුව මොකක්ද කියන එක ගැන තවදුරටත් හිතා බලා මැතිවරණ ක්‍රියාදාමයක් අවසන් වුණු මොහොතක ඒ දේ ඉෂ්ට සිද්ධ කිරීම වඩාත් සුදුසුයි කියන කාරණාව මේ අවස්ථාවේ සඳහන් කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දුන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Kaveenthiran Kodeeswaran. You have eight minutes.

[மு.ப. 11.56]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். சுமார் 33 வருடங்களாக அநீதி இழைக்கப்பட்டு வருகின்ற கல்முனை வடக்குப் பிரதேச செயலகம் சம்பந்தமாக நாங்கள் இந்த உயரிய சபையில் பல தடவை பேசியிருக்கின்றோம். NPP அரசாங்கம் ஆட்சிக்கு வந்த பிறகும் நான் இந்தச் சபையில் இவ்விடயம் பற்றி மூன்று தடவை பேசியிருக்கின்றேன். இன்றும் கல்முனை வடக்குப் பிரதேச செயலகம் சம்பந்தமாகவும் அந்தப் பிரதேச செயலகத்துக்கு இழைக்கப்பட்டு வருகின்ற அநீதி சம்பந்தமாகவும் இந்த இடத்தில் கூறலாமென நினைக்கின்றேன். நான் பேசிய பின்னர், கௌரவ அமைச்சர் அவர்கள் இதற்குத் தகுந்த பதிலைத் தர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நான் இந்த விடயத்தை முன்வைத்து வாய்மூல விடைக்கான வினாக்கள் நேரத்திலும் கேள்வி கேட்டிருக்கிறேன். அப்போது மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர் கௌரவ ருவன் செனரத் அவர்கள் எதிர்வரும் பாராளுமன்ற அமர்வில் அதற்குப் பதில் வழங்குவதாகச் சொல்லியிருந்தார். ஆனால், இற்றைவரை அவர் பதில் தரவில்லை. எனவே, இந்த விடயத்தை இந்த உயரிய சபையினூடாக இங்கிருக்கின்ற கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவரலாமென நினைக்கின்றேன்.

கல்முனை வடக்குப் பிரதேச செயலகமானது, 1989ஆம் ஆண்டு உப பிரதேச செயலகமாகவே இருந்தது. அதன்பின்னர், உப குழுவின் அறிக்கையின்படி,

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

1993.09.28ஆம் திகதி அமைச்சரவையின் அனுமதியோடு முழு அதிகாரம்கொண்ட ஒரு பிரதேச செயலகமாகத் தரமுயர்த்தப்பட்டது. அமைச்சரவையின் அனுமதியுடன் முழு அதிகாரம்கொண்ட ஒரு பிரதேச செயலகமாக அது இருந்தபோதிலும்கூட, இன்று அந்தப் பிரதேச செயலகத்துக்குரிய அதிகாரம் மறுக்கப்பட்டு இருக்கின்றது. சுமார் 33 வருட காலமாக மாறி மாறி ஆட்சியில் இருந்த அரசியல்வாதிகள் அரசியல் நோக்கத்தை அடைவதற்காக உயர் பதவிகளில் இருந்த செயலாளர்கள், அரசாங்க அதிபர்கள் போன்றோர் அவர்களின் கைக்கூலியாக இருந்து, தரமுயர்த்தப்பட்ட அந்தப் பிரதேச செயலகத்துக்குக் கொடுக்கவேண்டிய அதிகாரத்தைக் கொடுக்காமல் இருந்தார்கள். அந்தப் பிரதேச செயலகம் 323க்கும் மேற்பட்ட ஆளணியினரையும் 29 கிராம சேவையாளர் பிரிவுகளையும் கொண்ட ஒரு பிரதேச செயலகமாக இருக்கின்றது. SLAS-Class I தரத்தைக்கொண்ட ஒருவர் அங்கு பிரதேச செயலாளராக இருக்கின்றார். அதுமாத்திரமன்றி, அந்தப் பிரதேச செயலகத்துக்கு முழு வளங்களும் கொடுக்கப்பட்டு இருக்கின்றது. 2019ஆம் ஆண்டு Ministry of Internal and Home Affairs and Provincial Councils and Local Governmentஇன் அதிகாரபூர்வ websiteஇல் குறிப்பிடப்பட்டிருந்த 332 பிரதேச செயலகங்களில் கல்முனை வடக்குப் பிரதேச செயலகமும் ஒன்றாக இருந்தது.

ஆனால், பின்பு அது உப பிரதேச செயலகமாக மாற்றப்பட்டது. நான் இந்த இடத்தில் கௌரவ அமைச்சர் அவர்களிடம் சில கேள்விகளைக் கேட்க விரும்புகின்றேன். அமைச்சரவையின் அங்கீகாரம் அளிக்கப்பட்ட ஒரு பிரதேச செயலகம் எப்படி உப பிரதேச செயலகமாக மாற்றப்படும்? அதற்கான அதிகாரத்தை யார் கொடுத்தது? அமைச்சின் செயலாளருக்கோ, அரசாங்க அதிபருக்கோ அமைச்சரவை அங்கீகாரம் கொடுக்கப்பட்ட விடயத்தில் மாற்றம் செய்ய முடியுமா? கல்முனை தெற்குப் பிரதேச செயலகத்துடன் கல்முனை வடக்குப் பிரதேச செயலகத்தை உப பிரதேச செயலகமாக இணைக்க முடியுமா? அந்த அதிகாரம் எப்படி வந்தது? அவ்வாறு செய்வதற்கு செயலாளருக்கு அதிகாரம் இருக்கின்றதா? அல்லது அரசாங்க அதிபருக்கு அதிகாரம் இருக்கின்றதா? யாருக்கும் அந்த அதிகாரம் இல்லை! அப்படி மாற்ற வேண்டுமென்றால், நீங்கள் மீளவும் ஓர் அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பிக்க வேண்டும். அவ்வாறு செய்துதான் அந்தப் பிரதேச செயலகத்தை உப பிரதேச செயலகமாகத் தரமிறக்க முடியும்.

இன்று அந்தப் பிரதேச செயலகத்தின்கீழ் 29 கிராம சேவகர் பிரிவுகள் இருக்கின்றன. அங்கு நில அத்துமீறல்கள் நடக்கின்றன. அங்கு பாரிய நில மோசடிகளைச் செய்வதற் காகவே அது ஓர் உப பிரதேச செயலகமாகக் காட்டப்பட்டு இருக்கிறது. ஏன், பொது நிர்வாக உள்நாட்டலுவல்கள் அமைச்சில் இந்த Cabinet Paper மறைக்கப்பட்டு இருந்தது. அதைக்கூட ஒளித்திருக்கிறார்கள். நீங்கள் ஊழலை ஒழிப்பீர்கள்; நியாயத்தை வழங்குவீர்கள்; சரியான முறையில் நிர்வாகத்தைக் கட்டமைப்பீர்கள் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. அங்கு பாரியளவில் நிலமோசடி நடந்திருக் கிறது. நில மோசடி நடப்பதற்காக கடந்த காலங்களில் இருந்த அரசியல்வாதிகளுக்கு மட்டுமல்லாமல், அமைச்சில் இருந்த உயர் அதிகாரிகளுக்கும் இலஞ்சம் வழங்கப்பட்டு இருக்கிறது. இதை நீங்கள் விசேட குழு ஒன்றின்மூலம் கண்காணிக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இப்படியான செயற்பாடுகளைத் தடுத்து நிறுத்த வேண்டும்; அதற்கான உத்தரவாதத்தை வழங்க வேண்டும்.

சென்ற பாராளுமன்ற அமர்வில் வாய்மூல விடைக்கான வினாக்கள் நேரத்தில் நான் கேள்வியொன்றைக் கேட்டிருந்தேன். அப்பொழுது, கௌரவ பிரதி அமைச்சர் ருவன் சனரத் அவர்கள் இதில் பிழை நடந்திருக்கிறது என்பதையும் இந்த நிர்வாகத்தில் குளறுபடி நடந்திருக்கின்றது என்பதையும் ஏற்றுக்கொண்டார். இதில் அநீதி நடந்திருப்பதால் இதனை ஏற்றுக்கொள்ள முடியாது என்றும் கூறினார். அதற்குரிய சரியான பதிலை எதிர்வரும் பாராளுமன்ற அமர்வில் தருவதாகச் சொன்னார். ஆனால், தரவில்லை. நான் இந்த இடத்தில் உங்களிடம் கேட்டுக்கொள்வது என்னவெனில், ஒரு குழுவை அமைத்து இதற்கான நியாயத்தைப் பெற்றுத் தாருங்கள் என்றுதான். உங்களுடைய இந்த ஆட்சி சிறந்ததோர் ஆட்சியாக இருக்கின்றபடியால், நாங்கள் நியாயத்தைக் கேட்கின்றோம். ஊழலற்ற, நிர்வாகச் சீர்கேடற்ற ஓர் ஆட்சி முறையைக் கொண்டுவர நீங்கள் நினைக்கின்றீர்கள்.

நீங்கள் இந்த விடயத்தில் கவனம் செலுத்துவீர்கள் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. இது தொடர்பான முழு documentsஉம் இந்தக் கோவையில் இருக்கின்றது. நான் இதை உங்களுக்குத் தருகின்றேன். நீங்கள் இதைப் பார்த்துவிட்டு, இதற்கென ஒரு குழுவை அமைத்து, இதற்குரிய நீதியை சரியான முறையில் வழங்க வேண்டும். கடந்த காலத்தில் ஆட்சியில் இருந்தவர்கள் - சனாதிபதி, பிரதமர் உட்பட பலரும் - தொடர்ச்சியாக எங்களை ஏமாற்றி வந்தார்கள். தங்களுடைய ஆட்சியை நிலைநிறுத்த வேண்டும் என்பதற்காக - ஆட்சி கவிழ்ந்துவிடாதிருப்பதற்காக - அவர்கள் இவ்வாறான போலி வேலைகளைச் செய்தார்கள். 159 ஆசனங்களைக் கொண்டிருக்கின்ற இந்த அரசாங்கம், நியாயமான, நேர்மையான செயற்பாடுகளை முன்னெடுப்பதற் காக வந்த அரசாங்கம்! எனவே, நீங்கள் இந்த விடயங்களைக் கருத்திற்கொள்ள வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Kaveenthiran Kodeeswaran, your time is up.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Sir, please give me one more minute.

அடுத்து, வேலையற்ற பட்டதாரிகளுக்கு நியமனம் வழங்கவேண்டிய கடமைப்பாடு உங்களுக்கு இருக்கின்றது. இன்றும்கூட, அம்பாறை மாவட்டத்தின் காரைதீவிலும், மட்டக்களப்பிலும் அவர்கள் போராட்டத்தில் ஈடுபட்டுக் கொண்டு இருக்கின்றார்கள். அவர்களுக்கான நியாய பூர்வமான வேலைவாய்ப்பை வழங்க வேண்டும். பல்கலைக்கழகத்திலிருந்து pass out ஆகியதன் - வெளி யேறியதன் - அடிப்படையில், அவர்களுக்கான நியமனத்தை வழங்குங்கள்! போட்டிப் பரீட்சையில் சித்தியடைந்த குறிப்பிட்ட தொகையினருக்கு நியமனம் வழங்குகின்ற அதேநேரம், ஏனையவர்களுக்கும் அவர்களின் தகைமையின் அடிப்படையில் நியமனம் வழங்க வேண்டுமென நான் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், போட்டிப் பரீட்சை நடாத்தும்பொழுது, குறிப்பிட்ட தொகையினரே select பண்ணப்படுவார்கள்; ஏனையோர் தெரிவு செய்யப்படாமல் இருப்பதற்கு வாய்ப்பு இருக்கிறது. வட, கிழக்கில் விசேடமாக அம்பாறை மாவட்டத்தில் கிட்டத்தட்ட

1,800 வேலையற்ற பட்டதாரிகள் இருக்கின்றார்கள். தகுதி மற்றும் pass out ஆகிய வருடம் என்பவற்றின் அடிப்படையில், அவர்களுக்கு நியாயபூர்வமான வேலைவாய்ப்பை வழங்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Wasantha Samarasinghe. You have 17 minutes.

[අ.භා. 12.06]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු සභාපතිතුමනි, අද අය වැය කාරක සභා අවස්ථාවේ ඉතා වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා වෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේත්, කම්කරු අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව තමයි අද අපි සාකච්ඡා කරන්නේ. මේ විවාදයේදී කම්කරු අමාත්‍යාංශය ගැනත්, වැටුප් පිළිබඳව මතු වන ගැටලු පිළිබඳවත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ රටේ ශ්‍රම බලකාය මිලියනවලින් ගත්තොත්, 8.4ක් කියලායි කියන්නේ. ඒ මිලියන 8.4න් මිලියන 5.5ක් පුරුෂයින්, මිලියන 2.9ක් කාන්තාවන්. මේ පිරිසෙන් මිලියන 5.3ක් පිරිමි සේවා නියුක්තිකයන් ද මිලියන 2.7ක් කාන්තා සේවා නියුක්තිකයන් ද වෙනවා. ඒ අනුව සියයට 95.3ක් සේවා නියුක්තිකයන් ලෙස සලකනවා. හැබැයි, මේ සංඛ්‍යාලේඛන ගැන සලකද්දී සේවා නියුක්තිකයෙක් දිනකට පැය කීයක් වැඩ කරනවාද කියලා ඇහුවොත් මේ නිර්ණායකවල බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය පැත්තෙන් ගරු ඇමතිතුමා කරුණු ඉදිරිපත් කරයි.

ගරු සභාපතිතුමනි, අද රටේ රැකියා වියුක්තිය සියයට 4.7යි. හැබැයි, අපි මේ අය වැයෙන්ම රුපියල් මිලියන 10,000ක් වෙන් කරලා තිබෙනවා, රාජ්‍ය සේවයට 30,000කට වැඩි පිරිසක් අලුතෙන් බඳවා ගන්න. ඒ වාගේම තව ආයතන ගණනාවක් පිළිබඳවත්, අර්ධ කාලීනව, එහෙම නැත්නම් කොන්ත්‍රාත් සේවයේ රැකියා කරන අය පිළිබඳවත් ආණ්ඩුව අවධානය යොමු කරලා තිබෙනවා, සැලකිලිමත් වෙමින් තිබෙනවා.

අපේ රටේ ශ්‍රම බලකාය වඩා හොඳින් සේවයේ යෙදෙන ආකෘතිය ගත්තොත්, විශේෂයෙන් කර්මාන්ත අංශයේ සියයට 25ක්, 26ක් විතර සේවයේ යෙදෙනවා. කෘෂිකාර්මික අංශයේ සියයට 26ක් විතර සේවයේ යෙදෙනවා. ඒ වාගේම සියයට 48ක් විතර සේවා අංශයේ නියුක්ත වෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, වතු ක්ෂේත්‍රය තමයි අපි නිර්ණායක ලෙස සලකන ක්ෂේත්‍ර ටික. කෘෂිකාර්මික ක්ෂේත්‍රය වාගේම ස්වයං රැකියා ක්ෂේත්‍රයත්, අවිධිමත් ක්ෂේත්‍රයත් මේක ඇතුළේ තිබෙනවා.

විශේෂයෙන් අපේ රටේ පෞද්ගලික අංශයේ වැටුප් පිළිබඳ කාරණයේදී මෑත ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩිවීම, අවම වැටුප් වැඩි කිරීම ලබා දෙන්න කටයුතු කළේ වෙන කිසිවෙකු නොවෙයි, ජාතික ජන බලවේගයේ අපියි කියන කාරණය මේ විවාදයට එක්වෙමින් මම ඉතා ආඩම්බරයෙන් කියනවා. ඒ මොකද? පෞද්ගලික අංශයේ සේවකයන්ට රුපියල් 17,500ක අවම වැටුපක් තමයි තිබුණේ. ඒ රුපියල් 17,500ට රුපියල් 3,500ක අය වැය සහන දීමනා දෙකක් 2005-2015 කාලයේ ලබා දී තිබෙනවා. ඒ අනුව තමයි රුපියල් 21,000ක් තිබුණේ. හැබැයි, මේ අවුරුද්දේ අප්‍රේල් සිට රුපියල් 27,000ක් වෙනවා, මූලික වැටුප. ඒ වාගේම ලබන ජනවාරි සිට එයට තව රුපියල් 3,000ක් වැඩි වෙලා රුපියල් 30,000ක් වෙනවා. මේකට සමගාමීව තමයි වතු ක්ෂේත්‍රයත් කටයුතු කළේ. දින 25ක් වැඩ කරනවා කියලා සැලකුවොත්, රුපියල් 1,350ක අවම දෛනික වැටුපක් තිබෙනවා. දින 25ක් වැඩ කළොත් රුපියල් 38,750ක් උපයා ගැනීමේ හැකියාව තිබෙනවා. Kilo rate එකටත් ඒ අයට මුදල් ගන්න පුළුවන්කම තිබෙනවා; කිලෝ එකකට රුපියල් 50ක් ගන්න පුළුවන්කම තිබෙනවා.

මේවා ලබා ගැනීම සහතික කිරීම සඳහා ආණ්ඩුව වතු හාමිපුතුන් එක්ක දැන් සාකච්ඡා කරනවා. ඒ අයට රස්සාවට අදාළ දින කාලය ලබා දෙන්නත්, ඒ වෙනුවෙන් ඔවුන්ට ලබා දිය යුතු සහන ගැනත් අපි කථා කරනවා. මොකද, වතු ක්ෂේත්‍රයේ නිශ්චිත වැටුප් නැහැ, දෛනික වැටුප් තිබෙන්නේ. ලැබෙන දින ගණනටයි වැටුප හම්බ වෙන්නේ. හැබැයි, පෞද්ගලික අංශයේ එහෙම නොවෙයි. අනිවාර්යයෙන් මාසික වැටුප ලැබෙන්නේ. අවම වැටුප රුපියල් 30,000යි. ඊට අමතරව ඔවුන්ට විවිධ attendance allowances තිබෙනවා, overtime payment එක මෙකත් එක්ක හැදෙනවා. ඊට පස්සේ බෝනස් එකත් හැදෙනවා. ඒ අනුව මෑත ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩිවීම අපි ලබා දුන්නා. මේක තහවුරු කිරීම සඳහා අවශ්‍ය නීතිමය සංශෝධනය අපි කරන්න ඕනෑ.

ඒ තමයි, අවම වැටුප සම්බන්ධයෙන් පනතක් තිබෙනවා. ඒ පනත සංශෝධනය කරලා, මේ අය වැය සහන දීමනා දෙකත් එකතු කරලා, රුපියල් 30,000ට ඒ වැටුප ගෙන එන්න අපි කටයුතු කරනවා. ඒකට සමගාමීව තමයි රාජ්‍ය සේවයේ වැටුප් වැඩි වෙන්නේ.

වෘත්තීය සමිති ව්‍යාපාරය ඇතුළේ හිටපු මා ඇතුළු වෘත්තීය සමිති නායකයින් ගණනාවක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. අපේ කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයා, මහින්ද ජයසිංහ සහෝදරයා, ඒ වාගේම වන්දන සූරිය ආරච්චි සහෝදරයා, වතු ක්ෂේත්‍රය නියෝජනය කරන කිට්ටනන් සෙල්වරාජ් සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති ගණනාවක නායකයන් අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඒ නිසා ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා හැටියට මේ වැටුප් වැඩිවීම පිළිබඳව අප සමඟත් සාකච්ඡා කරලා, මෙතෙක් රාජ්‍ය සේවයේ තිබුණු සියලු වැටුප්වල ගැටලු හඳුනා ගත්තා. ඒ ගැටලු හඳුනා ගෙන තමයි, මේ වැටුප් වැඩිවීමට අපි මැදිහත් වෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ ඒ වැටුප් වැඩිවීම පිළිබඳව කාරණය කියද්දී රාජ්‍ය සේවයේ - public sector එකේ - තිබෙන පහළම තනතුර තමයි කාර්යාල කාර්ය සහායක - KKS - තනතුර. ඒ කාර්යාල කාර්ය සහායකයෙකුගේ අවම වැටුප රුපියල් 24,250යි. අපි ඒ basic salary එක රුපියල් 40,000 දක්වා ගේනවා.ඊට අමතරව, තව රුපියල් 17,800ක ජීවන වියදම් දීමනාවක් තිබෙනවා. ඒකත් එක්ක ගත්තාම, රුපියල් 57,800යි. තිබුණේ කීයද? රුපියල් 49,550යි. දැන් එය රුපියල් 57,800 දක්වා අරගෙන එනවා. ඩ්‍රයිවර් කෙනෙකුට රුපියල් 25,790යි තිබුණේ. ඒක රුපියල් 42,780ක් වෙනවා. අර රුපියල් 17,800ත් එක්ක රුපියල් 60,580යි.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ඊළඟට, සංවර්ධන නිලධාරියෙකුගේ gross salary එක වශයෙන් තිබුණේ රුපියල් 56,790යි, basic salary එක රුපියල් 31,490යි. දැන් ඒ අයගේ basic salary එක රුපියල් 53,060යි. රුපියල් 70,860යි, gross salary එක. එතකොට මේ වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවය ඇතුළේ තිබුණු සාකච්ඡාව තමයි, අපි මේ අරගත්තේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා ඒ සාකච්ඡාව ගන්න කොට කවුරුත් අමතක කළේ නැහැ, පසුගිය කාලය පුරාවට අපේ රටේ මිනිස්සු, අපේ රටේ වැඩ කරන ජනතාව, ගොවි ජනතාව කියන සියලුදෙනා ප්‍රශ්නවලට මුහුණ දීලා තමයි සිටියේ කියන එක. රටේ ආර්ථිකය බංකොලොත් තත්ත්වයට පත් කරලා තිබුණේ. ඒක අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් සියලුදෙනා දන්නවා. ණය ගෙවා ගන්න බැරිව බංකොලොත් වෙච්ච ආර්ථිකයක් ඇතුළේ, මහ බැංකුව කොල්ල කාපු, රටේ භාණ්ඩාගාරය හිස් කරපු, ඩොලර් ගෙවන්න නැති වෙච්ච, තෙල් ටික ගේන්න බැරි වෙච්ච, රටක් ඇතුළේ අපේ ජනාධිපතිවරයා පත් වෙලා මාස පහයි. මේ ආණ්ඩුවට මාස තුනයි, දවස් 15යි දැන්. ඒ නිසා මේ ආණ්ඩුවේ අපි මේ කටයුත්ත සඳහා මැදිහත් වෙනකොට, ඒ පැවතුණු ආර්ථික දුෂ්කරතා, අමාරුකම් ඔක්කොම වාගේම මේ රටේ වැඩ කරන ජනතාවගේ ඉල්ලීම ගැනත් හිතලා මේ වැටුප් වැඩිවීම් කළේ. මොකද, අපේ ජන වරම නියෝජනය කරන්නේ ඒක. ජාතික ජන බලවේගයේ ජන වරම නියෝජනය කරන්නේ මේ රටේ වැඩ කරන ජනතාවගේ ඉල්ලීම.

ඉතින්, මේකම තමයි, පොලිස් නිලධාරීන්ගේ වැටුප් සම්බන්ධයෙනුත් තිබෙන්නේ. සාමාන්‍ය පොලිස් කොස්තාපල්වරයෙකුගේ මූලික වැටුප තිබුණේ රුපියල් 29,540යි. ඒ අයගේ basic salary එක රුපියල් 49,550ක් වෙනවා. ඔහුගේ gross salary එක රුපියල් 108,042 දක්වා වැඩි වෙනවා. ඒ වාගේම, පොලිසියේ IP මහත්මයෙකුගේ මූලික වැටුප රුපියල් 37,030ක් ලෙසයි තිබුණේ. ඒක රුපියල් 63,070ක් වෙනවා. ඒ basic salary එක රුපියල් 63,070 වෙනවා වාගේම, gross salary එක රුපියල් 127,807ක් වෙනවා. මේ වැටුප් වැඩි වීම අපි කරලා තිබෙන්නේ. ඒ වැඩි කිරීම වෙනුවෙන් අය වැය ලේඛනය තුළින්, ඒකට අවශ්‍ය මුදල් අපි වෙන් කරලා තිබෙන්නේ.

ඒ වාගේම paramedical සහ අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අයගේ සාකච්ඡාවක් තිබෙනවා, ඒ අයගේ දීමනා අඩු කළා, එහෙම නැත්නම් ඒගොල්ලන්ට ගන්න තිබුණු ඉඩ නැති කළා කියලා. ගරු සභාපතිතුමනි, මම මේක කියන්න ගත්තේ, මේ සාකච්ඡාව බලහත්කාරයෙන්ද හදන්නේ, මේ ක්‍රියාමාර්ග එන්නේ එහෙමද කියන කාරණය සම්බන්ධයෙන් අපිටත් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, පසු ගිය කාලයේ අපේ ජාතික ජන බලවේගය එක්කත් වැඩ කරපු වෛද්‍යවරුන් ඉන්නවා. අපේ ගරු චන්දන අබයරත්න ඇමතිතුමා කිව්වා වාගේ, සමහරු මේක තේරුම් අරගෙන නැහැ, නැත්නම් සමහරුන්ට මේක වහලා කියන්නේ, කොටසයි කියන්නේ.

ඊළඟට බලන්න, නර්ස් කෙනෙකුගේ basic salary එක තිබෙන්නේ, රුපියල් 32,525යි. දීමනා එක්ක gross salary එක වශයෙන් රුපියල් 104,481ක් ගත්තා. අපි මොකක්ද කළේ? දැන් ඒ අයගේ basic salary එක රුපියල් 54,920ට වැඩි වෙනවා. ඒ විධියට රුපියල් 54,920 දක්වා වැඩි වෙනවා විතරක් නොවෙයි, එයාගේ gross salary එක රුපියල් 133,640ක් වෙනවා.

ඊළඟට මම මේ කාරණයට එන්නම්. දැන් මේක අනුව තමයි, ඒ අයගේ දීමනා, අතිකාල, නිවාඩු දීමනා ගණන් හැදුණේ. එතකොට කොහොමද කියන්නේ? මූලික වැටුප රුපියල් 32,525ක් වෙනකොට overtime එක හැදුවේ 160න් බෙදලා. 160න් බෙදුවාම පැයක දීමනාව වෙන්නේ රුපියල් 203යි. දැන් අපි මොකද කළේ? ඒ අයගේ මූලික වැටුප රුපියල් 54,920ට ගෙනාවා. රුපියල් 54,920ට ගෙනැල්ලා 200න් බෙදුවා. ඒ 200න් බෙදුවාම, රුපියල් 275ක් වෙනවා. එතැන පැයක වැඩිවීම රුපියල් 72ක්. ඒක නොකියා දැන් මොකක්ද කියන්නේ?

අපට දැන් මේ කියන්නේ රුපියල් 54,920ත් පැය 160ත් බෙදන්න කියලායි. ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමනි, මේ වැටුප් වැඩි වීම, දීමනා වැඩි වීම ඔක්කෝම අමතක කරලා අපට දැන් කියනවා පරණ එකටම අනුව බෙදන්න කියලා.

ගරු සභාපතිතුමනි, මෙවර වැටුප් වැඩි කිරීමේ දී මේ සියල්ල සලකා බැලුවා. Budget එකෙන් වෙන් කරන ගණන මොකක්ද කියලා සලකා බැලුවා. ඒවා සලකා බලා තමයි මේ වැටුප් වැඩි කිරීම කළේ. එහෙම නොකර මේක අනෙක් පැත්තට බෙදන්න ගියොත්, අපට මේ ප්‍රශ්නය බේරන්න වෙන්නේ නැහැ. මොකද, 1:4 අනුපාතයට අදාළව වැටුප් පරතරය තියා ගෙන යන්නත් ඕනෑ.

ගරු සභාපතිතුමනි, අපි මේ හැම කෙනාගේම වැටුප් වර්ධකය සියයට 80කින් වැඩි කරලා තිබෙනවා. රුපියල් 250 වැටුප් වර්ධකය රුපියල් 450 කරලා තිබෙනවා. රුපියල් 2,900ට තිබෙන වැටුප් වර්ධකයත් සියයට 80කින් වැඩි කරලා තිබෙනවා. මම මේ කියන්නේ නර්ස්ලාගේ වැටුප සම්බන්ධයෙන් වන වැඩි වීම්. හෙද සංගම් හැටියට සිටින අයගේ සමහර ක්‍රියාකාරකම් දෙස බලද්දී පෙනෙනවා, අපේ හෙද සේවාවේ ඉන්න බහුතරයකට මේ වැටුප් සංශෝධනය සම්බන්ධයෙන් අවබෝධයක් නැහැ කියලා. එහෙම නම් ඒ අයට මේ පිළිබඳව අවබෝධ කර දෙන්න ඕනෑ. මොකද, අපි මේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ හිටපු මිනිස්සු. රුපියල් 54,920 පැය 200න් බෙදුවාම රුපියල් 275ක් වෙනවා. ඒ කියන්නේ, පැයකට රුපියල් 72ක් වැඩියි. නර්ස් කෙනෙකුට gross salary එකට අදාළව net increase එක තිබෙනවා, රුපියල් 29,150ක් පමණ. මේ අවුරුදු තුන ඇතුළත, පළමු අවුරුද්දේ වැඩි වීම රුපියල් 22,233යි. ඒ මුදල basic salary එකට එකතු වෙනවා. මේ අවුරුදු 3 ඇතුළත -මේ, මාස 20ට- රුපියල් 29,000ක් පමණ basic salary එකට එකතු වෙනවා. පළමුවෙනි වැඩිවීම මේ අප්‍රේල්වල. එතැන ඉඳන් මේ අවුරුද්ද අවසන් වෙන්න තිබෙන්නේ තවත් මාස 9යි. ඊළඟ අවුරුද්දේ මාස 12යි. ඊළඟ අවුරුද්දේ ජනවාරියේදීත් මීට අදාළව වැටුප් වැඩිවීමක් සිදු වෙනවා. ඒ මාස 20 තුළ සමස්ත වැඩි වීම සිදු වෙනවා. මෙච්චර වැටුප් වැඩි වීමක් ලබා දීලා තිබියදී තමයි අපේ හෙද සේවාවේ අය ද ඇතුළුව සෞඛ්‍ය සේවාවේ අය නොමඟ යවන්න හදන්නේ. මා හිතන විධියට, ඒ නොමඟ යැවීම කරන්න හදන්නේ, ඇත්ත කියන්නේ නැතිවයි. රුපියල් 32,525ම තියලා පැය 200න් බෙදුවා නම්, ඒක වැරදියි. එතකොට ගණන අඩු වෙනවා. රුපියල් 32,525ම තියලා පැය 200න් බෙදුවා නම්, ගණන වැරදෙනවා.

මම දැන් කියන්නම්, අපේ වෛද්‍යවරුන්ට අදාළ වැටුප් වැඩිවීම ගැන. සෞඛ්‍ය සේවාවට අයත් වෛද්‍ය සේවයේ පහළම ශ්‍රේණියේ කෙනෙකුට, ඒ කියන්නේ වෛද්‍ය සේවයට බැඳෙන ආධුනික වෛද්‍යවරයෙකුට - medical officer කෙනෙකුට - මූලික වැටුප රුපියල් 54,290යි. ගරු සභාපතිතුමනි, වෛද්‍යවරයෙකු හැටියට ඔබතුමා ඒ බව දන්නවා. ඔහුට දීමනා එක්ක ඔක්කෝම හම්බ වෙනවා, රුපියල් 232,725ක්. අපි දැන් මොකක්ද කරලා තිබෙන්නේ? අපේ අය වැයෙන් අපි යෝජනා කරලා තිබෙනවා රුපියල් 54,290ක මූලික වැටුප රුපියල් 94,150 දක්වා වැඩි කරන්න. මේ කියන්නේ වෛද්‍යවරයෙකු හැටියට බැඳෙන කෙනාගේ වැටුප. එය වැඩි කළ විට රුපියල් 94,150යි. Gross salary එක 277,800යි. වැඩි වීම, රුපියල් 45,075යි. මේ කියන්නේ, මේ අවුරුදු තුනට අදාළවයි. මේ අවුරුදු තුනෙන් පළමු අවුරුද්දේ වැඩි වීම රුපියල් 25,923යි. ඒ, basic salary එකට

එකතු වෙලා එන ගණන. මේක වැටුප් වැඩිවීමක් නොවෙයි නම්, භාණ්ඩාගාරයෙන් අව්වු ගස්වපු මේ අය වැය ඇස්තමේන්තුව ඇතුළු පොත්වල සඳහන් කරලා තිබෙන්නේ ඇයි, රුපියල් බිලියන 110ක් මේ අවුරුද්දේ යෝජිත වැටුප් වැඩිවීම සඳහා වෙන් කරලා තිබෙනවාය කියලා? pension එක සඳහා වැඩිපුර රුපියල් බිලියන 10ක් වෙන් කර තිබෙනවාය කියලා? එතකොට වැටුප් සඳහා වැඩිපුර වෙන් කළ මුළු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 120යි. ඒ වාගේම, අපි තවත් රුපියල් බිලියන 10ක් - මිලියන 10,000ක් - වෙන් කරනවා රැකියාවලට බඳවා ගන්න.ඉතින්, මෙහි වැටුප් වැඩි වීමක් පෙනෙන්න තිබෙනවා. එහෙම නම්, මේකේ හංගලා තිබෙන්නේ මොකක්ද?

වෛද්‍යවරු - GMOA එක - අපට කියනවා - *[බාධා කිරීමක්]* Wait, wait. I will explain and then you can understand what I am saying. ඒ වෛද්‍යවරු මොකක්ද කියන්නේ? වෛද්‍යවරයකු හැටියට බැඳෙන විට මූලික වැටුප හැටියට දැනට තිබෙන්නේ රුපියල් 54,290යි. ඒක බෙදුවා පැය 80න්. *[බාධා කිරීමක්]* ඒ වෛද්‍යවරු විශාල පිරිසක් අපත් එක්කත් වැඩ කළා. දැන් මේ වෘත්තීය සමිති අරගළ; එහෙම නැත්නම් වෘත්තීය සමිති අරගළයක් වාගේ පෙන්වන්න හදලා වෛද්‍යවරුන්ගේ සංගමය තමන්ගේ අභිමානය බේරා ගන්න නම් හදන්නේ, අපට කියන්න තිබෙන්නේ මේකයි. අපි ජනාධිපතිවරයා එක්ක සාකච්ඡා කළා; පැහැදිලි කළා. ඔබතුමන්ලා මේ අසාර්ථක උත්සාහයක නියැළිලා වෛද්‍යවරුන් ඔක්කොම නොමඟ යවන්න නම් හදන්නේ, ඒක කරන්න බැරි වෙයි කියලායි මා හිතන්නේ. මෙහෙමයි වැටුප් වැඩි වෙන්නේ. රුපියල් 54,290 පැය 80න් බෙදුවාම පැයකට රුපියල් 678යි. වැටුප් වැඩි කළාම මූලික වැටුප කීය ද? රුපියල් 91,750යි. ඒ මුදල පැය 120න් බෙදුවාම,- *[බාධා කිරීමක්]* Wait, wait. ඒ මුදල පැය 120න් බෙදුවාම පැයකට රුපියල් 764යි. එහෙම තමයි වැටුප් වැඩි කරන්නේ. *[බාධා කිරීමක්]* දන්නේ නැත්නම් ඉගෙන ගන්න. වැටුප් වැඩි කරන්නේ එහෙම තමයි. දැන් වෛද්‍යවරුන් අපට කියනවා නම්, "ඔයගොල්ලෝ රුපියල් 54,290 පැය 120න් බෙදුවා" කියලා, ඒක වැරදියි. රුපියල් 54,290 පැය 120න් බෙදුවා නම් වැරදියි. එහෙම නොවෙයි බෙදුවේ. මූලික වැටුප වැඩි වුණාම එන රුපියල් 91,750 තමයි පැය 120න් බෙදන්නේ.

ඊළඟට, රාජ්‍ය සේවයේ වැටුප්වලට අදාළව අතිකාල හදන ක්‍රම තිබෙනවා, ගරු සභාපතිතුමනි. රාජ්‍ය සේවයේ හැම තනතුරකටම අදාළව වැටුප් හදන ක්‍රමයක් තිබෙනවා. ඒක තේරුම් ගන්න නම්, ඒක ගැන ටිකක් කල්පනා කරන්න ඕනෑ. රාජ්‍ය සේවයේ අතිකාල පැය 240ක් දක්වා තිබෙනවා. පැය 200න් නොවෙයි පැය 240නුත් බෙදනවා. ඉංජිනේරු සේවා පැය 200න් බෙදද්දී, අනෙක් සියලු සේවා පැය 240න් බෙදන්නේ. මේ කියපු වෛද්‍ය වෘත්තියට අදාළව පැය කීයෙන්ද බෙදලා තිබෙන්නේ? පැය 120න් බෙදලා තිබෙන්නේ. රුපියල් 91,750 දක්වා වෛද්‍යවරයකුගේ මූලික වැටුප වැඩි කරලා තිබෙනවා. එවිට gross salary එක රුපියල් 277,000යි.

ගරු සභාපතිතුමනි, රුපියල් 54,290 තිබෙන එක පොඩි සොච්චමක් වැඩි කරලා -රුපියල් 60,000 කරලා- ඒක 120න් බෙදලා තිබෙනවා නම්, ඒත් වැරදියි. එහෙම කරලා නැහැ. කීයද වැඩි වීම? රුපියල් 678ට තිබ්බිච්ච පැයක වටිනාකම රුපියල් 764යි. රුපියල් 86කින් වැඩි කරලා, පැයක වටිනාකම. *[බාධා කිරීම්]* පැයක වටිනාකම රුපියල් 86කින් වැඩි කරලා. *[බාධා කිරීම්]* 100කින් නොවෙයි, රුපියල් 86කින් වැඩි කරලා. මේ වැඩි වෙච්ච එක කියන්නේ නැතුව, මේක ඇතුළේ හැංගෙන්න හදනවා. එහෙම නම්, ප්‍රශ්නය තිබෙන්නේ කොහේද?

ඊළඟට කිව්වා, නිවාඩු දීමනා ගෙවන එකට අදාළ වන දෛනික පඩිය ගැන. රුපියල් 54,290 බෙදුවේ 20න්. සාමාන්‍යයෙන් ගත්තොත්, එම මුදල රුපියල් 2,715යි. නමුත් අපි රුපියල් 91,750 තමයි 30න් බෙදන්නේ. මාසයට දින 30යි. වැඩ කරන්නේ මාසයක්. පඩි හදන්නේ මාසයකට. රාජ්‍ය සේවයේ, පෞද්ගලික අංශයේ පඩි හදන්නේ එහෙම. දෛනික පඩි දෙනකොට රුපියල් 1,350ක් වතු සේවකයාට තිබෙන්නේ ඇයි? වත්තේ මාස් පඩි නැහැ. දවසට පඩි ගෙවන්නේ. ගරු සභාපතිතුමනි, රටේ හැම කෙනෙකුටම පඩි හදන ක්‍රමයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් නිශ්ශබ්ද වෙලා අහගෙන ඉන්න, අර්ච්චුනා මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් සද්ද නැතුව ඉන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Ramanathan Archchuna, could you please stop interrupting?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු සභාපතිතුමනි, අපි gross salary එකත් වැඩි කර තිබෙනවා. රුපියල් 91,750 තමයි 30න් බෙදලා තිබෙන්නේ. *[බාධා කිරීම්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Ramanathan Archchuna, would you please stop disturbing the House? Listen to the Hon. Minister.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
රුපියල් 91,750ක මූලික වැටුප 30න් බෙදුවාම දවසක පඩිය රුපියල් 3,058යි. අපි රුපියල් 2,715 අඩු කළා නම් වැරදියි. එහෙම කළා නම් වැරදියි නේ, ගරු සභාපතිතුමනි. අපි රුපියල් 2,715 රුපියල් 2,500ට ගෙනාවා නම් වැරදියි. නැහැ, අපි කරලා තිබෙන්නේ ඒක නොවෙයි. රුපියල් 2,715ට තිබුණු දෛනික පඩිය දැන් රුපියල් 3,058යි. දෛනික පඩිය රුපියල් 343කින් වැඩි වෙලා තිබෙනවා. මම මේ කියන්නේ දොස්තර මහත්මයෙකු හැටියට රස්සාවට just join වුණාට පසුව ලැබෙන වැටුප් සහ දීමනා ගැනයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Wasantha Samarasinghe, your time is up. Would you please wind up?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ නිසා රුපියල් 2,715 කිසි ලෙසවත් අඩු වෙලා නැහැ. දවසක පඩිය රුපියල් 3,058යි. *[බාධා කිරීම්]* ඒ අනුව රුපියල් 343කින් දෛනික පඩියත් වැඩි කරලායි තිබෙන්නේ. තිබ්බිච්ච ගණනත් නොවෙයි. අපි එය රුපියල් 2,715ට ගෙනැල්ලාත් නැහැ. එය, අවමය රුපියල් 3,058කට ගෙනැල්ලා තිබෙනවා.

මේ කථාව කියන්න හදන සංගම්වලට අපි මේ කාරණය කියන්න ඕනෑ. අපිත් ඒ සටන්වල හිටපු මිනිස්සු. ගණන් හදලා තමයි අපි මේ ගණන කිව්වේ. බඩු මල්ලේ ගණන, හතර

[ගරු වසන්ත සමරසිංහ මහතා]

දෙනෙකුගෙන් යුත් පවුලට යන වියදම, එහි වැඩි වීම, ඒ අනුව බදුවල එකතුව ආදි සියල්ල ගණන් හදලා තමයි කිව්වේ. මාස පහකට කලින් බංකොලොත් කියලා කියපු රට භාර ගත්තු අපි තමයි මාස පහකට පස්සේ මේ වෙනස්කම් ටික කළේ.

අපි මේ වැටුප් සංශෝධනය ඇතුළේ මේ අවුරුදු තුනට රුපියල් බිලියන 325ක් වෙන් කරනවා. වැටුප් වැඩිවීම සඳහා පමණක් රුපියල් බිලියන 325ක්. විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වැඩිවීම සඳහා රුපියල් බිලියන 40කට ආසන්න ප්‍රමාණයක් වෙන් කරනවා. මේවා එකතු කරලා බලන්න. මේ වැඩි වීම, රාජ්‍ය සේවයට ඉතිහාසයේ මෙතෙක් කළ වැඩිම වැටුප් වැඩි කිරීමයි කියන කාරණය අපි බොහොම අවධාරණයෙන් මේ සභාවට කියනවා. මොකද, ඒවා අංකවලින් තිබෙනවා. මේ rocket science නොවෙයි.

ගරු සභාපතිතුමනි, GMOA එක සහ සමහර හෙද සංගම් සෞඛ්‍ය කාර්ය මණ්ඩල නොමඟ යවන්න හදනවා නම්, අපි කියන්න ඕනෑ, එසේ නොමඟ යවන්න කලින් පිට කවරය විතරක් නොබලා ඇතුළටත් බහින්න කියලා. ඇතුළටත් බැහැලා බලන්න. ගණන් හදලා බලන්න. මොකද, 2027 පඩියට තමයි මේ අතිකාල හදන්නේ. 2027 පඩියට තමයි මේ OT එක හදන්නේ. 2027 පඩියටයි මේ නිවාඩු දීමනාව හදන්නේ. අපේ ආණ්ඩුව, වෘත්තීය සමිති ව්‍යාපාර නියෝජනය කරන බහුතරයක් ඉන්න ආණ්ඩුවක්. අපි මේ රටේ වැඩ කරන ජනතාවට අසාධාරණයක් වෙන්න දෙන්නේ නැහැ වාගේම, මේ ක්ෂේත්‍රවල සිටින කිසිම කෙනෙකුගේ වැටුප අඩු කරලාත් නැහැ; කප්පාදු කරලාත් නැහැ. තිබුණා නම් පැයක පඩිය, ඒකත් වැඩි කරලා, තිබුණා නම් දිනක පඩිය, ඒකත් වැඩි කරලා වැටුප් වැඩි කළා මිස කිසිදු ලෙසක කප්පාදුවක් හෝ අඩු කිරීමක් කරලා නැහැ. ඒ නිසා වැඩ කරන ජනතාවට අපි කියනවා, ඔබ තැබූ විශ්වාසය ආරක්ෂා කරලා මේ ආණ්ඩුව මේ වැටුප් වැඩි කිරීම කර තිබෙන බව. විශ්‍රාමිකයන්ගේ, පෞද්ගලික අංශයේ, වතු ක්ෂේත්‍රයේ, රාජ්‍ය අංශයේ, ඒ සියලු දෙනාගේ වැටුප් වැඩි කිරීම් සඳහා කරපු ඉල්ලීම්වලට කන් දීලා අපි මේ වැටුප් වැඩි කිරීම් ලබා දුන්නා කියන කාරණය අවධාරණය කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Rohitha Abeygunawardhana. You have nine minutes.

[අ.භා. 12.26]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු සභාපතිතුමනි, අද අය වැය කාරක සභා අවස්ථාවේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ කම්කරු අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මම රජයට ස්තුතිවන්ත වෙනවා, පසුගිය කාලයේ ඇති වෙච්ච සිද්ධි එක්ක පළාත් පාලන ඡන්දය පැවැත්වීමට කටයුතු කිරීම ගැන. ගරු විෂයභාර ඇමතිතුමා මෙතැනදී කිව්වා, පළාත් පාලන ඡන්දය තියන්න එතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදී විධියට කටයුතු කරනවා කියලා. ගරු සභාපතිතුමනි, මම විෂය භාර අමාත්‍යතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරනවා. ගරු අමාත්‍යතුමනි, මැතිවරණ කොමිසම නාම යෝජනාවලට දින දීලා තිබෙනවා, මේ මාර්තු මාසයේ 17 ඉඳන් මාර්තු මාසයේ 20 දවල් 12 වෙනකම්. ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ගැසට් නිවේදනයක් නිකුත් කරනවා, පළාත් පාලන ආයතන ආරම්භ කරන දිනය ලබන ජූනි 02වන දා කියලා. පළාත් පාලන මැතිවරණයේ නාම යෝජනාවලට දින දෙනවා, මාර්තු 17යි, 20යි අතර. ඒ සභා රැස්වෙන්න කියලා තිබෙනවා, ලබන ජූනි 02වන දා. නමුත් ඒ අතරමැද කාලයේ තොරතුරු නැහැ. දැන් ඒ මැද කෝ? කෝ, මේ මැතිවරණය පවත්වන දිනය? ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් වෙන දා ඒ ගැසට් නිවේදනය එන්නේ, නාම යෝජනා දිනයත් එක්කම මැතිවරණ දිනයත් සඳහන් කරලා. එතකොට අපි දන්නවා, අහවල් දවසේ මැතිවරණය තියෙනවා කියලා. නමුත් අද ඒ මැතිවරණ දිනය නැහැ. මැතිවරණ කොමිසම කියන්නේ නාම යෝජනා භාරදීම අවසන් වන දිනයේ මැතිවරණය පවත්වන දිනය කියනවා කියලා. ඒක හංගන් ඉන්නේ නැතුව කිව්වා නම් ඉවරයි නේ, දෙයියනේ. නීතියේ තිබෙන්නේ කොහොමද? ගරු ඇමතිතුමනි, ඔබතුමා මට පෙන්වන්න, නීතියේ තිබෙන්නේ කොහොමද කියලා. නීතිය අනුව, නාම යෝජනා භාරදීම අවසන් වන දිනයේ සිට දින 35ත්, දින 55ත් අතර ඡන්දය පැවැත්විය යුතුයි. ඒ කියන්නේ දින 35ට අඩු වෙන්න හෝ දින 55ට වැඩි වෙන්න බැහැ. ඉතින් ඒ දිනය දුන්නා නම් ඉවරයි නේ. මොකද, මේ රටේ ජනතාවට සැක ඇති වෙනවා නේ, පසුගිය ඉතිහාසයේ සිද්ධ වෙච්ච දේවල් නිසා. නාම යෝජනා දෙනවා, ඡන්දේ තියන්නේ නැහැ. එක්කෝ ඒකට සල්ලි නැහැ කියනවා. නැත්නම්, වෙන ප්‍රශ්න කියනවා. ඒ නිසා අපි කියනවා, කරුණාකරලා ඉතා ඉක්මනින් මැතිවරණ දිනය කියන්න කියලා. මම මේ කියන්නේ ඉතිහාසයේ සිද්ධ වෙච්ච දේවල් අනුව බය හිතෙන හින්දා මැතිවරණය පවත්වන දිනය කියන්න කියලායි.

මේ මැතිවරණ ප්‍රතිඵලය, මේ මැතිවරණය ජයග්‍රහණය කරන එක තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ පැවැත්ම සඳහා බලපානවා. අනිවාර්යයෙන් බලපානවා. මොකද, ජනාධිපතිතුමා ජනාධිපතිවරණය ජයග්‍රහණය කළා. පාර්ලිමේන්තු මැතිවරණයෙන් ආසන 159ක් ලබාගෙන ඓතිහාසික ජයග්‍රහණයකුත් වාර්තා කළා. ජනාධිපතිවරණය පවත්වපු දිනයේ ඉඳලා මේ පළාත් පාලන මැතිවරණයට නාම යෝජනා භාරදීම අවසන් වන දිනයට, හරියට මාස 6යි. මේ මාර්තු 21 ඉඳලා මාස 6යි. මේ මැතිවරණය පවත්වන දිනය වෙනකොට මාස 7ක්, 7 ½ක් වෙන්න පුළුවන්. නමුත් අපි තවම ඒ දිනය දන්නේ නැහැ. ඒකයි මම ඒ ප්‍රශ්නය කිව්වේ. ඒ දිනය වෙනකොට මේ ඡන්දයට මුහුණ දෙන්න වෙනවා. මම මීට ඉස්සෙල්ලාත් මේ සභාවේ කිව්වා, අපි මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් හිටපු ජ්‍යෙෂ්ඨයෝ හැටියට ආණ්ඩුවකට අපි දන්න දේ කියලා දෙන්න ඕනෑ කියලා. අපි ආණ්ඩුවට කියන්න ඕනෑ, අපි දන්න දේ. ඒක තමයි නේ මනුස්සකම. ඒක තමයි නේ මේ දේශපාලන ක්‍රමය. අපට වැරදිච්ච සමහර තැන්වලදීත් මම කියලා දුන්නා.

ගරු සභාපතිතුමනි, මම එදාත් මේ ගැන කිව්වා. ගරු සභාපතිතුමනි, හුහක් වෙලාවට කථාවට වැඩිය හොඳයි වැඩ කිරීම. ඒක නේ වෙන්න ඕනෑ. අතීත දේශපාලන නායකයෝ දිහා බැලුවාම පේනවා, වැඩියෙන් කථා කළාම, කථාම විතරයි, වැඩ නැහැ. මම අපේ ජනාධිපතිතුමාටයි, කැබිනට් මණ්ඩලයටයි එදාත් මේ ගැන කිව්වා. ඔබතුමන්ලාට මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා නේ; වැඩියි නේ. ඒගොල්ලෝ කොහේ හරි ගියාම මාධ්‍යවේදීනුත් එනවා නේ. ඒ එනකොට මොනවා හරි අහනවා. ඒ අහනකොට පරිස්සමින් උත්තර දෙන්න ඕනෑ. මොකද ඒක බලපානවා. පරිස්සමින් උත්තර දුන්නේ නැත්නම් ඒක බලපානවා. දැන් බලන්න, පරිස්සමින් උත්තර නොදුන්නාම වෙන දේවල්. දැන් මේ වෙනකොට හරිම ප්‍රසිද්ධයි නේ, මාර්තු 15වන දා උදේ 8.00.

මොකක්ද දිනය? මාර්තු 15වන දා. රිළවි ගණින, වදුරෝ ගණින, දඬුලේන්නු ගණින, අලි ගණින මාර්තු 15වන දා ගැන දැන් මිනිස්සු බලාගෙන ඉන්නවා. සිංහල අවුරුද්දේ කෑම පිසින වෙලාව, ගනුදෙනු කරන වෙලාව වාගේ දැන් ගොවියෝ ඇතුළු රටේ මිනිස්සු ඔක්කෝම මාර්තු මාසයේ 15වන දා වෙනකම් බලාගෙන ඉන්නවා, උදේ 8.00ට සත්තු ගණින්න.

දැන් "හිරු" නාළිකාවේ, "දෙරණ" නාළිකාවේ, "සිරස" නාළිකාවේ කියනවා උදේ 8.00ට සත්ව සංගණනය කරනවා කියලා. සත්තුන්ට මේක ආරංචි වෙලා; රිළවුන්ට ආරංචි වෙලා. ඔන්න බලන්න, එක රිළවෙක් එළියට එන්නේ නැහැ, එක වදුරෙක් එළියට එන්නේ නැහැ. මතක තබා ගන්න, එක රිළවෙක් කොටු පනින්නේ නැහැ. *[බාධා කිරීමක්]* කිව්වා, "සිරස" නාළිකාව කිව්වා, දෙයියෝ. *[බාධා කිරීමක්]* ඒ නාළිකා දෙකත් කිව්වා, "සිරස" නාළිකාවත් කිව්වා. අහන්නකෝ මගෙ අම්මා? උම්මා එකක් දෙන්න, එන්න. දෙයි හාමුදුරුවනේ ගනින්න කිව්වා නේ, ගරු ඇමතිතුමා. එහෙම කිව්වා නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)
රිළවි ගණින්න කිව්වේ නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(*மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன*)
(The Hon. Rohitha Abeygunawardhana)
දෙයි හාමුදුරුවනේ, නිවුස් බලන්නකෝ. දැන් ඔබතුමන්ලාට වැඩ වැඩි හින්දා බැලෙන්නේ නැහැ. අපි විපක්ෂයේ ඉන්න නිසා අපේ වැඩේ නම් ඒවා බලන එක. කිව්වා, රිළවි ගනින්න කියලා. මේවා නිලධාරින්ගේ වැඩ. මේවා වෙන්න ඕනෑ දේවල්. හැබැයි, නිලධාරින්ගේ වැඩ අපි කරන්න ගිහිල්ලා, ඉල්ලන් කනවා. මම මේ ආදරේට කියන්නේ, කුහකකමකට නොවෙයි. මම දන්නවා, මාලිමා රජය ඇතුළෙම මේ රිළවි කේස් එක නිසා ප්‍රශ්න කියලා. අපට ආරංචි වෙනවා නේ, දෙයියෝ. ආරංචි වෙනවා.

ඒ නිසා මම කියන්නේ මේකයි. මාධ්‍යවේදියා දැක්කාම, දැක්කේ නැහැ වාගේ යන්න ඕනෑ. මම මේ කියන්නේ ආණ්ඩුවේ රැක්ම ගැන.

ගරු සභාපතිතුමනි, අපේ ඇමතිවරු දෙදෙනාම කිව්වා, විශේෂයෙන්ම වසන්ත සමරසිංහ ඇමතිතුමාත් කිව්වා, වැටුප් වැඩි කිරීම ගැන. ඇත්තටම ඒක හොඳයි. මම එදාත් ඒක කිව්වා. මට තේරෙන්නේ නැහැ, වැටුප් වැඩි කිරීම ගැන මෙතැන කාටද නොතේරෙන්නේ කියලා. සෞඛ්‍ය ඇමතිතුමා පැහැදිලි කරලා කිව්වා, මෙන්න වෛද්‍යවරුන්ගේ වැටුප් වැඩි කිරීම, මෙන්න වෛද්‍යවරුන්ගේ අතිකාල දීමනා, මෙන්න වෛද්‍යවරුන්ට ලැබෙන වැටුප කියලා. දෙයි හාමුදුරුවනේ, රජයේ වෛද්‍ය නිලධාරින්ට මේක තේරෙන්නේ නැද්ද? මෙතැන කාටද වැරදිලා තිබෙන්නේ? අපි දෙලොවක් අතර. තිබුණාට වඩා වැටුප් වැඩි කරලා, ඒක ලොකු වැඩිවීමක් කියලා ඔබතුමන්ලා කියනවා. වෛද්‍යවරුන්ගේ සංගමය කියනවා, නැහැ, අපි අමාරුවේ දාලා, අපේ තිබුණු එකත් කපා දාලා කියලා. දැන් අපි මෙතැන කියන එක අහනවාද, එතැන කියන එක අහනවාද? හැබැයි, අපට අහන්න දවසක් එනවා. කවදාද ඒ? සිංහල අලුත් අවුරුද්දට ඉස්සෙල්ලා පඩිපත අතට එන දවස. *[බාධා කිරීමක්]* හරි නේද මම කිව්වා? අත්පුඩියක් ගහන්න මට. *[බාධා කිරීමක්]* එහෙම තමයි ඉන්න ඕනෑ. දැන් මම කියපු එක හරි නේ. ඒක දැනගන්න වැටුප අතට හම්බ වෙන්න එපායැ නේද? මේ ඉන්න රාමනාදන් අර්විචුනා මන්ත්‍රීතුමා ප්‍රසිද්ධ වෛද්‍යවරයෙක්. එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා දින කිහිපයයි. දැන් මුළු රටම එතුමා දන්නවා. රාමනාදන් අර්විචුනා අපේ වෛද්‍යතුමා. එතුමාත් කියනවා වැටුප් වැඩි වෙලා නැහැ කියලා. එතුමා මගේ ළඟ නේ ඉන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා කියන විධියට සුබවාදී විධියට වෛද්‍යවරුන්, කම්කරුවන් ඇතුළු 17ලක්ෂයක රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි වෙනවා නම්,-

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)
වැටුප් ලැබෙනකල් ඉන්න එපා යැ, ගණන් හදන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(*மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன*)
(The Hon. Rohitha Abeygunawardhana)
ඔහොම ඉන්න. මේක අහන්නකෝ. මම මේ කියන එක අහන්න. ඔබතුමා කියන අකාරයට, රජය කියන ආකාරයට වැටුප් වැඩි වෙලා තිබෙනවා නම්, ඔවුන් බලාපොරොත්තු වන දේ ඉෂ්ට වෙලා තිබෙනවා නම්, සිංහල අවුරුද්දට ඉස්සෙල්ලා වෙන දා ලැබුණු වැටුපට වඩා වැඩි වැටුපක් ලැබෙනකොට ඔවුන් සතුටු වෙනවා. එතකොට පළාත් පාලන මැතිවරණයේදී රාජ්‍ය සේවකයාගේ ඡන්දය ඔබතුමන්ලාට ලැබෙනවා. හැබැයි, යම් විධියකින් කොළේ වහලා ගහලා නම්, මේක ඇතුළේ මොනවා හෝ ගේම් එකක් ගහලා තිබෙනවා නම්, අන්න ඔබතුමන්ලාට රතු එළියක් දෙනවා. මේ දේශපාලන ඉතිහාසයේ රතු එළිය මුලින්ම දෙන්නේ කවුද? ඒ රාජ්‍ය සේවකයෝ. හැම දාම ආණ්ඩුවක් දිනනවාද නැද්ද කියලා පළමුවෙනි ඡන්ද ප්‍රතිඵලය දෙන්නේ රාජ්‍ය සේවකයා. ඒ නිසා ඔබතුමන්ලා ඉන්නේ ඉතාම තීරණාත්මක සාධකයක් ළඟ. මේක සුබවාදී වුණොත් අනිවාර්යයෙන් ඔබතුමන්ලාගේ ඡන්ද කොට්ඨාස ජයග්‍රහණය කරයි. මම හිතනවා සුබවාදී වෙයි කියලා.

ගරු සභාපතිතුමා
(*மாண்புமிகு தவிசாளர் அவர்கள்*)
(The Hon. Chairman)
Hon. Rohitha Abeygunawardhana, your time is up.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(*மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன*)
(The Hon. Rohitha Abeygunawardhana)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.
අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්, ගරු සභාපතිතුමනි. දැන් මේ රිළවි කේස් එක ගැන කථා කළා නේ. දැන් අපේ ගම්වල ඉන්න ගොවි මහත්වරුන්ට මේකයි කියන්න වෙන්නේ.

"රන් රඹුටන් ගස් දෙකයි - වලිකුකුළන් පස්දෙනයි
රිළා පැටවු තිස්දෙනයි -බලන්න හරි ලස්සනයි"

දැන් අපට බලන්න පුළුවන්, 15වැනි දාට උදේ 8 ඉඳලා 8.05 වෙනකල්, මේ කියන විධියට රිළා පැටව් කොච්චරද කියලා. ගැණ ගත්තොත් හරි. හැබැයි හරියට ගැණ ගත්තේ නැති වුණොත්? මම හරියට දිනය දන්නේ නැහැ, පළාත් පාලන මැතිවරණය පැවැත්වෙන. මේ කියන දේ හරියට ඉටු වුණොත් හරි. එහෙම නැති වුණොත් ඔබතුමන්ලාගේ ඡන්ද ප්‍රතිශතය අඩු වුණොත්, ඔබතුමන්ලාට ආණ්ඩුව ගෙන යනකොට හැමදාම ප්‍රශ්න ඇති වෙයි. අදත්, මේ දැන් ඇවිල්ලා ඉන්නවා උපාධිධාරීන්, විරෝධතාවකට. ඒ අයට අධිකරණ නියෝගයක් දීලා තිබෙනවා, එන්න එපා කියලා. ඒ නිසා සුබවාදීව මේ ගමන යන්න කියලා ආණ්ඩුවට අපි ආශීර්වාද කරනවා. හැබැයි ආණ්ඩුව හෙලවෙනකොට අපි විපක්ෂයේ කාර්යභාරය ඉටු කරනවා.

බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. (Dr.) Ramanathan Archchuna? You can have a minute.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
විසේෂමාක, තෝට්ටත් තොළිලාළර්කළින් සම්පළත්තෙ එටුත්තුක්කොණ්ටාල්, අඩිප්පටෙච් සම්පළමාක 1,700 රූපාය් වළුංක නීංකළ් සිපාරිසු සෙය්වතාකච් සොල්ලප්පට්ටිරුක්කින්රතු. කෝට්ටාපය අරසාංකමුම් සිපාරිසු සෙය්තතු; රණිල් වික්කිරමසිංහ අරසාංකමුම් සිපාරිසු සෙය්තතු; අනුර කුමාර තිසානායක්ක අරසාංකමුම් සිපාරිසු සෙය්තිරුක්කින්රතු. ආනාල්, ඉතෙක් කෙයිලේ වළුංකුවතර්කු එන්න නටවඩික්කෙ එටුක්කප්පට්ටුළ්ළතු? ඉතුසම්පන්තමාක නීංකළ් තෝට්ට මුකාමෙයාළර්කළ් අල්ලතු තෝට්ටක් කම්පනිකළෝටු පේසිනීර්කළා? මුතලාළිමාර් සම්මේළනත්තින් පේච්චාළර් ඉරාජතුරෙ අවර්කළ් අණ්මෙයිල් ඟ්ර්රන්, නානු ඔයාවිල් නටෙපෙර්ර ඔරු කූට්ටත්තිල් ඔරු විටයත්තෙච් සොල්ලියිරුක්කිරාර්. අපිත් එක්ක මේ ගැන කථා කළේ නැහැ. අපට කරන්න දෙයක් නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
මේ රුපියල් 1,700ට එන එකඟතාව අපි ඟදා ගන්නේ පඩි පාලක සභාවෙන්.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(මාණ්පුමිකු (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ඇමතිතුමා, ගිය සැරේත් පඩි පාලක සභාවෙන් තමයි ඒක තීන්දු කළේ. නමුත් දුන්නේ නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක තමයි කියන්නේ. ඒක දුන්නේ නැහැ නේ. ඒක දුන්නේ නැති නිසා තමයි නැවත අපි මැදිහත් වෙලා පසුගිය සැප්තැම්බර් මාසයේ මේ ගැන කථා කරලා මේ එකඟතාව ඟදා ගත්තේ. ඒ කියන්නේ, රුපියල් 1,350ක් දෛනික පඩියත්, 350ක් kilo rate එකටත්. එතකොට, රුපියල් 1,700 කියන ගණන ඒ තුළ තිබෙනවා. ඔබතුමා කියන කාරණය හරි. සමහර වතු සමාගම් මේකට එකඟ වුණේ නැති වුණත්, බහුතරයක් වතු සමාගම් එකඟ වුණා.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(මාණ්පුමිකු (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ඔබතුමන්ලා පොරොන්දු වුණේ කොහොමද? Basic salary දෙන්නද, නැත්නම් එකතු කළ salary එක දෙන්නද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
පඩිය හැටියට එකතු කරන එක තමයි. මොකද, basic salary එක දැන් තිබෙනවා, 33,750ක් දවස් 25ක් වැඩ කරන්න ආවොත්. ගරු මන්ත්‍රීතුමනි, අපි වතු සමාගම්වලට කියලා තිබෙන්නේ ඒ අයට දවස් 25ක් වැඩ දෙන්න, ඒ සඳහා කටයුතු කරන්න කියලා.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(මාණ්පුමිකු (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
එහෙම කොන්දේසියක් තිබෙනවා. දවස් 25ක් වැඩ කරන්න ඕනෑ කියලා කොන්දේසියක් තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(මාණ්පුමිකු (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
නමුත් දෛනික පඩිය 1,700ක් කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා කියන කාරණය හරි. වතු සමාගම් මේ ගණනටත් කැමැති වුණේ නැහැ. ඔබතුමාත් කිව්වේ දැන්, රාජදුරෙයි කිව්වා කියලා නැහැ කියලා. ඒ නිසා -

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(මාණ්පුමිකු (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ඒගොල්ලන් කියනවා, වෙනම ක්‍රමයක් හදුන්වා දෙන්නම් කියලා. එහෙම ක්‍රමයක් හදා දෙන්න ඉස්සෙල්ලා මේක ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක හරි. අපි එකඟයි, රුපියල් 1,700 කියන ගණන දෛනික වැටුප කරන්න පුළුවන් නම්. අපි පළමු වටයේ 1,350ක් කරගෙන තිබෙනවා. ඉතුරු 350ත් ඒකට එකතු කර ගැනීම සඳහා තමයි අපි කටයුතු කරන්න ඕනෑ. වතු සමාගම් අපට සියයට 80ක assurance එකක් දෙනවා, මේ 350 ගන්න පුළුවන් කියලා. ඒ නිසා ඒ 350 ලබා ගැනීම වෙනුවෙන් රජය පැත්තෙන් කරන්න පුළුවන් මැදිහත්වීම කරන්න අපි කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(මාණ්පුමිකු (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ගරු ඇමතිතුමා එක්ක අපි එකඟ වෙනවා; අපි support කරනවා. කිසිම ගැටලුවක් නැහැ. ගිය පාර පාඩි පාලක සභාවට ගිය වෙලාවේ -ඔබතුමාගේ නියෝජනයත් පැවති වෙලාවේ- තමයි එයා කිව්වේ 2,000ට වඩා අඩුවෙන් වැටුප් දෙනවා නම් අපි මේකට එකඟ වෙන්නේ නැහැ කියලා. එහෙම කියලා එළියට ආවා. එහෙම එළියට ආපු අය තමයි මෙතැන ඉන්නේ. ඒ නිසා ඔබතුමන්ලා මේකට මැදිහත් වෙලා කටයුතු කරන්න. ඔබතුමන්ලා පොරොන්දු වුණා, 2,000ක් දෙන්නම් කියලා, "කසාදයට" ඉස්සර වෙලා. දැන් බැන්දාට පස්සේ, නැහැ. *[බාධා කිරීමක්]* ඒක තමයි බැන්දාට පස්සේ මොකුත් කරන්නේ නැහැ.

අඩුත්තතාක, මුකාමෙත්තුව උතවියාළර්කළ් සම්පන්තමාක සිල විටයංකළෙච් සොල්ල වේන්ටුම්. මුකාමෙත්තුව උතවියාළර්කළ් සේවෙයිල් සම්පළ මුරණ්පාටුකළ් ඉරුක්කින්රන. අවර්කළුටෙය සේවෙක්කාන සරියාන ඌතියම් කිටෙක්කප් පෙරුවතිල්ලෙ. අවර්කළතු පතවි උයර්වු

තොටර්පාක 2013ඇම් ඇණ්ඩුක්කු මුන් කාණප්පට්ට මුර෈ මීණ්ඩුම් නටෙමුරෙප්පටුත්තප්පට වේණ්ඩුම්. අතාවතු, සේවෛක්කාල අටිප්පටෙයිල් ඉල්ලාමල්, පරීට්සෛ මුරෙයිල් පතවි උයර්වානතු වළංකප්පට වේණ්ඩුම්. ඉවර්කළ් පටිප්පටියාක පතවි උයර්වු පෙට්රුක්කොණ්ඩු පිරතේස සෙයලකංකළිල් නිරුවාක උත්තියෝකත්තර්කළාකවුම් සෙයලාළරාකවුම් ඉරුක්කින්රාර්කළ්. ආකවේ, ඉවර්කළුටෙය විටයංකළිල් කරිසනෛ කාට්ටි, මුන්නුරිමෛ කොටුක්ක වේණ්ඩුම්. අතේපෝන්රු පිරතේස සපෛකළිල් Supra Gradeඉල් උළ්ළ උත්තියෝකත්තර්කළ් එල්ලෝරුම් පටිප්පටියාක clerk පතවියිල් ඉරුන්තු මුන්නේරි වන්තවර්කළේ ආවර්. ඉන්රු 10 වරුටංකළුක්කු මේල් වේලෛ සෙය්තිරුන්තාල් පතවි උයර්වු වළංකප්පටුකින්රතු. අව්වාරිල්ලාමල්, පරීට්සෛ නටාත්ති අවර්කළුක්කුප් පතවි උයර්වු කොටුක්ක වේණ්ටුමෙන්පතෛ නාංකළ් ඉංකු සිපාරිසු සෙය්කින්රෝම්.

අටුත්තු, පට්ටතාරිකළින් සම්පළ විටයත්තිලුම් විසේට නටෙමුරෙයොන්රෛ අමුල්පටුත්ත වේණ්ටුමෙන්පතෛ නාංකළ් ඉන්ත නේරත්තිල් සොල්ලික්කොළ්ළ විරුම්පුකිරෝම්. ඒනෙන්රාල්, ඔරු සාතාරණ තොළිලාළි පට්ටතාරියෛවිටක් කූටුතලාන සම්පළත්තෛප් පෙරුවතෛ නාංකළ් අවතානික්කක්කූටියතාක ඉරුක්කින්රතු. ආකවේ, අවර්කළුක්කුම් සම්පළත්තෛ අතිකරිප්පතර්කාන නටවටික්කෛයෛ එටුක්ක වේණ්ටුම්. ඉච්සේවෛයිල් ඉරුප්පවර්කළුක්කු MN 2 සම්පළත්තිට්ටමේ නටෙමුරෙප්පටුත්තප්පටුකින්රතු. අවර්කළුක්කු MN 3 සම්පළත්තිට්ටත්තෛප් පෙට්රුක්කොටුප්පතර්කාන නටවටික්කෛයෛ එටුක්ක වේණ්ටුම්. ඉවර්කළ් එතිර්නෝක්කුම් ඒනෙය පිරච්සිනෛකළ් තොටර්පාකවුම් නීංකළ් කරුත්තිර්කොළ්ළ වේණ්ටුම්. ඒනෙන්රාල්, අතිකමාන අරස සේවෛයාළර්කළ් NPP අරසාංකත්තිර්කේ වාක්කළිත්තනර්. ආකවේ, අවර්කළෛප් පාතුකාක්ක වේණ්ටිය පොරුප්පු උංකළුක්කු නිච්සයමාක ඉරුක්කින්රතු. අන්ත වකෛයිල්, නීංකළ් අවර්කළෛප් පාතුකාක්ක වේණ්ටුම්. අතේපෝන්රු තෝට්ට මක්කළුම් උංකළුක්කු අතිකමාන වාක්කුකළෛ අළිත්තිරුක්කින්රාර්කළ්. ආකවේ, අවර්කළෛයුම් පාතික්කාත වකෛයිල් පාර්ත්තුක් කොළ්ළුංකළ්! පෙරුන්තෝට්ට අමෛච්සින් විවාතත්තිල් නාන් ඉන්ත විටයම් සම්පන්තමාක විරිවාකප් පේස එණ්ණුකිරේන්.

ඒක එනකොට මම කථා කරන්නම්. දැනට, මේ රැකියා කරන සියලුදෙනාම ආරක්ෂා කරන්න ඔබතුමන්ලා වැදගත් විධියට කටයුතු කරාවි කියලා බලාපොරොත්තුවෙන් මම නිහඬ වෙනවා. සියලුදෙනාටම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.04]

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(මාණ්පුමිකු කේ. සුජිත් සඤ්ජය පෙරේරා)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඉතා වැදගත් අමාත්‍යාංශ කිහිපයක් සම්බන්ධව කාරක සභා විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටට පත් වෙනවා. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය කියන්නේ, රජයේ කටයුතු ගමට ගෙන යන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලම පාලනය වන ඉතාම වැදගත් අමාත්‍යාංශයක් බව අපි දන්නවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගත්තොත් අද වෙනකොට විවිධ ආකාරයේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ප්‍රධාන වශයෙන් ගත්තොත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පහසුකම් සැපයීමේ අඩුපාඩු තිබෙනවා. විශේෂයෙන්ම ජනතාවට පහසුකම් සැපයීමේදී නොයෙකුත් ආකාරයේ අඩුපාඩුකම් තිබෙනවා. ඒකට එක හේතුවක් හැටියට අපි දැකලා තිබෙනවා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල බහුතරයක ඉඩ ප්‍රමාණය මදි බව. ඒ ගොඩනැඟිලිවල ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ, මහජනතාවට අවශ්‍ය කරන සේවා ලබා දෙන්න.

ඒකට එක්තරා හේතුවක් තමයි, පසුගිය කාල සීමාව තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටත්, ඒ වාගේම රජයේ අනෙකුත් කාර්යාලවලටත් විශාල වශයෙන් සේවකයන් බඳවා ගැනීම. හැබැයි, සේවකයන් බඳවා ගැනීමම නොවෙයි ප්‍රශ්නය වෙන්නේ. ඒ සේවකයින්ට ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගිහිල්ලා නිසියාකාරව සේවා කටයුතු කර ගැනීම සඳහා අවශ්‍ය කරන පහසුකම් ටික නැහැ. ඒ අයට නියමිත ආකාරයේ සේවාවක් ලබා දෙන්න, නිශ්චිත කාර්යයක් ලබා දෙන්න කටයුතු නොකිරීම බරපතළ අඩුපාඩුවක් හැටියට අපි දකිනවා. හුහක් වෙලාවට ඒ සේවකයන් සේවය කරන්න කැමැත්තෙන් ඉන්නවා. ඒ වාගේම ඒ ප්‍රදේශයට ගිහිල්ලා, field එකට ගිහිල්ලා වැඩ කටයුතු කරන්න බොහොම කැමැත්තෙන් හිටියා වුණත්, නිශ්චිත කාර්යයක් ඒ අයට නැති නිසා හුහක් වෙලාවට රජයේ මුදල් අපතේ යන තත්ත්වයක් තිබෙනවා.

විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන රජයේ සේවකයන් ගණනාවක් සිටින බව අපි දන්නවා. ඒ සෑම කෙනාටම පවතින උද්ධමනයට මුහුණ දෙන්න අවශ්‍ය කරන වැටුප් පරිමාව පසුගිය කාල සීමාව තුළ ලබා ගන්න හැකියාව ලැබුණේ නැහැ. වර්තමාන රජය මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා, රුපියල් 15,750කින් වැටුප් වැඩි කිරීමක් ලබා දෙනවා කියලා. විශාල වැටුප් වැඩිවීමක් ලබා දෙන තත්ත්වයක් තමයි ආණ්ඩුව පැත්තෙන් අපට දකින්න, අහන්න තිබෙන්නේ. එහෙම තමයි ඒ අය පෙන්නුම් කරලා තිබෙන්නේ. මේකේ සැබෑ තත්ත්වය දැනගන්න නම් රාජ්‍ය සේවකයන් ලබන මාසයේ වැටුප ලබා ගන්නකල් අපට ඉන්න වෙනවා. ඒ අනුව තමයි අපට තේරුම් ගන්න පුළුවන් වෙන්නේ.

මොකද, මේ වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් විවිධ මති මතාන්තර තිබෙනවා. අපට දැනගන්න ලැබෙන හැටියට නම් සුළු සේවකයින් පැත්තෙන් ගත්තොත් සමහර අය කියනවා, වැටුප් වැඩිවීම රුපියල් 900ක් කියලා. අනෙක් පැත්තෙන් ගත්තොත්, රුපියල් 5,700ක වැටුප් වැඩිවීමක් ලැබෙනවා කියන එක තමයි මෙතැනදී පැහැදිලි වෙලා තිබෙන්නේ. අපි දන්නේ නැහැ. අපි බලාගෙන ඉන්නවා, රජය කියන කාරණාවල් සත්‍යද, රජය කියන ආකාරයේ වැටුප් වැඩිවීමක් රජයේ සේවකයින්ට ලැබුණාද කියන එක ගැන. ඒ වාගේම රජයේ අනෙකුත් ආයතනවල වැඩ කරන අය සම්බන්ධව ගත්තොත්, විශේෂයෙන්ම වැටුප්වල හුහක් ප්‍රශ්න තිබෙනවා. මම එක ක්ෂේත්‍රයක් ගැන පමණක් නොවෙයි කථා කරන්නේ. නොයෙකුත් අවස්ථාවලදී වැටුප් විෂමතා සම්බන්ධයෙන් යම් යම් උද්ඝෝෂණ තිබෙනවා අපි දැකලා තිබෙනවා. ඒ වාගේම අරගළ තිබෙනවා. විවිධ ඉල්ලීම් කරපු අවස්ථා පසුගිය කාල සීමාව තුළ අපි දැක්කා.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ගැටලුව සම්බන්ධවත්. මොකද, මම පෞද්ගලිකවම දන්නවා, අපේ ගරු විපක්ෂ නායකතුමාත් මේ සම්බන්ධයෙන් කථා කළ බව. මම හිතන

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

විධියට විපක්ෂ නායකතුමා එක්කත් පසුගිය දවස්වල සාකච්ඡා ගණනාවක් පැවැත්වුවා. ඒ කියන්නේ, මැතිවරණයටත් ඉස්සෙල්ලා ඒගොල්ලන්ගේ නියෝජිතයන් ඇවිල්ලා සාකච්ඡා කළා. ඒ සාකච්ඡා කරපු වෙලාවේ නම් අපේ විපක්ෂ නායකතුමා පැහැදිලිවම කිව්වේ, එතුමා මේ රටේ රාජ්‍ය නායකයා වුණොත් - ජනාධිපති වුණොත්, රාජ්‍ය බලය ලැබුණොත්- අනිවාර්යයෙන්ම මේ වැටුප් විෂමතා ප්‍රශ්නය විසඳලා ඒ රාජ්‍ය නිලධාරීන්ගේ, කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ගැටලුව විසඳනවා කියලායි. එතුමා පොරොන්දු වෙලායි තිබුණේ.

වර්තමාන ආණ්ඩුවත් රජයේ සේවකයන්ගේ පැත්තේ තමයි හැමදාම හිට ගත්තේ. රජයේ සේවකයින්ට අසාධාරණයක් වුණා නම්, රජයේ සේවකයින්ගේ වැටුප් සම්බන්ධව, එහෙම නැත්නම් විෂමතා සම්බන්ධව නැඟී සිටියේ ජාතික ජන බලවේගයේ අය. ඔවුන් තමයි ඒවායේ ඉදිරියෙන්ම හිටියේ. ඉතින් රජයේ සේවකයෝ හැම කෙනාම විශ්වාස කළා, මේගොල්ලන් බලයට පත් වුණාම මේ තිබෙන වැටුප් විෂමතා ඒ වාගේම අනෙකුත් ගැටලු සහගත තත්ත්වයන් සම්බන්ධයෙන් රජයේ සේවකයන්ට මීට වඩා හොඳ සහනයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරයි කියලා. නමුත්, කියන්න කනගාටුයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ වෙනකල් රජයේ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ප්‍රශ්නය විසඳිලා නැහැ. අපි දන්නා තරමින් ගරු අමාත්‍යතුමාත් එක්ක දෙසැම්බර් මාසයේ සාකච්ඡාවක් කළා. දෙසැම්බර් මාසයේදී කරපු ඒ සාකච්ඡාවේදී ගරු ඇමතිතුමා කියලා තිබෙනවා, අනිවාර්යයෙන්ම මේ අය වැය තුළින් ඔබතුමන්ලාගේ ඒ වැටුප් විෂමතාව -වෙනස- එහෙම නැත්නම් යම් අඩු පාඩුවක් වෙලා තිබෙනවා නම්, ඒක අපි අය වැය තුළින් ලබා දීලා, ඒ අයගේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරනවා කියලා. එහෙම තමයි පොරොන්දු වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, නමුත් අපට පෙනෙන ආකාරයට මේ අය වැය ලේඛනයේ ඒ පිළිබඳව විශේෂයෙන් සඳහන් කරලා නැහැ. එහෙම නැත්නම් අනිවාර්යයෙන්ම ඒ ප්‍රශ්නය විසඳනවා කියලා කළමනාකරණ සේවා නිලධාරීන්ට දැනුම් දීලා නැහැ. මේ අවස්ථාවේදී මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. කළමනාකරණ සේවා නිලධාරීන් දීර්ඝ කාලයක් තිස්සේ මේ සම්බන්ධයෙන් අරගළයක නියැළී ඉන්නවා. ඒ නිසා අනිවාර්යයෙන්ම ඒ අයගේ ප්‍රශ්නය විසඳලා දුන්නොත් ඉතාම හොඳයි, කාලෝචිතයි. ඒක ඒ අයට කරන විශාල සාධාරණයක් හැටියට මා දකිනවා. මොකද, ඔවුන් හොඳ අනාගතයක් තිබෙන පිරිසක්.

අපි දන්නවා, කළමනාකරණ සේවා නිලධාරීන් ඒ කාලයේ හඳුන්වා දී තිබුණේ ලිපිකරුවන් විධියට බව. ඒ කාලයේ ලිපිකරුවන් විධියට බඳවා ගත් අය පරිපාලන ක්ෂේත්‍රයෙන් ඉහළටම ගියා. ඇත අතීතයේ ලිපිකරුවන් ලෙස බඳවා ගත් අය ප්‍රාදේශීය ලේකම්වරුන් බවට පවා පත් වෙලා ඉන්නවා. ඒ නිසා ඔවුන්ට හොඳ ගමනක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි දන්නවා, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්, මන්ත්‍රීවරුන් නැතිව තමයි ඒවායේ කටයුතු කරගෙන ගියේ කියලා. අපි දන්නවා, ඒ අවස්ථාවේදී ලේකම්වරුන් විසින් තමයි, මේ සම්බන්ධව විශාල වැඩ කොටසක් කළේ. ඒ සියලුදෙනා ඒ තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ, මුලින් කළමනාකරණ සේවා නිලධාරීන් විධියට කටයුතු කිරීමෙන් තමයි. ඔවුන් "සුප්‍රා" විභාගය කරලා, ඒ සම්බන්ධයෙන් සුදුසුකම් සම්පූර්ණ කරලා ඉදිරි කාලයේදී ලොකු ප්‍රයෝජනයක් ගන්න ඕනෑ පිරිසක්. ඒ නිසා මම නැවත වරක් ඉල්ලා සිටින්න කැමැතියි, ඒ අයගෙන් ඉදිරියේදී විශාල කාර්ය භාරයක් කර ගන්න තිබෙන නිසා ඒක ආයෝජනයක් විධියට හිතලා කටයුතු කරනවා නම් ඉතා හොඳයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට එච්චර කාලවේලාව නැහැ. නමුත්, මම මේ කාරණයටත් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. අපි දන්නවා, සීමා නිර්ණය සම්බන්ධව අපි ගොඩක් කථා කළ බව. ඒ වාගේම ඒවා කරන්න ඕනෑය කියලා අපි යෝජනා පවා ඉදිරිපත් කරලා තිබෙනවා. අපි දන්නා තරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙන් කරන ලද දැනට තිබෙන භූ විෂමතා තත්ත්වය වාගේම අනෙකුත් සාධක දිහා බලනකොට, සමහර ප්‍රදේශවල ජනතාවට බොහෝ කාලයක් ගත කරමින්, දුර බැහැර ඉඳලා ඇවිල්ලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවාව ලබා ගන්න සිද්ධ වෙලා තිබෙනවා. උදාහරණයක් හැටියට මා නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගම්මාන 4ක් තිබෙනවා. ඒවාට යන්න කිලෝමීටර 40ක, 50ක දුරක් යන්න ඕනෑ. ඒ වාගේම කන්දල්ඔය කියලා වත්තක් තිබෙනවා. හරියට බැලුවොත්, ඒ වත්තේ ඉන්න ජනතාවට කිලෝමීටර 60ක පමණ දුරක් ගෙවාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, මේ සම්බන්ධයෙන් කඩිනමින් අවධානය යොමු කරන්න කියලා. මම මේ කථා කරන්නේ, අනෙක් මැතිවරණ කොට්ඨාස ගැන නොවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙන සීමා වෙනස් කරලා, පහසුකම් තිබෙන තැනකට ජනතාව යොමු කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලායි මා ඉල්ලන්නේ. ඒ අය යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පහු කරගෙන තමයි බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන්නේ. යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එනවා නම්, කිලෝමීටර 10ක්, 15ක් වාගේ දුරක් තිබෙන්නේ. හැබැයි, ඒක පහු කරලා යනවා නම්, තවත් කිලෝමීටර 40ක්, 50ක් යන්න වෙනවා. එහෙම තත්ත්වයක් තමයි අද ඒ ප්‍රදේශවල තිබෙන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමාගේ කඩිනම් අවධානය යොමු කරලා, ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් භූමිය, එහෙම නැත්නම් සීමා වෙනස් කරන්න යම් වැඩ පිළිවෙළක් යෙදුවොත් හොඳයි කියලා මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මොකද, මම කම්කරුවන්ගේ විෂය සම්බන්ධයෙනුත් කථා කරන්න ඕනෑ. ගරු ඇමතිතුමාත් ඉන්න නිසා, කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන මේ අවස්ථාවේදී වතු කම්කරුවන් සම්බන්ධව මම පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. අපි දන්නවා, ගරු ජනාධිපතිතුමා අය වැයෙන් යෝජනා කරලා වතු කම්කරුවන්ට රුපියල් 1,700ක වැටුපක් ලබා දෙන්න කටයුතු කරනවා කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වතු කම්කරුවන්ගේ වැටුප සම්බන්ධයෙන් කථා කරද්දී, රුපියල් 1,700ක වැටුප සම්බන්ධයෙන් සාකච්ඡා කරන බව තමයි කියලා තිබෙන්නේ. පඩිපාලක සභාවේ සාකච්ඡාවලට මමත් වෘත්තීය සමිති නායකයෙක් හැටියට සම්බන්ධ වුණා. මට මතකයි, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් ඒ අවස්ථාවට පැමිණි වෘත්තීය සමිති නියෝජිතයෝ ඒ අවස්ථාවේදී එකහෙළාම කිව්වේ, අනිවාර්යයෙන්ම රුපියල් 2,000ක වැටුපක් දෙන්නේ නැත්නම් අපි මේ සාකච්ඡාවෙන් බැහැර වෙනවා කියලා බව.

එහෙම කියලා එදා ඔවුන් ඒ සාකච්ඡාවෙන් නැඟිටලා ගියා. අවසානයේ රුපියල් 1,350ක් දෙන්න පටන් ගත්තේ ඔබතුමන්ලාගේ කාලයේදී නොවෙයි, පසුගිය රජයෙනුයි එය තීරණය කළේ. එතුමන්ලා රුපියල් 1,700ක් දෙනවා කිව්වා. රුපියල් 1,350 දුන්නේ ඔබතුමන්ලාගේ කාලයේදී නොවෙයි. අවසානයට තිබුණු පඩිපාලක සභා සාකච්ඡාවට මම ගියා, ගරු ඇමතිතුමනි. දැන් ඔබතුමන්ලා පුළුවන් නම් රුපියල් 1,700 ලබා දෙන්න කෝ. එච්චරයි අපි ඉල්ලා සිටින්නේ. පඩිපාලක සභාවත් එක්ක සාකච්ඡා කරලා හරි කමක් නැහැ, කොහෙන් හරි රුපියල් 1,700ක් ලබා දීමේ කටයුත්ත කරන්න කියලායි අපි ඉල්ලා සිටින්නේ.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.13]

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(මාණ්පුමිකු මුහම්මට් පෛසල්)
(The Hon. Muhammad Faizal)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

අස්සලාමු අලෙක්කුම්; ආයුබෝවන්; වණක්කම්!

කෞරව පිරතිත් තවිසාළර් අවර්කළේ, පොදු නිර්වාහක, මාකාණ සභෛකළ් මර්රුම් උළ්ළූරාට්චි අමෛච්චින් ඉන්‍රෛය කුළුනිලෛ විවාතත්තිල් උරෛයාට්රච් චන්දර්ප්පම් තන්දමෛක්කු නන්‍රියෛත් තෙරිවිත්තුක් කොළ්කිරේන්. ඉදු ඉන්ත නාට්ටිල් ඉරුක්කින්‍ර අමෛච්චුක්කළිල් මුක්කියමාන ඔන්රාකක් කාණප්පටුකින්‍රත. අන්ත වකෛයිල්, 14,000ක්කුම් අතිකමාන කිරාම සේවෛයාළර්කළ් පිරිවුකළුක්කූටාකවුම්, 332 පිරතේච චෙයලකංකළුක්කූටාකවුම්, 271 පිරතේච සභෛකළුක්කූටාකවුම් ඉන්ත නාට්ටින් අපිවිරුත්තිකළෛයුම් මක්කළුක්කාන අතිකමාන සේවෛකළෛයුම් චෙය්යක්කූටිය ඉන්ත අමෛච්චුක්කූටාකච් චෙන්‍ර වරුටංකළිල් ඔදුක්කප්පට්ට නිතියිලිරුන්දු මක්කළුක්කුච් චිරන්ත මුරෛයිල් සේවෛකළ් චෙය්යප්පට්ටනවා? එන්‍රාල්, "ඉල්ලෛ" එන්‍රේ චොල්ල වේණ්ටුම්. නිති ඔදුක්කීටුකළ් චෙය්යප්පට්ටිරුන්දාලුම්, කටන්ත අරචාංකංකළිල් ඉරුන්ත පාරාළුමන්‍ර උරුප්පිනර්කළ් තමදු වේලෛත්තිට්ටංකළුක්කු උරිය නිතියෛච් චරියාන මුරෛයිල් පකිර්න්තළික්කාමෛයිනාල්, අන්ත නිතිකළ් මීණ්ටුම් තිරෛචේරික්කුත් තිරුම්පිච් චෙල්වතර්කාන වාය්ප්පුකළ් අතිකමාක ඉරුන්තන. ඉව්වාරු මක්කළුක්කාන ඔදුක්කප්පට්ට නිති චරියාන මුරෛයිල් පකිර්න්තළික්කප්පටාමල් ඉරුන්තදුම් නාට්ටින් පොරුළාතාරම් මුන්නේර්රම් අටෛයාමල් ඉරුප්පතර්කු මුක්කිය කාරණමාකුම්.

කටන්ත කාලත්තිල් පිරතේච සභෛ උරුප්පිනර්කළුම් මාකාණ සභෛ උරුප්පිනර්කළුම් පාරාළුමන්‍ර උරුප්පිනර්කළුම් මුළුමෛයාන අරචාංකංකළුම් ඉරුන්තුම්කූට උළ්ළූරාට්චිච් චභෛකළිනූටාකවුම් පිරතේච චභෛකළිනූටාකවුම් පිරතේච චෙයලකංකළුක්කූටාකවුම් මක්කළුක්කාන චේවෛකළෛච් චරියාන මුරෛයිල් චෙය්ය මුටියාදු ඉරුන්තාර්කළ්. ආනාල්, ඉන්‍රු එමදු තේචිය මක්කළ් චක්ති අරචාංකම් පිරතේච චභෛකළ්, මාකාණ චභෛකළ් ඉයංකාත නිලෛයිල්, කිරාම චේවෛයාළර් පිරිවු මක්කළුක්කුම් පිරතේච චභෛප් පිරිවු මක්කළුක්කුම් පිරතේච චෙයලකප් පිරිවු මක්කළුක්කුම් අතිකමාන චේවෛකළෛ වළංකි වරුකින්‍රදු.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்களின் வேண்டுகோளுக்கிணங்க, இம்முறை அனைத்து மக்களுக்கும் சேவைகளை வழங்கும் நோக்கில் அனைத்துப் பிரதேசங்களுக்கும் அதிகமான நிதி ஒதுக்கப்பட்டுள்ளது. அந்த வகையில் பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சுக்கு 496.5 பில்லியன் ரூபாய் - 11.8 சதவீதம் - ஒதுக்கப்பட்டுள்ளது. இந்த அமைச்சானது, அரச சேவை மற்றும் உள்ளூராட்சி நிறுவனங்களைப் பலப்படுத்துவதுடன், மக்களுக்குச் சிறந்த சேவையை வழங்கி அவர்களின் வாழ்க்கையை முன்னேற்றுவதற்கான ஊக்குவிப்புகளையும் செய்கின்றது. கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, மாண்புமிகு ஜனாதிபதி அவர்களும் கௌரவ அமைச்சர் அவர்களும், ஒதுக்கப்பட்ட நிதிகள் சிறந்த முறையில் மக்களுக்குச் சேவை செய்வதற்காகப் பயன்படுத்தப்பட வேண்டுமென அறிவுறுத்தியிருக்கிறார்கள். அடுத்து, 1970இல் நாட்டில் நடைபெற்ற உள்ளூராட்சி எல்லை நிர்ணயங்கள்கூடச் சரியான முறையில் நடக்கவில்லை. முன்னைய அரசாங்கங்கள், அமைச்சர்கள்கூட அவர்களுக்குச் சாதகமான முறையில், அவர்களுக்குத் தேவையான முறையில் இந்த எல்லை நிர்ணயங்களைச் செய்து கொண்டிருந்தார்கள். யுத்தத்திற்குப் பின்னர் புத்தளம் தொகுதிக்கு வருகைதந்த மக்களின் பதிவுகள் அதிகமாக இருக்கின்றபடியினால் அங்கு இந்த எல்லை நிர்ணயம் மீள் பரிசீலனை செய்யப்பட வேண்டுமென்பதை இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதுமட்டுமல்லாமல், புத்தளம் தொகுதியில், கற்பிட்டி பிரதேசத்தில் 1980-1990களில் தென்னை உற்பத்தி மட்டும்தான் இருந்தது. இன்று வேறு உள்நாட்டு உற்பத்திகள் அதிகமாகக் காணப்படுகின்றன. மீன் மற்றும் விவசாய உற்பத்திப் பொருட்களின் விநியோக மையமாகவும் அது மாறியிருக்கின்றது. அதுமட்டுமல்லாமல், கற்பிட்டிப் பிரதேசத்தில் விருதோடை, கடையாமோட்டை போன்ற பகுதிகளில் தும்பு உற்பத்தி செய்யப்படுகின்றது. அங்கு தும்பு உற்பத்தியில் ஈடுபட்டுள்ள மக்கள் மழைக் காலங்களில் மிகவும் கஷ்டப்படுகின்றார்கள். எனவே, அவர்களுக்கான உதவிகளையும் ஆலோசனைகளையும் வழங்க நடவடிக்கை எடுக்குமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

அத்தோடு, புத்தளம் தொகுதியில் அதிகமாக உப்பு உற்பத்தி செய்யக்கூடிய இடங்கள் இருக்கின்றன. ஆனால், கடந்த அரசாங்கங்கள் சரியான முறையில் அதற்கான திட்டத்தைச் செயற்படுத்தாமையால், மழை காலங்களில்கூட அங்கு உப்பு உற்பத்தி செய்யப்படாமல் தற்போது மிகவும் கஷ்டமான நிலையேற்பட்டுள்ளது. அதன் காரணமாகத்தான் இன்று அதிகமானளவு உப்பை இறக்குமதி செய்யவேண்டி ஏற்பட்டிருக்கின்றது.

அதுமட்டுமல்லாமல், இன்று எமது நாட்டில் GDPஇன் 4.8 சதவீதம் அரச ஊழியர்களுக்குச் சம்பளமாக வழங்கப்படுவதோடு, அரச ஊழியர்கள் எண்ணிக்கை 2022ஆம் ஆண்டில் 1.4 மில்லியனாகக் காணப்பட்டது. கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, எமது நாட்டில் பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின்கீழ் இணைந்த சேவைகள் பிரிவின்கீழ் வருகின்ற மிகவும் முக்கிய சேவையாக அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையைக் குறிப்பிடலாம். இனங்களுக்கிடையிலான நல்லிணக்கத்தைக் கட்டியெழுப்புவதிலும் இணைப்புப் பாலமாகச் செயற்படுவதிலும் இந்தச் சேவை மிகவும் முக்கியத்துவம் பெறுகின்றது என்பதை நான் இங்கு நினைவுபடுத்துவதில் பெருமையடைகின்றேன்.

[ගරු මුහම්මදු ෆයිසාල් මහතා]

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இச்சேவையில் தமிழ், சிங்கள மொழிபெயர்ப்பாளர்களுக்கு நாடளாவிய ரீதியில் பாரிய பற்றாக்குறை நிலவுகின்றது. இதன்மூலம் நீதிமன்ற வழக்கு விசாரணைகள் தாமதமடைகின்ற அதேவேளை, அரச ஆவணங்களை இரண்டு அரச கருமமொழிகளிலும் வெளியிடுவதிலும் அரச அலுவலகங்கள் பாரிய சிக்கலுக்கு முகங்கொடுத்து வருகின்றமையை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. எனவே, அரச சேவையில் நிலவும் மொழிபெயர்ப்பாளர்களின் தட்டுப்பாட்டை நிவர்த்தி செய்வதற்கு அரசு நடவடிக்கை எடுக்க வேண்டுமென்பதை நான் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

அதுமட்டுமல்லாமல், தற்போதைய அரசாங்கம் நாட்டிலிருக்கின்ற அத்தியாவசிய அரச துறைப் பதவி வெற்றிடங்களுக்கான ஆட்சேர்ப்புத் திட்டத்தின்கீழ் 30,000 வேலைவாய்ப்புகளை வழங்க முடிவு செய்துள்ளது. அந்த வகையில், தகுதியானவர்களுக்குத் தகுந்த நேரத்தில் அந்த வேலைவாய்ப்புகள் வழங்கப்படும்.

எமது நாட்டில் 2022ஆம் ஆண்டில் நடத்தப்பட வேண்டியிருந்த உள்ளூராட்சி சபைத் தேர்தலை ஒரு வருடமாக இழுத்தடிப்புச் செய்து, 2023ஆம் ஆண்டில் நடத்துவதற்கான ஏற்பாட்டைச் செய்திருந்தாலும், "தேர்தலை நடத்துவதற்குப் பணம் இல்லை; தேர்தலை நடத்துவதற்கு ஒரு தேர்தலும் இல்லை" என்று கூறி, அப்போது ஆட்சியில் இருந்தவர்கள் அதனை நடத்தாமல் விட்டிருந்தார்கள். ஆனால், தேசிய மக்கள் சக்தி அரசாங்கமும், கௌரவ அமைச்சர் அவர்களும் வருகின்ற காலங்களில் அந்த உள்ளூராட்சிச் சபைத் தேர்தலை நடத்துவதற்கான ஏற்பாடுகளைச் செய்து வருகின்றனர். இம்முறை உள்ளூராட்சிச் சபைத் தேர்தலில் எங்களுடைய தேசிய மக்கள் சக்தி அதிகமான பகுதிகளில் வெற்றியீட்டுவதோடு, இதில் தெரிவாக இருக்கின்ற 8,355 பேரில் அதிகமான உறுப்பினர்களையும் பெற்று, முழுமையான வெற்றியைப் பெறுவோம். அந்த வகையில், பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சுக்கான ஒதுக்கீட்டின் பேரில் தற்போது செய்துகொண்டிருக்கின்ற எமது சேவைகளைத் தொடர்வதுடன், ஒதுக்கீடுகளை அந்தந்தப் பிரதேசங்களின் கிராம சேவகர் பிரிவினூடாகவும், பிரதேச சபைகளினூடாகவும், பிரதேச செயலகங்களுக்கூடாகவும் சிறப்பாகவும் முழுமையாகவும் பயன்படுத்தி, மக்களுக்குத் தேவையான அபிவிருத்தியை ஏற்படுத்தி, அதன்மூலம் சிறப்பாக எமது நாட்டைக் கட்டியெழுப்புவதற்கு நாம் அனைவரும் முன்வருவோம் என்று கூறி, எனது பேச்சை முடிக்கின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[2.21 p.m.]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faizer Musthapha, PC)
Hon. Deputy Chairperson, I consider it a privilege being given the opportunity to speak at the Committee Stage Discussions on the Votes of the Ministry of Public Administration, Provincial Councils and Local Government and the Ministry of Labour.

As you are aware, provincial councils last had their elections in 2014 and then, their term expired. So, now we are in 2025 and the provinces are without electoral representatives. Fingers have been pointed at various persons. So, I would like to tell this Government that holding the election is a simple process. For the Amendment that was brought in, under which 50 per cent were to be elected under the PR System and 50 per cent under the ward system, two-thirds of the Parliament voted, including the present President. In terms of that process, a Delimitation Commission was appointed by the then President and that Delimitation Commission Report was presented to Parliament by the then Minister; that was me. However, that Commission Report was rejected by every single Member of this House. Then, there was a review committee appointed by the then Speaker, headed by the Prime Minister. At that point of time, the Prime Minister was the Hon. Ranil Wickremesinghe. But, their report was not submitted to the President, and that is the present obstacle to holding the Provincial Council Elections. During President Gotabaya Rajapaksa's time, the Prime Minister was the Hon. Mahinda Rajapaksa, followed by the Hon. Ranil Wickremesinghe and subsequently, the Hon. Dinesh Gunawardena. However, the review report on Delimitation Commission Report was not handed over to the President by the Prime Minister in terms of the Act. So, if this House is opposed to the Delimitation Commission Report that was rejected by this House, there is a process through which a review committee could make the relevant changes. Therefore, the present Speaker can appoint a review committee headed by the Prime Minister, and all the grievances in relation to the wards or electorates that were created could be addressed.
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ පනතට අනුකූලව වගකීමක් තිබෙනවා, අගමැතිතුමියට, ජනාධිපතිතුමාට ඒ වාර්තාව මාස දෙකකින් භාර දෙන්න. එම නිසා ඒ පනත අනුව ක්‍රියා නොකිරීම මත තමයි මේ මැතිවරණය කල් දමා තිබෙන්නේ. ඒ නිසා මම ආණ්ඩුවෙන් මේ කාරණය ඉල්ලා සිටිනවා. අපි පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කරලා තිබෙනවා. ඒ පනතට අනුකූලව අභියාචනා කමිටුවට වගකීමක් තිබෙනවා, එම වාර්තාව ජනාධිපතිතුමාට මාස දෙකකින් භාර දෙන්න. මෙම මැතිවරණ ක්‍රමයේ අඩුපාඩු ගැන හුඟක් අය කථා කරනවා. හැබැයි, මම මතක් කරන්න කැමතියි, මෙම පනත මේ පාර්ලිමේන්තුව විසින් තුනෙන් දෙකක බලයෙන් සම්මත කර තිබෙන බව. පළාත් සභා මැතිවරණය 2018 අවුරුද්දෙන් පස්සේ නොපැවැත්වීම නිසා අද වනකොට එම පළාත් සභා නිලධාරිවාදයට යටත් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, එක් එක් පළාතේ ආණ්ඩුකාරවරු සහ නිලධාරීන් යටතේ තමයි අද වනකොට පළාත් සභා කටයුතු කරන්නේ.

අපි දන්නවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ බලය විමධ්‍යගත කරන්න ඕනෑ කියලා උතුරු, නැගෙනහිර ජනතාවගේ විශේෂ ඉල්ලීමක් තිබුණු නිසායි කියලා. හැබැයි, දැන් අවුරුදු 7කට වැඩි කාලයක් නිලධාරීන් යටතේ ආණ්ඩුවේ අභිමතයට අනුකූලව තමයි පළාත් සභාවල වැඩකටයුතු සිදු වෙන්නේ. අපි දන්නවා, හුඟක් අය දේශපාලන අධිකාරිය ගැන කථා කරන බව; දේශපාලනඥයන් වැඩ කරන අයුරු ගැන කථා කරන බව. හැබැයි, නිලධාරිවාදය යටතේ වැඩ කරනකොට ඊට වඩා හුඟක් ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙනවා. ඊට හේතුව

මේකයි. ජනතා නියෝජිතයෝ යම් කර්තව්‍යයක් කරනකොට ජනතාවට යම් වගකීමක් තිබෙනවා වාගේම ජනතාවට ඒගොල්ලන්ගේ කර්තව්‍යය ගැන ප්‍රශ්න කිරීමේ හැකියාවක් තිබෙනවා. අද සියලුම ආණ්ඩුකාරවරුන් යටතේ තමයි ඒ පළාත්වල සියලු කටයුතු කරගෙන යන්නේ. ඒ කියන්නේ, මහ ඇමති කෙනෙක් සහ ඇමතිවරු පස්දෙනෙක් කරන කර්තව්‍යය 2018 අවුරුද්දෙන් පස්සේ ආණ්ඩුකාරවරුන්ගේ අභිමතය අනුව තමයි කරන්නේ. හැබැයි, ආණ්ඩුකාරවරයා පත් කරන්නේ ජනාධිපතිවරයා නිසා හුඟක් තැන්වල දේශපාලන අධිකාරිය මත තමයි කලින් ආණ්ඩුකාරවරු පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා ජනතා නියෝජිතයෙක් නොවන, සමහර අවස්ථාවලදී ජනතාව ප්‍රතික්ෂේප කරපු උදවිය ආණ්ඩුකාරවරු වශයෙන් පත් කිරීම තුළින් ඒ පළාතේ පැරදිච්ච දේශපාලනඥයෝ ආණ්ඩුකාර පට්ටම පාවිච්චි කරගෙන දේශපාලනය කරනවා. ඒ නිසා මම හිතනවා, ඒ තුළින් ජනතාවට ලොකු හානියක් සිදු වෙනවාය කියලා. ඒ වාගේම අපි පළාත් පාලන ක්‍රමයේ දී දූෂිත මනාප ක්‍රමය නැති කරලා, ගමට වගකියන මන්ත්‍රීවරයෙක් ලබා දීලා තිබෙනවා. අඩුපාඩු තිබෙනවා. නමුත්, අපි ගමට වගකියන මන්ත්‍රීවරයෙක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපි මොන සංශෝධන ගෙනාවත් ඒ සංශෝධන තුළින් ගමට වගකියන මන්ත්‍රීවරයෙක්ව නැති කරන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ රටට අද කාන්තා නියෝජනය අවශ්‍යයි. අද කාන්තාවන් විශාල ප්‍රමාණයක් ප්‍රාදේශීය සභාවල අපේක්ෂිකාවන් වශයෙන් හිටපු උදවිය. ඒ නිසා ඕනෑ සංශෝධනයක් ගෙනෙන්න. මේ රටේ සියයට 25ක කාන්තා නියෝජනය ඉතා ප්‍රගතිශීලී ලක්ෂණයක්. ගරු ඇමතිතුමනි, ඒකත් ආරක්ෂා කරගෙන පුළුවන් තරම් ඉක්මනට පළාත් සභා මැතිවරණය පවත්වන්න. අගමැතිතුමිය ඒ වාර්තාව ජනාධිපතිතුමාට භාර දුන්නාට පස්සේ අර සීමා නිර්ණය ක්‍රියාදාමය අවසන් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැනත් කථා කරන මේ අවස්ථාවේ දී මම යම් කාරණයක් කියන්න කැමතියි. මම දන්නවා, වසන්ත සමරසිංහ ඇමතිතුමා වෘත්තීය සමිති වෙනුවෙන් විශාල කර්තව්‍යයක් කරමින් ඒ වෙනුවෙන් හඬ නඟපු කෙනෙක් බව. නමුත්, වතුකරයේ සිටින අභිංසක ජනතාවගේ වැටුප තවමත් රුපියල් 2,000ක් කරන්න බැරි වෙලා තිබෙනවා. පසුගිය රජය පැවැති සමයේ මම උසාවියේ පෙනී සිටියා, Wages Board හරහා දෛනික වැටුප වශයෙන් රුපියල් 2,000ක් වතු සේවකයන්ට ලබා දෙන්න කියලා. හැබැයි, වතු හාමිපුතුන් ඒකට විරුද්ධ වුණු නිසා අපට ඒක කරන්න බැරි වුණා. තමුන්නාන්සේලා දන්නවා, අද දවසකට ලැබෙන රුපියල් 2,000කින් ජීවත් වීමේ අමාරුකම් තිබෙන බව. අද වතුකරයේ ජනතාවගේ ජීවන තත්ත්වය දෙස බලනකොට පෙනෙනවා, ඒගොල්ලන්ට දෛනිකව ලැබෙන වැටුපෙන් ජීවත් වෙන්න බැරි බව. ඒ නිසා විශේෂයෙන් ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා, පුළුවන් තරම් ඉක්මනට වතු හාමිපුතුන් සමඟ මේ ගැන සාකච්ඡා කරන්න. ඔවුන් හැමදාම ඒකට විරුද්ධ වෙයි. මොකද, ඒගොල්ලන් බලන්නේ ඒගොල්ලන්ගේ ප්‍රතිලාභය සහ ලාභය පමණයි. හැබැයි, ජනතා හිතකාමී රජයක් හැටියට තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලා සිටිනවා, ඒ කටයුත්ත කරන්න කියලා. කලින් රජය ඒ සඳහා උත්සාහයක් දැරුවත් එය කරන්න බැරි වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

වතුකරයේ ජනතාවගේ දෛනික වැටුප රුපියල් 2,000ක් කරන්නට පසුගිය රජයට බැරි වුණා. නමුත්, මා විශ්වාස කරනවා, ඔබතුමන්ලාට ඒක කරන්න ශක්තිය තිබෙනවාය කියලා. වතු හාමිපුතුන්ට ලාභයෙන් කොටසක් ලැබෙයි. හැබැයි, වතුකරයේ වැඩ කරන අභිංසක කම්කරු ජනතාවටත් එම වරම ලබා දෙන්න කියා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 2.30]

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

இன்றைய இந்த விவாதத்திலே சகோதரர் ஜீவன் தொண்டமான் அவர்கள் பேசுவதற்கு இருந்தார். நேற்று மாலை ஹட்டன் செனன் தோட்டத்தில் கே.எம். பிரிவில் ஏற்பட்ட தீ விபத்தின் காரணமாக 23 குடும்பங்களும் 90க்கும் மேற்பட்ட நபர்களும் பாதிக்கப்பட்டதன் காரணத்தினால் அவரால் இன்று இந்தச் சபைக்கு வர முடியாமற்போனதன் காரணமாக அவர் சார்பிலே ஒரு சில வார்த்தைகளைக் கூறுமாறு சொல்லியிருந்தார். எனக்கு அனுப்பிவைத்த அவருடைய உரையின் சில பகுதிகளை வாசித்துவிட்டு என்னுடைய கருத்துக்குப் போகலாம் என நினைக்கிறேன்.

> "கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, பெருந்தோட்ட மக்கள் கடந்த 200 வருடங்களுக்கும் மேலாக இந்த நாட்டுக்குத் தமது உழைப்பின் மூலமாக வருமானத்தை வழங்கி வருகின்றனர். அவ்வாறு இந்த நாட்டின் முன்னேற்றத்துக்கு முதுகெலும்பாக உழைத்தபோதும், அவர்களது வாழ்க்கைத் தரம், சமூக அந்தஸ்து மற்றும் அடிப்படை உரிமைகளை வழங்குவதில் இந்த நாட்டில் பாரபட்சமே காட்டப்படுகின்றது. எமது சமூகத்தின் கோரிக்கைகளைச் சாதகமான முறையில் பரிசீலனை செய்வதற்குப் பதிலாக, அவற்றை எப்படித் தட்டிக் கழிக்கலாம் என்பதில் அதிக கவனம் செலுத்தப்பட்டு வருகின்றது; இன்றுவரை அது தொடர்ந்துகொண்டுதான் இருக்கின்றது என்பதைச் சுட்டிக்காட்ட விரும்புகிறேன்."

இது நீண்ட உரையாக இருப்பதனால் நேரத்தைக் கருத்திற்கொண்டு எனது உரையைத் தொடங்குகிறேன். மிக முக்கியமாக தொழிற்சங்கக் காவலனாக கடந்த காலத்தில் செயற்பட்ட கௌரவ வசந்த சமரசிங்ஹ அவர்கள் அமைச்சராக இந்தச் சபையில் இருக்கின்ற காரணத்தில், தொழிலாளர்கள் தொடர்பில் சில வார்த்தைகளைக் கூறலாம் என நினைக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, கடந்த சில காலங்களுக்கு முன்னர் தோட்டத் தொழிலாளர்களின் அடிப்படைச் சம்பளம் 1,000 ரூபாயாக அதிகரிக்கப்பட்டது. அதனைத் தொடர்ந்து, கடந்த அரசாங்கக் காலப்பகுதியில் அதனை 1,700 ரூபாயாக அதிகரிப்பதற்கான பாரிய

[ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

முயற்சி எடுக்கப்பட்டது. பெருந்தோட்டக் கம்பனிகள் இந்தத் தொகையை அதிகரிப்பதற்கு இணங்காத காரணத்தினால் அவர்கள் நீதிமன்றத்தை நாடியிருந்தார்கள். அதனைத் தொடர்ந்து சம்பள அதிகரிப்புக் குறித்த வர்த்தமானி அறிவித்தலும் இரத்துச் செய்யப்பட்டது. அதன்பிறகு, 2024ஆம் ஆண்டு சம்பள நிர்ணய சபையினூடாக மீண்டும் பேச்சுவார்த்தையில் ஈடுபட்டார்கள். கௌரவ அமைச்சர் அவர்களே, அந்த நேரத்தில் உங்களுடைய கட்சியினுடைய தொழிற்சங்கத்தினூடாக - trade union ஊடாக- 2,136 ரூபாய் முன்மொழியப்பட்டது. ගරු ඇමතිතුමනි, 2,136ක්ද, 2,163ක්ද ඔබතුමන්ලාගේ trade union එකෙන් propose කළේ? *[බාධා කිරීමක්]* 2,136ක්ද? ගරු ඇමතිතුමනි, මම හිතන විධියට, 2,163ක් හරි 2,136ක් හරි.

தற்போதைய தேசிய மக்கள் சக்தியின் தோட்டத் தொழிலாளர்களுக்கான தொழிற்சங்கமான அகில இலங்கை தோட்டத் தொழிலாளர் சங்கத்தினர் - ඔබතුමන්ලාගේ trade union - 2,136 ரூபாய் சம்பளத்தினை விட்டு வேறு எதற்கும் தாம் இணங்கப் போவதில்லை என்று கடந்த காலத்தில் சொன்னார்கள். ஆனால், நிதி அமைச்சர் என்ற முறையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் சமர்ப்பித்த வரவு செலவுத்திட்ட உரையிலே அவர்களது சம்பளம் 1,700 ரூபாய் என்று குறிப்பிடப்பட்டிருக்கின்றது. கடந்த காலத்திலே 1,350 ரூபாய் அடிப்படைச் சம்பளமாகவும் 350 ரூபாய் கொடுப்பனவாகவும் கொடுப்பதற்கே பாரிய எதிர்ப்பைக் காட்டினீர்கள். இப்பொழுது 1,700 ரூபாய்தான் உங்களுடைய வரவு செலவுத்திட்டத்தில் சொல்லப்பட்டுள்ளது. நீங்கள் ஆட்சிக்கு - அதிகாரத்திற்கு - வர முன்னர் எடுத்த நிலைப் பாட்டுக்கும் இன்றைய இந்த நிலைப்பாட்டுக்கும் இடையில் எப்படி வித்தியாசம் வந்தது?

மலையக மக்கள் இந்த அரசாங்கத்தை நம்பி உங்களுக்கு வாக்களித்திருக்கின்றார்கள். அப்படி நம்பி வாக்களித்த மக்களை இந்த அரசாங்கம் மீண்டும் ஏமாற்றுகின்றது என்பதையிட்டுக் கவலையாக இருக்கின்றது. இது ஏற்றுக் கொள்ள முடியாத ஒரு விடயம். அரச ஊழியர்களுக்குரிய சம்பள உயர்வை எதிர்வரும் ஏப்ரல் மாதத்திலிருந்து தருவதாகச் சொல்லியிருக்கின்றீர்கள். ஆனால், தோட்டத் தொழிலாளர் களின் 1,700 ரூபாய் சம்பள விடயத்திலே ஏன் அந்த விளக்கத்தினைக் கொடுக்கவில்லை? எனவே, இந்தத் தோட்டத் தொழிலாளர்களுடைய, மலையக மக்களுடைய வாக்குகளை, உங்களுடைய பிரதிநிதிகளின் எண்ணிக்கையை 159 வரை அதிகரிப்பதற்காக மட்டுந்தான் நீங்கள் பயன்படுத்தி யிருக்கின்றீர்கள் என்பது மிகத் தெளிவாகத் தெரிகின்றது. உண்மையில் இந்த மக்கள்மீது கரிசனை இருந்திருந்தால், வர்த்தகர்களுக்கு உதவி புரிவதற்காக இவ்வாறான நடவடிக்கையை நீங்கள் எடுத்திருக்க மாட்டீர்கள். ஆகவே, மிகக் கவலையான ஒரு விடயமாகவே நான் இதனைப் பார்க்கின்றேன்.

இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்பு வதற்கும், அந்நியச் செலாவணியை நாட்டுக்குக் கொண்டு வருவதற்கும் கடுமையாகப் பாடுபடும் ஓர் இனம் இந்த மலையக மக்கள். இந்த மக்களின் அடிப்படைத் தேவைக்கு நீங்களும் துணை நிற்காதது மிகவும் கவலையைத் தருகிறது. அந்த வகையிலே, உங்களுக்கு வாக்களித்து இந்தச் சபைக்கு அனுப்பிய அந்த மக்களே எதிர்வரும் உள்ளூராட்சி மன்றத் தேர்தலின்போது உங்களை மலையகத்திலிருந்து விரட்டி யடிப்பார்கள். மலையகத்தினை நீங்கள் இழந்துவிடப் போகின்றீர்கள்! இன்று இந்தச் சபையிலே நிகழ்த்தப்பட்ட உரைகளைக் கேட்கும்போது, இந்த விடயங்களைத் தட்டிக் கேட்கக்கூட முதுகெலும்பு இல்லாத பிரதிநிதிகளைத்தான் NPPஇன் ஊடாகத் தாம் தெரிவு செய்திருக்கிறோம் என்பதை அந்த மக்களும் இனங்கண்டிருப்பார்கள். இந்தச் சபையிலே தங்களுடைய கட்சியினுடைய நிலைப்பாட்டுக்கு மாறாக எந்தவொரு கருத்தையும் சொல்ல முடியாதளவுக்குத்தான் அந்தப் பிரதிநிதிகள் இருக்கின்றார்கள்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

இப்போது கௌரவ ஜீவன் தொண்டமானுடைய உரையில் ஒரு பகுதியை வாசிக்கின்றேன்:

> "இன்று அதிகமான அடக்குமுறை நிலவுகின்ற ஒரு தொழில்துறையாக பெருந்தோட்டத் தொழில்துறை காணப்படுகின்றது. தோட்ட முகாமையாளர்களின் தான்தோன்றித் தனமான அடக்குமுறைகளுக்கு மலையகச் சமுகம் முகம் கொடுக்க வேண்டியுள்ளது. தோட்ட முகாமை யாளர்கள் அங்கு வசிக்கின்ற தொழிலாளர்களையும் குடியிருக்கும் மக்களையும் அடிமைகளாக நடத்துகின்றார்கள்."

இந்த முகாமையாளர்கள் பற்றி தொடர்ச்சியாகச் சொல்லிக்கொண்டு வருகிறார்கள். அதனால்தான் அந்த மக்கள் தமக்குக் காணி உரிமை வேண்டுமென்று பேசுகின்றார்கள். கௌரவ அமைச்சர் திருமதி சரோஜா சாவித்திரி அவர்களும் இருக்கின்றீர்கள்; உங்கள் அரசாங்கத்திற்கு இதைப் பற்றிச் சொல்லுங்கள்! வாக்குகளை மட்டும் பெற்றுக்கொண்டு இந்த மக்களை ஏமாற்றிவிடாமல், தயவுசெய்து இந்த மக்களுக்காக நீங்கள் குரல் கொடுக்க வேண்டும். அதேபோல இன்னும் பல விடயங்களைச் சகோதரர் ஜீவன் தொண்டமான் அவர்கள் எழுதித் தந்திருந்தாலும் அவற்றை எல்லாம் பேசுவதற்கு நேரமில்லை.

மிக முக்கியமாக, மாகாண சபைத் தேர்தல் முறைமை பற்றியும் ஒரு சில வார்த்தைகளைச் சொல்ல வேண்டும். கடந்த டிசம்பர் மாதம் மாண்புமிகு சனாதிபதி அவர்களைத் தமிழரசுக் கட்சியினராகிய நாங்கள் சந்தித்தபோது, "மாகாண சபைத் தேர்தலை முன்னைய தேர்தல் முறையில் நடத்துவதற்காகக் கடந்த பாராளுமன்றத்திலே கௌரவ சுமந்திரன் அவர்கள் முன்வைத்த தனிநபர் பிரேரணையை நான் மீண்டும் கொண்டுவரப் போகின்றேன்" என்று சொன்னபோது, "இல்லை, அதனை அரசாங்கமே செய்யும்" என்று அவர் சொன்னார். உள்ளூராட்சி மன்றத் தேர்தலை நடத்துவதற்கு எல்லா ஆயத்தங்களும் நடந்திருக்கின்றன. அதுபோல, மாகாண சபைத் தேர்தலை நடத்துவதற்கான தயார் நிலைக்கு வருவதற்கு அந்தச் சட்டமூலத்தை ஏன் இன்னும் கொண்டுவரவில்லை? இதற்கு நீங்கள் கட்டாயமாகப் பதில் சொல்ல வேண்டும்.

என்னுடைய சக பாராளுமன்ற உறுப்பினர், கௌரவ கோடீஸ்வரன் அவர்கள் தொடர்ச்சியாக நான்கு மாதங்களாக இந்தப் பாராளுமன்றத்திலே கல்முனை வடக்குப் பிரதேச

செயலகத்தினைப் பற்றிப் பேசிவருவதுடன், Ministry of Public Administration, Provincial Councils and Local Government இடம் எத்தனையோ தரம் கேள்வி கேட்டிக்கின்றார்; இதுவரைக்கும் ஒரு பதிலில்லை. இதனை அம்பாறை மாவட்டத்தில், அதுவும் கல்முனையில் இருக்கின்ற தமிழ் மக்கள் பார்த்துக் கொண்டிருக்கின்றார்கள். உங்களுடைய அரசாங்கத்தால் இதனைச் செய்ய முடியாது. செய்ய முடியாவிட்டால் ஒரு பதிலையாவது அளித்து விடுங்கள்!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි. කථාව අවසන් කරන්න.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
அதேபோலத்தான், கடந்த அரசாங்கத்தின் காலப் பகுதியில், அதிகளவான சனத்தொகை இருக்கும் சில பிரதேச செயலகங்களை இரண்டாகப் பிரிப்பதற்காகச் சில நடவடிக்கைகள் எடுக்கப்பட்டன. குறிப்பாக, மட்டக்களப்பிலே களுவாஞ்சிக்குடி பிரதேச செயலகம், செங்கலடி பிரதேச செயலகம், அதேபோல போரதீவுப்பற்று பிரதேச செயலகம் ஆகியவை சம்பந்தமாகவும் இந்த அரசாங்கம் தன்னுடைய கவனத்தைச் செலுத்தவேண்டுமென்று கேட்டு, தோட்டத் தொழிலாளர்கள் சம்பந்தமாக நேர்மையான ஒரு தீர்மானத்தை எடுக்க முடியாவிட்டால், அந்த மக்களுக்கு ஆகக்குறைந்தது உண்மையையாவது சொல்லிவிடுங்கள் என்று கூறி, என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.37]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මගේ කථාව ආරම්භයේදීම කාරණයක් මතක් කරන්න කැමැතියි. ඉස්සෙල්ලා විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් ඇහුවා, අපි දැන් වෛද්‍යවරුන්ටත් "හොරු" කියනවාද කියලා. හැමෝටම හොරු කියනවා, වෛද්‍යවරුන්ටත් "හොරු" කියලා කියන්න එපාය කිව්වා.

පළමුවැනි කාරණය විධියට බොහොම පැහැදිලිව අපි මේ කාරණය කියන්න ඕනෑ. අපි හොරුන්ට විතරයි හොරු කියලා කියා තිබෙන්නේ. අපි කිසිම අවස්ථාවක වෛද්‍යවරුන්ට හොරු කියලා කියා නැහැ. ලංකාවේ වෛද්‍යවරු ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු සේවක සේවිකාවන් අති විශේෂ කාර්ය භාරයක් රට වෙනුවෙන් ඉෂ්ට කරනවා. පසුගිය කාලය තුළ දැඩි ආර්ථික අපහසුතා යටතේ, කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ ඉතා විශිෂ්ට සෞඛ්‍ය සේවාවක් ලංකාවේ වෛද්‍යවරුන්, හෙදියන් ඇතුළු සෞඛ්‍ය සේවක සේවිකාවන් විසින් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ හින්දා අපි කිසිම අවස්ථාවක වෛද්‍යවරුන්ටවත්, වෙනත් කිසිම සෞඛ්‍ය සේවක සේවිකාවකටවත් හොරු කියලා කියා නැහැ. අපි හොරු කියලා කියන්නේ හොරුන්ට විතරයි. මහාධිකරණයේ අධිචෝදනාවලට ලක් වෙලා තිබෙන මන්ත්‍රීවරු මෙතැනට ඇවිල්ලා වැරදි මතයක් සමාජගත කරන්න උත්සාහ කිරීම සම්බන්ධයෙන් අපි ඇත්තටම කනගාටුව ප්‍රකාශ කරනවා. මේ අවස්ථාවේදී ඒකට දැඩි විරුද්ධත්වය ප්‍රකාශ කරන්න මම කැමැතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අද විවාදයට ගැනෙන වැය ශීර්ෂ අතරින් විශේෂයෙන් කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අපි කථා කරන්න අවශ්‍යයි, කම්කරු නීති ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන්. මේ ගැන කම්කරු අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ යටතේ කම්කරු ඇමතිතුමාත් ප්‍රකාශ කළා. දැනට ඉදිරිපත් වෙලා තිබෙන කම්කරු නීති ප්‍රතිසංස්කරණය අපි සංශෝධනයට ලක් කරනවා. ඒක කමිටුවක් යටතේ නැවත විමසා බලනවා කියන එක කම්කරු ඇමතිතුමා මීට ඉස්සෙල්ලා ප්‍රකාශ කරලා තිබුණා. මම කැමැතියි, කම්කරු ඇමතිතුමාගෙන් වැඩිදුරටත් ඒ සම්බන්ධව තොරතුරු ලබාගන්න. ඇමතිතුමාගේ කථාවේදී ඒක පැහැදිලි කරන්න පුළුවන් නම් හොඳයි, කම්කරු නීති ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් මේ අවස්ථාවේ තිබෙන තත්ත්වය මොකක්ද කියලා.

අපි ඉතිහාසය බැලුවොත්, මේ නිශ්චිත කම්කරු නීති ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් 2023 අවුරුද්දේදි තමයි දැනට draft එකක් හැටියට තිබෙන කම්කරු නීති ප්‍රතිසංස්කරණය පටන් ගත්තේ. එතකොට ඒ කාලයේදී කම්කරු ඇමති වෙලා හිටපු මනුෂ නානායක්කාර මහත්මයා යටතේ තමයි මේ කම්කරු නීති ප්‍රතිසංස්කරණය පටන් ගත්තේ. එතැනදි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මතු කරගන්නට ඕනෑ, මේ ප්‍රතිසංස්කරණය පටන් ගන්න අවස්ථාවේදී කම්කරු විරෝධී ආකල්පයකින් සහ විශේෂයෙන් වෘත්තීය සමිති විරෝධී ආකල්පයකින් තමයි, මනුෂ නානායක්කාර ඇමතිතුමා ඒ වෙලාවේ මේ කාර්ය භාරය පටන් ගත්තේ.

මම එහෙම කියන්න හේතුවක් තිබෙනවා. සාමාන්‍යයෙන් කම්කරු නීති ප්‍රතිසංස්කරණය කරනකොට ත්‍රෛපාර්ශ්වික එකඟතාවයෙන් තමයි කම්කරු නීති ප්‍රතිසංස්කරණය කරන්නේ. කම්කරුවන් නියෝජනය කරමින් වෘත්තීය සමිතිවලත්, රජයේත්, හාම්පුතුන්ගේත් එහෙම නැත්නම් සේවා යෝජකයන්ගේත් එකඟතාව ඇතිව තමයි කම්කරු නීති ප්‍රතිසංස්කරණය කරන්නේ. ඒක තමයි කම්කරු නීති ප්‍රතිසංස්කරණය කිරීමේදී තිබෙන ජාත්‍යන්තර ප්‍රමිතිය.

ලංකාවේ ජාතික කම්කරු උපදේශන සභාව හරහා මේ කම්කරු නීති ප්‍රතිසංස්කරණය ගැන සාකච්ඡා කරන්නේ නැතුව, අවශ්‍ය stakeholder consultation එක නැතුව එහෙම නැත්නම් ජාතික කම්කරු උපදේශන සභාවේ - 1994 ඉඳන් ලංකාවේ පැවතෙනවා, ජාතික කම්කරු උපදේශන සභාව - නිසි consultation එකක් නැතුව ඔවුන්ගේ අදහස් විමසීමකින් තොරව තමයි පවතින කම්කරු නීති ප්‍රතිසංස්කරණ draft එක; දැනට යෝජනා වෙලා තිබෙන කම්කරු නීති ප්‍රතිසංස්කරණය සකස් කරලා තිබෙන්නේ. එතකොට ඒ අවස්ථාවේදී ජාතික කම්කරු උපදේශන සභාවේ වෘත්තීය සමිතිවලින් දැඩි විරෝධයක් මතු වුණා, තමන්ව මේ ක්‍රියාවලියෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන්.

අපි ඉතා අගය කළ යුතුයි, කම්කරු ඇමතිතුමා පත් වුණාට පස්සේ කම්කරු අමාත්‍යාංශය ඉතා ඉක්මනින් ජාතික කම්කරු උපදේශන සභාව කැඳවීමට කටයුතු කිරීම පිළිබඳව. ජාතික කම්කරු උපදේශන සභාව අවුරුදු එකහමාරක් පමණ කැඳෙව්වේ නැහැ. කම්කරුවන් වෙනුවෙන්, වෘත්තීය සමිති වෙනුවෙන් කම්කරු නීති ප්‍රතිසංස්කරණය කිරීමේදී, ප්‍රතිපත්ති සකස් කිරීමේදී අදහස් ප්‍රකාශ කිරීමට තිබෙන අවකාශය තමයි ජාතික කම්කරු උපදේශන සභාව. මනුෂ නානායක්කාර මහත්මයා අවුරුදු එකහමාරක් විතර කාලයක් මේ සභාව කැඳවන්නේ නැතුව ඉතා

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

අත්තනෝමතික ලෙස, ඒක පාර්ශ්වීය ලෙස රජයේ කැමැත්ත කම්කරුවන් වෙත බලහත්කාරයෙන් පටවමින් තමයි ඉදිරියට ගියේ. මම හිතන්නේ ඒ ප්‍රතිපත්තිය නිශ්චිතව අවසන් කරමින් ජාතික කම්කරු උපදේශන සභාව නැවත කැඳවීමට කම්කරු ඇමතිතුමා ඇතුළු කම්කරු අමාත්‍යාංශය කටයුතු කිරීම අපි මුලින්ම අගය කරන්නට ඕනෑ. ඒ සම්බන්ධව පෞද්ගලිකව මගේ ප්‍රශංසාව පළ කරන්නට මම කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වෙලාවේ කම්කරු නීති ප්‍රතිසංස්කරණය කිරීම සාධාරණීකරණය කිරීමක් - justification එකක් - හැටියට මතු වුණා, කාන්තාවන් ශ්‍රම බලකායට සම්බන්ධ කර ගැනීම සඳහා දැනට පවතින නීති රීති ප්‍රමාණයේ පොඩි බාධාවක් තිබෙනවා, නීති රීති ප්‍රමාණවත් නැහැ; කාන්තාවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් නීති රීති ප්‍රමාණවත් නැහැ; ලංකාවේ කාන්තාවන් ශ්‍රම බලකායට දායක වන්නේ සියයට 30ක් වැනි ඉතාම අඩු අගයක් වාගේ කාරණා. මා හිතන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවා මෙය note කරලා තිබෙනවා - ලංකාවේ ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය අඩුයි කියන එක සම්බන්ධව observation එකක් දීලා තිබෙනවා. ඉතින් මා හිතන්නේ ඒ කාරණය මත සිට සමහර කම්කරු නීති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රවේශයක් ගෙන කටයුතු කරගෙන ගියා, පැවැති කම්කරු නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ - එනම්, මනුෂ නානායක්කාර මහතා පටන් ගත්තු ක්‍රියාවලිය තුළ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
හොඳමයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ ක්‍රියාවලියේ තිබිච්ච ප්‍රශ්නයක් මම ගරු කම්කරු ඇමතිතුමාගේ අවධානයට මේ අවස්ථාවේ යොමු කරන්න කැමැතියි. කම්කරු නීති ප්‍රතිසංස්කරණය විය යුතුයි. අපිත් හිතනවා, කම්කරුවන් සහ සේවා යෝජකයින් වෙනුවෙන් අපේ රටේ කම්කරු නීතිය modernize වෙන්න අවශ්‍යයි කියලා. විශේෂයෙන්ම ලංකාවේ කාර්මික ප්‍රතිපත්තිය සහ නව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කම්කරු නීති ප්‍රතිසංස්කරණය වීමට අවශ්‍යයි. ඒ සඳහා අපි අපේ agenda එකක් හදා ගන්න අවශ්‍යයි. නමුත්, කාන්තාවන් ශ්‍රම බලකායට සම්බන්ධ කර ගැනීමේදී විශේෂයෙන් සුරැකුම් ආර්ථිකය කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. සුරැකුම් ආර්ථිකය කිව්වාම, ළමයි බලා ගන්නා එක, ළමයි හදා වඩා ගන්නා එක, වැඩිහිටියන් බලා ගන්නා එක, රෝගීන් බලා ගන්නා එක ආදී බොහෝ කාරණා අයත් වනවා.

"වැඩ ඇරී වැඩට යති ගැහැනු" කියලා සිංදුවකත් තිබෙනවා. ඒ සංකල්පයෙන් කියන්නේ කාන්තාවන් ද්විත්ව ශ්‍රම කාර්ය භාරයක් ඉෂ්ට කරන බවයි. ඇය වැඩ පොළේදී වාගේම ගෙදර ගිහිල්ලා නැවතත් වැඩ කරනවා. එතකොට ඒ ගෙදර දොර කරන, නමුත් වැටුප් නොගෙවන කාර්ය භාරයක් තිබෙනවා. අපි ඒකට කියනවා, "සුරැකුම් ආර්ථිකයට අදාළ කාර්යයන්" කියලා. ඒ කාර්යයන් වෙනුවෙන් වැටුප් ගෙවන්නේ නැහැ. එය, ස්වේච්ඡාවෙන් කරන කාර්යභාරයක්. ඒ කරන කාර්යභාරය නිසාත් කාන්තාවන්ට ශ්‍රම බලකායට සම්බන්ධ වීමට බාධාවක් තිබෙනවා.

ඒ කාරණය මූලික කොට ගෙන තමයි කාන්තාවන් ශ්‍රම බලකායට සම්බන්ධ කර ගැනීමේදී ප්‍රතිපත්ති සහ නීති සකස් කරන්නට අවශ්‍ය වන්නේ. එතැනදී විශේෂයෙන්ම මාතෘ නිවාඩු, මාතෘ ප්‍රතිලාභ, ඒ වාගේම day care centres වාගේ දේවල් සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරන්න අවශ්‍යයි. කාන්තාවන්ගේ සුරැකුම් ශ්‍රමයට නිසි ඇගයීම ලබා දුන්නොත් පමණයි, අපට කාන්තාවන් විධිමත් ආර්ථිකයට, එහෙම නැත්නම් වැටුප් ගෙවන ආර්ථිකයට සම්බන්ධ කර ගැනීමට පුළුවන් වන්නේ. පසුගිය කම්කරු නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී මේ සුරැකුම් ආර්ථිකය පිළිබඳ අදහස කිසිදු ආකාරයකින් පිළිගත්තේ නැහැ. බොහොම ලිහිල්, එච්චර අවධානයට ගන්නේ නැති ආකාරයෙන් තමයි ඒ සම්බන්ධයෙන් වන ප්‍රතිසංස්කරණය සිදු කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට නියමිත කාලය අවසන්.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ නීති ප්‍රතිසංස්කරණය සිදු කිරීමේදී, එය ඉදිරියට ගෙන යෑමේදී සහ review කිරීමේදී විශේෂයෙන් කාන්තාවන් ශ්‍රම බලකායට දායක කර ගැනීමට අදාළව සුරැකුම් ආර්ථිකය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ලබා දීලා කටයුතු කරන්න කියලා. එහෙම වුණොත් මම හිතනවා, ලංකාවේ කාන්තාවන්ට ආර්ථිකයට මීට වඩා සම්බන්ධ වීමට -ඵලදායීව සම්බන්ධ වීමට- අවස්ථාව ලැබෙයි කියලා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.46]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට විනාඩි 14ක් තිබුණා. ඒක විනාඩි 9ට අඩු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. මා සූදානම් වෙච්ච කථාව කරන්න මට කාලය මදි. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ කම්කරු අමාත්‍යාංශය කින අමාත්‍යාංශ දෙකේම වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වෙන වෙලාව, මේක. අපේ දිස්ත්‍රික්කයේ තමයි රාජ්‍ය පරිපාලනය විෂය භාර අමාත්‍යවරයා ඉන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එම අමාත්‍යාංශය ගැන කථා කරනකොට මම අද විශේෂ යෝජනා කිහිපයක් කරන්න කැමැතියි. පළමුවෙනි යෝජනාව මේකයි. ආණ්ඩුව අද ග්‍රාම නිලධාරී මහත්වරුන් පාවිච්චි කරන්නේ රිළවුන් සහ වඳුරන් ගණන් කරන්නයි. හැබැයි, ඊට වඩා විශාල රාජකාරියක් ඒ අයට කරන්න තිබෙනවා. ඒ රාජකාරිය ඉතාම

වැදගත්. මොකද, ඒ අය යටතේ තමයි අපේ ප්‍රධාන වාගේම, කුඩාම පරිපාලන ඒකකය තිබෙන්නේ. ත්‍රිරෝද රථය ජනතාවත් එක්ක ගොඩක් සම්බන්ධ වාහනයක් වනවා වාගේම, ඒ නිලධාරින් තමයි රාජ්‍ය පරිපාලනය සම්බන්ධ වැඩි බරක් කරට අරගෙන කටයුතු කරන කණ්ඩායම. මොකද, එම නිලධාරියාට තමයි ගමේ සිද්ධිවලට මුහුණ දෙන්න සිදු වෙන්නේ. ගමේ දුප්පත් මිනිස්සු, අභිංසක මිනිස්සු, ආබාධිත අය, අසනීප අය වාගේම ව්‍යාපාර කරන අය ආදි වශයෙන් සියලුදෙනාගේම රාජ්‍යයත් එක්ක බැඳුණු වුවමනා එපාකම්, පරිපාලනයත් එක්ක බැඳුණු වුවමනා එපාකම් සියල්ල වෙනුවෙන් අවශ්‍ය කටයුතු කරන්න වාගේම රටේ ජනතාවගේ වගකීම භාර ගන්න ගමේ ඉන්න ප්‍රධාන නිලධාරියා ඔහුයි. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. මේ සේවාව ඉතා විධිමත් විධියට ඩිජිටල්කරණය කරමින්, හැම ග්‍රාම නිලධාරි මහත්මයෙකුටම කොම්පියුටර් එකක් ලබා දෙන්න අපට පුළුවන්. එයාට පුහුණුවක් ලබා දීලා කියන්න පුළුවන්, සම්පූර්ණ ග්‍රාම නිලධාරි වසම සමීක්ෂණය කරලා ඒ සියලු තොරතුරු පරිගණකයට ඇතුළත් කරන්න කියලා. එහෙම ඇතුළත් කළාට පසුව ඔහු ළඟ සියලු තොරතුරු තිබෙනවා; හැම කෙනාගේම වුවමනා එපාකම් ටිකක් සඳහන්ව තිබෙනවා. වැරැදි කරපු අයගේ, දඬුවම් නියම වෙලා හිරේ ගිහිල්ලා ඉන්න අයගේ තොරතුරු ටික ඒක රාශි කර ගන්න අවශ්‍ය වැඩසටහනත් එතැනින් සකස් කරන්න පුළුවන්. ඒ වාගේම කාට හරි වුවමනා නම් යම් ආයතනයකින් යම්කිසි සහතිකයක් හෝ යම් විධියක සේවාවක් ලබා ගන්න, ඒක ඉතා ඉක්මනින් ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් කුඩා ඒකකය තමයි ග්‍රාම නිලධාරි කාර්යාලය.

තමුන්නාන්සේලා දැන් තීන්දු කරලා තිබෙන්නේ ඩිජිටල්කරණයට යන්න ඕනෑ කියලා නේ. එහෙම නම්, ඒ කටයුත්ත පටන් ගන්න එතැනින්; ග්‍රාම නිලධාරි කාර්යාලයෙන්. ඒක ග්‍රාම නිලධාරි කාර්යාලයෙන් පටන් ගන්න කොට තමුන්නාන්සේලාට පුළුවන් ගමේ ඉන්න උගත්, බුද්ධිමත් ළමයින් ටික අරගෙන ස්වේච්ඡාවෙන් සේවයක් ලබා ගන්න. විශේෂයෙන්ම පරිගණක විද්‍යාව හදාරපු බොහෝ දෙනෙක් ඉන්නවා. ඒ අය උදව් කරන්න කැමැතියි, රටේ වැඩවලට. ඒ අය සම්බන්ධ කර ගන්න පුළුවන්, මේ තොරතුරු ටික, දත්ත ටික පරිගණකයට ඇතුළත් කරන්න. එහෙම කරන ගමන් ඒක සම්බන්ධ කරන්න පුළුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඒ තොරතුරු සම්බන්ධ කළාට පස්සේ රටේ ඉන්න, ගමේ ඉන්න ඕනෑම කෙනෙකුට තමන්ගේ අවශ්‍යතාව පැය කිහිපයක් ඇතුළත ඉෂ්ට කර ගන්න පුළුවන්. නමුත්, අද සිදු වන්නේ මොකක්ද? අද ජනතාවට දෙයක් කර ගන්න ගියාම, පටන් ගත්තු තැන ඉඳන් හැම තැනටම සල්ලි බෙදාගෙන බෙදාගෙන යන්න, කාලය ගැන කිසිම තැකීමක් නැතිව රස්තියාදු වෙන්න සිදු වෙලා තිබෙනවා. ජනතාවට අත්‍යවශ්‍ය කටයුත්තක් කර ගන්න තිබෙනවා නම් එය වුවමනා වෙලාවට කරගන්න බැහැ. සමහර වෙලාවට රට යන්න ලියුමක් ගන්න, සහතිකයක් ගන්න ඕනෑ වෙන්න පුළුවන්. රට යන කෙනාට වුවමනා වෙලාවට නොවෙයි ඒ සහතිකය ලබා දෙන්නේ. ඒක ලබා දෙන්නේ නිලධාරියාට වුවමනා වෙලාවටයි. ඒ නිසා මේ ක්‍රමවේදය නැති කරන්න අවශ්‍ය කරන වැඩසටහන රාජ්‍ය පරිපාලනයට අදාළව හදන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ගැටලු ටික නිරාකරණය කරන්න අපට පුළුවන්, පරිගණකයට දත්ත ඇතුළත් කරද්දී මේ සියලු තොරතුරු ඇතුළත් කරලා අදාළ අංශ එක්ක සම්බන්ධ කළාම. රජයේ බැංකු සහ සියලු රාජ්‍ය ආයතනවල තොරතුරු ඇතුළත් කරන්නත් පුළුවන්. විදේශ රැකියා සඳහා යන අයගේ සියලු දත්ත එකතු කරන්න, ඒ අයට වුවමනා ලිපි ලේඛන ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්නත් පුළුවන්. ඒ තුළින් රටේ ජනතාවගේ කාලය ඉතිරි වීම පමණක් නොවෙයි සිදු වන්නේ. ඒ කාලය ඉතිරි වෙද්දී ආර්ථික වශයෙන් බෙහෙවින් දියුණු වෙන්න ඒකෙන් ලොකු ශක්තියක්, දායකත්වයක් ලැබෙනවා.

ගරු ඇමතිතුමනි, මම හිතනවා, ඔබතුමාට ඒ සම්බන්ධයෙන් හොඳ දැනුමක් තිබෙනවා කියලා. ඔබතුමා ඒ දැනුම පාවිච්චි කරලා මේ කියපු තැනින් පටන් ගන්න; මේ කියන වැඩසටහනින් පටන් ගන්න.

මම හිතන හැටියට ඔබතුමා කැමැති වෙන එකක් නැහැ, ග්‍රාම නිලධාරින් රිළවුන් ගණන් කරන්න යන එකට. රිළවුන් ගණන් කරන එකට වඩා ඔබතුමා මේ වැඩේ හොඳට කරන්න. මොකද, මේක කළොත් ඔබතුමාටත් නමක් තිබේවි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවටත් නමක් තිබේවි. ඒක තමයි මම මූලිකව යෝජනා කරන්නේ, රාජ්‍ය පරිපාලනය ගැන.

ඊළඟට මට තිබෙනවා විශේෂයෙන්ම කම්කරු අමාත්‍යාංශය ගැන කථා කරන්න. කාල වේලාව මදි නිසා මම මේ කාරණයත් එක්ක කම්කරු අමාත්‍යාංශය, එහෙම නැත්නම් කම්කරු දෙපාර්තමේන්තුව ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මම හිතන හැටියට මම මේ කියන කාරණයේ විශේෂත්වයක් තිබෙනවා. කම්කරු සුබසාධනය වෙනුවෙන් 1923 අංක 01 දරන ඉන්දියානු ආඥාමික ආඥා පනතින් තමයි මේ අමාත්‍යාංශයට ඕනෑ කරන ආයතන ටික ආරම්භ කළේ. එතැනින් කම්කරු දෙපාර්තමේන්තුව ආරම්භ වුණාට පසු, ඊළඟට 1958 අංක 15 දරන පනතින් සේවක අර්ථසාධක අරමුදල පටන් ගත්තා. කම්කරු අමාත්‍යාංශය කියන්නේ ඉතා වැදගත් අමාත්‍යාංශයක්. හැබැයි, වැදගත් නැති විධියට පැත්තකට කරලා තිබෙන්නේ. බොහෝ වෙලාවට කම්කරු අමාත්‍යාංශය රාජ්‍ය සේවයේ ඉන්න අය දිහා බලන්නේ නැහැ. බොහෝ වෙලාවට රාජ්‍ය සේවයෙන් පිට සමාගම් වෙන්න පුළුවන්, සංස්ථා වෙන්න පුළුවන්, පෞද්ගලික අංශය වෙන්න පුළුවන්, ඒ ආයතනවල ඉන්න කම්කරුවන් දිහා තමයි බලන්නේ. පෞද්ගලික අංශය ගත්තාම, විධිමත් සහ අවිධිමත් කියලා වැටුප් ලබන කණ්ඩායම් දෙකක් රටේ ඉන්නවා. අවිධිමත් වැටුප් ලබන අයට තවමත් අර්ථසාධක අරමුදලක් හෝ සුබසාධන වැඩසටහනක් රටේ නැහැ. කොතැනකටවත් ඒක සම්බන්ධ කරලා නැහැ. මම හිතන හැටියට ඒක ආරම්භ කරන්න ගිය ආණ්ඩුව සූදානම් වුණා. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
වැටුප් සම්බන්ධ ප්‍රශ්නය දැන් දිගටම කථා කරනවා. විපක්ෂයෙන් එකම දේ කියනවා. අපිත් වැටුප් වැඩි කළා කියනවා. උදේ සෞඛ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ විග්‍රහයක් කළා. 5 පන්තියේ ළමයාටත් ඒක තේරෙනවා; හැමෝටම තේරෙනවා. ආණ්ඩු පක්ෂයට හොඳට තේරෙනවා. හැබැයි විපක්ෂයට තේරෙන්නේ නැහැ. ඔහොම නොවෙයි අපි ඔළුවෙන් හිටගෙන කිව්වත් වැටුප් වැඩි කළා කියලා, විපක්ෂය ඒක පිළිගන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක හරියට කොයි වාගේද කියන්න මම පරණ ජන කථාවක් කියන්නම්. කැලේ හිටියා කොටියෙක් සහ බූරුවෙක්. දවසක් බූරුවා කොටියාට කියනවා, "උන්නැහේ, තණකොළ නිල් පාටයි" කියලා. කොටියා කියනවා, "කොහේද බන් තණකොළ නිල් පාට, තණකොළ කොල පාටයි" කියලා. බූරුවා කියනවා, "නැහැ, නිල් පාටයි" කියලා. කොටියා කියනවා, "කොල පාටයි" කියලා. මේක බේරා ගන්න ඕනෑ. කැලේ නඩුකාරයා තමයි සිංහයා. මේ ප්‍රශ්නය බේරා ගන්න ගියා සිංහයා ළඟට. සිංහයා ළඟට ගියාට පස්සේ කොටියා කියනවා, "මම කියනවා තණකොළ කොල පාටයි කියලා. මේ බූරුවා කියනවා නිල් පාටයි කියලා. මේකේ සත්‍ය තත්ත්වය ඔබතුමා කියන්න" කියලා. සිංහයා කිව්වා, "ඔව්, බූරුවා කියන එක හරි. තණකොළ නිල් පාටයි." එහෙම කියලා සිංහයා කොටියාට දුන්නා දඬුවමක්, බූරුවත් එක්ක කථා කරන්න එපා කියලා. දැන් මේක තමයි සිංහයා දුන්න දඬුවම. ඊට පස්සේ කොටියා කල්පනා කරනවා නඩුකාරතුමා මෙච්චර දේ දැනගෙනත් කිව්වා නේ බූරුවා කියන එක හරි කියලා. කොටියා කල්පනා කරලා, කල්පනා කරලා ආපහු තනියම ගිහිල්ලා සිංහයා හම්බ වුණා. හම්බ වෙලා ඇහුවා, "ඔබතුමා මොකද මට දඬුවමක් දුන්නේ, ඔබතුමා හොඳටම දන්නවා නේ තණකොළ කොළ පාටයි කියලා" යනුවෙන්. ඊට පස්සේ සිංහයා කියනවා, "නැහැ, උඹට තමයි දඬුවම් කරන්න ඕනෑ. මොකද, බූරුවත් එක්ක තර්කයට ගියාට. උඹ කොච්චර කිව්වත් බූරුවා ඒක පිළිගන්නේ නැහැ. ඒ බූරුවත් එක්ක තර්ක කරපු එකටයි උඹටයි දඬුවම දෙන්න ඕනෑ" කියලා.

ඒ විධියට අපිටයි දඬුවම් කරන්න ඕනෑ. අපි කියන්නේ මොනවාද කියලා රටේ මිනිස්සුන්ට තේරෙනවා. ඉතින්, අපි මොකටද මේ විපක්ෂයේ අය එක්ක තවත් ඒ ගැන තර්ක කරන්න යන්නේ? ඔය කොහොම කිව්වත් විපක්ෂය විපක්ෂයම තමයි. මේ විපක්ෂය හදන්න බැහැ. කවදාකවත් හදන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අද විවාද කරන රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය කියන්නේ, අපි මේ රට ගොඩනඟන්න හදන වැඩ පිළිවෙළට මූලික වන මානව සම්පත තිබෙන තැන. ඒ නිසා තමයි මේ අමාත්‍යාංශය වඩාත්ම වැදගත් වන්නේ කියලායි මම විශ්වාස කරන්නේ. මේ රට ගොඩනැඟීම සඳහා ජනාධිපතිවරයා ඉදිරිපත් කර තිබෙන හැම වැඩසටහනක්ම සාර්ථක කරගන්න අවශ්‍ය මානව සම්පත තිබෙන්නේ අපේ මේ වන්දන අබයරත්න මැතිතුමා යටතේ තිබෙන මේ අමාත්‍යාංශයේ. ඒ නිසා තමයි මේ අය වැයෙන් ඒ මානව සම්පත දියුණු කිරීම වෙනුවෙන් විශාල වශයෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ. මේ වැටුප් වැඩි කිරීම තිබෙන්නේත් එතැනට.

ඒ වාගේම තමයි පුහුණුව. මේ නිලධාරින්ට පුහුණුව අවශ්‍යයි. මොකද, කාලයක් තිස්සේ මේ රටේ තිබුණු ආණ්ඩු කල්පනා කළේ නැහැ, අපේ මානව සම්පත දියුණු කරගන්න ඕනෑ කියලා, අපේ රාජ්‍ය සේවකයා ගොඩනඟා ගන්න ඕනෑ කියලා. ඒ අය ඒ ගැන නිතලා වැඩ කළේ නැහැ. අලුත් පරම්පරාව, තරුණ පරම්පරාව රාජ්‍ය සේවයට බඳවාගෙන මේ රාජ්‍ය සේවය ඉස්සරහට ගන්න ඒ අයට වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි ජනාධිපතිවරයා ඉදිරිපත් කර තිබෙන මේ අය වැයේ තිබෙන්නේ, විශාල ප්‍රමාණයක් අලුතින් සේවයට බඳවාගන්න කටයුතු කරනවා කියලා. ඒ වාගේම, මේ අය වැය තුළින් නිලධාරින් පුහුණු කිරීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ඒ මුදල වෙන් කර තිබෙන්නේ මානව සම්පත දියුණු කර ගැනීම පැත්තෙන්. Retire වෙන අත්දැකීම් සහිත අය වෙනුවට බඳවා ගන්නා නව නිලධාරින් ඒ මට්ටමට ගොඩනඟා ගැනීම පැත්තෙන් මේ අමාත්‍යාංශයට විශාල කාර්යභාරයක් තිබෙනවා. මොකද, විශ්‍රාම ගියාට පස්සේ එන්න එන්නම අත්දැකීම් තිබෙන හොඳම පිරිස රාජ්‍ය සේවය තුළ අඩු වෙනවා. ඒ නිසා මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා.

මේ අමාත්‍යාංශයටම අදාළ පළාත් පාලන ආයතන ගත්තාම, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහනක් තිබෙන්න ඕනෑ. දැන් පළාත් පාලන ඡන්දය එනවා, ඒ ඡන්දයට සූදානම් වෙනවා. මේ රටේ ජනතාවට සේවය කරන්න බිම් මට්ටමේ තිබෙන ආයතනය තමයි පළාත් පාලන ආයතනය කියන්නේ. ඒක දැන් කඩා වැටිලා තිබෙන්නේ. කලින් පාලන කාල ඇතුළේ පළාත් පාලන ආයතන විශාල වශයෙන් පිරිහිලා තිබෙන්නේ.

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

උදාහරණයක් හැටියට කිව්වොත්, මේ අය වැයෙන් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මධ්‍යම ආණ්ඩුව යටතේ වෙන් කරන්න කටයුතු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් පාලන ආයතනවලට අදාළ විෂයයන්, ඒවායේ තත්ත්වය ගත්තාම, මේ ආයතන කේන්ද්‍ර කරගන්නා ප්‍රදේශ සංවර්ධනය කිරීමට තිබෙන මේ පළාත් පාලන ආයතනවල මූල්‍ය තත්ත්වය අද පිරිහිලා තිබෙන්නේ, දුර්වල වෙලා තිබෙන්නේ.

ඒකට එක හේතුවක් තිබෙනවා. අර කථාවට කියන්නේ, "ලෝකෙට පරකාසේ, ගෙදරට මරගාතේ" කියලා. දැන් මේ පළාත් පාලන ආයතන අවුරුදු ගණනාවක් නැහැ නේ. ඒ මැතිවරණය කල් දැම්මා නේ. පළාත් පාලන ආයතන නැති ගාණට නේ තිබුණේ. හිටපු ජනාධිපතිතුමා කිව්වා නේ, එහෙම ඡන්දයක් නැහැ කියලා. එතැනිනුත් මේක දුර්වල කරලා තිබෙන්නේ. පළාත් පාලන ආයතනවල හිටපු සභාපතිවරු මොකද කළේ? අර ලෝකෙට පරකාසේ, ගෙදරට මරගාතේ කියනවා වාගේ, තමන්ට දරා ගන්න බැරි දේවල් කළා. සමහර පළාත් පාලන ආයතන ඒ ආයතනවලට දරා ගන්න බැරි මහා විශාල ගොඩනැඟිලි ගැහුවා, පෙනෙන්න. අන්තිමේදී මොකද වුණේ? අන්තිමට ණයවලට හිර වුණා. මේ කොළඹ දිස්ත්‍රික්කයේත් එවැනි පළාත් පාලන ආයතන ගණනාවක් තිබෙනවා. ජනතාවගෙන් ලබා ගන්නා වූ ඒ වරිපනම් බදු මුදල්වලින් කරන්නේ සුදු අලි වාගේ බාගේට හදලා තිබෙන ගොඩනැඟිලිවලට තව තවත් මුදල් යට කරන එක. අඩුම ගණනේ තමන්ගේ ප්‍රදේශයේ පාලමක්, බෝක්කුවක්, පාරක් හදාගන්න මුදල් නැහැ. ඒ නිසා තමයි පළාත් පාලන ආයතනවලින් හදන්න ඕනෑ ග්‍රාමීය පාරවල් හදන්නත් අපට -නව ආණ්ඩුවට- සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම, මේ ආණ්ඩුව ගුවන් තොටුපළේ මගී පර්යන්තය හදන්නත් ඕනෑ. අද ඒ ඔක්කොම කරන්න වෙලා තිබෙන්නේ මේ ආණ්ඩුවට. අද ඒවා ගැන වගක් නැතිව මෙතැන පම්පෝරි ගසමින් අපට විවේචන ඉදිරිපත් කරනවා. අඩුම ගණනේ තමන් මොකක්ද කළේ කියලාවත් හිතන්න ඕනෑ.

මේ වැය ශීර්ෂය යටතේ පළාත් පාලන ආයතනවලට විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම පළාත් සභාත් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒක දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළේ තිබෙන එකක්. ඒක ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. ඒවාත් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් ඒ සම්බන්ධවත් සැකයක් මතු කළා. මේ රට ගොඩ නහා ගැනීම සඳහා ඒ සියලු ව්‍යුහයන්ට මේ අය වැය ඇතුළේ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා ශක්තිමත් කරලා තිබෙනවා. පළාත් සභාවට වෙනම, පළාත් පාලන ආයතනයට වෙනම, මධ්‍යම ආණ්ඩුව රැකෙන්න වෙනම මුදල් වෙන් කරන්නේ නැතිව, සම්පූර්ණයෙන් රට ගොඩ නහා ගැනීම වෙනුවෙන් මේ අය වැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. අපට අන්න ඒ වේගයට දුවන්න සිද්ධවෙලා තිබෙනවා. ඒක නිසා තමයි මේ මානව සම්පත මේ අමාත්‍යාංශය යටතට වැටුණේ.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.00]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின்மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றுவதில் மகிழ்ச்சியடைகின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, இலங்கையில் உள்ள 25 மாவட்டங்களில் மிகவும் பின்தங்கிய மாவட்டமாக முல்லைத்தீவு மாவட்டம் காணப்படுகின்றது. வறுமையில் முதலாவது அல்லது இரண்டாவது இடத்தில் முல்லைத்தீவு மாவட்டம் உள்ளடக்கப்படுகின்றது. முல்லைத்தீவு மாவட்டத்தில் 6 பிரதேச செயலாளர் பிரிவுகள் மற்றும் 136 கிராம அலுவலர் பிரிவுகள் இருக்கின்றன. அங்கு ஆறு பிரதேச செயலாளர் பிரிவுகள் இருக்கும் அதேநேரம், 4 பிரதேச சபைகளே உண்டு. மக்கள் அதிகமாகவும் நிலங்கள் கூடுதலாகவும் உள்ள இரண்டு பிரதேச செயலகங்கள் ஒன்றாகச் சேர்ந்து ஒரு பிரதேச சபையாக இருக்கின்ற நிலைமையானது அந்தந்தப் பிரதேச செயலாளர் பிரிவுகளில் உள்ள மக்களைப் பாதிக்கின்ற விடயமாகும்.

அந்த வகையில் அங்குள்ள புதுக்குடியிருப்பு, ஒட்டுசுட்டான் ஆகிய இரண்டு பிரதேச செயலாளர் பிரிவுகளும் புதுக்குடியிருப்புப் பிரதேச சபையாக இயங்குகின்றது. வடக்கு மாகாண சபை இயங்கிய காலத்திலிருந்தே இந்தச் சபை தொடர்பான கோரிக்கையை உரிய வகையில் மக்களும் மக்கள் பிரதிநிதிகளும் முன்வைத்தே வருகிறார்கள். ஆனால், இன்றுவரை அந்த மக்களுக்கு அதற்கான தீர்வு கிடைக்கவில்லை. நான் அந்த மக்களின் பிரதிநிதி என்ற வகையில், அந்தப் பிரச்சினைக்குத் தீர்வை வழங்கி முல்லைத்தீவு மாவட்டத்திற்கு உதவுங்கள் எனக் கேட்கின்றேன்.

அடுத்தது, ஆளணி பற்றிய விடயத்தைக் கூற வேண்டும். பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் கீழுள்ள முல்லைத்தீவு மாவட்டச் செயலகம் மற்றும் பிரதேச செயலகங்களில் பல தேவைப்பாடுகளும் குறைபாடுகளும் காணப்படுகின்றன. இந்தக் குறைபாடுகள் தீர்க்கப்பட்டாலே அந்த மாவட்டத்தின் பல பிரச்சினைகள் தீர்ந்துவிடும். அந்த மாவட்டத்தின் மாவட்டச் செயலகம் மற்றும் பிரதேச செயலகங்களில் பதவிநிலை உத்தியோகத்தர்கள் உட்படப் பல உத்தியோகத்தர் வெற்றிடங்கள் காணப்படுகின்றன. நிருவாக சேவை 2, கணக்காளர் சேவை 3, திட்டமிடல் சேவை 6, பொறியியல் சேவை 1, முகாமைத்துவ உதவியாளர் சேவை 91, தொழில்நுட்ப அலுவலர் 8, தகவல் தொழில்நுட்ப உத்தியோகத்தர் 6, சாரதி 6, அலுவலகப் பணியாளர் 17 என்றவாறு மொத்தம் 140 வெற்றிடங்கள் காணப்படுகின்றன. இந்த ஆளணியினர் இல்லாமலேயே மாவட்டச் செயலகமும் பிரதேச செயலகங்களும் இயங்குகின்றன. கௌரவ அமைச்சர் அவர்களே, அனைத்து மாவட்டங்களிலும் மாவட்ட நிர்வாகத்தைச் சீராகவும் மக்களுக்கான சேவைகளை ஒழுங்கான முறையிலும் செய்வதென்பது அவசியமாகும். அதிலும் மிகவும் பின்தங்கிய மாவட்டத்துக்கு இது மிகவும் அவசியமாகும்.

இன்னொரு விடயத்தைக் குறிப்பிட வேண்டும். அங்கு கடமையாற்றும் உத்தியோகத்தர்களில் அதிகமானவர்கள் யாழ்ப்பாணத்தைச் சேர்ந்தவர்கள். அவர்கள் சுமார் 10 வருடங்களுக்கும் மேலாக அங்கு கடமை புரிபவர்களாகக்

காணப்படுகின்றார்கள். பணியாளர் பற்றாக்குறை இருக்கும் நிலையிலும், அங்கு பணியாற்றும் யாழ். மாவட்டத்தைச் சேர்ந்தவர்கள் தங்களால் இயலக்கூடிய அளவுக்கு நிறைவான சேவையைச் செய்து கொண்டிருக்கின்றார்கள். எனினும், அவர்கள் பெரிதும் சிரமப்படுகின்றார்கள். அந்த வகையில், மாவட்டச் செயலாளர் உட்பட அங்கு பணியாற்றும் உத்தியோகத்தர்களை நான் பாராட்டுகின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, இந்தக் குறைபாடுகளைத் தீர்க்க உதவுங்கள்!

முல்லைத்தீவு மாவட்டச் செயலகத்தின் கட்டிட வேலையின் முதலாம் கட்டம் 2014ஆம் ஆண்டு பூர்த்தியடைந்து சுமார் பத்து ஆண்டுகள் கடந்துவிட்ட நிலையில், அதனுடைய இரண்டாம் கட்டப் பணிகள் ஆரம்பிக்கப்படாமல் உள்ளது. போதிய இடவசதி இல்லாமல் அலுவலர்கள் பாரிய அசௌகரியங்களுக்கு முகம் கொடுக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, இந்தக் குறைபாடுகள் உங்களுடைய ஆட்சியில் தீர்க்கப்பட வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත වෙලාව අවසන්.

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please, give me one more minute, Sir.

அந்த மாவட்டம் பெருமளவில் பின்தங்கிய மாவட்டமாக இருப்பதற்கு இலங்கையின் நிர்வாகமும் ஒரு காரணம். இந்தப் புறக்கணிப்புக்கள் வேண்டாம்! நாட்டின் 25 மாவட்டங்களையும் உங்களது 25 பிள்ளைகளாகக் கருதி, சமமாகப் பாருங்கள்! கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய செயற்பாடுகளில் எங்களுக்கு நம்பிக்கை உண்டு; நிலைமைகள் சீராகும் என்று நம்புகின்றோம். தயவுசெய்து அவற்றைத் தீர்த்து வையுங்கள்!

இதுதவிர, மாவட்டத்தில் பலதுறைகளிலும் இப்படியான குறைபாடுகள் உள்ளன. அதுபற்றி அந்தந்த அமைச்சுக்களோடு நாங்கள் கதைக்கின்றோம். நான் வன்னி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர். நான் கூறிய இந்தக் குறைகள் வவுனியா, மன்னார் மாவட்டங்களிலும் உண்டு. தயவுசெய்து எங்களை ஒதுக்கிவிடாமல் இந்தக் குறைபாடுகளைத் தீர்த்து வையுங்கள் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දන සූරියආරච්චි මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහ කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී අපට රජයක් විධියට -ආණ්ඩුව විධියට- මේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් විශේෂ කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. 2001 ඉඳලා දශක ගණනාවක් අපේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පාරේ සටන් කරපු, විවිධ ක්‍රියාමාර්ගවල නියැළුණු, මේ රටේ වැඩ කරන ජනතාවට හොඳ වැටුපක්, යහපත් ජීවිතයක් නිර්මාණය කර දීම වෙනුවෙන් සටන් කරපු ව්‍යක්තීය සමිති නායකයන් අතර කෙනකු විධියට මම අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා - විශේෂයෙන් පළමුවරට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයම නියෝජනය කරනවා.

මේ රටේ රාජ්‍ය සේවය නවීකරණය කරමින් වඩාත් යහපත් රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහාත්, මහජනතාවට වඩාත් කාර්යක්ෂම ඵලදායී රාජ්‍ය සේවාවක් ලබා දීම සඳහාත් වූ වැඩ පිළිවෙළක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා. එම යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරමින්, මේ ආණ්ඩු කාලය තුළ ක්‍රියාත්මක කරන්නට අපේක්ෂා කරන ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන ඒ පස් අවුරුදු වැඩසටහනට අදාළ පළමු වසරේ, **ඉදිරි** මාස අටේ පුරවැසි අය වැය පිළිබඳව තමයි අද අපි සාකච්ඡා කරමින් සිටින්නේ.

විශේෂයෙන්ම අද විවාදයට ගන්නා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. මමත් ව්‍යක්තිය සමිති නායකයකු විධියට දශක ගණනාවක් තිස්සේ අපේ රටේ වැඩ කරන ජනතාවගේ මූලික වැටුප වැඩි කර ගැනීම සඳහා පාරේ සටන් කළා. ව්‍යක්තිය සමිති නායකයකු විධියට මම දන්නවා, අපි හැම දාම සටන් කළේ දීමනාවක් දිනා ගන්නවා වෙනුවට, වැඩ කරන ජනතාවගේ මූලික වැටුප වැඩි කර ගන්නයි කියන කාරණය. ඇයි ඒ? මූලික වැටුපට බර තැබීම රාජ්‍ය සේවකයාට වඩාත් ඵලදායී වෙනවා. ඔහුට ලැබෙන අනෙක් සියලු දීමනා, විවිධ වරප්‍රසාද ආදී සියල්ල බැඳී තිබෙන්නේ මූලික වැටුපේ අගය අනුවයි. වත්මන් ආණ්ඩුව, විශේෂයෙන්ම වත්මන් ජනාධිපති අනුර දිසානායක සහෝදරයා අය වැය ලේඛනය ඉදිරිපත් කරමින්, මේ රටේ වැඩ කරන ජනතාවගේ, මේ රටේ රාජ්‍ය සේවකයාගේ මූලික වැටුප වැඩි කරන්නට යෝජනා කළා. වැඩ කරන ජනතාවගෙන් ඉල්ලීමක් එන්නටත් මත්තෙන් තමයි එතුමා මේ මූලික වැටුප වැඩි කරන්නට යෝජනාවක් ඉදිරිපත් කළේ. මෙම යෝජනාවට අනුව මේ රටේ රාජ්‍ය සේවකයාගේ වැටුප් වර්ධක අගය සියයට 80කින් වැඩි වනවා. දශක ගණනාවක් අපි සටන් කරපු ඒ මූලික කාරණාව අනුව, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පළමු අය වැයෙන්ම මේ රටේ වැඩ කරන ජනතාවට ඒ සහනය ලබා දෙන්නට හැකි වීම, මේ රටේ වැඩ කරන ජනතාව දීපු ඡන්දයට දක්වන කළගුණ සැලකීමක්, ප්‍රත්‍යුපකාරයක් විධියට මම දකිනවා. මේ රටේ වැඩ කරන ජනතාවට එවැනි ජයග්‍රහණ ගෙන දෙන අය වැයක් පිළිබඳව තමයි අද අපි මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරමින් සිටින්නේ.

එක කාරණයක් කෙරෙහි මේ ගරු සභාවේ කෙටි අවධානය යොමු කරන්නට මම කැමැතියි. විශේෂයෙන්ම අද වනවිට වැටුප් වැඩිවීම් පිළිබඳව සාකච්ඡා වෙනවා. ඒ නිසා එක් එක් වැටුප් තලවලට අනුව මේ වැටුප් වැඩි කිරීම සිදු වී ඇති ආකාරය ගැන මම මේ ගරු සභාවට උදාහරණ කීපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. 2024.03.31 වනවිට නුපුහුණු, ප්‍රාථමික කම්කරුවාගේ මූලික වැටුප රුපියල් 24,250යි, වැටුප් වර්ධකය රුපියල් 250යි. අපේ යෝජනාව අනුව මේ අප්‍රේල් සිට ප්‍රාථමික කම්කරුවාගේ මූලික වැටුප රුපියල් 40,000ක් දක්වා ඉහළ යනවා. වැටුප් වර්ධකයක අගය රුපියල් 250 සිට 450 දක්වා වැඩි වෙනවා. අර්ධ පුහුණු කම්කරුවෙකුගේ මූලික වැටුප තිබෙන්නේ රුපියල් 25,250ට. එම වැටුප අප්‍රේල් මාසයේ සිට රුපියල් 41,800ක් දක්වා

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

වැඩි වෙනවා. ඒ වැටුප් වර්ධකය තිබුණේ රුපියල් 270ට. එය අප්‍රේල් සිට රුපියල් 490ක් දක්වා වැඩි වෙනවා. ඒ වාගේම, ප්‍රාථමික පුහුණු කෙනෙකුගේ මූලික වැටුප තිබෙන්නේ රුපියල් 25,790ට. එය රුපියල් 42,780ක් බවට පත් වෙනවා. රුපියල් 270ක ඒ වැටුප් වර්ධකය රුපියල් 490ක් බවට අප්‍රේල් සිට පත් වෙනවා. කළමනාකරණ සේවා-II ශ්‍රේණියේ කෙනෙකුගේ දැනට පවතින මූලික වැටුප රුපියල් 27,140යි. එය රුපියල් 45,230 දක්වා අප්‍රේල් මාසයේ ඉඳලා වැඩි වෙනවා. ඒ අයගේ වත්මන් වැටුප් වර්ධකය රුපියල් 300යි. එම වැටුප් වර්ධකය රුපියල් 540 දක්වා වැඩි වෙනවා.

කළමනාකරණ සේවා-I ශ්‍රේණියේ කෙනෙකුගේ මූලික වැටුප තිබෙන්නේ රුපියල් 28,940ට. මේ මාර්තු මාසයට තිබෙන්නේ ඒ ගණන. හැබැයි, ඒ ගණන අප්‍රේල් වැටුප තුළ රුපියල් 48,470ක් බවට පත් වෙනවා. ඒ වැටුප් වර්ධකය රුපියල් 300ට තිබෙන්නේ. එය රුපියල් 540ක් දක්වා වැඩි වෙනවා. ආශ්‍රිත සේවාවල සිටින සංවර්ධන නිලධාරීන් ඇතුළු උපාධිධාරීන්ගේ මූලික වැටුප රුපියල් 31,490යි. එය රුපියල් 53,060 දක්වා වැඩි වෙනවා. ඒ වැටුප් වර්ධකය රුපියල් 445යි. එය රුපියල් 800 දක්වා වැඩි වෙනවා. වෛද්‍ය නිලධාරියෙකුගේ ආරම්භක තනතුරේ දැනට පවතින මූලික වැටුප රුපියල් 52,955යි. එය රුපියල් 91,750 දක්වා වැඩි වෙනවා. ඊට අදාළව රුපියල් 1,335ක්ව පවතින වැටුප් වර්ධකය රුපියල් 2,400 දක්වා වැඩි වෙනවා. මේ ආකාරයෙන් දැවැන්ත විධියට මූලික වැටුප වැඩි කර, වැටුප් වර්ධක අගය සියයට 80කින් වැඩි කර මේ රටේ වැඩ කරන ජනතාවට- විශේෂයෙන්ම රාජ්‍ය සේවය, අර්ධ රාජ්‍ය සේවය, සංස්ථාපිත මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන ආදී සියලු අංශ ආවරණය වන පරිදි- මේ අය වැයෙන් දැවැන්ත ජයග්‍රහණයක් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ උපයන විට බද්ද අය කිරීම නිසා අපේ රටේ ගොඩක් වෘත්තිකයන් විවිධ ප්‍රශ්නවලට මුහුණ පෑ බව අපි දන්නවා. මට මතකයි, එදා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා හමු වෙලා උපයන විට අය කරන බද්ද පිළිබඳ ගැටලුව සාකච්ඡා කළා.

ඒ සඳහා යම් සහනයක් ඔවුන් ඉල්ලුවා. හැබැයි එදා උද්ධච්චකමට හිටපු ජනාධිපතිවරයා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා පුළුවන් නම් එය අඩු කරගන්න කියලා. එදා ඒ විධියට මේ රටේ පාලකයෝ වෘත්තීය සමිති නායකයන්ට උත්තර දෙනකොට, වත්මන් ජනාධිපති අනුර දිසානායක සහෝදරයා අදාළ වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා මෙතෙක් පැවති උපයන විට ගෙවීමේ බද්දේ සීමාව වූ රුපියල් 100,000 මේ අය වැයේදී රුපියල් 150,000ක් දක්වා **ඉහළ දමා** තිබෙනවා. එවැනි ජයග්‍රාහී යෝජනා මේ අය වැයෙන් අපි ඉදිරිපත් කර තිබෙනවා.

මට මතකයි, 2023දී වැඩ කරන ජනතාවට යම් වැටුප් වැඩිවීමක් ඉල්ලා අපි පාරට බැස්සා. හැබැයි, එදා රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව මොකක්ද කළේ? එදා කිව්වා, වැටුප් වැඩි කරනවා නම් සියයට 18 VAT එක තවත් සියයට 3කින් වැඩි කරන්න වෙනවා කියලා. නමුත් අපි ඒ සටන අත්හැරියේ නැති නිසා ඒගොල්ලන්ට සිද්ධ වුණා, යම් දීමනාවක් දෙන්න. ඒ දීමනාවත් ලබා දුන්නේ 2024 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස අත්හැරලා අප්‍රේල් මාසයේ සිට. මේ ආකාරයට විවිධ මට්ටම්වලින් තමයි වැඩ කරන ජනතාවට පැවැති රජයන් සැලකුවේ. නමුත්, ජාතික ජන බලවේගය ආණ්ඩුව ඒ වැඩි කිරීම් ටික ඉතා නිවැරදිව, සාධාරණව **ලබා දෙන්න** සමත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අද කථා වුණා, රාජ්‍ය සේවයේ නව බඳවා ගැනීම් සම්බන්ධයෙන්. රාජ්‍ය සේවයට උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව 2001 ඉඳලා සටන් කරපු නායකයෝ තමයි, අපි. මට මතකයි, 2001දී රැකියා විරහිත උපාධිධාරීන් රැකියා ඉල්ලා පාරට බසිද්දී එදා හිටපු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා ඇතුළු ඒ ආණ්ඩුවේ නායකයන් කිව්වා, රාජ්‍ය සේවයේ රැකියා දෙන්නේ නැහැ, රාජ්‍ය සේවයට බඳවා ගැනීම ඒගොල්ලන්ගේ ප්‍රතිපත්තිය නොවෙයි කියලා. නමුත්, අපි පාරේ සටන් කළා, අපි දිනුවා. හැබැයි අපි ඉතා පැහැදිලිව දැක්කා, 2020, 2021, 2022 වකවානුවලින් පසුව රාජ්‍ය සේවයට බඳවා ගැනීම අත්හිටුවා තිබුණු බව. මේ රටේ රාජ්‍ය සේවයේ පවතින පුරප්පාඩුවලට ඉතා විධිමත්ව, වෘත්තීයභාවයක් සහිතව බඳවා ගන්න උපාධිධාරීන්ට වැදගත් මට්ටමේ වෘත්තියක් හිමි වෙන පරිදි නව බඳවා ගැනීම් 30,000ක් කරන්න වත්මන් ආණ්ඩුව තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒ තීන්දුවට අදාළව අවශ්‍ය ප්‍රතිපාදනත් වෙන් කර තිබෙනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව පවතින පුරප්පාඩුවලට රැකියා විරහිත උපාධිධාරීන් 30,000ක් තරග විභාග මගින් බඳවා ගන්නත් කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම, ගුරු සේවයේ ආසන්න වශයෙන් 40,000කට ආසන්න පුරප්පාඩු ප්‍රමාණයක් නිර්මාණය වෙමින් පවතිනවා. ඒ බඳවා ගැනීම්වලට අවශ්‍ය අවධානයත් අපේ ආණ්ඩුව යොමු කරලා තිබෙනවා.

2019 වර්ෂය දක්වා වූ විශ්‍රාමික ප්‍රජාවගේත් ගැටලුවක් තිබෙනවා. විශේෂයෙන්ම 2020 වර්ෂය දක්වා විශ්‍රාම ගිය සියලුදෙනාගේම ඒ ගැටලුව අදියර 3කින් විසඳන්න ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 10,000ක මුදලක් මේ අය වැය මඟින් වෙන් කර තිබෙනවා. ඒ වාගේම 1997 ඉඳලා විශ්‍රාම ගිය අපේ රටේ ගුරු-විදුහල්පති ප්‍රජාවගේ විශ්‍රාමික වැටුප් පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. කෙසේ වෙතත්, අපි අදියර 2කදී මේ රටේ විශ්‍රාමික ප්‍රජාවගේ වැටුප් ගැටලුව විසඳීමට අවශ්‍ය මැදිහත් වීම් කරන්න බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ රාජ්‍ය සේවකයන්ගේ නොවිසඳුණු විශාල ගැටලු ප්‍රමාණයක් වසර ගණනාවක් තිස්සේ තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී මම යෝජනාවක් ඉදිරිපත් කළා, ඒ ගැටලු කඩිනමින් විසඳීම සඳහා අනුකමිටුවක් පත් කරලා අවශ්‍ය විසඳුම් කඩිනමින් ගේන්න කියලා. සංවර්ධන නිලධාරීන් ගත්තොත්, ඔවුන්ට 1999 ඉඳලා අවුරුදු 25කට වඩා වැඩි සේවා කාලයක සිට නිසි උසස් වීම් පටිපාටියක් නැහැ, ඇතැමුන්ට නිශ්චිත රාජකාරියකුත් නැහැ, පිළිගන්න පුළුවන් සේවා ව්‍යවස්ථාවකුත් නැහැ, උපාධියට සරිලන සාධාරණ වැටුප් තලයකුත් නැහැ. ඒ වාගේම MN -5 වැටුප් තලය පිළිබඳව ඔවුන්ට යම් යම් ඉල්ලීම් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔවුන්ට සුදුසු වැටුප් තලයක් නැහැ. ස්ථානමාරු ගැටලුව ගත්තත්, එයත් නිසියාකාරයෙන් විසඳිලා නැහැ. ආර්ථික සංවර්ධන නිලධාරීන්ට කාර්යාල දීමනාවක් ලබා දෙන්නේ නැහැ. නමුත්, ඒක සාධාරණ නැහැ. ඒ වාගේම වැඩ බැලීමේ දීමනාවක් නැහැ, ලිපි ද්‍රව්‍ය දීමනා නැහැ, ගමන් වියදම් දීමනා නැහැ, සන්නිවේදන දීමනා නැහැ.

කළමනාකරණ සේවයේ නිලධාරීන් ගත්තොත්, 2019දී පොරොන්දු වෙච්ච ඒ සේවා ව්‍යවස්ථාවේ නාමය ඔවුන්ට ලැබිලා නැහැ. ඒ වාගේම MN 3 වැටුප් තලය සඳහා වන එකඟතා තවම ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වාගේම MN 2 තනතුරේ පුරප්පාඩු බොහෝ ප්‍රමාණයක් තිබෙනවා.

රාජ්‍ය සේවාවේ අද ඌන සේවා උපාධිධාරීන් ද සැලකිය යුතු පිරිසක් ඉන්නවා. ඔවුන් කුමන අධ්‍යාපන සුදුසුකමකින් රාජ්‍ය සේවයට ආවත්, ඔවුන් තුළ තිබෙන **ධෛර්යය** මත දැන් උපාධියත් සම්පූර්ණ කර තිබෙනවා. එම නිසා ඔවුන් රාජ්‍ය සේවයේ ගැළපෙන තනතුරුවලට බඳවා ගැනීමේ අවශ්‍යතාවත් දැන් තිබෙනවා. මෙන්න මේ කාරණා පිළිබඳව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ වැඩිදුර කම්‌පු ක්‍රියාවලිය ඇතුළේ ඒ අදාළ ගැටලුවලට වඩා නිවැරදි විසඳුම් ලබා දීම සඳහා ආණ්ඩුවක් විධියට ඉදිරියේ දී අපි අවශ්‍ය පියවර ගන්නවාය කියන එක මේ ගරු සභාවට අපි ඉතා වගකීමෙන් කියන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[ප.ප. 4.18]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு சம்பந்தமான குழுநிலை விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், முக்கியமாக மாகாண சபை முறைமை பற்றிய விடயத்தைக் குறிப்பிடலாம் என்று நினைக்கின்றேன். இந்த மாகாண சபை முறைமையானது, 1987இல் அரசியல் யாப்புக்கான பதின்மூன்றாவது திருத்தத்தினூடாகக் கொண்டுவரப்பட்டது. அந்த அடிப்படையில், கிட்டத்தட்ட 38 வருடங்கள் கடந்திருக்கின்றது. இன்று இந்த மாகாண சபை முறைமைக்கு என்ன நடந்திருக்கின்றது? மாகாண சபைக்குக் கொடுக்கப்பட்ட காணி அதிகாரங்கள், காவல்துறை அதிகாரங்கள் பறிக்கப்பட்டிருக்கின்றன. அடுத்து, மொழிவாரியாக வடக்கு - கிழக்கு மாகாணங்கள் தற்காலிகமாக இணைந்திருக்க வேண்டும்; ஓராண்டின் பின்னர் சர்வஜன வாக்குரிமைமூலம் நிரந்தர இணைப்பைப் பற்றிச் சிந்திக்க வேண்டுமென்ற கருத்தும் அப்போது சொல்லப்பட்டது. அதுவும் நடைபெறவில்லை; அது பிரிக்கப்பட்டிருக்கின்றது. அதுபோல், 'திவிநெகும' என்ற சட்டத்தை மாகாண சபை முறையில் இருந்து மத்திய அரசு பறித்தெடுத்திருக்கின்றது. இப்பொழுது மாகாண சபைக்குக் காணி அதிகாரம் இல்லை, காவல்துறை அதிகாரம் இல்லை, 'திவிநெகும' சட்டத்துக்குரிய அதிகாரமும் எடுக்கப்பட்டிருக்கின்றது. வடக்கு - கிழக்கு இணைப்பும் இல்லாமல் செய்யப்பட்டிருக்கின்றது.

இதைவிட, கல்வி, சுகாதாரம், வீதிகள் போன்றவற்றுக்கான அதிகாரங்கள் மத்திய அரசுக்குரியதாகவும் மாகாண சபைக்குரியதாகவும் இரு வேறாகப் பிரிக்கப்பட்டிருக்கின்றன. தற்போது மாகாண சபைகளுக்கு வழங்கப்படுகின்ற நிதி மிகவும் குறைவாகக் காணப்படுகின்றது. இதன் காரணமாக, மாகாணப் பாடசாலைகள் புறந்தள்ளப்பட்ட நிலையில் காணப்படுகின்றன; மாகாண வைத்தியசாலைகளும் வசதியீனமானவையாக ஆக்கப்பட்டிருக்கின்றன.

மேலும், மாகாண சபையால் பரிபாலிக்கப்படுகின்ற வீதி அபிவிருத்தி அதிகாரசபைக்குட்பட்ட - RDA வீதிகளும் உடைந்து சிதைந்த நிலையில் காணப்படுகின்றன. மொத்தத்தில் ஜே.ஆர். ஜயவர்தன அவர்களால் கொண்டுவரப்பட்ட இந்த மாகாண சபை முறைமையானது ஒரு 'நொண்டி' முறையாக ஆக்கப்பட்டிருக்கின்றது. அதாவது, இயலாத ஒரு நிர்வாக அமைப்பாக்கப்பட்டிருக்கின்றது. 2018ஆம் ஆண்டு நடைபெறவேண்டிய மாகாண சபைத் தேர்தல் 7 ஆண்டுகளாகியும் இன்னும் நடத்தப்படாமல் இருக்கின்றது. ஆகவே, இனப் பிரச்சினைக்குத் தீர்வு என்ற வகையிலும், அதிகாரப் பகிர்வு என்ற வகையிலும், கொண்டுவரப்பட்ட மாகாண சபை முறைமையை முழுமையாக முடக்கிவிட்ட ஒரு நிலை காணப்படுகின்றது. அதற்குரிய அதிகாரங்கள் பறிக்கப்பட்டு, ஏறத்தாழ சாறு பிழியப்பட்ட சக்கை போன்று இந்த மாகாண சபை முறை காணப்படுகின்றது. எனவே, தேசிய இனப் பிரச்சினைத் தீர்வு விடயத்திற்காகக் கொண்டுவரப்பட்ட மாகாண சபை மொத்தத்தில் முடக்கப்பட்ட நிலையில் காணப்படுகின்றது. அதிகாரங்களைப் பகிர்ந்தளிக்காமல், வேலைப் பொறுப்புக்களைப் பகிர்ந்தளிக்காமல் உண்மையில் தீர்வுகளைக் காண முடியாது. இந்த நாடு இத்தனை ஆண்டுகளாக இவ்வளவுதூரம் மோசமாக்கப்பட்டு, பொருளாதாரத்தில் வங்குரோத்து நிலையினை அடைந்ததற்குக் காரணம், அந்தந்தப் பிரதேச மக்கள் தங்களது அதிகாரங்களைத் தாங்களே கையாளக்கூடிய விதத்திலும், தங்களுடைய பொறுப்புக்களைத் தாங்களே கையாளக்கூடிய விதத்திலும் அதிகாரங்கள் பகிரப்படாமைதான். அவ்வாறு செய்திருந்தால் இந்த நிலைமைகள் ஏற்பட்டிருக்காது.

இப்பொழுது ஒரு மாயை ஏற்படுத்தப்பட்டிருக்கின்றது. அதாவது, மாகாணப் பாடசாலைகள் தேசியப் பாடசாலைகளாக மாறினால்தான் நிதியைப் பெறலாம், அவற்றை அபிவிருத்தி செய்யலாம் என்ற நிலைமை ஏற்படுத்தப்பட்டிருக்கின்றது. மாகாண வைத்தியசாலைகள் தேசிய வைத்தியசாலைகளாக மாறினால்தான் அவற்றை அபிவிருத்தி செய்யலாம் என்ற மாயை உருவாக்கப்பட்டிருக்கின்றது. வலது கையால் கொடுத்த அதிகாரங்களை இடது கையால் பறித்தெடுக்கக்கூடிய விதத்தில் கைங்கரியங்கள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. நாங்கள் சொல்லக்கூடிய ஒரு விடயம் என்னவென்றால், மாற்றத்தினை எதிர்பார்க்கின்ற இந்தப் புதிய அரசாங்கம் அல்லது தீர்வுகளை எதிர்நோக்குகின்ற அரசாங்கம், சமத்துவத்தை விதைத்து மாக்ஸிஷ, லெனினிஸ பாதையில் பயணிக்க வேண்டுமென்று நினைக்கின்ற இந்த அரசாங்கம் பல்வேறுபட்ட பிரச்சினைகளுக்குரிய தீர்வுகளைக் காணவேண்டிய நிலையில் இருக்கின்றது என்றுதான். இந்தப் பிரச்சினைகளுக்குரிய தீர்வுகளைக் காண்பதாக இருந்தால், மாகாண சபைகளிலிருந்து பிடுங்கப்பட்ட அதிகாரங்களை மீள வழங்குவது மாத்திரமல்லாமல், முறையான அதிகாரப்பகிர்வு மூலமாக இனப்பிரச்சினைக்கான தீர்வை எட்டவும் வேண்டும். அதன்மூலம்தான் இந்த நாட்டில் சாந்தியும் சமாதானமும் நிலவக்கூடிய சூழ்நிலையையும் சகல துறைரீதியான அபிவிருத்தியையும் ஏற்படுத்தக்கூடிதாக இருக்கும்.

இந்த 'ஒற்றையாட்சி முறை' என்பதனை நாடு சுதந்திரம் அடைந்து ஏறத்தாழ 77 ஆண்டுகளாக நாங்கள் பரீட்சித்துப் பார்த்திருக்கின்றோம்; அது தோல்வியில் முடிந்திருக்கிறது. இந்த ஆட்சி முறையினால் நாட்டில் இன நல்லிணக்கத்தை ஏற்படுத்த முடியவில்லை; அபிவிருத்தியை ஏற்படுத்த முடியவில்லை; சர்வதேச ரீதியில் எமது நாட்டுக்கு ஒரு நல்ல

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

பெயரை ஏற்படுத்த முடியவில்லை; மனித உரிமையைப் பாதுகாக்க முடியவில்லை. மொத்தத்தில் பார்க்கப்போனால் சமூக, பொருளாதார, அரசியல், கலாசார ரீதியாக இந்த ஒற்றையாட்சி முறை தோல்வியைக் கண்டிருக்கின்றது. எனவே, முறையான அதிகாரப்பகிர்வு இல்லாமல் தேசிய இனப்பிரச்சினைக்குத் தீர்வு காண முடியாது, தேசிய நல்லிணக்கத்தினை ஏற்படுத்த முடியாது, தேசிய பொருளாதாரத்தையும் கட்டியெழுப்ப முடியாது என்பதை விளங்கிக்கொள்ள வேண்டும்.

பொது நிருவாக, மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சைப் பொறுத்தமட்டில், பிரதேச செயலகங்களை, மாவட்டச் செயலகங்களைக் கையாளுகின்ற பொறுப்பு அதற்கு இருக்கின்றது. உண்மையில் கடந்த காலங்களில் உருவாக்கப்பட்ட பிரதேச செயலகங்களைப் பொறுத்தமட்டில், மட்டக்களப்பு மாவட்டத்தில் ஏறாவூர்பற்று பிரதேச செயலகமும் போரதீவுப்பற்று பிரதேச செயலகமும் காணப்படுகின்றன. விசாலமான நிலப்பரப்பையும் அதிகமான கிராம சேவையாளர் பிரிவுகளையும் கொண்டவையாக இவை காணப்படுகின்றன. ஒவ்வொரு பிரதேச செயலகமும் ஏறத்தாழ 40 கிராம சேவையாளர் பிரிவைக் கொண்டிருக்கின்றபடியால், ஏறாவூர்பற்று பிரதேச செயலகம், போரதீவுப்பற்று பிரதேச செயலகம் போன்றவை உண்மையில் இரண்டு இரண்டாகப் பிரிக்கப்பட வேண்டிய தேவை இருக்கின்றது. அவ்வாறு பிரிப்பதன்மூலம் யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்குரிய பணிகளைச் செய்வதற்கு அதிகமான வாய்ப்புகள் இருக்கும். எனவே, அந்த விடயமும் கையாளப்பட வேண்டும்.

அதேபோன்று, கல்முனை வடக்கு பிரதேச செயலகம் பற்றி அதிக காலம் பேசிக்கொண்டிருக்கின்றோம். அதற்கான தீர்வும் இதுவரை கிடைக்கவில்லை. அந்த விடயத்திலும் நீங்கள் கவனம் செலுத்தவேண்டியிருக்கின்றது.

இதைவிட, கடந்த ஆட்சியின்போது அறிமுகம் செய்யப்பட்ட 60:40 என்ற ஒரு பிரதிநிதித்துவமுறை - 60% வட்டார முறையிலும், 40% விகிதாசார முறையிலும் பிரதிநிதிகளைத் தெரிவுசெய்கின்ற முறை - உள்ளூராட்சிச் சபைகளில் மிகுந்த சிக்கல்களை ஏற்படுத்தியிருக்கின்றது. இந்த வட்டார மற்றும் விகிதாசார முறை ஆசனங்களைவிட, 'தொங்குநிலை ஆசனங்கள்' என்ற விடயம் கொண்டுவரப்பட்டிருப்பதன்மூலம், எந்தவொரு பிரதேச சபையும் ஓர் உறுதியான ஆட்சியை அமைக்க முடியாமல், மற்றைய கட்சிகளில் தங்கியிருக்கின்ற நிலைமையும், மற்றைய கட்சிகளை இணைத்துக்கொள்வதற்காக அந்த உறுப்பினர்களுக்குப் பணம் கொடுத்து - இலஞ்சம் கொடுத்து - ஊழல், மோசடிகளில் ஈடுபடுகின்ற ஒரு நிலைமையும் உருவாக்கப்பட்டிருக்கின்றது. எனவே, உள்ளூராட்சிச் சபைக்கான தேர்தல்கள் என்பது, நிச்சயமாக விகிதாசார பிரதிநிதித்துவ முறைக்கு மாற்றப்பட வேண்டும் அல்லது அது 70:30 என்ற அடிப்படையில் வட்டாரத்தையும் விகிதாசாரத்தையும் உள்ளடக்கியதாகக் கொண்டுவரப்பட வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

எனவே, உள்ளூராட்சிச் சபைத் தேர்தல்கள் விகிதாசார பிரதிநிதித்துவ முறையின் கீழ் நடாத்தப்பட வேண்டும்; இம்முறை சாத்தியமில்லாதுவிட்டாலும் அடுத்தடுத்த கட்டங்களில் விகிதாசாரப் பிரதிநிதித்துவ முறையில் நடாத்தப்பட வேண்டும். அத்துடன், இந்த 60:40 என்ற பிரதிநிதித்துவமுறை உண்மையில் பலத்த பிரச்சினைகளை உருவாக்கியுள்ளபடியால் இது அகற்றப்பட வேண்டும் என்பதையும் இந்த இடத்தில் நான் முன்மொழிவாகக் கூறுகின்றேன்.

மாகாண சபை முறையில் காணப்படுகின்ற குறைபாடுகள் தேசிய இனப் பிரச்சினையை நீடித்துக் கொண்டிருக்கின்றது; அது சீரமைக்கப்பட வேண்டிய நிலைமை இருக்கின்றது. அந்த வகையில், ஒரு சமஷ்டி முறைமூலமான அரசியல் தீர்வு மூலமாகத்தான் இந்தப் பிரச்சினைகளுக்குரிய ஒட்டுமொத்தமான தீர்வினைக் காணலாம் என்பதைக் குறிப்பிட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහමඩ් සාලි නලීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.26]

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

Ministry of Public Administration, Provincial Councils and Local Government and Ministry of Labour ஆகியவற்றுக்கான நிதியொதுக்கீட்டின் குழுநிலை விவாதத்திலே பேசக் கிடைத்தமைக்காக இறைவனுக்கு முதலில் நன்றியைக் கூறிக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய கிழக்கு மற்றும் வடக்கு மாகாணங்களின் பல்வேறு பிரதேசங்களிலும் முஸ்லிம் சமூகமும், தமிழ்ச் சமூகமும், சிங்கள சமூகமும் பிட்டும் தேய்க்காய்ப்பூவும்போல வாழ்ந்து வந்தது உங்களுக்குத் தெரியும். அவர்களுக்குள் எதுவிதமான பிரச்சினைகளும் இருந்ததில்லை. ஆனால், கடந்த காலங்களிலேயிருந்த ஆட்சியாளர்களால் அவர்கள் இன ரீதியாக, மத ரீதியாக, பிரதேச ரீதியாக பிரித்து ஆளப்பட்டார்கள். அதன் காரணமாக, யுத்த வடு என்றும் பிரதேச வடு என்றும் மத வடு என்றும் உண்டான வடுக்கள் இன்னும் ஆறாத நிலைமையில்தான் இன்று அதை நிவர்த்தி செய்கின்ற வண்ணம் நாங்கள் பேசிக் கொண்டிருக்கின்றோம். கடந்த காலங்களில் இனரீதியாக ஆட்சிசெய்தவர்கள் மத்தியிலே, இங்கே NPP கட்சி மூலமாக ஆட்சி அமைத்திருக்கின்ற மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களை இன, பிரதேச, மத வேறுபாடுகளைக் கடந்த நல்லாட்சியை எதிர்பார்த்திருக்கும் மூவின மக்களும் நல்லதொரு மீட்பாளராகத்தான் பார்த்துக் கொண்டிருக்கிறார்கள். ஆகவே, இந்த அரசாங்கம் பிரதேச ரீதியான எல்லை நிர்ணயங்கள் சம்பந்தமான இவ்வாறான விடயங்களுக்கு முற்றுப்புள்ளி வைக்க வேண்டும்.

1999ஆம் ஆண்டு முன்னாள் ஜனாதிபதி அவர்களால் நியமிக்கப்பட்ட பனம்பலான ஆணைக்குழுவின் சிபாரிசுக்கு அமைய உருவாக்கப்பட்ட பிரதேச செயலகங்களில் கோரளைப்பற்று மத்தி - வாழைச்சேனை, கோரளைப்பற்று தெற்கு - கிரான் பிரதேச செயலகங்களும் உள்ளடங்கும். எனினும், இவ்விரு பிரதேச செயலகங்களும் கடந்த 20 வருடங்களுக்கு மேலாக உத்தியோகபூர்வமாக gazette பண்ணப்படாத நிலையிலே இயங்கி வருகின்றன. இப்பிரதேச செயலகங்களுடன் எல்லைகளைப் பகிர்ந்துகொண்ட ஓட்டமாவடி - KPW, வாழைச்சேனை - KP, வாகரை - KPN ஆகிய பிரதேச செயலகங்களின் எல்லைகள் மீள் நிர்ணயம் செய்யப்படாதுள்ளதனால் பல்வேறு நிர்வாகச் சிக்கல்கள் காணப்படுகின்றன. இவ்வாறு gazette பண்ணப்படாது இருப்பதனால் பொதுமக்கள் தங்களுடைய காணிப் பிரச்சினையைத் தீர்த்துக்கொள்வதில் அலைந்து திரியும் நிலைமை காணப்படுகின்றது. இதனால் ஓட்டமாவடி பிரதேச செயலகத்தின் 176 சதுர கிலோமீற்றர் நிலப்பரப்பு உத்தியோகபூர்வமற்ற முறையில் கிரான் பிரதேச செயலகத்தினால் நிர்வகிக்கப்படுகின்றது.

பனம்பலான ஆணைக்குழுவின் சிபாரிசுகளில் சொல்லப்பட்டவாறு கிரான் பிரதேச செயலகத்திற்கு 686 சதுர கிலோமீற்றர் நிர்வாகம் செய்வதற்கு வழங்கப்பட்டிருக்கின்ற நிலையில், கோரளைப்பற்று மத்தி பிரதேச செயலக நிர்வாகத்திற்குச் சிபாரிசு செய்யப்பட்ட 240 சதுர கிலோமீற்றர் நிலப்பரப்பு நிர்வாக நடவடிக்கைகளுக்கு அனுமதிக்கப்படாதிருப்பது கல்குடா முஸ்லிம்களுக்கு அரசினால் செய்யப்பட்டுவரும் பெரும் துரோகமாகும்.

அத்துடன், ஏறாவூர் நகர் பிரதேச செயலகத்துடன் நிர்வாக நடவடிக்கைக்காகத் தற்காலிகமாக இணைப்புச் செய்யப்பட்ட மீராகேணி, மிச்சி நகர், ஐயங்கேணி ஆகிய 3 கிராம சேவகர் பிரிவுகளும் இதுவரை gazette பண்ணப்படாமல் கடந்த 30 வருடங்களாக இழுத்தடிப்புச் செய்யப்படுகின்ற நிலைமை காணப்படுகின்றது. அதனால் அப்பிரதேச மக்கள் பிறப்பு பதிவுக்கு ஏறாவூர் நகர பிரதேச செயலகத்திற்கும் காணி உரிமத்திற்காகச் செங்கலடி பிரதேச செயலகத்திற்கும் அலைய வேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமைதான் காணப்படுகின்றது. வேண்டுமென்றே இழுத்தடிப்புச் செய்யப்படுகின்ற நிலை இந்த நல்லாட்சிக் காலத்திலும் காணப்படுகின்றது. இது இனரீதியான பிரச்சினைகளைக் கொண்டு ஆட்சி அமைத்தவர்களுக்குத் தீனி போடுகின்ற செயற்பாடாகக் காணப்படுகின்றது. இதன்மூலமாக உண்மையில் இன்று ஏற்பட்டுள்ள கவலைக்கிடமான விடயம் என்னவென்றால், கடந்த கிராம சேவகர் பரீட்சையிலே தோற்றி, அதிசிறந்த பெறுபேறுகளைப் பெற்ற 3 பேர் இவ்வாறான பிரச்சினையின் காரணமாக - அவர்களுடைய நிர்வாக எல்லை ஒரு பிரதேச செயலகத்திலும், காணி அதிகாரம் இன்னொரு பிரதேச செயலகத்திலுமாக இருப்பதன் காரணத்தால் - நேர்முகத் தேர்ச்சியிலே அவர்களுடைய மதிப்பெண்கள் குறைக்கப்பட்டு, வேண்டுமென்றே அவர்களுடைய வேலைகள் பறிக்கப்பட்ட நிலைமை ஏற்பட்டிருப்பதாகும். அந்தப் பரீட்சையில் அவர்கள் சித்திபெற்றும் அவர்களுடைய வாழ்க்கை சூனியமாக்கப்பட்ட நிலைதான் இன்று ஏற்பட்டுள்ளது.

மட்டக்களப்பு மாவட்டத்தில் மொத்தமாக 14 பிரதேச செயலகங்கள் காணப்படுகின்றன. இப்பிரதேச செயலகங்களின் நிர்வாக எல்லைகள் தெளிவாக வரையறுக்கப்பட்டு Gazette செய்யப்படாமையால் நிருவாக ரீதியான சிக்கல்கள் தொடர்ந்தும் காணப்படுகிறது. குறிப்பாக முஸ்லிம் மக்கள் அதிகமாக வாழுகின்ற காத்தான்குடி, ஏறாவூர், கோறளைப்பற்று மேற்கு, கோறளைப்பற்று மத்தி ஆகிய நான்கு பிரதேச செயலகங்களும், இப்பிரதேச செயலகங்களின் எல்லைகளுடன் தமது நிருவாக எல்லைகளைப் பகிர்ந்துகொள்கின்ற, தமிழ் மக்கள் அதிகமாக வாழ்கின்ற பிரதேச செயலகங்களுடன் தமது நிருவாக விடயங்களை மேற்கொள்கின்றபோது பல்வேறு முரண்பாடுகளைச் சந்திக்க வேண்டிய நிலை ஏற்பட்டுள்ளது. இவ்விடயம் குறித்து மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் பேசியும் எவ்விதமான தீர்வும் இல்லாது 'விழலுக்கு இறைத்த நீர் போல' தான் காணப்படுகிறது.

உதாரணமாக, 1993.01.01ஆம் திகதிய 883ஆம் இலக்க வர்த்தமானி மூலமாக கோறளைப்பற்று மேற்கு - ஓட்டமாவடி பிரதேச செயலக நிர்வாகத்திற்கென 176 சதுர கிலோமீற்றர் பரப்பளவு நிலபுலம் Gazette செய்யப்பட்டும், இதுவரை முறையாகக் கையளிக்கப்படாது வெறுமனே 8 கிராம உத்தியோகத்தர் பிரிவுகளுடன் 15 சதுர கிலோமீற்றர் நிலபுலத்துடன் நிருவாகம் நடைபெறுகிறது. சுமார் 156 சதுர கிலோமீற்றர் நிலபுலம் கிரான் பிரதேச செயலக நிருவாகத்தின்கீழ் முறையற்ற விதத்தில் நிருவாகம் செய்யப் படுகிறது. அதேபோன்று, பனம்பலான ஆணைக்குழுவின் தீர்மானத்திற்கு அமைய 2000ஆம் ஆண்டு உருவாக்கப்பட்ட கிரான் - KPS பிரதேச செயலகம் 686 square kilometres நிலபுலத்துடன் நிருவாகம் செய்து வருகின்றது. அதே ஆணைக்குழுவின் சிபாரிசுமூலம் உருவாக்கப்பட்ட கோறளைப்பற்று மத்தி - KPC பிரதேச செயலகத்துக்கு 240 square kilometres நிலபுலம் சிபாரிசு செய்யப் பட்டிருந்தபோதிலும் வெறுமனே 8 square kilometresஇற்குக் குறைவான நிலபுலத்திலேயே நிருவாகம் நடைபெற்று வருகிறது. மொத்தமாக 143,000 முஸ்லிம் சனத்தொகையைக் கொண்ட இந்த நான்கு பிரதேச செயலகத்தின் அதிகாரத்தின்கீழ் மாவட்டத்தின் மொத்த காணிப் பரப்பில் 1.3 சதவீதமான காணிகள் மட்டுமே நிருவாகத்திற்காக வழங்கப்பட்டுள்ளன. அதேபோன்று, 2,624 சதுர கிலோமீற்றர் பரப்பில் வெறுமனே 33 சதுர கிலோமீற்றர் மாத்திரம் குறித்த பிரதேச செயலக அதிகாரத்திற்குட்பட்டதாக எஞ்சியிருக்கிறது. மீதமுள்ள 98.7 சதவீதமானவை ஏனைய 10 பிரதேச செயலக நிர்வாகத்தின் கீழ்க் காணப்படுகிறது.

அண்மையில் 'உறுமய' நிகழ்ச்சித்திட்டத்தின் கீழ் மட்டக்களப்பு மாவட்டத்தில் 27,595 குடும்பங்களுக்குக் காணி உறுதிகள் வழங்கப்பட்டன. இதில் தமிழ்ப் பிரதேச செயலகங்களின்கீழ் வருகின்ற முஸ்லிம் கிராம உத்தியோகத்தர் பிரிவுகளில் காணிகளைக் கொண்டுள்ள முஸ்லிம் மக்கள் வெகுவாகப் புறக்கணிக்கப்பட்டுள்ளார்கள். ஏற்கனவே மானியம் - grant அல்லது அனுமதிப்பத்திரம் - permit ஊடாக நிபந்தனைகளுடன்கூடிய காணியின் உடைமையைக் கொண்டிருப்போருக்குக் குறித்த காணியின் உரிமையை முழுமையாகச் சொந்தமாக்கி அவர்களது பெயரில் உறுதிகள் வழங்கப்பட்டன.

குறிப்பாக, ஏறாவூர்ப்பற்று பிரதேச செயலகத்தின்கீழ் காணி அதிகாரம் உள்ளபடியினால், மிச்நகர், மீராகேணி, ஐயங்கேணி பிரதேசத்தில் 30 வருடங்களுக்குமேல் உறுதி வழங்கப்படாமல் காணி உடைமையைக் கொண்டிருக்கும் முஸ்லிம்கள் 'உறுமய' நிகழ்ச்சித்திட்டத்தின்கீழ்கூட உள்வாங்கப்படாத நிலைமை காணப்படுகிறது. மக்களுக்குத் தேவையான காணிகளை வழங்கும் அதிகாரம் பிரதேச செயலகங்களுக்குரியது. சனாதிபதியின் பணிப்பின் பேரில் grant ஆகவோ, permit அடிப்படையிலோ தேவையுடையவர்களுக்குக் காணியை வழங்குவதற்கு அவர்களது நிர்வாக அதிகாரத்தின்கீழ் காணி இருக்க வேண்டும்.

[ගරු මොහමඩ් සාලි නලීම් මහතා]

අතේපොන්නු, ඒරාවූර් නගර ප්‍රාදේශීය සභාවේ තාවකාලික ඒකාබද්ධයට යටතේ පවතින මීරාකේණි, ඉස්ලාමිය ප්‍රජාව සහ මිශ්‍ර නගර කෘෂිකාර්මික ප්‍රජාව යන ප්‍රජාවන් සඳහා වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒකක 25 වසර ගණනාවක් තිස්සේ ගැසට් කර නොමැතිව පවතින බව මා දන්වා සිටිමි. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒකක ඒරාවූර් නගර ප්‍රාදේශීය සභාවේ ඒකාබද්ධයට යටතේ පවතින අතර, ඒවා පවත්වාගෙන යනු ලබන්නේ ඒරාවූර් නගර ප්‍රාදේශීය සභාවේ සම්පත් භාවිතා කරමිනි. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒකක 25 වසර ගණනාවක් තිස්සේ ගැසට් කර නොමැතිව පවතින අතර, ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් වෙත ඒ පිළිබඳව දැනුම් දීමට ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ගණනාවක් ඇති බව මා දන්වා සිටිමි. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒකක 25 වසර ගණනාවක් තිස්සේ ගැසට් කර නොමැතිව පවතින බව මා දන්වා සිටිමි. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒකක ඒරාවූර් නගර ප්‍රාදේශීය සභාවේ ඒකාබද්ධයට යටතේ පවතින අතර, ඒවා පවත්වාගෙන යනු ලබන්නේ ඒරාවූර් නගර ප්‍රාදේශීය සභාවේ සම්පත් භාවිතා කරමින

එල්ලලා තිබෙන දීමනාව මූලික වැටුපට එකතු කරන්න කියලා. අද මොකද වෙලා තිබෙන්නේ? අද රුපියල් 24,250ක අවම වැටුප රුපියල් 40,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. මා ඒ එකින් එක කියන්න යන්නේ නැහැ. අපේ මන්ත්‍රීවරු ගණනාවක්, ඒ වාගේම අපේ අමාත්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා -මේ හැමෝම- අද දවස පුරාම වැටුප් වැඩි වීම ගැන පැහැදිලි කළා. මේක තවත් නොතේරෙනවා නම් මට තේරෙන්නේ නැහැ, කොහොමද ඒක මේගොල්ලන්ට කියලා දෙන්නේ කියලා. හැබැයි, අපි දන්නවා මේ වැටුප් වැඩි වීම කියන්නේ, මේ රටේ රාජ්‍ය සේවයේ,- *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
The GMOA has suspended the Islandwide token strike until March 21st.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
Thank you very much, GMOA. අන්න, GMOA එක suspend කර තිබෙනවා වැඩ වර්ජනය. මම හිතන්නේ, වැටුප් වැඩිවීම ගැන අද උදේ කියපු එක තේරුම් අරගෙන වෙන්න ඇති. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
GMOA එකත් එක්ක discuss කළාට පස්සේ.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
GMOA එකත් එක්ක අද discuss කළාට පස්සේ ඒ තීරණය අරගෙන තිබෙනවා. අපි ඒ අයට ස්තුතිවන්ත වෙනවා. අපට මේ රටේ වෛද්‍යවරුන් ගැන, මේ රටේ සෞඛ්‍ය සේවාව ගැන ඉතා ඉහළ ඇගැයීමක්, ගරුත්වයක් තිබෙනවා. අපට මතකයි, කොවිඩ් වසංගතය කාලයේ වෛද්‍යවරු ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය කරපු කැපවීම්, ඒ මැදිහත්වීම්. ඒ වාගේම, ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් කරද්දී ඔවුන්ගේ පැත්තෙන් දක්වපු දායකත්වය. අපට මතකයි, සමහර විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඉඳලා සාමාන්‍ය වෛද්‍යවරු දක්වා - මේ හැමෝම - channelling centresවල තමන්ගේ PP එකේදී තමන් ළඟට බෙහෙත් ගන්න එන කෙනා පවා දැනුවත් කරමින් මාලිමාව වෙනුවෙන් - ජාතික ජන බලවේගය වෙනුවෙන් - ඒ කටයුත්ත කළා.

ඇත්තටම ගත්තොත්, ඒ අයගේ වැටුප් අඩුවීමක් වෙලා නැහැ. ඒගොල්ලන්ගේ ප්‍රශ්නය වෙලා තිබුණේ විස්සෙන් එකේ නිවාඩු දින දීමනාව තිහෙන් එක බවට පත් කරපු එක. OT දීමනාව වශයෙන් තිබුණු අසුවෙන් එක එකසිය විස්සෙන් එක කරපු එක. ඒක තමයි ප්‍රශ්නය බවට පත් වෙලා තිබුණේ. ඔවුන් කිව්වේත් වැටුප් වැඩිවීම සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ කියලායි. මා නැවත ඒ ඉලක්කම් කියන්න යන්නේ නැහැ. ඒක ඔවුන්ගේ අභිමානය පිළිබඳ ප්‍රශ්නයක් කියලායි කිව්වේ. ඇත්තටම මට තේරෙන්නේ නැහැ, විස්සෙන් එක තිහෙන් එක කිරීමත්, අසුවෙන් එක එකසිය විස්සෙන් එක කිරීමත් ඇතුළේ අභිමානය නැති වෙන්නේ කොහොමද කියලා. කෙසේ වෙතත්, අපි ඉතා පැහැදිලිව විපක්ෂයේ මහත්වරුවන්ට කියන්න ඕනෑ, අප්‍රේල් වනකල් තව ටික දවසක් ඔය බොරුව කියන්න පුළුවන් කියලා. මේ රටේ රාජ්‍ය සේවකයෝ අප්‍රේල් මාසයේ වැටුප අතට ගන්නකොට විපක්ෂය කියපු බොරුව තේරෙනවා.

ඒ ගොල්ලෝ ගණන් හදන්න පටන් ගත්තේ කොහොමද? ගිය අවුරුද්දේ රනිල් වික්‍රමසිංහ රුපියල් 10,000ක දීමනාවක් ලබා දෙනකොට ජනවාරි, පෙබරවාරි, මාර්තු කියන මාස තුනේ දුන්නේ ඒ දීමනාවෙන් රුපියල් 5,000යි. රුපියල් 5,000 ගණනේ රුපියල් 15,000ක arrears එකක් තිබුණා. ඒ රුපියල් 15,000 අපේ ආණ්ඩුව මේ අවුරුද්දේ ජනවාරි, පෙබරවාරි, මාර්තු කියන මාස තුනට අදාළව ලබා දුන්නා. අපි වැටුප් වැඩි කළත් නැතත්, ලබන අප්‍රේල්වල ඒ දීමනාව ආයෙත් ලැබෙන්නේ නැහැ. වෙන ආණ්ඩුවක් හිටියත් ඒ දීමනාව නැවත ලැබෙන්නේ නැහැ. ඒක නතර වෙනවා. ඒක නතර වුණාම, ඒ ගොල්ලෝ කියනවා, වැටුප් වැඩි වෙන්නේ රුපියල් 975යි කියලා. ඉතින් මට තේරෙන්නේ නැහැ, ඒ අයට අංක ගණිතය කොහොමද උගන්වන්නේ කියලා. ඒ නිසා මම නැවත නැවත කියනවා, මේ බොරුව කියන්න එපා කියලා. මම දන්නේ නැහැ, මේක ගණන් දන්නේ නැතිකම ද, එහෙම නැත්නම් තක්කඩිකම ද කියලා. මේක ගණන් නොදන්නාකම ද, එහෙම නැත්නම් තක්කඩිකම ද කියන දෙකෙන් කෝකද කියන එක රටේ ජනතාව මේ වන කොටත් තේරුම් අරගෙන ඉන්නවා. ඒ නිසා හරි පැහැදිලියි, මේ වැටුප් වැඩි වීම පිළිබඳව.

අපි විශ්වාස කරනවා, මේ වැටුප් වැඩි කිරීමත් ප්‍රමාණවත් නැහැ කියලා. මේ රටේ ජීවන වියදම වැඩිවීමත් එක්ක, උද්ධමනය සියයට 70කින් විතර ඉහළ ගියා. මේවාත් එක්ක ගත්තාම මේ වැටුප් වැඩි වීම ප්‍රමාණවත් නැහැ. හැබැයි, ඔබ දන්නවා, අපි භාර ගත්තේ 2022 අප්‍රේල් මාසයේ 12වන දා බංකොලොත් කියලා ප්‍රකාශයට පත් කරපු, බුන්වත් වෙච්ච රටක් බව. ඊට පස්සේ, මේ ගෙවුණු මාස හතරපහ ඇතුළේ මේ ආර්ථිකය යම් ස්ථායීකරණයකට ගේන්න අපේ ආණ්ඩුව සමත් වුණා. ඒ තත්ත්වය තුළ මාස තුනහතරක් යන කොට පළමුවෙනි අය වැයෙන්ම අපට ලබා දිය හැකි හොඳම වැටුප් වැඩි වීම - සාපේක්ෂව හොඳම වැටුප් වැඩි වීම- අපි ලබා දුන්නා. අපි කියන්නේ නැහැ, මේක හොඳම එක කියලා. නමුත්, සාපේක්ෂව හොඳම වැටුප් වැඩි වීම ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා, වර්තමාන ආණ්ඩුව විධියට. ඒ නිසා තවදුරටත් අපට කියන්න තිබෙන්නේ, සමහරුන්ට තිබෙන මේ මානසික ලෙඩවලට නම් අපට උත්තර දෙන්න බැහැ කියලායි. අපි රටේ ජනතාවගේ - සේවකයන්ගේ- වැටුප් වැඩි කිරීමට යම් උත්සාහයක් දරා තිබෙනවා. නමුත්, මේ මානසික ලෙඩවලට උත්තර දෙන්න අපට බැහැ.

විශ්‍රාම වැටුප සම්බන්ධයෙනුත් කෙටි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම සියයට 75 සිට සියයට 79 දක්වා ප්‍රමාණයකින් විශ්‍රාම වැටුප වැඩි වෙලා තිබෙනවා. මා සතුව තිබෙනවා, ඊට අදාළ chart එකක්. මට ලැබී ඇති කාලයත් එක්ක ඒක කියවන්න වෙලාව නොවෙයි මේ. ඒ නිසා මම ලෑස්තියි මේ chart එක සභාගත කරන්න. විශේෂයෙන්ම අද දවසේ මට මෙය හදලා එවපු අපේ විශ්‍රාමික විදුහල්පතිවරයෙකු වෙච්ච අන්බු ජවහර්ෂ සහෝදරයාට මගේ ගෞරවය මේ වෙලාවේ පුද කරනවා. ආණ්ඩු පක්ෂයේ අය නම් මේ ගැන දන්නවා. විපක්ෂයේ හැමෝගේම දැන ගැනීම සඳහා මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

ඒ වාගේම තමයි මේකෙන් පසුවත් විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් තවදුරටත් නොවිසඳුණු ප්‍රශ්න ටිකක් තිබෙනවා. 1997 සිට 2021 දෙසැම්බර් දක්වා විශ්‍රාම ගිය ගුරු විදුහල්පතිවරු පිරිසක් ඉන්නවා. අපි 2021දී දින 120ක අඛණ්ඩ අරගළයක්

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මහින්ද ජයසිංහ මහතා]

කරලා වැටුප් විෂමතාවෙන් කොටසක් දිනා ගත්තා. ඒක නොලැබුණු පිරිසක් ඉන්නවා. ඒ අයගේ ප්‍රශ්නය මේකෙන් විසඳිලා නැහැ. ඒක විසඳිය යුතු ප්‍රශ්නයක් ලෙස අපට ඉතිරි වෙලා තිබෙනවා. ඒ වාගේම 2020 සිට 2024.12.31 දක්වා විශ්‍රාම ගිය අපේ රාජ්‍ය සේවකයන්ට මේ අය වැය තුළ යම් සහනයක් නැහැ කියන මැසිවිල්ලක් තිබෙනවා. ඔවුන් අපට දිනපතා කථා කරනවා, ලියුම් එවනවා, message කරනවා. ඔව්, අපට ඒ ගැන අවබෝධයක් තිබෙනවා. වැඩ කරන ජනතාව නියෝජනය කරන ආණ්ඩුවක් විධියට, වෘත්තීය සමිති නායකයන් විධියට අපට ඒ ගැන අදහසක් තිබෙනවා. මේක අපේ අවසන් අය වැය නොවෙයි. මේක මේ ආණ්ඩුවේ පළමුවෙනි අය වැය. ඊළඟ අය වැයවලදී ඊට අදාළ අවධානය යොමු කරන්න අපේ පැත්තෙන් අපි මැදිහත් වෙනවා කියන කාරණය සඳහන් කරන්න ඕනෑ.

මේ වැටුප් සංශෝධනය ගැන නොදන්නා අයට, තවමත් අපැහැදිලි අයට අපි කියනවා, මේ අය වැය කථාවේ Annexure V වල මේ සංශෝධනයට අනුව වැටුප් හදන්නේ කොහොමද, වැටුප් තල මොනවාද කියලා පැහැදිලිව සඳහන්ව තිබෙන බව. ඒක අරගෙන බලලා ගණනය කර ගන්න. ඒත් බැරි නම් මම නැවත කියනවා, අවශ්‍ය නම් ඊට අදාළ ටියුෂන් එකක් දෙන්න අපට පුළුවන් කියලා.

සමහරු කියනවා, අපි කරන්නේ පසුගිය අය වැය, පසුගිය ආණ්ඩු විවේචනය කිරීම විතරයි කියලා. එහෙම නැහැ. ඇයි අපි පසුගිය ආණ්ඩු විවේචනය කළේ? පසුගිය ආණ්ඩු කාලවල අපි වැටුප් ඉල්ලා සටන් කළා. ඒ සඳහා අපට සාධාරණ, යුක්තිසහගත අයිතියක් තිබුණා. ඇයි ඒ? පසු ගිය ආණ්ඩු කරපු අය හැමදාම ඔවුන්ගේ දීමනා වැඩි කර ගත්තා. රක්ෂණය රුපියල් 250,000 ඉඳලා මිලියනය දක්වා වැඩි කර ගත්තා. හැමදාම තමන්ට තමන්ගේ හැන්දෙන් බෙදා ගත්තා. රටේ ජනතාව අන්ත දුෂ්කර තත්ත්වයකට පත් වෙලා සිටිද්දී, ඔවුන්ගේ හැන්දෙන් ඔවුන්ට විතරක් බෙදා ගත්තා. ඒ නිසා මේ රටේ වැඩ කරන ජනතාව ඇතුළු අනෙක් අයට සාධාරණ, යුක්තිසහගත අයිතියක් තිබුණා, ඒ අයගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ඒ ආණ්ඩුවලට එරෙහිව සටන් කරන්න. හැබැයි, මේ ආණ්ඩුව මන්ත්‍රීවරුන්ගේ රක්ෂණය රුපියල් මිලියනයේ සිට රුපියල් 250,000 දක්වා අඩු කරපු ආණ්ඩුවක්; වාහන ප්‍රතික්ෂේප කරපු ආණ්ඩුවක්. ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, මේ අවුරුද්දේ මන්ත්‍රීවරුන්ට වාහන නැත කියලා. මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කප්පාදු කර ගත්තු ආණ්ඩුවක්, මේක. එවැනි ආණ්ඩුවක් තමයි අද මේ වැටුප් වැඩි කිරීම ඇතුළු මේ සහන ජනතාවට ලබා දීලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, අපි තවත් කාරණයක් කියන්න ඕනෑ. විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කිව්වා, රාජ්‍ය සේවය දේශපාලනීකරණය කරලා කියලා. මම දන්නේ නැහැ, කොයි පැත්තෙන්ද කථා කරන්නේ කියලා. රාජ්‍ය ආයතනවලට කඩා පැනලා රාජ්‍ය සේවකයන්ට පහර දීපු, රාජ්‍ය සේවකයන් ගස් බඳිද්දී සද්ද නැතුව හිටපු, කටවල් වහගෙන හිටපු මහත්තුරු තමයි අද මේ විධියට කථා කරන්නේ. ඒ වාගේම, ගස් යට ඉඳගෙන උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු කියලා රස්සා දීපු අය තමයි අද රාජ්‍ය සේවයේ දේශපාලනීකරණය ගැන කිඹුල් කඳුළු හෙළන්නේ. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ කම්කරු අමාත්‍යාංශය ගැනත් කිව යුතුයි. මෙවර අය වැය තුළින් අපි කම්කරු දෙපාර්තමේන්තුවට විතරක් රුපියල් මිලියන 598ක වැඩිපුර මුදලක් වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 4,422 ඉඳලා රුපියල් මිලියන 5,020 දක්වා අපේ කම්කරු අමාත්‍යාංශය යටතේ කම්කරු දෙපාර්තමේන්තුවට මෙවර අය වැයෙන් මුදල් වෙන් කරන්න අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, කම්කරු නීතිය හා කම්කරු සබඳතා ක්‍රියාවේ යෙදවීම සඳහා රුපියල් මිලියන 127ක් ද, කම්කරුවන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය සුබසාධනය සඳහා රුපියල් මිලියන 163ක් ද, සේවක අර්ථසාධක අරමුදල සඳහා රුපියල් මිලියන 1,600ක මුදලක් ද අපි වෙන් කර තිබෙනවා. ඒ වාගේම මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සඳහා අපි රුපියල් මිලියන 622ක් වෙන් කර තිබෙනවා.

මේ රටේ වැඩ කරන ජනතාව විවිධ ගැටලුවලට මුහුණ දෙමින් සිටින බව ඇත්ත. විශේෂයෙන්ම සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් ගත්තාම, ඔවුන්ට ගැටලු ගණනාවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අද අපි e-"B" Card - electronic "B" Card - එකක් නිකුත් කරන්න කටයුතු කරගෙන යනවා. එය කරගෙන යන්න ගියාට පසු ගැටලු ගණනාවක් මතු වෙලා තිබෙනවා. ඒවාට අදාළව විසඳුම් හොයන්න ඕනෑ කරන සැලසුම් ටික අපි සකස් කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කම්කරු නීති පිළිබඳවත් යම් ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. අපි ඒ සඳහා සැලසුම් සකස් කර තිබෙනවා. ඉදිරියේ දී ඊට අදාළ නීතිමය රාමුව ශක්තිමත් කරන්න අවශ්‍ය අවධානය යොමු කර තිබෙනවා.

අපේ රටේ පඩි පාලක සභා 44ක් තිබෙනවා. ඒ 44ම ක්‍රියාත්මක නැහැ. සමහර පඩි පාලක සභාවලට අවශ්‍ය පත් කිරීම් කරලා නැහැ; ඒ සභා පත් කරලා නැහැ. ගරු ඇමතිතුමාගේ නාම යෝජනා එක්ක, අපි මේ වනකොට සූදානමින් ඉන්නවා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් පොඩි වෙලාවක් දෙන්න. මොකද, විපක්ෂය කියපු බොරුවලට උත්තර දෙන්නම සෑහෙන වෙලාවක් ගන්න වුණා. ඒ නිසා විපක්ෂයෙන්වත් මට පොඩි වෙලාවක් ඉල්ලා දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
අපි දැන් ඒ පඩි පාලක සභා අලුත් කරලා තිබෙනවා. ඒ පඩි පාලක සභාවල කටයුතු යළි පණ ගන්වන්න ඕනෑ කරන වැඩ කටයුතු මොනවාද කියලා අපි තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම, 2023 ඉඳලා ජාතික කම්කරු උපදේශක සභාව - NLAC එක - පත් කරලා තිබුණේ නැහැ; කැඳවලා තිබුණේ නැහැ. පසුගිය ජනවාරි මාසයේ 15වන දා මමත්, ගරු ඇමතිතුමාත් ජාතික කම්කරු උපදේශක සභාව කැඳවන්න කටයුතු කළා. මේ කාල සීමාවේ අය වැය විවාදය පවතින නිසා අතිශය කාර්ය බහුලයි. මේ අය වැය විවාදයෙන් පසුව යම් නිශ්චිත කාල රාමුවකට අනුව ජාතික කම්කරු උපදේශක සභාව යළි කැඳවමින් අපේ සේවා-සේවක පාර්ශ්ව කැඳවමින් මේ tripartite වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න අපි කල්පනා කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා අව්ධිමත් වැටුප් ගැන. අපි එතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විපක්ෂයේ බොහෝ දෙනෙකු මේ අය වැය විවාදය පුරා විවිධ අඩ ඇඩියාවන් කරද්දී, අපේ මන්ත්‍රීවරයකුගේ මොකක් හෝ වචනයක් අල්ලාගෙන ඒ වචනය ඔස්සේ මුළු මහත් අය වැය විවාදයම ඉදිරියට ගෙන යද්දී විවිධ සාධනීය කරුණු පෙන්වා දීපු, අපේ පැත්තෙන් කළ යුතු දේවල් පෙන්වා දීපු විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සිටියා. අපි එතුමන්ලාට ගරු කරනවා. මට මතකයි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා අව්ධිමත් වැටුප් ගැන කරුණු පෙන්වා දුන්නා, ඒ සේවකයන්ට EPF නැහැ කියලා. ඔව්, අපි ඒ පිළිබඳ සාකච්ඡාවක නිරත වෙනවා. අපි ඒ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි, අපේ ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය. අද අපේ රටේ ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය සියයට 31යි. එය වැඩි කරන්න අවශ්‍ය කරන නීති රාමු ගේන්න, ILO Conventions අපේ රට තුළ ක්‍රියාවේ නහන්න ඕනෑ කරන සැලසුම් පිළිබඳව අපි සාකච්ඡා කරමින් තිබෙනවා. ඒ වාගේම, මේ ශ්‍රම බලකායට කාන්තා සහභාගිත්වය අඩු වෙන්න එක හේතුවක් වෙලා තිබෙනවා, මාතෘ ප්‍රතිලාභ හෙවත් Maternity Protection Convention එක අපේ රට තුළට අනුගත නොවීම. ඒ නිසා අපි ඒ පිළිබඳව සාකච්ඡා කරමින් තිබෙනවා. ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය නීතිමය රාමුව ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, ළමා ශ්‍රමය රටින් තුරන් කළ යුතුව තිබෙනවා. ළමා ශ්‍රමය රටින් තුරන් කිරීම සඳහා අවශ්‍ය අවධානය අපේ පැත්තෙන් යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි, EPF එකේ ප්‍රතිලාභ ලබද්දී ඒකෙන් සියයට 30ක් ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ සියයට 30 අරගෙන, නැවත සියයට 30ක් ගන්න නම් වසර 10ක කාලයක් ගත වෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, ඒ සඳහා විවිධ කොන්දේසි දාලා තිබෙනවා. සමහර විට ඒ කොන්දේසි නිසාම, විවිධ කූට ලේඛන හදන්න අපේ රටේ වැඩ කරන පන්තියේ EPF එක හිමි අය කටයුතු කරමින් සිටිනවා. අපි ඒ පිළිබඳව අපේ අවධානය යොමු කරලා තිබෙනවා. ඒ විධියට කූට ලේඛන හදලා ඒ මුදල ගන්නත් ඔවුන්ට තව අමතර මුදලක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ වසර දහය ටිට වඩා අඩු කරන්න, වසර පහක් දක්වා අඩු කරන්න කියලා විවිධ විධියට සේවකයන් අපෙන් ඉල්ලීම් කරලා තිබුණා. ඒ කාලය අඩු කිරීම සඳහා පනත් සංශෝධනයකට යන්න අපට පුළුවන්කම තිබෙනවාද කියලා අපි කම්කරු අමාත්‍යාංශයේ ලේකම්තුමා, කම්කරු කොමසාරිස් ජනරාල්තුමා ඇතුළු නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින් සිටිනවා.

ටිට අමතරව ගත්තොත්, වැඩ බිමේ ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳව විවිධ ගැටලු මතු වෙලා තිබෙනවා. අපි පසු ගිය දවස්වල ඒකල NERD ආයතනය තුළ වැඩමුළුවක් දියත් කළා, වැඩබිමේ ආරක්ෂාවත්, සෞඛ්‍යයත් රැක ගන්නේ කොහොමද කියලා. සමහර වෘත්තීන් නිසා හැදෙන විවිධ ලෙඩ රෝග තිබෙනවා. ඒවා පිළිබඳ අපේ අවධානය යොමු කරලා තිබෙනවා. අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, දීප ව්‍යාප්තව ඒ ගැන අපේ රටේ වැඩ කරන ජනතාව දැනුවත් කරමින්, ඔවුන් කොහොමද වැඩබිම තුළ ආරක්ෂා වෙන්නේ, කරන රැකියාව නිසාම, වෘත්තිය නිසා හැදෙන ලෙඩ රෝගවලින් මිදෙන්නේ කොහොමද කියන එක පිළිබඳව වැඩමුළු දියත් කරන්න. කම්කරු අමාත්‍යාංශය ලෙස අපේ අමාත්‍යාංශය සතු ආයතන හයක් තිබෙනවා. ඒ ආයතන හයම පදනම් කරගෙන, ඉදිරියේදී ඒ ආයතන වඩාත් හොඳට, සුමටව මෙහෙයවමින් ඉදිරියට ගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

කම්කරු අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අද දවසේ කරන මේ විවාදය තුළදී මම කලින් කිව්වා වාගේ, විපක්ෂය පැත්තෙන් සඳහන් කරපු සාධනීය යෝජනා අගය කරන අතරම, අපට ඕනෑ ආණ්ඩුවේ අඩු පාඩු නිවැරැදිව, සාධනීය ලෙස විවේචනය කරන විපක්ෂයක් මිස, හැමදාම වචනයක් දෙකක් අල්ලාගෙන තඩි බාන විපක්ෂයක් නොවෙයි කියන එක අපි නැවත නැවත කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මේ අමාත්‍යාංශ දෙකේම වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී පැන නැඟුණු සාධනීය කරුණු අපි ඉදිරි ගමනට ඉවහල් කර ගන්නත් සූදානම් කියන පණිවුඩයත් ලබා දෙමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතරක කාලයක් ලැබෙනවා.

Order, please! ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු අරවින්ද සෙනරත් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (පේරාසිරියර්) සේන නාණායක්කාර අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. ARAVINDA SENARATH left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[ප.ව. 4.53]

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(මාණ්පුමිකු (කලානිති) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொதுநிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மிகவும் சந்தோஷமடை கின்றேன். இந்த அமைச்சானது, இந்த நாட்டின் நிர்வாகத்தில் முக்கிய பங்கு வகிக்கின்ற ஓர் அமைச்சாகும். நிர்வாகம் சார்ந்த பல்வேறுபட்ட பிரச்சினைகள் பல ஆண்டுகளாகியும் இன்னும் தீர்க்கப்படாமல் இருக்கின்றன. அவை நீங்கள் ஆட்சிக்கு வந்த பின்னர் உருவான பிரச்சினைகள் அல்ல. அவை நீண்ட காலமாக ஒவ்வொரு மாவட்டத்திலும் ஒவ்வொரு பிரதேசத்திலும் இருந்துவருகின்ற பிரச்சினைகளாகும். கடந்த ஆட்சிக் காலத்தில் தீர்க்கப்படவில்லை என்பதற்காகத் தொடர்ந்தும் அவற்றை நீடிக்கச் செய்வது நல்ல விடயமல்ல. மக்கள் நம்பிக்கைவைத்தே உங்களை ஆட்சிக்குக் கொண்டுவந்து இருக்கிறார்கள். ஆகவே, அந்தப் பிரச்சினை களைத் தீர்த்துவைப்பதற்கு கௌரவ அமைச்சர் அவர்களும் கௌரவ பிரதி அமைச்சர் அவர்களும் அமைச்சின் செயலாளர் மற்றும் உத்தியோகத்தர்களும் உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தில் கோரளைப்பற்று மத்தி என்று ஒரு பிரதேச

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

செயலகம் இருக்கின்றது. அதற்கான எல்லைகள் இன்னும் வரையறுக்கப்படவில்லை. Panambalana Commission என்ற பெயரில் ஓர் ஆணைக்குழு நியமிக்கப்பட்டது. அந்த ஆணைக்குழு நாடளாவிய ரீதியில் சிபாரிசுகளைச் செய்தது. அந்த சிபாரிசுகளின் அடிப்படையில், நாட்டின் பல்வேறுபட்ட பிரதேசங்களிலுள்ள பிரச்சினைகள் தீர்க்கப்பட்டபோதிலும், இன்னும் Koralaipattu Central Divisional Secretariatக்குரிய பிரதேச சபை உருவாக்கப்படவில்லை. இவ்வாறான நிலையில்தான் அந்தப் பிரதேச செயலகம் செயற்பட்டுக் கொண்டு இருக்கின்றது. எனவே, Panambalana Commission Reportஇல் சொல்லப்பட்ட விடயங்களின் பிரகாரம், உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென நான் உங்களை அன்பாக வேண்டுகின்றேன். அதேபோன்று, மட்டக்களப்பு மாவட்டத்திலுள்ள பல பிரதேச செயலகங்களின் எல்லைகள் இன்னும் வரையறுக்கப்படவில்லை. யுத்தம் காரணமாக ஏற்பட்ட பிரச்சினைகளால், நிர்வாகம் சம்பந்த மான விடயங்கள் ஒரு பிரதேச செயலகத்திலும், காணி சம்பந்தமான விடயங்கள் இன்னொரு பிரதேச செயலகத்திலும் மேற்கொள்ளப்படுகின்றன. ஆகவே, நீங்கள் உங்களுடைய அமைச்சினூடாக special committee ஒன்றை நியமித்து, இந்தப் பிரச்சினைக்கு நிரந்தரத் தீர்வைக் காண வேண்டுமென மிகவும் அன்போடு கேட்டுக்கொள்கின்றேன்.

I would like to bring to the Hon. Minister's attention that government employees now in service are to get a salary increase in addition to the allowances amounting to Rs. 7,500 being added to the basic salary, as per the Proposal in Budget, 2025. At the same time, a Proposal has also been submitted to revise the pensions of government employees who had retired between 1996 and 31.12.2019, but employees who had retired after 01st Janurary, 2020 and due to retire up to 31st March, 2025 have been overlooked in the Budget, 2025. With the present financial situation in our country and the escalating cost of living, the pensioners who had retired after 01st Janurary, 2020 and due to retire upto 31st March, 2025 are struggling to manage their cost of living and other expenses. Hon. Minister, I would like to request you to consider the letter received from the Oddamavadi Pensioners' Association and I would submit the letter to you. Hon. Minister. Please, kindly consider their request also favourably.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මීරාසාහිබු උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.57]

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலே இந்த நாட்டினுடைய நிர்வாகத்தையும் நல்ல செயற்பாடுகளையும் முன்னெடுக்கின்ற ஓர் அமைச்சாக பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு இருக்கின்றது. இந்த அமைச்சினுடைய அமைச்சரும் செயலாளர் மற்றும் அதிகாரிகளும் உண்மையிலேயே சிறந்த முறையில் பணியாற்றிக் கொண்டிருக்கின்றார்கள். புதிதாக நியமனம் செய்யப்பட்டிருக்கின்ற அமைச்சர்களில் இன்னும் அதிகமான அனுபவங்களைப் பெறாத சிலர் அல்லது பலர் இருக்கிறார்கள். அதேநேரம், பக்குவப்பட்ட முறையிலே எல்லோருடைய ஆலோசனைகளையும் கருத்துகளையும் கேட்டு, ஜனநாயக முறையிலே செயற்பாடுகளை முன்னெடுக் கின்ற அமைச்சர்களும் இருக்கிறார்கள். அந்த வரிசையிலே இருக்கின்ற எங்களுடைய பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்களுக்கும் அமைச்சின் செயலாளர் உட்பட அதிகாரிகள் எல்லோருக்கும் அவர்களது நல்ல செயற்பாடுகளுக்காக இச்சந்தர்ப்பத்தில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று மாகாண சபை முறை தொடர்பாக இங்கே பல பிரதிநிதிகள் பேசினார்கள். உண்மையிலே வடக்கு, கிழக்கு மக்களுக்காக மாகாண சபை முறைமை ஏற்படுத்தப்பட்டு, இந்த நாட்டிலே இருக்கின்ற 9 மாகாண சபைகளுக்கும் அதிகாரங்கள் வழங்கப்பட்டன. அதன்மூலம் மத்திய அரசாங்கம் பாராளுமன்றத்தின்மூலம் செய்கின்ற நடவடிக்கைகளுக்கு மேலதிகமாக மாகாண சபைகள் தம் அதிகாரங்களைப் பயன்படுத்தி மக்களுக்குப் பணி செய்யக்கூடிய நிலைமை ஏற்பட்டது. துரதிருஷ்டவசமாக மாகாண சபைகளிடமிருந்த சில அதிகாரங்களை மீண்டும் பாராளுமன்றத்திற்குக் கொடுத்ததனால், நீண்ட காலமாக மாகாண சபைத் தேர்தல் நடைபெறாமல் இருக்கின்றது. எல்லோருடைய எண்ணமும் மாகாண சபைத் தேர்தல் நடைபெற்று, அதிகாரங்கள் பரவலாக்கப்பட வேண்டும் என்பதுதான். அதைத்தான் மக்கள் எதிர்பார்த்துக் கொண்டிருக்கிறார்கள். எனவே, இந்தத் தேர்தலை நடாத்துவதற்குரிய ஏற்பாடுகளை இந்த அமைச்சு செய்யவேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்ததாக, எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங் களிலே பாரிய பிரச்சினைகள் இருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, இன்று முஸ்லிம், தமிழ்க் கட்சிகளின் தலைவர்களும், மக்கள் பிரதிநிதிகளும் இந்தச் சபையிலே சில பிரச்சினைகளைச் சொன்னார்கள். குறிப்பாக, அம்பாறை மாவட்டத்திலே கல்முனை வடக்கு பிரதேச செயலகப் பிரச்சினையைச் சொன்னார்கள்; மட்டக்களப்பு மாவட்டத்திலே கோரளைப்பற்று பிரதேச சபைப் பிரச்சினையைச் சொன்னார்கள். அதுபோல, திருகோணமலை மாவட்டத்திலே உள்ள உப பிரதேச செயலகத்தைப் பிரதேச செயலகமாகத் தரமுயர்த்த வேண்டிய பொறுப்பு இருக்கின்றது. இவ்வாறு பல காணிப் பிரச்சினைகள், நிர்வாகப் பிரச்சினைகள், எல்லைப் பிரச்சினைகள் இருக்கின்றன. இவ்வாறான எல்லாப் பிரச்சினைகளுக்கும் தீர்வு காண நாங்கள் தமிழ் பேசும் முஸ்லிம், தமிழ் மக்கள் ஒன்றிணைந்து பேச்சுவார்த்தைகளை மேற்கொண்டிருக்கின்றோம்; நாங்கள் தமிழ்த் தலைவர்களிடம் எமது பிரச்சினைகளை வெளிப்படையாகச் சொல்லியிருக்கின்றோம். ஒரு தேர்தலிலே வெற்றி பெறவேண்டும் என்பதற்காகத் தமிழ் மக்களிடமோ, முஸ்லிம் மக்களிடமோ இனவாதத்தைப் பரப்ப வேண்டிய எந்தத் தேவையும் எங்களுக்கு இல்லை. சமூக மட்டத்தில் இருக்கின்ற பிரச்சினைகளை, இரண்டு சமூகப் பிரதிநிதிகளையும் புத்திஜீவிகளையும் அழைத்துப் பேசி, அதற்குத் தீர்வு காண்பதற்காகத்தான் நாங்கள் முயற்சி செய்து கொண்டிருக்கின்றோம்.

இந்த அரசாங்கத்தினுடைய ஒரு நல்ல பணியையும் நான் சொல்லவேண்டும். அதாவது, முழுமையாக - 90% இனவாதம் நிலவிய இந்த நாட்டில் இப்போது 50 - 60% இனவாதம் இல்லாமற் செய்யப்பட்டிருக்கின்றது. இனங்களுக்கிடையே நடைபெற்ற யுத்தத்தால் 30 ஆண்டு காலமாக நாங்கள் பாதிக்கப்பட்டோம். அப்போது மக்களுக்குப் பேசுவதற்குச் சுதந்திரம் இல்லை; தேர்தலில் நிற்பதற்குச் சுதந்திரம் இல்லை; மனிதர்களை நாய் போல் சுட்டுக்கொன்றார்கள். அந்தப் பிரதேசங்களிலே இருக்கின்ற மூவின மக்களுக்கும் பிரச்சினை இருக்கின்றது. சிங்கள மக்களுக்கும் எல்லைப் பிரச்சினை இருக்கின்றது; தமிழ் மக்களுக்கும் பிரச்சினை இருக்கின்றது; முஸ்லிம் மக்களுக்கும் பிரச்சினை இருக்கின்றது. நான் இங்கு கூறியபடி, இனவாதம் இல்லாமற் செய்யப்பட்டிருக்கின்ற இந்தக் காலகட்டத்திலே பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சுப் பொறுப்பைத் தாங்கியுள்ள நீங்கள், அந்த மூவின மக்களுக்குமான பிரச்சினைகளைப் பேசி, அவற்றுக்குத் தீர்வுகாண வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன். பாராளுமன்றத்திலே ஒருவர் வீரமாகப் பேசுகிறார் என்பதற்காக, நான் இங்கே பேசுகிறேன் என்பதற்காக, நீங்கள் எமது முஸ்லிம் சமூகத்திற்கு ஒத்துழைப்பு வழங்கத் தேவையில்லை. எல்லாச் சமூகங்களுடைய உணர்வுகளையும் மதித்து, அவர்களுடைய பிரச்சினைகளை உணர்ந்துகொண்டு ஒரு தீர்வுக்கு வரவேண்டுமென்று நான் மிகவும் கௌரவமாக இந்த அமைச்சையும் அமைச்சினுடைய அதிகாரிகளையும் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்ததாக, சாய்ந்தமருதிலே ஒரு பிரதேச சபையை உருவாக்குவதாகக் கூறி, நீண்ட காலமாக அந்த மக்கள் ஏமாற்றப்பட்டு வருகின்றார்கள். முன்னாள் சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள், அவர் ஆட்சிக்கு வருவதற்கு முன்பு, கல்முனை, சந்தாங்கேணி விளையாட்டு மைதானத்திலே நடைபெற்ற ஒரு நிகழ்வில் பேசியபோது, "நான் ஆட்சிக்கு வந்தால் சாய்ந்தமருது பிரதேச சபையைத் தருவேன்" என்று சொன்னார்; ஏமாற்றினார். அவரது ஆட்சிக் காலத்தில் அவரால் அதைச் செய்யமுடியவில்லை. முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய காலத்திலே அந்தப் பிரதேசத்துக்கான நகர சபை உருவாக்கம் தொடர்பாக ஒரு வர்த்தமானி அறிவித்தல் பிரசுரிக்கப்பட்டது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා මට තව විනාඩි දෙකක් අරගෙන දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, කථා කරන්න.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ஆனால், வேறு சிலர் தடுத்ததன் காரணமாகவும், சில அரசியல் காரணங்களுக்காகவும் அது இடைநிறுத்தம் செய்யப்பட்டது. அதனைத் தொடர்ந்து மீண்டும் கோட்டாபய அவர்களின் அரசாங்கம் வந்தபோது, சாய்ந்தமருது நகரசபை உருவாக்கம் தொடர்பான வர்த்தமானி இரத்துச் செய்யப்பட்டது; அண்ணன் வெளியிட்ட வர்த்தமானியைத் தம்பி இரத்துச் செய்தார். இதனால் அந்த மக்களுக்கு நியாயமாகக் கிடைக்கவேண்டிய சாய்ந்தமருது பிரதேசத்துக்கான உள்ளூராட்சிச் சபை இன்னும் வழங்கப்படாமல் இருக்கின்றது. எனவே, அது சம்பந்தமாக கௌரவ அமைச்சர் அவர்கள் தலையிட்டு, அந்த மக்களுடைய பிரச்சினையைத் தீர்க்க வேண்டுமென்று கேட்டுக்கொள்வதோடு, மேலும் ஒரேயொரு விடயத்தைச் சொல்லி எனது பேச்சை முடிக்கின்றேன்.

இப்போது பிரதேச மட்டத்தில் நாங்கள் DCC கூட்டங்களை நடாத்திக் கொண்டிருக்கின்றோம். அந்தக் கூட்டங்களை ஆகக்கூடியது 2½ அல்லது 3 மணித்தியாலங்களுக்குள் நடாத்த வேண்டுமென்று பொது நிருவாக அமைச்சினுடைய சுற்றுநிருபம் சொல்கிறது. ஆனால், அண்மையிலே சம்மாந்துறை, அட்டாளைச்சேனை, காரைதீவு, நிந்தவூர், பொத்துவில், அக்கரைப்பற்று போன்ற பிரதேசங்களில் நடைபெற்ற DCC கூட்டங்கள் 4 - 5 - 5½ மணித்தியாலங்கள் வரை நடைபெற்றிருந்தது. காலை 9.00 மணிக்கு ஆரம்பித்தால், பி.ப. 3.15 - 4.00 மணியளவில் முடிக்கின்றார்கள். அதனால் அங்கு வந்திருந்த திணைக்களத் தலைவர்களுக்கு - heads of departments - சாப்பிடக்கூட முடியாத நிலை இருந்தது.

நான் ஒரு பிரதேச சபையினுடைய தவிசாளராகவும், கிழக்கு மாகாண சபையில் இரண்டு தடவை அமைச்சராகவும் இருந்து, தற்போது பாராளுமன்ற உறுப்பினராக இருக்கின்றேன். நான் எத்தனையோ DCC கூட்டங்களுக்குப் போயிருக்கிறேன். அங்கு வரும் திணைக்களத் தலைவர்கள் இந்த அரசாங்கத்திடம் இதுபற்றிக் குறிப்பிடுமாறு என்னிடம் கூறியுள்ளார்கள். எனவே, இந்த DCC கூட்டங்களை இரண்டரை - மூன்று மணித்தியாலங்கள் வரை நடத்தலாம் என்பதை அமுல்படுத்த பொது நிருவாக அமைச்சு ஏற்பாடு செய்யவேண்டும்.

அது மாத்திரமல்லாமல், DCC கூட்டங்களுக்கு ஒரு பாராளுமன்ற உறுப்பினரோடு 10 பேர் வருகின்றார்கள்; ஒரு மணித்தியாலம் - ஒன்றரை மணித்தியாலம் நடைபெறும் கூட்டத்தில் பேசும்போது குறுக்கீடு செய்கிறார்கள். இது உண்மையில் பொது நிருவாக அமைச்சின் சுற்றுநிருபத்திற்கு மாறான விடயமாகும். அப்படியானால் எங்களுக்கும் அதற்கு அனுமதி தரவேண்டும். குறுக்கீடு செய்ய அனுமதிக்காவிட்டாலும் பரவாயில்லை; எங்களுக்கும் பலரை அழைத்துச்செல்ல அனுமதி தரவேண்டும். எனவே, ஒரு பாராளுமன்ற உறுப்பினருடன் அவரது செயலாளர் அல்லது யாராவது ஒரு பிரதிநிதி போக வேண்டும். இவ்வாறு பத்துப் பேர் வந்து குறுக்கீடு செய்வது பொது நிருவாக அமைச்சின் நடவடிக்கைக்கு அவமானமாக இருக்கின்றது. இதைப்பற்றிப் பேசுமாறு பிரதேச செயலாளர்கள் எங்களிடம் சொல்லுகின்றார்கள். எனவே, கௌரவ பொது நிருவாக அமைச்சர் உடனடியாக இது சம்பந்தமாக நடவடிக்கை எடுத்து, இதற்கு ஒரு கட்டுப்பாட்டை விதிப்பதுடன், DCC கூட்டங்கள் நடத்தப்படும் காலத்தையும் வரையறை செய்ய வேண்டும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலே வெள்ளம் வந்தால், ஒரு கஷ்டம் வந்தால், ஒரு பிரச்சினை நடந்தால் நாங்கள் மூன்று - நான்கு மணித்தியாலம் அல்ல, ஐந்தாறு மணித்தியாலம்வரைகூட பேசலாம். அக்கரைப்பற்றுப் பிரதேச செயலகத்தில் நடைபெற்ற கூட்டத்தில் கலந்துகொண்ட விவசாயக் குழுத் தலைவர் ஒருவர்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

சாப்பாடு இல்லாமல் மயங்கி விழுந்துவிட்டார். இவ்வாறான செயற்பாடுகளினால் அரசாங்கத்திற்கும் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் அவமானம் ஏற்படுகின்றது. இதை நீங்கள் செய்யவில்லையென்றால், இது தொடர்பில் நான் சனாதிபதி அவர்களிடம் முறையிடுவேன் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி. வஸ்ஸலாம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.05]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அமைச்சினுடைய விவாதத்திலே கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் தந்ததற்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நான் பிரதிநிதித்துவப்படுத்தும் வவுனியா மாவட்டத்திலே, வவுனியா வடக்கு பிரதேச செயலாளர் பிரிவு என்ற ஒரு பிரிவு இருக்கின்றது. அந்தப் பிரதேச செயலாளர் பிரிவில் 20 கிராம சேவையாளர் பிரிவுகள் இருக்கின்றன. எங்களுடைய வவுனியா வடக்கு பிரதேச செயலாளர் பிரிவு உள்ளடக்கப்படுகின்ற வவுனியா வடக்கு பிரதேச சபைக்கு ஒரு வித்தியாசமான முறையிலே மக்கள் பிரதிநிதிகள் தேர்ந்தெடுக்கப் படுகின்றார்கள். எங்களுடைய மாவட்டத்திற்கு அயலில் இருக்கின்ற மணலாறு பிரதேச செயலாளர் பிரிவில் 14 கிராம சேவையாளர் பிரிவுகள் இருக்கின்றன. அந்த 14 கிராம சேவையாளர் பிரிவில் இருக்கின்ற 5 கிராம சேவையாளர் பிரிவுகளை எடுத்து, அவற்றை நான்கு வட்டாரங்களாகப் பிரித்து, அவற்றை வவுனியா வடக்கு பிரதேச சபையினுடைய வட்டாரங்களாகக் கணித்து, தேர்தல்களில் அந்த மக்கள் பங்குபெறச் செய்யப்படுகிறார்கள். அதேமாதிரி, அதே பிரதேச செயலகப் பிரிவில் இருக்கின்ற 9 கிராம சேவையாளர் பிரிவுகளை ஒரு வட்டாரமாக எடுத்து கரைதுறைப்பற்று பிரதேச சபைக்கான தேர்தலில் வாக்களிக்கச் செய்யப்படுகின்றார்கள்.

இது ஒரு வினோதமான செயற்பாடு! இலங்கையில் எங்கேயும் நடைபெறாத செயற்பாடு என்று நான் நினைக்கின்றேன். முல்லைத்தீவு மாவட்டத்தினுடைய ஒரு நிர்வாக அலகாக இருக்கின்ற மணலாறு பிரதேச செயலாளர் பிரிவில் இருக்கின்ற 5 வட்டாரங்களில் ஒரு வட்டாரம் கரைதுறைப்பற்று பிரதேச சபையினுடைய ஆதிக்கத்தின் கீழும், 4 வட்டாரங்கள் வவுனியா வடக்கு பிரதேச சபையினுடைய ஆதிக்கத்தின் கீழும் இருக்கின்றது. இது ஒரு வித்தியாசமான செயற்பாடு! இது முழுமையாக அரசியல் நோக்கத்திற்காகக் கடந்த அரசாங்கங்களினால் செய்யப்பட்ட ஒரு செயற்பாடு!

வெலிஓயா - மணலாறு என்று சொல்லப்படுகின்ற பிரதேச செயலாளர் பிரிவானது 1980ஆம் ஆண்டுகளிலே வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களின் காணிகளை எடுத்து, அங்கு கொண்டுவந்து மக்களைக் குடியேற்றி உருவாக்கப்பட்ட ஒரு பிரதேச செயலாளர் பிரிவாகும். கிட்டத்தட்ட பதினையாயிரம் மக்கள் அந்த பிரதேச செயலாளர் பிரிவில் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அவர்கள் தங்களுடைய சேவையைப் பெறுவதற்கு அவர்களுக்கு ஒரு பிரதேச சபை உருவாக்கப்பட வேண்டும். அந்த மக்கள் ஒரு நிர்வாக மாவட்டத்திற்குக் கீழ் இருந்துகொண்டு, இன்னுமொரு நிர்வாக மாவட்டத்திற்கு வந்து வாக்களித்து பிரதேச சபைக்கு உறுப்பினர்களைத் தெரிவு செய்கிறார்கள். அதனால் அந்த மக்கள் பல துன்பங்களை அனுபவிக்கின்றார்கள். அவர்கள் கச்சேரிக்கு மூல்லைத்தீவுக்குப் போக வேண்டும்; பிரதேச சபைக்கு வவுனியாவுக்கு வரவேண்டும். இந்த நடவடிக்கையை அமைச்சர் அவர்கள் தலையிட்டு உடனடியாக நிறுத்த வேண்டும். உண்மையாக அந்த மக்கள் மிகவும் கஷ்டமான சூழ்நிலையில் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அவர்களுக்கான பிரதேச சபை அமைக்கப்பட வேண்டும். அந்த மக்கள் அந்த பிரதேச சபையில் உறுப்பினர்களாக இருந்து, தங்களுடைய பிரதேசத்தை அபிவிருத்தி செய்வதற்கான வசதியை இந்த அரசாங்கமாவது ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அரசியல் நோக்கத்திற்காக அவர்களை அங்கேயும் இங்கேயும் பந்தாடுகின்ற வேலையை நிறுத்த தயவுசெய்து இந்த அரசாங்கம் - கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, வவுனியா வடக்குப் பிரதேச செயலாளர் பிரிவில் மாத்திரம் 26 கிராம சேவை உத்தியோகத்தர்களுக்குரிய வெற்றிடங்கள் காணப்படுகின்றன. இதனால் அங்குள்ள மக்கள் தமது சேவைகளைப் பெறுவதில் மிகவும் மோசமாகப் பாதிக்கப்படுகின்றனர். தயவுசெய்து கௌரவ அமைச்சர் அவர்கள் 26 கிராம சேவையாளர்களையும் நியமிப்பதற்கு ஏற்பாடு செய்ய வேண்டும்.

வவுனியா கச்சேரியானது, 1938ஆம் ஆண்டில் கட்டப்பட்ட பழைமையான கட்டிடமாகும். ஏனைய மாவட்டங்களுக்கு கச்சேரிக்கான நிதி ஒதுக்கப்பட்டு புதிய மாவட்டச் செயலகக் கட்டங்கள் கட்டப்பட்டிருக்கின்றன. அந்த வகையில், எமது மாவட்டக் கச்சேரிக்குப் புதிய கட்டிடத்தைக் கட்டுவதற்காக நிதி ஒதுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

அதுபோல, மன்னார் மாவட்டக் கச்சேரியில் பாரிய ஊழியர் பற்றாக்குறை - human resource shortage காணப்படுகின்றது. அங்கு அபிவிருத்திக் குழுக் கூட்டங்களுக்குப் போகும்போது இந்தக் குறைபாடுகள் எங்களுக்குச் சொல்லப்படுகின்றது. அந்தக் கச்சேரியில் drivers 7 பேருக்கான வெற்றிடம் காணப்படுகின்றது. Technical officersக்கான cadre 7 ஆகக் காணப்படுவதோடு, அவை அனைத்தும் வெற்றிடமாகவே இருக்கின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Sir, please give me one more minute.

Management Assistant பதவிக்கு 66 வெற்றிடங்கள் காணப்படுகின்றன; OESஇல் 26 வெற்றிடங்களும் கிராம சேவை உத்தியோகத்தர் 18 வெற்றிடங்களும் காணப்படுகின்றன. இதற்கு மேலதிகமாக, அனர்த்த

முகாமைத்துவப் பிரிவு, சிறுதொழில் முயற்சியாளர் பிரிவு, வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரிவு போன்றவற்றுக்கான cadre fullஆக இருந்தாலும், அவர்கள் மன்னார் மாவட்டத்தில் கடமை புரியவில்லை. அவர்கள் திணைக்களத்திற்கூடாகச் சம்பளத்தைப் பெறுவதால், political influenceஇனைப் பாவித்து வேறு மாவட்டங்களில் கடமையாற்றிக்கொண்டு, சம்பள pay sheetsஇனை sign பண்ணுவதற்கு மாத்திரம் அங்கு GA இடம் வருகிறார்கள். ஆனபடியால், தயவுசெய்து இந்த விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள், மன்னார் மாவட்டத்தில் அனர்த்த முகாமைத்துவப் பிரிவு, சிறுதொழில் முயற்சியாளர் பிரிவு, வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரிவு மற்றும் மனித வலு, வேலைவாய்ப்புப் பிரிவு ஆகியவற்றில் கடமையாற்றுவதற்கு நியமிக்கப்பட்ட ஊழியர்களைத் தயவுசெய்து அந்த மாவட்டத்திலேயே கடமையாற்ற ஆவன செய்யுமாறு கேட்டுக்கொண்டு, நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රුවන් සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.11]

ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කම්කරු අමාත්‍යාංශයේත්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ විවාදයට ලක් කරනවා. විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය පිළිබඳව අද වැඩි වශයෙන් කථා කෙරුණා. මට ලැබී තිබෙන කාල සීමාව තුළ මම බලාපොරොත්තු වෙනවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව මූලික කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න.

අපි දන්නවා, පළාත් සභා 9ක් සහ ඒ යටතේ ඇති පළාත් පාලන ආයතන 341ක් නියෝජනය කරමින් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සකස් වෙලා තිබෙන බව. 2025 නව අය වැයෙන් රුපියල් මිලියන 22,789ක් වෙන් වෙලා තිබෙනවා, පළාත් පාලන ආයතන සඳහා. අපි දන්නවා, මේ මුදල මේ වතාවේ වෙන් කරපු වැඩිම මුදල කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශයට, අධ්‍යාපන අමාත්‍යාංශයට වාගේම පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මේ කියන විෂයය සඳහාත් මෙවර අය වැයෙන් අතිවිශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ වසරේ වෙන් කරන ලද ඒ මුදලින් මංමාවත් ඇතුළු ග්‍රාමීය ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් ටික ඉතා කඩිනමින් ලබා දෙන්න. විශේෂයෙන්ම උතුරු-නැගෙනහිර පළාත්වල ජීවත් වන ප්‍රජාවගේ යටිතල පහසුකම් නැංවීම සඳහා ග්‍රාමීය මාර්ග හා පාලම් ඉදි කිරීම වෙනුවෙන් එම පළාත් පාලන ආයතනවලට රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා.

උතුරු පළාත හා ඌව පළාත කේන්ද්‍ර කරගෙන තිරසාර ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කොරියානු රජය විශේෂ අවධානය යොමු කරලා අපට ඩොලර් මිලියන 10ක ප්‍රදානයක් ලබා දීලා තිබෙනවා. එය 2025, 2026, 2027 කියන වසර සඳහා තමයි ලබා දෙන්නේ. 2025 වසර සඳහා එයින් රුපියල් මිලියන 138ක් අපට ලැබෙනවා, මේ කටයුතු ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම තමයි, ඉන්දියානු බහු වාර්ෂික ප්‍රදාන හා ආධාර යටතේ නැගෙනහිර පළාතට අධ්‍යාපනය, සෞඛ්‍ය ඇතුළු මූලික අවශ්‍යතා ලබා දීමේ දැවැන්ත සංවර්ධන සැලැස්මක් වෙනුවෙන් ඉන්දියානු රජය විශේෂ මැදිහත්වීමක් කරනවා.

Clean Sri Lanka වැඩසටහන කියන්නේ අපි ආරම්භ කරපු දැවැන්ත ව්‍යාපෘතියක්. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ Clean Sri Lanka වැඩසටහන සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් වෙලා තිබෙනවා. ඒ අනුව කසළ කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ කසළ ප්‍රවාහනය කිරීමට කම්පැක්ටර් රථ ලබා ගැනීම සඳහා ඒ මුදල් වෙන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම සංචාරකයන් වැඩිපුර ආකර්ෂණය වන ප්‍රදේශ ගණනාවක් තිබෙනවා, අපේ රටේ මේ පළාත් පාලන ආයතන තුළ. අන්න ඒ පළාත් පාලන ආයතන පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ තෝරාගත් පළාත් පාලන ආයතනවල සනීපාරක්ෂක පහසුකම් දියුණු කිරීම වෙනුවෙන් වැසිකිළි පද්ධති ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 200ක මුදලක් මේ අය වැයෙන් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 750ක මුදලක් මේ අය වැයෙන් වෙන් වෙලා තිබෙනවා. ද්‍රව්‍ය ප්‍රතිසාදන මධ්‍යස්ථානයක් සඳහා තමයි මේ මුදල් වෙන් වෙන්නේ. පොලිතීන්, වීදුරු, කාඩ්බෝඩ් වැනි අපද්‍රව්‍ය වෙන් කරලා පළාත් පාලන ආයතනවලට ආදායම් උත්පාදනය කර ගැනීම වෙනුවෙන් අවශ්‍ය මූලික සැලැස්මක් තමයි මේ ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක වෙන්නේ. 2025 වසරේ පළාත් පාලන ආයතන 54ක් අපි තෝරාගෙන තිබෙනවා, මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නඟාසිටුවීම හා ආදායම් උත්පාදනය සඳහා රුපියල් මිලියන 675ක් වෙන් කර තිබෙනවා, මේ වසරේ අය වැයෙන්. එක් පළාතකින් පළාත් පාලන ආයතන 6ක් බැගින් රටේ පළාත් පාලන ආයතන 54ක් අපි තෝරාගෙන තිබෙනවා, මේ කටයුතු ක්‍රියාත්මක කරන්න. විශේෂයෙන්ම සංචාරක ආකර්ෂණය සහිත බල ප්‍රදේශ තමයි අපි මේ සඳහා තෝරාගෙන තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ගාල්ල, හීන්පැන්දල කසළ ප්‍රතිචක්‍රීකරණ අංගණයේ වැඩ කටයුතු සඳහා රුපියල් මිලියන 150ක ප්‍රතිපාදන වෙන්කර තිබෙනවා. ඒ කටයුතු දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ඒ වාගේම ඩිජිටල්කරණ ක්‍රියාවලිය තුළ පළාත් පාලන ආයතන 341ම කටයුතු ඩිජිටල්කරණය සඳහා රුපියල් මිලියන 52ක් වෙන්වෙලා තිබෙනවා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, මේ වසර තුළ පළාත් පාලන ආයතන 341ම කටයුතු ඩිජිටල්කරණය කරන්න. ඒ ක්‍රියාවලිය සඳහා අපේ අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් දැනටමත් මැදිහත් වෙලා තිබෙනවා. මාර්ගගත ගෙවීම් හරහා පළාත් පාලන ආයතනවල කටයුතු කාර්යක්ෂම කර ගැනීමට අපි මේ වසරේදී කටයුතු කර තිබෙනවා. දැනටමත් පළාත් පාලන ආයතන 100කට වැඩි ප්‍රමාණයක ඒ කටයුත්ත ආරම්භ කර තිබෙනවා. 2025 වසර අවසන් වෙනකොට සියලු පළාත් පාලන ආයතන ඒ සඳහා දායක කරගෙන ඩිජිටල්කරණ ක්‍රියාවලිය තුළින් ඒ ආයතනවල කටයුතු කාර්යක්ෂම කර ගැනීම වෙනුවෙන් අපි යම් මැදිහත්වීමක් කරනවා.

[ගරු පී. රුවන් සෙනරත් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික වශයෙන් වාගේම, හැම පැත්තෙන්ම අපට වැදගත් කේන්ද්‍රස්ථානයක් තමයි, කොළඹ ඇතුළු බස්නාහිර පළාත. බස්නාහිර පළාත මූලික කරගෙන අපි සැලසුම් ගණනාවක්, ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කළා. එකක් තමයි, කොළඹ මහ නගර සභාවේ බදු පරිපාලන තොරතුරු සම්බන්ධයෙන් තාක්ෂණික විසඳුම් ලබා දීම. ඒ වෙනුවෙන් ඩොලර් මිලියන 5ක කොරියානු රජයේ ආධාරයක් අපට ලැබෙනවා. ඒ කටයුත්ත අපි දැනටමත් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඒ වාගේම මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 3,000ක දේශීය අරමුදල් අපට ලැබී තිබෙනවා, මෙවර අය වැයෙන්. දැනටමත් ඒ සඳහා අදාළ ව්‍යාපෘති ආරම්භ කරලා එම කටයුතු ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියත් අපි මේ වන විට ආරම්භ කර තිබෙනවා. ඒ අනුව ග්‍රාමීය පාලම් 162ක ඉදිකිරීම් ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා නෙදර්ලන්ත රජයේ ණය සහ ප්‍රදාන යටතේ රුපියල් මිලියන 1,320ක අරමුදල් අපට ලැබී තිබෙනවා. දේශීය වශයෙන් වාගේම විදේශීය වශයෙනුත් අපට මේ ව්‍යාපෘති සාර්ථක කර ගන්න ආධාර, ණය සහ ප්‍රදාන ලැබී තිබෙනවා.

ඒ වාගේම උතුරු නැහෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල අඩු ආදායම් ලබන පවුල්වල යටිතල පහසුකම් අපි දියුණු කරනවා. විශේෂයෙන්ම නැගී එන පළාත් ලෙස හඳුනා ගත් පළාත් 4ක් තුළ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් ජපන් රජයේ ආධාර යටතේ රුපියල් මිලියන 6,000ක දැවැන්ත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න අපි මේ වන විට සියලු කටයුතු සූදානම් කර තිබෙනවා, මේ අමාත්‍යාංශය හරහා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන වැදගත්ම ආයතනය තමයි, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය. ඒ ආයතනයට කාර්යභාරයන් රැසක් පැවරිලා තිබෙනවා. එකක් තමයි, පළාත් පාලන ආයතනවල සභිකයන් පුහුණු කිරීම. ඒ වාගේම පළාත් පාලන ආයතනවල නිලධාරීන් පුහුණු කිරීම. අපි සොයා බැලුවා, පසුගිය කාලයේ මේ ආයතනයට මොකක්ද වෙලා තිබුණේ කියලා. එහි කටයුතු සියල්ල අඩපණ වෙලා තිබුණේ. ඒ ආයතනයේ පැවති විවිධ දූෂණ, වංචා ගණනාවක් අපට හෙළිදරව් වෙලා තිබෙනවා. එහි පාලන අධිකාරිය තුළ අධ්‍යක්ෂවරයාගේ ඉඳලාම ගැටලු ගණනාවක් මතුවෙලා තිබෙනවා. ඒ සේවකයන් අතරත් ගැටලු මතුවෙලා තිබුණා, පසුගිය කාල සීමාව තුළ. අධ්‍යක්ෂවරයා අත්තනෝමතික ලෙස කටයුතු කළ නිසා ඒ ආයතනය දැන් කඩා වැටිලා තිබෙනවා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, කෙටි කාලයක් ඇතුළත ඉතා කඩිනමින් අලුතින් අධ්‍යක්ෂ මණ්ඩලයක්, අධ්‍යක්ෂවරයෙක් පත් කරලා පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ට, සභිකයන්ට පුහුණු පාඨමාලා ලබා දෙන කාර්යක්ෂම ආයතනයක් බවට ඒ ආයතනය පත් කරන්න. ඒ වාගේම, ඒ ආයතනය තුළ අපට නිරීක්ෂණය වෙච්ච තවත් කරුණු ගොඩක් තිබුණා. මම මුලදී කිව්වා වාගේ රට පුරාම වාගේම ඒ ආයතනය තුළත් විශාල වශයෙන් වංචා, දූෂණ, නාස්තිය සිදුවෙලා තිබෙන ආකාරය අපි දැක්කා. විවිධ ව්‍යාපෘති ආරම්භ කරලා ජනතාවගේ මුදල් අවභාවිත කර තිබෙන ආකාරය, දූෂණයට ලක්වෙලා තිබෙන ආකාරය අපි දැක්කා. විශාල ඉදිකිරීමක් - මහල් 8ක ගොඩනැඟිල්ලක් ඉදිකිරීම - සඳහා මූල් ගල් තියලා, කුඩා ඉදිකිරීමක් විතරයි කරලා තිබුණේ; පහළම කොටසේ ඉදිකිරීමක් විතරයි කරලා තිබුණේ. හැබැයි, ඒ මුදල්වලට වෙච්ච දෙයක් නැහැ. ඒ නිසා ඒ පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. මගේ ළඟ ඒ ඡායාරූප තිබෙනවා. ඒ තුළිනුත් ජනතාවගේ මුදල් අවභාවිත වෙලා තිබෙනවා; නාස්ති වෙලා තිබෙනවා. මම ඒ කාරණයත් මේ අවස්ථාවේදී විශේෂයෙන් අවධාරණය කරනවා. මොකද, මේ දවස්වල COPA එකටත්, COPE එකටත් ගෙන්වන සෑම ආයතනයකම අක්‍රමිකතා රැසක් අපට දකින්න ලුළුවන් වුණා. මේ ආයතනය තුළත් එවැනි අක්‍රමිකතා රැසක් අපට නිරීක්ෂණය වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අහනවා, මේවා කරන්න ආණ්ඩුවට සල්ලි කොහෙන්ද කියලා. හැබැයි, අපි විශේෂයෙන් අවධාරණය කරන්නට ඕනෑ, ජාතික ජන බලවේග නව රජය වංචාව, දූෂණය, හොරකම නතර කරනවා, නාස්තිය නතර කරනවා කියලා මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නු බව. අපේ ආණ්ඩුව මේ රටේ ජනතාවගේ බදු සල්ලි නාස්ති නොකර ඉතා කාර්යක්ෂම ලෙස සහ පරිස්සමින් වියදම් කරන ආණ්ඩුවක්.

විශේෂයෙන්ම 2023 අවුරුද්දේත්, 2024 අවුරුද්දේත් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය පාවිච්චි කරපු වාහනවලට ඉන්ධන සඳහා වැය වූ මුදල පිළිබඳ විස්තර දැන් මගේ ළඟ තිබෙනවා. 2023 අවුරුද්දේ විතරක් එතුමාගේ සහ එතුමාගේ කාර්ය මණ්ඩලයේ වාහනවලට රුපියල් ලක්ෂ 100ක තෙල් ගහලා තිබෙනවා. මේවා රටේ ජනතාවගේ බදු සල්ලි. මගේ අමාත්‍යාංශයේ නිලධාරීන් හරහා මම 2023 වසරේ වැය වූ ගණන් හදලා බැලුවා. ඒ සඳහා උදවු කිරීම වෙනුවෙන් මම ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු පී. රුවන් සෙනරත් මහතා
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2024 අවුරුද්දේ අපි බලයට පත්වෙලා මුල් මාස දෙකට මටත්, මගේ කාර්ය මණ්ඩලයටත් විතරක් ඉන්ධන සඳහා වැය වෙලා තිබෙන්නේ රුපියල් 790,000යි. හැබැයි, 2024 අවුරුද්දේ මුල් මාස දෙකට විතරක් එවකට හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ සහ කාර්ය මණ්ඩලයේ වාහනවල ඉන්ධන සඳහා පමණක් රුපියල් 1,731,063ක් වියදම්වෙලා තිබෙනවා. මෙන්න මේකයි තත්ත්වය. ඒ නිසා, අපේ නව රජය නාස්තිය, දූෂණය, වංචාව, හොරකම නතර කරලා, ජනතාවගේ බදු සල්ලි ආරක්ෂා කරලා, ජනතාව වෙනුවෙන් ඒවා ඉතා පරිස්සමින් නැවත යොදන්න කටයුතු කරනවා කියන කාරණය විශේෂයෙන් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.23]

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහ කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතාම සන්තෝෂ වෙනවා. මොකද, අපි අවුරුදු ගණනාවක් ප්‍රාදේශීය සභාවේ, පළාත් සභාවේ ඉඳලා පාර්ලිමේන්තුවට ආපු අය. දීර්ඝ දේශපාලන ඉතිහාසයක් තිබෙන මන්ත්‍රීවරයකු හැටියට මෙම අමාත්‍යාංශ පිළිබඳව කථා කරන්නට ලැබීම ගැන ඉතා සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම කම්කරු අමාත්‍යාංශය පිළිබඳව මන්ත්‍රීවරු ගණනාවක් කථා කරනවා මම දැක්කා. එතුමන්ලා යෝජනා රාශියක් ඉදිරිපත් කළා. ඇත්තටම කම්කරුවන් වෙනුවෙන් ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් අපි ඉතාම සන්තෝෂ වෙනවා. ඒ වාගේම නව අණපනත් ගෙනැවිත් අලුතින් නීති සම්පාදනය කරන්න ඕනෑය කියාත් කථා කළා. ඒ නිසා මමත් අපේ ගරු කම්කරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරන්න ඕනෑ. 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත වාගේම, 1954 අංක 19 දරන සාජ්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥාපනත තිබෙනවා. අපේ රටේ කම්කරුවන් මේ පනත් යටතේ තමයි දීර්ඝ කාලයක් සේවය කරන්නේ. ඒ නිසා මෙම පනත් සංශෝධනය කරන්න පුළුවන් නම් ඒක ඔබතුමාට ලොකු ශක්තියක් වෙයි. මොකද, අපේ රටේ ජනතාව වැඩ කරනකොට මේ වාගේ පැරණි පනත් තියාගෙන වැඩ කරන්න බැහැ. එම නිසා ඔබතුමාට ඒ කාරණයත් මතක් කරන අතර, මෙම පනත් සංශෝධනය කරන්න කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

කම්කරු අමාත්‍යාංශය පිළිබඳව කථා කරනකොට මම කියන්න කැමතියි, අපේ රටේ කම්කරුවෝ දීර්ඝ කාලයක් විශාල පීඩනයකින් තමයි ඉන්නේ කියන එක. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය ගත්තාම රාජ්‍ය වතු 42ක් වාගේ සංඛ්‍යාවක් තිබෙනවා. ඒ වාගේම අපි වතු 300කට ආසන්න සංඛ්‍යාවක් බදු දීලා තිබෙනවා. ඒවායේ වැඩ කරන වතු සේවකයන්ට EPF සහ ETF ගෙවන්නේ නැතුව ගැටලු රාශියක් ඇතිවෙලා තිබෙනවා. මෙවැනි රාජ්‍ය වතු සේවකයන්ට නොගෙවූ EPF සහ ETF රුපියල් මිලියන ගණනක් තිබෙනවා. ඒ නිසා අපේ ගරු කම්කරු ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි, රජයේ වැවිලි සමාගමේ වැඩ කරන සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල් ගෙවන්න ඔබතුමා මේ අවුරුද්දේ යම් මුදලක් වෙන් කරලා තිබෙනවාද කියලා. එහෙම යම් මුදලක් වෙන් කරලා තිබෙනවා නම්, ඔවුන්ට ඒක ලොකු ශක්තියක් වෙයි. මොකද, අපි දන්නවා, මේ වෙලාවේ තිබෙන්නේ වමේ රජයක් බව. එම නිසා කම්කරුවන් වෙනුවෙන් ඔබතුමන්ලා මැදිහත් වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසායි මම ඔබතුමාට මේ කාරණය මතක් කරලා දුන්නේ.

ගරු කම්කරු ඇමතිතුමනි, පෞද්ගලික අංශයේ තමයි රැකියා විශාල ප්‍රමාණයක් තිබෙන්නේ. පෞද්ගලික අංශයේ ලක්ෂ 80කට ආසන්න සංඛ්‍යාවක් සේවයේ නිරත වෙනවා. හැබැයි, අර්ථසාධක ගෙවන්න පුළුවන් වෙලා තිබෙන්නේ ලක්ෂ 40ක් වැනි සංඛ්‍යාවකට. ඒ ලක්ෂ 80ටම ගෙවන්න විධියක් නැහැ. කම්කරු අමාත්‍යාංශයෙන්ම තමයි ඒ ගැන බලන්නේ.

කම්කරු අමාත්‍යාංශයේ තිබෙන සේවක පුරප්පාඩු ගැනත් අද කථා කළා. රජය කල්පනා කරනවා, රාජ්‍ය සේවයට අලුතින් 30,000ක් බඳවා ගන්න. මම ආණ්ඩුවට කියන්න ඕනෑ, මේ ගැන තමුන්නාන්සේලා සැලකිලිමත් වෙලා පෞද්ගලික අංශයේ සේවය කර රැකියාවෙන් ඉවත් වෙන අයට EPF, ETF ලබා ගැනීමට හැකි වන පරිදි ඒ ආයතන ගැන සොයා බැලීම සඳහා කම්කරු අමාත්‍යාංශයට රාජ්‍ය සේවකයන් වැඩි කොටසක් බඳවා ගන්න කියලා. පෞද්ගලික අංශයේ සේවකයන් ලක්ෂ 80න්, ලක්ෂ 40කට විතරයි EPF, ETF ගෙවන්නේ. ඒ අවශ්‍ය සේවකයන් බඳවා ගත්තොත් ඉතුරු ලක්ෂ 40ටත් ඒ අවස්ථාව උදා කරලා දෙන්න පුළුවන්. අපි දන්නවා, මේ සියලු කාර්යයන් කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් ඉන්නේ ඉතා සීමිත සංඛ්‍යාවක් බව. ඒ නිසා තමයි මේ සියලු දේවල් මහ හැරෙන්නේ. රාජ්‍ය සේවයේ ඉන්න අයටත් යම් දිරි දීමනාවක් දෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, petrol allowance එක මදි, ඒ අයගේ රාජකාරී කටයුතු ටික කර ගන්න. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ගැන. මම සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රීවරයකු විධියට හිටියා. අද වනකොට පළාත් සභාවේ සේවකයන් 200කට ආසන්න සංඛ්‍යාවක් ස්ථිර කරලා නැහැ. ලංකාවේම 2,000කට ආසන්න සංඛ්‍යාවක් ස්ථිර කරලා නැහැ. ඒ අයත් ස්ථිර කරන්න. ඒ සේවකයන්ටත් ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා.

අපි දන්නවා, රජයේ සේවකයන්ට අග්‍රහාර රක්ෂණය තිබෙන බව. ඒ අය ස්ථිර කරන්නේ නැත්නම් ඒ අග්‍රහාර රක්ෂණය ඔවුන්ට ලැබෙන්නේත් නැහැ. ප්‍රාදේශීය සභාවල ගොඩක් වැඩ කරන්නේ කම්කරුවන්. ඒ අයට කිසිම රක්ෂණාවරණයක් ලැබෙන්නේ නැහැ. රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගෙන් මම ඉල්ලන්නේ මෙයයි. රාජ්‍ය සේවකයෝ ලක්ෂ 15කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. අග්‍රහාර රක්ෂණය සඳහා රුපියල් 600ක් වැනි සුළු මුදලක් කපලා තමයි රාජ්‍ය සේවකයන්ට ඒ රක්ෂණය ලබා දෙන්නේ. රුපියල් ලක්ෂ තුනහමාරකට ආසන්න මුදලක් තමයි මේ රක්ෂණය විධියට ලැබෙන්නේ. හැබැයි, අපි දන්නවා, රාජ්‍ය සේවකයා සෞඛ්‍ය සේවාවලට ඒ මුදල් ගෙවීවාට පස්සේ තමයි ඒ මුදල් ප්‍රතිපූරණය කරලා ලබා ගන්න පුළුවන් වන්නේ කියලා. හැබැයි, පෞද්ගලික රක්ෂණ සමාගම් කවදාවත් එහෙම කරන්නේ නැහැ. ඔවුන් අදාළ ස්ථානයටම ගිහිල්ලා ඒ මුදල ගෙවනවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ කවුරු හරි කෙනෙක් hospital එකෙන් පිටත් වෙලා යනකොට ඒ අග්‍රහාර රක්ෂණ වැඩසටහන යටතේ එතැනදීම ඒ මුදල ගෙවන්න යම් වැඩසටහනක් සකස් කරන්න කියායි. ඒ හරහා රජයේ සේවයේ ඉන්න නිලධාරීන්ට යම් ශක්තියක් ලබා දෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, මේ අග්‍රහාර රක්ෂණයෙන් අපේ වැඩිහිටි දෙමව්පියන්ට සෞඛ්‍ය ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් කාල සීමාව විධියට දාලා තිබෙන්නේ වයස අවුරුදු 70. මම ඔබතුමාට කියනවා, ඒ අවුරුදු 70 කාල සීමාව අවුරුදු 75, 80 දක්වා වැඩි කරලා දෙන්න පුළුවන් නම්, ඔවුන්ට ඒක විශාල ශක්තියක් වෙවි කියලා. අද රාජ්‍ය සේවකයා බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඒගොල්ලන්ගේ ආර්ථිකය පවත්වාගෙන යන්න ටිකක් අපහසුයි. ඒ රක්ෂණයෙන් හෝ යම් සහනයක් ලැබෙනවා නම් ඒක රාජ්‍ය සේවකයන්ට විශාල ශක්තියක් වෙයි කියලා මම හිතනවා, ගරු ඇමතිතුමනි. ඒ කාරණයත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා අපේ vehicle permits ඔක්කොම නවත්වලා තිබෙන්නේ. Vehicle permits සම්බන්ධයෙන් කථා කරනකොට අපි දන්නවා, රාජ්‍ය සේවයේ විශ්‍රාම යන සමහර උසස් නිලධාරීන් vehicle permit

[ගරු වරුණ ලියනගේ මහතා]

එකකට entitled කියලා. නමුත් දැන් විශ්‍රාම යන රාජ්‍ය සේවකයාට retirement permit එක ගන්න බැරිව retire වෙනවා. ඒක අසාධාරණයි. Vehicle permit එක අපට දුන්නේ නැති වුණාට කමක් නැහැ. අපි කවුරුවත් vehicle permits ඉල්ලා නැහැ. Retirement permit එකක් ඔවුන්ට දෙන්න පුළුවන් නම් ඒක විශාල ශක්තියක් වේවි. කිහිපදෙනෙකුට විතරයි ඒක ලැබෙන්නේ. ඒක ලබා දෙන්න කියාත් විපක්ෂය විධියට අපි ඔබතුමන්ලාට මතක් කරනවා. ඒ වාගේම doctorsලා විශාල පිරිසක් පළමුවැනි permit එක නැතුව විශාල අසාධාරණයකට ලක් වෙලා ඉන්නවා. Doctorsලාට permit එකක් දෙන එක අත්‍යවශ්‍ය කාරණයක් විධියටයි මම නම් දකින්නේ.

මොකද, බොහොම අමාරුවෙන් ඉගෙනගෙන රැකියාවට ඇවිල්ලා අවුරුදු පහක් ගියාට පසුව ලැබෙන වාහන පර්මිට් එකවත් නැත්නම් ඒගොල්ලන් අධෛර්යවත් වනවා. අද ඒගොල්ලන් රට හැර යෑමේ තත්ත්වය වර්ධනය වෙලා තිබෙනවා. ඒ නිසා අපට නොලැබුණාට කමක් නැහැ. අපි කියන්නේ, අපේ ඒ සම්පත් රැක ගන්න කියලා. ඒ නිලධාරින්ටත් ශක්තියක් ලබා දෙන්න ඕනෑ. එම නිසා doctorsලාට වාහන පර්මිට් එක දෙන්න කියලා විපක්ෂය හැටියට අපි ඉල්ලා සිටිනවා. ඒක අපට ලැබෙන්න ඕනෑ නැහැ.

මම අහගෙන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ජනාධිපතිතුමා අපේ insurance එක කැපුවා කියලා. ඒක ඇත්ත වෙන්න පුළුවන්. රුපියල් ලක්ෂ 10ක් තිබුණු insurance එක දැන් ලක්ෂ දෙකහමාරකට අඩු කරලා තිබෙනවා. හැබැයි, ගරු ඇමතිතුමනි, ඒක ගෙවන්නේ private company එකකින්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
තව විනාඩි 4ක්වත් ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, ආපදාවක් වුණාම අපට රක්ෂණයෙන් නේ ගෙවන්නේ. ඒකට ආණ්ඩුවෙන් සල්ලි ගෙවන්නේ නැහැ. රක්ෂණය කරන company එකෙන් තමයි සල්ලි ගෙවන්නේ. අපෙන් ඉතා සුළු මුදලක් තමයි කපන්නේ. ජනාධිපතිතුමා විටින් විට කියනවා, අපේ insurance එක කැපුවා, ලක්ෂ දෙකහමාරට අඩු කළා කියලා. හැබැයි, ඒක ලක්ෂ දෙකහමාරට අඩු කරනකොට ආණ්ඩුව ඒ පෞද්ගලික company එකට ගෙවන මුදල කීයද කියලා අපි දැන ගන්න කැමැතියි. මම හිතන හැටියට රුපියල් 5,000කට හෝ රුපියල් 10,000කට අඩු මුදලක්.

පසුගිය කාලයේ අපට අමතක කරන්න නොහැකි සිද්ධියක් වුණා. අපේ පාර්ලිමේන්තුවේ හිටපු ඉතාම අභිංසක මන්ත්‍රීවරයෙක් තමයි පොළොන්නරුවේ අතුකෝරල මන්ත්‍රීතුමා. එතුමා පාරේ ඇදගෙන ගිහිල්ලා ගහලා මැරුවා. ඒක ඒ වෙලාවේ ඇති වුණු කෝපය නිසා වූ සිද්ධියක්. එතුමාට වන්දියක් ගෙවා ගන්න අපට බැරි වුණා. ඒ නිසා තමයි මේ යෝජනාව ක්‍රියාත්මක කළේ. එහෙම නැතුව අපි පෞද්ගලිකව ඉල්ලලා නොවෙයි. ගරු ඇමතිතුමනි, ඒවා කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේවා අපට ඉල්ලනවා නොවෙයි. හැබැයි, මේකෙන් වන පාඩුව කීයද කියලා ඔබතුමා මට කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන ගැනත් මා කිව යුතුයි. එම නිසා මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න. පළාත් පාලන ආයතන ගැන කථා කරනකොට ඇත්තටම මට ලජ්ජයි. මම හිටපු සභාපතිවරයෙක්, ගරු ඇමතිතුමනි. ඔබතුමන්ලා වමට සිග්නල් දාලා දකුණට හැරෙව්වා වාගේ නේ. පසුගිය සභයේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කළා, ඡන්දය තියන්න ඕනෑ නිසා. ඇත්තෙන්ම කිව්වොත් මම ඡන්දය ප්‍රකාශ කරන්නවත් ආවේ නැහැ. මොකද, මම ඒකට විරුද්ධයි. අපේ පක්ෂයේ කණ්ඩායම් රැස්වීමේදී මම ප්‍රසිද්ධියේ කිව්වා, මම ඒ පනත් කෙටුම්පතට විරුද්ධයි කියලා. අපේ කණ්ඩායම තීන්දු කළා ඡන්දය දෙන්න. හැබැයි, මම විරුද්ධයි. මම අවංකව කියන්නේ. එයට හේතුව තමයි ගරු ඇමතිතුමනි, මන්ත්‍රීවරු හත්දහස් ගණනක් අලුතින් එනවා. හිටියේ මන්ත්‍රීවරු හාරදහස් ගණනයි. මා ළඟ හරියටම ඒ සංඛ්‍යාලේඛන නැහැ.

තමුන්නාන්සේලා දන්නවා මේ රටේ වියදම. වියදම රුපියල් බිලියන 7,190යි. ආදායම රුපියල් බිලියන 4,990යි. අය වැය හිඟය රුපියල් බිලියන 2,200යි. ඔබතුමා කල්පනා කර බලන්න, ඒ මන්ත්‍රීවරු හත්දහස් ගණනට අපට වැටුප් ගෙවන්න අවශ්‍ය වනවා රුපියල් බිලියන 1,700ක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු වේලාවක් දෙන්න. මම මේ පැහැදිලි කිරීමක් කරන්නේ.

ඇත්තටම අපි හිතට අවංකව දේශපාලනය කරන්නේ. අපි කැමැතියි මේ රට හරියට කරගෙන යනවා නම්. ඒ නිසා තමයි මම ඒ පනත් කෙටුම්පතට ඡන්දය දුන්නේ නැත්තේ.

අපි දැක්කා පසුගිය ජනාධිපතිවරණයෙන් පසුව පවත්වපු ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීමේදී මොකක්ද වුණේ කියලා. ගරු ඇමතිතුමනි, මන්ත්‍රී ධුර බෙදී ගියේ 15යි, 15යි ලෙස. විපක්ෂයට 15යි, ආණ්ඩු පක්ෂයට 15යි. එතකොට සභාවක් කොහොමද ගෙන යන්නේ? කිසිම බලයක් නැහැ. ඒ නිසා මේ ක්‍රමය වැරදියි. මේ වැරදි නිවැරදි කරන්නම ඕනෑ කියන අදහසේ මම ඉන්නේ. මොකද, අපි දන්නවා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩි දෙකක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාවේ කටයුතුවලට වෙලාව මදි. ඉක්මනින් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මම මේ කාරණය කියලා අවසන් කරන්නම්.

ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සිද්ධිය තමයි මම කිව්වේ. ශක්තිමත් ප්‍රාදේශීය සභාවක් ගොඩනැඟුවොත් විතරයි ඒ ආයතන කරගෙන යන්න පුළුවන්. නැත්නම් ඒකේ හානිය වෙන්නේ තමුන්නාන්සේලාටමයි. ඒ සභා ටික කරගෙන යන්න බැරි වුණොත් ආණ්ඩුවට මොකක්ද වෙන්නේ? එතැනින්ම කඩා වැටෙනවා. ඒක තමයි ඇත්ත. අපි ඒකට කැමැති නැහැ. අපි හරි දේ වෙනුවෙන් පෙනී ඉන්නවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම කියන්නේ මේක නිවැරදි කරන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
අපි දැක්කා, තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමාත් මේ සංශෝධනවලදී සාකච්ඡා කළා; වැරදි පෙන්වා දුන්නා. පනත අනුව ඇප මුදල ස්වාධීන කණ්ඩායම්වලට රුපියල් 5,000යි. අනෙක් අයට රුපියල් 1,900 ගණනක්. ඒකත් විශාල අසාධාරණයක්. එම නිසා ගරු ඇමතිතුමාගෙනුත්, නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් මම ඉල්ලා සිටින්නේ, මෙයයි. මේක නිවැරදි කරන්න පුළුවන්. සුමන්තිරන් මැතිතුමා එදා පළාත් සභා සම්බන්ධයෙන් සංශෝධනය ගෙනෙනකොට එක දවසින් මේක නිවැරදි කරන්න තිබුණා.

හැබැයි, අපට බැරි වුණා ඒක නිවැරදි කරන්න. ඒ නිසා අපි සියලුදෙනාටම මේ වගකීම තිබෙනවා. ඒ නිසා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමනි, ඔබතුමාට පුළුවන් නම් මේක නිවැරදි කරන්න. ඒ වෙනුවෙන් ඔබතුමාට තවත් කාලය තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. නමුත්, මම දකින විධියට නම් මේ නිසා අවුරුදු 5ක් ආපස්සට යනවා. අපට දැන් මේක නිවැරදි කරන්න බැහැ. ඒක දැන් නිවැරදි කරන්න පුළුවන් ද, බැරි ද කියලා කියන්න මම දන්නේ නැහැ. කොහොම වුණත් ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ඔබතුමන්ලා මේ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඒ.එච්.එම්.එච්. අබයරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.36]

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ ගරු විපක්ෂ නායකතුමා සඳහන් කරපු කාරණයක් පිළිබඳව කෙටියෙන් නමුත් යමක් සඳහන් කරන්න අවශ්‍යයි. එතුමා සඳහන් කළා, ප්‍රධාන ලේකම්වරු සහ දිස්ත්‍රික් ලේකම්වරු දේශපාලන පළිගැනීම් ලෙස මාරු කරනවා කියලා. ඒක මුළුමනින්ම වැරදියි. ඒක මම ප්‍රතික්ෂේප කරනවා.

මම විශේෂයෙන්ම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. සබරගමුව පළාතේ ප්‍රධාන ලේකම් හැටියට හිටපු මහින්ද වීරසූරිය මහතා වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා විශ්‍රාම යෑමට ඉල්ලා තිබුණා. ඒ අතර ඔහු ඉල්ලා සිටියා නියමිත දිනට කලින් විශ්‍රාම යන්න. ඒ අනුව එතුමා කැමැත්තෙන් තමයි විශ්‍රාම ගියේ. ඊළඟට, වයඹ ප්‍රධාන ලේකම් හැටියට කටයුතු කරපු දීපිකා ගුණරත්න මහත්මිය විශේෂ ශ්‍රේණියට අදාළ තනතුරකට පත් කිරීමට නියමිතව ඉන්නවා. ඒ නිසා එතැන දේශපාලන පළිගැනීමක් නැහැ.

ඒ වාගේම, රත්නපුර දිස්ත්‍රික් ලේකම් හැටියට කටයුතු කරපු වසන්ත ගුණරත්න මහතා මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු හැටියට කටයුතු කරනවා. එතුමා pool එකේ නොවෙයි ඉන්නේ. ඒ වාගේම, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් නන්දන ගලබඩ මහතා උතුරුමැද පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයකු හැටියට කටයුතු කරනවා. මේ වෙනත් තැනකට මාරු කරලා තිබෙන්නේ යම් වගකීමක් සහිතවයි. ඒ වාගේම, මාතර දිස්ත්‍රික් ලේකම් හැටියට කටයුතු කරපු ගනේෂ අමරසිංහ මහතා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු හැටියට පත් කිරීමට නිර්දේශ කර තිබෙනවා.

හිටපු යම් තැනකින් එතුමන්ලා වෙනස් කර තිබෙනවා. නමුත්, තව තැනක වගකීමක් පවරමින් තමයි ඒ කාර්යය කරලා තිබෙන්නේ. ඒ නිසා විපක්ෂ නායකතුමා සඳහන් කරපු, දේශපාලන පළිගැනීම් මත ලේකම්වරුන් මාරු කරනවා කියන කථාව මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. එතුමන්ලා කියන විධියට බැලුවොත් මාරුවීමක් කරන්නම බැහැ, ඒක දේශපාලන පළිගැනීමක් කියලා තමයි කියන්නේ.

ඒ වාගේම, අපේ අමාත්‍යාංශයට අදාළව අද උදේ කථාවේදී සඳහන් කරන්නට නොහැකි වුණු කාරණා ටිකක් මම කියන්න ඕනෑ. 2025 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් රාශියක් අපට තිබෙනවා. ඒ අතර ඉතා කෙටියෙන් යමක් කියන්න ඕනෑ. විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ අභ්‍යන්තර ක්‍රියාවලිය හා විශ්‍රාමිකයන් වෙත සලසන සේවාව වඩා සරල කිරීමට IPMS නැත්නම්,Integrated Pension Management System එකක් අපි ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම, 1934 පෙබරවාරි 05වැනි දින ප්‍රකාශයට පත් කර තිබුණු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රයේ විධිවිධාන සංශෝධනය කිරීමටත්, එම දිනට පසුව නිකුත් කර ඇති සියලු ගැසට් නිවේදනවල විධිවිධාන ඇතුළත් කරමින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යාවත්කාලීන කිරීමටත් අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව කාර්යක්ෂමව විශ්‍රාම වැටුප්ලාභීන්ගේ අභාවය පිළිබඳව වාර්තා කර ගැනීමට දැනට බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරන ක්‍රමය දිවයින පුරා ක්‍රියාත්මක කිරීම මඟින් රුපියල් මිලියන 42ක් පමණ මුදලක් අපට මාසිකව ඉතිරි කර ගන්න පුළුවන්. මොකද, අභාවය ක්ෂණිකව වාර්තා වුණේ නැත්නම් විශ්‍රාම වැටුප එම මාසයටත් ගෙවනවා. කවුරු හෝ ඒක ගන්නවා. නැවත ඒ මුදල අය කර ගන්න පුළුන්කමක් නැහැ. එම නිසා මේ ක්‍රමය කඩිනම් කරලා, වැඩිපුර ගෙවීම නවත්වන්න අපි කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මහ පෙන්වීම යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

තුළ අල්ලස හා දූෂණයෙන් තොර සුපිළිපන් රාජ්‍ය සේවයක් සැලසීමට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අපි සකස් කරමින් ඉන්නවා. ඒ වාගේම, 2025 වර්ෂයට අදාළව Clean Sri Lanka වැඩ පිළිවෙළට සමගාමීව පාරිසරික, සමාජයීය හා ආචාර ධාර්මික වශයෙන් වන මූලික වෙනස්කම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාළව සිදු කිරීමට අපි පියවර ගනිමින් ඉන්නවා. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඩිජිටල් ඒකාබද්ධ කරන ක්‍රියාවලිය යටතේ, දෙපාර්තමේන්තුවේ වැඩි දියුණු කරන ලද නිල වෙබ් අඩවිය සහ පහත සඳහන් කරන ඩිජිටල් තාක්ෂණික පද්ධති හතර, 2025 ජනවාරි මාසයේ ජනගත කර තිබෙනවා. ඒ අනුව විශ්‍රාමිකයන්ට නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර ලබා ගැනීම හා දුම්රිය මගී ආසන වෙන් කර ගැනීමට දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මාර්ගගත තොරතුරු පද්ධතියක් හඳුන්වා දුන්නා.

ඒ වාගේම, රාජ්‍ය නිලධාරින් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීමේදී ඔවුන්ගේ සහ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය සඳහා නව මාර්ගගත තොරතුරු පද්ධතියක් හඳුන්වා දුන්නා. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ සාමාජිකයන් ලියාපදිංචිය, දායක මුදල් යොමු කිරීම සහ හිමිකම් ලබා ගැනීම සම්පූර්ණයෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීම සඳහා අන්තර් සම්බන්ධිත තොරතුරු තාක්ෂණ පද්ධතියක් හඳුන්වා දී තිබෙනවා. ඊට අමතරව, විශ්‍රාමික අභාවයන් වාර්තා කිරීමේ ක්‍රමය -කලින් සඳහන් කළ කාරණය- කාර්යක්ෂම කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව නව මාර්ගගත තොරතුරු පද්ධතියක් අපි හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ e-BMD දත්ත පද්ධතියට විදේශ තානාපති කාර්යාල 62ක් සඳහා ප්‍රවේශය ලබා දීලා තිබෙනවා. ඒ අනුව, ඒ රටවල සිටම කෙනෙකුට අවශ්‍ය කිසියම් document එකක්, සහතිකයක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මේ සාකච්ඡාවේදී විවිධ දිස්ත්‍රික්ක නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා, විශේෂයෙන්ම උතුර සහ නැඟෙනහිර පළාත් නියෝජනය කළ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ විවිධ යෝජනා, ඉල්ලීම්, අදහස් අපි සැලකිල්ලට ගන්නවා. එසේ සැලකිල්ලට ගනිමින් ඒ ප්‍රශ්න විසඳීම සඳහා අමාත්‍යාංශය හැටියට අපි අපේ උපරිම මැදිහත් වීම කරන බව කියන්න ඕනෑ. ඒ වාගේම, ඒ සමහර යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා ඉදිරිපත් කිරීමෙන් කඩිනමින් විසඳා ගන්න පුළුවන්කම තිබෙන බවත් සඳහන් කරන්න ඕනෑ.

අපගේ අමාත්‍යාංශය මඟින් 2025 නිදහස් උත්සවය සංවිධානය කළා, ඉතාම සාර්ථකව. ඇත්තටම අඩු වියදමකින්, ඉතාම අභිමානවත් ලෙස, ගෞරවනීය ලෙස අපි ඒ නිදහස් උත්සවය සංවිධානය කළා. අපේ අමාත්‍යාංශයේත්, රජයේත් ගමන් මඟ, මෙවර නිදහස් උත්සවය සංවිධානය කරපු ආකාරයෙන් අපට හඳුනා ගන්න පුළුවන් කියන කාරණය මම සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු කටයුතු සඳහා දායක වූ අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාට, අතිරේක ලේකම්වරුන්, අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂකවරුන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට ස්තුතිය පළ කරන්නත් මම මේ අවස්ථාව උපයෝගි කර ගන්නවා. මොකද, එතුමන්ලාගේ සහයෝගය නැතිව මේ කටයුතු ක්‍රියාත්මක කරන්න බැහැ. රාජකාරියෙන් ඔබ්බට ගිහින්, රාජකාරියට වඩා වැඩි යමක් එකතු කරමින් මේ කටයුතු සාර්ථක කර ගන්න එතුමන්ලා දායක වීම පිළිබඳව මගේ ස්තුතිය පුද කළ යුතුමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයේ මෙහෙම කියනවා.

"ප්‍රජා සුඛෙ සුඛං රාඥඃ - ප්‍රජානාං ච හිතෙ හිතම්

නාත්මප්‍රියං හිතං රාඥඃ - ප්‍රජානාංතු ප්‍රියං හිතම්"

රජු, එහෙම නැත්නම් රජය තමන්ගේ හිත සුව සලසාගන්නවාට වඩා ප්‍රජාවගේ හිත සුව සලසන්න ඕනෑ. අපේ ගරු ජනාධිපතිතුමා, අගමැතිනිය ඇතුළු ඇමති මණ්ඩලය, අපේ මන්ත්‍රීවරු තමන්ට ලැබිය යුතු දේවල් පරිත්‍යාග කරලා ජනතාවට ලැබිය යුතු දේවල්, ජනතාවට නොලැබී තිබුණු බොහෝ දේවල් ලබා දෙන්න පියවර ගෙන තිබෙනවා. ඉදිරියේදී ඒවා තවත් වැඩිදියුණු කරන්න අපි අපේක්ෂා කරනවා. කෞටිල්‍ය කියපු විධියට ජනතාවගේ හිත සුව සලසන රජයක් හැටියට අපි ඒ කටයුතු කරනවා. ඒ කාරණය සඳහන් කරමින්, මට කථා කරන්න වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.44]

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (පේරාසිරියර්) අනිල් ජයන්ත - තොළිල් අමෛච්සරුම් පොරුළාතාර අපිවිරුත්තිප් පිරති අමෛච්සරුම්)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දිනට නියමිත අමාත්‍යාංශ දෙකේ වැය ශීර්ෂ සලකා බැලෙන අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේ අවසාන කථාව සිදු කරන මේ මොහොතේ අපි පළමුකොට ම සැලකිල්ලට භාජන කරන්නට ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයකදී අප කළ යුතු වන්නේ, ඒ ඒ අමාත්‍යාංශවල වැය ශීර්ෂ යටතේ වෙන් වෙලා තිබෙන මහජන මුදල් අදාළ අරමුණු වෙනුවෙන් වෙන් වෙලා ද, ඒවා පරිහරණය කිරීම සඳහා කෙසේ මැදිහත් විය යුතු ද, ඒ සඳහා තිබෙන ආයතන ධාරිතාව හෝ ඒවායේ තිබෙන ගැටලු මොනවාද කියා විවේචනාත්මකව කරුණු ඉදිරිපත් කිරීමයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

ගරු සභාපතිතුමනි, මා සඳහන් කරමින් සිටියේ මේ අමාත්‍යාංශවල වැදගත්කමත්, අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයක වැදගත්කමත් පිළිබඳවයි.

මීට පෙර පැවැති අය වැය කාරක සභා අවස්ථාවේ විවාද පුරා තිබුණු ලක්ෂණය අදත් අපට දකින්න ලැබුණා. මොකද, විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු ප්‍රස්තුත කාරණයෙන් එළියට ගිහින් අදාළ නොවන කථා සහ අසත්‍ය කරුණු ගොඩක් ඉදිරිපත් කළා. නමුත්, අවසානයට විපක්ෂයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා මගේ අමාත්‍යාංශයට අදාළව වැදගත් කරුණු කිහිපයක්ම ඉදිරිපත් කළා. එතුමාට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. ඇත්තටම අපි ඒවා අපේ සැලකිල්ලට භාජන කළ යුතුයි. ඒවා අප හඳුනාගෙන තිබෙන ගැටලු. ඒ ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින්ම ස්තුතියි, ඒ කාරණා ඉදිරිපත් කිරීම පිළිබඳව.

ජාතික ජන බලවේගය මේ බලය ලබා ගැනීම හරහා සිදු වුණේ හුදෙක් දේශපාලන ක්‍රියාකාරකමකදී සිදු වන ආණ්ඩු මාරුවක් විතරක් නොව, තිරණාත්මක බල පෙරළියක්. කලින් ආණ්ඩු කරපු අය, එනම් දැන් විපක්ෂයේ ඉන්න කණ්ඩායම් පවත්වාගෙන ආපු ක්‍රමය ඒ බල පෙරළිය නිසා වෙනස් වෙලා තිබෙනවා. එතුමන්ලා ආණ්ඩු කරද්දී බොහෝ වෙලාවට මහ ජනතාව නොමහ යවන දේවල් කිව්වා වාගේම, අප පිළිබඳවත් ගොඩක් අසත්‍ය කිව්වා. ඒවා අසත්‍යයි කියලා මහ ජනතාවට ඔප්පු කරන්න, අපි කොයි වාගේද කියන්න දශක ගණනාවක් ගියා. ඒකට සරලම උදාහරණය මෙකයි. අපි ආණ්ඩු බලයට පත් වුණොත් මේ රටේ විශාල ප්‍රචණ්ඩත්වයක් ඇති වෙලා පෙරහැරවත් කරන්න බැරි තත්ත්වයකට පත් වෙනවා කියලා ස්වාමීන් වහන්සේලා පවා කියන තත්ත්වයක් ඇති වුණා. එය යථාර්ථයයි කියලා පිළිගත්තු පිරිසකුත් මහ ජනතාව අතර සමහර විට ඉන්න ඇති. හැබැයි අද අපට පුළුවන් වෙලා තිබෙනවා විශේෂයෙන් බෞද්ධ ජනතාවගේ මූදුන් මල් කඩ වූ දළ දා වහන්සේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදන්න. එය විශේෂයෙන් අපේ ගරු ජනාධිපතිතුමා ගෞරවනීය මහා නායක ස්වාමීන් වහන්සේලා හමු වෙලා කළ ඉල්ලීමේ ප්‍රතිඵලයක් කියා අපි හිතනවා. එය හුදෙක්ම ආගමික කාරණයකට වඩා එහා ගිය එකක්.

අප කියපු පරිවර්තනය සිදු කිරීම සඳහා සෑම දෙනෙක්ම එකට එකතු වෙන්න ඕනෑ. ඒක පාර්ලිමේන්තුව ඇතුළේ අය වැය කථාවකට, දේශපාලන කථාවකට විතරක් සීමා වන දෙයක් නොවෙයි. ඉන් එහා ගිය සමාජය, සංස්කෘතිය, ආගම කියන සියලු දේවල් බද්ධ වුණු තැනකටයි අපි යන්නට ඕනෑ. දැන් අපි ඉන්නේ ආණ්ඩුවේ. විපක්ෂය කියන බොරු මීට කලින් අවුරුදු ගණනාවක් කියාගෙන යන්න පුළුවන් වුණත් දැන් එහෙම කරන්න බැහැ. ඒ නිසාම තමයි වැටුප් පිළිබඳව මතු කරන ප්‍රශ්නයත්, සියයට 15ක tax පිළිබඳව මතු කරන ප්‍රශ්නයත්, තෙල් පෝලිම් පිළිබඳ ප්‍රශ්නයත් ඉතා ඉක්මනින් මහ ජනතාවට හෙළිදරව් වුණේ. අපිත් ඒවා මහ ජනතාවට හෙළිදරව් කරලා පෙන්වනවා. අපි කිසි විටෙක -එදාත්, අදත්, හෙටත්- බොරු කියන්නේ නැහැ. අපි ඇත්ත වෙනුවෙන්මයි පෙනී ඉන්නේ. ඇත්ත කථා කරන නිසා දැන් බොරුව වේගයෙන් හෙළිදරව් වෙනවා.

ඊළඟට, විපක්ෂය මතු කළ ප්‍රශ්නවලටත් පිළිතුරු කිහිපයක් ඉදිරිපත් කරන්න ඕනෑ. එතුමන්ලා රැකියා පිළිබඳ ප්‍රශ්නය මතු කළා. වැටුප් වැඩි වීමට අමතරව රැකියා ලබා දෙනවා කියලා අපි පොරොන්දුවක් වුණා කිව්වා. ඔව්, ඒ පොරොන්දු වූ ආකාරයටම කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ නිලධාරී කමිටුවක් විසින් අධ්‍යයනයක් කරලා වාර්තාවක් දීලා තිබෙනවා, කොහොමද ඒ බඳවා ගැනීම් සිද්ධ කරන්නේ කියලා. ඒ බඳවා ගැනීම්වලට මේ වර්ෂය සඳහා රුපියල් බිලියන 10ක් වෙන් කර තිබෙනවා. ඒ වාර්තාව අනුව, පළමුවෙනි පියවරේදී අපි හඳුනාගෙන තිබෙනවා පුරප්පාඩු 15,453ක්. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ 9ක් යටතේ 7,456දෙනෙකු බඳවා ගැනීම සඳහා මේ වනකොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වෙලා තිබෙනවා. ඊට අමතරව, ඒ නිලධාරී කමිටුව විසින් නිර්දේශ කරලා අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙනවා, තවත් තනතුරු 2,003ක්. ඒවා අතරේ තිබෙනවා දීප ව්‍යාප්ත විධායක සේවා, කළමනාකරණ සේවා, පවුල් සෞඛ්‍ය සේවා, ඖෂධවේදී, විකිරණ ශිල්පී, සෞඛ්‍ය ලිපිකරු, රෝහල් අරක්කැමි ආදි සේවා විශාල ප්‍රමාණයක තනතුරු. ඒ වාගේම මහාධිකරණ විනිසුරුවන්, අධිකරණ නිලධාරීන්, බන්ධනාගාර අධිකාරිවරුන් යනාදී වශයෙන් ක්ෂේත්‍ර ගණනාවක තනතුරු තිබෙනවා.

රාජ්‍ය අංශයට බඳවා ගැනීම් කිව්වාම, අපට අතීත අත්දැකීම් තිබෙන්නේ මොකක් හෝ විභාගයක් තියලා හෝ නැතිව, එහෙම නැත්නම් දේශපාලන හිතවත්කමක් මත බඳවා ගැනීම්. එහෙම බඳවා ගත් නිසා තමයි මේ රාජ්‍ය සේවයේ ගැටලු ඇති වෙලා තිබෙන්නේ. අපි ඒක වෙනස් කරමින් එවැනි බඳවා ගැනීම් වෙනුවට වඩාත් ක්‍රමවත්, විධිමත් ආකාරයට අවශ්‍ය කණ්ඩායම් බඳවා ගනිමින් යනවා. ඒකට අවශ්‍ය ප්‍රතිපාදනත් ලබා දීලා තිබෙනවා.

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 47,603,000,000

Question, "That the sum of Rs. 47,603,000,000, for Head 321, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 321, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 8,667,000,000

Question, "That the sum of Rs. 8,667,000,000, for Head 321, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 321, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

"193 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 220,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

193 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 52,000,000

"193 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 52,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

193 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 150,000,000

"193 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 150,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

193 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 6,000,000

"193 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 6,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

193 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

221 වන ශීර්ෂය.- කම්කරු දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 2,180,000,000

"221 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 2,180,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

221 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 910,000,000

"221 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 910,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

221 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 1,220,000,000

"221 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 1,220,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

221 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 710,000,000

"221 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 710,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

221 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

328 වන ශීර්ෂය.- මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 600,000,000

"328 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 600,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

328 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 7,000,000

"328 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 7,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

328 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 15,000,000

"328 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 15,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

328 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“තලෙප්පු 193, නිකුළ්ච්චිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඤ් සෙලවුක්කාන රූපාය් 220,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප් පඩුමාක” එනුම් විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 193, නිකුළ්ච්චිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිඩප්පට්ටදු.

නිකුළ්ච්චිත්තිට්ටම් 01.- සෙයල්මුරෛච් චෙයර්පාඩුකළ් - මූලතනච් සෙලවු, රූපාය් 52,000,000

“තලෙප්පු 193, නිකුළ්ච්චිත්තිට්ටම් 01, මූලතනච් සෙලවුක්කාන රූපාය් 52,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පඩුමාක” එනුම් විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 193, නිකුළ්ච්චිත්තිට්ටම් 01, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිඩප්පට්ටදු.

නිකුළ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් චෙයර්පාඩුකළ් - මීණ්ඩුවරුඤ් සෙලවු, රූපාය් 150,000,000

“තලෙප්පු 193, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් සෙලවුක්කාන රූපාය් 150,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප් පඩුමාක” එනුම් විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 193, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිඩප්පට්ටදු.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 6,000,000

"தலைப்பு 193, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 6,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 193, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

தலைப்பு 221.- தொழில் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,180,000,000

"தலைப்பு 221, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,180,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 221, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 910,000,000

"தலைப்பு 221, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 910,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 221, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,220,000,000

"தலைப்பு 221, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,220,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 221, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 710,000,000

"தலைப்பு 221, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 710,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 221, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

தலைப்பு 328.- மனிதவலு மற்றும் தொழில்துறை திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 600,000,000

"தலைப்பு 328, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 600,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 328, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 7,000,000

"தலைப்பு 328, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 7,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 328, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 15,000,000

"தலைப்பு 328, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 15,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 328, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 220,000,000, for Head 193, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 193, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 52,000,000

Question, "That the sum of Rs. 52,000,000, for Head 193, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 193, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 150,000,000

Question, "That the sum of Rs. 150,000,000, for Head 193, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 193, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 6,000,000

Question, "That the sum of Rs. 6,000,000, for Head 193, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 193, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 221.- DEPARTMENT OF LABOUR

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 2,180,000,000

Question, "That the sum of Rs. 2,180,000,000, for Head 221, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 221, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 910,000,000

Question, "That the sum of Rs. 910,000,000, for Head 221, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 221, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 1,220,000,000

Question, "That the sum of Rs. 1,220,000,000, for Head 221, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 221, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 710,000,000

Question, "That the sum of Rs. 710,000,000, for Head 221, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 221, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 328.- DEPARTMENT OF MANPOWER AND EMPLOYMENT
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 600,000,000

Question, "That the sum of Rs. 600,000,000, for Head 328, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.
Head 328, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 7,000,000

Question, "That the sum of Rs. 7,000,000, for Head 328, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.
Head 328, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 15,000,000

Question, "That the sum of Rs. 15,000,000, for Head 328, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.
Head 328, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

අ. භා. 6.17ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 05 වන බදාදා.

பி. ப. 6.17 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 மார்ச் 05, புதன்கிழமை.

At 6.17 p.m., the Chairman left the Chair to report Progress.
Committee report Progress; to sit again on Wednesday, 05th March, 2025.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශීර්ෂ අංක 253 සහ 315 සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 130, ශීර්ෂ අංක 254 සිට 279 දක්වා ද, ශීර්ෂ අංක 312 සිට 314 දක්වා ද, ශීර්ෂ අංක 316 සිට 319 දක්වා ද, ශීර්ෂ අංක 321 සහ ශීර්ෂ අංක 193, 221, 328 සංශෝධන රහිතව ද කාරක සභාවේ දී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

සභාව කල්තැබීම.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක්
இரத்தினபுரி மாவட்டத்தில் வெள்ளப்பெருக்கைக் கட்டுப்படுத்துவதற்கான முறையான நிகழ்ச்சித்திட்டம்
SYSTEMATIC PROGRAMME FOR FLOOD MITIGATION IN RATNAPURA DISTRICT

[අ.භා. 6.19]

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රත්නපුර දිස්ත්‍රික්කයට දීර්ඝ කාලීනව බලපාන කාලීන ගැටලුවක් වන ගං වතුර උවදුර පාලනය කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය හරහා ක්‍රමවත් නව වැඩ පිළිවෙළක් සකස්කොට දිස්ත්‍රික්කයේ ගං වතුර නිසා ආපදාවට ලක් වන ජනතාවට සහනයක් ලබා දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව දීර්ඝ කාලයක් තිස්සේ ගං වතුර උවදුර නිසා මහත් පීඩනයට ලක් වෙනවා. අපේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහකට ආසන්න සංඛ්‍යාවක් හැම වර්ෂයකදීම දෙසැරයක්වත් ගං වතුරෙන් යට වෙනවා. ඒ නිසා මේක අපේ දිස්ත්‍රික්කයට විශාල ගැටලුවක් විධියට අපි දකිනවා. මේ ගැන සමහර සම්බන්ධීකරණ කමිටුවලදී අපි කථා කළා. මේවාට යෝජනා සකස් කරන්න කියලාත් කරුණු ඉදිරිපත් කළා. නමුත් අපි ඒ ගැන කථා කළා පමණයි, වැඩ පිළිවෙළක් සකස් වෙලා නැහැ. හැබැයි අපි විශ්වාස කරනවා, මේ නව රජය බලයට පත් වෙලා මේ සම්බන්ධව යම් වැඩ පිළිවෙළක් සකස් කරයි කියලා. ඒ අදහසින් තමයි අද දින මේ යෝජනාව මා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. මොකද, වාරිමාර්ග අමාත්‍යාංශය කියන්නේ මේ රටේ අය වැයෙන් විශාල මුදලක් වෙන් කරපු අමාත්‍යාංශයක්.

හැබැයි, මෙවර අය වැයෙන් අපේ දිස්ත්‍රික්කය වෙනුවෙන් මේ සඳහා යම් වැඩ පිළිවෙළක් ඉදිරිපත් වුණේ නැහැ කියලා මම විශ්වාස කරනවා. ඒකේ ගැටලුවක් නැහැ. නමුත් ලබන අය වැයකදී හෝ යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, පීඩාවට පත් වෙලා ඉන්න මේ ජනතාවගේ ජීවිත හා දේපළ රැක ගන්න පුළුවන් නම් ඒක විශාල ශක්තියක් වේවි කියා මා හිතනවා. මොකද, අපේ රටට මේ කළු ගහෙන් ආර්ථික වශයෙන්, එහෙම නැත්නම් කෘෂි කාර්මික වශයෙන් ඉතා සුළු ප්‍රමාණයක ප්‍රයෝජනයක් තමයි ලැබෙන්නේ. කළු ගහෙන් විශාල ජල ප්‍රමාණයක් මුහුදට ගලාගෙන යනවා, කිසිම ප්‍රයෝජනයක් නැතුව. ඒ නිසා අපි මේ අමාත්‍යාංශයෙන් ඉල්ලන්නේ මේකයි.

ගරු කථානායකතුමනි, වේ ගහෙන් යම් වතුර ප්‍රමාණයක් අරගෙන කුඩාව කියන අතු ගංගාවට මුදා හරින්න පුළුවන් නම් ඒ ජලය උඩවලව ජලාශය දක්වා ගෙනිහිල්ලා, එතැන සිට හම්බන්තොට දක්වාත් ගෙනියන්න පුළුවන් කියලා අපි විශ්වාස

[ගරු වරුණ ලියනගේ මහතා]

කරනවා. නැත්නම් වළවේ ගහෙන් විතරයි ජලය උඩවලව ජලාශයට ලැබෙන්නේ. හැබැයි, අපිට මේ කුඩාව කියන අතු ගංගාවටත් ජලය මුදා හරින්න පුළුවන් නම් ඒ පැත්තේ වැලිගෙපොල, ගල්පාය, පනහඩුව, කොළොන්න ආසනය පුරාවටම මේ වතුර ටික ගෙනියන්න පුළුවන්. එහෙම වුණොත් වගා කරන්නේ නැති ඉඩම් ටික අපිට වගා කරන්න පුළුවන් වේවි කියලා අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් සුළු වැඩ කොටසක් තමයි අපිට කරන්න තිබෙන්නේ.

ඒ වාගේම අපි පසුගිය කාලයේ සම්බන්ධීකරණ රැස්වීම්වලදී කථා කළා, dry dam concept කියලා යම් වැඩ පිළිවෙළක් ගැන. මේක ලෝකයේ සමහර රටවල ක්‍රියාත්මක කරනවා. වැහි කාලවලදී ජලාශය වහලා යම් වතුර ප්‍රමාණයක් ඒවායින් නිදහස් කරනවා. එසේ නිදහස් කරන ජලය පාවිච්චි කරලා, කුඩා ජල විදුලි බලාගාරයක් මඟින් විදුලි බලය ලබා ගන්නත් පුළුවන් ක්‍රමයක් තිබෙනවා. ඒ නිසා මේ dry dam concept එක ගැන අපි වාරිමාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ කථා කළා. නමුත් අපිට ඒක ක්‍රියාත්මක කරගන්න බැරි වුණා. ඒ නිසා කළු ගඟේ අතු ගංගා කිහිපයක් ජන ජීවිතයට බලපාන්නේ නැති වන විධියට අපිට දැනට වසා දමන්න පුළුවන්. එහෙම නැතිව තවත් කාලයක් ගිහිල්ලා මේ පෝෂිත කලාපවල ජනාවාස ඇති වුණොත් අපිට නැවතත් මේ කටයුතු කරන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඉදිරි අවුරුදු 10ක්, 15ක් ගැන කල්පනා කරලා තමයි මේවා කඩිනමින් කරන්න ඕනෑ කියන මේ සභාව කල් තැබීමේ යෝජනාව මම මේ ගරු සභාවට අද ඉදිරිපත් කළේ, ගරු කථානායකතුමනි. මේ යෝජනාව අපේ වාරිමාර්ග ඇමතිතුමාගේ අවධානයට මා යොමු කරනවා. ඒ වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න කියලා එතුමාගෙන් ඉල්ලා සිටිමින් මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. B. Ariyawansha to second the Motion. You have six minutes.

[අ.භා. 6.24]

ගරු බී. ආරියවංශ මහතා
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා. විශේෂයෙන්ම එතුමා කිව්වා වාගේ රත්නපුර දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම රත්නපුර, අයගම ඇතුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක පමණ පහත්බිම් විශාල ප්‍රමාණයක් මේ කළු ගඟ හේතු කොටගෙන ගංවතුරට යට වීම නිසා ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වෙනවා. කළු ගඟ පටත් ගන්නේ සමනල කන්දේ ඉඳලා. මේ කළු ගඟ කළුතර දිස්ත්‍රික්කයෙන් තමයි මුහුදට ගලා බසින්නේ. රත්නපුර දිස්ත්‍රික්කයේ වාගේම කළුතර දිස්ත්‍රික්කයේත් ගම්මාන රාශියක් මේ කළු ගඟ ආශ්‍රිතව ඇති වන ගංවතුර තත්ත්වය හේතු කොටගෙන ජලයෙන් යට වෙනවා. මෙකට එකම විසඳුම තමයි, ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා සඳහන් කළේ. මීට වසර ගණනාවකට ඉස්සෙල්ලා කළු ගඟ ව්‍යාපෘතිය නමින් ගිලීමලේ, මල්වල ප්‍රදේශයේ විශාල ජලාශයක් ඉදි කරන්න යෝජනා වෙලා, මැනුම් කටයුතු කරලා, ඒකේ ශක්‍යතා වාර්තා පවා සකස් කරලා තිබුණා. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඒක ක්‍රියාත්මක වුණා නම් මෙතුමා සඳහන් කළ ආකාරයට ඇඹිලිපිටිය ප්‍රදේශයට, විශේෂයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රදේශයට ඒ ව්‍යාපෘතිය තුළින් ජලය ලබා ගන්න පුළුවන් වෙනවා.

ඒ වාගේම එම ව්‍යාපෘතියෙන් කොළඹ දිස්ත්‍රික්කයටත් යම් වතුර ප්‍රමාණයක් ලබා ගන්න තිබුණා. නමුත්, ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. කොහොම හරි ඒක යට ගියා. රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ ගැන කථා කරපු අවස්ථාවේදී යෝජනා වෙලා තිබෙනවා, ඇළවල් හරස් කරලා කුඩා වැව් ඉදි කරලා ඒ තුළින් ජලය රැස් කරලා, පසුව ක්‍රම-ක්‍රමයෙන් කොටස් වශයෙන් ජලය බැහැර කිරීම තුළින් ගංවතුර වළක්වා ගැනීමට හැකි වනවාය කියලා. මෙවර අය වැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් නොවුණත් ඔබගේ ආණ්ඩුවක් තුළ ඉදිරි අය වැයක් යටතේ හෝ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා මේ කටයුත්ත ඉටු කළොත් හොඳයි. දීර්ඝ කාලයක සිට රත්නපුර ජනතාව මේ ගංවතුර උවදුර හේතුවෙන් පීඩාවට පත් වෙනවා. රත්නපුරය කියන මේ රුවන්පුරය මැණික්වලින් ස්වයංපෝෂිත වුවත්, කෘෂි කර්මාන්තය පැත්තෙන් තේ වගාව, ගම්මිරිස් ඇතුළු වගාවලින් පෝෂණය වුණත්, ජනතාව ඉතාම දුක්ඛිත තත්ත්වයට පත් වෙලා ඉන්නේ. හැම වසරකම දෙතුන් වතාවක් එම ප්‍රදේශ ගංවතුරට ලක් වෙනවා. ඒ වාගේම හදිසි ආපදා -ගංවතුර, නාය යෑම්- යටතේ සිදු වන ආපදාවලින් ගෙවල් විනාශ වනවා. හැබැයි, ඒවාට වන්දි වශයෙන් ලබා දෙන්නේ ඉතාම සුළු මුදලක්. පසුගිය කාලය තුළ අපි දැක්කා, ඒ ප්‍රදේශයේ නාය යෑම් සිදු වුණා; ගංවතුරට යට වුණා. ග්‍රාම නිලධාරිතුමා ඇවිල්ලා අර්ධ හානි කියලා ඒවා සඳහන් කරනවා. ඉන් පස්සේ ඒ අයට ආධාර ලබා දීමේදී රුපියල් 10,000ක්, රුපියල් 20,000ක් වාගේ ඉතාම සුළු මුදලක් තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඒ නිවාසවලට ලබා දෙන්නේ. අඩුම ගණනේ ෂීට් දෙකක් ගන්නවත් ඒ මුදල ප්‍රමාණවත් වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ගංවතුර, නායයෑම් ඇති වීමෙන් කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූරියකන්ද ප්‍රදේශයේ අලුත් කැල්ල කියන කොටස නාය යෑමට ලක් වුණා. ඒ සිද්ධිය වෙලා දැන් අවුරුදු 15කට වැඩි කාලයක් වනවා. මේ වනකල් ඒ අයට ඉඩම් ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කර ගන්න බැරි වුණා. සූරියකන්ද වතු යායෙන් ඉඩම් කොටසක් ලබා දෙනවා කිව්වත්, මේ වනකල්ම ඒ අයට ඒ ඉඩම් ලබා දීලා නිවාස සකස් කරන වැඩ පිළිවෙළක් සකස් වෙලා නැහැ. සෑම වසරකම ඒ ප්‍රදේශය ගංවතුරෙන් යට වනවා විතරක් නොවෙයි නායයෑම්වලටත් ලක් වනවා. ඒ වාගේම එය දැඩි වර්ෂාපතනයක් සහිත සිංහරාජ වනාන්තරය ආශ්‍රිත ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ අය වැසි කාලයට පාසල්වලට ගිහිල්ලා තමයි ජීවත් වෙන්නේ. නැවත පායනකොට ඒ නිවෙස්වලටම ඇවිල්ලා ජීවත් වනවා.

ඊළඟට, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනාන, සපුගස්කන්ද ප්‍රදේශවල පවුල් 16ක් පමණ වසර ගණනාවක සිට ඒ අයුරින්ම තමයි ජීවත් වෙන්නේ. ඒ අයටත් නිසි ඉඩම් ලබා දීලා නිවාස සකස් කරන වැඩ පිළිවෙළක් නැහැ. ඒ වාගේම ලංකාබේරිය කියන පාසල නාය ගිහිල්ලා අවුරුදු 15කට වැඩියි. ඒ පාසල වසා දමා තිබෙන්නේ. එය දමිළ ජනතාව ජීවත් වන ප්‍රදේශයක්. ලංකාබේරිය පාසලේ දරුවන් අද අධ්‍යාපනය ලබන්නේ එතැනම තිබෙන පොඩි පැල්පතක. ඒ අයට එම පාසල සකස් කර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කරන්න කියා ඉල්ලා සිටිමින් ඔබ සියලුදෙනාටම ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Shantha Pathma Kumara Subasingha. You have four minutes.

[අ.භා. 6.29]

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
ගරු කථානායකතුමනි, අපේ දිස්ත්‍රික්කයේ වරුණ ලියනගේ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉතා කාලීන යෝජනාවක්. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කය විතරක් නොවෙයි, රත්නපුර, කළුතර යන දිස්ත්‍රික්ක දෙකම ආපදාවලට ලක් වෙනවා, ගංවතුර තත්ත්වයත් එක්ක. ගින්නක් ඇති වුණාම ඒ ගින්න නිවා දැමීම සඳහා ගිනි නිවන හමුදාව කටයුතු කරනවා වාගේ මෙතෙක් ආණ්ඩු කරපු හැමෝම කළේ ගංවතුර හේතුවෙන් ආපදාවට ලක් වුණාට පස්සේ සහන විධියට මොනවා හෝ ටිකක් දෙන එක විතරයි. නමුත්, අපේ වරුණ ලියනගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේකට ස්ථිරසාර විසඳුමක් අවශ්‍ය වෙනවා. ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව ලබා ගන්න පෙර ඉඳන් අපි විශේෂයෙන් ජාතික විද්වත් සංවිධානය විධියට දිස්ත්‍රික්කයේ සැලසුම් සකස් කළා.

අපි විශේෂ අවධානයක් යොමු කළා, රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කවලට බලපාන ගංවතුර තත්ත්වය ස්ථිරසාරව නවත්වා ගැනීම සඳහා. ඒ සඳහා අපේ පැත්තෙන් යෝජනා කිහිපයක්ම තිබෙනවා. කළු ගඟ නිසා විතරක් නොවෙයි වරුණ ලියනගේ මන්ත්‍රීතුමා, ප්‍රධාන වශයෙන් කළු ගඟට අමතරව වේ ගඟ, කුරු ගඟ කියන ගංගා නිසාත් රත්නපුර සහ ඒ අවට ප්‍රදේශ යටවෙලා විශාල හානියක් සිදු වෙනවා. ඒ සඳහා අපේ එක යෝජනාවක් තමයි, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් පැහැදිලි කරපු විධියට වියළි වේලි - dry dam - සංකල්පය. ඒක ලංකාවේ කොහේවත් තවම අත්හදා බලා නැහැ, මම හිතන විධියට. නමුත් ඇමෙරිකා එක්සත් ජනපදය වාගේ දියුණු රටවල ඒ ක්‍රමය පාවිච්චි කරනවා, ඔබතුමාත් කියපු විධියට. අපි සාකච්ඡා කරලා තිබෙනවා, විශේෂයෙන්ම මල්වල වාගේ ප්‍රදේශවල වියළි වේලි සංකල්පය ක්‍රියාත්මක කරන්න.

කළුගඟ කිලෝමීටර 100ක් විතර ගලාගෙන ගිහිල්ලා කළුතරින් තමයි මුහුදට වැටෙන්නේ. කිලෝමීටර 2ක් විතර මුහුදට සමාන්තරව ගලාගෙන ගිහිල්ලා මුහුදට වැටෙන්න ආසන්නයේදී අංශක 90ක නැමීමකින් තමයි කළුතරින් මුහුදට වැටෙන්නේ. ඉතින් අපට පුළුවන් නම් ඊට මෙහායින් ගංගා මෝයේ මුඛය පුළුල් කරන්න, ඒකත් හොඳ වැඩපිළිවෙළක්. එවැනි සංකල්පයකුත් ඉදිරිපත් වෙලා තිබෙනවා. විද්‍යාඥයන් ඒ වාගේ යෝජනාවකුත් කරනවා.

ඊට අමතරව ඔබතුමන්ලා දෙපළම කිව්වා, උඩවලව ජලාශය සම්බන්ධ කාරණාවක්. ඒකත් බොහොම සාර්ථක ව්‍යාපෘතියක් වෙනවා. ඊට අමතරව තවත් විද්‍යාඥයන් සහ ඒ පිළිබඳ විද්වතුන් ඉදිරිපත් කරන මතයක් තමයි ගංගා දෙපස ඉවුරු ටිකක් පුළුල් කරන්න ඕනෑය කියන එක. ඉතින් ඔන්න ඔහොම යෝජනා කිහිපයක්ම තිබෙනවා. ඉතින් අපි සාකච්ඡා කරමින් ඉන්නවා. ඊට අමතරව ආණ්ඩුව පැත්තෙන් කරන යෝජනා පිළිබඳව අපේ නියෝජ්‍ය ඇමතිතුමා දැනුවත් කරාවි. මම ඔබතුමාට ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, මේ වාගේ යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව. අපි ඔබතුමන්ලාට යෝජනා කරනවා, රත්නපුරයේ ගංවතුර තත්ත්වය සහමුලින් තුරන් කිරීම සඳහා එකතු වෙලා වැඩ කරමු කියලා.

යෝජනා කිහිපයක් තිබෙනවා වාගේම එක පැත්තකින් මේ වසරේ මේ වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන් නම් ඇත්තටම හොඳයි. මම දන්නේ නැහැ, නියෝජ්‍ය ඇමතිතුමා මේ සම්බන්ධව උත්තරයක් දෙයි. කෙසේ නමුත් වරුණ ලියනගේ මන්ත්‍රීතුමනි ඔබතුමාත් කියන පරිදි, අප හැකි ඉක්මනින් ඒ සඳහා විසඳුමක් සොයා ගන්න ඕනෑ. ඒ නිසා මම ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් විධියට ඒ අවශ්‍ය අරගළය කරනවා වාගේම අපේ නියෝජ්‍ය ඇමතිතුමා සහ මේ සියලුදෙනාම ඒ සඳහා සහයෝගය දෙයි. මොකද, රත්නපුරයට විතරක් නොවෙයි, කළුතර දිස්ත්‍රික්කයටත් මේ තත්ත්වය බලපානවා. නැවත වතාවක් ඔබතුමාට ස්තුති කරමින්, මේ පිළිබඳව අපේ අවධානය යොමු කරන බව මා කියා සිටිනවා. අපි යෝජනා මට්ටමෙන් බොහෝ දේවල් සාකච්ඡා කරමින් ඉන්නවාය කියන කාරණය මේ ගරු සභාවට ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Upul Kithsiri. You have four minutes.

[අ.භා. 6.34]

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු කථානායකතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයට බලපාන ගංවතුර තත්ත්වය පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේදී මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් විපක්ෂයේ වරුණ ලියනගේ මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ලංකාවේ දිස්ත්‍රික්ක අතරින් රත්නපුරය කියන්නේ ගංවතුරේ අයිතිය තිබෙන දිස්ත්‍රික්කය හැටියට හඳුන්වන්න පුළුවන්. ඒ කියන්නේ ගංවතුර පිළිබඳව වාර්ෂිකව, නිශ්චිතවම කථා කරන තැන තමයි රත්නපුරය කියලා කියන්නේ. රත්නපුරයේ ජනතාවට අප්‍රේල් මාසය පහු වෙනකොට ගංවතුර කියන එක දැනෙනවා. සාමාන්‍යයෙන් කියමනේ තිබෙන්නේ, සිංහල අලුත් අවුරුද්ද පහුවෙලා දින 45ක් විතර යනකොට ඒ ප්‍රදේශයට අනිවාර්යයෙන්ම ගංවතුරක් පැමිණෙනවාය කියලා. ඒ වාගේම සාමාන්‍යයෙන් මැයි මාසයේදී ස්වාභාවික පරිසරයෙන් පවා ඒ අය දැන ගන්නවා, ගංවතුරක් එනවාය කියලා. මම හිතන විධියට, වසර දහස් ගණනක් තිස්සේ සමනල අඩවියට වැටෙන වතුර වේගයෙන් ගලාගෙන ඇවිල්ලා රත්නපුර ප්‍රදේශයේ තිබෙන පහත් බිම් සහ සමතලා බව නිසාම ඒ ප්‍රදේශය යට වෙනවා; ඒ අය ඒකට හුරු වෙලා ඉන්නවා. සමහර වෙලාවට ගෙවල් හදනකොට ඒ අය යට තට්ටුව ගංවතුර සඳහා අත්හරිනවා.

සමහර වෙලාවට වගා කන්න දෙකෙන් එකක් වගා කරන්නේ නැහැ. ඒ වාගේම උපරිම ගංවතුර ආපු සීමාව සමහර ගෙවල්වල mark කරලා තිබෙනවා. එම නිසා වාර්ෂිකව ඇති වන ගංවතුර කියන්නේ, රත්නපුරයේ ජනතාව හා එකට බැඳුණු බේදවාචකයක්. ඒක කොච්චරද කියනවා නම්, මම හිතන විධියට අද මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාගේ නිවසත් ගංවතුරට යට වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මම ඔබතුමාට නැවතත් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාගේ තාත්තාත් ඒ දවස්වල මේ පිළිබඳව කථා කරලා තිබෙනවා. ඔබතුමන්ලා අපට මේ යෝජනාව ගෙනැවිත් තිබෙනවා. ඔබතුමා ගෙනාපු යෝජනාවට යම් සැලැස්මක් ඇතිව කෙටි කාලයකින් උත්තරයක් හදන්න ආණ්ඩුවක් හැටියට අපට පුළුවන් වුණොත්, එය රත්නපුරයේ ජනතාව වෙනුවෙන් කරන ලොකුම සේවාවක් හැටියට තමයි අපි දකින්නේ.

[ගරු උපුල් කිත්සිරි මහතා]

එම ගංවතුර හේතුවෙන් රත්නපුර, කුරුවිට, අයගම, කලවාන, නිවිතිගල, ඒ වාගේම ඇහැලියගොඩ වාගේ ප්‍රදේශවල පහත් බිම් ඇතුළු තවත් පහත් බිම් ගණනාවක් යට වෙනවා. විවිධ කාල වකවානුවලදී මේ පිළිබඳව තාක්ෂණික ඇගැයීම් සිදු කර ඇති අතර, විවිධ යෝජනා සහ විවිධ අවස්ථාවල සාකච්ඡාත් ඇතිවෙලා තිබෙන බව අපි දන්නවා. එම නිසා දැන් මේ යෝජනාව මතු වුණු එකත් හොඳයි. අපේ රටේ ප්‍රදේශයක් හැටියට රත්නපුර ජනතාව වාර්ෂිකව විඳින පීඩාව වෙනුවෙන් මේ යෝජනාවට උත්තර සොයන්න පුළුවන් නම් ආණ්ඩුවක් හැටියට අපි ඉතාම සතුටු වෙනවා.

ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා සමඟත් සාකච්ඡා කරලා රත්නපුර ජනතාව වෙනුවෙන් මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. එහිදී අපට යෝජනා ගණනාවක් ක්‍රියාත්මක කරන්න වෙයි. මේ යෝජනාවලින් එකක්, දෙකක්, තුනක් හෝ හතරක් කෙසේ හෝ ක්‍රියාත්මක කරලා මෙම ගංවතුර තර්ජනයෙන් රත්නපුරයේ ජනතාව මුදාගන්න කටයුතු කරන්න හැකිවෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙම උවදුරෙන් පීඩා විඳින මන්ත්‍රීවරයෙක් විධියට විපක්ෂ මන්ත්‍රී ගරු වරුණ ලියනගේ මැතිතුමා මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව යළිත් එතුමාට ස්තුතිවන්ත වෙමින්, ආණ්ඩුවත් එක්ක එකතුවෙලා රත්නපුර ජනතාව වෙනුවෙන් මේ ගැටලුව විසඳන්න යමක් කරමු කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. (Dr.) Susil Ranasinghe. You have seven minutes.

[අ.භා. 6.38]

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, ඇත්තටම රත්නපුර දිස්ත්‍රික්කය කියන්නේ, ගංවතුරෙන් දැඩි ලෙස පීඩා විඳින දිස්ත්‍රික්කයක්. එම ගැටලුවට පිළිතුරක් සෙවීම සඳහා ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව ඇත්තටම අපි සතුටු වෙනවා. සභාව කල් තබන අවස්ථාවේ ඒ යෝජනාව එතුමා ඉදිරිපත් කළ විලාසය, ඒ සංයමය පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම එම යෝජනාව ස්ථිර කළ මන්ත්‍රීතුමාත්, අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙපළකුත් මේ සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දැක්වුවා. ඒ කථා ඇතුළේම තිබුණා, රත්නපුරයේ ජනතාව කොපමණ පීඩාවක් විඳිනවාද, එම උවදුර ජන ජීවිතයට කොයි තරම් දුරට බලපා තිබෙනවාද කියන එක සහ ඒ සඳහා වන හේතු සාධක. ඒ වාගේම මෙම ප්‍රශ්නයට දැනට යෝජනා කර තිබෙන උත්තර පිළිබඳවත්, යම් යම් මට්ටමින් ක්‍රියාත්මක කරන්න දරපු උත්සාහයන් පිළිබඳවත් සාකච්ඡා කළා.

ගරු කථානායකතුමනි, ඇත්තටම රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර ඇති වීමට ප්‍රධාන හේතුව තමයි කළු ගඟ. කළු ගඟේ ඉහළ ප්‍රදේශය කියන්නේ විශේෂයෙන්ම නිරිත දිග මෝසම් කාලයේදී අධික වර්ෂාවක් ලැබෙන ප්‍රදේශයක්. එය තව ටික කාලයකින් ආරම්භ වීමට නියමිතයි. එම අධික වර්ෂාපතනය නිසා එක්වරම කළු ගඟට ලොකු ජල ධාරිතාවක් නිකුත් වෙනවා. එම ජල ධාරිතාව නිසා තමයි රත්නපුර දිස්ත්‍රික්කයෙන් පහළට කළුතර දක්වා බොහෝ ප්‍රදේශ යට වෙන්නේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව පැත්තෙන් මේ සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිද්ධවෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් ගංවතුර පාලනය කරන්න ගියාම විවිධ විසඳුම්, විවිධ ක්‍රියාමාර්ග ගන්නවා. රත්නපුර දිස්ත්‍රික්කයත් ගංවතුරෙන් යට වුණාම ඒ සම්බන්ධයෙන් වූ ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වාගේම යම් යම් දේවල් කරනවා. මිනිස්සු විඳින පීඩාව සම්බන්ධයෙන් විපක්ෂයවත්, අපිවත් සතුටු නැහැ. ඒ මිනිස්සු යම් මට්ටමකින් එම ගංවතුරට හුරුවෙලා තිබෙනවා. ගංවතුර නිසා සිදුවන හානි සඳහා ඔවුන්ට වන්දි ගෙවනවා. එම උවදුරුවලට මුහුණ දීම සඳහා ඔවුන්ගේ ජීවිත හැඩගසාගෙන ඉන්නවා.

දැනට ක්‍රියාත්මක කරන පිළියම් වාගේම, මේ සඳහා ස්ථිරසාර විසඳුමකුත් අවශ්‍යයි. ඒ නිසා තමයි මේ සම්බන්ධයෙන් ගෙනැවිත් තිබෙන යෝජනාව අතිශය වැදගත් වෙන්නේ. ගංවතුර පාලනය කරන්න ගියාම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේ සඳහා තාක්ෂණික පැත්තෙන් ඉදිරිපත් කරන ව්‍යුහාත්මක පිළිතුරු තිබෙනවා. ඒ කියන්නේ, ව්‍යුහයන් ගොඩනඟමින් ගංවතුර පාලනය කිරීම සඳහා උත්තර තිබෙනවා.

ව්‍යුහයන් ගොඩ නැඟීමකින් තොරව ලබා දෙන පිළිතුරු ද තිබෙනවා. දැන් යම් මට්ටමකින් ක්‍රියාත්මක වන්නේ ඒවායි. ව්‍යුහයන් ගොඩ නඟමින්, ඒ කියන්නේ යම් ඉදිකිරීම් කරමින් ගංවතුර පාලනය කිරීම සඳහා කළු ගඟ ආශ්‍රිතව අතීතයේදී අධ්‍යයනයන් විශාල ප්‍රමාණයක් සිදු වී තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනට පිළිගන්නා අධ්‍යයනය තමයි 2014 වර්ෂයේ ඊශ්‍රායල උපදේශක කණ්ඩායමක් රත්නපුර ප්‍රදේශයේ කළු ගඟ ආශ්‍රිතව සිදු වන ගංවතුර පාලනය සඳහා කරපු අධ්‍යයනය. එහිදී ඔවුන් විශේෂයෙන් යෝජනා කරනවා, අපේ ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා සඳහන් කරපු dry dam system එක. කළු ගඟේ යම් ස්ථානයකදී - මල්වල කියන ස්ථානයේදී - dry dam එකක් හදන්න යෝජනා කරනවා. ඒ වාගේම වේ ගඟේ තැන් දෙකකදී, දෑල 2 සහ දෑල 3 කියන දෑල ප්‍රදේශයන්හිදී, dams දෙකක් හදන්නත් යෝජනා කරනවා. Dry dam system කියන්නේ ලෝකයේ දැනට පාවිච්චි වන, තාක්ෂණිකව පිළිගන්නා ඉහළ විද්‍යාත්මක තාක්ෂණයක් තිබෙන ක්‍රමයක්. Dry dam system එකක් කියන්නේ, ගංවතුර මට්ටමට එන්නේ නැති වෙලාවේ ගඟේ ජලය එහෙමම ගලාගෙන යන්න ඉඩ දීලා අධික ජල ධාරාවක් එනකොට ඒක රඳවා ගන්න හදන වේල්ලක්.

ඒ ජල ධාරිතාව රඳවා ගන්නා වෙලාවට එය ජලාශයක් බවට පත් වෙනවා. නමුත් ක්‍රමිකව, පාලනයක් සහිතව ඒ වතුර මුදා හරිනවා, ඒ ආශ්‍රිත ප්‍රදේශ ගංවතුරට යට වෙන්නේ නැති වන විධියට. ඒකේ වාසි ගොඩක් තිබෙනවා කියලා මේ අධ්‍යයනයෙන් කියනවා. රත්නපුරයේ භූමිය ගත්තාම එය මැණික් තිබෙන, මැණික් පතල් කර්මාන්තයේ යෙදෙන භූමියක්; ඒ වාගේම වගාවන් සඳහා යොදා ගන්නා භූමියක්. ඒ භූමිය වටිනවා. ඒ නිසා මේ dry dam කියන තාක්ෂණය වැදගත් වන්නේ එතැනට. යම්තාක් කාලයකට -ජල ධාරිතාව රඳවා ගන්නා කාලයට- ඒ භූමිය යට වෙනවා. එය, දවස් කිහිපයකට වෙන්න පුළුවන්; සති කිහිපයකට වෙන්නත් පුළුවන්. නමුත්, එතැනින් පස්සේ ඒ භූමිය ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ගරු කථානායකතුමනි, වේල්ලක් ඉදි කරලා ජලාශයක් හැදුවාම ඒ භූමිය ආයෙත් වෙනත් දෙයකට

පාවිච්චියට ගන්න බැහැ. නමුත් මේ කියන ක්‍රමවේදයේදී ඒ භූමිය නැවත පාවිච්චියට ගන්න පුළුවන්. වතුර රැඳෙන වෙලාවට එතැනින් ඉවත් වෙන්න සිදු වෙනවා. අනෙක් වෙලාවට යම් යම් කෙටි කාලීන වගා කටයුතු කරන්න පුළුවන්. එහෙම නැත්නම්, දවස් කිහිපයක් ජලයට හසු වුව ද හානි නොවන දීර්ඝ කාලීන භෝගවලට යන්නත් පුළුවන්. මැණික් කර්මාන්තය වාගේ දේවලටත් යම් යම් මට්ටම්වල් ඒ භූමිය යොදා ගන්න පුළුවන්. ඒ භූමියේ අයිතිය ජනතාවට තිබියදීම ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න පුළුවන්. සාමාන්‍යයෙන් ජලාශයක් හදන්න ගියාම ජනතාව එම භූමියෙන් අයින් කරනවා. එතකොට resettlement එකක් කරන්න වෙනවා; භූමියේ අයිතිය වෙනත් තැනකට මාරු කරන්න වෙනවා. නමුත් මේ ක්‍රමයේදී එහෙම එකක් අවශ්‍ය නැහැ කියලා තමයි වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් දැනට සඳහන් කරන්නේ.

මේ කියන reservoirs තුනට අදාළව dry dams තුන ඉදි කිරීම තමයි දැනට මේ සම්බන්ධයෙන් කෙරුණු අධ්‍යයනයන්ගෙන් වඩා ඵලදායී කියලා යෝජනා කරන්නේ. ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීතුමෙකු කිව්වා වාගේ උඩවලව ජලාශය සඳහා විශේෂයෙන් කුඩා ගඟෙන් එන ජලය හැරවීම කරන්න පුළුවන්. උඩවලවට වතුර ඕනෑ. ඒ ප්‍රදේශයේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න පුළුවන්. ඒ පළාතට වතුර ඕනෑ. එම නිසා මේ ජල ධාරිතාව එහේට හැරවීම සඳහාත් යෝජනාවක් තිබෙනවා. එහිදීත් කුකුළේගම හරියේදී විශාල ජලාශයක් සෑදීමට යෝජනා කරනවා. තවත් තැන් දෙකකදී මධ්‍යම ප්‍රමාණයේ ජලාශ දෙකක් යෝජනා කරනවා. Tunnel එකකින් වතුර අරගෙන යෑම තමයි ඒ අධ්‍යයනයන්ගෙන් පෙන්වා තිබෙන්නේ. එහෙම සැලැස්මක්, යෝජනාවක් තිබෙනවා.

අපේ ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ ගංවතුර ඇති වීමට ප්‍රධාන හේතුවක් තමයි කළු ගඟ මුහුදට සමාන්තරව ගිහින් අංශක 90කින් වාගේ හැරිලා කිලෝමීටර 2ක් විතර ගොස් මුහුදට වැටෙන එක. අංශක 90කින් හැරෙන එක වතුර බැස යෑමට බාධාවක්. ඒ නිසා මෝය කට පුළුල් කිරීම සහ එතැන ප්‍රතිසංස්කරණයන් අතිශයින් වැදගත්. ඒත් එක්කම සිදු වෙනවා ලවණතාව ඉහළට එන එක. ඒ නිසා ලවණ බාධකයක් ඉදි කරන්නත් ඕනෑ. මේ යෝජනා තුන තමයි විශාල වශයෙන් සාකච්ඡා වෙමින් තිබෙන්නේ. මේ යෝජනා කෙරෙහි තමයි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වෙලා තිබෙන්නේ. මේ යෝජනා අතර තිබෙන ඒවාට තමයි යොමු වෙන්න සිදු වන්නේ. ඒ නිසා මේ යෝජනාවට අපේ අවධානය යොමු කරන්න පුළුවන්. එහි කිසි ගැටලුවක් නැහැ.

රත්නපුර ප්‍රදේශයේ ජනතාව විඳින පීඩාව අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් අපට කටයුතු කරන්න පුළුවන්. ඒ වාගේම අද දින සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමාත්, එය ස්ථිර කරපු මන්ත්‍රීතුමාත් පැහැදිලිවම කිව්වා, "මේ අය වැයෙන් ඒ සඳහා කිසිම මුදලක් වෙන් වෙලා නැහැ. ඒකට කමක් නැහැ, ඊළඟ සැරේදීවත් සලකා බලන්න" කියලා. බොහොම ස්තුතියි. ගරු කථානායකතුමනි, අපේ රටේ ආර්ථිකය තිබෙන මට්ටම අනුව මේ අය වැයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව පැත්තෙන් අපි බලන්නේ වාරිමාර්ග ව්‍යාපෘතිවල bottlenecks ටික clear කරන්නයි.

ව්‍යාපෘති ගොඩක් එකතු වෙලා තිබෙනවා. ඒවාට අදාළව නඩු ගොඩයි. ඒවායේ ප්‍රශ්න ගොඩයි. ඒවා හිර වෙලායි තිබෙන්නේ. ඒ නිසා එම ව්‍යාපෘති අතරමඟ නතර වෙලායි තිබෙන්නේ. ඒ ටික clear කළේ නැත්නම්, අපේ රටේ ආර්ථික වර්ධනයක් ළඟා කර ගන්න බැහැ. උමා ඔය ව්‍යාපෘතිය වෙන්න පුළුවන්, උමා ඔය පහළ ව්‍යාපෘතිය වෙන්න පුළුවන්, පහළ මල්වතු ඔය ව්‍යාපෘතිය වෙන්න පුළුවන්, ඒ වාගේ ව්‍යාපෘති ගොඩක් තිබෙනවා. අපි මුදලක් වෙන් කර තිබෙනවා. උතුරු පළාත් මඟ ඇළ ව්‍යාපෘතිය වාගේ ඒවා සෑහෙන්න ප්‍රශ්න තිබෙන ව්‍යාපෘති. ඒ ප්‍රශ්න නිරාකරණය කර ගනිමින්, පටන් ගත්තු ව්‍යාපෘති අවසන් කිරීම තමයි මේ වසරේ අපේ අරමුණ. එතකොට අපට ඉදිරි අවුරුදුවලදී ඔය කියන කටයුතු දිහාට හැරෙන්න පුළුවන්. වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් එක්ක කථා කළාම මේ ව්‍යූහාත්මක ඉදි කිරීම් සඳහා දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක්වත් වැය වේ යැයි ඔවුන් අදහස් කරනවා. අපේ රටේ හැටියට ඒක විශාල මුදලක්. නමුත්, ඒක එක අවුරුද්දකින් අවසන් වන කටයුත්තක් නොව, අවුරුදු කිහිපයක් ගත වන එකක්. අපට අභියෝගයක් තිබෙනවා, විදේශ ආයෝජන හෝ විදේශ ආධාර මත යැපෙමින් එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී. නමුත්, ජනතාව විඳින පීඩාවෙන් ඔවුන් මුදා ගැනීම සහ ගංවතුරෙන් ආර්ථිකයට වන බලපෑම අවම කර ගැනීම අපට වටිනවා; එය අපේ ආර්ථිකයට වටිනවා.

එවැනි යෝජනාත් තිබෙනවා. අපි බලමු ඉදිරි අවුරුදුවලදී එවැනි යෝජනාවලට යන්න. ඒ සඳහා අධ්‍යයන කෙරිලා තිබෙනවා. එම නිසා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ශක්‍යතා අධ්‍යයන සඳහා යොමු විය හැකියි. අපට ඒ සඳහා සම්පත් තිබෙනවා. නමුත්, මෙහි අභියෝගයක් තිබෙනවා. ඒ තමයි, මුදල්. ඉදිරියේදී අපට රටක් විධියට එය ජය ගන්න සිදු වනවා. අපි හිතනවා ඉදිරියේදී අපට රටක් විධියට, රජයක් විධියට මේ කියන කටයුතු සඳහා යොමු වෙන්න පුළුවන් වේවි කියලා. රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව මුහුණ දෙන ගංවතුර තත්ත්වය පාලනය කිරීම සඳහා ජලාශ, හැරවීම් සහ මෝයකට පුළුල් කිරීම් වැනි යෝජනා තුළින් ස්ථිරසාර විසඳුමක් යොදා ගැනීම සඳහා යොමු වෙන්න පුළුවන් වෙයි කියන දැඩි විශ්වාසය අපට තිබෙනවා. ඒ නිසා මම ඉස්සෙල්ලා කිව්වා වාගේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අප මේ පැටලිලා ඉන්න ව්‍යාපෘතිවලින්, අවසන් කර ගන්න බැරි වෙලා තිබෙන ව්‍යාපෘතිවලින් මේ අවුරුද්දේ මිදෙන්න පුළුවන් වුණොත් හොඳයි. මේ අවුරුද්දේ තව මාස 8යි තිබෙන්නේ. අය වැයෙන් වෙන් වන මුදල්වලින් මේ මාස 8 ඇතුළත ඒ ව්‍යාපෘති සාර්ථකව නිම කර ගන්න පුළුවන් වුණොත්, ඊළඟ අවුරුදුවලදී වේගයෙන් අවධානය යොමු කරන්න අපට පුළුවන්, ඔය වාගේ පැතිවල තිබෙන මේ කියන ප්‍රශ්නවලට. ඒ සඳහා අපේ උනන්දුවක් තිබෙනවා. රජය විධියට අපි ඒ සඳහා අවධානය යොමු කරන්න කැමැතියි. ඒ සඳහා ඔබතුමන්ලාගෙන් ලැබෙන සහයෝගයත් අපි ඉතා අගය කොට සලකනවා.

මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විපක්ෂයේ ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමාට වාගේම, එය ස්ථිර කරපු ගරු මන්ත්‍රීතුමාට නැවත වතාවක් අපේ ස්තුතිය පුද කර සිටිනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

එකල්හී වේලාව අ. භා. 6.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.47ට, 2025 පෙබරවාරි 21 වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 05 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி. ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி. ப. 6.47க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 05, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.47 p.m. until 9.30 a.m. on Wednesday, 05th March 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 318 - இல. 6
Volume 318 - No. 6

2025 මාර්තු 05වන බදාදා
2025 மார்ச் 05, புதன்கிழமை
Wednesday, 05th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 05වන බදාදා
2025 மார்ச் 05, புதன்கிழமை
Wednesday, 05th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 1000]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 1002-1026]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගිනි නිවන සේවා ඒකක ස්ථාපිත කිරීම [තීරුව 1026]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 – [දහතුන්වන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 124, 216, 331 (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම්); ශීර්ෂ 151, 290 (ධීවර, ජලජ හා සාගර සම්පත්)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 1028-1181]

කල්තැබීමේ යෝජනාව:
යාපනයේ තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීම හේතුවෙන් සිදු වන සමාජීය බලපෑම [තීරු 1182-1194]

பிரதான உள்ளடக்கம்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1000]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1002-1026]

தனி அறிவித்தல் மூல வினா:
முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களில் தீயணைப்புப் பிரிவுகளைத் தாபித்தல் [ப: 1026]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட பதின்மூன்றாம் நாள்]:
[தலைப்புக்கள் 124, 216, 331(கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல்); தலைப்புக்கள் 151, 290 (கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள்)] - குழுவில் ஆராயப்பட்டது [ப: 1028-1181]

ஒத்திவைப்புப் பிரேரணை:
யாழ்ப்பாண இளைஞர் சமூகம் போதைவஸ்துக்கு அடிமையாவதால் ஏற்படும் சமூகத் தாக்கம் [ப: 1182-1194]

PRINCIPAL CONTENTS

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1000]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1002-1026]

QUESTION BY PRIVATE NOTICE:
Establishment of Fire Service Divisions in Mullaitivu and Mannar Districts [Col. 1026]

APPROPRIATION BILL, 2025 – [Thirteenth Allotted Day]:
Considered in Committee - [Heads 124, 216, 331 (Rural Development, Social Security and Community Empowerment); Heads 151, 290 (Fisheries, Aquatic and Ocean Resources)] [Cols. 1028-1181]

ADJOURNMENT MOTION:
Social Impact of Drug Addiction among Youth in Jaffna [Cols. 1182-1194]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 05වන බදාදා
2025 மார்ச் 05, புதன்கிழமை
Wednesday, 05th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report and Accounts of the University of Kelaniya for the year 2023.

I move that this Report be referred to the relevant Sectoral Oversight Committee.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (වීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, 2022ஆம் ஆண்டுக்கான இலங்கை மீன்பிடித் துறைமுகங்கள் கூட்டுத்தாபனத்தின் ஆண்டறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென பிரேரிக்கின்றேன்.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2025;

(ii) ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති 2025-2027;

(iii) පුරවැසි අය වැය 2025; සහ

(iv) මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය 2025-2029 සහ වාර්ෂික ණය ලබා ගැනීමේ සැලැස්ම 2025

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) බොරලැස්ගමුව, අබේරත්න මාවත, රතනාරාම පාර, අංක 23 දරන ස්ථානයෙහි පදිංචි ඒ.කේ. බෝයගොඩ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතර, වල්ගම දකුණ, බෝගහවත්ත, "ශාන්ති" යන ලිපිනයෙහි පදිංචි ලතිරු යසංක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) දෙවිනුවර, විජේතුංග මාවත, අංක 32 දරන ස්ථානයෙහි පදිංචි පී.ජී. පසන් මෙත්සර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මාතර, හිත්තැටිය මැද, රාජපක්ෂ හේන, අංක 18/48 දරන ස්ථානයෙහි පදිංචි පී.වී. රත්නපාල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) මාතර, කඹුරුගමුව, කොටවිල, "දම්සෙවන" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ආර්.පී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කිරිබත්කුඹුර, බුළුමුල්ල, අංක 185/බී දරන ස්ථානයෙහි පදිංචි ආර්.එච්.ඒ.එම්.ජේ.ජී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුණ්ඩසාලේ, පල්ලෙකැලේ, සෙනරත් මාවත, අංක 155 දරන ස්ථානයෙහි පදිංචි විතානගේ ගෙදර දයාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, හික්කඩුව, පතන, සමර් සිටි, අංක 17 දරන ස්ථානයෙහි පදිංචි අයි.ජී.එස්.ඩබ්ලිව්. රවීන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කනත්තේවැව, පලුගස්වෙල යන ලිපිනයෙහි පදිංචි ඒ. ධර්ම ශ්‍රී රණතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මහව, බෝගස් හන්දිය, වැලියාය, රන්දෙනිගම පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.අයි.එම්. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මහකෙළිය, අංක 102 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, තලාව, දළදාපුර, අංක 419/02/45 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඒ.කේ.ඊ. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

මදුනාගල සංචාරක ව්‍යාපෘතිය: වර්තමාන තත්ත්වය
மதுனாகல சுற்றுலா கருத்திட்டம்: தற்போதைய நிலை
MADUNAGALA TOURIST PROJECT: CURRENT STATUS

7/2024

1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රුහුණු සංචාරක කාර්යාංශය විසින් මදුනාගල සංචාරක ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන බව දන්නේද;

(ii) එමඟින් මදුනාගල උණු දිය උල්පත් යොදා ගෙන හද සම්භාෂනය (හෘද පුනර්ජීවනය) කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා ඉදිකරන ලද ගොඩනැඟිල්ල සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම ගොඩනැඟිල්ලේ ඉදි කිරීම් කටයුතු මේ වනතෙක් අවසන් කර නොමැති බැවින් එම ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ව්‍යාපෘතිය යටතේ මදුනාගල සංචාරක කලාපයේ ඉදිකරන ලද ආපනශාලාව, විවේකාගාරය සහ භෝජනාගාරය වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විශාල මුදලක් වැය කර ඉදිකරන ලද සංචාරක බංගලාවේ ඇති විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාවිරහිත වී ඇති අතර එහි වහල අබලන් වී ඇති බව දන්නේද;

(iii) එහි ඉදි කරන ලද ගැමි කඩමණ්ඩිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) මේ වනවිට එම කඩමණ්ඩිය නටඹුන් වී ඇති බව දන්නේද;

(v) එම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) ருஹுணு சுற்றுலாப் பணியகத்தால் மதுனாகல சுற்றுலா கருத்திட்டம் ஆரம்பிக்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) இதன்கீழ் மதுனாகல வெந்நீர் ஊற்றைப் பயன்படுத்தி இதயத் தசை பிடித்துவிடுதல் (இதய புத்துயிரூட்டல்) நிலையமொன்றை அமைப்பதற்காக நிர்மாணிக்கப்பட்ட கட்டடத்துக்குச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கட்டடத்தின் நிர்மாணப் பணிகள் இதுவரை நிறைவு செய்யப்படவில்லை என்பதால், அந்நிர்மாணப் பணிகளை நிறைவு செய்வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டத்தின்கீழ் மதுனாகல சுற்றுலா வலயத்தில் நிர்மாணிக்கப்பட்டுள்ள சிற்றுண்டிச்சாலை, ஓய்வறை மற்றும் உணவகம் போன்றவற்றுக்காகச் செலவிடப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) அதிகளவான பணத் தொகையைச் செலவிட்டு நிர்மாணிக்கப்பட்டுள்ள சுற்றுலா விடுதியிலுள்ள மின் பிறப்பாக்கி செயலிழந்து காணப்படுவதுடன், விடுதியின் கூரையும் பழுதடைந்த நிலையில் இருப்பதை அறிவாரா என்பதையும்;

(iii) அங்கு நிர்மாணிக்கப்பட்டுள்ள கிராமியக் கடைவீதிக்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iv) தற்போது மேற்படி கடைவீதி சிதைவடைந்த நிலைக்கு உள்ளாகியுள்ளதை அறிவாரா என்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்தை மீண்டும் நடைமுறைப்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) whether he is aware that the Ruhunu Tourist Bureau has started the Madunagala Tourist Project;

(ii) the amount of money that has been spent to construct a building to establish a heart massage (heart revival) centre, using hot water springs in Madunagala; and

(iii) the steps that will be taken to complete the construction of that building as the work of that building has not yet been finished;

(b) Will he also inform this House -

(i) separately, the amount of money that has been spent on the cafeteria, restroom and dining hall that have been constructed in the Madunagala Tourist Zone under this project;

(ii) whether he is aware that the generators at the tourist bungalow which was constructed at a considerable expense are currently out of order and the roof is in a dilapidated condition;

(iii) the amount of money that has been spent to construct the rural bazaar;

(iv) whether he is aware that the bazaar is in ruins by now; and

(v) the steps that will be taken to re-implement that project?

(c) If not, why?

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)

(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) රු. 2,128,373.01යි.

එතැන හෘද සම්භාහන මධ්‍යස්ථානයක් ඉදි කර නැහැ. පාද සම්භාහන මධ්‍යස්ථානයක් තමයි ඉදි කරලා තිබෙන්නේ.

(iii) 2025 වසරේදී එම ගොඩනැඟිල්ලට විදුලි සම්බන්ධතාව ලබාගෙන කොටස් දෙකකට බෙදා වෙන් කිරීම ඇතුළුව ඇස්තමේන්තු සකස්කොට නිම කිරීමටත්, එහි එක් කොටසක රුහුණු සංචාරක කාර්යාංශයේ සමරු සිහිවටන හා පොත් අළෙවි මධ්‍යස්ථානයක් ඇති කිරීමටද, අනෙක් කොටසේ සංචාරක ක්‍රියාකාරකමක් ලෙස සමරු ඡායාරූපකරණය සඳහා අවස්ථාව සලසාලමින් මේ වන විටත් උණුදිය උල්පත් පැරණි කෞතුකාගාරය පරිශ්‍රයේ සිදු කරන මැකෝ ගිරවා සමඟ සංචාරක ඡායාරූපකරණ වැඩසටහන සඳහා ලබා දෙමින් මෙම ගොඩනැඟිල්ල ඵලදායී කාර්යන් සඳහා භාවිත කිරීමට අපේක්ෂිතයි.

(ආ) (i) ආපනශාලාව හා විවේකාගාරය සඳහා පිරිවැය - රුපියල් 5,582,246.77කි.

භෝජනාගාරය සඳහා පිරිවැය - රුපියල් 29,569,814.34

(ii) මදුනාගල සංචාරක බංගලාවේ විදුලි ජනක යන්ත්‍ර 03ක් පැවති අතර, ඉන් විදුලි ජනක යන්ත්‍ර 02ක් මාතර කලාප අධ්‍යාපන කාර්යාලයේ ඉල්ලීම මත එම ආයතනයේ ප්‍රයෝජනය සඳහා 2022.02.25 දින මාතර කලාප අධ්‍යාපන කාර්යාලය වෙත භාර දී ඇත. ඉතිරි විදුලි ජනක යන්ත්‍රය මදුනාගල භෝජනාගාරය තුළ ස්ථාපනය කර ඇත. එම විදුලි

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

ජනක යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. මදුනාගල සංචාරක බංගලාවේ වහල නිරන්තරයෙන් වදුරන් පැනීම හේතුවෙන් පිළිසකර කිරීමේ අවශ්‍යතාව ඇති වන අතර, ඒ සඳහා පිළියම් යෙදීම අවශ්‍යතාව අනුව ඉටු කෙරේ.

(iii) 2007 වර්ෂය - රුපියල් 1,471,215.00යි.

(iv) ඔව්.

(v) මේ ස්ථානය සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථානයක් ලෙස පවත්වා ගෙන යෑම සඳහා මාර්ගය පිළිසකර කිරීම, අලංකරණය, විදුලිය ලබා ගැනීම වැනි කටයුතු අවසාන කළ යුතුව තිබෙනවා. ඒ සඳහා 2025 වසර සඳහා රුපියල් මිලියන 42ක් වෙන් කර ස්ථානය පවත්වා ගෙන යෑම සඳහා කටයුතු සිදු කරනවා.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා. ප්‍රශ්නයේ (ඇ) කොටසට අදාළ පිළිතුර ද එහි සඳහන් වෙනවා.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු සංචාරක නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන්නු පිළිතුරට අනුව, ඔබතුමා කියන කාරණා අනුව එම ව්‍යාපෘතියට අදාළ ඉදි කිරීම් නටඹුන් වෙලා විනාශයට පත් වනවා කියන එක මමත් පිළිගන්නවා. ඒක ඇහින් දැකපු කෙනෙකු විධියට තමයි මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ. මේ, එක ස්ථානයක් විතරයි. අපේ රටේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ගන්නා වූ පියවරවලට -පළාත් සභාවෙන් වෙන්න පුළුවන්, මධ්‍යම රජයෙන් වෙන්න පුළුවන්- මෙය එක උදාහරණයක් විතරයි. අපි ඊයේ මෙවැනිම උදාහරණයක් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේදී දැක්කා. අපේ ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා නම්, එතුමා මෙයට සාක්ෂි දරයි. ඒ කියන්නේ, මධ්‍යම රජයෙන් මුදල් වෙන් කරලා ව්‍යාපෘතියක් කරගෙන යනවා. ඒ ව්‍යාපෘතියට මුදල් ගන්නවා, මධ්‍යම රජයෙන්; එහෙම නැත්නම් පළාත් සභාවෙන්. ප්‍රාදේශීය සභාව ගිහිල්ලා එය පෙන්නලා ප්‍රාදේශීය සභාවෙනුත් ඒ ව්‍යාපෘතිය කළා කියලා මුදල් ගන්නවා.

මේ කියන ව්‍යාපෘතියට අදාළවත් කිසිම ශක්‍යතා අධ්‍යයනයක් කරලා තිබෙනවා ද? මේ කියන ව්‍යාපෘතිය ගෙනෙන්න ඕනෑ තමයි. මොකද, මදුනාගල උණුවතුර ළිං ආශ්‍රිත ප්‍රදේශයට සංචාරකයෝ විශාල පිරිසක් යනවා. නමුත්, ඊට අවශ්‍ය මූලික පියවර ටික අරගෙන නොවෙයි, ඒ ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා මේ පිළිබඳව වගකීමක් අරගෙන එම ස්ථානය ඵලදායී තත්ත්වයකට ගන්න. මොකද, පාර හදන්නේ නැතුව ගොඩනැගිලි හදලා වැඩක් නැහැ. විදුලිය ලබා දෙන්න බැරි නම් ඒ සංචාරක නිකේතනයෙන් ඇති වැඩක් නැහැ. ඒක හොඳ ලස්සන concept එකක්. හැබැයි, ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. එම ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරුනුත් මේ ගරු සභාවේ ඉන්නවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුර අනුව මම ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ඒ ව්‍යාපෘතිය ගැන ඔබතුමා යම්කිසි අධ්‍යයනයක් කළා ද, ඒ ව්‍යාපෘතිය ඵලදායී තැනකට ගෙනෙන්න පුළුවන් ද, එහෙම නැත්නම් එය මේ විධියටම නටඹුන් වෙලා යන්න අත් හරින්න සිදු වන එකක් ද?

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ඒ පිළිබඳව අධ්‍යයනයක් කළා, ගරු මන්ත්‍රීතුමනි. මම මුලින් සඳහන් කළා වාගේ, එතැනට යන පාර හදන්න අවශ්‍යයි. ඒ බව අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ වාගේම විදුලිය ලබා දීමත් අවශ්‍යයි. එම ස්ථානයේ landscaping කරන්නත් තිබෙනවා. සංචාරක ආකර්ෂණය ඇති ස්ථානයක් විධියට එම ස්ථානය දියුණු කරලා පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවක් සහ ශක්‍යතාවක් ඇත්තටම තිබෙනවා. ඒ සඳහා එම ස්ථානය හඳුනා ගෙන අපි මේ වන කොට මුදල් වෙන් කරලායි තිබෙන්නේ.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම අපේ රටේ සමස්ත සංචාරක ක්ෂේත්‍රය ගැන යම්කිසි අදහසක් ආණ්ඩුවෙන් දැන ගන්න කැමැතියි. අපේ රට සංචාරක ගමනාන්තයක් විධියට ලෝකය තුළ මේ වන කොට බෙහෙවින් ඉස්සරහට ඇවිත් තිබෙනවා. හැබැයි, ඒ ඉල්ලුමට සරිලන ආකාරයේ සැපයුමක් දෙන්න පුළුවන් විධියට මේ ක්ෂේත්‍රය තුළ දියුණු විය යුතු ගොඩක් දේවල් තිබෙනවා. ආණ්ඩුව බලයට එන්න ඉස්සෙල්ලා පසුගිය කාලයේ මේ සම්බන්ධව එක එක යෝජනා, සාධනීය කාරණා ඉදිරිපත් කරනවා අපි දැක්කා. දැන් යම් කාලයක් ගිහින් තිබෙනවා. ඒ නිසා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි, නිශ්චිත කාල රාමුවක් තුළ මේ රටේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා කරන්නේ මොනවාද කියලා. දකුණු මුහුදුබඩ කලාපය දිගටම සංචාරක කර්මාන්තය හරහා දියුණු වෙමින් තිබෙනවා. නමුත්, අවශ්‍ය මූලික පහසුකම් ටික නැහැ. උදාහරණයක් විධියට, හෝටල් කර්මාන්තයේ යෙදෙන කෙනෙකුට හෝටලයක් හදාගන්න අවශ්‍ය වුණොත්, ඒ කාලයේ නම් තිබුණා refinance loan schemes. දැන් ඒ මොකවත් නැහැ. දැන් සංචාරක කර්මාන්තය දිරිමත් කිරීමේ කිසිම ක්‍රියාවලියක් නැහැ. සංචාරක කර්මාන්තය අල්ලාගෙන ඉන්න පිරිස නම් තවමත් ඉන්නවා. අලුතින් එම කර්මාන්තයට එකතු වන පිරිස අඩු වෙලා තිබෙනවා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි, ලංකාවේ සංචාරක කර්මාන්තය කාල රාමුවක් තුළ දියුණු කරන්න මේ වන කොට ගෙන ඇති පියවර මොනවාද කියලා.

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා, ඒ වැදගත් ප්‍රශ්නය මතු කිරීම පිළිබඳව. ඇත්තටම මේ වන කොට අපි හඳුනා ගනිමින් ඉන්නවා, සංචාරක ආකර්ෂණ 100ක්. ඒ එක ආකර්ෂණයකට රුපියල් මිලියන 10 බැගින් වාගේ වෙන් කරලා මූලික පහසුකම් වර්ධනය කරලා සංචාරක නිෂ්පාදනයක් - product එකක් - විධියට ඉහළට ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම Clean Sri Lanka වැඩසටහන යටතේ සංචාරකයින්ට rest centres ගණනාවක් ඉදි කරන්නත් අපි සැලසුම් කර තිබෙනවා. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයේ නිරත වන අය වෙනුවෙන් සමාජ සුබසාධන වැඩසටහනක්, contributory pension scheme එකක් ඇතුළු වැඩසටහන් ගණනාවක් අපි මේ වසර තුළ සැලසුම් කර තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මඩකලපුව සී-නෝර් නිවාස යෝජනා ක්‍රමය: හිමිකම් ඔප්පු ලබා දීම

மட்டக்களப்பு, சீ-நோர் வீடமைப்புத் திட்டம் : உரித்து உறுதிகளை வழங்குதல்

CEY-NOR HOUSING SCHEME, BATTICALOA: GRANT OF TITLE DEEDS

70/2024

2. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර්-පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කලුවන්කේනි-2 ප්‍රදේශයේ, සී-නෝර් නිවාස යෝජනා ක්‍රමය නමින් නිවාස යෝජනා ක්‍රමයක් 1982 වර්ෂයේදී ඉදි කරන ලද බව දන්නේද;

(ii) එම නිවාස/ඉඩම් සඳහා හිමිකම් ඔප්පු මේ දක්වා ලබා දී නොමැති වීම හේතුවෙන් එම නිවාස/ඉඩම්වලට විදුලිය සහ පානීය ජල පහසුකම් ලබා ගැනීමේදී ඒවායේ පදිංචිකරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බව දන්නේද;

(iii) එසේ නම්, එම නිවාස/ඉඩම්වලට හිමිකම් ඔප්පු ලබා දීමට පියවර ගන්නේද;

(iv) එම ඔප්පු ලබා දෙන කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නගර අපිවිරුත්දි, නිර්මාණිප්පු මර්රුම් වීදමෛප්පු අමෛච්සරෛක් කේට්දවිනා:

(அ) (i) 1982ஆம் ஆண்டு மட்டக்களப்பு மாவட்டத்தின் ஏறாவூர்பற்று பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட களுவன்கேணி-2 பிரதேசத்தில் சீ-நோர் வீடமைப்புத் திட்டம் என்ற பெயரில் வீடமைப்புத் திட்டமொன்று முன்னெடுக்கப்பட்டதை அறிவாரா;

(ii) மேற்படி வீடுகள்/காணிகளுக்கான உரித்து உறுதிகள் இதுவரை வழங்கப்படாததால், அவற்றில் வசிப்பவர்கள் அந்த வீடுகள்/காணிகளுக்கு மின்சாரம் மற்றும் குடிநீர் வசதிகளைப் பெற்றுக்கொள்வதில் பல்வேறு சிரமங்களை எதிர்கொள்வதையும் அறிவாரா;

(iii) ஆமெனில், அந்த வீடுகள்/காணிகளுக்கு உரித்து உறுதிகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iv) எக்காலப்பகுதியில் அந்த உறுதிகள் வழங்கப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether he is aware that a housing scheme named Cey-Nor Housing Scheme was constructed in the year 1982 in Kaluwankeni-2 in Eravur Pattu Divisional Secretary's Division of the Batticaloa District;

(ii) whether he is aware that the residents of those houses/lands are facing various difficulties in obtaining electricity supply and drinking water supply to those houses/lands as title deeds have not been issued to them for those lands to date;

(iii) if so, whether steps will be taken to issue title deeds for those houses/lands; and

(iv) the timeframe for granting those title deeds?

(b) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය පැන නඟින්නේ මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර්-පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලුවන්කේනි - 2 ප්‍රදේශයේ, 1982 වසරේ ආරම්භ කරපු සී-නෝර් නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන්. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) නැත.

එම සී-නෝර් නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති ඉඩම ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් හෝ පවරා ගැනීමට නියමිත ඉඩමක් නොවන බැවින් නිවාසලාභීන් වෙත ඔප්පු ලබා දීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පියවර ගැනීමේ හැකියාවක් නැහැ.

(iii) කටයුතු කළ නොහැකියි.

(iv) අදාළ නොවේ.

(ආ) නෝර්වේ රජයේ මුදල් ආධාරයෙන් එවකට ධීවර හා ජල සම්පත් අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මෙම නිවාස ව්‍යාපෘතියේ නිවාස ඉදිකිරීම් සඳහා තාක්ෂණික උපදෙස් පමණක් ලබා දී ඇති බැවින් හා පෞද්ගලික ඉඩමක මෙම නිවාස ව්‍යාපෘතිය ඉදිකර ඇති බැවින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාසලාභීන් වෙත ඔප්පු ලබා දීමේ හැකියාවක් නොමැති බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් තවදුරටත් දන්වා සිටී.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
කෞරව අමෛච්සර් අවර්කළේ, නන්රි!

இந்த வீட்டுத்திட்டம் சம்பந்தமான பிரச்சினை 1982ஆம் ஆண்டிலிருந்து இருக்கிறது. அதாவது, 43 வருடங்கள் கடந்தும் இந்தப் பிரச்சினை தொடர்ந்துகொண்டு இருக்கின்றது. களுவன்கேணி பிரதேசத்தில் அமைக்கப்பட்டுள்ள இந்த சீ-நோர் வீட்டுத்திட்டத்தில் வசிக்கும் மக்கள் மிக நீண்ட காலமாக உறுதி இல்லாமையால் பாதிக்கப்பட்டு வருகின்றார்கள். நாங்கள் இது சம்பந்தமாக பிரதேச அபிவிருத்திக் குழுக்

[ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

කූට්ටත්තිලුම්, මාවට්ට අපිවිරුත්තික් කුළුක් කූට්ටත්තිලුම් කතෙත්තිරුක්කිරෝම්. උණ්මෙයිලේයේ කටන්ත අරසාංක කාලත්තිල් ඉරුන්තතුපෝල ප්‍රච්සිනෙකළුක්කුත් තීර්වු කාණ මුටියාත නිලෙයිල්තාන් ඉන්රු ප්‍රතේස අපිවිරුත්තික් කුළුක් කූට්ටම්, මාවට්ට අපිවිරුත්තික් කුළුක් කූට්ටම් එන්පන ඉරුන්තුකොන්ටු ඉරුක්කින්රන. කුරිප්පාක, උංකළුටෙය අරසාංකත්තින් ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිල්කූට, මාණ්පුමිකු සනාතිපති අවර්කළ් කාණි උරිමෙ ඉල්ලාතවර්කළුක්කු 'පිම්සවිය' තිට්ටත්තින්කීළ් උරිත්තු වළංකුවතාකච් සොල්ලියිරුන්තාර්. අතේපෝන්රුතාන් කටන්ත අරසාංක කාලප්පකුතියිල් 'උරුමය' තිට්ටත්තින්කීළ් උරුතිකළ් වළංකුවතාකච් සොල්ලප්පට්ටතු. නීංකළ් පොරුප්පුල්ල අමෙච්සර් එන්ර වකෙයිල්, ඉන්ත විටයම් සම්පන්තමාක උංකළුටෙය අමෙච්සිනාටාකක් කුළුවොන්රෙ නියමික්ක වේන්ටුම්.

ඉන්ත වීට්ටුත්තිට්ටම් තනියාර් කාණියිල් අමෙක්කප්පට්ටුල්ළතෙන ඉන්රු නීංකළ් සොල්කින්රීර්කළ්. අන්රු ඉන්ත වීට්ටුත්තිට්ටම් කළුවන්කේණියිල් අමෙක්කප්පටුම්පෝතු, ඉතු අරස කාණියිල්ලෙ එන්පතු අන්තක් කාලප්පකුතියිල් ඉරුන්තවර්කළුක්කු මිකත් තෙළිවාකත් තෙරින්තිරුක්ක වේන්ටුම්. අතු තනියාර් කාණියිල් අමෙක්කප්පට්ටිරුක්කිරතු එන්රු සොන්නාල්, ඉතර්කු මක්කළ් එන්න සෙය්යලාම්? අරසාංකම්තාන් ඉතර්කු එතාවතු මුරෙයිල් තීර්වෛක් කාණ වේන්ටුම්. අතාවතු, ඉන්ත වීට්ටුත්තිට්ටත්තිල් උළ්ළවර්කළුක්කු උරිත්තු වළංකුවතු සම්පන්තමාක උංකළුටෙය අමෙච්සිනාටාක ඔරු කුළුවෙ නියමිත්තු, අතර්කුරිය පොරිමුරෙයෙ උරුවාක්ක වේන්ටුම්. එන්නෙප් පොරුත්තවරෙයිල්, ඉන්ත වීටුකළුක්කු ආට්සි උරුති එළුතුවතු මට්ටුම්තාන් ඉරුක්කිරතු. අන්ත මක්කළුක්කු ආට්සි උරුතියෙ එළුතුවතර්කාන ඒර්පාටුකළෙ ඒන් අරසාංකම් සෙය්තුකොටුක්ක මුටියාතු?

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, මම කලින් සඳහන් කළා වාගේ මේ ව්‍යාපෘතියට අවශ්‍ය තාක්ෂණික සහාය තමයි, ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබා දීලා තිබෙන්නේ. ඒ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය හරහා. එතකොට, අපේ අමාත්‍යාංශයේ විෂය පථයට අනුකූලව අපට ඒ සඳහා මැදිහත් වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අදාළ ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහ ප්‍රාදේශීය ලේකම්වරයාගේ මැදිහත්වීමෙන් කමිටුවක් පත් කරලා තමයි ඉදිරියටත් ඒ සඳහා කටයුතු කරනවා නම්, කරන්න පුළුවන්කම තිබෙන්නේ.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

කෞරව සභාපතිතුමා, තව්වෝදු ඉන්තච් සපෙයිල් මීන්පිටිත්තුරෙ අමෙච්සර් අවර්කළ් ඉරුක්කිරාර්. ඉව්වාරාන එත්තනෙයෝ ප්‍රච්සිනෙකළ් මට්ටක්කළප්පු මාවට්ටත්තින් එල්ලෙක්කුළ් ඉරුක්කින්රන. Ministry of Urban Development, Construction and Housingඉ එටුත්තුප් පාර්ත්තාලුම් අප්පටිත්තාන්. ඉන්රු මට්ටක්කළප්පු මානකර සපෙයින් එල්ලෙක්කුළ් ඉරුක්කින්ර එත්තනෙයෝ තරප්පිනර්, කාණික්කුරිය උරිත්තු ඉල්ලාමල් ඉරුක්කිරාර්කළ්. අංකු තේසිය වීටමෙප්පු අපිවිරුත්ති අතිකාරසපෙයාල් කට්ටප්පට්ට වීටුකළ් ඉරුක්කින්රන. ආනාල්, අවර්රුක්කු උරිත්තු ඉල්ලෙ. අතු තොටර්පිලුම් එන්ත නටවටික්කෙයුම් ඉල්ලෙ. අතේපෝන්රු, UDA එල්ලෙක්කුළ් වාළුම් මක්කළුම් පාරිය ප්‍රච්සිනෙකළුක්කු මුකංකොටුක්කිරාර්කළ්. අමෙච්සරාක ඉරුක්කුම් නීංකළ්, උංකළුටෙය අමෙච්සින් විටයප්පොරුප්පුක්කු අප්පාර්චෙන්රු, ඒනෙය අමෙච්සර්කළුටන් පේසි, ඉව්වාරාන විටයංකළුක්කුත් තීර්වු කාණ වේන්ටුම්. උතාරණත්තුක්කු, මට්ටක්කළප්පු මානකර සපෙයින් එල්ලෙක්කුළ් ඉරුක්කින්ර කාණිකළුක්කු උරිත්තු වළංකුවතර්කේ පින්නඩික්කිරාර්කළ්. ආනාල්, මුන්නාළ් මට්ටක්කළප්පු මාවට්ට අපිවිරුත්තික් කුළුවින් ඉණෙත් තලෙවර් සිවනේසතුරෙ සන්තිරකාන්තන් එනප්පටුකින්ර පිළ්ළෙයාන් අන්ත මාවට්ටත්තිල් training centre අමෙප්පතර්කාකප් පිටිත්ත එට්ටු ඒක්කර් කාණික්කු උරිත්තු වළංකප්පට්ටු ඉරුක්කිරතු. කටන්ත අරසාංකංකළ් සෙය්ත තවරුකළෙ නීංකළ් තට්ටික් කේට්පීර්කළ් එන්ර නම්පික්කෙයිල්තාන් මක්කළ් උංකළුක්කු ඉන්ත ආණෙයෙ වළංකියිරුක්කිරාර්කළ්. කවලෙක්කුරිය විටයම් එන්නවෙන්රාල්, ඉන්රු මට්ටක්කළප්පු මාවට්ට අපිවිරුත්තික් කුළුත් තලෙවරුම් ප්‍රතේස අපිවිරුත්තික් කුළුත් තලෙවරුම් ඉන්ත විටයම් කුරිත්තු කවනම් සෙලුත්තුවතු මිකක් කුරෙවාක ඉරුප්පතුතාන්. කෞරව අමෙච්සර් අවර්කළේ, ඒනෙය අමෙච්සර්කළෙයුම් ඉණෙත්තුක්කොන්ටු ඉතර්කු වේලෛත්තිට්ටත්තෙත උංකළාල් සෙය්ය මුටියුමා? මුටියාවිට්ටාල් සොල්ලුංකළ්, නාංකළ් අටුත්ත අරසාංකත්තිල් පාර්ප්පෝම්. නන්රි!

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, මම කලින් සඳහන් කළා වාගේ මේ වාගේ කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්කම තිබෙන්නේ දිස්ත්‍රික් ලේකම්වරයාට. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ විවිධ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දුන්නාට පස්සේ, ඒ ඉඩම්වල හිමිකම් ලබා දීම දීර්ඝ ක්‍රියාවලියක්. සමහර වෙලාවට ඒ අයට ගෙවීම් කරන්න අවුරුදු 30ක විතර කාලයක් අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ ගෙවීම් සම්පූර්ණ වුණාට පස්සේ තමයි ඔප්පු ලබා දීමේ කටයුතු සම්පූර්ණ කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ අනුව බොහෝ අවස්ථාවලදී බොහෝ ඉඩම් සඳහා ඔප්පු ලබා දීමේ කටයුතු මේ වන විට සිද්ධ කරමින් පවතිනවා.

මේ නිශ්චිත කාරණා සම්බන්ධයෙන් නිවාස සංවර්ධන අධිකාරියට හෝ අපේ අමාත්‍යාංශයට කිසිවක් කළ නොහැකියි. මම හිතන විධියට, අදාළ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවවේදී සාකච්ඡා කරලා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්නවා නම් හොඳයි.

ප්‍රමිතියෙන් තොර පොල්තෙල්: වෙළෙඳ පොළට නිකුත් කිරීම වැළැක්වීම

தரமற்ற தேங்காய் எண்ணெய்: சந்தைக்கு விநியோகிப்பதைத் தடுத்தல்

SUBSTANDARD COCONUT OIL: PREVENT SUPPLY TO THE MARKET

91/2024

3. ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු චමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,- (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළේ පරිභෝජනයට නුසුදුසු ප්‍රමිතියෙන් තොර පොල්තෙල් ඇති බවට හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ප්‍රමිතියෙන් තොර පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් කරනු ලබන ආකාරය කවරේද;

(iii) ඒ සඳහා භාවිත කරනු ලබන උපක්‍රම කවරේද;

(iv) ඒවා වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(v) උසස් ප්‍රමිතියෙන් යුතු පොල්තෙල් වෙළෙඳ පොළට නිකුත් නොවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කුඩා හා මධ්‍ය පරිමාණ පොල්තෙල් මෝල් හිමිකරුවන් මුහුණ දෙන ගැටලු කවරේද;

(ii) එම ගැටලු සඳහා දෙනු ලබන විසඳුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වර්ත්තක, වාණිප, උණවුප් පාතුකාප්පු මර්‍රුම් කූට්ටුරවු අපිවිරුත්‍ති අමైච්චරైක් කේට්ටවිනා:

(அ) (i) இலங்கை சந்தையில் பாவனைக்குப் பொருந்தாத தரமற்ற தேங்காய் எண்ணெய் இருப்பதாக கண்டறியப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், தரமற்ற தேங்காய் எண்ணெய் சந்தைக்கு விநியோகிக்கப்படும் முறை யாது என்பதையும்;

(iii) அதற்காகப் பயன்படுத்தப்படும் உத்திகள் யாவை என்பதையும்;

(iv) அவற்றைத் தடுப்பதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) உயர் தரத்திலான தேங்காய் எண்ணெய் சந்தைக்கு விநியோகிக்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சிறிய மற்றும் நடுத்தர அளவிலான தேங்காய் எண்ணெய் ஆலை உரிமையாளர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி பிரச்சினைகளுக்கான தீர்வுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether the prevalence of substandard coconut oil, which is not suitable for consumption, has been detected in the Sri Lankan market;

(ii) if so, the way such substandard coconut oil is supplied to the market;

(iii) the tactics that are used for it;

(iv) the measures that have been taken to prevent them; and

(v) the reasons for high standard coconut oil not being supplied to the market?

(b) Will he also inform this House the -

(i) problems faced by the owners of small and medium-scale oil mills; and

(ii) solutions that will be given to those problems?

(c) If not, why?

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

පරිභෝජනයට නුසුදුසු ප්‍රමිතියෙන් තොර පොල් තෙල් වෙළඳ පොළේ ඇති බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කරන ලද වෙළඳපොළ සාම්පල පරීක්ෂා කිරීමේදී දී හඳුනා ගෙන ඇත.

(ii) බොහෝ අවස්ථාවලදී මෙසේ ප්‍රමිතියෙන් තොර පොල් තෙල් දේශීය නිෂ්පාදකයන් විසින් ගුණාත්මකභාවය සම්බන්ධව නිසි අවබෝධයකින් තොරව නිපදවා වෙළඳපොළට නිකුත් කෙරේ. එසේම සමහර නිෂ්පාදකයන් සිතා මතාම නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමේ අරමුණින් සහ වැඩි ලාභ ලබා ගැනීමේ අරමුණින් නිසි ප්‍රමිතියෙන් තොරව නිෂ්පාදන කටයුතු සිදුකර පොල් තෙල් වෙළඳපොළට නිකුත් කරයි.

(iii) (1) සමහර කර්මාන්තකරුවන් විසින් කුරුටු තෙල්, පිරිපහදු කළ වරක් භාවිත කරන ලද තෙල්, ආනයනික තෙල් සහ වෙනත් තෙල් වර්ග මිශ්‍ර කරමින් ප්‍රමිතියෙන් බාල නිෂ්පාදන සකස් කරමින් පොල් තෙල් ලෙස වෙළඳපොළට ඉදිරිපත් කරනු ලබන බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත වාර්තා වී ඇත.

(2) පොල් තෙල් නිෂ්පාදන ක්‍රියාවලියේ දී නිසි නිෂ්පාදන ක්‍රමවේද අනුගමනය නොකිරීම මඟින් පොල් තෙල්වල ගුණාත්මකභාවය සම්බන්ධව ගැටලු ඇති වේ. උදාහරණයක් වශයෙන් ගෘහාශ්‍රිත සහ සුළු පරිමාණ කර්මාන්ත තුළ පොල් තෙල් නිෂ්පාදනය කිරීමේ දී පොල් කැබලි වියළීම සඳහා වියලන උඳුන් භාවිත නොකරයි. මේ හේතුවෙන් බොහෝ අවස්ථාවල දී පොල් කැබලි නියමිත පරිදි වියළීමට ලක් නොවීම හේතුවෙන් මේවායේ පුස් ඇති විය හැකි අතර එමඟින් පොල් තෙල්වල ඇෆ්ලටොක්සින් මට්ටම ඉහළ යා හැකියි.

(3) පොල් කැබලි ඇඹරීමට යොදා ගන්නා යන්ත්‍රෝපකරණ නිසි පරිදි පිරිසිදු නොකිරීම සහ නඩත්තු නොකිරීම හේතුවෙන් එම යන්ත්‍රෝපකරණ තුළ සිර වූ පොල් කැබලි කාලයත් සමඟ පුස්කෑමට ලක්වීම හේතුවෙන් පොල් තෙල්වල ප්‍රමිතිය සහ ගුණාත්මකභාවයට තර්ජනයක් ඇති විය හැකිය.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

(4) පොල් කැබලි නිසි පරිදි ගබඩා නොකිරීම හේතුවෙන් මීයන්, සුනඛයන්, බළලුන් සහ පක්ෂීන් වැනි සතුන්ගේ අපද්‍රව්‍ය මිශ්‍ර වීම සිදුවන අතර එය ද ගුණාත්මකභාවයට තර්ජනයකි.

(5) වෙළෙන්දන් විසින් පොල් තෙල් සිල්ලරට අළෙවි කිරීමේදී, පොල් තෙල් බැරල් වශයෙන් මිලදී ගන්නා අතර, ඒවායේ තෙල් හිස් වූ පසු එම බැරල් නැවත සෝදා පිරිසිදු කිරීමක් නොකර භාවිතයට ගන්නා බැවින් එහි ඉතිරි වන පොල් තෙල්වල ඇෆ්ලටොක්සින් වර්ධනය වී තිබුණහොත් අලුතින් එකතු කරන පොල් තෙල්වලටද එම විස එකතු වේ.

(6) පොල් තෙල් ඇසුරුමේ හෝ බහලුවේ අනිවාර්යයෙන් සටහන් කළ යුතු තොරතුරු නොමැතිව අළෙවියට තැබීම මඟින් එම පොල් තෙල්වල නිෂ්පාදකයාගේ නම, නිෂ්පාදිත දිනය, කල් ඉකුත් වන දිනය, සොයා ගැනීමට ඉතා අපහසු අතර, වෙළෙඳපොළ වැටලීම් සහ සාම්පල පරීක්ෂාවේ දී අප විසින් තත්ත්වයෙන් බාල පොල් තෙල් සොයා ගන්නා ලද වුවද, ඒවායේ සැබෑ නිෂ්පාදකයා සොයා ගැනීම ඉතාමත් අපහසු වේ.

(7) භාවිත කර ඉවත් කරන ලද පොල් තෙල් නැවත රසායනික ද්‍රව්‍ය දමා පිරිපහදුකර විකිණීම සඳහා ඉදිරිපත් කිරීම පිළිබඳවද වාර්තා වී ඇත.

(iv) (1) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත යටතේ පොල් තෙල් බාල කිරීම වැළැක්වීම සහ පොල් තෙල් විකිණීමේ දී එම නිෂ්පාදන බහාලන බහලුමේ තිබිය යුතු අවශ්‍යතා සම්බන්ධයෙන් ගැසට් පත්‍ර 2ක් නිකුත් කිරීම.

(2) පොල් සංවර්ධන අධිකාරිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව පොල් තෙල්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

(3) ලද පැමිණිලි මත හෝ අධිකාරිය විසින්ම සිදු කරන කාලීන වෙළෙඳ පොළ වැටලීම් සහ සාම්පල පරීක්ෂාවන් තමයි මේක නවත්වන්න කරනු ලබන උපක්‍රම විධියට තිබෙන්නේ.

(v) (1) බොහෝ දේශීය පොල්තෙල් නිෂ්පාදකයන් ප්‍රමිතීන් හා රෙගුලාසිවලට අනුගත නොවී තම නිෂ්පාදන වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම.

(2) අනාරක්ෂිත ඇසුරුම් හා ගබඩා කිරීමේ ක්‍රමවේද (බැරල් ලෙස පොල්තෙල් වෙළෙඳ පොළේ අළෙවි කිරීමට ඇති අවස්ථා හේතුවෙන් බහලුමේ අනිවාර්යයෙන් සටහන් කළ යුතු තොරතුරු නොමැතිව හෝ වංචනිකව සඳහන් කරමින් වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ හැකියාව)

(3) පොල්තෙල් කර්මාන්තකරුවන්ට නිෂ්පාදනයේදී පොල්තෙල්වල ගුණාත්මකභාවය අඩු විය හැකි අවස්ථා සම්බන්ධව නිසි අවබෝධයක් නොමැති වීම.

(4) සුළු හා ගෘහස්ථ කර්මාන්තකරුවන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම, මූල්‍ය පහසුකම් සහ යන්ත්‍රෝපකරණවල ඇති හිඟය.

(ආ) (i) කුඩා හා මධ්‍ය පරිමාණ පොල්තෙල් මෝල් හිමිකරුවන්හට පහත ගැටලුවලට මුහුණපෑමට සිදුවිය හැකි බව නිරීක්ෂණය කළ හැක.

- අමුද්‍රව්‍ය හිඟය, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ ගුණාත්මක බීජ පැළ සඳහා සීමිත ප්‍රවේශය වැනි සාධක පොල් නිෂ්පාදනයට බලපාන අතර එමඟින් මෝල් හිමියන් සඳහා අමුද්‍රව්‍ය හිඟයක් ඇති වේ.
- පොල් නිෂ්පාදනයේ අඩුවීම සහ වෙළෙඳ පොළ මිල ගණන්වල උච්චාවචනයන් මෝල් හිමියන්ගේ ආදායම අස්ථාවර කිරීමට හේතු වන අතර එය ඔවුන්ගේ මූල්‍ය ස්ථාවරත්වයට සහ සැලසුම්කරණයට බලපායි.
- ආර්ථික අර්බුදය සහ වෙළෙඳ පොළ උච්චාවචනයන්, නිෂ්පාදන පිරිවැය වැඩිවීමට හේතු වන අතර අමුද්‍රව්‍ය හිඟය සහ මිල ඉහළ යාම, මෙම මෝල් හිමියන්ගේ මූල්‍ය සම්පත් කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කර තිබීම.
- දැඩි ණය දීමේ නිර්ණායක සහ ඇපකර නොමැතිකම හේතුවෙන් දැරිය හැකි මූල්‍යකරණයක් ලබා ගැනීමේදී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහෝ විට දුෂ්කරතාවන්ට මුහුණ දෙයි. මෙම මූල්‍ය සීමාව නවීන තාක්ෂණයන්හි ආයෝජනය කිරීමට සහ මෙහෙයුම් පුළුල් කිරීමට ඇති හැකියාව සීමා කරයි.
- තිරසරභාවය පිළිබඳ ගැටලු, අපද්‍රව්‍ය කළමනාකරණය සහ තිරසාර කර්මාන්ත පිළිවෙත් ඇතුළු පාරිසරික අභියෝග සඳහා මෝල් හිමියන් අනුවර්තනය වීමට අවශ්‍ය වන අතර බොහෝ විට ඒ සඳහා අමතර ආයෝජන අවශ්‍ය වේ.
- ශ්‍රමය, බලශක්තිය සහ ප්‍රවාහනයට අදාළ වියදම් ඉහළ යාම.
- කෘෂිකාර්මික අංශයේ බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් -SME- නවෝත්පාදනයන් සහ නව විද්‍යාත්මක සොයාගැනීම් භාවිතය කෙරෙහි අඩු ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මෙම අකමැත්ත ඔවුන්ගේ තරගකාරිත්වයට සහ වර්ධන විභවයට බාධා කරයි.
- වෙළෙඳ පොළ තුළ ආනයනික හා දේශීය පොල්තෙල් වෙන්කර හඳුනා ගැනීමට නොහැකිවීමෙන් ආනයනික පොල්තෙල්ද දේශීය පොල්තෙල් ලෙස අළෙවි කිරීම.
- ආනයනික පොල්තෙල් සඳහා VAT බදු නිදහස් වීම, දේශීය පොල්තෙල් මෝල් හිමියන් මත අහිතකර ලෙස බලපෑම.

(ii) කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් වෙනස් කිරීම් සිදු කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය සෑම අවස්ථාවකම රජය හා අප අමාත්‍යාංශය අවධානය යොමු වී ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(*මාණ්පුමිකු සමිනද ඛිජේසිරි*)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, පිළිතුරු ලබාදීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයේ (අ) (iii) යටතේ මම අහලා තිබෙනවා, ප්‍රමිතියෙන් තොර පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් කිරීමේදී ඒ සඳහා භාවිත කරනු ලබන උපක්‍රම කවරේද කියලා.

ගරු ඇමතිතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ වෙළෙඳ පොළට ආපු අහිතකර පොල් තෙල් හරහා සමාජයට විශාල පරිහානියක් සිද්ධ වුණාය කියන කාරණය වැඩිපුරම ප්‍රකාශ කළේ ඔබතුමන්ලා බව අපි දන්නවා. ඔබතුමාට මතක ඇති, ඇෆ්ලටොක්සීන් කියන විෂ රසායන ද්‍රව්‍යයත් එක්ක ආපු පොල් තෙල් තොගය එවකට හිටපු විශාල ජාවාරම්කරුවන් එකතු වෙලා මේ රට විනාශ කරන්න ගෙනාවා කියන කාරණය තමයි ඔබතුමන්ලා කිව්වේ. මෙහිදී සාම්ප්‍රදායික කාරණා 7කින් බැහැර වෙලා,- මොකද, ඒ සාම්ප්‍රදායික කාරණා දීර්ඝ කාලයක් තිස්සේ තිබුණා. ඒක තමයි දිගින් දිගටම අහිතකර පොල් තෙල් රටේ ජනතාවට පරිභෝජනය කරන්න සිද්ධ වුණේ. හැබැයි, අපි දකිනවා ඒ කාරණාවලින් බැහැර වෙච්ච තව කාරණයක් තිබිය යුතු බව. ඔබතුමා, විශේෂයෙන්ම මේ හොර ජාවාරම් සහ සියලු කාරණා ඇතුළට එන්නේ කොහොමද, නැද්ද කියන කාරණය පැහැදිලිව දැනගත් ඇමතිවරයෙක්. විපක්ෂයේ සිටියදී, ඕවා එන්නේ කොහොමද, කවුද ගෙනෙන්නේ, කොතැනින්ද ගෙනාවේ කියන කාරණා එතුමන්ලා පැහැදිලිව දැනගෙන සිටියා, ගරු කථානායකතුමනි. මොකද, එතුමන්ලා විසින් හදපු ෆයිල්වල ඒවා තිබෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මේවා වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද කියලා මම අසා තිබෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් තිබෙන කාරණාවලට පරිබාහිරව ඔබතුමන්ලා 76 අවුරුද්දක් තිස්සේ මේ රටේ පොල් තෙල් වංචාවට සම්බන්ධ වෙච්ච, අහිතකර දේවල් ගෙනෙන කඳවුරට දිය යුතු දඬුවම තමයි ඊළඟ උපක්‍රමය වෙන්නට ඕනෑ. ඒ කාරණය ඒකේ ඇතුළත් වෙලා නැත්නම් මම ඔබතුමාට මතක් කරනවා, ඒ හොරු ටික අල්ලන්න පුළුවන් පැහැදිලි වැඩ පිළිවෙළ ඇතුළත් කරලා පොල් තෙල් වංචාව ඇතුළු ඒ සියලු දේ නවත්වන්න පුළුවන්, ඔබ විසින් දැකපු ඒ උපක්‍රමය මොකක්ද කියන එක ඊළඟ කාරණය හැටියට ඉදිරිපත් කරලා මේ ගරු සභාව දැනුවත් කරන්නය කියලා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*මාණ්පුමිකු වසන්ත සමරසිංහ*)
(The Hon. Wasantha Samarasinghe)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා පැහැදිලි කළා වාගේම අපේ රටේ ආනයන වෙළෙඳාමේදී සිදුවන ජාවාරම් අතර තවත් එක් ජාවාරමක් තමයි, මේ ජාවාරම. මොකද, අපි පිරිසිදු කරපු coconut oil ගෙනෙනවා වාගේම පිරිසිදු නොකරපු ඒවාත් ගෙනෙනවා. එහෙම ගෙනෙනකොට කරන ජාවාරම් තිබෙනවා. මීට සම්බන්ධ සමහර සමාගම් අපි හඳුනාගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ සමහර importing companies තිබෙන්නේ මාස 11යි. 12වැනි මාසය වෙනකොට accounts හදන්නේ නැතුව එම කොම්පැනිය වහලා අලුත් කොම්පැනියකට යනවා. ඔබතුමා මතු කරන මේ ප්‍රශ්නය අපේ රටේ තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වය වළක්වන්න අපි එක පැත්තකින් නීතිමය ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඒ සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නීතිය ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ රේගුව විසින් මේ වන විටත් හඳුනාගෙන තිබෙනවා, ආනයනවලදී ලංකාව ඇතුළට එවැනි දේවල් එන එක වළක්වන්න අවශ්‍ය ක්‍රියාමාර්ග මොනවාද කියලා. දැන් ඒකට අවශ්‍ය කටයුතු කරනවා. එතැනින් එහා තත්ත්වය ගැන තමයි ඔබතුමා කියන්නේ. එම නීති පවා උල්ලංඝනය කරනවා නම්, ඒ අයට දැඩි දඬුවම් ලබා දීමට හැකි විධියට නීති සංශෝධනය කරන්න අපි කටයුතු කරනවා. ඒකට අපි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කරන්න කටයුතු කරනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(*මාණ්පුමිකු සමිනද ඛිජේසිරි*)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, ඒක හොඳයි. ඒවා දීර්ඝ කාලයක් තිස්සේ ගන්නා ක්‍රියාමාර්ග. නමුත්, ඒ ජාවාරම් නැවතුණේ නැහැ. මම දැක්කා, මරික්කාර් මන්ත්‍රීතුමා ගිය සතියට එපිට සතියේත් තෙල් සම්බන්ධව සිදුවන යම්කිසි ජාවාරමක් පිළිබඳව අනාවරණ කළා. හැබැයි, ඔබතුමා ඒ මොහොතේ කිව්වා ඒ පිළිබඳව හවසට කියන බව. ඊට පස්සේ ඒ පිළිබඳව කිව්වාද කියලා මම දන්නේ නැහැ. නමුත්, ඒ ජාවාරම පිළිබඳව අදටත් සමාජය තුළ කථා වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම හිතනවා, ඔබතුමා යෝජනා කරපු කාරණා ප්‍රායෝගිකව අපේ රටට ගැළපෙන්නේ නැහැ කියලා. එතැනින් එහාට ගිය බොහෝ දේවල් විය යුතුව තිබෙනවා, විශේෂයෙන්ම ඔබතුමන්ලාගෙන් සහ ඔබතුමාගෙන්. ඒ, ඇයි? මේ වංචා හරහා සිදු වෙච්ච මූල්‍ය අලාභ හරහා රටේ ජනතාවට මේ බංකොලොත්භාවයට මුහුණපාන්න සිද්ධ කරපු සියලුදෙනාට දඬුවම් ලබා දීම සඳහා ඔබතුමන්ලාට තමයි ජනතාව රට භාර දුන්නේ. හැබැයි, ඒක ඔබතුමන්ලාට කරන්න බැහැ. මොකද, ඒ සඳහා උසාවියෙන් නියෝගයක් එන්න ඕනෑ. හැබැයි ඒ සඳහා නීතියේ විය යුතු වෙනස්වීම් මොනවාද කියලා ඔබතුමන්ලා මේ වන විට දැනගෙන ඉන්න ඕනෑ. අපි අහන්නේ ඒකයි. 76 අවුරුද්දක් තිස්සේ ඔබතුමන්ලා එළියේ ඉඳගෙන බලයේ හිටපු ආණ්ඩුවලට කිව්වා, නැවුණු නීතිය වෙනස් කළ යුතු ආකාරය. ඒ වාගේම ඒක වෙනස් කරන්න ඔබතුමන්ලාට බලය දෙන්න, බලය දීපු සැනින් මේ සියලු වැරදි නිවැරදි කරන්න පුළුවන් නීති හදනවා කිව්වා. දැනට තිබෙන නීති අනුව වැරදිකරුවන් අල්ලන්න බැරි නම්, අලුත් නීති හදලා හෝ ඒ සියලු හොරු අල්ලලා දඬුවම් දුන්නොත් ජනතාව ඔබෙන් බලාපොරොත්තු වූ කාරණා ඉටු කරන්න පුළුවන්. ඒ වෙනස් කරන නීතිය පැහැදිලිව මේ සභාවට කියන්න. එතකොට අපට ගැටලුවක් නැහැ. ඔබතුමන්ලා අතවල් කාලයේ නීති හදනවා, ඒ නීති හරහා මේ ජාවාරම්වලට සියයට 100ක් නිත තබනවා කියන බලාපොරොත්තුව දුන්නොත්, ඔබතුමන්ලාට ඡන්දය දුන් ජනතාවගේ ගෞරවය මෙන්ම අපේ ගෞරවයත් ඔබතුමන්ලාට ලැබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*මාණ්පුමිකු වසන්ත සමරසිංහ*)
(The Hon. Wasantha Samarasinghe)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇහුවා වාගේම අපේ රටේ පවතින සමහර නීතිවල සිදුරු තිබෙනවා. සමහර HS codes අපේ රටේ නැහැ. උදාහරණයක් ගත්තොත්, සමහර භාණ්ඩ ගෙන්වද්දී ඒ භාණ්ඩවලට අදාළව පරීක්ෂා කරන ක්‍රමත් අපේ රටේ නැහැ. අපි දැන් ඒවා හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා එම නීති සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත් සකස් කිරීම සඳහා අපි මේ වන විට ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. විශේෂයෙන්ම පාරිභෝගිකයාගේ ආරක්ෂාව වෙනුවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීමට අපි මේ වෙනකොටත් කටයුතු කරමින් ඉන්නවා.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ඊට අමතරව රේගුව හරහා සිදු විය යුතු පරීක්ෂාවන් ශක්තිමත් කරන්නත් ඕනෑ. එහෙම නැති නිසා තමයි සමහර භාණ්ඩ රට තුළට එන්නේ. එක පැත්තකින් ඒ සඳහා අවශ්‍ය රේගු පහසුකම් වැඩි කරලා, පරීක්ෂා කිරීමේ කටයුතු ක්‍රමවත් කිරීමේ ක්‍රියාමාර්ග අපි ගනිමින් තිබෙනවා. එම නිසා අදාළ නීති සංශෝධනය කරලා පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අපි ගන්නවා. Coconut oil ගෙනැල්ලා ලංකාවේදී සුද්ධ කරනවා කියලා ඔබතුමා මීට කලින් පාර්ලිමේන්තුවේදී මතු කළ ප්‍රශ්නයට අදාළ පරීක්ෂණයත් මේ වන විට ක්‍රියාත්මක වෙනවා. එම පරීක්ෂණය අවසන් වූ වහාම අවශ්‍ය තොරතුරු ලබා දීලා අවශ්‍ය ඉදිරි පරීක්ෂණ කටයුතු රේගුවත් එකතු කරගෙන කරන්න කියලා අපි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට දැනුම් දීලා තිබෙනවා. ඒ තොරතුරු ටිකත් අපි වාර්තා කරනවා.

ඒ වාගේම පාරිභෝගිකයාගේ ආරක්ෂාව වෙනුවෙන් ලංකාවට ගෙනෙන භාණ්ඩවල ප්‍රමිතියත්, ගුණයත්, ඒ වාගේම වෙළෙඳ පොළ තුළ පාරිභෝගිකයාගේ ආරක්ෂාවට අවශ්‍ය නීති සංශෝධනය කිරීම සඳහාත් කමිටු පත් කරලා අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා. අපි ඒවා කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ සඳහා ඔබතුමන්ලාටත් සහයෝගය දක්වන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

පොළොන්නරුව සිටි සෙන්ටර්හි බදු දුන් කඩ කාමර: විස්තර
பொலன்னறுவை 'சிட்டி சென்ட'ரில் குத்தகைக்கு விடப்பட்டுள்ள கடைகள்: விபரம்
SHOPS LEASED OUT IN POLONNARUWA CITY CENTER: DETAILS

490/2025

4. ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "පොළොන්නරුව සිටි සෙන්ටර්"හි ඇති මුළු කඩකාමර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වන විට බදු දී ඇති කඩකාමර සංඛ්‍යාව කොපමණද;

(iii) "පොළොන්නරුව සිටි සෙන්ටර්" ගොඩනැඟිල්ල බදු දීම සහ එහි ඇති කඩකාමර බෙදා දීම සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ කවරේද;

(iv) මේ වන විට එම තීරණ ක්‍රියාත්මක වන්නේද;

(v) ඉහත කඩකාමර බදු දීමෙන් පොළොන්නරුව මහා නගර සභාවට අලාභයක් සිදු වී තිබේ නම්, එම අලාභය අදාළ පාර්ශ්වයන්ගෙන් අය කර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) "பொலன்னறுவை சிட்டி சென்டர்"இலுள்ள மொத்தக் கடை அறைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவற்றில் இதுவரை குத்தகைக்கு வழங்கப்பட்டுள்ள கடை அறைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) "பொலன்னறுவை சிட்டி சென்டர்" கட்டிடத்தை குத்தகைக்கு வழங்குதல் மற்றும் அதிலுள்ள கடை அறைகளை பகிர்ந்தளித்தல் தொடர்பாக 2019ஆம் ஆண்டு ஆளுநரின் தலைமையில் நடைபெற்ற கலந்துரையாடலில் எடுக்கப்பட்ட தீர்மானங்கள் யாவை என்பதையும்;

(iv) தற்போது மேற்படி தீர்மானங்கள் அமுல்படுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(v) மேற்படி கடை அறைகளை குத்தகைக்கு வழங்கியதன்மூலம் பொலன்னறுவை மாநகர சபைக்கு நட்டம் ஏற்பட்டிருப்பின், மேற்படி நட்டம் சம்பந்தப்பட்ட தரப்பினர்களிடமிருந்து அறவிடப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) the total number of shops in Polonnaruwa City Center;

(ii) the number of shops, out of them, that have been leased out by now;

(iii) the decisions taken at the discussion held in 2019 headed by the Governor regarding the leasing out of the Polonnaruwa City Center building and the distribution of the shops therein;

(iv) whether the said decisions are being implemented at present; and

(v) if the Polonnaruwa Municipal Council has incurred a loss due to lease of the said shops, whether that loss will be recovered from the responsible parties?

(b) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කඩ කාමර 57කි.

(ii) කඩ කාමර 52කි.

(iii) 2019 සැප්තැම්බර් 24 දින ගරු ආණ්ඩුකාර නිල නිවසේ පැවති සාකච්ඡාවේ යෝජනා ඇමුණුම මඟින් ඉදිරිපත් කර තිබෙනවා. එම ඇමුණුම **සභාගත*** කරනවා.

(iv) මේ වන විට ක්‍රියාත්මක කර තිබෙනවා.

(v) බදුකරුවන් විසින් නිසි පරිදි කඩ කුලී ගෙවා නොමැති කඩ කාමර 06ක් 2024 පෙබරවාරි 26වන දින මුද්‍රා තබන ලද අතර, මහනගර සභා ආඥාපනතේ 266 වගන්තිය ප්‍රකාරව 2025 මාර්තු 03 දිනෙන් වාස බද්ද අවසන් කිරීමේ දැන්වීම නිකුත් කිරීමටත්, ඉන් අනතුරුව මාසයක් ඇතුළත අදාළ කඩ කාමර නගර සභාව වෙත පවරා ගැනීමටත් කටයුතු සිදු කරමින් තිබෙනවා. ඒ වාගේම හිඟ ආදායම් අය කර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම පිණිස නීති නිලධාරිනිය කටයුතු කරමින් ඉන්නවා.

(ආ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

පොළොන්නරුව පොදු වෙළෙඳ සංකීර්ණය දීර්ඝ කාලීන බදු පදනම යටතේ බදු දීම සඳහා වූ රැස්වීම සඳහා සහභාගි වූවන්,

දිනය	:-	2019.09.14
වේලාව	:-	පෙ.ව. 10.00
ස්ථානය	:-	ආණ්ඩුකාර නිල නිවස
සහභාගි වූවන්	:-	

අනු අංකය	නම	තනතුර
01	ගරු සරත් ඒකනායක මැතිතුමා	ආණ්ඩුකාරතුමා
02	එච්.එම්.පී. බණ්ඩාර මහතා	ප්‍රධාන ලේකම්
03	ගරු එල්.ජී. චානක සිදත් රණසිංහ මැතිතුමා	නගරාධිපතිතුමා
04	පාලිත අබේවර්ධන මහතා	බ.ප. සභාවේ නීති නිලධාරි
05	එම්. කොඩිප්පිලි ආරච්චි මෙනවිය	පළාත් පාලන කොමසාරිස්
06	එච්.එම්. චින්ද්‍යා ප්‍රසාදිනී හේරත් මිය	නාගරික කොමසාරිස්(වැ.බ)
07	ඩබ්ලිව්.ජී.එස්. සුනිමල් බණ්ඩාර මහතා	නාගරික ඉංජිනේරු
08	එන්.ටී.එස්. පීරිස් මහතා	නාගරික ගණකාධිකාරි
09	කේ. දේවිකා සෙනෙවිරත්න මිය	නීති නිලධාරි

පොළොන්නරුව මහ නගර සභාව විසින් ඉදිකර ඇති පොදු වෙළෙඳ සංකීර්ණය දීර්ඝ කාලීනව බදු දීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් උතුරුමැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් හා ගරු නගරාධිපතිතුමාගේත්, ප්‍රධාන ලේකම් - උතුරු මැද පළාත, පළාත් පාලන කොමසාරිස් - උතුරු මැද පළාත් සභාව සහ මහ නගර සභාවේ මාණ්ඩලික නිලධාරීන්ගේද සහභාගිත්වයෙන් 2019.09.14වන දින පැවති සාකච්ඡාවේදී ගත් තීරණ සම්බන්ධයෙන් පිළියෙල කර ඉදිරිපත් කරන වාර්තාවයි.

මෙම සාකච්ඡාවේදී විශේෂඥ උපදෙස් ලබා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාවේ නීති නිලධාරි පාලිත අබේවර්ධන මහතා සහභාගි විය.

භුක්තිය බැහැර කිරීමට අපේක්ෂිත ආකාරය:

අදාළ කඩ කාමර අංග සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් වන අතර, ස්ථාවර ව්‍යාපාරික කාර්යයන් වෙනුවෙන් දීර්ඝ කාලීන භුක්තිය බැහැර කිරීම යටතේ කටයුතු කිරීම සුරක්ෂිත ආයෝජනයක් ලෙස සැලකිය හැක. එම නිස අවම වශයෙන් පොළොන්නරුව මහ නගර සභාව තීරණය කරන පරිදි වසර 30ක දීර්ඝ කාලීන බදු පදනමක් යටතේ ලබා දීම උචිත බව යෝජනා විය.

ආයෝජන අවස්ථා සඳහා යෝජනා කැඳවීම:

මෙහි දේපළ වඩා ඵලදායී අන්දමින් ව්‍යාපාරික අවස්ථා සඳහා විවෘත කරනු වස් ව්‍යාපාරික යෝජනා "ආයෝජන යෝජනා" වශයෙන් කැඳවීමට තීරණය විය. මෙය ප්‍රධාන ජාතික පුවත්වල පළ කරනු ලබන දැන්වීමක් මඟින් -භාෂා ත්‍රිත්වයෙන්- යෝජනා කැඳවීම වඩා සුදුසු වන අතර පිළිගත් වෙළෙඳ සන්නාම යටතේ වූ ව්‍යාපාර සඳහා ඍජුව ආරාධනා කිරීම ද සිදු කළ යුතු බවට යෝජනා විය.

මෙම ආයෝජන යෝජනා මහ නගර සභාව වෙත ලැබුණු පසු ඒවා ඇගැයීම් කිරීම සඳහා නාගරික ඉංජිනේරුගේ සභාපතිත්වයෙන් නීති නිලධාරි - පොළොන්නරුව මහ නගර සභාව, ගණකාධිකාරි - පළාත් පාලන දෙපාර්තමේන්තුව යන අයගේ සහභාගිත්වයෙන් ඇගයුම් මණ්ඩලයක් පත් කර ගැනීමට තීරණය විය.

ඉහත කී ආයෝජන යෝජනා කැඳවීමේ යෝජනාව සහ ඇගයුම් මණ්ඩලය පත් කර ගැනීමේ යෝජනාව සඳහා මහා සභා අනුමැතිය ලබා ගත යුතුය.

මහ නගර සභා ආඥා පනතේ 40(1)ඊ වගන්තියේ සඳහන් විධිවිධාන අනුව දීර්ඝ කාලීනව බදු දීම සඳහා උතුරුමැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම ද කළ යුතු ය. තවද මෙම ගොඩනැඟිල්ල මහල් තුනකින් -කඩ කාමර 58කින්- සමන්විත වේ. මේවා මහල් වශයෙන් හෝ කඩ කාමර වශයෙන් බදු දීම ඇගයුම් මණ්ඩලයේ තීරණය අනුව සිදු කිරීමට ද යෝජනා විය.

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, PCC ගොඩනැඟිල්ල සම්බන්ධව මම දැනුවත් වෙලා ඉන්න ප්‍රමාණය ඉක්මවා ගිය අවබෝධයක් ඔබතුමාට ඇති කියලා මම විශ්වාස කරනවා. ඔබතුමාගේ නිවස ඊට ඉතා ආසන්නයේ පිහිටා තිබීම නිසා මේ සිදු වෙලා තිබෙන විශාල මූල්‍ය වංචාව පිළිබඳව ඔබතුමාටත් යම් අවබෝධයක් ඇති කියලා මා විශ්වාස කරනවා. 2012 වසරේ තමන්කඩුව ප්‍රාදේශීය සභාව තමයි මේ PCC ගොඩනැඟිල්ල ඉදිකරන්න යෝජනා කරන්නේ, ගරු කථානායකතුමනි.

මෙහි ඇස්තමේන්තු වටිනාකම රුපියල් ලක්ෂ 3,550ක්. නමුත්, මේක අවසාන වෙන්නේ රුපියල් ලක්ෂ 6,601ක් වියදම් කරලා. ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා, කඩ කාමර 57න්, 53ක් මේ වනකොට බදු දීලා තිබෙනවාය කියලා. ගරු කථානායකතුමනි, මේ කඩ කාමර බදු අරගෙන තිබෙන පිරිසගේ නාම ලේඛනය මා

**** පිළිතුර අවසානයේ පළ කර ඇත.***
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

[ගරු සුනිල් රත්නසිරි මහතා]

ළඟ තිබෙනවා. මේ නාම ලේඛනයේ, හිටපු නගරාධිපතිතුමා, ප්‍රාදේශීය සභාවල සභාපතිවරු සහ මන්ත්‍රීවරු වාගේම ගොඩනැඟිල්ල ඉදි කරපු සමාගම පිළිබඳවත් සඳහන් වනවා.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. සුදුසුකම් සම්පූර්ණ කරන ලද අය වෙත විධිමත් ගිවිසුම්ගත ආකාරයකට මේ කඩ කාමර ලබා දීම සිදු කරන්නට ඕනෑ. ඔවුන් මේ කඩ කාමර ලබා ගැනීමෙන් අනතුරුව අද වනවිට රුපියල් ලක්ෂ 944ක හිඟ මුදලක් තිබෙනවා. ඔවුන් මේ මුදල් ගෙවීම පැහැර හරිමින් ප්‍රකාශ කරන්නේ මේ වනවිට මෙම ගොඩනැඟිල්ලේ අඩුපාඩු ගණනාවක් තිබෙනවා, ඒ අඩුපාඩු නිවැරදි කර දුන්නොත් මේ මුදල ගෙවනවා කියායි. ගරු අමාත්‍යතුමාගෙන් මම දැනගන්නට කැමැතියි, ඒ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනවාද කියලා.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ඒ.එච්.එම්.එච්. අපයරත්න)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, මේ කියන ගොඩනැඟිල්ලේ කිසියම් අඩුපාඩුවක් තිබෙනවා නම් ඒ අඩුපාඩු නිවැරදි කිරීමට අපි කටයුතු කරනවා. නමුත්, මේ කඩ හිමිකරුවන් බදු නොගෙවා සිටීමේ ක්‍රියාවලිය ආරම්භ වෙන්නේ මේ අඩුපාඩු නිසාම නොවෙයි. හිතාමතාම ඒ මුදල් ගෙවීම පැහැර හැරපු බවක් තමයි අපට පේන්න තිබෙන්නේ. ඒ නිසා අපි මේ කඩ කාමරවල තිබෙන අඩුපාඩු නිවැරදි කරනවා වාගේම හිතාමතාම ගෙවීම් පැහැර හැරපු ඒ ව්‍යාපාරිකයන්ට එරෙහිව කටයුතු කිරීමටත් පියවර ගන්නවා.

ගරු සුනිල් රත්නසිරි මහතා
(මාණ්පුමිකු සුනිල් රත්නසිරි)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ කඩ කාමර බදු ගත්ත ව්‍යාපාරිකයන් සමඟ ගිවිසුම්ගත වීමේදී 20වැනි වගන්තිය පරිදි මාස 3ක් ඇතුළත ගෙවීම් නොකර ඇති අවස්ථාවකදී ගිවිසුම අවලංගු කළ යුතු බවට සඳහන් වෙනවා. නමුත්, මේ වනතුරුත් ඒ සඳහා කටයුතු කර නැති බව ප්‍රකාශ වෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්නට කැමැතියි, PCC ගොඩනැඟිල්ලේ තිබෙන අඩුපාඩු නවීකරණය කරනවා නම්, ඒවා නවීකරණය කිරීමෙන් අනතුරුව නැවත මේ ගොඩනැඟිල්ලේ කඩ කාමර විධිමත් ක්‍රියා පටිපාටියකට වෙනත් ඉල්ලුම්කරුවන්ට හෝ මේ සිටින කඩ හිමියන් වෙත ලබා දෙන්න කටයුතු කරනවාද කියලා.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ඒ.එච්.එම්.එච්. අපයරත්න)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු මන්ත්‍රීතුමනි, දැනට විධිමත්ව බදු ගෙවාගෙන යන කණ්ඩායම්වලට කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත්, විධිමත්ව බදු ගෙවා නැති කණ්ඩායම්වලට අදාළව නීතිය ක්‍රියාත්මක කරන අතරම, මෙම කඩ කාමර නවීකරණය කිරීමෙන් පසුව නැවත විධිමත්ව බදු ගෙවන්න පුළුවන් අයට ඒවා මුල සිට භාර දෙන්න කටයුතු කරනවා. දැනට සිටින බදු ගෙවා නැති කණ්ඩායම්වලටත් අවශ්‍ය නම් ඉල්ලන්න පුළුවන්. නමුත්, හිඟ මුදල් ගෙවා තමයි ඒගොල්ලන්ට නැවත ඒ කඩ කාමර ඉල්ලන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා ඉතාම විනිවිදභාවයකින් ඊට අදාළව කටයුතු කරන බව සඳහන් කරන්න ඕනෑ. එසේ නොවන අවස්ථාවලදී අපි නීතිමය පියවර ගන්න කටයුතු කරනවා.

නිල්වලා ගඟේ ලවණ බාධකයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් කරන ලෙස කරන ලද ඉල්ලීම: ප්‍රගතිය

නිල්වලා කඟකෙයින් குறுக்கேயுள்ள உவர்நீர்த் தடுப்பின் தாக்கம் குறித்த ஆய்வுக்கான கோரிக்கை: முன்னேற்றம்

REQUEST FOR STUDY ON IMPACT OF SALINITY BARRIER ACROSS NILWALA RIVER: PROGRESS

491/2025

5. ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නිල්වලා ගඟේ ඉදිකර ඇති ලවණ බාධකය හේතුවෙන් පැන නැඟී ඇති සමාජ, ආර්ථික හා පාරිසරික ගැටලු පිළිබඳ අධ්‍යයනය කර වාර්තාවක් ලබා දෙන ලෙස 2024.11.08 සිට 2025.01.14 දක්වා වූ කාලය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ ජල සම්පත් මණ්ඩලය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉල්ලීමක් කර තිබේද;

(ii) එසේ නම්, ඉහත ඉල්ලීම සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් තාක්ෂණික කමිටුවක් පත් කර තිබේද;

(iii) එසේ නම්, එහි සාමාජිකයන් කවුරුන්ද;

(iv) මේ වනවිට එම කමිටුවේ කටයුතුවල ප්‍රගතිය කවරේද;

(v) එම කමිටුවේ වාර්තාව ලබා දෙනු ලබන දිනය කවරේද;

(vi) ඉහත කමිටුව මේ දක්වා පත් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) நில்வளா கங்கையில் நிர்மாணிக்கப்பட்டுள்ள உவர்நீர்த் தடுப்பு காரணமாக எழுந்துள்ள சமூக, பொருளாதார மற்றும் சூழல் பிரச்சினைகள் குறித்து 2024.11.08 தொடக்கம் 2025.01.14 வரையிலான காலப்பகுதியினுள் கற்றாராய்ந்து, அறிக்கையொன்றைச் சமர்ப்பிக்குமாறு நீர்ப் பாசனத் திணைக்களம் அல்லது நீர் வளங்கள் சபை பேராதனைப் பல்கலைக்கழகத்திடம் கோரிக்கை முன்வைத்துள்ளதா;

(ii) ஆமெனில், இது தொடர்பாக பேராதனைப் பல்கலைக்கழகம் தொழில்நுட்பக் குழு வொன்றை நியமித்துள்ளதா;

(iii) ஆமெனில், அதன் உறுப்பினர்கள் யாவர்;

(iv) இன்றளவில் அக்குழு நடவடிக்கைகளின் முன்னேற்றம் யாது;

(v) அக்குழுவின் அறிக்கை சமர்ப்பிக்கப்படும் திகதி யாது;

(vi) மேற்படி குழு இதுவரையில் நியமிக்கப்பட வில்லையெனில், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House-

(i) whether the Department of Irrigation or the Water Resources Board has requested the University of Peradeniya during the period from 08.11.2024 to 14.01.2025 to study and submit a report on the social, economic and environmental concerns that have emerged due to the salinity barrier constructed across the Nilwala River;

(ii) if so, whether a Technical Committee has been appointed by the University of Peradeniya in this regard;

(iii) if so, the members of the said Committee;

(iv) the current progress of the conduct of the Committee referred to above;

(v) the date on which the report of the said Committee will be submitted; and

(vi) if the aforesaid Committee has not yet been appointed, the reasons for that?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) නැත.

(iii) ඉහත (ii) පිළිතුර අනුව අදාළ නොවේ.

(iv) ඉහත (ii) පිළිතුර අනුව අදාළ නොවේ.

(v) ඉහත (ii) පිළිතුර අනුව අදාළ නොවේ.

(vi) තාක්ෂණික අධ්‍යයනයක් සිදු කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් තාක්ෂණික යෝජනා කැඳවා ඇත. එහි යෝජනා භාර ගැනීමේ අවසන් දිනය 2025.02.19 වේ. දැනට තාක්ෂණික යෝජනා භාර දී නොමැති බැවින් තාක්ෂණික කමිටුවක් ගැන ප්‍රකාශ කළ නොහැක. එම තාක්ෂණික අධ්‍යයනය සිදු කරවා ගැනීමේ ක්‍රියාවලිය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් කරනු ලබයි.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඇත්තටම මාතර දිස්ත්‍රික්කයේ තිබෙන විශාල බෙදවාචකයක් සම්බන්ධ ප්‍රශ්නයක්. මෙය 2018 අවුරුද්දේ සිට 2022 අවුරුද්ද වෙනකල් නිල්වලා ගඟේ ඉදිකරන ලද ලවණ බාධකය නිසා ඇති වෙච්ච බෙදවාචකයක්. ඇත්තටම මේ නිල්වලා ගඟ නිසා සිදුවන ජල ගැලීම් - ගංවතුර - කියන එක සාමාන්‍ය තත්ත්වයක්. හැම අවුරුද්දකටම සැරයක්, දෙසැරයක් ගංවතුර ගලලා දවස් දෙක තුනකින් ඒ වතුර බැස යනවා. ඒක සාමාන්‍ය දෙයක්.

නමුත් මේ වැරදි ස්ථානයක ඉදි කළ, වැරදි design එකකට ඉදි කළ ලවණ බාධකය නිසා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඇත්ත වශයෙන්ම ජල සම්පත් මණ්ඩලය ජලය ලබා ගන්නා තැනට වඩා කිලෝමීටර ගණනක් පහළ, ගංමෝය කට ආසන්නයේ, ගඟේ පළල අඩුම තැන තෝරලා එතැන ගඟෙන් සියයට 40ක් විතර වපසරිය, වර්ගඵලය අවහිර කරලා හදපු මේ ලවණ බාධකය නිසා අද වෙනකොට විශාල ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒකේ දෙරවල් දාන්න තිබුණේ ගංවතුර කාලයට ඉස්සුවාට පස්සේ වතුර බැහැලා යන විධියට. නමුත් දෙරවල් දානවා වෙනුවට යටට කොන්ක්‍රීට් දාලා ගඟේ අඩි ගාණක් උස්සලා දැන් ගං පතුළේ ගැඹුර අඩු කරලා තිබෙනවා. ඒ නිසා දැන් ගඟේ ඉහළ ප්‍රදේශයේ රොන් මඩ, වැලි තැන්පත් වෙලා ගඟේ පතුල ඉස්සිලා තිබෙන්නේ. ඒ නිසා වැස්සාට පස්සේ ගංවතුර බහින්න කලින් වාගේ දහ පහළොස් ගුණයකින් වැඩි දවස් ගණනක් දැන් යනවා. ගිය සැරේ ගංවතුරට මාස එකහමාරක් ඒ ප්‍රදේශය යට වෙලා තිබුණා. ඒ තත්ත්වය නිසා ප්‍රදේශයේ කුරුඳු වගාව වාගේම කොස් ගස් පවා මැරිලා ගියා. ඒ වාගේ මහා විශාල බෙදනීය තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒක නිවැරදි කරන්න කියලා ඒ ගොවි ජනතාව සහ ප්‍රදේශවාසීන් උද්ඝෝෂණය කළා.

අවසාන වශයෙන් ඒ සම්බන්ධව කමිටුවක් පත් කළා ඒක ගැන අධ්‍යයනයක් කරන්න. ඒ වැරදි design එක හදපු, වැරදි උපදෙස් ලබා දීපු සමාගමටම තමයි ඒ සම්බන්ධව අධ්‍යයනය කරලා වාර්තාව ලබා දෙන්න බාර දුන්නේ. එතැන තිබෙනවා ලොකු conflict of interest එකක්. ඒක ඒ සමාගමටම බාර දුන්නා. ඒක එක වැරැද්දක්. ඒ සමාගම කියනවා එහෙම ප්‍රශ්නයක් නැහැ කියලා.

ඊට පස්සේ ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ 08වෙනි දා ජල සම්පත් මණ්ඩලයයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි එකතු වෙලා රැස්වීමක් තියලා තීරණය කළා මේ සම්බන්ධව අධ්‍යයනය කරන්න පේරාදෙණිය විශ්වවිද්‍යාලයට බාර දෙන්න. ඊට කලින් රුහුණ විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය අධ්‍යයනය කරලා මේකේ තිබෙන හානිය සම්බන්ධයෙන් පැහැදිලි වාර්තා කිහිපයක් දීලා තිබියදී, නැවත එහෙම තීරණයක් අරගෙන තිබෙනවා ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ 08වෙනි දා. හැබැයි, දැනට මාස 4ක් ගිහිල්ලාත්, මේ උත්තරවලට අනුව අද වෙනකම් එහෙම කමිටුවක් පත් කරලාවත් නැහැ. ඉතින් අපට පේනවා මේ ආයතන ක්‍රියා කරන ආකාරය.

අනෙක් පැත්තෙන්, මේ ඇති වෙච්ච බෙදවාචකය නිසා පසුගිය මාස දෙකට විතරක් වතුර පොම්ප කරන්න, -ගඟේ පතුළ ඉස්සිලා නිසා ගුරුත්වය හරහා වතුර බහින්නේ නැහැ- එක පොම්පාගාරයකට රුපියල් මිලියන 40ක ඩීසල් පුවිවලා තිබෙනවා. මේ, එක පොම්පාගාරයකට. ඒ වාගේ පොම්පාගාර 4ක් තිබෙනවා. මහා විශාල ධනස්කන්ධයක් නාස්ති කරනවා, මේ වෙනුවෙන්. අනෙක් පැත්තෙන් සමාජ බෙදවාචකයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරන්න.

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විධියට මේ ප්‍රශ්නයට උත්තර සොයන්න ඉදිරි කාලයේ මැදිහත් වෙනවාද? මොකද, මේක ඉක්මනින් විසඳන්න ඕනෑ ප්‍රශ්නයක්. ඒක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, මේ ගහ අයිති වාරිමාර්ග දෙපාර්තමේන්තුවට. නමුත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - National Water Supply and Drainage Board එක - මූලිකත්වය අරගෙන තමයි මේ ලවණ බාධකය ඉදි කිරීම සඳහා අනුමැතිය දීලා තිබෙන්නේ සහ වැඩ කරලා තිබෙන්නේ. ඉදිකිරීමක් සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබිලා තිබෙනවා. නමුත් මූලිකත්වය අරගෙන කටයුතු කරලා තිබෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව නොවෙයි. නමුත් බැලූ බැල්මට දැන් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. එය ප්‍රදේශයේ ජනතාවට බාධාවක් වෙලා තිබෙනවා. එහි යම් තාක්ෂණික දෝෂයක් තිබෙන බව බැලූ බැල්මට පෙනෙනවා. එය නිවැරදි කිරීම සඳහා තමයි තාක්ෂණික ඇගැයීම් වාර්තාවක් ලබා ගැනීමට කමිටුවක් පත් කරන්න කියලා තිබෙන්නේ. එහෙත් මේ කාර්යයට කාලය ගන්නවා, මේක ඇදගෙන යනවා, මේක හරියට වෙන්නේ නැති බවක් නිරීක්ෂණය වෙනවා. ඒ නිසා මම යෝජනාවක් කරනවා. අපි මේ සඳහා විසඳුමක් යොදන්න ඕනෑ. ඉදිරියේදී නිරිතදිග මෝසම එනවා. නැවත ගංවතුර තර්ජනය එන්න නියමිතයි. ඒ නිසා අපි ඇමතිතුමා එක්කත් කථා කරලා, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ වාරිමාර්ග දෙපාර්ත්මේන්තුවත් එකතු වෙලා - හැම පාර්ශ්වයක්ම එකතු වෙලා - සාකච්ඡා කරලා කඩිනමින් අපට යන්න පුළුවන් විකල්පය සහ ඉක්මනින් ගන්න පුළුවන් ක්‍රියාමාර්ග තේරාගෙන කටයුතු කරමු. ඒකට අපි -වාරිමාර්ග දෙපාර්තමේන්තුව- මැදිහත් වෙනවා. නමුත් මූලිකත්වය ගත යුත්තේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පැත්තෙනුයි. ඒ සම්බන්ධයෙන් අපි ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරමු, ගරු මන්ත්‍රීතුමා.

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙය ඉදි කරන කාලසීමාව තුළ ගොවීන් එක්ක එකඟතාවකට ඇවිත් තිබුණා, ගොවීන් වගා නොකරන කාලයට ගොවීන්ට වන්දි ලබා දෙනවා කියලා. එහෙම වන්දි ලබා දීමට හදපු ලැයිස්තුවක් තිබෙනවා. ඒකට අනුව වන්දි ලබා දීමට එකඟතාවක් තිබුණා. නමුත් මේ වෙනකම් ඒ හානි වෙච්ච ගොවීන්ට කීයක්වත් ගෙවලා නැහැ. අපි සම්බන්ධීකරණ රැස්වීමට කැඳෙව්වාට පස්සේ හැම දාම කියනවා, තව සති දෙකකින් වන්දි ලබා දෙනවා කියලා. නමුත් ඒ සති දෙක තවම උදාවෙලා නැහැ. වන්දි ලබා දීම සඳහා මැදිහත් වෙන්න කියලා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මෙය අධ්‍යයනය කරන්න පාර්ලිමේන්තු කමිටුවක් පත් කරන්න, එහෙම නැත්නම් වෙනත් සුදුසු උපාය මාර්ගයක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, වන්දි සම්බන්ධයෙන් ගත්තාමත් මූලිකත්වය ගෙන කටයුතු කරන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව නොවෙයි, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයයි කියන එක තමයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව පැත්තෙන් කරුණු දැක්වූවේ. ඒ නිසා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් මේ පිළිබඳව විමසීමක් කරන්න ඕනෑ. මම ඉස්සෙල්ලා යෝජනා කළා වාගේ මේ පාර්ශ්වය කිහිපයම එකතු කරලා සිදු කරන සාකච්ඡාවකදී මේ ගැටලුව විසඳා ගැනීමට අපි කටයුතු කරමු කියන යෝජනාව මම කරන්න කැමතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගිනි නිවන සේවා ඒකක ස්ථාපිත කිරීම
முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களில் தீயணைப்புப் பிரிவுகளைத் தாபித்தல்
ESTABLISHMENT OF FIRE SERVICE DIVISIONS IN MULLAITIVU AND MANNAR DISTRICTS

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்தமைக்கு நன்றி!

முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களில் தீயணைப்புப் படை இல்லை. முல்லைத்தீவு மாவட்டத்தை எடுத்துக் கொண்டால், அது பெரிய நிலப்பரப்பைக்கொண்ட ஒரு மாவட்டமாகும். அங்குள்ள மக்கள் அல்லது கடைத் தொகுதிகள் தீ அனர்த்தத்தால் பாதிக்கப்படும்போது, யாழ்ப்பாணத்திலிருந்து அல்லது வவுனியாவிலிருந்துதான் தீயணைப்புப் படையினர் அங்கு வரவேண்டும். அவர்கள் அங்கு வருவதற்கிடையில் உடைமைகள் எல்லாம் தீயால் அழிந்துவிடுகின்றன. எனவே, முல்லைத்தீவு மாவட்டத்தில் தீயணைப்புப் படையை அரசாங்கம் உருவாக்கித் தர வேண்டுமென்ற கோரிக்கையை நாங்கள் முன்வைக்கின்றோம். நாங்கள் இந்தக் கோரிக்கையை கடந்த அரசாங்கத்திடமும் முன்வைத்தோம். எனினும், அது நிறைவேற்றப்படவில்லை. ஆகையால்தான் உங்களிடம் முன்வைக்கின்றோம்.

அதேபோன்று, மன்னார் மாவட்டத்திலும் கடைகள் தீக்கிரையான பின்புதான் வவுனியாவிலிருந்து தீயணைப்புப் படையினர் வருகின்றார்கள். அங்கு தீயணைப்புப் படை இல்லாத காரணத்தால், அங்குள்ள மக்கள் மிகுந்த சிரமத்துக்கு உள்ளாகின்றார்கள். இரண்டு வாரங்களுக்கு முன்னர் அங்கு

පනෑ මරත්තොකුතියොන්රු එරින්තතු. අප්පොතු, තීයෙ අණෙක්ක මුටියාමල් මක්කළ් තිණ්ටාටිනාර්කළ්. ඉව්වාරාන තොරු නිලෙයේ මන්නාර් මාවට්ටත්තිල් ඉරුක්කිරතු. එනවේ, ඉන්ත ඉරණ්ටු මාවට්ටංකළිනතුම් නිලෙයෙක් කවනත්ති ලෙටුත්තු, අංකු තීයණෙප්පුප් පටෙයෙ අමෙප්පතු තොටර්පිල් උංකළුටෙය කවනත්තෙච් චෙලුත්ත වේණ්ටු මෙනක් කේට්ටුක් කොළ්කින්රේන්. නන්රි!

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණය නිවැරදියි. මේ තත්ත්වය මන්නාරම දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, රටේ තවත් බොහෝ ප්‍රදේශවල පවතින ප්‍රශ්නයක් හැටියට අපි හඳුනා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම එතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මේ විධියට සඳහන් කරන්න පුළුවන්.

<u>ගෙන ඇති ක්‍රියාමාර්ග</u>

පළාත් පාලන ආයතනයන්හි ගිනි නිවන ඒකක ස්ථාපිත කිරීම සඳහා මධ්‍යම රජයෙන් මුදල් ලබා දෙන ලෙස නිරන්තරයෙන් ඉල්ලීම් ලැබෙනවා. නමුත් ඒ ලැබෙන ඉල්ලීම් අදාළ ව්‍යාපෘති වාර්තා ද සමඟ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත මීට පෙර යොමු කර තිබුණත්, රටේ පැවති ආර්ථික තත්ත්වය අනුව මහා භාණ්ඩාගාරයෙන් ඒ සඳහා මුදල් වෙන් කරවා ගැනීමට හැකියාවක් තිබුණේ නැහැ.

ඒ නිසා රට තුළ ගිනි නිවීම් ඒකක ස්ථාපිත කිරීම සඳහා විදේශ ආධාර ලබා ගැනීමට විදේශ ආධාර ලබා දෙන ආයතන සමඟ සාකච්ඡා කර තිබෙනවා.

<u>වර්තමාන ප්‍රගතිය</u>

මේ වනවිට ගිනි නිවීමේ ඒකක සඳහා කොරියානු ආධාර ලබා ගැනීමට විශේෂයෙන් සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒ අනුව ගිනි නිවීමේ ඒකක සඳහා ද්‍රව්‍යමය ආධාර, අවශ්‍ය තාක්ෂණික සහාය සහ ධාරිතා සංවර්ධනයට අවශ්‍ය පහසුකම් ලබා දීමට කොරියානු රජය එකඟ වී තිබෙනවා.

ඒ වාගේම උතුරු පළාතේ මුලතිව් හා මන්නාරම දිස්ත්‍රික්ක දෙකට අදාළව මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හා මන්නාරම නගර සභා බල ප්‍රදේශයේ ගිනි නිවන ඒකක ස්ථාපිත කිරීමට ලෝක බැංකු ආධාර ලබා ගැනීමට රුපියල් මිලියන 60.5ක ව්‍යාපෘති දෙකක් සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර තිබෙනවා. ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවට උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයා දන්වා තිබෙනවා.

අපි උත්සාහ කරනවා, මේ ක්‍රියාමාර්ග හරහා ඉතා ඉක්මනින් එතුමා සඳහන් කළ ආකාරයට මේ ගිනි නිවීම් ඒකක ස්ථාපිත කරන්න.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩකටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, දහතුන්වන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: මාර්තු 04]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 04]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 04th March]
[HON. SPEAKER in the Chair.]

124 වන ශීර්ෂය.- ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු.270,000,000

තලෙප්පු 124.- கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 270,000,000

HEAD 124.- MINISTER OF RURAL DEVELOPMENT, SOCIAL SECURITY AND COMMUNITY EMPOWERMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 270,000,000

151 වන ශීර්ෂය.- ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු.395 ,000,000

තලෙප්පු 151. - கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 395,000,000

HEAD 151.- MINISTER OF FISHERIES, AQUATIC AND OCEAN RESOURCES

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 395,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 124, 216 සහ 331; ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 151 සහ 290.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.05 බදාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 124, 216, 331, 151 සහ 290 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, විවාදය ආරම්භ කරමින් මෙතැන් පටන් අදහස් දක්වනවා, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා.

[පූ.භා. 10.18]

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු සභාපතිතුමනි, අය වැය කාරක සභා අවස්ථාවේ අද දින සලකා බැලෙන ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේත්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මම බෙහෙවින්ම සතුටු වෙනවා.

ගරු සභාපතිතුමනි, ධීවර, ජලජ හා සාගර සම්පත් ගරු අමාත්‍යතුමාටත්, ඒ අමාත්‍යාංශයේ නිලධාරින්ටත් මගේ ස්තුතිය මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම පුද කරනවා. මොකද, එම අමාත්‍යාංශයෙන් උදුරා ගෙන තිබුණු "සාගර සම්පත්" කියන විෂය එම අමාත්‍යාංශයට එකතු කර තිබෙනවා. "සාගර සම්පත" කියන විෂය අයිති වෙන්න ඕනෑ ධීවර අමාත්‍යාංශයටයි. එම නිසා එම අමාත්‍යාංශයට "සාගර සම්පත්" කියන විෂය එකතු කිරීම ගැන මගේ ගෞරවනීය ස්තුතිය මම ඒ සියලු දෙනාට නැවත වතාවක් පුද කරනවා. ඒ වාගේම එම අමාත්‍යාංශයට එකතු කරගත යුතු තවත් ආයතනයක් තිබෙනවා. ඒ තමයි, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය. එයත් මේ අමාත්‍යාංශයට අයිති දෙයක්. ඒ නිසා එයත් මේ අමාත්‍යාංශයට එකතු කරන්න කියලා මම යෝජනා කරනවා.

සාගර සම්පත ගැන මා විශේෂයෙන් කිව යුතුයි. අපේ රට ගොඩ දමන්න පුළුවන් සම්පතක් තමයි, සාගර සම්පත. සාගර සම්පතේ වටිනාකම් බොහොමයි. සාගරයෙන් මත්ස්‍ය සම්පත ලබා ගන්න පුළුවන්. ඒ වාගේම, සමුද්‍රීය සංචාරක කර්මාන්තය දියුණු කරන්න පුළුවන්, බඩු ප්‍රවාහනය කරන්නත් පුළුවන්. ඒ වාගේම ඉන්ධන, ගෑස්, පුනර්ජනනීය බලශක්තිය, ඛනිජ සම්පත් ඇතුළු මේ සෑම දෙයක්ම උත්පාදනය කිරීමේ ශක්තිය සාගර සම්පත ආශ්‍රිතව තිබෙනවා. මේ සාගර සම්පතෙන් අපේ රට ගොඩ දමන්න පුළුවන්. එම නිසා සාගර සම්පත වෙනුවෙන් වෙනම ම සංස්ථාවක් හෝ ස්ථාපිත කරලා, සාගරයේ තිබෙන සම්පත් ලබා ගෙන අපේ රට දියුණු කිරීමට වැඩ පිළිවෙළක් සකස් කළ යුතුය කියලා මම ප්‍රථමයෙන්ම යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, 2025 වර්ෂයේ අය වැය තුළින් ධීවර කර්මාන්තයේ සංවර්ධනයට, ධීවරයන්ගේ සහ ධීවරයන්ගෙන් යැපෙන එම පවුල්වල කාන්තාවන්ගේ හා එම දරු පරපුරෙහි, ධීවර ගම්මානවල ඉන්න දරුවන් ඇතුළු ධීවර ජනතාවගේ සංවර්ධනයට, ඒ අයගේ ඉදිරි වැඩ කටයුතු ඉටු කර දීමට කිසිම මුදලක් මෙම අමාත්‍යාංශයෙන් වෙන් කරලා නැහැ. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා. ඒක බොහොම හොඳ වැඩක්. ඉස්සන් කර්මාන්තය, රට ඇතුළේ ඇති මිරිදිය ධීවර කර්මාන්තය, ජලජීවී කර්මාන්තය දියුණු කරන්න කටයුතු කිරීම හොඳ වැඩක්.

ගරු සභාපතිතුමනි, අද රටේ ධීවර කර්මාන්තයට බලපාන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, ඉන්ධන ප්‍රශ්නය; ඩීසල් හා ලාම්පුතෙල් ප්‍රශ්නය. බහුදින ධීවර යාත්‍රා හිමියන්ට, එක්දින ධීවර යාත්‍රා හිමියන්ට, කුඩා outboard motor boat හිමියන්ට තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි ලාම්පුතෙල් ප්‍රශ්නය. මේ ප්‍රශ්නය නිසා ධීවර කර්මාන්තය කඩා වැටිලායි තිබෙන්නේ. ගිය අවුරුද්ද වන කොට බහුදින යාත්‍රා 3,000කට වඩා ගැට ගහලා තිබෙන බව අපේ ධීවර සංගම්වල සභාපතිවරු ප්‍රකාශ කළා. අපේ ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමා ඒ ගැන දන්නවා. ඒ යාත්‍රා ධීවර රැකියාවට යවා ගන්න ඒ මිනිසුන්ට තවම හරියාකාර අවස්ථාවක් උදා වෙලා නැහැ.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. වර්තමාන අතිගරු ජනාධිපතිතුමාත්, තමුන්නාන්සේලාත් පසුගිය ජනාධිපතිවරණයේදී සහ මහ මැතිවරණයේදී වේදිකාවක් වේදිකාවක් ගණනේ ගිහින් ප්‍රකාශ කළා, මේ රටේ අහිංසක ධීවර ජනතාවට තෙල් සහනාධාරයක් ලබා දෙනවා කියලා; ඩීසල් ලීටරය රුපියල් 150ට ලබා දෙනවා කියලා. ඒ වාගේම, වේදිකාවක් වේදිකාවක් ගණනේ ගිහින් ප්‍රකාශ කළා ගොවියාට වී කිලෝවකට රුපියල් 154ක් ලබා දෙනවා කියලා. නමුත්, අද මේ රටේ ජනතාවට බත සපයන ගොවියා, "හාන්සිපයිස්."

ඒ වාගේම, මේ රටේ ජනතාවට බත් කන්න මත්ස්‍ය සම්පත ලබා දෙන්න මහ මුහුදේ සටන් කරන ධීවරයන්ගෙන් දෙකෙන් පංගුවකට වඩා ධීවර කර්මාන්තයෙන් ඉවත් වීමට හේතු වන වැඩ පිළිවෙළ අද සකස් වෙලා තිබෙනවා. මේවා ඇත්ත කථා. ඒ බව අපේ ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා දන්නවා. එතුමාගේ පවුල දකුණේ අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අපත් එක්ක එකට ධීවර ක්ෂේත්‍රයේ කටයුතු කරන පවුලක්. මම බලාපොරොත්තු වුණා එතුමාට ධීවර ඇමති ධුරය ලබා දෙයි කියලා. එතුමා ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක මන්ත්‍රීවරයා. නමුත්, අද එතුමාට ඒ තැන ලබා දීලා නැහැ. එතුමා ධීවර අමාත්‍ය ධුරයට පත් වුණා නම්, දකුණේ ධීවර කර්මාන්ත ක්ෂේත්‍රය වගකීමක් ඇතිව හොඳින් බලා ගන්නවා. අද ඒ මිනිසුන්ගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න කෙනෙක් නැහැ; ඒ ප්‍රශ්න දිහා බලන්න කෙනෙක් නැහැ. ඉතින් ජනාධිපතිතුමා ඇයි මෙහෙම කළේ කියලා මම ප්‍රශ්න කරනවා. ඒ මන්ත්‍රීතුමා හොඳ මනුස්සයෙක්. එතුමාගේ පියා ධීවර ක්ෂේත්‍රයේ ධීවර කර්මාන්තයයි කළේ. මගේ පියාත් ධීවර කර්මාන්තයයි කළේ. අපි එක ගමේ එකට ජීවත් වන මිනිස්සු. ධීවර ජනතාවගේ අයිතිවාසිකම් ලබා ගන්න අපි එකට සටන් කළා. නමුත්, අද එතුමාට ඒ තැන ලබා දීලා නැහැ. ඒ ගැන මම කනගාටු වෙනවා.

ගරු ජනාධිපතිතුමා එදා කිව්වා, ඩීසල් ලීටරයක් රුපියල් 150ට ලබා දෙනවා කියලා. එතුමා තවත් දේවල් කිව්වා. එතුමා කිව්වා, වරායෙන් තෙල් බාන කොට ඩීසල් ලීටරයකට රුපියල් 50ක බද්දක් ගහනවා, පෙට්ල්වලට රුපියල් 70ක බද්දක් ගහනවා, ඒ ගහන බදු ඉවත් කරලා ජනතාවට සහන ලබා දෙනවා කියලා. මහ බැංකුව ඩීසල් ලීටරයකින් රුපියල් 50ක් ණය වෙනුවෙන් කපා ගන්නවා, කංචන විජේසේකර හිටපු ධීවර ඇමතිතුමාගේ සාක්කුවට රුපියල් 60ක් බැගින් යනවා, ඒ රුපියල් 60යි, වරායෙන් බාන කොට යන රුපියල් 50යි, මහ බැංකුවට යන රුපියල් 50යි එකතු කරලා, ඩීසල් ලීටරයක් රුපියල් 150ට

දෙනවා කියලා ගරු ජනාධිපතිතුමා සහ ඔබතුමන්ලා පොරොන්දු වුණා. ඇයි, මිනිසුන්ට එහෙම බොරු කියලා, රවට්ටලා මේ රටේ බලය ලබා ගත්තේ? ධීවරයා කියන්නේ, මහ මුහුදට ගිහිල්ලා මහ මුහුද එක්ක සටන් කරලා, සමහර විට මාස එකහමාරක් තිස්සේ මහ මුහුද එක්ක සටන් කරලා මේ රටේ ජනතාවට අවශ්‍ය ප්‍රෝටීන් අඩංගු මත්ස්‍ය අස්වැන්න ගෙනෙන පුද්ගලයායි. ඒ වාගේම, ධීවරයා මේ රටට විදේශ විනිමය ද ගෙන එනවා. ධීවරයා තමයි, මේ රටේ රජයට, ආණ්ඩුවට බරක් නැතුව ජීවිතය පරදුවට තබලා මත්ස්‍ය සම්පත ගෙනැල්ලා ආර්ථිකයට ආදායම් උත්පාදනය කරන පුද්ගලයා. ඒ නිසා මා කියන්නේ මේකයි. මේ රටේ ධීවර ජනතාවට මේ වාගේ අයුක්තියක්, අහේනියක් කළොත්, කවදාවත් ඒ රජයට හරියන්නේ නැහැ. මම ඒක අහලා තිබෙනවා. මොකද, මමත් ධීවර කර්මාන්තයයි කරන්නේ. ඒ දවස්වල මම මගේ තාත්තා එක්ක කිරින්දේ වාඩියට ගියාම, බෝට්ටුවේ මාළු කිරන කොට, අප දන්නේ නැතුව අපේ මිනිස්සු මාළු කිලෝ එකදෙක හොරකම් කරනවා. අපේ තාත්තා මට අඬගහලා කිව්වා, "ඔය දේ කරන්න දෙන්න එපා පුතේ" කියලා. "මහ මුහුදෙන් හම්බ කරගෙන එන අහිංසක ධීවරයාගේ දේ හොරා කෑවොත්, කවදාවත් හරි යන්නේ නැහැ" කිව්වා. අන්න ඒක අපේ ලියන මහත්මයාට අපි එදා ප්‍රකාශ කළා. අන්න ඒ නිසා මම ආණ්ඩුවටත් කියනවා, මහ මුහුදත් එක්ක සටන් කරන ධීවරයා අසරණ තත්ත්වයට පත් කරන්න එපා කියලා; ධීවරයාට ලබා දුන් පොරොන්දු ඉෂ්ට කරන්න කියලා. මම තමුන්නාන්සේලා ඇතුළු මේ රජයෙන් ඉල්ලා සිටිනවා, ගරු ධීවර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ පොරොන්දු ඉෂ්ට කරන්න කියලා.

ඒ වාගේම, මා තවත් කාරණයක් කියන්න ඕනෑ. අපේ ගරු මංගල සමරවීර හිටපු ඇමතිතුමා මේ රටේ ඉන්ධන මිල සම්බන්ධයෙන් සූත්‍රයක් ආරම්භ කළා. ඒක හැම කෙනෙක්ම, හැම රජයක්ම පිළිගත්තා. ඒ මිල සූත්‍රය, මාසයෙන් මාසයට තෙල් මිල අඩු වැඩි වන මිල සූත්‍රයක්. ලෝක වෙළෙඳ පොළේ පවතින තෙල් මිලට අනුව, තෙල් මිල අඩු වැඩි වනවා. දැන් මාස ගණනක් තිස්සේ ඒ මිල සූත්‍රය ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ මාසයේ මිල සූත්‍රයට අනුව ඩීසල් මීලෙහි කිසිම වෙනසක් නැත; ලාම්පු තෙල් මීලෙහි කිසිම වෙනසක් නැත; oil මීලෙහි කිසිම වෙනසක් නැත කියලා සඳහන් කර තිබෙනවා මම දැක්කා. ඉතින්, ඇයි මෙහෙම? මේ ආණ්ඩුව මිල සූත්‍රයෙනුත් හොරකම් කරන ආණ්ඩුවක්. ධීවරයාගේ ඩීසල් ටික හොරකම් කරන ආණ්ඩුවක්. ධීවරයාගේ දහඩිය ටික හොරකම් කරන ආණ්ඩුවක්. ඒ නිසා මම මේ ආණ්ඩුවට බල කරලා කියනවා, මේ අහිංසක ධීවර ජනතාවගේ තෙල් සහනාධාරය ලබා දෙන්න කියලා. මම ඒක ඉල්ලීමක් විධියට කරනවා. රුපියල් 25ක තෙල් සහනාධාරයක් ලබා දෙන්න කියලා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වෙලා හිටපු කාලයේදීත්, ජනාධිපතිවරයා වෙලා හිටපු කාලයේදීත් මම යෝජනා කළා. එතුමා මමත් එක්ක සාකච්ඡා කළා. ජනාධිපතිවරණය වෙලාවේ එතුමා තෙල් ලීටරයකට රුපියල් 25ක සහනාධාරයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළා. ඒ කටයුත්ත ආරම්භ කළත් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ලැබුණේ නැහැ, මැතිවරණය නිසා ඒ වැඩ පිළිවෙළ නතර කළා. ඊට පස්සේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවා. රුපියල් 25 තෙල් සහනාධාරය දිගටම දෙනවා කිව්වා. මටත් බෝට්ටු තුනක් තිබෙනවා, බහු දින යාත්‍රා. මම bank statement එක ගෙනාවා. එක මාසයයි - නොවැම්බර් මාසයේ - තෙල් සහනාධාරය ලැබිලා තිබෙන්නේ. ගරු නිහාල් ගලප්පත්ති මැතිතුමනි, මිල සූත්‍රය අනුව රුපියල් 25ක තෙල් සහනාධාරය ලබා දීමේ වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. සල්ලි වෙන් කරලා තිබෙනවා කියලාත් දැන ගන්න ලැබුණා. නමුත්, තවමත් මාස තුනක මුදල් වැටිලා නැහැ. ඒ නිසා ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, මේ වැඩ පිළිවෙළ මේ විධියට සාර්ථක නොවුණොත් කවදාවත් ඔබතුමන්ලාට මේ ගමන යන්න ලැබෙන්නේ නැහැ කියන එක මම කියනවා.

ගරු සභාපතිතුමනි, මම යෝජනාවක් කරන්නම්. මම රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් මේ යෝජනාව කළා. මේ රටේ ධීවර වරාය 22ක් තිබෙනවා. ලංකාවේ මේ ධීවර වරාය 22 තුළ බහුදින ධීවර යාත්‍රා තිබෙනවා, 7,000කට කිට්ටු වෙන්න. දූපත් යන බෝට්ටු තිබෙනවා. වූනා කර්මාන්තයට යන බෝට්ටු තිබෙනවා. ඒ වාගේ එක එක කර්මාන්තයේ යෙදෙන බෝට්ටු තිබෙනවා. මේ බහුදින බෝට්ටු 7,000ම තෙල් ගහන්නේ මේ ධීවර වරාය 22න්. මේ බෝට්ටුවලට ඒ වරාය 22න් තෙල් ගහද්දි මාසයකට තෙල් ලීටර් ලක්ෂ 70ක්, ලක්ෂ 80ක් පමණ යනවා. මම ඒ ගැන වාර්තාවක් ගත්තා. ඒ වරාය 22න් වෙන වාහනවලට තෙල් ගහන්නේ නැහැ. එතකොට හොරකමක්, වංචාවක් සිද්ධ වෙන්නේ නැහැ; කරන්න බැහැ. මෙවර අය වැයෙන් ගොවියාට පොහොර ලබා දෙන්න රුපියල් මිලියන 35,000ක් වෙන් කළා නම්, ධීවරයාට මේ සහනය ලබා දෙන්න බැරි ඇයි කියන එක මම ප්‍රශ්න කරනවා. ඒකත් ඒ විධියටම ලබා දෙන්න පුළුවන්. මේ වරාය 22න් ඩීසල් ලීටර් ලක්ෂ 70ක්, ලක්ෂ 80ක් නිකුත් කරනවා කියලා හිතමු. ලක්ෂ 100ක් කියලා කියමු. ඩීසල් ලීටර් ලක්ෂ 100, ධීවර අමාත්‍යාංශයේ නිලධාරියෙක් දාලා, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ පිරවුම්හලෙන් පිටවන තෙල් ප්‍රමාණයේ වාර්තා අරගෙන රුපියල් 150ට ධීවරයන්ට තෙල් ටික දෙන්න පුළුවන්. මම කියලා දුන්නේ ධීවරයන්ට ඒ තෙල් සහනය ලබා දෙන හැටි. ඒක තමයි හරි ක්‍රමය. අපේ නායකතුමා ජනාධිපතිතුමා වුණා නම් මම මේ ක්‍රමය ක්‍රියාත්මක කරනවා. අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වුණා නම්, මම ධීවර ඇමති වෙලා මේ ක්‍රමය ක්‍රියාත්මක කරනවා. මේක තමයි ක්‍රමය. මේ සහනය තමයි ධීවරයාට දෙන්න ඕනෑ. ගොවියාට පොහොර ටික නම් දෙනවා. ධීවර කර්මාන්තයේ බහු දින යාත්‍රාවලට තමයි වැඩිම ඉන්ධන ප්‍රමාණයක් වැය වෙන්නේ. එක බෝට්ටුවකට trip එකක් යන්න තෙල් ලීටර් 15,000ක්, 20,000ක් අතර ප්‍රමාණයක් යනවා, කෙලවලු පන්නයේ කර්මාන්තය කරන්න. මේ විධියට එක එක ධීවර කර්මාන්ත තිබෙනවා. මේ තෙල් ප්‍රශ්නය විසඳුවොත් රස්සාවේ යන්න පුළුවන්. එහෙම වුණොත් මේ කර්මාන්තය කර ගන්න පුළුවන්. නැත්නම් මේ කර්මාන්තය කඩා වැටෙනවා. දැනට අවුරුද්දකට කිට්ටු වෙන්න මේ බෝට්ටු ගැට ගහලා තිබෙන්නේ. මේ බෝට්ටු නැවත රැකියාවේ යවනවා නම් රුපියල් ලක්ෂ 70ක්, 80ක් විතර යනවා. ඒ සඳහා බෝට්ටු එන්ජින් එක repair කරන්න ඕනෑ; බෝට්ටුවට අයිස් පටවන්න ඕනෑ. තව, තෙල්වලට යනවා රුපියල් ලක්ෂ 40ක් විතර. කනබොන බඩුවලටත් මුදලක් යනවා.

අයිස්වලට VAT එක ගහලා තිබෙනවා. අයිස් මිල වැඩි වෙලා. ඉතින් ලක්ෂ 100කට කිට්ටුවෙන්න යනවා, බෝට්ටුවක් මංගල ට්‍රිප් එක යවා ගන්න. අනුර කුමාර දිසානායක මැතිතුමා පොලී නැති, ඇප නැති ණය යෝජනා ක්‍රමයක් ගේනවා කිව්වා. ඒ නිසා ධීවර අමාත්‍යාංශය හරහා රුපියල් ලක්ෂ 100ක -කෝටියක- ණයක් ලබා දෙන්න. නැත්නම් කෝටි 50ක ණයක් ලබා දෙන්න මේ මිනිස්සුන්ට අතහිතදීමක් වශයෙන්. වාරික දෙක තුනකින් කපා ගන්න පුළුවන් ක්‍රමයට ණයක් ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

ඉතින් මෙවා කියලා දෙන්න එපා යැ අපේ රත්න ගමගේ මැතිතුමාට. එතුමන්ලා මුහුදේ, ඔරුවේ, බෝට්ටුවේ, වල්ලමේ, තෙප්පමේ ඒ හැම තැනම මේ ආණ්ඩුව ගන්න අවුරුදු ගාණක් තිස්සේ අමුඩ ගහගෙන උපවාස කළා. පන්දම් අරගෙන ගියා; උද්ඝෝෂණ කළා; මිනිස්සු මහ පාරට බැස්සුවා. එහෙම කරලා ආණ්ඩුව අරගෙන කොරන සෙල්ලමද මේක? කියන්නත් ලජ්ජයි. අපි බලය ගත්තා නම්, අපේ නායකතුමාත් එක්ක අපි මේ රට, මේ ධීවර කර්මාන්තය ඉදිරියට ගෙනියනවා. *[බාධා කිරීම්]* අපි කවුරු හරි එක්ක සාකච්ඡා කරනවා. දැන් මම සාකච්ඡා කරන්නේ ඔබතුමන්ලා එක්ක ධීවරයන්ට සහන ලබා ගන්න. රනිල් මහත්තයා ඉන්නකොට රනිල් මහත්තයා එක්ක සාකච්ඡා කළා. සජිත් මහත්තයා ආවොත් සජිත් මහත්තයා එක්ක වැඩ කරනවා. දැන් ඔබතුමන්ලාට නේ රටේ බලය තිබෙන්නේ. අපි ඔබතුමන්ලා

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

එක්ක සාකච්ඡා කරලා ධීවරයාගේ අවශ්‍යතා ලබා ගන්න කටයුතු කරනවා. ඒක තමයි ක්‍රමය. නැද්ද? අපි කුහක නැහැ. අපි ආදරෙයි. අපි උදවු කරන්න කැමැතියි. ඒ නිසා ඒ ණය ක්‍රමය ක්‍රියාත්මක කරන්න කියලා මම ඔබතුමන්ලාට යෝජනා කරනවා. නිහාල් ගලප්පත්ති මැතිතුමා හිටියා නම් එයා අපේ මිනිහා, හොඳ මනුස්සයා. අපට ඕනෑ දෙයක් කථා බහ කරලා ධීවරයන්ට අවශ්‍ය දේ කර ගන්න තිබුණා. එහෙම නේද නිහාල් අයියේ? *[බාධා කිරීමක්]* හොඳ මනුස්සයා. අපි එකට ඉන්න මිනිස්සු.

ඊළඟට මම තව ලොකු යෝජනාවක් කරනවා. මේ රටේ බහුදින යාත්‍රා 7,000ක්, කුඩා බෝට්ටු 50,000කට වැඩිය තිබෙනවා. 140,000ක් පමණ ධීවරයෝ මහ මුහුදු පුරා රැකියාව කරනවා. මහ මුහුදේ රෝහල් නැහැ; මහ මුහුදේ hospitals නැහැ. මම යහ පාලන ආණ්ඩුව වෙලාවේ ගිලන් රථ සේවාවක් ආරම්භ කරන්න කටයුතු කළා. නමුත් ඒක ක්‍රියාත්මක කරන්න දුන්නේ නැහැ, හිටපු කැබිනට් ඇමතිවරයා. ඒ නිසා මම ඔබතුමන්ලාට ඒ යෝජනාව කරනවා. ඒක හොඳ වැඩක්. දැන් ගොඩක් අයට ලෙඩ දුක් හැදෙනවා. පපුවේ අමාරු හැදෙනවා. අරවා මේවා ලෙඩ රෝග හැදිලා ධීවරයෝ මැරෙනවා. ඔවුන් ගොඩබිමට ගේන්න බැරි වෙනවා. ඒ නිසා බෝට්ටු ගිලන් රථ සේවාවක් ආරම්භ කරන්න කියලා ධීවරයන් වෙනුවෙන් ඉල්ලා සිටිනවා. බෝට්ටු ගිලන් රථ සේවාවක් ආරම්භ කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම තමයි බෝට්ටු මුහුදේදී ආපදාවලට අහු වෙනවා. ඒ බෝට්ටු ගොඩට ඇදගෙන එන්න ක්‍රමයක් නැහැ. එතකොට අපේ ගම්වල මිනිස්සු නාවික හමුදාවේ දොරකඩ ගාවට ගිහිල්ලා වැලපෙනවා, -නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා මේවා දන්නවා- වරායේ රේඩියෝ මධ්‍යස්ථානයට ගිහිල්ලා ධීවර ඇමතිතුමාට කථා කරනවා, ජනාධිපතිතුමාට කථා කරනවා. ඒ අයගේ රුපියල් කෝටි 3ක්, 4ක් වටිනා බෝට්ටුව මුහුදේ පාවෙනවා. ඒ බෝට්ටුව ගොඩට ගේන්න ක්‍රමයක් නැහැ. නාවික හමුදාවෙන් කියනවා, මුහුදු සැතැප්ම 200න් එහාට ඒගොල්ලන්ට යන්න බැහැ කියලා. තෙල් ගහන්නේ නැත්නම් ඒගොල්ලෝ යන්නේ නැහැ කියනවා. මේක ලොකු ප්‍රශ්නයක්. මෙන්න මේවා තමයි ප්‍රශ්න. ඒ නිසා මේ ආපදාවට පත් බෝට්ටු ගලවා ගැනීමට අධිවේගී බෝට්ටුවක් ඕනෑ. පැයට කිලෝමීටර 30ක, 40ක වේගයෙන් යන බෝට්ටු තිබෙනවා. එවැනි අධිවේගී බෝට්ටුවක් සහ ගිලන් රථ බෝට්ටුවක් පළමුවැනි වතාවට දකුණු පළාතේ වෙරළ තීරයේ වරායක ස්ථාපිත කරන්න. අපේ ධීවරයාගේ බෝට්ටුව මහ මුහුදේදී කැඩුණාම ඇමතිතුමාගේ පස්සෙනුයි, නාවික හමුදාව පස්සෙනුයි යමින්, රේඩියෝ මධ්‍යස්ථාන ගාව අඩා වැලපී වැලපී ඉන්න එක නතර කරන්න නම්, මේ දේවල් කරන්න ඕනෑ. මේවා තමයි වැඩ. මෙන්න මේවා තමයි කරන්න ඕනෑ. මේවා කරන්න. මේ අවුරුද්දේ මේ වැඩ පටන් ගන්න. අපට බලය තිබුණා නම් අපි කරනවා. මේවා කයිවරු නොවෙයි. අපි කයිය ගහන්නේ නැහැ. අපේ නායකයා සජිත් ප්‍රේමදාස කයියනායකයෙක් නොවෙයි. අපි හොඳට වැඩ කරපු මිනිස්සු. අපි වැඩ කරලා පෙන්වලා තිබෙනවා. අපි බස් දීලා තිබෙනවා, පැඩි දීලා තිබෙනවා, ගෙවල් හදලා තිබෙනවා, වැඩ කරලා පෙන්වලා තිබෙනවා. පොඩ්ඩක් ඉන්න. වැඩකාරයන්ට බඩු දුන්නා නම් වැඩ කරන හැටි පෙන්වනවා. මොකෝ? බොරු බැහැ. ආදරණීය මිත්‍රවරුනි, ඒ දේත් ඉෂ්ට කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු කථානායකතුමනි,-

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම නේ දැන් කථා කරන්නේ. ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමනි, ලංකාව වටේ මාදැල් තොටුපළවල් 1,000කට කිට්ටු වෙන්න තිබෙනවා. එය ධීවර කර්මාන්තයේ ආරම්භක කර්මාන්තය. මම යහ පාලන ආණ්ඩුව කාලයේ GPS මාර්ගයෙන් ඔක්කෝම වාරයවල මැනුම් කටයුතු ආරම්භ කළා. තවමත් ඒක කරනවා. පොඩ්ඩක් හොයලා බලන්න. කළුතර විතරයි ඉවර වෙලා තිබෙන්නේ. මම ඒක කරන්න ආරම්භ කළේ, මේ සංචාරක ව්‍යාපාරය කරනකොට මාදැල් තොටුපළවල ඉඩම්, ප්‍රවේශ මාර්ගය ඇතුළු ඔක්කෝම අත්පත් කරගන්නවා, මීල වැඩි නිසා.

ඔබතුමන්ලාගේ ජනාධිපති, අනුර කුමාර දිසානායක මැතිතුමා දැන් මාස 6කට උඩදී රැකව, ධීවර මාදැල් තොටුපළට ආවා. එතුමා එතැන සංවිධාන කටයුතු කරන්න ඇවිල්ලා හිටියා. ඒක අපේ මාදැල් තොටුපළ. ඒක නිසා අපිත් ගිහිල්ලා හිටියා. මම කිව්වා, "බලන්න මේ පාර. පළල අඩි එකහමාරයි. මාළු පෙට්ටිය අරගෙන එන්න බැහැ, රැකව පාරේ" කියලා. නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා දන්නවා නේ. රැකව, අඩි එකහමාරේ පොඩි පාරේ මාළු පෙට්ටිය ගේන්න බැහැ. මේවා දැකලා තමයි මම මුදල් වෙන් කරලා, GPS තාක්ෂණය උපයෝගි කරගෙන ඒ මැනුම් කටයුතු ආරම්භ කළේ. නමුත් තවමත් ඒ කටයුතු නිම කරලා නැහැ. දැන් අවුරුදු 4කටත් කිට්ටු වෙනවා. අන්න ඒ දේ හොයලා බලන්න කියලා මම කියනවා. ඒක කරන්න කියලා මම ඔබතුමන්ලාට යෝජනා කරනවා. දන්නේ නැත්නම් නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාගෙන් - නිහාල් අයියාගෙන් - අහගන්න, වැඩ කරන හැටි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අන්න වැඩ!

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
පසුගිය කාලයේ ධීවර පනතට සංශෝධනයක් ගෙනාවා නේ. ඔබතුමන්ලාත් ඒ ධීවර පනත් කෙටුම්පතට විරුද්ධ වුණා. ඒකට අපිත් විරුද්ධ වුණා. මමත් පේ්සම් අත්සන් කළා. මේ ධීවර පනතේ පිටු 171ක් තිබෙනවා. ධීවර අමාත්‍යාංශයේ නිලධාරින් විදේශීය රටවල සමාගම්වලින් මුදල් අරගෙන ධීවර වාර්තා හදන්න කියලා දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ගිහිල්ලා, හෝටල්වලින් කාලා බීලා, සල්ලි බෙදාගෙන වාර්තා හදලා ඒ රටවලට ඕනෑ විධියට වැඩකටයුතු කරනවා. ඒ කියන්නේ මහ මුහුදු බදු දීමේ වැඩ පිළිවෙළ, කෝටා ක්‍රමයට මාළු ඇල්ලීමේ වැඩ පිළිවෙළ, කෝටා ක්‍රමය ලබා දීම, බහුදින යාත්‍රාවල skipper වැරැද්දක් කළ විට බෝට්ටු හිමියා අත්අඩංගුවට ගැනීම වැනි නීතිරීති රාශියක් මඟින් ධීවරයාට ධීවර කර්මාන්තය එපා කරලා, බහුදින සමාගම්වලට අනාගතයේදී ධීවර කර්මාන්තය ලබාදෙන වැඩ පිළිවෙළක් තමයි මේ ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා මම රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමාට යෝජනා කරනවා, මේ ධීවර පනත ගෙනෙන එක නතර කරලා, නව සංශෝධනයක් කරලා, ධීවර සමාගම්, ධීවර සම්මේලන සමඟ සාකච්ඡා කරලා, ධීවරයන්ගේ අදහස් උදහස් අරගෙන අපේ රටට ගැළපෙන ධීවර පනතක් සකස් කරන්න කියලා.

ඊළඟට, මම තවත් යෝජනාවක් කරන්න කැමැතියි. යහ පාලන ආණ්ඩුව වෙලාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මගේ ආසනයේ ධීවරයන්ගේ ප්‍රධාන ඉල්ලීමක් තිබුණා. රැකව ධීවර වරාය තොටුපළට නැංගුරම්පොළක් ඉදිකිරීම, හම්බන්තොට තොටුපොළ ප්‍රතිසංස්කරණය කිරීම, මාවැල්ල ධීවර නැංගුරම්පොළ ඉදි කිරීම ආදී වශයෙන් ඉල්ලීම් කිහිපයක් තිබුණා.

යහ පාලන ආණ්ඩුව වෙලාවේදී මම මේ සම්බන්ධයෙන් තුන්හතර වතාවක් අධ්‍යයනය කරලා, ශක්‍යතා වාර්තා හදලා, මැනුම් කටයුතු කරලා, වරාය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන්නට මුදල් වෙන් කළා. රැකව ධීවර නැංගුරම්පොළ සඳහා රුපියල් මිලියන 315ක් සහ මාවැල්ලේ ධීවර නැංගුරම්පොළ සඳහා රුපියල් මිලියන 365ක් වෙන් කරලා එම වරායන් දෙක හදන්න කොන්ත්‍රාත් ලබා දීලා කටයුතු කළා. නමුත්, ආණ්ඩුව පෙරළුණා; මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව. කොන්ත්‍රාත්කරුවන් කළාද, නිලධාරින් කළාද මම දන්නේ නැහැ, ඔබතුමන්ලා පරීක්ෂණයක් කරලා බලන්න. නිහාල් ගලප්පත්ති මැතිතුමාත් මේ ගැන දන්නවා. වරාය දෙකම ගොඩ වෙලා pool එකක් හැදිලා තිබෙනවා. ඔබතුමන්ලා යන වෙලාවක මාවැල්ලට ගිහින් බලන්න, pool එකක් තිබෙන්නේ. හොඳට නාන්න පුළුවන්. පුංචි අයටත් නාගෙන එන්න පුළුවන් pool එකක් තිබෙන්නේ. රැකව ඔක්කොම ගොඩ වෙලා, බෝට්ටු අදින්න බැහැ, ගල්පරවල වැදිලා කැඩෙනවා. මේ ගැන හරි දැනුමක්, අවබෝධයක් තිබෙන අය මේ කර්මාන්තය කරන්න ඕනෑ.

කිරින්ද ධීවර වරාය 1977දී ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා හදපු ධීවර වරායක්. යම් යම් අඩු පාඩු නිසා එම ධීවර වරාය ගොඩ වෙලා, කඩා වැටිලා මිනිස්සු මැරුණා. මම මේ ගැන අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමාට කිව්වාම, ජපන් රජයත් එක්ක සාකච්ඡා කළා. අපේ රජයක් ආවා නම් එය නැවත වතාවක් අලුත් වරායක් හැටියට ප්‍රතිසංස්කරණය කරන්න බලාපොරොත්තුවෙන් හිටියේ. නමුත්, අපට ඒ දේ කරගන්න බැරි වුණා. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, ඒක කරන්න කියලා. ජනාධිපතිතුමා දැන් ලෝකේ වටේ යනවා නේ. එතුමාට එහෙම ගිහිල්ලා ඉල්ලීමක් කරලා මේ රටේ ධීවර ක්ෂේත්‍රයට ගිලන් රථ සේවාවක් ලබා ගන්න, ගිලන් රථ බෝට්ටු ලබා ගන්න පුළුවන්. පිට රටින් ඒ ආධාර දෙනවා. පිට රටවලින් වරාය හදන්න ආධාර දෙනවා. වරාය නිර්මාණය කරන්න ආධාර දෙනවා. ඉතින්, ඒවා කරන්න ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාට උපදෙස් දෙන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ මිරිදිය ධීවර කර්මාන්තය ගැනත් මම කියන්න කැමැතියි. මිරිදිය ධීවර කර්මාන්තය මේ රටේ හොඳට ක්‍රියාත්මක වෙන කර්මාන්තයක්. මම දන්නවා, නැක්ඩා ආයතනයේ නිලධාරින් හොරකමෙන් සහ වංචාවෙන් තොරව අතිසාර්ථක ලෙස ඒ කටයුතු ක්‍රියාත්මක කරගෙන යන බව. අපි හොඳ දේට හොඳයි කියන්න ඕනෑ. ඒ නිසා අපේ මිරිදිය ධීවර කර්මාන්තය සාර්ථක කර ගන්න උපරිම සහයෝගය ලබා දීලා කටයුතු කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයාට අවශ්‍ය තංගුස්, බිලී කටු, දැල් වර්ග, locks, snaps, ෆයිබර් බඳු, බෝට්ටු එන්ජින්, එන්ජින්වල අමතර කොටස්, auto motor engines, ඒවායේ අමතර කොටස් යනාදී සියල්ල සඳහා බදු ඉවත් කරනවාය කියලා ජනාධිපතිතුමා වේදිකාවල කිව්වා. නමුත්, ඒ කිසිම බද්දක් ඉවත් කරලා නැහැ. ඒ සියලු ධීවර ආම්පන්න සඳහා බදු ඉවත් කරලා නැහැ. පරිභෝජනයට ගෙන යන ද්‍රව්‍යවලට අදාළ බදු ඉවත් කරලා නැහැ. අයිස්වලට පනවා තිබෙන බදු ඉවත් කරලා නැහැ. තෙල් මිල වැඩි වෙලා තිබෙනවා. එතකොට බෝට්ටුවක රැකියාවක් කරන්න යන්නේ කොහොමද? මම අහන්නේ ඒකයි. මේ ප්‍රශ්නය නිසා අපි අසරණ වෙලා ඉන්නේ.

ඊළඟට, පිට රටින් ගෙනෙනවා සැමන් මාළු. සැමන් කර්මාන්තශාලා 25ක් තිබෙනවා. සැමන් කර්මාන්තශාලා 25ට අවශ්‍ය මාළු ප්‍රමාණය අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන්. දකුණේ ලින්නෝ කිලෝව රුපියල් 500ත්, 600ත් අතර මිලකට දෙන්න පුළුවන්. එතකොට අපේ ධීවරයාගේ මාළුවලටත් මිලක් එනවා. සැමන් කර්මාන්තයටත් වටිනාකමක් ලැබෙනවා. දැන් චීනයෙන් මාළු ටින් කරලා ලේබල් නොගහා ගෙනැල්ලා අපේ රටේ අහිංසක ජනතාවට කන්න දෙනවා. ඒවා හරිද? ඉතින් මේ ධීවර කර්මාන්තය නඟාසිටුවන්න නම්, ලංකාවට මාළු ආනයනය කිරීම වහාම නතර කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. අපේ රටේ කරවල නිෂ්පාදනය කරනවා, උම්බලකඩ නිෂ්පාදනය කරනවා. ඒ සෑම ක්ෂේත්‍රයකින්ම අපේ රටේ පරිභෝජනයට අවශ්‍ය මත්ස්‍ය සම්පත නිෂ්පාදනය කරනවා.

අපේ බහුදින යාත්‍රා 7,000ක් තිබෙනවා. පිට රටවලින් බහුදින යාත්‍රා 1,700 ගණනක් එනවා. කෙළවල්ලා මත්ස්‍ය කර්මාන්තය කරලා, පිට රට පටවලා විදේශ විනිමය ගෙන ඒමේ කර්මාන්තයේ නියැළෙන 1,700 ගණනක් ඉන්නවා. අනෙක් සියලුදෙනාම කරන්නේ ලින්නෝ මත්ස්‍ය කර්මාන්තය. එවැනි සෑම කර්මාන්තයක්ම අද කඩා වැටෙමින් තිබෙනවා. එවැනි කර්මාන්ත නැවත ක්‍රියාත්මක කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over now.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු සභාපතිතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, විපක්ෂය පැත්තෙන් මෙතුමාට අමතර විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
බොහොම ස්තුතියි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, සුළු පරිමාණ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින්ට ගොඩබිමත් එක්ක සම්බන්ධකම් පවත්වන්න විධියක් නැහැ. බහුදින යාත්‍රාවලට නම් ගොඩබිමත් එක්ක සම්බන්ධකම් පවත්වන්න පුළුවන් රේඩියෝ මධ්‍යස්ථාන තිබෙනවා. අම්බලන්ගොඩ තිබුණු රේඩියෝ මධ්‍යස්ථානය ක්‍රියා විරහිත වෙලා මේ වෙනකොට අවුරුද්දකට කිට්ටු කාලයක් ගතවෙලා තිබෙනවා. ඒ නිසා මුහුදේ සිටින ධීවරයාට ගොඩබිමත් එක්ක සම්බන්ධකම් පවත්වන්න බැහැ. ඒ හේතුවෙන් ධීවර වරායවල විශාල වශයෙන් ප්‍රශ්න ඇතිවෙලා තිබෙනවා. ධීවර වරායවල තිබෙන ඒ ප්‍රශ්න ඔක්කෝම වෙනම එකතු කරලා බලන්න. රේඩියෝ හරහා ගොඩබිමට කථා කරන්න නොහැකි වීමේ ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න ධීවරයින්ට අවස්ථාවක් නැහැ.

කුඩා බෝට්ටු, බහුදින යාත්‍රා 5,000ක් විතර තිබෙනවා. ඔවුන් මුහුදේ අතරමං වුණොත් ගොඩබිමට දැනුම් දෙන්න ක්‍රමයක් නැහැ. මීට පෙර ඒ සඳහා මොබිටෙල් ආයතනය හරහා ක්‍රියාත්මක වුණු තාක්ෂණික ක්‍රමයක් තිබුණා. දැන් ඒ සියල්ලම නතර කරලා තිබෙනවා. ඒ පිළිබඳ විස්තර මට අද ගෙනෙන්න බැරි වුණා. එම නිසා ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයාට මුහුදේ සිට ගොඩබිමත් එක්ක සම්බන්ධ වෙන්න වැඩ පිළිවෙළක් නැහැ. දකුණු පළාතේ ධීවරයින්ට ඒ ප්‍රශ්නය තිබෙනවා. ගරු නිහාල් ගලප්පත්ති මැතිතුමාත් ඒ ගැන දන්නවා. එම නිසා මේ ප්‍රශ්නයත් නිරාකරණය කරන්න කටයුතු කරන්න.

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

විශේෂයෙන්ම දකුණේ ධීවර කර්මාන්තය, ඒ වාගේම කරවල කර්මාන්තය, උම්බලකඩ කර්මාන්තය ආදී වශයෙන් සෑම ක්ෂේත්‍රයකටම අදාළ කර්මාන්ත කඩා වැටෙනවා, ඒ දේවල් විදේශීය රටවලින් ගෙන්වනකොට. එම නිසා කරවල, මාළු, ටින් මාළු, උම්බලකඩ පිට රටින් ගෙන්වන එක හය මාසයකට නතර කරලා බලන්න, ගරු ඇමතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over now.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු ඇමතිතුමනි, ඉන්ධන සහනාධාර ලබා දීලා මේ කටයුතු ටික කළොත් අපේ ධීවර කර්මාන්තය කඩා වැටෙන්නේ නැහැ. මේ කටයුතු වෙනුවෙන් අපි ඕනෑම අවස්ථාවක ඔබතුමන්ලාට සහයෝගය ලබා දෙන්න සූදානම්.

ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න. යහපාලන ආණ්ඩුව කාලයේ අපි "නිල් ආර්ථිකය" වැඩ පිළිවෙළ ආරම්භ කළා. එම වැඩ පිළිවෙළ යටතේ අපි වැඩකටයුතු රාශියක් ක්‍රියාත්මක කළා. ඒ පිළිබඳව මේ මා ළඟ තිබෙන "නිල් ආර්ථිකය" කියන පොතේ සඳහන් වෙනවා. ඔබතුමන්ලාට අවශ්‍ය නම් මම මේ පොත ලබා දෙන්නම්. අමාත්‍යාංශය තුළත් මේ පොත ඇති.

අපේ ධීවර කර්මාන්තය ගොඩගන්න අවශ්‍යයි. මාවැල්ලේ සහ රැකව ධීවර වරායන් සම්බන්ධව මැනුම් කටයුතු කරපු සියලු වාර්තා මා ළඟ තිබෙනවා. ඔබතුමන්ලා ඒවා අරගෙන, නිලධාරීන්ගෙන් ඒ දේ සිදු වුණාද, කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඒ දේ සිදු වුණා ද කියලා පරීක්ෂණයක් කරන්න. අපරාදේ මේ සල්ලි, කවුරු කෑවත්. ඒ ගැනත් සොයා බලන්න. ධීවර කර්මාන්තය ගොඩනඟන්න අපේ සහයෝගය ඕනෑ වෙලාවක ලබා දෙනවා. ධීවර ඇමතිතුමා -රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා- මගේ මිත්‍රයා. මම එතුමා එක්ක අවුරුදු ගණනාවක් මාදිවෙල මන්ත්‍රී නිල නිවාසවල හිටියා. මගේ දරුවොයි, එතුමාගේ දරුවොයි එකට හැදුණේ, මිත්‍රයෝ. අප සියලුදෙනා එකතු වෙලා ධීවර කර්මාන්තය ගොඩගන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. මම ඔබතුමන්ලාට උදව් කරනවා.

සියලු දෙනාටම ජය වේවා!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Rathna Gamage. You have 14 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 10.47]

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු සභාපතිතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් විවාදයට ගන්නා මේ අවස්ථාවේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් විවාදයට මුලින්ම සම්බන්ධ වන්න ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා. මේ රටේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනැඟීමේදී රට තුළ තිබෙන ප්‍රධාන ප්‍රභව කිහිපය අතරින් ධීවර කර්මාන්තයට ප්‍රධානත්වයක් ලැබෙනවා. විශේෂයෙන්ම කෘෂි කර්මාන්තය හා වැවිලි කර්මාන්තයත්, ධීවර කර්මාන්තය හා සාගර සම්පතත්, ඒ වාගේම කර්මාන්ත ක්ෂේත්‍රයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තත්, IT කර්මාන්තයත්, සංචාරක කර්මාන්තයත් ගත්තාම, ඒ අතරින් ධීවර සහ සාගර සම්පත කියන්නේ මේ රටේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟන ඒ ප්‍රධාන ළිප් ගල් තුනෙන් එක ළිප් ගලක් කියලා අපි විශ්වාස කරනවා. ජාතික ආර්ථිකය නැමැති බත් හැළිය ඉදෙනවා නම්, ඒ ඉදෙන බත් හැළිය තබන ළිප්ගල් තුනෙන් එකක් තමයි ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය. ඒ නිසා මෙවර ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයට අපේ රජයෙන් විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. විශේෂයෙන්ම ගරු අනුර දිසානායක මහතා ජනාධිපති වූ මොහොතේ සිට රටේ ධීවර කර්මාන්තය නහාසිටුවීම සඳහා එතුමාගේ පාර්ශ්වයෙන් ඉදිරිපත් වන කරුණු දැක්වීම්වල ඉඳලාම බැලුවොත්, අපේ රජය ධීවර කර්මාන්තයට දක්වන දායකත්වය ගැන ඉතාම පැහැදිලි වෙනවා.

විශේෂයෙන්ම ජනාධිපතිතුමා බලයට පත්වෙලා පළමුවැනි දවස් 10 ඇතුළත මේ රටේ කෘෂි කර්මාන්තයට සහ ධීවර කර්මාන්තයට යම් අස්වැසිල්ලක් ලබා දුන්නා. ඒ තමයි, මේ රටේ ධීවර ප්‍රජාව වෙනුවෙන් ඉන්ධන සහනාධාරයක් ලබා දීම. ඒක පළමුවැනි කර්තව්‍යය. ඒ කටයුත්ත මේ දක්වා සිදු කෙරෙනවා. ඉදිරියට කරන කටයුතු සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාත්, ගරු අමාත්‍යතුමාත් ඉදිරියේදී සාකච්ඡාවක් කරන්න නියමිතයි.

ගරු සභාපතිතුමනි, මේ රටේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟන්නේ කොහොමද කියලා අපි දිගින් දිගටම සැලකිල්ලට ගත්තා. නිෂ්පාදන ආර්ථිකයට සම්බන්ධ වන ධීවර ජනතාවගේ ජීවිත නහාසිටුවන්නත්, ඒ කුටුම්බ ඒකකවලට දක්වන්න පුළුවන් දායකත්වය උපරිම ලෙස ලබා දෙන්නත් අපි කටයුතු කළා. ඒ වාගේම මේ රටේ ජනතාවගේ බත්පතට වැඩි සත්ව ප්‍රෝටීන් ප්‍රමාණයක් ලබා ගත හැකි ආකාරයට මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය ලබා දීමත්, විශාල විදේශ විනිමයක් මේ රටට ගෙන ඒමත් කියන මෙන්න මේ ආකාර හතරෙන් අපි අපේ රටේ ධීවර කර්මාන්තය නහාසිටුවන්න අමාත්‍යාංශය පැත්තෙන් කටයුතු කළා.

අපේ රටේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට ධීවර කර්මාන්තයේ දායකත්වය කොපමණද කියලා අපි දන්නවා. ඒ ප්‍රමාණය 2000 අවුරුද්දේ සියයට 2.3යි. පසුගිය කාලය වන විට එය සියයට එකට අඩු වුණා. අපි කියන විධියට ඒ ප්‍රමාණය සමාන්තර ශ්‍රේණියේ දශම එකේ පොදු අන්තරයෙන් අඩුවෙලා තිබෙනවා. අපේ රජය යටතේ ඉදිරි පස් අවුරුදු සැලැස්ම තුළ සියයට එකට තිබෙන දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ධීවර කර්මාන්තයේ දායකත්වය ප්‍රශස්ත මට්ටමකට ගන්න අපි සැලසුම් කර තිබෙනවා. ඒක බොහොම පැහැදිලියි. මොකද, මෙවර අය වැයෙන් අපි රුපියල් මිලියන 11,440ක් ධීවර කර්මාන්තයට වෙන්

කර තිබෙනවා. ගියවර අය වැයෙන් වෙන් කර තිබුණේ රුපියල් මිලියන 7,000යි; බිලියන 7යි. නමුත්, මෙවර අය වැයෙන් අපි රුපියල් බිලියන 11.44ක් මේ සඳහා වෙන් කර තිබෙනවා. තවත් වෙන් කිරීම් තිබෙනවා. ඉන්ධන සහනාධාරයට රුපියල් බිලියන 3ක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් මිලියන 3,000ක්. සියල්ල එකතු කරලා බලන්න. මෙවර අය වැයෙන් රුපියල් මිලියන 14,440ක් වෙන් කර තිබෙනවා. තවත් රුපියල් මිලියන 863ක ඉන්ධන සහනාධාර අපි දීලා තිබෙනවා. මේ කර්මාන්තයේ ඉදිරි කටයුතු වෙනුවෙන් අපේ ගරු ඇමතිතුමා, ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කිරීමටත් නියමිතයි.

ගරු සභාපතිතුමනි, ඊට අමතරව අපි පසුගිය සිකුරාදා රටේ පළාත් නවයේම සිටින ධීවර අමාත්‍යාංශවල ලේකම්වරුන් කැඳවුවා. අපි ධීවර කර්මාන්තය නඟාසිටුවීම වෙනුවෙන් සැලැස්මක් හැදුවා. ඒ වාගේම අපි දැන් අලුත් පරිපාලන ව්‍යුහයකුත් හදලා තිබෙනවා. විෂයය ලැයිස්තුව අපි දන්නවා, විෂයය සමගාමී ලැයිස්තුවත් දන්නවා. පළාත් සභාවයි, මධ්‍යම රජයයි ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා. මේ පළාත් 9ට අදාළ ධීවර අමාත්‍යවරුන් එක්ක විමසා බලනකොට එතැනත් රුපියල් මිලියන 707ක් තිබෙනවා. ඒකත් එකතු වෙනවා. එතකොට රුපියල් බිලියන 15ක් වෙන් කර තිබෙනවා. අපි දන්නවා, එය ගියවර වෙන් කරපු මුදලට වඩා -එම මුදල අබිබවා- සියයට 200ක වර්ධනයක් බව. මේක මෑත කාලයේ ධීවර කර්මාන්තයට ආපු අලුත් වැඩ පිළිවෙළක්. ගරු සභාපතිතුමනි, වෙනදා වාගේ නොවෙයි දැන් මධ්‍යම රජයයි, පළාත් සභා අමාත්‍යාංශවල ලේකම්තුමන්ලායි, ධීවර අධ්‍යක්ෂවරුනුයි එක්ක අපි ඒකාබද්ධ යන්ත්‍රණයක් හැදුවා, මේ රටේ ධීවර කර්මාන්තය ගොඩනඟන්න. ඊට අමතරව අපි දිස්ත්‍රික් මට්ටමෙන් ධීවර සම්බන්ධීකරණ කම්ටු කැඳවනවා. ඒකට ගරු ඇමතිතුමා හෝ අපි සම්බන්ධ වෙනවා. එ් වාගේම අදාළ දිසාපතිතුමා, අපේ අමාත්‍යාංශ ලේකම්තුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, අපේ ආයතනවල සභාපතිවරුන්, අදාළ දිස්ත්‍රික්කවල මේ ව්‍යුහයට අදාළ නිලධාරීන් ඇවිල්ලා ප්‍රශ්න විසඳන රාජ්‍ය යන්ත්‍රණයකුත් මේ කෙටි කාලය තුළ අපි හදලා තිබෙනවා. අපි ඒක ගාල්ල දිස්ත්‍රික්කයෙන් පටන් ගත්තා. අපේ රටේ කරදිය ධීවර කර්මාන්තය තිබෙන දිස්ත්‍රික්ක 15ත්, ඊට අමතරව අභ්‍යන්තර ජලාශත්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියත් - NAQDA එකත් - සම්බන්ධ කරගෙන - මේ අධිකාරිය සෑම දිස්ත්‍රික්කයකටම සම්බන්ධයි - සියලු දිස්ත්‍රික්කවලට මේ පරිපාලන යන්ත්‍රණය අපි ගෙන යනවා. අපි සැලැස්ම හදලා තිබෙන්නේ එහෙමයි. ඒ නිසා ධීවර අමාත්‍යාංශයේ පරිපාලන යන්ත්‍රණය බොහොම පැහැදිලියි. පළාත් සභාවත් සමඟ සියලු ආයතනත් සම්බන්ධ කරගෙනයි අපි මේ කටයුතු කරගෙන යන්නේ. ඒක පරිපාලන යන්ත්‍රණයක්.

ඊළඟට, ධීවර පවුල් නඟාසිටුවීම වෙනුවෙන් මුදල් වෙන් කරලා නැහැ කියලා අපේ දිලිප් වෙදඅාරච්චි මැතිතුමා කිව්වා. ධීවර පවුල් නඟාසිටුවන්න අපි පැහැදිලිවම මුදල් වෙන් කර තිබෙනවා. අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙලා තිබෙනවා. අපේ ඉලක්කයක් තිබෙනවා. සෑම ධීවර පවුලකම; කුටුම්බ ඒකකයක ආදායම් මට්ටම ඉහළ ගෙනයන්න අපට ඉලක්කයක් තිබෙනවා. එහෙම ඉහළට ගේන්න ඕනෑ අපේ ආදායමයි. කොහොමද ඒ ආදායම ඉහළට ගේන්නේ? දැන් ඔවුන් ලබන ආදායම ප්‍රමාණවත් නැහැ නේ. ගරු සභාපතිතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා, ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 65යි කියලා. ඒක තමයි WHO එකෙන් කියන්නේ. හැබැයි අපේ කීයද? අපේ රටේ ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 36.85යි. අපේ රට වටේ මුහුදු තිබෙනවා. අපේ රට වාගේ අට ගුණයක් විශාල මුහුදු සීමාවක් අපට අයත්ව තිබෙනවා. ලජ්ජයි නේ! ගරු දිලිප් වෙදඅාරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කථාව කැඩපතක් ඉදිරියට ගිහිල්ලා ප්‍රකාශ කරන්න. මීට පෙර ඔබතුමන්ලා නියෝජනය කරපු ආණ්ඩු තිබුණා නේ. ඒක බොහොම පැහැදිලියි අපට. ඒ නිසා අපි මෙය ප්‍රශස්ත මට්ටමකට ගෙන එනවා. අපි ගණන් හදලා බැලුවා, කොහොමද ඒක කරන්නේ කියලා. සාමාන්‍යයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 65යි. සාමාන්‍යයෙන් අපි ගණන් හදලා බැලුවොත්, ග්‍රෑම් 65ක ප්‍රමාණය 365න් වැඩි කර, දෙකෝටි විසිලක්ෂයෙන් වැඩි කළාම මෙට්‍රික්ටොන් 521,000යි. හැබැයි, ලංකාවේ ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 36.85යි. ඒ අනුව ගණන් හදලා බැලුවොත් මෙට්‍රික්ටොන් 291,000යි. හැබැයි, සාමාන්‍යයෙන් බැලුවොත්, අපේ අස්වැන්න - harvest එක - තිබෙනවා, මෙට්‍රික්ටොන් 521,000ක්. මොකක්ද වෙලා තිබෙන්නේ? පසු අස්වනු හානිය සියයට 40ක් පමණ වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සී-නෝර් ආයතනය දැන් සැලසුම් කරලා තිබෙනවා, පසු අස්වනු හානිය වළක්වන්න අලුත් තාක්ෂණය යොදා ගන්න. අපේ සී-නෝර් ආයතනයේ සභාපතිතුමා සහ කාර්ය මණ්ඩලය මේ වනකොට යුහුසුළුව කටයුතු කරනවා, hybrid boat එක හදන්න; hybrid freezer එක හදන්න. අපි එතැනට යනවා.

අපි දන්නවා, විශේෂයෙන්ම අද අයිස් මිල වැඩිවෙලා තිබෙන බව. අපි ඒක සැලකිල්ලට ලක් කරලා තිබෙනවා. ඒ නිසා තමයි අපි අයිස් කර්මාන්තකරුවන් කැඳෙව්වේ. ඔවුන්ගේ තිබෙන්නේ ඒකාධිකාරයක්. අපේ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා, ලේකම්තුමන්ලා, අධ්‍යක්ෂ ජනරාල්තුමන්ලා ඇතුළු අපි සියලුදෙනා අයිස් කර්මාන්තකරුවන්ට එක හඬින් කිව්වා, "මතක තබා ගන්න, අයිස් ඒකාධිකාරයත් අපි කඩනවා" කියලා. ඒ අයට එහෙම කරන්න දෙන්න බැහැ. මේ ගන්නා වතුර ටිකෙන් එහෙම කරන්න දෙන්න බැහැ. ඒ නිසා අපේ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිතුමා සැලැස්මක් හදලා තිබෙනවා. දැනට අත්සන් කර තිබෙන ගිවිසුම් අවසන් වුණාට පස්සේ ඉදිරියේදී සියලු ධීවර වරායන්වල අයිස් නිෂ්පාදනය කරන්න අපි කටයුතු කරනවා. මේ ගිවිසුම් අත්සන් කර තිබෙන්නේ පසුගිය කාලයේ පැවැති මෙතුමන්ලාගේ ආණ්ඩුවලින්. මේගොල්ලන් 25 අවුරුදු බදු, 33 අවුරුදු බදු යටතේ ඇවිල්ලා, අපි නිකම් දෙන වතුර ටිකෙන් අයිස් හොණ්ඩරයකින් රුපියල් 500ක්, 530ක් ගන්නවා. ඉදිරියේදී අපේ අමාත්‍යාංශයෙන් මෙන්න මේ ඒකාධිකාරයත් කඩනවා. අපි සැලසුම්සහගතව, තාක්ෂණයත් සමඟ මේ කටයුත්ත කරනවා. ධීවරයින්ගේ ජන ජීවිතය නඟා සිටුවීම සඳහා අපි උපරිම මැදිහත්වීමක් කරනවා. ඒ සඳහා අපට සැලැස්මක් තිබෙනවා.

ඊළඟට, ඉන්ධන ප්‍රශ්නය ගැන කිව්වා. ගරු දිලිප් වෙදඅාරච්චි මන්ත්‍රීතුමනි, තවම ලංකාවේ ඉන්ධන ලීටර් 30,000ක් ගඟන්න පුළුවන් යාත්‍රා නැහැ. ඔබතුමාගේ පැත්තෙන් කිව්වා, ඉන්ධන ලීටර් 30,000ක් ගඟන්න පුළුවන් යාත්‍රා පිළිබඳ කථාවක්. ලංකාවේ තිබෙන යාත්‍රාවල උපරිම ධාරිතාව තිබෙන්නේ ඉන්ධන ලීටර් 16,000යි. අපි සෑම ටැංකි බෝට්ටුවකටම ලීටරයකට රුපියල් 25 ගණනේ ඉන්ධන සහනාධාරයක් දීලා තිබෙනවා. උපරිමය රුපියල් 300,000යි. ඒ රුපියල් 300,000 වෙන් කරනවා 12,000කට. ඒ වාගේම මේ වනවිට ධීවර ප්‍රජාව වෙනුවෙන් අපි රුපියල් මිලියන 863ක් ලබා දී තිබෙනවා. ඒ මුදල දීලා තිබෙනවා, ටැංකි බෝට්ටුවලට, බහුදින ධීවර යාත්‍රාවලට, එක්දින - one-day - ධීවර යාත්‍රාවලට, පිටත එන්ජින් සවි කළ යාත්‍රාවලට සහ එන්ජින් සහිත සාම්ප්‍රදායික යාත්‍රාවලට. මේ හැම එකකටම සහනාධාරයක් දීලා තිබෙනවා. පසුගිය කාලයේ ඔරු, බෝට්ටු ගැට ගහලා තිබුණේ. ඒවා මුහුදු ගියේ නැහැ. ඒ නිසා තමයි අපේ ජනාධිපතිතුමා බලයට පත් වුණු වෙලාවේ මේ සහනාධාර ලබා දුන්නේ. ඉතිහාසයේ සිට ගත්තාම, ඒ ලබා දෙන සහනාධාරය ඉලක්කම් දෙකකින් යුත් සංඛ්‍යාවක් බවට පත් කරලා රාජ්‍ය අය වැයෙන් මුදල් වෙන් කළේ ජාතික ජන බලවේග ආණ්ඩුව විතරයි. අපි බොහොම පැහැදිලිව කියනවා, ධීවර ප්‍රජාවගේ නිෂ්පාදන ආර්ථිකය නඟා සිටුවන්න අපි හැම දෙයක්ම කර තිබෙන බව.

[ගරු රත්න ගමගේ මහතා]

ගරු සභාපතිතුමනි, අපේ ධීවර වරායන්වල තත්ත්වය පිළිබඳවත් අපට පැහැදිලි අවබෝධයක් තිබෙනවා. වෙදආරච්චි මන්ත්‍රීතුමා කිව්වා, කිරින්දේ ධීවර වරාය ගැන. මේ ඉදිකළ ධීවර වරායන්වල විද්‍යාත්මක පදනමක් නැහැ. හික්කඩුව, අම්බලන්ගොඩ, පානදුර ආදී ධීවර වරායන් ඉදිකිරීමේදී නිවැරදි විධියට feasibility study එකක් කරලා නැහැ; ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් නැහැ. එවැනි දෙයක් කරද්දී ඉංජිනේරුවන්ගෙන් අහන්නත් ඕනෑ; ධීවරයින්ගෙන් අහන්නත් ඕනෑ. Breakwater එක දාලා තිබෙන්නේ, දාන්න ඕනෑ තැන නොවෙයි. අපට දැන් ඒ පව්වලට කරගහන්න වෙලා තිබෙනවා. කිරින්ද ධීවර වරායේ වැලි පිරිලා තිබෙනවා. හික්කඩුව ධීවර වරායේත් වැලි පිරිලා තිබෙනවා. දැන් වැලිගොව්වෝ යවලා වැලි අයින් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක ලෙහෙසි නැහැ. ඉතිහාසය පුරාවට කරපු දේවල්වලට දැන් අපට කර ගහන්න සිද්ධ වෙලා තිබෙනවා. කරන්න දෙයක් නැහැ. ඔන්න ඔහොම තමයි වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, අපේ රජයෙන් ඉදිරියේදී මේ ධීවර වරායන් 23 පුළුල් කරන බව. අපේ මයිලිඩ්ඩි ධීවර වරායට ඉන්දියාවෙන් ආධාරයක් ලැබිලා තිබෙනවා. එසේම, උතුරේ ධීවර කර්මාන්තය වෙනුවෙන් අපේ රජයෙන් සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා. හැම දාම බැට කාපු උතුරේ ධීවරයා යළි නඟාසිටුවන්න ජනාධිපතිතුමා, අමාත්‍ය රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා ඇතුළු අපි සියලුදෙනා මැදිහත් වෙලා තිබෙනවා. මේ රටේ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින්ගෙන් සියයට 25ක් කිලිනොච්චිය, මන්නාරම, යාපනය, මුලතිව් කියන ප්‍රදේශවල ඉන්නවා. ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමනි, මම කිව්වා හරි නේද? අපි සාධාරණව මුදල් වෙන් කරලා තිබෙනවා නේද? ඒක බොහොම පැහැදිලියි. ඒ අනුව දැන් මේ රට නිෂ්පාදන ආර්ථිකයකට ඇවිල්ලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ රටේ ධීවර කර්මාන්තයක් තිබෙනවා. හැබැයි, බෙදා හැරීමේ ක්‍රමවේදයක් නැහැ. හැම තැනම stalls තිබෙනවාය කියනවා. නමුත්, stalls තිබෙන්නේ 87යි. ලංකා ධීවර සංස්ථාව මේ වනවිට stalls ආරම්භ කරලා තිබෙනවා. ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, පිටිගලටත් එකක් දෙනවා; උඩුගමටත් දෙනවා; ළඟදී අම්බලන්ගොඩත් stall එකක් පටන් ගත්තා. අපි මේ මොහොත වනවිට වෙළෙඳ අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා, සතොස ආයතන 417ම stall එකක් ස්ථාපිත කරන්න. ඒ හැම තැනම freezer එකක් දානවා. එතකොට අලුතින් freezers අවශ්‍ය වෙන්නේ නැහැ. දැන් අපි ඒ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම අපේ ගරු ඇමතිතුමා සමඟ සහ සමුපකාරවල නිලධාරීන් එක්ක අපි ඒ ගැන සාකච්ඡා කළා. ඒ අනුව සියලු Co-op Cityවල ධීවර අළෙවි සැල් ආරම්භ කරනවා, ලංකා ධීවර සංස්ථාව මැදිහත් වෙලා. ගරු සභාපතිතුමනි, අපි ලංකා ධීවර සංස්ථාව ගන්නකොට රුපියල් මිලියන 1,500ක් ණයයි, පොලු තියලා. ධීවරයන්ටත් පොලු තියලා තිබුණා, රුපියල් මිලියන 603ක. EPF, ETF ගෙවලා නැහැ; gratuity ගෙවලා නැහැ. ඒවාත් එක්ක කර ගහන්න අපට සිද්ධ වුණා. නමුත්, අපි මේවා සියල්ලෙන් ධීවරයින් බේරා ගන්නවා. ධීවර සංස්ථාවේ සභාපතිතුමායි, කාර්ය මණ්ඩලයයි යුහුසුළුව වැඩ කරනවා. අපි මේ රට භදන්න සූදානම්.

අපි මිරිදිය ධීවර කර්මාන්තයත් එක්ක බැඳිලා ඉන්නවා. NAQDA ආයතනය ඉතා ක්‍රියාකාරීව වැඩ කරනවා, "වැවයි - කම්හලයි" කියන සංකල්පය යටතේ. මේ රටේ සියලු අභ්‍යන්තර දිස්ත්‍රික්ක සඳහා අපි ධීවර සමිතියක් ආරම්භ කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ සමිතිය මඟින් මිරිදිය ධීවර කර්මාන්තය නඟාසිටුවන්න අපි කටයුතු කරනවා.

ඉස්සන් කර්මාන්තය නඟාසිටුවීම සඳහා අපි පැහැදිලි වැඩ පිළිවෙළක් ඇති කරලා තිබෙනවා. NAQDA එක, අලුත් පර්යේෂණ ඉදිරිපත් කරන NARA එක, සී-නෝර් ආයතනය, North Sea Limited, ධීවර වරාය නීතිගත සංස්ථාව, ධීවර සංස්ථාව සහ ධීවර දෙපාර්තමේන්තුව යුහුසුළුව ඒ වෙනුවෙන් කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ ධීවරයින් මුහුදු යනවා නේ. මුහුදු ගියාට පස්සේ ධීවරයින්ට හදිසියේ damage එකක් වුණොත් මොකද වෙන්නේ? ලේසි නැහැ, ඒ අයට වන්දියක් ගන්න. අපි දන්නවා, පාරේ යන වාහනයක් වෙනත් වාහනයකට හේත්තු වුණත්, ගලක් වැදුණත්, පොඩ්ඩක් වෙනත් වාහනයක ගෑවුණත් රක්ෂණ ආයතනයෙන් insurance claim එකක් ගන්න බව. හැබැයි, ධීවරයාට එවැනි රක්ෂණ ක්‍රමවේදයක් නැහැ. ධීවරයෙක් මුහුදේ වැටිලා මැරෙන්නම ඕනෑ, රක්ෂණය දෙන්න නම්. ඒක හරි කැතයි. බෝට්ටුවක් නම් කුඩුපට්ටම් වෙලාම යන්න ඕනෑ. ඒ නිසා මේ රක්ෂණ ක්‍රමවේදය වෙනස් කරන වැඩ පිළිවෙළකට අපි ඇවිල්ලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපේ ධීවර දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා සෑම ධීවර කාර්මිකයෙකුගේම ජීවිත සහ දේපළවලට සිදු වන පූර්ණ සහ අර්ධ හානි සඳහා ප්‍රතිලාභ ලබා දෙන නව රක්ෂණ ක්‍රමවේදයක් සැලසුම් කරලා තිබෙනවා. මේ වර්ෂයේ සිට එය ක්‍රියාත්මක කරනවා. ධීවර ජනතාවට එය බොහොම අස්වැසිල්ලක් වේවි.

අපේ ධීවර ප්‍රජාව මහ මුහුදත් එක්ක ඔට්ටු අල්ලනවා; අව්ව, වැස්ස, මහන්සිය නොබලා ඔවුන් වැඩ කරනවා. නමුත් ඒ අයගේ ජීවිත සුරක්ෂිතභාවයට ක්‍රමවේදයක් නැහැ. ඇයි, ඒ? වයසට ගියාට පස්සේ ඔවුන් සාමාන්‍යයෙන් දුර්වල වෙනවා. ඇනියේ ඉඳන් කථා කරනකොට අවරයට ඇහෙන්නේ නැහැ; අවරයේ ඉඳන් කථා කරනකොට ඇනියට ඇහෙන්නේ නැහැ; voice එක අඩු වෙනවා. නමුත් ඒ අයට රක්ෂණ ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා අපි ගොව් විශ්‍රාම වැටුපත් එක්ක සම්බන්ධ වුණු රක්ෂණ ක්‍රමවේදයක්, විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් ඔවුන් වෙනුවෙන් ස්ථාපිත කරනවා.

ගරු සභාපතිතුමනි, දැනට තිබෙන විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් ලැබෙන්නේ රුපියල් 1,400ක, රුපියල් 1,500ක පොඩි ගණනක්. ඒකෙන් මොනවා කරන්නද? ඒ මුදල ධීවරයෙකුට බීඩි බොන්නත් මදි. ඒ නිසා ධීවර දෙපාර්තමේන්තුව සකස් කරලා තිබෙනවා, නව රක්ෂණ ක්‍රමවේදයක්. ඒ හරහා අපි මේ රටේ ධීවර කාර්මිකයන්ට හොඳ කල දවසක් උදා කරනවා. ගරු අමාත්‍යතුමා පසුගිය දා ධීවර දෙපාර්තමේන්තුව සහ අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත් සමඟ එක් වී නව රක්ෂණ ක්‍රමයකට අත්සන් තැබුවා. ඒ අනුව අපි යහපත්, හොඳ විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් ධීවර කාර්මිකයින් වෙනුවෙන් ස්ථාපිත කරනවා. මේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ scale එක අපි හදලා තිබෙනවා. ඕනෑ නම් pension එකක් ගන්න පුළුවන්. රුපියල් 50,000ක් ගන්න ඕනෑ නම් ඒ පුද්ගලයා දායක වෙන්න ඕනෑ ප්‍රමාණයක් තිබෙනවා. මේ විශ්‍රාම වැටුප් ක්‍රමවේදය තුළ තිබෙනවා, මාසික දායක මුදල, ත්‍රෛමාසික දායක මුදල, අර්ධ වාර්ෂික දායක මුදල් එකවර ගෙවන්න ඕනෑ ප්‍රමාණය. අපි ඒ scale එක හදලා තිබෙනවා. ඒ සඳහා අපේ ගරු අමාත්‍යතුමා අත්සන් තැබුවා; අමාත්‍යාංශ ලේකම්තුමා අත්සන් තැබුවා. ජාතික ජන බලවේගය රජයක් ඇවිල්ලා පළමුවෙනි මාස 4 ගත වනකොට මේ රටේ ධීවර ප්‍රජාවට හොඳ විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් අපි ස්ථාපිත කරනවා. ඔන්න, අපි කියපු දේවල් කරලා තිබෙනවා. අපි වේදිකාවේ කිව්වා; ඔරු, බෝට්ටුවල ගියා; පන්දම් ගත්තා; ඒ කටයුතු කළා. එහෙම කිව්වා වාගේම අපි ඒ වැඩත් කරනවා. ධීවරයන් සඳහා අලුත් රක්ෂණ ක්‍රමවේදයක්, අලුත් විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් සඳහා ඉතිහාසයේ වැඩිම මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට පළාත් ධීවර අමාත්‍යාංශයත් එකතු කරගෙන අපි ඒකාබද්ධ වැඩසටහනක් හැදුවා.

අපි දැන් දිස්ත්‍රික් ධීවර කමිටු කැඳවාගෙන යනවා. වැඩ පිළිවෙළක් හදනවා. ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමති හැටියට මමත් මැදිහත් වෙලා සෑම දිස්ත්‍රික්කයකම ධීවර කමිටු කැඳවාගෙන යනවා. ගමේ තිබෙන සාමාන්‍ය ප්‍රශ්න විසඳන්නවා. අපට හොඳ අමාත්‍යාංශයක් තිබෙනවා. ලේකම්වරයෙක්, අතිරේක ලේකම්වරු ඇතුළු හොඳ කණ්ඩායමක් අපට ඉන්නවා. ඒ වාගේම ධීවර දෙපාර්තමේන්තුව, NAQDA එක, NARA එක, Cey-Nor Foundation Limited, North Sea Limited, CFHC එක යන සියලු ආයතන එක්ක මනා කළමනාකරණයකින් යුත් හොඳ පරිපාලනයක් සහිත වැඩ පිළිවෙළක් ගෙන යන නිසා 2025 වර්ෂයේදී මේ රටේ ධීවර කර්මාන්තය ප්‍රශස්ත මට්ටමකට ගේන්න අපිට හැකියාව ලැබෙයි කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(*மாண்புமிகு தவிசாளர் அவர்கள்*)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa, Leader of the Opposition**.** You have ten minutes.

[ප.භා. 11.04]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்*)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු සභාපතිතුමනි, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් සහ ධීවර, ජලජ හා සාගර සම්පත් කියන ක්ෂේත්‍ර සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේ රජයේ වගකිව යුතු ඔබගෙන් මම අහන්න කැමැතියි, නිවැරදි දර්ශක ගැන අවබෝධයක් නැතිව, නිවැරදි දත්ත ගැන අවබෝධයක් නැතිව, නිවැරදි තොරතුරු ඔබ සතුව නැතිව ඔබ මේ රටේ සමාජ සවිබලගැන්වීම ගැන කථා කරන්නේ කොහොමද කියලා. දැන් බලන්න, ජනාධිපතිතුමාත් රටේ දුප්පත්කම ගැන කථා කරන්න උපයෝගී කර ගන්නේ ලෝක බැංකුවේ වාර්තාව. එහි තිබෙන්නේ, අපේ දරිද්‍රතා අනුපාතය සියයට 25.9යි කියලා. නමුත් ඇත්තටම සිදුවිය යුත්තේ ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය කරලා, ආහාර වියදම්, ආහාර නොවන වියදම් පිළිබඳ අවබෝධ කරගෙන, දරිද්‍රතා රේඛාව සකස් කරගෙන, දරිද්‍රතා රේඛාව තුළ සහ ඉන් පහළ ඉන්නේ කවුද කියන එක අවබෝධ කරගෙන සමාජය සවිබලගැන්වීමයි.

දැන් මම ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරන්න කැමැතියි. ජනාධිපතිතුමා අය වැය කථාවේ 8 වැනි පිටුවේ කියනවා, දරිද්‍රතා අනුපාතය සියයට 25.9යි කියලා. දැන් අපි ගනිමු, ඔබතුමන්ලා මේ සභාවට ඉදිරිපත් කර තිබෙන 2024 ප්‍රගති වාර්තාව. මේ ප්‍රගති වාර්තාවේ, කාර්යභාරය හැටියට කියනවා, "2025 සිට 2029 දක්වා වසර පහක කාලය තුළ බහුමාන දරිද්‍රතාවට මුහුණ දී ඇති පවුල් මිලියන දෙකක් සවිබලගැන්වීම" කියලා. පවුල් මිලියන දෙකක් සවිබලගැන්වීම බොහොම හොඳයි. ඒක හරි. නමුත් ඒක මේ රටේ මුළු දුප්පත්කම නොවෙයි නේ. ජනාධිපතිතුමා කියන ආකාරයට, දරිද්‍රතා අනුපාතය සියයට 25.9යි කියන 2023 ලෝක බැංකු වාර්තාව අනුව, අපේ රටේ සිටින මිලියන 21.9ක ජනතාව අතරින්, 5,600,000ක පමණ පිරිසක් දරිද්‍රතාවෙන් පෙළෙනවා.

මම පළමුවෙන්ම අහන්න කැමතියි, නිවැරදි සංඛ්‍යාලේඛනවත් ගන්නේ නැතිව දුප්පත්කම තුරන් කරන්නේ කොහොමද, සමාජ සවිබලගැන්වීම කරන්නේ කොහොමද කියලා. අස්වැසුම දීමනාව පමණක් ලබා දීලා දුප්පත්කම තුරන් කෙරෙනවාද? අපි හැම දාම කියන කාරණාවක් තමයි, දුප්පත්කම තුරන් කරන්නට ඉතිරි කිරීම, ආයෝජනය, නිෂ්පාදනය, අපනයනය, පාරිභෝජනය - savings, investment, production, exports and consumption - කියන මේ කොටස් පහම තිබෙන්නට ඕනෑය කියන එක. හැබැයි, දැනට තිබෙන්නේ පාරිභෝජනය විතරයි. මුදලක් ලබා දෙනවා. ඒ මුදල පාරිභෝජනය කරනවා. ඉතිරි කොටස් කිසිවක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එහෙම පුළුවන්ද දුගී දුප්පත්කම තුරන් කරන්න?

මම පැහැදිලිව කියනවා, මේ රජයට දුගී දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙළක් නැති බව. එවැනි වැඩ පිළිවෙළක් නොමැති තත්ත්වයක් තුළ ජනසවිය වැඩසටහනින්, සමෘද්ධි වැඩසටහනින් -ඒ වැඩසටහන් දෙකෙන්ම- ලබා ගන්න පුළුවන් පාඩම් ටික, උගත් පාඩම් ටික ලබාගෙන කරුණාකරලා ඉක්මනින්ම දුප්පත්කම තුරන් කිරීමේ විධිමත් වැඩසටහනකට ඔබතුමන්ලා මුල පුරන්නට ඕනෑ කියලා මම යෝජනා කරනවා. දත්ත ටික නොදැන කොහොමද අය වැය වාර්තා ඉදිරිපත් කරන්නේ? මේ රටේ දත්ත නැහැ, දුප්පත්කම ගැන. දුප්පත්කමින් පෙළෙන ප්‍රජාව ගැන හරියාකාරව සංඛ්‍යාලේඛන නැහැ. එවැනි සංඛ්‍යාලේඛන නැතුව තමයි අස්වැසුම ප්‍රතිලාභ ලබා දීලා තිබෙන්නේත්. ඒ නිසාම තමයි අපිට අහන්නට ලැබෙන්නේ ලැබිය යුතු සමහර අයට අස්වැසුම ප්‍රතිලාභ ලැබී නැහැ, සුදුසුකම් නොලබන සමහර අයට, පොහොසත් අයට අස්වැසුම ප්‍රතිලාභයත් දීලා තිබෙනවා කියා. ඒ ඔක්කෝම නිවැරදි කරගන්නට පුළුවන්, හරියාකාර දත්ත ටික ඒක රාශි කර ගැනීම තුළ. මම වගකීමෙන් කියනවා, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා අය වැය කථාව කර තිබෙන්නේ රටේ දුගී දුප්පත්කම තුරන් කිරීමේ දත්ත ටික හරියට නොදැන කියලා.

ඔබතුමන්ලාගේ පොතේ කියා තිබෙනවා, බහුමාන දරිද්‍රතාවට ලක් වුණු ලක්ෂ 20ක් ඉන්නවාය කියලා. හැබැයි, LIRNEasia survey එක කියනවා, දුප්පත්කමින් පෙළුණු ලක්ෂ 30ක ප්‍රමාණය ලක්ෂ 70ක් වෙලා තිබෙනවාය කියලා; ලක්ෂ 40කින් වැඩි වෙලා තිබෙනවාය කියලා; රටේ ජනතාවගෙන් තුනෙන් එකක්ය කියලා. LIRNEasia survey එක කියනවා, තුනෙන් එකක් කියලා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා කියනවා, සියයට 25.9ක් කියලා. මේ වාගේ පරස්පර දත්ත එක්ක පුළුවන්ද, අය වැයක් හරියාකාරව නිර්මාණය කරලා දුප්පත්කම තුරන් කරන්න?

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දන්නේත් නැහැ, දුප්පත්කම මොකක්ද කියලා. දුප්පත්කම ගැන නිර්වචනයක් හරියාකාරව නැහැ. මොකක්ද, definition එක? මම මේ ගැන අවස්ථා ගණනාවකදී ජනාධිපතිතුමාටත්, මේ සභාවේ කථාවලත් සඳහන් කර තිබෙනවා. කරුණාකරලා හරි නිර්වචනයක්, හරි අවබෝධයක් ඇති කරගෙන විධිමත් සමාජ සවිබලගැන්වීමේ ක්‍රියාවලියකට ඔබ මුල පුරන්න. එසේ මුල පුරනකොට, මේ රටේ පළාත් මට්ටමින් දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය මොකක්ද කියා කරුණාකර බලන්න කියලාත් මම යෝජනා කරනවා.

මේකෙදි බොහොම බරපතළ විෂමතා තිබෙනවා. බස්නාහිර පළාත ගත්තොත්, දළ දේශීය නිෂ්පාදිතයට විශාල දායකත්වයක් ලබා දෙනවා. හැබැයි, ඊට සාපේක්ෂව අනෙක් පළාත්වලින් දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය බොහොම සීමාසහිතයි. අපි යෝජනා කරනවා, පළාතට සීමා වෙන්නේ නැතුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ, උපලේකම් බල ප්‍රදේශ 341 මට්ටමින් දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය කොපමණද කියා සොයා බලන්න කියා. ඒක වඩාත් වැදගත් සංඛ්‍යාලේඛනයක්. එතැනට යන්න. එතකොට අපට පුළුවන් ප්‍රාදේශීය ලේකම් මට්ටමින් හඳුනා ගන්න, සමාජ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සවිබලගැන්වීමේ ක්‍රියාවලිය කොයි ආකාරයෙන්ද ක්‍රියාත්මක විය යුත්තේ කියලා. ඉන් පසුව හැකියාවක් තිබෙනවා නම් වඩාත් හොඳයි ග්‍රාම නිලධාරී වසම් මට්ටමටම; වසම් 14,021 තුළම මේ ගණනය ක්‍රියාත්මක කළොත්. එතකොට ශුද්ධ වශයෙන් දැන ගන්නට පුළුවන්, දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය ගැන. ඒ වාගේම ඒ තුළින් දුප්පත්කම තුරන් කිරීමේ විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නත් පුළුවන්.

ඒ වාගේම උපාධිධාරීන් 35,000-40,000 අතර ප්‍රමාණයකට රැකියා ලබා දෙනවාය කියා ඔබ පොරොන්දු දී තිබුණත්, මේ වනවිට ඒ පොරොන්දු කඩවී තිබෙනවා. ඒ පොරොන්දු ඉටු නොවී තිබෙන තත්ත්වයක් තුළ ඒ 35,000ත්, 40,000ත් දුප්පත්කමේ ගොඩට වැටෙනවා. ඊයේ දිනයේ ඒ අය පොල්දුව හන්දියට ඇවිල්ලා ඒ අයගේ දුක ප්‍රකාශ කළා. කවදාද, ඔබතුමන්ලා මේ උපාධිධාරීන් ප්‍රමාණය දුප්පත්කමේ ගොඩට වැටෙන්නට නොදී නිදහස් අධ්‍යාපනයේ, අපේ ජන සමාජයේ උගත්ම ජන කොට්ඨාසයට ශක්තිය ලබා දෙන්නේ කියලා මම අහන්නට කැමැතියි. කරුණාකරලා එම ගැටලුවට විසඳුම් ලබා දෙන්න. අපි සූදානම් ඒවාට විසඳුම් ලබා දෙන්න, අපි රජයේ හිටියා නම්. අපි සූදානම් විධිමත් අයුරින් දුප්පත්කම තුරන් කිරීමේ සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නට. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිවම ඒක සඳහන් කර තිබෙනවා. නිෂ්පාදනය, පාරිභෝජනය, ඉතිරි කිරීම, ආයෝජනය, අපනයනය කියන කොටස් 05 කේන්ද්‍ර කරගෙන විධිමත් සවිබල ගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න.

විශේෂයෙන්ම මම ධීවර ප්‍රජාව ගැනත් කථා කරන්න ඕනෑ. කෝ, අර පොරොන්දු වුණු ඉන්ධන සහනාධාරය? ඒ කාලයේ පැහැදිලිවම කිව්වා නේ, පැවැති ආණ්ඩුව බදු පිට බදු ගහනවා, ඒ බදු ටික මහා භාණ්ඩාගාරය ගන්නවා, ඊටත් අමතරව තවත් නාස්තිකාර වියදම් තිබෙනවා, කොමිස් මුදල් ගන්නවා කියලා; ඒවා ඔක්කොම ඉවත් කළාට පසුව පළමුවෙනි දවසේ ඉඳන් ධීවර ප්‍රජාවටත්, රටේ පොදු ජනතාවටත් ඉන්ධන සම්බන්ධයෙන් සැලකිය යුතු මිල අඩු කිරීමකට යන්න පුළුවන් වනවා කියලා. වේදිකාවක්, වේදිකාවක් පාසා එවකට ජනාධිපති අපේක්ෂකවරයාත්, ඔබතුමන්ලා සියලුදෙනාත් ඒ දේවල් ප්‍රකාශ කළා. මම කැමැතියි ඒක නැවත වරක් මතක් කරලා දෙන්න. ඉන්ධන සහනාධාරය ලබා දෙන කොට මේ රටේ එය ලැබිය යුතු පුද්ගල කොට්ඨාසවලට ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරන්න. ඒ දේට අපි එකඟයි. ඉන්ධන සහනාධාරය ලබා දෙන කොට සුපිරි පොහොසතුන්, උගු පොහොසතුන් හැර සහනාධාරය ලැබිය යුතු රටේ සෙසු ජන කොට්ඨාසවලට -ගොවි ජනතාවට, ධීවර ජනතාවට, කර්මාන්තකරුවන්ට, දුප්පත් ජනතාවට, සාමාන්‍ය ජනතාවට, වතු ක්ෂේත්‍රයේ, ග්‍රාමීය ක්ෂේත්‍රයේ, නාගරික ක්ෂේත්‍රයේ, ස්වයං රැකියා ක්ෂේත්‍රයේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩ කරන ජනතාවට- ඒ සහනාධාරය ලැබෙන විධියට යම්කිසි ක්‍රමවේදයක් සකස් කරනවා නම්, අපි ඒකට එකඟයි. කෝ, ධීවරයාට ලබා දෙනවා කියපු ඉන්ධන සහනාධාරය? ගරු ධීවර නියෝජ්‍ය ඇමතිතුමා එදා ධීවර ප්‍රජාවට ඉන්ධන සහනාධාරය ලබා ගැනීම වෙනුවෙන් ලොකු හඬක් නැඟුවා, මට හොඳට මතකයි. කොච්චර හොඳට හඬ නැඟුවා ද කිව්වොත්, අපි වුණත්- *[බාධා කිරීමක්]* මම ඔබතුමාගේ කථාවට බාධා කළේ නැහැ. කරුණාකර මේ කාරණයට සවන් දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
සහනාධාරය දෙනවා නේ. *[බාධා කිරීමක්]*

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඒකත් හම්බ වෙන්නේ රුපියල් කීයද? *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා එදා උද්ඝෝෂණය කරපු ආකාරය අපි ඇස් දෙකෙන් දැක්කා. *[බාධා කිරීමක්]*

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දන්නවා ඒ සහනාධාරය ලබා දෙන බව.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
කොහේද ලබා දෙන්නේ?

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ඔබතුමාටත් ලබා දෙනවා. *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගංගාවල සහ මුහුදේ බෝට්ටුවලින් ගිහිල්ලායි ඒ උද්ඝෝෂණය කළේ. බෝට්ටු උඩ ඉඳගෙනයි උද්ඝෝෂණය කළේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම මේ ඔබතුමාට අපහාසයක් කරනවා නොවෙයි. ඔබතුමා බොහොම දක්ෂ විධියට උද්ඝෝෂණ ව්‍යාපාරයක් ක්‍රියාත්මක කළා. කොච්චර දක්ෂ ද කිව්වොත්, මමත් ඔබතුමාට දුරකථනයෙන් ආමන්ත්‍රණය කළා. මම දැනගෙන හිටියේ නැහැ ඔබතුමා NPP කියලා; JVP කියලා. ඔන්න, ඇත්ත කථාව. මමත් ඒ තරම්ම ආකර්ෂණය වුණා, ඔබතුමාගේ උද්ඝෝෂණයට. මොකද, මම හිතුවා අපිත් එක්ක එකතු වෙන්න ඔබතුමා සුදුසුයි කියලා. ඇත්තමයි! ඇත්ත කථාව මම මේ කියන්නේ. ඔබතුමා ඒක දන්නවා. මම බොරුවක් නොවෙයි නේ මේ කියන්නේ. මම ඔබතුමාට call කළා නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Leader of the Opposition, you have exhausted your alloted time.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි. ඊළඟට තිබෙනවා, රසවත්ම කොටස.

එදා ධීවර ජනතාවට ඉන්ධන සහනාධාරය ලබා ගැනීම වෙනුවෙන් මහ සයුරේ බෝට්ටුවල ගිහිල්ලා, පන්දම් පවා අල්ලා ගෙන ඒ තරමටම උද්ඝෝෂණය කළා; ඉන්ධන මිල අඩු කරන්න කියලා උද්ඝෝෂණය කළා. භාණ්ඩාගාරයට ගෙවන බව කියපු අර බදු මුදල් ටික ඒ පොරොන්දු වූ ආකාරයට ඉවත් කරලා, අර කියපු කොමිස් මුදල් ටික ඉවත් කරලා, ඇමතිවරයෙකුට යනවා කියපු

සල්ලි ටික ඉවත් කරලා, -මොකද, එහෙම සල්ලි යනවා කිව්වේ ඔබතුමන්ලා නේ- නාස්තිය ඉවත් කරලා, ඇයි ධීවර ප්‍රජාවට ඉන්ධන සහනාධාරය ලබා දෙන්න බැරි? ඇයි, ගොවි ජනතාවට ඉන්ධන සහනාධාරය ලබා දෙන්න බැරි? ඇයි, මේ රටේ සාමාන්‍ය ජනතාවට ඉන්ධන සහනාධාරය ලබා දෙන්න බැරි? සුපිරි පොහොසතුන්ට හැර, සුපිරි ධනවතුන්ට හැර ඉන්ධන සහනාධාරය ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කරන්න. ගේන්න, ඒ ක්‍රමවේදය මේ පාර්ලිමේන්තුවට. අපි ඒකට උදව් කරන්නම්.

ගරු සභාපතිතුමනි, මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අපි දන්නවා, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය වාගේම ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයත් අද අඩාළ වෙලා තිබෙන බව; අඩපණ වෙලා තිබෙන බව. මම සතුටු වුණා, අලුත් රක්ෂණ විශ්‍රාම ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා කියලා. ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේත්, ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයේත් අඩු පාඩු සොයා බලා නිවැරදි අලුත් වැඩසටහනක් ක්‍රියාත්මක කළොත්, එවන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කළොත් අපිත් ඔබතුමන්ලාට සහයෝගය ලබා දෙන බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

අවසාන කාරණාව මෙයයි. අපේ රටේ වෙරළ තීරයේ ඉඳලා නාවුක සැතපුම් 200ක් - 200 nautical miles - අපේ රටට අයිතියි. ඒක අපට අයිති වුණේ UN Convention on the Law of the Sea හරහායි; ජාත්‍යන්තර නීති හරහා අපට ඒ අයිතිය ලැබී තිබෙනවා. එසේ නම්, මේ කියන නීල ආර්ථිකය -blue economy එක- ගොඩ නැඟීමේ ජාතික වැඩසටහනක් අවශ්‍යයි. හැබැයි, නීල ආර්ථිකය ගොඩ නහන කොට අප අනුගමනය කරන්නා වූ සංවර්ධන රටාව තිරසර සංවර්ධනයක් විය යුතුයි, a sustainable exploitation of resources in the sea. අපට අයිති නාවුක සැතපුම් 200ක වාගේ ප්‍රමාණයේ එම තිරසර සංවර්ධන රටාව ක්‍රියාත්මක කරලා අපේ රටට අවශ්‍ය ඩොලර් සම්පත ලබා ගන්න අපි දැන්වත් කටයුතු කරමු කියා මා යෝජනා කරනවා.

කරුණාකර අප ඉදිරිපත් කරපු අදහස් සහ යෝජනා සැලකිල්ලට ගෙන ඔබතුමන්ලාට ක්‍රියාත්මක කළ හැකි, දුප්පත්කම තුරන් කිරීමේ හොඳ වැඩසටහනක් සකස් කරන්න. අපි සැවොම අත්වැල් බැඳගෙන ග්‍රාමීය, නාගරික සියලු වතු ද, උතුර සහ නැගෙනහිර ඇතුළුව පළාත් 9 ම, පරිපාලන දිස්ත්‍රික්ක 25 ම, ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 341 ම, ග්‍රාම නිලධාරී වසම් 14,021 ම ආවරණය වන පරිදි එම වසම් 14,021හි තිබෙන කුඩා ගම් නියම්ගම් හා නගර 51,000හිම දුගී දුප්පත්කම තිරසර සංවර්ධන වැඩ පිළිවෙළක් තුළින් තුරන් කරමු; ධීවර ප්‍රජාව ආරක්ෂා කරන්නට කටයුතු කරමු. ස්තුතියි.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ පැත්තෙන් ඉල්ලීමක් ඉදිරිපත් වුණා, ඉන්ධන සහනාධාරය ලබා දෙන්න කියලා. එය ලබා දෙන්නේ නැහැ කියන අදහස මත තමයි ගරු විපක්ෂ නායකතුමා එම ඉල්ලීම ඉදිරිපත් කළේ. නමුත්, එතුමාගේ කථාවට මම දිගින් දිගටම බාධා කරන්න ගියේ නැහැ.

ගරු විපක්ෂ නායකතුමනි, අපේ ගරු ජනාධිපතිතුමා බලයට පත් වුණු මොහොතේ සිට අඛණ්ඩව ඉන්ධන සහනාධාරය ලබා දුන්නා. මගේ කථාවේදීත් මම එය කිව්වා. මා ළඟ තිබෙනවා ධීවර දිස්ත්‍රික්ක පහළොවේ මේ වන කොට ඉන්ධන සහනාධාරය ලබා දුන් විස්තර. ඒ අනුව ඉන්ධන සහනාධාරය වෙනුවෙන් මේ වන විට ලබා දී තිබෙනවා, රුපියල් මිලියන 863ක්. ඒ සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පාර්ලිමේන්තුවේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැන ගැනීම පිණිස දිස්ත්‍රික් මට්ටමින්, ධීවර යාත්‍රා මට්ටමින් මේ වන විට ලබා දීලා තිබෙන ඉන්ධන සහනාධාරය පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි, -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Leader of the Opposition?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම අපේ ගරු ධීවර නියෝජ්‍ය අමාත්‍යතුමාට අභියෝග කරනවා, ඔබතුමා තොටුපොළක් තොටුපොළක් පාසා ගිහිල්ලා ඔය ලබා දෙනවා කියන ඉන්ධන සහනාධාරයයි, වේදිකාවේ කියපු ප්‍රමාණයයි අතර වෙනසක් තිබෙනවාද, නැද්ද, ඔය ලබා දෙන සහනාධාරය සම්බන්ධයෙන් ධීවර ජනතාව සෑහීමකට පත් වනවා ද, නැද්ද කියන ප්‍රශ්නය ඉන්ධන සහනාධාරය ඉල්ලපු ධීවර ප්‍රජාවගෙන් අහන්න කියලා. එම ධීවර ප්‍රජාවගෙන් එම ප්‍රශ්නය ඇහුවොත්, ඔබතුමන්ලාටම හොඳම හොඳ උත්තරයක් ලැබෙයි.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු සභාපතිතුමනි, -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Dilip Wedaarachchi?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, රුපියල් 25ක තෙල් සහනාධාරයක් දැන් දෙනවා කියලා. රුපියල් 25ක සහනාධාරය දුන්නාට, එහි පළමු වාරිකය විතරයි තවම හම්බ වෙලා තිබෙන්නේ, එක් එක් ප්‍රදේශවලට. දැන් මාස හතරක් තිස්සේ ඒක ලැබෙන්නේ නැහැ. ඒකයි මම මේ කියන්නේ. සල්ලි වැටුණු bank statement එක මම ගෙනාවා. මාස හතරකින් ලැබිලා නැහැ. ඒ, රනිල් වික්‍රමසිංහ මහත්මයා දුන්නු සහනාධාරය නේ. ඒක නොවෙයි අපි කියන්නේ. ධීවරයාට දෙනවා කියපු සහනාධාරය දෙන්න. ඔබතුමන්ලා ධීවර ජනතාවට කිව්වා, රුපියල් 150ක සහනාධාරයක් දෙනවා කියලා; රුපියල් 150ට ඉන්ධන දෙනවා කියලා. රුපියල් 150ට තෙල් දෙන්න කියලායි අපි කියන්නේ. හිටපු කංචන ඇමතිතුමාට යනවා කියපු රුපියල් 60යි, වරායෙන් එන රුපියල් 50යි, මහ බැංකුවෙන් අඩු කරන 50යි එකතු කළාම රුපියල් 150ක් වෙනවා. ඒ රුපියල් 150 සහනය ධීවරයාට දෙන්න. ඒකයි අපි ඉල්ලන්නේ. අද ගමට යන්න බැහැ, වැල්ලට යන්න බැහැ ධීවරයෝ අම්මා මතක් කරනවා. ඒක හොඳට මතක තබා ගන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු සභාපතිතුමනි, මම කොහේවත් කියලා නැහැ, රුපියල් 150ට ඉන්ධන දෙනවා කියලා. *[බාධා කිරීමක්]* මම නම් කියල නැහැ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ජනාධිපතිතුමා කිව්වා.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
මම දන්නෙ නැහැ. රුපියල් 150ක කථාවක් නැහැ. මෙන්න මෙහෙමයි. අපි බහුදින ධීවර යාත්‍රා හිමියන්ට ඩීසල් ලීටරයකට රුපියල් 25 ගණනේ සහනයක් දීලා තිබෙනවා. ඒකේ සීමාව ලක්ෂ තුනයි. එක මුහුදු ගමනකට දීලා තිබෙන උපරිමය ලක්ෂ තුනයි. කුඩා යාත්‍රාවකට අදාළව රුපියල් 9,375 ගණනේ දීලා තිබෙනවා. ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා, ඔබතුමාටත් දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මේ බලන්න, ඔබතුමාගේ bank account අංකය 228500. ඔබතුමාට රුපියල් 42,475ක් දීලා තිබෙනවා. නැද්ද? ඔබතුමා තැන් තැන්වල කිව්වා දීලා නැහැ කියලා. ඊළඟට, ඔබතුමාගේ බෝට්ටුවලට දීලා තිබෙනවා, රුපියල් 62,500කුයි, 42,500කුයි. නැහැ කියනවා ද? ඔබතුමාත් මේ කියන සහනාධාර අරගෙන, දැන් නැහැ කියනවා. ඔබතුමා හිටපු ධීවර රාජ්‍ය අමාත්‍යතුමා නේ. ඔබතුමාත් සහනාධාරය අරගත්තා. එහෙම අරගෙනත් දෙන්නේ නැහැ කියනවා. සදාචාරාත්මකව ගත්තොත්, ඔහොම කියන එක කැතයි නේද වෙදආරච්චි මන්ත්‍රීතුමනි?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
පොඩ්ඩක් ඉන්න.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
දැන් ඔබතුමා කිව්වා, ඔබතුමාගේ හදවතේ නායකයා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියලා. ඒ විපක්ෂ නායකතුමාටයි දුන්නේ, ෂොට් එකක්. හදවතේ නායකයා, මම රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට කිව්වා; එතුමා ඇහුවා. ඉහියෙන් ගැහුවා නේද සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට? "හිතේ ඇති දේ කවුද දන්නේ කියන්නට විමසා" ඔන්න, විපක්ෂ නායකතුමනි, ළඟින් ඉන්නවා නේද? බලාගෙන ඉන්න, හදවතේ ඉන්නේ වික්‍රමසිංහ මහත්මයා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ සංකල්පය. ඒ දේ ව්‍යංගයෙන් කිව්වේ. මේ වෙනකොට ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාත් අරගෙන තිබෙනවා, රුපියල් 42,470ක්, රුපියල් 60,250ක්, 42,500ක්. Account number එක තමයි 228500. කැතයි නේද? දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමනි, කැතයි නේද? *[බාධා කිරීමක්]* තවත් කියන්න එපා. කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමාත් සහනාධාරය අරගෙන තිබෙනවා නේ. ඔබතුමා කිව්වා නේ, ගම්වලට ගියාම කවුද මතක් කරනවා කියලා. ඔබතුමාට මතක් කරන්න වෙන්නේ මේක අරගෙන වැල්ලට ගියාම, "මෙන්න බොලේ මෙයාත් අරගෙන තිබෙනවා" කියලා. ඔබතුමා මේ සහනාධාරය අරගෙන වැල්ලට ගිහිල්ලා තිබෙනවා. අන්න, එතකොට ඔබතුමාට අර කියපු කෙනා මතක් කරලා තිබෙනවා. ඒක නේද? කැතයි. දැන් පැහැදිලියි නේද? *[බාධා කිරීමක්]* මේ තොරතුරු තිබෙනවා. එන්න එපා, කථා කරන්න, අපේ ළඟ තොරතුරු තිබෙනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු සභාපතිතුමනි, මගේ නම කියැවුණා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dilip Wedaarachchi, you can have just one minute to clarify.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු සභාපතිතුමනි, මම ධීවර කර්මාන්තය කරන පුද්ගලයෙක්. මට බහුදින යාත්‍රා තුනක් තිබෙනවා. මගේ සහෝදරයන්ට දෙකක් තිබෙනවා. ඔක්කොම පහක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන කථාව හරි. මම bank statement එක මෙතැනට ගෙනාවා. මේ තිබෙන්නේ රුපියල් 42,475යි, මගේ IMUL 723 බෝට්ටුවට, අනෙක් බෝට්ටුවට රුපියල් 62,475යි. ඒ එක මාසයක. නොවැම්බර් මාසයේ විතරයි. මම ඔබතුමන්ලාට කියන්නේ ඒකයි. මේවා පටලැවිලා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, මම කථා කරලා ඉවර වෙනතුරු. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි,- *[බාධා කිරීමක්]*

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ඔබතුමා request එකක් කරලා තියෙනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මම request කරන්න අවශ්‍ය නැහැ. මම ගත්තේ මගේ බෝට්ටුවට දෙන සහනාධාරය. ඇයි, රණ්ඩු කරන්නේ? ඇයි, බොරු කරන්නේ? මට දෙන සහනාධාරය මම ගත්තේ. ඒක මගේ බෝට්ටුවට හිමි දේ, ලැබෙන දේ. හැබැයි, දැන් මාස හතරකින් ලැබිලා නැහැ. මම bank statement එක ගෙනැල්ලා මේ කථා කරන්නේ. මේ තිබෙන්නේ, බෝට්ටුවල නම් දෙක.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, could you please wind up?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
විනාඩියක් ඉන්න.

ඇයි, එහෙම අපහාස කරන්නේ? අපි හොරකම් කරලා නොවෙයි. මගේ බෝට්ටුවලට ලැබෙන සහනාධාරය මම ගත්තේ. මම බහුදින යාත්‍රා හිමියෙක්. ඔබතුමන්ලා නිකම් නින්දිත විධියට අපට කථා කරන්න එපා. අපි එහෙම ජරා වැඩ කරන මිනිස්සු නොවෙයි. අපි ධීවරයන් විධියට හොරකම් කරන මිනිස්සු නොවෙයි. ඔබතුමන්ලා කිව්වේ, තෙල් ලීටරයක් රුපියල් 150කට ධීවරයාට දෙනවා කියලා. අද කොහොමද දෙන්නේ? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බොරුවට කෑගහන්න එපා. අපි සද්භාවයෙන් ඔබතුමන්ලා එක්ක මේ කටයුතු කරන්නේ ධීවරයෝ වෙනුවෙන්. දැන් ඒ රුපියල් 60ක කොමිස් මුදල කාටද යන්නේ? කංචනගේ සාක්කුවට ගත්ත කොමිස් මුදල කාටද යන්නේ? ඒවා කියන්න කට ඇරලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බොරුවෙන් කටයුතු කරන්න එපා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Upali Pannilage. You have 18 minutes.

[පූ.භා. 11.26]

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු සභාපතිතුමනි, අය වැය කාරක සභා අවස්ථාවේදී ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සමහර අදහස්වලට ඇහුම්කන් දෙනකොට හිතෙනවා, අපි ඉන්නේ අපේ රටේද කියලාත්. මොකද, ඒ සමහර අදහස් අනුව දැන් අපේ රට සම්පූර්ණයෙන්ම සංවර්ධනය වෙලා, ජන ජීවිතය සුඛිත මුදිත වෙලා තිබෙන්න ඕනෑ.

මා වගකීම දරන මේ අමාත්‍යාංශයේ ප්‍රධානතම අරමුණ තමයි, මේ රටේ දිළිඳු බව තුරන් කිරීම. දැන් මට කලින් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු අපේ ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු සමහර දත්ත පිළිබඳව ප්‍රශ්න කළා. ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේදී දිළිඳු බව පිළිබඳ දත්ත ගණනාවක් භාවිත කළා. එකක් තමයි, එතුමාගේ කථාවේ හතරවැනි පිටුවේ සඳහන් පරිදි 2019 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලැබූ ගෘහස්ථ ආදායම් වියදම් පිළිබඳ සමීක්ෂණය. ඒ වාගේම, ලෝක බැංකු වාර්තා. එතුමා කිව්වා වාගේ දරිද්‍රතාව කියන්නේ අද ලෝකයේ එක දිශානතියකින් විතරක් තේරුම් ගන්න පුළුවන් එකක් නොවෙයි. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ දී දත්තවලට අමතරව, බහුමාන දරිද්‍රතාව පිළිබඳ අවධානය යොමු කළේ. ගරු සභාපතිතුමනි, බහුමාන දරිද්‍රතාව මනින්නේ සාම්ප්‍රදායික දරිද්‍රතාව මනින ආකාරයට නොවෙයි. එහිදී ප්‍රධාන දර්ශක තුනක් භාවිතයට ගන්නවා. අපි සාම්ප්‍රදායිකව දරිද්‍රතාව මැනීමට භාවිත කරන ජීවන තත්ත්වය - living standard එක - එහි එක දර්ශකයක් පමණයි. ඊට අමතරව තවත් දර්ශක දෙකක් භාවිත කරනවා. ඒ දර්ශක දෙක තමයි අධ්‍යාපනය සහ සෞඛ්‍යය. ඒ දෙක එකතු කරලා තමයි බහුමාන දරිද්‍රතාව මනින්නේ. එනම්, living standard, education and health. ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් ඒ අය වැය කථාවේ දී මේ සියලු වාර්තා භාවිත කරලා තමයි දරිද්‍රතාව පිළිබඳ එතුමාගේ අදහස් දැක්වූයේ. ඒ නිසා එක පැතිකඩකින් විතරක් බලලා එ් ගැන විවේචනයක් ඉදිරිපත් කිරීම සාධාරණ නැහැ, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය විධියට අපි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ක්ෂේත්‍ර මොනවාද කියන එක මේ සභාවේ අවධානයට යොමු කරන්න මා බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, පළමුවැන්න තමයි, අපි අත්විඳින මේ රටේ ග්‍රාමීය දිළිඳු බව. මම නැවතත් භාවිතයට ගන්නවා කලින් ඉදිරිපත් කරපු බහුමාන දරිද්‍රතාව පිළිබඳ වාර්තාව. ඒ අනුව අපේ රටේ සෑම පුද්ගලයන් හය දෙනෙකුගෙන් එක් අයෙක් දිළිඳු ලෙස හඳුන්වනවා. ඔවුන් අතරිනුත් සියයට 95කට ආසන්න ප්‍රමාණයක් ග්‍රාමීය සහ වතු ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වෙනවා. මා මේ කියන්නේ බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව. තවත් ඕනෑම විධියේ දර්ශක තිබෙනවා දරිද්‍රතාව තේරුම් ගැනීම සඳහා. ඒ කෙසේ වෙතත්, අපේ රටේ ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම වර්තමාන රජයේ ප්‍රධාන වශයෙන් අවධානයට යොමු වෙච්ච කාරණයක්. අපි මෙතැනදී ගම ගැන සාම්ප්‍රදායික අර්ථයෙන් එහාට ගිහිල්ලා හිතනවා.

අපේ රටේ ග්‍රාම නිලධාරී වසම් 14,022ක් තිබෙනවා. ඒවා සාම්ප්‍රදායික ගම් වෙන්න පුළුවන්, අඩු ආදායම්ලාභී, අඩු පහසුකම්වලින් ජීවත් වෙන නාගරික, අර්ධ නාගරික ප්‍රදේශ වෙන්න පුළුවන්, මලයගම් ප්‍රදේශයේ ජීවත් වෙන වතු ආශ්‍රිත ප්‍රජාව වෙන්න පුළුවන්, මේ සියලුදෙනා බරපතළ විධියට දරිද්‍රතාවෙන් පෙළෙනවා. මේ දරිද්‍රතාව තුරන් කිරීම තමයි අපේ අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරය. ඒ වෙනුවෙන් පසුගිය මාසයේ ග්‍රාම සංවර්ධන කාර්යාංශයක් අපේ කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා අලුතින් ආරම්භ කළා. ඒ කාර්යාංශය හරහා අපි මේ වසරේ දී විශේෂයෙන්ම අපේ රටේ පවතින 14,022ක් වූ ඒ සියලු ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අදාළ ග්‍රාම සංවර්ධන සැලසුම් සකස් කිරීමට නියමිතයි. ඒ හරහා ඉහළ සිට පහළට ගලා ගෙන එන සංවර්ධනය වෙනුවට, පහළ සිට ගමේ ජනතාවත් එක්ක බද්ධ වෙලා, ඒ ගමේ ජනතාවගේ අදහස් එකතු කරගෙන, ගමේ ජනතාවගේ අදහස් විශ්ලේෂණය කරලා, ජනතාව විසින්ම හදන ග්‍රාම සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් හැදීම තමයි ප්‍රධාන වශයෙන්ම අපේ අමාත්‍යාංශය මඟින් ග්‍රාම සංවර්ධන වැඩසටහන හරහා කිරීමට බලාපොරොත්තු වෙන්නේ. අපේ අමාත්‍යාංශය මඟින් ග්‍රාම සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරන නිසා අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1012ක ප්‍රතිපාදන වෙන් කර ගත්තා, ප්‍රධාන වශයෙන්ම මේ සැලසුම් කරන කටයුතු සඳහා. ඊට පෙර ක්‍රියාත්මක කරලා තිබුණු ග්‍රාම ශක්ති වැඩසටහනේ මේ වෙනකොටත් රජයේ මුදල් වශයෙන් තිබෙන රුපියල් මිලියන 500කට ආසන්න ප්‍රමාණයක් අපි මේ වසරේ මේ ග්‍රාම සංවර්ධන වැඩසටහනට එකතු කර ගැනීමට බලාපොරොත්තු වෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, අපි අපේ අමාත්‍යාංශයේ අවධානය යොමු කරන දෙවැනි ප්‍රධාන ක්ෂේත්‍රය තමයි සමාජ ආරක්ෂණය කියන එක. ගරු සභාපතිතුමනි, සමාජයේ යම් කිසි පවුල් ප්‍රමාණයක් - පුද්ගලයන් ප්‍රමාණයක්- ජීවත් වෙනවා. ඔවුන්ට සමාජයේ ආරක්ෂණයක් අවශ්‍යයි කියන එක අපි ආණ්ඩුවක් විධියට කල්පනා කරනවා. නිදහස ලබලා දශක ගණනාවක් ගිහිල්ලත්, අපට තවමත් බැරි වෙලා තිබෙනවා අපේ රට යම් කිසි ආකාරයකට හෝ සංවර්ධිත තත්ත්වයකට රැගෙන එන්නට. සමාජයේ ඉන්න අපේ විශේෂ අවධානයට යොමු වෙන පුද්ගල කණ්ඩායම් ඉන්නවා. ඒ අඩු ආදායම්ලාභී පවුල්වල වැඩිහිටියන් වෙන්නට පුළුවන්, ආබාධිතභාවයට පත් වූ පුද්ගලයන් වෙන්නට පුළුවන්, වකුගඩු රෝග වැනි විවිධ රෝගාබාධවලට ලක් වූ පුද්ගලයන් වෙන්න පුළුවන්, තනි මාපිය පවුල් වෙන්නට පුළුවන්, කාන්තා ගෘහ මූලික පවුල් වෙන්න පුළුවන්. ඒ අයට අපේ සමාජයේ රැකවරණයක් අවශ්‍යයි. මෙන්න මේ සමාජ ආරක්ෂණය ලබා දීම විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ රජය ප්‍රමුඛතම කටයුත්තක් විධියට සලකනවා.

ගරු සභාපතිතුමනි, මුදල් ඇමතිවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු අය වැය යෝජනාවලට අනුව, රුපියල් බිලියන 749ක් මේ සමාජ ආරක්ෂණය වෙනුවෙන් පමණක් වැය කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. එය අතිවිශාල මුදලක්. එය 2025 වසරේ වැය ප්‍රමාණයෙන් සියයට 10කටත් වඩා වැඩි ප්‍රමාණයක්. එයින් සමාජයේ ආරක්ෂණය

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

අත්‍යවශ්‍ය ප්‍රජාවට ඒ ආරක්ෂණය ලබා දීම සඳහා අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම මෙහිදී මම සඳහන් කරන්න ඕනෑ, ආබාධ සහිත ප්‍රජාව පිළිබඳව අපට නිවැරදි දත්ත නැහැ කියන එක. ඒක අපි පිළිගන්නවා. ඒ නිසා ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් අමතර රුපියල් මිලියන 100ක් වෙන් කළා, ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ නිවැරදි දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා. මේ නිවැරදි දත්ත පද්ධතිය හරහා ඔවුන්ට අවශ්‍ය සේවාවන් ඔවුන් ජීවත් වෙන ස්ථානයටම පහසුවෙන් ළඟා කරදීම තමයි අපේ අරමුණ, ගරු සභාපතිතුමනි. දැනටමත් අපි දන්නවා, ආබාධ සහිත පුද්ගලයින්ට පසුගිය රජයන් විසින් රුපියල් 7,500ක ආධාරයක් ලබා දුන් බව. 139,000කට ආසන්න ප්‍රමාණයකට මේ ආධාර ලබා දුන්නා. මේ ලබා දෙන රුපියල් 7,500 දීමනාව අප්‍රේල් මාසයේ සිට රුපියල් 10,000 දක්වා වැඩි කිරීමට අපේ රජය යෝජනා කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ වාගේම වඩාත්ම වැදගත් දේ තමයි, මේ 139,000කට ආසන්න ප්‍රතිලාභ ලබන පිරිස 410,000 දක්වා වැඩි කිරීමට අපේ අය වැය මඟින් යෝජනා කර තිබීම.

ඒ වාගේම මේ රටේ අඩු ආදායම්ලාභී පවුල්වල වැඩිහිටි පුද්ගලයින් රැකබලා ගැනීම සුවිශේෂ කාර්යභාරයක් ලෙස සලකනවා. ගරු සභාපතිතුමනි, ලංකාවේ තිබුණු විස්තෘත පවුල - extended family - ගත්තොත්, මේ විස්තෘත පවුල තුළ තමන්ගේ දෙමව්පියන් රැක බලා ගත්තා; තමන්ගේ ළමයින් රැක බලා ගත්තා. ඒ සියලු දෙනා රැක බලා ගන්න සමාජයක් තමයි අපට තිබුණේ. නමුත් සමාජය ක්‍රමයෙන් විකාශනය වෙලා මේ විස්තෘත පවුල කියන එක න්‍යෂ්ටික පවුල - nuclear family - දක්වා විකාශනය වෙලා තිබෙනවා. පවුල කුඩා වුණා. ඒ නිසා සමහර වෙලාවට මේ පවුල තුළ තවදුරටත් තමන්ගේ දෙමව්පියන් රැක බලා ගැනීම අපහසු වෙලා තිබෙනවා. සංස්කෘතික වශයෙන් අපි එය පිළිනොගත්තත්, අද ලංකාවේ 450කට ආසන්න වැඩිහිටි නිවාසවල 10,000කට ආසන්න වැඩිහිටියන් ප්‍රමාණයක් රැකවරණය ලබනවා. ගරු සභාපතිතුමනි, ඔවුන්ගෙන් 6,000කට අධික ප්‍රමාණයක් වැඩිහිටි කාන්තාවන් කියන එක තමයි සත්‍ය කාරණය. විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල වැඩිහිටියන් රැක බලා ගැනීම වර්තමාන ආණ්ඩුව සුවිශේෂී කාර්යභාරයක් විධියට සලකනවා. ඒ වෙනුවෙන් අපි මේ වර්ෂයේ සිට සුවිශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. වැඩිහිටියන් රැකබලා ගැනීම, ඒ වාගේම ආබාධ සහිත පුද්ගලයන් රැක බලා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ, ස්වේච්ඡා සංවිධාන සහ රජයේ මැදිහත්වීමෙන් විවිධ රැකවරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යන බව රජයක් විධියට අපි දන්නවා. නමුත් ඒ රැකවරණ මධ්‍යස්ථානවල බොහෝ අඩුපාඩු තිබෙනවා. ඒවායේ ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම තමයි මේ වසරේ අපේ රජයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ. ඒ සියලු වැඩිහිටි මධ්‍යස්ථාන රජයේ ලියාපදිංචි ආයතන බවට පත් කිරීමත්, ඒ වාගේම ඒවා තුළින් ගුණාත්මක සේවයක් ලබාදීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල පුහුණුව ලබාදීමත්, අවශ්‍ය නම් මූල්‍ය පහසුකම් ලබා දීලා ඒ සියලු වැඩිහිටියන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථානත්, ඒ වාගේම ආබාධ සහිත පුද්ගලයන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථානත් වැඩිදියුණු කරලා ඒවායේ සේවාවන් ලබන පුද්ගලයන්ට ඉහළම රැකවරණය, හොඳ සේවාවක් ලබාදීම සඳහා කටයුතු කිරීම තමයි අපේ අමාත්‍යාංශය යටතේ ආණ්ඩුවක් වශයෙන් මේ වේලාවේ සැලසුම බවට පත් වෙලා තිබෙන්නේ. මේ විධියට සමාජයේ රැකවරණය අවශ්‍ය කොටසට සමාජ රැකවරණය ලබාදීම සඳහා මේ වසරේ අපි විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අපි ඉතා පැහැදිලිව සඳහන් කළා, "සියලු දෙනාටම ප්‍රීතිමත් විශ්‍රාම දිවියක්" කියලා. මෙන්න මේ අරමුණ ඇතුව තමයි පසුගිය දින කිහිපයේම මේ අය වැය විවාදයේ බොහෝ වෙලාවට වැටුප් වර්ධක පිළිබඳව අවධානය යොමු කළේ. ඇත්තටම කියනවා නම් මූලික වැටුප් වැඩි කිරීමත්, වාර්ෂික වැටුප් වර්ධක වැඩි කිරීමත් හරහා රජයේ හෝ පෞද්ගලික අංශයේ සේවයේ නිරත වන කෙනෙක් විශ්‍රාම වයසට එනකොට තමන්ගේ ඒ විශ්‍රාම වැටුප යම්කිසි ප්‍රමාණයකින් ඉහළ දැමීමයි අපේ බලාපොරොත්තුව වෙන්නේ. එතකොට එයාගේ ජීවත්වීම සඳහා එය යම් රුකුලක් වෙනවා. එවැනි අරමුණක් ඇතුව තමයි අපි මූලික වැටුප් වැඩි කරන්නේ. ඒ වාගේම අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සමාජ ආරක්ෂණ අරමුදල මඟින්, විශේෂයෙන්ම සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් සියලු පුරවැසියන්ට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් යෝජනා කරලා, ඒක ශක්තිමත් ලෙස මේ වසරේ සිට ක්‍රියාත්මක කරනවා.

ගරු සභාපතිතුමනි, මේ වසරේදී අපි බලාපොරොත්තු වෙනවා, දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාවට නංවන්නට. විශේෂයෙන්ම අවිධිමත් අංශයේ සිටින අයට. ගරු සභාපතිතුමනි, විධිමත් අංශයේ සිටින අයට, විශේෂයෙන්ම රාජ්‍ය සේවයේ ඉන්නවා නම් ඔවුන්ට විශ්‍රාම වැටුපක් තිබෙන බව අපි දන්නවා. පෞද්ගලික අංශයේ සේවය කරනවා නම් සමහර වෙලාවට EPF, ETF වාගේ යම් දායකත්වයක් හරහා ඔවුන්ගේ විශ්‍රාම දිවිය යම් පමණකට සාර්ථක කරගන්න පුළුවන්. නමුත් අවිධිමත් අංශයේ සේවය කරන විශාල ප්‍රමාණයක් අපේ රටේ ඉන්නවා. සංඛ්‍යාලේඛනවල අඩුපාඩු තිබුණත්, දළ වශයෙන් මිලියන 2.7ක් ලෙස එය ගණනය කරලා තිබෙනවා. මේ පවුල් ප්‍රමාණයට තමන්ගේ විශ්‍රාම දිවිය ප්‍රීතිමත් ලෙස ගත කිරීම සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය හරහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කරලා ඔවුන්ගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය මූලික අදහස්, මූලික අඩිතාලම දැමීමට අපි මේ වසරේ සිට ක්‍රියාත්මක වන බව විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට ඉතාම වැදගත් වන කාරණය මෙයයි. මෙහිදී දිගින් දිගටම සඳහන් කළා, අපේ අමාත්‍යාංශයේ අවධානය යොමු වන අනෙක් ප්‍රධානතම ක්ෂේත්‍රය ප්‍රජා සවිබලගැන්වීමයි කියන අදහස. ගරු සභාපතිතුමනි, දිළිඳු බව තුරන් කිරීම පිළිබඳව බොහෝ අදහස්, බොහෝ සංකල්ප තිබෙනවා. දෙවැනි ලෝක යුද්ධයෙන් පස්සේ යටත් වෙලා තිබ්බිච්ච රටවල් නිදහස ලබාගත්තාට පස්සේ ඒ රටවල් දියුණු කිරීම පිළිබඳව විවිධ ප්‍රවේශ හඳුන්වා දුන්නා. උදාහරණයක් විධියට කිව්වොත්, මුලින්ම සුබසාධන ප්‍රවේශය - welfare approach - කියලා එකක් හඳුන්වා දුන්නා. ඊට පස්සේ anti-poverty approach කියලා ප්‍රවේශයක් හඳුන්වා දුන්නා. ඊටත් පසුව සමානාත්මතාව සඳහා equity approach කියලා ප්‍රවේශයක් හඳුන්වා දුන්නා. ඊට පස්සේ empowerment approach කියලා එකක් ආවා.

ගරු සභාපතිතුමනි, මම මුලින්ම කියන්න ඕනෑ, මේ සුබසාධන ප්‍රවේශය යටතේ තමයි ආධාරයක් දීලා ඒ අය සවිබලගන්වන්න පුළුවන්, දිළිඳුකමෙන් මුදාගන්න පුළුවන් කියන සංකල්පය සහ අදහස ආවේ කියන එක. ඒ නිසා අපේ රටේ පසුගිය දශක ගණනාව තිස්සේම සමහර වෙලාවට ආහාර මුද්දර දෙනවා, නැත්නම් ජනසවිය දෙනවා, -ඒක මෙතැනදීත් කියැවුණා- නැත්නම් සමෘද්ධිය දෙනවා, නැත්නම් අස්වැසුම දෙනවා. මේ ආධාර දීලා මේ අය නහාසිටුවන්න පුළුවන් කියන අදහසක් ආවා. නමුත් මේ ආධාර මඟින්; සහනාධාර මඟින් කිසියම් පුද්ගලයෙකු නහාසිටුවන්න බැහැ, රටක් සංවර්ධනය කරන්න බැහැ කියලා අද ලෝකයම පිළිගෙන තිබෙනවා. අන්න ඒ නිසා තමයි අර බලසතුකරණය, එහෙම නැත්නම් සවිබලකරණය කියන ප්‍රවේශය ඇවිල්ලා තිබෙන්නේ. මෙන්න මේ සවිබලකරණය කියන ප්‍රවේශය භාවිත කරලා දැනටත් සහනාධාර ලබන පවුල් ලක්ෂ

20කට ආසන්න ප්‍රමාණයක් මේ වසරේ සිට ඉදිරි වසර 5 තුළ සවිබලගැන්වීම තමයි අපේ අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යයක් වෙන්නේ. මෙන්න මේ කාර්යය සඳහා අපි මේ අය වැයෙන් සුවිශාල වැය ශීර්ෂයක් වෙන් කරගෙන තිබෙනවා. ඒ සඳහා අපිට වෙනත් විදේශීය ආධාර ලැබෙනවා. ඒ වාගේම දැනටත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව තිබෙන අපේ රුපියල් බිලියන 55කට ආසන්න මුදල් ප්‍රමාණයක් මූල්‍ය පහසුකම් ආධාර විධියට නොවෙයි, ඔවුන්ට ස්වයං රැකියා කරන්න; වෙනත් ආදායම් මාර්ග සඳහා වැය කරලා මේ සියලු පවුල් සවිබලගැන්වීම සඳහා අපි කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් මතක ඇති, අපේ ජනාධිපතිවරයා ජනාධිපති වීමට ප්‍රථම නිතරම සඳහන් කරපු එක කාරණයක් තමයි, කිසියම් රටක් දුප්පත් වෙලා ඒ රටේ පාලකයෝ පොහොසත් වුණේ කෙසේද කියන එක. මෙතැනදී මම පාලකයෝ ගැන විතරක් නොවෙයි සඳහන් කරන්නේ. නමුත් ඒ රටේ ඕනෑතරම් පොහොසත් වෙච්ච අය ඉන්න පුළුවන්. ඩූ බොයිස් කියලා ඇමෙරිකානු සමාජ විද්‍යාඥයෙක් හිටියා. කිසියම් රටක දුප්පත්කම කියන සාධකයේදී වඩාත් වැදගත් වෙන්නේ ඒ රටේ කෙතරම් දස ලක්ෂපතියන් ඉන්නවාද කියන එක නොවෙයි කියලා ඔහු සඳහන් කළා. එහෙම නම් අපේ පැත්තෙන් ගත්තොත් වැදගත් වෙන්නේ කොතරම් ලක්ෂපතියෝ ඉන්නවාද, කොච්චර දසලක්ෂපතියෝ ඉන්නවාද, කොතරම් කෝටිපතියෝ ඉන්නවාද කියන එක නොවෙයි. ඒ රටේ දිළිඳුකමට කුමක් සිදු වෙයිද කියන එකයි. අන්න ඒ අර්ථයෙන් ඉදිරියට යමින් මේ රටේ දිළිඳුකමෙන් පෙළෙන සියලු ජනතාව සවිබලගැන්වීම සඳහා අපේ රජය කටයුතු කරන බව සඳහන් කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නිහඬවෙනවා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Thurairasa Ravikaran. You have eight minutes.

[மு.ப. 11.46]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்தில் கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகின்றேன்.

கௌரவ கடற்றொழில் நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களே, இந்திய இழுவைமடிப் படகுகளின் அத்துமீறிய செயல்களால் வடக்கு, கிழக்கு மீனவர்கள் தொழில் செய்ய முடியாத நிலை! தொழில் உபகரணங்கள் சேதமடைவதோடு மீனவர்கள் வாழ்வு கேள்விக்குறியே! இந்திய விசைப் படகுகள் மீன்பிடியில் மிகவும் அழிவுகரமான முறைகளிலொன்றாகக் கருதப்படும் அடித்தள இழுவை வலைப் பிரயோகத்தை மேற்கொள்கின்றன. ஆழ்கடல் விசைப் படகுகள் கடலின் hoovers போன்றும், bulldozer போன்றும் மீன் மற்றும் அடித்தள மீன் இனங்களை அழித்தொழிக்கின்றன. இலங்கைப் பெருங்கடலில் இந்த bulldozing அடித்தள விசைப் படகுகளின் செயற்பாடுகள் தொடர்ந்தால், விரைவில் கடலில் எந்த மீனையும் பிடிக்க முடியாத நிலை ஏற்படும். அடித்தள இழுவை விசைப்படகு கடல் தளத்தைச் சிதைத்து, கடல் சூழலைச் சீர்குலைத்து, பழைய பவளப் பாறைகளைச் சேதப்படுத்துகின்றது; planktonsஇன் வளர்ச்சியைப் பாதிக்கின்றது. இறுதியாக ஆழ்கடல் இனங்களாகவுள்ள கடல் பாறை மீன், இறால் மற்றும் பிற கடல் வாழ் உயிரினங்களைப் பாதிக்கின்றது. இது கடல்வாழ் உயிரினங்களின் வாழ்விடச் சீரழிவுக்கு வழிவகுக்கும். இழுவை விசைப் படகு மீன்பிடி என்பது உண்மையில் ஒரு தேர்ந்தெடுக்கப்படாத முறையாகும். ஏனெனில், இதன்மூலம் இலக்கு அல்லாத உயிரினங்களும் பிடிக்கப்படுகின்றன; சுற்றுச்சூழலும் அழிக்கப்படுகின்றது. இந்த மீனவர்கள் கரைக்கு வந்த பின்னர் தாங்கள் விற்கக்கூடிய மீன்களை மட்டும் எடுத்துக்கொண்டு இலக்கு இல்லாத சிறிய மீன் இனங்களை அப்புறப்படுத்துகின்றார்கள்.

இலங்கையின் கடலோர மக்களில் பெரும்பாலானோர் மீன்பிடி அல்லது மீன் வளம் தொடர்பான தொழில் துறையை நம்பியுள்ளனர். அதுவே அவர்கள் அறிந்த ஒரே வாழ்வாதார நடவடிக்கையாகும். அந்த வாழ்வாதாரம் அழிக்கப்பட்டால், மனித பாதுகாப்பைப் பாதிக்கும் வகையிலான மிகப்பெரிய பொருளாதார, சமூக மற்றும் அரசியல் விளைவுகள் ஏற்படும்.

தவறுதலாக எல்லையைக் கடக்கும் மீன்பிடிக் கப்பல் மற்றும் படகுகள் ஒரு சிறிய சதவீத நிகழ்வுகளாக மட்டுமே உள்ளதென்பது அனைவரும் அறிந்த உண்மை. பெரும்பாலான எல்லைக் கடப்புகள் வேண்டுமென்றே இலங்கையின் கடல் எல்லைகளுக்குள் ஆழமாகப் பயணிப்பதை உள்ளடக்கியது. இராமேஸ்வரம் மீன்பிடிப் படகுகள் இலங்கைப் பகுதியில் மட்டுமே நல்ல மீன்பிடி மைதானங்களைக் காண்கின்றன. எனவே, அவற்றின் பெரும்பாலான மீன்பிடி அந்தப் பக்கத்தால்தான் நடைபெறுகிறதென்பது வெளிப்படையான இரகசியமும் உண்மையுமாகும். பெரும்பாலான pelagic விசைப் படகுகள் அல்லது விரிகடலுக்குரிய இழுவை வலைகளுடன் ஜோடியாக இழுவை செய்யும் இந்திய விசைப் படகுகள், பிரதானமாக இறால் இலங்கைக் கடல் பரப்பில் பெறப்படுவதால், இலங்கைக் கடற்பரப்பை அடைகின்றன. ஒன்றுவிட்ட ஒவ்வொரு நாளிலும் 500க்கும் மேற்பட்ட இழுவைப் படகுகள் குறிப்பாக வடக்குக் கடலில் இலங்கைக் கடற்பரப்புக்குள் மீன் மற்றும் இறால் பிடியில் ஈடுபடுகின்றன; சில படகுகள் கிழக்கிற்கும் செல்கின்றன.

கடல்வளப் பாதுகாவலர்களும் சர்வதேச விஞ்ஞானிகளும் இழுவை வலைகள் கண்மூடித்தனமாக அனைத்துக் கடல் வளங்களையும் அழிப்பதால் அவற்றை முழுமையாகத் தடை செய்யவேண்டும் என்று அழைப்பு விடுத்துள்ளனர். மீன் வள விஞ்ஞானிகளின் ஆலோசனையின் அடிப்படையில், இலங்கை அரசாங்கம் இலங்கைக் கடற்பரப்பில் அடித்தள இழுவைப் படகுகளை இயக்கத் தடை விதித்தது. இலங்கையின் வடக்குப் பகுதியில் உள்ள ஐந்து மாவட்டங்களில் முல்லைத்தீவு, மன்னார், கிளிநொச்சி, யாழ்ப்பாணம் ஆகிய நான்கு மாவட்டங்களிலும், கிழக்கிலும் உள்ள அதிகளவான மீனவர்கள் தமது முழுமையான வாழ்வாதாரமாக மீன்பிடியையே நம்பியுள்ளனர். நீங்கள் சற்றுச் சிந்தித்துப் பாருங்கள்! இந்தக் குடும்பங்களின் உணவுத் தேவை மற்றும் பிள்ளைகளின் கல்வித் தேவை உட்பட அத்தியாவசியத் தேவைகள் அனைத்திற்கும் இந்தக் கடலையே நம்பி, இதனால் கிடைக்கும் வருமானத்தையே தங்களுடைய வாழ்வாதாரமாக - ஜீவனோபாயமாக எண்ணி இலட்சக்கணக்கான மக்கள் வாழ்ந்துகொண்டிருக்கும் நிலையில், மிகவும் கொடூரமான முறையில் இலங்கை அரசினால் தடைசெய்யப்பட்டதாக அறிவிக்கப்பட்டிருக்கும் சட்டவிரோதத் தொழிலை கொள்ளையர்களைப்போலச் செய்துகொண்டிருக்கும் திருட்டுக் கும்பலைப் பிடித்துச் சட்டத்தின் முன் நிறுத்தாமலிருக்கக் காரணம்தான் என்ன? எங்களுடைய மீன்பிடியாளர் சமூகத்தைப் புறக்கணிக்க வேண்டாம், அவர்களது வயிற்றில் அடிக்க வேண்டாம், எமது மீனவர்களை வாழவிடுங்கள்! என்றுதான் கேட்கின்றோம்.

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

සට්ටවිරෝතත් තොෂිලෙච් සෙය්තු එමතු මීනව සමූකත්තෙ අෂිත්තුක්කොණ්ටිරුක්කුම් ඉලංකෙයිල් උළ්ළවර්කළෙයුම්, එල්ලෙ තාණ්ටි වන්තු එමතු වළංකළෙ අෂික්කුම් අයල් නාට්ටුච් සට්ටවිරෝතිකළෙයුම් තණ්ටියුංකළ්! එමතු මක්කළෙ මේලුම්මේලුම් කායප්පටුත්තාමල්, කටර්පටෙ, පොලිසාර්, කටර්තොෂිල් තිණෙක්කළෙප් පණියාළර් යාවරුම් තංකළුටෙය කටමෙකළෙච් චරියාකච් චෙය්තාල් නිලෙමෙකළ් සීරාකුම් එන්රු තෙරිවිත්තුක් කොළ්කින්රේන්. මීන්පිටිච් සට්ටංකළෙ ඉරුක්කමාක නටෙමුරෙක්කුක් කොණ්ටුවන්තාල් ඉන්තප් පිරච්සිනෙකළ් තීර්න්තුවිටුම්. සට්ටංකළෙ උරුවාක්කි වෙය්තුක්කොණ්ටු, අතනෙ මුළුමෙයාකච් චෙයර්පටුත්තාමල්, එමතු මීනව මක්කළින් වාළ්වෙ අෂිත්තුක් කොණ්ටිරුක්කිරීර්කළ්.

කෙළරව කටර්තොෂිල්, නීරියල් මර්රුම් කටල් වළංකළ් අමෙච්චර් අවර්කළේ, උංකළුක්කු ඉන්ත විටයංකළ් පර්රි නන්රාකත් තෙරියුම්; මීනවර්කළ් පටුම් කෂ්ටංකළ් උංකළුක්කුප් පුරියුම්. ඉන්තච් සට්ටවිරෝත මීන්පිටිච් චෙයර්පාටුකළෙ මුළුමෙයාක නිරුත්ත වේණ්ටුමෙන්රු නීංකළුම් පාටුපට්ටුක්කොණ්ටු ඉරුප්පතු එංකළුක්කුම් තෙරියුම්. ආනාල්, ඉන්තිය ඉලුවෙප් පටකුකළ් තංකළතු කටල් එල්ලෙයෙත් තාණ්ටි වරුම් විටයත්තිල් ඉන්තියක් කටර්පටෙයිනර්කූට පිළෙ විටුකින්රාර්කළ්; අතේපෝන්රු අන්ත අරචාංකමුම් පිළෙ විටුකින්රතු එන්පතෙච් චුට්ටික්කාට්ටුකිරේන්. තංකළුටෙය එල්ලෙයෙත් තාණ්ටි වරුවතර්කු අවර්කළ් තටෙවිතික්ක වේණ්ටුම්. අතේපෝල්, ඉලංකෙක් කටර්පටෙ එන්න පාර්ත්තුක්කොණ්ටු ඉරුක්කින්රතු? රෝහිංකියා අකතිකළ් මුල්ලෙත්තීවින් මුළ්ළිවාය්ක්කාල් කටර්පරප්පුක්කුළ් වරුම්වරෙ ඉලංකෙක් කටර්පටෙක්කුත් තෙරියාතු. අප්පටියානාල් අවර්කළ් එන්න චෙය්තුකොණ්ටු ඉරුක්කිරාර්කළ්? ඉලංකෙක් කටල් එල්ලෙයෙප් පාතුකාක්ක වේණ්ටියතු අවර්කළින් පොරුප්පු. ආතලාල්, නීංකළ් නිච්චයමාක ඉන්ත විටයත්තිල් උරුතියාකත් තලෙයිටුංකළ්! මීනව මක්කළෙක් කාප්පාර්රුංකළ්! නාංකළ් ඉන්ත විටයත්තිල් උංකළුක්කුත් තුණෙයාක ඉරුප්පෝම්. ඉල්ලෙයේල්, යාෂ්ප්පාණම්, මන්නාර්, මුල්ලෙත්තීවු, කිළිනොච්චි ආකිය නාන්කු මාවට්ට මක්කළුම් වීතික්කු ඉරංකි, වීතිච් චට්ටත්තෙ මතිත්තු, road අරුකිල් ඉරුන්තු චමෙත්තුච් චාප්පිට වේණ්ටිය නිලෙමෙ උරුවාකුම්. අන්ත නිලෙමෙ උරුවාක ඉටමලික්කාතීර්කළ් එන්රුතාන් නාන් කේට්ටුක් කොළ්කිරේන්. නන්රි, වණක්කම්.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
The Hon. Rohitha Abeygunawardhana. You have 17 minutes.

[පූ.භා. 11.53]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු සභාපතිතුමනි, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය සම්බන්ධයෙන් කටයුතු කරන අපේ විෂය භාර අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා අපේ පරණ මිත්‍රයෙක්. අපිත් එක්ක 2004 වර්ෂයේ වැඩ කරලා, ආණ්ඩු හදලා එකට හිටපු මිත්‍රයෙක්. ඒ නිසා ඔබතුමා ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම සම්බන්ධව මා සතුටු වනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ රජය බලයට පත් කරන්න නොයෙකුත් ක්ෂේත්‍රවල සිටින නොයෙක් වෘත්තිකයන් ඡන්දය දුන්නා. ඒ ඡන්දය දීපු අයගෙන් බහුතරයක් ධීවර ක්ෂේත්‍රයේ නියැළෙන්නන්. ධීවරයන් මෙන්ම ධීවර ක්ෂේත්‍රයට සමගාමීව ව්‍යාපාර කරන අයගෙන් සියයට 85ක්, 90ක් ඡන්දය දුන්නා, මේ ආණ්ඩුව බලයට පත් කරන්න. කලින් පැවති ආණ්ඩුවලට තමන් වෙනුවෙන් යමක් කරන්න බැරි වුණා, මෙන්න අපේ අනාගතය හදන ආණ්ඩුව කියලා තමයි ධීවර ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. ඒ දෙවුන්දර තුඩුවේ ඉඳන් පේදුරු තුඩුවට වනකල් ඉන්න සමස්ත ධීවරයෝ.

ධීවර ජනතාවගේ ඡන්දය මේ තරම් වැඩිපුර ලැබෙන්න, ධීවර ජනතාව මේ ආණ්ඩුව පත් කරගන්න හේතු වූ ප්‍රධානම සාධකය මොකක්ද? මේ ගරු සභාවේ නොයෙක් කථා ඉදිරිපත් වුණා, නොයෙක් දේවල් ගැන යෝජනා ආවා මම දැක්කා. හැබැයි, මෙතැන ප්‍රධානම සාධකයක් තිබුණා. ඒ සාධකය තමයි, ධීවරයාට තමන්ගේ රැකියාව කරන්න අත්‍යවශ්‍ය තෙල් ටික අඩු මිලට ලබා ගැනීම. ඩීසල් ටික, භූමිතෙල් ටික තමයි ධීවරයාට අවශ්‍යම දේ. ඩීසල්වල මිල අඩු වෙනවා නම්, භූමිතෙල්වල මිල අඩු වෙනවා නම්, ධීවරයා ගෙනෙන අස්වැන්නෙන් ඉතාම හොඳ ලාභයක් ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ රජය බලයට පත් වෙන්න ඉස්සෙල්ලා ගරු ජනාධිපතිතුමා ඇතුළු මේ රජය නියෝජනය කරන මැති ඇමතිවරු කළ ප්‍රකාශ දිහා බලමු. මේ කාටවත් කියන්න බැහැ, එදා එහෙම කිව්වේ නැහැ කියලා. මොකද, අපි මැතිවරණයට ඉස්සෙල්ලා කියපුවා හැම නාළිකාවකම වෙනම පටිගත කරගෙන තිබෙනවා. මෙන්න අපි කියපු දේ කියලා දැන් ඒවා ප්‍රචාරය කරනවා. මොනවාද දැන් ප්‍රචාරය කරන්නේ? ඩීසල් ලීටරයක වත්මන් මිල රුපියල් 286යි. ගරු සභාපතිතුමනි, එදා කිව්වා, ඩීසල් ලීටරයකින් එවක ආණ්ඩුව රුපියල් 160ක් හොරා කනවා කියලා. එහෙම නැත්නම් ඒ මුදල හිටපු ඇමතිවරයාගේ සාක්කුවට යනවා කියලාත් කිව්වා. ඒ වාගේ නොයෙක් දේවල් එදා කිව්වා. ධීවරයා සාධාරණයි නේ, ගරු සභාපතිතුමනි. එතකොට ඩීසල් ලීටරයකින් රුපියල් 160ක් අඩු වන බව දන්නවා නේ, මේ ආණ්ඩුව බලයට ආවාම. ඒක දන්නා නිසා ධීවරයෝ ඔක්කෝම මොකද කළේ? ධීවරයෝ ඔක්කෝම එකතු වුණා, මේ ආණ්ඩුවත් එක්ක. එකතු වෙලා මේ ආණ්ඩුව හදන්න ඔවුන්ගේ පූර්ණ සහයෝගය ලබා දුන්නා. ඒ පූර්ණ සහයෝගය මත තමයි ආණ්ඩුව පිහිටුවා ගත්තේ. ආණ්ඩුව පිහිටුවා ගත්තාට පසුව ඒගොල්ලන්ගේ බලාපොරොත්තුව වුණේ මොකක්ද? අන්න අර කියපු රුපියල් 160ක අඩු කිරීම, ගරු ඇමතිතුමනි. එහෙම බලාපොරොත්තු වෙනවා නේ. ඕනෑ කෙනෙක් ආණ්ඩුවක් හදන්නේ ඒක බලාපොරොත්තුවෙන් නේ. දැන් මාස හයක් ගත වෙන්න එනවා ආණ්ඩුවට. ඩීසල් ලීටරයක මිල අඩු වුණාද? අපි මේ කියන්නේ පසුගිය කාලයේදී ආණ්ඩුව ලබා ගන්නකොට කරපු ප්‍රකාශ ගැන. ඒ මුදල අඩු වුණේ නැහැ. ඒ මුදල අඩු වුණා නම් මේ ප්‍රශ්න ඔක්කෝටම විසඳුම් ලැබෙනවා. අර හිටපු රාජ්‍ය ඇමතිතුමා කියපු විධියට මාළු කෑල්ලක් අඩුවට කන්න පුළුවන් තත්ත්වය ඇති වෙනවා, මේ රටේ ජීවත් වෙන මිනිසුන්ට. දැන් මාළුවල මිල ගණන් අහනකොට ඇහේ මාළු නටනවා. මොකද, මාළු මිල ගණන් ඉහළ ගිහිල්ලා. මාළු මිල ගණන් ඉහළ යනවා නේ. මාළු අස්වැන්න ගෙනෙනකොට ඒගොල්ලන් බලන්නේ, ඩීසල්වලට කොච්චර ගියාද, කෑමට කොච්චර ගියාද, අයිස්වලට කොච්චර ගියාද, සේවකයන්ට කොච්චර ගියාද කියලා නේ. ඒ සියල්ල බලලා මාළු කිලෝවක මිලෙන් ඒ ගණන අල්ලනවා. අවසානයේදී ඒකට අහු වෙන්නේ මේ රටේ ඉන්න පාරිභෝගිකයා; මාළු කන මිනිස්සු. මාළු කන මිනිහාගේ ඇහේ මාළු නටනවා, මාළුවල මිල ගණන් ඇහුවාම. ඒ නිසා මම පැහැදිලිවම කියනවා ගරු සභාපතිතුමනි, පොරොන්දු වෙච්ච විධියට, හිටපු ඇමතිවරයාගේ

සාක්කුවට ගියාය කියපු ඒ රුපියල් 160 අයින් කරලා, ඩීසල් මිල අඩු කරලා දෙන්න කියලා. එහෙම නැත්නම් තවම එක්කෝ හිටපු ඇමතිවරයාගේ සාක්කුවට ඒ මුදල යනවා ඇති. මම නම් එහෙම කියන්නේ නැහැ. මොකද, අපට එහෙම කියලා පුරුදු නැහැ. එහෙනම් ඒ රුපියල් 160 හොයලා දෙන්න කෝ, දෙවි හාමුදුරුවනේ. ඒක තමයි පළමුවන කාරණය.

දෙවන කාරණය මොකක්ද, ගරු සභාපතිතුමනි? ඇමතිතුමා නම් තවම මුකුත් කිව්වේ නැහැ, එතුමා කථා කළේ නැති නිසා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, රුපියල් 25ක සහනාධාරයක් ගැන. පොඩි බෝට්ටු සහ බහුදින ධීවර යාත්‍රා සඳහා රුපියල් 25ක බුම්තෙල් සහනාධාර ලබා දෙනවාය කියලා එතුමා කිව්වා. බොහොම හොඳයි. මම කියන්නේ නැහැ, කොයි ආණ්ඩුවෙන්ද ඒවා ගත්තේ කින්ද මන්ද කියලා. හැබැයි, පසුගිය ආණ්ඩුවෙන් රුපියල් 25ක සහනාධාරයක් ලබා දුන්නා. ඒක ඉස්සරහට පවත්වාගෙන ගෙනියන්න. හැබැයි, ගරු ඇමතිතුමනි, ගරු සභාපතිතුමනි, සමහරුන්ට නොවැම්බර් මාසයේ ඒ සහනාධාරය හම්බ වෙලා තිබෙනවා. එතැනින් පස්සේ ගරු ඇමතිතුමනි, ඒ සහනාධාරය හම්බ වෙලා නැහැ.

මම ඉන්නේ කළුතර දිස්ත්‍රික්කයේ. බෙරුවල වරායට එන්න. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මම අදත් සිහිපත් කරනවා. එතුමාට පින්සිද්ධ වෙන්න එතුමා අපට හොඳ වරායක් හදලා දුන්නා. ඒ වරායේ ඉන්න ධීවරයන්ට මේ කියන සහනාධාරය ලැබිලා නැහැ. නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරිත් දැන් ඉවරයි, දෙනවාය කියපු සහනාධාරය මාස ගණනකින් ලැබිලා නැහැ. ඒ සහනාධාරය ලැබිලා නැහැ කියන්නේ, ඒ බෝට්ටුව ගැට ගහලා තියන්න වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ කාරණය ගැන ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරන්න. මොකද, මේ ගරු සභාවේ ඉඳලා අපට රස කරලා කියන්න පුළුවන්, ඒක දුන්නා, මේක දුන්නා කියලා. නමුත් ගිහිල්ලා ධීවරයාගෙන් අහන්න එපායැ, ධීවරයාගේ අතට ඒ සහනාධාරය හම්බ වුණාද කියලා. මම දැක්කා, දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාගේ නම කිව්වා. හැබැයි, ඒක සදාචාරාත්මක නැහැ. දිලිප් වෙදආරච්චි කියන්නේ මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වුණාය කියලා එතුමාට ධීවර රැකියාව කරන්න අයිතියක් නැද්ද? එතුමා හතර හිහන්නෙක්ද? අනුන්ගෙන් ඉල්ලාගෙන කන කෙනෙක්ද? නැහැ. මේ රටේ දේශපාලනය කරන ඕනෑම කෙනෙකුට තමන්ගේ ව්‍යාපාරයක් කරන්න අයිතිය තිබෙන්න ඕනෑ. ධීවර ක්ෂේත්‍රයේ නියැළෙන අනෙක් ව්‍යාපාරිකයන්ට තිබෙන අයිතිය තමයි එතුමාටත් තිබෙන්නේ. ඒ නිසා මේ කාරණය ගැන අවධානය යොමු කරන්න කියලා මම ගරු ඇමතිතුමාට කියනවා.

ගරු සභාපතිතුමනි, මම මේ කියන්නේ ඔබතුමන්ලා කියපු දේවල්. හිතන්න එපා, මේවා වෛරයෙන් කියනවාය කියලා. මොකද, තමුන්නාන්සේලා මේවා ඉටු කළොත් තමයි ජනතා කැමැත්ත, ප්‍රසාදය හම්බ වෙන්නේ. ගරු සභාපතිතුමනි, මැතිවරණ වේදිකාවේදී ගරු ජනාධිපතිතුමා පැහැදිලිවම කිව්වා, ධීවර කර්මාන්තයට නවීන තාක්ෂණය යොදා ගන්නවාය කියලා. එතුමා ඉන්දියාවට ගියා, මැතිවරණයට ඉස්සෙල්ලා. මැතිවරණයට ඉස්සෙල්ලා ඉන්දියාවට ගිහිල්ලා ඇවිල්ලා එතුමා කිව්වා, "නවීන තාක්ෂණය, චන්ද්‍රිකා තාක්ෂණය යොදාගෙන ඉන්දියාවේ ධීවර කර්මාන්තය කරනවා, ඉන්දියාවේ ධීවරයාට මාළු කොතැනද ඉන්නේ කියලා උදේ 5.00 වෙනකොට SMS පණිවුඩයක් එනවා, ඒ නවීන තාක්ෂණය යොදාගෙන අපි කොහොමද ධීවර රස්සාව කරන්නේ, මාළු ඉන්න තැන ගැන phone එකට SMS එකක් එනවා, අපේ ධීවරයා මොකක්ද කරන්නේ, අපේ ධීවරයා බෝට්ටුව, ඔරුව අරගෙන මාළු හොය හොයා හතර අතේ යනවා, මේ රටේ පාලකයන් මොනවාද කරලා තිබෙන්නේ" කියලා. මේ, එතුමා කියපු විධිය. මේ රටේ පාලකයන් මොනවාද කරලා තිබෙන්නේ කියලා ජනාධිපතිතුමා ඇහුවා. දැන් මම අහනවා, අපට මාළු හොයා ගන්න ඒ නවීන තාක්ෂණය දීලා තිබෙනවාද, ඒ නවීන තාක්ෂණය ගෙනෙන්න වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද කියා. හොඳයි, මේක කරනවා නම්, ගරු සභාපතිතුමනි. මේක කරන්න ඕනෑ දෙයක්. නවීන තාක්ෂණය යොදා ගත්තාම ඉලක්කය කොහේද තිබෙන්නේ කියලා හොයාගෙන යන්න පුළුවන්.

හැබැයි කෝ, මේ කියපු දේවල් ක්‍රියාත්මක කරනවාද? ධීවරයා ඒ දෙස බලාගෙන ඉන්නවා. නවීන තාක්ෂණය අපට ඉක්මනට සොයලා දෙන්න. නවීන තාක්ෂණය සොයාගෙන මාළු ගහනය කොතැනද ඉන්නේ කියලා SMS පණිවුඩ එවන්න. ඒ මාළු ගණවරය ළඟට යන්න අපට උදව් කරන්න කියලා ධීවරයෝ බලාගෙන ඉන්නවා. මේ දේවල් ඉටු කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒක තමයි කළ යුතු දේ.

ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලා ලබා දුන් බලාපොරොත්තු ගත්තොත් විශේෂයෙන්ම තමුන්නාන්සේලාගේ රජයෙන් මේ රටට මාළු ආනයනය කරයි කියලා අපි බලාපොරොත්තු වුණේ නැහැ. අපි දුපතක ජීවත් වෙන්නේ. රට වටේටම මුහුද. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ ගැන කියනවා මම අහගෙන සිටියා. රට වටේටම මුහුද තිබෙනකොට, අපට ධීවරයිනුත් ඉන්නකොට මේ රටට මාළු ආනයනය කරන එක සුබවාදී නැහැ. ඒ කාරණය මුලින් කථා කළ කථිකයෝත් කිව්වා. මේ රටට මාළු ආනයනය කරනවා. මොනවාද, ආනයනය කරන මාළු? තලපත් ගෙන්වනවා; කොප්පරා ගෙන්වනවා; ලින්නෝ ගෙන්වනවා; ඒ වාගේම ටින් මාළු ගෙන්වනවා.

මම මෙහෙම කියනකොට තමුන්නාන්සේලා අනික් පැත්තෙන් මට කියයි, "තමුන්නාන්සේත් ඒ කැබිනට් මණ්ඩලවල සිටියා නේ. තමුන්නාන්සේලාගේ කාලයේත් පිට රටින් මාළු ගෙන්නුවා නේද" කියලා. අම්මපල්ලා! ගෙන්නුවා. ගෙන්වපු නිසා තමයි දේශීය ආර්ථිකයක් හදන්න පුළුවන් හොඳම මිනිස්සු ටික ඉන්නේ ඔබේ පැත්තේ කියලා ඔබට ඡන්දය දුන්නේ. ඒ නිසා තමයි අපිව පැරද්දුවේ. පැරද්දුවා නොවෙයි, හෝදලාම ඇරියා. දෙවුන්දර තුඩුවේ ඉඳලා ජේදුරු තුඩුව දක්වා මම විතරයි ඉතුරු වුණේ. එහෙම නේද, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි? එහෙමයි සෝදලා ඇරියේ. ඇයි, ඒ? අපට කරන්න බැරි වුණු නිසා. එහෙම නේද, දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමනි? ඒවා අපට කරන්න බැරි වුණු දේවල්. හැබැයි, ඔබතුමන්ලාත් මාළු ආනයනය කරනකොට මේ රටේ ධීවරයාට යන කල මොකක්ද? ධීවර නිෂ්පාදන මේ රටට ආනයනය කරන ක්‍රමවේදයක් තිබෙනවා.

දැන් බලන්න, මාලදිවයිනෙන් අපේ රටට ටූනා -කෙළවල්ල- ආනයනය කරනවා. ආනයනය කරලා ඒවා ලංකාවේ කෙළවල්ලෝ කියලා වෙනම ප්‍රතිඅපනයනය කරනවා. ඒක වංචාවක්. මොකක්ද, මේකේ තේරුම? මේ ගැන සොයන්න, ගරු ඇමතිතුමනි. ටූනා මාලදිවයිනෙන් මෙහාට ගෙනැල්ලා ප්‍රතිඅපනයනය කරනවා. ලංකාවට මාළු ආනයනය කිරීම නිසා අපේ ධීවරයාට සිද්ධ වෙන්නේ මොකක්ද? ඔවුන්ගේ මාළුවලට මිලක් ලැබෙනවාද? අපේ ධීවරයා ගෙනෙන මාළු අස්වැන්න විකුණා ගන්න පුළුවන් වෙනවාද? ගරු ඇමතිතුමනි, මේ විධියට මාළු ආනයනය කිරීම සම්බන්ධයෙන් තමුන්නාන්සේ විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ කථාව කියනකොට මට පරණ සින්දුවක් මතක් වුණා. මේ රටේ එක එක ජාතියේ කලාකරුවෝ කරපු හොඳ නිර්මාණ නේ මේවා. මාළු පිට රටින් ගෙන්වන එක ගැන කියනකොට මට හොඳ සින්දුවක් මතක් වුණා. ගරු ඇමතිතුමනි, ඒක හොඳයි නේද?

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

"රට වටකර සාගරයයි
එහි සම්පත් ආකරයයි
පිටින් මාළු රටට ගේනවා ඕයි
රට මැද තනි වෙල් යායයි
බැලුවම හරි සිරියාවයි
නැවෙන් ගෙනත් හාල් බානවා ඕයි
මේ රටේ මිනිස්සු තනිකර කෙළින්නේ පිස්සු"

මේක පරණ සින්දුවක්. හැබැයි, මම ප්‍රාර්ථනා කරනවා, මේ සින්දුවේ අන්තිම කෑල්ල ලබන අය වැය එනකොට,- *[බාධා කිරීමක්]* අන්න හරි, ඔහොම ඉන්න. ගරු ඇමතිතුමනි, මම කියන්නේ ඊළඟ අය වැය එනකොට "මේ රටේ මිනිස්සු තනිකර කෙළින්නේ පිස්සු" කියන මේ සින්දුවේ අන්තිම කෑල්ල, "මේ රටේ ආණ්ඩුව තනිකර කෙළින්නේ පිස්සු" කියලා වෙනස් කරලා කියන එක නවත්වා දෙන්න කියායි.

මොකද, සියලුම මාළු වර්ග ආනයනය කරනවා; සහල් ආනයනය කරනවා. *[බාධා කිරීම්]* හරි, ඉවරයි නේ. ඇහුම්කන් දුන්නා, බොහොම හොඳයි. මේක පරණ සින්දුවක්. මම සින්දුව කියන්න ඉස්සෙල්ලා කිව්වා නේ, පරණ සින්දුවක් කියලා. පරණ සින්දු සමහර වෙලාවට අලුත් වෙනවා. බලන්න කෝ, reality showsවලදී පරණ සින්දු නේන්නම් කොල්ලෙක් ඇවිල්ලා කිව්වාට පස්සේ නැඟලා යන්නේ. එහෙම නේද? මේක remix එකක්. මතක තියා ගන්න පරණ ඒවා අමතක කරලා යන්න හදන්න එපා. පරණ බඩුවලට කියන්නේ antique කියලා. Antique බඩු තමයි වටින්නේ. ඒක නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා නවක මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලාගේ අදහස්වලටත් අපි ඇහුම්කන් දෙනවා. මේවා අවවාද, අනුශාසනා. මේවා අහන්න. ඒ නිසා මේ කරුණු ගැන අවධානය යොමු කරන්න.

ගරු සභාපතිතුමනි, දැන් තිබෙන තවත් ප්‍රශ්නයක් ගැන අපි බලමු. කරවල කර්මාන්තය කරන්න ලුණු අවශ්‍යයි. ලුණු මිටියක් කියන්නේ කිලෝග්‍රෑම් 40ක්. ධීවරයින් බෝට්ටුවේ දමාගෙන යන ලුණු මිටියක් -ලුණු ගහගෙන යනවා කියලා කියන්නේ- ගත්තේ කීයටද? රුපියල් 1,600යි. කරවල කර්මාන්තය කරන අය කිලෝග්‍රෑම් 40ක ලුණු මිටියක් ගත්තේ රුපියල් 1,600ට. ගරු ඇමතිතුමනි, ඔබතුමා වෙළෙඳ පොළට යන්න. හෙට උදේ වෙළෙඳ පොළට ගිහිල්ලා ලුණු මිටියක් කීයද කියලා අහන්න. රුපියල් 9,000යි. කිලෝග්‍රෑම් 40ක ලුණු මිටියක් රුපියල් 9,000යි. ගරු සභාපතිතුමනි, සමහර වෙලාවට හිතනවා ඇති මේක ජොලියට කියන එකක් කියලා. එහෙම නැහැ. පොළොවේ ඉන්න ඕනෑ නේ. අපිත් පොළොවේ හිටපු නැති හින්දා නේ මෙහෙම වුණේ. උඩ ඉඳලානේ. ඒකයි මම ඇමතිතුමාට ආරාධනා කළේ, ගිහිල්ලා ලුණු මිටියක් කීයද කියලා බලන්න කියලා. රුපියල් 9,000ටවත් ලුණු මිටියක් හොයා ගන්න නැහැ. කරවල කර්මාන්තය කඩාගෙන වැටෙන කොට මොකක්ද වෙන්නේ? අපේ රටට කරවල අවශ්‍යයි. කරවල කර්මාන්තය කඩාගෙන වැටුණාම කරවලත් මේ රටට ආනයනය කරන්න වෙනවා, ගරු සභාපතිතුමනි. ඔබතුමා කරවල කනවා නේද? *[බාධා කිරීමක්]* කනවානේ. හරියට හරි. කරවල කනවා නම් නියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානය මේකට යොමු වේවා. හොඳ කරවල කන්න. නැත්නම් කරුවලේ තමයි කරවල කන්න වෙන්නේ. මේ කියන්නේ ඇත්ත. මේ ගැන බලන්න වෙනවා. මේ ගැන බැලුවේ නැත්නම්, දන්නේම නැතුව ගිහිල්ලා අන්තිමට අපි ඔක්කෝම අමාරුවේ වැටෙනවා.

ඊළඟට ධීවර ආම්පන්නවල මුදල ගැන බලන්න. මම ගරු ඇමතිතුමාට මේ කාරණය මතක් කරනවා. මම එදා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කිහිපයක් ඇහුවා. එදා ඇමතිතුමා පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. මේ ගැන විශේෂ අවධානය යොමු කරන්න. ධීවර ආම්පන්නවල මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. දැල්වල, බෝට්ටු එන්ජින්වල මේ හැම එකකම මිල ඉහළ ගිහිල්ලා. මේකට අවධානය යොමු කරන්න.

ඒ වාගේම VMS පද්ධතියෙන් තමයි බෝට්ටුව කොහේ තිබෙනවාද කියලා හොයා ගන්නේ. ගරු සභාපතිතුමනි, මේ VMS පද්ධතිය හැම බෝට්ටුවකට සවි කරන්න ඕනෑ බෝට්ටුව කොහේද කියලා හොයා ගන්න. ගරු ඇමතිතුමනි, මම මේ කියන කාරණය තමුන්නාන්සේලාගේ රජය කරපු දෙයක් නොවෙයි. නමුත් මේක වෙනස් කරලා දෙන්න. මොකක්ද ඒ? VMS යන්ත්‍රයක් ජාත්‍යන්තර වෙළඳ පොළෙන් ලක්ෂ හතරකට, පහකට මෙරටට ආනයනය කර ගන්න පුළුවන්. එහෙම පුළුවන් වුණත් ගරු ඇමතිතුමනි, ඒවා ගෙනෙන්න කාටවත් ඉඩ දෙන්නේ නැහැ. ඇයි? ලංකාවටම VMS යන්ත්‍ර ගෙන්වන්න පුළුවන් එක ආයතනයකට විතරයි. ඇයි ඒ? කවුරු කළත් ඒ වරද නිවැරැදි කරන්න. NPP ආණ්ඩුව කියන්නේ වරද නිවැරැදි කරන ආණ්ඩුවක්. පිළිගන්නවා. ගරු අමාත්‍යතුමනි, මේක නිවැරැදි කරන්න. බෝට්ටු හිමියාට ඔහුගේ ලියාපදිංචි අංකය තිබෙනවා නම්, ඔහුගේ නමට බෝට්ටු තිබෙනවා නම්, ඔහුට දෙන්න "ඔබ ඔබේ බෝට්ටුවට VMS යන්ත්‍රය ආනයනය කරන්න" කියලා. ප්‍රශ්නය ඉවරයි. මොකද, ඒවායේ මිල මේ තරම් ඉහළ යන නිසා ඒ ගැන වැඩි අවධානයක් යොමු කරන්න.

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමනි, මාදැල් කර්මාන්තය ඉතා හොඳයි. පසුගිය කාලයේ මාළු පිරෙන්න ඇල්ලුවා. ගරු ඇමතිතුමනි, අපේ දකුණේ, ඔබතුමන්ලාගේ උතුරේ, නැගෙනහිර මේ හැම පැත්තේම මාළු ඇල්ලුවා. එහෙම මාළු අල්ලන කොට මා දැල් මාළුවලට මොකක්ද කරන්නේ? අල්ලපු ඔක්කෝම කනවානේ. කන්නමයි වෙන්නේ. වෙන මොනවාද කරන්නේ? මා දැල්වලින් අල්ලන මාළු කල්තියා ගන්න ශීතාගාර කොහේද තිබෙන්නේ? අපි අල්ලන මාළු තෙලට කනවා; මිරිසට කනවා; කරවල කරලා කරනවා. හැම විධියකටම හදලා කනවා. හැබැයි කාලා ඉවර කරන්න ඕනෑ. මේ සම්බන්ධ විශේෂ අවධානය යොමු කරන්න. මාස හතරයි ඒ රස්සාව තිබෙන්නේ. ඒ නිසා මාදැල් රස්සාව කෙරෙහි වැඩි අවධානය යොමු කරන්න.

ඊළඟ කාරණය දැන් මාදැල් අදින්න මිනිස්සු නැහැ. දැන් ඉස්සර වාගේ නොවෙයි, මාදැල් අදින්න මිනිස්සු එන්නේ නැහැ. ඒ මිනිසුන්ගේ ළමයි මොනවා හරි රැකියාවකට යනවා. මාදැල්වලට ට්‍රැක්ටර් යොදවලා-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මට විනාඩියක් දෙන්න, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විනාඩියක කාලයක් දෙන්න, ගරු සභාපතිතුමනි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, මාදැල් කර්මාන්තය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න. එහෙම කළොත් තමයි, අපි නෙළා ගන්න අස්වැන්න හරියාකාරව ප්‍රයෝජනයට ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ කියන එක මම ඔබතුමාට මේ වෙලාවේ සිහිපත් කරනවා.

ධීවර නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "අපි මුදල් වෙන් කරලා තිබෙනවා. අපි මේ මේ කාරණා ඉටු කරලා තිබෙනවා. මෙවර තමයි, ඉතිහාසයේ වැඩිපුරම මුදලක් මේ අමාත්‍යාංශයට වෙන් කළේ" කියලා. අපි සතුටුයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. හැබැයි, ඒක නොවෙයි ප්‍රශ්නය. මෙන්න මේ සමාජය තුළ, ධීවරයා තුළ තිබෙන කතිකාව තමයි මා ඉදිරිපත් කළේ. මේ කතිකාවට පිළිතුරු දෙන්න. ඒකට පිළිතුරු දෙන්න. ඒකට පිළිතුරු නොදී අපට ගමනක් යන්න බැහැ. ධීවරයා කියලා කියන්නේ ගොවියාට, අනෙක් අයට වැඩිය හරි වෙනස් කෙනෙක්. ඒ අය හයියෙන් කථා කරන්නේ. ඇහෙනවා අඩුයි. ඒ අය හයියෙන් කථා කරන්නේ කේන්තියෙන් නොවෙයි. හැබැයි, සමහර වෙලාවට මුහුදත් එක්ක ඔවිටු වෙලා, ඔවිටු වෙලා ඔවුන්ට කේන්ති යනවාත් වැඩියි. දේශපාලනඥයන් හැටියට තමුන්නාන්සේලාට, අපට මේ රටේ ධීවරයා ශක්තිමත් කළා කියන පණිවුඩය ඔබෙන් අහන්න ලැබෙනවා නම් සතුටුයි. හැබැයි, ඒක ඔබෙන් අහන්න ලැබෙන්න නම්, ඔබ විසින්ම මැතිවරණ වේදිකාවල සහ ඔබ දීපු පොරොන්දු පත්‍රවල, ඔබ දීපු ප්‍රතිපත්ති ප්‍රකාශනවල මේ රටේ ධීවරයා නහා සිටුවන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන්, නියෝජ්‍ය ඇමතිතුමාගෙන්, ජනාධිපතිතුමාගෙන්, රජයෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා එහෙම කළොත්, අපි විපක්ෂයේ හිටියත් බොහොම නිර්ලෝභීව කොන්ද කෙළින් තියාගෙන කියනවා, මේ ආණ්ඩුව හොඳයි කියලා. හැබැයි, ඒක නොකෙරුවොත් ධීවරයාගේ පැත්තේ හිටගෙන මේ ආණ්ඩුව ධීවරයා අමාරුවේ දැම්මා කියන එකත් කියන්න මම ලැහැස්තියි. ඒ බවත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ගරු සභාපතිතුමනි, මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Ajith Gihan. You have eight minutes.

[අ.භා. 12.13]

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු සභාපතිතුමනි, අද දින ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් සාකච්ඡා කරන අවස්ථාවේදී ඒ වෙනුවෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම අපේ ආණ්ඩුව මෙවර අය වැයෙන් ධීවර ක්ෂේත්‍රයට සාධාරණ ලෙස ප්‍රතිපාදන වෙන් කර තිබීම පිළිබඳව අපට ආඩම්බරයක් තිබෙනවා.

දැන් මේ විපක්ෂයේ අයගේ කථා බැලුවාම අපට නිතාගන්න බැහැ, මේ කථා කරන්නේ විපක්ෂයේ කවුද කියලා. ඒක අපට හරිම ප්‍රශ්නයක්. මේ කථා කරන්නේ කවුද? අපේ රටේ දශක ගණනක් මේ අමාත්‍යාංශවල ඉඳගෙන, ඒ අමාත්‍යාංශවල පුටු රත් කර කර, මේක විනාශ කරපු උදවිය නේ මේ අද කථා කරන්නේ. අපට ඕනෑ තරම් figures තිබෙනවා කථා කරන්න.

දැන් කියන කථාව තමයි, මේ ආණ්ඩුව ඔක්කෝම කරන්නය කියන එක. දශක ගණනක් මාරුවෙන් මාරුවට මේ අමාත්‍යාංශවල ඉඳගෙන -මේ අමාත්‍යාංශ හඳුනනවාද දන්නේත් නැහැ- ඒ යටතේ තිබෙන අනෙකුත් ආයතනත් විනාශ කරලා, කම්බස් කරපු මේ කණ්ඩායම දැන් සද්ද බද්ද නැතිව කියන්න පටන් අරගෙන තිබෙනවා, මේ මාස 4න් මේ ඔක්කෝම කරන්න කියලා. *[බාධා කිරීමක්]* අපි ජනතාවට පොරොන්දු වෙලා, වැඩ පිළිවෙළක් සාකච්ඡා කරලා තමයි රටට ඉදිරිපත් කළේ. මාස 4න් මේ දේවල් ඉටු කරනවා කියලා අපි කියා නැහැ. අපි ජනතාව ගැන හිතලා තමයි අය වැය ප්‍රතිපත්ති හදලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* සද්ද නැතිව දැන් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කථා කරන්න පසුව අවස්ථාව ගන්න. මන්ත්‍රීවරයෙක් කථා කරද්දී එයට බාධා කරමින් කථා කරන්න පුරුදු වෙන්න එපා. ඒක සදාචාරාත්මක නැහැ. *[බාධා කිරීමක්]* මේ සභාවේ වැඩ කටයුතු පවත්වාගෙන යන්නේ ස්ථාවර නියෝගවලට අනුවයි. ඒ අනුව වැඩ කරන්න පුරුදු වෙන්න. ඔබතුමා දොස්තර මහත්මයෙක් විධියට හැසිරෙන්න පුරුදු වෙන්න. *[බාධා කිරීමක්]* මෝඩයෝ වාගේ මේ පාර්ලිමේන්තුවේ හැසිරෙන්න එපා. *[බාධා කිරීමක්]* මේක පාර්ලිමේන්තුවක්. එදා තිබුණු පාර්ලිමේන්තුවේ පිස්සෝ පිහටිටෝ වාගේ හැසිරුණාට, අද මේ පාර්ලිමේන්තුව විධිමත් කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* එම නිසා ඒ අනුව හැසිරෙන්න පුරුදු වෙන්න කියලා අපි විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඒක විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරු මේ ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන සම්බන්ධයෙන් කථා කළා. මේ කථා කළ හිටපු මැති ඇමතිතුමන්ලා ධීවර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මොනවාද කරලා තිබෙන්නේ? ඔවුන් ඒ ආයතනවල තිබෙන ප්‍රශ්න, ගැටලු හඳුනාගෙන තිබෙනවා ද? අපේ රටේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව කියලා එකක් තිබෙනවා. දැන් මේ දෙපාර්තමේන්තුවට මොකක්ද වෙලා තිබෙන්නේ? අපේ ධීවර කර්මාන්තයේ යෙදන බහුදින යාත්‍රා හිමියන් 5,488ක් ඉන්නවා. මේ සාගරය කියන්නේ මහා සම්පතක්. වර්ග කිලෝමීටර් 517,000ක සාගරයක් අපට අයිතියි. ඒ වාගේම, කිලෝමීටර් 200ක අරයක් තිබෙනවා. ඒ වාගේම, කරදිය ධීවර කර්මාන්තයේ 318,470ක් සෘජුව යෙදී ඉන්නවා. ඒ වාගේම, මිලියන 1.1ක පමණ ජනතාවක් ධීවර කර්මාන්තය තුළින් ආදායම් ලබනවා; එ් තුළින් යැපෙනවා. ඒ වාගේම, මිලියන 2.7ක, -ලක්ෂ 27ක- පමණ ජනතාවක් මේ ක්ෂේත්‍රය තුළින් චක්‍රව ජීවත් වෙනවා. මේ කර්මාන්ත දැන් කොතැනටද ගිහිල්ලා තිබෙන්නේ? මාස 4ක් වෙන අපේ ආණ්ඩුවද මේක විනාශ කළේ?

ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේ බහුදින යාත්‍රාවක් මුහුදු ගිහිල්ලා නැවත එන්න රුපියල් ලක්ෂ 70ක්, 80ක් යනවා. මීට පෙර මෙවා පාලනය කළේ කවුද? පසුගිය කාලයේ ඉන්ධන මිල වැඩි කළේ කවුද? පසුගිය කාලයේ රුපියල් 87ට තිබුණු භූමිතෙල් ලීටරය අද කීයද? ඒක කළේ අපිද? රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමන්ලා මෙවා ගැන කියද්දී අපට අනෙක් පැත්තෙනුත් හිනා යනවා. හලාවත ධීවරයෝ ඉන්ධන සහනාධාරය දෙන්න කියලා ආයාචනා කරද්දී, ඒ අයට වෙඩි තියලා ඝාතනය කළා. ලජ්ජයි. ධීවරයා ගැන තව කථා කරන්න මෙතැනට එනවා. ඒ ධීවරයන්ට වෙඩි තියලා ඝාතනය කළා. ඒ විතරක් නොවෙයි, ඒ අයට පහරදීම් කළා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

Sir, I rise to a point of Order. ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා මගේ නම කිව්වා.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු මන්ත්‍රීතුමනි, මම කථා කළාට පස්සේ ඔබතුමා කථා කරන්න. ඔබතුමා මගේ කථාවට බාධා කරන්න එපා. එදා ධීවරයන්ව වෙඩි තියලා මරා දාපු කණ්ඩායම අද මෙතැන කථා කරන්න එනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, after he finishes you can have time.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
Sir, I rise to a point of Order. එතුමා මගේ නම කිව්වා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Rohitha Abeygunawardhana? ඔබතුමා මිනිත්තුවෙන් කියන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු මන්ත්‍රීතුමනි, අපි ධීවරයන් මරපු මිනිස්සු නොවෙයි. ඒ බව බොහොම පැහැදිලිව ඔබතුමාට කියන්න ඕනෑ. යම් ආණ්ඩුවක් කාලයේ ධීවරයෙකුට යම් විධියකින් වෙඩි තබලා මරණයක් වුණා නම්, ඒ ආණ්ඩුවලට දෙන්න තිබෙන punishment එක ජනතාව දීලා තිබෙනවා. මම මේක බොහොම නිහතමානීව කියන්නේ. දැන් ඔබතුමන්ලාට මේක කරන්න කියන එකයි අපි කියන්නේ. අපි කියන දේ අහලා අපිට වෛර කරන්න එපා. අපට බැණ වදින්න එන්න එපා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ajith Gihan, you may continue with your speech.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
බණිනවා නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා කරපුවා කිව්වේ නැත්නම් ඒක හරියට හොදිවල ලුණු නැහැ වාගේ. ඒ නිසා අපි කියන දේත් අහගෙන ඉන්න කෝ. *[බාධා කිරීමක්]* ඔබතුමා අහගෙන ඉන්න පුරුදු වෙන්න. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වාගේම දැන් ඉන්න මන්ත්‍රීවරයෙක්. ඒ නිසා සද්ධ නැතිව ටිකක් අහගෙන ඉන්න. ධීවරයා ගැන කිඹුල් කඳුළු හලන මේ කණ්ඩායම මේ ධීවර ක්ෂේත්‍රය විනාශ කළා. අද ධීවර කර්මාන්තයේ යෙදී සිටින අය අසරණයි. අද ධීවර ආම්පන්න මිල අධික ලෙස වැඩි වෙලා තිබෙනවා. ඒ හාණ්ඩ මිල වැඩි වෙලා තිබෙන්නේ ඇයි? ඒකට වග කියන්න ඕනෑ කවුද? මේ වර්තමාන ආණ්ඩුවද? මේ මාස 4 ආණ්ඩුව ද?

එදා තමුන්නාන්සේලා කොහොමද මේ රටේ ආර්ථිකය කඩා වැටිටුවේ? "ආර්ථික ඝාතකයෝ" කියා නම් දරපු අයගේ මන්ත්‍රීවරු තමයි වර්තමාන ආණ්ඩුව ගැන කථා කරන්නේ. ආර්ථික ඝාතකයෝ කියලා අධිකරණයෙන් තීන්දුව ලැබූ අයගේ ගෝල බාලයෝ කථා කරනවා මේ රටේ ධීවර කර්මාන්තය සම්බන්ධව. එදා ධීවර ආම්පන්නවලට බදු ගහපු නිසා ඒවායේ මිල වැඩි වුණා. රටේ ආර්ථිකය බිඳ වැටිටුවා. ඒ මත අපට ඩොලරයට ඝාපේක්ෂව වැඩියෙන් රුපියල් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. අපි රජය භාර ගත්තත් එසේ වැඩිපුර ගෙවන්න අපට සිදු වෙනවා. එන්ජින් මිල, resins මිල, බෝට්ටු ආම්පන්න මිල, දැල්වල මිල දැන් වැඩි වෙලා. ඒවා කළේ අපි ද? ඒවා කළේ අපි නොවෙයි. ඔබතුමන්ලාගේ කෙරුවාවේ ප්‍රතිඵල තමයි ධීවර කර්මාන්තයේ යෙදෙන ජනතාව මේ භුක්ති විඳින්නේ. ඉන්ධන මිල වැඩි කරලා, ඒ ආයතනවලට සේවකයන් පුරවලා පුරවලා ඒ ආයතන විනාශ කරලා, ගසා කාලා, ඒ ණය අපේ කර පිට දාලා තිබෙනවා.

ඉතින්, අපි ඒවා ගෙවන්න ඕනෑ නැද්ද? මේ ආණ්ඩුවත් වටිටන්න කියලා ද කියන්නේ? ඔබතුමන්ලා ආණ්ඩු කළා වාගේ මේ ආණ්ඩුවත් රට විනාශ කර කර ණය වෙවී යන්න ද ඕනෑ? එහෙම බැහැ. විධිමත් නියාමන ක්‍රියාවලියකටයි අප අත ගහලා තිබෙන්නේ. ඒ අනුව ධීවර කර්මාන්තය ගොඩ නහන්න තමයි මේ අය වැය යෝජනා සකස් කරලා තිබෙන්නේ. අපි මෙමඟින් සාධාරණය ඉෂ්ට කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ ගැන හිතලා බලන්න. දිලිප් වෙදඅරච්චි මන්ත්‍රීතුමන්ලා රාජ්‍ය අමාත්‍යවරුන් විධියට පසුගිය ආණ්ඩුවල කටයුතු කළ ආකාරය අපි දැක්කා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
හොඳමයි, ගරු සභාපතිතුමනි.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මෙතුමන්ලා කොතැනට ද ගෙනැල්ලා තිබෙන්නේ? අපේ රටේ මත්ස්‍ය පරිභෝජන අවශ්‍යතාව කොතැනට ද ගෙනැල්ලා තිබෙන්නේ? මේ ආයතන විනාශ වෙලා තිබෙනවා. මේවා ගොඩ ගන්න ඕනෑ; ගොඩ නහන්න ඕනෑ. ඒ සඳහා අපි ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ ආයතන ගොඩ නහලා නැහැ, විනාශ කරලායි තිබෙන්නේ. තොරතුරු අරගෙන බලන්න. ඒ figuresවලින් බලන්න, කොතැන ද මේ කර්මාන්ත තිබෙන්නේ කියලා. North Sea Limited සහ Cey-Nor Foundation Limited කොතැනද තිබෙන්නේ? දැල් කර්මාන්තශාලා බිඳ වැටිලා; ණය කඳු ගොඩ ගැහිලා. ඒවා ගොඩ ගන්නයි අපට සිදු වෙලා තිබෙන්නේ. ඒවා ගොඩ ගැනීම සඳහා අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඔබතුමන්ලා විනාශ කරපු සමස්ත ධීවර කර්මාන්තය ගොඩ නහන්න අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. මේ ආණ්ඩුව ඒ වැඩ පිළිවෙළ හදලා තිබෙන්නේ මෙතැනින් එහාට ගිහින් රට ගොඩ නහන්නයි; මේ රටේ ප්‍රධාන ක්ෂේත්‍රයක් වන ධීවර කර්මාන්තය ගොඩ නහන්නයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මගේ ගම කල්මුණේ. එය නැඟෙනහිර වෙරළාසන්න ප්‍රදේශයක්. එය ධීවරයන් බහුතරයක් වෙසෙන ප්‍රදේශයක් නිසා ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයට වෙන් කරන ලද මුදල සම්බන්ධයෙන් කථා කිරීම උචිත වුණත්, ඊට වඩා වැදගත්, මගේ ගමට සම්බන්ධ කාලෝචිත ප්‍රශ්නයක් පිළිබඳව කථා කරන්න මට සිද්ධ වෙනවා.

நான் கல்முனையைப் பிரதிநிதித்துவப்படுத்தும் பிரதிநிதி என்ற வகையில், பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் கௌரவ ஆனந்த விஜேபால அவர்களின் அண்மைய பத்திரிகைச் செய்தி தொடர்பாகவும், அமைச்சரவைப் பேச்சாளரும் அமைச்சருமான கௌரவ நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் கூறப்பட்ட விடயம் இன்றைய எல்லா தேசிய பத்திரிகைகளிலும் வெளிவந்துள்ள சூழ்நிலையில் அது சம்பந்தமாகவும் சில வார்த்தைகளைப் பேசக் கடமைப்பட்டுள்ளேன்.

குறிப்பாக, கல்முனைப் பகுதியில் மத அமைப்புகளினால் பிள்ளைகள் தீவிரவாதக் கற்பித்தல்களுக்கு உட்படுத்தப்படுகின்றனர் என்றும், அதன் காரணமாக உளவுப் பிரிவினரின் கண்காணிப்பு நடவடிக்கைகளை அதிகரிக்க வேண்டியுள்ளது என்றும் அவர்கள் கூறியுள்ளனர். இக்கூற்றுகள்மூலம் எனது தொகுதி மக்கள் மத்தியில் ஒரு குழப்பமான சூழ்நிலை உருவாகியுள்ளது. ஏனென்றால், இதனைப் பொதுவாகச் சொல்லியிருக்கின்றார்களே தவிர, எந்தவோர் அமைப்பையும் குறிப்பிட்டுச் சொல்லவில்லை.

கல்முனை ஜும்மா பள்ளிவாசல், பள்ளிவாசல் சம்மேளனம் மற்றும் ஜம்மியத்துல் உலமா போன்ற இஸ்லாமிய மத அமைப்புகள் உட்பட இஸ்லாமிய சமூகம், தீவிரவாதம் தொடர்பான விசாரணைகளுக்கும் தீவிரவாதத்தைத் தடுப்பதற்கான நடவடிக்கைகளுக்கும் சம்பந்தப்பட்ட அதிகாரிகளுடன் முழு ஒத்துழைப்புடன் செயற்படத் தயாராக உள்ளனர். எங்கள் மக்களும் இதுபோன்ற வித்தியாசமான போக்குகளிலுள்ள குழுக்களின் பின்னணியையும் அவர்களுக்கு யார் நிதி வழங்குகிறார்கள் என்று தெரிந்துகொள்வதற்கும் ஆர்வமாகத்தான் இருக்கின்றார்கள்.

In fact, we also want the authorities to investigate, in accordance with the law, the activities that have allegedly taken place in our area. We wish to identify, in particular, the forces that are financing, patronizing and orchestrating such activities. The fear of a deep state looms in our minds, too, as it may not be under the Government's control.

ஏனென்றால், இதுவும் ஒரு deep state நடவடிக்கையாகவும் இருக்கலாம். அப்படியென்றால் சில நேரங்களில் அரச கட்டுப்பாட்டையும் மீறிச் சம்பவங்கள் நடைபெறலாம். ஆனால், இந்தப் புலனாய்வும் விசாரணையும் சட்டத்துக்கு அமைவாக நடத்தப்பட வேண்டும் என்பதையும் இங்கே நான் வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

இதற்கு முன்பும் முஸ்லிம் சமூகத்தால் முன்னெச்சரிக்கைகள் வழங்கப்பட்டும், சம்பந்தப்பட்ட அதிகாரிகள் பொறுப்புடன் செயற்படத் தவறிய காரணத்தினால் சஹ்ரானுடைய உயிர்த்த ஞாயிறுக் குண்டுவெடிப்புச் சம்பவம் நடைபெற்றது என்பது உங்கள் அனைவருக்கும் தெரிந்த விடயம். அதையும் ஒரு deep state நடவடிக்கையாகவே நாங்கள் கருதுகிறோம். மற்றுமொரு 'சஹ்ரான் சம்பவம்' இந்த நாட்டில் ஒருநாளும் நடக்கக் கூடாது.

We do not want another incident where, despite early warnings and cooperation by the Muslim community, the authorities have failed to act in a timely and responsible manner. In fact, there is a prevalent culture of early warning within the Muslim community, which needs to be nurtured and respected.

நாளை எங்கள்மீது பழி சுமத்த பல தீய சக்திகள் முயற்சி செய்யலாம். அமைச்சர்களின் கூற்றுகளைத் தங்களுக்குச் சாதகமாகப் பயன்படுத்த இந்தத் தீய சக்திகள் நிச்சயமாக முயலும். ஆகவேதான் தீவிரவாதத்தைத் தடுப்பதற்கு நாங்கள் - கல்முனை வாழ் முஸ்லிம் மக்கள் - எப்பொழுதும் ஒத்துழைப்பை வழங்குவதற்குத் தயாராக உள்ளோம் என்ற செய்தியை மிகத் தெளிவாகச் சொல்லிவைக்க விரும்புகின்றேன். இருந்தாலும் அதிகாரபூர்வ அறிக்கைகள் தேவையற்ற பயம் மற்றும் சந்தேகங்களை உருவாக்காமலிருப்பதை உறுதிப்படுத்துவது அரசாங்கத்தின் கடமையாகும்.

ஆகவே, இப்படிப்பட்ட பொதுவான கூற்றுகள்மூலம் "முஸ்லிம் சமூகத்துக்குள் இஸ்லாமியத் தீவிரவாதம் செயற்படுத்தப்படுகின்றது" என்ற பழைய தப்பான அபிப்பிராயம் உருவாக்கப்படலாம் என்ற அச்சம் உருவாகியுள்ளது. இந்தப் பதத்தை வைத்தே பேரினவாத, தீவிரவாத சக்திகள் எங்களை முடக்க முயல்வார்கள் என்பதை மறந்துவிடக் கூடாது.

உண்மையிலேயே 'இஸ்லாமியத் தீவிரவாதம்' என்ற பதமே அடிப்படையில் இஸ்லாமியக் கொள்கைகளுக்கு முரண்பட்டது என்பதை நான் ஆணித்தரமாகக் கூறுகின்றேன். ஆகவே, அமைச்சர்களின் கூற்றுகளைத் தெளிவுபடுத்தி ஓர் அறிவிப்பு கௌரவ அமைச்சரினால் வழங்கப்பட வேண்டும் என்று தாழ்மையுடன் கேட்டுக்கொள்வதோடு, இது சம்பந்தமாக உரிய புலனாய்வு அறிக்கையின் அடிப்படையில் எடுத்துக்கொண்ட நடவடிக்கை என்னவென்று தெரிந்துகொள்ளவும் விரும்புகின்றேன்.

மேலும், நோன்பு ஆரம்பிக்கப்பட்ட காலப்பகுதியிலிருந்து இலங்கை ஒளிபரப்புக் கூட்டுத்தாபனம் இப்தார் முஸ்லிம் நிகழ்ச்சியை மிகச் சிறப்பாக நடாத்திக் கொண்டிருக்கின்றது.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

அதற்கு முஸ்லிம் வர்த்தகர்கள் பல கோடிக்கணக்கான வருமானத்தை விளம்பரங்கள்மூலம் கொடுத்துக் கொண்டிருக்கிறார்கள். அதையிட்டு நாம் மகிழ்ச்சியடைகின்றோம்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Just give me one more minute and I will finish.

ஆனால், ஏறத்தாழ 75 வருடங்களுக்கும் மேலாக இலங்கை ஒளிபரப்புக் கூட்டுத்தாபனத்தால் இரவு வேளைகளில் ஒளிபரப்பப்படும் ஒரு மணித்தியால இஸ்லாமிய நிகழ்ச்சி நேற்றுத் தொடக்கம் 15 நிமிடங்கள் குறைக்கப்பட்டு, 45 நிமிடங்களுக்கு முடக்கிவிடப்பட்டிருக்கின்றது. உடனடியாக இதை நிவர்த்திசெய்து மீண்டும் அந்த இஸ்லாமிய நிகழ்ச்சிக்கு ஒரு மணித்தியாலம் ஒதுக்கப்பட வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.50]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே! இன்று இந்தப் பாராளுமன்றத்திலே நடைபெறுகின்ற குழுநிலை விவாதத்திலே உரையாற்றச் சந்தர்ப்பம் வழங்கியதையிட்டு நன்றியைத் தெரிவித்து, கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சு தொடர்பான சில விடயங்களை முன்வைக்க விழைகின்றேன். குறிப்பாக இந்த அமைச்சு நாட்டிலே மிக முக்கியம் வாய்ந்த ஒன்றாகக் காணப்படுகின்றது. இன்று எமது நாட்டில் கூடுதலான மக்கள் கடற்றொழிலை நம்பி தங்களின் வாழ்வாதாரத்தை ஈட்டுகின்றவர்களாக இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. அந்த அடிப்படையிலே, அவர்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கான நடவடிக்கைகளை இந்த அரசாங்கம் முன்னெடுக்க வேண்டும்.

எங்களுடைய திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரைக்கும் இன்று அங்கேயிருக்கின்ற மீனவர்கள் பல பிரச்சினைகளை எதிர்நோக்குகின்ற நிலை காணப்படுகின்றது. குறிப்பாக, அவர்கள் இன்னும் பழைமையான மீன்பிடி முறைகளைக் கையாளுகின்றவர்களாக இருந்து கொண்டிருக்கின்றார்கள். ஆகையால், அந்த மீனவர்களுக்கு நவீன மீன்பிடி முறைகளை அறிமுகப்படுத்தி, அவர்களையும் புதிய முறையின் அடிப்படையிலே மீன்களைப் பிடிக்கின்ற நிலைக்கு மாற்ற வேண்டுமென்பதை கௌரவ அமைச்சர் அவர்களிடம் நான் இந்த இடத்தில் வேண்டுகோளாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மீனவர்களுக்கான கடன் வசதிகள் இன்று இடைநிறுத்தப்பட்டிருக்கின்றது. குறிப்பாக, தோணி, படகு போன்ற சிறிய வள்ளங்கள்மூலம் கடலுக்குச் செல்கின்றவர்களால் தங்களுடைய பொருளாதார நெருக்கடியின் காரணமாக அல்லது இந்தப் பொருளாதார பிரச்சினை காரணமாகப் பெரியளவான மீன்பிடி முயற்சிகளிலே களமிறங்க முடியாத ஒரு சூழல் காணப்படுகின்றது. அந்த அடிப்படையிலே, அவர்கள் தமது தொழிலை விரிவாக்கிக்கொள்கின்ற முயற்சிகளை முன்னெடுக்கக்கூடிய விதத்தில் அவர்களுக்கான கடன் வசதி போன்ற விடயங்களை அரசாங்கம் நடைமுறைப்படுத்த வேண்டுமென்பதையும் இந்த இடத்தில் நான் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, மீனவர்களுக்கான வீட்டுத் திட்டங்கள் மற்றும் அவர்களுக்கான தேவைகளைப் பூர்த்தி செய்கின்ற வேலைத்திட்டங்களையும் அமைச்சின் செயற்பாடுகளில் உள்வாங்குவோமாக இருந்தால் அது மீனவர்களுக்குச் செய்கின்ற மிகவும் சிறந்த விடயங்களாகக் காணப்படுமென நான் நினைக்கின்றேன்.

இன்று மீனவர்களுக்கும் கடற்படையினருக்கும் இடையில் சில பிரச்சினைகள் காணப்படுவதை நாங்கள் பார்க்கின்றோம். ஆகையால், அவற்றுக்குத் தீர்வு காண்கின்ற செயற்பாடுகளையும் கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமென்பதையும் இந்த இடத்தில் நான் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, எங்களுடைய புல்மோட்டைப் பிரசேதத்திலே மீனவர்கள் பயன்படுத்திய ஒரு பகுதி இன்று கடற்படையினரால் தடுத்து வைக்கப்பட்டிருக்கின்ற ஒரு நிலை காணப்படுகின்றது. அதனால் அந்தப் பிரதேசத்தைப் பயன்படுத்திய மீனவர்கள் பல அசௌகரியங்களுக்கு முகங்கொடுக்க வேண்டிய ஒரு சூழ்நிலையில் இருந்து கொண்டிருக்கின்றார்கள். இந்த விடயத்திலும் கவனம் செலுத்தி, அவர்களுக்கான அந்த இடத்தை மீண்டும் பெற்றுத் தருவதற்கான நடவடிக்கைகளையும் கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமென்று இந்த இடத்தில் நான் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய மாகாணத்தில், குறிப்பாக எங்களுடைய மாவட்டக் கடற் பிரதேசத்திலே காணப்படுகின்ற பெரும் பிரச்சினைதான் சுருக்கு வலை மீன்பிடி என்ற ஒரு விடயம். இந்தச் சுருக்கு வலை என்ற விடயத்தில் எங்களுடைய நாட்டிலே இன்று இரண்டு சட்டங்கள் காணப்படுவதாக நாம் விளங்கிக் கொள்ளக்கூடிய ஒரு சூழல் காணப்படுகின்றது. ஏனென்றால், இன்று வட, கிழக்கை எடுத்துப் பார்த்தால், அங்கு அந்த வலை தடைசெய்யப்பட்டுள்ளதாகச் சொல்லப்பட்டு, அந்த மீனவர்கள் கைதுசெய்யப்படுகின்ற ஒரு சூழல் காணப்படுகின்ற அதேநேரம், காலி, மாத்தறை போன்ற ஏனைய பிரதேங்களில் இருக்கின்ற மீனவர்கள் இதே வலையைப் பயன்படுத்திக் கொண்டிருக்கின்றார்கள். அந்த வலை தடை செய்யப்பட்டிருந்தால் அது நாடளாவிய ரீதியிலான தடையாக இருக்க வேண்டும். வட, கிழக்கிலே ஒரு சட்டம், ஏனைய பிரதேசங்களிலே இன்னோரு சட்டம் என்றால், இதைப்பற்றி யோசிக்க வேண்டிய ஒரு நிலைப்பாட்டில் நாங்கள் இருந்து கொண்டிருக்கின்றோம். கௌரவ அமைச்சர் அவர்களே, இன்று இந்தச் சுருக்கு வலை தடைசெய்யப்பட்டுள்ளதா? என்பதை நாங்கள் சற்று விளங்கிக்கொள்ள வேண்டும். குறிப்பாக, 1986ஆம் ஆண்டின்

சுருக்கு வலை தொடர்பான வர்த்தமானி அறிவித்தலின்படி, 3/8 அங்குல அளவு கண்கொண்ட சுருக்கு வலைக்கு அனுமதி வழங்கப்படலாமெனக் குறிப்பிடப்பட்டுள்ளது. அந்த gazette அறிவித்தலை ***ஹன்சாட்*** பதிவுக்காகச் *சமர்ப்பிக்கின்றேன்.

இந்த வர்த்தமானி அறிவித்தலின்படி, 3/8 அங்குலத்துக்கு மேற்பட்ட கண்ணுள்ள வலைகள் அனைத்தும் சட்டரீதியானவை என்று சொல்லப்பட்டுள்ளது. குறிப்பாக, நான் இங்கு காண்பிக்கும் இந்தச் சுருக்கு வலையானது எங்களுடைய பிரதேசங்களில் தடைசெய்யப்பட்டதாகவும் ஏனைய பிரதேசங்களில் தடைசெய்யப்படாமல் இன்னும் அங்குள்ள மீனவர்களால் பயன்படுத்தப்பட்டு வருகின்ற வலையாகவும் காணப்படுகின்றது. இன்றும்கூட மாத்தறை, காலி போன்ற பிரதேசங்களுக்குச் சென்று பார்த்தால், அவர்கள் இதே வலையைப் பயன்படுத்திக் கொண்டிருப்பதைப் பார்க்க முடியும். ஆனால், அதற்கெதிராக அங்கு என்ன சட்ட நடவடிக்கை எடுக்கப்படுகின்றதென்பதை நாங்கள் கேட்க விரும்புகின்றோம். குறிப்பாக, எங்களுடைய பிரதேசங்களில் இந்த வலையைப் பயன்படுத்தும் மீனவர்களுக்கு எதிராக வழக்குத் தாக்கல் செய்யப்படுகிறது. அந்த வழக்குகளின் மூலமாகச் சுமார் 20 இலட்சத்திற்கு மேற்பட்ட சொத்துக்கள் பறிமுதல் செய்யப்படுகின்ற அளவுக்கு அவர்கள் நஷ்டத்தை அடைகின்றார்கள்.

இவ்வாறு எமது மீனவர்கள் கைது செய்யப்பட்டு, அவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுக்கப்படுவதற்குப் பிரதான காரணம் இதற்கான அனுமதிப்பத்திரம் வழங்கப்படவில்லை என்பதுதான். இந்த வலை தடை செய்யப்பட்டதாக இருந்தால், அது ஒரு பிழையான தொழில் என்று அவர்களைக் கைதுசெய்திருப்பார்கள். ஆனால், அவ்வாறு செய்யாமல் அவர்களுக்கான அனுமதிப்பத்திரம் வழங்கப்படவில்லை என்ற காரணத்தினால் வழக்குத் தாக்கல் செய்யப்படுவதால் மீனவர்கள் பாதிக்கப்படுகிறார்கள். எனவே, அந்த மீனவர்களுடைய நிலைப்பாட்டை நாங்கள் கருத்திற்கொள்ள வேண்டும். இன்று ஒவ்வொரு மீனவரும் படுகின்ற கஷ்டங்கள் தொடர்பாக இன்னும் பல விடயங்களைச் சொல்ல முடியும். இருந்தாலும், எங்களுடைய திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில் இது மிகவும் கவனம் செலுத்தப்பட வேண்டிய ஒரு விடயமாகக் காணப்படுகிறது. ஆகையால், இந்த சுருக்கு வலைப் பிரச்சினை தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் விசேட கவனம் செலுத்த வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, எங்களுடைய பிரதேசத்தில் ஏழு கடல் மைல்களுக்கு அப்பால் சென்று மீன்பிடிக்க வேண்டுமென்ற விடயம் இன்னுமொரு குறைபாடாகக் காணப்படுகிறது. அது எந்தளவுக்குச் சாத்தியமாகும் என்பதை நாங்கள் உணர்ந்து கொள்ள வேண்டும். இது சில நேரம் ஏனைய மாவட்டங்களுக்குச் சரியாக இருந்தாலும், திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில் பிழையான ஒரு நிலைப்பாடாகக் காணப்படுகிறது. ஏனென்றால், அந்தக் கடற் பிரதேசம் குடா போன்று அமைந்திருப்பதன் காரணமாக அங்கிருக்கின்ற ஒரு பிரதேசத்திலிருந்து இன்னுமொரு பிரதேசத்துக்குப் போகும்போது 7 கிலோமீற்றர் என்பதைக் கணிக்க முடியாத நிலை காணப்படுகிறது. ஆகவே, இந்த விடயத்திலும் கவனஞ்செலுத்தி, இந்த 7 கிலோமீற்றர் தூரம் சென்று மீன்பிடிக்க வேண்டுமென்ற முடிவு எந்த அடிப்படையில் மேற்கொள்ளப்பட்டது என்பது பற்றியும் அதன் எல்லைகளைக் குறைக்கமுடியுமா? என்பது பற்றியும் மீண்டும் பரிசீலனை செய்யவேண்டுமெனக் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்றுதான், பெரிய படகுகளின் பயணப் பாதையைக் கண்காணிப்பு செய்கின்ற VMS உபகரணத்துக்காக மாதாந்தக் கட்டணமாக 5,500 ரூபாய் அறவிடப்படுகின்றது. உண்மையிலே பெரும்பாலான படகுகள் வருடத்தில் 6 மாதங்கள்தான் தொழில் ஈடுபடுத்தப்படுகின்றன. ஆனாலும், அவர்கள் எல்லா மாதங்களுக்கும் இந்தக் கட்டணத்தைச் செலுத்த வேண்டிய நிலைப்பாடு காணப்படுகிறது. ஆகையால், தொழிலுக்குச் செல்கின்ற 6 மாதத்துக்கு மாத்திரம் அந்தக் கட்டணத்தைச் செலுத்துகின்ற நிலையை உருவாக்குவீர்களாக இருந்தால் அது மீனவர்களுக்குச் செய்கின்ற சிறந்த விடயமாக இருக்குமென்பதை இந்த இடத்தில் கூறிக் கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි දෙකෙ කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
හොඳයි, කථාව මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கடற்றொழில் அலுவலர்கள் தமக்குரிய சில பிரச்சினைகளை இனங்காட்டியிருக்கிறார்கள். குறிப்பாக, அவர்களுக்குப் போக்குவரத்துக் கொடுப்பனவாக வழங்கப்படும் 1,500 ரூபாய் இரண்டு நாள் களப் பயணத்துக்கே போதாது. திருகோணமலை போன்ற பகுதிகளில் அவர்கள் கொக்கிளாய் முதல் வெருகல் வரை பொிய பரப்பைப் பார்க்க வேண்டியிருக்கிறது. எனவே, அவர்களது போக்குவரத்துக் கொடுப்பனவை அதிகரிக்க அமைச்சரவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும். அத்துடன் நாடு முழுவதும் கடற்றொழில் அலுவலர்களுக்கான பாரிய பற்றாக்குறை நிலவுகின்றது. கடைசியாக 2015ஆம் ஆண்டளவிலே கடற்றொழில் அலுவலர் பதவிக்குக் ஆட்சேர்ப்புச் செய்வதற்கான நிலைப்பாடு உருவாக்கப்பட்டிருந்தது. அதன்பின் அந்த ஆட்சேர்ப்புகள் இடைநிறுத்தப்பட்டதாகத் தகவல் வழங்கப்பட்டிருக்கிறது. கடந்த வருடம் இவர்களுக்கான விண்ணப்பங்கள் கோரப்பட்டபோதிலும் போதியளவிலான விண்ணப்பங்கள் கிடைக்காத காரணத்தினால் அதுவும் இரத்துச் செய்யப்பட்டதாகக் கூறப்படுகின்றது. எனவே, குறித்த விண்ணப்பதாரர்களுக்கான நியாயத்தை வழங்குவதற்கான நடவடிக்கைகளையும் கௌரவ அமைச்சரவர்கள் எடுக்க வேண்டுமென்று இந்த இடத்தில் நான் கேட்டுக் கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்திலே வெருகல், மூதூர், கிண்ணியா, திருகோணமலை, ஜமாலியா, இக்பால் நகர், நிலாவெளி, குச்சவெளி, புடவைக்கட்டு, புல்மோட்டை போன்ற பல இடங்கள் இன்று அதிகமான மீனவக் குடும்பங்கள் இருக்கின்ற பிரதேசங்களாகக் காணப்படுகின்றது. இவர்கள் அங்கு பல பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். எனக்குக் கிடைத்திருக்கின்ற இந்தப்

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[ගරු ඉමිරාන් මහරූෆ් මහතා]

10-12 නිමිඩංකලිලේ අවර්කලිේ මුලුප් පිරච්සිනෙකලියුම් සොල්ලිවිඩ මුඩියාදු. කෙලරව අමෙච්සර් අවර්කලිඩම් නාංකල් කේට්කින්ර විඩයම් එන්නවෙන්රාල්, නීංකල් ඔරු නාලාවදු එංකලුදෙය මාවට්ටත්තිර්කු වර වේණ්ඩුම්; උංකලුදෙය අමෙච්සින් සෙයලාලර් මර්රුම් NAITA පෝන්ර නිරුවනංකලුදෙය අදිකාරිකලියුම් අන්ත ඉඩත්තිර්කු අළෛත්තු වන්දු, අංකිරුක්කින්ර මීනව සංකත් තලෛවර්කලුඩන් කතෛත්තු, අන්ත මීනවර්කල් එදිර්නෝක්කුකින්ර පිරච්සිනෙකලෛ අරිය වේණ්ඩුම්. ඒනෙන්රාල්, ඒනෙය මාවට්ටත්තිලේ කාණප්පඩුකින්ර පිරච්සිනෙකලෛප් පෝන්රල්ලාමල්, එංකලුදෙය තිරුකෝණමලෛ මාවට්ටත්තිලේ කාණප්පඩුකින්ර පිරච්සිනෙකල් විත්තියාසමානවෛයාකක් කාණප්පඩුකින්රන. ආකෙයාල්, කෙලරව අමෙච්සරවර්කල් අන්තප් පිරදේසත්තිර්කු වරුකෙතන්දු, අංකිරුක්කින්ර මීනවර්කලුඩන් කතෛත්තු, අංකිරුක්කින්ර නිලෛප්පාට්ටෛ අරින්දු, අදර්කාන දීර්වුකලෛ වළංක වේණ්ඩුමෙන්රු නාන් ඉන්ත ඉඩත්තිලේ මීණ්ඩුම් කේට්ටුක් කොළ්කින්රේන්. ඒනෙන්රාල්, කූට්ටුදලාන මීනව සමුදායත්තිනර් ඉම්මුරෙ උංකලුදෙය අරසාංකත්තිර්කු ආදරවෛත් තන්දිරුක්කින්රාර්කල් එන නාන් නිනෛක්කින්රේන්. කුරිප්පාක, එංකලුදෙය පිරදේසංකලිල්කූට, ඉම්මුරෙ උංකලුදෙය අරසාංකම් සාර්පාකප් පෙරුම් කාරියාලයම් උරුවාක්කප්පට්ටු උංකලුක්කාන ආදරවුකලෛත් තන්දිරුක්කින්රාර්කල්. අවර්කල් තංකලුක්කාන ඔරු නියායත්තෛ, නීදියෛ එදිර්පාර්ත්දිරුක්කින්රාර්කල්. ආකෙයාල්, අවර්කලුදෙය පිරච්සිනෙකලෛ නීංකල් සෙවිමඩුත්තු, අදෛත් දීර්ත්දුත් දරුවදර්කාන නඩවඩික්කෙයෛ එඩුක්ක වේණ්ඩුමෙන්රු කේට්ටු, නිරෛවු සෙය්කින්රේන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කල්)
(The Hon. Deputy Chairperson)
මීළහට, ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු කුලුක්කලිේන් පිරතිත් තවිසාලර් අවර්කල් අක්කිරාසනත්තිනිේන්රු අකලවේ, මාණ්පුමිකු ලක්ෂ්මන් නිපුණ ආරච්චි අවර්කල් තලෛමෛ වකිත්තාර්කල්.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.

[අ.භා. 3.02]

ගරු නන්දන පත්මකුමාර මහතා
(මාණ්පුමිකු නන්දන පත්මකුමාර)
(The Hon. Nandana Pathmakumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය සහ ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ විවාදයට ගන්නා මේ මොහොතේ, එම විවාදයට එකතු වෙමින් ඉතා කෙටි වේලාවක් හෝ කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මම පළමුකොටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපේ ආණ්ඩුවේ අරමුණ වෙලා තිබෙන්නේම මේ සමාජයේ ජීවත් වන දුගී දුප්පත්භාවයෙන් පෙළෙන, කිසිම හවිහරණක් නැතිව ජීවිතයේ අන්ත අසරණභාවයට පත් වෙලා සිටින, ලෙඩ රෝගවලින් පෙළෙන, මානසික ආබාධවලින් පෙළෙන සියලු පුරවැසියන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමයි. එවැනි මිනිසුන්ගේ ජීවිත වෙනස් කිරීම, එම ජීවිත සවිබලගැන්වීම තමයි මේ අමාත්‍යාංශයට අදාළව තිබෙන ලොකුම කාර්යභාරය සහ වගකීම වන්නේ. විශේෂයෙන්ම අන්න ඒ වැඩ පිළිවෙළ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් තමයි ගරු ජනාධිපතිතුමා මේ අය වැයේදී විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙන්නේ. ගරු ජනාධිපතිතුමා ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා, ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදලා, එය මහ පොළොවේ ක්‍රියාත්මක කිරීමට ඕනෑ කරන වැඩසටහන් ටික හදලා, ඒවා ක්‍රියාත්මක කරමින් සිටින මොහොතක තමයි අය වැය සම්බන්ධව අද විපක්ෂයෙන් යම් යම් විවේචන එල්ල වෙමින් තිබෙන්නේ.

අද විපක්ෂ නායකතුමා මේ අය වැය විවාදයට එක් වෙමින් විමසීමක් කළා, "අපේ රටේ දුගී දුප්පත් බව තුරන් කරනවා, දුප්පත්භාවය අවසන් කරනවා කියලා ඔබතුමන්ලා පොරොන්දු වුණා. උපාධිධාරීන් 30,000කට රැකියා අවස්ථා ලබා දෙනවා කියලා කිව්වා. කෝ! දැන් රැකියා දුන්නාද?" කියලා. අය වැය තුළිනුත් අපේ ජනාධිපතිතුමා කිව්වා, උපාධිධාරීන් 30,000කට රැකීරක්ෂා ලබා දෙන ගමන්ම, තවත් විශාල පිරිසකට අපි ඒ අවස්ථාව ලබා දෙනවා කියලා. අපි දන්නවා, රැකියා කියන ඒවා එහෙම දෙන්න බැහැ කියලා. රජයේ රැකියා නිකම් දෙන්න බැහැ. රජයේ රැකියා ලබාදීමේදී ඒකට අදාළ ක්‍රමවේදයක් තිබෙනවා. ඒකට අයදුම් පත්‍ර කැඳවන්න ඕනෑ; සම්මුඛ පරීක්ෂණ පවත්වන්න ඕනෑ. එවැනි ක්‍රමවේදයක් සහිතව තමයි රැකී රක්ෂා දෙන්නේ. අපි ආණ්ඩු බලය අරගෙන තවම මාස කිහිපයයි ගතවෙලා තිබෙන්නේ. අපි අපේ පළමු අය වැය ඉදිරිපත් කරලා දින කිහිපයයි ගත වෙලා තිබෙන්නේ. හැබැයි දැන් විපක්ෂය අපෙන් අහනවා, "කෝ, දුන්නා ද; කෝ, දුන්නා ද?" කියලා. අපි ඒ දේවල් අනිවාර්යයෙන්ම ලබා දෙන බව විශේෂයෙන්ම කියන්න ඕනෑ. හැබැයි, එතුමන්ලා රැකියා දෙන විධියට, විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා රැකියා දෙන විධියට නම් අපට රැකියා දෙන්න බැහැ. එතුමා රැකියා ලබා දුන් විධිය අපට මතකයි. එතුමා කාර්යාලයට එන්න කියලා, උස නම් සිකියුරිටි රැකියා දුන්නා; මිටි නම් කම්කරු රැකියා දුන්නා; මහත නම් field එකේ යන්න දුන්නා; කෙට්ටු නම් office එකේ රැකියා දුන්නා. ඒ, එතුමා රැකියා දුන් විධිය. හැබැයි, ඒ විධියට රැකියා දෙන්න අපට බැහැ. අපි වග කිවයුතු රජයක්. අපි රැකියා දෙන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ සුදුසුකම් අනුව රැකියා දෙන්න ඕනෑ. එහෙම දෙනවා මිසක්, එතුමාට ඕනෑ විධියට රැකියා දෙන්න බැහැ. ඒ නිසා විශේෂයෙන්ම මේ සමාජයේ අසරණභාවයට පත්වෙලා සිටින හැමෝටම රැකීරක්ෂා දෙන ගමන්ම, රට තුළ විවිධ ආබාධවලට ගොදුරු වෙලා සිටින, අසරණභාවයට පත් වෙලා සිටින, සියලුදෙනා සවිබලගැන්වීම තමයි අපේ වැඩ පිළිවෙළ බවට පත් වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම අද අපේ සමාජයේ වැඩිහිටි ජනගහනය ඉතා වේගයෙන් ඉහළ යමින් තිබෙන බව අපි දන්නවා. අන්න ඒ ඉහළ යන වැඩිහිටි ජනගහනයට අපි මේ සමාජය තුළ රැකවරණයක් ලබා දෙන්න ඕනෑ. වැඩිහිටි ජනගහනයට රැකවරණයක් නොදීම නිසා අද විශාල වශයෙන් ලංකාව පුරාම වැඩිහිටි නිවාස ආරම්භ කරන්නට පටන් අරගෙන තිබෙනවා. අපේ රටේ හවිහරණක් නැති, කිසිම පිළිසරණක් නැති වැඩිහිටියන් 8,806 දෙනෙක් වැඩිහිටි නිවාස 392ක ජීවත් වෙනවා කියලා ජාතික වැඩිහිටි මහ ලේකම් කර්යාලය පසුගිය කාලයේ ප්‍රකාශ කර තිබෙනවා අපි දැක්කා. ඔවුන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයක් නැහැ; හැඳුනුම්පතක් නැහැ; ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වෙන්න කෙනෙක් නැහැ. ඒ තත්ත්වයට පත් වෙච්ච

වැඩිහිටියන් විශාල පිරිසක් අද වන විට අපේ සමාජයේ ඉන්නවා. වැඩිහිටියන් කියන්නේ යම් දෙයක් ඉගෙන ගෙන මේ සමාජය වෙනුවෙන් මහත් කාර්යභාරයක් ඉටු කරපු අය. එවැනි කාර්යභාරයක් ඉටු කරපු, වගකීම් සහිතව වැඩ කරපු අය වෙනුවෙන් රැකවරණයක් හදන්න, ඔවුන්ගේ ජීවිත වෙනස් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් හදන්න අපට හැකියාව ලැබිලා නැහැ. ඒ නිසා තමයි පසුගිය කාලය පුරාම වැඩිහිටියන් අසරණභාවයට පත් වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අපි අපේ දිස්ත්‍රික්කය තුළ තිබෙන වැඩිහිටි නිවාස කිහිපයකටම ගිහිල්ලා සොයා බැලුවා. එක වැඩිහිටි නිවාසයක වැඩිහිටියන් 70දෙනෙක් සිටියා. ඔවුන්ගෙන් වැඩිහිටියන් 56දෙනෙක් සිටියා, කිසිම කෙනෙකුගේ හවිහරණක් නැති, උප්පැන්න සහතිකයක් නැති, ජාතික හැඳුනුම්පතක් නැති අය. ඊළඟට අපි තවත් වැඩිහිටි නිවාසයකට ගියා. එතැන වැඩිහිටියන් 20දෙනෙක් සිටියා. එතැන හැඳුනුම්පතක් නැති, උප්පැන්න සහතිකයක් නැති, කිසිම කෙනෙකුගේ රැකවරණයක් නැති 14දෙනෙක් සිටියා. මේක තමයි අද වන විට අපේ සමාජයේ වැඩිහිටියන්ට අත්වෙලා තිබෙන ඉරණම.

මම එක අවස්ථාවකදී කළුතර ප්‍රදේශයේ මළ ගෙයක් වෙලා ආදාහනාගාරයට ගියා. ඒ ගියාට පස්සේ මට දැනගන්න ලැබුණා, ඒ ආදාහනාගාරය විවෘත කිරීමේදී එම ආදාහනාගාරය අත්හදා බැලීම සඳහා පාවිච්චි කර තිබෙන්නේ කිසිම කෙනෙකුගේ හවිහරණක් නැති මියගිය පුද්ගලයෙක් කියලා. ඒකේ සමරු සටහනේ මාතෘකාව ලෙස සඳහන් වෙලා තිබෙනවා, "නාඳුනන උදව්කරුවකුගේ සොහොන් කොත" කියලා. එහි තවදුරටත් සඳහන් වෙනවා, "කළුතර නගර සභාව විසින් ඉදිකරන ලද ආදාහනාගාරයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා නාගොඩ රෝහලේ අනුග්‍රහය මත ලබා ගත් නාඳුනන මළසිරුර ආගමික වතාවත් පවත්වා 2001.12.15වන දින ආදාහනාගාරයේදී ආදාහනය කරන ලද අතර, ඒ තුළින් ආදාහනාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කෙරෙන බව සාක්ෂාත් කර ගන්නා ලද අතර, කළුතර නගරයේ ජනතාව වෙනුවෙන් එකී උදව්ව ඉටු කළ ඒ නාඳුනන උදව්කරු සිහිපත් කරමින් එම තැනැත්තාගේ භෂ්මාවශේෂ තැන්පත් කර මේ සොහොන් කොත පිහිටුවන ලදී" කියලා. සමාජයේ මෙවැනි කිසිම හවිහරණක් නැති විශාල පිරිසක් ජීවත් වෙනවා. අපේ රජයේ වගකීම, අපේ ආණ්ඩුවේ වගකීම වෙන්නේ හවිහරණක් නැති සමාජයේ වැඩිහිටිභාවයට පත් වී සිටින මෙවැනි සියලුදෙනා වෙත රැකවරණය ලබා දීමයි. ඔවුන්ගේ ජීවිත සතුටින් තියන එක, අවසාන කාලයේ ඔවුන්ගේ ජීවිත ලස්සන කරන එක තමයි අපේ කාර්යභාරය බවට පත් වී තිබෙන්නේ.

අපේ වැඩිහිටියන්ට අද රෝහලට ගියාට පස්සේ බෙහෙත් ටික ගන්න නිසි වැඩ පිළිවෙළක් නැහැ, ඔවුන්ගේ අසරණභාවය නිසා. ඒ වාගේම බැංකුවට ගියාම තමන්ගේ මුදල් ටික ගන්න, මුදල් තැන්පත් කරන්න බැංකුවෙන් වැඩ පිළිවෙළක් නැහැ. තමන්ගේ යම් කාර්යයක් ඉෂ්ට කර ගැනීමට රාජ්‍ය ආයතනයකට ගියාට පස්සේ ඒ කාර්යය ඉෂ්ට කර ගන්න මඟ පෙන්වන්න කෙනෙකු නැහැ. බස් රථයකට නැග්ගත් එහෙමයි. ආපන ශාලාවකට ගියත් වැඩිහිටියන් වෙනුවෙන් විශේෂයෙන් වෙන් කළ ස්ථාන, විශේෂ සැලකිලි අපේ සමාජයේ නිර්මාණය කර නැහැ. එහෙම නම්, වැඩිහිටි ජනතාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරලා, ඔවුන්ගේ ජීවිත රැක බලා ගන්න සමාජයක් ලෙස, රටක් ලෙස අපට වගකීමක් තිබෙනවා.

අපේ සමාජයේ ආබාධිත පුද්ගලයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. මානසික ආතතියට ලක් වෙච්ච විශාල පිරිසක් ඉන්නවා. මේ සියලුදෙනා වෙත අපේ අවධානය යොමු කළ යුතුයි. ඔවුන්ගේ ජීවිත වෙනස් කරලා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගොඩ නැඟීම වෙනුවෙන් මේ සමාජය තුළ එම වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරලා, ඔවුන්ගේ ජීවිත ලස්සන කරන එක තමයි අපේ බලාපොරොත්තුව බවට පත් වෙන්නේ කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.10]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දයාසිරි ජයසේකර මැතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවට ආවා. සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවත් මම අහගෙන හිටියා. එහිදී යම් යම් චෝදනා එල්ල වුණා. ඒ වාගේම මම සුගත් වසන්ත මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඔබතුමාව අවභාවිත කරන්න දෙන්නත් එපා කියලා. පෙරේදාත් ගිහිල්ලා මම එතුමා එක්ක පෞද්ගලිකව කථා කළා. සමාජ මාධ්‍යයේ මාලිමාවේ pagesවල තිබෙනවා, එතුමාගේ photo එකයි, මගේ photo එකයි දාලා, "ඩී.වී. චානක මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී සුගත් මන්ත්‍රීවරයාට වාහනයක් ලබා දීමට විරුද්ධ වෙයි" කියලා. එතුමාට වාහනයක් දීපු එක වැරදියිද? මම එහෙම කිසිම දෙයක් කියලා නැහැ. අද තමයි මම ඒ මන්ත්‍රීතුමාගේ නම පාර්ලිමේන්තුවේ කිව්වෙත්. ඒ වාගේම එළියෙදි මම එතුමා ගැන කථා කරලාත් නැහැ. ඒ නිසා සමාජ මාධ්‍ය තුළ ඔබතුමාව අවභාවිත කරන්න දෙන්න එපා. මේක මාලිමාව කරපු හොඳ වැඩවලින් එකක්. මම විශ්වාස කරනවා, අපේ රටේ සාධාරණ නියෝජනයක් එතුමාටත් ලැබිය යුතුයි කියලා. ඒ වාගේම අපේ රටේ සිටින සියලු ආබාධිත ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටින්න එතුමාට ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරන ගමන් අපේ පූර්ණ සහයෝගය එතුමාට අනිවාර්යයෙන්ම ලබා දෙනවා.

අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. මම වසන්ත සමරසිංහ ඇමතිතුමාට පෞද්ගලිකවත් මේ ගැන කිව්වා. බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් විවාදය පැවැත් වූ අවස්ථාවේ අපි ප්‍රශ්න රාශියක් ඇමතිතුමාට ඉදිරිපත් කළා. හැබැයි, එතුමාට පිළිතුරු කථාවට තිබුණේ විනාඩි 10යි. අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමාටත් විනාඩි 25ක් තිබුණා. නියෝජ්‍ය ඇමති කෙනෙකුටත් විනාඩි 20ක්, විනාඩි 25ක් තිබුණා. වසන්ත සමරසිංහ ඇමතිතුමා දක්ෂ කථිකයෙක්. හැබැයි, අදාළ ඇමතිතුමාට උත්තර දෙන්න වෙලාවක් නැහැ. එතුමා කියන දේවල්වලට අපට ප්‍රතිප්‍රශ්න අහන්නත් වෙලාවක් නැහැ. එහෙම කරන්න එපා. අපිට තුන්දෙනෙක් ඉන්න නිසා විනාඩි 12යි තිබෙන්නේ. ඕනෑ නම් අපේ කාලය හරි දෙන්නම්, අදාළ අමාත්‍යාවරයාට අපි අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න. එහෙම නැත්නම්, අනෙක් දවස්වලටත් අපට විදුලි බලය ගැන කථා කරන්න වෙනවා.

ඒ වාගේම අමාත්‍යතුමා කියනවා අපි දැක්කා, "වන්දිකා වැවේ floating solar project එක, ඒ වාගේම කිරිඉබ්බන් ආර floating solar project එක 2025දී ආරම්භ කළා" කියලා. අනේ, ඒවා commission කරලාත් ඉවරයි. 2024දී ආරම්භ කරලා commission කරලා දැන් වැඩත් කරගෙන යනවා. ඒකෙන් දැන්

[ගරු ඩී.වී. චානක මහතා]

විදුලියත් උපදවනවා. ගිය ආණ්ඩුව කාලයේ අයිවීඑන් නාළිකාවේ දවස ගණනේ ඒ ගැන පෙන්වුවා. එහෙම එකේ ඔබතුමන්ලා කියනවා, "අපි පටන් ගත්තේ" කියලා. ඒ වාගේම, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ CPC එකට අයිති ටැංකි 24 ගැනත් කියනවා අපි දැක්කා. ඒවා සංවර්ධනය කිරීමේ වැඩ ආරම්භ කරලා, දැන් ටැංකි දෙකක වැඩත් ඉවරයි. ටැංකි පහකට මුදල් වෙන් කරලාත් ඉවරයි. හැබැයි ඇමතිතුමා ඊයේ කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා කැබිනට් පත්‍රිකාවක් දමනවා, ඒවා සංවර්ධනය කරන්න කියලා. ඒ නිසා මාධ්‍ය සන්දර්ශන කරන්න කැබිනට් මණ්ඩලය අවභාවිත කරන්න එපා කියලාත් අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටින්න මම කැමැතියි.

හෙට පාර්ලිමේන්තුවේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙනවා. හැබැයි නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා අද පැහැදිලි කිරීමක් කළා, වෛද්‍යවරුන්ගේ වැටුප් වැඩිවීම පිළිබඳව. ඒ වාගේම වෛද්‍යවරුන්ගෙන් ඉල්ලීමක් කළා, වැටුප් වැඩිවීමක් වෙනවා නම් ඇයි ඒකට විරුද්ධ, ඇයි මෙහෙම strike කරන්නේ, ඒ දේ කරන්න එපා කියලා. හැබැයි, අපි හැමදාම ඉන්නේ ජනතාවගේ පැත්තේ. අපි විපක්ෂය වශයෙන් කිසිම strike එකකට සහයෝගය ලබා දෙන්නේ නැහැ. එදා තෙල් පිරවුම්හල් හිමියන් strike කරපු වෙලාවේත් මම පාර්ලිමේන්තුවේදී කථා කළේ, රටේ ජනතාවගේ පැත්තේ ඉඳගෙනයි. අද වෛද්‍යවරුන් strike කළත් ඒකෙන් ජනතාවට තමයි ප්‍රශ්නයක් වෙන්නේ; රෝගීන්ට තමයි ප්‍රශ්නයක් වෙන්නේ. හැබැයි ඔවුන්ගේ strike කිරීමේ අයිතියට බාධා කරන්නත් අපට බැහැ. ඒ නිසා අමාත්‍යවරයා ඇතුළු ආණ්ඩුව මැදිහත් වෙලා ඒ ප්‍රශ්න විසඳන්න ඕනෑ. ඒ වාගේම තමයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කොයිම වෙලාවකවත් කියලා නැහැ, වැටුප් වැඩි වෙලා නැහැ කියලා. එතුමන්ලා අප පක්ෂයේ සාමාජිකයිනුත් හමු වුණා. ඒ හමු වෙච්ච වෙලාවේත් එතුමන්ලා කථාව පටන් ගත්තේම, මූලික වැටුප - basic salary එක - වැඩි කළාට ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවාය කියලායි. එහෙම තමයි එතුමන්ලා කථාව පටන් ගත්තේ. එහෙම කථාව පටන් අරගෙන ඔවුන්ට වෙලා තිබෙන අසාධාරණයක් ගැන කිව්වා. මොකක්ද, ඒ අසාධාරණය? ඒක මුදල්මය වශයෙන් වෙච්ච අසාධාරණයක් නොවෙයි. පූර්ණ කාලීනව, අනාගතයටත් බලපාන වෛද්‍යවරුන්ගේ රැකියාවට අදාළ වැටුපේ structure එකේ ප්‍රශ්නයක් ගැනයි මේ කියන්නේ. වැටුප හඳන ක්‍රමවේදයක් තිබෙනවා. මම අහගෙන හිටියා ඊයේ වසන්ත සමරසිංහ ඇමතිතුමා කියනවා, ඉරිදා දවසක හෝ වෙනත් නිවාඩු දවසක වැඩ කළොත් 1/30ක් දෙන එක සාධාරණයි කියලා. ඔබතුමා ඒක කියද්දි මමත් ඉස්සරහ හිටියා. කොහොමද ඒක සාධාරණ වෙන්නේ? ලංකාවේ මොන රාජ්‍ය ආයතනයක වුණත්, යම් කෙනෙක් අමතරව වැඩ කරනවා නම් ඒක OT එකට සමානයිප නේ. නමුත් ඉරිදා දිනයේ වැඩ කරනවා නම්, එය වෙනස් වෙනවා. *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අහන ඔය ප්‍රශ්නයට මම පිළිතුරක් දෙන්නම්. සාමාන්‍යයෙන් මාසයක වැටුප කියන්නේ දින 30ක වැටුපකට. සාමාන්‍ය දිනක වැටුප සොයන්නේ 30න් බෙදලායි, ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි අපි 30න් බෙදලා තිබෙන්නේ.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු ඇමතිතුමනි, මම කියපු කාරණය තමයි, වැටුපෙන් 1/30ක් දුන්නොත් ඒක තවත් සාමාන්‍ය දවසක් වෙනවා කියන එක. මේක අමතර වැඩක්. තමන්ට අදාළ දවස් ටිකේත් වැඩ කරලා, ඉරිදා දවසේත් වැඩ කරනවා නම්, පෝය දවසේත් වැඩ කරනවා නම් ඒක වෙනස්. තමන්ගේ පවුලත් එක්ක, තමන්ගේ ළමයි එක්ක ඉන්න තිබෙන කාලය කැප කරලා, එහෙම නැත්නම් PP - private practise - කර ගන්න තිබෙන කාලය කැප කරලා තමයි ඒ විධියට නිවාඩු දිනයක වැඩ කරන්නේ. එතකොට ඒක තවත් සාමාන්‍ය දවසක් නොවෙයි. ඔබතුමා ගිහිල්ලා පෙට්‍රෝලියම් එකේ සේවකයන්ගෙන් අහන්නකෝ. මමත් හිටියා, පෙට්‍රෝලියම් එකේ. සාමාන්‍යයෙන් පෙට්‍රෝලියම් එකේ ඉරිදා වැඩ කරනවා නම් සියයට 150ක් ගෙවනවා. මේ අතිකාල නොවෙයි. අතිකාල දෙන්නේ නැහැ, ඉරිදා දවසට. අතිකාල කියන්නේ වෙන කථාවක්, ඒක 1/80; ඒක නොවෙයි මේ. මම ඒකට එන්නම්. 1/30 කියනකොට සාමාන්‍ය දවසක වැටුප දෙන්නේ. හැබැයි, මෙතැනදි ඒක අසාධාරණයි. අසාධාරණ වෙන්න හේතුව මෙයයි.

ඕනෑම කෙනෙකු තමන්ගේ නිවාඩු දිනය කැප කරලා වැඩ කරනවා නම් ඕනෑම ආයතනයක් සාමාන්‍ය දිනක ගෙවන වැටුපට වඩා එදාට ගෙවනවා. පෙට්‍රෝලියම් එකේ සියයට 150ක් ගෙවනවා. සාමාන්‍ය දවසට 3,000 නම් ඉරිදාට 4,500ක් ගෙවනවා. ගිය සතියේ CPSTL එක ඉරිදා වැඩ කළා. එතකොට ගෙවන්න ඕනෑ සියයට 150ක්. අනෙක් රාජ්‍ය ආයතනවල රුපියල් 1,000ක් දවසකට ගෙවනවා නම් නිවාඩු දිනයකට රුපියල් 1,300ක් ගෙවනවා. මේක තමයි ඉරිදාට තිබෙන ක්‍රමවේදය; පෝය දවසට තිබෙන ක්‍රමවේදය. තමන්ගේ නිවාඩුව කැප කිරීම වෙනුවෙන් සාමාන්‍ය දවසකට වඩා value එකක් එදිනට ඉල්ලනවා. මේ ඒකයි ඉල්ලන්නේ.

වසන්ත සමරසිංහ ඇමතිතුමනි, එතුමන්ලා කියන්නේ නැහැ, අදම මැදිහත් වෙලා වැටුප් වැඩි කරන්න කියලා. එතුමන්ලා කියන්නේ අවුරුදු 2ක් ගියත් කමක් නැහැ, මේ වෙලාවේ මේ structure එක වෙනස් කරන්න එපා කියලායි. මොකද, එහෙම කළොත් ඒක සඳහටම පවතින නිසා. ඒ කියන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව අද තියෙයි, හෙට නැති වෙයි. *[බාධා කිරීමක්]* අවුරුදු 5ක් තියෙයි, එහෙම නැහැයි කියලා අපි කියන්නේ නැහැ. හැබැයි ඒක ඊළඟ ආණ්ඩුවටත් යනවා, තව අවුරුදු 50ක් ගියත් ඒ structure එක දිගටම තිබෙනවා. ඒක තමයි කියන්නේ මේ 1/20 තියන්න කියලා.

ඊළඟට කියනවා, 1/80 ගැන. 1980 ඉඳලාම මේ 1/80 තිබෙනවා. මේකට හේතුව විද්‍යාත්මක කරුණු. මේ, පුද්ගලයෙකුගේ මිනිස් පැයක වටිනාකම. වෛද්‍යවරයෙකුගේ මිනිස් පැයක වටිනාකමත් මේ විධියට ගණනය කරලා තිබෙනවා. සාමාන්‍ය සේවකයෙකුගේ මිනිස් පැය 4කට සමානයි, වෛද්‍යවරයෙකුගේ මිනිස් පැයක්. ඒක අනුව තමයි 1/80 තිබෙන්නේ. වැටුප් වැඩි වෙනකොට අමතර දීමනා වැඩි වෙනවා කියලා ඒක 1/120 කිරීම සාධාරණ නැහැ. ඒක permanently වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛද්‍යවරුන් කියන්නේ මේ රට දාලා යන්න ඕනෑ තරම් ඉඩ තිබෙන මිනිස්සු. මේ, රුපියල් ලක්ෂ 3ක, 4ක වැටුපකට ඉන්න ඕනෑ අය නොවෙයි. ලෝකයේ වෙනත් ඕනෑම රටකට ගියාම ඔවුන්ට රුපියල් ලක්ෂ 20ක්, 30ක් දෙනවා. රටේ ආර්ථික අර්බුදයක් තිබුණු වෙලාවේ වෛද්‍යවරුන් රාශියක් රට හැර ගියා. හැබැයි මේ මිනිස්සු ටික ගියේ නැහැ, රට වෙනුවෙන් හිටියා. එම නිසා ඒ මිනිස්සුන්ට මෙච්චර වැටුප් වැඩි වෙනවා, මෙච්චර වැටුප් වැඩි වෙනවා, ඒක අසාධාරණයි කියලා සමාජ මාධ්‍යවලින් මඩ ගහන එක වැරදියි. තමන් ලෙඩ වුණාම වෛද්‍යවරයෙක් ළඟට ගියාම ඒ වෛද්‍යවරයා දෙවියා වෙනවා. හැබැයි, ලෙඩේ හොඳ වෙච්ච දවසේ ඉඳලා වෛද්‍යවරයාට බණිනවා. මේක තමයි ඇත්ත. ඒක නිසා වෛද්‍යවරුන්ට මඩ

ගහන එක සම්පූර්ණයෙන් නවත්වන්න. ඔවුන්ට ඕනෑ වෙලාවක මේ රට දාලා යන්න පුළුවන්. එතැනට මේ රට ගෙනියන්න එපා කියලා අපි ඉල්ලීමක් කරන්න කැමැතියි. *[බාධා කිරීමක්]* ඔබතුමා ආණ්ඩු පක්ෂයෙන් වෙලාව ගන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ඉරිදා දවසක් හෝ නිවාඩු දවසක් වැඩ කළාම වෛද්‍යවරුන්ට හම්බ වෙනවා 1/30ක ප්‍රමාණය. ඒක හරි, basic salary එක 30ට බෙදලා, 1/30ක් හම්බ වෙනවා. ඊට අමතරව පැය 6යි එදාට වැඩ. ඊට අමතරව තව පැය 4ක overtime payment එකකුත් හම්බ වෙනවා. ඒ කථාව කියන්නේ නැහැ නේ ඔබතුමා. ඒකයි මම කියන්නේ, ඒ කථාවත් කියන්න.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකයි මම කිව්වේ, මේ කථා දෙකක්. ඒක තමයි 1/80. සාමාන්‍ය දවසටත් වෛද්‍යවරයෙක් වැඩ කරන්නේ පැය 6යි. ඔහුගේ basic salary එකට ඇතුළත් වන්නේ දවසකට පැය හයයි. හැබැයි, වෛද්‍යවරයෙක් ඇත්තටම දවසකට පැය 12ක්, 13ක් වැඩ කරනවා. *[බාධා කිරීමක්]* ඉන්න, ගරු ඇමතිතුමනි, මම ඒ ගැන කියන්නම්. වෛද්‍යවරයෙක් දවසකට පැය 12ක්, 13ක් වැඩ කරනවා. ඒ වෛද්‍යවරුන්ට අතිරේක වැඩ සඳහා ගෙවීම cap කරලා තිබෙනවා, දවසකට අතිරේක වැඩ සඳහා ගෙවන්නේ පැය හතරයි කියලා. අපේ දිස්ත්‍රික්කයේ වෛද්‍යවරු වැඩ කරන හැටි මම දන්නවා. අපේ දිස්ත්‍රික්කයේ වෛද්‍යවරු රජයෙන් බෙහෙත් දුන්නේ නැත්නම් පෞද්ගලික අංශයෙන් හරි බෙහෙත් ටිකත් හොයා ගන්නවා. Procurement කරන්නේත් ඒගොල්ලන්; අලුතින් එන වෛද්‍යවරුන් train කරන්නේත් ඒගොල්ලන්; අලුතින් nursesලා ආවත් train කරන්නේත් ඒගොල්ලන්. ඔවුන් අමතර වැඩ රාශියක් කරනවා. මේ ආණ්ඩුව විතරක් නොවෙයි, පසුගිය ආණ්ඩුවත් පැය හතරක් වෙනුවෙන් තමයි අතිරේක වැඩ සඳහා ගෙව්වේ. මේක තමයි ඇත්ත. මේ මිනිස්සු මේ රටින් යවන්න එපා. සමාජ මාධ්‍ය හරහා, පාර්ලිමේන්තුව හරහා ඒ අයට චෝදනා කරන එක නවත්වන්න.

මේ අවස්ථාවේදී මම ධීවර ක්ෂේත්‍රය ගැනත් කථා කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ නියෝජ්‍ය ඇමතිතුමා දීර්ඝ කථාවක් කරනවා අපි දැක්කා. එතුමා කියපු ඒ වැඩ ටික වෙනවා නම් අතිවිශිෂ්ටයි. කියන්න දෙයක් නැහැ. එතුමාගේ ඒ ප්‍රකාශය තුළ ඒ කියපු වැඩ ටික කෙරෙනවා නම් අතිවිශිෂ්ටයි. අපි අවුරුද්දක් ඒ දෙස බලාගෙන ඉන්නවා. හැබැයි, ඒක ධීවර සහනාධාරය වාගේ නම් කරන්න එපා. අද රටේ ධීවරයා හිතනවා, ඔබතුමන්ලා ඒ අය රැවැට්ටුවා කියලා, වසන්ත සමරසිංහ ඇමතිතුමනි. මොකද, මැතිවරණයෙන් පස්සේ ධීවර සහනාධාරය දීලා නැහැ. ඩීසල් ලීටරයකට රුපියල් 25ක සහනාධාරයක් දෙනවාය කිව්වා. හැබැයි, නොවැම්බර් මාසය දක්වා දුන්නා. දැන් මාර්තු මාසය ආරම්භ වෙලා තිබෙනවා. ඒ මාස ටිකේ නම් මේ සහනාධාරය දීලා නැහැ. රවට්ටන්න හොඳ මිනිස්සු නොවෙයි, ධීවරයෝ. ඒක නිසා මේ ධීවර සහනාධාරය ලබා දෙන්න කටයුතු කරන්න. අපි දැක්කා, අය වැයෙන් මුදල් ඒ වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. වෙලාවට ඒ සහනාධාරය දෙන්න, ඇමතිතුමා. මැතිවරණ කාලයේ ඒ සහනාධාරය දුන්නේ වෙලාවට නේ. ඔක්තෝබර් මාසයේ ටික මැතිවරණ කාලයේ වෙලාවට දුන්නා. නොවැම්බර් මාසයේ ටික මැතිවරණය වෙලාවේ වෙලාවට දුන්නා. මාස තුන, හතර ඒ ධීවර සහනාධාරය පහු කරන්න එපා. මොකද, සමහර බෝට්ටු ඒ වෙනකොට 20 වතාවක්, 30 වතාවක් මුහුදු ගිහිල්ලා ඉවරයි. මම වගකීමෙන් යුතුවයි මේ කාරණය කියන්නේ. මොකද, මම කුඩාවැල්ලේ ඉඳන් කිරින්ද දක්වා දිගටම තිබෙන ධීවර වරායන්වල සිටින ධීවරයින්ගෙන් අහලා බැලුවා, ඒ අයට සහනාධාරය ලැබුණාද කියලා. අද උදේ මම දැක්කා දිලිප් වෙදආරච්චි හිටපු ඇමතිතුමා එතුමාගේ බෝට්ටු තුනටත් ඒ සහනාධාරය හම්බ වුණේ නැහැ කියනවා. ඒක නිසා මම ඉල්ලීමක් කරනවා, ධීවරයන් වෙනුවෙන් ඔබතුමන්ලා මේ ගෙනාපු යෝජනා ඉස්සරහට ගෙන යන්න කියලා. ගරු ඇමතිතුමනි, නියෝජ්‍ය ඇමතිතුමනි, අපි ඔබතුමන්ලාට සුබ පතනවා. ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළට අපේ උපරිම සහයෝගය ලබා දෙනවා. ඒ කියපු වැඩ පිළිවෙළ ඉස්සරහට කරගෙන යන්න කියලා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.22]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ සුගත් වසන්ත ද සිල්වා මැතිතුමා පිළිබඳව මම කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන් විශේෂයෙන් සමාජ මාධ්‍යයේත් ඒ වාගේම විවිධ මාධ්‍ය හරහාත් මට දෝෂාරෝපණය කරලා තිබුණා. සුගත් වසන්ත ද සිල්වා මැතිතුමා කියන්නේ මාත් එක්ක විශ්වවිද්‍යාලයේ එකට හිටපු සහෝදරයෙක්. ඒ වාගේම මාව අඩගහගෙන ගිහිල්ලා මගෙන් ගීත අහලා තිබෙන සහෝදරයෙක්, එතුමා. මම විශේෂයෙන් මේ කාරණය කියන්න කැමැතියි. විශේෂ අවශ්‍යතා සහිතව මේ රටේ ඉන්න ප්‍රජාවට කිසිදු ආකාරයේ අපහාසයක් හෝ උපහාසයක් කරන්න මගේ බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. මම කථා කළේ වෙන කාරණයක් හින්දා නොවෙයි. එතුමා දැනුත් මාත් එක්ක එකට ඉඳගෙන කෑම කාලා ආවේ. මම කිව්වේ වෙන කාරණයක් හිතලා නොවෙයි. එතුමා වාගේ අයවත් තල්ලු කරලා තිබෙනවා, මේ වෛරය වැපිරවීමේ ක්‍රියාවලියට. ඒකයි මට කියන්න වුවමනා වෙලා තිබුණේ. එහෙම නැතිව, වෙන කාරණයක් හින්දා නොවෙයි. එතුමාගෙනුත්, මේ රටේ විශේෂ අවශ්‍යතා සහිත සියලුම ආදරණීය සහෝදරයන්ගෙනුත් මම විශේෂයෙන් මේ අවස්ථාවේදී සමාව ඉල්ලනවා. මම හදවතක් තිබෙන කෙනෙක්. අපි කවදාවත් ඒ අයව තළා පෙළා අපහසුතාවට පත් වන ලෙස වැඩ කරන අය නොවෙයි. ඒ නිසා එම සියලුදෙනා වෙනුවෙන් වාගේම ගරු සුගත් වසන්ත ද සිල්වා මැතිතුමාගේ හිත රිදුණා නම් එතුමාගෙනුත් නැවතත් මම සමාව ඉල්ලනවා. මම එතුමා සමඟ මීට කලිනුත් මේ සම්බන්ධයෙන් කථා කළා. ඒ සියලුදෙනා වෙනුවෙන් මම සමාව ඉල්ලනවා. මේ ප්‍රශ්නයට අපේ විපක්ෂ නායකතුමා ඇදා ගැනීම නතර කරන්න කියලා මම කරුණාවෙන් ඒ අයට කියනවා. මොකද, විපක්ෂ නායකතුමා කියන්නේ අපේ නායකයා. විපක්ෂයේ සියලු පක්ෂ එකට එකමුතු වෙලා වැඩ කරන්නේ. විපක්ෂයේ, සන්ධානයේ සියලු පක්ෂවල අයට යම් අපහසුතාවක් සිද්ධ වුණා නම් ඒකටත් මම සමාව ඉල්ලනවා. එහෙම සමාව ගන්න තරම් මනුස්සකමක් සහ හැදියාවක් අපට තිබෙනවා. හැබැයි, 1988-89 කාලයේ මරලා දමපු මිනිසුන් වෙනුවෙන්, මැරිච්ච අය වෙනුවෙන් "Sorry!" කියලා විතරයි මම හිතන්නේ නායකයෙක් විධියට

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

කිව්වේ. අඩුම තරමින් එවැනි විනාශයක් කරපු එක සම්බන්ධයෙන් කථා කරන්නවත් ඒ අයට වුවමනාවක් නැහැ. නමුත් මේ සිදුවීම මගේ ජීවිතයට ඇති වුණු විශාල අපහසුතාවක් කියලා මම හිතනවා. ඒ නිසා මගේ අතින් සිදුවුණු ඒ වැරැද්දට නැවතත් සමාව ඉල්ලමින්, ඔබතුමා ලබා දුන් කාලයට ස්තූතිය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.24]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව විවාදය පවතින මේ වෙලාවේදී ඒ ගැන අදහස් ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. මම ධීවර ඇමතිතුමා ළඟ වාඩිවෙලා සිටියදී එතුමා කිව්වා, අද දවසේ වැඩිපුර මන්ත්‍රීවරු කථා කරන්නේ ධීවර අමාත්‍යාංශය ගැන කියලා. ඒ නිසා මම හිතුවා, ධීවර අමාත්‍යාංශය ගැන මට කථා කරන්න තිබෙන කරුණු ටික කථා කරලා ඊට පසුව අපේ රටේ විශේෂ අවධානයට ලක් වන, විශාල වැඩ කොටසක් ඉටු කරන ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවලින් විශේෂ ආයතනයක් වන දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඊට සම්බන්ධ නිලධාරීන් පිළිබඳවත් යම් කරුණු ප්‍රමාණයක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉදිරියට කරන්න යන වැඩ පිළිවෙළ මොකක්ද කියලා අපේ නියෝජ්‍ය ඇමතිතුමා කරුණු ඉදිරිපත් කළා. ඇමතිතුමා පිළිතුරු කථාවේදී මේ පිළිබඳව කථා කරයි. මොකද, අපේ රට වාගේ අට ගුණයක් විශාල මහ මුහුදක් රට වටේට තිබුණාට අපේ ඒක පුද්ගල මාළු පරිභෝජනය අඩු වෙලා තිබෙන්නේ. අපේ රටේ දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය වැඩි වෙන්න, ගර්භිණී මාතාවන්ට අඩු බර දරුවන් උපදින්න මේ අවශ්‍ය පෝෂණය නොලැබීම බලපානවා. රට වටේට මහ මුහුදක් තිබුණත් මාළු ටිකක් අල්ලලා දෙන්න බැරි රටක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා. අපේ ඉතිහාස කථාව කෙසේ වෙතත් වර්තමානය සහ අනාගතය වෙනස් කිරීම සඳහා වෙච්ච වැඩ පිළිවෙළක යන ගමන්, ජනතාවට අඩු මුදලට මාළු කෑල්ලක් කන්න දෙන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් සකස් කිරීම පිළිබඳව අපි සාකච්ඡා කරමින් සිටිනවා.

ධීවර සංස්ථාව විසින් සකස් කරන ලද මාළු සතොස වෙළෙඳ සැල් ජාලය හරහා විකිණීමට අපි යෝජනාවක් ඉදිරිපත් කළා. මේ වනවිට ධීවර සංස්ථාවත්, සතොස ආයතනයත් ඒකාබද්ධව මේ සාකච්ඡාව ඉදිරියට අරගෙන යනවා. ඒ නිසා අපි සතුටින් කියන්න ඕනෑ, ඉදිරි වසර තුන අවසන් වනකොට වෙළෙඳ සැල් 1,000ක් දක්වා අපේ වෙළෙඳ සැල් ජාලය පුළුල් කරන්න අපි කටයුතු කරමින් සිටින බව. මාළු කපන්න සිදු වන නිසා තමයි අපේ රටේ ගොඩක් අය මාළු අරගෙන යන්නේ නැත්තේ. මොකද, මාළු ග්‍රෑම් 250ක්, 500ක් සුද්ද කරන්න ගිහින් අතේ පයේ ගාගන්නවාට වඩා ලෙහෙසියි, සුද්ද කරලා පැකට් කරලා, freeze කරලා තිබුණා නම්. පැකට් එක කඩලා හට්ටියට දමලා, සුදු ලූනු ගෙඩියක් තළලා දාලා, කරපිංචා ටිකක්, මිරිස් කරලක් කපලා දාලා, තුනපහ ටික දාලා මාළු ටික ළිපේ තියා ගන්න තිබෙනවා නම් ලෙහෙසියි. ඒ නිසා සකස් කරන ලද මාළු විකිණීමේ වෙළෙඳ සැල් ආරම්භ කරන්න, එහෙම නැත්නම් අපේ සතොස outlets ඇතුළේ මෙහෙම ජාලයක් පටන් ගන්න අපි දැනටම කටයුතු කරමින් තිබෙනවා. අපේ රටේ ජනතාවට සාධාරණ මිලකට මාළු ලබා ගන්න පුළුවන් වටපිටාව හදන්න වාගේම ඔවුන්ට මේ පහසුකම ලබා දෙන්න සතොස හරහා කටයුතු කරන්න මැදිහත් වීම පිළිබඳව මම මේ වෙලාවේ ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන්ට ස්තූතිවන්ත වෙනවා.

මේ අමාත්‍යාංශ දෙක ගැන කරන සාකච්ඡාවේදී මම කියන්න කැමතියි, මේ කාරණයත්. විශේෂ ප්‍රශ්න ගණනාවකට මුහුණ දීපු අමාත්‍යාංශයක් යටතේ තිබෙන ආයතනයක් තමයි දැන් අස්වැසුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව. දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ කරන සේවකයන් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන ප්‍රශ්න පත්‍රයක් ඉතුරු කරලා තිබෙන්නේ. අපි දන්නවා, සමෘද්ධිය කියන්නේ දේශපාලන දරුවෙක් කියලා. හැබැයි, සමෘද්ධිය නමැති දේශපාලන දරුවාට උපත දෙන්නේ තවත් දේශපාලන දරුවෙකුගේ මළගම සමඟ. ඒ තමයි ජනසවිය. ඒ වෙලාවේත් ඒ ජනතාවගේ ඉතිරි කිරීම් තිබෙනවා කිව්වා, රුපියල් 25,000ක් පමණ පොත්වල. නමුත් ශත 25ක්වත් තිබුණේ නැහැ.

1995දී සමෘද්ධි ව්‍යාපාරය පටන් ගත්තා. 1995දී පටන් ගත් සමෘද්ධි ව්‍යාපාරය තමයි 2024 වෙනකොට අස්වැසුම වැඩසටහන බවට පත් වුණේ. මේ ව්‍යාපාරයත් එක්ක සමාජ සවිබලගැන්වීමේ දැවැන්ත ක්‍රියාවලියක් ගොඩනඟන්න ඉඩ තිබෙනවා. මොකද, අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 17ක් මේ ව්‍යාපාරය තුළට ඇතුළත් වෙලා තිබෙනවා.

අපි රටක් හැටියට වාර්ෂිකව සුබසාධන කටයුතු සඳහා බිලියන 200කට වැඩි මුදලක් වෙන් කරනවා. සමෘද්ධි ව්‍යාපාරය තුළ 23,000කට ආසන්න සේවක ප්‍රමාණයක් සිටියා. එම සේවකයන්ගේ කාර්යභාරය මේ රටේ සංවර්ධනයට දායක කර ගැනීම සඳහා අපේ අමාත්‍යාංශය පැත්තෙන් දැන් වැඩකටයුතු කරමින් සිටිනවා.

මට කියන්න වුවමනාව තිබෙන්නේ මේකයි. මේ කටයුත්ත අතරේ පසුගිය කාලයේ සිටි ඇමතිවරුන්ගේ මැදිහත්වීම මත, එම ඇමතිවරුන්ගේ වුවමනා මත සමහර තැන්වලදී ගත් තීන්දු තීරණ විසින් දිවිනැඟුම දෙපාර්තමේන්තුවේ වැඩ කර විශ්‍රාම ගිය සේවකයන්ට සහ වැඩ කරමින් ඉන්නා සේවකයන්ට බරපතළ ප්‍රශ්න ගණනාවක් ඉතුරු කරලායි තිබෙන්නේ. හිටපු ඇමතිවරයා එකක් කියා තිබෙනවා. නිලධාරීන්ගේ පැත්තෙන් සමහර කරුණු ඉදිරිපත් කරද්දී, ඇමතිවරුන්ගේ දේශපාලන බලපෑම් නිසා නිවැරදි කරුණු ඉදිරිපත් වුණාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ සේවකයන් - සමෘද්ධි කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් - අද වනවිට විශ්‍රාම ගිහිල්ලා තිබුණත් ඒ අයට මේ තිබෙන ප්‍රශ්න නිසා විශ්‍රාම වැටුප ගන්න බැරුව මාස 7ක්, 8ක් තිස්සේ රස්තියාදු වෙනවා. ඒ නිසා අමාත්‍යාංශය පැත්තෙන් ගරු ඇමතිතුමාත්, ඒ වාගේම එම වෘත්තීය සමිති නියෝජිතයෝත් මේ පිළිබඳව සාකච්ඡා කරලා විසඳුම් හොයන වැඩ පිළිවෙළට ඇවිල්ලා තිබෙනවා. ඉතින් මේ වැඩ පිළිවෙළට එනකොට අවස්ථාවෙන් අවස්ථාව තුළ මතු වෙලා තිබෙන ගැටලුව තමයි, මේ දේශපාලන මැදිහත්වීම් විසින් සමෘද්ධි ව්‍යාපාරය තුළ වැඩ කරපු සේවකයන්ට බරපතළ ප්‍රශ්න ප්‍රමාණයක් ඉතිරි කර තිබීම.

අපිට මතකයි, දිවිනැගුම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරද්දී, විනිශ්චයකාරවරුන් පවා එළවා තමයි එය ස්ථාපිත කරන්න කටයුතු කළේ. ඒ වෙලාවේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිටි සේවකයන්ට මේකට එකතු වෙන්න අවස්ථා - options - 4ක් දුන්නා. අවසානයේ 2කට එකඟ වුණා. ඒ නිසා සේවකයෝ විශාල පිරිසක් EPF, ETF අරගෙන දිවිනැගුම දෙපාර්තමේන්තුවේ සේවකයන් ලෙස එකතු වුණා. ඒ එකතු වුණු සේවකයෝ ඉන්නවා. ඒ වාගේම 3,000කට වැඩි පිරිසක් ඉන්නවා, EPF, ETF ගත්තේ නැතුව තවදුරටත්. ඒ අයට අඩුම ගණනේ පත්වීම් ලිපිය දීලාත් නැහැ. EPF, ETF කැපෙනවා. එතකොට මේ අයගේ විශ්‍රාම වැටුප මොකක්ද කියන කාරණය පිළිබඳවත් ප්‍රශ්නයක් දැන් මතු වෙලා තිබෙනවා. දැන් මේ සේවකයෝ ඉල්ලනවා, එහෙම නම් අඩුම තරමේ අපිට ආපසු 1997දී රස්සාව කරපු තැනට යන්න දෙන්න කියලා. මොකද, නැත්නම් ප්‍රශ්නයක් එනවා. මොකද, ඒ අය විශ්‍රාම යනකොට ප්‍රශ්නයක් ඉතුරු වෙලා තිබෙනවා. ඒ නිසා මෙන්න මේ ආකාරයට අපේ ඇමතිතුමාට ප්‍රශ්න පත්තරයක් අද වනවිට ඉතුරු කරලා තිබෙනවා, පසුගිය කාලයේ සිටි පාලකයන් විසින්. ඒ මොහොතේ විසඳිය යුතුව තිබුණු ප්‍රශ්න පත්තරයක් ඉතුරු කරලා තිබෙනවා. ඒ මොහොතේ විසඳිය යුතු ප්‍රශ්න ඒ කාලයේම විසඳන්නේ නැතුව දේශපාලන හිතුවක්කාරකම්, අත්තනෝමතිකකම් කර තිබෙනවා. සමෘද්ධි ව්‍යාපාරය තුළ සමහර අරමුදල් යටතේ තිබුණු බිලියන 30කට වැඩි ප්‍රමාණයක් තවම දීලා නැහැ. ඒවා විවිධ වැඩවලට අරගෙන. ඒ වාගේ වැඩ නිසා සමෘද්ධි ව්‍යාපාරයට සම්බන්ධ වෙලා හිටපු කළමනාකරුවන් සහ සේවකයන් අද ඉන්නේ ප්‍රශ්නයක.

ඒ විතරක් නොවෙයි. සමෘද්ධි බැංකු 1,100ක් තිබෙනවා. මේ 1,100ම තනි තනිව තිබෙන්නේ. ඒ බැංකුවල මුදල් තැන්පත් කළ තැන්පතුකරුවන්, ඒවා තුළ ක්‍රියාත්මක වුණු සමහර ව්‍යාපෘති, ඒ ව්‍යාපෘතිවලට මුදල් ලැබුණු ආකාරය පිළිබඳවත් බලන්න ඕනෑ. අද සමෘද්ධි බැංකුව පැත්තක තබා ගිණුම්වලට සල්ලි දමමින් තිබෙනවා. අපි ආණ්ඩුවක් විධියට කල්පනා කර තිබෙනවා, ඩිජිටල්කරණ ක්‍රියාවලිය හරහා මේ බැංකු පද්ධතියත් ජාලගත කරමින්, සමෘද්ධි ව්‍යාපාරය ශක්තිමත් කරමින් සමාජ සවිබලගැන්වීමේ ක්‍රියාවලියට එකතු කරන්න, මේ සේවක ප්‍රශ්නත් විසඳලා. මොකද, මේ සේවකයන්ගේ ප්‍රශ්න විසඳනකොට තමයි ඒ අයට සතුටින් වැඩ කරන්න පුළුවන් වන්නේ. ඒ අය පැත්තක තබා, මේ ව්‍යාපාරය තුළ අවුරුදු 25ක්, 30ක් වැඩ කරපු සේවකයෝ එළියට දමා මේක ඉස්සරහට ගෙන යන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න වුවමනා වුණේ මේකයි. 2023 ජූලි මාසයෙන් පසුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා ගැසට් එකක් නිකුත් කරනවා, මේ විශ්‍රාම යන අය කලින් EPF එකෙන් ගත් සියයට 60, එහෙම නැත්නම් රජයේ දායක මුදල් ආපසු ගෙවන්න කියන කාරණය සම්බන්ධයෙන්. දැන් මේ කාරණයත් එක්ක සේවකයෝ තවත් ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. මේ වෙනකොට ඇමතිතුමා කැබිනට් පත්‍රිකාවක් යොමු කර තිබෙනවා. ඒ වාගේම මේකට අදාළ අධිකරණ ක්‍රියාවලියක් තිබෙනවා. ඒක අධිකරණයෙන් බේරිලා එනකම් අපට ඉස්සරහට යන්න වෙනවා කියන කාරණය කියන්න ඕනෑ. මොකද, අධිකරණයක තිබෙන ප්‍රශ්නයකට අපට මැදිහත් වෙන්න බැහැ.

ඒ වාගේම 2,808ක පිරිසක් ඉන්නවා, මේ සියයට 60 පිළිබඳ කාරණය අදාළ වන. දිවිනැගුම දෙපාර්තමේන්තුව විශ්‍රාම යන්න ඉන්න සේවකයන්ගෙන් ඉල්ලීමක් කරනවා, ඔවුන් විශ්‍රාම යනකොට, තම වගකීම් නිදහස් කරලා, නිරවුල් කරලා ලිපි භාර දෙන්න ඕනෑ කියලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා.

ඒ ලිපි භාර දෙන්න යනකොට ඔන්න එවනවා දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන්, තමන් ගත්ත EPF එකෙන් සියයට 60 සිව කැමැත්තෙන් ආපසු ලබා දීමට කැමැතියි කියලා ලිපියක් දෙන්න කියලා. නැත්නම් විශ්‍රාමය නවත්වනවා. දැන් ප්‍රශ්න ගොඩක් ගොඩගැහිලා තිබෙනවා. දවස ගණනේ ගොඩගැහෙනවා. ගත්ත EPF එකෙන් සියයට 60ක් ස්ව කැමැත්තෙන් ආපහු රජයට ගෙවන්න කැමැතියි කියලා ලියුමක් ඉල්ලනවා. සේවකයෝ ප්‍රශ්න කරනවා, නීත්‍යානුකූලභාවය කොහේද කියලා. නීත්‍යානුකූලභාවයක් තිබෙනවා නම් නිශ්චිතව ලිපි ලේඛන යවන්න පුළුවන්. Letterhead එකක් නැහැ, වගකීමක් නැහැ, ස්ව කැමැත්තෙන් දෙන්න කියා ඉල්ලන එක ඇතුළේ අද සේවකයන් ප්‍රශ්නයකට ඇද දමා තිබෙනවා.

මේකට අදාළව අද වන විට ඇමතිතුමා Cabinet Paper එකක් ඉදිරිපත් කරලා තිබෙනවා. මොකද, සේවකයන්ගේ මේ ගැටලුව බේරලා දෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය හැදුවේ 2023දී. 2023දී හදපු ප්‍රශ්නය තමයි, මේ විශ්‍රාම යන අයට කිව්වා, "2014 ඉඳන් තමයි ඔයගොල්ලන්ගේ පත්වීම තිබෙන්නේ. ඒ නිසා 2014 ඉඳන් ආපහු අලුත් සේවකයෙක් විධියට, එහෙම නැත්නම් එදා ඉඳන් වැටුප හදලා තමයි ඔයගොල්ලන්ගේ විශ්‍රාම වැටුප හදන්න වෙන්නේ" කියලා. ඒ කියන්නේ, අවුරුදු 11කට. අවුරුදු 19ක් විතර නැති වෙලා. එහෙම යන්න බැහැ. ඒ නිසා ප්‍රශ්න පත්‍රයක් ඉතිරි කරලා තිබෙනවා මේ ව්‍යාපාරය ඇතුළේ. මේක වහාම විසඳිය යුතු කරුණක් හැටියට අපි දකිනවා. ඒ වෙනුවෙන් ඇමතිතුමාත්, ඒ සේවකයනුත්, කළමනාකරුවනුත් මේ ප්‍රශ්නයත් එක්ක පොර බදනවා. මොකද, ලොකු මානව සම්පතක් මෙතැන තිබෙනවා. සමාජ සවිබලගැන්වීමේ ක්‍රියාවලියට මේගොල්ලන් එකතු කරගන්න ඕනෑ.

ඒ අයගේ ඉල්ලීම් හැටියට තිබෙන්නේ මොනවාද? EPF එකෙන් සියයට 40කට සේවකයා දායක වුණා. ඉතිරි සියයට 60ට තමයි රජය දායක වුණේ. රජයේ දායක මුදල ගෙවන්න කියලා තමයි දැන් යෝජනාව තිබෙන්නේ. එහෙම ගෙවන්න ඕනෑ නම් ඒගොල්ලන් එකඟයි. ඒගොල්ලන් කියන්නේ, W&OP එක කපා ගන්න, ඒක තියාගෙන ඉතිරි එක දෙන්න කියලා. ඒ වාගේම ඒගොල්ලන් කියනවා, විශ්‍රාම යන සේවකයාට විශ්‍රාම යන්න දෙන්න කියලා. විශ්‍රාම ගිය අයගේ වැටුප මාස 7, 8 නවත්වලායි තිබෙන්නේ. මහා උභතෝකෝටික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන මේ ප්‍රශ්නය විසඳන්න තමයි අපට දැන් කටයුතු කරන්න වෙලා තිබෙන්නේ.

අපි පත්වෙලා දැන් මාස 3යි. මාස 8ක්, 10ක් කලින් විශ්‍රාම ගිය සේවකයෝ ඉන්නවා. ඒ නිසා මේ හදපු ප්‍රශ්න පත්තරය විසඳීම තමයි අද ගරු ඇමතිතුමාට සමාජ සවිබලගැන්වීමේ ක්‍රියාවලිය තුළ තිබෙන ලොකුම අභියෝගය බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ඒ සේවකයන්ටත්, මේ ව්‍යාපාරයට සම්බන්ධ ජනතාවටත් - ඒ සියලුදෙනාට - අපි බලාපොරොත්තු හදලා තිබෙනවා, සමාජ සවිබලගැන්වීමේ ක්‍රියාවලිය හරහා අස්වැසුමට තව පිරිස් එකතු වෙනවා වාගේම ඒ එකතු කර ගැනීමේ තිබෙන නිර්ණායකවල ගැටලු විසඳලා ඉදිරියට සමෘද්ධි බැංකු පද්ධතියත්, ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට අවශ්‍ය කරන බැංකු පද්ධතියත් සංවර්ධනය කරලා, ඩිජිටල්කරණ ක්‍රියාවලියට මෙය එකතු කරලා, හැමෝගේම ප්‍රශ්න විසඳලා දෙන බවට. ඒ සඳහා මැදිහත් වෙන්න තමයි අමාත්‍යාංශයත්, ගරු ඇමතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයත් මේ දවස්වල කල්පනා කරමින්, ඒ ගැන කටයුතු කරමින් ඉන්නේ.

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා මේ වෙලාවේ අද ඒ සේවකයන් බලාගෙන ඉන්නවා, මොකක්ද සිද්ධ වෙන්නේ කියලා. සමහරු කියනවා, සමෘද්ධිය ඉවර කරන්නයි යන්නේ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 2ක් දෙන්න.

සමාජ සවිබලගැන්වීමක් අපේ රටේ තිබෙන්න ඕනෑ. මොකද, පවුල් ලක්ෂ 17ක් දැන් ප්‍රතිලාභ ලබනවා. සමාජ සවිබලගැන්වීමේ ක්‍රියාවලිය පුහුණු වෙච්ච අය තමයි සමෘද්ධි ව්‍යාපාරයේ වැඩ කරන්නේ. ඒ නිසා ඒ අයත්, බැංකු පද්ධතියත් එකතු කරලා ඉදිරියට සමාජ සවිබලගැන්වීමේ ක්‍රියාවලිය ශක්තිමත්ව ඉස්සරහට ගෙනයන්න රජයක් හැටියට අපි කටයුතු කරනවා.

ප්‍රශ්න වැලක පටලවා තිබෙනවා, මේ අමාත්‍යාංශයත්, මේ ව්‍යාපාරයත්. ඒ නිසා අපේ වගකීම බවට අපි අද පත් කරගෙන තිබෙනවා මේ මතුවෙලා තිබෙන ප්‍රශ්න විසඳීම. ඒ සේවකයන්ට අපි දැනුම් දීලා තිබෙනවා. ඇමතිතුමා ඒ අයත් එක්ක මේ ගැන සාකච්ඡා කරලා කරුණු කියලා තිබෙනවා. මේ මතු වෙලා තිබෙන ප්‍රශ්නය විසඳන්න අපි මැදිහත් වෙනවා.

ප්‍රශ්න එකක් නොවෙයි තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අලුත් appointments දෙන්න තිබෙන අය 8,374ක් ඉන්නවා. මේ අය 2017දී අලුත් appointments ලැබූ අය. ඒගොල්ලන් විශ්‍රාම යනකොට මොකක්ද ලැබෙන්නේ? ඒ වාගේම EPF ගත්තේ නැති 3,000කට වඩා ඉන්නවා. ඒ අයට පත්වීම් ලිපි දෙන්න ඕනෑ. ඒ වාගේම EPF එක අරගෙන ගෙදර ගිහිල්ලා, එහෙම නැත්නම් EPF එක අරගෙන දෙපාර්තමේන්තුවට මාරු වෙච්ච සේවකයන් දැන් විශ්‍රාම ගිහිල්ලා, විශ්‍රාම වැටුප ගන්න 800ක් විතර ඉන්නවා. ඒ අයගේ ප්‍රශ්නය අපි විසඳන්න ඕනෑ. ඒ නිසා මේ සියලු ප්‍රශ්න විසඳීම සඳහා අපේ ඇමතිතුමා අදාළ ආයතනත් එක්ක, අදාළ පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලායි තිබෙන්නේ. ඒ සේවකයන් මේ මොහොතේ මුහුණ දෙමින් තිබෙන ගැටලු අතර විශේෂයෙන්ම සියයට 60 ආපසු අය කර ගැනීමේ ක්‍රියාවලියේදී සියයට 4ක අධිභාරයක් අය කිරීම සඳහා වෙච්ච යෝජනාවකුත් ඇවිල්ලා තිබෙනවා. ඒ සේවකයන් විශ්‍රාම ගිය කාලයක තමන්ගේ gratuity එක හැදුවාම අධිභාරය ගෙවන්න ඒ gratuity එකත් මදි. අධිභාරය ගෙවන්න සමහර විට gratuity එකට අතිනුත් දාන්න වෙනවා. එම නිසා ගරු ඇමතිතුමා ඒ කාරණය වෙනුවෙනුත් - එය සලකා බැලීම සඳහා - කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. දැනට උසාවියේ තිබෙන නඩුව අවසන් වුණාම ඉහත කී සියයට 60 ගෙවීම සම්බන්ධ ප්‍රශ්නය විසඳන්නේ කොහොමද කියන එකටත්, අධිභාරය ගෙවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමටත්, එහිදී පත්වීම් නොදුන් අයට පත්වීම් ලබා දීමටත්, විශ්‍රාම යන අයට ගැටලුවකින් තොරව විශ්‍රාම පාරිතෝෂිකය අරගෙන විශ්‍රාම යන්න පුළුවන් ආකාරයට මේ ප්‍රශ්න විසඳීමටත් අපි මැදිහත් වෙනවා. සමෘද්ධි ව්‍යාපාරය සමාජ සවිබලගැන්වීමේ ව්‍යාපාරයක් ලෙස ශක්තිමත් කරලා, එම බැංකු පද්ධතියත් අපේ රටේ ජනතාවට, විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට මූල්‍ය පහසුකම් සපයන කටයුතුවලට මැදිහත් වීම සඳහා හොඳ microfinance system එකක් ක්‍රියාත්මක කරන තැනට ගෙන යන්නත් අපි කටයුතු කරනවා. මේ ප්‍රශ්න පත්‍රයට මේ ව්‍යාපාරය ඇද දමපු අය අද ඒ ගැන වචනයක්වත් කථා නොකරන එක ගැනත් අපි කනගාටු වෙනවා.

ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු කියයි. මෙම ව්‍යාපාරයට සම්බන්ධ පාර්ශ්වයන්ට අපි කියනවා, අපේ මාලිමාවේ ආණ්ඩුව පොරොන්දු වූ විධියට මේ ගැටලු සියල්ල විසඳලා ඔබට සතුටින් රාජකාරි කරන්න පුළුවන් වටපිටාවක්, සමාජය සවිබලගැන්වීමට හැකි වන වටපිටාවක් නිර්මාණය කරනවා කියලා. එම කාරණය අවධාරණය කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.39]

ගරු බී. ආරියවංශ මහතා
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ සහ ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අද දවස පුරා ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු ඇමතිතුමන්ලා දීර්ඝ වශයෙන් කථා කළා; වාද විවාද කළා.

මම ග්‍රාමීය ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මේ රටට නිදහස ලැබුණු 1948 ඉඳලා පැවැති සෑම රජයකින්ම විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ දුප්පත්කම තුරන් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙන බව අපි දන්නවා. මුලදී ඒ වෙනුවෙන් ආහාර මුද්දර ලබා දුන්නා. එදා දුප්පත් ජනතාව සමුපකාරයට ගිහිල්ලා ආහාර මුද්දරය දීලා බඩු ටික අරගෙන ආවා. එලෙස රජය දුප්පත්කම තුරන් කිරීම සඳහා එදා ඒ කටයුත්ත කළා. ඊළඟට, "ජන සවිය" වැඩසටහන ක්‍රියාත්මක වුණා. ඉන් පසුව, "සමෘද්ධිය", "දිවිනැගුම" ආදී වැඩසටහන් ක්‍රියාත්මක වුණා. දැන් "අස්වැසුම" වැඩසටහන ක්‍රියාත්මක වෙනවා.

හිටපු මන්ත්‍රීතුමෙක් කිව්වා, කිලෝග්‍රෑම් 40ක ලුණු මීටියක් රුපියල් 90,000ක් වනවා කියලා. නමුත්, කිලෝග්‍රෑම් 50ක ලුණු මීටියක් මේ වෙද්දී රුපියල් 4,500කට අරගන්න පුළුවන්. ඒ හින්දා මේ විපක්ෂය කියන බොරු අවලාදවලට නොරැවටෙන ලෙස අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. අපි මේ රට ධීවර කර්මාන්තය හරහා සංවර්ධිත රටක් බවට පත් කරනවා.

මට මේ කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.44]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(මාණ්පුමිකු ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் 4 துறைகள் சம்பந்தமான விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. அந்த வகையில், முதலில்

கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சுத் தொடர்பாக எனது கருத்தை முன்வைக்கலாமென்று நினைக்கின்றேன். முதலாவது விடயமாக, இந்தக் கடற்றொழில் நீரியல் வளங்கள் சம்பந்தமாக மட்டக்களப்பு மாவட்டத்தில் ஏற்கெனவே தொடங்கப்பட்ட சில உற்பத்தி முயற்சிகள் விடுபட்டுக் கிடக்கின்ற நிலைமையை நான் இங்கு குறிப்பிட்டாக வேண்டும். கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சர் இந்த விடயத்தைக் கவனத்திற்கொள்வார் என்று நினைக்கின்றேன்.

அதுபோல், மட்டக்களப்பு, தர்மபுரம் கடற்கரை ஓரமாக இறால் குஞ்சுகளை உற்பத்தியாக்குகின்ற ஒரு நிலையம் அமைக்கப்பட்டுச் செயற்பட்டு வந்தது; தற்போது அது செயற்படாது பூச்சிய நிலையில் காணப்படுகின்றது. எனவே, இந்த இறால் உற்பத்தி நிலையத்தை மீளவும் ஆரம்பிப்பதற்குரிய நடவடிக்கையை எங்களுடைய கடற்றொழில் அமைச்சர் மேற்கொள்வார் என்று நான் நம்புகின்றேன். புதுக்குடியிருப்பு, கிரான் குளத்தை அண்டிய பிரதேசத்தில் மீன் குஞ்சுகளின் உற்பத்திக்காக உருவாக்கப்பட்ட நிலையமும் அவ்வாறே மூடப்பட்டு இயங்காத நிலையில் இருக்கிறது. இந்த நிலையத்தையும் இயங்கச் செய்வதற்குரிய நடவடிக்கையை மேற்கொள்ள வேண்டும் என்பதை உங்களின் கவனத்திற்குத் தருகின்றேன். அடுத்து, கல்லடிப் பிரதேசத்தில் 'ஐஸ்' உற்பத்தி செய்துகொண்டிருந்த மீன்பிடிக் கூட்டுத்தாபனத்திற்குரிய ஒரு கட்டிமும் அவ்வாறே பாழடைந்த நிலையில் காணப்படுகின்றது. அதனையும் இயங்கச் செய்ய வேண்டுமென்று மீனவ சமூகம் எங்களிடம் கோரிக்கை விடுத்திருக்கின்றது.

இதையும்விட, வாகரையில் வட்டவான் என்ற பிரதேசத்தில் இறால் வளர்ப்புத் திட்டம் ஒன்று நடைபெற்றுக் கொண்டிருக்கின்றது. அங்கு உள்ளூர் மீனவ சமூகத்தைச் சேர்ந்த 27 பேர் இறால் வளர்ப்பில் ஈடுபட்டு வருகின்றார்கள். ஆனால், அவர்களுக்குரிய அனுமதிப்பத்திரம் - licence - இன்னும் புதுப்பித்துக் கொடுக்கப்படவில்லை என்ற ஒரு குறைப்பாட்டை அவர்கள் சொல்லியிருக்கின்றார்கள். அதற்குரிய நடவடிக்கையையும் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அதேவேளை அந்தப் பிரதேசத்தில் கம்பனி ஒன்றினால் 100 ஏக்கர் வரையான இடப்பரப்பில் இறால் வளர்ப்பு மேற்கொள்ளப்படுகின்றது. அதற்கான அனுமதி வழங்கப்பட்டிருக்கின்றதா? என்பதையும் நீங்கள் பரிசீலனை செய்ய வேண்டும்.

அடுத்து, இன்னுமொரு விடயம் பற்றிச் சொல்ல வேண்டும். மீன்பிடித் துறையை விருத்தி செய்யக்கூடிய, அது சம்பந்தமான ஆழமான கல்வி அறிவைக் கொடுக்கக்கூடிய Ocean University of Sri Lanka நிறுவனத்தின் பிராந்திய வளாகமொன்று கல்லடி, நாவலடிப் பகுதியில் காணப்படுகின்றது. அதனை முறையாக இயங்கச் செய்வதன்மூலம், அதற்கு உயிரூட்டுவதன்மூலம் அங்கு மீன்பிடி துறையில் நவீன உத்திகளைக் கையாளலாம் என்பதையும் உங்களது கவனத்துக்குத் தருகின்றேன்.

இதைவிட இன்னுமொரு விடயத்தைச் சொல்லியாக வேண்டும். மட்டக்களப்பைப் பொறுத்தவரை கதிரவெளியிலிருந்து கல்லாறு வரையான கடற்கரைப் பகுதி மீன் பிடிப்பதற்கு மிகவும் வசதியானதாகக் காணப்படுகின்றது. எனவே, இந்தப் பிரதேசத்தில் மீன்பிடித் தொழிலை விருத்தி செய்யக்கூடிய விதத்தில் அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும். கடந்த காலத்தில் மீனவர்களுக்கு மீன்பிடி உபகரணங்கள் வழங்கியபோது பாரபட்சம் நடைபெற்றதாகக் கூறுகின்றார்கள். அரசியல் சார்புடையவர்களுக்கு மட்டுமே தோணிகள், வலைகள் மற்றும் ஏனைய மீன்பிடி உபகரணங்கள் கொடுக்கப்பட்டதாக ஒரு குற்றச்சாட்டு முன்வைக்கப்படுகின்றது. எனவே, மீன்பிடித் தொழிலில் ஈடுபடுகின்ற சகலருக்கும் பாரபட்சம் இல்லாமல் இந்த உபகரணங்களை வழங்குவதற்குரிய நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென்று அவர்கள் எங்களிடம் மிகவும் விநயமாகக் கேட்டிருந்தார்கள். இதனை ஒரு முன்மொழிவாக நான் உங்களுக்குத் தருகின்றேன்.

கதிரவெளி - வாகரையிலிருந்து, குறிப்பாக களுவன்கேணி, வாழைச்சேனை, கல்லடி, நாவலடி, களுதாவளை, கிரான் குளம், சவுக்கடி போன்ற பல கடற்கரைப் பிரதேசங்கள் மீன்பிடிப்பதற்கு மிகவும் வசதியானதாகக் காணப்படுகின்றன. இருந்தும் இந்த இடங்களில் இதுவரை மீன்பிடித் துறைமுகங்கள் அமைக்கப்படவில்லை. களுவன்கேணி விசாலமான கடற்பரப்பைக்கொண்ட பிரதேசமாகும். அங்கே மீன்பிடியை அதிகரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் மட்டக்களப்புக்கு வருகை தருவீர்களாகவிருந்தால், நிச்சயமாக நாங்கள் உங்களை அழைத்துச் சென்று அந்தப் பிரதேசங்களைக் காண்பிப்பதற்குத் தயாராக இருக்கிறோம் என்பதைக் கூறிக்கொள்ள விரும்புகிறேன்.

அடுத்து, சமூக வலுவூட்டல், சமூகப் பாதுகாப்பு சம்பந்தமான ஒரு விடயம் பற்றியும் குறிப்பிட வேண்டும். குறிப்பாக, கசிப்பு உற்பத்தி, கஞ்சா விநியோகம், போதைவஸ்துப் பாவனை போன்றவையே சமூக வலுவூட்டல், சமூகப் பாதுகாப்புக்கு அச்சுறுத்தலாகக் காணப்படுகின்ற விடயங்களாகும். நேற்றைய தினம் மட்டக்களப்பில் நடைபெற்ற வாள்வெட்டுச் சம்பவத்தில் ஒருவர் இறந்துள்ளார். ஆரையம்பதியிலும் அவ்வாறான ஒரு சம்பவம் நடைபெற்று இருக்கின்றது. ஆகவே, சமூகத்தைக் குழப்பும் விதத்தில் பல்வேறு செயற்பாடுகள் நடைபெறுகின்றன. கடந்த காலத்தில் 'ஆவா குழு' என ஒரு குழுவை உருவாக்கி, யாழ்ப்பாணத்தில் வாள்வெட்டுச் சம்பவங்கள் நடைபெற்றன. பின்னர் 'கிறீஸ்' மனிதனை உருவாக்கினார்கள். இப்பொழுதும் அந்த 'ஆவா குழு' இயங்குகின்றது. இதனை உருவாக்குபவர்கள் யாரென்பது ஓரளவு மக்களுக்குத் தெரியும்! இப்போது மட்டக்களப்பிலும் வாள்வெட்டுக் கலாசாரத்தை உருவாக்க முயற்சிக்கின்றனர். மாண்புமிகு ஜனாதிபதி அவர்களும் தனது உரையொன்றிலே இப்படியான சம்பவங்கள் இடம்பெறுவதற்கு வாய்ப்புகள் இருப்பதாகக் குறிப்பிட்டிருந்தார்; அது நடந்திருக்கின்றது. இந்த விடயங்களை முளையிலேயே கிள்ளியெறிய வேண்டும்.

இந்தச் சமூக விரோதச் செயற்பாடுகள் - வாள்வெட்டு, கஞ்சா கடத்தல், கசிப்பு உற்பத்தி போன்ற சட்டவிரோதச் செயற்பாடுகள் - அதிகளவில் நடைபெற்றாலும், இவற்றுக்கெதிரான பொலிஸாரின் அக்கறை மிகக் குறைவாகக் காணப்படுகின்றது. குறிப்பாக, கசிப்பு உற்பத்தியாளருக்குச் சார்பாக அவர்கள் செயற்படுகிறார்கள் என்ற குற்றச்சாட்டுக்களைக்கூட சிலர் சொல்கிறார்கள். ஆகவே, நாம் சமூகத்தை வலுவூட்ட வேண்டுமாகவிருந்தால், சமூகப் பாதுகாப்பை ஏற்படுத்த வேண்டுமாகவிருந்தால், தயவுசெய்து போதைவஸ்துப் பிரயோகம், சட்டவிரோதமான கசிப்பு உற்பத்தி போன்ற விடயங்களை உடனடியாக நிறுத்த வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
කරුණාකර තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

අවසාන වශයෙන් මා කියන්නට කැමති කරුණ නම්, අපි මේ ගෙනෙන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ඒ ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ අදහස් විමසා බලා, ඒ ජනතාවගේ අවශ්‍යතා හඳුනා ගෙන, ඒ අවශ්‍යතා ඉටු කරන ආකාරයට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නය කියා ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදයට ගැනෙන අමාත්‍යාංශ දෙක අතරින්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයට අදාළව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. ගරු විපක්ෂ නායකතුමා උදේ මේ විවාදයට එක්වෙමින් කිව්වා, ගරු ජනාධිපතිතුමා කිසිදු සංඛ්‍යාලේඛනයක්, දත්ත නැතිව තමයි අය වැය ඉදිරිපත් කළේ කියලා. ඒක එතුමා දිගින් දිගටම ප්‍රකාශ කළා. හැබැයි, මේ මොහොතේ තිබෙන හරි හෝ වැරදි නීත්‍යානුකූල දත්ත පද්ධතිය පදනම් කරගෙන තමයි අපේ රජය මේ අය වැය ඉදිරිපත් කරන්නේ. එතුමන්ලා අවුරුදු 76ක් මේ රට පාලනය කළා. නිල් පාටින් අවුරුදු තිස් ගණනකුත්, කොළ පාටින් අවුරුදු තිස් ගණනකුත්, -අවුරුදු 40කට ආසන්න ප්‍රමාණයක්- මේ රට පාලනය කළා. ඒගොල්ලන් හරි ලස්සන දත්ත පද්ධතියක් හදලා තිබුණා නම් අපට මේ දත්ත පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ආබාධිත ප්‍රජාව පිළිබඳව, වැඩිහිටියන් පිළිබඳව, දුප්පතුන් පිළිබඳව නිසි දත්ත පද්ධතියක් විද්‍යාත්මකව සකස් කරලා තිබුණා නම්, අපට එතැන් සිට සෑම වර්ෂයකම අවසානයේ ඒකේ update එකක් විතරයි කරන්න වෙන්නේ. ඒ නිසා එතුමා විපක්ෂයේ නායකතුමා වුණාට, ඒ අවබෝධය නැහැ. අපි බලයට ඇවිල්ලා මාස 3ක්, 4ක් විතර තමයි වෙන්නේ. ඒ කාලය තුළ මේ දේ කරන්න පුළුවන්කමක් නැහැ. එතුමා ඉතාම ද්වේෂසහගත ලෙස තමයි ඒ අදහස ඉදිරිපත් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි මේ ග්‍රාමීය දුප්පත්භාවය සහ නාගරික දුප්පත්භාවය තුරන් කිරීම පිළිබඳවත්, සමාජය සවිබලගැන්වීම පිළිබඳවත් වසර 76ක් තිස්සේ කථා කරනවා. 1947ට පෙර සහල් සලාකයක් ලබාදෙමින්, 1947ට පස්සේ ආහාර මුද්දරය ලබා දෙමින්, ඊට පස්සේ ජනසවිය සහනාධාරය, ඊට පස්සේ සමෘද්ධි සහනාධාරය, ඊටත් පස්සේ අස්වැසුම සහනාධාරය ලබා දෙමින් අපේ රට මේ දක්වා පැමිණියා. ඒ වාගේම එතුමා කිව්වා, මේ වැඩ පිළිවෙළ තුළ තිබෙන්නේ, තවදුරටත් දුප්පතුන්ට ආධාර මුදලක් ලබා දීම, සහනයක් ලබා දීම විතරයි, එතැනින් එහා යන වැඩ පිළිවෙළක්, දැක්මක් වර්තමාන රජයට නැහැ කියලා. නමුත් මේ වනවිට වර්තමාන රජය, ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් එකතු වෙලා සමාජයේ ජීවත්වන මේ ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩ සටහනක් 2025 - 2029 දක්වා හදලා පවුල් ලක්ෂ 20ක් සවිබලගැන්වීම වෙනුවෙන් ඒ අදාළ වැඩ පිළිවෙළ දියත් කරමින් තිබෙනවා. ඒ පිළිබඳ වක්‍රලේඛ නිකුත් කරමින්, අදාළ නිලධාරීන් දැනුවත් කරමින් ඉන්නවා. මේ වෙනකොටත් දිස්ත්‍රික්ක ගණනාවක සියලු සමෘද්ධි නිලධාරීන්, අදාළ නිලධාරි මහත්ම-මහත්මීන් දැනුවත් කරලා, ඒ ප්‍රජාව තෝරා ගන්නේ කොහොමද, පවුල් සංවර්ධන වැඩසටහන හදන්නේ කොහොමද ආදී වශයෙන් දැනුවත් කරමින් සිටිනවා. දැඟි දුප්පත්භාවය තුරන් කරලා ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් ශක්තිමත් පවුලක් ගොඩනඟන විධිය අපි සැලසුම් කරලා ක්‍රියාත්මක කරමින් යන වෙලාවක්, මේක.

අපි දැඟි දුප්පත්භාවය ගැන නිතර කථා කරනවා. ඒ පිළිබඳ බොහෝ සංඛ්‍යාලේඛන, දත්ත ඉදිරිපත් කරනවා, වැඩසටහන් ඉදිරිපත් කරනවා. හැබැයි, මේ ප්‍රශ්නය විසඳීම මේ කථා කරන තරම් ලේසි නැහැ. මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. වැඩිහිටි ප්‍රජාවට අපි උදව් කරන්න ඕනෑ, සහයෝගය දෙන්න ඕනෑ, ආරක්ෂාව දෙන්න ඕනෑ. අපේ රටේ වැඩිහිටි ප්‍රජාව මිලියන 2.7ක් පමණ ඉන්නවා. ආබාධිත ප්‍රජාව 1,160,000කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. අපේ රටේ අවිධිමත් සේවා නියුක්තිය මිලියන 2.7ක්. අපේ රටේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් 152,979ක් ඉන්නවා. මානසික සෞඛ්‍ය ආබාධ සහිත ප්‍රජාව ලක්ෂ අටක් ඉන්නවා. ඒ වාගේම බන්ධනාගාරගතව සිටින අයගේ පවුල් සවිබලගැන්විය යුතුව තිබෙනවා. එවැනි පවුල් 25,500ක් පමණ ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සියලු කාණ්ඩවල සමස්තය ගත්තොත් 7,539,000 ඉක්මවනවා. මේකට තවත් බොහෝ පිරිසක් එකතු විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. මේ සංඛ්‍යාලේඛන අපේ අමාත්‍යාංශය හරහා සහ විවිධ ක්ෂේත්‍රවලින් ලබා ගත්ත ඒවා. උදාහරණයක් ගත්තොත්, වැඩිහිටි ප්‍රජාව මිලියන 2.7 කියන එක රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවෙන් 2023දී ලබා ගත්ත දත්තයක්. ඒ ආයතනවල තිබෙන දත්ත එකතුව අනුව මේ ප්‍රජාව පිළිබඳව සැලකිලිමත් වෙලා ඒ සියලුදෙනා රැක බලා ගන්න, ඒ සියලුදෙනාගේ ජීවිත ගොඩ නඟන, ඒ සියලුදෙනා ආර්ථික වශයෙන් සවිබලගන්වන ක්‍රියාවලියක් අපට තිබෙනවා. ඒ තුළින් අපට පවුල් ලක්ෂ 20කට ආසන්න ප්‍රමාණයක් සවිබලගන්වන්න තිබෙනවා. 2000දී මිලියන 1.2කට ජන සවිය ලැබුණා, සමෘද්ධි සහනාධාරය ලැබුණා. 2010දී 1,570,000 ඉක්මවා ගිය පිරිසකට සමෘද්ධි සහනාධාරය ලැබුණා. 2024 වෙනකොට 1,790,000 කට ආසන්න වෙලා තිබෙනවා, ඒ ප්‍රමාණය. එන්න එන්න මේ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මාසයකට රුපියල් මිලියන 12,000ක් අස්වැසුම සඳහා වියදම් කරනවා. ඒ වාගේම, 800,000කට එහා ගිය අපේ වැඩිහිටි ජනගහනය වෙනුවෙන් අපි යම්කිසි සහනාධාරයක් දෙනවා. අපි රජයක් විධියට උසුලන්න බැරි විශාල ධනස්කන්ධයක් යොදවනවා දැඟි දුප්පත් පවුල්වල යැපීම සඳහා. ඒ නිසා අපි ඒ යැපුම් මානසිකත්වය ඉවත් කරලා ඒ පවුල් සවිබලගැන්වීමේ ක්‍රියාවලියකට වහාම යා යුතුව තිබෙනවා. ඒ සඳහා නව රජය විශාල වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත එපිට දුෂ්කර ගම්මානවල විශාල ආර්ථික මූලාශ්‍ර තිබෙනවා; ප්‍රභව තිබෙනවා. අතීතයේ ඒ ගම්වලට හරක් පැටව් බෙදා දුන්නා, එළු පැටව් බෙදා දුන්නා, කුකුළු පැටව් බෙදා දුන්නා, තහඩු දුන්නා, මාළු පැටව් දුන්නා. සමහර විට ඒක ඒ දේශපාලනඥයාගේ මැතිවරණ කැම්පේන් එකේ කොටසක්, නැත්නම් තමන්ගේ ආසනයේ ඡන්ද දායකයන් නඩත්තු කරන වැඩසටහනක් බවට පත් වෙලා තිබුණා දුප්පතුන්ට උදව්වූ කිරීම. නමුත් තවදුරටත් ඒ ක්‍රියාමාර්ග හරියන්නේ නැහැ. අපි හැමෝටම අතිවිශාල වගකීමක් තිබෙනවා, ඒ සෑම පුරවැසියකුටම ඔවුන්ගේ ශක්තියෙන්, හැකියාවෙන් නැඟී සිටලා ආර්ථික තත්ත්වය වර්ධනය කර ගන්න සහයෝගය ලබා දෙන්න, මහ පෙන්වන්න. අන්න ඒ සඳහා මේ වෙනකොට අපේ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල්ගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්තුමිය, අධ්‍යක්ෂතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ 25,140ක් ඉන්නවා. හැබැයි අපේ අමාත්‍යාංශයට සම්පූර්ණ සේවක අවශ්‍යතාව 28,771ක්. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 17,624ක් සහ සමෘද්ධි කළමනාකරුවන් 2,094ක් ඉන්නවා. මේ දේශපාලන අධිකාරිය මතත්, මේ ආණ්ඩුව මතත්, මේ සමස්ත රාජ්‍ය නිලධාරීන් මතත් පවුල් ලක්ෂ 20ක් සවිබලගැන්වීමේ වැඩසටහන, ඒ ක්‍රියාවලිය පැවරී තිබෙනවා. ඒක අතිශයින් විශාල, අමාරු, දුෂ්කර කර්තව්‍යයක්. ඒ කටයුත්ත ඉෂ්ට සිද්ධ කිරීම සඳහා ඒ ගම්බිම්වලට ගිහිල්ලා, ඒ පවුල් එක්ක කථා කරලා, ඒ ප්‍රදේශයේ තිබෙන ඒ ආර්ථික මූලාශ්‍ර පදනම් කරගෙන, ඒ පවුලට යම් ස්වයං රැකියාවක් කරන්න පුළුවන් ආර්ථික ක්‍රියාවලියක් හඳුන්වලා දෙන්න අපි සැලසුම් කරලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, තරුණ දරුවන් ඉන්නවා නම්, ඒ දරුවන්ගේ හැකියාව අනුව ඔවුන් රැකියාගත කිරීම තමයි මෙහි අරමුණ වෙන්නේ. අධ්‍යාපනික වශයෙන්, සමාජයීය වශයෙන්, සංස්කෘතිකමය වශයෙන් ඒ පවුල් ගොඩ නැඟීම තමයි අපේ අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා තවදුරටත් මේ අය වැය හුදෙක්ම පොතක ලියැවුණු, එහෙම නැත්නම් අමාත්‍යාංශයකට මුදල් වෙන් වෙන වැය ශීර්ෂයක් බවටම පත් නොවී මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කිරීම අපගේ වගකීම බවට පත් වෙලා තිබෙනවා.

අන්න ඒ වගකීම ඉෂ්ට කිරීම වෙනුවෙන් අපි කටයුතු කරනවා. මේ සමාජයේ සියලු ජනතාවගේ දුගී දුප්පත්කම සහ ඔවුන් විඳින දුක් පීඩා ඉතා ගැඹුරින් තේරුම් ගෙන, ඔවුන්ගේ සුබසිද්ධිය වෙනුවෙන් ඔවුන් සවිබල ගැන්වීම සඳහා අමාත්‍යාංශයක් විධියට අපි කටයුතු කරන්න සූදානම්.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා. ඔබතුමාට විනාඩි 21ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.02]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අද විවාදයට බඳුන් කරන ධීවර අමාත්‍යාංශය වාගේම අනෙක් අමාත්‍යාංශයත් අපට ඉතාම ළඟ අමාත්‍යාංශ. මම ඊයේ කිව්වා, ග්‍රාම නිලධාරි මහත්වරුන්ට අලුතින් පොඩි රාජකාරියක් භාර දෙන්න කියලා. ඒ භාර දෙන රාජකාරිය මේ අමාත්‍යාංශවල වැඩ කටයුතු කර ගන්නත් ඉතා වටිනවා කියලා මා හිතනවා.

මගේ කථාව ආරම්භ කිරීමට පෙර කිව යුතු තවත් කරුණක් තිබෙනවා. අපේ ගලප්පත්ති මන්ත්‍රීතුමා ගැන මට පුංචි කනගාටුවක් ඇති වුණා. එතුමා මගේ බොහොම හොඳ හිතවතෙක්. මට මතකයි, Sectoral Oversight Committeesවලදී අපි ධීවර අමාත්‍යාංශය ගැන බොහෝ දේවල් කථා කර තිබෙනවා. ගරු ගලප්පත්ති මැතිතුමනි, ඔබතුමා මට දකුණ ගැන බොහෝ දේවල් කියා දීලාත් තිබෙනවා. ඒ ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද ඔබතුමාට කථා කරන්න හම්බ වුණේ විනාඩි 5යි. ඒ ගැන මගේ හිතේ ලොකු කනගාටුවක් තිබෙනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මට විනාඩි 10ක් තිබුණා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
විනාඩි 10ක් තිබුණාද? *[බාධා කිරීමක්]* ඒක හරි. ඒ කියන්නේ ඔබතුමාට ලැබුණු වේලාව ඔබතුමා පරිත්‍යාග කරලා? ඔබතුමා කථා කරන්නේ නැද්ද, නැත්නම් ඔබතුමාට කථා කරන්න දෙන්නේ නැද්ද? නීතියක් දමලාද? නැත්නම් - *[බාධා කිරීමක්]* ඔබතුමා හිටපු ධීවර නියෝජ්‍ය අමාත්‍යවරයෙක්. ඒකයි මම කියන්නේ. ඒ ගැන මට පොඩි කනගාටුවක් තිබෙනවා. ඔබතුමා ජනතා විමුක්ති පෙරමුණේ පළමු මන්ත්‍රීතුමා. ඉදිරි කාලයේදී අපි වෙනම උපහාරයක් අපි හෝ ඔබතුමාට කරනවා, ඔබතුමාගේ දක්ෂතාව සහ නිහතමානිකමට. ජනතා විමුක්ති පෙරමුණ තුළ අද සිටින මන්ත්‍රීවරුන්ගේ කල්ක්‍රියාව දිහා බැලුවාම ඇත්තටම ඔබතුමා ශ්‍රේෂ්ඨයි. මොකද, අද කථා කරන දේවල් දිහා බලන්න. මම දැක්කා එක මන්ත්‍රීවරයෙක් කවියක් කිව්වා, මේ පාර්ලිමේන්තුවට ඔබින්නේ නැති. මම හිතනවා, සරම් කොටයක් ඇඳගෙන "ජහුටා" එකකට ගිහිල්ලා ඒ කවිය කිව්වා නම් හරි කියලා. ඒක මේ පාර්ලිමේන්තුවේ කියන්න ඕනෑ කවියක් නොවෙයි. ඒක කියන්න ඕනෑ අර වාගේ තැනක. ඒ වාගේ අයත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ අය අතර ඔබතුමා ශ්‍රේෂ්ඨයි කියන එක තමයි මම අදහස් කළේ.

අපි අස්වැසුම ප්‍රතිලාභ ක්‍රමයෙන්ම කථාව පටන් ගනිමු. රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමෘද්ධිය වෙනුවට අස්වැසුම ප්‍රතිලාභ ක්‍රමය ආරම්භ කළා. අස්වැසුම වැඩසටහන කරගෙන යනකොට පැහැදිලිව, යම් කිසි ක්‍රමයක් අනුව දත්ත පරිගණකගත කරලා, ඒ දත්ත මඟින් තමයි තෝරා ගැනීම් ටික කළේ. නමුත් එම තෝරා ගැනීම් වැරදියි කියන එක සමස්ත ශ්‍රී ලංකාවේ සියලුදෙනාම දැන ගත්තා. හැබැයි, ඒ තෝරා ගැනීම් ටික වෙනස් කරන්න ක්‍රමයක් නැහැ. මොකද, ඒකට system එකක් හදලා තිබෙනවා. ඒ system එකෙන් පිට යන්න බැහැ. ඒ system එකෙන් පිට යන්න බැරි නිසා ඒ තෝරා ගැනීම් වැරදියි කියා හැම දෙනාම හඳුනා ගෙන තිබෙනකොට තමයි, තමුන්නාන්සේලා මේ රට වෙනස් කරන්න ඕනෑ කියලා ආවේ. මේ රට ගැන අලුතින් හිතන්න ඕනෑ, රට වෙනස් කරන්න ඕනෑ, රටට, ජනතාවට වැඩියෙන් වැඩ කරන්න ඕනෑ කියලා ආපු තමුන්නාන්සේලාම, අර ක්‍රමය වැරදියි කියලා මෙතැන කියපු තමුන්නාන්සේලාම, තීන්දුවක් ගත්තා ඒකම කරනවා කියලා.

අද මොකද වෙලා තිබෙන්නේ? අද අස්වැසුමට මොකද වෙලා තිබෙන්නේ? දැන් අස්වැසුම ලැයිස්තු හදනකොට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ නිලධාරීන්ට බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

තිබෙනවා, මොනවාද ඒ නිර්ණායක කියන එක ගැන. තමුන්නාන්සේලා ඒ නිර්ණායක දීලා නැහැ. අයදුම් පත්‍ර දීලා තමුන්නාන්සේලා කියනවා, මෙන්න මේ මේ තොරතුරු සටහන් කරගන්න කියලා. ඒ තොරතුරු ආවාට පසු, ග්‍රාම නිලධාරිතුමා, සමෘද්ධි නිලධාරි සහ ගොවි නියාමකගෙන් සමන්විත පොඩි කමිටුවක් තමුන්නාන්සේලා හදලා තිබෙනවා. ඒ තුන්දෙනාගෙන් සමන්විත කමිටුව වාඩි වෙලා යම් ආකාරයක තෝරා ගැනීමක් කරලා, ඊට පසුව නැවත අර system එකට දමා තෝරා ගැනීම කරන්න කියලා උපදෙස් දීලා තිබෙනවා. දැන් මේක ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු නිලධාරි මහත්වරුන් නිකම් උඩ තට්ටුවකින් බිමට දැමීමා වාගේ වැඩක් වෙලා. ඒ අය කල්පනා කරනවා, නිර්ණායකයක් නැතුව මේ වැඩේ කරන්නේ කොහොමද කියලා.

දැන් සමෘද්ධිය නතර කරලා ඒක අස්වැසුම බවට පත් කරලා තිබෙනවා. සමෘද්ධිය දුන්න අයගෙන් භාගයක් තමයි අර system එක ඇතුළෙන් අස්වැසුම හැටියටත් ඇවිල්ලා තිබෙන්නේ. තවත් භාගයක් ඉන්නවා. ඒ භාගයට අස්වැසුම දෙන වැඩ පිළිවෙළ හදනකොට, ඒකට ක්‍රමයක් නැහැ. අස්වැසුම දැන් කවදාද දෙන්නේ? මාර්තු 31න් ඉස්සෙල්ලා ඒ ලැයිස්තු ටික හදලා ඉවර කරන්න කියලා තිබෙනවා. හැබැයි, ඒකට නිර්ණායකත් නැහැ, ක්‍රමයකුත් නැහැ.

මේ අපභ්‍රංශ වැඩ පිළිවෙළ නිසා ග්‍රාම නිලධාරින්ට මොකද වුණේ? ග්‍රාම නිලධාරින් කියන්නේ, කුඩාම ඒකකය පරිපාලනය කරන අය; ගමේ සියලු තොරතුරු දන්නා අය. දැන් සමහර ග්‍රාම නිලධාරීන් මේ සේවාවෙන් අයින් වෙලා. ඒගොල්ලන් ඒ සේවාව සපයන්නේ නැහැ. එතකොට ඔවුන් ඒ සේවාව සපයන්නේ නැතුව ගියාම, අස්වැසුම වැඩසටහනේ යෙදී සිටින කමිටුවේ තුන්දෙනාගෙන් එක්කෙනෙක් අයින් වුණාට පසු, ගම ගැන වැඩිපුරම දන්නා පුද්ගලයා අයින් වුණාට පසු ඒ තෝරා ගැනීම කරන්නේ කවුද? එහෙම නැත්නම් ඒ අවශ්‍ය ලකුණු ටික දමන්නේ කවුද? ඒ කරුණු ඒකරාශි කර ගන්නේ කවුද? මේක, රටේ බරපතළ ප්‍රශ්නයක්. මේ වෙනුවෙන් තමුන්නාන්සේලාට system එකක් හදා ගන්න බැරි නම්, අස්වැසුම වැඩසටහන තමුන්නාන්සේලාගේ දේශපාලන ව්‍යාපෘතියක් හැටියට සලකා පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් අස්වැසුම බෙදන්න යනවා නම්, තමුන්නාන්සේලා මහජනයාගේ මුදල් කාබාසිනියා කරන ආණ්ඩුවක් බවට ප්‍රථමයෙන්ම පත් වෙනවා, විශේෂයෙන්ම මේ කාලයේ. ඒ කාරණය තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ.

ජනතාවගේ සල්ලිවලින් තමුන්නාන්සේලා සෙල්ලම් කරන්නයි හදන්නේ. තමුන්නාන්සේලාගේ බඩ ගෝස්තරවාදී දේශපාලනය තමයි මේ තුළින් පෙන්වන්නේ. කරුණාකර මේක නවත්වන්න කියලා අපි ඉල්ලනවා. ඒ නිසා මේ සඳහා system එකක් හදන්න. අස්වැසුම හම්බ වෙන්න ඕනෑ කෙනාටම ඒක දෙන්න. හැබැයි, මේ සහනාධාරය දෙන්න එපා, නිකම් ගෙදර කෑමට බඩු ටිකක් අරගෙන යන්න කියලා. අඩු ගණනේ සමෘද්ධි වැඩසටහන පරිශීලනය කරලා හරි එවැනි ක්‍රමයක් හදන්න. ඒ හරහා මේ රටේ අභිංසක දුප්පත් මිනිහෙක් ඉන්න තැනින් උඩට ගෙනැල්ලා තියන්නේ කොහොමද කියලා වැඩසටහනක් හදන්න. එහෙම වැඩසටහනක් තමුන්නාන්සේලා හදලා නැහැ. අවුරුදු 76ක් ගැන කියමින් අනෙක් ආණ්ඩුවලට ඇණිල්ල දිගු කරපු තමුන්නාන්සේලා, තවදුරටත් ඒ ආණ්ඩු කරපු වැඩසටහන් ටිකම කරන්න යනවා නම්, එතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඒ ක්‍රමය වෙනස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මට ධීවර අමාත්‍යාංශය ගැන කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. ඒ නිසා ඒ ගැන ඒ කොටස විතරක් කියලා මම ඊළඟට ධීවර අමාත්‍යාංශය ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ධීවරයා කියන්නේ, මේ රටේ ගොවියා වාගේම විශේෂිත වූ පුද්ගලයෙක්. එක පැත්තකින් ධීවරයා මේ රට ආරක්ෂා කරනවා. අනෙක් පැත්තෙන් අපට මත්ස්‍ය සම්පත ගෙනැවිත් දෙනවා. ඒක තමයි හැමදේටම ගුණදායී, පෝෂ්‍යදායීම ආහාරය. අපි විදේශ විනිමය ලබා ගන්නේ, වැඩිපුරම මුහුදු පාවිච්චි කරලා. මත්ස්‍ය සම්පත නෙළා ගෙන අපනයන ක්ෂේත්‍රයේ මූලිකව සිටින කණ්ඩායමක් තමයි ධීවරයෝ කියන්නේ. ධීවර ක්ෂේත්‍රය ඉතා විශාල ක්ෂේත්‍රයක්. එහෙම නැත්නම් විශාල විෂයයක්. ඒ හා සමානවම මේ ක්ෂේත්‍රයට අවශ්‍ය පහසුකම් ලබා දිය යුතුයි. ඒ විතරක් නොවෙයි. මේ වෙනුවෙනුත් ඔබතුමන්ලා system එකක් හදන්න ඕනෑ. එක එක්කෙනාට බැණ බැණ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරනවාට වඩා මේ වෙනුවෙන් system එකක් හදන එක තමයි පළමුවෙන්ම කරන්න ඕනෑ.

ධීවර කර්මාන්තය ගත්තොත්, ගඟේ කරන ධීවර කර්මාන්තය තිබෙනවා, වැවේ කරන ධීවර කර්මාන්තය තිබෙනවා, කලපුවේ කරන ධීවර කර්මාන්තය තිබෙනවා, මුහුදේ කරන ධීවර කර්මාන්තය තිබෙනවා. ඒ වාගේම මහ බෝට්ටු, පොඩි බෝට්ටු, තෙප්පම්, වල්ලම් වාගේ දේවල් මේ කර්මාන්තයේ තිබෙනවා. විශේෂයෙන්ම පොකුණු ආශ්‍රිතවත් ධීවර කර්මාන්තය තිබෙනවා. අපේ රටේ ඉතිහාසයේ සිටම තිබෙනවා, මා දැල් ක්‍රමය. ඒ නිසා මේ ක්‍රමත් එක්ක අලුත් තාක්ෂණය පාවිච්චි කරලා ලෝකයේ අනෙක් රටවල් අනුගමනය කරන විධියේ වැඩසටහනක් තමුන්නාන්සේලාගේ අය වැයෙන් ධීවර කර්මාන්තය වෙනුවෙන් කිසිම විධියකට ඉදිරිපත් කරලා නැහැ. අපි දන්නවා, මේ රටේ ජනතාව අද ජීවත් වන්නේ කොයි ආකාරයෙන්ද කියලා. මතක තබාගන්න, තමුන්නාන්සේලා අමතක කරපු දෙයක් තිබෙනවා. ධීවරයාට වැඩ කරන්න අවස්ථාව තිබෙන්නේ, හය මාසයයි. ඒ හය මාසයෙන් පසුව ධීවරයාගේ වැඩ නතර වෙන්න ඕනෑ. ඊළඟ හය මාසය ඉවර වෙනකල් මුහුදේ රැකියාව කරන්න බැහැ. ඒ නිසා සමහර වෙලාවට දකුණේ ඉඳලා උතුරු නැගෙනහිරට ධීවරයන් යනවා, සංක්‍රමණිකයන් හැටියට. පසුගිය කාලයේ උතුරු නැගෙනහිර ප්‍රදේශවලට සංක්‍රමණික ධීවරයන්ට එන්න හම්බ වුණේ නැහැ. මම උතුරු පළාත නියෝජනය කරන ධීවර අමාත්‍යවරයාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. දකුණේ සිටින ධීවරයාට ඒ පළාතේ ධීවර කර්මාන්තය කරන්න බැරි වෙන මොහොතේ උතුරු පළාතට සංක්‍රමණය වුණාම ඒ අය එළවන්න සූදානම් වෙන්න එපා. ධීවර අමාත්‍යතුමනි, තමුන්නාන්සේ උතුරෙන් පත් වෙලා ඉන්නේ. තමුන්නාන්සේලා හැම කෙනාටම එක හා සමානව සලකන නිසා තමුන්නාන්සේට ඒ කටයුත්ත කරන්න පුළුවන්.

ඊළඟට, තහනම් පන්න කර්මාන්තය ගනිමු. දැන් කල්පිටිය ගත්තොත්, එම ප්‍රදේශයේ සමහර පන්න ක්‍රම භාවිතය ගැසට් එකක් මඟින්ම තහනම් කර තිබෙන්නේ. එවැනි සමහර කාරණා සම්බන්ධයෙන් දැන් අධිකරණයේ නඩුත් තිබෙනවා. එම නිසා දැන් තහනම් පන්න ක්‍රම භාවිතය නතර කර තිබෙන්නේ. හැබැයි, යාපනයේ ඒක නතර කර නැහැ. යාපනයේ තවම ඒවා භාවිත කරනවා. හැබැයි තහනම් පන්න ක්‍රම භාවිතය දකුණු පළාතට, ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කයට තහනම් කර තිබෙනවා. කරුණාකරලා ඒ වැරදි ක්‍රමය අනුගමනය කරන්න ඉඩ දෙන්න එපා. රටේ හැම කෙනාටම එක හා සමානව ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්න කියන ඉල්ලීම මා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කරනවා.

අපි දන්නවා, ඒ තහනම් පන්න කර්මාන්තය වාගේම, ධීවර අමාත්‍යාංශයෙන් මේ රටේ ධීවර කර්මාන්තයට තහනම් කරපු සමහර දේවල් මේ රැකියාවට අවශ්‍යයි කියලා, ඒවා තහනම් නැති ගානට නීන්දු කරලා තිබෙන බව පෙනෙනවා. හැබැයි, ඒ දේවල් භාවිතයෙන් මුහුදට වන හානිය, මුහුදු පත්ලට වන හානිය, මුහුදු

පැළෑටිවලට වන හානිය වාගේම, විශේෂයෙන්ම මත්ස්‍ය වගාවට වන හානිය අවම කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් හදන්න පුළුවන් නම් අපට ඒ වැඩ පිළිවෙළත් ඉස්සරහට අරගෙන යන්න පුළුවන්. හැබැයි, තිබෙන ප්‍රශ්නය මේකයි. මම දැක්කා අමාත්‍යවරයාත් මෙතැන ඉඳගෙන කියනවා, ඉන්දියාව අපට උදව් කරනවා නම්, අපට උදව් කරන්න පුළුවන් එක ක්‍රමයක් තමයි, bottom trawling නතර කරන එක කියලා. දැන් අපේ අයට bottom trawling තහනම්. හැබැයි, ඉන්දියාවේ බෝට්ටු 500ක් විතර ඇවිල්ලා bottom trawling කරලා පෙනි පෙනී අපේ මත්ස්‍ය සම්පත අරගෙන යනවා. තවදුරටත් එය බලාගෙන ඉන්න බැහැ. ඒකට ක්‍රමයක් හදලා ඒ ගැන කථා කරන්න. මේ ගැන කාලයක් තිස්සේ අපිත් කියනවා. ධීවරයන් වෙනුවෙන් අපි ගිය ආණ්ඩුවටත් මේ ගැන කිව්වා. හැබැයි, ඒ වැඩ පිළිවෙළ හරියට සිද්ධ වුණේ නැහැ.

ඊළඟට අපි බලමු, තමුන්නාන්සේලා ධීවරයන්ට දුන් සහනාධාරය පිළිබඳව. මෙතැනට ඇවිල්ලා මොන තරම් කයිවාරු ගැහුවත්, එක එක අයට බැන්නත්, මඩ ගැහුවත්, අවලාද නැඟුවත්, අඩුම තරමින් ධීවරයාට දෙන සහනාධාරය හරියට දීගන්න බැහැ නේ තමුන්නාන්සේලාට. දැන් මේ ගැන ධීවරයන්ගෙන් අහලා බලන්න කෝ. ඕනෑ නම් මම දැන් තමුන්නාන්සේලාට දුරකථනයෙන් ධීවරයන්ට ඇමතුමක් අරගෙන දෙන්නම්, එළියට ඇවිල්ලා කථා කරමු. එතකොට දැනගන්න පුළුවන් ධීවරයන්ගෙන් කාටද මේ සහනාධාරය ලැබිලා තිබෙන්නේ, කාටද නොලැබුණේ කියලා. තවම ධීවරයන්ගෙන් භාගයකට ලැබිලා නැහැ. මහ බෝට්ටු හිමියන්ට ලැබිලාත් නැහැ. අනෙක් කාරණය තමයි, ඒ සහනය දෙනවා කිව්වේ, මාස හයකට. එහෙම නම් මාර්තු 31 වනකොට ඉවරයි. තමුන්නාන්සේලා දැන් ඒ වාරික ගෙවන්නේ නැතිව ඉඳලා අන්තිමට ඒවා මහ හරිව්. බැංකුවලට පොලු තියන අය කරනවා වාගේ තමුන්නාන්සේලාත් මේක මහ හරිව්. අවසානයේ කියාවි, දැන් මාස හය ඉවරයි තවදුරටත් සල්ලි වෙන් කරන්න බැහැ කියලා. ඒකද තමුන්නාන්සේලා කරන්න හදන්නේ?

මම දැක්කා ජනාධිපතිතුමා පළමුවැනි දවසේම කියනවා, "වැල්ලේ බැඳලා තිබෙන ධීවර බෝට්ටු ඔක්කෝම මුහුදට යන වැඩ පිළිවෙළ හදලා තමයි අපි ආවේ" කියලා. දැන් මොනවාද හදලා තිබෙන්නේ? දැන් මහ බෝට්ටු 6,000න් 2,000ක් වැල්ලේ බැඳලා තිබෙන්නේ. ඒවාට රැකියාවේ යන්න බැහැ. ඇයි යන්න බැරි? ඒවා අඩි 40, 50 බෝට්ටු වෙන්න පුළුවන්. ඒ බෝට්ටු මුහුදට යවන්න විශාල මුදලක් වැය වනවා. මාස දෙකක් මුහුදේ ඉඳලා ඇවිල්ලා මාළු ටික වික්කාට පස්සේ වියදම් ටික අයින් කළාම, කොටස් ටික බෙදපුවාම, මොනවාද ඉතුරු වෙන්නේ? එ බදු ටික තමුන්නාන්සේලා අඩු කරලා තිබෙනවා ද? තමුන්නාන්සේලා මාළු මිලට යම්කිසි සහයෝගයක් දීලා තිබෙනවාද, ධීවරයන්ට? විශේෂයෙන්ම බෝට්ටුවල එන්ජින් එකේ ඉඳලා තිබෙන අමතර කොටස්වල බදු අඩු කරලා යම් සහනයක් ලබා දෙන යම්කිසි වැඩසටහනක් තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරලා තිබෙනවාද?

අනෙක් රටවල ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන්ට සියයට 50ක තෙල් සහනාධාරයක් දෙනවා. හැබැයි, තමුන්නාන්සේලා මොනවාද දීලා තිබෙන්නේ? තමුන්නාන්සේලා මේ Budget එකෙන් ධීවරයා වෙනුවෙන් අබමල් රේණුවක වෙන් කිරීමක් කර තිබෙනවාද? ඒ අය වෙනුවෙන් මෙවර අය වැයෙන් ඔබතුමන්ලාට යමක් කරන්න තිබුණා. අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා නියෝජනය කරන දකුණු පළාතේ වරායන් ටිකේ ඉතුරු වැඩ කොටස් සම්පූර්ණ කරන්න තමුන්නාන්සේලා සල්ලි වෙන් කරලා තිබෙනවා. කමක් නැහැ, ඒක කරන්න ඕනෑ. හැබැයි මතක තබාගන්න, පුත්තලම දිස්ත්‍රික්කයේ මුට්ටුව ධීවර වරායේ ජැටියේ කටයුතු තවම අවසන් කරලා නැහැ. හැබැයි, ඒකට තමුන්නාන්සේලා මේ අය වැයෙන් ශත පහක් වෙන් කරලාත් නැහැ. මහ බෝට්ටුවලටවත්, පොඩි බෝට්ටුවලටවත්, කුඩා පරිමාණයේ ධීවර රැකියාවේ යෙදෙන අයටත් තමුන්නාන්සේලා ශත පහක සහනාධාරයක් හෝ ශක්තියක් ලබා දීලා නැහැ. දැන් බෝට්ටුවක එන්ජින් එකක් කීයද? එන්ජින් එකේ අමතර කොටස්වල මිල ගණන් කීයද? එන්ජින් එකට දාන තෙල් ටිකේ මිල දැන් කීයද? තෙල් සහනාධාරය ලැබුණේ නැත්නම් ඒ පාවිච්චි කරන ඩීසල්වලට, භූමිතෙල්වලට යන මුදල කොපමණද? ඒවාත් එක්ක ගත්තාම ධීවරයන්ට ජීවත්වන්න, පවුලේ පරිභෝජනයට හා දරුවන්ට ඉගෙන ගන්න, ඒ වාගේම බෙහෙත් හේත් ටික ගන්න අවශ්‍ය ආදායම ඔවුන්ට ලැබෙනවාද? ඔවුන්ට නිසි ආදායමක් ලැබෙන්නේ නැහැ. එම නිසා ඒ වෙනුවෙන් ආධාර දෙන යම් වැඩසටහනක් තමුන්නාන්සේලාට මෙම අය වැයෙන් හදන්න තිබුණා. නමුත්, ඒ අය වෙනුවෙන් ශත පහක වෙන් කිරීමක් කර නැහැ. තමුන්නාන්සේලා සම්පූර්ණයෙන්ම ධීවරයා සෙල්ලමකට අරගෙන තිබෙන්නේ. ඒක මතක තබාගන්න. තමුන්නාන්සේලා ධීවරයා විහිළුවකට අරගෙන තිබෙන්නේ.

ලංකාව වටේම තිබෙන්නේ මුහුදු. එතකොට මේ ලංකාව වටේම ඉන්නේ ධීවරයෝ. රට ඇතුළේ තමයි ගොවියෝ ටික ඉන්නේ. සමස්තයක් හැටියට ධීවරයා හැමදාම ධීවර කර්මාන්තය කරනවා. ඒ නිසා ධීවරයා අමතක කරලා, ධීවරයාට මේ වාගේ කුඩම්මාගේ සැලකිලි කරලා, තමුන්නාන්සේලාට ඉස්සරහට යන්න බැහැ. ඒ රැකියාව කරන අයට Cey-Nor Foundation Limited තිබෙනවා, North Sea Limited තිබෙනවා. ඒ ආයතන දැල් නිෂ්පාදනය කරනවා. හැබැයි, දැල් නිෂ්පාදනය කරලා අඩුවට ධීවරයන්ට ලබා දෙන වැඩසටහනක් තමුන්නාන්සේලා හදලා තිබෙනවාද? ඒ කර්මාන්තශාලා සඳහා තමුන්නාන්සේලා ශත පහක්වත් වෙන් කරලා තිබෙනවාද? මේ කර්මාන්ත ටික දියුණු කරන්න, අලුතින් දැල් ටික හදන්න අවශ්‍යයි. ඉස්සර අවුරුදු 10ක් පාවිච්චි කරන දැලක්, අද අවුරුද්දයි දෙකයි පාවිච්චි කරන්න පුළුවන්. නමුත් වියදම අරගෙන බැලුවොත්, එදාට වඩා දහ ගුණයක් වියදම් වෙනවා, අද දැලක් ගන්න. හැබැයි හොඳ ශක්තිමත් නූල් ටිකක් ගෙනැල්ලා ගුණාත්මකභාවයෙන් ඉහළ දැලක් නිර්මාණය කරන්න, ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න අපට බැරි ඇයි? කෝ එහෙම වැඩසටහනක්? කොතැනද එවැන්නක් හදලා තිබෙන්නේ? එහෙම වැඩසටහනක් තමුන්නාන්සේලා හදලා නැහැ. කොතැනද ධීවරයාට තමුන්නාන්සේලා දුන් සහන තිබෙන්නේ? ඒ නිසා මා හිතනවා, ධීවර කර්මාන්තය සඳහා තමුන්නාන්සේලාට කරන්න පුළුවන් බොහෝ දේ තිබෙනවා කියලා.

අනෙක් කාරණය මෙයයි. මහ බෝට්ටුවකින් මාළු ටික අල්ලාගෙන එනකොට, බොහෝ වෙලාවට ඒ මාළුවලින් සියයට 20ක් විතර අපනයනය කරන්න සුදුසු නැහැ. ඇයි, ඔවුන් ළඟ chilled bath එක නැහැ. Chilled bath එක හදාගෙන යනවා නම්, තව රුපියල් ලක්ෂ 100ක විතර මුදලක් වියදම් වෙනවා. Chilled bath එක හැදුවාට පස්සේ, මාළුවා නියමිත ආකාරයෙන්ම එල්ලා අයිස් මත ගල් කරන්න පුළුවන්. එහෙම කළාට පස්සේ තමයි, වෙනම pack කරලා අයිස් දමන්නේ. එතකොට මාළුවාගේ ගුණාත්මකභාවය කිසිසේත්ම අඩු වෙන්නේ නැහැ. හැබැයි දැන් කරන ක්‍රමය තමයි, roomsවල, එහෙම නැත්නම් පෙට්ටිවල දාලා ඒකට අයිස් දමන එක. ඒ වැඩ කටයුතු කරගෙන එනකොට, ඒ ගෙනෙන මාළුවලින් යම් ප්‍රමාණයක් ලංකාවේ කෑමට විතරයි ගන්න පුළුවන්. .ඒවා අපනයනය කරන්න බැහැ. ඒ නිසා එතැන නාස්තියක් සිද්ධ වෙනවා. එතකොට ආදායමේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා ධීවරයා නෙළා ගන්නා මත්ස්‍ය සම්පත නාස්ති නොවන ආකාරයට කල් තබා ගැනීමට අවශ්‍ය වැඩසටහනක් තමුන්නාන්සේලා හදන්න. විශේෂයෙන්ම මේ වන විට අපේ රටට ඩොලර් අවශ්‍යයි. වැඩි වශයෙන් ඩොලර් ඉපැයීමට එවැනි වැඩසටහන් අපට හදන්න පුළුවන්. අපේ පෞද්ගලික ව්‍යාපාරිකයා ලොකු ආශාවකින් ඉන්නවා, ඒ වැඩ කොටස කරන්න. ලොකු හැකියාවක් තිබෙන අය ඒ සඳහා බලාගෙන

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ඉන්නවා. ඒ වාගේම ධීවරයෝ ඉන්නවා, මාළු ඉන්නේ කොතැනද කියලා හරියට සොයා ගන්න පුළුවන් හොඳ හැකියාව තිබෙන. එම නිසා ඒ වැඩ කටයුතු ඔවුන්ට නිසි පරිදි කරන්න පුළුවන්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මහ බෝට්ටු සඳහා තමුන්නාන්සේලා පනවා ඇති බදු අඩු කරලා, තෙල් සහනාධාරයක් දීලා, විශේෂයෙන්ම අලුත් තාක්ෂණයත් එක්ක බෝට්ටු අලුතින් නිර්මාණය කරන වැඩසටහනක් හදලා, මේ රටේ අපනයන ධීවර කර්මාන්තය දියුණු කරන වැඩසටහනට තමුන්නාන්සේලාගේ සම්පූර්ණ ශක්තිය දෙන්න කියලා. මේ අය වැයේ කෙසේ සඳහන් වුණත්, තමුන්නාන්සේලා ඒක වෙනස් කරලා ඒ සඳහා අවශ්‍ය සල්ලි ලබා දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම බෝට්ටුවක් මුහුදට ගිහිල්ලා යම් විධියක කරදරයකට පත් වුණාට පස්සේ, ඒ බෝට්ටුව ආරක්ෂා කරගෙන, ඒ මිනිස්සු ටික ආරක්ෂා කරගෙන ගොඩට ගෙනෙන්න අද ලංකාවේ කිසිම ක්‍රමයක් නැහැ. Navy එකට කරදර කරලා, කරදර කරලා එතැනට ඔවුන් යද්දි සමහර වෙලාවට ඒ බෝට්ටුව පෙරළිලා, විනාශ වෙලා ඉවරයි. ඒ නිසා කරුණාකරලා ඒකටත් නිසි ක්‍රමයක් හදන්න. ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා ධීවර රාජ්‍ය ඇමතිවරයා හැටියට හිටපු කාලයේ අපි සූදානම් වුණා, විශේෂ බෝට්ටුවක් නිර්මාණය කරන්න. එන්ජින් දෙක, තුන දාලා බෝට්ටුවක් නිර්මාණය කරලා කණ්ඩායමක් stand by තියන්න. මුහුදේ යම් කිසි තැනක ප්‍රශ්නයක් වුණොත්, ඕනෑම වෙලාවක එතැනට ගිහිල්ලා අනතුරට පත් ධීවරයන් අරගෙන එන්න පුළුවන් විධියේ වැඩසටහනක්, එහෙම වැඩ පිළිවෙළක් හදන්න කියලා මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාගෙන් විශේෂයෙන් මා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. ධීවර ක්ෂේත්‍රය ගත්තාම, ප්‍රධාන වශයෙන්ම ධීවරයාට අපකීර්තියක් වෙන ඊළඟ වැඩසටහන තමයි, පිටරටින් ගෙනෙන මත් ද්‍රව්‍ය, එහෙම නැත්නම් වෙනත් ජාවාරම්. අපි දන්නවා, බොහෝ වෙලාවට මන්නාරමේ එහා කෙළවරේ ඉඳලා මීගමුව දක්වා තීරයෙන් දවස ගණනේ බෝට්ටුවලින් මත් ද්‍රව්‍ය ගෙනෙන බව. ධීවර අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධීකරණය කරලා, Navy එකත් එක්ක සම්බන්ධ වෙලා, තවත් ආයතන සම්බන්ධ කරගෙන එම ජාවාරම් ඇල්ලීමට අවශ්‍ය වැඩ කොටස තමුන්නාන්සේලාට කරන්න පුළුවන්. ඒ වැඩ කොටස කරන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, ධීවරයාටත්, ශ්‍රී ලංකාවටත් තමයි ඒකේ අපකීර්තිය තිබෙන්නේ. ඒ තුළින් විදේශ විනිමය සම්පූර්ණයෙන් විනාශ වෙනවා විතරක් නොවෙයි, රටේ සමස්ත ජනතාවම මත් ද්‍රව්‍ය උවදුරින් විනාශ වෙනවා. බහුතරයක් මත් ද්‍රව්‍ය අපේ රටට එන්නේ ඒ විධියට. ඒ නිසා තමුන්නාන්සේලා ධීවර අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා, ඒ දේ වළක්වන්න අවශ්‍ය වැඩසටහන හදන්න කියන ඉල්ලීම මා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් තිබෙන නිසා, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ගැනත් කථා කරන්න ඕනෑ. තමුන්නාන්සේලා දන්නවා, ඉස්සන් වගාව ගැන. මේ ඉස්සන් වගා කරද්දී අද බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකද, ඉස්සර wild-caught කියන වර්ගය අපේ මුහුදෙන් අරගෙන, බෝ කරලා තමයි හැදුවේ. ඒක තමයි ක්‍රියාත්මක වුණේ. ඒ ඉස්සන් වර්ගයට ලෙඩ හැදෙනවා ටිකක් අඩුයි. නමුත්, ඒ වර්ගයේ harvest එක අඩුයි. ඒ කියන්නේ, ගන්න අස්වැන්න අඩුයි. ඊට පස්සේ "වනමේ" කියන ඉස්සන් වර්ගය ගෙනැල්ලා බෝ කරන වැඩසටහන කළා. නමුත්, අද ඒ "වනමේ" කියන ඉස්සන් වර්ගයට EHP කියන රෝගය හැදිලා තිබෙනවා. අද සාමාන්‍යයෙන් ඉස්සන්ගේ බර ග්‍රෑම් 4, 5, 6 වෙනකොට ඒ ලෙඩේ හැදෙනවා. ඊට ඉස්සෙල්ලා ඉස්සන් අල්ලන්න ඕනෑ. එතකොට කිසිම ලාභයක් නැහැ. ඒ නිසා සම්පූර්ණයෙන් ඉස්සන් වගාව විනාශ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒත් එක්කම "penaeus monodon" කියන ඉස්සන් වර්ගයක් ඇවිල්ලා තිබෙනවා. හැබැයි, ඒ සඳහා ශ්‍රී ලංකාවේ තවමත් hatchery එකයි තිබෙන්නේ. ඒ නිසා මේ සල්ලි වෙන් කරද්දී තමුන්නාන්සේලාට මේවා ගැන සමීක්ෂණයක් කරන්න පුළුවන්. මේ කර්මාන්තය සම්පූර්ණයෙන්ම අපනයන කර්මාන්තයක්. මේ කර්මාන්තයේ යෙදිලා ඉන්න හොඳ ව්‍යාපාරික කණ්ඩායම් මේ රටේ ඉන්නවා. ඔවුන්ට මේ සහන ටික දෙන්න තිබුණා. ඒ වාගේම මේ සහන දෙන වැඩසටහන තමුන්නාන්සේලාට හදන්න තිබුණා. මේ hatcheries වැඩි කරලා, ඒ අවශ්‍ය පහසුකම් ටික ලබා දීලා ඉස්සන් පැටවු ටික ලබා දෙන වැඩසටහනක් තමුන්නාන්සේලාට ක්‍රියාත්මක කරන්න තිබුණා. හැබැයි, ඒවා ක්‍රියාත්මක කරන්න ශත පහක්වත් තමුන්නාන්සේලා වෙන් කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. කකුළුවෝ වාගේම මොදා වාගේ මාළු කර්මාන්තයත් කෙරෙනවා. හැබැයි, ලාභම කර්මාන්තය තමයි ඉස්සන් කර්මාන්තය. එහෙනම්, ඉස්සන් වගා කිරීම සඳහා වැඩසටහනක් හදන්න තමුන්නාන්සේලා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නමුත්, මෙවර අය වැයෙන් ඒ සඳහා ශත පහකවත් මුදලක් වෙන් කරලා නැහැ. ඒ සඳහා අවශ්‍ය මුදල් වෙන් කරන්න කියාත් මම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක්, දෙකක් ගන්න පුළුවන්ද? අපේ පැත්තේ වෙලාව ඉතුරු වෙලා නැද්ද? මට විනාඩි දෙකක් ගන්න පුළුවන්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේ කාරණයත් කියා කථාව අවසන් කරන්නම්. මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරන්න කැමතියි. සමස්තයක් හැටියට ධීවර පවුලක් ගත්තාම ඔවුන් ඉතා අමාරුවෙන් තමයි මුහුද ළඟ ඉඳගෙන ජීවත්

වෙන්නේ. එම නිසා ඒ පවුලේ දරුවන්ගේ අධ්‍යාපනය, දෙමව්පියන්ගේ සුබසාධනය වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් සකස් කරන්න ඕනෑ. ඒ විධියට ඔවුන්ගේ පවුල ආරක්ෂා කරනවා හා සමානවම අලුත් තාක්ෂණයත් එක්ක යමින් ඒ අයට ලෝකයේ පවතින ක්‍රම ඔස්සේ ධීවර කර්මාන්තය කිරීමට උගන්වන්න ඕනෑ. ඒක ඉතා වටිනවා. එම නිසා ඒ වැඩ කොටස තමුන්නාන්සේලා කරන්න සූදානම් වෙන්න. තමුන්නාන්සේලා මේ අමාත්‍යාංශය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන්නේ ගතානුගතිකව, පාරම්පරිකව පසුගිය වතාවේ තිබුණු විෂයයන් ටික අරගෙන ඒකට කෑල්ල කෑල්ල එකතු කරලා. හෝඩියේ ළමයෙක් එක, දෙක, තුන, හතර, පහ ගණන් කරනවා හා සමාන වැඩ පිළිවෙළකින් තමයි මේ අමාත්‍යාංශය සඳහා මුදල් වෙන් කරලා තිබෙන්නේ කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමතියි. ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරමින්, ධීවරයාට අවශ්‍ය කරන හයිය ලබා දෙන්න අපි සූදානම් බවත් ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.25]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சின் மிக முக்கியமான விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்ற இந்த நேரத்தில், மட்டக்களப்பு மாவட்டம் தொடர்பான ஓரிரு விடயங்களை மிகச் சுருக்கமாகக் கௌரவ அமைச்சரின் கவனத்துக்குக் கொண்டுவரலாம் என நினைக்கிறேன். கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பின் உறுகாமம், தும்பாலைச்சோலைப் பிரதேசத்தில் கித்துள் பகுதியில் ஒரு மீனவர் சங்கம் இருக்கின்றது. அந்தச் சங்கத்துக்கு உறுகாமத்தில் ஒரு மீன்பிடித் துறைமுகம் இல்லாதது பாரிய பிரச்சினையாக இருக்கின்றது. அங்குள்ள மீனவர்கள் யானைத் தொல்லைக்கு மத்தியிலும் 2.5 கிலோமீற்றர் தூரம் காட்டு பாதையால் பயணித்துத்தான் உறுகாமத்துக்கு சென்று மீன்பிடியில் ஈடுபடவேண்டியதாக இருக்கின்றது. அங்கே ஒரு மீன்பிடித் துறைமுகத்தை அமைக்க வேண்டுமென்பது அவர்களின் நீண்டகாலக் கோரிக்கையாக இருக்கின்றது. இது சம்பந்தமாக மட்டக்களப்பிலே இருக்கும் நன்னீர் மீன் வளர்ப்புத் தொடர்பான உத்தியோகத்தர் நெல்சன் அவர்களுக்கும் நன்றாகத் தெரியும். ஆகவே, இதுபற்றி உடனடியாகக் கவனம் செலுத்தி, ஒரு நல்ல தீர்மானத்தை எடுக்குமாறு கேட்டுக்கொள்கிறேன்.

இரண்டாவது விடயம், மட்டக்களப்பு, வாழைச்சேனை, பேத்தாழையில் பிள்ளையானுடைய தம்பி - 'அகிலா' என்று அழைக்கப்படும் நபர் - மீனவர்களுடைய boatகளை நிறுத்துவதற்கான இடத்தில் ஒரு வேலியை அமைத்து, அங்கு boatகளை நிறுத்துவதற்குத் தடையை ஏற்படுத்தியிருக்கிறார். இது சம்பந்தமாக மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் சொன்னபோது, அதன் தவிசாளரான கௌரவ அருண் ஹேமச்சந்திரா அவர்கள், "இந்த விடயத்தில் நாங்கள் அராஜகமான முறையில் செயற்பட முடியாது, சட்டப்படிதான் எதையும் செய்ய வேண்டும்" என்று சொன்னார். இன்று நான்கு மாதங்கள் ஆகியும் அதே பிரச்சினை அப்படியே இருக்கின்றது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, அந்த மீனவர்கள் அங்கு boatகளை நிறுத்துவதற்கேற்றவாறு நீதியைப் பெற்றுத்தர வேண்டுமென்று இந்த இடத்திலே கேட்டுக் கொள்கிறேன்.

மூன்றாவது விடயம், ஏறாவூரையும் களுவன்கேணியையும் இணைக்கும் பாதையானது மீனவர்களுக்கு முக்கியமானது. இந்தப் பாதையில் சிறிய பாலம் ஒன்றை அமைத்து, அந்தப் பாதையைப் புனரமைத்துத் தருமாறு கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், ஏறாவூரின் புன்னைக்குடாவிலேதான் கடற்றொழிலில் ஈடுபடுபவர்களுக்குத் தேவையான எரிபொருள் நிலையம், ice factory போன்றவையெல்லாம் இருக்கின்றன. களுவன்கேணி மீனவர்களுக்கும் இது மிக முக்கியமானது.

ඒ වාගේම මේ අවස්ථාවේදී කථානායකතුමා මුලසුනේ හිටියා නම් හොඳයි. මොකද, ඊයේ කථානායකතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් වුණත්, හවස් වරුවේ කථා කරන්න කියලා. එතුමාට තේරෙන්නේ නැහැ, හවස් වරුවේ මේවාට උත්තර දෙන්න ඇමතිවරු නැහැ කියලා. ඒකයි උදේ වරුවේ මේවා කථා කරන්නේ. සාමාන්‍යයෙන් කථානායකවරයෙක් මන්ත්‍රීවරු සියලුදෙනාම ආරක්ෂා කරන්න තමයි පෙනී ඉන්න ඕනෑ. කථානායකවරයා වැරැද්දක් කළාම එතුමාට විරුද්ධව කොහොමද අපි වරප්‍රසාද ප්‍රශ්නයක් ගේන්නේ? ඒක කොච්චර ලජ්ජාවක්ද? ඒ නිසා තමයි මම ඒක කළේ නැත්තේ.

අද "ලංකාදීප" පුවත් පතේ තිබෙනවා, "අර්ච්චුනාටත් - රාසමාණික්කම්ටත් කථානායකගෙන් දැඩි අවවාද, දෙන්නාගෙම හැසිරීම අශෝභනයි; අන්තිමයි" කියලා. මේ පාර්ලිමේන්තුවේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කථානායකතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. මම මේ පාර්ලිමේන්තුවට පොල් කෝම්බ ගහගෙන ආවා වාගේ ගහගෙන ආපු පුද්ගලයෙක් නොවෙයි. අපේ චරිත ඝාතනය කරන්න එපා, ඔය මුලසුනේ වාඩිවෙලා. ඔය මුලසුනේ ඉන්න කථානායකතුමාට වගකීමක් තිබෙනවා, මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරන්න.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

රටේ තුන්වැනි පුරවැසියා. රටේ තුන්වැනි පුරවැසියා හැටියට එතුමාට ලොකු වගකීමක් තිබෙනවා. එතුමා මේ සභාව හරියට හසුරුවන්න ඕනෑ.

මේක ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක්. මේ අවස්ථාවේදී ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා සභාවේ සිටින නිසා හොඳයි. ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද, දේශබන්දු තෙන්නකෝන් අත්අඩංගුවට ගන්න උසාවි නියෝගය එන්න දවස් දෙකකට පෙර පසුගිය රජයේ හිටපු ප්‍රබල ඇමතිවරයෙකුගේ business centre එකක රැස්වීමක් පවත්වලා තිබෙනවා කියලා? ඒ, ඊට දවස් දෙකකට පෙර. මේක ඉතාම බැරෑරුම් කාරණයක්. ඒ රැස්වීමට සම්බන්ධ වෙච්ච කට්ටිය තමයි Director, Military Intelligence - DMI - ලෙස හිටපු වූලා කොඩිතුවක්කු,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
විනාඩියකින් මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම තමයි Colombo Crimes Division එකේ හිටපු ASP නෙව්ල්. ඒ වාගේම මේ සාකච්ඡාවට ආරාධනා කරලා තිබෙනවා, පිල්ලෙයාන්ටත්. පිල්ලෙයාන්ට එන්න බැරි නිසා පිල්ලෙයාන් ඔහුගේ ගේ්ලයා වන ඉනියභාරතී කොළඹට එවලා තිබෙනවා. ඉනියභාරතී හිටපු හෝටලය තමයි, කොළඹ හිල්ටන් හෝටලය. ඔහුගේ වාහනය එළවාගෙන ආවේ "සුදා" කියලා පුද්ගලයෙක්. එතකොට හිටපු ඇමතිවරයෙකුගේ කාර්ය මණ්ඩලයේ සාකච්ඡාවක් මේ රට තුළ සිදු වෙලා තිබෙනවා. මොකක්ද දන්නේ නැහැ, ඒ කුමන්ත්‍රණය. ඔබතුමන්ලා මේ ගැන දන්නවාද දන්නේ නැහැ. විශාල බැරෑරුම් ප්‍රශ්නයක් තිබෙනවා. ඉනියභාරතී කියන්නේ පසුගිය කාලයේ මීනී මැරුම් රාශියකට සම්බන්ධ වෙච්ච පුද්ගලයෙක්. පිල්ලෙයාන් ගැන තොරතුරු රාශියක් තිබෙනවා. දැනට ඔබතුමන්ලා ජාතික ආරක්ෂාව තහවුරු කරලා තිබෙනවා කියනවා. නමුත් ගනේමුල්ල සංජීවගේ attack එකේ හිටපු ගැහැනු ළමයාවත් තවම සොයා ගන්න බැරි වෙලා තිබෙනවා. රටේ හිටපු පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් සොයා ගන්නත් බැහැ. එතකොට ඔබතුමන්ලාට මේවා ගැන වගකීමක් දෙන්න පුළුවන්ද? මොකද, රට තුළ අපේ ආරක්ෂාව පිළිබඳ විශාල ගැටලුවක් තිබෙනවා. මොකක්ද දන්නේ නැහැ, මේ plot එක. Military intelligence ඔක්කෝම එකතු වෙලා කරනවා නම් මේක plot එකක්. මොකක්ද දන්නේ නැහැ කළේ. මේ වාගේ වැදගත් කාරණයක් උදේ වරුවේ අපට මේ පාර්ලිමේන්තුව තුළ මතු කරන්න ඉඩ තිබෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය සතිය තුළ අපි දැක්කා, ගනේමුල්ල සංජීවගේ ඝාතනය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ පැය භාගයක් හැමෝම විවාද කළා. හැබැයි, මධකලපුවේ මනුෂ්‍යයෙක් පිහි පහරකින් මැරුණාම ඒක පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න කථානායකතුමා ඉඩ දෙන්නේ නැහැ. කථානායකතුමාට මම මේ අවස්ථාවේ කියන්නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඔබතුමා කථානායක කියන තනතුරේ ගෞරවය ආරක්ෂා කරන්න. ඒ වාගේම මම ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනවා, පක්ෂපාතී වෙන්න එපා කියලා. ලේකම්වරුන්ට වගකීමක් තිබෙනවා. මේ සභාවේ හෙට අපි නැති වෙයි. හැබැයි, මේ ලේකම්වරු මේ පාර්ලිමේන්තුවේ ඉදිරියටත් ඉන්න ඕනෑ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මොකද, මේවා මාධ්‍යයේ පළ වුණාට පස්සේ අපේ චරිත ඝාතනයට ලක් වෙනවා. මම අද උදේ පාර්ලිමේන්තුවේ හිටියා. මේ ප්‍රශ්නය උදේ මතු කරන්න ඕනෑ ප්‍රශ්නයක්. නමුත් දැන් තමයි මතු කරන්නේ. ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. ඒ නිසා කරුණාකරලා මම මතු කරපු කාරණය පිළිබඳව විශේෂයෙන් සොයා බලන්න කියා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක? *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]* මට විනාඩියක් දෙන්න වෙනවා. *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම කියැවුණා. *[බාධා කිරීම්]*

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි නිවැරදි කිරීමක් කරන්නට විනාඩියක් දෙන්න.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදෑසන සිට මේ දක්වා පැවැත්වෙන ධීවර අමාත්‍යාංශයේ,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා.

ගරු සුනිල් රත්නසිරි මහතා
(මාණ්පුමිකු சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉතා නිර්දය විවේචනයක් කළා, ගරු කථානායකතුමාට. එතුමා අපිත් එක්ක අපේ දිස්ත්‍රික්කයේ *[බාධා කිරීම්]* ඉතා හොඳ මැතිවරණ ව්‍යාපාරයක් කරලා දෙවැනි තැනට මනාප අරගෙන පාර්ලිමේන්තුවට ආවේ. *[බාධා කිරීම්]* පොල් කෝම්බ විධියට ගහගෙන ආවේ ඒගොල්ලෝ. ඒගොල්ලෝ තමයි පොල් කෝම්බ විධියට ගහගෙන ආවේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. *[බාධා කිරීම්]*

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(මාණ්පුමිකු ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று காலையிலிருந்து இடம்பெறுகின்ற இந்த - *[இடையீடு]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නමට හානියක් නොවන විධියටයි සඳහන් වුණේ.

[පි.ප. 5.33]

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(මාණ්පුමිකු ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சுத் தொடர்பிலான விவாதத்தில் கலந்துகொண்டு கருத்துகளைத் தெரிவித்த அனைவருக்கும் எனது மனமார்ந்த நன்றியை முதலில் தெரிவித்துக் கொள்கின்றேன். இன்று காலையிலிருந்து பல உறுப்பினர்கள் இங்கே பேசினார்கள். அவர்கள் முன்வைத்த கருத்துகளை நான் நன்கு அவதானித்தேன். ஒவ்வொரு பிரச்சினைக்கும் எதிர்வரும் காலங்களிலே தீர்வினை வழங்குவதற்கு ஏதுவான நடவடிக்கை எடுக்கின்றேன்.

அதேபோன்று, விசேடமாக இன்றைக்கு *[இடையீடு]* காலையிலிருந்து இடம்பெற்ற இந்த விவாதத்தின்போது,

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මගේ point of Order එකට අවස්ථාව දෙන්න. අඩු ගානේ මට කථා කරන්න අයිතියක් තිබෙනවා නේ. මගේ point of Order එකට අවස්ථාව දෙන්න.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

නේற்றும் இதேமாதிரித்தான் குழப்பம்! *[இடையீடு]*

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

உங்களுடைய குழப்பங்களைக் கொண்டுபோய் உங்களுடைய மாவட்டத்தில் வைத்துக் கொள்ளுங்கள்! அல்லது உங்களுடைய வீட்டுக்குள் வைத்துக் கொள்ளுங்கள்! இது என்னுடைய time? Disturb பண்ண வேண்டாம். உட்காருங்கோ! சரியோ!

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

යම්කිසි වරදක් කරනවා නම් අපි ඒක කියන්න ඕනෑ.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

அதனால், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, *[இடையீடு]* ලඟුවක් දාලා පොඩ්ඩක් බැඳලා දාන්න වෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ඔබතුමා, උතුරට එන්න ඕනෑ, මාව- [බාධා කිරීම්] එතකොට මම බලාගන්නම්. [බාධා කිරීම්]

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

අනේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි- [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තත්පර 30ක කාලයක් ගන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ඇයි, තත්පර 30ක්? Point of Order එකක් සඳහා විනාඩියක් තිබෙනවා. 31වැනි දා DCC meeting එකක් තිබුණා. 2021 මගේ phone එක tap කරලා - *[බාධා කිරීම්]* 23වැනි දා අපේ සභානායකතුමා පොලීසියට ලියුමක් දීලා තිබෙනවා, මා arrest කරන්න කියලා. හැබැයි, ඒ ගැන මට දැනුවත් කරලා නැහැ. එදා ඉඳන් අපේ සභානායකතුමා ක්‍රියාත්මක කරන්නේ ඔයගොල්ලන්ගේ plan එක තමයි. ඒක සම්පූර්ණයෙන් වැරදියි. මා arrest කරන්න-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එතැන point of Order එකක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වැඩකට නැති දේවල් කථා කරනවා මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන. *[බාධා කිරීම්]*

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று காலையிலிருந்து இந்த விவாதம் நல்ல முறையில் நடைபெற்றுச் செல்கின்றது. அவ்வாறு நடைபெறுகின்றபோது, 'சிவ பூசையில் கரடி புகுந்த மாதிரி' ஒருசில கரடிகள் புகுந்து விளையாடுவதையும் காணக்கூடியதாக இருக்கின்றது. நான் விசேடமாக ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். இன்று இங்கே காலையிலிருந்து உரையாற்றிய உறுப்பினர்கள் - மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம் அவர்களை எடுத்துக்கொண்டாலும் சரி, மாண்புமிகு திலிப் வெதஆரச்சி அவர்களை எடுத்துக்கொண்டாலும் சரி, எதிர்க்கட்சியில் இருக்கின்ற ஏனைய உறுப்பினர்களை எடுத்துக்கொண்டாலும் சரி, எங்களுடைய ஆளுங்கட்சி உறுப்பினர்களை எடுத்துக் கொண்டாலும் சரி - இந்த அமைச்சுத் தொடர்பாக உரையாற்றுகின்றபோது நல்ல யோசனைகளை முன்வைத்தார்கள். விசேடமாக மட்டக்களப்பைச் சார்ந்த உறுப்பினர்களை எடுத்துக்கொண்டால், ஒருவரைத் தவிர மற்றவர்கள் எல்லோருமே மிகவும் ஆணித்தரமான கருத்துகளை முன்வைத்திருந்தார்கள். கடைசியாக மாண்புமிகு உறுப்பினர் ஹெக்டர் அப்புஹாமி அவர்கள் உரையாற்றினார். அவர் காலையில் சபையில் இருக்கவில்லை; இப்பொழுதுதான் வந்தார். அவர் உரையாற்றியபோது, ஏதோ இரவு முழுவதும் தூங்கி, தற்போது விழித்தவர்போன்று பேசிக்கொண்டு போகின்ற ஒரு போக்குக் காணப்பட்டது. ஏனென்றால், காலையிலிருந்து இடம்பெறுகின்ற இந்த விவாதத்தில் உரையாற்றிய உறுப்பினர்களால் தொிவிக்கப்படுகின்ற கருத்துகள் தொடர்பாக எதிர்வினையாற்றும் வகையில் எங்களுடைய உறுப்பினர்கள் அவற்றுக்குப் பதில் வழங்கினார்கள்.

அவ்வாறு வழங்கியிருக்கின்றபொழுது மறுபடியும் மறுபடியும் அதே வார்த்தைகளையும் அதே குற்றச்சாட்டுகளையும் வெறுமனே முன்வைக்கின்ற நபர்களாகவே எதிர்க்கட்சியைச் சார்ந்த இந்த உறுப்பினர்கள் இருக்கின்றார்கள். அதனால் இந்த இடத்தில் நான் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, நான் இந்த அமைச்சைப் பொறுப்பேற்று இன்றைக்கு நான்கு மாதங்கள்தான் ஆகின்றது. ஆனால், இந்தப் பாராளுமன்ற உறுப்பினர்கள் பேசுவதைப் பார்க்கின்றபொழுது, என்னவோ கடந்த காலம் முழுவதும் நாங்கள்தான் இந்த ஆட்சி பீடத்தில் இருந்தது போன்றும், நாங்கள்தான் இந்த கடற்றொழில் அமைச்சினைத் தொடர்ந்து செய்தது போன்றும் இவர்களால் எங்கள்மீது குற்றச்சாட்டுகள் முன்வைக்கப்படுவதைக் காணக்கூடியதாக இருக்கின்றது. ஆனால், அது தொடர்பாக நான் அலட்டிக்கொள்ளப் போவதில்லை. ஏனென்றால், "தூற்றுவார் தூற்றட்டும், போற்றுவார் போற்றட்டும், நான் செல்லும் வழி நேர்வழியாகட்டும்!" என்ற சித்தாந்தத்தில் எனக்கு நம்பிக்கை இருக்கின்றது, இவர்கள் என்ன சத்தம் போட்டாலும்கூட, விசேடமாக இன்றைக்கு மீனவர்களுடைய பிரச்சினை சம்பந்தமாக - அது வடக்கா, கிழக்கா, தெற்கா என்றில்லாமல் - மீனவர்கள் வாழுகின்ற 15 மாவட்டங்களிலும் மிக ஆழமான தேடலை நாங்கள் செய்து வருகின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු අජන්ත ගම්මැද්දගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு அஜந்த கம்மெத்தகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. AJANTHA GAMMEDDAGE left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES took the Chair.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கடந்த நான்கு மாதங்களாக இங்கே இருக்கின்ற உறுப்பினர்கள் ஒரு விடயத்தைத் தெரிந்துகொள்ள வேண்டும். இந்த அமைச்சை நாங்கள் பொறுப்பேற்கின்றபொழுது, எங்களின் அமைச்சின் கீழ் இயங்கும் ஆறுக்கும் அதிகமான நிறுவனங்களின் செயற்பாடுகளையும் - அதாவது CFC என்கின்ற Ceylon Fisheries Corporationஐ எடுத்துக் கொண்டாலும் சரி, NAQDA நிறுவனத்தினை எடுத்துக் கொண்டாலும் சரி, Cey-Nor Foundation Limited நிறுவனத்தை எடுத்துக்கொண்டாலும் சரி, North Sea Limited நிறுவனத்தினை எடுத்துக்கொண்டாலும் சரி - அந்த அனைத்து நிறுவனங்களின் செயற்பாடுகளையும் மீளாய்வு செய்து, அங்கேயிருக்கின்ற அதிகாரிகளோடு ஆழ்ந்த உரையாடல்களைச் செய்து, அவர்களோடு சேர்ந்து இந்த மீன்பிடித் துறையை - கடற்றொழிலைக் கட்டியெழுப்புவதற்கான புதிய வேலைத்திட்டத்தை நாங்கள் இன்றைக்குத் தயாரித்திருக்கின்றோம். அவ்வாறு அந்த வேலைத்திட்டங்களைத் தயாரிக்கின்றபொழுது, இந்த நிறுவனங்கள் அனைத்துமே உடைந்து, விழுந்து, சீரழிந்துபோன நிலையில் இருந்தது எங்களுக்குத் தெரிய வந்தது.

6. தங்களது காணியைத் தங்களிடம் கையளிக்குமாறு போராடிவரும் காணி உரிமையாளர்களுக்கு அரசின் தீர்வு என்ன என்பதை அமைச்சர் அறியத்தருவரா?

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම කල් ඉල්ලා සිටිනවා. මේ සඳහා ඉඩම් අමාත්‍යාංශය ඇතුළු ආයතන කිහිපයකින් තොරතුරු ලබා ගත යුතු බැවින් ඉදිරියේදී පරිපූර්ණ පිළිතුරක් ලබා දීමට එකඟ වෙනවා.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, ஏற்கனவே, நான் 2025.02.06ஆம் திகதி கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரிடம் கேட்ட கேள்விக்கும் இதுவரை பதில் கிடைக்கவில்லை. அத்தோடு, 2025.02.28ஆம் திகதி ஹர்ஷன நாணாயக்கார அவர்களிடம் சிறைக் கைதிகள் தொடர்பாக கேட்ட கேள்விகளுக்கும் இதுவரை பதில் கிடைக்கவில்லை. இது எனது மூன்றாவது கேள்வி. தயவுசெய்து இந்த மூன்று கேள்விகளுக்கும் விடையளிக்கும் வகையில் ஒரு குறிப்பிட்ட திகதியைச் சொல்லி, சரியான விடையைத் தருமாறு கேட்கிறேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, දහහතරවන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: මාර්තු 05]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 05]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 05th March]
[HON. SPEAKER in the Chair.]

111 වන ශීර්ෂය.- සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 169,641,998,000

තලෛප්පු 111.- சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 169,641,998,000

HEAD 111.- MINISTER OF HEALTH AND MASS MEDIA
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 169,641,998,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 111, 210, 211, 220 සහ 308.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana. You have 20 minutes.

[9.44 a.m.]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

Hon. Chairman, I move,

> "That a sum of Rs. 10 be cut from the Recurrent and Capital Expenditures of each Programme, as per the tradition, out of the Heads of Expenditure Nos. 111, 210, 211, 220 and 308 pertaining to the Ministry, other departments and institutions coming under it and scheduled to be taken up for discussion today, Thursday, 06th March, 2025, at the Committee Stage Discussion of the Appropriation Bill, 2025."

ගරු සභාපතිතුමනි, අද අපි විවාද කරන අමාත්‍යාංශය ඉතා වැදගත් අමාත්‍යාංශයක්. මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳවයි අද අපි කථා කරන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන කථා කරනකොට, සෞඛ්‍ය පද්ධතිය ඩිජිටල්කරණය සඳහා ආණ්ඩුව අවධානය යොමු කර තිබෙනවා. ඒ සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒක හොඳයි. මොකද, අපට සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් ගොඩ නහන්න අවශ්‍ය නම්, මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කරන්න නම්, අලුත් තාක්ෂණයත් එක්ක යා යුතුයි. රෝග හඳුනා ගන්න, රෝග වළක්වා ගන්න, රෝගීන්ට ප්‍රතිකාර කරන්න මේ නව තාක්ෂණය ඉතා වැදගත්. ප්‍රාථමික සෞඛ්‍ය සේවයටත් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒක හොඳ ක්‍රියාවක්, අපි අගය කරනවා. ඒ වාගේම, වසංගත රෝග පිළිබඳවත් රජය අවධානය යොමු කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, කොවිඩ් වසංගතය හමුවේ අපි මොන තරම් භීතියට පත් වුණාද කියන එක මෑත ඉතිහාසයට ගියාම අපට මතක් වෙනවා. අපට ඒ පිළිබඳ අත්දැකීමක් තිබෙනවා. ඒ නිසා ඒවාට මුදල් වෙන් කිරීම අපි අගය කරන්නට ඕනෑ.

ඒ වාගේම, ඔටිසම් වාගේ රෝගී තත්ත්ව තිබෙන දරුවන් වෙනුවෙන් මෙම අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. අපි කුහක වෙන්නේ නැහැ, එවැනි හොඳ දේවල්වලට හොඳයි කියන්න.

ඊළඟ එක තමයි, මානසික සෞඛ්‍යය. මේ දියුණු වන සමාජයේ මානසික සෞඛ්‍යය ඉතා වැදගත්. ඒ නිසා මානසික ආතතිය වාගේ කරුණු කාරණාවලට අවධානය යොමු කිරීම ඉතා වැදගත්. මේ අය වැය ලේඛනයෙන් ගැබිනි මවුවරුන්ගේ පෝෂණය සඳහා රුපියල් බිලියන 7.5ක් වෙන් කරලා තිබෙනවා. 2015 වර්ෂයේ පැවති යහ පාලන ආණ්ඩුවෙන් අපි ගැබිනි මවුවරුන්ට පෝෂණ මල්ලක් ලබා දීම සඳහා මුදල් වෙන් කරලා, රුපියල් 28,000ක පෝෂණ මල්ලක් ලබා දෙන්න කටයුතු කළා. එවැනි වැඩ පිළිවෙළක් තවදුරටත් ක්‍රියාත්මක වෙනවා. ඒක අපි අගය කරනවා.

ගරු සභාපතිතුමනි, යහ පාලන ආණ්ඩුවෙන් අපි "සුවසැරිය" ගිලන් රථ සේවාව ආරම්භ කළා.

[ගරු කවින්ද භේෂාන් ජයවර්ධන මහතා]

ඒ ව්‍යාපෘතිය අපි ආරම්භ කරනකොට සමහර අය ඒක විවේචනය කළා, බිල්ලෝ මැව්වා, "රෝ" ඔත්තු සේවය එනවා කිව්වා. මේ රටේ තොරතුරු ඉන්දියාවට ගෙනියයි කිව්වා. ගරු සභාපතිතුමනි, මේ සුවසැරිය ව්‍යාපෘතිය හරහා මේ රටේ ජීවිත ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් බේරලා තිබෙනවා කියලා අද පැහැදිලිව ඔප්පු වෙලා තිබෙනවා. මේ ආණ්ඩුවත් රුපියල් බිලියන 4.9ක් වෙන් කරලා තිබෙනවා සුවසැරිය ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට කරගෙන යන්න. රෝග වළක්වා ගැනීම සඳහා රුපියල් බිලියන 12.5ක් වෙන් කරලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව තවත් අවධානය යොමු කරලා තවත් මුදල් වෙන් කරන්න පුළුවන් නම් ඒ සඳහා කටයුතු කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, අද ඉතා දෛවෝපගත දවසක්. අද වාගේ දවසක, 2015 දෙසැම්බර් 10වෙනි දා ඔබතුමා මේ පැත්තේ ඉඳන් සෞඛ්‍ය ඇමති වෛද්‍ය රාජිත සේනාරත්න මහත්තයා හිටපු සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කළා. වෛද්‍ය රාජිත සේනාරත්න මහත්තයා ඔබතුමාත් එක්ක කළුතර දිස්ත්‍රික්කයෙන් ආපු මන්ත්‍රීවරයෙක්. එදා මට මතකයි එතුමා කිව්වා, "මම කැමතියි යම් කිසි දවසක මේ රටේ සෞඛ්‍ය ඇමතිවරයා හැටියට වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා දකින්න" කියලා. අද ඔබතුමා මේ රටේ සෞඛ්‍ය ඇමතිතුමා.

2015 දෙසැම්බර් 10වන දා ඔබතුමා කළ කථාව එදින හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1272 හි ඔබතුමා මෙසේ කියා තිබෙනවා:

> "ගරු සභාපතිතුමනි, අපේ රටට සෞඛ්‍ය සම්බන්ධයෙන් ලෝකයේ වඩා ඉහළ පිළිගැනීමක් තිබුණා..."

ඔව්, ඒක ඇත්ත. ඒ වාගේම ඒකට ඔබතුමා කරුණුත් කියනවා:

> "...මාතෘ මරණ අනුපාතිකය ගත්තොත්, 1945දී සජීවී උපත් ලක්ෂයකට 1,652ක් වුණා. 2014 වන කොට අපි එම සංඛ්‍යාව 22 දක්වා අඩු කරගෙන තිබෙනවා. ළදරු මරණ අනුපාතිකය 1946දී 1,000කට 141ක්ව තිබුණා. 2014 වන කොට එය 9.02 දක්වා අඩු කරගෙන තිබෙනවා..."

ඒ කියන්නේ අපේ සෞඛ්‍ය පද්ධතිය ඉහළට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමා කියනවා, "මේ රටේ ඉන්නේ හෙදියන් 31,000කට ආසන්න ප්‍රමාණයක්; හැබැයි, මේ රටේ ඉන්න ඕනෑ හෙදියන් ප්‍රමාණය 66,000ක්" කියලා. අද ඔබතුමා සෞඛ්‍ය ඇමතිවරයා. ඉතින්, ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කරලා ඇති කියලා මම හිතනවා. එදා ඔබතුමා මේ කථාව කරනකොට මමත් ඔබතුමා එක්ක මේ පැත්තේ හිටපු පසුපෙළ තරුණ මන්ත්‍රීවරයෙක්. එදා ඔබතුමා කිව්වා මට මතකයි, Neurotrauma Unit එකේ ඇඳන් 60න් 24ක්ම පාවිච්චි කරන්න විධියක් නැහැ, මේ තිබෙන අඩුපාඩු නිසා කියලා. ඔබතුමා මේ වනකොට ඒවා ගැන අවධානය යොමු කරලා ඇති කියා අපි විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ලෝකයේ ශ්‍රේණිගත කිරීම්වලදී අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තිබෙන්නේ 47වැනි තැන. එංගලන්තය තිබෙන්නේ 37 වැනි තැන. ඒ කියන්නේ, අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය අද ලෝකයේ ඉදිරියට ඇවිල්ලා තිබෙනවා කියන එකයි. අපේ රටේ වෛද්‍යවරුන්ගේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ දහඩිය, මහන්සිය, කාලය, ශ්‍රමය වැය කරලා තමයි අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය මේ තරම් ඉදිරියට ඇවිල්ලා තිබෙන්නේ කියන එක මම මතක් කරලා දෙන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා අවුරුදු 75ක පාලන කාලයට බැන්නා. මේ අවුරුදු 75ක කාලයේ සිටි දේශපාලන නායකයන්ට බැන්නා. හැබැයි, ඒ දේශපාලන නායකයන් සහ පාලකයන් මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ලෝකයේ 47වැනි ස්ථානය දක්වා ගෙන එන්නට අවශ්‍ය කරන කැපවීම කළාය කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් පැය 8කට වඩා සේවය කරනවා. ඒ කියන්නේ, මාසයකට පැය 240කට වඩා ඔවුන් සේවය කරනවා. අපි ඒ සේවය අගය කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒ වාගේම වෛද්‍යවරයකු දිනකට පැය 24ක් වැඩ කළත්, ඒ අයට additionally claim කරන්න පුළුවන් එක්කෝ දිනකට පැය 6ක්, එහෙම නැත්නම් පැය 4ක්; මාසයකට පැය 120ක් විතරයි. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් වෛද්‍යවරයෙක්. ඒ නිසා මේක දෛවෝපගත සිදුවීමක්. මේ වෛද්‍යවරු ඒ පැය 6 තුළත්, තමන් කරන duty එක අතරතුරත් extra duty කරන බව ඔබතුමා දන්නවා, ගරු සභාපතිතුමනි. ඒ අය management කරනවා. ඒ වාගේම ඒ අය වෛද්‍ය සිසුන්ට උගන්වනවා. ඒ අය ඒ අයගේ රාජකාරියෙන් එහාට ගිය සේවයක් වෛද්‍යවරු හැටියට කරනවා කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ.

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ට අද නිවාඩු දිනයක් කියලා, අද පෝය කියලා, එහෙම නැත්නම් අද මහ සිකුරාදා කියලා, අද මහා ශිව රාත්‍රී දිනය කියලා ගෙදර ඉන්න බැහැ. ඒ වාගේම රාජ්‍ය සේවයේ විධායක නිලධාරීන්ට OT නැහැ. ඒ වාගේම, මම අර කලින් කියපු තමන්ගේ රැකියාවට එහා ගිය සේවයක් මේ රටේ දෙකෝටි විසිලක්ෂයක් වෙච්ච මිනිස්සු වෙනුවෙන් ඒ අය කරනවා, ගරු සභාපතිතුමනි. ඒ විතරක් නොවෙයි. Outpatient Department - OPD - එක ගත්තොත්, මේ රටේ වෛද්‍යවරු සමහර වෙලාවට දිනකට රෝගීන් 300කට ආසන්න ප්‍රමාණයකට ප්‍රතිකාර කරනවා, රෝග හඳුනා ගන්නවා, රෝග විනිශ්චය කරනවා කියන එක අපි මතක් කරලා දෙන්න කැමැතියි. ඒ වාගේම ශල්‍ය වෛද්‍යවරු ගත්තොත්, ඔවුන් තමන්ට කරන්න පුළුවන් උපරිම ශල්‍යකර්ම ප්‍රමාණය කරනවා, ගරු සභාපතිතුමනි. මොකද, ශල්‍යකර්ම සඳහා මේ රටේ දැවැන්ත රෝගීන් ප්‍රමාණයක් පෝලිම්වල ඉන්නවා. ඒ නිසා ඒ අය උපරිම මට්ටමෙන් තමන්ගේ සේවය කරනවා. මේ අය ඉල්ලන්නේ, extra duty එකට රුපියල් බිලියන 6කට ආසන්න ප්‍රමාණයක් වෙන් කරන්න කියලායි. මේක කොටස් වශයෙන් හරි අපට ලබා දෙන්න පුළුවන් නම් ඉතා වටිනවා, ගරු සභාපතිතුමනි.

අපට මතකයි, මේ රටේ පාඩු ලබන ආයතනයක් වෙච්ච ශ්‍රීලන්කන් ගුවන් සේවයට රුපියල් බිලියන 20ක් වෙන් කරනකොට, වඳුරෙක් පැනලා විදුලි පද්ධතිය බිඳ වැටුණාට පස්සේ, ඩීසල් බලාගාර on කරන්න රුපියල් බිලියන 4ක් වැය කරනකොට, මෙන්ඩිස් අරක්කු සමාගමට රුපියල් බිලියන 5ක බදු සහන දෙනකොට, අපේ රටේ අහිංසක රෝගීන්ට ප්‍රතිකාර කරන, මේ රටේ ජනතාව සුවපත් කරන සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඉල්ලන්නේ රුපියල් බිලියන 6ක් පමණයි, ගරු සභාපතිතුමනි. එදා -2016දී- යහ පාලන ආණ්ඩුව රුපියල් 10,000කින් රාජ්‍ය සේවක වැටුප් වැඩි කළා. ඒකෙදීත් extra duty එක සඳහා ඒගොල්ලන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා, 2018-2020 දක්වා. ක්‍රමානුකූලව තමයි එදා ඒක ක්‍රියාත්මක කළේ. 2018දී සියයට 64ක්, 2020 වනකොට සියයට 107ක් දක්වා වශයෙන් ක්‍රමානුකූලව වැටුප් වැඩිවීමක් ලබා දුන්නා; extra duty එකට අවශ්‍ය කරන මුදල් ටික ලබා දුන්නා. ඒ වෙලාවේ කවුරුවත් උද්ඝෝෂණය කරන්න, වැඩ වර්ජන කරන්න කටයුතු කළේ නැහැ කියන එකත් මම මතක් කරලා දෙනවා, ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම ලෝකයේ අනෙක් රටවල් වෛද්‍යවරුන්ට සලකන විධිය අපි දන්නවා. ගරු සභාපතිතුමනි, එක් වෛද්‍යවරයෙකුගේ extra duty පැයක් සලකන්නේ සාමාන්‍ය මිනිස් පැය තුනක් හැටියටයි. එතකොට

extra පැයක් සඳහා ඒ අයට ගෙවීම් කරන්නේ, පැය තුනකට සාපේක්ෂවයි. ඒ නිසා තමයි 1980.10.01වැනි දා මේ රටේ හිටපු වෛද්‍යවරුන් සටන් කරලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් extra duty allowance එක විධියට මූලික වැටුපෙන් 1/80ක් ලබා ගන්න කටයුතු කළේ කියන එක මේ වෙලාවේ මම පැහැදිලිව මතක් කරලා දෙනවා. ඉතින් ජේ.ආර්. ජයවර්ධන මහත්තයා හදපු මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ඒ වාගේම එතුමා මේ රටේ වෛද්‍යවරුන්ට ලබා දී තිබෙන දීමනා එක්ක වැඩිය සෙල්ලම් කරන්න නරකයි. මොකද, එතුමා විසින් සකස් කොට තිබෙන නීත්‍යානුකූල ක්‍රියාදාමයන්වල තිබෙන ගැඹුරුභාවය අපි තේරුම්ගත යුතුයි.

ගරු සභාපතිතුමනි, "මොනවද මුත්තේ මොකද කරන්නේ, මොකටද ඔබ ඔය බිම භාරන්නේ" කියන සින්දුව මේ වෙලාවේ මට මතක් වෙනවා. එදා ඒ මුත්තා මේ මහ පොළොවේ අඹ ඇටයක් හිටෙව්වා. ඒ අඹ ඇටය අද ගසක් බවට පත්වෙලා එහි ඵලවලින් ප්‍රතිලාභ ලබන සමාජයක් මේ රටේ ඉන්නවාය කියන එක මම මතක් කර දෙනවා. එම නිසා මේ රටේ වෛද්‍යවරුන්, හෙදියන්, පරිපූරක වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අනෙකුත් නිලධාරින් අපි උදෙව්ගීමත් කරන්න ඕනෑ, මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය සේවාව ලබා දෙන්න. එහෙම නොකරපු නිසා තමයි, 2019දී අපේ රටේ දැවැන්ත brain drain එකක් වුණේ, එහෙම නැත්නම් බුද්ධි ගලනයකට මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ලක් වුණේ කියන එකත් මම මතක් කර දෙනවා.

කෙහෙළිය රඹුක්වැල්ල හිටපු සෞඛ්‍ය ඇමතිවරයා වෛද්‍යවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව අවුරුදු 60 දක්වා අඩු කරපු අවස්ථාවේදී මම ඒ වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ, මේ ගරු සභාවේ හඬ නැඟුවා, ගරු සභාපතිතුමනි. වෛද්‍යවරුන්ට ලැබුණු vehicle permit එක නැති කළා. වෛද්‍යවරුන්ට තමන්ගේ රැකියාවට තිබෙන තෘප්තිමත්භාවය නැති කළා, ගරු සභාපතිතුමනි. වෛද්‍යවරයෙකු හැටියට ඔබතුමාත් දන්නවා, තමන්ගේ MBBS degree එක කරලා, ඊට පස්සේ postgraduate degree කරලා, super specialization course එක කරලා වෛද්‍යවරයෙකු හැටියට බිහි වෙන්න මොන තරම් කාලයක් ගත වනවා ද කියලා. අපේ රටේ හැම දෙමව්පියෙකුගේම බලාපොරොත්තුව වන්නේ තමන්ගේ දරුවන්ව වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවරයෙක්, එහෙම නැත්නම් ඉහළ පෙළේ උගතෙක් බුද්ධිමතෙක් කිරීම. තමන්ගේ කාලය, ශ්‍රමය, ධනය වැය කරලා මේ තැනට එන වෛද්‍යවරයාට අද රියදුරෙක් නැහැ, ප්‍රවාහන පහසුකම් නැහැ, නවාතැන් පහසුකම් නැහැ, සේවා ස්ථානයේ duty කරනකොට ඒ අයට අවශ්‍ය ප්‍රාථමික පහසුකම් ටිකවත් නැහැ, ගරු සභාපතිතුමනි. දුෂ්කර පළාත්වල වැඩ කරන වෛද්‍යවරුන් තමන්ගේ අතේ තිබෙන මුදලින් කුලියට ගෙවල් අරගෙන නතර වෙලා ඉන්නවා කියලා අපි දන්නවා. ඒ වෛද්‍යවරුන් අතර දවසේ පැය 24ම on call ඉන්න වෛද්‍යවරුන් සිටිනවා. ගරු සභාපතිතුමනි, මම දන්නා වෛද්‍යවරුන් ඉන්නවා, ඒ අය එක දිගට පැය 24, පැය 48, පැය 72 වැඩ කරනවා. එම නිසා අපි මේ ප්‍රශ්නය පිළිබඳව සංවේදී විය යුතුයි. මොකද, මේ වෛද්‍යවරුන් අපට අවශ්‍යයි. ඇයි, මම එහෙම කියන්නේ? 2021-2024 කාලය තුළ විශේෂඥ වෛද්‍යවරුන් 195දෙනෙක් මේ රට අතහැර ගිහින් තිබෙනවා. එවැනි වෛද්‍යවරයෙකු බිහි කරන්න මේ රට කොයි තරම් මුදලක් වැය කරනවාද, ඒ සඳහා ඒ වෛද්‍යවරයා මොන තරම් කාලයක් කැප කරනවාද කියන එක පිළිබඳව අපි සංවේදී විය යුතුයි කියලා මම විශ්වාස කරනවා, ගරු සභාපතිතුමනි. ඒ විතරක් නොවෙයි. 2020-2024 දක්වා කාලය තුළ වෛද්‍යවරුන් 2,440ක් අපේ රට අතහැර ගිහින් තිබෙනවා. ඒක මොන තරම් බේදජනකද කියන එක මම ඉදිරියේදී පැහැදිලි කරන්නම්. ඒ වාගේම මේ කෙටි කාලය තුළ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් 163දෙනෙකුත්, හෙද නිලධාරින් 1,027කුත් අපේ රට අතහැර ගිහින් තිබෙනවා. ඒ වාගේම වෛද්‍ය සේවාව හා සම්බන්ධ අනෙකුත් වෘත්තියවේදීන් 283ක් අපේ රට -මේ මාතෘ භූමිය; අපේ ලංකාව- අතහැර ගිහින් තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඒ විතරක් නොවෙයි. අතුරු වෛද්‍ය සේවා නිලධාරින් සහ MN 1 සේවා නිලධාරින් 79දෙනෙක් මේ රට අතහැර ගිහින් තිබෙනවා. ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් සේවාවල වෘත්තිකයින් 108දෙනෙකුත් අපේ රට අතහැර ගිහින් තිබෙනවා. අපි මේ පිළිබඳව මේ මොහොතේ අවධානය යොමු නොකළොත්, අනාගතයේදී අපට පසුතැවෙන්න වෙයි කියන එක මම මේ ගරු සභාවට මතක් කර දෙනවා.

මට මතකයි, පසුගිය පාර්ලිමේන්තුවේදී අපේ නායකතුමා වන සජිත් ප්‍රේමදාස මැතිතුමා රජයේ වෛද්‍යවරුන්ගේ සංගමයේ සාමාජිකයන් මුණ ගැසුණා. ඒ අය ඉල්ලීමක් කළා, වෛද්‍යවරුන්ට ලබා දෙන DAT allowance එකට මැදිහත් වෙන්න කියලා. ඒ අවස්ථාවේදී මේ ගරු සභාවේ හිටපු පක්ෂ, විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් අප සමඟ එකතු වුණා, ගරු සභාපතිතුමනි. එවකට හිටපු කථානායකතුමා අපට අවසර දුන්නා, වෛද්‍යවරුන්ගේ caucus එකක් මේ පාර්ලිමේන්තුවේ ස්ථාපිත කරන්න. එහිදී අපට පුළුවන්කම ලැබුණා, පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ගිහිල්ලා, ආණ්ඩුවට බලපෑම් කරලා ඒ වෛද්‍යවරුන්ට රුපියල් 70,000ක DAT allowance එක ලබා දෙන්න. ඒ caucus එකේ උප සභාපතිවරයෙකු හැටියට මමත් කටයුතු කළා. ඔවුන්ට ඒ මුදලත් මදි, ගරු සභාපතිතුමනි. ඒ අයට රුපියල් 260,000ක් ලැබිය යුතුයි කියන කාරණයත් මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා, "The Morning" පුවත්පතේ සිරස්තලයක්: "President announced a historic budget allocation for health sector in 2025". ඒ යටතේ මෙන්න මෙහෙම සඳහන් කර තිබෙනවා: "President Anura Kumara Dissanayake while delivering 2025 Budget Speech, said that the Government's Budget allocation for the health sector for 2025 has been significantly increased to Rs. 604 billion" . එහි ඒක පැහැදිලිව කියනවා.

එහි මෙසේ ද සඳහන් වී තිබෙනවා: "Dissanayake said that an amount of Rs. 185 billion has been allocated from the Budget to ensure the supply of medicines. Meanwhile, President Dissanayake highlighted that Rs. 7.5 billion will be allocated to supply nutrition packs for pregnant mothers, while Rs. 5 billion will be allocated for the 'Thriposha' programme." සල්ලි වෙන් කරලා තිබෙනවා, සෞඛ්‍ය ක්ෂේත්‍රයට. හොඳයි, ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, සල්ලි වෙන් කළාට වැඩක් නැහැ, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරින් තෘප්තිමත්ව කටයුතු නොකළොත්. අන්න ඒ කාරණය මම ඔබතුමාට මතක් කර දෙනවා. ඒ වාගේම පරිපූරක වෛද්‍ය සේවයේ, හෙද හා අතුරු වෛද්‍ය සේවාවල අතිකාල දීමනාව ලෙස ගෙවූ 1/160 දීමනාව, 1/200 බවට පත් කිරීමට විරුද්ධව අද ඒ අය හඬ නඟනවා. එම නිසා ඒ තිබුණු දීමනාවම ඒ අයට ලබා දෙන්න කියා අපි මේ පාර්ලිමේන්තුවේදී යෝජනා කර සිටිනවා. ඒ වාගේම නිවාඩු දින දීමනාව 1/20 සිට 1/30 බවට පත් කරලා තිබෙනවා. මෙතෙක් තිබුණු 1/20 නිවාඩු දින දීමනාවම ඒ අයට ලබා දෙන්න කියන ඉල්ලීම මා කරනවා. වැටුප් වැඩි කිරීම, basic වැටුප වැඩි කිරීම හොඳයි. හැබැයි, තිබුණු දීමනා ඉවත් කරන්න එපා කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු මන්ත්‍රීතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් ලබා දෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු සභාපතිතුමනි, වෛද්‍යවරුන්ට හවස 4.00ට ගෙදර යන්න බැහැ; දවල් 12.00ට ගෙදර යන්න බැහැ. නිවාඩු දවස්වල ගෙදර ඉන්න බැහැ. ඒ අයට පැය 24ම වැඩ කරන්න සිදු වෙනවා. ඒ වාගේම ජනතාවට අඛණ්ඩව සේවාව ලබා දීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ට අඛණ්ඩව වැඩ කරන්න සිදු වෙනවා, ගරු සභාපතිතුමනි. ඒකට පිරිවැයක් - cost එකක් - තිබෙනවා. උදාහරණයක් හැටියට පැය 24ක් වැඩ කරන හෙදියක් ගත්තොත්, ඒ හෙදියගේ දරුවන්ට කන්න දෙන්න විධියක් නැහැ; උයන්න විධියක් නැහැ; කඩෙන් තමයි දරුවන්ට කෑම ටික ගෙනැල්ලා දෙන්න වෙන්නේ; තමන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න, පන්ති අරගෙන යන්න වෙන්නේ නැහැ. වෙන කාට හරි තමයි ඒක පංගාර්තු කරන්න වෙන්නේ. වෛද්‍යවරයෙක් ගත්තොත්, private practise කරන්න වෙන්නේ නැහැ. අන්න ඒකට cost එකක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. වර්තමාන රජයේ ප්‍රතිපත්ති අනුව සියයට 3ක් සෞඛ්‍යයට වෙන් කරනවාය කියලා තිබෙනවා. හැබැයි, මේ අවුරුද්දේ මේ අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ, සියයට 1.8ක් බව මම මතක් කර දෙනවා. බෝ නොවන රෝගවලින් මරණයට පත් වන ප්‍රමාණයත්, රෝගීන්ට තිබෙන පහසුකම් පිළිබඳවත් තොරතුරු ඇතුළත් තොරතුරු සටහන මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, කාල වේලාව ගත වී තිබෙන නිසා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කළ යුතු කාරණයක් තිබෙනවා. ඊයේ දිනයේ මම දැක්කා "Sudaa Creation" කියන YouTube channel එකේ දාලා තිබෙනවා කොළඹ මහ රෝහලේ රෝගීන්ව මහ දවාලේ මහ පාරේ එහෙට මෙහෙට අරගෙන යන ආකාරය. මම හිතන විධියට, ඒක අවදානම්සහගත තත්ත්වයක්. ගරු ඇමතිතුමනි, ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ වෙනකොට අවධානය යොමු වෙලා ඇති කියලාත් මම හිතනවා.

ගරු සභාපතිතුමනි, දේශීයව නිෂ්පාදනය කරන ඖෂධවලට අවශ්‍ය ඇසුරුම්වලට පනවා තිබුණු VAT එක ඉවත් කරලා තිබෙනවා. ඒක හොඳයි. දේශීය නිෂ්පාදකයන් දිරිමත් කරන්න. හැබැයි, ඖෂධ 550න් 200කට ආසන්න ප්‍රමාණයක හිඟයක් තිබෙනවා. මේකට විශේෂයෙන්ම බලපාන්නේ ටෙන්ඩර් පටිපාටියේ තිබෙන ප්‍රමාදය. ඒ වාගේම බලපානවා ණයවර ලිපි නිකුත් කිරීමේදී තිබෙන ප්‍රමාදය. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. උදාහරණයක් විධියට, labetalol, salbutamol respiratory solution, human albumin, coagulation factors කියන බෙහෙත් වර්ග අපේ රටේ හිඟයි. ඒ වාගේම සෞඛ්‍ය අධ්‍යාපනයටත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මම මතක් කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම ගරු වෛද්‍ය රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට නියමිත intermediate cadre එක පිළිබඳ යෝජනාව සලකා බලා, එය අනාගතයේදී ලබා දෙන්න කියන ඉල්ලීමත් කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට කාලය ලබාදීම ගැන ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Nalinda Jayatissa. You have 25 minutes.

[පූ.භා. 10.06]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු සභාපතිතුමනි, වෛද්‍ය වෘත්තිකයෙකු සහ වෛද්‍ය පරිපාලකයෙකු ලෙස කටයුතු කළ ඔබතුමා මූලාසනයේ සිටියදී සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය ආණ්ඩුව පැත්තෙන් ආරම්භ කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා.

විපක්ෂය පැත්තෙන් අද විවාදය ආරම්භ කළ ගරු කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා කියපු පරිදිම 2015 දෙසැම්බර් මාසයේ ඉඳලා අවුරුදු 5ක් එක දිගට අය වැය විවාදයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට රුපියල් 10 කපලා, විවාදය ආරම්භ කළේ මම තමයි. අපි කවුරුත් මෙතෙක් කල් සෞඛ්‍ය පිළිබඳව දක්වපු අදහස් අපේ පාලනයක් යටතේ ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කරන්න තමයි අද අපි මේ අමාත්‍යාංශය මෙහෙයවමින් ඉන්නේ.

ගරු සභාපතිතුමනි, අද අපට කථා කරන්න තිබෙන්නේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳව. ඇත්තටම මේ විෂය පථය තුළ කලින් පැවති අමාත්‍යාංශ 4ක වැඩකටයුතු තිබෙනවා. ඒවා තමයි, සෞඛ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ තැපැල් අමාත්‍යාංශය. තැපැල් අමාත්‍යාංශයේ වැඩ කටයුතුත් දැන් තිබෙන්නේ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ. වසර කිහිපයකට කලින් රාජ්‍ය නායකයා යටතේ තිබුණු ශ්‍රී ලංකා පදනම් ආයතනය තිබෙන්නේත් අපේ අමාත්‍යාංශය යටතේ. ඒ නිසා මේ කෙටි කාලය ඇතුළතදී මේ සියලු ආයතන පිළිබඳව යම් අවධානයක් යොමු කරන්න මම බලාපොරොත්තු වෙනවා, ගරු සභාපතිතුමනි.

මේ රටේ ජනතාව පසුගිය මාස පහක කාලය ඇතුළත දෙවරක් අනුමත කරන ලද "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළ පසුගිය දා කැබිනට් මණ්ඩලයේදී අපි රාජ්‍ය ප්‍රතිපත්ති රාමුවේ කොටසක් බවට පත් කිරීම සඳහා යෝජනාවක් සම්මත කර ගත්තා. එම ප්‍රතිපත්ති රාමුවේ තිබෙන ප්‍රධාන තේමා හතරෙන් එකක් තමයි, "පරිසමාප්ත ජීවිතයක් - සුව පහසු රටක්" කියන එක. එහි 01.2 යටතේ තිබෙනවා "නීරෝගී ජීවිතයක් සහ සෞඛ්‍ය සම්පන්න ජනතාවක්" කියන එක. අපි අපේ ප්‍රතිපත්ති මාලාවේ ප්‍රධාන කොටසේ; අංක එක යටතේම මේ රටේ ජනතාවට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් උරුම කිරීම වෙනුවෙන් අපේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රතිපත්ති මාලාව සකස් වෙලා තිබෙන්නේම මේ වනවිට එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වෙලා, අද ලෝකයම පිළිගෙන තිබෙන Sustainable Development Goals නැත්නම් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහායි. SGDsවල තිබෙන තුන්වන ඉලක්කය තමයි නීරෝගීකම සහ යහ පැවැත්ම - good health and well-being-; මුළු ලෝකයේම ජනතාවට නීරෝගී ජීවිතයක් යහ පැවැත්මක් අත්පත් කරලා දෙන එක. මේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයටත්, ඒ වාගේම SGDs ඉලක්කවල සෞඛ්‍ය සම්බන්ධයෙන් තිබෙන තුන්වැනි ඉලක්කයටත් පදනම වෙන එක ප්‍රධාන කරුණක් හැටියට අපි පිළිගන්නේ, Universal Health Coverage කියන එකයි. ඒ කියන්නේ, විශ්වීය සෞඛ්‍ය ආවරණය. අන්න ඒ මූලික ප්‍රතිපත්තිය මත පදනම් වෙලා තමයි අපි අපේ සෞඛ්‍ය සේවාවේ වැඩකටයුතු මෙහෙයවන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ යටතේ ජනතාවට භේදයකින් තොරව, ගෞරවනීයව සෞඛ්‍ය සේවාවට ප්‍රවේශ වෙන්නට, ප්‍රතිලාභ ලැබීමට ඇති අයිතිය අපි තහවුරු කරනවා. ඒ ජනතාව කවර මාදිලියකින් සෞඛ්‍ය සේවාව ලබා ගත්තත්, ඒ වෙනුවෙන් රාජ්‍යය වග කියනවා.

තුන්වැනි කරුණ හැටියට ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව අපි උසස් තත්ත්වයේ සෞඛ්‍ය සේවාවක් ජනතාවට ලබා දෙන්න කටයුතු කරනවා. මේ ප්‍රධාන මූලධර්ම තුන යටතේ තමයි අපි මේ සමස්ත සෞඛ්‍ය සේවාව මෙහෙයවන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ අනුව එතෙක් මෙතෙක් ඉතිහාසයේ සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කරන ලද වැඩිම මුදල් ප්‍රතිපාදනය මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා කියලා අපට බොහොම ආඩම්බරයෙන් කියන්නට පුළුවන්.

සෞඛ්‍ය අමාත්‍යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 386ක් වෙන් කර තිබෙන අතරේ, ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් බිලියන 92ක් ඇතුළුව රුපියල් බිලියන 479ක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. මෙපමණක් නොවෙයි, ගරු සභාපතිතුමනි. අපි පළාත් සභා සඳහා සෞඛ්‍ය සේවා වැඩකටයුතු විශාල ප්‍රමාණයක් කරගෙන යනවා. ඒ අනුව සමස්ත සෞඛ්‍ය අංශය වෙනුවෙන් වෙන් කරන මුදල රුපියල් බිලියන 604ක්. ඒ බිලියන 604න් ප්‍රාග්ධන වියදම් සඳහා බිලියන 107කුත්, පුනරාවර්තන වියදම් සඳහා බිලියන 496කුත් අපි වෙන් කර තිබෙනවා. රුපියල් බිලියන 604ක් මේ රටේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා වෙනුවෙන් වියදම් කරන්න අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි මාස කිහිපය ඇතුළතදී.

2024ට සාපේක්ෂව ගත්තොත්, 2024දී දේශීය වෛද්‍ය අංශය ඇතුළු සමස්ත සෞඛ්‍ය අංශය වෙනුවෙන් වෙන් කර තිබුණේ රුපියල් බිලියන 352ක් පමණයි. සෞඛ්‍යය වෙනුවෙන් බිලියන 352ක් වෙන් කර තිබුණු රටකට, අපි මෙවර අය වැයෙන් රුපියල් බිලියන 604ක් වෙන් කර තිබෙනවා. මේ සියලු මුදල් ඉතාම ඵලදායී සහ කාර්යක්ෂම ලෙස මහජනතාව වෙනුවෙන් යොදවන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මම කියන්නට කැමැතියි, ඇලෝපති, දේශීය වෛද්‍ය, ආයුර්වේද, පාරම්පරික, සිද්ධ, යුනානි, හෝමියෝපති ඇතුළු මේ සියලු වෛද්‍ය ක්‍රමවලින් ආවරණය වන සෞඛ්‍ය ක්ෂේත්‍රය ප්‍රධාන ධාරා පහක් ඔස්සේ සංවර්ධනය කරන්නට අපි බලාපොරොත්තු වන බව. පළමුවැනි එක, ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම. දෙවැනි එක, අපේ ද්විතීයික, තෘතීයික ප්‍රතිකාර ඒකක, නැත්නම් රෝහල් පද්ධතිය සංවර්ධනය කිරීම. තුන්වැනි එක, අඛණ්ඩ හා ගුණාත්මක ඖෂධ සැපයීමක් සහතික කිරීම. හතරවැනි එක, මේ රටේ බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙන, හැම දාම සාකච්ඡා කරන මේ පෝෂණ ප්‍රශ්නයට උත්තර සැපයීම. පස්වැනි එක, සෞඛ්‍ය ක්ෂේත්‍රය ලෝකයට ගෙන ගොස් අපිට විදේශ විනිමය ඉපැයිය හැකි ආකාරයට සෞඛ්‍ය සංචාරක ව්‍යාපාරයක් දක්වා වර්ධනය කිරීම. මෙන්න මේ ප්‍රධාන ධාරා පහ ඔස්සේ තමයි අපි සෞඛ්‍ය ක්ෂේත්‍රය මෙහෙයවන්න බලාපොරොත්තු වන්නේ.

ගරු සභාපතිතුමනි, ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක්. මොකද, අපේ රටේ ජනගහනය මිලියන 22ක් වුණාට වසරකට රජයේ රෝහල්වල බාහිර රෝගී අංශවලින් ප්‍රතිකාර ගන්නා ප්‍රමාණය මිලියන 90ක්, 100ක් පමණ වෙනවා. පෞද්ගලික රෝහල්වල බාහිර රෝගී අංශවලිනුත් මීට ආසන්න ප්‍රමාණයක් ප්‍රතිකාර ගන්නවා. ආයුර්වේද අංශයෙනුත් මිලියන 6ක් පමණ වාර්ෂිකව ප්‍රතිකාර ගන්නවා. එහෙම ගත්තොත්, දළ වශයෙන් මිලියන 200ක්, 210ක් අතර ප්‍රමාණයක ජනතාවක් වාර්ෂිකව clinicsවලින් සහ OPDsවලින් බාහිර රෝගීන් හැටියට ප්‍රතිකාර ලබා ගන්නවා. ඒ කියන්නේ එක පුද්ගලයෙක් අවුරුද්දකට 10 වතාවක්, 11 වතාවක් පමණ බාහිර රෝගී අංශවලින් ප්‍රතිකාර ගන්නවා. මේක විසඳිය යුතු බරපතළ ප්‍රශ්නයක්.

දෙවැනි කාරණය තමයි, අපේ රටේ තිබෙන බෝ නොවන රෝග ව්‍යාප්තිය. අලුත් සංඛ්‍යාලේඛන අනුව ගත්තොත්, සාමාන්‍යයෙන් අපේ රටේ ජනගහනයෙන් සියයට 14ක් දියවැඩියාවෙන් පෙළෙනවා. සියයට 34ක් පමණ අධික රුධිර පීඩනයෙන් පෙළෙනවා. අපේ රටේ සිදු වන මරණවලින් සියයට 70කට හේතුව බෝ නොවන රෝග. එයිනුත් සියයට 70ක් පමණ සිදු වෙන්නේ හෘදය ආශ්‍රිත රෝගවලින්. ඒ නිසා NCDs නැත්නම් non-communicable diseases වැළැක්වීමට අපි කඩිනම් පියවරක් ගත යුතුයි.

ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන තුන්වන හේතුව තමයි අපේ රටේ වැඩිහිටි ජනගහනයේ සිදු වන වේගවත් වර්ධනය. කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක පුරෝකථනය කර තිබෙන හැටියට 2032දී අපේ රටේ වැඩිහිටි ජනගහනය සමස්ත ජනගහනයෙන් සියයට 20.8ක් වෙනවා. 2037 වෙනකොට ඒ ප්‍රමාණය සියයට 22.1 දක්වා වර්ධනය වෙනවා. මෙන්න මේ ප්‍රධාන හේතු තුන නිසා, ඒ කියන්නේ බාහිර රෝගී අංශවලට පැමිණෙන රෝගීන්ගේ සංඛ්‍යාව විශාල ප්‍රමාණයක් වීම, බෝ නොවන රෝග ව්‍යාප්තිය වැඩිවීම, වැඩිහිටි ජනගහනයේ වර්ධනය කියන හේතු සාධක නිසා, සෑම පුරවැසියෙකුටම තමන්ට වැලඳෙන රෝගවලට ප්‍රතිකාර ගන්න, රෝග නිවාරණය කරගන්න, සහන සත්කාර ලබා ගන්න, පුනරුත්ථාපනය - rehabilitation - ආදී සියලු කටයුතු සඳහා -ප්‍රතිකාර, නිවාරණ, සහන සත්කාර, පුනරුත්ථාපන කියන ක්ෂේත්‍ර හතර සඳහා- තමන් පදිංචි ස්ථානයේ සිට කිලෝමීටර දෙකක, දෙකහමාරක වපසරියක් තුළ ළඟාවීමට පහසු ආකාරයෙන් ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතියක් සකස් කළ යුතු වෙනවා.

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

අපේ ඉලක්කය ජනගහනයෙන් 5,000කට ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ලබා දීමයි; ඒ කියන්නේ, ජනගහනයෙන් 5,000ක් බලා කියා ගන්න පුළුවන් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් නිශ්චිතව නම් කිරීමයි. එතකොට මේ OPD එකෙන් අර OPD එකට, මේ clinic එකෙන් අර clinic එකට, රජයේ රෝහලෙන් private sector එකට, එතැනින් ගිහිල්ලා ආයුර්වේදයට ආදි වශයෙන් ජනතාවට තම තමන්ගේ කැමැත්ත අනුව එහේට මෙහේට පැන පැන ප්‍රතිකාර ගත යුතු නැහැ. පුරවැසියා වෙනුවෙන් වග වෙන, වග කියන ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතියක් නිර්මාණය කිරීම තමයි අපේ බලාපොරොත්තුව. ඇත්තටම ගත්තොත්, පසුගිය වසර 6 ඇතුළත මේ සඳහා අපේ රටේ ක්‍රියාත්මක වෙච්ච ප්‍රධාන ව්‍යාපෘති 2ක් තිබුණා. එකක් තමයි, ලෝක බැංකු ආධාර සහිතව ඩොලර් මිලියන 200ක් වියදම් කරලා රෝහල් 550ක කරගෙන ආපු PSSP එක. ඒක 2024 ජූනි මාසයේ අවසන් වුණා. ඒ වාගේම 2025 අග දක්වා දීර්ඝ කරලා තිබෙන ADB ව්‍යාපෘතියක් වන ඩොලර් මිලියන 60ක HSEP එකත් රෝහල් 135ක ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා මැදිහත් වෙලා තිබෙනවා. අපි මේ අත්දැකීම් සහිතව මෙවර අය වැයේදී PHSEP හෙවත් ප්‍රාථමික සෞඛ්‍ය සේවා සංවර්ධනය සඳහා රුපියල් බිලියන 12.1ක් වියදම් කරනවා. එයින් මධ්‍යම රජය යටතේ බිලියන 6ක් සහ පළාත් රෝහල් සඳහා බිලියන 6ක් හැටියට ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධනය වෙනුවෙන් මූලිකව රුපියල් බිලියන 12.1ක් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. අපි ලෝක බැංකු ආධාර යටතේ ඩොලර් මිලියන 100ක ව්‍යාපෘතියක් ඉදිරි අවුරුදු 5 ඇතුළත ක්‍රියාත්මක කරලා මා ඉහතින් ද කිව්වා වාගේ ඉතාම කෙටි දුරක් ඇතුළත ජනතාවගේ සෞඛ්‍යයට ප්‍රවේශ වෙන්න පුළුවන් ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන දහසක් ඉදි කරන්න අපේ සැලැස්මක් තිබෙනවා. ඒ කටයුත්ත අපි මේ අවුරුද්දේ ආරම්භ කරනවා. ජනාධිපතිතුමාත් අය වැය කථාවේ ඒ සම්බන්ධයෙන් සඳහන් කළා.

අපට තිබෙනවා, ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය සැපයීම සඳහා වන ප්‍රාදේශීය රෝහල් 486ක් සහ ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන 545ක්. මේ ප්‍රතිකාර මධ්‍යස්ථාන 1,031 නවීකරණය, සංවර්ධනය සඳහා මෙවර අය වැයේදී අපි මුදල් ප්‍රතිපාදන වෙන් කළා විතරක් නොවෙයි, ඒ සඳහා වන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නත් බලාපොරොත්තු වෙනවා.

ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධනය පිළිබඳව the Hon. (Dr.) Nihal Abeysinghe එතුමාගේ කථාවේදී වැඩිදුරටත් සඳහන් කරයි. මම මෙහිදී ආරාධනාවක් කරනවා. ග්‍රාම නිලධාරී වසම් තුනකට එක් ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ලබා දීම සඳහා මහාමාර්ග පහසුකම් සහිත පර්චස් 20ක ඉඩමක් පරිත්‍යාග කරන්න කැමැති කෙනෙකු ඉන්නවා නම්, ඒ සඳහා ආධාර කරන්න කැමැති අය ඉන්නවා නම් අපි ලෑස්තියි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැලසුම් සහිතව ඒ කටයුත්තට ඔබේ දායකත්වය ලබා ගන්න. පරිත්‍යාගශීලීන්ට, දේශීය, විදේශීය දානපතියන්ට අපි ආරාධනා කරනවා, එම ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා ඔබගේ ඉඩම් සහ මූල්‍යමය අනුග්‍රහය ලබා දෙන්න කියලා.

අපේ රටේ Consultant Community Physiciansලා සහ Family Physiciansලා ඉන්න ප්‍රමාණය අඩුයි. නමුත්, ඒ අයගේ විශේෂඥභාවය තිබෙන්නේම ප්‍රාථමික සෞඛ්‍ය පද්ධති නහා සිටුවීම සඳහායි. අපි ඒ අයටත් ආරාධනා කරනවා, ඔබේ සේවාව වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කරන්න, අපි මේ අභියෝගය ඉක්මනට ජයග්‍රහණය කරමු කියලා. ඒ වාගේම, ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය ආශ්‍රිතව අපි ඉතාම ඉක්මනින් ක්‍රීඩාව සහ ව්‍යායාම ආශ්‍රිත කාරණා ද යොදා ගන්නවා. ඔබ දන්නවා, ලෝකයේ දැන් "Exercise is Medicine" කියලා සංකල්පයක් තිබෙන බව. අපි ඒවාත් ගෙන ආ යුතුයි. ප්‍රතිකාර කියන්නේ, ඖෂධ ලබා දීම, එන්නත් ලබා දීම පමණක්ම නොවෙයි. ජීවන ශෛලිය වෙනස් කිරීම තුළින් පුරවැසියා ආරක්ෂා කරගෙන, නීරෝගි කර ගන්නේ කොහොමද කියන එකත් එයට අදාළයි. අපි ඒ ගැනත් අවධානය යොමු කර තිබෙනවා, ගරු සභාපතිතුමනි.

අපට මුහුණ දෙන්න සිදු වන තවත් ප්‍රශ්නයක් තමයි, වතු රෝහල්වල ප්‍රශ්නය. මේක 1998 ඉඳන් සාකච්ඡා කරමින් තිබුණු ප්‍රශ්නයක්. ඇත්තටම, වතු රෝහල්වලට සේවා සැපයීමේදී මධ්‍යම ආණ්ඩුවත්, පළාත් සභාත් ගැටලුවකට මුහුණ දෙනවා. මොකද, ඒ ඉඩම්වල අයිතිය අප සතුව නැහැ. ඒ ඉඩම්වල අයිතිය අපට මුළුමනින් නැති වුණත් ඒවාට සේවා සපයන්න, ඒ මධ්‍යස්ථාන නවීකරණය කරන්න පුළුවන් ආකාරයට යම් අයිතියක් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා ගැනීම සඳහා අපි මේ වන විට ඉඩම් අමාත්‍යාංශය, LRC එක හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය එක්කත් සාකච්ඡා කරමින් සිටිනවා. ඉතාම නුදුරු දිනකදී කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ඒවා අතරින් රෝහල් 44ක ප්‍රමාණයක් පවරා ගැනීමට අපි කටයුතු කරනවා.

දෙවැනි කරුණ හැටියට මා කිව්වේ, අපේ ද්විතීයික සහ තෘතීයික රෝහල් සංවර්ධනය පිළිබඳවයි. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා, අපේ රටේ තෘතීයික සේවා සපයන ජාතික රෝහල්, ශික්ෂණ රෝහල්, විශේෂිත රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල් ඇතුළු රෝහල් 52ක් තිබෙන බව. ද්විතීයික සේවා සපයන මූලික රෝහල් 80ක් තිබෙනවා. ඒ අනුව ද්විතීයික සහ තෘතීයික අංශයෙන් ප්‍රතිකාර කිරීමට අපට තිබෙන්නේ, රෝහල් 132යි. එම රෝහල් 132ට අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය සහ අවශ්‍ය පහසුකම් ලබා දීලා එම රෝහල්වල තත්ත්වය උසස් කිරීම අද පවතින මේ ප්‍රශ්නයට සැලකිය යුතු විසඳුමක් වෙනවා.

මෙතැනින් එහාට කිසිම ආකාරයකට දේශපාලන කැමැත්ත මත රෝහල් upgrade කරන්න අපේ බලාපොරොත්තුවක් නැහැ, ගරු සභාපතිතුමනි. මන්ත්‍රීවරුන් කැමැති වෙන්න පුළුවන් තමන්ගේ ගමේ තිබෙන base hospital එක දිස්ත්‍රික් මහ රෝහලක් කර ගන්න; ඒ වාගේම, දිස්ත්‍රික් මහ රෝහල ජාතික රෝහලක් බවට පත් කර ගන්න. නමුත්, ඒක විද්‍යානුකූල වැඩක්. එම නිසා මෙතැනින් එහාට අපි එම කටයුතු කරන්නේ විශේෂයෙන්ම 2020දී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද වක්‍රලේඛය අනුවයි. කවර රෝහල්, කවර තත්ත්වයකට උසස් කළ යුතු ද, එහෙම upgrade කරපු රෝහලක කාර්ය මණ්ඩලයේ සිටිය යුතු ප්‍රමාණය කීය ද, තිබිය යුතු වාට්ටු ප්‍රමාණය කොපමණ ද, සපයන විශේෂඥ සේවා මොනවා ද, රෝහලේ තිබෙන්න ඕනෑ උපකරණ මොනවා ද යනාදි සියල්ල වක්‍රලේඛයක් මඟින් සහතික කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඕනෑ කෙනෙකුට අයිතියක් තිබෙනවා තමන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කරන්න. පුන්තලම මූලික රෝහල දිස්ත්‍රික් මහ රෝහලක් බවට පත් කිරීම සඳහා අපේ ගරු මන්ත්‍රීවරයෙක් දැනට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. බණ්ඩාරවෙල ප්‍රාදේශීය රෝහල මූලික රෝහලක් බවට පත් කිරීම සඳහා ඉල්ලීමක් ලැබිලා තිබෙනවා. යම් පමණකට එවැනි අවශ්‍යතාවක් තිබෙන බවත් අපට පෙනෙනවා. කෙසේ නමුත්, රෝහල් upgrade කිරීමේදී ඒ පිළිබඳව ඉදිරියේදී අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා හා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රමුඛ කමිටුවක් මඟින් තීන්දු කරන තැනකට අපි ගෙන එනවා. ඔබතුමන්ලාගේ ඉල්ලීම් එතැනට ඉදිරිපත් කරන්න. ජාතික අවශ්‍යතාව අනුව, ජනගහන ව්‍යාප්තිය අනුව, අපේ සංවර්ධන සැලැස්ම අනුව, අපට පහසුකම් ලබා දිය හැකි ප්‍රමාණය අනුව එය තීන්දු කිරීමට අපි බලාපොරොත්තු වනවා.

මෙවර අය වැයේදී අපි ප්‍රධාන වශයෙන්ම හදිසි ප්‍රතිකාර ඒකක 5ක් සංවර්ධනය කිරීම සඳහා මේ මාස අටට පමණක් රුපියල් බිලියන 1.5ක් -රුපියල් මිලියන 1,500ක්- වෙන් කර තිබෙනවා. මහනුවර, ත්‍රිකුණාමලය, කෑගල්ල, අම්පාර හා හලාවත කියන රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකක අලුත්වැඩියා කිරීම සඳහා අපි කටයුතු කරනවා. ඒ සමහර ඉදිකිරීම් කාලයක් තිස්සේ අතරමඟ නතර කරලායි තිබුණේ. ඒ සඳහා අපි මෙවර අය වැයෙන් රුපියල් බිලියන 1.5ක් වෙන් කරනවා. 2026, 2027 වසර දෙක තුළදී තවත් රුපියල් බිලියන 4.6ක් වෙන් කරලා එම ව්‍යාපෘතිය අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ හෘද රෝගීන් සම්බන්ධව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. එම රෝගීන් හත්අටදාහක් පෝලිම්වල ඉන්නවා. සමහර අයට surgery එක කරන්න පණිවුඩය එනකොට ඒ අය ජීවතුන් අතරත් නැහැ. එය ප්‍රශ්නයක් හැටියට තිබුණා. ජපන් ආණ්ඩුව එය හඳුනා ගත්තා. ඒ අනුව JICA ව්‍යාපෘතියක් යටතේ හෘද කැතීටරීකරණ ඒකක අපේ රෝහල් පහකට ලබා දෙන්න එකඟතාවක් තිබුණා. නමුත් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, අවාසනාවකට දූෂිත දේශපාලනය නිසා එම ව්‍යාපෘතිය මුළුමනින්ම නතර වුණා. අපේ ආණ්ඩුව පත් වුණාට පසුව අපි ජපන් ආණ්ඩුවත් එක්ක සාකච්ඡා කළා. ඉතාම නුදුරු දිනයකදී මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල හා ත්‍රිකුණාමලය කියන රෝහල්වල ජපන් රජයේ ආධාර යටතේ එම හෘද කැතීටරීකරණ - cardiac catheterization - ඒකක අලුතින් ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වනවා.

ඒ වාගේම Lady Ridgeway Hospital එකේ හෘද මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා මෙවර අය වැයෙන් අපි රුපියල් මිලියන 1,600ක් වෙන් කරනවා. අපේ ළදරුවන්ගේ හෘද රෝගවලට ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් ඒක අත්‍යවශ්‍ය කටයුත්තක්.

ඊළඟට, අපේ රටේ තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි පිළිකා රෝග. දැන් අපි රෝහල් 23ක පිළිකා ප්‍රතිකාර කරමින් සිටිනවා. සාමාන්‍යයෙන් අවුරුද්දකට 36,000ක් පමණ රෝගීන් හඳුනා ගන්නවා. 24,000කට ප්‍රතිකාර කරනවා. අපේ ප්‍රතිකාර සේවා දැන් නවීකරණය කළ යුතුයි. ඒක එක තැනක හිර වෙලා තිබුණේ. ඒ අනුව තමයි අපි මේ linear accelerator machines ලබා දෙන්න කටයුතු කරන්නේ. එහි පළමු phase එකේ කටයුතු අවසන් වෙලා, අපි දෙවැනි phase එකට අදාළ කරන විධියේ ගිවිසුමට මෙම වසරේ ජනවාරි මාසයේ අත්සන් කළා. ඒ අනුව අනුරාධපුරය, කුරුණෑගල, බදුල්ල, රත්නපුර හා හම්බන්තොට කියන රෝහල් පහට linear accelerator machines, එහෙම නැත්නම් LINAC machines ලබා දීම සඳහා අපි කටයුතු කරනවා. ඒකට අදාළ කරන විධියේ ඉදිකිරීම් අපි රත්නපුර සහ බදුල්ල රෝහල්වල ඊළඟ සති හය ඇතුළත අවසන් කරන්නත්, හම්බන්තොට රෝහලේ ඊළඟ මාස හතර ඇතුළත අවසන් කරන්නත්, කුරුණෑගල රෝහලේ ඊළඟ මාස හය ඇතුළත අවසන් කරන්නත්, අනුරාධපුර රෝහලේ වසරක් තුළ ඒ bunker එක හදලා අවසන් කරන්නත් බලාරොත්තු වෙනවා. ඒ කටයුතු අවසන් කරලා, ඒ මැෂින් එක සවි කරලා, ඒ රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ කටයුතු කඩිනම් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒකෙන් ඇත්තටම විශාල සහනයක් ලැබෙයි. මොකද, ගොඩක් රෝගීන්ට මේ ප්‍රතිකාර ගන්න කොළඹට එන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙම නැත්නම් සමහර මැෂින්වල ඇත්තටම කාලය ඉකුත් වෙලායි තිබෙන්නේ. ඒ bunkers ඉදි කිරීම සඳහා අපි රුපියල් මිලියන 1,150ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

එපමණක් නොවෙයි, අපේ රටේ ද්විතීයික සහ තෘතීයික ප්‍රතිකාර සපයන රෝහල්වල තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, උපකරණවල තිබෙන හිඟය සහ විටින් විට ඒවා අක්‍රියතාවට පත්වීම. අපි එය හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසාම අපි biomedical equipment, lab equipment, medical equipment නඩත්තුව සඳහා, මෙවර අය වැයෙන් රුපියල් බිලියන 25ක් වෙන් කරනවා. ඒ ප්‍රශ්නය ඇත්තටම ගොඩක් තැන්වල තිබෙන ප්‍රශ්නයක්. මම හිතනවා, මේ මන්ත්‍රීවරුනුත් කථා කරන කොට කියයි කියලා, තමන්ගේ රෝහලේ මේ මැෂින් එක තිබුණා, දැන් වැඩ කරන්නේ නැහැ කියලා. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. ඒ සඳහා තමයි, රුපියල් බිලියන 25ක් මෙවර අය වැයෙන් අපි වෙන් කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒ වාගේම, ඉදිරි වසර තුන තුළදී මේ ඉදි කරන ලද රෝහල්වල සාමාන්‍ය නඩත්තුව සඳහා, - ඒ කියන්නේ A/C එක වෙන්න පුළුවන්, ජලය වෙන්න පුළුවන්, විදුලිය වෙන්න පුළුවන්, මලාපවහන පද්ධතිය වෙන්න පුළුවන්, ඒ ආදි කටයුතු සඳහා - අපි ප්‍රමුඛතාවක් ලබා දෙනවා. ඒ කියන්නේ, මේ තිබෙන ද්විතීයික සහ තෘතීයික මට්ටමේ රෝහල් 130, වඩා වැඩි පහසුකම් සහිතව සංවර්ධනය කරලා, ප්‍රතිකාර අංශය ශක්තිමත් කරන්න අපි අවධානය යොමු කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල ඉදි කරලා කාලයක් ගත වෙනවා. ඇත්තටම ඒ රෝහල වාට්ටු වාගේම, කාමර සහිතව ප්‍රතිකාර කරන්න පුළුවන් මධ්‍යස්ථානයක්. නමුත්, ඒකට අත්‍යවශ්‍ය මූලික පහසුකම් ටිකවත් ලබා දීලා තිබුණේ නැහැ. ඒ සඳහා අපි මෙවර අය වැයෙන් මූලධන වියදම් හැටියට රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, වෙනත් ආයුර්වේද රෝහල් සඳහා තවත් රුපියල් මිලියන 368ක් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. මේවාත් එක්කම ආයුර්වේද රෝහල් පද්ධතිය ද දියුණු කිරීමේ සැලැස්මක් අපට තිබෙනවා, ගරු සභාපතිතුමනි. මේ පිළිබඳව අපේ ගරු වෛද්‍ය සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා තවත් කරුණු කියයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

තුන්වැනි කාරණය තමයි, ගුණාත්මක තත්ත්වයේ ඖෂධ අඛණ්ඩව සැපයීම. ඒක තමයි අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන බරපතළම අභියෝගය. සෞඛ්‍ය සම්බන්ධයෙන් රටේ ජනතාවගේ විශ්වාසය පලුදු වුණේ, අනෙක් කරුණුවලට වඩා -ඒ කරුණුත් හේතු වුණු අතරේ- ඖෂධ සැපයීම කියන කාරණය අතිනුයි. ඒ අනුව අපි මෙවර අය වැයෙන් රුපියල් බිලියන 183.8ක් වෙන් කරනවා, ඖෂධ සැපයීම වෙනුවෙන්. එතැනදී අපේ වෛද්‍ය සැපයීම් ඒකකයට රුපියල් බිලියන 60ක්, ඒ වාගේම ඖෂධ නිෂ්පාදන සංස්ථාවට රුපියල් බිලියන 35.6ක්, දේශීය නිෂ්පාදකයන් සඳහා රුපියල් බිලියන 44ක් වෙන් කර තිබෙනවා. අපේ වෛද්‍ය සැපයීම් ඒකකය හරහා රෝහල්වලට සමහර ඖෂධ අඛණ්ඩව සපයන්න බැරි වෙනකොට, අපි අවස්ථාවක් හදලා තිබෙනවා ප්‍රාදේශීය මිලදී ගැනීම් කරන්න. ඒ සඳහා රෝහල්වලට රුපියල් බිලියන 35ක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා MSD එක හරහා ඖෂධ සැපයීමට අමතරව, ඒ රෝහල්වලට ප්‍රාදේශීය මට්ටමින් ඖෂධ මිලදී අරගෙනත් ජනතාවට අවශ්‍ය ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ඖෂධ සැපයීම සහතික කිරීම තමයි අපේ පරමාර්ථය. ඒ සඳහා අපි කරමින් ඉන්නේ මොකක්ද, පසුගිය මාස තුනේ මීට අදාළ ප්‍රගතිය මොකක්ද කියන එක අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී ප්‍රකාශ කරයි කියලා මම හිතනවා.

ඒ වාගේම අපේ බලාපොරොත්තුවක් තිබෙනවා, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල් ව්‍යාප්ත කරන්න. දැනට දිස්ත්‍රික්ක 18ක ඔසුසල් 61ක් ක්‍රියාත්මක වෙනවා. ඉදිරි මාස දෙක ඇතුළත දී මඩකලපුව, වව්නියාව සහ ත්‍රිකුණාමලය කියන නගරවල අලුතින් ඔසුසල් ආරම්භ කරන්න අපි කටයුතු කරනවා. කිරිබත්ගොඩ නගරයේ ඔසුසල තව සති දෙකකින් ආරම්භ

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

වෙනවා. ප්‍රධාන ඔසුසලේ නවීකරණ කටයුතු ඉදිරි මාස 5දී අවසන් වෙලා රටේ තිබෙන ප්‍රධානතම ඔසුසල බවට කොළඹ ජාතික රෝහල ඉදිරියේ තිබෙන ඔසුසල පත් කරනවා. අපි මේ ඔසුසල් ගමට අරගෙන ගියාම ඒවා හරහා රජය මඟින් සහතික කරන ලද ගුණාත්මක ඖෂධ ජනතාවට ලබා දීමේ හැකියාව ඇති වෙනවා. ජීවනී නිෂ්පාදනයෙන් අපි තමයි මාර්කට් එකේ ඉහළින්ම ඉන්නේ. ඒකට අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා අපි මෙවර අය වැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, ගරු කාවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා කිව්වා වාගේම මීට අමතරව බටහිර හෝ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා packing material ලංකාවට ගෙන්වන අයට මෙවර අය වැයෙන් අපි VAT සහනයක් ලබා දුන්නා. මේ VAT සහනය වාගේම විදුලි බිලෙන් ඇති කරපු සහනයත් එක්ක මේ ඖෂධ නිෂ්පාදකයන් සහ ඖෂධ ආනයනකරුවන් එක්ක සාකච්ඡා කරලා අපට පුළුවන්කමක් ලැබේවි, ජනතාවට දැනෙන ප්‍රමාණයකට ඖෂධ මිල අඩු කරන්න. ඊට අදාළ ආයතන වන NMRA එක, SPC එක, SPMC එක ඇතුළු අපේ ආයතන සම්බන්ධ කරගෙන මේ සඳහා වූ සූත්‍රයක් සකස් කරමින් ඉන්නවා. මම හිතනවා ආනයනකරුවන් හා නිෂ්පාදකයන් ඒ ක්‍රියාදාමයට එකඟ වෙලා මේ මිල අඩුකර ගැනීමට අපට සහයෝගය ලබා දෙයි කියලා.

ගරු සභාපතිතුමනි, අපට ඉලක්කයක් තිබෙනවා. දැන් මේ බාල ඖෂධ -ගුණාත්මකභාවයෙන් පහළ ඖෂධ- ලංකාවට ගෙන්වීම, බෙදා හැරීම නතර කිරීම සඳහා නිට්ටාවටම තිබෙන ප්‍රතිකාරය තමයි, ඒවා පරීක්ෂා කිරීම සඳහා පහසුකම් සහිත විද්‍යාගාරයක් ගොඩනඟන එක. සේනක බිබිලේ මහාචාර්යතුමාගේ "බිබිලේ ප්‍රතිපත්තියේ" අංක 7න් දක්වා ඇති අවසන් කරුණෙන් දක්වා ඇත්තේ, මෙවැනි පහසුකම් සහිත විද්‍යාගාරයක් අප රටට අවශ්‍යයි කියන එකයි. අපට ඒ සඳහාම මෙවර ප්‍රතිපාදනයක් වෙන් කරන්න බැරි වුණත්, රුපියල් මිලියන 25ක් වෙන් කරනවා, NMRA එකේ දැනට තිබෙන lab එක දියුණු කිරීම සඳහා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, you have two more minutes.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
Sir, I will take five minutes.

ගරු සභාපතිතුමනි, පෝෂණය සඳහා අපි අවධානය යොමු කරනවා. ඒ සඳහා වසර 3ක අඛණ්ඩ වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරනවා. ඒකට දැනටමත් අපේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන්, විශ්වවිද්‍යාල මට්ටමින්, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය මට්ටමින්, MRI එකේ ආදී වශයෙන් සියලු ආයතනවල ඉන්න පෝෂණය සම්බන්ධ විශේෂඥයන් සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙන්නේ ජනමාධ්‍ය අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා රටේ පෝෂණ ප්‍රශ්නය විසඳන්නයි. මේක බරපතළ ප්‍රශ්නයක්. මන්දපෝෂණය පමණක් නොවෙයි, සමාජයේ ස්ථූලතාවත් වර්ධනය වෙමින් තිබෙනවා. මේකට අපි උත්තරයක් සොයන්නට ඕනෑ. ඒ නිසා මේක්ම කොටසක් හැටියට ත්‍රිපෝෂ නිෂ්පාදනයට අපි මෙවර රුපියල් මිලියන 5,000ක් වෙන් කළා. ප්‍රශ්නයක් පැන නැගුණා, බඩ ඉරිහුවලින් ත්‍රිපෝෂ හදනකොට. මොකද, එතැනදී ඇල්ලටොක්සින් ප්‍රශ්නයක් ආවා. ඒ නිසා අපි සහල් පදනම් කරගෙන ත්‍රිපෝෂ නිෂ්පාදනය ආරම්භ කරලා තිබෙනවා. අපි ඒ පළමු නිෂ්පාදන තොගය නුවරඑළිය දිස්ත්‍රික්කයේ බෙදා හරිනවා. ඒක මාස 6යි, අවුරුදු 3යි අතර දරුවන් අතර තමයි බෙදා හරින්නේ. එතැනින් පසුව මේක ව්‍යාප්ත කරනවා, අවුරුදු 5 දක්වා වූ දරුවන් සහ ගර්භිණී මව්වරුන් දක්වා.

ඒ වාගේම බඩ ඉරිහු ආනයනය සහ නිෂ්පාදනය සඳහාත් අපි අවධානයක් යොමු කරලා තිබෙනවා, ඒ අමාත්‍යාංශත් එක්ක සම්බන්ධ වෙලා. කොහොම වුණත්, මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්න කැමැතියි, ත්‍රිපෝෂ ආයතනය ඇවර කරන්නේ නැහැ කියලා. ගරු විපක්ෂ නායකතුමනි, ඒ ආයතනය ඇවර කරන්නේ නැහැ. ඒ වෙනුවට රජය රුපියල් මිලියන 5,000ක් ලබා දීලා ඒ නිෂ්පාදන ක්‍රියාවලිය උඩට අරගෙන තිබෙන්නේ.

ඒ වාගේම මම අවසාන කරුණ හැටියට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අපේ ප්‍රධාන ධාරාවේ තිබෙන health tourism ගැන කියන්න අවශ්‍යයි. ඒ සඳහා අපි ආයුර්වේදයත් සම්බන්ධ වෙච්ච combined treatmentsවලට යන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. ආරම්භයක් හැටියට මෙවර ඒ සඳහා රුපියල් මිලියන 5ක් වෙන් කරනවා, දැනට ආරම්භ කරලා වැඩ නතර වෙලා තිබෙන එවැනි ඒකක ප්‍රමාණයක් ඉදිරියට අරගෙන යන්න.

අපි Pottuvil Base Hospital එක මධ්‍යම ආණ්ඩුවට පවරා ගත්තේම සංචාරක සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්. එපමණක් නොවෙයි, මම පෞද්ගලික අංශයට ආරාධනා කරනවා. ඔබට අවස්ථාවක් තිබෙනවා, මේ රටේ health tourism දියුණු කිරීම සඳහා රාජ්‍ය අංශයත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න. එහෙම කැමැති පෞද්ගලික අංශයේ හැම දෙනාටම මම කියන්න කැමැතියි, අවශ්‍ය නම් ඔබට නෙවිල් ප්‍රනාන්දු රෝහල medical tourismවල කේන්ද්‍රයක් හැටියට සංවර්ධනය කරන්න අපිත් එක්ක සාකච්ඡා කරන්න කියලා. ඒ සඳහා අපි සූදානම් කියන එක මම මේ වෙලාවේ ඒ අයට කියන්න කැමැතියි.

ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබුණු විශාලම ප්‍රශ්නය තමයි පසුගිය අවුරුදු 4 තිස්සේ බඳවා ගැනීම්වලදී තිබුණු ප්‍රශ්නය. ඒ ගැන මන්ත්‍රීවරු ඉස්සරහටත් කියාවි. හැම රෝහලකම අඩුපාඩුකම් තිබෙනවා. ඒ නිසා මෙවර අපි මේ බඳවා ගැනීම් සඳහා කටයුතු කරගෙන යනවා. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් 976කට මාර්තු මාසයේ මැද පත්වීම් ලබා දෙනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂකයන් 238කට, ඖෂධවේදීන් 65කට, වෘත්තීය චිකිත්සකයන් - occupational therapistලා - 43කට, චිකිරණ ශිල්පීන් 41කට මාර්තු මැද වන විට පත්වීම් ලබා දෙනවා. ඒ වාගේම හෙද නිලධාරීන් 3,147කට අප්‍රේල් මාසයේ පත්වීම් ලබා දෙනවා. හෙද නිලධාරීන්ගේ ඒ අඩුවට සැලකිය යුතු උත්තරයක් මෙතැනින් ලැබෙයි. උපස්ථායකයන් 1,000ක් බඳවා ගැනීම සඳහා අපට අනුමැතිය ලබා දීලා තිබෙනවා. දැන් අපි සීමිත බඳවා ගැනීම් සඳහා දැනුම්දීම් කරලායි තිබෙන්නේ. ඒ අනුව 2025 මැයි මාසය වෙනකොට උපස්ථායකයන් 1,000ක් බඳවා ගන්නවා.

වාට්ටු ලිපිකාරිනියන් 50කට සහ නිවාස භාරකරු 49කට අයදුම්පත් කැඳවලා තිබෙන්නේ. ඒ අය බඳවා ගන්න නියමිතයි. ඒ වාගේම, ලබන අප්‍රේල් මාසයේ මුල් සතියේදී ඖෂධ සංයෝජකයන් 151ක්, පාසල් දන්ත චිකිත්සකයන් 68ක්, බන්තු රේඛන ශිල්පීන් 61ක්, සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරීන් 30ක්, මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන් 22ක්, චිකිරණ ශිල්පීන් 88ක්, ශ්‍රවණවේදී කාර්මික ශිල්පීන් 17ක් සඳහා ඒ අයගේ පුහුණුව ආරම්භ කරනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, physiotherapistsලා?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
Physiotherapistsලා දාලා තිබෙන්නේ. මම ඒක බලලා කියන්නම්.

වැටුප් ප්‍රශ්නය සම්බන්ධයෙනුත් මම වචනයක් කියන්න ඕනෑ. කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ගැනත් කිව්වා. මතක තියාගන්න, අපේ රටේ වෛද්‍ය සේවාව, මේ වෛද්‍යවරු බිහිවෙන්න පටන් ගත්තේ Sir James Robert Longden ආණ්ඩුකාරයාගේ කාලයේ බව. එතැන ඉඳලා රනිල් වික්‍රමසිංහ ජනාධිපති දක්වාම ඔය ආණ්ඩුකාරවරු, ජනාධිපතිවරු, අගමැතිවරු ඔක්කෝම යටතේ මේ preliminary grade එකේ වෛද්‍යවරුන්ට ලබා දීලා තිබෙන්නේ රුපියල් 54,290ක් පමණයි. රුපියල් 54,290යි, අවුරුදු 150ටම ඒ කට්ටිය දුන්නේ. මූලික වැටුප අඩුවෙන් තියෙද්දී ඒ අයට එක එක දීමනා, පොඩි පොඩි සොච්චම් ගණන් එල්ලලා තිබුණා. අපි මොකද කළේ? අපි බලයට පත් වෙලා මාස තුනයි. රුපියල් 54,290ක මූලික වැටුප රුපියල් 40,000කින් වැඩි කරලා රුපියල් 94,000 දක්වා වැඩි කළා. Preliminary grade එකට රුපියල් 40,000 ඉඳලා රුපියල් 80,000 දක්වා මූලික වැටුප් වැඩිවීමක්; මූලික වැටුප් වැඩි කිරීමක්! ලබා දුන්නා. ඒ කියන්නේ සමහර අයගේ වැටුප් වැඩිවීම විතරක් රුපියල් 80,000ක් වෙනවා, රුපියල් 40,000න් පටන් අරගෙන. ඒ නිසා අපි මූලික වැටුප දැනෙන හැටියට ලබා දීලා තිබෙනවා. අපට අවශ්‍ය කරන්නේ මේ අය ගෞරවනීය වෘත්තිකයන් බවට පත් කරන්න නම්, ඔවුන්ගේ මූලික වැටුප් වැඩි කරන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. මම පසුගිය දවස්වල මේ ගැන වෘත්තීය ක්‍රියාමාර්ග ගත්ත සංගම් තුනත් එක්කම සාකච්ඡා කළා. ඒගොල්ලෝ අපිත් එක්ක බොහොම සුහදව සාකච්ඡා කළා, බොහොම සාධනීය ප්‍රවේශයකට ආවා. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, සමන් රත්නප්‍රියගේ සංගමය සහ රවී කුමුදේශ්ලාගේ සංගමය එක්ක සාකච්ඡා කළාම, මුදල් අමාත්‍යාංශය ඉන්න තත්ත්වයත් ඒගොල්ලෝ තේරුම් ගන්නවා. ඒ නිසා 5, 6, 7 දිනවල තිබුණු වැඩවර්ජන නැවැත්වුවා. ඒකට බොහොම ස්තුතියි. ඒ කියන්නේ, අපේ රටේ මහජනතාවට පීඩාවක් නොවන ආකාරයට ඉල්ලීම් ගැන අපට සාකච්ඡා කරන්න පුළුවන්. ඒ වාගේම, මේ වර්ජන ක්‍රියාමාර්ගයට නොගිය තවත් වෘත්තීය සමිති රාශියක් ඉන්නවා. ඒ අයටත් විශේෂයෙන් ස්තුති කරන්නට ඕනෑ. මේ මූලික වැටුප් වැඩිවීම සහ OT එකේ, extra duty එකේ සහ PH එකේ වැඩිවීම භාරගෙන ඔවුන් මේ සෞඛ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, මට තව වචනයක්, දෙකක් කියන්න දෙන්න, -අනෙක් අයගේ වෙලාවෙන් හරි අඩු කරලා දෙන්න- අනෙක් දේවල් පිළිබඳව.

අපේ තැපැල් දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් හැම දාම නොසලකා හැරපු ආයතනයක් බවට පත් වෙලා තිබුණේ. මේ සේවාව නවීකරණය කරන්න ඕනෑ. පෞද්ගලික අංශයත් එක්ක තරග කරන්න පුළුවන් විධියට තැපැල් සේවාව නවීකරණය කරන්න පුළුවන්. අපේ තැපැල්පතිතුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. තැපෑල නවීකරණය කරලා මේක ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න පුළුවන් කියලා ඔවුන්ට දැඩි අධිෂ්ඨානයක් තිබෙනවා. ඒ නිසා අපි මෙවර අය වැයෙන් පුනරාවර්තන වියදම් හැටියට රුපියල් බිලියන 21ක් සහ ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 2ක් හැටියට රුපියල් බිලියන 23.9ක් වෙන් කර තිබෙනවා. අපි අලුත් තැපැල් කාර්යාල 14ක් ඉදිකිරීමටත්, තවත් කිහිපයක් අලුත්වැඩියා කිරීම සඳහාත් රුපියල් මිලියන 1,300ක් වියදම් කරනවා.

ඒ වාගේම තැපැල් දෙපාර්තමේන්තුවේ වාහන ටික නවීකරණය කළ යුතුයි. එහෙම නොවුණොත් මේ තැපෑල පවත්වාගෙන යන්න බැහැ. ඒකට අපි වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා. සංචාරක ආකර්ෂණය දිනාගත හැකි නුවරඑළිය, නුවර, කොළඹ, ගාල්ල වාගේ ස්ථානවල තිබෙන තැපැල් කාර්යාල සංචාරක ආකර්ෂණීය මධ්‍යස්ථාන බවට පත් කිරීම සඳහා වූ වෙනම වැඩ පිළිවෙළක් දියත් වෙමින් පවතිනවා, ගරු සභාපතිතුමනි. අපේ ප්‍රධාන තැපැල් මූලස්ථානය ආශ්‍රිත කෞතුකාගාරය සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවක් තිබෙනවා. මේ ආදී වශයෙන් අපේ තැපැල් දෙපාර්තමේන්තුවේ සියලු සේවකයන්ගේ සහයෝගය ඇතිව තැපෑල හොඳ තැනකට නවීකරණය කරලා, රටේ ආදායම් උත්පාදනය කරන ක්ෂේත්‍රයක් බවට පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳවත් මම වචන කිහිපයක් කථා කරන්නම්. මෙයට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය මාධ්‍ය ආයතන හතර, රජයේ මුද්‍රණාලය, ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය අයිති වෙනවා. මේ සියලු ආයතන වෙනුවෙන් මෙවර අපි රුපියල් බිලියන 5.52ක් වෙන් කරනවා. 2023, 2024දී පැවැත්වීමට නොහැකි වූ ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල මාධ්‍යවේදීන් අගය කිරීම සඳහා මෙවර පවත්වන්නට අපි කටයුතු කරනවා. ඒ වාගේම ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා වරලත් ආයතනයක් - chartered institute එකක් - ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේක කාලයක් තිස්සේ ඇදෙමින් පවතින දෙයක්. මේ අවුරුද්දේ ඒ වෙනුවෙන් අපි රුපියල් මිලියන 25ක් වෙන් කළා. ගයන්ත කරුණාතිලක හිටපු ඇමතිතුමාත් දන්නවා ඇති, මේක කාලයක් තිස්සේ සාකච්ඡා කරපු දෙයක් බව. ඒ වරලත් ආයතනය ආරම්භ කිරීම සඳහා වූ කටයුතු අපි පටන් ගන්නවා. අපට ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. විටින් විට ඒ පිළිබඳ සාකච්ඡා මතු වුණා, යට ගියා. ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කරලා ජුනි මාසය වනකොට එළිදක්වන්න බලාපොරොත්තුවක් තිබෙනවා. අපි මාධ්‍යවේදීන්ට අවුරුද්දකට ශිෂ්‍යත්ව සියයක් ලබා දෙනවා. ඒකට මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ වාගේම ජනමාධ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව තිබෙන ආචාර ධර්ම පිළිබඳව, යහපත් ජනමාධ්‍යකරණයක් පිළිබඳව පාසල් සිසුන් අතර අවබෝධයක් හදන්න පුහුණු වැඩමුළු රාශියක් දියත් කර තිබෙනවා.

රජයේ මුද්‍රණාලය නවීකරණය කිරීම, අලුත් මැෂින් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 165ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අපේ රටේ රූපවාහිනී ආයතනවල ඩිජිටල්කරණ ව්‍යාපෘතිය එන්න එන්න පිටුපසට ගිහිල්ලා තිබුණා. මේක ජපාන ණය මුදලක් යටතේ කරන්න අවුරුදු 12ක්, 14ක් සාකච්ඡා කරමින් හිටියා. නමුත්, ඒ කටයුත්ත නතර වෙලා තිබුණා. අපේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත්, ජනමාධ්‍ය අමාත්‍යාංශයත්

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

එකතු වෙලා මේ කටයුතු කඩිනම් කරලා, රූපවාහිනී ආයතන ඩිජිටල්කරණ ව්‍යාපෘතියට අපි අත තියලා තිබෙන්නේ, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම, අපේ රටේ රාජ්‍ය මාධ්‍ය ආයතන ඉහළ මට්ටමකට ගෙනෙන්න මම බලාපොරොත්තු වෙනවා. මේවා දේශපාලනීකරණය වෙලා තිබුණේ. අන්තිමට ඒවාට මුදල් දුන්නේත් නැහැ. අපි මහා භාණ්ඩාගාරයත් එක්ක සාකච්ඡා කරලා අනාගතයේ හෝ මුදල් ප්‍රතිපාදන වෙන් කරගෙන එම ආයතන දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මම ශ්‍රී ලංකා පදනම් ආයතනය ගැනත් කියන්න ඕනෑ. රාජ්‍යය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කරනකොට යම් ආලෝකයක් සපයන්න තමයි ශ්‍රී ලංකා පදනම් ආයතනය තිබෙන්නේ. හැබැයි, මෙම ආයතනය කාලයක් තිස්සේ ගෙනැල්ලා, ගෙනැල්ලා, ගෙනැල්ලා, catering service එකයි, hall එක දෙන එකයි, rooms දෙන එකයි කරලා මුදල් උත්පාදනය කරන තැනට වට්ටලා, එම ආයතනය පටන් ගැනීමේ තිබුණු හරයාත්මකභාවය නැති කරලා තිබෙනවා. අපි මේක වෙනස් කරන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. මෙය වෙනස් කරලා, රටට පදනම සපයන තැන බවට එම ආයතනය පත් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඉතින්, මේ ආදී කටයුතුවලට මෙවර අය වැයෙනුත් යම් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. මේ සියලු ආයතන රටේ යහ පැවැත්ම වෙනුවෙන් යොදා ගන්න බලාපොරොත්තු වන බවත් සඳහන් කරමින්, මට වැඩිපුර කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa. You have 15 minutes.

[පූ.භා. 10.39]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු සභාපතිතුමනි, රෝග නිවාරණ ක්ෂේත්‍රයත්, රෝග ප්‍රතිකාර ක්ෂේත්‍රයත් යන ක්ෂේත්‍ර දෙකම ඇතුළත්ව සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

සෞඛ්‍ය අමාත්‍යතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් කරන්නා වූ ක්‍රියාවලීන් පිළිබඳව ඉදිරිපත් කිරීමක් කළා. ඒ යෝජනා සියල්ලක්ම මහ පොළොවේ සත්‍යයක්, යථාර්ථයක් බවට පත් වෙනවා නම්, අපි ඒ පිළිබඳව සතුටු වෙනවාය කියන කාරණාව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳව ඔබතුමා සඳහන් කළා. ඒ වාගේම බඳවා ගැනීම් ගැනත් කථා කළා. අපි පැහැදිලිවම අවබෝධ කර ගන්නට ඕනෑ, මේ සංවර්ධන වැඩ කටයුතුවලට සමගාමීව, බඳවා ගැනීම්වලට සමගාමීව අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයින් රඳවා ගැනීමටත් කටයුතු කරන්නට ඕනෑ බව. ඒ කාරණාවේදී බරපතළ ප්‍රශ්න සහ ගැටලු ගණනාවක් තිබෙනවා. එම නිසා මම ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කියන ආකාරයට සියලු කාණ්ඩවල වෛද්‍යවරුන්ගේ අතර රාජකාරී දීමනාව විධියට පැයකට ගෙවනු ලැබූ මූලික වැටුපෙන් 1/80 දීමනාව, 1/120 දක්වා අඩු කරලා තිබෙනවා. නිවාඩු දින සහ ඉරිදා දිනවල රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් ලබා දුන් මූලික වැටුපෙන් 1/20 ක දීමනාව, 1/30 දක්වා අඩු කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. වෛද්‍යවරුන්ගේ බාධා පැමිණීමේ, රැඳී සිටීමේ හා ප්‍රවාහන දීමනාව - DAT allowance - කියලා එකක් තිබෙනවා. ප්‍රවාහන ගැටලු, ඒ වාගේම වාහන බලපත්‍ර ගැටලු, සීමාවාසික වෛද්‍යවරුන්ගේ දීමනා, පශ්චාත් උපාධි අධ්‍යයනයේ යෙදෙන වෛද්‍යවරුන්ගේ විදේශ පුහුණුවේදී ලබා දෙන ජීවන වියදම් දීමනාව යනාදී මේ කිසිවක් යාවත්කාලීන කරලා නැහැ. මේ මොහොත වනවිට විශාල වශයෙන් වෛද්‍යවරුන් රට අතහැර ගිහිල්ලා තිබෙනවා. තවත් 5,000කට අධික වෛද්‍යවරුන් පිරිසක් විදේශ රටවල වෛද්‍ය සේවයට සුදුසුකම් සපුරා විදේශගත වීමට සූදානමක් තිබෙන පසුබිමක, ඒ වෛද්‍ය ක්ෂේත්‍රයේ සිදුවන උග්‍ර මානව සම්පත් හිඟයට මේ කරන්නා වූ කප්පාදු කිරීම් තුළ වෛද්‍යවරුන්ට මේ රටේ රැඳී සිටීමට යෝග්‍ය පරිසරයක් නිර්මාණය වෙනවාය කියලා මම හිතන්නේ නැහැ. ඒ නිසා මේ බුද්ධි ගලනය කියන ප්‍රශ්නය ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරන්න මම කැමතියි. ඒ ප්‍රශ්නය කේන්ද්‍රගත කරගෙන මේ වෛද්‍ය ක්ෂේත්‍රයේ කප්පාදුවක් සිදු වෙලා තිබෙනවා. ඔබතුමා වැටුප් වැඩිවීම ගැන කථා කළා. නමුත් ඔබතුමා නිවාඩු දින හා ඉරිදා දින රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් ලබා දෙන දීමනාව, අමතර රාජකාරී දීමනාව, DAT allowance ඇතුළුව ඒ ප්‍රශ්න පිළිබඳව නැවතත් අවධානය යොමු කරලා, ඒ වෛද්‍යවරුන් බඳවා ගැනීම වාගේම රඳවා ගැනීමටත් විශේෂ අවධානයක් යොමු කරලා බුද්ධි ගලනයට විධිමත් විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම approved cadre එක යාවත්කාලීන කිරීමට සුදුසු කාලය එළඹිලා තිබෙනවා කියලා අපි හිතනවා. ඒ පිළිබඳව කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

වාට්ටු භාර හෙද සොහොයුරා, සොහොයුරිය ඇතුළු හෙද ක්ෂේත්‍රයේ අයටත් වැටුප් හා දීමනා ගැටලුව තිබෙනවා. ඒ අයට මොකක්ද කරලා තිබෙන්නේ? රජයේ නිවාඩු දින දීමනාව, සති විවේක දින දීමනාව අඩු කරලා තිබෙනවා. රජයේ නිවාඩු දින, සති විවේක දින දීමනාව මූලික වැටුපෙන් 1/20ක දීමනාව 1/30 දක්වා අඩු කරලා තිබෙනවා. ඊට අමතරව සේවා පැයකට ගෙවපු 1/160 දීමනාව, 1/200 දක්වා අඩු කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම හෙද සේවයේ විශේෂිත වූ කාර්යභාරයක් ඒ හෙද හෙදියන් ඉෂ්ට සිද්ධ කිරීම අපි ඇගයීමට ලක් කරන්න ඕනෑ. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ බරපතළ හෙද හිඟයක් තිබෙනවා. ඒ වාගේම ඔබතුමාට මම මතක් කරලා දෙන්නට ඕනෑ, මේ හෙද හෙදියන් කියන්නේ යුනිෆෝම් එකෙන්ම ඇවිල්ලා ඔබතුමන්ලාට සහයෝගය දුන් අය බව. මහරගම තරුණ සේවා සභාවේ සම්මන්ත්‍රණ පරිශ්‍රයට හෙද හෙදියන් නිල ඇඳුම ඇඳගෙනයි ආවේ. ඒ තරම් එළිපිට සහයෝගයක් ලබා දුන් කණ්ඩායමකගේ මේ දීමනා කප්පාදුව ගැන නැවත වරක් සිතා බලා මෙය නිවැරදි කරන්නට කටයුතු කරන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා. ඒ වාගේම හෙද සේවාව තුළ හෙද අධ්‍යක්ෂ රෝහල්, ප්‍රධාන විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන්, විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන්, වාට්ටු භාර හෙද සොහොයුරු, සොහොයුරියන්, හෙද නිලධාරීන් ආදී හෙද සේවාවේ සමස්ත නිලධාරීන්ගේ අයිතිවාසිකම් කප්පාදුවට ලක් කිරීම කනගාටුවට කාරණාවක් බවත් මම මතක් කරන්න කැමතියි.

ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, සම සෞඛ්‍ය විද්‍යා උපාධිධාරීන්ගේ ගැටලුව පිළිබඳව, ගරු ඇමතිතුමනි. භෞත චිකිත්සක, විකිරණ ශිල්පී, ඖෂධවේදී,

වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යා හා හෙද කියන මේ කොටස්වල උපාධිධාරීන් ඉන්නවා. ඇත්ත වශයෙන්ම අපේ නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන උපාධිධාරීන් ලෙස සිටින විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අය දහසකට අධික ප්‍රමාණයක් රැකියා විරහිතව සිටිනවා. නිදහස් අධ්‍යාපනයට අගයක් එකතු වන ආකාරයට, ඒ නිදහස් අධ්‍යාපනයේ උපාධිධාරීන්ට මූලිකත්වයක් ලබා දෙන ආකාරයට මේ බඳවා ගැනීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ආයුර්වේද උපාධිධාරීන්ගේ ගැටලුව පිළිබඳවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මේ වන විට ආයුර්වේද උපාධිධාරීන් 1,800කට අධික පිරිසක් රැකියා විරහිත තත්ත්වයෙන් සිටිනවා. වාර්ෂිකව 200-250 අතර පිරිසක් සීමාවාසික පුහුණුව නිම කරලා විශ්වවිද්‍යාලයෙන් පිට වෙනවා. දේශීය වෛද්‍ය සේවයේ මේ වන විට පුරප්පාඩු 600කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා කියන එක නිරීක්ෂණය වෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම මේ රැකියා විරහිත ආයුර්වේද උපාධිධාරීන්ගේ ගැටලුවටත් විධිමත් විසඳුමක් ලබා දෙන්න කියලා. ඒ වාගේම 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත, විශේෂයෙන්ම එහි ප්‍රධාන ප්‍රඥප්තියේ 77වැනි වගන්තියේ, පළමුවැනි උපවගන්තිය සංශෝධනය කිරීම මඟින් ආයුර්වේද ක්ෂේත්‍රයට බරපතළ බලපෑම් ඇති වෙලා තිබෙන බව සමස්ත ලංකා දේශීය හා ආයුර්වේද ව්‍යවසායකයන්ගේ ඒකාබද්ධ සංගමය ප්‍රකාශ කරනවා. බොහෝදෙනෙක් ඒ කාරණාව පිළිගන්නවා. දේශීය ඖෂධ වගා කිරීම, සකස් කිරීම, මිලට ගැනීම, ගබඩා කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය, ප්‍රවාහනය, සැපයීම, සංයෝජනය ආදී කටයුතුවල නිරත වී සිටින ව්‍යවසායකයන්, ඖෂධ නිෂ්පාදන කර්මාන්තකරුවන්, ඖෂධ ආනයනකරුවන්, ඖෂධ අළෙවි සැල් හිමියන් බරපතළ අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. මේ තුළින් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිකාර ලබා ගන්නට බලාපොරොත්තුවෙන් සිටින රෝගී ප්‍රජාවත් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ආයුර්වේද ක්ෂේත්‍රය මුහුණ පා තිබෙන මේ ගැටලුවලට, විශේෂයෙන්ම නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටලුව, අමුද්‍රව්‍ය මිල ඉහළ යෑමේ ගැටලුව, නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම තුළින් රෝගීන්ට අත්වන ඉරණම, ඒ වාගේම අමුද්‍රව්‍ය වගා කිරීමට ඇති බාධක ඇතුළු මේ සමස්ත කරුණු කාරණා පිළිබඳව රජයේ අවධානය යොමු කරලා මේ ප්‍රශ්නවලට විධිමත් විසඳුම් ලබා දෙන්නට කටයුතු කරන්න කියලා අපි මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, ඩෙංගු මර්දන සහායක නිලධාරීන්ගේ ගැටලුව සම්බන්ධවත් මේ වෙලාවේ මම විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මේ ක්ෂේත්‍රයේ ඩෙංගු මර්දන සහකාර නිලධාරීන් වශයෙන් මේ මොහොත වන විට රුපියල් 22,000ක වැටුප් තලයක 1,200කට පමණ ආසන්න පිරිසක් සේවයේ නිරත වී සිටිනවා. මේ අයගේ සේවාව ස්ථිර කරන්නට ඔබතුමන්ලාගේ මැදිහත් වීම ඉතාම වැදගත් වෙනවා. ඒ පිළිබඳව අවධානය යොමුකොට එයට තිරසර විසඳුමක් ලබා දෙන්න කියාත් මා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම රෝහල් කනිෂ්ඨ කාර්ය මණ්ඩල ගත්තාම, ඇත්ත වශයෙන්ම ඒ අය විශාල සේවාවක් ඉෂ්ට කරනවා. නමුත්, ඒ අයට අතිකාල දීමනාවක් ලැබෙන්නේ නැහැ. කනිෂ්ඨ කාර්ය මණ්ඩල සඳහාත් සම්මත අතිකාල දීමනාවක් ලබා දීම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ඒ වාගේම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ට - ඒ අය අපි හඳුන්වන්නේ midwives හැටියට - ගමන් වියදම් හැටියට ලබා දෙන්නේ කිලෝමීටරයකට රුපියල් දෙකක මුදලක්. ඒ වාගේම ඔවුන්ට ලබා දෙන පහසුකම් ඉතාම පහළ මට්ටමක තිබෙන්නේ. එම තනතුරේත් පුරප්පාඩු රැසක් තිබෙනවා. මේ වන විට පුහුණුව අවසන් කරපු 937ක් සිටිනවා, ඒ අයට පත්වීම් ලබා දීලා නැහැ. තවත් 1,200ක් පුහුණුව ලබමින් සිටිනවා. කෙසේ වෙතත්, ඔබතුමාගේ සංවර්ධන ක්‍රියාදාමය මහ පොළොවේ සත්‍යයක් බවට පත් වුණොත් අපි එය අගය කරනවා. වෛද්‍යවරයෙකු හැටියට ඔබතුමාත් හොඳින් දන්නවා, මේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, එහෙමත් නැත්නම් midwife වෘත්තියේ නියැළී සිටින නිලධාරිනියන් රෝග නිවාරණ ක්ෂේත්‍රයේ දැවැන්ත කාර්යභාරයක් ඉෂ්ට කරන බව. ඒ නිසා රෝග නිවාරණ ක්ෂේත්‍රයේ ඇති වැදගත්කම හඳුනාගෙන, මේ ක්ෂේත්‍රයටත් අවධානය යොමු කරමින්, ඔවුන්ගේ ගැටලුවලටත් විසඳුම් ලබා දෙන්න කියා අපි ඉල්ලීමක් කරනවා. ඒ වාගේම හෙද හිඟයක් කේන්ද්‍ර කරගෙන ඉදිරිපත් කළ යෝජනාවකට කැබිනට් අනුමැතිය ලබා දීලා තිබෙනවා, ඔවුන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කරන්න කියලා. මෙය ක්‍රියාවට නංවන්නට කටයුතු කරන්න කියලාත් මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. සෞඛ්‍ය ක්ෂේත්‍රය, ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය අපි දකින්නේ මානව අයිතියක් හැටියටයි. ඔබතුමාත් දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මානව අයිතිවාසිකම් හැටියට අද තිබෙන්නේ ඉතාම පටු නිර්වචනයක් බව. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් ගැන පමණයි එහි සඳහන් වන්නේ. එය වරදක් හැටියට අපි දකින්නේ නැහැ. අපි දකිනවා, ඒකත් වැදගත් බව. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් වාගේම ආර්ථික, සමාජයීය, ආගමික, සංස්කෘතික, සෞඛ්‍ය, අධ්‍යාපන වැනි අනෙකුත් ක්ෂේත්‍රත් අපි දකින්නේ මානව අයිතීන් හැටියටයි. ඒ කියන්නේ, සුපුරුදු පරිදි මේ ජාත්‍යන්තර දේශපාලනික ක්‍රමවේදය එක්සත් ජාතීන්ගේ සංවිධානය ස්ථාපනය වීමත් සමඟ International Covenant on Civil and Political Rights කේන්ද්‍ර කරගෙන මානව අයිතිවාසිකම් කියන විෂයය පිළිබඳව විශ්‍රහයක්, නීති ස්ථාපනය කිරීමක්, රටේ උත්තරීතර නීතියක් බවට පත් වීම සිදු වුණා සේම පනස් ගණන්වල, හැට ගණන්වල අධිරාජ්‍යවාදී රටවල් ඒ අධිරාජ්‍යවාදයෙන් මිදීමත් සමඟ අර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් - civil and political rights - වාගේම ආර්ථික, සමාජයීය, සංස්කෘතික, ආගමික, අධ්‍යාපනය, සෞඛ්‍ය යනාදී සුබසාධන ක්ෂේත්‍රත් මානව අයිතියක් බවට පිළිගැනීම ලොව පුරාවටම සිද්ධ වුණා. දකුණු අප්‍රිකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දෙස බැලුවාම ඒ තුළ මෙවන් පුළුල් නිර්වචනයක් මානව අයිතිවාසිකම්වලට හිමි වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Leader of the Opposition, your time is over.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Give me a few seconds, please.

අපි හිතනවා, නිදහස්, නිවහල් සෞඛ්‍ය පහසුකම මානව අයිතියක් බවට පත් කිරීමට දැන් කාලය එළඹ තිබෙනවා කියලා. ඇත්ත වශයෙන්ම නිදහස්, නිවහල් සෞඛ්‍යයත් මානව අයිතියක් බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපනය කළ යුතුයි. ආර්ථික, සමාජයීය, ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍යය යන පුළුල් ක්ෂේත්‍රත් මූලික අයිතිවාසිකම්වලට - fundamental rightsවලට - ඇතුළත් කිරීමට කාලය එළඹ තිබෙනවා. ඒ උදෙසා අපට සංශෝධනයක් ලබා දෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඔබතුමන්ලා පොරොන්දු වුණු ආකාරයට අලුත් ව්‍යවස්ථාවක් එළි දක්වන්න පුළුවන්. ඒ අවස්ථාවේදී, මෙවන් පුළුල් නිර්වචනයක් මානව අයිතිවාසිකම්වලට ලබා දෙන කටයුත්තට අපේ පූර්ණ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සහයෝගය ලබා දෙන්නට අපි සූදානම් බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා. ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ කාර්යභාරය හොඳින් ඉෂ්ට සිද්ධ කරන්නට හැකියාව ලැබේවා කියාත් මම නැවතත් ඔබතුමාට සුබ පතනවා. හැබැයි, බඳවා ගැනීම වාගේම රඳවා ගැනීමත් වැදගත්. මොකද, බුද්ධි ගලනය බරපතළ ගැටලුවක්. විශේෂයෙන්ම එය රට බංකොලොත් වීමත් සමඟ ඉතා ශීඝ්‍රගාමීව සිදුවන ජාතික අභියෝගයක් බව පිළිගත යුතුයි. ඔබතුමා කියනවා, මූලික වැටුප් වැඩි කළාය කියලා. හැබැයි, දීමනා - allowances - කප්පාදු කරලා එය මූලික වැටුපට ගැළපීම නොකොට මූලික වැටුප වැඩි කිරීමත්, තිබුණු ආකාරයටම, එලෙසම දීමනා - allowances - ලබා දෙන්නට කටයුතු කරන්නය කියාත් ඉල්ලා සිටිමින්, වෙලාව වෙන්කර දීම සම්බන්ධව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කෙටි ඉදිරිපත් කිරීම අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා වුණත් පිළිගන්න ඕනෑ, මේ මූලික වැටුප් වැඩිවීම වුණත් අපි ඉතාම ඉහළින් කරලා තිබෙනවාය කියන එක. Paramedical servicesවල මූලික වැටුප රුපියල් 22,040 ඉඳලා රුපියල් 43,320 දක්වා වැඩිවෙලා තිබෙනවා. වෛද්‍යවරුන්ගේ මූලික වැටුප රුපියල් 39,860 ඉඳලා රුපියල් 79,815 දක්වා වැඩිවෙලා තිබෙනවා. හෙදියන්ගේ මූලික වැටුප රුපියල් 22,395 ඉඳලා රුපියල් 43,675 දක්වා වැඩි වෙනවා. ඒ අනුව ඔබතුමාට පෙනෙනවා ඇති, මේ මූලික වැටුප් වැඩිවීමට සාපේක්ෂව ඒ හැම කෙනාටම extra duty allowance, OT allowance, holiday pay සඳහා තිබුණාට වඩා වැඩි ගණනක් දෙනවාය කියන එක. හැබැයි, ආර්ථිකයට දරා ගන්න පුළුවන් ප්‍රමාණයට තමයි ඒවා දෙන්න වෙන්නේ කියන එක ඔබතුමා පිළිගන්න ඕනෑ. ඒ නිසා මේ මූලික වැටුප් වැඩිවීම ඔබතුමා සාදරයෙන් භාර ගනියි කියලා මම හිතනවා.

එක උත්තරයක් විතරක් මම දෙන්නම්. ඩෙංගු මර්දන සහායකයන් සම්බන්ධ ප්‍රශ්නයට ගරු විපක්ෂ නායකතුමනි, අවුරුදු 8ක් වෙනවා. ඒක ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේදීත් විසඳා ගන්න තිබුණු ප්‍රශ්නයක්. නමුත් ඒ ප්‍රශ්නය විසඳුවේ නැහැ. එතැන අපොස සාමාන්‍ය පෙළ විභාගය අසමත් 671දෙනෙක් ඉන්නවා. ඒ අය බහුකාර්ය සංවර්ධන සහායකයන් ලෙස බඳවා ගැනීමට අවශ්‍ය කරන කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබෙනවා. ඒ කටයුතු සිදු වෙමින් පවතිනවා. ඒ අයගේ ප්‍රශ්නය නිරාකරණය වෙමින් පවතිනවා. GCE O/L සමත් 301දෙනෙක් ඉන්නවා. ඇත්තටම අපි මේ ගැන අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් පවත්වන කමිටුවේදී සාකච්ඡා කළා. ඒ වාගේ අය තවත් 7,000ක් විතර රාජ්‍ය සේවය තුළ ඉන්නවා. හැබැයි, ඩෙංගු මර්දන සහායකයන්ට ප්‍රමුඛතාව ලබා දීමට අපි සාකච්ඡා කළා. ඒ අනුව මාස තුනක් ඇතුළතදී අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් 301දෙනාගේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්. අපොස සාමාන්‍ය පෙළ විභාගය අසමත් 671දෙනාගේ ප්‍රශ්නය ගැන අපි දැන් රාජ්‍ය සේවා කොමිසමට ලියා තිබෙනවා. ඒ ගැන අපි දැනුත් විමසමින් ඉන්නේ. මේ ප්‍රශ්නය දැන් සැලකිය යුතු මට්ටමකින් නිරාකරණය වෙලා තිබෙන්නේ. ඩෙංගු මර්දන සහායකයින්ගේ ප්‍රශ්නය ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේදීත් තිබ්ලා අවුරුදු 8ක් තිස්සේ වර්ධනය වෙච්ච එකක්. අපි එය විසඳා දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සභාපතිතුමනි, මට පොඩි වෙලාවක් ලබා දෙන්න.

ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුවට ගරු අමාත්‍යතුමාත් ඇතුළුව වෛද්‍යවරු විශාල ප්‍රමාණයක් මන්ත්‍රීවරු වශයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව සිටිනවා. වෛද්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ හිටපු පුද්ගලයෙක් ගරු කථානායකතුමා. වෛද්‍යවරු විශාල ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තුවේ සිටිනවා. මම ඔබතුමාත් එක්ක තර්ක විතර්ක කරන්න යන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. මේක මම නිර්මාණය කරලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ප්‍රශ්නයක් නොවෙයි. වෛද්‍යවරු අප වෙත ඉදිරිපත් කරපු දුක්ගැනවිල්ල මේ සභාවට ඉදිරිපත් කිරීම අපේ යුතුකමක්. එහෙම නැතුව ව්‍යාජ තර්කයක් ඉදිරිපත් කරනවා නොවෙයි.

මූලික වැටුප් සම්බන්ධයෙන් ඔබතුමා කියපු කාරණාව මම පිළිගන්නවා. හැබැයි, මූලික වැටුප ලබා දෙන්න දීමනා කප්පාදු කරන්න එපා කියන එකයි මම කියන්නේ. ඒ නිසා කරුණාකරලා මගේ කථාවේදී ඉදිරිපත් කරපු යෝජනා සැලකිල්ලට භාජන කරලා කටයුතු කරන්න. මොකද, අපි කැමතිත් නැහැ වැඩ වර්ජනවලට යනවාට. අපි කැමැතිත් නැහැ, වැඩ වර්ජන තුළින් මේ රටේ ජනතාව පීඩනයට පත් වෙනවාට, විශේෂයෙන් ගිලන් වූ ජනතාව; ගිලන් වූ ප්‍රජාව. කරුණාකරලා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා අර allowance එක කප්පාදු කරන්නේ නැතිව ඒකත් එලෙසම තිබෙන ආකාරයට මූලික වැටුපත් වැඩි කිරීමට කටයුතු කරන්න. මම හිතන විධියට, ඔබතුමා විවිධ සංවිධාන හමු වුණා. ඒ අයට පොරොන්දු වුණු ආකාරයට ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. (Dr.) Rizvie Salih. You have 14 minutes.

[11.00 a.m.]

ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)

Hon. Chairman, I would like to take this opportunity to thank you for the time allotted to me to speak at the Committee Stage Discussion of the Budget, 2025.

Today, we deal with the Heads of the Ministry which has literarily touched the lives of each one of us, the citizens of this country, from the day we were born, that is from our first breath, and thereafter, throughout our lives until we breathe our last. We all look forward to a healthy Discussion and I am happy to say that it has, indeed, been a healthy Discussion since it was started by the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana from the Opposition. Thereafter, the Minister of Health and Mass Media came out with his comments and the Hon. Leader of the Opposition had very positive suggestions. So, it has been a very cordial Discussion so far.

The Government of the day, from its maiden Budget, 2025, has allocated a sum of Rs. 604 billion to the Ministry of Health and Mass Media. If we take the allocation to the Ministry of Health and Mass Media for this year, there is Rs. 496.3 billion under Recurrent Expenditure and Rs. 107.3 billion under Capital Expenditure.

Speaking of healthcare of the urban middle and lower-middle class population of the Colombo Central, which I represent, their general health is already compromised due to the strangulated economic conditions. Many are families, where both parents have to work, mostly as informal daily wage earners. They usually end up seeking healthcare from dispensaries and pharmacies in their vicinity for the reason that they have to face the language barrier when they go to State health institutions. Another reason is, as the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana who opened the Discussion for the Opposition said, the long delays that people have to endure at the outpatient departments of hospitals. That makes it essential for the parents to stay away from work, many of whom, as I mentioned, are daily wage earners. It also makes it uncomfortable for the parents to leave the other children at home while the mother or the father takes their sibling to hospital. So, all that makes it necessary for those families who scrape the bottom to seek medical treatment from a private dispensary in their vicinity operating on a day-to-day basis. I am certain that the digitalization process initiated by the Government would ease such delays and streamline the services, cutting down on the time the patients have to spend at the OPD. The phenomenon of seeking medical services from the nearest dispensary - as a private practitioner, I witnessed it - has had a surge. There was an increased number of patients who came for private medical treatment, although they could not afford it, during the tragic incidences where infirmity and even death of individuals resulted mainly among those who chose to seek medical treatment from government institutions, and it was due to the low quality or substandard medicines and even contaminated injections. Those drugs were procured not due to ignorance, but driven by man's greed. It is not a mere crime against humanity, but also a sin against humanity.

The poorest of the poor were the worst affected. Let bygones be bygones as we resolve to ensure that such unfortunate, unforgivable incidents never ever happen in our nation.

Another factor that greatly contributes to infirmity and sickness among people of urban areas I mentioned earlier is the poor environmental conditions. As you would know, open drains, poor sanitary conditions and the overtly unhealthy state in and outside of their dwellings contribute to communicable diseases. With the "Clean Sri Lanka" concept and initiative by the Government, we all hope that those factors would be effectively controlled, managed and addressed.

The Hon. Leader of the Opposition spoke about the brain drain that has affected the health sector of this country. Yes, the brain drain has been a stumbling block when it comes to maintaining an effective health service in this country. Every segment of health service providers, be it consultants, medical officers, nursing staff or every category of trained paramedical technicians - perfusionists, physiotherapists, speech therapists or audiologists - chose to leave the shores of this country. The downfall in the economy, the deteriorating law and order situation, the education opportunities available for their children and other factors, too, were contributory to this brain drain. Though better salaries abroad was one attractive factor, it was not the only factor; it was because people just, sadly, lost hope in their motherland. They chose to leave mainly for the betterment of their children seeking for better education, better security and a better law and order situation where they could raise their children in. We all hope that with the "new reawakening", this trend affecting not only the health sector, but other sectors as well would be reversed and brought under control because every one of those who left the shores of this country did so only physically; they all left their hearts in Sri Lanka, the land we all love!

Another factor that I noticed affecting the people in the area I come from is substance abuse and narcotic drug usage. Today, that is a major factor for the negative health consequences of the users themselves and their families mainly among the urban population. That menace and curse to our society is causing various social evils in addition to breaking up the very fabric of families in the society.

I would like to tell you that I, as a doctor, have come across increased use of substance and narcotics by women of this society, especially where I come from. It could be the same in other areas, too. I have even come across mothers who were five or six months pregnant and who came with their other children, sat in front of me and asked, "ඩොක්ටර්, ඉඳලා හිටලා අයිස් ටිකක් ගත්තාට කමක් නැද්ද?" First, I was confused as to what they meant by "අයිස්"; I thought they were talking of cool drinks. But, no, that was the narcotic, crystal methamphetamine which has become a menace to this society. So, what do you expect the health of that mother and the unborn child would be? We, the Government, will certainly address that issue. We have to address that issue in different angles, while law enforcement is a necessity. We also have to include education among the categories of such persons who may have a tendency for such addictions, counselling, rehabilitation and taking steps to integrate such rehabilitated people into the society.

Then, the Government of the day has allocated Rs. 1.5 billion for control and prevention of communicable diseases. Our preventive health service has been the pride and the diamond on the crown of our health service admired by many countries in the region. The Government has implemented a plan and a programme for health screening of all individuals above the age of 40 years in order to detect very early non-communicable diseases such as heart diseases, diabetes, vascular diseases, kidney diseases and neurological diseases which come up among the aging population. We, as a nation, are also faced with an aging population, for which the Government has drawn up a plan.

I also wish to state before this House that the Government has allocated a sum of Rs. 32.4 billion towards maintenance, rehabilitation and improvement of the existing health service infrastructure, which includes completion of the construction of certain hospital buildings that had come to a standstill. This is in addition to the Rs. 3.2 billion set aside for constructing new units

[ගරු රිස්වි සාලි මහතා]

at certain identified hospitals around the Island. Key welfare projects are also addressed in the health budget of 2025. This includes a nutritional food package for expectant mothers, for which a sum of Rs. 7.5 billion has been allocated. The reviving of the Triposha Programme, which has already begun, is a great blessing for expectant mothers and children alike. I remember how mothers used to come to the clinic with their children and the joy on their faces when they got those two packets of Triposha; it brought happiness to the faces of the children and the mothers. So, that is a very welcome move and I think it should continue until this nation needs it. The "Suwa Seriya" Ambulance Service, which was mentioned by the Opposition Member who opened this Discussion, is also allocated Rs. 49 billion in this Budget.

Better salaries and allowances to doctors, nurses and the other categories of medical staff have been an issue since that new Budget was presented. The Hon. Minister of Health has taken so much pain to explain in detail and categorize this increase to this House and to the nation as such.

The Government and the nation truly appreciate the sincere dedication of the staff of the health service, which has served this nation so far, and their proclamation that their trade union action would be put off. I also would like to emphasize that doctors have the greatest passion for their career and profession; they sacrifice their personal time with their families and for leisure to be at work. Out of the nursing staff, 95 per cent are women who have multifaceted roles being a daughter, a wife, a mother and a homemaker. And, it touches us all that they come to duty, for example, in a paediatric ward, when their own children are sick at home or that they come to look after elderly patients in hospitals or other institutions while they also have old parents, who may be bedridden, at home. That is, indeed, laudable and is always appreciated by this nation.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி)
(The Hon. (Dr.) Rizvie Salih)
Please, give me one more minute, Sir.

I would like to state that, as I mentioned earlier, this Discussion has been very healthy so far; each of the Hon. Members of the Opposition who spoke before me, the Hon. Leader of the Opposition and the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana, were very passionate on improving the health sector of this country, and the whole House appreciates that.

In conclusion, I would like to share my personal experience. Every day when I come into Parliament through the Members' Entrance, on either side, I see pictures of Hon. Members of Parliament who had served before us and left. They had served before us. Sometimes, I keep my bag on the ground, look at those photographs and think of the good legacy they had left behind. I would like to say, let us all resolve that we leave a good legacy behind, which would be celebrated by generations to come. It reminds me of a quotation that I always valued and I would like to share with you, if you could give me thirty seconds, Sir: "One day this world would remember us for the good we did, for those with whom we had nothing in common, except our shared humanity."

Thank you, Sir, for the time given to me.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, what is the point of Order?

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු සභාපතිතුමනි, ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ මොහොතේ සභාවේ සිටින නිසා මා කලින් කී කාරණයක් කෙරෙහි එතුමාගේ විශේෂ අවධානය යොමු කරවන්න කැමතියි. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, ජාතික රෝහලේ දැවැන්ත අර්බුයක් තිබෙනවා. එහි රෝගීන් එහා මෙහා ගෙන යනවා, මහ පාර මැද.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, what is your point of Order?

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගේ අවසර ඇතිවයි මම මෙය ඉදිරිපත් කරන්නේ.

ඒ කාරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා දීර්ඝකාලීන සැලැස්මක් ක්‍රියාත්මක කරන තෙක් මොකක් හෝ කෙටිකාලීන සැලැස්මක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ඉතාම වැදගත්, ගරු ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ කාරණයට අදාළ යූටියුබ් වීඩියෝ එක සුදත්ත තිලකසිරි මටත් එව්වා. ඒ මොහොතේම මම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් එය යොමු කළා. ඔබතුමාත් දන්නවා, ජාතික රෝහලේ Cardiology Unit එක, OPD එක, Cardiothoracic Surgery Department එක පිහිටා තිබෙන ආකාරය අනුව සමහර වෙලාවට රෝගීන් එහේට මෙහේට කර ගන්න වෙනත් ක්‍රමයක් නැහැ කියලා. දැනට අපි ambulances පාවිච්චි කරමින් ඉන්නවා. නමුත් ස්ථිරසාර ක්‍රමයක් අවශ්‍යයි, රෝගීන්ට ප්‍රශ්නයක් නොවන ආකාරයට ඒ කටයුතු කරන්න. මම සුදත්තටත් කිව්වා. ඔහුත් කැමතියි මේ වෙනුවෙන් උදවු කරන්න. අපි සාකච්ඡා කරලා ඒ වෙනුවෙන් කටයුතු කරමු.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Pathmanathan Sathiyalingam, you have 12 minutes.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Hon. Chairman. I was informed that I have 14 minutes.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, I will give you 14 minutes.

[மு.ப. 11.17]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Thank you so much.

கௌரவ தவிசாளர் அவர்களே, சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சினுடைய இன்றைய விவாதத்தில் கலந்துகொள்வதையிட்டுப் பெரும் மகிழ்வடைகின்றேன். இலங்கையின் சுகாதாரக் குறிகாட்டிகள், ஏனைய ஆசிய நாடுகளுடன் ஒப்பிடும்போது நல்ல நிலையிலேயே உள்ளது. இருந்தபோதும் 2021ஆம், 2022ஆம் ஆண்டுகளில் ஏற்பட்ட 'கொவிட்-19' தாக்கம், அதேபோல் இந்த நாட்டில் ஏற்பட்ட பொருளாதார நெருக்கடி நிலை காரணமாக உலகிலுள்ள நாடுகளைப் போன்று எங்களுடைய நாட்டிலும் சுகாதார நிலையில் மோசமான பாதிப்பு ஏற்பட்டது. குறிப்பாக, சுகாதார சேவை வழங்கலில் ஏற்பட்ட தாக்கமே இதற்கான முக்கிய காரணமாகும். அதனால், மக்கள் தமது சேமிப்பிலிருந்து சுகாதாரத்துக்காகப் பெருந்தொகை நிதியைச் செலவிட நேரிட்டது. இந்த நிலை எமது மக்களின் பொருளாதாரத்தில் பாரிய தாக்கத்தைச் செலுத்தியதால், அவர்கள் ஏனைய தேவைகளுக்காகச் செலவிடக்கூடிய பணத்தின் அளவிலும் தாக்கம் செலுத்துகிறது.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වියෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you may continue, please.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
உலகளாவிய சுகாதாரப் பாதுகாப்பு - Universal Healthcare Coverage - அதன் தரத்திலிருந்து குறைவடைவதை அவதானிக்கக்கூடியதாக உள்ளது. உலகளாவிய சுகாதாரப் பாதுகாப்பை உறுதிப்படுத்த ஆரம்ப சுகாதார பராமரிப்பு அணுகுமுறையை நாடுமாறு உலக சுகாதார நிறுவனம் ஆலோசனை வழங்கியுள்ளது. அதாவது, Primary Healthcare Approach இதற்கு ஒரு சிறந்த முறைமை என்பதை அந்நிறுவனம் அறிவித்துள்ளது. சுகாதாரம் என்பது அபிவிருத்தியின் முன்நிபந்தனை மட்டுமல்ல, அது அபிவிருத்தியின் வெளிப்பாடு மற்றும் அளவுகோலுமாகும்.

இலங்கையின் சனத்தொகை 2050ஆம் ஆண்டளவில் அண்ணளவாக 25 மில்லியனை எட்டலாமெனக் கூறப்படுகிறது. இலங்கைச் சனத்தொகையில் மூத்தவர்களின் எண்ணிக்கையும் மக்களின் ஆயுட்காலமும் அதிகரித்துச் செல்வதைக் காணக்கூடியதாகவுள்ளது. இலங்கையில் இறப்புக்கான காரணத்தைப் பார்த்தால், பாரிசவாதம் -'ஸ்ரோக்' - இருதய நோய், சயரோகம் என்பன முதல் நிலையிலும், நாள்பட்ட நுரையீரல் நோய்கள் என்பது அதற்கு அடுத்ததாகவும் காணப்படுகிறது. மொத்த இறப்புகளில் 74.8 சதவீதமானவர்கள் தொற்றா நோயினாலேயே இறப்பதைக் காணக்கூடியதாக இருக்கிறது. எனவே, எமது நாடு ஆரம்ப சுகாதார பராமரிப்பு முறையை மேலும் அபிவிருத்தி செய்யவேண்டிய தேவையில் இருக்கிறது. ஆரம்ப சுகாதார அபிவிருத்தியென்பது உகந்த திறன், சமமான விநியோகம், தயாரிப்புக்கான அணுகல் வசதி ஆகியவற்றை முன்னுரிமைப்படுத்திச் செய்யப்பட வேண்டியதாக இருப்பதால், நாட்டின் சுகாதாரத்தை மேம்படுத்துவதற்கு நாங்கள் புதியதொரு அணுகுமுறையை நாடிப் போகவேண்டிய தேவை காணப்படுகின்றது.

அடுத்ததாக, எங்களுடைய மாவட்டத்திலுள்ள பிரச்சினைகளை ஆராய்ந்து பார்க்கும்போது, வவுனியா மாவட்டத்தைப் பொறுத்தவரையில் அங்குள்ள பொது வைத்தியசாலையில் முழுமைபெறாத நிலையில் காணப்படுகின்ற விபத்து மற்றும் அவசர சிகிச்சைப் பிரிவின் வேலைகளை நிறைவுசெய்வதற்காக 600 மில்லியன் ரூபாய் மேலதிகமாகத் தேவைப்படுகிறது. உங்களுடைய அமைச்சிலிருந்து இந்த 600 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்யுமாறு கௌரவ அமைச்சரவர்களிடம் மிகவும் தாழ்மையுடன் கேட்டுக் கொள்கின்றேன். அதேபோல, புதிதாக நிர்மாணிக்கப்பட்ட இருதய மற்றும் சிறுநீரக சிகிச்சைப் பிரிவை இயங்க வைப்பதற்கான ஆளணியை ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

நெதர்லாந்து நாட்டினுடைய நிதியினூடாக வவுனியா, முல்லைத்தீவு, கிளிநொச்சி, யாழ்ப்பாணம் ஆகிய மாவட்டங்களில் விசேட மருத்துவப் பிரிவுகள் உருவாக்கப்பட்டது. அந்தப் பிரிவுகள் தற்போது முழுமையாக இயங்காமையால், மக்கள் பயன்பெற முடியாத நிலைமை காணப்படுகிறது. இதற்குரிய முக்கியமான காரணம், அந்தப் பிரிவுகளுக்குத் தேவையான ஆளணிப் பற்றாக் குறையாகும். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இதில் முக்கிய கவனம் செலுத்த வேண்டுமென்று நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய வவுனியா மாவட்டம் சிறுநீரக நோயினால் - chronic diseases - பாதிக்கப்பட்ட நோயாளர்கள் அதிகமாகக் காணப்படும் இடமாக இருக்கிறது. அங்கு சிறுநீரக மற்றும்

[ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

இரத்த சுத்திகரிப்பு சிகிச்சைகள் நடைபெறுகின்றது. அங்கு தற்போது 180 நோயாளர்கள் தொடர்ச்சியான இரத்த சுத்திகரிப்பை - dialysis - செய்து கொண்டிருக்கின்றார்கள். ஆனால், அங்கு புதிய நோயாளர்கள் வந்துகொண்டிருக்கிறார்கள். இது தனியே வவுனியா மாவட்டத்திற்கு மாத்திரமான பிரிவு அல்ல. அண்மையிலே இருக்கின்ற பதவியா, மதவாச்சி, மன்னார் போன்ற ஏனைய பிரதேசங்களிலிருந்தும் பெருந்தொகையான நோயாளர்கள் அங்கு வருகிறார்கள். அங்குள்ள Dialysis Unitஇல் 2024ஆம் ஆண்டில் மாத்திரம் கிட்டத்தட்ட 12,000 dialysis slots செய்யப்பட்டிருக்கின்றது. இருதய சிகிச்சைப் பிரிவிலே 2022ஆம் ஆண்டில் மாத்திரம் கிட்டத்தட்ட 7,500 நோயாளிகள் பயன்பெற்றிருக்கிறார்கள். ஆகவே, அங்கு மேலும் 4 இரத்தச் சுத்திகரிப்பு இயந்திரங்களையாவது பெற்றுத் தரவேண்டிய கடமை கௌரவ அமைச்சர் அவர்களுக்கு இருக்கின்றது. தயவுசெய்து அதை எங்களுக்குப் பெற்றுத் தாருங்கள்!

அத்துடன், வவுனியா மாவட்டத்திலே இருக்கின்ற செட்டிகுளம் ஆதார வைத்தியசாலை ஒரு பாரிய பிரதேசத்தை cover பண்ணுகின்ற வைத்தியசாலையாக இருக்கின்றது. ஆனால், அங்கு பாரிய குறைபாடுகள் காணப்படுகின்றன. குறிப்பாக, அங்கு ஆய்வுகூட வசதிகள் மேம்படுத்தப்பட வேண்டும். வட மாகாண சுகாதார சேவைகள் திணைக்களத்தினூடாக அதற்குரிய கோரிக்கை சுகாதார அமைச்சர் அவர்களுக்கு முன்வைக்கப்பட்டிருக்கின்றது. மேலும், அந்த வைத்தியசாலையின் கழிவு நீர் முகாமைத்துவம் மிகவும் மோசமான நிலையிலே இருக்கின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இது சம்பந்தமாக உங்களுடைய கரிசனையைச் செலுத்த வேண்டும்.

அதேபோல, எங்களுடைய முல்லைத்தீவு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள வைத்தியசாலையில் medical wardsஇற்குரிய complex ஒன்று இல்லாதிருக்கின்றது. தற்போது அங்குள்ள 42 கட்டில்களை வைத்துக்கொண்டுதான் அங்குள்ள வைத்தியர்கள் நோயாளர்களுக்குச் சேவை செய்கிறார்கள். 2017ஆம் ஆண்டில் இந்திய அரசின் நிதியுதவியில் அங்கு Medical Ward Complex ஒன்றைக் கட்டுவதற்குரிய ஏற்பாடுகள் செய்யப்பட்டாலும்கூட, 2024ஆம் ஆண்டில்தான் அதற்குரிய soil test செய்கின்ற நிலைமையை அவர்கள் எட்டியிருக்கிறார்கள்; மிகவும் slow ஆகத்தான் இந்த process நடக்கின்றது. இதற்கு எங்கள் தரப்பில் இருப்பவர்களே முழுமையான பொறுப்பை ஏற்கவேண்டியிருக்கிறது. எங்களுடைய அமைச்சு மட்ட அதிகாரிகளினதும், குறிப்பாக ERD - External Resources Department - இனதும் காலதாமதம் இதற்கு முக்கியமான காரணமாகச் சொல்லப்படுகின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் தனிப்பட்ட கரிசனையைச் செலுத்தி, இந்தத் தாமதத்தை உடன் நீக்குமாறு தயவோடு கேட்டுக்கொள்கின்றேன்.

அதேபோல, முல்லைத்தீவு மாவட்டப் பொது வைத்தியசாலையிலே Board certified consultants இரண்டுபேர் இருக்கிறார்கள். மேலதிகமாக இன்னும் Board certified consultants இருவரை அங்கு நியமிப்பதனூடாக, உள்ளகப் பயிற்சிக்குரிய அனைத்து வசதிகளையும் கொண்ட அந்த வைத்தியசாலைக்கு உள்ளகப் பயிற்சி வைத்தியர்களை நியமிக்கும்போது அந்த வைத்தியசாலையினூடாக வழங்கப்படுகின்ற சேவையின் தரம் நிச்சயமாகக் கூடும் என்பதில் எந்த மாற்றுக் கருத்தும் இல்லை.

முல்லைத்தீவு மாவட்டத்தில் இருக்கின்ற புதுக்குடியிருப்பு வைத்தியசாலை 2017ஆம் ஆண்டு ஆதார வைத்தியசாலையாகத் தரமுயர்த்தப்பட்டாலும், இன்றுவரை அதன் ஆளணி என்பது மீள் விரிவாக்கம் செய்யப்படவில்லை. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களிடம் அதற்குரிய ஆளணி தொடர்பான கரிசனையை நான் வேண்டி நிற்கின்றேன்.

அதேபோல, மருந்துக் கலவையாளர்களை எடுத்துக் கொண்டால், குறிப்பாக எங்களுடைய நாட்டிலே இருக்கின்ற சிறிய வைத்தியசாலைகளிலே மருந்துகளை வழங்குவதற்குச் சிற்றூழியர்கள் பயன்படுத்தப்படுகிறார்கள். எங்களுடைய மாகாணத்தைப் பொறுத்தவரையிலே அங்கீகரிக்கப்பட்ட மருந்துக் கலவையாளர் ஆளணியில் 83 வெற்றிடங்கள் இப்போது காணப்படுகிறது. குறிப்பாக முல்லைத்தீவு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள 34 ஆளணியில் 13 பேர் மட்டுமே கடமையாற்றுகின்றார்கள். ஆகவே, வைத்தியர்கள் நல்ல முறையிலே சிகிச்சையளித்தாலும் நோயாளருக்கு உரிய மருந்துகளைக் கொடுக்கக்கூடியதாக இந்த மருந்துக் கலவையாளர்களேனும் போதிய அளவில் பணிக்கு அமர்த்தப்பட வேண்டும். அதை நீங்கள் நிச்சயமாகச் செய்வீர்கள் என்று நான் எதிர்பார்க்கின்றேன்.

மன்னார் மாவட்டப் பொது வைத்தியசாலையைப் பொறுத்தவரையிலே, இந்திய அரசாங்கத்தினுடைய நிதி அனுசரணையில் Accident and Emergency Unitஇற்குரிய முன்னாயத்த வேலைகள் செய்து முடிக்கப்பட்டிருக்கின்றது. அதனையும் விரைவுபடுத்துமாறு கேட்டுக்கொள்கின்றேன். மேலும், அங்கு CT scan இயந்திரம் இல்லை. தேவையேற்படும்போது அங்கிருந்து 150 கிலோமீற்றருக்கு அப்பால் இருக்கின்ற யாழ். போதனா வைத்தியசாலைக்கோ அல்லது 90 கிலோமீற்றருக்கு அப்பால் இருக்கின்ற வவுனியா பொது வைத்தியசாலைக்கோ நோயாளர்களை அனுப்ப வேண்டிய நிலை இருக்கின்றது. அங்கு CTscan இயந்திரத்தைப் பொருத்துவதற்கான கட்டுமானங்கள் 2020ஆம் ஆண்டிலே செய்யப்பட்டிருக்கின்றது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த வருடத்திலே, இந்தப் பாதீட்டின் ஊடாக ஒதுக்கப்படுகின்ற நிதியில் வாங்கவிருக்கும் CT scan இயந்திரங்களில் ஒன்றை மன்னார் மாவட்டத்திற்கு முன்னுரிமை அடிப்படையில் வழங்கவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, வவுனியா - மன்னார் எல்லையிலே இருக்கின்ற இரணை இலுப்பைக்குளம் வைத்தியசாலை, 50க்கும் மேற்பட்ட கிராமங்களைக் கையாள்கின்ற ஒரு நிலையில் இருந்தும், நீண்ட காலமாக அந்த வைத்தியசாலை ஒரு PMCU ஆகவே இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் கூறியதுபோல, விஞ்ஞான ரீதியாக ஆய்வுகளை மேற்கொண்டு அதனை ஒரு பிரதேச வைத்தியசாலையாகத் தரமுயர்த்த வேண்டிய தேவையிருக்கின்றது. அதற்கும் உங்களுடைய கவனத்தை நான் கோருகின்றேன்.

சித்த மருத்துவத் துறையை எடுத்துக்கொண்டால், எங்களுடைய வடக்கு மாகாணத்திலே 'லங்கா சித்த ஆயுர்வேத மருத்துவக் கல்லூரி' என்ற ஒரு கல்லூரி இருக்கின்றது. 1925ஆம் ஆண்டு - 100 வருடங்களுக்கு முன்னர் - இலங்கையிலே தாபிக்கப்பட்ட முதலாவது சுதேச மருத்துவக் கல்லூரியாக இது விளங்குகின்றது. இந்த மருத்துவக் கல்லூரியிலேயிருந்து வெளியேறிய 1000க்கும் மேற்பட்ட சித்த மருத்துவர்கள் மற்றும் பரம்பரை மருத்துவர்கள் இப்போது மக்களுக்குத் தங்களுடைய சேவையை வழங்கிக்

කොණ්ඩිරුක්කින්රර්කළ්. ආනාල්, කඩන්ත සිල ආණ්ඩුකළාක ඉන්ත ලංකා සිත්ත ආයුර්වේත මරුත්තුවක් කල්ලූරි නිතිප් පිරච්සිනෙ මර්රුම් අංකු ඒර්පට්ට නිර්වාකප් පිරච්සිනෙ කාරණමාක මූඩප්පට්ටිරුක්කින්රතු. එංකළුටෙය මාකාණත්තිලේ වාලූකින්ර පරම්පරෛච් සුතේස මරුත්තුවර්කළුටෙය අර්විවෙ මේම්පටුත්තක්කූටිය ඔරේයොරු සන්තර්ප්පමාක ඉරුක්කින්ර ඉන්ත ලංකා සිත්ත ආයුර්වේත මරුත්තුවක් කල්ලූරියෛච් සුතේස මරුත්තුවත් තුරෛයින් නිර්වාකත්තිල් එටුත්තු, මීණ්ටුම් ඉයංකුනිලෛක්කුක් කොණ්ටුවර වේණ්ටුමෙන්රු කෞරව අමෛච්චර් අවර්කළෛත් තයවාකක් කේට්ටුක් කොළ්කිරේන්.

එංකළුටෙය නාට්ටිලේ ආයුර්වේත, සිත්ත, යුනානි පිටිප්පෙ මූටිත්ත 1,800 පට්ටතාරිකළ් වේලෛයර්රවර්කළාක ඉරුක්කිරාර්කළ්. මරුත්තුවප් පට්ටප් පිටිප්පෙ මූටිත්තුළ්ළ ඉවර්කළිල් පලර් තර්පෝතු වෙව්වේරු තිණෛක්කළංකළිලේ අපිවිරුත්ති උත්තියෝකත්තර්කළාක - DOආක - වේලෛ සෙය්වතුටන්, සිලර් සුය තොළිල්කළෛච් සෙය්පවර්කළාකවුම් ඉරුක්කිරාර්කළ්. කෞරව අමෛච්චර් අවර්කළේ, ඉන්ත විටයත්තිල් කූටිය කවනම් සෙලුත්ති, පට්ටප්පිටිප්පෙ මූටිත්ත ඉන්ත මරුත්තුවර්කළුක්කුරිය නියමනංකළෛ වළංකුවතර්කුරිය ඒර්පාට්ටෛ නීංකළ් සෙය්යවේණ්ටුමෙන්රු කේට්ටුක් කොළ්කින්රේන්.

එංකළුටෙය පාරම්පරිය මරුත්තුව මුරෛයාන සිත්ත මරුත්තුවත්තුක්කුත් තේවෛයාන මරුන්තු වකෛකළ් ඉලංකෛයිල් කිටෛප්පතිල්ලෛ. ඉන්ත මරුන්තුකළ් ඉන්තියාවිලිරුන්තු කොණ්ටු වරප්පටුවතාල් අවර්රිනි විලෛ මිකවුම් අතිකමාක ඉරුක්කින්රතු. ආකවේ, සිත්ත මරුත්තුවත්තුක්කුත් තේවෛයාන මරුන්තුකළෛ උර්පත්তි සෙය්යක්කූටිය වකෛයිලාන මුතලාවතු තොළිර්සාලෛයෛ ඉලංකෛයිල් වටක්කු මාකාණත්තිල් උරුවාක්ක උංකළුටෙය අනුසරණෛයෛ වේණ්ටි නිර්පතුටන්, අතර්කාන නිති ඔතුක්කීට්ටිනෛ මේර්කොළ්ළ වේණ්ටුමෙනවුම් කේට්ටුක් කොළ්කින්රේන්.

ඉප්පෝතු එංකළුටෙය මාකාණත්තිලේ කාණප්පටුකින්ර පෝතෛවස්තුප් පිරච්සිනෙ තොටර්පාක නේර්රු ඙ංකේ විවාතික්කප්පට්ටතු. ඉන්තප් පෝතෛවස්තුප් පිරච්සිනෛයෛක් කෛයාළක්කූටිය වකෛයිලේ, එංකළුටෙය මාකාණ සුකාතාර අමෛච්සු වටක්කු මාකාණත්තින් 5 මාවට්টංකළිලුම් මතු මර්රුම් පෝතෛවස්තුප් පාවනෛයිලිරුන්තු අවර්කළුක්කු මරුත්තුවප් පුනර්වාழ්වෛ වළංකුවතර්කාන 5 නිලෛයංකළෛ ඔව්වොන්රුම් තලා 32 මිල්ලියන් රූපාය් සෙලවිලේ අමෛත්තිරුක්කිරතු. ඉන්ත නිලෛයංකළ් ඔන්රිරණ්ටෛත් තවිර මර්රෛයවෛ තර්පෝතු ඔළුංකාක ඉයංකුවතිල්ලෛ. අතර්කුරිය මුක්කියමාන කාරණමාකවුම් ආළණිප් පර්රාක්කුරෛයේ කාණප්පටුකින්රතු. ආකවේ, කෞරව අමෛච්චරවර්කළ් ඉන්ත විටයත්තිලේයුම් මුක්කිය කවනම් සෙලුත්ත වේණ්ටුම්.

කෞරව අමෛච්චර් අවර්කළේ, වවුනියා මාවට්ටත්තිලේ 'ඔසුසල' outlet ඔන්රෛක් කොණ්ටුවරුවතර්කු නටවටික්කෛ එටුප්පතාක නීංකළ් කූරියිරුන්තීර්කළ්. අතර්කාක එංකළුටෙය මක්කළ් චාර්පාක උංකළුක්කු නන්රියෛත් තෙරිවිත්තුක් කොණ්ටු, එනතු උරෛයෛ මූටිත්තුක් කොළ්කින්රේන්.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිචාලර් අවර්කළ්)
(The Hon. Chairman)

Next, the Hon. Rohitha Abeygunawardena. You have 18 minutes.

[අ.භා. 11.31]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කරන මේ වේලාවේ අපේ දිස්ත්‍රික්කයෙන් බිහි වුණු අමාත්‍යවරයකු වන නලින්ද ජයතිස්ස මැතිතුමාට මුලින්ම මම සුබ පතනවා. ඔබතුමාගේ අමාත්‍ය ධුරය, ආණ්ඩු පක්ෂයේ සංවිධායක ධුරය සහ ආණ්ඩුවේ කැබිනට් මාධ්‍ය ප්‍රකාශක ධුරය හොඳින් කරගෙන යන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

ගරු අමාත්‍යතුමනි, මම නිර්ලෝභීව කියන්න ඕනෑ ඔබතුමා දක්ෂයෙක් බව. ඇයි ඒ? ඊයේ වෙනකොට රට තුළ කථාවක් තිබුණා වෛද්‍යවරුන්ගේ වැඩ වර්ජනයක් ගැන. ඊයේ ඒක පටන් ගන්නවා, අද සිට අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනවා කිව්වා. අනෙක් පැත්තෙන් මේක අනෙක් කාර්ය මණ්ඩල, කම්කරුවන්, හෙදියන් ඒ අයගේ ප්‍රශ්න සම්බන්ධව වැඩ වර්ජනයකට යන්න සිටින වෙලාවක්. අපි දැක්කා ඔබතුමා ඒ වෛද්‍යවරු එක්ක, වෛද්‍යවරුන්ගේ සංගමයත් එක්ක, ඒ වෘත්තීය සමිති නායකයෝත් එක්ක සාකච්ඡා කරලා අද දවස ඇතුළත එක අවසන් කරගෙන තිබෙනවා. වැඩ වර්ජන නිසා අවසානයේ අමාරුවේ වැටෙන්නේ කවුද? ඒවා කරන්න ගියාම අමාරුවේ වැටෙන්නේ මේ රටේ ඉන්න රෝගී ජනතාව. ඒ නිසා අද ඒ පිරිස වර්ජනයෙන් ඉවත් කරගෙන සාකච්ඡාවට අවතීර්ණ කර ගැනීම ගැන මගේ ගෞරවය ඔබතුමාට පළ කරනවා. ගරු ඇමතිතුමනි, හැබැයි ඒක තාවකාලික පැලැස්තරයක් විය යුතු නැහැ, ස්ථිර විසඳුමක් දෙන්න ඕනෑ. මම විශ්වාස කරනවා වෛද්‍යවරයෙක් වෛද්‍යවරයකුට එරෙහි වෙන්නේ නැහැ කියලා. මොකද, ඔබතුමාට ඇමතිකම හම්බ වුණේ පස්සේ නේ. ඇමතිකම හම්බ වෙන්න ඉස්සෙල්ලා නේ වෘත්තීය වශයෙන් ඔබතුමා වෛද්‍යවරයෙක් වුණේ. අද මේ පාර්ලිමේන්තුවේ වෛද්‍යවරු වැඩියි. මම හිතනවා, -මම නිවැරදිද දන්නේ නැහැ- වෛද්‍යවරු 20ක් විතර ඉන්නවා කියලා. ඔව්, මෙතැන වෛද්‍ය රාමනාදන් අර්විචුනා මන්ත්‍රීතුමා කියනවා 21දෙනෙක් ඉන්නවා ලු. වෛද්‍යවරු 21දෙනෙක් ඉන්න පාර්ලිමේන්තුව, වැටුප් සම්බන්ධයෙන් හෝ වෙනයම් කාරණයක් සම්බන්ධයෙන් වෛද්‍යවරුන්ට විරුද්ධව තීන්දුවක් ගනියි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. හේතුව, මීට ඉස්සෙල්ලා වෛද්‍යවරුම නොවෙයි සෞඛ්‍ය අමාත්‍යවරයා වුණේ. නමුත්, වෛද්‍යවරයෙක් වෙන්න තිබෙන අමාරුව දන්න, වෛද්‍යවරයෙක් වෙන්න ඒ දුෂ්කර ගමන ආව කෙනකු විධියට ඔබතුමා වෛද්‍යවරුන්ට විරුද්ධ වෙන්නේ නැහැයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා ඉල්ලීමක් කරනවා සමස්ත වෛද්‍යවරුන්, සමස්ත හෙදියන් සහ මේ රටේ සමස්ත සෞඛ්‍ය කාර්ය මණ්ඩල වෙනුවෙන්, ඔබතුමා හොඳ තීන්දුවකට එන්න කියලා.

රටේ තිබෙන මූල්‍ය තත්ත්වයත් එක්ක, රටේ තිබෙන ආර්ථික තත්ත්වය එක්ක සමහරවිට මේ තීන්දු ගන්න අමාරු වෙයි. ඒක නොදැන නොවෙයි මම මේ කථා කරන්නේ. හැබැයි, මේ අත්‍යවශ්‍ය සේවාවක්. අපේ රටේ තිබෙන්නේ නිදහස් සෞඛ්‍ය සේවාවක්. ඒ නිසා මේක කරගෙන යන්න ඔබතුමාගේ පූර්ණ අවධානය යොමු කරන්න. ඔවුන්ට අසාධාරණයක් වෙන්න දෙන්න එපා. අසාධාරණයක් වෙච්ච ගමන් ඔවුන් වෘත්තීය ක්‍රියාමාර්ගවලට යනවා. එතකොට අභිංසක ලෙඩ්ඩු මැරෙනවා. පෞද්ගලික රෝහල්වලට යන්න බැරි මිනිස්සු, පැනඩෝල් පෙත්තක් ගන්න බැරි මිනිස්සු, අනේ ඇඳන් උඩ මැරෙනවා. ඊට පස්සේ මාධ්‍යයෙන් එතැනට ගිහිල්ලා මොකද වුණේ කියලා අහනකොට, ඒගොල්ලන් උත්තර දෙනවා. ඊට පසුව රටම ආණ්ඩුවට බණිනවා. ඒ නිසා මේ තත්ත්වය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ඔබතුමා කිව්වා, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් රුපියල් බිලියන 479ක් වෙන් කළා කියලා. ඒ වාගේම සමස්ත සෞඛ්‍ය අංශය වෙනුවෙන් රුපියල් බිලියන 604ක් වෙන් වෙනවා. පළාත් සභා සහ මධ්‍යම රජය හරහා මේ රටේ සෞඛ්‍යයට වැඩි මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒක ඉතාම හොඳ දෙයක්, ප්‍රමුඛතාව අනුව ගත්ත තීන්දුවක්.

ගරු ඇමතිතුමනි, මම තවත් කාරණයක් මතක් කරන්න කැමතියි. මම සාමාන්‍යයෙන් රෝහල්වල තිබෙන ස්කෑන් යන්ත්‍රය කැඩිලා, අරවා මේවා නැහැ කියලා සිල්ලරට කථා කරන්න කැමති නැහැ. හැබැයි ඔබතුමාත් දන්නවා, මීට ඉස්සෙල්ලා අපේ දිස්ත්‍රික්කයේ හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයකු විසින් ඩෙංගු මර්දනය සඳහා සේවකයන් බඳවාගෙන තිබෙනවා කියලා. මේක විශාල ප්‍රශ්නයක්. මේ අය ඔබතුමාත් හමුවෙන්න ඇති; අනන්ත අප්‍රමාණව ඔබතුමාත් හමුවෙන්න ඇති. දැන් මේ මිනිසුන්ට එලොවත් නැහැ, මෙලොවත් නැහැ. ඒ මිනිස්සු එලොවත් නැතිව, මෙලොවත් නැතිව ඉන්නේ. ඒ මිනිසුන්ට රුපියල් 20,000ක් විතර හම්බවෙනවා. තවම ගිහින් ඒකට කඹුරනවා. ඒ නිසා මේ අය ගැන මොකක් හරි තීන්දුවක් ගන්න. මේ අය අභිංසක මිනිස්සු. මෙයින් වැඩි දෙනෙක් කළුතර දිස්ත්‍රික්කයේ අය. මොකද, වැඩිපුර ඒ දිස්ත්‍රික්කයෙන් නේ අරගෙන තිබෙන්නේ. මම මේ ඒ ඇමතිවරුන්ගේවත් වෙන කාගේවත් නම් කියනවා නොවෙයි. වෙච්ච දේ ඇති සැටියෙන් කිව්වේ, ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාට යම් කාරණයක් මතක් කරන්න ඕනෑ. අපි ඔබතුමා ගැන බැලුවොත්, ඔබතුමාත් සිංහල බෞද්ධ. මමත් සිංහල, බෞද්ධ. හැබැයි, අනෙක් ජාතීන්ට, අනෙක් ආගම්වලට ගරු කරන මිනිස්සු, අපි. ගරු අමාත්‍යතුමනි, බුදුන් වහන්සේ දේශනා කරලා තිබෙනවා, "කතඤ්ඤූ කතවේදී පුග්ගලෝ භික්ඛවේ දුල්ලභෝ ලෝකස්මිං"කියලා. මෙය පන්සිය පනස් ජාතක පොතේ සඳහන් වන "සීලව නාගරාජ" ජාතක කථාවට අදාළව බුදුන් වහන්සේ දේශනා කර තිබෙනවා. මොකක්ද මේකෙන් කියන්නේ? "කතඤ්ඤූ" කතඤ්ඤූ කියන්නේ කෘතවේදී මිනිස්සු; කළගුණ දන්න මිනිස්සු. "කතවේදී" කියන්නේ කළගුණ හරියාකාරව ඉටු කරන මිනිස්සු; කළගුණ සලකන මිනිස්සු. "කතඤ්ඤූ කතවේදී පුග්ගලෝ භික්ඛවේ දුල්ලභෝ ලෝකස්මිං" ඒ කියන්නේ, කළගුණ දන්නා, කළගුණ සලකන මිනිස්සු ලෝකයේ ඉතා අඩුයි කියන එක, ගරු ඇමතිතුමනි. මේ තමයි බුදුන් වහන්සේ වදාළ ධර්මය. අපි පන්සිය පනස් ජාතක කථාවලින් තමයි මේ දේවල් උපුටා ගන්නේ. ගරු අමාත්‍යතුමනි, මම මෙක කිව්වේ ඇයි? අපි සිංහල බෞද්ධයන්. බුදුන් වහන්සේගේ ධර්මය තුළින් අපට උගන්වා තිබෙනවා, කළගුණ සලකන්න. උන්වහන්සේත් කළගුණ සැලකුවා, විශේෂයෙන්ම බෝ රජාණන් වහන්සේට. බුද්ධත්වය ලැබීමේදී උන්වහන්සේට උපකාර කිරීම වෙනුවෙන් බුදුන් වහන්සේ බෝධීන් වහන්සේට කළගුණ දැක්වූවා. බුද්ධ චරිතය තුළින් කළගුණ සැලකීම සම්බන්ධව අනන්ත අපට කියා දීලා තිබෙනවා.

මම මේ කළගුණ සැලකීම ගැන කියන්නේ ඇයි, ගරු ඇමතිතුමනි? ඔබතුමා දන්නවා, ඉතිහාසයේ ඉඳලා මේ රටේ ජනාධිපතිවරුන් බිහි වී තිබෙන බව. අපි මෑත යුගය ගනිමුකෝ. මෑත කාලය තුළ අපේ කාලයේ සිටි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගැන බලමු. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා දකුණෙන් ආපු නායකයෙක්. එතුමා රටටම වැඩ කරන ගමන්, විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයට, දකුණු පළාතට වැඩියෙන් වැඩ කළා. එහෙම වැඩ කරලා තමන්ගේ ජනතාවට කළගුණ සැලකුවා. එතුමාගේ කාලයේ අධිවේගී මාර්ග හැදුවා. ඔබතුමාත්, මමත් ඒවායේ යනවා. ඒ වාගේම එතුමාගේ කාලයේ වරායවල් හැදුවා, ගුවන් තොටුපොළවල් හැදුවා. ඒ විධියට මිනිස්සුන්ට උදවු කළා. අන්න, මහින්ද රාජපක්ෂ බුදුන් වහන්සේගේ දර්ශනය අනුව ගමනක් ගියා. ඉන් අනතුරුව තමුන්නාන්සේලාත් එකතු වෙලා හදා ගත් යහපාලන ආණ්ඩුවේ ජනාධිපති වුණු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොළොන්නරුවේ හොඳ රෝහල් හැදුවා. බලන්න ලස්සනයි. හොඳ රෝහල් හදලා, පාරවල් හදලා පොළොන්නරුවේ මිනිස්සුන්ට උදවු උපකාර කළා, බුදුන් වහන්සේගේ දර්ශනය අනුව.

මෑත යුගයේ බිහි වුණේ අපේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා. එතුමා ඉදිරිපත් කළ අය වැය කථාව අපි දැක්කා. එතුමා ඉපදුණේ තඹුත්තේගම. එතුමා ඉපදුණු තඹුත්තේගම ප්‍රදේශයේ මිනිස්සුන්ට කෘතවේදීත්වය දැක්වීම වෙනුවෙන් විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීම ඇතුළු තවත් සංවර්ධන කටයුතු සම්බන්ධව මේ අය වැය යෝජනාවලියේ සඳහන් වෙලා තිබෙනවා. මේවා කළගුණ දැක්වීම්. බෞද්ධ දර්ශනය අනුව, මම අර කියපු බුද්ධ වචනය එක්ක බැඳෙන දේවල් තමයි මේවා. දැන් මම කාගේ ළඟටද එන්න හදන්නේ? මම කාගේ ළඟටද මේ එන්න හදන්නේ, කරකවාගෙන? මම එන්න හදන්නේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය, නලින්ද ජයතිස්ස මැතිතුමා ළඟට. ගරු ඇමතිතුමනි, මම බොහොම පැහැදිලිව කියන්නේ මේකයි. බුදුන් වහන්සේ වදාළ ධර්මයට; ඒ දර්ශනයට සිංහල බෞද්ධයන් හැටියට අපි නිස නමනවා, අපි ඒ ගැන හිතනවා. අර මම කියපු නායකයෝ, - ඔබේ නායකයාත්; අපේ නායකයෝත්; හිටපු ඔක්කෝම නායකයෝත් කළා වාගේ - ඔබතුමා කළ සම්පූර්ණ කථාව මම අහගෙන හිටියා. ඔබතුමා කිව්වේ ඇත්ත; හරි න්‍යාය. ඒ කියන්නේ අපට ඕනෑ විධියට රෝහල් වැඩි දියුණු කරන එක, ජාතික රෝහල් කරන එක නොවෙයි කළ යුත්තේ. නමුත් තමුන්නාන්සේට මේ දේශපාලන ගමන එන්න ශක්තිය දීපු කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව ගැන හිතලා ඒ ප්‍රදේශයේ තිබෙන රෝහල් කෙරෙහිත් වැඩි අවධානයක් යොමු කරන්න. අන්තිමට ඉතුරු වෙන්නේ ඔව්වරයි ඇමතිතුමා. වෙන මොකුත් ඉතුරු වෙන්නේ නැහැ. මේ සමාජය එහෙමයි. අපි ඉන්නකම් - *[බාධා කිරීමක්]* ඔව්, මොකුත් ඉතුරු වෙන්නේ නැහැ, අන්තිමට. අපිට අන්තිමට ඉතුරු වෙන්නේ "අන්න අර මිනිහා ඉන්නා කාලයේ අර වැඩේ කෙරුවා" කියන එක විතරයි. ඕක තමයි ඉතුරු වෙන්නේ. අපි සදාකාලිකව ජීවත් වෙන මිනිස්සු නොවෙයි. අපේ කාලය තුළ අපි කරන දේ විතරයි ඉතුරු වෙන්නේ.

ගරු ඇමතිතුමනි, ජ්‍යෙෂ්ඨයෙක් හැටියට, වැඩිහිටියෙක් හැටියට මම ඔබතුමාට මේ දෙන්නේ පොඩි උපදෙසක්. ඒක පිළිගන්න එක හොඳයි නේ. මම ඒ දිස්ත්‍රික්කයෙන් ආපු අයියා හැටියට සලකා ඔබතුමා මල්ලි හැටියට සලකා පොඩි උපදෙසක් දෙන්නම්. අපේ ලොකු අයියා කුමාර වෙල්ගම මැතිතුමා. එතුමා නැති වුණා නේ. අපි පක්ෂ භේදයකින් තොරව කටයුතු කරමු. ලොකු අයියා, පොඩි මල්ලිට දෙන අවවාදයක් විධියට මෙය පිළිගෙන, කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය වැඩිදියුණු කර ඒ යුතුකම ඉටු කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒ වාගේම, රටේ සමස්ත ජනතාවටත් ඒ යුතුකම ඉටු කරන්න. *[බාධා කිරීමක්]*

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
රාජිතට -

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
රාජිත? හපොයි! *[බාධා කිරීමක්]* ඔව්, වැඩිය කථා කරන්න ගියොත්, වෙන වෙන ඒවා කියැවෙනවා, ලයින් එක පනිනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. ඔබතුමා බෝවන රෝග සහ බෝ නොවන රෝග සම්බන්ධව කථා කළා. මේ අතරින් බෝ නොවන රෝග හැදෙන ක්‍රම තිබෙනවා නේ, ගරු අමාත්‍යතුමනි. ඔබතුමා වෛද්‍යවරයෙක්. ඒ නිසා මට වැඩිය හොඳට ඔබතුමා ඒ ගැන දන්නවා නේ. ඒකට එක හේතුවක් තමයි අධික මත්ද්‍රව්‍ය භාවිතය. එහෙම වුණාම රෝග හැදෙනවා නේ. සිරෝසිස් හැදෙනවා, නොයෙක් ලෙඩ හැදෙනවා. ගරු අමාත්‍යතුමනි, මීට මාස 2කට විතර ඉහතදී ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, පසුගිය රජය -රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ රජය- කාලයේ ලබා දුන් මත්පැන් බලපත්‍ර 360ක විස්තර සහිත ලැයිස්තුවක්. හරි නේද, ගරු ඇමතිතුමනි? මා ළඟ තිබෙනවා, ඒ ලේඛනය. මෙතැන සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාත් සිටින නිසායි මම මේ කියන්නේ. ඒ විධියට මත්පැන් බලපත්‍ර ලබා දී තිබෙනවා. ඔබතුමන්ලා බොහොම පැහැදිලිව කිව්වා, මේ මත්පැන් බලපත්‍ර දීලා තිබෙන විධිය ගැන. ඒවා දීලා තිබෙන්නේ ටෙන්ඩර් කරලා නොවෙයි නේ. ඒවා ටෙන්ඩර් කරලා දීපු ඒවා නොවෙයි. ඒවා දේශපාලන හේතූන් මත දීපු මත්පැන් බලපත්‍ර. ඒ බලපත්‍රලාභීන් ගැන අපි දැනගත්තා. අහවල් සමාගම, අහවල් කොම්පැනිය කියලා එහි තිබෙනවා. ඔවුන් තමයි වයින් ස්ටෝර්ස් දාලා තිබෙන්නේ. හැබැයි, ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. කළුතර දිස්ත්‍රික්කයටත් මත්පැන් බලපත්‍ර 6ක්ද, 7ක්ද අලුතෙන් දීලා තිබෙනවා. ජනාධිපති අරමුදලෙන් සල්ලි ගත් අය පිළිබඳවත්, දේපළ හානි සම්බන්ධයෙන් සල්ලි ගත් අය පිළිබඳවත් ලැයිස්තුවක් ඔබතුමා ඉදිරිපත් කළා; ඒ ඔක්කොම ඉදිරිපත් කළා. අනෙක් ඒවා ගැන කෙසේ වෙතත් -අනෙක් ඒවා ගැනත් විස්තර දෙන්න- කළුතර දිස්ත්‍රික්කයට වයින් ස්ටෝර්ස් බලපත්‍ර දෙන්න නිර්දේශ කළේ කවුද කියලා මට ඉදිරිපත් කරන්න, ගරු ඇමතිතුමනි. කවුද ඒක කළේ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ද, ආසන සංවිධායකවරයෙක්ද, හිටපු ඇමතිවරයෙක්ද, එහෙම නැත්නම් තමන්ට හිතවත් කෙනෙක්ද, නිලධාරියෙක්ද කවුද කියන එක ඉදිරිපත් කරන්න. ඒක ඔබතුමාගෙයි, මගෙයි අනාගතයට සුබවාදී වෙයි. එලොවටයි, මෙලොවටයි දෙකටම සුබවාදී වෙයි. ඉක්මනටම මේක හොයලා දෙන්න. එහෙම වෙන එක හොඳයි නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ කාලයේ හොයා ගන්න බැරි වුණාද?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ඒ කාලයේ හොයන්නේ කොහොමද, හොරෙන් නේ වැඩේ ගිහිල්ලා තිබෙන්නේ. හොරෙන් ගිය ඒවා හොයන්නේ කොහොමද? ඒවා අපට හොයන්න බැහැ. ඒවා එහෙම, එහෙම ගිහිල්ලා ඇති. හැබැයි, එහෙම ගිය ඒවා දැන් හොයාගන්න පුළුවන්. නේද, ඇමතිතුමා? ඇයි, ඒ කාරණය සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දවසේදී නේ මම කිව්වේ. මේ රටේ තිබෙන රෝහල් පද්ධතියට ගියාට පස්සේයි අපට ඒක තේරෙන්නේ. හුහක් වෙලාවට මිනිස්සු මොකද කරන්නේ? මත්පැන් බීලා මිනිස්සු තමන්ගේ ජීවිතය නැති කර ගන්නවා. මිනිස්සු උදේ ඉඳන් රෑ වෙනකල් මත්පැන් බොනවා. මම කියන්නේ, මහජන නියෝජිතයෙක් මේ බලපත්‍ර ලබා දෙන්න නිර්දේශ කරලා තිබුණා නම්, ඒ විස්තර ඉදිරිපත් කරන්න කියලා. මහජන නියෝජිතයෙකුට ඒක නිර්දේශ කරන්න බැහැ. නමුත් ගරු ඇමතිතුමනි, මහජන නියෝජිතයෙක් ඒක නිර්දේශ කරලා තිබුණා නම් ඒ සම්බන්ධ විස්තර ඉදිරිපත් කර සභාගත කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම වයින් ස්ටෝර්ස් ගැන කථා කළාට මේ රටේ වයින් ස්ටෝර්ස් වහලාම දාන්න කියලා මම කියන්නේ නැහැ. මොකද, ඒක මේ රටේ ආර්ථිකයට බලපානවා. ඒ වාගේම ඇත්ත ඇති සැටියෙන් කථා කරන කෙනෙක් හැටියට මම ඇත්ත කියනවා, මම නම් ඉඳලා හිටලා පොඩි අඩියක් ගහනවා. එහෙම ජොලියකුත් තියෙන්න එපා යැ. ඉඳලා හිටලා සතුටු වෙන වෙලාවක මමත් පොඩි අඩියක් ගහනවා. හැබැයි, ඒක දිගටම කරන්න ගියාම තමයි අර මම කියපු විධියට ඉස්පිරිතාලේ යන්න වෙන්නේ. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය විශේෂයෙන්ම යොමු කරන්න. කළුතර දිස්ත්‍රික්කයට මේ මත්පැන් බලපත්‍ර ලබා දෙන්න නිර්දේශ කළේ කවුද කියන එක ගැන අපට කියන්න කියලා ඔබතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු අමාත්‍යතුමනි, මේ කාරණයත් මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මේ, අපේ දිස්ත්‍රික්කයේ නොවෙයි, ඔබතුමාටයි, මටයි යාබද්ව තිබෙන නෙළුව ප්‍රාදේශීය රෝහල ගැනයි කියන්නේ. නෙළුව කියන්නේ, පළාත් දෙකකට අයත් ප්‍රදේශයක්. බස්නාහිර පළාතට වාගේම දකුණු පළාතටත් අයත් නගරයක්. දිස්ත්‍රික්ක වශයෙන් ගත්තොත්, කළුතර දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය, මාතර දිස්ත්‍රික්කය අයත් වෙනවා. මාතරත් ඒකට අදාළයි. ඔබතුමා ඉපදුණු ගමේ ඉඳලා කිලෝමීටර ගණනක් යනකොට තමයි මේ ප්‍රාදේශීය රෝහල තිබෙන්නේ. මම ඒ රෝහලට ළඟදි ගියා. මගේ දරුවෙකුත් වෛද්‍යවරියක්. ඒ රෝහලේ තමයි සේවය කරන්නේ. ඒ නිසා මම එතැනට ගියා. මම එහි ගිය අවස්ථාවේ එම රෝහලට එන අයත් එක්ක කථා කළා. අඩුපාඩුකම් තිබෙනවා. ඒ අය අහිංසක මිනිස්සු. තේ දලු ටික කඩලා, වතුවල වැඩ කරලා, ලෙඩක් දුකක් හැදුණාම බෙහෙත් ගන්න ඒ රෝහලට එනවා. මම දැනගත්ත කාරණයක් මේ කියන්නේ. මේ ආණ්ඩුව ආපු ගමන් බඩු නැහැ කියන එක නොවෙයි මම කියන්නේ. මේ අඩුපාඩු පෙර ඉඳලා තිබුණු ඒවා. ඒ ගැන කියන එක නේ වටිනාකම. තුවාලයක් සිදු වුණාම ඒකට මැහුම් දමන්න අවශ්‍ය නූල ඒ රෝහලේ නැහැ. මම මේ එක දෙයක් විතරයි කිව්වේ. මෙන්න මේ වාගේ අඩුපාඩු තිබෙනවා, ඒ රෝහලේ. ගරු අමාත්‍යතුමනි, මේ අඩුපාඩුකම් ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු අමාත්‍යතුමනි, ප්‍රතිකාර ගන්න ගියාම සමහර රෝහල්වලින් කියනවා, ඇහැ ඔපරේෂන් කරන්න අහවල් පිහිය අරගෙන එන්න, අහවල් දේ අරගෙන එන්න, අහවල් බෙහෙත් ටික අරගෙන එන්න කියලා. සමහර විට ඒවා රෝහලේ නැතුව ඇති. එහෙම කියන එක කමක් නැහැ, යමක් කමක් තිබෙන මිනිසුන්ට. හැබැයි, මෙලෝ දෙයක් නැති මිනිහෙකුට එහෙම කිව්වාම මොකක්ද වෙන්නේ? ගරු අමාත්‍යතුමනි, ඔබතුමාත් දන්නවා, අද රෝහල් ඉස්සරහ තිබෙන්නේ මොනවාද කියලා. ඒ පෞද්ගලික ආයතන යම්කිසි සේවාවක් කරනවා. හැබැයි, ඒවා අද කළු කඩ බවට පත් වෙලා තිබෙනවා. රෝගීන්ට අවශ්‍ය බෙහෙත් හෝ වෙනත් දේවල්වලට ඒ අයට හිතුණු හිතුණු ගණන් අද ඒ අය කියනවා. හේතුව මොකක්ද? කීය කිව්වත් ගන්න එපා යැ. ඇස් දෙක පෙනෙන්නේ නැත්නම්, යමක් ගෙනෙන්න කිව්වාම ගෙදර තිබෙන කන කර බඩු උකස් තියලා හෝ කමක් නැහැ, ඒ වැඩේ කර ගන්නවා. ගරු අමාත්‍යතුමනි, එම නිසා මේ කාරණය ගැනත් ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරන්න.

ගරු අමාත්‍යතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට මතක් කරනවා, බෝ නොවන රෝග සම්බන්ධව. පුළුවන් නම් ඔබතුමා මේ සම්බන්ධව අලුත් ආරම්භයක් දෙන්න. බෝ නොවන රෝග අතර අපි බහුලව දකිනවා, හෘදයාබාධ සහ දියවැඩියාව. පුංචි දරුවන් පවා ගත්තාම අද මොනවාද අපට අහන්න ලැබෙන්නේ? මේ, ඉස්කෝලේ යන ළමයින්. පුංචි දරුවන්ටත් අද දියවැඩියාව තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඉස්සර අපි ඉස්කෝලේ යන කාලයේ අපේ විෂය ධාරවේ තිබුණා, ක්‍රීඩා. අද මොනවාද තිබෙන්නේ? අද ක්‍රීඩා නැහැ. ව්‍යායාම කරන එක අපි පාසලෙන්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

පටන් ගන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, ව්‍යායාම කරන තැන් ටිකක් වැඩි කරන්න. පාසල් කාලයේ ඉඳලා ළමයින්ව ඒවාට යොමු කරන්න පුරුදු කරමු. අපි කරන්නේ මොකක්ද? ලෙඩාට බෙහෙත් කරන එක. ඒකයි අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන්නේ. හැබැයි, අපි ලෙඩ වෙන්න ඉස්සෙල්ලා ලෙඩේට බෙහෙත් හෙව්වේ නැහැ. අපි පාසල් අධ්‍යාපනයේ ඉඳලා මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරනවා නම් බෝ නොවන රෝගීන් අඩු කර ගන්න පුළුවන්. අපි දැකලා තිබෙනවා, ජපානය වාගේ රටවල පාසල් පද්ධතියේ ඉඳලාම දරුවන්ව ඒ සඳහා යොමු කර තිබෙන ආකාරය. ව්‍යායාම කරලා ඔවුන්ගේ ඇහෙන් දහඩිය ටිකක් පිට කර නිරෝගි දරුවෙකු බවට පත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ඒ රටවල සකස් කර තිබෙනවා. ඉස්සර මිනිස්සු, අපේ තාත්තලාගේ කාලයේ සහ ඔබතුමන්ලා අපි, ළිඳෙන් වතුර ඇදලා නාපු මිනිස්සු. අපි පයින් ඇවිදපු මිනිස්සු. ඒවා ඔක්කෝම අද අපෙන් නැති වෙලා ගිහින් තිබෙනවා. අපි, දර පළපු මිනිස්සු. අපි ගහට නැඟලා පොල් කඩපු මිනිස්සු. දැන් ඒවා ඔක්කෝම නැති වෙලා ගිහින්, ගරු ඇමතිතුමනි. මෙන්න මේ ගැනත් ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉදිරියේදී මේ වගකීම් ටික හරියට ඉටු කළොත් අපට පුළුවන්, සෞඛ්‍ය ක්ෂේත්‍රය හරහා ශුභවාදී ප්‍රතිඵලයක් ලබා ගන්න. ඔබතුමාට මෙම වගකීම් ටික හොඳින් ඉටු කරන්න ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු සභාපතිතුමනි, අපේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමාට උත්තරයක් නොදී ඉන්න බැහැ නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට සිටි කාලයේ - 2017, 2018 කාලයේදී- කළුතර දිස්ත්‍රික් මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කරන්නත්, මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය නාගොඩ ඉදි කරන්නත් පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කළ බව. නමුත්, යම් යම් හේතු මත ඒක කාලයක් එහෙට මෙහෙට වෙලා තිබුණා. ඊට පස්සේ එම ශික්ෂණ රෝහල බවට මාලබේ නෙවිල් ප්‍රනාන්දු රෝහල පත් කරන්න තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ කාලයේ පියවර ගෙන තිබුණේ. ඇත්තටම ඒක නිවැරදි නොවන තීන්දුවක්. රෝගීන් විශාල ප්‍රමාණයක් එන, රෝගීන්ගේ සංයුතියේ විශාල වෙනස්කම් තිබෙන නාගොඩ මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කරලා එම වෛද්‍ය පීඨය ඉදි කළාම අපට දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවාව දියුණු කරන්න විශාල උත්තේජනයක් හම්බ වෙනවා. ඒ අනුව මෙම අවුරුද්දේ ජූනි මාසය වනකොට කළුතර ශික්ෂණ රෝහල ආශ්‍රිතව මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඒකකයේ - professorial unit එකේ - වැඩ කටයුතු ආරම්භ වෙනවා. ඒකට නාගොඩ රෝහලේ වාට්ටු කිහිපයක් වෙන් කරලා එම වැඩ කටයුතු පටන් ගන්නවා.

දැන් අපි නාගොඩ ඩිපෝ එකේ යම් ඉඩම් ප්‍රමාණයක් වෙන් කරගෙන තිබෙනවා, වෛද්‍ය පීඨය ඉදි කිරීම සඳහා. ඒකට අවුරුදු තුනක් විතර ගත වේවි. මේ කටයුත්තත් එක්කම අපි බලාපොරොත්තු වෙනවා, පානදුර මූලික රෝහල, හොරණ සහ වටේ තිබෙන අනිකුත් දිස්ත්‍රික් රෝහල් ප්‍රමාණයේත් සංවර්ධන කටයුතු කරගන්න. මම හිතනවා, මේක දිස්ත්‍රික්කයේ සංවර්ධනයටත්, ජාතික අවශ්‍යතාවක් ඉටු කිරීමටත් උදව් වේවි කියලා. ඒ ගැන ඔබතුමාත් දන්නවා. ඔබතුමන්ලාත් මේකට උදව් කරන්න. අපි මේ කටයුතු ඉස්සරහට කරගෙන යමු.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ඔබතුමා ඉඩම් සම්බන්ධයෙන් කියපු නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, ඩිපෝව ළඟ තිබෙන ඉඩම වාගේම Air Force එක වටේට තවත් ඉඩම් ගණනාවක් තිබෙනවා. මම ඇමතිවරයෙකු වශයෙන් හිටපු කාලයේ ඉඳන් මේ ගැන දන්නවා. Air Force එකට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ඉඩම් එතැන තිබෙනවා. එම ඉඩම් රෝහලට ඉතාම ළඟයි. එම ඉඩම් ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Jagath Manuwarna. You have 11 minutes.

[පූ.භා. 11.51]

ගරු ජගත් මනුවර්ණ මහතා
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

ගරු සභාපතිතුමනි, මේ රටේ හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයෙක් එන්නත් වෙනුවට වතුර ගෙනැල්ලා, ඒවා මේ රටේ මිනිසුන්ට විදලා, මිනිස්සු මැරිලා, අද උසාවියේ චෝදනාවට ලක් වෙලා ඉන්නවා. එවකට හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනාපු වෙලාවේ, ඒ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව ඡන්දය දීලා, ඒ ජාවාරම්කාර අමාත්‍යවරයා බේරාගත් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ සුමධුර ධර්ම දේශනාවට පසුව, මගේ කථාව වසල සූත්‍රයේ ගාථාවකින් ආරම්භ කරන්න මට සිතුණා. එම ගාථාව මේකයි.

"න ජච්චා වසලෝ හෝති - න ජච්චා හෝති බ්‍රාහ්මණෝ

කම්මනා වසලෝ හෝති - කම්මනා හෝති බ්‍රාහ්මණෝ"

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බුදු දහම සම්බන්ධයෙන් හොඳ දැනුමක් තිබෙනවා කියලා ප්‍රකට කරපු නිසා, ඒ ගාථාවේ තේරුමත් පොඩ්ඩක් සොයා බලන්න.

අද සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වූ විවාදයේදී, බොහෝ අය සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවධානය යොමු කළා. නමුත් මටත් සමීප ක්ෂේත්‍රයක් නිසා ජනමාධ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩි කාලයක් වැය කරන්න මම කල්පනා කළා. ඒ වාගේම තමයි, මේ අය වැයෙන් සැලකිය යුතු මුදලක් අනෙකුත් ක්ෂේත්‍රවලට වෙන් වෙලා තිබියදී, දෛවෝපගතව ඉතාම අඩු වැය ශීර්ෂයක් තමයි, ජනමාධ්‍ය ක්ෂේත්‍රයට වෙන් වෙලා තිබෙන්නේ. ඒ ඇයි කියන එකත් පැහැදිලි කරන ගමන්, මගේ තොරතුරු ඉදිරිපත් කරන්නම්.

ගරු සභාපතිතුමනි, ලංකාවේ ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයිති ආයතන 12ක් විතර තිබෙනවා. ඒවා තමයි, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සහ සීමාසහිත ලංකා පුවත් ආයතනය. අපි ඇත්තටම සොයා බැලුවොත්, මේ ආයතනවලින් බොහොමයක් පසුගිය කාලයේ අතිශය පාඩුවට තමයි කරගෙන ගිහින් තිබෙන්නේ. ඒ අතුරින් ආයතන කිහිපයක් ගැන, මට ලැබෙන කාලය ඇතුළත මම තොරතුරු ඉදිරිපත් කරන්නම්.

විශේෂයෙන්ම ජාතික රූපවාහිනිය කියන්නේ, එක්තරා කාලයක් තුළදී ලංකාවේ ප්‍රධාන මාධ්‍ය නාළිකාවලින් මේ රටේ මිනිසුන් අතර බොහෝ ජනප්‍රියත්වයට පත් වෙලා තිබුණු රූපවාහිනී නාළිකාවක්. මේ රටේ television එකට වැඩ කරන, එහෙම නැත්නම් teledrama කරන director කෙනෙක් තමන්ගේ teledrama එකක් ජාතික රූපවාහිනියේ විකාශය කරනවා කියන එක, තමන්ට ගෞරවයක් කොට සලකපු කාලයක් තිබුණා. ඒ වාගේම තමයි, මිනිස්සු හොඳ රස විඳීනයක් සඳහා ඉතා ඉහළ මට්ටමේ නිර්මාණ නරඹන්න ඕනෑ නම්, බොහෝ වෙලාවට එදා තෝරා ගත්තේ ජාතික රූපවාහිනිය. ඔබතුමන්ලාටත් මතක ඇති, ගොඩක් වෙලාවට ඒ කාලයේ "වෙදහාමිනේ", "දඬුබස්නාමානය" වාගේ ටෙලිනාට්‍ය අපි නැරඹුවේ ඒ නාළිකාව ඔස්සේයි. එතකොට මිනිසුන් අතර අදහසක් තිබුණා, ඒ නාළිකාව තුළින් අපට ගුණාත්මක නිර්මාණ අරගෙන එනවා කියලා. විශේෂයෙන්ම, ළමා වැඩසටහන්. ජපානයෙන් අපේ රටට ඒ වැනල් එක ප්‍රදානය කරද්දීම, ඒකේ අරමුණ වුණේ අධ්‍යාපනය සඳහා මූලිකත්වය දෙන එක තමයි. මට මතක හැටියට 1988දී ඒක complete package එකක් විධියටයි අපට ලැබුණේ. නමුත් එතැනින් පස්සේ මේ වෙනකොට ඒ ආයතනය ඉතාම නරක තැනකට පත් වෙලා තිබෙනවා. මේ වෙනකොට සාමාන්‍යයෙන් මාසයකට රුපියල් මිලියන 4ක, 5ක පාඩුවට තමයි ඒ ආයතනය කරගෙන යන්නේ. පසුගිය කාලය පුරාවට මහා භාණ්ඩාගාරයෙන් මුදල් යොදවමින්, එහි සේවකයන්ට පඩි නඩි ගෙවිලා, ඒ ආයතනය නඩත්තු කළා. නමුත්, අපේ රට මේ වෙනකොට තිබෙන තත්ත්වයත් එක්ක තවදුරටත් ඒවා ඉස්සරහට කරගෙන යන්න අපහසු නිසා, ඒ ආයතනය තුළම තිබෙන සම්පත් පාවිච්චි කරලා, ඒ ආයතනය නැවත වතාවක් නහාසිටුවන්නේ කොහොමද, දියුණු කරන්නේ කොහොමද, එහෙම නැත්නම් ඒ ආයතනවලින් ලැබිය යුතු සේවය මිනිස්සුන්ට ලබා දෙන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට සොයා ගන්න සිද්ධ වෙනවා. ඒ වාගේම මේ ආයතන මිනිස්සුන්ට අයිති දේපළක් වාගේම, මිනිස්සුන්ට යම් සේවයක් සැපයූ ආයතන. ඒ නිසා වසා දමන්නේ නැතුව, ඒ ආයතන පවත්වාගෙන යන්නේ කොහොමද කියලා අපි කල්පනා කරන්න ඕනෑ.

හැබැයි අපි දන්නවා, මේ ආයතන අපට ලැබෙද්දී මේ තත්ත්වයෙන් තිබුණාට, ඒවා සාර්ථකව තිබුණු යුගවලදී මේ රටේ ආණ්ඩු කරපු උදවිය ඒ ආයතනවලට මොනවාද කළේ කියලා. පසුගිය අවුරුදු තුනක විතර කාලය පුරාවට මේ ජාතික රූපවාහිනිය වාගේ ආයතන රජයේ වැඩ -ආණ්ඩුවේ වැඩ- නිකම් කරලා තිබෙනවා. 2021දී ඒ ආයතනය විසින් රුපියල් මිලියන 122ක වැඩ ආණ්ඩුවට කරලා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි, 2022දී රුපියල් මිලියන 144ක සහ 2023දී රුපියල් මිලියන 154ක වැඩ කරලා දීලා තිබෙනවා. මේ ආදී වශයෙන් කරපු වැඩ සඳහා ගෙවීම් කරලා නැහැ. ඒවා නිකම් ආණ්ඩුවට කරලා දීපු වැඩ. ආයතනයක් එහෙම අරගෙන යන්න බැහැ. ඒකත් රජයේ ආයතනයක් තමයි. නමුත්, ඒකේත් සේවකයෝ ඉන්නවා, ඔවුන්ට පඩි නඩි ගෙවන්න ඕනෑ, ආයතනය නඩත්තු කරන්න ඕනෑ, විදුලි බිල් ගෙවන්න ඕනෑ. ඒ ආදී වශයෙන් ඒ ආයතනයට කළ යුතු වියදම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා අපට හැකි වෙලා තිබෙනවා, 2024 අවුරුද්ද වෙද්දී මේ ආණ්ඩුව වෙනුවෙන් වැය කරන මුදල - time belts වෙන්න පුළුවන් - රුපියල් මිලියන 52කට අඩු කරන්න. 2023 අවුරුද්දේ රුපියල් මිලියන 154යි. හැබැයි. 2024 අවුරුද්ද වෙද්දී රුපියල් මිලියන 52කට ගෙනැල්ලා තිබෙනවා. තවදුරටත් මේක අඩු කර ගන්න තමයි අපි උත්සාහ කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් මේ ආයතන ඉස්සරහට අරගෙන යන්න බැහැ. රජයේ කුමන හෝ ආයතනයක් වෙන්න පුළුවන්. මේ ආයතන ඉස්සරහට අරගෙන යන්න නම් විශේෂ අවස්ථාවලදී හැර ගෙවීම් කළ යුතු වෙනවා.

2011 වර්ෂයේ World Cup තරගාවලිය ලංකාවේ පවත්වනකොට එම තරගාවලිය telecast කළේ ජාතික රූපවාහිනියෙන් බව ඔබතුමන්ලා දන්නවා. එතකොට මේ තරගාවලිය විකාශනය කරන්න වැනල් එක වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 143යි. නමුත්, ජාතික රූපවාහිනිය එතකොටත් රුපියල් මිලියන 550ක ආදායමක් උපයනවා, cricket matches telecast කරන එකෙන්. නමුත්, 2011න් පස්සේ එවකට ආණ්ඩු කරපු කට්ටිය; ඒ ජනාධිපති පුත්තු වැනල් පටන් ගත්තා. මොකද, cricket matchesවලින් වැනල්වලට ආදායම් ලැබෙනවා දැක්කා. ඊට පස්සේ ඒගොල්ලන් පටන් ගත්තා, sports channel එකක්. ඊට පස්සේ 2012-2015 කාලය සඳහා cricket matches telecast කිරීමේ අයිතිය ඒගොල්ලන් පවරා ගත්තා. මේක ඉතා අවම මිලකටයි ඒගොල්ලන් පවරා ගත්තේ. මට ගණන හරියට මතක නැහැ. ඒ නිසා මම පසුව හරියටම ගණන කීයද කියලා කියන්නම්. කොහොම හෝ ඉතා අවම මිලකට ඔවුන් එය මිලදී ගත්තා. නමුත්, ඒ තක්සේරු වටිනාකමට නොවෙයි. ඒ කියන්නේ, ඒ broadcastingවලට මේ අවුරුදු 3ට අදාළ මිල ගෙවන්නේ නැතුව ජාතික රූපවාහිනියට යම් විධියකට ආදායමක් උපයපු මේ වාගේ ක්‍රීඩා වැඩසටහන් වාගේ දේවල් එතැනින් ඉවත් කරලා, තමන්ගේ පෞද්ගලික නාළිකාවලට අරගෙන ගියා, ඒ කාලයේ හිටපු රාජපක්ෂ පුත්තු, ගරු සභාපතිතුමනි. ඒ විතරක් නෙවෙයි. ජාතික රූපවාහිනිය සතුව ඒ කාලයේ ඉඳන් archivesවල තිබුණු footages කිසිම වගකීමකින් තොරව මේ වැනල් එකට අරගෙන ගිහිල්ලා තිබුණා. අවසානයේ මේ වැනල් එක වහපු දවසේ ඒකේ තිබුණු OB bus එකක වැසියක් විතරක් ජාතික රූපවාහිනියට ගෙනැල්ලා දාලා තිබුණා. ඒ විධියට තමයි ඔවුන් මේ ආයතන බංකොලොත් කළේ. ඒ බංකොලොත්භාවයේ ණය අද මේ රටේ ජනතාවට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. Treasury එකට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා තවදුරටත් ජනතාවගේ මුදල් වැය කරලා මේ ආයතන නඩත්තු කරන එක තේරුමක් නැහැ. ඒ නිසා මේ ආයතන තුළින්ම තමයි මේක දියුණු කරන්න පුළුවන් ක්‍රමවේදය අපිට හොයා ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම මේ ආයතනවල සේවක මණ්ඩල ගැනත් මම කියන්න ඕනෑ. මම කලින් කථා කරපු සෞඛ්‍ය ඇමතිතුමා කාලයක් ජනමාධ්‍ය ඇමති වෙලාත් හිටියා. ඒ වාගේ කාලවල තමන්ගේ සමීපතමයින් ගෙනැල්ලා මේ ආයතන පිරෙව්වා. ඒ ආයතනවල අදාළ කාර්ය මණ්ඩලයට වඩා කාර්ය මණ්ඩලයක් ඒවායේ ඉන්නවා. නමුත්, ඒ අදාළ skilled labour නැහැ; විෂයයන්ට අදාළ වූ පුහුණු දැනුම නැහැ. ඒ වාගේ පුරවපු කාර්ය මණ්ඩල පිළිබඳ ප්‍රශ්නයක් තිබිලා අවසානයේ කාර්ය මණ්ඩල අඩු කළා. දැන් යම් මට්ටමකට එය ගෙනැල්ලා තිබෙනවා. නමුත්, ඒ ආයතනවලට ඔවුන්ට අදාළ කාර්යභාරය කර ගන්න අද වෙනකොට මුදල් නැතිව ගිහිල්ලා තිබෙනවා.

ජාතික රූපවාහිනියේ මට මතක විධියට නිෂ්පාදකවරු 94දෙනෙක් ඉන්නවා. අවුරුදු තුනකින් programme එකක්වත් කරපු නැති producersලා මේ වැනල්වල ඉන්නවා. මේක බෙදවාවකයක්. මිනිස්සු ඉන්නවා. ඔවුන් වැඩ කරන්න කැමැත්තෙනුත් ඉන්නවා. සමහර විට ආඩම්බරයෙන් කියන අයත් ඉන්නවා, "අවුරුදු තුනකින් මම programme එකක්වත් කරලා නැහැ" කියලා. නමුත්, මෙහෙම කාර්ය මණ්ඩලයක් එක්ක තමයි මේ ආයතන නඩත්තු කරගෙන ඉස්සරහට යන්නේ. අපි දන්නවා, television එකේ teledramas වාගේ දේවල් ජනප්‍රිය වෙලා තිබුණු කාලයේ මිනිස්සු television එකට කිට්ටු වෙන්නේ teledrama එකක් යන වෙලාවටයි කියන එක. ඒ වෙලාවට තමයි වැනල් එක ආදායම් උපයන්නේ. නමුත් අද මේ නිෂ්පාදකයින්ට නියමිත මිල ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා. ජාතික රූපවාහිනිය විතරක් නොවෙයි. ITN එකේ තත්ත්වයත් ඒකම තමයි, ගරු සභාපතිතුමනි.

ITN එකත් ඉතාම හොඳට නිර්මාණ කර දීපු නිෂ්පාදකවරුන්ට රුපියල් මිලියන ගණනක බිල ගෙවා ගන්න බැරිව ඉන්නවා. ඒකට හේතුව තමයි ඒ කාලයේ හිටපු සමහර ජනාධිපතිලා තමන්ගේ

[ගරු ජගත් මනුවර්ණ මහතා]

මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට මේ ආයතන පාවිච්චි කරලා, ඒවාට රුපියල් මිලියන ගණනින් පොලු තියලා තිබීම. අවසානයේ වැනල් එක බංකොලොත් වෙනවා. ඒ නිසා මේ වැනල් එකේ ආදායම් උපදවා තිබෙන නිර්මාණකරුවන්ට අදාළ මුදල ගෙවා ගන්න බැරිව යනවා. අපි දන්නවා, ITN වාගේ වැනල් එකක peak time එක ය. 7.30 සිට 9.30 වනතුරු කියන එක. මේ peak time එකේ වැනල් එකට ලැබෙන TV commercialsවලින් තමයි මුළු වැනල් එකම පවත්වාගෙන යන්නේ. මුළු දවසේම වියදම හොයා ගන්නේ මේ peak time එකෙන්. මේ peak time එකේ අදාළ content එක නිර්මාණය කරන්නේ කවුද? Teledrama නිෂ්පාදකවරු, directorsලා, නළු නිළියෝ, කාර්මික ශිල්පියෝ යනාදී වශයෙන්. නමුත්, ඔවුන්ට අදාළ මිල ලැබෙන්නේ නැහැ. ඒ නිසා සමහර නිෂ්පාදකවරු නිෂ්පාදනය කරන එක නැවැත්තුවා, මේ අදාළ මිල ගෙවා ගන්න බැරිව. ඒකට හේතුව, මොකක්ද? මේ channel බංකොලොත් කළා. මේවායේ තිබුණු සම්පත් හිටපු දේශපාලනඥයින් විසින් අවභාවිත කළා. ඒ වාගේම ඒ නිෂ්පාදකයින්ට මිල ගෙවා ගන්න බැරිව මේ වැනල් අසරණ වුණා. විශේෂයෙන් රාජ්‍ය නාළිකා. ඒ නිසා මේවා සම්බන්ධයෙන් නැවත හිතා බලන්න අපිට කාලය ඇවිල්ලා තිබෙනවා.

ඒ වාගේම තමයි, මේ කාර්ය මණ්ඩලවලට අදාළ පුහුණුව ලබා දෙමින්, අදාළ තාක්ෂණය නැවත ගෙනෙන්න ඕනෑ. විශේෂයෙන් මට මතක විධියට ජාතික රූපවාහිනිය 1998 අවුරුද්දේ විතර upgrade කරලා තිබෙනවා. එතැනින් එහාට කිසිම දෙයක් වෙලා නැහැ. පරණ කැමරා, පරණ studiosවලින් තමයි තවමත් ඒවා පවත්වාගෙන යන්නේ. එහෙම බැහැ. ඒ නිසා ඒකට අදාළ නව දැනුම ගේන්න, ඒ upgrading එක කරන්න අවශ්‍ය සහාය ලබා දෙන්න ජපානය වාගේ රටවල් සූදානමින් ඉන්නවා. ඒ රටවල් එක්ක එකතු වෙලා මේ ආයතන දියුණු කරන්න අපේ බලාපොරොත්තුවක් තිබෙනවා.

ඒත් එක්කම අපි අමතක කරන්න නරකයි, මේ රටේ මාධ්‍ය සංස්කෘතිය, එහෙම නැත්නම් විශේෂයෙන් ජනමාධ්‍යවේදීන්ගේ ඒ වෘත්තීයභාවය නහාසිටුවන්නත් යම් මැදිහත්වීමක් කරන්න අපට සිද්ධ වෙලා තිබෙන බව. ඒ නිසාම තමයි අපි ඉදිරි වසර කිහිපය ඇතුළත ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් මෙරටට හඳුන්වා දෙන්න උත්සාහ කරන්නේ. ඒකෙන් පසුව තමයි අපට හිතන්න වෙන්නේ මේ මාධ්‍ය ආයතන ගැන. එතැනින් පසුව අපට පුළුවන් වෙයි, වැය ශීර්ෂයක් වෙන් කරගෙන මේ ආයතන දියුණු කරන්න. ඒ වාගේම මේ රටේ මාධ්‍ය ආචාර ධර්ම - media ethics, මාධ්‍ය උපමාන වාගේ දේවල් සම්බන්ධයෙන් දක්වන සැලකිල්ල ගැනත් සඳහන් කරන්න අවශ්‍යයි. මම කියන්නේ නැහැ, හැම නාළිකාවක්ම, හැම මාධ්‍යවේදියෙක්ම කියලා. සමහර තැන්වල මේවාට දක්වන සැලකිල්ල අඩුවීම නිසා ගොඩක් වෙලාවට මිනිස්සු අපහසුතාවට පත් වෙනවා. ඒ නිසා මේවා සම්බන්ධයෙනුත් අපි හිතා බලා ඉහළ වෘත්තීමය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තියක් බිහි කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල රාජ්‍ය අනුග්‍රහය සහිත ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක්, ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයින්ගේ ආයතනය - Chartered Institute of Media Professionals of Sri Lanka - කියලා ඇති කරන්න උත්සාහ කරනවා. ඒ වාගේම මේ රටේ යහපත් මාධ්‍ය සංස්කෘතියකින් මිනිස්සුන්ට ලැබෙන්න ඕනෑ ඒ ප්‍රතිඵල ලබා දෙන්න කළ හැකි සියලු දේවල් අපි රජයක් විධියට කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම රජයේ වෙන්න පුළුවන්, පෞද්ගලික වෙන්න පුළුවන්, ඒ සියලු මාධ්‍ය ආයතන අපට ඒ සඳහා අදාළ සහයෝගය ලබා දෙන්න කියලා ආරාධනා කරමින් මම නිහඬ වෙනවා, ගරු සභාපතිතුමනි.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Gayantha Karunathilleka. You have 15 minutes.

[අ.භා. 12.04]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුවේ බර ගොඩක් තම උර මත තබාගෙන සිටින වගකීම් රාශියක් දරන අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මට කථා කරන්න ලැබීම ගැන සතුටු වෙනවා. ගරු අමාත්‍යතුමනි, මම දන්නවා, ඔබතුමා දරන අමාත්‍යාංශවල මොන තරම් වගකීමක් තිබෙනවාද කියලා. පසුගිය රජය කාලයේ ඉතාම අපකීර්තියට පත් වෙච්ච අමාත්‍යාංශයක් ඔබතුමාට සුද්ද කරන්න වෙලා තිබෙනවා. මම ප්‍රායෝගිකව දන්නවා, ජනමාධ්‍ය අමාත්‍ය ධුරය දරන එක කොයිතරම් අමාරු කාර්යයක්ද කියන එක. ආණ්ඩු පක්ෂයේ සංවිධායක ධුරය කියන එකත් මොන තරම් වගකීමක්ද කියන එක මම ප්‍රායෝගිකව දන්නවා. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමා සමඟ මම සම කැබිනට් ප්‍රකාශක හැටියට කටයුතු කරපු නිසා ඒකත් මොන තරම් අමාරු වැඩක් ද කියන එක මම දන්නවා. ඉතින් ඔබතුමාට සුබ පතන ගමන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා වෙලාවේ මම හිතුවා, හුඟ දෙනෙක් සෞඛ්‍ය ගැන කථා කරන නිසාත්, ළඟදී මම සෞඛ්‍ය ගැන ඔබතුමාත් එක්ක විවාදයකදී කථා කළ නිසාත්, -කරාපිටිය ගැන කියපු නිසා- හිටපු ජනමාධ්‍ය ඇමතිවරයෙක් හැටියට ජනමාධ්‍ය විෂයයට සම්බන්ධ කරුණු කිහිපයක් මතක් කර දෙන්නට.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා වර්තමානයේ දේශීය වශයෙන් බැලුවත්, ගෝලීය වශයෙන් බැලුවත්, ජනමාධ්‍ය කර්මාන්තය බොහෝ අභියෝගවලට මුහුණ දී තිබෙන බව. විශේෂයෙන් වෘත්තීය ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ පැවැත්ම සම්බන්ධයෙන් විශාල ගැටලු පවතින යුගයක් තමයි අපි මේ ගත කරමින් සිටින්නේ. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, රජයක් විධියට මේ අභියෝග තේරුම් අරගෙන ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට වත්මන් ජනමාධ්‍ය ඇමතිතුමාත්, මේ රජයත් වැඩ කරයි කියලා. ගරු සභාපතිතුමනි, බොහෝ දෙනෙක් හිතන දෙයක් තමයි ජනමාධ්‍ය ඇමතිවරයෙක් කිව්වාම, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරය ගැන කථා කරනකොට රාජ්‍ය මාධ්‍ය පාලනය කරන එක විතරයි මේකේ තිබෙන්නේ කියලා. ඒ වාගේම සමහරු හිතන්නේ රාජ්‍ය මාධ්‍යයේ අන්තර්ගතය හදන්නත්, රාජ්‍ය මාධ්‍ය ආයතනවලට සභාපතිවරු පත් කිරීම, නිලධාරීන් පත් කිරීම වාගේ දේවල් තමයි ජනමාධ්‍ය ඇමතිවරයාගේත්, අමාත්‍යාංශයේත් කාර්යභාරය කියලා. නමුත් ගරු සභාපතිතුමනි, ඊට එහා ගිය වගකීමක් ඇමතිතුමාටත්, අමාත්‍යාංශයටත් පැවරී තිබෙනවා. රටක ශක්තිමත් ජනමාධ්‍ය කර්මාන්තයක් බිහි වෙන්න බලපාන මූලික කරුණු කිහිපයක් තිබෙනවා. එයින් ප්‍රධානම කරුණක් තමයි තරගකාරී ව්‍යාපාරික වටපිටාවක් මාධ්‍ය කර්මාන්තය සතුව තිබෙන එක. රටක ක්‍රියාශීලී මාධ්‍ය කර්මාන්තයක් පවතින්න නම්, ඒ රට තුළ ශක්තිමත් ආර්ථිකයක් මෙන්ම ශක්තිමත් දැන්වීම් වෙළෙඳ පොළක් තිබිය යුතුයි කියලා අපි කවුරුත් දන්නවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ශක්තිමත් ස්වාධීන මහජන සේවා මාධ්‍ය කර්මාන්තයක් තිබිය යුතු වෙනවා. ඒ සඳහා ආණ්ඩුවට කරන්න බොහෝ දේවල් තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, පුවත්පත් මුද්‍රණය කරන කඩදාසි සහ තීන්ත සඳහා පනවා තිබෙන බදු අඩු කිරීම පෙන්වා දෙන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, ලෝකයේ බොහෝ රටවල ජනමාධ්‍ය කර්මාන්තය බදුවලින් සහන ලබන ක්ෂේත්‍රයක් බව අපි විශේෂයෙන් මතක තබා ගත යුතුයි. අපේ රටත් ඒ රටවල පවතින සම්ප්‍රදායට අනුගත වීම ගැන සලකා බැලිය යුතුව තිබෙනවා, ගරු ඇමතිතුමනි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීමත් අත්‍යවශ්‍යයි. මාධ්‍ය, අධ්‍යාපන අවස්ථා සහ නියාමන යන්ත්‍රණයක් හඳුන්වා දෙන්න අවශ්‍යයි. මම ජනමාධ්‍ය ඇමතිවරයා ලෙස හිටපු කාලයේත් අපි ඒ සඳහා විවිධ පියවර ගත්තා. මම හිටියේ අවුරුදු එකහමාරක් විතරයි, ඒ අමාත්‍යාංශයේ. ඒ පියවරම ඉදිරියට ගෙනියන්න පසුගිය රජයන්වල හිටපු ඇමතිවරුත් ඇත්තවශයෙන්ම උනන්දුවක් දක්වපු බව මම හොඳටම දන්නවා. ඒ අය මේ සභාවේදිත් ඒ ගැන අදහස් ප්‍රකාශ කරනකොට කියලාත් තිබෙනවා. විශේෂයෙන්ම වෘත්තීය මාධ්‍ය පුහුණු ආයතනයක් පිහිටුවීමට පවා පසුගිය රජයන් සැලසුම් කළා. විෂය භාර ඇමතිතුමා හොයලා බැලුවොත් එතුමාට ඒවා ගැන දැනගන්න පුළුවන්. ඒකත් හරියට වරලත් ගණකාධිකාරී ආයතනයක් වාගේ එකක්. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී කිව්වා, ඒ ගැන හොඳ සුබවාදී අදහසක්. ඒ නිසා අපි කැමැතියි, ජනමාධ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කිව්වා වාගේම ඒ සැලසුම් කරලා තිබෙන වරලත් ජනමාධ්‍යවේදී පුහුණු ආයතනය ඔබතුමා අධ්‍යයනය කරලා හැකි ඉක්මනින් මේ රටේ ස්ථාපිත කළොත් ජනමාධ්‍ය ඇමති හැටියට ඔබතුමා වටිනා සේවයක් කරපු කෙනෙක් වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තව ඉතා වැදගත් කාරණයක් තමයි, ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සහ ස්වාධීන නියාමන යන්ත්‍රණයක් සකස් කිරීම. ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් දැනටමත් සකස් වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. වත්මන් රජය හැටියට එය අධ්‍යයනය කරලා ක්‍රියාත්මක කළොත් බොහොම වටිනවා. මට මතක විධියට ඔබතුමාගේ කථාවේ සඳහන් කළා, ඒ ගැන අදහසක් තිබෙන බව.

ගරු සභාපතිතුමනි, රටක ස්වාධීන සහ නිදහස් ජනමාධ්‍ය කර්මාන්තයක් බිහිවෙන්න නම් ස්වාධීන නියාමන යන්ත්‍රණයන් තිබිය යුතුම වෙනවා. මට මතකයි, මම ජනමාධ්‍ය ඇමති කාලයේත්, මංගල සමරවීර ඇමතිතුමාගේ කාලයේත් ඒ වාගේ ස්වාධීන නියාමන ආයතන සම්බන්ධ නව නීති කෙටුම්පත් කරන්න අපි උත්සාහයන් රාශියක්ම ගත්තා. ගරු සභාපතිතුමනි, අපි එදා එතැනදි බැලුවේ ජනමාධ්‍ය ආයතනවල නිදහස වාගේම රටේ පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ ජනතාවට සත්‍ය තොරතුරු දැන ගැනීමට තිබෙන අයිතිය තහවුරු කරන්න. ඒ සඳහා ස්වාධීන විද්‍යුත් මාධ්‍ය කොමිසමක් පිහිටුවන්නත් විශේෂඥ කමිටුවක් මඟින් පනත් කෙටුම්පත් සකස් කරලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. වත්මන් රජය හැටියට, වත්මන් ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට ඒක යාවත්කාලීන කරලා, ඒක ඔබතුමන්ලාට අවශ්‍ය විධියට සකස් කරලා ක්‍රියාත්මක කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම, එදා තවත් වැදගත් යෝජනාවක් ක්‍රියාත්මක කරන්න අපි උත්සාහ කළා, ගරු සභාපතිතුමනි. ඒ තමයි, රජයේ හිමිකාරිත්වය යටතේ තිබෙන ජනමාධ්‍ය ආයතන BBC, NHK වැනි ස්වාධීන මහජන සේවා මාධ්‍ය ආයතන වාගේ පරිවර්තනය කරන්න පුළුවන්ද කියන එක. ඒකට අපි උනන්දුවක් දැක්වුවා. ගරු සභාපතිතුමනි, අද වෙනකොට අපේ රටේ ජනතාව විශාල දේශපාලන, සමාජ පරිවර්තනයක් ඉල්ලා සිටිනවා. ඒ පරිවර්තනයට විශාල දායකත්වයක් මේ වාගේ ස්වාධීන මහජන සේවා මාධ්‍ය ආයතනවලට කරන්න පුළුවන්කම තිබෙනවා කියලා මම කල්පනා කරනවා. ඒ නිසා ඒ කෙරෙහි වත්මන් රජයේ අවධානය යොමු කරන්න පුළුවන් නම් බොහොම වටිනවා, ගරු ඇමතිතුමනි.

ගරු ඇමතිතුමනි, අද ඔබතුමාගේ කථාවේදී කිව්වා -මම ඒ ගැන බොහොම සතුටු වුණා- ඩිජිටල්කරණය ගැන. අද ලෝකයේ ගුවන්විදුලි සහ රූපවාහිනී කර්මාන්තය ඇනලොග් තාක්ෂණයේ සිට ඩිජිටල් තාක්ෂණයට මාරුවෙමින් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම මේ ඩිජිටල්කරණය ගැන බොහෝ කලක් සාකච්ඡා පැවැත්වුවා. ජපන් රජය සමඟත් හුඟක් සාකච්ඡා තිබෙනවා. ලෝකය පුරාම digital switchover ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. මේ ව්‍යාපෘති නිසා මාධ්‍ය කර්මාන්තයට වාගේම රටේ පුරවැසියන්ටත් විශාල වාසි අත්වෙනවා. එම නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා මැදිහත් වෙලා ඩිජිටල්කරණ ව්‍යාපෘතිය පිළිබඳව ලොකු උනන්දුවකින් ක්‍රියා කරලා ඒක කඩිනම් කරන්න.

ගරු සභාපතිතුමනි, තවත් වැදගත් කාරණයක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. අපි දීර්ඝ කාලයක් තිස්සේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතක් ගැන මේ සභාවේ කථා කළා. අවස්ථා ගණනාවකදී ඒක ගෙනෙන්න උත්සාහ කළා. නමුත්, රාජපක්ෂ රජය ඒකට බොහොම විරෝධයක් දැක්වුවා. මට මතකයි, කරු ජයසූරිය මහත්මයා එක පාරක් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට මේක ගෙනෙන්න ඇහුවා. එතකොට, හිටපු අගමැති දිනේෂ් ගුණවර්ධන මහත්මයා කිව්වා, "පෞද්ගලික මන්ත්‍රී යෝජනා විධියට එහෙම ගෙනෙන්න බැහැ, අපි රජයක් හැටියට මේක ගෙනෙනවා" කියලා. එහෙම කියලා ඒක එහෙමම යටපත් කළා. ඔබතුමා දන්නවා, ඒ රජයට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගැන කථා කරනකොට නයාට අඳුකොළ වාගෙයි කියලා. මම ජනමාධ්‍ය ඇමති වෙලා දින කිහිපයක් ඇතුළත -දින 150ක් වාගේ ඇතුළත- මට භාග්‍යය ලැබුණා, ඒ ඓතිහාසික පනත පාර්ලිමේන්තුවට ගෙනෙන්නත්, 225දෙනාම අත ඔසවලා ඒක සම්මත කර ගන්නටත්, ඒක ක්‍රියාත්මක කරන්නටත්, ඒක යථාර්ථයක් කර පෙන්වන්නටත්. නමුත්, ඒ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අද වන විට අත් වී තිබෙන කනගාටුදායක ඉරණම ගැන යමක් කිව යුතුව තිබෙනවා, ගරු ඇමතිතුමනි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසමේ කාර්ය මණ්ඩලය හැටියට 26දෙනෙකු සිටිය යුතු වුවත්, මට දැනගන්න ලැබෙන විධියට දැන් ඉන්නේ 10දෙනෙකු වාගේ ප්‍රමාණයක්. අද වන විට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසම අක්‍රිය වීමේ අවදානමක් තිබෙනවා. මානව සම්පත් හිඟකම, අරමුදල් ප්‍රශ්නය වැනි කාරණා නිසා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතින් අපේ රටේ ජනතාවට ලැබුණු ප්‍රතිලාභ අද සම්පූර්ණයෙන්ම නැති වීමේ අවදානමක් තිබෙනවා කියලා තමයි අපට දැන ගන්න තිබෙන්නේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත නිසා අපේ රටේ බොහෝ දෙනෙකුට හුඟක් ප්‍රයෝජන අත් වෙලා තිබෙනවා. ආණ්ඩුවක් වීදුරු කුඩුවක් ඇතුළට ගියා වාගේ වුණා මේක පත් කළාම. බොහෝ දෙනෙකු ඒකට භය වුණේ ඒකයි. පෞද්ගලික තොරතුරු, වෛද්‍ය වාර්තා වාගේ ඒවා හැරුණුකොට ඕනෑම තොරතුරක් ඒකෙන් ගන්න මිනිස්සුන්ට පුළුවන්කම ලැබුණා. දූෂණය නවත්වන්න ඒක ලොකු පිටුවහලක් වෙලා තිබෙනවා. එම නිසා තොරතුරු දැනැගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හරහා ජනතාවට සිදු වූ සේවය අඩපණ වෙන්න නොදී, මේ කොමිසම ශක්තිමත් කරන්න අවශ්‍ය පියවර ඔබතුමා ගනීවි කියලා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට, තවත් විශේෂ කාරණයක් මතක් කරන්න මම කැමැතියි. සමාජ මාධ්‍ය පාලනය කරන්න, සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් බිය ගන්වන්න, ඔවුන්ට දඬුවම් දෙන්න පසුගිය ආණ්ඩුව ගෙනාපු මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනතට -ඒ කාලයෙත් අපි විරුද්ධ පක්ෂයේ හිටියේ- අපි විරුද්ධ වුණා, සමඟි ජන බලවේගය හැටියට. මට මතකයි, වර්තමාන

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ජනාධිපතිතුමා, වර්තමාන අගමැතිතුමිය, වර්තමාන විදේශ කටයුතු ඇමතිතුමා එම පනත සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතුයි කියලා එදා විපක්ෂයේ අපි එක්ක එකට ඉඳගෙන හඬ නැඟුවා. නමුත්, අද ඔබතුමන්ලා බලයට ආවාට පස්සේ ඒ ගැන සද්දයක් නැති නිසා මම මතක් කර දෙන්න කැමැතියි, ඒ තිබුණු උනන්දුව ගැන. අද ආසන 159කින් සමන්විත බලගතු ආණ්ඩුවක් තිබෙන වෙලාවේ, ඕනෑ දෙයක් කරන්න පුළුවන්කම තිබෙන වෙලාවේ විශේෂයෙන් ඒ ගැන බලන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ, ඒ පනත ගෙනෙනකොට ආණ්ඩුව ප්‍රමාණවත් සාකච්ඡාවක් අදාළ පාර්ශ්ව සමඟ නොකළ බව. ඒ පාර්ශ්වවලින් මේ පනතේ අඩුපාඩු පෙන්වා දුන්නා. නමුත්, ඒවා කිසි දෙයක් ගණන් ගත්තේ නැහැ. ඒ පාර්ශ්වකරුවන්ගේ හඬ යටපත් කරලා, ආණ්ඩුවේ බලය පෙන්වලා ආණ්ඩුව එ් වෙලාවේ කටයුතු කළා. විශේෂයෙන් කර්තෘ සංසදය ඒකට අදහස් ප්‍රකාශ කළා. මා ළඟ තිබෙනවා, ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයන්ගේ සංගමය මේකට විරුද්ධව අලුත් නීති රීති ගෙනැල්ලා මේක වෙනස් කරන්න කියලා ඇමතිතුමාට ලියපු ලියුම. ඒ එකක්වත් අහන්නේ නැතිව ගෙනාපු ඒ පනත යළි සංශෝධනය කිරීම ගැන අවධානය යොමු කරලා, -විරුද්ධ පක්ෂයේ ඉන්නකොට ක්‍රියා කළා වාගේම- කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, එවැනි අලුත් පනතක් ගෙනෙනවා නම් මේ ක්ෂේත්‍රයේ සියලුදෙනාටම ඇහුම්කන් දීලා, ඒ කාගෙත් අදහස් අරගෙන නව පනතක් හඳුන්වා දෙන එක සුදුසුයි කියන එකත් මම රජයට මතක් කරනවා. මේ රටේ ජනතාවට නිදහසේ මත පළ කිරීමට තිබෙන සමාජ මාධ්‍ය පාලනයට ගෙනාපු මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත ඇත්ත වශයෙන්ම භයානකයි. මේක ගැන වහාම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Gayantha Karunathilleka, you have two more minutes.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, මට තිබෙන්නේ තවත් විනාඩි දෙකක කාලයක් නිසා මම කැමැතියි තවත් එක කාරණයක් හෝ දෙකක් ගැන මතක් කරන්න. මේ අය වැයෙන් online mediaවලට සියයට 15ක බද්දක් ගහලා තිබෙනවා. මේ බද්ද නිසා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් අධෛර්යවත් වෙනවා. ඒ වාගේම සමාජ මාධ්‍ය ව්‍යාපාරික නිදහසට ඒකෙන් ලොකු බාධාවක් ඇති වෙනවා. අද ලෝකයේම අවධානය යොමු වෙලා තිබෙන්නේ අන්තර්ජාලය හැමෝටම නොමිලයේ ලබා දෙන්න ඕනෑය කියන එක ගැනයි. Free Internet world එකක් ගැන තමයි අද ලෝකය කථා කරන්නේ. ඒ හරහා ඩිජිටල් ආර්ථිකයත් ශක්තිමත් වෙනවා. එම නිසා දැනට පනවා තිබෙන ඒ සියයට 15 බද්ද ගැන නැවත සලකා බලන මෙන් ඉල්ලා සිටිමින් මම ඒ කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ටත්, අපේ රටේ තරුණ තරුණියන්ටත්, අධ්‍යාපන ආයතනවලටත්, dataවලට සහ ජංගම දුරකථනවලට මාස්පතා විශාල මුදලක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. හුහක් අයට ඒක දරා ගන්න අමාරුයි. ඒ ගැනත් විශේෂ අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, තවමත් අපේ රටේ ජනගහනයෙන් සියයට 45කට අන්තර්ජාලය පාවිච්චි කරන්න අවශ්‍ය පහසුකම් නැහැ. ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තමයි, අන්තර්ජාලයට ප්‍රවේශ වීමේදී ඇති වන තාක්ෂණික දුර්වලතා. අන්තර්ජාලයට ප්‍රවේශ වීම සඳහා රටේ බොහෝ ප්‍රදේශවලට සිග්නල් නොමැති වීමත් බරපතළ ප්‍රශ්නයක්. මේ තත්ත්වය වෙනස් කරන්න අය වැයෙන්වත් පැහැදිලි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන හැටියක් අප දැක්කේ නැති නිසා ඒ කාරණයත් අවධානයට ගන්න කියා මම ඉල්ලා සිටිනවා.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලාගේ රජයෙන් ජනතාව අපේක්ෂා කරන විශේෂ දෙයක් තිබෙනවා. එය අනෙක් හැම රජයකින්ම බලාපොරොත්තු වුණත්, ජනතාව මේ රජයෙන් එය විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා කියා මා හිතනවා. ඒ තමයි, පසුගිය කාලයේ අතුරුදහන් වුණු, ඝාතනය වුණු ප්‍රගීත් එක්නැලිගොඩලා, ලසන්ත වික්‍රමතුංගලා වාගේ මාධ්‍යවේදීන්ගේ පවුල්වලට ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේදී යුක්තිය ඉටු වෙයි කියන එක.

මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා රාජ්‍ය මාධ්‍ය ගැන කථා කරන කොට මට මතක් වුණා, මම ජනමාධ්‍ය ඇමති වශයෙන් පත් වන කොට මේ රටේ තිබුණු තත්ත්වය. මම යහ පාලන ආණ්ඩුවේ පළමුවැනි ජනමාධ්‍ය ඇමති. හැම තැනකම වාගේ මාධ්‍යවේදීන් ඝාතනය වන හැටි, මාධ්‍යවේදීන්ට පහර දෙන හැටි, මාධ්‍යවේදීන් රට හැර යන හැටි, සුදු වෑන්වල නංවාගෙන යන හැටි අහපු කාලයක තමයි මම ජනමාධ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වුණේ. නමුත් මම ඒ මන්ත්‍රීතුමාට කියනවා, මා එම අමාත්‍ය ධුරය දැරූ අවුරුදු කිහිපය ඇතුළත මාධ්‍යවේදීන්ට අල්පෙනෙති තුඩක තරමින්වත් හිරිහැරයක් වුණාද කියලා හොඳට සොයා බලන ලෙස. මාධ්‍යවේදීන්ට කිසිම හිරිහැරයක් නොවන පරිවර්තනයක් අපි කළා. මාධ්‍ය නිදහස දෝරේ යන කාලයක් බවට අපි ඒ කාලය පත් කළා. අගමැති, ජනාධිපති පවා විවේචනය කරන්න ඒ කාලයේ පටන් ගත්තා. තොරතුරු දැන ගැනීමේ පනතත් අපි ගෙන ආවා. එය ගෙන ආ ගමන් ඊට පහුවදාම ජනාධිපතිගේත්, අගමැතිගේත් වත්කම් හා බැරකම් පිළිබඳ තොරතුරුර ඉල්ලුවා. ඒ වාගේ තත්ත්වයක් ඇති වන බව දැන දැනත් අපි ඒ කටයුතු කළා.

රාජ්‍ය මාධ්‍ය ගැන කථා කරන කොට මට මතක් වනවා, මම පළමුවැනි Cabinet Paper එක දමපු අවස්ථාව. රූපවාහිනියට ආදායම් එන්න තිබුණු ක්‍රිකට් විකාශන අයිතිය ඒ කාලයේ සම්පූර්ණයෙන්ම පෞද්ගලික මාධ්‍යයකට අරගෙන තිබුණා. මම පළමුවැනි Cabinet Paper එක ඉදිරිපත් කරලා ක්‍රිකට් තරගවල රූපවාහිනී විකාශන අයිතිය ආපසු ජාතික රූපවාහිනියට ලබා ගත්තා. ඒ කාලයේ රාජ්‍ය ආයතන ඉතාම අමාරු තත්ත්වයකයි තිබුණේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ජාතික චිත්‍රපට සංස්ථාව ගැන කියලා එහි සම්මාන උළෙල පවත්වන්න හදනවා කියලාත් කිව්වා. ඒක බොහොම හොඳයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මා කිව්වේ, මාධ්‍ය සම්මාන උළෙල ගැන.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ආ, මාධ්‍ය සම්මාන උළෙල ගැනද කිව්වේ?

මා ජනමාධ්‍ය අමාත්‍ය ධුරයට පත් වන කොට ජනාධිපති සම්මාන උළෙල අවුරුදු 8කින් පවත්වා තිබුණේ නැහැ; සරසවි සම්මාන උළෙලත් අවුරුදු 8කින් පවත්වා තිබුණේ නැහැ. මම ඒ දෙකම මාස කිහිපයක් ඇතුළත පැවැත්වුවා. ඒවා දිගටම අඛණ්ඩව

පවත්වාගෙන යන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. මගේ කථාව අවසන් කරන්න කියලා ගරු සභාපතිතුමා තවම අණ දුන්නේ නැති නිසා මම තවත් එක කාරණයක් කියන්න හිතුවා.

ඒ කාලයේ රජයේ මුද්‍රණාලයත් අපේ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ තිබුණේ. ඒ කාලයේ මම ඇමතිවරයා වශයෙන් පත් වන කොට ඉවත දමන කඩදාසිවලින් ලොකු ගනුදෙනු කෙරිලා තිබුණා. ටෙන්ඩර් මොකුත් නැහැ. ඇමතිතුමා කිව්වා නම් කාට හරි දෙන්න කියලා, ඔහුට තමයි දුන්නේ. අපි Cabinet Paper එකක් දාලා ඒවා ටෙන්ඩර් මඟින් ලබා දෙන්න ක්‍රියා කළා. අද ඒවා ආපහු වෙනස් වෙලා ද කියලා මම දන්නේ නැහැ. ඒවා පිළිබඳව නැවත සොයා බලන්න ඔබතුමා වාගේ කෙනෙකුට පුළුවන්, ගරු ඇමතිතුමනි.

ඒ වාගේම රූපවාහිනී ටෙලිනාට්‍ය ගැනත් කථා කළා. ගරු ඇමතිතුමනි, මම ජනමාධ්‍ය අමාත්‍ය ධුරයට එනකොට ටෙලිනාට්‍යයක් විකාශනය කරන්න මහ උදව්ය එක්ක ගනුදෙනු කරන්න සිද්ධ වෙලා තිබුණා. ඒක ප්‍රසිද්ධ රහසක්. මම ඒක සම්පූර්ණයෙන්ම නැවැත්වුවා. විද්වත් කමිටුවක් පත් කරලා ස්වාධීන කමිටුවකින් තමයි ටෙලිනාට්‍ය විකාශන අවස්ථාව ලබා දුන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Gayantha Karunathilleka, your time is up.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ mike එක on කරපු නිසා මට මීට වඩා කථා කරන්න අවස්ථාවක් නැහැ. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු සභාපතිතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

නීටපු ජනමාධ්‍ය අමාත්‍යවරයකු හැටියට ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා Online Safety Bill එක ගැන ඇහුවා. Online Safety Commission එක ගැසට් කරලා තිබෙන්නේ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ. නමුත් අපි තවම ඒ Commission එක පිහිටුවා නැහැ. ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු වෙලාවේත් ඒ සම්බන්ධයෙන් සමාජ කතිකාවක් ඇති වුණා. එහි ඇතුළත් වගන්තිවලින් තුනෙන් දෙකකට පමණ සංශෝධන ආවා. දැන් අපේ අදහස වී තිබෙන්නේ, ජනමාධ්‍ය අමාත්‍යාංශයත් මුල් වෙලා, අධිකරණ අමාත්‍යාංශයත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයත් එක්ක, දැනට ඉදිරිපත් වෙලා තිබෙන සංශෝධන සහ ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන්න අවශ්‍ය සියලු පාර්ශ්ව එකතු කරගෙන ඒවා සමාලෝචනය කරලා ඉතාම ඉක්මනින් තීන්දුවක් ලබා දීමයි. එතකොට, කලින් අදහස් පළ නොකරපු හැමදෙනාටම ඒකට දායක වෙන්න පුළුවන්කම තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Harshana Rajakaruna. You have 12 minutes.

[අ.භා. 12.22]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම සුබ පතනවා මා මිත්‍ර නලින්ද ජයතිස්ස අමාත්‍යතුමාට. සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට වැඩ භාර ගත්තු එතුමාට සාර්ථකව ඒ කටයුත්ත ඉටු කරන්න හැකි වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

පසුගිය දින කිහිපයේදී අපට දැන ගන්න ලැබුණා, ඒ වාගේම අපට බියකුත් ඇති වුණා, සෞඛ්‍ය ක්ෂේත්‍රය ඇතුළු රාජ්‍ය සේවයේ දීමනා කප්පාදුව පිළිබඳව. ඒ දීමනා කප්පාදුව නිසා වැඩවර්ජන සිදු කරන්න වෘත්තීය සමිති තීන්දු තීරණ අරගෙන තිබුණා. නමුත්, ඊයේ දිනයේදී අමාත්‍යවරයා එක්ක ඒ පිළිබඳව සාකච්ඡා කරලා ඒ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීම තව සතියක, දෙකක කාලයක් කල් ගැනීමට යම් එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වුණා.

ඊයේ දිනයේදීත් රජයේ වෛද්‍ය නිලධාරි සංගමයේ ලේකම් වෛද්‍ය සුගතදාස මහතා සමඟ මමත්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ තවත් නිලධාරීන් කිහිපදෙනකුත් සාකච්ඡාවක යෙදුණා. එතැනදී ඒ අය සාධාරණ ඉල්ලීම් සිදු කළා කියන එකත් අපි අපේ පැත්තෙන් කියන්න ඕනෑ. එහිදී විශේෂයෙන් රජයේ වෛද්‍යවරුන් කරන කැප කිරීම පිළිබඳ ලොකු අවබෝධයක් අපටත් ලැබුණා. වෛද්‍යවරුන් නේවාසික පහසුකම් නොමැතිව, transport දීමනා සහ වෙනත් දීමනා නොමැතිව තමන්ගේ මුදල්වලින් ඒ වියදම් දරාගෙන ඉන්න අවස්ථා ද තිබෙනවා. විශේෂයෙන් රජයේ හැම රෝහලකම නිල නිවාස නොමැති නිසා ඒ අයට පෞද්ගලික ස්ථාන තමයි ඒ වෙනුවෙන් කුලියට ගන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ වාගේම තමන්ගේ වාහනයෙන් තමන්ගේ ඉන්ධන වැය කරගෙන සමහර වෙලාවට රාත්‍රියේ දෙපාර, තුන්පාර රෝහලට යන්න සිදු වන අවස්ථාත් තිබෙනවා.

රජයේ වෛද්‍යවරුන් විශාල පිරිසක් ආර්ථික අපහසුතා නිසා මේ වන කොට රට අත් හැර දමා ගිහින් තිබෙන බව ඔබතුමන්ලා දන්නවා. කොහොමටත් අපේ රටේ බුද්ධි ගලනයක් තිබෙනවා. සාමාන්‍යයෙන් වසරකට වෛද්‍යවරුන් 200ක් පමණ සංඛ්‍යාවකින් බුද්ධිගලනය සිදු වුණත් පසුගිය අවුරුදු කිහිපයේදී එය 2,000ක් වාගේ ප්‍රමාණයකට ඉහළ ගිහින් තිබෙනවා කියා දැන ගන්න ලැබී තිබෙනවා. මහජන මුදලෙන් අධ්‍යාපනය ලබපු ඒ වෛද්‍යවරුන් මේ රටේ තබා ගැනීමට අවශ්‍ය ආකර්ෂණය, දිරිගැන්වීම - incentive එක - රජයක් හැටියට අපි ලබා දිය යුතුයි.

තමුන්නාන්සේලා මේ අය වැයේදී මූලික වැටුප වැඩි කරලා තිබෙනවා. ඒක හොඳයි. ඒ මූලික වැටුප වැඩි කරලා දීමනා කප්පාදු කිරීම තුළින් වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ට අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා කියන එක ඉතා පැහැදිලිව අපට දකින්න ලැබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි, වෙනත් academicsලාටත් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන නිසා මම විශේෂයෙන්ම කියන්නේ, අපි ඒ ගැන අවධානය යොමු කරමු කියලායි.

වෛද්‍යවරුන්ගෙන් ඉතාම වැදගත් සේවාවක් තමයි සිදු වන්නේ. එම නිසා, මෙය වෙනත් සාමාන්‍ය strike එකක් වාගේ නෙවෙයි; වෙනත් වැඩ වර්ජනයක් වාගේ නොවෙයි. හමුදාවටවත් එහෙම නැත්නම් වෙන අයටවත් ඒ වැඩ ආවරණය කිරීමේ - cover කිරීමේ - හැකියාවක් නැහැ. ඒ අය වෘත්තීය ක්‍රියාමාර්ග ගත්තොත්,

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

රෝගීන්ගේ ජීවිත හානියට පත් වෙන්න, ජීවිත අවදානමකට ලක් වෙන්න පුළුවන්. එවැනි අවස්ථා අපි දැකලා තිබෙනවා. එක පැත්තකින්, එය නතර කරන්න ඕනෑ. අනෙක් කාරණාව මෙයයි. ඒ අය පිට රට ගියාම ඒ අයට ලංකාවට වඩා හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන් වෙනවා. මම පුරවැසියකු හැටියට අපේ වෛද්‍යවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. ඔබ අපේ රටේ මහජන මුදලින් අධ්‍යාපනය ලබපු අය. ඔබට වගකීමක් තිබෙනවා යම් යම් කාරණා පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම්, සාකච්ඡා කරලා විසඳුමකට එන්න. ඔබ පිට රට ගිහිල්ලා හොඳ ජීවිතයක් ගත කරනවාට වඩා, සැපවත් ජීවිතයක් ගත කරනවාට වඩා, අපේ රටේ ජීවත් වෙමින් අපේ රට වෙනුවෙන් සේවය කිරීම ඉතා වැදගත් කියලා මම පෞද්ගලිකව හිතනවා. අපි විපක්ෂයේ සිටියත් ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ රට තුළ රැඳී සිටිමින් මේ රටේ ජනතාවට සේවය කරන්න කියලා. පසුගිය කාලසීමාවේ වෛද්‍යවරු ගණනාවක් අපේ රට අතහැර ගිහින් තිබෙනවා. අපි ඒ අයට ආරාධනා කරනවා, නැවත මේ රටට එන්න කියලා. දැන් අපේ රටේ ආර්ථික තත්ත්වය යම් සුබවාදී පැත්තකට හැරිලා තිබෙනවා. එම නිසා යළිත් මේ රටට ඇවිල්ලා, මේ රටේ ජනතාව වෙනුවෙන් සේවය කිරීම ඔබේ වගකීමක් හැටියට අපි දකිනවා.

ඒ වාගේම, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳවත් මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. දේශීය වෛද්‍යවරු විශාල සේවයක් කරනවා. දේශීය වෛද්‍යවරු ලෙස පත්වීම් ලැබීමට අවශ්‍ය ඒ විභාගය සමත් වෙලා, රැකියාව ලබා ගන්න දැන් විශාල පිරිසක් බලාගෙන ඉන්නවා. දැන් අපට දැනගන්න ලැබී තිබෙනවා, දේශීය වෛද්‍යවරු ලෙස පත්වීම් ලබා ගැනීම සඳහා යම් අනුමැතියක් ලබාදීලා තිබෙනවා කියලා. නමුත්, ඒ විභාග සමත් වෙච්ච සියලුදෙනාට තවම ඒ පිළිබඳ පැහැදිලිතාවක් නැහැ. එවන් පිරිසක් මට අද උදේත් පෞද්ගලිකව දුරකථනයෙන් කථා කරලා ඒ අය පිළිබඳව කථා කරන්න කියලා විශේෂයෙන්ම ඉල්ලීමක් කළා. මේ වෛද්‍යවරු ලෙස කොපමණ පිරිසකට පත්වීම් ලබා දෙනවා ද, ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබෙනවා ද, ඒ බඳවා ගැනීම කොයි කාලයේ සිදු වෙනවා ද කියන ගැටලු ඒ අයට තිබෙනවා. එම නිසා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න කියලා. ගරු ඇමතිතුමනි, දේශීය වෛද්‍යවරු බඳවා ගැනීම පිළිබඳව අවධානය යොමු කරන්න. මොකද, දේශීය වෛද්‍යවරුන්ගෙන් වන ඒ සේවාව රටට ආදායමක් ලැබෙන ආකාරයෙන් දියුණු කරන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ආයුර්වේදය තුළින්, දේශීය වෛද්‍ය ක්‍රම තුළින් පෞද්ගලික ක්ෂේත්‍රය විශාල ආදායමක් උපයන බව ඔබතුමාත් දන්නවා. මම ඒ ආයතනවල නම් කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත්, ඒ ක්‍රමය ඉතාම වැදගත්. ඒ තුළින් අපේ රටට ලොකු ආදායමක් ලැබෙනවා. අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. ඒ නිසා දේශීය වෛද්‍ය ක්‍රමය පෞද්ගලික අංශය තුළ දියුණු කරන්න තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම, එවැනි නව ආයතන බිහි වෙන්න අවශ්‍ය දිරිගැන්වීම් කරන්න ඕනෑ. මේ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව අපි මීට වඩා පුළුල් විධියට හිතලා බැලුවොත්, ඒ තුළින් ලොකු ආදායමක් රටට ගෙන එන්න පුළුවන් නිසා ඒ ගැන වැඩිපුර අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, මේ වෙනකොට ඉතාම කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා. ඔබතුමා සතුටු වෙනවා, අය වැය ලේඛනයෙන් දැවැන්ත මුදලක් සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කර තිබෙනවා කියලා. ඒ ගැන අපිත් සතුටු වෙනවා. නමුත්, තවමත්, මේ වනකොටත් ඉතාම දුර්වල තත්ත්වයක තිබෙන්නේ අපේ රෝහල්වලට ඖෂධ සැපයීම. ඉතාම කනගාටුයි කියන්න, මේ වෙනකොට පිළිකා රෝහලට - Cancer Hospital එකට - අවශ්‍යම බෙහෙත් ටික ලැබිලා නැහැ. තවමත් නැහැ. ඕනෑම රෝහලකට යන්න. ඕනෑම රෝහලකට ගියාම බෙහෙත් තුණ්ඩුවක් ලබා දෙනවා. ඒ බෙහෙත් තුණ්ඩුව අරගෙන අල්ලපු වැටේ තිබෙන ෆාමසියට යන්න ඕනෑ.

ඔබතුමා බලන්න, දැන් රජයේ රෝහල් ළඟ තමයි ෆාමසි තිබෙන්නේ. රජයේ රෝහල්වලින් නොමිලේ බෙහෙත් ටික ලැබෙනවා නම්, රජයේ රෝහලට අල්ලපු වැටේ පෞද්ගලික අංශයේ ෆාමසි තිබෙන්න විධියක් නැහැ නේ. නමුත් අද ඒක සාමාන්‍ය දෙයක් බවට පත් වෙලා තිබෙනවා. හැම රෝහලකින්ම බෙහෙත් තුණ්ඩුව - prescription එක - දුන්නාම, බහුතරයක් බෙහෙත් වර්ග ගන්න වෙන්නේ පෞද්ගලික ෆාමසිවලින්. මම මේක විශේෂයෙන්ම තමුන්නාන්සේට කියන්න ඕනෑ. විශේෂයෙන්ම Cancer Hospital එකේ breast cancerවලට අත්‍යවශ්‍ය anastrozole කියන බෙහෙත තවමත් නැහැ. දැනට සතියකට දෙකකට කලින් රෝහලට ගිය රෝගියෙක් ඒ ගැන විශේෂයෙන්ම මා දැනුවත් කළා. ඒවාට මුදල් ලබා දුන්නා වුණාට, අවශ්‍ය වෙලාවට ඒ ඇණවුම් කිරීම් සිදු වෙලා නැහැ කියලා මට දැනගන්න ලැබිලා තිබෙනවා. අවශ්‍ය වෙලාවට ඇණවුම් කර නොමැති නිසා මේ බෙහෙත් හිඟය ඇති වෙලා තිබෙනවා.

අපි දේශීය ඖෂධ නිෂ්පාදකයන් දිරිමත් කරන්න ඕනෑ. Local manufacturersලා පිළිබඳවත් පොඩි කථා බහක් තිබෙනවා. තමුන්නාන්සේලා ඒ අයට තිබුණු VAT එක අයින් කරලා තිබෙනවා. ඒ ගැන සතුටු වෙනවා. නමුත්, ඒ VAT එක නැවත ස්ථාපනය කරන්න කියලා IMF recommendation එකක් තිබෙනවා කියලා කථාවක් තිබෙනවා. එම නිසා ඔබතුමන්ලා ඒ IMF recommendation එක පිළිබඳව දෙවතාවක් හිතලා ඒ අයට සාධාරණයක් කරන්න.

අවසාන වශයෙන් මම ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳවත් කාරණයක් කියන්න ඕනෑ. 2015-2019 කාල සීමාවේ වෙච්ච වැරැද්දක් නිවැරදි කරන්න දැන් ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා. ඔබතුමා දන්නවා, 2015ට කලින් තිබුණු ආණ්ඩුවලදී ජනමාධ්‍යවේදීන්ට හිරිහැර සිදු වුණා. "සිරස" ආයතනය, "සියත" ආයතනය වැනි ජනමාධ්‍ය ආයතනවලට බෝම්බ ගැහුවා. ලසන්ත වික්‍රමතුංග, ප්‍රදීප් එක්නැලිගොඩ ඇතුළු ජනමාධ්‍යවේදීන් ඝාතනය වුණා. පසුගිය යහපාලන ආණ්ඩුව පැවැති කාල සීමාවේ ඒ අයට මොකද වුණේ කියලා සොයා බලා සාධාරණයක් ඉෂ්ට වුණේ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Harshana Rajakaruna, could you please conclude your speech?

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
එම නිසා දැන් මෙම රජයට ඒ සඳහා අවස්ථාවක් තිබෙනවා. කරුණාකර, මෙම ජනමාධ්‍ය ආයතනවලට කරපු ඒ ප්‍රහාරවලට, ඒ ජනමාධ්‍යවේදීන්ට එල්ල කරපු ප්‍රහාරවලට, අතුරුදහන් වුණු, ජීවිත නැති වුණු, රට අත්හැර දමා යන්නට සිදු වුණු අයට සාධාරණය ඉටු කිරීම වෙනුවෙන් කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Sittings is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම රීට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පඩි, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට සහභාගි වෙන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. මගේ කථාව පටන් ගන්නට පෙර කියන්න ඕනෑ, ඇත්තටම අද අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු උත්සාහ කළේ, මේ වැටුප් වැඩිවීම හරහා වෛද්‍යවරුන්ගේ, හෙද හෙදියන්ගේ, පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන්ගේ වැටුප් හා දීමනා කප්පාදු වුණාය කියන්නයි. ඇත්තටම ඒක වැරදි මතයක් සමාජගත කරන්න උත්සාහ කිරීමක් හැටියට තමයි අපි දකින්නේ. දැන් මේ වැටුප් වැඩි කිරීමෙන් වෙලා තිබෙන්නේ මූලික වැටුප වැඩි කිරීමක්. එතකොට මූලික වැටුප වැඩි වෙනකොට වැටුපට අදාළ අනෙකුත් දීමනාත් වැඩි වෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍යවරයෙකුගේ මූලික වැටුප රුපියල් 54,290 සිට රුපියල් 94,150 දක්වා වැඩි වෙනවා. එහෙම වැඩි වුණාම ඊළඟට වෙන දේ මොකක්ද? අනිට ලැබෙන සම්පූර්ණ වැටුප වැඩි වෙනවා. ඒ වාගේම ප්‍රතිශතයක් හැටියට සියලු දීමනා වැඩිවෙලා, වැටුපට ලැබෙන දීමනා ප්‍රමාණය වැඩි වෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, සෞඛ්‍ය අමාත්‍යාංශය 2024දී වැටුප් සඳහා වියදම් කරලා තිබෙනවා, රුපියල් මිලියන 45,338ක්; අතිකාල දීමනා සහ නිවාඩු දින දීමනා සඳහා වියදම් කරලා තිබෙනවා, රුපියල් මිලියන 39,716ක්; අනෙකුත් දීමනා සඳහා වියදම් කරලා තිබෙනවා, රුපියල් මිලියන 50,449ක්. ඒ කියන්නේ අතිකාල දීමනා සහ නිවාඩු දින දීමනාවලට අමතරව තවත් දීමනා තිබෙනවා. ඒ නිසා අවසානයේදී වැටුපට එකතු වෙන දීමනා ප්‍රමාණය වැඩි වෙනවා. Argument එක තිබෙන්නේ, අනුපාතය ඒ කියන්නේ rate එක අඩු කිරීම පිළිබඳව. නමුත් අනුපාතය අඩු කළාට මේ මූලික වැටුප් වැඩි කිරීම හරහා අනිට ලැබෙන මුදල, දීමනාවල මුළු එකතුව අඩු වෙන්නේ නැහැ. ඒ වාගේම වසරකට වරක් වෛද්‍යවරුන්ට, සෞඛ්‍ය සේවකයන්ට ලැබෙන වැටුප් වර්ධකය වාර්ෂිකව වැඩි වෙනවා. ඒ වාගේම ඒගොල්ලන් යම් කිසි අවශ්‍යතාවකට ආපදා ණය ලබා ගන්නවා නම්, ඒ සඳහා ලැබෙන මුදල වැඩි වෙනවා. ඒ වාගේම විශ්‍රාම වැටුප වැඩි වෙනවා. ඉතින් ඒ නිසා ඇත්තටම මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරන එක තේරුමක් නැහැ කියලා මම හිතනවා. මොකද, මේක අංක ගණිතය පිළිබඳ ප්‍රශ්නයක්. මේ උත්සාහ කරන්නේ, මේ අනුපාත අඩුවීම වැටුප් කප්පාදුවක් හැටියට දක්වලා සෞඛ්‍ය සේවකයන්ගේ වැටුප් අඩු කළාය කියලා සමාජ මතයක් ගොඩනඟන්නයි. ඒක නිවැරදි කරන්න අපි දැන් ඕනෑ තරම් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2025 වසර සඳහා ඉදිරිපත් කරන ලද ජාතික ජන බලවේගය නව රජයේ මේ අය වැය සුවිශේෂ අය වැයක්. මෙහි සෞඛ්‍ය විෂයයට විශාල බරක් තබා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා රුපියල් බිලියන 604ක් වෙන්කර තිබෙනවා. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය තුළ තිබුණු අතීත ශ්‍රී විභූතිය නැවත ප්‍රතිෂ්ඨාපනය කරන්න තමයි අපි මේ උත්සාහ කරන්නේ. 1978දී සෝවියට් රුසියාවේ අල්මා-ආටා නගරයේ තිබුණා, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කළ, ප්‍රාථමික සෞඛ්‍ය සේවය පිළිබඳ පළමු සමුළුව. ඒ සමුළුවේදී බොහෝ රටවල් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන් සැපයීම සම්බන්ධයෙන් උදාහරණයට ගත්තේ ශ්‍රී ලංකාවයි. ඒ කාල සීමාවේදී අපේ සෞඛ්‍ය සේවයේ තිබිච්ච ගුණාත්මකභාවය නිසා ඇත්තටම අපි මේ වෙනකොට ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන් තුළින් සෞඛ්‍ය දර්ශකවල ඉතා ඉහළ තලයකට ඇවිල්ලා තිබෙනවා. 1980 -1990 දශක දක්වාම ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන් ඉතා හොඳින් ක්‍රියාත්මක වීම නිසා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය අනෙකුත් රටවල ගෞරවයට පාත්‍ර වුණා. ඒ වාගේම ඒගොල්ලන් අපව උදාහරණයට ගන්න, follow කරන්න නොයෙක් විට උත්සාහ කළා. ඒ නිසාම දැන් අපේ රටේ උපතේදී බලාපොරොත්තු විය හැකි ආයු කාලය සාමාන්‍යයෙන් අවුරුදු 75ක් වෙනවා. ළදරු මරණ අනුපාතය සජීවී උපත් 1,000කට 6යි. එය මේ කලාපයේ තිබෙන හොඳම අගයක්. ඊළඟට, අවුරුදු 5ට අඩු ළමා මරණ අනුපාතය සජීවී උපත් 1,000කට 10යි. මාතෘ මරණ අනුපාතය සජීවී උපත් 100,000කට 25.3යි. මේ දර්ශක ගත්තොත්, ලෝකයේ අනෙකුත් දියුණු රටවල් හා සමාන දර්ශක හැටියට අපට සලකන්න පුළුවන්. ඇත්තටම මේ කාල සීමාව තුළ ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල තිබුණු තත්ත්වය ගත්තාම, විශේෂයෙන්ම අපේ රටේ ප්‍රතිශක්තිකරණය පිළිබඳ ඉතාම හොඳ වැඩසටහනක් තිබෙනවා; මුළු ලෝකයටම ආදර්ශ සපයන වැඩසටහනක් තිබෙනවා. ඒ නිසා කක්කල් කැස්ස, ගලපටලය, පිටගැස්ම, සරම්ප, රුබෙල්ලා, මවගෙන් දරුවාට බෝවන සිපිලිස්, මැලේරියාව, පෝලියෝ වාගේ බෝවන රෝග ගණනාවක් පසුගිය කාලය තුළ පාලනය කරගන්න, අපේ රටින් තුරන් කරන්න, යම්කිසි ප්‍රමාණයකට හෝ එම රෝග පැතිරීම වළක්වාගන්නට ශ්‍රී ලාංකිකයින් වන අපට පුළුවන් වෙලා තිබෙනවා. ඇත්තටම මේ කරුණු වැදගත් වෙනවා. මොකද, අපි අවුරුදු ගණනක් තිස්සේ අපේ රටේ ගොඩනඟපු සෞඛ්‍ය සේවය මෑත අවුරුදු 20, 25 ඇතුළත තමයි මේ විධියට විනාශ වෙන්න පටන් ගත්තේ. මෙන්න මේක තමයි අපට නිවැරදි කරන්න වෙන්නේ. කනගාටුදායක තැන් තිබෙනවා. අපි මෙතෙක් ලබා දීපු සේවය පසුගිය වසර 25 තුළ යම්කිසි ප්‍රමාණයකට අවපාතයකට ලක් වෙලා තිබෙනවා. ඒ ගැන වැඩිය කථා කරන්න හොඳ නැහැ. මේක නිවැරදි කරන්න තමයි ජාතික ජන බලවේගය අලුත් රජයක් පිහිටුවාගෙන මේ රටේ ජනතාවගේ ශුභසිද්ධිය සඳහා සෞඛ්‍යයට වැඩි බරක් තැබූ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඉතින්, ඇත්තටම අපි උසස් අධ්‍යාපනය සඳහා වෛද්‍ය වෘත්තිය තෝරා ගන්නකොටම මේ අවශ්‍යතාව පිළිබඳ සලකා බලා තමයි ඒ තේරීම කළේ.

ඇත්තටම අපි මේ අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා ඩිජිටල්කරණය සඳහා වැඩි පිරිවැයක්. ඒ සඳහා රුපියල් මිලියන 6,000ක් වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ අවුරුද්දට මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා. ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, විශේෂයෙන්ම සෞඛ්‍ය තොරතුරු පද්ධතිය හරියාකාරව නිර්මාණය කර ගැනීමයි. ඕනෑම රෝගියෙක් රෝහලකට ගියාම, ඒ රෝගියාගේ history එක නිතර නිතර ගන්න අපට සිදු වෙනවා. වාට්ටුවකට ඇතුළත් වුණත්, රෝහලකට ගියත්, පරීක්ෂණයකට ගියත් වෙන වෙනම රෝගියාගේ history එක ගන්න වෙනවා. මෙන්න මේක වළක්වා ගෙන කාර්යක්ෂම කරන්න ඩිජිටල්කරණය අවශ්‍ය වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි සෞඛ්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීමට - to strengthen the health system - රුපියල් මිලියන 6,668ක් වෙන් කරලා තිබෙනවා. ශක්තිමත් ප්‍රාථමික සෞඛ්‍ය ඒකක ජාලයක් හදන්න රුපියල් මිලියන 12,190ක් වෙන් කරලා තිබෙනවා. මීට අමතරව කඳුකර ජනතාවට දියුණු යටිතල පහසුකම් සැපයීමට, ඒ වාගේම දියුණු සෞඛ්‍ය සේවාවක් ලබා

[ගරු නිහාල් අබේසිංහ මහතා]

දීමට මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ප්‍රමාණවත්, ගුණාත්මක, ආරක්ෂිත ඖෂධ සහ උපකරණ සැපයුමට රුපියල් බිලියන 183ක් වෙන් කරලා තිබෙනවා. කලිනුත් කියැවුණා වාගේ ගර්භිණී මව්වරුන්, පෙර පාසල් දරුවන් සහ පාසල් දරුවන්ගේ පෝෂණය නහා සිටුවීමට අපි මේ අය වැයෙන් රුපියල් බිලියන 12.5ක් වෙන් කරලා තිබෙනවා.

ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණයට, එහෙම නැත්නම් ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැංවීමේදී ජනගහනය 5,000කට හෝ 10,000කට විතර ප්‍රමාණයකට පවුලේ වෛද්‍යවරයෙක් පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අද කෙනෙක් අසනීපයකට ප්‍රතිකාර කර ගන්න තීරණය කරන්නේ එක්කෝ තමන්ම, එහෙම නැත්නම් පවුලේ අය එක්ක කථා කරලා, එහෙමත් නැත්නම් තමන් දන්නා කෙනෙක් එක්ක කථා කරලා. එහෙම තමයි තීරණයකට එළඹෙන්නේ, කොහොමද ප්‍රතිකාර ගන්නේ කියලා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
මට මගේ කාලය ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විනාඩියකින් පැහැදිලි කිරීම කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කඳුකර දෙමළ ජනයා ගැන කථා කළා. බොහොම ස්තුතියි. ඒ ජනතාව ගැන අවධානය යොමු කිරීම ගැන සතුටු වෙනවා. හැබැයි ජනාධිපති සහෝදරයා තමන්ගේ අය වැය කථාව අවස්ථාවේදී, - එතුමාගේ කථාවේ තිබෙනවා - එක තැනක කියලා තිබුණා, වතු management එක සම්බන්ධ කරගෙන වතුවල තිබෙන ඉස්පිරිතාල, - පොඩි dispensaries සහ institutions - දියුණු කරනවා කියලා. කරුණාකරලා ඒක කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා. දැන් වතු ජනතාව ජාතික ප්‍රවාහයට අතුළත්වීම කියන්නේ සම්පූර්ණයෙන් වතු පාලනයෙන් අයින් වෙන්න ඕනෑ කියන එක. වතු ජනතාවගේ රැකියාව, - තේ වතු වේවා, රබර් වතු වේවා - සම්බන්ධයෙන් පමණයි management එකට අයිතිය තිබෙන්න ඕනෑ. අනෙක් සෑම දේම ජාතික ප්‍රවාහයට ඇතුළත් කර ගන්න. ඒවා ඔබතුමන්ලාගේ health sector එකෙන් දාන්න. ඒ අයගේ සෞඛ්‍ය වතුවලට බාර දෙන්න එපා. දුන්නාම මොකද වෙන්නේ? වතු ජනතාව හැමෝම වතුවල වැඩ කරන්නේ නැහැ. සියයට 20යි වතුවල වැඩ කරන්නේ. එතකොට ඒගොල්ලන් කියයි වැඩ කරන අයට පමණයි බෙහෙත් දෙන්නේ කියලා. මම අවවාදයක් කරනවා, එහෙම කරන්න එපා කියලා. ඔබතුමන්ලා හොඳ හිතින්, සද්භාවයෙන් කරනවා ඇති. හැබැයි, ඒක හරි නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අපි ඒක විෂය භාර ඇමතිතුමාට භාර දෙමු.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
ගරු මන්ත්‍රීතුමා, අපි විෂය භාර ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරමු.

කොහොම වුණත්, රජය විධියට ඒ පිළිබඳ වගකීම ගන්න අපි බලාපොරොත්තු වෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, හොඳයි. අපි වතු ජනතාවට කිසිම වැරැද්දක් වෙන්න ඉඩ තියන්නේ නැහැ. අපටත් අවශ්‍ය වෙන්නේ, මෙතෙක් ඉතිහාසයේ නොලැබුණු සෞඛ්‍ය සේවයක් වතු ජනතාවට ලබා දීමට පුළුවන් උපරිමයෙන් කටයුතු කරන්නයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කවුරු හරි තීරණයක් ගන්නකොට ප්‍රතිකාර ගන්න, ඒක පෞද්ගලික තීරණයක්. නමුත් පවුලේ වෛද්‍යවරයෙක් පත් කිරීම හරහා අපි බලාපොරොත්තු වෙන්නේ, ඒ ප්‍රදේශයේ ජනතාව පවුලේ වෛද්‍ය ඒකකය සමඟ ලියාපදිංචි වෙලා, යම්කිසි අසනීපයකට ප්‍රතිකාර ගන්න තීන්දුවක් තීරණයක් ගන්නකොට අර වෛද්‍යවරයා, අර කණ්ඩායම එක්ක කථා කරලා ඒ තීන්දුව; තීරණය ගැනීමයි. එතකොට හොඳ මඟ පෙන්වීමක් ලැබෙනවා. දැන් තිබෙන තත්ත්වය අනුව තමන් වෛද්‍යවරයෙක් සොයාගෙන පෞද්ගලික අංශයට ගිහිල්ලා, එහෙම නැත්නම් consultant කෙනෙක් මුණ ගැහිලා තමන්ම කර ගන්නා ඒ කටයුතු ටික පහසු කිරීමක්, ඒ අය රැක බලා ගැනීමක් තමයි පවුලේ වෛද්‍යවරයාගෙන් කෙරෙන්නේ. දැන් මෙවැනි ක්‍රමයක් නැති නිසා ඇත්තටම වෙන්නේ පිට පළාත්වල - පර්යන්තයේ - ඉන්න ජනතාව නාගරික ද්විතීයික සහ තෘතීයික රෝහල්වලට පැමිණීමයි. එහෙම වුණාම ද්විතීයික සහ තෘතීයික රෝහල්වල තදබදයක් ඇති වෙනවා. මේ තදබදය නිසා මෙතෙක් පැවැති ආණ්ඩු කළේ ඒ රෝහල් තවතවත් දියුණු කිරීමයි. මෙන්න මේ නිසා නගරයේ රෝහල් දියුණු වුණා, පර්යන්ත රෝහල්වලට සාපේක්ෂව. දැන් පර්යන්තයේ රෝහල් කිසිම කෙනෙක් භාවිත නොකරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇත්තටම ඒ රෝහල් දියුණු කිරීම සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පිළිබඳ පවුලේ වෛද්‍යවරයෙක් පත් කිරීම තමයි ජාතික ජන බලවේගයේ සෞඛ්‍ය ප්‍රතිපත්තියේ මූලික අවශ්‍යතාව වෙලා තිබෙන්නේ. ඒකෙන් ඇත්තටම අපට overcrowding අඩු කරන්න පුළුවන් වෙනවා. ඒ වාගේම පර්යන්තයේ ඉන්න ජනතාවට තමන්ගේ සෞඛ්‍ය සේවා කටයුතු තමන්ගේ ඒකකය සහ පවුලේ වෛද්‍යවරයා හරහා කරගන්න හැකියාව ලැබෙනවා. ජනතාව නාගරිකව පවතින ප්‍රධාන රෝහල්වලින් ඔවුන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරගන්න යන නිසා ඒවායේ පහසුකම් වැඩිදියුණු වෙනවා වාගේම ඒ වෛද්‍යවරුන්ට සහ අනෙකුත් නිලධාරීන්ට නාගරිකවම කොටු වෙලා ඉන්න සිදු වෙලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, අපේ රටේ විශේෂඥ වෛද්‍යවරුන් 2,726ක් ඉන්නවා. ඔවුන්ගෙන් සියයට 37ක්ම ඉන්නේ බස්නාහිර පළාතේ. බස්නාහිර පළාතේ ඉන්න අයගෙනුත් සියයට 69ක් ඉන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ. මොකද, overcrowding නිසා නාගරිකව සංකේන්ද්‍රණය වුණු රෝහල්වල පහසුකම් වැඩි කරන්න ගිහිල්ලා පර්යන්තයේ රෝහල්, පර්යන්තයේ සේවා අමතක වෙලා තිබෙනවා. මෙන්න මේ නිසා තමයි ඇත්තටම අපි පවුලේ වෛද්‍යවරයෙක් යෝජනා කරන්නේ.

පවුලේ වෛද්‍යවරයෙක් යෝජනා කිරීම හරහා අපට දැන් විශාල අර්බුදයක් වෙලා තිබෙන බෝ නොවන රෝග මර්දනයටත් විශාල පිටුවහලක් ලැබෙනවා. පවුලේ වෛද්‍යවරයාගේ

කණ්ඩායමේ මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනියක් - Public Health Nursing Officer කෙනෙක් - ඉන්නවා. එතකොට ඔවුන්ට පුළුවන් වෙනවා, ප්‍රාථමික මට්ටමේදීම බෝ නොවන රෝග පාලනය කරන්න. STEPS Survey එක කියනවා, වයස අවුරුදු 18 -69 අතර ජනතාවගෙන් සියයට 14කට දියවැඩියාව, සියයට 34කට අධි රුධිර පීඩනය තිබෙනවා කියලා. ඒ කියන්නේ විශාල පිරිසක් බෝ නොවන රෝගවලින් පෙළෙනවා. ඒ වාගේම මරණවලින් සියයට 70ක් විතරම සිදු වෙන්නේ බෝ නොවන රෝග නිසායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වකුගඩු රෝගය වැඩි වශයෙන් පැතිරෙන ප්‍රදේශ තිබෙනවා. ඒ වාගේම මේ වන විට අපේ රටේ වාර්තා වන පිළිකා රෝගීන් සංඛ්‍යාවත් ඉහළ ගිහින් තිබෙනවා. 2021 වර්ෂයේ පිළිකා රෝගීන් 37,753ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ ජනගහනයෙන් පහෙන් එකක් 2031දී වයෝවෘද්ධ පුද්ගලයින් වෙනවා. 2041 වර්ෂය වෙනකොට මේ සංඛ්‍යාව හතරෙන් එකක් බවට පත් වෙනවා. ඒ කියන්නේ අනිවාර්යයෙන්ම බෝ නොවන රෝගවලට ගොදුරු වන සංඛ්‍යාව වැඩි වෙනවා. මෙන්න මේ නිසා තමයි පවුලේ වෛද්‍යවරයෙක් සහිත පවුල් වෛද්‍ය ඒකකය සහ පර්යන්තයේ තිබෙන රෝහල්වල ප්‍රාථමික සෞඛ්‍ය සේවා කටයුතු දියුණු කරලා ඒවායේ සේවය ජනතාවට ලබා දීම වැදගත් වෙන්නේ.

පිළිකා රෝගීන්ට, අංශභාග රෝගීන්ට - strokes ආ අයට - වයස්ගත වන අයට - සහන සේවා අවශ්‍යයි. අද සාමාන්‍ය කෙනෙකුට මේ සහන සේවා - palliative care - සඳහා අධික වියදමක් දරන්න වෙනවා. මොකද, ඒ සේවා ලබාගන්න පුළුවන් වෙන්නේ පෞද්ගලික අංශයෙන්. නමුත් අපි පවුල් වෛද්‍ය ඒකකය ගොඩනැඟුවාම අනිවාර්යයෙන්ම එතැනින් සහන සේවා, බෝ නොවන රෝග පාලනය කරන සේවා ලබා දෙන්න අපට හැකියාව ලැබෙනවා. පවුල් වෛද්‍ය ඒකකය ඒ ප්‍රදේශයේ සිටින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සමඟ සහයෝගයෙන් තමයි වැඩ කරන්නේ. එතකොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් හරහා මත් ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමේ වැඩ කටයුතු, තුවාලවීම් වැළැක්වීම - injury prevention - වැනි කටයුතු කරන්න පුළුවන්. මොකද, සාමාන්‍යයෙන් මිනිත්තුවකට අටදෙනෙක් රෝහල්ගත වෙනවා, injuries නිසා. ඒ කියන්නේ බොහෝ අය රෝහල්ගතවීමට ප්‍රධාන හේතුව - the leading cause for hospitalization - injuries. වසරකට මිලියන 1.3ක් පමණ ඒ හේතුව නිසා රෝහල්ගත වෙනවා. ඒ කියන්නේ සියයට 15ක්, 20ක් විතර. 2021දී එලෙස රෝහල්ගත වූ පුද්ගලයින් 10,600ක් මිය ගොස් තිබෙනවා. පැය තුනකට වරක් - every three hours - කෙනෙකු රෝහල්වලට ඇතුළත් කරනවා, තුවාලවීම් නිසා. මේ කරුණු අනුව අපි විශ්වාස කරනවා, අපි මේ සපයන්න උත්සාහ කරන ප්‍රාථමික සෞඛ්‍ය සේවාව හරහා -පවුලේ වෛද්‍යවරයෙක් සහ ඒ කණ්ඩායම හරහා- ජනතාවට ඔවුන් ජීවත් වන ප්‍රදේශයේම ලියාපදිංචි වී එදිනෙදා ජීවිතයට අවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සහ අවශ්‍ය මාර්ගෝපදේශ සපයා ගැනීමට හැකි වන බව. ඒ වාගේම යම් පුද්ගලයෙකු රෝගාතුර වුණාම යා යුතු රෝහල පිළිබඳව තීන්දු තීරණ ගැනීමටත් මේ තුළින් හැකියාව ලැබෙනවා. ඒ සඳහා ඒ අයට අවශ්‍ය ගමන් පහසුකම් සපයා ගැනීමටත්, පසුවිපරම් කිරීමටත් මේ තුළින් හැකියාව ලැබෙනවා. මෙන්න මේ සියලු කාරණා තමයි අපි ප්‍රාථමික සෞඛ්‍ය සේවාව හරහා ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. මෙන්න මේ ආකාරයට තමයි ජාතික ජන බලවේගය සෞඛ්‍ය අංශය කෙරෙහි අවධානය යොමු කර තිබෙන්නේ.

ඒ වාගේම ඩෙංගු මර්දනයට සහ අනෙකුත් වසංගත රෝග මර්දනයට සිදු කරනු ලබන සේවාවන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරමින්, ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස කියන අංශ දෙකේ සහයෝගය ඇතුව මෙම සේවාව පවත්වා ගෙන යාමට අපි පියවර ගනු ලබනවා. ඒ අනුව අපි ප්‍රාථමික සෞඛ්‍ය සේවාව දියුණු කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ, ජනතාව නාගරිකව පවතින පෞද්ගලික රෝහල්වලට ඇවිත් ලබා ගන්නා සේවාව වෙනුවට ඔවුන්ට තමන් ජීවත් වන ප්‍රදේශය තුළදීම ඒ පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීමයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.19]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අද දවසේ අපි සාකච්ඡා කරන්නේ ඉතාම වැදගත් මාතෘකාවක් ගැනයි. මේ අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේදී සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි අපි අද කථා කරන්නේ. මේ අවස්ථාවේදී පළමුවෙන්ම වත්මන් ආණ්ඩුවට මා ස්තුතිවන්ත වෙන්න ඕනෑ, සෞඛ්‍ය වෘත්තිකයන්ගේ ගැටලුව පිළිබඳව යම්තාක් දුරකට අවධානය යොමු කිරීම පිළිබඳව. විශේෂයෙන්ම වෛද්‍යවරුන් ඇතුළු හෙද නිලධාරි කාර්ය මණ්ඩල ඇතුළු සෞඛ්‍ය සේවාවට අයත් සියලු කාර්ය මණ්ඩලවල පවතින ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීම පිළිබඳව අප ස්තුතිවන්ත වෙනවා. අපි විශ්වාස කරනවා, ආණ්ඩුවට ඒ පිළිබඳව හොඳ අවබෝධයකුත් ඇති කියලා.

පසුගිය ආණ්ඩු කාලයේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට පණ පොවපු, ඒ වෘත්තීය සමිති අයිතිවාසිකම් දිනාගත් සියලු නායකයන් වත්මන් ආණ්ඩුවේ විවිධ අමාත්‍යාංශ හොබවමින් ඉන්නවා. ඒ නිසා මා විශ්වාස කරනවා, වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ඒ සියලු කාර්ය මණ්ඩලවලට පවතින ගැටලු පිළිබඳව ඔවුන් ඉතාම හොඳින් අවධානය යොමු කරයි කියලා. මොකද, බලය නැති කාලයේත් මේ අය ඒ ප්‍රශ්න ගැන කිව්වා. අද ඔවුන්ට බලය තිබෙන නිසා ඒවාට හොඳින් පිළිතුරු දෙන්න අවස්ථාව තිබෙනවා.

ඒ වාගේම මේ මොහොතේ මා විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ, අපේ සෞඛ්‍ය සේවාව අද තිබෙන තැන පිළිබඳවත්. අපි විශ්වාස කරනවා, දියුණු රටවල සෞඛ්‍ය සේවාව තුළ තිබෙන සියලු ගුණාංග අපේ රටේ සෞඛ්‍ය සේවයත් අද වන විට අත්පත් කරගෙන තිබෙන බව. ඒ කාර්යභාරය ඉෂ්ට කිරීමට පසුගිය කාලයේ පැවති සෑම රජයක්ම කටයුතු කළා. ඒ පැවති රජයන්වල ඒ වගකීම් දරපු සෞඛ්‍ය අමාත්‍යවරුන් ගත් විවිධ ප්‍රතිපත්ති තීන්දු ඒ සඳහා ඉවහල් වුණාය කියන කාරණයත් අපි පිළිගන්න ඕනෑ. සියලු සෞඛ්‍ය දර්ශක අනුව ගත්තාම, අපේ රට දියුණු රටවල තිබෙන තත්ත්වයන් හා සසඳා බලද්දි, ගළපා බලද්දී අපේ රටත් ඒ දියුණු රටවල තිබෙන සෞඛ්‍ය සේවාවන් හා සමාන සෞඛ්‍ය සේවාවක් සපයන රටක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මා විශ්වාස කරනවා, වත්මන් ආණ්ඩුව ඒ දියුණු රටවල තිබෙන සෞඛ්‍ය පද්ධති හා සමාන තත්ත්වයකින් අපේ රටේ සෞඛ්‍ය සේවාව තව තවත් ඉදිරියට ගෙන යන්න ඔවුන්ගේ මේ අය වැය ලේඛනය තුළින් විවිධ යෝජනා ඉදිරිපත් කර තිබෙන බව. විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රය ඩිජිටල්කරණය කිරීමට, ඒ වාගේම ප්‍රාථමික සෞඛ්‍ය සේවාව වර්ධනය කිරීමට සහ තවත් විවිධ දේවල් සෞඛ්‍ය

[ගරු චානක මාදුගොඩ මහතා]

ක්ෂේත්‍රය තුළට එකතු කිරීමට මේ අය වැය ලේඛනය තුළින් ඔවුන් කටයුතු සැලසුම් කර තිබෙනවා. මේ රටේ අහිංසක අම්මලා, තාත්තලා, සහෝදර සහෝදරියන් ළඟම තිබෙන රෝහලට ගිහිල්ලා, පෝලිම්වල ඉඳිමින් විශාල කාලයක් ගත කරමින් ඒ සෞඛ්‍ය සේවාව ලබා ගන්නා ආකාරය සමහර අවස්ථාවලදී අපි දකිනවා. අපේ ප්‍රාථමික මට්ටමේ සිටින, පීඩාවට පත් වෙච්ච ජනතාව ඒ සේවාව ලබා ගන්න ගියාම ඔවුන් යම් අපහසුතාවකට මුහුණ දෙනවා. එම නිසා ඒ පිළිබඳව අපි අවධානය යොමු කළ යුතුයි. විශේෂයෙන්ම ප්‍රාථමික සෞඛ්‍ය සඳහා වෙන් කරපු මුදල්වලින් ඒ සේවා ක්‍රමවත් කරන්න, පුළුල් කරන්න, පුළුවන් නම් ඒක වටිනවා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ.

සෞඛ්‍ය සේවය වෙනුවෙන් වර්තමාන ආණ්ඩුව වෙන් කරපු මුදල අපි කළමනාකරණය කරන්න අවශ්‍යයි. හැම ආණ්ඩුවක්ම සෞඛ්‍ය සේවාව වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරනවා. හැබැයි, ඒ වෙන් කරන මුදල කළමනාකරණය කර ගැනීම සෞඛ්‍ය සේවාවේ උන්නතියට විශාල වශයෙන් බලපානවා. අද රජයක් විධියට සෞඛ්‍ය සේවාවට වැඩි මුදලක් වෙන් කරන්න සිදු වෙලා තිබෙන්නේ හදිසි අනතුරු එහෙම නැත්නම් මත් ද්‍රව්‍ය නිසා ඇති වන රෝගාබාධ සහ ඩෙංගු ඇතුළු විවිධ උවදුරු වෙනුවෙනුයි. හැබැයි, අපි වෙනස් විධියකට හිතන්න ඕනෑ. හදිසි අනතුරු, මත් ද්‍රව්‍ය නිසා ඇති වන රෝගාබාධ වාගේම වෙනත් උවදුරු ඇති වීම කළමනාකරණය කර ගැනීම සඳහා දියුණු ක්‍රම භාවිත කරන්න පුළුවන් නම්, පාසල් අධ්‍යාපනය තුළින් දරුවන්ට වාගේම ග්‍රාමීය ජනතාවට යම් අවබෝධයක් ලබා දෙමින් නීති පනවන්න පුළුවන් නම්, අපට මේ සමහර කාරණා වෙනුවෙන් වෙන් කරන්න තිබෙන මුදල් අවම කරගන්න පුළුවන් වෙනවාය කියා අපි විශ්වාස කරනවා. ඒ කාරණය පිළිබඳව හිතනවා නම් එයත් වටිනවා කියන කාරණයත් මේ මොහොතේදී මම මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම කොරෝනා වසංගතය පැවති වෙලාවේ මේ රටේ සමස්ත සෞඛ්‍ය පද්ධතිය විසින් සිදු කරපු ඒ අද්විතීය කාර්ය භාරය අපට අමතක කරන්න බැහැ. වෛද්‍යවරුන්, හෙද හෙදියන්, කනිෂ්ඨ කාර්ය මණ්ඩලය, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ඇතුළු සියලුදෙනා කොරෝනා වසංගතය පැවති වෙලාවේ තමන්ගේ වගකීම ඉතාම ඉහළින් සිදු කළා. වගකීමටත් එහා ගිහිල්ලා මේ රටේ සමස්ත ජනතාව ආරක්ෂා කිරීම වෙනුවෙන් ඔවුන් සුවිශේෂී කාර්ය භාරයක් ඉෂ්ට කළා. ඒ සුවිශේෂී කාර්ය භාරය අද ඉදිරියට ගෙන යමින් අපේ රටේ සෞඛ්‍ය පද්ධතිය තුළ ඔවුන් කටයුතු කරනවා. හැබැයි, සමහර අවස්ථාවලදී අපි දැක්කා, සමහර රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන්ගේ ගැටලු තිබෙන බව. ඒ වාගේම සමහර වෛද්‍ය නිලධාරීන්ගේ, කාර්ය මණ්ඩලවල හිඟයන් තිබෙන බව අපි දැක්කා. ආණ්ඩුවක් විධියට ඒ පිළිබඳව අපි හිතන්න ඕනෑ.

ඒ වාගේම සමහර විශේෂඥ වෛද්‍යවරු, වෙනත් වෛද්‍ය වෘත්තීන්වල යෙදෙන වෛද්‍ය නිලධාරීන් වාගේම හෙද නිලධාරීන් විදෙස් රැකියා සඳහා යන නිසා අද මේ සෞඛ්‍ය අංශය විශාල කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. අපි වෙනදා රජයක් විධියට අවධානය යොමු කළේ විශ්‍රාම ගැන්වෙන ප්‍රමාණයට වෛද්‍යවරුන් සෞඛ්‍ය පද්ධතියට එකතු කර ගැනීමයි. නමුත්, රජයක් විධියට අපට අද වෙනස් විධියකට හිතන්න වෙලා තිබෙනවා. විශේෂඥ වෛද්‍යවරුන් බිහි කරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හරහා විශේෂ අවධානයක් යොමු කරලා, වෛද්‍යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන් තවතවත් මේ රටට එකතු කිරීමේ යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් විශේෂයෙන් මම සිහිපත් කරන්න ඕනෑ. රටක් විධියට අපි ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. වත්මන් ආණ්ඩුවට ඒ සතුට වර්ධනය කරගන්න පුළුවන් අවස්ථා තිබෙනවා.

පසුගිය ආණ්ඩු අපේ රටේ පාවිච්චි කරන බෙහෙත් වර්ග 850කින්, 210ක් පමණ අපේ රටේම නිෂ්පාදනය කරන තැනට ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, ඒක ප්‍රමාණවත් නැහැ. සමස්ත ඖෂධ නිෂ්පාදනයෙන් සියයට 20ක් පමණ තමයි අද අපේ රටේ නිෂ්පාදනය කරන්නේ. මේ සම්බන්ධයෙන් වර්තමාන රජයට වගකීමක් තිබෙනවා. වත්මන් සෞඛ්‍ය ඇමතිවරයා ඒ වගකීම ඉතා හොඳින් ඉටු කරයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. අපේ රටේ තිබෙන සමස්ත ඖෂධවලින් සියයට 20ක ප්‍රමාණයක් තමයි අපේ කර්මාන්තශාලා හරහා, ව්‍යාවසායකයන් හරහා අද වනකොට නිෂ්පාදනය කරන්නේ. අපට ඒක තවත් ව්‍යාප්ත කරන්න පුළුවන් නම්, රටේ අවශ්‍යතාවයෙන් සියයට 60ක්, සියයට 70ක් දක්වා ඖෂධ නිෂ්පාදනය වැඩි කිරීම ගැන හිතන්න පුළුවන් නම්, රජයක් විධියට ඒ සඳහා යම් වැඩ කොටසක් කරන්න පුළුවන් නම්, වත්මන් ආණ්ඩුවෙන් සෞඛ්‍ය සේවාවට ඉතාම ඉහළ අගයක් ලැබුණාය කියලා මා විශ්වාස කරනවා.

මම මුලින් කථා කළා, බාහිර රෝගී අංශය පිළිබඳව. අපි දකිනවා, බාහිර රෝගී අංශවලට රෝගීන් විශාල ප්‍රමාණයක් පැමිණෙන බව. උදේට කරාපිටිය රෝහලට ගියාම අපට පෙනෙනවා, අම්මලා, තාත්තලා සමහර විට පාන්දර 4.00ට, 5.00ට විතර ගෙවල්වලින් ඇවිල්ලා, පෝලිම්වල ඉඳගෙන වෛද්‍යවරුන්ගෙන් බෙහෙත් නියම කර ගන්න විශාල වෙහෙසක් ගන්නා ආකාරය. ගරු ඇමතිතුමනි, එම නිසා රෝහල්වල බාහිර රෝගී අංශ පුළුල්ව හදන්න පුළුවන් නම්, ඒ සඳහා යම් වැඩ කොටසක් කරන්න පුළුවන් නම් වටිනවාය කියන කාරණය මා විශේෂයෙන්ම සිහිපත් කරනවා. එය කිසිම ආණ්ඩුවකින් සිදු නොවුණු දෙයක්. නමුත්, මා හිතනවා මේ ආණ්ඩුව ඒ පිළිබඳව අවධානය යොමු කරයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම හිතුවේ මට තව දීර්ඝ කාල වෙලාවක් තිබෙනවාය කියායි. කිව යුතු කාරණා කිහිපයක් තිබෙනවා. මම ඉතා කෙටියෙන් එම කාරණා සිහිපත් කරන්නම්. ගරු ඇමතිතුමනි, සමහර රෝගී තත්ත්ව සඳහා ප්‍රතිකාර ගන්න පොරොත්තු ලේඛනයේ ඉන්න ඕනෑ. හෘද සැත්කම් වෙන්න පුළුවන්, වෙනත් විවිධ සැත්කම් වෙන්න පුළුවන්. ඒ සඳහා පොරොත්තු ලේඛනවල බොහෝ කාලයක් රැඳී ඉන්න ජනතාවට සිදු වෙලා තිබෙනවා. ඒ පොරොත්තු ලේඛනවල ඉන්නේ ජීවිතයත්, මරණයත් අතේ තබාගෙන සිටින ජනතාව. සමහර අවස්ථාවල ඔවුන්ගේ ඉඩකඩම් ඇතුළු සියලු දේපළ උකස් තියලා පෞද්ගලික අංශයේ රෝහල්වලින් එම සැත්කම් කර ගන්න ඔවුන් උත්සාහ කරනවා. අපට රජයක් විධියට ඒ සඳහා වෙනත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ඉතා වටිනවා. පොරොත්තු ලේඛනයේ වැඩි කාලයක් සිටීම අවශ්‍ය නොවන විධියට හෝ පොරොත්තු ලේඛනවල නොසිට හෘද සැත්කම් ඇතුළු විවිධ සැත්කම් කරන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් හදන්න පුළුවන් නම් එය වටිනවාය කියන කාරණයත් මම සිහිපත් කරන්න ඕනෑ.

ගාල්ල ජාතික රෝහලේ "ඩයි පරීක්ෂාව" කරන කැතීටර යන්ත්‍රය කැඩිලා දීර්ඝ කාලයක් වෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න පුළුවන් නම් වටිනවා. සෞඛ්‍ය ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් දෙදෙනාම ගාල්ලට නැකම් කියන එක ගැන අපි සතුටු වනවා. නියෝජ්‍ය ඇමතිතුමා රිච්මන්ඩ් විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙක්. ගරු ඇමතිතුමනි, අද ගාල්ල සෞඛ්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත්වී තිබෙනවා. කරාපිටිය ශික්ෂණ රෝහල අද වනකොට ගාල්ල ජාතික රෝහල බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ගාල්ලේ තිබෙන හෙල්මුට් කෝල් මාතෘ රෝහල දකුණු ආසියාවේ තිබෙන විශාලතම මාතෘ රෝහලයි. ඒ වාගේම බලපිටියේ වෙන්න පුළුවන්; උඩුගම වෙන්න පුළුවන්; ඇල්පිටියේ වෙන්න පුළුවන්;

හබරාදුව වෙන්න පුළුවන්; ඉමදුව වෙන්න පුළුවන්. එම ප්‍රදේශවල තිබෙන රෝහල්වල අඩුපාඩු සම්බන්ධව යම් අවධානයක් යොමු කරන්න පුළුවන් නම් වටිනවා. මොකද, මීට පෙර සිටි පසුගිය ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යාවරයාත් ගාල්ල නියෝජනය කළේ. එතුමා පටන් ගත්ත වැඩ කොටසක් තිබෙනවා. එම වැඩ කොටස ඔබේ ආණ්ඩුවෙන් ඉටු කරලා දෙන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

ජනමාධ්‍යවේදීන් පිළිබඳව විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ. විවිධ ආයතනවලට සම්බන්ධ නොවුණු ස්වාධීන ජනමාධ්‍යවේදීන් අද දැඩි අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. ඔවුන්ට අවශ්‍ය උපකරණ ගන්න විධියක් නැහැ. බැංකුවකට ගිහින් ණයක් ගන්න විධියක් නැහැ. ස්වාධීන ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් රජයක් විධියට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් වටිනවාය කියන කාරණයත් මා සිහිපත් කරනවා. කවදා හරි අපේ ආදරණීය අම්මා, තාත්තා කෙනෙකුට රෝහලට ගිහිල්ලා, මුදලක් නොගෙවා නිදහස් සෞඛ්‍ය සේවයේ ප්‍රතිලාභ ලබමින් බෙහෙත් ටික ගන්න පුළුවන් මට්ටමට චත්මන් ආණ්ඩුවේ සෞඛ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙලා, එය ඉතාම හොඳ සෞඛ්‍ය සේවාවක් බවට පත් කර ගැනීමට ආණ්ඩුවට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.31]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධ විවාදයේදී කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට මා ස්තුතිවන්ත වනවා. මෙම අය වැය විවාදය පුරාම දිගින් දිගටම අපි දැක්කේ වැටුප් ප්‍රශ්නය ගැන කථා කරන ආකාරයයි. අපේ සෞඛ්‍ය ඇමතිතුමාත් පසුගිය කාලය පුරාවටම මේ ගරු සභාවේ හුහක් වෙලා කථා කළේ රාජ්‍ය සේවකයින්ගේ පඩි ප්‍රශ්නය විසඳීම ගැනයි. දැන් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ යම් නොසන්සුන්තාවක් ඇති වෙලා තිබෙනවා. එම නිසා එතුමාට සිදු වුණා, හැම දාම උදේට යම් කාලයක් අරගෙන රාජ්‍ය සේවකයින්ට ලැබෙන පඩිපත ගැන විග්‍රහයක් කරන්න. මොකද, ඒ තරමට වැටුප් ප්‍රශ්නය අර්බුදයට ලක් වෙලා තිබෙනවා. එක්කෝ, ඔබතුමන්ලා කියන දේ රාජ්‍ය සේවකයින්ට තේරෙන්නේ නැහැ. එහෙම නැත්නම් රාජ්‍ය සේවකයින් කියන දේ ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ. හැබැයි, ඒ ගැන දිගින් දිගටම කථා කිරීම තුළ මොකක් හෝ ගැටලුවක් තිබෙන බව නම් අපට තේරුණා. ඒ කාරණය මත වැඩ වර්ජනයකුත් සිදු වුණා. ඒ වර්ජනයටත් තමුන්නාන්සේලා උත්තර දුන්නා. සමහර ඒවාට උසාවි නියෝග පවා ගත්තා.

ඒ වාගේ කරුණු කාරණාත් වුණා. සමහර අවස්ථාවල අපි දැක්කා, අර පෙට්‍රල් ෂෙඩ් හිමියන් එක්ක ඇති වෙච්ච ප්‍රශ්නයේදී CID එකට පවා ගියා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති වෙච්ච කිසිදු වැඩ වර්ජනයකට අපි උසාවි නියෝග ගත්තේ නැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු ඇමතිතුමනි, මම කිව්වේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නොවෙයි, අර උද්ඝෝෂණ සම්බන්ධයෙන් උසාවි නියෝග ගත්තා කියන එක. අපි දැක්කා නේ, පෙට්‍රල් ෂෙඩ් හිමියන් එක්ක ඇති වෙච්ච ප්‍රශ්නයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගියා. ඒ වාගේම ඔබතුමන්ලා අලුත් මන්ත්‍රීවරයෙකුට ලැයිස්තුවක් දීලා, මේ පාර්ලිමේන්තුවේත් පෙට්‍රල් ෂෙඩ් අයිතිකාරයෝ ඉන්නවා කියලා, හතර පස්දෙනෙකුගේ නම් කිව්වා. මම මේකෙන් පෙන්නුම් කරන්න හදන්නේ, ඔබතුමන්ලා ඒ තර්කයේදී කොච්චර පහළට ගිහිල්ලා තිබෙනවාද කියන එකයි. ඒ කියන්නේ, පෙට්‍රල් ෂෙඩ් හතරක්, පහක් මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ නෑදෑයින්ට තිබුණා කියලා, එහෙම දීප ව්‍යාප්ත strike එකක් කරන්න පුළුවන්ද? එහෙම කරන්න බැහැ. දැන් හෙට දොස්තරලා නිකම් හරි strike එකක් කළොත්, ඔබතුමන්ලා මෙතැන ඇවිල්ලා ලැයිස්තු කියවයි, අර මන්ත්‍රීතුමාගේ ඥාතියා මේ දොස්තර, අර මන්ත්‍රීතුමාගේ ඥාතියා මේ දොස්තර කියලා. ඔබතුමන්ලා ලැයිස්තුව කියවයි. ඊළඟට, ගුරුවරු strike කළොත්, ඔබතුමන්ලා ඇවිල්ලා කියයි, මේ මන්ත්‍රීතුමාගේ අක්කා මේ ගුරුවරිය, මේ මන්ත්‍රීතුමාගේ අම්මා ගුරුවරියක් විධියට හිටියා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට නම් තේරෙන්නේ නැහැ, ඇයි මේ තරම් පහළට වැටෙන්නේ කියලා. ඒ තරම් පහළට වැටෙන්න එපා. ඔබතුමන්ලා උසස් දේශපාලන සංස්කෘතියක් හදන්න නේ ආවේ. ඒක නේ, අපි ඇති කරන්න ඕනෑ කියලා කිව්වේ. එහෙම කියලා අන්තිමට මේ තරම් පහළ මට්ටමේ ඉඳන් තර්ක ඉදිරිපත් කරන්න එපා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දැන් මේ මාසයේ 15වැනි දාට රිළවුන් ගණන් කරනවා; උදේ 8.00 සිට 8.05 වෙනකම් රිළවුන් ගණන් කරන්න කියලා තිබෙනවා. එදාට නිකම් හරි උදේ 8.00 ඉඳන් 8.05 වෙනකම් රිළවුන් ආවේ නැත්නම්, ඔබතුමන්ලා ඇවිල්ලා කියයි, විපක්ෂය තමයි රිළවුන්ට යන්න එපා කිව්වේ කියලා. අන්තිමට රිළවුන් ටික CID එකට අරගෙන ගිහිල්ලා අහන්න වෙනවා, නුඹලාට 8.00 ඉඳන් 8.05 වෙනකම් යන්න එපා කිව්වේ කවුද කියලා. රිළවුන් ටික CID එකට අරගෙන ගිහිල්ලා ප්‍රශ්න කරන්න වෙනවා. ඔබතුමන්ලා උසස් දේශපාලන තර්ක ගැන කථා කරන උදවිය හැටියට, වැදගත් තර්ක ඉදිරිපත් කරන්න ඕනෑ. නිකම් ළාබාල, මොන්ටිසෝරි තර්ක ඉදිරිපත් කරලා හරියන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලා බලය ගත්තේ නොයෙකුත් බලාපොරොත්තු දීලා. ඉතින්, අපි විපක්ෂයක් හැටියට ඒ ප්‍රශ්න මතු කරනවා. ඒ මතු කළාම ඒවාට උත්තර නොදී, අර රාජපක්ෂලාගේ තියරිය දාලා හරියන්නේ නැහැ. මොකද, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් විපක්ෂය පැත්තේ හිටියා. අපි ආණ්ඩු කරන කාලයේත් හිටියා. ඔබතුමන්ලාගේ තව උදවිය පසුගිය පාර්ලිමේන්තුවේ අපිත් එක්කම විපක්ෂයේ හිටියා. ඒ නිසා රාජපක්ෂ තියරිය හරියන්නේ නැහැ. දැන් රාජපක්ෂ තියරිය නැති කරන්න නේ බලය ගත්තේ. ඒ නිසා රාජපක්ෂ තියරිය වෙනස් වෙන්න ඕනෑ. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියනවා, මේ ගැන අවධානය යොමු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා සභාවේ ඉන්න නිසා, මම විශේෂ ප්‍රශ්නයක් ගැන කථා කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, Lady Ridgeway Hospital එකේ 2022දී ඇති වෙච්ච සිද්ධියක් සම්බන්ධව කෙරෙන පරීක්ෂණ නැවතිලා තිබෙනවා. හම්දි ෆස්ලිම් කියලා අවුරුදු තුනක ළමයෙකුගේ වම් පැත්තේ kidney එකේ තිබුණු ගැටලුවක් නිසා, 2022 දෙසැම්බර් මාසයේ 24වැනි දා ඒ ළමයා රෝහලේ admit කරනවා. Dr. Malik Samarasinghe තමයි, ඒ ළමයාව භාර ගන්නේ. 2022.12.24 දින Dr. Naveen Wijekoon ඒ ළමයාව

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

operation එකකට භාජන කරනවා. ඒ ශල්‍යකර්මයට භාජන කරන්නේ, ඒ ළමයාගේ වම් පැත්තේ kidney එකේ තිබෙන ආසාදයක් නිසා. ඊළඟට, ඒ ළමයාව දිගින් දිගටම ICU එකේ තියනවා. 2023 හත්වැනි මාසයේ 27වැනි දා ඒ ළමයා අන්තා වෙනවා. ඒ ළමයා මරණයට පත් වුණාට පස්සේ, මම හිතන විධියට 2024 පළමුවැනි මාසයේ 05වැනිදා, Dr. Naveen Wijekoon කියන වෛද්‍යවරයා රටින් පිටමං වෙලා යනවා. මේ පිළිබඳව සොයා බලා ඒ දෙමාපියන් Dr. Malik Samarasinghe මුණ ගැහෙන්න උත්සාහ කළාම, ඔහු රෝහලේදී වෙලාවක් දෙන්නේ නැහැ. අන්තිමට මේ දෙමාපියන්ට Dr. Malik Samarasinghe පෞද්ගලිකව වැනල් කරලා හමු වෙන්න සිද්ධ වෙනවා. පෞද්ගලිකව වැනල් කරලා හමු වුණාම, ඔහු කියලා තිබෙන්නේත් යම් වැරැදීමක් සිද්ධ වුණා, අපි ඒක නිවැරැදි කරන්නම් කියලායි. ඒක ඒ ළමයා මරණයට පත් වුණාට පස්සේ කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන් ඒ ළමයා මිය යන්න කලින් ගත්ත වාර්තා ටිකක් තිබෙනවා. ඒ වාර්තාවල තිබෙනවා ඒ ළමයාගේ kidneys දෙකම තිබුණා කියලා. එකක් තමයි, Asiri Surgical Hospital එකේ Department of Nuclear Medicine මහින් දීපු වාර්තාව. මේ තිබෙන්නේ, ultra sound scan report එක. ඒක Asiri Surgical Hospital එකෙන් නිකුත් කරපු වාර්තාවක්. 2021.02.10වැනි දා තමයි ඒ වාර්තාව නිකුත් කරලා තිබෙන්නේ. ඒ වාර්තාවේ තිබෙනවා, "Left kidney is enlarged with gross hydronephrosis. Right kidney is also prominent in size" කියලා. ඒ වාගේම size එක දාලා තිබෙනවා, right kidney එක 6.7 cm සහ left kidney එක 8.9 cm කියලා. මේ වාර්තාවල කියැවෙනවා ඒ ළමයාගේ kidneys දෙකම තිබුණා කියන එක. Kidneys දෙකම තිබුණු ඒ ළමයාගේ operation එකෙන් පස්සේ - ඒ කියන්නේ, වම් පැත්තේ kidney එක අයින් කළාම - Lady Ridgeway Hospital එකේදී Histopathology Laboratory එකේ Dr. S. Gunarathna විසින් left kidney එක හාර අරගෙන තිබෙනවා කියලා වාර්තාවක් තිබෙනවා. ඒ සියලු වාර්තා මෙතැන තිබෙනවා. දැන් මේ සම්බන්ධව උසාවියේ නඩුවක් තිබෙනවා. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. උසාවියේදී මේ වෛද්‍යවරු දෙන කටඋත්තර එකිනෙකට පරස්පර විරෝධියි. පරස්පර විරෝධීවයි එක් එක්කෙනා ඇවිල්ලා කටඋත්තර දීලා තිබෙන්නේ. නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් මේ වන විටවත් මේ සම්බන්ධව කිසිදු ආකාරයක පරීක්ෂණයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කර නැහැ. ඒ ළමයා රෝහලට ඇතුළත් කරනකොට kidneys දෙකම තිබුණා කියලා වාර්තා වෙනවා. නමුත් operation එකෙන් පස්සේ ඒගොල්ලෝ කියනවා, horseshoe kidney එකක් තිබුණා කියලා. නමුත් horseshoe kidney කියලා නොවෙයි, ඒ වාර්තාවල සඳහන් වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධව ඉදිරිපත් කරපු ඔක්කොම වාර්තාවල තිබෙන්නේ duplex system කියලායි. මේක බරපතළ තත්ත්වයක්.

ගරු ඇමතිතුමනි, මීට පෙර මේ සභාවේ හිටපු සෞඛ්‍ය ඇමතිවරු දෙන්නෙකුගෙන් මම මේ පිළිබඳව ප්‍රශ්න කළා. මුලින්, කෙහෙලිය රඹුක්වැල්ල මහත්තයා හිටියා. ඊට පසුව රමේෂ් පතිරණ මහත්තයා හිටියා. එතුමන්ලා දෙදෙනාගෙන්ම මම පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධව ප්‍රශ්න කළා. එතකොට එතුමන්ලා කිව්වා, "වාර්තා හදලා තිබෙනවා, ඔබතුමාට පෞද්ගලිකව දෙන්නම්" කියලා. නමුත් දුන්නේ නැහැ. ඒ නිසා මම ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, එම ළමයාගේ පවුලේ උදවියට සාධාරණයක් කරන්න කියලා. ඒ, ඉතාම අසරණ පවුලක්. අවුරුදු තුනක ළමයෙකුටයි මේ දේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ ළමයාගේ වකුගඩුවලට මොකක්ද සිදු වුණේ කියලා ඒ දෙමව්පියන්ට දැන ගන්න අයිතියක් තිබෙනවා.

මොකද, මෙහෙම මාෆියාවක් තිබෙනවා. සමහර පෞද්ගලික රෝහල්වල මේ අවයව විකුණන්න ගිහිල්ලා පසුගිය කාලයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවා පරීක්ෂණ කරපු අවස්ථා අපි දැක්කා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් අපි ඉල්ලනවා මේ සම්බන්ධයෙන් සාධාරණත්වය ඉෂ්ට කරන්න කියලා. විශේෂයෙන්ම, ඒ ළමයා රෝහලට ඇතුළත් කිරීමේදී ඒ ළමයාගේ වකුගඩු දෙකම තිබුණා කියලා වෛද්‍ය වාර්තා ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඊළඟ කාරණය මෙයයි. පසුගිය දවස් ටිකේම ඔබතුමා හෙදියන්ගේ මූලික වැටුප සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. ඔබතුමා කිව්වා, හෙදියන්ගේ මූලික වැටුප රුපියල් 104,000ක් වෙනවා කියලා. මම කියන්න කැමැතියි, තුන්වන ශ්‍රේණියේ හෙදියකගේ මූලික වැටුප 2025 අප්‍රේල් මාසයට තමුන්නාන්සේලා වැඩි කරපු ගණනත් එක්ක රුපියල් 71,793යි වෙන්නේ කියන එක. එක්ලක්ෂ ගණනක් නොවෙයි. ඒ නිසා ඒක නිවැරදි වෙන්න ඕනෑ. මම දන්නේ නැහැ ඔබතුමාට ඒ දත්ත කවුද ලබා දුන්නේ කියලා. ඔබතුමන්ලා කළ වැටුප් වැඩිවීමත් එක්ක අප්‍රේල් මාසයේ හෙදියන්ගේ මූලික වැටුප වෙන්නේ රුපියල් 71,793යි. ඒක තමයි ගණන. ඒ වාගේම හෙදියන්ගේ overtime එක වෙනස් වෙලා තිබෙනවා. ඒගොල්ලන්ගේ promotionsවල කාලය වෙනස් වෙලා තිබෙනවා. අවුරුදු 5, අවුරුදු 10 වෙලා තිබෙනවා. අවුරුදු 10, අවුරුදු 20 වෙලා තිබෙනවා. සමහර අයට පළමුවෙනි ශ්‍රේණියට යන්න අවුරුදු 31ක් බලාගෙන ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ විධියට promotion කාලය වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය යෝජනා තුළ ඒ වෙනස් වෙලා තිබෙන සමහර දේවල් සම්බන්ධව නැවත සලකා බලලා ඒ ඉන්න කාර්ය මණ්ඩලයට; ඒ රජයේ සේවකයන්ට සාධාරණත්වය ඉෂ්ට කරන්න කියලා මම ඉල්ලනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමාගේ අවධානයට මම තවත් විශේෂ කාරණාවක් යොමු කරනවා. අපි දැක්කා, 2022, 2023 කාලයේ මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල ලෙස හදිසි මිලදී ගැනීම් සිද්ධ වුණු බව. බෙහෙත්වලට විශාල ලෙස වැඩිපුර මුදල් ගෙවිවා. එහිදී GE Healthcare Ireland ආයතනය විසින් contrast media කියන එකෙන් 34,000ක quantity එකක් අරගෙන තිබෙනවා. ඒ අරගෙන තිබෙන්නේ unit එකක් රුපියල් 2,025කට. ඒකට ගිහිල්ලා තිබෙන්නේ රුපියල් මිලියන 137යි. ඊළඟට ඒ අවුරුද්දේම Sunshine Healthcare Lanka කියන ආයතනයෙන් 22,500ක quantity එකක් අරගෙන තිබෙනවා, ඒ unit එකක් ගන්න රුපියල් 75,628ක් වියදම් කරලා තිබෙනවා. මේ, 2022, 2023 වර්ෂවල. අන්තිම order එක ඇවිල්ලා තිබෙන්නේ 2023දී. මේ ආයතන තවම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි වෙලා තිබෙන ආයතන. ඒකයි මම කියන්නේ, මේ වංචාව ගැන සොයන්න කියලා. ඒ කියන්නේ, රුපියල් බිලියන 1.7ක් ගෙවලා තිබෙනවා. බලන්න, gap එක කීයද කියලා. මව් සමාගම රුපියල් 2,025ක වටිනාකමට දෙනවා. ඒ ගොල්ලන්ගේ ඒජන්තයෝ සෞඛ්‍ය අමාත්‍යාංශයට විකුණනවා, රුපියල් 75,628ට. මේක බරපතළ මූල්‍ය වංචාවක්. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියනවා, මේ විධියට කොහොමද ගසා කෑවේ කියලා වහාම සොයන්න කියා. ඒ ආයතන තවමත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතන හැටියට තිබෙනවා. ඒකයි මම මේ කිව්වේ, මේ ගැන සොයා බලන්න කියලා. ඇමතිවරුන් පත් වෙලා ආවාම ඒගොල්ලෝ ගිහිල්ලා ඒ ඇමතිවරුන් අල්ලා ගන්නවා. ඒක ඉතාම දරුණුවට සිද්ධ වෙනවා. ඊට කලින් හිටපු ඇමතිවරුනුත් අල්ලා ගත්තා. ගරු ඇමතිතුමනි, සමහර විට නැරැඹිකාරයන් දාගෙන ඒගොල්ලෝ දැන් ඔබතුමන්ලාගේ වටෙත් කැරකෙනවා ඇති, ඔබතුමන්ලාත් අල්ලා ගන්න. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාට කියනවා, මේ පිළිබඳ පරීක්ෂණයක් කරන්න කියලා.

ඊළඟට, විශේෂයෙන්ම මාධ්‍ය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මා කැමැතියි, ගරු ඇමතිතුමනි. අපි ඔක්කෝම විපක්ෂයේ ඉන්න කොට මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනතට විරුද්ධත්වය පළ කළා. ඇයි ඒ පනත තවම අහෝසි නොකරන්නේ? දැන් ඔබතුමන්ලා අලුත් පනත් කෙටුම්පතක් ගේන්න හදනවා. අලුත් පනත් කෙටුම්පතක් ගේනවා නම්, ඒ අලුත් පනත් කෙටුම්පත ගෙන ඒමේදී, සමාජ මාධ්‍යවල වැඩ කරන උදවිය එක්ක සාකච්ඡා කරලා, අන්තර්ජාල සමාගම් එක්ක සාකච්ඡා කරලා ගේන්න පුළුවන්. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ පිළිබඳ අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙන කල් පසුගිය ආණ්ඩුව ගෙන ආ Online Safety Act එක වහාම අහෝසි කරන්න කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

කවුරු හරි කෙනෙකු අනියම් ආකාරයෙන් චෝදනා කරනවා නම්, එහෙම නැත්නම් අසත්‍ය චෝදනා කරනවා නම්, එහෙමත් නැත්නම් තමන්ට නැති නීතියක් වෙනත් අයුරකින් අතට අරගෙන වැඩ කරනවා නම්, ඒවා පාලනය කරන්න මේ රටේ ඕනෑ තරම් නීති රීති තිබෙනවා. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. ඒ හින්දා, මාධ්‍ය ඇමතිවරයා වන ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, ගිය ආණ්ඩුව ගෙන ආපු Online Safety Act එක - මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත - ඔබතුමා වහාම අහෝසි කරන්න කියලා. අලුත් පනත් කෙටුම්පතක් ගෙන එමු. ජනමාධ්‍යවේදීන්, අන්තර්ජාලයේ වැඩ කරන මාධ්‍යවේදීන්, අන්තර්ජාල සමාගම් ආදි සියලු දෙනාම එකතු කරගෙන සාකච්ඡා කරලා අපට අලුත් පනත් කෙටුම්පතක් ගේන්න පුළුවන්. ඒ වෙනුවෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.45]

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කියමනක් තිබෙනවා, "මා අත ඇති සැරයටිය මට ඕනෑ ලෙස ඕනෑම දිශාවකට, මට ඕනෑ ආකාරයකට හැරවිය හැකියි; නමුත් එසේ වැනීම අනෙකාගේ නාසය ළඟින් සීමා වන බව මා දත යුතුයි" කියලා. මම හිතනවා, මේ කියමන සියලු දෙනාට අදාළ වනවා වාගේම, ජනමාධ්‍යකරණයේ නියැළෙන සියලු දෙනාටත් අතිශයින් වැදගත් වෙනවා කියලා.

රටක නිදහස්, අපක්ෂපාතී ජනමාධ්‍ය කියලා කියන්නේ ඒ රට ප්‍රජාතන්ත්‍රවාදී මාවතක ගමන් කරනවාද කියලා පෙන්වන, ඒ සඳහා මහ පෙන්වීමක් කරන, යම් නියාමකත්වයක් දෙන කුලුනක්. අනෙක් අතට කියනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදයේදී සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් අපක්ෂපාතී, නිදහස්, ස්වාධීන, මැදහත් ජනමාධ්‍යකරණයක් පැවතීම කියන එක රටකට ඉතාම වැදගත්. හැබැයි, වර්තමානය වන කොට ලංකාවේ අපට මේ ජනමාධ්‍ය සම්බන්ධයෙන් අවදානම් දෙකක් තිබෙනවා. ඉන් පළමුවැනි අවදානම බවට පත් වෙලා තිබෙනවා, අපි ජනමාධ්‍ය කෙරෙහි අසීමිත විශ්වාසයක් තැබීම. ඒකට හේතුව, වර්තමානය වන කොට අප ජීවත් වන්නේ ඉතාම අසත්‍ය, වැරදි තොරතුරු සත්‍ය ආකාරයෙන් හුවා දක්වන ජනමාධ්‍යකරණයක් සමඟ වීමයි. ඒ වාගේම දෙවැනි අවදානම බවට පත් වෙලා තිබෙනවා, ඒ ජනමාධ්‍ය කෙරෙහිම අද වෙද්දී අසීමිත අවිශ්වාසයක් තබා තිබීම. හේතුව, වර්තමානයේ අපි තොරතුරු උකහා ගන්නේ, තොරතුරු බෙදා හදා ගන්නේ ජනමාධ්‍ය හරහා වීමයි. මේ නූතන ලෝකය තුළ අපට රටක් විධියට ලෝකයත් එක්ක අත්වැල් බැඳගෙන ඉදිරියට යන්න, ඒ වාගේම අවිධිමත් ආකාරයෙන් දැනුම ලබා ගන්න ජනමාධ්‍ය කියන එක ඉතාම වැදගත්. නමුත්, මේ අවදානම් දෙකත් එක්ක තමයි අපි ජීවත් වෙන්නේ. ජනමාධ්‍ය කෙරෙහි අසීමිත ලෙස විශ්වාසය තැබීමත් අවදානමක්. අසීමිත ලෙස අවිශ්වාස කිරීමත් අවදානමක් බවට පත් වෙලා තිබෙනවා.

පසුගිය දිනක අපි ආණ්ඩුව විධියට ගත්තු යම් දේශපාලනික තීරණයක් සම්බන්ධයෙන් වන ප්‍රවෘත්තිය ලංකාවේ ප්‍රසිද්ධ මාධ්‍ය ආයතන දෙකක් - රූපවාහිනී නාළිකා දෙකක් - මෙන්න මේ විධියට වාර්තා කරලා තිබුණා: "ඉදිරියේදී අඩු වියදමින් සුනිල් අරක්කු දෙන්නයි යන්නේ. ලංකාවම මත් කරන ආණ්ඩුවේ අලුත්ම වැඩේ" මෙහෙම තමයි පැත්ත ගියත් ඇත්ත කියනවා කියලා සමහර මාධ්‍ය ආයතන මේ දේශපාලන තීරණය ජනමාධ්‍ය හරහා වාර්තා කරලා තිබුණේ. මේකම වෙනත් ආකාරයකින් පෞද්ගලික රූපවාහිනී නාළිකාවක් වාර්තා කළා. ඒ, "ලංකා සීනි සමාගමෙන් ජනතාවට දෙන ප්‍රමිතිගත නිෂ්පාදනයක් ගැන ඇමති හඳුන්නෙත්තිගෙන් අනාවරණයක්" යනුවෙනුයි. මේ, එකම දේශපාලන සිද්ධියක් ගැන මාධ්‍ය ආයතන දෙකක් රටේ ජනතාවට තොරතුරු ලබා දෙන ආකාරයයි. එහෙම නම්, ජනමාධ්‍යකරණයයි, ජඩමාධ්‍යකරණයයි කියන්නේ මොකක්ද, ඒ දෙකේ වෙනස මොකක්ද කියන එක සම්බන්ධයෙන් තේරුම් නොගන්න තරම් අනුවණ, නොමේරූ, ළදරු මනසක් තිබෙන මිනිසුන් මේ රටේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. ආණ්ඩුවක් විධියට අපි කිසිසේත් නොමේරූ ළදරු ආණ්ඩුවක් නොවෙයි, මේ මාධ්‍යකරණයන් දෙකේ තිබෙන වෙනස වටහා ගන්න බැරි වෙන්න.

අපි දන්නවා, තමන්ගේ ජීවිතය පවා අවදානමට ලක් කරගෙන මිනිසුන්ට සත්‍ය තොරතුරු ලබා දෙන්න ප්‍රශස්ත මාධ්‍යකරණයක නියැළිච්ච මාධ්‍යවේදීන් එදත් හිටියා, අදත් ඉන්නවා කියලා. ලසන්ත වික්‍රමතුංග ජනමාධ්‍යවේදියා ඝාතනය වෙන්න මාස කීපයකට කලින් ප්‍රකාශයක් කරනවා, "බිය කියන එක මගේ ජීවිතයේ ගෑවිලාවත් තිබෙන වචනයක් නොවෙයි" කියලා. සැබෑ මාධ්‍යකරණයේ නියැළිච්ච එවැනි මාධ්‍යවේදීන් එදත් හිටියා; අදත් ඉන්නවා. අපි ඔවුන්ට ඉතා ගරුත්වයෙන් ඒ ගෞරවය ලබා දිය යුතුයි. ජනතාව යහ මඟට ගන්න, මේ රටේ system එක හරියට හදන්න, මෙහි තිබෙන අවුල් ලිහන්න තමන්ගේ පෑන, තමන්ගේ කැමරාව, තමන්ගේ පත පොත, තමන්ගේ පැන්සල පාවිච්චි කරන මාධ්‍යවේදීන් එදාත් හිටියා; ඒ වාගේම අදත් ඉන්නවා.

ආණ්ඩුව විධියට අද අපට විශාල වගකීමක් තිබෙනවා, මේ ජනමාධ්‍ය ප්‍රශස්ත මට්ටමකට රැගෙන ඒම සඳහා. මේ මාධ්‍යවේදීන් අද වන කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14වැනි ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදන අනුව, අයිතිවාසිකමක් විධියට තමන්ගේ නීත්‍යානුකූල වෘත්තිය කරගෙන යනවා, භාෂණයේ නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මුල් කරගෙන. ඒ වාගේම, ඔවුන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හරහාත්

[ගරු නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

තමන්ගේ වෘත්තිය ඉතා සාර්ථකව කරගෙන යනවා. හැබැයි, ඒ වාගේම අපි දන්නවා ජනමාධ්‍යවේදීන් තමන්ගේ වෘත්තිය කරගෙන යන්න ඕනෑ සීමා මොනවාද කියලාත් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම අපට කියා දෙන බව. මහජන ආරක්ෂාව, ජාතික සංහිඳියාව, අන් සියලුදෙනාගේ නන් වැදෑරුම් නිදහස සහ අයිතිවාසිකම්, වාර්ගික හා ආගමික සහයෝගීතාව, මහජන සෞඛ්‍යය, පාර්ලිමේන්තු වරප්‍රසාද වාගේම අධිකරණයට අපහාස කිරීම ආදිය හා සම්බන්ධ සීමාවන් තිබෙනවා. මේ සියලු සීමාවන්හි දිග පළල දැනගෙන තමයි ජනමාධ්‍යවේදීන් තමන්ගේ වෘත්තියෙහි නියැළිය යුතු වන්නේ.

නමුත් අපි දන්නවා, ප්‍රායෝගිකව ලෝකයට එන කොට, පොළොවට එන කොට ඒක එහෙම වෙන්නේ නැති බව. දණ්ඩ නීති සංග්‍රහයෙන් අසභ්‍ය ප්‍රකාශන පළ කරන්න බැහැ කියලා පැහැදිලිව කියා තිබුණාට ඒක එහෙම වෙන්නේ නැහැ. අසභ්‍ය ප්‍රකාශන මාධ්‍ය හරහා නිකුත් කෙරෙනවා අපි දකිනවා. ආගම්වලට අපහාස කිරීම ආගමික අපහාසකාරී ආඥා පනත, දණ්ඩ නීති සංග්‍රහය ආදියෙන් තහනම් කරලා තිබුණාට ඒක එහෙමම වෙන්නේ නැහැ. ඒ වාගේම, අපරාධයක විස්තිතයන් විධියට ළමයින්, කාන්තාවන් ඉන්න කොට ඒ අයගේ ඡායාරූප ප්‍රදර්ශනය කරමින්, අපරාධය සිද්ධ වෙච්ච ආකාරය කොහොමද කියලා ජනතාවට කියමින්, කතන්දරය ඉතා හොඳින් නිර්මාණය කරමින් තමයි ජනමාධ්‍ය එම ප්‍රචාරණ කටයුතු කරන්නේ. ඇතැම් අවස්ථාවල අපි දකිනවා, වෛරය උසිගන්වන ආකාරයේ පුවත් මේ මාධ්‍ය හරහා ප්‍රචාරය කෙරෙන ආකාරය. ඒ නිසා මේවා යම් නියාමනයකට ලක් විය යුතුයි කියන කාරණය ආණ්ඩුව විධියට අපි අවධානයට ලක් කර තිබෙනවා.

ඇයි මෙහෙම වෙන්න හේතුව? කාරණා දෙකයි. එකක්, ජනමාධ්‍ය පැහැදිලිවම දේශපාලනීකරණය වීම. එතකොට තමන්ම ආරාධනා කරන යම් යම් අය තමන්ගේ වැඩසටහනට ආවාම flat කරලා, නැති කරලා, චරිතය ඝාතනය කරලා දමන තැනට මාධ්‍ය ආයතන පත්වීම කෙතරම් අනුවේදනීය ද? මේක එහෙම වෙන්න හොඳ නැහැ. මේක යම් නියාමනයකට ලක් විය යුතුයි. මේ දේශපාලනීකරණය වීම ඇතුළේ තමන්ගේ ප්‍රතිවාදියාගේ මතවාදය දරා ගන්න බැරි නම් ඒ මාධ්‍ය ආයතන තවදුරටත් ඒ වැඩසටහන් කරලා තේරුමක් නැහැ. අපි මේ කාරණය අවධානයට ලක් කළ යුතුයි.

අනෙක් කාරණය තමයි, තරගකාරිත්වය සහ ලාභය. මළ සිරුරක් තිබෙනවා නම් ඒ මළ සිරුරෙන් හරි සල්ලි හොයන්න පුළුවන් ක්‍රමයක් තමයි හොයන්නේ. සියදිවි නසා ගැනීමක් නම් ඒ සියදිවි නසාගත්තු ක්‍රමය මොකක්ද, ඒ සඳහා පාවිච්චි කරපු උපකරණ මොනවාද ආදි සියල්ල පෙන්වනවා. තවත් දරුවෙකුට ඒක අත්හදා බලන්න පුළුවන් පහසු ක්‍රමවේද සියල්ල මාධ්‍ය හරහා හෙළිදරව් කරනවා. නඩුවක් නම් ඒ නඩුව අහලා, තීන්දුව දීලා, සැකකාරයන් චූදිතයන් කරලා, අපරාධකාරයන් කරලා දඩුවම ද දීලා ඉවරයි. මේ ක්‍රමය වෙනස් විය යුතුයි. ආණ්ඩුවක් හැම තිස්සේම උත්සාහ කරන්නේ ඍජු හෝ වක්‍ර නීති පනවා මාධ්‍ය පාලනය කරන්නම නොවෙයි. අප කියන්නේ මේක යම් නියාමනයකට ලක් වෙන්න ඕනෑ කියලායි. අපි ආණ්ඩුව විධියට මේ ගැන අවධානය යොමු කර තිබෙනවා. ලංකාවේ පත්තර කලාව බිහි වෙලා අවුරුදු 100ක් ගියාට පස්සේ තමයි, 1981දී පුවත් පත් කර්තෘවරු 21දෙනෙකු එකතු වෙලා ආචාර ධර්ම පද්ධතියක් හදන්නේ. හැබැයි, ඒක යාවත්කාලීන වෙලා නැහැ. අපි ණ්ඩුවක් විධියට අවධානයට ලක් කර තිබෙනවා, ඒ කටයුතු කරන්න.

ඒ වාගේම ගුවන් විදුලි සංස්ථාව ගත්තාම, අවුරුදු 10 - 15 රැකියාවේ ස්ථිර නොවුණු වැඩසටහන් අංශයේ, නිෂ්පාදන අංශයේ සේවයේ නියුතු අය ඉන්නවා. මේ අයගේ වෘත්තිය නිපුණත්වය මත යම් කිසි උසස්වීමක්, ස්ථිර වීමක් බලාපොරොත්තුවෙන් යම් කිසි කනස්සල්ලකින් ඉන්නවා නම්, ආණ්ඩුව විධියට අපි ඒ ගැන අවධානය යොමු කර තිබෙනවා.

ඒ වාගේම මේ වසරේදී ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කරන්න අපේ ආණ්ඩුව කල්පනා කරනවා. ඒ වාගේම ජනමාධ්‍යවේදීන් උපාධියක්, පශ්චාත් උපාධියක් හදාරනවා නම් රුපියල් ලක්ෂ දෙකක මුදල් ප්‍රදානයක්, සහතික පත්‍ර පාඨමාලාවක් හදාරනවා නම් රුපියල් ලක්ෂයක මුදල් ප්‍රදානයක් "ඇසිදිසි" ශිෂ්‍යත්ව ප්‍රදානය හරහා ලබා දෙන්න අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ වාගේම විධිමත් අධ්‍යාපනයක් ලබන්න, භාෂා කුසලතාව දියුණු කර ගන්න, යාවත්කාලීන පුහුණුවීම් සඳහා අපේ ආණ්ඩුව යටතේ ජනමාධ්‍ය පාසල බිහි කරන්න කල්පනා කර තිබෙනවා. ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය ස්ථාපිත කිරීම, වෙබ් අඩවි ලියාපදිංචි කිරීම කෙරෙහි අපි විශේෂ අවධානයක් ලක් කර තිබෙනවා. මේ හරහා අසභ්‍ය පුවත් සමාජගත කරන වෙබ් අඩවි යම් නියාමනයකට ලක් කරන්න බලාපොරොත්තුවක් තිබෙනවා.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව කියන්නේ ජාතික වටිනාකමක් සහිත ආයතනයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපි බලාපොරොත්තු වෙනවා, ගුවන් විදුලි සංස්ථාවේ තැටි/පටි ගබඩාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සතුව තිබෙන වටිනා ගීත පුස්තකාලය වාගේම, ආරම්භක යුගයේ සිට මේ දක්වා පාවිච්චි කරන සියලු උපකරණ ඇතුළත් කෞතුක වස්තු එකතු කරලා, රටේ දරුවන්ට වාගේම විදේශිකයන්ටත් නැරඹිය හැකි කෞතුකාගාරයක් ගොඩ නඟලා, ඒකෙන් යම් ආදායමක් උපයා ගන්න ගමන් එහි වටිනාකම රටේ ජනතාවට, ලෝකයට කියාපාන්න. ඒ අනුව, අපට යම් වැඩ පිළිවෙළක් තිබෙනවා, අපට දැක්මක් තිබෙනවා. අපි මේ අය වැයෙන් වෙන් කරපු ප්‍රතිපාදන එක්ක ප්‍රශස්ත ජනමාධ්‍යකරණයක් වෙනුවෙන් ජනමාධ්‍යවේදීන් සමඟ මේ අවුරුද්දක කාලය තුළ මේ ගමන ඉදිරියට යන්න බලාපොරොත්තු වෙනවා කියමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.55]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද කාරක සභා අවස්ථා විවාදයේදී මට ඇත්ත වශයෙන්ම ආණ්ඩුවට මේ කාරණා කියන්න ඕනෑ. පසුගිය ආණ්ඩුව කාලයේ තමයි ලංකා ඉතිහාසයේ දුෂණ, වංචා වැඩිම ප්‍රමාණයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිද්ධ වුණේ. ඒ නිසා අපි හිටපු අමාත්‍යවරයාට විරුද්ධව ඒ වෙලාවේ විශ්වාස භංග යෝජනාවකුත් ගෙනාවා. හැබැයි, ඒ විශ්වාස භංග යෝජනාවට විරුද්ධ වෙච්ච කට්ටියක් ඉන්නවා; මේ සභාවේත් ඉන්නවා. ඒ නිසා මම විශ්වාස කරනවා, මිනිස්සුන්ගේ ඇස් අන්ධ කරලා, පිළිකා රෝගීන්ට පිළිකා බෙහෙත් වෙනුවට වතුර විදපු කට්ටියට - මේ සහගහන අපරාධ කරපු අයට- දඬුවම් ලබාදීම ආණ්ඩුවේ වගකීමක් කියලා. ඒ නිසා දැන් 76 වසරක ශාපය කියලා බැණ බැණ ඉඳලා වැඩක් නැහැ, තේරුමක් නැහැ. මොකද, රාජපක්ෂලා බලයට ගෙනාවේ ඔබතුමන්ලා. 2004දී සුනාමි අරමුදල් වංචා සම්බන්ධ චෝදනා ලබලා තිබෙද්දී රාජපක්ෂලා බලයට ගෙනාවේ ඔබතුමන්ලා. මේ ඉස්සරහ පුටුවේ ඉඳගෙනද කොහේද එදා අනුර කුමාර දිසානායක මැතිතුමා -මා ළඟ වීඩියෝ එකත් ඇති- ජේවීපී එක මහින්ද රාජපක්ෂ අගමැති කරන්න පෙලඹුණේ ඇයි කියලා ඒක සාධාරණීකරණයත් කළා. මම ඊයේ දැක්කා, මහින්ද මහත්මයායි, චන්ද්‍රිකා මැතිනියයි, අනුර කුමාර මැතිතුමායි උදලු තලයක් තියාගෙන මුල් ගලක් තියන්න ගිය photo එකකුත්. එතකොට 76 වසරක ශාපයේ කොටස්කරුවෝ වෙච්ච ඔබතුමන්ලාත්, ඒක විකුණලා බලයට ආවා. දැන් අදාළ අයට දඬුවම් දෙන්න.

ඒ එක්කම මම සෞඛ්‍ය ඇමතිතුමාට මේකත් කියන්න ඕනෑ. ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව මේ රටේ මුස්ලිම් ජනතාවගෙන් පළිගැනීම උදෙසා, පැහැදිලිවම පළිගැනීම උදෙසා, කොරෝනා මෘතදේහ බලෙන් ආදාහනය කළා, කිසිදු විද්‍යාත්මක හේතුවක් නැතිව. අර වඳ කොත්තු මැව්වා වාගේ, වඳ ෂාෆි මැව්වා වාගේ, වඳ බෙහෙත් මැව්වා වාගේ තමයි ඒක කළේ. ඒ වෙනුවෙන් කඩේ යන්න ඕනෑ තරම් වෛද්‍යවරු, ආචාර්ය, මහාචාර්යවරු හිටියා. ඒ අය කිව්වා වතුරෙන් කොවිඩ් ආසාදනය වෙනවා කියලා. මට මතකයි, මම ඒ වෙලාවේ හිටපු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් දවසක් ඇහුවා, "මගේ ආසනයේ තමයි IDH රෝහල තිබෙන්නේ, වතුරෙන් කොරෝනා බෝ වෙනවා නම් ලංකාවේම ඉන්න කොරෝනා ලෙඩ්ඩු මෙහේට ගෙනැල්ලා මෙහේ ඉන්න අයට බෝ කරන්න හදන්නේ ඇයි" කියලා. ඒකට දෙන්න උත්තරයක් එතුමන්ලාට තිබුණේ නැහැ. ඒ නිසා මේක පළිගැනීමක්. මේක වෛරය පිරිමැහීමක්. ඒ නිසා බලෙන් මෘත දේහ ආදාහනය කරපු අයගේ නම් ලැයිස්තුව අපි ඉල්ලනවා. මේ රටේ මුස්ලිම් ජනතාවගෙන් සියයට 70ක් විතර ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ඡන්දය දුන්නා. අපි හිතුවා, අඩුම ගණනේ ඒකට සාධාරණයක් කරන්නවත් ඒ ලැයිස්තුව ලබාදෙයි කියලා. යම් යම් හේතු මත නම් වශයෙන් ඒක දෙන්න බැරි නම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෘත දේහ කොච්චර ප්‍රමාණයක් බලෙන් ආදාහනය කර තිබේද යන්න සොයා බලා, එම ලැයිස්තුවවත් දීලා ඒ අයට සාධාරණය ඉෂ්ට කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. සාමාන්‍යයෙන් මුස්ලිම් ජාතිකයෙකුගේ මෘත දේහයක් පැය 24ක් ඇතුළත භූමදානය කරනු ලබනවා. එම පුද්ගලයාගේ දේහය භූමදානය කරන්නේ, මිය ගිය පුද්ගලයාගේ මොළය මිය ගියත් පුච්චනකොට ඔහුගේ ශරීරයට අනිවාර්යයෙන්ම යම් බලපෑමක් ඇති වන නිසායි. ඒක මට වැඩිය හොඳට සෞඛ්‍ය ඇමතිතුමා දන්නවා. එම නිසා ඔවුන් වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

ඊළඟට, සෞඛ්‍ය ඇමතිතුමා ජනමාධ්‍ය ඇමති වශයෙනුත් කටයුතු කරන නිසා මම එතුමාගෙන් එක දෙයක් ඉල්ලන්න කැමැතියි. ලංකාවේ එක රාජ්‍ය මාධ්‍ය ආයතනයක්වත් ලාභ ලබන්නේ නැහැ. ඒ පාඩුව ආණ්ඩුවට දරාගන්න පුළුවන්ද? එතකොට, තරගකාරී වෙළෙඳ පොළට ඇතුළු වෙන්න රාජ්‍ය මාධ්‍ය ආයතනවලට වුවමනාවක් නැද්ද? විශේෂයෙන්ම බිලියන 5කට අධික advertising market එකේ ආණ්ඩුවේ spendings විශාල ප්‍රමාණයක් තිබෙනවා. එසේ වියදම් කරන ආයතන ආණ්ඩුවේ නිසා ඒවා ආණ්ඩුවේ මාධ්‍යයට දෙන්න කිව්වාට එහෙම වෙන්නේ නැහැ. රාජපක්ෂ පාලන කාලයේ එහෙම try කළා. නමුත් ඒ විධියට මාධ්‍ය ආයතන ගොඩ දමන්න බැහැ. Market share එක තිබෙනවා නම්, අනිවාර්යයෙන්ම හැම advertising agency එකකින්ම portion එකක් වෙන් වෙනවා. එතකොට, ආණ්ඩුවේ ආයතන තමන්ගේ market share එක වැඩි කර ගන්න අද කටයුතු කරනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. මොකද, එක රූපවාහිනී නාළිකාවකුයි, එක ගුවන්විදුලි නාළිකාවකුයි තනිකරම ගිය ආණ්ඩුවට වඩා විපක්ෂයට මඩ ගහන වැඩසටහන් තමයි කරන්නේ. ගරු ඇමතිතුමනි, මෙතැනදී ඒ වැඩසටහනේ නම කියන එක හොඳ නැහැ. මම දන්නේ නැහැ, ඔබතුමා ඒ ගැන දැනුවත්ද කියලා. පැලවත්ත කාර්යාලයෙන් ඒ පිටපත එවනවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. අපි ඉස්සර තමයි මාධ්‍ය ආයතන ඒ වාගේ රෙදි අපුල්ලනවා දැක්කේ. නමුත්, මේ ආණ්ඩුව කියපු දේවල් එක්ක ඒ විධියට වැඩ කටයුතු කරයිද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ඒ එක්කම, රජයේ රූපවාහිනී නාළිකා සහ ගුවන් විදුලි නාළිකා අදට ගැළපෙන පරිදි ජනතාවගේ රසඥතාව වාගේම market share එක අල්ලා ගැනීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කරනවාද කියන එක පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, නලින්ද ජයතිස්ස ඇමතිතුමා දන්නවා ඇති, මමත් ගුවන් විදුලි නාළිකා 5ක ප්‍රධානියෙක් වෙලා හිටියා. පාඩු ලබන සමාගම්, ලාභ ලබන සමාගම් බවට පත් කළා. රසාස්වාදය උදෙසා ප්‍රශස්ත වැඩසටහන් කළා. ඒ වාගේම වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් වැඩසටහනුත් ගෙනාවා. එම නිසා මේ ආණ්ඩුව මේවායේ බර දරන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඔව්, රාජ්‍ය මාධ්‍ය ආයතනවලට සාමූහික වගකීමක් තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමේ කාර්යයත් කළ යුතුයි. මම ඒක නැහැයි කියලා කියන්නේ නැහැ. නමුත් ඒ ආයතන විසින් සොයාගන්නා වූ මුදල්වලින් යැපෙන්න ඕනෑය කියන එක තමයි අපේ මතය. ඒ වාගේම මම පැහැදිලිව කියනවා, බොහෝ රජයේ මාධ්‍ය ආයතන වැට බද්ද ගෙවන්නේ නැති බව. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇවිල්ලා තවම මාස 5යි. එම ආයතන ලාභ ලබන තත්ත්වයට පත් කරන එක මාස 5න් කරන්න බැහැ. අඩුම ගණනේ අවුරුදු එකහමාරක් යනකොට proper marketing plan එකක් එක්ක ගිහිල්ලා, වැඩසටහන් නවීකරණය කරලා, market share එක වැඩි කරගෙන ලාභ ලබන තත්ත්වයට ගේන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ එක්කම අපි ඉල්ලීමකුත් කරන්න කැමැතියි. පසුගිය ආණ්ඩුව මාධ්‍ය මර්දනය සඳහා තමයි Online Safety Act එක ගෙනාවේ. මාධ්‍යවේදීන් ඉලක්ක කරගෙන තමයි Online Safety Act එක ගෙනාවේ. මට මතකයි, ඒ වෙලාවේ ආණ්ඩුව පැත්තේ හිටපු ඇමතිවරයෙක්ම, -එතුමා හිටපු මාධ්‍යවේදියෙක්- ඒක සාධාරණීකරණය කරලා කථා කළා. ඒ ගැන අපි කනගාටු වෙනවා. එම නිසා, ව්‍යුහාත්මක වෙනසක් සහිතව අලුත් පනත් කෙටුම්පතක් ගේන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මාධ්‍යවේදීන්, මාධ්‍ය ආයතන, වෘත්තිකයන් සහ විශේෂඥයන් එක්ක සාකච්ඡා කරලා එවැනි පනතක් ගේන්න යම් කාලයක් යනවා. නමුත්, එතෙක් මේ පනත අකුලා ගන්න. මොකද, මේ පනත නිසා මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය ආයතනවලට ඉලක්කගත

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

වෙලා තිබෙන කාරණා හේතුවෙන් යම් යම් අයට පීඩා ඇති වෙන්න පුළුවන්. එම නිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වර්තමානයේ තාක්ෂණය භාවිතයෙන් මාධ්‍ය හැසිරවීම සහ මාධ්‍ය භාවිතාව වෙනස් වීමත් එක්ක යූටියුබ් නාළිකා විශාල ප්‍රමාණයක් බිහිවෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ යූටියුබ් නාළිකා, ප්‍රධාන ධාරාවේ තිබෙන සමහර මාධ්‍යවලට වඩා ජනප්‍රියයි. හැබැයි, මේ යූටියුබ් මාධ්‍යවේදීන්ට licence එකක් නැහැ, registration එකක් නැහැ. මම දැනුවත්ව ඔවුන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමක් වෙන්නේ නැහැ. එහෙම දෙයක් වෙලා නැහැ. ඒ වාගේම එම මාධ්‍ය ආයතන ලියාපදිංචි වෙලාත් නැහැ. යම් ගුවන් විදුලි නාළිකාවක් හෝ රූපවාහිනී නාළිකාවක් හෝ ජනමාධ්‍ය අමාත්‍යාංශය හරහා රජයෙන් සංඛ්‍යාත ගනිද්දී යම් යම් වගන්තිවලට එකඟ වෙලා යම් යම් guidelines follow කරන්න ඕනෑ.

යූටියුබ් නාළිකාවලටත් ඒ විධියේ registration එකක් ඉදන්න. ඒ මාධ්‍යවේදීන් monetization මඟින් මොන තරම් ලාභයක් ලැබුවත්, බැංකුවකට ගියාම ණයක් ගන්න බැහැ. ඔබතුමන්ලා දාපු සියයට 15 බද්ද හරහා ණයක් ගන්න පුළුවන්කමක් ලැබෙයිද කියලා මම දන්නේ නැහැ. මොකක්ද හේතුව? අපි දන්නවා, යූටියුබ් චැනල් 177ක් අවුරුදු තුනක් තිස්සේ ඔබතුමන්ලාට වැඩ කළා, මාලිමාවේ campaign එක කරන්න. Facebook pages 400 ගණනක් තිබුණා. ඒ අය ක්‍රමානුකූලව බිත්තිය දිගේ වතුර බිංදුව, බිංදුව කාන්දු වෙනවා වාගේ තමයි ඔබතුමන්ලාගේ campaign එකට 76 වසරක ශාපය කියන එක මේ රටේ යූටියුබ් චැනල් නරඹන, ෆේස්බුක් බලන කාන්තාවන්ගේ ඔළුවට දැම්මේ. මම මීට පෙරත් ඒ කථාව කියපු නිසා මම නැවත ඒ කථාව කියන්නේ නැහැ. තනිකරම එයාගේ ජීවිතයට මෙහෙම වුණේ මේ ආණ්ඩු දෙකේ 76 වසරක ශාපය නිසාය කියන මතය මේ Facebook pages සහ යූටියුබ් චැනල් හරහා තමයි ගෙදර කාන්තාවගේ ඔළුවට දැම්මේ. හැබැයි, ඔබතුමන්ලා ආපු ගමන් මේ අයට සියයට 15ක බද්දක් දැම්මා. ඒකෙන් යම් සාධාරණයක් වෙනවා නම්, ඔවුන්ට වෘත්තීමය වටිනාකමක් ලැබෙනවා නම්, වෘත්තීය පිළිගැනීමක් ලැබෙනවා නම්, වෘත්තීය අයිතිවාසිකම් ලැබෙනවා නම් කමක් නැහැ. ඔබතුමා ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරයි කියලා මම හිතනවා. කෙසේ නමුත් මම ඉල්ලීමක් කරනවා, මේ යූටියුබ් මාධ්‍යවේදීන්ටත් මාධ්‍යවේදීන් බවට වටිනාකමක් ලැබෙන වැඩසටහනක් ගෙනැල්ලා ඔවුන්ව register කරන්න කියලා. ඔබතුමාත් දැකලා ඇති, මමත් දැකලා තියෙනවා, මේ අය ෆෝන් එකේ කැමරාව on කරගෙන හැම තැනම ඉන්නවා. ඔහු මාධ්‍යවේදියෙක්ද, නැද්ද කියලා කියන්න අපි දන්නේ නැහැ. ඒ මොකටද ආවේ කියලා අපි දන්නේ නැහැ. සමහර වෙලාවට දේශපාලන පක්ෂයක ක්‍රියාකාරියෙකු යූටියුබ් මාධ්‍යවේදියෙක් වාගේ එවන්න පුළුවන්. එතැන අනවශ්‍ය ප්‍රශ්නයකුත් ඇති වෙනවා. යූටියුබ් මාධ්‍යවේදීන්ට ලොකු හානියකුත් සිදු වෙනවා. ඒක නිසා මේ ලියාපදිංචිය අනිවාර්යයෙන්ම වටිනවා.

ප්‍රවෘත්ති සාකච්ඡාවකට හරි, යම්කිසි incident එකකට හරි ප්‍රධාන මාධ්‍ය ආයතනයකින් correspondent කෙනෙක් ආවාම ඔහුට වෘත්තීය වගකීමක් තිබෙනවා. ඔහු අහන ප්‍රශ්න, ඔහු හැසිරෙන විධිය සහ ඔහුගේ ක්‍රියාකලාපය සම්බන්ධව ඔහුට වගකීමක් තිබෙනවා. මොකද ඔහු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙලා තිබෙන නිසා. හැබැයි, ලියාපදිංචි නොවුණු පුද්ගලයෙකු ආවාම ඔහුට ඕනෑ ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඔහුට ඕනෑ විධියට හැසිරෙන්න පුළුවන්. කිසිම වගකීමක් නැහැ. මම මේ කියන්නේ යූටියුබ් නාළිකා පාලනය කිරීම සඳහා හෝ යූටියුබ් මාධ්‍යවේදීන් control කිරීම සඳහා නොවෙයි. ඔවුන්ට වෘත්තීය වටිනාකමක් සහ වෘත්තීය අයිතිවාසිකම් සහ වෘත්තීය ගෞරවය ලැබෙන විධියට ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම නැවතත් කියන්න කැමැතියි, හිටපු සෞඛ්‍ය ඇමතිවරයා හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හොරකම් කරපු නිලධාරීන්ට දඬුවම් දීම ඔබතුමන්ලාගේ වගකීමක් බව. එහෙම කරන කොට මිනිසුන්ට බෙහෙත් order කරන්න ඕනෑ, බෙහෙත් ටික නැති කර ගන්න එපා. අපට ආරංචියි, මේ දවස්වල anti-rabies බෙහෙත් ලංකාවේම නැහැ කියලා. කවුරු හරි කෙනෙකුව පිස්සු බල්ලෙක් කෑවොත් ලංකාවේ බෙහෙත් නැහැ ලු. මම ඒක හරියට දන්නේ නැහැ. ඒ අපට ලැබෙන තොරතුරු. ඒ පිළිබඳවත් සොයා බලා ඒ ගොල්ලන්ට දඬුවම් දෙන්න. ඔබතුමන්ලා බණින කොට රාජපක්ෂලා දිහා බලලා කියන්න. අපේ දිහා බලලා කියන්න එපා. ඒක අපට අදාළ නැහැ. විශ්වාසභංගයට අත ඔසවපු, ඒ වැරැදි කරපු අයට ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කිව්වා රූපවාහිනිය සහ ITN කියන රාජ්‍ය මාධ්‍ය ආයතන VAT ගෙවන්නේ නැහැ කියලා. පසුගිය මාස පහේ අපි නියමිත පරිදි VAT ගෙවලා තිබෙනවා. සැප්තැම්බර් මාසයට කලින් VAT නොගෙවා ඉඳලා තිබෙනවා. ඒකට අපි යම් සහනයක් අරගෙන ඒකත් ගෙවනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මම ඔබතුමාගේ කාලයේ කියලා කිව්වේ නැහැ. පසුගිය කාලයේ ගෙව්වේ නැත්නම්, ඒ ගෙව්වේ නැති එක accumulate වෙලා එනවා, ගරු ඇමතිතුමනි. ඒගොල්ලන් ඒක කවදාහරි ගෙවන්න ඕනෑ. පාලනයක් භාර ගත්තාම පරණ ඒවාත් එක්ක ඇදගෙන තමයි යන්න වෙන්නේ. හොඳ නරක දෙකම හම්බ වෙනවා, ගරු ඇමතිතුමනි. හොඳ විතරක් ගන්න බැහැ නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඔබතුමාගේ හිටපු නායකයා දාලා ගිය පොලු තමයි අපට ගෙවන්න සිදු වෙලා තිබෙන්නේ. අපේ ටික අපි ගෙවනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

මීළඟට, වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.07]

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்று பல்வேறு பிரச்சினைகளுக்கு மத்தியில் கௌரவ அமைச்சர் நளிந்த ஜயதிஸ்ஸ அவர்கள் சுகாதார அமைச்சை சிறப்பாகக் கொண்டுசெல்வதற்கு நடவடிக்கை எடுத்து வருகின்றார். அவர் திறமையான ஓர் அமைச்சர் என்று நான் நினைக்கின்றேன்.

மேலும், முன்னர் இருந்த சுகாதார அமைச்சர்களைவிட, அவர் இந்த அமைச்சை சிறப்பாகச் செய்வார் என்றும் அதற்கான வாய்ப்பு அவருக்கு எதிர்காலத்தில் கிடைக்கும் என்றும் நான் நினைக்கின்றேன். இந்த நாட்டிலுள்ள அமைச்சுக்களில் சுகாதார அமைச்சு முக்கியமானது என்பது எங்களுக்குத் தெரியும்! நான் இந்தச் சந்தர்ப்பத்தை எங்களுடைய மாவட்டத்திலுள்ள சுகாதாரத்துறை சார்ந்த பிரச்சினைகளை முன்வைப்பதற்குப் பயன்படுத்த விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இன்று நுவரெலியா மாவட்டத்தில் மஸ்கெலியா, ஹற்றன், கொட்டகலை, மன்றாசி, லிந்துலை, வலப்பனை, ரிக்கலகஸ்கட, உடபுஸ்ஸல்லாவை போன்ற பிரதேசங்களில் இருக்கின்ற வைத்தியசாலைகளில் எந்தவிதமான அபிவிருத்தியும் இல்லை என்பதை நான் உங்களுக்குச் சொல்ல வேண்டும். அவற்றில் அதிகமானவை வெள்ளைக்காரர்களால் ஆரம்பித்து வைக்கப்பட்ட வைத்திய சாலைகளாகும். விசேடமாக, ஹற்றனின் டிக்கோயா நகரிலுள்ள Glankan Hospital இந்திய நிதி உதவியால் நிர்மாணிக்கப்பட்ட hospital என்பது உங்கள் எல்லோருக்கும் தெரியும்! நான் நினைக்கின்றேன், 10 வருடங்களுக்கு முன்பு இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்களே அந்த ஆஸ்பத்திரையைத் திறந்து வைத்தார். இன்றும் அந்த வைத்தியசாலையில் அதே அளவு cadreதான் இருக்கின்றது. எனவே, அந்த வைத்தியசாலையின் cadre அதிகரிக்கப்பட வேண்டுமென நாங்கள் உங்களிடம் தெரிவித்துக் கொள்கின்றோம். அண்மையில் அங்கு bus accident ஒன்று நடந்தபோதுகூட, மிகுந்த கஷ்டத்துக்கு மத்தியில்தான் காயப்பட்டவர்களை அந்த வைத்தியசாலையில் அனுமதிக்கவேண்டிய நிலை ஏற்பட்டது. இவ்வாறான சந்தர்ப்பங்களில், ஒன்றில் அவர்களை நாவலப்பிட்டிய வைத்தியசாலைக்கு அனுப்ப வேண்டும். இல்லையென்றால், நுவரெலியா வைத்தியசாலைக்கு அனுப்ப வேண்டும். எனவே, ஹற்றன் பகுதியில் இருக்கின்ற இந்த hospitalஐ புனரமைப்பதற்கும் அதன் cadreஐ அதிகரிப்பதற்கும் உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், ஸ்ரீ பாதவுக்குச் செல்கின்ற மக்கள் பெரும்பாலும் மஸ்கெலியா ஊடாகத்தான் செல்கின்றார்கள். அவர்களுக்கு ஏதாவது உடல் நலக் குறைவு ஏற்பட்டால், மஸ்கெலியா வைத்தியசாலைக்குத்தான் கொண்டு செல்ல வேண்டும். ஏனெனில், அந்த வைத்தியசாலைதான் நல்லதண்ணிக்கு அருகாமையில் இருக்கிறது. எனவே, Maskeliya Hospitalஐ அபிவிருத்தி செய்வதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நுவரெலியாவிலுள்ள General Hospital தரமான நிலையில் இருக்கின்றது. அங்கு cadre பிரச்சினைதான் இருக்கின்றது. அந்த வைத்தியசாலையின் cadre 10 வருடங்களாக அதிகரிக்கப்படவில்லையென அந்த வைத்தியசாலையின் MS அவர்கள் இன்று காலை என்னிடம் கூறினார். எனவே, அங்கு cadreஐ அதிகரிப்பதற்குரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

நுவரெலியா பொது வைத்தியசாலையில் இரண்டு பகுதிகள் இருக்கின்றன. ஒன்று, புதிய hospital. மற்றையது, பழைய hospital. Gynaecology ward பழைய hospitalஇல்தான் இருக்கிறது. Gynaecology wardஇலிலுள்ள patient புதிய hospitalக்குச் செல்ல வேண்டுமென்றால், ambulanceஇல்தான் செல்ல வேண்டும். எனினும், அங்கு ambulance வசதி இல்லை. நுவரெலியாப் பகுதியில் மழையுடனான காலநிலைதான் அதிகளவு நிலவும் என்பது உங்களுக்குத் தெரியும்! அதனால் தனியே நோயாளர்களைத் தூக்கிக்கொண்டு செல்ல முடியாது. எனவே, அந்த வைத்தியசாலையின் cadreஐ அதிகரிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். பழைய hospitalஇலுள்ள gynaecology wardஇல் 10 patientsக்கு ஒரு toiletதான் இருக்கின்றது. ஆகவே, அதையும் அதிகரிப்பதற்குரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ மனோ கணேசன் அவர்கள் சொன்னதுபோல, பெருந்தோட்டப் பகுதிகளில் சுகாதாரச் சீர்கேடுகள் காணப்படுகின்றன. இது பற்றி கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றாகத் தெரியும்! இதற்குக் காரணம், அங்குள்ள 'லயன்' வாழ்க்கை முறைதான். எனவே, அதை ஒழிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். இல்லாவிட்டால், பெருந்தோட்டப் பகுதிகளில் இருக்கின்ற சுகாதாரப் பிரச்சினைகளைத் தீர்ப்பது பெரும் கஷ்டமான விடயமாக மாறிவிடும். பெருந்தோட்டப் பகுதியில் 502 தோட்ட வைத்தியசாலைகள் இருக்கின்றன. ඒ 502න්, කලින් පැවති ආණ්ඩුව හාරගෙන තිබෙන්නේ 44යි. அவற்றில் 44 hospitalsஐ கடந்த அரசாங்கம் பொறுப்படுத்து இருந்தது. மேலும், 59 hospitalsஐப் பொறுப்பேற்பதாகச் சொல்லி யிருந்தது. හාර ගන්නවා කියලා කියා තිබෙනවා. නමුත්, අද වෙනකම් ඒක වෙලා නැහැ. ඊට පස්සේ 25ක් අරන් තිබෙනවා. දැනට ඒ category එකෙන් තව 14ක් ගන්න ඕනෑ. அதுதவிர, இன்னும் 390 தோட்ட வைத்தியசாலைகள் அரசாங்கத்தினால் பொறுப்பேற் கப்படாமல் இருக்கின்றன. රජයෙන් හාර ගන්න තව 390ක් තිබෙනවා. මම කියන්නේ මේකයි. පසුගිය කාලයේ වතු පාසල් අමතක වෙලා තිබුණා. දැන් ඒ සියලුම පාසල් රජය හාර ගන්නා. ඒ වාගේ මේ hospitals ටිකත් සෞඛ්‍ය අමාත්‍යාංශය හාර ගන්න. මේ රෝහල්වලට doctorsලා දමන්න. දැනට වතුවල තිබෙන රෝහල්වල වැඩිපුරම ඉන්නේ EMAs - Estate Medical Assistantsලා. ඒ post එක තමයි එතැන තිබෙන්නේ. ඊළඟට තිබෙන්නේ dispensers. ඒගොල්ලන් තමයි බෙහෙත් දෙන්නේ. ඒ අය මොන බෙහෙත්ද දෙන්නේ? පාට පාට බෙහෙත් තමයි දෙන්නේ. ඒගොල්ලන්ගේ qualification එක එච්චරයි. මේ qualificationවලින් වතු ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය දියුණු කරන්න අමාරුයි. ඒ නිසා කරුණාකර ඔබතුමා මේ වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඔබතුමාට හිතෙන්න පුළුවන්, "ඔයගොල්ලන් පරණ ආණ්ඩුවේ හිටියා නේ, ඇයි ඒක කළේ නැත්තේ?" කියලා. කරලා නැහැ කියලා මම පිළිගන්නවා. නමුත්, මේක කරන්න ඔබතුමන්ලා පොරොන්දු වුණා. එම නිසා ඔබතුමන්ලා මේක කරන්න. යම්කිසි සහයෝගයක් ඕනෑ නම් අපි ඒක දෙන්නම්. කිසි ගැටලුවක් නැහැ.

எனவே,அரசாங்கம் அனைத்து தோட்ட வைத்தியசாலை களையும் சுவீகரிக்க வேண்டுமென நாங்கள் தெரிவித்துக் கொள்கின்றோம். பெருந்தோட்டத் துறையில் சத்துணவு வழங்கவேண்டிய முன்பள்ளிகளின் எண்ணிக்கை - preschools - 1,148 ஆகும். ஆனால், தற்போது சத்துணவு கொடுக்கப் படுகின்ற முன்பள්ளிகளின் எண்ணிக்கை 194 ஆகும். වතුවල පෙර පාසල් 1,194ක් තිබෙනවා. දැනට mid-day meal එක දෙන්නේ පෙර පාසල් 194කට විතරයි. එම නිසා මේ සම්බන්ධවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. பெருந்தோட்டங்களில் ஐந்து வயதுக்குட்பட்ட போசனை குறைந்த பிள்ளைகளின் சதவீதம் 27 ஆகும். அதேபோல, ஐந்து வயதுக்குட்பட்ட பிள்ளைகளில் வயதுக்கேற்ற உயரம் அற்றவர் களின் சதவீதம் 10.2 ஆகும். ஆரம்ப காலங்களில் குழந்தை பிறந்தது முதல் ஐந்து வயது வரை பிள்ளைகளுக்கு 'திரிபோஷா' வழங்கப்பட்டது. දැන් ගරු ඇමතිතුමා කිව්වා,

[ගරු වී.එස්. රාධකිෂ්ණන් මහතා]

ත්‍රිපෝෂ වැඩසටහන නැවත පටන් ගන්නවා කියලා. එම නිසා ඒ ගැන නැවත කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා කිව්වා. ඒක ගැන අපි සතුටු වෙනවා. ඊළඟට අපි කියන්න ඕනෑ, වතුවල toilet facilities සම්බන්ධයෙන්. ඒක තවම සම්පූර්ණ වෙලා නැහැ. අදටත් ලැයිම් කාමර 10කට, 20කට toilets දෙකයි, නැත්නම් තුනයි තිබෙන්නේ. ඒ වාගේම තමයි පානීය ජල -කුඩිනීර්- පහසුකම. අංකු කිට්ටුවට 4,500 මලසලකූඩංකල් කට්ටප්පට වේණ්ඩුම්.

වැසිකිළි 4,500ක් හදන්න ඕනෑ. ඒ වාගේම 30,000කට වැඩි පිරිසකට පානීය ජලය නැති ප්‍රශ්නයකුත් තිබෙනවා. ජල උල්පත් බොහොමයක් පටන් ගන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන්. ඒ වුණාට එම දිස්ත්‍රික්කයේ සිටින මිනිස්සුන්ට බොන්න පිරිසිදු වතුර ටිකක් නැහැ. ඒක තමයි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. ඒක එක ප්‍රශ්නයක්. විසේට පිරදේසංකල් අපිවිරුත්ති අමෙච්චරවෙ

අන්තස්තාත්ත අමෙච්චරාක නාන් ඉරුන්ත කාලත්තිල්, තෝට්ටත් තොළිලාළර්කළින් නලන්කරුති restroom අමෛක්කින්ර තිට්ටත්තෛක් කොන්ටු වන්තේන්. දැන් ඔබතුමන්ලා දන්නවා, වතුවල ඉන්න බොහෝ ජනතාව වැඩ කරන්නේ තේ වතුවල කියලා. ඒගොල්ලන්ට කිසිම restroom එකක් එතැන නැහැ. ඒක අලුත් යෝජනාවක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ වැඩේ කරන්න. ඒක හොඳයි. මොකද, ඒ අයට එතැන restroom එකක් නැහැ. ඒ අය උදේට ගියාම වැසිකිළි යන්න හෝ වතුර බොන්න හෝ කිසිම පහසුකමක් නැහැ. එක එක තේ වතුවල restrooms 4ක්, 5ක් හදලා දුන්නා නම් ඒක හොඳයි. ඒගොල්ලන්ට පහසුකම් හදලා දෙන්න ඕනෑ.

පෙරුන්තෝට්ටප් පකුතියිල් ඉරුක්කින්ර 'ලයන්' වාළ්ක්කෛ මුරෛ ඔළික්කප්පට වේණ්ඩුම්. අතනෛ ඔළික්කාමල් ඉතෛච් සෙය්ය මුටියාතු. මේලුම්, පෙරුන්තෝට්ට සුකාතාරත්තුරෛ යානතු, තේසිය සුකාතාර මුරෛමෛක්කුළ් කොන්ටුවරප්පට වේණ්ඩුම්. අංකුළ්ළ කුරෛන්තමට්ට පෝෂාක්කු නිලෛමෛ මාට්රප්පට වේණ්ඩුම්. මලෛයකම් නීරේන්තුම් පිරතේසමාක ඉරුන්තාලුම්, අංකුළ්ළ 70 සතවීතමාන මක්කළුක්කුච් සුත්තමාන කුඩිනීර් කිටෛප්පතිල්ලෛ. අතිකමාන කෂ්ටප් පිරතේසංකළුක්කු පෝක්කුවරත්තු වසතිකළ් ඉල්ලාමෛයාල්, වෛත්තිය සාලෛක්කුක් කොන්ටුසෙල්ලප්පටුවතර්කු මුන්නරේ පෙරුම් පාලාන නෝයාළිකළ් මරණමටෛකින්රනර්. කුරිප්පාක, කර්ප්පිණිත් තාය්මාරුක්කුම් මුතියෝරුක්කුම් ඉන්ත නිලෛමෛ එර්පටුකින්රතු.

මේලුම්, තෝට්ටප් පකුතිකළිල් මුරෛයාන මලසලකූඩ වසතිකළ් ඉල්ලෛ. එනවේ, අංකුළ්ළ සුකාතාරප් පිරච්සිනෛකළ් තොටර්පිල් අතික කවනම් සෙලුත්ත වේණ්ඩුම්. ඉන්තප් පිරච්සිනෛකළෛ පෙරුන්තෝට්ට මට්රුම් සමූක උට්කට්ට මෛප්පු වසතිකළ් අමෛච්සිනාල් මාත්තිරම් තීර්ක්ක මුටියාතු. අතේපෝල්, සුකාතාර අමෛච්සිනාල් මාත්තිරම් තීර්ක්ක මුටියාතු. එනවේ, ඉවර්රෛප් පෙරුන්තෝට්ට මට්රුම් සමූක උට්කට්ටමෛප්පු වසතිකළ් අමෛච්සු, නීර් වළංකලුක්කුප් පොරුප්පාන අමෛච්සු, මකළිර් මට්රුම් සිරුවර් අලුවල්කළ් අමෛච්සු, කල්වි අමෛච්සු එන එල්ලා අමෛච්සුක්කළුම් සේර්න්තුතාන් ඉතනෛච් සෙය්ය වේණ්ඩුමෙන නාන් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්.

අටුත්තු, 'අකිල ඉලංකෛ තමිල් ඌටකවියලාළර්කළ් ඔන්රියම්' එන තමිල් පත්තිරිකෛයාළර්කළාල් පුතිතාක ඔන්රියමොන්රු ආරම්පික්කප්පට්ටුළ්ළතු. අතිලුළ්ළ ඌටක නණ්පර්කළ් තංකළුක්කුප් පල්වේරු පිරච්සිනෛකළ් ඉරුප්පතාකච් සොල්කින්රාර්කළ්. නාන් ඉතු තොටර්පිල් කෛරව අමෛච්සර් අවර්කළුටන් පේසිනේන්. අතු තොටර්පිල් කතෛප්පතර්කු නේරත්තෛ ඔතුක්කිත් තරුවතාකච් සොන්නාර්. ඌටකවියලාළර් කළුක්කු ඔය්වූතියම් ඉල්ලෛ; අටිප්පටෛ වසතිකළ් ඉල්ලෛ; උපකරණංකළ් ඉල්ලෛ. වීට්ටු වසති ඉල්ලාත එත්තනෛයෝ ඌටකවියලාළර්කළ් වාටකෛ වීටුකළිල් වසික්කින්රාර්කළ්. අවර්කළෛ අරසාංකම් කවනික්ක වේණ්ඩුම්. අම්මෛයිල් ඉන්තිය තූතරකත්තිනර් අවර්කළෛච් සන්තිත්තු, වෙළිනාටු කළුක්කු අනුප්පි, ඌටකත්තුරෛයෛ මේම්පටුත්තුවතර්කාන වසතිකළෛච් සෙය්තිරුක්කිරාර්කළ්. අව්වාරානතොරු තිට්ටත්තෛ අරසාංකමුම් කොන්ටුවර වේණ්ඩුමෙන නාංකළ් එතිර්පාර්ක්කින්රෝම්.

මේලුම්, හෝමියෝපති මරුත්තුවත් තුරෛයිල් නිලවුම් පිරච්සිනෛකළ් සම්පන්තමාන විටයංකළ් එන්නිටම් කොටුක්කප් පට්ටු ඉරුන්තාලුම්, අවෛ පර්රි ඉංකු පේසුවතර්කු නේරම් පෝතාමල් ඉරුක්කිරතු. ආකෛයාල්, නාන් අතු තොටර්පාන ආවණත්තෛ සපෛක්කුච් *සමර්ප්පික්කින්රේන්.

අන්ත වකෛයිල්, හෝමියෝපති මරුත්තුවත් තුරෛ යිලුළ්ළ පිරච්සිනෛකළෛත් තීර්ත්තුවෛක්ක වේණ්ඩුමෙන නාන් කෛරව අමෛච්සර් අවර්කළෛ ඉන්ත නේරත්තිල් කේට්ටුක් කොළ්කින්රේන්.

ඉන්තප් පත්තාවතු පාරාළුමන්රත්තුක්කු 21 වෛත්තියර්කළ් තෙරිවුසෙය්යප්පට්ටු ඉරුක්කිරාර්කළ්. ඉතු මිකවුම් සන්තෝෂමාන විටයමාකුම්. ඉන්ත 21 වෛත්තියර්කළුම් තංකළතු තොළිලෛච් සෙය්යාමල් අරසියල් සෙය්තාර්කළා? එන්ර සන්තේකම් එංකළුක්කු එළුකින්රතු. වෛදාවරු 21දෙනෙක් මෙවර මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා, අපේ කථානායකතුමා ද ඇතුළුව. මම හිතන විධියට මේ දොස්තරලා ඔක්කෝම දොස්තර වැඩ කරලා නැහැ, politics තමයි කරලා තිබෙන්නේ. ඒ නිසා තමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. අපි ඒගොල්ලන්ව අගය කරනවා, වෘත්තියට වඩා වැඩියෙන් politics කරලා තිබෙනවා කියලා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු සඤ්ජීව රණසිංහ අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ආවණම් සමර්ප්පික්කප්පටවිල්ලෛ.
Document not tendered.

[අ.භා. 2.19]

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම විශේෂ දවසක් කියලා මට හිතෙනවා. මොකද, අද සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන විවාද කරනවා. පොදුවේ ගත්තාම, සමස්තයක් විධියට වෙන දවස්වලට වඩා යහපත්, ප්‍රසාදජනක බවක් මට අද දැනුණා. ඇත්ත වශයෙන්ම අපි පසුගිය දවස්වල දුටු විපක්ෂයෙන් ලැබුණු ප්‍රතිචාරවලට වඩා විශේෂ, වඩා සතුටුදායක, සමබර ප්‍රතිචාර රාශියක් අපට අද දැකගන්නට ලැබුණා. අද පාර්ලිමේන්තුවේ විශේෂ වෙනසක් සිදු වෙච්ච දවසක් කියලා මට හැඟෙනවා. ඒ සතුටත් සමඟම මගේ අවස්ථාව මම මේ වෙලාවේ භාවිත කරනවා, ජනමාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව යමක් කථා කරන්නට. ජනමාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව වඩා හොඳින් අපේ ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමාත්, නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමියත් කථා කළා. ඊට වඩා දෙයක්, යම්කිසි නොකියවුණු දෙයක් කියන්නයි මගේ අදහස.

අපි දන්නවා, ජනමාධ්‍ය පිළිබඳව සාකච්ඡා කරද්දී එහි තිබෙන වැදගත්කම, එහි තිබෙන උදාරත්වය, අභිමානය කොයි තරම් ද කියන කාරණය. ඇත්ත වශයෙන්ම මහාචාර්ය මැක්ස් එෆ්. මිලිකන් කියන විද්වතාණන්; සමාජ පර්යේෂකයාණන් ජනමාධ්‍ය පිළිබඳව කථා කළේ ඉතාම බරසාර විධියටයි. පසුගිය දශක දෙක, තුන තුළ මානව ජීවිතය කෙරෙහි වඩාත් බලපෑම් සහගත වූ සංසිද්ධිය ජනමාධ්‍යයේ නැඟී සිටීමයි කියන කාරණය තමයි එතුමා කියන්නේ. ඒ කියන්නේ, ලෝකයට ජනමාධ්‍ය කොයි තරම් වැදගත් වෙනවාද කියන කාරණය තමයි එහිදී මතු කෙරෙන්නේ. ඒ එක්කම, මහාචාර්ය ජේම්ස් ඩී. ෆැලෝ කියන විද්‍යාඥයා ප්‍රකාශ කරනවා, ජනමාධ්‍ය සම්බන්ධයෙන් ගත්තාම එහි තිබෙන සමාජ බලපෑම කොයි ආකාරයෙන් සංකීර්ණ ද, ගැඹුරු ද, පුළුල් ද කියන කාරණය. සාම්ප්‍රදායිකව පැවතෙන කුලාචාර සහ ඥාන මට්ටම් සමුදායක් යටපත් කරන්නට නූතනයේ වැරදි ලෙස ක්‍රියා කෙරෙන ජනමාධ්‍යයට හැකියාව ලැබිලා තිබෙනවා, පුළුවන්කම ලැබිලා තිබෙනවා කියන කාරණය ඔහු පෙන්නුම් කරනවා. අපට මෙතැනදී තේරෙනවා, මාධ්‍යයේ තිබෙන හැකියාව, ශක්‍යතාව ඉතාම ඉහළයි, සමාජය ඉහළ තැනකට ගෙනයන්න වාගේම සමාජය කඩා වට්ටන්නටත් මාධ්‍යයට පුළුවන් කියන කාරණය. මේක හරිම භයානක කාරණයක්. ඒකයි අපි හැම වෙලාවේම කියන්නේ ජනමාධ්‍ය කියන්නේ දෙපැත්ත කැපෙන ආයුධයක් කියලා. ජනමාධ්‍ය මෙහෙයවීම කියන්නේත් දැළි පිහියෙන් කිරි කනවා වාගේ වැඩක්. ඒ නිසා මේක ඉතාම අරපරිස්සමින් කරන්න ඕනෑ කටයුත්තක් කියන කාරණය තමයි අපට හැඟෙන්නේ.

මේ අවස්ථාවේදී අපට විශේෂයෙන් මතු කරන්න අවශ්‍ය වන්නේ ජනමාධ්‍යයේ තිබෙන ඒ ඉතා සුවිසල් ශක්‍යතාව භාවිත කරගෙන සමහර මාධ්‍ය වඩා ව්‍යාජ පරිසරයන් මතු කරන්නට උනන්දු වන කාරණය පිළිබඳවයි. රටේ තොටේ ඇති වෙලා තිබෙන සිද්ධීන් ගත්තාම, සමහර විට හොඳ හෝ නරක අතිශයෝක්තියෙන් පෙන්වන්න හෝ එහි තිබෙන ව්‍යාජත්වය මතු කරන්න හෝ ජනතාව කුපිත කරවන්නට හෝ ජනතාවට යම් ආකාරයකින් වැරදි අදහස් සම්ප්‍රේෂණය කරන්නට හෝ ඔන්න ඔය කාරණය ඉතා වැදගත් විධියට අපට මේ වෙලාවේ දැනෙනවා.

ව්‍යාජ පරිසරයක් - pseudo environment එකක් - මතු කිරීම ජනමාධ්‍ය තුළ තිබෙන ඉතාම භේදනීය තත්ත්වයක් විධියට තමයි අපි දකින්නේ. අපි දන්නවා, ජනමාධ්‍ය කියන්නේ පැහැදිලිවම ආණ්ඩු හදන්න පුළුවන්, ආණ්ඩු වට්ටන්න පුළුවන් එහෙම නැත්නම් රාජ්‍යයන් ගොඩනඟන්න පුළුවන්, රාජ්‍යයන් විනාශ කරන්න පුළුවන් ක්ෂේත්‍රයක් බව. එහෙමත් නැත්නම් සාමය ගොඩනඟනවා වාගේම මහා යුද ගිනි දැල් අවුළුවන්නත් ජනමාධ්‍යයට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා අපි දන්නා ආකාරයට ජනමාධ්‍යයේ ප්‍රබලත්වය වඩා හොඳින් පාවිච්චි කරනවා නම්, ඇත්ත වශයෙන්ම රටකට එහෙම ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙන්නේ නැහැ. අපි දන්නවා, 1970 දශකයේ අග භාගයේදී ඇමෙරිකාවේ හිටපු චිරප්‍රකට ජනාධිපතිවරයෙක් වුණු රිචඩ් නික්සන්ට ජනාධිපතිකම දමලා ගෙදර යන්න සිදු වුණු බව. ඒකට හේතුව, "The Washington Post" පුවත් පතේ හිටපු කාල් බර්න්ස්ටයින් හා බොබ් වුඩ්වර්ඩ් කියන නිර්භීත මාධ්‍යවේදීන් දෙදෙනා Watergate Scandal එක හෙළි කරලා තමන්ගේ අභීත යුතුකම ඉෂ්ට කිරීම. ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා, ජනමාධ්‍යය වඩා හොඳින් භාවිත කරන රටක ජනතාවට වාගේම ජනතාවගේ අනාගතයටත් එය යහපත් ප්‍රතිඵල ලබා දෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කිව්වේ මේකයි. අද අපි සාකච්ඡාවට බඳුන් කරන අපේ ජනමාධ්‍ය ප්‍රතිපත්තිය තුළ, අය වැය විවාදයේදී ජනමාධ්‍ය සම්බන්ධයෙන් අවධානය යොමු කරන තත්ත්වයන් තුළ වඩා හොඳ කාරණයක් මම දුටුවා. මම එය උද්ධෘතකොට ගත්තා, මේ වෙලාවේදී මෙම සභාවේදී කියවන්න. ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේඛනයක් උපුටා දක්වමිනුයි මම මේ වචන කිහිපය කථා කරන්නේ. "හොඳින් දැනුම්වත් වූ හෞඹිතික හා සක්‍රිය සමාජයක් ගොඩනැඟීම සඳහා නිදහස් මාධ්‍ය සම්ප්‍රදායයක් ප්‍රවර්ධනය කිරීමටත්, දේශීය ජන විඥානය ප්‍රගතිය කරා මෙහෙය විය හැකි වගකීම්සහගත මාධ්‍ය භාවිතයක් සඳහා අදාළ ක්ෂේත්‍රය ධෛර්යවත් කිරීමටත් ජනමාධ්‍ය අමාත්‍යාංශය අපේක්ෂා කරයි. එමෙන්ම, ජනමාධ්‍ය ක්ෂේත්‍රය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද සංවර්ධනය විය යුතු බව මෙම අමාත්‍යාංශය මැනවින් අවබෝධ කොටගෙන ඇත." ඇත්ත වශයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙය උද්ධෘතකොට ගත්තේ වෙනත් කිසිදු රජයක් මීට පෙර මෙබඳු ප්‍රකාශයක් කර නැති නිසායි. අපි ස්වයං විවේචනාත්මකව අද මේ රටේ තිබෙන ජනමාධ්‍ය මොන තත්ත්වයේද තිබෙන්නේ කියන එක පැහැදිලිව තේරුම් අරගෙන තිබෙනවා. ඒක හදන්න ඕනෑය කියන කාරණය තේරුම් අරගෙන තිබෙනවා. අපේ මනුවර්ණ සහෝදරයා ඉතා පැහැදිලිව ඒක ප්‍රකාශ කළා; කොට්ටහච්චි සහෝදරියත් ඉතා පැහැදිලිව ඒක ප්‍රකාශ කළා. වඩා සදාචාරාත්මකව, ආචාර ධාර්මිකව මේ සමාජය තුළ වඩා හොඳ, යහපත් ජනමාධ්‍ය භූමිකාවක් අපි අලුතින් නිර්මාණය කළ යුතුයි. මම හිතන විධියට 2025 අය වැය කථාවට අදාළව ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කළ ඒ නිවේදනය ඉතාම වැදගත්, මේ රටේ අනාගත ජනමාධ්‍ය සම්බන්ධයෙන් ගත්තාම.

අපි පැහැදිලිවම දන්නවා, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ආදී ආයතන ගණනාවක් මේ අමාත්‍යාංශයට අනුබද්ධිතව තිබෙන බව. ඉතින් මේ ආයතන සම්බන්ධයෙන් අය වැය කථාව ඇතුළේ යම් ආකාරයක ඉතා පැහැදිලි ආමන්ත්‍රණයක් අපි කරලා තිබෙනවා. මේ ආයතනවලට අදාළව 2025 වසරේදී සිදු කෙරෙන ව්‍යූහාත්මක සහ ප්‍රතිසංවිධානාත්මක ක්‍රියාකාරිත්වය ඇත්ත වශයෙන්ම වෙනස් කරන්න ජාතික ජන බලවේග රජය මේ වෙනකොට පිඹුරුපත් සකස් කරලා අවසානයි. එම නිසා ජනමාධ්‍ය සම්බන්ධයෙන් පැහැදිලිවම ඒ නිදහස් හා වගකීමෙන් යුක්ත, ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායය මේ මහ පොළොව තුළ ඇති කරන්න මේ අය වැය ලේඛනයෙන් යම් ආකාරයක අවධානයක් යොමු කරලා තිබෙනවා. නව තාක්ෂණය සම්බන්ධයෙන් අවධානයක් යොමු කරලා තිබෙනවා. තාක්ෂණ උපකරණ

[ගරු සේන නානායක්කාර මහතා]

අලුත්වැඩියාව, අලුත් තාක්ෂණය මිලදී ගැනීම, මාධ්‍යවේදීන් පුහුණු කිරීම, එහෙම නැත්නම් ගොඩනැඟිලි නවීකරණය, කාර්ය මණ්ඩලය සඳහා වන පුහුණු වැඩසටහන්, ශාස්ත්‍රීය පර්යේෂණ හා ප්‍රකාශන යනාදී වශයෙන් සකලවිධ තත්ත්වයන් සම්බන්ධයෙන් අපි පැහැදිලිවම මේ අය වැය ලේඛනය තුළින් ආමන්ත්‍රණය කරලා තිබෙනවා. මේ කියන කාරණා සඳහා රුපියල් මිලියන 528ක් වෙන් කරලා තිබෙනවා. ඒක ඉතාම ප්‍රබල, ප්‍රගතිශීලී පියවරක් කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම ජනමාධ්‍යවේදීන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා අවධානය යොමු වෙලා තිබෙනවා. අපි දන්නවා, රටක මාධ්‍යයක් කැලේ පනිනවා නම්, ආචාර ධාර්මික නොවේ නම් පැහැදිලිවම අපට ඒ මාධ්‍ය පිළිබඳව සතුටු වෙන්න බැහැ, ඒ රටේ අනාගතය පිළිබඳව සතුටු වෙන්න බැහැ කියන එක. ඒ තත්ත්වය යටතේ අපි පැහැදිලිවම පශ්චාත් උපාධි සහ උපාධි සඳහා මුදල් වෙන්කොට තිබීම ඉතාම ප්‍රගතිශීලී පියවරක්. සාමාන්‍යයෙන් ජනමාධ්‍යවේදීන්ට අදාළ ආචාර ධාර්මික ක්‍රියා පටිපාටිය පිළිබඳව අවබෝධය ලබා දෙන්නේ අධ්‍යාපනික ක්‍රියාවලියක් විධියට. ඒක නොවේ නම්, ඉබාගාතේ යන මාධ්‍යකරුවන් සහ මාධ්‍යවේදීන් වෙන්කොට හඳුනා ගත නොහැකි තත්ත්වයක් රට තුළ මතු වෙනවා. ඒ ගැන අපි විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ. රුපියල් මිලියන ගණනක් උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා වෙන් කරලා තිබෙනවා. ඒක ඉතා වැදගත් පියවරක් කියලා අපි දන්නවා.

අනෙක් කාරණය මෙයයි. රුසියානු මහා ලේඛකයෙක් වන ඇලෙක්සැන්ඩර් සොල්ෂෙනිට්සින් එක තැනක කියනවා අපි අහලා තිබෙනවා, "For a country to have a great writer is like having a second government" කියලා. වඩා හොඳ විශිෂ්ට ලේඛකයා, විශිෂ්ට කලාකරුවා, විශිෂ්ට රචකයා රටක තවත් රාජ්‍යයක්. ඒ තරම්ම ඔහු වටිනවා. ඔහු අගය කළ යුතු චරිතයක්. ඒ චරිතය පිළිබඳව ජනමාධ්‍ය අමාත්‍යාංශය මේ අය වැය කථාව තුළින් අවධානය යොමු කරලා තිබෙනවා. එබඳු වූ චරිත, එබඳු වැදගත් භූමිකා මේ මහ පොළොවේ නිර්මාණය කරන්න මේ අය වැය කථාව තුළින් ආමන්ත්‍රණය කරලා තිබෙනවා; ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ ජනමාධ්‍යවේදීන්, නිර්මාණශීලීන්, කලාකරුවන් වඩා හොඳ ප්‍රමිතිගත තත්ත්වයකට, අධ්‍යාපනික වශයෙන් උසස් තලයකට පත් කර ගැනීමට අවශ්‍ය කරන වටපිටාව සකසන්නට පැහැදිලිවම මෙවරත් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල සඳහා රුපියල් මිලියන 27.5ක් වෙන් කරලා තිබෙනවා. මේක ඉතා වැදගත් කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනමාධ්‍යවේදියෙක් කියන්නේ ඇත්ත වශයෙන්ම මේ රටට, මේ මහ පොළොවට, මේ සමාජයට අත්‍යවශ්‍ය සාධකයක්. රට ඉදිරියට ගෙනියන ගාමක බලවේග අතර ජනමාධ්‍ය කියන එක ඉතාම වැදගත් කාරණයක්. රටේ අධිකරණය, ව්‍යවස්ථාදායකය සහ විධායකය කියන ඒ රාජ්‍යයන් තුනට අමතරව සිව්වෙනි රාජ්‍යය විධියට ජනමාධ්‍ය හඳුන්වන්නේ ඒකයි. මම විශ්වාස කරනවා, අපි ඉදිරිපත් කරන විසර්ජන පනත් කෙටුම්පත, අය වැය කථාව මේ මහ පොළොවට බලපාන වඩා සුබදායී හෙටක් නිර්මාණය කිරීමේ තත්ත්වයක් ඇති කිරීමට සහ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ළඟා කර ගැනීමට ඉතා වැදගත් වෙනවාය කියලා.

ඒ වාගේම Clean Sri Lanka වැඩසටහන සම්බන්ධයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශයත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒකාබද්ධව කරන වැඩ පිළිවෙළක ඉතාම වැදගත් ආරම්භයක්, අභිමානවත් සමාරම්භයක් මේ අය වැය ලේඛනය තුළ අපි දකිනවා. මේක ඉතා වැදගත් කාරණයක්. දැනට මේ අය වැය ලේඛනයෙන් ජනමාධ්‍ය සම්බන්ධයෙන් වෙන් කරලා තිබෙන ප්‍රාග්ධන වියදම්, පුනරාවර්තන වියදම් ප්‍රමාණය ඉතා විශාලයි. ශ්‍රී ලංකා ගුවන් විදුලිය, ජාතික රූපවාහිනිය, "Channel Eye" සහ "Nethra TV" ආදී සියලු ආයතනවලට මුදල් වෙන් කිරීම ඉතාම වැදගත් කියන කාරණය මම ප්‍රකාශ කරනවා. තිරසර සංවර්ධන ඉලක්ක - Sustainable Development Goals - සපුරාලීම සම්බන්ධයෙන් ගත්තාම ජනමාධ්‍ය තුළිනුත් අපේ රටට වඩා විශිෂ්ටත්වයක් කරා ළඟා වෙන්නට වඩා හොඳ සැලසුම් මේ තුළ තිබෙනවා කියන කාරණයත් අවධාරණය කරමින්, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[ප.ව. 2.30]

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சின் குழுநிலை விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எனக்குக் கிடைத்திருக்கும் நேரம் போதாமையால் 5 நிமிடங்கள் சுகாதாரத்துறை சம்பந்தமாகவும் 2 நிமிடங்கள் ஊடகத்துறை சம்பந்தமாகவும் பேசலாமென நினைக்கின்றேன்.

நான் முதலாவதாக மன்னார் மாவட்ட பொது வைத்தியசாலை சம்பந்தமாகக் குறிப்பிட விரும்புகின்றேன். அங்கு நிறையக் குறைபாடுகள் காணப்படுகின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் ஒருமுறை அந்த வைத்தியசாலைக்கு வருகைதர வேண்டும் அல்லது உங்களுடைய பிரதி அமைச்சர் அவர்களை அனுப்பிவைக்க வேண்டுமென்ற கோரிக்கையை நான் முன்வைக்கின்றேன். ஏனெனில், அங்கு ஆளணிப் பற்றாக்குறை அதிகமாகக் காணப்படுகின்றது. அதுமாத்திரமன்றி, போதியளவு தளபாடங்களும் இல்லை. அந்த வைத்தியசாலையானது, பொது வைத்தியசாலை என்ற பெயரில் இயங்குகின்றதே ஒழிய, எல்லா வளங்களையும் கொண்ட ஒரு வைத்தியசாலையாக இல்லை என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அந்த வைத்தியசாலைக்கு அனுமதிக்கப்பட்ட வைத்திய நிபுணர் ஆளணி 24 ஆகும். எனினும், அங்கு ஒரு நிரந்தர வைத்திய நிபுணர்கூட இல்லை. தற்காலிக வைத்திய நிபுணர்கள் மாத்திரமே உள்ளனர். இதனால் மன்னார் மாவட்ட மக்களுக்குத் தரமான சிகிச்சையைத் தொடர்ச்சியாக வழங்க முடியாமல் இருக்கின்றது. மன்னார் மாவட்டத்திலுள்ள ஒரேயொரு பொது வைத்தியசாலை இதுவாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, மன்னார் மாவட்டத்துக்கென ஒரு CT scanner இல்லை என்பது பல வருடங்களாகப் பேசப்பட்டு வருகின்ற ஒரு விடயமாகும். அந்த மாவட்டத்திலுள்ள எந்தவொரு வைத்தியசாலையிலும் CT scanner இல்லை. எனினும், அதற்கான கட்டிடம் இருக்கின்றது. இதனால் அங்குள்ள நோயாளர்களை வவுனியா வைத்தியசாலைக்கும் யாழ்ப்பாண வைத்தியசாலைக்கும் கிளிநொச்சி வைத்தியசாலைக்கும்தான் அனுப்புகிறார்கள்.

இங்கு சிறிது நேரத்துக்கு முன்னர், எங்களுடைய வைத்தியர் பத்மநாதன் சத்தியலிங்கம் அவர்கள் மன்னார் மாவட்ட வைத்தியசாலை சம்பந்தமாகப் பேசியிருந்தார். அந்த விடயத்தில் நீங்கள் கவனமெடுக்க வேண்டும். அதாவது, கிடைக்கவுள்ள CT scannerஐ மன்னார் மாவட்டத்துக்குத் தந்துதவ வேண்டுமென்ற கோரிக்கையை நான் முன்வைக்கின்றேன். ஏனென்றால், அது எங்களுடைய மாவட்டத்துக்கு ஒரு முக்கிய தேவையாகக் காணப்படுகின்றது. இது சம்பந்தமாக உங்களுடைய பதிலை நான் எதிர்பார்க்கின்றேன்.

அதைவிட, மன்னார் பொது வைத்தியசாலையில் விபத்து மற்றும் அவசர சிகிச்சைப் பிரிவு இல்லை. எங்களுடைய பகுதியில் ஏதாவது விபத்து நடந்தால், பாதிக்கப்பட்டவர்களை வவுனியா வைத்தியசாலைக்கு அல்லது யாழ்ப்பாண வைத்தியசாலைக்குத்தான் அனுப்புகிறார்கள். எனவே, அங்கு விபத்து மற்றும் அவசர சிகிச்சைப் பிரிவை அமைப்பது தொடர்பில் உங்களுடைய கவனத்தைச் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மன்னார் மாவட்டப் பொது வைத்தியசாலையில் ஒரு மாத காலமாக குழந்தை வைத்திய நிபுணர் இல்லை. அங்கு இருந்தவர் சொல்லாமல் கொள்ளாமல் சென்றுவிட்டார் என்று சொல்லப்படுகின்றது. அதனால் நோய்வாய்ப்படுகின்ற குழந்தைகளை வவுனியா வைத்தியசாலைக்கும் யாழ்ப்பாண வைத்தியசாலைக்கும்தான் அனுப்பிக்கொண்டு இருக்கிறார்கள்.

நான் இங்கு குறிப்பிட்ட மூன்று விடயங்களும் நோயாளர்களை மன்னாரிலிருந்து வேறு மாவட்டங்களிலுள்ள வைத்தியசாலைக்கு அனுப்புகின்ற விடயங்களாகத்தான் இருக்கின்றன. சாவகச்சேரி வைத்தியசாலையில் பணிபுரியும் குழந்தை வைத்திய நிபுணரான பெண் வைத்தியர் ஒருவரை மன்னார் மாவட்ட பொது வைத்தியசாலைக்கு வரும்படி அழைத்துள்ளதாகச் சொல்கிறார்கள். ஆனால், இன்னும் அது நடைமுறைக்கு வரவில்லை. இதனால் சிறு குழந்தைகளும் தாய்மாரும் படுகின்ற துன்பங்களைப் பார்க்கும்போது மிகவும் வேதனையாக இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் உடனடியாக இந்த விடயங்களில் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மன்னார் பொது வைத்தியசாலையில் ஆளணிப் பற்றாக்குறை கூடுதலாக இருக்கின்ற காரணத்தால், அங்கு பல்வேறு பிரச்சினைகள் ஏற்பட்டு இருக்கின்றன. அங்குள்ள வைத்தியர்கள் கஷ்டப்பட்டு சேவையாற்றுகின்றபோதிலும்கூட, எங்களுடைய மக்களுக்கு அந்த வைத்தியசாலையின்மீது நம்பிக்கை ஏற்படாமல் இருக்கின்றது. அங்கு கடமையாற்றுகின்ற சிங்கள இனத்தைச் சேர்ந்த வைத்தியர்களுக்கு நான் நன்றி சொல்ல வேண்டும். ஏனெனில், அவர்கள் தென் இலங்கையைச் சேர்ந்தவர்களாக இருந்தாலும், பல்வேறு சிக்கல்களுக்கு மத்தியில் அங்கு வந்து சேவையாற்றுகின்றார்கள். அவர்களுடைய சேவை மனப்பான்மையை நான் பாராட்டுகின்றேன்.

தமிழ் மொழி பேசுகின்ற வைத்தியர்கள் எங்களது பிரதேசத்துக்கு வந்து வேலை செய்வதற்குத் தயங்குகின்ற நிலையில், சிங்கள இனத்தைச் சேர்ந்த வைத்தியர்கள் அங்கு வந்து சேவையாற்றுவதை நான் உண்மையிலேயே பாராட்டுகின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் உங்களுடைய பிரதி அமைச்சரை அனுப்பியாவது மன்னார் மாவட்ட வைத்தியசாலையிலுள்ள குறைபாடுகளை ஆராய்ந்து, சில முக்கிய விடயங்களை உடனடியாகச் செய்துதர வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, ஊடகம் சம்பந்தமான சில விடயங்களைச் சொல்லி எனது உரையை முடிக்கலாமென நினைக்கின்றேன். முதலாவது, ஊடகவியலாளர்களுக்கு வீட்டுத்திட்டம் வழங்கப்பட வேண்டும். ஏனெனில், அவர்கள் எந்தவொரு நிரந்தர வருமானத்தையும் பெறுகின்ற நிலையில் இல்லை. அவர்களுக்கு வீட்டுத்திட்டத்தை வழங்குவதனூடாக அவர்களுடைய குடும்ப நிலையை மாற்ற முடியுமென நான் நினைக்கின்றேன். அவர்களில் பலர் தங்களுடைய சேவையின் நிமித்தம் உயிர்நீத்து இருக்கிறார்கள். மேலும், சிவராம் போன்ற எங்களுடைய ஊடகவியலாளர்கள் படுகொலை செய்யப்பட்டு இருக்கிறார்கள். இது தொடர்பில் விசாரணை மேற்கொள்ளப்பட வேண்டும் என்பது என்னுடைய கோரிக்கையாகும்.

இரண்டாவது, ஊடகங்களில் குறிப்பாக இணையத் தளங்களில் மிக மோசமான முறையில் விமர்சனங்கள் முன்வைக்கப்படுகின்றன. என்மீது வைக்கப்பட்ட விமர்சனம்கூட இதற்கு ஓர் உதாரணமாகும். ஒருவருடைய நற்பெயரை இல்லாமல் செய்ய வேண்டுமென்றால், அதை ஊடகங்கள் ஊடாகச் செய்ய முடியும். இது பற்றி பாதிக்கப்படுகின்றவர்கள் cybercrimeஇல் அல்லது பொலிஸில் complain பண்ணினால், இவை வெளிநாட்டிலிருந்து இயங்குகின்றபடியால் இதற்கு எதிராக நடவடிக்கை எடுக்க முடியாமல் இருப்பதாகச் சொல்கிறார்கள். இதனால் அவர்கள் மன உளைச்சலுக்கு ஆளாகிக்கொண்டு இருக்கின்றார்கள். மேலும், பிரபல்யமான நபர்கள்மீதும் இன்று வதந்திகளைப் பரப்பிக்கொண்டு இருக்கின்றார்கள். இதற்கு எதிராகச் சட்டநடவடிக்கை எடுப்பது கடினமாக இருக்கிறது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்திலும் தனது கவனத்தைச் செலுத்தி, இவ்வாறான செயற்பாடுகளில் ஈடுபடுகின்றவர்களைத் தண்டிக்கக்கூடிய வகையில் ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடிக்கின்றேன். நன்றி!

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණා සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. පළමුවැනි එක තමයි, මන්නාරම දිස්ත්‍රික් මහ රෝහල සඳහා හදිසි අනතුරු ඒකකයක් ලබා දීමට කටයුතු කෙරෙනවා. ඒකට දැනට ක්‍රමවේදය ආරම්භ වෙලා තිබෙන්නේ. ඒ නිසා මම හිතනවා ඉතා ඉක්මනට ඉන්දියානු රජයේ ආධාර ඇතුව එම කටයුත්ත කරන්න පුළුවන්කමක් තිබෙනවා කියා. දෙවැනි කරුණ තමයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා සඳහන් කළ paediatrician කෙනෙකු නැති ප්‍රශ්නය. ඒ සම්බන්ධයෙන් වාවකච්චේරි රෝහලේ වැඩ කරන විශේෂඥ වෛද්‍යවරයා එම රෝහලට අනුයුක්ත කරන්න ලියුම් යවා තිබෙන්නේ. ඒ අනුව එම වෛද්‍යවරයාගේ සේවය ඔබේ ප්‍රදේශයේ රෝහලට ලබා ගන්න පුළුවන් වේවි. ඔබ සඳහන් කළ CT scanner එක මාස කිහිපයකින් ලබා දෙනවා කියලා මේ මොහොතේ නිශ්චිතවම සඳහන් කරන්න බැහැ. නමුත් අපි ඒ කාරණය සැලකිල්ලට ගන්නම්. මාර්තු 26 වැනි දා උදේ වරුවේ මම මන්නාරම මහ රෝහලට එනවා. ඔබතුමාත් එන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙතුමාට අවසර දෙනවාද කියන්න. නැත්නම් මගේ වෙලාව යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අවසර දෙනවා නම් - *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම තත්ත්පර තිහකින් අවසන් කරනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එතුමාට අවසර දෙන බවක් පෙනෙන්නේ නැහැ. ඒ නිසා මගේ කථාව ආරම්භ කරන්නම්. මේ මොහොතේ සිට මට ලබා දෙන වෙලාව ගණනය කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

[අ.භා. 2.39]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නලින්ද ජයතිස්ස මැතිතුමනි, විපක්ෂයේ ඉන්න කාලයේ සෞඛ්‍ය ගැන බොහෝ දේවල් කථා කරපු ඔබතුමා, අද මේ අමාත්‍යාංශය භාර ඇමතිතුමා වීම ගැන මම සතුටු වෙනවා. හැබැයි, ඔබතුමන්ලා එදා කථා කරපු දේවල් අද ක්‍රියාත්මක කරන්න පුළුවන්නම් මම තවත් සතුටු වෙනවා.

කෙහොම වුණත් මේ අය වැය තුළ තිබෙන හොඳ කාරණා කිහිපයක් සම්බන්ධයෙන් මම කථා කරන්න කැමැතියි. එකක් තමයි වතු රෝහල් සම්බන්ධ කාරණය. කාලයක් තිස්සේ ඇස්වලින් අයින් වෙලා තිබුණු මේ වතු රෝහල් නැවත වතාවක් නහා සිටුවන්නට කටයුතු කරනවා කියන එක හොඳයි. හැබැයි, ගරු ඇමතිතුමනි, ඒ කටයුත්ත වතු සමාගම්වලට භාර දෙනවා නම්, මම හිතනවා ඒකෙන් අපට සාර්ථක ප්‍රතිඵල ගන්න බැරි වෙයි කියලා. මොකද, ඒ සමාගම් යටතේ පාලනය වෙද්දී තමයි එම වතු රෝහල් වැසී ගියේ. ඒ නිසා එම කටයුත්ත රජයේ අධීක්ෂණය යටතේ සිදු වෙන්න ඕනෑ; එම කටයුතු රජය යටතට ගන්න ඕනෑ. එහෙම නැතුව වතු රෝහල් වතු සමාගම්වලින් බලන්නත්, අනෙක් රෝහල් රජයෙන් බලන්නත් කටයුතු කළොත්, එතැනම වෙනස් කොට සැලකීමක් හැටියට මම එය දකිනවා. එය එසේ නොවිය යුතුයි.

ඊළඟට, ඔටිසම් දරුවන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හොඳ දෙයක්. හැබැයි, ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. මොකද, මේ ඔටිසම් දරුවන් හඳුනා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් අපේ පාසල් පද්ධතිය තුළ නැහැ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ඔටිසම් දරුවන් හඳුනා ගන්නේ කොහොමද, ඒ අය සම්බන්ධයෙන් ක්‍රියා කරන්න ඕනෑ කොහොමද කියන කාරණය පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා ගුරුවරුන්ගට වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නය කියා.

ඊළඟට, තැලසීමියා රෝගීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන වැඩසටහනක් ගැනත් කථා වුණා. ඒක හොඳයි. හැබැයි, ඒ සම්බන්ධ වැඩසටහනක් පටන් ගත්තේ 2018දියි කියන එක මම ඔබතුමාට මතක් කරනවා. 2018 පැවති යහපාලන රජය කාලයේ පටන් ගත් වැඩසටහන තවදුරටත් දියුණු කරමින් ඉස්සරහට ගෙන යනවා නම් ඒකත් හොඳ වැඩසටහනක් හැටියට මම දකිනවා. එය එසේ විය යුතුයි.

ඊළඟට, මේ අය වැය විවාදය පුරාම මම දැක්කා ජනතාවාදී ආණ්ඩුවක් කියන එක පුන පුනා කියනවා. හැබැයි, ඒ ලේබල් එක ගහගත් ආණ්ඩුව ශ්‍රී ලංකන් ගුවන් සමාගම තුළ තිබෙන ණය ගෙවන්න රුපියල් මිලියන 20,000ක් වෙන් කරනවා, Capital Expenditure එක ගෙවන්න මිලියන 10,000යි; පොලිය ගෙවන්න මිලියන 10,000යි විධියට. හැබැයි, ඇමතිතුමනි, මුදල් අමාත්‍යාංශයෙන් මේවා කොළවල ලියා දුන්නාට, මේවා ගෙවන්නේ මේ රටේ මිනිස්සු ගෙවන බදු සල්ලිවලින්. Plane එකක් අහසේ යනවා විතරක් දැකපු මිනිස්සුත් මේ බදු ගෙවන මිනිස්සු අතරේ ඉන්නවා. ඒ නිසා මම හිතනවා, ඒවා ඒ තරම් ජනතාවාදී නැහැ කියලා.

දැන් අපි මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අරගෙන බලමු. රේඛීය අමාත්‍යාංශය යටතේ තිබෙන රෝහල්වල හදිසි අනතුරු ඒකකවල සැපයුම් පහසුකම් වැඩිදියුණු කරන්නට මුදල් වෙන් කරලා නැහැ, ප්‍රතිපාදන බින්දුවයි. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා සංවර්ධනයට වෙන් කර තිබෙන මුදල රුපියල් මිලියන 12,190යි. ඒ මුදල ශ්‍රීලංකන් ගුවන් සමාගමට දුන්නාට වඩා අඩුයි. ඒ නිසා ඒවා ජනතාවාදී නැහැ කියන එක තමයි මා කියන්නේ. මධ්‍යම රජයේත්, රේඛීය අමාත්‍යාංශය යටතේත් පළාත් නවයේත් සියලු රෝහල් ද ඇතුළුව සෞඛ්‍ය සේවාව සංවර්ධනයට තමයි මෙවර අය වැයෙන් ඔය කියන මුදල වෙන් කරලා තිබෙන්නේ.

අනෙක් කාරණාව තමයි, මේ හැමෝම කථා කරපු වෛද්‍යවරුන්ගේ සහ හෙද හෙදියන්ගේ ගැටලුව. අද ඒ අය ගැටලුවකට මුහුණ පා සිටිනවා; රැකියාව අත් හැරලා යන තැනට පත්වෙලා ඉන්නවා. ඒ තරමටම ඒ ගොල්ලන් මානසිකව වැටිලායි ඉන්නේ. ඔබතුමා දන්නවා, ඒ ගොල්ලන් මේ ආණ්ඩුව බලයට ගෙන එන්න ලොකු මෙහෙයක් කරපු අය බව. මා දැක්කා, එදා nursesලා uniform එකෙන් රැස්වීමට ගිය ආකාරය. ඒ වාගේම වෛද්‍යවරු රෝගීන්ට එදා කිව්වා, "වෙනසක් කරමු" කියලා. බලනකොට ආණ්ඩුවෙන් අද ඒ වෙනස වෙලා තිබෙන්නේ වෛද්‍යවරුන්ටයි, nursesලාටයි.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට කාරණා කිපයක් කියනවා. Nursesලාට ගෙවනු ලැබූ 1/160 අතිකාල දීමනාව 1/200 වෙලා තිබෙනවා. ඒ වාගේම doctorsලාට ගෙවපු 1/80 අතිකාල දීමනාව අද 1/120 වෙලා තිබෙනවා. රජයේ නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් nursesලාට ගෙවපු 1/20 දීමනාව අද 1/30 වෙලා තිබෙනවා. Doctorsලාට ගෙවපු 1/20 දීමනාවත් අද 1/30 වෙලා තිබෙනවා. එක මන්ත්‍රීතුමෙක් අය වැය විවාදයේදී කථා කරමින් කිව්වා මම දැක්කා, අය වැය යෝජනා අනුව පඩි ගෙවන්නේ මෙහෙමයි, මූලික වැටුප මෙච්චරයි, අතිකාල දීමනාවලට මෙච්චරයි, නිවාඩු දිනවල ගෙවීම් මෙච්චරයි, ඒ නිසා මෙහෙම කරන්න වුණා කියලා. මේක හරියට මේ පැත්තෙන් දීලා අර පැත්තෙන් අයින් කළා වාගේ දෙයක්.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති "less than and greater than" කියලා පාඩමක් 6 පන්තියේදී ගණිතයට අපි උගන්වන බව. මම ඔබතුමාගෙන් අහනවා, 1/160 ද ලොකු, 1/200 ද ලොකු කියලා. එහෙම නැත්නම් 1/80 ද ලොකු, 1/120 ද ලොකු කියලා. මේ අසාධාරණය වෛද්‍යවරුන්ට කරන්න එපා. මේ අසාධාරණය හෙදියන්ට කරන්න එපා. අනේ ගරු ඇමතිතුමා, කරුණාකර ඒ අයට රෙද්දක් ඇඳලා පාරේ යන්න ඉඩ තියන්න. දැන් කොල්ලෝ සවුත්තුව දානවා, "කරපු වෙනස හොඳද?" කියලා අහමින්. ඒ නිසා ඒ අයගේ ඒ ගැටලුව ඔබතුමා අර දීලා තිබෙන සාකච්ඡාවේදී විසඳා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

ඇත්ත ජනතාවාදී ආණ්ඩුවක් නම්, කරන්න ඕනෑ මොකක්ද කියන එකත් පොඩ්ඩක් බලන්න. ශ්‍රීලංකන් ගුවන් සේවයේ ණය ගෙවනවාට වඩා හොඳයි, ඒ මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශයට, අධ්‍යාපන අමාත්‍යාංශයට යොදවන්න; ජනතාවට පහසුකම් දීම ආදි දේවලට යොදවන්න; ප්‍රාදේශීය රෝහල් දියුණු කිරීම, ග්‍රාමීය සෞඛ්‍ය නහා සිටුවීම වාගේ දේවලට යොදවන්න. එසේ කරන්න කියලා මම යෝජනා කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන සියයට 6කින් වැඩි කරනවා කිව්වා නේ. එහෙම තමයි ඔබතුමන්ලා ඒ කාලයේ කථා කළේ. මේ රජය මේ රටේ තිබෙන සැබෑ ප්‍රශ්න හඳුනා ගෙන නැහැ කියන එක මම සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට කියන්න ඕනෑ ඖෂධ හිඟය ගැන. වෛද්‍ය සැපයුම් දෙපාර්තමේන්තුවට අදාළ "Out of stock Medicines at MSD - 333" කියන ලැයිස්තුව මම මේ වෙලාවේ **සභාගත*** කරනවා.

2025 ජනවාරි 27 වැනි දිනට වෛද්‍ය සැපයුම් දෙපාර්තමේන්තුවේ හිඟ බෙහෙත් වර්ග සංඛ්‍යාව 333 යි. මේ දවස් 6ට එම තත්ත්වය වෙනස් වන්නේ නැතුව ඇති කියලා මම හිතනවා. මේ රටේ බෙහෙත් වර්ග 333ක හිඟයක් තියාගෙන මේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක් කියන්නේ කොහොමද? සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, ඖෂධ වර්ග 56යි හිඟ කියලා. හැබැයි මේ වාර්තාවේ තිබෙනවා, ඖෂධ 333ක් හිඟයි, ඒවා ගේන්න මාස 9ක් යනවා කියලා. ඒ නිසා සුද්ද සිංහලෙන් කිව්වොත් -ඇත්තම කිව්වොත්- තව මාස 9ක් යනකල් ඒ බෙහෙත් වර්ග 333හි හිඟයක් පවතිනවා. මම මේ වෙලාවේ ඒ කාරණය විශේෂයෙන් කියන්න ඕනෑ. මෙන්න මේක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ඉඳලා lists හදන්නේ නැතුව සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තට එන්න කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තට ඇවිල්ලා ඒ ලැයිස්තු ටික හදන්න. එතැන ඉඳලා තොරතුරු ගත්තොත් හරියටම මේ හිඟය මොකක්ද කියලා ඔබතුමන්ලාට බලා ගන්න පුළුවන්.

ඊළඟට මම යෝජනා කරනවා, ඖෂධ මිල දී ගන්න ක්‍රමයක් හදාගන්න කියලා. තිබුණු ක්‍රමවේදය අද බිඳ වැටිලා තිබෙනවා. ආණ්ඩුව හිතාගෙන ඉන්නවා මේ අමාත්‍යාංශය ඇතුළේ ඉන්න නිලධාරීන් ඔක්කොම හොරු කියලා. ඒ නිසා නිලධාරීන් බයේ ඉන්නවා, ෆයිල් එකක් අරගෙන යන්න. තිබුණු ක්‍රමවේදය බිඳ වැටිලායි තිබෙන්නේ. 2016දී ඒ සඳහා හොඳ ක්‍රමයක් හදලා තිබුණා. සාමාන්‍යයෙන් ඖෂධ හිඟය සොයා ගන්න ඊළඟ වසරට බෙහෙත් කොච්චර අවශ්‍ය ද කියලා මේ වසරේ හොයනවා; ඒවා ගණනය කරනවා; සැපයුම්කරුවන් තෝරා ගන්න ප්‍රසම්පාදන කටයුතු කරනවා. එහෙමයි ඉස්සර කටයුතු කළේ. ඒ නිසා මම ගරු ඇමතිතුමාට කියනවා, ඒ ක්‍රමය ආපහු අනුගමනය කරන්න කියලා. සාමාන්‍යයෙන් නොවැම්බර් මාසය වන කොට ඒ කටයුතු අවසන් වෙන්න ඕනෑ. නොවැම්බර් මාසයෙන් පස්සේ මිල දී ගැනීම් කරන්න ඕනෑ. එහෙම වුණාම තමයි ඊළඟ අවුරුද්දට බෙහෙත් ටික ගන්න පුළුවන් වෙන්නේ. මේ වසරේ ඖෂධ මිල දී ගැනීමේ මූලික කටයුතු තවම අවසන් වෙලා නැහැ. ඒ කියන්නේ 2025 සැප්තැම්බර් වනකල් මේ කියන ඖෂධ 333 සම්බන්ධයෙන් හරියට කියාගන්න බැරි වෙනවා; රෝගීන්ට බෙහෙත් ටික ගන්න බැරි වෙනවා. මම කියනවා, 2022 ආර්ථික අර්බුදයක් තිබිලාත් මෙවැනි හිඟයක් තිබුණේ නැහැ කියලා. ඒ නිසා රාජ්‍ය නිලධාරීන්ටම දොස් කියන්න එපා. ඒ අය හොරු ගොඩට දමලා කටයුතු කරන්න එපා. ඒ අය බයයි. අද මේ සැපයුම් ජාලයේ අර්බුදයට හේතු වෙලා තිබෙන්නේ ඒකයි. ඒ නිසා ඒ ගැනත් හිතලා කටයුතු කරන්න.

මම ඉස්සෙල්ලාත් කිව්වා, 2016දී ඒකට App එකක් හැදුවා කියලා. ඒක සොයා ගන්න. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ආපු ගමන් කළේ ඒක නවත්තලා දමපු එක. ඒකෙන් වුණේ බෙහෙත් නැතිකමට වඩා බෙහෙත් ඉතිරි වෙලා තිබෙන්නේ කොහේද කියලා සොයා ගන්න ක්‍රමවේදයක් නැති වුණු එකයි. අද බෙහෙත් ඉතිරි වෙලා තිබෙන්නේ රෝහල්වල ද, ගබඩාවල ද කියන එක සොයා ගන්න බැහැ. ඒ නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, 2015 - 2019 වනකල් පාවිච්චි කරපු App එක සොයා ගන්න, ඒකේ වෙනස්කම් කරන්න අවශ්‍ය නම් ඒවා වෙනස් කරන්න, ඒක පාවිච්චි කරන්න, ජනතාවට සහන දෙන්න, බෙහෙත් ටික ඉක්මනට ගෙනැවිත් දෙන්න, ජනතාවාදී වෙන්න කියලා. ඒ වාගේම, ඖෂධ මිලත් නියාමනය කරන්න. අද වන කොට හිතූ මනාපයට බෙහෙත් මිල එහේ මෙහේ ගිහින් තිබෙනවා. යහ පාලනය කාලයේ ඖෂධ වර්ග 48ක මිල අඩු කළා. ඒ, මිල නියාමනය තුළින්. ඒ නිසා 2019දී වසරකට ඖෂධ සඳහා අවශ්‍ය වෙලා තිබුණු මුදල වූ රුපියල් බිලියන 14, රුපියල් බිලියන 4 දක්වා බිලියන 10කින් අඩු කර ගන්න පුළුවන් වුණා. ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවෙන් App එක වෙනස් කරපු නිසා ඖෂධ මිල බෙහෙවින් ඉහළ ගියා. ඒ නිසා ඒවා නැවත වතාවක් නියාමනය කරන්න අවශ්‍ය කටයුතු කරන්න. ඒ වාගේම, මම දෙවැනි වතාවටත් යෝජනා කරනවා, පෞද්ගලික රෝහල්වල සැත්කම් හා සේවා සඳහා තිබෙන මිල නියාමනයක් සිද්ධ වෙන්න ඕනෑ කියලා. එම මිල නියාමනය අවශ්‍යයි.

අද මෙම විවාදයේදී කථා කළ ගරු නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා කිව්වා "පවුලේ වෛද්‍යවරයා" කියන සංකල්පය ගැන. ඒක හොඳයි. හැබැයි මම කියනවා, ඒ කටයුත්ත කරපු අයට ඒකේ ගෞරවය දෙන්න කියලා. ඒ වැඩ පිළිවෙළ ඉස්සෙල්ලාම ආරම්භ කළේ 2017 වර්ෂයේ. ඒක මේ අය වැයෙන් ආවා නොවෙයි. මම දැක්කා ඇමතිතුමාත් බොහොම ලොකුවට කථා කරනවා, අවුරුදු 40ට වැඩි අයට health checkup එකක් හරහා වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමට පියවර ගන්නවා කියලා. අලුත් දෙයක් විධියට කිව්වාට, විශ්ව කර්ම වැඩක් විධියට කිව්වාට මේක අලුත් දෙයක් නොවෙයි. මම ඇමතිතුමාගෙන් අහනවා, stress එක වැඩි වන කොට dementiaවත් එනවාද කියලා. ඇයි එතුමාට මේවා අමතක වුණේ? යහ පාලන ආණ්ඩුව කාලයේ මේවා කළා. එතුමා දන්නවා, ලෝක බැංකුව මුලින්ම සෞඛ්‍ය සේවයට 2018 මැදිහත් වුණා කියලා. අබුඩාබිවල තිබුණු සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවකින් පසුව තමයි ඔය කියන තීරණය එළියට ආවේ. මම මේ අවස්ථාවේ "Reorganizing Primary Health Care in Sri Lanka" කියන වාර්තාවේ 30වන පිටුව **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ගරු ඇමතිතුමාටත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත්, මෙහි පිටපත් දෙකක් ලබා දෙන්න කියලා මම කියනවා. මේ වාර්තාවේ සඳහන් වන්නේ වයස අවුරුදු 35ට වැඩි පුද්ගලයන් සඳහා කියලායි. ඔබතුමන්ලා අවුරුදු 40 කියන එක, මේ වාර්තාවේ අවුරුදු 35 සිට ඉහළට කියලා තිබෙන්නේ. මේ බොරු ලියලා දෙන්න එපා. මෙහෙම ලණු දෙන්න එපා. මේ මනුස්සයා අමාරුවේ දමන්න එපා. ජිනීවා නුවර තිබුණු ඒ සමුළුවට හිටපු ඇමෙරිකානු ජනාධිපති ජිමී කාටර්, බිල් ගේට්ස්, ලෝක බැංකු අධිපති සහ ලංකාවේ සෞඛ්‍ය ඇමති විධියට හිටපු රාජිත සේනාරත්න මැතිතුමාත් සහභාගි වුණා. ඒකට මිලියන 200ක මුදලකුත් දුන්නා. නියෝජ්‍ය ඇමතිතුමනි, මේ වාර්තාවේ 30 වන පිටුවේ කොපියක් ඔබතුමාත් අරගෙන බලන්න. ඒකේ තිබෙනවා ඒ කතන්දරේ. මේ අවුරුදු 40 වන කල් ඉන්න එපා. ලෝකයේ රටවල උපතේ ඉඳලාම දරුවෙකුට සෞඛ්‍ය රක්ෂණයක් තිබෙනවා. එවැනි ක්‍රියා මාර්ග ගන්න කියලා මම යෝජනා කරනවා. තව බොරු කියන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒක නැහැ කියන්න බැහැ. දැන් ඉන්නේ සායනික විශේෂඥ වෛද්‍යවරු 1,900යි. මේ අවුරුද්දේ පුරප්පාඩු ලේඛනයේ 750ක් ඉන්නවා. දැන් සති දෙකක් වනවා, අද වනකොටත් මන්නාරම රෝහලට ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයෙක් නැහැ. අද එම රෝහල් පවත්වාගෙන යන්නේ Board certified doctorsලාගෙන් බවත් කියන්න ඕනෑ. අද උදේ වන විට, 2026 ස්ථාන මාරුවීම් ලැයිස්තුවට අනුව විශේෂඥ වෛද්‍යවරුන් 780කගේ හිඟයක් තිබෙනවා. විදේශ පුහුණුව අවසන් කරලා රටට ආපු වෛද්‍යවරු 278යි. ඉන් 100ක් සේවයට වාර්තා කරලා තිබෙනවා. ආයේත් 60ක් රට ගිහින් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මේ කාරණය කියලා මම අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට විශේෂඥ වෛද්‍යවරුන් 780ක් හිඟයි. එයින් එන්නේ 180යි. 2026 ස්ථාන මාරුවීම් කරනකොට විශේෂඥ වෛද්‍යවරු 600කගේ හිඟක් තිබෙනවා. ඊළඟට, ශල්‍ය වෛද්‍යවරු තනතුරු 180ක් තිබෙනවා. නමුත්, ඉන්නේ 130යි. 60දෙනෙක් හිඟයි. ඊළඟට, නිර්විඳ්ධන වෛද්‍යවරුන්ගේත් හිඟයක් තිබෙනවා. සමහර දිස්ත්‍රික්කවලට අක්ෂි වෛද්‍යවරු නැහැ. ළමා රෝග විශේෂඥ වෛද්‍යවරු 70ක් අඩුයි. ඒ වාගේ ගැටලු ගණනාවක් අද තිබෙනවා. එම නිසා මම යෝජනා කරනවා, මේ අය බඳවා ගන්න කටයුතු කරන්න කියලා. මුදල් පිළිබඳව ගැටලුවක් නම් තිබෙන්නේ, SriLankan Airlines එකට වෙන් කරපු මුදල් මේ රටේ ජනතාවට අවශ්‍ය වන, මේ රටේ ජනතාවට ලබා දෙන සේවා වැඩි කිරීම වෙනුවෙන් වෙන් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මම අවසාන වශයෙන් අහනවා, මේ රටට දැවැන්ත සේවයක් කරන ඩෙංගු කාර්ය සාධක බලකායේ අය ස්ථිර කරනවාද, නැද්ද? ඒ පණිවුඩය විතරක් දෙන්න.

අධිකරණ නියෝගයක් දීලා තිබෙනවා, හෝමියෝපති සභාව පිහිටුවන්න කියලා. හෝමියෝපති සභාව පිහිටුවලා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කරලා දෙන්න කියන එකත් ඉල්ලනවා.

පළාත් පාලන ඡන්දයට අමාත්‍යාංශයෙන් මාණ්ඩලික ශ්‍රේණියේ අය ඉදිරිපත් වෙලා තිබෙනවා. ඇමතිතුමා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ ධම්මික පයාගල මහතාත් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ අය නැවත සේවයට එන්න නොහැකිව අද ලොකු ගැටලුවක ඉන්නවා. ඒ අයට නැවත සේවයට එන්න දොර ඇරලා දීලා ජනතාවාදී වෙන්න. ඒවා නමට, කථාවට, වචනවලට සීමා කරන්න එපා කියන කාරණයත් මම කියනවා.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමිය සඳහන් කළ කාරණයක් ගැන පොඩි පැහැදිලි කිරීමක් කළ යුතුයි.

ඔබතුමිය සඳහන් කළේ 2017 වසරේ පටන් ගත්ත family medicine සඳහා වන වෛද්‍යවරුන් ගැන. අපි යෝජනා කරන්නේ, ප්‍රාථමික සෞඛ්‍ය ඒකකයක්. ඒ ප්‍රාථමික සෞඛ්‍ය ඒකකය සඳහා පවුලේ වෛද්‍යවරයෙක්, family physician කෙනෙක් - ඒකට ලියාපදිංචි වන කොට්ඨාසයේ මහ ජනතාවට වග කියන වෛද්‍යවරයෙක්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
කරුණාකරලා මේක එතුමාට ගිහින් දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, මේක කියවලා බලන්න. මේකේ තිබෙන්නෙත් ඒ ආකාරයටම තමයි. ඒවා වැඩිදියුණු කරන එක හොඳයි. ඒකට වෙන් කරපු මුදල කොච්චරද කියන එකත් සමාජගත කරනවා නම් හොඳයි.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)
ගරු ඇමතිතුමා මේ වෙලාවේ නැති නිසා මම උත්තරයක් දෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය කියපු කාරණාවලට මගේ කථාවේදී දීර්ඝව උත්තර දෙන්නම්. ඔබතුමිය බෙහෙත් සම්බන්ධව කියපු කාරණා සියල්ල අසත්‍යයි. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධව කියපු බොහෝ කාරණා අසත්‍යයි. ඇත්තටම මෙතැන වෛද්‍යවරු ඉන්නවා, විශේෂඥ වෛද්‍යවරු ඉන්නවා. ඔක්කෝම 20 ගණනක් ඉන්නවා. ඔබ technical කාරණා ගැන කියනකොට හොඳට homework කරලා එන්න. මගේ කථාවේදී මම ඒවාට උත්තර දෙන්නම්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය ගත වෙනවා, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ අමාත්‍යාංශයෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය ගත වෙනවා. ගරු මන්ත්‍රීතුමියනි, මේක සංවාදයක් කර ගන්න අවශ්‍ය නැහැ. කෙටියෙන් අවසන් කරන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමා කියනවා මේවා බොරු කියලා. මේ, අමාත්‍යාංශය නිකුත් කරපු වාර්තාව. මම දැන් ඒ වාර්තාව සභාගත කළා; ඔබතුමාට එව්වා. ඒක පෙබරවාරි 27වැනි දා ඉදිරිපත් කරපු වාර්තාව. ඒකේ තිබෙනවා, ඖෂධ 333ක් හිහයි කියලා.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
එහෙම වාර්තා ඉදිරිපත් කරන්නේ නැහැ. ඔබතුමිය මේ එක එක්කෙනා දීපු කොළ කැලි ගෙනැල්ලා මෙතැන කියවන්න එපා. මෙතැන ඉන්නේ subject එක දන්න මිනිස්සු. ඒකයි ප්‍රශ්නය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
කොළ කෑල්ලක් නොවෙයි, මහත්මයෝ. ඔබතුමාට දීලා තිබෙනවා නේ වාර්තාව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.57]

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ කථාවේදී සඳහන් කළ කාරණයක් ගැන කියමින් මම කථාව පටන් ගන්නම්. එතුමිය ඩෙංගු මර්දන සහායකයන් ගැන කථා කළා. ගරු ඇමතිතුමා ඔවුන් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග ගැන සඳහනක් කළා. ගරු මන්ත්‍රීතුමිය ඒ වෙලාවේ ගරු සභාවේ සිටියේ නැහැ. ඒක නිසා අනවබෝධයෙන් ඒක කියන්න ඇති.

ලංකාව ඇතුළේ national hospitals, PMCUs එක්ක ඔක්කොම 1,100කට වැඩි රෝහල් ප්‍රමාණයක් තිබෙනවා. MOH offices 560 ගණනක් තිබෙනවා. ඒවායේ විශේෂඥ වෛද්‍යවරුන්, ආචාර්යවරුන්, මහාචාර්යවරුන් ඇතුළුව කාර්ය මණ්ඩලය 110,000කට වැඩි ප්‍රමාණයක්, පුරප්පාඩු 12,000කට වැඩි ප්‍රමාණයක් එක්ක වැඩ කරනවා. ඒ නිසා ඔවුන් විශාල කාර්යභාරයක් කරනවා, මේ සෞඛ්‍ය පද්ධතිය නහා සිටුවීම වෙනුවෙන්. මේ රෝහල්වලට inward patientsලා විධියට මිලියන පහකට වැඩි ප්‍රමාණයක්, ඒ වාගේම outpatientsලා විධියට මිලියන 44කට වැඩි ප්‍රමාණයක් වාර්ෂිකව ඇතුළත් වෙනවා.

මේ අය වැයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් ඉතිහාසයේ වැඩිම මුදල විධියට රුපියල් මිලියන 406කට වැඩි ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. මමත් රෝහලක අවුරුදු හතරක් විතර වැඩ කළා. මෙච්චර කාලයක් මේ රට පාලනය කරපු පාලකයෝ, සෞඛ්‍ය ක්ෂේත්‍රය මොන තරම් පහත් තැනකට ඇද දැම්මාද, සෞඛ්‍ය ක්ෂේත්‍රයට මොන විධියටද සැලකුවේ කියලා යම් ප්‍රායෝගික අත්දැකීම් කිහිපයක් මටත් තිබෙනවා. හැබැයි, මෙතැනදී අපට තේරුණු විධියට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මුර දේවතාවුන්, දේවතාවියන් වාගේ තමයි විපක්ෂයේ මන්ත්‍රීවරු දැන් හැසිරෙන්නේ. හැබැයි, රෝහල් පද්ධතිය දිහා බැලුවාම, අපට අන්තිම ඵලයක් ඉතිරි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කරාපිටිය වාගේ රෝහලක සමහර සායනවලට එන ලෙඩ්ඩු ඊට කලින් දවසේ රෑ ඇවිල්ලා, ඉස්සරහ තිබෙන පන්සලේ නතර වෙලා ඉඳලා, පහුව දා උදේ තමයි අදාළ සායනයට එන්නේ. මම වෛද්‍ය ශිෂ්‍යයකු විධියට ඉගෙන ගනිද්දී ඒක දැකලා තිබෙනවා. ඒවා තමයි, මේ සෞඛ්‍ය පද්ධතිය මේ ගොල්ලෝ ගෙනාපු තැනේ අග්‍රඵල.

අපේ වෛද්‍යවරු උදේ private practise කරනවා, ආයෙත් රෝහලට එනවා. ඊට පස්සේ ආයෙත් සවස private practice කරනවා. මොන ජීවිතයක්ද? මුළු ජීවිතයම job එක වෙනුවෙන් වැය කරලා තිබෙනවා. මේවා තමයි, මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය මේ ගොල්ලෝ ගෙනාපු තැන්වල අග්‍රඵල. හැබැයි, ඒවා අස්සේ පවා හොරකම් කළේ නැද්ද? ඒවා අස්සේ පවා වංචා කළේ නැද්ද? හිටපු සෞඛ්‍ය ඇමතිතුමා, කෙහෙලිය රඹුක්වැල්ල මහත්මයා බාල බෙහෙත් ගෙනාවා. ඒ බාල බෙහෙත් ගෙනාපු කෙහෙලිය රඹුක්වැල්ල හිටපු ඇමතිතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනාපු වෙලාවේ එතුමාගේ පැත්ත ගත්ත මන්ත්‍රීවරුන් හතරපස්දෙනෙක් මේ ගරු සභාවේ ඉන්නවා. උදේ බණ කියලා ගියා, ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. එතුමා ගත්තේත් කෙහෙලිය රඹුක්වැල්ලගේ පැත්ත. ඒ වාගේම, ඊයේ බණ කිව්වා ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඒ මන්ත්‍රීතුමාත් ගත්තේ කෙහෙලිය රඹුක්වැල්ල මහත්මයාගේ පැත්ත. ඒ වාගේම තමයි, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත්. බාල බෙහෙත් ගෙනැල්ලා, මිනිස්සුන්ගේ ඇස් අන්ධ වුණා. හැබැයි, එතුමාත් ගත්තේ කෙහෙලිය රඹුක්වැල්ල මහත්මයාගේ පැත්ත. ඊළඟට, ගරු වාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා ගත්තේත් කෙහෙලිය රඹුක්වැල්ල මහත්මයාගේ පැත්ත. *[බාධා කිරීමක්]* ඒ නිසා මෙතුමන්ලා පවසන දේත්, මෙතුමන්ලාගේ ප්‍රායෝගික භාවිතයත් අතර තිබෙනවා විශාල වෙනසක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන් කොහොමද හොරකම් කළේ කියන එක දකින්න, තංගල්ල රෝහලේ තිබෙනවා, ICU එකට හදපු ගොඩනැඟිල්ලක්. ඒක 2009දී හැදුවේ. ඒ ගොඩනැඟිල්ලේ සමරු ඵලකයේ පින්තූරයක් මම ගෙන්වා ගත්තා. ඒ සමරු ඵලකයේ මේ අයගේ නම් තිබෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ කාලයේ ජනාධිපති. එතුමාගේ නම තිබෙනවා. මහින්ද අමරවීර මහත්මයාගේ නම තිබෙනවා, එතුමාත් ඒ කාලයේ ඇමතිවරයෙක්. නිමල් සිරිපාල ද සිල්වා මහත්මයාගේ නම තිබෙනවා, එතුමාත් ඇමතිවරයෙක්. චමල් රාජපක්ෂ මහත්මයාගේ නම තිබෙනවා. ඊළඟට, ෂාන් විජේලාල් ද සිල්වා මහත්මයාගේ නම තිබෙනවා. ඒක 2009දී හැදුවේ. දැන් වසර ගණනාවක් තිස්සේ ඒ ගොඩනැඟිල්ල දිරාපත් වෙමින් තිබෙනවා. ඉතින්, තමන්ගේ හිතවතුන්ට කොන්ත්‍රාත් දීලා, ඒවා ප්‍රමිතියක් නැතිව හදලා ඔහේ ගරා වැටෙනවා. එහෙම තමයි සෞඛ්‍ය වෙනුවෙන් කටයුතු කළේ, ඒ ඇමතිවරු වාගේම හිටපු නිලධාරීනුත්. 2019 ඔක්තෝබර් 2 දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්, චීන සමාගමක් සහ මැලේසියානු සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කළා, යෝජිත විද්‍යුත් රූප සංරක්ෂණ සහ සන්නිවේදන පද්ධතියක් හා විකිරණ තොරතුරු පද්ධතියක් - PACS and RIS - සම්බන්ධයෙන්. 2019දී රෝහල් 20ක් සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කළා. රෝහල් 20ක් සම්බන්ධයෙන් ගිවිසුම අත්සන් කළාට, ඒ කිසිම

[ගරු සඳරුවන් මදරසිංහ මහතා]

රෝහලකින් මේ වාගේ සන්නිවේදන පද්ධතියක් හදන්න කියලා විධිමත් ඉල්ලීමක් කරලා නැහැ. ඒ වෙනකොටත් රජයේ රෝහල්වල සන්නිවේදන පද්ධතියක් තිබිලා තිබෙනවා, HHIMS; එහෙම නැත්නම් HIMS කියලා. මේ මෘදුකාංග පද්ධතිය රජයේ රෝහල්වල තිබෙනවා. මේ අලුතින් පද්ධතියක් හදන්න වෙන් කරන මුදලින් ඒ තිබෙන පද්ධතිය නඩත්තු කරලා ගන්න පුළුවන්, අලුත් පද්ධතියක් විධියට. ඒ රෝහල් 20 සඳහා ඒ පද්ධතියට පිරිවැය විධියට ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 350ක් වැය කරනවා. අවුරුදු 11ක කාලයකදී මේ මුදල ගෙවන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ පොලිය ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 33.6ක්. ඊට පස්සේ අමාත්‍ය මණ්ඩල සාකච්ඡාවකින් පසුව මේ පිරිවැය අඩු කරලා තිබෙනවා ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 332කටත්, පොලිය ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 13.05කටත්, අවුරුදු 11කින් ගෙවන්න. එේ ගිවිසුම අත්සන් කරලා තිබෙනවා 2019දී. මාස තුනකින් මේ කටයුත්ත අවසන් කරන්න ඕනෑ කියලා තමයි ගිවිසුම අත්සන් කර තිබෙන්නේ. හැබැයි, 2023 වෙනකොටත් ඒ ගිවිසුමට අනුව කටයුතු අවසන් කරලා නැහැ. රෝහල් 20ක් සඳහා ගිවිසුම අත්සන් කළාට, රෝහල් පහකයි මේ කටයුත්ත කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට 2022දී මේ ගැන හොයන්න පංච පුද්ගල කමිටුවක් පත් කළා. ඒගොල්ලන්ගේ අවසන් නිර්දේශය වුණේ සමස්තයක් ලෙස ව්‍යාපෘති අසතුටුදායකයි කියලායි. ඊළඟට, පළමු වාරිකය විධියට ගෙවන්න කියලා තිබෙනවා මේ හදාපු රෝහල් පහට. හැබැයි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් ඉල්ලීමක් කරනවා රෝහල් 20ටම ගෙවන්න කියලා. රෝහල් පහක් නම්, වාරිකය වෙන්නේ ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 54.8යි. හැබැයි, නිලධාරීන් කිහිප වතාවක් ඉල්ලීම් කරනවා ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 30.2ක් වුණු රෝහල් 20ටම අදාළ මුළු මුදල ගෙවන්න කියලා. ඊළඟට, ඒ ගෙවීම කර තිබෙනවා. මෙහිදී පංච පුද්ගල කමිටුව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය වාගේම ජාතික අය වැය දෙපාර්තමේන්තුව යන සියල්ල නොසලකා හරිමින් මේ ගෙවීම් කරලා තිබෙනවා. ඊටත් වඩා වෙලා තිබෙන දේ තමයි, මේවායේ ලිපි ගොනු සැලකිය යුතු ප්‍රමාණයක් අතුරුදහන් ලු. ඉතින් මේ විධියට තමයි සෞඛ්‍ය සේවාව වෙනුවෙන් මේ ගොල්ලන්ගේ මැදිහත්වීම තිබුණේ. විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් මේ ගොල්ලන් ඉදි කරලා අතරමඟ නතර කරපු ගොඩනැඟිලි විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම සමහර අත්‍යවශ්‍ය ගොඩනැඟිලි අලුතෙන් ඉදි කළ යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 13,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ, ගොඩනැඟිලි 40කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහායි. මේ මුදල් යොදා ගෙන තිබෙන්නේ සමහර ගොඩනැඟිලි සම්පූර්ණ කරන්නයි, සමහර ඒවා ඉදි කරන්නයි.

අලුතෙන් CT scanners ලබා දෙන්නත් කටයුතු කරනවා. විශේෂයෙන්ම කළුබෝවිල රෝහල, කොළඹ ජාතික රෝහල, කරාපිටිය රෝහල, නුවර රෝහල ඇතුළු රෝහල් ගණනාවකට අලුතෙන් CT scanners ලබා දෙන්න මේ ආණ්ඩුව කටයුතු කරනවා. ඒ වාගේම මේ ආණ්ඩුව විසින් MRI machines වෙනුවෙන් ගාල්ල, නුවර, සහ LRH රෝහල සඳහා මේ ආණ්ඩුව විසින් මුදල් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හෘද රෝගීන් දහස් ගණනක් තමන්ගේ ශල්‍යකර්මය කර ගන්න බැරිව අවුරුදු 3ක්, 4ක්, 5ක් පෝලිමේ ඉන්නවා කියලා අපි දන්නවා. සමහර රෝගීන් ශල්‍යකර්මය කරගන්න කලින් මැරෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, JICA ව්‍යාපෘතිය ගැන ගරු ඇමතිතුමා සඳහන් කළා. ඊට අමතරව රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද රෝග මධ්‍යස්ථානයක් වෙනුවෙන් රුපියල් මිලියන 1,600ක්, ඒ වාගේම අම්පාර රෝහල වෙනුවෙන් රුපියල් මිලියන 200ක්, ඒ වාගේම බදුල්ල ශික්ෂණ රෝහලේ හෘද ඒකකයක් වෙනුවෙන් රුපියල් මිලියන 60ක්, ඒ වාගේම රත්නපුර රෝහලේ හෘද ඒකකයක් වෙනුවෙන් රුපියල් මිලියන 400ක මුදලක් වෙන් කරන්න කටයුතු කරමින් ඉන්නවා.

පිළිකා සඳහා ප්‍රතිකාර කරන ලිනැක් යන්ත්‍ර පිළිබඳව ගරු ඇමතිතුමා සඳහන් කළා. ඊට අමතරව මහනුවර රෝහලේ ඇට මිදුළු බද්ධ කිරීමේ ඒකකය වෙනුවෙන් -විශේෂයෙන් තැලිසීමියා රෝගීන්ට- රුපියල් මිලියන 250ක්, ඒ වාගේම මහනුවර ශික්ෂණ රෝහලේ පිළිකා රෝහල ඉදි කිරීමට රුපියල් මිලියන 620ක්, රත්නපුර ශික්ෂණ රෝහල සඳහා මහල් තුනකින් යුතු පිළිකා රෝග ඒකකයක් වෙනුවෙන් රුපියල් මිලියන 248ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මුල්ලේරියාව මූලික රෝහලේ ජාතික ආසාත මධ්‍යස්ථානයක් ඉදි කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම කරාපිටිය රෝහල ගත්තාට පස්සේ surgical and medical wards දෙකක් වෙනුවෙන් මහල් අටකින් යුතු ගොඩනැඟිල්ලකට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම එම රෝහලේම මහල් හතකින් යුතු ළමා වාට්ටු සංකීර්ණයක් වෙනුවෙන් මුදල් වෙන් කිරීම පිළිබඳව දැනට අධ්‍යයනය කරමින් පවතිනවා.

මේ විධියට යටිතල පහසුකම් සංවර්ධනය කරන්න මේ ආණ්ඩුව විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. එහෙම මුදලක් වෙන් කරලා තිබෙද්දීත් තමයි විශේෂයෙන්ම සෞඛ්‍ය සේවකයින් අතර යම් නොසන්සුන්තාවක් ඇති වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ජාතික ජන බලවේගය විසින් ඉදිරිපත් කරපු පළමුවැනි අය වැය. එකම අය වැය නොවෙයි. හැබැයි අපි හිතනවා, එතෙක් මෙතෙක් සෞඛ්‍ය සේවාව ගැන කථා කරපු හොඳම අය වැය මෙය බව. 2000 ඉඳන් 2024 වෙනතුරු කිසිම අය වැයක සෞඛ්‍ය සේවකයෙකුගේ වැටුපක් ගැන කථා කරලාවත් නැහැ. හැබැයි, දැන් මෙතැන සිටින මන්ත්‍රීවරුන්ගෙත්, එළියේ සිටින බොහෝ පිරිසකගෙත් ප්‍රධාන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා, සෞඛ්‍ය සේවාවන්ගේ වැටුප් ගැන. අපට සතුටුයි, structure එක පවා ඔක්කෝම දැන ගත්තා. ඒකත් ලොකු දෙයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි වේලාවක් දෙන්න; මම අවසන් කරන්නම්.

සෞඛ්‍ය සේවාව ගැනත්, සෞඛ්‍ය සේවකයින් ගැනත්, ඒ වාගේම ව්‍යාත්තීය සමිති ගැනත් හොඳ කියැවීමක් ආණ්ඩුවට තිබෙනවා. අපිත් වෛද්‍යවරු වශයෙන් තමයි සේවය කළේ. අපි පිළිගන්නවා, මේ වැටුප මෙතැනින් නතර වෙන එක සාධාරණ නැහැ කියලා. මේකත් මදි. අපට 1/80 , 1/120න් එක නොවෙයි 1/60 එක කරන්න පුළුවන් නම් හොඳයි. අපට 1/160 එක, 1/200 එක නොවෙයි, 1/120 එක කරන්න පුළුවන් නම් හොඳයි. හැබැයි, මේ නිශ්චිත මොහොතේ ආණ්ඩුව විවිධ පැතිවලින් ඒ සේවකයන්ට ගොඩක් සහන ලබා දීලා තිබෙනවා. ඒ නිසා මේ නිශ්චිත එක කාරණයක් අල්ලා ගෙන ඔය තත්ත්වයේ විවේචන ගෙන ඒම අසාර්ථකයි කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ආණ්ඩුව වැටුපට දඩ ගහලා උපදේශකයන්ට සැප දීපු ආණ්ඩුවක් නොවෙයි. මේ ආණ්ඩුව වැටුප් ඉල්ලනකොට IMF එකෙන් ගිහිල්ලා ඉල්ලා ගන්න කියපු ආණ්ඩුවකුත් නොවෙයි. මේ ආණ්ඩුව මුට්ටි දාලා ධම්මික පැණිය promote කරලා වෛද්‍ය සේවාව හැල්ලු කරපු ආණ්ඩුවකුත් නොවෙයි. ඒ නිසා, අපිව පත් කරපු විධියටම මේ සෞඛ්‍ය සේවකයින් අපිත් එක්ක මේ රට, සෞඛ්‍ය සේවාව වෙනස් කරන්න එකතු වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් ඔවුන්ට ලබාදිය යුතු සියලු ගෞරවය ලබා දෙන්න අපි කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[ප.ව. 3.09]

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கும் மற்றும் அனைவருக்கும் முதலில் எனது வணக்கத்தையும், சுகாதார அமைச்சு சம்பந்தமாக உரையாற்றச் சந்தர்ப்பமளித்தமைக்கு எனது நன்றியையும் தெரிவித்துக்கொண்டு, எனது உரையை ஆரம்பிக்கின்றேன்.

2025ஆம் ஆண்டுக்கு சுகாதார அமைச்சுக்கு ஏறக்குறைய 508.5 பில்லியன் ரூபாயை, அதாவது 12%ஆன தொகையை ஒதுக்கிய சுகாதார அமைச்சர் அவர்களுக்கும் மற்றும் சுகாதாரத் துறை சார்ந்தவர்களுக்கும் எனது வாழ்த்துக்களையும் நன்றியையும் தெரிவித்துக் கொள்கின்றேன். உண்மையாகவே நீங்கள் நிறைய நல்ல விடயங்களைச் செய்திருக்கின்றீர்கள். கர்ப்பிணித் தாய்மாருக்கான ஊட்டச்சத்து, 'திரிபோஷா' சத்துணவு, 'சுவசெரிய' அம்புலன்ஸ் சேவை மற்றும் ஓய்வூதியம் பெறும் உறுப்பினர்களுக்கான உதவி போன்ற திட்டங்களுக்குப் பாரிய நிதியை ஒதுக்கிப் பல நன்மையான விடயங்களைச் செய்வதற்குத் திட்டமிட்டிருக்கின்றீர்கள். நானும் ஒரு வைத்தியர் என்ற அடிப்படையிலே, இந்த இடத்திலே தங்களுக்கு எனது வாழ்த்துக்களை மீண்டும் தெரிவித்துக் கொள்கின்றேன்.

எனது பிரதேசம் சார்ந்த பிரச்சினைகளையும் நான் முன்வைக்கவேண்டிய தேவையிருக்கின்றது. மட்டக்களப்பு மாவட்டமானது ஒரு போதனா வைத்தியசாலையைக் கொண்டிருக்கின்றது. கிழக்கு மாகாணத்திலே பாரியளவு சேவையாற்றுகின்ற அந்த வைத்தியசாலையிலே மிக முக்கியமான பல வேலைத்திட்டங்களை முன்னெடுக்கவேண்டிய தேவையிருக்கின்றது. நீண்டகாலமாக அங்கு MRI இயந்திரம் இல்லை. இந்த முறை பெற்றுத் தருவதாகக் கடந்த குழுக் கூட்டத்திலும் உறுதியளிக்கப்பட்டிருந்தது. அதனோடு இணைந்ததாக இந்த cath lab செயற்றிட்டமும் முன்னெடுக்கப்பட வேண்டும். கடந்த வருடம் draft documentஇலே MRI, cath lab மற்றும் CT scan ஆகிய விடயங்களை Asian Development Bank programmeஇன் ஊடாகச் செய்வதாகச் சொல்லப்பட்டிருந்தது. ஆனால், இந்த வருடம் அது மாற்றப்பட்டு, MRI இயந்திரம் வழங்குவது மட்டும் உறுதியாகச் சொல்லப்படுகின்றது.

தனது உள்ளகப் பயிற்சிநெறியை முடித்தவர் என்ற அடிப்படையில், கௌரவ அமைச்சருக்கு மிகப் பாரிய பொறுப்பிருக்கின்றது. அந்த வகையில், மட்டக்களப்புப் போதனா வைத்தியசாலையை முன்னேற்றகரமாகக் கொண்டுசெல்வதற்கான முழுப்பொறுப்பும் அவருடைய கையிலே தங்கியிருக்கின்றது என்பதை நான் இந்த இடத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன். தங்களுடைய அரசாங்கத்தின் காலப்பகுதியில் மட்டக்களப்புப் போதனா வைத்தியசாலை பாரிய அபிவிருத்தியைக் காணவேண்டுமென்ற எதிர்பார்ப்பும் எனக்கு இருக்கின்றது. அந்த வகையில், அந்த cath lab, CT scan இயந்திரங்கள் போன்ற விடயங்கள் பற்றியும் நீங்கள் கரிசனைகொண்டு, இம்முறை வரவு செலவுத்திட்ட ஒதுக்கீட்டின்மூலம் அவற்றை வழங்க வேண்டுமென்ற ஒரு விண்ணப்பத்தையும் போதனா வைத்தியசாலைக்குச் சிகிச்சை பெற வருகின்ற நோயாளர்கள் சார்பாக நான் உங்களிடம் முன்வைக்கின்றேன்.

அதற்கப்பால், எங்களது பிராந்திய சுகாதார சேவைப் பணிமனையினூடாகப் பல விடயங்களை நாங்கள் முன்னேற்றகரமாகக் கொண்டுசெல்லவேண்டி இருக்கின்றது. எம்மைப் பொறுத்தளவில் வட, கிழக்கில், பிரதானமாக மட்டக்களப்பு மாவட்டத்தில் உள்ள 90 சதவீதத்திற்கும் மேற்பட்ட வைத்தியசாலைகள் மாகாண சபையினூடாக நிர்வகிக்கப்படுகின்றபொழுதும், அவற்றுக்கான நிதி ஒதுக்கீடுகள் மிகக் குறைவாகவே இருக்கின்றது. மிகப் பிரதானமாக, மட்டக்களப்பு மாவட்டத்திலே type A தரத்தில் இருக்கின்ற களுவாஞ்சிக்குடி மற்றும் வாழைச்சேனை ஆதார வைத்தியசாலைகளிலே - base hospitals - பாரிய ஆளணிப் பற்றாக்குறை காணப்படுகின்றது. அத்தோடு, களுவாஞ்சிக்குடி ஆதார வைத்தியசாலையிலே ஒரு consultant anaesthetist இல்லை; paediatrician இல்லை. ஆனால், இது ஒன்றரை இலட்சத்திற்கும் மேற்பட்ட மக்களுக்குச் சேவை செய்கின்ற பாரியதொரு வைத்தியசாலையாக இருக்கின்றது. இவற்றையும் நீங்கள் கருத்திற்கொண்டு, உடனடியாக இதற்குரிய ஏற்பாடுகளைச் செய்துதர வேண்டும். அதுபோல, வாழைச்சேனை வைத்தியசாலையும்கூட type A தர base hospitalஆக இருக்கின்றபொழுதும், அங்கு ஒரு கணக்காளர் நியமிக்கப்படவில்லை. இது மிக முக்கியமான தேவையாக இருக்கின்றமையால், இந்த விடயத்தையும் கருத்திற்கொண்டு அதனை நிறைவேற்றித் தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

மேலும், பொதுச் சுகாதாரத் துறையைப் பொறுத்தளவிலே அதைப் பாரியளவு முன்னேற்றகரமாகக் கொண்டுசெல்ல வேண்டிய தேவையிருக்கின்றது. அதற்கு, இந்த ஆரம்ப சுகாதாரப் பிரிவை விருத்தி செய்வதன்மூலம் பாரியளவு செலவைத் தவிர்த்துக்கொள்ள முடியும். எங்களுடைய பொதுச் சுகாதார சேவையில், 14 சுகாதார வைத்திய அதிகாரி பிரிவுகள் இருக்கின்றன. அவற்றில் பாவிக்கப்படுகின்ற வாகனங்கள் 30 வருடங்களுக்கும் மேலானவையாகக் காணப்படுவதனால், டெங்கு வேலைத் திட்டங்களுக்காக அந்த வாகனங்களில் செல்கின்றபோது புகையடிப்பது வாகனமா அல்லது புகையடிக்கும் இயந்திரமா? என்றுகூட அறிய முடியாதளவுக்கு அந்த வாகனங்கள் மிகப் பழுதடைந்திருக்கின்றன. இதனையும் நீங்கள் கருத்திற்கொண்டு எதிர்காலத்தில் அவர்களுக்குத் தேவையான வாகனங்களை வழங்க நடவடிக்கை எடுக்கவேண்டும்.

மேலும், நல்லாட்சிக் காலத்தில் உள்வாங்கப்பட்ட SKS எனப்படுகின்ற டெங்கு ஒழிப்பு வேலைத்திட்டத்திலிருக்கின்ற உத்தியோகத்தர்கள் படிப்படியாக மற்றைய அரசாங்கக் காலங்களில் பழிவாங்கப்பட்டு, நிரந்தரமாக்கப்படாமல்

[ගරු ඉලෙයතම්බි සිරිනාත් මහතා]

නීණ්ඩකාලමාක 20,000 - 21,000 රූපාය් සම්පළත්තෙ මට්ටුම් එටුත්තුක්කොණ්ටු, 'කොරෝනා' මර්රුම් පොරුළාතාර නෙරුක්කටි කාලප්පකුතිකළිලුම් නම්පික්කෙයෝටු කටමෙයාර්රිනාර්කළ්. අවර්කළුක්කාන නිරන්තර නියමනත්තෙ වළංකුවතර්කාන සෙය්තිට්ටත්තෙ උංකළ් කාලප්පකුතියිල් නිරෙවු සෙය්යවේණ්ටුමෙන්ර විණ්ණප්පමොන්රෙ නාන් මුන්වෛක්කින්රේන්.

අටුත්තු, ඉතනුටන් සම්පන්තප්පට්ටතාක ඉල්ලාවිට්ටාලුම් වාළෛච්චේනෙ ආතාර වෛත්තියසාලෙ පර්රිය ඔරු විටයත්තෛක් කුරිප්පිට වේණ්ටුම්. වාළෛච්චේනෙ ආතාර වෛත්තියසාලෙ කෝතළෛප්පර්රුප් පිරතේසත්තිල් අමෛන්තුළ්ළතු. අංකු නිකළුම් පිරප්පු මර්රුම් ඉරප්පුප් පතිවුකළ් තර්පෝතු කෝතළෛප්පර්රුප් පිරතේස සෙයලකත්තිල් නටෛපෙරුකිරතු. ඉතු සම්පන්තමාක මුන්නෛය අරසාංකත්තින් අමෛච්චරවෛක් කූට්ටත්තිලුම් විවාතික්කප්පට්ටතු. අතු කෝතළෛප්පර්රු පිරතේසත්තුක්කාන වෛත්තියසාලෛතාන් එන්රු එංකළාල් ආණිත්තරමාකක් කූරමුටියුම්. අංකු සුකාතාර වෛත්තිය අතිකාරි අලුවලකම් අරුකිල් ඉරුක්කින්රතු. ඉන්ත විටයත්තෛයුම් නීංකළ් මිකක් කවනමාකක් කවනික්ක වේණ්ටුම්.

එංකළුටෛය සිත්ත මරුත්තුවත්තෛප් පොරුත්තවරෛයිල් අතිකමානෝර් වේලෛ වාය්ප්පිල්ලාමල් ඉරුක්කින්රාර්කළ්. 2,258 පේර් සේවෛයිලුළ්ළපෝතුම්, 1,624 පේර් කාත්තිරුප්පෝරාක ඉරුක්කින්රනර්. එංකළුටෛය නාට්ටුක්කුරිය පාරම්පරියමාන සිත්ත වෛත්තියත් තුරෛයෛ නාංකළ් කෛවිට්ටුවිට මුටියාතු. ඉන්ත විටයත්තිනෛයුම් කරුත්තිර්කොණ්ටු අවර්කළුක්කුරිය වේලෛවාය්ප්පිනෛ ඒර්පටුත්තික් කොටුක්ක වේණ්ටිය තේවෛයිරුක්කිරතු.

මේලුම්, එමතු පොතුච් සුකාතාරත් තුරෛයුටන් ඉණෛන්තතාක ඉන්නුමොරු විටයත්තෛච් සොල්ලවේණ්ටුම්. තිරුකෝණමලෛ මාවට්ටත්තිල් මිකමුක්කියමාක oncology අතාවතු cancer සිකිච්සෛප් පිරිවු ඉල්ලෛ. අතර්කුරිය ඒර්පාටුකළුම් උංකළුටෛය කාලප්පකුතියිල් මේර්කොළ්ළප්පට වේණ්ටුමෙන්රු කේට්ටුක් කොළ්කින්රේන්.

එංකළුටෛය මට්ටක්කළප්පු මේර්කු, පටුවාන්කරෛප් පිරතේසත්තිල් 10 - 20 කිලෝ මීර්රරුක්කු අප්පාලුම් පල කිරාමංකළ් ඉරුක්කින්රන. අංකුළ්ළ මක්කළුක්කාන වෛත්තියසාලෛකළ්, සිරිය සිරිය dispensaryආක අල්ලතු සාතාරණ වෛත්තියසාලෛකළාක ඉරුක්කින්රන. අවෛ තරමුයර්ත්තප්පට වේණ්ටුම්. උතාරණමාක, මකිළුවිත්තීවු වෛත්තියසාලෛයෛත් තරමුයර්ත්තුවතර්කුරිය නටවටික්කෛකළෛ මේර්කොළ්ළවේණ්ටුමෙන්රු කේට්ටුක් කොළ්කින්රේන්.

ඉන්රෛය විවාතත්තිල් ඌටකත්තුරෛ සාර්පාකවුම් සිල විටයංකළෛත් තෙරිවික්ක විරුම්පුකින්රේන්. කටන්ත කාලංකළිල් අටක්කුමුරෛකළින්මූලම් ඌටකච් සුතන්තිරම් පාතික්කප්පට්ටිරුන්තතු. ඉන්රෛය කාලප්පකුතියිල් අන්ත නිලෛමෛ සර්රු නිවර්ත්තික්කුළ්ළාකි, මූච්චුවිටක්කූටියතාක ඉරුක්කින්රතු. කටන්ත කාලත්තිල් මට්ටක්කළප්පු මාවට්ටත්තිල් අවර්කළුක්කුරිය අටෛයාළ අට්ටෛයෛ වළංකුවතිල්කූට පාරිය නෙරුක්කටි ඉරුන්තතු. එනවේ, මට්ටක්කළප්පු සුතන්තිර ඌටකවියලාළර් සංකත්තිනූටාක අවර්කළෛ අටෛයාළප්පටුත්ති, අවර්කළුක්කුරිය අටෛයාළ අට්ටෛයෛ වළංක වේණ්ටුමෙන්රු නාන් ඉන්ත ඉටත්තිල් කේට්ටුක් කොළ්කින්රේන්.

කටන්ත කාලංකළිල් එල්ලා ඉටංකළිලුම් ඌටකවියලාළර්කළ් තාක්කප්පට්ටාර්කළ්, කොන්රොළික්කප්පට්ටාර්කළ්. කුරිප්පාක, වටක්කු, කිළක්කුප් පකුතිකළිල් මිකප් පාරියළවිල් ඌටක තර්මම් මිතික්කප්පට්ටතු, කුරල්වළෛ නෙරික්කප්පට්ටතු. එනවේ, නීංකළ් මික උණ්මෛයාක පොරුප්පුටන් උංකළුටෛය සෙය්පාටුකළෛච් සෙය්තු, ඌටකත් තුරෛක්කුරිය අංකීකාරත්තෛයුම් සුතන්තිරත්තෛයුම් උරුතිප්පටුත්ත වේණ්ටුමෙන්රු කේට්ටුක්කොණ්ටු, මාවට්ටත්තිල් සුකාතාරත් තුරෛයෛ උංකළුටෛය කාලප්පකුතියිල් අපිවිරුත්തි සෙය්වතර්කුරිය උරුතිප්පාට්ටෛයුම් නීංකළ් තරවේණ්ටුමෙන්ර වේණ්ටුකෝළෛ මක්කළින් සාර්පාක මුන්වෛත්තු, විටෛපෙරුකිරේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම, මේ රටේ වෛද්‍යවරුන්, හෙද හෙදියන්, සෞඛ්‍ය කාර්ය සහායකයින්ගේ ඉදලා ආයුර්වේද, හෝමියෝපති, පාරම්පරික වෛද්‍ය සේවාව ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල සියලු දෙනාට අපේ ස්තුතිය පිරිනමන්න ඕනෑ. මොකද, මේ රටේ අද අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යම්කිසි ජයග්‍රහණයක් ලබා තිබෙනවා නම්, ඒ ජයග්‍රහණයට ඔවුන් තමයි සම්පූර්ණයෙන් දායක වුණේ. ආණ්ඩු කොයි තරම් මුදල් වෙන් කළත්, මේ අයගේ කැපවීම නිසා අද රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පැත්තෙන් විශාල දියුණුවක් අපි ලබාගෙන තිබෙනවා කියන එක මම කියන්න ඕනෑ. ඒ නිසා මේ සියලු දෙනාටම අපේ ගෞරවය මුලින්ම මා පිරිනමනවා.

දෙවනුව, අපේ සෞඛ්‍ය ඇමතිතුමා මීට දවස් කිහිපයකට කලිනුත් මේ වෛද්‍යවරුන් සහ හෙද හෙදියන්ගේ වැටුප් ප්‍රශ්නය පිළිබඳව පැහැදිලි කිරීමක් කළා. අපි ස්තුතිවන්ත වෙනවා, ඒ වැටුප් වැඩිවීම සම්බන්ධව. මොකද, ඔවුන්ට අවුරුදු ගණනාවකට පස්සේ සෑහෙන වැටුප් වැඩිවීමක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම 2027 වර්ෂය දක්වා දිවෙන විධියට තමයි මේ වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙන්නේ. මෙහිදී මූලික ප්‍රශ්න කිහිපයකුත් මතු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වාගේම රජයේ හෙද නිලධාරීන්ගේ සංගමයත් මේ ගැන කථා කරලා තිබෙනවා. මේ ගරු සභාවේ ඉන්නවා, වෛද්‍යවරු සහ විශේෂඥ වෛද්‍යවරු 22කට අධික ප්‍රමාණයක්. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට එවැනි අය පාර්ලිමේන්තුවට පැමිණීම ගැන අපි සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන ප්‍රධානම කාරණය තමයි, වෛද්‍යවරුන්ගේ අතර දීමනා පිළිබඳ ප්‍රශ්නය. මෙතැන ඉන්න වෛද්‍යවරුන්ට අපිට මේ ගැන උගන්වන්න දෙයක් නැහැ. සාමාන්‍ය රජයේ සේවකයින් එක්ක බැලුවාම වෛද්‍යවරුන් ඊට වඩා විශාල සේවයක් කරනවා. මොකද, ඔවුන් සාමාන්‍යයෙන් දවස් 6ක් වැඩ කරන්න ඕනෑ. අනෙක් රජයේ සේවකයින් සාමාන්‍යයෙන් දවස් 5යි වැඩ කරන්නේ. ඒ කියන්නේ, රජයේ සේවකයින් දවසකට පැය 8 ගණනේ පැය 40ක් වැඩ

කරනවා. හැබැයි, ඊට වඩා වැඩි පැය ප්‍රමාණයක් වෛද්‍යවරු වැඩ කරනවා. ඒ නිසාම තමයි ඔවුන්ට මූලික - basic - වැටුපෙන් 1/80ක් ලෙස දමා තිබුණු අතිකාල පැයකට ගෙවන දීමනාව ඔබතුමන්ලා 1/120 කරලා තිබෙන්නේ. වැටුපත් වැඩි වෙලා අමතර දීමනාවත් වැඩි වුණාට පස්සේ රජයට අතිවිශාල වියදමක් ඒ වෙනුවෙන් දරන්න වෙනවාය කියන එක ගැන අපිට කියන්න දෙයක් නැහැ. ඒක අපිට තේරෙනවා. නමුත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඉල්ලන්නේ වෙන දෙයක් නොවෙයි. මේක 1980 විතර ඉඳලා මේ අය දිනා ගත්ත දීමනාවක්. 1/80, 1/30 සහ 1/20 කියන දීමනා අඩුම තරමින් 2027දීවත් ඒ විධියට ක්‍රියාත්මක වන විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා ඔබතුමන්ලාගෙන් මම ඉල්ලනවා. දැන් අත්හරින්න. කමක් නැහැ. මොකද, ඔබතුමන්ලා වැටුප් වැඩි කරලා තිබෙනවා. අපි දන්නවා, වැටුප් ගෙවන්න සෞඛ්‍ය අංශයට තමයි වැඩිම මුදල් ප්‍රමාණයක් - සියයට 75ක් විතර - වැය වෙන්නේ කියලා. එම නිසා ඒ පිළිබඳව අපිට තේරුම් ගැනීමේ හැකියාවක් තිබෙනවා. එක පැත්තකින් ඔවුන් සතුටු වෙනවා වාගේම තවත් පැත්තකින් වෛද්‍ය සේවාවේ ඉන්න අය විශාල අවුලක ඉන්නවා. මේ අය මේ දීමනාව නිකම් ගත්ත එකක් නොවෙයි. මේක ආණ්ඩුව නිකම් දුන්නු එකකුත් නොවෙයි. මේ අය සටන් කරලා තමයි මේ දීමනා ලබා ගත්තේ. ඔබතුමන්ලාත් මේ සඳහා අවුරුදු ගණනක් මහන්සි වෙච්ච අය. මහන්සි වෙලා ලබා ගත්ත එකේ වටිනාකම තියන්න කියන එක තමයි ඔවුන්ගේ ඉල්ලීම වෙලා තිබෙන්නේ. ඒ නිසා 2027දීවත් මේක ඒ විධියට පටන් අරගෙන ඉස්සරහට ගෙනියන්න කියන ඉල්ලීම තමයි මට මූලිකවම කරන්න තිබෙන්නේ.

ඒ වාගේම, හෙද සේවාවේත් යම්කිසි කප්පාදුවක් තිබෙනවා කියලා ඔවුන්ගේ චෝදනාවක් තිබෙනවා. මම ඒ ගැන විශේෂයෙන් කියන්නම්. වර්තමාන ක්‍රමය අනුව IIIවන ශ්‍රේණියේ හෙද නිලධාරීන්ගේ වසර 5ක්ව තිබුණු උසස්වීම් කාල සීමාව අය වැය යෝජනා අනුව වසර 10ක් කරලා තිබෙනවා. ඊළඟට, IIවන ශ්‍රේණියේ හෙද නිලධාරීන්ගේ උසස්වීම් කාල සීමාව වසර 7 ඉඳලා වසර 11 දක්වාත්, අධි ශ්‍රේණිය ගත්තොත් උසස්වීම් ලැබෙන කාල සීමාව වසර 22 ඉඳලා වසර 31 දක්වාත් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, ඔවුන්ගේ මූලික වැටුපෙන් 1/160ක්ව තිබුණු අතිකාල දීමනාව අය වැය යෝජනා අනුව 1/200 කිරීම තුළත් කප්පාදුවක් තිබෙනවා.

අපි දන්නවා, මේ අයත් බොහොම මහන්සි වෙලා වැඩ කරන අය බව. ඔවුන් නිකම් සිටින අය නොවෙයි. අපිට මතකයි, 2022 මැයි 09වැනි දා විශාල කලබලයක් ඇති වුණු වෙලාවේදීත් ඒ පහර දුන් අයත් රැක ගත්තේ වෛද්‍යවරු සහ nursesලා කියන එක. ඒ අය තමයි කිව්වේ, hospital එක ඇතුළට ආවාට පස්සේ ඒ හැම කෙනෙක්ම ලෙඩෙක්, ඒ නිසා ලෙඩ්ඩුන්ට සේවය කරන එකට අපිට අත තියන්න එන්න එපා කියලා. ඒ නිර්භීත වචන ටික කියමින් තමයි ඔවුන් ඒ ක්‍රියාදාමය කළේ.

මම විශේෂයෙන්ම හෙද සේවාවල නියුතු හෙද නිලධාරීන් සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනවා. අය වැයෙන් Grade III හෙද නිලධාරීන්ගේ වැටුප් වැඩිවීම විධියට ඔබතුමන්ලා දීලා තිබෙනවා, රුපියල් 7,968ක්. ඒකෙන් W&OP එක කැපුණාට පස්සේ සහ රුපියල් 5,000කුත් අඩු වුණාම ඔවුන්ට ඇත්තටම රුපියල් 872ක අඩුවීමක් තිබෙන්නේ. ඒ වාගේම IIවන ශ්‍රේණිය ගත්තොත්, ශත 46ක අඩුවීමක් තිබෙනවා. ඒ නිසා මේ අය ගැනත් යම්කිසි විධියකට කල්පනා කරලා බලන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ.

ඊළඟට, බුද්ධි ගලනය පිළිබඳව ගත්තොත් ගරු ඇමතිතුමනි, වෛද්‍යවරුන්ගේ අවුරුදු හතරෙන් හතරට සිදු කරන routine transfers තුළ විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙන බව ඔබතුමා දන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගැන හොඳින් දන්න නිසා මේ කාරණය මම කියන්න කැමැතියි. උදාහරණයක් විධියට ගත්තොත්, අනුරාධපුරයේ හිටපු විශේෂඥ වෛද්‍යවරයෙක් ලංකාව අත්හැර දාලා ගියා. ඔහු ලංකාව අත්හැර දමා ගියේ වෙන කාරණයක් නිසා නොවෙයි. ඔහුගේ මාරුවීමත් එක්ක ළමයි දෙදෙනාව Anuradhapura Central College එකට ඇතුළත් කර ගන්න වුවමනාවක් තිබුණා. නමුත්, ඒ පාසලට ළමයි දෙදෙනාව ඇතුළත් කර ගැනීමට නොහැකි වුණු නිසා ඒ විශේෂඥ වෛද්‍යවරයා අපේ රට අත්හැර දාලා ගියා. මේක අපි කවුරුත් පිළිගන්න ඕනෑ කාරණයක්. මම ඒකයි කියන්නේ වෛද්‍යවරු අපේ රට අත්හැර දමා යෑම නතර කර ගැනීම වෙනුවෙන් කරුණාකරලා වැඩ පිළිවෙළක් හදන්න කියලා. මොකද, අවුරුදු හතරෙන් හතරට routine transfers හදපු ගමන් වෙන්නේ මේ අය අනෙකුත් සියල්ල අත්හැර තමන්ගේ අම්මා, තාත්තා ඇතුළු මුළු කුටුම්භයම අරගෙන ලංකාව අත්හැර දමා යන එකයි. ඒ නිසා ඔබතුමන්ලාගෙන් මම ඉල්ලනවා, මේ four yearsවලින් routine transfers කරන වැඩ පිළිවෙළ වෙනුවට කරුණාකරලා මේ අයගේ දරු පවුලත් රැකගෙන තමන්ගේ සේවාවත් කරන්න පුළුවන් system එකක් හදලා, යම්කිසි විධියකින් මේ අයවත් බුද්ධි ගලනයට හේතුවක් නොකරන තැනකට ගෙනෙන්න කියලා. බුද්ධි ගලනය පිළිබඳව කරුණු කාරණා ගණනාවක් අද උදේත් ඉදිරිපත් කළා. මම කියන්න කැමැතියි, විශාල පිරිසක් මේ ක්‍රියාදාමයට දැන් නතු වෙමින් සිටින බව. ඒ, වෙන හේතුවක් නිසා නොවෙයි. සාමාන්‍යයෙන් consultant කෙනෙකුට රුපියල් 350,000ක විතර ආදායමක් ලැබෙනවා. හැබැයි, පිට රටකට ගිය ගමන් ඔහුට රුපියල් ලක්ෂ 28ත්, 35ත් අතර වැටුපක් ලැබෙනවා. වෛද්‍යවරයෙකු රුපියල් 250,000ක් අරගෙන ගෙදර යනවා වෙනුවට ඔහු පිට රටකට ගියොත් රුපියල් ලක්ෂ 16ත්, 22ත් අතර වැටුපක් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. මේ වැටුප් ප්‍රමාණයම ලංකාවේ දිය යුතුයි කියලා මම කියන්නේ නැහැ. නමුත්, මම කියන්නේ මේ විධියට ආකර්ෂණයක් සහ ලංකාව තුළ ඔවුන්ට පිළිගැනීමක් ලැබිය යුතුයි කියන එකයි. එහෙම නැතිව ඔවුන්ට අවශ්‍ය වැඩකටයුතු ටික කර ගන්න සුදුසු වාතාවරණයක් නැති වුණාම ඒ අය ලංකාව අත්හැර දමා යනවා කියන කාරණය අපට හිතා ගන්න පුළුවන්.

ඒ වාගේම සේවය අත්හැර යෑමේ නියෝග නිකුත් කර ඇති, විදේශ අධ්‍යාපනය අත්හැර දමා සිටින විශේෂඥ වෛද්‍යවරු 113දෙනෙක් ඉන්නවා. මේ ගැන අපට වෙනම බලන්න වෙයි. වෛද්‍ය නිලධාරීන් 2,444ක්, දන්ත ශල්‍ය වෛද්‍යවරු 163ක්, හෙද හෙදියන් 1,027ක් ඉන්නවා. ඒ වාගේම වෛද්‍ය සේවාව සම්බන්ධ අනෙකුත් වෘත්තීන්වල නියැළෙන අය තමයි අද අඩුවෙන්ම ඉන්නේ. මේ පිරිස අඩුවීම නිසා hospital එකක වැඩ කරගන්න බැරි තැනකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් විකිරණ ශිල්පීන්ගේ, වෘත්තීය වෛද්‍යවරුන්ගේ, භෞත වෛද්‍යවරුන්ගේ විශාල අර්බුදයක් අද වනකොට ඇති වෙලා තිබෙනවා.

මේ කාරණයත් මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. අවුරුදු 76ක කාලය ගත්තාම උපතේදී ජීවිත අපේක්ෂාව අතින් අද වනකොට අපි ඉතාම හොඳ තැනකට ඇවිල්ලා තිබෙනවා. මට හොඳට මතකයි, මම කුඩා කාලයේ අපේ පාසලේ මමත් එක්ක එකට ඉගෙන ගත්ත සහෝදරයෝ දෙදෙනෙකුට පෝලියෝ රෝගය හැදුණා. ඒ වාගේම මැලේරියා රෝගය අපට අද දකින්න නැහැ. නමුත්, මැලේරියා වසංගත දෙකකට අපි මුහුණ දුන්නා. වසූරිය, කොලරාව අපි ඇහෙන් දැකපු රෝග. බරවා රෝගයත් එහෙමයි. බෙරකොට වාගේ කකුල් තිබුණු මිනිස්සු ඉන්නවා අපි ඉතිහාසයේ දැකලා තිබෙනවා. අද එවැනි රෝග තත්ත්වයන් නැති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා කථා කරන අවුරුදු 76ක ශාපය තුළ ඔබතුමන්ලාගේම වෛද්‍යවරුන් සහ හෙද හෙදියන් සෞඛ්‍ය

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ක්ෂේත්‍රයට කරපු සේවය නිසා ජනතාව ඒ රෝගවලින් බේරුණා. ඒ නිසා විශේෂයෙන්ම මේ අය සම්බන්ධයෙන් අවශ්‍ය කරන සහයෝගය ලබා දිය යුතුයි කියා අපි විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, ප්‍රජා සෞඛ්‍ය කියන කාරණයත් මම හැම වෙලාවේම කියන කාරණයක්. ඉස්සර family doctor ළඟට යෑම වෙනුවට අද වනකොට අපි කෙළින්ම consultant ළඟට යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මම ඔබතුමාට ඒ සඳහා උදාහරණයක් කියන්නම්. Kurunegala Teaching Hospital එකේ ඇඳන් රෝගීන්ගෙන් පිරිලා, ඉන්න බැරි තැනකට තල්ලු වෙලා තිබෙනවා. ඒකට විකල්පය විධියට මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මම මහ ඇමතිවරයා විධියට හිටපු කාලයේ ගල්ගමුව රෝහල පටන් අරගෙන එහි වැඩ කටයුතු අවසන් කළා. එහා පැත්තෙන් අනුරාධපුරයත්, මේ පැත්තෙන් කුරුණෑගලත් සම්බන්ධ වන විධියට ගල්ගමුව රෝහල දියුණු කළොත්, කුරුණෑගලට සෙනඟ කන්දරාවක් ඇදෙන එක නතර කරන්න පුළුවන් වෙයි.

මම මේ කාරණය කියන්න තව විනාඩියක් ලබා ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාරම්පරික වෛද්‍ය සභාව පිළිබඳව ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධව මම ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා. පාරම්පරික වෛද්‍ය සභාව ස්ථාපිත කරන ක්‍රියාදාමය තුළ විශේෂයෙන්ම පාරම්පරික වෙදකම සෞඛ්‍යයට ඇතුළත් කර ගන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අපි ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි.

අපේ වෙද පරපුර, සහ පරපුර ගැනත් ඔබතුමා දන්නවා. විශේෂයෙන්ම මාලේවන, කෙරමිණිය, වටද්දර වාගේ ප්‍රදේශවල සිටින පාරම්පරික වෙදකමට සම්බන්ධ අය සමඟ සාකච්ඡා කරලා, ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරන්න කියලා ගෞරවයෙන් මම ඉල්ලීමක් කරනවා. මම දැක්කා, ඔබතුමා ඒ සම්බන්ධව කථා කරලා තිබෙනවා.

විශේෂයෙන් මාධ්‍යවේදීන් පිළිබඳව කථා කළොත්, ඔවුන්ගේ රක්ෂණය සම්බන්ධයෙන් මට හැම තැනකින්ම වාගේ කථා කළා. මෙවර අය වැයෙන් මාධ්‍යවේදීන්ගේ රක්ෂණය සම්බන්ධයෙන් කිසිම ප්‍රතිපාදනයක් වෙන් කර තිබෙනවා මම දැක්කේ නැහැ. ඒ වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දෙන්න කියා ගෞරවයෙන් ඉල්ලමින්, ඔබතුමාට ශක්තිමත්ව වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් සකස් කරන්න හැකි වේවා කියාත් සුබ පැතුම් එකතු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත්, තව මන්ත්‍රීවරුන් දෙදෙනෙකුත් හෙදියන්ගේ promotions සම්බන්ධ කාලය පිළිබඳව කථා කරනවා මම අහගෙන හිටියා.

හෙද ව්‍යවස්ථාව අනුව Grade IIIවල සිටින Nursing Officer කෙනෙක් අවුරුදු 5කින් Grade IIවලට එනවා. Grade IIවල කෙනෙක් අවුරුදු 7කින් Grade Iවලට එනවා. Grade Iවල කෙනෙක් අවුරුදු 10කින් අධිශ්‍රේණියට - supra Grade එකට - එනවා. ඒක හෙද ව්‍යවස්ථාවෙන් ලැබෙන එකක්. ඒක වෙනස් වෙන්නේ නැහැ. හෙද සේවයේ සිටින ඉතාම කුඩා කණ්ඩායමක් බොරුවක් ප්‍රචාරය කරමින් යනවා, අවුරුදු 10න් 10ට තමයි ඒ gradesවලට යන්න වෙන්නේ, එතකොට pension යනකොටවත් ඒ තත්ත්වය ලබන්න බැහැ කියලා. නමුත් එහෙම එකක් නැහැ. එම උසස්වීම් තිබුණු ආකාරයට නියමිත කාලයටම - අවුරුදු 5න්, 7න්, 10න් - සිද්ධ වෙනවා. ඒ පිළිබඳව කවුරුවත් සැකයක් තියාගන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වෛද්‍ය හංසක විජේමුණි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.29]

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශය ගත්තාම, ඇත්තටම කොටස් 4ක එකතුවක්. ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ තිබෙන විශේෂත්වය තමයි, ඒ කොටස් හතරේම ඉන්නේ පැය 24ම වැඩ කරන සේවකයන්. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තත්, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ගත්තත්, ජනමාධ්‍ය ක්ෂේත්‍රය ගත්තත්, තැපැල් ක්ෂේත්‍රය ගත්තත් පැය 24ම වැඩ කරන සේවකයන් තමයි ඉන්නේ. ඇත්තටම අපේ අමාත්‍යාංශය අපේ සේවකයන් ගැන ඉතාම ආඩම්බරයෙන් සිටින අමාත්‍යාංශයක්.

මේ අය වැය සුවිශේෂ වූ අය වැයක්. මොකද, මේක හදවතක් තිබෙන අය වැයක්. විශ්‍රාමිකයන්ට මේ අය වැයෙන් තරම් සැලකීමක් කිසිම දවසක කිසිම අය වැයකින් කරලා නැහැ. අද විශ්‍රාම යන කෙනෙකුට වුවත්, 2027 අවුරුද්දේ basic එකට විශ්‍රාම යන්න පුළුවන්. ඒ අනුව දළ වශයෙන් දෙගුණයක ප්‍රතිලාභ ප්‍රමාණයක් කෙනෙකුට හිමි වෙනවා.

ඒ වාගේම මෙච්චර කල් නොසලකා සිටි සමාජ කොටස්වලට, විශේෂයෙන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ ළමයින්, විශේෂ අවශ්‍යතා ඇති ළමයින්, මානසික ප්‍රශ්න තිබෙන රෝගීන් වැනි සමාජ කොටස්වලට මේ අය වැයෙන් වඩාත් ඉහළ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ එක්කම සිරකරුවන් සම්බන්ධයෙනුත් ඉහළ අවධානයක් යොමු කරලා තිබෙනවා. මේ අය වැය ඇතුළේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට වාගේම, අපේ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලවල අවශ්‍යතා කෙරෙහිත් ලොකු අවධානයක් යොමු කරලා තිබෙනවා. එසේම අපෙන් සේවා ලබා ගැනීමට එන හැම සේවාලාභියෙක් ගැනම මේ අය වැයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය හොඳින් ස්පර්ශ කරලා බලන්න කියලා අපි මේ රටේ ජනතාවට යෝජනා කරනවා. මෙහි ඉතාම හොඳ සාධනීය ලක්ෂණ තිබෙනවා.

විශේෂයෙන් අපි සෞඛ්‍ය වෘත්තිකයන්ට ආරාධනා කරනවා, මේ අය වැය analyse කරලා බලන්න කියලා. අපි දන්නවා, මහජනතාව හදවතක් තිබෙන මේ අය වැය ස්පර්ශ කළත්, සෞඛ්‍ය වෘත්තිකයන් මේක ඒ ආකාරයෙන්ම ගන්නේ නැහැ. ඔවුන් විද්‍යාත්මක ක්‍රමයකට ඉගෙන ගත් අය, ඔවුන් විද්‍යාත්මක ක්‍රමය practise කරන අය. එම නිසා වඩාත් තර්කානුකූලව, වඩාත් විද්‍යාත්මක ලෙස මේ අය වැය analyse කරන්න කියලා අපි ඒ අයගෙන් ඉල්ලා සිටිනවා. එතකොට අපට ගොඩක් ගැටලුවලට විසඳුම් සොයා ගන්න පුළුවන්.

විශේෂයෙන් මේ අය වැයෙන් අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයට කොටස් 4ක් යටතේ සේවය ලබා දී තිබෙනවා. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මානව සම්පත වැඩිදියුණු කිරීම, ඖෂධ සහ උපකරණ

ලබා දීම, පර්යේෂණ සහ සංවර්ධනය - research and development - කියන මේ කාරණා හතර ඔස්සේ මේ අය වැයෙන් සෞඛ්‍ය අංශයට මුදල් වෙන් කර තිබෙනවා.

යථිතල පහසුකම් සංවර්ධනය කියන එක ගත්තාම, අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නව දිශානතියකට යොමු කිරීමේ මූලික අදියර අපි ආරම්භ කර තිබෙනවා. සෞඛ්‍ය සේවකයන්ට, සෞඛ්‍ය වෘත්තිකයන්ගේ ගෞරවය - dignity එක - රැකගෙන ජීවත් වෙන්න සහ අභිමානවත් සෞඛ්‍ය සේවකයෙක් බිහි කරන්න අවශ්‍ය දේවල් මේ අය වැය ඇතුළේ තිබෙනවා. ඒ වාගේම අපෙන් ප්‍රතිකාර ලබා ගැනීමට එන රෝගියාටත්, එහෙම නැත්නම් අපෙන් සේවා ලබා ගැනීමට එන සේවාලාභියාටත් ගෞරවයක් - dignity එකක් - ඇතිව, ආත්ම අභිමානයක් ඇතිව අවශ්‍ය සේවය ලබා ගන්න පුළුවන් අවස්ථාව අපි මේ අය වැයෙන් සලසා දී තිබෙනවා. විශේෂයෙන්ම අපේ වෘත්තිකයන් සේවය කරන ස්ථානයේ දියුණු වටපිටාවක් ඇති කරන්න වාගේම, සේවා ස්ථානය වඩාත් සුවපහසු එකක් බවට පත් කරන්නත් අපි මේ මහින් බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම රෝහල්වල අද තත්ත්වය ගත්තොත්, බොහෝ රෝහල්වල සේවය කරන වෘත්තිකයන්ට අවම වශයෙන් සුදුසු පහසුකම් සහිත rest rooms නැහැ, changing rooms නැහැ.

ඒ නිසා මේ අය වැය තුළින් ඒ පහසුකම් වැඩිදියුණු කරන්න අපි අදහස් කරනවා. ඒ වාගේම සෞඛ්‍ය වෘත්තිකයන්ට වඩාත් පහසුවෙන් වැඩ කරගෙන යන්න පුළුවන් විධියේ වටපිටාවක් හදන්න, ඔවුන්ට දියුණු උපකරණ සපයා දෙන්න, අවශ්‍ය අනෙකුත් සම්පත් සපයා දෙන්න අපි මේ අය වැයෙන් ලොකු උත්සාහයක් ගෙන තිබෙනවා. රෝගීන්ගේ පැත්තෙන් ගත්තාමත් සෑම රෝගියෙකුටම ආත්ම ගෞරවයක් ඇතුව වඩාත් හොඳ සේවයක් ලබා ගන්න වාගේම, රෝහල්ගත වුණාට පස්සේ ඇඳක් ලබා ගන්න, හොඳ සනීපාරක්ෂක පහසුකම් ලබා ගන්න, හොඳ ආහාරයක් පිළිවෙළකට ලබා ගන්න අවශ්‍ය පහසුකම් අපි මේ තුළින් හදනවා.

අපි දන්නවා, හුහක් රෝහල්වල සමහර ශල්‍යකර්ම සඳහා දිගු පෝලිම් තිබෙනවා. මේ අය වැය තුළින් අපි ඒ පෝලිම් අඩු කිරීමට ලොකු උත්සාහයක් ගන්නවා. මීට ඉස්සෙල්ලා කථා කරපු බොහෝ කථිකයන් ඒ ගැන කරුණු කිව්වා. ඊට අමතර වශයෙන් මම තව කාරණයක් කියනවා. මේ පෝලිම් නැති කිරීම සඳහා ජනාධිපති අරමුදල යොදා ගන්නා ලෙසට ජනාධිපතිතුමා අපට උපදෙස් දීලා තිබෙනවා. විශේෂයෙන් දිගු පෝලිම් තිබෙන cataract surgeries - ඇසේ සුද ඉවත් කිරීමේ සැත්කම් - bypass surgeries, orthopaedic surgeries, ඒ කියන්නේ hip එක දැමීම, knee එක දැමීම වාගේ surgeries සඳහා ජනාධිපති අරමුදලත් යොදා ගෙන, සෞඛ්‍ය අමාත්‍යාංශයත් එකතු වෙලා ඒකාබද්ධ වැඩසටහනක් කරන්න අපි මේ දවස්වල සැලසුම් කරගෙන යනවා. ඒ වැඩකටයුතු මේ දවස්වල සිදු වෙනවා.

ඒ වාගේම අපේ දන්ත පද්ධතිය වැඩිදියුණු කිරීමත් කරනවා. මම හිතනවා, දන්ත පද්ධතිය වැඩිදියුණු කිරීමෙන් රෝගීන්ට වාගේම, අපේ වෘත්තිකයන්ට ඒකෙන් ලොකු වාසියක් ලැබෙයි කියලා. ඒ නිසා ඒ දන්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුත්තේදී අපේ වෘත්තිකයන්ගේ අවධානය ඒ සඳහා වඩාත් යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වාගේම අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ equity කියන එක ගැන අපි ඉතාම සැලකිලිමත් වෙනවා. ඒ කියන්නේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයට ප්‍රවේශ වීමට හැම කෙනෙකුටම සාධාරණ අවස්ථා තිබෙන්න ඕනෑ. ඒ නිසා අපි එක් ප්‍රදේශයක් අරගෙන, එහෙම නැත්නම් ඇමතිවරයාගේ, නියෝජ්‍ය ඇමතිවරයාගේ එහෙමත් නැත්නම් ජනාධිපතිතුමාගේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි අපි රෝහල් හදන්නේ. ලංකාව පුරා පැතිරිච්ච අවශ්‍යතා හඳුනාගෙන ඒ අවශ්‍යතා අනුව තමයි අපි ඒ රෝහල් සැකසීමේ කටයුතු කරගෙන යන්නේ.

ඒ වාගේම මානව සම්පත් - human resources - ගත්තාම අපි දන්නවා, අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ලොකු මානව සම්පත් හිඟයක් තිබෙන බව. පසුගිය අවුරුදු තුන ඇතුළත වෛද්‍යවරුන් හැර වෙනත් අය බඳවා ගෙන තිබුණේ නැහැ. ඒ නිසා අපි ඒ බඳවා ගැනීම් කඩිනම් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපේ මානව සම්පතේ තිබෙන ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා එහෙම නැත්නම් quality එක වැඩි කිරීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කිරීමටත් මේ අය වැය තුළින් කටයුතු සලසා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 10කට ආසන්න කාලයකදී ඉදිරිපත් වුණු අය වැය ලේඛන ගෙන බැලුවොත්, ඒ කිසිම අය වැය ලේඛනයකින් වැටුපේ basic salary එක වැඩි කරලා තිබුණේ නැහැ. ඒ නිසා අපට ලැබුණු අවස්ථාවෙන් අපි නොසිතූ ලෙස, කවුරුවත් නොපැතූ ලෙස අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න සියලු වෘත්තිකයන්ගේ මූලික වැටුප ඉතා විශාල ප්‍රමාණයකින් වැඩි කර තිබෙනවා. අපට ලේසියෙන්ම තිබුණා, පොඩි දීමනාවක් එල්ලලා මේ සැරේත් ෂේප් වෙලා යන්න. ඒ සඳහා වූ සාධාරණ අයිතියක් අපට තිබුණා. මොකද, මේ රට පතුලටම වැටිච්ච රටක්. සාමාන්‍යයෙන් ලෝකයේ බංකොලොත් වෙච්ච රටවල් දෙකක් හැරුණාම, අනෙක් රටවල් ඔක්කෝම නිබිච්ච තත්ත්වයට යන්න අවුරුදු 10ක්වත් කල් ගත වෙලා තිබෙනවා. නමුත් අපි රජයක් විධියට අපට තිබෙන ආත්ම විශ්වාසය මත අපි තීරණය කළා, මේ වතාවේ වැටුප් වැඩි වීමක් රජයේ සේවකයන්ට ලබා දිය යුතු බව සහ ඒ දිය යුත්තේ ප්‍රධාන වශයෙන් මූලික වැටුපට - basic salary එකට - කියන කාරණය. ඒක adjust කරන කොට යම් යම් technical කාරණා සිදු වෙනවා. හැබැයි, අපි මේ විධියටම අපේ ආර්ථිකය තියා ගැනීමේ අදහසක් නැහැ. අපේ ආර්ථිකය අනිවාර්යයෙන්ම ප්‍රසාරණය - expand - වෙනවා. මේ ආර්ථිකය ප්‍රසාරණය වෙනකොට එහි ප්‍රතිලාභ අනිවාර්යයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සෑම වෘත්තිකයෙකුට ලැබෙනවා. ඒ ගැන කිසිදු සැකයක් තියා ගන්න එපා. ඒ නිසා 2027දී නොවෙයි, ඊට කලින් වුණත් ඒ ප්‍රතිලාභ ලැබෙන්න පුළුවන්. ඒ නිසා අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා, යම් යම් පුද්ගලයන් කරන යම් යම් ප්‍රකාශවලට රැවටෙන්න එපා, ඔබ අපි ගැන විශ්වාසය තියන්න කියලා.

අපි බොහෝ දෙනෙක් මේ අමාත්‍යාංශය ඇතුළේ වැඩ කරලා පාර්ලිමේන්තුවට ආපු මිනිස්සු. මම අවුරුදු 25ක් වෛද්‍යවරයෙකු විධියට සේවය කර තිබෙනවා. ඒ අවුරුදු 25 ඇතුළත ඔබ අප කෙරෙහි තැබූ විශ්වාසය, අපට දැක්වූ ළෙන්ගතුභාවය ඒ විධියටම තබා ගන්න. ඔය කියන හැම circular එකක්ම අපි කියවා තිබෙනවා. ඔය හැම වංගුවක්ම අපි දන්නවා. ඒ වාගේම, හැම වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක් තුළම තිබෙන හැම දෙයක්ම හොඳින් අධ්‍යයනය කරපු මිනිස්සු, අපි. ඒක නිසා මේ රටේ සෞඛ්‍ය වෘත්තිකයන්ට හානියක් වන කිසිම දෙයක් අපේ රජයකින් කවදාවත් වෙන්නේ නැහැ. ඒ නිසාම අප ගැන පැහැදිලි විශ්වාසයක් තියා ගන්න. ඔබ මේ රටේ ඉහළම වෘත්තිකයන් අතර සෑම විටම රඳවා ගැනීමට අප උත්සාහ ගන්නවා විතරක් නොවෙයි, ඔබගේ වෘත්තීන් සියල්ල ජාත්‍යන්තර තලයට රැගෙන යෑම සඳහා අවශ්‍ය සෑම පියවරක්ම ගන්නවා කියන පණිවුඩය අපි ඔබට ලබා දෙනවා.

අපේ අමාත්‍යාංශයේ තිබෙන තවත් වැදගත්ම කොටසක් තමයි, බෙහෙත් සහ උපකරණ. මීට පෙර කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමිය ඒ ගැන කියාගෙන කියාගෙන ගියා. නමුත්, එතුමියට දීපු ඒ කොළකැලිවල මොනවා හෝ අඩු පාඩු ටිකක් තිබුණා. මම ඒ ගැන කියන්නම්.

[ගරු හංසක විජේමුණි මහතා]

ඖෂධ සම්බන්ධයෙන් වන ප්‍රධාන ආයතන 4ක් අපේ රටේ තිබෙනවා. එකක් තමයි SPC එක. ඒ කියන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව; අපේ රටට drugs ගෙන්වන ආයතනය. තවත් එකක්, SPMC එක. ඒ කියන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව. තවත් එකක්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය. අනෙක් එක, MSD එක. ඒ කියන්නේ, වෛද්‍ය සැපයීම් අංශය. ඔය කියපු ආයතන 4 තමයි මෙම කාර්යයට සම්බන්ධ වෙන්නේ. එතකොට MSD එකෙන් හැමදාම ඔවුන් ඉල්ලන්න ඕනෑ, කොච්චර බෙහෙත් ප්‍රමාණයක් ඕනෑ ද කියලා. ඒක තීරණය වෙන්නේ කොහොමද? අපි රෝහල්වලින් සහ අනෙකුත් ආයතනවලින් MSD එකට දන්වනවා, අපට ඖෂධ මෙච්චර ප්‍රමාණයක් ඕනෑ කියලා. එතකොට MSD එකෙන් ඒ order එක දෙනවා SPC එකට සහ SPMC එකට. ඒ ආයතන දෙකෙන් තමයි පිට රටින් ගෙන්වලා හෝ ලංකාවේ නිෂ්පාදනය කරලා හෝ ඒ බෙහෙත් සපයන්නේ. සාමාන්‍යයෙන් අපි බෙහෙතක් order කළාම ඒ බෙහෙත මෙහේට එන්න මාස 9ක් විතර ගත වෙනවා. පසුගිය කාලයේ මේ රටේ තිබිච්ච ආර්ථික වාතාවරණය නිසා ඒවා හරියට place වෙලා තිබුණේ නැහැ. මේ රටේ තිබුණු ආර්ථික අර්බුදය නිසා ඒ ඇණවුම් නියමිත කාලයේදී කර ගන්න බැරි වෙලා තිබුණා. තවමත් ඒ ප්‍රශ්න තිබෙනවා. මොකද, විශේෂයෙන්ම 2023 අවුරුද්දේ, 2024 අවුරුද්දේ ඒ ඇණවුම් හරියට place වෙලා තිබුණේ නැහැ. ඒ නිසා අපි ලබන අවුරුද්දට අදාළ සියලු ඖෂධ ඇණවුම් මේ ජනවාරි මාසය වන කොට ගෙන්වා ගත්තා. ඒක ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට සිද්ධ වෙච්ච දෙයක්. ඒ වාගේම, 2026 වර්ෂය සඳහා වූ ටෙන්ඩර් පටිපාටියත් අපි පටන් ගෙන තිබෙනවා.

නමුත්, අපි කියනවා මේ අවුරුද්දේ යම් යම් ප්‍රශ්න ඇති වෙන්න පුළුවන් බව. ඒ ප්‍රශ්න ලිහා ගන්න අපි mechanism එකක් හදලා තිබෙනවා. ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා විධියට මා හෝ හැම සතියකටම සැරයක් drug review committee meeting එකක් තියනවා. ලංකා ඉතිහාසයේ කවදාවත් ඇමතිවරු drug review committee meetingsවලට ගිහිල්ලා නැහැ. නමුත්, අපි යනවා. අපි ඒවාට ගිහිල්ලා ඉදිරියේදී ඇති වෙන්න පුළුවන් බෙහෙත් හිඟ මොනවාද කියලා හඳුනාගෙන ඒවාට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නවා.

රෝහල්වල ඖෂධ නොමැති වන අවස්ථා එනවා. අද ගත්තාම, ඖෂධ වර්ග 40 ගණනක විතර හිඟයක් තිබෙනවා. නමුත්, ඒවා පිටත ෆාමසිවලින් ගන්න අපි අවස්ථාව සලසා තිබෙනවා. හදිසියේවත් යම් ඖෂධයක් ලංකාවේ නැතිම වෙලා ගියොත්, අපි එය government-to-government ගෙන්වා ගන්නවා. එක බෙහෙතකට අදාළ ඒ වාගේ තොගයක් අද අපට ඉන්දියාවෙන් ලැබෙනවා. ඒ වාගේම, නිතර ප්‍රශ්න ඇති වන බෙහෙත් ටිකක් තිබෙනවා. ඒ බෙහෙත් සම්බන්ධයෙන් අපි හිතාගෙන ඉන්නවා, ලබන අවුරුද්ද සඳහා වූ ඇණවුම් රාජ්‍යයන්-රාජ්‍යයන් අතර සිදු කරන ඇණවුම් බවට පත් කරලා වඩාත් සුරක්ෂිතතාවට පත් කරන්න.

ඒ වාගේම, මිල යාන්ත්‍රණය ගැනත් කියන්න ඕනෑ. අපේ රෝහල්වලට බෙහෙත් ගන්න කොට අපි මිල සම්බන්ධයෙන් වඩාත් සැලකිලිමත් වෙනවා. අපි බලයට පත් වන කොට අලුතින් drugs register වෙන්න ලොකු පෝලිමක් තිබුණා. ඒ වාගේම, තිබිච්ච drugsවල re-registration සඳහාත් ලොකු පෝලිම් තිබුණා. ඒ පෝලිම් දැන් බොහෝ කෙටි කරලා තිබෙනවා. අලුත් drugsවලට අදාළව 2,200ක් වෙච්ච ඒ පෝලිම දැන් 400 ගණනට බස්සලා තිබෙනවා. ඒකෙන් වෙච්ච දේ තමයි, සමහර බෙහෙත්වලට අදාළව සමහර companiesවල තිබිච්ච ඒකාධිකාරය අපි බිඳ දමපු එක.

මම ඔබතුමන්ලාට කියන්නම්, ඒ ඒකාධිකාරය බිඳ දැමීමෙන් අපට ඇති වන වාසි. Papaverine injection එක රුපියල් 76,000ට තමයි ඉස්සර තිබුණේ. දැන් අපි ඒක ගන්නේ රුපියල් 370ට. Immunoglobulin කියන එන්නත ඔබට මතක ඇති. ඒක බොහොම ප්‍රසිද්ධ එන්නතක්. ඒක, අර හිටපු සෞඛ්‍ය ඇමතිවරයා සම්බන්ධ වෙච්ච එන්නත. ඒ vial එකක් රුපියල් 120,000කට ගත්තේ. එතුමාගේ කාලයේ ගෙනැවිත් තිබුණේ වතුර කියලා දැන් අපට වාර්තාව ඇවිල්ලා තිබෙනවා. රුපියල් 120,000කට ගත්තු ඒ එන්නත අප ඔය ඒකාධිකාරය - monopolies - නැති කළාට පස්සේ අවසන් වරට අරගෙන තිබෙන්නේ රුපියල් 30,000කට. ඒ ටෙන්ඩර් එකෙන් විතරක් අපි ඉතිරි කරපු මුදල රුපියල් මිලියන 200ක්. Cefuroxime කියන antibiotic එක අපට ගොඩක් වුවමනා වන antibiotic එකක්. අපි ඒක ඇමෙරිකානු ඩොලර් 1.97කට නැත්නම් රුපියල් 570කට තමයි මෙතෙක් කල් අරගෙන තිබුණේ. අවසන් වරට අපි ඒක ගත්තේ රුපියල් 70කට. ඒකෙන් අපි ඉතිරි කරගත් මුදල රුපියල් මිලියන 900ක්. අපි ඒ ටෙන්ඩර් එකෙන් විතරක් රුපියල් මිලියන 900ක් ඉතිරි කර ගත්තා.

දැන් කිව්වා, anti-rabies vaccines නැහැ කියලා. ඒ කියන්නේ, බල්ලන් සපා කෑවාම දෙන බෙහෙත් නැහැ කියන එක. ඒ බෙහෙත් තිබෙනවා. මම දන්නේ නැහැ, කොහෙන් ඒ තොරතුරු අරගෙන එනවා ද කියලා. ඒක ඒ කොළවල ලියා දෙන අයගේ වරද ද, එහෙම නැත්නම් වෙන මොනවා හෝ කියනවා ද කියලා මම දන්නේ නැහැ. අපි anti-rabies serum එක ගන්න කොට රුපියල් මිලියන 350ක difference එකක් තියලා තමයි මෙවර ගත්තේ. අන්තිම වරට ගත්තාට වඩා රුපියල් මිලියන 350ක difference එකක් තිබෙනවා. Enoxaparin කියන බෙහෙත හදවත් රෝග සඳහා ගන්නා බෙහෙතක්. ඒක ගන්න කොටත් රුපියල් මිලියන 300ක difference එකක් තිබුණා. මේ drugs හතර විතරක් ගත්තාම, රුපියල් මිලියන 1,750ක difference එකක් තිබෙනවා. ඒ නිසා අපි කියනවා, මෙවර අපට වෙන් කරපු මුදලින් සෑහෙන මුදලක් රජයට ඉතිරි කරලා දෙන්න අපි අනිවාර්යයෙන්ම බලාපොරොත්තු වන බව.

අනෙක් අතට ඔබ කියාවි, ඔය මිලට සෞඛ්‍ය අමාත්‍යාංශයට බෙහෙත් මිල දී ගත්තාට ෆාමසිවල බෙහෙත් මිල අඩු වෙලා නැහැ කියලා. ඒකට හේතුවක් තිබෙනවා. ඒකට හේතුව තමයි, අධිකරණ නියෝගයක් නිසා ලංකාවේ මිල පාලන Committee එක අවුරුද්දයි මාස 3ක කාලයක් අත්හිටුවා තිබීම. ඒකටත් හේතුවක් තිබෙනවා. මිල පාලන Committee එකක් තිබුණාට, පසුගිය අවුරුදු 10 තුළ මිල පාලන යාන්ත්‍රණයක් තිබුණේ නැහැ. අපි ඒ මිල පාලන යාන්ත්‍රණය හැදුවා. අපි ඒකට අවශ්‍ය නීතිමය කටයුතු කරලා තිබෙනවා. ළඟදීම අපි ඒක ගැසට් කරනවා. අපි ඒක ගැසට් කරලා, උසාවියට ඉදිරිපත් කරලා අර අධිකරණ නීන්දුව අයින් කර ගන්නවා. එතකොට අපි බලාපොරොත්තු වෙනවා ෆාමසිවල තිබෙන සෑම බෙහෙතකම බොහොම significant මිල අඩු වීමක්, පැහැදිලි මිල අඩුවීමක් වේවි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කිව්වා, පිළිකාවලට ලබා දෙන anastrozole කියන බෙහෙත නැහැ කියලා. ඒ බෙහෙත පසුගිය මාස එකහමාර තුළම කිසිම ප්‍රශ්නයක් නැතිව තිබුණා. ඊට ඉස්සර වෙලා නම් ප්‍රශ්නයක් තිබුණා. ඒ නිසා ටිකක් පරණ දත්ත තමයි ගෙනැල්ලා මෙතැන කියවා තිබෙන්නේ. තව මාස දෙකකට ඒ බෙහෙතේ තොග තිබෙනවා. ඒ වාගේම, දේශීයව නිෂ්පාදනය කරන ඖෂධ ගත්තාම, දැනට අපට අවශ්‍ය ඖෂධ 863ක් තිබෙනවා. ඒ ඖෂධ 863න්, 285ක් අපි දේශීයව නිෂ්පාදනය කරනවා. ඒ වාගේම, ඉදිරි මාස කිහිපය තුළ තවත් ඖෂධ 40ක් ඒකට එකතු කරන්න අපි සූදානම්. අපි බලාපොරොත්තු වෙනවා, අපට අවශ්‍ය ඖෂධවලින් අවම වශයෙන් සියයට 50ක් අපේ රටේ මේ අවුරුද්ද, එකහමාර තුළ නිෂ්පාදනය කරන්න. ඒ වාගේම, ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය packaging materialsවලට tax

එකක් ගහලා තිබුණා. අපි ඒ tax එකත් අයින් කළා. ඒ වාගේම, අපි රටවල් බොහෝ ගණනකට -ආසන්න වශයෙන් රටවල් 57කට- අපේ බෙහෙත් අපනයනය කරනවා.

Research and development පැත්ත ගත්තාම, ලංකාවේ research ආයතන තිබුණේ නිකම් නමට විතරයි. Medical Research Institute කියන ආයතනය තිබුණාට ඒකෙන් කරන්නේ lab එකක වැඩ විතරයි. අපි හිතනවා, ලංකාවේ මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා මේ පර්යේෂණ - researches - කිරීම අත්‍යවශ්‍යයි කියලා. ඒක නිසා මේ මහ පොළොව ස්පර්ශ වන, මහ පොළොවට අවශ්‍ය වන researches කරන්න අවශ්‍ය ප්‍රතිපාදන අපි මේ අය වැය තුළින් සලසා තිබෙනවා. එහෙම නම්, මේක ඉතාම සුවිශේෂ වූ අය වැයක්.

මේ අය වැය නිකම්ම නිකම් එක්කෙනෙක් දෙන්නෙක් හිතලා, එහෙම නැත්නම් පසුගිය අය වැයක් copy and paste කරලා හදපු එකක් නොවෙයි. මේක, නිශ්චිත සැලැස්මක් අනුව, නිශ්චිත වැඩ පිළිවෙළක් තුළ හදපු අය වැයක්. ඒ වාගේම, මේක සෙල් ලිපියකුත් නොවෙයි. මේක මේ රටේ අවසාන අය වැයත් නොවෙයි. මේක අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය. මේක සෙල් ලිපියක් නොවෙයි. මෙහි තිබෙන සියලු කාරණා, විශේෂයෙන්ම අපේ ආර්ථිකය සම්බන්ධ කාරණා, දීමනා සම්බන්ධ කාරණා ඉදිරියේදී අපට වෙනස් කර ගන්න හැකියාවක් තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමන්ලා සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා, මේ රටේ සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා, අපි බොහොම විශ්වාසයෙන් මේ ගමන යමු කියලා. අපට මේ ගමන යන්න පුළුවන්. අපි මේ ගමන කෙසේ හෝ යා යුතුයි.

ඔබ සියලුදෙනාට ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමාට පිළිතුරක් ලබා දෙන්න කැමැතියි, මඩකලපුව ශික්ෂණ රෝහල සම්බන්ධයෙන්. MRI machine එක මේ අවුරුද්දේ ලැබෙනවා. ටෙන්ඩර් ක්‍රියාවලිය අවසානයේ තමයි දැන් ඒ කටයුත්ත තිබෙන්නේ. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියක් යටතේ අපට ඒක ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. CT Scanner එක දැන් upgrade කරලා තිබෙන්නේ. අලුත්ම CT Scanner එකක් වාගේ තමයි ඒක දැන් වැඩ කරන්නේ. ඒ නිසා CT Scanner එකේ ප්‍රශ්නයක් නැහැ. ඊළඟට, මඩකලපුව රෝහලට අපි cath lab එකක් ලබා දෙනවා. නමුත් Cardiology Unit එකේ constructions තවම කෙරෙමින් පවතිනවා. ඒ නිසා මම හිතනවා, මාස 5ක් යන කොට ඒ කටයුතු අවසන් කරලා, constructions අවසන් වන කොටම අපට cath lab එක එතැන ස්ථාපනය කරන්න පුළුවන් වෙයි කියලා. *[බාධා කිරීමක්]* LINAC machines upgrading project එකේ Phase I එකට තමයි මඩකලපුව Teaching Hospital එක තිබුණේ. ඒක upgrade කරලා තිබෙන්නේ. අලුත් phase එකේ ඒක නැති වුණාට first phase එකෙන් ඒක upgrade වෙනවා. ඒ නිසා මූලික පහසුකම් ටිකක් එම රෝහලට ලැබෙනවා. ඔබතුමාන් කියපු CT Scanner, MRI machine, LINAC machine පහසුකම් පිළිබඳ කාරණයට සහ cath lab ප්‍රශ්නයට සැලකිය යුතු උත්තරයක් මඩකලපුව Teaching Hospital එකට අදාළව අපි ලබා දීලා තිබෙනවා.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

MRI machine එක ගැන අපට තිබුණේ ලොකු ප්‍රශ්නයක්. ඇත්ත වශයෙන්ම අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ දේවල් කිරීම ගැන.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

[3.51 p.m.]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Presiding Member, today is the 17th Death Anniversary of the late Member of this House, Mamanithar Sivanesan, who was killed by the military in a claymore attack. I would like to pay my respects to him. And also, since we are discussing the Votes of the Ministry of Health and Mass Media, I must mention that the Tamil media world lost two iconic figures: the founding proprietor of "Thinakkural", Mr. S.P. Samy, who was a legend in his field and an institution in his own right and also the late Editor of "Thinakkural" Sunday Edition, Mr. Bharathi Rasanayagam, whose last job was as the Editor of the Jaffna "Virakesari" edition. I would like to pay my respects to both of them also.

With regard to the situation in the Jaffna Teaching Hospital, Hon. Minister, its Director has issued me a letter; he actually produced the letter to the District Coordinating Committee. I will table it and give you a copy of it. It is a fairly comprehensive letter which calls for a cadre review and approval of various figures. The details are there. I would not go into it because I do not have time. He also asks for infrastructure development and specifically calls for a new maternity unit, a dedicated cardiology and cardiothoracic unit, a special unit for advanced treatments and infrastructure facilities for more than 30 clinics. Of these four requests - they are equally important - if I may draw your attention very specifically to the first one, a new maternity unit, it has to be done, Hon. Minister. The maternity unit in the Jaffna Teaching Hospital was destroyed in 2012 because it was dilapidated and since then, 16 wards are now functioning in the space of four wards. If you go to the unit, you would see that it is in an appalling situation, where mothers have to sleep on the floor and it is just completely unacceptable. Also, from where the current ward is functioning, mothers have to walk, after C-sections and other major operations, for almost 20 minutes to feed their babies in the post-natal care ICU. So, it is just completely unacceptable! Therefore, you have to prioritize that; I urge you to look into it and start something immediately with regard to that maternity ward.

The Director also asks for land. The Jaffna Teaching Hospital is supposed to be the fourth national hospital in the country. There is a land situated in the Meenachi Amman Road, a property of the Jaffna Teaching Hospital, which is currently being occupied by the security forces. So, he is asking that that land be returned to the hospital. He also asks for the land belonging to the Building Materials Corporation that is situated in the Clock Tower Road. So, these are matters that I would urge you to look into.

The second issue that I wish to bring up very importantly is the Tellippalai Trail Cancer Hospital. As

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

you know, Hon. Minister, the Tellippalai Trail Cancer Hospital, even though it is staffed under the Jaffna Teaching Hospital, is physically in the Tellippalai Base Hospital. So, there is this dichotomy between the Base Hospital and the Cancer Unit which comes under the Teaching Hospital. Therefore, there are some recommendations the doctors there have made for their convenience and for more productive operation. A separate director and an accountant to manage the cancer services is mandatory, according to them. Then, a separate matron and an overseer to manage the cancer services. All the staff be brought under the same administration is what they are asking for. Then, with regard to funding, a separate allocation of funds for the cancer services is essential. At the moment, again, it is a dichotomy between the Base Hospital and the Jaffna Teaching Hospital. So, they are asking for a separate dedicated funding.

With regard to the support services in that A Grade Base Hospital, they want the filling of the existing positions, at a minimum, the vacancies for the Consultant Pathologist and Consultant Haematologist, in the upcoming annual transfers. Also, their pleading is that the Tellippalai Trail Cancer Hospital be given a CT scanner. I think you would agree, Hon. Minister, that for a cancer hospital to work without a CT scanner is difficult; if so, I cannot understand how it could be a cancer hospital. So, that is also something that you must look into.

Finally, with regard to the question of dispensers, there are serious shortages. Some time ago, I brought up the issue of the dispensers and the Minister has been good enough to call for some training of those dispensers and I welcome that. But, the practice around the region and globally also is that, they have been phasing out dispensers. The pharmacists say they have almost a thousand who are fully qualified and who are unemployed at the moment. I think their request is reasonable. I have also spoken to the dispensers and they are quite happy to be absorbed into the pharmacists' cadre, to replace the dispensers' cadre with pharmacists and to make those appointments, Hon. Minister. The reason I ask for this is that at the lower levels, you would agree, it is only the dispensers who have to be filled and pharmacists cannot be filled.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
And, with regard to dispensers, there was such a huge shortage that they were covering two, three people's job and they just could not physically manage. The same situation exists with regard to the pharmacists and I strongly urge you to consider their request. I have a note with regard to other situations in the Northern Province. I will hand it over to you because I have very little time and would ask you to look at that also.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් පැවැත්වෙන කාරක සභා විවාදයේදී අදහස් ඉදිරිපත් කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මට පෙර කථා කරපු මැති ඇමතිවරු සියලුදෙනාම කිව්වේ, සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් මේ අය වැය තුළින් හොඳ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා රෝගීන් සුවපත් කරන්න පුළුවන් උපරිම දායකත්වය ලබා දෙනවා කියලායි.

අපේ රටේ පැවති දශක තුනක යුද්ධය වෙලාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හිටපු වෛද්‍යවරු, නිලධාරීන් ඇතුළු කාර්යමණ්ඩලය සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දුන්නු දායකත්වය අපි සිහිපත් කරන්න ඕනෑ. අපේ රටට කොවිඩ් වසංගතය ආපු කාලයේත් එහෙමයි. පවුලේ කෙනෙකුට කොවිඩ් වසංගතය හැදුණාම පවුලේ කෙනෙකුවත් එ් රෝගියා ළඟට නොගිය කාලයක, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩ කරපු වෛද්‍යවරු, නිලධාරි මණ්ඩලය පුදුමාකාර කැපවීමක් කළා. කොවිඩ් වසංගතය රටට ආවාම, කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් විධියට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද රෝහල අපි ලබා දීලා ඒ අවදානම ඒ දිස්ත්‍රික්කයේ ජනතාව භාරගත්තා. මට මතකයි, දියතලාවේ පෝස්ටර් පවා ගැහුවා, ඒ පළාතේ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වන්න එපා කියලා. එවැනි තත්ත්වයකදීත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද රෝහල ඒ වෙනුවෙන් පාවිච්චි කරලා, එදා සේවය කරපු වෛද්‍යවරු ඇතුළු සියලුදෙනාම ඒ අවදානම, වගකීම කරට අරගෙන විශාල කැපවීමක් කළා. අපි ඒ අය සිහිපත් කරනවා. මේ අවස්ථාවේදී ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා.

අද වන විට රට තුළ අත්‍යවශ්‍ය ඖෂධ ගණනාවක අඩුපාඩුවක් තිබෙනවා. උදේ ගරු ඇමතිතුමා කිව්වා, ඖෂධ මිලදී ගැනීමට රුපියල් බිලියන 185ක් වෙන් කරලා තිබෙනවා කියලා. ඖෂධ වගේම තමයි වෛද්‍යවරු සහ හෙද නිලධාරීන්ගේ හිඟය. බෙහෙත් තිබුණාට වැඩක් නැහැ අවශ්‍ය වෛද්‍යවරු, හෙද නිලධාරීන් නැත්නම්. වෛද්‍යවරු ඉඳලා වැඩක් නැහැ, රට තුළ බෙහෙත් නැත්නම්. පසුගිය කාලයේ වඳ බෙහෙත් ගෙනාවා කිව්වා. Vaccines ඇතුළේ වීදුරු කටු තිබෙනවා කිව්වා. නොයෙකුත් බෙහෙත් වර්ග රට තුළට ගෙනාවා. මේවා පරීක්ෂා කරන්න නිසි ක්‍රමයක් රට තුළ නැහැ කිව්වා. ඒක අපට පිළිගන්න වෙනවා. ගරු ඇමතිතුමාත් මේ සභාවේ ඉන්න නිසා මම මේ යෝජනාව කරනවා.

අපේ රටේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය තිබෙනවා. මේ රට තුළ නිෂ්පාදනය කරන බෙහෙත් වාගේම, අපි ආනයනය කරන බෙහෙත් පිළිබඳවත් අපි පරීක්ෂා කර බැලිය යුතුයි. අපේ රටේ lab එකක් තිබුණාට hi-tech lab එකක් නැහැ, බෙහෙත් හරියට පරීක්ෂා කරලා බලන්න. අපි ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, මේ අය වැයෙන් බැරි වුණත් ඔබතුමන්ලාගේ ඊළඟ අය වැයෙන් හරි මුදල් වෙන් කරලා අපේ රට තුළ hi-tech lab එකක් දමන්න කියලා. එතකොට අපට පුළුවන්, අපේ රටට ගෙනෙන ඖෂධ මොනවාද කියලා පරීක්ෂා කර බලන්න. එහෙම ක්‍රමයක් නැති නිසා තමයි පසුගිය කාලයේ මිනිස්සුන්ගේ ඇස් අන්ධ වුණේ,

මැරුණේ, දරුවන් නැති වුණේ, අංග විකල වුණේ. එහෙම වුණේ වැරදි බෙහෙත් රට තුළට ගෙනාපු නිසා. ඒ නිසා ජාතික ඖෂධ නියාමන අධිකාරිය හරහා අපි එවැනි ක්‍රමයක් හැදුවොත්, අපට පුළුවන් නිවැරදි බෙහෙත් ටිකක් අපේ රෝගීන්ට ලබා දෙන්න.

විශේෂයෙන්ම කියන්න ඕනෑ මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත්, ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් රෝහල්වල විශාල අඩුපාඩු තිබෙන බව. ගැබිනි මව්වරුන්ට දරු ප්‍රසූතිය කරන්න අවශ්‍ය වාට්ටු නැහැ. ඒ වාගේම මරණයක් වුණාම ඒ මරණය තියාගන්න මෘත ශරීරාගාර නැති රෝහල් තිබෙනවා, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ. විශේෂයෙන්ම ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන රෝහල ගත්තොත් එහි කිසිම පහසුකමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, **අරලගංවිල** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන රෝහලේ මෘත ශරීරාගාරයේ අධිශීතකරණය කැඩිලා වසර 2ක් වෙනවා. අපි මේක ගැන දිගින් දිගටම කිව්වා. මේ පාර්ලිමේන්තුවේ අපි මීට කලිනුත් මේ ගැන කථා කළා. හැබැයි තවමත් ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, මේ සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද, **අරලගංවිල** කියන්නේ 110,000ක ජනතාවක් ජීවත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්. ඒ රෝහලේ මරණයක් වුණොත්, මිනිය අරගෙන කිලෝමීටර් 50ක්, 60ක් පොළොන්නරුව මහ රෝහලට එන්න වෙනවා. ඒ වාගේම තමයි ගැබිනි මව්වරුන් සඳහා අවශ්‍ය පහසුකම් ඒ රෝහල තුළ නැහැ. මේ රෝහල අංගසම්පූර්ණ රෝහලක් බවට පත් කළොත්, ඒ ප්‍රදේශවල ජීවත් වන 110,000ක් ජනතාවට, ඒ රෝගීන්ට ලොකු සේවාවක් දෙන්න පුළුවන්.

විශේෂයෙන්ම පොළොන්නරුව වකුගඩු රෝහල ගැන කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වකුගඩු රෝහල අපට චීන රජයෙන් ලැබුණු පරිත්‍යාගයක්. වකුගඩු රෝගීන් සඳහා ඒ වාගේ අංග සම්පූර්ණ වෙනත් රෝහලක් ලංකාවේම නැහැ. මේ රෝහලේ dialysis කරන්න ඇඳන් පහසුකම් 67ක් තිබුණත්, ක්‍රියාත්මක වෙන්නේ ඇඳන් 48යි. නියමිත වෛද්‍යවරු සහ කාර්ය මණ්ඩලය නොමැතිවීම නිසා තමයි මේ සේවාව දෙන්න බැරි වෙලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, අද වකුගඩු රෝගය වසංගතයක් වාගේ. දවසකට පොළොන්නරුව රෝහලෙන් පමණක් රෝගීන් 100කට වැඩි සංඛ්‍යාවක් dialysis කරනවා. නිසි කාර්ය මණ්ඩලයක් නොමැතිවීම නිසා මේ අයට උපරිම පහසුකමක් ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයටම ඉන්නේ එක නිර්වින්දන වෛද්‍යවරයෙක් පමණයි. මේ වෛද්‍යවරයාට හදිසි ප්‍රශ්නයක් ඇති වුණොත්, ඒ වෛද්‍යවරයාට උණක් හැදුණොත් ශල්‍යකර්මයක් කර ගන්න ඉන්න රෝගියෙකුට ඒ ශල්‍යකර්මය කරගෙන යන්න බැරි වෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා, පොළොන්නරුව දිස්ත්‍රික්කයට තව නිර්වින්දන වෛද්‍යවරයෙක් ලබා දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරියේ සහ මනම්පිටියේ ආයුර්වේද රෝහල් තිබෙනවා. මම හිතන විධියට මින්නේරියේ වාගේ ආයුර්වේද රෝහලක් ලංකාවටම තිබෙන්නේ එකයි. මොකද, බටහිර බෙහෙත් දෙන ඉස්පිරිතාලයත් ආයුර්වේද රෝහලත් එකම භූමියේ පිහිටලා තිබෙන්නේ. හැබැයි, අවම පහසුකම් තමයි තිබෙන්නේ. වෛද්‍යවරයකුට ඉන්න නිවාසයක් නැහැ, පානීය ජල පහසුකම් නැහැ. විශේෂයෙන්ම මේ ආයුර්වේදය හරහා ලොකු සේවාවක් කරන්න පුළුවන්. මින්නේරිය ආයුර්වේදයට දිගින් දිගටම වන අලින්ගෙන් ප්‍රහාර එල්ල වෙනවා. ගිය සතියේත් මේ රෝහල ඉස්සරහ සවි කරලා තිබුණු වීදුරු ටික කඩලා බිඳලා දාලා ගිහින් තිබෙනවා. වනජීවී එකට මේ ගැන දැනුම්දීලා තිබෙනවා. ඒ අනුව මේ වෙනකොට ඇස්තමේන්තුවක් අරගෙන තිබෙනවා. හැබැයි මේ වෙනකම් ඒ සඳහා කිසිම අවධානයක් යොමු වෙලා නැහැ, ගරු ඇමතිතුමනි. ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න කියන එක තමයි මම කියන්නේ

ඒ වාගේම එම රෝහලේ සේවය කරන්න විශේෂඥ වෛද්‍යවරු තුන්දෙනෙක් ඉන්න ඕනෑ. නමුත් එක්කෙනෙක්වත් නැහැ. ඒ වාගේම හෙද නිලධාරීන් 6ක් ඉන්න ඕනෑ. නමුත් එක්කෙනෙක්වත් නැහැ. දැනට ඉන්න වෛද්‍යවරුන් ඇතුළු සේවකයන් පස්දෙනෙකුට ජනවාරි මාසයේ සිට ස්ථාන මාරු තිබෙනවා. ඒ නිසා මේ අය මෙතැනින් ස්ථාන මාරු වෙලා ගියොත්, මේ රෝහල වහන්න වෙයි. ඒ වාගේම අපේ ආගමික නායකයන්, ඒ ප්‍රදේශයේ සිටින ස්වාමීන් වහන්සේලා දිගින් දිගටම ඉල්ලීම් කරලා තිබෙනවා, ආයුර්වේද ප්‍රතිකාර ගන්න ස්වාමීන් වහන්සේලාට වෙනම වාට්ටුවක් ආරම්භ කරන්න කියලා. ගරු ඇමතිතුමනි, ඒ සඳහාත් ඔබතුමාගේ අවධානය යොමු කරයි කියලා මා විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය කියන්නේ අත්‍යවශ්‍ය සේවාවක්. මේ සේවාව තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ අපේ දුවා දරුවන්ට වාගේම, රෝගී තත්ත්වයට පත් වුණු අයට සුවය ලබා දෙන්නයි. ගරු ඇමතිතුමාට වෛද්‍යවරයකු විධියට මේ පිළිබඳ මනා අවබෝධයක් තිබෙනවා කියලා හිතනවා.

ඔබතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයට ඇවිත් තිබෙනවා. ඔබතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රෝහල් ගැන අහලා තිබෙනවා; දැකලා තිබෙනවා. මට ඔබතුමා කිහිපවිටක් පොළොන්නරුවේදී හමුවෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම කරපු යෝජනා ගැන ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, වැලිකන්ද රෝහල ගැනත් විශේෂයෙන් කියන්න ඕනෑ. වැලිකන්ද රෝහල තමයි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කොවිඩ් මධ්‍යස්ථානයක් විධියට අපි ඉස්සෙල්ලාම ආරම්භ කරපු රෝහල. මේ රෝහලේත් විශාල අඩු පාඩු රාශියක් තිබෙනවා. අපි එදා කොවිඩ් මධ්‍යස්ථානයක් වශයෙන් අංග සම්පූර්ණ රෝහලක් විධියට මෙය පරිවර්තනය කළත්, මේ රෝහලට අවශ්‍ය නිලධාරී මණ්ඩලය නැහැ; විශේෂඥ වෛද්‍යවරු නැහැ. ඒ රෝහලත් අපට හොඳ රෝහලක් විධියට පවත්වා ගෙන යන්න පුළුවන්. ඒ ගැනත් විශේෂ අවධානය යොමු කරයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෝමියෝපති වෛද්‍යවරුන්ට අද ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව ඔබතුමාට බලය තිබෙනවා. හෝමියෝපති වෛද්‍යවරුන්ගේ සභාව පිහිටුවා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන්න තීන්දුවට පටහැනිවයි. ඒ අය යෝජනා කරනවා, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දුන් තීන්දුව ක්‍රියාත්මක කරලා සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා. ඊට අදාළ ලේඛනය මා **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයට අදාළ නොවුණත්, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත ගැන ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයන්ගේ සංසදයේ මතය ඇතුළත් ලේඛනයත් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු කිංස් නෙල්සන් මහතා]

මම මේ අවස්ථාවේ තවත් කාරණයක් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, අපි අද විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් විධියට සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ අදහස් ඉදිරිපත් කළේ මෙරටට අතිශය වැදගත් වූ සෞඛ්‍ය ක්ෂේත්‍රය හොඳ තැනකට ගෙනෙන්න අපිත් කැමති නිසායි. ඒ නිසා ඔබතුමා ගන්න සුබවාදී, හොඳ තීන්දුවලට විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මට දෙන්න පුළුවන් උපරිම සහයෝගය වාගේම, විපක්ෂය විධියට අපට දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දෙන්න කටයුතු කරනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන වෛද්‍යවරුන්ට, හෙද නිලධාරීන්ට, එම කාර්ය මණ්ඩලයට මම සුබ පතනවා. ඒ වාගේම අපේ ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් සුබ පතමින් මා නිහඬ වෙනවා.

ඔබ සියලු දෙනාටම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේ ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සඤ්ජීව රණසිංහ අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (පේරාසිරියර්) සේන නාණායක්කාර අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[4.11 p.m.]

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
Hon. Presiding Member, thank you very much for giving me time to participate in this Discussion.

எமது நாட්ටිල් මක්කළුක්කු වළංගප්පටුම් ඉලවස සුකාතාර සේවෛයෛ මේම්පටුත්තුමුකමාක මාණ්පුමිකු ජනාතිපති අවර්කළාල් පාරියළවාන නිති ඔදුක්කප්පට්ටිරුප්පතන්මූලම්, අතාවතු, මොත්තච් චෙලවිනත්තිල් 12 සතවීතත්තෛ ඔදුක්කියතන්මූලම්, එමතු මක්කළ් ඔරු තරමාන වෛද්‍යිය සේවෛයෛයිප් පෙරුක්කොළ්ළ වළිවකුක්කප්පට්ටුළ්ළතු. අතර්කාක මාණ්පුමිකු ජනාතිපති අවර්කළුක්කුම් කෞරව සුකාතාර අමෛච්චරුක්කුම් එනතු නන්රියෛත් තෙරිවිත්තුක් කොළ්ළ විරුම්පුකිරේන්.

අටුත්තු, එමතු සුකාතාර සේවෛයිල් පණියාර්රුම් අමෛච්චින් චෙයලාළර් තොටක්කම් වෛද්‍යිය්චාලෛයිල් වේලෛ චෙය්යුම් ඌழියර්කළ් වරෛ මේර්කොණ්ට තොටර්ච්චියාන අර්ප්පණිප්පාන සේවෛයාල්, minimum per capita expenditure උටනුම්, minimum health workforce උටනුම් - අතාවතු, 1,000 පේරුක්කු 1.12 සතවීත වෛද්‍යිය්කළුටනුම් 2.4 සතවීත තාතියර් උත්තියෝකත්තර් මර්රුම් කුටුම්පනල මාතුක්කළුටනුම් - මිකත් තරමාන සේවෛයෛ වළංකි, එමතු පිරාන්තියත්තිලේයේ තරමාන heath index - සුකාතාරක් කුරියීටුකළුටන් එමතු නාට්ටෛ මුන්නිලෛයිල් වෛත්තිරුප් පතෛයිට්ටු අවර්කළෛප් පාරාට්ට නාන් මිකවුම් කටමෛප්පට්ටුළ්ළේන්. අන්ත වකෛයිලේ, එමතු නාට්ටිලුළ්ළ කිට්ටත්තට්ට 1,164 වෛත්තියචාලෛකළිනතුම්, 335 සුකාතාර වෛත්තිය අතිකාරිකළ් පිරිවිනරතුම් තොටර්ච්චියාන අර්ප්පණිප්පාන සේවෛමූලම් පෝලියෝ, මලේරියා, neonatal tetanus, රුපෙල්ලා පෝන්ර නෝය්කළ් එමතු නාට්ටිලිරුන්තු මුර්රාක ඔළික්කප්පට්ටුළ්ළතුටන්, සිරුවර්කළුක්කාන තටුප්පූසි ඒර්රල් 100 සතවීතමාක ඉරුප්පතුම් උණ්මෛයිලේයේ පාරාට්ටත්තක්ක විටයමාකුම්. අතර්කාකවුම් සුකාතාරත්තුරෛ උறුප්පිනර්කළුක්කුම් ඌழියර්කළුක්කුම් එනතු නන්රියෛත් තෙරිවිත්තුක්කොළ්ළ විරුම්පුකිරේන්.

අත්තුටන්, එමතු නාට්ටිලුළ්ළ 550ක්කුම් මේර්පට්ට PMCUs එනප්පටුම් ආරම්ප මරුත්තුවප් පරාමරිප්පුප් පිරිවුකළින් චේවෛයෛ මක්කළුක්කු වළංකක්කූටිය වකෛයිල්, අවර්රුක්කුත් තේවෛයාන වසතිකළෛ ඒර්පටුත්තික් කොටුත්තු, එමතු Primary Health Care Serviceඉ නාංකළ් මිකවුම් මුන්නේර්රකරමාක එටුත්තුච් චෙල්ලවේණ්ටිය තේවෛයිරුක්කින්රතු. නාන් පිරතිනිතිත්තුවප්පටුත්තුම් යාழ්ප්පාණ මාවට්ටම් මර්රුම් කිළිනොච්චි මාවට්ටංකළෛ එටුත්තුක්කොණ්ටාල්, යාழ්. මාවට්ටත්තිල් පෝතනා වෛත්තියචාලෛ උට්පට 45 වෛත්තියචාලෛකළ් ඉරුක්කින්රන; 14 සුකාතාර වෛත්තිය අතිකාරි පිරිවුකළ් ඉරුක්කින්රන. කිළිනොච්චියිලේ 4 වෛත්තියචාලෛකළුම් 11 වෛත්තිය අතිකාරිකළ් පිරිවුකළුම් ඉරුක්කින්රන. අවර්කළින් චේවෛ උණ්මෛයිලේයේ පරාට්ටත්තක්ක විටයම්. ඒනෙන්රාල්, යුත්ත කාලත්තිලුම්, 'කොවිට්' පෙරුන්තොර්රුක් කාලත්තිලුම්, පොරුළාතාර නෙරුක්කටි කාලත්තිලුම් අවර්කළ් තංකළතු චේවෛයෛ මිකවුම් අර්ප්පණිප්පුටන් වළංකියිරුන්තාර්කළ්. උතාරණමාක, පෝරාට්ටක් කාලත්තිල් උයිරිළප්පුකළින් මත්තියිලුම් අවර්කළ් තංකළතු චේවෛයෛ වළංකියිරුන්තාර්කළ් එන්පතු ඉංකේ කුරිප්පිටත්තක්කතු.

පොතුවාක කිරාමිය වෛත්තියචාලෛකළිල් ඔරළවුක්කුප් පෝතිය වසතිකළ් ඉරුන්තාලුම් තේවෛයාන මනිත වළම් ඉන්මෛයාල් නෝයාළිකළ් මිකවුම් සිරමත්තින් මත්තියිල් අතික පණත්තෛයුම් නේරත්තිනෛයුම් චෙලවුචෙය්තු නකරිලුළ්ළ වෛත්තියචාලෛකළෛ නාටි වරවේණ්ටිය ඔරු තේවෛ යිරුක්කින්රතු. එනවේ, නාංකළ් ඉන්තක් කිරාමිය වෛත්තියචාලෛකළුක්කුත් තේවෛයාන වසතිකළෛච් චෙය්තු කොටුත්තු, තේවෛයාන ඌழියර්කළෛ නියමනම් චෙය්තු, වෛත්තියර්කළෛයුම් අංකු චේවෛක්කු අමර්ත්ති, අන්ත වෛත්තියචාලෛකළින් චේවෛයෛ එමතු කිරාමිය මක්කළුක්කුප් පෙර්රුක්කොටුප්පතර්කාන නටවටික්කෛයෛච් චෙය්ය වේණ්ටියිරුක්කින්රතු. අත්තුටන්, එමතු චිල වෛත්තිය චාලෛකළෛ ඉණෛත්තු cluster වෛත්තියචාලෛකළ් එන්ර වකෛයිල් තේවෛයාන වළංකළෛප් පකිර්න්තු, මරුන්තු මර්රුම් උපකරණංකළෛයුම් වළංකි, අන්තන්තප් පකුති මක්කළුක්කු, කුරිප්පාකක් කිරාමප්පුර මක්කළුක්කුච් චුකාතාර චේවෛකළෛ වළංකුවෝම්.

අත්තුටන්, යාழ්. පෝතනා වෛත්තියචාලෛයිල් ඉරුන්ත පළෛමෛවාය්න්ත, ආපත්තාන නිලෛයිල් ඉරුන්ත පිරචව විටුතික් කට්ටිටම් ඉටික්කප්පට්ටුච් චුමාර් 15 වරුටංකළාකි විට්ටතු; එතිර්ක්කට්චි උறුප්පිනර්කළ්කූට ඉතනෛ එටුත්තුරෛත්තාර්කළ්. පුතිය කට්ටිටත්තිර්කාන වරෛපටම් තයාරික්කප්පට්ටු 12 වරුටංකළුක්කුම් මේලාකි විට්ටතු. චිල වරුටංකළුක්කු මුන්පු පාතීට්ටිල් ඉතර්කාකච් චුමාර් 500 මිල්ලියන් රූපාය් නිති ඔදුක්කප්පට්ටිරුන්තපෝතුම්, ඉන්රුවරෛ පුතිය කට්ටිට නිර්මාණ වේලෛකළ් එතුවුම්

நடைபெறவில்லை. எனவே, நாங்கள் இதில் முக்கிய கவனஞ்செலுத்தி, அங்கு இருதய நோய்ச் சிகிச்சைப் பிரிவையும், மகப்பேற்று விடுதியையும் அமைக்க நடவடிக்கை எடுக்கவேண்டிய அவசியத்தில் இருக்கின்றோம். இது தொடர்பில் வெளிநாட்டு உதவிகள் அல்லது நன்கொடைகளைப் பெற்றுக்கொள்ள நடவடிக்கை எடுக்க வேண்டும். இதுபற்றி நான் அமைச்சரிடமும் கதைத்திருக்கிறேன். அவர் இது தொடர்பில் நடவடிக்கை எடுப்பதாகச் சொல்லியிருக்கிறார்.

அடுத்து, மிக முக்கியமாக யாழ். மாவட்டத்திலே கட்டாக்காலி நாய்களின் எண்ணிக்கை மிகவும் அதிகளவாக இருப்பதனால் பெருமளவு வளங்களை நாங்கள் விரயமாக்க வேண்டியுள்ளது. சென்ற வருடம்கூட 12,489 பேர் நாய்க் கடிக்கு உள்ளாகி, அதில் 4 பேர் இறந்தும் இருக்கின்றார்கள். எனவே, அதற்காகத் தகுந்த நடவடிக்கை மேற்கொள்ள வேண்டிய நிலை இருக்கின்றது.

மேலும், கிளிநொச்சி வைத்தியசாலையில் நெதர்லாந்து நாட்டின் உதவியால் அமைக்கப்பட்டுள்ள மகளிர் மற்றும் குழந்தைப் பேறின்மை தொடர்பான கட்டிடத்திற்குத் தேவையான உபகரணங்கள், வைத்திய நிபுணர்கள் மற்றும் தாதிய உத்தியோகத்தர்களை நியமித்து, அதனை முழுமையாக இயங்கச்செய்ய வேண்டிய தேவை இருக்கின்றது.

வவுனியா வைத்தியசாலையிலும் மிகத் தரம் வாய்ந்த cath lab ஒன்று இருந்தாலும், அங்கே ஏற்கனவே வைத்திய நிபுணர்களோ, பயிற்சி பெற்ற தாதியர்களோ இன்மையால் அது முழுமையாக இயங்க முடியாமல் இருக்கின்றது. நாங்கள் அவற்றினையும் நிவர்த்தி செய்ய வேண்டிய தேவையிருக்கின்றது. அதனையும் நாங்கள் விரைவில் செய்வோம் என்று உறுதி கூறிக்கொள்கின்றோம்.

அடுத்ததாக, யாழ்ப்பாணப் போதனா வைத்தியசாலையை நான்காவது தேசிய வைத்தியசாலையாகத் தரமுயர்த்துவதாக அரசியல்வாதிகளால் காலத்திற்குக் காலம் வாக்குறுதிகள் வழங்கப்பட்டு வந்தாலும், விஞ்ஞான ரீதியில் ஆராய்ந்து நாங்கள் அதை ஒரு தேசிய வைத்தியசாலையாகத் தரமுயர்த்துவோம் என்றும் கூறிக்கொள்ள விரும்புகின்றோம். அத்துடன், தெல்லிப்பளை புற்றுநோய் வைத்தியசாலையையும் விசேட வைத்தியசாலையாகத் தரமுயர்த்துவதன்மூலம் வட மாகாணத்தில் புற்றுநோயால் பாதிக்கப்பட்டவர்களுக்கு ஒரு தரமான சேவையை வழங்கக்கூடியதாக இருக்கும்.

கௌரவ அமைச்சர் அவர்கள் வட மாகாணத்திற்கு இம்மாதம் விஜயம் செய்யவிருப்பதாகக் கூறியிருக்கின்றார். அவரை அங்கு வரவழைத்து அவரது உதவியுடன் அங்குள்ள ஏனைய பிரச்சினைகளையும் தீர்ப்பதற்கு நடவடிக்கை எடுப்போமெனக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

யாழ்ப்பாணத்திலுள்ள லங்கா சித்த ஆயுர்வேத வைத்தியக் கல்லூரி சுமார் 100 வருடங்களுக்கும் மேல் பழைமை வாய்ந்தது; தற்போது அது மூடப்பட்டிருக்கின்றது. ஆகவே, அதை மீண்டும் திறந்து பாரம்பரிய வைத்தியர்களும் அவர்களது சேவையை வழங்க ஏற்ற நடவடிக்கை எடுப்போம் என்றும் கூறி, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මැතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.19]

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சர் மாண்புமிகு வைத்தியர் நளிந்த ஜயதிஸ்ஸ அவர்கள், தனது பிரதி அமைச்சர் மற்றும் அமைச்சினுடைய அதிகாரிகளின் ஒத்துழைப்போடு இந்த வரவு செலவுத்திட்டத்திலே பல்வேறுபட்ட புதிய அம்சங்களை உட்புகுத்தியிருக்கிறார். குறிப்பாக தாய் - சேய் பாதுகாப்பு போன்ற பல்வேறுபட்ட சமூகநலத் திட்டங்கள் இந்த Budgetஇல் சமர்ப்பிக்கப்பட்டிருக்கிறது; அறிமுகம் செய்யப்பட்டிருக்கிறது. அதற்காக நாங்கள் அவரைப் பாராட்டுகின்றோம். அவருடைய பணிகள் மேலும் சிறப்படைய வேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறிப்பாக மட்டக்களப்பு வைத்தியசாலையில் எதிர்காலத்திலே செய்யவிருக்கின்ற வேலைத்திட்டங்கள்பற்றி கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார். கிழக்கு மாகாணத்திலே இருதய நோயாளிகள் மிக அதிகமாக இருக்கிறார்கள். அதற்கான angiogram பரிசோதனையைச் செய்வதற்கான வசதி கிழக்கு மாகாணத்திலே எந்தவோர் அரச வைத்தியசாலையிலுமே இல்லை. கிழக்கு மாகாணத்திலே இருக்கின்ற மிகப்பெரிய வைத்தியசாலை Batticaloa Teaching Hospital. அங்குகூட அதற்கான facilities இல்லை. கிழக்கு மாகாணத்திலுள்ள இருதய நோயாளிகளை angiogram செய்வதாக இருந்தால், Jaffna Hospitalக்குத்தான் அனுப்புவார்கள். முழு வடக்கு, கிழக்கிலிருந்தும் அனுமதிக்கப்படுகின்ற அனைத்து நோயாளர்களுக்கும் அங்கே angiogram செய்யவேண்டியிருப்பதால் ஒரு மாதத்தில் eight patients இற்குத்தான் அதனைச் செய்வதற்கான permission வழங்குகிறார்கள். ஆனால், ஆயிரக்கணக்கானவர்கள் இதனை மேற்கொள்ளவேண்டியிருப்பதால், கிட்டத்தட்ட 1 - 1½ வருடங்களுக்கு wait பண்ண வேண்டியிருக்கின்றது. அதற்கிடையிலே நூற்றுக்கணக்கான நோயாளர்கள் மரணித்துப் போகின்றார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் - கௌரவ பிரதி அமைச்சர் அவர்களும் இங்கே இருக்கின்றீர்கள் - கிழக்கு மாகாண மக்களுடைய நன்மை கருதி, மட்டக்களப்புப் போதனா வைத்தியசாலையிலே angiogram செய்வதற்கான facilitiesஐ ஏற்படுத்துவதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும் என்று நாங்கள் மிகவும் அன்போடு கேட்டுக் கொள்கின்றோம்.

மட்டக்களப்பு மஞ்சந்தொடுவாயில் Unani Teaching Hospital இருக்கின்றது. அது உங்களுடைய Ministryஇன் கீழ் இருக்கின்ற ஒரு hospital ஆகும். அங்கு இன்னும் permanent MOIC நியமிக்கப்பட்டவில்லை. அங்கிருக்கின்றவர் acting அடிப்படையில் பணி செய்துகொண்டிருக்கின்றார். அங்கு permanent MOIC இல்லாத காரணத்தினால் அந்த வைத்தியசாலையின் முன்னேற்றத்திலே பல பிரச்சினைகளை எதிர்நோக்க வேண்டியிருக்கின்றது. ஆகவே, permanent MOICஐ நீங்கள் அங்கு நியமிக்க வேண்டும். அங்கு மற்றைய எல்லா வசதிகளும் இருக்கின்றன; அதற்குரிய staffஉம் இருக்கிறார்கள். ஆனால், அங்கேயுள்ள doctors cadre 7ஆக இருந்தும் 2 - 3 doctors தான் இப்பொழுது இருக்கிறார்கள். ஆகவே, அங்கு doctorsஐ நியமிக்க நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும். மேலும், இலங்கையிலே இருக்கின்ற ஒரேயொரு

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

Unani Teaching Hospital இதுதான். Ayurveda Department அதற்கான நிரந்தரக் கட்டிடம் கட்டுவதற்கு ஒரு காணியைக் கேட்டபோது, அதற்குத் தேவையான மிகப்பெரிய காணியை நகரத்திலேயே பெற்று நாங்கள் சுகாதார அமைச்சுக்கு ஒப்படைத்திருக்கின்றோம். அதற்கென்று RS. 20 million allocate பண்ணப்பட்டது; அங்கு soil test செய்யப்பட்டது. அவ்வாறு சிற்சில வேலைகள் செய்யப் பட்டாலும் இன்னும் அதற்கான எந்தவொரு கட்டிட வேலையும் ஆரம்பிக்கப்படல்லை. ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள், கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இதிலே உரிய கவனம் எடுத்து, இதற்கு முக்கியத்துவம் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, Pottuvil Hospitalஐ 01st August 2024 இல் Central Government, take over பண்ணியிருக்கின்றது. இருந்தாலும் officially இன்னும் எந்தவொரு processஉம் நடக்கவில்லை. கடந்த 31st December வரை Eastern Provincial Councilஇனுடைய Budgetஇல்கூட எந்தவோர் allocationஐயும் செய்யவில்லை. இந்த hospitalக்குத் தேவையான மருந்துகளை - drugsஐ - collect பண்ணுவதற்குரிய lorryகூட அங்கு இல்லை. முன்பு கிழக்கு மாகாண சபை அந்த வைத்தியசாலைக்கு ஒரு lorryஐக் கொடுத்தது; இப்பொழுது அதுவும் நிறுத்தப் பட்டிருக்கின்றது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே! கௌரவ பிரதி அமைச்சர் அவர்களே! நீங்கள் உடனடியாகப் பொத்துவில் hospitalக்கு drugsஐ collect பண்ணுவதற்கான lorry ஒன்றைப் பெற்றுக்கொடுக்க ஏற்பாடு செய்ய வேண்டும். அங்கேயிருந்த ambulanceகூடச் சேதமடைந்திருக்கிறது; அதனையும் சீர்செய்து கொடுக்க வேண்டும். நீங்கள் ஏற்கெனவே Central Governmentஇன் கீழ் பொறுப்பெடுத் திருக்கின்ற அந்த hospitalஐ நல்ல முறையில் செயற்படுத்து வதற்குரிய processஐ அவசரமாகச் செய்யுமாறு உங்களைக் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, கிழக்கு மாகாணத்திலே இருக்கின்ற Ayurveda Departmentஇலே Ayurveda Provincial Commissioner position, Deputy Commissioner position, Medical Superintendent position ஆகிய எல்லாமே vacant ஆக இருக்கின்றது. அதற்குத் தகுதியான வைத்தியர்கள் அந்த மாகாணத்தில் இருக்கிறார்கள். உடனடியாக அவர்களுக்கு ஒரு interview நடத்தி, merit qualifiedஆனவர்களை அந்த positionsஇற்கு நியமித்தால் அந்த department சிறப்பாக இயக்கக்கூடியதாக இருக்கும்.

விசேடமாக, கிழக்கு மாகாணம் மிக நீண்ட காலமாக யுத்தத்தால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட ஒரு மாகாண மாகும். ஆனால், கிழக்கு மாகாண சபைக்கு மிகக் குறைவான நிதிதான் ஒதுக்கப்படுகின்றது. இதனால் அதன் செயற்பாடு களை முன்னெடுப்பதில் கௌரவ ஆளுநர் அவர்களும் செயலாளர் மற்றும் அதிகாரிகளும் மிகக் கஷ்டப்படு கின்றார்கள். ஒதுக்கப்படுகின்ற நிதியிலிருந்து கிழக்கு மாகாணத்திலே இருக்கின்ற வைத்தியசாலைகளினுடைய தேவைகளை நிறைவுசெய்ய முடியாமலிருக்கிறது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up in one minute, Sir.

போதிய நிதி வசதி இல்லாமையால் அங்கு பல வேலைகளைச் செய்யமுடியாமல் இருக்கின்றது. ஆகவே, கௌரவ சுகாதார அமைச்சர் மற்றும் அமைச்சின் அதிகாரிகள் இதனைக் கருத்திலெடுத்து, கிழக்கு மாகாணத்தினுடைய சுகாதாரத் துறையின் முன்னேற்றத்திற்காகத் தேவையான வசதிகளைச் செய்வதற்கு முன்வர வேண்டும். அங்குள்ள வைத்தியசாலைகள் Provincial Councilஇன் கீழ் வருகின்ற வைத்தியசாலைகளாக இருந்தாலும், நீங்களும் மேலதிகமாகச் சில உதவிகளைச் செய்து, அந்த மாகாணத்தைக் கட்டியெழுப்புதவற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 4.26]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි.

අපි අද විවාදයට ගන්නා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය කියන්නේ ජනතාවට ඉතා සමීප, ජනතාවට අත්‍යවශ්‍ය අමාත්‍යාංශයක්. මේ අමාත්‍යාංශය යටතේ තිබෙන රෝහල් සහ අනෙකුත් සියලු දේ මිනිසා ජීවත් කරවන්න තිබෙන ආයතන. ඇත්තටම මම සතුටු වෙනවා, නලින්ද ජයතිස්ස වැනි මන්ත්‍රීවරයෙක් අද මේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හැටියට පත් වීම ගැන. මොකද, එතුමා ඉතාම නිහතමානී කෙනෙක්; අපි කාලයක් තිස්සේ ඇසුරු කළ පුද්ගලයෙක්. හැබැයි, දැන් නම් පොඩ්ඩක් අහංකාර ගතියක් පෙනෙන්න තිබෙනවා. ඉස්සර ඇත්තටම හොඳට හිටියා, අපිත් එක්ක බොහොම සුහදශීලීව. නමුත් දැන් පොඩි වෙනසක් වාගේ පෙනෙනවා. කමක් නැහැ.

එතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය මුදල් විශාල ප්‍රමාණයකින් වෙන් කරගෙන තිබෙනවා. ඒක ඉතාම වැදගත්. හැබැයි, මතක තබා ගන්න, සෞඛ්‍ය අමාත්‍යාංශය තමයි මේ රටේ ඉතිහාසය තුළ කැබිනට් අමාත්‍යවරයෙක් හිරේ යවපු අමාත්‍යාංශය කියන එක. ඒ නිසා "Keheliya No. 1" හැටියට සිදු වුණු ඒ සිදුවීම, "Keheliya No. 2" හැටියට නැවත පටන් ගන්නත් පුළුවන්, මෙවැනි හොඳ අමාත්‍යවරයෙකුටත්. මොකද, ඒවායේ පාලන කටයුතුවල තවම ඉන්නේ අර පරණ කණ්ඩායම් ටික බව මතක තබා ගන්න. ගෝඨාභය රාජපක්ෂගෙන් පටන් ගත්ත, කෙහෙලිය රඹුක්වැල්ලගෙන් පටන් ගත්ත කණ්ඩායම තවම ඒ පාලනයේ ඉන්නවා. මම දැක්කා, පුවත් පතක මෙන්න මෙහෙම කථාවක් පළ වෙලා තිබෙනවා, "ඖෂධ ටෙන්ඩර් ලිපි ගොනු 250ක් නීති අංශයේ හිරවෙලා." කියලා. අපිත් කරුණු හොයන නිසා, අමාත්‍යාංශයෙනුත් කරුණු ගොඩක් එළියට එන නිසා, මේවා වෙන්නේ කෙසේද කියන එක සොයා බැලිය යුතුයි. අපි මේවා ගැන කියන්නේ තමුන්නාන්සේලාට සහයෝගයක් විධියටයි කියන එකත් මතක තබා ගන්න. තමුන්නාන්සේලාට මඩ ගැසීමක් නොවෙයි අපි මේ කරන්නේ. මේවා ගැන හරි විධියට සොයා බලා තීන්දු-තීරණ ගන්න. වැරැද්ද, නිවැරැද්ද හරියට හඳුනාගෙන, වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන්න. මට ලැබුණු තොරතුරු අනුවයි මම මේවා ගැන කථා කරන්නේ.

එවැනි කටයුතුවලට විශේෂයෙන්ම වගකිව යුත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ සුනෙත් සුබසිංහ ආරච්චි කියලා තමයි අපට තොරතුරු ලැබී තිබෙන්නේ. එතුමා ඒ ආයතනය තුළ කටයුතු කර තිබෙන්නේ ඒක එතුමාගේ පෞද්ගලික ආයතනයක් විධියට සලකාගෙන. දැනගන්න ලැබී තිබෙන තොරතුරු අනුව ස්ථාන මාරු ගොඩක් සිද්ධ කර තිබෙනවා, එතුමාට ඕනෑ විධියට. ඒ විතරක් නොවෙයි. ඒ සංස්ථාවේ සාමාන්‍යාධිකාරි තනතුරු හයෙන්, තුනක් පමණයි දැනට පවතින්නේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරක කෙනෙක් අයින් වෙලා. IT කළමනාකරු ඉල්ලා අස්වී තිබෙනවා. ටෙන්ඩර් ඇගැයීම් අංශයේ කළමනාකරු ඉල්ලා අස්වී තිබෙනවා. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරියක් තමයි අභ්‍යන්තර කටයුතු පාලනය කරනවා කියන්නේ. ඇයට චෝදනා තිබෙනවා කියාත් සඳහන් වෙනවා. දැනට ඖෂධ සම්බන්ධ ටෙන්ඩර් ගිවිසුම් 250ක් තමයි මේ භාර වෙලා තිබෙනවා කියන්නේ. හැබැයි, උපකරණ සහ අනෙක් ඒවාට අදාළ ටෙන්ඩර් ලිපි ගොනු 2,000ක විතර ප්‍රමාණයක් තිබෙනවා කියලා තමයි එළියට තොරතුරු ලැබී තිබෙන්නේ. මම කලින් සඳහන් කළ නිලධාරියා වාහනය පවා අයුතු ලෙස, වැරදි විධියට පාවිච්චි කරනවා කියලා තමයි තොරතුරු ලැබී තිබෙන්නේ. ගරු අමාත්‍යතුමනි, මම මේ කාරණා කියන්න හේතුව මේකයි. මේ විධියට තමයි මේ සියලු කටයුතු සිද්ධ වෙලා තිබෙන්නේ.

අපි එදාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන, බාල බෙහෙත් ගැන කථා කළා. එතකොට අපි දැක්කා, ඒ සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙක් කියනවා, බාල බෙහෙත් කියලා ජාතියක් නැහැ කියලා. අපි ඒක පිළිගන්නම්. හැබැයි, වතුර බෙහෙත් තිබුණා. ඒ නිසා එවැනි තැන් නිවැරදි කරද්දී ගරු අමාත්‍යතුමනි, මෙන්න මේවා ගැනත් හරියට හොයා බලන්න. මම කියපු කරුණු-කාරණා ටික හරි නම්, කරුණාකර මේවා සම්බන්ධයෙන් තීන්දු-තීරණ අරගෙන ඔබතුමාට වැඩ කරන්න පුළුවන් විධියට අමාත්‍යාංශය ශක්තිමත් කරගෙන, සෞඛ්‍ය ක්ෂේත්‍රය ඉදිරියට ගෙනයන්න පුළුවන් විධියට ඔබතුමාට ඕනෑ කරන හොඳ කණ්ඩායමක් පත් කර ගන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

මොකද, මේ අමාත්‍යාංශය විශේෂයි. ඔබතුමා මේ අමාත්‍යාංශය සඳහා විශාල මුදලක් වෙන් කරගෙන තිබෙනවා. හැබැයි, විශාල මුදලක් වෙන් කරගෙන මේ රටට වැඩ කරද්දී සමහර කණ්ඩායම් ඒවා කඩාකප්පල් කරමින්, වැඩ කරන්න බැරි විධියට ආපස්සට අදිනවා නම් වැඩක් නැහැ. අපි හිතමු, මේ විධියට ටෙන්ඩර් ටික නිවැරදි ක්‍රමයට දෙන්නේ නැතුව ඒකට කාලය ගන්නවා කියලා. ඒ කාලය ගන්නේ මොකටද කියලා අපි දන්නවා. එහෙම කාලය ගන්නේ ඇයි? ඒකට හේතු තිබෙනවා. නියමිත කාලය පසු වුණාම තමයි මේක අපට කරලා දෙන්න කියලා ටෙන්ඩර්කරු එයාලා හොයාගෙන එන්නේ. එහෙම කාලය පසු කරලා බෙහෙත් නිහයක් ආවොත් ඒක කාටද බලපාන්නේ? මේ රටේ අහිංසක ජනතාව තමයි ඒ හේතුව නිසා මැරෙන්නේ. එහෙම වෙනකොට ඇඟිල්ල දිගු වෙන්නේ තමුන්නාන්සේලාට.

ඒ නිසා මම කියනවා, "Keheliya No. 2" ක්‍රියාත්මක වෙන්න ඉඩ දෙන්න එපා කියලා. මොකද, එහෙම ක්‍රියාත්මක වුණොත්, ඔබතුමා මෙච්චර හොඳ අමාත්‍යවරයකු හැටියට වැඩකටයුතු කරද්දී, මුදල් විශාල ප්‍රමාණයක් අය වැයෙන් වෙන් කරගෙන තිබෙද්දී වුණත් ඔබතුමාට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කටයුතු ඉදිරියට ගෙන යන්න බැරි වෙනවා. රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බරපතළ ප්‍රශ්න තිබෙනකොට එම ප්‍රශ්න විසඳන්න අවශ්‍ය වැඩ පිළිවෙළ තමුන්නාන්සේලා කොච්චර සැලසුම් කළත් ඒවා ක්‍රියාත්මක කරමින් ඉස්සරහට යන්න බැරි වෙනවා කියන කාරණය හොඳට මතක තබා ගන්න. මේ කාරණය මම සිහිපත් කළාට, සමහර විට ඔබතුමාත් මේ තොරතුරු දන්නවා ඇති. එම නිසා තව ඕනෑවට වඩා කියන්න අවශ්‍ය නැහැ.

ගරු ඇමතිතුමනි, පුත්තලම දිස්ත්‍රික්කය ගැන මම පොඩි කාරණයක් කියන්නම්. පුත්තලම දිස්ත්‍රික්කයේ රෝහල්වල බරපතළ ප්‍රශ්න ටිකක් තිබෙනවා. විශේෂයෙන්ම පුත්තලම රෝහල, ජාතික රෝහලක් හැටියට ගන්න බව ඔබතුමාගේ කථාවේදී කිව්වා. ජාතික රෝහලක් හැටියට ගන්නවා නොවෙයි, ගන්න උත්සාහ කරනවා කිව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
තව තත්පර දෙකෙන් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පුත්තලම රෝහලේ බොහෝ අඩු පාඩු තිබෙනවා. වැසිකිළියට යන්න බැහැ, ගියොත් රෝගියා ආපහු රෝගී වෙනවා. කානු පද්ධතිය වතුරෙන් යට වනවා. ඊළඟට, වාට්ටුවල තිබෙන අඩු පාඩු බොහොමයි. එක ඇදේ හතරදෙනා ඉන්නවා. එම නිසා කරුණාකරලා ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න. එම රෝහල ජාතික රෝහලක් හැටියට ගන්න ඔබතුමා අකැමැති නම්, කරුණාකරලා ඒ රෝහලේ ප්‍රතිසංස්කරණ කටයුතු ටික කරලා දෙන්න. ජාතින් වශයෙන් වෙන් කරගෙන නොවෙයි මම කථා කරන්නේ. ආගම් වශයෙන් ගත්තාමත් කණ්ඩායම් හතරක් එකට ඉන්න, සහෝදරයෝ වාගේ ජීවත් වන තැනක් පුත්තලම කියන්නේ. එම නිසා පුත්තලම රෝහල ඉතාම විශේෂයි. දුප්පත්, අහිංසක මිනිස්සු එතැනට එන්නේ. ඒ නිසා ඒ රෝහල හොඳට හදලා දෙන්න කියලා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 08ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.32]

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාවේදී වැඩිපුර කථාබහට ලක් නොවුණු කාරණාවක් තමයි තැපෑල කියන්නේ. තොරතුරු තාක්ෂණය දියුණු වෙන්නට පෙර ජංගම දුරකථන, ස්ථාවර දුරකථන පහසුකම් ලැබෙන්නට පෙර, අපි දුක, සැප, සතුට, වියෝව, ශෝකය හා ආදරය කියන ඒ සියල්ලක්ම බෙදා හදා ගත්තේ, ඒ සියල්ලක්ම හුවමාරු කර ගත්තේ තැපෑල හරහා. අපේ ගමට දිනපතාම එන නිලධාරියා කවුද කියලා මතක් කළොත්, ඕනෑම කෙනෙකුට මතක් වෙන්නේ, තැපැල් මහත්මයා. ඔහුට අපි කියන්නේ, පියුම් මහත්මයා කියලා. අපේ ආච්චිලා සීයලාගේ, අම්මලා තාත්තලාගේ කාලයේ ඉඳලා, අපේ කාලයේත් pushbike එක පැදගෙන ඇවිල්ලා bell එක ගහන ක්‍රමය තවමත් ඒ අයුරින්ම තමයි පවත්වාගෙන යන්නේ. ජන ජීවිතය හා බැඳුණු සේවාවක් කරන ඔවුන්ට ඉතාම සමීප සම්බන්ධතාවක් තිබෙනවා ජනතාව සමඟම.

අධිරාජ්‍යවාදී යුගයේ සිට අද දක්වාම අවම පහසුකම්වලින් වුවත් වටිනාම කාර්යභාරයක් ඉටු කරන තැපැල් සේවයේ නියුතු නිලධාරීන්ට හිමි විය යුතු වැටුප් වර්ධක, වරප්‍රසාද, ස්ථිර කිරීම්,

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

උසස්වීම් කිසිවක් ලැබිලා තිබුණේ නැහැ. අද මේ වැය ශීර්ෂය විවාදයට ගෙන තිබෙන අවස්ථාවේ ඒ ඒ කරුණු පිළිබඳව කථා කරන නිසා ගොඩක් අයගෙන් විවිධාකාර messages ආවා. ගුවන් විදුලි සංස්ථාවේ සේවය කරන නිවේදක මහත්මයෙක් එවා තිබුණා, 2005දී සහන නිවේදකයෙක් ලෙස බැඳුණු බවත්, 2015 ජුනි කොන්ත්‍රාත් පදනම මත නිවේදකයෙකු ලෙස පත්වීම් ලැබුණ බවත්, අවුරුදු 20ක් ගත වෙලාත් තවමත් කොන්ත්‍රාත් පදනමේ සිටින බව. ඉතින්, අපි ඉදිරියේදී ඒ සියල්ලම ක්‍රමානුකූලව සකස් කරමින් දේශපාලන අත පෙවීමකින් තොරව ඔවුන්ට ලැබිය යුතු දේවල් ලබා දෙනවා. පසුගිය කාලය පුරාවටම අපි දැක්කා මේ පත්වීම්, ස්ථාන මාරුවීම්, උසස් වීම් කියන සියල්ලක්ම දුන්නේ දේශපාලන බලපෑම් මත. තමන්ගේ හිතමිත්‍රාදීන්ට, ඥාතීන්ට තමයි ඒවා ලැබුණේ. නමුත් ඒ සම්ප්‍රදාය, ඒ සංස්කෘතිය සම්පූර්ණයෙන්ම ඉවත් කරලා සුදුස්සාට සුදුසු තැන ලබා දීම වෙනුවෙන් අපි ක්‍රමානුකූලව කටයුතු කරමින් යනවා.

විවිධ ආණ්ඩු මේ රට පාලනය කළත් නූතන සමාජයට ගැළපෙන අයුරින් යාවත්කාලීනව තැපෑල දියුණු කරන්නට කටයුතු යොදලා තිබුණේ නැහැ. නමුත්, අපි 2025 අය වැය ලේඛනය ඉදිරිපත් කරලා සාකච්ඡා කරන මේ මොහොතේ මේ සභාව දැනුවත් කරන්න කැමැතියි, අපේ ඉදිරි සැලසුම් පිළිබඳව. අපි නවීන තාක්ෂණික දියුණුවේ අභියෝග මැද වුවත් මිනිසුන්ට වඩාත් හොඳ සේවයක් සලසන නූතනවාදී දියුණු ආයතනයක් බවට තැපෑල පත් කරන්න සැලසුම් සකස් කරලා ඉවරයි.

ඔබතුමන්ලාට මතක ඇති පසුගිය කාලයේ නුවරඑළියේ තැපැල් මධ්‍යස්ථානයට වෙන්න ගිය දේ. හිටපු ජනාධිපතිවරු හරියට වෙන්දේසිකරුවන් ඇවිල්ලා තක්සේරු කරනවා වාගේ, රාජ්‍ය නිලධාරීන් හෝටල්වලට ගෙන්වලා, විවිධාකාරයෙන් බලපෑම් කරලා, ඒ ආයතන පවරා ගන්න, ඒ ආයතන විකුණන්න උත්සාහ කළා. නමුත්, අපි රජයක් විධියට ඒවා විකුණන්න නොදී, ඒ රජයේ සම්පත් නැවත පවරා ගෙන, ඒවා දියුණු කරලා, සංචාරක කර්මාන්තය නඟා සිටුවීමට දායකත්වයක් දීලා තිබෙනවා. ඒ විකුණන්න හදපු තැපැල් මධ්‍යස්ථානය ඉතා වටිනා, පෞරාණික වටිනාකමක් සහිත ස්ථානයක්. හැබැයි, මේ වන විට අපි එතැනින් එහාට ගිහිල්ලා සංචාරක කර්මාන්තය දියුණු කරන්න, එතැන photo එකක් අරගෙන සංචාරකයන් ඔවුන්ගේ රටට යනකොට, සමරු මුද්දරයක් සකස් කරලා, ඒක මතක සටහනක් විධියට අරගෙන යන්න පුළුවන් වෙන විධියට විවිධාකාරයේ ක්‍රම සකස් කරලා තිබෙනවා. පසුගිය රජය කාලයේ ගුවන් විදුලි සංස්ථාවට අයිති ඉඩමක්, නුවරඑළියේ තිබෙන circuit bungalow එකක් seal තියලා තිබෙනවා. මේ වෙනකොට ඒකත් spa එකකට ගත්තා කියලා සාක්ෂි ලැබිලා තිබෙනවා. ඒ ආකාරයට තමයි, පසුගිය කාලය පුරාවම රාජ්‍ය දේපළ අවභාවිත කළේ. එහෙම වෙන්න නොදී, ඒවා ජනතාවගේ සුබසාධනය උදෙසා, ජනතාවට ඒවායේ ප්‍රතිලාභ ලබාදීම උදෙසා අපි කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේම, සාම්ප්‍රදායික ලියුම් හුවමාරුවෙන් එහාට ගිහිල්ලා, තැපැල නූතන යුගයේ කාර්යභාරය හඳුනා ගනිමින් තිබෙනවා. ඒ නිසා අපට නැති වෙලා තිබෙන පැරණි ශ්‍රී විභූතිය නැවතත් අත්පත් කර ගැනීම වෙනුවෙන්, සියලුදෙනා වැඩ ආරම්භ කරලා තිබෙනවා. 2025 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ ආදායම රුපියල් මිලියන 18,000ක් දක්වා වර්ධනය කර ගැනීමට සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම, China Postal Express and Logistics Company Limited සමඟ *e*-packet ක්‍රමය වෙනුවෙන් ද්විපාර්ශ්වික ගිවිසුම්වලට එළැඹී තිබෙනවා. තැපැල් දෙපාර්තමේන්තුවේ ගෙවීම් කටයුතු සඳහා භාවිත වන මෘදුකාංග මඟින් *e*-counters හරහා ගනුදෙනු කිරීමට, ඒ වාගේම *e*-Commerce, *e*-Post, digital post, mobile apps, EMS වැනි ක්‍රම භාවිත කරමින්, අවම මුදලකින් අපේ භාණ්ඩ වෙනත් රටවලට ගෙන යෑමේ ඒ ක්‍රම යාවත්කාලීන කරලා ක්‍රියාත්මක වෙනවා. නවීන තාක්ෂණ ක්‍රම අනුගමනය කරමින් යාවත්කාලීන කරලා, ඒවා ලාභ ලබන ආයතන බවට පත් කරන්න, ඒ කියන්නේ break-even එකේවත් නැති පාඩු ලබන ආයතන, break-even දක්වා ගෙනැල්ලා ලාභ ලබන ආයතන බවට පත් කර ගැනීමට අපි ක්‍රම සකස් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 23,918ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ලෝකයේ තිබෙනවා, anti-siphoning law කියලා නීතියක්. එංගලන්තය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව වාගේ රටවල ඒ නීතිය ක්‍රියාත්මකයි. මම කථා කරන්න යන්නේ, අපේ රටේ ජාතික මාධ්‍යයට වෙලා තිබෙන විනාශය පිළිබඳවයි. අපේ රටේ ක්‍රීඩා පිළිබඳව පසුගිය කාලය පුරා කථා කළා. මම හිතන්නේ, ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව කථා කරලා තිබුණා. ජාතික නාළිකාවලින් විකාශය වෙන්න තිබුණු ගොඩක් දේවල් CSN නාළිකාව හරහා විකාශය කරන්න, 2011දී Cabinet Paper එකක් දාලා ජාතික නාළිකාවට තිබුණු monopoly එක නැති කළා. 2011 Cricket World Cup match එකේ advertisingවලින් රුපියල් මිලියන 400ක් සොයලා තිබුණු ජාතික නාළිකාව අද වෙනකොට රුපියලක්වත් සොයන්නේ නැති තත්ත්වයට කඩා වටිලා තිබෙනවා. එතකොට මේ නීතිය ක්‍රියාත්මක වන රටවල්, ක්‍රීඩාවට අදාළ දේවල් තමන්ගේ රටේ මොන චැනල් එකේ විකාශය වුණත්, තමන්ගේ රටේ ජාතික නාළිකාවේත් විකාශය කරනවා. ඒ අනුව මම මේ ගරු සභාවට යෝජනා කරනවා, ජාතික වැදගත්කමකින් යුතු events සියල්ල - events of national interest - ජාතික නාළිකාවෙන් පෙන්වන්න කියලා. මේක win-win situation එකක්. මොකද, ownership එක මොන නාළිකාව සතුව තිබුණත්, ජාතික නාළිකාව advertisingවලින් සොයන මුදලින් වැඩි ප්‍රමාණයක් ඒ ownership එක තිබෙන අයට දෙන්න පුළුවන්. ඒ දීලාත් සියයට 25ක වාගේ ප්‍රමාණයක් ජාතික නාළිකාව සතු වෙනවා.

මේ විධියට බිඳ වටිලා තිබුණු රාජ්‍ය ආයතන break-even level එක දක්වා ගෙනැල්ලා, ඒවා ලාභ ලබන ආයතන බවට පත් කිරීම වෙනුවෙන් අපි මේ අය වැය සකස් කර තිබෙනවා. අපි හිතනවා විපක්ෂයේ සිටින ගරු මන්ත්‍රීතුමන්ලාත් මේ රට පොහොසත් රටක් බවට පත් කරලා මේ රටේ මිනිසුන්ගේ ජීවිත ලස්සන ජීවිත බවට පත් කර ගන්න සහයෝගය දක්වයි කියලා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 4.41]

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நமது நாட்டில் முக்கியமான ஓர் அமைச்சாக இருக்கின்ற சுகாதார அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் பேசுவதையிட்டு நான் மகிழ்ச்சி அடைகின்றேன். உண்மையிலேயே இவ்வமைச்சு ஆரோக்கியமான சமூகத்தை உருவாக்குகின்ற, பாரிய பணிகளைச் செய்கின்ற ஓர் அமைச்சாகும். ஏனைய உலக நாடுகளில் இல்லாத அளவுக்கு

இலவச சுகாதார சேவையை வழங்குகின்ற இந்த நாட்டில், நல்ல பல பணிகளைச் செய்து வருகின்ற இந்த அமைச்சை நாங்கள் பாராட்டுகின்றோம். ஏனெனில், இந்த அமைச்சினூடாகத்தான் இந்த நாட்டில் ஆரோக்கியமான சமுதாயத்தை உருவாக்கலாம். அதற்கு ஒத்துழைப்பு வழங்குகின்ற கௌரவ அமைச்சர் அவர்களுக்கும் அமைச்சின் செயலாளர் உட்பட அனைத்து அதிகாரிகளுக்கும் நாங்கள் நன்றி சொல்லக் கடமைப்பட்டு இருக்கின்றோம்.

கௌரவ அமைச்சர் அவர்களே, நேற்று முன்தினம் நடைபெற்ற அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் நான் சில முக்கியமான விடயங்களை முன்வைத்தேன். அவற்றை நிறைவேற்றித் தருவதாக நீங்கள் வாக்குறுதி அளித்தீர்கள். எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்கள் இந்தச் சபையில் 'கொரோனா' தொற்றால் மரணித்தவர்களுடைய பெயர்ப்பட்டியலைச் சமர்ப்பிக்க வேண்டுமெனக் கேட்டிருந்தார். அது பற்றியே நான் முதலில் உங்களிடம் கேட்டேன். அதனை விரைவாகச் சமர்ப்பிப்பதாக நீங்கள் தெரிவித்திருந்தீர்கள். அதற்காக உங்களுக்கு எனது நன்றியைத் தெரிவிக்கின்றேன்.

இரண்டாவதாக, பொத்துவில் தள வைத்தியசாலை சம்பந்தமான விடயத்தை முன்வைத்தேன். அந்த வைத்தியசாலையின் நிலைமையை நான் உங்களுக்குத் தெளிவுபடுத்தினேன். அங்கு நிறைய ஆளணிப் பற்றாக்குறை இருப்பதை ஏற்றுக்கொண்டு, அதனை நிவர்த்தி செய்து தருவதாக நீங்களும் அமைச்சின் செயலாளர் அவர்களும் சொல்லியிருந்தீர்கள். அந்த வைத்தியசாலையானது, உல்லாசப் பிரயாணத்துறையில் மிகவும் பிரபல்யமான பிரதேசமாகக் காணப்படுகின்ற அறுகம்பை பிரதேசம் அமைந்துள்ள பொத்துவிலிலே உள்ளது. அந்த வைத்தியசாலையில் Medical Officerக்கான வெற்றிடங்கள் மட்டும் 22 இருக்கின்றன; Medical Consultantக்கான வெற்றிடங்கள் 3 இருக்கின்றன; Nursing Officerக்கான வெற்றிடங்கள் 40 இருக்கின்றன. இவ்வாறு நிறைய வெற்றிடங்கள் அங்கு இருக்கின்றன. அது தொடர்பான ஆவணத்தை நேற்று முன்தினம் இடம்பெற்ற அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் நான் சமர்ப்பித்தேன். அதை நான் இந்தச் சபையிலும் ***சமர்ப்பிக்கின்றேன்.**

எனவே, அவற்றை நிவர்த்தி செய்வதற்கான நடவடிக்கைகளை அமைச்சின் செயலாளரும் ஏனைய உயர் அதிகாரிகளும் மேற்கொண்டு, அங்குள்ள மக்களின் சுகாதார சேவைக்கு உதவிசெய்ய வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

மூன்றாவதாக, பாலைமுனை ஆஸ்பத்திரியில் அக்கரைப்பற்று தள வைத்தியசாலையுடன் இணைந்து ENT பிரிவை அமைப்பதற்கான அனுமதியை கிழக்கு மாகாண ஆளுநர் அவர்கள் வழங்கியும் இதுவரை அது நடைமுறைப்படுத்தப்படாமல் இருப்பது சம்பந்தமாக உங்களின் கவனத்துக்குக் கொண்டுவந்தேன். சுகாதார அமைச்சின் செயலாளர் அவர்கள் அதுதொடர்பாக நடவடிக்கையெடுக்க வேண்டுமெனச் சொன்னார். அதனைச் செய்தால், அது கிழக்கு மாகாணம் முழுவதற்கும் பிரயோசமாக அமையும். எனவே, இந்த விடயத்தில் அமைச்சு நடவடிக்கையெடுக்க வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

நான்காவதாக, கிழக்கு மாகாணத்தில் imigran என்ற மருந்து இல்லாமை பற்றிக் கூறினேன். 2004ஆம் ஆண்டிலிருந்து இந்த மருந்து அங்கு இல்லாமல் இருந்தது. அதனால் அந்த நோயாளிகளுடைய நோயின் தன்மை வேறுவிதமாக மாறிக்கொண்டு இருக்கின்றது. கிழக்கு மாகாணத்தில் ஒருசில அரச வைத்தியசாலைகளில்தான் அந்த மருந்து இருக்கின்றது. எனவே, வெளியிலுள்ள pharmaciesஇல் இந்த மருந்து கிடைப்பதற்கு உரிய நடவடிக்கை எடுப்பதாக நீங்கள் சொல்லியிருந்தீர்கள். அதற்கான ஏற்பாடுகளை நீங்கள் அவசரமாகச் செய்ய வேண்டும். ஏனெனில், அந்த நோயாளிகளுடைய நோயின் தன்மை மாறினால், வேறு பிரச்சினைகள் ஏற்படக்கூடிய அபாயம் இருக்கின்றது.

இலங்கையில் சுதேச மருத்துவர்களின் வேலையில்லாப் பிரச்சினை மற்றும் யுனானி மருத்துவர்களுக்கு நேரிடும் அநீதியை நீக்க வேண்டும் என்ற விடயம் மிக முக்கியமானது. கடந்த பல வருட காலமாக 2,500க்கும் மேற்பட்ட ஆயுர்வேத மருத்துவர்கள் அரசாங்க வேலைவாய்ப்பைப் பெறமுடியாமல் தவிக்கின்றனர். இது அவர்களின் வாழ்வாதாரத்துக்கு மட்டுமல்ல, நாட்டின் சுகாதாரத் துறைக்கும் பாரியதோர் இழப்பாகும். ஓய்வுபெற்ற மருத்துவர்களின் வெற்றிடங்களை நிரப்பும் வகையில் 2023ஆம் ஆண்டில் 61 புதிய நியமனங்களை அரசு வழங்கியது. அவ்வாறு நியமனம் பெற்றவர்களின் பெயர்ப்பட்டியலையும், அது சம்பந்தமான விடயங்கள் அடங்கிய ஆவணத்தையும் நான் இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்**.

இந்த நியமனத்தில் முறையாக அனைத்து சுதேச மருத்துவ முறைகளும் உள்ளடக்கப்படவில்லை. குறிப்பாக, யுனானி மருத்துவர்களுக்குரிய இடங்கள் புறக்கணிக்கப்பட்டு, அவை ஆயுர்வேதம் மற்றும் சித்த மருத்துவர்களுக்கு வழங்கப்பட்டன. இது யுனானி மருத்துவர்களுக்கு இழைக்கப்பட்டுள்ள அநீதியாகும். இலங்கையில் ஆயுர்வேத மருத்துவம், யுனானி மருத்துவம், சித்த மருத்துவம் போன்ற சுதேச மருத்துவ முறைகள் நூற்றுக்கணக்கான ஆண்டுகளாக நம் மக்களின் சுகாதாரத்துக்குப் பங்களித்து வருகின்றன. ஆனால், ஆயுர்வேத சட்டத் திருத்தங்களின்படி, இலங்கையிலுள்ள சுதேச மருத்துவ அதிகாரிகள் அனைவரும் 'ஆயுர்வேத மருத்துவ அதிகாரி' - Ayurvedic Medical Officer - என்ற ஒரே பதவிக்குள் அடக்கப்பட்டுள்ளனர். இது யுனானி மருத்துவர்களின் தனித்துவத்தையும் அவர்களின் தொழில்வாய்ப்புகளையும் பாதிக்கும் ஒரு தவறான நடைமுறையாகும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි දෙකක් දෙන්න, කරුණාකරලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

2023ஆம் ஆண்டு வழங்கப்பட்ட நியமனங்களில் யுனானி மருத்துவர்கள் சேர்க்கப்படாதது, அவர்களுக்கு நேரிடும் அநீதியை மேலும் ஆழப்படுத்தியுள்ளது. இது மிகவும் தவறான செயலாகும். அத்துடன், யுனானி மருத்துவர்களின் தொழில்வாய்ப்புகளை இல்லாமல் செய்யும் சூழ்நிலையும் உருவாகியுள்ளது. மேலும், 2,500க்கும் மேற்பட்ட ஆயுர்வேத பட்டதாரி வைத்தியர்கள் தொழில்வாய்ப்புக்காகப் பல ஆண்டுகளாக காத்திருக்கிறார்கள். அவர்களுக்கு எப்போது தொழில்வாய்ப்புகளை வழங்கப்போகின்றீர்கள்? என்பதை கௌரவ அமைச்சர் அவர்கள் எங்களுக்குத் தெரிவிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் வெகுசன ஊடகத்துறைக்கும் பொறுப்பான அமைச்சர் என்ற வகையில் உங்களிடம் ஒரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்துக்கு அதிக வருமானத்தைப் பெற்றுக்கொடுக்கும் ஒரு சேவையாக முஸ்லிம் சேவை காணப்படுகின்றது. 1951ஆம் ஆண்டிலிருந்து இன்றுவரை - 75 வருடங்களாக - இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்தால் இரவு நேரத்தில் முஸ்லிம் நிகழ்ச்சிகள் நடத்தப்பட்டு வருகின்றன. புனித ரமழான் மாதத்தில் முஸ்லிம் சேவைக்கு அதிக நேரத்தை ஒதுக்கவேண்டிய நிலையில், ஒரு மணித்தியாலம் ஒலிபரப்பப்பட்டு வந்த முஸ்லிம் சேவை 40 நிமிடங்கள் மாத்திரமே ஒலிபரப்பப்படுகின்றது. இதனால் இலங்கை வாழ் முஸ்லிம் மக்கள் மிகவும் கவலை அடைந்துள்ளனர். எனவே, வழமைபோல் முஸ்லிம் நிகழ்ச்சியை ஒரு மணித்தியாலம் ஒலிபரப்புவதற்கான ஏற்பாடுகளை மேற்கொள்ளுமாறு நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

தற்போது முஸ்லிம்களின் புனித ரமழான் மாதம் ஆரம்பித்துள்ள நிலையில், அவர்களுக்குச் சிக்கல் நிலை ஏற்படுகின்ற இரண்டு விடயங்கள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. அவை தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டும். கௌரவ சுகாதார அமைச்சர் அவர்களே, நீங்கள் உட்பட ஏனைய அமைச்சர்களும் சிறந்த பணிகளைச் செய்கின்றீர்கள்; பிரச்சினைகளை balance பண்ணுகின்றீர்கள்; எதிர்க்கட்சியினரின் ஆலோசனைகளைக் கேட்கின்றீர்கள். நாங்கள் எதிர்க்கட்சியினராக இருந்தாலும், இந்த நாட்டை நல்லமுறையில் கொண்டுசெல்ல வேண்டும் என்பதற்காகச் சில விடயங்களை உங்களிடம் முன்வைக்கின்றோம். அந்த வகையில், சிறப்பாக இயங்குகின்ற சுகாதார அமைச்சு தொடர்ந்தும் நல்ல பணிகளைச் செய்ய வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහීර් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.48]

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

அவைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, இன்றைய தினம் சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சுத் தொடர்பான பாதீட்டில் என்னுடைய கருத்துகளை முன்வைப்பதையிட்டுச் சந்தோஷமடைகின்றேன். "நோயற்ற வாழ்வே குறைவற்ற செல்வம்!" என்று கூறுவார்கள். அந்த அடிப்படையில், கௌரவ சுகாதார அமைச்சர் அவர்கள், இந்தத் துறையில் பணிபுரிகின்ற வைத்தியர்கள், தாதியர், ஏனைய பணியாளர்கள் அனைவரும் சுகதேகிகளாக, திடகாத்திரமாக வாழவேண்டுமென்ற பிரார்த்தனையோடு எனது உரையைத் தொடருகின்றேன்.

எனது அம்பாறை மாவட்டத்தில் இரண்டு RDHS அலுவலகங்கள் இருக்கின்றன. அதில் கல்முனை பிராந்தியத்தில் இருக்கின்ற பிரச்சினைகளை முதலில் இங்கு முன்வைக்கலாமென்று நினைக்கின்றேன். அந்த அடிப்படையில், எனது சொந்த ஊரான நிந்தவூரில் இயங்குகின்ற வைத்தியசாலையில் சுமார் 35 வைத்தியர்கள் இருக்கவேண்டிய நிலையில் 15 வைத்தியர்களும், 71 தாதிமார் இருக்கவேண்டிய நிலையில் 40 தாதிமாரும், 61 பணியாளர்கள் இருக்க வேண்டிய நிலையில் 26 பேரும் பணிபுரிகின்றார்கள். இதனால் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுக்குத் தரமான சேவையை - quality service - வழங்க முடியாத மிகவும் கஷ்டமான சூழல் காணப்படுகின்றது. ETUஇல் நான்கு bedsஉம், HDUஇல் மூன்று bedsஉம்தான் காணப்படுகின்றன. இந்த ஊர் இந்த நாட்டினுடைய சுகாதார இராஜாங்க அமைச்சர் ஒருவரைக் கொண்டிருந்த ஊராகும். எனவே, இந்த விடயத்தைக் கௌரவ அமைச்சர் அவர்கள் கவனத்தில் எடுப்பாரென்று நினைக்கின்றேன்.

மேலும், எமக்கு அண்மித்த பிரதேசமான சம்மாந்துறையிலுள்ள ஆதார வைத்தியசாலை type A தரம் கொண்டதாகக் காணப்படுகிறது. இங்கு 2018ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட Chinese-funded building இன்னும் பூரணப்படுத்தப்படாத சூழ்நிலையில் காணப்படுகிறது. இதுபோன்ற நிலை பொத்துவில் வைத்தியசாலையிலும் காணப்படுகிறது. எனவே, அவற்றைப் பூரணப்படுத்தி மக்களுக்குக் கையளித்து, அதன் சேவைகளை வழங்கக்கூடிய வாய்ப்பினை வழங்குமாறு கேட்டுக்கொள்கிறேன்.

சம்மாந்துறை வைத்தியசாலையில் ஒரு கணக்காளரை நியமிப்பதற்காக எங்களுடைய முன்னாள் அமைச்சரும் அகில இலங்கை மக்கள் காங்கிரஸ் தலைவருமான றிஸாட் பதியுதீன் அவர்களின் முயற்சியின்போில் அதற்கான ஆளணியை உருவாக்குவதற்குக் கடந்த அரசின்மூலம் ஏற்பாடு செய்யப்பட்டும் இதுவரை அந்த ஆளணி நிரப்பப்படாமல் காணப்படுகின்றது. இதனையும் கவனத்தில் கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

சம்மாந்துறைப் பிரதேசம் சுமார் ஓரிலட்சம் மக்களைக் கொண்டதாகக் காணப்படுகின்றது. அந்த வைத்தியசாலையின் surgeon தற்போது வெளிநாட்டுக்குச் சென்றுள்ளார். எனவே, அந்த வெற்றிடம் தொடர்ச்சியாகக் காணப்படுகிறது. இதனையும் அமைச்சரவர்கள் கவனத்திற்கொள்ள வேண்டும். அதேபோன்று, அங்கிருந்த radiographer promotion பெற்று களுவாஞ்சிக்குடி பிரதேசத்துக்கு இடமாறிச் சென்றிருக்கின்றார். எனவே, குறித்த பதவிக்கு நிரந்தரமாக ஓர் உத்தியோகத்தரை நியமிக்குமாறு கேட்டுக் கொள்வதோடு, இந்தப் பிரதேசத்தில் கண் வைத்திய சேவைக்குரிய ஒரேயொரு வைத்தியசாலையாக கல்முனை வடக்கு வைத்தியசாலை மாத்திரம் இயங்கி வருகின்ற நிலையில், சம்மாந்துறை வைத்தியசாலையிலும் கண் வைத்திய சேவையைச் செய்வதற்கான ஏற்பாடாக அங்கு Phaco machineஇனை வழங்குகின்றபோது அங்குள்ள அனைத்து மக்களும் அதன் சேவையைப் பெறமுடியும் என்பதைக் கூறிக்கொள்ள விரும்புகிறேன்.

අතේපෝන්று, அரச 'ஒசுசல' மருந்தகமொன்றின்மூலம் அங்கு மிகக்குறைந்த விலையில் மக்கள் மருந்துகளைப் பெறக்கூடிய வாய்ப்பினை வழங்க வேண்டிய தேவையிருக்கிறது. அதற்கான முயற்சிகளை நாங்கள் செய்திருக்கின்றோம். அதற்கும் ஆவன செய்யுமாறு எங்கள் அமைச்சர் அவர்களை இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். அதேபோன்று, இந்தப் பிரதேசத்தில் மருந்தாளர்கள் தட்டுப்பாடாக உள்ள குறைபாடும் காணப்படுகின்றது. இங்கே வைத்தியசாலைகளில் இருக்கின்ற மருந்தகங்களில் தாதிமார், மற்றும் சிற்றூழியர்கள்மூலம்தான் மருந்துகளை வழங்குகின்ற நடைமுறை காணப்படுகின்றது. இவ்வாறு வழங்குகின்றபோது நடைபெறக்கூடிய தவறுகள் மூலமாக மனித இறப்புக்கள் அல்லது வேறு நஷ்டங்கள் ஏற்படும் பட்சத்தில் அதற்கு வகை சொல்கின்றவர்கள் யார்? என்கின்ற விடயம் எல்லா வைத்தியசாலைகளிலும் கேள்விக்குறியாகக் காணப்படுகின்றது. எனவே, இருக்கின்றவர்களைப் பயிற்றுவிக்க வேண்டிய அல்லது வேறு மருந்தாளர்களை உள்வாங்க வேண்டிய கட்டாயத் தேவையிருக்கின்றது. இந்த விடயத்தையும் அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டும்.

அதுபோல, எமது மாவட்டத்தில் மிகவும் வறிய கிராமங்களாகக் காணப்படுகின்ற வாங்காமம், தாண்டியடி, ஆலையடிவேம்பு போன்ற இடங்களில் PMC unitஐ நிறுவுவதற்காக வைத்தியர்களையும் ஏனைய வளங்களையும் வழங்க வேண்டுமென்றும் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கிறேன்.

குறிப்பாக மிக நீண்ட காலமாக - 2007ஆம் ஆண்டு தொடக்கம் இன்று வரைக்கும் - 1,700க்கும் அதிகமான சுதேச வைத்தியர்கள் இன்னும் அரச சேவையில் உள்ளீர்ப்புச் செய்யப்பட முடியாத நிலையில் காணப்படுகின்றார்கள். இவர்களில் முஸ்லிம்கள், தமிழர்கள், சிங்களவர்கள் என்று 35 வயதிற்கும் மேற்பட்ட அதிகமானவர்கள் உள்ளடங்குகிறார்கள். இந்த விடயத்தையும் எங்களுடைய அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டும் என்று இந்த சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கின்றேன்.

எங்களது அண்மைக் கிராமமாக இருக்கின்ற திருக்கோவில் - குறிப்பாக, கல்முனை RDHS பிரிவுக்குட்பட்டதாகக் காணப்படுகின்ற இந்தப் பிரதேசம் தமிழ் மக்கள் கூடுதலாக இருக்கின்ற கிராமமாக இருக்கின்றது. அங்குள்ள வைத்தியசாலைக்கு இதுவரை புதிய கட்டிடம் ஒன்று கட்டப்படாமல் இருக்கின்றது. அங்கு 200 மில்லியன் ரூபாய் பெறுமதியான கட்டிடம் ஒன்றை அமைப்பதற்கான வேலைத்திட்டங்களை முன்னெடுத்திருந்தபோதும், இதுவரைக்கும் அது சாத்தியப்படாத ஒரு விடயமாகக் காணப்படுகின்றது. எனவே, அந்தக் கட்டிடத்தை அமைத்துக் கொடுக்கும் அதே சந்தர்ப்பத்தில், இரத்தச் சுத்திகரிப்புக்கான dialysis செய்கின்ற வசதியையும் அந்த வைத்தியசாலைக்கு வழங்க வேண்டுமென்று நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கிறேன்.

இந்த நாட்டில் எல்லா இடங்களிலும் பல பணிகளை இந்த அமைச்சு செய்து வருகின்றது. எமது கட்சியின் தலைவருடைய மன்னார் மாவட்டத்திலுள்ள வைத்தியசாலையில் மிகக்கூடுதலான வைத்தியர்களுடைய சேவையும் மருந்துகளும் இன்னோரன்ன வசதிகளும் தேவையாகக் காணப்படுகின்ற நிலையில், அவற்றையும் பெற்றுத்தர நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

கடந்த காலங்களில் நாங்கள் அறிந்த வகையிலே வைத்தியர்கள் தனியார் சேவைகளை வழங்குகின்ற பகுதிகளுக்கு அண்மித்த இடங்களில்தான் 'பார்மஸி'கள் அதிகமாக காணப்படும். ஆனால், இன்று அரச வைத்தியசாலைகள் இருக்கின்ற பிரதேசங்களில்தான் 'பார்மஸி'கள் கூடுதலாகக் காணப்படுவதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அதற்குக் காரணம் இந்த நாட்டிலே இருக்கின்ற அரச வைத்தியசாலைகளில் நிலவும் மருந்துத் தட்டுப்பாடாகும். எனவே, இந்த தட்டுப்பாடுகளை நீக்குகின்ற விடயத்திலே அமைச்சர் அவர்கள் கூடுதலான கவனத்தைச் செலுத்தவேண்டிய கட்டாய தேவைப்பாடு இருக்கின்றது.

இந்த நாட்டு மக்கள் சுகதேகிகளாக வாழ வேண்டும். அதன்மூலம் இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கான வாய்ப்பு இருக்கின்றது. இந்த அமைச்சின் மூலமாக இந்தத் துறையிலே பலதரப்பட்ட நல்ல விடயங்கள் முன்னெடுக்கப்படுகின்றபோதிலும், 'சம்பளம்' என்கின்ற ஒரு பாரிய பிரச்சினை எல்லோராலும் பேசப்படுகின்றது. எனவே, அமைச்சர் அவர்கள் இந்த விடயத்திலும் கவனம் எடுத்து, நாட்டினுடைய முதுகெலும்பாகக் காணப்படுகின்ற வைத்தியத் துறைக்கு முடியுமானளவு சம்பள உயர்வினை எதிர்வரும் காலங்களில் வழங்க வேண்டுமென்று கேட்டு, வாய்ப்பளித்ததற்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අශෝක ගුණසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.57]

ගරු අශෝක ගුණසේන මහතා
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳව කථා කරන අද දිනයේ ඒ පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලා මේ විවාදය තුළ අදහස් ඉදිරිපත් කිරීමේදී, මේක ජනතාවාදී නොවන අය වැයක් ලෙස අර්ථ දැක්වුවා. ඇත්තටම ඒ සඳහා එතුමන්ලා සහ එතුමියලා යොදා ගත්තේ ශ්‍රීලන්කන් ගුවන් සේවයට වියදම් කරන මුදල් ප්‍රමාණය. එතකොට මට හිතුණේ ඒ අදහස් දක්වන්න යන්නේ මිග් යානා ගනුදෙනුව වාගේ එකක් ගැන ද කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමියට අදහසක් නැහැ ශ්‍රීලන්කන් ගුවන් සේවය කියන්නේත් ජනතාවගේ දේපළක් කියලා. ජනතාවගේ ඒ දේපළ ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් තමයි මේ අය වැයේදී ඒවා ගැන හිතලා තිබෙන්නේ. ඒ නිසා මේ අය වැය ජනතාවාදී නොවන අය වැයක් කියන්න, ඒ වාගේ බාල විධියේ කරුණු දැක්වීම වැරදියි.

ඒ එක්කම, ඔටිසම් දරුවන් හඳුනා ගැනීමේ ක්‍රමයක් පාසල් පද්ධතිය තුළ සකස් කරන්න කියලා එතුමිය යෝජනාවක් කළා. මට හිතෙන විධියට මේ අය වැයේ තිබෙන ජයග්‍රාහී ලක්ෂණයක් තමයි, එවැනි මාතෘකා මේ අය වැය ඇතුළේ විශේෂයෙන් කථා කර තිබීම. මේ අය වැයේ තිබෙන ජනතාවාදී ස්වභාවය නිසා තමයි එතුමියට එවැනි අදහසක් ඉදිරිපත් කරන්න හැකියාව ලැබුණේත්. එතුමිය ඉදිරිපත් කළ අදහස් අතර තවත් කාරණා ගණනාවක් තිබුණා.

[ගරු අශෝක ගුණසේන මහතා]

ඒ වාගේම තවත් මන්ත්‍රීතුමන්ලා කරුණු ඉදිරිපත් කළා, රට අත්හැරලා යන අය සම්බන්ධයෙන්, බුද්ධි ගලනය සම්බන්ධයෙන්. ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ අය වැය ඉදිරිපත් කිරීම දක්වා ආපු ගමන ඇතුළේ විශාල කැප කිරීම් තිබුණා. පසුගිය කාලය තුළ අපේ රටේ කරන ලද ආර්ථික කඩා වැටීම ඇතුළේ, වෛද්‍යවරුන්, හෙද හෙදියන් මේ රට අත්හැර නොයා දක්වපු සහයෝගය නිසා අපේ රටේ සෞඛ්‍යය ලෝකයේ ඉතා ඉහළින් තබන්න සමත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ කාලයේත් රට නොගිහින් අල්ලාගෙන හිටපු අයට ගෞරවයක් හිමි විය යුතුයි. ඒ කාලයේත් සෞඛ්‍ය ක්ෂේත්‍රය අල්ලාගෙන හිටපු වෛද්‍යතුමන්ලා, එ් හෙදියන් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ට අපේ ගෞරවය හිමි වෙන්න ඕනෑ. මොකද, ඒගොල්ලන් තමයි මේ ක්ෂේත්‍රය අල්ලාගෙන හිටියේ. හැබැයි, මෙවැනි කාලයක, ඔවුන්ට එහෙම යන්න තරම් අවස්ථාවක් නිර්මාණය වෙලා නැහැ. මොකද, මෙච්චර ජයග්‍රාහී ලෙස ජනතාව ගැන හිතපු අය වැයක් අපි ඉදිරිපත් කර තිබෙන නිසා.

ඒ වාගේම මෙවායේ අඩුපාඩු දකින විපක්ෂයක් ඉන්නවා කියන්නේත් අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේම තව අඩු දියුණු පැත්තක්. මේ වාගේ අය වැයක් මෙතෙක් කාලයක් හිටපු ආණ්ඩු විසින් ඉදිරිපත් කළා නම් මෙවැනි විපක්ෂයක් නොවෙයි අපට දකින්න ලැබෙන්නේ. එහෙම නම්, මේ අය වැයත් එක්ක සම්බන්ධ වෙලා මේ රට ඉස්සරහට ගෙනියන්න සම්බන්ධ වන විපක්ෂයක් තමයි අපට දකින්න ලැබෙන්නේ.

ජාතික ජන බලවේගයේ අපේ ප්‍රතිපත්තිය තමයි, පොහොසත් රටක් නිර්මාණය කිරීම. පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගත කරන මිනිස්සු නිර්මාණය කරන එක තමයි අපේ බලාපොරොත්තුව. අපි අහලා තිබෙනවා, ප්‍රසිද්ධ, ශ්‍රේෂ්ඨ ලේඛකයෙකු වන Nikolai Ostrovsky ගැන. ඔහු රුසියානු ලේඛකයෙක්. රුසියානු ලේඛක Nikolai Ostrovsky ගේ "වානේ පන්නරය ලැබූ හැටි" පොතේ තිබෙනවා, "මිනිසාගේ අතිඋතුම් වස්තුව ජීවිතයයි. එය ඔහුට ලැබෙන්නේ එක වරක් පමණයි" කියලා. එක වරක් පමණක් මිනිස්සුන්ට ලැබෙන ජීවිතය ලස්සන ජීවිතයක් බවට පත් කර දීම තමයි අපේ පරමාර්ථය. ඒ වෙනුවෙන් තමයි මේ සෞඛ්‍ය ප්‍රතිපත්ති හැදෙන්නේ; මේ වැය ශීර්ෂය හැදෙන්නේ. ජීවිතය ලස්සන කර ගන්න නම් ලෙඩ රෝගවලින් ඈත් වෙච්ච ජීවිතයක් වෙන්න ඕනෑ. ලෙඩ රෝගවලින් වැළකුණු ජීවිතයක් වෙන්න ඕනෑ. ලෙඩ රෝගවලින් ඈත් වෙන්න, ලෙඩ රෝග සුව වෙන්න, ලෙඩ රෝග වළක්වා ගන්න හදපු අය වැයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ.

අපි දන්නවා, සෞඛ්‍ය ජයග්‍රහණ කියන්නේ මිනිස් ඉතිහාසය ඇතුළේ කරපු විශේෂ කැප කිරීම් ගොඩක ප්‍රතිඵලයක් බව. අපි දන්නවා, එඩ්වඩ් ජෙනර් මහත්මයා වසූරිය එන්නත සොයා ගත් බව. එතුමා ඒ එන්නත සොයා ගැනීම දක්වා ආපු කාලය තුළ ලෝකයේ මිනිස්සුන්ගේ ජීවිත කොච්චර ප්‍රමාණයක් වසූරිය නිසා නැති වෙලා ඇත්ද?

හැබැයි, ඒ වසූරිය එන්නත හොයා ගන්න තෙක් කරපු කැප කිරීම වාගේම කැප කිරීම් ගොඩක් මිනිස් ඉතිහාසය ඇතුළත තිබෙනවා. එතකොට තමයි අපට හමු වෙන්නේ ඒ කැප කිරීම්වල ප්‍රතිඵල ඇතුළේම විශාල කැප කිරීම් කරපු වෛද්‍ය සේවයක් වන ආයුර්වේද වෛද්‍ය සේවය. සමහර ගම්වල තවමත් වෙද මහත්තුරු ඉන්නවා. එතුමන්ලා කරන සේවය වෙනුවෙන් වැටුපක් ගන්නේ නැහැ. අපේ දේශපාලනය වාගෙයි. අපි වැටුප් නොලබා වැඩ කරන කලාව ඇත්තටම ප්‍රගුණ කරන්නේ, අපේ රටේ අපට එහෙම කරන්න පුළුවන් කියලා විශ්වාසය හැදෙන්නේ, එහෙම අය අතීතයේ අපේ රට ඇතුළේ හිටියා කියලා දැන ගන්න ලැබුණු නිසායි. ඒ නිසා මෙවර අය වැයේ දී ආයුර්වේද ක්ෂේත්‍රය ගැන විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. මේ අය වැයෙහි දී සිංහල පාරම්පරික වෙදකම, යුනානි වෙදකම, සිද්ධායුර්වේද යන අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ වාගේම ඒ අංශ ගැන කියනවා නම්, දේශීය වෛද්‍ය අංශය, පරිපාලන හා ආයතනික සේවා සඳහා රුපියල් මිලියන 574ක් වෙන් කරලා තිබෙනවා. ඒක ඇතුළේ පළාත් රෝහල් 75ක් සඳහා ප්‍රදාන, හෝමියෝපති රෝහල් 21ක් සඳහා ප්‍රදාන, සංරක්ෂණ සහා සඳහා ප්‍රදාන සහ වෙනත් අංශ යටතේ -මේ ආයුර්වේද වෛද්‍ය අංශය සඳහා- මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඊළඟට, දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධනය සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. පෝෂණ මන්දිර ස්ථාපිත කිරීම, හෝමියෝපති ක්‍රම සංවර්ධනය, හෝමියෝපති රෝහල් රසායනාගාර පර්යේෂණ සේවා පිහිටුවීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා.

ඊළඟට, ඔසු වගාව - "ඔසු දිරිය"- සඳහා අවධානය යොමු කරලා තිබෙනවා. ඇත්තටම අපේ රට තුළින් විශාල වශයෙන් විදේශ විනිමය ඇදී යන අවස්ථාවක් හැටියට අපි දැකලා තිබෙනවා, මේ ඔසු වෙනත් රටවලින් ගෙන්වා ගන්නට සිදුවීම. ඒ නිසා ඔසු වගාව සඳහා මෙවර අය වැයේ විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඊටත් අමතරව පාරම්පරික වෛද්‍ය පර්යේෂණ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ යටතේ තිබෙනවා, සාම්ප්‍රදායික දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය සහ සංරක්ෂණය. ඒ වාගේම ඒ ආශ්‍රිත වෙනත් ව්‍යාපෘති සේවා සඳහාත්, පර්යේෂණ සහ ඔසු උයන් සඳහාත්, ඒ ආශ්‍රිත වෙනත් සේවා සඳහාත් විශාල වශයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝහල් මෙහෙයුම යටතේ,- මේක විශේෂ අවස්ථාවක්. ඇත්තටම ආයුර්වේදය සමඟ සහයෝගී සත්කාරක සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව, අපේ රටේ රෝහල් ඇතුළේත් ආයුර්වේද සත්කාරක සේවා සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ කොහොම වෙතත්, මෙවර අය වැය ගැන කථා කරද්දී, මෙය සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂ අවස්ථාවක් හැටියට සලකන්න පුළුවන්. සෞඛ්‍ය සේවකයන් හැම කෙනෙකුටම පුහුණුව සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම වයස අවුරුදු 35ට වැඩි හැම කෙනෙකුම පරීක්ෂා කිරීම සඳහා අවධානය යොමු කරලා තිබෙනවා. ඊළඟට විශේෂයෙන් පාසල් ළමුන් සම්බන්ධ කරගෙන ප්‍රථමාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට කටයුතු සලසා තිබෙනවා. ඒ හේතුවෙන් හැම ගෙදරකම ප්‍රථමාධාර දන්නා කෙනෙක් බිහි වෙනවා. ඇත්තටම අපි දැකලා තිබෙනවා, heart attack එකක් හැදුණු පුද්ගලයෙක් රෝහලට ගෙන යන්නට පෙර මිය යන අවස්ථා. ඒ ගෙදර අය ප්‍රථමාධාර දන්නේ නැති නිසා තමයි එහෙම වෙන්නේ. ඒ නිසා මෙවර අය වැයෙන් ඒ කෙරෙහිත් අවධානය යොමු කරලා ජනතාවාදී අය වැයක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. සෞඛ්‍ය අංශය කියන්නේ විශේෂ එකක්. ඒ සඳහා මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව බර දරා තිබෙනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ගොඩක් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මොහොමඩ් සාලි නලීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.05]

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சுகாதார அமைச்சுக்கான நிதி ஒதுக்கீட்டின்மீது பேசக் கிடைத்த சந்தர்ப்பத்திற்காக இறைவனுக்கு நன்றி கூறுகிறேன். உண்மையில், எங்களுடைய சுகாதார அமைச்சினுடைய நடவடிக்கைகள் பாராட்டத்தக்க விதமாக இருப்பதை நாங்கள் பார்க்கின்றோம். ஏனென்றால், இந்த அமைச்சினூடாக நிறைய விடயங்களுக்கு நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டிருக்கின்றது. ஆனால், கிழக்கு மாகாணத்திற்கு சுகாதார அமைச்சின் மூலமான நிதி ஒதுக்கீடு போதாது; மொத்த ஒதுக்கீட்டில் சுமார் 0.12 சதவீதம்தான் கிழக்கு மாகாணத்திற்கு சுகாதார அமைச்சின்மூலம் நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது என்று சொல்லப்படுவது உண்மையில் கவலையான ஒரு விடயம். எனவே, எங்களுடைய கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் கவனம் செலுத்தி, அங்கு மேலதிக நிதியை ஒதுக்கித்தருமாறு இந்த இடத்திலே நான் வேண்டிக் கொள்கின்றேன்.

அத்துடன், நான் இன்னொரு விடயத்திற்காக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அதாவது, நான் கடந்த பெப்ருவரி மாதம் பாராளுமன்றத்தில் பேசியபொழுது வேண்டிக்கொண்ட விடயம்தான் சீனாவின் நிதியுதவியின் மூலமாக நிர்மாணிக்கப்பட்ட ஏறாவூர் தள வைத்தியசாலைக் கட்டிடத்திற்கு மின் இணைப்பை மேற்கொண்டு அதனை இயங்க வைப்பதற்கு 160 megawatt கொண்ட மின் பிறப்பாக்கி - generator - ஒன்று தேவையென்பது. அந்த மின்பிறப்பாக்கி இன்னும் 2 தினங்களுக்குள் ஏறாவூர் வைத்தியசாலைக்குக் கொண்டுவரப்பட்டுத் தொழிற்படுத்தப்படவிருப்பதாக நான் இன்று அறிந்தேன். அந்த வகையில், எங்களுடைய கௌரவ அமைச்சர், பிரதியமைச்சர், அமைச்சின் செயலாளர், மாகாண சுகாதார சேவைகள் பணிப்பாளர் Dr. கொஸ்தா, பிராந்திய சுகாதார சேவைகள் பணிப்பாளர், ஏறாவூர் வைத்தியசாலை அத்தியட்சகர் Dr. Bandara ஆகிய அனைவருக்கும் நான் இந்த இடத்தில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அத்துடன், அங்கே ஏற்கெனவே இயங்கிவந்த அந்தப் பழைய மின்பிறப்பாக்கியை எங்களுடைய ஏறாவூர் ஆயுர்வேத வைத்தியசாலைக்கு மாற்றித் தருமாறு இந்த இடத்திலே நான் வேண்டிக் கொள்கின்றேன். ஏனென்றால், அந்த வைத்தியசாலை சுமார் 20 வருடங்கள் பழமைவாய்ந்தது. அதற்கும் நிறையத் தேவைகள் இருக்கின்றன. ஆகக் குறைந்தது ஏறாவூர் தள வைத்தியசாலையில் இருக்கின்ற அந்தப் பழைய generatorஐ ஆவது அந்த வைத்தியசாலைக்கு வழங்கி, அதை அங்கு தொழிற்படும் வண்ணம் ஏற்பாடு செய்யுமாறு இந்த இடத்திலே வேண்டிக் கொள்கின்றேன்.

அதேபோல, நாங்கள் கடந்த பாராளுமன்ற அமர்விலே பேசும்போது, Batticaloa Teaching Hospitalக்கு ஒரு MRI scanner வழங்கப்பட வேண்டுமெனவும், அங்கு அரச 'ஒசுசல' ஒன்று அமைக்கப்பட வேண்டுமெனவும் கேட்டிருந்தோம். அந்தக் குறையையும் நிவர்த்தி செய்து தருவதாக கௌரவ அமைச்சர் அவர்கள் கூறியிருக்கின்றார். உண்மையில் 'ஒசுசல' எங்களுடைய மாவட்டத்துக்கு அத்தியாவசியமானதொன்றாகும். மருந்துகளுக்காக ஏழை மக்களுக்கு ஏற்படும் அதிக பணச் செலவைக் குறைத்து, அவர்களது தேவையைப் பூர்த்திசெய்கின்ற வண்ணம் அதை அமைத்துத் தருவதாகக் கூறியிருந்தார். அதற்காகவும் இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஏறாவூர் தள வைத்தியசாலையின் நிலைமையானது, அங்கிருந்து நோயாளர்கள் மட்டக்களப்பு வைத்தியசாலைக்குப் போக்குவரத்து செய்யப் பயன்படும் bus stand போன்றதாகத்தான் இருக்கின்றது. ஏனென்றால், அங்கே சுகாதார சேவையை நாடி வருகின்றவர்களுக்கு எதுவிதமான சேவையையும் வழங்க முடியாதளவுக்கு அடிப்படை வசதிகளற்ற வைத்தியசாலையாக அது காணப்படுகின்றது. அங்கிருந்து நோயாளர்கள் மட்டக்களப்பு வைத்தியசாலைக்கு அனுப்பப்படுவதால், அதை ஒரு bus stand என்றுதான் கூறமுடியும். அங்கு பொது சுகாதார வைத்திய அதிகாரி இல்லை, சத்திரசிகிச்சை நிபுணர் இல்லை, மகப்பேற்று நிபுணர் இல்லை, சிறுவர் வைத்திய நிபுணர் இல்லை, மயக்க மருந்து நிபுணர் இல்லை, மருத்துவ அதிகாரிகள் இல்லை, போதிய தாதியர் இல்லை, சுகாதாரத் தொழிலாளிகள் இல்லை. இவ்வாறு பல அசௌகரியங்களோடு எந்தவித அடிப்படை வசதியும் இல்லாமல் இயங்குகின்ற நிலைமையில் அந்த வைத்தியசாலை காணப்படுகின்றது. அங்கே வருகின்ற வைத்தியர்களுக்கு எதுவிதமான வசதிகளும் ஏற்படுத்திக் கொடுக்கப்படுவதில்லை. உதாரணமாக, அந்த வைத்தியசாலைக்கு வருகின்ற பொது வைத்திய நிபுணர்கள், வைத்தியர்கள், surgeons போன்றோர் தங்கிப் பணியாற்றுவதற்குரிய கட்டிடம் இல்லை. ஆகவே, அவர்கள் தங்கிப் பணியாற்றக்கூடிய வகையில் அடிப்படை வசதிகளுடனான கட்டிடத்தை அமைத்துக்கொடுக்க வேண்டும். அவ்வாறு கொடுத்தால் மாத்திரம்தான் தூர இடங்களில் அல்லது வெளிமாட்டங்களிலிருந்து இடமாற்றம் பெற்று வருகின்ற வைத்தியர்கள் அங்கே தங்கிப் பணி செய்வார்கள். ஆகவே, அந்த வசதியை ஏற்படுத்திக் கொடுக்குமாறு கௌரவ அமைச்சர் அவர்களை வேண்டிக் கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

மீராகேணிப் பகுதியிலே அமைந்திருக்கின்ற கிராமிய வைத்தியசாலையானது 30 - 40 ஆண்டுகள் பழமை வாய்ந்ததாகக் காணப்படுகின்றது. அங்கு OPD பிரிவு மாத்திரம்தான் இயங்கி வருகின்றது. தற்போது அங்கே attachment என்ற அடிப்படையில் வைத்தியர் ஒருவர் சேவை செய்து கொண்டிருக்கின்றார். ஆகவே, அந்த வைத்தியசாலைக்கு வருகின்ற நோயாளிகளைத் தங்கவைத்துப் பராமரித்து வைத்திய சேவைகளை வழங்கும் வகையில் அதற்கான அனைத்து வளங்களையும் வழங்கி, நிரந்தமான ஒரு வைத்தியரையும் தாதியரையும் நியமித்து, அந்தப் பகுதி மக்களுக்குச் சேவை செய்கின்ற வகையில் அதனைத் தரம் உயர்த்துமாறு கௌரவ சுகாதார அமைச்சர் அவர்களை வேண்டிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නජීත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.11]

ගරු (වෛද්‍ය) නජීත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා බොහොම විස්තර ඇතුව ප්‍රකාශ කළා, මේ වෙද්දි සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවාව, සෞඛ්‍ය වෘත්තිකයන් සම්බන්ධ තත්ත්වය කොහොමද තිබෙන්නේ, කොහොමද අපි ඒ කටයුතු වර්ධනය කරලා තිබෙන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළේ මෙච්චර කල් තිබුණු ගැටලු මොන ආකාරයටද නිරවුල් කරන්න කටයුතු කරන්නේ කියන කරුණු. ඖෂධ සම්බන්ධ ප්‍රශ්න, අනෙකුත් ප්‍රශ්න නිරවුල් කරන්න කොහොමද කටයුතු කරන්නේ කියලා සංඛ්‍යා, දත්ත සහිතව එතුමා අදහස් දැක්වීමක් කළා. ඒ අනුව යමින් මේ අය වැයේ විශාලතම වැය ශීර්ෂයක් වන සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන වෙලාවේ මමත් මේ රටේ සෞඛ්‍ය සේවය ගැන කථා කරන්න අදහස් කරනවා. එතකොට අපට මඟ හරින්නම බැරි කාරණය තමයි, මේ රටේ සෞඛ්‍ය සේවය මේ මට්ටමින් හරි තිබෙන්නේ මේ රටේ සෞඛ්‍ය සේවකයන් නිසාය කියන එක. ඒ කාරණය කථිකයන් කිහිප දෙනෙකුගෙන්ම අද කියැවුණා.

ලංකාව බංකොලොත් රාජ්‍යයක් බවට පත් වෙද්දී, බංකොලොත් රාජ්‍යයක් බවට පත් වෙලා තිබියදී, දිළිඳු රටක් බවට පත් වෙලා තිබියදී, ලංකාවේ ඒක පුද්ගල ආදායම ලෝකයේ පහළ මට්ටමක තිබියදී, දිළිඳුකමේ ප්‍රමාණයෙන් ලෝකයේ ඉහළ මට්ටමක ලංකාව තිබෙනවා. ඒ වාගේ අනෙකුත් සංඛ්‍යාලේඛන ඔක්කෝම එක්ක අපි ඉතාම පහළ මට්ටමක හිටියාට, අපේ සෞඛ්‍ය දර්ශක, අධ්‍යාපන දර්ශක යුරෝපීය, නැත්නම් ලෝකයේ දියුණු රටවල් හා සම තැනක තිබෙනවා. ඒ දර්ශක අතරින් මාතෘ මරණ අනුපාතය, ළදරු මරණ අනුපාතය, අපේක්ෂිත ආයු කාලය වාගේ දේවල් ගත්තාම, ලංකාව ඉතාම ඉහළ තැනක ඉන්නවා. එහෙම ඉන්නේ ඉතිහාසය පුරා පැවති ආණ්ඩු සෞඛ්‍ය ක්ෂේත්‍රයට මනාව මුදල් වෙන් කරලා, නියම කළමනාකරණයක් කරපු හින්දා නොවෙයි. ඉතාම දුෂ්කර තත්ත්ව යටතේ වුවත් මේ රටේ සෞඛ්‍ය සේවකයෝ කටයුතු කරපු නිසායි එහෙම වුණේ. ඒ නිසා ඒ කාරණය අපි අවධාරණය කළ යුතුයි. මම හිතනස විධියට, ඉතිහාසයේ පළමු වතාවට ඒ සෞඛ්‍ය සේවකයන් මහන්සි වෙන මට්ටමට, ඔවුන් දුෂ්කර ජීවිත අත්විඳින මට්ටමට, ඔවුන් රටේ සෞඛ්‍ය සේවය වෙනුවෙන් කැපවෙන මට්ටමට සුදුසු විධියට ඔවුන්ට පහසුකම් නිර්මාණය කරන්න, ඒවාට අවශ්‍ය සවිබලය ලබා දෙන්න පුළුවන් ජනතා ආණ්ඩුවක් දැන් පත් වෙලා තිබෙනවා. මා හිතන විධියට දැනට තිබෙනවාට වඩා දැවැන්ත පිම්මක් ගන්න පුළුවන් මාර්ගයක් මෙතැනින් එහාට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ දුෂ්කර රෝහලක වැඩ කරපු වෛද්‍යවරයෙකු විධියට මම දන්නවා, සෞඛ්‍ය සේවකයන්, වෛද්‍යවරුන්, හෙද හෙදියන්, රියදුරන් ඇතුළු අනෙකුත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල සියලුදෙනා ඈත ගම්වල නැවතිලා ඉඳගෙන, කන්න බොන්න කඩයක්වත් නැතුව කොහොමද මේ දේවල් කරගෙන ගියේ කියලා. අතින් මුදල් වියදම් කරමින් තමයි ඔවුන් මේ කටයුතු කරගෙන ගියේ. ලංකාව රෝග තුරන් කළේ එහෙමයි. කාන්තාවක් විවාහ වෙච්ච දවසේ ඉඳන් දරුවා හම්බ වෙලා මුල් කාලය ගත වෙනතුරුත් ලංකාවේ හැම ගෙදරකටම පවුල් සෞඛ්‍ය සේවිකාවක් පෞද්ගලිකව යනවා. ඒ වාගේම හැම කෙනෙකුටම යන්න පුළුවන් දුරක වෛද්‍යවරයෙකුත් රැඳිලා ඉන්නවා. එතකොට ඔවුන්ට නියමිත පැය ගණනට වඩා ඔවුන් වැඩ කරනවා. එහෙම තත්ත්වයක් තුළ තමයි මේ සෞඛ්‍ය සේවය ඉස්සරහට ගියේ. ඒ නිසා ඔවුන්ට අදාළ ඒ සියලු පහසුකම් සපයන්න, අදාළ ගෞරවය ලබා දෙන්න, අදාළ වැටුප් තලවල පිහිටුවන්න මේ ආණ්ඩුව කටයුතු කරමින් සිටිනවා. මේ අය වැයෙන් ඒකට අදාළ පළමුවෙනි ප්‍රවේශය අරගෙන තිබෙනවා කියලා අපට කියන්න පුළුවන්.

විශේෂයෙන්ම අපි දැක්කා, පසුගිය කාලයේ අපිත් එක්ක හිටපු බොහෝදෙනා බුද්ධි ගලනය ගැන කථා කරනවා. මේ පාර්ලිමේන්තුවේ කළ පළමුවෙනි කථාවේදීත් මම ඉලක්කම් සහිතව ඒ ගැන කථා කළා. බුද්ධි ගලනය ගත්තොත් අපි දන්නවා, විශාල පිරිසක් රට අතහැර ගිය බව. ඔවුන් එහෙම රට අතහැර ගියේ වැටුප් සම්බන්ධ ප්‍රශ්න නිසාම විතරක් නොවෙයි. මේ රටේ අනාගතය, මේ රටේ දරුවන්ගේ අනාගතය, තමන්ගේ දරුවන් සම්බන්ධ ප්‍රශ්න, මේ රටේදී දරුවෝ උස් මහත් කරන්නේ කොහොමද කියන ප්‍රශ්න ඔවුන්ට තිබුණා. ගෙන්වන බෙහෙත් ටික දරුවන්ට දෙන්න පුළුවන් කියන විශ්වාසය නැත්නම්, මේ රටේ මැර දේශපාලනය, මැර බලය ඉහ වහා ගිහිල්ලා නම්, කිසිම දේක සාධාරණත්වයක් නැත්නම්, රට හැදෙන පාටකුත් නැත්නම්, වෙන රටකට යන්න හැකියාවකුත් තිබෙනවා නම්, වෙන රටක ගිහිල්ලා වැඩ කරන්න අවශ්‍ය වෘත්තීයභාවය උපයා ගෙන තිබෙනවා නම් ඒක කරන්න ඕනෑ කියලා ඔවුන් හිතුවා. මේ ආණ්ඩුව පත් කරන්න මේ රටේ වෛද්‍යවරුන්, හෙද හෙදියන් ඇතුළු බොහෝදෙනා මැදිහත් වුණේ අන්න ඒ අවිනිශ්චිත අනාගතය වෙනස් කරලා, මේක ජීවත් වෙන්න පුළුවන් රටක් බවට පත් කරන්නයි. මම හිතන විධියට, ඒකට අදාළ පළමුවෙනි පියවර අපි තබා තිබෙනවා. විශේෂයෙන් මේ වැටුප් වැඩි කිරීම පමණක් නොවෙයි, ගෞරවාන්විතව ජීවත් වෙන්න පුළුවන්, සුරක්ෂිතව ජීවත් වෙන්න පුළුවන් රටක් බවට මේ රට පත් කරන්න අදාළ පියවර ගනිමින් අපි මේ ගමන යනවාය කියන එක අපි පෙන්වා තිබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවෙනුත් ඒක පැහැදිලි වුණා.

අපි බෙහෙත් වර්ග හතරකින් පමණක් රුපියල් මිලියන 1,750ක් ඉතුරු කරලා තිබෙනවා, මේ මාස හතරට. ඒක සෙල්ලමක් නොවෙයි. මේ අය වැය අපි ඉදිරිපත් කරන්නේ IMF රෙගුලාසි යටතේ හිරවුණු රටක් විධියට.

මේකේ වැය විධියට අපට ඕනෑ ගණනක් තීරණය කරන්න බැහැ. ඒක නිශ්චිතයි. හැබැයි කොහොමද සල්ලි ඉතුරු කරන්නේ, මොනවාටද වැඩියෙන් දෙන්නේ, මොනවායින්ද කපා හරින්නේ කියන එක තමයි මේ ආණ්ඩුවට ගත යුතුව තිබුණු තීරණය. එතැනදී සියලු ආකාරයේ දූෂණ, අක්‍රමිකතා නවත්වා මුදල් උපයා ගන්නත්, ඉතිරි කර ගන්නත්, ඒ වාගේම ජනාධිපති වැය ශීර්ෂයේ සිට මන්ත්‍රීවරුන් වෙනුවෙන් තිබුණු දේවල් ඇතුළු සියලු දේ කප්පාදු කරලා හැකි සෑම රුපියලක්ම මේ රටේ ජනතාවට නැවත ලබා දෙන්නත් අපි කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා තමයි බලාපොරොත්තු නොවෙච්ච නැත්නම් ඉල්ලපු නැති විශාල වැටුප් වැඩි කිරීමක් අපට කරන්න පුළුවන් වුණේ. මේ සාකච්ඡාව තිබෙන මේ වෙලාවේ නැවත වතාවක් මා ඒක කිව යුතුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර 30ක් දෙන්න.

අපි හැමෝම දන්නවා doctorsලා කියන්නේ noble profession එකක් කරන අය කියලා. මම හොඳටම දන්නවා, මම හිතන විධියට ආණ්ඩුව පැත්තේ doctorsලා 16ක් ඉන්නවා, මේ පැත්තේ doctorsලා හතරදෙනෙක් ඉන්නවා. මම කවදාවත් ඔයගොල්ලන්ට personally ප්‍රශ්න ඇති කරන්නේ නැහැ. මම කියන්නේ අපේ රටේ 2022, 2023 තිබුණු economic turmoil එක ගත්තොත්, නැත්නම් අපේ political instability එක ගත්තොත් ඒ කාලයේ අපේ doctorsලා ඔක්කොම පිට රටවලට යන්න පටන් ගත්තා. Doctorsලා විතරක් නොවෙයි, nursesලා පවා යන්න පටන් ගත්තා. අපේ රටේ normal MBBS doctor කෙනෙක් හදන්න සාමාන්‍යයෙන් රුපියල් මිලියන 7 සිට රුපියල් මිලියන 128ක් වෙනකල් වියදම් වෙනවා කියලා එක් එක් universitiesවලින් ගණන් හදලා තිබෙනවා. සාමාන්‍යයෙන් consultant කෙනෙක් ගත්තාම, G.C.E. A/L සිට consultant කෙනෙක් වෙන්න අපට සාමාන්‍යයෙන් අවුරුදු 15ක් යනවා. එහෙම යනකොට අපට රුපියල් මිලියන 15කට වඩා - රුපියල් ලක්ෂ 150ට වඩා - මුදලක් වෙන් වෙනවා. රුපියල් ලක්ෂ 180ක් විතර අපට වෙන් වෙනවා. Doctorලා 2,400ක් මේ රට දාලා ගිහින් තිබෙනවා. ගිය අවුරුද්දේ විතරක් අපට රුපියල් බිලියන 36ක පාඩුවක් තිබෙන්නේ. මේ අවුරුද්දේ doctorලා 5,000ක් යන්න ඉන්නවා කියලා අද විපක්ෂ නායකතුමා කිව්වා. එහෙම doctorලා 5,000ක් ගියොත් අපට රුපියල් බිලියන 75ක පාඩුවක් වෙනවා.

ඔබතුමන්ලා හොඳට දන්නවා, සාමාන්‍යයෙන් doctorsලා කියන්නේ 24 hours වැඩ කරන පිරිසක් බව. අපට කවදාවත් on call කියලා ගෙදර නිදහසේ ඉන්න බැහැ. අපි බලන ලෙඩෙක් අවුල් වුණොත් අපට හැම දාම hospital එකෙන් call එකක් එනවා, "මචං, management එකේ උඹ මොනවාද ලියලා ගියේ, අපට කියපං" කියලා. අපිත් ඒ පිරිස අතර ඉඳලා ආපු නිසා doctor කෙනෙකුගේ කැක්කුම අපට විතරයි තේරෙන්නේ. අපේ Deputy Minister වුණත්, Minister වුණත් දන්නවා, doctorsලා කොහොමද අමාරුවෙන් ඉන්නේ කියලා. මේ සැරේ අපි ලොකු expectation එකක සිටියා, මේ ආණ්ඩුවේ Budget එකෙන් අපට මොනවා හෝ ලැබෙයි, අඩුම ගණනේ වාහනයක්වත් ගෙන්වන්න පුළුවන් වෙයි කියලා. අපේ රටේ දැන් doctor කෙනෙකුට private වාහනයක් ගන්න අවුරුදු 40ක් සල්ලි ඉතුරු කරන්න වෙනවා. සාමාන්‍යයෙන් postgraduate trainee doctorsලා ගත්තොත්, husband and wife දෙදෙනාම වැඩ කරනවා නම්, ඒගොල්ලන්ට සාමාන්‍යයෙන් මාසයකට ඉතුරු කරන්න පුළුවන් රුපියල් 50,000යි. එතකොට ඒගොල්ලන්ට අවුරුදු 20ක් වැඩ කරන්න වෙනවා පවුලට වාහනයක් ගෙන්වන්න. දැන් ඉන්න doctorsලා පිට රට යන එකට ප්‍රධාන හේතුව economic instability එක. ඒ කියන්නේ, ඒගොල්ලන් ගන්න loan ගෙවන්න බැරිව තමයි පිට රට යන්නේ.

ඔබතුමන්ලා හොඳටම දන්නවා, සාමාන්‍යයෙන් postgraduate trainee කියන්නේ, ඒගොල්ලන් MBBS සමත්වෙලා ඊට පස්සේ අවුරුදු පහක්, අවුරුදු හයක්, අවුරුදු හතක් දිගටම ඉගෙන ගන්නවා. එතකොට ඒගොල්ලන්ට OT නැහැ. ඒගොල්ලන්ට overtime payments ගෙවන්නේ නැහැ. 1/120ක් ගෙවන එක 1/160කට අඩු කරලා තමයි pay කරන්නේ. ඒ වාගේම අපේ doctorsලාට ඉන්න තැනක් නැහැ. ඔබතුමන්ලා දන්නවා, අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් දන්නවා, PG traineesලාට ඉන්න තැනක් - quarters - නැහැ. ඒගොල්ලන්ට වාහනයක් නැහැ. ඒගොල්ලන්ට කන්න, බොන්න සල්ලි නැහැ. ඒගොල්ලන්ට පාඩම් කරන්න, එහාට මෙහාට යන්න ඔක්කෝටම loans අරගෙන තමයි ගෙවන්නේ. මම මේ සභාවට යෝජනාවක් කරන්න කැමැතියි. අපි මේ රටේ වැඩිපුර පාවිච්චි කරන්නේ PG traineesලා. මමත් PG trainee කෙනෙක් විධියට MSc Medical Administration කරලා, එ්කෙන් තමයි first appointment එක විධියට Chavakachcheri Base Hospital එකට ගියේ. එතැනදී වංචාවක් අල්ලන්න ගිහිල්ලා තමයි මම හිරේ ගියේ. හැබැයි වංචාව අල්ලපු මා හිරේ දමපු එක්කෙනෙක්වත් මේ පාර්ලිමේන්තුවේ නැහැ. රනිල් වික්‍රමසිංහටත් කථා කරන්න කිව්වා. පී.ජී. මහීපාලට කථා කරන්න කිව්වා. ඒ කාලයේ අපේ විපක්ෂ නායක හිටියා. එතුමාටත් කථා කරන්න කිව්වා. මම අල්ලපු වංචාව මම කොහොමද හොයා ගත්තේ කියලා මට නඩුවක් දැම්මා. මගේ පෞද්ගලික නඩුව 25වැනි දා තිබෙනවා. මම වංචාවක් හොයා ගත්ත එක වැරදියි කියලා ආණ්ඩුවෙන් දමපු නඩුවත් ඒක ඇතුළේ තිබෙනවා. සමහර doctorsලා එළියට ගිහිල්ලා patientsලා පාවිච්චි කරලා ඒ patientsලාගෙන් privately සල්ලි ගන්නවා. ඒක නවත්වන්න යනකොට මට නඩුව වැටුණා. ඒ නඩුව තවම පවත්වාගෙන යනවා.

මම මේ සභාවට යෝජනාවක් කරන්න කැමැතියි. අපි කවදාවත් PG traineesලාට හරි විධියට සලකන්නේ නැහැ. ඔබතුමන්ලා හිතනවා වාගේ PG traineesලා පැය 4ක්, පැය 3ක් වැඩ කරන්නේ නැහැ. උදේ 8ට hospital එකට ආවොත්

සතියකින් පස්සේ තමයි ගෙදර යන්නේ. සමහර අය wivesලා divorce කරනවා. බබාලාට අම්මා තාත්තා කවුද කියලා හඳුනා ගන්න බැරි වෙනවා. ඒ තරමට PG traineesලා වැඩ කරනවා. ඒගොල්ලන්ගේ දැනට තිබෙන hope එක අපේ රටට serve කරන්න නොවෙයි, කොහොම හරි මේ රටින් එළියට යන්නයි. මමත් PG training එකේදී Medical Administration කළේ, 2029දී කොහොම හරි ඕස්ට්‍රේලියාවට යන්න බලාගෙන තමයි. මම මේ රටට සේවය කරන්න නොවෙයි PG training කළේ. දැන් ඉන්න doctorsලා, internsලා pass out වෙන්න කලින් කරන්නේ මොකක්ද? PLAB exam එක හරි AMC exam එක හරි කරන්න බලාගෙන ඉන්නවා, කොහොම හරි මේ රටින් එළියට යන්න. අපේ හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. මගේ පෞද්ගලික යෝජනාව තමයි අපි intermediate cadre එකක් හදන්න ඕනෑ. සාමාන්‍යයෙන් doctor කෙනෙක් හොඳටම වැඩ කරලා, වැඩ කරලා අවුරුදු දහයක් යනකොට ඒ doctorට එක දවසෙන් surgeries 20ක්, 30ක් කරන්න පුළුවන්; consultantට වඩා හොඳට ලස්සනට කරගන්න පුළුවන්. හැබැයි ඒ වුණත් ඒ doctor ඉන්නේ SL-2 grade එකේ. පඩිය සාමාන්‍යයෙන් preliminary grade MOට වඩා ටිකක් වැඩිපුර තමයි ගෙවන්නේ. ඒ නිසා මම යෝජනා කරනවා, ඒ වාගේ senior doctorsලාට intermediate cadre එකක් හදමු කියලා. Intermediate cadre එකක් හැදුවාම ඒ ගොල්ලන් වැඩ කරන්න කැමැති වෙනවා, මේ රටින් එළියට යන්නේ නැහැ. ඒක පළමුවැනි එක.

දෙවැනි යෝජනාව තමයි අපි කොහොම හරි PG traineesලා මේ රටේ තියා ගන්න ඕනෑ. අපි normal MO කෙනෙකුට PG trainee කෙනෙක් විධියට ඉගෙන ගන්න පුළුවන් විධියට මොකක් හරි සුදුසු විධියක් හදලා දුන්නොත්, ඒගොල්ලන් තවත් කැමැත්තෙන් ඉගෙන ගනියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir.

මොකද, ගොඩක් doctorsලා අපේ රට දාලා ගියොත් අපේ රටේ doctorsලා ඉතුරු වෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් ගත්තොත් කවුරුවත් PG training කරන්න කැමැති නැහැ. මොකද, ඒ අයට OT නැහැ, basic පඩිය තිබෙන්නේ. දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුව හොඳම වැඩක් කරලා තිබෙනවා. Basic පඩිය වැඩි කරලා තිබෙනවා, රුපියල් 54,000 ඉඳලා 94,000ට. මම අනිවාර්යයෙන් ඒකට ස්තුතිවන්ත වෙනවා. හැබැයි ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ, ඒ doctorsලා වෙනුවෙන් ඔබතුමන්ලා වචනයක්වත් කථා කළේ නැහැ, 80න් බෙදන එක 120න් බෙදන්න යන එක ගැන. ඒ වචනය තමයි ඒගොල්ලන් බලාපොරොත්තු වුණේ. Doctor කරන්නේ profession එකක්. අපි පාරේ යනකොට අපට සල්ලි දෙන්නේ නැහැ, මිනිස්සු. හැබැයි doctor කෙනෙක් එනවා කියලා අයින් වෙනවා. ඒක අපි බලාපොරොත්තු වෙන දෙයක්. අපි අවුරුදු 15ක්, 16ක් අමාරුවෙන් ඉගෙන ගත්ත එක මිනිස්සු පිළිගන්න ඕනෑ කියලා තමයි අපි expect කරන්නේ. ඔබතුමන්ලා දැන් ඒ ගොල්ලන් නෝන්ඩි කරලා තිබෙනවා. ඒගොල්ලන්ට කියන්නේ නැතුව ඒගොල්ලන්ගේ OT එක 80න් බෙදපු එක දැන් 120න් බෙදන්න යෝජනා කරලා තිබෙනවා. ඒ නිසා මම කියනවා, - GMOA එක කරන්නේ සම්පූර්ණ වැරදි වැඩක්. ඒක මට අදාළ නැහැ. ඒකට මම ඒගොල්ලන්ට support කරන්නේ නැහැ. මම කියන්නේ doctorsලා ගෙන්වලා කථා කරලා, අඩුම ගණනේ දෙතුන් දෙනෙකුට ඔබතුමන්ලාට පැහැදිලි කරන්න තිබුණා. "මේ ආණ්ඩුවෙන් 80න් බෙදලා දෙන්න බැහැ, හැබැයි අපි ලබන අවුරුද්දේ අපේ Budget එකෙන් ඔබතුමන්ලාට 120න් නොවෙයි 80න් බෙදලා දෙනවා" කියලා වචනයක් දෙන්න තිබුණා. මම බලාපොරොත්තු වෙනවා, අපේ ජනාධිපතිතුමා Budget එක අවසානයේදී doctorsලාට ඒ බලාපොරොත්තුව ඇති කරයි කියලා. මම කවදාවත් ඔබතුමන්ලාට අත දිගු කරන්නේ නැහැ. මම දැන් ඉන්නේ ස්වාධීනව නේ. එතකොට මම විපක්ෂයේ ඉඳගෙන ආණ්ඩුවක් හදන්න නොවෙයි ඔබතුමන්ලාට අත දිගු කරන්නේ. මම ඔබතුමන්ලාට ගොඩක් ආදරෙන් හිටියා. හැබැයි මාව හිරේ දැම්මා, ජනාධිපතිතුමා Jaffna එනවා කියලා බොරු කථාවකට සිග්නල් ලයිට් දමපු නිසා. ඔබතුමන්ලාට ආදරෙයි කියලා මම පළමුවැනි දවසේ මේ සභාවේදී කියපු කෙනා. ඔබතුමන්ලා වෙනුවට මැරෙන්න වුණත් කැමතියි කියපු කෙනාට තමයි ඔබතුමන්ලා මෙච්චර වෛර කරලා තිබෙන්නේ. බල්ලෙක් arrest කරනවා වාගේ මා arrest කරලා මගේ phone එක track කළා. මම කරපු වැරැද්ද මොකක්ද? එල්ඊඩී බල්බ් දමපු එක තමයි මගේ වැරැද්ද. ඒ නිසා ඔබතුමන්ලා මාර වැරැද්දක් කළේ. එහෙම වැරදි කරන්න එපා. පෞද්ගලික තරහ පෙන්වන්න එපා. අපි ඔක්කෝම කථා කරනවා කැන්ටීන් එකේදී. කවුරු හරි කෙනෙක් ඇවිල්ලා මට බණිනවාද, කැන්ටීන් එකේදී? නැහැ. ඇයි, අපි මෙහෙම අනෙක් පැත්තට හැරෙන්නේ? ඔබතුමන්ලා හදා ගන්න. අපට තිබෙන දේවල් ඔබතුමන්ලා පාවිච්චි කරන්නේ නැහැ. ඔබතුමන්ලා දන්නවා මෙතැන doctorsලා 16ක් ඉන්නවා කියලා. අපේ මොළේ ඔබතුමන්ලාට ඕනෑ නැහැ. හැබැයි, කවුරු හරි පාවිච්චි කරනවා. ඒක තමයි වෙන්නේ. බොහොම ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු පී. සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 6.04]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களால் கொண்டுவரப்பட்டுள்ள மருத்துவ நிபுணர்கள் முகங்கொடுக்கும் சவால்கள் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையை நான் வழிமொழிவதோடு, அந்தப் பிரேரணையை இந்தச் சபையில் கொண்டுவந்ததற்காக அவருக்கு நன்றி கூறவும் கடமைப்பட்டிருக்கிறேன்.

எமது நாட்டிலுள்ள வைத்தியர்கள், முதலில் வைத்திய அதிகாரியாக - MO - இருப்பார்கள். அதற்கடுத்த படியாக, consultantsஆக இருப்பார்கள். இவ்விரண்டு பதவிகளுக்கும் இடையில் எந்தவிதமான பதவிநிலையும் இல்லை. சுகாதாரத் துறையில் அபிவிருத்தி அடைந்த நாடுகளில் வைத்தியர்களுக்கென intermediate cadre position இருக்கிறது. அதை எமது நாட்டில் அறிமுகப்படுத்துவதனூடாக வெளிநாடுகளுக்குச் செல்லும் வைத்தியர்களை இங்கேயே தங்க வைக்கலாம். இடைநிலை ஆளணியை - intermediate cadreஐ - தாபிப்பதானது, சுகாதாரத்துறையை மேலும் மேம்படுத்துவதற்கு முக்கியதொரு படியாக அமையும் என்பதில்

[ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

එන්ත මාර්ගුක් කරුත්තුම් ඉල්ලෙ. ඉන්‍රු අරස වෙත්තියසාලෙකළිල් පණිපුරිකින්‍ර පල වෙත්තිය අතිකාරිකළ්, කුරිප්පිට්ටතොරු තුරෙයිල් නීණ්ටකාලප් පයිර්සියෙයුම් අනුපවත්තෙයුම් skillsඉයුම් පෙර්රු, අන්තත් තුරෙයිල් මිකච් සිරන්ත වෙත්තියර්කළාකප් පණිපුරිකින්‍රනර්කළ්. ඉරුන්තාලුම්, අතනූටාක අවර්කළුටෙය සොන්ත වාළ්ක්කෙයිල් කුරිප්පාක career developmentඇල් පෙරියළවිල් නන්මෙ කිටෙප්පතිල්ලෙ. ආකෙයාල්, එමතු නාට්ටිල් ඉන්ත intermediate cadreඉ අරිමුකප්පටුත්තුවතු නල්ලතොරු විටයම් එන්මේ නාන් කරුතුකින්මේන්.

ඉන්ත නාට්ටිලුළ්ළ පල වෙත්තියර්කළ් Masters මුටිත්තිරුක්කිනර්කළ්. අතේපෝල්, postgraduate diploma මුටිත්තවර්කළුම් ඉරුක්කිනර්කළ්. එනිනුම්, අවර්කළුම් සාතාරණ වෙත්තිය අතිකාරියාකවේ - MO - කණික්කප්පටුකින්‍රනර්කළ්. අවර්කළුටෙය සම්පළත්තිල් එන්තප් පෙරිය විත්තියාසමුම් ඉල්ලෙ. අවර්කළුක්කෙන පිරත්තියේකමාන සම්පළ නටෙමුරෙයුම් ඉල්ලෙ. එනවේ, intermediate cadre එන්‍ර විටයත්තෙ එංකළුටෙය වෙත්තියත්තුරෙයිල් උට්පුකුත්ත වේණ්ටුම්. ඉන්ත නාට්ටිල් පල මාර්‍රංකළ් ඒර්පටුත්තප්පටුකින්‍රපෝතු, වෙත්තියත් තුරෙයිලුම් මාර්‍රත්තෙ ඒර්පටුත්තවේණ්ටිය කට්ටායත් තේවෙ ඉරුක්කින්‍රතු. උතාරණත්තුක්කු, Diploma in Psychiatryඉ මුටිත්තු, 20 වරුටංකළ් psychiatristආක වේලෙසෙය්ත ඔරු වෙත්තියර්, MOsඇන් annual transferඇල් PMCUක්කු ඇටමාර්‍රම් සෙය්යප්පටුකින්‍රනර්.

ඇතු මිකවුම් අනියායමාන ඔරු සෙයලාකුම්. ඇතනාල් අන්ත 20 වරුටංකළිල් අවර් කර්‍රුක්කොණ්ට විටයංකළ්, පෙර්‍රුක්කොණ්ට තුරෙසාර්න්ත අනුපවම්, වළර්ත්තුක් කොණ්ට ආළුමෙ එන්පන වීණ්ටික්කප්පටුකින්‍රන. ඇතනෙක් කරුත්තිර්කොණ්ටු, අව්වාර්‍රාන වෙත්තියර්කළුක්කෙන පිරත්තියේකමාන Service Minutes ඔන්‍රෙක් කට්ටායම් කොණ්ටුවර වේණ්ටුම්. අව්වාර්‍රානතොරු Service Minutesඇක් කොණ්ටුවරාමල්, intermediate cadreඇ උරුවාක්ක මුටියාතු. විසේට පයිර්සිකළෙක් කොටුත්තු, කුරිප්පිට්ට කාලත්තුක්කුප් පිරකු, අන්තත් තුරෙයිල් තනියාක වෙත්තියම් සෙය්යක්කූටිය නිලෙක්කු අවර්කළ් වන්තාල්, අවර්කළෙ ඇන්ත ආළණික්කුළ් උළ්වාංකලාම්. උතාරණත්තුක්කු, එංකළුටෙය නාට්ටිල් ඉරුක්කින්‍ර පල පල්කලෙක්කළංකළිල්, කුරිප්පාක යාළ්ප්පාණ මරුත්තුව පීටත්තිල් postgraduate diploma අල්ලතු Masters අල්ලතු ඒනෙය කර්කෙනෙරිකළෙත් තොටර්වතර්කුරිය වසති වාය්ප්පුකළෙ ඒර්පටුත්තික් කොටුත්තාල්, නිච්සයමාක අවර්‍රුක්කුප් පල වෙත්තියර්කළ් විණ්ණප්පිප්පාර්කළ්.

එනවේ, අන්ත intermediate cadreඇ එමතු වෙත්තියත්තුරෙයිල් අරිමුකප්පටුත්ත වේණ්ටුමෙන නාන් මීණ්ටුම් වලියුරුත්තුකින්මේන්. අතු එංකළුටෙය නාට්ටින් සුකාතාරත් තුරෙයෙ මේම්පටුත්තුවතර්කු මික මුක්කිය කාරණියාක අමෙයුම්. Masters අල්ලතු postgraduate diploma මුටිත්තවර්කළුක්කුම් කුරිප්පිට්ට තුරෙයිල් නීණ්ට කාලම් අනුපවත්තෙප් පෙර්‍රවර්කළුක්කුමෙන salary scale ඔන්‍රෙ උරුවාක්කි, අවර්කළෙ ඉන්තක් cadreක්කුළ් උළ්වාංකුවතර්කු සුකාතාර අමෙච්චර් අවර්කළ් නටවටික්කෙයෙටුක්ක වේණ්ටුම්. පල තිරමෙයාන වෙත්තියර්කළ් ඉප්පටියාන සන්තර්ප්පංකළෙ ඉළන්ත නිලෙයිල් pension පෝයිරුක්කිනර්කළ්. කෙළරව ඉරාමනාතන් අර්ච්සුනා අවර්කළ් මුන්මොළින්ත ඉන්තප් පිරේරණෙක්කු නාංකළ් එල්ලෝරුම් ආතරවු තෙරිවික්කින්මෝම්. මේලුම්, postgraduate செய்துகொண்டிருக்கின்ற வைத்தியர்களுக்கான வசதி வாய்ப்புகள் தொடர்பிலும் அவர் ஏற்கெனவே சொல்லியிருந்தார். அவற்றையும் நாங்கள் ஆதரிக்கிறோம். இறுதியாக, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[6.10 p.m.]

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

Hon. Presiding Member, thank you very much for this opportunity.

I think this is a very reasonable proposal. I know that this matter was discussed several times in the past at various forums, but nothing got materialized. So, this is the right time to discuss this matter and find a favourable solution for the problem through this Parliament. As of now, we have discussed in detail the granting of benefits for medical officers as well as others under the Ministry of Health because that will help prevent the brain drain in this country and develop our health system.

Therefore, it is our duty to discuss with the various colleges and the Postgraduate Institute of Medicine to develop this as an uninterrupted service of medical officers and appoint them as middle-level medical officers under the Ministry of Health. These medical officers have been working in hospitals for a long time with enough skills and experience obtained under very experienced consultants. So, their service is very much helpful to this nation and we have to create this middle-level medical officers' grade. After discussing with the Department of Management Services, we have to create a Service Minute for them and thereafter, appoint them as middle-level medical officers. That will also help us appoint them to divisional hospitals as officers in charge so that they can offer their service to the people in the rural areas. So, it is very much appreciated if it could be implemented. With that, we could also prevent people from going to urban hospitals for treatments. We can appoint a committee to discuss this matter and find a favourable solution to this problem, to appoint them as middle-level medical officers. Our Government will take necessary actions to solve this problem as soon as possible.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 6.13]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்களால் முன்வைக்கப்பட்டுள்ள மருத்துவ நிபுணர்கள் முகங்கொடுக்கும் சவால்கள் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையை நானும் வரவேற்கின்றேன். இது இந்தக் காலகட்டத்துக்குத் தேவையான முக்கிய விடயம் என்பதால், அவருக்கும் இதனை வழிமொழிந்து உரையாற்றிய உறுப்பினர் அவர்களுக்கும், ஆளுந்தரப்பிலிருந்து உரையாற்றிய வைத்தியர் எஸ். ஸ்ரீ பவானந்தராஜா அவர்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இவர்கள் சொன்ன விடயங்களை ஏற்றுக்கொண்டு, அதற்குரிய வழியை ஏற்படுத்தித் தரவேண்டும் என்பது எங்கள் எல்லோரினதும் கோரிக்கையாகும்.

சுகாதார அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்கு எனக்கு நேரம் கிடைக்காதபடியால், நான் இந்தச் சந்தர்ப்பத்தில் முல்லைத்தீவு மாவட்டத்தில் நிலவும் சுகாதாரத்துறை சார்ந்த சில குறைபாடுகளை இங்கு சொல்ல விரும்புகின்றேன். இதனை கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் கருத்தில் எடுப்பாரென நான் நினைக்கின்றேன். நாங்கள் ஏற்கெனவே கௌரவ அமைச்சர் அவர்களிடம் முல்லைத்தீவு மாவட்டத்தின் சுகாதாரத் தேவைகளை முன்வைத்துள்ளோம். அவற்றை அவர் கவனத்தில் எடுப்பார் என்ற நம்பிக்கை எம்மிடம் தாராளமாக உண்டு. அங்குள்ள வைத்தியசாலைகளில் வைத்தியத்துறை உட்பட சகல துறைகளிலும் ஆளணிப் பற்றாக்குறை உள்ளது. மாவட்டப் பொது வைத்தியசாலையில் கட்டிட வசதி மிக அவசிய தேவையாகவுள்ளது. நோயாளர்கள் தங்கி சிகிச்சை பெறமுடியாமல் தவிக்கின்றார்கள். நோயாளர் காவுவண்டிகளின் தேவை முல்லைத்தீவு, அலம்பில், கொக்குளாய் உட்பட இன்னும் சில இடங்களுக்கு மிகவும் அவசியமாகவுள்ளது.

கௌரவ அமைச்சர் அவர்களே, முல்லைத்தீவு மாவட்டம் என்பது மிகவும் பின்தங்கிய மாவட்டமாகும். அந்த மாவட்டத்தின் அபிவிருத்தி தொடர்பில் நீங்கள் கவனத்திற்கொள்வீர்கள் என நம்புகின்றேன். மேலும், நீங்கள் முல்லைத்தீவுக்கு வருகை தந்து, அங்குள்ள சுகாதாரக் குறைபாடுகளை நேரடியாகப் பார்வையிட வேண்டுமென்ற கோரிக்கையை முன்வைத்து, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.15]

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අය වැය කාරක සභා අවස්ථාවේ විවාද කළ අද දවසේ ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉතාම කාලෝචිත සහ වැදගත් යෝජනාවක් බව ආණ්ඩුව විධියට අපි පිළිගන්නවා.

අපේ රටේ විශේෂඥ වෛද්‍යවරු විශාල පිරිසක් රට බංකොලොත්භාවයට පත්වීමත් එක්ක විදේශ පුහුණුව සඳහා රට අතහැර ගියාට පස්සේ, ඉන් සැලකිය යුතු පිරිසක් නැවත ලංකාවට එන්නේ නැතිව ඒ රටවල නවතින ප්‍රවණතාවක් පසුගිය වසර කිහිපයේම දක්නට ලැබුණා. ඒ නිසා අපට ඒ හිස්තැන පිරවීමේ අවශ්‍යතාවක් තිබෙනවා. සාමාන්‍යයෙන් වෛද්‍යවරයෙක් එක් ක්ෂේත්‍රයක වසර ගණනාවක් අත්දැකීම් ගත්තාට පස්සේ, විශේෂඥ වෛද්‍යවරයෙකු තරමටම නොවුණත්, සාපේක්ෂව යම්කිසි සේවයක් කරන්න පුළුවන් නිපුණතාවක් ලබා ගන්නවා. උදාහරණයක් විධියට මමත් අවුරුදු 14ක් ශල්‍ය ඒකකවල එක දිගට සේවය කළා. කිසිදු දිරි දීමනාවක් වැනි දෙයක් නැතිව තමයි වෛද්‍යවරු එම සේවය සපයන්නේ. ඒ නිසා intermediate cadre එකක් හදන්න, අතරමැදි තනතුරක් ස්ථාපිත කරන්න අපට පුළුවන් නම් කොළඹින් බැහැර ප්‍රදේශවල සෞඛ්‍ය සේවයේ පවතින අඩු පාඩු සම්පූර්ණ කිරීම සඳහා එය යම් උදව්වක් වෙයි කියලා මා හිතනවා. මොකද අවුරුදු 10ක්, 15ක්, 20ක් එක ක්ෂේත්‍රයක නිරත වුණු වෛද්‍යවරයෙකුට ඒ වැඩ ප්‍රමාණය අධිකවීම නිසාම වෙහෙසට පත් වෙලා -එයින් විශේෂ වාසියකුත් නැති නිසා- තමන්ට ලේසි පහසු තැනකට යනවා, ආපහු හිටපු ක්ෂේත්‍රයට එන්නේ නැතිව. ඒක ඔහු ලබා ගත්ත අත්දැකීම් රටට අහිමිවීමක් විධියට අපිත් දකිනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශය මේ යෝජනාව එන්න පෙර සිටම අවධානය යොමු කරලා තිබුණු කාරණයක් තමයි, ඔය intermediate cadre කියන එක. නමුත් ඒකේ තිබෙනවා, යම්කිසි සංකීර්ණ තත්ත්ව ටිකක්. එකක්, විශේෂඥ වෛද්‍යවරුන් එය කොහොම පිළිගනීවිද කියන එක. ඒ නිසා මේ ගැන ඔවුන් එක්ක සාකච්ඡා කරන්න වෙනවා. ඒ වාගේම එහි නීතිමය පැත්තකුත් තිබෙනවා. මෙහිදී යම්කිසි සංකූලතාවක් සිද්ධ වුණොත් ඒකට මුහුණ දෙන්නේ කොහොමද? ඒ අනුව මේක අතිශය සංකීර්ණ දෙයක්. නීතිමය පැත්ත වාගේම ඒ අදාළ විද්‍යායතනවල - collagesවල - අනුමැතිය එක්ක තමයි මේ යෝජනාව පිළිබඳව ඉස්සරහට කටයුතු කරගෙන යන්න වෙන්නේ. ඒ නිසා මේක සරල කාරණයක් නොවෙයි. මේ යෝජනාව අපට අමාත්‍යාංශය විධියට රෑස් වෙලා තීරණයක් අරගෙන ක්‍රියාත්මක කරන්න පුළුවන් එකක් නොවෙයි. මොකද, මේක තාක්ෂණික කාරණයක්.

ඒ නිසා අපි සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට දැනටමත් සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා, තාක්ෂණික කටයුතු පිළිබඳව කථා කරන්න. කෙසේ වෙතත්, මෙම යෝජනාව ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගරු අර්චුනා මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම postgraduate traineesලා සම්බන්ධව කථා කරද්දි අපි දන්නවා, ආර්ථික වශයෙන් ලොකු දුෂ්කරතාවලට ඔවුන් පත් වන බව. මොකද, ඔවුන්ට මාස තුනෙන් තුනට, මාස හයෙන් හයට එක එක hospitalsවලට මාරු වෙන්න සිදු වෙනවා. සමහර වෙලාවට දිස්ත්‍රික්කයකින් දිස්ත්‍රික්කයකටත් මාරු වෙන්න සිදු වෙනවා. එතකොට ඔවුන්ට ඒ ප්‍රදේශවලින් නවාතැන් සොයාගන්නත් වෙනවා. එතකොට විශාල කරදරවලට, ආර්ථික වශයෙන් අපහසුතාවලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ නිසා postgraduate traineesලාට යම් කිසි සහනයක් ලබා දීම පිළිබඳවත් අපි සලකා බලමින් ඉන්නවා. ඒක අපට සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළේ කථා කරලා ඉක්මනින්ම විසඳාගන්න පුළුවන් කාරණාවක් විධියට තිබෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.19]

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම ස්තුතිය පළ කරනවා, ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමාට. වෛද්‍ය ක්ෂේත්‍රය ගත්තාම, වෛද්‍යවරයෙකු විධියට මුලින්ම සේවයට බැඳුණාට පස්සේ ඔහුට අවස්ථාව තිබෙනවා, පශ්චාත් උපාධියක් - postgraduate degree එකක් - කරන්න. නමුත් ඒ සඳහා ඔහු බොහෝ කැප කිරීම් කළ යුතුයි. විශේෂයෙන්ම කොළඹින් පිට ඉන්න වෛද්‍යවරුන්ට ඒක කරගෙන යන්න බාධක ගොඩක් තිබෙනවා. මොකද, මේ සඳහා ඔහු නගරයට එන්න ඕනෑ; කොළඹට එන්න ඕනෑ. ඒ කඩඉම පහු කළාට පස්සේ තවත් කඩඉම් ගොඩක් තිබෙනවා, පහුකර ගන්න. එහෙම ගිහිල්ලා ආවත් හුහක් වෙලාවට ලංකාවේ system එකෙන් ඔවුන් පිළිගන්න නිසි ක්‍රමයක් හදලා නැහැ. බොහෝ විශේෂඥ වෛද්‍යවරු ඇවිල්ලා තනිවම තමයි කටයුතු කරන්නේ. ඔවුන් තනිවම ward එකක් හදාගෙන වැඩ කරන ක්‍රමයක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ, විශේෂඥ වෛද්‍යවරුන්ගේ පැත්තෙන්.

අනෙක් වෛද්‍යවරුන්ගේ පැත්තෙන් ගත්තාම, එ් අයත් යම් ක්‍රමයකට වැඩ කරගෙන යනවා. අවුරුදු හතරක් වැඩ කළාට පස්සේ ඔවුන්ට හොඳ ප්‍රාගුණ්‍යයක් ලැබෙනවා. නමුත්, හිටපු ගමන් ඔවුන්ට වෙනත් තැනක වැඩ කරන්න වෙනවා. සමහර වෙලාවට OPD එකේ වැඩ කරනවා, ඊළඟට eye ward එකේ වැඩ කරනවා, ඊළඟ appointment එකේදී ENT එකේ වැඩ කරනවා, ඊට පස්සේ මාතෘ වාට්ටුවක වැඩ කරනවා. එහෙම වැඩ කරලාත් ලොකු ධාරිතාවක් ඇතිව, ලොකු දක්ෂතාවක් ඇතිව ඔවුන් ඒවා කරගෙන යනවා. මෙහෙම ක්‍රමයක් බොහොම කලාතුරකින් තමයි ලෝකයේ දකින්න තිබෙන්නේ. සාමාන්‍යයෙන් ලෝකයේ තිබෙන ක්‍රමය තමයි, ඔවුන් කැමති ක්ෂේත්‍රයක දිගට වැඩ කරන්න දෙන එක. එහෙම වැඩ කරන්න දීමට අවශ්‍ය අධ්‍යාපනික පසුබිම අපි හදන්න ඕනෑ. ඒකට අපට PGIM එකත් එක්ක ලංකාවේ තිබෙන අනිකුත් විශ්වවිද්‍යාල ටිකත් පාවිච්චි කරන්න පුළුවන්. මොකද, PGIM, Colombo හැර, දැනට ගාල්ලේ තිබෙනවා, පේරාදෙණියේ තිබෙනවා. ඒ වාගේම අපට Jaffnaවලත් පටන් ගන්න පුළුවන්.

හුහක් තැන්වල ඒ පහසුකම් තිබෙන නිසා අපට ඒවා පාවිච්චි කරන්න පුළුවන්. ආණ්ඩුවක් විධියට අපි හිතනවා, යම්කිසි කෙනෙක් රෝහලක වැඩ කරන්න ආවාම, ඔහු උපයා ගත යුත්තේ මුදල් පමණක් නොවෙයි කියන එක. ඔහු ඒ වැඩ කරන වෙලාව තුළ යම්කිසි ලකුණු ප්‍රමාණයක් උපයා ගත යුතුයි කියලා අපි හිතනවා. එතකොට ඒ අය වැඩ නිමවී ගෙදර යනකොට මුදලක් උපයාගෙන තිබෙනවා වාගේම ව්‍යක්තිමය ලකුණු ප්‍රමාණයකුත් උපයා ගෙන තිබෙනවා. අන්න ඒ වාගේ ක්‍රමවේදයකින් අපට මේ middle-grade cadre එහෙම නැත්නම් intermediate cadre කියන එක establish කරන්න පුළුවන්. මම හිතන විධියට මේ සම්බන්ධව අපේ වෛද්‍යවරුන් අතර ගොඩක් discussions සිදු වෙනවා. මම මේ ගැන Ministry එකේදීත් කථා කළා. මීට කලිනුත් Ministry එකේදී මේ වාගේ discussions පවත්වා තිබුණා. ඒගොල්ලන් anaesthesia, ICU, neurosurgical and cardiothoracic වශයෙන් ක්ෂේත්‍ර 4ක් හදුනා ගෙන තිබෙනවා. මම හිතන විධියට ඒ colleges එක්ක කථා කරලා එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව ඒ තැන්වල එහෙම cadres හදන්න ඒගොල්ලන් කැමැති වෙලා තිබෙනවා.

ඒ වාගේම PGIM එක එක්කත් සාකච්ඡා කරලා තිබෙනවා. නමුත් ඒකෙන් ලොකු conclusion එකකට ඇවිල්ලා නැහැ. ඒ වාගේම cadre එක සම්බන්ධයෙනුත් ලොකුවට නිගමනයකට ඇවිල්ලා නැහැ. අපේ රජය පත් වුණාට පසුව අපි පොඩි කමිටුවක් පත් කරගෙන මේ පිළිබඳව සාකච්ඡා කළා. දැනටත් අපි ඒ සාකච්ඡා සිදු කරමින් පවතිනවා. අපි රජයක් විධියට විශ්වාස කරනවා, අනිවාර්යයෙන්ම මේ තත්ත්වය ඇති කරන්න ඕනෑය කියලා. ඇත්තටම මේකෙන් කාටවත් threat එකක් නැහැ. මේකෙන් එන්නේ benefit එකක්. ලංකාවේ මිනිස්සු ප්‍රතිකාර ලබා ගන්නා වෛද්‍යවරුන්ගේ සුදුසුකම් ප්‍රමාණය තව තවත් වැඩි වෙන එක තමයි මේකෙන් වෙන්නේ. ඒ වාගේම hospital system එකටත් ගොඩක් ලෙහෙසියි; අපේ Ministry එකටත් මේක ගොඩක් ලෙහෙසි වැඩක්. මේ ප්‍රශ්න නිසා වෛද්‍යවරු බොහෝදෙනෙක් තෘප්තිමත්භාවයකින් නොවෙයි කටයුතු කරන්නේ. ඒ කියන්නේ තමන්ගේ වෘත්තියේ දියුණුව සම්බන්ධව තෘප්තිමත්භාවයක් ඔවුන් තුළ නැහැ, මේ ප්‍රශ්න නිසා. ඒ නිසා ඔවුන්ගේ සේවා තෘප්තියටත් මේක හොඳ දෙයක්. මේක අනිවාර්යයෙන්ම කළ යුතු දෙයක්. ඒක නිසා අපි රජයක් විධියට අනිවාර්යයෙන්ම මේ වැඩ කටයුත්ත ඉදිරියට අරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව ඔබතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.

PGIM traineesලා ගැනත් සඳහන් කළ යුතුයි. ඇත්තටම ඒගොල්ලන් ලොකු දුෂ්කරතාවකට පත් වුණු පිරිසක්. එක පැත්තකින් ගත්තාම ඔවුන් පැය 24ම වැඩ කරනවා. අර house officersලාගේ කාලයේ වාගේ තමයි මේගොල්ලන් පැය 24ම වැඩ කරනවා. ඒ වාගේම එක තැනක වැඩ කරලා ඊළඟ appointmentsවලට ගොඩක් ඈත යන්න සිද්ධ වෙනවා. ඔවුන්ගේ ගෙවල් දොරවල් කොහේද කියන එකවත් ඇත්තටම PGIM එකෙන් එහෙම සලකා බලන්නේ නැහැ. ඔවුන්ටම සුවිශේෂ වූ ප්‍රශ්න තිබෙනවා. මෙහිදී මට පෙනෙනවා, මුදල් වෙන් කරලා කරන්න පුළුවන් වැඩ ප්‍රමාණයකුත්, මුදල් වෙන් නොකර කරන්න පුළුවන් වැඩ ප්‍රමාණයකුත් තිබෙන බව. විශේෂයෙන්ම ගත්තාම, මේ අය Ministry එකට එන්න ඕනෑ, හැම මාසයේම අත්සන් කරන්න. Jaffna, Trincomalee, Batticaloa, Kandy වාගේ පැතිවල ඉඳලා ඔවුන් එහෙම එන්න ඕනෑ. මම හිතන විධියට අපට පුළුවන්, ඒ සඳහා ඊට වඩා පහසු ක්‍රමයක් හදා ගන්න. ඒකට සල්ලි ඕනෑ නැහැ. ඒ අදාළ hospital එකේ Director දන්නවා, ඒ කෙනා කවුද කියලා. ඇත්තටම ඔහු ජීවතුන් අතර ඉන්නවාද කියලා බලා ගන්න තමයි ඒක කරන්නේ. ඒක නිසා එහෙම hospital එකට ගිහිල්ලා අත්සන් කරලා ආවාම ඇති. ඇත්තටම ඔවුන් අර විධියට රස්තියාදු කරන එක පුළුවන් තරම් අපි අඩු කරන්න ඕනෑ. මොකද, PGIM traineesලා එහෙම Ministry එකට ඇවිල්ලා ඉන්නවා පෙනෙනවා. ඒ ගැන ගොඩක් දුකයි. ඒ නිසා ඔවුන් සම්බන්ධව අපට අර විධියට මුදල් නැතුව කරන්න පුළුවන් දේවල් පවා තිබෙනවා.

ඒ වාගේම අනිවාර්යයෙන්ම PGIM traineesලාට නවාතැන් පහසුකම්, quarters දිය යුතුමයි. එහෙම දෙන්න බැරි නම් රජයක් විධියට අපි පිටින් හෝ hire කරලා එම පහසුකම් ලබා දිය යුතුයි කියන තැන තමයි අපි ඉන්නේ. ඒ අවශ්‍ය පහසුකම් ඇත්තටම අපිට Ministry එකෙන් සපයන්න පුළුවන්. අපි ඒකට අවශ්‍ය වැඩ කටයුතු කරනවා. ඒ වාගේම ඔවුන්ගේ අතිකාල දීමනා සම්බන්ධ ප්‍රශ්නය ගත්තාම, ඒ වාගේ එකක් අපට Ministry එකේ මට්ටමින්

විසඳන්න බැහැ. ඒකට Cabinet approval එකක් ගන්න ඕනෑ. අපි ඒ පිළිබඳවත් සාකච්ඡා කර බලමු.

අපි middle-grade cadre එක සම්බන්ධ ප්‍රශ්නය ගත්තොත්, අප ඒ පිළිබඳව colleges එක්ක කථා කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල සහ අපේ Ministry එක එක්කත් කථා කරලා - අපි දැනට පොඩි කමිටුවක් පත් කර තිබෙන්නේ - broader committee එකක් පත් කරගෙන ඒ ගැන සාකච්ඡා කරලා ඒකෙන් එන ප්‍රතිඵලය මත අපේ Service Minutes amend කරලා කොහොම හරි ඉක්මනට මේ සඳහා විසඳුමක් ලබා දෙමු කියා මම අමාත්‍යාංශය පැත්තෙන් කියනවා. ඒ වාගේම මේ සම්බන්ධව අදහස් දැක්වූ ඔබ සැමටත්, විශේෂයෙන්ම මෙම කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමාටත් මා ස්තුතිය පළ කරනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගොඩක් ස්තුතිවන්ත වෙනවා, Hon. (Dr.) Hansaka Wijemuniටත්, මගේ සර් කෙනෙක් වන Hon. (Dr.) S. Sri Bavanandarajahටත්, මේ සම්බන්ධයෙන් ගරු සභාවේදී අදහස් දැක්වූ අනෙකුත් doctorsලාටත්. ඇත්තටම මම බලාපොරොත්තු වුණේ නැහැ, ඔය තරමටම ඔබතුමන්ලා support එකක් දෙයි කියලා. මම කියනවා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව අවුරුදු 5ක් නොවෙයි, අවුරුදු 20ක් පවතින්න ඕනෑ කියලා. ඔබතුමන්ලාට හොඳ දෙයක් තමයි මම කියන්නේ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුරට ඇත්ත වශයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.26ට, 2025 පෙබරවාරි 21 වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 07 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.26 மணிக்கு பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 07, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.26 p.m. until 9.30 a.m. on Friday, 07th March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 318 - இல. 8
Volume 318 - No. 8

2025 මාර්තු 07වන සිකුරාදා
2025 மார்ச் 07, வெள்ளிக்கிழமை
Friday, 07th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 07වන සිකුරාදා
2025 மார்ச் 07, வெள்ளிக்கிழமை
Friday, 07th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

වරප්‍රසාද: 2025 ජනවාරි 20වන දින යාපනයේ සිට ගමන් කරන අතරතුරදී වූ සිද්ධිය [තීරුව 1377]

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීම [තීරුව 1377]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [තීරුව 1379]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 1381-1401]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 – [පහළොස්වන වෙන් කළ දිනය]:

[ශීර්ෂ 117, 306, 307, 336 (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා); ශීර්ෂ 123, 309 - 311, 332 (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 1401– 1564]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

சிறப்புரிமை: 2025 சனவரி 20ஆம் திகதியன்று யாழ்ப்பாணத்திலிருந்து பயணிக்கும்போது இடம்பெற்ற சம்பவம் [ப: 1377]

பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம் (இலங்கைக் கிளை), அனைத்துப் பாராளுமன்ற ஒன்றியம் (இலங்கைக் குழு) மற்றும் "சார்க்" பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் (இலங்கைக் கிளை) என்பவற்றினது இணைந்த விசேட பொதுக் கூட்டம் [ப: 1377]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 1379]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1381-1401]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட பதினைந்தாம் நாள்]:

[தலைப்புக்கள் 117, 306, 307, 336 (போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள்); தலைப்புக்கள் 123, 309 – 311, 332 (நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு)] – குழுவில் ஆராயப்பட்டது [ப: 1401 - 1564]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Privilege: Incident Occurred on 20th January, 2025 while Travelling from Jaffna [Col. 1377]

Joint Special General Meeting of Commonwealth Parliamentary Association (Sri Lanka Branch), Inter-Parliamentary Union (Sri Lanka Group) and SAARC Parliamentarians' Association (Sri Lanka Branch) [Col. 1377]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1379]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1381-1401]

APPROPRIATION BILL, 2025 – [Fifteenth Allotted Day]:

Considered in Committee - [Heads 117, 306, 307, 336 (Transport, Highways, Ports and Civil Aviation); Heads 123, 309 -311, 332 (Urban Development, Construction and Housing)] [Cols. 1401-1564]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 07වන සිකුරාදා
2025 மார்ச் 07, வெள்ளிக்கிழமை
Friday, 07th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

වරප්‍රසාද: 2025 ජනවාරි 20වන දින යාපනයේ සිට ගමන් කරන අතරතුරදී වූ සිද්ධිය
சிறப்புரிமை: 2025 சனவரி 20ஆம் திகதியன்று யாழ்ப்பாணத்திலிருந்து பயணிக்கும்போது இடம்பெற்ற சம்பவம்
PRIVILEGE: INCIDENT OCCURRED ON 20TH JANUARY, 2025 WHILE TRAVELLING FROM JAFFNA

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් 2025 පෙබරවාරි 05 වැනි දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය.

II

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීම
பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம் (இலங்கைக் கிளை), அனைத்துப் பாராளுமன்ற ஒன்றியம் (இலங்கைக் குழு) மற்றும் "சார்க்" பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் (இலங்கைக் கிளை) என்பவற்றினது இணைந்த விசேட பொதுக் கூட்டம்
JOINT SPECIAL GENERAL MEETING OF COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION (SRI LANKA BRANCH), INTER-PARLIAMENTARY UNION (SRI LANKA GROUP) AND SAARC PARLIAMENTARIANS' ASSOCIATION (SRI LANKA BRANCH)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මාර්තු 07වන දා, එනම් අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම අවසන් වීමෙන් පසුව පාර්ලිමේන්තුවේ අංක 1 දරන කාරක සභා කාමරයේ දී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය) ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය) ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීමට සහභාගි වන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2020 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

[ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

(i) 2023 වර්ෂය සඳහා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා හින්දු සංස්කෘතික අරමුදලේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ජී. එස්. එම්. බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2023 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(vi) 2023 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்புப் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)

ගරු කථානායකතුමනි, හිහුරක්ගොඩ, ඩෙන්සිල් කොඛ්බෑකඩුව මාවත, අංක 43/1 දරන ස්ථානයෙහි පදිංචි කේ.එල්. අනුර ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හය පිළිගන්වමි.

(1) කින්නියා, කුරුන්වාන්කේනි 03 දරන ස්ථානයෙහි පදිංචි අහමදු ජාන් රසුල් ජාන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කන්තලේ, ලයිට් පාර, 06 වැනි පටුමග, අංක 07/110 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඒ. රමණී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) කින්නියා 05, අඩප්පනාර් වයල්, පෙරුන්තෙරු, අංක 30/26 දරන ස්ථානයෙහි පදිංචි කාමිදු කමාල්දීන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ත්‍රිකුණාමලය, ශිවන් වීදිය, අංක 23/10 දරන ස්ථානයෙහි පදිංචි රාසතුරෙයි අකිලන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) ත්‍රිකුණාමලය, ඕර්ස්හිල්, ලෝවර් පාර, අංක 164/16 දරන ස්ථානයෙහි පදිංචි ටී.පී. කමලනාදන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) කන්තලේ, තඹලගමුව, සිරාජ් නගර්, අංක 531 දරන ස්ථානයෙහි පදිංචි යූ.එල්.කේ. මොහොමඩ් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මාවනැල්ල, රන්දිවල, අංක එෆ් 1/62 දරන ස්ථානයෙහි පදිංචි අයි.ආර්.පී. මැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි

(1) මාතර, මාකඳුර, දිද්දෙනිපොත, "සැනසුම" යන ලිපිනයෙහි පදිංචි ජී. සුමින්ද ජයසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතර, හිත්තැටිය මැද, රාළහාමි පිටිටෙනිය, අංක 2/53 දරන ස්ථානයෙහි පදිංචි එන්.ඩී.එල්. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ඌරුබොක්ක, පහළ කිරිපිටිය, උඩහ අංගහවත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්. ප්‍රේමදාස මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -154/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -253/2024- (2), ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා. *-[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -292/2024- (1), ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා. *- [සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -304/2024- (1), ගරු රවී කරුණානායක මහතා. *- [සභා ගර්භය තුළ නැත.]*

ඖෂධවේදීන්ගේ හිඟය සහ බාහිර ඖෂධවේදී විභාගය: විස්තර
மருந்தாளர்களின் பற்றாக்குறை மற்றும் வெளிவாரி மருந்தாளர் பரீட்சை: விபரம்
SHORTAGE OF PHARMACISTS AND EXTERNAL PHARMACIST EXAM: DETAILS

492/2025

5. ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ලියාපදිංචි ඖෂධශාලා සංඛ්‍යාව සහ ලියාපදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත අනුව ලියාපදිංචි ඖෂධශාලා, ලියාපදිංචි ඖෂධවේදියකුගේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යා යුතු වන්නේද;

(iii) ලියාපදිංචි ඖෂධශාලා සංඛ්‍යාවට සාපේක්ෂව ලියාපදිංචි ඖෂධවේදීන්ගේ හිඟයක් පවතින බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම හිඟය මහ හරවා ගැනීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර සහ ඉදිරියේදී ගැනීමට නියමිත පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) බාහිර ඖෂධවේදී විභාගයට පෙනී සිටීම සඳහා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමට අ.පොස. (උ.පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව සඳහා සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු බව දන්නේද;

(ii) අවසන් වරට පවත්වන ලද බාහිර ඖෂධවේදී විභාගයට පෙනී සිටි 1,700ක් පමණ වන අයදුම්කරුවන් අතරින් අයදුම්කරුවන් 99ක් පමණක් සමත් වී ඇති අතර එම සංඛ්‍යාව විභාගයට පෙනී සිටි මුළු අයදුම්කරුවන්ගෙන් 6%ක් වැනි අඩු ප්‍රතිශතයක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பதிவுசெய்யப்பட்ட மருந்தகங்கள் மற்றும் பதிவுசெய்யப்பட்ட மருந்தாளர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(ii) 2015ஆம் ஆண்டின் 05ஆம் இலக்க தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தல் அதிகாரசபைச் சட்டத்தின்படி, பதிவுசெய்யப்பட்ட மருந்தாளர் ஒருவரின் மேற்பார்வையின்கீழ் பதிவுசெய்யப்பட்ட மருந்தகங்கள் கொண்டுநடத்தப்பட வேண்டுமா என்பதையும்;

(iii) பதிவுசெய்யப்பட்ட மருந்தகங்களின் எண்ணிக்கையுடன் ஒப்பிடுகையில், பதிவு செய்யப்பட்ட மருந்தாளர்களின் பற்றாக்குறை காணப்படுவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அந்தப் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்காக இன்றளவில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் மற்றும் எதிர்காலத்தில் மேற்கொள்வதற்கு உத்தேசிக்கப்பட்டுள்ள நடவடிக்கைகள் வெவ்வேறாக யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வெளிவாரி மருந்தாளர் பரீட்சைக்குத் தோற்றுவதற்காக மருத்துவ சபையில் பதிவுசெய்வதற்கு க.பொ.த (உ/த) பரீட்சையில் இரசாயனவியல் பாடத்தில் திறமைச் சித்தியைப் பெற்றிருக்க வேண்டியதை அறிவாரா என்பதையும்;

(ii) இறுதியாக நடாத்தப்பட்ட வெளிவாரி மருந்தாளர் பரீட்சைக்குத் தோற்றிய சுமார் 1,700 விண்ணப்பதாரர்களில் 99 விண்ணப்பதாரர்கள் மாத்திரமே சித்தியடைந்துள்ளனர் என்பதோடு அவ்வெண்ணிக்கையானது பரீட்சைக்குத் தோற்றிய மொத்த விண்ணப்பதாரர்களில் வெறுமனே 6%இலும் குறைவான விகிதமாக உள்ளதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the number of the registered pharmacies and the number of registered pharmacists in Sri Lanka, separately;

(ii) whether the registered pharmacies should be operated under the supervision of a registered pharmacist, as per the National Medicines Regulatory Authority Act, No.05 of 2015;

(iii) whether he accepts that there is a shortage of registered pharmacists compared to the number of registered pharmacies; and

(iv) if so, the measures that have been taken so far and measures that will be taken in the future to address the shortage referred to above, separately?

[ගරු දේවානන්ද සුරවීර මහතා]

(a) Will he also inform this House-

(i) whether he is aware that a credit pass for Chemistry subject at GCE (A/L) Examination is required to register with the Sri Lanka Medical Council in order to sit for the External Pharmacist Examination; and

(ii) whether he accepts that the pass rate is as low as 6 per cent of the total number of candidates who took the examination as only 99 out of 1,700 candidates have passed the recent External Pharmacist Examination?

(b) If not, why?

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ලංකාවේ දැනට ලියාපදිංචි ඖෂධශාලා සංඛ්‍යාව - 5,200

ලියාපදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව - 8,521

ඒ කිව්වේ, රාජ්‍ය සහ පෞද්ගලික අංශය කියන දෙකේ සියලුම සංඛ්‍යාවයි.

(ii) ඔව්.

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ අංක 120 ප්‍රකාරව, 120 (02) - බලපත්‍රයක් දරන්නකු විසින් තම ඖෂධශාලාවෙහි අවම වශයෙන් සුදුසුකම් ලත් එක් ඖෂධවේදියකුවත් සේවයේ යොදවනු ලැබිය යුතු අතර ඔහු විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ හෝ සීමාස්ථ නිෂ්පාදනවලට අදාළව ඖෂධශාලාවේ සියලු කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතුය.

120 (03) - සෑම ඖෂධශාලාවකම ඖෂධ, වෛද්‍ය උපකරණ හෝ සීමාස්ථ නිෂ්පාදනයක් නිකුත් කිරීම ඖෂධවේදියෙකු හෝ ඖෂධවේදියෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ ලියාපදිංචි ආධුනික ඖෂධවේදියෙකු විසින් සිදු කළ යුතුය.

(iii) ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ අංක 120 අනුව කටයුතු කිරීමේදී වග කිව යුතු ඖෂධවේදියෙකු ඖෂධශාලාවක පූර්ණ කාලීනව සිටීම අනිවාර්ය වන අතර, ලියාපදිංචි ඖෂධවේදීන්ගෙන් සමහරු රජයේ හෝ පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වූවන් වන බැවින් ඔවුන්ට ඖෂධශාලාවක වග කිව යුතු ඖෂධවේදියෙකු ලෙස පූර්ණ කාලීනව සිටිය නොහැක. රජයේ හෝ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වන පුද්ගලයින් විසින් ඔසුසල් සඳහා අයදුම් කර ඇති බැවින් ආසන්න වශයෙන් ඔසුසල් 200ක පමණ සංඛ්‍යාවක බලපත්‍ර අලුත් කිරීම මේ වන විට ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් තාවකාලිකව අත්හිටුවා ඇත.

(iv) පෞද්ගලික අංශයේ ඖෂධවේදීන්ගේ නිහය පියවීම සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් විසින් 2025.01.10 දිනැතිව කමිටුවක් පත් කර ඇත. ඊට අදාළ ලිපිය ඇමුණුමෙහි දක්වා ඇත.

`ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාල සභාව විසින් පවත්වන බාහිර ඖෂධවේදී විභාගයට පෙනී සිටීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමට අවම ලෙස අ.පොස. (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයක් ලබා තිබීම ප්‍රමාණවත්ය.

(ii) අවසන් වරට පවත්වන ලද 2023 වසරට අදාළ බාහිර ඖෂධවේදී විභාගය සඳහා 1,697ක අයදුම්කරුවන් සංඛ්‍යාවක් සුදුසුකම් ලැබුවත්, ඉන් විභාගය සඳහා පෙනී සිටියේ 1,487ක සංඛ්‍යාවකි. ඉන් ලිඛිත, ප්‍රායෝගික හා වාචික පරීක්ෂණ යන කොටස් තුනෙන්ම සමත් වී ඇත්තේ අයදුම්කරුවන් 100දෙනෙකු පමණි. එය සියයට 6.7ක ප්‍රමාණයක් පමණි.

(ඇ) පැන නොනඟී.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත අනුව අපි දන්නවා, ශ්‍රී ලංකාවේ ඖෂධවේදීන්ට වෛද්‍යවරයකුගේ අවසරයකින් තොරව කිසිදු බෙහෙතක් නිකුත් කරන්න බැහැ කියලා. ඒ අනුව විශේෂයෙන්ම antibiotics නිකුත් කරන්න බැරි බවත් අපි දන්නවා. ගරු ඇමතිතුමනි, හැබැයි මේ වන කොට ශ්‍රී ලංකාවේ ඖෂධවේදීන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අපේ රටේ සාමාන්‍ය ජනතාව පුරුදු වෙලා ඉන්නවා, තමන්ට වෛද්‍යවරයෙකුගෙන් අනුමැතියක් නොමැතිව වුණත්, ෆාමසියකට ගිහින් metformin පෙත්තක්, atorvastatin පෙත්තක්, losartan පෙත්තක් ආදිය මිල දී ගන්න.

ඒක සාමාන්‍යයෙන් අපේ රටේ ජනතාව පුරුදු වෙලා ඉන්න තත්ත්වයක්. හැබැයි, අපේ රටේ ජනතාව ගිහිල්ලා ඉල්ලුවාම, ෆාමසියකින් ඒ බෙහෙත නිකුත් කළොත් ඒගොල්ලන්ට විශාල දඩයක් ගහනවා; උසාවියෙන් දඩයක් ගහනවා. ඒකත් කමක් නැහැ කියමුකෝ. හැබැයි, ප්‍රධානම කාරණාව තමයි, ඊට පස්සේ ප්‍රසිද්ධ පුවත් පතක භාෂා තුනෙන්ම තමුන් ඒකට වරදකරු යැයි කියලා දැන්වීමක් - ad එකක් - පළ කරන්න ඕනෑ. ඒක කොතෙක් දුරට සාධාරණ ද, එය අයින් කළ හැකිද කියන කරණාව තමයි මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ඇත්තටම ඔය නීතිය ලංකාවේ පවතින එකක් නොවෙයි. ලෝකයේ හුඟක් රටවල පවතින එකක්. පාරිභෝගිකයාගේ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ආරක්ෂාව සඳහා තමයි ඇත්තටම ඒක දාලා තිබෙන්නේ. ඖෂධ වර්ග කරලා තිබෙනවා, ෆාමසිවල. ඒ අනුව, over-the-counter ගන්න පුළුවන් ඖෂධ තිබෙනවා. දැන්, පැරසිටමෝල් වාගේ එකක් ඕනෑ කෙනෙකුට ගිහිල්ලා ගන්න පුළුවන්. ඕනෑම රටක ඒ වාගේ ඖෂධ මාලාවක් තිබෙනවා, over-the-counter ගන්න පුළුවන්, prescription එකක් අවශ්‍ය නැති. නමුත්, අනෙකුත් ඖෂධ සඳහා ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය අනිවාර්යයෙන්ම අවශ්‍ය වනවා.

තවත් ඖෂධ තිබෙනවා, විශේෂයෙන්ම narcotic පැත්තට වැටෙන ඒවා. ඒවා විශේෂ prescription එකකට සහ විශේෂ ගබඩා කිරීමේ ක්‍රමයකට තමයි දෙන්නේ. ඒ වාගේම ඒවා සම්බන්ධ වූ දත්ත පද්ධති පවත්වාගෙන යන්නත් ඕනෑ. මේ සියල්ල මේ රටේ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් තමයි හදලා තිබෙන්නේ. ඒ නිසා ඒ නීති ඒ විධියටම පවත්වාගෙන යෑම අවශ්‍යයි කියා අපි හිතනවා.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම විශේෂයෙන් මේ කාරණය ඔබතුමාට අවධාරණය කරන්න කැමැතියි. පුංචි වරදක් වුණාම ලක්ෂ හය හතක් දීලා පුවත් පතක ප්‍රධාන පිටුවේ paper advertisement එකක් පළ කරන එක සාධාරණද? ඒ දඬුවම සාධාරණද කියලා මම දැන ගන්න කැමැතියි. නමුත් ඔබතුමා ලබා දුන් පිළිතුර අපි පොදුවේ පිළිගන්නවා.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

අපේ රටේ ඒ වාගේ දෙයක් ගැන සලකා බලන්න පුළුවන්. නමුත්, එවැනි දේවල් සඳහා අනිවාර්යයෙන්ම අපේ රටේ නීති තිබිය යුතුයි කියන ස්ථාවරයේ තමයි අපි ඉන්නේ.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්තටම අපේ රටේ pharmacistsලාට ඒ විධියට නීති අණපනත් ක්‍රියාත්මක වුණත්, වෛද්‍යවරු ඖෂධ රැස් කරගෙන ඒ ඖෂධ ලෙඩ්ඩුන්ට අළෙවි කරනවා. ඇත්තටම ඒක පිළිගත් ක්‍රමයක් නොවෙයි. එවැනි දේවල් නියාමනය කරන්න කුමක් හෝ ආයතනයක් තිබෙනවාද? එහෙම නැත්නම්, ඉදිරියේදී එවැනි ආයතනයක් ඇති වෙයි කියලා අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ඒ සඳහා පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමන පනතක් තිබෙනවා. ඒ වාගේම ඒකට සම්බන්ධ කාර්යාලයක් අපේ අමාත්‍යාංශයේ තිබෙනවා. පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යන හැම කෙනෙක්ම, private hospitals පවත්වාගෙන යන හැම කෙනෙක්ම එහි ලියාපදිංචි කළ යුතුයි. එම පනතේ පැහැදිලිව දක්වා තිබෙනවා, ඒ අය කොහොමද ඖෂධ කළමනාකරණය කරන්න ඕනෑ කියලා. නමුත්, අවාසනාවකට වාගේ නොයෙකුත් හේතු නිසා, විශේෂයෙන්ම වෘත්තීය සමිතිවල බලපෑම් නිසා එම ලියාපදිංචි වීම හරියට සිද්ධවෙලා නැහැ. ලියාපදිංචි වෙලා නැති නිසා ඒවා නියාමනය කිරීමේ යම් යම් ගැටලු ඇති වී තිබෙනවා. නමුත්, මෑත කාලීනව ගත්තාම ලියාපදිංචි වන ප්‍රමාණය එන්න එන්නම වේගයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා සහ ඔවුන් අපේ guidelines ටික අනුගමනය කරනවා.

මම පිළිගන්නවා, පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය සඳහා මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් යෙදීම අවශ්‍යයි කියලා. ඒක නිසා ඒ සඳහා අමාත්‍යාංශයක් විධියට අපි කටයුතු කරමින් ඉන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

තම්බපවනි සුළං විදුලි බලාගාරය: විස්තර
தம்பபவனி காற்றாலை மின்னுற்பத்தி நிலையம்: விபரம்
THAMBAPAVANI WIND POWER STATION: DETAILS

154/2024

1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க- மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Ajith P. Perera)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මන්නාරම පිහිටුවා ඇති "තම්බපවනී" සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ඉදිකිරීම් සඳහා භාවිත කරන ලද දේශීය ආයෝජන ප්‍රමාණය සහ විදේශීය ආයෝජන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බලාගාරයේ ධාරිතාව - installed capacity - කොපමණද;

(iv) එම බලාගාරයේ විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(v) වර්ෂ 2021 සිට 2024 දක්වා එම බලාගාරය මඟින් ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලද බලශක්ති ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත විදුලි බලාගාරය හේතුවෙන් සංක්‍රමණික කුරුල්ලන්ට සිදු වන හානි වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පියවරවල සාර්ථකත්වය කෙබඳුද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) මන්නාරම දූපතේ තවත් සුළං විදුලි බලාගාර ඉදිකිරීමට විභවයක් තිබේද;

(ii) එසේ නම්, එම සුළං විදුලි බලාගාරවල ධාරිතාවය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னாரில் நிறுவப்பட்டுள்ள "தம்பபவனீ" காற்றாலை மின்னுற்பத்தி நிலையத்தின் நிர்மாணப்பணிகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) மேற்படி நிர்மாணப் பணிகளுக்காகப் பயன்படுத் தப்பட்டுள்ள உள்நாட்டு மற்றும் வெளிநாட்டு முதலீடுகளின் அளவு வெவ்வேறாக யாதென் பதையும்;

(iii) மேற்படி மின்னுற்பத்தி நிலையத்தின் கொள்ளளவு - installed capacity - யாதென் பதையும்;

(iv) மேற்படி மின்னுற்பத்தி நிலையத்தில் மின்சார அலகு ஒன்றை உற்பத்தி செய்வதற்காகச் செலவிடப்படும் பணத்தொகை யாதென் பதையும்;

(v) 2021ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை மேற்படி மின்னுற்பத்தி நிலையம் மூலமாக தேசிய மின் கட்டமைப்புக்குச் சேர்க்கப்பட்டுள்ள வலுசக்தியின் அளவு ஒவ்வோர் ஆண்டு வாரி யாக வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி மின்னுற்பத்தி நிலையம் காரணமாக இடம்பெயரும் பறவைகளுக்கு ஏற்படும் பாதிப்புக்களைத் தடுப்பதற்காக எடுக்கப்பட் டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

(ii) அந்த நடவடிக்கைகள் எவ்வாறு வெற்றி யளித்துள்ளன என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மன்னார் தீவில் மேலும் காற்றாலை மின்னுற்பத்தி நிலையங்களை நிர்மாணிப் பதற்கான சாத்தியம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி காற்றாலை மின்னுற்பத்தி நிலையங்களின் கொள்ளளவு யாதென்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the date on which the construction of the Thambapavani Wind Power Station located in Mannar was commenced;

(ii) the amounts of the local investments and the foreign investments used for the aforesaid construction, separately;

(iii) the installed capacity of the said power station;

(iv) the per unit cost of generating electricity by the said power station; and

(v) the amount of energy added to the National Grid by the said power station in each year from 2021 to 2024, separately?

(b) Will he also inform this House -

(i) the steps that have been taken to prevent the harm caused to migratory birds due to the said power station; and

(ii) the effectiveness of those steps?

(c) Will he further inform this House -

(i) whether there is potential to construct more wind power stations on the Mannar Island; and

(ii) if so, the capacity of those wind power stations?

(d) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2019.03.04වන දින

(ii) දේශීයව රුපියල් බිලියන 2.1ක් ද විදේශීයව ඇමෙරිකානු ඩොලර් මිලියන 125ක් ද වේ.

(iii) මෙට්‍රික්ටොන් 103.5කි.

(iv) ජනන පිරිවැය රුපියල් 12.19කි. (වැඩිදුර තොරතුරු සඳහා මීට අදාළ පිරිවැය සටහන අමුණුමෙහි** දක්වා ඇත.)

(v)

වර්ෂය	ශුද්ධ බලශක්තිය (ගි.වොෑ.පැය)
2021	318
2022	347
2023	391
2024	383

(ආ) (i) ඒ සඳහා කුරුල්ලන් හඳුනාගැනීමේ පද්ධතියක් ස්ථාපනය කර ඇත. (එමඟින්, ටර්බයින පෙත්තකට මීටර් 500ක් ඇතුළතින් කුරුල්ලෙකු හඳුනා ගතහොත් රේඩාර් පද්ධතිය මඟින් ටර්බයිනය ස්වයංක්‍රීයව නතර කරනු ලබයි.)

(ii) ඒ නිසා කුරුල්ලන්ට සිදුවන හානිය සැලකිය යුතු ලෙස අඩු වී ඇති බැවින් එම පද්ධතිය භාවිත කිරීම සාර්ථක වී ඇත. කෙසේ වෙතත්, පද්ධතිය තවමත් අඛණ්ඩ අධීක්ෂණය සහ සත්‍යාපනය යටතේ - under continuous monitoring and verification - පවතී.

(ඇ) (i) ඔව්.

(ii) 2014 වසරේදී ආසියානු සංවර්ධන බැංකුවෙහි තාක්ෂණික සහාය ඇතිව සකසන ලද "මන්නාරම දිස්ත්‍රික්කයේ සුළං විදුලි ජනන සංවර්ධන ප්‍රධාන සැලැස්ම" ට අනුව මන්නාරම දූපත තුළ මෙගාවොට් 300ක විභවයක් හඳුනා ගන්නා ලදී. කෙසේ වෙතත් ඉන් අනතුරුව සිදුකරන ලද සවිස්තරාත්මක අධ්‍යයනයන්ට අනුව සමස්ත විභවය මෙගාවොට් 400ක් ලෙස දක්වා ඇත.

ධාරිතාව	විස්තරය
103.5	ලංවිම තම්බපවනි සුළං විදුලි බලාගාර උද්‍යානය
50	දැනට ටෙන්ඩර් ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.
250	ඉදිරියේදී ක්‍රියාත්මක කළ හැකි විභවයන්

(ඇ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

හපුතලේ සහ හල්දුම්මුල්ල ප්‍රා.ලේ. කොට්ඨාස: LRC සහ රජයට අයත් ඉඩම්

ஹப்புத்தளை மற்றும் ஹல்தமுல்லை பிரதேச செயலாளர் பிரிவுகள்: LRC மற்றும் அரசுக்கு சொந்தமான காணிகள்

HAPUTALE AND HALDUMMULLA DS DIVISIONS: LANDS BELONGING TO LRC AND THE STATE

253/2024

2. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා වෙනුවට)

(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு ரவீந்திர பண்டார சார்பாக)

(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Ravindra Bandara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් ග්‍රාම නිලධාරී වසම් අනුව වෙන් වෙන් වශයෙන් හෙක්ටෙයාරවලින් කොපමණද;

(iii) එම ඉඩම්වලින් දෙවැනි පාර්ශ්ව වෙත ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද;

(iv) එම එක් එක් දෙවැනි පාර්ශ්වයේ නම, එම පාර්ශ්වයට ඉඩම් ලබා දී ඇති ස්ථානය සහ ලබා දී ඇති පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් නොවන, රජයේ ඉඩම් පිහිටි ස්ථාන හා ප්‍රමාණය හෙක්ටෙයාරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මේ වනවිට හඳුනාගෙන ඇති කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද;

(iii) එම ඉඩම් අතරින් මේ වනවිට වගා කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹப்புத்தளை மற்றும் ஹல்தமுல்லை பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகளின் அளவு ஹெக்டயார்களில் எவ்வளவு என்பதையும்;

(ii) அந்தக் காணியின் அளவு ஒவ்வொரு கிராம அலுவலர் பிரிவின் பிரகாரம் ஹெக்டயார்களில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி காணிகளில் இரண்டாம் தரப்பினருக்கு வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு ஹெக்டயார்களில் எவ்வளவு என்பதையும்;

(iv) அந்த ஒவ்வோர் இரண்டாம் தரப்பினரதும் பெயர், அத்தரப்பினருக்கு காணிகள் வழங்கப் பட்டுள்ள இடம் மற்றும் வழங்கப்பட்டுள்ள அடிப்படை என்பவை வெவ்வேறாக யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி பிரதேச செயலாளர் பிரிவுகளில், காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமற்ற அரச காணிகள் அமைந்துள்ள இடங்கள் மற்றும் அளவுகள் ஹெக்டயார்களில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி பிரதேச செயலாளர் பிரிவுகளில் இது வரையில் இனங்காணப்பட்டுள்ள விவசாயக் காணிகளின் அளவு ஹெக்டயார்களில் எவ்வளவு என்பதையும்;

(iii) அக்காணிகளுள் இன்றளவில் பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்டுள்ள காணிகளின் அளவு ஹெக்டயார்களில் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the total area of lands belonging to the Land Reform Commission situated in the Haputale Divisional Secretary's Division and the Haldummulla Divisional Secretary's Division in hectares;

(ii) the extent of the said lands as per their Grama Niladhari Divisions, separately in hectares;

(iii) the extent of lands, out of the lands concerned, that have been given to second parties in hectares; and

(iv) the name of each of the said second party, the location of the land thus granted to each such party and the basis on which the land has been granted to each person, separately?

(b) Will he also inform this House -

(i) the places where lands belonging to the State, but do not belong to the Land Reform Commission are located in the Divisional Secretary's Divisions named above and the extents of lands located in each such place, separately in hectares;

(ii) the extent of agricultural lands that have been identified in the above-named Divisional Secretaries' Divisions in hectares; and

(iii) extent that has been cultivated, out of the agricultural lands concerned, in hectares?

(c) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය - හෙක්ටෙයාර 634.3690

හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය - හෙක්ටෙයාර 2755.2279

(ii) අදාළ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 01)**

(iii) දෙවන පාර්ශ්ව වෙත ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය

<u>නිවාස අරමුණු සඳහා</u>

හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - හෙක්ටෙයාර 10.8703

හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - හෙක්ටෙයාර 197.8005

<u>බදු පදනම මත</u>

හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - හෙක්ටෙයාර 12.6483

හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - හෙක්ටෙයාර 0.6287

වැඩි විස්තර ඇමුණුම 02හි** දක්වා ඇත.

(iv) අදාළ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 03)**

(ආ) (i) අදාළ ලේඛනය අමුණා ඇත.

(හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ඇමුණුම 04 හි** දැක්වෙන වගුවේ A තීරුව මඟින් දැක්වේ.)

හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් නොවන ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 545.2ක් පමණ වේ.

(ii) අදාළ ලේඛනය අමුණා ඇත.

(හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ඇමුණුම 04 හි දැක්වෙන වගුවේ B තීරුව මඟින් දැක්වේ)

හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 84.480 පමණ වේ.

(iii) අදාළ ලේඛනය අමුණා ඇත.

(හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ඇමුණුම 04 හි දැක්වෙන වගුවේ C තීරුව මඟින් දැක්වේ)

හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය අතුරින් වගා කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 42.377

(ඇ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පුත්තලම මූලික රෝහල: නිසි ජලාපවහන පද්ධතියක් ලබා දීම
புத்தளம் ஆதார வைத்தியசாலை: முறையான வடிகான் அமைப்பு
BASE HOSPITAL, PUTTALAM: INSTALATION OF PROPER DRAINAGE SYSTEM

292/2024

3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரஊப் ஹகீம் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rauff Hakeem)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අධික වැසි නිසා ඇති වූ ජල ගැලීම් හේතුවෙන් පුත්තලම මූලික රෝහලේ නේවාසික වාට්ටු, බාහිර රෝගී අංශ, සායන ඇතුළුව රෝහල් පරිශ්‍රය ජලයෙන් යට වූ බවත්;

(ii) එම රෝහලේ අපජලය බැහැර කිරීමට සහ වැසි ජලය බැස යෑමට කාණු පද්ධතියක් නොමැති බවත්;

(iii) රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන රෝහල් පරිශ්‍ර වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යා යුතු බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) එසේ නම්, ඉහත රෝහල් පරිශ්‍රය වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යෑම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024ஆம் ஆண்டு நவம்பர் மாதத்தில் இலங்கையில் பெய்த கடும் மழையால் ஏற்பட்ட வெள்ளப் பெருக்குக் காரணமாக புத்தளம் ஆதார வைத்திய சாலையின் நோயாளர் தங்கும் விடுதிகள், வெளிநோயாளர் பிரிவுகள், சிகிச்சைப் பிரிவுகள் உள்ளிட்ட வைத்தியசாலை வளாகம் வெள்ளத்தால் மூழ்கியதென்பதையும்;

(ii) மேற்படி வைத்தியசாலையில் கழிவு நீரை வெளியேற்றவும், மழைநீர் வழிந்தோடவும் வடிகான் தொகுதி இல்லையென்பதையும்;

(iii) நோயாளர்களுக்குச் சிகிச்சை வழங்கும் வைத்திய சாலை வளாகங்கள் மிகவும் பாதுகாப்பாகப் பராமரிக்கப்படல் வேண்டுமென்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) ஆமெனில், மேற்படி வைத்தியசாலை வளாகத்தை மிகவும் பாதுகாப்பாகப் பராமரிப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Does he accept that -

(i) the premises of the Puttalam Base Hospital including its residential wards, OPDs and clinics, were inundated due to the heavy floods caused by the heavy rain that fell in November, 2024 in Sri Lanka;

(ii) the hospital lacks a proper drainage system to dispose of the hospital's waste water and to channel the rain water;

(iii) the hospital premises where patients receive treatment must be kept safer?

(b) If so, will he inform this House of the steps that will be taken to keep the aforementioned hospital premises safer;

(c) If not, why?

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2024 නොවැම්බර් මාසයේ ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් පුත්තලම මූලික රෝහලේ වාට්ටු අංක 08 පිහිටා ඇති ප්‍රදේශය ජලයෙන් යට වූ අතර දින දෙකකින් ජලය බැස ගියේය.

(ii) පුත්තලම රෝහලේ අපජලය බැස යෑම සඳහා කාණු පද්ධතියක් සකස් කර අති අතර එම කාණු පද්ධතියේ වැඩිදියුණු කිරීම සිදු කිරීමට ඇත.

(iii) ඔව්.

(ආ) පුත්තලම රෝහලේ අපජලය පද්ධතිය (පල්දෝරු පද්ධතිය) වැඩිදියුණු කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ඇස්තමේන්තුවක් සකස් කර ඇත. ඒ සඳහා 2025 වසරේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිපාදන වෙන්කොට අදාළ වැඩිදියුණු කිරීම සිදු කිරීමට නියමිතව ඇත.

(ඇ) පැන නොනඟී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ පෞද්ගලික සමාගම් සතු පර්යන්ත: මෙහෙයුම්

இலங்கைத் துறைமுக அதிகாரசபை மற்றும் தனியார் நிறுவனங்களினால் கையாளப்படும் முனையங்கள்: செயற்பாடுகள்

TERMINALS HANDLED BY SRI LANKA PORTS AUTHORITY AND PRIVATE COMPANIES: OPERATIONS

304/2024

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රවී කරුණානායක මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Ravi Karunanayake)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු සහ පෞද්ගලික සමාගම් සතු එක් එක් පර්යන්තයට පැමිණි නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී කාල සීමාව තුළ එම එක් එක් පර්යන්ත විසින් මෙහෙයවන ලද බහලුම් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී කාල සීමාව තුළ එම එක් එක් පර්යන්තය ලැබූ මෙහෙයුම් ලාභය කොපමණද;

(iv) එකී කාල සීමාව සඳහා අධිකාරිය විසින් උපයන ලද ආදායම සහ ලාභය කොපමණද;

(v) ඉහත අංක (i) හි සඳහන් එක් එක් පර්යන්තය විසින් පැයකට මෙහෙයවන ලද බහලුම් සංඛ්‍යාව අනුව එම එක් එක් පර්යන්තයේ කාර්යක්ෂමතාව කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ මෙහෙයවන ලද මුළු බහලුම් සංඛ්‍යාව සහ සාමාන්‍ය භාණ්ඩ ප්‍රමාණය (ටොන්වලින්) කොපමණද;

(ii) ඉදිරි වසර දහය තුළ මෙහෙයවීමට නියමිත ප්‍රක්ෂේපිත බහලුම් සංඛ්‍යාව සහ සාමාන්‍ය භාණ්ඩ ප්‍රමාණය (ටොන්වලින්) කොපමණද;

(iii) පසුගිය වසර පහ තුළ බහලුම් මෙහෙයවීම අනුව ශ්‍රී ලංකාවට ලැබී ඇති ලෝක ශ්‍රේණිගත කිරීම කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இற்றை வரை இலங்கைத் துறைமுக அதிகாரசபை மற்றும் தனியார் நிறுவனங்களுக்குச் சொந்தமான ஒவ்வொரு முனையத்துக்கும் வந்தடைந்த கப்பல்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அதே காலப்பகுதியில் அந்த முனையங்கள் ஒவ்வொன்றினாலும் கையாளப்பட்ட கொள் கலன்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அதே காலப்பகுதிக்கான அத்தகைய முனையங்கள் ஒவ்வொன்றினதும் தொழிற் பாட்டு இலாபம் எவ்வளவு என்பதையும்;

(iv) அதே காலப்பகுதியில் அதிகாரசபையால் ஈட்டப் பட்ட வருமானம் மற்றும் இலாபம் எவ்வளவு என்பதையும்;

(v) மேலே இல.(1) இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு முனையங்களின் வினைத்திறன், அத்தகைய ஒவ்வொரு முனையத்தாலும் ஒரு மணி நேரத்துக்குக் கையாளப்பட்ட கொள்கலன்களின் எண்ணிக்கையின் அடிப்படையில் எவ்வளவு என்பதையும்;

வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை இலங்கையில் கையாளப்பட்ட கொள் கலன்கள் மற்றும் பொதுச் சரக்குகளின் மொத்த எண்ணிக்கை (தொன்களில்) யாதென்பதையும்;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) அடுத்த பத்து ஆண்டுகளில் கையாள்வதற்கு எதிர்பார்க்கப்படும் கொள்கலன்கள் மற்றும் பொதுச்சரக்குகளின் எண்ணிக்கை (தொன்களில்) யாதென்பதையும்;

(iii) கடந்த 5 ஆண்டுகளில் கொள்கலன் கையாளுதலில் இலங்கையின் உலகத் தரவரிசை யாதென்பதையும்;

வெவ்வேறாக அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House, separately -

(i) the number of ships arrived at each terminal owned by the Sri Lanka Ports Authority and private companies from 2015 to date;

(ii) the number of containers handled by each of those terminals during the same period;

(iii) the operational profit of each of those terminals for the same period;

(iv) the income and profit earned by the Authority for the same period; and

(v) the efficiency of each of the terminals mentioned in the (a)(i) above by means of the number of containers handled per hour by each of those terminals?

(b) Will he also inform this House, separately -

(i) the total number of containers and general cargo (in tonnes) handled in Sri Lanka from 2020 to 2024;

(ii) the projected number of containers and general cargo (in tonnes) to be handled over the next ten years; and

(iii) Sri Lanka's world ranking in container handling over the past five years?

(c) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ)

(i)

එක් එක් පර්යන්තයට පැමිණි නැව් සංඛ්‍යාව

TERMINAL	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
JCT	1,495	1,349	1,277	1,250	1,220	1,132	1,104	1,131	1,247	1,130
ECT	0	0	0	0	0	26	181	169	261	198
UCT	121	111	75	92	135	93	1	4	13	6
OTHER	0	0	0	0	0	1	0	0	0	2
SAGT	1,026	1,087	1,073	1,152	1,016	926	867	837	1,000	937
CICT	1,001	1,257	1,258	1,245	1,233	1,103	1,027	1,146	1,369	1,248
PORT OF COLOMBO	3,643	3,804	3,683	3,739	3,604	3,281	3,180	3,287	3,890	3,521

(ii)

එක් එක් පර්යන්තය විසින් මෙහෙයවන ලද බහළුම් සංඛ්‍යාව (TEUs)

TERMINAL	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
JCT	2,138,007	2,001,812	1,948,737	2,213,572	2,158,972	1,976,138	1,808,115	1,579,136	1,460,466	1,913,445
UCT	114,316	98,305	61,965	90,962	123,646	79,925	150	585	9,124	3,086
ECT	-	-	-	-	-	41,741	390,069	346,174	495,541	496,631
SAGT	1,371,245	1,632,207	1,809,835	2,066,758	2,052,153	1,872,052	1,838,693	1,752,236	1,763,863	2,025,840
CICT	1,561,899	2,002,599	2,388,531	2,676,194	2,893,566	2,884,906	3,212,331	3,184,053	3,220,918	3,353,067
PORT OF COLOMBO	5,185,467	5,734,923	6,209,068	7,047,486	7,228,337	6,854,762	7,249,358	6,862,184	6,949,912	7,792,069

(iii)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

මූල්‍ය වර්ෂය (ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා)	ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් ලාභය (ශ්‍රී.ලං.රු.)
2015	9,179,602,488.00
2016	14,334,066,922.00
2017	14,394,984,263.00
2018	20,143,491,068.00
2019	14,509,281,626.00
2020	20,529,162,841.00
2021	24,865,590,147.00
2022	47,496,760,820.00
2023	36,329,649,543.00

සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්

මූල්‍ය වර්ෂය (ජනවාරි 01 දින සිට මාර්තු 31 දින දක්වා)	සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් හි මෙහෙයුම් ලාභය (එ.ජ.ඩො.)
2015	31,738,852.00
2016	28,055,589.00
2017	31,507,056.00
2018	40,337,310.00
2019	39,689,100.00
2020	38,214,101.00
2021	30,988,098.00
2022	43,226,177.00
2023	51,062,806.00
2024 මාර්තු 31	43,534,504.00

කලම්බු ඉන්ටනැෂනල් කන්ටේනර් ටර්මිනල්

මූල්‍ය වර්ෂය (ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා)	කලම්බු ඉන්ටනැෂනල් කන්ටේනර් ටර්මිනල් හි මෙහෙයුම් ලාභය (එ.ජ.ඩො.)
2015	30,056,262.11
2016	44,765,648.05
2017	65,700,044.31
2018	73,262,258.85
2019	75,511,439.34
2020	75,356,486.84
2021	89,051,278.07
2022	91,924,484.82
2023	87,752,890.92

(iv)

මූල්‍ය වර්ෂය (ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා)	ආදායම	ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් ලාභය	වර්ෂයේ ලාභය
	ශ්‍රී.ල.රු.	ශ්‍රී.ල.රු.	ශ්‍රී.ල.රු.
2015	35,128,354,069.00	9,179,602,488.00	(14,168,555,873.00)
2016	36,799,110,383.00	14,334,066,922.00	1,035,725,890.00
2017	35,389,455,404.00	14,394,984,263.00	12,095,478,542.00
2018	38,546,124,626.00	20,143,491,068.00	4,247,246,073.00
2019	40,769,627,957.00	14,509,281,626.00	11,646,339,054.00
2020	38,930,948,198.00	20,529,162,841.00	18,738,343,769.00
2021	45,454,580,320.00	24,865,590,147.00	20,695,251,889.00
2022	68,696,429,000.00	47,496,760,820.00	42,319,195,558.00
2023	63,261,171,026.00	36,329,649,543.00	19,940,065,689.00

(v)

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයවන ලද බහළු සංඛ්‍යාව - පැයට මෙහෙයුම් (මෙහෙයුම් වාර/පැය)

TERMINALS	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
JCT	22.23	24.82	24.98	24.81	23.80	21.52	20.48	22.14	22.95	19.37
UCT	20.67	20.94	22.25	17.92	17.65	16.23	7.05	8.49	10.48	10.82
ECT	-	-	-	-	-	13.78	23.96	26.37	27.91	22.99

[ගරු බිමල් රත්නායක මහතා]

(ආ)

(i)

නැව්බඩු මෙහෙයුම් චාරිත්‍රවය මෙට්‍රික් ටොන් වලින් – කොළඹ වරාය

	2020	2021	2022	2023	2024
බහළුම්ගත නැව් බඩු(මෙ.ටො.)	88,787,135	94,595,193	89,920,386	93,403,066	107,223,929
බහළුම්ගතනොවන නැව් බඩු(මෙ.ටො.)*	8,894,157	9,228,581	6,249,425	6,270,522	7,369,981

* බහළුම්ගත නොවන නැව්බඩු = පොත කඩන+ වියළි තොග+ දුවතොග

(ii) කරුණාකර ඇමුණුම (1) බලන්න.

Table : Container Forecast to 2050

Containers		2019	2020	2025	2030	2040	2050
Gateway							
High Case	'000 TEU	-	-	1,650	2,130	2,880	3,450
Base Case	'000 TEU	1,273	1,223	1,572	1,900	2,390	2,754
Transhipment							
High Case	'000 TEU	-	-	7,850	11,240	19,360	25,700
Base Case	'000 TEU	5,802	5,329	6,215	8,701	14,103	16,518
Total – High Case	'000 TEU	-	-	9,490	13,370	22,240	29,150
Total – Base Case	'000 TEU	7,075	6,550	7,768	10,577	16,463	19,237

Note: Forecast for containers excludes re-stowage that has been assumed for the financial & economic assessments as 2.0% of total for gateway & transhipment.


The forecasts for other cargo types are presented in the table below for the base forecast up to 2050.

Table : Other Trades Forecast to 2050

Cargo Type	Unit	2019	2020	2025	2030	2040	2050
Cement	'000 tons	1,850	1,840	2,771	2,000	2,440	2,400
Wheat / Maize / Corn	'000 tons	169	183	261	294	355	349
Fertiliser	'000 tons	400	405	415	-	-	-
Total – Dry Bulk		2,419	2,428	3,447	2,294	2,795	2,749
General Cargo	'000 tons	641	626	1,575	772	1,000	1,232
RoRo	Vehicles	6,743	3,882	13,998	14,633	41,74	47,982
Crude Oil	'000 tons	1,842	2,009	2,009	2,009	2,009	2,009
Refined Products	'000 tons	3,722	4,244	3,847	767	1,957	2,656
Total – Liquid Bulk ex Bunker & LNG	'000 tons	5,564	6,253	5,856	2,776	3,966	4,665
Bunker	'000 tons	1,123	1,135	1,441	1,823	2,496	2,860
LNG	'000 tons	-	-	1,053	1,024	1,732	2,629
Cruise Arrivals	Vessels	56	14	147	165	185	207

Development Options and Preferred Option

A range of development options were considered and a shortlist of five options assessed in greater depth, using multi-criteria analysis. Two options D5A and D6 provided the best overall fit, with Option D6 slightly preferred, as shown below.



(iii) -

2019 : කොළඹ වරාය, ගෝලීය වශයෙන් 25 වන වඩාත්ම කාර්යබහුල බහළු මෙහෙයුම් වරාය ලෙස හිමිකරගෙන ඇති ස්ථානය ආරක්ෂා කර ගනිමින් 2019 වර්ෂයේ දී ආසන්න වශයෙන් බහළු විස්සේ සම ඒකක (TEUs), මිලියන 7.23 ක් මෙහෙයුම් කරන ලදී. -World Shipping Council

2020 : කොවිඩ් 19 වසංගතය තත්ත්වයේ අභියෝගය හමුවේ, කොළඹ වරාය ලෝකයේ වඩාත්ම කාර්යබහුල වරායයන් අතර පසු වූ 25 වන ස්ථානය තවදුරටත් රැකගනිමින් බහළු විසසේ සම ඒකක මිලියන 6.86ක් මෙහෙයුම් කරමින් එහි කාර්ය සාධනය පවත්වා ගැනීමට සමත්විය. - World Shipping Council

2021 : 2021 වර්ෂයේ දී කොළඹ වරාය බහළු විස්සේ සම ඒකක මිලියන 7.25ක් මෙහෙයුම් කරමින් 6% ක වර්ධනයක් අත්විඳිමින් එහි ගෝලීය ශ්‍රේණිගත කිරීම 22 වන ස්ථානය දක්වා ඉහළ නංවා ගැනීමට සමත් විය. Xinhua News

2022 : බහළු විස්සේ සම ඒකක මිලියන6.94 ක් මෙහෙයුම් කරමින් සහ ගෝලීය ශ්‍රේණිගත කිරීමවල 25 වන ස්ථානය තවදුරටත් ආරක්ෂාකරගනිමින් කොළඹ වරාය එහි ඉදිරිගමන්මග අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. - World Shipping Council

2023 :2023 වර්ෂයේ දී, ලෝකයේ වඩාත්ම කාර්යබහුල බහළු වරායයන් අතර 25 වන ස්ථානයේ පසුවෙමින් බහළු විස්සේ සම ඒකක මිලියන 6.94 ක් මෙහෙයවන ලදී. - World Shipping Council

(ඇ) පැන නොනගී

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2025, පහළොස්වන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: මාර්තු 06]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 06]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 06th March]
[HON. SPEAKER in the Chair.]

117 වන ශීර්ෂය,- ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාවරයා

01 වන වැඩසටහන,- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,133,000,000

தலைப்பு 117.- போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,133,000,000

HEAD 117.- MINISTER OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,133,000,000

123 වන ශීර්ෂය.- නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,275,000,000

தலைப்பு 123.- நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,275,000,000

HEAD 123.- MINISTER OF URBAN DEVELOPMENT, CONSTRUCTION AND HOUSING
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,275,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 117, 306, 307 සහ 336; නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 123, 309 සිට 311 සහ 332.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. S.M. Marikkar. You have 25 minutes.

[පූ.භා. 9.49]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.07වන සිකුරාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 117, 306, 307, 336, 123, 309 සිට 311 සහ 332 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අද දින ලංකාවේ වැදගත්ම අමාත්‍යාංශ දෙකක් වන ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයටත්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශයටත් අයත් විෂයයන් ගණනාවක් විවාදයට ගැනීමට නියමිතයි. විශේෂයෙන්ම නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශය ගැන කථා කළොත්, ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය කියලා කියන්නේ 2019ට පෙර, විශේෂයෙන්ම පාස්කු ඉරිදා ප්‍රහාරයට පෙර ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 8ක්, 9ක් වාගේ දායකත්වයක් ලබා දුන් ක්ෂේත්‍රයක්.

ඒ වාගේම මිලියන 1.4ක් - ලක්ෂ 14ක් - වැනි පිරිසකට රැකියා අවස්ථා ලබා දුන් ක්ෂේත්‍රයක්. නමුත්, අද වෙනකොට ආර්ථික අර්බුදයත්, පොලී අනුපාත ඉහළ යෑමත්, අමුද්‍රව්‍ය මිල ඉහළ යෑමත්, ඩොලරයේ අගයත් කියන කාරණා මත ඉදිකිරීම් ක්ෂේත්‍රය දැවැන්ත අර්බුදයකට මුහුණ පා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, 2018 වෙනකොට ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය export කරන level එකට එමින් පැවතුණා. නමුත්,

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පසුගිය සතිය වෙනකොට ලංකාවේ මේ ක්ෂේත්‍රය පිට රටවලින් ආක්‍රමණය කරන level එකට ඇවිල්ලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා විශේෂයෙන්ම අපි රජයට යෝජනාවක් කරන්න කැමැතියි. ගරු අගමැතිතුමියනි, පසුගිය දවස්වල ඩුබායිවලින් ඇවිල්ලා, එහේ ගෙවල් ගන්න කියලා මෙහේ promote කළා. මොකටද ඒ? අපේ රටින් ඩොලර් අදින්න. ඕස්ට්‍රේලියාවෙන් ඇවිල්ලා මෙහේ exhibitions තියනවා, මෙහේ අයට එහේ ගෙවල් මිලදී ගන්න කියලා. මේක අපේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට ලොකු ප්‍රශ්නයක් කියලා මම හිතනවා. අපි පිට රටවල එම ක්ෂේත්‍රය ජයග්‍රහණය කරන්නේ කොහොමද කියලා තමයි දැන් අපි බලන්න ඕනෑ. එහෙම කරනවා විනා, අපේ රට ඇතුළේ තිබෙන ඩොලර් ප්‍රමාණය ගෙනයන්න ඉඩදෙන එක අපට පාඩුයි කියන එක තමයි විශේෂයෙන්ම කියන්න තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, අපි පැහැදිලිව කියනවා, අද වෙනකොට මේ ඉදිකිරීම් ක්ෂේත්‍රය අභියෝග ගණනාවකට මුහුණ දී තිබෙන බව. බදු පිට බදු පනවලා මේ ක්ෂේත්‍රය විශාල අර්බුදයකට ගෙන ගිහින් තිබෙනවා. උදාහරණයක් වශයෙන්, කිසියම් සමාගමක් මොකක් හෝ housing project එකකට invest කළොත් ඒ සම්පූර්ණ ආයෝජනයෙන් සියයට 40ක් විතර රජයට ගෙවන්න ඕනෑ. ඉඩම මිලදී ගන්නකොට සියයට 4ක් මුද්දර ගාස්තු ගෙවන්න ඕනෑ. ඊට පසුව plan එක අනුමත කරගන්න ගියාම UDA එකට, අදාළ පළාත් පාලන ආයතනවලට ගෙවන්න ඕනෑ. Construction එක කරද්දී සිමෙන්තිවලට, යකඩවලට, වානේවලට, වීදුරුවලට - ඒ ඔක්කොටම - බදු ගෙවන්න ඕනෑ.

ඊට පසුව ඒක නැවත විකුණද්දී සියයට 18ක VAT එකක් ගෙවන්න ඕනෑ. ඊළඟට, මිලදී ගන්නා විසින් නැවත සියයට 4ක මුද්දර ගාස්තුවක් ගෙවන්න ඕනෑ. සමාගම් බද්ද සියයට 30ක් ගෙවන්න ඕනෑ. ඊට පස්සේ profit එකක් තිබුණොත් shareholdersලාට තවත් සියයට 15ක බද්දක් ගෙවන්න ඕනෑ. ආණ්ඩුවට ප්‍රධාන ආදායම් මාර්ගයක් තමයි ඉදිකිරීම් ක්ෂේත්‍රය කියන්නේ. ඒ නිසා පටන් ගන්නකොටම මේ ආකාරයට මිරිකලා ආදායම ගන්න බැහැ. ඒ නිසා ඒ අයට ආයෝජන අවස්ථා දීලා, හම්බ කරන්න අවස්ථාව දීලා, ඒ හම්බ කරන එකෙන් profit එකක් ගන්න එක, tax එකක් අය කරන එක තමයි වඩා උචිත වෙන්නේ, ගරු ඇමතිතුමනි. ගරු සභාපතිතුමනි, මොකද ඔවුන් හම්බ කළේ නැත්නම්, ආදායමක් ගන්න බැහැ. ඒ වාගේම තවත් දෙයක් තිබෙනවා. ඒ තුළ සිටින වෘත්තියවේදීන් PAYE Tax එකකුත් ගෙවන්න ඕනෑ, සියයට 36ක. විශාල ආදායම් ප්‍රමාණයක් එන ක්ෂේත්‍රයක් තමයි මේ ඉදිකිරීම් ක්ෂේත්‍රය කියන්නේ. ඒ නිසා එය ප්‍රවර්ධනය කිරීම රජයේ වගකීමක් කියලා මම විශ්වාස කරනවා.

ඊළඟට, ලංකාවේ නිවාස ප්‍රශ්නය සම්බන්ධයෙන් මම පැහැදිලිවම මේ කාරණය කියන්න ඕනෑ. ආණ්ඩුවෙන්ම, UDA එකෙන්ම ඔක්කෝම ගෙවල් හදලා දෙනවාය කියන එක ප්‍රායෝගික නැහැ. දියුණු රටවල නම් 80:20 ප්‍රමිතියට තමයි යන්නේ. අපි එතැනට ළඟා වෙන්න තියා හිතන්නත් අමාරුයි. 2030 වෙද්දිවත් ඒ ප්‍රමිතියට ළඟා වෙන්න පුළුවන් ඉලක්කයක් තිබෙනවාද කියලා ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම අපි අමාත්‍යාංශයට යෝජනාවක් කරන්න කැමැතියි, ගරු සභාපතිතුමනි. ලෝකයේ දියුණු රටවල් අරගෙන බැලුවාම, ඒ රටවල් කරන දේවල්වලින් අපටත් කොච්චර ඉස්සරහට යන්න පුළුවන්ද කියලා බලන්න ඕනෑ. Smart city සංකල්පය බලන්න. Smart city සංකල්පය ගැන අපි තවම හිතලාවත් නැහැ. ඒ සම්බන්ධව UDA එකෙන් සැලසුම් කරලා තිබෙනවාද කියලාවත් මම දන්නේ නැහැ. එහෙම එකක් හිතලා තිබෙනවාද කියන ප්‍රශ්නයත් තිබෙනවා. හැබැයි, අපි එතැනට ගියේ නැත්නම්, අනාගතයේදී හොඳ ජීවිතයක්, ලස්සන ජීවිතයක් ගතකිරීම කෙසේ වෙතත් තරගකාරීව කලාපයේ ඉන්න පුළුවන්ද කියන ප්‍රශ්නයත් මතු වෙනවා.

ඒකට හේතුව මොකක්ද? ගරු සභාපතිතුමනි, ආසියානු කලාපයේ ඉදිකිරීම්වල පිරිවැය අධිකම රටක් බවට දැනටම ලංකාව පත්ව තිබෙනවා, number two. ශ්‍රී ලංකාවේ per square metre පිරිවැය බැලුවොත්, ඩොලර් 1,200ක් වෙනවා. අපි සිංගප්පූරුවට විතරයි පහළින් ඉන්නේ. වියට්නාමය, මියන්මාරය, බංග්ලාදේශය, ඉන්දියාව, චීනය කියන ඔක්කෝම රටවල ඉදි කිරීම් පිරිවැය අපට වඩා අඩුයි. ඒ නිසා එම ක්ෂේත්‍රය පිළිබඳව අවධානය යොමු කරන්න කියලා අපි පැහැදිලිව කියන්න කැමැතියි.

වර්තමාන ආණ්ඩුව PPPsවලට -public-private partnership sවලට - යන්න කැමැති නිසා, දැන් අභිලාෂ කැඳවනවා කියනවා. ඒ අභිලාෂ කැඳවලා හෝ smart city සංකල්පය ක්‍රියාත්මක කරන්න. අඩුම වශයෙන් කොළඹ, නුවර, ගාල්ල කියන දිස්ත්‍රික්කවලින් එහාට ගිහිල්ලා අනුරාධපුරය, පොළොන්නරුව, මාතර, හම්බන්තොට වාගේ දිස්ත්‍රික්කවල අක්කර 50 බැගින් අරගෙන හෝ මේ Smart City සංකල්පය ක්‍රියාත්මක කළා නම්, එක නගරයකට කේන්ද්‍රගත නොකර, නැත්නම් නගර දෙකකට කේන්ද්‍රගත නොකර කොළඹින් එළියට, එහෙම නැත්නම් බස්නාහිර පළාතෙන් එළියට අපේ ආර්ථිකය ගෙනියන්න පුළුවන් වෙයි, ගරු ඇමතිතුමනි. එහෙම දර්ශනයක් තිබෙන්න ඕනෑ; එහෙම vision එකක් තිබෙන්න ඕනෑ. මීට අවුරුදු 48කට පෙර තමයි රණසිංහ ප්‍රේමදාස කියන නිවාස ඇමතිවරයාට කොළඹ නගරයේ ගුවන් පාලම් හදන්න, එහෙම නැත්නම් භූගත මාර්ග හදන්න නාගරික සංවර්ධන සැලසුම් තිබුණේ, තාක්ෂණය මෙච්චර නොදියුණු කාලයේත්. ඒ කළ දේවල් නිසා තමයි කොළඹ නගරය එදා මේ තරම් ශීඝ්‍රයෙන් දියුණු වුණේ. මම හිතන විධියට දැන් කාලය ඇවිල්ලා තිබෙනවා, එවැනි සංකල්ප හරහා අපේ රටේ ආර්ථිකය කොළඹින් පිට පළාත්වලට ගෙනියන්න.

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශයටම අයිති විෂයයක් සම්බන්ධයෙන් නිකුත් කළ කැබිනට් පත්‍රිකාවක් මම දැක්කා. ඇත්තටම මම ඒකට රජයට ස්තුතිවන්ත වෙනවා. එම පත්‍රිකාව අනුව කොළොන්නාව ප්‍රදේශයේ ගංවතුර පාලනය සඳහා කැබිනට් කමිටුවක් සහ තවත් කමිටුවක් පත් කරලා තිබෙනවා.

දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන මේ ප්‍රශ්නයට අපේ රජය පැවති කාලයේ සැලකිය යුතු මට්ටමින් යම් විසඳුමක් ලබා දීලා තිබෙනවා. ඉතිරි ටික කරන්න දැන් කමිටුවක් පත් කරලා තිබෙනවා. මොකද, පසුගිය රජය කාලයේ ඕක කරන්න බැරි වුණා. මම මේ වෙලාවේ මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මීට අවුරුදු දෙකකට කලින් ගංවතුර ආපු වෙලාවේ එවකට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ලිඛිතවත්, වාචිකවත්, රැස්වීම් ගණනාවකදිත් මේ ගැන අපි කිව්වා. නමුත් කිසිදු විසඳුමක් ලබා දුන්නේ නැහැ. නමුත් වර්තමාන රජය ඒ වෙනුවෙන් කමිටුවක් පත්කරලා මූලිකත්වය ගැනීම පිළිබඳව මම ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, කොලොන්නාවේ ගංවතුර පාලනය, කොළඹ වැහි වතුර පාලනයත් එක්ක සම්බන්ධයි. ඉතින් මේ දෙක එකිනෙකට සම්බන්ධ කරලා ඒ සඳහා කටයුතු කරන්න ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, කොළඹ නගරයේ ජනතාව පැල්පත්වල සහ flatවල ජීවත් වනවා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ආරක්ෂක ලේකම් වෙලා හිටපු කාලයේ කොළඹ නගරයේ අවුරුදු 30ක්, 40ක් එක තැන ජීවත් වෙච්ච මිනිස්සු බලෙන් ඇදගෙන

ගිහින් ඔවුන්ට වෙන වෙන තැන්වල නිවාස ලබා දුන්නා. නාරාහේන්පිට හිටපු අයට දෙමටගොඩින් නිවාස දීලා තිබෙනවා. දෙමටගොඩ හිටපු අයට හේනමුල්ලෙන් නිවාස දීලා තිබෙනවා. කොම්පඤ්ඤ වීදියේ හිටපු අයට කොළොන්නාවෙන් නිවාස දීලා තිබෙනවා. අවුරුදු 30ක්, 40ක් ජීවත්වෙච්ච තැන්වලින් මේ මිනිස්සු එක්කරගෙන ගියේ බලෙන්. ගියේ නැත්නම් සුදු වෑන්වලට දාලා එක්කරගෙන ගියා. කොහොම හරි එක එක තැන්වලට ඒ මිනිස්සු එක්ක ගිහින් දැම්මත්, අද වෙනකම් ඒ මිනිස්සුන්ට ඒවාට ඔප්පු දීලා නැහැ. විශේෂයෙන්ම 2015-2019 කාලයේ තිබුණු යහ පාලන රජයටත් ඒ ගැන උනන්දුවක් තිබුණේ නැහැ. මේ වෙලාවේ මම ඒකත් කියන්න ඕනෑ. ඒ කාලයේ මම එක ඇමතිවරයෙකුගෙන් ඇහුවා, මේ අයට ඔප්පු ලබා නොදෙන්නේ ඇයි කියලා. ඒ ඇමතිවරයා කිව්වා, මේගොල්ලන්ට ඔප්පු දුන්නොත් ඒ නිවාස විකුණනවාය කියලා.

ඉතින් ඒ මිනිස්සුන්ගේ ගෙවල් ඒ මිනිස්සුන්ට විකුණන්න හරි, ඕනෑ දෙයක් කරගන්න හරි පුළුවන් නේ. ඒ නිවාසවලට ඔප්පුවක් නොලැබීම නිසා ඔවුන්ගේ දරුවන්ට ඉස්කෝලයක් ලබා ගන්න බැහැ, ඔවුන්ට බැංකු ණයක් ගන්න හම්බ වෙන්නේ නැහැ. මේවායේ වැඩිහරියක් ඉන්නේ ස්වයං රැකියා කරන මිනිස්සු. ඔප්පුවක් නැති නිසා ඒ අයට බැංකු ණයක්වත් ගන්න විධියක් නැහැ.

අපි නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේ යම් ඉල්ලීමක් කරනවා. මොකද, ගිය ආණ්ඩුව කාලයේ තනිකර ප්‍රෝඩාවක් කළා. ජනාධිපතිවරණය පැවැති සමයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා සන්දර්ශන මාලාවක් කරගෙන ආවා. COPE එකේත් මේ දවස්වල ඒවා ගැන අහනවා නේ. ඒ කාලයේ එක එක සන්දර්ශන කරගෙන ආවා වාගේ තව සන්දර්ශනයක් කළා, ඔප්පු නැති හැමෝටම ඔප්පු දෙනවා කියලා. කොළඹ, හේනමුල්ල මහල් නිවාස සංකීර්ණයට ඇවිල්ලා කොළඹ නගරයේ ඉන්න ඔක්කෝටම ඔප්පු ලබා දෙනවා වාගේ ලොකු සන්දර්ශනයක් කළා. මම මීට පෙර අවස්ථාවක ප්‍රශ්නයක් අහපු වෙලාවේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ඇමතිතුමා ඒ සම්බන්ධව උත්තරයක් දුන්නා. ගෙවල් 167කටද කොහේද නේද, ඔප්පු ලබා දීලා තිබෙන්නේ? පල් බොරුවක් නේ එදා කියා තිබෙන්නේ. එදා ඒ රැස්වීමේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා කිව්වා, එදා ඉඳලා වාරික ගෙවන්න එපා කියලාත්. ඊට පසුව මිනිස්සු වාරික ගෙවන එකත් නැවැත්වුවා. දැන් බැලින්නම්, වැල් පොලියත් එක්ක වාරික ගෙවන්න වෙලා තිබෙනවා. දැන් ඒකට වග කියන්න කවුරුවත් නැහැ. ඒක ජනතාවගේ වැරැද්දක් නොවෙයි, හිටපු ජනාධිපතිවරයා විසින් ජනතාව ඇන්දවීමේ වැරැද්දක්. ඒ නිසා අර අධික පොලිය කපා හැරලා ඒ මිනිස්සුන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න කියාත් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ඒ අය ඒ ගෙවල්වල මේ වෙනකොට අවුරුදු 05, 07, 10, 12, 13, 15 වාගේ කාලයක් තිස්සේ පදිංචි වෙලා ඉන්නවා. ඒ කියන්නේ අවම වශයෙන් අවුරුදු 05කට වැඩි කාලයක් තිස්සේ ඔවුන් ඒ ගෙවල්වල පදිංචි වෙලා ඉන්නවා. ඒ නිසා ඒ අයට ඔප්පු ලබා දීම සඳහා කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

සමහර අය හිතාගෙන ඉන්නවා, ඒවා luxury ගෙවල් කියලා. ගරු ඇමතිතුමනි, ඇත්තටම ඒවා කුකුළු කූඩු වාගේ ගෙවල්. වර්ග අඩි 450 නිවාස තිබෙන්නේ. එහාට හැරෙන්නත් බැහැ, මෙහාට හැරෙන්නත් බැහැ. අඩු ගණනේ ඒ අයට ඒ අයිතිවාසිකමවත් ලබා දෙන්න. ඒ වාගේම කළමනාකරණ කමිටු කියලා දාලා ඒ අයගෙන් මුදල් අය කරනවා. හැබැයි, lift එකක් කැඩුණොත් එහෙම හදන්න එන්නේ නැහැ. ඒ වාගේ වෙලාවට UDA එකේ ඉන්න සමහර නිලධාරීන්ගේ ගෑස් බලන්න ඕනෑ. පසුගිය මැතිවරණ කාලයේ අපි හේනමුල්ල මහල් නිවාස සංකීර්ණයට යනකොට ඒ lift එක කැඩිලා. සමහර ගෙවල් තිබෙනවා, තට්ටු විශාල ගණනක් පහළට එන්න ඕනෑ. එවැනි තැනකින් ලෙඩෙක් ගේන්න ගියාම සමහර වෙලාවට ලෙඩ්ඩු මැරෙනවා. ඒ නිසා මේ කළමනාකරණ කමිටු UDA එකෙන් පවත්වා ගෙන යනවා නම් අලුත්වැඩියා කටයුතු කාර්යක්ෂම කළ යුතුයි. එහෙම නැත්නම් ඒ අයට ඔප්පු ලබා දීලා, ඒ පදිංචිකරුවන්ගෙන් කළමනාකරණ කමිටු පත් කිරීමට කටයුතු කරන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, අද ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් සාකච්ඡාවට ගන්නවා. ඒ නිසා ඒ පිළිබඳවත් කරුණු කිහිපයක් කථා කරන්න මම කැමැතියි. ආණ්ඩුව කිව්වා, කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තයේ ඉදිකිරීම් කටයුතු ඉතා ඉක්මනින් අවසන් කරනවාය කියලා. නමුත්, තිබෙන තොරතුරු අනුව අපට කියන්න තිබෙන්නේ, නැඟෙනහිර පර්යන්තයේ ඉදිකිරීම් කටයුතු අවසන් වෙන්න තව අවුරුදු එකහමාරක්වත් යනවා කියලායි. මොකද, equipment tender එක කිසිදු හේතුවක් නැතුව cancel කරලා තිබෙනවා. ඒ ටෙන්ඩරය දමන්න මාස 8ක් ගත වෙනවා. ඒ වාගේම ඒ බඩු ටික ගේන්න තව මාස 10ක් ගත වෙනවා. ECT එක තව අවුරුදු එකහමාරක් පස්සට යනවා නම් වරායේ ආදායමට මොකක්ද වෙන්නේ? මේ නිසාම Cabinet paper එකක් ඉදිරිපත් කරලා තිබෙනවා, 2024.12.03වැනි දා. මම හිතන විධියට ඇමතිතුමා තමයි ඒ Cabinet paper එක දාලා තිබෙන්නේ. ඒ, මේ ටෙන්ඩර් එක cancel කරන්න. Cancel කළා නම් මොකක්ද විකල්පය? ECT එක ඉක්මන් කරගන්න ඊළඟට කරන යෝජනාව මොකක්ද? ඒ පිළිබඳව මම හිතන විධියට තවම කිසිදු සඳහනක් නැහැ.

කනගාටුවෙන් වුණත් මේ කාරණයත් මම කියන්න ඕනෑ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය කියන්නේ හොඳටම ආදායම් ලබන ආයතනවලින් එකක්. හැබැයි, එතැන අවුලක් තිබෙනවා. ආදායම් ලබනවා කියලා ඒකට අධික සේවක සංඛ්‍යාවක් බඳවා ගෙන තිබෙනවා. ඒ පිළිබඳව පසුගිය කාලයේදී COPE එකේදි හෙළි වුණා. ලාභ ලබනවා කියන එක එකක්. හැබැයි, මෙච්චර සේවක සංඛ්‍යාවක් බඳවා ගන්න ඕනෑද කියන එක ප්‍රශ්නයක්. අපි දන්නවා, විවිධ ඇමතිවරු තමන්ට ඕනෑ ඕනෑ විධියට බැරි කාලයේදීත්, පුළුවන් කාලයේදීත්, අවශ්‍ය කාලයේදීත්, අවශ්‍ය නැති කාලයේදීත් - හැම කාලයේදීම - මිනිස්සු රැකියාවලට දාලා තිබෙන බව. හැබැයි, ඒ ආයතනවලට ඒක දරා ගන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසාම තමයි කළමනාකරණ අකාර්යක්ෂමතා එක්ක දැන් මෙහෙයුම් ප්‍රමාණයත් අඩු වෙලා තිබෙන්නේ. පසුගිය අවුරුද්දේ ජනවාරි මාසයට සාපේක්ෂව මේ වනවිට මෙහෙයුම් ප්‍රමාණය සියයට 13.7කින් අඩු වෙලා තිබෙනවා.

හැබැයි, පෞද්ගලික අංශය ගත්තාම South Asia Gateway Terminal එකේ සියයට 21.6කින් මෙහෙයුම් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ආණ්ඩුවේ ආයතනවල මෙහෙයුම් ප්‍රමාණය අඩු වෙන්නයි, පෞද්ගලික අංශයේ මෙහෙයුම් ප්‍රමාණය වැඩි වෙන්නයි හේතුව මොකක්ද? පැහැදිලිවම එතැන තිබෙන්නේ අකාර්යක්ෂම කළමනාකරණය. එම නිසාම දැන් ප්‍රධාන පෙළේ නැව් සමාගම් කොළඹ වරායේ අපේ පර්යන්තවලින් බැහැරව ඔවුන්ගේ මෙහෙයුම් පිළිබඳව අවධානය යොමු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම MCC නැව් සමාගම තමයි JCT එකෙන් සියයට 55ක් විතර operate කළේ. අද ඔවුන් වෙනත් උපාය මාර්ග සොයමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ETC එක හරහා පාරක් හදන්න යෝජනා කර තිබුණා. එම පාර හදන්න විශේෂයෙන්ම වරාය අධිකාරියේ ඉංජිනේරුවරු වාගේම සියලු

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පාර්ශ්ව සාකච්ඡා කරලා එකඟ වුණාට පසුව එක වතාවටම අදිසි හස්තයකින් එය නතර වෙලා තිබෙනවා. මේ පිළිබඳව වරාය අධිකාරියේ වෘත්තීය සමිති ඒකාබද්ධ සංවිධානය සිය විරෝධතාව විෂය භාර ඇමතිතුමාට 2025 පෙබරවාරි මාසයේ 11වැනි දා දන්වා තිබෙනවා. මොකද, මේකෙදි කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් කරලා නැහැ. ඉංජිනේරුවරු, වෘත්තිකයින් එක්ක සාකච්ඡා කරලා නැහැ. ඒ වාගේම වරාය විධායක නිලධාරීන්ගේ සංගමයත්, ඉංජිනේරු සංගමයත් මේ පිළිබඳව දැනුම් දීලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට අමාත්‍යාංශය යටතේ ආර්ථික මර්මස්ථාන වශයෙන් තිබෙන ප්‍රධාන ආයතන ගණනාවක් - ශ්‍රී ලංකා වරාය අධිකාරිය, RDA එක, SLTB එක, Sri Lanka Railway Department එක, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, SriLankan Airlines එක - භාර වෙලා තිබෙනවා. ඒ වාගේම පැලවත්තේ වැඩත් තිබෙනවා. ඒ වැඩකටයුතු ඔක්කොම එක්ක තව දේවල් කරන්න වෙලාව තිබෙනවාද කියලා ප්‍රශ්නයකුත් තිබෙනවා. මොකද, එතුමා අනුප්‍රාප්තික නායකයා විධියට පක්ෂයේ යන්ත්‍රණයත් මෙහෙය වන්න එපායැ, ගරු සභාපතිතුමනි. මේ ටික කරන්න කාලය ප්‍රමාණවත්ද කියන ගැටලුවත් තිබෙනවා. *[බාධා කිරීමක්]* මම මේ කරන්නේ චෝදනාවක් නොවෙයි. අවධානය යොමු කරන්න කියලා මම මේ පොඩ්ඩක් ඒ ගැන මතක් කර දෙනවා. *[බාධා කිරීමක්]* අපට පෙනෙනවා නේ. මැතිවරණ කාලයේ ගොඩක් අය හිතුවේ බිමල් රත්නායක මැතිතුමා කැපිලා කියලා. හැබැයි, එතුමාව හංගලා campaign manager විධියට නේ ගේම ගැහුවේ. ජාතික ලැයිස්තුව එනකොට තමයි කට්ටිය දැනගත්තේ එතුමා ඊළඟ නායකයා කියලා. පෙනෙන්නේ නැද්ද? එතුමාට හිනා, මම ඇත්ත කියනකොට.

ගරු සභාපතිතුමනි, ඊළඟට තව භයානක කථාවක් තිබෙනවා. මේ, සමාජවාදී කොමියුනිස්ට් ආණ්ඩුවේ පොඩි යෝජනාවක් තිබෙනවා, ETC එක විකුණන්න. ඇත්ත වශයෙන්ම JVP එකයි, වෘත්තීය සමිති සියල්ලමයි fight කරලා තමයි ETC එකේ සියයට සියයක් ආණ්ඩුව භාරයට ගත්තේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලැබෙන සම්පූර්ණ ආදායමේ විශාල කොටසකට දායකත්වය දෙන්නේ ECT එකෙන්. හැබැයි, පළමුවැනි මාසයේ 31වැනි දා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් වරාය අධිකාරියේ chairmanට letter එකක් යවනවා. ඒකේ "Expression of Interest partner with the Government of Sri Lanka for the East Container Terminal in the port of Colombo." යනුවෙන් සඳහන් වෙනවා. දැන් මොකක්ද මේ ලිපියේ දීලා තිබෙන recommendation එක? Recommendation එක තමයි, "Submit views on this to the Ministry soon as possible." මේක privatize කළාම මොකක්ද වෙන්නේ? වරාය අධිකාරියට එන ආදායම අඩු වෙනවා. ආදායම අඩු වුණාම අවසානයේදී වරාය අධිකාරියේ මෙහෙයුම් ක්‍රියාන්විතය අඩු වෙනවා. මෙහෙයුම් ක්‍රියාන්විතය අඩු වුණාම, රැකියා අවස්ථා නැති වෙනවා. රැකියා අවස්ථා නැති වුණාම මොකක්ද වෙන්නේ? ආයෙත් ඉතින් ඔබතුමන්ලා කළා වාගේ, වෘත්තීය සමිතිවලට ජනතාව පාරට බස්සවන්න තමයි සිද්ධ වෙන්නේ.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, වරාය අධිකාරිය සම්බන්ධවත් කාරණයක් කියන්න තිබෙනවා. ඔබතුමාත් ඒ ගැන දන්නවා ඇති. මම උත්තරයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ, අවධානයට විතරයි යොමු කරන්නේ. වරාය අධිකාරිය වෘත්තීමය වටිනාකම්වලින් උපරිම ප්‍රයෝජන ගන්න ආයතනයක් වීම වෙනුවට, දැන් දේශපාලන පළිගැනීම් කරන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඔබතුමාට ඒ ගැන සොයා බලන්න පුළුවන්. ඒ ගැන සොයා බලා මම කියන ඒවා ඇත්තද, බොරුද, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා බලන්න. වෘත්තීය සමිතිවලට අවස්ථාව දෙන්න ඕනෑ. වෘත්තීය සමිතිවලට ඇහුම්කන් දෙන්න ඕනෑ. ඒක ඇත්ත. හැබැයි, එතැනින් එහාට ගිහිල්ලා, වරාය අධිකාරිය, RDA එක, UDA එක වාගේ ලාභ ලැබිය යුතු ආයතනවල, ලංකාවේ රජයට ආදායම එකතු කරන රාජ්‍ය අංශයේ ආයතනවල වෘත්තීය වටිනාකම්වලට සහ වෘත්තීය ඇගැයීම්වලට ප්‍රමුඛතාව ලබා දිය යුතුයි කියන එක තමයි මගේ යෝජනාව වෙන්නේ.

ගරු සභාපතිතුමනි, මම මහාමාර්ග සම්බන්ධයෙනුත් කථා කරන්න ඕනෑ. අධිවේගී මාර්ග හදන කාලයේ නොදන්නාකමටද දන්නේ නැහැ, ගරු ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා, highway එකේ යනකොට bag එකක් අරගෙන යන්න, සත්තු හැප්පෙනකොට දඩමස් ගේන්න පුළුවන් කියලා. අද එතුමා ගරු සභාවේ නැහැ. හැබැයි, දැන් ඔක්කොම කට්ටිය highway එකේ යනවා. ජනාධිපතිතුමා helicopterවල යන්නේ නැති නිසා, මැතිවරණ කාලයේ වැඩියෙන්ම ගියේ highway එකේ. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, එහෙම නේද? එතුමා highway එකේ තමයි සෑහෙන්න ගියේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා අපි ඔබතුමාට මෙන්න මේ යෝජනාව ඉදිරිපත් කරනවා. නුවර -කොළඹ අධිවේගී මාර්ගයේ කොටසක් හදන්න ඉතිරි වෙලා තිබෙනවා. ඒ වාගේම, රුවන්පුර අධිවේගී මාර්ගය හදන්න තිබෙනවා. දැන් මෙතැන සිටින අයගෙන් MCC ගිවිසුමට විරුද්ධ වෙච්ච බොහෝ අය ඉන්නවා. හෙට අනිද්දාට MCC ගිවිසුම අත්සන් කරනවා කියලා කිව්වොත්, මම නම් පුදුම වෙන්නේ නැහැ. ඉතා සතුටට පත් වෙනවා. මොකද, MCC ගිවිසුමෙන් රට බෙදනවා කියලා නේ කිව්වේ.

නමුත් ගරු සභාපතිතුමනි, MCC ගිවිසුම apply කරලා ගන්න ඕනෑ එකක්. ඉන්දුනීසියාව වාගේ රටවල් දෙපාර, තුන්පාර apply කරලා අරගෙන තිබෙන්නේ. ඒ ඩොලර් මිලියන 500 දෙන්නේ ආධාරයක් විධියට, ක්‍රමවේදයකට අනුව. අපිට ආවේ 2014දී apply කරපු එකක්. ඒකේ තිබුණේ මොකක්ද? හෝමාගම සිට පැල්මඩුල්ල දක්වා මාර්ගය ගත්තොත්, ලංකාවේ වැඩිම වායු දූෂණය සිදු වෙන ප්‍රදේශයක් ඒක. ඒ පාර හදන්න සල්ලි දෙන්න තිබුණේ. දැන් ඒ පාර හදන්න MCC එකෙන් සල්ලි එන්නේ නැති නිසා මම ඔබතුමාට යෝජනා කරනවා රුවන්පුරයේ අධිවේගී මාර්ගය ණය ගැනීමෙන් තොරව පෞද්ගලික ආයෝජන එකතු කරලා හදන්න කියලා. මොකද, මේ අධිවේගී මාර්ග එකිනෙකට connect කිරීම හරහා අපිට මුදල්, කාලය, වායු දූෂණය අඩු කරන්න පුළුවන් වාගේම යටිතල පහසුකම් සංවර්ධනය වේගවත් කරන්නත් පුළුවන්. මට මතක විධියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී කටාර් රජය කල්පිටිය දූපත් ටික සංචාරක කර්මාන්තය සඳහා දියුණු කරන්න ගන්න කැමැති වුණා. මම හිතන විධියට, ඒ පෞද්ගලික ආයෝජකයෙක්. හැබැයි, ඔවුන්ගේ ඉල්ලීම වුණේ මොකක්ද? කටුනායක සිට කල්පිටිය දක්වා පාර හදලා දෙන්න කියන එකයි. ඔවුන් ආවේ නැත්තේ යටිතල පහසුකම් දියුණු වෙලා නැති නිසා. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා ඒ යටිතල පහසුකම් දියුණු කිරීම ඉතා අත්‍යවශ්‍යයි කියලා. මොකද, මහින්ද රාජපක්ෂ මහත්තයා කොට්ටාවේ ඉඳලා ගාල්ලට අධිවේගී මාර්ගය හැදුවාම, 2015 අපේ ආණ්ඩුව ඇවිල්ලා ඉතිරි ටික හදන එක නතර කළේ නැහැ. අපි හම්බන්තොට දක්වා ඒක හැදුවා. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්තයා හැදුවා කියලා තමයි සමාජගත වුණේ. කඩවත දක්වා ටිකත් හැදුවා. ඇත්තවශයෙන්ම කිලෝමීටර ගණන්වලින් බැලුවොත්, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ අවුරුදු 7ට හදපු අධිවේගී මාර්ග කිලෝමීටර ප්‍රමාණයට වැඩිය යහ පාලන ආණ්ඩුව කාලයේ හදපු අධිවේගී මාර්ග කිලෝමීටර ප්‍රමාණය වැඩියි. නමුත් යහපාලන ආණ්ඩුව කාලයේ නුවර-කොළඹ අධිවේගී මාර්ගයේ ඉතිරි ටික හදන්න බැරි වුණා.

ගරු සභාපතිතුමනි, New Kelani Bridge එක දානකොට ඊළඟ අදහස තිබුණේ, ඔරුගොඩ වත්තේ ඉඳලා රාජගිරියේ HSBC එක දක්වාත්, HSBC එක ළඟ ඉඳලා-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you are given another two more minutes.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, එතුමාට තව විනාඩි 3ක් ලබා දෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමනි, එහි තුන්වන පියවර විධියට රාජගිරියේ ඉඳලා අතුරුගිරිය entrance එකට elevated highway එකක් දමන්න තමයි සැලසුම් කළේ. මම හිතන විධියට කොළඹ නගරයේ රථ වාහන තදබදය විසඳනවා වාගේම, ජනතාවට කාලය ඉතිරි කිරීම සඳහාත් මේක අතිශය වැදගත්. හැබැයි, පසුගිය ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය අහෝසි කිරීම සඳහා කටයුතු කළා.

ඒගොල්ලන්ට එතැනින් කොමිෂන් එන්නේ නැහැ; ගාණ එන්නේ නැහැ. ජපානයෙන් ඒක ගන්න බැරි නිසා ඒ අය ලැහැස්ති වුණේ මේක BOT ක්‍රමයට කරලා හොඳ ගාණකට විදින්නයි. නමුත් ඒක කර ගන්න බැරි වුණා, කොවිඩ් ආපු හින්දා. මම ඔබතුමාට යෝජනා කරනවා, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයෙන් හෝ පෞද්ගලික ආයෝජනවලින් මේ කාර්යය කරන්න කියලා. මොකද, ඇත්ත වශයෙන්ම එදිනෙදා විශාල පිරිසක් කඩුවෙල සිට, අතුරුගිරියේ සිට, කොට්ටාවේ සිට, පන්නිපිටියේ සිට, තලවතුගොඩ සිට රැකියාවලට යන අය සහ එන අය ඉන්නවා. මේ තුළින් ඒ අයට විශාල කාලයක් ඉතුරු වෙනවා. ඒ වාගේම පිට පළාත්වලට යන අයට ඉතා ඉක්මනින් අධිවේගී මාර්ගයට enter වෙන්න මේ තුළින් අවස්ථාව ලැබෙනවා. ඒ නිසා ඒ ගැනත් බලන්න කියා ඉල්ලනවා.

ඊළඟට, මගේ ආසනයේ ගැටලුවකුත් ඔබතුමාට කියන්න ඕනෑ. ගරු ඇමතිතුමා, කොළොන්නාව කියලා කියන්නේ කොළඹ නගරය ආශ්‍රිතව තිබෙන ආදායම අඩුම ප්‍රදේශයක්. දෙහිවලට වැල්ලවත්තට, රත්මලානට යන්න බැරි ගොඩක් අය ඔය පැත්තේ තමයි පදිංචියට ඇවිල්ලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම දැනට අවුරුදු 10ක් ඇතුළත ජනගහනය දළ වශයෙන් 30,000කින් විතර වැඩි වෙලා තිබෙනවා. මැදකොළඹ අතහැර එන අය මේ පැත්තටයි එන්නේ. *[බාධා කිරීමක්]* කොළොන්නාවට ඇවිල්ලා තමයි කඩුවෙලට යන්නේ. ඉතින් ගරු ඇමතිතුමනි, low-level මාර්ගය දළ වශයෙන් රුපියල් බිලියන 16ක් විතර වියදම් කරලා සැලකිය යුතු ප්‍රමාණයක් හැදුවාට පස්සේ අද වෙනකොට ඉඩම් මිල නම් වැඩි වෙලා තිබෙනවා. මම ඔබතුමාගෙන් දවසක් මේ ගැන ප්‍රශ්නයක් ඇහුවා. ඊට පස්සේ මේ අය වැය යෝජනාවල තිබුණා, අර වැඩ ඉතිරිව ඇති පාලමට මුදල් වෙන් කරලා තිබෙන බව. ඒ පිළිබඳව මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

ඊළඟ කාරණය තමයි, අඹතලේ - ග්‍රෑන්ඩ්පාස් මාර්ගය; ගහ දිගේ දිවෙන මාර්ගය. ගරු ඇමතිතුමනි, පසුගිය යහ පාලන ආණ්ඩුව තිබුණු කාලයේ ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක අවස්ථා ගණනාවක් අපි මේ ගැන සාකච්ඡා කළා. ඒ වෙලාවේ රුපියල් මිලියන හත්සිය හතළිස්ගණනක් තමයි ඒක හදන්න යන වියදම ලෙස දළ වශයෙන් ඇස්තමේන්තු වුණේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, මේ කාරණය. ඒ මාර්ගය මේ කොළඹ නගරය අවට තිබෙන මාර්ගයක් වුණාට තවම බස් එකක් යන්න බැරි මාර්ගයක්. බස් එකක් යන්නේ නැහැ. බස් එකක් ගියාම ගහනවා, ඒකත් ඇත්තයි. ඒකට හේතුව, ඒ මාර්ගය සංවර්ධනය නොකිරීමයි. දැන් ඒක තාවකාලිකව කාපට් දාගෙන යනවා. කාපට් දාගෙන ගියාට ලබුගම ඉඳලා එන ප්‍රධාන ජල මාර්ගය යන්නෙත් ඒ පාරේ. ඒ ජල මාර්ගය දාන්නේ නැතුව, ඒ පාර කාපට් කරන්නත් බැහැ; හදන්නත් බැහැ. මම ඔබතුමාට යෝජනා කරනවා, ආසියානු සංවර්ධන බැංකුව එක්ක එකතු වෙලා හෝ ඒ පාර මං තීරු තුනේ පාරක් හැටියට සංවර්ධනය කරන්න කියලා. එහෙම කෙරුවොත්, විශාල සංවර්ධනයක් සිද්ධ වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඔබතුමාගේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්තුමාගෙන් ඒ ගැන අහන්න පුළුවන්. මොකද, මම දන්නා තරමට එතුමාත් ඔය පැත්තේ තමයි පදිංචි වෙලා ඉන්නේ. හැබැයි ඒ මාර්ගය වැහි වතුරට; ගං වතුරට යට වුණාම ඒ මිනිසුන්ගේ ළමුන්ට පාසල් යන්න විධියක් නැහැ; ප්‍රධාන බස් එකක් නැහැ. ත්‍රීවීල් එකේ යන්න ඕනෑ. මේ කියන මාර්ගය කොළඹ නගරය අවටයි පිහිටා තිබෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ මට ඒ සම්බන්ධව හෙට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මම හෙට ඒක අහන්නේ නැහැ. මොකද, මම ඒ ගැන දැන් කිව්වා. ඒ කටයුත්තත් කරලා දෙන්න කියා ඉල්ලා සිටිමින් මේ කරුණු පිළිබඳව ඇමතිවරු දෙදෙනාගේම අවධානය යොමු කරන්න කියාත් මම ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම තව එක කාරණයක් කියන්න ඕනෑ. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබුණා, ජලය කපපු අයගේත්, නව ජල සම්බන්ධතා ලබා ගන්නා අයගේත් ගෙවීම් එක පාර අය කර ගන්නේ නැතුව බිල්වලට එකතු කරලා අය කරන ක්‍රමයක් ගේන්න ඕනෑ කියලා. ඒ කාරණය සඳහන් පිටු අංකය මට දැන් මතක නැහැ. මොකද, අද ඒ file එක මා ළඟ නැහැ. ගරු ඇමතිතුමනි, ඒක ලොකු වැඩක් නොවෙයි. ඒ නිසා එයත් implement කරන්න ඔබතුමාට හැකි වේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. මොකද, මහජන නියෝජිතයන් හැටියට අපට අඩුම ගණනේ දවසට telephone calls 4ක්, 5ක් විතර එනවා, කොළඹ නගරයේ හරි කොළොන්නාවේ හරි වතුර කැපුවා කියලා. වතුර කැපුවාම ඒ මිනිස්සුන්ට නැවත වතුර ගන්න ක්‍රමයක් නැහැ. හැබැයි වතුර කියන එක අත්‍යවශ්‍ය දෙයක්. විදුලි බලයත් එහෙමයි. මම එදා විෂය භාර ඇමතිතුමාගේ අවධානයට මේ කාරණය යොමු කළා. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඒ ගැන සඳහන්ව තිබුණාට තවම ඒක කරලා නැහැ. ගරු ඇමතිතුමනි, ජල සම්බන්ධතාව කියන එක-

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමාට තවත් වෙලාව තිබෙනවා. ලයිට් කපපු එකත් කියන්න පුළුවන්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ලයිට් කපපු එක කිව්වා නේ, එදා. ආයේ කියන්න ඕනෑ නැහැ.

කොළඹ නගරයේ සිටින නාගරික පැල්පත්වාසී ජනතාව සාමාන්‍යයෙන් වර්ග අඩි 85ක, 100ක, 125ක වාගේ ගෙවල්වල ජීවත් වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නේ නැති හින්දායි මම මේ කියන්නේ. සමහර ගෙවල්වල ජනතාව shift ක්‍රමයටයි නිදා ගන්නේ. සමහර දෙමව්පියෝ රෑ එළි වනකල් TV බලනවා, දරුවන්ට නිදාගන්න දීලා. දරුවෝ උදේට ගියාට පස්සේ තමයි ඒ දෙමව්පියෝ නිදාගන්නේ. ඒ වාගේ අවස්ථාවක වතුර කැපුවොත්

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කොච්චර අසාධාරණ ද කියලා බලන්න. ඔබතුමා මම කියන එක පිළිගන්නේ නැත්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමාට කියන්න, පොඩ්ඩක් ගිහිල්ලා බලලා මැද කොළඹ visit එකක් දාලා එන්න කියලා. මේක තමයි තිත්ත ඇත්ත. පිටකොටුවේ වැඩි හරියක් ඉන්නේ බිස්නස් කරන කට්ටිය; පේමන්ට් බිස්නස් කරන කට්ටිය, ත්‍රීවීල් එළවන කට්ටිය. ඊයේ එක ගෙදරකින් මට කථා කරලා කිව්වා, රුපියල් 15,500 බිලකට වතුර කපලා ගියා කියලා. පොඩ්ඩක් කල්පනා කරලා බලන්න ගරු ඇමතිතුමනි, ඒක සාධාරණ ද කියලා. මොකද, ඒගොල්ලන්ගේ වතුර බිලත් එන්නේ රුපියල් 2,000යි, 3,000යි. ඒ වාගේ පැල්පත්වාසී ගෙදරක වතුර කපලා ගියාම ඒ අය toilet එකටවත් යන්නේ කොහේ ද? පොදු වැසිකිළියකට යන්න ද? පාඩම් කරන දරුවෙකුට හැන්දෑවට වත්තකට යන්න පුළුවන් ද? බැහැ. කවුරු හරි එකෙක් කෑ ගහමින් ඉන්නවා.

ඒ වතු නිවාස ජීවිතය තුළම විශාල ගැටලුවක් තිබෙනවා. ඒ අයගේ ජීවිත පිළිබඳ විශාල ගැටලුවක් තිබෙනවා. ත්‍රී රෝද රථයක් පදවන තාත්තාගේ පුතාට ත්‍රී රෝද රථයක්ම පදවන්න සිද්ධ වෙලා තිබෙනවා; කඩයප්පම් විකුණන අම්මාගේ දුවටත් කඩයප්පම් විකුණන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකද, ඔවුන්ට තමන් ඉන්න ගෙදරට අයිතිය නැහැ; අයිතිය නැති නිසා ඔප්පුව නැහැ; ඔප්පුව නැති නිසා ළඟම තිබෙන හොඳම පාසලට ඒ දරුවන්ට යන්න බැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Please, give me 30 seconds, Sir.

එවැනි පීඩාවක් විඳින ජනතාවගේ නිවාසවල වතුර කපලා ගියාම, කරන්ට් කපලා ගියාම ඔවුන් ජීවත් වෙන්නේ කොහොමද කියන එක ගැන කල්පනා කරන්න. ගරු ඇමතිතුමනි, ඉස්සර නම් ඒ අය වැඩි හරියක් ඡන්දය දුන්නේ අපිට. මේ වතාවේ ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. ඔබතුමන්ලා කොළඹ ආසන 5ම දිනුවා නේ. ඒ නිසා ඒ ගැනවත් හිතලා ඒ පිළිබඳව කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Bimal Rathnayake. You have 20 minutes.

[පූ.භා. 10.19]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු සභාපතිතුමනි, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, ඇත්තටම අපට අද විවාදය පටන් ගන්න වෙන්නේ බොහොම කනගාටුදායක ප්‍රවෘත්තියකින්. ඒ කියන්නේ, ළඟදී සිද්ධ වෙච්ච මාරක රිය අනතුරක් පිළිබඳ දැනුම් දීමකින්. ෆෙරාරි ලයිසන් එකක් තිබෙනවා කියපු කෙනා අල්ජසීරා එකේ හැප්පිලා කුඩු පට්ටම් වෙලායි ඉන්නේ. මා හිතන විධියට, එතුමාගේ මොළයට සෑහෙන්න damage වෙලා තිබෙනවා. එතුමා මේ දවස්වල විකාර කියවනවා. ඒ නිසා ප්‍රවාහන මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේත් කාරක සභා අවස්ථාවේ විවාදය වෙලාවේ, ෆෙරාරි ලයිසන් එක තිබෙනවා කියපු ඒ කෙනාට ඒ වෙච්ච අකරතැබ්බය පිළිබඳව ප්‍රථමයෙන්ම මාගේ කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පළමුවෙනි අය වැයේ අද දින කාරක සභා අවස්ථාවේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය අවස්ථාවෙයි අපි ඉන්නේ. මේ විවාදයේදී මමත්, මගේ නියෝජ්‍ය අමාත්‍යවරු දෙදෙනාත්, ආණ්ඩු පක්ෂයේ කථික මන්ත්‍රීවරුනුත්, ගරු අගමැතිතුමියත් කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි විශ්වාස කරනවා, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ පැත්තෙනුත් අපට ඉතා සාධනීය විවේචන සහ යෝජනා ලබා දේවි කියලා.

ගරු සභාපතිතුමනි, අපි අමාත්‍යාංශය ක්‍රියාත්මක කරගෙන යන ජාතික ප්‍රතිපත්තියක් තිබෙනවා. මම හිතුවා මුලින්ම ඒ ගැන කියන්න. එය සරලව කියන්නම්. අපේ අමාත්‍යාංශය තුළ නිලධාරීන් 75,000ක් විතර වැඩ කරනවා. අපි ඒ අයට හැම විටම කියන දේ තමයි, "අපි ඔයගොල්ලන් බලාගන්නම්. ඔයගොල්ලන් ජනතාව බලා ගන්න" කියන එක. ඕක තමයි අපේ මූලික තේමාව. ජනාධිපතිතුමා රජයේ සේවකයන් ඉතාම හොඳින් බලාගනිමින් ඉන්නවා. ඒ ගොල්ලන්ගේ අනෙක් ප්‍රශ්න, උසස්වීම් ප්‍රශ්න, SORs පිළිබඳ ප්‍රශ්නත් විසඳන්න අපි උත්සාහ කරනවා. අපි වැඩ කරන අය බලාගන්නවා; ඒ අයට අවශ්‍ය කරන රැකවරණය උපරිම වශයෙන් ලබා දෙනවා.

අපි කිසිම දේශපාලන පළිගැනීමක් කරන්නේ නැහැ. වරායේ වෙච්ච මොකක්දෝ සිද්ධියක් ගැනත් මෙහිදී කිව්වා. මම ඒ ගැන සොයා බලන්නම්. අපි කිසිසේත් දේශපාලන පළිගැනීම් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අවංකව සහ අදූෂිතව වැඩ කරනවා නම්, අපට ඒ නිලධාරීන්ගේ දේශපාලනය කිසිසේත් අදාළ නැහැ. ඒ වාගේම අපි දන්නවා, ඕනෑම දේශපාලනයක් කරන කෙනෙකුගෙන් වැඩ ගන්න. එම නිසා ඒ ගැන කවුරුවත් වැඩිපුර හිතන්න ඕනෑ නැහැ කියලා අපි කියනවා.

ගරු සභාපතිතුමනි, මාර්ග ආරක්ෂාව අපේ රටට අද විශාල ප්‍රශ්නයක්. රිය අනතුරු නිසා අපේ රටේ සාමාන්‍යයෙන් දවසකට 4දෙනෙක්, 5දෙනෙක් විතර මිය යනවා. මේ දවස්වල එම සංඛ්‍යාව ටිකක් අඩු වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් වසරකට 2,000කට වැඩි පිරිසක් මිය යනවා.

ජනතාවට ඉතා හොඳ ප්‍රවාහන සේවයක් ලබා දීම තමයි අපේ අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ. නමුත් අපි කොහෙත්ම සතුටු වෙන්නේ නැහැ, කෝච්චියේදීවත්, බස් එකේදීවත්, ත්‍රී රෝද රථයේදීවත්, මෝටර් සයිකල් එකේදීවත්, පාරේදීවත්, පදික වේදිකාවේදීවත් ජනතාවට හොඳ ප්‍රවාහන සේවයක් ලැබෙනවා කියලා. එම නිසා හොඳ ප්‍රවාහන සේවයක් ලබා දීමේ කාර්යය සම්පූර්ණ කර ගැනීම තමයි අපේ අභිලාෂය. අපි ඒ වෙනුවෙන් මහන්සි වෙනවා.

ගරු සභාපතිතුමනි, මාර්ග ආරක්ෂාව බිඳ වැටෙන ආකාර ගණනාවක් තිබෙනවා. අපේ රටේ පෞද්ගලික අංශයත් සම්බන්ධ

කරගෙන මාර්ග ආරක්ෂාව වෙනුවෙන් අපට කරන්න පුළුවන් උපරිම දේවල් කරන්න අපි කටයුතු ආරම්භ කර තිබෙනවා. පාරවලට ගල් වැටීම වාගේ එක එක දේවල් සිදු වීම නිසා ලංකාව පුරා අනතුරුදායක ස්ථාන ඇති වෙලා තිබෙනවා. මුලින්ම එම ස්ථාන හඳුනාගෙන, ඒවා පිළිසකර කිරීමේ වැඩසටහනක් අපි දැනටමත් ක්‍රියාත්මක කරගෙන යනවා.

ඒ වාගේම, අපේ රටේ අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග විශාල ප්‍රමාණයක් තිබෙන බව ද ඔබතුමන්ලා දන්නවා. අද උදේත් අලුත්ගම ප්‍රදේශයේදී ත්‍රි රෝද රථයක් හැප්පිලා තිබෙනවා. මීට දවස් දෙකකට, තුනකට කලින් වැලිගම ප්‍රදේශයේදීත් අනතුරක් සිදු වුණා. අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 400 ගණනක් තිබෙනවා. එම නිසා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික වැඩ පිළිවෙළ ඇතුළේ ජනතා සහභාගිත්වයත්, පෞද්ගලික අංශයේ සහභාගිත්වයත් ඇතිව මේ වසර ඇතුළතදී ලංකාවේ අනාරක්ෂිත යැයි සම්මත 400ක් පමණ වූ දුම්රිය හරස් මාර්ග සියල්ල ආරක්ෂිත ස්ථාන බවට පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, ඒක අපේ වගකීමක් කියලා අපි හිතනවා. හොඳ ප්‍රවාහන පද්ධතියක් ඇති කරන්න කාලයක් ගත වුණත්, ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්න අපි එච්චර කාලයක් ගත කළ යුතු නැහැ කියලා මම හිතනවා.

ගරු සභාපතිතුමනි, මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් අපි සැලකිය යුතු වැඩ කොටසක් පටන් ගෙන තිබෙනවා කියා ඔබතුමා දන්නවා. අපි උදාහරණයක් ගනිමු. කොළඹ නගරයේ සහ තවත් බොහෝ නගරවල traffic lights තිබෙනවා. ඒ traffic lightsවල countdown systems නැහැ. එම නිසා ඒ traffic lightsවල සිටින විට මිනිස්සු හරිම nervous. විශේෂයෙන්ම delivery service කරන අය ගත්තොත්, ඔවුන් විශාල වශයෙන් තරගකාරී රැකියාවලයි යෙදිලා ඉන්නේ.

RMV එක සතුව තිබෙන VET Trust Fund එකේ මුදලුත් අරගෙන, පෞද්ගලික අංශයේ දායකත්වයත් අරගෙන කොළඹ නගරයේත්, ලංකාව පුරාමත් තිබෙන traffic lightsවලට countdown system එකක් හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒකෙන් ආරක්ෂාවත් වැඩි වෙනවා. ඒ වාගේම වායු විමෝචනය වුණත් අඩු වෙනවා. මොකද, රියදුරන් ඒ lights වැටෙනකල් වාහනය රේස් කර කර ඉන්නවා නේ.

අපි පාර්ලිමේන්තු උපකමිටුවක් පත් කළා, නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමියගේ නායකත්වයෙන්. ගරු සභාපතිතුමනි, ඒකෙන් අපි බලාපොරොත්තු වෙනවා, මාර්ග ආරක්ෂාව සහ යහපත් මගී ප්‍රවාහන සේවයක් සඳහා අවශ්‍ය සම්පූර්ණ නීති අධ්‍යයනය කරලා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව හරහා වාර්තාවක් ලබා ගෙන, මහ පෙන්වීමක් ලබාගෙන ඒ කටයුතු කරන්න. අපි බලාපොරොත්තු වෙනවා, ඒ උපදෙස් මත ඉතා කෙටි කාලයකින් පොදු ප්‍රවාහනයේ යෙදෙන වාහනවලට seat belts අනිවාර්ය කරන්න සහ බස්වල අනෙකුත් ප්‍රතිසංස්කරණ කරන්න, ආරක්ෂක පැත්ත වැඩි කිරීම වෙනුවෙන්.

ගරු සභාපතිතුමනි, අපි බලාපොරොත්තු වෙනවා, ත්‍රිරෝද රථ වලට, ඒ වාගේම app-based workersලාට වෙනම වෘත්තිය සමිතියක් හදලා, වෙනම සමාජ ආරක්ෂණ අරමුදලක් හදන්න. අපි ටැක්සියකින් ගමනක් යනවා නම්, ඒ ටැක්සියෙන් යන කෙනාගේ ගාස්තුව රුපියල් 500 නම්, එයින් සියයට දශම පහක වාගේ ගණනක් අරගෙන ඒකෙන් සමාජ ආරක්ෂණ අරමුදලක් පළාත් සභාව යටතේ හෝ මධ්‍යම ආණ්ඩුව යටතේ හදන්න බලාපොරොත්තු වෙනවා. ඉන්දියාවේ ප්‍රාන්ත ආණ්ඩු රාශියක් ඒක කරලා තිබෙනවා. අපිත් බලාපොරොත්තු වෙනවා, එවැනි නීත්‍යානුකූල රාමුවකට එන්න. ඒ වෘත්තිකයන්ගේ වෘත්තීමයභාවය සහ සේවා සුරක්ෂිතතාව හදන්න බැරි නම් ඔවුන්ගෙන් හොඳ සේවයක් ලබා ගන්න බැහැ. ඒක නිසා අපි බලාපොරොත්තු වෙනවා ඒ වාගේ දේවල් ටිකක් කරන්න.

ගරු සභාපතිතුමනි, අද ලංකාව කිව්වාම විදේශිකයන්ට මතක් වෙන්නේ, ඇත්තෙනම කෝච්චි. අපේ දුම්රිය හරිම sexy වෙලා තිබෙන්නේ. Railway system එක sexy; කවුරුත් ආසයි. නමුත් මම කියන්න ඕනෑ, ඒක sexy වුණාට ඒක healthy නැහැ කියලා. ඒක ප්‍රමාද වෙනවා. අපේ දුම්රිය නිලධාරීන් මහන්සි වෙලා ප්‍රමාදය හා cancel වීම් අඩු කරලා තිබෙනවා. නමුත් ඒක හොඳ මට්ටමක නැහැ. මම මාස දෙකක් තිස්සේ ප්‍රමාදවීම් පිළිබඳව, cancellations පිළිබඳව වාර්තා හැමදාම ගෙන්වා ගන්නවා. අඩුවීමක් තිබුණාට, ඒක ප්‍රමාණවත් නැහැ. කෝච්චියක් ප්‍රමාද වෙනවා කියන්නේ මිනිස්සු දාහක් රස්තියාදු වෙනවා කියන එකයි. මේ දුම්රිය සේවය අපේ රටට අභිමානයක්. ඒක පුළුවන් ඉක්මනට හදන්න අමාරුයි. නමුත් අවුරුද්දක්, දෙකක් යනකොට මේ දුම්රිය සේවය ජනතා ආකර්ෂණය තිබෙන ඒ වාගේම හොඳ කාර්යක්ෂම එකක් බවට පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, දුම්රිය සේවය මඟින් හොඳ දේවල් වාගේම අඩුපාඩුකම් සිද්ධ වුණු බව අපි දන්නවා. පසුගිය දවස්වල දුම්රියේ ගැටී වනඅලි ගණනාවක් මිය ගියා. අපි හිතනවා, ඒක පැහැදිලිවම අපේ දුම්රිය මාර්ගවල අඩුපාඩුවක් නිසා සිදු වුණා කියලා. ඒ සම්බන්ධව මේ සභාවේත් අපි වාද විවාද කළා. ඒ සඳහා අපි අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කර, ඒවා පටන් අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග මට වඩා අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කරයි. එතුමා ඒ ක්‍රියාමාර්ග මෙතැනට ඉදිරිපත් කරාවි කියලාත් මම විශ්වාස කරනවා.

දුම්රිය සේවය තුළ අපි යම් යම් ප්‍රතිසංස්කරණ පටන් අරගෙන තිබෙනවා. ඒක විශාල investment එකක් අවශ්‍ය දෙයක්; ඒ සඳහා රුපියල් බිලියන ගණනක investment එකක් අවශ්‍යයි. ඒවා කරන්න යම් මුදල් ප්‍රමාණයක් අපට ලැබී තිබෙනවා. නමුත්, කෝච්චි එන්ජින් මිලදී ගැනීම ගත්තොත් ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් දැන් කෝච්චි engine එකක් මගේ දැනීමේ හැටියට බිලියන එකහමාරක් විතර වෙනවා. ඒ නිසා අපට කරන්න පුළුවන් දේ තමයි, දැනට තිබෙන සේවය යම් ප්‍රමාණයකට upgrade කරන්න පුළුවන් දේවල් කරන එක. අපි කොළඹ කොටුවේ විවේකාගාරයක්- *[බාධා කිරීමක්]* දුම්රිය සේවයේ තිබෙන ප්‍රධානම අඩුපාඩු හඳලා එය දියුණු කරන්න අපට අවුරුද්දක්, දෙකක් යයි. සමහර විට අවුරුදු තුන, හතරක් යයි. ගරු සභාපතිතුමනි, අපි බලාපොරොත්තු වෙනවා ජනතාවට විවේක ගන්න පුළුවන් නව විවේකාගාර හදන්න. අපි ඉදිරි කාලය තුළදී, -ඉදිරි මාස කිහිපය තුළදී- සියලු ප්‍රධාන දුම්රිය ස්ථානවල කාන්තා විවේකාගාර, locker systems ඔක්කෝම හදනවා.

Online booking system එකෙන් වංචා කර තිබුණා. අපි ඒක CID එකේ සහ පොලිසියේ උදව්වෙන් නතර කළා. ඊට සම්බන්ධ අය අත්අඩංගුවට ගත්තා. ඉදිරියටත් මෙවැනි දේවල් කළොත් අනිවාර්යයෙන්ම ඒ අයත් අපි අත්අඩංගුවට ගන්නවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, online booking system එක ඉදිරි කාලයේදී හොඳින්ම කරන්න.

ඒ වාගේම, දුම්රිය සියයට 2යි දැන් cargo ගේන්නේ. දුම්රියේ main business එක ඒක. අපි railwayවලින් බලාපොරොත්තු වෙනවා cargo business එක දියුණු කරන්න.

ගරු සභාපතිතුමනි, අපි සතුටු වෙනවා සහ ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, රත්නපුර ජනතාවගේ දිගුකාලීන සිහිනයක් ඉටු කිරීමට කැපවීම පිළිබඳව. අවිස්සාවේල්ල සිට රත්නපුර දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කරන්න අපි තීන්දු කරලා තිබෙනවා. අපි

[ගරු බිමල් රත්නායක මහතා]

ඒකට මුදල් වෙන් කරලා තිබෙනවා, මේ අවුරුද්දේ ඒකට අදාළ දේවල් කරන්න. නමුත්, අපි එතැනදී ජනතාවගේ අදහස් උදහස් විමසලා ජනතාවත් සම්බන්ධ කරගෙන තමයි ඒ කටයුත්ත කරන්නේ. ඒ වාගේම, පාදුක්ක සිට අවිස්සාවේල්ල දක්වා දුම්රිය මාර්ගයත් වැඩි වේගයෙන් යන්න පුළුවන් විධියට commercially sustainable විධියට වැඩි කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, අපේ දුම්රිය සම්පූර්ණයෙන්ම ආණ්ඩුව සතුව තිබෙන්නේ. නමුත්, ඒකේ සමහර පැති තිබෙනවා, විශාල වශයෙන් පෞද්ගලික අංශයට සම්බන්ධ කර ගන්න පුළුවන්. අපි බලාපොරොත්තු වෙනවා, දුම්රිය වාගේම railway stations brand කරන්න. අපි පෞද්ගලික අංශයට ආරාධනා කරනවා, ඒ brandingsවලට එන්න කියලා. ඒ වාගේම, අපට ඉතා විශේෂ යෝජනාවක් ආවා. මේ ළඟදී අපි කලාකරුවන් පිරිසක් එකතු කළා. ඒ කලාකරුවන් කිව්වා, නානුඔය සිට නුවරඑළියට කෝච්චි පාරක් අතීතයේ තිබුණා, දැන් නැහැ කියලා.

ඒක ඉතාම දුෂ්කර ප්‍රදේශයක්. ඒ වාගේම මම හිතන විධියට නාය යෑම් සිදු වන ප්‍රදේශයක්. ඒ නිසා නානුඔය ඉඳලා නුවරඑළිය දක්වා ඒ තිබුණු දුම්රිය මාර්ගය අලුත්වැඩියා කරන්න පුළුවන්ද කියලා ශක්‍යතා අධ්‍යයනයක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එම දුම්රිය මාර්ගයේ කිලෝමීටර 8ක් වාගේ දුර ප්‍රමාණයක් තිබෙන්නේ. නානුඔය ඉඳලා නුවරඑළිය දක්වා පොදු මගී ප්‍රවාහනයට, commercial train එකක් වශයෙන් නොවෙයි, touristsලා සඳහා පමණක්, පෞද්ගලික සංචාරක සමාගම්වලට ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. එහෙම දෙයක් කරන්න කැමැති අයට ඉදිරියේදී ඒ සඳහා ආරාධනා කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා දුම්රිය සේවයේ ගොඩක් තනතුරු තිබෙන බව. ඒවායේ කිසිම කාන්තාවක් වැඩ කරන්නේ නැති ක්ෂේත්‍ර තිබෙනවා. බස්වලත් එහෙමයි. ලංගම ගත්තත් එහෙමයි. හෙටට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් අමාත්‍යාංශය භාර ඇමතිවරයා වශයෙන් මමත්, නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාත් -අපි තුන්දෙනාම- තීන්දු කරලා තිබෙනවා, අපේ ලංගමට, දුම්රිය සේවයට -මේ හැම එකටම- කාන්තාවන් බඳවා ගැනීමට. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දුව අපි අරගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ඉතාම කාර්යක්ෂමව වැඩ කරන බස් රථ රියදුරුවරියන්, engine driversලා, guardsලා වාගේ අය තව අවුරුද්දක් යනකොට අපට දකින්න ලැබෙයි කියලා. සිහිනයක් තිබෙනවා school bus service එක වැඩිපුර කාන්තාවන්ට භාර දෙන්න. ඉතින්, අපි බලමු. ඒ වාගේ සිහිනයක තමයි අපි ජීවත් වෙන්නේ.

ගරු සභාපතිතුමනි, අපි මේ අය වැය තුළින්ම කරන්න බලාපොරොත්තු වන තවත් දෙයක් තිබෙනවා. දැන් මාර්ග අනතුරු සිද්ධ වෙනවා. හැබැයි, ඒ අනතුරු වළක්වාගන්න ඒ ගැන නිවැරදි study එකක් කරන්නේ නැහැ, පොලීසියෙන් එන report එක විතරයි තිබෙන්නේ. මේ ළඟදී තෝරයායේ දී හැප්පුණා කදුරුවෙල බස් දෙකක්. කවුරුත් හිතුවා පිටුපසින් ආපු බස් එක තමයි වැරැද්ද කළේ කියලා. නැහැ, බැලුවාම දෙගොල්ලන්ම වැරදියි. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සිටින විශේෂඥයන් යවලා අපි ඒක හරියට study කළා, ගරු අලවතුවල මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ තමයි ඒ අනතුර වුණේ. අපි හඳුනාගත් දේ තමයි, බස් එක නතර කරන්න bus bay එකක් නැහැ. බස් එක නතර කරන්නේ පාරේම තමයි. තරගය නිසාත් පාරේම නතර කරනවා. ඒ නිසා හැම ප්‍රධාන අනතුරකටම පස්සේ අපි බලාපොරොත්තු වෙනවා, ගරු සභාපතිතුමනි, ඒකට අදාළ permanent solution එකක් ගෙනෙන්න. ඒ permanent solutionsවලට මිලියන, බිලියන ගණන් සල්ලි යන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, අපි පාර්ලිමේන්තුව උපරිම වශයෙන් මේ කටයුතුවලට පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙනවා. මේ වන විට අපේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව දෙවතාවක් කැඳවා තිබෙනවා. අපි අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව තුළ උප කමිටු 3ක් පිහිටුවා තිබෙනවා. එක් උප කමිටුවක් තමයි ප්‍රවාහනය ආරක්ෂිත, කාර්යක්ෂම එකක් බවට පත් කරන්න අවශ්‍ය නීති පිළිබඳ කමිටුව. ඒක නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මැතිනියගේ නායකත්වයෙන් පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වන උප කමිටුවක්. ඒ වාගේම, අපි වන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමාගේ නායකත්වයෙන් තවත් උප කමිටුවක් හදලා තිබෙනවා, රථවාහන ක්ෂේත්‍රයේ සිටින සියලු වෘත්තිකයන් වෘත්තීය සම්මිතගත කරලා, ඔවුන්ට සමාජ ආරක්ෂණයක් ලැබෙන විධියට ඉස්සරහට ගන්න.

මොකද, ඒ වැඩ කරන මිනිස්සු ආණ්ඩුවකින් බලා ගන්නේ නැත්නම්, ඒ සේවකයන් කවදාවත් ජනතාව බලා ගන්නේ නැහැ. අපි ජනතාවාදී ආණ්ඩුවක්. මේ පුංචි මිනිස්සු වෙනුවෙන් හදපු ආණ්ඩුවක්. ඒ නිසා අපි ඒක කරන්න බලාපොරොත්තු වෙනවා, ඒ කමිටුවේ තීරණ මත.

ඒ වාගේම අපි දුම්රියවත්, වරායවත් පෞද්ගලීකරණය කරන්නේ නැහැ. වරායේ ECT එක පෞද්ගලීකරණය කරන්නේ නැහැ. අපට කරන්න බැහැ ඒක. ඒක moral issue එකක්; මිනිස්සු බේරා ගත්ත එකක්. ඒ නිසා ඒවා ගැන තිබෙන බොරු කථා විශ්වාස කරන්න ඕනෑ නැහැ. නමුත් වරාය කියන්නේ ලෝකයේ තිබෙන ලොකුම industry එක. ඒකට අනිවාර්යයෙන්ම private playersලා ගෙන්වන්න වෙනවා. නමුත් ඒ ECT එකට නොවෙයි. මම ඉදිරියේදී ඒ විස්තර කියන්නම්. අනිවාර්යයෙන්ම West Container Terminal 2 ව්‍යාපෘතිය, ඒ වාගේම Colombo North Port එක වාගේ master plan එකේ තිබෙන ඒවා සඳහා අපි ලෝකයේ තිබෙන ප්‍රධාන shipping linesවලින් ඉතාම ඉක්මනින් EoIs කැඳවනවා. නමුත් ECT එක ජනතාවගේ දේපළක් වශයෙන් පවත්වාගෙන යනවා.

ගරු සභාපතිතුමනි, දුම්රිය ස්ථානවල, bus standsවල අතිවිශාල ව්‍යාපාරික අවස්ථා තිබෙනවා. අපි අවධානය යොමු කරලා තිබෙනවා, ඒ core business එක ඉතුරු කරගෙන කටයුතු කරන්න. දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් විකුණන එක නොවෙයි, දුම්රිය දෙපාර්තමේන්තුව ඒගොල්ලන්ගේ වැඩේ කරන අතරේ, core business එක රැක ගන්න අතරේ ඒකට අදාළ අනෙක් supportive businesses කොහොමද develop කරන්නේ කියලා බලන්න අපි චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාගේ නායකත්වයෙන් උප කමිටුවක් පත් කරලා තිබෙනවා. මම ඉතාම සතුටු වෙනවා, ඒ උප කමිටුවේ අපේ ජගත් විතාන මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා සජබයේ මන්ත්‍රීවරයෙක්. එතුමා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉන්න දක්ෂ ව්‍යාපාරිකයෙක්. අපි එතුමා ඒකට සම්බන්ධ කරගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, එතුමා ඩිපෝ එකෙන් ඩිපෝ එකට එක්කගෙන යන්න. ඩිපෝ එකෙන් ඩිපෝ එකට ගෙනිහිල්ලා, ඒ ඩිපෝවල business opportunities වැඩි කර ගන්නේ කොහොමද කියලා එතුමාගේ ව්‍යාපාරික ඥානය යොදා ගන්න අපි බලාපොරොත්තු වෙනවා, ගරු සභාපතිතුමනි. එතුමා ඒක ඔප්පු කළ පුද්ගලයෙක්. අපි දේශපාලන වශයෙන් කඳවුරු දෙකක වුණාට, එතුමා ඉතාම constructive සේවයක් කරනවා. අනෙක් මන්ත්‍රීතුමන්ලාත් එතුමාගෙන් ඉගෙන ගන්නවා නම් හොඳයි කියලා මම හිතනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම කියන්න කැමැතියි, අපි උතුරේ මාර්ග හදන්න රුපියල් මිලියන 8,000ක් වෙන් කරලා තිබෙන බව. 1917 සෝවියට් විප්ලවයෙන් පස්සේ ලෙනින් කිව්වා, සමාජවාදය යන්නේ විදුලි කම්බි දිගේ කියලා. අනුර සහෝදරයාගේ අය වැය ගැන මට කියන්න තිබෙන්නේ, උතුරට ආදරය සහ සහෝදරත්වය යන්නේ වට්ටුවාකල් පාලමෙන් එගොඩ වෙලා, උතුරේ තිබෙන පුංචි දුප්පත් ගම්මානවල අපි හදන පුංචි පාරවල් දිගේ කියලා. අපි ඒක කරනවා.

ඒ වාගේම අපි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඩිජිටල් කරනවා. ඒක digitalize කරන්න ලොකු project එකක් තිබුණා. නමුත් ඒක සැලකිය යුතු ලෙස වංචා. දූෂණවලින් පිරිලා තිබුණේ. ඩිජිටල් අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා අපි ඒ කටයුත්ත සෑහෙන ප්‍රමාණයකින් නිවැරදි කරගෙන යනවා. ඒ මඟින් driving licences digitalize කරලා දෙන්නත්, registration කටයුතු කරන්නත්, වංචා දූෂණ අවම කරන්නත් අපි කටයුතු කරනවා.

ඒ වාගේම රියදුරු පුහුණු පාසල් ගැනත් අපි බලන්න ඕනෑ. ඔබතුමා දන්නවා, කවදාවත් පුහුණුවට ගිය නැති අයට driving licences තිබෙනවා. අපට ඒ ගැන අත්දැකීම් තිබෙනවා. ෆෙරාරි ලයිසන් තිබෙනවා කිව්ව එක්කෙනාත් එහෙම කෙනෙක් නේ. අපි හිතාගෙන හිටියේ රනිල් වික්‍රමසිංහ කියන්නේ බොහොම හොඳ කෙනෙක් කියලා. එහෙම තමයි අපට කියලා තිබුණේ. දැන් බැලුවාම හොර ලයිසන් එකක් තිබිලා තිබෙන්නේ. අල් ජසීරා සම්මුඛ සාකච්ඡාවේදීත් බලාස්ටි වුණා. අන්න ඒ ජාතියේ ඛ්‍රයිවර්ලා ඉන්නවා ලංකාවේ, "Ranil Wickremesinghe category", "Ferrari category" එකේ. ඒ නිසා අපි හොඳ රියදුරු පුහුණු පාසල් හදලා හරි පුහුණුවක් දෙන්න ඕනෑ. මොකද, අපේ බස්වල ගහලා තිබෙනවා, "රියදුරු දැතට දෙවි පිහිටයි" කියලා. ගරු සභාපතිතුමනි, ඇත්තටම ඒ පුහුණුවෙන් තමයි රියදුරු දැතට දෙවි පිහිට එන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, you have only two more minutes.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, මම අවසන් කරන්නම්.

පෞද්ගලික අංශයේත්, රාජ්‍ය අංශයේත් සියලුදෙනා පුහුණු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපේ අමාත්‍යාංශය යටතේ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය තිබෙනවා. ඒකේ digitalization ඉතා ඉක්මනින් කරන්න පුළුවන්. අපි ඒකෙන් බලාපොරොත්තු වෙනවා අඩුම ගාණේ මේ වසරේ කෝටි 5ක්, මිලියන 50ක් ඉතුරු කරන්න. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා සිංහල දෙමළ අලුත් අවුරුද්ද පටන් ගන්නකොට විශේෂයෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගයේ මාතරට, ගාල්ලට යන අයට card payment system එකක් හඳුන්වා දෙන්න. දැනට ambitious project එකක් යනවා. අපි හිතනවා අප්‍රේල්වලදී ඒක කරන්න පුළුවන් වෙයි කියලා. මොකද, RDA එක ඒක කරන්න පොරොන්දු වෙලා තිබෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා online bookingsවලට ඒ ක්‍රමය හඳන්න.

ගරු සභාපතිතුමනි, අපි ළඟදීම ලංකාවේ සිටින සියලුම කොන්ත්‍රාත්කරුවන් කැඳවන්න බලාපොරොත්තු වෙනවා. ඔවුන් විශාල වැඩ කොටසක් කරනවා. නමුත් ඔවුන් පුරුදු කරලා තිබෙන්නේ commissionsවලට, පගාවලට, බොරු වැඩවලට. ඒ නිසා අපි ඒ සියලුදෙනාම ගෙන්වලා එක භාෂාවකින් ඔවුන්ට කථා කරන්න බලාපොරොත්තු වෙනවා. අපි ඔවුන්ට කියනවා, "අපට සත පහක්වත් දෙන්න එන්නත් එපා, අපිව හම්බ වෙන්නත් බැහැ, කළ යුතු දේ තමයි tender procedure එක අනුව ගිහින් කොන්ත්‍රාත් අරගෙන වැඩේ හරියට කරන එක. වැඩේ හරියට කළොත් හරියට payments කරනවා, බොරු කළොත් නම් සොරිම තමයි" කියලා. අපි ජනතාවට පොරොන්දු වෙනවා, තමන්ගේ ගමේ පාර හොරෙන් හදලා යන්න අපි අවස්ථාව තියන්නේ නැහැ කියලා. හැම පාරක්ම හදනකොට ගමේ මිනිස්සු සම්බන්ධ කර ගන්න ඕනෑ. කොහොමද මේ පාර හැදෙන්න ඕනෑ, කොතැනින්ද කානුව එන්න ඕනෑ, කොතැනින්ද වැඩිපුර වතුර යන්නේ කියන එක දැන ගන්න ගම්මුන්ගෙන් අහන්න ඕනෑ.

අපි මගී සංගම් ගොඩ නහනවා. ගරු සභාපතිතුමනි, අපි ඒක දැනටමත් පටන් අරගෙන තිබෙනවා. අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, අපි ගුවන් සේවය, ගුවන් තොටුපොළ දියුණු කරන්න බලාපොරොත්තු වෙන බව. අපි නතර කරලා තිබුණු projects රාශියක් දැනටම ජපානයත් එක්ක පටන් අරගෙන තිබෙනවා. මම කැමැතියි, නම් වශයෙන් විතරක් කියන්න. එකක් තමයි, Port Access Elevated Highway එක, කොළඹ වරාය ඇතුළෙන් යන expressway එක. මේක විශාල blunder එකක්, නාස්තියක්. නමුත් අපි උත්සාහ කරනවා මේ වසර අවසන් වෙන්න කලින් ඒකේ කටයුතු අවසන් කරන්න. ඊළඟට, Central Expressway එක. ඔබතුමන්ලා දන්නවා, සමාගම් මේක දාලා ගිය බව.

ජනාධිපතිතුමා චීනයට ගිය වේලාවේත්, ඊට පසුවත් අපි දිගටම මහන්සි වෙලා කටයුතු කරපු නිසා China Exim Bank එක අනිද්දා ලංකාවට එනවා. ඒ අනුව Central Expressway Project එකේ first phase එක පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම Kandy Multimodal Transport Terminal එක නතර කරලා තිබුණු blunder එකක්, වංචනික දෙයක්. අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් මේ සඳහා විශේෂයෙන් මැදිහත් වෙනවා. ඒ වාගේම Urban Development, Construction and Housing Ministry එකත් මේකට සම්බන්ධයි. අපි ඒක කරන්න යනවා, ගරු සභාපතිතුමනි. ඊළඟට, Mattala Airport Project එක හදන්න බිලියන 36.5ක් වියදම් කරලා තිබෙනවා. මේ අවුරුදු පහට එහි බිලියන 38.5ක් වෙනවා, ගරු සභාපතිතුමනි. අපි මේ 09වැනි දා ගිහින්, ප්‍රධාන පෙළේ විදේශීය ඉංජිනේරු සමාගම් සම්බන්ධ කරගෙන Mattala Airport එකේ යම් ආකාරයක planes repair කරන centre එකක් පටන් ගන්න බලනවා. අපට ඒ ගැන යම් කිසි ආකාරයක green light එකක් ඇවිත් තිබෙනවා. ඊළඟට, Bandaranaike International Airport Development Project එක වංචාව නිසා නතර වුණු ව්‍යාපෘතියක් බව අපි දන්නවා. අපි ඒකේ ඉදිකිරීම් කටයුතු මේ ඔක්තෝබර් මාසය වෙනකොට පටන් ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම East Container Terminal ව්‍යාපෘතියටත් කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. මරික්කාර් මන්ත්‍රීතුමාටත් මම ආරාධනා කරන්නම්. මේ වසරේ ජූලි මාසයේදී අපි East Container Terminal එකේ වැඩ සියයට 50ක් පටන් ගන්නවා. ඒක පටන් ගන්න බාධාවක් වෙලා තිබෙන්නේ හොරකම් කරලා, ගෙනෙන්න ඕනෑ මැෂින් ගෙනෙන්න පරක්කු කිරීමයි ඔබතුමන්ලා දන්නවා අපට කඩෙන් බඩු ගන්නවා වාගේ gantries ගන්න බැහැ; carriers ගන්න බැහැ කියලා. ඒවා customized දේවල්; ඒවා order කරලා තමයි ගන්න වෙන්නේ. ඒවාට ගතවන කාලය අපට වළක්වන්න බැහැ. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, Julyවල East Container Terminal එකේ වැඩ පටන් ගන්න. ඔය ටික තමයි මට කියන්න තිබෙන්නේ, ගරු සභාපතිතුමනි.

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන්, පොදු ජනතාවගෙන් - හැම දෙනාගෙන්ම- මම ඉල්ලා සිටිනවා, මේ අමාත්‍යාංශයේ තිබෙන අඩුපාඩුකම් අපට සාධාරණව පෙන්වා දෙන්න කියලා.

ගරු සභාපතිතුමනි, මේ කාරණය කියන්න මම ඔබතුමාගෙන් තව විනාඩියක් ඉල්ලා සිටිනවා. අපි ඇමතිවරු වශයෙන් විශාල ලෙස මේ අමාත්‍යාංශවල වියදම් අඩු කරලා තිබෙනවා. මම ඒ පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනය **සභාගත*** කරනවා.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු සභාපතිතුමනි, ඇමති සහ පෞද්ගලික කාර්ය මණ්ඩලය යන දෙකම එකතු කරලා ගත්තොත්, 2020දී ඇමතිවරයා සහ පෞද්ගලික කාර්ය මණ්ඩලයට මාසයකට වියදම, එහි average එක රුපියල් ලක්ෂ 132යි. 2021දී ඇමතිවරයා සහ පෞද්ගලික කාර්ය මණ්ඩලයට වියදම රුපියල් ලක්ෂ 136යි. 2022දී කොවිඩ්-19 පැවතුණා, ඒත් වියදම රුපියල් ලක්ෂ 83යි; 2023 ඇමතිවරයා සහ පෞද්ගලික කාර්ය මණ්ඩලයට වියදම රුපියල් ලක්ෂ 158යි; 2024 සැප්තැම්බර් දක්වා වියදම රුපියල් ලක්ෂ 136යි. එදා සිට මේ දක්වා ගත්තොත්, මාසයකට - මම මේ කිව්වේ මාසයකට ගණන - මම සහ මගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට වියදම් වෙලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 23යි. අපි අඩුම ගණනේ හත් ගුණයකට ආසන්න ප්‍රමාණයකින් වියදම් අඩු කරලා තිබෙනවා. අපි එවැනි ආදර්ශයක් ලබා දෙමින් තමයි වැඩ කරන්නේ.

මට වැඩිපුර වෙලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Kaveenthiran Kodeeswaran. You have five minutes.

[மு.ப. 10.43]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தலைப்பு களுக்கான விவாதத்துக்கு நான் நேரடியாக வருகின்றேன். விசேடமாக, நெடுஞ்சாலைகள் சம்பந்தமாகவும் போக்கு வரத்துச் சம்பந்தமாகவும் வீடமைப்புச் சம்பந்தமாகவும் உரையாற்றலாமென்று நினைக்கின்றேன். அம்பாறை மாவட்டத்திலே உள்ள கிட்டங்கிப் பாலம் நீண்ட காலமாகப் புனரமைக்கப்படாத நிலையில் இருக்கின்றது. மிகவும் பழைமைவாய்ந்த இந்தப் பாலம் அம்பாறைக்குச் செல்லுகின்ற பிரதான வீதியிலே கல்முனை - நாவிதன்வெளியை இணைக்கின்ற ஒரு பாலமாக இருக்கின்றது. இப்பாலம் புனரமைக்கப்படாததன் காரணமாக மழை காலத்திலே பல உயிர்கள் காவுகொள்ளப்படுகின்றன. மாரி காலம் வருகின்ற போது நாவிதன்வெளியிலே இருக்கின்ற கிட்டத்தட்ட 30,000 பேர் வேறு இடங்களுக்குச் செல்ல முடியாமல் கிட்டத்தட்ட இரண்டு மாதங்களுக்கு முடக்கப்படுகிறார்கள். இந்த விடயங்களை அடிப்படையாகக்கொண்டு அம்பாறை மாவட்டத்திலே உள்ள மிகவும் முக்கியமான இந்தப் பாலத்தைப் புனரமைக்க வேண்டும். இது சம்பந்தமாகப் பல தடவை இந்தச் சபையிலும் பலர் கூறியிருக்கிறார்கள். நீங்கள் இதுசம்பந்தமாக அந்த மாகாணத்திலே இருக்கின்ற Provincial Director - RDA இடம் கேட்டுப் பார்க்கலாம். இது அங்குள்ள மக்களின் போக்குவரத்துக்கு மிகவும் அவசியமானதாக இருக்கின்ற காரணத்தினால் கட்டாயம் இந்தக் கிட்டங்கிப் பாலத்தைப் புனரமைக்க நடவடிக்கை எடுக்கவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதுதவிர, அரசாங்கத்தின் பாலங்கள் புனரமைப்புத் திட்டத்தின்கீழ் பின்வரும் பாலங்களை உள்ளடக்கும்படி இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன். விசேடமாக, அம்பாறை மாவட்டத்திலே கோமாரியிலே அமைந் திருக்கின்ற மணற்சேனைப் பாலம் பொருளாதார ரீதியாகவும் சுற்றுலாத்துறை ரீதியாகவும் மீன்பிடி ரீதியாகவும் மிகவும் முக்கியத்துவம் வாய்ந்த ஒன்றாக இருக்கின்றது. இதனை நீங்கள் கட்டாயம் புனரமைக்க வேண்டும். ஏனென்றால், இது பொருளாதார நடவடிக்கைகளுக்குப் பாரிய பங்களிப்புச் செய்கின்ற பாலமாக இருக்கின்றது. அதேபோல் கணபதிபுரம் - சின்னவாய்க்கால், தம்பிநாதபுரத்தில் இருக்கின்ற பாலம், துரைவந்தியன் மேட்டுப் பாலம் போன்றவை அமைக்கப் படுவது கூடுதலான மாணவர்கள் போக்குவரத்தை மேற்கொள்ள இலகுவாக அமையும். இந்தப் பாலங்கள் சீரமைக்கப்படாமல் இருப்பதன் காரணமாக, பாடசாலை மாணவர்கள் மாதக் கணக்கில் பாடசாலைக்குச் செல்வதில்லை. அதன் காரணமாக அவர்களின் கல்வி மிகவும் பின்தள்ளப்பட்ட நிலையில் காணப்படுகின்றது.

அதேபோல், வளத்தாப்பிட்டியில் விபுலானந்த வீதியில் இருக்கின்ற பாலம், நாவிதன்வெளி மாரியம்மன் கோவில் முன் உள்ள பாலம் ஆகியவை அதிகளவான மக்கள் பிரயாணம் செய்கின்ற பாலங்களாகும். இந்தப் பாலங்களின் புனரமைப்புப் பற்றியும் நீங்கள் கவனத்திற்கொள்ள வேண்டுமென்று இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன்.

விசேடமாக, பொத்துவில் - கனகர் கிராமம் 60ஆம் கட்டையிலே, 45 வருடங்களாக இடம்பெயர்ந்திருந்து மீளக் குடியேற்றப்பட்டிருந்தவர்களில் 76 பேருக்குத் தற்பொழுது காணி கொடுக்கப்பட்டிருக்கின்றது. மிகுதி 126 பேருக்குக் காணி கொடுக்கப்பட வேண்டும். இவ்வாறு காணி கொடுக்கப்பட்ட 76 பேருக்கும் வீட்டுத் திட்டங்கள் மற்றும் ஏனைய அடிப்படை வசதிகளைக் கட்டாயமாகச் செய்து கொடுக்கவேண்டிய கடமைப்பாடு இருக்கின்றது. மீளக் குடியமர்த்துகின்ற திட்டத்தின்கீழ், அவர்களுக்கான வீதியமைப்பு மற்றும் வீட்டுத் திட்டம் போன்ற அடிப்படை வசதிகளைச் செய்து, அந்த இடத்திலே அவர்களைக் குடியமர்த்தும்படி இந்த இடத்திலே தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

அதைத் தவிர, கல்முனை தொடர் மாடியிலே 938 வீடுகள் இருக்கின்றன. அவை குடியிருப்பு வீட்டுத்திட்டங்கள். அவற்றுக்கான உரிமைப் பத்திரம் கிட்டத்தட்ட 17 வருடங் களாகக் கொடுக்கப்படவில்லை. நீலாவணை - '1பி'இல் இருக்கின்ற மூன்று மாடிக் குடியிருப்புத் திட்டம், நீலாவணை - 1இல் இருக்கின்ற 'அம்மா வீட்டுத் திட்டம்' மற்றும் 'குருந்தடி வீட்டுத் திட்டம்' போன்ற வீட்டுத் திட்டங்களின்கீழ் condominium வீடமைப்பாக அமைக்கப்பட்ட அந்த 938 வீடுகளில் குடியிருக்கின்றவர்களுக்கான வீட்டுரிமைப் பத்திரத்தை வழங்குவதற்கு வழிசெய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Sir, give me one more minute, please.

அதேநேரம், அந்த இடங்களில் கழிவகற்றுகின்ற பொறிமுறை இல்லாத காரணத்தினால், அதனையும் அங்கு செய்ய வேண்டுமென்று இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன். அத்துடன், NHDA வீட்டுத் திட்டத்தின்கீழ் 1980ஆம் ஆண்டு தம்பிலுவிலில் 30 ஏக்கர் நிலத்தில்

අමෙක්කප්පට්ට වීට්ටුත් තිට්ටත්තිල් උළ්ළ 157 වීටුකළ්, මත්රුම් ආලෙයඩිවේම්පු, කණ්ණකිපුරත්තිලේ අමෙක්කප්පට්ට 76 වීටුකළුක්කාන උරිමෙප් පත්තිරම් මත්රුම් කාණි උරිමෙප් පත්තිරම් ඉන්නුම් වළුංකප්පඩවිල්ලෙ. අවර්කළිල් 90 සතවීතමානවර්කළ් අතර්කාන පණත්තෙයුම් කොටුත්තු විට්ටාර්කළ්. 1980ආම් ආණ්ටිලිරුන්තු අංකු වසිප්පවර්කළුක්කු අන්ත උරිමෙප් පත්තිරම් වළුංකප්පටාත නිලෙයෙක් කරුත්තිර්කොණ්ටු, අවර්කළුක්කාන උරිමෙප් පත්තිරංකළෙ උටනටියාක වළුංකුවතර්කු ආවන සෙය්යුමාරු තයවාකක් කේට්ටුක් කොළ්කින්රේන්. අත්තුටන්, කටන්ත ආට්චික් කාලත්තිලේ වීට්ටුත් තිට්ටත්තින්කීළ් අලිකම්පෙයිල් ආරම්පික් කප්පට්ට 100 වීටුකළුම්, තාණ්ටියටියිල් ආරම්පික්කප්පට්ට 50 වීටුකළුම් තර්පෝතු කුරෙයාක ඉරුක්කින්රන. අවර්රෙයුම් පූර්ත්තිසෙය්තු වළුංකුම්පටි කේට්ටුක්කොණ්ටු, එනතු උරෙයෙ මුටික්කින්රේන්. නන්රි!

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
The Hon. Sunil Kumara Gamage. You have 14 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ වීය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිණින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්පුමිකු (වෛත්තියර්) රිස්වි සාලි] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 10.48]

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු සුනිල් කුමාර කමකේ - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු සභාපතිතුමනි, අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේදී අද දින මා අදහස් දැක්වීමට බලාපොරොත්තු වන්නේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේයි. මෙම අමාත්‍යාංශය යටතේ තිබෙන ලංකාවේ විශේෂිත ආයතනයක් තමයි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. මේ ආයතනයේ වැදගත්කම පිළිබඳව අපි හැමෝම දන්නවා. මොකද, මිනිස්සුන්ට මොනවා නැති වුණත් ජීවත් වෙන්න වතුර ඕනෑ; පානීය ජලය ඕනෑ. ලංකාවේ පානීය ජලය සපයන එකම ආයතනය වන්නේ ජල සම්පාදන මණ්ඩලයයි. එම නිසා ජල සම්පාදන මණ්ඩලය සම්බන්ධව මේ සභාවේදී සාකච්ඡා කළ යුතුම කාරණා කිහිපයක් තිබෙනවා.

ජල සම්පාදන මණ්ඩලය සතු ශක්‍යතාව ගත්තොත්, එහි දක්ෂ නිලධාරීන් පිරිසකුත්, දක්ෂ සේවක පිරිසකුත් ඉන්න බව අපි දන්නවා. ඒ වාගේම විශාල සම්පත් ප්‍රමාණයක් ජල සම්පාදන මණ්ඩලය සතුව තිබෙනවා. ඒ වාගේම අමුද්‍රව්‍ය - raw materials - නොමිලේ - free - ලැබෙන එකම ආයතනය ලෙසත් අපට ජල සම්පාදන මණ්ඩලය හඳුන්වන්න පුළුවන්. මෙන්න මේ වාගේ ආයතනයක් තමයි අපට කළමනාකරණය කරන්න වෙලා තිබෙන්නේ, ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය විසඳීම වෙනුවෙන්; පානීය ජල අවශ්‍යතාව සපුරාලීම වෙනුවෙන්.

මේ ආයතනයේ මූල්‍ය තත්ත්වය ගැන කිව්වොත්, 2014 වර්ෂයේ සිට මේ වෙනකොට ලංකාවේ ජල සම්බන්ධතා 3,150,000ක් ලබා දී තිබෙනවා. ඒ වාගේම pipe-borne water ලංකාවේ ආවරණය කරන ප්‍රතිශතය 45 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. නමුත්, එය ප්‍රමාණවත් නැහැ. ඒ ප්‍රමාණය අපි වැඩි කරගන්න ඕනෑ. *[බාධා කිරීමක්]* සියයට 60 එන්නේ අනෙක් ආයතනත් එක්ක. CBOs ඇතුළු අනෙක් ආයතන සියල්ල ගත්තොත් සියයට 60යි. National Water Supply and Drainage Board එක සියයට 45යි. මේ ආයතනයේ පිරිවැටුම ගිය වර්ෂයේ - 2024දී- රුපියල් බිලියන 84යි. විකුණුම් පිරිවැය රුපියල් බිලියන 37යි. ඒ අනුව මේ ආයතනය රුපියල් බිලියන 46ක -සියයට 50ක- විතර දළ ලාභයක් තිබෙන ආයතනයක්. ඒ නිසා ජනතාවට ගැටලුවක් මතු වෙනවා, මේ වාගේ ආයතන කොහොමද අලාභ ලබන තත්ත්වයට පත් වෙන්නේ කියලා. අපි ඒ ගැන වෙනම සාකච්ඡා කරමු.

ජල සම්පාදන මණ්ඩලයේ මුළු වියදම් ඇතුළේ විශේෂ වියදම් කිහිපයක් ද තිබෙනවා; දශක ගණනක ඉඳලා එන ප්‍රශ්න කිහිපයකුත් එක්ක එන වියදම් කිහිපයක් තිබෙනවා. ඉන් ප්‍රධාන එකක් තමයි, ජල සම්පාදන මණ්ඩලයේ මේ දවස්වල තිබෙන මූල්‍ය වියදම. මේ වෙනකොට ජල සම්පාදන මණ්ඩලයට සිද්ධ වෙලා තිබෙනවා, පසුගිය වර්ෂයේ මණ්ඩලය ලබා ගත් ණය වෙනුවෙන් රුපියල් බිලියන 12.2ක් මූල්‍ය වියදම විධියට දරන්න. එතකොට ගිය වර්ෂයේ මේ ආයතනයේ ලාභය රුපියල් බිලියන 24ක් වෙනකොට, ඉන් භාගයකට සමාන ප්‍රමාණයක් මූල්‍ය වියදම් විධියටත් දරන්න සිදු වෙලා තිබෙනවා.

මේ මූල්‍ය වියදම් ගැන ඇයි මම සඳහන් කරන්නේ? අපේ රට මේ අර්බුදයට ගිහිල්ලා තිබෙන ප්‍රධාන හේතුවක් තමයි, පසුගිය රජයන් ලබා ගත් ණය. ඒ ණය හරියට ආයෝජනය නොකිරීම නිසා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. අපි හැමදාම කියනවා වාගේ ණය ගැනීම වැරදි වැඩක්, ශාපයක් නොවෙයි. නමුත්, ඒ ගන්න ණය හරියට ආයෝජනය නොකිරීම නිසා, ඒ ණය නිවැරදිව කළමනාකරණය නොකිරීම නිසා රටත්, ආයතන ගණනාවකුත් විනාශයට, අභාවයට යමින් තිබෙනවා. ජල සම්පාදන මණ්ඩලයත් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ කරුමයට කර ගහපු එක ආයතනයක්.

ජල සම්පාදන මණ්ඩලය 2024 වර්ෂය වෙනකොට ගොඩ නඟපු, ප්‍රාග්ධනගත කරපු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 529යි. ඒ රුපියල් බිලියන 529ඉ වත්කම් තිබෙනවා වාගේම තවමත් වත්කම් නොවී කෙරිගෙන යන ව්‍යාපෘති තිබෙනවා, රුපියල් බිලියන 347ක. ඒවා ගත්තොත්, ව්‍යාපෘති 24ක් තවමත් කෙරිගෙන යන ඒවා විධියට තිබෙනවා. ඇයි, මේ කෙරිගෙන යන ව්‍යාපෘති ගැන මම මේ වෙලාවේ කථා කරන්නේ? මොකක්ද ඒකේ තිබෙන විශේෂත්වය? විශේෂත්වය තමයි, මේ ව්‍යාපෘති 24න් 20ක්ම ආරම්භ කරන්නේ, 2017 වර්ෂයට ඉස්සෙල්ලා. තවමත් මේ ව්‍යාපෘති කෙරිගෙන යන වැඩ ගොඩේ තමයි තිබෙන්නේ. මේ බොහෝ ව්‍යාපෘතිවලට ඒ ව්‍යාපෘතියට වෙන්කර තිබෙන කාලය වාගේ තුන් ගුණයක්, හතර ගුණයක් ගතව තිබෙනවා. ඇයි, ජල සම්පාදන මණ්ඩලයේ ව්‍යාපෘතිවලට එහෙම වුණේ? මාස දෙකෙන් මොකද වුණේ කියලා අපෙන් අහන අයට අපි කියනවා, අපි මේ කරගහලා තිබෙන්නේ පොඩි කරුමයකට නොවෙයි කියලා. මේක විශාල එකක්. මේ ව්‍යාපෘති 20 ඇතුළේ තිබෙනවා, the Greater Colombo Water and Wastewater Management Improvement Investment Project. මම මේ කියන්නේ කිහිපයක් පමණයි. මේ

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

ව්‍යාපෘතිය ආරම්භ කරන්නේ 2014දී. වර්ෂ 5කින් මේ ව්‍යාපෘතිය අවසන් වෙන්න ඕනෑ. දැනට වර්ෂ 10ක් ගිහිල්ලා තිබෙනවා. හැබැයි, තවමත් මේ ව්‍යාපෘතිය තිබෙන්නේ කෙරීගෙන යන වැඩ ගොඩ ඇතුළේ.

ඊළඟ එක තමයි, Jaffna and Kilinochchi Water Supply and Sanitation Project එක. ඒ ව්‍යාපෘතිය ආරම්භ කරන්නේ 2011 අවුරුද්දේ. එම ව්‍යාපෘතිය අවුරුදු 7කින් අවසන් වෙන්න ඕනෑ. නමුත්, දැන් ඒ ව්‍යාපෘතියට අවුරුදු 14ක් ගත වෙලා තිබෙනවා. තවමත් එම ව්‍යාපෘතිය වැඩ කෙරීගෙන යන ව්‍යාපෘතියක් විධියටයි තිබෙන්නේ.

ඊළඟට තිබෙනවා, Laggala New Town Water Supply Project එක. ඒ ව්‍යාපෘතිය 2016 අවුරුද්දේ පටන් ගත්තේ. අවුරුදු දෙකෙන් එහි වැඩ අවසන් වෙන්න ඕනෑ. නමුත්, දැන් අවුරුදු 8ක් ගත වෙලා තිබෙනවා. අපි මේවා මතු කරන්නේ ඇයි? මේ ව්‍යාපෘති 24ම මේ වාගේ තත්ත්වයක තමයි තිබෙන්නේ. මේවා ළඟදී පටන් ගත්ත ව්‍යාපෘති නොවෙයි; කොවිඩ් ප්‍රශ්න නිසා නැවතුණු ව්‍යාපෘති නොවෙයි; අරගළය නිසා නැවතුණු ව්‍යාපෘතිත් නොවෙයි. මේ ව්‍යාපෘති 2015, 2016, 2017 වර්ෂවල පටන් ගත්ත ඒවා. මේ දවස්වල අපට ආණ්ඩුකරණය සම්බන්ධයෙන් උපදෙස් සපයමින් සිටින අයගේ ආණ්ඩු කාලයේ පටන් ගත්ත ව්‍යාපෘති තමයි මේ තිබෙන්නේ. ඒ සමහර ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයන කර නැහැ. සමහර ව්‍යාපෘති අවසන් වෙන්නේ කොහොමද කියලා දන්නේ නැහැ; කිසිම සැලැස්මක් නැහැ. ඒ දවස්වල ආණ්ඩුවේ තිබුණු ඒකාධිකාරයට, ඇමතිවරුන්ගේ තිබුණු power එකට ආරම්භ කරපු බොහෝ ව්‍යාපෘති මේක ඇතුළේ තිබෙනවා. මෙම ව්‍යාපෘතිවලින් සිදු වෙලා තිබෙන හානිය තමයි රටේ ජනතාවගේ මුදල් නාස්ති වීම.

අපි දන්නවා, ලංකාවේ ටෙන්ඩර් ක්‍රමයක් තිබුණු බව. එම ටෙන්ඩර් ක්‍රමය 2010 අවුරුද්ද වනකොට වෙනස් කළා, එවකට හිටපු ආණ්ඩුව. ඒක වෙනස් කරලා ලංකාවට හඳුන්වා දුන්නා, unsolicited proposals කියන ටෙන්ඩර් ක්‍රමය. මේ unsolicited proposals කියන ටෙන්ඩර් ක්‍රමය තමයි අපේ රටේ ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට කරන්න පුළුවන් ලොකුම හානිය කළේ. ඒකෙන් තමයි අපේ රටේ ජනතාවගේ මුදල් විශාල වශයෙන් නාස්ති වුණේ. එම ටෙන්ඩර් ක්‍රමවේදය යටතේ තමයි මේ ව්‍යාපෘති සියල්ල ආරම්භ කළේ. එලෙස ආරම්භ කරපු ව්‍යාපෘති වෙනුවෙන් ගත්ත ණය නිසා දැන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිර වෙලා තිබෙනවා. ඒ ණය නිසා අපට තවමත් ගෙවන්න වෙලා තිබෙනවා, රුපියල් බිලියන 286ක්. අදටත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ණය විධියට රුපියල් බිලියන 286ක් ඉතුරු වෙලා තිබෙනවා. අන්න ඒ සැලැස්මක් නැතිව ආරම්භ කරපු අකාර්යක්ෂම ව්‍යාපෘතිවලට තමයි අර මම කලින් සඳහන් කරපු රුපියල් බිලියන 12ක, 13ක මූල්‍ය වියදම් අදටත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවන්න වෙලා තිබෙන්නේ. දැන් අපට හිතෙන්න පුළුවන්, "ආ, මේ සංඛ්‍යාලේඛනේ" කියලා. ඒ රුපියල් බිලියන 12 ගෙවීම වෙනුවෙන් තමයි පසුගිය අවුරුද්දේත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වතුර බිල වැඩි කළේ. දැන් ජනතාවගේ වතුර බිල වැඩි වෙනවා. ඒකට හේතුව මොකක්ද? ණය වාරික සහ පොලී ගෙවන්න සල්ලි නැති වීම. පොලී ගෙවන්න වතුර බිල වැඩි කරනවා. පොලී ගෙවන්න සිදු වුණේ මොකද? අකාර්යක්ෂමව ක්‍රියාත්මක කරපු සැලසුමක් නැති ව්‍යාපෘති. දැන් අපට උපදෙස් දෙන අයගේ ආණ්ඩු ඒ කාලයේ සැලසුමක් නැතුව පටන්ගෙන අකාර්යක්ෂමව ක්‍රියාත්මක කරපු නාස්තිකාර, මිල ගණන් වැඩි ව්‍යාපෘති නිසා අවසානයේ අපේ රටේ ඇත ගම්වල ඉන්න දුප්පත් මනුස්සයාටත් ණය ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඒක තමයි මේක ඇතුළේ තිබෙන බේදවාචකය. මේ හානිය කරපු කට්ටිය මේවා ගෙවනවා නම් මිනිසුන්ට කිසි ප්‍රශ්නයක් නැහැ. එම නිසා ගරු සභාපතිතුමනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මේ ව්‍යාපෘති ගැටලුව අදටත් විශාල වශයෙන් තිබෙනවා. ඒක ශාපයක් විධියට කරකැවෙමින් තිබෙනවා. අපේ රජය බලාපොරොත්තු වෙනවා, මේ ගැටලුව විසඳා ගන්න.

ගරු සභාපතිතුමනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තිබෙනවා, ආදායම් නොලබන ජලය - NRW, Non-Revenue Water - කියලා එකක්. අදටත් අපට නිෂ්පාදනයෙන් සියයට 27ක් ආදායම් ලබන්න බැහැ; ආදායම එන්නේ නැහැ. ඒ කියන්නේ, අපේ නිෂ්පාදනයෙන් හතරෙන් එකක් තවමත් පිරිවැයක් විධියට තිබෙන්නේ. අපේ ජල පරිභෝජනයේදී unit එකකට අපි රුපියල් 100ක් ගෙවනකොට ඒකෙන් සියයට 27ක් ආදායම් නොලබන - non-revenue - කොටස විධියටයි තිබෙන්නේ; ඒ කියන්නේ, වියදමක් විධියට. අපි වතුර ඒකකයකට ගෙවන මුදලෙන් සියයට 16ක් ඒකේ මූල්‍ය පිරිවැය විධියට අපට දරන්න වෙලා තිබෙනවා.

ඒ වාගේම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඒකක පිරිවැය ඇතුළේ සියයට 21ක් සේවක නඩත්තුව වෙනුවෙන් කරන වියදම තිබෙනවා. 2015 අවුරුද්දේ පත් වුණු ආණ්ඩුවේ හිටපු ජල සම්පාදන අමාත්‍යාංශය භාර ඇමතිතුමා - මම නම් කියන එක හරි නැහැ. කවුද කියලා සොයා බැලුවොත් සොයා ගන්න පුළුවන් - සේවකයින් 500ක් අනවශ්‍ය විධියට මණ්ඩලයට බඳවා ගත්ත බව අපි දන්නවා. අම්පාරේ ඔෆිස්වල සංගීත පුටු තරගයක් වාගේ තිබුණා, ඒ අයට වාඩි වෙන්න ඉඩ නැතිව. නුවර ඔෆිස් එකේත් සංගීත පුටු තරගයක් වාගේ තමයි තිබුණේ. උදේට එක්කෙනෙක් එනවා; සවසට එක්කෙනෙක් එනවා. කිසි සැලැස්මක් නැතුව සේවකයින් 500ක් දේශපාලන බලපෑම් මත බඳවා ගත්තා. ඒවාත් පිරිවැය වැඩි වෙන්න හේතු වෙලා තිබෙනවා. වාගේම, දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිවරයාගේ කාලයේදීත් මේ ආයතනයට සේවකයෝ බඳවා ගත්තා. මම නිශ්චිතව, දැඩි විශ්වාසයෙන් යුතුව කියනවා, අපේ ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා එක සේවකයෙක්වත් මේ ආයතනයට බඳවා ගෙන නැති බව. එහෙම තමයි, අපි රාජ්‍යය පාලනය කරන්නේ. එහෙම තමයි අපි කටයුතු කරන්නේ. ඒවාත් මණ්ඩලය අද තිබෙන තත්ත්වයට පත් වෙන්න හේතු වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශයේ "Water for All" කියලා project එකක් පටන් ගත්තා. අපි ඒකට කිව්වේ, "Waterfall" කියලා. ඒක හරියට දියඇල්ල වාගේයි පවත්වා ගෙන ගියේ. කිසිම සැලැස්මක් නැතුව පයිප්ප ගෙනාවා. ඒවාත් කළේ ඔය හොඳටම කළාය කිව්ව කාලයේ හිටපු ලේකම්තුමන්ලා. මෙන්න මේ වාගේ නාස්තිකාර, අර්බුදයට යවපු ආයතනයක් තමයි අපිට ගොඩ ගන්න වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sunil Kumara Gamage, your time is up.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න.

අපේ අමාත්‍යාංශයේ මුළු වියදම රුපියල් මිලියන 95,000යි. ඒකෙන් රුපියල් මිලියන 49,000ක් - සියයට 51කට වැඩි ප්‍රමාණයක් - මේ අවුරුද්දේ මේ අර්බුදයට පත් කරපු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගොඩ ගැනීම වෙනුවෙන්

අපේ ආණ්ඩුව වියදම් කරනවා. විශේෂයෙන්ම, Jaffna Kilinochchi Water Supply and Sanitation Project එක වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් මේ අය වැය ලේඛනයෙන් වෙන් කරලා තිබෙනවා. මේ අර්බුදයට යවලා, අනලා, විනාශ කරලා අපට ලබා දීපු ආයතන අපේ රජය තුළ අපි කොහොම හරි ගොඩ ගන්නවා. ඒකට අපිට දියුණු, දක්ෂ සේවක මණ්ඩලයක් ඉන්නවා; හොඳ, අවංක නිලධාරීන් ඉන්නවා. ඒ අයත් එකතු කරගෙන ජනතාවට හොඳ සේවයක් සපයන්න, අපේ රජයට වාගේම ගරු ඇමතිතුමාට පුළුවන් වෙනවා කියන විශ්වාසයෙන් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. J.C. Alawathuwala. You have five minutes.

[පූ.භා. 11.03]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සභාපතිතුමනි, ඉතා වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී මට කථා කරන්න ඉතා කෙටි කාලයක් හෝ ලබා දීම පිළිබඳව මම සතුටු වෙනවා. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ගැන ගරු ඇමතිතුමා කරුණු ගණනාවක් කිව්වා. මම හිතන විධියට, එතුමාටත් කථා කරන්න වේලාව මදි වුණා. ගරු ඇමතිතුමාගෙන් මම මේ කාරණය දැනගන්න කැමැතියි. අධිවේගී මාර්ගවලට 2025 වර්ෂයේ මුදල් වෙන් කරපු ඇස්තමේන්තුවල ඔබතුමා කියපු අනෙක් මාර්ග ඔක්කොම සඳහන්ව තිබෙනවා. කුරුණෑගල - දඹුල්ල මාර්ගය කියන්නේ ඉතා වැදගත් මාර්ගයක්. නමුත්, 2025 ඇස්තමේන්තුවලත් ඒ මාර්ගය සඳහා කිසිම මුදලක් වෙන් වෙලා නැහැ. ඒ ගැන මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි. මොකද, ඒක ඉතා වැදගත් මාර්ගයක්. කුරුණෑගල - දඹුල්ල මාර්ගය කියන්නේ, එක පැත්තකින් ත්‍රිකුණාමලයටත්, අනෙක් පැත්තෙන් අනුරාධපුරයේ සිට යාපනය දක්වාත් යන්න පුළුවන් ඉතා වැදගත් මාර්ගයක්. ඇත්තටම ඒක උතුර, නැහෙනහිර යා කරන්න කලින් ආරම්භ කිරීමට තිබුණු මාර්ගයක්. ගොඩක් අය දන්නවා, ත්‍රිකුණාමලයේ ඉඳන් දඹුල්ල දක්වා එන්න පහසුයි කියන එක. මොකද, ඒ මාර්ගයේ විශාල තදබදයක් නැහැ. නමුත්, සමහර වෙලාවට කුරුණෑගල සිට දඹුල්ල දක්වා යන්න පැය දෙකක් විතර ගත වෙනවා. මොකද, නගර ගණනාවක් පසු කරලා යන්න තිබෙනවා. දඹුල්ල කියන්නේ, නිෂ්පාදන ගණනාවක් කරන, විශේෂයෙන්ම එළවලු සහ අනෙකුත් වගා රාශියක් කරන, "නොනිදන නගරය" කියලා හඳුන්වන නගරය; "නින්ද නැති නගරය" කියලා තමයි දඹුල්ලට කියන්නේ. මම හිතන විධියට, එහෙම නගරයකට යන මාර්ගය හදන එක ඇත්තටම ප්‍රමාද වෙලා වැඩියි. මේ සඳහා ඉඩම් මැනලා, ඉඩම් අත්පත් කරගෙන ගොඩක් දේවල් කරලා තිබෙනවා. අපේ කුරුණෑගල දිස්ත්‍රික්කය හරහා තමයි මේ මාර්ගය යන්නේ. මේක උතුර, නැහෙනහිර යා කරන වැදගත්ම මාර්ගයක් කියන එක හැමදෙනාම දන්නවා. ඒ සඳහා 2025 අවුරුද්දේදීවත් යම් කාර්යයක් කෙරෙන්නේ නැද්ද කියලා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කඩවත-මීරිගම අධිවේගී මාර්ගය ගැන. ඔබතුමා දන්නවා මේ මාර්ගය ආරම්භ කරලා ගොඩාක් කල් බව. චීන සමාගම මේකේ වැඩකටයුතු නැවැත්තුවා. ඒකට හේතු ගණනාවක් බලපෑවා. විශේෂයෙන්ම යහපාලන රජය කාලයේ මෙය ආරම්භ කරලා, මුල් අදියර අවසන් කරන්න තිබුණත් අවසන් කරන්න බැරි වුණා. නමුත් මීරිගම-කුරුණෑගල කොටස අවසන් කළා. දේශීය ව්‍යාපාරිකයන්, කොන්ත්‍රාත්කරුවන් ඒ කටයුත්ත භාර අරගෙන කළා. නමුත්, චීනයට තිබුණු කොටස යම් හේතුවක් නිසා ප්‍රමාද වෙලා තිබෙනවා. දැන් තවදුරටත් ප්‍රමාද වෙලා තිබෙනවා. මම හිතන විධියට සියයට 25ක, 30ක ප්‍රමාණයක් හදලා තිබෙනවා. මේක ඉතා වැදගත් මාර්ගයක්. ඒ සඳහා ඔබතුමා කරුණු ගණනාවක් කිව්වා. ඒ කටයුත්ත චීනයත් එක්ක කථා කරලා නැවත ආරම්භ කරනවා කිව්වා. ඒ සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරීමක් මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. මම හිතන විධියට, ඔබතුමාට ඒ ගැන හරි පැහැදිලි කිරීමක් කරන්න ලැබුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, අනෙක් එක තමයි පොතුහැර-ගලගෙදර දක්වා මාර්ග කොටස. මෙහි රඹුක්කන දක්වා කොටසේ වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඒකත් මම හිතන විධියට දේශීය කොන්ත්‍රාත්කරුවන් කරන්නේ. එතකොට රඹුක්කන ඉඳලා ගලගෙදර දක්වා කොටසත් ඉතා වැදගත්. මොකද, මේක නුවර ඉඳන් එන්න තිබෙන අධිවේගී මාර්ගය. නුවර අය ගොඩාක් දෙනෙක් මාවතගම හරහා මල්ලවපිටියට ඇවිල්ලා තමයි අධිවේගී මාර්ගයට පිවිසෙන්නේ. ඒක ලෙහෙසියි අනෙක් පැත්තෙන් යනවාට වැඩිය. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙනුත් පොඩි පැහැදිලි කිරීමක් කරන්න. මේවා ඉතා වැදගත් මාර්ග.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have only one more minute.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සභාපතිතුමනි, මම දීර්ඝ වශයෙන් වෙලාව ගන්නේ නැහැ. මට අත්‍යවශ්‍ය වෙලා තිබුණේ මේ කාරණා ටික ඉදිරිපත් කරන්නයි.

දකුණු අධිවේගී මාර්ගයට අපි කවුරුවත් විරුද්ධ නැහැ. එය හම්බන්තොට දක්වා තිබෙනවා. නමුත්, මේ දඹුල්ල දක්වා, නුවර දක්වා, කුරුණෑගල දක්වා වන අධිවේගී මාර්ග ටිකත් අපේ රටේ සංවර්ධනයට, අපේ රට ඉදිරියට යන්න ඉතා වැදගත්. උතුර, දකුණ යා කරන්න තිබෙන මාර්ගය තමයි දඹුල්ල දක්වා දිවෙන අධිවේගී මාර්ගය. ඒ නිසා මේ සම්බන්ධයෙන් වන ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Rauff Hakeem. You have 15 minutes.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Chairman, I will be taking the time allotted to Hon. Nalin Bandara Jayamaha as well because he is not coming today. So, his time also can be added to my time.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay.

[පූ.භා. 11.08]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, වැදගත් ආයතන රාශියක් එකතුව තිබෙන ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න ලැබීම සතුටක්. ඇත්තටම මම පුදුමයට පත් වෙනවා, ගරු ඇමතිතුමා විනාඩි 20යි ගත්තේ. මෙම අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ පිළිබඳව දවස පුරා කථා කළත් ප්‍රමාණවත් නැහැ. අද අපි කථා කරනවා නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැනත්. මෙහිදී මම මුලින්ම සඳහන් කළ යුතුයි, නාගරික සංවර්ධන අධිකාරිය මේ අමාත්‍යාංශය යටතේ තිබෙන බැවින්, විටින් විට කථා බහට ලක් වන අකුරණ නගරයේ ජල ගැලීම් පිළිබඳව. නිතර නිතර මේ සම්බන්ධව කථා බහට ලක් වෙනවා. ඇත්තවශයෙන්ම මෑතකදී 2001, 2006, 2010, 2011, 2012, 2014 සහ 2023 යන වසරවල අකුරණ නගරය සම්පූර්ණයෙන්ම ජල ගැලීම්වලට ලක් වුණා. මේ පිළිබඳව පසුගිය මැතිවරණ කාල සීමාවේදී මට විරුද්ධවත් දෝෂාරෝපණ කිහිපයක් එල්ල වුණා. ඉන්පසුව මට සිදු වුණා, මගේ මැතිවරණ ව්‍යාපාරයට මගේ අතේ තිබෙන මේ පොත් පිංච මුද්‍රණය කරලා නිකුත් කරන්න. ඒ ජල ගැල්ම සම්බන්ධවත්, ඒ සම්බන්ධයෙන් අපි ගත්ත පියවර පිළිබඳව තමයි මෙහි සඳහන් වෙන්නේ. නමුත්, ඒ පියවර කිසි දෙයක් තවමත් නිම වෙලා නැහැ. මොකද, මේ කටයුතු කිරීමට සිවිල් සමාජයේ සහභාගිත්වයත් අවශ්‍යයි. ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය තමන්ගේ නීති රීති හරිහැටි පාවිච්චි කරලා අනවසර ඉදි කිරීම් පිළිබඳව වහාම කටයුතු කරන්න ඕනෑ. ඉතින් මේවා සිදු නොවීම තුළ මේ ඛේදවාචකයට අවුරුද්දක් පාසා මේ ප්‍රදේශයේ ජනතාවට මුහුණ පාන්නට සිදු වෙලා තිබෙනවා.

පිහා ඔය කියන ගංගා නිම්නයේ තවත් ගංගා කිහිපයක් තිබෙනවා. ඒ කියන්නේ, හුන්නන් ඔය තිබෙනවා, ඕවිස්ස ඔය තිබෙනවා, බලපිටිය ඔය තිබෙනවා, වහගල්ල ඔය තිබෙනවා, අලවතු ඔය තිබෙනවා.

මේ ඔක්කෝම ඇවිල්ලා පිහා ඔයට එකතු වෙලා ඒ නගරය හරහා යන බැවින්, ධාරානිපාත වැස්සක් ආවාම නගරය විටින් විට ජල ගැල්මට ලක් වනවා. ඒක විශාල අපරාධයක්. මේ පිළිබඳව ශක්‍යතා වාර්තාවක් ලබා දෙන ලෙස අපි ඉල්ලීමක් කළා, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන්. ඒ ආයතනයත් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන තවත් වැදගත් ආයතනයක්. ඉංජිනේරුවරු 400 දෙනෙක් විතර ඒ ආයතනයේ වැඩ කරනවා. විශේෂයෙන්ම රටේ ජල ගැලීම් පිළිබඳව විසඳුම් ලබා දීමේදී මේ ආයතනය තමයි වැදගත්ම විශේෂඥ දැනුම තිබෙන ආයතනය වන්නේ. ඉතින් අපි මේ ආයතනයෙන් ඉල්ලා සිටියා, මේ පිළිබඳ ශක්‍යතා වාර්තාවක්. ඒ ශක්‍යතා වාර්තාවට ගෙවීමක් කරන්න වෙලා තිබෙනවා, රුපියල් මිලියන 22ක. කරුණාකරලා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් මෙවර මේ ගෙවීම කරලා මේ සම්පූර්ණ වාර්තාව ලබා ගන්න. මාස හතක් ගත වෙවි වාර්තාව සකස් කරන්නට. ඉන් පසුව මේ ජල ගැල්ම පිළිබඳව විධිමත් වැඩ පිළිවෙළකට අපට බහින්න පුළුවන්. මොකද, මේ සම්බන්ධයෙන් නොයෙකුත් මිථ්‍යා මත තිබෙනවා. සමහරු කියනවා, පොල්ගොල්ල වේල්ල හැදුවාට පසුව තමයි මේ ජල ගැල්ම සිද්ධ වෙන්නේ කියලා. ඒ ඔක්කෝම විද්‍යානුකූලව ඔප්පු කරන්න බැරි දේවල් බව අකුරණ ඉන්න වැදගත් ඉංජිනේරුවරුන්ගේ සංගමය ලිපියක් මඟින් දන්වා තිබෙනවා.

එහි මෙසේ සඳහන් වෙනවා:

"Engineering Association Akurana

EEA Recommendations to Mitigate Flash Floods in Akurana

The Engineers' Association, Akurana (EEA) has been deeply concerned about the repeated flash flooding of Akurana from Pinga Oya tributaries. Since the late 1990s, there has been increased construction into the river channel, dumping of wastewater and other waste, loss of flood plains in the river margins, and a rapid increase of impervious surfaces in the Pinga Oya sub-catchment around Akurana.

Here, we set out the position of the EEA on the causes, proposed recent mitigation steps and its shortcomings and the principles for developing effective flood mitigation and river restoration.

Primary Causes of Flash Flooding

The primary causes of flooding are:

The continued construction into the river and its margins.

The filling of flood overflow zones.

Land cover used for soil and vegetation beneficial in the infiltration of water to the ground is being reduced rapidly in the catchment.

Dumping of solid waste and construction debris in the river."

Sir, this has been signed off by Eng. J.M. Samoon and Eng. L.M. Zubair, very senior citizens of Akurana who are very qualified engineers, one of whom had been working in the University of Yale in the USA. He has a climate research institute functioning at his home. He has taken the rainfall figures related to Akurana and its floods for several years; he has all the figures. So, these gentlemen have to be invited to the Ministry or the UDA. In fact, I asked the Hon. Minister K.D. Lal Kantha about this at the last DCC Meeting in Kandy. I wrote a letter to him and tabled it at the DCC Meeting. I wanted him to have a detailed seminar on why this flooding is taking place in Akurana. In fact, a seminar was conducted at the Peradeniya University a few years ago regarding the Akurana floods and detailed research papers also had been presented. So, several ideas can be taken out of those to mitigate the flooding in Akurana.

ඉහත කී කරුණු ඇතුළත් "ඉංජිනේරු සංගමය - අකුරණ" මාතෘකාව සහිත ලේඛනයත්, අකුරණ ප්‍රදේශයේ ගංවතුර හා සම්බන්ධ විස්තර ඇතුළත් තවත් ලේඛනයකුත්, අපේ මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා වන ගරු ලාල් කාන්ත අමාත්‍යතුමාට ලබා දුන් ලිපියේ පිටපතකුත්, මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

මම මේ කියපු කරුණු හැම දෙයක්ම මේ ලේඛනවල අඩංගු වෙලා තිබෙනවා. කරුණාකරලා මේ ශක්‍යතා වාර්තාවට අනුකූලව ලබා දිය යුතු ඒ මුදල ලබා දීලා ඒ කටයුත්ත ඉක්මන් කරන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ විතරක් නොවෙයි, UDA එකේ බලතල පාවිච්චි කරලා, ඉදිකිරීම් සම්බන්ධයෙන් තිබෙන නොයෙකුත් නීති කඩකිරීම් පිළිබඳව කටයුතු කිරීමේ අවශ්‍යතාවකුත් තිබෙනවා. අපේ රියාස් මන්ත්‍රීතුමා මේ වෙලාවේ

---

* *ප්‍රස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

සභාවේ නැති වුණත්, අපේ ගම්පොළ මන්ත්‍රීතුමා මෙහි ඉන්නවා. එතුමන්ලා මේ පිළිබඳව කලිනුත් කථා කළා. එම නිසා එතුමන්ලා දන්නවා මේ ප්‍රශ්නය පිළිබඳව. මේ පිළිබඳව වහාම රජය කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා. මොකද, ගිය මැතිවරණයේදී මෙය විශාල වශයෙන් විවාදයට ලක් වුණු කාරණාවක් වුණා. එබැවින් මම නැවත වතාවක් ඒ කාරණය පිළිබඳව මතක් කරනවා.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගැන කථා කිරීමට පෙර අද අපට දකින්න තිබෙන තවත් කාරණයක් ගැන මම කියන්න ඕනෑ. තිරිච්චිවල ඉඳන් පලාලි දක්වා ගුවන් සේවාවක් ඉන්ඩිගෝ එයාර් ලයින් සමාගම පටන් ගන්නවා, මේ මාසයේ 30වන දා වන කොට. ඒ වාගේම, ලංකාවේ KKS වරායේ ඉඳන් ඉන්දියාවේ නාගපට්ටිනම් දක්වා බෝට්ටු සේවාවක් -මගී බෝට්ටු සේවාවක්- තිබෙනවා. ඒක විටින් විට නතර වන ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම නාගපට්ටිනම් ඉඳලා තමිල්නාඩු ව්‍යාවස්ථාදායක සභාවේ අලූර් ෂා නවාස් මන්ත්‍රීවරයාත් මෑතකදී මෙහේට ආවා. ඒ නාගපට්ටිනම්හි මගීන්ට අවශ්‍ය වන පහසුකම් පිළිබඳව ඉන්දියානු රජය සෑහෙන දුරට කටයුතු කර තිබෙනවා. නමුත් KKS වරායේ මගීන්ට ගොඩ වීමට තිබෙන පර්යන්තයේ කිසිම පහසුකමක් නැති බව මම කිව යුතුයි. ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවමින් මම ඉල්ලා සිටිනවා කරුණාකර එහි අවශ්‍ය නවීකරණ කටයුතු සිදු කරලා නවීකරණය කරපු මගී පර්යන්තයක් KKS වරායේ මගීන් සඳහා ලබා දෙන්න කියලා.

ඒ වාගේම ඔලුවිල් වරාය පිළිබඳවත් නිතර මේ ගරු සභාවේ කථා වෙනවා. ඔලුවිල් වරාය පසුගිය ආණ්ඩුව කාලයේදී ධීවර සංස්ථාවට පවරා ගත්තා. එය පවරා ගත්තාට පසුව එහි යම් කොටසක් පෞද්ගලික සමාගමකට ලබා දීලා තිබුණා.

That is, to pack fish for export. That is also a matter of concern as all the fishing boats cannot enter the Oluvil Harbour because the harbour mouth is blocked. That is because of a wrong design of the breakwater. The breakwater design had been done by DANIDA. DANIDA was the agency which funded it and that agency had finally accepted their fault and was prepared to give US Dollars 12 million as compensation. But, the Sri Lanka Ports Authority is unable to access it because the whole cost of it would be more than US Dollars 20 million. The balance has to be provided by Sri Lanka Ports Authority. So, the correction of the breakwater has been held back and it needs to be done. If it is improved, it will be a big help.

இது அம்பாறை மாவட்டத்திலுள்ள மீனவர்களுக்குப் பயன்தரக்கூடிய ஒரு விடயமாக இருக்கும். குறிப்பாக, கடல் கொந்தளிப்பாக இருக்கின்ற காலங்களில் கல்முனையில் இருந்து பொத்துவில் வரை இருக்கின்ற கரையோரப் பகுதியில் மீனவப் படகுகளைக் கட்டுவதற்கு இயலாமற் போகின்றது. அதனால் அந்த மீனவர்கள் வாழைச்சேனை வரை செல்ல வேண்டிய நிர்ப்பந்தம் ஏற்படுகின்றது. எனவே, கடல் கொந்தளிப்புக் காலங்களில் அந்த மீனவர்களுடைய படகுகளை ஒலுவில் துறைமுகத்தில் கட்டுவதற்கான வசதிகளைச் செய்துகொடுப்பதற்கும், அந்தத் துறைமுகத்தை முழுமையாக மீன்பிடித் துறைமுகமாக மாற்றி அமைப்பதற்கு மான ஏற்பாடுகளைச் செய்ய வேண்டும்.

ஆரம்பத்தில் இத்துறைமுகமானது வர்த்தகத் துறைமுகமாக இருப்பதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டு இருந்தாலும், ஏற்கெனவே அந்தப் பிரதேச மக்கள் கடலரிப்பால் நிறையப் பாதிக்கப்பட்டு இருக்கின்ற நிலையில், இந்தத் துறைமுகத்தை மீண்டும் திறப்பதென்பது கடலரிப்புக்கு வழிகோலும் என்ற அச்சம் அவர்கள் மத்தியில் இருக்கின்றது. அந்த அச்சத்தை நீக்குவதற்கான நல்ல திட்டமொன்றை வகுத்து, பாரிய முதலீட்டோடு ஆரம்பிக்கப்பட்ட இந்தத் துறைமுகத்தை மீண்டும் மக்கள் பாவனைக்கு கையளிக்கும் வகையில், உரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமென நான் பணிவாகக் கேட்டுக் கொள்கின்றேன்.

I would also like to refer to the issue of the Batticaloa International Airport. ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් හැටියට ප්‍රකාශයට පත් වූ ගුවන් තොටුපළවල් 5ක් තිබෙනවා. ඒවා තමයි, මත්තල, රත්මලාන, කටුනායක, පලාලි සහ මඩකලපුව කියන ගුවන් තොටුපළවල්. ත්‍රිකුණාමලය පිළිබඳවත් කථා කරන්න පුළුවන් because China Bay is an important location. It had been a military airport in the past. The runway of the Batticaloa International Airport needs to be properly designed and completed so that commercial aircraft can be landed there. සංචාරක ව්‍යාපාරයට ලොකු රුකුලක් වෙනවා, මඩකලපුව ගුවන් තොටුපළ නවීකරණය කිරීම. ඉතින් ඒ පිළිබඳවත් මම අපේ ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා. නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විෂය භාර අමාත්‍යවරයාව හිටපු කාලයේ ඒ පිළිබඳව යම් කටයුත්තක් කරන්න එතුමා පෙළඹුණා. නමුත් ඒක සම්පූර්ණ වුණේ නැහැ.

Sir, I also want to tell something about the Kandy Multimodal Transport Terminal. ගරු අමාත්‍යතුමාගේ කථාවේදී ඒ ගැන සඳහන් කළා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
The Hon. Deputy Minister of Transport and Highways is there to explain.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Okay. The Multimodal Transport Terminal may not be useful unless you set up the necessary facilities for the buses entering the Kandy City to be parked in three different locations - Katugastota, Peradeniya and Pallekele. Those are the entry points to Kandy. A large number of busses come from outstations and when they come into the city during peak hours, a severe congestion takes place. To prevent that, there has been plan: to have three places at which those busses could be stopped and the commuters to use a shuttle service operated within the city. Not only was there a plan for a shuttle service of buses, but also a tram or single train service travelling through the Kandy City, using the rail track; those services had also been included in the original master plan. So, those have to be finalized in order to completely solve the problem of traffic congestion in Kandy. That is a very serious problem. I am sure the Hon. Minister would attend to it when the Multimodal Transport Terminal is completed.

Having said that, may I also deal with another matter. අපේ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ කථාවේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිළිබඳවත් සඳහන් වුණා. මා දැන් කියන්න යන මේ ප්‍රවෘත්තිය ඊයේ පුවත් පතක පළ වෙලා තිබුණා. The Deputy Minister of Ports and Civil Aviation, the Hon.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

Janitha Ruwan Kodithuwakku, had given a statement to the "Daily Mirror." It was a headline in the "Daily Mirror" the day before yesterday. It states, I quote:

> "Govt. to woo top ten shipping liners in world for Colombo port expansion."

Then, the Hon. Deputy Minister goes on to describe what they propose to do. But, Hon. Minister, I want to share with you that some of the experts in the logistics sector has pointed out some serious ideological gaps in this issue. I am sure this is part of the President's Budget Speech, a promise made through the Budget. The Hon. President has said that the calling for Expressions of Interest for the Colombo West Container Terminal 2 and the Colombo North Port Project will take place within one month. So, you are obviously trying to fulfil what the Hon. President said.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
We are having discussions.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Yes, you are having discussions, I understand. But, let me point out some experts' comments regarding this, particularly about creating excess capacity. The available container terminal capacity of the Colombo Port by the end of 2026 is expected to be 14.15 million TEUs, as detailed in this table I have here with me and which I **table***.

It is about 45 per cent more than the 7.79 TEUs handled in the year 2024. So, by 2026, next year, you are going to double the capacity at the Port with all these completions that have been earmarked. But, I have an issue regarding the completion of the ETC. I do not think it will be completed within the next two years; it might take at least another two years with the way you have cancelled some of the tenders. Well and good, if you think there had been some fraud or some issue; you can do that. But, the fact is, as you said, when you try to get some of the equipment, those equipment will not available ex-stock. You have to order those and they will have to start producing them and it is going to take a long time.

Once you cancel a tender, the impact is, the entire project gets delayed. So, definitely the ECT's completion will be delayed by at least another one and a half to two years; that is my assumption. However, without dealing with the issue further, I would like to point out that the National Port Master Plan completed in 2019 - the consultant was the MTBS - states that the 14.15 million TEUs capacity will be sufficient to meet the demand forecasted through to the year 2040. Once you achieve this capacity of 14 million TEUs, that would be enough to go by the demand forecasted until 2040. So, what is the use of now trying to do the Colombo North Port with three new container terminals, featuring a combined quay length of 4,600 metres, which is not required till 2040.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
It will take a decade.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Yes, it will take a decade or more. So, therefore, if you all are going to consult and do it after a decade, if you are going to be prepared ten years ahead, well and good. But, we have another serious problem coming up. Of course, the newspapers have given details about the issue pertaining to the concession agreement with the Adani Ports. That issue is also an impediment to calling for new tenders. So, the Adani-run Port terminal contract blocks the SLPA's partnership for East terminal; that is another issue. That issue will also result in further delays in getting a new third party identified to start developing the balance available terminals. So, these issues will also have to be considered.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Hon. Member, you are a very senior former Minister in charge of ports, whom I respect. Yes, the Adani agreement has blocked and created some issues, but it is not relevant to the development of the ECT and we can even start West Terminal 2.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
I understand that.

Then, with regard to the capacity of the Hambantota Port, it is expected to be increased from one million to two million TEUs by end of 2027. This would also create a further excess capacity over the country's demand and a price war with terminals in the Colombo Port, which is going to have 45 per cent over capacity by the end of 2026, as explained earlier. The SLPA-JCT is going to be affected by that trade war; not anybody else, but your own terminal, which is giving you 70 per cent of income, is going to suffer because of the price war. Then, the JCT would not have any customers coming there. At the rate these terminals are getting developed and with this overcapacity, the biggest impact would be on the JCT. So, if the JCT gets impacted on, the SLPA would find it difficult to operate because it has to pay back the cost of the breakwater of the ECT as well. For the breakwater, a big loan was taken and that has to be paid back, all of which would be hampered once this price war starts. At the discussions on the SAGT, which was commissioned

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

way back when my late Leader, the Hon. Ashraff, was the Minister, they commented on having to deal with a price war. So, if there is going to be several terminals operated by different operators, the only way to handle that is to have a proper regulator. You need to have a Port Terminal Regulator appointed and that Regulator needs to be appointed immediately because there are going to be several terminals - the CICT, the SAGT, the JCT, the ECT and the Colombo North Port, which is also going to come up in the latter stages. So, it will become a serious pricing war and would affect the country's income, if it goes on without any proper regulation.

So, the appointment of a Port Terminal Regulator is a *sine quo non*; it has to be done without much delay. I hope the Hon. Minister would consider these suggestions and make sure that this price war would not affect the ultimate earning capacity of the SLPA.

Sir, now, I come to the much talked-about internal container dry port in Veyangoda. According to experts, the proposed internal container dry port in Veyangoda is to be established as a long-term measure to ease the container traffic congestion in and around the Colombo Port and to increase foreign earnings through value addition. You can, of course, do some value addition with the logistics park and all that. The congestion at the Colombo Port is mainly due to Customs clearance delays of import and export cargo containers in and out of the Port. A rise in the number of containers being inspected daily by the Customs due to various clearance issues and the surge in the number of ships docking at the Port have resulted in higher container volumes requiring inspection, leading to delays in the container release process causing congestion and impacting on the efficiency of the Port operations. Several hundreds of containers imported are inside the Port of Colombo and more are queued up for days awaiting entry to the Port pending Customs inspections. The congestion in the Colombo Port cannot be eased by making use of a dry port which is located about 40 km away from the Port and in a non-logistic corridor. It is not in a logistic corridor and is a dry port far away from the Colombo Port. Of course, a dry port is all right, but that is not going to help ease this congestion. Therefore, what I suggest is, as an interim measure to ease the congestion, it is possible to hire privately-operated container yards located close to the Port of Colombo until the Kerawalapitiya Customs Inspection Yard and the Bloemendhal Logistics Park are fully established and operational. Until that is done, many such privately-owned, well-equipped and modern container freight stations and yards available in close proximity to the Port of Colombo and in its logistic corridor need to be put in place to be used for the necessary parking of containers. So, rather than going on to create a dry port at a far away place as a solution to this problem, that would be the best way to handle this issue.

Sir, having said all that, I would now like to comment on one other important matter concerning water security for Colombo and particularly, the Gampaha District, the two highly populated districts in the country. There has been a suggestion that we must have dedicated reservoirs for water alone, the Yatimahana and Wee Oya Reservoirs. Those two projects are very important and cannot be delayed any further. So, immediate feasibility studies have to be done and some studies have already been done. The Wee Oya and Yatimahana reservoirs are very important to meet the demand for water in the highly populated areas in Wayamba as well as in the Western Province.

I also would like to remind you that a famous PPP project suggested during our time, the Weliwita Bulk Water Supply Project, has finally not happened. The Hon. President has been talking about PPP projects. That is a PPP project for which the Asian Development Bank was willing to support, but to that project, unfortunately, there were a lot of objections by engineers of the CEB, the National Water Supply and Drainage Board and various other places. Engineers, sometimes, take over the advisory role and try to prevent these things from happening. But, if those projects are good for the country and if there are PPP project which have already been identified by multilateral agencies as suitable to be supported and promoted, those have to be immediately done in order to bring in a new culture, where private parties cooperate with the public sector, by putting in their capital, to improve the utilities for the common good of the people.

Having said that, I wish the Hon. Minister with so many different important institutions under him - I wonder how he manages his time to deal with all these problems - all the best! - *[Interruption.]* He says Allah will help. Certainly, this is the month of Ramadan and we will pray that Allah helps you to fulfil your tasks as efficiently as possible.

Thank you.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Prasanna Gunasena. You have 14 minutes.

[පූ.භා. 11.36]

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු ඇමතිතුමාගේ කථාවේදී වනඅලි දුම්රියේ ගැටීම සම්බන්ධයෙන් අප ගත් ක්‍රියාමාර්ග පිළිබඳව කිව්වා. ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග 10ක් තිබෙනවා. එම ක්‍රියාමාර්ග **සභාගත*** කරමින් මගේ කථාව පටන් ගන්නම්.

** පූස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

ගරු ඇමතිතුමා දුම්රිය සම්බන්ධව කථා කරනකොට කිව්වා, අපි පුළුවන් තරම් දුම්රිය අවලංගු - cancel - වන වාර ගණන අඩු කළ යුතුයි කියලා. අද දින මට වාර්තාවක් ලැබුණා. ඊයේ දිනයේ අවලංගු - cancel - වෙලා තිබෙන්නේ එක දුම්රියයි. දුම්රිය 286ක් ධාවනය වෙලා තිබෙනවා. එක දුම්රියයි අවලංගු වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මේ අපේ පළමුවෙනි අය වැය. මේ අය වැයෙන් සුරබිඳෙන පහළ නොවන බව අපි දන්නවා. හැබැයි, මෙච්චර කාලයක් - දශක ගණනාවක් - ගෙන ආ අසාර්ථක ආර්ථික කළමනාකරණ මොඩලය නතරකොට ජනතාවාදී ආර්ථිකයක් බවට පරිවර්තනය කරන හැරවුම් ලක්ෂ්‍යය බවට මේ අය වැය පත් වනවා කියා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා.

අපේ අමාත්‍යාංශය ගත්තොත්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා යනාදී වශයෙන් විෂය පථ කිහිපයකින් සමන්විත දැවැන්ත අමාත්‍යාංශයක්. මිනිසුන් සමඟ ඍජුවම ගැටෙන විශාල ආයතන 16ක් විතර මෙහි තිබෙනවා. මේ ආයතන 16න් එක දවසින් මුළු රටම වටිටන්න පුළුවන් ආයතන තිබෙනවා. SLTB එක ඉන් එකක්. හැබැයි, අද ඒවායේ තත්ත්වය ඉතාම ශෝචනීයයි. මේ ආයතන දේශපාලනීකරණය කර බංකොලොත්භාවයට පත් කර තිබෙනවා. තව අවුරුදු 3ක්, 4ක් මේ ගමන මේ විධියට ගියා නම් මේ ආයතන සියල්ල කඩා වැටෙනවා.

ගරු සභාපතිතුමනි, SLTB එකේ සිටින සේවකයන්ගේ තත්ත්වයත් ඉතාම ශෝචනීයයි. ඔවුන්ට අවශ්‍ය මූලික පහසුකම්වත් නැහැ. ඔවුන්ට කෑම ගන්න තැනක් නැහැ. කාර්යාලයේ වැඩ කරන සේවකයෝ කොයි වෙලාවේ වහල කඩා වැටෙයිද කියලා බයෙන් බලාගෙන ඉන්නවා. එම ගොඩනැඟිලි එච්චරට අබලන් වෙලා. මම මුලින් කිව්වා වාගේ ඒ සම්බන්ධව වැඩි දෙයක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. Toilet පහසුකම්වත් නැහැ, ඒවායේ. එතරම් අඳුරු තත්ත්වයක තමයි තිබෙන්නේ. අපි කවුරුත් දන්නවා, මධ්‍යම බස් නැවතුම්පොළ - CBS එක ගැන. එය ඉස්සරහට ගිහින් බලන්න, මීයෝ ඉන්නවා, හාවෝ වාගේ. තනිකරම අපායක්. හැබැයි, අපි බස් එක ඇතුළෙන් දිව්‍යලෝකය බලාපොරොත්තු වෙනවා. ඒක සාධාරණද? මේගොල්ලන්ට ලැබිය යුතු දේවල් ලැබෙන්නේ නැතිව අපට කිසි දෙයක් එළියට ගන්න බැහැ, ගරු සභාපතිතුමනි.

වැලිකඩ බන්ධනාගාරය ඉස්සරහ ගහලා තිබෙනවා, "සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය" කියලා. SLTB ඩිපෝවල ඉස්සරහත් ගහන්න ඕනෑ, "සියලු SLTB සේවකයෝද මනුෂ්‍යයෝය" කියලා. ඇයි, මේක මේ තත්ත්වයට පත් වුණේ? දශක ගණනාවක් තිස්සේ මේ ආයතන ක්‍රම ක්‍රමයෙන් දේශපාලනීකරණයට ලක් කළා. දේශපාලනීකරණය නිසා මේ තත්ත්වයට පත් වෙච්ච ආයතන ලැයිස්තුගත කරන්න කිව්වොත්, උඩින්ම තිබෙන්නේ ලංගම. ලංගමට නිලධාරීන් පත් වෙන්නේ කොහොමද? ඡන්දයක් තියනකොට ඡන්දෙට වැඩ කරනවා. ඡන්දෙට වැඩ කරලා දිනන පක්ෂයේ ඉන්න පුද්ගලයන් උදෙන්ම ගිහිල්ලා එක එක පුටුවල වාඩි වෙනවා. ඩිපෝ අධිකාරිගේ - DSගේ - පුටුව වාඩි වුණොත් ඔහු ඩිපෝ අධිකාරි. OMගේ පුටුවේ වාඩි වුණොත් ඔහු OM. එහෙමයි තනතුරු ලැබුණේ. පුටුවේ වාඩි වෙලා තමයි ලියුම ගහන්නේ. ඒ තරමට මේ ආයතන දේශපාලනීකරණය වෙලා තිබුණා. හැබැයි, මේ දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කළා. එක පුටුවක් මාරු කළේ නැහැ. බෙරේ වැවේ නාපු කට්ටිය තවමත් ඒ පුටුවල ඉන්නවා. හැබැයි, අපි බොහොම ගෞරවයෙන්, ආදරයෙන්, කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ ගිය ගමන වෙනස් කරමු කියලා. ඔබ මෙච්චර කාලයක් අකාර්යක්ෂම විධියට දූෂිත ගමනක ගියා නම් එයින් වෙනස් වෙන්න. ජන වරමේ හැඩය හඳුනා ගන්න. මේ ජන වරම හරහා ජනතාව බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියන එක තේරුම් ගන්න. ඒ වෙනුවෙන් කැප වෙන්න. එහෙම කරලා මේ ගමන සඳහා අපිත් එක්ක එකතු වෙන්න කියලා බොහොම ආදරයෙන් ගෞරවයෙන් මා ඉල්ලා සිටිනවා. හැබැයි, ඔබ තවමත් යන්නේ ඒ ගමන නම්, දැන්වත් එය නවත්වන්න. දුන්නේ ඊතලය අදින්න අදින්න ඊතලය වැදුණු දවසට වෙන damage එකත් වැඩියි. ඒකත් මතක් කරන්න අවශ්‍යයි.

ගරු සභාපතිතුමනි, දළ වශයෙන් ගත්තොත්, ශ්‍රීලංගමයේ ධාවනය සඳහා දෛනිකව බස් රථ 7,300ක් පමණ අවශ්‍ය වෙනවා. නමුත් 5,500ක් පමණ වූ බස් රථ බල ඇණියක් තමයි අපට තිබෙන්නේ. එයිනුත් දළ වශයෙන් දෛනික ධාවනය සඳහා එක් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ බස් රථ 4,500ක් විතරයි. මොකද, රියදුරන්ගේ ප්‍රශ්නය තිබෙනවා, කොන්දොස්තර මහත්වරුන්ගේ ප්‍රශ්නය තිබෙනවා, කාර්මික නිලධාරීන්ගේ ප්‍රශ්නය තිබෙනවා. මේ නිසා බස් රථ 4,500ක් වගේ ප්‍රමාණයක් තමයි දෛනිකව ධාවනය සඳහා එක් කළ හැකි වෙන්නේ. මේ බස් රථ 4,500 ලංකාව පුරා ධාවනය වන mileage එක එකතු කළොත්, ගිය අවුරුද්දේ දෙසැම්බර් වන විට දළ වශයෙන් කිලෝමීටර 972,000ක් වාගේ ප්‍රමාණයක් තිබුණා. අපි දෛනික ධාවන වාර ගණන වැඩි කළා. ජනවාරි මාසය වෙනකොට එය කිලෝමීටර මිලියන 1.1ක් -ලක්ෂ 11ක්- වාගේ ප්‍රමාණයක් දක්වා වැඩිවෙලා තිබෙනවා.

බස් රථයක ආයු කාලය කොච්චරද? සාමාන්‍යයෙන් කිලෝමීටර ලක්ෂ 10ක් වාගේ ප්‍රමාණයක්. ඒ ප්‍රමාණය දුවන්න වෙන්නේත් දෙවතාවක් engine overhaul කරලා. එතකොට, theoretically ගණන් හදලා බැලුවොත්, මේ බස් බල ඇණියෙන් දවසකට එක් බස් රථයක් අයින් වෙනවා. එහෙම නම් මොකක්ද කරන්න ඕනෑ? දැනට ලබාදෙන service එක මේ තත්ත්වයෙන්ම පවත්වාගෙන යන්න දවසකට එක් බස් රථය ගණනේ අලුතින් එකතු වෙන්න ඕනෑ. නමුත් මොකක්ද වෙලා තිබෙන්නේ? SLTB එක දැනට ලබාදෙන service එක ඒ තත්ත්වයෙන්වත් පවත්වාගෙන යන්න නම් අවුරුද්දකට බස් රථ 365ක්, 400ක් අලුතින් එකතු වෙන්න ඕනෑ. හැබැයි 2017 දී super luxury බස් රථ 9ක් ආනයනය කර තිබෙනවා. ඊට පස්සේ 2018 දී Indian Credit Line එක යටතේත් බස් රථ ආනයනය කළා. ඒක තමයි දූෂණ, වංචා සිදු වුණා කියලා පසුගිය කාලයේ මතභේදයට ලක් වුණේ. හැබැයි, අවුරුදු 7කට පස්සේ අපි ප්‍රතිපත්තිමය එකඟතාවකට එනවා, SLTB එක නඟා සිටුවීම සඳහා බස් රථ 1,100ක් ආනයනය කරන්න. මෙහෙමයි මේ ආයතනය ගොඩනඟන්න ඕනෑ.

ජනාධිපතිතුමා එතුමාගේ අය වැයෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා, city service එකක් සඳහා low-floor බස් රථ ආනයනය කරන්න. ඒ වාගේම SLTB එක බලාපොරොත්තු වෙනවා, ඒගොල්ලන්ගේ මුදල්වලිනුත් තවත් එක් එක් ආකාරයේ බස් රථ ආනයනය කරන්න. සාමාන්‍යයෙන් highwaysවල - ඇත්තටම අපි highways කියලා කිව්වාට ඒවා expressways - ධාවනය කිරීම සඳහා SLTB එක සතුව බස් රථ 144ක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, එම බස් රථ 144නුත් බස් රථ 135ක්ම අවුරුදු 10කට වඩා පරණයි. ඒ කියන්නේ, ඒවා Euro 2 standard and Euro 3 standard බස් රථ. එම බස් රථවලින් එළියට එන වායුව විෂකරයි. Euro 4 standard නොවෙයි. මෙම බස් රථ බල ඇණියට මෙවර තවත් බස් රථ 200ක් එකතු කරන්න SLTB එක බලාපොරොත්තු වෙනවා. මේ ආකාරයෙන් කටයුතු කරලා දැනට වැටී තිබෙන SLTB එක මෙතැනින් උඩට ගෙනැල්ලා ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයට ලබා දෙන දායකත්වය මීට වඩා වැඩි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒක කරලා පෙන්වලා තිබෙනවා. ලක්දිව ඉන්ජිනියරින් ආයතනය

ඈවර කරලා විකුණන්න දාලා තිබුණා. අපේ අලුත් කළමනාකාරිත්වය යටතේ නොවැම්බර් මාසයේ බස් රථ 3ක් හදලා එළියට දානවා; දෙසැම්බර් මාසයේ බස් රථ 12ක් හදලා එළියට දානවා; ජනවාරි මාසයේ බස් රථ 24ක් හදලා එළියට දානවා. වැටුණු ආයතන ගොඩනඟන්නේ කොහොමද කියන එක අපි ක්‍රියාවෙන් කරලා පෙන්වලා තිබෙනවා, ගරු සභාපතිතුමනි.

අපේ ගරු රවුෆ් හකීම් මැතිතුමා සභාවෙන් එළියට ගිහිල්ලා නේද? එතුමා මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය - Kandy Multimodal Transport Terminal - KMTT එක - ගැන කථා කළා. 2022 දී තමයි ඒක පටන් අරගෙන තිබෙන්නේ. හැබැයි, ඒ වැඩේ පටන් ගන්නකොට එම ඉදිකිරීම කළ හැක්කේ කුමන අධිකාරියටද කියන එක පිළිබඳව හරිහමන් අවබෝධයක් නැතිව තමයි පටන් අරගෙන තිබෙන්නේ. ඉස්සෙල්ලාම ඒක UDA එකට කරන්න දුන්නා. ඒ අයට කර ගන්න බැරි වුණු නිසා ඊට පස්සේ මාර්ග සංවර්ධන අධිකාරියට - RDA එකට - දුන්නා. වසර කිහිපයකින් ඉදිකිරීම් ඉවර කරන්න නියමිතව තිබුණත්, ඒ කටයුතු තවත් වසර ගණනාවක් ඇදිලා ගිහින් තිබුණා. ඒ නිසා මහනුවර නගරය තුළ ලොකු අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම බස් රථ ගාල් කර තිබුණේ Goods Shed එකේ. බස් රථ ගාල් කරපු ස්ථාන ටික town එකේ හැම තැනටම මාරු කරනු ලැබුවා. මම එක උදාහරණයක් කියන්නම්. මහනුවර උතුර ඩිපෝවේ බස් රථ Goods Shed එකේ park කරන්නේ නැතුව අලුත් තැනක park කිරීම නිසා විශාල අලාභයක් සිදුවෙලා තිබෙනවා. එම ඩිපෝවට බස් රථ 50ක් තිබෙනවා, ඒ බස්වලට තෙල් ගහන්න දෙනිකව කිලෝමීටර 20ක පමණ දුරක් යනවා. එම නිසා සිදු වන දෛනික පාඩුව විතරක් රුපියල් 148,230යි. මෙම ව්‍යාපෘතිය දවසින් දවස ප්‍රමාද වීම නිසා මාසිකව රුපියල් 4,446,900ක අමතර වැය බරක් දරනවා. නිසි කළමනාකරණයක් නැතුව, නිසි අධීක්ෂණයක් නැතුව, නිසි සැලැස්මක් නැතුව මේකේ ඉදිකිරීම් පටන් අරගෙන තිබෙනවා. හැම වෙලාවේම මොකක්ද කළේ? ජාතික සංවර්ධන සැලැස්මේ කාලසටහන සම්පාත කළා, ලංකාවේ ඡන්ද කාලසටහනත් එක්ක. මේකයි අවුල. අපි කිසි දිනක ජාතික සංවර්ධන සැලැස්ම ලංකාවේ ඡන්ද කාලසටහනත් එක්ක සම්පාත කරන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. අපි මේ ප්‍රශ්නය ගොඩදානවා. මෙවර අය වැයෙනුත් මේ ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබෙනවා, රුපියල් මිලියන 7,730ක්. අපි බලාපොරොත්තු වෙනවා, 2027 අවුරුද්දේ මැයි වෙනකෙට KMTT කියන structure එකේ සිවිල් වැඩ සම්පූර්ණයෙන් අවසන් කරන්න. මේක අවසන් කළාට විතරක් හරියන්නේ නැහැ. මේ හා සමානව ප්‍රවේශ මාර්ග - corridors - තිබෙනවා.

මහනුවර කියන්නේ එච්චර සංකීර්ණ නගරයක් නොවෙයි. කොළඹ නගරය ගත්තොත්, සංකීර්ණයි. එහි ප්‍රවේශ මාර්ග 7ක් තිබෙනවා. දළ වශයෙන් මිනිස්සු 1.9 million කොළඹ town එකට ඇදිලා එනවා. වාහන එනවා, ලක්ෂ 6ක්. ඉන් සියයට 5ක් බස් රථ, සියයට 85ක් පෞද්ගලික වාහන. ඒ නිසා අපි මාරුවෙන්න ඕනෑ, නව විධියකට. එහෙම නම් බස් රථ ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. මහනුවර නගරය සරලයි. ප්‍රවේශ මාර්ග තුනයි තිබෙන්නේ. ඊරියගම ප්‍රදේශයෙනුත් අපි ඉඩමක් හදුනාගෙන තිබෙනවා. එතැන parking සඳහා තැනක් හදනවා. ඒක ක්‍රියාත්මක වෙන්නේ UDA එක යටතේ. කටුගස්තොටත් අපි ඉඩමක් හදුනාගෙන තිබෙනවා. එතැනත් parking සඳහා තැනක් හදනවා. තැන්නෙකුඹුරේත් ඉඩමක් තිබෙනවා. එතැනත් parking සඳහා තැනක් හදනවා. මේ සඳහා pre-feasibility studies ඔක්කෝම ටික කරලා තිබෙන්නේ. මේවාට මුදල් වෙන් වෙලා තිබෙනවා, රුපියල් මිලියන 1,500ක්. දැන් මම ඒ ගැන අහනකොට කිව්වා, ඒ මුදල් ලබා දෙනවා කියලා. ඒ නිසා අපට පුළුවන්, මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන සම්පූර්ණ ප්‍රවාහන සැලැස්ම වෙන තලයකට අරන් යන්න. 2027 අවුරුද්දේ මැයි වෙනකොට මෙහි civil works ඉවර වුණාට තව අවුරුදු දෙකක් ඇතුළත අපි බලාපොරොත්තු වෙනවා, මහනුවර නගරයේ තිබෙන මේ රථවාහන තදබදය ක්‍රමවත් ආකාරයෙන් විසඳන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම මේ KMTT එකට ප්‍රවේශ මාර්ග විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මෙවර අය වැයෙන් රුපියල් මිලියන 400ක් වෙන් කරනවා, ඒවා සංවර්ධනය කරලා මේ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කරන්න.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම කථා කළා, මධ්‍යම අධිවේගී මාර්ගය ගැනත්. එය අවුරුදු ගණනාවක් තිස්සේ ඇදි-ඇදී ආපු එකක්. ඒක ඇදි-ඇදී ආවා කියන්නේ "කිරි-කිරි" ගාමින් තිබුණේ. මේකේ කොටස් කිහිපයක් තිබෙනවා. මේක කොටස් 4කට කඩනවා. පළමුවැනි කොටස කිලෝමීටර 36.475ක් දිගයි. ඒක තිබෙන්නේ කඩවත සහ මීරිගම අතර. දෙවැනි කොටස තිබෙන්නේ මීරිගම සිට කුරුණෑගලට. තුන්වැනි කොටස පොතුහැර-රඹුක්කන, රඹුක්කන-ගලගෙදර. හතරවැනි කොටස තමයි, කුරුණෑගල-දඹුල්ල. මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවැනි කොටස හදලා තිබෙනවා, මීරිගම සිට කුරුණෑගල දක්වා. පළමුවැනි කොටස හදලා තිබෙනවා, කඩවත සිට මීරිගම දක්වා. ඒකේත් කොටස් දෙකක් තිබෙනවා, package one සහ package two කියලා. Package one එක කිලෝමීටර 4.014ක් දුරයි. ඒ සඳහා agreement අත්සන් කළේ 2016 ජූනි 20වැනි දා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Prasanna Gunasena, you have only two minutes more.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
මට තව ටිකක් වෙලාව දෙන්න, ගරු සභාපතිතුමනි.

දෙවැනි කොටස කිලෝමීටර 32.441ක් දුරයි. ඒ සඳහා agreement එක අත්සන් කළේ 2015 අගෝස්තු 4වැනි දා. හැබැයි, මේ ව්‍යාපෘතිය පටන් ගන්නකොට මේ සඳහා වැය වෙන මුදල විධියට තක්සේරු කළේ රුපියල් බිලියන 158යි, දශම ගණනක්. හැබැයි මේකට කල් මරලා අවුරුදු 10ක් ගිහිල්ලාත් අවසන් කරන්න බැරි වෙලා තිබෙන නිසා අද මේ ව්‍යාපෘතිය අවසන් කරන්න රුපියල් බිලියන 350කට වඩා වැඩි වැය බරක් දරන්න අපට සිදු වෙනවා. මෙහි නිසි කළමනාකරණයක් නැහැ. මේක ඇදි-ඇදී යනවා. මෙහි දූෂණ, වංචා රාශියක් තිබෙනවා. පැයක් කියන්න පුළුවන්, මෙහි දූෂණ, වංචා ගැන. එච්චරකට තිබෙනවා. මේවා, රටේ සල්ලි. හැබැයි, අපි මේ ව්‍යාපෘතිය අවසන් කරනවා. ජනාධිපතිතුමාගේ චීන සංචාරයේදී කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට Exim Bank එක තමයි මේ සඳහා සියයට 85ක දායකත්වයක් දක්වන්නේ. ඒ අය ළඟදී ලංකාවට එනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඔවුන් එක්ක සාකච්ඡා කරන්න. අපි බලාපොරොත්තු වෙනවා, රුපියල් මිලියන 81,300ක ආයෝජනයකින් මේ අවුරුද්ද ඇතුළත මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සියයට 60ක භෞතික ප්‍රගතියක් ගන්න.

ඒ වාගේම මධ්‍යම අධිවේගී මාර්ගයේ පොතුහැර-රඹුක්කන කොටස ලබන අවුරුද්දේ මැයි වෙනකොට අපි අවසන් කරනවා. මෙවර අය වැයෙන් ඒ සඳහා රුපියල් බිලියන 34ක් වෙන් කරලා තිබෙනවා. රඹුක්කන-ගලගෙදර කොටස සඳහා ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කරලා තිබෙනවා. ඒ අනුව ළඟදීම එහි ඉදිකිරීම් පටන් ගන්නවා. මේ මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ කටයුතු අපේ වසර 5 ඇතුළත කෙසේ හෝ අවසන් කරන එක අවසන් කරනවාමයි, ගරු සභාපතිතුමනි. ඒ අය අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් අවුල් විධියට plan කළාට තමන් ඉන්න තැන නම්

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

ලස්සනට සැලසුම් කරලා තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරියේ - RDA එකේ - නවවැනි තට්ටුවේ තමයි මමයි, බිමල් ඇමතිතුමායි ඉන්නේ. ඒකේ size එක මේ Chamber එකෙන් භාගයක් විතර ඇති. Wooden interior. ඒක, one sort of a palace, ගරු සභාපතිතුමනි. ඒ ඔෆිස් එක දෙකට බෙදලා ඇමතිතුමාටයි, මටයි ඕනෑ නම් ටෙනිස් ගහන්නත් පුළුවන්. ඒවා නියමෙට සැලසුම් වෙනවා. මෙතැන වැඩ ඉවර වුණාම එක එක සාකච්ඡාවලට මන්ත්‍රීවරුන්ට මම එන්න කියනවා නේ, අපේ අමාත්‍යාංශයට. ඒ අය මට විහිළුවට කියන්නේ, "මචං උඹව හම්බ වෙන්න ආවාම කොළ අත්තක් අරගෙන එන්න ඕනෑ. මොකද කොළ කෑලි තැන් තැන්වල එල්ලලා යන්න ඕනෑ. නැත්නම් ආපහු එන්න පාර හොයා ගන්න බැහැ" කියලා. ඒවා ලස්සනට සැලසුම් වෙනවා. හැබැයි, මේ ජාතික ප්‍රතිපත්ති සැලසුම් කරනකොට මොකක්ද වෙන්නේ?

මධ්‍යම අධිවේගී මාර්ගයේ ලොකු blunder එකක් තිබෙනවා. කඩවත-මීරිගම කොටස පටන් ගන්න කොට ඒක එන්නේ Outer Circular Highway එකේ continuation එකක් විධියට. Outer Circular Highway එකෙන් ඇවිල්ලා මධ්‍යම අධිවේගී මාර්ගයෙන් කඩවත පිවිසුමට ඇතුළු වෙනකොට මීටර් 500ක කොටසක් තිබෙනවා. 2015 අගෝස්තු 4වැනි දා agreement අත්සන් කරන කොට ඒකේ ඉදිකිරීම් වෙන්නේ නැහැ. ඒකට විසඳුමක් නැතුව තමයි 2015 අගෝස්තු 4වැනි දා ගිවිසුම අත්සන් කරන්නේ. මොකක්ද වෙන්නේ? කිලෝමීටර 100ක වේගයකින් ඇවිල්ලා, මීටර් 500ක් පනින්න සැලසුම් කරලා තිබෙන්නේ. එහෙමයි ඒ මාර්ගයේ යන්න වෙන්නේ. මේවා ගැන දවසක් වුණත් කියන්න පුළුවන්. ඒ ඉදිකිරීම්වලට මෙවර අය වැයෙන් වෙන් කරනවා, රුපියල් මිලියන 5,000ක්. ඉහළ තැන ඉඳලා පහළට යන කල් දූෂණය තමයි තිබුණේ. වාහන වංචාත් සිදු වෙලා තිබෙනවා. මම මේ විස්තර කියන්නේ විගණන වාර්තාවෙන්. 2021 අප්‍රේල් මාසයේ ඉඳලා මාස 15ක් යන කල් සේවකයෝ වැඩ කළේ නැහැ; මේ ව්‍යාපෘතියේ වැඩ නැවතිලා තිබුණේ. ඒ, ආර්ථික අර්බුදය නිසා. හැබැයි, අතිකාල දීමනා ගන්නවා. ඒ සඳහා රුපියල් මිලියන 21ක් වෙන් කරනවා. වාහන පාවිච්චියත් ඒ වාගේමයි. මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් නොවන, වාහන හිමිකම් නැති නිලධාරිනුත් වාහන පාවිච්චි කරලා තිබෙනවා. මෙහෙමයි ආතල් අරගෙන තිබෙන්නේ. රජා ආතල් ගන්නකොට පොඩි එවුනුත් ආතල් ගන්නවා.

ගරු සභාපතිතුමනි, යෝෂිත රාජපක්ෂ පිස්තෝල හතක් පාවිච්චි කරනවා. උදේට බත් කටවල් හතක් කෑම පෙට්ටියට දාලා යවන්න බැරි දෙමව්පියන් ජීවත් වෙන දිස්ත්‍රික්කයක් තමයි ඒ අය නියෝජනය කරන්නේ. එහෙව් දිස්ත්‍රික්කයක රජාගේ පුතා පිස්තෝල හතකින් ආතල් ගන්නවා. ගරු සභාපතිතුමනි, මේවා කැටපෝල්ල නොවෙයි පිස්තෝල. එහෙමයි ආර්ථිකයේ කටයුතු සිදු වුණේ. මේගොල්ලන් කවදාවත් හිතුවේ නැහැ, අපි වාගේ දේශපාලන ව්‍යාපාරයක් මේ වාගේ තැන්වලට එයි කියලා. මේ සමහර ගොඩනැගිලි හදලා තිබුණේ එක් ටැම් ගෙවල් වාගේයි. අපි ඒවා කැඩුවේ පඩු අබා පරපුරක් හදන්න නොවෙයි. රටෙන් අවතැන් කරපු, ජාතික ආර්ථිකයෙන් එළියට දාලා තිබුණු ජනතාව එක් කරගෙනයි අපි මේ ජාතික ආර්ථික ගමන යන්නේ.

ගරු සභාපතිතුමනි, ඊළඟට කිලෝමීටර ලක්ෂයේ මාර්ග සංවර්ධන වැඩසටහනක් කියලා එකක් පටන් ගත්තා. ඒ, මාර්ගවලට කාපට් දාන්න. ලංකාවේ තිබෙන පාරවල් ගණන කොච්චරද? සියලුම පාරවල් 119,302යි. ලක්ෂයක් කාපට් කරන්න පටන් ගන්නවා. සල්ලි හොයන්න පුළුවන් ලෙහෙසිම විධිය තමයි මේ. පුළුවන් නම් ලංකාවම කාපට් කරයි. රුපියල් මිලියන 1,500ක වැඩසටහන අවසන් කරන්න බැරිව අතරමඟදී අත්හැරලා දානවා. එම නිසා ලොකු අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙන්නේ. පාරක යන්න බැහැ, කැඩිලා බිඳිලා ගිහිල්ලා. මෙවර අය වැයෙන් රුපියල් මිලියන 66,500ක් වෙන් කර තිබෙනවා, ඒ පාරවල් යථා තත්ත්වයට පත් කරන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Prasanna Gunasena, your additional time is also up.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි. මට තව විනාඩියක් දෙන්න.

මත්තල ගුවන් තොටුපොළ ගැනත් අද සඳහන් කළා. එය ඉදිකිරීම සඳහා වැය කරනවා, රුපියල් බිලියන 36.5ක්. 2018 ඉඳලා 2023 දක්වා පසුගිය අවුරුදු පහ ඇතුළත විතරක් එහි පාඩුව රුපියල් බිලියන 38.5යි. මොකක්ද වෙලා තිබෙන්නේ? ඉදිකිරීමට ගිය වියදමට වඩා වැඩියි පාඩුව, පසුගිය අවුරුදු පහ ඇතුළත. මෙහෙමයි මේ ආර්ථිකය කළමනාකරණය කරලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, විපක්ෂය බලාපොරොත්තු නොවූ විධියට මේ ආයතන එකක් නැර අපි හදනවා හදනවාමයි. මීට අවුරුදු දෙකකට කලිනුත් විපක්ෂයේ හිටපු ඔබතුමන්ලා හිතුවේ නැහැ, අප වාගේ දේශපාලන ව්‍යාපාරයක් අද මේ තැන්වල ඉඳීවි කියලා. ඒ වාගේම අවුරුදු පහක් ඇතුළත විපක්ෂයේ ඔබතුමන්ලා බලාපොරොත්තු නොවන තැනකට අපි මේ රට අරගෙන යනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. D.V. Chanaka. You have 12 minutes.

[පූ.භා. 11.54]

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ බිමල් රත්නායක ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් මේ වෙලාවේ මම සුබ පතනවා. මට අද එතුමාගේ අමාත්‍යාංශය ගැන අවධානය යොමු කරන්න වෙන්නේ නැහැ. මම අද ජල සම්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. මම සති දෙකකට කලින් යම්කිසි හෙළිදරව්වක් කළා, ලංකාවේ බීමට ගන්නා ජලය පිළිබඳව. ඕනෑම මනුස්සයෙකුට ආහාර නැතුව ඉන්න පුළුවන්. සඳහටම නොවෙයි, යම්කිසි කාලයක්. හැබැයි, වතුර බොන්නේ නැතුව ජීවත් වෙන්න බැහැ. අද අපි දන්නවා, ලංකාවේ බහුතරයක් ටැප් ජලය තමයි බීමට ගන්නේ කියලා. මේ ජලය පිරිපහදු කරනකොට ඒ සඳහා භාවිත කරන සංඝටක තිබෙනවා. විශේෂයෙන්ම ඒ අතරින් හුනු ගල්වලට - calcium hydroxideවලට - ජලය -H_2O- එකතු කරලා හදා ගන්න සංඝටකයක් තමයි ජලයේ තිබෙන pH අගය පවත්වාගෙන යන්න පාවිච්චි කරන්නේ. ඒ වාගේම, ජලයේ මෘදුභාවය පවත්වාගෙන යන්නත් hydrated lime පාවිච්චි කරනවා. එහෙම නැත්නම් හුනු ගල්වලට ජලය එකතු කරලා සාදා ගත්ත ඒ සංඝටකය පාවිච්චි කරනවා. හැබැයි, මේ පාවිච්චි කරන hydrated limeවල

chromium content එක තිබෙන්න ඕනෑ ප්‍රමාණයට වඩා වැඩිවෙලා කියලා අපට වාර්තා වුණා. විශේෂයෙන්ම ලංකාවේ මේ hydrated limeවල සාමාන්‍යයෙන් තිබෙන්න පුළුවන් උපරිම chromium content කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 10යි.

හැබැයි, ටෙන්ඩරයක් මඟින් මෙට්‍රික්ටොන් 1,500ක් ආනයනය කරන්න තිබුණා. නමුත්, මෙට්‍රික්ටොන් 500ක් ලංකාවට ආවා. හැබැයි, මේකේ නිසි ප්‍රමිතිය නැහැ කියලා අපි දැනගත්තා. මොකද, ස්ථාන 4කින් මේවායේ ප්‍රමිතිය check කර තිබෙනවා. තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අඹතලේ lab එක සහ රත්මලාන කියන ස්ථාන හතරෙන්ම chromium content එක check කර තිබෙනවා. ISO standardsවලට අනුව හදපු labවලින් තමයි මේක check කරලා තිබුණේ. ඊට පස්සේ අපි දැක්කා, මේ ආකාරයට check කරනකොට එන්න එන්නම අඩු වෙන පැත්තට තමයි යන්නේ කියන එක. මුලින්ම check කරන්න පටන් ගන්නකොට තිබුණේ කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 14යි. ඊට පස්සේ කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 13ක් වුණා. ඊටත් පසුව කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 12ක් වුණා. ඉන්පසුව කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 11ක් වුණා. අපට දැනගන්න තිබෙන තොරතුරු අනුව පෞද්ගලික labවලිනුත් මේක check කරන්න බලාපොරොත්තු වෙලා තිබෙනවා. මම මේ ගැන හෙළි කළේ නැත්නම් සමහර විට තව එක වතාවක් check කරලා, අර කලින් ක්‍රමයට අනුව කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 10ක් වෙලා මේ ජලය පාවිච්චි කරන්නත් ඉඩ තිබුණා.

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව මම පාර්ලිමේන්තුවේදී දැනුවත් කිරීම් කළා. ඊට පස්සේ අපි දැක්කා, ගරු අමාත්‍යතුමාත්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිතුමාත් මාධ්‍ය ප්‍රකාශන දෙකක් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂතුමා හරහා මාධ්‍යයට යවා තිබුණු බව. විශේෂයෙන්ම මෙකේ සඳහන් වෙලා තිබුණා, එක් එක් රටවල මේ hydrated limeවල තිබෙන chromium content එක ලංකාවට වඩා වැඩියි කියලා. නවසීලන්තය, UK වාගේ රටවල් රාශියක් ගැන කථා කළා. හැබැයි, ඒ වෙලාවේ මම Google එකේ ඒ ගැන පරීක්ෂා කර බැලුවා. එතකොට බැලූ බැල්මට මටත් පෙනුණේ අමාත්‍යතුමාත්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිතුමාත් කියපු සමහර කාරණා ඇත්ත වාගේයි. හැබැයි, මම දවස් කිහිපයක් අරගෙන ඒ ගැන ගවේෂණයක් කළා.

ගරු සභාපතිතුමනි, මේකේ තිබෙන ප්‍රධානම කාරණය මෙයයි. අපේ ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. 2025 පෙබරවාරි 07වැනි දා එතුමා මේ පාර්ලිමේන්තුවේදී කරපු ප්‍රකාශය ඇතුළත් හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. ඒ වාගේම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉදිරිපත් කරපු මාධ්‍ය ප්‍රකාශනයත් මා ළඟ තිබෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, මේ දෙකේ තිබෙන්නේ දෙකක්. මම මේකට උදාහරණයක් කියන්නම්.

2025 පෙබරවාරි 07වැනි දා හැන්සාඩ් වාර්තාවේ, තීරු අංක 1644හි ගරු අමාත්‍යතුමා විසින් කළ ප්‍රකාශයේ මෙසේ සඳහන් වනවා:

> "නමුත්, 2024.07.26 දින SLS ආයතනය විසින් අඩංගු විය හැකි උපරිම ක්‍රෝමියම් ප්‍රමාණය කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 12 දක්වා ඉහළ දමා තිබුණා."

හැබැයි, අනික් පැත්තෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිතුමා කියනවා, දින කිහිපයකට පෙර SLS ප්‍රමිතිය සඳහා උපරිම chromium content එක 10mg per kg සිට 12 දක්වා වැඩි කළා කියලා. එතුමා කියනවා, පෙබරවාරි මාසයේ මුල, දින කිහිපයකට කලින් තමයි මේකේ SLS standards එහෙම නැත්නම් ප්‍රමිතිය 12 දක්වා වැඩි කළේ කියලා. හැබැයි, ඇමතිතුමා කියනවා, 2024.07.26වැනි දා තමයි අඩංගු විය හැකි උපරිම chromium content එක කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 12 දක්වා වැඩි කළේ කියලා. ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් මේක වෙනස් කරපු ලේඛනයත් මම ළඟ තිබෙනවා. ඒක නියමිත වේලාවට කරලා තිබෙන්නේ, 2025.01.21වැනි දා. මම ඒ ලේඛනය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එතකොට ඇමතිතුමා ඇයි මේ බොරු කියන්නේ? කාව ආරක්ෂා කරන්න ද එතුමා බොරු කියන්නේ? හැන්සාඩ් වාර්තාවේ තිබෙන ඔබතුමා කළ ප්‍රකාශයයි, ප්‍රමිති ආයතනයෙන් මේ වෙනස් කරපු එකේයි, දින දෙක අතර මාස 7ක පරතරයක් තිබෙනවා. මේකත් පසුගිය ආණ්ඩුවට දාලා බේරෙන්න හදන එකක්. ඒක තමයි පළමුවැනි කාරණය. දෙවැනි කාරණය විධියට ගරු අමාත්‍යතුමා මෙසේ සඳහන්කොට තිබෙනවා.

2025 පෙබරවාරි 07වැනි දින හැන්සාඩ් වාර්තාවේ, තීරු අංක 1644හි මෙසේ සඳහන් වනවා:

> "ඒ වාගේම, ලෝකයේ බොහෝ රටවල් ක්‍රෝමියම් උපරිම ප්‍රමාණය වශයෙන් ලංකාවේ SLS ප්‍රමිතීන්වලට වඩා වැඩි ප්‍රමාණයක් තමයි භාවිත කරන්නේ. උදාහරණයක් හැටියට ගත්තොත්, යුරෝපයේ රටවල සහ UKවල කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 20ක්, සිංගප්පූරුවේ මිලිග්‍රෑම් 20ක් සහ නවසීලන්තයේ මිලිග්‍රෑම් 150ක් වශයෙන් තමයි තිබෙන්නේ."

හැබැයි, ඒකම අනෙක් පැත්තෙන් National Water Supply and Drainage Board එකේ සභාපතිතුමා කියනවා, New Zealand Water and Waste Association එක අනුව මිලිග්‍රෑම් 25 කියලා. ඇමතිතුමා කියනවා, කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 25ක් Chromium පාවිච්චි කරන්න පුළුවන් කියලා. හැබැයි, National Water Supply and Drainage Board එකේ සභාපතිතුමා කියනවා, නවසීලන්තයේ මිලිග්‍රෑම් 25ක් පාවිච්චි කරන්න පුළුවන් කියලා. ඇත්තම තත්ත්වය නම් මේ දෙකම බොරු. මොකද, මේ National Water Supply and Drainage Board එක කියන මේ report එක 1997දී නිකුත් කරලා තිබෙන්නේ New Zealand Water and Waste Association එක මඟින්. මේක නිකම්ම එහේ හදපු Association එකක්. ඒක මේ ජල සම්පාදන මණ්ඩලයේ එකක් නොවෙයි. 1997 හදපු report එකක් base කරගෙන කියනවා, නවසීලන්තයේ මිලිග්‍රෑම් 25 කියලා. මේකේ හොඳම කාරණය ඒක නොවෙයි, ගරු සභාපතිතුමනි. ඒ Association එකම කියනවා, "Neither the Organisation of Water New Zealand nor any person involved in the preparation of this publication accept any form of liability whatsoever for its contents." කියලා. ඒ Association එකම කියනවා, මේ report එකේ තිබෙන කිසිම දෙයක් ගැන වගකීම ගන්නේ නැහැ කියලා. දැන් හදපු මනුස්සයාත් කියනවා, අපි වගකීම ගන්නේ නැහැ කියලා. හැබැයි, ලංකාවේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා කියනවා, මෙන්න මේක තමයි New Zealand standards කියලා.

මෙන්න තිබෙනවා, ඇත්තම New Zealand standards. ඒගොල්ලන් හරියටම පාවිච්චි කරන්නේ WHO standards. New Zealandවල ජලයට දමන hydrated limeවල තිබෙන Chromium අගය ගැන නොවෙයි බලන්නේ. ඒගොල්ලන් බලන්නේ final product එක. පිරිසිදු ජලයේ කොච්චර ප්‍රමාණයක් Chromium

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඩී. වී. චානක මහතා]

තිබෙනවාද එහෙම නැත්නම් කිලෝග්‍රෑමයකට උපරිම 0.05 milligram තිබෙන්න පුළුවන් කියලා තමයි නවසීලන්තය කියන්නේ. මේ තිබෙන්නේ නවසීලන්තයේ water legislation එකක්. මේකේ සම්පූර්ණයෙන් විස්තරය තිබෙනවා. හැබැයි, යම්කිසි association එකක් අරගෙන තමන්ට වාසි විධියට මේක වෙනස් කරගන්න ගන්නා උත්සාහයක් පිළිබඳව තමයි අපට පෙනෙන්නේ, ගරු සභාපතිතුමනි.

දැන් අපට තිබෙන ප්‍රශ්නය ඇයි මෙච්චර මේක වැඩි කරන්න තිබෙන වුවමනාව කියන එකයි. අපි සියලුදෙනාම දන්නවා, Chromium කියන්නේ පිළිකාකාරකයක් බව. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් විශේෂඥ වෛද්‍යවරයෙක්. කලිනුත් වෛද්‍යවරයෙක් කථා කළා. එතුමන්ලා දන්නවා, මේ Chromium ශරීරයට හොඳ නැහැ කියලා. දවසකට ගන්න පුළුවන් Chromium ප්‍රමාණය මනින්නේ මයික්‍රෝග්‍රෑම්වලින්. මයික්‍රෝග්‍රෑම් 1,000ක් තමයි මිලිග්‍රෑම් එකක් වෙන්නේ. අපි සාමාන්‍යයෙන් ග්‍රෑම්, කිලෝග්‍රෑම්වලින් විතරයි කටයුතු කරන්නේ. මයික්‍රෝග්‍රෑම් 1,000ක් තමයි මිලිග්‍රෑම් එක. මිලිග්‍රෑම් 1,000ක් තමයි ග්‍රෑම් එක. මෙහෙම මනින එකක් ඇයි ලංකාවේ මේ හදිසියේ වැඩි කරන්නේ? පසුගිය අවුරුදු 20 තුළ ලෝකයේ කිසිම රටක් තමන්ගේ ප්‍රමිතිය බාල කරලා නැහැ. මේක පටන් ගන්නේ 1990දී. 1990දී ලෝකයේ Chromium content එක තිබෙන්නේ කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 0.1යි. ඊට පස්සේ 2005 වෙනකොට මේක වැඩි කර ගන්නවා, මිලිග්‍රෑම් 0.05 දක්වා. මේක තමයි WHO එකේත්, හැම තැනමත් තිබෙන්නේ.

හැබැයි, හැම තැනම එහෙම තිබියදී ලංකාවේ විතරක් පුනරුද ආණ්ඩුව ආපු ගමන් හදිසියේ ලංකාවේ මිනිස්සුන්ට,- මේ ආණ්ඩුව බලයට ආවේ පිළිකා රෝගීන්ට වතුර දුන්නා කියමින්. හැබැයි, අන්තිමට මේ ආණ්ඩුව වතුර හරහා නීත්‍යානුකූලව පිළිකාකාරක ජනතාවට පොවන්න සූදානම් වෙනවා, ගරු සභාපතිතුමනි. මට ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න තිබෙනවා. පළමු ප්‍රශ්නය මේකයි. පළමු stock එක fail වෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මට උත්තර දුන්නොත් හොඳයි, තවම ඒ ටික තිබෙනවා. තවම ගාල්ලේ තිබෙනවා, අඹතලේ තිබෙනවා, කළුතර තිබෙනවා. ඇයි, මේවා අයින් කරන්නේ නැත්තේ? ඒක තමයි පළමුවන ප්‍රශ්නය.

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
මම බොහොම වගකීමෙන් කියනවා, මේ ප්‍රශ්නගත hydrated lime තවමත් අපි use කරන්නේ නැහැ කියන එක. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. දැන් ඔබතුමා පුනරුච්චාරණය කරමින් කියන්නේ අපි ඇවිල්ලා මේ සීමාවන් ඉහළ දමන්න ඉල්ලීම් කළා කියන එකයි.

හැබැයි මම ඔබතුමාට වගකීම් සහගතව කියනවා, මේ ප්‍රමාණය ඉහළ දැමීම සඳහා අපි කිසි විධියකින් අපේ කාලය තුළ ඉල්ලීමක් කළේ නැහැ කියන එක. මම සඳහන් කරපු කාලයේ තමයි ඒ පිළිබඳව ඉල්ලීම කරලා තිබෙන්නේ. ඒ වාගේම ඒ ඉල්ලීම සහ මේ තොගය සම්බන්ධයෙන් කිසිම සම්බන්ධතාවක් ඇත්තේ නැහැ. ඒ වාගේම මම කලිනුත් සඳහන් කළා වාගේ අපි tender call කරනකොට අදාළ පිරිවිතරයන් සඳහන් කරනවා. ඒ පිරිවිතරයන්ට අනුකූලව ලැබෙන තොග විතරයි අපි භාවිත කරන්නේ. මේ තොගය තවමත් අපි ජල පිරිපහදුව සඳහා භාවිත කරන්නේ නැහැ. මම නැවත වරක් වගකීමෙන් කියනවා,-

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
කොහේද තිබෙන්නේ?

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
තිබෙන තැන කියන්න, ඇමතිතුමා. ඒවා කොහේද තිබෙන්නේ දැන්?

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
ඒවා ගබඩා කරලා තිබෙනවා.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
කොහේද තිබෙන්නේ?

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
මෙහෙමයි. ඔබතුමා procedure එක දන්නවා නේ. තොග ලැබුණාට පස්සේ අදාළ ගබඩාවලට dispatch කරනවා. මුලින් පරීක්ෂා කරනවා. ඒ වාගේම භාවිත කරන්න කලින් ඒ ගබඩාවලදීත් ආයෙත් සැරයක් පරීක්ෂා කරනවා. ඒ පරීක්ෂණයන්ට අනුකූලව, පිරිවිතරයන්ට අදාළ වුණොත් විතරයි පිරිපහදුව සඳහා භාවිත කරන්නේ. මේ තොගය අපි tender call කරනකොට තිබුණු පිරිවිතරවලට අනුකූල නැති නිසා භාවිත කරලා නැහැ. එතකොට අපට අවස්ථාව තිබෙනවා, ඒ වෙනුවෙන් අදාළ සැපයුම්කරුගෙන් අලුත් තොග ලබා ගන්න. ඒ නිසා මේ රටේ ජනතාවට බොහොම පැහැදිලිව කියනවා, ලංකාවේ ප්‍රමිතීන්වලට අනුකූල hydrated lime විතරයි National Water Supply and Drainage Board එක පාවිච්චි කරන්නේ; මේ තොගය පාවිච්චි කරන්නේ නැහැ කියන එක.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, මම කලින් කිව්වා වාගේම ඒ තොග තවම තිබෙන්නේ පිරිපහදුවල. දැන් මාස හතරක් වෙනවා reject වෙලා. ඇයි ඒවා ගෙනියන්නේ නැත්තේ? ඒකට හේතුවත් මම කියන්නම්, ගරු සභාපතිතුමනි.

ඒකට හේතුව තමයි දැන් මෙතුමන්ලා සූදානම් වෙනවා, අලුත් ටෙන්ඩරයක් call කරන්න. අලුත් ටෙන්ඩරය call කරනකොට දැන් standards up වෙලා තිබෙන්නේ. දැන් ලංකාවේ ප්‍රමිතිය බාල වෙලා තිබෙන්නේ. කලින් කිලෝ ග්‍රෑමයක තිබෙන්න පුළුවන් ක්‍රෝමියම් ප්‍රමාණය මිලි ග්‍රෑම් 10යි; දැන් මිලි ග්‍රෑම් 12ක් වෙලා තිබෙන්නේ. අලුත් ටෙන්ඩරයක් දැම්මාම එකම කොම්පැනියට පුළුවන් නැවත වතාවක් අලුත් ටෙන්ඩරයට ඇවිල්ලා මිල ගණන් දෙන්න; අර ටිකම නැවත පාවිච්චි කරනවා. හරි සාධාරණයි නේද? බැලුවාම සාධාරණයි. හැබැයි ප්‍රශ්නය ගරු සභාපතිතුමනි,-

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
උපකල්පන මත ඉඳලා කියන දේවලට අපට උත්තර දෙන්න බැහැ. ඔබතුමා ඔය සිද්ධීන් වුණාට පස්සේ කියන්න. හැබැයි, ගරු මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමැතියි, අර කෙහෙලිය

රඹුක්වැල්ල හිටපු ඇමතිතුමා පිළිකාකාරක ඖෂධ ගෙනැල්ලා එතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනාපු වෙලාවේ ඔබතුමා කොහේද හිටියේ කියලා. පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. ඒ නිසා මම නැවත වරක් කියන්නේ, ඔබතුමා උපකල්පනය කරමින් ප්‍රකාශ නිකුත් කරලා මේ රටේ ජනතාවත්, මේ ගරු සභාවත් නොමඟ යවන්න එපා. උපකල්පන උපකල්පන හැටියට තියා ගන්න; සිහින සිහින හැටියට තියා ගන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. D.V. Chanaka, you have got one more minute, please.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමා මට විනාඩි දෙකක කාලයක් ලබා දෙනවාය කිව්වා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, එතුමාට විනාඩි දෙකක් ලබා දෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay. You may continue for two minutes.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, කෙහෙලිය රඹුක්වැල්ල මහත්මයා සම්බන්ධ කාරණයටත් මම එතුමාට උත්තරයක් දෙන්නම්. ගරු ඇමතිතුමනි, එතුමාට දෝෂාභියෝගයක් ගෙනාවා වාගේම එතුමා සිරගත වුණේත් ගිය ආණ්ඩුව තිබෙද්දීමයි. රටේ නීතිය ක්‍රියාත්මක කළා. එතකොට හිටියේ ඔබතුමන්ලා නොවෙයි. මේ, SLS ප්‍රමිතීන්. මෙතුමාගේ අමාත්‍යාංශයේ නොවෙයි. හැබැයි, මේ ප්‍රමිතිය වෙනස් කළේ ඇයි? මේ අගය මිලිග්‍රෑම් 12ක් කළේ ඇයි? මේ සභාවේ ඉන්නවා අපේ හිටපු කථානායකතුමා - රන්වල මහත්මයාගෙන් ඇහුවොත් කියාවි. ඔබතුමා පිටුපස හැරිලා එතුමාගෙන් අහන්න. එතුමා කියාවි. මේක වැරදියි. ලෝකයේ කිසිම රටක ප්‍රමිතිය වැඩි කළේ නැත්නම්, ඇයි වැඩි කළේ?

දෙවැනි කාරණය ගරු සභාපතිතුමනි, අලුතෙන් ආපු stock එකත් fail. පරණ එක වාගේම අලුතෙන් ආපු stock එකත් fail. ඒ වාගේම ඒ stock දෙකම පිට රටින් check කරලා ගෙනාපු ඒවා. ඇමතිතුමනි, පරීක්ෂණයක් කරලා එකක් වරදින්න පුළුවන්. දෙවැනි එකත් fail නම් කොහොමද, තවදුරටත් මේවා විශ්වාස කරන්නේ? අනෙක් එක lab හතරකින් එකම sample එකට results හතරක් එනවා නම්, හරි එක තියාගෙන ඉතුරු තුන වහන්න. එහෙම නැත්නම් ඒ ගොල්ලන් blacklist කරන්න, එකම කොට්ටයෙන් sample හතරට ප්‍රතිඵල හතරක් එනවා නම්.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි මේ පුනරුද ආණ්ඩුව ඉතිහාසගත වෙනවා ලංකාවේ. ක්‍රෝමියම් කියන්නේ රටේ ජනතාවට හිතකර දෙයක් නොවෙයි, පිළිකාකාරකයක්. ඒකෙන් වකුගඩු රෝග ඇති වෙන්න පුළුවන්, pregnant අයට හොඳ නැහැ. ඒ හැම දේම නිසා ඒවා මනින්නේ මයික්‍රෝග්‍රෑම්වලින්. මිලිග්‍රෑම් එකකට මයික්‍රෝග්‍රෑම් 1,000ක් තිබෙනවා. මයික්‍රෝග්‍රෑම්වලින් තමයි රටේ ජනතාවට ගන්න පුළුවන් ප්‍රමාණය මනින්නේ. එහෙම දෙයක ප්‍රමිතිය වැඩි කරලා, වතුර හරහා පිළිකාකාරක දෙන්න තමයි ඔබතුමන්ලා උත්සාහ කරන්නේ. ඇයි ඇමතිතුමාගෙයි, සභාපතිතුමාගෙයි ප්‍රකාශ දෙකක්? මොකද, මේ ගොල්ලන්ට ඕනෑ "ලෝකයේ වැඩියි, අපේ අඩුයි" කියලා පෙන්වන්න. පැහැදිලිවම මේ පිළිබඳව පරීක්ෂණයක් කළ යුතුයි, රටේ ජනතාව බේරා ගන්න.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Dilip Wedaarachchi. You have 15 minutes.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මම බෙහෙවින්ම සතුටු වෙනවා. විශේෂයෙන්ම මෙවර අය වැයෙන් නාගරික සංවර්ධන, ඉදිකරීම් සහ නිවාස අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. මම ඒ ගැන බොහොම සන්තෝෂ වෙනවා. අපේ දිස්ත්‍රික්කයේ නිවාස ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ මුදල්වලින් ඒවා විසඳන්න සහයෝගය ලබා දෙන්න මම මේ අදහස් ටික ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, 2015-2019 කාලයේ "උදාගම්" සංකල්පය යටතේ ගම්මාන 333ක්-

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Antorn Jayakoday?

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු සභානිතුමනි.

ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා ක්‍රෝමියම් ගැන මේ සභාවට වැරදි අවබෝධයක් ලබා දෙන්න උත්සාහ කළා. ඒ නිසා මම ඒක ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ලෝකයේ හුණුගල්වල ක්‍රෝමියම් content එක per kilogram මිලිග්‍රෑම් දශම 1 සිට 10 දක්වා තිබෙන්න ඕනෑ. හැබැයි, WHO එකේ standards තමයි ලීටරයට මිලිග්‍රෑම් 0.05යි කියන එක. ඒ කියන්නේ, water purify කරලා බොන්න දෙන වතුරේ තිබෙන්න ඕනෑ ලීටරයට මිලිග්‍රෑම් 0.05යි. සාමාන්‍යයෙන් අපට වතුර ලීටරයක් purify කරන්න alum එහෙම නැත්නම් හුණු ගල් පාවිච්චි කරන්නේ ඉතාම ස්වල්ප ප්‍රමාණයයි. එතකොට මෙන්න මේකේ පරස්පරයක් තිබෙනවා. මම හිතනවා තවම අපි අර standards භාවිත කරලා නැහැ කියලා. ඒක භාවිත කළාට පස්සේ තමයි check කරන්න ඕනෑ. Purify කළ වතුරේ තිබෙන්න ඕනෑ මිලිග්‍රෑම් 0.05යි. *[බාධා කිරීමක්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. D.V. Chanaka, let us take it as a clarification.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මට තත්පර 10ක් දෙන්න, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, take 10 seconds, please.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, ඉතාම බරපතළ ප්‍රකාශයක්. මම එතුමාත් එක්ක එකඟ වෙනවා, ලීටරයකට මිලිග්‍රෑම් 0.05 තමයි තිබෙන්න ඕනෑ කියලා. එතුමා කියනවා 10mg ඉඳන් 12mg දක්වා වැඩි කළා කියලා. හැබැයි වැඩි කරලා purify කරලා පාවිච්චි කරලා තමයි ලු, බලන්න වෙන්නේ ඒකේ පිළිකාකාරක තිබෙනවාද කියලා. එතකෙට standards හදන්නේ මේවා check කරලා නොවෙයිද? මේක තමයි මම කියන්නේ. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, දැන් අපේ පරිසර නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, එතුමන්ලා හදපු එක, 12mg, purify කරලා තමයි බලන්න වෙන්නේ ඒක 0.05mgද, නැද්ද කියලා යනුවෙන්. ඉතින් මේක නේ ප්‍රශ්නය. මේක තමයි මම කියන්නේ. මේ standards හැදුවේ අර කොම්පැනියේ වුවමනාවට මිස රටේ වුවමනාවට නොවෙයි. පැහැදිලිවම ඇමතිතුමාගේ ප්‍රකාශයෙන් ඒක පැහැදිලි වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dilip Wedaarachchi, you may continue, please.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු සභාපතිතුමනි, මම දැන් ඉඳලා වේලාව ගන්නම්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

Hon. Chairman, we appreciate this type of intervention. But, I hope it is allowed not only for today, but as a practice when things like this come up. I mean, this intervention is good. I hope we get the entire matter sorted out. I only made a point, that we appreciate this type of intervention. Do not stop it from happening in the future as well.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
I agree with the Hon. Ravi Karunanayake. But, I think one intervention is enough. Otherwise, we would have to continue until midnight.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, otherwise, we would not be able to go forward, Hon. Member.

Hon. Dilip Wedaarachchi, your time starts now.

[අ.භා. 12.10]

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේත්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ ගැන කථා කරන මේ අවස්ථාවේ අපේ දිස්ත්‍රික්කයේ ඇති වෙලා තිබෙන ගැටලු ටිකක් ඉදිරිපත් කරලා ඒවා විසඳා ගැනීම සඳහා සහයෝගය ලබා ගන්න මම බලාපොරොත්තු වෙනවා.

මම මෙහිදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. 2015-2019 කාලයේ පැවති යහ පාලන ආණ්ඩුව සමයේ උදාගම් 337ක ගෙවල් 8,663ක් ඉදිකිරීම ආරම්භ කළා. ඒවායෙන් ගෙවල් 2,863ක වැඩ නිම කළා. ගෙවල් 5,798ක වැඩ අතරමග නතර වුණා. මොකද, 2020 මහ මැතිවරණය ආවා. එම මහ මැතිවරණය අවස්ථාවේ ඒ කටයුතු ඔක්කොම නතර වුණා. මහ මැතිවරණය අවස්ථාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකයින් ගම්මානයෙන් ගම්මානයට ගිහිල්ලා ඒ නිවාස ඉදි කරලා දෙනවා කියලා ඒ නිවාස හිමි ජනතාවගෙන් ඡන්ද ලබා ගත්තා. නමුත්, අද ඒ මිනිස්සු භාගෙට හදපු ඒ ගෙවල්වල ටකරන් ඇදගෙන, ඉටිකොළ ඇදගෙන ඉන්නවා. ඒ ගෙවල්වල ඉදි කිරීම් වැඩ භාගෙට කරලා තිබෙන්නේ. ඒවාට විදුලිය නැහැ, ජලය නැහැ. අද ඒ ගෙවල් සියල්ලේම මිනිස්සු අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා.

මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ රජයෙන් නිවාස ව්‍යාපෘතිවලට විශාල මුදලක් වෙන් කර තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ උදාගම් 337 ගැන වෙනම research එකක් කරලා, වැඩ අවසන් කරපු නැති ගෙවල් හදලා දීලා, විදුලිය, ජලය ලබා දීලා ඒ ගෙවල්වලට අවශ්‍ය කටයුතු කර දෙන්න කියා මම නව රජයෙන් ඉල්ලා සිටිනවා.

ඒ කාලයේම නිවාස 225ක උදාගමක් ඉදි කරලා තිබෙනවා, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අග්‍රහැර ග්‍රාම නිලධාරි වසමේ. ඒ ගම්මානයේ ගෙවල් 225න් පවුල් 45යි පදිංචි වෙලා ඉන්නේ. මොකද, එහි ජල පහසුකම නැහැ. ඒ කිට්ටුවම ජල උල්පතක් තිබෙනවා. ඒකෙන් ජලය supply කරනවා. නමුත්, ප්‍රමාණවත් නැහැ. ඒ ගම්මානයේ පාසල් යන දරුවන් ඉන්නවා; කාන්තාවන් ඉන්නවා. වතුර නැති නිසා ඒ ජනතාව වැහි වතුර එකතු කරලා තම අවශ්‍යතාවලට යොදා ගන්නවා; සල්ලි ගෙවලා වතුර බවුසර් ගෙන්වාගෙන තම වැඩ කටයුතු කරගන්නවා. ඒ ගමේ කට්ටිය සියලුදෙනාම එකතු වෙලා මේ ගැටලුව ජල සම්පත් මණ්ඩලයට ලිව්වා. ගරු ජනාධිපතිතුමාටත් ලියා එවා තිබෙනවා. ඒ ඔක්කොම ලියුම්වල පිටපත් මා ළඟ තිබෙනවා. ඒ අය ජාතික ජල සම්පත් මණ්ඩලයට, ජාතික ජල සැපයුම් දෙපාර්මේන්තුවට, ගරු ජනාධිපතිතුමාට, ගරු ඇමතිතුමාට බොහෝ සෙයින් ලියුම් ලියා තිබෙනවා. නමුත්, ඒ කටයුත්ත කරගන්න බැරිව එම ජනතාව අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා.

අපේ ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජලය තමයි අත්‍යවශ්‍ය දේ. නොකා හිටියත් ජලය නැතිව මනුස්සයින්ට ජීවත් වෙන්න අමාරුයි. ඒ ප්‍රදේශයේ ජල ප්‍රශ්නයත් හරිම උග්‍ර ප්‍රශ්නයක්. එම නිසා ඒ අහිංසක මිනිසුන්ගේ ඒ ගම්මානයට ජල පහසුකම් ලබා දෙන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන්, දකුණු පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වෙතින් 2024.08.07වැනි දා ලියුමක් එවා තිබෙනවා. ඒ ලියුමේ එතුමා කියා තිබෙනවා, එම පහසුකම ලබා දෙන්න පුළුවන්, ඉදිරියේදී එම වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා කියලා. ඒ නිවාස ව්‍යාපෘතිය 2015 - 2019 කාලයේ ඉදි කරපු නිසා දේශපාලන වශයෙන් කල්පනා කරලා රාජපක්ෂ ආණ්ඩුව කාලයේ එහි වැඩ කටයුතු නතර කරලායි තිබුණේ. නිලධාරීන් විසින් ඒවා ක්‍රියාත්මක කළේ නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. වීරකැටිය, අග්‍රහැර පිහිටි එම උදාගම්මානයේ ගෙවල් 225ක් තිබෙනවා. ඒ නිවාසවල පවුල් හතළිස් ගණනක් පදිංචිව සිටිනවා. අනෙක් මිනිස්සු පදිංචි වෙන්නේ නැත්තේ ජලය නැති නිසා; විදුලිය නැති නිසා. ඒ නිසා ඒ ව්‍යාපෘතියේ වැඩකටයුතු ක්‍රියාත්මක කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපේ ගරු ප්‍රවාහන ඇමතිතුමාට ලොකු ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න ඕනෑ. පාන්දර 5.25ට බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කළ "රුහුණු කුමාරි" කෝච්චිය යළි මාතරින් ගමන් ආරම්භ කරවන්න මංගල සමරවීර ඇමතිතුමා කටයුතු යෙදුවා. ඒ, මාතර ජනතාව වෙනුවෙන්. ගරු ඇමතිතුමනි, අපේ ඉල්ලීම පරිදි රුහුණු කුමාරි කෝච්චිය බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කරන්න කටයුතු කර තිබුණා. නමුත් එය ආයෙත් මාතරින් ගමන් ආරම්භ කරන්න පටන් ගත්තා. මාතර ජනතාවගේ ඉල්ලීම පරිදියි ඒ කෝච්චිය මාතරින් ගමන් ආරම්භ කළේ.

අපි දුම්රිය දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කරලා, කථා කරලා තමයි එය බෙලිඅත්තෙන් ආරම්භ කරන්න කටයුතු කළේ. ඒ අනුව 2024 පළමුවැනි මාසයේ පළමුවැනි දා ඉඳන්, මරදාන දක්වා යන කෝච්චිය බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කළා. ඒ කෝච්චිය එසේ බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කරලා දවස් 11ක් යන කොට වීරසුමන වීරසිංහ හිටපු මන්ත්‍රීතුමා 2024 ජනවාරි 11වන දා පාර්ලිමේන්තුවේදී ඒ ගැන ප්‍රශ්න කළා. එහිදී වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා ඇතුළු මාතර දිස්ත්‍රික්කය නියෝජනය කළ සියලු මන්ත්‍රීවරු එකතු වුණා. එදා හිටපු කථානායකතුමා, වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා, සාගල රත්නායක මන්ත්‍රීතුමා, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, නිපුණ රණවක මන්ත්‍රීතුමා කියන සියලුදෙනා එක්කාසු වෙලා මාතර ජනතාවගේ ඉල්ලීමට අනුව නැවත වරක් ඒ කෝච්චිය මාතරින් ගමන් ආරම්භ කරන්න කටයුතු කළා. ඒ දුම්රිය මාර්ගය දීර්ඝ කරලා තිබෙනවා, බෙලිඅත්තට යනකල්. ඒ කෝච්චිය බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කළාම මාතර ඉන්න ජනතාවට මාතර ඉඳලා එන්න අපහසු නිසා ඒගොල්ලන් එය බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කරන එක නතර කළා. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී වීරසුමන වීරසිංහ මන්ත්‍රීවරයා කළ කථාව ඇතුළත් හැන්සාඩ් වාර්තාවත් මම දැන් අරගෙන ආවා. මම නැවත වතාවක් පාර්ලිමේන්තුවේදී මේ ගැන ප්‍රශ්න කළා. එසේ ප්‍රශ්න කළාට කවදාවත් ඒ ප්‍රශ්නය විසඳුණේ නැහැ.

ගරු ඇමතිතුමනි, මම කරන ඉල්ලීම මේකයි. දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, ඒ වාගේම රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව කොළඹට එන්නේ බෙලිඅත්තට ඇවිල්ලායි. ඒ නිසා විශාල ජනතාවකගෙන් ඉල්ලීමක් තිබෙනවා, මේ ප්‍රශ්නය විසඳන්න කියලා. ඒ කෝච්චිය බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කරන එක නතර කළේ දේශපාලන අධිකාරියයි; මාතර දිස්ත්‍රික්කය නියෝජනය කළ මැති ඇමතිවරුන් විසිනුයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් වෙලා මරදාන බලා එන රුහුණු කුමාරි කෝච්චිය උදේ 5.25ට බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කරවන්න කටයුතු කරන්න. දහවල් 12.50ට බෙලිඅත්තෙන් නුවර බලා ගිය ශීඝ්‍රගාමී කෝච්චියත් නතර කළා. මාතරින් තමයි ඒ කෝච්චියත් යන්නේ. උදේ 5.25ට ගාලු කුමාරි කෝච්චිය බෙලිඅත්තේ ඉඳන් මාතරට යන කල් ඉන්නවා මාතරින් ගමන් ආරම්භ කරන කෝච්චිය මාතරින් පිටත් වෙන්න. එතකොට, භාණ්ඩ ප්‍රවාහනය වෙන්නේ නැහැ; භාණ්ඩ පටවන්නේ නැහැ. ඒ නිසා හම්බන්තොටින්, මොනරාගලින් කරපු බඩු ප්‍රවාහනයත් දැන් නතර වෙලා තිබෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහ මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට කොළඹට එන්න හැකියාවක් නැහැ, මේ ප්‍රශ්නය නිසා. මේක දේශපාලන අධිකාරිය විසින් නතර කරපු එකක්. ගරු බිමල් රත්නායක මැතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ. ඔබතුමා දැන් අපේ ප්‍රවාහන ඇමතිතුමා. ඉතින් ඔබතුමා මැදිහත් වෙලා එම දිස්ත්‍රික්කයේ වැඩ කටයුතු-

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා ගමට, -

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගමට කරන සේවයක් විධියට නොවෙයි, සාධාරණය ඉෂ්ට කරන්න. මම තනියම සටන් කළේ මාතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් එක්ක. එහෙම සටන් කරලා එම කෝච්චිය බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කරන්න කටයුතු කළා. නමුත්, දවස් 11යි එම කෝච්චිය බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කළේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ වගකීම භාර දෙනවා. රුහුණු කුමාරි දුම්රිය උදේ 5.25ට බෙලිඅත්තෙන් ආරම්භ කරන්න. 12.50ට මහනුවර බලා යන ශීඝ්‍රගාමී කෝච්චියත් බෙලිඅත්තෙන් ආරම්භ කරන්න. මීට ඉස්සෙල්ලා අලුයම 2.15ට කෝච්චියක් - ශීඝ්‍රගාමී කෝච්චියක්- පිටත් වුණා උදේ 6.00ට කොළඹට ළඟා වෙන්න. ත්‍රිකුණාමලයට, යාපනයට යන ඕනෑම කෙනෙකුට ඒ කෝච්චියෙන් ඇවිල්ලා යන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සෙනඟ හිටියා ද?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඔව්, ඒ කාලයේ සෙනඟ ඉඳලා තිබෙනවා. නමුත් ඒ කෝච්චියත් නතර කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ගැනත් පොඩ්ඩක් පරීක්ෂා කර බලන්න. මම සඳහන් කළ මේ කෝච්චි තුන බෙලිඅත්තෙන් ගමන් ආරම්භ කරන්න කටයුතු කරන්න. බෙලිඅත්තෙන් නේ රුහුණු කුමාරි දුම්රිය ආරම්භ කරන්න ඕනෑ. රුහුණු කුමාරි දුම්රිය ආරම්භ කරන්න එපායැ, රුහුණු රටින්. ඒක අත්‍යවශ්‍ය කාර්යයක්. ඒ නිසා මේ ඉල්ලීම ඉෂ්ට කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

ඒ වාගේම තවත් ප්‍රශ්නයක් ගැන කියන්න තිබෙනවා. මේ ඔක්කෝම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රශ්න. මේකත් දේශපාලනමය වශයෙන් ඇති වුණු ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, සජිත් ප්‍රේමදාස මැතිතුමා හදපු නිවාස කියලා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ රජය ඒ නිවාස අලුත්වැඩියා කළේ නැහැ, ඒ අවුරුදු 4ටම. කියන්නත් ලජ්ජයි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මිනිස්සු

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

තමයි නරකාදියක ජීවත් වෙනවා වාගේ ජීවත් වෙන්නේ. සජිත් මැතිතුමා හදපු ගෙවල් තිබෙනවා කියලා ගෙවල් 300 ගණනකට වතුර ටික දෙන්නේ නැත්නම්, විදුලිය දෙන්නේ නැත්නම් මොකක්ද තත්ත්වය? *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
වානක මන්ත්‍රීතුමාට, -

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
වානක මන්ත්‍රීතුමාට බණින්නේ නැහැ මම. එතුමාට බණින්නේ නැහැ මම. ගරු ඇමතිතුමනි, ඒ ප්‍රශ්නයත් නිරාකරණය කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, තවත් ප්‍රශ්නයක් තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කළා, විශාල පාලම් ව්‍යාපෘති කිහිපයක්. එකක් තමයි මෝදරපැලැස්ස පාලම. ඒක කිරිදිඔය හරහා ඉදිවන අලුත් පාලමක්. එය මීටර් 54ක් දිගයි. එහි සියයට 50ක් වැඩ නිම කර තිබෙනවා. ඊළඟට, තාලිගල-රිදියගම යා කරන පාලම. ඒක මීටර් 82ක් දිගයි. ඒකේ සියයට 70ක් වැඩ නිම කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, මම මේ විස්තර ඔක්කොම ඔබතුමාට දෙන්නම්. ඊළඟට, බැදිගංතොට-ලියන්ගස්තොට පාලම. එය මීටර් 95ක් දිගයි. සියයට 10යි එහි වැඩ නිම කර තිබෙන්නේ. ඊළඟට, රන්මුදුවැව-තණමල්විල පාලම, මීටර් 36ක් දිගයි, සියයට 55ක් වැඩ නිම කර තිබෙනවා. මැදගොඩ පාලම මීටර් 40ක් දිගයි, සියයට 55ක් වැඩ නිම කර තිබෙනවා.

තල්උන්න අඳුපැළැන පාලම මීටර් 28යි, සියයට 20ක් වැඩ කරලා තිබෙනවා. අහුල්මඩුව අරන්වෙල පාලම මීටර් 27යි, සියයට 31ක් වැඩ කරලා තිබෙනවා. කෙහෙල්වත්ත කටුවන පාලම බලන්න ඔබතුමා යන්න. ඒ පාලම කොනට එනකල්ම හදලා ඉවරයි. හැබැයි, පාලම උඩින් ගිහිල්ලා, ඉණිමගක් තියලා පහළට බැහැලා තමයි ඒ ගමට යන්නේ. ඒ පාලමෙන් යන්නේ නැතුව කෙහෙල්වත්ත ගම්මානයට රවුමෙන් යනවා නම්, කිලෝමීටර 8ක් යන්න ඕනෑ. අළුපොත්දෙනියෙයි, උඩවෙල් මුල්ලෙයි, මැදකන්දෙයි භෝග ඔක්කොම ගේන්න ඕනෑ ඒ පාලමෙන්. මේ ඔක්කොම පාලම්වල වාර්තා මා ළඟ තිබෙනවා. බාගෙට හදපු පාලම්වල විස්තරත්, ඒවාට වියදම් වෙච්ච මුදල් සම්බන්ධ විස්තරත් මා ළඟ තිබෙනවා. ඒවා හැන්සාඩ්ගත කරලා ඔබතුමාට දෙන්නම්, ගරු ඇමතිතුමනි. SD & CC ආයතනය තමයි ඒ කොන්ත්‍රාත් එක කරලා තිබෙන්නේ. ඒ, අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා ආරම්භ කරපු පාලම් ටික. ඒවා හොර කොන්ත්‍රාත්කරුවන්ට දීලා නැහැ. ඒවා හරියාකාරව කරලා තිබෙනවා. 2019දී අපේ ආණ්ඩුව නැති වුණාම, සජිත් ප්‍රේමදාස හදපු පාලම් කියලා ඒ පාලම් එකක්වත් රාජපක්ෂ ආණ්ඩුවෙන් හැදුවේ නැහැ. සජිත් ප්‍රේමදාස ගෙවල් හදන්න ඉඩම් කැබැල්ලක් දුන්නා. ගේ හදා ගන්න ණයකුත් දුන්නා. ණය වුණා කියලා සජිත් ප්‍රේමදාස මැතිතුමාට ඡන්දය නොදී පොහොට්ටුවට ඡන්දය දුන්නා, ඒ ප්‍රදේශවල ජනතාව. ඒ ජනතාව පොහොට්ටුවට ඡන්දය දුන්නා. පොහොට්ටුව ඒ ඡන්ද අරගෙන පළි ගත්තා. ඊට පස්සේ පොහොට්ටුවටත් නොදී ඔබතුමන්ලාට ඡන්දය දුන්නා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව. ඔබතුමන්ලාට ඡන්ද දෙලක්ෂ අසූහතරදහස් තුන්සිය ගණනක් දුන්නා. අපට දුන්නේ ඡන්ද 52,000යි. පොහොට්ටුවට දුන්නේ ඡන්ද 26,000යි. ඒ දෙලක්ෂ අසූහතරදහසම ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය දීපු කට්ටිය. ඒ ගෙවල්වල ඉන්නේ, අහිංසක, දුප්පත් කට්ටිය; නැති බැරි මිනිස්සු. නරකාදියක ඉන්නවා වාගෙයි ඔවුන් ඉන්නේ. ඔබතුමන්ලාට තුනෙන් දෙකක ලොකු බලයක් ලබා දී තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ නිවාසවල ප්‍රශ්නය විසඳලා දෙන්න කියලා. ඒ වාගේම මේ පාලම් 13ම ප්‍රතිසංස්කරණය කරන්න හැකි ඉක්මනින් කටයුතු කරන්න කියලාත් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* හම්බන්තොට තමයි ඉතින්. ඒවායේ ඉතුරු ටික ඔක්කොම හොයලා,- *[බාධා කිරීමක්]* අපේ ඇමතිතුමා නේ ඉන්නේ.

ඊළඟට, පාරිභෝගික ජනතාවට ගොඩනැඟිලි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් තංගල්ල ආසනයටයි, බෙලිඅත්ත ආසනයටයි, මුල්කිරිගල ආසනයටයි ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ආරම්භ කරලා තිබුණා, සීමාසහිත ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව. ඒ ආසන තුනටම තිබුණේ තංගල්ලේ එක විතරයි. ඒක ගිය මාසයේ වැහුවා. මම ඒ අවස්ථාවේ ඇමතිතුමාට කථා කළා. සභාපතිතුමාටත් කථා කළා. කථා කළාම මාසයක් ඇතුළත පරීක්ෂණයක් කරලා නැවත ආරම්භ කරනවා කිව්වා. ඒ ආයතනය බෙලිඅත්ත ආසනයටයි, තංගල්ල ආසනයටයි, මුල්කිරිගල ආසනයටයි ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ඉදි කරපු ආයතනයක්. ඒක දිස්ත්‍රික්කයේ ජනතාවට ගොඩනැඟිලි ද්‍රව්‍ය ලබා ගන්න තිබුණ ආයතනය. ඒ නිසා ඒ ආයතනය නැවත වතාවක් තංගල්ල ප්‍රදේශයේ ඉදි කරන්න කියලා ගරු නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්න ඔක්කොම පළිගැනීම්වලට ගොදුරු වෙච්ච නිසා තිබෙන ප්‍රශ්න, ගරු ඇමතිතුමනි. අපේ දිස්ත්‍රික්කය ලොකු පළිගැනීම්වලට ලක් වුණා. 2019න් පස්සේ පළි ගැනීම්වලට ලක් වුණා. *[බාධා කිරීමක්]* යාළුවා වුණාට කලේ නැහැ නේ. 2019.09.01වැනි දා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ දින 180 සම්පූර්ණ කරපු සේවකයන් 2,511ක් ස්ථිර කරන්න සූදානම් වූ අවස්ථාවේදී මැතිවරණ කොමසාරිස්වරයා කිව්වා, මැතිවරණයක් එන නිසා - මේ ජනාධිපතිවරණය අවස්ථාවේ නොවෙයි, පසුගිය ජනාධිපතිවරණය අවස්ථාවේදී- ඒ කටයුත්ත වහාම නතර කරන්න, මැතිවරණයෙන් පස්සේ ඒ කටයුත්ත කරන්න කියලා. ඒ මැතිවරණයෙන් පස්සේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති වුණා. නිවාස සංවර්ධන ඇමති හැටියටත් මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් වුණා. එතුමන්ලා පත් වෙනකොට ඒ සේවකයන්ගේ ඒ රැකියාව නතර කරලා තිබුණේ.

ඒ සේවකයන් හම්බන්තොට මහනගර මන්දිරයට කැඳවලා, ඔක්කෝටම කථා කරලා ඒ අයගේ ඡන්දය ලබා ගත්තා. ඡන්ද ලබාගෙන ජනාධිපති වුණාට පස්සේ ඒ අයගේ රැකියා දුන්නේ නැහැ. එම නිසා ඒ අය උසාවි ගියා. ඒ ඒ අය තමන්ගේ දිස්ත්‍රික්කවල උසාවි ගියා. මාතලේ උසාවියෙන් නියෝග කළා, ඒ දිස්ත්‍රික්කයේ රැකියා දෙන්න කියලා. මාතර උසාවියෙන් නියෝග කළා, වන්දි ගෙවන්න කියලා. JVP එකේ පාර්ලිමේන්තු මන්ත්‍රී අපේක්ෂක සහ පළාත් සභා මන්ත්‍රී ජයන්ත පතිරණ මහතාත් මාතර උසාවියේ ඒ නඩුවට හිටියා. මම හිතන හැටියට එතුමාත් පාර්ලිමේන්තුවේ ඇති. රැකියා නොදුන් අය නඩු පැවරුවා. එක නඩුකාරතුමෙක් වන්දි දෙන්න කිව්වා. එම නඩුකාරතුමා විශ්‍රාම ගියාට පස්සේ වෙන නඩුකාරතුමෙක් ඊළඟට නඩුව ඇහුවා. එම නඩුකාරතුමා නඩුව නිෂ්ප්‍රභ කළා. රැකියා නොදුන් අයට වන්දි ලබා දීමේ කටයුතු එක ප්‍රදේශයක කරලා තිබෙනවා, තව ප්‍රදේශයක කරලා නැහැ. උසාවිවලින් නියෝග දීලා තිබෙනවා. නමුත්, ගොඩක් කට්ටියට වන්දි ලැබිලා නැහැ. දැන් ඒ සමහර උපාධිධාරීන් වෙන රැකියාවලට ගිහින් තිබෙනවා. ඒ නිසා එතැන වැඩි ප්‍රමාණයක් නැහැ. ඒ අයට වන්දි මුදල් හෝ රැකියාව හෝ ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඒ අවස්ථාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් 2,500කගේ රැකියා අහිමි කළා; පළි ගත්තා. ඒ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අභිංසක දරුවෝ. ඒ අය බැංකුවලට ණය වුණා, ගෙවල් උකස් තිබ්බා. අන්තිමට පොලී ගෙවා ගන්න විධියක් නැති වුණා. එවැනි ලොකු ප්‍රශ්නයක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ අයට තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නයට විසඳුම් ලබා දීලා, මම ඉදිරිපත් කරපු යෝජනා හතරත් ඉෂ්ට කරලා අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට ඒ සේවාව ලබා දෙන්න කටයුතු කරන්න කියලා. මේවා සියල්ල කරන්න ගරු ඇමතිතුමාට ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැනත් ස්තුති කරමින් නිහඬ වනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Sitting is suspended till 1.30 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි. -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Leader of the House?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, මට තත්පර 30ක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

අද නුවරඑළිය ප්‍රදේශයේදී පාසල් දරුවන් ශ්‍රීලංගම බස් රථයකට ඇතුළු වෙච්ච අවස්ථාවේදී එම පාසල් දරුවන්ට බස් රථයෙන් බැහැලා යන්න කියලා බස් රථයේ වැඩ කරපු කොන්දොස්තර මහතා කරපු ප්‍රකාශයක් ගැන සමාජ මාධ්‍යවල විශාල සංවාදයක් ඇති වෙලා තිබෙනවා, එම අසාධාරණ සැලකීම ගැන. ඔබතුමාත් දන්නවා, season tickets සහිත සියලු දරුවන් සහ මගීන්ව අනිවාර්යයෙන්ම ශ්‍රීලංගම බස් රථවලට භාර ගන්න ඕනෑ කියලා අපි තීන්දුවකුත් ගත් බව.

අපි දැනුවත් කරන්න කැමතියි, ශ්‍රීලංගමයේ ඉහළ කළමනාකාරීත්වය විසින් එම කොන්දොස්තර මහතාව සියලු රාජකාරිවලින් ඉවත් කරලා තිබෙන බව. පරීක්ෂණ අවසන් වන තෙක් ඔහුව නැවත වැඩවලට යොදා වන්නේ නැති බවට ඔවුන් තීරණය කරලා තිබෙනවා. ඒ, අනිසි ලෙස කටයුතු කරපු පුද්ගලයාට විරුද්ධව අපි දැනට විනය ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay. Next, the Hon. Ruwanthilaka Jayakody. You have ten minutes.

[අ.භා. 1.32]

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමු වරට පුරවැසි අය වැයක් ඉදිරිපත් කර ඇති මොහොතක ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වනවා. ඒ සඳහා මා හට අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අපේ රට උච්චතම ආර්ථික අර්බුදයට පත්ව තිබුණු මොහොතක පහසුවෙන් රට ගොඩගත හැක්කේ කා හට දැයි හඳුනාගත් ජනතාව ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට පත් කරන්න ඡන්දය පාවිච්චි කළා.

ඒ බිඳවැටුණු රට නැවත ගොඩ නැඟීම සඳහා, අනාගත පරම්පරාව වෙනුවෙන් රට ගොඩ නැඟීම අරමුණු කර ගනිමින්, ඊට අවශ්‍ය පදනම සකස් කරන අභිලාෂයෙන්, ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විසින් 2025 වර්ෂය සඳහා අය වැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අපි දන්නවා, ඉතිහාසයේ ඉඳලාම මේ රටේ අතිශයින් අසාර්ථක වෙච්ච ජනාධිපතිවරු, ඒ වාගේම අගමැතිවරු, ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් පසු ගිය දශක ගණනාවකම මේ පාර්ලිමේන්තුවේ හිටපු බව. ඇත්තටම මම එහෙම කියන්නේ ඇයි? අපි දන්නවා, අවසාන වශයෙන් රටේ ශේෂ පත්‍රය අරගෙන බැලුවොත්, එදා අපේ රට දරුණු ණය අර්බුදයකට ගිහිල්ලා තිබුණු බව. එය නැවත ගොඩනැඟීමේදී අසාර්ථක ප්‍රතිපත්ති හා අමනෝඥ මූල්‍ය කළමනාකරණය මේ අර්බුදයට මූලික හේතුවක් ලෙස අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය පාලනය මෙහෙයවූ දේශපාලන නායකයන්ගේ නොහැකියාවද, නොවුමනාවද, ඔවුන්ට ආවේනික අසාර්ථකත්වයද නිසා මේ අර්බුදය තවත් තීව්‍ර වුණා. ඒ වාගේම රටේත්, ජනතාවගේත් වාසනාවට අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට බලය මාරු වුණා. අපි දන්නවා, අර්බුදයේ උච්චතම අවස්ථාවක් විධියට 2022 වර්ෂයේ තමයි මේ රට කඩා වැටීමේ ඉරණමට ළං වෙලා තිබුණේ කියන එක. රූගර් බ්‍රෙග්මාන් නැමැති ඕලන්දජාතික ඉතිහාසඥයා විසින් කියා ඇති විධියට "අර්බුදය විසින් ජනතාව වෙත කැඳවන ලද්දේ නරකම නොව වඩාත් හොඳ දෙයයි." ඒ නිසා තමයි, අද ඉතිහාසයේ පළමුවරට මේ අය වැය පුරවැසි අය වැයක් විධියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, අද දවසේ මම නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් යම් අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. අපි දන්නවා, අපේ රටේ මුල්ම නගරය අනුරාධපුරය බව. පණ්ඩුකාභය රජු විසින් ක්‍රිස්තු පූර්ව 377දී පමණ එය ගොඩනඟා තිබෙනවා. ඊට පස්සේ මාගම නගරය බිහි වුණා. එයින් පසුව අනුරාධපුරයේ සිට පොළොන්නරුව නිරිතදිග තැන්න සහ කන්ද උඩරට රාජධානිය විතැන්වීම හේතුවෙන්, දිවයිනේ විවිධ ප්‍රදේශවල නගර බිහි වුණා. ඒ නගරවලට විවිධාංග එකතුවීමෙන් ඒවා ක්‍රමයෙන් සංවර්ධනය වුණා. නමුත්, ජනගහනය වර්ධනයවීමත් එක්කම ගෝලීයකරණයත්, වෙළෙඳාමේ ප්‍රවර්ධනයත් හේතුවෙන් මේ නගරවල බොහෝ අංශ දියුණු වී තිබෙනවා.

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

එකී අවශ්‍යතාව මැනවින් හඳුනා ගත් ජාතික ජන බලවේගයේ රජය, 2025 වර්ෂයේදී නාගරික සංවර්ධනය සඳහා රුපියල් බිලියන 5.7ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, "සියත් නගර ව්‍යාපෘතිය" යටතේ නගර සංවර්ධනය සඳහා රුපියල් බිලියන 1.8ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, අනුරාධපුරය හා යාපනය නගර සංවර්ධනය සඳහා රුපියල් බිලියන 1.46ක්ද, යාපනය නගරශාලා ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 400ක්ද වෙන් කර තිබෙනවා. දීර්ඝ කාලයක පටන් නාගරික සංවර්ධන අමාත්‍යාංශයක් ක්‍රියාත්මක වුණත්, විධිමත්, උසස් නාගරික සංවර්ධන අත් දැකීම් විඳගන්නට අපේ රටේ ජනතාවට අවස්ථාවක් ලැබුණේ නැහැ. කිසිම පදනමක් නැති අවිද්‍යාත්මික ක්‍රියාකාරකම් රැසක් පමණයි සිද්ධ වුණේ. ඒවායේත් මුඛ්‍ය පරමාර්ථය වුණේ සංවර්ධනය නොවෙයි. අල්ලස් හා කොමිස් ගසාකෑම් තමයි ඒ සංවර්ධනයේ අරමුණ, ඉලක්කය වෙලා තිබුණේ.

ඒ සම්බන්ධව උදාහරණ කියන්නට මම කැමැතියි. මගේ ප්‍රදේශය තමයි ගම්පහ දිස්ත්‍රික්කය. ඔබතුමන්ලා දන්නවා, මීට කලින් හිටපු නාගරික සංවර්ධන අමාත්‍යවරයාත් ඒ ප්‍රදේශයේ කෙනෙක් බව. එතුමා සහ ඒ ප්‍රජාව විසින් ඇති කරපු සංවර්ධන යෝජනා ක්‍රම ගැන අපි පොඩ්ඩක් හිතලා බැලුවොත්, විශේෂ කාරණා ගණනාවක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, කැලණිය ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් සඳහා දේශපාලන අධිකාරිය විසින් කූට ලේඛන සෑදීම සම්බන්ධයෙන් මර්වින් සිල්වා හිටපු ඇමතිතුමා අද අත් අඩංගුවට අරගෙන තිබෙන බව. ඒ වාගේම, ප්‍රසන්න රණවීර හිටපු අමාත්‍යවරයාත් ඒ සම්බන්ධයෙන් අත් අඩංගුවට ගැනීම සඳහා සොයනවා. ඒ මොකද, ඉතිහාසයේ නාගරික සංවර්ධන විෂය භාරව සිටි අය මිනිස්සුන්ට අයිති ඉඩම් ඒ ගොල්ලෝ කොල්ලකන විධියට තමයි වැඩිපුර කටයුතු කළේ. ඒ සඳහා හිටපු පළාත් සභා මන්ත්‍රීවරුත් සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ ගොල්ලෝත් අත් අඩංගුවට ගැනීම සඳහා සොයනවා. ඒ වාගේම, සමහර නිලධාරිනුත් ඒ සම්බන්ධව සොයනවා.

මිනුවන්ගොඩ ප්‍රදේශයේ සමහර තට්ටු දෙක, තුනක බිල්ඩින් හදලා තිබෙනවා. අපි ඒවා නිරීක්ෂණය කළාම හිතෙනවා, මේවා ශක්‍යතා අධ්‍යයනයක් කරලාද හදලා තිබෙන්නේ කියලා. නමුත්, සමහර ඒවාට එහෙම කරලා නැහැ. මොකද, මිනුවන්ගොඩ ප්‍රධාන වශයෙන් තට්ටු තුන, හතරක බිල්ඩින් එකක් තිබෙනවා. ඒකත් එක්ක ඒ ආසන්නයේම තිබෙන වතුර මල සඳහා භූගත ටැංකියක් හදලා තිබෙනවා. ඒ ටැංකියත් එක්කම මාළු කඩ සහ වෙනත් මස් කඩ හදලා තිබෙනවා.

මේ ගොඩනැඟිලි සම්බන්ධයෙන් යම් ශක්‍යතා අධ්‍යයනයක් කරලාද හදලා තිබෙන්නේ කියන එක තමයි අපිට අහන්න තිබෙන්නේ. ඒවා, කිසියම් දේශපාලන අවශ්‍යතා අනුව එක එක පුද්ගලයන් පිනවීම සඳහා හදපු ඒවා. ඒ වාගේම, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බිල්ඩිම හදපු තැනම ඊට එහා පැත්තෙන් පොළ හදලා තිබෙනවා. ඒ පොළත් එක්ක හදපු තවත් බිල්ඩින් රාශියක් තිබෙනවා. ඒ සමහර ගොඩනැඟිලි ඉතිහාසයේ ඒ ඒ අවශ්‍යතා පරිදි හැදුවත්, සමහර කඩ දැනට අවශ්‍ය නැහැ කියලා හිතලා, ඒ ගොල්ලෝ කිසිම ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඒ ප්‍රදේශයේ හදලා තිබෙන බිල්ඩින් වාගේ ඒවා නැවත වතාවක් වෙනත් තැන්වල හදනවා. එහෙම තමයි මේ නාගරික සංවර්ධනයේ සමහර ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ.

ඒ වාගේම අපේ සහෝදර මන්ත්‍රීවරු ගිහිල්ලා කඩවත ප්‍රදේශය නිරීක්ෂණය කළා. තට්ටු තුන, හතරක බිල්ඩින් එකක් තිබෙනවා. ඒක රුපියල් කෝටි ගණනක් - රුපියල් මිලියන 370ක් - වියදම් කරලා CECB ආයතනය විසින් තමයි ඉදි කරලා තිබෙන්නේ. නමුත්, ඒ බිල්ඩින් එක අවුරුදු හතරක් තිස්සේ කිසිම දෙයකට භාවිතයට අරගෙන නැහැ. සාමාන්‍යයෙන් මේ නගර සැලැස්මේ දී අපි අනිවාර්යෙන් හිතන්න ඕනෑ දෙයක් තමයි අනාගතයේ දී මේවා භාවිත කරන්නේ කොහොමද කියන එක. ඒ සම්බන්ධව හිතලා තමයි ඒවා නිර්මාණය කරන්න ඕනෑ. නමුත්, එහෙම නොවෙයි කරලා තිබෙන්නේ. දූෂණ, වංචාවන් එක්ක ඒ අදාළ කොමිස් මුදල් සාක්කුවට ලබා ගැනීමේ අවශ්‍යතාව මත පමණක් කළාද කියලා තමයි අපිට සැක හිතෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව තවත් කථා කරන්න තිබෙනවා. අපි දන්නවා පසුගිය කාලයේදී සමහර ප්‍රදේශවල "සේවා පියස", ඒ වාගේම "බහු කාර්ය ගොඩනැඟිලි" හදලා තිබෙනවා. ඒ නිසා අපි ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන ගොඩනැඟිලි ගැන හොයා බැලුවා. දැනට අපිට ලැබුණු ඒ ගොල්ලන්ගේ වාර්තාවලින් 286ක් තිබෙනවා, තවම සම්පූර්ණ - complete - කරලා නැහැ. භාවිතයට ගන්න සුදුසු නැති මට්ටමේ ගොඩනැඟිලි සියයකට වඩා වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ භාවිතයට ගන්න ඒවායෙත් වැසිකිළි පහසුකම් නැහැ. සමහර ගොඩනැඟිලිවල ජල සැපයුම නැහැ. සමහර තැන්වල විදුලිය නැහැ. ඒ නිසා ඒ ගොඩනැඟිලි භාවිත කරන්න බැරි විධියට තමයි තිබෙන්නේ. ඒ නිසා මේ නගර නිර්මාණය කිරීමේදීත්, ගොඩනැඟිලි හැදීමේදීත් ක්‍රමවත් ශක්‍යතා අධ්‍යයනයකින් නොවෙයි කරලා තිබෙන්නේ, ඒ ඒ දේශපාලනඥයන්ගේ වුවමනාව මත තමයි මේ වැඩය කරලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාව සතුව සමහර ඉඩම් තිබෙන බව අපි දන්නවා. සාමාන්‍යයෙන් ඉඩම් කැබලි බෙදුවාට පස්සේ සියයට 10ක ප්‍රමාණයක් රජයට ලබා දෙනවා; ප්‍රාදේශීය සභාවට ලබා දෙනවා. ඒ ලැබුණු සියයට 10ක ඉඩම් ප්‍රාදේශීය දේශපාලනඥයන් විසින් අත්පත් කරගෙන සමහර බිල්ඩින් හදලා විකුණලා තිබෙනවා. මේ විධියේ අවභාවිතයන් විශාල වශයෙන් සිද්ධ වෙනවා. අපි රජය විධියට මේ සම්බන්ධව විමර්ශනය කරලා මේ සියලු දේවල් හොයමින් ඉන්නවා. දැන්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පුළුවන් තමන්ගේම හදවතින්ම අහලා බලන්න. ඔබතුමන්ලා මේ විධියට රජයේ ඉඩම් අත්කරගෙන කූට ආකාරයෙන් ලියා ගෙන තිබෙනවා නම්, ඒවා නැවත රජයට භාර දෙන්න ඕනෑ නම් දැන් අවස්ථාව තිබෙනවා. අපේ අධිකරණ අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාගෙන් අපි අහමු, ඒ විධියට නැවත භාර දෙන අයට විරුද්ධව නඩු පවරන්නේ නැතිව මොකක් හෝ යම් සහනයක් දෙන්න පුළුවන්ද කියලා. ඒ නිසා ඒ ගොල්ලන්ට ඕනෑ නම් ඇවිල්ලා එහෙම භාර දෙන්න කියලා අපි ආරාධනා කරනවා. මොකද, අපි දිගටම මේවා ගැන පරීක්ෂණ කරගෙන යනවා. ඉදිරියේ දී එම විමර්ශනවලදී අනිවාර්යෙන්ම ඒ ගොල්ලන්ට මේවා සම්බන්ධයෙන් උත්තර දෙන්න වෙනවා.

ඉතිහාසයේ පළමු වතාවට අපි රට භාර ගත්තාම අපි හිතුවා, මේ සම්බන්ධයෙන් විධිමත් නාගරික සංවර්ධන ක්‍රියාදාමයක් අපි ආරම්භ කළ යුතුයි කියලා. මොකද, පසුගිය කාලය පුරාම නගර කේන්ද්‍ර කර ගනිමින් අපි අත්දුටුවේ අසමතුලිත සංවර්ධනයක්. ගම සහ නගරය අතර විශාල අසමතුලිතතාවක් තිබෙනවා. ඒ නිසා ජනතාව විවිධාකාරයෙන් පීඩාවට, දුෂ්කරතාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා, මෙන්න මේ නගර සැලසුම් සහ සියලු දේවල් සඳහා අපි යම් දළ අදහසක් අරගෙන, දළ සැකැස්මක් එක්ක සියලුම නගර සභා සහ ප්‍රාදේශීය සභා ඇතුළත් පළාත් පාලන ආයතනවල ඒ ගොල්ලෝ නිර්මාණය කරන ගොඩනැඟිලි සියලු දේවල්, ඒ යටිතල පහසුකම් මේ සැලැස්ම තුළ ක්‍රියාත්මක කළ යුතුයි කියලා අපි යෝජනා කරනවා. එහෙම වුණොත් ජනතාවගේ මුදල් අපිට ඉතිරි කර ගන්න පුළුවන් වනවා.

ඒ වාගේම අපේ උපාය මාර්ගික නගර සැලැස්ම යටතේ අනුරාධපුර නගරයේ පූජනීය සහ නූතන කොටස අතර සමතුලිත සම - සංවර්ධන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඒ සඳහා රුපියල් මිලියන 3,000ක් පමණ වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 19,400ක් විතර සැලසුම් කරලා තිබෙනවා. ඒ කටයුත්තට අපි ආරම්භයක් වශයෙන් 2025 වර්ෂයේ දී රුපියල් මිලියන 18,000ක් පමණ වැය කරන්නට බලාපොරොත්තු වෙනවා. බස්නාහිර පළාත වාගේම නැගෙනහිර පළාත සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රධාන සැලසුම් සකස් කිරීමට සූදානම්.

ඒ වාගේම කොළඹ නගරය ඉලක්ක කර ගනිමින් මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය, හෝමාගම තාක්ෂණ නගර සංවර්ධනය, ඒ වාගේම මහ කොළඹ ආශ්‍රිත සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය, කොළොන්නාව වැනි ජල අපවහනය හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත් අප බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ruwanthilaka Jayakody, your time is up.

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු සභාපතිතුමනි, මම අවසාන වශයෙන් මේ කරුණ කියනවා. අපි අනිවාර්යයෙන්ම හිතපු දෙයක් තිබෙනවා. අපි මේ වියදම් කරන මුදල්වලට මේ රටේ මිනිස්සුන්ට සාධාරණයක් ඉෂ්ට කළ යුතුයි. මොකද, මිනිස්සුන්ගේ බදු මුදල් තමයි අපි පාවිච්චි කරන්නේ. ඒ නිසා මේ බදු මුදල් අනිවාර්යයෙන්ම අපි නිවැරදි දේවල්වලට යොදවනවා කියන එකත්, විනිවිදභාවයෙන් යුතුව අපි ඒ සම්බන්ධයෙන් වැඩ කටයුතු කරනවා කියන එකත් කියමින් මගේ කථාව හමාර කරනවා.

බොහොම ස්තුතියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Leader of the House?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ මම පොදු කරුණක් කියන්න අවශ්‍යයි. අපේ හැම අමාත්‍යාංශයකම ඉන්න නිලධාරීන්, නිලධාරිනියන් අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. නමුත් අපේ officials' box එකේ ඉන්න ඉඩ මදි නිසා ඔවුන්ට සිද්ධ වෙනවා, මේ ගැලරියේ ඉන්න. අපේ අමාත්‍යාංශයේත්, මම හිතන්නේ Urban Development, Construction and Housing Ministry එකේත් officialsලා එතැන ඉන්නවා. නමුත්, පාර්ලිමේන්තුවේ පවතින නීතිරීති අනුව ඒ නිලධාරීන්ට ගැලරියට handphones ගෙනයන්නත් බැහැ. අද ආයතන ප්‍රධානීන් පවා ඇවිල්ලා ඉන්නවා. මන්ත්‍රීවරයෙක් යම්කිසි කරුණක් ගැන අපෙන් ඇහුවාම, ඒ නිලධාරීන්ගෙන් පිළිතුරු ලබා ගන්න තිබෙන ක්‍රමය මේ නිසා දැන් බිඳ වැටිලා තිබෙන්නේ. මොකද, ඔවුන් ළඟ handphone එකත් නැහැ; ලියලා දෙන්න ක්‍රමයකුත් නැහැ. ඒ නිසා මම ලේකම් මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා, ඒකට යම් ක්‍රමවේදයක් හදන්න කියලා, අදට සහ ඉදිරි දවස් ටිකට. මොකද, මේ තත්ත්වය යටතේ ඒ ආයතන ප්‍රධානීන්ට එන විවේචනයකට පිළිතුරු දෙන්න බැහැ. අද පුළුවන් නම්, අද rectify කරලා දෙන්න. බැරි නම් හෙට ඉඳලා හරි ඒක කරන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Leader of the House, I will bring it to the notice of the Secretary-General of Parliament and the Serjeant-at -Arms.

Next, Hon. Anuradha Jayaratne. You have 15 minutes.

[අ.භා. 1.44]

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු සභාපතිතුමනි, අද දිනයේදී ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය මූලික වෙච්ච වැය ශීර්ෂ දෙකට අදාළව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අවස්ථාවේදී මට විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙන්නේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ කාරණා කිහිපයක් ගැනයි. එදා අය වැය සම්බන්ධ පොදු විවාදයේදීත් අපි මේ සම්බන්ධයෙන් මූලික කරුණු-කාරණා සහ අදහස් ඉදිරිපත් කළා. ප්‍රවාහනයට අදාළව සහ මේ කියන කාරණා ටික ගත්තොත්, ඒවා රටක සංවර්ධනයට, දියුණුවට අත්‍යවශ්‍ය කාරණා වනවා. හැබැයි, කලින් නිබිච්ච ක්‍රමවේදවලට අනුවම නැවත වතාවක් ප්‍රවාහන විෂය දකින්න ගත්තොත්, අපි බලාපොරොත්තු වෙන ඉලක්කයට මේ ක්ෂේත්‍රය කොච්චරදුරට අරගෙන යන්න පුළුවන්ද කියන එක පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. පසුගිය පොදු විවාදය වෙලාවේදීත් අපි කිව්වේ, ප්‍රවාහන විෂයයට අදාළව සාම්ප්‍රදායිකව හිතන ක්‍රමයෙන් එළියට ඇවිල්ලා out of the box හිතලා අලුත් හිත්වුවක් ගත්තේ නැත්නම්, අලුත් ක්‍රමවේදයකට මේ ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගත කරලා සැලැස්මක් හැදුවේ නැත්නම් අපි බලාපොරොත්තු වන ඉලක්කයට ප්‍රවාහන විෂය ගෙනයන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ කියන එකයි.

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශ ගත්තොත්, දොළුවේ සිට මහනුවර වෙනතුරු ගත්තොත්, අපි ත්‍රිත්ව විද්‍යාලයට බස් එකේ යනකොට පාර lanes දෙකකට හැදුණා; කාපට් වුණා. හැබැයි, අර GP 17 බස් එක අදටත් යනවා. එදා හිටපු පොඩි විජය මාමා විතරක් අද නැති වෙලා. හැබැයි, අර බස් එකම තමයි තවමත් ඒ විධියටම යන්නේ. ඒ නිසා මේ ක්‍රමවේදය වෙනස් වෙන්න ඕනෑ. ප්‍රවාහන ඇමතිතුමා ඒ කාරණා පිළිබඳවත් කිව්වා. ඒ නිසා නව ක්‍රමවේදයකට ප්‍රවාහන ක්ෂේත්‍රය ගමන් කළ යුතුයි. අපේ ආයෝජන සියල්ලම රජය හැටියට දරාගෙන මේ ටික ගෙනයන්න පුළුවන් කියන තැන අපට ඉන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පෞද්ගලික කණ්ඩායම් මේකත් එක්ක එකතු වෙන්න ඕනෑ. අද

[ගරු අනුරාධ ජයරත්න මහතා]

දුම්රිය ගත්තොත්, දුම්රියේ වහලය උඩ විතරයි සෙනඟ යන්නේ නැත්තේ, ගරු ඇමතිතුමනි. හැබැයි, පරිපාලනය පිළිබඳව අපි කරගෙන එන ක්‍රමවේදය යම්කිසි විධියකට වෙනසක් කරලා පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධ වෙච්ච ක්‍රමවේදයකට අපි කොච්චර කැමැති වුණත්, නැති වුණත් මේ ක්ෂේත්‍රය තල්ලු කළේ නැත්නම් සමස්තයක් හැටියට මේ ආයතන ටික ඉදිරියට ගෙනයන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මම මේ සභාවේදී ඔබතුමාට පොඩි යෝජනාවක් කරනවා. එදා monorail project එක, ඒ කියන්නේ LRT එක නතර වුණා. ගරු ඇමතිතුමනි, ඒ වෙනුවෙන් චීන ආයෝජනයක් ආවා. BYD Company එක තමයි ඒ monorail project එක සම්බන්ධයෙන් ආයෝජනය ගෙනාවේ. චීන BYD Company එක, ඒ කණ්ඩායම ගෙනාපු ඒ ආයෝජනයෙන් යෝජනා වුණේ, airport එකේ ඉඳලා Port City එක දක්වා monorail project එක හදන්න ඕනෑය කියලායි. හැබැයි, ඒ වෙලාවේදී නැවත චානාවක් ජපානය සමඟ තිබුණු යෝජනාව සක්‍රිය වුණා. එවකට හිටපු රනිල් වික්‍රමසිංඝ ජනාධිපතිතුමා ඒ සාකච්ඡා ආරම්භ කරලා නැවත ගිවිසුම්ගත වුණා. ඒ අනුව monorail project එක මහනුවර නගරයට ගෙනයන්න ඒ කණ්ඩායම එකඟතාව පළ කළා. එකඟතාව පළ කළා විතරක් නොවෙයි, එවකට ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමා, අමාත්‍යතුමා, ඒ සියලුදෙනා මුණ ගැහිලා, ඒ නිලධාරීන් එක්කත් සාකච්ඡා කළා. අපේ ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා නියෝජනය කරන්නේත් මහනුවර දිස්ත්‍රික්කය. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, නැවත චානාවක් ඒ ව්‍යාපෘතිය මහනුවරට ගෙන එන්න කියලා. මොකද, නිලධාරීන් අත විතරක් මේ වැඩේ තිබුණොත්, කවදාවත් මේක කෙරෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ නිසා ඔබතුමන්ලාම සක්‍රියව මේ ව්‍යාපෘතිය අතට අරගෙන කටයුතු කරන්න. මොකද, මෙය මුළු මහනුවරම වෙනස් කරන්න පුළුවන් ව්‍යාපෘතියක්. එදා මහනුවරට එකතු වෙන ප්‍රධාන ස්ථාන ටික හැටියට හඳුනාගෙන තිබුණේ කඩුගන්නාව, තැන්නෙකුඹුර, කටුගස්තොට කියන ප්‍රධාන නගරයි. ඒ නගර ඒකාබද්ධ කරපු monorail ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා කියන අදහසයි එදා යෝජනා වෙලා තිබුණේ. ඒ වාගේම එහිදී මහනුවර නගරයට කොච්චර මිනිස්සු ප්‍රමාණයක් එනවාද, මොන route එකේද එය දාන්න ඕනෑ කියන ඒ සියල්ල පිළිබඳව සැලැස්මක් හැදුවා. ඒ වාගේම Greater Kandy Project එකටත් මේක සම්බන්ධ කරලා, ඒ presentation එක ඉදිරිපත් කළා, කොහොමද මේක ඉස්සරහට ගෙන යන්නේ කියලා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා ප්‍රවාහන විෂයය ගැන කථා කරන මේ වෙලාවේදී මේ කාරණයත් ඉතාම වැදගත් වනවා. BYD කියන්නේ අද ලෝකයේ බොහොම පිළිගත් ආයතනයක්. ඒක චීන රජයත් එක්කම සම්බන්ධ වෙලා ගෙනාපු ව්‍යාපෘතියක්. ඒ නිසා ඔබතුමාට පුළුවන් නම් නැවත චානාවක් මේ ව්‍යාපෘතිය සක්‍රිය කරලා රජය හැටියට මේ කටයුත්තට මැදිහත්වීමක් කරලා මහනුවර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න. මම හිතනවා, එය මුළු මහනුවර දිස්ත්‍රික්කයම වෙනස් කරන්න පුළුවන් ව්‍යාපෘතියක් වෙයි කියලා. ඔබතුමාටත් ඒකේ ගෞරවය හිමිවෙයි, ඒ වැඩේ අතට අරගෙන ඔබතුමා ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරන වෙලාවේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබුණොත්.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරිය විවිධ අවස්ථාවලදී, විවිධ යෝජනා අනුව තිබෙන ව්‍යාපෘතීන් සම්බන්ධ කරගෙන නගර තුළ සුවිශේෂී වූ වැඩ කොටස් බොහොමයක් ක්‍රියාත්මක කළා. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු සියලු ප්‍රධාන නිලධාරීන් විවිධ අවස්ථාවලදී විශාල කැප කිරීමක් කළා, මෙම නගර මේ තත්ත්වයට නහාසිටුවන්න, සංවර්ධනය කරන්න සහ ඒ වැඩ කටයුතු ඉස්සරහට ගෙනියන්න.

ගරු සභාපතිතුමනි, හැබැයි මේකේ අපි දකින අඩුපාඩුවක් තිබෙනවා. එදා ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ආරක්ෂක ලේකම්වරයා හැටියටත් කටයුතු කරමින් නාගරික සංවර්ධන අධිකාරියටත් නායකත්වය දීපු වෙලාවේදී කොළඹ නගරය ආසියාවේ වේගයෙන්ම සංවර්ධනය වන දියුණුම නගරයක් බවට පත් කරන්න වාගේම හරිත නගරයක් වශයෙන් සංවර්ධනය වන නගරයක් බවට පත් කරන්නත් සමහර යෝජනා ඉදිරිපත් කළා. ඒ අනුව කොළඹ නගරය ආසියාවේ වේගයෙන්ම සංවර්ධනය වන දියුණුම නගරය වාගේම හරිත නගරය බවටත් පත් වුණා. හැබැයි, අද ගැටලුවක් ඇති වෙලා තිබෙන්නේ කවුද, කින්ද, මන්ද කියන එක පිළිබඳව නොවෙයි. මේ හදන යෝජනා කොච්චර දුරට හරියාකාරව ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව අද වනකොට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ යෝජනා හදන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවද, කවුද, කින්ද, මන්ද කියන එක නොවෙයි ගැටලුව. හැබැයි, ආණ්ඩුවක් වෙනස් වනකොට, විෂය භාර අමාත්‍යවරයා වෙනස් වනකොට, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඒකට අදාළව ඉන්න අධ්‍යක්ෂවරයා මාරු වනකොට සමස්ත යෝජනාවම වෙනස් වෙනවා නම් මේ රට කවදාවත් නහාසිටුවන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි.

අපි දන්නවා, එවැනි දේවල් ඉතිහාසයේ වෙලා තිබෙන බව. සමහර ජනාධිපතිවරු ඇවිල්ලා අත්තනගල්ලේ සිට මහනුවර අධිවේගී මාර්ගය හදන්න හැදුවා. ඊට පස්සේ තව කාලයක් යනකොට ඒක කුරුණෑගල ඉඳලා හදන්න හැදුවා. ඒ නිසා එක එක්කෙනා පත් වන විධියට තිබෙන සමස්ත යෝජනාම වෙනස් වෙන්න ගියොත් මේ රට කවදාවත් නහාසිටුවන්න බැහැ. ඒ වාගේම, පෞද්ගලික කණ්ඩායම්වලින් මේ රටට ආයෝජන ගේන්න පුළුවන්කමක් ලැබෙන්නේත් නැහැ.

මේ සම්බන්ධයෙන් අපි දකින ප්‍රධානම කාරණාවක් තිබෙනවා. අද තිබෙන්නේ මන්ත්‍රීවරු එකසිය පණස්නවයක් ඉන්න ආණ්ඩුවක්. ඒ නිසා ඔබතුමන්ලාට නීති සම්බන්ධයෙන්, කෙටුම්පත් සම්බන්ධයෙන් කරන්න බැරි දෙයක් නැහැ, ගරු සභාපතිතුමනි. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා සමස්තයක් හැටියට ඔබතුමන්ලා කරලා තිබෙන යෝජනා සියල්ල නැවත චානාවක් සලකා බලන්න කියා මම ඉල්ලීමක් කරනවා. ඒවායේ වෙනස්කම් තිබෙනවා නම් ඒ අවශ්‍ය වෙනස්කම් ටික කරලා, ඉන්පසු මේක සමස්ත සංවර්ධනය හැටියටම ගැසට් කරලා ස්ථාපිත කරන්න. රජයක් හැටියට, පුද්ගලයෝ හැටියට, ඇමතිවරයා වෙනස් වනකොට එහෙමත් නැත්නම් වෙන කවුරු හරි එනකොට මේවා වෙනස් කරන්න බැරි වන විධියට මේ සමස්ත සංවර්ධන යෝජනා ටික හදන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි ඔබතුමාගෙන් කරනවා, ගරු ඇමතිතුමනි. මම මෙහෙම කියන්නේ වෙන මොනවත් නිසා නොවෙයි.

ගරු සභාපතිතුමනි, අපේ ගම්පොල නගරය ගත්තොත්, ගම්පොල සහිරා විද්‍යාලය ළඟ ඉඳලා නිදහස් මාවතට යන මාර්ගය 1997 අවුරුද්දේ තමයි හදන්න තිබුණේ. හැබැයි, අපි යන්තම් ඒ මාර්ගය හදන්න පටන් ගත්තේ 2017 අවුරුද්දේ. ඒ කියන්නේ, අවුරුදු 20කට පස්සේ. හැබැයි, අවුරුදු 20කට පසුව හදන්න පටන් ගත්ත මාර්ගයේ කොන් දෙකම හදලා මැද හදන්නේ නැතුව තවම තිබෙනවා. ඉදිරියේදී මොකක් හරි රජයකින් මේ ඉඩම් නැවත වරක් කාට හරි බදු දීලා මොනවා හරි ප්‍රශ්නයක් ඇති වුණොත් ඒ මාර්ගයේ කොන් දෙක හදපු එකෙන් වැඩක් වෙන්නේත් නැහැ. මේක තමයි අපේ රටේ වෙලා තිබෙන්නේ.

අනෙක් කාරණාව මෙයයි. නාගරික සංවර්ධන අධිකාරියෙන් Land Acquisition Act එකේ Section 38 යටතේ සංවර්ධන කටයුතුවලට මොකක් හරි ඉඩමක් - ඒක සමහර විට Greater Kandy නම් Greater Kandy Project එක වෙවා - කැබිනට් මණ්ඩල අනුමැතිය අරගෙන අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක් හැටියට රජයට අත්පත් කර ගත්තා නම් උසාවියට ගිහිල්ලා ඒ ආණ්ඩුව මාරු වෙනකම් නඩු කියන්න තමයි අද වනකොට බොහෝ පිරිස් පුරුදු වෙලා ඉන්නේ, ගරු සභාපතිතුමනි. හැබැයි, නඩුවට පෙනී ඉන්නේත් නැහැ. Stay Order එකක් ගන්නවා, ගරු ඇමතිතුමනි. මේක සාමාන්‍ය ක්‍රමවේදය. එහෙම කරලා මාස හයෙන් හයට calling date එකක් දීලා, ආණ්ඩුව මාරු වෙනකම් නඩු කියනවා.

රටට අවශ්‍ය වෙච්ච national projects ඔබතුමන්ලා ලැයිස්තුගත කරලා බලන්න. මේ රටට අවශ්‍යයි කියලා සියලු ආණ්ඩු තීන්දු කරපු ව්‍යාපෘති බොහොමයකට කැබිනට් පත්‍රිකා දාලා, මුදල් වෙන් කරලා, ආයෝජන ලැබිලා සියල්ල සිදු වෙලා තිබෙනවා. හැබැයි, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එක්කෝ, ඒක නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙනවා. එහෙම නැත්නම්, මාස හයෙන් හයට calling dates දෙමින් ඒ නඩුව ඉස්සරහට අරගෙන යනවා. මම මෙහෙම කියන්නේ මේකයි. ගරු සභාපතිතුමනි, ගම්පොල නගර සංවර්ධනයට රුපියල් මිලියන 678ක් වෙන් කරලා අපි ඒ මුදලින් වියදම් කළේ රුපියල් මිලියන 112යි. ඉතුරු මුදල් සියල්ල නැවත මහා භාණ්ඩාගාරයට ගියා. අද වනකොට නඩු 7ක් දාලා තිබෙනවා. හැබැයි, අත්පත් කරගත්ත ඉඩම සම්බන්ධයෙන් නඩුවක් දාලා, අවුරුද්දක්, දෙකක් තිස්සේ ඒ නඩුව අරගෙන යනවා. මම මෙහෙම කියන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. අපි මේකට පෞද්ගලිකව මැදිහත් වෙලා නීතිපතිතුමා සමඟ කථා කරන්න පුළුවන්, එහෙම නැත්නම් representation එකක් කරලා කථා කරන්න පුළුවන්. ඒක පිළිබඳව නොවෙයි මම කියන්නේ. ඔබතුමන්ලා රටට අත්‍යවශ්‍ය වෙච්ච තීන්දු අනුව වැඩ කොටස් ටික නතර කරන්නේ නැතුව ඉස්සරහට ගෙනියන්න පුළුවන් අඛණ්ඩ වැඩ පිළිවෙළක් අපි මේ වෙනුවෙන් නිර්මාණය කරගන්න ඕනෑ. මේ සඳහා අවශ්‍ය ආයෝජන ටික තිබෙනවා; මුදල් ටික තිබෙනවා; අනුමැතීන් ටික තිබෙනවා. හැබැයි, ව්‍යාපෘතිය මහ පොළොවේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ඒ නිසා අපි විශේෂයෙන් කියනවා, නාගරික සංවර්ධනය තුළ අවශ්‍ය සංවර්ධන කටයුතු ටික අපි හරියාකාරව ඉදිරියට අරගෙන ගියේ නැත්නම් මේක බරපතළ ප්‍රශ්නයක් වෙනවාය කියන එක. අපි නාගරික වශයෙන් අද වනකොට එවැනි ප්‍රශ්න නිසා හටගත් දරුණු ඵල විපාකවලට මුහුණ දෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. රජයක් හැටියට එවැනි තීන්දු-තීරණ ක්‍රියාත්මක කරනවා නම් ඒ ස්ථාවර තීන්දු-තීරණ එක්ක රජයේ නිලධාරීන්ට ඒ වැඩ ටික ඉස්සරහට ගෙනියන්න පුළුවන් ක්‍රමවේදයක් අපි නිර්මාණය කරගත යුතුයි කියන එක විශේෂයෙන් මේ වෙලාවේදී මම සිහිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම පසුගිය අවුරුද්දේ අපි මහනුවර නවක නීතිඥවරු 200කට උසාවි කටයුතු කරගෙන යෑම සඳහා නීතිඥ කාර්යාල හදන්න ඉඩම් කොටසක් ලබා දුන්නා. මේ ඉඩම් කොටස තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරිය සතු භූමියක. මේ භූමිය 1990දී ප්‍රාදේශීය ලේකම් හරහා පවරාගෙන තිබෙන්නේ අධිකරණය සහ බන්ධනාගාරය හදන්නයි. හැබැයි, බන්ධනාගාරය පල්ලේකැලේ ප්‍රතිස්ථාපනය කිරීම නිසා යම් භූමි ප්‍රමාණයක් ඉතුරු වුණා. ගරු සභාපතිතුමනි, නවක නීතිඥවරු 200කට වඩා ඉන්නවා. ඔවුන්ට අවශ්‍ය කාර්යාල පහසුකම් ටික මහනුවර නගරයේ නැහැ. ඒ නිසා අපි පසුගිය කාලයේ ඒ සම්බන්ධයෙන් යෝජනාවක් කළා. නාගරික සංවර්ධන අධිකාරියේ මූලික පරමාර්ථය වුණේත් අධිකරණ කටයුතුවලට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය ලබා දෙනවාය කියන එකයි. ඒ අනුව නවක නීතිඥවරුන්ට ඔවුන්ගේ නීතිඥ කාර්යාල ටික හදා ගන්න ඒ ඉඩම ලබා දෙන්න කියලා යෝජනා කළා. ඒ අනුව රුපියල් මිලියන 307ක් නවක නීතිඥවරු ඒ වෙනුවෙන් වියදම් කරනවා. රජය කරන්නේ ඉඩම ලබා දීම විතරයි.

ගරු ඇමතිතුමනි, යෝජනාව වුණේ 1990 අවුරුද්දේ එම ඉඩම ගත්ත මුදලට නවක නීතිඥවරුන්ට, නීතිඥ සංගමයට මේ ඉඩම ලබා දෙන්න කියන එකයි. හැබැයි, අවාසනාවකට නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා යෝජනා කළා, 1990 අවුරුද්දේ අත්පත් කර ගත්ත වටිනාකමට නීතිඥ සංගමයට මේ ඉඩම ලබා දෙන්න කියලා. අවශ්‍ය නම් මට ඒ ලියකියවිලි ටික දෙන්න පුළුවන්. හැබැයි, කැබිනට් පත්‍රිකාවේ පළ වෙන්නේ වර්තමානයේ පවතින වටිනාකමට මේ ඉඩම නීතිඥ සංගමයට දෙන්න කියායි. නීතිඥවරුන් එක්ක ආණ්ඩුවට බිස්නස් එකක් කරන්න අවශ්‍යතාවක් නැහැ, ගරු ඇමතිතුමනි. මොකද, 1990 අවුරුද්දේ ගත්ත ඉඩමේ තට්ටු 25ක ගොඩනැඟිල්ලක් හදන්න ගිහිල්ලා අසාර්ථක වුණා. එම නිසා ඒ කටයුත්ත කෙරෙන්නේත් නැහැ. අද මේක අත්හැර දමපු ඉඩමක් විධියට තිබෙන්නේ. මේකෙන් පර්චස් 40ක් නවක නීතිඥවරුන්ට දීලා, නීතිඥවරු 200ක් විතර තමන්ගේ කාර්යාල පහසුකම් හදා ගන්නවා කියන්නේ, ඒ කණ්ඩායමට සහනයක් වනවා විතරක් නොවෙයි, නීති කටයුතුවලටත් එය විශාල ශක්තියක් වනවාය කියන එකයි. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, මේ ගත්ත තීන්දුව පිළිබඳව නැවත සලකා බලන්න කියලා. නොමේලේ කාටවත් ඉඩම් දෙන්න අවශ්‍යතාවක් නැහැ. රජය හැටියට දරපු වියදම නැවත ලබා ගැනීම පිළිබඳ ගැටලුවක් නැහැ. හැබැයි, නවක නීතිඥවරුන්ට ඔවුන්ගේ වැඩ කටයුතු ටික කරගෙන යන්න පුළුවන් වන විධියට වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලනවා, ගරු ඇමතිතුමනි.

අනෙක් කාරණය මෙයයි. පසුගිය කාලය පුරාවටම සැමට පිරිසිදු ජලය ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණා. ඒ සැමට පිරිසිදු ජලය ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් හැදුවා. ඒ වාගේම සමස්ත ජනතාවටම පානීය ජලය ලබා දීම සඳහා වන වැඩ පිළිවෙළ හැදුවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මහනුවර නිසා දන්නවා, ජනතාවගෙන් සියයට 65ක, සියයට 68ක වාගේ ප්‍රමාණයකට තමයි පානීය ජලය තිබෙන්නේ කියන එක. තෙල්දෙණිය ආසනය ගත්තාම ජනතාවගෙන් බොහොම අඩු ප්‍රමාණයකට තමයි පානීය ජලය තිබෙන්නේ. මහවැලි ගඟ ආසනය මැදින් ගලාගෙන යනවා. Reservoirs දෙකක් තිබෙනවා. එහෙම තිබුණත්, මම හිතන විධියට තෙල්දෙණිය ආසනයේ ජනතාවගෙන් සියයට 40කට, 45කට තමයි පානීය ජලය තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, සැමට පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ සමස්ත ජනතාවට ජලය ලබා දීම සඳහා වන වැඩ පිළිවෙළක් හැදුවා. ඒත් ජලය ලබා දෙන්න බැරි තැන්වල ප්‍රජා ජල ඒකකයේ ව්‍යාපෘති ටික එකට එකතු කරලා ඒ වැඩ පිළිවෙළ කරලා පෙන්නුවා. ඒ නිසා මම ඔබතුමන්ලාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ගම්පොල මගේ ආසනය නියෝජනය කරන 128,000ක් වූ සියලුම ජනතාවට වතුර ටික ලබා දෙන්න රුපියල් බිලියන 3.2 වැය වෙන්නේ, ගරු සභාපතිතුමනි. මම දන්නවා, රජයක් හැටියට ඒ සියලු වියදම් ටික, ආයෝජන ටික මේ වෙලාවේ කරන්න පුළුවන්කමක් නැහැ කියන එක. හැබැයි, ඒ අත්පත් කර ගත්ත ඉඩම් ටික හරියාකාරව කළමනාකරණය කරලා, ඒවා තියාගෙන අවශ්‍ය වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන ගියොත් සැමට ජලය ලබා දෙන වැඩ පිළිවෙළ හරියාකාරව, ශක්තිමත්ව ඉටු කරන්න පුළුවන්කම ලැබෙයි. භාගෙට කරගෙන ආපු ව්‍යාපෘතිවලට සමහර වෙලාවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉඩම් අත්පත් කරගත් බව අපි දන්නවා. හැබැයි, ඒ අත්පත් කර ගත්ත

[ගරු අනුරාධ ජයරත්න මහතා]

ඉඩම් ටික සම්බන්ධයෙන් නව රජය තව අවුරුද්දක්, දෙකක්, තුනක් ඇතුළත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැත්නම් ඔය ඉඩම් ටිකවත් ඉතුරු වෙන්නේ නැහැ කියන එක ඔබතුමන්ලා මතක තබා ගන්න. එක්කෝ ඉඩම් ටික අල්ලාගෙන නැත්නම් රජය විසින්ම වෙනත් ව්‍යාපෘතිවලට ඔය ඉඩම් ටික ලබා දීලා. අවසානයේ ජලය ලබා දීම සඳහා වන ප්‍රධාන කාර්යය තමයි අත්හැරෙන්නේ. මේ ව්‍යාපෘතිය අත්‍යවශ්‍යම කාරණාවක්. මොකද, අපි කියන මූලික අවශ්‍යතා ටික -මිනිසුන්ට අවශ්‍ය කරන වතුරට ටික, ප්‍රවාහන පහසුකම්, මහාමාර්ග- නැත්නම් එතැනින් එහාට අපි සංවර්ධනයේ දියුණුව ගැන කථා කරලා වැඩක් නැහැ. ඒ හදපු සැලසුම් ටික ඒ විධියටම ක්‍රියාත්මක කරන්න කියන එක නොවෙයි මම කියන්නේ. ඔබතුමන්ලාගෙන් සමන්විත කමිටුවක් පත් කරලා, ඒ කාරණා ටික සමාලෝචනය කරලා වැදගත් වූ, නිවැරදි වූ, රටේ ක්‍රියාත්මක කරන්නම අත්‍යවශ්‍ය යෝජනා ටික ඔබතුමන්ලා හඳුනා ගන්න.

ඒ යෝජනා ටික ඉදිරියට අරගෙන යන්න සැලැස්මක් හදන්න කියලා අපි ඔබතුමන්ලාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලනවා. මොකද, රුපියල් බිලියන ගණනක් වෙන් කර තිබෙනවා කිව්වත්, ඒ මුදලින් මේ සියල්ල කරන්න පුළුවන්කමක් නැහැ. විදුලි බලය ගත්තොත්, අපි දන්නවා hydropower plants හදනකොට අපි private sector එකත් එක්ක mergeවෙලා තිබෙන බව. ඒ වාගේම solar projectsවලදීත් අපි private sector එකත් එක්ක mergeවෙලා තිබෙනවා. ඒ වාගේම ජල පරිභෝජනය ගත්තත්, ඒ සම්බන්ධයෙන් අලුත් concept එකක් හිතන්න කියලා අපි යෝජනා කරනවා, ගරු සභාපතිතුමනි. මොකද, ජලය ලැබෙන මූලාශ්‍ර සියල්ලම අපේ රටේ ජාතික සම්පත්. පෞද්ගලික අංශයත් එක්ක එකතුවෙලා, ඔවුන්ටත් යම් මුදලක් උපයන්න හැකි පරිදි ඒ මූලාශ්‍රවලින් ලැබෙන ජලය උපරිමව ප්‍රයෝජනයට අරගෙන, හැමෝටම ජලය ලබා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ගැන අලුතින් හිතන්න කියලා මම රජයට යෝජනා කරනවා. මොකද, එහෙම නැතුව මේක බිලියන ගණනකින් කරන්න පුළුවන් වැඩකුත් නොවෙයි. ඔබතුමන්ලා මහා භාණ්ඩාගාරයේ තිබෙන සම්පූර්ණ මුදල් ටික යෙදෙව්වත් මේ රටේ සියලුදෙනාට පානීය ජලය දෙන්න පුළුවන්කමක් නැහැ. එම නිසා අලුතින් හිතලා, mini -hydro power plantsවලදී Government එක private sector එකත් එක්ක mergeවෙලා විදුලිය එකතු කළා හා සමානවම මේ ජල මූලාශ්‍ර ටික සම්බන්ධයෙනුත් පෞද්ගලික අංශයත් එක්ක එකතුවෙලා අලුත් වැඩ පිළිවෙළක් හිතන්න කියන යෝජනාව කරමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Mujibur Rahman. You have 22 minutes.

[අ.භා. 2.00]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේත්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව කථා කරන මේ මොහොතේ, ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම නාගරික සංවර්ධන, ඉදිරිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය කොළඹ නගරයට ඉතාම වැදගත් වන අමාත්‍යාංශයක් බව අපි දන්නවා. මොකද, එම අමාත්‍යාංශය විසින් විශේෂයෙන්ම "නැවත පදිංචි කිරීම" යටතේ පසුගිය කාලය පුරාම කොළඹ නගරයේ ජීවත් වන ජනතාව විශාල පිරිසක් මහල් නිවාසවල -තට්ටු නිවාසවල- පදිංචි කරවා තිබෙනවා. විශේෂයෙන් එම පදිංචි කරවීම් පටන් ගත්තේ යුද්ධය අවසන් වීමෙන් පසු 2010 වසරේ ආරක්ෂක ලේකම් හැටියට හිටපු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින්. විශේෂයෙන්ම අපට පෙනෙන දෙයක් තමයි, එම පදිංචි කිරීම් කිසිදු ආකාරයක විද්‍යානුකූල ක්‍රමයකට සිදු නොවුණාය කියන කාරණය. එහෙම නැත්නම් ඒ ජනතාව කලින් හිටපු ප්‍රදේශවල තිබුණු පහසුකම්, ඔවුන්ගේ ජීවනෝපාය ගෙන යන්න තිබුණු ක්‍රමවේද, ඒ කිසි දෙයක් සලකා බලන්නේ නැතුව තමයි ඔවුන්ව පදිංචි කෙරෙව්වේ. එසේ පදිංචි කරවූ විශාල තට්ටු නිවාස දෙස අද බලනකොට අපට පෙනෙනවා, ඒවායේ තිබෙන යටිතල පහසුකම් අද වෙනකොට විශාල වශයෙන් අඩපණ වෙලා තිබෙන බව. එම ජනතාවට ඒක විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අඩු ආදායම්ලාභීන් ජීවත් වන මහල් නිවාස හැටියට ඒවා හඳුනාගෙන තිබෙනවා. එම මහල් නිවාස යථා තත්ත්වයට ගේන්න ඒවායේ ජීවත් වන ජනතාවට ආර්ථික පසුබිමක් හෝ ආර්ථික හයියක් නැහැ. එම නිසා රජයට සිද්ධ වෙනවා, මේ වෙනුවෙන් විශාල මුදලක් වැය කරන්න. ඒ මහල් නිවාසවලට අවශ්‍ය පහසුකම් නැවත හදන්න ජනාධිපතිතුමා රුපියල් මිලියන 1,000ක වාගේ මුදලක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, කොළඹ නගරයේ ජීවත් වන ජනතාවගෙන් සියයට 60ක් වාගේ පිරිසක් ජීවත් වෙන්නේ ස්වයං රැකියා කරමින්. එදිනෙදා කීයක් හරි සොයාගෙන ජීවත් වන ජනතාවක් තමයි කොළඹ නගරයේ බහුතරයක් ඉන්නේ. කොළඹ නගරයේ ලක්ෂ 6කට, 7කට ආසන්න ජනගහනයක් සිටියත්, ඒ ජනගහනයෙන් සියයට 40ක් වාගේ පිරිසක් කොළඹ නගරයේ රැකියා කරන උදවිය. එසේ රැකියා කරන උදවිය සමහර විට සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා වාගේ දවස් එනකොට කොළඹ නගරයෙන් පිටවෙලා යනවා. කොළඹ නගරයේ ඉපදිලා කොළඹ නගරයේම ජීවත් වන ජනතාවගෙන් සියයට 60ක පමණ පිරිසක් එදිනෙදා ස්වයං රැකියා කරගෙන ජීවත් වෙනවා. ඒ මිනිස්සු තමයි පසුගිය කාලයේ නැවත පදිංචි කරනවා -relocate කරනවා- කියලා පදිංචි කළේ. සමහර අවස්ථාවල බලහත්කාරයෙන් එක්කගෙන ගිහිල්ලා පදිංචි කරවනවා අපි දැක්කා. කොම්පඤ්ඤවීදිය වාගේ ප්‍රදේශවල සමහර ඉඩම් බලහත්කාරයෙන් අරගෙන අද ඒ ඉඩම් බහු ජාතික සමාගම්වලට දීලා තිබෙනවා අපි දකිනවා. ඒවා කෝටි ගණන් වටිනා ඉඩ කඩම්. අපි දැක්කා, ඒවායේ හිටපු ජනතාව අරගෙන ගිහිල්ලා ඒ ජනතාවට සම්බන්ධයක් නැති හේනමුල්ල, මට්ටක්කුලිය වාගේ ප්‍රදේශවල ගාල් කරලා තිබෙනවා. විශේෂයෙන්ම dump කරනවා වාගේ තමයි පසුගිය කාලයේ මේක කළේ. ඒ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දමන්න, එහෙම නැත්නම් ඒ අයගේ lifestyle එක වෙනස් කරන්න හෝ ඒ අයගේ lifestyle එක ඉහළට දමන්න මේ projects එකකින්වත් පුළුවන් වෙලා නැහැ. අද අපි ගිහිල්ලා බැලුවොත්, ඒ projects ඔක්කෝම අසාර්ථක ව්‍යාපෘති හැටියට තමයි තිබෙන්නේ. ඒක වෙන්න ප්‍රධාන වශයෙන් හේතු වුණේ, එදා හිටපු ආරක්ෂක ලේකම්තුමාට ඕනෑ වුණා, එම වටිනා ඉඩ කඩම් ටික අරගෙන විදේශීය සමාගම්වලට දෙන්න.

ඒ ඉඩකඩම් බලහත්කාරයෙන් ලබාගෙන, ඒවා අද විදේශීය සමාගම්වලට දීලා තිබෙනවා. අපේ ආණ්ඩු කාලයේත් මෙවැනි දේවල් මම විශාල ලෙස විවේචනයට ලක් කළා. එදා හිටපු ඇමතිතුමා එක්කත් මේ තිබෙන ව්‍යාපෘති සම්බන්ධව මගේ විශාල ගැටීමකුත් ඇති වුණා. මොකද, කොළඹ නගරයේ ජීවත් වන

මිනිසුන් තට්ටු 14ක මහල් නිවාසවලට ගාල් කරලා, ඒ මිනිසුන්ගේ ජීවිත ගොඩනඟන්න පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඒ පිළිබඳව මට වෙනම මතයක් තිබෙනවා. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ගොඩ නඟපු මාලිගාවත්ත නිවාස සංකීර්ණය ගත්තොත්, මේ සමාජයේ හැම මට්ටමකම, හැම තරාතිරමකම උදවිය ඒ මහල් නිවාස සංකීර්ණයේ ජීවත් වෙනවා. එම මහල් නිවාස සංකීර්ණයේ අඩු ආදායම්ලාභීන් ඉන්නවා; මධ්‍යම පාන්තිකයන් ඉන්නවා; ඉහළම මධ්‍යම පාන්තිකයන් ඉන්නවා. ඒ වාගේම, එහි කලාකරුවනුත් පදිංචි වෙලා හිටියා. ඒ වාගේ විවිධත්වයක් තිබෙන මහල් නිවාස හැටියට එම මහල් නිවාස හඳුන්වන්න පුළුවන්. එවැනි මහල් නිවාස තමයි ගොඩනැඟෙන්න ඕනෑ. පසුගිය කාලයේ ගොඩනැඟුණේ එවැනි විවිධත්වයක් තිබෙන මහල් නිවාස නොවෙයි. එකම ජන කණ්ඩායමක් එක තැනකින් අරගෙන ගිහිල්ලා තව තැනකට dump කරපු එක විතරයි වුණේ. ඒ නිසා අපි ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා, ඉදිරියේදී මෙවැනි ජනාවාස හදනකොට කොළඹ නගරයේ සිටින ජනතාවගේ සමාජ මට්ටම් ගැන, තරාතිරම ගැන අවබෝධයක් තිබෙන්න ඕනෑ කියන කාරණාව. ඒ අවබෝධය උඩ විතරයි මේක සාර්ථක ව්‍යාපෘති බවට පත් විය හැකි වන්නේ. අද අපට පේනවා, අවුරුදු 10කට, 15කට කලින් හදපු ව්‍යාපෘති, -2010දී විතර ගොඩනඟපු ව්‍යාපෘති- බහුතරයක් අද වන විට අසාර්ථක වෙලා තිබෙන ආකාරය. ඒ ජනතාවගේ ජීවන තත්ත්වය, ඔවුන්ගේ ක්‍රියාකලාප, ඔවුන්ගේ ආකල්ප කිසිදු ආකාරයකින් වෙනසක් වෙලා නැහැ. ඔවුන් අර පරණ හිටපු තැනම තමයි ඉන්නේ. නැවත වරක් ඔවුන් කලින් හිටපු පරණ තැනටම තමයි පත්වෙලා තිබෙන්නේ කියලා අපට පේනවා.

විශේෂයෙන්ම දැන් තිබෙන කුලී නිවාස ගැනත් මම කථා කරන්න ඕනෑ. මේ වන විට කොළඹ නගරය ඇතුළේ පවුල් 20,000ක් විතර කුලියට ඉන්නවා. මේ නගරයේම ඉපදිලා, නගරයේම හැදිලා, ළමයි නගරයේම ඉස්කෝලවලට යවලා, නගරයේම ජීවත් වෙන පවුල් 20,000ක් විතර ඉන්නවා. අවාසනාවකට, 1994 ඉඳන් කොළඹ නගරයේ ජීවත් වන මිනිස්සු වෙනුවෙන් ගෙවල් හැදුණේ නැහැ. මම කිව්වා වාගේ 2010න් පස්සේ සීමිත ගෙවල් ප්‍රමාණයක් තමයි හැදුණේ. ඒ හැදුණේත් තිබෙන වටිනා ඉඩම් ටික ගන්න. ඒක තමයි ඒකේ අධිෂ්ඨානය හා අරමුණ වුණේ. නමුත් මේ කොළඹ නගරයේ කුලියට ඉන්න පවුල් 20,000ක පමණ ප්‍රමාණයට දැන් ගෙවල් හැදෙන්නේ නැහැ. අපි නාගරික සංවර්ධන අධිකාරිය එක්ක කථා කළත් හැමදාම කොළඹ ගෙවල් හැදෙන්නේ නැවත පදිංචි කිරීම - relocate කිරීම - සඳහා පමණයි. එහෙම නැතිව අඩු ආදායම්ලාභීන්ට, නිවාසයක් නැතිව ඉන්න උදවියට, පහළ මධ්‍යම පාන්තික උදවියට කොළඹින් ගෙයක් ගන්න බැහැ.

ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ UDA එක කොළඹ නගරයේ projects දෙකක් පටන් ගත්තා. එකක් තමයි, බොරැල්ල ප්‍රදේශයේ තිබෙන Oval View Residencies එක. මේ Oval View Residencies හදලා එතුමා වෘත්තිකයන්ට දුන්නා. රුපියල් මිලියන 7ක, 8ක වාගේ මුදලකට ඒ ගෙවල් දුන්නා. දැන් ඒ ගෙවල්වල වෘත්තිකයන් කවුරුවත් නැහැ. දැන් ඒ වෘත්තිකයන් ඔක්කෝම එම ගෙවල් කුලියට දීලා. දැන් කොළඹ නගරයේ පවුල් 20,000ක් විතර ඉන්නවා, මාසිකව යම් මුදල් ප්‍රමාණයක් ගෙවලා නිවසක් ගන්න බලාගෙන. නමුත්, ඒගොල්ලන්ට ඒ ගෙවල් දුන්නේ නැහැ. ඒ වාගේම, දැන් බොරැල්ල ප්‍රදේශයේ එලියට ප්ලේස් එකේත් ඒ වාගේ නිවාස යෝජනා ක්‍රමයක් හදලා තිබෙනවා. මම හිතන විධියට ඒ නිවසකුත් රුපියල් මිලියන 9කට, 10කට ආසන්න මුදලකට තමයි විකිණෙන්නේ. මම කියන්නේ මේකයි. කොළඹ නගරයේ කුලියට ඉන්න මිනිස්සු වෙනුවෙන් තමයි ගෙවල් හදන්න ඕනෑ. නමුත්, UDA එක කරන්නේත් පෞද්ගලික සමාගම් කරනවා වාගේ මුදල් තිබෙන අයටම ඔවුන් හදන ගෙවල් ටික දෙන එකයි. එහෙම කරලා මේ නිවාස ප්‍රශ්නය විසඳන්න බැහැ. අපිට පේනවා, දැන් මේක වෙනස් වෙන්න ඕනෑ කියලා. දැන් බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ ගෙවල් 450ක් හදලා තිබෙනවා. ඒ ගෙවල් 450 විශේෂයෙන්ම හැදුවේ කුලියට ඉන්න මිනිස්සුන්ට ඒ ගෙවල් ගන්න කියලායි. නමුත්, පසුගිය ආණ්ඩුව එක ගෙයක් රුපියල් මිලියන 10ක මිලකට තීන්දු කළා. ඒ ගෙදරක ප්‍රමාණය වර්ග අඩි 450යි. මේ කොළඹ නගරයේ ඉන්න පහළ මධ්‍යම පාන්තිකයාට, අඩු ආදායම්ලාභී පවුල්වලට රුපියල් මිලියන 10ක් ගෙවලා එවැනි නිවසක් මිලදී ගන්න බැහැ. අන්තිමට ගෙවල් තිබෙන උදවියම තමයි ඒ ගෙවල් ටිකත් ගන්නේ. එම නිසා ඒකෙන් නිවාස ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමා ඒ ගැන හොඳ අවධානයෙන් බලන්න. දැන් ඔරුගොඩවත්තේත් ගෙවල් 1,100ක් හදාගෙන යනවා. ඒ ගෙවලුත් මේ කුලියට ඉන්න අය වෙනුවෙන් ලබා දෙන්න කියලායි මා කියන්නේ. නමුත්, ඒවා කොළඹ නගරයේ කුලියට ජීවත් වන මිනිසුන්ට ඇත්තටම ලැබෙනවා ද කියන එක තමයි ඒ ගෙවල් ලබා දෙන කොට හොයන්න ඕනෑ. එහෙම නැතුව UDA එකත් ඒ ගෙවල් හදලා ව්‍යාපාර කරන්න හදනවා නම් අවසානයේ මේ කොළඹ නගරයේ ඉන්න මිනිස්සුන්ට ඒ ගෙවල් හම්බ වෙන්නේ නැහැ. ගෙවල් තිබෙන උදවියම ඇවිල්ලා මුදල් වියදම් කරලා කොළඹ නගරයෙන් ඒ ගෙවල් ගනීවි. එහෙම වුණොත් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාගේ අවධානයට ඒ කාරණය යොමු කරනවා. කොළඹ නගරයේ කුලී නිවාසවල ඉන්න පවුල් 20,000ක් විතර ඉන්නවා. ඒගොල්ලන්ගේ ප්‍රශ්න විසඳන්න ඒ හදන ගෙවල් භාවිත කරන්න. විශාල මිල ගණන්වලට දුන්නත් ඒ මිනිසුන්ට හයියක් නැහැ, ඒ ගෙවල් මිල දී ගන්න. එවැනි ක්‍රය ශක්තියක් ඔවුන්ට නැහැ. මොකද, මම කලින් කිව්වා වාගේම ඒ ජනතාවගෙන් සියයට 60ක්ම වාගේ ඉන්නේ රාජ්‍ය සේවයේ වැඩ කරන උදවිය නොවෙයි, පෞද්ගලික සේවයේ executive level එකේ වැඩ කරන උදවියත් නොවෙයි. ඒ සියලුදෙනාම පාහේ -ඒ බහුතරය- ස්වයංරැකියාවල් කරලා ජීවත් වෙන මිනිස්සු. එදිනෙදා කියක් හෝ හොයාගෙන ජීවත් වන පරිසරයක ඉන්න අය තමයි වැඩියෙන් ඉන්නේ. ඒ හින්දා ඔබතුමන්ලාට අපි යෝජනා කරනවා ඒ ගෙවල් ලබා දීමේදී විශේෂයෙන්ම මේ කියන නිර්ණායක පිළිබඳව සැලකිලිමත් වෙන්න කියලා. එහෙම නැතුව අපි කොයි තරම් ගෙවල් හදලා විකුණුවත්, අන්තිමට මුදල් ශක්තිය තිබෙන අය ඇවිත් ඒ ගෙවල් ගන්නවා. අර කියපු පහළ මධ්‍යම පාන්තිකයන්ට, ඒ වාගේම නිවසක් නොමැතිව අවුරුදු ගණන් කොළඹ නගරය තුළම කුලියට සිටින අයට ඒ ගෙවල් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

ඒ වාගේම, ඔබතුමාගේ අවධානයට තවත් කාරණයක් යොමු කරන්න කැමැතියි. පසුගිය කාලය පුරාම -විශේෂයෙන්ම 2020-2024 කාලයේදී- නිවාස අමාත්‍යාංශයට, එහෙම නැත්නම් නිවාස සංවර්ධන අධිකාරියට අයිති ඉඩම් බොහොමයක් අවභාවිත වෙලා තිබෙනවා. පසුගිය ආණ්ඩුව ඒවා හිතුමතේ තමන්ගේ හිතවතුන්ට ලබා දීලා තිබෙනවා. ඉඩම් විතරක් නොවෙයි, සමහර ස්ථාන පවා ඒ ආකාරයට ලබා දී තිබෙනවා. මම මේ කාරණය පසු ගිය දවසකත් ඔබතුමාට යොමු කළා. මාලිගාවත්ත නිවාස සංකීර්ණය තුළ තිබෙන රථ ගාල් -විශේෂයෙන්ම නිවාස හිමියන් පාවිච්චි කරන රථ ගාල්- පවා වෙන වෙන දේවල්වලට; ව්‍යාපාරික ස්ථානවල stores හැටියට පාවිච්චි කරන්න පුළුවන් විධියට කුලියට දීලා තිබෙනවා. ඒක වැරදියි. එහෙම දෙන්න බැහැ. මා හිතන විධියට, නිවාස අමාත්‍යාංශයට, නිවාස සංවර්ධන අධිකාරියට අයිති ඉඩ කඩම් කිසිදු වාණිජමය කටයුත්තක් සඳහා ඒ විධියට දෙන්න බැහැ; පනතේ හැටියට දෙන්නත් බැහැ. නමුත්, ඒ ස්ථානයේ නීති විරෝධීව එහෙම ලබා දීලා තිබෙනවා. ගරු

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ඇමතිතුමනි, ඔබතුමාට බලය තිබෙනවා ඒවා අවලංගු කරන්න. මොකද, ඒවායේ කිසිදු ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් නැහැ. Board එකේ අනුමැතිය විතරක් අරගෙන ඒවා දීලා තිබෙනවා, තමන්ගේ හිතවතුන්ට. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ගැන වහාම ක්‍රියාත්මක වෙන්න කියලා. මොකද, තව කල් යන්න යන්න ඔවුන් එළවාගන්න බැරි වෙනවා. තව අවුරුද්දක් විතර ප්‍රමාද වන කොට ඔවුන්ටත් නීතිමය අයිතියක් ලැබෙනවා; "අවුරුද්දක් විතර ගිහින් තිබෙනවා, ඇයි මෙච්චර කල් මේවා අයින් කළේ නැත්තේ" කියලා අහන්න පුළුවන්. දැන් තිබෙන්නේ අලුත් ආණ්ඩුවක්. ඔබතුමන්ලාට තීන්දු ගන්න පුළුවන්. එවැනි දේපළ -විශේෂයෙන්ම නිවාස සංවර්ධන අධිකාරියට අයිති දේපළ- විශාල වශයෙන් අවභාවිත වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මැදිහත් වෙලා ඒ දේපළ නැවත චතාවක් ජනතාවගේ පරිභෝජනයට ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, ඒ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න මා කැමැතියි.

ගරු ඇමතිතුමනි, නිවාස අමාත්‍යාංශයෙන් ඔබතුමන්ලා චක්‍රලේඛයක් යවා තිබෙනවා මම දැක්කා. මේ අවුරුද්දේ ග්‍රාම නිලධාරි වසම් 14,022ක ගෙවල් හදන්න රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. මම හිතන්නේ නැහැ ඒ සඳහා රුපියල් මිලියන 500ක් ප්‍රමාණවත් වෙනවා කියලා. ආධාරයක් හැටියට එක් පවුලකට රුපියල් ලක්ෂ 10ක් ලබා දෙන්න යෝජනා වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අද මේ රටේ ජනතාව ආර්ථික වශයෙන් ඉතාම අර්බුදකාරී තැනකට වැටිලායි ඉන්නේ. ජීවන වියදම ඉතාම අධිකයි. එහෙම මුදල් දෙන්න තමුන්නාන්සේලා යෝජනා කළොත්, ඒ මුදල් හරියාකාරව නිවාස හදන්න යොදවයි ද? මේ තිබෙන ගැටලුකාරී ආර්ථිකයත් එක්ක මිනිස්සු ඒ මුදල් අරගෙන ගිහිල්ලා සමහර විට ඒගොල්ලන්ගේ පෞද්ගලික පරිභෝජනයට යොදා ගන්න පුළුවන්. එසේ මුදල් ලබා දීමේ ප්‍රතිඵලය ඒක වෙන්න පුළුවන්. ඒ හින්දා ඒ ගැන නැවත චතාවක් හිතන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අපේ රටේ ග්‍රාම නිලධාරි වසම් 14,022ක් තිබෙනවා. එක් පවුලකට රුපියල් ලක්ෂ 10ක් වෙන් කළත් ඒ රුපියල් මිලියන 500න් විශාල ප්‍රමාණයකට මුදල් වෙන් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. වෙන් කළත්, ඉතාම සුළු මුදල් ප්‍රමාණයක් තමයි වෙන් කරන්න ලැබෙන්නේ.

ඒ වාගේම, අද වන විට ඉදි කිරීම් කර්මාන්තයට අවශ්‍ය අමු ද්‍රව්‍යවල, ගොඩනැඟිලි ද්‍රව්‍යවල මිල ඉහළ යෑම නිසාම මධ්‍යම පාන්තිකයන් සහ අඩු ආදායම්ලාභීන් නිවාස ඉදි කිරීමේ කාර්යයෙන් ඉවත් වෙලා ඉන්නවා. මොකද, ඒක ඒ අයට දරා ගන්න බැහැ. ඒ හින්දා ඒ හුඟක් අය දැන් නිවාස ඉදි කිරීමෙන් ඈත් වෙලා ඉන්නවා.

ඊළඟ ප්‍රශ්නය, නිවාස ණය පොලිය ඉහළ දැමීමයි. නිවාස ණය පොලිය ඉහළ දැමීම නිසාත් හුඟක් අය ගෙවල් හැදීම අත් හැර දමා තිබෙනවා. ඒකේ ඊළඟ ප්‍රතිඵලය වන්නේ, අනවසර ඉදිකිරීම් වර්ධනය වීමයි. අඩු ආදායම්ලාභී අය තමන්ගේ නිවසේම ඉදිරිපසට හරි පිටුපසට හරි අනවසර ලෙස තවත් කොටසක් එකතු කර ගෙන ඒ තුළම ජීවත් වෙන්න පුරුදු වෙනවා. මොකද, ගොඩනැගිලි ද්‍රව්‍යවල, ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍යවල මිල ඉහළ යෑම නිසාම ඔවුන්ට අලුත් නිවසක් තනා ගැනීම බොහෝ දුරට අපහසු වෙලා තිබෙනවා. ඒ වාගේම බැංකු පොලිය ඉහළ යෑම නිසාත් ඔවුන් අද වන කොට ඒ කාර්යයෙන් ඉවත් වෙලා ඉන්නවා. ඒ හින්දා අපි ගරු ඇමතිතුමාට කියනවා, මේ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා. විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය නිවාස ලබා දෙන කොට, කොළඹ නගරය තුළ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කොට ඒවා අනිවාර්යයෙන්ම විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව කරන්න. ඒ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති ඒ මිනිසුන්ගේ ජීවිත ගොඩ නගන්න, ඒ ජීවිතවල තත්ත්වය ඉහළ නංවන්න, ඒ ජීවිත ඉස්සරහට අරගෙන යන්න පුළුවන් ව්‍යාපෘති බවට පරිවර්තනය කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් නැවත චතාවක් මා ඉල්ලා සිටිනවා.

අද මේ විවාදයේදී වරාය පිළිබඳවත් කරුණු ඉදිරිපත් වුණා. වරායේ West Container Terminal එක අදානි සමාගමට ලබා දීලා තිබෙනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ඒ සමාගම එවකට පැවැති ආණ්ඩුවත් එක්ක ගිවිසුම අත්සන් කරන කොට යම් target එකක් ලබා දීලා තිබෙන බව. ඒ target එකට යන්න බැරි වුණොත්, අපට ඔවුන්ගෙන් ලබා ගන්න තිබෙන සහනය ලබා ගන්න බැරි වෙනවා කියන එක තමයි ඒ ගිවිසුම අනුව පෙනී යන්නේ. ඒ වාගේම අපි දැක්කා, පසුගිය දා අදානි සමාගම ඉන්දියාවේ කොවින් ප්‍රදේශයේ Vizhinjam නමින් අලුත් වරායක් ආරම්භ කළ බව. අපේ රටට vessels එන පාර හරහා තමයි ඒ Vizhinjam වරාය තිබෙන්නේ. පසුගිය දා අපේ රටේ රේගුවේ ඇති වෙච්ච වැඩ වර්ජනයත් එක්ක අපේ රටට ආපු නැව් 30කට ආසන්න සංඛ්‍යාවක් ආපසු හැරිලා ගියා. ඒ නැව් හැරිලා ගියේ, Vizhinjam වරායට. එය, අදානි සමාගම අලුතින් පටන් ගත්තු වරාය. එහෙම වුණේ ඇයි? එතැන strike එකක් පටන් ගත්තා. ඒ strike එක පටන් ගත්තාට පසුව එතැනට ආපු නැව් 30කට වැඩි ප්‍රමාණයක් නැවත චතාවක් හැරිලා ගියා. ඒ හැරිලා ගියේ Vizhinjam වරායට. ඒ හින්දා අපි දැන් යෝජනා කරනවා, ඒ තත්ත්වය ගැන සොයා බැලිය යුතුය කියලා. Vizhinjam වරාය සංවර්ධනය කරන්නද ලංකාවේ වරායට ආපු නැව් ටික ආපහු හැරිලා ගියේ? ඒ වර්ජනයත් එක්ක නැව් හැරිලා ගිය එකේ යම්කිසි ආකාරයේ සම්බන්ධයක් තිබෙනවාද?

ගරු සභාපතිතුමනි, මේ සංඛ්‍යාලේඛන අනුව බැලුවාම පෙනෙනවා, 2024 ජනවාරිවලට වඩා 2025 ජනවාරිවලදී පර්යන්ත මෙහෙයුම්වල අඩුවීමක් වෙලා තිබෙන බව. 2024දී බහලු 236,520ක් ඇවිත් තිබෙනවා. 2025දී බහලු 204,095යි ඇවිල්ලා තිබෙන්නේ. ඒ කියන්නේ 2024 හා 2025 ජනවාරි මාසය සංසන්දනය කර බලන කොට පෙනෙනවා, සියයට 13ක අඩුවීමක් තිබෙන බව. සමස්තයක් හැටියට සියලුම terminals එකතු කරලා බැලුවොත් සියයට 3ක අඩුවීමක් වෙලා තිබෙනවා. පර්යන්ත මෙහෙයුම් කටයුතුවලින් සියයට 50ක් මෙහෙයවන්නේ MSC නැව් සමාගමයි. MSC නැව් සමාගමත් එක්ක 2025ට, 2026ට අත්සන් කරන්න ඕනෑ ගිවිසුම් තවම අත්සන් වෙලා නැහැ කියලා තමයි වාර්තා වෙන්නේ. ඉතින් මම හිතනවා, වරායේ ඉදිරි කටයුතුවලට, වරායේ සංවර්ධන කටයුතුවලට ඒක විශාල බාධාවක් වෙන්න පුළුවන් කියලා.

ඒ වාගේම තමයි වරායේ නැඟෙනහිර පර්යන්තය. ගරු ජනාධිපතිතුමාත් කිව්වා, මේ අවුරුද්දේ -2025 අවුරුද්දේ- ජූලි මාසය වන කොට නැඟෙනහිර පර්යන්තයේ කටයුතු පටන් ගන්න පුළුවන් කියලා. නමුත් දැන් මේ වාර්තා වන දේවල් අනුව නැඟෙනහිර පර්යන්තයේ - ECT එකේ - කටයුතු පටන් ගන්න එක 2027 දක්වා කල් යනවා.

ඒ කල් යන්නේ මොකක් හින්දාවත් නොවෙයි, ඒ පර්යන්තයට භාවිත කරන්න අවශ්‍ය උපකරණ ගෙන්වන්න කැඳවපු ටෙන්ඩරය අවලංගු කරලා තිබෙන නිසා. නැවත චතාවක් එම ටෙන්ඩරය කැඳවන්න අඩුම ගාණේ මාස 18කට වඩා වැඩි කාලයක් යන්න බොහෝදුරට ඉඩ තිබෙනවා. මාස 18ක් වාගේ කාලයක් ගියොත්, 2027දී තමයි අපට මේක නැවත පටන් ගන්න පුළුවන් වෙන්නේ කියලා තමයි අපට දැන් වාර්තා වෙන්නේ. ඒ නිසා 2026 ජූලි

මාසයේ ඒක පටන් ගන්න හම්බ වෙන්නේ නැහැ. දැන් නව කළමනාකාර අධ්‍යක්ෂවරයෙක් අලුතින් පත් වෙලා ඉන්නවා. එතුමාගේ ක්‍රියාකලාපය තමයි මේ ප්‍රශ්න ඇති වෙන්න විශේෂ හේතුව බවට වාර්තා වෙන්නේ.

ගරු සභාපතිතුමනි, අපේ ඇමතිතුමාගේ කථාවේදී කිව්වා Port Access Elevated Highway Project එක ගැනයි, Central Expressway Project එක ගැනයි, Kandy Multimodal Transport Terminal Development Project එක ගැනයි. එතුමා කථා කරනකොට කිව්වා මේවා blunder projects කියලා. මේ projects දෙකටම මුදල් ලබා දීලා තිබෙන්නේ ADB එකයි, World Bank එකයි; Asian Development Bank එක සහ World Bank එක. ඒ banks දෙක තමයි මේ projects දෙකටම මුදල් වෙන් කරලා තිබෙන්නේ. අපි දන්නවා, ADB එකයි, World Bank එකයි blunder projectsවලට සල්ලි දෙන්නේ නැහැ කියලා. ඒගොල්ලන් ව්‍යාපෘති කරනකොට feasibility report එකක් කැඳවලා, -ශක්‍යතා අධ්‍යයන කරලා- තමයි මුදල් ලබා දෙන්නේ. Blunder projectsවලට සල්ලි දෙන්නේ නැහැ මේ ආයතන දෙකම. මොකද, මේ දෙකම ජාත්‍යන්තර ආයතන නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුත් මේ ආයතනත් එක්ක දැන් වැඩ කරනවා. ඔබතුමන්ලාටත් ළඟදී World Bank එකෙන් විශාල ණය මුදලක් ලබා දුන්නා. ඒවා එහෙම නිකම්ම ලබා දෙන්නේ නැහැ. අපේ සභානායකතුමා මේ ආණ්ඩුවේ ඉන්න ප්‍රබලයා. මම හිතනවා ජනාධිපතිතුමාට පස්සේ ඔබතුමා තමයි ඉන්නේ කියලා. ඒ නිසා ඔබතුමන්ලා ගනුදෙනු කරන ආයතන ගැන කථා කරනකොට, ඒ ආයතනවලට චෝදනා කරනකොට පරිස්සම් වෙන්න. මොකද, ඔවුන් කවදාවත් blunder projectsවලට සල්ලි දෙන්නේ නැහැ. ඔවුන් සල්ලි දෙන්නේ feasibility reports බලලා. මේ Port Access Elevated Highway Project එකේ exits දෙකක් තිබුණා. ඒ exits දෙකම ගිය ආණ්ඩුවෙන් කළේ නැහැ. විශේෂයෙන් පිටකොටුව මල්වත්ත මාවතට යන exit එකයි, අලුත් මාවතට යන exit එකයි. ගිය ආණ්ඩුව ඒ exits දෙකම කළේ නැහැ. ඔබතුමන්ලා දැන් මුදල් වෙන් කරලා තිබෙනවා ඒ exits දෙක කරන්න, මේ අය වැයෙන්. ඒවා blunder projects නම් එහෙම මුදල් වෙන් කෙරෙන්නේත් නැහැ නේ. නමුත් ඒවාට මුදල් වෙන් කරලා තිබෙනවා. 2020-2024 ආණ්ඩුව කාලයේ මුදල් වෙන් කළේ නැති නිසා තමයි ඒ exits දෙකේ වැඩ කළේ නැත්තේ.

ඔබතුමා ඒ චෝදනාව කළේ, සමහරවිට ඔබතුමා හිතුවාද දන්නේ නැහැ මේවා unsolicited proposals කියලා. මේවා unsolicited proposals නොවෙයි. Unsolicited proposals දුන්නා 2010ට කලින්. ඒ කියන්නේ රාජපක්ෂ පාලනය විසින් දීපු හැම එකක්ම unsolicited proposals හැටියට තමයි දුන්නේ. ඒවා හරි. චීනයෙන් ගත්ත ණය හුඟක් blunder projects හැටියට තමයි ගිහින් තිබෙන්නේ. අද ඒවා සුදු අලි බවට පත් වෙලා තිබෙනවා. ඒක ඇත්ත. ඔබතුමන්ලා දන්නවා, හම්බන්තොට ප්‍රදේශයේ projects කීයක් නතර වෙලා තිබෙනවාද කියලා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Mujibur Rahman, your time is up.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මම අවසන් කරන්නම්; I will finish.

2005න් පස්සේ රාජපක්ෂලා බලයට ආවාට පස්සේ, -ඔබතුමන්ලාගේ සහයෝගයෙන් බලයට ආවේ- හම්බන්තොට ප්‍රදේශයේ කොයි තරම් blunder projects වෙලා තිබෙනවාද චීන ණය අරගෙන? සම්මන්ත්‍රණශාලාවක් ගොඩ නඟලා තිබෙනවා. ඒකට විශාල පාරවල් හදලා තිබෙනවා. හම්බන්තොට වරායත් අපට ඒ විධියට ගන්න පුළුවන්. ඒ වාගේ blunder projects රාශියක් කළා චීන ණයවලින්. නමුත් Asian Development Bank එකවත්, World Bank එකවත් blunder projectsවලට මුදල් දෙන්නේ නැහැයි කියන මම මේ සභාවට අවධාරණය කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, නැවත වතාවක් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මට මේ කාලය ලබා දීම පිළිබඳව.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
The next speaker is the Hon. (Ms.) Lakmali Hemachandra. You have eight minutes.

Order, please! The Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள் அக්කිරාசனத்தினින්று அகலவே, குழுக்களின் பிரதித් තවිසාළර් அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித් තවිසාළර් அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ කථාව කරන්න.

[අ.භා. 2.24]

ගරු නීතිඥ ලක්මාලි හේමවන්ද්‍ර මෙනෙවිය
(මාණ්පුමිකු சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Thank you, Hon. Deputy Chairperson.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විපක්ෂයේ ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා මහනුවර නීතිඥවරුන්ට office complex එකක් හදන එක ගැන කථා කළා. මම මුලින්ම ඒ ගැන කථා කරන්න කැමතියි. මම හිතන විධියට එතුමාට කියන්න අමතක වූ කාරණයක් තිබෙනවා. මැතිවරණ කාලයේදී අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමාත්, එවකට සිටි අධිකරණ ඇමති විජයදාස රාජපක්ෂ මහත්මයාත් Urban Development Authority එකෙන් අදාළ ඉඩම නිදහස් කර ගන්නේ නැතිව, අනුන්ගේ ඉඩමක මුල්ගලක් තියලා තිබෙනවා, Lawyers' office complex එකක් හදන්න. මේ වෙනකොටත් ඒ ඉඩම release කරගෙන නැහැ. Lawyersලාට office තිබෙන්න ඕනෑ කියන එක හරි. අපිත් නීතිඥවරු. අපි ඒ ගැන දන්නවා. Lawyersලාට office තිබෙන්න ඕනෑ කියන එක ඇත්ත. නමුත් අධිකරණ අමාත්‍යාංශයේ වගකීමක් නොවෙයි, lawyersලාට ඉඩම් ලබා දෙන එක. එහෙම නැත්නම් Lawyers' office complex එකක් ලබා දෙන එක. නමුත් මහනුවර නීතිඥ සංගමයත් එක්ක අධිකරණ අමාත්‍යවරයා මේ වෙනකොටත් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තිබෙනවා. අපි රජයක් හැටියට අපට කරන්න පුළුවන් දේ කරගෙන යනවා. මම හිතන විධියට නිවැරදිව වෙන්න ඕනෑ දේ තමයි, විය යුතුව තිබූ දේ තමයි ඒ

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

ඉඩම් release කරගෙන මුල්ගල තියන එක. නමුත් අපේ රටේ හිටපු දේශපාලනඥයන් සහ - අවසානාවට අනුරාධ ජයරත්න වාගේ - මන්ත්‍රීවරුත් හැසිරිලා තිබෙන්නේ එහෙමයි. මුල්ගල තියලා ඇවිත් තමයි ඉඩම් release කර ගන්න පාර්ලිමේන්තුවේ කථා කරන්නේ. මම හිතන විධියට ඒක අනෙක් පැත්තට තමයි විය යුතුව තිබුණේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද අපි කථා කරන්නේ ප්‍රවාහන අමාත්‍යාංශය පිළිබඳව. ගරු ඇමතිතුමා -ගරු බිමල් රත්නායක මහත්මයා- අද උදේ සඳහන් කළා, මගේ සභාපතිත්වය යටතේ තිබෙන -ප්‍රවාහන උපදේශක කාරක සභාව යටතේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ නීති පිළිබඳව සොයා බැලීමට පත් කර තිබෙන- Subcommittee එකක් ගැන. අපි විශේෂයෙන් මෙතැනදී මතක් කර ගන්න ඕනෑ, පොදු ප්‍රවාහනය කියන එක. බස්, දුම්රිය ඇතුළු පොදු ප්‍රවාහනය කියන්නේ ජනතා සේවාවක්. ජනතාවට ලැබෙන සේවාවක් තමයි පොදු ප්‍රවාහනය කියන්නේ. නමුත් මේක ජනතා සේවාවක් විතරක් නොවෙයි, රටේ ආර්ථිකය මත අතිවිශාල බලපෑමක් සිදු කරන සේවාවක්.

මොකද, පොදු ප්‍රවාහනය දුර්වල වෙනකොට අනිවාර්යයෙන් ජනතාවට බලපානවා. දැන් අපේ රටේ සිද්ධ වෙලා තිබෙන්නේ ඒක තමයි. පැවති සාකච්ඡා කිහිපයකදීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පැත්තෙනුත් මේ අදහස මතු වුණා. ඒ කියන්නේ පොදු ප්‍රවාහනය දුර්වල වීම නිසා ජනතාව අතිශය විශාල ලෙස පෞද්ගලික ප්‍රවාහනයට යොමු වෙලා තිබෙනවා. පෞද්ගලික ප්‍රවාහනය තෝරා ගැනීම නිසා නගරාශ්‍රිතව වාහන තදබදය - traffic- සහ වායු දූෂණය ඇති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මම හිතන විධියට මේ තත්ත්වය ලංකාවේ ආර්ථිකයටත් සෘජුව බලපානවා. අපි අතිවිශාල විදේශ විනිමය වියදමක් දරනවා, රට තුළට තෙල් අරගෙන එන්නට. ඒ වාගේම වාහන අරගෙන එන්නට. ඒ නිසා පොදු ප්‍රවාහනය යහපත් ලෙස සකස් කිරීම සමස්ත ආර්ථිකයට විවිධ පැතිවලින් වැදගත් වෙනවා. එකක් තමයි connectivity කියන එක. විශේෂයෙන් ශ්‍රමිකයන්, කම්කරුවන්, වැඩ කරන ජනතාව, සාමාන්‍ය ජනතාව පොදු ප්‍රවාහනය තමයි පාවිච්චි කරන්නේ. එතකොට හොඳ පොදු ප්‍රවාහන සේවාවක් තිබීමෙන් රටේ සමස්ත ශ්‍රම බලකායේ ඵලදායිත්වය ඉහළ නංවනවා. ඒ වාගේම රටේ ආර්ථිකයේ සම්බන්ධතාව -connectivity - වර්ධනය කිරීම තුළින් ආර්ථිකයේ ඵලදායිතාව ඉහළ නංවනවා.

අපේ රටේ ආර්ථිකය තුළ තිබෙන අමතර වියදම් කප්පාදු කර ගැනීමට සහ පාරිසරික හානිය අඩු කර ගැනීමටත් හැකි වෙනවා, හොඳ පොදු ප්‍රවාහන පද්ධතියක් තිබෙනවා නම්. මේ කාර්යය කිරීමේදී අපි මුලින්ම 2011 - 2021 කාලය වෙනකම් road safety වැනි දේවල් ගැන බැලුවා. පොදු ප්‍රවාහනයේදී තිබිය යුතු වැදගත්ම දේවල් ගැන අපි බැලුවා. පොදු ප්‍රවාහනයේදී හොඳ පාරක් තිබෙන්න ඕනෑ; road safety තිබෙන්න ඕනෑ. ඒ වාගේම බස් රථ, දුම්රිය වාගේ වාහන ආරක්ෂිත -safe- වෙන්න ඕනෑ. මාර්ගය පාවිච්චි කරන අය ආරක්ෂිත ලෙස මාර්ගය පාවිච්චි කරන්න ඕනෑ. ආරක්ෂිත මාර්ග කියන එක -road safety - හොඳ පොදු ප්‍රවාහන සේවයක මූලිකාංගයක් හැටියට තිබෙන දෙයක්. අපි road safety කියන්නේ පාරේ ආරක්ෂාව විතරක් නොවෙයි. ඒ කියන්නේ සමස්ථයක් ලෙස, වාහනයේ ආරක්ෂාව, මගියාගේ ආරක්ෂාව, පාරේ physically තිබෙන ආරක්ෂාව වැදගත් කරුණු හැටියට තිබෙනවා.

2011-2021 වෙනකම් Decade of Action for Road Safety කියලා initiative එකක් තිබිලා තිබෙනවා. පසුගිය අවුරුදු පහ ඇතුළත ලංකාවේ පුද්ගලයන් 12,240 දෙනෙක් මිය ගිහින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය අවුරුදු 05 ඇතුළත ලංකාවේ පුද්ගලයින් 12,240ක් මිය ගිහින් තිබෙනවා, road accidents නිසා. මේ road accidents අඩු කරගන්න නම් මාර්ග අනතුරු සම්බන්ධව අවධානය යොමු කරමින් 2014දී පී. දයාරත්න වාර්තාව සකස් කර තිබෙනවා. ගරු ඇමතිතුමාත් ඒ ගැන අවධානය යොමු කළා කියලා මම හිතනවා. මේ පාර්ලිමේන්තුවෙන්ම පත් කළ කාරක සභාවක් තුළින් ප්‍රවාහන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නේ කොහොමද, නියාමනය කරන්නේ කොහොමද කියා වාර්තාවක් සකස් කළා. හැබැයි, අවුරුදු 10ක් ගත වුණත් එම වාර්තාවේ තිබෙන බොහොමයක් නිර්දේශ - recommendations, ඒ වාගේම ප්‍රවාහන ක්ෂේත්‍රය නියාමනය කිරීමට, ශක්තිමත් කිරීමට ඉදිරිපත් කර තිබෙන යෝජනා පැවැති ආණ්ඩුවලට ක්‍රියාත්මක කරගන්න බැරි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභාව ශක්තිමත් කළ යුතුයි. අපි දන්නවා, බස් රථ සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව කටයුතු කරනවා. නමුත් ත්‍රීවීලර් රථ, පාසල් ප්‍රවාහන සේවයේ යොදවන රථ වාගේ දේවල් නියාමනය කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාවට මේ වනතෙක් නීතිමය හැකියාවක් නැහැ. හැබැයි, අවුරුදු 10ක් තිස්සේ පැවැති ආණ්ඩු ජාතික ගමනාගමන කොමිෂන් සභාව ශක්තිමත් කිරීමට කටයුතු කරලාත් නැහැ.

ලංකාව තුළ අවුරුද්දකට මිනිස්සු 2,000කට වඩා මාර්ග අනතුරුවලින් මිය යනවා. එසේ මාර්ග අනතුරුවලින් - road accidentsවලින් - මිය යන්නේ කවුද කියා බැලුවොත්, පදිකයෝ, මෝටර් සයිකල් පදින අය, ත්‍රීවීලර් රථ රියැදුරන්; ඒ කියන්නේ ඉතාම පහළ ආදායම් මට්ටම්වල සිටින අය තමයි බොහෝ දුරට ඒ අතර සිටින්නේ. ලංකාවේ මාර්ග අනතුරු කියන්නේ ඛේදවාචකයක්. නමුත් අවුරුදු 10කට පමණ ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවෙන් විශේෂ කාරක සභාවකුත් පත් කළා, මේ සම්බන්ධව පරීක්ෂා කරන්න. එම කාරක සභාවේ සිටි සාමාජිකයෝ ඇත්තටම වෙන රටවලට පවා ගිහිල්ලා ඒ ගැන අධ්‍යයනය කර තිබෙනවා. ඒ සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කරලාත් තිබෙනවා. නමුත් අවුරුදු 10ක් තිස්සේ අපට බැරි වෙලා තිබෙනවා, අපේ නියාමන පද්ධතිය ශක්තිමත් කර ගන්නට.

ඒ වාගේම road safety සම්බන්ධව තිබෙනවා, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව. පනතක් මඟින් එය කොමිසමක් හැටියට පත් කරලා එම ආයතනයට මාර්ග ආරක්ෂාව - road safety - සම්බන්ධව තිබෙන බලතල පුළුල් කරන්නට කියලා යෝජනා කර තිබෙනවා. නමුත් අවුරුදු 10කට අධික කාලයක් තිස්සේ පැවැති කිසිදු රජයක් එම recommendations ක්‍රියාත්මක කර නැහැ. මම හිතන විධියට ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කර අර කියපු සමහර සංශෝධන එම පනතට ඇතුළත් කිරීමට මීට සති කිහිපයකට පෙර කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් වුණා. ඇත්තටම ඒ සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, විශේෂයෙන්ම ත්‍රී රෝද රථ ඇතුළු පෞද්ගලික ප්‍රවාහන සේවය regulate කරලා මාර්ග ආරක්ෂාව හඳන්නේ කොහොමද කියන එක ගැන අවුරුදු 10ක් තිස්සේ ඉදිරිපත් වුණු සංශෝධන අපේ ආණ්ඩුව යටතේ තමයි ඇත්තටම ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්නේ.

අර මුලින් සඳහන් කළ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - National Council for Road Safety එක - තවත් බලාත්මක කරලා එය කොමිසමක් හැටියට පත් කරලා මාර්ග ආරක්ෂාව -

road safety - සම්බන්ධව system එකක් සකස් කිරීමට මේ දවස්වල කටයුතු කරමින් ඉන්නවා. මාර්ග ආරක්ෂාව කියන එක system එකක් හැටියට වෙන්න ඕනෑ; හැම අංශයක්ම එක තැනකින් පාලනය වෙමින් සිද්ධ වෙන්න ඕනෑ. ඒ කාරණය සම්බන්ධයෙන් කටයුතු කරන්නට මේ වෙනකොට අපේ රජය පැත්තෙන් කටයුතු කරගෙන යනවා. ඒ නිසා මම හිතන විධියට ප්‍රවාහන අමාත්‍යාංශය සම්බන්ධව විශේෂ ඇගයීමක් කරන්නට ඕනෑ, අවුරුදු 10ක් තිස්සේ නොකළ දෙයක් සිද්ධ කරන එක සම්බන්ධව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නට කැමැතියි. කාලයකට ඉහතදී ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරපු මණ්ඩලයක් තමයි - එවකට CTB එක, එහෙම නැත්නම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - SLTB එක. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට තමයි කාලයකට ඉහතදී ලංකාවේ ප්‍රවාහන සේවයේ -විශේෂයෙන්ම බස්රථ සම්බන්ධයෙන්- මූලික වශකීම තිබුණේ. නමුත් අපි දන්නවා, පසුගිය අවුරුදු 40ක කාලය තුළ හැමෝම කථා කරන අර නව-ලිබරල් ආර්ථික ක්‍රමය තුළ මේ අංශය -

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ඔබතුමියට ලබා දී තිබෙන කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමිය.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Hon. Deputy Chairperson, please give me thirty seconds.

පසුගිය අවුරුදු 40ක කාලය තුළ අදහසක් තිබුණා, රාජ්‍ය අංශය එම වගකීමෙන් අයින් වෙලා පෞද්ගලික අංශයට ඉඩ ලබා දෙන්න ඕනෑය කියා, නියාමන කාර්ය භාරය පමණක් රජය කරන්නට ඕනෑය කියලා. නමුත් අවාසනාවකට අපට පෙනෙන්න තිබෙන දේ තමයි නියාමන කාර්ය භාරය පවා රජයෙන් - ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ආදී ආයතන හරහා - සිද්ධ කර නැහැ කියන එක, පැහැදිලිවම. මේ තුළ බරපතළ ඛේදවාචකයක් තිබෙනවා. මාර්ග ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න නිසා පසුගිය අවුරුදු 05 ඇතුළත පුරවැසියන් 12,240ක් පමණ මිය ගිහින් තිබෙනවා. ඒ කියන්නේ අවුරුද්දක කාලයකදී මිය ගොස් තිබෙන සංඛ්‍යාව 2,000කට වඩා වැඩියි. මේක බරපතළ ඛේදවාචකයක්. ගරු ඇමතිතුමනි, මේ කාරණය කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ කියා මම හිතනවා. අපි විසඳා ගත යුතුම ප්‍රශ්නයක් තමයි මාර්ග ආරක්ෂාව කියන එක. ඒ නිසා ඒ සම්බන්ධව අවධානය යොමු වෙයි කියා බලාපොරොත්තු වෙමින් මම කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
මීළඟට, රිසාඩ් බදියුදීන් මහතා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.33]

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இரண்டு முக்கிய மான அமைச்சுக்கள் மீதான இன்றைய விவாதத்திலே பேச வாய்ப்பளித்தமைக்கு நன்றி கூறுகிறேன். கடந்த கால அரசாங்கத்தின் துறைமுகங்கள் மற்றும் துறைமுக அபிவிருத்தி அமைச்சினால் அமைக்கப்பட்ட ஒலுவில் துறைமுகம் சம்பந்தமான எந்தவொரு விஷயமும் இந்த Budgetஇல் சொல்லப்படவில்லை. இது சம்பந்தமாக நான் ஏற்கெனவே இங்கு பேசியிருந்தேன். அந்தத் துறை முகத்தினால் அந்தப் பிரதேசத்தில் உள்ள மக்களுக்கோ, மீனவர்களுக்கோ எந்தவொரு பிரயோசனமும் இருப்பதாக நாங்கள் காணவில்லை. இந்தப் புதிய அரசாங்கம் அது சம்பந்தமாக என்ன நிலைப்பாட்டிலே இருக்கிறதென்று தெரியவில்லை. ஏனென்றால், ஏற்கெனவே கடற்றொழில் அமைச்சினுடைய பொறுப்பின்கீழ் அந்தத் துறைமுகத்தைக் கொண்டுவருவதாக அறிவித்தார்கள். அந்த அமைச்சு பொறுப்பெடுத்த பின்னராவது, private கம்பனிகளோடு சேர்ந்து ஏதாவது ஒரு வேலைத்திட்டத்தைச் செயற்படுத்தி, அந்தப் பிரதேச மீனவர்களுடைய நலனுக்காகவாவது அதனைப் பயன்படுத்தியிருக்கலாம். ஆனால், இதுவரை எதுவும் செய்யப்பட்டதாக இல்லை. நீங்கள் தற்போதுதான் புதிய அரசாங்கத்தை அமைத்திருக்கின்றீர்கள். எனவே, இது சம்பந்தமாக உங்களுடைய நிலைப்பாடு என்ன? என்பதை இந்தச் சபையிலே தெளிவுபடுத்தினால் நன்றாக இருக்குமென எதிர்பார்க்கின்றேன்.

அடுத்ததாக, நான் ஏற்கெனவே இங்கு சொன்ன இரண்டு முக்கியமான பாலங்கள் புனரமைக்கப்படவேண்டி இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் எனது உரையைச் செவிமடுத்துக் கொண்டிருக்கின்றார். அம்பாறை யிலே இருக்கின்ற கிட்டங்கிப் பாலம் மற்றும் மாவடிப்பள்ளிப் பாலம் ஆகிய இரண்டு பாலங்களும் நீண்ட காலமாகப் புனரமைக்கப்படாது இருக்கின்றது. மக்களின் போக்குவரத்துக்குத் தேவையான இவ்விரு முக்கியமான பாலங்களையும் புனரமைப்பதற்கான proposalஐ ஆகக் குறைந்தது அடுத்த Budgetஇல் ஆவது நீங்கள் செய்யுமாறு நான் உங்களிடத்திலே அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேபோல, மாவடிப்பள்ளி - கல்முனைப் பாதைக்கு alternative road ஏற்கெனவே போடப்பட்டது; இடையிலே ஏதோ சதி காரணமாக அது நிறுத்தப்பட்டது. அந்தப் பாதை உயர்த்திப் போடப்படாமையினால் பொலிவேரியன் போன்ற சில கிராமங்கள் வெள்ள அனர்த்தத்தின்போது மிகவும் பாதிக்கப்பட்டதுடன், மக்களும் நிறைய பாதிப்பு களுக்கு உள்ளாக்கப்பட்டார்கள். எனவே, அதனையும் கவனத்திலெடுத்து, அந்தப் பாதையை அமைக்க நடவடிக்கை எடுக்குமாறு உங்களிடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன். அதுபோல, ஒலுவில் அஷ்ரஃப் நகரை ஊடறுத்துச் செல்லுகின்ற ஒரு முக்கியமான பாதையான தீகவாபி பாதையையும் concrete அல்லது carpet வீதியாகப் பூரணப்படுத்தவேண்டிய தேவை இருக்கிறது.

அதேபோலத்தான் மன்னார் townஇலிருந்து railway stationக்குப் போகின்ற இரண்டரைக் கிலோ மீற்றர் தூரமுள்ள, ஆயிரக்கணக்கான மக்கள் பயன்படுத்துகின்ற RDAக்குச் சொந்தமான முக்கியமான பாதையும் இன்னும் புனரமைக்கப்படாமல், அபிவிருத்தி வேலைகள் எதுவும் செய்யப்படாமல் இருக்கின்றது. எனவே, அதையும் கவனத்தில் கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

முருங்கன் - சிலாபத்துறை வீதியில் RDAஇனால் 6 கிலோ மீற்றர் தூரம் வரையான பாதை தற்பொழுது புனரமைப்புச் செய்யப்படுகின்றது. ஆனால், 6 முதல் 15 கிலோ மீற்றர் தூரமுள்ள பாதையில் எந்தவொரு வேலைத் திட்டமும் செய்யப்படுவதாகத் தெரியவில்லை; அதுவும்

[ගරු රිෂාඩ් බදියුදීන් මහතා]

பாதிக்கப்பட்டிருக்கிறது. எனவே, அதையும் அந்தப் புனரமைப்பு வேலைத்திட்டத்தில் உள்வாங்கிக்கொள்ளுமாறு உங்களிடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்தாக, வட்டுவாகல் bridgeஐ புனரமைப்பதற்காக இந்த முறை உங்களுடைய வரவு செலவுத்திட்டத்தில் 1,000 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கியிருக்கின்றீர்கள்; அதற்காக வன்னி மாவட்ட மக்கள் சார்பாக எமது நன்றியைச் செலுத்துகிறோம். ஆனால், அதன் புனரமைப்புக்கான estimate 2,750 மில்லியன் ரூபாயாக இருக்கிறது. மிகுதிப் பணமும் வழங்கப்படும் என்ற உத்தரவாதம் அளிக்கப் பட்டால், அதற்கான tender call பண்ணுவதாகச் சொல்லப்படுகின்றது. ஆகவே, இது சம்பந்தமாக நடவடிக்கை எடுக்குமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேபோல, வவுனியாவிலிருந்து மன்னாருக்குச் செல்லு கின்ற பாதையில் அதிகமான தூரம் iRoad Projectஇன்கீழ் திருத்தம் செய்யப்பட்டது. தற்பொழுது பறையனாளங்குளப் பிரதேசத்தின் மூன்றரைக் கிலோமீற்றர் தூரமான பாதையின் வேலை இடையிலே நிறுத்தப்பட்டிருக்கிறது. அந்தப் பாதைக்கு iRoad Projectஇல் ஒதுக்கப்பட்ட பணம் மீதம் இருப்பதாகவும் நாங்கள் கேள்விப்படுகின்றோம். எனவே, அந்தப் பாதையையும் உடனடியாகத் திருத்தம் செய்தால், மக்கள் அதனைப் பயன்படுத்த முடியும்.

அதேபோலத்தான், RDAக்குச் சொந்தமான வெளிக்குளம் - மாமடுப் பாதை இதுவரை புனரமைக்கப்படாமல் இருக்கிறது. வவுனியாவில் நேரியகுளத்திலிருந்து நெலுக்குளம் போகின்ற RDAஇற்குச் சொந்தமான பாதை அமைக்கப்பட்டு விட்டது. ஆனால், அதன் 12ஆவது கிலோமீற்றரிலே பாலம் ஒன்று அமைக்கப்படாமல் இருக்கின்றது. மழைக் காலங்களில் அதனூடாக வெள்ளம் பெருக்கெடுத்துச் செல்வதனால் பெரிய பாதிப்பாக இருக்கிறது. அது பெரிய பாலமல்ல, சாதாரண பாலம். அதனையும் RDAஇனூடான வேலைத்திட்டத்தில் அவசரமாக உள்வாங்குமாறு வேண்டுகோள் விடுக்கின்றேன்.

அதுபோல, இடம்பெயர்ந்த 100,000 பேர் புத்தளம் நகரப் பகுதிக்கு வந்து அந்தப் பகுதியில் முகாம்களை அமைத்து வாழ்ந்துவருவது உங்களுக்குத் தெரியும். அந்தப் பகுதி யிலுள்ள பாதைகள் நீண்டகாலமாகப் போடப்படாமல், சாதாரணமாக ஒரு three-wheelerகூட ஓட முடியாதளவு துர்ப்பாக்கிய நிலையில் காணப்படுகிறது. நான் கடந்தகால அரசாங்கத்துடன் கதைத்து, குறித்த பாதைகளின் அவசரத் திருத்த வேலைகளுக்காக 150 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்து கொடுத்தேன். புதிய அரசாங்கம் வந்ததன் பின்னர் விடுக்கப்பட்ட ஒரு circular இன் அடிப்படையில் அந்தப் பணம் திரும்பப் பெறப்பட்டுள்ளது. எனவே, நான் DCC Chairman இடம் அந்தப் பாதைகளை நீங்களாவது போட்டுக் கொடுங்கள் என்று சொன்னேன். கௌரவ அமைச்சர் அவர்களே, ஏற்கனவே estimate போடப்பட்டுள்ள அந்தப் பாதைகள் சம்பந்தமாகக் கவனம் செலுத்தி, அவசரமான தேவையாகவிருக்கின்ற குறித்த பாதைகளை அமைப்பதற் கான உங்களுடைய நடவடிக்கையை நான் எதிர்பார்த்து நிற்கின்றேன்.

தலைமன்னார் என்பது ஒரு international island போன்றதென்பது உங்களுக்குத் தெரியும். அங்கு தற்போது wind power மின் உற்பத்தி, mineral மண் தோண்டுதல் போன்ற நிகழ்வுகள்தான் நடைபெறுகிறது. ஆனால், ஒருகாலத்தில் இராமேஸ்வரத்துக்கும் தலைமன்னாருக்கும் இடையிலான கப்பல் சேவை நடைபெற்றபோது தலைமன்னார் ஒரு பொருளாதாரக் கேந்திர நிலையமாக காணப்பட்டது; மக்களும் பொருளாதாரத்தில் மேம்பட்டார்கள். தற்பொழுது இந்திய மீனவர்களுடைய தொல்லையினால் அங்குள்ள மீனவர்களின் வருமானம்கூட மிகக் குன்றியிருக்கின்றது. சுற்றுலாப் பயணிகள் அந்தப் பகுதிக்கு வருவதாகவிருந்தால் இராமேஸ்வரம் - தலைமன்னார் கப்பல் சேவை மீண்டும் ஆரம்பிக்கப்பட வேண்டும். கடந்த அரசாங்கத்தில் அதற்குப் பொறுப்பான அமைச்சினால் Jetty புனரமைப்புக்கு tender call செய்யப்பட்டு, அதற்குரிய பணமும் Budgetஇல் ஒதுக்கப்பட்டிருந்தது. ஆனால், எந்த வேலையும் நடைபெற்றதாக நாங்கள் காணவில்லை. தற்போது யாழ்ப்பாணத்துக்கு ஊடாக அந்தக் கப்பல் சேவை நடத்தப்பட்டாலும், கடந்த காலங்களில் நாங்கள் அறிந்தவரையில் இராமேஸ்வரம் - தலைமன்னார் பகுதிதான் மிகக்குறுகிய தூரமுடையதாக - 25-30 கிலோமீற்றர் தூரமுடையதாக - இருக்கிறது. அந்த jettyஐப் புனரமைப்பதற்கு இந்தியா readyஆக இருக்கிறது. கௌரவ அமைச்சர் அவர்களே, இலங்கை அரசாங்கம் பணம் ஒதுக்காவிட்டால் இந்தியாவுடன் பேசியாவது அதனை உங்களுடைய காலத்தில் புனரமைக்குமாறு வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேபோன்றுதான் மன்னார் - புத்தளம் வீதியில், மன்னாரிலிருந்து மறிச்சுக்கட்டி வரையிலும், புத்தளம் முதல் எலுவன்குளம் வரையிலும் உள்ள பாதை carpet பாதையாகப் போடப்பட்டுள்ளது. வெளிநாட்டிலிருந்து பணம்பெறுகின்ற சில இனவாத NGOs, குறித்த பாதையை மூடுமாறும் அதனைப் புனரமைக்க வேண்டாமென்றும் courtsஇல் வழக்குப் போட்டார்கள். ஆனால், நீதிமன்றம் அதனை carpet பாதையாகப் புனரமைப்பதை மாத்திரம் தற்காலிகமாகத் தடைசெய்தது. ஆனால், கிறவல் போட்டு, அந்தப் பாதையை motorable conditionக்குக் கொண்டுவந்து பயன்படுத்த முடியும். குறித்த பாதையைப் பயன்படுத்தும் போது மன்னார் - புத்தளத்துக்கான 100 கிலோமீற்றர் பயணத் தூரம் மிச்சமாகும். யால ஆகவிருக்கலாம், அல்லது அதுபோன்ற வெவ்வேறு இடங்களிலாக இருக்கலாம், அங்கெல்லாம் wildlife பகுதிக்கூடாகப் பாதைகள் போகின்றன. இந்த வீதியின் ஒரு சிறிய areaஇல் மட்டும்தான் wildlife காணி இருக்கிறது. ஆனால், இது 100 வருடத்துக்கும் மேற்பட்ட பழமைவாய்ந்த, RDAக்குச் சொந்தமான பாதையாகும். இந்தப் பாதை வடக்கினை இணைப்பதனால்தான் கடந்தகால ஆட்சியாளர்கள் ஓர் இனவாதப் பார்வையோடு அதனைப் பார்த்தார்கள். இந்தப் பாதை தெற்கில் அல்லது வேறு எங்கேயாவது இருந்திருந்தால் அவர்கள் அதனை அழகாகப் புனரமைத்து, சுற்றுலாப் பயணிகள் அந்தப் பாதையினூடாகச் செல்ல ஏற்பாடு செய்திருப்பார்கள்.

அந்தப் பாதையைத் திறந்து போக்குவரத்துக்கு அனுமதிக்கும்போது யாழ்ப்பாணம், மன்னார் போன்ற இடங்களில் உற்பத்தி செய்யப்படுகின்ற பொருட்களைக் கொண்டுவருகின்ற செலவு மிச்சப்படுத்தப்படுவதுடன், விலையும் குறைக்கப்படும்; அந்தப் பகுதியின் பொருளாதாரமும் மேம்படும். அதில் சிறியதாக மூன்று பாலங்களும் இருக்கின்றன. அந்தப் பாதை நான் அமைச்சராக இருக்கும் போதுதான் திறந்துவைக்கப்பட்டது. கோட்டாபய ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக வரும்வரை அந்தப் பாதையூடாக மக்கள் போய்க் கொண்டிருந்தார்கள். கோட்டாபய ஜனாதிபதி யாக வந்த பின்னர்தான் அது மீண்டும் மூடப்பட்டது. அந்தப்

பாதையை மூடுமாறு நீதிமன்றத்தினால் எந்தத் தீர்ப்பும் வழங்கப்படவில்லை. பாதையை நிரந்தரமாகப் புனரமைப்பது தொடர்பாகவே ஓர் இடைக்காலத் தடையுத்தரவு விதிக்கப்பட்டது. ஆனால், பாதையைப் பயன்படுத்த முடியும். மன்னார், முள்ளிக்குளம் பகுதியில் இருக்கின்றவர்கள், அங்குள்ள Navy Campஇல் இருக்கின்றவர்கள் எல்லோரும் அதனூடாகத்தான் முன்பு பயணம் செய்தார்கள். இப்போதுதான் அது மூடப்பட்டுள்ளது. தயவுசெய்து AG's Department மற்றும் Ministry of Environment உடன் கதைத்து, வழக்கு விடயம் தொடர்பாக அவதானத்தைச் செலுத்தி, ஆகக்குறைந்தது மக்களின் போக்குவரத்துக்கு ஏற்றளவிலாவது அதனைச் செய்து கொடுங்கள்! நிரந்தரப் பெரிய carpet பாதையாக அவசரமாகப் போடுங்கள் என்று நான் சொல்லவில்லை. தென்பகுதியில் அவ்வாறான பாதைகள் எவ்வாறு போடப்பட்டுள்ளதோ அதுபோன்று அதனை அமைப்பதில் கவனம் செலுத்துமாறு கௌரவ போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களிடம் வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேபோல, குருநாகல் - கண்டி expresswayஐ BOT basisஇல் வடக்கு, கிழக்குப் பகுதிப் பாதைகளுடன் இணைக்க முடியுமாக இருந்தால், குறிப்பாக, தம்புள்ளை, பொலன்னறுவை, பாசிக்குடா, அறுகம்பை போன்ற பகுதிகளிலே சுற்றுலாப் பயணத்தை மேம்படுத்த முடியும். இதற்கு அரச பணத்தையோ அல்லது கடனையோ பெறவேண்டிய தேவையில்லை. வெளிநாட்டு அரசாங்க மொன்றின் அல்லது கம்பனிகளின் நிதி உதவியுடன் BOT basisஇல் அவ்வாறான ஒரு திட்டத்தைச் செயற்படுத்த நீங்களும் முயற்சி செய்யலாம். உலகிலுள்ள எத்தனையோ நாடுகள் அவ்வாறுதான் செய்கின்றன.

கடந்த காலங்களிலே நான் அமைச்சராக இருந்த பொழுது இலங்கைக்கு விஜயம் செய்திருந்த கட்டார் நாட்டினுடைய மன்னர் - இப்போது இருக்கின்ற மன்னருடைய தந்தை, "நாங்கள் one billion dollars ஐ உடனடியாக இலங்கையிலே முதலீடு செய்கிறோம்; கற்பிட்டியிலே ஒரு பகுதியைத் தாருங்கள்; அதனை நாங்கள் அபிவிருத்தி செய்கின்றோம். கட்டுநாயக்கவையும் கற்பிட்டியையும் இணைக்கின்ற expresswayஐ BOT basisஇல் அமைத்துத் தரத் தயாராக இருக்கின்றோம்" என்றெல்லாம் சொன்னது எனக்கு ஞாபகம் இருக்கின்றது**.** நான் எவ்வளவோ முயற்சி செய்தும், அன்றிருந்த ஆட்சியாளர்கள் அதைச் செய்ய ஏனோ உடன்படவில்லை. ஆனாலும், எதிர்காலத்திலே நீங்கள் அவ்வாறு சில நாடுகளோடு பேசி, BOT basis இலே இந்த மாதிரியான expresswaysஐ அமைக்கின்றபொழுதுதான் இந்த நாட்டை முன்னேற்ற முடியும். மீண்டும் மீண்டும் கடன் பெற்று இவ்வாறான பெரிய திட்டங்களைச் செய்யுமாறு நான் உங்களிடத்தில் சொல்லவில்லை. எனவே, இந்த விஷயத்திலே கவனம் செலுத்துங்கள்!

அதேபோல, வீடமைப்பு பற்றிய விடயத்தை எடுத்துக் கொண்டால், வீடமைப்பு அமைச்சராக சஜித் பிரேமதாஸ அவர்கள் இருந்த காலத்திலே - *[இடையீடு]*

මම බලාපොරොත්තු වෙනවා, ඔබතුමාට කියපු දේවල් ඊළඟට එන Budgetsවලින් හරි ඉටු කරයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, පරිසර නියෝජ්‍ය ඇමතිතුමා අනිද්දා මන්ත්‍රාරමට එනවා. එතකොට ඔබතුමා ඔය කියන තැන් බලන්න එතුමා යනවා. මම ඔබතුමා මුණ ගැහුණාම අනෙක් දේවල් ගැන පැහැදිලි කරන්නම්.

ගරු රිෂාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
බොහොම ස්තුතියි.

மன்னார், வவுனியா, முல்லைத்தீவு உட்பட வடக்கு, கிழக்கின் எல்லாப் பகுதிகளிலும் அவரால் ஆரம்பிக்கப்பட்ட வீடமைப்புத் திட்டத்தின்கீழான அனைத்து வீடுகளும் அரைகுறையாகக் கட்டப்பட்டுக் கிடக்கின்றன. மழை வந்தால் அந்த மக்களால் அந்த வீடுகளுக்குள் தூங்க முடியாது. நாங்கள் DCC கூட்டத்துக்கு அல்லது மக்களைச் சந்திக்கச் சென்றால், அவர்கள் அழுகிறார்கள். அவர்கள் என்ன செய்வார்கள்? சஜித் பிரேமதாஸ அவர்கள் அமைச்சராக இருந்தபோது அரைகுறையாகக் கட்டப்பட்ட அந்த வீடுகளைப் பூர்த்திசெய்வதற்காக, பின்னர் ஆட்சி மாறி வந்த கோட்டாபய அரசாங்கம் ஒரு ரூபாய்கூட அந்த மக்களுக்குக் கொடுக்கவில்லை; கண்ணை மூடிக்கொண்டு இருந்தது. தயவுசெய்து, நீங்களும் அதே வேலையைச் செய்யாதீர்கள்! அவர்களுடைய அவ்வாறான இனவாதச் செயற்பாட்டின் காரணமாகத்தான் அவர் துரத்தியடிக்கப் பட்டார். யாருக்கும் நடக்காத ஒரு விடயம் அவருக்கு நடந்தது ஏன்? காரணம், அப்படியான இனவாதச் சிந்தனை! கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் ஆரம்பித்திருந்தாலும், அது மக்களுக்கான வீட்டுத் திட்டம். எனவே, அந்தத் தமிழ், முஸ்லிம், சிங்கள அப்பாவி ஏழை மக்களுக்கு மீதிப் பணத்தைக் கொடுத்து, அந்த வீடுகளை முழுமையாகக் கட்டுவதற்கு உதவி செய்யுங்கள்!

அதுபோல, சிலாவத்துறையில் ஒரு கலாசார மண்டபத்தை கட்ட நான் நடவடிக்கை எடுத்திருந்தேன். அதன் 20 சதவீத வேலை முடிந்த நிலையில், 80 சதவீத வேலையைச் செய்யாது கடந்த அரசாங்கம் நான்கு வருடங்களாக இழுத்தடித்தது. அதற்கான proposalஇனை உங்களிடம் தந்திருந்தேன். தயவுசெய்து, அதைக் கட்டித் தாருங்கள்! உங்களிடம் பணம் இல்லையென்றால், ERD ஊடாக பெற்றாவது அதைக் கட்டித் தாருங்கள்! நானும் சில நாடுகளோடு கதைத்திருக்கின்றேன். அந்த நாடுகளும் உதவி செய்யத் தயாராக இருக்கின்றன. UDA Director Generalக்கும் இந்த விடயம் நன்றாகத் தெரியும். ஆகவே, அந்த proposalக்கு அமைய அவசரமாக ERD ஊடாக நிதியைப் பெற்று, அந்தக் கட்டிடத்தைக் கட்டி முடிக்க உதவி செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன். இல்லாவிட்டால், ஏற்கனவே செலவழிக்கப்பட்ட அரச பணம் வீணாக்கப்பட்டு விடும். எனவே, அந்த விடயத்திலும் கவனம் செலுத்துங்கள்!

இந்த நாட்டின் railway துறையினை நவீனமுறையில் மேம்படுத்த நடவடிக்கை எடுக்கவேண்டும். இந்தியாவைப் பாருங்கள், அங்கே railway துறை எவ்வளவு சிறப்பாக இருக்கின்றது!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
Please give me thirty seconds.

SLTB நட்டத்திலே இயங்கும் நிறுவனமாக மாறியிருக்கின்றது. Private bus உரிமையாளர்கள் அதை இலாபத்துடன் இயக்குகிறார்கள்; ஒரு பஸ் வைத்திருந்தவர் 10 பஸ் வண்டிகளை வாங்குகிறார். எனவே, SLTB விடயத்திலும் புதிய மாற்றங்களைக் கொண்டுவாருங்கள் என்று கேட்டு, விடைபெறுகிறேன். நன்றி.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.46]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ பிரதித் தவிசாளர் அவர்களே! இன்றைய தினம் இச்சபையில் நடைபெறுகின்ற போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு, நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு என்பவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு பல விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன்.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டமானது, சுற்றுலாவுக்கு மிகவும் உகந்த ஒரு மாவட்டமாகக் காணப்படுகின்றது. அதுமாத்திரமன்றி, எமது நாட்டின் பொருளாதார வளர்ச்சிக்கும் உதவக்கூடிய ஒரு மாவட்டமாகவும் காணப்படுகின்றது. போர்த்துக்கேயர், ஒல்லாந்தர், ஆங்கிலேயர் ஆகியோரின் ஆட்சிக் காலத்தில் திருகோணமலையானது முக்கிய நகரமாக - பட்டினமாக - காணப்பட்டது. மேலும், இலங்கையின் உத்தியோகபூர்வமற்ற தலைநகரமாகப் பார்க்கப்பட்ட ஒரு மாவட்டம்தான் திருகோணமலை மாவட்டம். இதனை ஒரு காலத்தில் 'தூங்கா நகரம்' என்று அழைத்ததாகவும் நாங்கள் கேள்விப்பட்டு இருக்கின்றோம். யுத்தத்தாலும் சுனாமி போன்ற இயற்கை அனர்த்தங்களாலும் பாதிக்கப்பட்ட ஒரு பிரதேசமாக எங்களுடைய திருகோணமலை மாவட்டம் காணப்படுகின்றது. கொழும்பிலிருந்து திருகோணமலைக்கு வருவதென்றால், கிட்டத்தட்ட ஏழு மணித்தியாலங்கள் பயணம் செய்யவேண்டிய நிலைப்பாடு காணப்படுகின்றது. தற்பொழுது குருநாகல் வரை அமைக்கப்பட்டுள்ள அதிவேக நெடுஞ்சாலையை தம்புள்ளை அல்லது ஹபரனை வரை நீடித்தால், அதை வடக்கு, கிழக்குக்கான ஒரு பிரதான expresswayஆக அமைத்தால், அது tourism போன்ற விடயங்களுக்குக் கூடுதலான பங்களிப்பைச் செலுத்தும் என்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். எனவே, இதுதொடர்பில் இந்த அரசாங்கம் உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய மாவட்டத்திலுள்ள திருகோணமலைத் துறைமுகமானது சர்வதேச புகழ்வாய்ந்த ஒரு துறைமுகமாகும். குறிப்பாக, திருகோணமலையை யார் கைப்பற்றுவது என்பதற்காகப் பல தசாப்த காலம் யுத்தம் நடைபெற்றிருப் பதாக நாங்கள் வரலாறுகளில் படித்திருக்கிறோம். "திருகோணமலையைக் கைப்பற்றினால் ஒட்டுமொத்த இலங்கையையும் கைப்பற்றியது போன்றுதான்" என்ற கூற்றை நாங்கள் கேள்விப்பட்டு இருக்கின்றோம். எனவே, திருகோணமலை நகரத்துக்கான போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் பாலங்கள் அமைப்பது சம்பந்தமான விடயங்களில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய கிண்ணியா பிரதேசத்திலுள்ள குறிஞ்சாக்கேணிப் பாலம் சம்பந்தமாக காலாகாலமாகப் பேசப்பட்டு வருகின்றது. இந்தப் பாலம் புனரமைக்கப்படாமையால் கடந்த காலத்தில் எட்டு உயிர்கள் பலிகொள்ளப்பட்டன. இந்தப் பாலத்தின் தற்போதைய நிலை என்ன? அதன் புனரமைப்புப் பணிகள் எப்போது ஆரம்பிக்கப்பட இருக்கின்றன? அது எந்த அடிப்படையில் முன்னெடுக்கப்பட இருக்கின்றது? என்பதை கௌரவ அமைச்சர் அவர்கள் இந்தச் சபையில் தெளிவுபடுத்தினால் சிறப்பாக இருக்கும்.

திருகோணமலை, கருமலையூற்றிலுள்ள முஸ்லிம்களின் அடையாளமாகக் காணப்படுகின்ற பழைமை வாய்ந்த பள்ளிவாசலுக்குரிய 139 பேர்ச்சஸ் காணியும், ஸியாரத்துக்குச் சொந்தமான 16 பேர்ச்சஸ் காணியும் இப்பொழுது துறைமுக அதிகாரசபையின் காணி எனச் சொல்லப்படுகின்றது. இந்தச் சந்தர்ப்பத்தில் அதே காணியை 4ஆம் படைப்பிரிவின் 'ஆமட்கோ' பாதுகாப்புப் படையினர் தங்களுடைய காணி யெனச் சொல்லி, அந்தக் காணிக்குள் மக்கள் செல்வதைத் தடுக்கிறார்கள். அதுமாத்திரமன்றி, அந்தப் பள்ளிவாசலின் நடவடிக்கையையும் இடைநிறுத்தி இருக்கிறார்கள். இந்த விடயத்தில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், இது தனியார் காணியாகும். அதுமாத்திரமல்ல, கருமலையூற்று ஜும்ஆ பள்ளிவாசலுக்குரிய காணியுமாகும். அதற்கான ஆதாரங்கள் எங்களிடம் இருக்கின்றன. எனவே, அந்தக் காணியையும் பள்ளிவாசலையும் மக்களுடைய பாவனைக்குக் கையளிப்பதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அந்தப் பள்ளிவாசலுக்குச் செல்லும் வழியில் 4ஆம் படைப்பிரிவின் ஆமட்கோ பாதுகாப்புப் படையினரின் சிறிய camp ஒன்றும் அமைக்கப்பட்டு இருக்கின்றது. அந்தக் camp அமைக்கப்பட்டு இருக்கின்ற காணி அந்தப் பள்ளிவாசலுக்குரியது. எனவே, அந்தக் campஐ அங்கிருந்து அகற்றி, வேறோர் இடத்தில் அதனை அமைப்பதற்கான நடவடிக்கைகளை விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் எடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

திருகோணமலையின் பட்டினமும் சூழலும் பிரதேசத் திலுள்ள 11 கிராம சேவகர் பிரிவுகளில் இலங்கைத் துறைமுக அதிகாரசபைக்குச் சொந்தமான காணிகள் இருப்பதாகக் கூறப்படுகின்றது. குறிப்பாக, முத்துநகர், கப்பல்துறை, வெள்ளமணல், கருமலையூற்று, நாச்சிக்குடா, பாலையூற்று போன்ற பிரதேசங்களில் மக்கள் நீண்ட காலமாகக் குடியிருந்த காணிகள் மற்றும் பயிர்ச்செய்கை செய்த விவசாயக் காணிகள் இன்று இலங்கைத் துறைமுக அதிகாரசபைக்குச் சொந்தமான காணிகள் எனச் சொல்லப்படுகின்றது. இது அங்குள்ள மக்களுக்குப் பெரும் அச்சுறுத்தலாக இருக்கின்றது. 1984ஆம்

ஆண்டு வெளியிடப்பட்ட வர்த்தமானி அறிவித்தலில் அவ்வாறு குறிப்பிடப்பட்டு இருக்கின்றது. அதில் சில மாற்றங்களை ஏற்படுத்தி, நீண்ட காலமாக அங்கு வாழுகின்ற மக்களின் குடியிருப்புக் காணிக்கான உத்தரவாதத்தையும், விவசாயச் செயற்பாடுகளை முன்னெடுக்கின்ற காணிக்கான உத்தரவாதத்தையும் வழங்குவதற்குரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இங்கு போக்குவரத்து சம்பந்தமான பல விடயங்கள் பேசப்பட்டன. திருகோணமலை - கொழும்பு புகையிரதம் தொடர்பான விடயத்தை நான் ஏற்கெனவே கௌரவ அமைச்சரின் கவனத்துக்குக் கொண்டுவந்து இருக்கின்றேன். பகல் நேரத்தில் இருந்த இந்தப் புகையிரத சேவை தற்போது இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. இன்று படிப்படியாக வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகளின் வருகை அதிகரித்துச் செல்கின்ற காரணத்தால், இது மிக முக்கிய விடயமாகக் காணப்படுகின்றது. இப்பொழுது அந்தப் புகையிரத சேவை குறிப்பிட்டளவு நஷ்டத்தை ஏற்படுத்தினாலும், எதிர்காலத்தில் அது இலாபகரமானதாக அமையும். இதனைக் கருத்திற்கொண்டு, அந்தப் புகையிரத சேவையின் நேர அட்டவணையில் சில திருத்தங்களைச் செய்யவேண்டிய தேவை இருக்கின்றது. நாங்கள் கடந்த DCC கூட்டத்தில்கூட, இது சம்பந்தமாகக் கதைத்துச் சில தீர்மானங்களை எடுத்திருக்கிறோம். அந்தப் புகையிரத சேவையை துரிதப் படுத்தினால், அது மக்களின் போக்குவரத்துக்கு இலகுவாக இருக்கும். எனவே, இந்த விடயத்தில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் திருகோணமலையிலுள்ள சீனக்குடா விமானத் தளத்திலிருந்து மீளவும் உள்நாட்டு விமான சேவையை ஆரம்பிப்பதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும். ஏனெனில், சென்ற காலங்களில் நடைமுறையில் இருந்த இந்த விமான சேவை இப்பொழுது இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. குறிப்பாக, சீனக்குடா-கொழும்பு, சீனக்குடா-இரத்மலானை, சீனக்குடா-பலாலி, சீனக்குடா-மட்டக்களப்பு ஆகியவற்றுக்கு இடையிலான விமான சேவைகள் தற்பொழுது இடைநிறுத்தப்பட்டு உள்ளன.

இன்று கிண்ணியா பாலத்திலிருந்து உப்பாறு பாலம் வரையான பகுதியில் கடலரிப்பு மிக மோசமாகக் காணப்படுகின்றது. இதனால் அங்குள்ள பல வீதிகள் கடலால் காவுகொள்ளப்படுகின்றன. இவ்வாறே மூதூர் பிரதேசத்திலும் கடலரிப்புக் காரணமாகப் பல பிரதேசங்கள் பாதிக்கப்பட்டு இருக்கின்றன. சென்ற காலங்களில் இதனைத் தடுப்பதற்கென நிதி ஒதுக்கப்பட்டாலும், அதில் ஊழல் இடம்பெறுவதாகக் கூறி அப்பணி இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. குறிப்பாக, மூதூர் பிரதேசத்தில் அவ்வாறான குற்றச்சாட்டுக்கள் காணப்படுகின்றன. அதில் என்ன நடைபெற்று இருக்கின்றது? அப் பிரச்சினையை எவ்வாறு தீர்க்க முடியும்? போன்ற விடயங்களில் கவனம் செலுத்தி, இதற்கொரு தீர்வை கௌரவ அமைச்சர் அவர்கள் வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நகர அபிவிருத்தித் திட்டத்தை எடுத்துக்கொண்டால், இன்று திருகோணமலை மாவட்டத்தில் குறிப்பாக கிண்ணியா, தோப்பூர், புல்மோட்டை ஆகிய பிரதேசங்களில் காணப்படுகின்ற சுற்றுவட்டாரத்தை - roundaboutஐ - அமைக்கின்ற விடயத்தில்கூட புறக்கணிப்புகள் காணப்படுகின்றன. பல்லாயிரக்கணக்கான மக்கள் வாழ்கின்ற அந்தப் பிரதேசங்களில் கவர்ச்சிகரமான நிலை இல்லாத காரணத்தால், அவை இருள்மயமாகக் காணப்படுகின்றன. எனவே, அந்த சுற்றுவட்டாரங்களை அழகுபடுத்துவதற்கான அல்லது மணிக்கூட்டுக் கோபுரத்தை அமைப்பதற்கான வேலைத் திட்டங்களை கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமென நான் உயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, அண்மையில் பொலிஸ் உத்தியோகத்தர் ஒருவரால் மௌலவி ஒருவர் மிகக் கொடூரமாகத் தாக்கப்பட்டார். இந்தத் துரதிருஷ்டவசமான சம்பவம் கடந்த பெப்ருவரி மாதம் 23ஆம் திகதி மாலை கெக்கிராவைக்கு அருகிலுள்ள மடாட்டுகம, கைலப்பத்தான பகுதியில் இடம்பெற்றுள்ளது. இது தொடர்பான காணொளிகள் சமூக ஊடகங்களில் வெளியாகியிருந்தன. இந்தச் சம்பவத்தில் பாதிக்கப்பட்ட அல்-ஹாபில், அல்-ஆலிம் அப்துல் லதீப் கியாஸ்தீன் (ரஹ்மானி) அவர்கள் ஹொரவப்பொத்தானை, அங்குநெச்சி மஸ்ஜிதுல் ஹுதா ஜும்ஆ பள்ளிவாசலில் பேஷ் இமாமாக கடமையாற்றுபவர். சம்பவத்துடன் தொடர்புடைய பொலிஸ் உத்தியோகத்தர் கைதுசெய்யப்பட்டு பின்னர் பிணையில் விடுவிக்கப் பட்டுள்ளார். இவ்வாறு ஒரு பொலிஸ் உத்தியோகத்தர் மதகுரு ஒருவர்மீது கண்மூடித்தனமாக தாக்குதல் நடாத்தியதை நாங்கள் உண்மையிலேயே உலமாக்களை அகௌரவப் படுத்தும் ஒரு செயலாகவே பார்க்கின்றோம். அதுமாத்திர மன்றி, இந்தச் சம்பவமானது ஒட்டுமொத்த முஸ்லிம்களையும் மனவேதனைக்கு உள்ளாக்கியுள்ளது. அகில இலங்கை ஜம்இய்யதுல் உலமா சபைகூட, இதற்குக் கண்டனம் வெளியிட்டு இருக்கிறது. அதுமாத்திரமல்ல, இது தொடர்பில் பதில் பொலிஸ்மா அதிபருக்கும் கடிதம்மூலம் அறிவித்திருக்கிறது. இந்த விடயம் தொடர்பில் பொது மக்கள் பாதுகாப்பு அமைச்சு கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இந்த அரசாங்கம் இன ஒற்றுமை, இன ஐக்கியம் பற்றிப் பேசுகின்ற இந்தத் தருணத்தில், இவ்வாறான செயற்பாடுகள் மக்கள் மத்தியில் எவ்வாறான தாக்கத்தை ஏற்படுத்தும் என்பதை நீங்கள் உணர்ந்துகொள்ள வேண்டும்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

நேற்றைய தினம் வெளிவந்துள்ள 'விடிவெள்ளி' பத்திரிகையில்கூட, இவ்விடயம் பிரதான செய்தியாக வெளிவந்திருக்கிறது. அதில், "மௌலவி ஒருவரை நடுவீதியில் பொலிசார் தாக்கிய சம்பவம்: நடந்தது என்ன?" என்ற தலைப்பின்கீழ் முழுமையான கட்டுரையொன்றை எஸ்.என்.எம். சுஹைல் அவர்கள் எழுதியுள்ளார். அதை நான் ஹன்சாட் பதிவுக்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

இனமுறுகலை ஏற்படுத்தக்கூடிய இவ்வாறான செயற்பாடு களுக்கு முற்றுப்புள்ளி வைப்பதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු අර්කම් ඉල්යාස් මන්ත්‍රීතුමා.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ගරු සභාවේ නැති අවස්ථාවේදී ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය මගේ නම සඳහන් කරමින් කියා තිබෙනවා, මමත්, විජයදාස රාජපක්ෂ හිටපු ඇමතිතුමාත් ගිහිල්ලා නුවර උසාවි සංකීර්ණය හදන්න මුල්ගලක් තැබුවා කියලා. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස විෂය භාර අමාත්‍යතුමා ගරු සභාවේ සිටියදී, එම අමාත්‍යාංශයේ නිලධාරින් නිලධාරි කුටියේ සිටින අවස්ථාවේදී එම කටයුත්ත කඩිනම් කරන්න කියලා මම ඉල්ලුවා. හැබැයි, ගරු මන්ත්‍රීතුමිය හිතාගෙන ඉන්නේ අපි මුල්ගල ගිහින් තැබුවේ අනුමැතියක්, අවසරයක් හෝ වැඩ පිළිවෙළක් නැතුව කියායි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කරුණු නොදැන කවුරුන් හෝ ලියා දුන් කොළ කෑල්ලක් මේ ගරු සභාවට ගෙනැල්ලා කියවන්නේ නැතුව මා ළඟ තිබෙන මේ ලියකියවිලි ටික අධ්‍යයනය කරන්න කියලා මම එතුමියගෙන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහනුවර නීතිඥ කාර්යාල සංකීර්ණය පුළුල් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙන් කොටසක් ලබා දීමට එම අධිකාරිය එකඟතාව ලබා දීපු ලිපියත්, -නාගරික සංවර්ධන අධිකාරිය මුලින් ලංකා විදුලිබල මණ්ඩලයට එම ඉඩම ලබා දීලා තිබුණා - නාගරික සංවර්ධන අධිකාරිය එම ඉඩම නැවත මහනුවර නීතිඥ සංගමයට දෙන්න ලබා දීපු එකඟතා ලිපියත්, Kandy Bar Association එක එම ඉඩම භාර ගැනීමට එකඟතාව පළ කරපු ලිපිය ඇතුළු ඊට අදාළ සියලු ලිපි මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ වාගේම මා ළඟ තිබෙනවා, එවකට හිටපු අමාත්‍යවරුන් වන ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමාත්, අලි සබරි මැතිතුමාත් ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව. ඒක අත්සන් කරලා නැහැ. එම නිසා මම එය සභාගත කරන්නේ නැහැ. හැබැයි, එවකට අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය අලි සබ්රි මහතාත්, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා දීලා අවසන්. එම නිසා එතුමියට මම මතක් කරනවා, නොදන්න කතන්දර මේ ගරු සභාවේ කියන්න එපා කියලා. සියලු අනුමැතීන් ලබාගෙන තමයි එම නීතිඥ සංකීර්ණය පුළුල් කිරීමේ වැඩ පටන් ගත්තේ. කුමන හෝ හේතුවකට කවුරු හෝ එය නතර කරගෙන ඉන්නවා. මම ගෞරවයෙන් ඉල්ලුවේ, ඒ ගැන නැවත සොයා බලලා වැරැදි තිබෙනවා නම් නිවැරදි කරලා, ඒ වැඩේ පටන් ගන්න කියන එක විතරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එහෙම නොකළා නම් ගම්පොළ විවෘත කර තිබෙන නීතිඥ සංකීර්ණයේ ඉඩම අදටත් තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ; ගාල්ල අධිකරණ සංකීර්ණයේ ඉඩම අදටත් තිබෙන්නේ අධිකරණ අමාත්‍යාංශය යටතේ; මාතර අධිකරණ සංකීර්ණයේ ඉඩම අදටත් තිබෙන්නේ අධිකරණ අමාත්‍යාංශය යටතේ. නිලධාරින්ගෙන් වන අතපසුවීම්වලට අපි දෙපැත්තේ සිටිමින් ගහගෙන වැඩක් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මම එතුමියට කියනවා, මේ ලිපි අධ්‍යයනය කරන්න, කාරණා දැනගෙන විතරක් මේ ගරු සභාවේ කථා කරන්න කියලා. ඊට අදාළ සියලු ලිපි මම දැන් සභාගත කළා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාට මා පිළිතුරක් දිය යුතුයි. එතුමා කියපු Kurinchakerny Bridge එක හදන්න අපි සල්ලි වෙන් කරලා තිබෙනවා. තවත් මන්ත්‍රීවරු ගණනාවක් කිව්වා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ටෙන්ඩර් ප්‍රශ්නයක් ගැන. ඒ කාරණය අපි ජනාධිපති විමර්ශන ඒකකයටත් භාර දී තිබෙනවා. වෙලාව නැති නිසා ඒ ගැන මම කෙටියෙන් කියන්නම්. වරායට straddle carriers ගෙන ඒම සම්බන්ධව බරපතළ වංචාවක් සිදු වෙලා ඒ පිළිබඳව උසාවි පවා ගිහින් තිබෙනවා.

මේක සිද්ධ වෙච්ච විධිය මම කියන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. දිගටම වංචනික දේවල් සිදු වීම නිසා කැබිනට් මණ්ඩලය එය නතර කරන්න තීන්දු කරනවා. එය නතර කරන්න අවසාන වශයෙන් තීන්දු කරපු කැබිනට් පත්‍රිකාව එලෙස තිබියදී, ඒ කැබිනට් පත්‍රිකාවම පාවිච්චි කර, 2024 සැප්තැම්බර් 13වැනි දා මේක තහනම් කරන්න කියලා ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාව වෙනස් කරනවා, මේවා ගෙන්වන්න. ඒ, straddle carriers කියන ඒවා විශාල වටිනාකමක් තිබෙන දේවල්. මට මතක හැටියට එහි full tender එක ඩොලර් මිලියන 18ක්. අපට ඔය ගණන් මතක නැහැ, අපි හොරකම් කරන්නේ නැති නිසා.

ජනාධිපතිවරණය තිබුණේ 2024 සැප්තැම්බර් 21වැනි දා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, CANC එක, ඒ කියන්නේ, specifications සම්බන්ධයෙන් තිබෙන Committee එක bypass කරලා කැබිනට් මණ්ඩලය ඒක approve කරනවා, සැප්තැම්බර් 18වැනි දා. සැප්තැම්බර් 13වැනි දා කැබිනට් මණ්ඩලයේදී තහනම් කරන්න කියපු එක අනුමත කරනවා. ඒ procedure එක අනුමත කරන්න යන්නේ නැතුව සැප්තැම්බර් 18වැනි දා කැබිනට් මණ්ඩලය එය ratify කරනවා. ඊට පසුව සිදු වුණු දේ මේකයි. සැප්තැම්බර් 19වැනි දා -කැබිනට් මණ්ඩලය ratify කරපු දවසට පසුව දා- Ports Authority එකේ සිටි අධ්‍යක්ෂ මණ්ඩලය එම ටෙන්ඩරය approve කරනවා. ජනාධිපතිවරණය පැවැත්වුණේ සැප්තැම්බර් 21වැනි දා. සැප්තැම්බර් 20වැනි දා ටෙන්ඩර් එක award කරනවා. එහෙම තමයි ඒ හොරකම කළේ. ඒ හොරකම මෙච්චර වේගයෙන් කළේ ඇයි කියලා අපට තේරෙන්නේ නැද්ද? ඒ, බොම්බයි මොටයි ගන්නවා නොවෙයි නේ; බයිසිකල් ටයර්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගන්නවා නොවෙයි නේ. එම නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි හැම උපදෙසක්ම අරගෙන ඒ straddle carriers 15 නැවත ටෙන්ඩර් කරන්න තීන්දු කළේ. ඒ ටෙන්ඩරය ලබා දුන්නාට අනිවාර්යයෙන් මාස 10ක් ගත වෙනවා, ඒවා ගෙනෙන්න. අපි ගත්ත ඒ තීන්දුවෙන් අමුතුවෙන් විශේෂ ප්‍රමාදයක් වෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමන්ලා තොරතුරු දැන ගෙන නම් කථා කරන්නේ, ප්‍රශ්නයක් නැහැ. නැත්නම් අපට සැකයක් තිබෙනවා, ඒ වංචනික පුද්ගලයන්ගේ අරමුණු වෙනුවෙන්ද මෙහෙම දන්නේ නැතුව තොරතුරු කියන්නේ කියලා. අපි කිසිම වංචාවක් කරලා නැහැ. ඔබතුමන්ලා බලන්න. මේක dramatic. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අර්කම් ඉල්යාස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

ගරු අර්කම් ඉල්යාස් මහතා
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා වන අවස්ථාවේ එම විවාදයට සහභාගි වෙන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. නාගරික සංවර්ධනය පැත්තෙන් මගේ අදහස් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැයෙන්ම විශාල මුදල් ප්‍රමාණයක් නාගරික සංවර්ධන අධිකාරියට අපි වෙන් කර තිබෙනවා. අගයක් ලෙස ගත්තොත්, බිලියන 98ක වාගේ මුදලක් නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන කටයුතු සඳහා අපි වෙන් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් රටක ආර්ථිකය රඳා පවතින්නේ, රටේ සංවර්ධන ව්‍යාපෘති මතයි. බොහෝදුරට ආර්ථිකයේ කොඳු නාරටිය බවට පත් වෙන්නේ, රටක සංවර්ධනයයි. අවුරුදු කිහිපයකට පසුව ඒ සඳහා විශාල මුදලක් අපට මේ අවුරුද්දේ වෙන් කරගන්න පුළුවන් වෙලා තිබෙනවා.

සාමාන්‍යයෙන් අපි ඉදිකිරීම් ක්ෂේත්‍රය සලකන්නේ, ලෝකයේ ආර්ථිකය පටන් ගත්ත දවසේ ඉඳලා අවසානය දක්වා නොනැසී පවතින ව්‍යාපාරයක් ලෙසයි. මොකද කිව්වොත්, නිවාස එහෙම නැත්නම් ඉඳුම් හිටුම් කියන්නේ, මිනිසාගේ මූලික අවශ්‍යතාවලින් එකක්. ඒ වාගේ ව්‍යාපාරයක් කවදාවත් වැනසෙන්නේ නැහැ. හැමදාම ඒ ව්‍යාපාරය පවතිනවා. නමුත්, ලංකාව ගත්තොත් ඒක වෙනස්ම තත්ත්වයක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, මේ වාගේ ව්‍යාපාර ලෝකයේ පටන් ගත්තේ කවදාද, එදා ඉඳන් ලස්සනට කෙරීගෙන යනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රය කියන්නේ, විවිධ මිනිසුන්ගේ විවිධ අවශ්‍යතා හින්දා කාලානුරූපීව විකාශනය වෙන දෙයක්. ඒවාත් එක්කම එකතු වෙලා ඉදිකිරීම් ක්ෂේත්‍රයත් විකාශනය වෙනවා. නමුත්, අපේ රට ගත්තොත්, මීට වඩා ගොඩක් වෙනස් තත්ත්වයකට තමයි පසුගිය වසර කිහිපය තුළ කටයුතු සිද්ධ වුණේ. ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම ඇනහිටින තත්ත්වයකට පත් වෙලා තිබුණා. ඒ ක්ෂේත්‍රවල නියැළුණු ඒ විෂය පිළිබඳ විශේෂඥයන්, ඒ විෂයයන්වල රැකියාවල නියුතු සුළු සේවකයාගේ සිට ගොඩක් අය රැකියා විරහිතභාවයට පත් වුණා. ඒ වාගේම ඒ ක්ෂේත්‍රවල නියැළුණු තවත් විශාල පිරිසක් අපේ රට දාලා යන තත්ත්වයට පත් වුණා. මේක ලොකු ප්‍රශ්නයක්. ඇත්තටම, අහස උසට හැදිච්ච බිල්ඩින් ගොඩක් තිබුණත්, ඒවායෙන් ප්‍රයෝජනයක් ගන්න බැරි තත්ත්වයට අපේ රට පත් වුණා. බිලියන ගණනක් මුදල් වටිනාකම් තිබෙන විශාල ඉඩම් ප්‍රමාණයක් අපහරණයට ලක් වෙලා තිබෙනවා. තවත් පැත්තකින්, රටේ ජනතාවගේ මුදල් විශාල ප්‍රමාණයක් ගොඩක් බිල්ඩින්වල සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජනය වෙලා තිබෙනවා. ඒත් අපට ප්‍රයෝජනයක් ගන්න බැරි තත්ත්වයටම ඒවා පත් වෙලා තිබෙනවා.

උදාහරණයක් විධියට අපට ගන්න පුළුවන්, කොළඹ නගර මධ්‍යයේ - in the heart of Colombo - තිබෙන ක්‍රිෂ් ගොඩනැඟිල්ල. Land value එක විතරක් ඩොලර් බිලියන 5ක් පමණ වන, අක්කර 3.7ක ඉඩමක පිහිටි ඒ බිල්ඩින් එක දැන් අපට හරි ප්‍රයෝජනයක් ගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇත්තටම කිව්වොත්, තට්ටු 60ක විතර ඒ බිල්ඩින් එක හොල්මන් බංගලාවක තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපේ වෙළඳ නගරයේ හදවත වූ කොළඹයි මේ වාගේ ස්ථානයක් තිබෙන්නේ. මම හිතන විධියට, 2015දී තමයි, එහි construction පටන් ගත්තේ. ඒ කටයුතු තවමත් අපට නිම කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඇත්තටම කිව්වොත්, ඒ බිල්ඩින් එකෙන් අපට දැන් ආයෝජනයකට වඩා අවාසි ගොඩක් ඇවිල්ලා තිබෙනවා. දැනට තිබෙන තත්ත්වය අනුව ඒ ගොඩනැඟිල්ල නිම කිරීමට බැරිවීම හින්දා අවාසි ගොඩක් තිබෙනවා. පසුගිය අවුරුද්දේ කොටුව පොලිසියට සිද්ධ වුණා, අධිකරණයෙන් නියෝගයක් ගන්න. මොකද කිව්වොත්, අදාළ ගොඩනැඟිල්ලේ තාවකාලික ඉදිකිරීම්වල තිබුණු අඩු පාඩු හින්දා. අනෙක් පැත්තේ තිබෙන ජනාකීර්ණ ප්‍රදේශවලට, එහෙම නැත්නම් නාගරික ප්‍රදේශවලට ඒ තාවකාලික ඉදිකිරීම් කඩා වැටෙන තත්ත්වයට පත් වී තිබුණා. අන්තිමට කොටුව පොලීසිය කොළඹ මහාධිකරණයෙන් නියෝගයක් ගත්තා, ඒ ගොඩනැඟිල්ලේ තාවකාලික ඉදිකිරීම් වහාම නවත්වන්න කියලා. ඒ වාගේම පසුගිය මාසය වෙනකොට fire outbreak එකකුත් සිද්ධ වුණා.

අපි මොනවා හෝ ආයෝජනයකට කියලා ගෙනාපු ගොඩක් projects අද ආයෝජනයකට වඩා හිසරදයක් බවට පත් වෙලා තිබෙනවා. බොහෝ වෙලාවට මේවාට ලොකුම හේතුව තමයි, කොමිස් මුදල්වලට, එහෙමත් නැත්නම් වෙනත් වෙනත් දේශපාලනඥයන්ගේ චුවමනාකම්වලට මේ ව්‍යාපෘති භාර දීම. මේ වාගේ ව්‍යාපෘතිවලින් රටට ලැබුණේ වාසි නොවෙයි අවාසි. මේ විධියට කොළඹ නගරයේ තිබෙන වටිනා ඉඩම් අපට අහිමි වෙලා තිබෙනවා. සමහර වෙලාවට ප්‍රයෝජනයට ගන්න බැරි වෙලා තිබෙනවා. ගොඩක් ඒවා idle වෙනවා. ඒ වාගේ විවිධ ව්‍යාපෘතිවලට අපේ රටේ ජනතාවත් විශාල වශයෙන් ආයෝජනය කරලා තිබෙනවා. ඒ ආයෝජන එනවිට සම්පූර්ණ මුදලම අදාළ ව්‍යාපාරිකයා අරගෙන එන්නේ නැහැ. ඒගොල්ලන් ලංකාවේ තිබෙන apartmentsවලට, ඒ වාගේ ස්ථානවලට දේශීය ආයෝජකයන්ගෙන් ආයෝජන ගන්නවා. ඒ මුදල් බොහෝ ප්‍රමාණයක් දැනට නාස්ති වෙලා තිබෙනවා. ඒ වාගේම මහා පරිමාණ ආයෝජකයන් තවදුරටත් ලංකාව තුළට එන්නත් බය වෙනවා, මේ වාගේ projects එකවරම නවතිනකොට, අවුරුදු ගණනක් නිස්සේ වැඩකටයුතු කරන්නේ නැතුව ඉන්නකොට. ඒවායෙන් ගොඩක් ප්‍රශ්න එනවා.

උදාහරණයක් විධියට ගත්තොත් මේ ක්‍රිෂ් ව්‍යාපෘතිය වාගේම ග්‍රෑන්ඩ් හයට් ව්‍යාපෘතිය, Destiny Mall and Residency ව්‍යාපෘතිය වාගේ ගොඩක් ව්‍යාපෘති ලංකාව තුළ දැනට නැවතිලා තිබෙනවා. තට්ටු 20කට වඩා වැඩි, අහස උසට ගොඩනැඟිලි ඉදි කරපු, විශාල ප්‍රමාණයේ ව්‍යාපෘතියේ 20කට අධික ප්‍රමාණයක් කොළඹ නගරයේ විතරක් දැනට අතහැර දමා තිබෙනවා. දේශීය ව්‍යාපාරිකයන්ගේ මුදල් විශාල ප්‍රමාණයක් කිසිම return එකක් නැතුව මේවායේ ආයෝජනය කරලා තිබෙනවා. නිසි

[ගරු අර්කම් ඉල්යාස් මහතා]

අධ්‍යයනයකින් තොරව, වෙනත් වෙනත් ආශාවන් නිසා මේවා ආරම්භ කරපු නිසා සහ මේ වාගේ projectsවලට දේශපාලන මැදිහත්වීම් තිබුණු නිසා තමයි මේ projects අපට හිසරදයක් වෙලා තිබෙන්නේ. නිවැරැදි feasibility study එකකින් තොරව ආරම්භ කරපු ව්‍යාපෘති නිසා තමයි, මේ වාගේ දේවල් සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ වාගේම, අපට තවත් දෙයක් වාර්තා වෙනවා. පසුගිය වසරේ පැවති නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී රජයේ ව්‍යාපෘති 34ක් සඳහා යෙදවූ රුපියල් බිලියන 6.5ක මුදලක් දැනට අපිට ප්‍රයෝජනයට ගන්න බැරි වෙලා තිබෙන බව වාර්තා වෙලා තිබෙනවා. මේ වාගේ ගොඩක් දේවල් සඳහා අපිට ඉදිරියේදී උත්තර සොයන්න වෙලා තිබෙනවා. ඒ වාගේම, මේ බිල්ඩින්වලට අපි මොනවාද කරන්නේ කියලා බලන්න වෙනවා.

ඒ වාගේම මම හිතනවා මීට වැඩිය ගොඩක් දේවල් අපිට නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හරහා කරගන්න පුළුවන්කම තිබෙනවා කියලා. මොකද, අපි ඇත්තටම ආයෝජනය කරන්න ඕනෑ තවත් ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඇත්තටම කිව්වොත්, ජාතික ආපදා තත්ත්වයන්ට අදාළව උත්තර සොයන්න, අපි ගොඩක් කල් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම දික්වැල්ල බෙරුවල, වැවුරුකන්නල ප්‍රදේශයේ අවුරුදු ගණනාවක් තිස්සේ ඇති වන ගංවතුර තත්ත්වය. ඒ ගැනත් ඇත්තටම වෙනස් විධියට කථා කරන්න පුළුවන්. කලින් ආණ්ඩුවක අවිධිමත් සංවර්ධන ව්‍යාපෘතියක් නිසා, මුහුදට මීටර් 50ක්, 100ක්වත් නැති ස්ථානයක ලොකු ගංවතුර තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ ඒක විසඳන්න බැරිව ඉන්නවා. ඉතා සංවේදී කළපු ප්‍රදේශයකට, වෙනත් සංවර්ධන ව්‍යාපෘතියකින් ගෙනාපු පස් දමා, අක්කර 30ක වාගේ ප්‍රදේශයක් සම්පූර්ණයෙන් ගොඩ කිරීම නිසා, ඇති වෙච්ච තත්ත්වය මත මුහුදට මීටර් 50ක්වත්, 100ක්වත් නැති ස්ථානයක 2017 වර්ෂයේ සිට ගංවතුර තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය විසඳන්න, ඊට අදාළ ශක්‍යතා අධ්‍යයන වාර්තාව ගන්න විතරක් අපට SLLRDC එකට, එහෙම නැත්නම් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රුපියල් මිලියන 6ක මුදලක් වෙන් කරන්න වෙලා තිබෙනවා. ඒ ශක්‍යතා අධ්‍යයන වාර්තාව ගන්න විතරක්, project එක කරන්න නොවෙයි. මම අහගෙන හිටියා මට කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් අකුරණ ප්‍රදේශයේ ගංවතුර ප්‍රශ්නය පිළිබඳව කථා කළා. ඒ පිළිබඳවත් ශක්‍යතා අධ්‍යයන වාර්තාව ලබා දීමට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රුපියල් මිලියන 22ක මුදලක් මේ ආණ්ඩුවෙන් වෙන් කරලා තිබෙනවා. ඒක තවත් දේශපාලන කාරණාවක් නොකර, ඉතා ඉක්මනින්, පුළුවන් විධියට, විද්‍යාත්මකව නිවැරැදි ක්‍රමවේදයකින් අදාළ විසඳුම් ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. මේ වාගේ අපට ආයෝජන කරන්න පුළුවන් විධියේ project ගොඩක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ අවස්ථාවේ මට මතක් වෙනවා, "වෙඩි නොවදින ළමයි" කියන චිත්‍රපටයට රුවන් බන්දුජීව මහතා ලියපු සින්දුවක කොටසක්. ඒ තමයි, "හතර පැත්තෙන්ම මුහුදු තිබුණාම රටවල් මලකඩ කනවද, ලේනෝ ලේනෝ මේ රට අරගෙන අලුත් රටක් මට දෙනවද" කියන කොටස. අපිට ඇත්තටම ලැබිලා තිබෙන්නේ මලකඩ කාපු රටක්. හැබැයි, ඒ මලකඩ කාලා තිබෙන්නේ, හැම පැත්තෙන්ම මුහුදු තිබෙන නිසා මුහුදු සුළං වැදිලා නොවෙයි, රට ඇතුළේ කරන්න ඕනෑ දේවල්, කරන්න ඕනෑ විධියට නොවීම නිසායි. ජාතික ජන බලවේගයේ අපි ඇවිල්ලා ඉන්නේ, ඒ රටේ මලකඩ ඇරලා, අලුත් ලස්සන රටක් ගොඩ නහන්නයි.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.11]

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் வித்தான)
(The Hon. Jagath Vithana)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා අපේ ගරු ප්‍රවාහන ඇමතිතුමාට; පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමාට. මම උදේ වරුවේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ, මංගල උත්සවයකට සහභාගී වුණා, සාක්ෂියට අත්සන් කරන්න. ගරු ඇමතිතුමා මගෙන් ඉල්ලීමක් කළා, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳව මට තිබෙන දැනුමෙන් මේ විවාදයට දායක වෙන්න කියලා එතුමා. මම ඇත්ත වශයෙන්ම ඒ සඳහා සැදී පැහැදී ඉන්න බව එතුමා දන්නවා.

මට මේ වෙලාවේදී මතක් වෙනවා, ඉතිහාසයේ වුණු සිදුවීමක්. අපේ කුමාර වෙල්ගම මැතිතුමා, මගේ ඥාති සහෝදරයා, ප්‍රවාහන ක්ෂේත්‍රය භාරව හිටපු කැබිනට් ඇමතිවරයෙක්. එතුමා ප්‍රවාහන ඇමතිවරයාව සිටියදී දවසක් මට කථා කරලා කිව්වා, "මල්ලී, මට මේක කරන්න බැහැ. මගේ බස් ටික ඔක්කොම ගන්න" කියලා. ඒ බස් ටික ඔක්කොම මම මුදල් දීලා ගත්තා. ගරු ඇමතිතුමනි, අද මට පුළුවන් ඔබතුමාගේ අමාත්‍යාංශයට නොමිලයේ උදව් කරන්න. මට වාහන අවශ්‍ය නැහැ, වැටුප් අවශ්‍යත් නැහැ.

මෙන්න මේ කාරණය මම මුලින්ම කියන්න ඕනෑ. අපේ ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා අදහස් දක්වනකොට මම අහගෙන හිටියා. මට හිතුණා, එතුමා ඉන්නේ විපක්ෂයේද කියලා.

මොකද එතුමා නිර්ලෝභීව, කිසිම බයක් සැකක් නැතුව ප්‍රවාහන අමාත්‍යාංශයේ තිබෙන, ප්‍රවාහන කටයුතු පිළිබඳව තිබෙන, ඒ පද්ධතියේ තිබෙන අඩු පාඩුකම් ටික කියාගෙන කියාගෙන ගියා. මම හිතනවා එතුමා ලොකු අධ්‍යයනයක් කරලා තිබෙනවා කියලා. ඒ කියපු ඒවා ඇත්ත.

අපි අසුබවාදීව හිතන්න හොඳ නැහැ. කළුතර ගත්තොත්, ඩිපෝ පහක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ ඩිපෝ පහේම අඩුම තරමින් jack එකක් නැහැ, බස් උස්සලා යට බලන්න. ඒ බස් සෝදන්නේ නැහැ. Service කරන්න බැහැ. තෙල් ටික මාරු කරන්න පහසුකම් නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ මේ අඩු පාඩුකම් මැද්දේ බස් ටික ධාවනය වෙනවා. තරහා වෙන්න එපා, මම මේ කියන කාරණයට. මම කැමැති නැහැ ඒවා හෑල්ලුවට ලක් කරන්න. එහෙම එකක් නොවෙයි මේ කරන්නේ. ලංකා ගමනාගමන මණ්ඩලයට අයිති බස් එකකුයි, පෞද්ගලික අංශයේ අපේ බස් එකකුයි පාරේ යන කොට ticket ගත් මගියා ඒ බස් එකෙන් බැහැලා පෞද්ගලික අංශයේ බස් එකක නතින අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. මොකද, අපි පහසුකම් ගොඩක් දෙනවා.

එහෙම පහසුකම් දෙන්න ලංකා ගමනාගමන මණ්ඩලයට බැරි ඇයි කියන එකත්, ලංකා ගමනාගමන මණ්ඩලය නහා සිටුවන්න බැරි ඇයි කියන එකත් මම කියන්නම්. අමාත්‍යාංශයේ නිලධාරීන් ඇවිල්ලා ඉන්නවා නම්, මේ කියන කාරණා ලියා ගන්න. පළමුවැනි කාරණය, බස්වලට සේවක අතිරික්තයක් තිබීම. හැබැයි, මම වත්මන් ආණ්ඩුවට මේ කාරණය කියනවා. ඔබතුමන්ලා හොඳ වැඩක් කළා. මමත් දේශපාලනයට බොහොම පරණයි. මොනම පක්ෂයක් වුණත් තට්ටුමාරු ක්‍රමයට බලයට පත්

වුණාට පස්සේ, ඉස්සෙල්ලාම සේවකයෝ දැම්මේ SLTB එකට. සේවක අතිරික්තයක් ආවේ එහෙමයි. බලය මාරු වුණාට පස්සේ ආයෙත් SLTB එකට සේවකයෝ දමනවා. ඩිපෝ අධිකාරිවරයෙක් වෙන්නේ කවුද? කොන්දොස්තර කෙනෙක්, එහෙම නැත්නම් රියැදුරු මහත්මයෙක්. එතකොට කොහොමද පරිපාලනය කරගෙන යන්නේ? මේ කියන කාරණය නිසා මට දැවැන්ත ප්‍රහාරයක් එල්ල වෙන්න පුළුවන්. නමුත් මේක තමයි ඇත්ත. මම ගණන් හදලා බැලුවාම බස් එකකට මේ වන විට ඉන්නේ 7දෙනෙක්, 8දෙනෙක් විතර පිරිසක්. පසුගිය කාලයේ බස් එකකට 12දෙනෙක්, 13දෙනෙක් විතර හිටියා. එතකොට කොහොමද ඒ ආයතනය පවත්වාගෙන යන්නේ? එය දිගින් දිගටම අලාභ ලැබුවේ ඒකයි. ඒකට වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය මම දැක්කා. ඒ මුදල් ප්‍රමාණය ලංකා ගමනාගමන මණ්ඩලයෙන් හම්බ කරන්න ලැබෙන්නේ නැහැ.

මගේ බස් රථ ලංකාව වටේම ධාවනය වෙනවා. ඔබතුමන්ලා හැමෝම ඒ බව දන්නවා. අපි කොහොමද බස් දුවන්නේ කියලා මම කියන්නම්. එතකොට ඒ කියන ඒවායින් ඔබතුමන්ලාට ගන්න ඕනෑ ටික ඔබතුමන්ලා ගන්න. මගේ සේවකයන් විධියට බස් රියැදුරන්, කොන්දොස්තරවරුන් ඉන්නවා නේ. මම ඒ driverටම පුහුණුවක් ලබා දීලා කොන්දොස්තර licence එක අරගෙන දෙනවා. NTC licence එකත් අරගෙන දෙනවා. පළාත් සභාවේ licence එකත් තිබෙනවා. මට ඕනෑ මගේ බස් රථ හැම දාම ධාවනය කරවන්නයි. මම උදේට නැඟිට්ටාම බලන්නේ එදා දවසේ බස්වල සේවයේ නොයෙදෙන්නේ කවුද කියලායි. බස් එකක සේවකයෙකු අඩු වුණා නම්, දෙන්නාගෙන් එක්කෙනෙක් යොදවලා බස් රථය ධාවනය කරවනවා. තවත් බස් එකක සේවකයෙක් නිවාඩු ගියා නම් ඒ වෙනුවට තවත් කෙනෙක් යොදවනවා. බස් එකකට සේවකයන් තුන්දෙනෙක් තමයි අපේ ළඟ ඉන්නේ. අන්න එහෙම තමයි අපි බස්රථ ධාවනය කරවන්නේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසිම බස් එකක ආයුධ පෙට්ටියක් නැහැ. ආයුධ පෙට්ටියක් කියන්නේ පොඩි දෙයක්. 10 ඉඳලා 14 වන කල් යතුරු සෙට් එකක්, cable එකක්, accelerator cable එකක් ආදි දේවල් තියෙන්න ඕනෑ, පොඩි පොඩි repairs කරගන්න. ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් එකක් මහදි කැඩුණොත් මිනිස්සු බැහැලා බලාගෙන ඉන්නවා අනෙක් බස් එක එනකල්. මගේ බස් නම් නැවතිලා නැහැ කොහේවත්. මගේ බස් කිලෝමීටර් 500 ධාවනය කරවන අවස්ථාත් තිබෙනවා. කිලෝමීටර් 500 ධාවනය කරලා ආපසු එනකොට අපි සැදී පැහැදී ඉන්නවා, අවශ්‍ය කරන කටයුතු ටික කරන්න. අපි මෙන්න මෙහෙම ක්‍රමවේදයක් තමයි ක්‍රියාත්මක කරන්නේ. විනය අතින් ගත්තත් එහෙමයි. පෞද්ගලික බස් රථ රියැදුරෙකු අතින් පොඩි වැරැද්දක් වුණාම අපේ සියලු ක්ෂේත්‍රවලටම ඒක බලපානවා. ඒක මේ රටේ හැටි. ලංකා ගමනාගමන මණ්ඩලයට මට කියන්න තිබෙන්නේ මේ කාරණයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙතැනදී මට ආරාධනා කළා වාගේම මම ඒ වගකීම භාර ගන්නම්. මට වැටුප් නැතුව අධීක්ෂණ මන්ත්‍රීකමක් දෙන්න. මම ඩිපෝ එකට ගිහිල්ලා පාට දාන්නේ නැතුව ඒ ගොල්ලන් එක්ක සුහදව කථා කරලා මා දන්නා දේ apply කරලා දෙන්නම්. අද මෙහි ඇවිත් ඉන්න ප්‍රවාහන ක්ෂේත්‍රයේ නිලධාරීන් මේ කාරණා ලියා ගන්න. ඔබතුමන්ලා ළඟ spare parts නැහැ. බස් රථ 50ක්, 60ක් ධාවනය වන ඩිපෝ එකක අඩු ගණනේ එදිනෙදා move වන ලක්ෂ 25ක, 30ක spare parts ටික අරගෙන තියාගන්න ඕනෑ නැද්ද? දැන් බොහෝ ආයතන ඩිජිටල්කරණය කරනවා කියලා අපේ ගරු ජනාධිපතිතුමා තීරණයක් අරගෙන තිබෙනවා. ඒක ඉතා හොඳයි. අමතර ද්‍රව්‍ය තිබෙන ගබඩාවක් පාලනය කරලා, තවත් රස්සාවකුත් දීලා, ඒ බඩු ටික එතැනින්ම අරගෙන සවි කරන එක හොඳ නැද්ද, බස් එක සුමානයක් එක තැන තිබෙනවාට වඩා? දැන් බස් එකක කුමක් හෝ repair එකක් ආවොත් ඒ බඩු කොළඹ තිබෙන කාර්යාලයෙන් ගෙන්වන්න වෙනවා. ඒවා කොළඹ තිබෙන කාර්යාලයෙන් ගෙන්වන්නත් සිදු වන්නේ පෞද්ගලික අංශයෙන් මිල දී ගෙනයි. කවුද දන්නේ පෞද්ගලික අංශයෙන් ගන්න අය original එක ගන්නවා ද, duplicate එක ගන්නවා ද කියලා. එකම පෙට්ටිය. එකම විධියට ගහලා තිබෙනවා. ඒවායේ නම් කියන්නේ නැහැ, මම. නම් කියන්නත් පුළුවන් මට. කාලය මදි නිසා, නම් කියන්න බැහැ. අමතර කොටස් හැටියට මොනවාද දමන්නේ? කිලෝමීටර් 10ක්, 15ක් දුවන කොට කැඩෙන ඒවා තමයි දාන්නේ. ඒ ගැන බලන්න කවුරුවත් නැහැ. තත්ත්ව පරීක්ෂාවක් තිබෙන්න ඕනෑ. මේ වාගේ ඉතා සරල න්‍යාය පත්‍රයක් තිබෙන්නේ.

මම මේ වෙලාවේ තවත් කාරණයක් කියන්න ඕනෑ. දැන් අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. NTC එකේ මගේ බස් තිබෙනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේත් බස් තිබෙනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් එකක අයිතිය සංශෝධනය කරන්න රුපියල් ලක්ෂයක් අරගෙන පුළුවන්, ගරු ඇමතිතුමා. NTC එකේ බස් එකක අයිතිය සංශෝධනය කරන්න අවස්ථාවක් දීලාම නැහැ. ඒකට Cabinet approvals තුනක් ලැබිලා තිබෙනවා. මා දන්නා තරමින් මේ ආණ්ඩුවෙනුත් Cabinet approval එකක් ලැබුණා. එහෙම නම් එය කඩිනම් කරලා පාර්ලිමේන්තුවේදී සම්මත කරලා නියමිත ගණනක් තීරණය කරලා අයිතිය සංශෝධනය කරන්න අවස්ථාව ලබා දෙන්න. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් එකක් නම් රුපියල් ලක්ෂයක් දුන්නාම transfer කරන්න පුළුවන්. ඒ වාගේ මොකක් හෝ මීලක් නියම කරලා ඒකට අවස්ථාව හදලා දෙන්න. දැන් මොකද වෙලා තිබෙන්නේ? එක්කෝ බස් රථ අයිතිකරු බස් එක විකුණලා; එක්කෝ රට ගිහිල්ලා. එහෙම නැත්නම්, අයිතිකරු මිය ගිහිල්ලා. දැන් බස් එක දුවන අයගේ අතින් මොකක් හරි accident එකක් වුණොත් මොකද වෙන්නේ? කොහොමටත් accidents වෙනවා නේ. මොකක් හෝ fatal accident එකක් වුණොත් එහෙම, බස් එක දිරනවා. Route permit holder නැහැ. එතකොට කොයි තරම් නම් අසාධාරණයක් සිදු වනවා ද, මේ ව්‍යාපාරික ලෝකයට. එහෙම වෙන්න දෙන්න එපා. අයිතිය පැවරීමේ කටයුත්තට කඩිනමින් ඉඩ හදලා දුන්නොත් රජයටත් ලොකු ආදායමක් එනවා.

ගරු ඇමතිතුමනි, බස්වලට ගහන VAT එක අඩු කරලා දෙන්න. බස් විතරක් නොවෙයි ඔබතුමාගේ විෂයයට අයිතියි, ත්‍රිරෝද රථ පවා. ත්‍රිරෝද රථවලට ගහන VAT එකත් අඩු කරන්න. ත්‍රිවිලර් එකක් රුපියල් ලක්ෂ 20ක් වෙනවා. ඉතින්, මිනිස්සු වාහන ගනියි ද? බස් එකක් රුපියල් ලක්ෂ 175ක් වෙනවා.

ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ සිද්ධ වෙච්ච වංචාවක් ගැනත් මම කියන්නම්. ඒ ගැනත් සොයන්න. මම Ashok Leyland කම්පැනි එකෙන් බස් රථ ගනිද්දී, මම බස් රථ ගත්තු ගණනට වඩා ලක්ෂ 25ක් වැඩිපුර දීලා බස්රථ එක්දහස් ගණනක් ගමනාගමන මණ්ඩලයට එක සැරේ ගත්තා. මම මෙය වගකීමෙන් කියන්නේ. ඒ ගැන පරීක්ෂා කරන්න. ඒ මුදල් කොහේටද ගියේ කියලා බලන්න. එය දැවැන්ත වංචාවක්. අන්න ඒකේ file එක තිබෙනවා, ගෞතම ළඟ. ගෞතම් කියන්නේ,- *[බාධා කිරීමක්]* එවැනි දැවැන්ත වංචා සිදු වුණාම පසු විපරමක් හෝ කරනවා නම් ඒක හොඳයි. මම ඒ වංචාව ගැන වගකීමෙන් කියන්නේ. ඒක ඒ දවස්වල සිදු වූ ලොකු වංචාවක්. කොහොම නමුත් ඒක යට ගියා. Ashok Leyland Company එකේ ඒ file එක එහෙමම තිබෙනවා. මොකද, මේ ක්ෂේත්‍රය ගැන මට තිබෙන අත්දැකීමත් එක්ක මම දන්නවා එහෙම දෙයක් සිද්ධ වුණා කියලා. ඒක වහන්න දෙන්න එපා. ඒක ගැන සොයන්න. දඬුවම් කරන්න නොවෙයි මම කියන්නේ. ඒ ගැන හොයලා ඒ වංචාව කරපු කට්ටියට දඬුවම් කළත් කමක් නැහැ. මොකද, දේශපාලන අධිකාරියට විතරක් එකතු වෙලා මේ වාගේ දෙයක් කරන්න බැහැ. මේක කරන්න නම් නිලධාරිනුත් එකතු වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, තවත් විනාඩි දෙකක කාලයක් ඔබතුමාට තිබෙන්නේ.

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට කාලය නම් මදි වෙනවා. කමක් නැහැ, මම ඉක්මනින් කියන්නම්. මට කියන්න තිබෙන්නේ මෙන්න මේ කියපු දේවල් ටික කරන්න කියලායි.

ගරු ඇමතිතුමනි, දුර ගමන් සේවා ගැනත් කියන්න ඕනෑ. දුර ගමන් සේවා බස්රථවල අඩුවක් තිබෙනවා. මතුගම ඉඳන් අරගෙන බලන්න. මම මතුගම base කරලා තමයි බස් රථ ධාවනය කරවන්නේ. මතුගම ඉඳන් ත්‍රිකුණාමලයට යන්න බස් එකක් නැහැ. මතුගම ඉඳලා බදුල්ලට යන්න බස් එකක් නැහැ. මතුගම ඉඳලා හපුතලේට යන්න, අම්පාරට යන්න බස් එකක් නැහැ. අපේ පැත්තේ කෝච්චිත් නැහැ නේ. ඉතින් අම්පාරට යන අය මොකද කරන්නේ? ඒ නිසා ඒ ගොල්ලන් කොළඹට එනවා, ආයෙත් බස් එකකට මාරු වෙනවා, ආයෙත් තවත් බස් එකකට මාරු වෙනවා. එහෙම නොවෙන්නත්, රජයට ආදායමක් ගන්නත් හැකි විධියක් තිබෙනවා. ටෙන්ඩර් කරන්න. එහෙම නැත්නම් අවුරුද්දට මෙන්න මෙච්චර ගණනක් දෙන්න ඕනෑ කියලා ක්‍රමවේදයක් හදන්න. මොකද, ඒ මාර්ගය හදා ගන්න වෙනවා. ඒක හදා ගන්න ලෙහෙසියි. බස් රථවලට ගහන VAT එක අයින් කළොත් මිනිස්සු මේ ප්‍රවාහන ක්ෂේත්‍රයට යොමු වෙයි.

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මැතිනිය මේ ක්ෂේත්‍රය ගැන දිගින් දිගටම අදහස් ප්‍රකාශ කළා. ඒ කථාවේ එක තැනකදි කියැවුණා, "පෞද්ගලික අංශයට මේක කරන්න පුළුවන්" කියලා. පෞද්ගලික අංශයට විතරක් නොවෙයි, ඇත්ත වශයෙන්ම ලංකා ගමනාගමන මණ්ඩලයටත් මේක කරන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, මම කළුතර දිස්ත්‍රික්කයෙන් පටන් අරගෙන ඒ ආදර්ශය ලබා දෙන්න සූදානම්. ඔබතුමා ඒ සඳහා මට ප්‍රවේශය ලබා දෙන්න. ඔබතුමාගේ ප්‍රකාශයත් එක්ක දැනටම ප්‍රවෘත්ති නාළිකාවල යනවා ලු, මම ආණ්ඩුවට යනවා කියලා. මා හිතන විධියට, ආණ්ඩුව කියන්නේ අපි ඔක්කෝම. අපි, අවුරුදු 5කට රජය. අපි උදව් කරන්න ඕනෑ. මම ඒකටයි ඇවිල්ලා ඉන්නේ. මට බේරක් නැහැ. මට ඉලක්ක නැහැ. මම එදා මගේ මංගල කථාවේදීත් කිව්වා. ඒ නිසා ඔබතුමාගේ ආරාධනාව මම ඉතාම ආදරයෙන් පිළිගන්නවා, ගරු ඇමතිතුමනි. මට කරන්න පුළුවන් දේවල් ටික කරලා දෙන්නම්.

තවත් කියන්න කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. මම ඒ ටික ලිඛිතව භාර දෙන්නම්. මමත් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ඉන්නවා. එම නිසා ඔබතුමන්ලාටත් අපටත් එකතු වෙලා මේ ක්ෂේත්‍රය ගොඩ නහන්න පුළුවන් බව මම කියනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.22]

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද විවාදයට මම ඉතිහාසයක් එක්ක ප්‍රවිෂ්ටයක් ගන්නම්. ඔබතුමන්ලා දැකලා තිබෙනවාද, ටොලමීගේ පළමුවෙනි world map එක? ඒකේ තිබෙන ලංකාව දැක්කා ද? ලංකාව කියලා නොවෙයි, ඒකේ තිබෙන්නේ "තැප්‍රොබේන්" කියලා. සාපේක්ෂව ඒ ලංකාව ලොකුයි; ඉන්දියාවටත් වඩා පොඩ්ඩක් ලොකුයි. එහෙම වෙන්නේ කොහොම ද? ටොලමී මේ සිතියම අඳින්නේ දේශ ගවේෂකයන්ගෙන්, වෙළෙන්දන්ගෙන් එන තොරතුරු මත. මේ දෙගොල්ලෝ දෙන තොරතුරු මොනවාද? ලංකාව කියන්නේ ඉතා පොහොසත්, විශාල රටක් විධියට තමයි ඒගොල්ලෝ දකින්නේ. ඒ ගැන මෙහෙමයි කියන්නේ: "It was about a Great Nation somewhere down, who knows international trading well, who knows the effective communication at their best, and who had a great foreign policy and professional diplomats; it was a large nation at a very strategic location." ඉන්දියන් සාගරයේ තිබෙන පොඩි රටක් විධියට ඔවුන් දෙවැනි ශත වර්ෂයේදී අපේ රට දැක්කේ නැහැ.

And now, here we are as a nation which has missed centuries, not decades.

Hon. Deputy Chairperson, the Ministry Transport, Highways, Ports and Civil Aviation is now the gateway to a modern Sri Lanka, connecting us to the world. We are 22nd in the list of the best-connected countries in the world and we will lead in bringing back our country to its old glory. Our ports, both seaports and airports, can play a significant role in our journey towards a new era of renaissance, achieving economic prosperity while uplifting the living standards of all Sri Lankans.

Moving on to seaports, Madam, you know that the Colombo Port ranks 25th in business volume, handling 7.5 million TEUs. However, considering its strategic location and business potential, the Colombo Port is the 13th best-connected seaport. The 13th best-connected seaport! Exploring this potential for rapid growth, we are focusing on achieving its full operational capacity with the new terminals: the West and East ContainerTerminals. The West Container Terminal would handle 2.5 million TEUs while the East Container Terminal would handle 3 million TEUs. By the end of 2026, the total handling capacity of the Colombo Port wouldl be around 14 million TEUs. So, we are increasing our capacity. Yes, we do have an issue with regard to straddle carriers for the ECT, but not with regard to all the equipment. However, we have a solution for that. We will use prime mover trucks and as the Hon. Minister mentioned, we will operate this Port with a 50 per cent efficiency. So, that is the answer to the question that was raised.

Madam, at present, we are facing a bottleneck in marketing our Port due to capacity constraints and congestion. With continuously increasing volumes, we believe that strategic marketing would raise us to have a

better stake in the regional market. Having these targets in the national plan, this year we are calling for EoIs to build the West Container Terminal 2 with a total volume of 3 million TEUs. For that project, feasibility studies have been completed and money has been allocated for detailed drawings to be completed in 2025. Then, the Colombo North Port consists of three container terminals with a total volume of 10 million TEUs. So, with all these terminals together, the Colombo Port would reach a handling capacity of 30 million TEUs by the end of 2035. Now, the Port of Singapore, the second-largest port in the world, is handling 35 million TEUs. By the end of 2035, they target to handle 65 million TEUs, with 30 million more TEUs coming from the global and the regional markets. And, we would increase our capacity by 22 million TEUs. So, that is what we are targeting for. If they could achieve 30 million TEUs, why can we not target for 22 million TEUs?

For that, we have to increase the volume of the Port. Without increasing the volume of the Port, we cannot get any business done. So, to do the marketing, we need to increase the volume. We have set the target to reach that volume by 2035 and we are on the move. We humbly request you all to support, join hands and work together in this journey.

Madam, cargo operations are not enough for ships to call at the Port. We need to facilitate other auxiliary services with heavy infrastructure. Traditionally, bunkering and logistics. The transportation business does not run without fuel. At the moment, Sri Lanka has a very low storage capacity. This year, we are planning to join the CPC with the JCT Oil Bank to enhance our storage capacity and the last mile operations would be done through a joint venture between the private sector and the Ceylon Shipping Corporation.

Then, moving on to logistic centres, we will start a feasibility study this year for a multimodal logistics centre at Bloemendhal, which will be funded by the ADB. That is a cargo hub incorporated with railway transportation. Most significantly, it would be an inland dry port. As we all know, we had a congestion within the Port during the last few days. Apart from that, there are about 30 prime movers roaming around the Colombo City every day. So, how can we come out of that congestion? We have to remove those prime movers from the city traffic. For that, we are establishing this dry port.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
Hon. Leader of the House, can I have two more minutes?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Okay.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
Not only infrastructure, but to cater to the requirement of this industry, to enter the international maritime industry and to have a better stake, we also need qualified and skilled human resources. In line with that, we will empower the Mahapola Training Centre to generate the required labour force. And also, Sri Lankan seafarers can significantly contribute to the economy of the country. The Merchant Shipping Secretariat has set their roadmap to increase seafarers up to 50,000 by 2030 with the collaboration of the private sector and State-owned institutions.

Madam, as per the NPP policy, we are bound to boom the economy and spread its benefits throughout the country. This year, we will re-evaluate the master plan for the Trincomalee Port on main sectors such as the oil terminal, the cruise terminal and the container terminal. Oil terminal facilitates the oil tanks which are being restored. With regard to the cruise terminal, as per the national tourism plan, with the increased number of tourists, we need new destinations. Thereby, we may create new destinations, building infrastructure. The container terminal will act as transshipment base for the shipping route to Indian Eastern Seaboard.

When it comes to the aviation sector, our first initiation is to amend the Act to facilitate, one, domestic aviation, for which we did not have enough regulation, two, aviation tourism including ballooning, parachuting, paragliding, para-jumping et cetera and three, agriculture drones.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
I will wind up, Madam.

These areas had a bottleneck due to lack of proper regulations and we will be able to ease up these operations without conflicting national security and the ICAO Regulations. And, we are also expecting a rapid boom in this industry.

Then, moving on to the Bandaranaike International Airport, which has a designed capacity for 6 million passengers, it handled 8.8 million passengers last year. So, we need to expedite its Terminal 2 constructions, which are expected to resume in the second half of this year. Terminal 2 will increase the Airport's volume per annum by another 9 million passengers. And also, due to our strategic location, we have around 40,000 to 50,000 aircraft passing through our airspace and we are offering all these aircraft with navigation facilities. In 2024, our revenue was Rs. 3,200 million. Considering its importance as a foreign currency generator, we have

[ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා]

allocated Rs. 3,500 million this year for a new building and the upgrading of technologies.

Finally, Madam I would like to say that we are on the right track. So, through this Budget, we would be able to lay the foundation for what we are going to build in the next few years.

Thank you very much.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.32]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு, எனது கருத்துக்களைக் கூற விழைகின்றேன். முதலாவதாக, துறைமுகங்கள் பற்றி பேசலாமென நினைக்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தின் முதன்மையான வளமாகக் காணப்படுவது அதன் இயற்கைத் துறைமுகமாகும். பதினெட்டாம் நூற்றாண்டில் இங்கிலாந்து நாட்டின் கடற்படைத் தளபதியாகப் பணிபுரிந்த வில்சன் என்பவர் இங்கிலாந்து அரசுக்கு எழுதிய கடிதத்தில், "யார் திருகோண மலைத் துறைமுகத்தை வைத்திருக்கிறானோ, அவனே இந்து மா கடலின் திறவுகோலை வைத்திருப்பவன் ஆவான்" என்று குறிப்பிட்டிருப்பதிலிருந்து திருகோணமலைத் துறைமுகத்தின் முதன்மையை நாம் உணர்ந்து கொள்ளலாம். சுதந்திரத்துக்குப் பின்னர், ஆட்சிக்கு வந்த அரசுகள் இந்தத் துறைமுகத்தை அபிவிருத்தி செய்வதில் பெரிய அக்கறை காட்டவில்லை.

திருகோணமலை துறைமுகத்தின் உள்ளே நான்கு இறங்குதுறைகள் உள்ளன. அவற்றில் ஒன்று 'அஷ்ரப்' இறங்குதுறை என அழைக்கப்படுகின்றது. இது இலங்கைத் துறைமுக அதிகாரசபையின் கட்டுப்பாட்டில் உள்ளது. எஞ்சிய மூன்று இறங்குதுறைகளில் ஒன்றை பிறிமா மா ஆலையும், மற்றொன்றை டோக்கியோ சீமெந்து ஆலையும், பிறிதொன்றை இந்திய எண்ணெய்க் கூட்டுத்தாபனமும் பயன்படுத்துகின்றன. அஷ்ரப் இறங்குதுறையானது, தொடக்கத்தில் மேற்கொள்ளப்பட்ட அபிவிருத்தி வேலை களுடன் மாத்திரம் இன்றுவரை ஆளணிப் பற்றாக்குறை, போதிய கப்பல் தரிப்பிட வசதியின்மை, போதிய சரக்குக் களஞ்சிய வசதியின்மை, சரக்கு ஏற்றி இறக்கும் கனரக எந்திரங்கள் இன்மை, முறையான வாகன ஓடுதளம் இன்மை முதலிய குறைபாடுகளோடு காணப்படுகின்றது. இதன் காரணமாக இங்கு வரவேண்டிய கடற்கலங்களுக்குச் சிறந்த சேவை கிடைப்பதில்லை. அதனால் அவை வேறு துறைமுகங்களை நாடிச் செல்கின்றன. இதன் விளைவாக நமக்குப் பாரிய வருவாய் இழப்பு ஏற்படுகின்றது. துறைமுகத்திலுள்ள குறைபாடுகளைச் சீர்செய்வதன்மூலம் கணிசமான அந்நிய நாணயமாற்று வருவாயை ஈட்ட முடியும். முற்கூறியவாறு அந்நிறுவனங்கள் பயன்படுத்தும் மூன்று இறங்குதுறைகளையும் இலங்கைத் துறைமுக அதிகாரசபையே நிருவகித்தால், கூடுதலான வருவாயை நாட்டுக்கு ஈட்ட முடியும் என்பதோடு, வேலைவாய்ப்புகளையும் வழங்க முடியும்.

துறைமுகத்தை அண்டியுள்ள எண்ணெய்க் குதங்களில் 10 சதவீதத்துக்கும் குறைவானவையே பயன்பாட்டில் உள்ளன. ஏனையவற்றையும் பயன்பாட்டுக்குக் கொண்டுவந்தால், இந்துமா கடலில் பயணம் செய்கின்ற கடற்கலங்களுக்கு எரிபொருள் வழங்கி, பெருமளவு அந்நிய நாணய மாற்றை ஈட்ட முடியும் என்பதோடு, வேலைவாய்ப்புகளையும் வழங்கலாம் என்பதை நான் கௌரவ அமைச்சரது மேலான கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

துறைமுக அதிகாரசபைக்கும் மக்களுக்கும் இடையில் ஒரு பிரச்சினை உள்ளது. திருகோணமலை துறைமுக அதிகாரசபையானது 5,266 ஏக்கரை கையகப்படுத்தியுள்ளது. இந்தப் பகுதிக்குள் 1,888 ஏக்கரில் மக்கள் வாழ்கின்றார்கள். 1987ஆம் ஆண்டு கையகப்படுத்த முன்னரே, அங்கு அந்த மக்கள் வாழ்ந்து வருகின்றார்கள். அவர்களுக்கும் துறைமுக அதிகாரசபைக்கும் இடைவிடாத முரண்பாடுகள் காணப்படு கின்றன. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் விரைவில் அந்த மக்களுக்குக் காணிகளைக் கொடுத்து, அவர்களுடைய பிரச்சினையைத் தீர்க்க வேண்டுமென வேண்டுகின்றேன்.

இலங்கைப் போக்குவரத்துச் சபையின் திருகோணமலை மாவட்ட அலுவலகத்துக்கு 37 பேருந்துகள் தேவை. எனினும், 20 பேருந்துகள் மட்டுமே அதனிடம் உள்ளன. இதனால் இலங்கைப் போக்குவரத்துச் சபையால் சிறந்த சேவையை வழங்க முடியாதுள்ளது. எனவே, பழுதுபட்டுக் கிடக்கின்ற பேருந்துகளைத் திருத்த ஆவன செய்யுமாறும், குறைந்தது 10 புதிய பேருந்துகளையாவது திருகோணமலை மாவட்டத்துக்கு வழங்குமாறும், இலங்கைப் போக்குவரத்துச் சபையின் திருகோணமலை மாவட்ட அலுவலகத்தில் காணப்படும் 50 சதவீதமான ஆளணிப் பற்றாக்குறையைத் தீர்ப்பதற்கு ஆவன செய்யுமாறும் வேண்டிக் கொள்கின்றேன். மேலும், இலங்கைப் போக்குவரத்துச் சபையின் திருகோணமலை மாவட்ட தரிப்பிட உள்ளக ஓடுதளம் மிக மோசமாகப் பழுதடைந்துள்ளது. இதனைப் புனரமைப்பதற்கு ஆவன செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற பாலங்கள் மிகவும் பழுதடைந்துள்ளன. இவை நீண்ட காலத்துக்கு முன்னர் கட்டப்பட்டவையாகும். எடுத்துக் காட்டாக, மூதூர் பிரதேச செயலாளர் பிரிவிலுள்ள கறுப்புப் பாலம் என்று அழைக்கப்படுகின்ற கட்டைபறிச்சான் பாலமும் இறால் பாலமும் முழுமையாகச் சேதமடைந்து காணப்படு கின்றன. இவற்றைச் சீர்செய்யாவிட்டால் உயிர்ச் சேதங்கள் ஏற்படுவதற்கான வாய்ப்பு உண்டு. எனவே, இவற்றைப் புதிதாக அமைக்க ஆவன செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், வெருகல் பிரதேசத்தில் ஏரிக்கும் கடலுக்கும் இடையில் ஏறத்தாழ 5,000 மக்கள் வாழ்கின்றார்கள். பேரிடர் காலங்களில் மக்கள் இங்கிருந்து வெளியேற முடியாமல் சிக்கி, மரணத்தைச் சந்திக்கக்கூடிய வாய்ப்பு உண்டு. இவ்வாறான விளைவுகளைத் தடுக்கும் பொருட்டு ஏரியின்மீது பாலம் அமைக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இந்தப் பாலம்தான் புன்னையடிப் பாலம்! இதனை அமைப்பதற்கான

சாத்தியக்கூற்று ஆய்வுகள் வீதி அபிவிருத்தி அதிகாரசபையால் 2019ஆம் ஆண்டில் செய்யப்பட்டது. அப்பொழுது அதற்கு 464 மில்லியன் ரூபாய் தேவையென மதிப்பிடப்பட்டது. கொரோனா பெருந்தொற்றுக் காரணமாக இந்தச் செயற்றிட்டம் செயற்படுத்தப்படாமல் போய்விட்டது. எனவே, இந்தப் பாலத்தைத் தாமதமின்றி அமைக்க ஆவன செய்யுமாறு வேண்டிக் கொள்கின்றேன்.

திருகோணமலை மற்றும் முல்லைத்தீவு மாவட்டங்களுக்கு இடையில் கொக்கிளாய் ஏரி உள்ளது. இந்த ஏரி ஆழமற்ற ஓர் ஏரியாகும். புல்மோட்டையில் வாழும் மக்கள் கொக்கிளாய் ஏரி வழியாக 32 கிலோமீற்றர் பயணம் செய்தால் முல்லைத்தீவைச் சென்றடையலாம். பாலம் இல்லாத காரணத்தால், மக்கள் வவுனியா வரை சுற்றிச் சென்று, 75 கிலோமீற்றர் தூரம் அதிகமாகப் பயணம்செய்தே முல்லைத்தீவுக்கு செல்ல வேண்டியுள்ளது. இது பணச் செலவையும் நேரச் செலவையும் ஏற்படுத்துகின்ற விடயமாகும். எனவே, கொக்கிளாய் ஏரியின் மீது ஒரு பாலத்தை அமைக்க ஆவன செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

இந்த அரசால் முன்வைக்கப்பட்டுள்ள பாதீட்டில், போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சுக்கு 52.4 பில்லியன் ரூபாய் மீண்டெழும் செலவுக்காகவும் 421 பில்லியன் ரூபாய் மூலதனச் செலவுக்காகவும் ஒதுக்கப்பட்டுள்ளது. இது கடந்த ஆண்டைவிட 13 சதவீதம் அதிகமாகும். இது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். எனினும், வீதி அபிவிருத்திக்கு கடந்த ஆண்டு ஒதுக்கப்பட்ட நிதியைவிட, இந்த ஆண்டு 13 சதவீதத்தால் குறைக்கப்பட்டுள்ளது. இது மகிழ்ச்சிக்குரிய விடயமல்ல. வீதி அபிவிருத்தி மற்றும் பராமரிப்புக்கென ஒதுக்கப்படும் நிதியில் பெருமளவான நிதி வீதி அபிவிருத்தி அதிகாரசபையின்கீழ் வரும் 10 சதவீதமான பெருந் தெருக்களுக்கே ஒதுக்கப்படுகின்றது. அதேநேரம், வீதி அபிவிருத்தி அதிகாரசபை, உள்ளூராட்சி சபைகள், நீர்ப்பாசனத் திணைக்களம் முதலியவற்றின்கீழ் வரும் வீதிகள் கவனிப்பாரற்றுக் கிடக்கின்றன. இவற்றைப் புனரமைப்பதற்கு கௌரவ அமைச்சர் அவர்கள் ஆவன செய்ய வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු අග්‍රාමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාදයට ගන්නා මේ මොහොතේ ඊට වවන කිහිපයක් එකතු කිරීමට හැකි වීම පිළිබඳව මම සතුටු වෙනවා.

ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමාටත්, ගරු නියෝජ්‍ය ඇමතිවරුන් ඇතුළු ප්‍රවාහන අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ටත් මගේ කථාව ආරම්භයේදීම ස්තුති කරන්න මම කැමතියි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. මේ රටේ කාන්තාවන් වෙනුවෙන් ඉතාම හොඳ, ඉතාම වැදගත් තීරණයක් සහ ක්‍රියාවක් ළඟදී ක්‍රියාත්මක කරනවා මම දැක්කා. කොළඹ කොටුව Railway Station එකේ කාන්තාවන් සඳහා පහසුකම් සහිත rest room එකක් ඉතාමත් ලස්සනට සකස් කරලා තිබුණා. ඒක එක ක්‍රියාවක් විධියට ලෝකය දැක්කාට, පොදු ප්‍රවාහන සේවයක් වන දුම්රිය සේවය පාවිච්චි කරන කාන්තාවන්ට ඒක විශාල සම්පතක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය ඇතුළු අපි සියලුදෙනාම දන්නවා, ගැහුණුන් හැටියට පොදු ප්‍රවාහන සේවය භාවිත කරනකොට මුහුණ දෙන්නට සිදු වන අත්දැකීම කොහොමද කියලා. අපි වතුර බොන්නේ නැතුව ගමන් යන්න පුරුදුවෙලා සිටින පිරිසක්. අපි කොච්චර අමාරුවෙන්, දුෂ්කරතාවලට මුහුණ දෙනවාද කියන එක මෙතැන අලුතින් කථා කළ යුතු නැහැ. ඒ නිසා මෙවැනි initiative එකක්, මෙවැනි මැදිහත් වීමක් අපට අතිශයින්ම වැදගත් සහ අතිශයින්ම දැනුණු කටයුත්තක්. මම ඒක විශේෂයෙන් අගය කරන්නේ, ඒක නිකම් rest room එකක් හැදුවා විතරක් නොවෙයි, කාන්තාවන්ට යන්න ආස හිතෙන විධියට ඒක හදලා තිබෙනවා. ඒක නිකම් "අපි ශ්‍රී ලාංකිකයන්, අපි ඉන්නේ තුන්වැනි ලෝකයේ රටක, සංවර්ධනය වෙමින් පවතින රටක, ඒ නිසා නිකම් ලාවට හදලා, ඔන්න අපි මෙහෙම එකකුත් කළා" කියන පදනමෙන් හදපු එකක් නොවෙයි. ඒක ඉතාම උසස් මට්ටමකින්, අපි සියලුදෙනාට කිසිම හිරිකිතයක් නැතුව පාවිච්චි කරන්න පුළුවන් විධියට හදලා තිබෙන තැනක්. ඇත්ත වශයෙන්ම මේ ගත්ත initiative එක වෙනුවෙන් ගරු ඇමතිතුමා ඇතුළු ඒ සියලුදෙනාටම මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම කාන්තාවන්ට අවශ්‍ය පහසුකම් නැති වීම තුළින් ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න ලාවට සලකන්න බැහැ. මේක ඔබතුමියත් හොඳින් දන්නා දෙයක්. මේක අපේ mobility එකට බලපාන ප්‍රශ්නයක්. Mobility කියන්නේ, point "A" ඉඳලා point "B" දක්වා යන්න තිබෙන හැකියාව විතරක් නොවෙයි. Mobility එකක් සඳහා තිබෙන බාධාවන් තුළින් අපට අහිමි වන ගොඩක් දේවල් තිබෙනවා. අපි මේ වෙලාවේත් කථා කරනවා; හෙට ජාත්‍යන්තර කාන්තා දිනය නිසා අද හැම තැනම කථා වෙනවා, ඒ වාගේම අදයි හෙටයි මේ සතියේම කථා වෙයි, අපේ රටේ ශ්‍රම බලකායට කාන්තාවන්ගේ සහභාගිත්වය අඩුයි කියලා. ඒ ශ්‍රම බලකායේ කාන්තාවන්ගේ සහභාගිත්වය ගණනය කරන්නේ කොහොමද කියන එක ගැන වෙනම විවාද කරන්න ඕනෑ. අපි ඒක හෙට කථා කරමු. නමුත් ඒකට ප්‍රධාන හේතුවක් හැටියට අපට ගන්න පුළුවන්, මේ ශ්‍රම බලකාය තුළ අඩු සහභාගිත්වයට mobility ප්‍රශ්න, ප්‍රවාහන ප්‍රශ්න හේතු වන බව. ඒ කියන්නේ ආරක්ෂිත, සුරක්ෂිත සහ පහසුකම් තිබෙන පොදු ප්‍රවාහන සේවාවක් මේ රටේ නොතිබීම තුළින් කාන්තාවන් විශාල ප්‍රමාණයක් ශ්‍රම බලකායෙන් අයින් කරලා, එහෙම නැත්නම් ශ්‍රම බලකාය තුළ ඉන්නේ අපහසුවෙන්, අසහනයෙන්.

බොහෝ වෙලාවට අපේ කාන්තාවන්ට යම්කිසි රැකියාවක් භාර ගන්නවාද, නැද්ද කියන තීන්දු-තීරණ ගන්න සිද්ධ වෙලා තිබෙනවා, එම රැකියා ස්ථානයට යන්න තිබෙන ප්‍රවාහන පහසුකම් මත. අපි දන්නවා, ප්‍රවාහන පහසුකම් ආරක්ෂිත නොවීම නිසා අපේ කාන්තාවන් රැකියාවලින් අස් වෙලා ගිය අවස්ථා, ඒ වාගේම අධ්‍යාපනයෙන් හැළුණු තැන්, සමාජයෙන් කොන් වෙච්ච අවස්ථා පිළිබඳව. මා හිතන විධියට පොදු ප්‍රවාහන සේවයක දවසක් ගියා නම්, කාන්තාවන් හැටියට අපි හැමෝම ඒ කටුක අත්දැකීම ලබලා තිබෙනවා. ඉතින් මේ ආරක්ෂිතයි එහෙම නැත්නම් සුරක්ෂිතයි කියන පොදු ප්‍රවාහනය කියන දේ සුළුකොට සලකන්න පුළුවන් දෙයක් නොවෙයි. විශේෂයෙන්ම

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහතා]

කාන්තාවන්ට, දරුවන්ට සහ ආබාධ සහිත තැනැත්තන්ට. ඒ කියන්නේ අපේ පොදු ප්‍රවාහන සේවය හදලා තිබෙන්නේ, බහුතරයක් ගැන හිතන්නේ නැතුවයි. මම කිව්වොත්, ඔවුන් අමතක කරලා කියා එය නිවැරදියි. හැබැයි, ඒ අයත් මේ රටේ පුරවැසියන්. ඒ අයටත් මේ රටේ සියලු ක්‍රියාවලට පුරවැසියන් හැටියට සහභාගි වීමේ අයිතියට ප්‍රවාහනය කොච්චර වැදගත් ද කියන එක ගැන හිතන්නේ නැතුව තමයි අපේ ප්‍රවාහන පද්ධතිය හැදිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේක බලපාන්නේ ආර්ථිකයට විතරක් නොවෙයි. ඔබතුමියත් දන්නවා, වයසක කෙනෙකුට, කුඩා දරුවෙකු සමඟ ප්‍රවාහනයේ යෙදෙන අම්මා කෙනෙකුට, pregnant අම්මා කෙනෙකුට, පොදුවේ ගත්තාම කාන්තාවකට අපේ පොදු ප්‍රවාහන සේවයේ ඇති දුෂ්කරතාව මොකක්ද, අපේ පොදු ප්‍රවාහන සේවයක ගමන් කිරීම කොච්චර අමාරුද කියන එක. එතකොට මෙවැනි තත්ත්වයන් තුළින් තමයි අපේ සමාජය තුළ කාන්තාව සමාජයෙන් ආන්තිකරණයට ලක් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම disabled අය ගැන කථා කළොත්, ඇත්තටම කථා කරන්න දෙයක් නැහැ. මොකද, අපේ පොදු ප්‍රවාහන සේවය කිසිසේත්ම ඒ අය ගැන හිතලා, ඒ අයට සංවේදී විධියට නොවෙයි සකස් වෙලා තිබෙන්නේ.

එතකොට පොදු ප්‍රවාහන සේවයකින් මොකක්ද අපි බලාපොරොත්තු වෙන්නේ? සමාජයේ සියලු කොටස්වලට පහසුවෙන් ප්‍රවේශ වෙන්න පුළුවන් විධියේ පොදු ප්‍රවාහන සේවයක් තමයි ශිෂ්ට සම්පන්න සමාජයක් තුළ බිහි විය යුත්තේ. ඒක සියලුදෙනාගේ අයිතියක්. ඒක එහෙම තමයි. ඒක එහෙම නොවෙන එක අපට කිසිසේත්ම පිළිගන්න බැහැ. මොකද, එය අනිවාර්යයෙන් එසේ විය යුතුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා මේ අරගෙන තිබෙන initiative එක, එහෙම නැත්නම් මේ ආරම්භය, මැදිහත්වීම මම හිතන්නේ සුළුපටු එකක් නොවෙයි. ඒක ඉතාම වැදගත් පියවරක් හැටියට මා දකිනවා. එය අපේ අය වැය තුළ අපි කථා කරන ඒ ශිෂ්ට සම්පන්න රට, වෙනස් වටිනාකම් මත සංවිධානය වෙන සමාජය, සියලුදෙනාම පිළිගන්න, සියලුදෙනාම කොටස්කරුවන් වන, සියලුදෙනාටම සහභාගි වෙන්න පුළුවන් සමාජයක් ගොඩනැඟීම කියන එක ප්‍රායෝගිකව පෙන්වපු අවස්ථාවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු අගමැතිතුමියනි, ඔබතුමියට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(මාණ්පුමිකු (කලානිති) හරිණි අමරසූරිය)
(The Hon. (Dr.) Harini Amarasuriya)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම ප්‍රවාහන අමාත්‍යාංශය තුළින් අරගෙන තිබෙන මේ පියවර කිහිපය තුළ අපේ අය වැය තුළ, අපේ රජයේ ප්‍රතිපත්තිය තුළ අන්තර්ගත වන සමානාත්මතාව, සාධාරණත්වය, සුරක්ෂිතභාවය කියන ඒ වටිනාකම් පෙන්නුම් කරනවා. ඒ සියලු කරුණු මේ මැදිහත්වීම් ගණනාව තුළින් පෙන්නුම් කරලා තිබෙනවා කියන එක මම ඉතාම ආඩම්බරයෙන් තමයි නිරීක්ෂණය කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ප්‍රවාහන අමාත්‍යාංශයෙන් තවත් ඉල්ලීමක් කරන්න කැමැතියි, අපේ පාසල් පද්ධතිය ගැනත් හිතන්න කියලා. අපි දන්නවා, පාසල් පද්ධතිය තුළ මේ වෙලාවේ දරුවන්ට ප්‍රවාහන සේවය ලබා ගැනීම කොච්චර අමාරු දෙයක්ද, ප්‍රවාහන පහසුකම් නැතිවීම තුළින්, ගමනාගමනයට සුදුසු තත්ත්වයෙන් මාර්ග නොතිබීම තුළින් ඉගෙනුම් අත්දැකීම කොච්චර කටුක වෙලා තිබෙනවාද කියලා. අපේ පාසල් පද්ධතිය තුළ පාසල් ගණනාවක් තිබෙනවා, ඉතාම අඩු ළමුන් සංඛ්‍යාවක් ඉන්න. ඒකට එක හේතුවක් තමයි, ප්‍රවාහන අපහසුතාව; ගමනාගමනයට සුදුසු තත්ත්වයෙන් මාර්ග නොතිබීම. ගමනාගමනයට සුදුසු තත්ත්වයෙන් මාර්ග නොතිබීම තුළින් සිද්ධ වෙන්නේ දරුවන්ට පාසලට යන්න බැරිවීම විතරක් නොවෙයි, අපට ගුරුවරුන්ව එවැනි පාසල්වලට යොමු කරන්නත් නොහැකි වනවා. විශේෂයෙන්ම අපට මහහැරුණු, අමතක වෙච්ච, පොදු සමාජයෙන් දුරස් වෙච්ච අය මේ සමාජයේ කොටස්කරුවන් කර ගැනීම සඳහා මාර්ග ඇතුළු ප්‍රවාහන පද්ධතිය අපට අතිශයින්ම වැදගත් වෙනවා.

මට මතකයි, Southern Expressway එක හැදුණාම අපි සතුටු වුණු බව, අපට පැයෙන් ගාල්ලට ගිහිල්ලා dinner අරගෙන එන්නත් පුළුවන් කියලා. කමක් නැහැ, ඒවාත් හොඳයි. නමුත්, අපේ මාර්ග පද්ධතිය ගැන හිතනකොට අපේ ප්‍රමුඛතා මොනවාද? දුර බැහැර ඉන්න කෙනෙකුට චිත්‍රපටයක් නරඹන්න එන්න, නාට්‍යයක් නරඹලා ආපහු රෑ 7ට, 8ට, 9ට, 10ට ගෙදර යන්න සිදුවන අවස්ථා තිබෙනවා. ඒවා ගැන අපි හිතලා නැහැ. නමුත් මේවාත් අපට අතිශයින්ම වැදගත් දේවල්. මේවා ශිෂ්ට සම්පන්න සමාජයකට අතිශයන්ම වැදගත් දේවල්. මේ පහසුකම් සුළු පිරිසකට හෝ තෝරා ගත් ප්‍රජාවකට විතරක් තිබිය යුතු දේවල් නොවෙයි. සතුට, විඳදනය, සංස්කෘතිය කියන එක කිහිපදෙනෙකුට විතරක් සීමා කරන්න බැහැ. ඒක මනුෂ්‍යයන් හැටියට අප සියලුදෙනාටම තිබෙන අයිතිවාසිකමක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම නැවත වතාවක් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. මම ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරීන්ට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, අපේ ආණ්ඩුවේත්, අපේ අය වැය තුළත් අපි පාදක කරගත් වටිනාකම් පෙන්නුම් කරමින් ඒ වටිනාකම්වලට ප්‍රායෝගික පණක් ලබා දීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 3.49]

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(මාණ්පුමිකු ජීවන් තොණ්ඩමාන්)
(The Hon. Jeevan Thondaman)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கௌரவ பிரதமர் அவர்கள் மிகவும் கண்ணியமாகச் சொல்லியிருந்தார், குழந்தைகளுக்கும் பெண்களுக்கும் போக்குவரத்தின்போது கட்டாயம் பாதுகாப்பு வழங்கியாக வேண்டும் என்று. இன்றைக்கு நடந்த ஒரு விஷயத்தை நான் எல்லோருக்கும் தெளிவுபடுத்த விரும்புகின்றேன். கௌரவ பிரதமர் அவர்களே, headphoneஜப் போட்டுக்கொண்டால் நல்லது. இன்றைக்கு ஹற்றனில் நடந்த ஒரு விஷயத்தை நான் உங்களுக்குச் சொல்ல விரும்புகின்றேன். நுவரெலியா மாவட்டத்தில் school போகின்ற சில பிள்ளைகள் SLTBக்குச் சொந்தமான Busஇல் ஏறியிருக்கிறார்கள். அவர்கள் busஇல் ஏறும்போது, bus

conductor உடன் வாக்குவாதம் ஏற்பட்டு இருக்கின்றது. இதன்போது, bus conductor மிகத் தவறான முறையில் நடந்திருக்கிறார். அதாவது, தவறான சொற்களைப் பாவித்து, அந்தப் பிள்ளைகளை busஇலிருந்து வலுக்கட்டாயமாக இறக்கியிருக்கிறார். இதன்போது அந்த bus conductor சொல்லியிருக்கிறார், "இது என்னுடைய பஸ்; யாரை உள்ளே வைத்திருப்பது, யாரை வெளியே அனுப்புவது என்பது என்னுடைய இஷ்டம். வெளியே போங்க!" என்று.

கௌரவ பிரதமர் அவர்களே, கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களே, நான் இங்கு ஒரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். 50 வருடங்களுக்கு முன்னர், இந்த நாட்டில் இனவாதம் தலைதூக்கி ஆடும்போது, எந்தத் தவறும் செய்யாத மலையக மக்களை இதே மாதிரி busஇலிருந்து இறக்குவது, stationsக்கு உள்ளே போக விடாமல் வைத்திருப்பது எனப் பல விஷயங்களைச் செய்தார்கள். இப்போது திரும்பவும் அந்த நிலைமை வருகின்றது என்றால், அது பிரச்சினைதான்! இதற்கு நீங்கள்தான் அல்லது அரசாங்கம்தான் காரணம் என்று நான் சொல்ல வரவில்லை. நீங்கள் இந்த bus conductorமீது நடவடிக்கை எடுப்பீர்கள் என்று நம்புகின்றேன். ஏன் நான் இதைச் சொல்கின்றேன் என்றால், -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු නිසා මම මේ කාරණය කියන්න කැමැතියි. මම මීට පැය දෙකකට කලින් කිව්වා, ඊයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වූ සිද්ධියට සම්බන්ධ වූ කොන්දොස්තරවරයාගේ සේවය අත්හිටුවා තිබෙන බවත්, ඔහුට විරුද්ධව විනය පරීක්ෂණ ක්‍රියාත්මක වන බවත්. අපි එම දරුවන් වෙනුවෙන් අමාත්‍යාංශයක් විධියට අපේ කනගාටුව ප්‍රකාශ කරලාත් තිබෙනවා. සීසන් හාවිත කර බස් රථවල ගමන් කරන දරුවන් ඇතුළු මගීන් කිසිම කෙනෙකු මහ දාලා යන්න එපා කියන තීන්දුව අපි අරගෙන මේ වනකොට සති කිහිපයක් වෙනවා. නමුත්, එම තීන්දුව අරගෙන තිබියදීත් වූ මෙම සිදුවීම පිළිබඳව අපි ඒ දරුවන්ගෙන් සමාව ඉල්ලනවා.

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
இவ்விடயம் குறித்து நடவடிக்கை எடுத்திருப்பதற்கு கௌரவ சபை முதல்வர் அவர்களுக்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அந்த bus conductorஐ சேவையிலிருந்து இடைநிறுத்துவதோடு மட்டும் நின்றுவிடாது, எடுக்கப்பட்ட நடவடிக்கை நிரந்தரமாக இருக்க வேண்டும். ஏனென்றால், நிறைய இடங்களில் இவ்வாறு தற்காலிகமாக சேவையிலிருந்து இடைநிறுத்திவிட்டு, ஆறு மாதங்கள் கழித்து மீண்டும் சேவையில் இணைத்துக் கொள்வார்கள். இதை நீங்கள் கருத்தில் எடுப்பீர்களென்று நம்புகின்றேன்.

அடுத்து, வீதி அபிவிருத்தி சம்பந்தமாக ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். நான் நீர் வழங்கல் அமைச்சைப் பொறுப்பேற்கும்போது, அது மாதத்துக்கு கிட்டத்தட்ட 3,200 மில்லியன் ரூபாய் lossஇல் போய்க்கொண்டிருந்தது. அதைச் சரியான முறையில் நடத்தி, கிட்டத்தட்ட 6,000 மில்லியன் ரூபாய் இலாபத்தைக் காண்பித்தோம். அதன்பிறகு, நாங்கள் அப்போது சனாதிபதியாக இருந்த ரணில் விக்கிரமசிங்ஹ அவர்களிடம் ஒரு கோரிக்கை விடுத்திருந்தோம். அதாவது, "நாங்கள் இலாபத்தை காண்பித்திருக்கிறோம். தயவுசெய்து, அதை மலையக மக்களுக்கு ஓர் அபிவிருத்தி நிதியாக ஒதுக்கீடு செய்து தாருங்கள்!" என்று. நாங்கள் கேட்டதுபோலவே, அவர் வீதி அபிவிருத்திக்காக நிதி ஒதுக்கீடு செய்திருந்தார். அந்த நிதி ஒதுக்கீட்டின் ஊடாக நாங்கள் பொகவந்தலாவையில் இருந்து லொய்னோன் செல்லும் 4.2 கிலோமீற்றர் roadஐப் புனரமைத்து இருக்கின்றோம். அதில் இன்னும் அரை கிலோமீற்றர் புனரமைக்கவேண்டி இருக்கின்றது. அதே போன்று, பொகவந்தலாவையில் இருந்து கியூக்குச் செல்லும் 3 கிலோமீற்றர் வீதியைப் புனரமைத்து இருக்கின்றோம். நோர்வூட் - பொகவந்தலாவை வீதியில் 12 கிலோமீற்றரைப் புனரமைத்து இருக்கின்றோம். அதில் 2 கிலோமீற்றர் புனரமைக்கவேண்டி இருக்கின்றது. அதையும் கட்டாயம் புனரமைத்தாக வேண்டும்.

அதுமாத்திரமன்றி, போடைஸ் - பட்டல்கல 4 கிலோமீற்றர் வீதியைப் புனரமைத்து இருக்கின்றோம். கொட்டகலையில் இருந்து KGKக்கும் செல்லும் 5 கிலோமீற்றர் வீதியைப் புனரமைத்து இருக்கின்றோம். கால்ட்டன் - பீகன்ட்பீல்ட் இரண்டரைக் கிலோமீற்றர் வீதியைப் புனரமைத்து இருக்கின்றோம். வட்டகலயில் 5 கிலோமீற்றர் வீதியைப் புனரமைத்து இருக்கின்றோம். சந்திரி கிராமத்திலிருந்து போயிஸ்லன்ட் வரையுள்ள 5 கிலோமீற்றர் வீதியைப் புனரமைத்து இருக்கின்றோம். அதில் 2 கிலோமீற்றர் புனரமைக்கவேண்டி இருக்கின்றது. நாகசேனா - பசுமலை வீதியில் 4 கிலோமீற்றரைப் புனரமைத்து இருக்கின்றோம். ஹற்றன் - போடைஸ் வீதியில் 17 கிலோமீற்றரைப் புனரமைத்து இருக்கின்றோம். இவ்வாறு நாங்கள் பிரதானமாக இருந்த வீதிகளின் பிரச்சினைக்கு முடிவு கட்டி இருக்கிறோம். ஆனாலும், ஒரேயொரு பிரச்சினை இருக்கிறது. அதாவது, இன்னும் மலையகத்தில் கிட்டத்தட்ட 294 கிலோமீற்றர் வீதி புனரமைக்கப்படாமல் இருக்கின்றது. அந்த roadsஐப் புனரமைப்பதற்கான transportation of materialsஇன் விலை மிக அதிகம் என்பதால் நிறைய contractors மலையகத்தில் வேலை செய்வதற்கு மறுக்கிறார்கள். உதாரணத்துக்கு, Dayagama road, Frotoft roadஐ எடுத்துக்கொள்வோம். இவை நீண்ட காலமாகப் புனரமைக்கப்படாமல் இருக்கின்றன. இவற்றுக்கு நாங்கள் என்னதான் நிதி ஒதுக்கீட்டைச் செய்தாலும், அதைப் பாரமெடுத்து வேலை செய்வதற்கு contractor யாரும் முன்வருவதில்லை. இது தொடர்பில் அவர்களிடம் கேட்டால், BSR rateஐ உயர்த்த வேண்டுமெனச் சொல்கிறார்கள். தயவுசெய்து, அதையும் கௌரவ அமைச்சர் அவர்கள் கருத்தில் எடுக்க வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் ஏற்கெனவே முன்னெடுக்கப்பட்ட வேலைகளை நிறுத்தாமல் தொடர்ச்சியாகச் செய்துகொண்டு போகின்றீர்கள். அதற்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மலையகத்தில் இருக்கின்ற வீதிகளில் Dayagama roadஉம் Frotoft roadஉம் மஸ்கெலியாவில் இருக்கும் St. Andrew's Upper Roadஉம்தான் பாரிய பிரச்சினையாக இருக்கின்றன. நீங்கள் இவற்றைக் கட்டாயம் புனரமைப்பீர்கள் என்று நான் நம்புகின்றேன். அதற்கு எங்களுடைய முழுமையான ஆதரவைக் கொடுப்போம்.

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

கௌரவ பிரதி அமைச்சர் அவர்கள்கூட, ஹற்றனுக்கு வந்து இவற்றைக் கண்காணித்தார். இந்த road வேலைகளை எல்லாம் முடித்தால், அடுத்த மாதமே திறப்புவிழாவை வைத்து, அவருக்கு முதல் மாலையை நானே மிகவும் சந்தோஷமாகப் போடுவேன். அதில் எனக்கு எந்தப் பிரச்சினையும் இல்லை.

அடுத்து, வீட்டுத்திட்டம் சம்பந்தமாகப் பார்ப்போம். இன்று நாங்கள் பேசுவது இந்திய வீட்டுத்திட்டம் சம்பந்தமாக அல்ல. அமைச்சின் ஊடாக மேற்கொள்ளப்படுகின்ற வீட்டுத்திட்டம் சம்பந்தமாகத்தான் பேசுகிறோம். கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் வீடமைப்பு அமைச்சராக இருக்கும்போது, மலையகத்தில் வீடுகள் அதிகளவு அமைக்கப்படவில்லை. காரணம் என்னவென்றால், இந்திய வீட்டுத்திட்டம் இருப்பதனால் அமைச்சினூடாக வீடு கொடுக்கத் தேவையில்லை என்ற தவறான எண்ணம் இருந்ததுதான். 2025ஆம் ஆண்டுக்கான Budgetஇல் மலையகம் சார்ந்த அமைச்சுக்கு வெறுமனே 387 வீடுகளுக்கு மட்டும்தான் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அதாவது, இலங்கை அரசாங்கத்தின் ஊடாக 387 வீடுகள் அமைப்பதற்கு மாத்திரமே நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. இந்திய அரசாங்கத்தின் ஊடாக 1,300 வீடுகள் அமைக்கப்பட இருக்கின்றன. தயவுசெய்து, NHDA - தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை - மூலமான நிதி ஒதுக்கீட்டை அதிகரிக்க வேண்டும்.

மலையகத்தில் வீடு கட்டுவதைவிட, அங்குள்ள மக்களுக்குக் காணி உரிமை வழங்குவதே பொருத்தமானது. இதைத்தான் நாங்கள் ஒவ்வொரு பாராளுமன்ற அமர்விலும் ஆலோசனையாக முன்வைத்து வருகின்றோம். நான் ஏற்கனவே சொன்னதுபோல மலையகத்தில் 251,000 குடும்பங்கள் வீடு இல்லாமல் இருக்கின்றன. இந்திய அரசாங்கம் மூலமாக ஏற்கெனவே எங்களுடைய மக்களுக்கு 4,000 வீடுகள் கிடைத்திருக்கின்றன. அதைவிட, இன்னும் 10,000 வீடுகள் இருக்கின்றன. இங்குள்ள வாய்ச்சொல் வீரர்கள் என்னதான் தாங்கள் 5,000 வீடுகளைக் கட்டுவோம், 10,000 வீடுகளைக் கட்டுவோம் என்று சொன்னாலும், இந்த வருடத்தில் உங்களால் ஆகக் கூடியது 1,000 வீடுகளைத்தான் கட்டிமுடிக்க முடியும். எனினும், மலையகத்திலுள்ள வீட்டுப் பிரச்சினை தீராது. அதுதான் உண்மையான நிலவரம்!

பெருந்தோட்ட நிறுவனங்களுக்குச் சொந்தமான 204,000 ஹெக்டெயார் காணியில் ஒரு குடும்பத்துக்கு பத்து பேர்ச்சஸ் வீதம் கொடுத்தால்கூட, கிட்டத்தட்ட 4,777 ஹெக்டெயார் காணிதான் மலையக மக்களுக்குக் காணி உரிமை வழங்குவதற்குத் தேவைப்படும். இதற்காக நாங்கள் கடந்த அரசாங்கத்தில் 2,000 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்திருந்தோம். ஆனால், இன்றைக்கு அந்த 2,000 மில்லியன் ரூபாய் காணி உரிமை வழங்குவதற்குப் போதாது. எங்களுடைய மக்களுக்குக் காணி உரிமைதான் அத்தியாவசிய மானது. சலுகை அரசியலானது மலையக மக்களுடைய வாழ்க்கையை மாற்றப்போவது கிடையாது. இன்று நான் பாராளுமன்றத்தில் இருப்பேன்; நாளை இருக்க மாட்டேன். எல்லோருக்கும் அதே கதிதான். ஒரு மாற்றம் தேவையென்றால், கட்டாயம் எங்களுடைய மக்களுக்குக் காணி உரிமையை வழங்கித்தான் ஆக வேண்டும். நாங்கள் அமைச்சைப் பாரமெடுத்து ஒரு வருடத்தில் 629 வீடுகளைக் கட்டி முடித்தோம். அதுதவிர, இந்திய அரசாங்கம் மூலமாகக் கிடைத்த 1,300 வீடுகளில் 600 வீடுகளைக் கட்டுவதற்குத் தொடங்கினோம். மாண்புமிகு சனாதிபதி அவர்களின் கொள்கைப் பிரகடன உரையில் ஒரு விடயம் கூறப்பட்டது. அதாவது, தற்போது இருக்கின்ற 'லயன்' தொடர் குடியிருப்பை renovate பண்ணுவதாகக் கூறப்பட்டது. அதற்குப் பதிலாக அவற்றை முழுமையாக இடித்துவிட்டு காணிகளை மக்களுக்குக் கொடுத்தால் அவற்றில் அவர்களே வீடுகளைக் கட்டிக் கொள்வார்கள்.

இன்றைக்கு நிறையப் பேர் நினைக்கிறார்கள், மலையக மக்களால் வீடுகளைக் கட்டிக்கொள்ள இயலாது என்று. அது தவறு! நான் இன்றைக்கும் சொல்கின்றேன், அவர்களின் கையில் காணியை ஒப்படைத்தால் அவர்கள் வீடுகளைக் கட்டிக் கொள்வார்கள். தோட்டத்தில் வேலை செய்பவர்களாக இருந்தாலும் சரி, தோட்டத்தில் வேலை செய்யாதவர்களாக இருந்தாலும் சரி, அவர்களால் தங்களது சொந்த வீட்டை கட்டாயம் கட்டிக்கொள்ள முடியும். அவர்களுக்கு ஒரு வாய்ப்புக் கொடுத்தால்தானே தெரியும்! நான் அமைச்சராக இருக்கும்போது, அதற்கு அவ்வளவு அரசியல் எதிர்ப்பு இருந்தது. காரணம் என்னவென்றால், இந்த மக்களுக்குக் காணியைக் கொடுத்தால் அவர்கள் அதனை விற்று விடுவார்களாம்! அவர்கள் காணியை விற்கிறார்களோ, வைத்துக்கொள்கிறார்களோ அது எங்களுடைய பிரச்சினை இல்லையே! இன்று நாடளாவிய ரீதியில் எல்லோருக்கும் காணி உறுதிப்பத்திரம் வழங்கப்படுகின்றது. ஆனால், மலையக மக்களுக்கு மட்டும் வழங்கப்படுவதில்லை.

உங்களுக்கு ஐந்து வருடங்கள் இருக்கின்றன. அதுமாத்திரமன்றி, உங்களிடம் 2/3 பெரும்பான்மை பலமும் இருக்கின்றது; மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்களும் இருக்கிறார்கள். யாராவது ஓர் உறுப்பினர் எழுந்து சொல்லட்டும், ஜீவன் தொண்டமான் சொல்வது தவறு என்று. நான் அதை ஏற்றுக்கொள்கின்றேன். உண்மை என்னவென்று அவர்களுக்கும் தெரியும்; எனக்கும் தெரியும்! வீட்டை வைத்து அரசியல் செய்ய முடியாது. எங்களுடைய மக்களுக்குக் காணி உரிமையை வழங்கியாக வேண்டும். அதற்கு நாங்கள் முழுமையான ஒத்துழைப்பைக் கொடுப்போம். அது சம்பந்தமான ஆலோசனை எங்களிடம் இருக்கின்றது; ஆவணம் அமைச்சில் இருக்கின்றது. அதை எடுத்துப் பார்த்தால் உங்களுக்கே புரியும், காணி உரிமை வழங்குவதற்கு நாங்கள் அமைச்சரவையில் மூன்று முறை அங்கீகாரம் பெற்று இருக்கின்றோம் என்பது. அதனை அமுல்படுத்துவது மட்டும்தான் இருக்கின்றது. எனவே, நீங்கள் அதையும் கருத்தில் எடுப்பீர்களென நான் எதிர்பார்க்கின்றேன்.

Hon. Prime Minister, I would like to bring up just one more matter. I believe at a previous Parliamentary Sitting, my Colleague, the Hon. D.V.Chanaka had brought up an important matter regarding the chromium content in the water that is being supplied. He had initially mentioned - *[Interruption]* I understand that the Minister concerned is not here, but I want to bring it to your notice. I believe even the Minister of Fisheries had retaliated quite aggressively regarding this. It has been mentioned that hydrated lime containing 14 mg of chromium has been brought in. But, anything above 10 mg of chromium will cause liver-related diseases, CKD and so on and so forth; it creates a lot issues. So, we asked you all to test it and bring it down to 10 mg. I believe this morning, the Hon. Deputy Minister for Environment has mentioned, “No, we have brought it down to 12 mg” and when questioned whether it has been tested or not, he said, “We will try it out and then test it". Hon. Prime Minister, I would like to sincerely make a request. There is an institution called the

JRDC - Joint Research and Demonstration Centre for Water Technology - under the National Water Supply and Drainage Board, which is based in the University of Peradeniya. So, I put forward a humble request to send these samples across to the JRDC, which is a Government institution and a Government plant, get it tested and curtail it below 10 mg because anything beyond that is going to be harmful to the people.

Likewise, Hon. Leader of the House, with all due respect, I must address one statement you had made regarding former President Ranil Wickremesinghe. Earlier, you had mentioned that, after his interview with Al Jazeera, he may have suffered brain damage. Hon. Leader of the House, I must tell you again - I do have a lot of respect for you - that we should understand that, today, people have voted for me not to defend the Hon. Ranil Wickremesinghe at every given chance. Similarly, people have also voted for you to change the political culture and the administration in this country, not for petty insults, if I my say so. I can only imagine had you been there, they would have had to call for a stretcher or an ambulance to get you out after the first question or what is even worse is, God forbid, if the President had been there, we would have had to check his pulse, I am just saying.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
I only mentioned about the Ferrari licence.

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
No, no. - *[Interruption.]* See, the Hon. (Dr.) Kavinda Jayawardhana is getting very angry that you had insulted former President Ranil Wickremesinghe.

Madam, I am just trying to say that we are all trying to work together, and given the current geopolitical climate with America going on a trade war with China, Mexico and Canada, we are going to face a risk of increased inflation and not only that, but also decreased demand, especially for our exports. I think to gear up for that, we all must come together regardless of there being one party with a majority and 13 parties in the Opposition. I would like to say that we are looking forward to work with you all and my suggestion would be to create an inter-party action committee, where we can actually come together, discuss and come to solutions concerning the Sri Lankan people.

Thank you.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු අග්‍රාමාත්‍යතුමිය ප්‍රකාශ කළ පරිදිම පාසල් දරුවන් සඳහා ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව විසින් "සිසුසැරිය" නමින් බස් සේවයක් කාලයක් තිස්සේ පවත්වාගෙන යනවා. දැනට බස් 1,500කින් ඒ සේවය ලබා දෙනවා. අපි මේ වසරේ පාසල් බස් රථ ප්‍රමාණය 2,000ක් දක්වා වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමිය අධ්‍යාපන අමාත්‍යාංශය හරහා දැනුවත් කරනවා නම් මේ සේවය දුෂ්කර ප්‍රදේශවල පාසල්වලට ලබා ගන්න පුළුවන් කියලා, මම හිතනවා, ඒක වැදගත් කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජගත් විතාන මන්ත්‍රීතුමා කිව්වා, licence transfer කරන එක ගැන. ඒක තිබෙන්නේ NTC එකට, National Transport Commission එකට. අපි ඒ පනතට අදාළ සංශෝධනය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරලා පනත සංශෝධනය කරලා තිබෙනවා. ඒක ගැසට් කරන්න යවලා තිබෙන්නේ. ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තාට පසු, එම ownership transfer කරන එක NTC එකට අයිති බස්වලටත් කරන්න පුළුවන්කම ලැබෙනවා. අපි හිතනවා, ඉදිරි මාස කිහිපය තුළදී ඒක කරන්න පුළුවන්කම ලැබෙයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ටී.බී. සරත් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.02]

ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்புப் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය පිළිබඳව අද සාකච්ඡා කරද්දී විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන්ගෙන් කියවුණු දේ තමයි කලින් හිටපු බොහෝ ඇමතිවරු නිවාස ප්‍රශ්නය පිළිබඳ කාරණයේදී ඒ අමාත්‍යාංශය විද්‍යානුකූලව මෙහෙයවූයේ නැහැ කියන එක. විශේෂයෙන් මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් කිව්වා, අමාත්‍යාංශය විද්‍යානුකූලව මෙහෙයවීමක් තිබුණේ නැහැ කියලා.

අපේ රටේ බොහෝ කාලයක්, විශේෂයෙන් 1977න් පස්සේ ජනාධිපතිවරු මූලික කරගෙන, ජනාධිපති සිහින දකිමින් තමයි මේ නිවාස අමාත්‍යාංශය ක්‍රියාත්මක වුණේ. ඒ වුණත් අපේ රටේ ජනතාවගෙන් තවමත් සාතිශය බහුතරයකට නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න හැකියාවක් ලැබිලා නැහැ. ඒ වාගේම රටේ ජනතාවත් නිවාසයක් ගැන සිහින මවමින් ඉන්නවා. මේ නිවාස සිහිනය ඉටු නොවුණ මූලික හේතුව තමයි, ජනාධිපති සිහින දකිමින් බොහෝ කාලයක් -අවුරුදු 30ක්, 40ක්- මේ නිවාස අමාත්‍යාංශය මෙහෙයවා තිබීම. ඊට කලින් ගත්තොත්, කොළඹ නගරයේ නිවාස ඉදිකිරීමේදී යම් විද්‍යානුකූලභාවයකින් ඒ කටයුතු මෙහෙයවීම පිළිබඳව පීටර් කෙනමන් මහතාට යම් ප්‍රසාදයක් තිබෙනවා. එතුමා අමාත්‍යවරයා විධියට කටයුතු කරනකොට යම් විද්‍යානුකූලභාවයකට මේ අමාත්‍යාංශය මෙහෙයවූවාය කියා ප්‍රසාදයක් තිබෙනවා. එතැනින් පස්සේ ගත්තොත්, විශේෂයෙන් මෑත ඉතිහාසයේ 2015-2019 කාලයේ ආදර්ශ ගම්මාන පිහිටුවීමේදී නිවාස 4,313ක් ආදර්ශ ගම්මාන 313ක් මූලික කරගෙන හදලා තිබෙනවා. මේ නිවාස 4,313න් නිවාස 779ක දැනටත් පදිංචි වෙලා නැහැ. ඒ කියන්නේ, මේ නිවාස ලබා දීලා තිබෙන්නේ නිවාස අවශ්‍ය අයට නොවෙයි. මේ නිවාස 4,313න් නිවාස 1,000කට, 1500කට වඩා කුලියට දීලා තිබෙනවා, දැනටත්.

2015-2019 කාලයේ නිවාස 343,769ක් හදනවා කියලා කයිවාරු ගැහුවාට, එවැනි නිවාස ප්‍රමාණයක් හැදිලා නැහැ. ඒ සඳහා රුපියල් මිලියන 58,712ක් වෙන් කරලා තිබෙනවා. ඒකෙන් නිවාස 238,852ක් හැදුවා කියලා සඳහන් වුණාට, ඒවා

[ගරු ටී.බී. සරත් මහතා]

නිවාස විධියට නොවෙයි හදලා තිබෙන්නේ. සමහර ඒවාට සිමෙන්ති කොට්ට දහයක් දුන්නාමත් නිවාසයක් හැදිලා තිබෙන විධියට සඳහන් වෙලා තිබෙනවා. සිමෙන්ති කොට්ට 20ක් දුන්නාම නිවාසයක් හැදිලා තිබෙන බවට සඳහන් වෙලා තිබෙනවා. රුපියල් 20,000ක වෙක් එකක් ලියලා දුන්නාම නිවාසයක් හැදිලා තිබෙන බවට සඳහන් වෙලා තිබෙනවා. එහෙම තමයි මේ සංඛ්‍යාලේඛනවල තිබෙන්නේ. මේ කියන 343,769ක නිවාසවලින් නිවාස 91,459ක් බාගෙට ඉදිකළ ඒවා. ඒ කියන්නේ, foundation මට්ටමේ තිබෙන්නේ, බිත්ති බැඳලා නැහැ. එහෙම නිවාස 91,459ක් තිබෙනවා.

ඒ නිවාසවලින් නිවාස 45,117ක් හදනවා කියලා රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ රුපියල් මිලියන 15,444ක් වෙන් කර තිබෙනවා. හැබැයි, 2024.06.18වැනි දා වනවිටත් මේ නිවාස හදපු බවට හරියට සංඛ්‍යාලේඛන නැහැ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පමණක් එක කාලයක නිවාස 68,097ක් හදන්න යෝජනා වෙනවා. හැබැයි, නිවාස හදලා තිබෙන්නේ -සිමෙන්ති කොට්ට බෙදලා තිබෙන්නේ- 30,840යි. නිවාස 37,257ක් හදලා නැහැ. ඒක තමයි අද දිලිප් වෙදආරච්චි මහත්මයා අදෝනා නැඟුවේ, නැවත මේවා කරන්න කියලා. මෙහෙම සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළාට ඒවා මහ පොළොවේ යථාර්ථයක් කරන්න බැහැ. යථාර්ථයක් කරන්න බැරි හේතුව තමයි, ඒ ආකාරයේ විස්මිත නිවාස මවන්න හැකියාවක් නැහැ, තිබෙන තත්ත්වයට සාපේක්ෂව ගත්තොත්.

2015-2019 කාලය තුළත්, ඉන් අනතුරුවත් දේශපාලන අධිකාරිය රජයේ මුදල් ලබාගෙන විනිවිදභාවයකින් තොරව නිවාස ඉදිකිරීමේ කටයුතු කළ නිසා තමයි මේ විනාශය සිද්ධ වෙලා තිබෙන්නේ. විශේෂයෙන් 2015-2019 කාලයේ අත්තිවාරම් පමණක් යෙදූ නිවාස පමණක් 45,117ක් තිබෙනවා. මේ ආකාරයට ජනාධිපති සිහින දකිමින් සෑම තැනකම නිවාස හදනවා කියලා අත්තිවාරම් දැමීම නිසාම, දැන් අපි මේ නිවාස හදන්නේ කොහොමද කියන අභියෝගයට මුහුණ දීලා තිබෙනවා. අපේ ආණ්ඩුව මේ අවුරුද්දේ රුපියල් ලක්ෂ 2,000ක් මේ කටයුතු සඳහා වෙන් කර තිබෙනවා, ඒවායෙන් යම් ප්‍රමාණයක් හෝ හදන්න.

ඒ වාගේම 2019 වසරේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ක්‍රීඩා ජයග්‍රහණ ලබා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට නිදහස් දීමනාවක් වශයෙන් එවකට අඟුලාන, සයුරුපුර, "තිළිණ" මහල් නිවාසයෙන් ගෙවල් දෙනවා කියලා මාධ්‍ය සන්දර්ශනයකුත් තිබ්බා, එවකට හිටපු නිවාස ඇමති, අද විපක්ෂ නායකතුමා. හැබැයි, මේ ගෙවල් නිකම් දෙනවා කිව්වාට එතුමාම අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර තිබෙනවා, එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා. මෙහෙම තමයි එදා කටයුතු කර තිබෙන්නේ. පැවති රජයන් පටන් ගත්ත සමහර ව්‍යාපෘති ගත්තොත්, රන්පොකුණුගම නව නිවාස ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 259යි, වැඩ නිම කර තිබෙන්නේ සියයට 28යි. හැබැයි, සියයට 50ක් වියදම් කර තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් මිලියන 96.7ක් වියදම් කර තිබෙනවා. යක්කල, වැරැල්ලවත්ත නිවාස ව්‍යාපෘතියට වෙන් කළ මුදල රුපියල් මිලියන 1,331යි. සියයට 6යි වැඩ නිම කර තිබෙන්නේ. රුපියල් මිලියන 173ක් වියදම් කර තිබෙනවා. මෙම නිවාස ව්‍යාපෘතිය මහල් 12කින් යුක්ත ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර, නාගරික සංවර්ධන අධිකාරියෙන් මූලික සැලසුම් අනුමැතියක්වත් ලබා නොගෙන කටයුතු කර තිබෙනවා. අමාත්‍ය මණ්ඩලය නොමඟ යවමින්, අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා නොගෙන, ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව, අතිවිශාල මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබා දීමෙන් එම මුදල් උපකොන්ත්‍රාත්කරුවන් මඟින් එවකට සිටි රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මහතා විසින් වංචා කර ඇති අතර, අද වන විටත් මෙම ඉදිකිරීම් කර තිබෙන්නේ සියයට 6කට වඩා අඩු ප්‍රමාණයක්. සමහර එ්වායේ ලිපිගොනු සොයා ගන්නත් නැහැ.

ඒ වාගේම මැතින් ටවුන් නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ගණනාවක් දේශපාලන හිතවතුන්ට නොමිලේ ලබා දීලා තිබෙනවා. ඒකේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ නමටත් නිවාසයක් තිබෙනවා. එකට අදාළ එක වාරිකයක් පමණක් ගෙවලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

සජිත් ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ අතිරික්ත ලෙස සේවකයන් 2,336 දෙනෙක් බඳවාගෙන තිබෙනවා. ඒ අය ජාතික නිවාස සංවර්ධන අධිකාරියට බරක් වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒ බඳවා ගත් අතිරික්ත සේවකයන්ගෙන් 1,432ක් පසුගිය ආණ්ඩුව එළියට දාලා තිබෙනවා. ඒගොල්ලන් එක්ක නඩු කියන්න රුපියල් ලක්ෂ 150කට වඩා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට වියදම් කරන්න සිදු වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. වීර මාවත, වියත්පුර නිවාස සංකීර්ණයෙන් මන්ත්‍රීවරුන්ට නිවාස ලබා දීලා තිබෙනවා. අරගළය වෙලාවේ මන්ත්‍රීවරුන් පිරිසකගේ නිවාස ගිනි තැබුවාට පස්සේ මන්ත්‍රීවරුන් 76දෙනෙකුට නිවාස ලබා දෙන්න කියලා හිටපු කථානායකවරයාගෙන් ඉල්ලා තිබෙනවා. ඒ නිවාස ලබා දීමේදී, එම නිවාසවල මුළු වටිනාකම ගෙවන්න බැහැ කියලා ඒ මන්ත්‍රීවරු කියා තිබෙනවා. ඒ නිවාස සංකීර්ණයේ B Block එකේ නිවාස 101ක් තිබෙනවා. ඒකෙන් ඒ සඳහා නිවාස 76ක් වෙන් කර තිබෙනවා. ඒවා දීපු පදනම මා කියන්නම්. ඒ නිවාස හදන වෙලාවේ තිබුණු වටිනාකම අපි කියමු රුපියල් මිලියන 10යි කියලා. නිවාස හැදුවාට පස්සේ වටිනාකම රුපියල් මිලියන 20යි කියමු. මේ දෙක එකතු කළාම එන මිලියන 30 දෙකෙන් බෙදලා එන උත්තරයෙන් සියයට 25ක කොටසක් අවුරුද්දක් ඇතුළත ගෙවීම සහ ඉතිරි ටික අවුරුදු 15කින් ගෙවීම තමයි පදනම. සාමාන්‍ය අය මේ නිවසක් ගැනීමේදී මුළු මුදල වසරකින් ගෙවන්න ඕනෑ.

මට මේ ටික කියන්න පොඩි කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ නිවාස ලබා ගත් මන්ත්‍රීවරුන් මෙසේයි. ප්‍රසන්න රණතුංග මහත්මයාට වෙන් කරපු නිවසට රුපියල් මිලියන 9.9ක් ගෙවා තිබෙනවා; රජයට පාඩුයි, රුපියල් මිලියන 11ක්. මුස්මිල් මන්ත්‍රීතුමාට -දේශප්‍රේමී මන්ත්‍රීතුමාට- වෙන් කරපු නිවසට ගෙවා තිබෙන්නේ, රුපියල් මිලියන 3.3යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 10ක්. නිමල් පියතිස්ස මන්ත්‍රීතුමාට -දේශප්‍රේමී මන්ත්‍රීතුමාට- වෙන් කරපු නිවසට රුපියල් මිලියන 3.3යි ගෙවා තිබෙන්නේ; රජයට පාඩුයි, රුපියල් මිලියන 9.9ක්. ගාමිණී ජයනන්ද වලේබොඩ මන්ත්‍රීතුමාට වෙන් කරපු නිවසට රුපියල් මිලියන 3.3යි ගෙවා තිබෙන්නේ; රජයට පාඩුයි, රුපියල් මිලියන 9ක්. මහින්ද යාපා අබේවර්ධන මහත්මයාට -අපේ හිටපු කථානායකතුමාට- වෙන් කරපු නිවසට ගෙවා තිබෙන්නේ රුපියල් මිලියන 5.3යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 16ක්. ගාමිණී කුලවංශ ලොකුගේ මහත්මයාට -ගාමිණී ලොකුගේ මහත්මයාට- වෙන් කරපු නිවසට රුපියල් මිලියන 4යි ගෙවා තිබෙන්නේ; රජයට පාඩුයි, රුපියල් මිලියන 12ක්. කුමාරසිරි රත්නායක මහත්මයාට වෙන් කරපු නිවසට ගෙවා තිබෙන්නේ

රුපියල් මිලියන 3.3යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 9.9ක්. හම්බන්තොට අජිත් නිශාන්ත රාජපක්ෂ මහත්මයාට වෙන් කරපු නිවසට ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 4.2යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 12.6ක්. එතුමා හිටපු නියෝජ්‍ය කථානායකතුමා. කට්ටිය ලස්සනට බෙදාගෙනයි තිබෙන්නේ. චින්තක අමල් මායාදුන්න මහත්මයාට වෙන් කරපු නිවසට රුපියල් මිලියන 4.2යි ගෙවා තිබෙන්නේ; රජයට පාඩුයි, රුපියල් මිලියන 12ක්. මිලාන් සජිත් ජයතිලක මන්ත්‍රීතුමාට වෙන් කරපු නිවසට ගෙවා තිබෙන්නේ රුපියල් මිලියන 4.6යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 13ක්. තිසකුට්ටි ආරච්චිගේ චමින්ද ජනක මන්ත්‍රීතුමාට වෙන් කරපු නිවසට ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 4.1යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 12ක්. වීරසිංහ දේවගේ වීරසිංහ මහත්මයාට - අම්පාරේ වීරයාට- වෙන් කරපු නිවසට ගෙවා තිබෙන්නේ රුපියල් මිලියන 4.2යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 12ක්. අසංක සමිතජීව නවරත්න මහත්මයාට වෙන් කරපු නිවසට ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 3.3යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 9.9ක්. බණ්ඩාර හේරත් මහත්මයාට වෙන් කරපු නිවසට ගෙවා තිබෙන්නේ රුපියල් මිලියන 4.2යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 12ක්. අනුරාධපුරයේ එස්.එම්. චන්ද්‍රසේන මහත්මයාට වෙන් කරපු නිවසට ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 4.6යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 13ක්. දේවගේ ප්‍රියන්ත අශෝක මහත්මයාට වෙන් කරපු නිවසට ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 4.1යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 12ක්. නීතිඥ ප්‍රේමනාත් චමින්ද දොලවත්ත මහත්මයාට -ඒක තමයි හැමදාම කෝටි එක දාගෙන උසාවියට යන්නේ- වෙන් කරපු නිවසට ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 4.1යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 12ක්.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
කළුවර පුටු නැද්ද?

ගරු ටී.බී. සරත් මහතා
(මාණ්පුමිකු ரී.පි. சரத்)
(The Hon. T.B. Sarath)
කළුවර පුටු නැහැ.

හිටපු මුදල් රාජ්‍ය ඇමති එස්.ඒ. සේමසිංහ මහත්මයාට වෙන් කරපු නිවසට ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 4.6යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 13.8ක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித් தவிசாளர් அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු ටී.බී. සරත් මහතා
(මාණ්පුමිකු ரී.පි. சரத்)
(The Hon. T.B. Sarath)

ශාන්ත බණ්ඩාර මහත්මයාට වෙන් කරපු නිවසට ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 4.1යි; රජයට පාඩුයි, රුපියල් මිලියන 12.5ක්. මට මේ ඔක්කොම කියන්න කාලයක් නැහැ.

මන්ත්‍රීවරු 76දෙනෙක් නිවාස ඉල්ලා තිබෙනවා. මන්ත්‍රීවරු 26 දෙනෙකුට තමයි නිවාස ලබා දී තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ආකාරයට නිවාස ලබා ගත් මන්ත්‍රීවරු 26 දෙනාගේ නම් සහ ඒ පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි දැනගන්න කැමැතියි කලින් වන්දි ගත්තු කට්ටියත් ඔය අතර ඉන්නවාද කියලා.

ගරු ටී.බී. සරත් මහතා
(මාණ්පුමිකු ரී.පි. சரத்)
(The Hon. T.B. Sarath)
ඔව්, මේ අය අතර ඉන්නවා, වන්දි ගත්තු අයත්.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඒ කියන්නේ, වන්දිත් අරගෙන, ගෙවලුත් අරගෙන ද?

ගරු ටී.බී. සරත් මහතා
(මාණ්පුමිකු ரී.පි. சரத்)
(The Hon. T.B. Sarath)
වන්දි මුදලුත් අරගෙන තිබෙනවා. ඊට අමතරව ඒ අයගේ ගෙවල්වලට insurance මුදලුත් අරගෙන තිබෙනවා. ඊට අමතරව රජයේ ගෙවල් ටිකත් කුණු කොල්ලයට අරගෙන තිබෙනවා. අපට නම් හිතෙන්නේ ඒ ගෙවල් ගිනි තියාගත්තා ද දන්නේත් නැහැ කියලායි. අම්මපා, මේ මිනිස්සුන්ගෙ වැඩ! ජනෙල් ගිනි ගත් ඒවාටත් ගෙවල් අරගෙන තිබෙනවා. සමහර අයගේ ගෙවල්වල ජනෙල් තමයි ගිනි අරගෙන තිබෙන්නේ. ජනේලය ගිනි ගත් ඒවාටත් ගෙයක් අරගෙන තිබෙනවා. එහෙමයි ජනතා මුදල් අරගෙන තිබෙන්නේ. මේවා හෙළි වන කොට තමයි ඔය විපක්ෂය කුලප්පු වෙලා ඉන්නේ. එතකොට තමයි අර National Water Supply and Drainage Board එකේ හුණුගල් කැලි වාගේ අනං මනං මතක් වෙන්නේ. ගිලපුවා වමාරන්න බැරි වන කොට තමයි ඒ කැලි අරගෙන එන්නේ. ඒවාත් කොන්ත්‍රාත්. ඒ කොන්ත්‍රාත් ගත්තු මහත්මයාගේ කොන්ත්‍රාත් එක අහෝසි වෙලා තමයි ඔය කෑ ගහන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித් தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
දැන් කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු ටී.බී. සරත් මහතා
(මාණ්පුමිකු ரී.පි. சரத்)
(The Hon. T.B. Sarath)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්. මට තවත් විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මේ අවුරුද්දේ කොළඹ දිස්ත්‍රික්කයේ මහල් නිවාසවලට අයත් සියලු ගෙවල් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රුපියල් මිලියන 1,360ක් අපි වෙන් කරලා තිබෙනවා. ඔව්, මහල් නිවාසවල ප්‍රශ්න තිබෙනවා තමයි. ඒ ගැන ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් කිව්වා. ඒ වාගේම, මුළු රටේම ගෙවල් හදන්න අපි රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා. ඒ මුදල ගත්තොත්, ඇත්තටම 2015-2019 වසර 5 තුළ හදපු ගෙවල් සංඛ්‍යාව මේ අවුරුද්ද තුළ හදන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම රුපියල් මිලියන 2,850ක් ආධාර වශයෙන් ලබා දෙන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා. තවත් ගොඩක් දේවල් තිබෙනවා කියන්න. කාලය අවසන් නිසා මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කියපු, රජයට වෙච්ච පාඩුවට අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කරනවා ද?

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

රජයට වෙච්ච පාඩුව අය කර ගන්නවා. අපේ නව රජය ප්‍රතිපත්තිමය තීන්දු ගණනාවක් ගන්න ඕනෑ ඒ දේවල් ආපසු ගන්න. හේතුව, ඒ වෙලාවේ කැබිනට් මණ්ඩලයේත්, ඒ වාගේම මේ උත්තරීතර සභාවේත් අනුමැතිය අරගෙන තමයි ඒවා දීලා තිබෙන්නේ. රජයේ දේවල් හොරකම් කිරීම නීත්‍යානුකූල කරගෙනයි තියෙන්නේ. රජයේ දේවල් හොරකම් කරන්න නීත්‍යානුකූලභාවය හදාගෙනයි තිබෙන්නේ. අනෙක් නිවාස ලබා දීම අපි දැන් නතර කර තිබෙනවා. නිවාස 76ක් ඉල්ලා තිබියදී 26යි දීලා තිබෙන්නේ. ඉතිරි ඒවා නවත්වා තිබෙනවා. අපි ඒවා සම්බන්ධවත් නීත්‍යානුකූලව කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.18]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ම කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

මගේ කථාවට කලින් කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමා list එකක් ඉදිරිපත් කළා. ඒ lists ඉදිරිපත් කරන එක හොඳයි. හැබැයි, ඒවාට නීතිය ක්‍රියාත්මක කරන්න. Lists ඉදිරිපත් කරලා, අන්තිමට මිනිසුන්ට ඒ lists විතරක් ඉතිරි වෙයි. ඒකෙන් කාගේවත් බඩ පිරෙන්නේත් නැහැ, සමාජයට යමක් දැනෙන්නේත් නැහැ.

කෙසේ වෙතත්, ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන කථා කරන්න කලින් මට හිතුණා එතුමා කියපු තවත් කාරණයක් ගැන කියන්න. අපේ විපක්ෂයේ ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා කිව්වා ජලය පිරිපහදු කරන්න භාවිත කරන සංඝටකයක අන්තර්ගත ක්‍රෝමියම් ප්‍රතිශතය මිලිග්‍රෑම් 12 දක්වා වැඩි කිරීම පිළිබඳ කාරණාව. මීට පෙර කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමා ඒ කාරණාව ගෙවල් ගිනි තියපු එකට සමාන කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ක්‍රෝමියම් ප්‍රතිශතය මිලිග්‍රෑම් 12 දක්වා වැඩි කිරීම නිසා මේ රටේ අහිංසක මිනිසුන්ට පිළිකා ඇති වීමේ ප්‍රවණතාවක් තිබෙනවා. එදා කෙහෙළිය රඹුක්වැල්ල මේ රටේ අහිංසක මිනිසුන්ට බාල ඖෂධ ගෙනෙන කොට අපි ඒකට විරුද්ධව කථා කළා. මම තමයි ඔහුට විරුද්ධව මේ සභාවට විශ්වාසභංග යෝජනාවක් ගෙනාවේ. අදත් අපි මේ රටේ අහිංසක මිනිසුන්ගේ සෞඛ්‍යය වෙනුවෙන් පෙනී සිටිනවා. ඒක සමව්වලයට ලක් කරන්න එපා. ලෝකයේ කිසි දවසක එම ක්‍රෝමියම් ප්‍රතිශතය වැඩි කරන්නේ නැහැ, අඩු කරනවා විතරයි. ඒ කාරණය ඉදිරිපත් කරපු ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ප්‍රවාහන ක්ෂේත්‍රය අපට මෙච්චර වැදගත් වෙන්නේ ඇයි කියලා අපි කථා කරමු. ලෝකයේ සාමාන්‍ය පුද්ගලයෙකු ඇවිදින කාලය කොච්චරක් ද බලමු. According to the available data, a normal person will likely to spend around 37,000 to 50,000 hours travelling in their lifetime. ඒ කියන්නේ, සාමාන්‍ය පුද්ගලයෙක් තම ජීවිත කාලයෙන් අවුරුදු 5කට ආසන්න ප්‍රමාණයක් යම් ආකාරයේ ප්‍රවාහන පහසුකමක් භාවිත කරනවා; travel කරනවා. අපේ රටේ ප්‍රවාහන සේවය ගත්තොත්, පොදු ප්‍රවාහන සේවය තිබෙනවා, පෞද්ගලික ප්‍රවාහන සේවය තිබෙනවා.

පොදු ප්‍රවාහන සේවය ගත්තොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපට metro නැහැ, tram cars නැහැ. අපට තිබෙන්නේ බස් රථ. ඒ වාගේම දුම්රිය. බස් රථ ගත්තොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා ඒ බස් රථවල මිනිස්සු යන්නේ කොහොමද කියලා. දහඩිය පෙරාගෙන ඉතාම අසීරුවෙන් තමයි මිනිස්සු බස්වල ගමන් කරන්නේ. ඒ වාගේම කිසිම customer service එකක් නැහැ. ඒ අය Customersලාට කථා කරන්න දන්නේ නැහැ, customersලාට සලකන්න දන්නේ නැහැ, බල්ලෝ බළල්ලු වාගේ සමහර වෙලාවට බස් රථවල දමාගෙන යන්නේ. බස් රථයේ තිබෙනවා නම් සීට් 58ක්, පොල් ගෙඩි පටවනවා වාගේ මිනිස්සු 60ක්, 80ක්, 90ක් අරගෙන යනවා. ඒ විතරක් නොවෙයි, ඒවාට timetable එකක් නැහැ. මොන වෙලාවටද, කොතැනටද ඒ බස් එක එන්නේ කියලා හරි වැඩ පිළිවෙළක්, හරි යාන්ත්‍රණයක් නැහැ. එහෙම යාන්ත්‍රණයක් නැති නිසා පාරේ බස් රේස් යන හැටි අපි අනන්ත අප්‍රමාණ දැකලා තිබෙනවා. මේ රජයට වගකීමක් තිබෙනවා, මේ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්න.

ඒ වාගේම අපේ රටේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ, රියදුරු මහත්වරු පරීක්ෂාවට ලක් කිරීම. අපි දන්නවා, ගුවන් සේවාවක් ගත්තොත්, ඒ ගුවන් සේවාවේ කපිතාන්වරයා - pilot - යම් කිසි මත්ද්‍රව්‍යයක් පානය කරලාද ඉන්නේ, සුරා - alcohol - පානය කරලාද ඉන්නේ කියලා පරීක්ෂා කරනවා. හැබැයි, ජීවිත සිය දහස් ගණනක් අරගෙන යන බස් රථවල රියදුරන් එවැනි පරීක්ෂාවකට ලක් වෙන්නේ නැහැ. ඒ නිසා රජයට වගකීමක් තිබෙනවා, ප්‍රවාහන ක්ෂේත්‍රය ඩිජිටල් කරනවා වාගේම, ප්‍රවාහන ක්ෂේත්‍රයේ වග කිව යුත්තන්ට අවශ්‍ය නීති සම්පාදනය කරන්න. අපි ඒ යෝජනාව කරනවා ආණ්ඩුවට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ආරක්ෂිත ප්‍රවාහන සේවාවක් මේ රටට අවශ්‍යයි. උදාහරණයක් හැටියට ගත්තොත්, දුම්රිය ධාවනය කොයි තරම් දුරට අනාරක්ෂිතයිද කියන එක පැහැදිලියි, ආරක්ෂිත ගේට්ටු නැති, ගේට්ටුවල බෙල් වැඩ කරන්නේ නැති මහා මාර්ගය හරහා යන දුම්රිය මාර්ග - level crossing - කොයි තරම් තිබෙනවාද කියලා බැලුවාම. ඒ තැන්වලට යම් කිසි පුද්ගලයෙක් යොමු කරලා තිබුණත් එක්කෝ ඒ කෙනා සමහර වෙලාවට එතැන නැහැ. එහෙම නැත්නම් ඒ මනුස්සයා අසනීප වෙලා. එහෙමත් නැත්නම් ඒ මනුස්සයා වෙන ගමනක් ගිහිල්ලා. එතකොට අහිංසක ජීවිත දුම්රියට බිලි වෙනවා.

අපට මනුෂ්‍ය ජීවිත වාගේම මේ රටේ සත්වයන්ගේ ජීවිතත් වටිනවා. 2020 වසරේ අලි තුන්දෙනෙක් මරණයට පත්වෙලා තිබෙනවා, දුම්රිය අනතුරුවලින්. ඒ වාගේම, 2021 වසරේ හයදෙනෙක්, 2022 වසරේදී දාහතරදෙනෙක් මරණයට පත්වෙලා තිබෙනවා. මේ වසරේ මාස තුනයි ගත වුණේ, ඒ කෙටි කාලය තුළ අලි හයදෙනෙක් ජීවිතක්ෂයට පත්වෙලා තිබෙනවා. අද උදේ "සිරසේ" ප්‍රවෘත්තිවලින් මම දැක්කා, ඇතෙක් ලොරියක වැදිලා ඒ ඇතාගේ දළ කැඩිලා මහ පාරේ වැටිලා තිබුණා. ඒ තරම් සෝචනීය තත්ත්වකට පත්වෙලා තිබෙනවා. එක පැත්තකින් අද මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ ජීවිත විනාශ වෙනවා. අනෙක් පැත්තෙන් අපි ආදරය කරන වන සතුන්ගේ ජීවිත විනාශ වෙනවා.

විශේෂයෙන්ම මේ පොදු ප්‍රවාහන සේවය අපි මිනිසුන්ට යන්න පුළුවන් ප්‍රවාහන සේවයක් බවට පත් කරන්න ඕනෑ. අපි කවුරුත් මිනිස්සු. අපි කවුරුත් කැමැතියි, හොඳට ඇඳ පැලඳලා සැපට ඉන්න. මේ බස් රථවල යන මිනිස්සු දහඩිය පෙරාගෙන ගඳ ගහගෙන යනවා වෙනුවට, රැකියාවට යනකොට බොහොම වැදගත් විධියට ලස්සනට යන්නත්, රැකියාව අවසන් කරලා ගෙදර එනකොට බොහොම ලස්සනට එන්නත් පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්න මේ රජය අවධානය යොමු කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මේ රටේ සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න කටයුතු කරන්න ඕනෑ. මම හිතන්නේ නියෝජ්‍ය ඇමතිතුමා e-ticketing පිළිබඳව අවධානය යොමු කරලා තිබුණා. බොහොම හොඳයි. දැන් ඒක ජාවාරමක් වෙලා. අපේ යාළුවෝත් පිට රට ඉඳලා ආවාම ඇල්ලට යන්නේ කෝච්චියෙන්. ඒ ගොල්ලන් ඒකට ආසයි. අද ලෝකයේ කිසිම රටක නැති අත්දැකීමක් ලබන්න පුළුවන් අපේ රටේ ඒ දුම්රිය ගමනින්. ඉතාම ලස්සන පරිසරයක් පහු කරගෙන තමයි ඇල්ල ප්‍රදේශයට දුම්රිය යන්නේ.

හැබැයි, ඒ මිනිස්සුන්ට අද ඒ ටිකට් එක ගන්න වෙලා තිබෙන්නේ කළුකඩ මුදලාලිගෙන්. මේක නිවැරදි විය යුතුයි. *[බාධා කිරීමක්]* හරි, බොහොම හොඳයි. නමුත් නිවැරදි විය යුතුයි. ඒකට අවධානය යොමු කරන්න. ඒ වාගේම දුම්රිය ඇතුළත පිරිසිදු කළ යුතුයි. ඒ වාගේම වැසිකිළි පිරිසිදු කළ යුතුයි. සංචාරයට එන සංචාරකයන් ලෝකයේ අනෙකුත් රටවල ප්‍රමිතිය අපෙන් බලාපොරොත්තු වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ නිසා එවැනි ක්‍රියාදාමයකට අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

බස්වල විතරක් නොවෙයි දුම්රියේත් timetable එකකට ගමනාන්තය දක්වා යන්න පුළුවන් නම් ඉතාම වැදගත්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, internet එකේ බැලුවොත් ලංකාවේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන අඩු පාඩු මොනවාද කියලා, පළමුවෙන්ම කියන්නේ delays. අනෙක් එක overcrowding. අනෙක් එක hygiene issues. ආණ්ඩුවට මේවා පිළිබඳව අවධානය යොමු කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2019 නිකුත් කළ UNFPA report එකට අනුව, 90 per cent of Sri Lankan women and girls have faced sexual harassment in public buses and trains at least once in their lifetime. මේක ඉතාම සෝචනීය තත්ත්වයක්. අපේ රටේ කාන්තා අයිතිය ගැන අපි කථා කරනවා. අපි කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටිනවා. කාන්තා දිනය වෙනුවෙන් අපි පාර්ලිමේන්තුවට දම් පාට ඇඳගෙන එනවා. හැබැයි අපේ රටේ සහෝදරියන්, නැඟනියන්, පාසල් යන දැරියන් අපයෝජනයට ලක් වෙනවා. අපි මේ පිළිබඳව අවධානය යොමු කරන්න අවශ්‍යයි.

ඇයි මම දිගින් දිගටම බස් රථ, පොදු ප්‍රවාහනය ගැන කථා කරන්නේ? ඔබතුමන්ලා දන්නවා, පෞද්ගලික බස් සහ ලංගම බස්වල වැඩි ප්‍රමාණයක් ගෙනියන්නේ සාමාන්‍ය මිනිස්සු. 2024දී පමණක් බස් අනතුරු නිසා 258ක් මරණයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම 2024දී බරපතළ රිය අනතුරු, පෞද්ගලික බස්වලින් 409කුත්, ලංගම බස්වලින් 156කුත් සිදු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ හානි වෙන හැම ජීවිතයක්ම අපට වටිනවා. අවුරුදු 7ක් වැනි කෙටි කාලයක් තුළ රිය අනතුරු නිසා ජීවිත හානි සිදු වෙලා තිබෙනවා, 15,903ක්. 2024දී විතරක් අපේ රටේ වටිනා කියන ජීවිත 2,521ක් අපට අහිමි වෙලා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා මේ ජීවිත ආරක්ෂා කරන්න කටයුතු කරන්න කියලා. අපේ රටේ අහිංසක මිනිසුන්ගේ ජීවිත තවදුරටත් මහ පාරේ අකාලයේ විනාශ වෙන්න ඉඩ දෙන්න එපා කියන ඉල්ලීම කරනවා.

විශේෂයෙන්ම අපේ ගුවන් තොටුපොළ ගත්තොත්, outdated. SriLankan Airlines එකේ flights delay. ඒවායේ ප්‍රමිතිය ගැනත් ප්‍රශ්නයක් තිබෙනවා. ගුවන් යානයට නැග්ගාම පාඩු ලබන එකක් කියලා පේනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. විශේෂයෙන්ම අඩු පහසුකම්වලින් මේ ගුවන් යානා තවදුරටත් පවත්වාගෙන යෑම පිළිබඳව ශ්‍රීලන්කන් ගුවන් සේවයේ නිලධාරින්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

අපේ ඇමතිතුමාට සුබ පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, [ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 4.29]

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ පාර්ලිමේන්තුවේ අපි ඉතා වැදගත් විෂයකට අදාළ වැය ශීර්ෂ සාකච්ඡා කරමින්, ඒ පිළිබඳ විවිධ අදහස් යෝජනා ඉදිරිපත් කරමින් සාකච්ඡාව පවත්වාගෙන යනවා. විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු ඉතා ධනාත්මක, සාධනීය යෝජනා අද ඉදිරිපත් කළා. ඒ යෝජනාවලට අපි රජය විධියට අවශ්‍ය අවධානය යොමු කරමින්, ඒ කාරණා පිළිබඳව සැලකිලිමත් වෙන්න සූදානම්.

අද උදේ ඉඳලා මේ සාකච්ඡාව අහගෙන සිටිද්දි මට දැනුණු කාරණාවක් තිබෙනවා. විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු ලංගමය, දුම්රිය දෙපාර්තමේන්තුව වැනි මහජන ප්‍රවාහන සේවා පිළිබඳ බරපතළ ප්‍රශ්න මතු කරමින් තිබෙනවා. ඒ මන්ත්‍රීවරුන්ගේ අපේක්ෂාව වෙන්න ඇති, දැන් මේ මතු කරන්නේ. මේවා මීට වඩා හොඳ විධියට තිබුණා නම් හොඳයි නේ කියන කාරණය තමයි මතු කරන්නේ. නමුත් බේදවාචකය මේකයි. ඒ මන්ත්‍රීවරු නියෝජනය කරපු ආණ්ඩු, එහෙම නැත්නම් ඒ ආණ්ඩුවල නායකයන් මේ සේවා නහා සිටුවනවාට වඩා, ඒවා බිඳ වටිටන්න, ඒවා අඩපණ කරන්න තමයි විවිධ තීන්දු තීරණ අරගෙන තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා පසුගිය කාලයේ ජනාධිපති වෙලා හිටියේ නිවැරදි ජනවරමක් තුළ නොවෙයි, ව්‍යවස්ථාවේ යම් ප්‍රතිපාදනයක් පාවිච්චි කරලායි. ඊයේ පෙරේදා දවසක එතුමා ජාත්‍යන්තර මාධ්‍ය

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

ආයතනයක මාධ්‍යවේදීන් එක්ක කරපු සාකච්ඡාවකදී යම් සංවාදයක් මතු වුණා. අපි ඒ ගැන කිව යුතු දෙයක් තිබෙනවා. එතුමා එදාත් මේ රටට විරුද්ධව කටයුතු කළා. මේ රටට එරෙහිව යම් යම් ආණ්ඩුවලට අදාළව විවිධ ප්‍රකාශ නිකුත් කරමින් විවිධ කටයුතු කළා. අවශ්‍ය ජනවරම නොලැබීම නිසා බලයෙන් පහ වෙච්ච හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා අද විවිධ සංවිධානවල යම් යම් වරප්‍රසාද ඇතුළේ, පහසුකම් ඇතුළේ කටයුතු කරමින් අපේ රටට එරෙහිව කටයුතු කරනවා. විශේෂයෙන් මේ රටේ ශක්තිමත් ජනවරමක් ලබාගෙන මේ මොහොතේ රටට නිවැරදි නායකත්වයක් දෙන ජාතික ජන බලවේගය ආණ්ඩුවට එරෙහිවත් විවිධ අවලාද නඟමින් රට පුරා, ලෝකය පුරා යමින් සිටිනවා. එදාත් රනිල් වික්‍රමසිංහලා වැනි අය මේ රටේ කීර්තිනාමයට, රටේ අනන්‍යතාවයට, මේ රටේ තිබිය යුතු ඇතැම් දේවල්වල අනන්‍යතාවට එරෙහිව විවිධ කුමන්ත්‍රණ කළා; ප්‍රකාශ කළා. ඒ නිසා අපි එතුමන්ලාට කියනවා, දැන්වත් පාඩුවේ මේ රටට ඉදිරියට යන්න ඉඩ දෙන්න, ඒවා වළක්වන්න, ඒවාට බාධා කරන්න එපා කියලා. ජාත්‍යන්තර වුවමනාව වෙනුවෙන් රටට එරෙහිවත්, ආණ්ඩුවට එරෙහිවත් විවිධ ප්‍රකාශ, අවලාද නඟන එක වහාම නතර කරන්න කියා ඉල්ලා සිටිනවා. එතුමාට යම් හෝ දේශපාලන සදාචාරයක් ඉතිරි වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳ සැලකිලිමත් වෙලා කටයුතු කරන්න කියා අපි කියනවා. මම ඒක මෙතැනට අදාළ කර ගත්තේ මේ නිසායි. ඒ අය තමයි මේ සේවා පවත්වා ගෙන යන්න නායකත්වය දුන්නේ. හැබයි, අද ජාතික ජන බලවේගයේ අපි ආණ්ඩුවක් විධියට මහජනතාවට අත්‍යවශ්‍ය සේවා, කාර්යයන් වඩා විධිමත් කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම, නිවැරදිව ආණ්ඩුව කරන්න සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයේදී වැඩිපුර අවධානයට ලක් වුණේ විධිමත් ප්‍රවාහන සේවය ගැනයි. විශේෂයෙන්ම ලංගමය සහ දුම්රිය දෙපාර්තමේන්තුව ගැන. ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළව ගත්තොත්, අපේ ප්‍රවාහන අමාත්‍යතුමාගේ විශේෂ උපදෙස් අනුව පසුගිය දා පැවැති ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී මේ රටට අවශ්‍ය, රටේ ජනතාවට අවශ්‍ය ප්‍රවාහන සේවා විධිමත් කරන්නත්, ඒ ප්‍රවාහන සේවාවලින් පහසුකම් ලබන, අවශ්‍යතා සපුරා ගන්න ජනතාවට වඩාත් හොඳ ගුණාත්මක සේවාවක් සැපයීමටත්, විවිධ විෂයයන්ට අදාළව යම් යම් අනුකමිටු පත් කරලා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා යම් දායකත්වයක් ලබා දීමේ කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙනවා. අපි පසුගිය දිනක උපදේශක කාරක සභාවේදී අවිධිමත් ප්‍රවාහන කර්මාන්තය හා සම්බන්ධ ව්‍යක්තිකයන්ගේ ව්‍යක්තීය සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට අදාළව අනුකමිටුවක් පත්කර ගත්තා. එහි සභාපතිවරයා විධියට මම කටයුතු කරනවා.

මීට කලින් අදහස් දක්වපු විපක්ෂයේ ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා, ආණ්ඩු පක්ෂයේ දිනිඳු සමන් මන්ත්‍රීතුමා, දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා ඒ අනුකමිටුව නියෝජනය කරනවා. අපේ රටේ විශේෂ අවධානයට ලක් නොවන, සාකච්ඡාවට ලක් නොවන, යම් නියාමනයකට ලක් නොවන අවිධිමත් ප්‍රවාහන කර්මාන්තයට සම්බන්ධ යම් කාරණා ටිකක් මේ සභාවට ඉදිරිපත් කරන්න මම දැන් බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ ත්‍රිරෝද රථ සේවයෙන් ඉතා විශාල පිරිසක් සේවා සපයා ගන්නවා. ඒ වාගේම පාසල් ප්‍රවාහන සේවය, බස් රථ සේවය, කාර්යාල ප්‍රවාහන සේවය වැනි සේවා සපයන ව්‍යක්තිකයන් විශාල ප්‍රමාණයක් අද අපේ රටේ ජීවත් වෙනවා.

හැබැයි, ඒ සේවාවල නිරත වන ව්‍යක්තිකයන්, ඒ කියන්නේ රියැදුරු මහත්වරු සම්බන්ධයෙන් හෝ කොන්දොස්තර මහත්වරු සම්බන්ධයෙන් හෝ එහෙම නැත්නම් ත්‍රීවීලර් රථයක් හිමි පෞද්ගලිකව ස්වයං රැකියාවක් කරන තැනැත්තෙකු සම්බන්ධයෙන් හෝ පසුගිය කාල සීමාව ඇතුළත ඒ අවශ්‍ය අවධානය යොමු කර තිබුණේ නැහැ. නමුත් එම සේවාවල යෙදෙන, එම සේවාව ලබා දෙන අයට යම් ව්‍යක්තීයමය සුරක්ෂිතභාවයක් ඇති කරන්නත්, ඒ වාගේම ඔවුන්ගේ ව්‍යක්තීය නිමිකම්, සුබ සාධනය ඇතුළු ඒ අවශ්‍ය කරුණු කෙරෙහි අවධානය යොමු කරලා ඉදිරියේදී යම් ප්‍රතිපත්ති සම්පාදනයක් සඳහා මේ සභාව තුළින් අවශ්‍ය කටයුතු කරන්නත්, අපි පත් කරගත් අනුකමිටුව තුළින් විශේෂයෙන්ම අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම එම ව්‍යක්තිකයන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය සැලසීමට සහ ඔවුන්ගෙන් එම සේවාව ලබා ගන්නා අයගේ ආරක්ෂාව සහ පහසුකම් සැලසීමට යම් විධිමත් නියාමනයක් සිදු කරලා ඒ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය වැඩ පිළිවෙළ ඉදිරියේදී සකස් කිරීම සඳහා අපි ආණ්ඩුවක් විධියට විශේෂ අවධානය යොමු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංගමය පිළිබඳවත් මෙතැනදී යම් යම් කරුණු කාරණා සාකච්ඡා වුණා. අපි ඉතා පැහැදිලිව කියනවා, පසුගිය කාලයේ පැවැති හැම ආණ්ඩුවක්ම බලයට පත් වුණාට පසුව පළමු දේශපාලන මැදිහත්වීම, බලපෑම ඇති වුණු පළමු රාජ්‍ය ආයතනය ලංගමය බව. නමුත් නව දේශපාලන සංස්කෘතියක් රට තුළ නිර්මාණය කරමින් ඒ ආකාරයේ දේශපාලන අත්දැකීමක් ලංගමය තුළ ඇති නොවන ආකාරයට යම් නිවැරදි දේශපාලන නායකත්වයක් අපි ජාතික ජන බලවේගය විධියට ලබා දුන්නා. කිසිදු ආකාරයකින් දේශපාලන අරමුණු වෙනුවෙන් තනතුරුවල වාඩි කරවන එක, පුටු මාරු කරන එක අපි මේ දක්වා සිද්ධ කරලා නැහැ. යම් විනය කාරණාවක් හෝ පරිපාලනමය ගැටලු මත යම් වෙනස්කම් ඇති වුණත්, දේශපාලන කාරණා මත එවැනි ආකාරයේ සිදුවීම් වෙලා නැහැ. මීට පෙර අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාත් ලංගමය ගැන කරුණු සඳහන් කළා. විශේෂයෙන්ම අද වනවිට ලංගමය තුළ සිටින කාර්ය මණ්ඩලය ගත්තාම, ඔවුන් විවිධ අපහසුතාවලට, දුෂ්කරතාවලට ලක් වුණු පිරිසක් බව අපට පෙනී යනවා. ඒ නිසා අපි ආණ්ඩුව විධියටත්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මමත් ඒ පිළිබඳව වඩා හොඳින් දන්නවා. අපි ලංගමය විධිමත් කිරීමට කටයුතු කළ යුතුයි. අද වනවිට ලංගමය මඟී ප්‍රවාහන අවශ්‍යතාවෙන් සියයට 14යි සම්පූර්ණ කරන්නේ. මඟී ප්‍රවාහන අවශ්‍යතාවට බස් රථ 7,500ක් අවශ්‍ය වුණාට, දැනට පවතින්නේ බස් රථ 4,500ක්-5,000ක් අතර ප්‍රමාණයක් පමණයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලංගමය විධිමත් කිරීම සඳහා අපි රජයක් විධියට විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ අනුව එහි පරිපාලනය විධිමත් කරන්නත්, අදාළ තනතුරුවලට අවශ්‍ය සුදුසුකම් සහිත පුද්ගලයන් පත් කරන්නත්, අනුමත බඳවා ගැනීම් පටිපාටි ක්‍රියාත්මක කරන්නත්, මීලඟදී ගැනීම්වලදී දිගින් දිගටම ඇති වෙන

ගැටලු නිරාකරණය කරන්නත් අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම 6/2006 වැටුප් චක්‍රලේඛය අනුව එම කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ වැටුප් සංශෝධන කටයුතු විධිමත් අයුරින් සිදු කර ලංගමය තුළින් මහජනතාවට වඩාත් ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය අවධානය යොමු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒත් එක්කම, දුම්රිය දෙපාර්තමේන්තුව ගැනත් සඳහන් කළ යුතුව තිබෙනවා. අද වනවිට දුම්රිය සේවාව නවීකරණය කරමින්, විශේෂයෙන්ම කොටුව සහ මරදාන දුම්රිය ස්ථාන Clean Sri Lanka වැඩසටහන යටතේ මහජනතාවට ප්‍රියමනාප, පහසුකම් සැපයෙන, කාර්යක්ෂම ස්ථාන බවට පත් කරන්න අමාත්‍යවරයා ඇතුළු නිලධාරි පිරිස ඒ අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. දුම්රිය සේවාව වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු අපි ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව රත්මලාන දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය නවීකරණය කර උසස් මට්ටමට පත් කර, දුම්රිය දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා තාක්ෂණික ශිල්පීන්, කාර්මික ශිල්පීන් විධිමත්ව පුහුණු කර, ඒ අවශ්‍ය තාක්ෂණ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයකින් සමන්විත හොඳ මහජන සේවාවක්, ප්‍රවාහන සේවාවක් සැපයීමට අවශ්‍ය මට්ටමට දුම්රිය දෙපාර්තමේන්තුව පරිවර්තනය කිරීම පිළිබඳවත්, එම සේවාව නවීකරණය කිරීම පිළිබඳවත් රජය විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා කියන කාරණාවත් මේ ගරු සභාවට මා සඳහන් කරන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 08ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.40]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இரண்டு முக்கியமான அமைச்சுகள் தொடர்பான இன்றைய விவாதத்திலே கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். ஏற்கெனவே போக்குவரத்து அமைச்சர் அவர்களிடம் நான் எங்களுடைய மாவட்டத்திற்கு அவசியமாகவிருக்கின்ற வீதிச் சமிக்ஞைகளைப் பொருத்த வேண்டுமென்ற ஒரு கோரிக்கையை எழுத்துமூலம் கையளித்திருக்கிறேன். எங்களுடைய வவுனியா நகரம் A9, A29, A30 ஆகிய 3 பிரதான A Grade roads சந்திக்கின்ற ஒரு நகரமாகும். சுமார் 200,000 பேர் வாழும் இடமாக இருக்கின்ற வவுனியா மாவட்டம், Northern Provinceஇன் gatewayஆகவும் இருப்பதால், வெளிமாவட்டத்திலிருந்தும் நிறைய வாகனங்கள் வந்துபோகின்ற ஓர் இடமாக இருக்கிறது. இதனால் அங்கு நிறைய வீதி விபத்துக்கள் ஏற்படுகின்றன. இம்முறை வரவு செலவுத்திட்டத்தினூடாக, வவுனியாவிலே ஏற்கெனவே நான் குறிப்பிட்ட 5 இடங்களிலும், A9 வீதியிலே 3,000 மாணவர்கள் படிக்கின்ற மிகவும் முக்கியமானதொரு பாடசாலையாக இருக்கின்ற வவுனியா தமிழ் மகா வித்தியாலயத்திற்கு முன்பாகவும் வீதிச் சமிக்ஞைகளை அமைத்து, மக்களுடைய பாதுகாப்பை உறுதிப்படுத்துமாறு உங்களைத் தயவாகக் கேட்டுக் கொள்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, உங்களிடம் ஏற்கெனவே இது சம்பந்தமான கோரிக்கையை நான் முன்வைத்திருக்கின்றேன்.

அடுத்ததாக, வவுனியா மாவட்டத்திலே நெலுக்குளம் - நேரியகுளம் வீதி, பூவரசங்குளம் - செட்டிகுளம் வீதி ஆகிய இரண்டு வீதிகளிலும் முக்கியமான 2 பாலங்கள் அமைக்கப்பட வேண்டும். மழை காலத்திலே மக்கள் அந்தப் பாதையால் செல்ல முடியாத நிலைமை ஏற்படுகின்றது. அதேபோல, புதுக்குளம் - பேயாடிகூழாங்குளம் வீதியை அண்மித்த கிராமம் மழை காலத்திலே வெள்ளத்தினால் இரண்டாகத் துண்டாடப்படுகின்றது. எனவே, அங்கு ஒரு மேம்பாலத்தை அமைத்து, மக்கள் இலகுவாகச் சென்றுவரக் கூடியதாக வசதி வாய்ப்பை நீங்கள் ஏற்படுத்தித் தரவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

வவுனியா மாவட்டத்தில் இலங்கைப் போக்குவரத்துச் சபையின் 51 பேருந்துகள் காணப்பட்டாலும், 34 பேருந்துகள் தான் இப்போது சேவையிலே ஈடுபடுத்தப்படுகின்றன. அங்கே பொறியியல் பிரிவிலே ஆளணிப் பற்றாக்குறை காணப்படுகின்றது. உடனடியாக அதில் 5 ஆளணி வெற்றிடமாவது நிவர்த்தி செய்யப்பட வேண்டும். அதேபோல, சாரதிகளுக்கு 7 வெற்றிடங்களும் நடத்துநர்களுக்கு 11 வெற்றிடங்களும் காணப்படுகின்றன. எங்களுடைய மாவட்டம் பெரும்பாலும் கிராமங்களை உள்ளடக்கியது. பாடசாலை மாணவர்கள் மற்றும் விவசாயிகள் இலங்கைப் போக்குவரத்துச் சபையினுடைய பஸ்களை நம்பியிருக்கிறார்கள். கிராமத்து மக்கள் தங்களுடைய விவசாய உற்பத்திப் பொருட்களை நகரத்திற்குக் கொண்டுவந்து விற்பனை செய்வதற்கும், குறிப்பாக, பாடசாலை மாணவர்கள் தமது போக்குவரத்துக்கும் இந்த பஸ் சேவையினையே பயன்படுத்துகின்றமையால், எங்களுடைய மாவட்டத்திலே இருக்கின்ற இலங்கைப் போக்குவரத்துச் சபையின் குறைபாடுகளை நிவர்த்திசெய்து, அந்த சேவையினை மக்கள் பயன்படுத்துவதற்கு ஆவன செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இலங்கையில் இருக்கின்ற 9 மாகாணங்களில், வட மாகாணத்தைத் தவிர ஏனைய மாகாணங்களில் தனியார் துறை மற்றும் இலங்கைப் போக்குவரத்துச் சபையின் இணைந்த நேர அட்டவணை காணப்படுகிறது. ஆனால், எங்களுடைய மாகாணத்திலே இணைந்த நேர அட்டவணை காணப்படாததால், அங்கு போக்குவரத்திலே நிறையப் பிரச்சினைகள் காணப்படுகின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இதிலே முக்கியமான கவனம் செலுத்தி, இந்தப் பிரச்சினைக்கு ஒரு தீர்வை வழங்கும் வகையில் இதனைக் கையாள வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, பாடசாலை மாணவர்களுக்கான பஸ் சேவையை எடுத்துக்கொண்டால், அங்கு பாடசாலை மாணவர்கள் இலகுவாகப் பயணிக்கக்கூடிய வகையில், A9 வீதியூடாக வவுனியாவிலிருந்து மாங்குளம் வரையான பிரதேசத்துக்கிடையில் குறுந்தூர பஸ் சேவை இல்லை. மாவட்டங்களுக்கு இடையேயான பஸ் சேவையைத்தான் மாணவர்கள் நம்பியிருக்கவேண்டியிருக்கின்றது. குறிப்பாக, கனகராயன்குளம் மகா வித்தியாலயத்திற்குச் செல்கின்ற மாணவர்களைத் தற்போது அந்த வீதியால் செல்கின்ற பஸ் வண்டிகளில் ஏற்றுவதில்லை; இது ஒரு பாரிய பிரச்சினையாக இருக்கிறது. இந்த பஸ் வண்டிகள் பாடசாலை மாணவர்களை நிச்சயமாக ஏற்றிக்கொண்டு போகவேண்டிய

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

ඔරු තේවෙයිරුක්කින්රදු. කෙළරව අමෙච්චර් අවර්කළේ, ඉන්ත විටයත්තිලේ නීංකළ් කවනම් චෙලුත්ත වේණ්ටුම්; පාටචාලෙ මාණවර්කළෙ පස් වණ්ටිකළිල් ඒර්රික් කොණ්ටු චෙල්ල වේණ්ටුමෙන්ර උංකළුටෙය ආණෙ - instruction - ඉලංකෙප් පෝක්කුවරත්තුච් චපෙක්කුප් පෝක වේණ්ටුම් එන්රු කේට්ටුක් කොළ්කින්රේන්.

අතේපෝල, ඉලංකෙයින් තොටරුන්තුප් පාතෙකළිල් 1,925 වීතික් කටවෙකළ් ඉරුප්පතාකච් චොල්ලප්පටුකින්රදු. ඉප්පෝතු එංකළුටෙය පිරතේචත්තිලුළ්ළ 25 වීතික් කටවෙකළුක්කුත්තාන් කාප්පාළර්කළ් ඉරුක්කින්රනර්. වටක්කු මාකාණ පුකෙයිරතප් පාතෙයිල් ඔව්වොරුනාළුම් accidents නටෙපෙරුවතෙක් කාණක්කූටියතාකවුළ්ළතු. ඉන්තප් පුකෙයිරතක් කටවෙක් කාප්පාළර්කළ් 250 රූපාය් නාට්කූලියෙයුප් පෙරුකින්රාර්කළ්. කුරිත්ත 250 රූපාෙයක් කොණ්ටු තංකළ් කුටුම්පච් චෙලවුකළෙ නටාත්ත මුටියාමල් පෙරුම්පාලෝනාර් විලකිච් චෙන්රුළ්ළනර්; චිලර් වේලෙ චෙය්කිරාර්කළ්. ඉන්තක් කාප්පාළර් ඔරුවරිටම්, "උංකළුක්කු ඉන්ත 250 රූපාය් පෝතුමානතා?" එන්රු නාන් කේට්ටපෝතු, "250 රූපාය් පෝතාතු. ආනාලුම්, එන්නුටෙය මුයර්චියාල් එත්තනෙයෝ උයිර්කළෙක් කාප්පාර්රියිරුක්කිරේන්" එන්රු මිකවුම් පෙරුන්තන්මෙයාකච් චොන්නාර්. ආකවේ, කෙළරව අමෙච්චර් අවර්කළේ, නීණ්ටකාලමාක 250 රූපාය් පෙර්රු වේලෙ චෙය්තුවරුකින්ර පණියාළර්කළුක්කු ඒතෝ ඔරු වකෙයිල් නිරන්ත නියමනත්තෙක් කොටුත්තු, උයිර්කළෙප් පාතුකාක්කින්ර ඉන්තච් චේවෙයිල් අවර්කළෙ ඊටුපටුත්ත වේණ්ටුමෙන්රු කේට්ටුක් කොළ්කිරේන්. අන්තප් පාතුකාප්පර්ර පුකෙයිරතක් කටවෙකළිල් පණියාළර්කළෙ නියමික්කමුටියාත සූළල් කාණප්පට්ටාල්, මාර්රීටාන ඔරු තිට්ටත්තෙ, ඔරු පොරිමුරෙයෙයික් කොණ්ටුවරුවතර්කුම්, චමික්ඤෙකළෙ යාවතු පොරුත්තවුම් නටවටික්කෙ එටුක්කවේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්.

එංකළුටෙය මාවට්ටත්තිල්, ඕමන්තෙ පුකෙයිරත නිලෙයම් මීළවුම් අමෙක්කප්පට්ටපෝතු 100 වරුටංකළුක්කු මුර්පට්ට පළමෙයාන ඔරු පාතෙ මරික්කප්පට්ටමෙයාල් අතිල් මක්කළ් පයණම් චෙය්ය මුටියාත නිලෙමෙ කාණප්පටුකිරතු. මාර්රුප් පාතෙයොන්රු අමෙක්කප්පට්ටාලුම්කූට අතු මක්කළින් පයන්පාට්ටුක්කුප් පොරුත්තමර්රතාකවුළ්ළතු. කෙළරව අමෙච්චරුටන් ඉතු තොටර්පාක ඒර්කනවේ පේචියිරුක්කිරේන්; අතර්කුරිය තීර්විනෙත් තරුවතාක අවර් චොල්ලියිරුක්කිරාර්. කෙළරව අමෙච්චරවර්කළුටෙය ආලෝචනෙප්පටි නිච්චයමාක ඉන්නුමෝර් මාර්රුප් පාතෙයෙ අටෙයාළප්පටුත්ති, මේලතික නටවටික්කෙක්කාක නාංකළ් මුන්වෙප්පෝම්. අතුපෝල, වවුනියාවිලිරුන්තු මාංකුලම්වරෙ පුතිය පුකෙයිරතප් පාතෙ අමෙක්කුම්පෝතු අල්ලතු තිරුත්ත වේලෙකළ් චෙය්යප්පට්ටපෝතු railway trackඉනෙ cross චෙය්කින්ර ඉටංකළිල් ඉරුන්ත පල චිරිය පාතෙකළෙප් පේණුවතර්කුරිය ඒර්පාටුකළ් චෙය්යප් පටවිල්ලෙ. ඉතනාල් ඉරන්ත පිරේතත්තෙක්කූට ඔරු පක්කත්තිලිරුන්තු මරුපක්කත්තුක්කු කොණ්ටුචෙල්ල මුටියාත නිලෙමෙ කාණප්පටුකිරතු. කෙළරව අමෙච්චර් අවර්කළේ, ඉන්ත විටයත්තිලුම් කූටිය කවනත්තෙච් චෙලුත්ති ඉන්ත විටයත්තෙක් කෙයාළවේණ්ටුමෙන්රු කේට්ටුක් කොළ්කින්රේන්.

වීටමෙප්පු තොටර්පාකප් පාර්ත්තාල්, චජිත් පිරේමතාච අවර්කළ් වීටමෙප්පු අමෙච්චරාක ඉරුන්තපෝතු වවුනියාවිල් 3,349 වීටුකළ්, මුල්ලෙත්තීවිල් 3,557 වීටුකළ්, මන්නාරිල් 2,854 වීටුකළ් එන්ර වකෙයිල් වීට්ටුත් තිට්ටංකළ් මක්කළුක්කාකක් කොටුක්කප්පට්ටන. ආනාල්, ඉන්රු වවුනියා මාවට්ටත්තිල් 13 චතවීත වීටුකළුම්, මුල්ලෙත්තීවු මාවට්ටත්තිල් 3.7 චතවීතමාන වීටුකළුම්තාන් මුටිවුරුත්තප් පට්ටුළ්ළන. නකර අපිවිරුත්ති, නිර්මාණිප්පු මර්රුම් වීටමෙප්පු අමෙච්චර් අවර්කළේ, නීංකළ් පල වීට්ටුත් තිට්ටංකළෙක් කොණ්ටුවන්තුළ්ළීර්කළ්. ආනාල්, කුරිත්ත වීට්ටුත් තිට්ටත්තුක්කාක මක්කළ් තමතු චොත්තෙ විර්රු, නකෙකළෙ විර්රු, වංකියිල් කටනෙටුත්තු ඉන්රු කටනාළි කළාක ඉරුක්කින්රාර්කළ්. ආකවේ, තොටංකප්පට්ටු අරෙකුරෙයාක ඉරුක්කින්ර වීට්ටුත් තිට්ටංකළෙ මුටිවුරුත්තුවතර්කාන මිකුතිප් පණත්තිනෙ අවර්කළුක්කුක් කොටුත්තු, අවර්රෙ නිරෙවුචෙය්වතර්කුරිය නටවටික්කෙයෙ නීංකළ් එටුක්කවේණ්ටුමෙන්රු කේට්ටුක්කොළ්කින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 09ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.46]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු චතුරංක අපේචිංහ - කෙත්තොළිල් මර්රුම් තොළිල් මුයර්චියාණ්මෙ අපිවිරුත්තිප් පිරති අමෙච්චර්)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය අහගෙන ඉන්නකොට අපට මුලින්ම තේරුණා, කරගන්න බැරි වෙච්ච දේවල් ගැන විපක්ෂය අද පුන පුනා කියන දේ මොකක්ද කියලා. එතුමන්ලාට කරගන්න බැරි වුණු දේ, අනේ, කරුණාකරලා මේ රට වෙනුවෙන් කරන්න කියන එක තමයි එතුමන්ලා අපට කිව්වේ. ප්‍රවාහන ක්ෂේත්‍රය කියන්නේ රටක ආර්ථිකයක backbone එක. එහෙම නැත්නම් ආර්ථිකය පදනම් වෙන්නේ ප්‍රවාහනය මත. ලෝකයේ වෙනත් රටවල් ගත්තත් ඒක එහෙමයි. ලෝකයේ ජනාවාස ව්‍යාප්ත වෙනකොට, නිෂ්පාදනය වැඩි වෙනකොට, mobility කියන දේ තමයි ආර්ථිකය සංවර්ධනය කරන්නේ. ඒ නිසා අපි logistics කර්මාන්තය ගත්තොත්, භාණ්ඩ ප්‍රවාහනය, මගී ප්‍රවාහනය කියන දේ මත තමයි අගය එකතු කිරීම් සිද්ධ වෙන්නේ. කොයි පැත්තෙන් ගත්තත් ඒක එහෙමයි. ආර්ථිකයක භාණ්ඩ නිෂ්පාදනයේ සිට පාරිභෝගිකයා දක්වාත්, රැකියාවක් විධියට යොදවා සේවා කර්මාන්තයට එකතු කිරීම යන සමස්ත ක්‍රියාවලියේ පදනම වෙන්නේත් ප්‍රවාහනයයි. විශේෂයෙන්ම ප්‍රවාහනයේ සුලබතාව, පිරිවැය අවමවීම, කාර්යක්ෂමතාව සහ ආරක්ෂිතභාවය තමයි ආර්ථිකයක ශක්තිමත්භාවය, එහෙම නැත්නම් ආර්ථිකයක වර්ධනය තීරණය කරන්නේ.

මම හිතනවා, මෙවර අය වැයෙන් වෙන් කරපු රුපියල් බිලියන 483 තමයි, අපේ රටේ ආර්ථිකය පරිවර්තනය කරන්න ගන්න ප්‍රධානම පියවර, නැත්නම් අඩිතාලම විධියට වැටෙන්නේ කියලා. පද්ධතියක් විධියට ගත්තාම ගුවන්, නාවික, මහාමාර්ග, දුම්රිය මාර්ග කියන මේ කොයි පැත්තෙන් ගත්තත්, මේ දක්වා රට පාලනය කරපු අයට මේවාට ආර්ථික දායකත්වයක්, නැත්නම් ආර්ථිකමය හැඩරුවක් දෙන්න බැරි වුණා. අපේ රටේ ආර්ථිකයෙන් සියයට 2.5ක ප්‍රමාණයකට දායක වන මේ ක්ෂේත්‍රය, සමහර කර්මාන්තවල පිරිවැයෙන් සියයට 10ක් පමණ

වෙනවා. මේ විපක්ෂය, එහෙම නැත්නම් නව ලිබරල් ආර්ථිකය ගෙනාපු අය කවදාවත් ප්‍රවාහනය ආර්ථික උපාය මාර්ගයක් විධියට දැක්කේ නැහැ. ඒ අය හැම තිස්සේම ඒක දැක්කේ වියදමක් විධියටයි, කප්පාදු කළ යුතු දෙයක් විධියටයි, ලාභ ලැබිය යුතු දෙයක් විධියටයි. ප්‍රවාහන ක්ෂේත්‍රයේ ලාභ උපරිම කරන්න ගියොත්, අපේ තරගකාරිත්වය ලෝක මට්ටමින් අඩු වෙනවා කියන එක මේ ආර්ථික ඔස්තාර්ලාට කාලයක් යනතුරු තේරුම් ගන්න බැරි වුණා.

විශේෂයෙන්ම ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ ප්‍රවාහනය කියන්නේ මේ ආර්ථිකයට සේවයක්. ඒ තුළින් එක පැත්තකින් නිෂ්පාදන ආයතනවල පිරිවැය අඩු කරලා දෙනවා. ඒ වාගේම ඒ අයගේ සේවකයන් ප්‍රවාහනයට යන වියදම අඩු කරලා දුන්නොත්, එතැනත් වියදම අඩු වෙනවා. මහ මග ගත කරන කාලය අවම කිරීම තුළිනුත් අපට ඵලදායීතාව වැඩි කර ගන්න පුළුවන්. සේවකයන්ගේ තෙහෙට්ටුව අඩු කර ගැනීම තුළිනුත් ඵලදායීතාව වැඩි කර ගන්න පුළුවන්. භාණ්ඩවල සුරක්ෂිතතාව වැඩි කර ගැනීම තුළිනුත් ඵලදායීතාව වැඩි කර ගන්න පුළුවන්. Sri Lanka Customs එකේ හිර වෙලා තිබෙන කාලය මත, එහෙම නැත්නම් කර්මාන්තශාලාවලට බඩු ගෙන්වා ගැනීමේදී තිබෙන අපහසුතාව මත ඵලදායීතාව අඩු වෙලා තිබෙනවා. ඒක දියුණු කර ගන්නත් ප්‍රවාහනය අපට උපාය මාර්ගයක් වෙනවා.

මේ අය වැයෙන් අපි පැහැදිලිව ඉදිරිපත් කරනවා, මේ පරිවර්තනය ලංකාවේ සිද්ධ කර ගන්න, රාජ්‍ය සහ පෞද්ගලික කියන අංශ දෙකේම දායකත්වය අපට අත්‍යවශ්‍ය වෙනවා කියන කාරණය. මේ ක්‍රියාවලිය තුළින් අමාත්‍යාංශයිය උපදේශක කාරක සභා යටතේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ නව business models හදන්න මේ වෙලාවේ අපේ කණ්ඩායමක් කටයුතු කරනවා. ඒ වාගේම, මේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන ඉඩ - space - අපි භාවිත කරන්නේ කොහොමද, ප්‍රවාහන ක්ෂේත්‍රය භාවිත කරන මගීන් පාරිභෝගිකයන් විධියට සලකා, ඒ පාරිභෝගිකයන්ගෙන් නව ධනය උත්පාදනය කරන්න පුළුවන් ව්‍යාපාරික අවස්ථා බිහි කරන්නේ කොහොමද කියන දේවල් ගැනත් අපි සොයා බලනවා.

ඒ වාගේම දැනට තිබෙන බස් රථ, දුම්රිය, දුම්රිය පාරවල්, මහාමාර්ග සහ ජල මාර්ග උපරිම ධාරිතාවට අනුව භාවිත කරන්නේ කොහොමද, මේ සමස්ත ක්‍රියාවලිය optimize කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් මේ වෙනකොට අපි යෝජනා ඉදිරිපත් කරමින් සිටිනවා. මගී ප්‍රවාහනයට අමතරව භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය සේවාව භාවිත කරන්නේ කොහොමද, දුම්රිය මාර්ගයත් එක්ක ඒකාබද්ධ කරලා parking පහසුකම් සලසා, ඒ තුළින් අමතර ආදායමක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ලබා ගන්නේ කොහොමද, delivery එහෙම නැත්නම් courier ක්‍රියාවලියක් සඳහා දුම්රිය භාවිත කරන්නේ කොහොමද, advertising සහ marketing කියන අවස්ථා ළඟා කර දී ඒවායෙන් අමතර මුදලක් උත්පාදනය කරන්නේ කොහොමද කියාත් අපි යෝජනා ඉදිරිපත් කරමින් සිටිනවා. අගය එකතු කළ සේවා - value added services - පාරිභෝගිකයාට ලබා දීලා, අදාළ ඉඩම් සහ buildings ආර්ථික උත්පාදන මාර්ග බවට පත් කර ගෙන ඒ ක්‍රියාවලියට අවශ්‍ය spare parts සහ repairs කරන ව්‍යාපාරික ස්ථාන, මුදල් උත්පාදනය කරන ස්ථාන බවට පත් කිරීම තුළින් අපට පුළුවන්, භාණ්ඩාගාරයට බරක් නොවන විධියට පොදු ප්‍රවාහනයේ වියදම අඩු කරලා, ලාභදායී විධියට අපේ ප්‍රවාහන සේවය පවත්වා ගෙන යන්න.

ඒ වාගේම තමයි අපේ SLTB බස් සේවය. අපට අවශ්‍ය ප්‍රමාණයට බස් රථ නැහැ. ඒවා නඩත්තු කරලා නැහැ. අවශ්‍ය fleets අරගෙන නැහැ. ඒ නිසා එතැනින් එහාට ගිහිල්ලා අපි ඒකට තාක්ෂණය පාවිච්චි කරන්නේ කොහොමද, ඒකාබද්ධ ප්‍රවාහන සේවයක් පෞද්ගලික සහ රාජ්‍ය කියන අංශ දෙකටම පාවිච්චි කරන්නේ කොහොමද, විශේෂයෙන්ම, දුර ප්‍රදේශවලට භාණ්ඩ ප්‍රවාහනය කර ගැනීම සඳහා ඒවා භාවිත කරන්නේ කොහොමද, workshops සහ repairs කියන ඒවා ව්‍යාපාරයක් විධියට මේ කටයුත්තට බද්ධ කර ගන්නේ කොහොමද කියාත් අපි සොයා බලනවා. ඒ වාගේම sea and air logistic hubs කියන සංකල්ප සියල්ල මේ නව අය වැය තුළ ගැබ් වෙලා තිබෙනවා, ආරම්භයක් විධියට අනුගමනය කරන්න.

විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ, මේ වෙන් කර තිබෙන රුපියල් බිලියන 433 තුළින් අපේ රටේ ආර්ථිකයේ නව නැම්මක්, නව හුරුවක් ඇති කරන්න සූදානම් වෙලා තිබෙන බව. විශේෂයෙන්ම මාර්ග පද්ධතිය දියුණු කිරීම සඳහා රුපියල් බිලියන 335ක්, පාලම්- bridges - ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් බිලියන 22ක්, railways දියුණු කිරීම සඳහා රුපියල් බිලියන 24ක්, transportation sector එකට රුපියල් බිලියන 23ක්, ports and airportsවලට රුපියල් බිලියන 9ක් වශයෙන් අපි මුදල් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම ports and airports ගත්තොත්, අපට ඒ සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික අංශයත් දායක කර ගන්න වෙනවා. ඒ වාගේම අපේ කර්මාන්තකරුවන් කාලයක් තිස්සේ ඉල්ලපු dry port එක දශක ගණනකට පසුව ලංකාවට එනවා. මොකක්ද, dry port එකක් කියන්නේ? ඒ අයගේ භාණ්ඩ වෙනත් තැනක - වෙයන්ගොඩ වාගේ ප්‍රදේශයක - එකලස් කරන්න පුළුවන් නම්, ඒකට Sri Lanka Cutoms එකෙන් approval වාගේම clearances ගන්න පුළුවන් නම්, කොළඹ වරායේ භාණ්ඩ ගොඩ ගැහෙන තත්ත්වය අපට මහ හරවා ගන්න පුළුවන්. මේක ගොඩක් අපනයනකරුවන් ඉල්ලපු සේවාවක්. ඉදිරියේදී රට පුරා තිබෙන නිෂ්පාදන කර්මාන්ත පදනම් කරගෙන dry ports බිහි කරන්න අපට හැකියාවක් ලැබෙනවා.

අවසාන වශයෙන් මම කියනවා, බ්‍රිතාන්‍ය ජාතිකයන් රේල් පාර හැදුවේ නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා බව. නිෂ්පාදනය මත තමයි ප්‍රවාහන ක්ෂේත්‍රය නිර්මාණය විය යුත්තේ. නිෂ්පාදනය කරන භාණ්ඩ කොහොමද අපි ඵලදායී ලෙස ප්‍රවාහනය කරන්නේ? පසුගිය දශක කිහිපයේදී අපි දැක්කේ පාරවල්වල සංවර්ධන කටයුතු නාස්තිකාර විධියට සිද්ධ වන ආකාරය. මොන මූල්‍ය ආයතනයෙන් මුදල් දුන්නත් ජාතික සැලැස්මක් යටතේ නොවෙයි ප්‍රවාහන පද්ධතිය දියුණු වුණේ. ඒ නිසා අපේ මේ අලුත් ආරම්භයට විපක්ෂයත්, රටේ ජනතාවත් යෝජනා ලබා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. ආර්ථිකය ඉහළ නැංවීමේ ප්‍රධානම සාධකයක් වන ප්‍රවාහන ක්ෂේත්‍රය ඉදිරියට ගැනීම තමයි ලංකාවේ ආර්ථික පුනරුදයේත්, නිෂ්පාදන ආර්ථිකයේත් අඩිතාලම වෙන්නේ. කර්මාන්ත අමාත්‍යාංශය මොන සැලසුම් හැදුවත්, ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් දායකත්වය ලැබෙන්නේ නැතුව අපට මේ රට ඉදිරියට ගෙන යන්න බැහැ.

බොහොම ස්තුතියි මට මේ අවස්ථාව ලබා දුන්නාට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පත්මනාදන් සත්‍යලිංගම් මැතිතුමාට මම විනාඩියකින් පිළිතුරු ලබා දෙන්න කැමැතියි.

එතුමා පැහැදිලි කළා, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග - unprotected level crossings - ලෙස හඳුන්වන ස්ථාන පිළිබඳව. අපි ඊයේ දුම්රිය පාලන අධිකාරියෙන් ඒ තොරතුරු ලබා ගත්තා. ලංකාවේ දැනට ගත්තොත්, Trincomalee line එකේ එවැනි අනාරක්ෂිත ස්ථාන 60ක්, Batticaloa line එකේ 80ක්, Badulla

[ගරු බිමල් රත්නායක මහතා]

line එකේ 63ක්, Northern line එකේ 65ක්, Mannar line එකේ 35ක්, Main line එකේ 17ක්, Puttalam line එකේ 63ක්, KV Line එකේ 32ක් හා coastal line එකේ 20ක් වශයෙන් ස්ථාන 429ක් තිබෙනවා. මගේ ආරම්භක කථාවේදී කිව්ව විධියටම අපි ඒ අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 429ම මේ වසර තුළදී ආරක්ෂිත ස්ථාන බවට පත් කිරීමේ ambitious programme එකක ඉන්නවා. ඒ සඳහා කලාකරුවන් සහ පෞද්ගලික අංශයත් දායක වෙන්න ලෑස්ති වෙලා ඉන්නවා.

දුම්රිය ගේට්ටුකරුවන් යෙදවීම එතරම්ම සුදුසු නැහැ. නමුත්, දුම්රිය ගේට්ටුකරුවන් මේ දක්වා විශාල සේවයක් කරලා තිබෙනවා. ඔවුන් ඉතා කුඩා වැටුපකට තමයි ඒ සේවාව ලබා දෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් දුම්රිය ගේට්ටුකරුවන් කරන සේවාවෙන්ම ඒ අනතුරු වළක්වා ගන්න බැහැ. සමහර අත්දැකීම් තිබෙනවා, ඒ ගේට්ටුකරුවන් යෙදෙව්වාට පසු අනතුරු වැඩි වෙලා තිබෙන බවට. මොකද, ඔවුන්ට එතැන දිගටම රැදී සිටින්න බැහැ, රුපියල් 7,500ක් හෝ රුපියල් 10,000ක් වාගේ වැටුපකට. මිනිසුන් භය නැතුව දුම්රිය මාර්ගය හරහා යනවා දුම්රිය ගේට්ටුකරුවන් ඉන්නවා කියලා හිතලා. හැබැයි, ඇත්තටම ඔහු එතැන නැහැ. එම නිසා දුම්රිය අනතුරු වැඩි වූ අවස්ථාත් ඕනෑ තරම් අපට දකින්නට තිබෙනවා. එම නිසා දුම්රිය දෙපාර්තමේන්තුව තීන්දු කරන පරිදි electronic control systems හෝ traffic lights control systems හදලා ඒ සියල්ල මේ වසර තුළදී අවසන් කරන්න අපි උපරිමයෙන් කටයුතු කරන්න බලාපොරොත්තු වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා.

[ප.ව. 4.59]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෛරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, නන්රි.

මතිප්පුක්කුම් මරියාතෛක්කුම් උරිය කෞරව අමෛච්චරුම් පාරාළුමන්රච් සපෛ මුතල්වරුමාන පිමල් රත්නායක්ක අවර්කළේ, උංකළුටෙය පාරපට්චමින්මෛයෛයුම්, එල්ලෝරෛයුම් අරවණෛත්තුක්කොණ්ටු චෙල්ලවේණ්ටුමෙන්ර එණ්ණත්තෛයුම් නාන් මිකමිකප් පාරාට්ටුකින්රේන්; වාළ්ත්තුකින්රේන්. උංකළතු අමෛච්චින්කීළ් චෙය්යප්පට්ට නිති ඔදුක්කීටුකළ් පූරණත් තිරුප්ති! මුල්ලිවාය්ක්කාල් කිළක්කු කිරාම අලුවලර් පිරිවිලුල්ල වට්ටුවාකල් පාලත්තෛ අමෛප්පතර්කාන කෝරික්කෛ අතර්කාන නිතියොතුක්කීට්ටින් මූලම් නිරෛවේර්රප්පට්ටිරුක්කිරතු. අතර්කාක, මාණ්පුමිකු ජනාතිපති අවර්කළුක්කුම් උංකළුක්කුම් මනම් නිරෛවාන නන්රිකළ්! ඉන්තප් පාලත්තින් කට්ටුමානප් පණිකළෛත් තුරිතමාක මුන්නෙටුක්කවුම්, ඉන්ත වරුටත්තිර්කුළ් ඉතර්කාක ඔදුක්කප්පට්ට පණත්තුක්කාන වේලෛත්තිට්ටංකළෛප් පූරණප්පටුත්තවුම් උංකළුටෙය ආතරවු මුළුමෛයාකත් තේවෛ.

අටුත්තු, ඉප්පෝතු ඔරු මුක්කියමාන කෝරික්කෛයෛ උංකළිටම් මුන්වෛක්කින්රේන්. අටුත්ත වරවු චෙලවුත් තිට්ටත්තිලෝ ඉල්ලාවිට්ටාල්, අතර්කු මුන්නර් නිති කිටෛක්කුම් පට්චත්තිලෝ ඉත්තිට්ටත්තිර්කු මුන්නුරිමෛ අළියුංකළ්! අතාවතු, මුල්ලෛත්තීවු, කොක්කිළායිලිරුන්තු තිරුකෝණමලෛ, පුල්මෝට්ටෛ වරෛයිලාන ඉරණ්ටු මාවට්ටංකළුක්කුම් ඉටෛයිල් ඔරු පාලම් අමෛක්ක වේණ්ටියිරුක්කින්රතු. එනවේ, අතනෛ අමෛප්පතනූටාක අන්ත මක්කළිනතු කනවෛ නිරෛවේර්රුංකළ්! අතිකමාන චුර්රුලාප් පයණිකළුක්කුම් ඉතු පයනුළ්ළතාක අමෛයුම්. ඉන්තප් පාලත්තෛක් කොක්කිළාය් නීරේරියිනූටාක අමෛප්පතාල් මිකවුම් කුරුකිය නේරත්තිල් පයණිකළ් පිරයාණම් චෙය්වතර්කු උතව මුටියුම්. පාරාළුමන්ර උරුප්පිනර් එන්ර වකෛයිල්, නාට්ටින් මුන්නේර්රත්තිර්කු එර්ර වකෛයිල් ආලෝචනෛ වළුංකවේණ්ටිය පොරුප්පු එමක්කුම් උණ්ටු. ඉන්තප් පාලත්තෛ අමෛප්පතාල් ඉරණ්ටු මාවට්ට මක්කළුටෛය කෝරික්කෛයෛ නිරෛවේර්රුවතාක අමෛවතෝටු, චුර්රුලාප් පයණිකළ් පෙරුමළවිල් ඉන්තප් පකුතිකළුක්කු වරුවතන්මූලම් නාට්ටින් වරුවාය්ක්කුම් උතවුම් එන්පතු එනතු අචෛක්ක මුටියාත නම්පික්කෛ.

අටුත්තු, ඉන්නුමොරු කෝරික්කෛයෛයුම් එංකළුටෛය කෞරව අමෛච්චර් අවර්කළිටම් නාන් මුන්වෛක්කින්රේන්. අතනෛච් චෙය්වතුම් චෙය්යාතතුම් උංකළෛප් පොරුත්තතු. ආනාල්, උංකළෛ එනක්කුප් පිටික්කුම්. අන්ත වකෛයිල්, නාන් ඉන්තක් කෝරික්කෛයෛ මුන්වෛක්කින්රේන්. කෞරව අමෛච්චර් අවර්කළේ, ඉරන්තවර්කළෛ නිනෛවු කූරුවතෙන්පතෛ අවරවරතු චමය නම්පික්කෛකළුක්කේර්ප මක්කළ් චෙය්තුවරුවතු වළමෛයාකුම්. එංකළුටෛය මක්කළ් වටක්කු, කිළක්කිල් යුත්තත්තිල් ඉරන්තවර්කළෛ නවම්පර් 27 අන්රු තුයිලුම් ඉල්ලංකළිලුම්, මේ 18 අන්රු මුල්ලිවාය්ක්කාලිලුම් නිනෛවුකූරුවාර්කළ්. කටන්ත නවම්පර් 27ආම් නාළෛ උංකළුටෛය ආට්චියිල් තටෛයිල්ලාමල් උණර්වුපූර්වමාක නිම්මතියාක මක්කළ් නිනෛවුකූර්න්තාර්කළ්. ආනාලුම්, තුයිලුම් ඉල්ලංකළ් චිලවර්රිල් ඉන්නමුම් ඉරාණුවත්තිනර් ඉරුක්කින්රාර්කළ්. ඉරාණුවත්තිනරින් එණ්ණික්කෛ වටක්කු, කිළක්කිල් අතිකමාකවුම් මුල්ලෛත්තීවිල් ඉන්නුම් අතිකමාක, 2 පේරුක්කු ඔරු පටෛයිනර් එන්ර අටිප්පටෛයිලුම් උළ්ළතෛප් පලරුම් චුට්ටික්කාට්ටි යිරුක්කින්රනර්. මක්කළ් තංකළුටෛය උරවුකළෛ නිනෛත්තු, ඔරු චොට්ටුක් කණ්ණීර් චින්ති, තමතු මනතෛ ආරුතල්පටුත්ත, ඉරාණුවම් අත්තුමීරි ඉරුක්කින්ර මුළ්ළියවළෛ, අළම්පිල්, තේරාවිල්, ඈච්චංකුළම් උළ්ළිට්ට ඉන්නුම් චිල තුයිලුම් ඉල්ලංකළෛ විටුවියුංකළ් එන්රු නාන් වටක්කු, කිළක්කු තමිළ් මක්කළ් චාර්පාක උංකළෛක් කේට්టුක් කොළ්කින්රේන්.

අටුත්තතාක, වීටමෛප්පු චම්පන්තමාක ඉංකු පලරාලුම් කරුත්තුකළ් චොල්ලප්පට්ටතු. ඉරුන්තාලුම් 2018ආම් ආණ්ටු තේචිය වීටමෛප්පු අපිවිරුත්ති අතිකාරචපෛයිනාල් වළංකප් පට්ටු ඉටෛනිරුත්තප්පට්ට වීට්ටුත් තිට්ටම් තොටර්පාක නානුම් ඔරු විටයත්තෛච් චොල්කින්රේන්. කටන්ත 2018ඉල් තර්පෝතු එතිර්ක්කට්චිත් තලෛවරාකප් පතවි වකික්කුම් චජිත් පිරේමතාච අවර්කළ් වීටමෛප්පු අමෛච්චරාකප් පතවි වකිත්ත කාලප්පකුතියිල් වටක්කු, කිළක්කුප් පකුතියිල් වෙළ්ළ ඉටර්කළිනාල් පාතික්කප්පට්ටවර්කළ්, යුත්තත්තිනාල් ඉටම්පෙයර්න්තු අකති මුකාම්කළිලේ තංකි වාළ්න්තු මීළක් කුටියේර්රප්පට්ටවර්කළ්, පුනර්වාළ්වළික්කප්පට්ට පෝරාළිකළ් මර්රුම් වරුමෛ නිලෛයිල් වාළ්න්ත කුටුම්පංකළෛච් චාර්න්තවර්කළ්, අනාතෛච් චිරුවර්කළ් මර්රුම් යුත්තත්තින්පෝතු කණවනෛ ඉළන්ත පෙණ් තලෛමෛතාංකුම් කුටුම්පංකළෛච් චාර්න්තවර්කළ් එන්ර අටිප්පටෛයිල් වරුමෛක් කෝට්ටුක්කු උට්පට්ට, අටිප්පටෛ වචතිකළර්ර, තර්කාලික වීටුකළිල් කෛයරුනිලෛයිල් වාළ්කින්ර කුටුම්පංකළෛච් චේර්න්තවර්කළුක්කු 750,000 රූපාය් පෙරුමතියාන

වීට්ටුත් තිට්ටමානනු 2 මාත කාලප්පකුතික්කුළ් කට්ටි මුටික්කප්පටවේණ්ටුමෙන්ර නිපන්තනෙයින් අටිප්පටෙයිල් වළුංකප්පට්ටතු. ඉරුප්පිනුම්, අරසාංකම් මාර්රප්පට්ටතන් විළෙවාක ඉත්තිට්ට නටවටික්කෙයානනු ඉටෙනිරුත්තප් පට්ටු, කේප්පාරර්රුක් කෙවිටප්පට්ට නිලෙයිල් කාණප්පටු කින්රනු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please, ඉරු නිමිටත්තිල් මුටික්කිරේන්.

ඉතනෙත් තොටර්න්තු 2019ආම් ආණ්ටු කාලප්පකුතියිල් වළුංකප්පට්ට වීට්ටුත් තිට්ටංකළ් අනෙත්තුම් මේර්කුරිප් පිට්ට තිට්ටත්තිනාල් පාතික්කප්පට්ටවර්කළෙත් තවිර්ත්තේ වළුංකප්පට්ටතු. අරසාංකංකළ් මාරිනාලුම් ඉත්තිට්ටම් තොටර්පාක එව්විතමාන මුන්නේර්රංකළුම් ඉතුවරෙයිල් ඉටම්පෙරාමල් ඉරුප්පතු මිකවුම් වරුන්තත්තක්කතු. එනවේ, වටක්කු, කිළක්කිල් මුල්ලෛත්තීවිල් මට්ටුමන්රි, මන්නාර් වවුනියා උළ්ළිට්ට වන්නියිල් උළ්ළවර්කළුක්කුම් ඉන්ත වීට්ටුත් තිට්ටම් මුළුමෙයාකක් කිටෙක්ක ආවන සෙය්යුමාරු කේට්ටුක් කොළ්කිරේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආචාර්ය අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.04]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී අද දින අපි සාකච්ඡා කරනවා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් ගැන. ඇත්ත වශයෙන්ම අපි අවධානය යොමු කරන්නට ඕනෑ, අය වැයෙන් වෙන් කරන මුදල් කළමනාකරණය කරන්නේ කොහොමද, එම මුදල් යොදවන්නේ මොනවාටද, ඒවායෙන් ලැබෙන ප්‍රතිඵලය මොකක්ද කියලා. සමහර ඒවායේ ප්‍රතිඵලය මෙම වර්ෂය තුළම දකින්න පුළුවන්. හැබැයි, සමහර ඒවායේ ප්‍රතිඵලය ලැබෙන්න වසර ගණනාවක් යනවා. එම අර්ථයෙන් ගත්තාම විශේෂයෙන්ම ප්‍රවාහන මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට මෙම වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 487.5ක්. එහිදී සලකා බැලිය යුතු වනවා, කොපමණ ප්‍රමාණයක් ප්‍රාග්ධන වැය -මූලධන වියදම්- සඳහා වෙන් කරනවාද කියන කාරණය. මෙම අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වැය සඳහා සියයට 89කට, සියයට 90කට ආසන්න ප්‍රමාණයක් වෙන් වනවා. ඒක තමයි ආයෝජනය. එම මුදල් වෙන් කිරීම ගිය වර්ෂයට සාපේක්ෂව සියයට 16කින් වැඩි වෙලා තිබෙනවා. සමස්ත වියදම ගත්තාම එය සියයට 6.8කින් වැඩි වෙලා තිබෙනවා. එහි වැදගත්කම අපි සැලකිල්ලට භාජන කරනවා. එහි වැදගත්කම අපි ඇයි විශේෂයෙන් සැලකිල්ලට භාජන කරන්නේ? අනිකුත් අය වැය අරමුණු ඉෂ්ට කර ගන්නා අතරතුරේදීම එම අංශයට වියදම් කරන ප්‍රාග්ධන මුදල්වලින් අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය කිරීම ආර්ථික වර්ධනය සහ සංවර්ධනය කියන කාරණාවලට දායක වන බැවින්. එම ප්‍රාග්ධන වියදම්වල ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. එතැනත් ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් තිබෙනවා. එකක් තමයි, නව වත්කම් අත්පත් කර ගැනීම. ඊළඟට, තිබෙන වත්කම් නඩත්තු කිරීම සහ ඒවා නැවත සකස් කර ගැනීම. එවැනි කාරණාවලට සමස්තයෙන් සියයට 74.4ක් වෙන් වී තිබෙනවා.

ඊළඟට, මෙම අරමුදල් වෙන් වන්නේ කොහොමද කියලා බැලුවොත්, එය ක්ෂේත්‍ර ගණනාවකට යනවා. යටිතල පහසුකම් සංවර්ධනයේදී මාර්ග සංවර්ධනය ඉතාම වැදගත්. මේ ප්‍රතිපාදන ඇතුළේ ප්‍රාග්ධන වියදම්වලින් සියයට 86ක් මාර්ග සංවර්ධනයට වෙන් වනවා.

මෙතැනදීත් විශ්ලේෂණය කර බැලුවාම පෙනෙනවා, ඒ මාර්ග සංවර්ධනය හුදෙක් එක් දිස්ත්‍රික්කයකට, එක් ප්‍රදේශයකට සීමා වෙලා නැහැ, මුළු ලංකාව පුරාවටම ජාලගත ආකාරයට මේ කටයුත්ත යෝජනා කර තිබෙන බව. ඉන් කිහිපයක් මම සඳහන් කරන්න කැමැතියි. දැනට තිබෙන සමහර ව්‍යාපෘති කලින් පවත්වාගෙන ආපු ඒවා. ඒවාත් අපි නිසි පරිදි කළමනාකරණය කරලා, වේගවත් කරලා ඉදිරියට ගෙන යන්න ඕනෑ. ඒ වාගේම අලුත් ව්‍යාපෘති ඒ ආකාරයට සැලසුම් කරන්න ඕනෑ. මොකද, රටක අය වැය සකස් කරනකොට අලුත් ආණ්ඩුවක් ආවා කියලා සියලු දේ නවත්වලා අපිට අලුතෙන් පටන් අරගෙන ඉදිරියට යන්න බැහැ. මෙය, රටක් ඉදිරියට යන ගමනේ එක් ස්ථානයක්, එක් වර්ෂයක් පමණයි. ඒ නිසා මේ අමාත්‍යාංශය ඇතුළේ කටයුතු කරගෙන යාමේදී අපිට හිර වෙච්ච සමහර කරුණු කාරණා ගණනාවකුත් තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, වෙන වෙන ආයතනවලට ගත්තු ණය තිබෙනවා. ඒවා රාජ්‍ය භාණ්ඩාගාරයේ ණය විධියට නොවෙයි පෙන්නුම් කර තිබෙන්නේ. සමස්ත ණය බරෙනුත් ඒවා අයින් කර තිබෙනවා. ඒ අනුව මේ අවුරුද්දේත් රුපියල් බිලියන 66ක් එවැනි පැරණි ණය මේ අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් විධියට අපිට ගෙවන්න සිදු වෙලා තිබෙනවා.

ඊළඟට, අධිවේගී මාර්ගවලට රුපියල් මිලියන 153.8ක් වෙන් කරලා තිබෙනවා. කොළඹ-රත්නපුර මාර්ගය ඉදි කිරීම සහ කැලණි පාලම සිට අතුරුගිරිය දක්වා කුලුනු මත ඉදි වෙන මාර්ගයට මුදල් වෙන් වෙලා තිබෙනවා. ඉහුරුකඩේ හන්දිය සිට වරාය පිවිසුම් මාර්ගයට රුපියල් මිලියන 23,900ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම මධ්‍යම අධිවේගී මාර්ගය දැන් තීරණාත්මකයි. අපිට ඒ මාර්ගය හදන්න වෙනවා, එහි ගැටලු සමාකරණය කරලා. මේ වාගේ ක්ෂේත්‍ර 4කට අදාළව අපි යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. කඩවත-මීරිගම මාර්ගයේ කිලෝමීටර 37ක ප්‍රමාණය, මීරිගම- කුරුණෑගල මාර්ගයේ කිලෝමීටර 39ක ප්‍රමාණය, පොතුහැර-රඹුක්කන මාර්ගයේ කිලෝමීටර 12ක ප්‍රමාණය සහ Kadawatha Interchange එක වෙනුවෙන් රුපියල් බිලියන 122.4ක් වෙන් කරලා ප්‍රමුඛතාව දීලා තිබෙනවා. ඊට අමතරව පිටකොටුව අන්තර් නුවමාරු මධ්‍යස්ථාන දෙකක් වෙනුවෙනුත් රුපියල් මිලියන 4,500ක් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහා මාර්ගවලට අමතරව අනෙකුත් මාර්ග සංවර්ධනය කෙරෙහිත් අපි අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන් ගංවතුර හානියෙන් බිඳ වැටුණු මාර්ග ඇතුළුව දිවයින පුරා විහිදී තිබෙන මාර්ග නඩත්තුව සඳහා රුපියල් මිලියන 31,500ක් වෙන් කරනවා. බෙස්ලයින් පාරේ අදියර 3

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කරනවා. පේරාදෙණිය-බදුල්ල-වෙන්කලඩි මාර්ගයේ කටයුතු සඳහාත්, අම්පාර උහන, ලුණුගල ප්‍රදේශ සඳහාත් සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම මාර්ග ජාල ගොඩනැඟීමේදී ඔරුගොඩවත්ත සඳහාත්, පිළියන්දල-මහරගම මාර්ග සංවර්ධන කටයුතු සඳහාත්, මධ්‍යම ඌව පළාතේ පාලම් සහිතව කිලෝමීටර 51ක දුර සඳහාත්, විකල්ප මාර්ග පද්ධති සඳහාත් රුපියල් මිලියන 15,000ක් වෙන් වෙනවා. විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක් තමයි, අපි වියදම් යෝජනා යටතේ උතුරු පළාත ඇතුළුව අනෙකුත් පළාත්වල මාර්ග සංවර්ධනය සඳහාත් මුදල් වෙන් කළා. ඒ සඳහා විශේෂයෙන්ම විමධ්‍යගත අරමුදල් යටතේ වෙන් කරන ලද මුදල්වලින් රුපියල් මිලියන 9,000ක් වෙන් කරලා තිබෙනවා. ඊට අමතරව ග්‍රාමීය මාර්ග කිලෝමීටර 1,000ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 18,080ක් වෙන් කර තිබෙනවා.

නව වියදම් යෝජනා යටතේ විශේෂ කථා බහට ලක් වෙච්ච වඩඩුවාකල් පාලම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. හුදෙක්ම භෞතිකව පෙනෙන සංවර්ධනයටත් වඩා එහා ගිය කාරණයක් මේ තුළ පෙන්වනවා. ඒ තමයි, අපි කොහොමද මේ සංවර්ධනය ගමට අරගෙන යන්නේ, සෑම තැනකම සම්බන්ධතාව හදන්නේ කොහොමද කියන එක. මොකද, ලංකාවේ තිබෙන තවත් සුවිශේෂී ප්‍රශ්නයක් තමයි ප්‍රාදේශීය විෂමතාවක් - regional disparity එකක් - තිබීම. මේක වෙනස් කරන්න නම් ආර්ථික සංවර්ධනයේදී ගම, නගරය හා සම්බන්ධ වෙන්න ඕනෑ.

පාලම් හා ගුවන් පාලම් සඳහා රුපියල් මිලියන 20,350ක් වෙන් වෙලා තිබෙනවා. එහිදී අබලන් පාලම්, ග්‍රාමීය පාලම්, ගුවන් පාලම් ඇතුළුව ඒ කටයුතු සඳහා විශාල මුදල් ප්‍රමාණයකුත්, මාර්ගස්ථ ප්‍රවාහනය දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 2,465ක් වෙන් වෙනවා. නව දුම්රිය මාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 11,775ක් වෙන් වෙනවා. එහිදී අවධානය යොමු වෙනවා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පාසල් ළමුන් සඳහා ප්‍රවේශ බලපත්‍ර ලබා දීම. ඒ සඳහා රුපියල් මිලියන 11,500ක් වෙන් කර ඒ සහනය අපි ලබා දෙනවා.

ඒ වාගේම ලාභදායී නොවන මාර්ගවල ගමනාගමන මණ්ඩලය හරහා ප්‍රවාහන පහසුකම් ලබාදෙන්න අපට සිදු වනවා. ඒ නිසා ඒ සඳහාත් මුදල් වෙන් කිරීමක් කර තිබෙනවා. සාමාන්‍යයෙන් ලාභය ඉලක්ක කරගත්ත ප්‍රවාහන පද්ධතිවල; පෞද්ගලික අංශයේ වාහන ඒ මාර්ගවල යොදවන්නේ නැහැ.

ඊළඟට, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධනය සඳහාත්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගොඩ නැඟීම සඳහාත් මුදල් වෙන් කරලා තිබෙනවා.

එහිදී විශේෂ අවධානය යොමු කළ ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. දුම්රිය මෙහෙයුම් හා සංවර්ධනය කිරීම, දුම්රිය බලඇණිය, සංඥා පද්ධති දියුණු කිරීම, නව රේල් පිලි ඉදි කිරීම, මගී මැදිරි 160ක් මිල දී ගැනීම ආදි වශයෙන් ක්ෂේත්‍ර ගණනාවක පැතිරුණු කාරණා ගණනාවක් තිබෙනවා. ඒ වාගේම කැලණිවැලි දුම්රිය ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම ආදි වශයෙන් කටයුතු ගණනාවක් තිබෙනවා. ඒ වාගේම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළවත් විද්‍යුත්කරණය සඳහා තාක්ෂණය එතැනට කැඳවීමටත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් වනවා.

මෙහිදී විශේෂයෙන් වෙළඳ නාවික ලේකම් කාර්යාලය ගැනත් කිව යුතුයි. එය කලින් තිබුණු ආයතනයක්. එය ප්‍රතිසංස්කරණයේදී අපි බලාපොරොත්තු වන කාරණයක් තිබෙනවා. අනෙකුත් සංවර්ධන කටයුතුත් එක්කම අපි අපේ රට නාවික කේන්ද්‍රස්ථානයක්, වෙළෙඳ කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ගන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය කරන ජාතික වෙළෙඳ ප්‍රවර්ධනය, නාවික හා වරාය කළමනාකරණ කටයුතු කිරීම, නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, වෙළෙඳ හා නාවික ආයෝජනය ආකර්ෂණය කර ගැනීම සහ විශේෂයෙන්ම ව්‍යාපාර හා නාවික සේවා පහසුකම් සැපයීම කියන ක්ෂේත්‍ර වෙනුවෙන් මේ වෙළඳ නාවික ලේකම් කාර්යාලය සඳහා අපි මුදල් වෙන් කර තිබෙනවා.

ඊට අමතරව, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය සඳහා 2025 වර්ෂයට සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් වෙනවා. එයිනුත් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය විශාලයි. වෙන් වන සමස්ත රුපියල් බිලියන 104න් රුපියල් බිලියන 102ක්ම වෙන් වන්නේ ප්‍රාග්ධන වියදම් සඳහා. එහිදී නාගරික සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 14.8ක් ද, නිවාස සංවර්ධනය සඳහා රුපියල් මිලියන 25ක් ද වෙන් වනවා. ජල සම්පාදනය හා සනීපාරක්ෂා කටයුතු වෙනුවෙනුත් රුපියල් බිලියන 54.6ක් වෙන් කරනවා. මීට අමතරව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ වෙන් වෙලා තිබෙන රුපියල් බිලියන 58ක් ජල සම්පාදන කටයුතු වෙනුවෙන් වෙන් කර තිබෙනවා. මේ ආදී වශයෙන් මේ ප්‍රධාන අමාත්‍යාංශ දෙක යටතේ අපට පැහැදිලිව මේ සංඛ්‍යාවලිනුත් පෙනෙනවා, අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කරලා සංවර්ධනය කරා යන්න අපේ අය වැය තුළ සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා කියලා. ඒ වාගේම මේ සංඛ්‍යා ඇතුළේ පෙන්නුම් කරනවා, මේ සංඛ්‍යාවලට එහා ගිය සංවර්ධනයට අවශ්‍ය කරන ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමකුත්. ඒ නිසාම ඉතා සුබවාදීව මේ අය වැය දෙස බැලිය හැකියි. විශේෂයෙන් මේ අමාත්‍යාංශ දෙක කැපී පෙනෙන අමාත්‍යාංශ දෙකක් වනවා කියන අදහස දක්වමින් මම මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 5.14]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிகக்குறுகிய நேரத்தில் சில விடயங்களைச் சுருக்கமாகச் சொல்ல வேண்டியுள்ளது. முதலாவதாக, மட்டக்களப்பு மாவட்ட bus depotஇல் சாரதிகள் பற்றாக்குறை காணப்படுவதால் புதிய சாரதிகளுக்கான நியமனத்தைப் பெற்றுத் தருமாறும், சேவையில் ஈடுபடுகின்ற அநேகமான பேருந்துகள் பழைமைவாய்ந்தனவாகக் காணப்படுவதனால் புதிய பேருந்துகளைப் பெற்றுத் தருவதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறும் உங்களை விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, RDA appointment என்ற வகையில் வீதி அபிவிருத்தி அதிகாரசபையால் 10 வருடங்களுக்கு முன்னர் வீதி அபிவிருத்திப் பணியாளர்கள் தற்காலிகமாக நியமிக்கப்பட்டார்கள். அவர்களுக்கு இன்னும் நிரந்தர

නියමනම් වලංගුකප්පඩවිල්ලෙ. එනවේ, අවර්කලුක්කු නිරන්තර නියමනත්තෙ වලංගුකුමාරුම් අමෙච්චරවර්කලිඩම් පණිවාකක් කේට්ටුක්කොල්කිරේන්.

ඉන්නුමොරු විඩයත්තෙච් චොල්ලියාක වේණ්ඩුම්. අතාවතු, පුකෙයිරතක් කඩවෙකලිල් කාප්පාළර්කලාක ඊඩුපඩුත්තප්පට්ටිරුප්පවර්කළ් සුමාර් 6,000 රූපාය් චම්පලත්තුක්කු පණියාට්රික් කොණ්ඩිරුක්කින්රාර්කළෙන නාන් නිනෙක්කිරේන්. අවර්කලුක්කුම් ඒතාවතු වකෙයිල් ඔරු චම්පල උයර්වෙක් කොඩුත්තුතවුමාරුම් කේට්ටුක් කොල්කින්රේන්.

1985ආම් ආණ්ඩු කාලප්පකුතියිල් මට්ටක්කළප්පු, වලෙයිරවිල් විමාන නිලෙය විස්තරිප්පු නඩෙපෙට්රපෝතු, වලෙයිරවු, තිරුප්පෙරුන්තුරෙ, චේත්තුක්කුඩා, පුතූර්, තිමිලතීවු පෝන්ර ඉන්තු කිරාමංකළිලිරුන්ත මක්කළ්, අතු යුත්ත කාලමාක ඉරුන්තපෝතු අංකිරුන්තු අකට්රප්පට්ටිරුන්තාර්කළ්; 300ක්කුම් මේර්පට්ටවර්කළ් ඉටම්පෙයර්න්තු වෙලියේර නේරිට්ටතු. පින්නර් අවර්කලුක්කු 1997ආම් ආණ්ඩු පතිල් කාණිකළ් කොටුක්කප්පට්ටතාක කූරප්පටුකින්රතු. ආනාල්, ඉප්පොළුතුවරෙ අන්තක් කාණිකළුක්කාන උරුතිකළ් අවර්කලුක්කු වලංගුකප්පඩවිල්ලෙ. අතනාල් අන්තක් කාණිකළෙ වෛත්තුක්කොණ්ඩු අතර්කු උරිමෙ පාරාට්ට මුඩියාත නිලෙයිල්, අතනෙ වෛත්තුක් කඩන් පෙර මුඩියාත නිලෙයිල්, අඩුත්ත චන්තතියිනරුක්කු එළුතික්කොටුක්ක මුඩියාත නිලෙයිල්, පාඩචාලෙයිල් පිළ්ළෙකළෙච් චේර්ක්කින්රපෝතු උරුතික් කාණි එන්ර අඩිප්පටෙයිල් පුළ්ළිකළ් වලංගුකප් පඩුවතනාල් උරිය පුළ්ළිකළෙප් පෙර මුඩියාත නිලෙයිල් අන්ත මක්කළ් චිරමප්පඩුකින්රාර්කළ්.

අතුමාත්තිරමල්ලාමල්, විමාන නිලෙය විස්තරිප්පු නඩවඩික්කෙයින්පෝතු අතන් මත්තියිනූඩාක චෙන්ර වීති මූඩප්පට්ටතු. ඉතනාල් සුමාර් 400 මීර්රර් ඉටෙවෙළියිල් පයණම් චෙය්ත මක්කළ් කිට්ටත්තට්ට ඉරණ්ටරෛක් කිලෝමීර්රර් සුර්රිවළෛත්තු පයණම් චෙය්යවේණ්ටිය නිලෛමෙ කාණප් පටුකිරතු. අන්ත ඉරණ්ටරෛක් කිලෝමීර්රර් තූරත්තෛයුම් එට්ටු වළෛවුකළුක්කූටාක චෙන්රේ කඩක්ක වේණ්ටියුළ්ළතනාල්, විපත්තුක්කළ් ඒර්පඩක්කූටිය නිලෛමෙ කාණප්පටුකින්රතු. 2009ආම් ආණ්ඩු යුත්තම් මුඩින්ත පින්නර් අන්ත ඉටත්තිල් එන්තවොරු කුණ්ටුම් වෙටිත්තතිල්ලෙ, තුප්පාක්කිච් චූටුම් නඩෙපෙට්රතිල්ලෙ. එනවේ, මත්තියිල් ඉරුක්කින්ර වීතියෛත් තිරක්ක මුඩියාවිට්ටාලුම් විමාන නිලෙය වළාකත්තින් වේලික්කුප් පක්කමාක චෙල්කින්ර වීතියෛයාවතු තිරන්තු කොටුක්කුමාරු කෙළරව අමෙච්චර් අවර්කලිටම් නාන් විනයමාක කේට්ටුක් කොල්කිරේන්. අන්ත වීතියෛත් තිරන්තු කොටුත්තාල්, අන්ත මක්කළ් මිකවුම් ඉලකුවාක පයණත්තෛ මේර්කොළ්ළක්කූටියතාක ඉරුක්කුම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(මාණ්පුමිකු ඥානමුත්තු ශ්‍රීනේසන්)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, give me one more minute, please.

ඉරුතියාක, නාන් ඉංකු කුරිප්පිට්ට RDA ඌළියර්කළින් temporary appointmentsඅ නිරන්තරමාක්කික් කොටුප්පතෝටු, පස් චාරතිකළ් පට්රාක්කුරෛයෛ නිවර්ත්ති චෙය්යුමාරුම් මීණ්ටුම් කේට්ටුක් කොල්කිරේන්. පුකෙයිරතක් කඩවෙකලිල් පණියාට්රු කින්ර ඌළියර්කළුක්කු චම්පලමාක 6,000 රූපායේ වලංගුකප්පඩුකින්රතු. අතු එව්වාරාන නියමනම් එන්රු එනක්කුත් තෙරියවිල්ලෙ. අවර්කළ් 15 ආණ්ඩුකළුක්කුම් මේලාක වේලෛ චෙය්කින්රාර්කළ්. එනවේ, අතර්කාන පරිකාරත්තෛච් චෙය්යුමාරුම් කේට්ටුක් කොළ්වතෝටු, මට්ටක්කළප්පු, වලෙයිරවු විමාන නිලෙයත්තුක්කුප් පක්කමාකච් චෙල්කින්ර වීතියෛප් පුනරමෛත්තුත් තරුමාරුම් මීණ්ටුම් කේට්ටු, එනතු උරෛයෛ නිරෛවු චෙය්කින්රේන්.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, Batticaloaවල ගුවන් තොටුපළ ආශ්‍රිතව තිබෙන පාරක් වසා දැමීම පිළිබඳව. ඒක වසා තිබෙන්නේ RDA එකෙන් ද, නැතිනම් Sri Lanka Army එකෙන් ද, එහෙම නැතිනම් Airport and Aviation Services එකෙන් ද කියලා අපට දැන ගන්න පුළුවන්ද?

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(මාණ්පුමිකු ඥානමුත්තු ශ්‍රීනේසන්)
(The Hon. Gnanamuththu Srineshan)
නිච්චයමාක මත්තිය වීති අංකිරුක්කින්ර විමාන නිලෙය අතිකාරිකළාල් මූඩප්පට්ටිරුක්කින්රතු; අතෛත් තිරක්ක මුඩියාතු. ආනාල්, විමාන නිලෙය වළාකත්තින් වේලික්කුප් පක්කමාක ඉරුක්කින්ර වීතියෛත් තිරප්පතර්කාන වචති ඉරුක්කින්රතෙන නාන් නිනෙක්කින්රේන්. අතන් ඔරු පකුති තිරන්ත නිලෙයිල් ඉරුක්කින්රතු; ඉටෙයිල් චිල කුරුක්කීටුකළ් කාණප්පටුකින්රන. අතිල් ඔරු චිලර් වීටුකළෛක් කට්ටියිරුන්තාලුම් අතෛත් තිරප්පතිල් එන්තවිතමාන චිරමමුම් ඉරුක්කාතු. නීංකළ් ඔරු කට්ටළෛ විටුත්තාල් අතෛ ඉලකුවාක චෙය්ය මුඩියුම් එන්ර විඩයත්තෛත් තංකළින් කවනත්තිර්කු තරුවතෝටු, අතෛච් චෙය්තු තරුමාරුම් මිකවුම් විනයමාකක් කේට්ටුක්කොල්කින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 23ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.20]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ ගැන කථා කරන මේ මොහොතේ මටත් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම මම දැක්කා, එක නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, ජනාධිපති සිතින විතරයි, ඉතිහාසයේ සිට නිවාස අමාත්‍යාංශයේ වැඩක් සිද්ධ වෙලා නැහැ කියලා. එතැනින් පොඩ්ඩක් මගේ කථාව පටන් ගන්නම්. හැබැයි, නිවාස අමාත්‍යාංශය කියන්නේ වැඩක් සිද්ධ වෙච්ච අමාත්‍යාංශයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔක්තෝබර් මාසයේ 1වෙනි දා ලෝක ජනාවාස දිනය විධියට නම් කරන්න යෙදුණේ, එක්සත් ජාතීන්ගේ ජනාවාස කොමිසමට යෝජනාවක් ඉදිරිපත් කරලා ඒක සම්මත කරගන්නට දිවංගත ආර්. ප්‍රේමදාස මැතිතුමා කටයුතු කරපු නිසා. ඒ වාගේම, 1987 වර්ෂය ජාත්‍යන්තර නිවාස වර්ෂය විධියට ප්‍රකාශයට පත් කෙරුණා, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට ඉදිරිපත් කළ එතුමාගේ යෝජනාවක් මත. ඒ වාගේම,

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

කැන්ටබරියෙහි අගරදගුරුතුමා විසින් ලෝකයේ හොඳම නිවාස ඇමති විධියට 1987දී නම් කරන්නේත් දිවංගත ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමායි. එතුමා අපේ රටේ නිවාස ප්‍රශ්නය විසඳන්න දැවැන්ත දායකත්වයක් දුන්නු ජනාධිපතිවරයෙක්.

ඒ නිසා අපේ රටේ නිවාස ප්‍රශ්නයට එතුමා දුන්න දායකත්වය, ශක්තිය අපට අමතක කරන්න බැහැ. ඒ වාගේම තමයි, නිවාස ඇමතිවරයකු විධියට හිටපු සජිත් ප්‍රේමදාස මැතිතුමාත්. එතුමා නිවාස විතරක් නොවෙයි, නිවාස සහිත ගම්මානත් හැදුවා. ජලය, විදුලිය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සහිතව ඒ ජනතාවට යම්කිසි කර්මාන්තයක යෙදෙන්න පුළුවන් වටපිටාවකුත් හැදුවා. එක්කෝ කෘෂිකර්මාන්තයේ, එහෙම නැත්නම් ධීවර කර්මාන්තයේ යෙදෙන්න පුළුවන් වටපිටාවකුත් එක්ක නිර්මාණය කරපු පුංචි ගමක් තමයි එතුමා හැදුවේ.

ඇමතිතුමා නිවාස පිළිබඳ list එකකුත් කිව්වා නේද? මොකක්ද ඒ, නිවාසිපුර නේද? මොකක්ද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වියත්පුර.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ආ, වියත්පුර. අපට දැන් lists අහලා ඇතිවෙලා, ගරු ඇමතිතුමනි. Lists දාන්න එළියට. හැබැයි actionsත් වැදගත්. Actions ටිකත් වෙන්න ඕනෑ, අපේ ගරු ඇමතිතුමනි. ඒ නිසා list එක එනවාත් එක්කම ඒ පිටිපස්සෙන් ඒ ඒ ක්‍රියාමාර්ගත් - actionsත් - අරගෙන වැඩ ටික කරනවා නම් තමයි හොඳ. නැත්නම් හැම දාම lists දැම්මාම, ඒවා නිකම් කුණුබක්කියට යන lists බවට පත් වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා listsවලින් එහා ගිය වැඩ පිළිවෙළක් අවශ්‍යයි. Lists දාන එක හොඳයි. List එක දාලා ඊළඟ සතියේ දෙන්න ඒකට ගත්ත action එක. ඒ ගත්ත ක්‍රියාමාර්ගත් ඉදිරිපත් කරන්න කියලා මම ඔබතුමාට කියනවා, ගරු ඇමතිතුමනි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය තමයි මෙතැන ප්‍රධානම අමාත්‍යාංශය විධියට තිබෙන්නේ. මම දැක්කා, ඔබතුමා ඊයේ-පෙරේදා ඉන්දියාවටත් පොඩි පාට එකක් දැම්මා. පාට එකක්ම නොවෙයි, නිකම් පොඩි බෝලයක් දැම්මා. ඉන්දියාව අපට ගොඩක් උදව් කරපු රටක්. අපට මතකයි, ආර්ථික අර්බුදය ඇතිවෙච්ච වෙලාවේ බිලියන 4.5ක් දීලා අපේ රටේ ජනතාවට, ආණ්ඩුවට, රාජ්‍යයට ඔවුන්ගේ දායකත්වය දුන්නා.

ඉන්දියාව ආධාර කරගෙන, ඉන්දියාවේ උදව් අරගෙන අපට නහාසිටුවන්න පුළුවන් ස්ථානයක් තමයි පලාලි ගුවන් තොටුපළ, ගරු ඇමතිතුමනි. පලාලි ගුවන් තොටුපළට ඉඩම් පවා අත්පත් කරගෙන තිබෙනවා. නමුත් පලාලි ගුවන් තොටුපළ සංවර්ධනය කිරීම සඳහා ඔබතුමන්ලා ගන්න ක්‍රියාමාර්ග සහ ඒකට ඉන්දියාවේ දායකත්වය ගන්නවාද කියන එක අපට පැහැදිලි නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතීතයේ තිබුණා, තලෙයිමන්නාරමේ ඉඳන් රාමේශ්වරම් දක්වා ferry service එකක්. ඒකෙන් විනාඩි 45න් ඉන්දියාවට යන්න පුළුවන්. ඒ ferry service එක දැනට නතර වෙලා තිබෙනවා. ඒ වෙනුවට නාගපට්ටිනම්වල ඉඳලා KKSවලට පැය තුනක් ගතවෙන ferry service එකක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, කලින් තිබුණු ferry service එක දියුණු කරන්න. ජනාධිපතිතුමා ඉන්දියාවට ගියා. අපට ආධාර උපකාර ගන්න කථා කළාද කියලා මම දන්නේ නැහැ. කථා කළා නම් හොඳයි. ඉන්දියාව අපේ ලොකු අයියා; මෝදි අගමැතිතුමා ඉන්නවා. එතුමාගේ සහයෝගය අරගෙන මේ ferry service එක නැවත ආරම්භ කළොත් හොඳයි. අපේ උතුරේ ජනතාව බොහොම සමීපයි දකුණු ඉන්දියාවත් එක්ක. දකුණු ඉන්දියාවත් එක්ක ඔවුන්ගේ තිබෙන සබඳතාවලට විතරක් නොවෙයි, ඒකෙන් අපට ආර්ථිකමය වශයෙනුත් විශාල ශක්තියක් ලැබෙනවා.

ඒ වාගේම එදා ඉඳන්ම කථා කරපු කාරණයක් තමයි, ඉන්දියාවයි, ලංකාවයි අතර තිබෙන land connectivity එක. මේ ගැන මොකක්ද ඔබතුමන්ලාගේ අදහස? මොකක්ද ඔබතුමන්ලාගේ මතය? ඉන්දියාව කියන්නේ ලෝකයේ ඉන්න billionairesලාගෙන් තුන්වැනියට වැඩිම billionairesලා ඉන්න රට. ඉන්දියාව දැවැන්ත ආර්ථිකයක් තිබෙන රටක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Ferry service එක?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
නැහැ. Ferry service එක ගැන නොවෙයි මම කියන්නේ. Land connectivity එක ගැන මම කථා කරන්නේ. මේකට අපි බද්ධ වෙන්න ඕනෑ. අපි ඉන්දියාවත් එක්ක මීට වඩා ගනුදෙනු කරන්න ඕනෑ. අපි ඉන්දියාව සමීප කරගන්න ඕනෑ. අපි ඉන්දියාව සහ ලංකාව අතර පාලමක් හැදුවා කියලා, නැත්නම් ගමන් මාර්ගයක් හැදුවා කියලා, එහෙම නැත්නම් මාර්ගයක් නිර්මාණය කළා කියලා අපි දැන් බය විය යුතු නැහැ. අපි ඒවාට බය වෙන්න ඕනෑ ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කාලයේ. එතකොට නේ, ඔබතුමන්ලා බිල්ලෝ මැව්වේ. ඉන්දියාව බිල්ලෙක් විධියට නේ කිව්වේ. දැන් අපි බිල්ලෝ මවන්නේ නැහැ. ඒ නිසා මේ වැඩේ දැන් ඔබතුමන්ලාගෙන් තමයි කරගන්න වෙන්නේ. අතීතයේ ඔබතුමන්ලා බිල්ලෝ මැව්වා. බිල්ලෝ මැව්වා විතරක් නොවෙයි, ඉන්දියාවේ ව්‍යාප්තවාදය ගැන, ඒ වාගේම බලය බෙදීම ගැන දැවැන්ත සටනක් මේ රටේ, මේ භූමියේ ඇති කළා නේ. 1988-1989 කාලයේ ඔබතුමන්ලාගේ මූලික සටන් පාඨය බවට පත් වුණේ බලය බෙදීම කියන කාරණය නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාත් අපිත් එක්කද හිටියේ ඒ කාලයේ?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
1988දී මම 8 වසරේ. ඒ ඔබතුමා ඡන්දය ඉල්ලන කාලයේ. ඔබතුමාට මම මනාපෙකුත් දුන්නා. මතක නැද්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
2004දී?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

1988 ගැන මම කිව්වේ. 2004දී නොවෙයි. 2004දී අපි එකට නේ හිටියේ. එතකොට අපි ඔබතුමාගේ යාළුවෝ නේ.

ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මම කියන්නේ ඉන්දියාවේ සහයෝගය අරගෙන ඔබතුමන්ලාට පුළුවන් මේ land connectivity එක දියුණු කරන්න. මම හිතන හැටියට අපට ණය වෙන්නේ නැතුව ඉන්දියාව ලවා මේ වැඩේ කරගන්න හැකියාව තිබෙනවා.

ඒ වාගේම, ත්‍රිකුණාමලය වරාය දියුණු නොකිරීම මම හිතන හැටියට ඓතිහාසිකව භූ දේශපාලනයේ අපට වෙච්ච බාධාවක්. ඒක අපට දියුණු කරගන්න බැරි වුණු තැනක්. හැබැයි, දැන් අපට ඉන්දියාවේ තිබෙන සුහදතාව සහ ඔවුන්ගේ ආර්ථික ශක්තිය භාවිත කරලා ත්‍රිකුණාමලය වරාය දියුණු කරන්න පුළුවන් වුණොත්, බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ආර්ථිකය කේන්ද්‍රගත කරන්න පුළුවන් ත්‍රිකුණාමලය වරායට. මේ කලාපීය ආර්ථිකය, නාවුක ආර්ථිකය ත්‍රිකුණාමලය වරාය මූලික කරගෙන දියුණු කරන්න අපට පුළුවන්. මොකද, දැන් උතුරු, නැඟෙනහිර සියලු ජනතාව ඔබතුමන්ලාත් එක්ක ඉන්නවා. එදා සාම්පූර්වල ගල්අඟුරු බලාගාරය හදන්න යනකොට ටීඑන්ඒ එක විරුද්ධ වුණා. හැබැයි දැන් මම හිතන්නේ නැඟෙනහිර ජනතාව ඔබතුමන්ලා කරන වැඩකට විරුද්ධ වෙයි කියලා. ඒකට ඉන්දියාවේ සහයෝගය තිබෙනවා. මම දන්නේ නැහැ, ඔබතුමන්ලාගේ චීන සහෝදරයෝ මේකට -ත්‍රිකුණාමලය වරාය දියුණු කරනවාට- විරුද්ධ වෙයිද කියලා. එහෙම නැහැ නේද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

තෝසෙයි, නූඩිල්ස්සුයි දෙකම කනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

තෝසෙයි, නූඩිල්ස්සුයි දෙකම කෑවට කමක් නැහැ. හැබැයි, රස දෙකක්, two different tastes. නූඩිල්ස් කන්නේ chopsticks වලින්. තෝසේ කන්නේ අතින්. ඒ නිසා බොහොම පරිස්සමින් ඒ දෙක කරන්න ඕනෑ. කමක් නැහැ. ඒ දෙකම කෑවත්, හරි වෙලාවට වටිනා දේ, ගුණ දේ තෝරාගෙන කෑවොත් තමයි හොඳ. අපට, වඩා හොඳ තෝසේ කියලා තමයි මට නම් හිතෙන්නේ, නූඩිල්ස් කනවාට වඩා. ඒක අපට හොඳයි; අපේ taste එකටත් හොඳයි. අපේ අසල්වැසි රටේ අය තමයි තෝසේ කන්නේ. චීනය ඔබතුමන්ලාගේ සහෝදර රටක්. ඒ නිසා ඒ කාරණයත් අවබෝධ කරගත්තොත් හොඳයි.

ඒ වාගේම මහාමාර්ග අමාත්‍යාංශය ගැන කථා කරද්දී , Central Expressway Project එකේ CEP-3 එක, Kandy දක්වා යන කොටසේ පොතුහැර සිට රඹුක්කන දක්වා වන කොටස ගැනත් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මේක පටන් ගත්තේ ඔබතුමාගේ කාලයේ නොවෙයි. ඒකත් මම කියන්න ඕනෑ. මම දන්නා විධියට මේකේ contract එකේ පොඩි packages 12කුත්, ලොකු packages 5කුත් award කළා. කුඩා packages සහ ලොකු packages දුන්නේ එකම qualifications තිබෙන companiesවලට. හැබැයි, කුඩා packages 12 ලබා දුන් සමාගම්වලට වාගේ නොවෙයි, ලොකු packages 5 ලබා දුන් සමාගම්වලට දීපු unit rate එක ඔබතුමා හොයලා බලන්න. මේ BOQs දෙක ගෙනැල්ලා සන්සන්දනය කරලා බලන්න. එය ඉතාම වැඩියි; ආසන්න වශයෙන් තුන්ගුණයක් වැඩියි. මම නම කියලාම කියන්නම්. ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා තමයි ඒ වෙලාවේ ඒක දුන්නේ. හිතවත්කමට අනෙක් කොන්ත්‍රාත්කරුවෝ පැත්තකට දාලා ප්‍රධාන සමාගම් 5කට දුන්නා. කාටද ඒ? ICC, Maga Engineering, NEM Construction, Access Engineering සහ KDAW කියන සමාගම් 5ට තමයි දුන්නේ. ඒක වෙනම බෙදිල්ලක්. හැබැයි, ඒ සමාගම් ඔබතුමන්ලාත් එක්කත් බොහොම හිතවත් කියන එක මම දන්නවා. මම ඒකේ වරදක් කියන්නේ නැහැ. Maga Engineering එකේ පියදාස මහත්මයාට ජනාධිපතිතුමා ස්තුති කළා, මට මතකයි. මම හිතන විධියට ඉංජිනේරු වෘත්තිකයන්ගේ සමුළුව තිබෙන වෙලාවේ එතුමා ඔබතුමන්ලාට උදවු කළා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. ව්‍යාපාරිකයෝ උදවු කරනවා. ඒක සාමාන්‍ය දෙයක්. හැබැයි, ඔය ව්‍යාපාරිකයෝ ටිකම ඉස්සෙල්ලා ජොන්ස්ටන් මහත්මයාට තමයි උදවු කළේ. ඒ නිසා ඔය ව්‍යාපාරිකයෝ එක්ක කටයුතු කරද්දී ඔබතුමන්ලාට බොහොම පරිස්සමෙන් වැඩ කරන්න වෙයි.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ කොටසේ ටෙන්ඩර් එක මුලින්ම award කරද්දී, මේකේ ABC overlaying, ඒ කියන්නේ කාපට් කරන එක හැර ඉතුරු කොටස තමයි දීලා තිබුණේ. ඔබතුමන්ලා ඉතුරු කොටස දෙන්න ටෙන්ඩර් කරද්දී මේකේ National Procurement Commission එකේ guidelinesවලට එහා ගිහිල්ලා International Competitive Bidding - ICB - system එක පාවිච්චි කරලා, අපේ NCB එකේ තිබෙන guidelineවලින් එහාට ගිහිල්ලා තමයි කටයුතු කරන්නේ. ඒ කරන්නේ වෙන මුකුත් නිසා නොවෙයි. ප්‍රධාන තුන්දෙනෙකුට, හතරදෙනෙකුට favour කරන්න; ඒගොල්ලන්ට මේ අවස්ථාව ගන්න. මේකෙන් competitive bidding එකක් වෙන්නේ නැහැ. අන්තිමට තුන්හතරදෙනාම එකතු වෙලා ඒගොල්ලන්ට ඕනෑ rate එකට මේ job එක ගන්නවා. ඔබතුමා ඒක කරන්න දෙන්න එපා. National Procurement Commission එකේ guidelines අනුව, එහෙම නැත්නම් ඒ නිර්ණායක අනුව මේ කටයුත්ත කරන්න කියලා මම මතක් කරනවා. ඒ වාගේම මම කියපු විධියට ජොන්ස්ටන් ප්‍රනාන්දුලා ටෙන්ඩර් 5 දෙද්දී තුන්ගුණයක් වැඩියෙන් දුන් එක ගැනත් හොයලා බලන්න.

රුවන්පුර අධිවේගී මාර්ගයේ වැඩ නැවැත්තුවා. ඔබතුමන්ලා නොවෙයි, කලින් ආණ්ඩුව කාලයේ ඒක නැවැත්තුවේ. මේක දීලා තිබෙන්නේ මාගා සමාගමට. අපට ආරංචියි, ඒගොල්ලන් බිලියන 30ක විතර claim එකක් දාලා තිබෙනවා කියලා. ටෙන්ඩර් එකත් ආසන්න වශයෙන් බිලියන 30ක්. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මාගා සමාගමට වැඩේ කරනවාට වඩා ලාභයි වැඩේ නොකරන එක. මාගා සමාගම ලංකාවේ තිබෙන ප්‍රධාන හොඳ සමාගමක්. හැබැයි, වැඩේ කරනවාට වඩා වැඩේ නොකිරීම ඒ සමාගමට වාසියි. මාත් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හිටපු කෙනෙක්. මේ ගොල්ලන් දාලා තිබෙන claim එක ගැන ඔබතුමන්ලා හොඳට හොයලා බලන්න. Claim එක ගෙවනවාට වඩා මේක දෙන එක හොඳයි නම්, ඒගොල්ලන්ටම මේ contract එක award කරලා දෙන්න පුළුවන් ඉඩකඩක් තිබෙනවාද කියලා බලන්න.

ඔබතුමා දන්නවා, අද වනවිට මීරිගම-කඩවත කොටසේ වැඩ ඉබිගමනින් යන්නේ කියලා. තවම එහි සියයට 10ක්වත් වැඩ කෙරිලා නැහැ. මම හිතන විධියට මේකට හේතු වුණේ, Exim Bank of China සහයෝගය නොදීම. ඔවුන්ට 2015දී ටෙන්ඩර් එක award කළා. 2015 ඉඳන් 2020 වනකල් මේ loan එක දුන්නේ නැහැ, agreement එක sign කළේ නැහැ. ඒ නිසා මේකේ එහා පැත්තේ කොටස විතරක් දේශීය සමාගම් ටික කළා. මේකේ අවශ්‍ය ප්‍රධානම කොටස කෙරිලා නැහැ. මම දන්නා විධියට ඔබතුමන්ලා චීනයට ගිය වෙලාවේ මේ සඳහා සහයෝගය ඉල්ලා තිබෙනවා. Exim Bank of China එකේ අය මේ වනකොට

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ලංකාවට ඇවිල්ලා තිබෙනවා කියලාත් ආරංචියි. ඔවුන්ගේ සහයෝගය අරගෙන,- *[බාධා කිරීමක්]* අනිද්දා එනවා. මේ කොටස ඔබතුමාටත්, අපිටත්, කාටත් ඉතාම වැදගත් කොටසක්. රටේ ආර්ථිකයටත් වැදගත් කොටසක්. මේ කොටසේ වැඩ අවසන් කිරීමට කටයුතු කරන්න. ඒක රටේ ආර්ථිකයට ඉතාම වැදගත් වෙනවා.

ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, East Container Terminal එක ගැනත් ඔබතුමා දන්නවා. දැන් ඒකේ වැඩ ප්‍රමාද වෙලා තිබෙන්නේ. ඒ ප්‍රමාදයට හේතුව මොකක්ද කියලා මම දන්නේ නැහැ.

අපි දන්න විධියට equipment ගෙනෙන්න දාපු ටෙන්ඩර් එක cancel කරලා තිබෙනවා. ඒක එක හේතුවක්. මම හිතන විධියට චයිනා හාබර් ඉංජිනේරු සමාගම තමයි මේකේ contractor. ඒ contractorට වරාය අධිකාරිය පැත්තෙන්, ඒ නිලධාරින්ගෙන් ලැබිය යුතු සහයෝගය ලැබෙන්නේ නැහැ. මම දන්නා විධියට MD එක්ක හෝ වෙනත් කවුරු හරි හෝ එක්ක ලොකු පලහිලව්වක් තිබෙනවා; නඩුවක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(*மாண்புமிகு பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)
නඩුවක් නැහැ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*மாண்புமிகு நலின் பண்டார ஜயமஹ*)
(The Hon. Nalin Bandara Jayamaha)
නඩුවක් නැහැ කියලා ඔබතුමා කියනවා, ගරු ඇමතිතුමනි. නමුත්, නඩුවක් තිබෙනවා කියලා තමයි අපි දන්නේ. නඩුවක් තිබුණත් නැතත්, එම සමාගමට ඉදිකිරීම් කරන්න අවශ්‍ය වැඩ කටයුතු ඉතා ඉක්මනින් සකස් කර දෙන්න. ඒ වාගේම ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න. අපට ආරංචි විධියට මෙහි ප්‍රධානම ප්‍රශ්නය තමයි, පිවිසුම් මාර්ගය - access road එක - වෙනස් කර තිබීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි මුල් සැලසුම්වල තිබුණු පිවිසුම් මාර්ගය වෙනස් කරලා වෙනත් තැනකින් ඒ පිවිසුම් මාර්ගය හදන්න යෝජනා කරලා තිබෙනවා. මෙතැනත් තිබෙන්නේ ලොකු ගේම් එකක්. ඔබතුමන්ලා දන්නේ නැහැ, මේවා නිලධාරින් ගහන ගේම්. ගරු ඇමතිතුමනි, ඔබතුමා බොහොම පරිස්සමින් මේවා handle කරන්න ඕනෑ. මොකද, ඔබතුමාගේ සභාපතිතුමා අලුත්, ඔබතුමාගේ උප සභාපතිතුමා අලුත්, ඒ වාගේම ඔබතුමාගේ MD අලුත්.

ගරු බිමල් රත්නායක මහතා
(*மாண்புமிகு பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)
මමත් අලුත්.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*மாண்புமிகு நலின் பண்டார ஜயமஹ*)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමා අලුත් නැහැ, ඔබතුමා කොච්චර පරණද? ඒ නිසා ඔබතුමා ඒ නිලධාරින් මතම යැපෙන්න එපා. ඊට වඩා එහාට ගිහිල්ලා සොයා බලන්න. ඔබතුමා උපදෙස් දෙනකොට ඒ මත පදනම්ව තීන්දු තීරණ ගන්න එපා. මේ access road එක වෙනස් කිරීමේ කටයුත්ත නිසා SAGT පර්යන්තයට විශාල වාසියක් ලැබෙනවා. ඒක පෞද්ගලික පර්යන්තයක්. ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී සමාගම තමයි ඒක manage කරන්නේ. Access road එක වෙනස් කිරීම හරහා එහි වාසිය යන්නේ SAGT පර්යන්තයට. එම පර්යන්තයට ඒ වාසිය අත් පත් කර දෙන්නද, මේ පිවිසුම් මාර්ගය වෙනස් කරන්නේ කියන බරපතළ ප්‍රශ්නය අපට තිබෙනවා.

ගරු අනුර කරුණාතිලක ඇමතිතුමනි, National Water Supply and Drainage Board එක අයත් වන ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් අද දවසේ අපි කථා කරනවා. ඔබතුමා සභාවේ ඉන්න මේ වෙලාවේ මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, Exim Bank of Koreaහි ණය ආධාර යටතේ 2016 දී මගේ දිස්ත්‍රික්කයේ අදියර 1 - phase 1 - යටතේ වන Deduru Oya Water Supply Project එක ආරම්භ වුණා. එහි intake pump station එක, ඒ වාගේම water tank, treatment plant, ඒවා ටික හැදුවා. Distribution network එකේත් යම් කොටසක් හැදුවා. ඒකේ phase 2 යටතේ- මහව සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ තමයි එම ව්‍යාපෘතියෙන් ආවරණය වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කයේ වකුගඩු ආසාදනය වන පිරිස යම් මට්ටමකට වැඩි බව. එයිනුත් වැඩි පිරිසක් ඉන්නේ පොල්පිතිගම ප්‍රදේශයේ. ඒකට විසඳුමක් තමයි මේ ව්‍යාපෘතිය. එම ව්‍යාපෘතිය යූඑස් ඩොලර් මිලියන 27ක් පමණ වටිනා ව්‍යාපෘතියක්. මෙම ව්‍යාපෘතියේ distribution network එක යටතේ කිලෝමීටර 260ක් විතර ආවරණය වෙන්න ඕනෑ. ඒ සඳහා Cabinet approval එකත් හම්බවෙලා තිබෙනවා; contract එකත් award කරලා තිබෙනවා. හැබැයි, තවම agreement sign කරලා නැහැ. මෙහි ප්‍රමාදයක් තිබෙනවා කියලා ආරංචියි. ඔබතුමා හොයලා බලන්න. මේක ඉතාම වැදගත්. ඒ වාගේම මෙය අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක්. මෙම මූලික ව්‍යාපෘතිය මඟින් දවසකට කියුබික් මීටර් 17,000ක පමණ ජලය පිරිසිදු කිරීමක් සිද්ධ වෙනවා. හැබැයි, දැනට හදලා තිබෙන distribution network එකෙන් දවසකට කියුබික් මීටර් 8,000ක් විතර තමයි පිරිසිදු කරන්නේ. තවත් කියුබික් මීටර් 8,000ක්, 9,000ක් අපේ ජනතාවට බෙදා ගන්න පුළුවන්. එහෙම බෙදා ගන්න නම්, කොරියන් ණය ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, මෙහි තිබෙන වැදගත්ම කාරණය මේකයි. කොරියන් ණය ආධාරවල පොලිය සියයට 0.15යි. ඒ වාගේම ණය ආපසු ගෙවීම සඳහා අවුරුදු 15ක grace period එකක් තිබෙනවා. අවුරුදු 40කින් තමයි ණය ගෙවලා ඉවර කරන්න තිබෙන්නේ. විශේෂයෙන්ම මේක මේ වෙලාවේ මේ රටේ ආර්ථිකයට, රටට බරක් නැති ව්‍යාපෘතියක්. අවුරුදු 15කින් තමයි මෙම ණය ආපසු ගෙවන්න පටන් ගන්නේ. එම නිසා කුරුණෑගල දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම පොල්පිතිගම සහ මහව ප්‍රදේශයේ ජනතාවට මෙම ජල ව්‍යාපෘතිය ඉතාම වැදගත් ව්‍යාපෘතියක් නිසා ඒ සඳහාත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම මතක් කරනවා.

ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, දුම්රිය සේවාව ගැන කථා කරද්දී මෙන්න මේ කාරණයත් කියන්න ඕනෑ. අපි සුද්දාගේ, -

ගරු බිමල් රත්නායක මහතා
(*மாண்புமிகு பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)
ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ කාලයෙන් තත්පර 30ක් ගන්නවා.

ඔබතුමා මේවා දන්නවා ඇති. මම මේවා එච්චර ලොකුවට දන්නේ නැහැ. ඔබතුමා කිව්වා නේ, companies කිහිපයකට favour කරන්න තමයි අපි tender documents හදන්නේ කියලා. නමුත් මෙහි සඳහන් වෙනවා, CS1 and CS2, companies 21 කියලා. ඒ companies ඔක්කෝටම පුළුවන්, CEP-03 එකේ carpet project එකට bid කරන්න. ඔබතුමාගේ කොම්පැනියක් තිබෙනවා නම්, ඒත් පුළුවන්. ඒ විධියට companies 21කට පුළුවන්.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, මා දන්නා විධියට එතැන ප්‍රශ්නයක් තිබුණා. ඒ වාගේම මේ ලිපිය මම ඔබතුමාට එවන්නම්. National Construction Association of Sri Lanka මඟින්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ට යවන ලද ලිපිය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (මහාචාර්ය) සේනා නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභානායකතුමනි, 2025 පෙබරවාරි 24වෙනි දා ඔබතුමාගේ Secretaryට, "Subject: Comments on unfair situation in the bidding process reducing competition" ශීර්ෂය යටතේ ලිපියක් ලියලා තිබෙනවා. ඒ ලිපිය ලියලා තිබෙන්නේ, National Construction Association of Sri Lanka මඟින්. මා සඳහන් කළ ගැටලුව පිළිබඳවයි ඔබතුමාගේ ලේකම්ට ලියලා තිබෙන්නේ. මේ පිළිබඳවත් ඔබතුමා අවධානය යොමු කරන්න. මේ ලිපියේ පැහැදිලිව තිබෙනවා, ඒ අයට සිදුවන අසාධාරණය පිළිබඳව. මම ඒ ලිපිය සභාගත කළා. ඔබතුමා ඉතාම කෙටි කාලයකින් මට reply කරපු එක ගැන සතුටු වෙනවා වාගේම ඒක ඇත්තද කියන එක ගැනත් හොයා බලන්න කියලා මම මතක් කරනවා.

දුම්රිය සේවාව ගැන කථා කළොත්, සුද්දා හදපු railway lines භාවිත කරමින් තමයි අපේ දුම්රිය සේවය තවම කටයුතු කරන්නේ. එහි මහා සංවර්ධනයක්, මහා වෙනසක් වෙලා නැහැ. ඇයි, එහෙම වුණේ? SLTB එක ගැනත් අද කථා කළා. ඇයි, SLTB එක ඒ තත්ත්වයේ තිබෙන්නේ? 1960-1970 දශකයේ අපේ රටේ හොඳ ප්‍රවාහන සමාගම් තිබුණා. ඊබට් සිල්වා සමාගම තිබුණා, මෙන්ඩිස් සමාගම තිබුණා, අපේ ගම වන උඩුබද්දාවේ තිබුණා, "ලංකා මාතා" කියලා ප්‍රවාහන සේවයක්. ඒ වාගේම "සිටි මුදලාලි" හිටියා, කුරුණෑගල. ඔබතුමන්ලාත් දැන් කථා කරමින් අගය කළා, අපේ ජගත් චිතාන මහත්තයා. නොයෙක් ප්‍රවාහන සමාගම් අතීතයේ තිබුණා. ඒවාට මොකක්ද කළේ? සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය ඒවා සියල්ල ජනසතු කෙරුවා. ඒවායේ ප්‍රතිඵල තමයි අපි අද භුක්ති විඳින්නේ. අපේ දුම්රිය දෙපාර්තමේන්තුවටත් ඕක තමයි වුණේ. එදා ප්‍රේමදාස මහත්තයා සැලසුම් කරපු ජනතාකරණ වැඩසටහන යටතේ දුම්රිය දෙපාර්තමේන්තුව, SLTB එක පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා දියුණු කළා නම් අද සිංගප්පූරුවේ දකින, මලයාසියාවේ දකින ප්‍රවාහන පද්ධතියක් අපටත් උරුම කරගන්න තිබුණා. ඒ දවස්වලත් ඔබතුමන්ලාගේ දේශපාලන මතය වුණේ ඒවාට විරුද්ධව කටයුතු කරන එකයි. ඒවාට විරුද්ධව ඔබතුමන්ලා සටන් කළා. ඔබතුමන්ලා පෞද්ගලීකරණයට විරුද්ධ වුණා. මම දැක්කා ඔබතුමාගේ කථාවේදී කිව්වා, පෞද්ගලික අංශයේ කෙනෙක් ඉන්නවා නම් නානුඔය ඉඳන් railway track එක හදන්න දෙනවා කියලා. ඒක හොඳයි. මොකද, ඒ මාර්ගය කලිනුත් උඩුපුස්සැල්ලාවට යනකල් තිබුණා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two minutes.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි, මම ඉක්මනින් අවසන් කරනවා.

ඇත්තටම එතැනට යන්නේ cost එකක් විතරයි. ඔබතුමා කියපු නාය යෑමේ තර්ජනය ඒ කොටසේ නැහැ, ගරු ඇමතිතුමනි. හැබැයි, අපට පිරිවැයක් - cost එකක් - යනවා. ඒ සඳහා අපට ආයෝජනයක් අවශ්‍යයි. හොඳ ආයෝජකයෙකු සොයාගෙන ඔබතුමා ඒ කොටස භාර දෙන්න. අපේ tourism එකේ ලෝකය ඉදිරියට ගිය තැනක් නේ, අපේ railway track එක. නානුඔයෙන් පටන් ගත්තාම, පැරකුම්පුර, අඹේවෙල, පට්ටිපොල, ඔභිය, ඉදල්ගස්හින්න, හපුතලේ, දියතලාව, බණ්ඩාරවෙල, හීල්ඔය, ඇල්ල කියන්නේ සුන්දර ස්ථාන. *[බාධා කිරීමක්]* ඉස්සර මම කුරුණෑගල class ගිහිල්ලා night mail එකට නඟිනවා. පහුවදා බණ්ඩාරවෙල ඉඳලා එනවා. ඒ දවස්වල මගේ ජීවිතයේ ආසම ගමන ඕක තමයි. *[බාධා කිරීමක්]* ගැහැනු ළමයි ඉන්න ඕනෑ නැහැ. අපි කොල්ලෝ එක්ක ගියේ. ගැහැනු ළමයි එක්ක යන්න බැරිව ගියා. දැන්වත් යන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, මේ දුම්රිය ගමන දැන් promote වෙලා තිබෙන්නේ, ආයෙත් promote කරන්න දෙයක් නැහැ. හැබැයි, මේකට ආයෝජනය කරන්න ඕනෑ. මේ මාර්ගයට තව දුම්රිය යොදවන්න. සමහර trains යවන්න, කොළඹ ඉඳන්. සමහර ඒවා යවන්න, නානුඔය ඉඳන්. ගම්පොල ඉඳන් යවන්න, නාවලපිටියේ ඉඳන්ම යවන්න පුළුවන් නම් එතැන ඉඳන්ම ලස්සනයි. එම railway stationවල ඉඳලාම trains යවන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, අපට opportunities තිබෙනවා. මේවා කරන්න ලෙහෙසියි. මොකද, හැම දේටම විරුද්ධ වුණු විපක්ෂයක් දැන් නැහැ. ඔබතුමන්ලාට තිබෙන හොඳම chance එක මේක තමයි. වෘත්තීය සමිති දාගෙන රට බංකොලොත් කරන තත්ත්වයකුත් නැහැ. දැන් ඔබතුමන්ලාට තිබෙන වටිනාම විපක්ෂය තමයි, සමගි ජන බලවේගය. අපි බිල්ලෝ මවන්නේත් නැහැ. ජාතිවාදින් මවන්නේත් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
විපක්ෂය කියලා ගැසට් කරන්න ඕනෑ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
විපක්ෂය කියලා ගැසට් කරන්න. කමක් නැහැ. ඔබතුමන්ලා හොඳට කරන්න. අපි හැම දාම විපක්ෂයේ ඉඳගෙන support එක දෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

ඒ නිසා ඔබතුමන්ලා මේ වැඩ ටික කරන්න. මේ ආයතන පෞද්ගලීකරණය කරන්න. SLTB එක පෞද්ගලීකරණය කරන්න; Sri Lanka Railways එක පෞද්ගලීකරණය කරන්න. මේ ආයතන පෞද්ගලීකරණය කළොත් තමයි ඉතාම දියුණු තත්ත්වයකට යන්න පුළුවන් වෙන්නේ. ගරු සභානායකතුමනි, මම මේ කියන දේට වමට දකුණට නොවෙයි, ඔබතුමා ඔළුව ඉහළට පහළට වනන්න. ඔබතුමන්ලාට දැන් ආණ්ඩු බලය ලැබිලා තිබෙනවා. ඔබතුමන්ලා දැන් මේවා දකිනවා. ඔබතුමන්ලා ලජ්ජා වෙන්න එපා. අතීතයේ කරපු දේවල්, අතීතයේදී විරුද්ධ වෙච්ච දේවල් දැන් අතීතයට දමන්න. ඒවා කුණු බක්කියට දමන්න. දැන් නිවැරදි තීන්දු-තීරණ අරගන්න. විපක්ෂයක් විධියට අපි දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දෙනවා. අපි රට බංකොලොත් කරන්න, රට අගාධයට ඇද දමන්න, බිල්ලෝ මවන්න කටයුතු කරන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Anura Karunathilaka. You have 23 minutes.

[අ.භා. 5.44]

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු සභාපතිතුමනි, ප්‍රධාන මාතෘකාවට එන්න කලින් විවාදය තුළ මතු වෙච්ච විශේෂ කරුණක් සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් කරන්න මම කැමැතියි. විශේෂයෙන්ම hydrated lime පිළිබඳව කථා කරද්දි ප්‍රධාන වශයෙන් කරුණු 03ක් මතු වුණා. එකක් තමයි, SLS standards වෙනස් වුණේ අපේ ඉල්ලීම මත කියන එක. ඇත්තටම 2024.04.17 දිනැති ලිපියෙන් තමයි එවකට හිටපු National Water Supply and Drainage Board එකේ General Manager ඉල්ලීමක් කර තිබෙන්නේ, purify කරන්න භාවිත කරන සමහර රසායනික ද්‍රව්‍ය පිළිබඳව revision එකක් කරන්න කියලා. හැබැයි, mainly ඉල්ලා තිබෙන්නේ මැංගනීස් කියන ද්‍රව්‍යය සම්බන්ධයෙන් පිරිවිතරයන්වල පුනරීක්ෂණයක් - revision එකක් - කරන්න කියලා. ඒ අනුව Sri Lanka Standards Institution - SLSI - එක 2024 ජූලි මස 26වැනි දා ආරම්භ කරලා, සැප්තැම්බර් 24 දක්වා සිදු කළ මහජන මත විමසීමකින් පසුව තමයි ඒ අදාළ දේවල් කර තිබෙන්නේ. එතකොට මේ තිබෙන hydrated lime තොගය සහ SLS standards වෙනස් කිරීම අතර කිසිම සබඳතාවක් අපට පෙනෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නගත hydrated limeවලට tenders call කර තිබෙන්නේ 2024.05.01වැනි දා. ඒ වාගේම ටෙන්ඩරය ප්‍රදානය කර තිබෙන්නේ 2024.07.31වැනි දා. එතකොට මේක ඇත්තටම අපි බලයට එන්න කලින්, අපේ අලුත් සභාපතිතුමා පත් වෙන්න කලින් සිදු වෙච්ච දෙයක්. ඒ නිසා මේ සැපයුම්කරු තෝරා ගැනීම සම්බන්ධයෙන් අපේ විශේෂ ළබැඳියාවක් හෝ සබැඳියාවක් ඇත්තේ නැහැ. ඒ වාගේම තමයි, පළමුවැනි තොගය deliver කර තිබෙන්නේ 2024.12.13වැනි දා. ටෙන්ඩර් පටිපාටියේදී සඳහන් කළ පිරිවිතරයන්වලට අනුරූප නොවන නිසා එය ප්‍රතික්ෂේප කර තිබෙනවා. එලෙස ප්‍රතික්ෂේප කරලා, එම තොග අදාළ තැන්වල ගොඩගසා තිබෙනවා. සැපයුම්කරු විසින් මේ දේවල් නැවත අරගෙන පිරිවිතරයන්ට අදාළ සැපයුම් භාර දෙන්න ඕනෑ. එහෙම නැත්නම් මුදල් ආපසු ලබා දෙන්න ඕනෑ. ඒ නිසා අපි මේ රටේ ජනතාවට කියනවා, මේ ප්‍රශ්නගත hydrated lime කිසිම ලෙසකින්වත් ජලය පිරිපහදු කිරීම සඳහා භාවිත කර නැති බව. ඒ නිසා අනියත බියක් ඇතිකර ගත යුතු නැහැ. ඒ වාගේම සමහර testing සම්බන්ධයෙනුත් සාකච්ඡාවක් ආවා, ඇත්තටම මේ පරීක්ෂණ ප්‍රතිඵල ඒකාකාර නැත්තේ ඇයි කියලා. මේ hydrated lime කියන සංඝටකය ගන්නේ ස්වාභාවිකව තිබෙන හුනු ගල් නිධිවලින්. අපි දන්නවා, පොළොවේ විවිධ තැන්වල තිබෙන හුනු ගල් නිධිවල ඇති මූලද්‍රව්‍ය සංයුතිය ඒකාකාර නැහැ කියලා. එතකොට ඒවා යොදාගෙන කරන පරීක්ෂණවල ප්‍රතිඵලත් තොගයෙන් තොගයට වෙනස් වෙන්න පුළුවන්. ඒ නිසා තමයි සියලුම තොග වෙන වෙනම පරීක්ෂා කර බලා, අදාළ ප්‍රමිතීන්ට අනුකූලව මේවා තිබෙනවාද කියලා බලන්න කටයුතු කරන්නේ.

ඊළඟට, සංඛ්‍යා පිළිබඳ ගැටලුවකුත් සාකච්ඡා කළා. ඒක වෙන්නේ මෙහෙමයි. මෙතැනදී පිරිපහදු කිරීම සඳහා ගන්නා hydrated lime කිලෝග්‍රෑම් එකක අඩංගු විය හැකි chromium මිලිග්‍රෑම් ගණන සම්බන්ධයෙන් සම්මුතීන් තිබෙනවා. ඒ වාගේම සමහර රටවල් පාවිච්චි කරනවා, පිරිපහදු කළාට පස්සේ ජලයේ අඩංගු වෙලා තිබෙන chromium level එක සම්බන්ධයෙන් වූ දත්ත. ඒවා එකිනෙකට වෙනස්. ඒකත් එක්ක සංඛ්‍යාත්මක වෙනස්කම් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා මම මේ සාකච්ඡාව මෙතැනින් අවසන් කරනවා.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු ඇමතිතුමනි, -

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම ඔබතුමාගේ නම සඳහන් කළේ නැහැ.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු ඇමතිතුමනි, මට ප්‍රශ්නයක් අහන්න අවස්ථාව දෙන්න. ඔබතුමාගේ ළබැඳියාව පිළිබඳව මම කිසිම වෙලාවකවත් ප්‍රශ්න කළේ නැහැ, ගරු ඇමතිතුමනි. ඔබතුමා මේ සමාගමත් එක්ක සම්බන්ධයි කියලා මම කිව්වේත් නැහැ. මම කියපු එකම කාරණාව තමයි, මේ chromium content එක වැඩි කරන්න එපා, මේක පිළිකාකාරකයි කියන එක. අනෙක් කාරණය තමයි, ඔබතුමා අන්තිම දවසේ මේ ගැන ප්‍රකාශ කරද්දි New Zealand ගැන කියා සිටියා, 150 mg per kilo කියලා.

ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඊට අදාළ වාර්තාවක් මම අද උදේ සභාගත කළා. ඒ අනුව ඔබතුමා පසුගිය දිනක කථාවේදී ඉදිරිපත් කරපු ඒ දත්ත වැරදියි. ඒකත් නිවැරදි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම, ISO Standards සංශෝධනය කළේ 2024.07.26වැනි දා නොවෙයි, 2025.01.21වැනි දා ඔබතුමා ඇමතිවරයා වශයෙන් පත් වුණාට පසුවයි. ඔබතුමාගේ අමාත්‍යාංශය නොවෙයි ඒක කරලා තිබෙන්නේ. ඒකත් නිවැරදි කරන්න කියන ඉල්ලීමත් මම කරනවා.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

අදාළ සැපයුම්කරු සමඟ අපේ සභාපතිතුමාගේ හෝ අමාත්‍යාංශයේ හෝ අපේ රජයේ විශේෂ සබැඳියාවක්, ළඟැදියාවක් නැහැ කියලා ඔබතුමා ප්‍රකාශ කරපු එක ගැන බොහොම ස්තූතියි.

ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධනය සම්බන්ධයෙන් කථා කරනකොට විශේෂයෙන් අපි දන්නා කාරණයක් තමයි, සැලසුම්කරණයේදී සාමාන්‍යයෙන් ලෝකයේ සම්මුතීන්වලට අනුකූලව අප විසින් අවධානයට ලක් කරන කරුණු ගණනාවක් තිබෙන බව. විශේෂයෙන් වර්තමාන අවශ්‍යතා සපුරා ගන්නා අතර අනාගත පරම්පරා සඳහා මේ සම්පත් භාවිත කරන්නේ කොහොමද කියන එකත් එක්ක තමයි හරිත ගොඩනැඟිලි, පරිසර හිතකාමීත්වය, පරිසර හිතකාමී ප්‍රවාහන සේවා, පුනර්ජනනීය බලශක්තිය වාගේ දේවල් සාකච්ඡාවට එන්නේ. ඒ වාගේම, smart නගර සහ මිශ්‍ර සංවර්ධනය පිළිබඳ අදහසත් මේ නාගරික සංවර්ධනයත්, නාගරික සැලසුම්කරණයත්, ග්‍රාමීය සැලසුම්කරණයත් එක්ක එන එකක්. තාක්ෂණය සහ දත්ත මත පදනම් වූ සංවර්ධන සැලසුම් වාගේම ගමනාගමනය කාර්යක්ෂම කිරීම සඳහා නේවාසික සහ වාණිජ පොදු විනෝදාත්මක අවකාශ ඒකාබද්ධ කර සජීවී අසල්වැසි ප්‍රදේශ ඇති කරන්නේ කොහොමද කියන සංකල්පයත් මේ නාගරික සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ සාකච්ඡාවේදී මතු වන කරුණු හැටියට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වාගේම, නාගරික හරිත අවකාශයන් හරහා එහි ජීවත් වන පුරවැසියන්ගේ මානසික සෞඛ්‍යය, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, නගරවල වායු ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම වැනි විවිධ කරුණු පිළිබඳව සැලකිල්ලට ලක් කරමින් තමයි මේ නාගරික සැලසුම්කරණය කියන එක කරන්නේ. ඒ වාගේම, ඕනෑම අවස්ථාවක සංවර්ධනයත් එක්ක ඉදිරියට යනකොට ඒ සංවර්ධනයත් එක්ක ඉදිරියට යන්න අවකාශය නොලැබෙන කොටසක් ඉන්නවා. විශේෂයෙන් ඒ වාගේ අවස්ථාවක අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ අවතැන්වීම් වැළැක්වීම සඳහා, ඒ වාගේම සංවර්ධනයේ සමතුලිතතාව ඇති කිරීම මඟින් ජනතය සහ සමාජ සමානාත්මතාව ඇති කිරීම පිළිබඳ සංකල්පයත් මෙතැනදී වැදගත් වෙනවා.

ඒ නිසා ජාතික ජන බලවේගයේ රජය හැටියට අපි මේ නාගරික සැලසුම්කරණය වාගේම ග්‍රාමීය සැලසුම්කරණය සකස් කරද්දී මේ පිළිබඳව අවධානය යොමු කරමින් තමයි කටයුතු කරන්නේ. ඒ අනුව, අපේ මුදල් රාජ්‍ය ඇමතිතුමාත් සඳහන් කළා වාගේ මේ අවුරුද්ද තුළ මේ විෂය ක්ෂේත්‍ර සඳහා රුපියල් බිලියන 180.9ක් වෙන් කර තිබෙනවා. මෙතැනින් සමහර දේවල් රාජ්‍ය භාණ්ඩාගාරය හරහා ලැබෙනවා. ඒ වාගේම සමහර කොටස් විදේශ ණය සහ ආධාර මත ලැබෙනවා. ඒ වාගේම, ඒ ඒ ආයතනවලින් ජනනය කරනු ලබන අරමුදල් භාවිත කරලා, රුපියල් බිලියන 180.9කට ආසන්න ප්‍රමාණයක් 2025 අවුරුද්ද තුළ මේ අමාත්‍යාංශය විසින් තමන්ගේ විෂය පථයන්ට අදාළව වියදම් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. මෙතැනදී වැදගත් කාරණයක් හැටියට මතු කරන්න ඕනෑ, මේ මුදල් අතුරින් රුපියල් බිලියන 175.3ක්ම ප්‍රාග්ධන වියදම් හැටියට තමයි අපි වියදම් කරන්නේ කියන එක. එතැනින් පෙනෙනවා, මේකේ සංවර්ධන දිශාව. ඒ වාගේම ජනතාවගේ යටිතල පහසුකම් ඇති කිරීම සඳහා අපේ තිබෙන කැපවීම ඒ තුළින් පෙනෙනවා.

අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අනුව සියයට 96.9ක්ම ප්‍රාග්ධන වියදම් හැටියට තමයි වෙන් කර තිබෙන්නේ. ඒ වාගේම තමයි, මෙතැනදී පානීය ජලය සම්පාදනය සඳහා රුපියල් බිලියන 108.7ක්, නිවාස හා ඉඩකිරීම් සඳහා රුපියල් බිලියන 39.2ක්, නාගරික සංවර්ධනය සඳහා රුපියල් බිලියන 24.5ක්, අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රුපියල් බිලියන 8.5ක් ආදී වශයෙන් ඒ ඒ ක්ෂේත්‍ර සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරන්න සහ ඒ මුදල් වැය කිරීම තුළින් ජනතාවගේ මහජන සේවාවන් සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

මෙහිදී නාගරික සංවර්ධනය යටතේ විශේෂයෙන් මේ අවුරුද්දේ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන එක් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

සාමාන්‍යයෙන් ලෝකයේ මේ වනකොට කථා කරන එක සංකල්පයක් තමයි, නගර සන්නාමකරණය - city branding - කියන එක. මේ නගර සන්නාමකරණයේදී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් තිබෙනවා. එකක් තමයි, ඒ නගරයේ අනන්‍යතාව. සාමාන්‍යයෙන් ඒ නගරයේ ඉතිහාසය, වර්තමානයට ඒ ඉතිහාසය දායකත්වය දක්වන විධිය වාගේම ඒ නගරය සංස්කෘතික විවිධත්වයක් සහිත, විවිධ ජාතීන් ජීවත් වන - cosmopolitan - නගරයක්ද කියන එක, එහෙම නැත්නම් ශක්තිමත් දේශීය සම්ප්‍රදායයක් තිබෙන නගරයක්ද කියන එක පිළිබඳව අවධානය යොමු කරමින් තමයි ඒ city branding කළ යුතු වෙන්නේ. ඒ වාගේම නගරයේ විශේෂිත වූ භූගෝලීය ලක්ෂණ සහ සමහර icons සැලකිල්ලට ලක් කරමින් තමයි city branding කරන්න ඕනෑ. උදාහරණයක් හැටියට ගත්තොත්, අපි කවුරුත් දන්නා විධියට අයිෆල් කුලුන තමයි පැරිස් නගරයේ සංකේතය. එතකොට city brandingවලදී "Paris" කියලා ලියනකොට "a" අකුර capitalවලින්, අනෙක් අකුරුවලට වඩා ටිකක් ඉහළින් ලියලා තමයි ඒ නාමය සඳහන් කරන්නේ. ඒ නගරයේ අනන්‍යතාව වන අයිෆල් කුලුන සංකේතවත් වන විධියට තමයි නාමකරණය පවා සිදු කරන්නේ. දැන් ලංකාවේ ගාල්ල කොටුව, මහනුවර දළදා මාළිගාව, ඒ වාගේම සැන් ෆ්‍රැන්සිස්කෝ නගරය ගත්තොත් Golden Gate Bridge එක වාගේ ඒ නගරයට ආවේණික වූ සමහර ලක්ෂණ පාවිච්චි කරමින් තමයි city branding කරන්න ඕනෑ. ඒ වාගේම ඉදිරි අවුරුදු 20ක, 30ක කාලය තුළ ඒ නගරය සකස් කරන්න ඕනෑ කොහොමද, නගරයේ ආර්ථික සංවර්ධනයේ දිශානතිය කොහේටද ළඟා වෙන්න ඕනෑ, සංචාරක ආකර්ෂණය ලබා ගන්නේ කොහොමද, ව්‍යාපාරික ප්‍රජාවට ආයෝජන අවස්ථා උදා කරලා දෙන්න ඕනෑ කොහොමද කියන කරුණු සැලකිල්ලට අරගෙන තමයි city branding කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස් වේ.

රීට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.
அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.
Accordingly, Parliament resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් අවශ්‍ය කාලය ලබා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී -
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பட்டது. -
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee. -
[THE HON.SPEAKER in the Chair.]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමා කථා කරන්න.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ඒ අනුව මම සඳහන් කළා වාගේ මේ 2025 වසරේදී අපි Clean Sri Lanka වැඩසටහනේ එක් ව්‍යාපෘතියක් හැටියට ලංකාවේ තෝරා ගත් නගර කිහිපයකින් මේ නගර සන්නාමකරණය ආරම්භ කරනවා. මේ අවුරුද්දේදී අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, ගාල්ල, කතරගම, මහනුවර, ඇල්ල, කොළඹ කොටුව හා ත්‍රිකුණාමලය ආදී ප්‍රදේශවල නගර සන්නාමකරණය - city branding - සඳහා අපි කටයුතු කරනවා. ඒ සඳහා රුපියල් මිලියන 500ක් වැය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපි ලස්සන ජීවිතයක් ගැන කථා කරනකොට මිනිස්සු ජීවත් වන පරිසරය වාගේම ඒ පුද්ගලයන්ගේ නිවාස ගැනත් අමතක කරන්න බැහැ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අපි හැම පුරවැසියෙකුටම සැප පහසු, සෞඛ්‍යාරක්ෂිත රටක් ඇතිකර දීම පිළිබඳව ප්‍රකාශ කළේ අන්න ඒ නිසායි. සාමාන්‍යයෙන් ලංකාවේ නිවාස අවශ්‍යතාව මේ වෙනකොට වසරකට ලක්ෂ 8ක්, 10ක් කියලා තමයි සංඛ්‍යාලේඛනවල තිබෙන්නේ. 2012-2022 දක්වා කාලය තුළ නිවාස අවශ්‍යතාව සාමාන්‍යයෙන් සියයට 11.9කින් වැඩි වුණත් නිවාස සැපයීමේ වේගය වැඩිවෙලා තිබෙන්නේ සියයට 9.5කින්. එතකොට මේ සංඛ්‍යාලේඛන දිහා බැලුවාම පෙනෙනවා, ඒ අගයන් දෙක අතර වෙනසක් තිබෙන බව. අවශ්‍යතාව වැඩි වෙන වේගය වැඩියි. නමුත් අවශ්‍යතාව සපුරාලන වේගය අනුව අපි ඉන්නේ ඒකට වඩා මදක් පිටුපසින්. ඒ වාගේම විශේෂයෙන් කොළඹ නගරය ගත්තොත්, සමස්ත ලංකාව තුළ නිවාස අවශ්‍යතාව සියයට 11.9කින් වැඩි වෙනකොට කොළඹ නගරය තුළ නිවාස අවශ්‍යතාව සාමාන්‍යයෙන් සියයට 10කින් තමයි වැඩි වෙන්නේ. ඒකට විශේෂ හේතුවක් තිබෙනවා. කොළඹ නගරයෙන් ඈත් වෙලා ජනාවාස බිහිවීම තමයි ඒකෙන් පෙනෙන්නේ. නමුත් කොළඹ නගරය තුළ නිවාස අවශ්‍යතාව සියයට 10කින් වැඩි වෙනකොට සැපයීම සිද්ධ වෙන්නේ සියයට 7.4ක වේගයකින් විතරයි. ඒ අනුව අපට පෙනෙන දෙය තමයි, නිවාස අවශ්‍යතාව වේගයෙන් වැඩි වෙනවා, නමුත් ඒකට මදක් පිටුපසින් තමයි සපුරාලීමේ වේගය පවතින්නේ කියන එක.

ඒ නිසා පුරවැසියාගේ නිවාස සැපයීම පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න ඕනෑ කියන එක හරි පැහැදිලියි. ඒ නිසා තමයි මේ අවුරුද්දේ අපි විවිධ අරමුදල් හරහා රුපියල් බිලියන 39.2ක් ඒ සඳහා වැය කරන්නේ.

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය හැටියට ප්‍රධාන වශයෙන් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන 3ක් තිබෙනවා. නිවාස සංවර්ධන අධිකාරියෙන් ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් යොදවන්න අපි මේ වෙනකොට බලාපොරොත්තුවෙන් ඉන්නවා. අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් රුපියල් බිලියන 3,054ක් යොදවනවා. මේ සභාවේදී සාකච්ඡා වුණා උතුරු, නැඟෙනහිර, විශේෂයෙන් වන්නි දිස්ත්‍රික්කය තුළත්, හම්බන්තොට දිස්ත්‍රික්කය තුළත් විවිධ ව්‍යාපෘති හරහා ඉස්සර ක්‍රියාත්මක කළ සමහර නිවාස ව්‍යාපෘති සම්පූර්ණ වෙලා නැහැ, ඒවා අතරමැද නතර වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන් 2015-2019 කාලය තුළ පටන් ගත් ඒ විධියට අසම්පූර්ණ නිවාස 45,117ක් තිබෙනවා ගරු සභාපතිතුමනි. සමහර ඒවායේ තිබෙන්නේ අත්තිවාරම් විතරයි, සමහර ඒවායේ ජනෙල් මට්ටමට විතරයි සම්පූර්ණ කරලා තිබෙන්නේ, සමහර ඒවා වහල මට්ටමටවත් ගිහිල්ලා නැහැ, තවත් සමහරක වහල නිම කරලා තිබෙනවා, නමුත් ඉතිරි ටික සම්පූර්ණ කරලා නැහැ. ලංකාවේ මේ වෙනකොට මේ විධියට තිබෙන සම්පූර්ණ නිවාස සංඛ්‍යාව 45,117ක්. අපි බලාපොරොත්තු වුණත් සමහර විට අපට බැරි වෙයි මේ 45,117ම මේ අවුරුද්ද තුළ සම්පූර්ණ කරන්න. නමුත් මම කලින් සඳහන් කළ රුපියල් බිලියන 3,054ම වෙන දා අපි ණය හැටියටයි පාවිච්චි කරන්නේ. හැබැයි අපි මේ අවුරුද්දේ බලාපොරොත්තු වෙනවා ආධාර හැටියටම ලබා දෙමින් මේ නිවාස 45,117ත් කොටසකටත්, ඒ වාගේම නව නිවාස සඳහාත් වෙන් කරන්න. සමහර වෙලාවට, "නිවාස හැදුවා, නිවාස හදනවා" කියලා විශේෂ අවධානයෙන් කථා කරලා මාධ්‍ය සංදර්ශන පෙන්නුවත් අපට කල්පනා කරලා බලන්න වෙනවා ඒ වේගයෙන් ඒ දේවල් සිද්ධ වෙලා තිබෙනවාද කියලා.

මම උදාහරණයක් ගන්නම්. 2015-2019 කාලය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආදර්ශ ගම්මාන ව්‍යාපෘති 333ක් ආරම්භ කරලා තිබෙනවා. එයින් 269ක් ණය ගම්මාන හැටියට තමයි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වාගේම, ආධාර ගම්මාන හැටියට 64ක් යෝජනා වෙලා ආරම්භ කරලා තිබුණා. ඒ, ඉන්දියානු ණය ආධාර යටතේ 50ක් සහ "ශ්‍රම ශක්ති" ව්‍යාපෘතිය හරහා 14ක්. නමුත් අවසානාවකට මේ කාලය තුළ සම්පූර්ණ කරලා තිබෙන්නේ අර 269න් 83ක් විතරයි; විවෘත කරලා තිබෙන්නේ 83ක් විතරයි. ඉන්දියානු ව්‍යාපෘතියෙන් විවෘත කරලා තිබෙන්නේ එක ගම්මානයක් විතරයි. "ශ්‍රම ශක්ති" ව්‍යාපෘතියෙන් 14ක් විවෘත කිරීමට තිබුණා, නමුත් විවෘත කරලා තිබෙන්නේ එකක් විතරයි. එතකොට මේකෙන් පේනවා සමහර දේවල් ලොකු සද්දයක් දාලා කළාට ඇත්තටම නිසි නායකත්වයක්, නිසි මහ පෙන්වීමක් යටතේ මේ ව්‍යාපෘති කරලා නැති බව. ආධාරවලින් කරන නිසා ගොඩක් වෙලාවට මේවාට මුදල් පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. සම්පූර්ණ මුදල ලැබෙන්නේ නැති වුණත් සැලකිය යුතු මුදලක් ඉන්දියානු ආධාරවලින් ලැබෙනවා. ඒ නිසා අපට කල්පනා කරලා බලන්න වෙනවා සමහර දේවල් ශබ්ද දාලා කළාට ඇත්තටම ඒ දේවල් සිද්ධ වෙලා තිබෙනවාද කියලා.

අද දවසේ සාකච්ඡාව තුළ මතු වුණු තවත් එක කරුණකට මම අවධානය යොමු කරන්න කැමැතියි. අපේ ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. එතුමා කථා කරද්දි නිවැසියන් 255ක් ඉන්න වීරකැටිය, නයිගල නිවාස ව්‍යාපෘතියක් ගැන කිව්වා. නමුත් එතැනට ජල සම්පාදනය සිද්ධ වෙලා නැහැ. ඇත්තටම අපි සොයලා බැලුවාම පේන කාරණය තමයි, මේ ගමට නළ ජලය සපයන්න ජාතික ජලාපවහන මණ්ඩලයට පුළුවන්කමක් නැහැ, අදාල පීඩනය එතැනට නැති නිසා. ඒ නිසා ඒ ගම්මාන හදනකොට, නිවාස ව්‍යාපෘති හදනකොට අපි විසින් සැලකිල්ලට ගත යුතු කාරණයක් තමයි අදාළ යටිතල පහසුකම්, මහජන සේවා සම්පාදනය කිරීම සඳහා සැලසුමක් තිබෙනවාද කියන එක. එහෙම සැලසුමක් නැතිව, ජලය සපයන්න, විදුලිය සපයන්න, අත්‍යවශ්‍ය දේවල් සපයන්න සැලසුමක් නැතිව ආරම්භ කරන සමහර ව්‍යාපෘති නිසා ඇත්තටම අවසානයේ සිද්ධ වෙන්නේ ඒ නිවාසලාභීන් කබලෙන් ළිපට වැටුණා වාගේ තත්ත්වයකට පත් වෙන එකයි.

අපි සොයලා බැලුවා, නයිගල ඒ කියන තැන ගැන. එතැනට National Water Supply and Drainage Board එකෙන් supply එක දෙන්න බැහැ. නමුත් නළ ළිඳක් සකසලා ජල ව්‍යාපෘතියක් හදලා ඒ පිළිබඳ කටයුතු කරන්න පුළුවන්. ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මම කලින් සඳහන් කළා වාගේ මේ හතළිස් පන්දහස් ගණනට සහ

අලුත් නිවාසලාභීන්ට නිවාස සංවර්ධන අධිකාරිය යටතේ විවිධ ව්‍යාපෘති හරහා නිවාස ආධාර ලබා දෙන්න, ඒ හරහා ඔවුන්ගේ නිවාස අවශ්‍යතා සම්පූර්ණ කරන්න කටයුතු කරන බව මම මේ අවස්ථාවේ ගරු සභාවට දැනුම් දෙන්න කැමැතියි.

මම තව එක කරුණක් සඳහන් කරලා නිවාස සංවර්ධන අධිකාරියේ කටයුතු පිළිබඳවත් කථා කරන්නම්. ඔබතුමන්ලාට මේ කාරණය මතක ඇති. අපේ ජනාධිපතිතුමා අය වැය කථාව තුළ සඳහන් කළා, උතුරු, නැඟෙනහිර පළාත්වල ගැටුම්වලින් පීඩාවට පත් ජනතාවට රුපියල් මිලියන 2,500ක් වෙන් කරනවා කියලා. ඒ වාගේම උතුරු, නැඟෙනහිර පළාත්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා තවත් රුපියල් මිලියන 1,000ක් ලබා දෙනවා කිව්වා. මේ අය වැය විවාදය තුළ බොහෝ අවස්ථාවලදී අපට අහන්න ලැබුණා, උතුරට සහ නැඟෙනහිරට සමහර දේවල් ලැබුණේ නැඟැ කියලා. නමුත් ප්‍රතිපාදන ලැබෙන විධියට අපි කටයුතු කරනවා. අපි දන්නවා, ඒ ප්‍රදේශවල ජනතාව අඳුරු කාලයක් ගත කරපු බව. විශේෂයෙන් අවධානයට ලක් විය යුතු, ඒ හරහා විශේෂයෙන් ප්‍රතිපාදන ලැබිය යුතු කලාපයක් හැටියට තමයි උතුරු, නැඟෙනහිර අපි විසින් හඳුනාගත යුත්තේ. ඒ නිසා ලැබෙන ප්‍රතිපාදන අනුව නිවාස සහ අනෙක් යටිතල පහසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් මේ අය වැය තුළින් ප්‍රතිපාදන හැටියට වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම UDA එක යටතේත්, අපේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේත් විවිධ ව්‍යාපෘති හරහා නිවාස අවශ්‍යතා ඉටු කරලීම සඳහා අපි මේ අමාත්‍යාංශයට මේ වනවිට මුදල් වෙන් කරලා තිබෙනවා. වෙලාව ප්‍රමාණවත් නැති නිසා මම ඒ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. වීන ආධාර යටතේ ලැබුණු ව්‍යාපෘති හරහා, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ජනනය කරපු අරමුදල් හරහා මේ නිවාස අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරියේදී අපි කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, ආරම්භ කරලා තිබුණු විවිධ නිවාස ව්‍යාපෘති පසුගිය කාලයේ ඇති වෙච්ච ආර්ථික අර්බුදය නිසා මේ වනවිට මහ නතර වෙලා තිබෙනවා. අපි මේ අවුරුද්ද තුළ සමහර වෙලාවට පෞද්ගලික ආයෝජකයන් සම්බන්ධ කර ගනිමින් ඒ නිවාස ව්‍යාපෘති ඉදිරියට අරගෙන යන්න කටයුතු කරන බව මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමතියි. විශේෂයෙන් සමහර පළාත්වල තිබෙන දේවල් මම නම් වශයෙන් සඳහන් කරන්න උත්සාහ කරන්නේ නැහැ, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා. නමුත් ඇණ හිට තිබෙන බොහෝ නිවාස ව්‍යාපෘතිවලට මේ වනවිට සැලසුම් සකස් කරලා තිබෙනවා. ඊයේ දවසේ නියෝජ්‍ය ඇමතිතුමාත්, මමත් නිවාස සංවර්ධන අධිකාරියත් එක්ක සාකච්ඡා කළා. අවශ්‍ය නිලධාරීන් සම්බන්ධයෙනුත් ඒ අයත් එක්ක සාකච්ඡා කළා. ඒ වාගේම අනෙකුත් ආයතනත් එක්ක අපි මේක සාකච්ඡා කරලා මේ අවුරුද්ද තුළ සැලසුම් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

මම කලිනුත් කිව්වා වාගේ ජල සම්පාදනය පැත්තෙන් විශාලම මුදලක් වෙන් කරලා තිබෙන්නේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කරන්නයි. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 109කට ආසන්න ප්‍රමාණයක් අපි වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ සමහර ව්‍යාපෘති දැනටමත් ආරම්භ කරලා විවිධ හේතූන් නිසා අතරමග නතර කරලා තිබෙන්නේ. අපි මේ අවුරුද්ද තුළ ඒ ව්‍යාපෘතිවල වැඩ නැවතත් ආරම්භ කරලා ඉදිරියට පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරන බව මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. මම එක උදාහරණයක් විතරක් සඳහන් කරලා ඊළඟ කරුණට යන්නම්. අනුරාධපුර උතුර ජලසම්පාදන ව්‍යාපෘතිය සඳහා අපි මේ අවුරුද්දේ රුපියල් මිලියන 6,432ක් වැය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒකෙන් නව ජල සම්බන්ධතා 67,000ක් සම්පූර්ණ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is over.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

ඒ අනුව ඉතා විශාල අරමුදල් ප්‍රමාණයක් ඒ, ඒ ක්ෂේත්‍රවලට යොමු කරමින්, මේ අමාත්‍යාංශයට පැවරිලා තිබෙන විෂය පථ ඔස්සේ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා පසුගිය වසරට සාපේක්ෂව ඉතා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා.

විශේෂයෙන් තවත් එක කරුණක් කියලා මම මගේ කථාව අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි. ගංවතුර ප්‍රශ්නය ගැන අපි දන්නවා. ඒ වාගේම ඝන අපද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නයත් අද ලංකාවේ බරපතළ ප්‍රශ්නයක් බව අපි දන්නවා. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීමෙන් සැලකිය යුතු කොටසක් ඉටු කිරීම අපේ අමාත්‍යාංශය හරහා සිද්ධ වෙනවා. එහිදී බොහෝ වෙලාවට අප දකින කාරණයක් තමයි, සමහර නගර ගංවතුරටත් වඩා වැසි වතුර නිසා යට වෙනවා කියන එක. ඒ නිසා වැසි වතුර පාලනය කිරීම සඳහා කටයුතු කළ යුතුයි. එහිදී විශේෂයෙන්ම අනවසර ඉදිකිරීම් වළක්වන්න, ඒවා ඉවත් කරන්න, ඒ වාගේම retention areasවල වැසි වතුර රඳවා ගැනීමේ කටයුතු වැඩිදියුණු කරලා වැසි ජලයෙන් 1/3ක් රඳවා ගන්න, 1/3ක් භූගත කිරීම සඳහා සහ ඉතුරු 1/3 ගංගා ඇළ දොළ හරහා මුහුදට ගලා යෑමට සැලැස්වීම සඳහා කටයුතු කරන්න මේ වන කොට සැලසුම් සකස් කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්දේ ඒ වෙනුවෙන් ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව හරහා රුපියල් මිලියන 700ක් වැය කරන්න.

මේ අමාත්‍යාංශය යටතේ තවත් ආයතන ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. අපි උත්සාහ කරනවා, අපේ අමාත්‍යාංශයට වෙන් කර තිබෙන සියලු මුදල් මේ අවුරුද්ද ඇතුළත ඒ සියලු ආයතන හරහා භාවිත කරලා හොඳ ප්‍රතිඵලයක් රටේ ජනතාවට ලබා දෙන්න. අපි දන්නවා, ඉතා ප්‍රතිඵලදායී, සාධනීය යෝජනා රැසක් මේ අය වැය තුළින් ඉදිරිපත් කිරීමට අපට පුළුවන්කම ලැබුණු බව. ඒ වෙනුවෙන් කටයුතු කරපු අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්වරුන්, සැලසුම් අධ්‍යක්ෂවරුන්, සියලු ආයතන ප්‍රධානීන්, ප්‍රධාන මූල්‍ය නිලධාරිතුමා ඇතුළු සියලු නිලධාරීන්ට මම මේ අවස්ථාවේ විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, ඉතාම සාධනීය සහ ප්‍රතිඵලදායී යෝජනා රැසක් ඉදිරිපත් කරලා, ඒවාට මුදල් වෙන් කරගෙන මේ අවුරුද්ද තුළ වඩා හොඳ සේවයක් ජනතාවට ලබා දීම සඳහා කටයුතු කිරීමට දැරූ උත්සාහය සම්බන්ධයෙන්.

මා කලින් සඳහන් කළා වාගේ මේ ලැබුණු මුදල් ප්‍රතිපාදන සියල්ල මේ අවුරුද්ද තුළ වියදම් කරලා මේ අවුරුද්ද අවසානයේදී "අපට ලැබුණු වගකීම අපි නිසි පරිදි ඉටු කළා" කියන තෘප්තිමත් හැඟීමෙන් යුතුව ඊළඟ අවුරුද්දට පිය මනින්න පුළුවන් වන විධියට සියලු නිලධාරීන් ඇතුළු අපි ඔක්කෝම එකට එකතු වෙලා වැඩ කරමු. ඒ සඳහා මේ ගරු සභාවේ සියලුදෙනාගේ - පක්ෂ, විපක්ෂ සියලුදෙනාගේ - සහයෝගය බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා.

බෙහෙවින්ම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Bimal Rathnayake, please.

[අ.භා. 6.11]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශය සම්බන්ධව අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන මේ අවස්ථාවේ ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ රැඳී සිටීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන් මතු කළ ප්‍රධාන කාරණාවලට මම ටෙලිග්‍රෑම් ක්‍රමයට ඉක්මනින් පිළිතුරු දෙන්නම්.

The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana ඇතෙකු ගැන කිව්වා. එම කාරණය මගේ අමාත්‍යාංශයට අදාළ නැති වුණාට අපේ රටට අදාළයි. ඒ, සුමේධ කියන ඇතාගේ දළය අහිමි කළ ලොරි රථ රියැදුරා අත්අඩංගුවට අරගෙන 21වැනි දා දක්වා රක්ෂිත බන්ධනාගාගත කර තිබෙනවා, නඩු අංක B/332/2025 යටතේ. වනජීවී නිලධාරීන් එම කටයුත්ත කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා ඒ ගැන විශාල උනන්දුවක් දැක්වූ නිසායි මා ඒ පිළිබඳව සඳහන් කළේ.

(ii) however, that physical resources conforming to Grade "A" have not been hitherto provided to the said hospitals; and
(iii) that the aforesaid hospitals have not been provided with adequate staff?

(b) Will he inform this House the -
(i) steps that will be taken to provide the necessary physical resources to those hospitals;
(ii) number of consultant doctors currently serving in each of those hospitals, separately;
(iii) steps taken to fill the staff vacancies existing in the said hospitals; and
(iv) reasons for not taking over the Kinniya and Mutur Hospitals to the Central Government?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) භෞතික සම්පත්වල යම් යම් අඩුපාඩු පවතී.

(iii) මෙම රෝහල්වල දැනට අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතියද රෝගී සත්කාර සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෛද්‍ය, හෙද ඇතුළු කාර්ය මණ්ඩල සැලකිය යුතු ප්‍රමාණයක් සේවා නියුක්තව සිටී. කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත ඇමුණුමෙහි දක්වා ඇත.

Details of BH, Mutur & BH, Kinniya Cadre, in Position - 2025

S.NO	Hospitals - Trincomalee Region	BH - Mutur "A"		BH - Kinniya "A"	
		Cadre	In position	Cadre	In position
1	Medical Superintendent	1	0	1	1
2	Medical Consultant	8	3	8	5
3	Medical Officer	40	41	40	36
4	Dental Surgeon	2	2	2	2
5	AMO/RMO*	0	1	1	
6	Administrative Officer	1	1	1	1
7	Matron	2		2	
8	Ward Sister/Master	8	2	8	5
9	Nursing Officer	80	67	80	68
10	Pharmacist	4	5	4	6
11	MLT	4	3	4	3
12	Radiographer	3	1	3	1
13	Physiotherapist	2	2	1	1
14	Public Health Midwife	12	7	12	12
15	Supervisory PHM				
16	Development Officer	1	3	2	5
17	PHI				
18	ECG Recordist	2	1	2	3
19	PHLT	1	1	1	
20	Dispenser	4	1	4	3
21	Management Service Officer	8	8	5	5
22	Diet Stewards	1		1	1
23	Ward Clerk	1		1	
24	Driver	2	2	2	2
25	Attendant	22	9	20	17
26	Cooks	1	3	2	2
27	Hospital Overseer	1		2	
28	Lab Orderly	1		1	
29	Plant Operator				
30	Seamstress	1	1	1	2
31	Telephone Operator	2		2	
32	Plumber/PMO	1		1	1
33	KKS	0	1	0	1
34	SKS (Ordinary)	40	15	40	20
35	SKS (Junior)	60	33	60	33
36	Watcher				
37	Psychologist				
38	Occupational Therapist				
39	Psychiatric Social Wr.				
40	TOTAL	316	213	314	236

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ආ) (i) මෙම රෝහල්වල භෞතික සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන "පළාත් සංවර්ධන ප්‍රතිපාදන" මඟින් අවශ්‍යතාවන්ගේ ප්‍රමුඛතාව මත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ii)

රෝහලේ නම	විශේෂඥ වෛද්‍යවරුන් ගණන
මුතූර්	03
කින්නියා	05

(iii) මෙම රෝහල්වල පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු ඉදිරි බඳවා ගැනීම සිදු කිරීමේදී පළාතේ රෝහල්වල පවතින සේවා අවශ්‍යතාවල ප්‍රමුඛතාවන් මත සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අය වැය විවාදයේදීත් කිව්වා, අපි nursing officersලා බඳවා ගන්නවා කියලා. ඒකෙදී මේ cadre එක සම්පූර්ණ කරන්න බැරි වෙයි. නමුත්, යම් ප්‍රමාණයක් ලබා දෙන්න පුළුවන්.

(iv) මුතූර් සහ කින්නියා රෝහල් මධ්‍යම රජය යටතට පවරා නොගැනීමට හේතු වනුයේ, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ශික්ෂණ රෝහල් සහ විශේෂ කාර්ය සඳහා පිහිටුවනු ලබන රෝහල් හැර ප්‍රාදේශීය රෝහල්, මාතෘ නිවාස සහ බෙහෙත් ශාලා පිහිටුවා පවත්වාගෙන යාම පළාත් සභාව යටතේ සිදු කළ යුතු බැවිනි.

ඒ අනුව මුතූර් සහ කින්නියා රෝහල් මූලික රෝහල් කාණ්ඩයට අයත් ද්විතීයික ප්‍රතිකාර සේවා සපයන රෝහල් බැවින් මධ්‍යම රජයට පවරා ගැනීමේ නීත්‍යානුකූලභාවයක් නොමැත.

ගරු මන්ත්‍රීතුමනි, අපට "A" සහ "B" වශයෙන් base hospitals 80ක් තිබෙනවා. ඒ සියල්ලම පාහේ පළාත් සභා යටතේ තමයි ක්‍රියාත්මක වෙන්නේ. අපි තෘතීයික මට්ටමේ තිබෙන රෝහල් තමයි මධ්‍යම ආණ්ඩුවට පවරාගෙන තිබෙන්නේ. තවත් එවැනි රෝහල් 4ක්, 5ක් තිබෙනවා. ඒවාත් පවරා ගැනීමට කටයුතු කරනවා.

(ඇ) පැන නොනඟී.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
නන්‍රි, கௌரவ அமைச்சர் அவர்களே!

කිණ්ණියා, මූතූර් වෛද්‍යශාලාවලින් ප්‍රයෝජන ලබන්නේ අධිකතරයක් ජනතාවයි. එනම්, 100,000කට වඩා වැඩි ජනතාවක් ඒ වෛද්‍යශාලාවලින් ප්‍රයෝජන ලබනවා. මේ වෛද්‍යශාලා පළාත් සභාවට පවරා ගැනීම ගැන අපි විරුද්ධ වන්නේ නැහැ. නමුත්, ඒ වෛද්‍යශාලා පවරා ගැනීමට පෙර ඒවායේ පවතින ඌනතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වනවා. ඒ ගැන ඔබතුමා කරුණු දැක්වුවා. ඒ නිසා මම ඒ ගැන නැවත කියන්නේ නැහැ. ඒ ඌනතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගැන අපි ඉල්ලා සිටිනවා.

කිණ්ණියා, මූතූර් වෛද්‍යශාලාවලින් ප්‍රයෝජන ලබන්නේ 100,000කට වඩා වැඩි ජනතාවක් බව මම කලින් කිව්වා. ඒ ජනතාවට ඒ වෛද්‍යශාලා දෙකෙන් සේවය සපයන්නේ විශේෂඥ වෛද්‍යවරු 8 දෙනෙක් පමණයි. ඒ වෛද්‍යවරුන් 8 දෙනා ඒ ජනතාවට සේවය සපයන්නේ කොහොමද කියා අපි ඔබතුමාගෙන් අහනවා. ඒ නිසා ඒ ඌනතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගැන අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, මූතූර් වෛද්‍යශාලාවේ ඔක්සිජන් ප්ලාන්ට් එක ඉතා ඉක්මනින් පුරවන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගැනත් අපි ඉල්ලා සිටිනවා. ඒ ගැන ඔබතුමා කරුණු දැක්වුවා. ඒ නිසා මම ඒ ගැන නැවත කියන්නේ නැහැ. ඒ ඔක්සිජන් ප්ලාන්ට් එක ඉතා ඉක්මනින් පුරවන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගැන අපි ඉල්ලා සිටිනවා.

මූතූර් වෛද්‍යශාලාවේ ඔක්සිජන් ප්ලාන්ට් එක පුරවන්න ඔක්සිජන් සිලින්ඩර් 1,000ක් අවශ්‍ය වනවා. ඒ සඳහා ඔක්සිජන් සිලින්ඩර් 1,000ක් ලබා දෙන්න කියා අපි ඉල්ලා සිටිනවා. ඒ ගැන ඔබතුමා කරුණු දැක්වුවා. ඒ නිසා මම ඒ ගැන නැවත කියන්නේ නැහැ. ඒ ඔක්සිජන් සිලින්ඩර් 1,000ක් ලබා දෙන්න කියා

ලංකා ඛනිජ වැලි සමාගමට බඳවා ගත් අනියම් කම්කරුවන්: වැටුප් නොගෙවීම

இலங்கை கனிய மணல் கம்பனிக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்ட தற்காலிக தொழிலாளர்கள்: சம்பளம் வழங்காமை

CASUAL LABOURERS RECRUITED TO CEYLON MINERAL SANDS LIMITED: NON-PAYMENT OF SALARIES

444/2025

5. ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුල්මුඩේ, ලංකා ඛනිජ වැලි සමාගමට 2024.07.01 දින සිට අනියම් පදනම මත කම්කරු තනතුර සඳහා බඳවා ගන්නා ලද සේවකයන්ට මේ වනතෙක් කිසිදු වැටුපක් හෝ දීමනාවක් ගෙවා නොමැති බව දන්නේද;

(ii) ඔවුන්ට වැටුප්/දීමනා නොගෙවීමට හේතු කවරේද;

(iii) ඔවුන්ට වැටුප් ගෙවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புல்மோட்டை, இலங்கை கனிய மணல் கம்பனிக்கு 2024.07.01ஆந் திகதி முதல் தற்காலிக அடிப்படையில் தொழிலாளர்களாகச் சேர்த்துக்கொள்ளப்பட்ட ஊழியர்களுக்கு இதுவரை எவ்வித வேதனமோ, கொடுப்பனவோ செலுத்தப்படவில்லை என்பதை அறிவாரா;

(ii) வேதனம்/கொடுப் பனவு மேற்படி ஊழியர்களுக்குச் செலுத்தப்படாமைக்கான காரணங்கள் யாவை;

(iii) இவ்வூழியர்களுக்கு வேதனத்தைச் செலுத் துவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

(iv) இவர்களது தொழில் பாதுகாப்பை உறுதிப் படுத்துவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -

(i) whether he is aware that the employees recruited to the Ceylon Mineral Sands Limited, Pulmudai for the post of labourer on casual basis with effect from 01.07.2024 have not been paid any salaries or allowances so far;

(ii) the reasons for not paying them salaries or allowances;

(iii) the steps that will be taken to pay their salaries; and

(iv) the measures that will be taken to ensure their job security?

(b) If not, why?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඉහත සඳහන්, අනියම් පදනම මත බඳවා ගෙන ඇති සේවකයන් ආයතනයේ අනුමත තනතුරුවලින් බැහැරව හා විධිමත් ක්‍රමවේදයෙන් පරිබාහිරව බඳවා ගැනීම මත එම සේවකයන්ට වැටුප් ගෙවා නොමැත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 118දෙනෙක් බඳවාගෙන තිබෙනවා, cadre එකෙන් පිට; ඒ වාගේම දේශපාලන වුවමනාවට. පසුගිය මැතිවරණ කාලයේදීත් විශාල ප්‍රමාණයක් බඳවාගෙන තිබෙනවා. ඒ විධියට බඳවාගෙන තිබෙන අය ඔක්කොම 118දෙනෙක් ඉන්නවා.

(iii) දැනටමත් ලංකා ඛනිජ වැලි සමාගම වෙත අනුමත කම්කරු තනතුරු 118ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව එම තනතුරු සඳහා බඳවා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු අනියම් පදනම මත බඳවාගෙන ඇති සේවකයන් සුදුසු පරිදි එම කම්කරු තනතුරුවල පිහිටුවා වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැනටමත් මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. මේ කිසිම සේවකයෙකු ඉවත් කරන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. මම ගිහිල්ලා ඒ සේවකයන් සමඟත් කථා කළා. මොකද, cadre එකෙන් පිට බඳවාගත් සේවකයන්ට අපි වැටුප් ගෙවිවොත්, අපටත් විගණන ප්‍රශ්න එනවා. එම නිසා දැනට මම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කළා. ඔවුන් වාචිකව අපට ඒ සඳහා එකඟතාව පළ කර තිබෙනවා. එම එකඟතාව ලිඛිතව ලැබුණාට පස්සේ මේ මාර්තු මාසයේ සිට ඒ අවශ්‍ය බඳවා ගැනීම් කරන්න පුළුවන්. මොකද, කොන්ත්‍රාත් පදනම මත තමයි අපට ඔවුන් මුලින්ම බඳවා ගන්න වෙන්නේ.

(iv) ඉහත අංක (iii) යටතේ සඳහන් කර ඇති පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු අනියම් පදනම මත බඳවා ගෙන ඇති සේවකයන් සුදුසු පරිදි ආයතනයේ කම්කරු තනතුරුවල පිහිටුවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් ඒ සුබවාදී පිළිතුරට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම ඔබතුමා ඒ ස්ථානයට ගිය වෙලාවේත් සේවක මහත්වරුන්ට ඒ සහතිකය දීලා තිබුණා. ඔබතුමා ඒ සේවක මහත්වරුන්ට අසාධාරණයක් කරන්නේ නැහැ කියන කාරණය සඳහන් කරලා තිබුණා. මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ලබා දුන් පිළිතුර වෙනුවෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Second Round.

අඹතලේ සිට ග්‍රෑන්ඩ්පාස් දක්වා මාර්ගය: සංවර්ධනය
அம்பதலே தொடக்கம் கிரேண்ட்பாஸ் வரையான வீதி: அபிவிருத்தி
ROAD FROM AMBATALE TO GRANDPASS: DEVELOPMENT

274/2024

2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. S.M. Marikkar)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) අඹතලේ සිට ග්‍රෑන්ඩ්පාස් දක්වා දිවෙන මාර්ගය (පරණ පාර) සංවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

(iii) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பதலே தொடக்கம் கிரேண்ட்பாஸ் வரையான வீதியை (பழைய வீதி) அபிவிருத்தி செய்வதற்கு வேலைத்திட்டமொன்று முன்மொழியப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வேலைத்திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு எதிர்பார்த்துள்ள காலப்பகுதி யாதென்பதையும்;

(iii) அந்த வீதியை அபிவிருத்தி செய்வதற்குத் தேவையான நிதி எவ்வாறு பெற்றுக்கொள்ளப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) whether a programme has been proposed for the development of the road (old road) from Ambatale to Grandpass;

(ii) if so, the timeframe during which the said programme is expected to be implemented; and

(iii) the manner in which the funds required for the development of the said road would be provided?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. අඹතලේ සිට ග්‍රෑන්ඩ්පාස් දක්වා මාර්ගය කොටස් තුනකින් සමන්විත වන අතර, මෙම මාර්ගය සංවර්ධනය සිදු කරන ආකාරය අනුව කොටස් 03කි.

අනු අංකය		මාර්ග කොටස	දුර	අයිතිය	තත්ත්වය
1	1	පළමු කොටස	මීටර් 0 සිට මීටර් 270 දක්වා කොටස	කොළඹ මහ නගර සභාව සතුය	ගමනාගමනයට සුදුසු තත්ත්වයේ පවතී.
2	2(a)	දෙවන කොටස	මීටර් 270 සිට මීටර් 830 දක්වා කොටස	මාර්ග සංවර්ධන අධිකාරිය	සංවර්ධනය කළ යුතු තත්ත්වයේ පවතී.
	2(b)	තුන්වන කොටස	මීටර් 830 සිට කි.මී.3 මීටර් 760 දක්වා කොටස	මාර්ග සංවර්ධන අධිකාරිය	සංවර්ධනය කළ යුතු තත්ත්වයේ පවතී.

ඉහත සඳහන් සංවර්ධනය කළ යුතු මාර්ග කොටස් (අනු අංක 02හි පරිදි), ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත තැන්පත් කර ඇති මුදලින් සංවර්ධනය කිරීමට යෝජිතව ඇත.

(ii) ඉහත අංක 2(a)හි සඳහන් මීටර් 270 සිට මීටර් 830 දක්වා කොටසෙහි ප්‍රතිසංස්කරණ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කිරීමට සැලසුම් කර තිබුණද, නැවතත් 2025 පෙබරවාරි මස දැනුම් දීමක් මඟින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම

කොටසෙහි ගෘහස්ථ ජල සැපයුම වෙනුවෙන් නැවතත් ජල නළ එළීමට අවශ්‍ය බව දන්වා ඇත. එම නිසා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අදාළ සංවර්ධන කටයුතු තාවකාලිකව නවතා ඇත. මෙම කොටසෙහි ජල නළ එළීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට එම මණ්ඩලයට දැනුම් දී ඇති අතර, එදින සිට මෙම කොටසෙහි ප්‍රතිසංස්කරණ කටයුතු වහාම ආරම්භ කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ඇත.

මීටර් 830 සිට කිලෝමීටර 3 මීටර් 760 දක්වා කොටසෙහි ජල නළ එළීමේ කටයුතු අවසන් කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දීමට කටයුතු කළ පසු එම කොටසෙහි සංවර්ධන කටයුතු කඩිනමින් ආරම්භ කිරීම සිදු කළ හැකි අතර, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් එම මාර්ග කොටස භාර දෙන දිනය නිශ්චිත නොවන බැවින් ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වන දිනය පිළිබඳ ප්‍රකාශ කළ නොහැක.

(iii) සම්පූර්ණ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රුපියල් මිලියන 288ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් තැන්පත් කර ඇති අතර, දෛනික නඩත්තු කටයුතු වෙනුවෙන් වැය වී ඇති රුපියල් මිලියන 85ක මුදල හැරුණුකොට ඉතිරිව ඇති රුපියල් මිලියන 203ක මුදලක් ඉහත කී ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් යොදා ගැනෙනු ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Questions under Standing Order 27(2), the Hon. Ravi Karunanayake. - *[Not in the Chamber.]*

Statement by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister.

ජාත්‍යන්තර කාන්තා දිනය: ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රකාශය
சர்வதேச மகளிர் தினம்: மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று
INTERNATIONAL WOMEN'S DAY: STATEMENT BY HON. PRIME MINISTER

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Deputy Speaker, I thank you for giving me this time.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනට යෙදී තිබෙන ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙනුයි මම මේ ප්‍රකාශය කරන්නේ. ලොව වටා සියලු කාන්තාවන්ගේ අරගළ සනිටුහන් කරන දිනය තමයි ජාත්‍යන්තර කාන්තා දිනය ලෙස අද අපි සමරන්නේ.

අද ජාත්‍යන්තර කාන්තා දිනය වෙන්නේ ඒ නිසායි. අද මම කැමැතියි විශේෂයෙන්ම ලංකාව තුළ දශක ගණනාවක් තිස්සේ විවිධ අන්දමින්, විවිධ තැන්වල, විවිධ අවස්ථාවල, විවිධ හේතු මත අරගළ කළ ඒ සියලු ගැහැනුන්ට, අපේ සහෝදරියන්ට ප්‍රණාමය සහ ස්තුතිය ප්‍රකාශ කරන්නට. අද වන විට අපි විසිදෙදෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් හැටියට පත් වෙලා සිටින්නේ ඒ අරගළවල ප්‍රතිඵල හැටියට. ඉතිහාසය තුළ සිදු කළ ඒ අරගළ හරහා තමයි අද අපට මේ තත්ත්වය ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒක කිසිසේත්ම පහසු වූ පාරක් නොවන බව අපි සියලුදෙනාම හොඳින් දන්නා දෙයක්. අපි අද මෙතැන හිටගෙන ඉන්නේ ඒ විධියට අරගළ කරලා, අපි වෙනුවෙන් පෙනී හිටපු ඒ සහෝදරියන් නිසායි.

විශේෂයෙන් ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරියන් විසිදෙනා වෙනුවෙන්, අපි වෙනුවෙන් සටන් කළ, අපි වෙනුවෙන් පෙනී හිටපු, නම් දන්නා, නම් නොදන්නා, වේදිකාවල හිටපු, වේදිකා පිටුපස්සේ හිටපු ඒ දහස් ගණනක් වූ සහෝදරියන්ට මගේ ස්තුතිය ප්‍රකාශ කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද අපට විශේෂ අවස්ථාවක් ලැබිලා තිබෙනවා. මේ වෙනස් වෙමින් පවතින දේශපාලන තත්ත්වය තුළ කාන්තා දේශපාලනයට දැන් වෙනදාට වඩා හඬක් ලැබිලා තිබෙනවා, වෙනදාට වඩා අවධානයක් ලැබිලා තිබෙනවා.

අපි නායිකාවන් මතුකරගෙන තිබෙනවා. පක්ෂ, පාට කිසිම භේදයක් නැතිව අපට ඒක දකින්න තිබෙනවා. කාන්තා දේශපාලනය කියන එක ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂ දේශපාලනය පමණක් නොවෙයි. එහෙම නැත්නම් නියෝජිත දේශපාලනය පමණකුත් නොවෙයි. ඔබතුමා දන්නවා, ස්ත්‍රීවාදී මතවාදය තුළ අපි සියලුදෙනාම සටන් පාඨයක් හැටියට ගන්න දෙයක් තමයි, "The personal is political" කියන එක. ඒ කියන්නේ විශේෂයෙන් ගැහැනු අපට පෞද්ගලික සහ ප්‍රසිද්ධ, ඒ කියන්නේ, private and public කියලා භේදයක් නැතිව සටන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා, අරගළ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. අපේ හැම අරගළයක්ම දේශපාලනිකයි. අපි ගෙදර තුළ අපේ ආරක්ෂාව වෙනුවෙන් කරන අරගළය දේශපාලනිකයි. ආර්ථිකය තුළ අපේ ගෙදර පවත්වාගෙන යෑම සඳහා බඩු මිල වෙනුවෙන් කරන අරගළය අතිශයින්ම දේශපාලනිකයි. ගෙදර දියණිය රැක බලා ගන්න අපේ අම්මලා කරන අරගළය, අපේ ආච්චිලා කරන අරගළය දේශපාලනිකයි. ආබාධිත ගැහැනියක් ඇයගේ ජීවිතය ගොඩ නහා ගැනීමට ගෙදර තුළ, ප්‍රජාව තුළ, වැඩ කරන තැන තනියෙන් කරන අරගළය වුණත් දේශපාලනිකයි. ආයතනයක් තුළ තමන්ගේ ගරුත්වය ලබා ගන්න, ගරුත්වය නියාගෙන තමන්ගේ වෘත්තීය කරගෙන යන්න කරන ඒ අරගළය දේශපාලනිකයි. පොදු ප්‍රවාහනයේ යනකොට කරදරයක් නැතිව යන්න, අපි දිනපතා කරන ඒ අරගළය දේශපාලනිකයි.

අපේ ජීවිත තුළ අපි හැම දාමත් අරගළ කර තිබෙනවා. නමුත් ඒ අරගළවලට අපට නමක් තිබුණේ නැහැ; අපි සංවිධානගත වුණේ නැහැ; අපි පොදු සටනකට එකතු වුණේ නැහැ. ඒවා අපි බොහෝ දෙනෙක් තනි තනියෙන් කරපු දේවල්. අපි හිතුවා මේක තමයි අපේ ජීවිතය කියලා. නමුත් අද ඒක වෙනස් වෙමින් පවතිනවා. අද අපි තේරුම් ගෙන තිබෙනවා, එය පෞද්ගලිකව කර තිබෙන අරගළයක් බව. ඒක ඇත්තටම දේශපාලන අරගළයක් බවට පත් කළ යුතුයි කියන එක මේ රටේ හැම තැනකම සිටින ගැහැනුන් තේරුම් ගනිමින් පවතින නිසා තමයි අද දේශපාලනය තුළ කාන්තා නියෝජනය මෙහෙම පිළිගන්නා තැනකට පත් වෙලා තිබෙන්නේ; සංවිධානාත්මක හඬක් බවට පත් වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා අද වාගේ දිනයක අපි ඒ ගැන මතක් කරගත යුතුයි, අපි එය සැමරිය යුතුයි කියා මා හිතනවා. මොකද, මේක සුවිශේෂී දෙයක්. මේක අපි පොදුවේ සාමූහිකව කරන අරගළයක්. තනි තනිව කරපු ඒ අරගළය, අද අපි සාමූහිකව කරනවා. අපි එකිනෙකා වෙනුවෙන් සාමූහිකව පෙනී සිටින තැනකට ඒ අරගළය පත් කරමින් යනවා. බාධක නැතිව නොවෙයි; වැරදෙන තැන් නැතිව නොවෙයි. ඒ වාගේම අභියෝග නැතිවත් නොවෙයි.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

නමුත් අභියෝග නැති, බාධක නැති අරගළ නැහැ කියන එක අපි සියලු දෙනා දන්නවා. අපිට තව දිනා ගන්න බොහෝ දේවල් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වුණත් බලන්න, Global Gender Gap Report එක අනුව රටවල් 146කින් අපි ඉන්නේ 110වැනි තැන. ඒක පිළිගත හැකි තැනක් නොවෙයි. අද මෙච්චර ජයග්‍රහණයක් ලබා ගෙනත්, අපේ පාර්ලිමේන්තුව තුළ තිබෙන කාන්තා නියෝජනය බලන්න. පාර්ලිමේන්තුව තුළ අපේ කාන්තා නියෝජනය තවමත් සියයට 10ක්වත් නැහැ. තවම එය සියයට 9.8යි. It is almost 10 per cent. But, that could, in no way, be seen as sufficient.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේ යන තවත් විශේෂ සංවාදයක් තමයි අපේ ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගිත්වය කොච්චරද කියන එක. කාලයක් තිස්සේ කථා වෙන, කාලයක් තිස්සේ මතු කරන දෙයක් තමයි ලංකාවේ අධ්‍යාපනය සහ වෙනත් ක්ෂේත්‍රවලින් ඉහළින්ම සිටින ගැහැනුන් ශ්‍රම බලකාය තුළ ඉතාම අඩු සහභාගිත්වයක් දක්වනවා කියන එක. අද වෙනකොටත් පිරිමි අයගේ ශ්‍රම සහභාගිත්වය සියයට 74ක් වන අතර, ගැහැනු අයගේ ශ්‍රම සහභාගිත්වය සියයට 32යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේක තේරුම් ගන්නේ කොහොමද? මේක අතිශයින්ම වැදගත් කරුණක්. මම සතුටු වෙනවා, ජාතික ජන බලවේගය හැටියට අපි මේ කාරණය දිගින් දිගටම මතු කිරීම පිළිබඳව. ඒ විතරක් නොවෙයි. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනවලත්, අපේ ප්‍රතිපත්ති අපි ක්‍රියාත්මක කරන තැනත් මේක තේරුම් ගැනීම ගැන මම ඉතාම සතුටු වනවා. විශේෂයෙන්ම ජාත්‍යන්තර සංවිධානත්, ප්‍රතිපත්ති දායකයන් ගණනය කරනකොටත් මහ හැරෙන දෙයක් තිබෙනවා. ඒක තමයි වැටුප් රහිත සුරැකුම් වැඩවලට ගැහැනුන්ගේ සහභාගිත්වය. ඒ නිසා මේ ශ්‍රම බලකාය තුළ ඇය මහහැරෙන හේතුව ගැන ඇති තරම් සංවාදයට ලක්වෙලා නැහැ. බොහෝදුරට ශ්‍රම බලකාය තුළ ගැහැනුන්ගේ සහභාගිත්වය අඩුවීමට ආර්ථිකය තුළින්ම තමයි අපි විසඳුම් හොයන්න යන්නේ.

නමුත්, ආර්ථිකයක් තුළ සමාජයක් සංවිධානය වෙලා තිබෙන විධිය ආර්ථිකයට බලපානවා. සමාජය සංවිධානය වෙලා තිබෙන විධිය තුළ සුරැකුම් වැඩවල බහුතර වගකීම ගැහැනුන්ට තිබෙන තාක් කල් සහ ඒ සුරැකුම් වැඩ පෞද්ගලික වගකීමක් හැටියට පමණක් දකින තාක් කල්, ඒකට තිබෙන සමාජීය වැදගත්කම, සමාජීය වගකීම සමාජයක් හැටියට අපි තේරුම් නොගන්නා තාක් කල් අපට කවදාකවත් අර්ථාන්විත විධියට ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කරන්න බැරි වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම වැටුප් රහිතව කරන ඒ සුරැකුම් වැඩ තවදුරටත් පෞද්ගලික වගකීමක් නොව, සමාජමය මෙහෙවරක්; අපේ අම්මලා, අපේ නංගිලා, අපේ ආච්චිලා, අපේ සහෝදරියන් කරන්නේ සමාජ මෙහෙයුමක් කියන එක තේරුම් අරගෙන ඒ වෙනුවෙන් සමාජයෙන් ප්‍රතිචාරයක් ලැබෙන තාක් කල් අපට මේ මූලික ගැටලුව විසඳන්න බැරි වෙනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත්, අපේ අය වැය තුළත් විශේෂයෙන්ම දිවා සුරැකුම් මධ්‍යස්ථාන, වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන, පොදු ප්‍රවාහනය, සෞඛ්‍යය, අධ්‍යාපනය කියන දේවල් දියුණු කිරීම මේ අරගළයේ කොටසක් බවට පත් වෙලා තිබෙන්නේ අන්න ඒ නිසායි. මේ සමාජ ආරක්ෂණ වැඩ ශක්තිමත් නොවන තාක් කල්, සුරැකුම් වැඩ කියන එක අපි සියලු දෙනාගේම වගකීමක්, ඒක ගෙදර ඉන්න අම්මාගේ වගකීමක් පමණක් නොවෙයි කියන සමාජ කතිකාව නොහැදෙන තාක් කල් අපට මේ ප්‍රශ්නයට තිරසාර, සාධාරණ විසඳුමක් ගෙනෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේ මේ කාරණය මතු කළේ, ජාතික ප්‍රතිපත්තියක් ලෙසත්, ජාතික වැදගත්කමකින් යුතුවත් අපි මේ කාරණය භාර ගන්නා නිසායි. ජාත්‍යන්තර කාන්තා දිනය හුදෙක් දවසකට සීමා වන දිනයක් නොවෙයි. අපි කළ යුත්තේ, ඒ සමාජ පරිවර්තනය තුළ, ගැහැනියගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව තුළ ඇති වෙලා තිබෙන අසමානතාව සහ අසාධාරණය සමාජ දේශපාලන ප්‍රශ්නයක් හැටියට, ආර්ථික ප්‍රශ්නයක් හැටියට නිවැරදිව හඳුනාගෙන එයට ජාතික තලයේදී මැදිහත් වීමයි. අද අපි එකතු වෙලා හදන ප්‍රතිපත්ති තුළත්, අපි කරන මැදිහත්වීම් තුළත් නිරන්තරයෙන් මේ කාරණා මතු කිරීම පිළිබඳවත්, ඒවාට ඇහුම්කන් දීම පිළිබඳවත් අපේ සහෝදර මන්ත්‍රීවරුන්ටත්, ජනාධිපතිතුමාගේ ඉඳන් ඇමති මණ්ඩලයටත් ස්තුති කරමින් මා නිහඬ වෙනවා. කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்காணி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member?

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்காணி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද ජාත්‍යන්තර කාන්තා දිනයයි. කාන්තාවගේ අභිමානය, එහෙම නැත්නම් අයිතිවාසිකම් සම්බන්ධයෙන් කථා කරන දිනය අදයි. ගරු අගමැතිතුමියනි, සේවා ස්ථානයකදී අපේ කාන්තාවකගේ සේවා අයිතිවාසිකම් කඩවීමක් ගැන ඔබතුමියට පැහැදිලි කරන්න මම කැමැතියි. ගරු අගමැතිතුමියනි, අපි මේ මොහොතේත් කථා කරන්නේ කාන්තාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වාගේම කාන්තාවට ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ලබා ගැනීම, කාන්තාව හිංසනයෙන්, පීඩනයෙන් මුදා ගැනීම පිළිබඳවයි.

ගරු අගමැතිතුමියනි, හැබැයි අපි ජාතික කාන්තා සතියක් ප්‍රකාශයට පත් කරලා තිබෙන මොහොතකත්, ඊයේ ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ, ඇඹිලිපිටිය හල්මිල්ල විද්‍යාලයේ ගුරුවරියකට එම විද්‍යාලයේම ගුරුවරයෙකු විසින් පහරදීමක් කර තිබෙනවා. විදුහල්පතිතුමිය ඉදිරියේ එම පහරදීම සිදු වනකොට එම ගුරුතුමිය නීත්‍යානුකූල පසුබිම තුළ ලොග් සටහන් පොතේ සටහනක් තබා අද වනකොට රෝහල්ගතව ඉන්නවා. ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අපි ජාතික කාන්තා සතියක් ප්‍රකාශයට පත් කරලා තිබෙන මොහොතකත් මේ තරම් දැවැන්ත හිංසනයන්ට සේවා ස්ථාන තුළ කාන්තාවන් ලක්වීම ඇත්ත වශයෙන්ම කනගාටුවට කාරණාවක්. මන්ත්‍රීවරියක විධියට මේ ගරු සභාව තුළ එය මා හෙළා දකිනවා.

ගරු අගමැතිතුමියනි, මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් ඔබතුමිය දැනුවත් ද, මේ සම්බන්ධයෙන් ඉදිරියට ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා. ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අද මම ඔබතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා මේ ගරු සභාවට දන්වන්න කියලා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අද උදේ තමයි එම සිද්ධිය පිළිබඳව වාර්තා වුණේ. අනිවාර්යයෙන්ම ඒ පිළිබඳව හොයලා නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා විතරක් නොවෙයි, විනය ක්‍රියාමාර්ගත් ගත යුතුයි කියලා මම අමාත්‍යාංශයට දැනුම් දෙනවා. ගරු මන්ත්‍රීතුමියනි, එම විමර්ශනය පිළිබඳව තවත් තොරතුරු ලැබී තිබෙනවා නම් මා අද දවස ඇතුළත ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්. මෙම කාරණය ගරු සභාවේ අවධානයට ලක් කිරීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, I appreciate your encouraging the particular Standing Orders to butt in when irrelevant points are raised. But, the matter raised just now is important, as the Hon. Prime Minister mentioned. I hope the same sense of leniency would be maintained because that is the sense of vibrancy required in Parliament.

Sir, is it okay if I raise my Question under Standing Order No. 27(2)? I had to attend to a medical matter and got late just a few minutes. So, Sir, could I raise the Question? If I am allowed to raise it, I would greatly appreciate it.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. The Hon. Ravi Karunanayake.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

යෝජිත සරල කරන ලද එකතු කළ අගය මත බද්ද අහෝසි කිරීම
உத்தேச எளிமைப்படுத்தப்பட்ட சேர்பெறுமதி வரியை ஒழித்தல்
PROPOSED ABOLITION OF SIMPLIFIED VALUE ADDED TAX

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Thank you, Sir. Again, I am sorry for being late since it was due to a medical matter that I had to attend to.

I would like to ask the following Question from the Minister of Finance, Planning and Economic Development under Standing Order No. 27(2).

I wish to draw the attention of the Government to a matter of urgent public importance concerning the proposed abolition of the Simplified Value Added Tax -SVAT- system in September, 2025 without ensuring a guaranteed and efficient refund mechanism for exporters.

The Government has projected an export revenue target of US Dollars 19 billion. However, the removal of SVAT without a proper refund system could severely impact on cash flows, discourage exports and create financial uncertainty among exporters, including SMEs. The lack of a swift and transparent refund mechanism may lead to delays, increasing the cost of doing business and affecting the competitiveness of Sri Lankan exports in global markets.

Sri Lankan exporters have to compete in a region where all benefits are being given to the competing peer country companies with a very low cost of capital and no administrative hassles. Sir, I raise this is in light of President Trump adopting an anti-globalization approach. So, that is the reason why we have to look at it and help our companies to reach international state.

In light of all this, I seek a response from the Hon. Minister of Finance on the following:

1. What measures are being taken to ensure a timely and a guaranteed VAT refund system before abolishing SVAT?
2. Evasion of taxes must be eradicated at all cost. However, in order to achieve that, a feeling of equity and reasonableness must be demonstrated. When tax refunds have become a major "nightmare", do you think adopting this measure at this stage would be practical? This has been tried for the last seven years.
3. Has the Government consulted key stakeholders, including exporters, the chambers of commerce and the SME chambers on the practical challenges arising from this decision?
4. Given the Government's expectation of earning US Dollars 19 billion from exports, which is excellent and has to be done, how does it plan to mitigate the adverse effects of this policy change on exporters' liquidity and competitiveness?
5. Will the Government consider postponing the abolishing of SVAT until an efficient refund mechanism is fully implemented and tested?
6. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය විසින් මහා පරිමාණ, සුළු පරිමාණ ව්‍යවසායකයින් වෙත ලබා දී ඇති සහතිකයන් කවරේ වුවද, වාණිජ බැංකු විසින් ලබා දෙන පොලී අනුපාත ජාත්‍යන්තර වෙළෙඳ පොළ තුළ කෙසේ වෙතත්, කලාපය තුළ පවා තරග කිරීම අපහසු කරවන ඉහළ මට්ටමේ අනුපාත වේ.
7. අළෙවි ලක්ෂ්‍යය - the point of sale, උපකරණ හඳුන්වා දීම- I appreciate that this was mentioned in the Budget by the President, the Minister of Finance -

[ගරු රවී කරුණානායක මහතා]

හරහා එකතු කළ අගය මත බදු අය කිරීම නවීකරණය කිරීමේ අවශ්‍යතා පිළිබඳව ජනාධිපතිවරයා විසින් සිය අය වැය කථාව තුළ සඳහන් කරන ලදී. එසේ නම්, මේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වන තෙක් අපට රැඳී සිටිය නොහැකිද?

8. ණය අර්බුදයෙන් මිදීම සඳහා අපනයන ඉහළ නැංවීම අත්‍යවශ්‍යයි. ඉතා ඉහළ සංස්ථාපිත බදු ඇතැම් වියදම් මත රඳවා තබා ගැනීම බදු ක්‍රියාත්මක කිරීම සහ රටේ පවත්නා මූල්‍ය තත්ත්වය හේතුවෙන් අපනයනකරුවන් වෙත බදු සහන ලබා දී නොමැති තත්ත්වයක, අපනයනකරුවන් වෙත තරගකාරී තත්ත්වයක් ලබා දෙමින් රටේ දළ දේශීය නිෂ්පාදනය - GDP - වර්ධනය කරනු පිණිස වියදම් පාදක බදු සහනයක් හඳුන්වා දිය නොහැකිද?

9. ගෙවීම පැහැර හැරීම හරහා වසරකට රජයට අහිමි වනු ඇතැයි රජය අපේක්ෂා කරන ඇස්තමේන්තු බදු මුදල් ප්‍රමාණය කවරේද? මෙය වූ කලී ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය සහ සමස්ත ආර්ථික ස්ථාවරත්වයට සෘජුව බලපාන කරුණක් වන බැවින් මේ සඳහා රජයෙන් කඩිනම් පැහැදිලි කිරීමක් අපේක්ෂා කරමි.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රවී කරුණානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ස්ථාවර නියෝග 27(2) යටතේ වන ප්‍රශ්නයට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අපේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරක් ලබා දෙනවා. නමුත් මේ වෙලාවේ මා ඉල්ලන්න කැමැතියි, මේක සම්ප්‍රදායක් කර ගන්න අවශ්‍ය නැහැ කියන කාරණය. මොකද, ගරු මන්ත්‍රීතුමනි ඔබතුමාගේ අභිමතයට ඉඩ තිබෙන අතරේම, ඒ අභිමතය එක වේලාවක පූර්වාදර්ශයක් වෙනවා. ඊට පසුව එය සම්ප්‍රදායක් බවට පත් වෙනවා. අපි ස්ථාවර නියෝග 27(2)ට අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ වෙලාවේ අදාළ මන්ත්‍රීවරයා ඒක ඉදිරිපත් කළ යුතුයි. නමුත් කුමන හෝ හේතුවක් මත ඒ මන්ත්‍රීවරයා පැමිණ නොසිටියොත්, ඒ වාගේම මේ විධියට අවස්ථාව දෙන්න සිදු වුණොත්, අපට සභාවේ කටයුතු කරගෙන යන්න බැරි වෙනවා. ඊළඟ සතියේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අසන මන්ත්‍රීවරයෙක්, "පළමුවන වටයේදී මා හිටියේ නැහැ, දෙවන වටයේදී මට ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න" කියලා කිව්වොත්, ඒක කර ගන්න බැහැ. මොකද, ඒක ඔබතුමාගේ අභිමතය වුණාට, ඊට පස්සේ එය පූර්වාදර්ශයක් බවට පත් වෙන්න ඉඩකඩ තිබෙනවා. ඒ නිසා මම සඳහන් කරන්න කැමැතියි, කරුණාකරලා මේක සම්ප්‍රදායක් කර ගන්නේ නැතිව මේ අවස්ථාව අදට විතරක් යොදා ගනිමු කියලා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දීම මම අගය කරනවා. මම කනගාටුව ප්‍රකාශ කරනවා ප්‍රමාද වීම පිළිබඳව. මොකද, මට වෛද්‍ය පරීක්ෂණයක් තිබුණ නිසා. පූර්වාදර්ශයක් කර ගන්න අවශ්‍යතාවක් නැහැ, මේක. නමුත් මෙය මීට පෙර ඇති වූ දෙයක් තුළින් තමයි මම ඉදිරිපත් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

All right. Hon. Member, we will not make this a precedent in the future.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, let us move forward. And, the sense of vibrancy and openness you mentioned, we appreciate and must be maintained in the future as well. That is the Parliamentary spirit which should be there, whether it be the UK Parliament or the Indian Parliament.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Anil Jayantha to anwer the Question.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

මේක මේ දවස්වල විවාදයට තුඩු දුන් කාලීන ප්‍රශ්නයක්. But, before answering it, we need to understand what SVAT and VAT are. First of all, I would like to mention that it is not a hasty decision to remove the SVAT system simply disregarding other things. In the meantime, before answering the Question, I would also like to draw your attention to the Budget Speech of 2017. In page page 85, the Finance Minister states, I quote:

> "460. I propose to remove the SVAT scheme as it could hardly be called simple. It has become redundant with an efficient and smoothly operational technology driven VAT administration process brought about by the IRD...."

That is, the Inland Revenue Department.

> ".....automation system.
>
> 461. A refund mechanism at ports and airports will be introduced for foreigners..."

So, just pay attention to paragraph 460. අපි ඒ paragraph එක විතරක් ගත්තත්, එතැන පැහැදිලිව කියනවා, "ඒ වෙනකොට ඉතා smooth refund system එකක් IRD එක introduce කරලා තිබුණා. ඒ නිසා මම propose කරනවා..." කියලා. ඇත්තටම ඒක බොරුවක්. ඒ වෙලාවේ එහෙම refund system එකක් තිබුණේ නැහැ. මම මේ කියන්නේ, ඇත්තටම සමාජයේ ඒ සාකච්ඡා ගත්තේ නැහැ, මේ වාගේ දේවල් කථා කරනකොට. ඒවා යට ගිහින් තිබුණා. අපි එහෙම කරලා නැහැ. ඒ වාගේම තමයි, ඒකේ page number 135වල Technical Note එකේ Value Added Tax Act එක යටතේ තිබෙනවා, "The SVAT system will be terminated" කියලා.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, මේ කාරණය මතු කිරීම සම්බන්ධයෙන්. අපි ඒක එකවර අයින් කරන්න යන්නේ නැහැ. දැනටමත් ඒ අදාළ කටයුතු ටික සිද්ධ කරමින් යනවා, සාකච්ඡා කරමින් යනවා, අදාළ training කරගෙන යනවා. විශේෂයෙන් පැති දෙකකින් අපිට මේක වැදගත් වෙනවා. මෙතැන පදනම වෙලා තිබෙන්නේ SVAT එක අහෝසි කිරීම. මොකද, manipulations සඳහා යොදා ගැනීම වැනි ගැටලු ගණනාවක් මේක SVAT system එකේ තිබෙනවා.

But, on the other hand, as you just highlighted, Hon. Member, the abolition of it could lead to cash flow and liquidity problems for exporters. So, we have taken all those things into consideration.

මේකෙදි එක පැත්තකින් වැදගත් වෙනවා, capacity building. So, we have taken technical assistance from the IMF and other experts and training is being done. Also, we need technology. As of now, there are certain things to be fixed and incorporated into the technological platform. As a result, we have developed a plan. The detailed plan will be introduced by the end of June with a simulation. අපි මේක introduce කරන්න කලින් simulation එකකට යනවා, refund system එක කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. ඒ නිසා අපි ඒක ගැන සාකච්ඡා කරනවා. මම හිතනවා, මේවා ඉදිරියේදී සාකච්ඡාවට ගන්න එක හොඳයි කියලා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I appreciate what you said because I was the prime mover.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
First, may I finish, Hon. Member? So, that is regarding the basic idea about the refund system.

Now, I move on to the interest rates raised in question number 6.

ඇත්තටම අපි කවුරුත් දන්නවා, ආර්ථික විද්‍යාත්මකව, මූල්‍ය කළමනාකරණය පැත්තෙන් ගත්තාම රටක පොලී අනුපාතය ක්‍රමිකව පහළ යනවා කියන එක. ඒක බලහත්කාරයෙන් පහළ දමන්න බැහැ. වෙළෙඳ පොළ බලවේග විසින්, නිෂ්පාදනය වැඩිවීම තුළින් එය ක්‍රමිකව පහළ යන එක තමයි හොඳ. දැන් ටික ටික ඒ තත්ත්වය නිර්මාණය වෙලා මහ බැංකුවත්, අදාළ මූල්‍ය අධිකාරිනුත් ඒකට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. එහි ප්‍රතිඵලයක් විධියට එලදා වක්‍රය - yield curve එක - normal yield curve එකක් බවට පත් වෙලා තිබෙනවා. අපි දන්නවා, ආයෝජකයෝ පොලී අනුපාතය දකින්නේ මේ yield curve එක දිහා බලලා. විශේෂයෙන්ම ආර්ථික අර්බුදය පැවති කාලයේදී මේ yield curve එක turned upside down. ඒ කියන්නේ, shorter maturity දේවල්වලට විශාල interest එකක් ගෙවන්න ගත්තා. දැන් ඒක normalize වෙලා තිබෙනවා. ඒ අනුව දැන් තිබෙන්නේ normal yield curve එකක්. Shorter maturity කියන 91 days වාගේ අවුරුදු දෙකට අඩු ඒවාට අඩුවෙනුත්, ඉන් ඈතට යනකොට වැඩියෙනුත් යනවා වාගේම පොලී අනුපාතයත් ක්‍රමිකව පහළට යනවා. දැන් 91 daysවලට around 7 per cent වාගේ interest එකක් දක්වා පොලී අනුපාතය පහළට ඇවිල්ලා තිබෙනවා.

හැබැයි, මම පිළිගන්නවා ඔබතුමා කියන කාරණය. බැංකු පද්ධතිය ඇතුළේ පොලී අනුපාතය -මහජනතාවට ණය දෙන පොලී අනුපාතය- ටිකක් වැඩියි. ඒකට ඇත්තටම මහ බැංකුව මැදිහත් වෙලා monitor කරනවා. ඒකේ අඩුපාඩු තිබෙනවා නම් අපි සාකච්ඡා කරමු. මොකද, රාජ්‍ය බැංකු පද්ධතියක් තිබෙනවා, අනෙකුත් බැංකු පද්ධතියක් තිබෙනවා. මම හිතන විධියට, මේවා අතර විධානය දීමක් තවමත් සිද්ධ වෙන්නේ නැහැ. ඉදිරියේදී අපිට සාකච්ඡා කරන්නට වෙනවා, ඒ monitoring mechanism එක ගැන. අපි පිළිගන්නවා, වෙළෙඳ පොළේ ණය සඳහා පොලී අනුපාතය වැඩියි කියලා. නමුත්, ආණ්ඩුවේ ණය ගැනීමේ පොලී අනුපාතය සහ yield curve එක සාමාන්‍ය මට්ටමකට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා 9වැනි ප්‍රශ්නයෙන් SVAT එක ආශ්‍රිතව තවත් ප්‍රශ්නයක් අහලා තිබෙනවා, about the estimated tax evasion that the Government is worried would be lost out per year. අපි කවුරුත් දන්නවා, මේකේ inefficiencies තිබෙනවා. So, there can be leakages.

But, as of now, we are not planning the SVAT system or the refunding system by anticipating that this much of tax would be evaded because if we plan for the evasion first, what happens automatically is that the system would also drive to evade that. Then, that would be an implication. Therefore, our plan is to have zero avoidance, but we know that due to practical reasons, we may not be able to go for that. But, our planning is different.

Under a very efficient tax system and in a responsible society, it is the responsibility of everyone to pay the due taxes and if we just create an environment where everyone tries to evade or avoid taxation and the authorities have to try hard with the tools they have to catch those who evade, it would be a struggle and always, there would be leakages. We are not planning for such a situation, but for a vibrant, democratic and a transparent tax system. We know and understand that it would take time, Hon. Member. So, that is how we are planning to do it and, again, I would like to say that we are not going to abruptly do away with the SVAT system unless and until we ensure that the refund system works smoothly. For that, we are planning with the technology being brought up, without which we cannot do this. You know that the value-added tax system is more efficient compared to the turnover tax system, in which there is a cascading impact. So, to avoid that cascading impact and in order to implement the SVAT system vibrantly, we need to connect all the players into the system, but, as of now, they are not; only selected and registered players are there. But, gradually, we will move towards that until we implement a very extensive system. That is our idea and plan, and we are working with all the agencies.

I will highlight another point - stakeholder consultation. Not only the exporters and taxpayers, but we are having consultations with other stakeholders as well. ඒ කියන්නේ, ඒ සියලුම තත්ත්වයන් සැලකිල්ලට භාජන කරලා ක්‍රමිකව සහ පාරදෘශ්‍යව මේ කටයුත්ත කරමින් යනවා. ඒ පිළිබඳව අපි පාර්ලිමේන්තුවත්, සියලුදෙනාත් දැනුවත් කරනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Ravi Karunanayake?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Minister, I appreciate your very practical answer. That is what I am getting at. You quoted earlier what I had mentioned. We were all thinking that the prospective approach ASYCUDA would be introduced and that it would link up the 34 government institutions. But, Hon. Minister, the situation is that the officials do not work in the speed that you and I would like them to. That is the reason why I said that at that particular moment. That has been an attempt made for about seven or eight years. Tax evasion is there. I know that what you stated is a laudable step, but the point of sale approach that the President addressed in the Budget Speech is what you have got to take forward.

The other matter is, when you are competing in a region where there is an interest rate of 3 to 4 per cent, our competition basically has a 10 to 11 per cent cost of capital disadvantage.

Imposing an additional bureaucratic process would only deprive our exporters from competing under already difficult circumstances. So, it was a more proactive approach because being in the industry, I know for a fact that this is a herculean task. You set about providing answers correctly. And, let us get together and ensure that we put this system in place. But, if you adopt the point of sale approach tomorrow, you would have a quick refund system in place. I appreciate it. So, let us work together. As you quite rightly said, the SVAT would not be implemented until a firm, refund mechanism is in place. That is the answer required. But, to say September and IMF-mandated is not the answer. With all authority, I say that IMF is a way forward, but they cannot dictate terms. So, you decide on a policy and take it forward. That is the correct step, I would say without any hesitation. So, please ensure that it is done.

Sir, the other matter is, the Central Bank makes Monetary Policy, but they must follow Government policy as well. You expect Rs. 5 trillion to be your revenue. With an interest rate of 17 to 18 per cent, you would never be able to achieve the expected 5 per cent growth in the economy in the next ten months or by the end of the financial year.

So, it is in that spirit I raised this Question, being an exporter. Therefore, please ensure that you take a practical approach with regard to this issue, like the Answer you gave. So, I appreciate if the SVAT would be done away with, with only a guaranteed refund system in place.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Thank you very much, Hon. Member.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I just want a clarification regarding a small point. So, may I be permitted -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Could you please wait till the Hon. (Dr.) Anil Jayantha reply?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Shall I first finish this clarification? Otherwise, my point would be lost.

In fact, Hon. Karunanayake, I would like to mention that it is not a dictation from the IMF; we work in a collaborative way on a programme. When the programme is in place, actions are taken and benchmarks are set. So, September is a new structural benchmark and it does not mean that it is something that we have to do compulsorily. Regarding that particular benchmark also, they have very clearly stated that we have to establish a very good refund system and then only we can move forward. In any case, there may be situations, due to unforeseen or unavoidable reasons, where we would not are able to implement that. If that is the case, we have room to discuss and negotiate.

Just to point out one thing, yesterday, the Hon. President had a discussion on Zoom with the Managing Director of the IMF, Ms. Kristalina Georgieva. She also reaffirmed IMF's continued support to the efforts to revive Sri Lanka's economy, going beyond the IMF programme. So, that is that.

Then, regarding ASYCUDA, which you raised about, the point of sale approach and e-invoicing, I would like to say that we have to bring in technology to have a very good system for VAT refund and of course, to go for point of sale machines and e-invoicing. Initial discussions and work has already been done in this regard with consultation of all the stakeholders.

So, thank you very for your constructive ideas. We will work accordingly.

Thank you.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Hon. Minister, I would like have a small clarification.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, are you willing to respond to that?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
This is just a small clarification on the same matter.

Hon. Deputy Minister, you said that a directive cannot be given by the Central Bank on interest rates and other decisions made by the banks. The Governor of the Central Bank also said that they cannot -

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
A directive cannot be given, but there are lacunas in the monitoring system. Of course, the Central Bank is authorized to direct the banks and the financial institutions. They are doing it. We know that this is not something that happens all of a sudden. This has been observed in the past or during the previous times as well. So, it is being monitored gradually, Hon. Member. You know that there is a time lag involved. When these statutory rates and the policy rates are announced, the banks may not adjust accordingly. Of course, the State banks may adjust, but other banks may not. So, to some extent, the Central Bank can do that. On the other hand, we strongly believe that a proper market mechanism, demand for money, supply and the revival of economic activities would do the rest. So, it has to go parallelly or hand in hand, I believe.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Hon. Deputy Minister, the Central Bank Governor stated that they cannot give directives to the private or any other banks and that they can only guide them. So, what is the actual status of it? We would like to have a clarification whether you have the authority to direct the Central Bank, whether the Central Bank has independent powers to make its decisions and whether they can manoeuvre the other banks.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Actually, we need to get details from the Central Bank as to what measures they could take and tools they could use. Basically, they are supposed to monitor. But, if it is needed, sometimes, some directives may also be given to financial institutions like not to engage in certain activities. Specially, when it comes to interest rates, what the Central Bank does is, it closely monitors the specified policy rates. But, of course, we admit that there is a gap between the policy rates and the current interest rates. As I just highlighted, parallel actions - the Central Bank's monitoring actions and the economic revival efforts - would resolve the problems. As of now, things are going very well. As I told you, the now normal yield curve is a very good indicator for investors to see how the economy is being driven. So, we need to maintain this particular price level and ensure stability of the financial system, in the long run. So, that is one of our objectives in economic revival.

Thank you.

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

2025 ජනවාරි 20 වන දින යාපනයේ සිට ගමන් කරන අතරතුරදී වූ සිද්ධිය
2025 சனவரி 20ஆம் திகதியன்று யாழ்ப்பாணத்திலிருந்து பயணிக்கும்போது இடம்பெற்ற சம்பவம்
INCIDENT OCCURRED ON 20TH JANUARY, 2025 WHILE TRAVELLING FROM JAFFNA

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 පෙබරවාරි 05 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Commencement of Public Business. Item No. 1 of today's Order Paper, Appropriation Bill, 2025. Sixteenth allotted day of the Committee Stage.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: මාර්තු 07]
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 07]
[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 07th March]
[HON. DEPUTY SPEAKER in the Chair.]

171 වන ශීර්ෂය.- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 475,000,000

தலைப்பு 171.- மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 475,000,000

HEAD 171.- MINISTER OF WOMEN AND CHILD AFFAIRS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 475,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

First Schedule, the Ministry of Women and Child Affairs - Heads 171 and 217. Consideration from 10.00 a.m. to 6.00 p.m.

The Cut to be moved by the Hon. (Mrs.) Rohini Kumari Wijerathna. You have 30 minutes.

[පූ.භා. 10.22]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.08වන සෙනසුරාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවට අදාළ අංක 171 සහ 217 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමියනි, ගරු පෝල්රාජ් අමාත්‍යතුමියනි, ජාත්‍යන්තර කාන්තා දිනය වන අද දවස; අපේ දවස පිරිමින් විසින් ගත්තා වැඩි ද කියලා මට හිතෙනවා. අද උදේ වරුවේ සෑහෙන්න වෙලාවක් මේ ගරු සභාවේ අපේ කාලයෙන් වැය වුණා. මෙන්න මෙක තමයි අපට තිබෙන ලොකුම ගැටලුව. පිරිමින්ගේ ලෝකය ඇතුළේ "කාන්තාව" කියන කෙනා බොහොම පුංචි කෙනෙක්. මේක තමයි ඇත්ත තත්ත්වය.

ගරු අගමැතිතුමියනි, අද ජාත්‍යන්තර කාන්තා දිනය. මගේ ඇහැට පෙනෙන්න සිටින ගරු අග්‍රාමාත්‍යතුමිය, කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමිය, ඒ වාගේම ඉතිහාසයේ සිට ගත්තාම මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ වැඩිම නියෝජනය වන 22ක් වූ මන්ත්‍රීවරියන්, ඒ වාගේම මේ ගැලරියට ඇවිල්ලා සිටින සියලු කාන්තාවන්, ගෑහැනු ළමයින් ද ඇතුළුව මගේ දෑස් මානයේ නැති සියලු කාන්තාවන්ට සහ දැරියන්ට ද මම මේ අවස්ථාවේ සුබ පතනවා. තමන්ගේ අයිතිවාසිකම් සුරැකෙන, සමානාත්මතාව යථාර්ථයක් වන, ඒ වාගේම මානසිකව, කායිකව, සමාජයීයව සහ ආර්ථිකව සවිබලගැන්වෙන ජීවිතයක් මේ සියලුදෙනාට ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. අපි මේ විධියට තවත් අවුරුද්දකට සුබ පතා ගන්නවා. හැබැයි, අපි හැමදාම කථා කරන දේ ඉදිරියට ගිහින් තිබෙනවා ද කියන එක පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා.

මෙවර ලංකාවේ කාන්තා දිනයේ තේමාව තමයි "තැනුමට තිරසර හෙටක් - සවිමත් ඇය වේ මහක්" කියන එක. ජාත්‍යන්තර තේමාව තමයි, "Accelerate Action" කියන එක. ඒ කියන්නේ, "ක්‍රියාව වේගවත් කරන්න" කියන එකයි. කුමක් සඳහා ද, ක්‍රියාව වේගවත් කරන්න ඕනෑ? සියලු කාන්තාවන්ගේ සහ ගැහැනු දරුවන්ගේ අයිතිවාසිකම් රැක ගැනීම උදෙසා, සමානාත්මතාව දිනා ගැනීම උදෙසා, ඒ වාගේම සවිබලගැන්වීම උදෙසා තමයි ක්‍රියාව වේගවත් කරන්න කියන්නේ. ඒ සඳහා කරන සියලු ක්‍රියා වේගවත් කරන්න.

අපි අවුරුදු ගණනාවක් තිස්සේ කාන්තාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් කථා කරනවා. ලෝක කාන්තා දිනය කවදා ආරම්භ වුණත්, 1975දී තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය කාන්තා දිනය නිල වශයෙන් පිළිගත්තේ. එදා තේමා පාඨය වුණේ, "අතීතය සමරමින්, අනාගතය සැලසුම් කරන්න" කියන එකයි.

අපට දැන ගන්න තිබෙන හැටියට, ඉතිහාසයේ මුලින්ම 1857දී කර්මාන්තශාලාවක කාන්තාවන් එළියට බැහැලා ආරම්භ කරපු විප්ලවය තමයි අද ජාත්‍යන්තර කාන්තා දිනය හැටියට අපි යථාර්ථයක් බවට පත් කරගෙන මේ කටයුතු කරන්නේ.

හැබැයි, අපි අතීතය සමරනවා. මම ඒ අයට සුබ පතනවා. ඒ අයට ස්තුතිවන්ත වෙනවා. එදා මෙදා තුර ඒ වෙනුවෙන් පෙනී සිටි බොහෝදෙනෙක් අද ජීවතුන් අතර නැතුවත් ඇති. ඒ වාගේම, සුජීවත්වන අයත් ඇති. ඒ සියලුදෙනාටම මම මේ රටේ සමස්ත කාන්තා ප්‍රජාව වෙනුවෙන් මගේ ගෞරවය පුද කරනවා. හැබැයි, අපි අතීතයට මල් තියනවා. වෙලාවකට අපි අතීතයට ගල් ගහනවා, දෙස්දෙවොල් තියනවා. හැබැයි, අපි අනාගතය සැලසුම් කරලා තිබෙනවාද කියන එක පිළිබඳ ගැටලුවක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඇත්තටම කිව්වොත්, මේ ලෝකයේ කාන්තාවන් ඉදිරියේ තිබෙන ගැටලුවලට හේතු වෙලා තිබෙන ඇත්තම ප්‍රශ්නය තිබෙන්නේ ගැහැනුන් තුළ නොවෙයි. කාන්තාවන්ගේ ප්‍රශ්නයක් නිසා නොවෙයි, කාන්තාවන්ට ගැටලු ඇති වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමියනි, රන්බණ්ඩා සෙනෙවිරත්න රචනය කරපු, අමරසිරි පීරිස් ගායනා කරන ගීතයක් තිබෙනවා, "පිරිමින්ගේ පාප කඳට දෝස විදින ළඳුනේ" කියලා. මම එහෙම කියන්නේ මේ කාරණය නිසායි. ලෝකයේ රටක්, ජාතියක්, ආගම් භේදයක් නැතිව කාන්තාවට ගෘහස්ථ හිංසනය සිදු වෙනවා. කාන්තාව ගෘහස්ථ හිංසනයට ලක් වෙන්නේ, ඇය හිංසනයට ලක් කරන අනෙක් කෙනාගේ ප්‍රශ්නයක් හින්දා. එහෙම නැතුව ඒ කාන්තාව නිසා නොවෙයි.

අපේ රටේ දැරිය හැකි මිලකට සනීපාරක්ෂක තුවායක් මිල දී ගැන්න බැරි නිසා ගැහැනු ළමයි සියයට 50ත්, 60ත් අතර ප්‍රමාණයක් ඔසප් කාලයේදී පාසල් යන්නේ නැහැ. ඒක ගැහැනු ළමයින්ගේ වැරැද්ද නොවෙයි. ඒක මේ නීති සම්පාදනය කරන අයගේ වැරැද්ද. මුලින් කථා කරපු සිද්ධියේදී ඒ ගුරුවරිය පහර දීමට ලක් වෙන්නේ, ආවේගය පාලනය කර ගන්න බැරි පිරිමියාගේ වැරැද්ද නිසා. හැබැයි, මෙවා අද කාන්තාවන්ට ප්‍රශ්න වෙලා තිබෙනවා. උපාධි අපේක්ෂකයන්ගෙන් සියයට 64.8ක් කාන්තාවන් වුණාට, එම වසරේම ශ්‍රම බලකායේ කාන්තා නියෝජනය සියයට 32.1යි. ඒ වාගේම පිරිමින්ගෙන් සියයට 75ක් කාන්තා සේවකයන්ට එරෙහිව -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම සතුටු වෙනවා, ඔබතුමිය මූලාසනයට පැමිණීම ගැන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පිරිමින්ගෙන් සියයට 75ක් කාන්තාවන් සේවයට බඳවා ගන්න එකට ඉඩකඩ අහුරනවා. ඒ ප්‍රමාණය අඩු කරන්න උත්සාහ කරනවා. ප්‍රසූත නිවාඩුව ඉස්සරහට දාගෙන කාන්තාවන් සේවයට බඳවා ගන්න අකැමැත්තක් පෙන්වනවා. ඒකේ වැරැද්ද කාන්තාවන්ගේ නොවෙයි. ගැහැනු ළමයින් සියයට 90ක් පොදු ප්‍රවාහනයේදී ලිංගික හිංසනයට ලක් වෙනවා, වාචික හිංසනයට ලක් වෙනවා. ඒකේ වැරැද්ද තිබෙන්නේ ඒ ගැහැනු දරුවන්ගේවත්, කාන්තාවන්ගේවත් නොවෙයි. සෑම කාන්තාවන් පහකට එක්කෙනෙක්ම තම සමීපතම සහකරුවාගෙන් කායිකව හෝ ලිංගිකව හිංසනයට ලක් වෙනවා කියලා සමීක්ෂණ වාර්තාවලින් හොයාගෙන තිබෙනවා.

එතකොට, මේ ප්‍රශ්නවලට මුහුණ දෙන කාන්තාවගේද ඒ වැරැද්ද තිබෙන්නේ? කෝ, අපි ඉතිහාසය පුරා හොයපු, කථා කරපු ඒ අයිතිවාසිකම්? සමානාත්මතාව, බලගැන්වීම කියන කාරණා සියල්ල පිරිමින්ගේ ආකල්පවල ගැටලුවක් විධියටයි මම දකින්නේ. මේක නීති හදන, නීති ක්‍රියාත්මක කරන තැන්වල ඉන්න අයගේ ගැටලුවක් හැටියටයි මම දකින්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2022 වසරේ විතරක් වාර්තා වෙච්ච ස්ත්‍රී දූෂණ සිද්ධි ගණන 1,986ක්. දළ වශයෙන් ගත්තොත්, දිනකට ස්ත්‍රී දූෂණ 5ක් සිදු වෙලා තිබෙනවා. වාර්තා වූ ස්ත්‍රී දූෂණවලින් සියයට 87ක චින්දිතයන් වුණේ වයස අවුරුදු 16ට අඩු ගැහැනු දරුවන්. 2023 අවුරුද්දේ අවුරුදු 16ට අඩු ගැබ් ගැනීම් 163යි, 2024 අවුරුද්දේ ඒ සංඛ්‍යාව 213ක් වෙලා තිබෙනවා. මෙතැන තිබෙන බේදවාචකය මේකයි. ඒ 213දෙනා අතර ඉන්නවා, අවුරුදු 10ක ගැහැනු දරුවෙක්. මෙතැනදී සිද්ධ වුණේ ඒ ගැහැනු දරුවාගේ වැරැද්දක් ද? ඒකයි UN එක කියන්නේ, "Accelerate Action" කියලා. ඉදිරි පරම්පරා 5 ඇතුළතවත් ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගෙන මේ සිදුවන වෙනස්කොට සැලකීම නතර වෙන්න ඕනෑ. එහෙම නැතිව, මේ equal rights සහ equal opportunities කියන ඒවා තවදුරටත් අපට සුරංගනා කථා විය යුතු නැහැයි කියන එක මම මේ ගරු සභාවට කියනවා. මම හිතන විධියට ඒක නිසාම තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය, "ක්‍රියාව වෙගවත් කරන්න" කිව්වේ. රටක් විධියට අපි මේ තේමාවට මොන විධියට ද මේ සැරේ ලෑස්ති වෙන්නේ කියන එක අපි බලන්න ඕනෑ. අපි මේ වැඩ ආරම්භ කර තිබෙනවා ද කියලා බලන්න ඕනෑ. මේ අය වැය ඇතුළේ තිරසර හෙටක් සඳහා, කාන්තාව සවිබලගන්වන්නට අරගෙන තිබෙන පියවර මොනවාද කියන එක පිළිබඳව අපි කථා කරන්න ඕනෑ. 2015 ඉඳන් මම මේ පාර්ලිමේන්තුවේ කියනවා, gender-responsive budgeting එන්න ඕනෑ කියලා; ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගෙන අය වැයකරණය සිද්ධ වෙන්න ඕනෑ කියන එක මම වසර ගණනාවක් තිස්සේ කියනවා. අපට වඩා ආර්ථික අතින් පහළින් ඉන්න නේපාලයේත් මේ ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගෙන අය වැයකරණයේ යෙදෙනවා. ගරු අගමැතිතුමියනි, ඔබතුමියට මතක ඇති, අපි විපක්ෂයේ ඉඳගෙන ඒ දවස්වල මේවාට fight කළා. ඒ නිසා ලබන අවුරුද්දේවත් gender-responsive budgeting කියන එක අපේ පාර්ලිමේන්තුවේත් ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා.

විශේෂයෙන්ම, ඉතිහාසය පුරාම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට මුදල් වෙන් වෙන්නේ සාමාන්‍යයෙන් අඩුවෙන්. ලෝක නිර්ණායක අනුව කාන්තා හා ළමා කටයුතුවලට අනුවිෂයයන් තිබෙනවා, 147ක්. ඒ වාගේම, ඔවුනගේ පැතිරුම් සීමාව හා බලපෑම් ගත්තාම උපක්ෂේත්‍ර 66ක් හැදෙනවා. ඒ නිසා මම හිතන හැටියට මේක තමයි තිබෙන විශාලම අමාත්‍යාංශය. මේ අමාත්‍යාංශයට කන් හැන්දෙන් බෙදුවාට, ජනගහනයෙන් සියයට 66කට වඩා, සියයට 75කට ආසන්න වන ප්‍රමාණයක් ගැන කථා කරන අමාත්‍යාංශය තමයි මේක. ඒ නිසා මේ පිළිබඳව අපි මීට වඩා විධිමත් ක්‍රමයක් සකස් කරගන්න ඕනෑය කියන එක මම මේ සභාවට යෝජනා කරනවා.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය කියන්නේ තනිවම යන්න පුළුවන් අමාත්‍යාංශයක් නොවෙයි. මේක අනෙක් අමාත්‍යාංශ 25ත් එක්කම බද්ධ වෙලා යන්න ඕනෑ අමාත්‍යාංශයක්. මම ඒකට උදාහරණයක් ඉදිරිපත් කරන්නම්. ළමයින් ගත්තොත්, ළමයින්ගේ අධ්‍යාපනය ගැන කථා කරන්න අපි අධ්‍යාපන අමාත්‍යාංශය එක්ක බද්ධ වෙන්න ඕනෑ. ළමයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කථා කරන්න අපි අධිකරණ අමාත්‍යාංශය එක්ක බද්ධ වෙන්න ඕනෑ, ගරු ඇමතිතුමා. ළමයින්ගේ පෝෂණය සහ සෞඛ්‍ය ගැන කථා කරන්න අපි සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ක බද්ධ වෙන්න ඕනෑ. කාන්තාව ගත්තොත්, ඇය සවිබලගන්වන්නට නම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය එක්ක අපි බද්ධ වෙන්න ඕනෑ. ඒ වාගේම, ඇය දැනුවත් කරන්නට අධ්‍යාපන අමාත්‍යාංශය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය එක්ක බද්ධ වෙන්න ඕනෑ. ඇයගේ සෞඛ්‍යය සහ පෝෂණය සම්බන්ධයෙන් කථා කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ක බද්ධ වෙන්න ඕනෑ. මේ ආදී වශයෙන් ගත්තාම සියලු අමාත්‍යාංශ එක්ක අපි බද්ධ වෙන්න ඕනෑ. විදේශගත කාන්තාව ගැන කථා කරන්න නම් අපි අධිකරණ අමාත්‍යාංශය එක්ක, විදේශ රැකියා අමාත්‍යාංශය එක්ක බද්ධ වෙන්න ඕනෑ.

ඊළඟට අපි බලන්න ඕනෑ මොන විධියටද අපි මේවාට බද්ධ වෙලා කටයුතු කරන්නේ කියලා. මේ කටයුතු අපට තනිවම කරන්න බැහැ. ගරු ඇමතිතුමියනි, සියලු ප්‍රවීණයන් එකතු වෙලා මේකට පිළිවෙළක් ඇතිව ලැයිස්තුගත කිරීමක් කර ගන්නට ඕනෑ, 2026 වෙනකොට අපි කොහොමද අපේ කාන්තාව සවිබලගන්වන්නේ, කොයි ක්ෂේත්‍ර එක්කද අපි එකතු වෙන්නේ කියලා. මෙන්න මේ විධියට අපි බද්ධව කටයුතු කරන්න ඕනෑ. එතකොට තමයි මම කියපු අර gender-responsive budgeting කියන එක වැදගත් වෙන්නේ. මම මේ හැම දේටම දොස් කියනවා හෝ අඩුපාඩු කියනවා නොවෙයි. අය වැයකරණයේදී අපේ යෝජනා ඉදිරිපත් කරනවා නම්, ඒවා පිළිබඳව ඔබ ශුභවාදීව දකින්න කියන එක මම මුලින්ම කියනවා.

කාන්තාවන්ගේ හා ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලා දෙන්න නම්, සමානාත්මතාව ඇති කරන්න නම්, ඒ සඳහා අපි මුලින්ම කරන්න ඕනෑ ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන එකයි.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ඒකට අපි විවිධ අමාත්‍යාංශ බද්ධ කර ගන්න ඕනෑ. ඇත්තටම මම gender-responsive budgeting ගැන කථා කරපු වෙලාවලදී සමහර නිලධාරීන් කිව්වා, අධ්‍යාපන අමාත්‍යාංශය ගත්තාම, ගැහැනු ළමයිනුත් ඉගෙන ගන්නවා නේ කියලා. නමුත් gender-responsive budgeting කියන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ගැහැනු ළමයිනුත් ඉගෙන ගන්නවාය කියන එක නොවෙයි. මම උදාහරණයක් කියන්නම්. ගැහැනු ළමයින්ට තිබෙනවාද, ගැහැනු ළමයින්ට හිතකර වැසිකිළි පද්ධතියක්? අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අන්න ඒකට මුදල් වෙන් වෙනවා නම්, අන්න එතැනදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය සැලකිල්ලට ලක් කරලා තිබෙනවා. ඊළඟට, ගැහැනු ළමයා සම්බන්ධයෙන් සමාජයේ තිබෙන ආකල්පය වෙනස් කරන්න විෂය නිර්දේශ තුළ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ වැඩ පිළිවෙළක් තිබෙනවාද? ඒකට මුදල් වෙන් කරලා තිබෙනවාද? අන්න ඒක තමයි gender-responsive budgeting කියන්නේ.

ඊළඟට, සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම වතුකරයේ කාන්තාවට පෝෂණය ලබා දෙන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද? සංක්‍රාන්තික ලිංගිකයනුත් අද ඉන්නවා. මේ අය සම්බන්ධයෙන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගැන කථා කරන්නේ මොන විධියටද කියලා අද අපි බලන්න ඕනෑ. හැබැයි මට පෙනෙනවා, මේ පහසුකම් ලබා දීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මුල් කරගෙන සිදු වෙන්නේ නැහැ කියලා. මේ Budget එක නම් හැබැයි සම්පූර්ණයෙන්ම gender-responsive budgeting එකක් නොවෙයි, සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියනි, මෙය IMF-responsive budgeting එකක්. පිරිවැය මත විදුලි බිල වැඩි කරන්නය කියලා IMF එක කියලා තිබෙනවා මම දැක්කා. ඒකේ පීඩාව එන්නේ කාටද? විදුලි බිල වැඩි වෙච්ච ගමන් ගෙදර පෝෂණයට; දරුවන්ට කන්න දෙන්න තිබෙන මුදලෙන් තමයි ඒක අඩු කරන්න වෙන්නේ. ඇය පාවිච්චි කරපු විදුලි උපකරණ ටික පාවිච්චි කිරීම නවත්වන්න වෙනවා. ආපහු වංගෙඩියෙන් කොටන්න වෙනවා. බ්ලෙන්ඩරය පාවිච්චි කරන එක නවත්වන්න වෙනවා. එහෙම නම්, ඒ පීඩනය එන්නේ කාන්තාවට කියලා මම කියනවා. තේ ගහ වටේ කැරකිලා, රබර් ගහ වටේ කැරකිලා, පොල් ගහ වටේ කැරකිලා වැඩ කරන, රෑ එළි වෙනකල් කර්මාන්තශාලාවල මහලා මේ රටට ඩොලර් ගෙනෙන, දළ දේශීය නිෂ්පාදනයට වැඩිම දායකත්වය දෙන කාන්තාව සවිබලගන්වන්නට අරගෙන තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා මේ සභාවට පැහැදිලි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

විදේශගත ශ්‍රමිකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් කාන්තාවන්. ඒ අය එවන මුදල්වලින් සියයට 15ක බද්දක් ගන්න යනවා කියලා තිබෙනවා මම දැක්කා. මම පත්තරවල දැක්ක දෙයක් මේක, ඒක වැරදි නම් නිවැරදි කරන්න. ගෙදර දරුවන්ට කන්න දෙන්න විධියක් නැතිව, උගන්වා ගන්න විධියක් නැතිව, අලුතින් ගෙයක් හදා ගන්න විධියක් නැතිව තමයි බොහෝ කාන්තාවන් විදේශගත වෙන්නේ. නමුත්, ඇතැම් කාන්තාවන් විදේශගත වෙන්නේ මේ කිසි දෙයක් නිසා නොවෙයි, ගෙදර පිරිමියාගෙන් සිදුවන හිංසනයෙන් බේරෙන්න. එහෙම ගිහිල්ලා කඹුරලා සොයාගෙන එන මුදලට සියයට 15ක බද්දක් ගහනවා නම්, මේ ආණ්ඩුව වෙගයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ ඒ පැත්තටද කියන එක කනගාටුවෙන් වුණත් අහන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ අමාත්‍යාංශයට රුපියල් මිලියන 14,526ක් වෙන් වෙලා තිබෙනවා. එයින් පුනරාවර්තන වියදම්, ඒ කියන්නේ පඩිනඩි, දීමනා, නඩත්තු කිරීම් වාගේ දේවලට රුපියල් මිලියන 14,134ක් වෙන් වෙලා තිබෙනවා. එතකොට මූලධන, ඒ කියන්නේ අලුතින් වැඩක් කරන්න තිබෙන්නේ රුපියල් මිලියන 392යි; කෝටි 39යි. ගරු ඇමතිතුමියනි, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්වලට අර දීපු බිලියන 20 ඉල්ලා ගන්න බැරිද කියලා බලමු. මොකද, අපේ රටේ කාන්තාවන්ගෙන් මීට වඩා සේවයක් කරවා ගන්න ඕනෑ, මේ රටේ ආර්ථිකයට. ඒ නිසා, කාන්තාව ආර්ථික වශයෙන් සවිබලගැන්වීමට, ව්‍යවසායකයන් ලෙස සවිබලගන්වන්නට ඔබතුමන්ලා අය වැයෙන් රුපියල් මිලියන 63ක් වෙන් කරලා තිබෙනවා මම දැක්කා. ඒ කියන්නේ රුපියල් කෝටි 6.3යි. ව්‍යවසායිකාවන්ට අවශ්‍ය ණය දෙනවා කියලා අපි හිතමු, එතකොට 100,000 ගාණේ දුන්නත් ඒ මුදලින් ණය දෙන්න පුළුවන් 600කට විතරයි. ඒ නිසා මම යෝජනා කරනවා, ඒ මුදල තව වැඩි වෙන්න ඕනෑ කියලා. එහෙම නොවුණොත් වෙන්නේ මොකද? ඒ අය ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ අහුවෙලා ජීවිත විනාශ කර ගන්නවා.

මෙතෙක් කාලයක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ කාන්තාව ආර්ථිකව සවිබලගැන්වීමට ණය යෝජනා ක්‍රමයක් තිබුණා. මේ සැරේ ඒක ඉස්සරහා ඉරි කැල්ලක් ගහලා තිබෙනවා. ඒ කියන්නේ ඒකට මුදල් වෙන් වෙලා නැද්ද කියන එක ගැන ඔබතුමියලා, ඔබතුමන්ලා මේ සභාව දැනුවත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. එහෙම නොවුණොත් ඇත්තටම "නැනුමට තිරසර රටක් - සවිමත් ඇය වේ මගක්" කියන එක සිද්ධ වෙයිද? ඒක යථාර්ථයක් බවට පත් කර ගන්න පුළුවන් වෙයිද? ඇය සවිබලගන්වා ගන්නට පුළුවන් වෙයිද කියලා මම අහනවා. අපට නොපෙනී වෙනත් අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් ඇතුළේ ඒවාට මුදල් වෙන් කරලා තිබෙනවාද කියන එක ගැනත් මේ සභාව දැනුවත් කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දරු උපත් 100,000කින් අඩු වෙලා තිබෙනවාය කියලා පෙරේදා පත්තරයේ තිබෙනවා මම දැක්කා. ඊට ඉස්සෙල්ලා අවුරුද්දේ ඒ ප්‍රමාණය 75,000යි. පසුගිය අවුරුද්දේ ලක්ෂයයි. අපි මේ තත්ත්වය කියවා ගන්න ඕනෑ කොහොමද? දැන් බලන්න, ආර්ථික අර්බුදය කොතෙක් දුරට බලපා තිබෙනවාද කියලා. 2023 වර්ෂයේ විවාහපත් වූ යුවලවල් සංඛ්‍යාව 131,000 ගණනක් කියලා මම දැක්කා. මේ අය දරුවන් හදන්න මැළිකමක් දක්වන්නේ දරුවන්ට ආදරේ නැති නිසා නොවෙයි. මේ ආර්ථිකය ඇතුළේ දරුවෙක් පෝෂණය කරන්න තිබෙන ගැටලුව නිසායි. අද තිබෙන තත්ත්වය බලන්න. පොල් ගෙඩිය රුපියල් 250 වෙනකොට, හාල් කිලෝව රුපියල් 250 වෙනකොට ලබන අවුරුද්දේ දරු උපත් සංඛ්‍යාව ගැන අපට හිතාගන්න පුළුවන්. ඒ නිසා මම කියනවා, මේ සම්බන්ධයෙන් අපේ අවධානය යොමු වෙන්න ඕනෑ කියලා. එහෙම නැති වුණොත් වයස්ගත වැඩිහිටියන් පමණයි මේ රටේ ඉතිරි වෙන්නේ. අලුත් පරම්පරාව අඩු වීම තුළ දීර්ඝ කාලීන ව්‍යසනයකට, ගැටලුවකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කාන්තා වැඩසටහන්වලට රාජ්‍ය නොවන සංවිධානවල දායකත්වය ඉතාම වැදගත්. ඒ නිසා මම යෝජනා කරනවා, අත්දැකීම් බහුල කාන්තා සංවිධානවල උපදේශනය ගන්න කියලා. අපි දීර්ඝ කාලයක් තිස්සේ ඒ දේවල් කරනවා. කාන්තාව ගැන පිරිමි තීරණ ගත් යුගය අපි අවසන් කරමු. කාන්තාවන් වෙනුවෙන්, කාන්තාවන් සවිබලගැන්වීම වෙනුවෙන්, කාන්තාවන්ගේ හා දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් අපි අන්තර් ක්ෂේත්‍ර සම්බන්ධීකරණය කරගෙන හොඳ වැඩ පිළිවෙළකට යෑම අවශ්‍ය බව මම මේ වෙලාවේ අවධාරණය කරනවා.

කාන්තා හිංසනයේ පැතිරුණු ස්වභාවය ගැන මම පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. ඒකට මම මාවම උදාහරණයකට ගන්නම්. මේ පාර්ලිමේන්තුව ඇතුළේ මම අවස්ථා ගණනක් වාචික හිංසනයට ලක් වෙලා තිබෙනවා. හැබැයි, ඒ මගේ වරදකට නොවෙයි. මුලින්ම තිසකුට්ටි ආරච්චි හිටපු මන්ත්‍රීතුමා වම්බටු කථාවක් කියලා මාව හිංසනයට ලක් කරන්නේ, මේ රටට ගෙන්වපු කාබනික පොහොර සම්බන්ධයෙන් සිදුවූ වංචාව ගැන මම කථා කරපු නිසායි. ඊළඟට, සුසිල් ප්‍රේමජයන්ත හිටපු අධ්‍යාපන ඇමතිතුමාගේ කටින් අර වාගේ වචන පිට වෙන්නේ ගුරුවරුන්ට පහර දීම ගැන කථා කරපු නිසායි. අශෝක ප්‍රියන්ත හිටපු ස්වදේශ කටයුතු රාජ්‍ය ඇමතිතුමාගේ වචනවලින් මම අපහසුතාවට පත් වෙන්නේ මේ රටේ විශ්‍රාමික ප්‍රජාව ගැන මම කථා කරපු නිසා. ඒ වාගේම නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් එවැනි කථාවක් කියැවුණේ මම තඹුත්තේගම දුම්රිය මාර්ගය ගැන කථා කරපු නිසායි.

එතකොට ඒක මගේ වැරැද්දක්ද, ඒ අයගේ වැරැද්දක්ද? ඒ නොසන්ඩාලකම්වලට, එහෙම නැත්නම් වාචාලකම්වලට තැනක් නොතැනක් නැහැ. මේ පාර්ලිමේන්තුවේදීත් එහෙම නම්, මින් පිටතදීත් -බාහිරවත්- එහෙමයි කියන එක අපි මතක් කරන්න ඕනෑ.

මම මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය -කාන්තා සංසදය- ගැනත් වචනයක් කථා කරන්න ඕනෑ. මහ ලේකම්තුමියනි, මා හිතන විධියට කාන්තා සංසදය ක්‍රියාත්මක වන පස්වන පාර්ලිමේන්තුව මෙයයි. මා හිතනවා, මා නිවැරදි ඇති කියලා. සුමේධා ජී. ජයසේන මැතිනියගේ ප්‍රධානත්වයෙන් තමයි අපි ඉස්සෙල්ලාම කාන්තා සංසදය ආරම්භ කළේ. ඒ, හයවැනි පාර්ලිමේන්තුවේදී වෙන්න ඕනෑ. අපි අද දම් පැහැයෙන් සැරසුණා. මට ලස්සන නැති වුණත්, මමත් දම් පැහැයෙන් සැරසුණා. අපේ සභාපතිතුමිය තීරණයක් ගත්තා, අපි අද දම් පැහැයෙන් යුතු ඇඳුම් අඳිමු කියලා. ඔව්, අපි අද දම් පාට අඳිනවා. සංසදය තුළ අපට දේශපාලනය නැහැ. අපි ඉන්නේ එකම මතයක. මේ රටේ කාන්තාවන්ට කොතැනද අසාධාරණයක් වෙන්නේ, ඒ වෙනුවෙන් අපි පෙනී සිටිනවා. දම් පාටින් කියවෙන්නේ යුක්තියයි. ඒ නිසා අපි අද දම් පාටින් සැරසුණා. ගරු ඇමතිතුමියනි, පිරිමි ගන්නා තීරණවලට මේ සංසදයේ පූර්ණ මැදිහත්වීම අත්‍යවශ්‍යයි කියා මා ඔබතුමියට කියනවා.

පසුගිය පාර්ලිමේන්තුවල පැවති කාන්තා සංසදවලදී අපි ලබා ගත් ජයග්‍රහණ තිබෙනවා. එකක් තමයි, පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා සියයට 25ක කෝටාව ගැනීම. ඒක සංසදයේත් ජයග්‍රහණයක් හැටියට මා දකිනවා. හැබැයි, ඒ තුළ අපි කථා නොකළ පැත්තකුත් තිබෙනවා. යහ පාලන රජය පැවති සමයේ සියයට 25ක කාන්තා නියෝජනය තහවුරු කරගන්න මුල පුරපු කෙනෙක් ඉන්නවා. ඇය ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. බොහෝ දෙනෙක් නොදන්නා ඒ කාරණාව මම කියන්නම්. 2012දී පුත්තලමේ තිබුණු රැස්වීමකදී තමයි පුත්තලමේ ඉන්ද්‍රාණි කුසුමලතා කියන කාන්තාව මේ සියයට 25 යෝජනාව ගෙනාවේ, ගරු විපක්ෂ නායකතුමනි. එතුමිය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂිකාවක් හැටියට 2018දී මැතිවරණයකට ඉදිරිපත් වුණා. හැබැයි, එහිදී ඇයට ජයග්‍රහණය කරන්න බැරි වුණා. මේ යෝජනාව ගෙනාපු ඇයට මේ කාන්තා නියෝජනය තුළට එන්න බැරි වුණා. එදා ඇයට කොටියාසයකට ලැයිස්තුවෙන් එන මන්ත්‍රී ධුරයක්වත් පොදුජන පෙරමුණ ලබා දුන්නේ නැහැ. අද 3,000කට වැඩි කාන්තා පිරිසක් මේ රටේ පළාත් පාලන ආයතනවලින් නායිකාවන් හැටියට එළියට ඇවිල්ලා ඉන්නවා. හැබැයි, මේ වාගේ දේවල්වලට උර දුන් කුසුමලතා වැනි ඉතිහාසය තුළ සැඟවුණු වීරවරියන් ඉන්නවා කියන එකත් මතක් කරන්නට මා මෙය අවස්ථාවක් කරගන්නවා.

ගරු ඇමතිතුමියනි, අපි පසුගිය සංසදය තුළදී යෝජනා ගණනාවක් ගෙනාවා. ඒ දේවල් ඉදිරියට ගෙනයන්න අවශ්‍යයි.

පාර්ලිමේන්තුව තුළ හා පළාත් සභාව තුළත් කාන්තා නියෝජනය සඳහා කෝටාවක් ලබා දෙන්න කියන ඉල්ලීම අපි මේ වෙනකොට ඉදිරිපත් කරලා තිබෙනවා. මේ රටේ ජනතාව තුළ කාන්තාව දේශපාලනයට සුදුසුයි කියන ආකල්පය පැළ වෙනකන්වත් මේ කෝටා ක්‍රමය තහවුරු කරන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා. ඒ වාගේම කමිටුවල පවතින කාන්තා නියෝජනය ගැනත් මම කථා කරන්න ඕනෑ. උදාහරණයක් විධියට ගත්තොත්, තුන්දෙනෙක් ඉන්න තැනකදී එක්කෙනෙක්වත් කාන්තාවක් වෙන්න ඕනෑ. පස්දෙනෙක් ඉන්න තැනකදී අවම වශයෙන් දෙන්නෙක්වත් කාන්තාවන් වෙන්න ඕනෑය කියන යෝජනාව ගරු හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය -අද එතුමිය ගරු අගමැතිතුමිය- ඇතුළු අපි එදා ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු අගමැතිතුමිය ඒ ගැන දන්නවා. මම එතුමියගෙන් ඉල්ලා සිටිනවා, මේවා යථාර්ථයක් කරන්න මැදිහත් වෙන්න කියලා.

කාන්තාවන්ට හා දරුවන්ට එරෙහිව සිදු වූ හිංසනවලට අදාළ නඩු විශාල සංඛ්‍යාවක් අධිකරණවල තිබෙනවා. සමහර නඩු අවුරුදු 15ක් විතර ඇදෙනවා. මම දැක්කා ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් මේ සම්බන්ධව සඳහන් කරලා තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා, මේ ක්‍රියාව කඩිනම් කරන්න කියලා. එහෙම නොවුණොත් වෙන්නේ වූදිතයාට නිදහස් වෙන්න තිබෙන ඉඩකඩ වැඩි වෙන එකයි. මම හිතන විධියට ඒක අධිකරණ ඇමතිතුමාටත් තේරෙනවා ඇති. කාන්තා සංසදය හැටියට අපි 12දෙනෙකුගෙන් යුත් කමිටුවකින් ඒ සම්බන්ධව ඉදිරිපත් කළ යෝජනා තිබෙනවා. ඒ යෝජනා තුළ තිබෙනවා, සතියේ දවස් පහෙන් එක දවසකදී දරුවන්ට සහ කාන්තාවන්ට එරෙහිව සිදු වෙලා තිබෙන හිංසන සම්බන්ධයෙන් තිබෙන නඩු ටික අහලා ඉවර කරලා ඒ වූදිතයන්ට දඬුවම් ලබා දෙන්න ඕනෑය කියලා. ඒ දඬුවමත් ආකල්ප සංවර්ධනයට, ආකල්ප වෙනස් වෙන්න ඉවහල් වෙනවා කියන එකත් මම මේ වෙලාවේ මතක් කරනවා. එහෙම නැතිව, වෙනම අධිකරණ හදලා මේවා විසඳන්න ගියොත් ඒවා මේ ආත්මයේදී සිද්ධ වෙන දේවල් නොවෙයි.

ඊළඟට, තවත් වැදගත් කාරණයක් කියන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු කම්කරු ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මට තව විනාඩි 5ක් ලබා දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමියට තවත් විනාඩි 5ක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අපි දන්නවා, Convention No. 190 අපි අත්සන් කරලා තිබෙන බව. හැබැයි, ඒක බලාත්මක කරලා නැහැ. මේ වෙලාවේ ගරු සභාවේ කම්කරු ඇමතිතුමා නැහැ. මම එතුමාට කියනවා, වැඩ භූමියේ සිද්ධ වෙන කාන්තාවන්ට එරෙහි හිංසනය වළක්වන්නට අවශ්‍ය කටයුතු කරන්න කියලා. එහෙම වුණොත් තමයි මේ රට පොහොසත් රටක් වෙන්නේ. එහෙම නැතිව ගණිකා වෘත්තිය නීතිගත කරලා රට පොහොසත් කරන්න හිතන්න එපා කියන එකත් මම කියනවා. ඊට එහා හිතන්න. සියයට 52ක් වෙච්ච කාන්තාව මේ රටේ ආර්ථිකයට දායක කර ගන්න. මම හිතනවා, ගණිකා වෘත්තියට එහා ගිහිල්ලා කළ හැකි ගොඩක් දේවල් කාන්තාවට තිබෙනවා කියලා.

ඇත්තටම කාන්තාවක් ගණිකාවක් වෙන්නේ, ආශාවට නොවෙයි කියන එක මම කියන්න ඕනෑ. දරුවන්ට කන්න දෙන්න බැරි වුණාම, එහෙම නැත්නම් වෙන කරන්න දෙයක් නැති වුණාම ඇය එතැනට පත් වෙනවා. අපි කවුරුත් ප්‍රසිද්ධියේ කථා නොකරන දෙයක් ගැන මම කියනවා. ඒක සමාජය මොන විධියට දකීවිද මම දන්නේ නැහැ, ගරු අගමැතිතුමියනි. කිසිම කාන්තාවක් පිරිමියෙක් එක්ක යහන්ගත වෙන්නේ නැහැ, තමන්ට ආදරය, රැකවරණය, ගෞරවය, භක්තිය නැත්නම්. හැබැයි, ගණිකාවට ඒ කිසිදෙයක් නැතිව ඒ තත්ත්වයට මුහුණ දෙන්න වෙනවා නම්, ඒක බෙදාවාචකයක්. ඒ නිසා කාන්තාව අර කිව්ව නරා වළට -ජරා වළට - දමන්න ඔබතුමියලා කථා කරපු එක ගැන මම කනගාටු වෙනවා.

පාදඩ නීතිය ගත්තොත්, ඇයි ගැහැනුන්ට විතරක් බලපවත්වන්නේ? TV එකේ පෙන්වන්නේම අල්ලා ගත්ත කාන්තාවන් ටික විතරයි. ඇයත් එක්ක අත්පුඩි ගහපු අනෙක් කෙනා පෙන්වන්නේ නැහැ. තනියෙන් අත්පුඩි ගහන්න බැහැ. ඇයත් එක්ක හිටපු අනෙක් කෙනා අපි දකින්නේ නැහැ, මාධ්‍යයෙන්. එහෙම නම්, මෙතැනදී සිද්ධ වෙන දෙවැනිකොට සැලකීම, සමානාත්මතාව බිඳීම නිවැරදි කරන්න කියලා මම කියනවා.

ඊළඟට මම කියනවා, ඉසුරුපාය, සුහුරුපාය, සෙන්සිරිපාය කියන රාජ්‍ය ආයතන ටිකේවත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන හදලා දෙන්න කියලා. අපි පාර්ලිමේන්තුවේත් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හදලා දෙන්න උත්සාහ කළා. දැනට අපි පාර්ලිමේන්තු දෙකකදී මේ ගැන කථා කළා. නමුත් අපට තවම බැරි වෙලා තිබෙනවා, මේ රටේ රැකියා කරන කාන්තාවන්ට තමන්ගේ දරුවා තබා යන්න පුළුවන් සුරක්ෂිත තැනක් හදලා දෙන්න. ඒ නිසා මම කියනවා, මේ කටයුත්ත කාර්යක්ෂම කරන්න කියලා.

ගරු අධිකරණ ඇමතිතුමනි, ලංකාවේ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12වෙනි ව්‍යවස්ථාවට විතරක් සීමා වෙලායි. පොතේ බරට ඒක වැහිලා තිබෙන්නේ. ඒ නිසා මේවා නිවැරදි කරන්න කියලාත් මම යෝජනා කරනවා. අපි පාර්ලිමේන්තුවේ හදපු නීති ටිකත් ක්‍රියාත්මක කරන්න. Prevention of Domestic Violence Act එක අපි ගෙනැත් තිබෙනවා. තවම එය ක්‍රියාත්මක කරගන්න බැරි වෙලා තිබෙනවා. ඒවා බලාත්මක කරන්න කියලාත් මම යෝජනා කරනවා. ඒ වාගේම නවක මන්ත්‍රීවරියන් හැටියට අපි ඒ දවස්වල National Action Plan to Address Sexual and Gender Based Violence හැදුවා. ඒ, 2016 දී. ඒවායේ අඩුපාඩු තිබෙනවා නම් නිවැරදි කරලා ඉදිරියට ගෙනයන්න. Women Empowerment Act එකත් කාන්තා සංසදය හැටියට අපි මැදිහත් වෙලා හදපු එකක්. National Commission on Womenත් කාන්තා සංසදය හැටියට අපි මූලිකත්වය අරගෙන ඉදිරියට ගිය දේවල්. මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ හිටපු සභාපතිතුමිය වූ සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියත්, හිටපු උප සභාපතිතුමිය වූ සීතා අරඹෙපොළ මැතිනියත්. මොකද, ඒ අය මේවාට උර දුන්නා. ඒ නිසා මේවා බලාත්මක කරන්න කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

ගරු ඇමතිතුමියනි, මම තව එක දෙයක් අහන්න ඕනෑ. කෝ, මේ කාන්තා කමිටුව? මේ කාන්තා කමිටුව හැදෙන්නේ නැතුව ජාතික කාන්තා කොමිසම ක්‍රියාත්මක කරන්න බැහැ. මම ඉල්ලා සිටිනවා, මේවා පැලවත්තට සීමා කරන්න එපා කියලා.

ඒවා පොඩ්ඩක් පුළුල්ව දකින්න. මේ විශාල දේ ගිනි පෙට්ටියක් තරමට සීමා කර ගන්න එපා. ඒවා ගැනත් අවධානය යොමු කරන්න කියලා මම යෝජනා කරනවා. සාම්ප්‍රදායික රැකියාවලින් ඉවත් වෙලා කාන්තාව වෙනත් රැකියාවලට යොමු කරන්න අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න. ගරු අමාත්‍යතුමිය හැටියට ඔබතුමිය ඒ සඳහා පෙරමුණ ගන්න. අධ්‍යාපන අමාත්‍යාංශය තමයි මේවා කරන්න ඕනෑ. නමුත්, පෙලඹවීම කරන්න ඕනෑ ඔබතුමියයි. අද මාධ්‍යවල පෙන්වන්නේ මොනවාද? සාර්ථක කාන්තාවන් ගෙන්වා මාධ්‍ය තුළින් පෙන්වන්න. ඝාතන, එහෙම නැත්නම් කාන්තාවන් මරා දමා ඇති ප්‍රවෘත්ති මාධ්‍ය තුළ හැම වෙලාවකම පළ කරනවාට වඩා හොඳයි, සාර්ථක කාන්තාවන් ගෙන්වා පූර්වාදර්ශ චරිත හැටියට සමාජගත කිරීම. ඒ තුළිනුත් සමාජය වෙනස් වෙනවා. මේ වෙලාවේ මම ඒ යෝජනාවත් කරනවා.

ඊළඟට, ලංකාවේ පවතින ගෘහ සේවිකා ගැටලුව ගැන බලන්න. ගෘහ සේවිකාවන් ලෙස ලක්ෂ තුනක් පමණ ලංකාවේ වැඩ කරනවා. මේ, ගෙවල්වල උයන පිහන, රෙදි සෝදන අය. ඒ අයට නියමිත වැටුප් ක්‍රමයක් නැහැ, රක්ෂණයක් නැහැ, සේවා මුරයක් නැහැ. එම නිසා මම යෝජනා කරනවා, මෙරට වැඩ කරන ගෘහ සේවිකාවන්ට නිසි රක්ෂණයක් සහිතව, වැටුප් තලයක් ඇතිව, සේවා කොන්දේසි ඇතුව ඒ අයගේ රැකියා සුරක්ෂිතභාවය ඇති කරන්න කියලා. මම දැක්කා, ඕස්ට්‍රේලියාවේ තානාපති කාර්යාලයේ හිටපු නිලධාරිනියකට යම් ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණේ ඕස්ට්‍රේලියාවේ එවැනි නීති නිබුණු නිසා බව. එම නිසා මෙන්න මෙවැනි කාරණාවලට අපි මූලිකත්වය දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. මාර්තු 6වැනි දා -පෙරේදා- සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගත් අවස්ථාවේදී මම කිව්වා, පෙබරවාරි 25වැනි දා වෛද්‍ය සැපයීම් අංශය ඉදිරිපත් කරපු ලියවිල්ලක් තිබෙනවාය කියලා, ඖෂධ වර්ග 333ක් හිඟයි යනුවෙන්. එතකොට දොස්තර මහත්මයෙක් උත්තර දීලා මට කිව්වා, තාක්ෂණික තොරතුරු දන්නේ නැතුව කථා කරන්න එපා කියලා. මම හිඟ ඖෂධ පිළිබඳ ලැයිස්තුව සභාගත කළා. එහි ඖෂධ වර්ග 333ක් තිබුණා. ඒ ඖෂධ හිඟයි; ඒ ඖෂධ නැහැ. මම දැන් ඒ ගැන කියන්නම්. ඊයේ -මාර්තු 7වන දා- හවස තුන වනකොට ලංකාවේ කිසිම රෝහලක පොඩ්ඩක්වත් නැති, හිඟ ඖෂධ වර්ග 93ක් තිබෙනවා. වෛද්‍ය සැපයීම් අංශයේ නැති ඖෂධ වර්ග 200ක් තිබෙනවා. ඖෂධ 199කුත් නොවෙයි, 201කුත් නොවෙයි. 200ක් නැහැ.

ලංකාවේ කිසිම රෝහලක පොඩ්ඩක්වත් නැති එම හිඟ ඖෂධ 93 පිළිබඳව විස්තර සඳහන් ලැයිස්තුවක් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මේ ඖෂධ වෛද්‍ය සැපයීම් අංශයේ නැහැ. තාක්ෂණික කාරණා කියන්න එපා කිව්ව දොස්තර මහත්වරුන්ට මම මේ වෙලාවේදී අභියෝග කරනවා, මෙන්න මේ පොඩ්ඩක්වත් නැති ඖෂධ 93 අතර කාන්තාවන්ට සහ දරුවන්ට අවශ්‍ය වන ඖෂධ කීයක් තිබෙනවාද කියලා මේ රටට හෙළි කරන්න කියලා. ඒ නිසා මම කියනවා, විපක්ෂය කියන්නේ ආණ්ඩුවේ ගමන් මහ වැරැදියට යනවා නම් ඒක හරි පාරට ගන්න අය කියන එක. ඒ නිසා විපක්ෂය දෙස වෛරයෙන් බලන්න එපා. හඳ පෙන්වනකොට ඇඟිල්ලේ ඇද කුද සොයන්න එපා කියන එකත් මම මේ වෙලාවේදී ඔබතුමන්ලාට මතක් කරනවා. අපි ප්‍රශ්නයක් ඉදිරිපත් කරනකොට, ඇතැම් උද්ධච්ච පිරිමි ඇවිල්ලා, ගමේ භාෂාවෙන්ම කිව්වොත්, ඒක වණ කරලා දමනවා එහෙම නැත්නම් අල කරලා දමනවා. අපි මේ කථා කරන්නේ මේ රටේ කාන්තාවන්ගේ හෙට දවස සවිබලගන්වන්නට අවශ්‍ය කරන යෝජනා පිළිබඳවයි. ඒ නිසා මම මේ අවස්ථාවේදී විශේෂයෙන් යෝජනාවක් කරනවා. අද මෙතැන තිබෙන රාජ්‍ය නිලධාරි මැදිරියට පරිපාලන සේවයේ නිලධාරින් ඇවිල්ලා ඉන්නවාද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. මේ ආණ්ඩුව තමයි අඩුම අමාත්‍යාංශ ගණනක පරිපාලන සේවයේ නිලධාරින් නියෝජනය කරන ආණ්ඩුව. මේ රටේ අමාත්‍යාංශ විසිපහෙන් හතක විතරයි පරිපාලන සේවයේ නිලධාරින් ලේකම්වරු හැටියට ඉන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ කථාව තව විනාඩියකින් අවසන් කරන්න.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු ඇමතිතුමියනි, මම යෝජනා කරනවා, මේ සමාජයේ සිටින අත්දැකීම් බහුල ප්‍රවීණයන් වාගේම විෂයයේ ප්‍රවීණයන් එකතු කරගෙන මේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ඉස්සරහට ගෙනියන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. ඒ වාගේම ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේදී ගත් තීරණයක් අනුව අපි මේ රටේ දරුවන්ට සිද්ධ වන ලිංගික හිංසනය අවම කරන්නට සමාජය පුරාම කතිකාවක් ඇති වන විධියට, අමාත්‍යාංශ පහක් එකතු කරගෙන ලිංගිකත්ව අධ්‍යාපනය පිළිබඳ වැඩ පිළිවෙළක් කරගෙන ගියා. ඒ වැඩ පිළිවෙළේ වර්තමාන තත්ත්වය කොහොමද කියන එකත් මේ ගරු සභාවට පැහැදිලි කරන්න කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය, ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මැතිනිය. ඔබතුමියට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 10.59]

ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලංකාවේත්, ලෝකයේත් වැඩ කරන පන්තිය නියෝජනය කරන, මේ මොහොතේදීත් මේ රටේ ආර්ථිකය ගොඩනඟමින්, සෑම නිවසකම ගෘහ සුරැකුම් ආර්ථිකය ඇතුළේ වගකීම් දරමින්, පරිපාලන, විධායක සියලු ශ්‍රේණිවල කාර්යභාරයන් ඉටු කරමින් සිටින කාන්තාවන් සියලුදෙනාටත්, මේ අවස්ථාවේදී මුලසුන දරන ගරු නියෝජ්‍ය සභාපතිතුමියටත්, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියටත්, ගරු අග්‍රාමාත්‍යතුමියටත්, මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපේ ගරු මන්ත්‍රීවරියන් විසිදෙදෙනාටත් 2025 ජාත්‍යන්තර කාන්තා දිනය සමරන අද දිනයේ සුබම සුබ කාන්තා දිනයක් වේවා කියා මම මුලින්ම ප්‍රාර්ථනා කරනවා. ලෝකය පුරාම කාන්තා දේශපාලන ඉතිහාසය ගැන කථා කරද්දී අපි වැඩ කරන වැඩ බිමේ අයිතිය පිළිබඳව කථා කරමින් ඉඳලා තිබෙනවා. ලෝකය පුරා රටවල සිටින කාන්තාවන් තමන්ගේ වැඩ බිමේ අයිතිය, ශ්‍රමයේ අයිතිය, දරුවන්ගේ අයිතිය, දරුවා වෙනුවෙන් ලැබෙන කිරි පැයේ අයිතිය වෙනුවෙන් අරගළ කරපු ඉතිහාසයක් හරහා තමයි මෙන්න මේ කාන්තා දිනය කියන එක දිනා ගත්තේ. ඒ එක්කම ආර්ථිකයේ ඉපැයීමේ කාර්යයට විශාල වශයෙන් දායක වන කාන්තාව ප්‍රතිලාභ ලබද්දී ඉන්නේ කොතැනද කියන ප්‍රශ්නය හැමදාම තිබුණා. අන්න ඒ නිසා තමයි, අපිට මෙන්න මේ gender-sensitive budgeting කියන එක ගැන, එහෙම නැත්නම් gender-responsive budgeting කියන එක ගැන කථා කරන්න සිද්ධ වුණේ.

අපි දන්නවා, නිදහසින් පසු වසර 76ක ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළ නොයෙක් වර මේ ආර්ථික ඉපැයීමේ කාර්යයට කාන්තාවන් කොයි තරම් දායක කර ගත්තත්, ඒකේ ප්‍රතිලාභ භුක්ති විඳින තැනදී කාන්තාවන්ට හිමි වුණේ අසමාන ස්ථානයක්, එහෙම නැත්නම් අඩු තැනක් බව. ඒ නිසාම ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ස්ත්‍රී පාර්ශ්වය ගැන සංවේදී වන gender-sensitive Budget එකක් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන් මෙවර ඉදිරිපත් කරලා තිබෙනවා කියන එක අපි සතුටින් කියනවා. මේ අය වැයේදී කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය හැටියට අපිට තිබෙන එකම වගකීම, මේ මුදල්මය වශයෙන් වෙන් කරලා තිබෙන ප්‍රතිලාභවලින් ජනතාවට සහන සලසන්නේ කොයි වාගේද, සුබසාධනය සලසන්නේ කොයි වාගේද කියන කාරණාව විතරක් නොවෙයි. මම මේ අමාත්‍යාංශය භාරගෙන මාස තුනක් තුළදී වසර 20ක ඉතිහාසය තුළ අමාත්‍යාංශයේ තිබුණු ලිපි ලේඛන පරීක්ෂා කළා.

අමාත්‍යවරුන්ගේ කාර්යභාරය මොකක්ද කියා මම පරීක්ෂා කළා. ඒ කාලය තුළ අරගෙන තිබෙන තීන්දු තීරණ පිළිබඳව මම කල්පනා කළා. ඒවා පිළිබඳව තිබෙන තොරතුරු කියවා බැලීමේදී මම සොයාගෙන තිබෙනවා, අපේ රට තුළ ප්‍රතිපත්ති, තීන්දු තුළින් සංස්කරණය කළ යුතු දේවල් ගොඩක් තිබෙනවාය කියලා.

** පූර්වකාලයේ නඛා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

විශේෂයෙන්ම කාන්තාවන් සහ දරුවන් සම්බන්ධව මේ රටේ පවතින තත්ත්වය ප්‍රතිපත්තිමය හා ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම තුළින් සංස්කරණය කළ යුතුයි. ඒ සඳහා වන වගකීම ආණ්ඩුවක් හැටියට අපි භාරගෙන තිබෙනවාය කියන එක ඉතාම සතුටින් මම දැනුම් දෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධ්‍යාපනය, සෞඛ්‍ය, කාන්තාව සවිබලගැන්වීම, නීතිය, සමාන හිමිකම් කියන කාරණා සම්බන්ධයෙන් කාන්තාවන්ට සහ දරුවන්ට ලබා දිය යුතු තැන කොතැනද කියන එක තීරණය වෙන්නේ අනාගත ලෝකයත් එක්ක බව අපි දන්නවා. අනාගත ලෝකය තුළ අපේ කාන්තාවන්ට සහ දරුවන්ට සුරක්ෂිත තැනක් හදන්න ගත යුතු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මොනවාද කියන එක පිළිබඳවත්, ලෝකයේ දිශානතියට අනුව, ලෝකය සංවර්ධනය වන වේගය අනුව අපේ රට කොයි තරම් ඉහළට ඔසවා තබන්නට ඕනෑද කියන එක පිළිබඳවත් අපි තනි අමාත්‍යාංශයක් හැටියට නොවෙයි වගකීම දරා තිබෙන්නේ. සමස්ත රජය හැටියට අනාගත දරු පරපුරේ වගකීම අපි භාර ගන්නවා කියන එක මේ අවස්ථාවේදී මා සඳහන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපි දන්නවා, මෙවර ඉදිරිපත් කරලා තිබෙන්නේ මාස 8ක් සඳහා වන අය වැයක් බව. අපේ නව රජය පත්වීමෙන් පසුව මාස තුනකට නොවැඩි කාලයක් තුළ ගෙනා මේ අය වැය ලංකා ඉතිහාසයේ අවසාන අය වැය නොවෙයි කියන කාරණාවත් අපි මතක් කර දෙන්න කැමැතියි. ඒ නිසාම තමයි අපි මේ ආරම්භක පියවරේදී අපට ගන්න පුළුවන් ඉහළම සාධනීය පියවර සහ ප්‍රවේශයන් කාන්තාවන්ගේ සහ දරුවන්ගේ සංවර්ධනය වෙනුවෙන් අරගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම මේ අවස්ථාවේදී තවත් පුංචි කාරණාවක් කියන්න ඕනෑ. අපි සමානාත්මතාව බලාපොරොත්තු වනවා. කාන්තාවන්ට සම තැන හෝ නිසි තැන ලැබිය යුතුයි කියන කාරණය පිළිබඳව ලෝකයේ රටවල් වාගේම ලංකාව තුළත් ගොඩක් කථා වෙනවා. ජාතික ජන බලවේගය හැටියටත්, කාන්තා ක්‍රියාකාරිනියන් හැටියටත්, කාන්තාවන්ගේ නිදහස සහ සාධාරණත්වය අගය කරන පිරිසක් හැටියටත් හැමදාම අපි ඒ ගැන කථා කරනවා. මේ සමාජය විශාල යන්ත්‍රයක් නම්, මේ විශාල යන්ත්‍රය ඇතුළේ මම ඇතුළු ඕනෑම ගැහැනියක් nut එකක්, මුරිච්චියක්, ඇණයක් වෙන්න පුළුවන්. හැබැයි, ඒ තත්ත්වය ඒ ආකාරයෙන් භාර ගන්නට ඕනෑ. මේ සමාජය ඇතුළේ ඒ අනන්‍යතාව ලකුණු කිරීම තමයි අපි ඉල්ලන ගැහැනියකට තිබෙන නිසි තැන කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම අපි හැම කෙනෙකුගේම ප්‍රාර්ථනාව වන්නේ සෑම ගැහැනියකම සතුව තිබෙන කුසලතා, ආකල්ප, අත්දැකීම් සහ දැනුම තුළින් සමාජ පරිවර්තනයේ ඊළඟ ඉලක්කයට, සමාජ ප්‍රවාහයේ ඉදිරි සංවර්ධනයට, එහෙම නැත්නම් ඊළඟ අත්පත් කර ගැනීමට, ඊළඟ ප්‍රවේශය සටහන් කරන්නට පුරවැසියෙක් හැටියට තමන්ට අදාළ කාර්යභාරය කිරීමට හැම ගැහැනියකටම නිදහස් අවකාශයක් තිබිය යුතුයි කියන එකයි. ඒ නිදහස් අවකාශය හදලා දෙන්න කියන ඉල්ලීම අපි කරනවා. අන්න ඒ නිදහස් අවකාශය ඇතුළේ ඇගේ කුසලතා, ආකල්ප, දැනුම, අත්දැකීම් සමාජ සංවර්ධනයට දායක කිරීමේදී අදාළ වන ඇගැයීම, ගරුත්වය, පිළිගැනීම, සහභාගිත්වය වාගේම ඒ සඳහා වන ශ්‍රමයේ දායකත්වයේදී නිසි පිරිවැය කියන එක අපි බලාපොරොත්තු වෙනවා. ඒකට තමයි අපි "දියුණු සමාජය" කියන්නේ. අන්න ඒක තමයි කාන්තාවකට ලැබෙන නිසි පිළිගැනීම කියලා අපි කියන්නේ. ඒ නිසා මේක විශාල සංකල්පයක්. මේ විශාල සංකල්පය ගොඩනැඟීම සඳහා අපට තිබෙන ප්‍රවේශයේදී අපි විශ්වාස කරනවා, ගරුත්වය දීලා ගරුත්වය ලබන්න ඕනෑ කියන එක; ගරුත්වය දීලා ගරුත්වය ලබන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගැහැනියක ලෙස පිරිමියාටත්, පිරිමියා ලෙස ගැහැනියටත් ගරු කරන සමාජයක් ඇති කිරීම තුළින් තමයි අපි කියන ඒ උත්තුංග මානව දර්ශකවලට අපට යන්න පුළුවන් වෙන්නේ. එහෙම නොවන තාක් කල් අපි ලඝු වෙනවා. එකිනෙකාට අපහාස කර ගැනීම්, පීඩා විඳීම්, හිංසනයට ලක්වීම් සහ පාගා දැමීම්, අමතක කර දැමීම්, ප්‍රතික්ෂේප කිරීම් වාගේ කාරණා බොහෝ වෙලාවට අපි අතරේ පවතින්නේ මෙන්න මේ කාරණා නිසායි. ඒක නිසා අපි බලාපොරොත්තු වෙනවා, හුදෙකලාව සිද්ධිවලට ප්‍රතිචාර දැක්වීම වෙනුවට මේ සමස්ත සමාජ ප්‍රවාහය වෙනස් කිරීම සඳහා වන ආකල්පමය පරිවර්තනයක්, ව්‍යුහාත්මක පරිවර්තනයක් වාගේම ප්‍රතිපත්තිමය පරිවර්තනයක් අවශ්‍යයි කියලා. න්න ඒ සඳහා තමයි අපි ජාතික වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙන්නේ.

අපේ අමාත්‍යාංශය ගත්තොත්, කාන්තා කටයුතු වාගේම ළමුන් සම්බන්ධ කටයුතුත් අපට තිබෙනවා. ඒකෙදි හැම ගැහැනියෙකුටම, විශේෂයෙන්ම හැම අම්මා කෙනෙකුටම තමන්ගේ දරුවා අමතක කරලා ගමනක් නැහැ. අද දිනයේ අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ විවාදයට ගන්න නියමිතව තිබුණා. විපක්ෂය හැටියට ඔබතුමන්ලාගේ පැත්තෙන් යෝජනා වුණේත් අමාත්‍යාංශ දෙකක් පිළිබඳව සාකච්ඡා කළ හැකියි කියලායි. හැබැයි අපේ පැත්තෙන් තමයි "මේක පුළුල් මාතෘකාවක්, විශේෂිත මාතෘකාවක්. මේ සඳහා මුළු දවසක විවාදයක් ඕනෑ" කියලා ඉල්ලා හිටියේ. ඒකයි අපි මේක කියන්නේ. ඒ වාගේම, අපි හැමෝටම මේ විෂය පථය ඇතුළේ කථා කරන්න තිබෙනවා. මේක ස්ත්‍රීන් වෙනුවෙන්, නැත්නම් ගැහැනුන් වෙනුවෙන් විතරක් කථා කරන මාතෘකාවක් නොවෙයි. අපි ජාතියක් හැටියට, රටක් හැටියට සියලුදෙනාම වෙනුවෙන්; කාන්තාවන් වෙනුවෙන්, පිරිමින් වෙනුවෙන්, දරුවන් වෙනුවෙන්, විශේෂ අවශ්‍යතා තිබෙන ප්‍රජාව වෙනුවෙන් සහ අත්හැරෙන -මහහැරෙන- සෑම පුරවැසියෙක් වෙනුවෙන්ම කථා කරනවා. ඒක අතුළේ ගැහැනියක් හැටියට, අම්මා කෙනෙක් හැටියට මම නැවත වතාවක් කියන්නේ, දරුවන් සම්බන්ධ වගකීම අපිට පැවරිලා තිබෙනවා කියන එකයි. මෙතෙක් පැවති රජයන්වල කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සඳහා කැබිනට් අමාත්‍ය ධුරයක් නොතිබුණු අවධියක අපි මෙවර ඒකට කැබිනට් අමාත්‍ය ධුරයක් පත් කර තිබෙනවා. ඒ නිසාම මේක වෙනම විෂය පථයක් හැටියට සාකච්ඡා වෙනවා. කැබිනට් අමාත්‍ය ධුරයක් හැටියට තිබෙන නිසා අමාත්‍ය මණ්ඩලයේ සියලුදෙනාගේම අවසරය පරිදි තමයි අපේ අමාත්‍යාංශයේ තීන්දු, තීරණ ගනු ලබන්නේ. මේකේ විෂය පථය සඳහා ඒ තරම්ම වගකීමක් අපේ රජය තුළින් අපි අරන් තිබෙනවා.

මෙවර කාන්තා දිනයෙන් ඊළඟ කාරණාව මම පටන් ගන්නම්. අපි මෙවර කාන්තා සතියක් නම් කර තිබෙනවා. මේ කාන්තා සතිය සඳහා අපි තෝරා ගත්ත මාතෘකාව තමයි "තැනුමට තිරසර හෙටක්. සවිමත් ඇය වේ මහක්" කියන එක. මේක අපේ ජාතික තේමාව. ජාත්‍යන්තර තේමාවට සමගාමීව තමයි අපි කාන්තා සතිය සඳහා මේ තේමාව තෝරාගෙන තිබෙන්නේ. අපි දන්නවා, එක්සත් ජාතීන්ගේ සංවිධානය හඳුන්වා දීලා තිබෙන තේමාව ඇතුළේ ලෝකය පුරාම සෑම ගැහැනියකටම සහ ගැහැනු දරුවෙකුටම සමාන අයිතීන් වාගේම සමානාත්මතාව සහ සවිබලගැන්වීම කියන එක තිබෙන බව. ඊටත් වඩා, අපේ රටට ගැළපෙන, වඩාත් සංවේදී මාතෘකාවක් හැටියට අපි සලකනවා, "අපේ රටට තිරසර හෙටක් දකින්න බැහැ. සවිබලගැන්වුණු ගැහැනියක් නොදකින තාක්කල්" කියන එක. ඒ වෙනුවෙන් අපි මේ සතිය පුරාම නීතිමය වශයෙන් දැනුවත් කිරීම්,

සවිබලගැන්වීමේ ව්‍යාපෘති, සෞඛ්‍ය ආරක්ෂණ වැඩ පිළිවෙළවල්, සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීම් ජාතික මට්ටමෙන්, පළාත් මට්ටමෙන්, දිස්ත්‍රික්ක මට්ටමෙන් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් හැම ගමකම ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ නිසා මේක ජාතික උත්සවයක් හැටියට එක තැනක සමරනු ලබන උත්සවයක් විතරක් නොවෙයි. අපි මෙන්න මේ ආකාරයට විධිමත්ව ගම්වල ඉන්න හැම කාන්තාවක් වෙනුවෙන්ම ඒ දැනුවත් කිරීම, නීතිමය ආවරණය, ඔවුන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය ගැන දැනුවත් කිරීම වාගේම අපේ ව්‍යාපෘති පිළිබඳව, අපේ අමාත්‍යාංශයේ නව ව්‍යාපෘති පිළිබඳව දැනුවත් කිරීමේ සතියක් හැටියට තමයි අපි මේක නම් කරලා තිබුණේ.

අද අපේ අමාත්‍යාංශය ළමා සංවර්ධනය සඳහා කටයුතු කරනවා. අපි හිතන විධියට, නීරෝගී දරුවෙක් බිහි කරන්න පුළුවන් වෙන්නේ නීරෝගී අම්මා කෙනෙකුට. නීරෝගී අම්මා කෙනෙකුගෙන් තමයි නීරෝගී දරුවෙක් බිහිවෙන්නේ. ඒ නිසා කාන්තාවන් සවිබලගැන්වීමේදී, විශේෂයෙන් අනාගත දරු පරපුර ගැන හිතද්දී, මන්දපෝෂණය වළක්වාගෙන ඒ දරුවා බිහි කරන අම්මාට හොඳ පෝෂණීය ආහාර වේලක් ලබා දීමේ ඉඳලා සියලු වගකීම් අපේ අමාත්‍යාංශය භාරගෙන තිබෙනවා. ඒ නිසා ගර්භිණී මවුවරුන් සඳහා පෝෂණ දීමනාව ලබා දීම සඳහා විතරක් රුපියල් මිලියන 7,500ක් අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වෙන් කරලා තිබෙනවා. බිහිවෙන දරුවන් වෙනුවෙන් මවුවරුන්ට ගර්භිණී කාලය තුළ හොඳ පෝෂණීය ආහාර වේලක් ලබා ගැනීම සඳහායි ඒ මුදල වෙන් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තවත් කිව යුතු කාරණා කිහිපයක් තිබෙනවා. මේ මෑතක් වනතුරුම ලංකාවේ අපේ පෙර පාසල් දරුවන්ට උදෑසන ආහාර වේල සඳහා වෙන් කර තිබුණේ රුපියල් 60යි. රුපියල් 60කින් දරුවෙකුට පෝෂණීය ආහාර වේලක් දෙන්න පුළුවන්ද කියන කාරණාව අපි කල්පනා කළා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, ජනාධිපතිවරුන්ට, මෙතෙක් හිටපු අමාත්‍ය මණ්ඩලවලට තමන්ගේ සුඛෝපභෝගී පැවැත්ම සඳහා අතිවිශාල මුදල් කන්දාරවක් වෙන් කරගෙන, මන්දපෝෂණයෙන් පෙළෙන, ඌන පෝෂණ තත්ත්වයෙන් පෙළෙන ඒ අහිංසක දරු පැටවුන්ගේ උදෑසන ආහාර වේලට රුපියල් 60ක් වෙන් කරපු අය එක්ක තමයි අපි මේ සාකච්ඡා කරමින් ඉන්නේ කියලා.

හැබැයි, අපි ඒ මුදල රුපියල් 100 දක්වා වැඩි කර තිබෙනවා. එ් විතරක් නොවෙයි, ප්‍රතිලාභීන්ගේ ප්‍රමාණය වැඩි කර තිබෙනවා. ඒ පෙර පාසල් දරුවන්ගේ ප්‍රතිලාභ ප්‍රමාණය අපි වැඩි කර තිබෙන්නේ, අද දවසේ නොව අනාගත ලෝකය භාර ගන්නා දරුවන් නීරෝගී දරුවන් බවට පත් වෙන්න ඕනෑ නිසායි. ඒ පිළිබඳව අම්මලාගේ හිතේ තිබෙන වේදනාව අපි තුනී කරන්න ඕනෑ. දරුවන්ගේ බර කියන එක ජාතික වගකීමක් හැටියට අපි භාරගෙන තිබෙනවා.

ඒ වාගේම පෙර පාසල් දරුවන්ට උගන්වන ගුරුවරියන් සඳහා "ගුරු අභිමානී" දීමනාව වැඩි කරදීම සඳහා අපි මුදල් වෙන් කර තිබෙනවා. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා, ඒ වාගේම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා, ඒ වාගේම පරිවාස හා ළමාරක්ෂක සේවා සඳහා මෙවර අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

විශේෂයෙන්ම අධිකරණ තීන්දුව ලැබුණාට පස්සේ පරිවාසගත වන දරුවන් මෙතෙක් ප්‍රවාහනය කරමින් තිබුණේ අනෙකුත් අපරාධකරුවන් සහ චූදිතයන් ප්‍රවාහනය කරන වාහනවලම තමයි. ඒක නිසා පරිවාස භාරයට දරුවන් අරගෙන යද්දී ඒ දරුවන් සුරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා වෙනම වාහනයක් අවශ්‍යයි කියන එක අපි කිව්වා. ඒ සම්බන්ධයෙන් අපි කැබිනට් තීරණයක් අරගෙන මෙවර ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවා. අපි ඒ තත්ත්වයන් පැහැදිලි කර තිබෙනවා. පරිවාස භාරයට යන දරුවෙකුට පවා සුරක්ෂිත ප්‍රවාහන සේවාවක්, වඩාත් හොඳ සුරක්ෂිතතාවක් අවශ්‍යයි කියා අපි විශ්වාස කරනවා.

මම පිළිගන්නවා, මේ ආයතන ඇතුළේ වාගේම මේ ව්‍යුහය ඇතුළේ කාලාන්තරයක් තිස්සේ අඩු පාඩු පැවතිලා තිබෙන බව. ඒ අඩුපාඩු පිළිබඳව අපට හොඳ අවබෝධයකුත් තිබෙනවා, හොඳ අධීක්ෂණයකුත් තිබෙනවා. නීති, සෞඛ්‍ය, අධ්‍යාපන පද්ධති තුළ වාගේම කම්කරු නීතිය තුළ ආවරණය නොලබන, ඒ වාගේම ප්‍රතිපත්තිමය තීරණවල පවතින දුර්වලතා නිසා අගතියට ලක් වන දරුවන් සහ කාන්තාවන් වෙනුවෙන් අලුත් වැඩ පිළිවෙළක අවශ්‍යතාව අපි හඳුනාගෙන තිබෙනවා. එ් නිසා අපට කාලය අවශ්‍යයි. මේක අපේ ආරම්භක ප්‍රවේශය. ඒ නිසා ඔබතුමන්ලා, ඔබතුමියලා ඉදිරිපත් කරන සාධනීය යෝජනා අපි ඉතා සතුටින් භාර ගන්නවා; ඒ පිළිබඳව අපි සලකා බලනවා.

ඒ වාගේම දරුවන් වෙනුවෙන් ගත යුතු නීතිමය කාරණා පිළිබඳව වාගේම සෞඛ්‍ය, අධ්‍යාපනික වැඩසටහන් පිළිබඳ යෝජනා අපි සාකච්ඡා කරමින් ඉන්නවා. මේ අමාත්‍යාංශය භාරගෙන මේ කෙටි කාලය තුළ අපි විවිධ පාර්ශ්ව සමඟ සාකච්ඡා කර තිබෙනවා. ඒ කියන්නේ, අපට මේ අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධීකරණය කරන්න රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් එක්ක සාකච්ඡා කර තිබෙනවා. ඒ වාගේම අපට සංවර්ධන සහකරුවන් හැටියට ආධාර උපකාර ලබාදෙන, ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන සියලු සංවර්ධන සහකරුවන් සමඟ අපි සාකච්ඡා කරමින් ඉන්නවා. අපේ අමාත්‍යාංශය යටතේ අංශ 5ක් පවතිනවා. මේ අංශවල සියලු කණ්ඩායම් එක්ක, අපේ නිලධාරි මණ්ඩලයත් එක්ක අපි සාකච්ඡා කරමින් ඉන්නවා. අපේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මුල් ළමා විය සංවර්ධනය පිළිබඳව ජාතික ලේකම් කාර්යාලය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, ජාතික කාන්තා කමිටුව කියන මේ සියලු ආයතන එක්ව අපි ඉතා හොඳ බද්ධතාවක් සකස් කරගෙන ඒකමතියක් සහිතව අපේ අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩසටහන් සියල්ල සකස් කර තිබෙනවා. මේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනවල පවතින ආයතනික අඩුපාඩු, සේවක ගැටලු වාගේම උපරිම සේවාවක් කරමින් ඉන්න අපේ නිලධාරීන්ට පවතින ගැටලු පිළිබඳව අපි කථා කරනවා. අපි අනිවාර්යයෙන්ම ඒවාට හොඳම විසඳුම් ලබාදීමට කටයුතු කරමින් ඉන්නවා.

ඒ විතරක් නොවෙයි. සීමිත සේවක සංඛ්‍යාවකින් භාරදූර වගකීම් දරාගෙන, දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන්, කාන්තාවන්ගේ රැකවරණය වෙනුවෙන්, කාන්තාවන් නඟා සිටුවීම වෙනුවෙන් ඉතාම අසීරු කර්යභාරයක් කරමින් ඉන්න නිලධාරීන් පිරිසක් මේ රාජ්‍ය සේවය තුළ ඉන්න බව අපි දන්නවා. අපි ඔවුන් වෙනුවෙන් වග කියනවා. ඒ වගකීම ආණ්ඩුවක් හැටියට අපි භාර ගන්නවා. ඔවුන්ව තාක්ෂණික වශයෙන් සවිබලගන්වන්න අවශ්‍යයි. මේ පද්ධතිය තුළ වඩාත් හොඳ කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න නම් ඔවුන්ට තාක්ෂණික පුහුණුව අවශ්‍යයි. ප්‍රවාහන පහසුකම් ඇතුළු ලබා දිය යුතු අවශ්‍යතා බොහොමයක් තිබෙනවා. ඒවා අපි හඳුනාගෙන තිබෙනවා. වසර ගණනාවක් තිස්සේ අඩුම ප්‍රවාහන දීමනාවක් දීලා තිබෙන්නේ. ඉතා විශාල ඟයිල් කන්දරාවක් නඩත්තු කරගෙන, තොරතුරු පවත්වාගෙන යන්න අවශ්‍ය කරන ඉඩකඩවත් නැතිව මේ රාජ්‍ය නිලධාරීන් තැනින් තැනට ගිහිල්ලා දරුවන්ගේ තොරතුරු සොයා බලා තිබෙනවා. ඒ වාගේම ගෙයින් ගෙට ගිහිල්ලා මේ කාර්යභාරය කරමින් ඉන්නවා. ඒකේ අඩුපාඩු පවතින්න පුළුවන්. හැබැයි, මේ පද්ධතිය මේ මට්ටමින් හෝ රැකිලා තිබෙන්නේ මෙතෙක් හිටපු දේශපාලන බල අධිකාරිය නිසා නොවෙයි. ඒ කාර්යභාරය තමන්ගේ කර මත පටවාගෙන දරුවන්, කාන්තාවන් වෙනුවෙන් වගකීම් ඉටු කළ මේ නිලධාරීන් නිසායි.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

ඒ නිසා, අපේ රාජ්‍ය සේවයේ, විශේෂයෙන්ම මාගේ අමාත්‍යාංශයේ ඉහළ සිට පහළට සේවය කරන සියලුදෙනාත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කටයුතු කරමින් ළමා ආරක්ෂණය වාගේම, කාන්තාවන් සවිබලගැන්වීම, පූර්ව ළමාවිය සංවර්ධනය, උපදේශන සේවාව, ළමා හිමිකම් ආදි සියලු කටයුතුවලදී මේ රටේ කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් ඒ වගකීම් දරාගෙන කටයුතු කරන සියලු නිලධාරිනුත් මම මේ අවස්ථාවේ ඉතාම ආදරයෙන් සිහිපත් කරනවා. ඒ හැමදෙනාටම රජයක් හැටියට අපි කෘතවේදී වෙනවා. ඒ වාගේම, ඩිජිටල්කරණය හරහා අපේ අමාත්‍යාංශයේ කටයුතු වඩාත් විධිමත්ව වාගේම වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කරන බවටත්, ඔබ සියලුදෙනාට අවශ්‍ය පහසුකම් ලබා දෙන බවටත් අපි මේ අවස්ථාවේ පොරොන්දු වෙනවා. රජයක් හැටියට අපි ඒ වගකීම භාර ගන්නවා කියන සහතිකය අපි මේ වෙලාවේ ලබා දෙනවා. අප මේ කරන්නේ පොදු කාර්යභාරයක්. මේ පොදු කාර්යභාරය රටේ ජනතාවගේ, දරුවන්ගේ, කාන්තාවන්ගේ උන්නතිය සඳහායි.

අපේ සමාජ පද්ධතියේ කාන්තාවන් සහ දරුවන් පිළිබඳ කාරණාව අතිශය වැදගත්. කාන්තාවන් සවිබලගැන්වීමේදී අධ්‍යාපනයෙන් සවිබලගන්වන්න ඕනෑ; සෞඛ්‍ය විද්‍යාත්මකව සවිබලගන්වන්න ඕනෑ. ඒ වාගේම, කාන්තාවන්ට නීතිමය ආවරණය සලස්වන්න ඕනෑ. වැඩ කරන වැඩ බිමේදී කම්කරු නීති මඟින් කාන්තාවන් ආරක්ෂා වෙන්න ඕනෑ. දරුවන් පිළිබඳ කාරණාවේදී පූර්ව ළමා විය සංවර්ධනය ඉතා වැදගත්. දරුවන්ගේ අධ්‍යාපනය කියන කාරණාවේදී විෂය මාලාව සකස් වෙන්න ඕනෑ කොයි විධියට ද, ඒ විෂය මාලාව නවීකරණය කිරීම සඳහා අප ගන්න ඕනෑ තීරණ මොනවා ද යන්න අධ්‍යාපන අමාත්‍යාංශයේ ගරු අග්‍රාමාත්‍යතුමිය ඇතුළු කමිටුවක් සමඟ අපි සාකච්ඡා කළා. දැනටත් ඒ සාකච්ඡා යමින් තිබෙනවා. අප එහිදී බලාපොරොත්තු වන්නේ ලෝකයේ පවතින විධිමත්ම සේවාවක් හැටියට මෙන්න මේ කියන පූර්ව ළමා විය සංවර්ධනයයි. අවුරුදු 0-5 අතර -උපතේ සිට අවුරුදු 5 දක්වා- දරුවාගේ ළමා කාලය වඩාත් හොඳ, පිරුණු පෞරුෂයකින් යුතු තත්ත්වයට පත් කරන්නේ කොහොමද කියන කාරණාව අපි කල්පනා කරමින් ඉන්නවා. ඒ සඳහා වන වැඩ පිළිවෙළ ගැන අපි අධ්‍යාපන අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කළා. ඒ වාගේම, සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ක, අධිකරණ අමාත්‍යාංශය එක්ක, කම්කරු අමාත්‍යාංශය එක්ක ඒකාබද්ධව කථා කරමින් දරුවන්ට හා කාන්තාවන්ට වඩාත් හොඳ ජීවන අයිතියක් ලබා දෙන්න කටයුතු කරමින් සිටින මොහොතක්, මෙය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු රෝහිණී කුමාරි මන්ත්‍රීතුමියනි, විදේශවල වැඩ කරලා මුදල් එවන ජනතාවගෙන් -විශේෂයෙන්ම කාන්තාවන්ගෙන්- රජය සියයට 15ක බද්දක් අය කරනවා කියන ප්‍රවෘත්තිය ඔබතුමිය පුවත් පතක දැක්කත්, එතැනින් එහාට ඒ සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේදී සිද්ධ වෙච්ච දේ නොදැක්ක එක ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද, ඒ පුවත් පතේ පළ කරන ලද්දේ වැරදි තොරතුරක් බවත්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා බවත් මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරමින් එම ප්‍රකාශය නිවැරදි කළා. පුවත් පතේ පළ වූ එය අසත්‍ය ප්‍රවෘත්තියක්. එම නිසා මම එතැනින් එහාට ඒ ගැන කථා කරන්නේ නැහැ.

ඉදිරියේදී අපට කථා කළ හැකි බොහෝ කාරණා තිබෙනවා. මේක ආරම්භයක් පමණයි; ප්‍රවේශයක් පමණයි. අපි නැවත නැවතත් කියන්නේ එයයි. අපි මේ ප්‍රවේශය ඇතුළේ කාන්තාවන්ට සහ දරුවන්ට යහපත් සමාජයක් ලබා දෙනවා. ඒ වෙනුවෙන් අප හැම කෙනාටම ලොකු වගකීමක් තිබෙනවා. ගැහැනියකට සැලකීම කියන්නේ මොකක්ද? කාන්තාව කියන්නේ, "ගැහැනු, පිරිමි" කියන අර්ථයෙන් ගන්නා එකම නොවෙයි. එයින් කියන්නේ මේ සමාජය තුළ ජීවත් වන පුරවැසියෙකු හැටියට "ගැහැනු ජීවියා" භාර ගන්න කියන එකයි. ඒ ජීවියාට තිබෙන අනන්‍යතාව, අනෙකුත් ජීවීන්ට තිබෙන අනන්‍යතාවට වඩා අඩු තැනක්; ලඝු තැනක් නොවෙයි. ඒක නිසා ස්වාධීන පුරවැසියෙකු හැටියට "ගැහැනිය" කියන මිනිස් සත්ත්වයා භාර ගන්න පුළුවන් සමාජයක් වෙනුවෙන් ආකල්පමය සංවර්ධනයක්, ඒ වාගේම ව්‍යුහාත්මක සහ නෛතික සංවර්ධනයක් සහිත රටක් අපි අනිවාර්යයෙන් ගොඩ නඟනවා කියන සහතිකය ලබා දෙමින් මම නවතිනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩි 29ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.21]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙය ඉතාම වැදගත් මාතෘකාවක් වාගේම සංවේදී මාතෘකාවක්. ජන සමාජයේ කාන්තාව, දරුවා, දැරිය, ළමයින් ගැන සාකච්ඡාවට භාජන වන මේ මොහොතේ විශේෂයෙන්ම ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් සියලු කාන්තාවන්ටත්, ඒ වාගේම කාන්තා අයිතීන් නිර්ව්‍යාජව සුරක්ෂා කරන්නට කැප වන සියලුදෙනාටත් මම අද සුබ ජාත්‍යන්තර කාන්තා දිනයක් ප්‍රාර්ථනා කරනවා.

විශේෂයෙන්ම සමාජයේ දරුවන්, මව්වරුන්, කාන්තාවන් දිහා බලන කොට පෙනෙනවා, ආහාර උද්ධමනය නිසා, මන්දපෝෂණය නිසා, දිළිඳුභාවය නිසා නිර්මාණය වන ඉතාම පීඩනකාරී, අහිතකාරී ආර්ථික, සමාජීය විෂම චක්‍රය තුළ කාන්තාව, දරුවා, දැරිය සදාකාලික සිරකරුවෙකු බවට පත් වන බව. උද්ධමන වේගය වර්ධනය වීම තුළ සහල් වේවා, පොල් වේවා, ලුණු වේවා මිනිස් ජීවිතය පවත්වා ගෙන යෑමට වුවමනා කරන ඒ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කරන්නට අවශ්‍ය පහසුකම් මවට, දරුවාට අහිමි වන කොට ඒක මුළු රටටම බලපාන විෂම චක්‍රයකට යොමු වන බව අපි හැමෝම දන්නවා. මාතෘ මන්දපෝෂණය පමණක් නොවෙයි, ළමා මන්දපෝෂණය ගැනත් අපි අවධානය යොමු කරන්නට ඕනෑ. දරුවාගේ මන්දපෝෂණ තත්ත්වය තුළ ඒ මන්දපෝෂිත දරුවා වැඩිහිටියෙකු බවට පත් වන කොට, මවක හැටියටත් මන්දපෝෂණයෙන් පෙළෙන කොට, ඇයගෙන් බිහි වන දරුවාත් මන්දපෝෂිත දරුවෙක් කියන එක අපි අවබෝධ කර ගන්නට ඕනෑ. ඒ නිසා මේ චක්‍රය පටන් ගන්නේ මාතෘත්වයෙන්ම පමණක් නොවෙයි. මෙය ළදරුවාත්, මවත් මුහුණ දෙන බරපතළ අභියෝගයක්.

ශ්‍රී ලංකාවේ මන්දපෝෂණ තත්ත්වය ගැන සොයා බලන්න නවවැනි පාර්ලිමේන්තුවේ -2024දී- විශේෂ කාරක සභාවක් පත් කළා. එහි රැස්වීම් මාලාවක් පැවැත්වුණා. මේ තිබෙන්නේ එහි වාර්තාව. මේ වාර්තාව තුළ විශේෂයෙන්ම මන්දපෝෂණයට මුල් වුණු දරුවන්, අඩු බර දරුවන්, අඩු උපත් බර දරුවන්, කෘෂවීම, මිටිවීම, අධික බර දරුවන්, නීරක්තිය නොහොත් රක්තහීනතාව, මව්වරුන්ගේ ශරීර ස්කන්ධ දර්ශකය -Body Mass Index- අඩු වීම, ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණවත් නොවීම -micronutrient deficiency- යනාදි කරුණු කාරණා පිළිබඳව සඳහන් වනවා. මේ හැම අතකින්ම අපේ රටේ දරු පරපුර ඒ වාගේම මව් පරපුර අභියෝග රැසකට මුහුණ දෙනවා. මේ අභියෝගවලින් ගොඩ එන්නට නම් ඒ විවිධ ක්ෂේත්‍ර ඒකාබද්ධ කර ගත් ඒකාග්‍රතාවකින් යුක්ත වූ ජාතික වැඩ පිළිවෙළක් අතිශයින් වැදගත්.

එක්සත් ජාතීන්ගේ සංවිධානය -විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන- වාර්තා ඉදිරිපත් කරමින් බහුමාන අවදානම් තත්ත්වයන් ගැන කථා කර තිබෙනවා; බහුමාන අවදානම් දර්ශකයක් ගැන කථා කර තිබෙනවා. අපේ රටේ පුද්ගලයන් 10 දෙනෙකුගෙන්, 6 දෙනෙක් බහුවිධ අවදානමට - multidimensional vulnerabilitiesවලට - ලක් වනවා කියන කාරණාව කියා තිබෙනවා. මේ කරුණු කාරණා තුළ අපි හැමෝම දන්නවා, සමාජයේ වැඩිම අවදානමක් තිබෙන කොට්ඨාසය මව, දරුවා, දැරිය, කාන්තාව බව. මෙවන් තත්ත්වයන් තුළ වැඩිම පීඩනයකට ලක් වන්නේත් ඔන්න ඔය කොට්ඨාස. ආපදාවලදී වේවා, වසංගතවලදී වේවා, නිවසේදී වේවා, වැඩ බිමේදී වේවා, නිවසේ සිට වැඩ බිමට යන කොට එන කොට වේවා, මේ හැම අවස්ථාවකදීම කාන්තාව වාගේම දරුවා, දැරිය බරපතළ ඛේදවාචකයකට මුහුණ දෙමින් සිටින බව අපි පිළිගන්නට ඕනෑ.

ඒ පිළිබඳ ජාතික වැඩ පිළිවෙළක් අවශ්‍යයි, සර්ව පාක්ෂික වැඩ පිළිවෙළක් අවශ්‍යයි, සර්ව පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මේකට multistakeholder approach එකක් තිබෙන්නට ඕනෑ. මෙය නිර්දේශපාලනීකරණයට ලක් වෙන්නට ඕනෑ. මන්දපෝෂණය දුරලන්නට, දරුවන්ගේ අයිතිය, කාන්තාවන්ගේ අයිතිය සුරක්ෂා කරන්නට කළ හැකි සියලු කාර්යභාරය ඉෂ්ට කරන්නට අපි හැමෝම එක්සිත්ව, එක්සත්ව කටයුතු කරමුයි කියා මේ අවස්ථාවේදී මම යෝජනා කර සිටිනවා.

ගරු සභානායකතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ UN Women කියලා සංවිධානයක් තිබෙනවා. Lionel Wendt Art Centre එකේ ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ඔවුන් ඉතාම වැදගත් ප්‍රදර්ශනාත්මක ඉදිරිපත් කිරීමක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම කාන්තා අයිතීන් පිළිබඳව, කාන්තා සුබසාධනයේදී මුහුණ දෙන ගැටලු පිළිබඳව, ඒ වාගේම ළමුන් පිළිබඳව යම් යම් ඉදිරිපත් කිරීම් එතැන තිබෙනවා. මට වාසනාව ලැබුණා ඊයේ සවස ගිහිල්ලා ඒක බලන්න. එතැනින් උපුටා ගත්ත කරුණු කිහිපයක් මම අද මේ සභාවේ ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. අපේ රටේ ගතානුගතික අදහස් ඇති සේවායෝජකයන් ඉන්නවා. ඒ අය කාන්තාවන් රැකියාවලට බඳවා ගන්නේ බොහොම අඩුවෙන්. සේවා ස්ථානයේ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර නිසා එක් සේවකයෙකුට සාමාන්‍යයෙන් වසරකට වැඩ කරන දින 6ක් අහිමි වෙනවා. මේ සමීක්ෂණය කරලා තිබෙන්නේ ශ්‍රී ලංකාවේ සමාගම් 9ක් තුළ. ඒ නිසා අහිමි වන අවම පිරිවැය ඩොලර් මිලියන 1.7ක්. පිරිමින්ගෙන් සියයට 75ක්ම කාන්තා සේවකයන්ට එරෙහිව අවිඥානික පක්ෂග්‍රාහිත්වයක් දරන අතර, ඔවුන් කාන්තාවන් බඳවා ගැනීමට ඇති ඉඩ අඩු කරනවා. පවතින කම්කරු නීතිවලින් ගෘහ සේවිකාවන් ආවරණය වන්නේ නැහැ. ඒ නිසා ස්වාධීන රැකවරණ සේවකයන් සඳහා අවම වැටුපක් ඒ ගෘහ සේවයේ යෙදී සිටින කාන්තාවන්ට බලාපොරොත්තු වෙන්න බැහැ.

උපාධි අපේක්ෂකයන් ලෙස බඳවා ගැනීම්වලදී සියයට 64.8ක් කාන්තාවන්. හැබැයි, ශ්‍රම බලකායේ කාන්තා නියෝජනය සියයට 32යි. ලැප්ටොප් පරිගණකයක් හෝ ස්මාර්ට් ජංගම දුරකථනයක් තනිවම භාවිත කරන්නේ කෙසේදැයි දන්නේ කාන්තාවන් සහ ගැහැනු ළමයින්ගෙන් සියයට 54ක් පමණයි. ඒ කියන්නේ, ඩිජිටල් අධ්‍යාපනයට ප්‍රවේශය - access to digital education - ගැහැනු ළමයින්ට වඩා පිරිමි දරුවන්ට තිබෙනවා.

අපි අධිකරණ ක්ෂේත්‍රය දෙස පොඩ්ඩක් බලමු. අභියාචනාධිකරණය දෙස බලමු. අභියාචනාධිකරණ විනිසුරුවන් 15දෙනාගෙන් එක් කෙනෙක්වත් නැහැ කාන්තා විනිසුරුවරියක්. ශ්‍රේෂ්ඨාධිකරණය දෙස බලමු. ගරු අග්‍ර විනිශ්චයකාරතුමිය ඇතුළත්ව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් 17දෙනාගෙන් තුන්දෙනෙක් කාන්තාවන්. 2019දී කළමනාකරණ තනතුරුවල කාන්තා නියෝජනය සියයට 37යි. ප්‍රධාන විධායක නිලධාරී තනතුරුවල කාන්තා නියෝජනය සියයට 16යි. අපි සතුටු වෙනවා, මෙවර පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය ඉතාම ඉහළ තත්ත්වයකට ඇවිල්ලා තිබෙන එක ගැන. අපි උත්සාහ දරන්නට ඕනෑ ඒ ප්‍රතිශතය තවත් ඉහළට ගෙනයන්නට.

STEM ක්ෂේත්‍රවල වැඩ කරන කාන්තා ප්‍රතිශතය ගනිමු. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ඉංජිනේරු උපාධි සිසුන්ගෙන් සියයට 25ක් පමණයි කාන්තාවන්. අපි ජනමාධ්‍ය ක්ෂේත්‍රය ගත්තොත්, පුවත් ලිපි සියයට 76කට වැඩි ප්‍රමාණයක් සහ රූපවලින් සියයට 85කට වැඩි ප්‍රමාණයක් පිරිමි ක්‍රීඩා නිරූපකයන් සඳහා කැප වෙනවා.

ක්‍රීඩක නිරූපක රූපවලින් ස්ත්‍රීත්වය ඉස්මතු කරන්නේ සියයට 12කින් පමණයි. විශ්ලේෂණය කරන ලද වෙළෙඳ දැන්වීම්වලින් සියයට 51ක් තුළ ශ්‍රී ලාංකික කාන්තාවන් පිරිමි බලය සහ දැනුම මත යැපෙන අසරණයන් ලෙස නිරූපණය කරනවා.

ඒ වාගේම ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි අපරාධවලින් වාර්තා වන්නේ සියයට 4යි. ශ්‍රී ලංකාවේ කාන්තාව සමීප සහකරුවෙකු වෙතින් කායික හිංසනයට මුහුණ දීමට තිබෙන ඉඩ දෙගුණයකට වඩා වැඩියි. වාර්තා වූ ස්ත්‍රී දූෂණවලින් සියයට 87ක විඳීදිනයන් වූයේ අවුරුදු 16ට අඩු ගැහැනු ළමයි. 2022 වසරේ වාර්තා වූ ස්ත්‍රී දූෂණ සිද්ධි ගණන 1,986යි. වාර්තා වූ ඒවා. වාර්තා නොවූ ඒවා හුඟක් තිබෙන්න පුළුවන්. ඒ කියන්නේ එක් දිනක සාමාන්‍ය අගය 5යි. අපි දන්නවා, ජාත්‍යන්තර ප්‍රඥප්ති තිබෙනවා, ජාත්‍යන්තර අවබෝධතා තිබෙනවා,ජාත්‍යන්තර එකඟතා තිබෙනවා, ඒවා පිළිබඳව සමුළු පවත්වනවා, workshops පවත්වනවා. Seven-star hotelsවල තමයි ඒ ඔක්කෝම කරන්නේ. හැබැයි අපි හදවතට තට්ටු කරලා අහන්න ඕනෑ, ඒ කියන දේවල්වලින් කොච්චරක් ක්‍රියාත්මක කෙරෙනවාද කියලා. මේ සඳහා පහත සඳහන් සම්මුති සහ යෝජනා තිබෙනවා. ඒවා තමයි, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙන්කොට සැලකීම් පිටුදැකීම පිළිබඳ සම්මුතිය - CEDAW එක- 1979. බීජිං ප්‍රකාශය - 1995. කාන්තාවන්ගේ සාමය සහ ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා- 2000. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හා ඒවාට එරෙහිව සටන් කිරීම - 2011. තිරසර සංවර්ධන ඉලක්ක - 2015. ඒ වාගේම ළමුන් සඳහා වන ළමා අයිතිවාසිකම් සම්මුතිය - 1989. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ විකල්ප සන්ධාන පත්‍රය-2000. ළමුන් රැකියාවල යෙදවීමට අදාළ, වඩාත් අයහපත් ආකාරය පිළිබඳ සම්මුතිය -1999. අවම වයස් සීමාව පිළිබඳ සම්මුතිය-1973. ඒ වාගේම ළමුන් ආරක්ෂා කිරීම පිළිබඳ හේග් සම්මුතිය, පැලර්මුවර් සන්ධාන පත්‍රය ආදී වශයෙන් ලොකු ලොකු එකඟතා තිබෙනවා; අවබෝධතා තිබෙනවා. නමුත් අපි හදවතට තට්ටු කරලා අහන්න ඕනෑ, ඒ ඇති කර ගත්ත

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අවබෝධතා, ඒ එකඟ වූ ප්‍රඥප්ති, කොන්දේසි කොපමණ ප්‍රමාණයක් රටේ නීතිය බවට පරිවර්තනය කරලා තිබෙනවාද කියලා.

නීතියේ සමානාත්මතාව පිළිබඳව තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.(1) අනු ව්‍යවස්ථාවේ. වෙන්කොට නොසැලකීම ගැන තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.(2) අනු ව්‍යවස්ථාවේ. අපි යෝජනා කරනවා මේ අවස්ථාවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා Fundamental Rights Chapter එකේ විශේෂිතව, specifically, ළමා අයිතිවාසිකම් - children's rights - සහ කාන්තා අයිතිවාසිකම් -women's rights- අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතුයි කියලා. එපමණක් නොවෙයි. අපේ රටේ කාන්තා අයිතීන් ආරක්ෂා කරන්නට, 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත, 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය පනත, 1956 අංක 47 දරන තරුණ පුද්ගලයන් සහ ළමුන් සේවා නියුක්ති පනත තිබෙනවා. ඒ වාගේම ජාතික කාන්තා කමිටු පිහිටුවා තිබෙනවා. ඒ වාගේම 1998 අංක 50 දරන ජාතික ළමාරක්ෂණ අධිකාරි පනත, 1939 අංක 48 දරන ළමුන් සහ තරුණ පුද්ගලයන් පිළිබඳ ආඥා පනත, 1956 අංක 47 දරන කාන්තාවන්, තරුණ පුද්ගලයන් සහ ළමුන් සේවා නියුක්ති පනත, 1943 අංක 75 දරන අනිවාර්ය අධ්‍යාපන ආඥා පනත තිබෙනවා.

ඇත්ත වශයෙන්ම අපි බලාපොරොත්තු වෙන රැකවරණය, ආරක්ෂාව, ශක්තිය කාන්තාවන් සහ ළමුන් කියන කොටියාස දෙකටම මේවායින් ඉෂ්ට සිද්ධ වෙනවාද කියන එක ගැන අපි සොයලා බලන්නට ඕනෑ; අපි ප්‍රශ්න කරන්නට ඕනෑ. අපේ පූර්ණ අවධානය ඒ වෙනුවෙන් යොමු කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, අපි මේ ගැටලු ගැන කථා කළා; මේ ප්‍රශ්න ගැන කථා කළා. ඒ ගැටලුවල, ප්‍රශ්නවලට අපි මේ අවස්ථාවේ විසඳුම් යෝජනා කරනවා; උත්තර යෝජනා කරනවා. කාන්තා අයිතිවාසිකම් පිළිබඳව, ළමා අයිතිවාසිකම් පිළිබඳව අපි රටක් හැටියට එකඟ වෙලා තිබෙන ඒ අවබෝධතා, ඒ ගිවිසුම්, ඒ එකඟතා, ඒ ප්‍රඥප්ති අපේ රටේ නීතිය තුළ ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න ඕනෑ කියලා අපි යෝජනා කරනවා. නැවතත් මම ප්‍රකාශ කරනවා, මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට - Fundamental Rights Chapter එකට - කාන්තා අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම් අනිවාර්යයෙන්ම විශේෂිතව ඇතුළත් කරන්නට කටයුතු කරන්න ඕනෑ කියලා. There should be a specific mentioning of children's rights and women's rights.

අපේ රටට අවශ්‍යයි, ජාතික පෝෂණ ප්‍රතිපත්තියක්. ළදරුවන්ගේ, ළමුන්ගේ, කුඩා දූ දරුවන්ගේ, මව්වරුන්ගේ මන්ද පෝෂණ තත්ත්වය නැති කර දමන්නට, හොඳ පෝෂණ මට්ටමකට අපේ රටේ දරු පරපුර, මව් පරපුර ළඟා කරවන්නට, හොඳ ඉලක්ක කරා ළඟා කරවන්නට ඒ ජාතික පෝෂණ ප්‍රතිපත්තිය නිර්මාණය කරන්නට ඕනෑ.

ඒ වාගේම අපි යෝජනාවක් කරනවා, මාතෘ නිවාඩු ප්‍රතිලාභ ගැන. ප්‍රසූත දීමනා කියලා තවත් විටෙක සඳහන් කරනවා. ඇත්ත වශයෙන්ම රජයේ අනුග්‍රහයෙන් රාජ්‍ය ක්ෂේත්‍රයටත්, පෞද්ගලික ක්ෂේත්‍රයටත් සති 12ක කාලයක් ඒ දීමනාව ලබා දෙන්න පුළුවන්. මහා ලොකු පිරිවැයක් වැය වෙන්නේ නැහැ. රුපියල් බිලියන 7-10 අතර මුදලක් තමයි ඒකට වැය වෙන්නේ. ඇත්ත වශයෙන්ම ඒ ක්‍රියාව තුළ අපට පුළුවන්කම ලැබෙනවා, ශ්‍රම බලකාය සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය වර්ධනය කරන්න. ඒක දැනට තිබෙන්නේ සියයට 32ක වාගේ මට්ටමක. අපි ඒක සියයට 45ක, 47ක මට්ටමක් දක්වා ගෙන යන්නට කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා තිබෙන එක් බාධාවක් හැටියට හඳුනාගෙන තිබෙනවා, ප්‍රසූත කාලය තුළ නිවාඩු දීමනා ලබා දීමට සමහර ආයතන අපොහොසත්වීම තුළ කාන්තා පාර්ශ්වය රැකියාවලට සම්බන්ධ කර ගැනීමට සමහර ආයතන මැළිකමක් දැක්වීම.

මම විශේෂයෙන් යෝජනා කරනවා, මේ රටේ ළමුන් වෙනුවෙන්; දරු පරපුර වෙනුවෙන් වෙනමත්, කාන්තා පරපුර වෙනුවෙන් වෙනමත් විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකා දෙකක් ප්‍රකාශයට පත් කරන්නය කියලා. එකක් ළමුන් වෙනුවෙන්; ළදරුවන් වෙනුවෙන්; දරුවන් වෙනුවෙන්, අනෙක කාන්තාවන් වෙනුවෙන් ප්‍රකාශයට පත් කරලා, ඒක ක්‍රියාවට නංවන්න කියලා. "Clean Sri Lanka" වැඩසටහනට ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කරලා තිබෙනවා අපි දැක්කා. රට පිරිසිදු කරන්නට; රටේ පරිසරය ශක්තිමත් කරන්නට; ඒ කර්තව්‍ය ඉෂ්ට කිරීමට. අපි එය නරකක් හැටියට දකින්නේ නැහැ. නමුත් එහි ක්‍රියාකාරකම් පිළිබඳව අපට යම් යම් විවේචන තිබෙනවා. ඒවා ගැන පසුව කථා කරන්න පුළුවන්. නමුත් Clean Sri Lanka ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කරන්නට පුළුවන් නම්, මේ රටේ දරු පරපුර වෙනුවෙනුත්; ළමා පරපුර වෙනුවෙනුත්; ළදරු පරපුර වෙනුවෙනුත්, දරුවා කේන්ද්‍ර කරගෙන විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම අමාරු කර්තව්‍යයක් නොවෙයි කියලා අපි විශ්වාස කරනවා.

කාන්තාව කේන්ද්‍ර කරගෙන, කාන්තා අයිතීන් සුරක්ෂා කිරීම කේන්ද්‍ර කරගෙන, කාන්තා සංවර්ධනය, සුභසාධනය කේන්ද්‍ර කරගෙන විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවීම අමාරු දෙයක් නොවෙයි. මොනවාටද ඒවා පිහිටුවන්නේ? මේ සභාවේදී බොහෝ දෙනෙකුගෙන් මතු වුණු කාරණාවක් තමයි, තීන්දු තීරණ ගැනීමේදී ඒකාග්‍රතාවක් නැහැ කියන එක. හුදෙකලා තීන්දු තීරණ ගැනීමේ ක්‍රමවේදය කාලයක් පුරාවට ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒකට කියනවා, "individualistic *ad hoc* decision-making" කියලා. It is good to have the whole decision-making process integrated; ඒකාග්‍රතාවකින් යුක්ත වූ තීන්දු තීරණ ගැනීමේ වැඩ පිළිවෙළකට යොමු වීම ඉතාම වැදගත්. මොකද, මේක multi-stakeholder approach එකක්; පාර්ශ්වකරුවන් - stakeholdersලා - ගණනාවක් ඉන්නවා. ඒ සියලු පාර්ශ්වකරුවන් එකට එකතු කරගෙන මේ ජනාධිපති කාර්ය සාධක බලකායන් දෙක හරහා, - එකක් දරුවන්ට, එකක් මවුවරුන්ට - නිශ්චිත කාලවානුවක් සහිත මාර්ග සිතියමක්, ඉලක්ක සහිත මාර්ග සිතියමක් අනුගමනය කරන්නට අපට පුළුවන්. Key Performance Indicators එක්ක, timeline එක්ක රටක් හැටියට මේ ඉලක්ක කරා යන්න අපට පුළුවන්.

දැන් මේ ගරු සභාවේදී කියවුණා, මෙව්වර ප්‍රමාණයක් මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා කියලා. ඉතින්, ඒක හොඳයි. මේ මුදල් යොදවලා අවසානයේ අපි සපුරා ගත්ත ඉලක්ක quantitative විධියටත් අපි බලන්නට ඕනෑ, qualitative විධියටත් බලන්න ඕනෑ. අපි මේක සංඛ්‍යාත්මකවත් බලන්නට ඕනෑ, ගුණාත්මකවත් බලන්නට ඕනෑ. ඒ වාගේම මෙව්වර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා සපුරා ගත්ත ඉලක්ක පිළිබඳව හොඳ evaluation එකකුත් තිබෙන්නට ඕනෑ. ඒ වාගේම මම මේ අවස්ථාවේ මේ කාරණය මතක් කරන්නට කැමැතියි. මේ කාර්ය සාධක බලකායන් දෙකම යහපත්, ප්‍රබුද්ධ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්නට ඉවහල් වෙනවා.

අද සමාජයේ තිබෙන ක්ෂුද්‍ර මූල්‍ය ණය මර උගුල -microfinance debt trap එක, debt trap එකක් විතරක් නොවෙයි, debt death trap එකක්. අද ක්ෂුද්‍ර මූල්‍ය ණය මර උගුලක් නිර්මාණය වෙලා තිබෙනවා. මේකට යොමු වෙලා

තිබෙන බහුතරයක් අපේ කාන්තා පාර්ශ්වය. මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය මර උගුලෙන් අපේ රටේ කාන්තා පාර්ශ්වය මුදා ගන්නට යම් කිසි පැහැදිලි වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

ඒවාගේම කාන්තා කේන්ද්‍රීය ගෘහ මූලික ඒකක තිබෙනවා. කාන්තා මූලික ගෘහ ඒකක -women-headed households- කියලා තිබෙනවා. පසුගිය කාල වකවානුව පුරාවට අපේ රටේ සිදු වුණු විවිධ ව්‍යසන නිසා, සමාජයීය, දේශපාලන යනාදි වශයෙන් ඇතිවූ යුදමය තත්ත්වයන් නිසා කාන්තා මූලික පවුල් - women-headed households - විශාල ප්‍රමාණයක් බිහි වී තිබෙනවා. මේ අය වෙනුවෙන් විශේෂිත වූ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට අවශ්‍යව තිබෙනවා. අපි ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනකොට ඉදිරිපත් කළා, "One million new business start-ups and one million new modern entrepreneurs" කියන සංකල්පය. දසලක්ෂයක් නව ව්‍යවසායකයන්, දසලක්ෂයක් නව ව්‍යාපාර ව්‍යවසායක ආරම්භ කිරීමේ වැඩසටහන. කාන්තාව කේන්ද්‍ර කරගෙනත් එවන් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අද යුගයේ අවශ්‍යතාව බවට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම කාන්තාව මුහුණ දෙන සෞඛ්‍යමය ගැටලු තිබෙනවා. අපි ඒකට කියනවා, ආර්තව දරිද්‍රතාව - period poverty - කියලා. මේක වැඩි වශයෙන් සමාජයේ කථා බහට ලක් නොවුණු මාතෘකාවක්. It was a stigmatized issue. නමුත් මේ කාරණාව ගැන කථා කරලා අපි ගත්ත ආරම්භය තුළ, අපි දක්වපු උනන්දුව තුළ යම් යම් වැඩ පිළිවෙළවල්, පුංචි පුංචි වැඩ පිළිවෙළවල් ආරම්භ වෙලා තිබෙනවා. මම මේ කාරණය බොහොම පැහැදිලිව කියන්න කැමතියි. ස්කොට්ලන්තයෙත් කෙරෙනවා නම්, නවසීලන්තයෙත් කෙරෙනවා නම්, අපි මේක සියලුම කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වෙන universal වැඩසටහනක් බවට පත් කරන්නට ඕනෑ.

ඒ ආර්තව දරිද්‍රතාව කියන ගැටලුවට අවධානය යොමු කරලා විශේෂයෙන්ම ඒ ප්‍රශ්නය තුළ නිර්මාණය වන ගැබ්ගෙල පිළිකාව, වකුගඩු ආසාදනය සහ ඒ තුළින් සිදු වන විවිධ හානි පිළිබඳව හිතා බලා එම ගැටලු විසඳීමටත් අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. හැකි නම් ආර්තව දරිද්‍රතාව කියන ප්‍රශ්නය විසඳීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දී රටක් හැටියට අපි ලොවටම ආදර්ශවත් වන ආකාරයට අපේ වැඩ පිළිවෙළ දියත් කිරීම සුදුසුයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමැතියි.

මේ සභාවේ කියනවා අපට ඇහුණා, පෙර පාසල් පද්ධතියට ලොකු මුදලක් වෙන් කර තිබෙනවා කියලා. මම අහන්න කැමැතියි, ඒ අනුග්‍රහය ලැබෙන්නේ සමස්ත පෙර පාසල් පද්ධතියටද, එහෙම නැත්නම් රජය මඟින් පාලනය කරනු ලබන පෙර පාසල්වලට පමණක්ද කියා. සංඛ්‍යා ලේඛන බැලුවාම අපට පෙනී යනවා, අපේ රට තුළ පෙර පාසල් 17,910ක් තිබෙන බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තව විනාඩි 02ක කාලයක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතුමාට තව විනාඩි 05ක කාලයක් ලබා දෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අපේ රට තුළ පෙර පාසල් 17,910ක් තිබෙනවා. අපේ රටේ 279,000ක් පමණ වන දු-දරුවන් පිරිසක් පෙර පාසල් අධ්‍යාපනය ලබනවා. මේ සභාවේ සිටින ගරු මන්ත්‍රීවරුන් සියලුදෙනාම දන්නවා, තමතමන්ගේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල, නගර සභා බල ප්‍රදේශවල තිබෙන පෙර පාසල්වලින් කීයක්ද රජය යටතට එන්නේ කියා. පෙර පාසල්වලට ප්‍රතිපාදන වැඩියෙන් ලබා දෙන එක හොඳ දෙයක්, ඒක නරකයි කියලා අපි කියන්නේ නැහැ. නමුත්, අපේ රටේ තිබෙන අවිධිමත් පෙර පාසල් ක්‍රමවේදය තුළ මේ පෙර පාසල් 17,910ම ශක්තිමත් කරන වැඩසටහනකට ප්‍රවේශ වෙන්නට ඕනෑ. පෙර පාසල් ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වෙන්නේ ඉතාම අවිධිමත් අධ්‍යාපනයක්. එය විධිමත් කරන්නට ඕනෑ. මේ සම්බන්ධව පළාත් සභා මට්ටමින් විවිධ ප්‍රඥප්ති ක්‍රියාත්මක වෙනවා. නමුත්, ඒවා තුළ කිසිම ඒකාග්‍රතාවක් නැහැ.

ඒ වාගේම අප මතක තබා ගත යුතු තවත් කාරණයක් තිබෙනවා. අපි අවබෝධ කරගෙන තිබෙන ආකාරයට පෙර පාසල් අධ්‍යාපනය යටතට ගැනෙන්නේ වයස අවුරුදු 3ත්-5ත් අතර වයසේ සිටින දරුවන්ට ලබා දෙන අධ්‍යාපනයයි. ළමා රෝග විශේෂඥවරුන් කියා තිබෙනවා, දරුවෙකුගේ මොළයේ වර්ධනය අවුරුදු 5 දක්වා සියයට 70ක් සිද්ධ වෙනවා කියා. එතකොට මොළයේ වර්ධනය එහෙම නැත්නම් cognitive development සියයට 70ක් සිදු වන වයස වන අවුරුදු 3ත්-5ත් අතර කාල වකවානුව තුළ අපේ රටේ දරුවන්ට ලබා දෙන අධ්‍යාපනය අවිධිමත්; ක්‍රමවේදයකින් තොරයි. මම හිතන විධියට අග්‍රාමාත්‍යතුමිය යම් උත්සාහයක් දරනවා, ඒක ක්‍රමවත් කරන්නට. අපට ඒ ගැන අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ දීර්ඝව කථා කරන්න පුළුවන්. ඒ වාගේම මම කියන්න කැමැතියි, පෙර පාසල්වලට ලබා දෙන ප්‍රතිලාභය ලැබෙන්නේ ඉතාම කුඩා පෙර පාසල් සංඛ්‍යාවකට බව. මොකද, අපේ රටේ තිබෙන පෙර පාසල්වලින් විශාල සංඛ්‍යාවක් තිබෙන්නේ පෞද්ගලිකව ක්‍රියාත්මක වන පෙර පාසල් විධියටයි.

මම මේ අවස්ථාවේදී සංඛ්‍යාත්මකව තර්කයක් ඉදිරිපත් කරන්නට කැමැතියි. අපට අද ඇසුණා, 76 වසරක ඉතිහාසය තුළ මේ රට පරිහානියට පත් වුණා, මේ රටට සිදු වුණු දෙයක් නැහැ යනාදී කාරණා. මම කැමැතියි, හැමෝම පිළිගන්න දර්ශක තුනක් මේ සභාවට ඉදිරිපත් කරන්න. විශේෂයෙන්ම බලන්න, අපේ රටේ ආයු අපේක්ෂාව පිළිබඳව. මම මුලින්ම කියන්නම්, පුරුෂ පාර්ශ්වය ගැන. 1945-1947 කාල වකවානුව තුළ අපේ රටේ පුරුෂයින්ගේ ආයු අපේක්ෂාව අවුරුදු 46යි. 2021 වර්ෂය වෙනකොට එය අවුරුදු 72ක් වෙලා තිබෙනවා. කාන්තාවන්ගේ ආයු අපේක්ෂාව 1945-1947 කාල වකවානුව තුළ අවුරුදු 44යි. 2021 වර්ෂය වෙනකොට එය අවුරුදු 80ක් වෙලා තිබෙනවා.

එතකොට මේ කාල වකවානුව තුළ ආයු අපේක්ෂාව වර්ධනය වුණේ අපේ රටේ ක්‍රියාත්මක වුණු ඒ සමාජ සුබසාධන රාජ්‍යයේ ධනාත්මක, ගුණාත්මක, හරාත්මක ප්‍රගතිශීලී ක්‍රියාකාරිත්වය මත නොවෙයි ද කියන එක මම අහන්න කැමැතියි. අපේ රට ජාතික සුබ සාධන රාජ්‍යයක්, a national welfare State. ඒ ජාතික සුබසාධන රාජ්‍යය හරහා විවිධ කාල වකවානු තුළ ලබපු දියුණුව නිසා තමයි අවුරුදු 46ක් පමණක් ජීවත් වුණු පිරිමින් අවුරුදු 72ක් දක්වා ජීවත් වෙන්නේ. අවුරුදු 44ක් පමණක් ජීවත් වුණු කාන්තාවන් අද අවුරුදු 80ක් දක්වා ජීවත් වෙන්නේ. මේ විද්‍යාත්මකව ඉදිරිපත් කරන දත්ත සහ සංඛ්‍යා ලේඛනයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

ඊළඟට, අපි ළමා මරණ අනුපාතය ගැන බලමු. 1950 සිට 1955 දක්වා කාලයේදී සජීවී උපත් දහසකට - per 1,000 live births - ළමා මරණ අනුපාතය 103යි. 1950 සිට 1955 කාලයේ 103ට පැවති ළමා මරණ අනුපාතය 2015-2020 කාලය වෙනකොට අඩු වෙලා තිබෙනවා, 6.5ට. ඒ දියුණුව ලැබුවේ අපේ සමාජ සුබසාධන රාජ්‍යයේ විවිධ ක්‍රියාකාරකම් මත සිදු වුණු ධනාත්මක ක්‍රියාවලි නිසායි; නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය කියන සුබසාධන රාජ්‍යය නිසායි. ඉතින් කොහොමද කියන්නේ පසුගිය අවුරුදු 76ක් තුළ සිදු වුණේ පරිහානියක් කියලා. පරිහානියක් සිදු වුණා නම් ජීවිත අපේක්ෂාව - life expectancy - මෙච්චර වැඩි වෙන්නේත් නැහැ, ළමා මරණ අනුපාතයේ මෙහෙම වෙනසක් වෙන්නේත් නැහැ.

ගරු ඇමතිතුමනි, මම තවත් සංඛ්‍යා ලේඛන කිහිපයක් ඔබතුමාට කියන්නම්. මම මේ තොරතුරු කියන්නේ මට දීලා තිබෙන සංඛ්‍යා ලේඛනවලින්. 1930 ගණන්වල මාතෘ මරණ අනුපාතය බලන්න. අනිවාර්යයෙන්ම 2,000කට වැඩියි. සජීවී උපත් ලක්ෂයකට මාතෘ මරණ අනුපාතය - maternal mortality ratio - 2,000කට වැඩියි. ඒ, 1930 ගණන්වල. 1950 ගණන්වල මාතෘ මරණ අනුපාතය 500ත්-600ත් අතර වුණා. 1930 ගණන්වල මාතෘ මරණ අනුපාතය 2,000කට වැඩි වුණාට, 2020 වර්ෂය වන විට ඒ අනුපාතය 29යි. ඒක ප්‍රගතියක් නොවෙයිද? මාතෘ මරණ අනුපාතය අඩුවීම, ළමා මරණ අනුපාතය අඩුවීම, ආයු අපේක්ෂාව වැඩි වීම කියන්නේ අවුරුදු 76ක ශාපයක්ද?

විශේෂයෙන්ම ඒ කරුණුත් සමඟ මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, අපි මේ යෝජනා ඉදිරිපත් කළේ සද්භාවයෙන්, දත්ත කේන්ද්‍රීයව, තොරතුරු කේන්ද්‍රීයව, සාක්ෂි කේන්ද්‍රීයවයි කියන එක. මේ කියපු හැම කාරණාවකටම අපි දත්ත ඉදිරිපත් කරනවා; සාක්ෂි ඉදිරිපත් කරනවා; තොරතුරු ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, ළමා සහ මාතෘ සුරක්ෂිතභාවය සඳහා ගරු මන්ත්‍රීවරුන් 225දෙනාම අත්වැල් බැඳගන්න ඕනෑ බව. මෙය පක්ෂග්‍රාහීත්වයකට ලක් නොවිය යුතු දෙයක්. අපි හැමෝම එක්සිත්ව, එක්සත්ව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න ඕනෑ.

මම ගරු ඇමතිතුමියගේ කථාවේ පුංචි නිවැරදි කිරීමක් කරන්න කැමැතියි. මේ කාරක සභා අවස්ථාවේ කාලසටහන සකස් කරන්නේ විපක්ෂය විසින්. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අද මුළු දවසේම විවාදයක් ලෙස ගෙන යන්න කාලසටහන හැදුවේ අපි හිතාමතාමයි. එහිදී ඔබතුමන්ලාගේ ආශීර්වාදයත් අපි අගය කොට සලකනවා.

ඔබතුමන්ලාත් ඒ මතයේම සිටියා නම් ඒකට අපේ ගෞරවය පළ කර සිටිනවා. මෙක මේ brownie points දමා ගන්න අපියි කළේ, ඔයගොල්ලන් නොකළයි කියන කථාවක් නොවෙයි කියන්නේ. නමුත්, මම ඒ පැහැදිලි කිරීම කරන්න ඕනෑ. Committee Stage එකේදී අපි මේ යෝජනාව ඉදිරිපත් කළා. ඒ සඳහා ඔබතුමන්ලාගේත් ආශීර්වාදය තිබෙන එක සතුටට කරුණක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඔබතුමන්ලාගේ පාර්ශ්වයේ කිහිපදෙනෙක් ඉල්ලීම් කළා, ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් අද උත්සව රැසක් තිබෙන නිසා මේ විවාදය වෙනත් දිනයකට යොමු කරන්න කියලා. නමුත්, අවසානයේ අපි හැමෝම එකඟ වෙලා මේ කර්තව්‍යය ඉෂ්ට කළා. ඒ වැය ශීර්ෂය පිළිබඳ විවාදය මේ කාන්තා දිනය සමරන දිනයේදීම සිදු කිරීම අපි හිතාමතාමයි සිදු කළේ. එයට ඔබතුමන්ලාගේ ආශීර්වාදය දැන් ලැබීමත් හොඳ දෙයක්. ඔන්න ඔය සංකේතය තුළ මේ එකමුතුභාවය යම්කිසි ජාතික ඒකාග්‍රතාවක් බවට පරිවර්තනය කරගෙන, අපේ ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වාගේම ක්‍රියාත්මක කරපු ප්‍රතිපත්තිවල පසු විපරමත් ශක්තිමත්ව කරගෙන යන්නට අපි කටයුතු කරමු. අපේ පැත්තෙන් දරුවන්ගේ, මව්වරුන්ගේ අයිතීන් සුරක්ෂා කරන්නට කටයුතු කරමු.

අපේ ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමාත් ගරු සභාවේ සිටින මේ මොහොතේ මම අවසාන වශයෙන් මේ යෝජනාව කරනවා. අපේ රටේ Fundamental Rights Chapter එක ලියලා තිබෙන්නේ බටහිර කේන්ද්‍රීය දෘෂ්ටි කෝණයකින් බලලා. ඒකේ තිබෙන්නේ UN සිවිල් සහ දේශපාලන ප්‍රඥප්තිය, International Covenant on Civil and Political Rights. හැබැයි, අපේ FR Chapter එක අමතක කරලා තිබෙනවා, economic rights, social rights, cultural rights, religious rights, educational rights and health rights. ඒ කියන්නේ ඔබතුමා දන්නවා, International Covenant on Economic, Social and Cultural Rights - ICESCR - කියලා ප්‍රඥප්තියක්, covenant එකක් තිබෙන බව. අපේ පූර්ණ සහයෝගය අපි ලබා දෙනවා. මේ Fundamental Rights Chapter එක පුළුල් වෙන්න ඕනෑ. ආර්ථික, සමාජයීය, සංස්කෘතික, ආගමික, අධ්‍යාපනික, සෞඛ්‍යමය අයිතීන් සුරක්ෂා කරන්නටත් අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. විශේෂයෙන්ම ළමා අයිතීන් - children's rights - සහ කාන්තා අයිතීන් මේ Fundamental Rights Chapter එකේ වෙනමම සඳහන් කිරීම අතිශයින්ම වැදගත්. මොකද, රටේ උත්තරීතර නීතිය හරහා අපේ දරුවන්ටත්, මව්වරුන්ටත්, කාන්තාවන්ටත් දැවැන්ත රැකවරණයක් ලැබෙනවා කියන එක ප්‍රකාශ කරමින් මගේ අදහස් ඉදිරිපත් කිරීම අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඊළඟට, ගරු අගමැතිතුමිය. ඔබතුමියට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[මධ්‍යාහ්න 12.00]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඇත්තටම මට මේ වෙලාවේ මතක් වෙනවා, පසුගිය අවුරුද්දේ මාර්තු මස 08වැනි දා. මේ ගරු සභාවේ ඉන්න සහෝදරියන් බොහෝ ප්‍රමාණයකට සහ තව විශාල පිරිසකට එදා පොල්දූවේදී වතුර ප්‍රහාරයක් එල්ල වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියටත් ඒ ගැන මතක ඇති. මොකද, ඔබතුමියත් ඒ අවස්ථාවේදී එතැන හිටියා. එලෙස වතුර ප්‍රහාරයකට හසු වෙලා තමයි මට එදා පාර්ලිමේන්තුවට එන්න සිදු වුණේ. එවකට තිබුණු ආණ්ඩුව අපට විරුද්ධව නඩුත් දැම්මා, ඒ අවස්ථාවේ මල් පෝච්චි පාගලා කියලා. ගරු අධිකරණ ඇමතිතුමනි, මම හිතන්නේ තවම ඒ නඩුව අහනවා. මම අගමැති වුණාට පසුවත් ඒ සම්බන්ධයෙන් මගෙන් කටඋත්තරත් ගත්තා. මම හිතන්නේ මේ ගරු සභාවේ ඉන්න අපේ මන්ත්‍රීවරියන් ගණනාවකගෙන්ම කටඋත්තර ගත්තා, මල් පෝච්චි පෑගුවා කියන වරදට. කමක් නැහැ. ඒ අරගළ හරහා තමයි අපි බොහෝදෙනෙක් මේ ගරු සභාවට ඇවිල්ලා තිබෙන්නේ. ඒ ගැන මේ අවස්ථාවේදී මම මතක් කරනවා. ඒ වාගේම මම සතුටු වෙනවා, අපි කාලයක් තිස්සේ පෙනී හිටපු දේවල් හරහා අපට මේ ගරු සභාවට ඇවිල්ලා මේ ගැන කථා කරන්න හැකියාව ලැබීම පිළිබඳව.

අපේ ගරු අමාත්‍යතුමිය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරනකොට කිව්වා, ඒක විශාල සංකල්පයක් කියලා. එතුමිය කිව්ව කාරණය හරියටම හරි. ඒ විශාල සංකල්පය තුළ ඉඳගෙන ඒවා ක්‍රියාත්මක කරනකොට අපට යම් යම් දේවල් දිහා වියුක්තව බලන්න බැහැ. කාන්තා අයිතිවාසිකම් ඇතුළු ඒ සියලුම අයිතිවාසිකම් ගැන කථා කරනකොට අපි intersectionality කියන එක ගැනත් කථා කරනවා. ගැහැනියක් වීම තුළින්ම නොවෙයි සමාජය තුළ අපට අසාධාරණ සිද්ධ වෙන්නේ. ඒ ගැහැනියගේ පන්තිය, ආගම, ජාතිය, කථා කරන භාෂාව, කුලය ආදී ඒ සියලුම දේවල් හරහා තමයි අපි සමාජය තුළ ස්ථානගත - position - වෙන්නේ. ඒ හරහා තමයි අපට ලැබෙන අවස්ථා - opportunities - සහ සම්පත්වලට තිබෙන ප්‍රවේශය තීරණය වෙන්නේ.

එම නිසා ඒක සංකීර්ණ මාතෘකාවක්. එය සරලව ගත්තොත් ගැහැනු, පිරිමි බෙදීමක් ගැන සාකච්ඡාවක් නොවෙයි. එම නිසා තමයි අපි මේ ගැන කථා කරනකොට හැම වෙලාවේදීම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සම්බන්ධතා ගැන කථා කරන්නේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හරහා සමාජය සංවිධාන වෙලා තිබෙන විධියත්, සමාජ සම්බන්ධතා සංවිධානය වෙලා තිබෙන විධියත් තුළින් තමයි ඒ අසමානතාවත්, අසාධාරණත්වයත් සමාජය තුළ ක්‍රියාත්මක වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 76 වසරක ශාපයක් ගැන අපි කථා කරනවා. එහිදී අපි කථා කරන්නේ, ඒ අවුරුදු 76 තුළම මේ රට තුළ වෙච්ච සියලු දේ ගැනම නොවෙයි. ඒක පැහැදිලිවම අපි තේරුම් ගන්න ඕනෑ. 76 වසරක ශාපය කියලා අපි විශේෂයෙන්ම කථා කරන්නේ දේශපාලන ශාපයක් ගැන. එහෙම නැතුව මේ රටේ ජනතාව කරපු කියපු දේවල් තුළින් මේ රටේ ගොඩනැඟුණු දේවල්, ලෝකය වෙනස් වීමත් සමඟ රට තුළ ඇති වුණු වෙනස්කම්, සංවර්ධනය වාගේ දේවල් අපි නොතකා නොවෙයි කටයුතු කරන්නේ. අපි 76 වසරක දේශපාලන ශාපයක් ගැනයි කථා කරන්නේ. ඔබතුමිය දන්නවා, අද වනකොටත් ලංකාවේ ස්ත්‍රීන් ලෝකයත් එක්ක බලනකොට යම්කිසි ඉහළ තැනක සිටින බව. විශේෂයෙන්ම අපේ කලාපය තුළ අපි ඉන්නේ හොඳ තැනක කියන එක ලෝකයම පිළිගන්න දෙයක්.

ඒකට බලපාන ප්‍රධාන හේතු දෙකක් තිබෙනවා. අපේ රට තුළ 1940 ගණන්වල ඇති වුණු නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍ය පද්ධතියත් තුළ තමයි අපි බොහෝ දේවල් දිනාගෙන තිබෙන්නේ. අපේ නිදහස් අධ්‍යාපන ක්‍රමය තුළ මුල ඉඳන්ම ගැහැනු ළමයින්ට අධ්‍යාපනය ලබා දීම ප්‍රතිපත්තියක් හැටියට තිබුණා. අපේ කාන්තාවන්, අධ්‍යාපනවේදීන්, නායිකාවන් බොහෝ දෙනෙක් ඒ වෙනුවෙන් පෙනී හිටපු නිසා තමයි අද වනකොට අපේ රටේ ගැහැනු දරුවන් අධ්‍යාපනය අතින් ඉදිරියෙන්ම ඉන්නේ සහ කාන්තාවන් ලංකාව තුළ ඉදිරියෙන් ඉන්නේ.

නිදහස් අධ්‍යාපනය අරගළ හරහා රැක ගත් දෙයක් බව අපි අමතක නොකළ යුතුයි. ශිෂ්‍ය ශිෂ්‍යාවන් දහස් ගණනක් ජීවිත පූජා කරලා තමයි නිදහස් අධ්‍යාපනය රැක ගත්තේ. විශේෂයෙන්ම 1977න් පසුව නිදහස් අධ්‍යාපනය කප්පාදු කරන්න පැවැති රජයන් - ඒ ආණ්ඩු - විවිධ අවස්ථාවල උත්සාහ කළා. ඒක නිල නොවන විධිවලටත් ක්‍රියාත්මක වුණා. නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න උත්සාහ කරපු හැම අවස්ථාවකම මේ රටේ ජනතාව, විශේෂයෙන්ම මේ රටේ සිසු සිසුවියන් -ශිෂ්‍ය ශිෂ්‍යාවන්- මැදිහත් වෙලා තමයි ඒ නිදහස් අධ්‍යාපනය රැක ගත්තේ. ඒ නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ භුක්ති විඳපු ස්ත්‍රිය තමයි අද ඉදිරියෙන් ඉන්නේ; අද වනකොට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉහළම ප්‍රතිඵල ලබා ගන්න හැකියාව ලබාගෙන තිබෙන්නේ. ඒ නිසා අපි ඒවාත් අමතක නොකළ යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි හැම තිස්සේම කථා කරන දෙයක් තමයි, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය. අමාත්‍යතුමියත් කිව්වා, මෙහි තිබෙන සංකීර්ණත්වය අපි අමතක නොකළ යුතුයි කියලා. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අසමානතාව ගැන කථා කරනකොට විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අපි අද ආමන්ත්‍රණය කළ යුතුම දෙයක් තමයි ගැහැනු දරුවන්ගේ විභාග ප්‍රතිඵල. අද අපි ඉතාම සතුටු වනවා, අපේ ගැහැනු දරුවන්ගේ ප්‍රගතිය පිළිබඳව. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා, අද දවස වනවිට පිරිමි දරුවන්ගේ විභාග ප්‍රතිඵල සහ අධ්‍යාපන කටයුතුවලට ඇති සහභාගිත්වයේ අඩු වීම පිළිබඳව. ඒ සම්බන්ධවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම පිරිමි දරුවන් අතරමඟදී අධ්‍යාපනයෙන් හැලෙන්නේ ඇයි, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඔවුන් නැත්තේ මොකද කියන කාරණා තුළින් ඇති වන සමාජ අර්බුදය ගැනත් මේ හා සමානව අපි මැදිහත් විය යුතුයි. මොකද, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිගන්න, එයට ගරු කරන සමාජයක් ඇති කරන්න නම් ඒ සඳහා මැදිහත්වීම සිද්ධ විය යුත්තේ අනිවාර්යයෙන්ම අධ්‍යාපන ක්‍රමය තුළිනුයි. අධ්‍යාපන ක්‍රමය තුළ ඉගෙනීම කියන්නේ, පොත පතේ දැනුම විතරක් නොවෙයි. ඉගෙනුම් පරිසරය තුළින් ලැබෙන බලපෑම තුළින් තමයි ඒක තීන්දු-තීරණ වෙන්නේ. එම නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ අපි හැම තිස්සේම මූලිකත්වය දීලා තිබෙන්නේ කුසලතා වර්ධනයට විතරක් නොවෙයි.

අපි ප්‍රාර්ථනා කරන, අපි බලාපොරොත්තු වන, ඒ ශිෂ්ට සම්පන්න රට තුළ ජීවත් විය යුතු පුරවැසියන්, ඒ රට තුළ ගෞරවාන්විත විධියට සියලුදෙනාම පිළිගන්නා, සියලුදෙනාට ගරුත්වය දෙන, වෙනස්කම්වලට ගරු කරන, ඒ පුද්ගලයා බිහි කරන්න පුළුවන් අධ්‍යාපනයක් ගැන අපි කථා කරන්නේ. ඒ නිසා

[ගරු(ආචාර්ය) හරිනි අමරසූරිය]

තමයි, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සම්බන්ධතා, ඒ අනන්‍යතා ගැන සංවේදී සහ ඒවා තේරුම් ගත්ත, ඒවාට ගරු කරන සමාජයක් බිහි කරන්න පුළුවන් අධ්‍යාපනයක් හදන්න අපි උත්සාහ කරන්නේ. ඒ නිසා අනිවාර්යයෙන්ම අපි ඒ ගැන සලකමින් තමයි, ඉදිරියට අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිද්ධ කරන්නේ. එහිදී මෙය අනිවාර්යයෙන්ම මූලික තැනක් ගන්නවා.

ඒ වාගේම, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මැදිහත්වීම් තුළදී gender-budgeting, gender mainstreaming ගැන කථා කරනවා. ඒවා ඔක්කොම හරි. ඒවා අපි අනිවාර්යයෙන්ම කළ යුතු දේවල්. නමුත්, මේ gender-budgeting, gender mainstreaming කියන එක අපිට ප්‍රතිපත්තිවලින්ම විතරක් බලන්න බැහැ. නීති සෑදීමෙන් විතරක් ගැහැනුන්ගේ ජීවිතය, ස්ත්‍රියකගේ ජීවිතය වෙනස් වෙනවා නම් ඒක හරි පහසුයි. නමුත් ඒක එහෙම වෙන්නේ නැහැ. මේවා ව්‍යුහාත්මක ප්‍රශ්න. ව්‍යුහාත්මක ප්‍රශ්න වෙනස් කරන්න ප්‍රතිපත්ති හා නීතිවලින් පමණක්ම බැහැ. ප්‍රතිපත්තියක් හැදුවා නම්, ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න පුළුවන් විධියේ ව්‍යුහයකුත් හැදෙන්න ඕනෑ. නීතියක් හැදෙනවා නම්, නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් අධිකරණ පද්ධතියක් තිබෙන්න ඕනෑ, පොලිස් පද්ධතියක් තිබෙන්න ඕනෑ. ඒ නීති ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් වෙන්න ඕනෑ. අපි ළමා හා කාන්තා කාර්යාංශය හැදුවාට, ඒකට මුදල් වෙන් වෙන්නේ නැත්නම්, මේවා ක්‍රියාත්මක කරන්න අමාරුයි.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ මේ අය වැය ලේඛනය තුළ තිබෙන වැදගත්ම දේ තමයි, ප්‍රායෝගික මැදිහත්වීම. ප්‍රායෝගික මැදිහත්වීම් කරන්න පුළුවන් විධියට මුදල් වෙන්වීම. ඒක තමයි සුවිශේෂීම දෙය. ඒ නිසා තමයි, අපිට ප්‍රවාහන අමාත්‍යාංශය හරහා මීට වඩා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදී පොදු ප්‍රවාහන සේවයක් හදන එක කරන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය තුළින් කාන්තාවන් හා ළමුන්ගේ සෞඛ්‍ය ගැන විශේෂ අවධානයක් යොමු කරන්න පුළුවන් වෙන්නේ. ඔටිසම් රෝගය තිබෙන දරුවාට ලැබිය යුතු අධ්‍යාපනය, ලැබිය යුතු සේවා පහසුකම් ගැන විශේෂයෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒවා අපි නිශ්චිත වශයෙන් හඳුනා ගෙන, ඒවාට මුදල් වෙන් කරන්නේ නැත්නම්, ප්‍රතිපාදන වෙන් කරන්නේ නැත්නම්, මොන දෙයක්වත් ප්‍රතිපත්තිමය තලයේ විතරක් කථා කරලා ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ නිසා තමයි, මෙවර අපි ඉදිරිපත් කරපු අය වැය ලේඛනය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න පුළුවන් ආකාරයට ප්‍රතිපාදන වෙන් කරපු අය වැයක් විධියට මම දකින්නේ.

මතක තබා ගන්න, මේ අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය ලේඛනය. පළමුවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කිරීම තුළ අපිට ඉතිරි වෙලා තිබෙන්නේ මාස නවයයි. ඒ මාස නවයක කාලය තුළ කරන්න පුළුවන් දේ තමයි, අපි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඊළඟ, අය වැය ලේඛන තුළින් අපි මීට වඩා මැදිහත් වෙනවා. මේක පියවරෙන් පියවර සැලැස්මක් අනුව යන දෙයක්. ඒ නිසා මේක ආරම්භයක් කියන එක මතක තබා ගන්න. මෙතැනදී වැදගත්ම දේ තමයි, මෙතැන තිබෙන consistency එක. අපි කණ්ඩායමක් හැටියට මේ සියලු දේ මත එකඟතාවක් තුළ කැබිනට් මණ්ඩලය මැදිහත් වෙන්නේ. මේක අපි කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය තනි කරලා කරන දෙයක් නොවෙයි. මේක අපි සියලුදෙනා භාර ගත්ත වගකීමක් කියන එකත් මම මතක් කරන්න කැමැතියි. ඒ නිසා අපි සියලුදෙනා තුළම කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් විශේෂ අවධානයක් තිබිය යුතුයි. කාන්තාවන් සහ දරුවන් විතරක් නොවෙයි, සමාජය තුළ අඩු සැලකිල්ලක් ලබන, සමාජයෙන් වෙන් කරපු, සමාජයෙන් exclude කරපු සියලු කණ්ඩායම්වලට විශේෂ අවධානයක් දිය යුතුයි කියන එක අපේ ආණ්ඩුව පිළිගන්නවා. ඒ පිළිගන්නා අතරම, ඒ මත ඉදගෙන තමයි අපි තීන්දු-තීරණ සියල්ල ගන්නේ.

ඒ වාගේම, මෙතැනදී යම් වැරැදි මතයක් ඉදිරිපත් වුණා. මම ඒක නිවැරැදි කරලා ඉන්න ඕනෑ. විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මත අලුතෙන් බද්දක් පනවා තිබෙනවා කියලා කිව්වා. එවැනි බද්දක් ගැන කිසිසේත්ම අය වැය ලේඛනය තුළ කිසිම සඳහනක් නැහැ. ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියනි, එහෙම එකක් වෙලා නැහැ. සමහර විට ඔබතුමිය මෙය පටලවා ගෙන ඇත්තේ, විදේශවලට සේවා සැපයීමේදී අය කරන බද්දත් එක්ක වෙන්න ඇති. *[බාධා කිරීමක්]* ඔබතුමිය දන්නවා නේ, මාධ්‍ය තුළ බොහෝ වෙලාවට වැරැදි කරුණු ඉදිරිපත් වෙනවා.

විදේශවලට සේවා සැපයීමේදී අය කරන බද්ද ගිය ආණ්ඩුවේ සියයට 30 තිබ්බ එක සියයට 15ට අඩු කළා. මේක තමයි මේ මාධ්‍යත්, විවිධ පාර්ශ්වත් වැරදි විධියට අර්ථකථනය කරලා තිබෙන්නේ. ඒ නිසා මම නැවත වතාවක් අවධාරණය කරනවා, විදේශයන්හි වැඩ කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට අලුත් බද්දක් පනවා නැත කියන එක. ඒ වාගේම මම හිතන්නේ මාධ්‍ය තුළ තිබෙන දේවල් අපිත් එසේම පිළිනොගත යුතුයි. අපි දන්නවා නේ, බොහෝ දුරට අපි ගැනත් මාධ්‍යවල කියන ඕනෑ තරම් කතන්දර තිබෙනවා නේ. නමුත් ඒවා එහෙම නොවෙයි. අපි තොරතුරු එක්ක කාරණා ඉදිරිපත් කළ යුතුයි කියලා මමත් හිතනවා. තව එකක් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අගමැතිතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
බොහොම ස්තුතියි, මම ඉක්මනින් අවසන් කරන්නම්.

ගිය ආණ්ඩුව තුළත් අපේ සංසදය හරහා ආපු ඒ බලපෑම නිසා ජාතික කාන්තා කොමිසම පත් කරන්න තීන්දුවක් අරගෙන තිබෙනවා. මේ වෙනකොටත් ඒ නාම යෝජනා ව්‍යවස්ථා සභාවට ඇවිල්ලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉතාම ඉක්මනින් රටේ පළමුවෙනි ස්වාධීන ජාතික කාන්තා කොමිසම පත් කරලා වැඩ ආරම්භ කරන්න හැකි වෙයි කියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, මේ අවස්ථාවේ මේ ඇති වෙලා තිබෙන පිබිදීම තුළින් කාන්තා නායකත්වයන් ඉදිරිපත් වීම පෙනෙන්නට, පෙනෙන්නට ඒකට එරෙහි ප්‍රතිගාමී බලවේගත් ඕනෑ තරම් හැදෙන බව. ඒ ප්‍රතිගාමී බලවේගවලට අපි මේ කරන්න හදන දේ අල්ලා ගන්න අපි ඉඩ නොදිය යුතුයි. මේක අපේ රට තුළ විතරක් නොවෙයි, ජාත්‍යන්තරයේත් දකින්න ලැබෙනවා. මේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව කියන මාතෘකාව සංස්කෘතික යුද්ධයක් බවට පත් කරන්න උත්සාහ ගන්නවා, මේ ප්‍රතිගාමී කණ්ඩායම්. ඒකට අපි කිසිසේත් ඉඩ නොදිය යුතුයි කියන එක මම යෝජනා කරනවා. අපි මේක ප්‍රගතිශීලී තැනකින් කරන්නේ. මේක සමානාත්මතාව, සාධාරණය හා යුක්තිය පිළිබඳ ප්‍රශ්නයක් මිස විවිධ පුද්ගලයන්, කණ්ඩායම් අතර තිබෙන යුද්ධයක් නොවෙයි, කියන එකත් මතක් කරමින් මෙය සමානාත්මතාව අගය කරන, සාධාරණත්වය අගය කරන සියලු දෙනා එකතු වෙලා

දිනා ගත යුතු අරගළයක් කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. කාලය ලබාදීම පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.15]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද මා ආරම්භයේදීම කාන්තාවන් සියලු දෙනාට සුබ කාන්තා දිනයක් වේවා! කියා ප්‍රාර්ථනා කරනවා.

කාන්තාවන් සමාජයට දක්වන දායකත්වය, සේවය අරගෙන බලනකොට ඔවුන්ට දවසක් නොවෙයි, ගරු ඇමතිතුමිය, සතියක්, අවුරුද්දක් දුන්නත් ප්‍රමාණවත් නැති වේවි කියා මම විශ්වාස කරනවා.

කෙසේ වෙතත්, මා මුලින්ම කියන්නට ඕනෑ, ඉතාම ධනාත්මක අදහස් රාශියක් ආණ්ඩු පක්ෂයෙන් මෙන්ම විපක්ෂයෙන් මේ සභාවට ඉදිරිපත් වුණා කියන එක. එතැනදී කාන්තාවගේ ආරක්ෂාවට අවශ්‍ය නීති, ඔවුන්ගේ ව්‍යවස්ථාපිත අයිතීන් යනාදී ඒ සියල්ලම ගැන මනාවට කරුණු ඉදිරිපත් කළා. ඔව්, මම පිළිගන්නවා, නීති පද්ධතියක් තිබිය යුතුයි. එය ශක්තිමත් ලෙස ක්‍රියාත්මක විය යුතුයි, කාන්තාවගේ ආරක්ෂාවට. විපක්ෂ නායකතුමා කිව්වා වාගේ ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම ගැනත් බලන්න ඕනෑ. නමුත් මෙතැනින් මම ගන්නවා, අපේ ගරු අගමැතිතුමිය කියූ කරුණ. ඒ මොකක්ද? ඒ තමයි නීතියෙන් විතරක්, කොළවල ලියලා විතරක් මේ අයිතිය තහවුරු කරන්න පුළුවන්ද, මිනිසුන්ගේ ආකල්ප වෙනස් නොවී කියන එක. මේ ආකල්ප හැදෙන්නේ කොයි කාලයේ ද? ළමා කාලයේ. එතකොට ළමයාගේ ආකල්ප වර්ධනය වෙන්නේ කොහොම ද? ඔහු පරිසරයේ දකින දේවල් අනුව. එහෙම නම්, කාන්තාවට ආරක්ෂිතව ඉන්න, කාන්තාවන්ට ගරු සරු කරන සමාජයක් බිහි වෙන්න නම්, ඒක ආරම්භ වෙන්න ඕනෑ ගෙදරින්. අපි නීති රීතිත් හදමු; ව්‍යවස්ථාත් හදමු. නමුත් මම හිතනවා, සෑම අම්මා කෙනෙක්ම, සෑම තාත්තා කෙනෙක්ම තමන්ගේ ගෙදර ඉන්න පිරිමි ළමයාට ඉගැන්නුවා නම්, කාන්තාවට ගරු කරලා සලකන්න, කුස්සියේ උයන එක, පිහානක් සෝදන එක ජීවන කුසලතාවක් විනා ගැහැනියකට අයත් කාර්යයක් නොවෙයි කියන ආකල්පය පොඩි කාලයේදීම ප්‍රවර්ධනය කළා නම්, මම හිතන්නේ පරම්පරාවක් දෙකක් වැඩිහිටියෝ වෙනකොට කාන්තාවගේ ආරක්ෂාවට නීති වෙනුවට සමාජයේ පිරිමි ඉදිරිපත් වෙන සමාජයක් නිර්මාණය කරන්න අපට පුළුවන් වෙයි.

ඉතින් මම හිතනවා, මව්වරුන්ට, සහ පියවරුන්ට ඒ සම්බන්ධයෙන් ලොකු වගකීමක් තිබෙනවා කියලා. There is a view in the society that when a boy does something, people say, "Oh, boys are like that. Boys will always be boys". So, they are allowed to do things that girls are normally not allowed to do. Then, what happens is, boys grow up to become men, and when they do, their naughty, childish behaviour becomes the norm. මම කියනවා, අපි ඒ දේත් මේ මොහොතේ කල්පනාවට ගනිමු කියලා.

අපි එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අත්සන් තබන්නේ 1990 and we ratified it in 1991. එහි තිබෙන ප්‍රධානම කරුණ මෙයයි. If we take our country, in a legal sense, we are a dualist State. That means, we have to establish a separate domestic law to incorporate the provisions of the United Nations Convention on the Rights of the Child - UNCRC. එහෙත් මේ වන විට Supreme Court එකෙනුත් තීන්දු-තීරණ රාශියක් දීලා තිබෙනවා, සියලු රාජ්‍ය කාරණාවලදී එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ තිබෙන සංකල්ප, ප්‍රතිපත්ති අපට හැම විටම සලකා බැලිය හැකි බව සඳහන් කරමින්. විශේෂයෙන්ම "the best interest of the child" කියන කාරණය අපේ ICCPR Act එකේ Section 5(2) යටතේ සඳහන් කර තිබෙනවා. අන්න ඒ ආකාරයට බලන කොට එය නීතියක් වශයෙන් මෙහි නොතිබුණත්, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ පිහිටි සංකල්ප සහ කාරණා රජයක් වශයෙන් වැඩ කිරීමේදී, තීන්දු-තීරණ ගැනීමේදී අනිවාර්යයෙන්ම අනුගත කර ගන්න අපට කිසිම බාධාවක් නැහැ. එය සිද්ධ වෙමින් පවතිනවා.

ඒ වාගේම, if you look at Article 27 of the Constitution - Directive Principles of State Policy and Fundamental Duties - ඒකෙත් මේ කරුණු තිබෙනවා. අපි අද මේ විවාදයට ගැනෙන වැය ශීර්ෂය හදලා තිබෙන්නේ ඒ සියලු කරුණු කාරණා තේරුම් අරගෙන. The Convention on the Rights of the Child ගත්තොත්, එහි Article 6 - children's right to survive and develop, Article 3 - the best interest of the children - and Article 12 - having the views of the children heard and taking them and their evolving capacity seriously - යන සියල්ල තේරුම් අරගෙනයි අපි මේ වැය ශීර්ෂය නිර්මාණය කළේ.

අපේ සමස්ත අය වැය කරුණු කිහිපයක් ඔස්සේ දිව යනවා. අපට ළමා මන්දපෝෂණය පිටු දකින්න ඕනෑ. අන්න ඒ හේතුව හින්දා තමයි, ගර්භිණී මවුවරුන් සඳහා මාසිකව පෝෂණ දීමනාවක් ලබා දීමට රුපියල් මිලියන 7,500ක මුදලක් වෙන් වෙන්නේ, පෙර පාසල් දරුවන් සඳහා උදැසන ආහාර වේල සැපයීමට රුපියල් මිලියන 1,000ක් වෙන් වෙන්නේ. මේ Budget එකෙන් ඒ ප්‍රතිපාදන වෙන් වන්නේ අපි මේ තත්ත්වය තේරුම් ගෙන තිබෙන නිසා.

අනාගතය සඳහා අපගේ ළමා පරපුර සුදානම් කරන අධ්‍යාපන ක්‍රමයක් සැකසෙන්නට ඕනෑ. ඒකට අපේ ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් විශාල කාර්යභාරයක් කෙරෙනවා. දරිද්‍රතාවෙන් මිදී ඉදිරියට ගමන් කිරීමේ අවස්ථාව සෑම දරුවෙකුටම සාධාරණව උදා කර දෙන්නට ඕනෑ. විශේෂයෙන්ම දරුවන්ට හානිකර කායික දඬුවම් තහනම් කරන්නට ඕනෑ. මෙන්න මේ කියන කායික දඬුවම් තහනම් කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධියේදී මා කියන්නට ඕනෑ, මේ වන විට ඒ සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් නිර්මාණය වෙලා තිබෙන බව. එය හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීමට අධිකරණ ඇමතිවරයා වශයෙන් මා පියවර ගන්නා බව දන්වන්නට ඕනෑ. ඇයි අපි මෙහෙම කියන්නේ? ඒකට හේතුව තමයි, කායිකව පමුණුවන දඬුවම් දරුවෙකුගේ සංවර්ධනය කෙරෙහි අතිවිශාල බලපෑමක් ඇති කරන බව පෙන්වා දෙන අව්වාදාත්මක විද්‍යාත්මක සාක්ෂි රාශියක් තිබෙනවා. කායික හා මානසික කම්පනය ඇති වීමට ද, දරුවෙකුගේ මොළය වර්ධනයට හානි සිදු වීමට ද, මුළු ජීවිත

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

කාලයටම සුව නොවන මානසික ආබාධයන්ට ලක් වීමට ද එය හේතු විය හැකියි. පාසල මහ හැරීම් හෝ මුළුමනින් පාසලෙන් ඉවත් වී යෑම සඳහා හේතු වන ආකාරයට දරුවා තුළ ඉගෙනීම කෙරෙහි ඇති උනන්දුව හීන වීම ද එයින් සිදු විය හැකියි. දරුවෙකුගේ ආත්ම අභිමානය, ගරුත්වය විෂයෙහි දිගු කාලීන අහිතකර බලපෑම් ද එමඟින් ඇති විය හැකියි. ඉන් අදහස් කරන්නේ නිවස තුළ හෝ පාසල තුළ හෝ පමුණුවනු ලබන කායික දඬුවම්. මතක තියාගන්න, දරුවන් විනය සම්පන්න කරන්න එපා කියන්නේ නැහැ, දඬුවම් කරන්න එපා කියන්නේ නැහැ. අපි එහෙම කියන්නේ නැහැ. කායික දඬුවම් ගැන විතරයි මේ කථා කරන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

හැදිගාල හදන හොද්ද සවුත්තු කරගන්නේ නැතිව චුට්ටක් හරි හැදිගාන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඔව්. ජන සමාජයේදී පුද්ගලයන් අර්බුදවලට මුහුණ දෙනවා. දරුවන්ගේ ප්‍රචණ්ඩත්වය ගත්තොත්, පොඩි කාලයේ ඉඳලාම ඔවුන් හිතනවා, ප්‍රශ්න විසඳන්න තිබෙන්නේ ප්‍රචණ්ඩත්වය හරහා කියලා. වැඩිහිටියෙකු වෙලා සමාජගත වුණාමත්, ඔවුන් ප්‍රශ්නවලට මුහුණ දීමේදී මුල්ම විකල්පය වශයෙන් ප්‍රචණ්ඩත්වය තමයි භාවිත කරන්න පෙළඹෙන්නේ. ආක්‍රමණශීලිත්වය විසින් ආක්‍රමණශීලිත්වයක්ම නිර්මාණය කරනු ලබනවා. Even if you look at our Children and Young Persons Ordinance - CYPO - ඒකේ පූර්විකාවේ සඳහන් වෙන්නේ මොකක්ද? "An Ordinance to make provision for the establishment of juvenile courts, for the supervision of juvenile offenders....." That means, to supervise, not to punish; දඬුවම් කරන්න නොවෙයි. ඒකට හේතුව තමයි, අපේ අධිකරණ පද්ධතියේ ළමා බාල වයස්කාර යුක්තිය පසිඳලීම ක්‍රියාත්මක වන්නේ දරුවාව supervise කරලා හරි මහට, යහ මහට පුනරුත්ථාපනය කර ගන්න මිස දඬුවම් කිරීමේ අරමුණින් නොවීම.

ඒකට හේතුව තමයි, it is easier to fix a broken child, rather than a broken adult. A broken adult will cost a lot to the society. අද අපි මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය, අපරාධ රැල්ල, පාතාලය ආදි සියල්ලම පහළට කියවාගෙන කියවාගෙන යන කොට කැඩුණු බිඳුණු පවුල් පරිසරයකින් ආපු කැඩුණු බිඳුණු දරුවෙකු නිවැරදි ලෙස පුනරුත්ථාපනය නොවීමේ ගැටලුව ඇති බව සියයට 99ක්ම අවස්ථාවලදී ඔබතුමන්ලාටත් පෙනෙන්නට තිබෙනවා.

ළමයින් නීතිය හා ගැටෙනවා ක්‍රම කිහිපයකට. Take, children and young persons in need of care and protection. ළමයින් හා යෞවනයින් ආඥාපනතේ 34 වන වගන්තිය අනුව භාරය හා ආරක්ෂාව අවශ්‍ය දරුවකු යනු කවරෙක්ද යන්න සඳහන් කර තිබෙනවා. ගොඩක් වෙලාවට දුප්පත් පරිසරයක ඉන්න ඔවුන්ට භාරය හා ආරක්ෂාව අවශ්‍යයි. ඔවුන්ගේ දෙමාපියන්ට ඒ රැකවරණය දෙන්න බැහැ. ඒ වාගේමයි, වැරදිකරුවන් වශයෙන් - as offenders, එහෙම නැත්නම් වැඩිහිටියෙකු විසින් කරන අපරාධයක විත්දිතයකු වශයෙන් - as victims of crime - හඳුනා ගන්නා දරුවන්; එහෙමත් නැත්නම්, අධිකරණයට වෙන යම් හේතුවක් මත පැමිණෙන දරුවන්. උදාහරණයක් වශයෙන් දික්කසාද නඩුවලදී සහ maintenance නඩුවලදී අපි ඒ තත්ත්වය දකිනවා.

අපට අත්‍යවශ්‍යයි, ළමයින්ට මිත්‍රශීලි අධිකරණ පද්ධතියක් ස්ථාපිත කර ගැනීමට. අධිකරණය කියන තැනට ළමයින් එන්න ඕනෑ නැහැ. එනවා නම්, ඒක අවම කරන්නට ඕනෑ; ඒ ගොල්ලන්ගේ experience එක ඒ ළමා මනසට ගෝචර තැනක් බවට පත් වෙන්නට ඕනෑ. අද අපේ අධිකරණ පද්ධතිය ගෙන බැලුවොත්, ළමයින්ට විවේක ගන්න තැනක් නැහැ, අම්මා කෙනෙකුට දරුවාට කිරි දෙන්න විධියක් නැහැ. යෑමට සුදුසු වැසිකිළියක්වත් නැහැ. එවැනි පහසුකම් නැහැ. ඒ වාගේම අධිකරණ පද්ධතිය තුළ ඒ දරුවන්ට ඇහෙන වචන, භාෂාව හොඳ මදි. මම දන්නවා, දැනටත් ගොඩක් නඩුකාරතුමන්ලා, දරුවා උසාවියට එන අවස්ථා ප්‍රමාණය අඩු කරන්නත්, කාලය අඩු කරන්නත් තමන්ගේ මට්ටමින් නොයෙකුත් පියවර ගෙන තිබෙන බව. මම ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. නමුත්, දැන් එය ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාවට නැඟීමේ වගකීම අධිකරණ අමාත්‍යාංශය සතු වනවා. ඒ හින්දා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහ මගේ උගත් ඇමතිතුමියගේ සහභාගිත්වයෙන් අපි child-friendly courts establish කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කරනවා. අපි ඒ සම්බන්ධයෙන් බලන්නට ඕනෑ.

තිබුණු තවත් ලොකු ගැටලුවක් තමයි, ඒ දරුවන් ප්‍රවාහනයේදී -ළමා නිවාසවල සිට වෙන්න පුළුවන්- හැම විටම වැඩිහිටියන් හා මිශ්‍රව ප්‍රවාහනය වීම; ඔවුන්ට ආරක්ෂිත ප්‍රවාහන පද්ධතියක් නොමැති වීම. මෙය වසර ගණනාවක් පරිවාස ක්ෂේත්‍රයේ කථා බහට ලක් වුණු, එහෙත් නොවිසඳුණු ප්‍රශ්නයක්. හැමෝම මේ ගැන කිව්වාට, සම්මන්ත්‍රණ පැවැත්වූවාට ප්‍රතිපාදනයක් වෙන් වුණේ නැහැ. මෙදා පාර අය වැයෙන් -Budget එකෙන්- පළමුවෙනි වතාවට, මේ දරුවන්ට ප්‍රවාහනයේදී මතු වන ගැටලු මඟ හැරවීමට ප්‍රවාහනය සඳහා වාහන ලබා ගන්නට රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. ඒක සාධනීය දෙයක්. ඒක අපේ ප්‍රතිපත්තියේදී පැහැදිලිව කියපු දෙයක්.

අපි juvenile justice ගත්තොත්, හැම විටම we should look for diversions in the system. First, we must look at prevention, to prevent a child from coming into the system. If they are in the system, to get them out of the system as fast as we could. And, if a child is convicted for an offence, if he is an offender, we need to find a suitable alternative care option for him, instead of institutionalization. ඒ කියන්නේ මොකක්ද? නියම ප්‍රතිපත්තිය විය යුත්තේ මේ දරුවන් මේ ක්‍රමයට එන එක වළක්වා ගන්න එකයි. ආවොත් ඉක්මනට එළියට යන්න අවශ්‍ය safety valves අපි නිර්මාණය කරන්න ඕනෑ. අපි ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර අවශ්‍ය පියවර ගන්නවා.

හැම විටම අපේ රජයේ ප්‍රතිපත්තිය වන්නේ මොකක්ද? දරුවාට හොඳම තැන තමයි දරුවාගේ පවුල. දරුවා තම පවුලෙන් වෙන් වන හේතු අපි බලන්න ඕනෑ. ඒ හේතු වැළැක්වීමට අවශ්‍ය ප්‍රතිපත්ති හදන්න, ප්‍රතිපාදන හදන්න තමයි මේ අය වැයෙන් කටයුතු කර තිබෙන්නේ.

අපි මේ මැතකදී -2019දී- සංගණනයක් කළා. එයින් පෙනෙනවා, ළමා නිවාස සම්බන්ධයෙන්. ඒක ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව කරපු එකක්. ළමා නිවාස සම්බන්ධයෙන් බලන කොට, සියයට 85ක්ම ආයතනගත වන ළමයි එන්නේ කැඩුණු බිඳුණු පවුල්වලින්; මූලිකවම දුප්පත්කමින් පෙළෙන ආර්ථිකයේ පහළම ස්ථරයෙන්. දැන් මේ අයට psycho-social support අවශ්‍ය වනවා, නැවත සමාජයට යන්න. මනෝ සමාජයේ ප්‍රතිකාර ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
හොඳමයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ කට්ටිය නිසි ලෙස සමාජගත නොකළොත්, ඔවුන් වැඩිහිටියන් වෙන්නේ ඉතාම හානිකාරී විධියට. මට කරුණු ගොඩක් කියන්න තිබුණත්, අවසාන විනාඩි දෙක නිසා මම මේ සම්බන්ධයෙන් තවත් කාරණා දෙකතුනක් පමණක් කියන්නම්.

මම පැහැදිලිව කියනවා, we have to be very focused on a gatekeeping mechanism for orphanages. The probation officer must have an opportunity to check into the reasons, as to why children are entered into orphanages because, now, due to poverty, without any supervision, parents admit them to orphanages. Remember, we consider institutionalization as the last option available because there is no family environment there. Therefore, I am requesting the Hon. Minister to focus on that.

We have to have a zero-tolerance policy on violence against children. We must establish resources for capacity -building and professional supervision. අපට ඒ සඳහා වෙන් කරන්න වෙනවා. Also, Hon. Minister, you might want to consider additional costs for transport of probation officers and for some victim support because without probation officers checking, supervising and working with those children, we would have difficulties in delivering justice to those children who are separated from their families.

Also, at every stage of institutionalization, there should be a process of gatekeeping and for gatekeeping, allocate some money if you can. Then, focus on reunification and consider alternative care policies because, I know, at the NCPA, there was a discussion to establish separate alternative care programmes.

Also, family-based care options must be looked into. Let us look into transforming some institutions into family care options, if possible. We have to spend money. ළමා නිවාසවල සංවර්ධන කටයුතු සඳහා අපට සල්ලි වියදම් කරන්න වෙනවා. නමුත්, අපි අවධානය යොමු කරන්නට ඕනෑ, දැන් බොහෝ තරුණ ළමයි අයිස් මත් ද්‍රව්‍යවලට පුරුදු වීමේ ප්‍රවණතාවක් තිබෙනවා. Therefore, we have to have some allocation for mental health of adolescents, drug rehabilitation, for vocational training for convicted persons, to support those who are in these institutions and to get them out.

එම කරුණු ටික සඳහන් කරමින් ගරු අමාත්‍යතුමියට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, ඔබතුමිය විසින් ඉදිරිපත් කරන ලද වැය ශීර්ෂයේ ළමා රක්ෂණය, ළමා සුබසාධනය යන කරුණු සඳහා ඉතා මනාවට හා නිසි ලෙස මුදල් වෙන් කර තිබෙන බව පෙනෙනවා. මේ තමයි ඉදිරි මාස 8ට කළ හැකි දේවල්. අපට කළ හැකි දේ බොහොමයි. තව ඉදිරියටත් කෙරෙනවා.

Also, we are going to amend the Children and Young Persons Ordinance, 1939. It is way outdated and I think the reform process has also been way too long. It is under my Ministry. So, I will make sure that it is expedited. එම කරුණුත් සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
Order, please! දිවා ආහාර විවේකය සඳහා කාරක සභා අවස්ථාවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත් හිටුවනු ලැබේ.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி. ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER in the Chair.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Kathiravelu Shanmugam Kugathasan. You have nine minutes.

[பி.ப. 1.00]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ தவிசாளர் அவர்களே, இந்த அவையின் பிரதம அமைச்சருக்கும், மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர் உள்ளிட்ட 22 பெண் நாடாளுமன்ற உறுப்பினர்களுக்கும் ஏனைய மகளிருக்கும் எனது மகளிர் தின நல்வாழ்த்துக்களைத் தெரிவித்துக்கொண்டு, 2025ஆம் ஆண்டுக்கான பாதீட்டின் மீதான விவாதத்தில் மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சுத் தொடர்பாக எனது கருத்துகளை இந்த மேலான அவையில் எடுத்துரைக்க விழைகின்றேன்.

கௌரவ தவிசாளர் அவர்களே, உலகத்தின் முதலாவது பெண் பிரதமரைத் தெரிவுசெய்த நாடு என்ற பெருமை இலங்கைக்குரியதாகும். இந்திய நாட்டின் பிரதமராகத் தெரிவுசெய்யப்பட்ட மாண்புமிகு இந்திரா காந்தி அவர்களாயினும் சரி, இஸ்ரேல் நாட்டின் பிரதமராகத் தெரிவுசெய்யப்பட்ட மாண்புமிகு கோல்டா மேயர் அவர்களாயினும் சரி, இங்கிலாந்து நாட்டின் பிரதமராகத் தெரிவுசெய்யப்பட்ட மாண்புமிகு மார்கிரெட் தட்சர் ஆயினும் சரி, இலங்கை நாட்டின் பிரதமராக மாண்புமிகு சிறிமாவோ பண்டாரநாயக்க அம்மையார் தெரிவு செய்யப்பட்டதனை அடியொற்றியே இவர்கள் யாவரும் தெரிவுசெய்யப்பட்டதை எண்ணி நாம் பெருமை கொள்ளலாம்.

இன்றைய உலகில் அரசியல், பொருளியல், வாழ்வியல் முதலியவற்றில் பெண்களின் பங்குபற்றுதலானது ஒரு நாட்டின் அபிவிருத்தியின் அளவுகோலாகக் கொள்ளப்படுகிறது. இச்சூழலில் இந்த நாட்டின் குடித்தொகையில் 50 சதவீதத்துக்கும் மேலாகவுள்ள பெண்களின் நிலை

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

- அரசியலிலும் சரி, பொருளியலிலும் சரி, வாழ்வியலிலும் சரி - முன்னிலையில் இருப்பதாக நாம் பெருமைகொள்ள முடியாது. உலகிலுள்ள பல நாடுகள் பெண்களின் மேம்பாட்டில் இலங்கையைவிட முன்னணியில் உள்ளன. எடுத்துக்காட்டாக, நோர்வே, சுவீடன், பின்லாந்து முதலிய நாடுகளில் பெண்கள் அரசியல் மற்றும் பொருளாதாரப் பங்குபற்றுதலில் முன்னணியில் உள்ளனர். இந்த நாடுகளில் முற்கூறிய துறைகளில் பெண்களின் பிரதிநிதித்துவம் 40 சதவீதத்துக்கும் மேலாகவுள்ளது. ஆபிரிக்க நாடான ருவண்டா நாடாளுமன்றத்தில் பெண்களின் பங்குபற்றுதல் 61 சதவீதமாக உள்ளது. மேற்படி சூழலில் இறுதியாக 2018ஆம் ஆண்டு இலங்கையில் நடைபெற்ற உள்ளூராட்சித் தேர்தலில் தெரிவுசெய்யப்பட்ட 8,325 உறுப்பினரில் 1,919 பேர் மட்டுமே பெண்களாக இருந்தனர்; இது தெரிவுசெய்யப்பட்ட உறுப்பினரில் 23 சதவீதமாகும். கடைசியாக நடத்தப்பட்ட மாகாண சபைத் தேர்தலில் தெரிவுசெய்யப்பட்ட உறுப்பினர்களில் 5 சதவீதத்துக்கும் குறைவானவர்களே பெண்களாவர். இறுதியாக 2024இல் நடைபெற்ற நாடாளுமன்றத் தேர்தலில் தெரிவு செய்யப்பட்ட 225 உறுப்பினரில் 22 பேர் மட்டுமே பெண்களாவர். இது தெரிவுசெய்யப்பட்ட உறுப்பினர்களின் 9.8 சதவீதமாகும். அதேபோல், இந்த அமைச்சரவையில் உள்ள பெண்களின் எண்ணிக்கை 8.3 சதவீதமாகும். இதை அதிகரிக்க வேண்டுமென்று நான் வேண்டிக் கொள்கின்றேன்.

இந்தச் சூழலில் இலங்கை நாட்டில் பெண் பிரதிநிதித்துவம் 50 சதவீதத்தினை அடைய இன்னும் நெடுந்தொலைவு பயணிக்க வேண்டியுள்ளது. இந்த நிலையை மாற்றியமைக்க நாம் அனைவரும் ஒன்றுபட்டு உழைக்கவேண்டும். உள்ளூராட்சிச் சபைகள், மாகாண சபை மற்றும் நாடாளுமன்றத் தேர்தல்களில் பெண்கள் 50 சதவீதத்துக்கும் குறையாமல் தெரிவு செய்யப்படக்கூடிய வகையில் தேர்தல்கள் சட்டங்கள் திருத்தப்பட வேண்டும். அதேபோன்று, பல்கலைக்கழக அனுமதி, உயர் அரசுப் பணிகள் முதலியவையும் 50 சதவீதத்துக்குக் குறையாமல் அவர்களுக்குக் கிடைக்கக்கூடிய விதத்திலே சட்டங்கள் இயற்றப்பட வேண்டும். நமது அயல் நாடான இந்தியாவில் உள்ள தமிழ்நாடு மாநிலத்தில் மேற்படி துறைகள் அனைத்திலும் பெண்களது பங்குபற்றுதலை உறுதிப்படுத்தும் வண்ணம் பெண்களுக்கான சிறப்பு ஒதுக்கீட்டுச் சட்டம் உள்ளதென்பதை இவ்விடத்தில் நான் நினைவுபடுத்த விரும்புகின்றேன்.

இந்த நாட்டில் பெருந்தொகையான பெண்கள் தலைமைதாங்கும் குடும்பங்கள் உள்ளன. குறிப்பாக, வடக்கு, கிழக்கில் 92,000 பெண்கள் தலைமைதாங்கும் குடும்பங்கள் உள்ளன. நான் பிரதிநிதித்துவப்படுத்தும் திருகோணமலை மாவட்டத்தில் ஏறத்தாழ 16,000 பெண்கள் தலைமைதாங்கும் குடும்பங்கள் உள்ளன. இவர்களுக்கு நிலையான வருமான வழிமுறைகள் இல்லை. இதனால் இந்தக் குடும்பங்களில் உள்ள பிள்ளைகளின் எதிர்காலம் கேள்விக்குறியாகி உள்ளது. இவர்களில் பெரும்பாலானோருக்குத் தொழிற்சந்தையில் வேலைவாய்ப்பைப் பெற்றுக்கொள்ளக்கூடிய படிப்பறிவு, பட்டறிவு, வினைத்திறன் முதலியவை போதுமானதாக இல்லை. எனவே, இவர்களுக்கு வினைத்திறன் மேம்பாட்டுக்கான பயிற்சியளித்து, வருவாய் பெறக்கூடிய சுய தொழில்களை உருவாக்கிக் கொடுக்க வேண்டும். இதன் பொருட்டாக இந்த அமைச்சுக்கான ஒதுக்கீடு பன்மடங்கு அதிகரிக்கப்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கிறேன்.

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சுக்குக் கடந்த ஆண்டில் 19.2 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தது; இந்த ஆண்டில் இத்தொகை 14 பில்லியன் ரூபாயாக, அதாவது, 26 சதவீதத்தினால் குறைக்கப்பட்டிருக்கின்றது. அத்தோடு, இந்த அமைச்சின்கீழ் வரும் மகளிர் அபிவிருத்தித் திட்டங்களுக்குக் கடந்த ஆண்டில் 2,818 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது; இந்த ஆண்டில் இந்த ஒதுக்கீடானது 844 மில்லியன் ரூபாயாக, 70 சதவீதத்தால் குறைக்கப்பட்டுள்ளது. அதேபோன்று, கடந்த ஆண்டில் சமூக அபிவிருத்தித் துறைகளுக்கென 1,836 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது; இந்த ஆண்டில் அந்த ஒதுக்கீடானது முழுமையாக இல்லாமற் செய்யப்பட்டுள்ளது. இவை மிகுந்த கவலை தரும் செயல்களாகும். இதனை அரசு கவனத்தில் எடுத்து, இந்த அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதியைப் பன்மடங்கு அதிகரிக்க ஆவன செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த நாட்டின் குடித்தொகையில் ஏறத்தாழ 25 சதவீதமானோர் சிறார்கள் ஆவர். மேற்கு நாடுகளில் சிறார்களின் நலன் மேம்பாட்டுக்காகக் காட்டப்படும் அக்கறையும் அதற்கான செலவும் இந்த நாட்டில் இருப்பதாகக் கொள்ள முடியவில்லை. இந்த அரசின் பாதீட்டிலே சிறுவர் நன்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்புச் சேவைகளுக்கென 479 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இது கடந்த ஆண்டின் ஒதுக்கீட்டைவிட 36 மில்லியன் ரூபாய் அதிகமாகும்; இது வரவேற்கத்தக்க விடயம். எனினும், சிறுவர் அபிவிருத்தி நடவடிக்கைக்காகக் கடந்த ஆண்டில் 13 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. இந்த ஆண்டில் இத்தொகை 12.6 பில்லியன் ரூபாயாக 2.7 சதவீதத்தினால் குறைக்கப்பட்டுள்ளது. இது கவலை தரக்கூடிய ஒரு விடயமாகும்.

சிறுவர் நலனோம்புக்காக ஐக்கிய அமெரிக்கா அதனது பாதீட்டில் 10 முதல் 12 சதவீதத்தினையும், சுவீடன் மற்றும் பின்லாந்து 8 முதல் 10 சதவீதத்தினையும், பிரித்தானியா 6 முதல் 8 சதவீதத்தினையும், கனடா 5 முதல் 7 சதவீதத்தினையும் ஒதுக்குகின்ற சூழலில், இந்த நாட்டில் மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சுக்கு மொத்தமாக பாதீட்டின் 0.3 சதவீதம் மட்டுமே ஒதுக்கப்பட்டுள்ளது. இது மகிழ்ச்சி தரக்கூடிய விடயம் அல்ல. இந்த அமைச்சுக்கான ஒதுக்கீட்டினைப் பன்மடங்கு அதிகரிக்க அமைச்சரவை ஆவன செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த நாட்டில் அரசு நடத்துகின்ற 47 சிறுவர் பராமரிப்பு இல்லங்களில் 1,075 சிறாரும், தன்னார்வத் தொண்டு நிறுவனங்கள் நடத்தும் 312 சிறுவர் இல்லங்களில் 8,182 சிறாருமாக மொத்தம் 9,257 சிறார்கள் பராமரிக்கப் படுகின்றனர். இவர்களில் அண்ணளவாக 10 சதவீதமான சிறார்கள் மட்டுமே தாய், தந்தையை இழந்தவர்களாவர். எஞ்சிய 90 சதவீதமான சிறார்கள் குடும்பப் பொருளாதாரச் சிக்கல் காரணமாகப் பெற்றோர் ஒருவரினாலோ அல்லது இருவராலுமோ வளர்க்க முடியாமல் சிறுவர் இல்லங்களில் கொண்டுவந்து சேர்க்கப்பட்டவர்களாவர். இந்தச் சிறார்களைப் பார்ப்பதற்குப் பெற்றோர் அவ்வப்பொழுது வருகின்றனர்; வரும்பொழுது தின்பண்டங்களைக் கொண்டுவந்து கொடுக்கிறார்கள்; விடுமுறை நாட்களில் வீட்டுக்கு அழைத்துச் செல்கின்றனர். இந்த வாய்ப்பு 10 சதவீதமான பெற்றோர் அற்ற சிறார்களுக்குக் கிடைப்பதில்லை. இதனால் இவர்கள் உளவியல் ரீதியான தாக்கத்திற்கு உள்ளாகின்றனர். இந்தச் சிக்கலைத் தீர்ப்பதற்கு ஆவன செய்யுமாறு அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன். பிள்ளைகள் பெற்றோர், உறவினருடன் வாழும்பொழுது உள நலத்தோடு வாழ்வதாக ஆய்வுகள் கூறுகின்றன. எனவே, இந்த 90 சதவீதமான பிள்ளைகள் சார்ந்த குடும்பங்களுடைய வருவாயைக் கூட்டுவதன்மூலம் சிறுவர் இல்லங்களில்

சேர்க்கப்படும் சிறார்களின் எண்ணிக்கையை 90 சதவீதத்தால் குறைக்க முடியும். எனவே, இதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த நாட்டில் ஏறத்தாழ 5,000 குடும்பங்கள் பிள்ளைகளைத் தத்தெடுத்து வளர்ப்பதற்காக நீதிமன்றத்தை நாடியுள்ளதாக அறிய முடிகிறது. அன்னையும் தந்தையும் அற்ற சிறார்களை இத்தகைய பெற்றோருக்குக் கொடுப்பதன்மூலம் அந்தப் பிள்ளைகளையும் குடும்பச் சூழலில் உள நலத்தோடு வாழ வழிசெய்யலாம். இதற்கு மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு, நீதி அமைச்சோடு இணைந்து ஆவன செய்யவேண்டுமெனக் கேட்டுக்கொண்டு எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Faiszer Musthapha. You have 17 minutes.

[1.09 p.m.]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Chairman, I am thankful to you for giving me the opportunity to speak at the Committee Stage Discussion on the Votes of the Ministry of Women and Child Affairs. Today is also the International Women's Day.

Sir, Sri Lanka has achieved a lot in relation to women. We had the first woman Head of State in the world. At present, our Prime Minister is a woman, our Chief Justice is a woman and we have the highest number of women representing Parliament compared to any other era. So, as regards to women, we have them in high offices. We also have a woman DIG. So, women are holding high offices all over. Even at the local government level, Sir, we have over 23 per cent women. The Provincial Councils Elections Act also provides for a 25 per cent quota for women. So, overall, Sri Lankan women are progressive; we have achieved a lot.

But, unfortunately, Hon. Minister, we have a male-chauvinistic society. We have a 52 per cent women population, but how many of our women are part of our workforce is a question. There is an issue which I would like to raise with regard to Muslim women in this country. As you are aware, the Muslim Marriage and Divorce Act was brought about in 1951. The community has been agitating with regard to certain reforms. There have been various committees, various meetings. We, as Muslim politicians, also should be held responsible for not bringing in certain amendments that should have been brought in. Hon. Minister, you are aware of it. Also as you are aware, in terms of the general Marriage Registration Ordinance, the age of marriage is 18. The Muslims, as a community, are at a consensus that it should be 18. So, Hon. Minister, I do not think there is any impediment for you to bring in that reform and for exceptional circumstances, there should be a proviso. In addition, if you take the Muslim women's right to sign the marriage certificate or give consent, we should bring in reform to provide for a Muslim woman, at the time of marriage, to sign the marriage certificate. That is an urgent reform needed and I do not think you need to wait any longer because there is a consensus among the community to do that.

Then, if you take our Quazi Court system, that is where our divorces are adjudicated while other divorces are adjudicated in the District Court. We need the Quazi Court system because it deals with a personal law to us, but it needs to be strengthened. We need to bring in an amendment under which women are entitled to be members or judges of the Quazi Court. That is also an urgent reform. Further, District Court lawyers, who are adjudicating, become judges. We also need to have persons of competence to be appointed to Quazi Courts. So, consider appointing judges to the Quazi Court also. Their salaries and the facilities should be attractive, if you are to bring about that change. So, as regards the Muslim Marriage and Divorce Act, urgent reforms are needed and I hope you would consider bringing them in as soon as possible.

In addition, if you take maintenance, it is adjudicated in the Magistrate's Court. But, if a Muslim woman wants to get maintenance, she first has to go to the Quazi Court, get an order and then get it enforced by the Magistrate's Court. So, I would suggest that you make provision for a direct mechanism, through which a Muslim woman also can go direct to the Magistrate's Court and seek maintenance.

Hon. Minister, with regard to the Judiciary, I have to bring up an issue, which does not come under your Ministerial Consultative Committee, but is a matter of national importance.

At present, in relation to the appointment of Judges from the High Court to the Court of Appeal, there are three institutions involved. That is, the President, the Chief Justice and the Constitutional Council. Even though there is no constitutional process for recommending judges' names to the Constitutional Council, the President, by convention, consults the Chief Justice on the basis that the Chief Justice is the Head of the Judiciary. Unfortunately, in Sri Lanka, when a person's appointment or a promotion is due, we have a petition culture, not only in the Judiciary, but everywhere. If anybody is to get a promotion, there would always be a petition trying to prevent his promotion, which results in the person who is entitled to the promotion by virtue of seniority being overlooked on the basis that an inquiry has been initiated on a petition. So, that results in, on certain occasions, the persons who are entitled to promotions being overlooked on the basis of an inquiry. Some frivolous petitions have been lodged purely to deprive the promotions. Consequent to the names being sent to the Constitutional Council, deliberations are being held only with regard to the suitability of the names that have been sent and they do not touch upon the names of the seniormost judges who have been overlooked. The deliberations do not provide for a mechanism where a judge entitled to a promotion by way of seniority and against whom a purported complaint has been made is granted an

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

opportunity to provide a repudiation or an explanation as regards to the complaint. As you know, there are legitimate expectations with regard to everybody, but when it comes to judges, we do not have that. And also, when a seniormost judge is overlooked - they also have families - the society looks at them in a different way. So, there needs to be a collective process where a seniormost judge, who feels that his name has unjustly not been recommended, could place his grievance before the Chief Justice and the Constitutional Council and the merits and demerits of his grievance would be considered before depriving that seniormost judge the promotion. Sir, I wanted myself to be clear in this because this deals with the Judiciary.

Now, I come to what is under discussion today. Hon. Minister, something which I believe is important are day-care centres. If we are to get more women into our workforce, we need to improve the quality of the day-care centres for their children and also have more day-care centres within organizations. Even the private sector should be compelled to have such day-care centres. That is the only way of attracting more women to join the workforce. Also, when women work overseas, as housemaids or otherwise, there should be a mechanism to look after the welfare of their children by having day-care centres and by assuring that they are not deprived of preschool education.

Another important matter, Hon. Minister, is the estate wages. Today, an estate worker gets a daily wage of Rs. 1,350. Socially and economically, the most deprived in Sri Lanka are the estate workers. I think at the Wages Board, the last regime tried to increase it to Rs. 2,000. Members of your party also were mebers of the Wages Board. I would urge you to speak to the Minister of Plantation and Community Infrastructure and the Minister of Labour and see that a wage of Rs. 2,000 is given to them because, always, you have estate owners milking profits and not giving the estate employee that Rs. 2,000 wage.

That is justly due. And, I believe that the estate women are the most affected. I started my politics from the Ceylon Workers' Congress. Therefore, the estate worker is always a subject which I would touch upon.

Then, Hon. Minister, I would like to read from a report with regard to rape and domestic violence in this country. It states, "One of the greatest problems in the country is the gender-based violence against women, especially in the public transport system." So, that has also been raised in it. As per a UN survey conducted in 2013, the "Daily Mirror" Editorial of 05th of March 2025 reports, three out of five women are victims of domestic violence and a woman is raped every 90 minutes in our country! However, less than five per cent of the culprits are brought to book. We have a mechanism with regard to domestic violence; it is a very powerful tool. So, you could work with the police and have awareness programmes to bring the provisions of the Prevention of Domestic Violence Act into public domain. In terms of the Prevention of Domestic Violence Act, if a woman is abused or threatened, she can go to the Magistrate's Court and get a restraining order. But, unfortunately, women are not aware of it. It is a very simple mechanism, but a very powerful tool. You can get a restraining order to prevent the man who purports violence against his wife from even coming home. Therefore, please look at it because that is a very important aspect.

Then, let us look at women who go overseas for employment. Unfortunately, the majority of the women go as housemaids and they are unskilled workers or skilled at a lower level. We need to promote more skilled women leaving the country for employment overseas. When women go as housemaids, there is a grave social cost and that also should be looked into. We should try to discourage women who have young children from going overseas as housemaids by giving them income-earning opportunities in Sri Lanka and empowering them. I believe a lot of self-employment programmes have been initiated and thereby, a lot of women who thought they need to go abroad have opted otherwise, not to leave the country.

Another important issue that women in this country face is sexual harassment at workplace. We have a society where women are shy to go and complain that they are being sexually harassed by their bosses. So, sexual harassment takes place in Sri Lanka. You have a lot of people in power against whom there are cases of sexual harassments filed by employees. So, you should have a 24-hour call centre which deals with issue of sexual harassment. You must encourage women who are raped, sexually harassed or subject to domestic violence to bring the culprits to book. Unfortunately, they feel that there is a social stigma. A woman who is raped is scared to go and make a complaint to the police thinking that if she goes and makes a complaint, the society would look at her in a different way. Unfortunately, she is the victim. So, we need to educate the society also that these people should not be looked at in a different way. Unfortunately, when a woman is raped, she - the victim - has difficulty in finding a partner. So, this is a serious issue, which we really need to look at.

In addition, if you take children in this country, child abuse takes place at a greater rate, against which we need to bring in a mechanism. Generally, if you take schools, there are instances where teachers have sexually harassed children.

But, a child is not aware what sexually harassed means. So, they should include it in the school curriculum and every school should conduct programmes to explain children that if anybody sexually harasses them, the law would take care of them. In addition, in schools, there should be a mechanism where there is a special, dedicated person - either the principal or a special person assigned - to whom any child, who is sexually harassed by their school teacher or by any other teacher, could go and complain because sexual harassment of children is on the rise. So, that also has to be looked at very seriously.

In addition, if you look at opportunities given, the children in the North have suffered a great deal. They are victims of war. So, we need a special programme to empower them. You need to give more focus on widows and orphans, especially in the Northern Province. We need to address their problems because they have really suffered during that period. So, how do we empower them? I am sure we could get a lot of foreign aid for that and that Sri Lankan expats living abroad would also contribute immensely towards such a programme. So, if you could initiate a specific programme to empower those widows and children who have suffered in the North and accelerate that programme, it would be a great help socially because they really need upliftment.

Hon. Minister, you have been given a Ministry and a task - 52 per cent of women in this country look up to you - to change their economic and social standard. I believe you could give leadership to them and hope you would take cognizance of certain issues I raised with regard to children and empowering women.

Thank you, Hon. Chairman.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු සභාපතිතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

බොහොම ස්තුතියි, අපේ ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමාගේ යෝජනා සියල්ලටම. ඔබතුමා බොහොම සාධනීය කරුණු ටිකක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම මුස්ලිම් විවාහ සහ දික්කසාද නීතිය සම්බන්ධ කාරණාව ගත්තාම, ඒක පෞද්ගලික නීතියක් හැටියට තමයි අපි සලකන්නේ. ඇත්තටම එහිදී ඔබතුමා කථා කළා වාගේම අපි බලාපොරොත්තු වුණු එකම දේ දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීමයි. ළමයින්ට අධ්‍යාපනය ලබා දීම කියන කාරණාව සම්බන්ධයෙන් තමයි අපි පෙනී ඉන්නේ. මම මේ අවස්ථාවේදී ඉතාම වගකීමෙන් කියනවා, අපි ඒකපාර්ශ්විකව - තනිවම - කිසිදු සංස්කරණයක් සිදු කරන්නේ නැහැ කියන එක. ඔබතුමන්ලා, සිවිල් සංවිධාන, ආගමික සංවිධාන ඇතුළු අපි සියලුදෙනාම එකතු වෙලා වඩාත් හොඳ තීරණයකට යමු. ඒ වෙනුවෙන් අපි multi-sectoral committee එකක් පත් කරනවා කියන කාරණාව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Mrs.) Samanmali Gunasingha. You have 12 minutes.

[අ.භා. 1.25]

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු සභාපතිතුමනි, අද දින කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරද්දී මුලින්ම මම ස්තුතිවන්ත වෙනවා, පසුගිය අවුරුදු දෙකක කාලයක් තිස්සේ අපේ රටේ දේශපාලනිකව සවිබලගැන්විලා, නායිකාවන් විධියට ඉස්සරහට ඇවිල්ලා, මේ රට තුළ සමාජ වෙනසක් කරන්න මහන්සි වුණු, දායක වුණු සියලු කාන්තාවන්ට. මොකද, මේ දසවන පාර්ලිමේන්තුව තුළට මන්ත්‍රීවරියන් බහුතරයකට පැමිණීමට අවස්ථාව සලසා දුන්නේ මේ රටේ සැබෑ වෙනසක් කරපු අපේ රටේ ධෛර්යවන්ත ගැහැනුන් විසින්. ඒ වෙනුවෙන් මම ඔවුන්ට නැවතත් ස්තුතිවන්ත වෙනවා. අද මේ ආණ්ඩුවේ වාඩිවෙලා ඉන්න මන්ත්‍රීවරියන් කරන ඒ කැප කිරීම, මහන්සිය තුළින් තමයි හෙට දවසේදී අපි නියම නායිකාවන් කවුද කියලා රටට පෙන්වන්නේ. සමහර අය ඇහුවා, ක්‍රියාකාරීත්වයයි අපට ඕනෑ, කෝ ක්‍රියාකාරීත්වය කියලා. වර්ෂ ගණනාවක් මේ පාර්ලිමේන්තුවේ දේශපාලනය කරපු සමහර නායිකාවන්ට බැරි වුණා, තමන්ට පස්සේ ඒ නායකත්වය දෙන මන්ත්‍රීවරියන් මේ සභාවට ගෙනෙන්න. හැබැයි, අපේ රටේ කාන්තාවන්ට දේශපාලන වශයෙන් උගන්වලා, සවිබලගන්වලා අපට පුළුවන් වුණා, ඉතිහාසය වෙනස් කරන්න. පාර්ලිමේන්තුවත් අයිති කාන්තාවන්ට. ඒ නිසා අපි මේ ඉතිහාසය ක්‍රම ක්‍රමයෙන් වෙනස් කරලා බහුතරයක් කාන්තාවන්ට පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වන විධියේ දේශපාලන වටපිටාවක් හදනවා. ඒ වාගේම තමයි, කෝ මේ ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය? ප්‍රශ්න ගොඩක් ඉතුරු කරලා තිබුණේ. හැබැයි, අපි ඒ ප්‍රශ්නවලට උත්තර හොයන ආණ්ඩුවක්. ඒ ප්‍රශ්නවලට උත්තර හොයන්න හැම අමාත්‍යාංශයකටම අතිවිශාල මුදල් ප්‍රමාණයක් කාන්තාවන් සඳහා වෙන් කරලා තිබෙනවා. ඒ නිසා තමයි මගේ කථාව තුළ මම හැම විටම කියන්නේ මේ අය වැය "ස්ත්‍රීවාදී" අය වැයක් කියලා. හැබැයි, අපේ රටේ කාන්තාවන්ට උරුම වෙලා තිබුණු පරිසරය මොකක්ද? මේ කාන්තා දිනයේ මගේ ඇස ගැටුණු කියමනක් මම කියවන්නම්.

"ගැහැනු අපිට මහන්සියි - උයලා මහන්සියි - කවලා මහන්සියි - නිදි මරලා මහන්සියි - උදේට නැඟිටලා මහන්සියි - ගෙදර වැඩ කරලා මහන්සියි - ළමයි බලලා මහන්සියි - ඔසප් වෙලා මහන්සියි - දරුවෝ ලැබිලා මහන්සියි - කිරි දීලා මහන්සියි - සංස්කෘතිය රැකලා මහන්සියි - ආගම පරිස්සම් කරලා මහන්සියි - නම්බුව බේරලා මහන්සියි - කථා අහලා මහන්සියි - ගුටි කාලා මහන්සියි - ලජ්ජා වෙලා මහන්සියි"

ඔව්, අපේ රටේ කාන්තාවන්ට ගොඩක් මහන්සියි. ඇය පවුල වෙනුවෙන් විතරක් නොවෙයි වැඩ කරන්නේ. සමාජය රැක ගැනීම සඳහාත්, සමාජ ප්‍රගමනය සඳහාත්, අපේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහාත් ඇය වැඩ කරනවා. ඒ නිසා ඇයට මහන්සියි. මේ 114වන ජාත්‍යන්තර කාන්තා දිනයේදී මම අපේ රටේ හැම පුරවැසියෙකුගෙන්ම ඉල්ලන එක දෙයක් තිබෙනවා. ඒ තමයි, අපේ රටේ ගැහැනුන්ට ගොඩක් මහන්සියි. ඒ නිසා ඔබ ඇයට උදව් වෙන්න. ඇයට උදව්වක් කරන්න; ඇය ආරක්ෂා කරන්න; ඇයට ගෞරව කරන්න. එතකොට ඇයටත් දැනෙනවා, ඇය ජීවත් වෙනවා කියලා. එවිට තමන්ගේ පවුලටත්, රටටත්, ආර්ථිකයටත් කරන සේවය ඇය සතුටින් කරයි; එය දෙගුණ තෙගුණව කරයි. ඇයට ඔබේ උදව් ඕනෑ. ඔබ උදව් කරන්නේ ඒ ගැහැනියට පමණක් නොවෙයි. ගැහැනිය ශක්තිමත් වීමත් සමඟ ආර්ථිකය ශක්තිමත් වෙනවා; සමාජය ශක්තිමත් වෙනවා. සමාජය ශක්තිමත් වීමත් සමඟ අපට ඒ ප්‍රතිලාභය නැවතත් සමාජ සංවර්ධනයටම දායක කර ගන්න පුළුවන් වෙනවා. එම නිසා මේක චක්‍රයක්. හැබැයි, ඔබ ඒ පහන නිවනවා නම්, මොකක්ද ඇති වන තත්ත්වය? අරුන්දති රෝයි කියලා තිබෙනවා, "ගැහැනියගේ දීප්තිය ගිනි සිළුවටත් වඩා වැඩියි" කියලා. හැබැයි, ඒ ගිනි සිළුව නිවා දමන්නේ පිරිමින් විතරක්ම නොවෙයි. මොකද, තවත් එක් අම්මා කෙනෙක් විසින් තමයි ඒ පිරිමියා ගොඩනහන්නේ. එම නිසා අපි මේ ප්‍රශ්නය මෙහෙම ලියාගෙන හරියන්නේ නැහැ.

අපේ අය වැයෙන් මුදල් වෙන් කරන්නේ ගැහැනිය ශක්තිමත් කරන්න පමණක් නොවෙයි. පවුල ශක්තිමත් කරන්න, ඒ ගැහැනියගේ ආර්ථිකය ශක්තිමත් කරන්න, සමාජය ශක්තිමත් කරන්න.

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

ඒ නිසා දුප්පත්කම ඉහ වහා ගිය පරිසරයකට, දුප්පත්කම නිර්මාණය කරපු සමාජයකට බැහැ පවුල, දරුවන් ආරක්ෂා කරන්න. මේ දුගීභාවය වෙනස් කරන එක අද අපට තිබෙන අභියෝගයක්. ඒක තමයි අපි තේරුම් අරගෙන තිබෙන්නේ. මේ අවුරුදු පහ ඇතුළත ලක්ෂ 20ක් අපි ඉලක්ක කරලා තිබෙනවා, ඒ අයගේ දුගීභාවය කොහොමද නැති කරන්නේ කියලා. ඒ දුගීභාවය නැති කරන එක තුළ තමයි ගැහැනියගේ, දරුවන්ගේ අයිතිවාසිකම් ලැබෙන්නේ. සමාජය දියුණු වෙන්න, දියුණු වෙන්න අධ්‍යාපනය ලැබෙන්න, ලැබෙන්න ඒකේ අයිතිය, ඒකේ කොටස්කරුවන් වෙන්න ගැහැනියටත්, සමාජයටත් හැකියාවක් ලැබෙනවා.

ඒ වාගේම මම තව කාරණාවක් කියන්න කැමැතියි. පසුගිය කාලයේ හිටපු දේශපාලනඥයන්ට උදව් වුණු කණ්ඩායමක් හිටියා. අපේ පොලිස් නිලධාරිනියන්ගෙන් ඒගොල්ලන්ට කුඩේ අල්ලපු අය හිටියා, ඒ අයගේ සපත්තු පොලිෂ් කරපු අය හිටියා, ඒ අයගේ කට්ට ගහපු අය හිටියා. හැබැයි, පසුගිය කාලයේදී පොලිස් නිලධාරිනියන් නීතිය ආරක්ෂා කරන්න මේ සමාජයේ යම් වැඩ කොටසකට දායක වුණත්, අඩුම ගණනේ ඒ පොලිස් නිලධාරිනියන්ට සපත්තු දෙකක් තිබෙනවාද කියලා බලන්න මේ දේශපාලනඥයන්ට බැරි වෙලා තිබුණා. මේ පාර්ලිමේන්තුවේ හිටියා නේ, මන්ත්‍රීවරියන්. ඒ සේවාවත් ගත්තා. හැබැයි, 2018 ඉඳන් පොලිස් නිලධාරිනියන්ට සපත්තු දෙකක් තිබෙනවාද, නැද්ද කියලාවත් බලන්න ඒ අය අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ නව රජය ඒ අපහසුතාවට පත් වෙලා හිටපු පොලිස් නිලධාරිනියන්ට ඒ අවශ්‍යතා ඉෂ්ට කරන්න කටයුතු කරනවා කියලා ඒ අදාළ අමාත්‍යාංශයේ නිලධාරීන් වාගේම ඇමතිතුමා පොරොන්දු වෙලා තිබෙනවා.

ඊළඟට මම කථා කරන්න කැමැතියි, අපේ රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ගෙනැල්ලා දෙන, මෙරට විදේශ සංචිතය වැඩි කරන විදෙස්ගත ශ්‍රමිකයන් ගැන. ඇමෙරිකානු ඩොලර් බිලියන 6.095ක් අපට ගෙනැල්ලා දෙන්නේ විදේශගත ශ්‍රමිකයන්. ඒ විදේශගත ශ්‍රමිකයන් පිළිබඳව මම කථා කරන්න ගත්තේ ඔවුන් මේ රට දාලා යන්නේ ඇයි කියන කාරණය පැහැදිලි කරන්නයි. ඔවුන්ට රට දාලා යන්න සිදු වුණේ ඇයි? අපි හදලා නැහැ, ආර්ථිකයක්. අපි හදලා නැහැ, ඔවුන්ට ජීවත් වෙන්න පරිසරයක්. අපි හදලා නැහැ, ඔවුන්ට දරුවන් එක්ක පවුලක් විධියට මේ රට තුළ රැකිලා ඉන්න සමාජයක්; ඔවුන්ට පුළුවන් විධියට ඒ දරුවන්, එහෙම නැත්නම් ඒ පවුල එක්ක ආදරයෙන් ඉන්න සමාජයක්. ඒ නිසා අපේ අම්මලා, අපේ අක්කලා, අපේ නංගිලා දහස් ගණන් විදේශගත වෙලා තිබෙනවා.

අපේ රටෙන් විදේශගත වූ සංඛ්‍යාව බැලුවොත්, 2019 වර්ෂයේදී විදේශගත වුණු සංඛ්‍යාවෙන් සියයට 60.2ක් පුරුෂයන්. හැබැයි, 2019 වර්ෂයේදී කාන්තාවනුත් සියයට 60.5ක් විදේශගත වෙන්න ඉල්ලුම් කරලා තිබෙනවා. ඒ වාගේම 2019 වර්ෂයේදී ගෘහ සේවිකාවන් විධියට කාන්තාවන් 61,489ක් විදේශගත වෙලා තිබෙනවා. ප්‍රතිශතයක් විධියට ගත්තොත්, ඒ අවුරුද්දේ විදේශගත ප්‍රමාණය 30.3ක්. 2020 වෙනකොට -කොවිඩ් වසංගතය කාලයේ- විදේශගත වුණු ගෘහ සේවිකාවන් ප්‍රමාණය 15,332ක් දක්වා අඩු වෙලා තිබෙනවා. හැබැයි, 2023 වෙනකොට ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වන ප්‍රමාණය 100,876ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. නැවතත් ඒක සියයට 33.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2024 වසරේ 93,808ක් ගෘහ සේවිකාවන් විධියට විදේශගත වෙලා තිබෙනවා. එය ප්‍රතිශතයක් විධියට 29.9ක්.

විශේෂයෙන් මැදපෙරදිග ගෘහ සේවිකාවන් විධියට තමයි අපේ කාන්තාවන් විදේශගත වෙන්නේ. 2021දී මැදපෙරදිග රටවලින් අපට ලැබෙනවා, අපේ මුළු විදේශ විනිමය ප්‍රමාණයෙන් සියයට 51.6ක්. ඒ වාගේම 2022දී සියයට 65.8ක්, 2023දී සියයට 65.6ක් මැදපෙරදිග රටවලින් අපට ලැබී තිබෙනවා. ඒ අනුව අපට විදේශ ප්‍රේෂණවලින් බහුතරයක් ලැබෙන්නේ විදේශගත අපේ ශ්‍රමිකයන්ගෙන්.

ගරු සභාපතිතුමනි, අපට විදේශ ප්‍රේෂණ එවන එම ගෘහ සේවිකාවන්ගේ ප්‍රශ්න කිහිපයක් ගැන මේ කෙටි වෙලාව ඇතුළත මම කියන්න කැමැතියි. මම කලින් කිව්වා වාගේම, තමන්ගේ සියලු සම්බන්ධතා අත්හැරලා ඈත රටකට ගිහිල්ලා ශ්‍රමය වැය කරලා තමයි අපේ අම්මලා අපේ රටට මේ ප්‍රේෂණ එවන්නේ. හැබැයි ඔවුන් හරි අමාරුවෙන් විදේශගත වෙන්නේ. මිනිස් ජාවාරම්වලට හසුවෙලා ඔවුන් විකිණෙනවා. ඒ නිසා නිශ්චිත පුහුණුවක් සහිතව යම් කිසි සේවා දායකයෙක් එක්ක ඇතිකර ගන්නා ගිවිසුමක් මත ඔවුන්ට විදේශගත වෙන්න අවස්ථාව සලසන්න පුළුවන් නම්, ඒ අයට සිද්ධ වෙන හිංසනය හා පීඩනය අඩු වෙනවා. ඒ නිසා රජයක් විධියට අපි පුළුවන් තරම් උත්සාහ ගන්නේ, ඔවුන්ට යම් පුහුණුවක් ලබා දීලා යම් ගිවිසුමක් මත විදේශගත වෙන්න අවස්ථාව සලසා දෙන්නයි. එතකොට අපේ කාන්තාවන්ට යම් සුරක්ෂිතභාවයක් තිබෙනවා.

ඒ වාගේම ඔවුන් විදේශගත වෙලා විශාල මුදල් ප්‍රමාණයක් අපේ රටට එවනවා වුණත් මෙතෙක් කල් ඔවුන්ට විශ්‍රාම වැටුපක් ලැබිලා නැහැ. ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීමක් තමයි විශ්‍රාම වැටුපක් ලබා දෙන්න කියන එක. ඒ නිසා මේ අය වැයෙන් අපි විදේශගත ශ්‍රමිකයන්ටත් -ආයතනගත නොවුණු, විශ්‍රාම වැටුප් නොලබන විශාල පිරිසක් මේ අතර ඉන්නවා- දායක විශ්‍රාම වැටුපක් ලබා දීම සඳහා මූලික පියවර මේ අය වැයෙන් අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි ඔවුන්ට ණය පහසුකමක් ලබා දෙන්න ආයතනයක් නැහැ. ඔවුන් අපේ රටට බිලියන ගණන් මුදල් එව්වත්, ඔවුන්ට ණයක් දෙන්න බැංකුවක් නැහැ. ඔවුන් අපේ රටට මුදල් එවන්නේ බැංකු හරහා. ඒ නිසා අපි උත්සාහ කරනවා, ඔවුන්ගේ ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා, ව්‍යාපාර කටයුත්තක් කර ගැනීම සඳහා යම් ණය වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ වාගේම තමයි ඔවුන්ගේ දරුවන් වෙනුවෙන්, ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් මේ අය වැය පුරාවටම විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා අපේ කාන්තාවන් හා ළමයින් වෙනුවෙන්, අගතියට පත් ළමයින් හා කාන්තාවන් වෙනුවෙන් කථාවට එහා ගිය, ක්‍රියාත්මක වෙන, ඇත්ත වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ තිබෙනවා. ඒ සඳහා අපි ක්‍රියාත්මක වෙමින් සිටිනවා. මේ පළමුවැනි අය වැයෙන් වාගේම ඉදිරි අවුරුදු කිහිපය තුළත් අපේ රටේ කාන්තාවන් ඉස්සරහට ගෙනෙන්න, සවිබලගන්වන්න, සමාජයීය වශයෙන් ඔවුන් ඉස්සරහට ගෙන යන්න, අගය කළ යුතු කෙනෙක් බවට පත් කරන්න අපි උත්සාහ ගන්නවා.

බොහොම ස්තුතියි, කාලය ලබා දුන්නාට, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Chanaka Madugoda. You have 14 minutes.

[අ.භා. 1.40]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි මේ අවස්ථාව ලබා දුන්නාට.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගෙන තිබෙන අද දවසේදී පළමුවෙන්ම මම සෑම අංශයකින්ම නොබියව ඉදිරියට යන සමස්ත ශ්‍රී ලාංකීය කාන්තාවන්ට අපේ පක්ෂයේ -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ- සුබ පැතුම් එක් කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

අද ලෝක කාන්තා දිනය තේමා කරගෙන, ඒ දවසත් අර්ථවත් කරමින් මේ සමස්ත සභාව අද උදේ ඉඳන් කථා කළා. අපි සතුටු වෙනවා, වත්මන් පාර්ලිමේන්තුවට, ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට ඉහළ කාන්තා නියෝජනයක් ලැබීම ගැන. එතුමියලා තම කාර්ය භාරය ඉතාම හොඳින් ඉටු කරන වෙලාවක්, මෙය. ඒ අනුව අද දවස සමස්ත ශ්‍රී ලාංකීය කාන්තාවට යම් වටිනාකමක් එකතු කරපු දවසක්.

ශ්‍රී ලාංකික කාන්තාව ගැන කථා කරන කොට අපට අමතක කරන්න බැහැ, ලෝක ඉතිහාසයේ පළමුවෙනි කාන්තා අගමැතිතුමිය වුණු සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය. එතුමිය සමස්ත කාන්තාවට ලබා දීපු ඒ ගෞරවය ලෝක ඉතිහාසයට එක් වන අයුරින් කටයුතු කළා. ඒ වාගේම ශ්‍රී ලාංකීය කාන්තාවට තවත් වටිනාකමක් ලබා දුන්නා, හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය. එතුමියත් සමස්ත කාන්තාවට ගෞරවයක්, වටිනාකමක් එක් කර දුන්නා. ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා සතුටු වෙන්න ඕනෑ ඔබතුමන්ලාගේ ගරු අගමැතිතුමිය අද ශ්‍රී ලාංකීය කාන්තාවට වටිනාකමක් එක් කරමින් කටයුතු කරන එක ගැන. ඒ වාගේම අපේ මේ සභාවේ, අපේ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරය දරන්නේත් කාන්තාවක්. ඒ අනුව මේ රටේ සමස්ත ව්‍යුහය තුළ ඉතාම හොඳ වටිනාකමක් මේ රටේ කාන්තාවට ලැබී තිබෙනවා. ඒ ලැබුණු වටිනාකම ඉදිරියට ගෙන යෑම, ඒ ලැබුණු වටිනාකම තවත් වර්ධනය කිරීම, ඒ ලැබුණු වටිනාකමට තවත් ගෞරවයක් එක් කර දීම වාගේම තිබෙන අඩු පාඩුකම්වලට, ගැටලුවලට උත්තර සෙවීම තමයි අප අද දවසේ සිදු කළ යුත්තේ. මා ඒ කාරණය විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, කාන්තාව පිළිබඳව කථා කරන කොට අපේ ගම්වල ඔබ අප ඇතුළු සියලුදෙනා දකින දෙයක් තිබෙනවා. ඒ තමයි, කාන්තාවන් විශාල පිරිසක් ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ ගොදුරක් වී සිටීම. සමහර කාන්තාවන් ඒ ණය උගුලට ගොදුරු වන්නේ තමන්ගේ ස්වාමි පුරුෂයා පවා නොදැනුවත්වයි. ඒ කියන්නේ, තමන්ගේ ස්වාමි පුරුෂයා දැනුවත් කරලා නොවෙයි. ගෙදර දොරේ කටයුතුවලට, දරුවන්ගේ අධ්‍යාපනයට ක්ෂණිකව ලබා ගන්නා මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා ග්‍රාමීය කාන්තාව සමහර විට ඒ උගුලට හසු වෙනවා. ඒ නිසා මම මේ සභාවට යෝජනාවක් කරනවා, ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමයට, ක්ෂණිකව ලබා දෙන ණය ක්‍රමයට රජය විධියට යම් විසඳුමක් ලබා දිය යුතුයි කියලා; යම් එකතුවක් කළ යුතුයි කියලා. අපේ සමෘද්ධි සංවර්ධන බැංකු හැම තැනම ක්‍රියාත්මක වෙනවා. ග්‍රාමීයව කණ්ඩායම් සමිතිවලට වාගේ විවිධ ක්‍රමවලට ඒ බැංකු ණය ලබා දෙනවා. ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන බැංකු හරහා අපේ කාන්තාවන්ට ක්ෂණික ණය ක්‍රමයක් හදලා දෙන්න අපට පුළුවන් නම් ඒක වටිනවා කියන කාරණය විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ.

කාන්තාව හා බැඳුණු, ළමයා හා බැඳුණු විශේෂිතම ආයතනයක් තමයි පෙර පාසල, එහෙම නැත්නම් මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානය කියන්නේ. අපි දන්නවා පෙර පාසල් ගුරුතුමියට පළමුවෙන්ම වටිනාකමක් ලැබුණේ කොහොමද කියන කාරණය. අපට ඒක අමතක කරලා කථා කරන්න බැහැ. රුපියල් 250ක දීමනාවක් ලබමින් සිටි පෙර පාසල් ගුරුතුමියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුව රුපියල් 2,500 දක්වා යම්කිසි එකතුවක් කළා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ඒකට තවත් රුපියල් 2,500ක එකතුවක් කරමින් පෙර පාසල් ගුරුතුමිය රුපියල් 5,000ක දීමනාවක් ලබන තැනට පත් කළා. හැබැයි අද ඔබේ ආණ්ඩුව එයට තවත් රුපියල් 1,000ක මුදලක් එක් කර තිබෙනවා. අපි සතුටු වෙනවා මුදලේ වටිනාකමට වඩා ඔබතුමන්ලා පෙර පාසල් ගුරුතුමිය වෙනුවෙන් අවධානය යොමු කිරීම ගැන; කටයුතු කිරීම ගැන.

ගරු සභාපතිතුමනි, අපට පෙර පාසල් ගුරුතුමියගෙන් වන සේවය රුපියල් 5,000ට, 6,000ට ලඟු කරන්න පුළුවන්ද? මේ රටේ, සමාජයේ හැමෝම පිළිගන්නා කාරණයක් තමයි මුල් ළමා විය සංවර්ධනය. පෙර පාසල තමයි මේ රටේ අනාගතය තීරණය වන තැන. රටේ අනාගතය තීරණය කරන මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානය -පෙර පාසල- කියන තැන ඉතාම ගෞරවනීය වෘත්තියක නියැළෙන පෙර පාසල් ගුරුතුමිය පිළිබඳව අපට මීට වඩා හිතන්න පුළුවන් නම්, පෙර පාසල් ගුරුතුමියගේ දීමනාව අවම වශයෙන් රුපියල් 10,000ක්, 15,000ක් දක්වා ගෙන යන්න පුළුවන් නම්, ඒ සඳහා ඔබේ ආණ්ඩුවට ඉදිරි අය වැයවලින් යම් එකතුවක් කරන්න පුළුවන් නම් වටිනවා කියන කාරණය මම මේ මොහොතේ සඳහන් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම මේ මොහොත වන විට පෙර පාසල් විෂය පිළිබඳව පෙර පාසල් ගුරුවරියගේ දැනුම යාවත්කාලීන වෙනවාද කියන කාරණය පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා.

පෙර පාසල් ගුරුතුමිය කියන්නේ මේ රටේ අනාගතය තීරණය කරන තැනැත්තිය. ඒ නිසා එතුමිය දැනුමෙන් පොහොසත් කරන්න ඕනෑ; දැනුමෙන් යාවත්කාලීන කරන්න ඕනෑ. අපි ඒ පිළිබඳව හිතන්න ඕනෑ. පෙර පාසල් ගුරුතුමියට අපි අපේ දරුවා යොමු කරන කොට, පෙර පාසලට එකතු වන අපේ දරුවා තුළ තිබෙන යම් යම් රෝගාබාධ පිළිබඳව, විවිධ කාරණා පිළිබඳව එතුමියට අවබෝධයක් ලබා දෙන්න ඕනෑ. ශ්‍රවණාබාධ වෙන්න පුළුවන්, ඇස් පෙනීමේ දුර්වලතා වෙන්න පුළුවන්, ඒ දේවල් මුලින්ම හඳුනා ගන්නේ පෙර පාසල තුළින්. ඒ නිසා පෙර පාසල් ගුරුතුමියට ඒ විෂය පිළිබඳ, ඒ කරුණු පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න අපට පුළුවන් නම් ඒක වටිනවා කියන කාරණය මම මේ මොහොතේ සඳහන් කරනවා.

ගරු සභාපතිතුමනි, මෙහිදී විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි දන්නවා, පෙර පාසල් ගුරුතුමිය දැනුමෙන් සන්නද්ධ කරලා එතුමියට වටිනාකමක් ලබා දිය යුතුයි කියා. දැයේ දරුවන් පෝෂණය කරලා, දැයේ දරුවන් ගොඩ නහලා පෙර පාසල් ගුරුතුමිය විශ්‍රාම යන කොට, පෙර පාසලෙන් ඉවත් වන කොට එතුමියට රැකවරණයක් නැත්නම්, එය කනගාටුවට කරුණක්. ඒ අයට සුදුසු විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කරන්න අපට පුළුවන් නම්, යම් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදලා දෙන්න අපට පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මේ මොහොතේ සඳහන් කරන්න ඕනෑ.

මේ මොහොතේ සඳහන් කරන්න ඕනෑ තවත් වැදගත් කාරණයක් තිබෙනවා. රජය යටතේ ඇති පරිවාස දෙපාර්තමේන්තුව හරහා ළමා නිවාස රාශියක් නඩත්තු වෙනවා; ක්‍රියාත්මක වෙනවා. මා පළාත් සභා නියෝජනය කරන කොට ළමා නිවාස සම්බන්ධයෙන් විමසා තිබෙනවා; අපි ගිහින් ඒවා බලලා තිබෙනවා. අපි ඒ තුළ විවෘතභාවයක් දකින්නේ නැහැ. ළමයා කොටු කරලා, හිර කරලා, පීඩනයට පත් කරලා ළමයාගේ මානසිකත්වය බින්දුවට වටිනා ආකාරයට තමයි සමහර ළමා නිවාස ක්‍රියාත්මක වෙන්නේ. එම නිසා මේ දියුණු ලෝකය තුළ තිබෙන විවිධ ක්‍රම, විශේෂයෙන්ම SOS ළමා ගම්මාන වැඩසටහන වැනි ක්‍රම අපේ ළමා නිවාස තුළට එකතු කරන්න පුළුවන් නම් හොඳයි. මොකද, ඒ තුළ තිබෙනවා "සෑම ළමයෙකුටම ආදරණීය පවුලක්" කියන තේමාව; සංකල්පය. පෞරුෂය, විවෘතභාවය,

[ගරු චානක මාදුගොඩ මහතා]

සමාජයට මුසු වන ආකාරය යන කාරණාවලට ඉතා ඉක්මනින් අනුගත වෙමින් කටයුතු කරන දරුවන් බවට SOS ළමා ගම්මානයේ දරුවන් අද පත් වෙලා සිටිනවා. එවැනි ක්‍රමයක් මේ රජය තුළින් ද ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් වටිනවා. එසේ කරන්න කියන යෝජනාව මම මේ මොහොතේ මේ ගරු සභාව හමුවේ කරනවා.

ඒ වාගේම අප දකින තවත් කාරණයක් තිබෙනවා. පීඩිත දෙමාපියන්, පහළ ග්‍රාමීය ආර්ථිකයේ ඉන්න දෙමාපියන් අද සමහර අවස්ථාවල මානසික ගැටලුවලට මුහුණ දෙනවා. තමන්ගේ දරුවා බිහි වෙන්න පෙර, ඒ දරුවා නීරෝගි දරුවෙක් ද, නැද්ද කියා පරීක්ෂා කර බලන දියුණු සමාජයක් අද තිබෙනවා. අද ආර්ථික ශක්තිය ඇති අම්මාවරු ඒ ක්‍රමය භාවිත කරනවා. හැබැයි, අපේ ගම්වල සිටින, පහළ ආර්ථික තත්ත්වයක් තිබෙන අම්මා කෙනෙකුට ඒ පිළිබඳව හිතන්න පුළුවන් ද? මොකද, ඒ පරීක්ෂණ සඳහා විශාල මුදලක් වැය කරන්න සිදු වෙනවා. තමන්ගේ දරුවා නීරෝගිමත් ද කියලා බලන්න මාස තුනෙන්, හයෙන් සිදු කරන anomaly scan පරීක්ෂණයට විශාල මුදලක් දරන්න වෙනවා. ඒ නිසා ඒ පරීක්ෂණය කරන්න යම්කිසි ඉඩක්, යම්කිසි පහසුකමක්, යම්කිසි ක්‍රමවේදයක් රජයක් විධියට ආදරණීය අම්මාවරුන්ට ලබා දෙන්න පුළුවන් නම් ඒක වටිනවා කියන කාරණයත් මම විශේෂයෙන් සඳහන් කරනවා.

විවාදාත්මක කරුණක් වුණත් මේ ගැනත් කථා කළ යුතුව තිබෙනවා. සමහර අම්මලා ආබාධිත දරුවන් කරේ තියාගෙන, ගෙදර උඩුබැලි අතට තියාගෙන ඒ දරුවන් වෙනුවෙන් කොතරම් වෙහෙසක් තමන්ගේ ජීවිත කාලය තුළ දරනවා ද කියලා අපි දකිනවා. හැබැයි, ඒ ආදරණීය අම්මා දැයෙන් සමුගත්තු දවසට ඒ ආබාධිත දරුවාට අත් වන ඉරණම කුමක්ද කියන ප්‍රශ්නය මේ සමාජයේ තිබෙනවා. මේ කාරණයේදී ආගමික බැඳීම් නිසා, සංස්කෘතික බැඳීම් නිසා, ජීව විද්‍යාත්මක බැඳීම් නිසා අපට දියුණු ක්‍රමවලට යන්න බැරි වෙලා තිබෙනවා. මේක යෝජනාවක් නොවෙයි. නමුත්, අපට වෙනස් විධියට හිතන්න පුළුවන් නම් හොඳයි. ජීවිතයක් ජීවත් කරවන්න බැරි, තමන්ගේ අවයව පාවිච්චි වෙන්නේ නැති දරුවෙකු මෙලොව එළිය දකින තැනට පත් වන ක්‍රමවේදයට යම් දියුණු විසඳුමක් ගේන්න අපට පුළුවන් නම් වටිනවා කියන කාරණය මම සඳහන් කරනවා. ඒක සමහර අම්මාවරුන් මුහුණ දෙන ද්වෛදාවකයක්. ඒ පිළිබඳවත් හිතන්න කියා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපි දකිනවා, වැන්දඹු අම්මාවරුන් අද කොතරම් අපහසුතාවලට පත් වෙලා ඉන්නවාද කියලා. පාසලක් ළඟට ගියාම වැන්දඹු අම්මලා තමන්ගේ දරුවන් -දරුවන් දෙදෙනා වෙන්න පුළුවන්, තුන්දෙනා වෙන්න පුළුවන්- පාසලට එක්ක ගෙන එන; පාසලෙන් රැගෙන යන ආකාරය අපට දකින්න ලැබෙනවා. ඒ නිසාම ඔවුන්ට තමන්ගේ ජීවනෝපායක් ගැන හිතන්න බැරි වෙලා තිබෙනවා. තමන්ගේ දරුවා පාසලට එක්කරගෙන යන, දරුවා පාසලෙන් අරගෙන යන කාර්ය භාරයෙන් බැහැර වෙලා තම පවුලේ ජීවනෝපාය නහා සිටුවන්න ඒ මවට බැරි වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, වැන්දඹු තත්ත්වයට පත් වුණු කාන්තාවන් සමහර අවස්ථාවලදී දෙමව්පියන් යටතේ ඉන්නේ. එතකොට රජයෙන් ලැබෙන සමහර ආධාර මුදල් ලබා ගන්න ඔවුන්ට හැකියාව ලැබෙන්නේ නැහැ, ඇතැම් කොන්දේසි සහ නීති රීති නිසා. ඒ නිසා මම විශේෂයෙන්ම වත්මන් ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් ඒ නීති ලිහිල් කරන්න කියලා. අස්වැසුම ප්‍රතිලාභ ගත්තත්, එක ගෙදරක පවුල් ඒකක දෙකක් පදිංචි වී ඉන්නවා නම්, අර අනුපවුලට අස්වැසුම ප්‍රතිලාභය දෙන්නේ නැහැ. ඒ නිසා වැන්දඹු තත්ත්වයට පත් වූ, අසරණ වූ කාන්තාවන් දෙමව්පියන්ගේ රැකවරණය යටතේ ඉන්නකොට ඒ අයට ඇස්වැසුම ප්‍රතිලාභ ලබා ගන්නට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් අපට හිතන්න පුළුවන් නම්, ඒ අය සඳහා යම් ක්‍රමයක් සකස් කරන්න පුළුවන් නම් ඉතා වටිනවා කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරනවා.

මේ සියලු කාරණා ගැන සඳහන් කරමින් අද වනවිට පවතින තවත් ගැටලුවක් මේ සභාව හමුවේ තබන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ගරු සභාපතිතුමනි, අපේ ගම්වල ඉන්න අම්මලා භාණ්ඩ මිලදී ගන්න මුලින්ම සතොස වාගේ ආයතනයකට යන්නේ එය රජයේ ආයතනයක් නිසා. නමුත් අද වනවිට ඒ අයට උද්ගත වී තිබෙන ගැටලුවක් තමයි මම මේ සභාව හමුවේ දැන් පවසන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chanaka Madugoda, you have only two minutes more.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
බොහොම ස්තුතියි.

ඊයේ සතොස ආයතනයේ සුදු සීනි කිලෝ එකක් රුපියල් 232යි, පරිප්පු කිලෝ එකක් 283යි, පාන් පිටි කිලෝ එකක් 175යි, බීලූනු කිලෝ එකක් 185යි, මුංඇට කිලෝ එකක් 640යි, දුඹුරු සීනි කිලෝ එකක් 285යි ගරු සභාපතිතුමනි. මම මේ කියන සතොස ආයතනය ආසන්නයේම තිබෙන පෞද්ගලික වෙළෙඳ සැල් දෙකක මිල ගණන් මම දැන් සඳහන් කරන්නම්. ඒ එක් වෙළෙඳ සැලක සුදු සීනි කිලෝ එකක් 225යි, ඒ කියන්නේ සතොස මිලට වඩා රුපියල් 7ක් අඩුයි. පරිප්පු කිලෝ එකක් 275යි, රුපියල් 8ක් අඩුයි. පාන් පිටි කිලෝ එකක් 160යි, රුපියල් 15ක් අඩුයි. බීලූනු කිලෝ එකක් 165යි, රුපියල් 20ක් අඩුයි. මුංඇට කිලෝ එකක් 620යි, රුපියල් 20ක් අඩුයි. දුඹුරු සීනි කිලෝ එකක් 280යි, රුපියල් 5ක් අඩුයි. ඊටත් එහා තිබෙන අනෙක් පෞද්ගලික වෙළෙඳ සැලේ මිල මීටත් වඩා අඩුයි. ගරු සභාපතිතුමනි, මේ මිල ගණන් ගත්තාම, සතොසෙන් භාණ්ඩ මිලදී ගන්නවාට වඩා අර පෞද්ගලික වෙළෙඳ සැල්වලින් භාණ්ඩ මිලදී ගත්තොත්, ඒ අයට රුපියල් 70ක්-130ක් අතර ලාභයක් ලැබෙනවා. ඒ නිසා රජයේ ආයතනවල කටයුතු මීට වඩා විනිවිදව, මීට වඩා ශක්තිමත්ව කරන්න පුළුවන් නම්, භාණ්ඩ මිලදී ගැනීමේදී සතොස හරහා යම් ඉඩක් ලබා දෙන්න පුළුවන් නම් තමන්ගේ දරුවන්, තමන්ගේ පවුල රැක ගන්න අනුපමේය කාර්යභාරයක් කරන මේ අම්මාවරුන්ට එය වටිනවා කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, මේ සමාජය තුළ අපි කාන්තාවට නිසි තැන ලබා දෙනවාද, නැද්ද කියන කාරණයටත් වඩා වැදගත් වන්නේ ලබා දීපු තැන රැකෙනවාද කියන කාරණයයි. අපේ ආදරණීය කාන්තාව, විශේෂයෙන්ම පාර්ලිමේන්තුව නියෝජනය කරන කාන්තාවන් ඒ කාර්යභාරය ඉතාම හොඳින් ඉෂ්ට කරනවා. හැබැයි, එතැනින් පහළට ගියාම පළාත් සභාවලට, ප්‍රාදේශීය සභාවලට යනකොට අපි ඒවාට නිවැරදි දැනුමක් තිබෙන, වටිනාකමක් තිබෙන අපේක්ෂිකාවන් ඉදිරිපත් කරනවාද, ඔවුන්ගේ කාර්යභාරය ඉදිරියට ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද කියන කාරණය පිළිබඳවත් අපි සිතිය යුතුයි කියා විශේෂයෙන්ම සිහිපත් කරනවා.

අද ලෝක කාන්තා දිනය අර්ථවත් කරන දවස; ලෝකයේම කාන්තාවන්ට වටිනාකමක් දීපු දවස. එසේ වටිනාකමක් දීපු අද දවසේ කාන්තාව ශක්තිමත් කරන්න මේ පාර්ලිමේන්තුව තුළින් අපි ගන්නා තීන්දු තීරණවලින් ශක්තියක් ලැබෙනවා නම් එය වඩාත් වටිනවා කියන කාරණයත් මා සඳහන් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ළමයින් පිළිබඳවත් මේ මොහොතේ සඳහන් කළ යුතුයි. ළමයින් වෙනුවෙන් අපට "මුතුහර" ළමා සමාජය වාගේ ළමා සමාජ හරහා -මේ සමස්ත සභාව වාගේම, සමස්ත සමාජය එකතු වෙලා- යම් වැඩ පිළිවෙළක් හදා ළමා සමාජය ගොඩ නගන්නත්, ළමයින්ගේ කුඩා කාලය ඉතා හොඳින් ගත කරන්න පුළුවන් වටපිටාවක් ගොඩ නගන්නත් පුළුවන් නම් වටිනවා කියන කාරණයත් සිහිපත් කරමින් මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. (Mrs.) Anushka Thilakarathne. You have ten minutes.

[අ.භා. 1.54]

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මගේ කථාවේ මූලාරම්භයක් ලෙස, 114 වන ජාත්‍යන්තර කාන්තා දිනය සමරන අද දිනයේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනයේ විශිෂ්ටතම සන්ධිස්ථානයක් පසු කළ දසවැනි පාර්ලිමේන්තුවේ ආදරණීය අගමැතිතුමියටත්, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියටත්, නියෝජ්‍ය කාරක සභාපතිතුමියටත්, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියටත්, දසවැනි පාර්ලිමේන්තුවේ ලස්සනම කාන්තා නියෝජනයක් කරන අපේ ආණ්ඩු පක්ෂයේ ආදරණීය මන්ත්‍රී සහෝදරියන් 20දෙනාටත්, විපක්ෂය නියෝජනය කරන ආදරණීය මන්ත්‍රී සහෝදරියන් දෙදෙනාටත්, මේ පාර්ලිමේන්තුවේ සේවය කරන සියලු කාන්තා නිලධාරින්ටත් සුව හා සුබ කාන්තා දිනයකට ශුභාශිංසනය කරනවා.

ඇත්තටම ලෝකයේ වැඩියෙන්ම කවි ලියැවුණු, ලෝකයේ වැඩියෙන්ම රසාලිත්‍යය තැවරුණු තැන ඉන්නේ කාන්තාවයි; ගැහැනියයි. ඔබ සියලුදෙනා අද කොහේ කොතැනක හිටියත් - ගොවි බිමේ වෙන්න පුළුවන්, වැඩ බිමේ වෙන්න පුළුවන්, කර්මාන්තශාලාවේ වෙන්න පුළුවන්, නීතිය හා සාමය ආරක්ෂා කරන තැන වෙන්න පුළුවන්, විදේශයේ අපේ රටේ සුළඟ හමන තැනක නොවෙන්න පුළුවන්, මිලක් නොලබා ගෙදරක සේවය කරන ගෘහිණියක වෙන්න පුළුවන්- ඒ සියලුදෙනාට මම ශුභාශිංසනය කරනවා. ඔබ, අදට වඩා හෙට ශක්තිමත්ව, තිරසාරව සිටිය යුතුයි. 2025 වසරේ කාන්තා දිනයේ අපේ තේමා පාඨය වන්නේ, "තැනුමට තිරසර හෙටක් ඇය වේ සවිමත් මහක්" යන්නයි. ඒ නිසා ඔබ සියලුදෙනාම හෙට දවසේ තිරසර මාර්ගය තීරණය කරන තරු ලකුණයි. ඒ නිසා ඔබ සියලුදෙනාටම මා ශුභාශිංසනය කරනවා.

ගරු සභාපතිතුමනි, අද උදැසන ඉඳලා අපේ මන්ත්‍රී සහෝදරියන් බොහෝ දෙනෙක් කථා කළා. ගරු අගමැතිතුමිය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය සහ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රී සහෝදරියන් කථා කළා. ඒ කථා හැම එකක් ඇතුළේම කාන්තා නියෝජනය, කාන්තා දේශපාලනය, තීන්දු, තීරණ ගන්නා තැන කාන්තාවන් සිටීමේ වැදගත්කම, කාන්තාවන් ඇයි මෙතැන ඉන්න ඕනෑ කියන කාරණා පිළිබඳව කථා කළා. ඒ වාගේම අපට අහිමි වෙච්ච දේවල් ගැනත් කථා කළා. අපට අහිමි වෙච්ච අයිතිවාසිකම් ගැන කථා කළා. ඒවා නැවත නහාසිටුවා ගැනීම වෙනුවෙන් අප කළ යුතු දේ ගැන කථා කළා.

ගරු සභාපතිතුමනි, 1947 ඉඳලා ගත්තාම, ශ්‍රී ලංකාවේ දේශපාලනයේ කාන්තා නියෝජනය සියයට 3 ඉඳලා දසවැනි පාර්ලිමේන්තුවේ සියයට 10ක් දක්වා ගෙන ඒමට, අපේ හැකියාව උපරිමයට ළඟා කර ගන්න මහ කියූ ජාතික ජන බලවේගයේ අපට පිටුපසින් සිටින දස දහස් සංඛ්‍යාත ගැහැනුන්ගේ ශක්තියට මම මේ වෙලාවේ ආචාර කරනවා. ඔවුන් සියලුදෙනා එකට එකතු වෙලා -ගැහැනු එක මිටට එකතු වෙලා- ඉතිහාසයේ වැඩිම කාන්තා නියෝජනය දසවැනි පාර්ලිමේන්තුවට ගෙනැල්ලා දෙන්න මහන්සි වුණා. ඔවුන්ට අහිමි වෙච්ච සමාජ ජීවිතය, දේශපාලන ජීවිතය, ආර්ථික ජීවිතය යන මේ සියල්ල තිරසරව නහා සිටුවා ගැනීම වෙනුවෙන් ඔවුන්ට තිබුණා, සිහිනයක්. ඒ සිහිනය වෙනුවෙන් හුදෙකලා නොවුණු අරගලයක ඔවුන් නිරත වුණා. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි අපි සියලුදෙනා අද මෙතැන වාඩි වෙලා ඉන්නේ. ඒ නිසා ඔවුන්ට මම මේ අවස්ථාවේ දී නැවත වතාවක් ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා මේ වෙලාවේ මම මේ කාරණයත් කියන්න ඕනෑ. ව්‍යක්තියෙන් නීතිඥවරියක විධියට අධිකරණය තුළ අවුරුදු 10කටත් වඩා මා අත්දැකීම් ලබා තිබෙනවා. ඒ අත්දැකීම් මත පදනම්ව කාන්තා හා ළමා හිංසනය වළක්වා ගැනීම වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ. කාන්තා හා ළමා හිංසනය ගැන කෑ ගහලා කියන එක, ඒ ගැන හැම දාම කථා කරන එක තවදුරටත් ඉදිරියට සිදුවීම වළක්වා ගැනීම වෙනුවෙන් ජාතික ජනබලවේග ආණ්ඩුවේ පළමු අය වැයෙන් අපි අතිවිශාල මුදලක් වෙන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සමහර දේවල් ගැන වියුක්තව, තනිව කථා කරන්න බැහැ. මේ අය වැය ලේඛනයේ අමාත්‍යාංශ ගණනාවක් සඳහා මුදල් වෙන් කර තිබෙනවා. අධ්‍යාපනයට, සෞඛ්‍යයට, ප්‍රවාහනයට, කර්මාන්තවලට යනාදී වශයෙන් මේ හැම අමාත්‍යාංශයකටම වෙන් කරන ලද මුදල්වලින් කෙරෙන, අපි බලාපොරොත්තු වන සුබසාධන කටයුතු තුළින් කාන්තාවට සහ ළමයාට ලැබෙන ආරක්ෂණය සහ කාන්තාවගේ සහ ළමයාගේ ජීවිත සුවපත් කර ගැනීම වෙනුවෙන් ලැබෙන දේවල් ගැන අපට කථා කරන්න සිද්ධ වෙනවා. මේ හැම එකක්ම එකිනෙකට බැඳිලා තිබෙන්නේ; මේ හැම කාරණයක්ම එකිනෙකට සමගාමීව බැඳිලා තිබෙන්නේ.

ඒ නිසා කවුරු හරි කෙනෙක් තර්ක කරන්න පුළුවන්, අදහස් දක්වන්න පුළුවන්, "කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට වෙන් කර තිබෙන මුදල ප්‍රමාණවත් නැහැ, අපි බලාපොරොත්තු වෙන දේවල් මේකෙන් ලැබෙන්නේ නැහැ" කියලා. යම් යම් අය එවැනි කථා කියන්න පුළුවන්. නමුත්, අපි ඉතිහාසයේ පළමුවැනි වතාවට දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ඉතිහාසයේ වෙන් කරපු වැඩිම මුදල වෙන් කර තිබෙන්නේ 2025 අය වැයෙන්. මේ තුළින් අපි ආරක්ෂා කරන්නේ අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය. දරුවන්ගේ අධ්‍යාපනයෙන් වැඩිපුරම සතුටු වෙන්නේ, ලෝකයේ වැඩිපුරම දරුවන්ට උගන්වන්නට මහන්සි වෙන්නේ ලංකාවේ අම්මලා; ලංකාවේ ගැහැනු. මොකද, ඔවුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, ඔවුන් දරුවන්ට කොච්චරද උගන්වන්නේ, ඔවුන්ට දරුවන් ගෙනියන්න පුළුවන් වන්නේ කොතැනටද, ඒ මත තමයි දරුවන්ගේ අනාගතය තීරණය වෙන්නේ කියන කාරණය අම්මලාගේ හිත්වල තිබීම. ඒ නිසා අපි ඒක වෙනස් කළ යුතුයි. මේ හැම ප්‍රශ්නයක්ම ඓතිහාසිකව සහ විෂය මූලිකව තමයි තීරණය වෙලා තිබෙන්නේ. ඒ නිසා අපට සිහිනයක් තිබෙනවා. මේ

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

සියල්ල අපට එක පාර විසඳා ගන්න බැරි වෙයි. මේ සියලු ප්‍රශ්නවලට අපට එක වතාවකදී උත්තර දෙන්න බැරි වෙයි. නමුත්, අපි මේ තැබූවේ අපේ පළමුවැනි පියවර; පළමුවැනි අඩිය. මේ අමාත්‍යාංශවලට අපි වෙන් කර තිබෙන මුදල් ගැන කෙනෙකුට විවේචනයක් තිබෙන්න පුළුවන්; වෙනස් අදහසක් තිබෙන්න පුළුවන්. මේක හොඳම අය වැය නොවෙන්න පුළුවන්; මේක අපි ඉදිරිපත් කරපු හොඳම දේ නොවෙන්න පුළුවන්. හැබැයි, මේක හොඳම දේ වෙනුවෙන් අපි තියපු පළමුවැනි පියවර.

ගරු සභාපතිතුමනි, ළමා හා කාන්තා හිංසනය වළක්වා ගැනීම වෙනුවෙන් අපි ජාතික සහ ජාත්‍යන්තර සම්මුතීන් ගණනාවකට අත්සන් තබා තිබෙනවා. වර්ණය, කුලය, පාට, වෙන මොනවා හෝ වෙනස්කමකින් තොරව සියලුදෙනා නීතිය ඉදිරියේ සමානයි කියලා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අපි මූලිකවම පිළිගන්නවා. නමුත් වචනවලට සීමා වෙච්ච නීති, වචනවලින් අර්ථ ගන්වන නීති අපේ ඇත්ත ජීවිතයේ තිබෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. අපි ඉතිහාසය පුරාවටම දැකලා නැහැ, වත්තේ කම්කරුවා නියෝජනය කරමින් සුබ්‍රමනියම්, ලෙච්චමී මන්ත්‍රීවරු හැටියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා; වතු කම්කරු ජනතාව නියෝජනය කරන මන්ත්‍රී සහෝදරියන් අපේ මේ දසවන පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා මේක ඉතිහාසයේ වෙනම ලකුණක්; ඉතිහාසයේ වෙනම කාරණයක්. ඒ නිසා අපි නීතිය හා සාමය ආරක්ෂා කරමින්, ළමයින්ගේ සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින්, ඔවුන්ගේ ජීවිතයේ එකිනෙකට බැඳිලා තිබෙන විවිධ ක්ෂේත්‍ර හරහා ඔවුන්ට හිමිවිය යුතු අයිතිවාසිකම් ආරක්ෂා කරමින්, ඔවුන්ට හොඳ ජීවිතයක් අත්පත් කරදීම වෙනුවෙන් තමයි මේ මහන්සි වෙන්නේ. ගරු සභාපතිතුමනි, කොච්චර නීති තිබුණත්, කොච්චර සම්මුතීන්වලට අපි අත්සන් කර තිබුණත්, ඒවා සවිබලගැන්වීමේදී, ඒවා ක්‍රියාත්මක කිරීමේදී අසමානතාවක් තිබුණා. අන්න ඒක වළක්වා ගැනීම වෙනුවෙනුත්, එය යම් තරමක් දුරට හෝ වෙනස් කරවා ගැනීම වෙනුවෙනුත් තමයි අපි මේ මූලික පියවර තබා තිබෙන්නේ.

ඉදිරියේදී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හරහා අපි විශාල වැඩසටහන් ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම එහිදී මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මුල් ළමා විය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, ජාතික කාන්තා කමිටුව කියන මේ සියලු ආයතන එකිනෙකා හා බැඳෙමින්, අධිකරණවල සේවය කරන නීතිඥ මහත්ම මහත්මීන් කළුකබාය ඇතුළේ ඔවුන්ට තිබෙන විවේචන සියල්ල පසෙකින් තියලා, ඔවුන්ගේ හෘදය සාක්ෂියට එකඟව මේ අපචාර හිංසනයන්ට ලක්වන දරුවන්ගේ සහ කාන්තාවන්ගේ සුබසිද්ධිය වෙනුවෙන් කොතරම් මහන්සි වෙනවාද කියලා මම හොඳටම දන්නවා. ඒ නිසා මම ඔවුන් ගැනත් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. අධිකරණ අමාත්‍යාංශය හරහා ඔබ සිදු කරන සියලු දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී ජීවිතය අහිමි වෙච්ච මේ මිනිසුන්ට ඔබ ජීවිතය ගැන කියලා දෙන්න. ඔබ ඔවුන්ට උදව් කරන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. (Mrs.) Anushka Thilakarathne, your time is up now.

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මගේ කථාව අවසන් කිරීමට පෙර නැවත වතාවක් මෙය කිව යුතුයි. මෙවර කාන්තා දිනය ඉතිහාසගත කාන්තා දිනයක් වෙනවා නොඅනුමානයි. අපි අසමත් වෙච්ච පියවරකට, අපි තියන්න අකමැති වෙච්ච පියවරකට අපි මුල් පියවර තබා තිබෙනවා. ඒ නිසා මම සියලුම මන්ත්‍රී සහෝදරියන් ඇතුළු සියලුම ආදරණීය මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ඔබ සියලුදෙනා ඉතාම අවංකව කටයුතු කරන්න කියලා. අම්මා ගැන කථා කරද්දී ඔබ සියලුදෙනා අවංකව කථා කරනවා. ඔබ තමන්ගේ බිරිඳ ගැන කථා කරද්දී ඉතා අවංකව සහ ඇත්ත ආදරයකින් කථා කරනවා.

ඒ නිසා කාන්තාව කියන කෙනා ගැන තිබෙන ගෞරවනීයභාවය ඉතිරි කරන්න. ඔබ කවි ලියද්දී වැඩිපුරම කවි ලියැවුණේ කාන්තාව ගැන වෙන්න පුළුවන්. ඔබ කථා කරද්දී වැඩිපුරම ආසා කළ වචනය අම්මා වෙන්න පුළුවන්. ඒ නිසා අදත්, හෙට දිනයේත්, මතු මතුවටත් ගැහැනුන්ගේ ජීවිතය තුළ ඔවුන්ට තියන්න පුළුවන් විනය, ආරක්ෂාව සහ ගෞරවනීයභාවය උපරිම වශයෙන් ඉතිරි කරන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. (Mrs.) Chamindranee Kiriella. You have 19 minutes.

[අ.භා. 2.06]

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, අද අපි මේ ඉතා වැදගත් දිනයක තමයි කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1977 මාර්තු 8වැනි දා තමයි කාන්තා දිනය නියම කළේ. ඇත්තටම, මම ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විපක්ෂ නායක කාර්යාලයේ නිලධාරින්ටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, කාන්තාවන්ගේ ප්‍රශ්න සහ ඔවුන්ට තිබෙන ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මේ වැදගත් විවාදය අද දිනට -කාන්තා දිනයේම- නියම කිරීම සම්බන්ධයෙන්. ඒ වාගේම මගේ අදහස් ඉදිරිපත් කිරීමට කාලය ලබා දීම සම්බන්ධයෙන්ද මම ස්තුතිවන්ත වෙනවා. මේ සභාවේ සිටින සියලුම කාන්තා මන්ත්‍රීවරියන්ට, පාර්ලිමේන්තුවේ මහලේකම්තුමිය ඇතුළු පාර්ලිමේන්තුවේ සේවය කරන සියලුම කාන්තාවන්ට, ශ්‍රී ලාංකික කාන්තාවන්ට සුබ කාන්තා දිනයකට මම සුබ පතනවා.

ශ්‍රී දළදා මාළිගාවේ වැඩ සිටින ගෞතම බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතූන්වහන්සේ මෙන්ම ශ්‍රී මහා බෝධීන් වහන්සේ ද ලංකාවට වැඩම කළේ කාන්තාවක්. අපි දන්නවා, මහා වංශයේ සඳහන් වෙන ආකාරයට හේමමාලා කුමරිය තමන්ගේ කේශ කලාපය තුළ දන්ත ධාතූන්වහන්සේ සඟවා ගෙන නොබියව ලංකාවට වැඩම කරපු ආකාරය ගැන. ඒ වාගේම සංඝමිත්තා තෙරණින් වහන්සේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව රැගෙන ලංකාවට වැඩම කළා. අපේ ජන්ම භූමියේ සුරක්ෂාව වෙනුවෙන් මුහුදට බිලි වූයේද අතීත කාන්තාවක් වන විහාර මහා දේවියයි.

කන්ද උඩරට සෙංකඩගල පුරවරය නියෝජනය කරන කාන්තා මන්ත්‍රීවරියක් වශයෙන් මම මේ අවස්ථාවේ අපේ අභීත කන්ද උඩරට කාන්තාව සිහිපත් කරනවා. එදා තමන්ගේ හිස ගසා දැමීමට නොබියව මුහුණ දුන් වීර මද්දුම බණ්ඩාරගේ අභීත පෞරුෂය පිටුපස හිටපු ඇහැලේපොල කුමාරිහාමි මෙන්ම 1818 කැරැල්ල, මාතලේ කැරැල්ල වැනි අධිරාජ්‍යවාදී පරදේශක්කාරීන්ගේ කෲර වධ හිංසාවලට විරුද්ධව තමන්ගේ ආදරණීය ස්වාමිපුරුෂයා මෙන්ම ආදරයෙන් හදා වඩා ගත්ත තමාගේ පුත්‍ර රත්නය ද ඒ යුධ බිමට පූජා කළෙත් කාන්තාවක්. ඒ වාගේම මෑත ඉතිහාසයේදී අපේ රට ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගන්නට හසලක ගාමිණී, පාරමී කුලතුංග, ඩෙන්සිල් කොඩිබෑකඩුව වැනි වීරෝදාර රණවිරුවන්; මේ ආදරණීය පුතණුවන් ලක් මෑණියන්ට පූජා කළෙත් අභිමානවත් කන්ද උඩරට කාන්තාවන්. මේ ආකාරයට ඉතිහාසයේ සිටම සුවහසක් කාන්තාවන් අපේ රට මෙන්ම මුළු ලෝකයටම ජීවය ලබා දුන්නා. මුළු ලෝකයම හැඩ කෙරෙව්වා.

නමුත්, වර්තමානයේ අපේ කාන්තාවට නිසි තැන, නිසි ගෞරවය ලබා දීලා තිබෙනවාද කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ රටේ සියයට 52ක් ඉන්නේ, කාන්තාවන්. කාන්තාවන් වශයෙන් අපි අද ඉන්නේ කොතැනද කියලාත් මේ අවස්ථාවේ සිහිපත් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම අපේ ඉදිරි පරම්පරාව ගැන කථා කළොත්, ලංකාවේ වයස අවුරුදු 5 දක්වා කුඩා දරුවන් ලක්ෂ 14ක් විතර ඉන්නවා.

නමුත්, එම දරුවන්ට අවශ්‍ය පහසුකම් රජයෙන් ලබා දෙනවාද කියලා අපි මදක් කල්පනා කර බැලිය යුතුයි. අපි දන්නවා, දරුවෙකුගේ මොළයේ වර්ධනය වැඩියෙන්ම සිදු වන්නේ, එනම් සියයට 70ක් පමණ මොළය වර්ධනය වෙන්නේ මේ වයස් සීමාව ඇතුළත බව. නමුත්, ලංකාවේ එම වයස් සීමාවේ සිටින දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය අද උග්‍ර වෙලා තිබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කරන ලද සමීක්ෂණයකට අනුව වයස අවුරුදු 0 - 5 අතර දරුවන්ගෙන් සියයට 10.3ක් කුරු - stunted - දරුවන්, සියයට 10ක් කෘශ - wasted - දරුවන්, සියයට 17.1ක් අඩු බර - under weight - දරුවන්. ඇත්තටම මේක හොඳ තත්ත්වයක් නොවෙයි. අපි දැක්කා, මෙවර අය වැයෙන් විශේෂයෙන්ම පෙර පාසල් දරුවන් වෙනුවෙන් උදැසන ආහාර වේලක් සැපයීම සඳහා රුපියල් මිලියන 3,200ක් වෙන් කර තිබුණු බව.

අපේ කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමියත් ගරු සභාවේ ඉන්න අවස්ථාවේ තවත් කාරණයක් කියන්න මම කැමැතියි. ගරු ඇමතිතුමියනි, ඔබතුමියගේ කථාවේදී සඳහන් කළා, පෙර පාසල් දරුවෙකුගේ එක් ආහාර වේලකට කරනු ලබන ගෙවීම රුපියල් 60 සිට රුපියල් 100 දක්වා වැඩි කළා කියලා. නමුත්, එයත් ප්‍රමාණවත්ද කියලා මම මේ අවස්ථාවේ අහන්නට කැමැතියි. මොළයේ වර්ධනය සියයට 70ක් සිදු වන මේ වයස් කාණ්ඩයට රුපියල් 100කින් පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දිය හැකිද යන ප්‍රශ්නය තමයි මම මේ අවස්ථාවේ මතු කරන්නේ. මොකද, ප්‍රෝටීන් බහුල ආහාර වේලක් තමයි මේ වයස් කාණ්ඩයේ දරුවන්ට දෙන්න ඕනෑ. ඔබතුමියගෙන් මම ඉල්ලා සිටින්නේ, මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා හැකි නම් මීට වඩා මුදලක් මේ සඳහා වෙන් කරන්න කියලායි.

අපි දැක්කා, කලින් අවුරුදුවල ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ඉදිරියට කරගෙන යෑමට මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබුණු බව. විශේෂයෙන්ම ගර්භිණී මව්වරුන් වෙනුවෙනුත් ආධාරයක් ලබා දීලා තිබෙනවා, පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා. ඒ වාගේම පෙර පාසල් ගුරුවරියන්ට දීමනාවක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අපි දැක්කා, ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන්ට අවුරුදු පහක ජාතික වැඩසටහනකට රුපියල් මිලියන 450ක් වෙන් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව අපි සතුටු වෙනවා. මොකද, ඔටිසම් රෝගයෙන් පෙළෙන ළමුන් වෙනුවෙන් මම හිතන්නේ කලින් පැවති රජයන් විසින් කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන තිබුණේ නැහැ. මම ඔබතුමියටත් ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම කලින් ආණ්ඩුව ගෙන ගිය පාසල් දැරියන්ට සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන තවදුරටත් ඉදිරියට ගෙන යන්න යෝජනා කර තිබෙනවා. මම මේ අවස්ථාවේ අපේ ගරු විපක්ෂ නායකතුමාව සිහිපත් කරන්නට කැමැතියි. මොකද අපි දන්නවා, 2019දී සනීපාරක්ෂක තුවා පිළිබඳව කිසිම කෙනෙක් කථා කරන්නට අකැමැති වුණු අවස්ථාවක එතුමා තමයි ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධයෙන් කතිකාවක් ඇති කළේ කියලා. ඊට පසුව අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය දරන අවස්ථාවේ මීට අදාළ සියලුම පාර්ශ්වකරුවන් කැඳවා මේ වෙනුවෙන් රුපියල් බිලියනයක් වෙන් කරන්නට කියලා ඉල්ලීමක් කළා. ඉන් අනතුරුව ගිය ආණ්ඩුව විසින් සනීපාරක්ෂක තුවා ගැනීම සඳහා පාසල් දැරියන්ට වවුචර් මාර්ගයෙන් ඒ පහසුකම ලබා දුන්නා. මේ ආණ්ඩුවත් පසුගිය ආණ්ඩුව ආරම්භ කරපු එම වැඩ පිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙන යෑම සම්බන්ධයෙන් අපි සන්තෝෂ වනවා.

මේ සනීපාරක්ෂක තුවා පිළිබඳ ප්‍රශ්නය පාසැල් දැරිවියන්ට සීමා වන ප්‍රශ්නයක් නොවෙයි, ගරු ඇමතිතුමියනි. විශේෂයෙන්ම අපි දන්නවා, බන්ධනාගාරගතව සිටින කාන්තාවන් අතරත් අද මේක ලොකු ප්‍රශ්නයක් බව. මොකද, අපේ බන්ධනාගාරවල කාන්තා රැඳවියන් 400දෙනෙකුට පහසුකම් තිබුණත්, අද කාන්තා රැඳවියන් 1,040ක් ඉන්නවා. එම කාන්තාවන්ටත් සනීපාරක්ෂක තුවා භාවිතය විශාල ප්‍රශ්නයක් වන නිසා ඒ සම්බන්ධයෙනුත් ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අද කරපු කථාවලදී අපි දැක්කා, කාන්තා නියෝජනය ගැනත් අදහස් දැක්වූ ආකාරය. අපේ රට ලෝකයේ ප්‍රථම අගමැතිවරිය බිහිවුණු රට වාගේම ප්‍රථම විධායක ජනාධිපතිවරිය බිහි වුණු රට. නමුත් අපි දැක්කා, කලින් පැවති පාර්ලිමේන්තුවලදී කාන්තා නියෝජනය ඉතා අඩු මට්ටමක තිබුණු බව. මෙවර නම් අපට සියයට 10ක කාන්තා නියෝජනයක් තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් සන්තෝෂ වෙනවා. නමුත්, ඒක ප්‍රමාණවත් යැයි අපි කිසිවිටෙක කියන්නේ නැහැ. මොකද අපි දන්නවා, පළාත් සභාවල වාගේම පාර්ලිමේන්තුවේත් මීට වඩා කාන්තා නියෝජනයක් අවශ්‍යයි කියන එක. මොකද අපේ රටේ බහුතරයක්, සියයට 52ක් ඉන්නේ කාන්තාවන්. මේ ආණ්ඩුවට ජනතාව බහුතර බලයක් ලබා දීලා තිබෙන නිසා, ඒ සඳහා අවශ්‍ය නීතිමය රාමුව ඉදිරි අවුරුදුවලදී අනිවාර්යයෙන්ම සකස් කරයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී තවත් කාරණයක් ගැන කථා කරන්න කැමැතියි. අපේ රටේ ආර්ථිකයට කාන්තාවන්ගේ දායකත්වය ඉතාම අඩු මට්ටමකයි තිබෙන්නේ. එය සියයට 32ක් වැනි ප්‍රමාණයක්. ඒකට සංස්කෘතික සහ සමාජයීය හේතු රාශියක් තිබෙනවා. හැබැයි, මම මේ අවස්ථාවේදී ප්‍රසූත නිවාඩු දීමනාව සම්බන්ධයෙන් සඳහන් කරන්න කැමැතියි. මොකද, දකුණු ආසියාවේ අනිකුත් රටවල් එක්ක සංසන්දනය කරනකොට, අපේ රටේ කාන්තාවන්ගේ සාක්ෂරතාව සියයට 93ක් වැනි ඉහළ මට්ටමක තිබෙනවා. ඒ වාගේම අපේ රටේ කාන්තාවන් අධ්‍යාපනය පැත්තෙනුත් ඉදිරියෙන් ඉන්නවා කියලා අපට සඳහන් කරන්න පුළුවන්. නමුත්, ශ්‍රී ලංකාවේ කාන්තාවන් ශ්‍රම වෙළෙඳ පොළට පිවිසීමේ සම්භාවිතාව, පිරිමින් ශ්‍රම වෙළෙඳ පොළට

[ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය]

පිවිසීමේ සම්භාවිතාවට වඩා අඩක්ව පවතිනවා. ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය සියයට 31යි, පිරිමින්ගේ දායකත්වය සියයට 69යි. ඒ වාගේම කාන්තාවන් රැකියා විරහිත වීමේ සම්භාවිතාව පිරිමින්ට වඩා දෙගුණයක්ව පවතිනවා. ඒකට මම කලින් කියපු ආකාරයට සංස්කෘතික හා සමාජයීය වශයෙන් නොයෙකුත් හේතු බලපා තිබෙනවා. එක් හේතුවක් තමයි, අපේ රටේ කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින් කාන්තාවක් තමාගේ company එකට බඳවා ගැනීමේදී, ඇයට දීමට සිදු වන ප්‍රසූත නිවාඩු දීමනාව වෙනුවෙන් වැයවන මුදල වැඩි නිසා, කාන්තාවන් සේවයට බඳවා ගැනීමේ යම් කිසි පසුබෑමක් දක්නට ලැබීම.

විශේෂයෙන් Verite Research එක විසින් කරන ලද සමීක්ෂණයකින් හෙළිදරව් වෙන්නේ, ශ්‍රී ලංකාවේ අවුරුදු 20ත්, 39ත් අතර සිටින කාන්තාවන්ගේ විරැකියාව සියයට 80ක් වන බවයි. ඇත්තටම ඉතාම වැදගත් වයස් කාණ්ඩයේ විරැකියාව සියයට 80ක්ව තිබෙන එක සම්බන්ධයෙන් අපි සලකා බලන්න ඕනෑ. Verite Research එක ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියන්නේ, ප්‍රසූත නිවාඩු දීමනාවට යන වැය බර පෞද්ගලික ව්‍යවසායකයන් දරනවා වෙනුවට රජය විසින් දරන්නට ඕනෑය කියන එකයි. ඒක අපේ සමගි ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබුණා. අපි පොරොන්දු වුණා, බලයට ආවොත් එක්කෝ ඒකෙන් අඩක්, නැත්නම් සම්පූර්ණයෙන්ම ඒ වියදම දරනවා කියලා. මොකද, ඒ වියදම වශයෙන් ඇත්තටම රුපියල් බිලියන 7.4ක් පමණයි රජයට වැය කරන්න වෙන්නේ. ඒ කියන්නේ රජයේ මුළු වියදමෙන් සියයට 0.01ක් වැනි ඉතාම කුඩා ප්‍රමාණයක් තමයි ඒ සඳහා වැය වන්නේ. ගරු සභාපතිතුමනි, එම යෝජනාව ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

ඒ වාගේම ඒ සම්බන්ධයෙන් සලකා බලන්න කියලා, අපේ ගරු අමාත්‍යතුමියගෙනුත් මේ අවස්ථාවේදී ඉතාම ගෞරවයෙන් මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලට අපේ රටේ කාන්තාවන් විශාල වශයෙන් හසු වෙලා තිබෙනවා. මීට කලින් ගරු මන්ත්‍රීවරු කරපු කථාවලදීත් මේ සම්බන්ධව අදහස් පළ වුණා. විශේෂයෙන්ම කාන්තාවන්ට අද මේක විශාල ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය ණය නීති විරෝධීව ලබා දෙන අවස්ථා ගැනත් අපි අහලා තිබෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිමින්, අද දිනයේ පැවැත්වෙන ඉතාම වැදගත් මේ විවාදයට මගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Bimal Rathnayake. You have 15 minutes.

Order, please! The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne will now take the Chair.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා.

[අ.භා. 2.21]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තමන්ගේ ජීවිත කාලයම කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් කැප කරන ඔබතුමිය මූලාසනයේ සිටින අවස්ථාවක කාන්තා දිනය ගැන කථා කරන්න ලැබීම ඇත්තටම historical event එකක් කියලා මම හිතනවා. අද ජාත්‍යන්තර කාන්තා දිනය. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද තමයි මගේ අම්මාගේ උපන් දිනය. මම හිතන විධියට අම්මලා කියන්නේ තමන්ගේ තාරුණ්‍යය, වැඩිහිටි ජීවිතයම දරුවන් වෙනුවෙන් දියකර හරින අය. ඒ නිසා මම හිතනවා, හැම අම්මා කෙනෙකුගේම උපන් දිනයක් කියන්නේ එක්තරා විධියක කාන්තා දිනයක් කියලා. එය එක පැත්තකින් ගැහැනියකගේ බෙදවාචකය පිළිබඳ දිනයක් වාගේම තවත් පැත්තකින් ඇය කරන සටන පිළිබඳ දිනයක්.

කාන්තා දිනය ගැන විවිධ තේමාවන් තිබෙනවා. නමුත්, ඒ හැම තේමාවක් තුළින්ම ඉටු කිරීමට උත්සාහ කරන අවසාන අරමුණක් තිබෙනවාය කියා මම හිතනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ තමයි, ගැහැනිය පුරවැසියෙක් කරන්නේ කොහොමද කියන එක. මම හිතන විධියට, අපි සාකච්ඡා කරන හැම කාරණයක් ඇතුළේම තිබෙන්නේ ගැහැනියට සම තැන, නිසි තැන ලැබිය යුතුයි කියන එකයි. නමුත්, ඔය කොයි තැනටත් වඩා, ගැහැනිය පුරවැසියෙක් නොවීම පිළිබඳ ප්‍රශ්නය තමයි අපි මේ කථා කරන ප්‍රශ්නයේ හරය වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සාමාන්‍ය පුරවැසියෙක් සාමාන්‍යයෙන් පැය 8ක්වත් කුමන හෝ රැකියාවක් කරන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. ඔවුන්ට පැය 8ක ශ්‍රමික ජීවිතයක් තිබෙනවා. ඒ වාගේම මිනිස්සු විධියට අපට පැය 8කවත් සංස්කෘතික ජීවිතයක් තිබෙන්න ඕනෑ, සෙල්ලමක් කරන්න, නාට්‍යයක් බලන්න, යාළුවොත් එක්ක සෙට් වෙන්න, මළ ගෙදරක යන්න, මඟුල් ගෙදරක යන්න වාගේ දේවල්වලට. ඊට පසුව තව පැය 8ක් තිබෙනවා, නිදා ගන්න, කන්න වාගේ ඉතා අත්‍යවශ්‍ය ජීව විද්‍යාත්මක අවශ්‍යතා සඳහා. පැය 24 වෙන් වෙලා තිබෙන්නේ එහෙමයි. විධිමත් ක්ෂේත්‍රයේ රැකියා ගත්තොත්, ඒ පැය 24න් පැය 8ක් වැඩ කරන එක නම් ගැහැනු, පිරිමි කවුරුත් වාගේ කරනවා. නමුත් පැය 8ක සංස්කෘතික ජීවිතය තමයි මම හිතන විධියට ගැහැනියට අහිමි වෙලා තිබෙන්නේ. ගැහැනිය නිවසට, නැත්නම්

ආයතනයක් තුළ පොඩි කොටසකට සීමා වෙලා තිබීම තමයි මම හිතන විධියට ප්‍රධානම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. මොකද, ඇයට සංස්කෘතික ජීවිතයත්, දේශපාලන ජීවිතයත්, සමාජීය ජීවිතයත් අහිමි වෙලා තිබෙනවා. මම කලිනුත් මේ ගැන කියලා තිබෙනවා.

අපි හිතමු, නෝනා සහ මහත්තයා කියන දෙදෙනාම සවස වැඩ ඇරිලා ගෙදර ගියාම ඥාති කෙනෙකුගේ මළ ගෙදරක් ආරංචි වුණාය කියලා. එතකොට මොකද කරන්නේ? දරු පැටවු දෙදෙනෙක් විතර ඉන්නවා නම්, ඒ දෙදෙනාටම මළ ගෙදර යන්නත් බැහැ නේ. ඒ නිසා දෙදෙනා කථා කරගෙන මහත්තයාට නෝනා කියනවා, "එහෙනම් ඔයා ගිහිල්ලා එන්න, මම බබාලා එක්ක ඉන්නම්" කියලා. ඒ නිසා මහත්තයා මළ ගෙදර යනවා. ඔහුට එතැනදී දැනගන්න හම්බ වෙනවා, NPP ආණ්ඩුව දිනලා, අද EDCS එකේ ඡන්දය නිතරගයෙන් ජයග්‍රහණය කරලා, ඊළඟට අල්ලපු ගමේ වෙච්ච මිනී මැරුම්, වෙන වෙන දේවල් ආදිය ගැන. මේ වාගේ ගොඩක් දේවල් ගැන ඔහුට එතැනදී දැනගන්න ලැබෙනවා. Match එකක් තිබුණා නම්, match එකේ score එක ඔක්කොම දැනගෙන ඔහු ගෙදර එනවා. නමුත් ගැහැනිය ගෙදරට වෙලා දරු පැටවුන්ගේ කතන්දර අසමින්, ටෙලි නාට්‍යයකින් උපරිම වශයෙන් කොටසක් හෝ බලමින් ඉන්නවා. ඒ විධියට ඇය සහමුලින්ම සංස්කෘතික ජීවිතය, සමාජයීය ජීවිතය අහිමි වෙච්ච කෙනෙක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඇත්තටම ගැහැනිය පුරවැසියෙක් නම් ඇයට සංස්කෘතික ජීවිතයක් ලැබෙන්න ඕනෑ. ඇයටත් තමන් කැමති විධියට සවස 5.00න් හෝ 6.00න් පසුව තමන් කැමැති තෝරා ගැනීමක් කර ගන්න පුළුවන් වන විධියේ සමාජ, ආර්ථික වටපිටාවක් තිබෙන්න ඕනෑ. මම හිතන විධියට ඒ වටපිටාව නොමැතිවීම පිළිබඳ ප්‍රශ්නය තමයි අපි මේ එක එක විධියට පෙන්වන්න උත්සාහ කරන්නේ. යම්කිසි වරප්‍රසාදිත, සමහර විට රැඩිකල් කාන්තාවන් කොටසකුත් ඒ අතරතුර ඉන්නවා. ඒ, සමහර විට ඔබතුමිය වාගේ තරමක් ඉහළ සංස්කෘතික හා සමාජයීය ජීවිතයක් ගත කරන අය.

නමුත් මම හිතන විධියට ආණ්ඩුවක් වශයෙනුත්, සමාජයක් වශයෙනුත් අපේ ජීවිත අභිලාෂයේ ලොකු කොටසක් තමයි, ගැහැනිය පුරවැසියෙක් කරන එක. මේ අය වැයේ සහ මේ මුළු කාන්තා ව්‍යාපෘතියේම තිබෙන්නේ එය ඉලක්ක කරගත්ත කාරණාවක් කියා මම හිතනවා. ඒ නිසා ගැහැනියක් පුරවැසියෙක් කරන්න දරන අරගළය තමයි මම හිතන විධියට කාන්තා දිනයේ පදනම් වශයෙන් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගැහැනියක් පුරවැසියෙක් කරන්න, ඇය හුදු බත් තම්බන, දරුවෝ බලා ගන්න, දරුවෝ වදන, හදන කෙනෙකුට එහා ගිය කෙනෙක් බවට පත් කරන්න හේතු වෙච්ච දේවල් මීට අවුරුදු 4,000කට කලින් ලිඛිත ඉතිහාසයේ ඉඳලාම තිබෙනවා කියලා අපි දන්නවා. ලෝකයේ පළමුවැනි caesarean operation එක පිළිබඳව ලියලා තිබෙන්නේ Chinese female doctorsලා. හැබැයි, ඒගොල්ලන්ගේ නම් එතරම් ප්‍රචලිත නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නවා, හයිපතියා ගැන. ඇය female Greek mathematician කෙනෙක්. ඇය elite කෙනෙක්. නමුත් නව දැනුම හොයා ගත්තා කියලා හයිපතියාව ඝාතනය කරනවා. අපි දන්නවා, Europeවල "Witch-Hunt" කියලා ලොකු මතවාදයක් තිබුණු බව. ඒ අනුව ගැහැනුන්ට විද්‍යාත්මක කටයුතුවල නිරත වෙන්න දුන්නේ නැහැ. ගැහැනුන්ට තමන්ගේ නමින් පොත් පළ කරන්න දුන්නේ නැහැ. ඒ නිසා ගැහැනු මායාකාරියන් ලෙස වෙස්වළාගෙන වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණ කළා. "The Alchemist" කියන පොතේ තිබුණු කරුණු අනුව ඇත්තටම ඒ කාන්තාවන් විද්‍යාඥවරියන් තමයි; truly විද්‍යාඥවරියන්. හැබැයි, ඔවුන්ට එලෙස පෙනී සිටින්න දුන්නේ නැහැ. ඒ නිසා ඔවුන් මායාකාරියන් විධියට ආවාට පස්සේ සමාජය ඔවුන්ට පොඩි ඉඩකඩක් දුන්නා, මිනිස්සු ඒවාට පොඩ්ඩක් භය නිසා. නමුත් මේක ඇතුළේ යම්කිසි විද්‍යාත්මක දෙයක් වෙනවා කියලා පසුව දැනගත්තාම Europeවල වර්ෂ එක්දහස් දෙසිය, එක්දහස් තුන්සිය, එක්දහස් හාරසිය ගණන්වල ලක්ෂ ගණන් ගැහැනුන් ඝාතනය කළා; පුච්චලා මැරුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නවා, අපි O/L, A/Lවලට අහසේ තරු රටා ගැන ඉගෙන ගත්තා කියලා. ඒ කාලයේ ලොකු telescopes තිබුණේ නැහැ. ගැහැනු තමයි විද්‍යාගාරවල ඉඳන් මේ තරු බලමින් පොත් ලිව්වේ. එහෙම තමයි ඒ පොත් සකස් වෙලා තිබෙන්නේ. ඔබතුමිය දන්නවා ඇති, logbooks වාගේ තිබෙනවා, තරු රටා පිළිබඳ පොත්, 1600, 1700 කාලයේ. ඒවා ඔක්කොම ලියලා තිබෙන්නේ විද්‍යාගාරවල වැඩ කරපු කාන්තාවෝ. හැබැයි, මහන්සිය කාන්තා විද්‍යාඥවරියන්ගේ. හැබැයි, පොතට නම දැමුවේ විද්‍යාඥවරයාගේ. මොකද, ගැහැනුන්ගේ නම්වලින් පොත් ගහන්න හම්බ වුණේ නැහැ. හැබැයි, සමහර ප්‍රගතිශීලී පිරිමි විද්‍යාඥවරු ලියලා තිබුණා, "මගේ නම ගියාට ඇත්තටම මේක කළේ මගේ නෝනා, නැත්නම් මගේ ආයතනයේ වැඩ කරපු විද්‍යාඥවරියන්" කියලා. අපිට මෙන්න මේ වාගේ ඉතිහාසයක් තිබෙනවා. මම හැම තැනම අහන ප්‍රශ්නයක් තිබෙනවා. ඒක තමයි, මාරි කියුරි හැර වෙන විද්‍යාඥවරියක් ඉන්නවා නම් කියන්න කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියලා වාගේ සමාජ විද්‍යාඥවරියන් ඒ අංශයේ ඉන්නවා. නමුත් natural science අංශයේ, pure science අංශයේ විද්‍යාඥවරියක් කියන්න කියලා අපි කිව්වොත්, මාරි කියුරි හැර කියන්න වෙන කෙනෙක් නැහැ. මම ඕනෑ ඔටවුවක් අල්ලනවා, මෙතැන ඉන්න හුඟක් අයට ඒක කියන්න බැහැ කියලා. මෙතැන විතරක් නොවෙයි, මේක ලෝකයේම තිබෙන ප්‍රශ්නයක්. American seminar එකකදී, මාරි කියුරි හැර එක natural scientist කෙනෙක් කියන්න කියලා කියනවා මම අහගෙන හිටියා. නමුත්, සාමාන්‍ය audience එක ඒ ගැන කියන්න දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් ඒ ගැන කල්පනා කරනවා නේද? නමුත්, එක වතාවට මතක් වෙන්නේ නැහැ නේ. මම අගමැතිතුමියගෙනුත් ඒ ගැන ඇහුවා, එතුමියත් සමාජ විද්‍යාඥවරියක් නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ සියල්ලටම පදනම් වෙලා තිබෙන දේ තමයි, ඒ සඳහා විශාල කැපවීමක් කරන්න ඕනෑ කියන එක. ඒ කැපවීම කරන්න ගැහැනියට ඉඩ ලැබෙන්නේ නැහැ. ගැහැනිය පුරවැසියෙක් කිරීම පිළිබඳ ප්‍රශ්නය අවසන් නොවීම නිසා මේ පෘථිවිය; මුළු ග්‍රහ ලෝකයම -ලංකාවත් එක්කම- විශාල පීඩාවකට පත් වෙලා තිබෙනවා; ඒ අවස්ථා විශාල වශයෙන් අහිමි කරලා තිබෙනවා.

අද මේ පාර්ලිමේන්තුව මන්ත්‍රීතුමියලා විසිදෙදෙනෙකුගෙන් - සියයට 10කින් - බැබළෙනවා. මම හිතුවා, මෙතුමියලාට හයිපතියාට වෙච්ච දේ වෙන්න දෙන්න හොඳ නැහැ කියලා. මේ අයට හයිපතියාට වෙච්ච දේ වෙන්න දෙන්න හොඳ නැහැ. මේ අයට එම්ල්ට වෙච්ච දේ වෙන්න දෙන්න හොඳ නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතුවා, අපි මේ රටේ ඉන්න පොදුවේ වැඩ කරන ගුරුවරියන් ගැන, පොදුවේ වැඩ කරන වෙනත් කාන්තාවන් ගැන කථා කරනවා වෙනුවට මට තිබෙන වෙලාවේ මේ මන්ත්‍රීවරියන් විසිදෙදෙනා ගැන අද කථා කරන්න ඕනෑ කියලා. ඒ නිසා මම comments section එකට ගිහිල්ලා ඔබතුමියලා මේ පාර්ලිමේන්තුවේ කරපු පළමුවැනි කථාවට තිබෙන comments ටිකක් ලියාගෙන ආවා. ඒවායින් මම වැඩිපුර ගත්තේ හොඳ ඒවා. හොඳ ඒවා තමයි වැඩිපුර තිබෙන්නේ. ඉඳලා හිටලා වෙන පොඩි පොඩි දේවල් තිබෙනවා. අපිට පේනවා, ඒවා දේශපාලනමය වශයෙන් ආරෝපණය කරපු දේවල් මිස, මෙතැන

[ගරු බිමල් රත්නායක මහතා]

ඉන්න කිසිම මන්ත්‍රීතුමියකගේ පෞද්ගලික තත්ත්වය අනුව කරපු ඒවා නොවෙයි කියලා. මොකද, මම මේක කිව්වේ මේ පාර්ලිමේන්තුවේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රීතුමියලා විසිදෙනෙක් සහ සජබ පක්ෂයෙන් මන්ත්‍රීතුමියලා දෙදෙනෙක් ඉන්න නිසායි. මම හිතුවා, අපේ රටේ කාන්තාවන් වෙනුවෙන් පෙනී ඉන්න මේ විසිදෙදෙනා ආරක්ෂා කරන්න ඕනෑ කියලා. මේ විසිදෙදෙනාට මඩ ගැහුවොත්, මේ විසිදෙදෙනාව හයිපතියාගේ ඉරණමට ලක් කළොත් ඊට පස්සේ එන්න ඉන්න ඊළඟ 50දෙනා, 100දෙනා එන්නේ නැහැ. ඒ නිසා මම හිතුවා, ඒ comment sectionsවල තිබුණු ඒවා කියන්න. ඒවා අනුමත කරන නිසා තමයි මම මේ කියන්නේ.

ඊට කලින් මම මේ කාරණය කියන්න කැමැතියි. කාන්තා දිනය ලෝක සමාජවාදී කාන්තා ව්‍යාපාරයෙන් පටන් ගත් දෙයක්. 1910 පෙබරවාරි 28 දින Second International Conference of Working Women කෝපන්හේගන්වල තමයි declare කළේ. ව්ලැඩිමීර් ලෙනින් සෝවියට් රුසියාවේ විප්ලවයෙන් පස්සේ 1922 මාර්තු 8වැනි දා තමයි, අන්තර්ජාතික වැඩ කරන කාන්තා දිනය නම් කළේ. මොකද, 1917 මාර්තු 8වැනි දා තමයි පෙට්‍රොග්‍රෑඩ්වල කාන්තාවන් සාමය සහ පාන් ඉල්ලා උද්ඝෝෂණය කළේ. Russian Calendar එකට අනුව ගත්තාම මාර්තු 8 කිව්වාට ඒක පෙබරවාරි. ඒ නිසා පෙබරවාරි විප්ලවය රුසියාවේ ඇති වුණේ ඒ කාන්තාවන්ගේ අරගළය නිසා. ඒකට සම්මානයක් ලෙස තමයි ව්ලැඩිමීර් ලෙනින් සෝවියට් දේශයේ නායකයා වශයෙන් 1922 මාර්තු 08වන දා කාන්තා දිනය ලෙස නම් කළේ. මේක වමේ ව්‍යාපාරයට උරුමයක් තිබෙන සටනක්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාන්තා දිනය වෙනුවෙන් සෝවියට් දේශය නිකුත් කළ stamp එකකුත්, ඒ පිළිබඳව Wikipediaවල සඳහන් වන history එකේ තොරතුරුත් මම **සභාගත*** කරනවා. මම ඉක්මනින්ම මගේ ප්‍රධාන අරමුණට යොමු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ඉන්නවා, චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. එතුමිය ගුරුවරියක්. විශේෂත්වය තමයි, එතුමිය ඒ පවුලේ පළමුවැනි දේශපාලන ක්‍රියාකාරිනිය වීම. එතුමිය ගැන comment section එකේ ලියා තිබෙන දේවල් මම කියන්නම්. "ඔබ වෙනුවෙන් ලබා දුන් මනාපය ගැන අපට ආඩම්බරයි සහෝදරී", "එදා මෙදා තුර මොනරාගල පීඩිත ජනතාව සැබෑවටම තමන්ගේ නියෝජනය වෙනුවෙන් නිවැරදිම තේරීම කරලා තිබෙනවා. රටට ජය!", "කොයි පුටුවට ගියත් අදටත් අපේ එකෙක් කියලා විතරයි දැනෙන්නේ. ඒ ළෙන්ගතුකමට හරි ආදරෙයි" කියා ලියා තිබෙනවා. ඒ වාගේම තව තිබෙනවා, "මේ අපේ ඡන්දයේ මහිමය සහ අස්වැන්නයි. අපේ ගුරු සහෝදරිය" කියලා. තව comments ගොඩක් තිබෙනවා. මේ වෙලාවේ ගොඩක් කියන්න බැහැ.

ඊළඟට දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමියත් ගුරුවරියක්. ඒ වාගේම එම පවුලේ පළමුවෙනි දේශපාලන ක්‍රියාකාරිනිය. Commentsවල එතුමිය ගැන ලියා තිබෙන දේවල් ගත්තොත්, "ආදර්ශවත් නායකත්වය, මිනිසුන් බලාපොරොත්තු වන සැබෑ වෙනස", "හරිම අගෙයි. ගම්වල පාරවල් ටික සුද්ද කරන්න ගමේ අය ලවාම වැඩ පිළිවෙළක් සකස් කරන්න. අපේ සම්පූර්ණ සහයෝගය ඔබතුමියට තිබෙනවා" කියා ලියා තිබෙනවා.

ඊළඟට හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. එතුමිය නීතිඥවරියක්. මම හිතන විධියට, එතුමිය මේ පාර්ලිමේන්තුවේ ඉන්න ළාබාලතම මන්ත්‍රීවරිය. එතුමියත් තමන්ගේ පවුලේ පළමුවැනි දේශපාලන ක්‍රියාකාරිනිය. එතුමිය ගැන කියා තිබෙනවා, "Beautiful clear voice with immense personality. Perfect speech! So proud of you" කියලා. තවත් comment එකක් තිබෙනවා, "මගේ පළමු පාර්ලිමේන්තු ඡන්දය ඔබතුමියට ලබා දීම ගැන මා සතුටු වෙමි" කියලා.

ඊළඟට හේමාලි සුජීවා වීරසේකර මන්ත්‍රීතුමිය. එතුමිය අපේ Deputy Chairman of Committees. එතුමිය දේශපාලන නායිකාවක්. එතුමියගේ පවුලේ දේශපාලන පසුබිමක් තිබෙනවා. නමුත්, තාත්තලා, අයියලා ඇමතිලා නොවෙයි. එතුමිය අපේ පක්ෂය තුළ ඉන්න තනිවම ගොඩ නැඟුණු දැවැන්ත පෞරුෂයක්. එතුමිය ගැන කියනවා, "යුක්තිය වෙනුවෙන් හඬ නඟන, පාර්ලිමේන්තු වරම් ලබා, තම රාජකාරිය හරියාකාරව ඉටු කරන, කාන්තා අයිතීන් වෙනුවෙන් හඬ නඟන ඔබතුමියටත් අපේ මව්බිමටත් ජයෙන් ජයම වේවා!" කියලා. තව එකක් තිබෙනවා. මේක හොඳ කාරණයක්. "ඔබලාගේ උත්සාහය, කැපවීම අගය කරමු. හිවල්ලු, සතුටට හා දුකට දෙකටම කරන්නේ "හූ" කියන එක නේ. ඒක නිසා ඒවා ගණන් නොගෙන ඉදිරියට යමු" කියලා ලියා තිබෙනවා. ඒ වගේම කියා තිබෙනවා, "අපි දුන්නු ඡන්දය ගැන ආඩම්බරයි. මීට පෙර මන්ත්‍රීලා එන්න හිතපු නැති තැන්වලට ඔබතුමිය පෞද්ගලික සියලු රාජකාරි පසෙකලා ඇවිත් කරන මෙහෙවරට, respect" කියලා.

ඊළඟට මුතුමැණිකේ රත්වත්තේ මන්ත්‍රීතුමිය. එතුමිය ආරක්ෂක අංශයේ සේවය කළ කාන්තාවක්. එතුමියත් එතුමියගේ පවුලේ පළමු දේශපාලන ක්‍රියාධරිය. එතුමිය ගැන කියා තිබෙනවා, "ඔයා හරිම නිර්භීත කාන්තාවක්", "මුතුවලටත් වඩා වටින මැණිකක්" කියලා.

ඊළඟට නිලූෂා ලක්මාලි මන්ත්‍රීතුමිය. එතුමියත් නීතිඥවරියක්. ඒ වාගේම එම පවුලේ පළමු දේශපාලන ක්‍රියාධරිය. එතුමිය ගැන comment section එකේ කියා තිබෙනවා, "ගොඩක් පැහැදිලිව සහ කාටත් තේරෙන විධියට ගුණාත්මකව කථාව කළා. සුබ පැතුම්! රුවන්පුර කාන්තා හඬ. ජය වේවා!", "ඉතිහාසයේ පළමුවෙනි වතාවට කහවත්තට පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක්. රත්නපුර තිබ්බ කාන්තා නියෝජනය ජයග්‍රහණය කළ එක පිළිබඳව සතුටුයි" කියලා. කලින් හිටියා, රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමියලා. ඒ වාගේම තව comment එකක් තිබෙනවා. ඒකත් මම කියන්නම්. "අපේ දිස්ත්‍රික්කයේ අවුරුදු ගණන් හිටපු - මේක නම් ටිකක් negative - සමහර මෝඩ තකතීරු දේශපාලනඥයන් දිහා බැලුවාම ඔබ ගැන ඡන්දය දීපු අපට ආඩම්බරයි" කියලා ලියා තිබෙනවා.

ඊළඟට සාගරිකා ගංගානි මන්ත්‍රීතුමිය. එතුමිය නීතිඥවරියක්, පවුලේ පළමුවැනි දේශපාලන ක්‍රියාධරිය. එතුමිය ගැන කියනවා, "කොහොම වුණත්, ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ කථා හරිම ප්‍රසන්නයි. වචන හොඳින් සංවිධානය වෙලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ කථා ඕනෑවට වඩා ශබ්ද නඟා නොතිබීම සහ සවන් දීමට පහසු වීම හරිම විශේෂයි. පිළිවෙළට කථා කරනවා"; "අපේ මනාපය ගැන ආඩම්බරයි", "අපේ මනාපයෙන් පත් වූ කෑගල්ලේ එකම නියෝජිතවරිය කොහොම හරි අපට හොඳ රටක් හදලා දෙන්න" යනුවෙන්. ඒ වාගේම එතුමිය ගැන තව comment එකක් තිබෙනවා. එතුමිය මෙතැන නම් ඉන්නේ බොහොම නිහඬ විධියට. නමුත් ඇත්ත ඒක නොවෙයි වාගේ. එතුමිය ගැන කියනවා, "පාසල් කාලයේ සිට අප දුටු සිහිනය සැබෑ වී ඇත. ශිෂ්‍ය නායිකාවක් ලෙස ඔබ ජනතා නායිකාවකගේ ප්‍රතිබිම්බයක් මා දුටුවා. එය ඒ ලෙසම ඉටු වී ඇත. ඉස්කෝලෙන් එව්වරයි. කථා කරද්දී හෝල් එකම නිහඬයි. සුබ පැතුම්!" යනුවෙන්.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ඊළඟට අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. එතුමියත් දේශපාලන ක්‍රියාධරියක්; පවුලේ පළමුවැනි දේශපාලන ක්‍රියාධරිය. එතුමිය ගැන කියනවා, "Lady superstar of Haputale District. Power of Tea plantation people!" කියලා. ඒ වාගේම තව කියනවා, "අගේ ඇති කෙලි පැටික්කියක්" කියලා. ඒක අම්මා කෙනෙකු කියා තිබුණු නිසායි මම ඒක ගත්තේ. ඊළඟට තව කෙනෙක් කියනවා, "මම බදුල්ලේ නෙමෙයි. ඒත් හදවතින් සුබ පතනවා. ඔයාගේ ජනතාවගේ දුප්පත්කම නැති කරන්න, අභිංසක බලාපොරොත්තු ඉටු කරන්න ඔබට හැකියාව ලැබේවා!" කියලා. තවත් කෙනෙක් කියනවා, "සහෝදරිය, මම සිංහල. අපි ඔබගේ ජයග්‍රහණය බලාපොරොත්තු වුණා. වතුකරයේ මිනිසුන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් මෙන්ම, කඳුකර ජනතාව මත්පැනින් බේරා ගන්න උත්සාහ කරන්න" යනුවෙන්. තවත් comment එකක් තිබෙනවා, "අම්බිකා දුවේ, හැමදාමත් ඇඬුවා Estate Tamils සහ අපේ දුප්පත් මිනිස්සු වෙනුවෙන්. ඉදිරියේ සිනහ වන කාලය එනවා" කියලා. ඒ තමයි ඔවුන්ගේ බලාපොරොත්තුව.

ඊට පස්සේ අපේ සරෝජා පෝල්රාජ් ඇමතිතුමිය ගැන තිබෙන comments මම කියන්නම්. එතුමිය ගුරුවරියක්. පවුලේ පළමු දේශපාලන ක්‍රියාධරිය. එතුමිය ගැන ගොඩක් දේවල් තිබෙනවා. මම එකක් දෙකක් විතරක් කියන්නම්. "සිංහල දෙමළ සහෝදරත්වය එක් කරන අපේ පෝල්රාජ් සහෝදරිය, ඔබ ගැන අපට හරිම ආඩම්බරයි. භාෂා ත්‍රිත්වය එක හා සමානව කථා කරන්න පුළුවන් අය ඉතාම අල්පයි. ඒ වාගේම ඔබේ කථා විලාසයද, සුපැහැදිලි වචන උච්චාරණයද අද්විතීයයි. ඔබ අපට සම්පතක්" යනුවෙන් සඳහන් කර තිබෙනවා. එතුමිය ගැන ගොඩක් අය කථා කර තිබෙන නිසා මම comments වැඩිය කියන්න යන්නේ නැහැ.

ඊට පස්සේ ඉන්නවා, තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. එතුමිය නීතිඥවරියක්. එතුමියගේ පවුලේ පළමු දේශපාලන ක්‍රියාධරිය. එතුමිය ගැන කියනවා, "නීතිය හා සාධාරණත්වයෙන් යුත් හෙටක් වෙනුවෙන් නාවලපිටියෙන් ශක්තිමත් නායකත්වයක්" යනුවෙන්. නීතිය හා සාධාරණත්වයයි, නාවලපිටියයි ගත්තාම සාමාන්‍යයෙන් ආලෝක වර්ෂයක් විතර gap එකක් තිබුණු තැනක්. දැන් ඒක වෙනස් වෙලා. ඊළඟට, "නිහතමානී නීතිඥවරියක්. නාවලපිටිය අපේ සුවිශේෂී තෝරා ගැනීමක්. ඔබ නාවලිපිටිය දේශපාලනයේ හැරවුම් ලක්ෂ්‍යයක්" කියාත් සඳහන් වනවා. ඔව්, මමත් එහෙම හිතනවා. ඒ වාගේම, "Kandyans, you have to pick her. You will never find anyone like her. She is an amazing person. A great citizen. Everyone who knows her personally will second me" කියලාත් සඳහන් වනවා.

ඊළඟට ගීතා රත්නකුමාරි මන්ත්‍රීතුමිය ගැන කිව්වොත්, එතුමිය නීතිඥවරියක්. එතුමිය පවුලේ පළමුවැනි දේශපාලන ක්‍රියාධරිය. එතුමිය ගැන කියනවා, "යාපහුවේ පළමු කාන්තා හඬ. නිහතමානී කාන්තා නායකත්වයක්" යනුවෙන්.

ඊට පස්සේ හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය. එතුමියත් නීතිඥවරියක්. පවුලේ පළමු දේශපාලන ක්‍රියාධරිය. එක comment එකක් තිබෙනවා, ඒක කියන්න නම් මට ටිකක් බයයි. "පුත්තලමේ ජනතාව -අර එහේ සතෙක් ඉන්නවා, ප්‍රසිද්ධ- ඒ තත්ත්වයෙන් මිදිලා අලුත්, උගත් නායකත්වයෙන් දියුණු වෙන්න අලුත් ගමනක් යන්න එකතුවෙලා" කියලා සඳහන් වනවා. තව comment එකක් තිබෙනවා, "අඩු වයසින් කිව්වාට, අපේ! ඒ වයස හොඳටම ඇති. නීතිඥවරියක්. දැනුම තිබෙනවා. උගත්, හොඳයි, දේශපාලන කටයුතු සාර්ථකව කරගෙන යෑමට ඇයට සුබ පතනවා" කියලා.

ඊළඟට ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. එතුමිය නීතිඥවරියක්. පවුලේ පළමුවැනි දේශපාලන ක්‍රියාධරිය. එතුමිය ගැන කියනවා, "අපි කවදාවත් මාලිමාවට ඡන්දය දුන්නේ නෑ. මේ පාර අපි ගත්ත තීරණය ගැන සතුටුයි. රටට දැනුම ගෙනෙන ආණ්ඩුවක්. ඔයා සැබෑම ලක්මාලියක්" යනුවෙන්. ඒ වාගේම, "Super English! Super personality! Super woman!" , "එඩිතර, නිර්භීත, බුද්ධිමත්, නැණවත්, උගත්, දක්ෂ, තරුණ, අවංක, අභිමානවත් -ඔක්කෝම වචන දාලා- ලක්මාලි මැතිනියට ජයෙන් ජයම වේවා!" කියලාත් සඳහන් වනවා.

ඊළඟට, නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. එතුමියත් නීතිඥවරියක්. පවුලේ පළමු දේශපාලන චරිතය. එතුමිය ගැන ගොඩක් comments තිබෙනවා. මට කථා කරන්න තිබෙන කාලයත් ඉවර වෙගෙන යන්නේ මම හිතන්නේ. ඉවර වෙලාද මන්දා.

එතුමිය ගැන කියනවා, "පාර්ලිමේන්තුවේ නිර්භීත කාන්තා නියෝජනයක්. අපි පැතුවේ මෙහෙම තත්ත්වයක් තමයි. ඒ පැතුම ඉටු කර ගැනීමට අපේ දායකත්වය ලබා දීම ගැන ලොකු සතුටක් දැනෙනවා. වැදගත් කාන්තාවක්" යනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් කියන්නේ ඔබතුමිය ගැනයි. ආචාර්ය කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය. නීතිඥවරියක්. ඒ වාගේම ආචාර්යවරියක්. මම හිතන්නේ හත්මුතු පරම්පරාව ගැනම බැලුවත් පළමු දේශපාලන ක්‍රියාධරිය. ඔබතුමිය ගැන කියා තිබෙනවා, "නිස්කලංකව සම්පූර්ණ විනාඩි 17ක්ම සවන් දුන්නේ අද. මට කනගාටුවක් තියෙනවා, මෙතුමියට මනාපයක් දෙන්නට නොහැකි වීම ගැන. නමුත් සතුටක් තිබෙනවා, පසුගිය වසර තුනකට අධික කාලයක් මාලිමාව වෙනුවෙන් තබන ලද සටහන් සම්බන්ධයෙන්"; "ඉදිරි දිනක මෙවැනි හරවත් චරිතවලින් දියවන්නාව හැඩ වේවි. පක්ෂ පාට දේශපාලනය නොව, බහුතරයක් දේශපාලන ධාරා තුළින් මෙවැනි චරිත ජනගත කළ යුතුයි" යනුවෙන්. ඔබතුමිය වාගේ අය අනෙක් හැම පැත්තකින්ම එන්න ඕනෑ කියලා තමයි කියන්නේ.

ඊළඟට, ඕෂානි උමංගා මැතිනිය ගැනත් කියන්නම්. එතුමියත් පවුලේ පළමුවැනි දේශපාලන ක්‍රියාධරිය. ඇය කර්මාන්තයක් හිමි කෙනෙක්. ඇය ගැන සඳහන් වනවා, "ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත යන කියමන පරදා සෑම අංශයකින්ම කුසලතාවකින් පිරුණු අයෙක් බව මනාව පැහැදිලි වේ...", "නිහතමානී එඩිතර චරිතයක්...! ශක්තිමත් සුන්දර කාන්තා නායිකාවක්..." කියලා. තවත් කෙටි වෙලාවකින් මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඊළඟට, අනුෂ්කා දර්ශනී මැතිනිය ගැන කියන්නම්. එතුමියත් නීතිඥතුමියක්. පවුලේ පළමුවැනි දේශපාලන ක්‍රියාධරිය. ඇයගේ ස්වාමි පුරුෂයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට ආවේ නැති වුණාට අපේ පක්ෂයේ ප්‍රධාන ක්‍රියාධරයෙක්. අනුෂ්කා දර්ශනී මන්ත්‍රීතුමිය ගැන සඳහන් වෙනවා, "ගමෙන් ගිහින් කථා කරනවා දැක්කමයි. විනය නම් කියලා වැඩක් නැහැ" යනුවෙන්. ඇය ගැන හරිම ලස්සන සඳහනක් තිබෙනවා. මොකක්ද, ඒ? "මම හරිම ආදරය කරන සහෝදරියක්. ඇයගේ උපමා කථා තමයි ලස්සන. කොත්මලේ ජනතාවගේ වාසනාව. නුවරඑළිය දිස්ත්‍රික්කයටම මැණිකක්. අගස්ති මාලයයි, බෝරිවිවි හැට්ටයයි කොච්චර හැඩයි ද? ඉස්සර මැණිකෙලා ඇන්දේ. (මගේ අම්මා මතක් වෙනවා)" යනුවෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම අවසන් කරනවා, මට ඒ වෙලාව ඇති වෙයි.

තවදුරටත් එතුමිය ගැන සඳහන් වෙනවා, "විශිෂ්ටයි ඔබගේ කථාව. කොත්මලේ අපිට ලොකු ආඩම්බරයක්. දශක ගණනාවකට පස්සේ කොත්මලේ හඬක් පාර්ලිමේන්තුවේ" යනුවෙන්. එතුමිය ගැන තව comment එකක් තිබෙනවා, "නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කළ කෙනෙක් සාමාන්‍ය පන්තියේ මිනිස්සු ගැන කථා කරනවා දැක්කේ අද තමයි" යනුවෙන්.

ඊළඟට, හරිනි අමරසූරිය මැතිනිය ගැන කියන්නම්. එතුමිය ගැන ගොඩක් කථා කරන්න දෙයක් නැහැ. එතුමිය අපේ superstar. එකක තිබෙනවා, "මොකා කොහොම බාධා කළත් එක වචනයක් පැටලුණේ නැහැ", "කාන්තාවන් වෙච්ච අපිට හරිනි අගමැතිතුමිය බොහොම වටිනවා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමියගේ birthday එක තිබුණා 06වැනි දා. එතුමිය යෞවන සම්මාන කලා උළෙලට ගියා. ඔබතුමියට මතක ඇති, මීට අවුරුදු දෙකකට කලින් ඒකට ගිය එක ඇමති කෙනෙකුට වෙච්ච දේ. "හූ" කියලා එළෙව්වා. නමුත්, අගමැතිතුමිය එතැනට ගියාට පස්සේ එතැන හිටපු audience එක එතුමියට "Happy birthday!" song එක කිව්වා. මම හිතනවා, ඒ අවස්ථාව ලෝකයේ වුණත් හරිම දුර්ලභ අවස්ථාවක් කියලා.

ඒ වාගේම, සමන්මලී ගුණසිංහ මැතිනිය ගැනත් කියන්න ඕනෑ. එතුමිය ගැන මගේ comment එක මම අවුරුදු 25කට කලින් දීලා තිබෙනවා. එතුමිය ගැනත් තිබෙනවා, comments ගණනාවක්. එතුමිය ගැන සඳහන්ව තිබුණා, "බොහොම ශක්තිමත් කාන්තාවක්, ධෛර්යවත් කාන්තාවක්" කියලා. "සමන් මලක් වාගේ" කියලාත් තිබුණා.

ඊළඟට, කියන්නම් රෝහිණී කවිරත්න මැතිනිය ගැන. එතුමිය ගැන සඳහන්ව තිබෙනවා. "මාතලේ ගැහැනු එඩිතර බව හිතට ගන්න", "ඔබ වැනි දිරිය කාන්තාවන් පාර්ලිමේන්තුවේ සිටිය යුතුමයි" කියලා. දේශපාලන පවුලකින් එතුමිය පැවත එන්නේ. එහෙම ආවා වුණත්, මේ රටේ දේශපාලනය කරන එක කාන්තාවකට ලේසි නැහැ.

චමින්ද්‍රාණී කිරිඇල්ල මැතිනිය ගැනයි දැන් කියන්නේ. එතුමිය ගැන සඳහන් වෙනවා, "කිරිඇල්ලගේ දුව ගැන ආඩම්බරයි. නොසැලී ඉදිරියට යන්න වාසනාව ලැබේවා", "මෙතුමිය දැක්කාම හරිම සතුටුයි. නියම එඩිතර කාන්තාවක්. වැදගත් කාන්තාවක්" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා හිතන විධියට මට එක නමක්වත් අත්හැරුණේ නැහැ. එහෙම වුණොත් නම්, ඒක ලොකුම නඩුවක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, කාලය අවසන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තවත් තත්පර කීපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මම මේ දේවල් මතක් කරමින් කියන දේ මේකයි. අපි මේ විසිදෙදෙනා ආරක්ෂා කරන්න ඕනෑ. මේ අයගේ අඩු පාඩු ගැන කථා කළාට කමක් නැහැ. නමුත් මේ අයට ලිංගිකත්වය ආරෝපණය කරලා, බොරු කියලා, මඩ ගහලා අර හයිපතියාට කරපු දේ කරන්න දෙන්න එපා. මේ කාන්තාවන් රටේ අනෙකුත් පොදු මහ ජනතාව වෙනුවෙන් වැඩ කරන්න ආපු අය. ජාත්‍යන්තර කාන්තා දිනය වන අද දිනයේදී මම හිතනවා, මේ විසිදෙදෙනා ආරක්ෂා කරගෙන ඔවුන් ශක්තිමත්ව ඉස්සරහට ගෙනිව්වොත් තවත් දහස් ගණන් කාන්තාවන් මේ ගරු සභාවට එයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි, මට මේ වෙලාව ලබා දුන්නාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Thurairasa Ravikaran. You have nine minutes.

[பி.ப. 2.44]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, மார்ச் மாதம் 8ஆம் திகதியான இன்று பன்னாட்டு மகளிர் தினமாகும். இறுதி யுத்த காலத்தில் இராணுவத்திடம் பிள்ளைகளைக் கையளித்த தாய்மாரும், கணவன்மாரைக் கையளித்த மனைவிமாரும் எமது வடக்கு, கிழக்குப் பகுதிகளில் வலிந்து காணாமலாக்கப்பட்ட உறவுகளைத் தேடி 2,923 நாட்களாகத் தொடர் போராட்டத்தில் ஈடுபட்டு வருகின்றனர். அந்த வகையில், ஒவ்வொரு மகளிர் தினத்தையும் துக்க நாளாக அறிவித்து பாரிய கவனயீர்ப்பு ஆர்ப்பாட்டத்தைச் செய்ததைப்போல, இந்த வருடமும் வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவுகள் முல்லைத்தீவு வட்டுவாகல் பகுதியில் கவனயீர்ப்புப் பேரணியொன்றை நடாத்தித் தமக்கான நீதியைக் கோரியிருக்கிறார்கள். இந்த மகளிருக்கான பதில்தான் என்ன? இந்த பன்னாட்டு மகளிர் தினத்தில் புதிய அரசாங்கம் அந்த மகளிருக்கான நீதியை வழங்குமா என்பதை உறுதியாகத் தெரிவிக்க வேண்டும்.

அன்றைய அரசின் வாக்குறுதிகளை நம்பி ஒப்படைக்கப்பட்ட பல ஆயிரக்கணக்கானவர்களுக்கு என்ன நடந்தது? தொடர் ஓலங்கள், அழுகுரல்கள் என்பவற்றுக்கு மத்தியில் பலர் மன அழுத்தத்துக்கு உள்ளாகி இறந்தும் விட்டார்கள். இந்த நிலையில், நீதி கிடைக்க வேண்டும் எனப் போராடும் அவர்கள்மீது, அடிக்கடி பொலிஸார் மூலமான நீதிமன்றத் தடை உத்தரவு, பயங்கரவாதத் தடுப்புப் பிரிவினரின் விசாரணைகள், வழக்குத் தாக்கல் செய்யவுள்ளதாக மிரட்டுதல், மறைமுகத் தாக்குதல்கள், உயிர் அச்சுறுத்தல்கள், போராட்டங்களிலிருந்து வெளியேற்றும் முயற்சிகள் எனப் பல ஒடுக்குமுறைகள்! 2009க்குப் பின்னர் பல பெயர்களில் கொண்டுவரப்பட்ட பொறிமுறைகளினூடாக அமைக்கப்பட்ட ஆணைக்குழுக்களை நம்பி தாம் ஏமாந்ததுதான் மிச்சம் என்று அவர்கள் புலம்புகின்றார்கள்.

புதிய அரசானது இந்த விடயத்தில் உண்மைத் தன்மையுடன் நடந்துகொள்ள வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். கடந்த கால அரசுகள் அவர்களுக்குப் பதில் சொல்லவில்லை. புதிய அரசு நிச்சயமாகப் பதில் சொல்ல வேண்டும்; பதில் சொல்லும் என்று நாங்கள் நம்புகின்றோம். கௌரவ அமைச்சர் அவர்களே, இந்தக் குறைகளை நீண்ட நாட்களாகச் சொல்லிக் கொண்டிருக்கும் அந்த மகளிரை நீங்கள் சந்தித்து ஆறுதல் கூற வேண்டும்; தீர்வுக்கான முயற்சிகளில் இறங்க வேண்டும்; அவர்களின் துன்பங்களில் பங்கெடுத்துக்கொள்ள வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய பிரதேசத்தில் பெண் தலைமைத்துவக் குடும்பங்கள் மிகப் பெரிய அளவில் காணப்படுகின்றன. வடக்கு, கிழக்கு மாகாணங்களில் சுமார் 92,000 பெண் தலைமைத்துவக் குடும்பங்கள் காணப்படுகின்றன. இக்குடும்பங்கள் சமூகத்தில் பல்வேறு துன்பங்களை அனுபவித்து வருகின்றன. அதுமாத்திரமன்றி, தமது வாழ்வாதாரத்துக்காகப் பெரிதும் சிரமப்படுகின்றன. மிகவும் குறைந்த எண்ணிக்கையிலான குடும்பங்கள் ஓரளவுக்கு வருமானத்தை ஈட்டினாலும், மிகுதிப் பெரும்பாலான குடும்பங்கள் தமது வாழ்வாதாரத்துக்காகப் பெரிதும் சிரமப்படுகின்றன.

2023 இறுதிப் புள்ளிவிபரத்தின்படி, முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுறைப்பற்றில் 2,617 பெண் தலைமைத்துவக் குடும்பங்களும் புதுக்குடியிருப்பில் 2,121 பெண் தலைமைத்துவக் குடும்பங்களும் ஒட்டுசுட்டானில் 1,941 பெண் தலைமைத்துவக் குடும்பங்களும் மாந்தை கிழக்கில் 890 பெண் தலைமைத்துவக் குடும்பங்களும் துணுக்காயில் 813 பெண் தலைமைத்துவக் குடும்பங்களும் மணலாறில் 681 பெண் தலைமைத்துவக் குடும்பங்களும் என மொத்தம் 9,063 பெண் தலைமைத்துவக் குடும்பங்கள் உள்ளன. இவ்வாறு வவுனியா, மன்னார் உள்ளிட்ட வன்னியிலும், வடக்கு, கிழக்கிலும் கிட்டத்தட்ட 92,000 பெண் தலைமைத்துவக் குடும்பங்கள் உள்ளன. தயவுசெய்து, அவர்களுக்கு மாதாந்தம் வருவாயை ஈட்டக்கூடிய வகையில் ஏதாவது உதவி செய்யுங்கள்! அவர்கள் தங்களது குடும்பங்களைச் சீராகக் கொண்டுசெல்வதற்காகப் பல்வேறு சவால்களை எதிர்நோக்குகின்றார்கள்.

குடும்பச் சுமை, பொருளாதாரத்தில் மிகவும் பின்தங்கிய நிலைமை, பாதுகாப்பின்மை, அன்றாட வாழ்வாதாரப் பாதிப்பு, உளரீதியான பாதிப்புகள், பிள்ளைகளின் கல்விப் பாதிப்பு, வேலைவாய்ப்பின்மை, பாலியல் ரீதியான பாதிப்புகள், சமூகத்தால் ஓரங்கட்டப்படுதல், தாழ்வு மனப்பான்மை, நுண்நிதிக் கடன் நிறுவனங்களுக்கு அடிமையாதல் என்பவற்றால் சிலர் தற்கொலை முயற்சிக்குச் செல்கின்றார்கள். எனவே, அவர்களுக்குச் சமூகத்தில் தலைநிமிர்ந்து வாழக்கூடிய வகையில் உதவிகள் வழங்கப்பட வேண்டும். இக்குடும்பங்களைச் சேர்ந்த சிறுவர்கள்தான் பாடசாலை இடைவிலகல் நிலைமைக்குக் கூடுதலாக உள்ளாகின்றனர். இக்குடும்பங்களின் பொருளாதாரத்தில் சிறு மாற்றங்களையாவது மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு ஏற்படுத்த வேண்டும்.

முல்லைத்தீவு மாவட்டத்தில் பெற்றோரை - தாயையும் தந்தையையும் - இழந்த சிறுவர்கள் 390 பேர் காணப் படுகின்றார்கள். தாயை மட்டும் இழந்த சிறுவர்கள் 514 பேரும், தந்தையை மட்டும் இழந்த சிறுவர்கள் 2,263 பேரும் காணப் படுகின்றார்கள். மாற்றுத்திறனாளியாகவுள்ள சிறுவர்கள் 292 பேர் காணப்படுகின்றார்கள். பொருளாதாரத்தில் மிகவும் நலிவடைந்தவர்களாக குடும்பத்தின் சுமைகளை இந்தச் சிறுவர்களே தாங்கவேண்டியுள்ளது. இவர்களிடையே பாடசாலை இடைவிலகல் கூடுதலாகக் காணப்படுகின்றது.

கௌரவ மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர் அவர்களே, தற்பொழுது இங்கு பிரதமர் அவர்கள் இல்லாவிட்டாலும் அவரையும் நான் விளிக்கிறேன். நீங்கள் இருவரும் பெண்மணிகள்! அரசாங்கம் தகுதியானவர்களைப் பொருத்தமான இடங்களுக்கு நியமித்திருக்கின்றது. உங்களுக்கு நாம் விரிவாக எடுத்துச்சொல்ல வேண்டும் என்றில்லை. முல்லைத்தீவு மாவட்டமானது, யுத்தத்தால் முழுமையாகப் பாதிக்கப்பட்ட ஒரு மாவட்டம்; பொருளாதார ரீதியாகப் பலம்குறைந்த ஒரு மாவட்டம்! முல்லைத்தீவில் மகளிர் தினத்திலேயே கவனயீர்ப்புப் போராட்டம் நடைபெறுகின்றது என்றால் பாருங்கள்! அவர்கள் தங்களது பிரச்சினைகளை அரசின் கவனத்துக்குக் கொண்டுவருவதற்கு மகளிர் தினத்திலேயே போராடுகின்றார்கள். கௌரவ மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர் அவர்களே, நீங்கள் முல்லைத்தீவுக்கு வாருங்கள்! நீங்கள் அங்கு வந்து சொல்லும் ஆறுதல் வார்த்தைகள் அவர்களுடைய வேதனைகளுக்குச் சிறிய அளவிலாவது மருந்தாக அமையலாம்!

எமது மாவட்டத்தில் மாற்றுத்திறனாளிகள் குறிப்பிட்டளவு உள்ளனர். புதுக்குடியிருப்பில் 943 பேரும் கரைதுறைப்பற்றில் 851 பேரும் ஒட்டுசுட்டானில் 625 பேரும் துணுக்காயில் 319 பேரும் மாந்தை கிழக்கில் 275 பேரும் மணலாறில் 145 பேரும் என மொத்தம் 3,158 பேர் எமது மாவட்டத்தில் மாற்றுத்திறனாளிகளாக உள்ளனர்.

அடுத்து, கல்வி அமைச்சுத் தொடர்பான ஒரு விடயம் மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சருக்கும் தெரிய வேண்டும் என்பதால் சொல்கின்றேன். முன்பள்ளிகளில் மிகவும் குறைந்த கொடுப்பனவில் ஆசிரியர்களாக மகளிரே கடமையாற்றுகின்றார்கள். அவர்களுடைய மாதாந்தக் கொடுப்பனவு வெறும் 6,000 ரூபாய் மட்டுமே! இதை வைத்து அவர்கள் எப்படி மாதாந்தச் செலவைச் சமாளிக்க முடியும் என்பதை யோசித்துப் பாருங்கள்! இது பற்றி பலரும் என்னிடம் சொன்னார்கள். சிறு பிள்ளைகளுக்கு அறிவைப் போதிக்கும் திறமைசாலிகளாகவே இந்த முன்பள்ளி ஆசிரியர்கள் காணப்படுகின்றார்கள். எனவே, இந்தக் குறையை நீக்குவதற்கு நீங்களும் ஒத்துழையுங்கள்! அவர்களுடைய சேவைக்குரிய கொடுப்பனவு போதுமா என்பதைச் சிந்தித்துப் பாருங்கள்! தயவுசெய்து, இந்த விடயத்தில் அரசு கவனம் செலுத்த வேண்டும். இதற்கு உங்களுடைய ஒத்துழைப்பு மிக அவசியமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඔබතුමියගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, මට විනාඩියක කාලයක් දෙන්න කියලා. මගේ අතින් විශාල වරදක් වෙලා තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු ක්‍රිෂ්ණන් කලෙයිවෙල්වි මන්ත්‍රීතුමිය වෙනුවෙන් තිබ්විච සටහන මට අතහැරුණා. වෙලාව පිළිබඳව ආපු ප්‍රශ්නයත් එක්ක මට ඒක අතහැරුණා. මම ඒ ගැන

[ගරු බිමල් රත්නායක මහතා]

කනගාටු වෙනවා. ගරු ක්‍රිෂ්ණන් කලෙයිවෙල්වි මන්ත්‍රීතුමිය තමයි ඇගේ පවුලේ පළමු දේශපාලන ක්‍රියාධරිය. ඇය ගැන මෙසේ සඳහන් කොට තිබෙනවා, "We are looking forward, we want you because our community must grow and our whole community must be happy. Excellent talk." ඒ වාගේම තිබෙනවා, "ඔබතුමිය මහත් කැපකිරීම් කරපු කෙනෙක්. හරිම ශක්තිමත් කාන්තාවක්" යනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එතුමිය ගැන සඳහන් කරපු තවත් කාරණයක් තිබුණා. මම ඒක ලියාගෙන ආවේ නැහැ. මට ඒක දැන් මතක් වුණා. එහි තිබුණා, "ඇහ පොඩි වුණාට හිත ශක්තිමත් අපේ වෙල්වි අක්කා" කියලා. මීට පෙර එතුමිය ගැන සඳහන් කිරීමට නොහැකිවීම පිළිබඳව මම එතුමියගෙන් සමාව ඉල්ලනවා. මා ඇය කුඩා කළ සිටම දන්නවා. ඔබතුමියගේ මහත් කැපකිරීම් සහගත දේශපාලනයට අපි ගරු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව දුන්නාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අමතක වෙලා මහහැරුණු ඒ අඩුපාඩුව සකස් කිරීම ගැන ගරු සභානායකතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද අපේ කාන්තාවන්, දරුවන් පිළිබඳව කෙරෙන මේ විවාදයේදී මම විශේෂයෙන්ම අපේ බිමල් රත්නායක මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලු කාන්තා නියෝජිතවරියන් පිළිබඳව යම් ඇගයීමක් සහ අදහසක් ඉදිරිපත් කිරීම ගැන. විශේෂයෙන්ම ඒ සියලුදෙනාම කාන්තාවන් ලෙස පිරිමින්ට වඩා විශාල ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙමින් ජීවිතය ගත කරන අය. ඒක ලේසි පහසු කාර්යයක් නොවෙයි. කාන්තාවකට මේ සමාජ ක්‍රමය තුළ දේශපාලනය කරනවා කියන්නේ ලේසි පහසු දෙයක් නොවෙයි. එම නිසා අපි ඒ සියලුදෙනා ඇතුළු සියලු කාන්තාවන්ට අපේ ගෞරවය සහ සුබපැතුම් එක් කරනවා. විශේෂයෙන්ම මේ දසවන පාර්ලිමේන්තුවට පැමිණි පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරියන්ටත් අපේ ගෞරවය සහ සුබපැතුම් එක් කරනවා. එ් අය ආරක්ෂා කර ගැනීම වාගේම, මීටත් වඩා වැඩි කාන්තාවන් පිරිසක් ඊළඟ පාර්ලිමේන්තුවට කැඳවාගෙන ඒමේ යුතුකම් කොටස අපට තිබෙනවා. ඒ වෙනුවෙන් කාන්තා quota එක සියයට 25ක් දක්වා වැඩි කරලා එය පාර්ලිමේන්තුවටත්, පළාත් සභාවටත් ඉදිරිපත් කළොත් හොඳයි කියලා මම හිතනවා. මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, දැනට පළාත් පාලන ආයතනවලට තිබෙන මේ සියයට 25ක quota එක, ඊළඟ පළාත් සභා මැතිවරණයත්, පාර්ලිමේන්තු මැතිවරණයත් පවත්වන්න කලින් ඇතුළත් කිරීමට අවශ්‍ය වැඩ කටයුතු සකස් කරන්න කියලා. ගරු සභානායකතුමනි, පුළුවන් නම් ඒ සියයට 25ක quota එක පාර්ලිමේන්තුවටත් ගෙනෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න. මම හිතන විධියට සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මැතිනිය ඇතුළු Women Parliamentarians' Caucus එකට පුළුවන් වෙයි ඒ සම්බන්ධ මූලික වැඩ කටයුතු ටික කරන්න. අපි අපේ පැත්තෙන් ඒ වෙනුවෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය සහ ශක්තිය දිය යුතුයි. මොකද හේතුව, ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා ඉන්න කාන්තාවන් විශාල ප්‍රමාණයක් ඉදිරියේදී පවත්වන ප්‍රාදේශීය සභා මැතිවරණයේදී හැලෙන්න තිබෙන ඉඩකඩ වැඩියි. ඒ අයට නැවත දේශපාලනයට එන්න තිබෙන ඉඩකඩ අඩු වුණාට පස්සේ ඒ අය දේශපාලනය අතහරිනවා. එම නිසා ඒ අයත් ඉදිරියට ගෙනයන වැඩ පිළිවෙළක් ගැන කල්පනා කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. මොකද, එතැන තමයි දේශපාලන අකුරු කියැවීම පටන් ගන්නා ස්ථානය.

මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. කල්පනා කර බැලුවාම තවමත්, මේ අය වැයේදීත් සියයට 0.3ක් තමයි කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයටත්, ඒ හා සම්බන්ධ අනෙකුත් කාරණා සඳහාත් මුදල් ලබාදී තිබෙන්නේ. සමස්ත අය වැය ඇස්තමේන්තුව අනුව මේ අමාත්‍යාංශයට වෙන් කර තිබෙන්නේ සියයට 0.3ක පමණ මුදලක්. කෙසේ වෙතත්, මේ වැඩ පිළිවෙළ තුළ ඔටිසම් ඇතුළු ස්නායු ආබාධ ඇති තැනැත්තන් පිළිබඳවත්, පරිවාස, පුනරුත්ථාපන කාර්යභාරය පිළිබඳවත්, විශේෂයෙන්ම වූදිත ළමයින් පිළිබඳවත් ගෙන තිබෙන පියවර අපි අගය කරනවා.

ඒ වාගේම, ළමා හා කාන්තා හිංසනය වැළැක්වීම සඳහා, ඔවුන් සවිබලගැන්වීම සහ සුරැකීම සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත විය යුතුයි.

සමීක්ෂණයට භාජන කරන ලද තොරතුරු ඇතුළත් වගුවක් මා ළඟ තිබෙනවා. ඒ අනුව, අද සෑම පස්දෙනෙකු අතුරින් තුන්දෙනෙක් වැඩබිම තුළ කිසියම් හෝ ලිංගික හිංසනයකට ලක් වන වාතාවරණයක් තිබෙනවා. මාර්ගගත හිංසනය පිළිබඳව ගත්තොත්, වාර්තා නොවන සිදුවීම් විශාල සංඛ්‍යාවක් අපි දකිනවා. මේ ගැනත් අපි කල්පනා කළ යුතුයි කියලා මා හිතනවා.

අනෙක් කාරණය තමයි, ලංකාවේ කාන්තා හා පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්වය ගත්තොත්, පුරුෂ පක්ෂය සියයට 68.6ක් ශ්‍රම බලකා සහභාගිත්වයට සම්බන්ධ වුණත්, තවමත් සියයට 31.3ක ප්‍රමාණයක් තමයි කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය තිබෙන්නේ. ඒකට මූලිකම හේතුව වෙලා තිබෙන්නේ, ඇත්තටම අපේ රටේ කාන්තාවන් තවමත් පුරුදු වෙලා සිටින්නේ housewife කෙනෙකු විධියට, ඒ කියන්නේ ගෙදර බලාගන්නා, දරුවන් බලාගන්නා අම්මා කෙනෙකු බවට පත්වෙන්නයි. නමුත්, ලෝකයේ අනෙක් රටවල කාන්තාවන් පිරිමියා සමඟ සම සමව වැඩ කරමින්, දරුවෝ ටිකත් බලාගෙන, වැඩටත් ගිහිල්ලා කටයුතු කරනවා. පිරිමිනුත් ඒකට සම සමව සහභාගි වන තත්ත්වයක් අපි දකිනවා. ඒ නිසා අපේ ලංකාවේ තිබෙන මේ ක්‍රමය යම් කිසි විධියකට වෙනස් කරන වැඩ පිළිවෙළකට අපි වහ වහා යා යුතුයි කියලායි මා විශ්වාස කරන්නේ.

වතු අංශය ගත්තොත්, අපි දකින විධියට වතු අංශයේ වැඩිම ප්‍රමාණයක් ඉන්නේ කාන්තාවෝ. විශේෂයෙන්ම වතු අංශයේ ක්‍රියාකාරිව වැඩ කරන කාන්තාවන් 227,202ක් ඉන්නවා. පිරිමින් ගත්තොත්, 98,000ක් විතර තමයි වතු අංශයේ ක්‍රියාකාරිව වැඩ කරන්නේ. ඒකෙන් අපි තේරුම් ගන්න ඕනෑ, මේ රටේ වතු අංශයෙන් ආදායම් ලබා දෙන්න කාන්තාවන් කටයුතු කරන නිසා ඔවුන්ට විශේෂ සහයෝගයක්, ශක්තියක් අපේ පැත්තෙන් ලබා දීම අත්‍යවශ්‍යයි කියන කාරණය.

අනෙක් පැත්තෙන් මම කලින් කියපු කාරණය, විශේෂයෙන්ම කාන්තාවන් ඇයි මේ තත්ත්වයට පත් වෙන්නේ නැත්තේ කියලා ගත්තොත්, අද ලංකාවේ කාන්තාවන් විශාල ප්‍රමාණයක් අධ්‍යාපන කටයුතුවල යෙදෙන නිසා රැකියාවක නියුක්ත වීම අඩු වෙලා තිබෙනවා. අද හැම තැනකම ගත්තොත් පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන් අධ්‍යාපනය පැත්තෙන් ඉතාම ඉහළ තැනකට යමින් තිබෙනවා. ඒ වාගේම, ගෘහස්ථ කටයුතුවල යෙදීමත්, විශ්‍රාම යෑම

සහ ආබාධිත තත්ත්වත් මේකට විශේෂයෙන් හේතු වෙලා තිබෙනවා. සියයට 57.2ක් ගෘහ ආශ්‍රිත කටයුතුවල යෙදෙන කාන්තාවන් තමයි අපට දකින්න ලැබෙන්නේ.

විශේෂයෙන් කාන්තාවන් හා දරිද්‍රතාව පිළිබඳව කල්පනා කරද්දී, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත සම්මත කරලා තිබෙනවා. එම පනතේ ඉතාම වැදගත් කරුණු ගණනාවක් ඇතුළත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරනු ලැබූ නඩුවකට පවා මැදිහත් වෙන්න පුළුවන් බලය මේ පනත මඟින් කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම නඩු විභාගයක් අතරතුර උද්ගත වන කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකදී ඒ පිළිබඳ කරුණු වාර්තා කරලා, පරීක්ෂණ කරලා, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරුණු වාර්තා කරන්න පුළුවන් බලයක් කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට මේ පනතෙන් දීලා තිබෙනවා. අනෙක් පැත්තෙන් "පාර්ලිමේන්තු කොමසාරිස්" තනතුර ගත්තොත්, ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ යම් පැමිණිල්ලක් ආවොත් ඒ සඳහා වැඩ කරන්නත් සම්පූර්ණ බලය මේ තනතුරට දීලා තිබෙනවා.

ඊළඟට මම කියන්න කැමැතියි, කාන්තාවන් සඳහා වූ ජාතික අරමුදල පිළිබඳව. මේ සම්බන්ධවත් පනතේ වැඩ කටයුතු කරලා තිබුණාට, කාන්තාවන් සඳහා වූ ජාතික අරමුදලට මේ වෙලාවේ මේ අය වැයෙන් යම් මුදලක් වෙන් කරලා තිබෙනවාද, නැද්ද කියන කාරණය මම අහන්න කැමැතියි. මොකද, ඒ අරමුදල දැන් පටන් අරගෙන වැඩ කරන්න පුළුවන් තැනකට යා හැකියි. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමියගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. මට මතක විධියට ප්‍රාග්ධන වියදම් හැටියට ඔබතුමියට දීලා තිබෙන්නේ රුපියල් මිලියන 392ක් පමණයි. මේ සියලු දේවල් කරන්න ඒ රුපියල් මිලියන 392 ප්‍රමාණවත් වෙයි කියලා මට හිතන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අමතර විනාඩි 10ක කාලයක් ලැබී තිබෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Thank you, Madam.

මේ කරුණු ටික මම ඉදිරිපත් කළේ, පළමුවෙන්ම මේ කොමිසම ක්‍රියාවට නඟනවාද නැද්ද කියන කාරණය ඔබතුමියට හිතා බලන්නයි. මම දැක්කා ගරු අගමැතිතුමිය කිව්වා, ඒ සම්බන්ධ කටයුතු ටික ඉතා ඉක්මනින් කරනවාය කියලා. ඒ වාගේම මම අහන්න කැමැතියි, මොනවාද මේ නිර්ණායක කියලා. මේ නිර්ණායක පිළිබඳව කිසිම සඳහනක් නැහැ. මේ පනතේ තිබුණාට එතැනින් පස්සේ ඒ සම්බන්ධයෙන් වන ක්‍රියාමාර්ග පිළිබඳව කරුණාකරලා අපට යම් පැහැදිලි කිරීමක් කරන්න කියලා මම විශේෂයෙන්ම කියන්න කැමැතියි.

ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ 1325 දරන යෝජනාව අනුව, කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳව සඳහන් 2025.02.24 දිනැති CEDAW වාර්තාව මා ළඟ තිබෙනවා. මම එය **සභාගත*** කරනවා.

**** ප්‍රශ්නකාලයේ නබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඇමතිතුමියනි, ඔබතුමිය පසුගිය 13, 14, 15 දිනවල ජිනීවාවලට ගියා. මම හිතන විධියට එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුව නවවැනි වාර්තාව, ලංකාවේ නවවැනි වාර්තාව තමයි එහිදී සාකච්ඡාවට භාජන වුණේ. ඒකේ යෝජනා මම දැක්කා. විශේෂයෙන්ම women, peace and security පිළිබඳව Women and Child Affairs Ministry එකේ ක්‍රියාවලියත් මම ඒකේ ටිකක් කියවලා බැලුවා. සෑහෙන වැඩ කොටසක් පොරොන්දු වෙලා තිබෙනවා. හැබැයි මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය මේකයි. හැම වෙලාවේම ජිනීවාවලට ගියාම ඔවුන් අහන්නේ, කාන්තාවන් සම්බන්ධව චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ ඉඳලා කථා කරනවා repetitions; දිගින් දිගටම කථා කරමින් ඉන්නවා, ඇයි මේවා ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ කියලා.

අද අපට තිබෙන ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය තමයි පුද්ගල නීති නිසා කාන්තාවන්ට සිද්ධ වෙන අසාධාරණකම්. අපේ ෆයිසර් මුස්තාපා මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මුස්ලිම් ජාතිකයෙක් වුණත්, ඇති වෙලා තිබෙන තත්ත්වයන් පිළිබඳව එතුමා කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. ඒ වාගේම CEDAW වාර්තාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, ලංකාවේ තේසවලමෙයි නීතිය, ඒ වාගේම මුස්ලිම් විවාහ හා දික්කසාද නීතිය ඇතුළු නීති ගණනාවක් තුළින් කාන්තාවන්ට සිද්ධ වෙලා තිබෙන අසාධාරණය පිළිබඳව අවශ්‍ය කරන කටයුතු ටික කරන්න කියලා. පෝල්රාජ් මැතිනිය ජනාධිපතිවරණයට කලිනුත්, ඊට පසුවත් මුස්ලිම් කාන්තාවන් සම්බන්ධයෙන් ඉතා නිර්භීත ලෙස ප්‍රකාශයක් කළා, මම දැක්කා. ඔවුන්ගේ විවාහය සම්බන්ධව, අත්සන් කිරීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම කාන්තාවන්ට ක්වාසි උසාවිවල නියෝජිතත්වය ගන්න විධියක් නැහැ. ඒ වාගේම ඔවුන්ට එහි විනිසුරුවන් විධියට වැඩ කරන්න හැකියාවක් නැහැ. ඒ විතරක් නොවෙයි. විවාහ නීතිය ගත්තත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. විවාහ වීමේ වයස පිළිබඳවත් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මම අහන්න කැමැතියි, මුස්ලිම් විවාහ හා දික්කසාද නීතිය පිළිබඳව නීති කෘත්‍යයන් අලුත් කරන යෝජනාව ගෙනෙන්නේ කවදාද කියලා. මොකද, මේ ගැන දිගින් දිගටම කථා කළා. තලතා අතුකෝරල මැතිනිය ඇමතිවරිය වශයෙන් හිටපු කාලයේ මට මතකයි, එතුමියත් ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ කථා කළා, කාන්තා කටයුතු පිළිබඳව. නමුත් ඒක සිදු කරන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඒ නිසා මේක ඉතා ඉක්මනින් කථා කළ යුතුයි කියලා තමයි අපි විශ්වාස කරන්නේ.

ඊළඟට, යුද්ධයෙන් විපතට පත් වැන්දඹුවන් සඳහා අවශ්‍ය ආධාර සම්බන්ධයෙන් වන සංඛ්‍යාලේඛනවල විශාල අඩුවක් තිබෙනවා. මේ CEDAW වාර්තාවේ ඔවුන් දිගින් දිගටම ඒ සම්බන්ධයෙන් කථා කරනවා. විශේෂයෙන්ම අස්වැසුම වැනි වැඩසටහන්වලදී. ඒගොල්ලන් දිගටම කථා කරන්නේ, gender-disaggregated data පිළිබඳව. ඒ කියන්නේ මේ සම්බන්ධයෙන් කිසිම data එකක් අද අපේ ළඟ නැහැ කියන එක.

මොකක්ද, හේතුව? ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංඛ්‍යාලේඛනයක්, කිසිදු තොරතුරක්, නිවැරදි දත්ත ලේඛනයක් අපි ළඟ නැහැයි කියන කාරණය. අඩුම තරමින් ඡන්දය ඉල්ලපු අපේක්ෂකයන්ගේ, කාන්තාවන්ගේ නම්, ගම් ටිකවත් මැතිවරණ කාර්යාලයෙන් සොයා ගන්න විධියක්, වැඩ පිළිවෙළක් නැහැ. ඒක සොයා ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ මේ සිටින NGOsවලට, එහෙම නැත්නම් අනෙක් ආයතනවලට. එම ආයතනවලට තමයි ඒ සම්බන්ධව කථා කරන්න සිද්ධවෙලා තිබෙන්නේ. ඒ වාගේම, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කියමින් සිටියේ මේකයි. මේ තොරතුරු පිළිබඳව, මම අර කිව්ව gender-disaggregated data පිළිබඳව CEDAW Committee එක විශාල වශයෙන් කථා කරලා තිබෙනවා. කාන්තා සංවේදීතාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන්නය කියන අදහස ඒකෙන් ඉදිරිපත් වෙනවා. ඒ වාගේම අස්වැසුම වාගේ වැඩසටහනකදී කොපමණ ප්‍රමාණයක් කාන්තාවන් වෙනුවෙන් වෙන් වෙනවාද කියන කාරණය පිළිබඳව තොරතුරු, දත්ත අපි ළඟ නැහැ. මේ පිළිබඳව තිබෙන දත්ත ගැන විශේෂයෙන් සාකච්ඡා කර බලන්න කියලා මම රජයෙන් ඉල්ලනවා. මෙවන් තත්ත්වයක් තුළ අස්වැසුම වාගේ වැඩසටහනකදී වැඩි වශයෙන් කාන්තාවන්, වැන්දඹුවන්, අසාධාරණයට ලක් වූ කාන්තාවන් පිළිබඳව බලන්න වෙයි. කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමියට පුළුවන් වෙයි, අස්වැසුම වැඩසටහනෙන් කාන්තාවන් සඳහා කොතරම් ප්‍රමාණයක් වෙන් කරන්න පුළුවන්ද කියන කාරණය පිළිබඳව එම වැඩසටහන කරන අයත් එක්ක සාකච්ඡාවක් කරලා දැනගන්න. අස්වැසුම දිය යුතුම, නමුත් දීලා නැති බොහෝ කාන්තාවන් ප්‍රමාණයක් මටත් හමු වෙලා තිබෙනවා. නමුත් ඒ අයට කියන්න තැනක් නැහැ. ගිහිල්ලා කථා කරලා කොතරම් කරුණු ඉදිරිපත් කළත් වැඩක් නැහැ, ඒ තිබෙන system එක ඇතුළේ ඔවුන් විශාල අපහසුතාවකට පත් වෙන නිසා.

2001 රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කාලයේ gender-based budget එකක් ගෙනාවා. අපට මතක හැටියට එක එක අමාත්‍යාංශවලට මුදල් වෙන් කළා වාගේම ඒ ඒ අමාත්‍යාංශවලින් කාන්තාවන්ට යම් මුදල් ප්‍රමාණයක් වෙන් කළා. හැබැයි 2001න් පස්සේ කිසිම කෙනෙක්, කිසිම ආණ්ඩුවක් ඒක practise කළේ නැහැ. අද දවසේ මම මේ ගැන කියන්නේ මේ අය වැය ගැන කථා කරන්න නොවෙයි. අනාගතයේ අපට පුළුවන් වෙයි අලුත් වැඩ පිළිවෙළක් විධියට projects ටිකක් සොයාගෙන, ඒ ඒ අමාත්‍යාංශවලින් කාන්තාවන්ට අවශ්‍ය කරන සහයෝගය දෙන්න. නැත්නම් හැම වෙලේම UNDP එකට යන්න, World Bank එකට යන්න, ඒවායින් සල්ලි ඉල්ලන්න, fundsවලට යන්න අපට සිදු වෙනවා. අවසානයේ සිද්ධ වෙන්නේ අපි ඒ අයතනවල හිරකරුවන් බවට පත් වෙන එක. ඒ නිසා අපේ තිබෙන අය වැය මතම විවිධ අමාත්‍යාංශවලට මේ බෙදීම් ටික කරන්න.

විශේෂයෙන් වතු කම්කරුවන් ලෙස කාන්තාවන් විශාල ප්‍රමාණයක් -දෙලක්ෂයකට වැඩි ප්‍රමාණයක්- වැඩ කරනවා කියලා මම කිව්වා. මම මීට පෙර ඒ ගැන කිව්වා. ඇත්තටම ගත්තොත්, ඔවුන්ට දෛනිකව ලැබෙන මේ රුපියල් 1,700ක ප්‍රමාණය මදි, විශේෂයෙන්ම කාන්තාවන්ට. මේකේ වැඩිම ප්‍රමාණයක් ඉන්නේ කාන්තාවන්. එහෙම තමයි මා ළඟ තිබුණු සංඛ්‍යාලේඛනවල සඳහන් වුණේ. මම ඒක ඉදිරිපත් කළා. රුපියල් 1,700ක් කියන්නේ ඉතාම අඩු මුදලක්. ඒ නිසා වහාම ඒ මුදල වැඩි කරන්න අවශ්‍ය කරන කටයුතු ටික කරන්න කියලා අපි ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝක කම්කරු සංවිධානයේ decent work සංකල්පය සම්බන්ධයෙන් අපි අත්සන් කරන්නේ කවදාද? මේක දිගින් දිගටම, දවස ගානේ පහු වෙලා, පහු වෙලා, ඇදීගෙන, ඇදීගෙන යන කාරණයක් වෙලා තිබෙන්නේ. අවුරුදු ගණනාවක්, ආණ්ඩු ගණනාවක් මේ decent work සංකල්පය ගැන කථා කළා.

හැබැයි, මේ සම්බන්ධව තවමත් තීන්දුවක් අරගෙන නැහැ. කරුණාකරලා මේ සම්බන්ධව ලෝක කම්කරු සංවිධානයත් - ILO එකත් - එක්ක කථා කරලා මේක අත්සන් කරන්නේ කවදාද කියලා අපට කියන්න. එතකොට ඒකත් එක්ක කාන්තාවන්ට තවත් ශක්තියක් දෙන්න අපට පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කරනවා කියලා ජනාධිපතිතුමා මේ අය වැයෙන් ප්‍රකාශ කළත්, තවමත් ඒ සම්බන්ධව කිසිම තීන්දුවක් අරගෙන නැහැ. ඔවුන් කිසිම කාරණයක් පිළිබඳව කථා කරන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම පෞද්ගලික අංශයේ නිදහස් වෙළෙඳ කලාපවල සේවය කරන කාන්තාවන් ඉන්නේ විශාල අර්බුදයක. ඉතාම අවම වැටුපක් ඔවුන්ට ලැබෙන්නේ. ඔවුන්ට ජීවත් වෙන්න ඒක ප්‍රමාණවත් නැහැ. ගම්වලින් රැකියාවලට පැමිණි කාන්තාවන් විශාල වශයෙන් විවිධ හිංසනවලට ලක් වනවා. ලිංගික හිංසනවලට විතරක් නොවෙයි, වෙනත් අතවරවලටත් ඔවුන් ලක් වනවා. ගම්වලින් පැමිණි කාන්තාවන් විශාල සංඛ්‍යාවක් නිදහස් වෙළෙඳ කලාප අවට ගෙවල්වල නතර වෙලා තමයි රැකියාව කරන්නේ. මාස තුන හතරකට සැරයක්, අවුරුද්දකට සැරයක් තමයි ඔවුන් ගෙවල්වලට යන්නේ. ඔවුන් ඉතාම අඩු වැටුපකින් ජීවත් වෙන්නේ. ඒ නිසා මේ අය ගැන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සොයා බලන්න ඕනෑ. ඒ සඳහා අපට දෙන්න පුළුවන් සහයෝගය, ශක්තිය අපේ පැත්තෙන් ලබා දෙන්නම්. ඔබතුමන්ලා, අපි එකතු වෙලා පෞද්ගලික අංශයට, විශේෂයෙන් නිදහස් වෙළඳ කලාපවල ඉන්න කාන්තාවන්ට මීට වඩා යම් සහනයක් ලබා දෙන්න ඕනෑ කියන කාරණය මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාන්තාවන්ට සිදුවන ලිංගික අතවර වැළැක්වීම පිණිස බස්වල stickers ගහලා තිබෙන ආකාරය මම දැක්කා. ලිංගික අතවර වළක්වන්න බස්වල stickers ගහලා වැඩක් නැහැ. අපේ ප්‍රවාහන සහ මහාමාර්ග විෂයය භාර ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. අපි මේ සම්බන්ධව කිසියම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුමයි, ගරු ඇමතිතුමනි. කාන්තාවන්ට සිදු වන අතවර පිළිබඳව ඔවුන් කොහේවත් කථා කරන්නේ නැහැ. ඔවුන් ඉතාම අපහසුවෙන්

මේවා දරාගෙන ඉන්නවා. ඔවුන් කවදාවත් ඒ තොරතුරු හෙළි කරන්නේ නැහැ. එහිදී ඔවුන් විඳින පීඩාව කොයි තරම්ද කියලා අපි කල්පනා කළ යුතුයි. ඒ වාගේම ලිංගික අතවරවලින් තොර කලාප නම් කිරීමට ලෝකයේ සමහර රටවල් කටයුතු කර තිබෙන ආකාරයත් මා දැකලා තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දයාසිරි මන්ත්‍රීතුමා වාගේ අනික් හැම පිරිමියෙකුම කාන්තාවන්ට ආදරය කරනවා නම් හරි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක නේ. අපි ආදරේ නිසා තමයි අද කාන්තාවන් ගැන කථා කරන්නේත්, ඒ වෙනුවෙන් වැඩ කරන්නේත්.

ගරු ඇමතිතුමියනි, අනෙක් කාරණය තමයි, rape law එක. නීතිඥවරුන් ගණනාවක් මෙතැනත් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් මේ ගැන දන්නවා නේ. මෙවැනි නඩු අවුරුදු ගණනාවක් ඇදගෙන යනවා. මේ නිසා එක පැත්තකින් ඒ කාන්තාවන්ට තව කෙනෙක් එක්ක විවාහ වෙන්නත් බැහැ. එහෙම නැත්නම් ඇයට දරුවන් ලැබිලා තිබෙනවා කියලා හිතමු. ඇය ඒ දරුවනුත් බලාගන්න ඕනෑ. මේ වාගේ විශාල අර්බුදයක් මේ rape law එකත් එක්ක තිබෙනවා. ඒ නිසා මම කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමියගෙන් ඉල්ලා සිටිනවා, ස්ත්‍රී දූෂණ පිළිබඳ නඩු විශේෂ - special - අධිකරණයකට යොමු කරලා, එහෙම නැත්නම් වෙනම අධිකරණ ක්‍රියාවලියකට ලක් කරලා ඉක්මනින් විභාග කරලා අවසන් කරන්න කටයුතු කරන්න කියලා. අවුරුදු ගණන් - අවුරුදු හත, අට, නවය, දහය- ගතවෙනවා, මේ සමහර නඩු විභාග කරලා අවසන් කරන්න. ඒ ගැන මම දන්නා කථාවක් කියන්නම්. එවැනි නඩුවක් කියන කාන්තාවක් අවුරුදු 10කට පස්සේ විවාහ වුණා. මම ඒ ගැන දන්නවා. නමුත්, අවසානයේ rape කරපු කෙනා අවුරුදු 20කට විතර හිරේ ගියා. අන්තිමට බලනකොට ඒ දෙදෙනා තමයි සම්බන්ධ වෙලා -යාළු වෙලා- විවාහ වෙලා තිබෙන්නේත්. හැබැයි, අර case එක අයින් කර ගත්තේ නැහැ. දෙදෙනාම තරහා වෙලා වාගේ හිටියා. අවසානයේ ඒ දෙදෙනාට ඒ ඉරණම අත් වුණා. අපි මෙවැනි කරුණු ගැන කල්පනා කළ යුතුයි. ගරු ඇමතිතුමියගෙන් මම ඉල්ලා සිටිනවා, අධිකරණ ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා rape law එක සම්බන්ධව සාකච්ඡා කරලා ස්ත්‍රී දූෂණ සම්බන්ධ නඩු විශේෂ අධිකරණ ක්‍රියාපටිපාටියක් තුළ ඉක්මනින් විභාග කරලා අවසන් කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. මම එවැනි එක නඩුවක් ගැන කියන්නම්, ගරු සභානායකතුමනි. මම ඊයේ මේ ගැන සොයා බැලුවා. මේ නඩුව අවසන් වෙන්නේ අවුරුදු 13කට පස්සේ. දූෂණයට ලක් වූ කාන්තාවගේ රතු පාටට තිබුණු ඇඳුම රෝස පාට වෙනවා, අවුරුදු 13කට පස්සේ. ඒ අනුව එම නඩුව හා සම්බන්ධ සියලුම සාක්ෂි වියැකී ගිහින් තිබෙනවා. ඒ නිසා මෙවැනි නඩු කටයුතු ඉක්මන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම නැවතත් මම කරන්න කැමැතියි.

කාන්තාවන්ගේ සමානාත්මතාව පිළිබඳව අපි හැම දාම කථා කරනවා. මේකෙදි contempt of Constitution තමයි අපි හැම දාම කථා කරන්නේ; අපි අපේ ව්‍යවස්ථාවට අපහාස කරනවා. අපි හැම දාම කාන්තාවන්ගේ සමානාත්මතාව ගැන කථා කළත්, කාන්තාවන්ට සමානාත්මතාව ඇති කර දීලා නැහැ. ඒ වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන් හොඳම අවස්ථාව දැන් එළඹිලා තිබෙනවා. ජාතික ජන බලවේගය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුව තුළ කාන්තාවන් විශාල පිරිසක් ඉන්නවා. මේච්චර කාලයක් තිස්සේ පැවතුණු, තමන්ගේ අම්මා තාත්තා මිය ගියාම, නැත්නම් ස්වාමිපුරුෂයා මිය ගියාම දේශපාලනයට එන කාන්තා නියෝජනය වෙනුවට හොඳ අවබෝධයක් ඇතිව ඔබතුමියලා දැන් මේ වැඩේ පටන් අරගෙන තිබෙනවා. මම ඉල්ලා සිටිනවා, මේ ක්‍රියාදාමය ඉස්සරහට ගෙනයන්න පුළුවන් උපරිම ක්‍රියාවලිය සිදු කර, කාන්තාවන්ට හිමි ස්ථානය නැවත ලබා දෙමු කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාන්තාවන් ගැන කථා කරන අද දවසේ නොකියාම බැරි තවත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, ඉෂාරා සෙව්වන්දි තවම සොයා ගෙන නැහැ කියන එක. ඇය කොහේ ගිහිල්ලාද කියලා සොයා ගන්න විධියකුත් නැහැ. ඇය සොයා දෙන්න කියලා තමයි අපටත් ඉල්ලන්න තිබෙන්නේ. මා හිතන විධියට අද අපි සියලුදෙනා මෙතැනදි කරුණු ඉදිරිපත් කළේ ඉතාම හොඳ චේතනාවකින්.

ගරු සභානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඊයේ ෆෙරාරි එකක් ගැන කිව්වා. ෆෙරාරි එකක් හැප්පිලා තිබෙනවා කිව්වා. නමුත් ඒ ෆෙරාරි එකේ වාර්තා කිහිපයක් තිබෙනවා. ඉමාම් වාර්තාව, අල්විස් වාර්තාව තවම සභාගත කරලා නැහැ. ඊළඟට, බටලන්ද වාර්තාව. කරුණාකර මේ වාර්තා ඉදිරිපත් කරන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලනවා. මේක ඔබතුමා කරන්න ඕනෑ වැඩක් නොවෙයි, කලින් කරන්න තිබුණු වැඩක්. පසුගිය සැප්තැම්බර් මාසයේදී අල්විස් වාර්තාවේ කටයුතු අවසන් වුණා කියලා තමයි අපට ආරංචි වෙලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකර ඒ වාර්තා ටික සභාගත කරන්න කියා මා ඉල්ලනවා. ඒ වාගේම මම දැක්කා, බටලන්ද වාර්තාව සම්බන්ධව අල් ජසීරා නාළිකාවේ මාධ්‍යවේදියා ප්‍රශ්න කළ ආකාරය. මමත් ඒ වැඩසටහන සෑහෙන වෙලාවක් බැලුවා. ඒකේ හොඳත් තිබෙනවා, නරකත් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම ඒක ෆෙරාරිම නොවෙයි. සමහර විට තමුන්නාන්සේලාත් මේ අවස්ථාවට මුහුණ දුන්නා නම්, ඒක කොයි විධියට අවසන් වෙයිද කියලා මට හිතාගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න. කලබල වෙන්න එපා. එතුමාත් කලබල වුණා. පොඩ්ඩක් ඉන්න. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේත් කලබලය නිසාම තමයි ඒ ඇන ගැනිල්ල කරගත්තේ. *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයේ සිටියදී "හිරු" නාළිකාවේ "සලකුණ" වැඩසටහනට ගියත්, වෙනත් වැඩසටහනකට ගියත් විශේෂයෙන්ම අපේ වත්මන් ජනාධිපති අනුර සහෝදරයාගෙන් ප්‍රශ්න කළ විධිය ඔබතුමාත් දන්නවා. ඔහොම නොවෙයි, FBI ගෙනිහින් 4වැනි තට්ටුවේදී ප්‍රශ්න කරනවා වාගේ තමයි එදා මාධ්‍යවේදීන් ප්‍රශ්න කළේ. අපි ඒවාට හරියට මුහුණ දී තිබෙනවා. හැබැයි, ලංකාවේ ප්‍රභූ පන්තියේ දේශපාලනයෙන් කවදාවත් ඔහොම ප්‍රශ්න කළේ නැහැ. ඒ නිසා ඒගොල්ලන්ට පුළුවන් වුණා, "මට ෆෙරාරි තිබෙනවා" කියලා කියන්න. හැබැයි, බැලුවාම ත්‍රීවීලර් ලයිසන් එකක්වත් තිබිලා නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම කිව්වේ ඒක නොවෙයි. *[බාධා කිරීමක්]* හරි. "හිරු" නාළිකාවෙන් නොවෙයි, තුන්දෙනෙක් නොවෙයි, පස්දෙනෙක් ඇහුවත් අපිත් පොඩ්ඩක් ඉවසලා තමයි උත්තර දෙන්නේ. නමුත් එදා රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ඉවසීමේ ගුණය නැතිකම සහ එතුමාගේ තිබෙන මහන්තත්තකම මත ඒ සියල්ල සිද්ධ වුණාය කියලා තමයි මම විශ්වාස කරන්නේ. කෙසේ වෙතත්, එතුමා රට වෙනුවෙනුත් යම් කාර්යභාරයක් කළා කියන එක මා විශ්වාස

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

කරනවා. ඒ ගැනත් ප්‍රකාශ කරමින්, පෝල්රාජ් ඇමතිතුමියට මේ ක්‍රියාවලිය ඉස්සරහට කරගෙන යෑමට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිෂ්ණන් කලෙයිවෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.20]

ගරු කිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 114ஆவது சர்வதேச மகளிர் தினத்தை உலக வாழ் பெண்கள் அனைவரும் கொண்டாடும் இவ்வேளையில், எனது சொந்த சமூகமான மலையக சமூகம் சார்ந்து சில கருத்துக்களைத் தெரிவிப்பதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறுகின்றேன். இந்த உலகத்தில் வாழும் உழைக்கும் பெண்கள் அனைவருக்கும் இன்றைய தினம் விசேடமான ஒரு தினமாகும். அந்த வகையில், இந்த மகளிர் தினமானது சகலருக்கும் சகலதும் நிறைந்த மகளிர் தினமாக அமையட்டும் என நான் பிரார்த்திக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் விவசாயத்துறையில் பணியாற்றும் பெண்கள், அரச நிறுவனங்களில் பணியாற்றும் பெண்கள், கைத்தொழிற்றுறையில் பணியாற்றும் பெண்கள், ஆடைத்துறையில் பணியாற்றும் பெண்கள் என அனைத்துத் துறைகளிலும் பணியாற்றும் பெண்கள் தொடர்பாகவும் இந்தச் சபையிலுள்ள பெண் பாராளுமன்ற உறுப்பினர்கள் பேசினார்கள். விசேடமாக, நான் மலையக தோட்டத்தில் வாழும் பெண்கள் தொடர்பாக ஒருசில கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன். தோட்டத்தில் பிறந்து, வளர்ந்து, வசிக்கும் பெண் என்ற வகையில், எனக்கு தோட்டத்தில் தொழில்புரியும் பெண்களின் வாசனை, அவர்களின் கடின உழைப்பு என்பன பற்றி நன்கு தெரியும்!

විශේෂයෙන්ම 2019දී පැවැති 108වැනි ILO Session එකේදී තමයි, Convention No. 190 - C190 - සම්මත කර ගත්තේ. නමුත්, මේ වෙනකොට එයට අවුරුදු පහක් ගත වෙලා තිබෙනවා. ඒ අවුරුදු පහ තුළම පැවැති කිසිදු ආණ්ඩුවක් ILO Convention එක අපේ රට තුළ අපරානුමත කරන්න කටයුතු කළේ නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. නමුත් අපි දන්නවා, මේ ගෙවුණු අවුරුදු පහ තුළත්, ඊට කලිනුත් අපේ රට තුළ කාන්තාවන් වැඩබිම් තුළදීත්, අපේ ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළා වාගේ ඉන් පිටතදීත් විවිධාකාරයේ ප්‍රචණ්ඩත්වයට, හිංසාවට, මානසික පීඩාවට ලක් වෙලා තිබෙන බව. අපේ ආණ්ඩුව වාගේම, කම්කරු අමාත්‍යාංශයත් ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා. අපේ ගරු ඇමතිතුමා අය වැය කාරක සභා අවස්ථාවේ අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදීත් ඒ ගැන සඳහන් කළා. අපි ඒ පිළිබඳව දැනටමත් අවශ්‍ය කරන අවධානය යොමු කරලා, ඒ ගැන සාකච්ඡා කරමින් සිටිනවා. අපි අමාත්‍යාංශයේ වැඩ භාර ගත් දිනයේ සිට ඉතා කෙටි කාලයක් ඇතුළත අපේ රටේ කම්කරු නීති සංශෝධනය පිළිබඳ මූලික වටයේ සාකච්ඡා ආරම්භ කළා. අපි දැන් ඊට අදාළ පියවර ගනිමින් තිබෙනවා. මේ ILO Convention No. 190 - C190 එක- අපේ රට තුළ අපරානුමත කරන්න අවශ්‍ය කරන මැදිහත්වීම් අපි කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, 2019 වර්ෂයේ සිට මේ ගෙවුණු වසර පහ තුළ ඒ පිළිබඳව සාකච්ඡා නොවුණාට, 2019 සිට ගෙවුණු වසර පහේම ජිනීවා නුවර පැවැත්වෙන ILO වාර්ෂික සමුළුවලට අපේ රටේ මහජන මුදල් වියදම් කරමින්, ඇමතිවරුන් ඇතුළු අදාළ පාර්ශ්ව සහභාගි වුණු බව. හැබැයි, මේ Convention එක අපේ රට තුළ අපරානුමත කරන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. අපි දන්නවා, අපේ රටේ ශ්‍රම බලකායට කාන්තා සහභාගිත්වය ගත්තොත්, එය සමස්ත කාන්තා ජනගහනයෙන් සියයට 32ක වාගේ ඉතා කුඩා ප්‍රතිශතයක් බව. ඒ ප්‍රමාණය ලෝකයත් එක්ක සන්සන්දනය කළාම ඉතා අවම ප්‍රතිශතයක්. ඒ නිසා අපි හිතනවා, මෙවැනි සම්මුති රට තුළ අපරානුමත කිරීම තුළින් ශ්‍රම බලකායට කාන්තා සහභාගිත්වය දක්වන ප්‍රතිශතය ඉහළ දැමීමට අපට පුළුවන්කම ලැබෙයි කියලා. එය කළ යුතුම දෙයක් හැටියට අපි දකිනවා.

අපේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසය ගත් විට වැඩිම කාන්තා නියෝජනයක් තිබෙන්නේ මෙවර පාර්ලිමේන්තුව තුළයි. ඒ නිසා අපි හිතනවා, අපේ රටේ ශ්‍රම බලකායට කාන්තා සහභාගිත්වය දක්වන ප්‍රතිශතය ඉහළ දැමිය යුතු බව. ඒක රාජ්‍ය සේවයේ වෙන්න පුළුවන්, පෞද්ගලික අංශයේ වෙන්න පුළුවන්, අර්ධ රාජ්‍ය සේවයේ වෙන්න පුළුවන්, වතු ක්ෂේත්‍රයේ වෙන්න පුළුවන්. ඒ හැම තැනකම කාන්තා සහභාගිත්වය, නියෝජනය මීට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ දැමිය යුතුව තිබෙනවා. ඒ සඳහා මෙවැනි සම්මුති අපේ රට තුළ අපි අපරානුමත කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම, මම කියන්න කැමැතියි, ධීවර කටයුතු පිළිබඳ සම්මුතිය - Work in Fishing Convention, C188, වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සම්මුතිය - Occupational Safety and Health Convention, C155, මාතෘ ආරක්ෂණය පිළිබඳ සම්මුතිය - Maternity Protection Convention, C183 - වැනි සම්මුති අපේ රට තුළ අපරානුමත කරන්න අපේ අමාත්‍යාංශය තවදුරටත් අවධානය යොමු කරලා තිබෙන බව.

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියනි, අද මේ ජාත්‍යන්තර කාන්තා දිනයේදී ඔබතුමිය විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව ඉතා කාලෝචිත, විශේෂයෙන් අද දවසට අදාළ වටිනා යෝජනාවක් ලෙස අර්ථ දක්වන්න පුළුවන්. ඉදිරියේදී අපේ අමාත්‍යාංශය මෙවැනි යෝජනා ඇතුළුව අපේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සේවා-සේවක දෙපාර්ශ්වයේම එකඟතා මත, අපේ රටේ නීති අවශ්‍ය ප්‍රමාණයට වෙනස් කරන්න, සංශෝධනය කරන්න මැදිහත් වෙනවා කියන කාරණයත් අවධාරණය කරමින්, මට කථා කරන්න මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.25]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම අද රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් ගෙනා සභාව කල් තැබීමේ යෝජනාව එක පැත්තකින් රටක සමස්ත වටිනාකම ජනනය වෙන නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළේ - එනම් වැඩ පොළේ, වැඩ බිමේ - කරන ඒ කාර්යභාරය එක්ක ගත්තාම පොදු වැදගත්කමක් ගන්නා කාරණයක්. සුවිශේෂයෙන්ම මේ ILO C190 ප්‍රඥප්තියේ සඳහන් වන පරිදි අපේ රට ප්‍රචණ්ඩත්වය සහ හිංසනයෙන් තොර ස්ථානයක් බවට පත් කිරීම, ඒ සඳහා ප්‍රවර්ධනය කිරීම සහ එය බලාත්මක කිරීම කියන කාරණය අතිශය වැදගත්. මොකද, හිංසනයට සහ ප්‍රචණ්ඩත්වයට කාන්තාව භාජන වෙනවා, සමාජය විසින් ඇය දුර්වල තැනකට පත් කරන වෙලාවකදී. මේ සභාව කල් තැබීමේ යෝජනාව තුළින් විශේෂ අවධානයක් මේ කාන්තාව වෙනුවෙනුත් යොමු කර තිබෙන නිසා ඒක ඉතාම වැදගත් යෝජනාවක් කියලා අපි දන්නවා. ඒ අරමුණ ඉෂ්ට කර ගැනීම සඳහා අපේ ආණ්ඩුව අනිවාර්යයෙන්ම මැදිහත් වෙනවා. ඒ සඳහා අදාළ සාකච්ඡා පවත්වමින් එය බලාත්මක කිරීමටත්, ඊට අපරාදුමතිය ලබා දීමටත් ඉක්මනින්ම කටයුතු කිරීමට අපි සූදානම් වනවා.

ඒ විතරක් නොවෙයි. ඒ සඳහා වන මැදිහත්වීම් වෙනුවෙන් දැනටමත් යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මේ කෙටි කාලය තුළ අවස්ථා දෙකකදීම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ Country Director, ජොනී සිම්ප්සන් මහත්මිය සමඟ මමත්, අපේ නියෝජ්‍ය ඇමතිතුමාත්, ලේකම්තුමාත්, නිලධාරිනුත් සාකච්ඡා පැවැත්වුවා, හොඳ කාර්මික සම්බන්ධතා ගොඩනඟා ගන්නේ කොහොමද, නිෂ්පාදනය වැඩි කරන්න රටේ ජනතාව එතැනට සම්බන්ධ කර ගන්නේ කොහොමද කියන කාරණා ගැන. එතැනදීත් මේ කාරණය අපි සාකච්ඡාවට බඳුන් කළා. ඉන් අනතුරුව ජාත්‍යන්තර කම්කරු සංවිධානය, අපේ අමාත්‍යාංශය මුල් කරගෙන තවත් අමාත්‍යාංශ කිහිපයකුත්, තවත් පාර්ශ්වකරුවනුත් සම්බන්ධ කරගෙන වැඩමුළුවක් පැවැත්වුවා. විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය අධ්‍යාපන සහ ප්‍රවාහන අමාත්‍යාංශයත් සම්බන්ධ කරගෙන තමයි මාර්තු 06වැනි දා මේ වැඩමුළුව පැවැත්වුවේ. එහිදීත් විශේෂ අවධානය යොමු කරපු කාරණා අතර එක කාරණයක් තමයි හිංසනය සහ ප්‍රචණ්ඩත්වය. එතැනදී මේ ILO C190 පිළිබඳව සාකච්ඡා කළා. ඒ වාගේම අපේ නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කරපු ඒ අනෙකුත් සම්මුති කොහොමද ඉදිරියට ගෙනියන්නේ කියන සාකච්ඡාවත් සිදු කළා. විශේෂයෙන් ඒ අවස්ථාවේදී ඇත්තටම හිංසනය සහ ප්‍රචණ්ඩත්වය කියන්නේ මොකක්ද කියන කාරණය පිළිබඳවත් අවධානය යොමු කළා. හිංසනය සහ ප්‍රචණ්ඩත්වය සිද්ධ වෙන්නේ කොහේදීද? එය සිදු වෙන්නේ වැඩපළේදී විතරමද? මේ කාරණය ආවරණය කරලා තිබෙනවා, විශේෂ ක්ෂේත්‍ර ගණනාවක්. කාන්තාව ගමන් කරන තැන, වැඩපළින් එළියට යන එන ඒ ඔක්කෝම ඇතුළත්ව.

හැබැයි, තිබෙන ප්‍රශ්නය මේකයි. නීතිරීතිවලින් පමණක් හෝ මේ අපරාදුමතිය තුළින් පමණක් මේ වැඩකටයුත්ත අවසාන කර ගන්න පුළුවන් වෙයි කියලා මා හිතන්නේ නැහැ. සමාජයත් මේ සඳහා සම්බන්ධ වෙන්න ඕනෑ. අපටත් මේ පිළිබඳ දැනුම, ඕනෑකම තිබෙන්නට ඕනෑ. ඒක අපේ ඇඟට එන්න ඕනෑ. එහෙම නැතුව ඒක පිටතින් ගෙනැල්ලා දමන්න පුළුවන් දෙයක් නොවෙයි කියා අපි විශ්වාස කරනවා. අපි කොහොමද මේක තේරුම් අරගෙන තිබෙන්නේ? එම නිසාම ඒ වැඩමුළුවේදී සාකච්ඡා කළා, මේ හිංසනය සහ ප්‍රචණ්ඩත්වය කියන්නේ මොකක්ද කියන නිර්වචනය - definition එක - ගැන. මේ සම්මුතියට තිබෙන නිර්වචනය යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන්, සාකච්ඡා පැවැත්වීමේ වැදගත්කම පිළිබඳවත් කථා කළා.

අපි හිතනවා, ඒක ඉතාම වැදගත් කියලා. අපට අවබෝධයක් තිබෙන්නට ඕනෑ, මේ කාරණය ගැන. මොකද, වැඩපළ ඇතුළේ විතරක් මේක සාකච්ඡා කරන්නේ ඇයි? ඇත්තටම හිංසනය සහ ප්‍රචණ්ඩත්වය කියන ගැටලුව මුළු සමාජයෙන්ම පිටුදැක්කා නම්, වැඩපළ ඇතුළේ අමුතුවෙන් අපට ඒ ගැන කථා කරන්න වෙන්නේ නැහැ. විශේෂයෙන්ම වැඩපළ තුළදී මේ ගැන කථා කරන්න සිද්ධ වෙන්නේ, අපි වැඩ කිරීමට ශ්‍රමය ලබා දෙනකොට එතැන ඇති වන බල අධිකාරීන්, බල කේන්ද්‍ර නිසා දුර්වලයා යටපත්වීමේ, හිංසනය සිදුවීමේ ප්‍රවණතාව වැඩි වෙන්න පුළුවන් නිසායි. හිංසනයට පත් වෙනකොට ඊට එරෙහිව නැඟී සිටීමට ඔවුන් අසමත් වෙන්න ඉඩ තිබෙනවා. මොකද, රැකියාව නැති වෙයි, ආදායම නැති වෙයි, අසරණභාවයට පත් වෙයි කියන මෙන්න මේ විධියේ බියකින් ජීවත් වෙන නිසාම විශේෂයෙන්ම වැඩ භූමිය තුළ, වැඩ ලෝකය තුළ මේ කාරණය සුවිශේෂී ස්ථානයක් ගන්නවා. ඇත්තටම අපි පළමුවෙන් වැඩ ලෝකය තුළ මේ තත්ත්වය නැති කරගෙන ඉස්සරහට යෑම සඳහාත්, ඉන් අනතුරුව සමාජයත් හිංසනයෙන් සහ ප්‍රචණ්ඩත්වයෙන්, පීඩනයෙන් තොර තැනකට රැගෙන යෑම සඳහාත් තමයි යොමු විය යුත්තේ. අපි ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් කරනවා.

මට මේ අවස්ථාවේදී යම් කාරණයක් මතක් වෙනවා. මම එක වතාවක් යුරෝපයේ සංචාරයකට ගියා. ඒ අවස්ථාවේදී හිංසනය පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වුණා. විශේෂයෙන් වැඩපළ පිළිබඳව පැවති සාකච්ඡාවකදී එක් පුද්ගලයෙක් කිව්වා, ඒ රටේ ඒ පුද්ගලයා දන්නා හිතවතියකට මුහුණපාන්න වෙච්ච සිදුවීමක් පිළිබඳව. ඇය යුරෝපීය රටක කෙනෙක්. අපේ කෙනෙක් නොවෙයි. මේ පරිසර වෙනස් වෙන්න පුළුවන්. ඇය සම්මුඛ පරීක්ෂණයකට - interview එකකට - ගිය වෙලාවේදී employer ඇතුළු interview board එකේ හිටපු අය ඇයගෙන් "Are you married?" -"ඔබ විවාහකද"- කියලා ප්‍රශ්නයක් අහලා තිබෙනවා. එතැන හිංසනය හෝ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ගැටලුවක් තිබේවි කියලා අපට දැනේවිද?

අපිට දැනෙන්නේ නැහැ. නමුත් ඒක හිංසනයක්. ඒ නිසා ඒ කාන්තාව ඒ interview එක කරපු කෙනාට විරුද්ධව නඩු දාලා තිබෙනවා. මම හිතනවා, ඒ නිසා අපි මේ නිර්වචනය ගැන දීර්ඝව සාකච්ඡා කළ යුතු වෙනවා කියලා. මේක අතීතයේදීත් -2019දී- ඉදිරියට අරගෙන ඇවිල්ලා තිබෙනවා. 2020දි යම් යම් සාකච්ඡා සිද්ධ වුණත්, මේක ඉදිරියට ගිහිල්ලා නැහැ. ඒ නිසාම ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෘත්තීය සමිතිත් එක්ක එකතු වෙලා gap analysis එකක් කරලා තිබෙනවා, ලංකාවේ. අපි මොකද කළේ? අන්න ඒ gap analysis එකෙන් මතුවෙච්ච කරුණුත් පදනම් කරගෙන ඉදිරියට යන්න තමයි අපි දැන් සූදානම් වෙන්නේ. එතැනදීත් කලින් සඳහන් කරපු ධීවර කටයුතු පිළිබඳ සම්මුතියත්, මාතෘ ආරක්ෂණය පිළිබඳ සම්මුතියත්, වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සම්මුතියත් මේ සමඟ එකට එකතු කරමින් වැඩකටයුතු කරනවා.

මම කියන්නට කැමැතියි, අපි ඉතා වේගයෙන් මේ ILO C190 අපරානුමතිය ලබාදීම සඳහා මැදිහත්වෙමින් කටයුතු කරන ගමන් ලංකාව ඇතුළේ decent working environment එකක් බිහිකර ගැනීමට බලාපොරොත්තු වෙන බව. එය මනුෂ්‍යත්වයට ගරු කරන, විශේෂයෙන්ම කාන්තාවන්ට ගරු කරන එකක් විය යුතුයි. මොකද, කාන්තා ශ්‍රමය පහළ මට්ටමක තිබෙන්නේ. අපේ රට ආර්ථික වශයෙන් දියුණු කරන්න මේ යන ගමනේදී කාන්තාවගේ දායකත්වයත් වැඩිපුර ලබා ගන්න නම් ඇයට ඉතාම සුරක්ෂිත, හිංසනයෙන්, පීඩනයෙන් තොර පරිසරයක් අවශ්‍යයි. ඒ සඳහා අපි ඇප කැප වෙලා වැඩ කටයුතු කරන බව සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එකල්හි වේලාව අ. භා. 6.30 පසු කර තිබුණෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.31ට, 2025 පෙබරවාරි 21 වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 10 වන සඳුදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி. ப. 6.31க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 10, திங்கட்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.31 p.m. until 9.30 a.m. on Monday, 10th March 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 318 - இல. 10
Volume 318 - No. 10

2025 මාර්තු 10 වන සඳුදා
2025 மார்ச் 10, திங்கட்கிழமை
Monday, 10th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 10 වන සඳුදා
2025 மார்ச் 10, திங்கட்கிழமை
Monday, 10th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය පිළිබඳ විශේෂ වැඩමුළුව [පිටුව 1731]

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ක්‍රියාත්මක සමූහ රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන [පිටුව 1731]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [පිටුව 1733]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 1735-1750]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [දහහත්වන වෙන් කළ දිනය]:

[ශීර්ෂ 126, 212-215, 335 (අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන)]- කාරක සභාවේදී සලකා බලන ලදී [පිටු 1751-1903]

කල්තැබීමේ යෝජනාව:

වයඹ පළාත සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම [පිටු 1903-1908]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

டிஜிட்டல் பொருளாதார உபாய முறைகள் பற்றிய விசேட செயலமர்வு [ப: 1731]

பாராளுமன்ற உறுப்பினர்களுக்கான கூட்டுக் காப்புறுதித் திட்டம் தொடர்பில் விழிப்புணர்வூட்டும் நிகழ்ச்சித்திட்டம் [ப: 1731]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 1733]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1735-1750]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட பதினேழாம் நாள்]:

[தலைப்புக்கள் 126, 212-215, 335 (கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி)] – குழுவில் ஆராயப்பட்டது [ப: 1751-1903]

ஒத்திவைப்புப் பிரேரணை:

வடமேல் மாகாணத்தை சுற்றுலாத் தலமாக அபிவிருத்தி செய்தல் [ப:1903-1908]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Special Workshop on Digital Economy Strategy [Col. 1731]

Awareness Programme on Group Insurance Scheme for Hon. Members of Parliament [Col. 1731]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1733]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1735-1750]

APPROPRIATION BILL, 2025 - [Seventeenth Allotted Day]:

Considered in Committee - [Heads 126, 212-215, 335 (Education, Higher Education and Vocational Education)] [Cols. 1751-1903]

ADJOURNMENT MOTION:

Development of North-Western Province as a Tourist Destination [Cols. 1903-1908]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 10වන සඳුදා
2025 மார்ச் 10, திங்கட்கிழமை
Monday, 10th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය පිළිබඳ විශේෂ වැඩමුළුව
டிஜிட்டல் பொருளாதார உபாய முறைகள் பற்றிய விசேட செயலமர்வு
SPECIAL WORKSHOP ON DIGITAL ECONOMY STRATEGY

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025.02.20 දින පැවැති ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේදී එම කාරක සභාවේ සභාපති, ගරු ජනාධිපතිතුමා විසින් ලබා දුන් උපදෙස් පරිදි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය පිළිබඳව විශේෂ වැඩමුළුවක් 2025 මාර්තු 10වැනි සඳුදා, එනම් අද දින පස් වරු 2.30 සිට පස් වරු 4.30 දක්වා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 01 හිදී පැවැත්වීමට නියමිත බව මෙම සභාවට දන්වන අතර, ඒ සඳහා සහභාගි වන ලෙස සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට කාරුණිකව ආරාධනය කරනු කැමැත්තෙමි.

II
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ක්‍රියාත්මක සමූහ රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන
பாராளுமன்ற உறுப்பினர்களுக்கான கூட்டுக் காப்புறுதித் திட்டம் தொடர்பில் விழிப்புணர்வூட்டும் நிகழ்ச்சித்திட்டம்
AWARENESS PROGRAMME ON GROUP INSURANCE SCHEME FOR HON. MEMBERS OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ක්‍රියාත්මක වන සමූහ රක්ෂණය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ

වැඩසටහනක් 2025 මාර්තු 10 දින, එනම් අද දින පෙර වරු 11.30 සිට මධ්‍යාහ්න 12.00 දක්වා සහ පස් වරු 1.00 සිට පස් වරු 1.30 දක්වා සැසි වාර දෙකක් වශයෙන් කාරක සභා කාමර අංක 01 හිදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

මෙම සැසි වාර දෙකෙන් පහසු සැසි වාරයකට සහභාගි වන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

Hon. Speaker, I present the -

(i) Annual Report and Financial Statements of the Sri Lanka Social Security Board for the year 2022; and

(ii) Annual Performance Report of the Rehabilitation of the Visually Handicapped Trust Fund for the year 2023.

I move that these Reports be referred to the Relevant Sectoral Oversight Committee.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය;

(iii) 2023 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(v) 2023 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2019 සහ 2020 වර්ෂ සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2022/2023 වර්ෂය සඳහා සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 වර්ෂය සඳහා පුනරුත්ථාපන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2023 වර්ෂය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වැල්ලවාය, මල්වත්තාවෙල, හපුතලේ පාර යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්.එන්.ජී. එදිරිසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වැල්ලවාය, ඇල්ල පාර, හීනහපුව, "නයන" යන ලිපිනයෙහි පදිංචි එච්.ඒ. නයන තිලක් රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අජිත් අගලකඩ මහතා
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මොනරාගල, නක්කල, එකමුතුපුර යන ලිපිනයෙහි පදිංචි දොන් ගමගේ රූපසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මොනරාගල, හිදි කිවුල, පන්සල ඉදිරිපිට පාර යන ලිපිනයෙහි පදිංචි ආර්.ඒ. දසනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
(மாண்புமிகு வசந்த புஷ்ப குமார)
(The Hon. Wasantha Pushpa Kumara)
ගරු කථානායකතුමනි, බලංගොඩ, පින්නවල, හිටුවල යන ලිපිනයෙහි පදිංචි එච්.එල්. ලක්මිණී කුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) ඕපනායක, කිරඹ යන ලිපිනයෙහි පදිංචි ඊ.ඩබ්ලිව්. උපාලි කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පැල්මඩුල්ල, ගුරුදොල, අංක 214/1/බී දරන ස්ථානයෙහි පදිංචි එල්.එස්. ශිරෝෂණී මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බලංගොඩ, හොරකැටිය, "මදාරා" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.යූ. ප්‍රියන්ත කුමාරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා පවරාගත් ඉඩම්: වන්දි
ருவன்புர அதிவேக நெடுஞ்சாலைக்காகச் சுவீகரிக்கப்பட்ட காணிகள்: நட்டஈடு
LANDS ACQUIRED FOR RUWANPURA EXPRESSWAY: COMPENSATION

419/2025

1. ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් පවරා ගැනීමේදී හා ඒවාට වන්දි ගෙවීමේදී පසුගිය ආණ්ඩුව විසින් ගන්නා ලද සමහර තීරණ හේතුවෙන් දැඩි ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලු විසඳීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ருவன்புர அதிவேக நெடுஞ்சாலையை நிர்மாணிப்பதற்கான காணி கொள்ளலின்போதும் அவற்றுக்கு நட்டஈடு செலுத்தும்போதும் கடந்த அரசாங்கம் மேற்கொண்ட ஒருசில தீர்மானங்கள் காரணமாகப் பாரிய சிக்கல் நிலை தோன்றியுள்ளதென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி சிக்கலைத் தீர்த்துவைப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) whether he is aware that a serious problematic situation has arisen because of some of the decisions taken by the previous Government in acquiring lands for the construction of the Ruwanpura Expressway and in paying compensation for the lands so acquired; and

(ii) if so, whether measures will be taken to resolve the said problems?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් පවරා ගැනීමේදී හා ඒවාට වන්දි ගෙවීමේදී ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව පූර්ණ වාර්තාවක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට එම විස්තර ඇතුළත් සම්පූර්ණ ෆයිල් එකම ලබා දෙන්න පුළුවන්.

එම තොරතුරු මම සංක්ෂිප්තව ඉදිරිපත් කරන්නම්.

ඉඩම් හෙක්ටෙයාර 210.1ක් පමණ අත්කර ගැනීම් කටයුතු 2016 වර්ෂයේ ආරම්භ කර ඇත. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආවරණය වන ඉඩම් කැබලි අත්පත් කිරීම 2020 වසර තුළ ආරම්භ කර ඇත. අත්කර ගැනීමට නියමිත ඉඩම් කැබලි සංඛ්‍යාව 2,910කි. ඉන් 576ක් රජයේ ඉඩම් වන අතර, 2,334ක් පෞද්ගලික ඉඩම් වේ.

[ගරු බිමල් රත්නායක මහතා]

වන්දි මුදල්, දීමනා සහ කරුණාසහගත දීමනා තීරණය කිරීම, ඉඩම් අත්කර ගැනීමේ පනත සහ අංක 1864/54 දරන 2014 මැයි 30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති "2013 ඉඩම් අත්කර ගැනීමේ (වන්දි ගෙවීම්) නියෝග" සහ එහි සංශෝධනවලට අනුව සිදු කරනු ලැබේ. එමෙන්ම, විශේෂ කමිටු (සුපර් ලාර්ක්) පවත්වා වන්දි ගෙවීම්, 1991/47 හා 2016.11.04 සහ අංක 2012/20 හා 2017.03.29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර මඟින් සිදු කරනු ඇත.

මේ සම්බන්ධව ගන්නා ලද විවිධ අමාත්‍ය මණ්ඩල තීරණත් සමඟ ව්‍යාපෘති කටයුතු අතරමග නතර කිරීම හේතුවෙන් අධිවේගී මාර්ගයට අදාළව අත්කර ගන්නා ලද සීමාව තුළ සිටින මහජනතාවට අහිතකර බලපෑම් ඇති බව පිළිගනී. ඒ අනුව පීඩාවට පත් පාර්ශ්වය ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මහාමාර්ග අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මහජන ගැටලු ඉදිරිපත් කර ඇත. එම පීඩාව ප්‍රධාන කොටස් හතරකට තිබෙනවා.

1. ඉඩම් පවරා ගැනීමේදී හා අත්කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේදී ඉඩම් හිමියන්ට වන්දි ගෙවීම ප්‍රමාද වීම.
2. උද්ධමනය හේතුවෙන් නව නිවාස ඉදිකිරීම් සඳහා වන පිරිවැය ඉහළ යෑම.
3. ආදායම් මාර්ග අහිමි වීම.
4. අඩක් නිම කළ නිවාසවල ඉතිරි වැඩ අවසන් කර ගැනීමට නොහැකි වීම.

(ii) ගැටලු විසඳීම සඳහා කටයුතු කරන ආකාරය ගත්තොත්, 2022දී රුපියල් මිලියන 1,180ක්, 2023දී රුපියල් මිලියන 1,925ක් හා 2024දී රුපියල් මිලියන 2,500ක් වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, 2025 වර්ෂයට අතුරු සම්මත ගිණුම මඟින් රුපියල් මිලියන 2,000ක් වෙන් කර ඇත. අත්කර ගත් ඉඩම් සහ දේපොළ සඳහා ගෙවිය යුතු වන්දි හා දීමනා ගෙවීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර, 2024 දෙසැම්බර් 31 දින වන විට වන්දි හා දීමනා වශයෙන් රුපියල් මිලියන 5,098ක මුදලක් ගෙවා අවසන් කර ඇත. මෙයට අමතරව මෙම 2025 වර්ෂය තුළ මේ දක්වා ඉඩම් කැබලි 31ක් සඳහා රුපියල් මිලියන 129.66ක් ගෙවා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරට අනුව මම අතුරු ප්‍රශ්න දෙකම අහන්න බලාපොරොත්තු වෙනවා.

හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් කැබලි 592ක් මේ ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගෙන තිබෙනවා. නමුත් ඉඩම් කැබලි 6ක් තමයි නියමිත වශයෙන් තක්සේරු කරලා තිබෙන්නේ. ඉතිරි ඉඩම් කිසිවක් මේ වනතුරු තක්සේරු කරලා නැහැ. මේ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසා මිනිසුන්ට ඒ ඉඩම්වල අලුතෙන් ගොඩනැඟිල්ලක් හදාගන්නවත්, එහෙම නැත්නම් විකුණා දමන්නවත්, ඒ කිසිවක් කරන්න බැරි වෙලා තිබෙනවා.

ඒ ඉඩම් රජයේ ඉඩම් හැටියට දැන් අත්පත් කරගෙන තිබෙන නිසා ඒ අය වරිපනම් ගෙවීමෙන් නිදහස් විය යුතුව තිබෙනවා. නමුත් තවම පළාත් පාලන ආයතන - ප්‍රාදේශීය සභා - ඒ ඉඩම්වලට අදාළව ඒ අයගෙන් වරිපනම් අය කර ගන්නවා. ඒ නිසා ඒ අය විශාල ගැටලුවකට මුහුණ දී සිටිනවා. ඒ අය තමන්ගේ ඉඩම රජයේ ව්‍යාපෘතියක් සඳහා දීලා තිබෙනවා. නමුත්, තමන්ට නියමිත වන්දි ලැබිලා නැහැ. නියමිත ප්‍රමාණයට තක්සේරුව සිද්ධ වෙලා නැහැ. මෙය අවුරුදු 10ක් තිස්සේ පවතින තත්ත්වයක්, ඊයේ පෙරේදා ඇති වෙච්ච තත්ත්වයක් නොවෙයි. අවුරුදු 10ක් තිස්සේ එම ජනතාව විශාල පීඩාවකට පත් වෙලා ඉන්නවා, මේ ගැටලුව නිසා. ඒ නිසා මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, ඒ ජනතාව මුහුණ දී තිබෙන ගැටලුව විසඳීම වෙනුවෙන් මේ වෙලාවේ ගන්නා කඩිනම් ක්‍රියාමාර්ග මොනවාද කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, හෝමාගමට අදාළව ග්‍රාම නිලධාරි කොට්ඨාස කීපයක් තිබෙනවා. ඒවා තමයි, කහතුඩුව උතුර, කහතුඩුව බටහිර, කහතුඩුව නැඟෙනහිර සහ කහතුඩුව දකුණ කිරිගම්පමුණුව. එම ග්‍රාම නිලධාරි කොට්ඨාස තමයි මේ ව්‍යාපෘතිය යටතේ හෝමාගමට අයිති වෙන්නේ. මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව 590ක් නොවෙයි, 560යි. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 10(1) වගන්තිය යටතේ නිකුත් කර ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව 44යි. ඔබතුමන්ලා දන්නවා, ඉඩම් අත්කර ගැනීම ක්‍රියාවලියක් කියලා. ඒ නිසා පනතේ එක් එක් වගන්තිය අනුවයි යන්නේ. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17වැනි වගන්තිය යටතේ නිකුත් කරපු ඒවා 15ක් තිබෙනවා. වන්දි ගෙවීම සම්බන්ධව LARC එකෙන් තීන්දු කරපු ඉඩම් කැබලි 15ක් තිබෙනවා. ගෙවීම් කටයුතු කෙරෙමින් පවතින ඉඩම් කැබලි සංඛ්‍යාව 9යි. ඉඩම් කැබලි 15න්, 9කට ගෙවීම් කටයුතු කෙරෙමින් පවතිනවා. LARC එක යටතේ කරන්න තිබෙන 6ක් තිබෙනවා. දැනට මේ ක්‍රියාවලිය සිද්ධ වෙමින් තිබෙනවා.

ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි, මේ වන්දි ගෙවීම් කටයුතු සඳහා කිසියම් කාල රාමුවක් මේ වන කොට තීරණය කර තිබෙනවාද කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මේ වසරේ රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙනවා, රුවන්පුර අධිවේගී මාර්ගයට ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ වන්දි ගෙවීම් කටයුතු සඳහා. අපි පිළිගන්නවා, ඒ ජනතාව අපහසුතාවට පත් වෙලා තිබෙන බව. මම ඒකයි කිව්වේ, හෝමාගම පමණක් නොවෙයි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03ක් තිබෙනවා. මම ඒවායේ නම් කියන්නම්, ඒ ප්‍රදේශවල ජනතාවගේත් දැන ගැනීම සඳහා. හෝමාගමට අමතරව හොරණ, ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලත් ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණනාවක් මෙයට අයිති වෙනවා. ගරු

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කථානායකතුමනි, මා පිළිතුරේදී සඳහන් කළ පරිදි ඒවායෙන් ඉඩම් කැබලි 31ක් සඳහා රුපියල් මිලියන 129ක් ගෙවා තිබෙනවා. මේ වසරට රුපියල් මිලියන 2,000ක් අප සතුව තිබෙනවා, වන්දි ගෙවන්න. ඒ නිසා අපි හිතනවා, මේ වසර තුළදී එම වන්දි ගෙවා අවසන් කරන්න පුළුවන් වෙයි කියලා.

ගරු මන්ත්‍රීතුමනි, වරිපනම් ගෙවීමේ කාරණය පිළිබඳව ප්‍රාදේශීය සභාව සමඟ සාකච්ඡා කරලා අදාළ පියවර ගැනීමට ඔබතුමාට හැකියාව ඇති කියලා මම හිතනවා.

ලංකා විදුලිබල මණ්ඩලය: 2020 සිට 2024 දක්වා ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති

இலங்கை மின்சார சபை: 2020 முதல் 2024 வரை நடைமுறைப்படுத்தப்பட்ட விசேட கருத்திட்டங்கள்

CEYLON ELECTRICITY BOARD: SPECIAL PROJECTS IMPLEMENTED FROM 2020 TO 2024

435/2025

2. ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு தினிந்து சமன்)
(The Hon. Dinindu Saman)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2020 සිට 2024 දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා ඉල්ලීම ඉදිරිපත් කරන ලද පාර්ශ්වය, අනුමතිය ලබා දීමේදී සලකා බලන ලද සුවිශේෂ හේතු, වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වලුසක්ති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை இலங்கை மின்சார சபையால் அமுலாக்கப்பட்ட விசேட கருத்திட்டங்களின் எண்ணிக்கை எத்தனை;

(ii) அக்கருத்திட்டங்களில் பதுளை மாவட்டத்தில் அமுலாக்கப்பட்ட கருத்திட்டங்களின் எண்ணிக்கை எத்தனை;

(iii) அந்த ஒவ்வொரு கருத்திட்டத்துக்குமான கோரிக்கையை முன்வைத்த தரப்பினர், அனுமதி வழங்கப்பட்டபோது கருத்திற்கொள்ளப்பட்ட பிரத்தியேக காரணிகள் மற்றும் செலவிடப்பட்ட தொகை வெவ்வேறாக எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he state the -

(i) number of special projects that were implemented by the Ceylon Electricity Board from the year 2020 to the year 2024;

(ii) number of projects, implemented in the Badulla District, out of the aforesaid projects; and

(iii) name of the party that requested each of the aforesaid projects, the special reasons considered in granting approval and the amount spent, separately?

(b) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජනන හා සම්ප්‍රේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව 20කි. එම ව්‍යාපෘති හා ඒවාට අදාළ තොරතුරු ඇමුණුම මඟින් දක්වා ඇත.

මෙයට අමතරව බෙදා හැරීම් අංක 1, 2, 3 සහ 4 මඟින් වෙන් වෙන්ව සකසන දස අවුරුදු බෙදාහැරීම් පද්ධති සංවර්ධන සැලසුම්වලට අදාළව එම එක් එක් අංශ මඟින් වාර්ෂිකව කුඩා පරිමාණ බෙදා හැරීම් පද්ධති සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි.

(ii) ව්‍යාපෘති සංඛ්‍යාව 01යි. උමා ඔය ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය.

වාරිමාර්ග අමාත්‍යාංශ විෂය පථය යටතේ බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස උමා ඔය ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය -ඇමුණුමෙහි අයිතම 3- ක්‍රියාත්මක විය.

(iii) එම ව්‍යාපෘති බාහිර පාර්ශ්වයන්හි ඉල්ලීම් මත සිදු නොකරන අතර, එම ව්‍යාපෘති ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ හා ජනන සැලසුම් ශාඛාව විසින් සකස් කරනු ලබන විසි අවුරුදු දිගු කාලීන ජනන සැලසුම සහ ඒවාට සමගාමීව සකසනු ලබන දස අවුරුදු දිගු කාලීන සම්ප්‍රේෂණ පද්ධති සංවර්ධන සැලැස්ම මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අනුමත කිරීමෙන් අනතුරුව, දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල ආධාර මත ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම එක් එක් ව්‍යාපෘති හා සම්බන්ධව අරමුදල් සැපයූ ආයතනය, ඇස්තමේන්තුගත මුදල හා මෙතෙක් වැය කළ මුදල ඇතුළත් තොරතුරු ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි

(ආ) අදාළ නොවේ.

ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு தினிந்து சமன்)
(The Hon. Dinindu Saman)
ගරු අමාත්‍යතුමනි, මම මේ කියන්න යන කාරණයට අදාළ භූමිය හල්දුම්මුල්ල, මහලන්ද ග්‍රාම නිලධාරී වසමේ බෝගහපැලැස්ස රක්ෂිතයට අයත් භූමියක්. එය වනජීවී සංරක්ෂිත භූමියක්. මෙහි අක්කර 1,000කට අධික ප්‍රමාණයක්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දිනිඳු සමන් මහතා]

ජාවාරම්කාරයන් පිරිසක් විසින් අනවසරයෙන් වගා කරලා තිබෙනවා. ඒ ජාවාරම සඳහා උඹව පළාතේ හිටපු ආණ්ඩුකාරවරයෙක් සම්බන්ධයි. ඒ වාගේම ඒ ආණ්ඩුකාරවරයා ජනාධිපති අධ්‍යක්ෂ ජනරාල්වරයා විධියට බලපෑම් කරමින් විදුලිබල මණ්ඩලයට ලිපියක් යවලා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න අදාළ කරන කටයුතු සිද්ධ කරලා තිබෙනවා. පසුගිය රජය යටතේ එම රක්ෂිත භූමිය හරහා එම අනවසර ජාවාරම්කාරයන් සඳහා විදුලිය ලබා දෙන්න විදුලිබල මණ්ඩලය විසින් විශාල මුදලක් වියදම් කරමින් අවශ්‍ය කටයුතු සිද්ධ කරලා තිබුණා.

ගරු කථානායකතුමනි, අපි දන්නවා සාමාන්‍යයෙන් ජනතාවට විදුලිය ලබා දෙන්න යද්දි, මේ වාගේ විශේෂ ව්‍යාපෘතියක් කරන්න යද්දී එය ඉතා අපහසු කටයුත්තක් බව. නමුත්, දේශපාලන බලපෑම් කරමින් රක්ෂිත භූමියක අක්කර දහස් ගණනක් විනාශ කරමින් කරපු ව්‍යාපෘතියක්, මෙක. එහි විශේෂත්වය වන්නේ උඩවලවේ ඉඳන් වනඅලින් එන යන අලිමංකඩ හරහා එම අක්කර දහස් ගණනක වගාව සිද්ධ කරලා තිබීමයි. ඒ වාගේම ඒ සතුන්ට ආහාර සපයා ගන්න තිබෙන තණ භූමි ටික තමයි ඒ අත්පත් කරගෙන තිබෙන්නේ. ඒ කණ්ඩායම ඇතුළේ රජයේ නිලධාරීන් ඉඳලා තිබෙනවා; දේශපාලනඥයෝ ඉඳලා තිබෙනවා; විවිධ පරිපාලන නිලධාරීන් ඉඳලා තිබෙනවා; ව්‍යාපාරිකයෝ ඉඳලා තිබෙනවා. ඒ සියලු දෙනා එකතු වෙලා තමයි ඒ ජාවාරම කරලා තිබෙන්නේ. හැබැයි, ඒ ජාවාරම සාධාරණීකරණය කරන්න විදුලිබල මණ්ඩලයෙන් මේ වාගේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ඒ අනීතික ව්‍යාපෘතිය සඳහා වැය වෙච්ච මුදල අය කර ගැනීමට ඔබතුමන්ලා කටයුතු කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඇත්තටම ගරු කථානායකතුමනි, ඒ ව්‍යාපෘතිය ගැන මා වෙත ආරංචිය ලැබුණු වෙලාවේම මම ඒක තාවකාලිකව අත්හිටෙව්වා. ඒ පිළිබඳ පරීක්ෂණයක් කරලා අවශ්‍ය තොරතුරු ලබා දෙන්න කියලා මම දැනුම් දීලා තිබෙනවා, ලංකා විදුලිබල මණ්ඩලයට. ඒ ව්‍යාපෘතියට වැය වෙච්ච මුදල් සහ අය කර ගැනීම් පිළිබඳ වාර්තාව ලැබුණාට පස්සේ අපට ක්‍රියාත්මක වෙන්න පුළුවන්. ඒ මුදල කීයද කියලා සඳහන් වෙන වාර්තාවක් මා ළඟ නැහැ.

අනෙක් කාරණය තමයි, මේ විධියට ක්ෂණිකව ප්‍රශ්න ඇහුවාම මට ඒකට පිළිතුරු දෙන්න අමාරුයි. විධිමත්ව ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළා නම් මට පුළුවන් detailed පිළිතුරක් ලබා දෙන්න.

ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு தினிந்து சமன்)
(The Hon. Dinindu Saman)

ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රදේශය ආශ්‍රිතව සාම්ප්‍රදායික ගොවි ජනතාව ජීවත් වන ප්‍රදේශයක් තිබෙනවා. ඒ, රුණකන්ද රක්ෂිතය ආශ්‍රිත දිරිය ගොවි සංවිධානයට අයත් ගොවි ජනතාව. මේ අනීතික ක්‍රියාව සඳහා මේ ගොවි සංවිධානයත් සම්බන්ධ කරගෙන තිබුණා. මේ ව්‍යාපෘතිය තුළ ඒ ගොවි සංවිධානයට විදුලිය ලබා දීමට කිසිම බාධාවක් නැහැ. ඒ ගොවීන්ට විදුලිය ලබා දෙන්න ඕනෑ. අපි පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තීන්දුවක් ගත්තා, ඒ ගොවීන්ට විදුලිය ලබා දෙන්න. ඔවුන්ට විදුලිය ලබා දෙන ඒ විදුලි ව්‍යාපෘතිය කඩිනම් කරනවාද, ඒක අවසන් කරන්නේ කවදාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඇත්තටම, ඒ දිනය ගැන මට මේ මොහොතේ ප්‍රකාශ කරන්න බැහැ. කෙසේ නමුත්, එම නිවෙස්වල පදිංචිකරුවන්ට විදුලි සැපයුම ලබා දෙන්න කියලා මම විදුලිබල මණ්ඩලය වෙත උපදෙස් දීලා තිබෙන්නේ. DCC එකේ අනුමැතිය නැතිවයි තිබුණේ. මොකද, තාවකාලිකව ව්‍යාපෘතිය නැවැත්තුවාම, ඒක නවත්වනවා කියන අදහසේ හැමෝම හිටපු හින්දා. මම හිතන විධියට DCC එකේ අනුමැතියත් එක්ක ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙයි. ඒ දිනය ගැන මට මේ මොහොතේ කියන්න බැහැ.

ගුරු ස්ථාන මාරු සහ පුරප්පාඩු: විස්තර
ஆசிரிய இடமாற்றமும் வெற்றிடங்களும் : விபரம்
TEACHER TRANSFERS AND VACANCIES: DETAILS

451/2025

3. ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) විනය හේතු මත හැර රජයේ ගුරුවරුන්ගේ ස්ථාන මාරු, ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව සිදු කරනු ලබන බව දන්නේද;

(ii) පසුගිය කාලයේදී ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය නිවැරදි ලෙස ක්‍රියාත්මක නොවූ බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග කවරේද;

(iv) පසුගිය කාලයේදී රජයේ පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී විශාල ලෙස දූෂණ, වංචා සහ අක්‍රමිකතා සිදු කර ඇති බව දන්නේද;

(v) ඒවා වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රායෝගික වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා අධ්‍යාපනඥ සේවයේ සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ බොහෝ පුරප්පාඩු පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් සේවාවේ මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க ஆசிரியர்களின் ஒழுக்காற்று நடவடிக்கைகளைச் சாராத இடமாற்றங்கள், தேசிய ஆசிரிய இடமாற்றக் கொள்கைக்கு அமைவாக மேற்கொள்ளப்படுகின்றன என்பதை அறிவாரா;

(ii) கடந்த காலப்பகுதியில் தேசிய ஆசிரியர் இடமாற்றக் கொள்கையானது உரிய முறையில் இடம்பெறவில்லை என்பதை அறிவாரா;

(iii) ஆமெனில், இது தொடர்பில் மேற்கொள்ளப்படும் கொள்கை ரீதியான நடவடிக்கைகள் யாவை;

(iv) கடந்த காலப்பகுதியில் அரச பாடசாலைகளுக்கு மாணவர்களை அனுமதிக்கும்போது பாரிய அளவிலான ஊழல்கள், மோசடிகள் மற்றும் முறைகேடுகள் இடம்பெற்றுள்ளன என்பதை அறிவாரா;

(v) இவற்றைத் தடுப்பதற்காக நடைமுறைப்படுத்தப் படும் நடைமுறை சாத்தியமான வேலைத்திட்டம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை கல்வி நிர்வாக சேவை, இலங்கை கல்வியியலாளர் சேவை மற்றும் இலங்கை அதிபர் சேவையில் வெற்றிடங்கள் பெருமளவில் நிலவுகின்றன என்பதை அறிவாரா;

(ii) ஆமெனில், மேற்படி ஒவ்வொரு சேவையிலும் இன்றளவில் காணப்படும் வெற்றிடங்களின் எண்ணிக்கை தனித்தனியாக யாது;

(iii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House-

(i) whether she is aware that government school teacher transfers are made according to the National Teacher Transfer Policy, except on disciplinary issues;

(ii) whether she is aware that the National Teacher Transfer Policy has not been properly implemented in the recent past;

(iii) if so, the policy measures that will be taken in that regard;

(iv) whether she is aware that rampant corruption, fraud and irregularities have taken place in the admission of students to government schools in the recent past; and

(v) the practical mechanism that will be implemented to prevent them?

(b) Will she also inform this House-

(i) whether she is aware that there are numerous vacancies in the Sri Lanka Education Administrative Service, the Sri Lanka Teacher Educators' Service and the Sri Lanka Principals' Service;

(ii) if so, separately, the number of vacancies existing in each of the services referred to above; and.

(iii) the measures that will be taken to fill the vacancies referred to above?

(c) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) අනිවාර්ය ගුරු ස්ථාන මාරු ප්‍රාථමික අංශවල 2017, 2019, 2020, 2022 හා 2024 වර්ෂවල ක්‍රියාත්මක කර ඇත.

(iii) ගුරු ස්ථාන මාරු 2024 වර්ෂයේ මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවා වර්ෂයකට අඩු කාලයක් තුළ ක්‍රියාත්මක කළ අතර, එම අත්දැකීම් මත මෙම වසරේ සිට වාර්ෂිකව ගුරු ස්ථාන මාරු ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. මෙම වසරේ අප්‍රේල් මාසය තුළ 2025 වර්ෂයට අදාළව ස්ථාන මාරු ආරම්භ කිරීමට නියමිතව ඇත.

(iv) ඔව්, වාර්තා වී ඇත.

(v) මීට පෙර අවස්ථාවලදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමට ලිපි නිකුත් කිරීම් සිදු කර ඇති අතර, ඇතැම් අවස්ථාවල පන්ති කාමරයක් තුළ සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව ද ඉක්මවා සිසුන් ඇතුළත් කිරීමට ලිපි නිකුත් කර ඇත.

පුරප්පාඩු නොමැති අවස්ථාවලදී අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය මින් ඉදිරියේදී කටයුතු නොකරන අතර, පුරප්පාඩු පවතින විට පමණක් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

පාසල්වලට ළමුන් ඇතුළත් කිරීම තවදුරටත් විධිමත් කිරීම සඳහා පවතින චක්‍රලේඛ අවස්ථානුකූලව සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) (i) ඔව්.

(ii)

සේවය	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යාපන පරිපාලන සේවය	1,334 (2025.02.28 දිනට)
අධ්‍යාපනඥ සේවය	1,310 (මේ දක්වා)
විදුහල්පති සේවය	1,610 (2024.12.31 දිනට)

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග:

පසු ගිය වර්ෂවල රට තුළ පැවති කොවිඩ් 19 වසංගතය සහ ආර්ථික අර්බුදය මත රජයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අනුමැතිය නොලැබීම හේතුවෙන් මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සිදු වී නැත. කෙසේ වුවද, මේ වන විට බඳවා ගැනීම්වලට අදාළව පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. සීමිත පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් 442ක් බඳවා ගැනීම සඳහා තරග විභාගය 2023.09.23 වන දින පවත්වා හා සම්මුඛ පරීක්ෂණ 2024.08.21,22,24,27,29,30 සහ

[ගරු මධුර සෙනෙවිරත්න මහතා]

2024.09.03,04,06,07 දිනවල පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත 2025.01.29 වන දින අදාළ ලේඛන යොමු කර ඇත.

2. විවෘත පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට 113ක් බඳවා ගැනීමට අදාළ තරග විභාගය 2023.07.29 දින හා සම්මුඛ පරීක්ෂණ 2024.10.23 සහ 24 දිනවල පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත 2025.01.03 වන දින අදාළ ලේඛන යොමු කර ඇත.

3. ඒ අනුව ඉහත 1 හා 2 යටතේ දක්වා ඇති පුරප්පාඩු 555 (442+113) සඳහා ඉදිරි මාස 03 ඇතුළත කඩිනමින් බඳවා ගැනීම් සිදු කර තවදුරටත් සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු 779ක් පිරවීම සඳහා තරග විභාගයක් ඉදිරියේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

විදුහල්පති සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග:

- විදුහල්පති සේවයේ 2025.01.01 දින පවත්නා පුරප්පාඩු ප්‍රමාණය ගණනය කර ඒ අනුව නව තරග විභාගයක් පවත්වා ශ්‍රී ලංකා විදුහල්පති සේවයට නිලධාරීන් බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා 2025.01.31 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. මේ සඳහා අනුමැතිය ලද පසු බඳවාගැනීම් කඩිනමින් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

අධ්‍යාපනඥ සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග:

- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 2,098ක් වන අතර දැනට නිලධාරීන් 788ක් සේවයේ නියුතු වේ. ඒ අනුව අද දින වන විට නිලධාරීන් 1,310ක පුරප්පාඩු පවතී. රජයේ ප්‍රතිපත්ති තීරණයක් මත 2022 වර්ෂයේ බඳවාගැනීම් සමාලෝචනය කර තිබීම හේතුවෙන් එම තීරණ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ බඳවා ගැනීමටද, අදාළ වූ බැවින් පසුව නව බඳවාගැනීම් සඳහා අනුමැතිය ලද විගස සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබීය.

- ඒ අනුව විවෘත පදනම මත නිලධාරීන් 384ක් හා සීමිත පදනම මත නිලධාරීන් 706දෙනෙකු ඇතුළුව නිලධාරීන් 1,090ක් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා (එකී පුරප්පාඩු 2019.08.06 දිනට ගණනය කර ඇත) අදාළ තරග විභාග 2021 වර්ෂයේදී පවත්වා විභාගයේ ප්‍රතිඵල 2022 වර්ෂයේ නිකුත් කර ඇත. නමුත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම් මෙම කාලය තුළ නතර කර තිබූ අතර නැවත බඳවා ගැනීම් 2024 වර්ෂයේදී ආරම්භ කර ඇත.

- විවෘත පදනමින් 384දෙනෙකු බඳවා ගැනීමට අදාළ තරග විභාගයේ ප්‍රතිඵල 2022 වර්ෂයේ නිකුත් කර ඇති අතර ඊට අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණ 2024 නොවැම්බර් මස පවත්වන ලදී. එම මූලික සම්මුඛ පරීක්ෂණයන්ට අදාළ ලිපිගොනු පරීක්ෂා කර ලකුණු සහිත උපලේඛන, ලිපිගොනු සමඟ ඉදිරියේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත යොමු කිරීමට මේ වනවිටත් කටයුතු ආරම්භ කර ඇත.

- සීමිත පදනමින් 706දෙනෙකු බඳවා ගැනීමට අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණ 2023 ජූලි මසදී පවත්වන ලද අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ 2024 මැයි මස පවත්වන ලදී.

එම සම්මුඛ පරීක්ෂණයන්ට අදාළ ලිපිගොනු පරීක්ෂා කර ලකුණු සහිත උපලේඛන ලිපිගොනු සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත යොමු කර ඇති අතර මේ වන විටත් එම ලකුණු විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

- ඒ අනුව ඉහත පරිදි නිලධාරීන් 1,090 බඳවා ගැනීමෙන් පසුව ද, තවදුරටත් පුරප්පාඩු 225ක් පවතින බවද, කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) අදාළ නොවේ.

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ථාපිත කරලා තිබෙන මාරු මණ්ඩල ගැන අපි දන්නවා. ලංකාවේ පළාත්බද පාසල්වල මාරු මණ්ඩල සහ ජාතික පාසල්වල මාරු මණ්ඩල වෙන වෙනම ස්ථාපිත කරලා තිබෙනවා. නමුත් කාලයක් තිස්සේ මේ ක්ෂේත්‍රයේ නියැළිලා අප ලැබූ අත්දැකීම් අනුව ඊට අදාළව තිබෙන නීතිමය තත්ත්වයන් සහ ඊට අදාළව ඒ මාරු මණ්ඩලවලට තිබෙන බලය පිළිබඳව ගත්තොත්, ජාතික පාසල්වල ගුරුවරුන් මාරු කිරීමේ බලය කලාප මාරු මණ්ඩලවලට නැහැ. නමුත් මා නියෝජනය කරන පොළොන්නරුව වාගේ දිස්ත්‍රික්කවල තිබෙන ප්‍රධානම ගැටලුව මේකයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. මේ පළාත් පාසල්වල සිටින ගුරු භවතුන් ජාතික පාසල්වලට මාරුවීම සඳහා බලාපොරොත්තුවෙන් ඉන්නවා. නමුත් ඒ සඳහා ඔවුන්ට අවස්ථාවක් ලැබිලා නැහැ. ඒ වාගේම ගුරු තුලනය තුළදී, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටත් ඒ ගැටලුව බරපතළ ලෙස තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. ගුරු මාරු කිරීම්වලදී පවතින මේ ප්‍රධාන ගැටලුව ඉදිරියේදීවත් විසඳා ගැනීම සඳහා මේ මාරු මණ්ඩලවලට පවතින බලතල වෙනස් කරලා, කලාප මාරු මණ්ඩල සඳහා එම බලතල පැවරීමේ කාර්යය කරන්න පුළුවන්ද? ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් මම බලාපොරොත්තු වෙනවා.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර තමයි, ඔව් කියන එක. ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය තුළ ජාතික පාසල් සහ පළාත් පාසල් අතර ගුරු මාරු සම්බන්ධයෙන් ගැටලු විශාල ප්‍රමාණයක් අපට ලැබෙමින් පවතිනවා. විශේෂයෙන්, ඔබතුමා කියපු විධියට සමහර

දිස්ත්‍රික්කවල ජාතික පාසල් අඩුයි. එතකොට ගුරු මාරුවක් සඳහා නැවත ඉල්ලීමක් කරද්දී, තමන්ට අකමැත්තෙන් හෝ යන්න වෙන්නේ ළඟම තිබෙන ජාතික පාසලකට. ඒක ලොකු ප්‍රශ්නයක්. අනෙක් කාරණාව තමයි සේවා අවශ්‍යතාව තිබුණත්, ගුරු තුලනයේදී පළාත් පාසල් සහ ජාතික පාසල් අතර ගුරු මාරු කිරීමේ ගැටලු මතු වෙලා තිබෙනවා. එම නිසා ඉදිරියේදී ක්‍රියාත්මත කිරීමට නියමිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වුවත් ක්‍රමානුකූලව, විෂයයන්ට අදාළව ගුරුවරු ස්ථානගත කිරීමේ අවශ්‍යතාව අපට තිබෙනවා. එතැනදීත් මේ බාධාවන් තිබෙනවා. සේවා අවශ්‍යතාව ගත්තත්, ගුරුවරයාගේ අවශ්‍යතාව ගත්තත්, මේ මොහොතේ ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවක් අපට තිබෙනවා. එහිදී තිබෙන ප්‍රශ්න අපි හඳුනාගෙන තිබෙනවා. අපි නිලධාරි මට්ටමින් සාකච්ඡා කිහිපයක් පැවැත්වුවා. එතැනදී අපි ගත් තීරණයක් අනුව, ගුරු මාරු ප්‍රතිපත්තිවල තිබෙන සමහර කරුණු වෙනස් කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ අනුව, මෙහි තිබෙන ගැටලු අවම කරලා විශේෂයෙන් ගුරුවරයාට ළඟ පාසලක් ලැබෙන විධියට මේ ක්‍රියාවලිය ඉතා ඉක්මනින් කාර්යක්ෂම කිරීමට ඉදිරියේදී අපි සැලසුම් කරනවා. ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරලා තිබෙනවා.

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි දන්නවා, ලංකාවේ පාසල් වර්ග කිහිපයක් තිබෙන බව. එකක් තමයි, ප්‍රාථමික පාසල්. ඊළඟට, මහා විද්‍යාල. ඒ වාගේම කනිෂ්ඨ පාසල්. ඊට පස්සේ තිබෙනවා, මහින්ද රාජපක්ෂ ආදර්ශ ජාතික පාසල්. ඒ වාගේම ජාතික පාසල්. පාසල් වර්ගීකරණයේදී මේ විධියට පාසල් වර්ග ගොඩක් තිබෙනවා. හැබැයි, එම වර්ගීකරණය නිසා ඒ සියලු පාසල්වලට විශාල ගැටලුවක් ඇතිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම දරුවෝ වාගේම දෙමව්පියෝ ප්‍රාදේශීය මට්ටමින් සහ ග්‍රාමීය මට්ටමින් තිබෙන පාසල්වල බෝඩ්වලට රැවටිලා එම පාසල් කරා ඒමේ ලොකු තරගයක් ඇතිවෙලා තිබෙනවා. ඒ තරගකාරී තත්ත්වය නැති කිරීම සඳහා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළින් පාසල් වර්ගීරණයක් යෝජනා කරලා තිබෙනවා, ප්‍රාථමික පාසල්, ද්විතියික පාසල් සහ ජ්‍යෙෂ්ඨ ද්විතියික පාසල් වශයෙන් පාසල් වර්ග තුනක්. මෙන්න මේ තත්ත්වය ඇති කිරීම සම්බන්ධයෙන් දැනට ගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද? ඒ වාගේම එම වර්ගීකරණය කොතරම් කාලයක් ඇතුළත ලංකාව තුළ ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් අහනවා.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, විශේෂයෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළත පාසල් වර්ගීකරණය සම්බන්ධ කටයුතු මේ වනකොටත් ක්‍රියාත්මක කරමින් පවතිනවා. එතුමා කියන කාරණාව ඇත්ත. අපි පාසල් පද්ධතිය නිශ්චිත, විද්‍යානුකූල වර්ගීකරණයකට ලක් කරනවා. ළඟ තිබෙන පාසලක්, විශේෂයෙන් අපි ගත්තොත් කිලෝමීටර තුනක අරයක් ඇතුළත පවතින පරිදි සහ සියලු පහසුකම් සහිත පාසලක් භූ විෂමතාව සහ ඒ අදාළ ප්‍රදේශයට අනුකූලව ස්ථානගත කිරීමේ වැඩ පිළිවෙළ තමයි මේ අවස්ථාවේදී ක්‍රියාත්මක වෙන්නේ. මේ මොහොත වනකොට නියමු ව්‍යාපෘතියක් විධියට පළාත් නවයේම ශිෂ්‍යයන් 50ට අඩුවෙන් සිටින පාසල් 98ක් සම්බන්ධ වාර්තා අමාත්‍යාංශය මඟින් ලබා ගෙන තිබෙනවා. දැනට අපි මේ සියලු පාසල්වලට අදාළ තොරතුරු සංචිතයක් ලබා ගනිමින් සිටිනවා, profile කරමින් සිටිනවා. ඉතාම ඉක්මනින් - ලබන අවුරුද්ද වනකොට - මේ ප්‍රතිසංස්කරණ කටයුතු පටන් ගැනීමේ අරමුණ අපට තිබෙනවා. එම නිසා සංඛ්‍යා මතම නොවෙයි, විද්‍යානුකූල ක්‍රමයකට, ඉතාම ඉක්මනින් පාසල් වර්ගීකරණය සිදු කරන්න අවශ්‍ය වැඩ කටයුතු අපි කරමින් ඉන්නවා. මේ මොහොතේදී කරපු වැඩ ටික තමයි මම කිව්වේ, ගරු මන්ත්‍රීතුමනි. ඉදිරියේදී අපි මේ සම්බන්ධව තවත් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -501/2025- (1), ගරු ටී.කේ. ජයසුන්දර මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

හිනිදුම මැතිවරණ කොට්ඨාසය: නතර කර ඇති iRoad ව්‍යාපෘතිය
ஹினிதும தேர்தல் தொகுதி: இடைநிறுத்தப்பட்டுள்ள i-Road கருத்திட்டம்
HINIDUMA ELECTORATE: STALLED iROAD PROJECT

501/2025

4. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා (ගරු ටී.කේ. ජයසුන්දර මහතා වෙනුවට)
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர - மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர சார்பாக)
(The Hon. (Dr.) Nishantha Samaraweera on behalf of the Hon. T.K. Jayasundara)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම මැතිවරණ කොට්ඨාසයේ, iRoad ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවකට පත්වී ඇති බව දන්නේද;

(ii) අතරමඟ නවතා දමා ඇති එක් එක් මාර්ගය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් වහාම විසඳිය යුතු ආයතන කවරේද;

(iv) එම එක් එක් මාර්ගය සඳහා ඇස්තමේන්තුගත මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ගමනාගමනයට බාධාවක් නොවන ආකාරයෙන් එම මාර්ග පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தின், ஹினிதும தேர்தல் தொகுதியில் நடைமுறைப்படுத்தப்பட்ட i-Road கருத்திட்டம் இடைநடுவில் நிறுத்தப்பட்டதால், அப்பகுதி மக்கள் மிகுந்த சிரமத்துக்கு உள்ளாகியிருப்பதை அறிவாரா என்பதையும்;

(ii) இடைநடுவில் நிறுத்தப்பட்டுள்ள ஒவ்வொரு வீதி தொடர்பிலும் எழுந்துள்ள பிரச்சினைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

[ගරු නිශාන්ත සමරවීර මහතා]

(iii) அது தொடர்பில் பொறுப்புக்கூறவேண்டிய நிறுவனங்கள் யாவை என்பதையும்;

(iv) அந்த ஒவ்வொரு வீதிக்குமாக மதிப்பிடப்பட்ட தொகை வெவ்வேறாக யாது என்பதையும்;

(v) அந்த வீதிகளை போக்குவரத்துக்கு இடையூறு ஏற்படாத வகையில் பராமரிப்பதற்கு மேற்கொள்ளப்படவிருக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) whether he is aware that the residents of the Hiniduma Electoral Division in the Galle District have been seriously inconvenienced due to halting of the iRoad Project implemented in that area;

(ii) the issues that have arisen in relation to each of the said roads, of which the construction work has been halted, separately;

(iii) the institutes that are responsible in this regard;

(iv) the estimated cost of each of the said roads, separately; and

(v) the steps that will be taken to maintain these roads in such manner that transportation would not be obstructed?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) කොන්ත්‍රාත්තුව අවසන් කරන විට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 76ක් වන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ කිලෝමීටර ප්‍රමාණය වන 64.2න් කිලෝමීටර 51ක ප්‍රමාණයකට asphalt අතුරා ඇත.

මුළුමනින්ම වැඩ අවසන් කර ඇති කිලෝමීටර ගණන 23.57කි.

කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද මුළු දිග	- කි.මී. 64.62
සම්පූර්ණ වැඩ අවසන් කරන ලද දිග	- කි.මී. 23.57
Asphalt පමණක් අතුරා ඇති දිග	- කි.මී. 27.91
කිසිදු ඉදිකිරීමක් සිදු නොකරන ලද දිග	- කි.මී. 4.70
ඉදිකිරීම් ඇරඹුවද asphalt ඇතිරීමට නොහැකි වූ දිග	- කි.මී. 8.02

වැඩ අවසන් නොකරන ලද මාර්ග සම්බන්ධයෙන් තොරතුරු ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම

වැඩ අවසන් නොකරන ලද මාර්ග ලැයිස්තුව	සම්පූර්ණ දිග (කිලෝමීටර)	Asphalt අතුරා ඇති ප්‍රමාණය (කිලෝමීටර)	ගැටලුව
මැදගම-ඉහළමැදගම-පුස්වැල්කඩ-මැද්දෙගම - බෝපගොඩ	7.38	6.37	කි.මී. 1.01ක ප්‍රමාණයකට Asphalt අතුරා නැත.
බටහේන-කුඩගල්පොල - හබරකඩ	9.60	7.50	කි.මී. 2.10ක ප්‍රමාණයකට Asphalt අතුරා නැත.
ධර්මපාල විද්‍යාලය - දුන්හේන	1.24	0.00	සම්පූර්ණ මාර්ගයටම Asphalt අතුරා නැත.
හබරකඩ-ඉඹබාවල යටිපාත	2.90	0.43	කි.මී. 2.47ක ප්‍රමාණයකට Asphalt අතුරා නැත
කුඹුරගොඩ - මණ්ඩලපුර	6.37	6.08	කි.මී. 0.29ක ප්‍රමාණයකට Asphalt අතුරා නැත
කිඹුලාවල - පොරවගම පාර	3.85	1.94	කි.මී. 1.91ක ප්‍රමාණයකට Asphalt අතුරා නැත.
හත්තක-පිටිගල උතුර - සාසනකිලක මාවත	3.46	0.00	සම්පූර්ණ මාර්ගයටම Asphalt අතුරා නැත.
කුරුපනාව මැලිබන් හන්දිය - පරණ සමෘද්ධි ගොඩනැඟිල්ල, පොල්කැල්ල හරහා	1.19	0.65	කි.මී. 0.54ක ප්‍රමාණයකට Asphalt අතුරා නැත.
උඩුගම, අලුත්වත්ත පාර	5.06	4.94	කි.මී. 0.12ක ප්‍රමාණයකට Asphalt අතුරා නැත.
එකතුව	**41.05**	**27.91**	

(iii) මහාමාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය

(iv) කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලැබ ඇත්තේ මාර්ග සියල්ලටම එකම ඇස්තමේන්තුවක් මඟිනි. එම G-01 පැකේජයේ මාර්ග 64.62 Km සඳහා ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 1,458කි.

(v) ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/HCCA/LA/254/2021 මඟින් පවත්නා තත්ත්වය පවත්වාගෙන යාමට (maintain status quo) නියෝග කර ඇත. නඩු කටයුත්ත අවසන් වනතුරු ඉතිරි ඉදිකිරීම් පිළිබඳ අදාළ තීරණ ගැනීමට නොහැක. දැනට පවත්නා අධිකරණ නියෝගය අනුව සියලු ඉදිකිරීම් නතර කිරීමට (maintain *status quo*) උසාවි තීන්දුවක් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, දහහත්වන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: මාර්තු 08]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 08]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee.- [Progress: 08th March]
[THE HON. SPEAKER in the Chair.]

126 වන ශීර්ෂය.- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 39,360,000,000

தலைப்பு 126.- கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 39,360,000,000

HEAD 126.- MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 39,360,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 126, 212 සිට 215 දක්වා සහ 335.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කථා කිරීමේ යෝජනාව, the Hon. (Dr.) V.S. Radhakrishnan. You have 20 minutes.

[10.05 a.m.]

ගරු (ආචාර්ය) වී.එස්. රාධාකිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
Hon. Chairman, I move,

> "That a sum of Rs. 10 be cut from the Recurrent and Capital Expenditures of each Programme, as per the tradition, out of the Heads of Expenditure Nos. 126, 212 to 215 and 335 pertaining to the Ministry and other departments and institutions coming under it and scheduled to be taken up for discussion today, Monday, 10th March, 2025, at the Committee Stage Discussion of Appropriation Bill, 2025."

இலங்கையில் மிக முக்கியமாகப் பேசப்படுகின்ற அமைச்சாக இருக்கின்ற கல்வி அமைச்சின் இன்றைய குழுநிலை விவாதத்தை ஆரம்பித்து வைத்து உரையாற்றுவதற்கான சந்தர்ப்பத்தைக் கொடுத்த எதிர்க்கட்சித் தலைவர் அவர்களுக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று உலகில் மிகப் பிரசித்தமான விஞ்ஞானிகளாகவும் பொறியியலாளர்களாகவும் வைத்தியர்களாகவும் சட்டவல்லுநர்களாகவும் பேராசிரியர்களாகவும் ஆசிரியர்களாகவும் ஏனைய தொழிற்றுறை சார்ந்தவர்களாகவும் இலங்கையர்கள் இருக்கிறார்கள் என்பது இலங்கையின் கல்வித்துறை வளர்ச்சிக்கு ஓர் எடுத்துக்காட்டாகும். தொன்றுதொட்டு இந்த நாட்டுக்குப் பல புத்திஜீவிகள் நிறைய சேவை செய்திருக்கிறார்கள். அதற்குக் காரணம் இந்த நாட்டினுடைய இலவசக் கல்விக் கொள்கையாகும். அதனை அறிமுகப்படுத்திய கலாநிதி சி.டபிள்யூ. டபிள்யூ. கன்னங்கரா அவர்களுக்கு எங்களது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். இன்று இந்தப் பாராளுமன்றத்தில் நான் உட்பட படித்த நிறையப் பேர் இருப்பதற்கு அவரும் ஒரு காரணமாகும்.

இரண்டு முக்கிய நோக்கங்களுக்காக இலவசக் கல்வி அறிமுகப்படுத்தப்பட்டது. ஒன்று, இயற்கையாகவே திறமையுள்ள அனைவரும் படித்து சமூகத்தில் உயர்நிலைக்கு வர வேண்டும். இரண்டாவது, வேறுபாடுகள் இருந்தபோதிலும், அதாவது கையில் இருக்கின்ற காசளவில் இல்லாமல் இலங்கையில் பிறந்த அனைத்துக் குழந்தைகளுக்கும் பாரபட்சமின்றி இலவசக் கல்வி கொடுக்கப்பட வேண்டும். இதுவே அவருடைய நோக்கமாக இருந்தது. இதனால் பிற்காலத்தில் நம் நாட்டில் அறிஞர்கள், புத்திஜீவிகள், தொழில் வல்லுநர்கள், தொழில் முனைவோர் எனப் பலர் உருவாவதற்கு வாய்ப்பு ஏற்பட்டது. அவரது கால முடிவில் நாடு முழுவதும் 54 மத்திய கல்லூரிகள் நிறுவப்பட்டன. அதற்கு அவருக்குக் கிடைத்த பரிசு என்னவென்றால், ஹொரணை மக்களால் தோற்கடிக்கப்பட்டதுதான். அதற்குப் பிறகு கல்வி அமைச்சராக வந்த ஏ.டி. நுகவெல அவர்கள் கல்வித்துறைக்குப் பாரிய பங்காற்றியதுடன், 50 மத்திய கல்லூரிகளையும் நிறுவினார்.

இன்று நாங்கள் கல்வி அமைச்சு சம்பந்தமாகப் பேசும்போது, திரு. ரணில் விக்கிரமசிங்ஹ அவர்களை மறந்துவிட முடியாது. මේ කාලයේ වාගේ නොවෙයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපන ඇමති හැටියට ඉන්නකොට ගොඩක් වැඩ කරලා තිබෙනවා. ඒ ගැන ප්‍රසාදය පළ කරන්න ඕනෑ. அவர் கல்வி அமைச்சராக இருந்த காலத்திலேயே தொலைதூர அடிப்படையில் ஆங்கில ஆசிரியர் பயிற்சி எனப்படும் 'டெரிக்' முறை அறிமுகப்படுத்தப்பட்டது. மேலும், பூரணகால தொலைதூர ஆசிரியர் பயிற்சி, பாடசாலை மாணவர்களுக்கான பகல் உணவு, மீபே அழகியல் கலை நிறுவனம், முறைசாரா கல்வி விரிவாக்கம், ஆசிரியர்களின் சேவைக் காலத்தை 60 வயதாக்கியமை, பிக்குகளுக்கான ஆசிரியர் பயிற்சிப் பாடசாலைச் சங்கங்களைத் தாபித்தல், மாணவர்களுக்கான ஆலோசனைச் சேவைகளை ஆரம்பித்தல், ஆசிரியர்களின் தேவை கருதி மாவட்ட ஆசிரியர் நியமன முறையைக் கொண்டுவருதல் போன்ற திட்டங்களையும் அவர் அறிமுகப்படுத்தினார். ஆசிரியர் கல்விக் கல்லூரி முறையை அறிமுகப்படுத்தி, 1988ஆம் ஆண்டில் 9 கல்விக் கல்லூரிகளை ஆரம்பித்தார். இன்று அது 20ஆக அதிகரித்திருக்கின்றது. அமரர் ரணசிங்ஹ பிரேமதாஸ அவர்கள் சனாதிபதியாக இருந்த காலத்தில் மாணவர்களுக்கான இலவச சீருடை, சப்பாத்து, பாடசாலைப் புத்தகம் வழங்கும் திட்டங்கள் அறிமுகப்படுத்தப்பட்டன. இந்த நேரத்தில் நாங்கள் மஹிந்த ராஜபக்ஷ அவர்களையும் மறக்க முடியாது. அவருடைய ஆட்சிக் காலத்தில் 1,000 மஹிந்தோதய ஆய்வுகூடங்களை அமைக்கும் திட்டம் அறிமுகப்படுத்தப்பட்டதுடன், E-tech, B-Tech போன்றனவும் அறிமுகப்படுத்தப்பட்டன.

இப்பொழுது இலங்கையில் 10,096 பாடசாலைகள் இருக்கின்றன. அவற்றில் 396 தேசிய பாடசாலைகளும் 9,700 மாகாணப் பாடசாலைகளும் அடங்குகின்றன. மொழி மூலமாகப் பார்த்தால், 6,247 சிங்கள மொழிமூலப் பாடசாலைகளும் 3,011 தமிழ் மொழிமூலப் பாடசாலைகளும் காணப்படுகின்றன. மாணவர்களின் எண்ணிக்கை 3,882,688; ஆசிரியர்களின் எண்ணிக்கை 225,216; அதிபர்களின் எண்ணிக்கை 12,571. ஆசிரிய கல்விக் கல்லூரிகளின் எண்ணிக்கை 20.

[ගරු වී.එස්. රාධාකෘෂ්ණන් මහතා]

ආසිරිය මාණවර්කලින් එණ්ණික්කෙ 10,600. ඉප්පොළුදු ඉවර්කළ් කල්වියිර් කල්ලූරිකළිල් training එටුත්තුක්කොණ්ටු ඉරුක්කිරාර්කළ්. ආසිරියර් පයිර්සික් කලාසාලෙකළින් එණ්ණික්කෙ 08. අවර්රිලුළ්ළ ආසිරිය මාණවර්කළින් එණ්ණික්කෙ කිට්ටත්තට්ට 1,000 ආකුම්.

අදනෙත් තොටර්න්තු 'නල්ලාට්සි' අරසාංක කාලත්තිල් පාටසාලෙකළෙ අපිවිරුත්তි සෙය්වතර්කාක "අරුකිලුළ්ළ පාටසාලෙ සිරන්ත පාටසාලෙ" එන්ර තිට්ටම් ආරම්පික්කප්පට්ටතු. අත්තිට්ටත්තුක්කු අතික පණම් ඔතුක්කප්පට්ටු ඉරුන්තාලුම් ඉන්නුම් අතන් වේලෙකළ් පූර්ත්තිසෙය්යප්පටාමල් ඉරුප්පතෙ නාංකළ් උංකළුටෙය කවනත්තුක්කුක් කොණ්ටු වරුකින්රෝම්. නිරෙයප් පාටසාලෙ කළිල් ඉතු තොටර්පාන වේලෙකළ් ආරම්පික්කප්පට්ටු, තර්පොළුදු පූර්ත්තියාකුම් නිලෙයිල් ඉරුක්කින්රන. එනිනුම්, නීංකළ් අතෙච් සර්රු අවසරමාකච් සෙය්යවේණ්ටි උළ්ළතු. ඒනෙනිල්, කෝට්ටාපය රාජපක්ෂ අවර්කළුටෙය ආට්සික් කාලත්තිල් අන්තප් පණිකළිල් තාමතම් ඒර්පටුත්තප්පට්ටු ඉරුන්තතු. එනවේ, නීංකළ් උංකළුටෙය ආට්සික් කාලත්තිල් අන්තප් පණිකළෙ විරෙවාකච් සෙය්වීර්කළෙන නාංකළ් එතිර්පාර්ක්කින්රෝම්.

මුන්නාළ් සනාතිපති සන්තිරික්කා අම්මෙයාරින් ආට්සික් කාලත්තිල් පෙරුන්තෝට්ටප් පාටසාලෙකළුක්කු 3,400 උතවි ආසිරියර් නියමනංකළ් වළංකප්පට්ටන. අතර්කුප් පිරකු, මහින්ත රාජපක්ෂ අවර්කළින් ආට්සික් කාලත්තිල් 3,500 උතවි ආසිරියර් නියමනංකළ් වළංකප්පට්ටන. අතර්කුප් පිරකු, 3,196 උතවි ආසිරියර් නියමනංකළ් 'නල්ලාට්සි' අරසාංක කාලත්තිල් වළංකප්පට්ටන. කටන්ත Cabinetඉල්කූට, පෙරුන්තෝට්ටප් පාටසාලෙකළුක්කු 2,500 උතවි ආසිරියර්කළෙ නියමිප්පතර්කු අනුමති පෙරප්පට්ටු ඉරුන්තතු. එනිනුම්, අතු ඔරු වළක්කු කාරණමාක ඉටෙනිරුත්තප්පට්ටු ඉරුක්කින්රතු. අතු පර්රි කෞරව පිරතම මන්තිරි අවර්කළුක්කුත් තෙරියුමෙන නාන් නිනෙක්කින්රේන්. අන්ත නියමනංකළෙ විරෙවාක වළංකුවතර්කුරිය නටවටික්කෙ කළෙ කෞරව අමෙච්සර් අවර්කළ් එටුක්ක වේණ්ටුමෙන නාංකළ් කේට්ටුක් කොළ්කින්රෝම්. අතිල් ඔරු සික්කල් ඉරුක්කින්රතු. කටන්ත කාලත්තිල් අන්ත නියමනංකළ් තමිල් මොළිමූල පාටසාලෙකළුක්කෙනච් සොල්ලප්පට්ටතු. ඉප්පොළුදු අවර්රෙ තමිල්ප් පාටසාලෙකළුක්කෙන කොටුත්තාල්, අතිල් මුස්ලිම් පාටසාලෙකළුම් අටංකුම්. එනවේ, පිරච්සිනෙ ඒර්පටාතු. එනවේ, නීංකළ් අන්ත නියමනංකළෙ තමිල් මොළිමූල පාටසාලෙකළ් එන්රිල්ලාමල්, තමිල්ප් පාටසාලෙකළ් එන්ර අටිප්පටෙයිල් කොටුක්ක වේණ්ටුමෙන නාන් ඉන්ත නේරත්තිල් කේට්ටුක් කොළ්කින්රේන්.

කටන්ත කාලංකළිල් පෙරුන්තෝට්ටක් කල්වි අපිවිරුත්තික් කාක 2,550 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටිරුන්තතු. අතිල් 250 මිල්ලියන් රූපාය් තේර්න්තෙටුක්කප්පට්ට පාටසාලෙකළුක්කුක් කොටුක්කප්පට්ටු ඉරුක්කින්රතු. අතාවතු, එතිර්කාලත්තිල් Advanced Levelඉල් science, maths පිරිවුකළ් උළ්ළටංකුම් වකෙයිල් 25 පාටසාලෙකළ් ඉතිල් තේර්න්තෙටුක්කප්පට්ටු ඉරුන්තන. අම්මෙයිල් අතු ඔරු පිරච්සිනෙයාකච් සොල්ලප්පට්ටතු. අන්තක් කාලත්තිල් මලෙයක මාණවර්කළුක්කු Advanced Level පිටික්ක වසතියිල්ලෙයෙන්ර කාරණත්තාල් තාන් අන්ත 25 පාටසාලෙකළුම් අපිවිරුත්තික්කාකත් තෙරිවු සෙය්යප්පට්ටන. කෞරව අමෙච්සර් අවර්කළේ, අන්තප් පාටසාලෙකළින් පෙයර් listඉ නාන් උංකළුක්කුත් තරුකිරේන්. නීංකළ් අවර්රෙ මේලුම් අපිවිරුත්ති සෙය්තාල්, නිච්සයමාක පෙරුන්තෝට්ටප් පකුතියිලුළ්ළ අතිකමාන මාණවර්කළ් university සෙල්වතර්කාන වාය්ප්පු එර්පටුම්. ඉන්රෙය කාලකට්ටත්තිල් පෙරුන්තෝට්ටප්පකුතියිලිරුන්තු universityක්කුච් සෙල්ලවේණ්ටිය මාණවර්කළින් සතවීතම් 1.5 ආකුම්. ආනාල්, ඉප්පොළුදු පෙරුන්තෝට්ටප් පකුතියිලිරුන්තු universityක්කුච් සෙල්ලුම් මාණවර්කළින් සතවීතම් 0.5 ආකුම්. එනවේ, පෙරුන්තෝට්ටප් පකුතියිලිරුන්තු පල්කලෙක්කළකම් සෙල්ලුම් මාණවර්කළින් එණ්ණික්කෙයෙ අතිකරිප්පතර්කු නටවටික්කෙ එටුක්ක වේණ්ටුම්. අතර්කු Advanced Levelඉල් performance කාට්ට වේණ්ටුම්. Advanced Levelඉල් performance කාට්ට වේණ්ටුමෙන්රාල්, අංකුළ්ළ graduate teachersඉන් තොකෙයෙ අතිකරික්ක වේණ්ටුම්. පෙරුම්පාලුම් එමතු පකුතියිලුළ්ළ තමිල් මොළිමූල පාටසාලෙකළිල් graduate teachers ඉල්ලෙ. කටන්ත කාලත්තිල් නාන් කල්වි ඉරාජාංක අමෙච්සරාක ඉරුන්තපොතු, ඉන්තියාවිලිරුන්තු ආසිරියර් කළෙක් කොණ්ටුවර වේණ්ටුමෙන නිනෙත්තේන්. අප්පොළුදු, අතෙ මුතලිල් එතිර්ත්තතු JVPතාන්. ඉප්පොළුදු නීංකළ්තාන් අතෙච් සෙය්ය වේණ්ටුම්. නීංකළ් එතිර්ත්තතෙ නීංකළේ සෙය්ය වේණ්ටුමෙන නාංකළ් එතිර්පාර්ක්කින්රෝම්.

අටුත්තු, තේසිය තමිල් මොළිත් තිනම් පර්රිච් සොල්ල වේණ්ටුම්. කටන්ත 'නල්ලාට්සි' අරසාංක කාලත්තිල් තමිල් මොළිත් තිනමානතු තේසිය තමිල් මොළිත්තින විළාවාකක් කොණ්ටාටප්පට්ටතු. අන්රු අතර්කු මෛත්තිරිපාල සිරිසේන අවර්කළ් තලෙමෛතාංකිනාර්. අවර් අතනෙ කණ්ටි, යාළ්ප්පාණම්, මාත්තළෙ නකරංකළිල් නටත්තියිරුන්තාර්. අතෙ නීංකළුම් follow පණ්ණ වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්. ඒනෙනිල්, උංකළුටෙය Deputy Minister නුවරෙලියාවෛච් සේර්න්තවර්. අවරුම් ඉතිල් අක්කරෙ එටුත්තුච් සෙයර්පට වේණ්ටුමෙන නාන් කේට්ටුක් කොළ්කින්රේන්.

NPP අරසාංකමානතු, 2025ආම් ආණ්ටුක්කාන වරවු සෙලවුත්තිට්ටත්තිල් කල්වි, උයර් කල්වි මර්රුම් තොළිර්කල්වි අමෙච්සුක්කු 271,000 මිල්ලියන් රූපායෙ ඔතුක්කියිරුක්කිරතු; ඉතු වරවේර්ක්කක්කූටිය විෂයමාකුම්. අතිල් උළ්නාට්ටු නිතියළිප්පු 242,722 මිල්ලියන් රූපාය් ආකුම්; වෙළිනාට්ටු නිතියළිප්පු 28,278 මිල්ලියන් රූපාය් ආකුම්. ඉන්ත නිතිමූලම් කෞරව අමෙච්සර් අවර්කළ් කල්වි අපිවිරුත්තියෙ නල්ල මුරෙයිල් සෙය්ය වේණ්ටුමෙන නාංකළ් එතිර්පාර්ක් කින්රෝම්.

ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිල් ආසිරියර් කල්ලූරිකළ් මර්රුම් පයිර්සි නිලෙයංකළුක්කු 1,083 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටු ඉරුක්කින්රතු. තේසිය කල්වියියල් කල්ලූරික්කු 2,836 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටිරුක්කින්රතු. තේසිය කල්වියියල් කල්ලූරිකළිල් කට්ටිට මර්රුම් තළපාටංකළුක්කාන කුරෙපාටුකළ් නිලවි වරුකින්ර අතේවේළෙ, අංකු ආළණිප් පර්රාක්කුරෙයුම් කාණප්පටුකින්රතු. එනවේ, ඉන්නිතියොතුක්කීට්ටින් මූලමාක ඉව්විටයංකළිල් අතික කවනම් සෙලුත්ත වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්. මේලුම්, තමිල් මොළි මූලමාන කොට්ටකලෙ Training Collegeඉන් කට්ටිට වේලෙකළ් අරෙකුරෙයිල් ඉරුක්කින්රතු. එනවේ, අතෙයුම් පූර්ත්තිසෙය්තුතර වේණ්ටු මෙන්පතු එංකළතු එතිර්පාර්ප්පාකුම්. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ ආසනයේ තිබෙන Kotagala Training College එකේ වැඩ හාගෙට නැවතිලා තිබෙනවා. ඔබතුමා ඒ කටයුතු අවධ්‍යෂය කරලා ඒක සම්පූර්ණ කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

அதேபோல, அனைத்துப் பாடசாலைகளிலும் சுகாதார மற்றும் நீர் வசதிகளை வழங்குவதற்கு இம்முறை 50 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கிறது. இருந்தபோதும், 424 பாடசாலைகளுக்கு குடிநீர் வசதியோ மலசலகூட வசதியோ இல்லாமல் இருக்கின்றது என்பதை நாங்கள் இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்கின்றோம். පාසල් 424කට toilet, ඒ වගේම පානීය ජලය නැති ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒ ප්‍රශ්නවලටත් ඔබතුමා ඇහුම්කන් දෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

தேசிய ரீதியாக கணினி வசதிகள் இல்லாத பாடசாலைகளின் எண்ணிக்கை 1,876 ஆகவும், மத்திய மாகாணத்திலே 392 ஆகவும், ஊவா மாகாணத்திலே 128 ஆகவும், சப்ரகமுவ மாகாணத்தில் 317 ஆகவும் காணப்படுகின்றன. Digital மயப்படுத்துவதற்கு முக்கியத்துவம் அளிக்கும் மாண்புமிகு சனாதிபதி அவர்களுடைய கொள்கைக் கேற்ப, பாடசாலைகளுக்கு கணினிகள் பெற்றுக் கொடுக்க வேண்டும். அத்துடன், மலையகத்தில் பல்கலைக்கழகம் ஒன்று உருவாக்கப்பட வேண்டுமென்று, கடந்த காலத்தில் மாறிமாறி வந்த அரசாங்கங்களிடம் நாங்கள் கேட்டிருக்கிறோம். ஆனால், அது நடைமுறையில் சாத்தியப்படவில்லை.

பேராதனைப் பல்கலைக்கழகம், ஊவா பல்கலைக்கழகம், சப்ரகமுவ பல்கலைக்கழகம் ஆகியன மலையகத்தில் அமைந்திருக்கின்றன. நாங்கள் என்ன எதிர்பார்க்கின்றோம் என்றால், மலையகத்திற்கென ஒரு தனிப் பல்கலைக்கழகம் என்றில்லாமல் தமிழ் மக்களைப் பிரதிநிதித்துவப்படுத்தக்கூடிய வகையிலே சில பாடத்திட்டங்களை உள்ளடக்கியதாக ஒரு பல்கலைக்கழகக் கல்லூரியை மலையகத்திலே உருவாக்கு வதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதைத்தான். அதற்காக காணியும் ஒதுக்கப்பட்டிருக்கின்றது. எனவே, அதனை அமைப்பதற்கான முன்மொழிவை அடுத்த முறை Budgetஇல் உள்ளடக்கினால் நாங்கள் சந்தோசப்படுவோம். உங்களிடமிருந்து அச்செய்தியைக் கேட்பதற்கு நாங்கள் ஆவலாக இருக்கின்றோம். அந்த வகையில், அதைச் செய்வீர்களென நாங்கள் எதிர்பார்க்கின்றோம். மஹபொல திட்டத்திற்காக சென்ற வருடம் 2,600 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தது. இந்த முறை அரசாங்கம் 4,600 மில்லியன் ரூபாய்களை ஒதுக்கீடு செய்திருக்கிறது. இது சந்தோசமான விஷயம்.

இந்திய நிதி உதவியோடு மத்திய, ஊவா மற்றும் தென் மாகாணங்களில் 9 தோட்டப் பாடசாலைகளைத் தரமுயர்த்து வதற்காக கிட்டத்தட்ட 300 மில்லியன் ரூபாய் இம்முறை வரவு செலவுத்திட்டத்திலே ஒதுக்கப்பட்டிருக்கின்றது. நீங்கள் இந்தியாவுடன் சேர்ந்து நிறையப் பாடசாலைகளை அபிவிருத்தி செய்ய வேண்டுமென நாங்கள் கேட்டுக் கொள்கின்றோம்.

"அருகிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்ற வேலைத்திட்டத்தின்கீழ் ஆரம்பிக்கப்பட்ட பாடசாலைகளின் நிர்மாணப் பணிகள் இப்பொழுது தாமதமாகி இருக்கின்றது. அவற்றை நிறைவுசெய்வதற்காக கிட்டத்தட்ட 5,250 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருப்பது பாராட்டத்தக்கது. கொழும்பிலே யிருக்கின்ற இந்துக் கல்லூரியின் கட்டுமானப் பணிகள் இப்போது முடிவடையும் தறுவாயிலே இருக்கின்றது என நான் நினைக்கின்றேன். அதற்கு நாங்கள்தான் அடிக்கல் நாட்டி வைத்தோம். எனினும், அதைத் திறந்து வைப்பதற்குரிய சந்தர்ப்பம் உங்களுக்குக் கிடைத்திருக்கின்றது. எது எப்படி யிருந்தாலும், மாணவர்களுக்கு அதன் நன்மை சென்ற டைந்தால் நாங்கள் சந்தோசமடைவோம்.

பெருந்தோட்டப் பாடசாலைகளில் 'ஸ்மாட்' வகுப்புகளை நிறுவுவதற்கு இந்திய அரசாங்கம் அதிகளவான நிதியை ஒதுக்கியிருக்கின்றது. அதை நீங்கள் உங்களது budgetஇல் காட்டியிருக்கின்றீர்கள். இருந்தாலும், இந்தியாவின் உதவி யோடு அதனைச் செய்ய வேண்டுமென்பதை நாங்கள் எதிர்பார்க்கின்றோம். பாடசாலை மாணவர்களுக்கு மடிக்கணினி வழங்குவதற்காக சென்ற முறை 8 மில்லியன் ரூபாயாக இருந்த வட்டி மானியம் இம்முறை 5 மில்லியன் ரூபாயாகக் குறைக்கப்பட்டிருக்கின்றது. இதற்கான நிதி அதிகரிக்கப்பட வேண்டும் என்பது எங்களுடைய யோசனையாக இருக்கிறது. Computers ගත්න මුදල් ටිකක් වැඩි කරලා
දෙයි කියලා අපි බලාපොරොත්තු වනවා.

பல்கலைக்கழக மாணவர்களுக்கு மடிக்கணினி என்பது அத்தியாவசியமாக மாறிவிட்டது. ஆகவே, அரசாங்கம் இந்நிதியொதுக்கீட்டைச் சற்று அதிகரித்து இத்திட்டத்தைச் செயற்படுத்த வேண்டும்.

கஷ்ட மற்றும் அதிகஷ்டப் பிரதேசங்களிலுள்ள பாடசாலை மாணவர்களுக்கு காலணிகள் வழங்குவதற்காக 2,500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கிறது. கடந்த வருடம் இதற்கு 1,350 மில்லியன் ரூபாய் மட்டுமே ஒதுக்கப் பட்டிருந்தது. இந்த முறை இது அதிகரிக்கப்பட்டிருப்பது சந்தோசமான விஷயம். எனினும், ஒரு விடயத்தை உங்களின் கவனத்திற்குக் கொண்டு வருகின்றேன். அதாவது, 300 மாணவர்களுக்குக் குறைந்த பாடசாலைகளுக்குத்தான் அதனைக் கொடுக்கவிருப்பதாக நீங்கள் சொல்லியிருக் கின்றீர்கள். 1,000 மாணவர்கள் உள்ள பாடசாலைகளிலும் ஏழை மாணவர்கள் படிக்கின்றார்கள் என்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும். எனவே, உங்களுடைய திட்டத்தின் மூலம், அந்த மாணவர்களுக்கும் ஏதாவது ஒரு வகையிலே காலணிகள் போய்ச் சேருவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்று நான் கேட்டுக் கொள்கின்றேன்.

மாணவர்களின் எண்ணிக்கை குறைவாகவுள்ள 599 பாடசாலைகளில் 53,923 பிள்ளைகளுக்கு மாத்திரமே இத் திட்டத்தில் காலணிகள் வழங்கப்பட்டிருக்கின்றன. 264 பெருந்தோட்டப் பாடசாலை மாணவர்கள் இதில் உள்வாங்கப் படவில்லை. 145,230 பாடசாலைப் பிள்ளைகளுக்கு அது கிடைக்கவில்லை. தேசியப் பாடசாலைகளிலும் மிகவும் கஷ்ட நிலையில் கல்வி கற்கின்ற பிள்ளைகளும் இருக்கின்றார்கள். ஆகவே, வருமான அறிக்கையை கிராம சேவகர் ஊடாகப் பெற்றுக்கொண்டு, அவர்களுக்கும் அதனைப் பெற்றுக் கொடுக்கின்ற செயன்முறையை அரசாங்கம் முன்னெடுக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

அதேபோல, பாடசாலை எழுது கருவிகளுக்காக 6,000 ரூபாய் அண்மையில் கொடுக்கப்பட்டது. அதிலும் 300 பிள்ளைகளுக்கும் குறைந்த பாடசாலையில் கல்வி கற்கின்ற 646 பெருந்தோட்டப் பாடசாலைகளிலே 66,679 பிள்ளை களுக்கு மட்டுமே கிடைக்கப் பெறுகின்றது. முந்நூறுக்கும் மேற்பட்ட பிள்ளைகள் கல்வி கற்கின்ற பாடசாலைகளிலும் கஷ்டமான பிள்ளைகள் இருக்கின்றார்கள். ஆகவே, இந்த முறையில் மாற்றங்களைக்கொண்டு வந்து இந்த விடயத்திலும் கிராம சேவகர் மூலமாக வருமான அறிக்கையைப் பெற்றுக் கொண்டு தேவையானவர்களுக்கு அது கிடைக்க ஆவன செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

பொருளாதாரப் பிரச்சினை காரணமாக இன்று மாணவர் களின் இடைவிலகல் - dropouts - அதிகரித்துள்ளது. 2024.12.06ஆம் திகதிய கல்வி அமைச்சின் கணக்கெடுப்புக்கு

[ගරු වී.එස්. රාධකිෂ්ණන් මහතා]

අමෙවාක இடைவிலகிய மாணவர்களின் தொகை 50,345 ஆகும். நுவரெலியா மாவட்டத்தில் மாத்திரம் இடைவிலகிய மாணவர்களின் தொகை 2,754. என்னிடம் அது தொடர்பான details இருக்கின்றது. அமைச்சர் அவர்களுக்குத் தேவை யென்றால், நான் பிறகு சமர்ப்பிக்கிறேன்.

அன்றிருந்த மாணவர்களின் தொகையைவிட இன்று அவர்களின் தொகை அதிகமாகும். அதிகமான பாடசாலை களில் போதிய கட்டிட வசதி இல்லாமல் இருக்கின்றது. அதனால் போதிய கட்டிட வசதிகளைப் பெற்றுத் தரும்படி கேட்டுக் கொள்கிறோம். இன்று ஒரு வகுப்பறையில் 40 மாணவர்கள் இருக்கின்றார்கள். அவர்களுக்கு அதிக இடப்பரப்பளவுள்ள அறைகள் இருக்க வேண்டும். ஆனால், கடந்த காலங்களில் கட்டப்பட்ட வகுப்பறைகளில் இடவசதி மிகக் குறைந்ததாகவே காணப்படுகின்றது. ஆகவே, இந்த நிலைமையை மாற்ற வேண்டுமென்று உங்களை அன்பாகக் கேட்டுக்கொள்கிறேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have another two minutes.

ගරු (ආචාර්ය) වී.එස්. රාධකිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
එච්චරයිද තිබෙන්නේ? මට තව මිනිත්තු පහක් දෙන්න.

நான் பிரதி அமைச்சராக இருந்த நல்லாட்சி காலத்தின்போது, 2016ஆம் ஆண்டு பாடசாலை மாணவர் களுக்காக "சுரக்ஷா" என்ற காப்புறுதித் திட்டத்தை அறிமுகப் படுத்தினோம். இப்பொழுது அத்திட்டம் கைவிடப்பட்டுள்ளது. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் இம்முறை வரவு செலவுத்திட்டத்தில் "சுரக்ஷா" காப்புறுதித் திட்டத்தை மீள செயற்படுத்துவதாகக் கூறியிருக்கிறார்.

வலயக் கல்விப் பணிப்பாளர்களாக அதிகமாக சிங்கள மொழியில் பணி புரியும் உத்தியோகத்தர்கள்தான் இருக்கின் றார்கள். அத்தகைய இடங்களிலே உதவிக் கல்விப் பணிப்பாளர்களாக தமிழ் அதிகாரிகள் நியமிக்கப்பட வேண்டு மென்று உங்களை விநயமாகக் கேட்டுக் கொள்கிறேன். பாடரீதியாக பணிப்பாளர்களின் பற்றாக்குறை அதிகமாகக் காணப்படுகின்றது. ஆகவே, அதையும் நீங்கள் நிவர்த்தி செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கின்றோம்.

கட்டாயம் ஊழல் ஒழிக்கப்பட வேண்டுமென அரசாங்கம் சொல்லியிருக்கின்றது. நாங்கள் அதை வரவேற்கின்றோம். எந்த அரசாங்கமானாலும் பாடசாலைகளில் இடம்பெறுகின்ற ஊழலுக்கு எதிராகச் செயற்பட வேண்டும். ஆனால், அங்கு ஊழல் இடம்பெறுகின்ற விதம் மாறியிருக்கின்றது. அதாவது, அதிபரும் ஆசிரியர்களும் நேரடியாக பணம் வாங்காமல், பாடசாலை அபிவிருத்திக்கான நன்கொடை என்ற பெயரில் வாங்குகிறார்கள் அல்லது தனக்கு வேண்டப்பட்ட கடை களுக்கும் நபர்களுக்கும் பணத்தைக் கொடுக்குமாறு சொல்கின்றார்கள். இதுவும் ஊழல்தான். ஆகவே, இத்தகைய ஊழலையும் மாற்றியமைப்பதற்கான நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென்பதை நான் இந்த நேரத்திலே சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த பாராளுமன்றத்தில் நான் கல்வி மேற்பார்வைக் குழுவின் தவிசாளராக இருந்தபோது, புதிய கல்வி மறுசீரமைப்பு இந்த நாட்டிலே கொண்டுவருவதற்கான ஏற்பாடு செய்யப்பட்டது. அதேபோல, சத்துணவுத் திட்டத் தையும் கொண்டுவருவதற்கான ஏற்பாடு செய்யப்பட்டது. அந்தத் திட்டங்களை மறு பரிசீலனை செய்து பொருத்த மென்றால், அதனை நடைமுறைப்படுத்தலாம்; இல்லை யென்றால், விட்டுவிடலாம் என்பதை நான் இந்த நேரத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகிறேன்.

பெருந்தோட்டத்துறைக்கு மட்டுமல்ல, தேசிய அளவிலும் கல்வித் துறைக்கு தொன்றுதொட்டு இந்தியா பெருமளவு உதவி வருகின்றது. அந்த வகையில், இம்முறையும் அனைத்து கல்வி வளர்ச்சிகளுக்கும் இந்தியா நிதி உதவி செய்திருக்கிறது. அதற்காக இந்திய அரசாங்கத்திற்கும் இந்திய உயர் ஸ்தானிகர் அவர்களுக்கும் இந்த நேரத்திலே விசேட நன்றியை இவ்விடத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகிறேன். கடந்த காலத்தில் நான் கல்வி மேற்பார்வைக் குழுவின் தவிசாளராக - Chairman of Sectoral Oversight Committee ஆக - இருந்தபொழுது கல்வி மறுசீரமைப்புக்கான சில பரிந்துரைகளைச் செய்திருக் கிறோம். அந்தப் பரிந்துரைகள் பொருத்தமாக இருந்தால், அவற்றை நடைமுறைப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்று மீண்டும் கேட்டுக் கொள்கிறேன். நாங்கள் உங்களுடைய அரசாங்கத்தை எந்த விதத்திலும் குற்றம் சொல்ல முடியாது. ஏனென்றால், இதுதான் உங்களுடைய ஆரம்பம்! அடுத்த வருட Budgetஇல் இவற்றைச் செய்ய வில்லையென்றால் உங்கள்மீதும் குற்றச்சாட்டைச் சுமத்தலாம் என்பதைத் தெரிவித்துக்கொண்டு என்னுடைய உரையை நிறைவு செய்கிறேன். நன்றி, வணக்கம்.

[பூ.ஈ. 11.26]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු සභාපතිතුමනි, අතිශයින් වැදගත් සහ සංවේදී අමාත්‍යාංශයක් ගැන කථා කරන අද දිනයේ මේ විවාදයට සහභාගි වීමට අවස්ථාව ලැබීම මට ලැබුණු විශාල ගෞරවයක් ලෙස සලකනවා.

ගරු සභාපතිතුමනි, විෂය ගැන කථා කරන්න ප්‍රථම මා විශේෂ කාරණයක් කෙරෙහි සියලු දෙනාගේ අවධානය යොමු කරවනවා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන, විශ්වවිද්‍යාල ප්‍රජාවෙන් ආපු අපි 14දෙනෙක් මේ ගරු සභාවේ ඉන්නවා. අපි සියලුදෙනාගේම ඉතාම කිට්ටු සගයෙක්, මිතුරියක් වුණු ආචාර්ය ජානකී ජයවර්ධන මහත්මිය මීට දින දෙකතුනකට කලින් ඉතාම අනපේක්ෂිත විධියට රිය අනතුරකට මුහුණ දීලා අපෙන් වෙන් වෙලා ගියා.

ගරු සභාපතිතුමනි, මම කථාව ආරම්භයේදීම ජානකී ජයවර්ධන මහත්මිය ගැන මතක් කරන්නේ ඇය අපෙන් වෙන් වීම පිළිබඳව සංවේගය ප්‍රකාශ කිරීමටම පමණක් නොවෙයි. විශ්වවිද්‍යාල ප්‍රජාවක් හැටියට අපි සියලු දෙනා බලාපොරොතු වෙනවා ideal intellectual කෙනෙක්. ආචාර්ය ජානකී ජයවර්ධන කියන්නේ එවැනි චරිතයක්; එවැනි ideal චරිතයක්. ඇයගේ ශිෂ්‍ය ප්‍රජාවෙන් ඇය ගැන අහලා බැලුවොත් කියාවි, ඇය කවුද කියලා. මොකද, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇයට දැක්වූයේ පුදුම

ආදරයක්. ඒ විතරක් නොවෙයි. ඇය අපේ සගයෙකු හැටියට අපත් එක්ක ඉතාම කිට්ටුවෙන් වැඩ කරමින්, අපට විශාල ආදර්ශයක් දුන්නු, අපට විශාල ශක්තියක් වුණු චරිතයක්. එවැනි විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අපට අහිමි වීම පෞද්ගලිකව අපට වඩා මේ රටට බරපතළ loss එකක්. ඒ නිසා තමයි මා එතුමිය ගැන කියමින් මේ කථාව ආරම්භ කරන්නේ.

ගරු සභාපතිතුමනි, මේ සභාවේ සිටින සියලුදෙනාම දන්නවා 2011, 2012 වර්ෂ තුළ විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයෙන් - FUTA එකෙන් - දියත් කරපු ඒ වෘත්තීය සමිති අරගළය මේ රටේ අධ්‍යාපන ඉතිහාසයේ ටිකක් සුවිශේෂී අරගළයක් බව. වෘත්තීය සමිතියකට තමන්ගේ වෘත්තීය අයිතිවාසිකම්වලට එහා ගිහින් සමාජ අරගළයකට නායකත්වය දෙන්න පුළුවන් කියන විශ්වාසය ඒ අරගළය හරහා ඇති කළා. 2011-2012 කාලයේ පැවැති ඒ අරගළය වෘත්තීය සමිති අරගළයක් විතරක්ම නොවෙයි. ඒක අධ්‍යාපනය වෙනුවෙන් දියත් කරපු සටනක්; අරගළයක්. ඒකට වෘත්තීය සමිති විතරක්ම නොවෙයි සම්බන්ධ වුණේ. එය, ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ සිටින අධ්‍යාපනය පිළිබඳ යම්කිසි හැඟීමක්, සංවේදීභාවයක් දක්වපු සියලු දෙනා එකතු වුණු අරගළයක්. ඒක වෙනත් වෘත්තීය සමිති, ගුරු වෘත්තීය සමිති වාගේම, සිවිල් සමාජය පුරවැසියන් හැටියට එකතු වෙලා කරපු අරගළයක්. ඒ අරගළය තුළින් සමාජයටත් විශාල පණිවුඩයක් ලබා දුන්නා, අප සියලු දෙනාටම දැනෙන, විශාල සංවේදීභාවයක් තිබෙන පොදු දෙයක් වෙනුවෙන්; අධ්‍යාපනය වැනි විෂයයක් වෙනුවෙන්; අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රයක් බේරා ගැනීම වෙනුවෙන් අපට එකතු වෙලා අරගළ කරන්න පුළුවන් කියලා.

ඒ සටනේදී අපට නායකත්වය දුන්නු චරිතයක් තමයි ආචාර්ය ජානකී ජයවර්ධන කියන්නේ. නිහඬවයි එතුමිය ඒ නායකත්වය දුන්නේ. පිටුපසින් ඉඳන් තමයි ඇය ඒ නායකත්වය දුන්නේ. ඒ නිසා තමයි එහි වැඩි වටිනාකමක් තිබෙන්නේ. එතුමිය ලොකුවට ස්ටේජ්වල මතු වුණේ නැහැ; කථාවලින් මතු වුණේ නැහැ. නමුත්, ඒ වෘත්තීය අරගළය අපට කරන්න බැරි වෙනවා, ආචාර්ය ජානකී ජයවර්ධන හිටියේ නැත්නම්.

ගරු සභාපතිතුමනි, මම පොඩි උදාහරණයක් දෙන්නම්. අපි ඒ අරගළයේදී ගාල්ලේ සිට කොළඹ දක්වා දින 5ක long march එකක් කළා ඔබ සියලුදෙනාගේ මතකයේ ඇති. ගාල්ලේ ඉඳන් කොළඹ දක්වා ඒ march එක කරන කොට විශ්වවිද්‍යාල ආචාර්යවරු - අප සියලුදෙනා - "සියයට 6" කියලා ගහපු තැඹිලි සහ කළු පාට ටී-ෂර්ට් ඇන්දා. ඒ ටී-ෂර්ට් හදා ගන්න අපට ඒ කාලයේ මුදල් තිබුණේ නැහැ. ආචාර්ය ජානකී ජයවර්ධනගේ ඉඩමක් විකුණලා ලැබුණු මුදලින් තමයි අපි ඒ ටී-ෂර්ට් හැදුවේ. අන්න එවැනි චරිතයක් ඇය. තමන් විශ්වාස කරන දෙයක් වෙනුවෙන් ඕනෑම දෙයක් කැප කරන්න පුළුවන් කෙනෙක්, බය නැතුව නායකත්වය දෙන්න පුළුවන් කෙනෙක්, ඇය. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙවැනි මොහොතක ඇය නැති අඩුව අපට හොඳටම දැනෙනවා. මොකද, එවැනි චරිත අපට අවශ්‍යයි; විශ්වවිද්‍යාලයට අවශ්‍යයි; සමාජයට අවශ්‍යයි. ඇය, වෘත්තීය අනන්‍යතාවට එහා ගිය නියම public intellectual කෙනෙක්; සමාජ වගකීමක් දකින, තමන්ගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන්, තමන්ගේ විෂයය වෙනුවෙන්, ඒ discipline එක වෙනුවෙන්, ප්‍රජාව වෙනුවෙන් ඉදිරිපත් වෙන්න පුළුවන්, නායකත්වයක් දෙන්න පුළුවන්, කැපවීම් කරන්න පුළුවන් චරිතයක්. එවැනි චරිත අපට අවශ්‍යම මොහොතක ඇය අහිමි වීම පිළිබඳව මම මගේ බලවත් සංවේගය පළ කරනවා. ඇයගේ පවුලේ සාමාජිකයන්, ඇයගේ අඩුව හොඳින්ම දැනෙන ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ඇයගේ සගයන්, විශ්වවිද්‍යාල ප්‍රජාවේ සගයන් ඇතුළු සියලුදෙනාට මම මේ වෙලාවේ මගේ සංවේගය ප්‍රකාශ කරනවා. ඇයට භිටියා, විශාල මිතුරු කණ්ඩායමක්.

මා ජානකී ජයවර්ධන සිහිපත් කරන්නේ ඇයගේ වෙන්වීම තුළින් අපට ශෝකයක් දැනෙන නිසා පමණක් නොව, ඇය අපට ආදර්ශයක් වීම නිසා සහ අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇයගෙන් ලැබුණු එළිය අපට අහිමි වීම නිසායි. අපට එවැනි චරිත තවත් අවශ්‍ය වන නිසා අප අනිවාර්යයෙන් ඇයව මතක තබා ගත යුතු බව කියමින් මම අද දවසේ අය වැය විවාදයේ මගේ කථාව ආරම්භ කරන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, අපේ රජය විසින් 2025 වසරට ඉදිරිපත් කර තිබෙන අය වැය තුළ මෙතෙක් කල් අධ්‍යාපනයට වෙන් වුණු මුදලට වඩා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මේ අය වැයෙන් අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 619ක් ඉදිරි මාස අටට පමණක් වෙන් කර තිබෙනවා. ඒ වෙන් කිරීම තුළ ප්‍රාග්ධන වියදම ලෙස විතරක් රුපියල් බිලියන 21ක් වෙන් කර තිබෙනවා. එයත් මෑත ඉතිහාසය තුළ අධ්‍යාපන ප්‍රාග්ධන වියදම වෙනුවෙන් වෙන් කර තිබෙන වැඩිම මුදල් ප්‍රමාණය වනවා.

ගරු සභාපතිතුමනි, අප වෙන් කරගෙන තිබෙන එම මුදල වියදම් කිරීම සඳහා අපි පැහැදිලි සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා. අධ්‍යාපනය නිවැරදි විධියට හදාගන්නේ නැතිව රට තුළ කරන්න බලාපොරොත්තු වන ඒ පරිවර්තනය අපට සිද්ධ කරගන්න බැහැ. අධ්‍යාපන පරිවර්තනය හරහාම තමයි අප බලාපොරොත්තු වන සමාජ, දේශපාලන, ආර්ථික පරිවර්තනය කරගන්න පුළුවන් වන්නේ.

ගරු සභාපතිතුමනි, මේ අය වැයෙන් වෙන් කරපු ඒ මුදල වියදම් කිරීමේ සැලැස්ම ගැන කථා කරන විට මා කිව යුතුයි, අධ්‍යාපනය තුළ ඇති විය යුතු පරිවර්තනය ගැන ඉතා බැරෑරුම් ලෙස කල්පනා කරමින්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගනිමින් අපේ අමාත්‍යාංශය ඒ සඳහා සූදානම් වෙමින් සිටින බව.

ගරු සභාපතිතුමනි, මම දත්ත කිහිපයක් ඉදිරිපත් කරන්නම්. අප යෝජනා කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණය වෙනුවෙන් කුලුනු පහකින් මැදිහත් වෙන්න අපි බලාපොරොත්තු වෙනවා. පළමුවැනි කුලුන තමයි විෂය නිර්දේශය. විෂය නිර්දේශය යාවත්කාලීන කිරීමට විතරක් නොවෙයි, සමාජ පරිවර්තනය සිදු කිරීමට අවශ්‍ය මානව සම්පත බිහි කිරීමේ දිශාවට ගෙන යන්න පුළුවන් අධ්‍යාපන ක්‍රමයක් හැදීම සඳහා අලුත් විෂය මාලාවක් ඉදිරිපත් කරන්න අපි යෝජනා කර තිබෙනවා. ඒ, අපේ පළමුවැනි කුලුන. ඒ සඳහා අමාත්‍යාංශයට රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. ඊට අමතරව ඒ සඳහා ව්‍යාපෘති හරහා රුපියල් මිලියන 160ක් වෙන් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, නිරීක්ෂණය කර බැලුවාම අපට පෙනී ගිය දෙයක් තිබෙනවා. ඒ තමයි, මීට කලිනුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කර තිබෙන බව. විවිධ අවස්ථාවල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් අවුරුදු ගණනාවකින් ඒවා හරියට ක්‍රියාත්මක වෙලා නැහැ. ඒවා ක්‍රියාත්මක නොවීමට ප්‍රධාන හේතුවක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කිරීමට නම් විෂය නිර්දේශය විතරක් වෙනස් කරලා හරියන්නේ නැහැ. මේකට සම්බන්ධ තව කොටස් ගණනාවක් තිබෙනවා. ඒ නිසා තමයි අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ අපි කුලුනු 5ක් හඳුනා ගෙන තිබෙන්නේ. ඒ 5න් එකක් තමයි විෂය නිර්දේශය. ඒ නිසා තමයි ගරු සභාපතිතුමනි, මේ අය වැය තුළත් අපි විශේෂ අවධානයක් යොමු කර තිබෙන්නේ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව සම්පත සූදානම් කිරීමට. එහිදී ගුරුවරු විතරක් නොවෙයි, විදුහල්පතිවරුත්, ඒ වාගේම විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට පුහුණුව ලබා දෙන ගුරු අධ්‍යාපනඥයන් ඇතුළු අධ්‍යාපන පරිපාලන සේවයේ ඉන්නා සියලු

[ගරු හරිනි අමරසූරිය]

දෙනාගේම ධාරිතාව වර්ධනය කිරීම සඳහා අපි විශාල අවධානයක් යොදවනවා. ඒක තමයි අපේ දෙවන කුලුන. ඒ සඳහා, ඒ අයගේ ධාරිතාව වර්ධනය කිරීම වෙනුවෙන් මේ අය වැය තුළින් ඉතිහාසයේ පළමු වතාවට අපි වැඩිම මුදලක් වෙන් කර තිබෙනවා, රුපියල් මිලියන 1,640ක් වශයෙන්. ගරු සභාපතිතුමනි, මේ විෂයට මෙතෙක් කල් හරි අවධානයක් දීලා තිබුණේ නැහැ. නමුත් මේ අවුරුද්දේ එම වැඩ පිළිවෙළත් හරියට, සැලසුම්සහගතව ආරම්භ කිරීමට අපට පුළුවන්වීම පිළිබඳව මම සතුටු වෙනවා.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ගරු අගමැතිතුමියනි,-

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ගරු අගමැතිතුමියනි, ඒ කාලයේ මාස 5ක් වෙන් කළා, ප්‍රතිසංස්කරණ කටයුතු කරන්න. ඒකට USAID එක තමයි අපට උදව්ු කළේ. ඒ වාර්තා ඔක්කෝම බලන්න. ඒවා බලා ආයෙත් සැරයක් කැඳවනවා නම්, කැඳවලා ඒක බලන්න.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
හොඳයි, ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දැනට ගුරු සේවාව තුළ ඉන්න මානව සම්පතට එහා ගිහිල්ලා අපේ අවධානය යොමු කර තිබෙනවා, විද්‍යා පීඨ තුළින්, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබෙන අධ්‍යාපන පීඨ තුළින් පුහුණු වෙන ගුරුවරයා පිළිබඳවත්. ඇත්ත වශයෙන්ම ඉතාම ඛේදනීය තත්ත්වයක් තමයි අපේ ජාතික විද්‍යා පීඨ පද්ධතිය තුළ තිබෙන්නේ, අද වනවිට. මම එයින් කිහිපයකට ගියා. පොළොන්නරුව, යාපනය කියන පැතිවල තිබෙන විද්‍යා පීඨ නිරීක්ෂණය කරන්න මම ගියා. ඒවායේ ඉන්න ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට, කවදා හෝ ගුරුවරු වෙන්න නියමිත ඒ ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට කිසිම පහසුකමක් නැහැ. ඒ අයට හරියට hostels නැහැ, වතුර නැහැ.

අපි පාසල්වල smart classrooms ගැන කථා කරනවා. නමුත්, ඒ smart classroomsවල ගුරුවරුන් තවම උගන්වන්නේ blackboard එකෙන්. ඒවායේ විදුලි පහසුකම් නැහැ. යටිතල පහසුකම් නැහැ. ඒ නිසා තමයි ගරු සභාපතිතුමනි, අපි මේ අවුරුද්දේ මේ සඳහා විශේෂ අවධානයක් යොමු කරන්නේ.

ගරු සභාපතිතුමනි, අවුරුදු ගණනාවක් තිස්සේ පාසල්වල යටිතල පහසුකම් ගැන විවිධ ව්‍යාපෘති ඉදිරිපත් කරලා තිබුණා. "ළඟම පාසල, හොඳම පාසල" යනුවෙන් යහ පාලන ආණ්ඩුවෙන් කළ වැඩසටහන 2016 සිටම ක්‍රියාත්මක වෙනවා. නමුත්, අදටත් තිබෙනවා, බාගෙට වැඩ ඉවර වුණු බිල්ඩින්. ඒවා ඉතාම භයානකයි, දරුවන්ට අනතුරුදායකයි. ඒවාට හරියට electricity නැහැ. බෝඩ් තිබෙනවා, තාප්ප තිබෙනවා, ගේට්ටු තිබෙනවා. හැබැයි, ඒ ගේට්ටු ඇරගෙන ඒ තාප්පෙන් ඇතුළු වුණාම දරුවන්ට ලැබිය යුතු ඒ පහසුකම් නැහැ. අදටත් තිබෙනවා මේ රටේ සනීපාරක්ෂක පහසුකම් නැති පාසල්. ජලය හරියට නැති පාසල් තිබෙනවා. ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමාත් මේ කාරණය මතු කළා. ඒ නිසා තමයි අපේ අය වැය තුළින් මේවාට විශේෂ අවධානයක් යොදවලා තිබෙන්නේ. පාසල්වල අවසන් නොවුණු ව්‍යාපෘති, බාගෙට සකස් කරලා තිබෙන ව්‍යාපෘති අවසන් කරන්න, සම්පූර්ණ කරන්න මිලියන 11,000ක් අපි වෙන් කරලා තිබෙනවා. අපි විශේෂයෙන්ම කියලා තිබෙන්නේ මේ මිලියන 11,000න් සනීපාරක්ෂක පහසුකම්වලට අවධානය දෙන්න කියලා. අපේ රටේ දරුවන් තවදුරටත් සනීපාරක්ෂක පහසුකම් නැති පාසල්වලට යන එක අපි මේ අවුරුද්දෙන්වත් අවසන් කරන්න තීරණය කරලා තිබෙන්නේ. එහෙම තිබෙන එක කිසිසේත්ම අපට පිළිගත හැකි දෙයක් නොවෙයි. විශේෂයෙන්ම අපි වතු ක්ෂේත්‍රයේ ඒ ප්‍රජාවගේ පාසල්වලට විශේෂ අවධානයක් යොදවලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු සභාපතිතුමනි, රේඛීය අමාත්‍යාංශය හරහා අපි රුපියල් මිලියන 11,126ක් මේ වෙනුවෙන් වෙන් කරලා තිබෙන අතර, පළාත් සභා හරහා රුපියල් මිලියන 14,896ක් වෙන් කරලා තිබෙනවා. අපට විශ්වාසයි, මේ හරහා මේ ප්‍රශ්නය ඉවර කරන්න පුළුවන් කියලා. ඒ, අපේ තුන්වැනි කුලුන.

ගරු සභාපතිතුමනි, හතරවැනි කුලුන මෙයයි. ළමයින්ට උගන්වන්නත් ඕනෑ. ඒ ඉගෙනුම් ක්‍රියාවලිය ඇගයීමකට ලක් කරන්නත් ඕනෑ. ඇගයීම් සඳහා ඒ විශේෂ වගකීම තිබෙන්නේ විභාග දෙපාර්තමේන්තුවට. විභාග දෙපාර්තමේන්තුවේ කාලයක් තිස්සේ සපුරා නැති අවශ්‍යතා ගොඩක් තිබෙනවා.

මට මතකයි, පාර්ලිමේන්තුවට ආපු පළමුවෙනි අවුරුද්දේම මම අහපු ප්‍රශ්නයක් තමයි, විභාග දෙපාර්තමේන්තුවට වෙන් කර තිබෙන ප්‍රාග්ධනය කොපමණද කියන එක. එය ඉතාම අඩුයි. ගරු සභාපතිතුමනි, මෙවර අපි විභාග දෙපාර්තමේන්තුවට මිලියන 12,360ක් වෙන් කරලා තිබෙනවා. පසුගිය අවුරුදු ගණනාවක ඉඳන් බැලුවොත්, ඒ ප්‍රමාණය තමයි විභාග දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට ලැබී තිබෙන වැඩිම මුදල. ඒක අවශ්‍යයි. විෂය මාලාව විතරක් නොවෙයි අපේ අවධානයට යා යුත්තේ. අද අපේ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන විශාලම ප්‍රශ්නය තමයි, විභාග කේන්ද්‍රීය ක්‍රමය නිසා දරුවා තුළ ඇතිවන මානසික පීඩනය. ඒක වෙනස් කරන්න නම් ඒ ඇගයීම පිළිබඳ ප්‍රධාන වගකීමක් දරන එම ආයතනය අපි ශක්තිමත් කළ යුතුයි.

අපේ පස්වැනි කුලුන මෙයයි. අපි දකින විධියට අධ්‍යාපනය කියන එක අමාත්‍යාංශයේ හෝ ගුරුවරුන්ගේ හෝ ළමයින්ගේ විතරක් වගකීමක්, සාකච්ඡාවක් වෙන්න බැහැ. ඒකට සමාජයම සූදානම් වෙන්න ඕනෑ. අපි බලාපොරොත්තු වෙන ඒ අධ්‍යාපන පරිවර්තනය කරන්න සමාජ කතිකාවක් අවශ්‍ය වෙනවා. මේ ගැන කථා කරනකොට තමයි, මට ජානකී ජයවර්ධන වාගේ අය නැවත වතාවක් මතක් වෙන්නේ. මොකද, ඒ සමාජ කතිකාව හදන්න අපට public intellectualsලා අවශ්‍යයි, සමාජ ක්‍රියාකාරීන් අවශ්‍යයි. අන්න ඒ සමාජ කතිකාව හදන එකත් අපේ සැලැස්ම තුළ තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, දරුවන්ගේ සුබසාධන කටයුතු සඳහා වෙනම ප්‍රතිපාදන අපි වෙන් කරලා තිබෙනවා. ඒකට අදාළ විස්තර අද දවස තුළ -මේ විවාදය තුළ- ඉදිරිපත් කරනවා.

මම උසස් අධ්‍යාපනය ගැනත් විශේෂ දෙයක් කියන්න ඕනෑ. උසස් අධ්‍යාපනය තුළත් ගුණාත්මකභාවය කියන එකට අපි ප්‍රමුඛතාව දීලා තිබෙනවා. නිකම්ම විශ්වවිද්‍යාල හදන එක නොවෙයි, අපි කළ යුත්තේ. විශ්වවිද්‍යාලයක් කියන්නේ, board

එකක් හදන එක නොවෙයි. මේ සඳහා අපට ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. අතිශයින්ම පෞද්ගලික, දේශපාලන හේතු නිසා faculties, universities හැදිලා තිබෙනවා, courses පටන් ගෙන තිබෙනවා. ඒවායේ ගුණාත්මකභාවය ගැන කිසිම විපරමක් කරලා නැහැ. ඒ විතරක් නොවෙයි, ඒ තුළින් ඒ ශිෂ්‍යයන්ට ලැබෙන ප්‍රතිලාභ ගැන, ඒ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනයට මොකක්ද වෙන්නේ කියන එක ගැන කිසිම අවධානයක් යොමු නොවුණු ඕනෑ තරම් උදාහරණ අපේ උසස් අධ්‍යාපන පද්ධතිය තුළ තිබෙනවා. ඒ නිසා තමයි උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කිරීමට අපි විශේෂ අවධානයක් යොදවලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, ශිෂ්‍ය සුබසාධනයත්. විශ්වවිද්‍යාල හදලා තිබෙනවා. නමුත්, එම ළමයින් ඉගෙන ගන්නේ මොන තත්ත්වයක් තුළද? අධ්‍යාපනය ගැන හෝ තමාගේ අනාගතය පිළිබඳව විශ්වාසයක් ඇති වෙන ආකාරයට ඒ ශිෂ්‍ය ප්‍රජාවටත් ගරුත්වයකින් සලකන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා අපේ ශිෂ්‍ය ප්‍රජාව වැඩි කරලා තිබෙනවා. නමුත්, ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය පහසුකම් ගැන අවුරුදු ගණනාවකින් කිසිම අවධානයක් දීල නැහැ. මම ඊයේ හිටියේ අම්පාරේ. මම Hardy Advanced Technological Institute එකට ගියා. මට ඇත්තටම පුදුම හිතුණා. එය 1955දී ආරම්භ කරපු, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් දක්වපු ආයතනයක්. ගරු සභාපතිතුමනි, එහි ළමයින් ඉන්න තත්ත්වය දැක්කාම පුදුම හිතෙනවා. මම ඒ නේවාසිකාගාරයේ ගත්ත පින්තූරවල ඡායා පිටපත් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

Dormitories තිබෙනවා, අර කුකුළන් ඉන්න කොටුවල වාගේ වයර් තිබෙන්නේ. හරියට බිත්තිවත් නැහැ. හරියට ලයිට් නැහැ. මදුරුවෝ ඉන්නවා. ඇඳන්වලට මෙට්‍රස් නැහැ. ඇඳට දාලා තිබෙන්නේ නිකම් ස්පොන්ජ් කැල්ලක් වාගේ එකක්. ඒ දරුවන් තමන්ගේ කෑම ටික උයාගෙන කන්නේ. හැබැයි, ඒ කුස්සියේ හැටි දැක්කාම එතැන උයන්නේ කොහොමද කියලා හිතෙනවා. දවසට එකපාරයි උයන්නේ. එම දරුවන් රෑට විතරයි උයාගෙන කන්නේ. මොකද, වෙලාව නැහැ. Farm එකක් කියලා තිබෙනවා. ඒ farm එකේ එළුවෝ දෙදෙනෙක් විතර මම එහෙන් මෙහෙන් දැක්කා. ඒක දකුණු ආසියාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අවශ්‍ය මානව සම්පත බිහි කරන්න 1955දී හදපු ආයතනය. හැබැයි, මේ කිසි දෙයක් ගැන අවධානය යොමු කරලා නැහැ, ගරු සභාපතිතුමනි. ඒ වාගේම තත්ත්වයක් තමයි, කිලිනොච්චියේ German Training Institute එකෙත් තිබෙන්නේ. ළමයින්ට hostels නැහැ. ඒ ළමයින් නාන්නේ faculty එකට හදපු office එකේ toiletsවල; hostels නැහැ.

ගරු සභාපතිතුමනි, මේ විධියට යටිතල පහසුකම්වත් නැතුව දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපනය ගැන, ඔවුන්ගේ පෞරුෂය ගැන අපි යම් හැඟීමක් දෙන්නේ කොහොමද? අපි මේ වාගේ තැන්වලින් මොන වාගේ අයද පිට කරන්නේ? සමාජය ගැන මොන වාගේ හැඟීමක් ඇතිවද ඒ අය පිට කරන්නේ? තමන් ගැනම මොන වාගේ හැඟීමක් ඇතිවද පිට කරන්නේ? එම නිසා අපි මේ තත්ත්වය වෙනස් කරන්න උසස් අධ්‍යාපනයේ යටිතල පහසුකම් සඳහා රුපියල් මිලියන 36,841ක් වෙන් කරලා තිබෙනවා. අපි ප්‍රමුඛතා හැටියට කියලා තිබෙන්නේ, ශිෂ්‍යයන්ගේ සුබසාධන කටයුතු. අපි උසස් අධ්‍යාපන ආයතන සියල්ලෙන්ම ඉල්ලා සිටිනවා, ඒ සඳහා ප්‍රමුඛතාව දෙන්න කියලා. මෙහිදී අපි කියන්නේ, හැම විශ්වවිද්‍යාලයේම hostels හදන්න කියන එකම නොවෙයි. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ accommodation ගැනත් සොයා බලන්න කියන එකයි. ඔවුන් ඉන්නේ කොහොමද, කන්නේ බොන්නේ කොහොමද කියන එක ගැන හොයන්න ඕනෑ, ගරු සභාපතිතුමනි.

ඊළඟට, තුන්වැනියට අපේ අමාත්‍යාංශයට ලැබිලා තිබෙන්නේ වෘත්තීය අධ්‍යාපනය. ගරු සභාපතිතුමනි, වෘත්තීය අධ්‍යාපනය කියන එක, අතහැර දමපු කුඩම්මාගේ සැලකිලි ලබන ක්ෂේත්‍රයක් නොවී, අද ලෝකයට ගැළපෙන, දියුණු වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයක් ලෙස නිර්මාණය කළ යුතු වෙනවා. මොකද, එතැනින් තමයි අපේ රටට අවශ්‍ය ශ්‍රම බලකාය සෘජුවම නිර්මාණය වෙන්නේ. නූතන ශ්‍රම බලකායේ අවශ්‍යතාව අනුව, අනාගත ශ්‍රම බලකායේත් අවශ්‍යතාව අනුව ගළපා ගන්න පුළුවන් වටිනාකමක් ඇති තෝරා ගැනීමක්; තරුණයෙකුගේ තෝරා ගැනීමක් ලෙස දියුණු වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයක් අපි නිර්මාණය කරනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Prime Minister, you have only two more minutes.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මම අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ඒ නිසා, සියලුදෙනාගෙන්ම අපි ඉල්ලා සිටින්නේ පක්ෂ, පාට සහ වෙන කිසිම බෙදීමකින් තොරව අපි මේ විෂය දිහා බලමු කියලායි. මේ විෂය අපි එකතු වෙලා ගොඩ නඟමු. මේ, අපේ රටේ අනාගතයට අතිශයින්ම වැදගත් ක්ෂේත්‍රයක්. මේ හරහා තමයි අපේ රටේ දරුවන් ලෝකයට සුදුසු විධියට හදා ගන්න පුළුවන් වෙන්නේ. ඒ කියන්නේ මොළය හදන එක විතරක් නොවෙයි. හදවතක් තිබෙන, මනුෂ්‍යත්වය තිබෙන, ශිෂ්ට සම්පන්න සමාජයක් අපිට අවශ්‍ය නම්, අපි අධ්‍යාපනය අනිවාර්යයෙන්ම පරිවර්තනය කළ යුතුයි. අධ්‍යාපනය මානුෂීය විය යුතුයි. අධ්‍යාපනය සමාජ වගකීමක් ලෙස දැනෙන තැනක් බවට පත් කළ යුතුයි. ඒ වෙනස අපි අනිවාර්යයෙන්ම කරනවා කියන මතක් කිරීම කරමින්, මට වේලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa. You have 30 minutes.

[පූ.භා. 10.51]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු සභාපතිතුමනි, පවතින අධ්‍යාපන ක්‍රමවේදය, වැඩ පිළිවෙළ, විශේෂිත වූ වෙනස්කමකට ලක් විය යුතුයි කියන එක අපි හැමදෙනාම පිළිගන්නා කාරණාවක්. අපේ රටේ අධ්‍යාපන ක්‍රමවේදය තුළින් ගෝලීය පුරවැසියා නිර්මාණය වෙනවාද? වටිනාකමක් සතු, ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳ පොළේ ඉල්ලුමට සරිලන සැපයුම ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාව අපි හැමදෙනාම හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසා නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ අරමුණින් අපි මේ ක්‍රමවේදයට, මේ වෙනසට යා යුතුයි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දරුවෙකුගේ මොළය වර්ධනයේ සියයට 70ක් සිද්ධ වෙන්නේ ඉපදුණු මොහොතේ සිට අවුරුදු 5 දක්වා. මුල් ළමාවිය අධ්‍යාපනය, එහෙමත් නැත්නම් පෙර පාසල් අධ්‍යාපනය දරුවෙකුගේ වයස අවුරුදු 3ත්, 5ත් අතර ක්‍රියාත්මක වෙන අධ්‍යාපනයක්. අපේ රටේ ඒ අධ්‍යාපනය අවිධිමත්. ඒකට මුල් ළමාවිය අධ්‍යාපනය කියලා කියනවා, පෙර පාසල් අධ්‍යාපනය කියලා කියනවා. අපේ රටේ පෙර පාසල් 17,910ක් තිබෙනවා. හැබැයි, දරුවෙකුගේ මොළයේ වර්ධනය සියයට 70ක් සිදු වෙන කාලවකවානුවේ, ඒ කියන්නේ වයස අවුරුදු 5 දක්වා වන කාලය තුළ දරුවන් යන පෙර පාසල්වල තත්ත්වය කෙබඳුද? අපේ රටේ තිබෙන්නේ අවිධිමත් පෙර පාසල් අධ්‍යාපන ක්‍රමයක්, ගරු සභාපතිතුමනි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පටන් ගත යුත්තේ පෙර පාසල් පද්ධතියේ සිට බවත්, පෙර පාසල් පද්ධතියේ සිට ප්‍රාථමික ද්විතීයික, තෘතීයික - preschool, primary, secondary and tertiary - යනාදී ආකාරයෙන් මේ වෙනස්කම් ටික සිදු විය යුතු බවත් ගරු අග්‍රාමාත්‍යතුමියට අපි යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ අධ්‍යාපනය දිහා බැලුවොත්, අධ්‍යාපනයේ පැහැදිලි බෙදීමක් තිබෙනවා. ඒක නිදහස් අධ්‍යාපනය තුළත් තිබෙනවා, සමස්ත අධ්‍යාපනය තුළත් තිබෙනවා. ඇති-හැකි අධ්‍යාපනය තිබෙනවා. නැති-බැරි අධ්‍යාපනය තිබෙනවා. මෙහෙම වෙන්න බැහැ. ඒ නිසා විශේෂයෙන්ම නිදහස් අධ්‍යාපනය සුරක්ෂා කරන්නට ප්‍රතිපාදන ලබා දීම, ක්‍රමයේ වෙනසක් ඇති කිරීම, භෞතික සම්පත, මානව සම්පත ලබා දීම, නූතන ලෝකයට ඔබින ආකාරයට දියුණු කිරීම, නවීකරණය කිරීම, යාවත්කාලීන කිරීම කියන ප්‍රතිපත්තියට අපි යා යුතුයි. 2023 සංඛ්‍යාලේඛන අනුව අපේ රටේ නිදහස් අධ්‍යාපනයේ පාසල් 10,096ක් තිබෙනවා. 38 ලක්ෂයකට ආසන්න දූ දරුවන්, 237,000කට වැඩි ගුරු පරපුරක්, 12,500කට වැඩි විදුහල්පති පරපුරක් ඇතුළත් අධ්‍යාපන පද්ධතියක් අපේ රටේ තිබෙනවා.

නමුත්, සමාජය තුළ අධ්‍යාපනයේ තිබෙන බෙදීම බලන්න. වතු ක්ෂේත්‍රයේ පාසල්, ග්‍රාමීය ක්ෂේත්‍රයේ පාසල්, නගරයෙන් බැහැර පාසල්, ජනප්‍රිය නොවන පාසල් යනාදී වශයෙන් හැම අතකින්ම අපේ රටේ අධ්‍යාපනය බෙදිලා තිබෙන්නේ. ඒ බෙදී තිබෙන අධ්‍යාපනය ඒකාග්‍රතාවකට ලක් කරලා පාසල් 10,096ම විශිෂ්ට පාසල් බවට පත් කරන නව රජය ප්‍රතිපත්තියකට යොමුවීම ඉතාම කාලෝචිතයි. මම පිළිගන්නවා, කෙටි කාලයක් තුළ මේ රජය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව බරපතළ විශ්ලේෂණයක් කිරීම යථාර්ථවාදී නැති බව. හැබැයි, රජය අනුගමනය කරන වැඩ පිළිවෙළ හරහා මේ යන දිශානතිය පිළිබඳව අපට යම් යම් නිගමනවලට එන්නට හැකියාව තිබෙනවා. එදා මැතිවරණ වේදිකාවේදී කිව්වා, අධ්‍යාපන උපකරණවලට තිබෙන VAT ඉවත් කරනවා කියලා. ඇයි, ඒ දේ අද ඉෂ්ට සිද්ධ කරලා නැත්තේ කියලා මම ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අහන්න කැමැතියි. එදා ඔබ වේදිකාවේ ප්‍රකාශ කරපු ඒ කාරණාවත්, අද ක්‍රියාවත් අතර බරපතළ විෂමතාවක්, බරපතළ ඌනතාවක් තිබෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය සඳහන් කළා, බොහොම ඛේදනීය සිද්ධියක් ගැන. ඒ විශ්වවිද්‍යාල ආචාර්යතුමියගේ අභාවය පිළිබඳව සඳහන් කරමින් ඔබතුමිය ශෝකය පළ කළා. අපේත් සාතිශය සංවේගය, බලවත් කනගාටුව මේ අවස්ථාවේ පළ කරනවා, එතුමියගේ පවුලේ සාමාජිකයින්ට.

ඔබතුමිය පෙන්වා දුන්නා, ඒ කාලයේ අධ්‍යාපනය වෙනුවෙන් සටන් කළේ කොහොමද කියලා. ඔබතුමියගේ වචනයෙන්ම ඔබතුමිය මතක් කරලා දුන්නා, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය එදා දැවැන්ත පා ගමනක නිරත වුණා කියන කාරණාව.

මම විශ්වාස කරනවා, ඒ සටන් පාඨය ඔබතුමියට මතක ඇති කියලා. එහිදී කිව්වේ, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 6ක් - 6 per cent of GDP - අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන්න කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට අධ්‍යාපනය සඳහා මේ වසරේ වෙන් කරලා තිබෙන්නේ 0.84යි. ගිය අවුරුද්දේත් සියයට 0.86ක් වෙන් වුණා. ඔබතුමිය පා ගමන ගැන මතක් කළා. අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ යුතු ප්‍රතිශතය ගැන ඉදිරිපත් කළ සටන් පාඨ ගැන මතක් කළා. නමුත්, ඔබතුමියලා එදා දවසේ ප්‍රකාශ කරපු දේත්, අද ක්‍රියාවට නංවන දේත් අතර බරපතළ ඌනතාවක්, ලොකු පරතරයක් තිබෙනවා. එදා කියපු දේ අද ඉෂ්ට සිද්ධ වෙනවාද කියන එක ලොකු ගැටලුවක්.

මම තවත් කාරණයක් මතක් කරන්න කැමැතියි. අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනකොට, අධ්‍යාපන වැඩ පිළිවෙළ ගැන කථා කරනකොට මම අහන්න කැමැතියි, අපේ රටේ පාසල් පද්ධතිය, ඒ වාගේම විශ්වවිද්‍යාල පද්ධතිය ගොඩනඟන්න රජයෙන් වෙන් කරන මුදලම ප්‍රමාණවත්ද කියලා. එය කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. ගරු අගමැතිතුමියනි, මම ඔබතුමියට යෝජනා කරනවා, අධ්‍යාපන මාපිය කැපකරු ක්‍රමයක් ආරම්භ කරලා, ලෝකයේ සිටින ධනවතුන් සම්බන්ධ කරගෙන රජයේ අය වැයෙන් වෙන් වන මුදලට අමතරව තවත් අරමුදල් අපේ රටේ පාසල් පද්ධතියට, විශ්වවිද්‍යාල පද්ධතියට, තෘතීයික අධ්‍යාපන පද්ධතියට ලබා දෙන නැවුම් වැඩ පිළිවෙළකට යොමු වෙන්න කියලා. ඒ වාගේම මෙරට නිදහස් අධ්‍යාපනයේ පාසල් පද්ධතියත්, ධන සම්පත්වලින් සමන්විත වූ ජාත්‍යන්තර පාසල් පද්ධතියත් අතර සහෝදර සම්බන්ධතා වැඩ පිළිවෙළක් විධිමත්ව ක්‍රියාත්මක කරන්න. අපි ඒකට කියනවා, Sister School Partnership කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි, මම විග්‍රහ කරමින් ඉන්නේ, සමගි ජන බලවේගයේ - සමගි ජන සන්ධාන - රජයක් තුළ අපි ක්‍රියාත්මක කරන්නට අදහස් කරපු වැඩසටහන් පිළිබඳවයි. අධ්‍යාපන මාපිය කැපකරු ක්‍රමය ගැන කථා කරනකොට ඒ පිළිබඳ නොදන්නාකම නිසා සමහරු එයට හිනාවුණා; all laughed due to ignorance. අපි කියනවා, මෙරට නිදහස් අධ්‍යාපනයේ පාසල් පද්ධතියත්, විශ්වවිද්‍යාල පද්ධතියත්, විදේශීය රටවල ධනවත් පාසල් සහ විශ්වවිද්‍යාල සමඟ sister school or brother school relationship එකක් හදාගෙන සම්පත් ලබා ගැනීමේ නැවුම් වැඩසටහනකට ප්‍රවේශ වෙන්න කියලා. රජයෙන් වෙන් කරන මුදල් ගැනම පමණක් කථා කිරීමෙන් පළක් නැහැ. මේ රටේ නිදහස් අධ්‍යාපනය ඇති සෑම පාසලකම, ඒ පාසල පිහිටි ප්‍රදේශයේ

දානපතියන්ගෙන් ආධාර උපකාර ලබා ගනිමින් භාරකාර අරමුදලක් ස්ථාපනය කරන්න පුළුවන්. එවන් ආධාර උපකාර කරන දානපතියන්ට විශේෂිත වූ සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ වෙනුවෙන් ඔවුන්ට මොනයම් හෝ සහනයක් ලබා දෙන්න පුළුවන්. කාටවත් අගතියක් නොවන ආකාරයෙන් ලබා දිය හැකි විවිධාකාර සහන ක්‍රම තිබෙනවා. ඒ තුළින් අපට හැම පාසලකම; පාසල් 10,096 තුළම භාරකාර අරමුදල් ස්ථාපනය කරන්න පුළුවන්. එම නිසා මාපිය කැපකරු ක්‍රමය හරහා, සහෝදර පාසල් සබඳතා හරහා, භාරකාර අරමුදල් හරහා අධ්‍යාපන ක්ෂේත්‍රයට කැප කරන මුදල් ප්‍රමාණය ඉහළ මට්ටමකට ගේන්න අපට පුළුවන්කම තිබෙනවා.

මම මේක කියන්නේ, පාසල් පද්ධතියට අදාළව පමණක් නොවෙයි. පෙර පාසල් පද්ධතියේ ඉඳලා, පාසල් පද්ධතියේ ඉඳලා, විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන පද්ධතිය දක්වා අපට ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒක නිසා මම ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් - අධ්‍යාපන ඇමතිතුමියගෙන් - මේ අවස්ථාවේදී තවත් ඉල්ලීමක් කරනවා. තවමත් ප්‍රමාද නැහැ. ප්‍රමාණවත් තීන්දු තීරණ ගන්න. පාසල් උපකරණවලින් VAT ඉවත් කරන්න පුළුවන්, Appropriation Bill එක තුන්වන වර කියවීමට - Third Reading එකට - පෙර.

විශේෂයෙන්ම අධ්‍යාපනයට වෙන් කර තිබෙන මේ මුදල් ප්‍රමාණය වැඩි කිරීමේ කර්තව්‍යය ඉෂ්ට කිරීම තවදුරටත් ක්‍රියාත්මක කරන්නට ඔබතුමියට හැකියාව තිබෙනවා. විශේෂයෙන් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මානව සම්පත දිහා බැලුවොත් අනධ්‍යයන, ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, ගුරු අධ්‍යාපනඥ, අධ්‍යාපන පරිපාලන කියන මේ ක්ෂේත්‍ර රැසක අඩුපාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන් මානව සම්පත් ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා. එදා සුබෝධිනී වාර්තාව පදනම් කරගෙන දැවැන්ත පාද යාත්‍රා ක්‍රියාත්මක කරලා, ගුරු විදුහල්පති වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා සටන් කරලා ඒ වැටුප් නිර්දේශයෙන් තුනෙන් එකක් දිනා ගත්තා. නමුත් අද මහා ජන වරමක් ලැබුණායින් පස්සේ විදුහල්පතිවරුනුත් අමතක කරලා, ගුරුවරුනුත් අමතක කරලා, ඉතිරි තුනෙන් දෙකක කොටස බැහැර කරලා තිබෙනවා. අපි අහන්න කැමැතියි, සුබෝධිනී වාර්තාවේ නිර්දේශ අනුගමනය කරන්නට රජය කටයුතු කරනවාද, නැද්ද කියලා. මේ රටේ ගුරු හිඟයට විසඳුමක් ලබා දෙන්නට කටයුතු කරනවාද, නැද්ද කියලා. ඒ වාගේම අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය සුහුරු - smart - කරන්නට ඔබතුමන්ලා ගන්නා වැඩ පිළිවෙළ මොකක්ද? තොරතුරු තාක්ෂණය, ඩිජිටල් තාක්ෂණය, සුහුරු තාක්ෂණය පමණක් නොවෙයි, අද artificial intelligence කියන ක්ෂේත්‍රය මුළු ජන සමාජයම වෙළා ගන්නවා. අධ්‍යාපනයේ දැවැන්ත සාධනීය විපර්යාස AI හරහා ක්‍රියාත්මක වෙනවා. කොහොමද අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා මේ අභියෝගවලට මුහුණ දෙන්නේ? STEAM - Science, Technology, Engineering, Arts and Mathematics - education, ඒ වාගේම medicine, ඒ වාගේම information technology මේ යනාදී ක්ෂේත්‍ර වැඩිදියුණු කරන්නට ගන්නා වැඩ පිළිවෙළ මොකක්ද?

විශේෂයෙන්ම කොරෝනා සමයේ, රට බංකොලොත් වුණු කාලයේ ගුරු හිඟය පියවන්නට දැවැන්ත කාර්යභාරයක් ඉෂ්ට කරපු ඒ සංවර්ධන නිලධාරීන්ට මැතිවරණයට පෙර කිව්වා, ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දෙනවා කියලා. නමුත්, අද වෙනකොට අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරියට එනකොට ඒ අයට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ ගුටි බැට සහ ජල ප්‍රහාරවලට. මේක හරිද? මේක සාධාරණද? විශේෂයෙන්ම අපි යෝජනා කරනවා, අනධ්‍යයන, ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, අධ්‍යාපනඥ, අධ්‍යාපන පරිපාලන යන ක්ෂේත්‍ර සියල්ලකගේම පාර්ශ්වකරුවන් කැඳවා ඒ අය මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දෙන්න කියලා. මම ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් ඒ ඉල්ලීම කරනවා.

ඒ වාගේම ආබාධිත ප්‍රජාව වෙනුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවිය යුතු විශේෂ වෙනස්කම් ගැනත් මම කියන්නම්. අපේ රටේ ලක්ෂ 17ක ආබාධිත ප්‍රජාවක් ඉන්නවා. අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා සිදු විය යුතු වෙනස්කම්, ප්‍රතිසංස්කරණ ඒ ආබාධිත ප්‍රජාවට හිතවාදීව ක්‍රියාත්මක කිරීම අතිශයින්ම වැදගත් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමැතියි.

මම මේ වෙලාවේ ගරු අග්‍රාමාත්‍යතුමියගේ අවධානය යොමු කරන්නට කැමැතියි, රැකියා විරහිත උපාධිධාරීන්ගේ ගැටලුවටත්. 35,000ත්, 40,000ත් අතර රැකියා විරහිත උපාධිධාරීන් පිරිසක් ඉන්නවා. ඔබතුමියලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 72වන පිටුවේ කියනවා, උපාධිධාරීන් 20,000ක් ගුරු වෘත්තිය සඳහා බඳවා ගන්නවා කියලා; STEM උපාධිධාරීන් 3,000ක් බඳවා ගන්නවා කියලා; STEM නොවන උපාධිධාරීන් 9,000ක් තොරතුරු තාක්ෂණයට බඳවා ගන්නවා කියලා; දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගු දෙපාර්තමේන්තුවට, විදේශ සේවාවට, සංචාරක කර්මාන්තයට තවත් සේවකයන් 3,000ක් බඳවා ගන්නවා කියලා.

මේක තිබෙන්නේ ඔබතුමියලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ. එහි තිබෙනවා, උපාධිධාරීන් 35,000ක් බඳවා ගැනීම පිළිබඳව. නමුත්, රැකියා විරහිත උපාධිධාරීන් අතර ලොකු සැකයක් තිබෙනවා, මේ ක්‍රියාව ඉටු වෙයිද්ෝ, නොවෙයිද්ෝ කියලා. ඒ මොකද? ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මෙලෙස සඳහන් වුණාට, 35,000ත්, 40,000ත් අතර සිටින රැකියා විරහිත උපාධිධාරීන් කොටියාසයට තිරසර වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්නට ගරු ජනාධිපතිවරයා අය වැය කථාව හරහා අපොහොසත් වෙලා තිබෙනවා කියන එක මේ අවස්ථාවේ මම මතක් කරන්නට කැමැතියි. මම හිතන විධියට උතුරු මැද බලප්‍රදේශයේ උපාධිධාරීන් ගරු අගමැතිතුමියව හමු වුණා. විශේෂයෙන්ම විභාග ප්‍රතිඵල එළියට දමන්නටත් පෙර උතුරු මැද පළාතේ බඳවා ගැනීම් කර තිබෙනවා. ඒ වාගේම, මධ්‍යම පළාතේ interview කරලා pass වුණු උදවියට තවම පත්වීම් ලබා දීලා නැහැ. පළාත් මට්ටමින් එවැනි අක්‍රමිකතා රැසක් මැද අපේ රටේ රැකියා විරහිත උපාධිධාරීන් ඉතාම බරපතළ ලෙස අසරණභාවයට පත් වෙලා තිබෙන මොහොතක ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මම අහන්න කැමැතියි, 35,000ත්, 40,000ත් අතර සිටින රැකියා විරහිත උපාධිධාරීන් වෙනුවෙන් ඔබතුමිය ඉටු කරන යුතුකම මොකක්ද කියලා. පොරොන්දු වුණු ආකාරයට මේ සියලුදෙනාට රැකී රක්ෂා ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවාද, නැද්ද කියන එක ගැන අපිව දැනුවත් කරන්න කියලා මම මේ අවස්ථාවේදී ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු අගමැතිතුමියනි, ඔබතුමියගේ කථාවේදී විශ්වවිද්‍යාල ආචාර්යවරු දකුණේ සිට කොළඹ දක්වා ආපු පා ගමන ගැන මතක් කළා. නමුත්, අද විශ්වවිද්‍යාල ආචාර්යවරු මොකක්ද කියන්නේ? විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ශාස්ත්‍රීය දීමනාව - Academic Allowance එක - සම්පූර්ණයෙන්ම පහත හෙළා තිබෙනවා. ඒ වාගේම, පර්යේෂණ දීමනාව - Research Allowance එක - සම්පූර්ණයෙන්ම පහත හෙළා තිබෙනවා. ඒ වාගේම, විශ්වවිද්‍යාල අනධ්‍යයන නිලධාරීන්ගේ MC Allowance එක, ඒ මාසික දීමනාව අහිමි කර තිබෙනවා. ඔබතුමියත් විශ්වවිද්‍යාල ආචාර්යතුමියක්; කීර්තිමත් ආචාර්යතුමියක්. වැඩිදුර යන්නට ඕනෑ නැහැ; ඔබතුමියගේ ඒ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ සිටින මේ කථිකාචාර්ය, ආචාර්ය, මහාචාර්යවරුන්ගෙන් අහන්න, ශාස්ත්‍රීය දීමනාව - Academic Allowance එක-, පර්යේෂණ දීමනාව - Research Allowance එක - කප්පාදු වෙලා තිබෙනවාද, නැද්ද කියන කාරණාව. එය බරපතළ ලෙස පහත දමා තිබෙනවා. මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරලා මේ සඳහා පියවර ගන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු සභාපතිතුමනි, මම නම් හිතුවේ නැහැ, මේ වාගේ මහා ජන වරමක් එක්ක බිහි වුණු රජයක් දේශපාලන පළිගැනීම්වලට යොමු වෙයි කියලා. බොහොම කනගාටුවෙන් මේ කාරණයත් මම කියන්නට ඕනෑ. බලන්න, දෙහිඅත්තකණ්ඩියේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ටී.එස්.ඩී. පීරිස් මහත්මයාට මොකක්ද සිද්ධ කර තිබෙන්නේ කියලා. ඒ අධ්‍යාපන කලාප බලප්‍රදේශයේ බොහොම නිර්පාක්ෂිකව, බොහොම ශක්තිමත්ව කරගෙන ආපු ඒ වැඩසටහන් කිහිපදෙනෙක් එකතුවෙලා ප්‍රතික්ෂේප කිරීම තුළ ඔහුගෙන් දේශපාලන පළිගැනීම් කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රජරට විශ්වවිද්‍යාලයේ කුලපති ධුරය දැරූ ගෞරවනීය ඊතලවැටුණුවැවේ ඥාණතිලක නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ එම ධුරය අහිමි කළේ ඇයි? අපි උන්වහන්සේට කියන්නේ රුවන්වැලි මහා සෑයේ ලොකු හාමුදුරුවෝ කියායි. උන්වහන්සේගේ එම ධුරය අහිමි කළේ ඇයි?

උන්වහන්සේ රජරට විශ්වවිද්‍යාලයට විශාල සේවාවක් ඉෂ්ට කරපු ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක්. රුහුණ, රජරට, නැඟෙනහිර සහ අග්නිදිග විශ්වවිද්‍යාලවල උපකුලපති පත් කිරීම් ක්‍රියාවලිය සිදු කර තිබෙන්නේ කොහොමද? කනගාටුවෙන් වුණත් මම කියන්නට ඕනෑ, එය සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණයට ලක් වුණු වැඩ පිළිවෙළක් බව. රුහුණ විශ්වවිද්‍යාලය ගත්තොත්, ඊයේ පෙරේදා එම විශ්වවිද්‍යාලයට නව උපකුලපති කෙනෙක් පත් කරලා තිබෙනවා. තනතුරට ඉල්ලුම්පත්‍ර කැඳවුවායින් පසුව ඒ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසුරුවා තිබෙනවා. ඊට පසු තමන් විසින්ම පත් කළ නව පාලක සභාව විසින් පළමුවැන්නා හැටියට සුදුසුකම් ලබපු මහාචාර්ය සමන්ත කුමාර නොසලකා හැර දෙවැනියාට උපකුලපති ධුරය ලබා දීලා තිබෙනවා. මෙය සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණයට ලක් වෙලා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත් ප්‍රශ්නසහගත ආකාරයට හැසිරෙනවා. විශ්වවිද්‍යාලයේ පාලක සභා තීන්දුවලට බලපෑම් කරන්නට කිසිම නෛතික බලයකුත් නැහැ, ඒක සදාචාරයටත් පටහැනියි. වැරදි පූර්වාදර්ශ දෙන්නට එපා. විශේෂයෙන්ම, රජරට විශ්වවිද්‍යාලයේ කටයුතු කරපු ආකාරයත් වැරදියි. අග්නිදිග සහ නැඟෙනහිර විශ්වවිද්‍යාලවලත් මේ උපකුලපති පත් කිරීමේ ක්‍රියාවලියේදී දේශපාලනය ගාවාගෙන කටයුතු කිරීම සම්පූර්ණයෙන්ම වැරදියි.

සාධාරණව මම කියන්නට ඕනෑ, ඔබතුමන්ලා system change එක ගැන කෙසේ කථා කළත්, මේ ක්‍රියාවලිය පරණ system එකටම තමයි යන්නේ කියන එක. හිටපු ආණ්ඩුත් ඔහොමයි කළේ. ඒ නිසා මේ උපකුලපතිවරුන්, කුලපතිවරුන් පත් කිරීමේ ක්‍රියාවලිය කුසලතාව, නිපුණතාව, එහෙම නැත්නම් meritocratic system එකකට, merit-based system එකකට ක්‍රියාත්මක කරන්නය කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කරන්නට කැමැතියි.

ඊළඟට මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, අපේ රටේ අධ්‍යාපනය නවීකරණභාවයට ලක් කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳව කියන්න. මම කියන්නේ නැහැ, පිට රට systems ගෙනැල්ලා මෙහේ ක්‍රියාත්මක කරන්නය කියලා. නමුත්, පාඩම් රැසක් තිබෙනවා, අපට ඉගෙන ගන්නට. ඉන්ධනය ශ්‍රේණිගත කිරීම්වලින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළින්ම සිටිනවා. සමානාත්මතාව, විශ්වාසය, ගුරුවරුන් ආශ්‍රිත ගුණාත්මකභාවය හා ස්වායත්තත්වය, සමබර ප්‍රවේශය - equity and trust, teacher quality and autonomy, balanced approach - කියන ගුණාංග නිසා තමයි ඉන්ධනය ඉදිරියට ඇවිත් තිබෙන්නේ. ඊළඟට, සිංගප්පූරුව ශක්තිමත් විෂය මාලාව - rigorous curriculum, වෘත්තීය සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම - investment in professional development, ශක්තිමත් රාජ්‍ය සහයෝගය - strong governmental support - තුළින් ඉදිරියට ඇවිත් තිබෙනවා. දකුණු කොරියාව උසස් අධ්‍යයන ප්‍රමිතිය - very high academic standards, අධ්‍යාපනයේ සංස්කෘතික වටිනාකම - putting on a big value on cultural education -, අඛණ්ඩ වැඩිදියුණු කිරීම - continuous improvement - තුළින් ඉදිරියට ඇවිත් තිබෙනවා. ඒ වාගේම ජපානය අඛණ්ඩතාව, අනුකූලතාව සහ ශික්ෂණය - consistency and discipline, හරි විෂයයන් හෙවත් මූලික විෂයයන් ආශ්‍රිතව ස්ථිර හා ශක්තිමත් පදනම් - solid foundation in core subjects, සමස්ත හෙවත් සාඵල්‍ය සංවර්ධනය - holistic development - තුළින් ඉදිරියට ඇවිත් තිබෙනවා. කැනඩාව අන්තර්ග්‍රාහිත්වය සහ සාධාරණත්වය - inclusivity and equity, දේශීය ස්වාධිපත්‍යය සහ නවෝත්පාදනය - local autonomy and innovation, ජාත්‍යන්තර කාර්ය සාධනය - international performance - තුළින් ඉදිරියට ඇවිත් තිබෙනවා. එස්ටෝනියාව තාක්ෂණයේ නවෝත්පාදනීයභාවය - innovative use of technology, නවීන විෂය මාලාව - modern curriculum, ශක්තිමත් ප්‍රතිඵල - strong results - තුළින් ඉදිරියට ඇවිත් තිබෙනවා. මම එස්ටෝනියාව, කැනඩාව, ජපානය, දකුණු කොරියාව, සිංගප්පූරුව, ඉන්ධනය වැනි රටවලින් මේ උදාහරණ එළිදැක්වූවේ ඒ රටවල තිබෙන systems ගෙනැල්ලා මෙහේ තබන්න නොවෙයි. නමුත්, ඇත්ත වශයෙන්ම ඒ රටවල අධ්‍යාපන ක්‍රමවේදය හොඳින් හැදෑරීම තුළ අපට උගත් පාඩම් ඉගෙන ගන්නට පුළුවන්.

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න. ඔබතුමන්ලා වසර 76ක ශාපය ගැන නිතර මතක් කරමින් තමයි බලයට පැමිණියේ. අවුරුදු 76ක් තිස්සේ අපේ රටේ ක්‍රියාත්මක වුණේ මහා කොඩිවිනයක් කියලා කිව්වා; මොනවත්ම රටට සිද්ධ වෙලා නැහැ කිව්වා. මම කැමැතියි, මේ වසර 76 තුළ අපි අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් ලබා තිබෙන ප්‍රගතිය සම්බන්ධයෙන් කරුණු 11ක් ඉදිරිපත් කර පෙන්වන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sajith Premadasa, you have two more minutes.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
It is okay, Sir, I can have a bit more time. There is no issue.

අපි බලමු, අපේ රටේ සාක්ෂරතාව ගැන. 2022 අවුරුද්ද වෙනකොට අපේ රටේ සාක්ෂරතාව සියයට 92.49ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ප්‍රාථමික පාසල් තුළ ගුරු-සිසු අනුපාතය ඉතාම ඉහළ ලෙස වර්ධනය වෙලා තිබෙනවා. සාධනීය ප්‍රාථමික ගුරු-සිසු අනුපාතයක් අපේ රට ලබා තිබෙනවා. එය 2022 අවුරුද්දේදී සියයට 16.8 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කරන ප්‍රතිශතය 1976දී 42යි. 2022 වෙනකොට එය සියයට 96යි. ප්‍රාථමික අධ්‍යාපනය තුළ පුහුණු ගුරුවරුන්ගේ ප්‍රමාණය 2010දී සියයට 82යි. 2022 වෙනකොට එය සියයට 87යි. තෘතීයික අධ්‍යාපනය සඳහා යොමුවීම - tertiary school enrolment - 2015 වසරේ සියයට 18.7යි. 2022 වෙනකොට එය සියයට 22 දක්වා ඉහළ ගිහින් තිබෙනවා.

රජයේ පාසල් සංඛ්‍යාවේ වර්ධනය ගත්තොත්, 1950දී තිබුණේ 3,188යි. අද වන විට අපේ රටේ පාසල් 10,096ක් තිබෙනවා. ගුරුවරු සංඛ්‍යාව 1950දී සිටියේ 38,000යි. මේ මොහොත වන විට 250,000කට ආසන්න ගුරුවරුන් සංඛ්‍යාවක් ඉන්නවා. 1948දී

නිදහස ලබා ගන්නා විට University of Ceylon නමින් එක් විශ්වවිද්‍යාලයක් තිබුණා. අද වන විට විශ්වවිද්‍යාල 17ක් තිබෙනවා. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය 2,808 සිට 7,807 දක්වා වැඩි වෙලා තිබෙනවා. උපාධිධාරීන් බිහි කිරීම ගත්තොත්, 1995දී 4,206යි; 2022දී 30,329 දක්වා වැඩි වෙලා තිබෙනවා. රජයේ විශ්වවිද්‍යාලවලින් වසරක් තුළදී බිහි වන පශ්චාත් උපාධිධාරීන් සංඛ්‍යාව, 1995දී 1,048යි; 2022දී 10,348යි. මෙන්න, 76 වසරක් තුළ ශාපයක් හැටියට හඳුන්වා තිබෙන ඒ මාතෘකාව සම්පූර්ණයෙන්ම නිෂේධ වන සංඛ්‍යාලේඛන. අධ්‍යාපන ක්ෂේත්‍රයෙන්මයි අපි මේ කරුණු ඉදිරිපත් කරන්නේ.

අපි පැහැදිලිවම විශ්වාස කරනවා, අපේ රටේ අධ්‍යාපනයේ වෙනසක් සිද්ධ වෙන්නට ඕනෑ බව. දැනට තිබෙන ඇති හැකි නැති බැරි අධ්‍යාපන පරතරය ඉවත් වෙන්නට ඕනෑ. නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරන්නට ඕනෑ. අපි ඉගෙන ගනිමු. Indian Institute of Management - IIM - වාගේම Indian Institute of Technology - IIT- හරහා ඉන්දියාවේ නිර්මාණය වෙන දසලක්ෂ සංඛ්‍යාත උගත්, බුද්ධිමත් මැද පන්තිය කොච්චරද බලන්න. ඇමෙරිකාවේ සිලිකන් නිම්නය ගත්තාම වැඩිම ප්‍රමාණයක් මෘදුකාංග ඉංජිනේරුවන් ඉන්නේ මොන රටෙන්ද? අපි දන්නා ආකාරයට ඉන්දියාවෙන්. අපිත් බිහි කරමු අපේ රටේ මෘදුකාංග ඉංජිනේරුවන් බිහි කරන ආයතන. මහා උගතුන්ගේ, බුද්ධිමතුන්ගේ නිම්න ගණනාවක් අපට බිහි කරන්නට පුළුවන්. අපි පළමුව ඒවා පළාත් නවයේ බිහි කරමු. ඊළඟට, දිස්ත්‍රික්ක විසිපහේ ආරම්භ කරමු. ඊළඟට අපි ප්‍රාදේශීය ලේකම්, උපලේකම් බලප්‍රදේශ 341ටම එය ගෙන යමු. මෙරට නිදහස් අධ්‍යාපනය සුරක්ෂා කරන්නට ගත යුතු සියලු ප්‍රගතිශීලී, සාධනීය පියවර ගන්නට රජය කටයුතු කරනකොට ඒ හොඳ පියවරවලට, ගුණාත්මකභාවයෙන් වැඩි, අගයක් එකතු කරන පියවරවලට සහයෝගය දීලා නිදහස් අධ්‍යාපනය සුරක්ෂා කරන්න අපි සූදානම්. බොහොම ස්තූතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 11 minutes.

[පූ.භා. 11.24]

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු සභාපතිතුමනි, අපේ රජයේ මූලික වගකීමක් වන, අපේ රටට ඉතා වැදගත් වන අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා අද දවසේ කථා කරන්නට ලැබීම මම භාග්‍යයක් ලෙස සලකනවා. අපි අපේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේ "ශිෂ්ට සම්පන්න පුරවැසියෙක් - දියුණු මානව සම්පතක්" කියන title එක යටතේ තමයි අධ්‍යාපනය කියන ප්‍රතිපත්තිය සකස් කළේ. ඒ වාගේම ඒක අපේ ප්‍රතිපත්තියේ ප්‍රධානම සහ කේන්ද්‍රීය කොටසක් කියලා මම මතක් කරන්න කැමැතියි.

ගරු අගමැතිතුමිය එතුමියගේ කථාව ආරම්භයේදී කව්වා, මේ දක්වා අධ්‍යාපනයට වෙන් කළ වැඩිම මුදල් ප්‍රමාණය වන රුපියල් බිලියන 619ක් අධ්‍යාපනය වෙනුවෙන් මෙවර වෙන් කර තිබෙනවා කියලා. ඒක අපි අපේක්ෂා කරන මට්ටමට යන ගමනේ පළමු පියවර. අධ්‍යාපනයේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක වර්ධනය ගැන අපි ගොඩක් කථා කරනවා. ගුණාත්මක වර්ධනය ගැන අද දවසේ මේ සභාවේ ගරු මන්ත්‍රීවරු බොහොමයක් කථා කරන නිසා මම හිතුවා ප්‍රමාණාත්මක වර්ධනය, නැත්නම් යටිතල පහසුකම් ගැන කථා කරන්න ඕනෑය කියලා. මොකද, ඒකත් අධ්‍යාපනය සම්බන්ධයෙන් වැදගත්ම දෙයක්. අධ්‍යාපනය ගැන කථා කරනකොට යටිතල පහසුකම් සංවර්ධනය කියන්නේ නිකම් බිල්ඩින් ටිකක් හදන එක හරි හුදෙක් විද්‍යාගාර ටිකක් හදන එක හරි නොවෙයි; සංඛ්‍යාත්මක වශයෙන් බිල්ඩින් ගොඩක් වැඩි වීම සහ ඉස්කෝල ගොඩක් වැඩි වීම කියන එකම නොවෙයි. ඊට වඩා එහා ගිය ආරක්ෂිත, ශාරීරික සහ මානසික සුවතාව සහිත අධ්‍යාපනයක් ලැබීමට ඇති අයිතියේ ප්‍රධාන කොටසක් තමයි ගොඩනැඟිලි කියන්නේ.

ගොඩනැඟිලි කියන කාරණය කොටස් තුනකට වෙන් කරලා කථා කරන්න මම කැමැතියි. පළමුවෙනි එක තමයි, විද්‍යාලවල තිබෙන ප්‍රමිතියෙන් තොර ගොඩනැඟිලි. මා හිතන විධියට, එවැනි ගොඩනැඟිලි ලංකාවේ හැම තැනම තිබෙනවා. එවැනි බිල්ඩින් සෑහෙන්න තිබෙනවා; ලක්ෂ ගණනක් තිබෙනවා. ලක්ෂ 500, 600 වියදම් කරලා, තමන් දන්නා කියන කොන්ත්‍රාත්කරුවන්ට දීලා හදපු බිල්ඩින් එක අවුරුදු 5ක් විතර යන කොට condemn වෙලා කඩා වැටෙන තත්ත්වයට පත් වෙනවා. මා නියෝජනය කරන කඩුවෙල ආසනයේ පාසල් 10ක් විතර තිබෙනවා, එවැනි ගොඩනැඟිලි සහිත. බෝමිරිය ජාතික පාසල, තලාඳෙන සුබෝධි විද්‍යාලය, අතුරුගිරිය මහාමාත්‍ය විද්‍යාලය, වැලිවිට ශාන්ත මරියා විද්‍යාලය ඒවායෙන් කිහිපයක් පමණයි. ඒ වාගේ තවත් බොහෝ පාසල් තිබෙනවා, ප්‍රමිතියෙන් තොර ගොඩනැඟිලි හදපු.

දෙවැනි කාරණය තමයි, විද්‍යා සහ තාක්ෂණ පහසුකම්. විද්‍යා සහ තාක්ෂණ පහසුකම් ගැන කථා කරන කොට අපට හැම තිස්සේම අහන්න ලැබෙනවා smart පන්ති කාමර, සුහුරු පන්ති කාමර, smart boards කියන ඒවා ගැන. අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගත්තු වෙලාවේ ගරු ඇමතිතුමියට එහි තිබෙන අවුල ලිහා ගන්න, මෙච්චර ලොකුවට මේක අවුල් වෙලා කියලා තේරුම් ගන්න ටිකක් කල් ගියා. මොකද, තාක්ෂණයේ නාමයෙන් කරලා තිබෙන කොමිස් ගැහිලි සහ හොරකම් ටික අල්ලන්න කාලයක් ගත වෙනවා.

මම එක උදාහරණයක් කියන්නම්. 2024 පෙබරවාරි මාසයේදී පාසල් 1,000ක් සඳහා සුහුරු පුවරු - smart boards - 1,000ක් දෙන්න චීන රජය ලංකාවේ රජය සමඟ එකඟ වෙලා තිබුණා. රජය රුපියල් බිලියන 1.5ක් වියදම් කරලා ඒ smart boards ටික ගෙන්නුවා. ඒ smart boards ටික සවි කරන, smart classrooms හදන තාක්ෂණය දෙන්න තිබුණේ චීන රජයෙන්. නමුත්, ඒ තාක්ෂණය ලැබුණේ නැහැ. අද වන විටත් ඒ smart boards 1,000 පත්තලගෙදර ගබඩාවේ නිකම් දිරාපත් වෙනවා. අපි දැන් සාකච්ඡා කරගෙන යනවා, එවැනි නාස්තිකාර දේවල්, නාස්තියට ලක් වුණු සම්පත් නැවත හොඳ පරිදි ප්‍රයෝජනයට ගන්නේ කොහොමද කියලා.

ගොඩනැඟිලි සම්බන්ධව කථා කළ නිසා මම අවධාරණය කරන්න ඕනෑ, සනීපාරක්ෂක පහසුකම් ගැනත්. එය තමයි, තුන්වෙනි කාරණය. අපි දන්නවා, සමහර විද්‍යාලවල වැසිකිළි පහසුකම්, ජල පහසුකම් නැති බව. සමහර විද්‍යාලවලට වතුර බිල ගෙවා ගන්න බැහැ. ඒ වාගේම, ගැහැනු දරුවන්ගේ ආර්තව දරිද්‍රතාව පිළිබඳව අද අපි ගොඩක් කථා කරනවා. විශේෂයෙන් බොහෝ පාසල්වල දැරිවියන්ට සනීපාරක්ෂ තුවා බැහැර කරන ක්‍රමයක්වත් නැහැ. අපි ඒ වෙනුවෙන් විශේෂ වැඩසටහනක් දියත් කරලා තිබෙනවා. ඒ වාගේම දැරියන්ට නොමිලයේ සනීපාරක්ෂක තුවා ලබා දීම වෙනුවෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය මෙවර වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ඒවා බෙදා හැරීමේදී ප්‍රශ්න ගොඩක් තිබුණා. ඒවා ලබා දෙන ක්‍රමය විධිමත් කරලා, පාසල් හරහා ලබා දෙන ක්‍රමයක් හඳුන්වා දෙනවා.

[ගරු කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

ඊට අමතරව, පාසල් අතර විෂමතා අවම කිරීම සඳහා පාසල්වල අසම්පූර්ණ ගොඩනැඟිලිවල වැඩ සම්පූර්ණ කිරීම සහ අවදානම් ගොඩනැඟිලි නවීකරණය සඳහා අපි රුපියල් මිලියන 11,000ක් වෙන් කර තිබෙනවා. ඊටත් අමතරව, ආපදා අවම කිරීම සහ ආරක්ෂාව සඳහා රුපියල් මිලියන 400ක්, පළාත් සභා පාසල්වල යටිතල පහසුකම් සඳහා රුපියල් මිලියන 14,896ක්, විශේෂ අධ්‍යාපනය සඳහා වන සම්පත් මධ්‍යස්ථාන සඳහා, ජාතික සහ පළාත් මට්ටමින් රුපියල් මිලියන 33ක් වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඊට අමතරව ආබාධ සහිත සිසුන් සඳහා ගෘහ භාණ්ඩ සහ උපකරණ සඳහා රුපියල් මිලියන 18ක්, ගුරු විද්‍යාල සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ උපකරණ සහ පුහුණුව සඳහා රුපියල් මිලියන 1,850ක්, ජාතික පාසල් 396ක පවත්නා ජල අවශ්‍යතා සහ වැසිකිළි නවීකරණ කටයුතු සඳහා රුපියල් මිලියන 524ක් වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒ නිසායි මම කිව්වේ බිල්ඩින් කියන කාරණය අපි බරපතළ ලෙස ගන්නවා කියලා.

අපට තව කාරණයක් දැනගන්න ලැබුණා. කොරියානු රජයේ ආධාර යටතේ කුලියාපිටියේ ගොඩනංවා තිබෙනවා තාක්ෂණ විෂය උගන්වන ගුරුවරුන් පුහුණු කරන පීඨයක්. ඒක බිල්ඩින් ගොඩක් විතරයි. ඒ ආධාර යටතේ එය ඉතාම හොඳට හදලා තිබෙනවා. හැබැයි අද වනකල්ම ඒකට ගුරුවරුන් බඳවාගෙන නැහැ; ළමයින් බඳවාගෙනත් නැහැ. අද අපි එයට ශිෂ්‍යයින් 200ක් බඳවාගෙන තිබෙනවා. මේ වන විට එහි නේවාසිකාගාර පහසුකම් සම්බන්ධයෙනුත් අපි කටයුතු කරගෙන යනවා. ඉතා ඉක්මනින් එවැනි ඌන ප්‍රයෝජිත සම්පත් ප්‍රයෝජනයට අරගෙන පාසල් අතර තිබෙන විෂමතාව නැති කිරීමත්, තත්ත්වය උසස් කිරීමත් වෙනුවෙන් මේ රජය කැප වී වැඩ කරනවා. ඒ කථා කළේ පාසල් ගැන විතරයි.

මට ගොඩක් සමීප සහ මෙතැන ඉන්න අපේ මන්ත්‍රීවරුන් වැඩි පිරිසක් වැඩ කරපු විශ්වවිද්‍යාල ගෙන බැලුවොත් කියන්න වෙන්නේ, විශ්වවිද්‍යාලවල තත්ත්වය ඊට වඩා බරපතළයි; භයානකයි කියලායි. මහාචාර්ය නිරා වික්‍රමසිංහ කියනවා, "බොහෝ ආකාරවලින් විශ්වවිද්‍යාල භූමියේ පෙනුම විසින් දැනුම, ඉගෙනීම, සුන්දරත්වය සහ මානව වටිනාකම් කෙරෙහි ඒ කාලයේ සමාජය විසින් ලබා දෙන අවධානය පිළිබිඹු කරනවා" කියලා. ගරු සභාපතිතුමනි, විශ්වවිද්‍යාලයක බිල්ඩිමක් කියන්නේ නිකම්ම නිකම් බිල්ඩිමක් නොවෙයි. ඒ කියන්නේ, ඒ ඒ කාලයේ සමාජ වටිනාකම් සහ අපේ අගයන් - values - තීරණය කරන දර්ශකයක් විධියට තමයි විශ්වවිද්‍යාල පෙනී සිටින්නේ.

අපේ විශ්වවිද්‍යාල ගත්තොත්, ඒවායේ මුල ඉඳන් අගටම ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. මා හිතන විධියට, අපේ රටේ ප්‍රශ්න නැති විශ්වවිද්‍යාල සොයන්න බැහැ. මම උදාහරණ කිහිපයක් ඉතා ඉක්මනින් කියන්නම්, මට ඉතිරිව තිබෙන සීමිත කාලයත් එක්ක. අපි දන්නවා, කැලණිය විශ්වවිද්‍යාලයේ තට්ටු හතක බිල්ඩිමක් හදලා තිබෙන බව. ප්‍රමිතියෙන් තොරව භාගෙට හදලා තිබෙන නිසා ඒක ප්‍රයෝජනයට ගන්න බැරිව තිබෙනවා. ජ'පුර තාක්ෂණ පීඨයේ බිල්ඩිම හදලා අවුරුදු පහයි. දැන් ඒක ඉරි තළලා. කොළඹ විශ්වවිද්‍යාලයේ හෙද විද්‍යා පීඨය පටන් ගත්තු දවසේ ඉඳන් අත්හැර දමලා. මොකද, ඒක හදලා තිබෙන්නේ වගුරු බිමක. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය ආයතනය පාඨමාලා දෙකක් පටන්ගෙන තිබෙනවා. නමුත්, එහි දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨයේ විද්‍යාගාර නැහැ. ඒ නිසා ප්‍රායෝගික පරීක්ෂණ කරන්න විධියක් නැහැ. පළමුවැනි batch එක ළඟදී out වෙනවා. ඒගොල්ලන් කරන්න ඕනෑ රස්සාව මොකක්ද කියලාවත් සොයා බැලීමක් නැතිව තමයි ඒක පටන්ගෙන තිබෙන්නේ. වවුනියාව විශ්වවිද්‍යාලයේ ආපනශාලාවේ, කියවීම්ශාලාවේ තිබෙන්නේ ටකරන්. දේශගුණික වශයෙන් ඒ ප්‍රදේශයේ තිබෙන උණුසුමත් එක්ක ඒ ළමයි වැඩ කරන්නේ කොහොමද? කිලිනොච්චි මණ්ඩපයට අලි වැටක් ගහන්න කියලා ළමයි දැන් ඉල්ලීමක් කරනවා. මොකද, ඒකේ lecturer කෙනෙකු අලියෙක් ගහලා මැරුණා. ඒ වාගේම එහි වතුර නැහැ. ඌව විශ්වවිද්‍යාලයේ hostels නැහැ. පෞද්ගලික ආයතන 48ක් වෙත මුදල් ගෙවලායි නවාතැන් අරගෙන ඉන්නේ. මා ඒ සඳහන් කළේ අපේ රටේ විශ්වවිද්‍යාලවල තිබෙන ප්‍රශ්න කිහිපයක් ගැන පමණයි.

අනෙක් කාරණය ඉතාම වැදගත්. ඒ තමයි ප්‍රවේශය කියන කාරණය. වැඩිදුර යන්න ඕනෑ නැහැ, මා ඉගෙන ගත්තු සහ සේවය කළ කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උඩ තට්ටුවේ දේශනශාලාවලට යන්න සහ lecturersලා හමුවෙන්න යන්න ආබාධ සහිත දරුවෙකු ආවොත් - රෝද පුටුවකින් යන දරුවෙකු ආවොත් - උස්සාගෙන තමයි යන්න වෙන්නේ. කළමනාකරණ පීඨයේත් Administration Block එකට යන්න lift එකක් නැහැ. කලා පීඨය ගත්තොත්, අවම වශයෙන් නඩත්තු වන lift එකක් තිබෙනවා. ඒකත් අවුරුද්දේ වැඩි කාලයක් කැඩිලා. මම මේ කියන්නේ වැඩිදුර තිබෙන විශ්වවිද්‍යාලයක් ගැන නොවෙයි, කොළඹ විශ්වවිද්‍යාලය ගැනයි. අප සමාජයක් ලෙස ආබාධ සහිත සිසුන්ට ඉගෙනීම සඳහා ඇති ප්‍රවේශය පිළිබඳ අඩු අවධානයක් තමයි යොමු කරලා තිබෙන්නේ. මම මේ සඳහන් කළේ උදාහරණ කිහිපයක් පමණයි.

අපි මේ වන විට සමහර ව්‍යාපෘති පටන් ගෙන තිබෙනවා. ඒවායෙන් ඉදිකිරීම් තුනක් ගැන මම සඳහන් කරන්නම්. නැහෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨ ගොඩනැඟිලි සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් සහ සබරගමුව විශ්වවිද්‍යාලයේ හා මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ඉදිකිරීම වෙනුවෙන් අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිකිරීම් අතරමඟ නවතා ඇති නේවාසිකාගාර ගොඩනැඟිලි සම්පූර්ණ කිරීම වෙනුවෙන් අපි මෙවර විශේෂ අවධානයක් යොමු කරමින් මුදල් වෙන් කර තිබෙනවා. මම මේ කාරණය නැවත වතාවක් අවධාරණය කරන්න කැමැතියි. දේශනශාලා පර්යේෂණාගාර, පුස්තකාල, ආපනශාලා, අන්තර්ජාල පහසුකම් නියමිත ප්‍රමිතීන්ට අනුව සකස් කිරීම ගැන අපි අවධානය යොමු කරනවා.

ඒ වාගේම, අපි මෙවර අය වැයෙන් මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 10,000ක් දක්වා වැඩි කළා. ඒකත් සිසුන්ට යම් ආකාරයක පහසුවක් වෙයි. අපි හිතන්නේ නැහැ, ඒක ප්‍රමාණවත් කියලා. මීට වඩා හොඳ පහසුකම් සහිත විශ්වවිද්‍යාල ඇති කරන්න පුළුවන් නම් ඒක තමයි අපේ ඉලක්කය.

තවත් කාරණා දෙකක් සඳහන් කරලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි. ඉන් පළමු කාරණය මේකයි. ගරු විපක්ෂ නායකතුමා එතුමාගේ කථාවේදී කිව්වා, අවුරුදු 76ක් නිස්සේ අපේ රට ලබා ඇති ජයග්‍රහණ ගැන. මම සතුටු වෙනවා, එතුමා අධ්‍යාපනය ගැන විශේෂයෙන් කථා කරපු එක සම්බන්ධයෙන්. මොකද, අධ්‍යාපනය සහ සෞඛ්‍යය තමයි ලංකාවේ වාමාංශික ව්‍යාපාරය විසින් සටන් කරද්දී අත් නොහැර සටන් කරපු areas දෙක; කලාප දෙක. එහි ප්‍රතිඵලයක් ලෙස තරුණ ජීවිත පූජා කර තිබෙනවා. ඒ වාමාංශික ව්‍යාපාරවල සටනේ ප්‍රතිඵලයක් ලෙස තමයි අද නිදහස් අධ්‍යාපනය මේ තත්ත්වයෙන් පවත්වාගෙන යන්න සමත් වෙලා තිබෙන්නේ. නිදහස් අධ්‍යාපනය විකුණන්න හදපු හැම නව ලිබරල් ප්‍රතිසංස්කරණයකටම විරුද්ධ වෙමින් නිදහස් අධ්‍යාපනයේ ස්වාධීනත්වය වෙනුවෙන් සටන් කරපු ඉතිහාසයක් අපට තිබෙනවා.

ඒ නිසා මම ස්තුතිවන්ත වෙනවා, ඒ ඉතිහාසය ගැන එතුමා අවධාරණය කිරීම ගැන. මොකද, අපි දන්නවා, අද වෙනකොට විශ්වවිද්‍යාලවලට පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පුළුවන් තරම් සිසුන් බඳවා ගන්නා බව ලාභ උපයන්න. විශේෂයෙන්ම පශ්චාත් උපාධිවලට සිසුන් වැඩිපුර බඳවා ගැනීමට ආචාර්ය මණ්ඩල මත දැඩි පීඩනයක් පටවනවා, විශ්වවිද්‍යාල පරිපාලනය විසින්ම. මේ පීඩනය නිසාම විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලාවලට සිසුන් 200, 300, 400 යනාදි වශයෙන් බඳවා ගන්නවා. හැබැයි, අවශ්‍ය පහසුකම් නැහැ. ඒ නිසා ඒවායේ ගුණාත්මක තත්ත්වය බහිනවා. එහෙම වෙලා තිබෙන්නේ මොකද? ලාභය ඉපයීම අරමුණු කරගෙන තිබීම තුළ එල්ල වන බරපතළ පීඩනය නිසා එම උපාධි පාඨමාලාවල ගුණාත්මක තත්ත්වය අඩු වෙනවා. ඒ, එක කාරණයක්.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Member, your have exhausted your time.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(මාණ්පුමිකු (කලානිති) (සෙල්වි) කෞෂල්‍යා ආරියරත්න)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
I will wind up, Sir.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, අපේ ප්‍රතිපත්තිය ඉස්කෝල 10,000ට කෝටිපතියෝ 10,000ක් හොයන එක නම් නොවෙයි කියන එක. අපේ ප්‍රතිපත්තිය තුළ රජයට අත්හැරිය නොහැකි බරපතළ සහ රජය මූලික වගකීමක් දරන අංශයක් තමයි නිදහස් අධ්‍යාපනය. ඒ නිසා නිදහස් අධ්‍යාපනය අපි රාජ්‍ය වගකීමෙන් ගිලිහෙන්න දෙන්නේ නැහැ. එහිදී පෞද්ගලික අංශයට සහයෝගයෙන් වැඩ කරන්න පුළුවන්. ඒකේ ගැටලුවක් නැහැ. උදවු කරන්න පුළුවන්. ගරු විපක්ෂ නායකතුමාටත් පුළුවන්, කැමැති නම් පාසල්වලට බස් රථ ලබා දෙන කටයුත්ත නැවත පටන් ගන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපි රජයේ වගකීමෙන් එක බින්දුවක්වත් අත් නොහරින ඉතා වැදගත් කේන්ද්‍රීය කොටසක් තමයි අධ්‍යාපනය කියන එක. එය නැවත අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have seven minutes.

[மு.ப. 11.36]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ தவிசாளர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான பாதீட்டின்மீதான விவாதத்தில் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு தொடர்பான எனது கருத்துகளை இந்த மேலான அவையில் எடுத்துரைக்க விழைகின்றேன்.

இந்த நாட்டில் கல்வித்துறையை மேம்படுத்த வேண்டுமாயின் பாடத்திட்டம், கற்பித்தல் முறைமை, ஆசிரியர் பணிக்கு ஆட்சேர்ப்பு முதலியவற்றில் பாரிய மாற்றங்கள் செய்யப்பட வேண்டும். அத்தோடு, நிதி ஒதுக்கீடு, ஆளணி மற்றும் பௌதிக வளப் பற்றாக்குறைக்கும் தீர்வு காண வேண்டும். எமது நாட்டிலுள்ள பாடசாலைகளில் பெரும்பாலும் ஆசிரியர் மையக் கல்வியை ஒட்டியே கற்பிக்கப் படுகின்றது. மேற்கு நாடுகளில் Howard Gardner's Multiple Intelligences Theory and Differentiated Learning Theory, John Dewey's Inquiry-Based Learning Vygotsky's Collaborative Learning and Scaffolding Theory முதலிய கோட்பாடுகளைப் பின்பற்றிக் கற்பிக்கின்றார்கள். இதன்மூலம் மாணவர்கள் engage, explore, explain, elaborate, evaluate அடிப்படையில் ஆர்வத்தோடு கற்கிறார்கள். மேற்படி மாணவர் மையக் கற்பித்தல் முறைகளை நாமும் பின்பற்றுவதன்மூலம் நமது நாட்டின் கற்றல் திறனையும் கல்வித் தரத்தையும் அறிவையும் மேம்படுத்தலாம்.

நமது நாட்டில் உள்ள மாணவர்கள் பல்கலைக்கழகம் செல்ல வேண்டுமென்ற நோக்கத்தோடு கல்வியைக் கற்கின்றனர். இதன்பொருட்டு ஆண்டுதோறும் அண்ணளவாக 265,000 மாணவர்கள் க.பொ.த. உயர்தரத் தேர்வுக்குத் தோற்றுகின்றனர். இவர்களில் 165,000 மாணவர்கள் பல்கலைக்கழக அனுமதி பெறத் தகுதிபெறுகின்றனர். அதில் 40,000 மாணவர்களுக்கு மட்டுமே பல்கலைக்கழக அனுமதி கிடைக்கின்றது. மேலும், 10,000 மாணவர்களுக்குக் கல்வியற் கல்லூரி அனுமதி கிடைக்கின்றது. தேர்வில் வெற்றி பெறாத 100,000 மாணவர்களும் பல்கலைக்கழகத்திற்குத் தகுதி பெற்று அனுமதி கிடைக்காத 115,000 மாணவர்களும் என்ன செய்வதென்று தெரியாமல் தடுமாறி நிற்கின்றனர். இவர்களுக்கு வழிகாட்ட வேண்டிய பொறுப்பு அரசுக்கும் சமூகத்திற்கும் உண்டு.

எமக்கு அண்மையில் உள்ள இந்தியா உட்பட உலகிலுள்ள பல்வேறு நாடுகள் தத்தம் நாட்டிலுள்ள அத்தகைய மாணவர்களுக்காக Polytechnic எனும் தொழில்நுட்பக் கல்லூரிகளை நடத்துகின்றன. இக்கல்லூரிகளில் நூற்றுக் கணக்கான மூன்றாண்டுப் பட்டயப் பயிற்சி நெறிகள் கற்பிக்கப்படுகின்றன. பல்கலைக்கழக அனுமதி கிடைக்காத மாணவர்கள் இவற்றில் சேர்ந்து கல்வி கற்று எளிதாக வேலை வாய்ப்பைப் பெற்றுக்கொள்ளக்கூடியதாக உள்ளது. அத்தகைய பயிற்சிநெறிகளை நமது நாட்டிலும் தொடங்க வேண்டும்.

நமது நாட்டின் கல்வி முறையானது, தொழிற் சந்தையோடு இணைந்ததாக இல்லை. அதாவது, தொழிற் சந்தையில் வேலையொன்றைப் பெற்றுக்கொள்வதற்குரிய qualification, skills and experience அவர்களிடம் இல்லை. இதனால் பட்டதாரிகள் தொழிற் சந்தையில் வேலையைப் பெற்றுக் கொள்ள முடியாமல் உள்ளனர். எனவே, நம் நாட்டுப் பாடத்திட்டங்களைத் தொழிற் சந்தைத் தேவைகளோடு இணைந்ததாக மாற்றியமைக்க வேண்டும். மேற்கு நாடுகளில் உள்ள பல்கலைக்கழகங்கள் தமது மாணவர்கள் உலகத் தொழிற் சந்தையில் போட்டிபோட்டு வேலையைப் பெற்றுக்கொள்ளும் விதத்தில் ஆயிரக்கணக்கான பட்டப் படிப்புகளை நடத்துகின்றன. எடுத்துக்காட்டாக, Toronto பல்கலைக்கழகம் 948 பட்டப்படிப்புகளை நடத்துவதைக் குறிப்பிடலாம். இதுபோல நமது நாட்டிலுள்ள பல்கலைக் கழகங்களும் வேலை வாய்ப்புகளைப் பெறக்கூடிய பட்டப் படிப்புகளை நடத்த ஆவன செய்ய வேண்டும். இதன்பொருட்டு தொழிற்பயிற்சி, ஆய்வு நிதி மற்றும் STEM - அறிவியல், தொழில்நுட்பம், பொறியியல் மற்றும் கணிதம் - திறன் மேம்பாட்டுத் திட்டங்களை உள்ளடக்கிய நன்கு வரையறுக்கப்பட்ட உயர் கல்விச் சீர்திருத்த உத்தியை அரசு அறிமுகப்படுத்த வேண்டும்.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

இந்த அரசால் முன்வைக்கப்பட்டுள்ள பாதீட்டில் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சுக்கு 206 பில்லியன் ரூபாய் மீண்டெழும் செலவுக்காகவும் 65 பில்லியன் ரூபாய் மூலதனச் செலவுக்காகவும் மொத்தமாக 271 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இது கடந்த ஆண்டைவிட 11 பில்லியன் ரூபாய் கூடுதலானது ஆகும். இந்த அதிகரிப்பு கல்வித் துறையைப் பொறுத்தவரை போதுமானது அல்ல. மொத்தப் பாதீட்டில் கல்விக்கான ஒதுக்கீடு 6.4 சதவீதமாக உள்ளது. இது குறைந்தது 10 சதவீதமாகவாவது உயர்த்தப்பட வேண்டும்.

ஆசிரியர் அபிவிருத்திக்கு இந்த ஆண்டில் 6.13 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இது கடந்த ஆண்டைவிட 2.08 பில்லியன் ரூபாய் அதிகமாகும். இது பாராட்டப்பட வேண்டிய விடயமாகும். எனினும், தொடக்கப் பள்ளிகளின் வசதியை மேம்படுத்த கடந்த ஆண்டு 302 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. இந்த ஆண்டில் இது 10 மில்லியன் ரூபாயாகக் குறைக்கப்பட்டுள்ளது. இது கவலை தரும் செய்தியாகும்.

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்கள் உள்ளிட்ட நாட்டிலுள்ள பெரும்பாலான பல்கலைக்கழகங்கள் மோசமான உட்கட்டமைப்பு மற்றும் வரையறுக்கப்பட்ட ஆய்வு நிதியால் பாதிக்கப்பட்டுள்ளன. அறிவு சார்ந்த பொருளாதாரமாக இலங்கை மாறுவதை நோக்கமாகக்கொண்டால், இந்தப் பல்கலைக்கழகங்கள் நவீன வசதிகள், ஆய்வு நிதி மற்றும் வினைத்திறனான ஆசிரியர் குழாத்தைக் கொண்டதாக இருக்க வேண்டும். உயர் கல்வி மற்றும் தொழில்நுட்ப கல்வித் தரத்தை மேம்படுத்தும் பொருட்டு உட்கட்டமைப்பு மேம்பாடு, ஆராய்ச்சி மானியங்கள் மற்றும் தொழிற்துறை ஒத்துழைப்பு முதலியவற்றுக்கான ஒதுக்கீடுகளுக்கு அரசு முன்னுரிமை யளிக்க வேண்டும்.

இப்பொழுதுள்ள முறையில் ஆசிரியர் வளப்பங்கீடு சரியான முறையில் அமையவில்லை. ஆசிரியர் நிமயனத்தின் பொழுது பெரும்பாலான ஆசிரியர்கள், பின்தங்கிய இடங் களுக்கு நியமனங்களைப் பெற்று வருகின்றனர். அவ்வாறு வந்து சில காலங்களில் தத்தமது மாவட்டங்களுக்கு இடமாற்றம் பெற்றுச் சென்று விடுகின்றனர். கல்வியற் கல்லூரிக்கு அனுமதி வழங்கும்பொழுது பிரதேச செயலாளர் மட்டத்திலுள்ள வெற்றிடங்களுக்கு அந்தந்தப் பிரதேச செயலாளர் பிரிவுகளில் இருந்து பயிலுநர்களைத் தெரிவு செய்தால் இந்தச் சிக்கலைத் தீர்க்கலாம்.

பொது நிர்வாக அமைச்சு கிராம அலுவலர்களை நியமிக்கும்பொழுது பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள வெற்றிடங்களுக்கு அந்தந்தப் பிரதேச செயலாளர் பிரிவுகளில் உள்ளவர்களையே நியமிக்கின்றது. இதே முறையை கல்வி அமைச்சும் பின்பற்றினால் ஆசிரியர் பற்றாக்குறைக்குத் தீர்வு காணலாம். இது குறித்து ஒரு கொள்கை முடிவை அரசு விரைவில் எடுத்துச் செயற்படுத்த வேண்டும்.

திருகோணமலை மாவட்டத்தில் தொடக்கக் கல்வியில் 278 ஆசிரியர் பற்றாக்குறையும், இடைநிலைக் கல்வியில் 991 ஆசிரியர் பற்றாக்குறையும், உயர்நிலைக் கல்வியில் 606 ஆசிரியர் பற்றாக்குறையுமாக மொத்தம் 1,875 ஆசிரியர் பற்றாக்குறை காணப்படுகின்றது. இவ்வாறு ஆசிரியர் பற்றாக்குறையோடு பாடசாலைகளை நடத்துவது வருங்கால சமூதாயத்துக்கு எதிராக நாம் மேற்கொள்ளும் ஒரு குற்றச் செயலாகும். தொடர்ந்தும் இவ்வாறான வெற்றிடங்களை விட்டுக் வைக்காமல் அவற்றை நிரப்ப ஆவன செய்ய வேண்டும். திருகோணமலை மாவட்டத்தில் 195 பாடசாலைகள் அதிபர் இல்லாமல் இயங்குகின்றன. இது மட்டுமல்லாமல், 73 கல்வி நிருவாக சேவை அதிகாரிகள் இல்லாமல் அலுவலகங்கள் இயங்குகின்றன.

திருகோணமலை மாவட்டத்தில் 78 கல்விசாரா ஊழியர்களுக்கான வெற்றிடங்கள் காணப்படுகின்றன. இதில் 73 வெற்றிடங்கள் காவலாளிகளுக்கானதாகும். காவலாளிகள் இல்லாமல் பாடசாலை காணப்படும்போது களவுக்கு வழிவகுக்கும்.

திருகோணமலை மாவட்டத்தில் உடைந்து விழக்கூடிய நிலையில் 16 பாடசாலைகள் காணப்படுகின்றன. இவற்றைத் திருத்தியமைக்க 39 மில்லியன் ரூபாய் செலவு ஏற்படும். திருகோணமலை மாவட்டத்தில் 12 பாட சாலைகள் தொழில்நுட்ப ஆய்வுகூடமின்றி இயங்கு கின்றன. அதேபோல, வகுப்பறைகள் நவீன மயப்படுத்தப் பட வேண்டியுள்ள 19 பாடசாலைகள் காணப்படுகின்றன. 15 பாடசாலைகள் வெள்ளப் பேரிடர் ஆபத்தோடு காணப்படுகின்றன. அத்தோடு, யானைத் தாக்குதல் அபாயத்துக்கு உள்ளாகக் கூடியவாறு 33 பாடசாலைகள் காணப்படுகின்றன. இடர்களிலிருந்து பாடசாலைகளைப் பாதுகாப்பதுக்கு நிதி ஒதுக்கப்பட வேண்டும். இச்சிக்கல் களுக்குத் தீர்வு காண்பதன் மூலம் நாட்டினது கல்வித்துறை யினை வளர்ச்சிப் பாதையில் வினைத்திறனுடன் செயற்படுத்தலாம் என்று கூறி எனது உரையை நிறைவு செய்கின்றேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Rohitha Abeygunawardhana. You have 17 minutes.

[ප.භා. 11.43]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු සභාපතිතුමනි, අද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, මම තවත් සතුටු වෙනවා මේ විෂයභාර අමාත්‍යතුමිය වන ගරු අග්‍රාමාත්‍යතුමිය මේ මොහොතේ ගරු සභා ගැබේ හිටියා නම්. මම එහෙම කියන්නේ මේ නිසායි. අද තමයි 2025 වර්ෂය සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක්, නව වැඩ පිළිවෙළක් ගැන කථා කරන අවස්ථාව. අපි ඇහුම්කන් දුන්නා එතුමියගේ කථාවට. ඒකෙන් හොඳ යෝජනා, හොඳ අදහස් ඉදිරිපත් වුණා. නමුත්, එතුමිය මේ විපක්ෂයේත්, ආණ්ඩුවේත් ඉන්න මැති ඇමතිවරුන්ගෙන් එන යෝජනා, හොඳ අදහස්, වැරදුණු තැන් ගැන යම් අදහසක් ලබා ගන්න මේ ගරු සභා ගැබේ හිටියා නම් සුදුසුයි කියලා මම මේ වෙලාවේ සඳහන් කරනවා. මම එතුමියට සුබ පතන්නත් ඕනෑ එතුමිය අපේ රටේ තුන්වන අගමැතිතුමිය හැටියට පත් වූ නිසා. අපේ අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා මේ සභාවේ ඉන්නවා. අපි මේ යෝජනා ටික එතුමාට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා, ගරු සභාපතිතුමනි.

අපි දන්නවා, අධ්‍යාපනය ලබන දරු පරපුර තමයි රටේ අනාගතය. අපේ රටේ දරු පරපුර,-

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කළ කරුණාව ගැනයි මම කියන්නේ. ගරු අගමැතිතුමිය මේ මොහොතේ කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාවක ඉන්නේ. ඒ නිසා එතුමියට මේ සභා ගැබේ සිටිය නොහැකියි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

හොඳයි, බොහොම ස්තුතියි.

අධ්‍යාපනය වෙනුවෙන් නව රජය 2025 වර්ෂය සඳහා විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. මොකද, අධ්‍යාපනයට හොඳ අනාගතයක් කරා උරුම කර දීමට කටයුතු කිරීම නිසා. ගරු අගමැතිතුමිය පැහැදිලි කළා, කුලුනු හයක් යටතේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගොඩනඟනවා කියලා. ගුරු පුහුණුව, අනෙකුත් ක්ෂේත්‍ර, භෞතික සම්පත් කියන මේ සියල්ල එකට අරගෙන අධ්‍යාපනය දියුණු කරන්න කටයුතු කරන්නේ කොහොමද කියලා එතුමිය පැහැදිලි කළා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අපි මේ අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ ගැන කියද්දි ගරු අගමැතිතුමිය හිටියා නම් හොඳයි අපට පිළිතුරක් දෙන්න. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, එතුමිය නැති නිසා ඔබතුමාගේ කථාවේදී මේකට පිළිතුරක් දෙන්න. නියෝජ්‍ය අමාත්‍යවරු කිහිප දෙනෙක් ඉන්නවා. මම ප්‍රවෘත්තිවලදී දැක්කා එක නියෝජ්‍ය අමාත්‍යවරයෙක් කියනවා, "අපි අධ්‍යාපනයේ සැබෑ වෙනසක් කරනවා" කියලා. ඒ සැබෑ වෙනස තමයි මේ අධ්‍යාපන ක්‍රමයේ වෙනසක් ඇති කරන එක. මොකක්ද ක්‍රමය? ඒ ක්‍රමය තමයි, 9වන පන්තියේදී නව විභාගයක් හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙන එක. ඒක හොඳයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් කරනකොට, 9වන පන්තියේදී යම් විභාගයක් ගෙනෙනවා නම්, අපට අහන්න සිද්ධ වෙනවා ශිෂ්‍යත්ව විභාගයට මොකක්ද කරන්නේ කියලා. ශිෂ්‍යත්ව විභාගය ගැන දැන් යම් යම් කතිකා මතු වෙන නිසා, ශිෂ්‍යත්ව විභාගය අහෝසි වීමක් වෙනවාද? එහෙම නැත්නම්, සාමාන්‍ය පෙළ, උසස් පෙළ විභාග සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග මොනවාද කියන එක ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ලාගේ කථාවලින් අපට පැහැදිලි කරලා දෙන්න. ඒක සුබවාදී එකක් නම්, ඒ ගැන අධ්‍යයනය කරලා අපට කියන්න පුළුවන්, ඒක බොහොම සුබවාදී වැඩක් කියලා. හැබැයි, ඒක අසුබවාදී වැඩක් නම් අපට කියන්න වෙනවා, මේක අසුබවාදී වැඩක් කියලා.

ගරු සභාපතිතුමනි, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා මම නියෝජනය කරන දිස්ත්‍රික්කය වන කළුතර දිස්ත්‍රික්කයේ කෙනෙක්. ඔබතුමාත් දන්නවා, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා තමයි නිදහස් අධ්‍යාපනය මේ රටට හඳුන්වා දුන්නේ කියලා. අපි එතුමා නිදහස් අධ්‍යාපනයේ පියා වශයෙන් හඳුන්වනවා. එතුමා නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් මේ රටේ යුග මෙහෙවරක් කළ නායකයෙක්. ගරු සභාපතිතුමනි, මේවා අපි අත්දැකීම් වශයෙන් ගත යුතු දේවල්. නිදහස් අධ්‍යාපනය රටට හඳුන්වා දුන් සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ඒ වගකීම ඉටු කරලා, කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ආසනයෙන් ඊළඟ ඡන්දයට ඉදිරිපත් වුණා. නමුත් එතුමාට - නිදහස් අධ්‍යාපනයේ පියාට - මතුගම ආසනයේ ජනතාව සැලකුවේ කොහොමද? ඒ කාලයේ තිබුණේ දිස්ත්‍රික් මැතිවරණයක් නොවෙයි, ආසන මැතිවරණයක්. මතුගම ආසනයේ ජනතාව එදා ඒ ඡන්දයේදී සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාව - නිදහස් අධ්‍යාපනයේ පියා - ගෙදර යැව්වා. මේවා හොඳ පාඩම්. මේවා ගැන අපි හොඳින් වටහා ගන්න ඕනෑ.

මම මේවා ගැන කියන්න හේතුවක් තිබෙනවා. විශේෂයෙන්ම තමුන්නාන්සේලාගේ නව රජය තුළ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනකොට, තමුන්නාන්සේලාට ඒ ගැන වගකීමකින් කටයුතු කරන්න වෙනවා. මම එහෙම කියන්නේ ඇයි? "මේ විශ්වය පවතිනකම් අපි ආණ්ඩු කරනවා" කියලා ඔබේ ආණ්ඩුවේ සමහර අය හිතාගෙන ඉන්නවා නම්; "මේ විශ්වය තිබෙනකම් අපි තමයි ආණ්ඩු කරන්නේ" කියලා ඒ අය හිතාගෙන ඉන්නවා නම්, ඒක වැරදියි. ඇයි, මම එහෙම කියන්නේ? මොකද, වෙන්නේ මොකක්ද කියලා අපි දන්නේ නැහැ. අපේ ජීවිත වාගේ තමයි ආණ්ඩුත්. අපි ඉපදුණු දවස දන්නවා. නමුත් ඉපදී තිබෙනවාද, මිය යන දිනය කියන්න පුළුවන් කෙනෙක්? එහෙම කෙනෙක් නවම ඉපදිලා නැහැ. ජීවිතයත් හරියට තණ අග පිනි බින්දුව වාගේයි. අපි කොයි වෙලාවේ මැරෙයිද දන්නේ නැහැ. එහෙම නේද, ගරු සභාපතිතුමනි? ඒ නිසා අපි පරිස්සමින් ඉන්න ඕනෑ නේ. මේ ජීවිතය තුළ අපි ඉපදුණු දවස දන්නවා. නමුත් මැරෙන්නේ කොයි වෙලාවේද කියලා අපි දන්නේ නැහැ. සමහර අය ආයුෂ වැඩියෙන් ලබනවා. තව සමහරු නොයෙක් හේතු නිසා මිය යනවා. ආණ්ඩුත් ඒ වාගේයි. ආණ්ඩුත් කොයි වෙලාවේ බිඳ වැටෙයිද කියලා කියන්න බැහැ. මම මේ ගැන කිව්වේ අපි මේවා ගැන අවධානය යොමු කළ යුතු නිසායි.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වන ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් පසුගිය 08වැනි දා මම වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්නයක් ඇසුවා. එදා ඒකට පිළිතුරු දෙන්න අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා සති 2ක් කල් ඉල්ලුවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පුළුවන් නම් ඔබතුමා එදාට ඒ පිළිතුර ලබා දෙන්න. නමුත්, ඊට ඉස්සෙල්ලා මෙන්න මේ පැහැදිලි කිරීම කරලා දෙන්න.

පසුගිය රජය තීන්දුවක් ගත්තා, මේ රටේ පළාත් නවයෙහි තිබෙන පළාත් සභා පාසල් - පළාත් සභාව විසින් පෝෂණය කරලා ඉතා හොඳ තත්ත්වයට ගෙනාපු පාසල් - ජාතික පාසල් බවට පරිවර්තනය කරන්න. එවැනි පාසල් 1,000ක් ජාතික පාසල් බවට පරිවර්තනය කරන්න තීන්දුවක් ගත්තා. ඉතිහාසයේ පාසල් 48කින් තමයි මධ්‍ය මහා විද්‍යාල පටන් ගත්තේ කියලා අපි දන්නවා. ඒ මධ්‍ය මහා විද්‍යාල තමයි ජාතික පාසල් බවට පත් වුණේ. මම පැහැදිලිව කියන්න ඕනෑ, මම ඒ රජයේ හිටියත්, ඒ ගත් තීන්දුව කෙරෙහි මට ලොකු ප්‍රසාදයක් නැහැ කියන එක. එකවර පාසල් 1,000ක් ජාතික පාසල් බවට පත් කරන්න එදා තීන්දුවක් ගත්තා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ වෙලාවේ "ජාතික පාසල" කියන නාම පුවරුව ගහන්න, තීන්ත ටිකක් ගාන්න රුපියල් ලක්ෂ 10ක් දුන්නා. දෙවනුව, අන්තර්ජාල පහසුකම්වලට තව රුපියල් ලක්ෂ 10ක් දුන්නා. එතකොට රුපියල් ලක්ෂ 20ක් තමයි ඒ පාසල්වලට ලබා දීලා තිබෙන්නේ. ඒ පාසල්වල "ජාතික පාසල" කියලා බෝඩ් එක ගහලා තිබෙනවා; ජාතික පාසලක් කියලා නම ගසා තිබෙනවා. ඒ පාසල්වලට දරුවන් යනකොට අම්මයි, තාත්තයි ආඩම්බරයෙන් කියනවා, "අපේ පුතා දැන් යන්නේ, ජාතික පාසලට. අපේ දුව දැන් යන්නේ, ජාතික පාසලට" කියලා. ඒක පේන්න තිබෙනවා, බෝඩ් එකේ. හැබැයි, දැන් කලාප කාර්යාලවලින් ලියුම් යවා තිබෙනවා, ජාතික පාසල් කියන නම භාවිත කරන්න එපා කියලා. ජාතික පාසල් එපා කියනකොට, තෝරා ගත් කොටසකුත් තිබෙනවා. ඒ නිසා, ජාතික පාසල් කියන නම ඉවත් වුණේ කොහොමද, අනික් ඒවා තෝරා ගත් නිර්ණායකය මොකක්ද කියන එක මට පැහැදිලි කරලා දෙන්න. මම ඒකයි මුලින්ම කිව්වේ, මේ ගත් තීන්දුව ගැන මගේ ප්‍රසාදයක් නැහැ කියලා. පළාත් සභාවලින් පෝෂණය කළ, ළමයින් 3,000ක්, 4,000ක් ඉන්න හොඳ පාසල්, ඒවා. හැබැයි ඒ පාසල්වලට අද අම්මා, තාත්තා නැහැ. අම්මා, තාත්තා කොහේද? ජාතික පාසලක් නම්, ඒ ජාතික පාසල තමයි අම්මා, තාත්තා. පළාත් සභාවට නම් අයිතිය තිබෙන්නේ, එහි අම්මා, තාත්තා

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

පළාත් සභාව කියලා කියන්න පුළුවන්. දැන් පළාත් සභාවත් කියනවා, "ඔබේ අම්මා තාත්තා මම නොවෙයි" කියලා. ජාතික පාසලෙනුත් කියනවා, "ඔබේ අම්මා තාත්තා මම නොවෙයි" කියලා. ඉතින්, මේ පාසල් වැටෙන්න දෙන්න එපා. මේ පාසල්වලට හරි නිර්ණායකයක් ක්‍රියාත්මක කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමියත් ප්‍රකාශ කරපු ආකාරයට, මේ රජය පත් කරන්න සියයට 90ක් පමණ මේ රටේ ගුරුවරු, විදුහල්පතිවරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරු සහයෝගය දුන්නා. මම හිතන විධියට මා නිවැරදියි. ඒ සියල්ලන්ගේම සහයෝගයෙන් තමයි නව රජය ගොඩ නැඟුණේ. මේ රජය පත් කරන්න ඔවුන්ගේ සහයෝගය ලබා දුන්නා. පා ගමන් යනකොට දීපු සහයෝගය ගැන අගමැතිතුමියත් කිව්වා. සහයෝගය දීලා ඔවුන්ට, රටට සහ අධ්‍යාපනයට වන සේවාව ගැන ඔවුන් බලාගෙන ඉන්නවා. මේ වන විට වැටුප් වැඩි කරලා තිබෙනවා. සතුටුයි, ඒ ගැන. හැබැයි ගුරුවරු, විදුහල්පතිවරු, අනධ්‍යයන කාර්යමණ්ඩලය ඇතුළු අනෙකුත් සියලුදෙනා බලාගෙන ඉන්නවා, සිංහල අවුරුද්ද එනකල්. දැන් කොහා කෑ ගහන්න පටන් ගෙන තිබෙනවා. කොහා 6, 7වැනි දා ඉඳන් කෑ ගහනවා, සිංහල අවුරුදු එනවා කියලා. කොහා කෑ ගහන ගමන්ම ගුරුවරු, විදුහල්පතිවරු බලාපොරොත්තු වෙනවා, - වැටුප ලැබෙන්නේ අප්‍රේල් මාසයේ සිංහල අවුරුද්දට ඉස්සෙල්ලා. - 8වැනි දා, 10වැනි දා වෙනකොට ලැබෙන ඒ වැටුප සැලකිය යුතු මට්ටමකින් තිබෙනවාද කියලා. එහෙම ලැබෙන බව ඔබතුමන්ලා කියා තිබෙනවා. හැබැයි, ඒ වැටුප් පැකට්ටුව අතට හම්බ වුණාම තමයි සතුටු වෙනවාද කියලා කියන්න පුළුවන් වෙන්නේ.

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ටියුෂන් එකක් දෙන්නම්, වෙලාවක.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
බොහොම හොඳයි. ඔබතුමා ටියුෂන් එකක් දෙන එක ගැන මම සතුටු වෙනවා. ඇයි දන්නවාද? ඔබතුමා ඒ සියලු විදුහල්පතිවරු වෙනුවෙන්, ගුරුවරු වෙනුවෙන් මහ පාරේ දුක් විඳපු කෙනෙක්; මහ පාරේ හිටපු කෙනෙක්. ලිප්ටන් වටරවුම, කොටුව ස්ටේෂන් එක, ඒ නොයෙකුත් තැන් ඔබතුමාට හොඳට හුරුයි. එහෙම හිටපු කෙනෙක් අද මේ ගරු සභාවේ ඉන්න එක ගැන මම හෘදයංගමව සතුටු වෙනවා. ඇයි ඒ? මින් ඉදිරියට වැඩ වර්ජන නැත; මින් ඉදිරියට ගුරුවරු පාරට බහින්නේ නැත

.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
අවශ්‍යතාවක් නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
අවශ්‍යතාවක් නැත. මින් ඉදිරියට මේ රටේ සමස්ත ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට කාලා බීලා සතුටින් ඉන්න සමාජයක් බිහි කරලා තිබෙනවා. මම කියන්නේ මේකයි. මම මේවාට අවකැපෙන දේවල් කියන්නේ නැහැ. මම කියන්නේ අනාගතය ගැන. අනාගතය ගැන කියන්නේ අතීතය ගැන හිතලා. අතීතයට අනුව අනාගතයේ මොකද වෙන්නේ? ඒ ගැන හිතලා මම මුලින්ම කිව්වේ අප්‍රේල් මාසයේ වැටුප ගැන. අන්න ඒක දුන්නාම ඔබතුමා කියන විධියට වැටුප් විෂමතා ගැන, ඒ එන ප්‍රශ්න ගැන බලන්න පුළුවන්. හැබැයි, ප්‍රශ්නයක් නැතිව රාජ්‍ය සේවකයෝ ඒ වැටුපෙන් සතුටු වනවා නම්, ජනතාවත් සතුටු වෙයි. මොකද, ඒකෙන් දරුවන්ටත් හොඳක් වනවා. ඇයි? මොන යම් හෝ හේතුවක් නිසා කවුරු ස්ට්‍රයික් කළත්, ක්ෂේත්‍ර දෙකක් ස්ට්‍රයික් කරන්න ඕනෑ නැහැ නේ. ඒ මොනවාද? සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍රය. බයම ඒ දෙක. ඒ ක්ෂේත්‍ර දෙකේ ඉන්න අය ස්ට්‍රයික් කළාම රටටම වෙන දේ මොකක්ද? සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අය ස්ට්‍රයික් කළ ගමන්ම ලෙඩ්ඩු ටික මැරෙනවා. මිනිස්සු අසරණ වෙනවා. ගනුදෙනුව තිබෙන්නේ අපේ දේශපාලනඥයන් අතර. හැබැයි, ඒකෙන් ප්‍රශ්න ඇති වෙන්නේ සහ රිදෙන්නේ මිනිස්සුන්ට.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ අය ස්ට්‍රයික් කළාම මොකද වෙන්නේ? පසුගිය දවස්වල එහෙම වුණා නේ. සති ගණන්, මාස ගණන් පාසල් වහලා තිබුණා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ අය ස්ට්‍රයික් කළාම අහිංසක දරුවන්ගේ අනාගතයට තමයි බලපාන්නේ. දැන් එහෙම වෙන්නේ නැහැ. මගේ සහෝදර නියෝජ්‍ය අමාත්‍ය ගරු මහින්ද ජයසිංහ මැතිතුමාට පින් සිදු වන්න මේ රටේ නැවත වැඩ වර්ජන නැති බවට එතුමා අද සහතිකයක් දෙනවා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
දින වකවානුත් එක්ක කියනවා නම්, සති ගණන්, මාස ගණන් ඉස්කෝල වහලා තිබුණා නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ඒ ගැන ඔව්වර කියන්න ගියොත් මට තවත් වෙලාව ඉල්ලා ගන්න වනවා. වහපු දින ගණන දන්නේ ඔබතුමා නේ. දෙවි හාමුදුරුවනේ, වහන්න කියපු කෙනා දැන් ඒක මගෙන් අහනවා. ඔබතුමා, දැන් නියෝජ්‍ය ඇමතිතුමා නේ. ඒක හරියට, හොරාගෙ අම්මගෙන් ජේන අහනවා වාගේ වැඩක් නේ. දැන් මම සතුටින් ඉන්නේ වැඩ වර්ජන නොමැති නිසායි. හැබැයි, මම කියපු කාරණය හොඳට මතක තබා ගන්න. මේක, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්තයාව පරද්දපු රට. ඒ කාරණය ඔබතුමා ඔළුවේ තබා ගන්න. මම ඒකයි කිව්වේ, සතුටු වනවා කියලා. ඒක කරන්න පුළුවන් නම් ඉතා හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, හැබැයි මට පෙනෙනවා, ජෝසප් ස්ටාලින් මහත්මයා ඉඳලා හිටලා පොඩි පොඩි රතිඤ්ඤා පත්තු කරනවා. පොඩි පොඩි ඒවා පත්තු කරනවා, අර කරලක් වාගේ තිබෙන එකක් පත්තු කරනවා, "අලිඩෝං" එකක් දානවා. හැබැයි, මේවා පත්තු කර කර ඉඳලා අන් බෝම්බයක් - hand grenade එකක් - ගහපු දවසට තමයි වැඩේ වරදින්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rohitha Abeygunawardhana, you have only two more minutes.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු සභාපතිතුමනි, කථාවට බාධා කරපු වෙලාව මට දෙන්නේ නැද්ද? අනුකම්පා කරලා ඒ වෙලාව දෙන්න, ගරු සභාපතිතුමනි. මම කථා කරනකොට හැම දාම මූලාසනයේ ඉන්නේ ඔබතුමා. මම ඔබතුමාට හරි ආදරෙයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මම එතුමාට මයික් එක නම් දුන්නේ නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
බාධා කළා කිව්වාට, ඒක මට කරදරයක් නොවෙයි. කොහොම හරි ඒකට මට විනාඩි දෙකක් දෙන්න, ගරු සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ජෝසප් ස්ටාලින් මහත්මයාව බේරීබ ගහන්නේ නැති තැනට හදාගන්න. ඒක කරන්න ඔබතුමාට පුළුවන්. එකට හිටපු දෙන්නා. හරියට, රයිගමයයි ගම්පලයයි වගේ නේ, දෙන්නා එකට හිටියේ. දකුණු අතයි, වම් අතයි වාගේ හිටියේ. වෙන් වෙන්න දෙන්න එපා. තියාගෙන හදාගන්න. මම මේවා කියන්නේ හොඳට; ආදරේට.

අගමැතිතුමිය සභාවේ හිටියා නම් මම කවියකුත් කියනවා. එතුමිය මේ වෙලාවේ නැහැ නේ. අගමැතිතුමිය නැතුව මෙතැන නිකම් පාළු වෙලා ගිහිල්ලා. කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාවක් තිබෙන නිසා කරන්න දෙයක් නැහැ නේ. ගරු සභාපතිතුමනි, අගමැති ධුරයේ කාන්තාවක් ඉන්න එක ගැන මම සතුටු වනවා. බලන්න, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන් 22ක් ඉන්නවා. එතුමිය අධ්‍යාපන ඇමතිවරිය. චන්ද්‍රිකා කුමාරතුංග නෝනාත් මීට කලින් අධ්‍යාපන ඇමති විධියට හිටියා. මෙතුමිය රටේ තුන්වන අගමැතිවරිය. හරි සතුටුයි. අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියත් එදා මතක් කළා වාගේ දැන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන් 22ක් ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ විස්සයි, විපක්ෂයේ දෙදෙනායි. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් 64දෙනා මේ මන්ත්‍රීවරියන් දෙදෙනාව බලාගන්න ඕනෑ. අපට දෙදෙනායි. තමුන්නාන්සේලාට මන්ත්‍රීවරියන් 20ක් ඉන්නවා බලාගන්න, අගමැතිතුමියත් එක්ක. *[බාධා කිරීමක්]* අනිවාර්යයෙන්. අනේ, ඔය පැත්තේ අයවත් අපි බලාගන්නවා. 225දෙනා එකට ඉන්න එපා යැ. හැබැයි, එක දෙයක් කියලා දෙන්නම්. අපි පාර්ලිමේන්තුවෙන් අධ්‍යාපනයට ආදර්ශයක් ලබා දෙමු. මොකක්ද දෙන ආදර්ශය? පාර්ලිමේන්තුවේ අපි 225දෙනෙක් ඉන්නවා; මාලිමාව ලකුණෙන්ද, පුටුවෙන්ද, පොහොට්ටුවෙන්ද, කුකුළාගෙන්ද, එළවාගෙන්ද කියලා නැතුව දැන් අපි මෙතැනට ඇවිල්ලා ඉන්නවා නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. අපි මෙතැනින් අපේ සුභදත්වය වර්ධනය කර ගනිමු. අවුරුදු පහක් අපි එකට ඉන්න එපා යැ. අපි දරුවන්ට දෙනවා, මෙන්න මෙතැනින් නව ආදර්ශයක්. ඔබ නව ආදර්ශයක් දෙන ආණ්ඩුවක්. පළමුවෙන් අපි දෙමු ආදර්ශය, එකිනෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධයක් ඇති කර ගැනීමට.

කෙනෙක් "Good morning!" කිව්වාම, "Good morning!" කියන්න; හිනාවුණාම, හිනාවෙන්න. මම ඒකයි කිව්වේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියන් 20දෙනෙක් ඉන්න නිසා පහසුවෙන් මේක කරන්න පුළුවන් කියලා. මම නම් හැම දාම කාන්තාවන් එක්ක හිනා වෙලා, සතුටින් කථා කරන්නේ; හරි සතුටින්.

ඉතින්, ඒ වෙලාවට ඒ අයත් අපට සතුට දෙනවා නම් හොඳයි. ඒ අයටත් අපිත් එක්ක තිබෙන සුභදත්වය වර්ධනය කර ගන්න කියලා මේ වෙලාවේ මම මතක් කරනවා. ඒ ගැනත් විශේෂයෙන් මතක් කරමින්, මට වෙලාව ලබා දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු අගමැතිතුමිය, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු දෙපළගෙන් මම ඉල්ලීමක් කරනවා, ඔබතුමන්ලා මේ කටයුත්ත කරන්න කියලා. ඔබතුමන්ලා අධ්‍යාපනය වෙනුවෙන් ගන්නා හොඳ තීන්දුවලට විපක්ෂයේ සිටියත්, භය නැතුව අත උස්සලා මගේ සහයෝගය ලබා දෙනවා.

ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Sugath Wasantha de Silva. You have 11 minutes.

[අ.භා. 12.01]

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමිය මතක් කළා වාගේම ආචාර්ය ජානකී ජයවර්ධන මැතිනියගේ අභාවය ඉතාම කනගාටුවෙන් යුතුව මේ වෙලාවේ මා සිහිපත් කරනවා. එතුමිය කථිකාචාර්ය ධුරය ලබමින් පළමුව කොළඹ විශ්වවිද්‍යාලයට ආවාට පස්සේ, එතුමියගෙන් ඇමෙරිකානු ඉතිහාසය පිළිබඳව ඉගෙන ගත් පළමුවැනි කණ්ඩායමේ ශිෂ්‍යයෙකු විධියටත්, විද්‍යාර්ථයෙකු විධියටත් එතුමියගේ අභාවය ගැන මම කනගාටු වෙනවා. එතුමියගේ මරණය සැලවුණාම ඇත්තටම මටත් මතක් වුණු දේ තමයි, ජීවිතය තණ අග පිනි බිඳු වැන්නේය කියන එක. නිදහස් අධ්‍යාපනයේ පියා වූ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට නිදහස් අධ්‍යාපන පනත සම්මත කිරීමෙන් පසුව පැවති මැතිවරණයෙන් ගෙදර යන්න සිද්ධ වුණා. එතුමා එදා ගෙදර ගියාට, එතුමා නිර්මාණය කරලා දීපු නිදහස් අධ්‍යාපනයේ දරුවෝ අපි. ඒ වාගේම තමයි, ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ නිදහස් අධ්‍යාපනය අවුරුදු ගණනාවක් තිස්සේ ආරක්ෂා කර ගන්න පෙළ ගැහිලා, පෙරට ඇවිල්ලා කඳවුරු බැඳලා, සටන් කරපු අය. ඒ නිසා නිදහස් අධ්‍යාපනය පිළිබඳව විශාල අයිතියක්, විශාල වගකීමක් අපට තිබෙනවා. ඒ ගෞරවය සමහම මේ වසරේ අය වැය කාරක සභා අවස්ථාවේදී මට කථා කරන්න ලබා දීපු අවස්ථාව සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින්, අපි අදාළ කාරණයට පිවිසෙමු.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍ය බව අපි වසර ගණනාවක් තිස්සේ දන්නා දෙයක්. ඒ ප්‍රතිසංස්කරණ තුළට අනිවාර්යයෙන්ම ගැඹුරින්, විශේෂ අධ්‍යාපනය එකතු විය යුතුයි. ඒක අපි විශ්වාස කරන දෙයක්. පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් පෙළ, විශ්වවිද්‍යාලය, වෘත්තීය පුහුණුව කියන මේ සෑම ක්ෂේත්‍රයකම විශේෂ අධ්‍යාපනයට ලොකු භූමිකාවක් තිබෙනවා වාගේම ඒ සඳහා ලොකු අවකාශයක් අවශ්‍යයි. ඒ නිසා අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ සිද්ධ වන අවස්ථාවක ගරු අග්‍රාමාත්‍යතුමියට අපි යෝජනාවක් කරන්න කැමැතියි, ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නා වූ කණ්ඩායම් හමුවලට අනිවාර්යයෙන්ම විශේෂ අධ්‍යාපනය පිළිබඳ විශේෂඥභාවය තිබෙන කණ්ඩායම් ඇතුළත් කර ගන්නා ලෙස. ඒ වාගේම මේ විශේෂ අධ්‍යාපනය කියන කාරණය බිම් මට්ටමින් ක්‍රියාත්මක කරන්නේ, බිම් මට්ටමේ එළන්නේ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් විසිනුයි. මේ වෙනකොට ලංකාවේ එවැනි විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ගේ හාරසිය ගණනක හිඟයක් තිබෙනවා. හැබැයි, ඒ විශේෂ අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාව සඳහා මෙවර විද්‍යාපීඨවලට බඳවාගෙන තිබෙන්නේ පහළොස්දෙනායි. මම දන්නේ නැහැ, මොන අධ්‍යාපන නිලධාරින්ද එය තීන්දු කළේ කියලා. කවුද, ඒ තීරණය ගත්තේ? ඇයි, මේ වාගේ අදූරදර්ශී තීරණ ගන්නේ? මෙහෙම වුණොත්, විශේෂ අධ්‍යාපනය කඩා වැටෙනවා. විශේෂ අධ්‍යාපනය කඩා වැටෙනවා කියන්නේ, ආබාධ සහිත දූ දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටෙනවා කියන එකයි. මා හිතනවා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරින් මේ වෙලාවේ අපි කියන දේට කන් දෙනවා ඇති කියලා. අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ විධියට පහළොස්දෙනාට ඒක සීමා කළේ කවුද, කුමක් නිසාද කියන එකට පිළිතුරක් ලබා දෙන්න.

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

ඒ වාගේම එම ක්ෂේත්‍රයේ වෘත්තීයභාවයකින් ක්‍රියාත්මක වන කණ්ඩායමක් තමයි, විශේෂ අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරීන්. ඒ ව්‍යාපෘති නිලධාරීන්ගේ වැටුප් සහ තත්ත්වය පිළිබඳව 2006දී කැබිනට් මණ්ඩල තීරණයක් නිකුත් වනවා. අධ්‍යාපන නිලධාරීන් ඒක ක්‍රියාත්මක නොකර, අපේ දේශපාලනික වචනවලින් කිව්වොත්, වංගු ගහමින් ඔවුන්ට අගතියක් කළා. ඒ සමහර නිලධාරීන් දැනටත් මිය පරලොව ගිහිල්ලා; සමහරු විශ්‍රාම ගිහිල්ලා. තවමත් සේවයේ යෙදෙන කණ්ඩායමකුත් ඉන්නවා. ඔවුන්ට සාධාරණය, යුක්තිය ඉෂ්ට කිරීමේ වගකීම රජයක් විධියට අපට භාර ගන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඊළඟට, අපි යෝජනා කරන දේ මෙයයි. ලංකාව විධියට සලමන්කා ප්‍රකාශනය ඇතුළු විවිධ අධ්‍යාපනික ප්‍රඥප්තිවල ප්‍රතිපත්ති අපි පිළිගනිමින් ඉන්නවා. අපි කියන දේ තමයි, ආබාධ සහිත ප්‍රජාවට අන්තර්කරණීය අධ්‍යාපනයක් හිමි විය යුතුයි කියන කාරණය. ආබාධ සහිත ප්‍රජාවට අන්තර්කරණීය අධ්‍යාපන ක්‍රමයක් හිමි වෙනවා නම් එය හිමි විය යුත්තේ කාරණා කිහිපයක සහසම්බන්ධයෙනුයි. පළමුවැනි එක තමයි, පන්ති කාමරය ප්‍රවේශ පහසුකම් සහිත එකක් විය යුතුයි කියන එක. ඒක භෞතිකමය ප්‍රවේශය වෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන් එය තාක්ෂණික මෙවලම්මය ප්‍රවේශයක් වෙන්න ඕනෑ. දෘශ්‍යාබාධිත පුද්ගලයෙකුට තමන්ගේ දෘශ්‍යාබාධිතභාවය අවම කරන තාක්ෂණය පාසල් පන්ති කාමරය තුළට එන්න ඕනෑ. ශාරීරික වශයෙන් ආබාධිත කෙනෙකුට හැසිරීම, සංචරණය පිළිබඳ ප්‍රවේශය තිබෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන් බිහිරි දුවා දරුවන්ට සංඥා භාෂාව හෝ කථන තොල් කියැවීම බදු සන්නිවේදන මාධ්‍යයක් පන්ති කාමරය තුළට එන්න ඕනෑ. මේ දේවල් ආවේ නැත්නම් අන්තර්කරණීය අධ්‍යාපනය අසාර්ථකයි; ෆේල්; ෆේල්. අපි රජයක් විධියට වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය විධියට අනිවාර්යයෙන්ම පොරොන්දු වෙච්ච දේ තමයි අන්තර්කරණීය සමාජයක් තුළ ආබාධ සහිත ප්‍රජාව බලගන්වනවා කියන එක. නිර්බාධිත සමාජ ජීවිතයක්, නිර්බාධිත අධ්‍යාපන ජීවිතයක් උරුම කරදීමේ වගකීම අපේ රජයට පැවරිලා තිබෙනවා. අගමැතිතුමිය අධ්‍යාපන ඇමතිවරිය වශයෙන් ඒ යුතුකම සහ ඒ සමාජයීය වගකීම අනිවාර්යයෙන්ම ඉෂ්ට සිද්ධ කරන බව අපට සහතිකයි.

අනෙක් කාරණය තමයි, විභාග ක්‍රියාවලියේදී ප්‍රශ්න පත්‍ර සැකසීම. ඇත්තෙන්ම ප්‍රශ්න පත්‍රයක් තුළින් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ප්‍රශ්න පත්‍රයක් තුළින් බලාපොරොත්තු වෙන්නේ ශිෂ්‍යයාගේ නිපුණතාව මැනීම. ඇස් පෙනෙන දරුවෙකුට සිතියමක යම්කිසි ස්ථානයක් සලකුණු කරන්න ප්‍රශ්න පත්‍රයෙන් නියම කරනවා නම් ඔහුට තමන්ගේ පෙනීම පාවිච්චි කරමින් ඒ සිතියම සලකුණු කරන්න පුළුවන්. ඒකෙන් කියැවෙන්නේ මොකක්ද? එම ස්ථානය පිළිබඳව ඔහුට අවබෝධයක් තිබෙන බව. ඒ වාගේ ප්‍රශ්නයක් දෘශ්‍යාබාධිත කෙනෙකුට ආවොත් උත්තර ලියන්න බැහැ; සිතියමේ සලකුණු කරන්න බැහැ, පවතින තාක්ෂණික හැකියාව මත. විදේශ රටවල නම් සිතියම් සලකුණු කිරීමේ අවස්ථාව දෘශ්‍යාබාධිත අපට ද උරුම කර දීලා තිබෙනවා. ලංකාවේ තවම එහෙම කරන්න බැහැ. එහෙනම් මේ දරුවාගේ නිපුණතාව මැනීමට වෛකල්පික ප්‍රශ්නයක් ඉදිරිපත් කළ යුතුයි. එතකොට දෘශ්‍යාබාධිත ශිෂ්‍යයාගේත්, ඇස් පෙනෙන සාමාන්‍ය දරුවාගේත් මෙන්න මේ නිපුණතාව තමයි මැනිලා, ප්‍රශ්න පත්‍රයට ලකුණක් ලැබිලා, ඔහුගේ ප්‍රතිඵල ලේඛනයට එම ලකුණ ඇතුළත් වෙන්නේ. මම දන්නවා, මාත් එක්ක මන්ත්‍රීවරු විධියට කටයුතු කරන, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරු විධියට කලින් වැඩ කරපු ඕනෑම කෙනෙකුට මම මේ කියන කාරණය ඉතා පැහැදිලියි කියලා. මෙන්න මේ විධියට අධ්‍යාපනය තුළ සම අවස්ථා මෙන්ම සාධාරණ අවස්ථා ද ලබා දෙන්න ඕනෑ. අපේ සහෝදර මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් දන්නා ආකාරයට දෘශ්‍යාබාධිත ගුරු කණ්ඩායමක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරමින් ඉන්නවා. ඔවුන් එම තනතුරු දිනා ගන්නේ තරග විභාගයකටත් මුහුණ දීලා, උපාධියකුත් අරගෙන. මෙන්න මේ තරග විභාගය කියන එක මම කලින් කිව්වා වාගේම අභියෝගාත්මකයි. ආබාධිතතාවට ප්‍රතිපක්ෂවයි මේ තරග විභාග යන්ත්‍රණය හැදිලා තිබෙන්නේ. මේකේ ප්‍රතිඵලයක් විධියට දැනටත් නැඟෙනහිර පළාතේ, මධ්‍යම පළාතේ විභාගයට පෙනී හිටපු දෘශ්‍යාබාධිත ගුරු අපේක්ෂකයන්ට පත්වීම් අහිමි වෙලා තිබෙනවා. මේක මෙහෙම වෙන්න දෙන්න බැහැ. සාධාරණ සහ යුක්තිසහගත, ආබාධිත බව පදනම් කර ගත්ත වැඩ පිළිවෙළක් හරහා මේ උපාධිය ලබා ගත්ත ගුරු අපේක්ෂකයින්ට මේ අවස්ථාව ලබා දිය යුතුයි.

අනික් කාරණය තමයි, උසස් අධ්‍යාපනය; විශ්වවිද්‍යාල අධ්‍යාපනය. විශ්වවිද්‍යාල තුළ ආබාධ සහිත පුද්ගලයන්ට කිසිදු පහසුකමක් නැති බව කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය අවධාරණය කළා. එතුමිය කිව්ව කාරණය ඇත්තම ඇත්තයි. කොළඹ විශ්වවිද්‍යාලයේ අපි ඉගෙන ගන්නකොට බ්‍රේල් නිතක් තිබුණේ නැහැ. හැබැයි, මේක මේ විධියට ඉස්සරහට පවත්වාගෙන යන්න බැහැ. අධ්‍යාපනයේදී ආබාධ සහිත පුද්ගලයන්ට අනිවාර්යයෙන්ම යුක්තිය ඉෂ්ට වෙන්න ඕනෑ. එහෙම යුක්තිය ඉෂ්ට නොවුණොත් ඔවුන්ට අත්හැරෙන්නේ ජීවිතය. එම නිසා අපි කලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට යෝජනා කළා, ආබාධ සහිත වූවන් පිළිබඳ හිතකර ඒකකයක් - මධ්‍යස්ථානයක් - පිහිටුවන්න ඕනෑ කියන එක. මෙතැනදී බ්‍රේල් මාධ්‍යයෙන් ඉගෙන ගන්නා ළමයින්ගේ පරිවර්තන අවශ්‍යතා සඳහා නිලධාරියෙක්, නූතන තාක්ෂණය ඔවුන්ට හඳුන්වා දෙන නිලධාරියෙක්, සංඥා භාෂාව හසුරුවන්න හැකි නිලධාරියෙක්, ආබාධ සහිත වූවන් පිළිබඳ උපදේශනය, සුබසාධනය, ප්‍රවේශ පහසුකම් පිළිබඳව කටයුතු කළ හැකි නිලධාරියෙක් සහිත ඒකකයක් අනිවාර්යයෙන්ම සෑම විශ්වවිද්‍යාලයක් තුළම පිහිටුවන්න කියලා අපි යෝජනා කළා. එවකට හිටපු UGC එකේ සභාපතිවරයා ඒ යෝජනාව භාර ගත්තා. හැබැයි, ඒ යෝජනාව කුණු කූඩයට ගියා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ ආබාධ සහිත විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ අපේක්ෂා ඉෂ්ට කරන වැඩ පිළිවෙළකට නව රජයක් විධියට, නව අධ්‍යාපන අමාත්‍යාංශයක් සහ නව ප්‍රතිසංස්කරණයක් විධියට අපට ගමන් කරන්න පුළුවන් වෙයි කියලා. අපේක්ෂාසහගතව නිදහස් අධ්‍යාපනයේ උරුමය ආරක්ෂා කරපු පක්ෂයක් විධියට මේ ඉදිරි 8 මාසය සඳහා ගෙනෙන මේ අය වැය ලේඛනය තුළින් උපරිම ප්‍රතිපාදන යොදමින් යුක්තිසහගත බව සහ සාධාරණත්වය ආබාධ සහිත වූවන්ට ද අධ්‍යාපන ක්ෂේත්‍රයේදී උරුම කරදීමට කටයුතු කිරීම ඇත්තෙන්ම අපි සතුටට පත් කරන කාරණයක්.

බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Harshana Rajakaruna. You have 14 minutes.

[අ.භා. 12.13]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු සභාපතිතුමනි, අද අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය යටතේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරනවා. අපි බොහෝ

කාලයක ඉඳලා අහලා තිබෙනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණය කළ යුතුයි කියන එක. හැම ආණ්ඩුවක්ම ජයග්‍රහණය කළාම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන විශේෂ අවධානයක් යොමු කරනවා. මම විශ්වාස කරනවා, යම් යම් ප්‍රතිසංස්කරණ සිදු වෙලා තිබෙන බව. නමුත්, එය අවශ්‍ය තැනට සිදු වෙලා නැති බවත් මම පැහැදිලිව කියන්න ඕනෑ. එක පැත්තකින්, අධ්‍යාපනයේ ඇති අඩුපාඩු නිසා රැකියා විරහිතයින්ගේ ප්‍රමාණයේ වැඩිවීමක් වාගේ දේවල් අපට දකින්න ලැබෙනවා.

අධ්‍යාපනය ගැන කථා කරනකොට පෙර පාසල් අධ්‍යාපනය විශේෂයි. මම හිතන විධියට, එය අධ්‍යාපනයේ ඉතාම වැදගත් කොටසක්. මොකද, අඩු වයසේ දරුවන්ට සමහර අවස්ථාවලදී නිසි අධ්‍යාපනයක් නොලැබිලා තිබෙනවා. ඒ නිසා පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. නමුත්, ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනවාද කියන සැකය අපට තිබෙනවා. මොකද, පෙර පාසල්වල කිසිම ප්‍රමිතියක් නැහැ. තමන්ට ඕනෑ විධියට ඒ පෙර පාසල් ක්‍රියාත්මක කරනවා. පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳව දැනුමක් නැති, ඒ පිළිබඳව අවශ්‍ය අධ්‍යාපනය නොලබපු බොහෝ පිරිසක් අද වනකොට ලංකාව පුරාම පෙර පාසල් විවෘත කරගෙන සිටිනවා. ඒ විතරක් නොවෙයි. ඒවායේ සේවය කරන අය වාගේම පෙර පාසල් දරුවන්ට උගන්වන අය පිළිබඳව තිබිය යුතු ප්‍රමිතිය ගැන කථා වෙනවාත් බොහොම අඩුයි. සමහර පෙර පාසල් ඇත්තටම තමන්ට හිතවත් අයව තමයි ඒවායේ සහාය ගුරුවරුන් හැටියට බඳවාගෙන තිබෙන්නේ. සහාය ගුරුවරුන් හැටියට ඒ අයව බඳවා ගත්තත් දරුවන්ගේ අධ්‍යාපනයට අත්‍යවශ්‍යම, ප්‍රධානතම foundation එක මේ පෙර පාසල් තුළින් නිසි පරිදි ක්‍රියාත්මක වෙනවාද කියන එක අද වනකොට ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා.

ප්‍රාථමික අධ්‍යාපනයත් ඒ වාගේම තමයි. ප්‍රාථමික අධ්‍යාපනය ගත්තාම, පහ වසර ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන් තමයි දෙමව්පියන්, දු දරුවන්, එතකොට ටියුෂන් ගුරුවරු, ඒ සියලුදෙනාම අවධානය යොමු කරන්නේ. ඒ තුළින් දරුවන්ට වැදගත් සහ හොඳ අවස්ථාවක් ලැබෙනවා, තමන්ගේ අධ්‍යාපන කුසලතා එක්ක ප්‍රසිද්ධ පාසල්වලට යන්න. හැබැයි ඒ වාගේම අපි පිළිගන්නවා, ඒ තුළින් ඔවුන් කුඩා කාලයේම ලොකු පීඩනයකටත් ලක් වෙනවා කියන එක. අපට අහන්න ලැබුණා, ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ වෙනසක් සිදු කරනවා කියලා. නමුත්, එහි ස්ථාවරය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී ඔබේ අදහස ප්‍රකාශ කළොත්, එය වඩාත් හොඳයි කියලා මම හිතනවා.

ප්‍රාථමික අධ්‍යාපනය දෙස බලනකොට, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය අරමුණු කරගෙන දරුවන්ට ලොකු පීඩනයක් එල්ල වෙනවා. මගේ දරුවා යන පාසල කොළඹ තිබෙන පෞද්ගලික පාසලක්. ඒක ජාත්‍යන්තර පාසලක් නොවෙයි. නමුත් මම එහි හොඳ දෙයක් දකිනවා. පළමු අවුරුදු තුනේ කිසිම විභාගයක් නැහැ. එම නිසා ඒ දරුවන්ට එම කාලවකවානුවේ දරුවන් හැටියට ගත කරන්න; ජීවත් වෙන්න අවස්ථාවක් ලැබී තිබෙනවා. Grade 1, 2, 3 යන අවුරුදු තුනේම කිසිම විභාගයක් පවත්වන්නේ නැහැ. ඒ කියන්නේ, අධ්‍යාපනයක් නොලබනවා කියන එක නොවෙයි. ඒ දරුවන්ට විභාගයක් නැති වුණත්, වෙන වෙන ක්‍රියාකාරකම්වලින් දැනුම ලබා ගැනීමේ ක්‍රමවේද සකස් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. රජයේ පාසල්වලටත් මේ වාගේ ක්‍රමවේදයක් ලබා දීම සුදුසුයි කියලා මම හිතනවා. මොකද, ඒ දරුවන් පුදුම විධියේ පීඩනයක ඉන්නේ. එකේ පන්තියේ දරුවාත් අමතර පන්තිවලට යවනවා, දෙකේ පන්තියේ දරුවාත් අමතර පන්තිවලට යවනවා; ටියුෂන්වලට යවනවා. එතකොට, ඒ දරුවන්ට තමන්ගේ කුඩා අවධිය විනෝදයෙන් ගත කරන්න කිසිම හැකියාවක් නැහැ. ඒ වාගේම අපේ අහිංසක දෙමව්පියන්ටත් අවස්ථාවක් ලැබෙන්නේ නැහැ, තම දරුවා හොඳ පාසලකට යවන්න. ඒ හින්දා ශිෂ්‍යත්ව විභාගය සමත් වෙන්න ඕනෑ. ශිෂ්‍යත්ව විභාගය ඉහළින්ම සමත් කරවන්න එකේ පන්තියේ ඉඳලාම උත්සාහ කරනවා. ඒ තුළින් දරුවාට පුදුමාකාර පීඩනයකට මුහුණ දෙන්න වෙනවා. අපේ දෙමව්පියන් ඒ විධියට තම දරුවාගේ අධ්‍යාපනය ගැනම හිතලා; ඒ ගැන පමණක්ම අවධානය යොමු කරලා, තම දරුවා ශිෂ්‍යත්ව විභාගය සමත් කරවනවා අපි දැකලා තිබෙනවා. හැබැයි කියන්න ඉතාම කනගාටුයි, - මම අධ්‍යාපනය ලැබුවේ කොළඹ රාජකීය විද්‍යාලයේ - ශිෂ්‍යත්ව විභාගය පාස් වෙලා කොළඹ රාජකීය විද්‍යාලයට ආපු මගේ මිත්‍රයින් ඉන්නවා, ඔවුන්ගෙන් සමහරු GCE O/L විභාගය පාස් වුණේ නැහැ, ෆේල් වුණා. ඔවුන් GCE O/L විභාගය ෆේල් වුණේ මොකද? ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන් ඒ දරුවන්ට සම්පූර්ණ පීඩනය යොමු කළත්, එතැනින් එහාට ඔවුන්ගේ අධ්‍යාපනය පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වලා නැහැ. මේ වාගේ අවස්ථා තිබෙනවා. එම නිසා ප්‍රාථමික අධ්‍යාපනය ලබන කාල වකවානුවේදී පුළුවන් තරම් දරුවන්ගේ කුසලතා ඉහළ දැමීම සඳහා විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයේ යම් වෙනසක් සිදු විය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ඒ විතරක් නොවෙයි. GCE O/L විභාගය ගත්තාම, එම විභාගයට තිබෙන subjects ප්‍රමාණය පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. දරුවා කොහොමද, ඒ තරම් subjects ගොඩක් දරා ගන්නේ? දරුවන් කොහොමද, ඒ තරම් විභාග ප්‍රමාණයකට මුහුණ දෙන්නේ? ඒ වාගේම දරුවන් තුළ දැන් මෙන්න මේ විධියේ ප්‍රවණතාවක් තිබෙනවා. විශේෂයෙන් ඔවුන් ක්‍රීඩා කටයුතු ඇතුළු extra-curricular activities කෙරෙහි අවධානය යොමු කරන්නේම නැහැ.

මොකද, GCE O/L විභාගය පාස් වෙන්න ඉතාම අපහසුයි ක්‍රීඩාත් කරනවා නම්. ක්‍රීඩා කරන අයට GCE O/L විභාගය පාස් වෙන්න ඒ තිබෙන subjects ප්‍රමාණය පිළිබඳව, ගණිතය සමත් වීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. එතකොට ක්‍රීඩාවට ඉතාම දක්ෂ දරුවෙකුට ක්‍රීඩාව තුළින් ඉදිරියට යන්න මේ අධ්‍යාපන ක්‍රමය තුළ අවස්ථාවක් තිබෙනවාද කියන ගැටලුව තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ ගම්වල වුණත් කිසිම ප්‍රමිතියක් නැති ජාත්‍යන්තර පාසල් තිබෙනවා. පෞද්ගලික පාසල් හැටියට, ජාත්‍යන්තර පාසල් හැටියට තිබෙන ඒ පාසල් කිසිම ප්‍රමිතියක් නැතුව පවත්වාගෙන යන්නේ. මම කියන්නේ නැහැ, ජාත්‍යන්තර පාසල් සියල්ල එහෙමයි කියලා. ජාත්‍යන්තර පාසල් ගණනාවක් තිබෙනවා, ඉතා හොඳ අධ්‍යාපනයක් දරුවන්ට ලබා දෙන. ඒ ජාත්‍යන්තර පාසල්වලින් සිදුවන සේවාව අපි අගයන්න ඕනෑ. නමුත් සමහර වෙලාවට ජාත්‍යන්තර පාසල් කියලා පාසල් කඩ විවෘත වෙලා තිබෙනවා. ඉංග්‍රීසි භාෂාවෙන් උගන්වනවා කිව්වාට ඉංග්‍රීසි භාෂාවේ මට්ටම, ඒ ප්‍රමිතීන් ඒ සියල්ලම ඉතා කනගාටුදායකයි. අපේ ජනතාවට වුවමනාවක් තිබෙනවා, ඉංග්‍රීසි දැනුම ලබා දෙන්න, ජාත්‍යන්තර පාසලකට දරුවන්ව ඇතුළත් කරන්න. ඒ නිසා ජාත්‍යන්තර පාසලකට දරුවන්ව ඇතුළත් කරනවා. නමුත් ඒ ජාත්‍යන්තර පාසලේ මට්ටම තේරුම් ගන්නේ නැහැ. ඉතාම දුර්වල අධ්‍යාපන ක්‍රමයක්, මට්ටමක් තමයි විශේෂයෙන් කොළඹින් පිට සමහර ජාත්‍යන්තර පාසල්වල තිබෙන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් ඒවා පිළිබඳව අධීක්ෂණයක් තිබිය යුතුමයි. විශේෂයෙන් පෙර පාසල් ඒ වාගේම පෞද්ගලික, ජාත්‍යන්තර පාසල් පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය විශේෂ අවධානයක් යොමු කරලා, ඒ ගැන watchdog කෙනෙකු වාගේ කටයුතු කරමින් ඒවා අධීක්ෂණය කරන්න ක්‍රමවේදයක් සකස් කරන එක සුදුසුයි කියලා මා කියනවා.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

ඊළඟට අපි කවුරුත් දන්නවා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන වැටුප් විෂමතා පිළිබඳව. මේ වැටුප් විෂමතා පිළිබඳව දැවැන්ත සටනක් කරපු කෙනෙක් තමයි අපේ මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. එතුමා කියනවාද දන්නේ නැහැ, දැන් එහෙම විෂමතාවක් නැහැ කියලා. නමුත් ඒ විෂමතා ඉවත් කිරීම පිළිබඳ බලාපොරොත්තු ඉටු වෙලා නැහැ කියන එක අද උදේත් මට දුරකථනයෙන් සමහර ගුරුවරු, විදුහල්පතිවරු සඳහන් කළා; මේ ගැන කථා කරන්න කියලා කිව්වා. තමුන්නාන්සේලා ගුරු වැටුප් විෂමතා පිළිබඳව කථා කරලා, ගුරුවරුන්ගේ ඒ වාගේම විදුහල්පතිවරුන්ගේ විශ්වාසය දිනාගෙන ආණ්ඩුවට පැමිණි පිරිසක්. දැන් විදුහල්පතිවරුන්ට තිබෙන ලොකුම ගැටලුව තමයි, ගුරුවරුන්ට වැඩි වැටුපක් ලැබෙනවා, විදුහල්පතිවරයෙකු වුණාම ඒ වැටුප සමහර වෙලාවට ගුරුවරයෙකුගේ තිබෙන වැටුපට වඩා අඩුයි කියන එක. ඒ නිසා විදුහල්පතිවරයෙකු වීමට සමහර ගුරුවරු අකැමැතියි. මොකද, වැටුප අඩු නිසා. ඒක ලොකු ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. අපට විදුහල්පතිවරුන්ගේ භිඟයක් තිබෙනවා; ගුරුවරුන්ගේ භිඟයකුත් තිබෙනවා. නමුත් විදුහල්පතිවරුන්ගේ ලොකු භිඟයක් තිබෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේලාට විශේෂයෙන් කියන්න ඕනෑ, ඒ විදුහල්පතිවරුන්ගේ වැටුප පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා.

ඒ වාගේම තමයි දැන් විදුහල්පතිවරුන්ට දේශපාලනික පත්වීම් ලබා දීම පිළිබඳව, අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ලාට දේශපාලන පත්වීම් ලබා දීම පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. විපක්ෂ නායකතුමාත් සඳහන් කළා, දේශපාලන අකටයුතුකම් සිදු වෙලා තිබෙනවාය කියලා.

විදුහල්පතිවරුන්ට, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට ඉතාම චුවමනාවෙන් කියන්න ඕනෑ, අපේ අධ්‍යාපන ක්‍රමය දේශපාලනීකරණය කරන්න එපා කියලා; දේශපාලනයෙන් තොර වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා.

ඉස්සර අපි දැක්කා, පාසලේ පළමුවැනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කරන්න දෙමව්පියන් දේශපාලනඥයන් ළඟට ගිය ආකාරය. දැන් ඒ තත්ත්වය නැහැ. ඒක හොඳ දෙයක්. දැන් නියම ක්‍රමවේදයකට ඒ කටයුතු සිදු වනවා. එදා ඒ ලබා දී තිබුණු අවස්ථා දැන් දේශපාලනඥයන්ට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා පාසල්වල පළමුවැනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර දෙන්න කියලා දැන් දේශපාලනඥයන් ගාවට දෙමව්පියන් එන්නේ නැහැ. ඒ නිසා ඉතාම ඕනෑකමින් කියනවා, දේශපාලනීකරණය කිරීම තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රය විනාශයට පත් වෙනවා කියලා. එම නිසා ගරු විපක්ෂ නායකතුමාත් සඳහන් කරපු දේශපාලන පළිගැනීම් පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරන්න.

පවතින ගුරු පුරප්පාඩු පිළිබඳවත් මම මේ වෙලාවේ කියන්න ඕනෑ. තමුන්නාන්සේලා දන්නවා, ගුරු පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙන බව. අපේ ප්‍රදේශවල පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා වන බඳවාගැනීම් තමුන්නාන්සේලා හැකි ඉක්මනින් සිදු කරන්න. මොකද, අපට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් ඉදිරියට යන්න නම් ගුරු පුරප්පාඩු ටික පුරවන්න ඕනෑ; ඒ අඩුපාඩු නැති වෙන්න ඕනෑ. ගුරු පුරප්පාඩු තිබෙන පාසල් විශාල ප්‍රමාණයක් අපේ රටේ තිබෙනවා. පාසල්වල ගුරු පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙන කොට, සුදුසු අධ්‍යාපනයක් අපේ දරුවන්ට ලැබෙන්නේ නැහැ. මේ ගැන ඔබ කවුරුත් දන්නවා. ඒ වාගේම, මේ සම්බන්ධයෙන් බලයට පත් වන සෑම ආණ්ඩුවක්ම කථා කරනවා. නමුත්, ඒ පුරප්පාඩු නිසි පරිදි fill වෙන්නේ නැහැ. එම නිසා අවශ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමට හැකි ඉක්මනින් කටයුතු කරන්න. ඒ සඳහා තමුන්නාන්සේලා දිරිමත් වෙන්න.

මට ප්‍රථමයෙන් කථා කරපු විශේෂ අවශ්‍යතා සහිත අපේ ගරු මන්ත්‍රීතුමා වැදගත් කාරණාවක් ප්‍රකාශ කළා, විශේෂ අවශ්‍යතාවන් සහිත දරුවන් ගැන. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට පාසල්වල, විශ්වවිද්‍යාලවල නිසි පහසුකම් ලබා දිය යුතුයි. ඒ වාගේම, එකී දරුවන්ට විශේෂ කුසලතා තිබෙන, විශේෂ training එකක් තිබෙන ගුරුවරු සිටිය යුතුයි. ඒ අවශ්‍යතාව සපුරාලීම වෙනුවෙන් අපි කටයුතු කරන්න අවශ්‍යයි. ඒ කියන්නේ, බිල්ඩින් තිබිලා ඒවායේ පහසුකම් තිබුණාටම වැඩක් නැහැ. ඒ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් handle කරන්න පුළුවන්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන් ආකාරයේ නිසි training එක තිබෙන teachersලා ඒ පාසල්වල සිටිය යුතුයි.

අධ්‍යාපනය වෙනුවෙන් සියයට 6ක් වෙන් කරන්න කියලා සටන් කරපු විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයේ සාමාජිකාවක් තමයි අද අධ්‍යාපන ඇමතිතුමිය විධියට ඉන්නේ. එම නිසා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ කථිකාචාර්යවරුන්ගේ වැටුප් ගැටලුව පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. මොකද, විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයේ සභාපති ආචාර්ය අනුරුද්ධ කරුණාරත්න මහතා ප්‍රකාශ කරනවා, "වෛද්‍යවරයෙකුට entry level එකේදීම රුපියල් 250,000ක විතර වැටුපක් ලැබෙනවා; හැබැයි, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයෙකුට ලැබෙන්නේ ඊට වඩා ගොඩක් අඩු වැටුපක්. මේ වැටුප් වැඩිවීම හරහා ඒ තත්ත්වය උග්‍ර වෙයි කියලා හිතනවා" කියලා. අපි වෛද්‍යවරුන් වාගේම විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ද මේ රට තුළ රඳවා ගත යුතුයි. ඒ වාගේම, පසුගිය කාල සීමාවේදී යම් යම් ආර්ථික අපහසුතාවන් නිසා අපේ රට අත්හැර පිට රටවලට ගිය කථිකාචාර්යවරු - lecturersලා - විශාල පිරිසක් ඉන්නවා. එම නිසා දැන් අපේ රටේ සිටින කථිකාචාර්යවරුන් ප්‍රමාණයවත් ආරක්ෂා කර ගන්න. ඒ වෙනුවෙන් සටන් කරපු කෙනෙක් තමයි අද අධ්‍යාපන ඇමතිවරිය හැටියට පත් වෙලා ඉන්නේ. ඒ තමයි අපේ ගරු අග්‍රාමාත්‍යතුමිය. එතුමිය ඒ තනතුරේ ඉඳලාත් තවම ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. ඒක මේ මම කියන දෙයක් නොවෙයි. විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයේ කැඳවුම්කරු ඇතුළු ඒ සංවිධානය තමයි එහෙම ප්‍රකාශ කරන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Harshana Rajakaruna, your time is up.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ නිසා තමුන්නාන්සේලා සියලු දෙනා ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව භාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.00]

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சின் குழுநிலை விவாதத்தில் பங்குகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

இதுவரை காலமும் வரவு செலவுத்திட்டத்தில் கல்விக்காக ஒதுக்கப்பட்ட நிதியைவிட, அதிகளவு நிதியை தேசிய மக்கள் சக்தி அரசாங்கமானது 2025ஆம் ஆண்டுக்காக ஒதுக்கியிருக்கின்றது. எமது அரசாங்கம் கல்விக்குக் கொடுக்கும் முக்கியத்துவத்தை நாம் இதிலிருந்து விளங்கிக் கொள்ளலாம். இலங்கையில் 1945ஆம் ஆண்டு சி.டபிள்யூ.டபிள்யூ. கன்னங்கரா அவர்கள் இலவசக் கல்வியை அறிமுகம் செய்தார் என்பது எம் அனைவருக்கும் தெரியும்! எனினும், மலையக மக்களுக்கு அதனைப் பெறுவதற்கான வாய்ப்பு 1977ஆம் ஆண்டுதான் கிட்டியது. இந்த நாட்டை ஆட்சி செய்த பல அரசாங்கங்கள் கல்வி தொடர்பான பல திட்டங்களை முன்னெடுத்தாலும்கூட, மலையகப் பகுதியில் அந்தத் திட்டங்களை நடைமுறைப்படுத்துவதில் பின்னடிப்புகளையும் பாரபட்சங்களையும் காட்டின.

மலையகத்திலுள்ள பாடசாலைகளைப் பொறுத்தளவில், அங்கு மனித வளப் பற்றாக்குறை அதிகமாக உள்ளது. வறுமையும் போஷாக்கின்மையும் பெற்றோரின் குறைந்த வருமானமும் அங்குள்ள மாணவர்களின் கல்வியில் பாதிப்பைச் செலுத்துகின்றன. இன்று மலையகத்தில் குடியிருப்புப் பிரச்சினை, சுகாதாரப் பிரச்சினைகள், உணவுப் பாதுகாப்பின்மை, 55 சதவீதமாகவுள்ள பெண் தலைமைத்துவக் குடும்பங்கள், பாடசாலைகளுக்குப் போதியளவு நிதி ஆதாரங்கள் இல்லாமை, பாடசாலைகளுக்குச் செல்வதற்குப் போதியளவு போக்குவரத்து வசதியின்மை, உயர் கல்வி நிறுவனங்கள் இன்மை, பாடசாலைகளில் போதியளவு சிற்றூழியர்கள் இன்மை, அதிபர் மற்றும் ஆசிரியர்களுக்கான விடுதியின்மை எனப் பல்வேறுபட்ட பிரச்சினைகள் காணப்படுகின்றன. அதிலும் விசேடமாக, இன்று ஆசிரியர் நியமனம் மற்றும் வளப் பகிர்வு போன்ற விடயங்களில் மலையகப் பாடசாலைகளுக்குத் தொடர்ச்சியாகப் பாரபட்சம் காட்டப்பட்டு வருவதை நாங்கள் அறிவோம்.

மலையகப் பாடசாலைகளில் பிரதான பாடங்களைப் போதிக்கும் ஆசிரியர்களின் பற்றாக்குறை அதிகமாகக் காணப்படுகின்றது. எந்தப் பாடசாலைகளுக்கு வளங்கள் தேவையோ, அந்தப் பாடசாலைகளுக்கு அவற்றை வழங்காது, அரசியல் நிகழ்ச்சிநிரலுக்கு ஏற்ப அவற்றைப் பகிர்ந்ததனால், இன்று மலையகத்திலுள்ள பல பாடசாலைகள் பாதிப்படைந்து இருப்பதாக நாங்கள் அறிகின்றோம். முன்னாள் கல்வி இராஜாங்க அமைச்சர் கௌரவ இராதாகிருஷ்ணன் ஐயா அவர்கள் கூறியதுபோல, மலையகம் இன்னும் கல்வியில் பின்தங்கிய நிலையிலே இருக்கின்றது. அவர் 'நல்லாட்சி' அரசாங்க காலத்தில் பல்வேறு திட்டங்களை எங்களுடைய பகுதியில் நடைமுறைப்படுத்தி இருந்தார். அதற்காக அவருக்கு எனது பாராட்டுக்களையும் நன்றிகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று மலையகத்திலுள்ள பாடசாலைகளில் கணித, விஞ்ஞானப் பிரிவுகளில் கற்பதற்கான வசதி மிக மிகக் குறைவாகவே காணப்படுகின்றது. நாங்கள் இந்த நாட்டுக்கு வந்து பல நூற்றாண்டுகளாகின்றன. அதுமாத்திரமன்றி, நாங்கள் இந்த நாட்டின் பொருளாதாரத்தை உயர்த்துவதற்காக உழைக்கின்ற மக்களாகவும் இருக்கின்றோம். எனினும், நான் வசிக்கும் இரத்தினபுரி மாவட்டத்தில் உயர் தரத்தில் விஞ்ஞான மற்றும் கணிதப் பிரிவில் பாடங்களைப் போதிக்கக்கூடிய சகல வசதிகளுடன் கூடிய முழுமையான ஒரு பாடசாலை இன்னும் இல்லை.

அங்குள்ள ஓரிரு பாடசாலைகளில் உயர் தர விஞ்ஞான மற்றும் கணிதப் பிரிவுகள் ஆரம்பிக்கப்பட்டு இருந்தாலும்கூட, அங்கு ஆளணி மற்றும் பௌதிக வளங்கள் இன்னும் முழுமை பெறவில்லை. அந்தப் பாடசாலைகளிலுள்ள அதிபர் மற்றும் ஆசிரியர்களின் முயற்சியால்தான் அந்தப் பிரிவுகள் கொண்டு நடத்தப்படுகின்றதே ஒழிய, அரசாங்கம் இன்னும் முழுமையான கவனம் செலுத்தவில்லை என்பதை நான் தெரிவித்துக் கொள்கின்றேன். இன்று ஆசிரியர் நியமனங்கள் பாடங்களின் தேவைக்கு ஏற்றவாறு, பாடசாலைகளில் நிலவும் வெற்றிடங்களுக்கு ஏற்றவாறு வழங்கப்படுவதில்லை.

இரத்தினபுரி மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு நூற்றுக்கணக்கான ஆசிரியர் வெற்றிடங்கள் காணப்படுகின்றன. எனினும், அவை இன்னும் நிரப்பப்படவில்லை. அங்கு பட்டதாரிகள் இருக்கிறார்கள். பட்டதாரி நியமனத்தின்போது, அங்குள்ள தமிழ் மொழிமூல பட்டதாரிகள் புறக்கணிக்கப்படுவதை நாங்கள் அவதானித்து இருக்கின்றோம். ஒவ்வொரு மாவட்டத்திலுமுள்ள பட்டதாரிகளுக்கு ஆசிரிய நியமனங்களை வழங்குவதன்மூலம் அங்குள்ள ஆசிரியர் பற்றாக்குறையை நிவர்த்தி செய்ய முடியுமென நான் கூற விரும்புகின்றேன். கடந்த காலத்தில் பெருந்தோட்டப் பாடசாலைகளுக்கு ஆசிரிய உதவியாளர்களை நியமிப்பதற்காக விண்ணப்பம் கோரப்பட்டது. எனினும், அதற்கு எதிராக வழக்குத் தாக்கல் செய்யப்பட்டதன் காரணமாக அவை இன்னும் வழங்கப்படாமல் இழுபறி நிலையில் இருக்கின்றது. நீதிமன்றத் தீர்ப்பு கிடைத்தவுடன், அதற்கு ஏற்ற வகையில் செயற்பட்டு, மலையகப் பாடசாலைகளிலுள்ள ஆசிரியர் பற்றாக்குறையைத் தீர்ப்பதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று அதிகமான பாடசாலைகளில் கடமை நிறைவேற்றும் அதிபர்கள்தான் இருக்கின்றார்கள். அவர்கள் அதிபர் சேவைக்குள் உள்வாங்கப்படாமையால் பல்வேறு பாதிப்புகளுக்கு உள்ளாகி இருக்கின்றார்கள். அந்த அதிபர்களை மலையகப் பாடசாலைகளுக்கு நியமிக்கும் செயற்றிட்டத்தை ஆரம்பிப்பது மிக முக்கியமானது என்பதை நான் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருக்கும் அவரது பிரதி அமைச்சருக்கும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

தற்பொழுது இச்சபையில் வடக்கு, கிழக்கைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பிர்கள் இருக்கிறார்கள். நான் இலங்கை ஆசிரியர் சேவை சங்கத்தின்

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

தேசிய அமைப்பாளராக இருந்தபோது, முல்லைத்தீவு, கிளிநொச்சி போன்ற தூரப் பிரதேசங்களிலுள்ள பாடசாலைகளுக்கும் சென்றிருக்கிறேன். அங்கு ஆசிரியர்களுக்குப் பாரிய பிரச்சினைகள் காணப்படுகின்றன. அங்குள்ள ஆசிரியர் விடுதிகள் மிருகங்கள்கூட வாழ முடியாதளவுக்கு மிக மோசமான நிலையில்தான் காணப்படுகின்றன. இன்று யாழ்ப்பாணத்திலிருந்து கிளிநொச்சி, முல்லைத்தீவு போன்ற தூரப் பிரதேசங்களிலுள்ள பாடசாலைகளுக்கு ஆசிரியர்கள் வந்து செல்வதற்குப் போக்குவரத்து வசதிகள் கிடையாது. இவ்வாறான பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும்.

கல்வி என்பது ஒரு நாட்டின் கண் போன்றது. கல்விக்கு எந்தளவு முக்கியத்துவம் கொடுக்கப்படுகின்றதோ அந்தளவுக்கு அந்த நாடு வளர்ச்சிப் பாதையில் முன்னோக்கிச் செல்லும். இந்த நாட்டை இதுவரை மாறி மாறி ஆட்சி செய்த அரசாங்கங்கள் கல்விக்கு நிதி ஒதுக்கீடு செய்யவில்லை என்று நான் கூற வரவில்லை. எனினும், அவை கல்விக்கு ஒதுக்கிய நிதி மிக மிகக் குறைவாகவே இருந்தது. ஏனைய துறைகளுக்கு முக்கியத்துவம் கொடுக்கப்பட்டிருந்தாலும்கூட, கல்வித்துறைக்கு முக்கியத்துவம் கொடுக்கப்படவில்லை. கடந்த காலங்களில் கல்விக்கு நிதி ஒதுக்கப்பட்டாலும்கூட, அதைப் பகிர்ந்தளிப்பதில் பிரதேச, இன ரீதியாகப் பாரபட்சம் காட்டப்பட்டது. இதனால் கடந்த காலங்களில் இலங்கையில் கல்வித்துறையானது பாரிய பின்னடைவைச் சந்தித்தது.

மலையகத்துக்கு ஒரு பல்கலைக்கழகம் வேண்டுமென நாங்கள் தொடர்ச்சியாக கோரிக்கைவிடுத்து வருகின்றோம். இன்று பல மாவட்டங்களில் சிங்கள மொழி மூலமான தேசியப் பாடசாலைகள் அதிகமாக இருந்தாலும்கூட, தமிழ் மொழி மூலமான தேசியப் பாடசாலைகள் மிக மிகக் குறைவாகவே இருக்கின்றன. எந்த மாவட்டமாக இருந்தாலும், மாணவர்கள் கல்வியைக் கற்றுக்கொள்வதற்கான வாய்ப்பு வழங்கப்பட வேண்டும். எதிர்வரும் காலங்களில் ஒவ்வொரு மாவட்டத்திலும் இருக்கின்ற பாடசாலைகளைச் சிறந்த முறையில் அபிவிருத்தி செய்து, அங்குள்ள மாணவர்களுக்குச் சிறந்த முறையில் கல்வி கற்பதற்கான வாய்ப்பை வழங்குவதற்கு நாங்கள் தீர்மானித்து இருக்கின்றோம்.

இன்று மலையகத்தில் 400க்கும் மேற்பட்ட பயிற்றப்படாத ஆசிரியர்கள் இருக்கிறார்கள். அவர்களுக்கு உடனடியாகப் பயிற்சிகளை வழங்க வேண்டும். அத்தோடு, அங்குள்ள தமிழ் மொழிமூல பாடசாலைகளில் நிலவும் சில பாடங்களுக்கான ஆசிரியர் வெற்றிடங்களையும் நிரப்புமாறு நான் கௌரவ கல்விப் பிரதி அமைச்சர் அவர்களிடம் கோரிக்கை விடுக்கின்றேன். அன்று வடக்கு, கிழக்கில் இருந்து வருகை தந்த ஆசிரியர்கள்தான் எங்களுக்கு கல்வியைப் போதித்தார்கள். எனக்கு உயர் தரத்தில் அரசறிவியலைப் போதித்தவர், ஜுட் மரியரத்னம் என்ற யாழ்ப்பாணத்தைச் சேர்ந்த ஆசிரியர் ஆவார். சில பாடங்களுக்குரிய ஆசிரியர்களை மீண்டும் வடக்கு, கிழக்கிலிருந்து வரவழைத்து, அவர்களுக்கு விசேட கொடுப்பனவுகளை வழங்கி, அவர்களை மலையகப் பகுதிகளில் சேவைக்கு அமர்த்துவதன்மூலம் அந்தப் பகுதியின் கல்வியை மேலும் மேம்படுத்தலாமெனக் கூறிக் கொள்கின்றேன்.

இன்று எதிர்க்கட்சியினர் பல்வேறு குற்றச்சாட்டுகளை முன்வைக்கின்றார்கள். இன்று நடைபெறுகின்ற கல்வி அமைச்சின் குழுநிலை விவாதத்தில்கூட, உறுப்பினர் ஒருவர் தாறுமாறாகச் சில குறைகளைக் கூறியிருந்தார். நான் அவருக்கு ஒன்றைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். இந்த மாதம் 8ஆம் திகதி கல்வி கூட்டுறவுச் சங்கத் தேர்தல் - EDCS election - நடைபெற்றது. அதில் அரச ஊழியர்களின் நிலைப்பாடு என்னவாக இருந்தது? குறிப்பாக, ஆசிரியர்களின் நிலைப்பாடு என்னவாக இருந்தது என்பது உங்களுக்குத் தெரியும்! இதன்போது தெரிவு செய்யப்பட்ட 382 உறுப்பினர்களில் 370 உறுப்பினர்கள் இலங்கை ஆசிரியர் சேவை சங்கத்தைச் சேர்ந்தவர்கள். இதுதான் யதார்த்தம்! இதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். இன்று மக்களுடைய நிலைப்பாடும் இதுவாகத்தான் இருக்கின்றது. இந்தக் கல்வி கூட்டுறவுச் சங்கத் தேர்தல் முடிவானது, ஒட்டுமொத்த மக்களுடைய நிலைப்பாடு என நான் கூறவரவில்லை. இருந்தாலும், நாங்கள் அதை ஓர் எடுகோளாக எடுக்கலாம். எனவே, இதைப் புரிந்துகொண்டு செயற்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

கல்வி என்பது இருளில் இருந்து ஒளியை நோக்கி நகர்வதாகும். இன்றும் எமது சமூகம் இருளில்தான் இருக்கின்றது. அதற்குக் காரணம், கடந்த கால அரசாங்கங்கள் எமது சமூகத்துக்குக் கல்வியைச் சிறந்த முறையில் வழங்காமையே ஆகும். எமது சமூகத்துக்குச் சிறந்த கல்வியைப் பெற்றுக்கொடுப்பதற்காக கடந்த காலங்களில் கௌரவ மனோ கணேசன் போன்றவர்கள் போராடினார்கள் என்பதை நான் இங்கு பெருமையாகக் கூறிக்கொள்கின்றேன். இருந்தும்கூட, அதனைச் சில அரசாங்கங்கள் கண்டுகொள்ளவில்லை. எனவே, நாம் எல்லோரும் எமது மலையக மக்களுக்காக ஒன்றிணைந்து செயற்படுவோம் எனக் கூறி, வாய்ப்புக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். வணக்கம்!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.12]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
நன்றி, கௌரவ பிரதித் தவிசாளர் அவர்களே!

இங்கு எனக்கு முன்னர் உரையாற்றிய கௌரவ பிரதி அமைச்சர் சுந்தரலிங்கம் பிரதீப் அவர்கள் எனது பெயரைக் குறிப்பிட்டு, நாங்கள் போராடியதாகக் குறிப்பிட்டார். அது உண்மைதான்! நாங்கள் இன்றும் போராடிக்கொண்டுதான் இருக்கின்றோம். எனவே, நாங்கள் ஆளுங்கட்சி, எதிர்க்கட்சி என்ற பேதம் இல்லாமல் ஒன்றாகக் கரம்கோர்த்துப் போராடுவோம். மிகவும் பின்தங்கிய, வறிய நிலையில் வாழக்கூடிய எமது மக்களுக்காக நாங்கள் நிச்சயமாக நன்மைகளைப் பெற்றுக்கொடுப்போம் என்று கூறிக்கொள்கின்றேன்.

ஓரிரு மாதங்களுக்கு முன்னர் இந்தச் சபையில் பிரதமரும் கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களிடம் நான் கேள்வியொன்றைக் கேட்டிருந்தேன். அப்போது அவர் சபையில் இருக்கவில்லை. அமைச்சரவைக் கூட்டத்தில் இருப்பதாகப் பிரதி அமைச்சர் அவர்கள் சொன்னார். அதனால் நான் அந்தக் கேள்வியைப் பிரதி அமைச்சரிடம் கேட்டேன். தற்பொழுது பிரதமர் அவர்கள் இந்தச் சபையில் இருக்கிறார். மிகவும் சந்தோஷமாக இருக்கிறது. அவரது மாவட்டமான கொழும்பு மாவட்டத்திலுள்ள கல்வித்துறை சார்ந்த சில குறைபாடுகளைச் சொல்ல விரும்புகின்றேன். நான் இங்கு சொல்லப்போகும் குறைபாடுகள் இந்த அரசாங்கத்தால் ஏற்படுத்தப்பட்டவை அல்ல. மாறாக, நீண்ட காலமாக நிலவிவரும் குறைபாடுகளாகும்.

உதாரணத்துக்கு, கொழும்பில் இருக்கக்கூடிய றோயல் கல்லூரி, இசிப்பத்தான கல்லூரி, டி.எஸ். சேனாநாயக்க கல்லூரி ஆகிய மூன்று பிரதான தேசியப் பாடசாலைகளை எடுத்துக்கொள்வோம். இந்த மூன்று பாடசாலைகளிலும் தமிழ்ப் பிரிவும் சிங்களப் பிரிவும் இருக்கின்றன. இருந்தாலும்கூட, வளம் நிறைந்த இந்தத் தேசியப் பாடசாலைகளில் படிப்படியாக தமிழ்ப் பிரிவுக்கான வகுப்புகள் குறைக்கப்பட்டு வருகின்றன. றோயல் கல்லூரியில் primaryஇல் - ஆரம்பப் பிரிவில் - Sinhala medium வகுப்புகள் எட்டு இருக்கின்றன. ஆனால், Tamil medium வகுப்புகள் இரண்டுதான் இருக்கின்றன. அதேபோல, Secondaryஇல் - தரம் 6 முதல் 12 வரை - Sinhala medium வகுப்புகள் ஏழு இருக்கின்றன. English medium வகுப்புகள் ஆறு இருக்கின்றன. ஆனால், Tamil medium வகுப்புகள் இரண்டுதான் இருக்கின்றன. அதேபோல, உயர் தரத்தில் - Advanced Levelஇல் - கணித, விஞ்ஞானப் பிரிவுகளில் Sinhala medium வகுப்புகள் பதினான்கும் Tamil medium வகுப்புகள் இரண்டும் English medium வகுப்புகள் இரண்டும் இருக்கின்றன. Advanced Level Commerce பிரிவில் Sinhala medium வகுப்புகள் ஐந்தும் Tamil medium வகுப்பு ஒன்றும் English medium வகுப்பு ஒன்றும் இருக்கின்றன.

டீ.எஸ். சேனாநாயக்க கல்லூரியில் Primaryஇல் Sinhala medium வகுப்புகள் ஆறும் Tamil medium வகுப்பு ஒன்றும் இருக்கின்றன. Secondaryஇல் - தரம் 06 முதல் 11வரை - Sinhala medium வகுப்புகள் ஏழும் Tamil medium வகுப்புகள் இரண்டும் English medium வகுப்புகள் இரண்டும் இருக்கின்றன. உயர் தரத்தில் - A/Lஇல் - கணித, விஞ்ஞானப் பிரிவுகளில் Sinhala medium வகுப்புகள் நான்கும் Tamil medium வகுப்பு ஒன்றும் English medium வகுப்புகள் இரண்டும் இருக்கின்றன. Advanced Level Commerce பிரிவில் - வர்த்தகப் பிரிவில் - Sinhala medium வகுப்புகள் நான்கும் Tamil medium வகுப்புகள் ஒன்றும் English medium வகுப்பு ஒன்றும் இருக்கின்றன. இசிப்பத்தான கல்லூரியில் primaryஇல் - ஆரம்பப் பிரிவில் - Sinhala medium வகுப்புகள் ஆறும் Tamil medium வகுப்பு ஒன்றும் இருக்கின்றன. Secondaryஇல் - தரம் 6 தொடக்கம் 11 வரை - Sinhala medium வகுப்புகள் ஆறும் English medium வகுப்பு ஒன்றும் Tamil medium வகுப்பு ஒன்றும் இருக்கின்றன. உயர் தரப் பிரிவில் Sinhala medium வகுப்புகள் ஆறும் Tamil medium வகுப்பு ஒன்றும் இருக்கின்றன. கௌரவ பிரதமர் அவர்களே, இது மிகவும் பாரபட்சமான ஒரு நிலைப்பாடாக இருக்கின்றது.

பல இனங்கள் வாழக்கூடிய கொழும்பு போன்ற மாவட்டங்களில்தான் தேசிய ஒற்றுமையைக் கட்டியெழுப்ப முடியும். அதாவது, தமிழர்கள், சிங்களவர்கள், முஸ்லிம்கள் அல்லது பௌத்தர்கள், இந்துக்கள், இஸ்லாமியர்கள், கத்தோலிக்கர்கள் சேர்ந்து வாழக்கூடிய cosmopolitan districtsஇல்தான் தேசிய ஒற்றுமையைக் கட்டியெழுப்ப முடியும். இவ்வாறான மாவட்டங்களில் எல்லாம் நாங்கள் தமிழ்ப் பாடசாலை, சிங்களப் பாடசாலை, முஸ்லிம் பாடசாலை, கத்தோலிக்க பாடசாலை, பௌத்த பாடசாலை, இந்துப் பாடசாலை என்று ஆரம்பித்துவிட்டு, சிறு வயதிலேயே பிள்ளைகளை, "நீங்கள் இந்துக்கள்! நீங்கள் தமிழர்கள்! நீங்கள் சிங்களவர்கள்! நீங்கள் முஸ்லிம்கள்!" எனப் பிரித்து வைக்கின்றோம். 18 வயதாகிய பிறகு, அவர்கள் எல்லோரையும் பார்த்து, "நீங்கள் இலங்கையர்களாக எழுந்து நில்லுங்கள்!" என்று சொல்கின்றோம். இது பிழை!

வாய்ப்புகள் அதிகமாக இருக்கும் இடம்தான் கொழும்பு! அது வர்த்தகத் தலைநகரமாகவும் இருக்கின்றது. எனவே, கொழும்பில் வாழக்கூடிய மக்களுக்கு இத்தகைய பாடசாலைகளை முதலில் ஆரம்பியுங்கள்! பிரதான தேசியப் பாடசாலைகளில் வளங்கள் நிறைய இருக்கின்றன. அந்தப் பாடசாலைகளில் தமிழ் மொழிமூல வகுப்புகளை அதிகரியுங்கள்! விசேடமாக றோயல் கல்லூரி, இசிப்பத்தான கல்லூரி, டீ.எஸ். சேனாநாயக்க கல்லூரி போன்றவற்றில் தமிழ் மொழிமூல வகுப்புகளை அதிகரியுங்கள்! எனக்கு நன்றாகத் தெரியும். ஆனாலும், பெயரைச் சொல்ல விரும்பவில்லை. ஒருசில அதிகாரிகளும் அதிபர்களும் ஒன்று சேர்ந்து, இசிப்பத்தான கல்லூரி, டீ.எஸ். சேனாநாயக்க கல்லூரி, றோயல் கல்லூரி போன்றவற்றில் தமிழ் மொழிமூல வகுப்புகளைத் திட்டமிட்டுக் குறைக்கின்றார்கள்.

அதுமட்டுமல்ல, ஒரு வகுப்பில் ஏறக்குறைய 40 மாணவர்கள் இருக்கலாமென்றாலும், தமிழ் மொழிமூல வகுப்புகளில் 40 மாணவர்களைச் சேர்ப்பதில்லை. அனுமதிக்கான கோரிக்கைகள் வந்தாலும் அவர்கள் சேர்ப்பதில்லை. இதெல்லாம் எனக்குத் தெரியும்! இது நீண்ட காலமாக நடைபெற்று வருகின்ற ஒரு விடயமாகும். நாங்கள் ஆட்சியில் இருந்தபோதும் இது நடைபெற்றது; இப்பொழுதும் நடைபெற்றுக் கொண்டுதான் இருக்கின்றது. இதனை நான் கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். ஒரு முறை நான் அமைச்சரவையில் றோயல் கல்லூரி சம்பந்தமாகப் பிரஸ்தாபித்தபோது, அப்போது அங்கிருந்த கல்வி அமைச்சர் அகில விராஜ் காரியவசம் அவர்கள், "අනේ මගෝ, රෝයල් විද්‍යාලය ගැන කථා කරන්න එපා." என்று சொன்னார். அதன் அர்த்தம் என்ன? அவ்வேளையில் நான் போராடினேன். கௌரவ சுந்தரலிங்கம் பிரதீப் அவர்கள் சொன்னது உண்மைதான்! நாங்கள் போராடித்தான் பல விஷயங்களைச் செய்திருக்கிறோம். போராடாமல் ஒன்றும் நடக்காது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்களாவது அதைச் செய்து காட்டுங்கள்! நாங்கள் அதற்கு முழுமையான ஒத்துழைப்பைத் தருவதற்குத் தயாராக இருக்கின்றோம்.

பல இனங்கள் சேர்ந்து வாழக்கூடிய மாவட்டங்களில்தான் - cosmopolitan districtsஇல்தான் - தேசிய ஒற்றுமையைக் கட்டியெழுப்ப முடியும் என்பதை நான் மீண்டும் கூறிக்கொள்ள விரும்புகின்றேன். ஒரே கூரையின்கீழ் சிங்களப் பிள்ளைகள், தமிழ்ப் பிள்ளைகள், முஸ்லிம் பிள்ளைகள், கத்தோலிக்க பிள்ளைகள் என எல்லோரும் சேர்ந்து கல்வி கற்கக்கூடிய நிலையை ஏற்படுத்துங்கள்! அது நல்ல விஷயம்தானே! அவ்வாறு செய்தால் இளைஞர், யுவதிகள் ஒற்றுமையாக வாழ்வார்கள். நீங்கள் இதை முதலில் பிரபல பாடசாலையில் ஆரம்பியுங்கள்! றோயல் கல்லூரியில் பழைய மாணவர்கள், அதிபர்கள், அதிகாரிகள் எனப் பலர் சேர்ந்த பலம்வாய்ந்த ஓர் அமைப்பு இருக்கின்றது. அதை உடையுங்கள்! ஏனெனில், அது சரியாக இருக்க வேண்டும். அதை உடைத்து, நீங்கள்

[ගරු මනෝ ගනේසන් මහතා]

සරිප්පடுத்துங்கள்! இசிப்பத்தான கல்லூரியிலும் அப்படித்தான்! டீ.எஸ். சேனாநாயக்கா கல்லூரியிலும் அப்படித்தான்! எனவே, இதனை இங்கே ஆரம்பியுங்கள்! வேறு எங்கும் ஆரம்பிக்க முடியாது.

යாழ்ப்பாணத்தில் சிங்கள மகா வித்தியாலயம் இருக்கின்றது. எனது தனிப்பட்ட அபிப்பிராயம் என்னவென்றால், சிங்கள மகா வித்தியாலயம் என்று யாழ்ப்பாணத்தில் இருக்கத் தேவையில்லை என்பதுதான். ஏனெனில், அங்கு பிரபலமான பல தேசியப் பாடசாலைகள் இருக்கின்றன. உதாரணத்துக்கு, யாழ். இந்துக் கல்லூரி, யாழ். மத்திய கல்லூரி என்பவற்றைக் குறிப்பிடலாம். அந்தக் கல்லூரிகளில் சிங்களப் பிரிவை ஆரம்பித்து இந்தச் சிங்கள மகா வித்தியாலயத்தை அவற்றுடன் சேர்த்துவிடுங்கள்! அப்படிச் செய்தால் ஒரே கூரையின்கீழ் யாழ்ப்பாணத் தமிழ் பிள்ளைகளும் சிங்களப் பிள்ளைகளும் படிப்பார்கள். அதைச் செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

அதுமட்டுமல்ல, பாடசாலைகளில் ஆளணிப் பிரச்சினையும் இருக்கின்றது. குறிப்பாக, management ஆளணி, ஆசிரியர் ஆளணி என்பவற்றில் நிறையக் குறைபாடுகள் இருக்கின்றன. நான் இங்கு சொன்ன தேசியப் பாடசாலைகளில் management சார்ந்து தமிழ்ப் பிரிவுக்கென தனியான cardre இல்லை. அந்தக் cardre கட்டாயம் வேண்டும். இல்லாவிட்டால், அந்தப் பிரிவை கொண்டுநடாத்த முடியாது. அங்கு பொது cardre இருப்பதன் காரணமாக எல்லா ஆளணியையும் சிங்களப் பிரிவுக்குக் கொடுக்கிறார்கள். இதனால் தமிழ்ப் பிரிவுக்குப் போதியளவு ஆளணி இல்லை. அதனால்தான் நாங்கள் சொல்கின்றோம், தயவுசெய்து பல இனங்கள் வாழுகின்ற கொழும்பு போன்ற பகுதிகளிலுள்ள தேசியப் பாடசாலைகளிலுள்ள தமிழ் பிரிவுகளையும் தமிழ் பாடசாலைகளையும் ஒன்றாகச் சேர்த்து பிரத்தியேகமான வலயம் - zone - ஒன்றை அமையுங்கள் என்று. அவ்வாறு அமைத்தால்தான் பாடசாலைகளின் நிர்வாகத்தைச் சிறப்பாகச் செய்ய முடியும். அதாவது, Development of educationஐயும் administration of educationஐயும் சிறப்பாகச் செய்ய முடியும். ஆகவே, அதனைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மலையகத்தைப் பற்றி எனது நண்பரும் கௌரவ பிரதி அமைச்சருமான சுந்தரலிங்கம் பிரதீப் அவர்கள் பேசினார். அது நல்ல விஷயம். அவர் கூறியது உண்மைதான்! நுவரெலியா மாவட்டத்தை தவிர, அவரது மாவட்டம் உட்பட மலையகத்தின் பல இடங்களில் உயர் தரத்தில் விஞ்ஞானப் பிரிவு இல்லை. எங்களது ஆட்சிக் காலத்தில் மலையகப் பாடசாலைகள் தொடர்பில் பிரத்தியேகமான ஓர் அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பித்து, அந்தப் பாடசாலைகளுக்கு அண்மித்து இருக்கின்ற 2 ஏக்கர் காணியைப் பெறக்கூடிய வாய்ப்பைப் பெற்றுக்கொடுத்து இருக்கின்றோம். நண்பர் பிரதீப் அவர்களே, நீங்கள் அதைப் பயன்படுத்துங்கள்! உங்களுக்கு உரிமை இருக்கின்றது!

2003ஆம் ஆண்டுதான் எங்களுடைய மக்களுக்கு முழுமையாக குடியுரிமை கிடைத்தது. நாங்கள் late starters. இதனால் நாங்கள் அரசியல், சமூக, பொருளாதார, கலாசார, கல்வி, சுகாதாரம் எனப் பல துறைகளிலும் பின்தங்கி இருக்கின்றோம். காரணம் இதுதான்! Systemஐ மாற்றாமல் நாங்கள் உங்களைக் குறைசொல்வதும், நீங்கள் எங்களைக் குறைசொல்வதும் சரிவராது. You have come to change the system. So, change the system from the plantations என கூறிவைக்க விரும்புகின்றேன்.

கௌரவ கல்வி அமைச்சர் அவர்களே, நீங்கள் விசேட ஆசிரியர் பயிற்சிக் கலாசாலை ஒன்றை அமையுங்கள்! அதன்மூலமாக பெருந்தோட்டப் பாடசாலைகளிலுள்ள ஆசிரியர் பற்றாக்குறையை நிவர்த்தி செய்யுங்கள்! We need a remedial action plan there because we are the most backward people. Therefore, we need remedial action. We have a reasonable and fair-minded Minister for education. So, I kindly request her to take remedial action. நண்பர் பிரதீப் அவர்களே, முதலில் பேராதனைப் பல்கலைக்கழகத்தின் வளாகமொன்றை நுவரெலியாவில் அமையுங்கள்! காலக்கிரமத்தில் அதனைப் பல்கலைக்கழகமாக மாற்றுங்கள்! வவுனியாவில் அமைக்கப்பட்ட யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் வளாகம்தான் இப்பொழுது வவுனியா பல்கலைக்கழகமாக மாறியிருக்கின்றது. எனவே, அதைச் செய்யுமாறு கூறி, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 22ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.21]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මගේ කථාව ආරම්භ කරන්න පෙර මතක් කරන්න ඕනෑ, විෂය භාර ඇමතිතුමිය හැටියට ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් රාධාකෘෂ්ණන් මන්ත්‍රීතුමාගේ කථාවට ලබා දුන් පිළිතුරක් ගැන. එතුමා විද්‍යාපීඨ සම්බන්ධයෙන්, පාසල් ගුරුවරුන් සම්බන්ධයෙන් කථා කළා. ඔබතුමිය ඒ ගැන කියද්දී ලොකු විප්ලවයක් ගැන කිව්වා. මම ඔබතුමියට මේ කාරණය කියනවා. මේ වෙනකොට උතුරු, නැඟෙනහිර පළාත්වල සිංහල මාධ්‍ය ගුරුවරුන් interview කරලා සියලු කටයුතු සිදු කරලා තිබෙනවා. ඒ පත්වීම් දීලා අපි විප්ලවය පටන් ගනිමු. ඒ වාගේම මධ්‍යම පළාතේ පවතින ගුරු හිඟයට විසඳුමක් හැටියට ඒ පළාතේ සිටින උපාධිධාරීන් ගුරු විභාගය ලියලා මේ වෙනකොට පත්වීම් ගන්න බලාගෙන ඉන්නවා. අපි එතැනින් මේවා ආරම්භ කරමු කියන යෝජනාව මම ඔබතුමියට ඉදිරිපත් කරනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය ලෙස කටයුතු කරන ඔබතුමිය හොර සහතික දීලා නැහැ කියලා මම දන්නවා. මොකද, ඔබතුමිය ඇත්තටම ආචාර්ය උපාධියක් තිබෙන, විදේශ අධ්‍යාපනයක් තිබෙන, ඒ වාගේම විශ්වවිද්‍යාලයක කථිකාචාර්යවරියක ලෙස කටයුතු කරපු කෙනෙක්. ඒ සහතිකය අපට තිබෙනවා. මම ඔබතුමියව 2020 වර්ෂයේ ඉඳලා දන්නවා. මේ පැත්තේ ඉඳගෙන අධ්‍යාපන ආංශික අධීක්ෂණ කාරක සභාවේදී, එහෙම නැත්නම් උපදේශක කාරක සභාවේදී ඔබතුමියත්, අද මේ රටේ ජනාධිපති ධුරය දරන අනුර කුමාර දිසානායක මැතිතුමාත්, මමත් -අපි හැමෝම- අධ්‍යාපනය සම්බන්ධයෙන් හිටියේ එකම මතයක. අද අපි දෙපැත්තට වෙලා කථා කරන්නේ, එදා අපි එකම මතයක ඉඳලා හඬ නඟපු, එහෙම නැත්නම් කරපු වැඩ කටයුතු ටික ඉස්සරහට ගෙනියන්නේ කොහොමද කියන එක ගැනයි. මම පසුගිය මාස කිහිපය තුළ සිදු වූ දේවල් දෙස බලාගෙන හිටියා. ඔබතුමිය විපක්ෂයේ සිටියදී දරපු ස්ථාවරය දැන් වෙනස් වෙලා කියලා අමාත්‍යාංශය දිහා බලනකොට මට පේනවා. මොකද,

හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යවරිය පසුගිය කාලයේ මන්ත්‍රීවරියක හැටියට ඉන්නකොට අපි දැකපු හැඩය දැන් එතුමියගේ අමාත්‍යාංශයෙන් එළියට එන්නේ නැහැ. ඇත්තටම අමාත්‍යාංශය මෙහෙය වන්නේ ඔබතුමියද, එහෙම නැත්නම් මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාද කියලා ගුරුවරුන් අතර, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අය අතර කථාවක් තිබෙනවා. දැන් මේ යන විධිය දැක්කාම මටත් ඒ සැකය තිබෙනවා. ගරු ඇමතිතුමියනි, මම ඒක කියන්න එක හේතුවක් තමයි, ඔබතුමිය ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකා කිහිපයක් සම්බන්ධව මතභේදයක් ඇතිවීම. හැබැයි, නිල වශයෙන් ඔබතුමිය අධ්‍යාපන ඇමතිතුමිය විධියට දැක්වෙන නිසා මම අද ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ගාමණී ජයසූරිය, බදියුදීන් මහමුද්, නිශ්ශංක විජේරත්න, රනිල් වික්‍රමසිංහ, ලලිත් ඇතුලත්මුදලි, රිවර්ඩ පතිරණ, ජී.එල්. පීරිස් සහ තවත් අය අධ්‍යාපන අමාත්‍ය ධුරය දැරුවා. එවැනි සුවිශේෂී නායකයන් තරම්ම හරිනි ඇමතිතුමියත් අධ්‍යාපනයේ වෙනස්කමක්, වෙනසක වටිනාකමක් හොඳින් තේරුම් ගන්න පුළුවන් කෙනෙක් විධියට මා දකිනවා. ඒ නිසා අද අධ්‍යාපනයේ ප්‍රතිපත්තිවලට වෙලා තිබෙන අවුල මොකක්ද කියන එක ගැන කරුණු කිහිපයක් මම අද ඔබ ඉදිරියේ දක්වන්නට බලාපොරොත්තු වෙනවා.

පළමුවැනි කාරණය මේකයි. අපේ රටේ අධ්‍යාපනයේ තිබෙන ලොකුම ප්‍රශ්නය, යුගයේ අවශ්‍යතාවට අනුව අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් නොවීම කියන එක මා දකිනවා. අපේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිද්ධ වුණේ නැහැ නොවෙයි, අධ්‍යාපන ප්‍රතිපත්ති යුගයෙන් යුගයට ප්‍රතිසංස්කරණය කරන්නට ඉඩ දුන්නේ නැහැ කියන එක තමයි ඇත්ත. සමහර වෙලාවට ඒක බලහත්කාරයෙන් වැළැක්වුවා. ඒ බලහත්කාරයේ ප්‍රතිඵල යුග ගණනාවක් තිස්සේ අපි භුක්ති විඳිමින් ඉන්නවා. මම මතක් කරන්න ඕනෑ, 1960දී අධ්‍යාපන ධවල පත්‍රිකාවෙන් සැලසුම් සහගත අධ්‍යාපන ක්‍රමයක් හදන්න පටන් ගත් බව. හැබැයි, අපි එදා ඒ පටන් ගත් අධ්‍යාපන ක්‍රමයම තමයි, තවමත් පැලැස්තර දාගෙන මේ ඉස්සරහට ගෙනයන්නේ. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතම තමයි අද දක්වාම ක්‍රියාත්මක වෙන්නේ. අපට ඇත්තටම ඒකට පැවි දමන්න විතරයි පුළුවන් වෙලා තිබෙන්නේ. අවුරුදු 47ක් තිස්සේ විශ්වවිද්‍යාල එක තැනම පල් වෙන්නේ අන්න ඒ නිසායි. මම විස්තර ටිකක් කියන්නම්. 1960දී අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවෙන් නිර්දේශ කරපු දේවල් තමයි අදටත් ක්‍රියාත්මක වෙන්නේ. උදාහරණයක් හැටියට, 1960දී පාසල් ශිෂ්‍ය නේවාසිකාගාර ගැන ගහපු චක්‍රලේඛයම තමයි අදටත් ක්‍රියාත්මක වෙන්නේ. ගරු අග්‍රාමාත්‍යතුමියනි, 1980දී පහසුකම් හා සේවා ගාස්තු ගැන ගහපු චක්‍රලේඛයම තමයි අදටත් සංශෝධනය වෙලා ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ. මේවා වෙනස් වෙන්න ඕනෑ. හැබැයි, ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්න හදපු හැම වෙලාවේම ඒකට එක්කෝ දේශපාලන පක්ෂ මැදට පැන්නා, එහෙම නැත්නම් දේශපාලන පක්ෂ පිටුපසින් ඉඳගෙන ශිෂ්‍ය ව්‍යාපාර ඉස්සරහට දාලා ඒවා කඩාකප්පල් කළා.

1978දී සිදු කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගත්තාම, 1978දී විශ්වවිද්‍යාල පනත සම්මත කර ගන්නට එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ රජයට හැකියාව ලැබුණා. එදා ඒකට ජනතා විමුක්ති පෙරමුණේ සහයෝගය ලැබුණු නිසා ඒ ආණ්ඩුව බලයට ඇවිල්ලා කෙටි කාලයකින් ඒ පනත සම්මත කරගන්න හැකියාව ලැබුණා.

1981දී ඉදිරිපත් වූ අධ්‍යාපන ධවල පත්‍රිකාව ඊට වඩා වෙනස්. එමඟින් යෝජනා කරපු ප්‍රතිසංස්කරණ වෙනස් කරගන්න අපට ඇත්තටම බැරි වුණා. ඒ කාලයේ අපි නම් බොහොම පුංචියි, ඔබතුමිය සහ මා ප්‍රාථමික අධ්‍යාපනයේ යෙදුණු කාලය. හැබැයි, මේ සභාවේ ඉන්න සමහර මන්ත්‍රීතුමන්ලාට තමන්ගේ හදවතට තට්ටු කරලා අහලා බලන්න කියලා මම කියනවා. ලංකා ඉතිහාසයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් වෙච්ච ලොකුම වැරැද්ද තමයි එදා ඒකට විරුද්ධ වීමෙන් සිද්ධ වුණේ. අවුරුදු 44කට පස්සේ අදත් එදා -1981දී- යෝජනා කරපු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා, ඒවාට ප්‍රතිසංස්කරණ ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අතර, එදා අධ්‍යාපන ධවල පත්‍රිකාවට විරුද්ධ වෙච්ච අයගේ දරුවෝ, ඔවුන්ගේ දරුවන්ගේ දරුවෝ අද වෙනකොට ජාත්‍යන්තර පාසල්වල, එහෙම නැත්නම් විදේශ රටවල අධ්‍යාපනය ලබනවා. එදා ඔවුන් ඒකට විරුද්ධ වුණා. ඒ දරුවෝ ඒ තැන්වල අධ්‍යාපනය ලබනවාට මම විරුද්ධ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මොකද, සෑම දරුවෙකුටම අධ්‍යාපනයේ නිදහස තිබිය යුතුයි. ඒක නිදහස් අධ්‍යාපනයට එහා ගිය පුළුල් මානෘකාවක්. හැමෝටම අධ්‍යාපනයේ නිදහස තිබිය යුතුයි.

චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, තාරා ද මෙල් ලේකම්තුමිය 1997දී ගෙනාපු සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සිද්ධ වුණේ මොකක්ද කියලා ඒ ගැන අවබෝධයෙන් හිටපු සියලුදෙනාම දන්නවා ඇති. ඒ යුගයේ ඉගෙන ගත් මන්ත්‍රීවරුනුත් මේ පාර්ලිමේන්තුවේ ඇති. 2000දී අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව පෙළපාළි ගිහිල්ලා කඳුළු ගෑස් කාපු අය මේ සභාවේ ඉන්නවා. මේ යෝජනා දෙස නැවත වතාවක් හැරිලා බලන්න. ඒවා ගිනි තියපු එකේ ප්‍රතිඵලය අපි අද භුක්ති විඳිනවා. 2007දී විෂයමාලා ප්‍රතිසංස්කරණවලට විරුද්ධව ලංකාවේ සියලුම විශ්වවිද්‍යාලවල සිසුන් පාරට බැස්සුවා මතක ඇති. මොකද වුණේ? මුදල් තිබෙන බහුතරය පෞද්ගලික විශ්වවිද්‍යාලවලට, විදේශ විශ්වවිද්‍යාලවලට ගියා. එහෙම වියදම් කරගන්න බැරි අඩු ආදායම්ලාභීන් බහුතරය මේ රටේ ජාතික විශ්වවිද්‍යාලවල තනි වුණා.

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ හිටපු සාමාජිකයින් අද මේ ගරු සභාවේ ඉන්නවා. තමන්ගේ හෘදය සාක්ෂියට කථා කරලා මේ කාරණය අහන්න කියලා මම එතුමන්ලාට කියනවා. මේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැළැක්වීම හේතුවෙන් අද මේ රට කොච්චර මිලක්, කොච්චර වන්දියක් ගෙවනවාද කියලා හොඳට හිතා බලන්න. අද මේ ආණ්ඩුවේ මුල් පෙළ සිටින බොහෝදෙනෙකුගේ දරුවන් කී දෙනෙක් උපාධිය හැදෑරීම සඳහා වෙනත් රටවල විශ්වවිද්‍යාලවලට යොමු වෙලා තිබෙනවාද, ඒවායේ අධ්‍යාපනය ලබනවාද? හැබැයි, එදා මේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල, එහෙම නැත්නම් විදේශ විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට විරුද්ධ වුණා. අද අපේ ලංකාවේ විශ්වවිද්‍යාලවල දරුවෝ, උපාධිය නැතුව රස්තියාදු වෙන අය සමාජයේ නැද්ද කියලා ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහන්න කියලා මම කියනවා.

දෙවන කාරණය මේකයි. ගරු අග්‍රාමාත්‍යතුමියනි, කාන්තා දිනයේදීත් ඔබතුමිය කිව්වා, නිදහස් අධ්‍යාපනයේ වටිනාකම ගැන. මම කලිනුත් ඒ කාරණය ගැන කිව්වා. ඔව්, මම පිළිගන්නවා, නිදහස් අධ්‍යාපනය ඉතා වැදගත් කියලා. හෝඩියේ ඉඳලා උසස් පෙළ දක්වා, උසස් පෙළ ඉඳලා විශ්වවිද්‍යාලය දක්වා, එහෙම නැත්නම් Technical College එක දක්වා අධ්‍යාපනය ලබා ගැනීම ඉතාම වැදගත්. ඒ සඳහා නිදහස තිබෙන්න ඕනෑ. දරුවන් ලක්ෂ එකහමාරක් උසස් පෙළ විභාගය පාස් වෙනකොට විශ්වවිද්‍යාලයට ඇතුළු වෙන්නේ එයින් කී දෙනෙක්ද කියන එක පිළිබඳව අපි මීට වඩා අවධානය යොමු කරන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනයට වඩා අධ්‍යාපනයේ නිදහස වැදගත් කියලා මම මේ සභාවට යෝජනා කරන්නේ ඒකයි. අපේ දරුවන්ට, එහෙම නැත්නම් ඒ දරුවන්ගේ දෙමව්පියන්ට තමන්ගේ දරුවන්ට අධ්‍යාපනයේ නිදහස ලබා දීමට තිබෙන අයිතිය අපි තහවුරු කරන්න ඕනෑ.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ඊළඟට, අධ්‍යාපනයේ නිදහස ගැන කියනකොට මම මේ කාරණයත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. වසරකට දරුවන් ලක්ෂ එකහමාරක් උසස් පෙළ විභාගය සමත් වෙනවා. නමුත්, විශ්වවිද්‍යාලයට අරගෙන තිබෙන වැඩිම සංඛ්‍යාව 44,000යි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2015-2019 යහ පාලන සමයේ තමයි විශ්වවිද්‍යාලවලට දරුවන් වැඩිම පිරිසක් ඇතුළත් කර ගත්තේ. 2018දී 32,000ක්ව තිබුණු එම අගය 2020 වෙනකොට 41,700 දක්වා වැඩි කළා. ඒ මඟින් අද වෙනකොට අවුරුදු 10ක් ඇතුළත බිහි වන උපාධිධාරීන් සංඛ්‍යාව වෙනදාට වඩා ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවකින් වැඩි වෙලා තිබෙනවා. ඒක අවිධිමත්ව සිද්ධ වුණා කියලා ඔබතුමිය කිව්වා, ගරු අගමැතිතුමියනි. හැබැයි මම කියනවා, ඒ වුණේ රැකියා ඉලක්ක කරගෙන වුණු සිදුවීමක් කියන එක.

ඊළඟට, මම මේ වෙලාවේ මෙම කාරණයත් මතක් කරන්න ඕනෑ. කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය කිව්වා, අධ්‍යාපනය ලබා දීම රජය මඟින්ම කරන්න ඕනෑ කියලා. එතැන පොඩි තර්කයක් තිබෙනවා. එහෙම අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන් නම් ඇත්තටම හොඳයි. රජය මැදිහත් වෙලා උසස් පෙළ විභාගය සමත් වන 150,000ටම රජයේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හදාරන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. හැබැයි, දැන් විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නේ 44,000ක් වාගේ සංඛ්‍යාවක්. ඒ කියන්නේ, ඒ වාගේ තවත් තුන් ගුණයක් ඉන්නවා. අපේ රට මුදල් යහමින් නැති රටක් නිසා අය වැය සීමා තිබෙනවා. එතකොට ඒ තුන් ගුණයට වියදම් කරන්න රජයට හැකියාව තිබෙනවාද? ඒ නිසා ප්‍රායෝගිකව විශ්වවිද්‍යාලවලට ඒ 150,000 ඇතුළත් කර ගන්න පුළුවන්ද කියලා මම ප්‍රශ්න කරනවා. ඒක කවදාවත් කරන්න බැහැ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය මීට වඩා හොඳින් තේරුම් ගන්න කියලා මම ඔබතුමියට කියන්නේ.

තුන්වන කාරණය තමයි, අධ්‍යාපනයේ නිදහස. ඔබතුමිය දන්නවා, වෛද්‍ය උපාධියකට ආණ්ඩුව රුපියල් ලක්ෂ 55ක් වියදම් කරන බව; නීති උපාධියකට රුපියල් ලක්ෂ 31ක් වියදම් කරනවා; කලා උපාධියකට රුපියල් ලක්ෂ 14ක් වියදම් කරනවා. මෙතැනදී මම බොහොම සංකල්පීය ප්‍රශ්නයක් අහනවා. උසස් පෙළ විභාගය සමත් වෙච්ච දරුවෙකුට ඒ මුදල දීලා කැමැති විශ්වවිද්‍යාලයක් තෝරා ගන්න කිව්වොත්, ඒ දරුවා තෝරා ගන්නේ රජයේ විශ්වවිද්‍යාලයක්ද, පෞද්ගලික විශ්වවිද්‍යාලයක්ද එහෙම නැත්නම් විදේශ විශ්වවිද්‍යාලයක්ද? ඒ පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ.

ඊළඟට, අපි උසස් පෙළ දරුවන් ගැන කථා කරනවා. සාමාන්‍ය පෙළ විභාගය සමත්වෙලා උසස් පෙළ ඉගෙන ගන්න එන දරුවාට අධ්‍යාපනයේ නිදහස තිබෙනවාද? තමන් කැමති විෂය ධාරාවක් හදාරන්න ඒ දරුවන්ට හැකියාව තිබෙනවාද? සමහර පාසල්වල ගුරුවරු නැහැ. සමහර පාසල්වල ඉඩකඩ නැහැ.

ඒ තිබෙන කාල සටහනේ හැටියට දරුවා කැමති විෂයයක් කරන්න හැකියාව නැහැ. පාසල දෙන කාල සටහනට අනුව තමයි දරුවන්ට විෂයයන් තෝරා ගන්න වෙලා තිබෙන්නේ. අන්න, අධ්‍යාපනයේ නිදහස නැති වන තැනක්. ඒ වාගේම විශ්වවිද්‍යාලයට යන දරුවන්ට තමන් කැමති විෂයයක් හදාරන්න තිබෙන අයිතිවාසිකම ලැබෙනවාද, එහෙම නැත්නම් අධ්‍යාපනයේ නිදහස තිබෙනවාද? සරලව කිව්වොත්, මේ වෙනකොට අධ්‍යාපනයේ නිදහස සීමා වෙනවා කියන එක මම කියන්න කැමතියි.

නිදහස් අධ්‍යාපනය කියන එක 1960දී කන්නන්ගර මැතිතුමාගේ -නිදහස් අධ්‍යාපනයේ පියාගේ- සංකල්පයක් අනුව ඇති කළ එකක්. ඒක ඉතා වැදගත්. ඒ නිසා තමයි අපේ රට මේ විධියට ඉස්සරහට ආවේ. හැබැයි, අද ලංකාවේ තිබෙන්නේ නිදහස් අධ්‍යාපනයට එහා ගිය, අධ්‍යාපන නිදහස ලබා දෙන්නේ කොහොමද කියන සාකච්ඡාව. ඒක මම පැහැදිලි සිංහලෙන් කිව්වොත්, තවදුරටත් දේශපාලන අවශ්‍යතා මත විශ්වවිද්‍යාල දරුවෝ කුලප්පු කරන එක නවත්වලා, හැම දරුවාටම තමන් කැමති විෂයයක් හදාරන්න, තමන් කැමති පෞද්ගලික, ආණ්ඩුවේ හෝ විදේශ විශ්වවිද්‍යාලයකට යන්න අවස්ථාව ලැබෙනවා නම් මම දකින විධියට ඒක තමයි අධ්‍යාපනයේ නිදහස කියන්නේ. උසස් පෙළ විභාගය සමත් වෙන මුදල් ඇති-නැති සියලු දරුවන්ට උසස් අධ්‍යාපනය ලබන්න තිබෙන අයිතිය තහවුරු කරන්න කියලාත් මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කළ යුතුය කියන එක අපි හැමෝම කියනවා. මම මේ වෙලාවේ ඒ ගැන කථා කරන්නේ නැහැ. මොකද, මේ සභාවේ හුඟක් අය ඒ ගැන කථා කළා. නමුත්, මම ආචාර්ය ජානකී ජයවර්ධන මැතිනිය ගැන මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. එතුමිය සද්භාවයෙන් ඒ සඳහා කැප වුණු කෙනෙක්. එතුමියට මම නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. එදා එතුමියත් සමඟ සටන් සගයෙක් හැටියට ඔබතුමියත් පාරට බැස්සා, ගරු අගමැතිතුමියනි. අද ඔබතුමිය අග්‍රාමාත්‍ය ධුරයේ සිටිනවා. නමුත්, එතුමිය අද ජීවතුන් අතර නැහැ. මේ සියයට 6 වෙනුවෙන් දිවි පුදපු අය තමයි මමත් දන්නා, කැලණිය විශ්වවිද්‍යාලයේ ජානක, රුහුණ විශ්වවිද්‍යාලයේ සිසිත කියන අය. මේ සියලුදෙනා ඔබතුමිය දිහා බලාගෙන ඉන්නවා ඇති, මේ සියයට 6 කියන එක යථාර්ථයක් කරන්නට ඔබතුමියට හැකි වෙනවාද කියලා. ඒ නිසා මම ඔබතුමියට කියනවා, මෙන්න මේවා පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියලා. ඒ වාගේම අද ඔබතුමන්ලාට, ඔබතුමියලාට මේවා නිදහසේ කරන්න පුළුවන්. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද මේවාට බාධා කරන්න කවුරුවත් නැහැ. ඒ නිසා දැන් හරි මේවා කරන්න පටන් ගන්න. මොකද, ඔබතුමිය මෙතෙක් සිටි අධ්‍යාපන ඇමතිවරුන්ට වඩා බොහොම වාසනාවන්තයි. මොකද, ශිෂ්‍යයන් කුලප්පු කරන්න අද කවුරුවත් නැහැ. අපි හැමෝම බලාපොරොත්තු වෙන්නේ අධ්‍යාපනයේ යහ ගමනක් යන්නයි.

ඊළඟ කාරණයට එන්න කලින් මට කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. ගරු ඇමතිතුමියනි, FUTA එකේ අයට හම්බ වෙන්න අවස්ථාවක් දෙන්න. මොකද, ඔබතුමියත් මම හිතන විධියට ඉස්සර එතැන ඉන්න ඇති. මම දැක්කා ඒ අය ප්‍රවෘත්ති සාකච්ඡා පවත්වමින් තැන් තැන්වල යනවා, ඔබතුමියලා දුන්නු වැටුප ලොකු වැඩියි, ඒක තියාගෙන කලින් දීපු දීමනා ටික එහෙමම දෙන්න කියලා. එම නිසා ඒ අයත් එක්ක සාකච්ඡා කරලා ඒ කටයුත්ත කරන්න කියලා මම යෝජනා කරනවා.

හතරවන කාරණය ලෙස අපි උසස් අධ්‍යාපනය ගැන කථා කරමු. 1978දී තමයි උසස් අධ්‍යාපන පනත ගෙනාවේ. මේ පනත වෙනස් කරන්න අවස්ථා 5කදී උත්සාහ කරලා තිබෙනවා. ඒ හැම අවස්ථාවකදීම විශ්වවිද්‍යාල වහලා, ගිනි තියලා, අරගළ කරලා, කඳුළු ගෑස් ගහලා - ඒ වාගේ දේවල් කළ නිසා - ඒ කටයුත්ත කර ගන්න බැරි වුණා. 2025 වසරේ උසස් අධ්‍යාපන පද්ධතියේ තිබෙන ප්‍රශ්නවලට එම පනත තුළින් උත්තර ලැබෙන්නේ නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමියනි, ඒ නිසා මම ඔබතුමියට යෝජනාවක් කරනවා. 1978 ගෙනා උසස් අධ්‍යාපන පනත තුළින් යන්න පුළුවන් උපරිම දුර දැන් ගිහිල්ලා ඉවරයි. ඒ නිසා එය සංශෝධනය කරලා වෙනස් කරමු කියා මම ඔබතුමියට යෝජනා කරනවා. එය වෙනස් කරලා මේ රටට ගැළපෙන, ඒ වාගේම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගැළපෙන පනතක් ගෙනැල්ලා අපි එම කටයුතු ඉදිරියට ගෙනියමු කියලා මම යෝජනා කරනවා.

පස්වන කාරණය තමයි වෘත්තීය අධ්‍යාපනය. එහිදී මම අවධානය යොමු කරන්න කැමැතියි, zero skill gap එක ගැන. ඒ කියන්නේ රැකියාවට හරියන අධ්‍යාපනයක් ලබා දීම වැදගත්

කියන එකයි මම කියන්නේ. ඒ නිසා විශේෂයෙන්ම Technical Colleges කෙරෙහි අපි අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, කාර්මික විද්‍යාල, වෘත්තීය අධ්‍යාපන ආයතන වැනි ඒවා තමයි මේ රටේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වැඩියෙන්ම ඇතුළත් වෙලා තමන්ගේ වෘත්තිය සුදුසුකම් හදා ගන්නා ස්ථාන. ඒ නිසා මේ කාරණය සම්බන්ධවත් ඔබතුමියගේ අවධානය යොමු කරන්න. 2017-2019 කාලයේදී වෘත්තීය අධ්‍යාපන ආයතනවලට සිසු සිසුවියන් බඳවා ගැනීම් වැඩි වුණා වාගේම වෘත්තීය අධ්‍යාපනයේත් පුදුමාකාර ඉදිරි පිම්මක් දක්නට ලැබුණා. හැබැයි, 2020දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එය එතැනම අත්හිටුවීම නිසා එම කටයුතු එකතැන නතර වුණා. ඒ නිසා එම කටයුතු ඉදිරියට ගෙනියන්න කියලා මම ඔබතුමියට යෝජනා කරනවා.

ඊළඟට, මම ඔබතුමියගෙන් නිශ්චිතවම පිළිතුරක් අපේක්ෂා කරන තව ගැටලුවක් තිබෙනවා. ගරු ඇමතිතුමියනි, පසුගිය රජය අධ්‍යාපනයට අදාළ පනත් කෙටුම්පත් මට මතක හැටියට 6ක් විතර ගෙනාවා. ඒවා කෙටුම්පත් කරලා තිබෙනවා. ඒවායේ අඩුපාඩු තිබෙන්න පුළුවන්; ගුණ-දොස් තිබෙන්න පුළුවන්. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා, ඒවා ඒ පාරේම ඉදිරියට ගෙන යනවාද, නැත්නම් ඒවා වෙනස් කරනවාද, අලුත් පාරක ගෙන යනවාද කියන එක ගැන. ඒ ගැන නිශ්චිත පිළිතුරක් ලබා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. එහෙම වෙනස් කරනවා නම්, ඒවා ජනතාවට, අධ්‍යාපනයට හොඳ විධියට සිද්ධ වෙනවා නම්, අපේ සහයෝගය ඔබතුමියට දෙන්න මේ වෙලාවේ පොරොන්දු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(*மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன*)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව මිනිත්තු 5ක කාලයක් දෙන්න. මම ඒ ගැන දන්වා තිබෙනවා.

ඒ වාගේම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සුසිල් ප්‍රේමජයන්ත හිටපු ඇමතිතුමාටත් ලොකු ඕනෑකමක් තිබුණා. මොන අභාග්‍යයක් නිසාද කියන්න මම දන්නේ නැහැ, එම කටයුතු නතර වුණා. ඒවා නතර වුණේ කොතැනද කියන එක පිළිබඳව මම දන්නේ නැහැ. ගරු ඇමතිතුමියනි, මම මේ කියපු ප්‍රශ්නවලට ඔබතුමිය උත්තර දෙන්න. මම මේ සඳහන් කළ ප්‍රශ්න කිහිපයට උත්තර හොයනකොට, ඇත්තටම අපි ප්‍රායෝගිකව එදිනෙදා අත්විඳින ගැටලුවලට නිකම්ම උත්තර හම්බ වෙනවා.

ඊළඟට, මානව සම්පත ගැනත් මම පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. අද වනවිට ගුරුවරු සඳහා 235,924ක අනුමත cadre එකක් තිබෙනවා. අනුපාතිකව බලනකොට 2015දී හිටියේ 18:1ක් වශයෙන්. 2020 වෙනකොට ඒක 16:1 වශයෙන් අඩු කර තිබුණා. හැබැයි, අද වනවිට 40,000කට ආසන්න ප්‍රමාණයක ගුරු හිඟයක් තිබෙනවා. ඒක වසා ගන්නේ සංවර්ධන නිලධාරීන්ගෙන්. එතකොට ඒ අය අධ්‍යාපනයෙන් අයින් කරලා වෙන තැන්වලට යොමු කළොත් අධ්‍යාපනයට මොකක්ද වෙන්නේ කියන එක ගැනත් ඔබතුමිය හොඳට හිතා බලන්න කියා මම යෝජනා කරනවා.

ඊළඟට, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සහ ගුරු විදුහල් ගත්තාම ඒවාත් යුගයේ අවශ්‍යතාව අනුව වෙනස් වෙන්න ඕනෑය කියලා මම යෝජනා කරනවා. විද්‍යා පීඨයක් කියන්නේ ගුරුවරයාට ක්ෂේම භූමියක්. එතැනින් එළියට එන්නේ ඉතා හොඳින් පුහුණු වුණු ගුරුවරයෙක්. හැබැයි, අද යුගයේ හැටියට ඒවායේ තත්ත්වය වෙනස් වෙන්න ඕනෑ. ඒවා විශ්වවිද්‍යාල මට්ටමට ගෙනෙන්න ඕනෑ කියලා පසුගිය ආණ්ඩුවේත් කථා කළා. එය යථාර්ථයක් කරන්න කියාත් මම යෝජනා කරනවා.

ඊළඟට, ගුරු වැටුපට අදාළව ලබා නොදුන් තුනෙන් දෙකක කොටස ගැනත් කථා කරන්න ඕනෑ. ගුරුවරුන්ට තුනෙන් දෙකක වැටුප් විෂමතාවක් තිබෙනවා කියලා මතක ඇති. අද මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා නම් ප්‍රකාශයක් කර තිබුණා. මම දැක්කා, සමාජ මාධ්‍ය තුළ පළ වුණු වීඩියෝ එකක්. ඒක නැහැයි කියන්න බැහැ. අද ගුරුවරයාට තුනෙන් දෙකක වැටුප් විෂමතාවක් නැහැයි කියලා එතුමා කියා තිබුණා. බී.සී. පෙරේරා වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ මත නිකුත් කළ 2/97 වැටුප් චක්‍රලේඛය නිසා ගුරුවරුන්ට වැටුප් විෂමතාවක් මතු වුණා නම්, ඊට පසු වැටුප් වැඩි කළ හැම වෙලාවේම සමාන්තරව නම් වැටුප් වැඩි වුණේ, ගුරු වැටුප් විෂමතාව නැති වුණේ කොහොමද කියන එක මට අහන්න සිද්ධ වෙනවා. එතුමාට මම කියන්න ඕනෑ, එදා - 2020 දෙසැම්බර් 01වැනි දා- මම මේ පාර්ලිමේන්තුවේදී ගුරුවරුන්ට වැටුප් විෂමතාවක් තිබෙනවා කියා කථා කරපු එක එළියට අරගෙන ගිහිල්ලා එය අරගළයක් බවට පත් වුණු බව. ඒක නවත්වන්න එතුමන්ලා දැවැන්ත උත්සාහයක් ගත්තා. අන්තිමට මේක ලැබෙන බව දැන ගත්තාම තමයි ඒගොල්ලන් අරගළයට එකතු වුණේ. ඒක දන්නා ගුරුවරුන් ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහනවා, අද ගුරු වැටුප තුළ තුනෙන් දෙකක විෂමතාවක් නැහැ කියනවා නම්, වැටුප් විෂමතාව සම්බන්ධයෙන් වුණු අරගළයේදී මිය ගිය දෙනියාය මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ වරුණි අසංකා නම් අවුරුදු 27ක ගුරුවරිය - *[බාධා කිරීමක්]*

ගරු මහින්ද ජයසිංහ මහතා
(*மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ*)
(The Hon. Mahinda Jayasinghe)
Hon. Deputy Chairperson, I rise to a point of Order.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(*மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன*)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මගේ කථාවෙන් පස්සේ ඔබතුමා උත්තර දෙනවා නම් හොඳයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා. මොකද, මට විනාඩි දෙකයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
මෙතුමියගේ කථාව අවසානයේ දී උත්තර දෙන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(*மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன*)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ තුනෙන් දෙකක වැටුප් විෂමතාව නැහැයි කියනවා නම්, ඇයි ඔබතුමන්ලා එදා ගුරුවරු සටන් බිමට ඇද්දේ කියන එක මට අහන්න සිදු වෙනවා. මම දන්නේ නැහැ ගුරුවරු අද ඔබතුමාට කියනවා ද කියලා "අපිට තුනෙන් දෙකක වැටුප් විෂමතාවක් නැහැ"යි කියලා. එහෙම කියනවා නම් සතුටුයි.

ඊළඟට ගරු ඇමතිතුමියනි, අපි අධ්‍යාපනයට වියදම් කරන මුදලින් වඩා වැදගත්ම කොටස තමයි ප්‍රාග්ධන වියදම්. සමහර අවුරුදුවලදී මේ වියදම්වලින් සියයට 50ක්වත් අමාත්‍යාංශවලට ලැබිලා නැහැ. ව්‍යාපෘති වැඩවලට සියයට 40ක්වත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒවා ගැන ඔබතුමියගේ අවධානය යොමු කරන්න.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ඊළඟට මම තවත් වැදගත් දෙයක් කියන්න ඕනෑ. මම දැන් එන්නම් විශ්වවිද්‍යාලවලට කුලපතිවරු පත් කිරීම පිළිබඳ කාරණයට. උදේ විපක්ෂ නායකතුමාත්, තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙකුත් කථා කළා රුහුණ විශ්වවිද්‍යාලයේ වෙච්ච සිද්ධියක් ගැන. මම ඒ ගැන විස්තර කථා කරන්නේ නැහැ. ඒ තත්ත්වයම රජරට විශ්වවිද්‍යාලයේත්, නැගෙනහිර විශ්වවිද්‍යාලයේත්, අග්නිදිග විශ්වවිද්‍යාලයේත් තිබෙනවා. මැතිවරණයට පෙර සම්මුඛ පරීක්ෂණ පවත්වලා තෝරා ගත්ත තුන්දෙනා වෙනුවට මැතිවරණයෙන් පස්සේ තමන්ට හිතවත් කෙනෙකු පත් කර ගැනීම ඔබතුමිය වාගේ කෙනෙක් අමාත්‍යතුමිය ලෙස ඉන්න වෙලාවක සුදුසු නැහැයි කියන එක මම මේ වෙලාවේ යෝජනා කරනවා. ඒ වාගේම ඒ ගැන කලකිරුණු මහාචාර්ය සමන්ත කුමාර මහතා සංවේදී සටහනක් එතුමාගේ මිතුරෙකුට යොමු කරලා තිබෙනවා මම දැක්කා. ගරු අගමැතිතුමියනි, ඒ සටහනේ කියා තිබෙනවා, "...ඔබට ද මා මෙන්ම මේ දේශපාලන ක්‍රමය තුළදීම කලකිරීමට පත්වීමට සිදු වේවි" කියලා. මම ඒ සටහන **සභාගත*** කරනවා. මේවා මම නොවෙයි කියන්නේ, එතුමා. මොකද, එතුමා පැහැදිලිව කියනවා, තමන්ට හිතවත් ජේවීපී අයට දෙන්නට එතුමාව ඉවත් කළා කියලා.

ඊළඟට තවත් දෙයක් තමයි හොර සහතික පිළිබඳ කාරණය. මේ දවස්වල ඒක ලොකුවට යනවා. ලංකා ඉතිහාසයේ හොර සහතික ඉදිරිපත් කරලා මැතිවරණයට ඉදිරිපත් වෙච්ච වැඩිම කණ්ඩායම ඉන්නේ මෙතැන වෙන්න ඇති කියලා මම හිතනවා. පසුගිය මාර්තු 05 වෙනිදා "Daily FT" පුවත්පතේ පළ වූ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.පී. ජයතිස්ස මහතාගේ "Fake Journal Publications : Silent Fraud in University Sytems Costing Billions to Taxpayers" කියන මාතෘකාව යටතේ වන ලිපිය මම මේ වෙලාවේ **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමියට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඊළඟට තවත් කාරණයක් තිබෙනවා. මම එය කෙටියෙන් කියන්නම්. 2018දී යූ. පන්නිලගේ නැමැත්තාගේ - මම දන්නේ නැහැ, මේ කවුද කියලා - උසස්වීම සහ ආචාර්ය උපාධිය සම්බන්ධ පර්යේෂණ පත්‍රිකා 15න්, 7ක්ම ව්‍යාජ, එහෙම නැත්නම් උපක්‍රමශීලීව වෙනස් කරන ලද - manipulated - පත්‍රිකා කියලා තිබෙනවා. මම ඒ අදාළ සියලු ලේඛනත් මේ වෙලාවේ **සභාගත*** කරනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමියනි, ආචාර්යවරු සේවයට එනකොට ඒ අයට වැඩ කරන්න පැය ගණනක් තිබෙනවා. ඒ වුණාට මම දකිනවා මේ ඉලංගසිංහ කියන කථිකාචාර්යතුමා පැය 39.5යි උගන්වා තිබෙන්නේ. හැබැයි, එතුමාට තිබුණු චෝදනා පත්‍රය අයින් කරලා, වෙන කෙනෙක් මහාචාර්ය තත්ත්වයට පත් කරලා තිබෙනවා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. මම දැක්කා සියයට 25ක් සැර අඩු කරපු -සැර බාල කරපු- මත්පැන් මිලිලීටර් 180 බෝතල්වල ඇසුරුම් කර සමාජයට දෙන්න යනවා කියලා. ඒ තුළින් දරුවන් මත්පැන්වලට ළඟා කර ගැනීමට, අත්පත් කර ගැනීමට තිබෙන හැකියාව වැඩි වෙනවා. එහෙම වුණොත් දරුවන් මත්පැන්වලට යොමු වීමේ අවස්ථාව වැඩි වෙනවා. පාසල් සිසුවියන් මත්පැන් පානය කිරීම සියයට 1.8ක මට්ටමේ තිබුණේ. ඒක මේ වන විට සියයට 2.5ට වැඩි වෙලා තිබෙනවා. මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27වන වගන්තිය උල්ලංඝනය කිරීමක් බව මම මතක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමියනි, මම අවසාන වශයෙන් කියන්නේ, විපක්ෂ නායකතුමා කිව්වා වාගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්නා සියලු සේවකයන්ගේ ගැටලු සම්බන්ධව ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියායි. මොකද, මේ ආණ්ඩුව බලයට ගෙනාවේ මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත වෙලා හිටපු අය. ඒ අය දැස් දල්වා ගෙන බලාගෙන ඉන්නවා ඒ අයගේ ගැටලු විසඳා දෙනකල්. ඒ කටයුතු කරන්නට ඔබතුමියට හැකියාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමියනි, මේ පාර්ලිමේන්තුවේ හැමදාම ඔබතුමියලා අපි නැති තැන බොරු කිව්වා. මම ඔබතුමියට අභියෝග කරනවා, මේ රටේ ගුරුවරුන්ට වැටුප් විෂමතාවක් නැති බව මම කිව්වේ කොහේදිද කියලා පුළුවන් නම් අද මේ විවාදය අවසන් වෙන්න කලින් කියන ලෙස. මම ඔබතුමියට අභියෝග කරනවා, අද දවස තුළ ඒ ගැන කියන්න කියලා. බොරු කියන්න එපා ගරු මන්ත්‍රීතුමිය. දැන්වත් ඔය බොරු කීමේ කලාව ඉවත් කර ගන්න. මොකද, ඉස්සර කිව්වාට අද බොරු කියන්න බැහැ, අපි මේ පැත්තේ ඉන්න නිසා. ඔයගොල්ලන් හැමදාමත් බොරු කියලා මේ රටේ ගුරුවරු රැවැට්ටුවා; හැමෝම රැවැට්ටුවා. මම challenge කරනවා. මේක challenge එකක්. මා කිව්වා කියන දෙය පුළුවන් නම් වීඩියෝ පටය දාලා අද තහවුරු කරන්න. මොකද, මම හැමදාම වැටුප් විෂමතා වෙනුවෙන් පෙනී සිටියා. අද මේ විවාදය තුළ මගේ කථාවක් තිබෙනවා. එතැනදී මම පැහැදිලි කරන්නම් මොකක්ද වැටුප් විෂමතාව කියන්නේ කියලා. ඔබතුමියලා 2/3ක් ගැන කථා කරනවා. විපක්ෂ නායකතුමාත් කථා කළා. පුළුවන් නම් පැහැදිලි කරන්න කෝ 2/3 මොකක්ද කියලා. මම ඒ ගැන සියලු documents සහිතව පැහැදිලි කරන්නම්, මගේ කථාවේදී.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට ඒ වීඩියෝ පටය ලැබෙන්න සලස්වන්නම්. ඒක සමාජ මාධ්‍යයේ මේ වන කොට ප්‍රචාරණය වන එකක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමිය, විවාදයකට යන්න එපා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒක කිව්වේ ඔබතුමා නොවෙයි නම්, ඒක AI තාක්ෂණයෙන් කරපු දෙයක් නම් ඔබතුමාට පුළුවන් ඒකට උත්තර දෙන්න. [බාධා කිරීමක්] මම ඒක ඔබතුමාට එවන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.50]

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ ඉතා වැදගත් විවාදයට එකතු වෙන්නට අවස්ථාව ලැබීම විශේෂයෙන් ගෞරවයක් කොට සලකනවා. මංගල අය වැය කියන්නේ, විශේෂයෙන් ආණ්ඩු මාරුවකට පස්සේ ඉදිරිපත් කරන මංගල අය වැය කියන්නේ විශේෂිත දෙයක්. අපේ ඉතිහාසය ගත්තත් එහෙමයි. මංගල අය වැයක් කියන්නේ, ආණ්ඩුවට තමන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන යන්න පාර පෙන්වන ලියවිල්ල. ඒ නිසා අපි හිතනවා, මංගල අය වැය කියන එක විශේෂිතයි කියලා.

අය වැය කියන එක ගලේ කෙටූ අකුරක් -සෙල් ලිපියක්- නොවෙයි. විශේෂිත තත්ත්වයන් අනුව, කාලය අනුව ඒක වෙනස් වෙන්න පුළුවන්. නමුත්, අප යන මාර්ගයේ දිශානතිය පෙන්වන්නේ, අපේ ආණ්ඩුව මුලින්ම ඉදිරිපත් කරන මෙන්න මේ අය වැයෙන්. ඒ නිසා අපි හිතනවා, මේක විශේෂිත අවස්ථාවක් කියලා. වෙනත් ආණ්ඩුත් එහෙමම තමයි. ආණ්ඩු මාරුවකින් පස්සේ එන ඕනෑම ආණ්ඩුවක් fresh start එකකින්, තම මංගල අය වැය ඉදිරිපත් කරලා අලුත් ජවයකින් කටයුතු පටන් ගන්නවා. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ එතැන නොවෙයි. තම කටයුතු පටන් ගන්නේ ඉලක්ක සහගතව ද, මාර්ග සිතියමක් - road map එකක් - එක්ක ද, ප්‍රායෝගික තලයේ ද, එහෙම නැත්නම් තිරසරව ද කියන කාරණා මත තමයි මොන අය වැයක් වුණත් සමාජගත වෙලා, ඉදිරියට ගිහින් ඊට පසුව එහි ප්‍රතිලාභ ලැබෙන්නේ. අධ්‍යාපනය ගත්තත් එහෙමම තමයි කියලා අපි හිතනවා.

මෙතැනදී කථා වුණා, ලංකාවේ අධ්‍යාපනය අවුරුදු 76ක් තිස්සේ යම්කිසි මට්ටමකින් තිබුණා කියන කාරණාව. ඔව්, ඒක ඇත්ත. අවුරුදු 76ක් නොවෙයි, ඊට කලිනුත් -අවුරුදු 2,000කට කලින්- ලංකාවේ පිරිවෙන් පද්ධතිය පටන් ගත්තා. අවුරුදු එක්දහස් ගණනකට කලින් නාලන්දා විශ්වවිද්‍යාලය තිබුණා. ඇෆ්ගනිස්ථානයෙන් පවා ශිෂ්‍යයන් ඇවිල්ලා ඉගෙන ගත්තා. යටත්විජිත කාලයේත් හොඳ හෝ නරක අධ්‍යාපන ක්‍රමයක් තිබුණා. ඒ ආකාරයට ලංකාවේ අඛණ්ඩ අධ්‍යාපනයක් තිබුණා. ඒ නිසා අවුරුදු 76ක් නොවෙයි, ලංකාවේ අඛණ්ඩ අධ්‍යාපනයක් තිබුණා; මොන කඩා වැටීම් තිබුණත්, යම්කිසි මට්ටමකින් අපේ අධ්‍යාපනය පැවතුණා. ඒක හොඳ තත්ත්වයක්. භූගෝලීය පිහිටීම අනුව ගත්තත්, අපේ රට සාක්ෂරතාවෙන් ඉහළ මට්ටමක තිබුණා. එහෙම වුණේ, අපේ රටේ අඛණ්ඩ අධ්‍යාපනයක් හැදිලා තිබුණු නිසායි. ඒ නිසා අවුරුදු 76ක් තිස්සේ නොවෙයි, ඉතිහාසයේ ඉඳලාම ආපු අධ්‍යාපන ක්‍රමයක් ලංකාවේ තිබුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලංකාවට විශේෂිත කඩුලු පනින්න සිද්ධ වුණා. එකක් තමයි නිදහස් අධ්‍යාපනය. ඒක විශේෂිත අවස්ථාවක්. අධ්‍යාපනයේදී ලංකාවට ලැබිච්ච සෞභාග්‍යවත්ම දේ එයයි කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධ්‍යාපනය කියන්නේ, දැනුම, කුසලතාව සහ ආකල්ප වර්ධනය ප්‍රධාන කරගත්තු දෙයක් කියලා අපි හිතනවා. අධ්‍යාපන ප්‍රතිපත්තිය නිර්මාණය කරද්දී අපි බලන දේවල් කීපයක් තිබෙනවා. එකක් තමයි ඉතිහාසය. අපි එහිදී ඉතිහාසය දිහාත් ටිකක් බලනවා.

අපි ඉතිහාසයෙන් අහඹු ලෙස උදාහරණ කීපයක් ගෙන බලමු. 1971දී ආචාර්ය එන්.එම්. පෙරේරා මහත්මයා අය වැය කථාවේදී අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රමුඛතා කරුණු හැටියට කියනවා, "අධ්‍යාපනය පර්යන්තයට යා යුතුයි, කන්නන්ගර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය යුතුයි" කියන කාරණා. ඒවා සාධනීය දේවල්. හැබැයි, එහි සඳහන්ව තිබුණේ නැහැ, තාක්ෂණය සහ වෘත්තීය අධ්‍යාපනය ගැන. නමුත්, අපි සාධනීය දේවල් සාධනීය විධියට භාර ගනිමු. නමුත්, එදා ඉලක්කයක් තිබුණා ද, දිශානතිය තිරණය කරන road map එකක් තිබුණා ද, තිරසාර බවක් තිබුණා ද?

ඊළඟට අපි ගනිමු, 1978 වන කොට තත්ත්වය. රොනී ද මැල් මහත්මයා 1978 ඉදිරිපත් කළේ ඊට වඩා හාත්පසින් වෙනස් අය වැයක්. එතැනදී අධ්‍යාපනය පැත්තෙන් එතුමා අවධානය යොමු කරපු සුවිශේෂී දෙයක් තමයි, තාක්ෂණික අධ්‍යාපනය; තාක්ෂණික අධ්‍යාපනය පැත්තෙන් industrialization සඳහා ලැබෙන තැන. හැබැයි, එතැනදී අධ්‍යාපනය පර්යන්තයට - ගමට - යා යුතුයි, නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක විය යුතුයි කියන කාරණා මඟ හැරිලා තිබෙනවා. ආර්ථිකය පැත්තෙන් ගත්තොත්, ඔන්න ඔය 1977 පරිවර්තනයට තමයි අප කියන්නේ, "තැවර් - රේගන් මාදිළියේ පරිවර්තනයක්" කියලා. ඒ පරිවර්තනය ඇතුළේ තවත් දේවල් ටිකක් අධ්‍යාපනයට සිදු වෙනවා. ඒවා එතරම් හොඳ දේවල් නොවෙයි. ඒ මොනවා ද? ඒ වන කල් අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක් -commodity එකක්- වෙලා තිබුණේ නැහැ. නමුත්, අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක් විධියට මිනිසුන් හිතන්න පටන් ගත්තේ, හිතන්න පෙළඹුණේ, 1977දී වෙච්ච පරිවර්තනයත් සමඟයි. මෙන්න මේ කාරණාවත් එක්ක තමයි මිනිසුන්ගේ හිත්වල අධ්‍යාපනය සම්බන්ධයෙන් වික්ෂිප්තභාවයක්, ප්‍රමුඛතා සම්බන්ධයෙන් වික්ෂිප්තභාවයක් - confusion about priorities - ඇති වන්නේ. අන්න එතැනදී තමයි විභාග කේන්ද්‍ර කරගත්තු, සුදු කරපටි රැකියා ඉල්ලන අධ්‍යාපන ක්‍රමයකට පරිවර්තනීය වෙනසක් වන්නේ. ඒක හොඳ දෙයක් නොවෙයි. ඒකෙන් තමයි අධ්‍යාපනයේ කඩා වැටීම් ටික, අප දකින කඩා වැටීම් ටික පටන් ගන්නේ.

ඊළඟට 2015දී පමණ පැවැති අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරමු. ඒ වෙද්දී විශේෂයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ICT - සම්බන්ධයෙන් කථා වෙනවා. නමුත්, තිරසර බවක් අපට පෙනෙන්නේ නැහැ. අප ඉතිහාසයේ ආ ගමන් මඟ ගත්තොත්, අපේ අධ්‍යාපනයට ඉතිහාසයේ අඛණ්ඩතා එක්ක තිබුණු දේවල් පමණයි තිබෙන්නේ. තිරසාර බවක් නැති, අඛණ්ඩතාවක් නැති, සමබරතාවක් නැති අධ්‍යාපන ප්‍රතිපත්තියක් තුළ තමයි අප මේ හිර වෙලා ඉන්නේ. එහෙම නම් දැන් අප ඉන්නේ කොතැනද?

අද ළමයින්ට ළමා ජීවිතයක් නැහැ. අප කියන්නේ, ළමයා කියන කෙනා පොඩි වැඩිහිටියෙක් නොවෙයි - a child is not a small adult - කියලායි. ළමයාට සුවිශේෂී සමාජ අවශ්‍යතා තිබෙනවා. ළමයාට සුවිශේෂී සංස්කෘතික අවශ්‍යතා තිබෙනවා. ඒ ළමා කාලය ළමයාට නොදෙන අධ්‍යාපන ක්‍රමයක් තමයි දැන්

[ගරු මධුර සෙනෙවිරත්න මහතා]

තිබෙන්නේ. විභාග බර නිසා තමන්ගේ ළමා කාලය ළමයාට අහිමි වෙනවා; තමන්ගේ යහළුවන් සමඟ ගත කරන කාලය ළමයාට අහිමි වෙනවා. මෙන්න මේ සමාජ ක්‍රමය තුළ තමයි ළමයා වැඩිහිටියෙකු වන්නේ. ඔහු පුරවැසියෙකු වන කොට ඔහුගේ ආකල්ප සහ දැනුම වර්ධනය වන්නේ ඔහු ළමා කාලය ගත කරපු විධියෙන්. ඉතින්, පෞරුෂය සම්බන්ධයෙන් සෑහෙන ගැටලු තොගයක් එනවා. තනිව තීරණ ගැනීමට, ස්වාධීන තීරණ ගැනීමට - අපි එයට කියනවා, soft skills කියලා - අවස්ථාවක් නැති කොට දරුවා සමාජයට එන්නේ තනි පුද්ගලයෙකු විධියට. එය මහත් අභාග්‍යයක්. ඉතින්, අපි මෙන්න මේ කියපු වෙනස්කම් කළ යුතුයි. එය කවදා හෝ කොතැනින් හෝ පටන් ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් අප කරන එක දෙයක් තමයි, ගෝලීය රැකියා ජනනය වන විධියේ උසස් අධ්‍යාපනයකට මාරු වීම. මීට පෙර අපි කවදාකවත් කථා කළේ නැහැ, මානව ප්‍රාග්ධනයක් - human capital - ගැන. අපි මේ ලංකාවේ තිබෙන ලොකුම, හොඳම මානව ප්‍රාග්ධනය අගය කිරීම මේ අධ්‍යාපන ක්‍රමය තුළින් හදලා, ශ්‍රම විභජනය ඇතුළත ලොකු ශ්‍රම හමුදාවක් ලංකාවටත්, ජාත්‍යන්තරයටත් දෙන අධ්‍යාපන ක්‍රමයක් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් සිද්ධ කරන බව කියන්න කැමැතියි.

ඒ වාගේම, අපි ශ්‍රමය මූලික කරගෙන, එහෙම නැත්නම් ශ්‍රම හමුදාව මූලික කරගෙන විතරක් නොවෙයි පෝෂණය විය යුත්තේ. ළමයෙක් කියන්නේ පුරවැසියෙක්. පුරවැසි වගකීම් තිබෙන, පොදු වගකීම් තිබෙන සමාජයක් හැදෙන්න ඕනෑ. ඒක හැදෙන්නේ කොතැනින්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒක මුල් ළමාවියෙන් පටන් ගන්න ඕනෑ. අවුරුදු 3ත්, 5ත් අතර කාලයේ තමයි දරුවෙකුගේ මොළය වර්ධනය වෙන්නේ, පෞරුෂය develop වෙන්නේ. ඒ කාලය ඇතුළත අපි විශේෂිත ක්‍රියා මාර්ග ගොඩක් ගන්නවා, මුල් ළමාවිය සංවර්ධනය වෙනුවෙන්. ඒ සඳහා පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරලා තිබෙනවා. පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතිනවා.

ඊළඟට, මේ ප්‍රතිසංස්කරණ කියන්නේ මොකක්ද? ළමයාගේ විභවතා, ශක්‍යතා සියල්ල උරා ගෙන, ළමයාගේ හැකියාව උරා ගෙන, ඊට පස්සේ ළමයා කැමැති තැනකට යන විධි ක්‍රමයකට අපි ළමයා ඇතුළු කර ගන්නවා. ඒ තුළින් එළියට එන ළමයා අර කියපු ළමයා නොවෙයි. ඒ ළමයා තමයි, අපි බලාපොරොත්තු වන, අපි කියන මේ රටේ වගකීම් දරන පුරවැසියා. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙනුත් වග කියනවා.

ඊට පස්සේ, අපි විශේෂයෙන් කථා කරන, නිරන්තරයෙන් නැවත නැවත කථා කරන, විශේෂ අධ්‍යාපනය තිබෙනවා. ලෝකය වෙනස් කරපු සමහර විද්‍යාඥයන්, ලෝකය වෙනස් කරපු සමහර පිරිස්වල ළමා කාලය ගත්තොත්, ඒ අයගේ ළමා කාලය ගත කරලා තිබෙන්නේ, අපි නම් කරන සමහර රෝගී තත්ත්ව එක්ක, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා එක්ක. මට ඒ අයගේ නම් කියන්න බැහැ. නමුත්, ඒ අය සමාජය වෙනස් කරන තැනට පත් වෙන්න නම්, ඒ විශේෂ අධ්‍යාපනයක් අවශ්‍ය කෙනාට විශේෂ අධ්‍යාපනයක් දුන්නාට පස්සේ, ඔවුන්ට පුළුවන් එක්කෝ විද්‍යාඥයෙක්, එහෙම නැත්නම් සමාජය වෙනස් කරන පුද්ගලයෙක් බවට පත් වෙන්න. ඒක විශේෂිත කාරණාවක්. එහෙම නොවුණොත් මොකක්ද වෙන්නේ? එහෙම නොවුණොත්, ඒ ළමයා වැඩිහිටියෙක් වන විට සමාජ විරෝධී පුද්ගලයෙක්වීමේ හැකියාව බොහොම වැඩියි. ඒ නිසා, විශේෂ අධ්‍යාපනයට අපි විශේෂ අවධානයක් යොමු කරන්නේ, විශේෂ අධ්‍යාපන ඒකක ඇති කරන්නේ, විශේෂ අධ්‍යාපනයට වැඩිපුර මුදල් යොදවන්නේ මෙන්න මේ හේතුව නිසායි. අපි හිතනවා, ඒ ප්‍රශ්නය හඳුනා ගත්ත පළමුවැනි අය වැය මේ අය වැය කියලා. විශේෂ අවශ්‍යතා තිබෙන ළමයින්ගේ ශක්‍යතාත් අපේ සමාජයට ලබා ගත යුුතුයි කියන අදහස තමයි අපට තිබෙන්නේ.

ඊළඟට, මතු වෙච්ච කාරණා කිහිපයක් තිබෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්නම්. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පෞද්ගලික පාසල් සහ ජාත්‍යන්තර පාසල් නියාමනය සඳහා රාමුවක් සකස් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතයි. එය සකස් කිරීම සඳහා අධ්‍යාපනය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් එකතු වෙලා තිබෙනවා.

ඒ වාගේම, තවත් මතු වෙච්ච කාරණාවක් තිබුණා. ඒ තමයි, 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධයෙන්. ශිෂ්‍යත්ව විභාගයේ අවශ්‍යතාව එන්නේ කොතැනින්ද? ඒ අවශ්‍යතාව එන්නේ මෙන්න මේ මානව සම්පත් සහ භෞතික සම්පත් බෙදී යෑමේ විෂමතාව එක්ක. අවශ්‍යතාව නැති වුණොත්, ශිෂ්‍යත්ව විභාගය නැති වෙයි. නමුත්, මේ මොහොතේ අපි ඉන්නේ මෙන්න මේ වෙනස් වන, transitional period එක ඇතුළේ. ඒ period එක ඇතුළත ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙයි. යම් කිසි මොහොතක මානව සම්පත් සහ භෞතික සම්පත් සියල්ල සියලු දෙනාට දෙන්න පුළුවන් වෙයි. ඒ අවස්ථාව ඉක්මනින් එළැඹෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එතකොට සමාජය විසින්ම ශිෂ්‍යත්ව විභාගය කියන අවශ්‍යතාව නැති කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට විනාඩියක් දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතුමාට තව විනාඩි තුනක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
සමාජය විසින් යම්කිසි දෙයක් ඉල්ලනවා නම්, අන්න ඒ නිසා තමයි මේ විභාගය පවත්වන්නේ. අපි කරන ලොකු වැඩක් තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් එක්ක මේ ඇගයීම් ක්‍රමය වෙනස් කරන එක. ඇගයීම් ක්‍රමය වෙනස් කරනවා කියන්නේ අර විභාග රටාව වෙනස් කරන එකම නොවෙයි. ඒක කරන්නේ ළමයාගේ ළමා කාලය ගත කරන්න පුළුවන් විධියට. ළමයාගේ ඔළුවට stress එකක් එන්නේ නැති විධියට, බරක් එන්නේ නැති විධියට ළමයාව assess කර ගන්න පුළුවන් නම්, ඒක තමයි වැදගත්. මේ සභාවේ මතු වෙච්ච කාරණාවක් තිබුණා, සමහර රටවල ළමා

කාලයේදී විභාග තියන්නේ නැහැ කියලා. අපි දන්නේ නැහැ, සමහර විට ඒ විධියේ තැනකට අපි මේ කියන ඇගයීම් ක්‍රමයත් එන්න පුළුවන්. ඒ නිසා අපි ශිෂ්‍යත්ව විභාගයත් ඒ විධියට ගනිමු. අපි මේ සංකල්පය පුළුල්ව ගනිමු. එතකොට යම්කිසි කාලයක් එයි මේ විභාගය අවශ්‍ය නොවන.

ඊළඟට, අපි පොදුවේ කියන සමාජය ගොඩනගන්න නම්, මානව සම්පත ගොඩනැගිය යුතුයි. මානව සම්පත ගොඩනගන්න නම් අපට ලොකු ශ්‍රමයක් වැය කරන්න වෙනවා. ඊට අවශ්‍ය පිරිස තමයි අපේ අධ්‍යාපන ක්‍රමය ඇතුළේ ඉන්න අපේ නිලධාරි පිරිස. අපි තවම ගම්වල දකිනවා, මඩ කඩිති පැන වැව් තාවුළුවල ඉන්න ගුරුවරු; වෘත්තිය සේවයක් කර ගත්ත ගුරුවරු අපි දකිනවා. ගුරු උපදේශකවරු අපි දකිනවා. විදුහල්පතිවරු අපි දකිනවා. ඒ වාගේම අපි දකිනවා, කාර්යාලවලදී, අමාත්‍යාංශවලදී සේවය උපරිමව තමන්ගේ රටට දායක කරන පිරිස. අපේ මේ පොදු ක්‍රියාදාමය ඇතුළත ඉන්න මේ නිලධාරීන් සහ ගුරුවරුන් පිරිසටත් නිහතමානිව හිස නමන ගමන්, මේ ක්‍රියාදාමය අපි ඉදිරියට ගෙන යන බවට සපථ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අජිත්.පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON.CHANAKA MADUGODA took the Chair.

[අ.භා.2.06]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය පිළිබඳ විප්ලවීය වෙනසක් ඇති කරන්න අවශ්‍ය කාලයක, ඒ සඳහා ජනවරමක් තිබෙන ආණ්ඩුවක් තමයි මේ තිබෙන්නේ. නිදහස් අධ්‍යාපනය පිළිබඳව අපි හැමෝම කථා කරනවා, නිදහස් අධ්‍යාපනය පිළිබඳව අපි හැමෝම ප්‍රශ්න කරනවා, නිදහස් අධ්‍යාපනයේ තිබෙන වටිනාකම් ගැන අපි හැමෝම වර්ණනා කරනවා. 1943දී දිවංගත සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර ශ්‍රීමතාණන් ඉතාම දීර්ඝ ලෙස බිම් මට්ටමේදී සහ ව්‍යවස්ථාදායකය තුළ කරපු අරගළයකින් පසුව මේ රටේ දුප්පත් පොහොසත් හැමෝටම එක විධියට රජයෙන් නොමිලේ අධ්‍යාපනය ලබාදිය යුතු බවට ව්‍යවස්ථාදායකය හරහා සම්මත කර ගත්තා. එහි වැදගත් කාරණය තමයි සමානාත්මතාව. දුප්පත් පොහොසත් භේදයක් නැතුව, ශිෂ්‍යත්වලාභීන් වෙනවාද කියන එකක් නැතුව, සිංහල, දෙමළ, මුස්ලිම් හැම ළමයාටම පෞද්ගලිකව මුදල් ගෙවීමකින් තොරව අධ්‍යාපනය ලැබීමට තිබෙන අයිතිය තහවුරු කළා. නමුත් අපි අමතක කරන දෙයක් තිබෙනවා. කන්නන්ගර ශ්‍රීමතාණන් නිදහස් අධ්‍යාපන පනත සම්මත කරලා, මේ රටේ අධ්‍යාපනයට අවශ්‍ය වන ඒ භෞතික සම්පත් දියුණු කිරීමට අවධානය යොමු කරලා, එවකට තිබුණු මැතිවරණ කොට්ඨාසයකට එක ගණනේ මධ්‍ය මහා විද්‍යාල පිහිටෙව්වා. ද්විතීයික අධ්‍යාපනය සඳහා ඇති කරපු ඒ මධ්‍ය මහා විද්‍යාල හැම එකකම ඉගැන්වුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන්. මගේ පියා ගෝනදුව කනිෂ්ඨ විද්‍යාලයේ 8වැනි ශ්‍රේණිය වෙනකම් ඉගෙන ගෙන ශිෂ්‍යත්ව විභාගය සමත් වෙලා වාද්දුව මධ්‍යමහා විද්‍යාලයට ගිහිල්ලා ඉගෙනගෙන තිබෙන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන්. මධ්‍යමහා විද්‍යාල පමණක් නොවෙයි, ඒ කාලය වන විට තවත් සිය ගණනක් පාසල් තිබුණා. ඒවා ද්වීභාෂා පාඨශාලා. ඒ කියන්නේ සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් උගන්වන පාඨශාලා. ඉංග්‍රීසි මාධ්‍යයෙන් විතරක් උගන්වන තවත් පාසල් තිබුණා. ගරු අගමැතිතුමියනි, හැබැයි කන්නංගර මැතිතුමාගේ සංකල්පය අනුව ඇති කරපු නිදහස් අධ්‍යාපනය තුළ ගම්වල දක්ෂ ළමයි ඉගෙන ගත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන්.

දීර්ඝ කාලයකට පස්සේ; අවුරුදු 80කට පස්සේ - අද දුප්පත්කම, පොහොසත්කම තීරණය කරන්නේ ඉංග්‍රීසි දන්නවාද, නැද්ද කියන කාරණය මත කියලා අපි දන්නවා. 1943 දුප්පත්කම, පොහොසත්කම තීරණය කළේ අධිරාජ්‍යවාදී පාලකයන් සමඟ සමීපව කටයුතු කරනවාද, නැද්ද කියන කාරණය මතයි. අද අපේ රට පාලනය කරන්නේ ස්වදේශිකයන් වුණත්, අද මේ රටේ තිබෙන රැකියා අවස්ථා හිමි කරගන්නේ මේ රටේ තිබෙන රැකියා අවස්ථාවන්වල ඉහළම අංශ හිමි කරගන්නේ ඉංග්‍රීසි භාෂාව හොඳින් දන්නා අය බවට කිසිම සැකයක් නැහැ. මේ නිසාම අද හතු පිපෙන්නා වාගේ ජාත්‍යන්තර පාසල් ඇති වෙලා තිබෙනවා. පුළුවන්කම තිබෙන අය තමන්ගේ දරුවන් ජාත්‍යන්තර පාසල්වලට යොමු කරනවා. ජාතික පාසල්වල හැකි පමණින් ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා පවත්වාගෙන යන්න උත්සාහ කරනවා. සමහර පාසල්වල English medium පන්ති වෙනම තිබෙනවා.

ගරු අගමැතිතුමියනි, ඉංග්‍රීසි භාෂාව දැනගැනීමේ වාසිය ගැන මේ ගරු සභාවට මම අමුතුවෙන් පැහැදිලි කරන්න යන්නේ නැහැ. ගරු අගමැතිතුමියනි, ඉංග්‍රීසි භාෂාව හොඳින් දැනගෙන විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණොත්, තමන්ගේ උපාධි පාඨමාලාවේ තිබෙන ගුණාත්මකභාවය කොපමණ පහසුවෙන් වැඩිදියුණු කරන්න පුළුවන්ද කියන එක ගැන ඔබතුමියත්, මේ සභාවත් හොඳින් දන්නවා. විශ්වවිද්‍යාලයට ගිහිල්ලා, නීති විද්‍යාලයට ගිහිල්ලා ඉංග්‍රීසි ඉගෙන ගන්න තිබෙන අපහසුකම ගැන, අභියෝග ගැන අපි හොඳින් දන්නවා. ඒ වාගේම විශ්වවිද්‍යාලයකට නොගියත්, කාර්මික පාඨමාලාවක් කළත්, ඩිප්ලෝමාවක් කළත් - ඒක සංචාරක කර්මාන්තය වෙන්න පුළුවන්; වෙනත් කාර්මික ක්ෂේත්‍රයක් වෙන්න පුළුවන්; වෙන ඕනෑම ක්ෂේත්‍රයක් වෙන්න පුළුවන්. - ඉංග්‍රීසි දැන ගත්තොත් ගොඩ. ඉංග්‍රීසි දන්නේ නැත්නම් ජීවිතය අපහසුයි. මේකට තිබෙන විසඳුම මොකක්ද?

ගරු අගමැතිතුමියනි, 2012දී විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කළා. සෑම පාසලකම ප්‍රාථමික අධ්‍යාපනය තමන්ගේ මව් භාෂාවෙන්; සිංහලෙන් සහ දෙමළෙන් සිදු විය යුතුයි, ද්විතීයික අධ්‍යාපනය අනිවාර්යයෙන්ම ඉංග්‍රීසියෙන් සිදු කළ යුතුයි කියන යෝජනාව මම ඉදිරිපත් කළා. තමන්ගේ මව් බස ගැන ප්‍රවීණතාවක් ඇති කරගන්න ප්‍රාථමික අධ්‍යාපනය ප්‍රමාණවත්. දෙමළ භාෂාව කථා කරන දරුවෙකුට, සිංහල භාෂාව කථා කරන දරුවෙකුට, - සිංහල වෙන්න පුළුවන්, දෙමළ වෙන්න පුළුවන්, මුස්ලිම් වෙන්න පුළුවන් - තමන්ගේ මව්බස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබාගන්න ප්‍රාථමික අධ්‍යාපනය ප්‍රමාණවත්. හැබැයි විද්‍යා විෂයක් වෙන්න පුළුවන්, වාණිජ විෂයක් වෙන්න පුළුවන්, කාර්මික විෂයක් වෙන්න පුළුවන්, නීතිය වෙන්න පුළුවන්, තමන්ට යම් වෘත්තියක් කරා යොමුවීම සඳහා ශාස්ත්‍රීය අධ්‍යාපනය ළඟා කරගන්න අවශ්‍ය වන අපට හුරු, අපි උරුමය ලබපු, අපට සමීප, අදටත් සැලකිය යුතු

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

පිරිසක් භාවිත කරන ජාත්‍යන්තර භාෂාව තමයි ඉංග්‍රීසි භාෂාව. ජාත්‍යන්තර භාෂා ගණනාවක් තිබෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් link language එක හැටියට ඉංග්‍රීසි භාෂාවට පිළිගැනීමක් ලබා දී තිබෙනවා. සමහරු ඒක පිළිගන්න අකමැතියි. අපේ සිංහල සහ දෙමළ භාෂාවන් නිල භාෂාවන් බවට පත් කරලා තිබෙන අතර, සම්බන්ධීකරණ භාෂාව - link language - එක හැටියට ඉංග්‍රීසි භාෂාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගැනීමක් ලැබිලා තිබෙනවා.

ගරු අගමැතිතුමියනි, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විප්ලවීය වෙනසක් ඇති කරන්න ඕනෑ නම්, පහසුකම් නැති, විෂය නිර්දේශයක් නැති ජාත්‍යන්තර පාසල්වලට යොමුවෙලා දරුවන් අතරමං වන එක වළක්වන්න ඕනෑ නම්, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ, නීති ක්ෂේත්‍රයේ, වෛද්‍ය විද්‍යාවේ, අනෙකුත් වාණිජ ක්ෂේත්‍රවල සහ ශාස්ත්‍රීය විෂයයන්වල පවා ඉදිරියට යන්න අවශ්‍ය නම්, අපි නිර්භීතව මේ රටේ ද්විතියික පාසල් සියල්ලේම ඉංග්‍රීසි මාධ්‍ය පන්ති පටන් ගන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා. එකවර 6 ශ්‍රේණියේ සිට අ.පොෂ.(උසස් පෙළ) දක්වාම කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අධ්‍යයනයක් කරලා බලන්න; සමීක්ෂණයක් කරලා බලන්න, ඉංග්‍රීසි භාෂාව දන්නා ඉංග්‍රීසි උගන්වන්න පුළුවන් සැලකිය යුතු ගුරු පිරිසක් දැනට ඉන්නවා. මොකද, පසුගිය අවුරුදු 10 තිස්සේ විශ්වවිද්‍යාල බොහෝමයක ඉංග්‍රීසි මාධ්‍යයෙන් තමයි උගන්වන්නේ. එතකොට, එම විශ්වවිද්‍යාලවලින් පිට වුණු ඉංග්‍රීසි හොඳින් දන්නා පිරිසක් ඉන්නවා. ඒ පිරිස මාර්ගයෙන් අපට මේක 6 ශ්‍රේණියෙන් පටන් ගන්න පුළුවන්. දැනට සිටින ගුරුවරු පුහුණු කරලා, ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් කරලා, අපට වසරින් වසර 7 ශ්‍රේණිය, 8 ශ්‍රේණිය, 9 ශ්‍රේණිය, 10 ශ්‍රේණිය වශයෙනුත්, ඉන් පසුව අ.පොෂ.ස. (උසස් පෙළ) දක්වාත් අපට ඒ ක්‍රමය අරගෙන යන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපට ඒ පිළිවෙළ අරගෙන යන්න පුළුවන්. මේ පිළිබඳව ගුරුවරුන්ගෙන් සෘජුව විමසුවොත් "බැහැ" කියනවා. මොකද ඔවුන් කැමැතියි, දැන් තිබෙන විධියට තමන්ගේ කටයුතු කරගෙන යන්න. අපි රටක් විධියට, විපක්ෂයක් හැටියට ඔබතුමියලාට සහයෝගය ලබා දෙනවා, ද්විතියික අධ්‍යාපනය තුළ මේ ක්‍රමය අරගෙන යන්න. මොකද, කන්නන්ගර මැතිතුමා ආරම්භ කරපු මධ්‍ය මහා විද්‍යාලවල අධ්‍යාපනය අරගෙන ගියේ, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න. ඔබතුමාටත් මේක වටිනවා, අහගෙන ඉන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කන්නන්ගර මැතිතුමා ද්විතියික අධ්‍යාපනය කරගෙන ගියේ ඉංග්‍රීසි මාධ්‍යයෙන්. ගම්වල ඉංග්‍රීසි අකුරක් නොදැන සිටි දරුවෝ ගිහිල්ලා ද්විතියික අධ්‍යාපනය කළේ ඉංග්‍රීසි මාධ්‍යයෙන්. ඔවුන් ජීවිතය ගොඩ ගියේ, තාත්තලාගේ පරම්පරාව දුප්පත්කමින් එළියට ආවේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගත් නිසායි. දුප්පත්කමින් එළියට එන්න ඒක ඔවුන්ට පහසු වුණා. අද අපි පහළට ගිහිල්ලා තිබෙන්නේ ජාත්‍යන්තර භාෂාව නොදන්නා ප්‍රශ්නය නිසයි. ගරු අගමැතිතුමියනි, එම නිසා අභියෝගාත්මකව මේක භාර ගන්න. පාසල් දස දහසෙන් ද්විතියික පාසල් තිබෙන්නේ 1,300යි. අපි මේ අභියෝගය භාර ගනිමු. මේ අභියෝගය භාර ගත්තොත්, මේ රටේ දුප්පත්කම තුරන් කරලා පිම්මක් ඉදිරියට පනින්න අවකාශය ලැබෙනවා. ඔබතුමියට බොහොම ස්තුතියි. වැඩිමනත් වශයෙන් අපි කැමැතියි, මේ පිළිබඳව සාකච්ඡා කරලා අවශ්‍ය සහයෝගය හා දැනුම ලබා දෙන්න. ඒ පිළිබඳව කල්පනා කරපු අත්දැකීම් තිබෙන බොහෝ දෙනෙක් මේ රටේ ඉන්නවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.15]

ගරු කිංස් නෙල්සන් මහතා
(මාණ්පුමිකු கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව වාගේම විශ්වවිද්‍යාල පද්ධතිය ගැන අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ උසස් අධ්‍යාපනය ගත්තොත්, අපේ රටේ විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපනය හදාරන දරුවන් 176,661ක් සිටියත්, ඒ අයගෙන් 61,000කට ආසන්න කණ්ඩායමකට විතරයි නේවාසික පහසුකම් තිබෙන්නේ. විශේෂයෙන්ම අද ඒ දරුවන් තමන්ගේ විශ්වවිද්‍යාලය අවටින් නවාතැන් පහසුකම් ලබා ගන්න ගියාම, ඔවුන්ගේ දෙමව්පියන්ට විශාල මුදලක් වැය කරන්න සිදුවෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් ඔවුන්ට මාසිකව රුපියල් 20,000ක්, 30,000ක් වගේ විශාල මුදලක් වැය කරන්න සිදු වෙනවා. ගරු අගමැතිතුමියනි, ඔබතුමිය විෂය භාර ඇමතිවරිය විධියට සහ විශ්වවිද්‍යාල ගැන මනා අවබෝධයක් තිබෙන කෙනෙක් විධියට, මේ සඳහා අය වැයෙන් විශේෂ අවධානයක් යොමු කරලා විශ්වවිද්‍යාවල ඉගෙන ගන්නා දරුවන්ට නවාතැන් පහසුකම් ලබා දෙන්න කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම රජයේ විශ්වවිද්‍යාල ගත්තාම, නියමිත කාර්ය මණ්ඩලය 29,425ක් සිටිය යුතු වුවත්, මේ වෙනකොට පුරප්පාඩු 7,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙන බව තමයි අපට ලැබුණු තොරතුරුවලින් පෙනෙන්නේ. සමහර වෙලාවට විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයත් අවම පහසුකම් එක්ක තමයි දරුවන්ට අවශ්‍ය දැනුම ලබා දෙන්න කටයුතු කරන්නේ. එම නිසා විශේෂයෙන්ම

අපේ රටේ උසස් අධ්‍යාපනය හදාරන දරුවන් වෙනුවෙන් රජයක් විධියට දෙන්න පුළුවන් උපරිම දායකත්වය ලබා දෙන බව ඇත්ත. හැබැයි, අපි ඒ දරුවන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු කරගෙන යෑම සඳහා හොඳ පරිසරයක් නිර්මාණය කරන්න වෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අඩු පාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පරිගණක නැති පාසල් 1,876ක් තිබෙනවා. අ.පොෂ. (සාමාන්‍ය පෙළ) සහ අ.පොෂ.(උසස් පෙළ) විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් 707ක් තිබෙනවා. විධිමත් පුස්තකාල පහසුකම් නැති පාසල් 6,201ක් තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩා පිටි නැති පාසල් 2,993ක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබෙන පාසල්වලින් සියයට 51කට ක්‍රීඩා පිට්ටනි නැහැ. ඒ වාගේ විශාල අඩුපාඩු රාශියක් ඒ පාසල්වල තිබෙනවා. ඒ නිසා මම හිතනවා, ඔබතුමිය ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා ඒවායේ තිබෙන අඩුපාඩු සකස් කරලා දෙයි කියලා. අපි ඒ අඩුපාඩු පෙන්වා දෙන්නේ ඒවා නිවැරදි කරන්නයි. මම විශ්වාස කරනවා, අධ්‍යාපන ඇමතිතුමිය විධියට ඔබතුමිය මේ සම්බන්ධව ඔබතුමියගේ අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය එක්ක කථා කරලා ඒ සඳහා අවශ්‍ය කටයුතු කරයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබෙන මුළු පාසල් සංඛ්‍යාව 254ක්. ඒ අතර ජාතික පාසල් 9ක් තිබෙනවා. පසුගිය කාලයේ ජාතික පාසල් විවෘත කරගෙන, විවෘත කරගෙන ගියාම අපි බොහොම සතුටු වුණා. ජාතික පාසලක් වුණාම එම පාසලට අවශ්‍ය උපාංග, ගොඩනැඟිලි තිබෙන්න ඕනෑ. හැබැයි, එවැනි දේවල් ඒ පාසල්වලට ලැබුණේ නැහැ. මම මේ කාරණය පසුගිය පාර්ලිමේන්තුවේත් කිව්වා. ජාතික පාසලක් කියලා විවෘත කළාට පාසල ඉස්සරහ තාප්පය හදලා, ගේට්ටුව හැදුවා, ලස්සන board එකක් දැම්මා. ඇතුළට ගියාම ඒක ජාතික පාසලක්ද, නැද්ද කියන එක පෙනෙනවා. ඔබතුමිය දැන් රට වටේම යනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයටත් ආවා, පොළොන්නරුවේ තිබෙන පාසල් බලන්න. අපේ දිස්ත්‍රික්කයේ තිබෙන විද්‍යාපීඨය ඔබතුමිය ගිහිල්ලා බැලුවා. ඒ වාගේම ත්‍රෛභාෂා පාසල දැන් ඉදිකෙරෙනවා. අපි පසුගිය පාර්ලිමේන්තුවේදී එහි අඩුපාඩු පෙන්වා දුන් නිසා ඒ කටයුතු දැන් කරගෙන යනවා. මේ අවුරුද්දේ ඔබතුමියගේ අතින් ඒක විවෘත කරන්න ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු අගමැතිතුමියනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තාම අනුමත ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් 4,962ක් ඉන්න ඕනෑ. හැබැයි පුරප්පාඩු තිබෙනවා, 1,181ක්. පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තාම ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව කියන විෂයයන්වලට අදාළ වන ගුරුවරුන් බොහොම අඩුයි. ගරු අගමැතිතුමියනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පරිගණක පහසුකම් නැති පාසල් 91ක් තිබෙනවා. ඒ වාගේම ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නැති පාසල් 151ක් තිබෙනවා. ඒ වාගේම විද්‍යාගාර පහසුකම් නැති පාසල් 51ක් තිබෙනවා. ඒ වාගේම ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් නැති පාසල් 49ක් තිබෙනවා. ක්‍රීඩා පිට්ටනි නැති පාසල් ගණන 34ක්. අපි මේ අඩුපාඩු පෙන්වා දෙනවා. ඔබතුමියන්ලාගේ මංගල අය වැයෙන් ඒ හැම දෙයක්ම කරන්න බැරි වේවි. අපි දන්නවා, ඔබතුමියන්ලා භාර ගත්තේ වැටිච්ච රටක්; බංකොලොත් වෙච්ච රටක් බව. හැබැයි, අප සියලුදෙනාගේම අරමුණ එකයි.

අධ්‍යාපනය කියන්නේ අපට ආභරණයක්. කිසි කෙනෙකුට ගන්න බැරි, අපි සතු එකම වස්තුව තමයි, අධ්‍යාපනය. මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, විශේෂයෙන් දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දරුවන් පාසලට එනකොට ඉතා අවදානම් තත්ත්වයකින් තමයි පාසලට එන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවත්වන අම්මා කෙනෙක් දරුවා සමඟ පාසලට ගිය අවස්ථාවේ අලියෙක් ගහලා පාසල ඉස්සරහම ඒ අම්මා මිය ගියා. අපි මේ සම්බන්ධව වනජීවී දෙපාර්තමේන්තුවට කථා කළා, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න සියලු නිලධාරීන්ට, බලධාරීන්ට කථා කළා, මේ ප්‍රදේශයේ මෙහෙම තත්ත්වයක් තිබෙනවා කියලා. එහෙම කියලා සතියක් ගියේ නැහැ, ඒ වාගේම පහර දීමක් නැවත සිදු වුණා. මේ සම්බන්ධවත්, පොළොන්නරුව දිස්ත්‍රික්කය සම්බන්ධවත් ඔබතුමිය විශේෂ අවධානයක් යොමු කරයි කියා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබෙන ජාතික පාසලක් තමයි, තෝපාවැව ජාතික පාසල. ඒ ජාතික පාසලේ ළමයින් 1,500කටත් වැඩි සංඛ්‍යාවක් ඉගෙනුම ලබනවා. එය ජාතික පාසලක් වුණාට, පරිගණක විද්‍යාගාරයේ පරිගණක 40ක් තියන්න පුළුවන් පහසුකම් තිබුණාට, ගොඩනැඟිල්ල විතරයි තිබෙන්නේ. එක පරිගණකයක්වත් නැහැ. උසස් පෙළ සඳහා Bioscience, ගණිතය, වාණිජ්‍යය, දේශපාලන විද්‍යාව කියන විෂයයන් උගන්වන කිසිම ගුරුවරයෙක් ඒ ජාතික පාසලේ නැහැ. මේක කොහොමද ජාතික පාසලක් වෙන්නේ? ගරු අගමැතිතුමියනි, පොළොන්නරුව නගරයේ තිබෙන ජාතික පාසල වන තෝපාවැව ජාතික පාසලට ගුරුවරුන් ආවත්, ඔවුන් රැඳී නොසිටින්නේ නගරයක් වුණාට කිසිම ගුරු නිවාසයක් මේ ජාතික පාසලේ නොමැති නිසායි.

ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමියගේ අවධානය යොමු වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විලයාය ජාතික පාසලට මම කිහිප විටක්ම ගිහින් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේ පාසලට ගිය සෑම අවස්ථාවකදීම ඔවුන් කියා සිටි ලොකුම ප්‍රශ්නය තමයි, දිඹුලාගල විශාල භූමි ප්‍රමාණයක මේ පාසල පිහිටා තිබෙන නිසා වනඅලි ප්‍රහාර හේතුවෙන් මේ දරුවන් දැඩි අපහසුතාවකට පත් වෙනවා කියන එක. ඒ පාසලේ දරුවන්, විදුහල්පතිතුමා, ගුරුවරුන්, දෙමව්පියන් ඇතුළු සියලු දෙනාගේම ඉල්ලීම තමයි, පුළුවන් නම් ඒ පාසල අවට තිබෙන රක්ෂිතවලට අලිවැටක් සකස් කර දෙන්න; නැත්නම් පුළුවන් නම් පාසල වටා අලිවැටක් සකස් කර දෙන්න කියන එක. මේ විලයාය ජාතික පාසලේ ළමයි 2,200ක් පමණ අධ්‍යාපනය හදාරනවා. මේ පාසලේ English medium තිබුණත්, විශේෂයෙන්ම ගණිතය, විද්‍යාව වාගේ විෂයයක් English mediumවලින් උගන්වන්න අවශ්‍ය ගුරුවරුන් නැහැ. එම නිසා මේ ජාතික පාසලට English mediumවලින් උගන්වන්න අවශ්‍ය ගුරුවරුන් ලබා දීම සඳහා ඔබතුමියගේ අවධානය යොමු වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම ඇලහැර මහසෙන් ජාතික පාසලේ ළමයි 1,800ක් පමණ ඉගෙනුම ලබනවා. මේ පාසල ජයග්‍රහණ රැසක් ලබා ගෙන තිබෙන පාසලක්. මේ පාසල විශේෂයෙන්ම සෞන්දර්ය විෂයයන්ගෙන් -සංගීතයෙන්, නැටුම් කලාවෙන්- ජයග්‍රහණ රැසක් ලබා ගත් පාසලක්. මේ පාසලේ දරුවන්ගේ, දෙමව්පියන්ගේ සහ ගුරුවරුන්ගේ ඉල්ලීම තමයි, මේ දරුවන්ට නැටුම්, සංගීතය ආදී දේවල් පුරුදු වෙන්න මේ පාසලට ශාලාවක් ලබා දෙන්න කියන එක. ඒ වාගේම මේ පාසලට අනධ්‍යයන කාර්ය මණ්ඩලය 13ක් අනුමතයි. හැබැයි, ඉන්නේ තුන්දෙනායි. ඒ වාගේම පාසල් කාර්යාල කාර්ය සහායක හයදෙනෙක් ඉන්න ඕනෑ. ඉන්නේ එක්කෙනායි. හැබැයි, මේක ජාතික පාසලක්. මේ පාසලේ තිබෙන ගැටලුව තමයි, ගුරුවරුන්ට ඉන්න ගුරු නිවාස නොමැතිවීම, වැසිකිළි පහසුකම් සහ පානීය ජල පහසුකම් නොමැතිවීම. මේ නිසා ගුරුවරුන් ආවත් මේ පාසලේ රැඳෙන්නේ නැහැ.

[ගරු කිංස් නෙල්සන් මහතා]

අධ්‍යාපන ඇමතිතුමිය ලෙස කටයුතු කරන ගරු අගමැතිතුමියනි, මම මේ ස්ථාන නම් එක්කම කියන්නේ ඔබතුමිය මේවා සටහන් කරගෙන ඉදිරියේදී මේ පාසල්වලට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනීවි කියන විශ්වාසය ඇතිවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ පාසලේ ක්‍රීඩා පිට්ටනිය තිබෙන්නේ පාරෙන් එහා පැත්තේ. මහියංගනය-දඹුල්ල ප්‍රධාන පාර හරහා තමයි ළමයි 200ක්, 300ක් ක්‍රීඩා තරගවලට සහභාගිවීමට එහා පැත්තට යන්නේ. අපි මෙතැනට ක්‍රමවත් වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම්, මේ ළමයින්ගේ ජීවිත පවා අවදානමකට ලක් වේවි. ඕනෑ නම් අපට පුළුවන් මෙතැනට ගුවන් පාලමක් දාන්න. මොකද, මේක ජාතික පාසලක්. ළමයි 200ක්, 300ක් පාර මාරු වෙලා යන මේ පිට්ටනිය ඉස්කෝලේ පැත්තට ගේන්න බැහැ නේ. පිට්ටනිය තිබෙන්නේ පාරෙන් එහා පැත්තේ. ඒ නිසා මම යෝජනා කරනවා, මේ පාසලත්, ක්‍රීඩා පිට්ටනියත් යා කරමින් ගුවන් පාලමක් දාලා දෙන්න පුළුවන් නම්, මේ ළමයින් ක්‍රීඩා කිරීම සඳහා පාර පනිනකොට ඒ දරුවන්ගේ ජීවිතවලට ඇති විය හැකි අනතුරු නැතිව යයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දැන් අපේ රටේ තිබෙන ලොකුම ගැටලුව තමයි, පාසල් උපකරණවලට පනවා තිබෙන සියයට 18ක VAT එක. මම ගිය අය වැයේදීත් මේ යෝජනාව කළා. අපට පුළුවන්, රජයේ පාසල්වල bookshop එකක් විවෘත කරන්න. ඒක අපට මේ අය වැයෙන් කරන්න බැරි වේවි. දෙමව්පියන්ට තිබෙන ලොකුම ගැටලුව තමයි, පාසල් උපකරණවල තිබෙන අධික මිල. රජයේ පාසල් තුළ bookshop එකක් -පොත් සැලක්- දාලා දරුවන්ට සහන මිලකට පොත් ලබා දෙන්න කටයුතු කරන්න කියන එක තමයි මගේ ඉල්ලීම. ඒ වාගේම පාසල් උපකරණවලට තිබෙන VAT එක ගැනත් මම කියන්න ඕනෑ. විශේෂයෙන්ම පාසල් උපකරණවලට සියයට 18ක VAT එකක් ගහලා තිබෙනවා. මැතිවරණ කාලයේදී ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශන තුළත් තිබුණා, පාසල් උපකරණවලට තිබෙන VAT එක ඉවත් කරලා දරුවන්ට සහන මිලකට පොත්පත් ටික ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරනවා කියලා. අපට පුළුවන්, රජයේ පාසල්වල bookshop එකක් විවෘත කරලා, මේ bookshop එක හරහා දරුවන්ට සහන මිලකට මේ පොත් ටික ලබා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසාන නිසා දැන් කථාව අවසන් කරන්න.

ගරු කිංස් නෙල්සන් මහතා
(මාණ්පුමිකු කිංස් නෙල්සන්)
(The Hon. Kins Nelson)

මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට මේ අය වැයෙන් මේක කරන්න බැරි වුණත්, පාසල් යන අපේ දරුවන් වෙනුවෙන් ඉදිරියේදී හෝ නොමේලේ පොත්පත් ටික ලබා දුන්නොත් හොඳයි කියන එක තමයි විශේෂයෙන්ම මම යෝජනා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපට මතකයි, එදා අපේ දරුවන්ට සුරක්ෂා රක්ෂණය ලබා දුන් බව. මම හිතන්නේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ, එතුමා බලයට ආපු ගමන් ඉස්සෙල්ලාම කළේ මේ සුරක්ෂා රක්ෂණය අයින් කර දමපු එක. මම ගරු අගමැතිතුමියට යෝජනා කරනවා, ඒ රක්ෂණය; ඒ දීපු මුදලම නැවතත් දරුවන්ට ලබා දෙන්න කටයුතු කරන්න කියලා. දරුවෙකුට යම් කිසි කරදරයක් වුණොත් -තුවාලයක් වුණොත්; අසනීපයක් වුණොත්- එදා තිබුණු සුරක්ෂා රක්ෂණය දෙමව්පියන්ට ලොකු ශක්තියක් වුණා. ඒ නිසා ඒක නැවතත් අපේ දරුවන්ට ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මා කරනවා. මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[පි.ප. 2.29]

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් ජෙකදීස්වරන්)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மக்கள் இப்பொழுதும் தேசிய மக்கள் சக்தியுடன்தான் இருக்கிறார்கள் என்பதை மறுபடியும் நாங்கள் நிரூபித்துள்ளோம். கடந்த 8ஆம் திகதி நடைபெற்ற EDCS - கல்விக் கூட்டுறவுச் சங்கத் தேர்தலிலே கிட்டத்தட்ட 384 இடங்களிலே 370 இடங்களைக் கைப்பற்றி அதனை மீண்டும் நிரூபித்திருக்கிறோமென்பதை இவ்விடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். அதுமட்டுமல்ல, வட மாகாணத்திலே 14 இடங்களிலே 13 இடங்களில் எமது கட்சியின் ஓர் அங்கமாக இருக்கின்ற CTSU வெற்றிபெற்றிருக்கின்றது என்பதை இவ்விடத்தில் நான் பெருமையாகக் கூறிக்கொள்கின்றேன்.

ஒரு நாட்டின் முதுகெலும்பானது கல்வித்துறை என்ற வகையிலே எமது அரசாங்கம் இம்முறை இந்த வரவு செலவுத்திட்டத்திலே ஆகக்கூடுதலான நிதியை வரலாற்றில் முதல் தடவையாக ஒதுக்கிச் சாதனை படைத்திருக்கின்றது. இதனூடாக எமது நாட்டில் கல்வித் துறையிலே காணப்படுகின்ற பல்வேறுபட்ட குறைபாடுகளைத் தீர்த்துவைக்கக்கூடிய வசதி வாய்ப்புகள் ஏற்பட்டிருக்கின்றது. அந்த வகையிலே, கடந்த காலங்களிலே தங்களுடைய கல்வியைக் கற்பதில் பல்வேறுபட்ட இடர்பாடுகளை எதிர்நோக்கியிருந்த பல்கலைக்கழக மாணவர்களுக்கான 'மஹபொல' கொடுப்பனவு அதிகரிக்கப்பட்டுள்ளது. அதுபோல, புலமைப்பரிசில் பரீட்சையிலே சித்தியடைந்த மாணவர்களுக்கான கொடுப்பனவு அதிகரிக்கப்பட்டுள்ளது. அதைவிட பல்வேறுபட்ட உட்கட்டமைப்பு வசதிகளுக்கான நிதி கூடியளவாக எமது வரவு செலவுத்திட்டத்தினூடாக அதிகரிக்கப்பட்டுள்ளது.

ஒரு நாட்டின் அபிவிருத்தியை அளவிடும் அளவுகோல்களில் ஒன்றான எழுத்தறிவு வீதத்தை அதிகரிக்கக்கூடிய வகையிலான கல்வித் திட்டங்களை எதிர்காலத்திலே முன்வைக்க இருக்கின்றோம். அந்த வகையிலே, நாங்கள் தேசியப் பாடசாலைகளின் உட்கட்டமைப்பு வசதிகளில் கூடுதலாகக் கவனஞ்செலுத்த வேண்டியிருக்கின்றது. மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களிலே காணப்படுகின்ற தேசியப் பாடசாலைகளிலே உட்கட்டமைப்பு வசதிகள் மிகவும் மோசமான நிலையில் காணப்படுகின்றன. குறிப்பாக, மன்னார் மாவட்டத்திலே இருக்கின்ற சித்தி விநாயகர் இந்துக் கல்லூரி, St. Xavier's Boys' College, St. Xavier's Girls' College, அல்-அக்ஸா மகா வித்தியாலயம் போன்றவற்றைக் குறிப்பிடலாம். நாங்கள் கடந்த மாதம் அல்-அக்ஸா மகா

வித்தியாலயத்தைப் பார்வையிட்டோம். அங்கே உட்கட்டமைப்பு வசதிகள் மிகவும் மோசமாக இருப்பதுடன், கட்டிடங்கள் பழுதடைந்து, இடிந்துவிழக்கூடிய நிலை காணப்படுகின்றது. இம்முறை வரவு செலவுத்திட்டத்தில் தேசியப் பாடசாலைகளின் உட்கட்டமைப்பு வசதிக்காக கிட்டத்தட்ட 10,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இந்த ஒதுக்கப்பட்ட நிதியிலிருந்து எமது மாவட்டங்களிலே காணப்படுகின்ற தேசியப் பாடசாலைகளின் உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்த வேண்டுமென்று கல்வி அமைச்சர் அவர்களிடம் வேண்டுகோள் விடுக்கின்றேன்.

அத்தோடு, கடந்த காலங்களில் அதிபர், ஆசிரியர் நியமனங்கள் வழங்கப்படும்போது, சரியான பொறிமுறையோ, திட்டமிடுதலோ இல்லாத காரணத்தினால் அவர்கள் தங்களது கடமைகளைப் பொறுப்பேற்பதில் பல்வேறுபட்ட சிரமங்களை எதிர்நோக்கினார்கள். வடக்கு மாகாணத்தில் அதிபர்களாக 349 பேருக்கு நியமனம் வழங்கப்பட்டபோதும் 299 பேர் மட்டுமே தங்களது கடமையைப் பொறுப்பேற்ற நிலையில், மிகுதி 50 பேர் கடமைகளைப் பொறுப்பேற்காததுடன், அவர்களில் பலர் மீண்டும் ஆசிரியர் சேவைக்குத் திரும்பியுள்ளார்கள். அதைவிட, 374 பேருக்குப் பட்டதாரி ஆசிரியர் நியமனம் வழங்கப்பட்ட போதும் 242 பேர் மட்டுமே நியமனத்தை ஏற்றுள்ளார்கள்; 32 பேர் ஏற்றுக்கொள்ளவில்லை. அதேபோன்று, கல்வியியற் கல்லூரி ஆசிரியர்கள் 5 பேரும் நியமனங்களைப் பொறுப்பேற்கவில்லை. இதற்குக் காரணம் இந்த நியமனங்கள் வழங்கப்படும்போது சரியான பொறிமுறைக்குட்பட்டு அவர்களுக்குப் பொருத்தமான இடங்கள் வழங்கப்படாமையாகும்.

இதன் காரணமாகப் பின்தங்கிய பிரதேசங்களில் தொடர்ந்தும் ஆசிரியர், அதிபர்களுக்கான பற்றாக்குறை காணப்படுகின்றது. அந்த வகையில், வடக்கு மாகாணத்தில் 3,539 ஆசிரியர்களுக்கும், 187 அதிபர்களுக்கும், 111 கல்வி நிர்வாக சேவை அதிகாரிகளுக்குமான வெற்றிடங்கள் காணப்படுகின்றன. இவையனைத்துக்கும் காரணம் சரியான முறையில் இடமாற்றங்கள் நடைபெறாமையாகும். எனவே, இடமாற்றம் மற்றும் நியமனங்களை வழங்கும் முறையில் மாற்றங்களை ஏற்படுத்தவேண்டிய தேவையிருக்கின்றது. அதாவது, புலமைப் பரிசில் பரீட்சையில் சித்தியடைகின்ற மாணவர்களுக்கு மாவட்ட ரீதியில் வெட்டுப்புள்ளி இருப்பதுபோல, ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற மாவட்டங்களிலும் பரீட்சைகள் மூலமாக அதிபர், ஆசிரியர்களைத் தெரிவுசெய்யும்போது மாவட்ட ரீதியாக வெட்டுப்புள்ளிகளை வழங்கும் பட்சத்தில், அந்தந்த மாவட்டங்களுக்குரிய பற்றாக்குறை நிவர்த்தி செய்யப்படுவதோடு, அவர்கள் சந்தோஷமாகவும் திருப்தியுடனும் சேவையாற்ற முடியும். எனவே, மாவட்ட அடிப்படையில் இந்த நியமனங்களைச் செய்ய வேண்டுமென்ற எனது ஆலோசனையை கௌரவ பிரதம அமைச்சரும் கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரிடம் ஓர் வேண்டுகோளாக நான் முன்மொழிகின்றேன்.

எமது நாடு பூராவும் கடந்த 08.08.2012இல் 'மேலதிக ஆளணிகள்' அல்லது 'மிகை ஊழியர்கள்' என்ற வகையில், 3,000க்கும் மேற்பட்ட அதிபர்கள் நியமிக்கப்பட்டார்கள். ஆனால், அவர்களுக்கு இதுவரை இடமாற்றமோ, அதிபர்களுக்கான கொடுப்பனவோ வழங்கப்படவில்லை. பல வருடங்களாக ஒரே பாடசாலையில் கடமையாற்றுவதால் அவர்கள் மிகுந்த மன உளைச்சலுக்கு உட்பட்டுள்ளார்கள். எனவே, இவர்கள் தொடர்பான நடைமுறையில் திருத்தங்களை மேற்கொண்டு, அவர்களுக்கு நியாயம் வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று இவ்விடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அதுபோல, வடக்கு மாகாணத்தில் கடமை நிறைவேற்று அதிபர்களாக 88 பேர் காணப்படுகின்றனர். இவர்கள் நேர்முகப் பரீட்சை மூலமாகத்தான் அதிபர்களாகத் தெரிவு செய்யப்பட்டார்கள். ஆனாலும் அவர்களுக்கான அதிபர் நியமனம் இதுவரையும் வழங்கப்படவில்லை. இவர்கள் கிட்டத்தட்ட 10 வருடங்களுக்கும் மேலாகக் கடமை நிறைவேற்று அதிபர்களாகப் பணிபுரிந்து கொண்டிருக்கின்றார்கள். இவ்விடயத்தினையும் கவனத்திற் கொள்ளவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

மேலும், பாடசாலைகளில் சிற்றூழியர்களுக்குப் பாரியளவில் பற்றாக்குறை காணப்படுகிறது. குறிப்பாக, வடக்கு மாகாணப் பாடசாலைகளில் போதிய சிற்றூழியர்கள் இன்மையால் அந்த வேலைகளையும் அதிபர், ஆசிரியர்கள், மாணவர்களே செய்யவேண்டிய துர்ப்பாக்கிய நிலை காணப்படுவதன் காரணமாக அவர்களது வேலைப்பளு அதிகரித்துள்ளது. நாங்கள் கடந்த மாதத்தில் பல பாடசாலைகளுக்கு நேரடியாக விஜயம் செய்தபோது, அங்கு sanitary labourers மற்றும் துப்புரவுப் பணியாளர் இல்லாமையால் மலசலகூடங்கள், பாடசாலை வளாகங்கள் தூய்மையாக்கப்படாமல் மிகுந்த அவலட்சணமாகக் காணப்பட்டதையும் அந்த வேலையையும் மாணவர்களே செய்யும் நிலையையும் அவதானித்தோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
எனக்கு மேலும் ஒரு நிமிடம் தருமாறு அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

சிற்றூழியர்களுடைய வேலையையும் மாணவர்கள் செய்ய வேண்டியிருக்கின்ற நிலைமையைக் கருத்திற்கொண்டு வட மாகாணப் பாடசாலைகளுக்குப் போதிய சிற்றூழியர்களை நியமிப்பதற்கு ஆவன செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

அத்தோடு, ஆசிரிய வாண்மை விருத்தி நிலையங்களுக்குக் கடந்த காலங்களிலே போதிய நிதி ஈட்டங்கள் செய்யப்படாத காரணத்தினால், அவர்கள் பயிற்றப்படாமல், module வகுப்புக்களை நிறைவுசெய்ய முடியாமல் 2 - 3 வருடங்களாகத் தங்களுடைய பதவி உயர்வுகளையோ, சம்பள ஏற்றங்களையோ பெறமுடியாத ஒரு துர்ப்பாக்கிய நிலையில் இருக்கின்றார்கள். இவ்வருடம் எமது ஆட்சியில் அதை நாங்கள் நிச்சயமாக மேற்கொள்வோம் என்று கூறிக்கொள்கிறேன்.

இறுதியாக, அரிசி, உப்பு, தேங்காய் போன்றவற்றின் தற்காலிக விலை அதிகரிப்பைத் தாண்டி தூரநோக்கோடு சிந்திக்கத் தெரியாத குறுகிய சிந்தனை நோக்கம் கொண்டோரே, உங்களுக்கான செய்தி! எமது மாண்புமிகு ஜனாதிபதியின் தலைமையில் தேசிய மக்கள் சக்தியினராகிய எமது ஆட்சியின் 5 வருடப் பூர்த்தியின்போது, நாடு தன்னிறைவான நிலையை எட்டப்போவது உறுதி! நன்றி, வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.38]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்று கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சினுடைய விவாதத்திலே பேசக்கிடைத்தமையையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். கல்வி சம்பந்தமாகப் பேசுவதற்குப் பல விடயங்கள் காணப்படுகின்றன. குறிப்பாக, எங்களுடைய நாட்டிலே பின்தள்ளப்பட்டிருக்கின்ற சமுதாயம் ஏற்படுவதற்கு ஒரு பிரதான காரணமாகக் கல்வி என்ற விடயம் காணப்படுகின்றது. அந்த வகையில், சரியான முறையிலே கல்வி எல்லோருக்கும் சென்றடைகின்றதா? என்ற விடயத்தை நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டியவர்களாக இருக்கின்றோம். அந்த அடிப்படையிலே, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டக் கல்வி வலயம் சம்பந்தமான ஒரு பிரச்சினையை முதலில் இங்கு குறிப்பிடலாம் என நினைக்கின்றேன்.

இன்று எங்களுடைய மாவட்டத்திலே கிண்ணியா வலயம், மூதூர் வலயம், திருகோணமலை வலயம், திருகோணமலை வடக்கு வலயம், கந்தளாய் வலயம் ஆகிய 5 கல்வி வலயங்கள் காணப்படுகின்றன. அதில் தம்பலகாமம் பிரதேசத்திலே இருக்கின்ற பிரச்சினை என்னவென்றால், அந்தப் பிரதேசத்திலுள்ள பாடசாலைகள் இன ரீதியாகப் பிரிவினை அடைந்திருக்கின்ற ஒரு நிலைப்பாடு காணப்படுவதாகும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் எல்லோரும், குறிப்பாக இந்தப் பாராளுமன்றத்திலும் பலரும் பேசுகின்ற விடயம், நாட்டில் இனவாதமற்ற, மதவாதமற்ற ஒரு நிலையை உருவாக்க வேண்டுமென்பதாகும். இருந்தபோதிலும், இன்று எங்களுடைய தம்பலகாமம் பிரதேசத்திலே காணப்படுகின்ற சிங்களப் பாடசாலைகள் எல்லாம் கந்தளாய் வலயத்துடனும், முஸ்லிம் பாடசாலைகள் கிண்ணியா வலயத்துடனும், தமிழ்ப் பாடசாலைகள் திருகோணமலை வலயத்துடனும் இணைக்கப்பட்டிருக்கின்றன. கல்வி மட்டத்திலே பக்கத்துப் பக்கத்தில் இருக்கின்ற பாடசாலைகள் இவ்வாறு இன ரீதியாகப் பிரிவினையாக்கப்பட்டிருக்கின்றபொழுது, நாங்கள் எப்படி அங்கிருக்கின்ற மாணவ, மாணவிகளுக்கு இனவாதமற்ற, மதவாதமற்ற செயற்பாடுகள் சம்பந்தமாகப் பேசுவதென்ற ஓர் அச்சம் எங்கள் மத்தியிலே காணப்படுகின்றது. ஆகையால்தான், நாங்கள் சென்ற காலங்களிலே தம்பலகாமம் பிரதேசத்திற்குத் தனியான ஒரு கல்வி வலயத்தைக் கொண்டுவர வேண்டுமென்ற ஒரு முயற்சியை மேற்கொண்டிருந்தோம். ஆயினும், அதனைத் தனி வலயமாக உருவாக்குவதற்கு அங்குள்ள பாடசாலைகளின் எண்ணிக்கை போதாதென்ற ஒரு நிலைப்பாடு காணப்பட்டது.

அதேபோன்றுதான் எங்களுடைய திருகோணமலைக் கல்வி வலயத்தினுள் வருகின்ற குச்சவெளிக் கோட்டத்திலே பல பிரச்சினைகள் காணப்படுகின்றன. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குச்சவெளிப் பிரதேசத்திலே காணப்படுகின்ற பல பாடசாலைகள் இன்று பல குறைபாடுகளுடன் இயங்கிக் கொண்டிருக்கின்றன. கட்டடங்கள் தொடர்பான குறைபாடுகளை ஒரு பக்கம் வைத்தாலும், இன்று குச்சவெளிக் கோட்டப் பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறையென்பது மிகவும் மோசமான ஒரு நிலையிலே காணப்படுகின்றது. அதனடிப்படையில்தான், திருகோணமலைக் கல்வி வலயத்திலே குச்சவெளிக்கெனத் தனியான கல்வி வலயம் ஒன்றை அமைக்க வேண்டுமென்று சென்ற காலங்களில் நாங்கள் முயற்சித்திருந்தோம். அங்குள்ள எல்லை நிர்ணயம் சம்பந்தமான விடயங்களையெல்லாம் கருத்திற்கொண்டு, இது தொடர்பில் 2023.09.26இல் அந்த மாகாணக் கல்வி அமைச்சினுடைய செயலாளரினால் ஒரு recommendation தரப்பட்டிருக்கின்றது. குச்சவெளிக்காகத் தனியான ஒரு கல்வி வலயத்தை ஆரம்பிப்பதற்கான எல்லா ஏற்பாடும் தங்கள் மட்டத்திலே நடைபெற்றிருப்பது பற்றியும் அதற்கான தமது விருப்பத்தையும் கிழக்கு மாகாணக் கல்வி அமைச்சினுடைய செயலாளர் கடிதமூலம் எங்களுக்குத் தெரிவித்திருக்கின்றார். அந்தக் கடிதத்தின் பிரதியை நான் ***ஹன்சாட்*** பதிவுக்காகச் *சமர்ப்பிக்கின்றேன்.

ஆனால், அந்தக் கடிதம் மத்திய அரசாங்கத்தினுடைய கல்விச் செயலாளருக்கு அனுப்பப்பட்டதன் பின்னரும், அது தொடர்பான எந்தவொரு நடவடிக்கையும் எடுக்கப்படாமல், தொடர்ந்தும் அது கிடப்பிலே போடப்பட்டிருக்கின்றது. தயவுசெய்து அந்தக் கடிதத்தின் விடயங்களை, குறிப்பாக எங்களுடைய பிரதேச மாணவர்களின் கல்விச் செயற்பாடுகள் பின்தள்ளப்பட்டிருக்கின்ற நிலையைக் கருத்திற்கொண்டு, குச்சவெளிக் கோட்டத்தைத் தனிக் கல்வி வலயமாக உருவாக்குவதற்கான நடவடிக்கையை முன்னெடுக்க வேண்டுமென்று இந்த இடத்தில் கௌரவ பிரதம அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, நான் ஆரம்பத்தில் சொன்னதுபோன்று தம்பலகாமம் பிரதேசத்தில் மூன்று இனப் பாடசாலைகளும் மூன்று வலயங்களாகக் காணப்படுவது உண்மையிலேயே இனவாதச் செயற்பாடாகப் பார்க்கப்படுகின்றது. ஆகையால், இந்த விடயத்தையும் கருத்திற்கொண்டு தம்பலகாமத்துக்கான தனியான கல்வி வலயத்தை உருவாக்குவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும். ஏனென்றால், சென்ற அரசாங்கம் மூதூர் வலயத்தில் காணப்பட்ட ஒரு சிங்கள மொழிப் பாடசாலையை கந்தளாய் வலயத்துடன் இணைத்திருக்கின்றது. எந்தவொரு சம்பந்தமும் இல்லாது மேற்கொள்ளப்பட்ட இந்த இணைப்பை ஓர் இன ரீதியான செயற்பாடாகத்தான் நாங்கள் பார்க்கின்றோம். இவ்வாறான இன ரீதியான வேறுபாடுகள் கல்வி நடவடிக்கையில் இருக்குமாகவிருந்தால், எவ்வாறு மாணவர் சமுதாயத்தில் நல்லிணக்கத்தை ஏற்படுத்துவது என்ற அச்சம் இன்று எங்கள் மத்தியிலே காணப்படுகின்றது. ஆகையால், திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற குச்சவெளி, தம்பலகாமம் ஆகியவற்றுக்கான தனியான வலயம் தொடர்பான விடயங்களிலே கூடுதலான கவனம் செலுத்தவேண்டுமென இந்த இடத்திலே நான் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, கிண்ணியா கல்வி வலயம் கல்வி மட்டத்திலே கூடுதலான குறைபாடுகளைக் கொண்ட வலயமாகக் காணப்படுகின்றது. முக்கியமாக கிண்ணியா கல்வி வலயத்தில் இலங்கை கல்வி நிருவாக சேவை உத்தியோகத்தர்களுக்கான பற்றாக்குறை காணப்படுகின்றது. குறிப்பாக, 20 உத்தியோகத்தர்கள் கடமை புரிய வேண்டிய இந்த வலயத்தில் 3 பேர் மட்டுமே கடமையாற்றுகின்ற நிலைமை காரணமாகப் பல நிருவாகச் சிக்கல்கள் எழுந்துள்ளன. நாங்கள் கடந்த மூன்று மாதங்களுக்கு முன்னர் கிழக்கு மாகாண சபையின்

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ஆளுநரைச் சந்தித்து இந்த விடயம் சம்பந்தமாகத் தெளிவுபடுத்தியபோதும் இதுவரை நாங்கள் வழங்கிய கடிதத்திற்குக்கூட பதில் கிடைக்காத நிலையே காணப்படுகின்றது. ஆகையால், தயவுசெய்து இந்த விடயத்திலும் கவனஞ்செலுத்தி அதற்கான தீர்வைப் பெற்றுத்தர வேண்டுமெனக் கௌரவ அமைச்சர் அவர்களிடம் நாங்கள் வேண்டிக் கொள்கின்றோம்.

அடுத்து, நான் ஆரம்பத்தில் சொன்னது போன்று, திருகோணமலை கல்வி வலயத்தின்கீழ் இயங்கி வருகின்ற குச்சவெளிக் கோட்டத்திலுள்ள நிலாவெளி, இறக்கக்கண்டி, குச்சவெளி, புடவைக்கட்டு போன்ற பிரதேசங்களின் கல்வி கேள்விக்குறியாகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. ஏனென்றால், அந்தப் பிரதேசப் பாடசாலைகளுக்கு நியமிக்கப்படுகின்ற ஆசிரியர்கள் அங்கிருந்து உடனடியாக இடமாற்றம் பெற்றுச் செல்கின்றார்கள். அங்கிருக்கின்ற தமிழ், முஸ்லிம், சிங்களப் பாடசாலைகள் அனைத்திலும் இதே நிலைமைதான்! குறிப்பாக, கோமரங்கடவெல, பதவிஸ்ரீபுர, மொறவெவ போன்ற பிரதேசங்களிலே காணப்படுகின்ற சிங்களமொழிப் பாடசாலைகளில்கூட ஆசிரியர் பதவிக்கான பல வெற்றிடங்கள் காணப்படுகின்றது. இதற்கு ஒரு தீர்வை வழங்கவேண்டுமாக இருந்தால், இம்முறை வழங்கப்படவிருக்கின்ற Colleges of Educationஇனை முடித்தவர்களுக்கான நியமனங்களின்போது எங்களுடைய மாகாணத்தின் சகல மாவட்டங்களுக்கும் சரியான ஆசிரியர் பகிர்வை மேற்கொள்ளக்கூடிய வகையில் சரியான cadre listஇனைக் கவனத்திற் கொள்ளவேண்டுமென கௌரவ அமைச்சர் அவர்களிடம் நான் கேட்டுக் கொள்கிறேன். ஏனென்றால், இவ்வாறு ஆசிரியர் நியமனங்களை வழங்கும்போது சொல்லப்படுகின்ற விடயம், "சரியான cadre creation செய்யப்படவில்லை" அல்லது "2018ஆம் ஆண்டிலுள்ள cadre creation அடிப்படையில்தான் நியமனம் வழங்குகின்றோம்" என்பதாகும். ஒவ்வொரு வருடமும் இவ்வாறு சொல்லப்படுகின்ற காரணத்தினால், எங்களுடைய பிரதேசங்களைச் சேர்ந்த ஆசிரியர்கள்கூட வெளிமாவட்டங்களுக்குச் சென்று கற்பிக்கின்ற சூழலுக்குத் தள்ளப்படுகின்றார்கள். ஆகையால், இந்த விடயத்தில் விசேட கவனம் செலுத்தவேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களிடம் நான் மீண்டும் கேட்டுக் கொள்கின்றேன்.

இன்று கல்வியிலே தனியார் வகுப்புக்கள் - tuition classes - என்பது பெரும் சவாலான விடயமாக மாறியிருக்கின்றது. இந்த tuition மூலமாக மாணவர்கள் எவ்வாறு வழிநடத்தப்படுகின்றார்கள் என்பது தொடர்பில் சிந்திக்கவேண்டி இருக்கின்றது. பல மாணவர்கள் இரவு நேரங்களில்கூட tuition வகுப்புகளுக்குச் செல்லுகின்ற காரணத்தினால், வீடுகளில் சுயமாகக் கல்வி கற்கின்ற நிலைமை முடக்கப்படுகின்றது. ஆகையால், இந்த tuition என்ற விடயத்திலே கவனஞ்செலுத்தி, அதனை ஒரு விசேட முறைமையின்கீழ் கொண்டுவருவதற்கான வழிமுறையை மேற்கொள்ளும் வகையில் ஒரு கல்விக் கொள்கையை உருவாக்கவேண்டுமென்பதையும் இந்த இடத்தில் கூறி, எனது உரையை நிறைவு செய்துகொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහමඩ් සාලි නලීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.48]

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ பிரதம அமைச்சர் கலாநிதி ஹரிணி அமரசூரிய அவர்களுடைய கல்வி அமைச்சின் நிதி ஒதுக்கீட்டில் இறைவனை வேண்டிக்கொண்டவனாக எனது பேச்சைத் தொடர்கிறேன். நாங்கள் தொடர்ந்தேர்ச்சியாக இந்த வரவு செலவுத்திட்ட விவாதத்திலே பல்வேறு விதமான பிரச்சினைகளைப் பேசி வருகின்றோம். அவற்றுக்குச் சரியான தீர்வுகளைப் பெற்றுத் தரவேண்டுமென்று இந்த இடத்தில் வேண்டிக் கொள்கின்றேன்.

ஏறாவூர் பொலிஸ் நிலையம் அமைந்திருந்த காணி அங்குள்ள அலிகார் தேசியப் பாடசாலைக்காகச் சுவீகரிக்கப்பட்டது உங்களுக்குத் தெரியும். கிட்டத்தட்ட இரண்டு rood அளவான, 90 - 95 'பேர்ச்' அளவான அந்தக் காணி தற்போது கல்வி அமைச்சின்கீழ் வருகின்ற, அலிகார் தேசிய பாடசாலைக்குச் சொந்தமான ஓர் இடமாகும். அவ்விடத்தில் இருந்த பொலிஸ் நிலையம் தற்போது வேறோர் இடத்திற்கு மாற்றப்பட்டுள்ளபோதிலும், அவர்களுடைய தங்குமிட விடுதிகள் - quarters - அங்கே இருக்கின்றது. கௌரவ பிரதம அமைச்சர் அவர்கள் அதற்கான அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பித்து அந்தக் காணியை முழுமையாக மீட்டுத் தருவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்று இந்த இடத்தில் வேண்டிக் கொள்கின்றேன்.

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, அலிகார் தேசிய பாடசாலைக்குரிய தொழில்நுட்பப் பிரிவுக்கான கட்டிடம் அமைக்கப்பட்டு, உபகரணங்கள் பொருத்தப்பட்டு நான்கு வருடங்கள் சென்ற நிலையிலும், மாணவர்கள் கற்றல் நடவடிக்கைகளை மேற்கொள்ளும்வகையில் தொழில்நுட்ப வசதிகளுடன்கூடிய கற்கை நிறுவனத்தை உருவாக்குகின்ற விடயத்தில் மத்திய அரசின் அசமந்தப்போக்கு நிலைமை காணப்படுகின்றது. கௌரவ பிரதம அமைச்சர் அவர்களே, இவ்விடயத்தினையும் கருத்திற்கொள்ளுமாறு உங்களை வேண்டிக் கொள்கின்றேன்.

எங்களுடைய ஏறாவூரில் அமைந்திருக்கின்ற மீராகேணி மாக்கான் மாக்கார் தேசியப் பாடசாலையில் 6ஆம் ஆண்டு தொடக்கம் உயர்தரம் வரை சுமார் 1,500 மாணவர்கள் கற்கை நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றார்கள். இந்தப் பாடசாலை 2018ஆம் ஆண்டு 09ஆம் மாதம் 15ஆம் திகதி தேசியப் பாடசாலையாகத் தரமுயர்த்தப்பட்டு ஏழு வருடங்கள் கடந்து சென்றும் இன்னும் அந்தப் பாடசாலைக்கான அடிப்படை வசதிகள் எதுவுமே நிவர்த்தி செய்யப்படவில்லை. வெறுமனே தேசியப் பாடசாலை என்கின்ற பெயர்ப்பலகை மாத்திரமே அந்தப் பாடசாலைக்குச் சொந்தமானதாக இருக்கின்றதே தவிர, அதற்கான எதுவித வசதிகளும் மேற்கொள்ளப்படவில்லை. அங்கே நிர்வாகக் கட்டிட வசதிகள் இல்லை; சுமார் 30 வகுப்பறைகள் தேவையான நிலையில் போதிய கட்டிட வசதியும் இல்லாமல் இருக்கின்றது. கௌரவ பிரதம அமைச்சர் அவர்களே, 50 வருடம் பழைமை வாய்ந்த கட்டிடங்களில்தான் அந்தப் பாடசாலை தற்பொழுதும் இயங்கி வருகின்றது. கிட்டத்தட்ட 30 கல்விசாரா ஊழியர்களுக்கான ஆளணிப் பற்றாக்குறை நிலவுகின்றது. ஒரு பாடசாலையில் 30 ஆளணியினரது பற்றாக்குறை என்பது எவ்வளவு அசௌகரியத்தையும் பாரிய நிர்வாகச் சிக்கலையும்

[ගරු මොහමඩ් සාලි නලීම් මහතා]

ඒ්ත්පඩුත්තක්කූඩිය ඔරු විඩයම් එන්පදු උංකළුක්කුත් තොිියුම්. ආකවේ, මීරාකේණි මාක්කාන් මාක්කාර් තේසියප් පාඩසාලෛක්කාන ආළණිප් පර්රාක්කුරෛයෛ උඩනඩියාක නිවර්ත්ති ච්ය්යුමාරු උංකළෛ වේණ්ටික් කොළ්කින්රේන්. අතුපෝල්, තේසිය රීතියාන එරිපන්තුප් පෝට්ටියිල් පල්වේරු සාතනෛකළෛ නිකළ්ත්තිය පාඩසාලෛ අතු. අන්ත මාණවර්කළ්, ආසිරියර්කළ් තමතු පයිර්සිකළෛ මේර්කොළ්ළක්කූඩිය වකෛයිල් අන්තප් පාඩසාලෛයින් විළෛයාට්ටු මෛතානත්තෛප් පුනරමෛත්තුක් කොටුක්කුමාරුම් ඉන්ත ඉඩත්තිලේ වේණ්ටික් කොළ්කින්රේන්.

අතේපෝල, මට්ටක්කළප්පු, තිරුකෝණමලෛ, තිකාමටුල්ල පෝන්ර මාවට්ටංකළිල් උළ්ළ පාඩසාලෛකළිල් ඉටප් පර්රාක්කුරෛ, විඥ්ඤාන පාට ආසිරියර් පර්රාක්කුරෛ, ආරම්පක් කල්වි ආසිරියර් පර්රාක්කුරෛ පෝන්ර නිලෛමෛකළ් කාණප්පටුකින්රන. ආකවේ, අප්පාඩසාලෛකළුක්කුත් තේවෛයාන ආසිරියර්කළ් අනෛවරුමේ උළ්වාංකප්පට වේණ්ටුමෙන්රු ඉන්ත ඉඩත්තිල් වේණ්ටික් කොළ්කින්රේන්.

ආසිරියර් නියමනංකළෛ එටුත්තුක්කොණ්ටාල්, පුතිතාකප් පල්කලෛක්කළකංකළිලිරුන්තු වෙළියේරුකින්රවර්කළුක්කු වේලෛවාය්ප්පුක් කොටුක්කින්ර වේළෛයිලේ, අවර්කළෛ අන්තන්තප් පකුතිප් පාඩසාලෛකළිල් නියමික්ක නටවටික්කෛ එටුක්කවේණ්ටුම්. උණ්මෛයිල් ආසිරියප් පණි ච්ය්කින්රවර්කළ් සන්තෝෂමාන මුරෛයිලේ මන නිම්මතියෝටු චෙන්රු මාණවර්කළුක්කුක් කල්වි පුකට්ටක්කූඩිය නිලෛමෛයෛ නාංකළ් කට්ටියෙළුප්ප වේණ්ටුම්. ආනාල්, ඉන්රෛය නිලෛමෛයිල් පලර් 20 - 30 කිලෝමීට්රර් පිරයාණම් ච්ය්තුතාන් කුරිප්පිට්ට පාඩසාලෛකළුක්කු චෙන්රු, මනච්චෝර්වෝටුම් අచතියෝටුම් මාණවර්කළුක්කුක් කල්වියෛප් පුකට්టුකින්ර නිලෛ ඉරුක්කිරතු. කෞරව පිරති අමෛච්චර් අවර්කළේ! ඉව්වාරාන නිලෛමෛයිල් නාංකළ් system change එන්රු පේච්ික්කොණ්ටු ඉරුක්කින්රෝම්. එනවේ, ආසිරියර් පර්රාක්කුරෛ කාණප්පටුකින්ර පාඩසාලෛකළිල් අන්තන්තප් පිරතේසත්තෛච් චේර්න්තවර්කළෛ නියමිත්තු අන්තක් කුරෛයෛප් පූර්ත්තිච්ය්කින්ර වණ්ණම් උංකළුටෛය නටවටික්කෛකළෛ මේර්කොළ්ළුමාරු ඉන්ත ඉඩත්තිලේ නාන් පණිවාකක් කේට්ටුක්කොළ්කින්රේන්.

(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න.

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
Please give me two more minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තවත් කාලය ලබා දෙන්න අපහසුයි, තිබෙන කාල වේලාව අනුව. ඔබතුමා ඉක්මනින් කථාව අවසන් කරන්න.

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
සගෝදරයා අර්ච්චුනා අවර්ණුක්කුච් චිල විඩයඞ්කළෛක් කූරි මුඩිත්තුක්කොළ්ළලාමෙන්රු නිනෛක්කින්රේන්. අවර් පඩිත්තවර්, පණ්පුළ්ළවර්. අවර් ඔරු දේසියප් පට්ටියල් උරුප්පිනර් අල්ල; මක්කළිනාල් තෙරිවුසෙය්යප්පට්ටු වන්දිරුක්කින්රාර්; මක්කළින් ආදරවෛප් පෙට්රු වන්දවර්. එනවේ, අවර් ඉන්ත නාට්ටිලුම් ඉරුක්කින්ර අනෛත්තු මක්කළෝටුම් ඉණෛන්තු සෙයර්පඩ වේණ්ඩුමෙන්රු පිරාර්ත්තිත්තවනාක, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දීර්ඝ පැහැදිලි කිරීමකට යන්න බැහැ. කථාව අවසන් කරන්න.

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
ඉන්ත විඩයත්තිලේ අවර් තනදු කූර්රුකළෛ මුළුමෛයාක වාපස් පෙරවේණ්ඩුම් අල්ලදු අන්ත නිලෛප්පාට්ටිලිරුන්දු මාරවේණ්ඩුමෙන්ර විඩයත්තෛක් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්.

එමදු ඉලංකෛත් තිරුනාට්ටිලේ 6 මාකාණංකළිලේ පල්කලෛක්කළකක් කල්ලූරිකළ් අමෛක්කප්පට්ටිරුක්කින්රන. කිළක්කු මාකාණත්තිලේ -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

මීළහට, ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දීර්ඝ කාලයක් ගන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ අදහස් දැක්වීම ඉක්මනින් අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් ලබා දෙන්න.

නාන් ඉන්ත මුස්ලිම් සගෝදරයර් සොන්න විඩයඞ්කළිල් ඔරුසිල විඩයඞ්කළෛත් තෙළිවුපඩුත්ත වේණ්ඩුම්. පොදුවාක මක්කළිඩමිරුන්දු වන්ත කෝරික්කෛකළෛයේ නාන් පෙණ්කළ් චාර්පාකච් සොන්නේනේයොළිය, එන්නුඩෛය සගෝදරයර් තාහිර් උට්පඩ හිස්පුල්ලාහ් අවර්කළ් තෙරිවිත්ත කරුත්තුකළෛ නාන් ඒර්රුක්කොළ්කින්රේන්. මුස්ලිම් මතම් එන්පදු නාඞ්කළ් නිනෛප්පදු පෝන්රු ඔරු සිරිය මතම් අල්ල, අදු ආයිරම් ආයිරම් ආණ්ඩුකළාක වළර්න්දු වරුකින්ර මතම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දීර්ඝ පැහැදිලි කිරීමකට යන්න බැහැ. ඉක්මනින් අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට කෙටි වෙලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා.

අන්ත මතත්තිල් එන්ත මාට්රංකළෛයුම් ඒර්පඩුත්තුවතර්කු නාඞ්කළ් යාරුම් මුයර්සික්කවිල්ලෛ. එඞ්කළුඩෛය ඉරත්තම් අවර්කළ්! ආකවේ, නාන් සොන්න විඩයම්, සිරුපිළ් ළෛකළෛයුම් පෙණ්කළෛයුම් මට්ටුමේ නාඞ්කළ් කරුතියතේ තවිර, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉන්ත මතත්තෛ නිඞ්දිප්පතර්කාක නාන් අවර්රෛච් චොල්ලවිල්ලෛයෙන්පතෛක් කූර විරුම්පුකිරේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළහට, ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 3.51]

ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් අදහස් පළ කිරීමේදී ඉතා වැදගත් වනවා, අපේ රට සංවර්ධනය කිරීමේදී අධ්‍යාපනයට පැවරෙන කාර්යභාරය පිළිබඳව විමසා බැලීම. අපි විශ්වාස කරනවා, රට සංවර්ධනය කිරීමේදී ප්‍රමුඛතාව අතින් අපට අංක 1ත්, අංක 2ත්, අංක 3ත් අධ්‍යාපනයම බව.

අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරද්දී අපි විශේෂයෙන්ම සතුටු වෙනවා, අපේ රටේ අධ්‍යාපන අමාත්‍යාංශය භාරව සිටි ඇමතිවරුන් 25දෙනෙකුට පසුව 26වැනියා විධියට අධ්‍යාපන අමාත්‍ය ධුරයට අපේ රටේ කාන්තා නියෝජනය තුළින් ඇමතිවරියක පත්වීම ගැන. පාර්ලිමේන්තුවේ පුස්තකාලයෙන් ගත් තොරතුරුවල සඳහන් වෙලා තිබෙන කරුණු අනුවයි මම මේ කාරණය කියන්නේ. ඒක ඓතිහාසික සිද්ධියක්. විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයේ විෂය පථය කාලයකට පසුව විද්‍යාත්මක පදනමකින් බෙදා තිබෙනවා, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන වශයෙන්. අධ්‍යාපනය අතින් ඉදිරි ගමනක් යන්න එයත් දැවැන්ත පිටුවහලක් වනවා කියා අපි විශ්වාස කරනවා. ඉතිහාසයේ පළමු වතාවට මෙවර අධ්‍යාපනයට දැවැන්ත මුදලක් වෙන්කර තිබෙනවා. මෙන්න මේ සියලු කාරණා ගත්තාම අපි හිතනවා අධ්‍යාපනයේ දැවැන්ත ගුණාත්මක පරිවර්තනයක් ළඟා කර ගන්න අපට පුළුවන් වෙයි කියලා.

අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරද්දී මට ලෙනින්ගේ ප්‍රකාශයක් මතක් වෙනවා. ලෙනින් වරෙක සඳහන් කර තිබෙනවා, "ජීවිතයෙන් සහ දේශපාලනයෙන් වෙන් කරන ලද අධ්‍යාපනය කුහකකමක් සහ ප්‍රෝඩාවක් බව අපි තරයේ ප්‍රකාශ කරන්නෙමු" කියලා. අධ්‍යාපනය අපේ ජීවිතයට සම්බන්ධ වෙලා නැත්නම්, ඒක දේශපාලනයෙන් වෙනස් කරලා නම් ඒ අධ්‍යාපනයෙන් තිබෙන පිටුබලය අවමයි කියලා තමයි ලෙනින් සහෝදරයා සඳහන් කර තිබෙන්නේ. තවත් තැනකදී අධ්‍යාපනයේ වැදගත්කම සම්බන්ධයෙන් සාකච්ඡා කරන කොට මට ශ්ලෝකයක් හම්බ වුණා. එය මෙසේයි:

"ස්වගෘහේ පූජ්‍යතේ මූර්ඛඃ - ස්වග්‍රාමේ පූජ්‍යතේ ප්‍රභූඃ
ස්වදේශේ පූජ්‍යතේ රාජා - විද්වාන් සර්වත්‍ර පූජ්‍යතේ"

ගෙදර ප්‍රභූත්වයට පත් වෙන්න පුළුවන් මෝඩයෙකුට. ගමක ප්‍රභූත්වයට පත් වෙන්න පුළුවන් ප්‍රභූවරයෙකුට. රටක ප්‍රභූත්වයට පත් වෙන්න පුළුවන් රජෙකුට. හැබැයි, උගතා බුද්ධිමතා ලෝකයේම ප්‍රභූත්වයට පත් වෙනවා. එහෙම ගත්තාම, අපට අධ්‍යාපනයේ තිබෙන වැදගත්කම හිතා බලන්න පුළුවන්.

මම හිතනවා, සියලුම දෙයට මූලික වන්නේ අධ්‍යාපනයයි කියලා. අධ්‍යාපනය දුබල නම්, එම රටේ සෞඛ්‍යය දුබලයි. අධ්‍යාපනය දුබල නම්, එම රටේ සදාචාරය දුබලයි. අධ්‍යාපනය දුබල නම් එම රටේ නීතිය දුබලයි. අධ්‍යාපනය දුබල නම් එම රටේ මනුෂ්‍යත්වය දුබලයි. සියලුම දේවලට මූලික පදනම - foundation එක - බවට පත් වන්නේ අධ්‍යාපනයයි. මේ සියලු අමාත්‍යාංශවලට මව් අමාත්‍යාංශය බවට පත් වෙන්න ඕනෑ, අධ්‍යාපන අමාත්‍යාංශයයි. ඒ අධ්‍යාපනය ගැන තමයි අප අද දවසේ සාකච්ඡාවට බඳුන් කරන්නේ.

එක්තරා දාර්ශනිකයෙකුගෙන් ඇහුවා, "ඔබ අධ්‍යාපනය කියන්නේ මොකක්ද?" කියලා. ඔහු කිව්වා, "ඔබ ඉගෙන ගත්තු සියලු දේවල් අමතක කළාට පස්සේ, ඔබට යම් දෙයක් ඉතුරු වේද, අන්න ඒ දේ තමයි අධ්‍යාපනය" කියලා. ඔබ ඉගෙන ගත්තු සියලු දේවල් අමතක කළාට පස්සේ, ඔබට යම් දෙයක් ඉතුරු වෙනවා නම්, අන්න ඒ දේ තමයි අධ්‍යාපනය කියලායි ඒ දාර්ශනිකයා කිව්වේ. අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉතා ලඝු ගණයේ තර්ක ගොඩක් ඉදිරිපත් කරලා විපක්ෂයට කරුණු දක්වන්න පුළුවන්. මා හිතන්නේ නැහැ, නිලෙන්, කොළෙන් මේ අධ්‍යාපනය කවදාවත් හදයි කියලා. මොකද, ඇත්තටම ඒ අය විසඳන්නේ නැති ප්‍රධාන ප්‍රශ්න දෙකක් අපි හඳුනාගෙන තිබෙනවා. එකක් තමයි, ඒ අය කවදාවත් අධ්‍යාපන ප්‍රශ්නය නිලෙන්, කොළෙන් විසඳන්නේ නැහැ. දෙවැනි එක මොකක්ද? ඒ අය කවදාවත් දුප්පත්කම පිළිබඳ ප්‍රශ්නය නිළෙන් කොළෙන් විසඳන්නේ නැහැ. මොකද, ඒ අයට මේ ස්ථානවලට එන්න පාවාඩ බවට පත් වුණේ දුප්පත්කම සහ නුගත්කම. අන්න ඒක වෙනස් කරන්න තමයි, අපි මේ දැවැන්ත සද්ව්‍යායාමයක නියැළෙන්නේ. අපි හිතනවා, ඒක වෙනස් කරන්න ඕනෑ කියලා. අපි මේ වන කොට අපේක්ෂා කරලා තිබෙනවා, අධ්‍යාපනයේ දැවැන්ත පරිවර්තනයක්.

අධ්‍යාපනය සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කියපු කාරණා ගැන ගොඩක් විවේචනය කරන්න මට පුළුවන්. මම හිතන විධියට, ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ. උදේ එක්තරා මන්ත්‍රීවරයෙක් කිව්වා, අධ්‍යාපනයට දේශපාලනය සම්බන්ධ කර ගන්න එපා කියලා. හැබැයි, එතුමාගේ නායකයාම -ඔය සජිත් ප්‍රේමදාස මහත්මයාම- තමයි, ඡන්ද කාලයේ "හුස්ම" කියලා වැඩසටහනක්, ඒ වාගේම "සක්වල" කියලා වැඩසටහනක් කරමින්, දිනපතා පාසල්වලට ගිහිල්ලා දේශපාලනය කළේ. අද "හුස්ම" නැහැ. අද හුස්ම වැටෙන්නේ නැහැ. අද "හුස්ම" නතර වෙලා. මා හිතන විධියට, "සක්වල" සක්වල ගලේ ගහලා. අද ඒවා නැහැ.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
දැනුත් ඒවා දෙන්න කියන්න.

ගරු නලින් හේවගේ මහතා
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
එහෙම නම්, දැනුත් ඒවා දෙන්නකෝ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක ඇති, ඒ දවස්වල එක දවසට පාසල් දෙකතුනකටත් ගියා. දැන් එහෙම නැහැ. මම කියන්නේ ඒ සුළු සුළු දේවල් ගැන නොවෙයි. එහෙම ගත්තොත්, 2017දී අධ්‍යාපනයට වෙන් කරපු මුදලින් භාගයයි ලැබුණේ. එහෙමයි දුන්නේ. අධ්‍යාපනයට දැවැන්ත ප්‍රහාරයක් ඒ පක්ෂය එල්ල කර තිබෙනවා. මට ඒක වැඩක් නැහැ. ඒවා සාමාන්‍යයෙන් අපට ගණන් කරන්න පුළුවන්, මනින්න පුළුවන්. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා අධ්‍යාපනයට කරපු දැවැන්ත අනර්ථයක් තිබෙනවා.

[ගරු නලින් හේවගේ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දැනුම" කියන එක ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතයි කියලා අපි දන්නවා. එකක් තමයි, ඉන්ද්‍රිය ගෝචර දැනුම. අපි ඇසට පෙනිලා දැනුමක් ලබා ගන්නවා; කනට ඇහිලා දැනුමක් ලබා ගන්නවා; මේ සමට දැනිලා දැනුමක් ලබා ගන්නවා. ඒ වාගේ ඉන්ද්‍රිය ගෝචර දැනුමක් තිබෙනවා. තව දැනුමක් තිබෙනවා. ඒ තමයි, තාර්කික දැනුම. මට විපක්ෂය සම්බන්ධයෙන් තිබෙන ප්‍රධාන විවේචනය තමයි, පසු ගිය කාල පරිච්ඡේදය පුරා මෙතුමන්ලා ඒ දැනුමෙන් එකක් වැහුවා. පංචේන්ද්‍රිය දැනුම විතරක් දැනුම බවට පත් කරලා, තාර්කික දැනුම කියන පළුව වැහුවා. අන්න ඒකට සමාවක් දෙන්න මට බැහැ. වෙන වෙන දේවල් අපට හදාගන්න පුළුවන්. එතුමන්ලා දැනුම බවට පත් කළේ පංචේන්ද්‍රිය දැනුම විතරයි. ලොකු කුලුනු ගැහුවා, දිග පාරවල් හැදුවා, ලොකු වළවල් හාරලා චතුර පිරෙව්වා. එතුමන්ලා කිව්වා, මේක තමයි සංවර්ධන මාවත කියලා. අපටත් ලොකු කුලුනු පෙනෙනවා; ලොකු වළවල් පෙනෙනවා; ඉස්කෝලවල buildings පෙනෙනවා. ඒවා තමයි සංවර්ධනය කියලා අපට පෙන්වපු දේවල්. හැබැයි, තාර්කික ඥානය වැහුවා. ඔය රූපවාහිනී නාළිකා අධ්‍යාපනය ඇතුළේ මිථ්‍යාව වැපුරුවා. ඒකෙන් දැවැන්ත අපරාධයක් රටට වුණා. ඒ නිසා අධ්‍යාපනය කියන්නේ, මේ කොටස් දෙකම බවට පත් වෙන්න ඕනෑ කියලායි මා හිතන්නේ. බුදු හාමුදුරුවෝත් එක්තරා තැනකදී දේශනා කළා, යමක් භක්තියෙන් පිළිගන්න එපා කියලා. භක්තිය කියන්නේ, යමකට හෝ යමෙකුට ඇති වන භය නිසා වන පිළිගැනීමයි. බුදු හාමුදුරුවෝ දේශනා කළා, භක්තියෙන් පිළිගන්න එපා, ශ්‍රද්ධාවෙන් පිළිගන්න කියලා. ශ්‍රද්ධාවේත් කොටස් දෙකක් ගැන කිව්වා. එකක් තමයි, අමූලිකා ශ්‍රද්ධාව. දෙවැනි එක තමයි, ආකාරවතී ශ්‍රද්ධාව. ආකාරවතී ශ්‍රද්ධාව කියන්නේ, කරුණු වටහාගෙන ඇති වන පැහැදීම. එහෙම සම්පූර්ණ පළුවක් තමයි මෙතුමන්ලා වහලා ගියේ. දැන් අපට ඕනෑ තාර්කික මනුෂ්‍යයෙක් හදන්න. පංචේන්ද්‍රිය දැනුම හා තාර්කික දැනුම මිශ්‍ර වෙච්ච දැනුමෙන් තමයි අපට සැබෑ දැනුම එන්නේ. ඒ නිසා අන්න ඒ දෙකෙන්ම යුක්ත මනුෂ්‍යයෙකු තමයි දැන් අපට හදන්න ඕනෑ. අර වැසුණු පළුව ඇරියාට පස්සේ, විද්‍යාවේ දැවැන්ත ආලෝක ධාරාවක් මනුෂ්‍යයන්ගේ ජීවිතවලට ඇතුළත් වෙනවා. අන්න ඒක තමයි අපට අවශ්‍ය වෙන්නේ. ඒ අයට ඕනෑකම තිබුණේ ඒක වහන්න. දැන් ඒක ඇරෙනවා. හැබැයි, ඒක ඇරෙන කොට ඔවුන්ට මේ ස්ථානවලත් දොරවල් වැහෙනවා. ඒක ඔවුන් දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අධ්‍යාපනය ගත්තොත් පෙනෙනවා, අධ්‍යාපනයේ දැවැන්ත විෂමතාවක් තිබෙන බව. ඔවුන් පසු ගිය කාලයේ පාසල් පද්ධතියක් හැදුවා. මොනවාද හදපු පාසල්? ජාතික පාසල් හැදුවා, පෝෂිත පාසල් හැදුවා, ප්‍රාථමික පාසල් හැදුවා, ද්විතීයික පාසල් හැදුවා, පර්ෂද පාසල් හැදුවා, පොකුරු පාසල් හැදුවා, හුදෙකලා පාසල් හැදුවා, ප්‍රදීපාගාර පාසල් හැදුවා. ජනප්‍රිය පාසල් හැදුවා. ඒ වාගේ තව ගොඩක් කියන්න තිබෙනවා. ඒවායේ ළමයි ඉන්නේ වර්ග දෙකයි. කෙල්ලෝ ඉන්නවා, කොල්ලෝ ඉන්නවා. නමුත් පාසල් වර්ග තිබෙනවා, හැටහුටහමාරක්. මොනවාද මේ තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කියනවා මෙන්න මේ කාරණයත්. 2018දී ගාල්ල දිස්ත්‍රික්කයේ පාසලක් තිබුණා. ඒ පාසලේ පළමුවැනි වසරේ කවුරුවත් නැහැ, දෙවැනි වසරේ කවුරුවත් නැහැ, තුන්වැනි වසරේ කවුරුවත් නැහැ, හතරවැනි වසරේ එක කෙලි පැංචියෙක් හිටියා, පහ වසරේ කවුරුවත් නැහැ. ඔන්න ඉස්කෝලයක්! මෙන්න අවුරුදු 76ක් රට පාලනය කරපු මේ පාලකයෝ අධ්‍යාපනය ගෙනාපු තැන. එක ඉස්කෝලෙක එක පන්තියකයි ළමයෙක් හිටියේ. මම ගාව තිබෙනවා, ළමයි 50ට අඩු පාසල් සඳහන් වන ලියවිල්ලක්. කලින් කිව්වා, "කොළඹට කිරි, ගමට කැකිරි" කියලා. ඒත් මේක බලනකොට, කොළඹටත් කැකිරිම තමයි. බස්නාහිර පළාත් සභාවේ තිබෙනවා, ළමයි 1ත්, 10ත් අතර ඉන්න පාසල් 3ක්. ළමයි 10ක් ඉන්න පාසල් තිබෙනවා 115ක්. මේවා පාසල්ද? මේ පාලකයන්ට මේවා තෙරෙන්නේ නැද්ද? ළමයි 50ට අඩු පාසල් තිබෙනවා, සියයට 14.9ක්. මේවා පාසල්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමයි 10ක් ඉන්නවා කිව්වාම, ඒ ඉස්කෝලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙලක් නැහැ, swimming pool එකක් නැහැ, jogging track එකක් නැහැ, සාහිත්‍ය සමිතියක් නැහැ, විද්‍යාගාරයක් නැහැ, පුස්තකාලයක් නැහැ. Output එක zero. මේක තේරෙන්නේ නැද්ද? මේවාට තමයි මෙතුමන්ලා අධ්‍යාපනය කියලා කිව්වේ.

මම කියන්නම්, අධ්‍යාපනය හදන්න එක විසඳුමක්. ලංකාවේ තිබෙනවා, පාසල් 10,096ක්. ශිෂ්‍යයෝ ඉන්නවා, 4,800,000ක්. මේවායේ හොඳ සම්පත් කළමනාකරණයක් කරන්න ඕනෑ. බලන්න මේක කරන්න බැරිද කියලා. ලංකාවේ තිබෙනවා, ග්‍රාම නිලධාරී වසම් 14,022ක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ ඡන්දෙට ලංකාවේ මේ ග්‍රාම නිලධාරී වසම් කැඩුවා, කොට්ඨාසවලට. කොට්ඨාසයක් -ward එකක්- කිව්වාම, ඒකේ තිබෙන්නේ ග්‍රාම නිලධාරී වසම් දෙකයි, නැත්නම් තුනයි. සමහර තැන්වල එකයි. ලංකාවේ ඒ කොට්ඨාස තිබෙනවා, 4,991ක්. අපි දළ වශයෙන් හිතමු කොට්ඨාස 5,000ක් කියලා. ග්‍රාම නිලධාරී වසම් දෙකක් තිබෙන, තුනක් තිබෙන, සමහර විට එකක් තිබෙන කොට්ඨාස තිබෙනවා, 5,000ක්. අපි මේ කොට්ඨාස 5,000 හොඳ පාසල් 5,000ක් හදමු. එතකොට ඒකේ swimming pool එකක් තිබෙනවා, විද්‍යාගාරයක් තිබෙනවා, පුස්තකාලයක් තිබෙනවා, ගුරුවරුත් ඉන්නවා. පහසුකම් දීලා එ් වාගේ පාසල් 5,000ක් අපි හදමු. සාමාන්‍යයෙන් මේ කොට්ඨාසවල ජනගහනය සමානයි, පවුල් සංඛ්‍යාව සමානයි. පාසල් 5,000ක් හදලා එක පාසලකට ළමයි 800ක් දැම්මොත්, ශිෂ්‍යයෝ 4,000,000ක් ඉවරයි. දැන් තිබෙනවා, පාසල් 10,096ක්. හොඳ තත්ත්වයේ පාසල් 5,000ක් හදලා ළමයි 800ක් මේ එක පාසකලට දැම්මොත්, ශිෂ්‍යයෝ 4,000,000 ඉවරයි. එහෙනම් ඉස්කෝලෙක ඉන්නේ ළමයි 800යි. ගමේ ළමයා ගමේ පාසලට යන්නේ. එතකොට අපට තෙල් ගොඩක් අවශ්‍ය වෙන්නේ නැහැ, වාහන ගොඩක් අවශ්‍ය වෙන්නේ නැහැ, ළමයින්ගේ කාලය ගොඩක් නාස්ති වෙන්නේ නැහැ, දෙමව්පියන්ගේ දෘෂ්ටිමානයේ ළමයා ඉන්නවා, අපට වියදම් ගොඩක් අඩු වෙනවා. දැන් පාසල් 10,000ක් තිබෙනවා. එතකොට පාසල් 5,000ක් වැඩියි. මේ වැඩි පාසල් 5,000ට අපි හැම දාම මොනවාද දෙන්නේ? ඩෙස්ක් දෙන්න ඕනෑ, පුටු දෙන්න ඕනෑ, ගුරුවරු දෙන්න ඕනෑ, වොචර්ලා දෙන්න ඕනෑ, තව ගොඩක් දේවල් දෙන්න ඕනෑ. ඒ ටික අපි දමමු, මේ පාසල් 5,000ට. එතකොට මොකද වෙන්නේ? ඒ පාසල් 5,000න් එක පාසලක ඉන්නේ ළමයි 800යි. ලෝකයේ හොඳම අධ්‍යාපනය තිබෙන්නේ ෆින්ලන්තයේ. එහි පාසලක ඉන්න ළමයින්ගේ average එක 600යි. කැනඩාවේ average එක 650යි. ලංකාවේ හොඳ පාසල් 5,000ක් හදමු. එතකොට ලංකාවේත් average එක 800යි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ලංකාවේ එච්චරද පාසල්?

ගරු නලින් හේවගේ මහතා
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
මම කිව්වේ, පාසලක ළමයින්ගේ average එක. පාසලක ළමයින්ගේ average එක සාමාන්‍යයෙන් 600ක්. එතකොට අපටත් ළමයි 800ක average සහිත හොඳ පාසලක් හදන්න පුළුවන්. දැන් ඉන්නවා, ගුරුවරු 250,000ක් විතර. මම හිතනවා, අපට හොඳ පාසල් 5000 පද්ධතියක් limit කරගන්න වුණොත්, ගුරුවරු

250,000න් ගුරුවරු 50,000ක විතර අතිරික්තයක් තිබෙනවා. මමත් ගුරුවරයෙක්. අපේ අක්කාත් විශ්‍රාම ගියා ළඟදී; ගුරුවරියක්. හැබැයි අපට මොකක් හරි හොඳ පුහුණුවක් හම්බ වුණේ නැහැ. ගුරුවරු 250,000න් ගුරුවරු 50,000ක් විතර ගත්තොත්, අපට පුළුවන්, ඒ ගුරුවරයාට අවුරුදු 5කට සැරයක් අවුරුද්දක නිවාඩුවක් දෙන්න. වැටුප් සහිතව නිවාඩුවක් දීලා අපට ඒ ගුරුවරයාට උගන්වන්න පුළුවන්. මොකද, දැනුම වේගයෙන් වර්ධනය වෙනවා. වේගයෙන් වර්ධනය වෙන දැනුම අපි ගුරුවරයාට දෙන්නේ නැත්නම්, ඒ දැනුම ළමයාට දෙන්න හම්බ වෙන්නේ නැහැ. එහෙම නම් මොකක්ද කරන්න ඕනෑ? ඒ ගුරුවරුන්ට අවුරුදු 5කට සැරයක්වත් rotate වෙන ක්‍රමයකට අවුරුද්දක නිවාඩුවක් දීලා මේ දැනුම, ආකල්ප උගන්වන්න ඕනෑ. අන්න ඒකට තමයි දැවැන්ත relocation එකක් ඕනෑ, අධ්‍යාපනයට.

මගේ විෂය ගැනත් කථා කරන්න මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි වෘත්තීය අධ්‍යාපනය. අද අපි ඒකට ගන්නේ අධ්‍යාපනයෙන් හැළෙන ළමයි. අපි ඉස්සරහට මේ තත්ත්වය වෙනස් කරනවා. 9 වසරේදී විභාගයක් තියලා මේ යන මාවතේම ළමයි යනවා නම්, ඉන් එහාට යන්නත් එහෙම නැත්නම් වෘත්තීය අධ්‍යාපනයට එන්නත් අවස්ථාව හදනවා. ඇයි, අද ළමයි වෘත්තීය අධ්‍යාපනයට එන්නේ නැත්තේ? ඒකට ප්‍රධානම සාධක දෙකක් අපි හඳුනාගෙන තිබෙනවා. එකක් තමයි ඒවායේ තිබෙන අඩුපාඩු. මට ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ.

දැනට ගත්තොත්, සාමාන්‍යයෙන් වෘත්තීය අධ්‍යාපනය ඇතුළේ ඉන්න ඕනෑ, cadre එක 4,727ක්. නමුත් ඉන්නේ 2,585යි. එතකොට 2,084ක් අඩුයි. ඔන්න, ඔබතුමන්ලා ගෙනාපු තැන! 2,000ක් අඩුයි. 4,000න් 2,000යි ඉන්නේ. ඒක නොවෙයි, මට අවධාරණය කරන්න ඕනෑ. ඇයි, මේ වෘත්තීය අධ්‍යාපනයට එන්නේ නැත්තේ කියන කාරණය. ඒ හැම වෘත්තියකටම පිටරට යන්නේ ඇයි? මේ වෘත්තීය අධ්‍යාපනයට එන්නේ නැත්තේ, ප්‍රධානම කාරණා දෙකක් නිසා. එක, වඩු මහත්තයෙක්, මේසන් මහත්තයෙක් කියන්නේ ඉතාම වැදගත් අය. නමුත් ඇයි ඒ අය එන්නේ නැත්තේ? ඒවාට සමාජ පිළිගැනීමක් නැහැ, වෘත්තීමය ගරුත්වයක් නැහැ. ඒ නිසා අන්න ඒක හදන්න ඕනෑ. දෙක, ඒ වෘත්තියෙන් ඔවුන්ගේ ජීවිතය ගොඩනගා ගන්න පුළුවන් ආදායමක් ලැබෙන්න ඕනෑ. වෛද්‍යවරයෙක් වෙන්නේ ඇයි? ඒකට ගරුත්වයක් තිබෙනවා. ඒ වාගේම ඒ වෘත්තියෙන් ඔවුන්ගේ ජීවිතය ගොඩනගා ගන්න පුළුවන්. ඉංජිනේරුවෙක් වෙන්නේ ඇයි? ඒකට ගරුත්වයක් තිබෙනවා. ඒකෙන් ඔවුන්ගේ ජීවිතය ගොඩනගා ගන්න පුළුවන්. එහෙම නම්, වඩු මහත්තයාටත්, මේසන් මහත්තයාටත් ඒ ගරුත්වය තිබෙන්න ඕනෑ.

පිටරටක් ගත්තොත්, යුරෝපීය රටක් ගත්තොත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඒ හැමෝටම වාගේ වාහනයක් තිබෙනවා. ඒ හැම කෙනාම සවස හොටෙල් එකට යනවා. එහි වෛද්‍යවරයාත් ඉන්නවා, අතුගාන කෙනාත් ඉන්නවා, බෙදීමක් නැහැ, වෘත්තියට ගරුත්වයක් තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට ලැබෙන ආදායමින් වාහනයක්, ජීවිතයක්, දරු පවුලක් නඩත්තු කරන්න පුළුවන්. නමුත් ඒ තත්ත්වය අධ්‍යාපනයෙන් විතරක් හදන්න බැහැ. ඒ පිළිබඳව ආණ්ඩුවට vision එකක් තිබෙන්න ඕනෑ, හැම වෘත්තියටම ගරුත්වයක්, හැම වෘත්තියක්ම වැදගත් කියන. හැම වෘත්තියකටම ගරුත්වය වාගේම, හැම වෘත්තියකින්ම ජීවන වෘත්තිය සලසා ගන්න පුළුවන් මට්ටමේ වැටුපක් තිබෙන්න ඕනෑ. අන්න ඒ සඳහා අපි මේ අධ්‍යාපනය දැවැන්ත ප්‍රතිසංස්කරණයට ලක් කරන්න බලාපොරොත්තු වෙනවා. 2026 ඉඳලා ඒක පටන් ගන්නවා. රටේ දැවැන්ත පෙරළියක් වුණා, විශේෂයෙන් මාලිමාව බලයට පත් කරගෙන. ඒ පෙරළිය දෙගුණ තෙගුණ කරලා ආණ්ඩුව, විශේෂයෙන්ම අධ්‍යාපනය ඇතුළේ දැවැන්ත පෙරළියක් කරනවා. මේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් දීලා මේ රට අධ්‍යාපනයේ ප්‍රමුඛතම කේන්ද්‍රස්ථානය බවට පරිවර්තනය කරනවා. ඒක සහතිකයි. අවුරුදු පහකින් මේ වෙනස බලා ගන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[4.06 p.m.]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I take great pleasure in speaking on the Votes of this Ministry because I have the utmost respect for educators. I have said this once before at the Committee Stage Discussion of a Budget on the Votes of the Ministry of Education. I think this is the only field I can point to, where the entire aspiration in life of these teachers and principals is to see the children they educate reach the highest levels in society. That is the greatest gift you could give those teachers and principals. If you put it in another way, their whole aim is to see the children they teach reach higher levels than they have. Such is the sort of magnanimity behind those individuals. Certainly, my experience with regard to teachers I have had is - I might have not been a very obedient student; I might have been a terrible student - their aspiration was always well meaning.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Results can be seen.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Results can be seen? I do not know. I think we had better not go into that.

So, it is in that respect I would like the Hon. Prime Minister, who is also the Minister of Education, Higher Education and Vocational Education, to take my intervention today because I, for one, believe that if there are any Heads that deserve the most amount of support in a Budget, they have to be, one, education and two, health. If we get those two Heads wrong, I can assure you, nobody would want to remain in this country. I ask the Hon. Members opposite as well as those who are here in the Opposition, be honest, do you not believe that if you had an opportunity to send your children abroad, you would not have taken it? Would you not take it? Those are the depths to which we have fallen. So, my comments today, Hon. Presiding Member and Hon. Prime Minister, is on the basis that we must give the maximum support we could to educators. The salaries these educators get is

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

nothing compared to the amount of effort they make and the goodwill they repose in those students. It is actually nothing! And, it is in that respect I would ask the Hon. Prime Minister to see my comments.

One other matter I want to raise is with regard to the increase in salary scales. The Government has made an increment. But, I remember that some time ago when the teachers and principals were protesting, the Hon. Prime Minister and other NPP members were very supportive of that protest. I also remember speaking in Parliament in support of that protest and I completely agreed with the comments made by the Hon. Prime Minister then. That was, if I am not mistaken, with regard to the Subodhini Salary Commission recommendations. And, because of those protests, eventually, if I am not mistaken, in 2022, the protestors - teachers and principals - managed to secure the first stage of the Subodhini Salary Commission recommendations. It was divided into three years. So, they managed to secure the first stage and the assurance given at that time was that the second and third stages would follow in the two consecutive years. But, that never happened.

So, if we take the increments that are being offered under this Budget for the next three years and the whole of what was recommended by the Subodhini Salary Commission for three years, had it been fully implemented - it was implemented only in the first year - an SLTS 2-II teacher would get, under this Budget, a salary of Rs. 66,880 whereas under the Subodhini Salary Commission Recommendations, she would have got Rs. 82,150, a difference of Rs. 15,270. That difference for the grade SLTS 2-I, after the full implementation of the salary increment under this Budget at the end of the next three years and the Subodhini Committee Recommendations at the end of the three years it recommended, would have been Rs. 27,310. So, like that, it goes on. That difference in salary for SLTS 1 would have been Rs. 34,990, for the Sri Lanka Principals' Service - SLPS 3 - Rs. 9,870, for SLPS 2, Rs. 25,120 and for SLPS 1, Rs. 32,230. So, what I am saying is, if the Hon. Prime Minister - if the economy improves in some way - goes to these Subodhini Commission's Recommendations at least in the next Budget, I would be its strongest supporter and can assure the Hon. Prime Minister that not a single Member in this House would oppose her implementing them. There are so many Ministries, totally unnecessary ones, from the Votes of which cuts can be made. One such ministry is the Defence Ministry. But, education is one field, I think, to which we all owe. We all owe those people who work so hard and are so magnanimous in the way they approach this field.

The second matter I wish to raise - I raised this in my speech on the Second Reading Debate of the Budget also - is with regard to the Civil Security Department running preschools in the Northern Province. That must stop. They run preschools where their preschool teachers are given an allowance amounting to over Rs. 30,000 and if I am not mistaken, it is around Rs. 40,000 now, whereas the Ministry of Education gives their preschool teachers an allowance of only Rs. 6,000 and that is the only intervention that the Ministry of Education has with regard to those preschool teachers. That must stop immediately and the entire scheme of preschool teachers must come under the Ministry of Education and the recommendations for salaries must be, at the bare minimum, the amount that the Defence Ministry is paying. Surely, is that not a militarization of education? What does education have to do with the Ministry of Defence and why is it happening only in the Northern Province? So, that is the legacy you have inherited, which you must change. And, those would be individual instances of a litmus test, Hon. Prime Minister, and at least, on your watch, let us have this put right.

The Northern Province is in dire need of funds to complete the buildings which have already been started. I have been informed by the Northern Provincial Council that a minimum of Rs. 2 billion is required in order to ensure that the projects that have been started - the construction of those buildings - could, to some extent, be completed. So, that, too, I would ask the Hon. Prime Minister to look into.

Then, with regard to the severe situation of teacher vacancies, today's "Kalai Murasu Newspaper" gives a full page detail. In the Northern Province, the total cadre of teachers is 18,983. At the moment, there is a current recruitment of 15,426. But, there are 3,557 more vacancies, Hon. Prime Minister. If you look at the SLEAS vacancies, there are 111 and also 397 minor staff vacancies. All these are important; in a school, nothing, in our view, could be omitted and these vacancies must be filled. If you take the vacancies, in Jaffna, there are 261, Valikamam, 498, Vadamarachchi, 333, Thenmarachchi, 189, the Islands of Jaffna, 222, Kilinochchi North, 97, Kilinochchi South, 281, Mannar, 452, Madhu, 216, Vavuniya North, 236, Vavuniya South, 283, Mullaitivu, 318 and Thunukkai, 171. So, Hon. Prime Minister, I would urge you to look into this matter, too.

Sir, I wish to raise one other matter. I brought this matter to your notice earlier also. The UGC has called for examinations for the promotion of Management Assistant Grade III to Grade II and the examination is supposed to be held on the 21st of March. There are 61 applicants from Jaffna. I have been in touch with the Jaffna University. They have written to the UGC and asked - in the previous years when those examinations were held, they were held in Jaffna - that if in case the UGC does not want to hold it on Jaffna, whether it could, at least, be held in Vavuniya because out of the 61 applicants, 40 applicants are females who are either pregnant, feeding mothers or are going through fertility treatment. So, they have asked for special treatment and I do not think it is unreasonable considering the number who are actually willing to sit for this exam. Also, the outside district applicants are also willing to travel to Jaffna; they prefer coming to Jaffna because it is much cheaper and the University says that they will make accommodation possible for them. So, I think the University Grants Commission must consider this request also favourably.

I reiterate to the Hon. Prime Minister that the Ministry of Education has to be the heart and soul of a country. If we get that wrong, everything else would go wrong. The fact that you have people who are so capable leaving this country is, fundamentally, because we are getting it wrong. People who struggle here go through a life-threatening trip abroad. They seek asylum or do something and manage to stay in those countries and do brilliantly well. They do brilliantly well! In Europe, certainly the Tamils do brilliantly well, but also the Sinhalese. Every single ambassador or Foreign Ministry I have visited in the Western world tells us that the Tamil community, I would add the Sinhalese as well, who have gone abroad are the best and the most productive citizens. That means we are losing all of that and we are losing it for reasons that could easily be avoided. We are losing it because of racism and because we are not giving adequate resources to the areas which those should actually be given. And, I think the Ministry of Education is probably the most important in that regard.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

Hon. Member, thank you for raising this issue. I think you yourself are a credit to your educators. And, certainly, we agree that education should be the heart and soul of any country.

I just want to say that the request you made with regard to the examinations held by the UGC has been referred to the UGC and they have promised me that they would look into it. They are meeting tomorrow to see if there could be some resolution. I will keep you posted.

Thank you.

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු අගමැතිතුමියගෙන් පොඩි ඉල්ලීමක් කරන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අගමැතිතුමිය එකඟද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
එතුමියට අවස්ථාව දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු අගමැතිතුමියනි, මේක පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිසුවියන් කරන ලද ඉල්ලීමක්. ඔබතුමියත් දන්නවා ඇති, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨවලට වඩා පොඩ්ඩක් එහායින් තිබෙන බව. එම නිසා එතැන රාජ්‍ය බැංකුවක ATM මැෂින් එකක් සවි කර දෙන්න කියලා ඒ සිසුවියන් ඉල්ලා සිටිනවා. මම ඔබතුමියගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් සලකා බලන්න කියලා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු මන්ත්‍රීතුමියනි, එම ඉල්ලීම මම UGC එකට යොමු කරන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.22]

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේ විවාදයට සම්බන්ධ වීමට ලැබීම මට ලැබුණු විශේෂ අවස්ථාවක් කොට සලකනවා.

විශේෂයෙන් මගේ අවධානය යොමු වෙන්නේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙනුයි. අපි කවුරුත් දන්නවා, අධ්‍යාපනය කියන්නේ කිසියම් සමාජයක අවධානය යොමු කළ යුතු ප්‍රධානතම කාරණයක් බව. ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි කල්පනා කරන දෙයක් තමයි, කිසියම් රටක සංවර්ධනයත් එක්ක එරට තුළ ඉතා දියුණු මානව සම්පතක් බිහි කර ගැනීම අපට තිබෙන සුවිශාල වගකීමක් බව. ඒ වාගේම අද පවතින තත්ත්වය හමුවේ අප මුහුණ දෙන ප්‍රධානතම අභියෝගක් බවට එය පත්වෙලා තිබෙන බවත් අපි දන්නවා. විශේෂයෙන්ම අපි අධ්‍යාපනය සමාජ සංස්ථාවක් විධියට සැලකුවාම සමාජයේ පුද්ගලයින්, එහෙම නැත්නම් සමාජිකයන් සමාජයට අනුකලනය වීමේදී, එහෙම නැත්නම් සමාජයට හුරු වීමේදී - socialization process කියලා අපි කියනවා - අධ්‍යාපනය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනවා. එම නිසා අද මා මෙතැනදී කථා කරන්නේ විධිමත් අධ්‍යාපනය ගැන පමණක් නොවෙයි. විධිමත් අධ්‍යාපනය වෙන්න පුළුවන්, අවිධිමත් අධ්‍යාපනය -නොවිධිමත් අධ්‍යාපනය- වෙන්න පුළුවන්, මේ සියලුම ආකාරයේ අධ්‍යාපනයන් තුළින් කිසියම් සමාජයක පුද්ගලයින් සමාජානුයෝජන ක්‍රියාවලියේදී සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනවා.

[ගරු උපාලි පන්නිලගේ මහතා]

ගරු මන්ත්‍රීතුමන්ලා මෙතැනදී සඳහන් කළා වාගේ, අපේ රටේ අධ්‍යාපන පද්ධතියේ අද වෙනකොට තිබෙන තත්ත්වය පිළිබඳව අපි කවුරුත් දන්නවා. විශේෂයෙන්ම උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම, පළමු වසරට ඇතුළත් වන ළමයින්ගෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය හරහා අදටත් උසස් අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට හැකි වෙන්නේ සියයට 13කට ආසන්න පිරිසකටයි. වාර්ෂිකව අපොස (උසස් පෙළ) විභාගය සමත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඇතුළත් විය හැකි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය විශ්වවිද්‍යාල 17ක් පවතිනවා. ඒ වාගේම අමාත්‍යාංශය යටතේ තවත් විශ්වවිද්‍යාල 3ක් පවතිනවා. අදටත් මෙම විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමට හැකියාව ලැබී තිබෙන්නේ සියයට 24කට ආසන්න පිරිසක් පමණයි. මෙවැනි තත්ත්වයක් තුළ තමයි අපේ රටේ අධ්‍යාපනයට ගුණාත්මක වෙනසක් අවශ්‍යයි කියන කාරණය ජාතික ජන බලවේගය කාලාන්තරයක් තිස්සේ සාකච්ඡාවට, සමාජ කතිකාවකට යොමු කළේ. ඒ අනුව අපි ඉදිරිපත් කර තිබෙන අපේ මංගල අය වැය තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා විශාල වැයක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය වසරට සාපේක්ෂව බලනකොට මෙවර -2025 වර්ෂය සඳහා- වැඩිපුර රුපියල් මිලියන 80,000ක පමණ මුදලක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කිරීමට අපි කටයුතු කර තිබෙනවා. ඒ අතරිනුත් රුපියල් බිලියන 135ක් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කිරීමට අපි කටයුතු කරලා තිබෙනවා. අපේ රටේ අධ්‍යාපනයේ තිබෙන සුවිශේෂී තත්ත්වයත් එක්ක සමාජයේ ඉදිරියට යන්න නම්, මෙවැනි විශාල වැයක් අධ්‍යාපනය වෙනුවෙන් දරන්න සිදු වෙනවා. අපේ ආණ්ඩුව ඒක සලකන්නේ වැයකට වඩා අධ්‍යාපනය සඳහා කරන ආයෝජනයක් විධියටයි. මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, අධ්‍යාපනයේදී ප්‍රධාන වශයෙන් අපි අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් තිබෙන බව. පළමුවෙනි එක, කුමක්ද උගන්වන්නේ කියන එක. ඒ කියන්නේ අපේ විෂය නිර්දේශය. දෙවැනි එක, අපේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය - teaching-learning process. තුන්වැනි එක, evaluation, නැත්නම් assessment process එක. මෙන්න මේ ක්‍රියාවලි තුනම ශක්තිමත් කිරීම හරහා තමයි අපට අධ්‍යාපනයේ සුවිශාල ජයග්‍රහණ ලබා ගැනීමට හැකියාවක් ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම අවධානය යොමු කරන්න කැමැතියි, අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය ගැන. අද වෙනකොට අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ 144,000කට ආසන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් අධ්‍යාපනය ලබනවා. උපාධිධාරියෙකු බිහි කිරීම සඳහා රජය වාර්ෂිකව විශාල වැයක් දරනවා. රජය අඩුම පිරිවැයක් දරන්නේ කළමනාකරණ උපාධිධාරියෙකු බිහි කිරීමටයි. නමුත් ආසන්න වශයෙන් රුපියල් 260,000ක් වාගේ මුදලක් වැය කරනවා, කළමනාකරණ උපාධිධාරියෙකු බිහි කරන්න. නමුත් පශු වෛද්‍ය වාගේ උපාධිධාරියෙකු බිහි කිරීමට අපි ආසන්න වශයෙන් රුපියල් 1,372,000ක් වාගේ මුදලක් වැය කරනවා, 2022 වර්ෂයේ වැය අනුව. මේ සියල්ල එක්ක අපට පෙනෙනවා, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උපාධිධාරීන් බිහි කිරීම සඳහා දරන වැය ශීර්ෂයන්ගේ පරස්පරතා, වෙනස්කම් තිබෙනවා කියලා.

ඒ වාගේම අප විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ තවත් කරුණක් තිබෙනවා. අපේ රටේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නා විද්‍යාර්ථීන්ගෙන් අතිබහුතරයක් ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේ තමයි අධ්‍යාපනය ලබන්නේ. උදාහරණයක් විධියට ගත්තොත්, රාජ්‍ය විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර සිසුන් 148,000ක් පමණ ඉන්නවා. ඔවුන්ගෙන් 65,832ක් පමණ අද වෙනකොට මහපොළ ශිෂ්‍යාධාර ලබනවා. ඒ වාගේම අනෙකුත් ශිෂ්‍යාධාර ලබන පිරිස 36,000ක් පමණ වෙනවා. මේ අනුව ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන්ගෙන් සියයට 71ක් පමණ රජයේ කුමක් හෝ ආධාර මුදලක් ලබා ගන්නවා. මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි, අපි මෙවර අය වැයෙන් මේ වසරේ අප්‍රේල් මාසයේ සිට මහපොළ ශිෂ්‍යාධාරයත්, අනික් ශිෂ්‍යාධාරයත් වැඩි කර තිබෙන බව. මේ අනුව මහපොළ ශිෂ්‍යාධාර මුදල රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා -සියයට 50කින්- වැඩි කිරීමට මෙවර අය වැය තුළින් අපි යෝජනා කර තිබෙනවා. ඒ අනුව සිසුන් 65,832කට මේ විශේෂ ප්‍රතිලාභය ලැබෙනවා. ඒ වාගේම තමයි දැනට මාසයකට රුපියල් 4,000ක් ලෙස තිබෙන ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 6,500 දක්වා, එනම් සියයට 62.5කින් ඉහළ නැංවීමට -අප්‍රේල් මාසයේ සිට- මේ අය වැය මඟින් යෝජනා කර තිබෙනවා. ඒ යටතේ සිසුන් 36,040කට ප්‍රතිලාභ ලැබෙනවා. අපි දන්නවා, මේ මුදලත් ප්‍රමාණවත් නැහැ කියලා. නමුත් අපි විශාල වශයෙන් -සියයට 50කින්, සියයට 62කින් පමණ- මේ මහපොළ ශිෂ්‍යාධාරය සහ අනික් ශිෂ්‍යාධාර දීමනාව වැඩි කර තිබෙනවා. මේ සඳහා රුපියල් මිලියන 4,600ක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

අපි දන්නවා, විශේෂයෙන්ම අපේ රටේ විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් අධ්‍යාපනයේදී මුහුණ දෙන සුවිශේෂී ප්‍රශ්න ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සේවය කළ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සියයට 80ක්, 85ක් ඉන්නේ ශිෂ්‍යාවන්. එම නිසා ඔවුන්ගේ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. මේ පීඨයේ 2,000ක් විතර ඉන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පොදු වැසිකිළි තිබෙන්නේ 8ක් පමණයි. මේ සියලුදෙනාට වැසිකිළි පහසුකම් තිබෙන්නේ පොදුවේ. හැබැයි අපි සාම්ප්‍රදායිකව ශිෂ්‍යයන්ටයි, ශිෂ්‍යාවන්ටයි සමාන පහසුකම් තමයි නිර්මාණය කරලා තිබෙන්නේ. නමුත්, අපි අද තිබෙන තත්ත්වයන්ට ගැළපෙන පරිදි මේ පහසුකම් වැඩිදියුණු කරන්න ඕනෑ.

ඒ අනුව විශේෂයෙන්ම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට වාගේම hostels වැනි දේවල් වැඩිදියුණු කිරීම සඳහා මේ වසරේ අපේ අය වැයෙන් රුපියල් මිලියන 37,891ක් වෙන් කරලා තිබෙනවා. ඒ ඔස්සේ අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා, විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැඩි අවධානයක් යොමු වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මා පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ, මේ විවාදයේදී විපක්ෂයේ සමහර කථිකයන් විසින් ඉදිරිපත් කරපු කරුණු කිහිපයක් පිළිබඳව. ඔවුන් ඉදිරිපත් කළා, විශේෂයෙන්ම උපකුලපතිවරුන් පත් කිරීම සම්බන්ධයෙන් වන කාරණය. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, උපකුලපතිවරුන් පත් කිරීමේ ක්‍රියාවලියට ප්‍රායෝගිකව සම්බන්ධ වුණු කෙනෙක් විධියට මා ඉතා හොඳින් මේ ක්‍රියාවලිය ගැන දන්නා බව. මීට වසර කිහිපයකට කලින් පාලක සභාවල ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමක් තිබුණා. දැනට ලකුණු දීමේ ක්‍රියාවලියක් තිබෙනවා. මේ ක්‍රියාවලි දෙකම අපි දන්නා ඉතිහාසය පුරාම දේශපාලනීකරණය වෙලා තිබුණේ. ඒක කාටවත් නැහැ කියලා කියන්න බැහැ. නමුත් මේ ගරු සභාවේදී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සඳහන් කළා, පාලක සභාව විසින් නිර්දේශ කරන නම් සම්බන්ධයෙන් ඊට පසුව අමාත්‍යාංශය විසින් මැදිහත් වෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ගැන දන්නවා. ලංකාවේ ක්‍රියාත්මක වෙන්නේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත. මේ පනත අනුව අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයෙක් පත් කිරීම සම්බන්ධයෙන් කිසිදු කාර්යභාරයක් පැවරී නැහැ. විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයෙකු පත් කිරීම සඳහා මූලික නිර්දේශ නිකුත් කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයේ පාලක සභාවයි. විශ්වවිද්‍යාලයේ

පාලක සභාව විසින් නිර්දේශ කරන නම් අතුරින් නම් නැවත වතාවක් සමාලෝචනයට ලක් කරලා, එය නිර්දේශ කිරීමේ බලය සහ වගකීම තිබෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරනු ලබන නිර්දේශ සලකා බලා ජනාධිපතිවරයා විසින් තමයි උපකුලපතිවරයෙකු පත් කරනු ලබන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල උපකුලපතිවරු පත් කිරීමේ ක්‍රියාවලිය දේශපාලනීකරණය වීම කෙතරම්ද කියලා මම ඔබතුමාට කිව්වොත්, අපි බලයට පත් වුණාට පසුව එක විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයෙක් පත් නොකිරීම සඳහා හේතු විධියට ලිපියක් ඉදිරිපත් කරලා තිබුණා. අපි දැක්කා, ඒ ලිපිය. රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධානියා තමයි ඒ ලිපිය නිකුත් කරලා තිබුණේ. ඒ ලිපියේ තිබුණේ මේ පුද්ගලයා පළමුවෙනියාට ආවාට ඔහුව පත් කිරීම සුදුසු නැහැ කියන එකයි. ඒකට හේතුව විධියට සඳහන් කරලා තිබුණේ ඔහු ජාතික ජන බලවේගය කියන දේශපාලන පක්ෂයට උදවු කළා කියන එකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මෙතරම් දේශපාලනීකරණය වෙච්ච ක්‍රමයක් තමයි විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් පත් කිරීම සම්බන්ධයෙන් අතීතයේ තිබුණේ. අපි පිළිගන්නවා, මේ තත්ත්වය නිර්දේශපාලනීකරණය කළ යුතුයි කියලා. ඒ වාගේම අපි පිළිගන්නවා, දැනට විශ්වවිද්‍යාලවලට උපකුලපතිවරුන් පත් කිරීමේ ක්‍රමවේදය වෙනස් විය යුතුයි කියලා. අපි ජාතික ජන බලවේග ආණ්ඩුව විධියට ඉතා කෙටි කාලයක් තුළ ඒ කටයුතු කරනවා. දැනට පවතින ක්‍රමය වෙනස් කිරීම සඳහා අපේ රජය අනිවාර්යයෙන්ම කටයුතු කරන බවත් මේ ගරු සභාවට මම සඳහන් කරන්නට කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ මතු වෙලා තිබෙන තවත් ප්‍රධාන ගැටලුවක් තිබෙනවා. ඒ ගැන මේ ගරු සභාවේදීත් ගරු මන්ත්‍රීවරු සඳහන් කළා. අපේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලය 13,332ක් ඉන්න ඕනෑ. ඒ වාගේම අනධ්‍යයන කාර්ය මණ්ඩලය approved cadre එක අනුව 16,324ක් ඉන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ වනවිට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියයට 46කුත්, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියයට 25කුත් ලෙස විශාල වශයෙන් පුරප්පාඩු පවතිනවා. මෙන්න මේ පුරප්පාඩු පිරවීම සඳහා අපි දැන් කටයුතු කරනවා. මොකද, පසුගිය වසර ගණනාවක් තිස්සේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ලැබුණු කුඩම්මාගේ සැලකිලි නිසා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දුන්නේ නැහැ; බඳවා ගැනීම් කළේ නැහැ. ඒ නිසා අද වනවිට විශ්වවිද්‍යාල පද්ධතියම අර්බුදයකට ගිහින් තිබෙනවා. මේ අර්බුදය විසඳීම සඳහා අපි මේ වසරේ අවශ්‍ය බඳවා ගැනීම් වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව විශ්වවිද්‍යාල පද්ධතියේ මේ ඇති වෙලා තිබෙන ගැටලු අපි ක්‍රමයෙන් විසඳීම සඳහා කටයුතු කරනවා. අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැටුප් සම්බන්ධයෙන් මෙහිදී අපි විශේෂයෙන් අවධානය යොමු කළා.

මම තවත් කරුණක් කියන්න ඕනෑ. මට ඒක නොකියාම බැහැ. මම කලිනුත් කිව්වා, විශේෂයෙන්ම ශිෂ්‍යාවන්ට තිබෙන වැසිකිළි පහසුකම් ගැන. ඒ වාගේම තමයි ආපනශාලා වැනි පහසුකම්. මා කලින් කිව්ව විශ්වවිද්‍යාලයේ ළමයි 2,000ක් ඉන්න පීඨයක ඒ ළමයින්ට තමන්ගේ ආහාර ගන්න කැන්ටීමේ තිබෙන්නේ බංකු 33යි. 330කටයි ඒවායේ වාඩි වෙන්න පුළුවන්. ඒ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අපි මෙවර සිට කටයුතු කරන බවත් විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි විශ්වාස කරනවා, අනිවාර්යයෙන්ම අධ්‍යාපනයේ විප්ලවීය වෙනසක් සිදු වෙන්න ඕනෑ කියලා.

අපි කවුරුත් දන්නා ඉතා ප්‍රසිද්ධ කියමනක් තිබෙනවා. නෙල්සන් මැන්ඩෙලා එක අවස්ථාවකදී කිව්වා, "Education is the most powerful weapon which you can use to change the world" කියලා. ලෝකය වෙනස් කිරීම සඳහා ඔබට භාවිත කළ හැකි බලවත්ම අවිය අධ්‍යාපනයයි කියන එකයි එහි අදහස. අන්න ඒ කියමන මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුරෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.36]

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி!

கௌரவ பிரதமர் அவர்களே, நீங்கள்தான் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சுக்கும் பொறுப்பாக இருக்கின்றீர்கள். இது எங்களுக்கு மகிழ்வாக இருக்கின்றது. நிச்சயமாக நீங்கள் இந்த அமைச்சை சிறப்பாகச் செய்வீர்கள் என்ற நம்பிக்கை எங்கள் எல்லோரிடமும் இருக்கின்றது.

கல்வியில் தரம், சமத்துவம் மற்றும் சிறந்து விளங்குதல் என்ற நோக்கிலேயே அரசின் இவ்வாண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் கல்விக்கான நிதி ஒதுக்கீடு அமையப்பெற்று இருக்கின்றது. 'தேசிய அபிவிருத்திக்கான அடித்தளமே கல்வி' என்ற வகையில், குறிப்பிடத்தக்க ஒதுக்கீடுகள் இம்முறை இப்பாதீட்டில் உள்ளடக்கப் பட்டமையை நான் இந்த நேரத்தில் வரவேற்கின்றேன். தயவுசெய்து, கல்விக்கான ஒதுக்கீடு நாடளாவிய ரீதியில் சமத்துவ அடிப்படையில் பகிரப்படுவதை உறுதிப்படுத்துங்கள்! இதை நான் வன்னித் தேர்தல் மாவட்ட பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில், அம்மாவட்ட மக்கள் சார்பாகக் கேட்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் பாடசாலை உட்கட்டுமான மேம்பாட்டுக்காக 10,000 மில்லியன் ரூபாய் ஒதுக்கப் பட்டிருப்பதை நாம் வரவேற்கின்றோம். போதியளவு கட்டிடங்கள், கட்டிமுடிக்கப்படாத வகுப்பறைகள், நூலகங்கள் மற்றும் ஆய்வுகூடங்கள் இன்றி வன்னிப் பிராந்தியத்திலுள்ள பாடசாலைகள் இன்னும் இருப்பதை நான் கௌரவ அமைச்சரின் கவனத்துக்குக் கொண்டு வருகின்றேன். வன்னியில் வாழும் எங்கள் பிள்ளைகள் போதுமான

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

ආசිரியர்கள் இன்றி, இணைய வசதிகள் இன்றி, முறையான வழிகாட்டல்கள் இன்றி பாடசாலை மட்டத்தில் மிகவும் இடர்படுகின்றார்கள். இன்றும் வன்னிப் பிராந்தியத்தில் பாடசாலை இடைவிலகல் அதிகளவில் காணப்படுகின்றது என்பதை நான் இந்தச் சபையில் குறிப்பிடுகின்றேன். வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள பாடசாலைகள் எதிர்கொள்ளும் சவால்களில் முதன்மையானது ஊழியர் பற்றாக்குறை ஆகும். வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள ஆறு கல்வி வலயங்களில் குறிப்பாக முல்லைத்தீவு கல்வி வலயத்தில் கணிதம், விஞ்ஞானம், ஆங்கிலம், அழகியல், விசேட கல்வி, பௌதிகவியல், இணைந்த கணிதம், வணிகக் கல்வி போன்ற பாடங்களுக்கு ஆசிரியர்கள் பற்றாக்குறை காணப்படுகின்றது. 1AB பாடசாலை தொடக்கம் type 2 பாடசாலை வரை உரிய பாட ஆசிரியர்கள் இன்மையால் நீங்கள் முன்மொழியும் தரமான கல்வியை எங்களுடைய மாணவர்கள் பெற இயலாதுள்ளனர். தரமான கல்விக் கொள்கையை எங்களுடைய வன்னிப் பிரதேசத்திலும் உறுதிப்படுத்துவீர்களா? என்றுதான் நாங்கள் கேட்கின்றோம்.

STEM கல்வியில் கடைசி நிலையிலுள்ள எங்களுடைய முல்லைத்தீவு மாவட்டத்தின் ஆசிரியர் ஆளணித் தேவைக்கு உங்களது வரவு செலவுத்திட்டம் முன்னுரிமை கொடுக்க வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன். எமது மாவட்டத்திலுள்ள பல பாடசாலைகளில் போதுமான அளவு கல்விசார், கல்விசாரா ஊழியர்கள் இல்லை. முல்லைத்தீவு கல்வி வலயத்தில் மாத்திரம் 392 ஆளணி வெற்றிடங்கள் காணப்படுகின்றன. அவற்றில் 322 ஆசிரியர் வெற்றிடங்களும், 23 அதிபர் வெற்றிடங்களும், 20 காவலாளி வெற்றிடங்களும், 12 சிற்றூழியர் வெற்றிடங்களும் உள்ளடங்குகின்றன. மேலும், விஞ்ஞானம், கணிதம், தகவல் தொழில்நுட்பம் உட்பட பத்து துறைகளுக்கு ஆசிரிய ஆலோசகர்கள் இல்லை. 14 பாடசாலைகளில் அதிபர்கள் இல்லை. வவுனியா தெற்கு வலயத்தில் 29 காவலாளர்களுக்கான வெற்றிடங்களும் 10 சிற்றூழியர்களுக்கான வெற்றிடங்களும் உள்ளன. பட்டதாரிகளை உள்ளீர்ப்புச் செய்யும் வகையில், பாடசாலைகளில் பணியாற்றும் அபிவிருத்தி உத்தியோகத்தர் களுக்கான நிரந்தரத் தீர்வுதான் என்ன? கௌரவ கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சர் அவர்களே, நீங்கள் சொல்லும் தரமான கல்வி, சமத்துவமான கல்வி என்பவற்றுக்கான வாய்ப்புகளை எங்கள் பிள்ளைகள் பெறுவதையும் உறுதிப்படுத்துங்கள்! இதுவரை நாங்கள் அவற்றைப் பெறவில்லை என்பதற்கான சான்றுகளே இவை ஆகும்.

தகவல் தொழில்நுட்ப நிலைமாற்றத்தில் ஏனைய ஏழு மாகாணங்களைவிட, வடக்கு, கிழக்கு மாகாணங்களே பின்தங்கிய நிலையில் உள்ளது. கௌரவ கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சர் அவர்களே, இலங்கையிலுள்ள ஒன்பது மாகாணங்களில் போதியளவு தகவல் தொழில்நுட்ப மற்றும் தொலைக்கல்வி நிலையங்கள் இல்லாத மாகாணங்கள் வடக்கும் கிழக்கும்தான். கிழக்கில் நான்கு கல்வி வலயங்களிலும், வடக்கில் மூன்று கல்வி வலயங்களிலும் தகவல் தொழில்நுட்ப வள நிலையங்கள் இல்லை. ஏன் இந்தப் பாகுபாடு? நான் சார்ந்த வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள முல்லைத்தீவு கல்வி வலயத்துக்கும் மன்னார் கல்வி வலயத்துக்கும் ஏன் இன்னமும் அந்த வள நிலையங்கள் வழங்கப்படவில்லை? மேலும், அங்குள்ள ஆசிரியர்கள் போதியளவு பயிற்சி பெறுவதற்கான வசதிகள் அற்றுக் காணப்படுகின்றனர். அத்துடன், அங்குள்ள பெருமளவான கணினிகள் பழுதடைந்தும் காணப்படுகின்றன. இலத்திரனியல் கருவிகளை பதிவழிப்பதிலுள்ள இறுக்கமான நடைமுறையால் பல பாடசாலைகளில் பத்து ஆண்டுகளுக்கும் மேலாகப் பல கணினிகள் இலத்திரனியல் குப்பைகளாக அறைகளில் பூட்டிவைக்கப்பட்டு உள்ளன.

2024இல் முல்லைத்தீவு கல்வி வலயத்தில் மேற்கொள்ளப்பட்ட ஆய்வில் 57 சதவீதமான மேசைக் கணினிகள் பழுதடைந்து காணப்படுவதாக கண்டறியப் பட்டுள்ளது. வவுனியா தெற்கு கல்வி வலயத்தில் 75 சதவீதமான மேசைக் கணினிகள் பழுதடைந்துள்ளன. திருத்தப்படாதுள்ள கணினிகள் கிடப்பில் போடப்படும்போது சிறு பிழைகள் பெரும் பிழைகளாகின்றன. காவலாளிகள் இல்லாத சூழலில், அறைகளில் வைக்கப்பட்டுள்ள பழுதடைந்த கணினிகள், அதன் பாகங்கள் களவு போகின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Sir, give me one more minute, please.

இலத்திரனியல் கருவிகளின் திருத்தம் மற்றும் பதிவழித்தலிலுள்ள இறுக்கமான நடைமுறைகளால் நாடு முழுவதிலுமுள்ள பாடசாலைகள் இடர்களை எதிர்நோக்கி இருக்கின்றன. ஆய்வாளர் கருணாகரன் உள்ளிட்ட பலரின் ஆய்வுகள் இதற்குச் சான்றாகும். கௌரவ கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சர் அவர்களே, இலத்திரனியல் கருவிகளை முகாமை செய்வதில் பொருத்தமான, சாத்தியப்பாடான நடைமுறைகளை கொள்கையளவில் ஏற்றுக்கொள்ளுங்கள்! தொழில்நுட்ப நிலைமாற்றத்துக்கு மேலாக வன்னியிலுள்ள பல பாடசாலைகளுக்குப் போதியளவு உட்கட்டமைப்பு வசதிகள் இல்லை. வன்னிப் பிரதேசத்திலுள்ள பல பாடசாலைகளில் முறையான சுகாதார வசதிகள் இல்லை. இது மாணவர்களைப் பாதிக்கின்றது. அதுமாத்திரமன்றி, பல பாடசாலைகளில் விஞ்ஞான ஆய்வுகூட வசதிகள் இல்லை. இதனால் STEM கல்விக்குத் தேவையான செயன்முறைப் பயிற்சிகளை எங்களுடைய மாணவர்கள் பெற இயலாதுள்ளனர். வன்னிப் பிராந்தியப் பாடசாலைகளில் நூலக வலுவூட்டலும் இல்லை. இறுதியாக, "கல்விக்கான முதலீடு செலவல்ல; அது சிறந்ததோர் எதிர்காலத்துக்கான முதலீடு" என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.43]

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு மீதான இன்றைய

குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதில் நான் மகிழ்ச்சியடைகின்றேன். எங்களுடைய நாட்டிலே கல்வியானது மிகப் பெரியதொரு விடயமாக, சிறந்ததொரு ஆயுதமாக எங்களுடைய மக்களால் பார்க்கப்பட்டு வருகின்றது. கடந்த காலங்களிலே இந்த நாட்டிலே யுத்தம் நடைபெற்ற பொழுது, பலர் இடம்பெயர்ந்தபொழுது, குண்டுவீச்சுகளிலே மக்கள் இறந்தபோதுகூட இந்தக் கல்வியை அவர்கள் கைவிடவில்லை. கடந்த காலங்களில் தெரு விளக்குகளிலும் மெழுகுதிரி வெளிச்சங்களிலும் கல்வி கற்றவர்கள் இந்த நாட்டுக்கு மிகச் சிறந்த சேவையினை ஆற்றியிருந்தார்கள். அந்தவகையிலே, இன்று இந்த நாட்டின் சனாதிபதியாக இருக்கின்ற மாண்புமிகு அநுர திசாநாயக்க அவர்கள்கூடத் தெருவிளக்கின் ஒளியிலே கல்வி கற்றவர். எனவே, கல்வியானது இந்தத் தேசத்தினுடைய மிக முக்கியமான ஓர் ஆயுதமாகக் காணப்படுகின்றது. இந்தக் கல்வித் துறையிலே பெரிய மறுமலர்ச்சி ஒன்றை நாங்கள் ஏற்படுத்துவதனூடாக, இந்த நாடு அனைத்து மக்களும் வாழக்கூடிய ஓர் அழகான பூமியாகத் திகழவேண்டும் என்பதற்காகத்தான் எங்களுடைய அரசாங்கம் இந்த வருடத்தின் 8 மாதங்களுக்கான Budgetஇலே கல்வி அமைச்சுக்கு 271 பில்லியன் ரூபாய் பணத்தை ஒதுக்கியிருக்கின்றது.

நான் இந்த இடத்திலே ஒரு விடயத்தைப் பதிவுசெய்ய விரும்புகின்றேன். அதாவது, எங்களுடைய தேசிய மக்கள் சக்தியினுடைய ஆட்சிக் காலத்திலே எங்களுடைய நாட்டிலே கல்வியிலே மறுமலர்ச்சி காணக்கூடியதான யுகம் ஒன்று நிச்சயமாக ஏற்படுத்தப்படும். அதற்குக் காரணம் எங்களுடைய கௌரவ கல்வி அமைச்சர் மற்றும் மாண்புமிகு சனாதிபதி அவர்களால் முன்வைக்கப்பட்டுள்ள வேலைத்திட்டங்களாகும். அதன்மூலம் நிச்சயமாக மக்கள் எதிர்பார்க்கின்ற நன்மைகள் அவர்களுக்குக் கிடைக்கும்.

எங்களுடைய கல்வியமைச்சின்கீழ் 5 மாகாணங்களில் விளையாட்டுப் பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்காக 500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. அந்த விளையாட்டுப் பாடசாலைகளுக்கூடாகப் பிள்ளைகளுடைய உடல், உள விருத்திகளை மேம்படுத்துவதனூடாக மிகச்சிறந்த ஆரோக்கியமான மாணவ சமூகத்தை ஏற்படுத்த நாங்கள் நினைக்கின்றோம்.

அதேபோன்று, கடந்த காலங்களிலே முன்பள்ளி ஆசிரியர்களாக நியமிக்கப்பட்டவர்கள் இன்றுவரை மிகக் குறைந்த வேதனத்துடன் கற்பித்து வருகின்றார்கள் என்பது உங்களுக்குத் தெரியும். அவர்கள் நாளாந்தம் தங்களுடைய அவலங்களை எங்களிடம் சொல்லிவருகின்றார்கள். அந்தவகையிலேதான், அந்த முன்பள்ளி ஆசிரியர்களின் சம்பளத்தை அதிகரிப்பதற்காக 100 மில்லியன் ரூபாய் எங்களுடைய அரசாங்கத்தால் ஒதுக்கப்பட்டிக்கின்றது.

அதேபோன்று, பல பாடசாலைகளிலே உட்கட்டமைப்பு வசதிகள் குறைவாகக் காணப்படுகின்றது. எங்களுடைய கௌரவ பிரதம மந்திரி அவர்கள் தன்னுடைய இன்றைய உரையிலும் இதுபற்றிக் கூறியிருந்தார். அவர் யாழ்ப்பாணம் வந்தபோதும் இதுபற்றிக் கூறியிருந்தார். பல பாடசாலைகளிலே நீண்டகாலமாக இந்தப் பிரச்சினைகள் காணப்படுகின்றன. வகுப்பறைக் கட்டிடங்கள் போதாது; பல பாடசாலைகளிலே கடந்த காலங்களிலே தொடங்கி வைக்கப்பட்ட கட்டிட வேலைகள் இன்றுவரை முடிக்கப்படாமல் காணப்படுகின்றது. அதேபோன்று, பல பாடசாலைகளிலே toilet facilities மிக மோசமாகக் காணப்படுகின்றது.

அண்மைய தினத்தில்கூட நாங்கள் கோப்பாய் கல்வியியல் கல்லூரிக்குச் சென்று பார்த்தபொழுது, பல toilets பயன்படுத்தப்பட முடியாத நிலையில் மூடப்பட்டுக் காணப்பட்டதை அவதானித்தோம். அங்கே படிக்கின்ற மாணவர்கள் வெறும் தரையிலே படுத்திருந்ததையும் காண முடிந்தது. இவ்வாறு பல வகையிலும் வசதிகளற்ற நிலையிலே கல்வியற் கல்லூரிகள் காணப்படுவதாக கௌரவ பிரதம மந்திரி அவர்கள் தெளிவாகக் கூறியிருந்தார். நான் 2004 - 2005 காலப்பகுதியிலே பஸ்துன்ரட்ட தேசிய கல்வியற் கல்லூரியில் படித்திருந்தேன். அண்மையில் அங்கு விளையாட்டுப் போட்டி நிகழ்வுக்காக என்னை அழைத்திருந்தார்கள். அங்கே சென்று பார்த்தபோது, அன்று நான் உறங்கி, படித்த கட்டிடங்கள் இன்று மூடப்பட்டுக் காணப்பட்டன. காரணம், குடிநீர் வசதி, மலசலகூட வசதி போன்றவை இல்லாமையே ஆகும். அன்று நான் பார்த்த அதே தோற்றம்தான் இன்றும் காணப்படுகின்றது. அப்போது எனக்கு அருகில் வந்த ஒரு விரிவுரையாளர், "இந்தக் கல்லூரியிலே என்ன மாற்றம் தெரிகின்றது?" என்று கேட்டார். "ஒரு மாற்றமும் தெரியவில்லை" என்று சொன்னேன். ஏனென்றால், அந்தக் கட்டிடங்கள், சூழல்கள் அப்படியே காணப்படுவதை அவதானித்தேன். எனவே, எங்களுடைய இந்த ஆட்சிக் காலத்திலே இவ்வாறான பிரச்சினைகளை நீக்கி, கல்வியிலே மறுமலர்ச்சியை ஏற்படுத்துவதற்கு எதிர்பார்த்திருக்கின்றோம். அது ஒரு நீண்ட, நிரந்தரமான மாற்றத்தை ஏற்படுத்தும் என நம்புகிறோம்.

அடுத்து, கடந்த காலங்களில் காணப்பட்ட பல பிரச்சினைகள் தீர்க்கப்படவேண்டியிருக்கின்றது. பிரபல பாடசாலைகள், முன்னணிப் பாடசாலைகள் அதிகளவிலான மாணவர்களைச் சேர்த்துக்கொள்ளுகின்றன. இதனால், கிராமப்புறத்தில் காணப்படுகின்ற பாடசாலைகள் மிகக் குறைந்தளவிலான பிள்ளைகளைக் கொண்டவையாகவே இயங்கிவருகின்றன. நானும் அரசியலுக்கு வருவதற்கு முன்பு ஓர் அதிபராக இருந்தேன். பிள்ளைகளைத் தேடிச் செல்கின்ற வேலையைத்தான் அதிபர்கள் பார்க்க வேண்டியிருந்தது. இவ்வாறு பல்வேறு பிரச்சினைகள் காணப்பட்டபோதும் எங்களுடைய ஆட்சிக் காலத்திலே பிள்ளைகளின் கல்வித் தரத்தை முன்னேற்றி, கல்வியினால் அதிகமான நன்மைகளை அடைவதற்கான சந்தர்ப்பத்தை ஏற்படுத்த எதிர்பார்க்கின்றோம்.

இலங்கையின் பல்கலைக்கழகக் கல்வியை எடுத்துப் பார்த்தால், அக்கல்வியினூடாகப் பட்டதாரிகளுக்கான தொழில் வாய்ப்பானது மிகவும் குறைவாகவே காணப்படுகின்றது. இலங்கைப் பல்கலைக்கழகங்களினால் வழங்கப்படுகின்ற கல்வி 69.2 வீதமான தொழில் வாய்ப்பையே பெற்றுக்கொடுப்பதை அதற்கு உதாரணமாகச் சொல்லலாம். அதிலும் யாழ்ப்பாணப் பல்கலைக்கழகம், கிழக்குப் பல்கலைக்கழகம் போன்றன குறைந்த வீதமான வேலை வாய்ப்புக்களையே வழங்குகின்றன. குறிப்பாக, கிழக்குப் பல்கலைக்கழகம் 52 வீதமான வேலை வாய்ப்பையும் யாழ்ப்பாணப் பல்கலைக்கழகம் 53.5 வீதமான வேலைவாய்ப்பையுமே வழங்குகின்றது. அங்குள்ள அதிகமான கற்கைநெறிகள் வேலை வாய்ப்புக்களுக்கான சந்தர்ப்பத்தை வழங்காத நிலையே காணப்படுகின்றது. இருந்தபோதும், திறந்த பல்கலைக்கழகங்கள் 93.8 வீதமான வேலை வாய்ப்புக்களை வழங்குகின்றன. எனவே, பல்கலைக்கழகங்கள் அவற்றின் பாடநெறிகளை வினைத்திறனாக மாற்றி, உலக சந்தையில் வேலை வாய்ப்புக்களைப் பெற்றுக்கொள்ளக்கூடிய வகையில் கல்வித் திட்டம் நிச்சயமாக மாற்றியமைக்கப்படும். அதனூடாக எங்களுடைய இளம் சந்ததிகள் சிறந்த எதிர்காலத்தை அடையக்கூடியதாக இருக்கும்.

[ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා]

කඩන්ත කාලංකලීල් නඩෙපෙට්ර ඔරු විඩයත්තෛ නාන් ඉංකේ කෙළරව පිරතම මන්තිරියුම් කල්වි අමෛච්චරුමානවරුක්කුච් චුට්ටික්කාට්ට විරුම්පුකිරේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(මාණ්පුමිකු රජීවන් ජෙයච්චන්තිරමූර්ත්ති)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Sir, I need one more minute.

2010 - 2016ආම් ආණ්ඩු වරෙයාන කාලප්පකුතියිල් ආසිරියර් පයිර්සියිනෛ නිර්‍රෙවු සෙය්තවර්කළුක්කාන චාන්රිතළින් මූලප්පිරතිකළ් පරීට්සෛත් තිණෛක්කළත්තාල් ඉදුවරෙයුම් වළංකප්පඩවිල්ලෛ. ඉදු කුරිත්තු ගුරු විද්‍යාලයේ අතිපර්කළ් අසමන්තප්පෝක්කිල් ඉරුක්කිරාර්කළා අල්ලතු පරීට්සෛත් තිණෛක්කළ අතිකාරිකළ් අසමන්තපෝක්කිල් ඉරුක්කින්රාර්කළා එනත් තෙරියාතු. ආනාල්, 15 වරුඩංකළාකියුම් අන්තච් චාන්රිතළ් වළංකප්පඩ මුඩියාතිරුප්පතර්කාන කාරණම් තෙරියවිල්ලෛ. එනවේ, නිච්චයමාක ඉදු තොඩර්පිල් නීංකළ් නඩවඩික්කෛ එඩුප්පීර්කළ් එනක් කරුති, ඉන්ත විඩයත්තෛ උංකළින් කවනත්තුක්කුක් කොණ්ඩු වරුකින්රේන්.

එංකළුඩෙය අරසාංකම් 2025ආම් ආණ්ඩිලිරුන්තු ආට්සේර්ප්පුක්කළෛච් චෙය්යවිරුක්කින්රතු. අතන් පිරකාරම්, කල්වි නිරුවාක සේවෛ තරම් IIIක්කු 555 පේරෙයුම්, ඉලංකෛ ආසිරියර් සේවෛ තරම් 3 - Iක්කු 'ටිප්ලෝමා' පට්ටතාරිකළ් 4,140 පේරෙයුම්, 'අනෛවරුක්කුම් ආංකිලම්' එන්ර තිට්ටත්තින්කීළ් ආංකිල ආසිරියර්කළාක 2,500 පේරෙයුම්, තේසිය මර්‍රුම් මාකාණප් පාඩසාලෛකළුක්කු 22,000 ආසිරියර්කළෛයුම්, ආසිරියර් ආලෝසකර්කළාක 2,100 පේරෙයුම්, පෙරුන්තෝට්ටප් පාඩසාලෛකළුක්කු ආසිරියර් උදවියාළරාක 2,935 පේරෙයුම් උල්වාංකුවතර්කු නඩවඩික්කෛ එඩුත්තිරුක්කින්රතු. ඉතන්මූලම් එංකළුඩෙය කල්විත් තුරෛයිල් නිච්චයමාක කල්වියිල් මරුමලර්ච්චි ඒර්පඩුමෙන නම්පුකිරෝම්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු චානක සම්පත් මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.52]

ගරු චානක මාදුගොඩ මහතා
(මාණ්පුමිකු චානක මාදුකොඩ)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අය වැය කාරක සභා අවස්ථාවේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයට ගන්නා මේ මොහොතේ ඒ සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. වත්මන් ආණ්ඩුව ප්‍රතිපත්තියක් විධියට මෙවර අය වැය ලේඛනයෙන් අධ්‍යාපනය වෙනුවෙන් යම් ප්‍රතිපාදන මුදලක් වැඩි කිරීම පිළිබඳව විපක්ෂය විධියට අප සතුටු වෙනවා කියන කාරණය පළමුවෙන්ම මම සඳහන් කරන්න ඕනෑ.

අධ්‍යාපනය ගැන කථා කරන කොට නිදහස් අධ්‍යාපනයේ පියා වන සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ගැන කථා කළ යුතුමයි. මොකද, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා කරන අද දවසේ එතුමා පිළිබඳව කථා නොකර, එතුමා පිළිබඳව මතක් නොකර අපට මේ විවාදය ඉදිරියට ගෙන යන්න හැකියාවක් නැහැ. එතුමා මේ රටට උරුම කර දුන් නිදහස් අධ්‍යාපනයේ ඵල ප්‍රයෝජන ඔබත්, මමත් -අපි සියලු දෙනා- භුක්ති විඳ තිබෙනවා. නමුත්, මේ මොහොත වන විට සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා බලාපොරොත්තු වූ නිදහස් අධ්‍යාපනය මේ රට තුළ තිබෙනවාද කියන කාරණය පිළිබඳව තිබෙන්නේ ප්‍රශ්නාර්ථයක්. අද තරගකාරී ලෝකය නිදහස් අධ්‍යාපනයෙන් ඔබ්බට ගිහින් තිබෙනවා. දෙමව්පියන් අද තමන්ගේ දරුවා පාසල් අධ්‍යාපනයෙන් පරිබාහිරව තරගයකට යොමු කිරීමේ කටයුත්ත කරමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි වකවානුවක තමයි අපි නිදහස් අධ්‍යාපනය පිළිබඳව කථා කරන්නේ.

නිදහස් අධ්‍යාපනය ගැන කථා කරන කොට කිව යුතුයි, අපේ රටේ නිදහස් අධ්‍යාපනයට පණ පොවන අපේ ආදරණීය ගුරු මෑණිවරුන්ට, ගුරු පියවරුන්ට හැම ආණ්ඩුවකින්ම විවිධ අවස්ථාවලදී වටිනාකම් ලබා දී තිබෙන බව. ඒ ලබා දීපු වටිනාකම් තුළින් දැයේ දරුවන් පෝෂණය කරමින්, දැයේ දරුවන් යහ මහ යවමින් එම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙමින්, සුවිශේෂී කාර්යභාරයක් ආදරණීය ගුරු මව්වරුන්, ගුරු පියවරුන් විසින් සිදු කරනු ලබනවා. ඔවුන් සිදු කරන එම කාර්යභාරයට පළමුවෙන්ම වටිනාකමක් ලබා දුන්නේ, විශිෂ්ට ඇමතිවරයකු විධියට කටයුතු කළ -විශේෂයෙන් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ- ගරු රිවර්ඩ් පතිරණ ඇමතිතුමායි කියන කාරණයත් මම මේ මොහොතේ එතුමාට ගෞරව පිණිස සිහිපත් කරන්න ඕනෑ. එතුමා තමයි ගුරුවරුන්ගේ වැටුප් පිළිබඳව සිතමින් ගුරුවරුන්ට පළමුවෙන්ම වටිනාකමක් ලබා දුන්නේ. අපේ පසුගිය ආණ්ඩුව සම්බන්ධයෙන් මොන විවේචන තිබුණත්, මොන කාරණාවක් විවේචනාත්මකව ඉස්මතු කළත්, පසුගිය ආණ්ඩුව සුබෝධනී කමිටු වාර්තාවේ නිර්දේශ මත, වෘත්තීය සමිතිවල ඉල්ලීම් මත ගුරුවරුන්ගේ වැටුපට විශාල මුදලක් එකතු කළා. අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව -වත්මන් ආණ්ඩුව- කටයුතු කරමින් ඉන්නේ ඒ සුබෝධනී කමිටු වාර්තාවේ සම්පූර්ණ එකඟතාවන් ආදරණීය ගුරු මහත්ම මහත්මීන්ට ලබා දෙනවා කියන අදහස තුළයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ එකඟතාව ගන්න එදා සටන් කරපු, එදා සටනට නායකත්වය දීපු ඔබතුමා අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න මොහොතේ අපි විශ්වාස කරනවා, ඒ ගුරුවරුන්ගේ බලාපොරොත්තුව මෙවර අය වැය ලේඛනය තුළ යථාර්ථයක් බවට පත් කරයි කියලා. ඒ විශ්වාසය අප තුළ තිබෙනවා.

විවිධ ආණ්ඩු අපේ රටේ අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කරන්න, විවිධ කාලවල විවිධ කාර්යභාරයන් රැසක් ඉෂ්ට කර තිබෙනවා. අද අපත්, අපේ දරුවනුත් සාක්ෂරතාවෙන් ඉහළට ඔසවා තබන්න අධ්‍යාපන පද්ධතිය තුළින් කළ ඒ විශිෂ්ට කාර්යභාරය අපි අගය කළ යුතුයි. මෑත කාලයේදී අපි ඒ කාර්යභාරය ශක්තිමත් කරන්න "පෝෂිත පාසල්" සංකල්පය වැනි සංකල්ප ගෙන ආවා. විශේෂයෙන් පෝෂිත පාසල් සංකල්පය තුළින් ගොඩ නැඟුණු ප්‍රාථමික පාසල් දහස් ගණනක් අද රට පුරා ඉතා ශක්තිමත්ව ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, තාක්ෂණ විෂය

අධ්‍යාපන පද්ධතියට එක් කර දෙමින්, "මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර" හදලා අපේ අධ්‍යාපන පද්ධතිය තවත් ශක්තිමත් කළ ආකාරය අපට අමතක කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම, පසුගිය ආණ්ඩු "ළඟම පාසල - හොඳම පාසල" වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පාසල් පද්ධතියට මහා ශක්තියක් එක් කර දුන්නා. අපේ රටේ ආදරණීය දරුවන්ට විවිධ සහන රැසක් ඒ ආණ්ඩු තුළින් ලබා දුන්නා කියන කාරණයත් මම විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ. ඒ සියලු කළ කාර්යභාරයන් කිහිපයක් මම කෙටියෙන් කියන්නම්. අපේ රටේ පාසල් දරුවන්ට නොමිලේ පෙළ පොත් ලබා දුන්නා; පාසල් නිල ඇඳුම් රෙදි ලබා දුන්නා; දරුවන්ට නොමිලේ ආහාර වේලක් ලබා දුන්නා; විවිධ ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කළා. ඒ වාගේම අපි අගය කරන්න ඕනෑ, "සුරක්ෂා" රක්ෂණ ක්‍රමයත්. මෙවර ගරු අගමැතිතුමිය ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. ඒ සියල්ල පසුගිය ආණ්ඩු, මෑත කාලීන ආණ්ඩු දැයේ දරුවන් වෙනුවෙන් එකතු කරපු දේවල්.

අපි විශේෂයෙන් අගය කරන්න ඕනෑ, වත්මන් ආණ්ඩුව පාසල් දරුවකුට ලිපි ද්‍රව්‍ය ගැනීම සඳහා රුපියල් 6,000ක මුදලක් ලබා දීපු එක. අපි මීට පෙරත් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙනවා. ඒ ලැබුණු මුදල අද හැම දරුවෙකුටම ලබා ගන්න හැකියාව ලැබුණේ නැහැ. ඔබතුමන්ලා ඉතා හොඳ කාර්යභාරයක් කළා. ඔබතුමන්ලා ළමුන් 300ට අඩු පාසල්වල දරුවන්ට එය ලබා දුන්නා. හැබැයි, දරුවන් 300ට වැඩි පාසල්වල, ජනප්‍රිය පාසල්වල, ප්‍රසිද්ධ පාසල්වල ඉගෙන ගන්නා දරුවන්ට ඒ පහසුකම ලබා ගන්න අද හැකියාව ලැබිලා නැහැ. ගරු අගමැතිතුමියනි, විශේෂයෙන් ඔබතුමියගේ අවධානය ඒ කෙරෙහි යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ ඉල්ලීම ඉතා මානුෂික ඉල්ලීමක්. ඒ ප්‍රතිපාදන ලබා දීමේදී අඩු ආදායම්ලාභී නිර්ණායකය තුළ ඉඳන් තමයි කටයුතු කරන්නේ. හැබැයි, අඩු ආදායම්ලාභී කියන නිර්ණායකය යටතේ අප සුදුස්සන් තෝරාගත යුත්තේ ඒ ඒ පවුල්වල ස්වභාවය අනුවයි. රාජ්‍ය සේවකයෙක්ද, එහෙම නැත්නම් කවර ආදායමක් ලබන කෙනෙක්ද කියන එක පිළිබඳව සොයා බලා ඒ ඒ පවුල්වල ස්වභාවය අනුව අපට මේ රුපියල් 6,000 මුදල ලබා දෙන්න පුළුවන්. හැමෝටම ලබා දෙන්න බැරි වුණත් අඩුම ගණනේ ඒ පිළිබඳව සමාලෝචනය කරලා ඒ මුදල ලබා දෙන්න පුළුවන් නම් වටිනවා කියන කාරණය මම මේ මොහොතේ සඳහන් කරනවා.

මේ ගරු සභාවේ මීට පෙරත් කථා කළා, පසුගිය ආණ්ඩුව ජාතික පාසල් දහසක වැඩසටහනක් ක්‍රියාත්මක කළා කියන කාරණාව. පළාත් සභාව නියෝජනය කරමින් සිටි අවධියේ අපි ප්‍රතිපත්තියක් විධියට එයට විරුද්ධ වුණා. නමුත්, අපේ පළාත් සභාව යටතේ තිබුණු ඉතා ශක්තිමත් පාසල් ජාතික පාසල් බවට පරිවර්තනය කළා. හැබැයි, එවකට පාසල් පද්ධතිවල හිටපු විදුහල්පතිවරුන්, දරුවන්, දෙමව්පියන් ඒ "ජාතික පාසල්" සංකල්පයට කැමති වුණා. එදා ඒක ඒ පාසල්වලට ගෞරවයක් බවට පත් වුණා. හැබැයි, ඒ ජාතික පාසල් සංකල්පය අද තිබෙන්නේ කොතැනද කියන කාරණය පිළිබඳ ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. පළමු වටයේ රුපියල් මිලියනයක මුදලක් ලබා දීලා ජාතික පාසල් නාම පුවරුව සකස් කරලා ඒ පාසලට වටිනාකමක් එක් කර දුන්නා. හැබැයි, අද ඒ ජාතික පාසල් සංකල්පය තිබෙන්නේ කොතැනද කියන ප්‍රශ්නය අපි මේ සභාවෙන්, විශේෂයෙන් තමුන්නාන්සේලාගෙන් අහනවා. අපි මේ මොහොත් බලාපොරොත්තු වෙනවා, එයට සාධනීය පිළිතුරක්. ඒ වාගේම, විශ්වවිද්‍යාල ඇතුළු විවිධ කාරණා වෙනුවෙන් පසුගිය ආණ්ඩු වැඩියෙන් මුදල් යොදමින් කරමින් කටයුතු කළාය කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

අද දියුණු ක්‍රමයක් විධියට රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් විදුහල්පතිවරුන් පත් කිරීමේ ඉතාම හොඳ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් නිවැරදිව ඒ කටයුත්ත කරනවා. හැබැයි, ක්ෂේත්‍රයට එකතු වන විදුහල්පතිවරුන් ඒ කාර්යභාරය ඉෂ්ට කරන්න පුළුවන් වටපිටාවක් ගොඩනඟාගෙන තිබෙනවාද කියන කාරණය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ගාල්ල දිස්ත්‍රික්කය ගත්තත්, ඉතාම නිවැරදි ලෙස විදුහල්පතිවරු පත් කරන්න ඇති. හැබැයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ඒ විදුහල්පතිවරු පත් කළත්, ප්‍රායෝගික දැනුමක් නැතිව, පාසල් පද්ධතිය පිළිබඳ, පාසල් පද්ධතියේ සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් නැතිව, කිසිදු දවසක පාසල් පද්ධතියට ඇතුළු නොවුණු සමහර විදුහල්පතිවරුන්ට ඒ කාර්යභාරය ඉෂ්ට කරන්න බැරිවෙලා තිබෙනවා. ඒ නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පත් කරන විදුහල්පතිවරුන්ට යම් කිසි ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙමින්, පාසල් පද්ධතිය පිළිබඳව අවබෝධයක් ලබා දෙමින් කටයුතු කරන්න පුළුවන් අලුත් ක්‍රමයක් ගැන අපට හිතන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරන්න ඕනෑ.

මට නියමිත කාල වේලාව ඉතාම ඉක්මනින් ගෙවුණු නිසා, අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි මාධ්‍ය භාවිත කිරීම පිළිබඳවත් ඉතාම කෙටියෙන් සිහිපත් කරන්න ඕනෑ. රිවර්ඩ් පතිරණ අමාත්‍යවරයා ලබුදුව සිරිධම්ම විද්‍යාලය බිහි කරපු වෙලාවේ, ඒ විද්‍යාලයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ආරම්භ කරපු වැඩසටහන අපට දිගට කරගෙන යන්න හැකියාව ලැබුණේ නැහැ. හැම ආණ්ඩුවක්ම ඒ සඳහා උත්සාහ ගත්තා. නමුත්, මේ රටේ අධ්‍යාපනඥයන් ඒ පිළිබඳව දරන මතය පිළිබඳ ප්‍රශ්නයක් මේ සමාජය තුළ තිබෙනවා. ඒ නිසා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දීම පිළිබඳව මේ ආණ්ඩුවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළින් යම් කාර්යභාරයක් ඉටු කරන්න වැඩි අවධානයක් යොමු කරයි කියා අපි හිතනවා.

ගරු අගමැතිතුමියනි, ඔබතුමිය මේ සභාවේ සිටින වෙලාවේ, මේ මොහොතේ සමාජයේ තිබෙන ප්‍රශ්නයක් වන, අධ්‍යාපන පරිපාලන සේවය සඳහා පවත්වපු සීමිත තරග විභාගය පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඒ සීමිත තරග විභාගයට 2021 වර්ෂයේ තමයි අයදුම්පත් කැඳෙව්වේ. හැබැයි, දැනට වසර 4ක් ගත වෙලා තිබෙනවා. විභාගය පැවැත්වූයේ 2023 වර්ෂයේ. අද වන විට ඒ පුරප්පාඩු 442ක් තිබෙනවා. වසර 4ක් පුරාවට මේ ක්‍රියාවලිය සිදුවෙනවා. ඒ නිසා ගරු අගමැතිතුමියනි, ඒ පිළිබඳව ඉතාම ඉක්මනින් කටයුතු කරලා ඒ අධ්‍යාපන පරිපාලන විභාගය සමතුන්ට අවස්ථාව ලබා දෙන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරනවා.

ඒ වාගේම, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලවල වැටුප් තලවල අවිධිමත්භාවයක් ගොඩනැඟිලා තිබෙනවාය කියන කාරණය ඔවුන් දැඩිව ප්‍රකාශ කරනවා. ඒ පිළිබඳවත් සොයා බලන්නය කියන එකත් මම කරනවා.

ඒ වාගේම, මීලාගිරිය, ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලයේ අවුරුදු 4ක සිට විදුහල්පතිවරු හතරදෙනෙක්, පස්දෙනෙක් මාරු වෙමින් කටයුතු කරනවා. අද ඒ පාසලට ස්ථිර විදුහල්පතිවරයෙක් නැහැ. මීලාගිරිය, ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලයට ස්ථිර විදුහල්පතිවරයෙක් නැති වුණාම ඒ පාසලේ කටයුතු ඉදිරියට යන්නේ නැහැ. ඒ නිසා ගරු අගමැතිතුමියනි, ඒ පිළිබඳවත් ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියා සිහිපත් කරනවා. ඒ වාගේම ගාල්ලට, දකුණට, මුළු රටටම බලපාන දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ අඩුපාඩුව ඉතාම දැඩියි. ඒ වාගේම, වෘත්තීය පුහුණු අධිකාරිවල උපදේශක මහත්වරු විදේශගත වීමත් ඒ ආයතනවලට විශාල අඩුපාඩුවක්. ඒ පිළිබඳවත් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න කියන කාරණය

[ගරු වානක මාදුගොඩ මහතා]

සිහිපත් කරනවා. දැයේ දුවා දරුවන්ට ඉතාම හොඳ අධ්‍යාපනයක් ලබා දීම වෙනුවෙන් ඔබේ ආණ්ඩුව ඉතාම හොඳ වගකීමකින්, වගවීමකින් කටයුතු කරයි කියන විශ්වාසය අප තුළ තිබෙනවාය කියන කාරණයත් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.03]

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ, වසර 25ක ගුරු සේවයකින් පසුව පාර්ලිමේන්තුවට පිවිසි මට අධ්‍යාපනය පිළිබඳව කථා කරන්නට ලැබීම විශේෂ අවස්ථාවක් ලෙස දකිනවා. ඇත්තටම අධ්‍යාපනය කියන්නේ සමාජ ගමන් මඟ දියුණුවේ දිශාවට ගෙනයන්න, සමාජ ප්‍රගමනයට දායක වෙන්න ප්‍රධානම සාධකයක් බව අපි දන්නවා. මම දීර්ඝ කාලයක් තිස්සේ දැකපු දරුවන්ගේ සමාජ පරිවර්තනයක් තිබෙනවා. විශේෂයෙන්ම කකුලට සෙරෙප්පුවක්වත් නොදාපු දෙමාපියන්ගේ දරු පරපුරට ආරක්ෂිත මෙවලමක් විධියට පාවහන් ලබා දෙන එන, ඒවා පළඳින්න අවස්ථාව අරගෙන දෙන එක වාගේ ආරක්ෂක මෙවලමක් තමයි අධ්‍යාපනය කියන්නේ.

උඩුකය වැහෙන්න කමිසයක්වත් නැතුව, අව්වට වේළෙමින් වැස්සේ තෙමෙමින් වැඩ කරපු කම්කරු පන්තියේ පියවරුන්ගේ දු පුතුන්ට අංග සම්පූර්ණ ජාතික ඇඳුම, යුරෝපා ඇඳුම් කට්ටලය ඇඳලා විධායක, මාණ්ඩලික, පරිපාලන ශ්‍රේණිවලට එන්න මහ පාදපු වරප්‍රසාදයක් තමයි අධ්‍යාපනය කියන්නේ. චීත්ත රෙද්දෙන් සීතල මකා ගත්ත අපේ වතුකරයේ අම්මලාගේ දියණිවරුන්ට මේ පාර්ලිමේන්තුව දක්වා එන්න පාර පෙන්වපු මහා පහන් ටැඹක් තමයි අධ්‍යාපනය කියන්නේ. හබරල කොළයක් ඉහට ඉහළාගෙන ගිය සමාජයේ හිටපු අපේ කලින් පරපුරේ දෙමව්පියන්ගේ දරු පැටවුන්ට උඩු වියන් යට, පා වියන් උඩ ඇවිදින්න අවස්ථාව ලබා දුන් වටිනාම මෙවලමක් හැටියට තමයි අපි අධ්‍යාපනය දකින්නේ. ඒ විතරක් නොවෙයි. ලෝකයේ ඈත එපිට කාලයක පිටගැස්ම, උමතු රෝග වාගේ දේවල් යක්ෂයා විසින් ඇති කරන රෝග ලෙස සලකා දෙහි කොළයෙන්, නැන්නම් දෙහි අත්තකින් පහර දීලා ඒ රෝග පලවා හරින්නට උත්සාහ කරපු මිථ්‍යාවේ යුගය පහු කරලා විද්‍යාත්මක දියුණුවක් සහිතව ලෝකය දියුණු කරන්නට සමත් වෙච්ච දෙයක් තමයි අධ්‍යාපනය කියන්නේ. මිය ගිය අයෙකුගේ දේහය අරගෙන ගිහිල්ලා කැලයට දමපු, ආහාර අමුවෙන්ම අනුභව කරමින් හිටපු, කිසිම මෙවලමක් පාවිච්චි නොකර හිටපු, වැසිකිළි කැසිකිළි කටයුතු සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගත්තේ නැති, ඒ සඳහා ස්වාභාවික පරිසරයම පාවිච්චි කරමින් හිටපු සමස්ත සමාජයම, විද්‍යාත්මක දියුණුවකට, සෞඛ්‍ය විද්‍යාත්මක දියුණුවකට, මානව සමාජයීය දියුණුවකට, අයිතිවාසිකම්වල දියුණුවකට අරගෙන ඇවිල්ලා, හැම කෙනාගේම ජීවත්වීමේ අයිතිය තහවුරු කරපු ප්‍රධාන මෙවලම තමයි අධ්‍යාපනය කියන්නේ. ඒ නිසා අධ්‍යාපනය කියන සාධකය මත තමයි මේ සමාජ පන්ති අතර තිබෙන අසමානතාව පියවෙන්නේ කියලා අපි විශ්වාස කරනවා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමන් එදා අධ්‍යාපනයේ සම අවස්ථාව කියලා සෑම දරුවෙකුටම සාධාරණ අධ්‍යාපනයක් නිදහස් අධ්‍යාපනය තුළ ලබා දෙන්න කටයුතු කිරීම තුළ අන්න ඒ අරමුණ තිබුණා. එක් පන්තියක් අතර විතරක් සංසරණය වූ දැනුම, ධනය, බලය, ගෞරවය, සමාජ තත්ත්වය, තාක්ෂණය, විද්‍යාත්මක දැනුම සෑම සමාජ ස්තරයකටම ලැබිලා විශ්ව සාධාරණ අයිතියක් ලෝකය තුළ නිර්මාණය වුණේ අධ්‍යාපනයේ දියුණුවත් එක්කයි. ලෝකයේ පෑගෙමින් හිටපු සෑම පුරවැසියෙකුටම අභිමානවත් මිනිසෙක් වෙන්න සාධාරණ අයිතිය ලැබුණේ අධ්‍යාපනයෙන්. ඒ නිසා තමයි ලෝකය වෙනස් කිරීමට භාවිත කළ හැකි බලවත්ම ආයුධය අධ්‍යාපනය කියලා සලකන්නේ.

මහත්මා ගාන්ධිතුමන් විසින් කියනවා, හිරු රැස් හා වර්ෂාව සෑමදෙනාටම සම සේ ලැබෙන්නා සේ අධ්‍යාපනයද සම සේ ලැබිය යුතුයි කියලා. ඒ නිසාම තමයි අපි රජයක් හැටියට මෙවර අය වැය තුළින් අධ්‍යාපනයෙන් අතරමගින් පිටමං වන දරුවන්ගේ වගකීම භාර අරගෙන තිබෙන්නේ. අම්මා තාත්තාගේ පොකට් එකේ තිබෙන මුදල් මත අධ්‍යාපනය තීරණය වෙමින් තිබුණු ක්‍රමය වෙනස් කරලා, දෙමව්පියන් මත පටවා තිබුණු ඒ අධ්‍යාපනයේ බර රාජ්‍ය වගකීමක් සේ සලකා භාර ගන්න මෙවර අය වැය තුළින් අපි කටයුතු කරලා තිබෙනවා. ඒක මැතිවරණයට පෙර අපේ ජනාධිපතිතුමා විසින් ලබා දුන් විශාල පොරොන්දුවක්. මේ රටේ ජනතාවට එදා ලබා දුන් පොරොන්දුව තමයි, අධ්‍යාපනය හා සෞඛ්‍යය ප්‍රධාන අයිතිවාසිකම් දෙකක් හැටියට සලකා, ඒ අයිතීන් මූලික මිනිස් අයිතීන් හැටියට පිළිගත යුතුයි, මේ සමාජයේ දෙමව්පියන්ගේ වත්පොහොසත්කම් මත දරුවන්ගේ අධ්‍යාපනය හෝ මිනිසාගේ ජීවත් වීමේ අයිතිය තීරණය නොවිය යුතුයි කියන එක. ඒ කියපු වචනය ඒ ආකාරයෙන්ම ආරක්ෂා කරමින්, අධ්‍යාපනයෙන් පිටමං වන දරුවන්ගේ, ඒ වාගේම නොයෙකුත් සමාජ විෂමාචාරවලට ලක්වෙලා පරිවාස, ළමා නිවාස, සුරැකුම් නිවාස ආදී ස්ථානවල රැඳෙමින් අධ්‍යාපනය ලබන දරුවන්ගේ වගකීම වෙනුවෙන් රජය මෙවර විශාල වෙන් කිරීමක් කරලා තිබෙනවා. මෙවර අය වැය තුළ වැඩිම වෙන් කිරීම අධ්‍යාපනය සඳහා ලබා දීලා තිබෙන්නේ ඒ නිසායි.

අද පාසල් දරුවන්ට ලබා දෙන රුපියල් 6,000ක දීමනාවෙන් පොත් පත් මිලදී ගන්නට අවස්ථාව ලැබීමෙන් දරුවන් රජ කරවන්නට බලාපොරොත්තුවෙන් හිටපු, ඒ සිහින දැකපු දෙමව්පියන්ගේ සිහිනවලට අත්වැලක් සපයා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පාසල් පාවහන් නොමිලයේ ලබා දීම, නිල ඇඳුම් සඳහා රෙදි ලබා දීම අද සිදු වෙනවා. ඒ තුළින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා දෙමව්පියන් තනි තනිව දරමින් සිටි පිරිවැයට රජය මෙවර සුවිශේෂී සහනයක් ලබා දීලා තිබෙනවා; අතිරේක සහායක් ලබා දීලා තිබෙනවා. අද මහපොළ ශිෂ්‍යාධාර දීමනාව වැඩි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පෙර පාසල් දරුවන්ටත්, පාසල් දරුවන්ටත්, අඩු ආදායම්ලාභී දරුවන් සිටින බවට හඳුනා ගත් ප්‍රදේශවල විශේෂ පෙර පාසල් සහ පාසල් පද්ධතියටත් උදෑසන ආහාර වේල සපයා දෙමින්, ඒ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ මුදල් තුළින් විශේෂ ව්‍යාපෘති සකස් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය සම්පූර්ණ වෙන්න නම් වෘත්තීය අධ්‍යාපනයත් වැදගත් වෙනවා. වෘත්තීය අධ්‍යාපනය වැදගත් වෙන්නේ විධිමත් අධ්‍යාපනයේ පරතෙරටම ගිහිල්ලා, ඒ අධ්‍යාපනයේ අවසාන ප්‍රතිඵලය හැටියට වෘත්තීය ක්ෂේත්‍රයට පිවිසෙන අයට නොවෙයි. අධ්‍යාපනය අතරමඟ අඩාළ වෙලා, තමන්ගේ අධ්‍යාපනය කර ගන්න බැරිව අතරමඟ නතර වෙන තවත් පරපුරක් අපට ඉන්නවා. අන්න ඒ දරුවන් වෘත්තීය

වශයෙන් නඟා සිටුවීම සඳහා තමයි මේ වෘත්තීය අධ්‍යාපනය කියන එක වැදගත් වෙන්නේ. ඒ වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය සඳහා මෙවර අය වැයෙන් රුපියල් බිලියන 15.4ක මුදලක් වෙන් වෙලා තිබෙනවා.

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කරන අතරම, ඒ විශ්වවිද්‍යාල අධ්‍යාපනය වඩාත් පරිපූර්ණ අධ්‍යාපනයක් කරන අතරම රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් වෙන්න බැරි දරුවන් සඳහා ණය ලබා දීලා, ඒ දරුවන්ගේ විශ්වවිද්‍යාල උපාධි සිහිනය කියන එක සම්පූර්ණ කර ගන්න රුපියල් බිලියන 2.78ක් මේ අය වැය තුළ වෙන් කරලා තිබෙනවා. විශ්වවිද්‍යාලයට යන්නට සිහින දකිමින් සිටි දරුවන්ට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළු වෙන්න බැරි වුණාම ඒ සඳහා වන ආවරණයක් හැටියට තමන්ගේ උසස් අධ්‍යාපනය දිගටම කරගෙන යන්න ණය පහසුකම් ලබා දෙන්නට මේ තුළ මුදල් වෙන් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අධ්‍යාපන කාර්යයේ නිරත වෙලා සිටින ගුරු-විදුහල්පතිවරු ගැනත් මේ අය වැයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. අපි දන්නවා, අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා භෞතික සංවර්ධනය පමණක් ප්‍රමාණවත් නොවන බව. යටිතල පහසුකම් සංවර්ධනය පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ වාගේම තමයි ධාරිතා සංවර්ධනය සඳහා විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නියැලී සිටින අයගේ වෘත්තීය සංවර්ධනයටත්, ඒ වාගේම වෘත්තීය අභිමානය ආරක්ෂා කිරීමටත්, ඒ වෘත්තීයභාවය වැඩි කිරීමටත් අනිවාර්යයෙන්ම රජය කටයුතු කළ යුතු වෙනවා. ඒ නිසා තමයි ඉතිහාසයේ පළමුවෙනි වතාවට අපේ රජය තුළින් මෙවර වැඩිම වැටුප් වැඩිවීමක් මේ සෑම වෘත්තිකයකුටම ලබා දුන් ආකාරයටම ඒ වැටුප් වැඩි වීම ගුරු-විදුහල්පතිවරුන්ටත් ලබා දුන්නේ. මේ තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ ගුරුවරයාගේ, විදුහල්පතිවරයාගේ අභිමානය ආරක්ෂා කරන එක විතරක් නොවෙයි, ඒ වෘත්තීයභාවය වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීමේ වගකීම ප්‍රකාශ කිරීම. ඒ තුළින් තමයි තෘප්තිමත් සේවාවක් පද්ධතිය තුළට ලබා ගන්න පුළුවන් වෙන්නේ. මේ පද්ධතියේ තව බොහෝ අඩු පාඩු තිබෙන නමුත් ඒවා ක්‍රමක්‍රමයෙන් සංවර්ධනය කර ගනිමින් අපි අපේක්ෂා කරන අධ්‍යාපනයේ ගෝලීය ඉලක්ක කරා යන්නට අපි බලාපොරොත්තු වෙනවා.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යවරිය හැටියට මම අධ්‍යාපනය පිළිබඳව කථා කරද්දී ඒකේ තව විශේෂත්වයක් තිබෙනවා. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානතාව ඇති කළ හැකි මාභැඟිම කාරණය, සාධකය වෙන්නේ අධ්‍යාපනයයි. ඒ අධ්‍යාපනයේ සම අවස්ථාව කියන එක ගැහැනු දරුවන්ට ලැබිය යුතුයි. ගැහැනු දරුවන්ගේ අධ්‍යාපනය වඩාත් හොඳින් නඟා සිටුවන්නට, සම අවස්ථා තුළ සිටීමට, ඔවුන්ට සුරක්ෂිත අධ්‍යාපන පසුබිමක් හදන්නට කටයුතු කළ යුතුයි. ඒ වාගේම සනීපාරක්ෂාවෙන් යුතු පාසල් පද්ධතියක් ඇති කරන්නට රජය හැටියට අප කටයුතු කර තිබෙන බවත් මේ අවස්ථාවේ මා මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම වයස අවුරුදු 13ට වැඩි බාලිකාවන් තමන්ගේ මාසික ඔසප් චක්‍රය සිදුවෙද්දී පාසල් පද්ධතිය තුළ අපහසුතාවට පත් වෙමින් ගත කළ ඒ යුගය අවසන් කරමින්, ඔවුන්ට සනීපාරක්ෂක තුවා ලබා දෙන්නට අපි රුපියල් බිලියන 1.4ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පාසල තුළ පවතින ධාරිතා සංවර්ධනය කිරීම වාගේම යටිතල පහසුකම් සංවර්ධනය තුළ බාලිකාවන් පාසලට පැමිණීම කියන එක වඩා වඩාත් දිරිගැන්වීමේ ව්‍යාපෘති අපි සකස් කරනවා.

උසස් අධ්‍යාපනය විතරක් නොවෙයි, වැඩිහිටි අධ්‍යාපනය නඟා සිටුවීමටත්, විශේෂයෙන්ම කාන්තාවන් සඳහා වැඩිහිටි අධ්‍යාපනය නඟා සිටුවීමටත් රජයක් හැටියට අප ක්‍රියාමාර්ග ගන්නවා. මේක අපේ අවසාන අය වැය නොවෙයි. අපේ ඉදිරි වැඩ පිළිවෙළ ඇතුළේදී වැඩිහිටි අධ්‍යාපනය දිරි ගන්වලා ලෝකය ජය ගන්න පුළුවන් තැනට අපේ කාන්තාවන් සහ ගැහැනු දරුවන් ගෙන එනවා කියන කාරණයත් මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

කොන්ෆියුසියස්තුමා පැවසූ කථාවක් මට මේ අවස්ථාවේ මතක් වෙනවා. "අධ්‍යාපනයේ උත්තරීතර අගය නම්, ගුණ දහමින් යුත් හඳවත් ඇති පුද්ගලයෙකු බිහි කිරීමයි" කියලා එතුමා සඳහන් කරලා තිබෙනවා. අන්න ඒ සහකම්පනය සහිත, සමාජානුයෝජනය සහිත අධ්‍යාපන පද්ධතියක අවශ්‍යතාව තිබෙනවා. ඒ නිසා තමයි මෙතෙක් ප්‍රධාන අධ්‍යාපන ධාරාවෙන් වියුක්තව පැවැති පෙර පාසල් අධ්‍යාපනය, ජාතික අධ්‍යාපන පද්ධතියට, එහෙම නැත්නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය එක්ක ගැට ගහලා සමස්ත අධ්‍යාපනය -පෙර පාසලේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා- එකම අධ්‍යාපන ධාරාවක් බවට පත් කළ යුතුයි කියා අපි විශ්වාස කරන්නේ. ඒ වාගේම පෙර පාසල් අධ්‍යාපනය තුළ දැනට පවතින අඩුපාඩුකම්, දීමනා සහ ගෙවීම් කියන ඒවා පිළිබඳව අපට තවදුරටත් කළ හැකි විධිමත් දේ අපි කරනවා. විශ්වවිද්‍යාල පද්ධතිය වාගේම විශ්වවිද්‍යාල පද්ධතියට ප්‍රවේශ වන දරුවා පරිපූර්ණ දරුවෙකු කිරීමට ආරම්භක පියවර ඉතා වැදගත් වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නියමිත කාලය අවසන්, ගරු අමාත්‍යතුමියනි.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඉක්මනින් අවසන් කරනවා.

පෙර පාසල් පද්ධතිය තුළ විෂයමාලා නවීකරණය, පෙර පාසල් ගුරුවරුන් සඳහා ලබා දෙන ඩිප්ලෝමා පාඨමාලාව, පෙර පාසල් දරුවන්ගේ විෂය මාලාව ආදි සියල්ල පිළිබඳව අපි අධ්‍යාපන අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. පූර්ව ළමාවිය සංවර්ධනය කොයි ආකාරයෙන්ද කරන්නේ කියන එක පිළිබඳව සාකච්ඡා කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ කමිටුවක් පිහිටුවා තිබෙනවා. එමඟින්, පවතින සියලු ගැටලු නිරාකරණය කරගෙන පූර්ව ළමාවිය සංවර්ධනය හොඳම මට්ටමකට ගෙනෙන්න අපේ රජය කටයුතු කරමින් සිටිනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. අධ්‍යාපනවේදිනියක් වන, ලෝකයේ ලාබාලතම නොබෙල් සම්මානලාභිනිය වන මලාලා යුසෆ්සායි කියන්නේ ගැහැනු දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් සටන් වැදුණු අධ්‍යාපනවේදිනියක්; අධ්‍යාපන ක්‍රියාකාරිනියක්. ඇය කියනවා, අන්තවාදීන් වඩාත්ම බය වන්නේ පොතක් අතින් දරාගත් ගැහැනියකට කියලා. ඒක නිසා මම කියනවා, අධ්‍යාපනය කියන එක ප්‍රතිවාදීන් සලිත කරවන මෙවලමක් කියලා. ඒ නිසා අපි සැමට සාධාරණ අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑ. අධ්‍යාපනය විශ්ව සාධාරණ අයිතියක්. ඒ විශ්ව සාධාරණ අයිතිය සෑම ශ්‍රී ලාංකික දරුවෙකුටම කිසිදු භේදයකින් තොරව ලබා දීලා ඔවුන්ගේ ලෝකය දිනන්නට අවශ්‍ය පාර හදන්න අපි රජයක් හැටියට කැප වෙනවා කියා මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින්, මා නවතිනවා. මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.17]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சுத் தொடர்பான குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்கு வழங்கிய சந்தர்ப்பத்திற்கு நன்றி! எந்தெந்தத் துறையில் ஆற்றல் உள்ளவர்கள் இருக்கின்றார்களோ அவரவருக்குரிய துறைகளை வழங்க வேண்டுமென்பது உண்மையில் பொருத்தமான விடயமாகும். அந்த அடிப்படையில் பார்க்கின்றபோது, கல்வித்துறையில் ஆற்றல்மிக்க முனைவர் பட்டத்தைப் பெற்றிருக்கின்ற ஒருவருக்கு இந்த அரசாங்கத்தில் கல்வியமைச்சுப் பதவி கிடைத்திருப்பதென்பது வரவேற்கத்தக்க ஒரு விடயம். கல்வியமைச்சினுடைய பொறுப்பு பொருத்தமான ஒருவருக்குக் கொடுக்கப் பட்டிருக்கின்றது. ஆகவே, உங்களுடைய பணி சிறக்க வேண்டுமென்று நான் இந்த இடத்திலே வாழ்த்துகின்றேன்.

நானும் கல்விப் புலம் சார்ந்து 30 ஆண்டுகள் பணியாற்றியவன். குறிப்பாக, இலங்கை கல்வி நிர்வாக சேவையில் ஒரு கல்விப் பணிப்பாளராகப் பணியாற்றியவன் என்ற வகையில், கல்விப் புலம் பற்றி அதிகமாக அறிவதற்கு எனக்கு வாய்ப்புக் கிடைத்தது. வலதுசாரிக் கொள்கையைக் கடைப்பிடித்து ஆட்சி செய்த ஆட்சியாளர்கள் கடந்த காலத்தில் இருந்தார்கள். இருந்தாலும்கூட, சி.டபிள்யூ.டபிள்யூ. கன்னங்கரா அவர்கள் சாதித்த ஒரு விடயம் காரணமாக, அவர் இறந்தும் அவரது நாமம் அழியாத புகழுடன் வாழ்ந்து கொண்டிருக்கின்றது. ஏழை மக்களுக்குக் கல்வியளிக்க வேண்டும் என்ற அடிப்படையில் அவர் சிந்தித்தபடியால், மறைந்தாலும் மறக்கமுடியாத ஒரு தலைவராக அவர் இருக்கின்றார். கௌரவ கல்வி அமைச்சர் அவர்களே, கல்விப் புலத்தில் அல்லது கல்வி ஆற்றலில் பொருத்தமான ஓர் அமைச்சர் என்ற வகையில், உங்களுக்கு ஒரு சந்தர்ப்பம் கிடைத்திருக்கின்றது. எனவே, தாங்கள் இந்தச் சந்தர்ப்பத்தைச் சரியாகப் பயன்படுத்தி கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களில் வாழுகின்ற ஏழை மாணவர்களுக்குரிய கல்வியை நேர்த்தியாக வழங்க வேண்டுமென்று இந்த இடத்தில் மிகவும் பொறுப்புடன் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இந்த இடத்தில் இன்னுமொரு விடயத்தைச் சொல்கின்றேன். நான் மட்டக்களப்பைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில், அங்கு காணப்படுகின்ற கல்விப் பிரச்சினைகள் மற்றும் சில நிறுவனங்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் சம்பந்தமாக அம்மக்கள் என்னிடம் குறிப்பிட்டிருந்தார்கள். அந்த வகையில், உங்களுக்குத் தெரிய வேண்டுமென்பதற்காகச் சொல்கின்றேன். பாடசாலைகளை 3 வகுதியாகப் பார்க்கலாம். முதலாவது, வசதியான பாடசாலைகள்; மற்றையது, கஷ்டப் பிரதேசப் பாடசாலைகள்; மற்றையது, அதிகஷ்டப் பிரதேசப் பாடசாலைகள்.

மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில், கல்குடா கல்வி வலயம், மட்டக்களப்பு மேற்கு கல்வி வலயம், பட்டிருப்பு - போரதீவுப்பற்று கோட்டம் மற்றும் பட்டிப்பளை கோட்டம் போன்றன காணப்படுகின்றன. இந்த இடங்களில் உள்ள பாடசாலைகள் வசதியற்ற சூழ்நிலையில் காணப்படுகின்றன. மாணவர்கள் சமத்துவமாகக் கற்பதற்குரிய வளங்கள் அங்கு கிடைப்பதில்லை. குறிப்பாக, கல்குடா பிரதேசத்தில் பாடசாலை நடக்கின்றபோதே காட்டுப் பிரதேசத்திலிருந்து யானைகள் வந்து அச்சுறுத்தும் நிலை காணப்படுவதாக அப்பிரதேச கல்விப் பணிப்பாளர் சொன்னார். மாணவர்கள் பயத்துடனேயே கல்வி கற்கின்ற சூழ்நிலை அங்கு காணப்படுகின்றது. குறிப்பாக, கட்டுமுறிவுக் கிராமம், புலிபாய்ந்தகல் கூழாக்காடு, வாகரை, பாவற்கொடிச்சேனை, பன்சேனை, 40 வட்டை, கச்சைக்கொடி சுவாமிமலை போன்ற அதிகஷ்டப் பிரதேச மாணவர்கள் மிக அச்சத்துடன் கல்வி கற்றுக் கொண்டிருக்கின்றார்கள். அவர்களுக்குரிய சமத்துவமான கல்வி கிடைப்பதில்லை. ஆசிரிய வளம் மற்றும் தொழில்நுட்ப ரீதியான சாதனங்களின் பற்றாக்குறை என்பன காணப்படுகின்றமையால் அவர்களுக்குரிய கல்வி நேர்த்தியாகக் கிடைக்கவில்லையென்பதை இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். கௌரவ கல்வி அமைச்சர் அவர்களே, உங்களுடைய காலத்தில் கஷ்ட, அதிகஷ்ட பிரதேசத்தில் கல்வி கற்கின்ற மாணவர்களுக்கான கல்வி சமத்துவமாகக் கிடைப்பதற்குரிய வழிவகைகளை நீங்கள் ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அண்மையில் ஆசிரிய ஆலோசகர் நியமனம் வழங்கப்பட்டது. அதாவது, Teacher Advisors' Service என்று சொல்வார்கள். இந்த சேவையில் முரண்பாடுகள் காணப்படுவதாக எனக்கு முறைப்பாடுகள் கிடைத்திருக்கின்றன. பாடசாலையைப் பொறுத்தமட்டில், அதிபர் சேவை இருக்கின்றது, ஆசிரியர் சேவை இருக்கின்றது. அடுத்ததாக, அவர்களை மேற்பார்வை செய்வதற்கென்று Advisors' Service எனப்படும் ஆலோசகர் சேவை இருக்கின்றது. ஆசிரியர் சேவையில் Class 1 அல்லது Class 2(1) தரத்தில் உள்ளவர்களைத்தான் ஆசிரிய ஆலோசகர்களாக போட்டிப் பரீட்சை அல்லது நேர்முகப் பரீட்சைமூலம் தெரிவு செய்கின்றார்கள். அவ்வாறு தெரிவு செய்யப்படுபவர்கள் உண்மையில் ஆசிரியர் சேவையைவிட உயர்ந்தவர்களாகக் கருதப்படுகின்றார்கள். உங்களுடைய வகைப்படுத்தலில்கூட, அதிபர் சேவை, ஆசிரிய ஆலோசகர் சேவை என்பவற்றுக்கு அடுத்ததாகத்தான் ஆசிரியர் சேவை இருக்கின்றது. ஆனால், அவர்களுடைய சம்பளத்தை அவதானிக்கின்றபோது, ஆசிரியர் சேவையில் இருக்கின்ற Class 1 teacherஐவிட, ஆசிரிய ஆலோசகர் சேவையில் உள்ள Class 1 தரத்தில் உள்ளவர்களின் சம்பளம் குறைவாகக் காணப்படுகின்றது. அவர்களுடைய சம்பள ஏற்றம்கூட குறைவாகத்தான் காணப்படுகின்றது.

ஆசிரியர்களில் இருந்து மூப்புநிலை, தகுதி, நேர்முகப் பரீட்சை, போட்டிப் பரீட்சை மூலமாகத் தெரிவு செய்யப்படுகின்ற ஆசிரிய ஆலோசகர்கள் அல்லது Teacher Advisors' Serviceஇல் இருக்கின்றவர்களுக்கு உரிய சம்பளமானது, Class 1 teacherஐவிட Class 1இல் இருக்கின்ற ஆசிரிய ஆலோசகர்களுக்கான சம்பளம் குறைவாக இருக்கின்றது. ஆண்டுதோறும் அவர்களுக்குக் கொடுக்கின்ற படிநிலை ஏற்றம்கூட குறைவாக இருக்கின்றது என்று சொல்கின்றார்கள். இதனால் ஆசிரிய ஆலோசகர் சேவைக்கு வருவதற்கு ஆசிரியர்கள் விரும்பமாட்டார்கள் என்ற கருத்தும் இருக்கின்றது. உண்மையில் எங்களுடைய கல்வி முறைமையின் அடிப்படையில், அதிபர்கள் அதிகமான சம்பளத்தைப் பெறுகின்றார்கள். அடுத்ததாக, ஆசிரிய ஆலோசகர்கள்தான் அந்த சம்பளத்தைப் பெற வேண்டும்.

ஆனால், Teacher Gradeஇல் இருக்கும் Class 1 teacher ஒருவரைவிட, ஆசிரிய ஆலோசகராக இருக்கின்ற Class 1 உத்தியோகத்தர்கள் குறைந்த சம்பளத்தைப் பெறுகின்றார்கள் என்ற முறைப்பாட்டை அந்த ஆசிரிய ஆலோசகர்கள் ஒரு குழுமமாக வந்து செய்திருக்கிறார்கள். அவர்கள் அங்கலாய்த்துக் கொண்டிருக்கிறார்கள். கௌரவ கல்வி அமைச்சரிடம் இந்த விடயம் தொடர்பாகக் குறிப்பிடுமாறு அவர்கள் சொன்னார்கள். எனவே, ஆசிரிய சேவையிலிருந்து உயர்ந்த நிலையில் இருக்கின்றவர்களுக்குரிய சம்பள ஏற்றம் உறுதி செய்யப்பட வேண்டுமென்பதனையும், அவர்களின் தராதரத்திற்குரிய சம்பளம் கொடுக்கப்பட வேண்டு மென்பதையும் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, பல்கலைக்கழகம் சம்பந்தமான ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். கிழக்குப் பல்கலைக்கழகம் மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்றது. உண்மையில் பல்கலைக்கழகக் கல்வி என்பது ஒரு தரமான கல்வியாக இருக்க வேண்டும். நாங்கள் Master of Educationஇனைக் கற்றுக்கொண்டிருந்தவேளை எங்களுடைய பேராசிரியர் ஒருவர் கூறிய wonderful joke - அருமையான பகிடி - ஒன்று எனக்கு ஞாபகத்துக்கு வருகின்றது. அதாவது, கலைபீடத்தை அரசாங்கம் உருவாக்கி இருக்கின்றது. அவர்களுக்கான கல்வியை பல்கலைக்கழகங்கள் மற்றும் ஆசிரிய பயிற்சிக் கல்லூரிகள் வழங்குகின்றன.

அந்த வகையில், எல்லாவற்றையும் அரசாங்கம் செய்கின்றது. அவர்கள் பட்டப்படிப்பை முடித்துக்கொண்டு தொழிலுக்காகச் செல்லுகின்றபோது, "நீங்கள் பெற்ற கல்வி இங்கிருக்கின்ற தொழில்வாய்ப்புக்குப் பொருத்தமாக இல்லை" என்கிறார்கள். கலைபீடத்தில் இன்ன பாடங்களை எடுக்கலாம் என்று தீர்மானிக்கப்படுகின்றது. அதன் அடிப்படையில், அவர்கள் கற்றுவிட்டு தொழில்வாய்ப்புக்காகச் செல்கின்ற போது, "உங்களுடைய பட்டச் சான்றிதழில் இருக்கின்ற பாடங்களுக்குப் பொருத்தமான வேலைவாய்ப்புகள் இங்கே இல்லை" என்று சொல்கின்றார்கள். எனவே, தொழில் உலகத்திற்குப் பொருத்தமான வேலைவாய்ப்புகளைக் கொடுக்க வேண்டிய தேவை இருக்கின்றது.

அடுத்து, கிழக்குப் பல்கலைக்கழகம் தொடர்பாக எனக்குக் கிடைத்த தகவல்களைச் சொல்கின்றேன். கிழக்குப் பல்கலைக்கழகத்தில் உபவேந்தர் - Vice Chancellor - பதவி சம்பந்தமாக அங்கு கடுமையான போட்டித்தன்மை காணப்பட்டது. அதற்கான தெரிவு நடைபெற்றது. ஆனால், இன்னும் நியமனம் கிடைக்கவில்லை. விரைவில் நீங்கள் அதனைச் செய்வீர்கள் என்று நினைக்கின்றேன். ஊழல், மோசடி அற்ற, இலஞ்சம் பெறாத, நேர்மையான, செயற்றிறனுள்ள ஓர் உபவேந்தர் அங்கு நியமிக்கப்பட வேண்டும். அரசியல்வாதிகளுக்குப் பின்னால் சென்று தங்களுடைய பதவி உயர்வைப் பெற்றுக்கொள்கின்ற தன்மை இருக்கக்கூடாது. கடந்த காலத்தில் சில சில குளறுபடிகள் அங்கு நடந்திருக்கின்றன. தொழில்நுட்ப பீடத்திற்கான Dean ஒருவரை நியமிக்கின்றபோதும் முறைகேடுகள் நடந்திருக்கின்றன என்று சொல்லப்படுகின்றது.

மேலும், பல்கலைக்கழகத்தில் பேரவை - Council - இருக்கின்றது. இப்போது அது கலைக்கப்பட்டிருக்கின்றது. தவறுகள் நடந்தால் அதைக் கலைப்பதில் பிழையில்லை. ஆனால், Councilக்குரிய நியமன உறுப்பினர்களை வழங்குகின்றபோது சில வழிமுறைகளைப் பின்பற்ற வேண்டும். கடந்த காலத்தில் பார்த்தீர்களென்றால், தென்னிலங்கைப் பக்கமாக நியமனங்கள் வழங்குகின்றபோது, அங்கு தமிழ்ப் பிரதிநிதித்துவம் பேணப்படவில்லையென்று சொல்கின்றார்கள். அதேபோல, கிழக்குப் பல்கலைக்கழகத்தில் ஒரு நடைமுறை காணப்பட்டது. அங்கே 77 சதவீதமான தமிழ் பேசுகின்ற மக்கள் இருக்கிறார்கள் என்ற அடிப்படையில் நான் சொல்லவில்லை. முதலில் அந்த நியமனம் வழங்குகின்றபோது, 9 தமிழர்களும் 4 முஸ்லிம்களும் 2 பெரும்பான்மையின சிங்களமொழி பேசுகின்றவர்களும் நியமிக்கப்பட்டிருந்தார்கள். தற்போது அது மாற்றியமைக்கப்பட்டிருக்கின்றது. அதனை அவர்கள் கேள்வியாக எங்களிடம் கேட்கின்றார்கள். ஒன்பது தமிழர்கள் இருந்த இடத்தில் தற்போது 5 பேர் நியமிக்கப்பட்டிருக்கிறார்கள். அதேபோன்று, 2 சிங்களப் பிரதிநிதித்துவத்திற்குப் பதிலாக 7 உறுப்பினர்களை நியமித்திருக்கிறார்கள். அந்த மாவட்டத்தில் இருக்கின்ற ஊழல், மோசடி இல்லாத, இலஞ்சம் பெறாத, திருத்தமான பணியைச் செய்கின்றவர்களை நியமித்தால் அதனை நாங்கள் ஏற்றுக்கொள்வோம். மாவட்டம் கடந்து அவர்களை நியமிக்கின்றபோது, அவர்களுடைய போக்குவரத்துச் செலவுக்கு ஒரு தடவை வந்து போவதற்கு 30,000 ரூபாய் வரையில் செலவாகும் என்று சொல்லப்படுகின்றது. உங்களுடைய செலவினத்தைக் குறைக்கின்ற செயற்பாட்டுக்கு அது முரணாக அமைந்திருக்கின்றது. எனவே, இந்த விடயத்தையும் நீங்கள் கவனத்திற்கொள்ள வேண்டும்.

அடுத்ததாக, உட்படுத்துகைக் கல்வி - inclusive education - பற்றி நான் சொல்ல வேண்டும். பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு சுகத் வசந்த த சில்வா அவர்கள் இதுபற்றிக் குறிப்பிட்டிருந்தார். மட்டக்களப்பில் உதயம் விழிப்புலனற்றோர் அமைப்பொன்று இருக்கின்றது. கண்பார்வையற்ற மாணவர்கள் கற்பதற்கான தரிசனம் விழிப்புலனற்றோர் பாடசாலை கல்லடியில் காணப்படுகின்றது. இதில் கற்கின்ற 40 - 50 பேர் வருடாந்தம் பல்கலைக்கழகம் செல்கின்றார்கள். பல்கலைக்கழகம் சென்றுவிட்டு, போட்டிப் பரீட்சை எழுதுகின்றபோது வரைபுகள் சார்ந்த, படங்கள் சார்ந்த கேள்விகளைக் கொடுக்கின்றபோது விழிப்புலனற்றவர்களாக இருக்கின்ற படியால் அவற்றைக் கிரகிக்க முடியாமையால் விடையளிக்க முடியாதவர்களாக அவர்கள் இருக்கிறார்கள். நான் இது சம்பந்தமாக ஆலோசனைக் குழுக் கூட்டத்தின்போதும் சொன்னேன். ஆகவே, போட்டிப் பரீட்சைக்கு அவர்கள் முகங்கொடுக்கக்கூடிய விதத்தில் கருணை காட்ட வேண்டு மென்று இந்த இடத்தில் நான் கேட்டுக்கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, please give me one more minute.

அதேபோன்றுதான் விளையாட்டு சம்பந்தமான விடயமும் பாடசாலைகளிலிருந்து விருத்தி செய்வதுண்டு. அந்த வகையில், விளையாட்டை மேம்படுத்துவதற்கும் பாடசாலையில் செயற்பாடுகள் அமைந்திருக்க வேண்டும் என்பதை இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். கடந்த காலத்தில் wrestling போட்டிக்கு எங்களுடைய மாவட்டத்திலிருந்து சென்றவர்கள் நாடளாவிய ரீதியில் வெற்றிபெற்று முதலாவது இடத்தைப் பெற்று வந்தார்கள். திருச்செல்வம் என்ற பயிற்றுவிப்பாளர் அவர்களுக்கான பயிற்சியை வழங்கியிருந்தார். ஆனால், எங்களுடைய மாணவர்களுக்கு அவ்வாறான பயிற்சிகளைப் பெறுவதற்கான வசதிகள் குறைவாக இருக்கின்றன. வசதிகள்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

இல்லாதபோதும் அவர்கள் அந்த வெற்றியைப் பெற்றிருக்கிறார்கள் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

சப்பாத்து வழங்குகின்ற விடயம் சம்பந்தமாக எடுத்துக் கொண்டால், 300 மாணவர்களுக்கு உட்பட்ட மாணவர்களைக் கொண்ட பாடசாலைகளுக்கு சப்பாத்து வழங்குகின்ற நடைமுறை காணப்படுகின்றது. உண்மையில் வசதியற்ற 300க்கும் மேற்பட்ட மாணவர்கள் கல்வி கற்கின்ற பாடசாலைகளிலும் -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
ஆம், நிறைவுசெய்கின்றேன்.

ஆகவே, எண்ணிக்கையை அடிப்படையாகக் கொள்ளாமல் தயவுசெய்து அவர்களுடைய ஏழ்மை நிலை, வசதியீனத்தை அடிப்படையாகக் கொண்டு இந்தச் செயற்பாடுகளைச் செய்ய வேண்டுமென்று இந்த இடத்தில் நான் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

நெல்சன் மண்டேலா அவர்கள் சொன்ன ஒரு விடயத்தைக் கூறி எனது உரையை முடித்துக் கொள்கின்றேன். அதாவது, "Education is the most powerful weapon which you can use to change the world." You have this weapon. Therefore, you can change our society during your period என்று கூறிக்கொண்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.30]

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
මට විනාඩි 15ක් තිබුණා නේ. දැන් ඒක විනාඩි 12ට අඩු වෙලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා බෙහෙවින්ම සතුටු වෙනවා, විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙක් වන ඔබතුමා මූලාසනය දරද්දී ගුරුවරයෙක් ලෙස කාලයක් සේවය කළ, ඒ වාගේම ව්‍යක්තීය සමීති ක්‍රියාධරයෙකු සහ නායකයෙකු ලෙස කටයුතු කළ මාහට අද දින අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ ව්‍යක්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ විවාදයට එක්වීමට ලැබීම ගැන. ජාතික ජන බලවේගයේ අපි බලය ගන්න කලිනුත්, බලය ගත්තාට පසුවත් නිරන්තරයෙන් කිව්වේ අධ්‍යාපනය තමයි අපේ ආණ්ඩුවේ ප්‍රමුඛතාව කියලායි. අපි පළමුවත්, දෙවනුවත්, තුන්වනුවත් ප්‍රමුඛතාව දෙන්නේ අධ්‍යාපනයට. ඒ නිසාම තමයි අපේ පළමු අය වැයෙන්ම රුපියල් බිලියන 619ක්; ඉතිහාසයේ වැඩිම මුදලක් අධ්‍යාපනය සඳහා වෙන් කරන්න කටයුතු කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි

අපි දන්නවා, අපේ රටේ දෙමව්පියන්ගේ විශාලම බලාපොරොත්තුව තමයි තමන්ට වඩා හොඳ අධ්‍යාපනයක්, තමන් ලැබූ අධ්‍යාපනයත් පසුකර යන අධ්‍යාපනයක් තමන්ගේ දරුවන්ට ලබා දීම බව. ඒක තමයි අපේ රටේ දෙමව්පියන්ගේ විශාලතම බලාපොරොත්තුව. ඒ නිසා තමයි ඔවුන් විවිධ කැපවීම් කරමින්, විවිධ මැදිහත්වීම් කරමින්, සමහර විට නොකා නොබී දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල පිරිවැයක් දරන්නේ, මහන්සි වෙන්නේ. ඒ නිසාම අපි ආණ්ඩුවක් ලෙස අධ්‍යාපනය කියන විෂයය හැම මොහොතකම ප්‍රමුඛතාවයේ තබා සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී ඇතැම් මන්ත්‍රීවරුන් ප්‍රශ්න කළා. මා සඳහන් කරන්න කැමැතියි, මේ වසර තුළදී ගුරු පුරප්පාඩු 7,913ක් පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මේ අය වැය තුළින් අවධානය යොමු කර තිබෙන බව. දිගින් දිගටම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රශ්නයක් මතු වුණා, උපාධිධාරීන් පිළිබඳව; විශේෂයෙන්ම පාසල් තුළ කටයුතු කරන සංවර්ධන නිලධාරීන් පිළිබඳව. නමුත් අපි දන්නවා, අධිකරණමය ක්‍රියාවලියක් නිසා යම් ගැටලුසහගත තත්ත්වයක් මතු වෙලා තිබෙන බව එම පත්වීම් ලබා දීම සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට විදුහල්පති සේවයේ පුරප්පාඩු 1,610ක් තිබෙනවා. ඒ නිසා ජනවාරි මාසයේ 31වැනි දා වනවිට පැවති පුරප්පාඩු සංඛ්‍යාව ගණනය කරලා ඉදිරියේදී විදුහල්පතිවරුන් බඳවා ගන්න අවශ්‍ය කරන මැදිහත් වීම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කරමින් තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන පරිපාලන සේවයේ 1,334ක පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. එයින් 422ක් බඳවා ගැනීම සඳහා මේ වෙනකොට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අනුමැතිය සඳහා යවා තිබෙනවා. ඒ සඳහා වන සීමිත තරග විභාගය පවත්වා මේ වනවිට අවුරුදු 4කට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. හැබැයි, පසුගිය අවුරුදු 4කට ආසන්න කාලයක් තිස්සේ බඳවා නොගත් අය බඳවා ගැනීමට ඕනෑ කරන මැදිහත්වීම කෙටි කාලයක් තුළ අපේ ආණ්ඩුව සිදු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගුරු අධ්‍යාපනඥ සේවයේ පුරප්පාඩු 1,310ක් තිබෙනවා. එයින් පුරප්පාඩු 706ක් බඳවා ගැනීම සඳහා මේ වනකොට අනුමැතිය ලැබී තිබෙනවා; ඒ සඳහා අද අනුමැතිය ලැබී තිබෙනවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන්. එම විභාගය ගැසට් කළේ 2020 පෙබරවාරි මාසයේ 17වැනි දා. විභාගය පැවැත්වුණේ 2021 අප්‍රේල් මාසයේ 25වැනි දා. කල්පනා කර බලන්න, අවුරුදු 5කට ආසන්න කාලයක් මේ වනකොට ගත වෙලා තිබෙනවා, එම විභාගය ගැසට් කළ දිනයේ සිට. නමුත්, පසුගිය කාලය තිස්සේ එම කටයුතු ක්‍රියාත්මක වුණේ නැහැ. එම ක්‍රියාමාර්ග විධිමත්ව ගැනීමට අවශ්‍ය කරන මැදිහත්වීම් ඒ ආණ්ඩු පාර්ශ්ව විසින් සිදු කළේ නැහැ. හැබැයි, අපේ ආණ්ඩුව කෙටි කාලයක් තුළ එම බඳවා ගැනීම් සම්පූර්ණ කරන්න ඕනෑ කරන මැදිහත්වීම් කර තිබෙනවා.

ඒ වාගේම ජාතික පාසල් සම්බන්ධයෙන් දැන් විශාල සෝෂාවක් මතු වුණා. එදා වරහන් ඇතුළේ තමයි ජාතික පාසල් කියලා නම සඳහන් කළේ. බෝර්ඩ් එක විතරයි ගැහුවේ. ඊට අවශ්‍ය කරන අනෙක් කිසිදු පහසුකමක් සැලසුවේ නැහැ. දැනටත් අධ්‍යාපන අමාත්‍යාංශය ස්ථාවර නියෝග 50 යටතේ ජාතික පාසල් 22ක් පවරාගෙන තිබෙනවා. අනෙක් පාසල් පළාත් සභා පරිපාලනයට යටත් කර තිබෙනවා. ඒ නිසා බෝර්ඩ් විතරක් ගසා ඒවා ජාතික පාසල් කළාට වැඩක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම වෙන්න ඕනෑකම තිබෙන්නේ ජාතික පාසල් කියලා කොටසක් බෝර්ඩ් ගසා වෙන් කරන එක නොවෙයි. සියලු පාසල් එක හා සමානව සලකන තැනකට ගෙනෙන එකයි කළ යුත්තේ.

කාලයක් තිස්සේ ජාතික පාසල් ක්‍රියාත්මක වුණේ කොහොමද? ඒ ඒ ප්‍රදේශවල දේශපාලකයින්ට ඕනෑ විධියට තමතමන්ගේ ප්‍රදේශවල ජාතික පාසල් නම් කර ගත්තා. එහෙම නැතුව දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කරන්නවත්, අධ්‍යාපනයේ අවශ්‍යතාව නිසාවත් නොවෙයි එහෙම කටයුතු කළේ. දේශපාලන වුවමනාවට තමයි ඒ කටයුතු සිදු වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම මේ කාරණය කෙරෙහිත් ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමතියි. අද විශාල සෝෂාවක් බවට පත් වෙලා තිබෙනවා, ගුරුවරුන්ගේ මේ තුනෙන් දෙකක වැටුප් විෂමතාව. අද දවසේත් ගොඩක් මන්ත්‍රීවරු මේ ගැන කථා කළා. සමහර මන්ත්‍රීවරු මම ගැන විවිධ බොරු බෙගලුත් ඇදබෑවා. මට මතකයි, විපක්ෂ නායකතුමා කලින් දවසකත් lunch break එක ගන්නේ නැතිව පාර්ලිමේන්තුවේ කටයුතු ඉදිරියට ගෙනියන්න කථා කරලා, පසුව නැඟිටලා යන්න හදනකොට මම ප්‍රශ්නයක් මතු කළා. ඒ අවස්ථාවේදී එතුමා කිව්වා, "මට ගුරුවරුන්ගේ තුනෙන් දෙකක වැටුප් විෂමතාව ගැන සාකච්ඡා කරන්න තිබෙනවා. ඒකට තමයි මම මේ යන්නේ" කියලා. එතුමා අදත් ඒ ගැන කිව්වා. තව ගොඩක් මන්ත්‍රීවරු මේ තුනෙන් දෙකක වැටුප් විෂමතාව ගැන කිව්වා. මම අහනවා, මෙතුමන්ලා තුනෙන් දෙකක වැටුප් විෂමතාව කියන්නේ මොකක්ද කියලා දන්නවාද කියලා. මෙතුමන්ලා කථා කරනවා, ෆින්ලන්තයේ අධ්‍යාපනය ගැන. ඊළඟට කියනවා ලෝකයේ ඉහළම අධ්‍යාපනයක් තිබෙන රටවල් ගැන. ඒ අතරේ කථා කරනවා, තුනෙන් දෙකක වැටුප් විෂමතාව ගැන. හැබැයි, මම හිතනවා මෙතුමන්ලා මේකේ අගක් මුලක් මොකක්වත් දන්නේ නැතිව ඇති කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1997 ජනවාරි මාසයේ සිට තමයි මේ වැටුප් විෂමතාව ආරම්භ වුණේ. බී.සී. පෙරේරා වැටුප් කොමිසමෙන් තමයි මේ වැටුප් විෂමතාව නිර්මාණය කළේ. එතැන් සිට ගත්තොත්, අද වෙනකොට මේ වැටුප් විෂමතාවට අවුරුදු 27ක් ගත වෙලා තිබෙනවා. මේ අවුරුදු 27න්, අවුරුදු 8ක් මේ රට පාලනය කළේ වෙන කවුරුවත් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ අද මේ සජබයේ ඉන්න මහත්තුරු. එතුමන්ලා තමයි අවුරුදු 8ක් ආණ්ඩු කළේ. ඒ වාගේම ඉතුරු අවුරුදු 19 ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුව තමයි මේ රට පාලනය කළේ. එතුමන්ලා අවුරුදු 27ක් තිස්සේ මේ ප්‍රශ්නය විසඳුවේ නැහැ. ඒ නිසා අපි දිගටම අරගළ කළා. නමුත්, ප්‍රශ්නය විසඳුවේ නැහැ. 2021 අවුරුද්දේ දින 120ක සටනකින් පසුව තමයි අපි වෘත්තීය සමිති ලෙස ඒ වැටුප් විෂමතාවෙන් කොටසක් ලබාගෙන ජයගහණය කරන්න සමත් වුණේ. මොකක්ද, මේ තුනෙන් දෙකක මේ වැටුප් විෂමතාව? මම පසුගිය දිනක ස්වාධීන රූපවාහිනී සේවයේ වැඩසටහනකට සහභාගි වෙලා සැලකිය යුතු කාලයක් අරගෙන මේ ගැන පැහැදිලි කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, පසුගිය දවසක ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය සහභාගි වුණු මාධ්‍ය සාකච්ඡාවකදීත් විනාඩි 6ක්, 7ක් අරගෙන මේ ප්‍රශ්නය පැහැදිලි කළා. එක්කෝ මම කරපු විග්‍රහ මේ අයට තේරෙන්නේ නැහැ. නැත්නම් තේරුණත්, නොතේරුණා වාගේ ඉන්නවා, මම කලින් දවසකත් කිව්වා වාගේ. මම හිතනවා, විපක්ෂයේ අයට මේ ගැන තේරුණත් නොතේරුණා වාගේ තක්කඩිකමට කථා කරනවා කියලා. එළියේත් කිහිපදෙනෙක් මේ වැටුප් විෂමතාව ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ඒ ගැන යම් පැහැදිලි කිරීමක් කරන්න මට පොඩි වෙලාවක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 3 - II ශ්‍රේණියේ ගුරුවරයා කියන්නේ උසස් පෙළින් ගුරු සේවයට එන කෙනා. ඔහුගේ වර්තමාන මූලික වැටුප රුපියල් 31,490යි. ඒ මූලික වැටුප මෙවර අය වැයෙන් රුපියල් 53,060 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ගුරු සේවයේ 1වන පන්තියේ ආරම්භක වැටුප ලබන ගුරුවරයාගේ වර්තමාන මූලික වැටුප රුපියල් 56,770යි. මේ මූලික වැටුප රුපියල් 98,580 දක්වා මෙවර අය වැයෙන් ඉහළට ගෙනැත් තිබෙනවා. ඒ වාගේම විදුහල්පති සේවයේ IIIවන පන්තියේ කෙනෙකුගේ මූලික වැටුප රුපියල් 42,175 ඉඳලා රුපියල් 72,280 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. 1වන පන්තියේ විදුහල්පතිවරයෙකුගේ මූලික වැටුප රුපියල් 58,345 ඉඳලා රුපියල් 103,740 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම ගුරු උපදේශක සේවයේ මූලික වැටුප රුපියල් 41,385 ඉඳලා රුපියල් 72,280 දක්වාත්, 1වන පන්තියේ ගුරු උපදේශක සේවයේ වැටුප රුපියල් 53,520 සිට රුපියල් 86,370 දක්වාත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. මම සියල්ල කිව්වේ නැහැ, වෙලාව ප්‍රමාණවත් නොවන නිසා. මේක තමයි වැටුප් වැඩිවීම. අපි පසුගිය කාලයේ ඉල්ලුවේ මොකක්ද? ගුරු සේවයේ 2 - II ශ්‍රේණිය සඳහා අපි රුපියල් 47,615ක වැටුපක් ඉල්ලුවා. හැබැයි, මෙවර අය වැයෙන් ඒ අයට රුපියල් 66,880ක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව රුපියල් 19,265ක් ඉල්ලපු මුදලට වඩා වැඩියෙන් ලබා දීලා තිබෙනවා. රුපියල් 62,595ක් වෙච්ච 2 - I ශ්‍රේණියේ ගුරුවරයෙකුගේ වැටුප රුපියල් 81,780 දක්වා, එනම් රුපියල් 19,185ක් වැඩිපුර මේ අය වැය තුළින් ලබා දීලා තිබෙනවා. 1වන පන්තියේ ගුරුවරයෙකුට රුපියල් 76,175ක වැටුපක් තමයි ඉල්ලුවේ. හැබැයි, මෙවර අය වැය තුළින් රුපියල් 98,580ක්, ඒ කියන්නේ, රුපියල් 22,405ක වැටුප් වැඩිවීමක් ලබා දීලා තිබෙනවා. නමුත්, මේක ඇතුළේ වැටුප් විෂමතාව විසඳිලා නැහැ කියා අපි කියලා තිබෙනවා. මම ඒ ගැන පැහැදිලි කරලා තිබෙනවා. මම කොතැනකවත් කියලා නැහැ, "වැටුප් විෂමතාවක් නැහැ. අපි දැන් වැටුප් දීලා තිබෙනවා" කියලා. මම කිව්වේ, ඉල්ලපු වැටුපට වඩා වැඩි මුල්‍ය අගයක් අපි ලබා දීලා තිබෙනවා කියන එකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම කථා කරන්න පටන් ගත්තා විතරයි නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක තමයි ජාතික ජන බලවේගය මැතිවරණයට ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය. මේක අපේ ජාතික ප්‍රතිපත්තිය ලෙස පසුගිය දිනෙක කැබිනට් මණ්ඩලයෙනුත් අනුමත කරනු ලැබුවා. අපේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 16වැනි පිටුවේ සඳහන් කර තිබෙනවා, ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව කඩිනමින් ඉවත් කරනවා, ගුරු සේවා ව්‍යවස්ථාවක් සහ ගුරු සභාවක් හදනවා, ගුරු වෘත්තිය ඉහළම වැටුප් ලබන වෘත්තීන් 10 අතරට ගේනවා කියලා. මේ වැටුප් විෂමතාව විසඳනවා කියලා අපි පැහැදිලිව කියලා තිබෙනවා. හැබැයි, මේ වැටුප් විෂමතාව විසඳන්න වෙන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1994 අවුරුද්දේ තමයි ගුරු සේවා ව්‍යවස්ථාව හැදුවේ. මා ළඟ තිබෙනවා, ඒ ගුරු සේවා

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ව්‍යවස්ථාව. එම ගුරු සේවා ව්‍යවස්ථාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, විශේෂයෙන් විපක්ෂයේ මේ ගැන නොදන්නා මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා.

මේ ගුරු සේවා ව්‍යවස්ථාව තුළින් ගුරු සේවය දීප ව්‍යාප්ත සේවා වැටුප් මට්ටමට ගෙනාවා. හැබැයි, එලෙස ගෙනෙන ගමන් මොකක්ද කිව්වේ? එලෙස ගෙනෙන ගමන් කොන්දේසි ගණනාවක් සම්පූර්ණ කළ යුතුයි කියලා සඳහන් කළා. ගුරු සේවයේ ඉහළට යන්න නම් තරග විභාගයකට මුහුණ දෙන්න ඕනෑ, ඒ විභාගයෙන් සමත් වෙන්න ඕනෑ, ඒ වාගේම නිශ්චිත සේවා කාලයන් සම්පූර්ණ කරන්න ඕනෑ ආදී වශයෙන් සේවා කොන්දේසි ගොඩක් තිබුණා. දැන් මේ හැම කොන්දේසියක්ම විග්‍රහ කරන්න මට වෙලාවක් නැහැ. මේ කොන්දේසි සපුරාගෙන තමයි ගුරු සේවයේ ඉහළට යන්න ඕනෑ. එකම එක වතාවක් ගුරු සේවයේ 1වන පන්තියට යන්න විභාගයක් පැවැත්වූවා; එක වතාවයි. මට මතක හැටියට, 800-1,500 අතර ප්‍රමාණයක් තමයි ගුරු සේවයේ 1වන පන්තියට යන්න ඒ විභාගයෙන් සුදුසුකම් ලැබුවේ. ඒක තමයි දීප ව්‍යාප්ත සේවා වැටුප ලබා දෙන්න දමපු කොන්දේසිය. හැබැයි, පසුගිය අවුරුදු 30 තිස්සේ පැවැති කිසිදු ආණ්ඩුවක් - එක්සත් ජාතික පක්ෂය, සජබ ප්‍රමුඛ ආණ්ඩු, අද සජබ වුණාට එදා මේ අය යූඑන්පී නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු- මේ කොන්දේසි ඉටු කරන්න අවශ්‍ය පියවර ගත්තේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය සීමාසහිතයි. ඒ නිසා තව විනාඩියක් දෙන්නම්.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හොඳයි.

එහි ප්‍රතිඵලයක් ලෙස අවසානයේදී මොකද වුණේ? ගුරුවරු කිසිදු කොන්දේසියකින් තොරව ඉහළ ශ්‍රේණිවලට දමන්න පටන් ගත්තා, කැබිනට් තීරණවලින්. දැන් එහෙම නම් අපේ වගකීම මොකක්ද? ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව ආවේ පසුගිය 76 වසරක් තිස්සේ මේ රටේ කරපු වැරදි නිවැරදි කරන්න. ගුරු සේවාවේ නම්, අවුරුදු 30ක් තිස්සේ කරපු වැරදි නිවැරදි කරන්න තමයි අපි ඇවිල්ලා තිබෙන්නේ. අන්න ඒක නිවැරදි කරන්න ඕනෑ කරන මහ - path එක - තමයි අපි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කියලා තිබෙන්නේ. ඒ මොකක්ද? අගමැතිතුමිය එක්කත් සාකච්ඡා කරලා අපි ගුරු සභා වෙනුවට හදනවා, Education Council එකක්. අපි ඒක නම් කළා, අධ්‍යාපන සභාව - Education Council - කියලා. අපි අධ්‍යාපන සභාව හදනවා. ඒකට ඕනෑ කරන Cabinet Paper එක අගමැතිතුමිය දැනටමත් අත්සන් කර තිබෙනවා. මම හිතන විධියට, තව සති දෙකක් ඇතුළත එම කැබිනට් පත්‍රිකාව සම්මත වේවි. ඊට පසුව Education Council එක හැදෙනවා. ඒ Education Council එක ඇතුළේ ඉන්ටර්න්ෂිප් දක්වා යන්න ඕනෑ කරන ගුරුවරයාගේ ගුණාත්මකභාවය - quality එක - වැඩි කරන්න ඕනෑ කරන සැලසුම් ටික හදලා තිබෙනවා.

මොකක්ද මේ Education Council කියන්නේ? මේ ඉන්න ගුරුවරු ඔක්කොම එකවරම Education Council එකේ register වෙන්න ඕනෑ කියලා අපි කියන්නේ නැහැ. නමුත්, ක්‍රමානුකූලව අපි ගේන්න ඕනෑ කොතැනටද? ගුරු සේවයේ ගුණාත්මකභාවය රැකෙන්න නම් කරන්න ඕනෑ මොකක්ද? Sri Lanka Medical Council එකේ registered doctor කෙනෙකුට විතරයි එළියේ බෙහෙත් දෙන්න පුළුවන්; පෞද්ගලික අංශයේ හරි රාජ්‍ය සේවයේ හරි බෙහෙත් දෙන්න පුළුවන්. අන්න එතැනට ගුරු සේවයත් ගේන්න ඕනෑ. ඒකට ඕනෑ කරන පසුබිම හදන්න තමයි Education Council හැදෙන්නේ. ඒ හරහා ගුරුවරයාගේ ගුණාත්මකභාවය වැඩි කරන ප්‍රමාණයට මේ ඉතිරි වැටුප් විෂමතාව විසඳන්න ඕනෑ කරන පියවර ඉදිරියේදී අපි ගන්නවා. ඒකට අපි මේ වසර ඇතුළත අනිවාර්යයෙන්ම මැදිහත් වෙනවා. ඒ වෙනුවෙන් කටයුතු කරනවා. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරන්න සූදානම් කියන පණිවුඩයත් මා ලබා දෙනවා.

විශේෂයෙන් අද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගැනෙන දවසේ අපේ ආණ්ඩුවට යම් වගකීමක් තිබෙනවා. මෙතුවක් කල් මේ රටේ පාලකයින් විසින් හැම පැත්තක්ම විනාශ මුඛයට ගෙන ගියා වාගේ අධ්‍යාපනයත් විනාශ මුඛයට ගෙන ගොස් තිබුණේ. අන්න ඒ අධ්‍යාපනය ගොඩ නැඟීම අපේ වගකීමක් වෙනවා. ඒක ගොඩ නැඟීමේදී ගුරුවරයා සතු විශාල කාර්යභාරයක් තිබෙනවා. ඔය හැමෝටම පෙරේදා දවසේ -8වැනි දා- මේ රටේ ගුරුවරු හොඳ, පැහැදිලි උත්තරයක් දුන්නා. අධ්‍යාපන සමුපකාර සමිතියේ නිලධරණයෙන් -නියෝජිතයන් 384දෙනෙක් තෝරා පත් කරගන්නා නිලධරණයේදී- ජාතික ජන බලවේගය නියෝජනය කරන අපේ ගුරු සංගමයෙන් 370ක්ම ජයග්‍රහණය කළා. අඩුම ගණනේ මේගොල්ලන් ඡන්දයටවත් ආවේ නැහැ. ඔය කියපු මන්ත්‍රීවරු නියෝජිතයන් ඉදිරිපත් කළා. හැබැයි, ඒගොල්ලන් පරාද වුණා. ඒ නිසා මේ රටේ ගුරුවරු ඇතුළු අධ්‍යාපන සමුපකාර සමිතියේ සාමාජිකයන් උත්තර දීලා තිබෙනවා, මේ නහන චෝදනා සියල්ලට. ඉතිරි උත්තරය, ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී ලබා දෙනවාය කියන පණිවුඩයත් ලබා දෙමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් සිරිවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.44]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 20ක කාලයක් තිබුණා. වැඩකට නැති කථාවකට විනාඩි තුන හතරක් අපරාදේ අපතේ යැව්වා මේ සභාවේ. ඇත්තටම මට විනාඩි 20ම ගන්න පුළුවන් නම් හොඳයි කියලා හිතෙනවා, වැඩකට නැති කථාවකට ඔච්චර වෙලාවක් දුන්නු නිසා.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඇත්තෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත වන කෙනෙකු විධියටත්, නිදහස් අධ්‍යාපනය උපරිමයෙන්ම භුක්ති විඳපු, අපේ ජීවිත ගොඩ නහා ගැනීම උදෙසා නිදහස් අධ්‍යාපනය භාවිත කරපු කෙනෙකු විධියටත් අද දවසේ මේ සභාව ආමන්ත්‍රණය කරන්න ලැබීම ම මා ලද භාග්‍යයක් විධියට සලකනවා. ඒ වාගේම නිදහස් අධ්‍යාපනය, එහෙමත් නැත්නම් අධ්‍යාපනයට තිබෙන නිදහස මේ රටේ තව තවත්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම අධ්‍යාපනය කියන ක්‍රියාවලිය ගත්තාම, මොකක්ද මේ අධ්‍යාපනය කියන්නේ? නවීන ලෝකයට ගැළපෙන මිනිසුන් නිර්මාණය කිරීමත්, අනාගත ලෝකය තුළ ජීවත් වෙන්න මිනිස්සුන්ට හැකියාව හදන එකත් තමයි අධ්‍යාපනය කියන්නේ. රැකියාව වෙන්න පුළුවන්, ජීවත් වෙන විධිය වෙන්න පුළුවන්, ජීවන වට පිටාව හදාගන්න විධිය වෙන්න පුළුවන්, මේ සියල්ල තීරණය කරන්නේ අධ්‍යාපනය විසින්. නමුත්, මේ රටේ අධ්‍යාපනය විසින් මේ අපේක්ෂා සියල්ල ඉෂ්ට කළාද කියන බරපතළ ප්‍රශ්නය තමයි මේ රට ඉදිරියේ නිර්මාණය වෙලා තිබෙන්නේ. ඇත්තෙන්ම මෙන්න මේ මානෘකාව තමයි මේ රට ඇතුළේ නිර්මාණය කර ගත යුතු මානෘකාව වෙන්න ඕනෑ. ඇයි මම එහෙම කියන්නේ? මේ රටේ මිනිස්සුන්ට මේ රට දියුණු රටක් බවට පත් කරගන්නට අවශ්‍ය නම්, අනිවාර්යයෙන්ම හැම කෙනෙකුටම ඒකට සුදුසු අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑ. අධ්‍යාපනය කියන එකෙන් අදහස් කරන්නේ, විශ්වවිද්‍යාල අධ්‍යාපනයවත් එහෙම නැත්නම් පෙළපොත්වල අධ්‍යාපනයවත් නොවෙයි. කොහොමද මේ රට ඇතුළේ ඉදිරි දශකයක, දශක දෙකක හෝ දශක තුනක කාල සීමාව තුළ මිනිසුන් ජීවත් වන්නේ කියන කාරණය තීරණය වන්නේ වර්තමානයේ ලබා දෙන අධ්‍යාපනය අනුව. රටක් විධියට අපි පසුගිය කාල සීමාවේදී බොහෝ දුෂ්කරතා සහ බොහෝ මහ හැරීම්වලට ලක් වුණා. අපට ගිලිහුණු යුග ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම ලෝකය ඉදිරියට යන අතරවාරයේදී කෘෂි කාර්මික යුගය රටක් විධියට අපට අහිමි වුණා. අපට බැරි වුණා, රටක් විධියට කෘෂි කාර්මික යුගයට එකතු වෙන්න. කාර්මික යුගය ආවා. කාර්මික යුගයේදී අපට බැරි වුණා රටක් විධියට එකතු වෙන්න. මෙවා තමයි අපේ රටේ ප්‍රශ්න. ඊට පස්සේ තොරතුරු තාක්ෂණ යුගය ආවා. අපට රටක් විධියටත්, රටේ පුරවැසියන් විධියටත් ඒකේ එල්ලෙන්න බැරි වුණා. අනාගත ලෝකයේ එන්න තිබෙන නවීන අධ්‍යාපනික ක්‍රමවේද, සමහරවිට AI වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඉන් ඉදිරියට එන අධ්‍යාපන ක්‍රමවේද වෙන්න පුළුවන්. මෙන්න මේ අධ්‍යාපන ක්‍රමවේද එක්ක කොහොමද රටක් විධියටත්, රටේ පුරවැසියන් විධියටත් අපි එකතු වන්නේ කියන කාරණාව තමයි ගරු සභාවේ සාකච්ඡාවට ගත යුත්තේ.

කෘෂි කාර්මික යුගයේ අවසානයේ අපි යන්තම් එල්ලුණා. මොකක්ද හේතුව? එකට අවශ්‍ය කරන ප්‍රාග්ධනය තිබුණේ නැහැ. ඒකට අවශ්‍ය කරන තාක්ෂණය රට ඇතුළට ආවේ නැහැ. ඒකට අවශ්‍ය කරන මානව සම්පත දියුණු කර ගන්න බැරි වුණා. කාර්මික යුගය අපට ගිලිහුණා. ඒකට හේතුවත් අර කාරණා ටිකම තමයි. අපි මේ පසුකරමින් යන්නේ තොරතුරු තාක්ෂණ යුගය. හැබැයි, තොරතුරු තාක්ෂණ යුගයටත් අපට අවශ්‍ය විධියට එකතු වන්න බැරි වෙනවා. මොකද, සමීප අන්තර්ජාල පහසුකම්, ලාභදායී මිලට ලැබෙන බලශක්තිය, මේ කිසිවක් නොමැතිව තොරතුරු තාක්ෂණ යුගයත් අපි අතින් ගිලිහෙමින් පවතිනවා. එහෙම නම් ගරු සභාවේ සාකච්ඡාවට ගත යුත්තේ, ගිලිහුණු යුගවලටත් වඩා අනාගත ලෝකයේ, අනාගත යුග තුළට අපි කොහොමද අපේ රටේ දරු දැරියන් රැගෙන යන්නේ කියන කාරණාවයි. එහෙම නම් කොහේද මේ ප්‍රශ්නය තිබෙන්නේ? මේ ප්‍රශ්නය තිබෙන්නේ ආර්ථිකය හසුරවන ස්ථානය මතයි. ආර්ථිකයේ කවර ප්‍රමාණයක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන්න පුළුවන්ද කියන කාරණය මතයි. අධ්‍යාපනයට කවර ප්‍රතිශතයක් සහ ඒ ප්‍රතිශතය ඇතුළේ කවර මුදල් ප්‍රමාණයක් මේ අධ්‍යාපනයට ආයෝජනය කරන්න පුළුවන්ද කියන එක තමයි ප්‍රශ්නය. ඒ වෙන් කරන මුදල් ප්‍රමාණය අනුව තමයි මේ රටට අනාගත ඵලදායී ප්‍රතිපත්ති, අනාගත ඵලදායී ක්‍රියාවලියක් ලැබෙන්නේ. එහෙම නම් කොහේද මේක වැරදිච්ච තැන? කොහේද ලංකාවේ අධ්‍යාපනයට හරි ගිය තැන? හැම වෙලාවකම මම කියනවා වාගේ, මේ රටේ අධ්‍යාපනයේ විප්ලවීය වෙනස්කම් කළේ හැමදාම දක්ෂිණාංශික ආණ්ඩු. ආයේ ඒකේ හංගන්න දෙයක් නැහැ. මේ රටේ අන්තර්ජාලය භාවිත කරන ඕනෑම කෙනෙකුට එය හොයලා බලන්න පුළුවන්. මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් පාසල් යන ළමයෙක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් තරුණ පරපුරට තමන්ගේ දුරකථනයෙන් බලන්න පුළුවන් කවුද මේ රටේ අධ්‍යාපන විප්ලව සිදු කළේ කියලා.

පළමුවැනි අධ්‍යාපන විප්ලවය තමයි, මේ රටේ ඇති වෙච්ච නිදහස් අධ්‍යාපනය. නිදහස් අධ්‍යාපන විප්ලවයත් එක්ක මධ්‍ය මහා විද්‍යාල මේ රටේ නිර්මාණය කළේ දක්ෂිණාංශික ආණ්ඩු. ඒ මධ්‍ය මහා විද්‍යාලවලින් නිර්මාණය වෙච්ච මිනිස්සු අපි. ඒ මධ්‍ය මහා විද්‍යාලවල පෝෂණය ලබලා මේ විධියට ගරු සභාවට ඇවිල්ලා කථා කරන පුළුවන් වුණේ වෙයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය වාගේ, ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළේ අලුත් සංකල්පයක් ඔස්සේ මධ්‍ය මහා විද්‍යාලය නිර්මාණය වෙච්ච නිසා. එතැනින් ඉස්සරහට ගියාට පස්සේ, මේ රටට පෙළ පොත් ටික නොමිලේ ලබා දුන්නේ දක්ෂිණාංශික ආණ්ඩු. එතැනින් ඉස්සරහට ගියාට පස්සේ පාසල් නිල ඇඳුම් ටික ලබා දුන්නේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා. ඒත් දක්ෂිණාංශික ආණ්ඩු. එතැනින් ඉදිරියට ගියාට පස්සේ 2015 තමයි "සුරක්ෂා" සිසු රක්ෂණ ක්‍රමය හඳුන්වා දුන්නේ. මේ සියල්ල ලබා දුන්නේ දක්ෂිණාංශික ආණ්ඩු. හැමදාම වාමවාදී ආණ්ඩු කළේ, අතීතයට දෝෂාරෝපණය කරන එකයි, මොනවා හෝ සුබසාධනයක් ගැන කථා කරමින් කාලය මිඩංගු කරන එකයි විතරයි. නමුත්, සාමාන්‍ය පවුල්වල මිනිසුන් සැබෑවටම මේ රටේ ආර්ථිකයේ කොටස්කරුවන් බවට පත් කරන්නට, අධ්‍යාපනය තුළින් ලෝකය දිනන තත්ත්වයට ගෙන එන්නට මේ රටේ දක්ෂිණාංශික ආණ්ඩු සහ දක්ෂිණාංශික දේශපාලන ව්‍යාපාර පමණයි කටයුතු කළේ.

මම දැක්කා අද උදේ නියෝජ්‍ය ඇමතිවරයෙක් විපක්ෂ නායකවරයාගේ "සක්වල" වැඩසටහන පිළිබඳව ඉතාම කුහක අදහසින් මොනවාදෝ, මොනවාදෝ ටිකක් කියනවා. මේ රටේ පළමු වතාවට විපක්ෂ නායකවරයෙක් තමන්ගේ පක්ෂයේ අරමුදල භාවිත කරලා මේ රටට "සක්වල" කියලා වැඩසටහනක් නිර්මාණය කළා. ඒ වාගේම "හුස්ම" කියලා වැඩසටහනක් නිර්මාණය කළා. පාසල්වලට බස් රථ ලබා දුන්නා. ඒ වෙනුවෙන් ලක්ෂ 16,000ක් වැය කළා. මම හැමදාම කියනවා, දේශපාලන

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ව්‍යාපාරයක් ලෙස මේ වෙලාවේ අපි මේ පැත්තේ වාඩි වෙන්න බලපාපු ප්‍රධාන හේතුව ඒක බව. පක්ෂ අරමුදල දේශපාලන ක්‍රියාකාරකම්වලට භාවිත කරපු දේශපාලන ව්‍යාපාරය අද ආණ්ඩුවේ ඉඳගෙන. පක්ෂ අරමුදලේ සල්ලි ළමයින්ගේ අධ්‍යාපනයට භාවිත කළ, විශේෂයෙන් අනාගත ලෝකය දිනා ගැනීම උදෙසා කවදාවත් පරිගණකයක් පරිහරණය නොකළ, smart board එකක් ස්පර්ශ නොකළ දරු දැරියන්ගේ අධ්‍යාපනයට පක්ෂ අරමුදල භාවිත කළ එකම විපක්ෂ නායකවරයා සජිත් ප්‍රේමදාස මැතිතුමා විතරයි. මේ ඉතිහාසය තුළ කිසිදු විපක්ෂ කණ්ඩායමකට බැරි වුණා ඒ ජාතියේ විප්ලවීය තීරණයක් ගන්න.

ඒකෙන් එතුමා පෙන්නුම් කළේ කුමක්ද? අනාගත රාජ්‍යයක, අනාගත රජයක අපි කොයි තරම් තොරතුරු තාක්ෂණය වෙනුවෙන් පෙනී සිටිනවාද කියන එකයි එ් තුළින් පෙන්නුම් කළේ. රටේ ජනතාව ඒ පිළිබඳව විශ්වාසයක් තැබුවේ නැහැ. අපට ඒකේ ප්‍රශ්නයක් නැහැ. අපි ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරනවා. හැබැයි, මේ රටේ කුහක මිනිසුන්ගේ කථා අසමින්, මේ රටේ දේශපාලනය කරන්න අපට සිද්ධ වුණේ, වැදගත්භාවයකින් යුක්ත අධ්‍යාපනය වෙනුවෙන් අපේ පක්ෂ අරමුදලින් සල්ලි වෙන් කිරීම නිසායි. ඒවා ආණ්ඩුවේ මුදල් නොවෙයි; මහ ජනතාගේ බදු මුදල් ද නොවෙයි. අපේ පක්ෂ අරමුදලේ සල්ලි එම වැඩසටහන් වෙනුවෙන් වෙන් කිරීම නිසා අපේ මැතිවරණ ව්‍යාපාරවලට මුදල් අවශ්‍ය කරන අවස්ථාවේදී මුදල් සොයා ගන්න අපට නොහැකි වුණා.

එයත් අප මේ තත්ත්වයට පත් වෙන්න එක් හේතුවක් වුණා. මැතිවරණ පරාජයට පවා හේතුවක් වන නමුත් මේ රටේ රෝගී ජනතාවගේ සෞඛ්‍ය උන්නතිය වෙනුවෙන් මුදල් වෙන් කරපු විපක්ෂ නායකවරයෙක්, එතුමා. නමුත් ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයෙක් කියනවා මම දැක්කා, ඒවා කළේ ඡන්දය ඉලක්ක කරගෙනයි කියලා. 2021දීයි "සක්වල" වැඩසටහන ආරම්භ කළේ. ඒ කාලයේ කොහේද ඡන්දයක් තිබුණේ? හරි නම් එතුමා නියෝජ්‍ය ඇමතිවරයෙකු විධියට, ආණ්ඩුව විධියට විපක්ෂ නායකතුමාට -විපක්ෂ නායකවරයා විධියට බැරි නම් අඩුම තරමින් සාමාන්‍ය පුද්ගලයකු ලෙස සලකා හෝ- ස්තුති කළ යුතුයි, යහපත් සිතිවිල්ලකට අනුව ඒ ජාතියේ වැඩසටහනක් නිර්මාණය කිරීම ගැන. නමුත්, කුහකකම ඊට වඩා ඉස්සරහින් තිබෙන බව අදත් මේ සභාවේ දකින්න ලැබුණා. ඒ නියෝජ්‍ය ඇමතිවරයා ඇහුවා, "කෝ, දැන් සක්වල?" කියලා. එක පැත්තකින් ගරු අගමැතිතුමිය, අධ්‍යාපන ඇමතිවරිය විධියට කියනවා, පාසලට දේශපාලකයන් ගෙන්වන්න එපා කියලා. දේශපාලකයන්ගේ උදවු ගන්න එපා කියලා, කාගේවත් උදවු අවශ්‍ය නැහැ කියලා සෞඛ්‍ය ඇමතිවරයාත් කියනවා. හැබැයි, ඒ සියල්ල කියන අතරවාරයේ මෙතැනට ඇවිල්ලා නියෝජ්‍ය ඇමතිවරයෙක් සමිවිවලයට අහනවා, "කෝ දැන් ඒවා?" කියලා. ඉස්සර වෙලා කට්ටිය කථා වෙලා නාට්‍යය රඟ දැක්වුවා නම් හොඳයි. එක එක නළුවෝ සහ එක එක නිළියෝ එක එක වෙලාවට එක එක දෙබස් කියන්නේ නැතුව, එක පිළිවෙළකට ඔය ටික කිව්වා නම් හොඳයි කියලා අපි හිතනවා. හැබැයි මම නැවත කියනවා, ආණ්ඩුවක් ලෙස අනාගත ලෝකය දිනා බලලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුයි කියා. අපි දක්ෂිණාංශික ව්‍යාපාරයක් ලෙස එහෙම කරනකොට එදා මේ රටේ වාමජාතිකවාදීන් මොනවාද කළේ? 1956දී මේ රට විනාශ කළා; ඉංග්‍රීසි අධ්‍යාපනය නැති කළා; සිංහල භාෂාව පමණක් ඕනෑ කිව්වා. එතැන් පටන් මේ රටේ ඉංග්‍රීසි අධ්‍යාපනය බිඳ වැටුණා. ඒකේ අවසන් ප්‍රතිඵලය වුණේ, ලෝකයේ ලියැවුණු වැදගත් පොතක් කියවා ගන්න බැරි, අන්තර්ජාලයට යන්න බය මිනිස්සු බිහි වීමයි. අවුරුදු 50ක් විතර ගියාට පස්සේ, 2002 ආණ්ඩුව තමයි නැවත වතාවක් ඉංග්‍රීසි අධ්‍යාපනය පාසල්වලට ගෙන ආවේ. අන්න එහෙමයි, දක්ෂිණාංශික ආණ්ඩු ලෝකයත් එක්ක එකතු වෙලා දේශපාලනය කරන්නේ.

තමුන්නාන්සේලා හැමදාම "හොරකම, හොරකම, හොරකම" කිය කියා සිටියා මිස ලෝකයට ගැළපෙන ප්‍රතිපත්ති පිළිබඳව සොයා බැලීමක් කිසි දවසක කළේ නැහැ. අද පවා ඇවිල්ලා, අරකයි, මේකයි කියලා මේ විවාදය පුරාවටම කථා කරන්නේ, ගෙවපු දේවල්, දුන්නු දේවල් ගැනයි. හැබැයි, අනාගත ලෝකය හමුවේ අපේ රටේ ළමයි AI එක්ක ගනුදෙනු කරන්නේ කොහොමද? අද පෙර පාසලට යන ළමයා, අවුරුදු පහෙන් පාසලට ඇතුළත් වන ළමයා තමයි, තවත් අවුරුදු 20කින් රැකියා වෙළෙඳ පොළට එන්නේ. මේ ආණ්ඩුවේ ඉන්න අයට කියන්න පුළුවන්ද, 2045දී මොනවාද තිබෙන රැකියා, මොනවාද නැති වෙලා යන රැකියා, දැන් තිබෙන රැකියා කීයක් එදාට නැති වෙනවාද කියලා? අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කළ යුත්තේ, 2045 වර්ෂයේ රැකියා ඉලක්ක කරලායි. 2045 වර්ෂයෙන් පටන් ගන්න. 2075 පමණ වනතුරු රැකියා වෙළෙඳ පොළ ඉලක්ක කරලා තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරන්න ඕනෑ. එහෙම නැතුව විෂයන් සංඛ්‍යාව අඩු කිරීමවත්, විෂයක තිබෙන පාඩම් මාරු කිරීමවත්, එහෙමත් නැත්නම් මොනවා හරි වෙනත් විෂයක් ඒ තුළට ඇතුළු කිරීමවත් නොවෙයි කළ යුත්තේ. රැකියා වෙළෙඳ පොළ දිහා බලලා, ලෝකය යන වේගය දිහා බලලා, ලෝකයට ගැළපෙන මනුෂ්‍යයෙකු නිර්මාණය කරන්න තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු වෙන්න ඕනෑ. රැකියා වෙළෙඳ පොළ ඉලක්ක කර ගන්න ඕනෑ.

මම මේ කාරණයට තවත් කොටසක් එකතු කරන්න කැමැතියි. මේ රටේ අන්තර්ජාල පහසුකම් තිබෙන තරුණ තරුණියන් සියලුදෙනාත්, ඔබත්, 1982දී ඔබේ පක්ෂය කරපු විනාශය පිළිබඳව නැවත කියවීමකට යන්න ඕනෑ. ඔබ සියලුදෙනා අධ්‍යාපන ධවල පත්‍රිකාව කියවන්න. 1982දී අධ්‍යාපන ධවල පත්‍රිකාව ක්‍රියාත්මක වුණා නම්, අද මේ රට අධ්‍යාපනයේ විශාල පිම්මක් පනිනවා. මේ අධ්‍යාපන ධවල පත්‍රිකාව කියන්නේ මොකක්ද? අපේ පක්ෂය විසින් අධ්‍යාපනයට නිදහස ලබා දීමේ දෙවැනි පිම්ම තමයි ඒක. එදා නිදහස් අධ්‍යාපනය ලබා දුන්නා; ළමයින්ට නොමිලයේ ඉගෙන ගන්න ඉඩ දුන්නා. 1982දී තමයි දැවැන්ත විප්ලවයක් ආරම්භ කරන්න උත්සාහ කළේ, අධ්‍යාපනයට නිදහස දෙන්න, පෞද්ගලික අධ්‍යාපනයට ඉඩ දෙන්න, වෘත්තීය අධ්‍යාපනය පාසල් පද්ධතියට ගේන්න, පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඉඩ දෙන්න, ඊට අමතරව වෛද්‍ය විද්‍යාල පෞද්ගලික අංශයට ලබා දෙන්න. නිදහස් අධ්‍යාපනය බදු මුදලින් රැක ගන්නා ගමන්, දෙමාපියන්ගේ මුදල්වලින් තමන් කැමැති නම් තමන්ගේ දරුවන්ට උගන්වන්න පුළුවන් පරිසරයක් මේ රටේ හදන්න උත්සාහ කළේ 1982දීයි. මේ රටේ ඉන්න කිසියම් කෙනෙක්,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස් වේ.

ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.
அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.
Accordingly, Parliament resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දිනට නියමිත කටයුතු අවසන් වන තෙක් අවශ්‍ය කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී.-
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பட்டது.-
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee. -
[THE HON. SPEAKER in the Chair.]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා, කථාව කරගෙන යන්න.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ධවල පත්‍රිකාව නැවත කියවා බලන්න කියලා මේ රටේ මහ ජනතාවට මම යෝජනා කරනවා. අන්තර්ජාල පහසුකම් තිබෙනවා නම් ඒ ගැන සොයා බලන්න. 1982දී ධවල පත්‍රිකාව ක්‍රියාත්මක වුණා නම්, 2025දී මේ රටේ අධ්‍යාපනය තිබෙන්නේ කොතැනද කියලා හිතා බලන්න කියාත් මම යෝජනා කරනවා.

ඒ වාගේම, රජයටත් මම යෝජනාවක් කරන්න කැමැතියි. මේ මොහොත වනකල්ම රටේ ප්‍රශ්න, ප්‍රශ්න, ප්‍රශ්න පිළිබඳව මිසක්, උත්තර පිළිබඳව සාකච්ඡා නොකළ දේශපාලන ව්‍යාපාරයක් දැන් උත්තර සොයන්න ඇවිල්ලා ඉන්නවා. අද මේ රටේ පාසල් පද්ධතියේ දැවැන්ත අර්බුද ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා.

අද අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙන නිසා මම පාසල් පිළිබඳව පොඩි සොයා බැලීමක් කළා. මා නියෝජනය කරන මීරිගම ආසනයේ එක පාසලක් තිබෙනවා, තිළිණගම ප්‍රාථමික විද්‍යාලය කියලා. ඔබතුමන්ලාට ඉතා වැදගත් තොරතුරක් මේක. ඒ පාසලේ ඉන්නේ ළමයින් 54දෙනායි. ගුරුවරු 6දෙනෙක් ඉන්නවා. ඒකේ සම්පූර්ණ වැටුප් සහ වියදම්වලට යනවා, රුපියල් 540,000කට ආසන්න මුදලක්. ඒකේ තේරුම තමයි, එක ළමයෙකු වෙනුවෙන් රුපියල් 10,000ක් වියදම් කරනවා කියන එක.

ඊළඟට, මම ප්‍රාථමික අධ්‍යාපනය ලබපු බලබෝව කනිෂ්ඨ විද්‍යාලයෙන් මම විස්තර ඇහුවා. ඒ පාසලේ ළමයින් 200ක් ඉන්නවා. එහි මාසික වියදම රුපියල් ලක්ෂ 16යි. එක ළමයෙකු වෙනුවෙන් රුපියල් 8,000ක් වියදම් කරනවා. මා ඊළඟට අධ්‍යාපනය ලබපු වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලයේ තොරතුරුත් හොයලා බැලුවා. ඒ පාසලේ සම්පූර්ණ වියදම රුපියල් 13,000,000කට වඩා වැඩියි. හැබැයි ළමයෙකු වෙනුවෙන් වියදම් වෙන්නේ රුපියල් 4,000යි. ඔන්න, ප්‍රශ්නය පටන් ගන්න තැන. එක පාසලක ළමයෙකුට වැය වන මුදල රුපියල් 10,000යි; ඒ පාසලේ ළමයි 54යි. අනෙක් පාසලේ එක ළමයෙකුට මාසයකට රුපියල් 8,000යි; ඒ පාසලේ ළමයි 200යි. අනෙක් පාසලේ එක ළමයෙකුට මාසයකට රුපියල් 4,000යි. හැබැයි ඒ පාසලේ ළමයි 3,500යි. මෙන්න මෙතැන තමයි කථාව තිබෙන්නේ. අර කුඩා පාසල්වලට යන ළමයෙකුට ඒ පාසලේ අභිමානය නැහැ. ක්‍රීඩා උත්සවයක්, තරගයක් නැහැ. තමන්ගේ පාසල මේක කියලා කියන්න පුළුවන්කමක් නැහැ. ඒ පාසල් ඇතුළේ ඉන්න කවුරුවත් සතුටින් නොවෙයි ඉන්නේ. ගොඩනැඟිලිවල ප්‍රශ්න, සෙල්ලම් මිදුලේ ප්‍රශ්න ආදිය තමයි ඒ පාසල්වල තිබෙන ප්‍රශ්න. හැබැයි අර ප්‍රධාන පාසලක් ගත්තාම, ඒ පාසලේ ඉන්න ළමයින්ට අභිමානයක් තිබෙනවා. ඕනෑ තැනක බය නැතුව අපේ පාසල මේකයි කියලා කියනවා. විභාගවලින් සමත් වෙලා විශ්වවිද්‍යාලයට නොගියත්, ඒ අධ්‍යාපනය ලබා ගන්නා පරිසරය ඇතුළේ ඒ අය මේ රටට ගැළපෙන මිනිසුන් බවට පත් වෙනවා. එහෙම නම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිර්මාණය වෙන්න ඕනෑ ඔන්න ඔය කාරණාව පදනම් කර ගනිමින්. වැඩි මුදලක් වෙන් කළත්, ඒක අවසානයේ එය ඵලදායී මුදලක් බවට පත් වෙලා නැහැ. එහෙම නම් අප කළ යුත්තේ මේ මුදල් ප්‍රමාණය වඩා ඵලදායී ලෙස යොදා ගන්නේ කොහොමද කියන එක ගැන සාකච්ඡා කිරීමයි. එහෙම නැතුව වෙන වෙන විකාර කථා කරන්න නොවෙයි මේ සභාවේ කාලය වෙන් කරගත යුත්තේ.

ඊළඟ ප්‍රශ්නය පාසල් ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය. මේ ගරු සභාවේ ඒ පිළිබඳව කථා කළා. පාසල් ගුරුවරුන්ගේ වැටුප් තල පිළිබඳ අර්බුදයක් තිබෙනවා. ඒ අර්බුදය නිසා පාසල් පද්ධතියේ අධ්‍යාපන පද්ධතිය කඩා වැටෙමින් තිබෙනවා කියන එක ඔබ විශ්වාස කරනවාද දන්නේ නැහැ. විශේෂයෙන් පාසල්වල අපොස (උසස්පෙළ) විද්‍යා, ගණිත පන්තිවල මේ වෙද්දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව බොහෝ සෙයින් අඩු වෙමින් යනවා. මොකක්ද ඒකට හේතුව? ඒ පාසල්වල ප්‍රමාණවත් ගුරුවරු නැහැ. ඇයි, ගුරුවරුන් නොඑන්නේ? ඒ වැටුපට විද්‍යා විෂය ධාරාවලට -ජීව විද්‍යාව වෙන්න පුළුවන්, භෞතික විද්‍යාව වෙන්න පුළුවන් - ඊළඟට සංයුක්ත ගණිතය වෙන්න පුළුවන්, ගුරුවරු එන්නේ නැහැ. ඒකට හේතුව, එළියේ ඊට වඩා වැඩි වැටුපක් ලබා ගන්න පුළුවන් රැකියා තිබෙනවා. ඒ නිසා විද්‍යා විෂය ධාරාවන්ගෙන් යුක්ත පාසල් පද්ධතියක් මේක ඇතුළේ අලුත් විප්ලවයක් ඇසුරින් නිර්මාණය නොකළොත්, ඒ ගුරුවරුන් ආකර්ෂණය කරගන්න පුළුවන් වැටුප් තල වෙත ඒ අයව ගෙන නොගියොත් පාසල් අධ්‍යාපනයේ "විද්‍යා අංශය" කියන කොටස බිඳ වැටෙනවා. ඒ බිඳ වැටෙන අධ්‍යාපනය ගොඩ නහන්නේ අප වාගේ පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළිලා ඉන්න අය. පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න ගුරුවරුන් අතරත් විවිධ අදහස් තිබෙන අය ඉන්නවා.

මේ දවස්වල විශේෂ සාකච්ඡාවක් යනවා, ඔබේ දේශපාලන ව්‍යාපාරය වෙනුවෙන් ඉදිරිපත් වෙච්ච පුද්ගලයෙකු තමන්ගේ ආචාර්ය උපාධිය විධියට හොර ආචාර්ය උපාධියක් දාගෙන ඔබේ දේශපාලන වේදිකාවල කථා කළා කියා. ඔබේ දේශපාලන ව්‍යාපාරය වෙනුවෙන් පළමුවැනි වතාවට මේ රටේ අධ්‍යාපනය හොරකම් කළා, අධ්‍යාපන සහතික හොරකම් කළා. ඒ නිසා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මම විශේෂ ඉල්ලීමක් කරනවා, ආචාර්ය උපාධි හොරට ගන්න එක නවත්වන්න කියලා. සෑම ආකාරයකින්ම ආචාර්ය උපාධි අධ්‍යාපනික නොවන විධියට ගන්න එක නවත්වන එක ඔබතුමියගේ වගකීමක්. හේතුව, මා විශ්වාස කරන විධියට ඔබතුමිය පෞද්ගලික අධ්‍යාපනය තුළින් ආචාර්ය උපාධිය දක්වා ගිය, ඉගෙන ගත්ත කෙනෙක්. එහෙම නම් පෞද්ගලික අධ්‍යාපනයේ වැදගත්කමත් ඔබතුමිය දන්නවා. ආචාර්ය උපාධියක් ලබා ගන්න ගත යුතු මහන්සියත් ඔබතුමිය දන්නවා. මේ රට අතුළේ අන්න ඒ මහන්සි වෙලා උපාධිය ගන්න අයගේ අධ්‍යාපන සහතිකවලට වටිනාකමක් ලබා දීමේ වගකීම ඔබතුමිය සතුව පවතිනවා.

ඒ වාගේම තමයි, උසස් අධ්‍යාපනය. උසස් අධ්‍යාපනයේ බරපතළ අර්බුද ගණනාවක් තිබෙනවා. විශේෂයෙන් නවීන ලෝකයට ගැළපෙන උසස් අධ්‍යාපන ආයතන අපේ රටේ නැහැ. පෞද්ගලික අධ්‍යාපන ආයතන වේගයෙන් ඉස්සරහට ඇවිත් තිබෙනවා. සමහර විට වාමවාදී පක්ෂයක් නිසා ඔබේ පක්ෂයේ කවුරුත් විශ්වාස කරන එකක් නැහැ, රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් එළියට එන අයට වඩා පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් එළියට එන අයට දැන් රැකියා වෙළෙඳ පොළේ තිබෙන පිළිගැනීම එන්න එන්න වැඩි වෙනවා. ඒකට හේතුව, ඒ අයට අධ්‍යාපන හැකියාව නොමැති වීම නොව, ඒ අයගේ විෂය නිර්දේශ නව ලෝකයට

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ගැළපෙන විධියට යාවත්කාලීන වෙලා නැති එක. මෙන්න මේ පිළිබඳව ඔබේ අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම දේශපාලන ව්‍යාපාරයක් ලෙස ඔබ අධ්‍යාපනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරනවා කිව්වා. ඒ වෙනුවෙන් සටන් කරපු පුරෝගාමී කාන්තාවක් තමයි මේ රටේ අගමැතිතුමිය ලෙස ඉන්නේ. නමුත්, මේ අය වැයෙන් එහෙම එකක් අපි දැක්කේ නැහැ. එහෙම නම් ඔබේ වගකීම තමයි, මේ අවුරුදු 5 ඇතුළේ ඒ කියපු සියයට 6 වෙන් කරන්නේ කොහොමද කියන කාරණාව පිළිබඳ මේ රටට පැහැදිලි කරන එක.

ඊළඟ කාරණාව මේකයි. පෞද්ගලික විශ්වවිද්‍යාලවලට පුළුවන් තරම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගන්න අපි උදව් කරන්න ඕනෑ. ආණ්ඩුවක් විධියට ඔබ තමයි මේ මොහොතේ රට පාලනය කරන්නේ. බය නැතුව පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යන්න ළමයින්ට loans දෙන්න. අවුරුදු 5කින්, 6කින් ඒවා ගෙවන්න ඒ අය සූදානම්. අපි, 2029දී ඔබ නිර්මාණය කරන පොහොසත් රටේ දේශපාලනය කරන්න බලාපොරොත්තු වන, ආණ්ඩු බලය ලබා ගන්න බලාපොරොත්තු වන දේශපාලන ව්‍යාපාරයක්. අවුරුදු 5කින් ණය ගෙවන පොරොන්දුව පිට බය නැතුව උසස්පෙළ ළමයින්ට විශ්වවිද්‍යාලවලට යන්න -තොරතුරු තාක්ෂණය හදාරන්න වෙන්න පුළුවන්, වෛද්‍ය විද්‍යාව හදාරන්න වෙන්න පුළුවන්, ඉංජිනේරු විද්‍යාව හදාරන්න වෙන්න පුළුවන්- ඉඩ දෙන්න. ඒ අය රැකියාවලට ගියාට පස්සේ ණය ආපසු ලබා ගැනීමේ වගකීම අපි 2029න් පස්සේ ආණ්ඩුවක් ලෙස ගන්න සූදානම් කියන එකත් මම කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මම තව විනාඩියක් ගන්නවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම විශ්වවිද්‍යාල පිළිබඳ ප්‍රශ්නයක් මම දකිනවා. විශ්වවිද්‍යාල ආචාර්යවරු කිව්වා මේ වෙලාවේ මේ පිළිබඳව දැනුවත් කරන්න කියලා. විද්‍යාපීඨ විශ්වවිද්‍යාල බවට පත් කරන බව ඔබතුමන්ලා කිව්වා. නමුත් මේ අය වැයෙන් ඒකට මුදල් වෙන් වෙලා නැහැ. ඒ වාගේම දැන් විශ්වවිද්‍යාලවල පර්යේෂණ දීමනාව අඩු කරලා තිබෙනවා, අධ්‍යයන දීමනා අඩු කරලා තිබෙනවා, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැටුප් සහ දීමනා සියයට 29කින් කප්පාදුවකට ලක් කරලා තිබෙනවා. මේ කාරණාවලට පැහැදිලි හේතුවක් විශ්වවිද්‍යාලවලට හොයා ගන්න බැරුව තිබෙනවා. විශ්වවිද්‍යාල පද්ධතිය තව තවත් කාර්යක්ෂම කරමින් නවීන ලෝකයට ගැළපෙන තත්ත්වයට පත් කර ගන්නට ඕනෑකම තිබෙනවා යැයි කියන අතරතුර, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලවල, විද්‍යාපීඨවල ප්‍රශ්න විසඳීම වෙනුවට, ඒ ප්‍රශ්න තව තවත් තීව්‍ර කරමින් කුමන ආකාරයකින්ද මේ රට නවීන අධ්‍යාපනයෙන් යුත් රටක් බවට පත් කර ගන්නේ කියන කාරණාව අසමින්ම, මම තව එක යෝජනාවක් කරන්න කැමැතියි. ඔබතුමන්ලා ලෑස්ති නම් අලුත් පියවරක් තබන්න, මේ රට ආසියාවේ අධ්‍යාපනික කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්න. අපි වාගේ දුප්පත් මිනිස්සුන්ට, අපි වාගේ සාමාන්‍ය පවුල්වල මිනිස්සුන්ට අධ්‍යාපනය නිදහසේ ගන්න පුළුවන්කම තිබෙද්දී, ලෝකයේ අනික් රටවල අයට අධ්‍යාපනය විකුණමින්, ඒ මුදල්වලින් අධ්‍යාපනය පෝෂණය කරන්න තරම් විශ්වාසනීය ඉදිරි පියවරක් තබන්න කියා මම ඔබතුමන්ලාට කියනවා. අධ්‍යාපනය ලෝකයට විකුණුම් භාණ්ඩයක් කරමින් ඒකේ ප්‍රතිලාභ මේ රටේ මිනිස්සුන්ට ලබා ගන්න පුළුවන් විධියට විප්ලවීය පියවරක් තබන්නට ඔබතුමන්ලාට ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, ඊට ඔබතුමන්ලා එකඟ කර ගන්න උත්සාහ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Prime Minister. You have 15 minutes.

[අ.භා. 6.03]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

පළමුවෙන්ම ගරු සභාපතිතුමනි, මම ස්තුතිය පුද කරන්න කැමැතියි, අද මේ විවාදයට සූදානම් වෙන්නත්, මේ කරුණු ඉදිරිපත් කරන්නත්, අපි මේ උත්සාහ කරන අධ්‍යාපනය තුළ පරිවර්තනීය වෙනස ඇති කරන්නට අමාත්‍යාංශය තුළ දිවා රෑ නොබලා, නිවාඩු දින, වැඩ කරන දින කියන හේදයකින් තොරව වැඩ කරන අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීන්ට. මේ කාර්යය වෙනුවෙන් ඔවුන් කරන කැපවීමට සහ ඔවුන් කරන සේවයට ස්තුතිය පුද කරනවා.

ගරු සභාපතිතුමනි, අපි කණ්ඩායමක්. අපේ ආණ්ඩුව කණ්ඩායමක්. නමුත් විපක්ෂයේ සමහර අයට ඒක තේරුම් ගන්න බැරි දෙයක්. අපි විෂයයන් හැටියට වගකීම් බෙදා ගෙන තිබුණාට, අපේ අරමුණ එකයි. අපි යන්න හදන, අපි හදන්න යෝජනා කරලා තිබෙන රට හදන්නට අපි වගකීම් බෙදා ගෙන තිබෙනවා. අපේ අරමුණ එකක් නිසා අපි එකිනෙකා එක්ක ඉතාම සහයෝගයෙන් තමයි වැඩ කරන්නේ. එතකොට, මම අධ්‍යාපන ඇමති වුණාට, අපේ ඉතුරු ඇමතිවරුන්ගෙන්වත්, නියෝජ්‍ය ඇමතිවරුන්ගෙන්වත්, අපේ මන්ත්‍රී කණ්ඩායමෙන්වත් උදව් ගන්න බැරි හේතුවක් මට නැහැ. මට ඒ අයගේ සහයෝගයක් නැතිවෙන්න හේතුවක් නැහැ. අපි කණ්ඩායමක් හැටියට වැඩ කරන්නේ. අපි සාමූහික ගමනක් යන්නේ. ඉතින් ඒ සහයෝගයට සහ ඒ සාමූහිකත්වයටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, ඉතාම වගකීම් සහිත අමාත්‍යාංශයක පරිවර්තනීය වෙනසක් කරන්න උත්සාහ කරන මොහොතක, ඒ සාමූහික කණ්ඩායම් හැඟීම තුළ එකිනෙකා මත තබලා තිබෙන විශ්වාසයත්, එකිනෙකාගෙන් ලැබෙන ඒ සහයෝගයත් නිසා තමයි, අපි කියන දේ, අපි ලියපු දේ, අපි කියපු දේ, අපි සටන් කරපු දේ යථාර්ථයක් බවට පත් කර ගන්න පුළුවන් වන්නේ කියන ඒ දැඩි විශ්වාසය අපට එන්නේ. ඒ නිසා මම ඒ සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, අපි ඉතාම සැලසුම්සහගතව මේ ගමන යන්නේ. අපට අරමුණක් තිබෙනවා. අපට යන්න ඕනෑ තැන ඉතාම පැහැදිලියි. ඒ නිසා කලබලයක් නැතුව, ඉතාම සැලසුම්සහගතව, විශ්වාසයෙන් යුතුව ඒ ගමන අපි යනවා. මේ

ගමන අපට යන්න ගොඩක් ලේසි වෙනවා සභාපතිතුමනි, අපට බින්දුවේ ඉඳන් පටන්ගන්න පුළුවන් වුණා නම්. අපට අවුරුදු 76ක කාලය මකලා දාලා බින්දුවෙන් පටන් ගන්න පුළුවන් වුණා නම්, මේ ගමන යන්න හරිම ලේසියි. නමුත් අපෙට එහෙම කරන්න බැහැ. අපි මේ ගමන යන අතර, අපට මහ කුණු ගොඩකුත් ශුද්ධ කරමින් තමයි යන්න වෙලා තිබෙන්නේ. අවසන් නොකරපු ව්‍යාපෘති, අත්හැරපු දේවල්, දූෂණ, වංචා, විනාශ කරපු ආයතන යනාදී මේ සියල්ලමත් හදමින් තමයි අපි මේ ගමන යන්නේ. ඒ නිසා තමයි අපට මේක අභියෝගාත්මක. හැබැයි, අපි ඒ අභියෝගය භාර අරගෙන තිබෙන්නේ. ඒ නිසා අපි යන්න ඕනෑ තැනට යන අතර, පවතින ප්‍රශ්නත් විසඳාගනිමින් තමයි අපි ඒ ගමන යන්නේ. ගරු සභාපතිතුමනි, විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු නිකම් ඔහේ කියනවාට වඩා කරුණු සහගතව, දත්ත සහිතව කරුණු ඉදිරිපත් කළා. ඒ පිළිබඳව මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඒ අදහස්වලට අපි ගරු කරනවා. ඒ අදහස් අපි ඉතාම සාධනීයව භාර ගන්නවා. විශේෂයෙන්ම තමන්ගේ දිස්ත්‍රික්කවල පැනනැඟී ඇති, දිස්ත්‍රික්කවලට සුවිශේෂී වූ ප්‍රශ්න ඉදිරිපත් කිරීම පිළිබඳව අපි ඉතා ස්තුතිවන්ත වෙනවා. නමුත් අවාසනාවකට මන්ත්‍රීවරු කිහිපදෙනෙක් සිටියා, එක්කෝ හරියට දන්නේ නැතුව, එහෙම නැත්නම් වරද්දලා තොරතුරු ඉදිරිපත් කළ. එවැනි තොරතුරු තිබෙන නිසා මම ඒවා නිවැරදි කරන්නත් මේ කාලය යොදා ගන්නවා.

අවාසනාවට, මට පටන් ගන්න වෙන්නේ ගරු විපක්ෂ නායකතුමාගෙන්. එතුමා කිව්වා, අපේ අය වැයෙන් අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙන්නේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 0.84ක් කියලා. ඒ figure එක සම්පූර්ණයෙන්ම වැරැදියි. අපි දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා සියයට 1.9ක් වෙන් කරලා තිබෙනවා, මේ වසරේ ඉදිරි මාස 8ට. ඒක සියයට 6 දක්වා වැඩි කිරීම තමයි අපේ ඉලක්කය. ගරු සභාපතිතුමනි, අපි ඒ ඉලක්කය වෙත ක්‍රමානුකූලව යනවා. හැබැයි අපි දන්නවා, ඒක දවසින් දෙකෙන් කරන්න පුළුවන් දෙයකුත් නොවෙයි කියලා. මොකද, අධ්‍යාපන පද්ධතියේ ධාරිතාව වැඩි කරමින් තමයි අපට ඒ සඳහා යොදන මුදලත් වැඩි කරන්න වෙන්නේ. ඒ අරගළයේ හිටපු අපිත් කොතැනකදීවත් කිව්වේ නැහැ, එන අවුරුද්දේ ඉඳලා සියයට 6ක් වෙන් කරන්න කියලා. ක්‍රමානුකූලව සියයට 6 කියන ඒ target එකට යන්න, ඒ standard එක තියාගන්න කියලා තමයි අපි අරගළ කළේ. ඉතින් ඒක අපි හොඳින් තේරුම් අරගෙන ඒ අරමුණ කරා යනවා. ඒ ගැන කිසිම සැකයක් තියාගන්න එපා.

ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ අපි රජයක් හැටියට මුළු රාජ්‍ය සේවකයන්ටම මූලික වැටුප් වැඩි කිරීමක් කළා. ඒක එක් එක් ක්ෂේත්‍රවල තිබෙන සුවිශේෂී ප්‍රශ්න පිළිබඳව විතරක් හිතලා නොවෙයි, සමස්ත රාජ්‍ය සේවයටම කරපු වැටුප් වැඩි වීමක්. නමුත් එක් එක් වෘත්තියට අදාළව තවමත් නොවිසඳුණු කාරණා බොහොමයකුත් තිබෙනවා. ඒක අපි දන්නවා. මේ වැටුප් වැඩි කිරීමෙන් ඒ සියලු ප්‍රශ්න විසඳනවා කියලා අපි කොතැනකවත් කියලා නැහැ. නමුත්, අපට අවශ්‍ය වුණා මේ සියලුදෙනාගේම මූලික වැටුප වැඩි කරන්න. ඒ වැඩි කිරීම තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවය කරන සියලුදෙනා ඇතුළු රජයේ සියලු සේවකයන්ට අප්‍රේල් මාසයේ සිට ඉතාම හොඳ, සෑහීමකට පත් වෙන්න පුළුවන් වැටුප් වර්ධනයක් සිද්ධ වෙනවා. මේකද, අපි ලබා දෙන අවසාන විසඳුම? නැහැ. අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය සහ විශ්වවිද්‍යාල පද්ධතිය වෙන්ත රටවල් එක්ක සංසන්දය කරලා කියන්න පුළුවන්ද, අපි දැන් එතැන ඉන්නවා කියලා? එහෙම කියන්න බැහැ. නමුත් අපේ රට අද තිබෙන තත්ත්වය තුළ රාජ්‍ය සේවයේ සියලුදෙනාටම සාධාරණයක් ඉෂ්ට වන වැටුප් වර්ධනයක් අපි කරලා තිබෙනවා.

ඒ අතරතුරම අධ්‍යාපනයේ ගුණාත්මකභාවයත්, අධ්‍යාපන සේවයේ ගුණාත්මකභාවයත් වැඩි කරන්න අපි විශාල මැදිහත් වීමක් කරනවා. ඒ පිළිබඳව තමයි ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කථා කළේ. අපි Education Council එකක් හරහාත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මැදිහත් වීම හරහාත් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කරන ගමන්, අපේ රටේ ආර්ථිකයත් දියුණු වෙනකොට අපට අවශ්‍ය තැනට ක්‍රමානුකූලව එන්න පුළුවන්. අපි කොතැනකවත් කියලා නැහැ, මේ වැටුප් වැඩි කිරීම හරහා සියලු ප්‍රශ්න විසඳලා මෙතැනින් ඉවර කරනවා කියලා. කිසිසේත්ම එහෙම කියලා නැහැ. එම නිසා මේක ඒ විධියට භාර ගන්න කියලා මම කියනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම උපකුලපතිවරු පත් කරන විධිය ගැන මෙතැන කථා වුණා. මීට පෙර උපකුලපතිවරු පත් කරපු හැටි අපි හොඳින් දන්නවා. ඇත්ත වශයෙන්ම මම මේ වෙලාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට - UGC එකට - ස්තුතිවන්ත වෙනවා, විද්‍යාත්මක පදනමක ඉඳගෙන යම් කිසි විශ්ලේෂණයක් එක්ක ගරු ජනාධිපතිතුමාට ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කරන්න පටන් අරගෙන තිබෙන එක ගැන. තැපැල් කන්තෝරුවකින් කරනවා වාගේ Council එකෙන් එන නම් ටික නිකම් ඔහේ ජනාධිපතිතුමා වෙත යවන්නේ නැතුව, University Grants Commission එක හැටියට ඒක වගකීමක් භාර අරගෙන, ඒ ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනයක් කරලා, ඒ ක්‍රියාවලිය විශ්ලේෂණය කරලා, ඒ marks ගැන යම් කිසි විශ්ලේෂණයක් කරලා ඔවුන්ගේ වාර්තාවක් හා නිර්දේශයක් එක්ක තමයි ගරු ජනාධිපතිතුමා වෙත ඒ නම යෝජනා කරලා තිබෙන්නේ. ඒ ක්‍රියාවලිය අපට තව දියුණු කරන්න පුළුවන්ද? දේශපාලන මැදිහත්වීම අපට තව අවම කරන්න පුළුවන්ද, අපට ඒක තව transparent කරන්න පුළුවන්ද? ඔව්, අපි ඒක කරනවා. ගරු සභාපතිතුමනි, හැබැයි ඒක කරන්න පුළුවන් ආණ්ඩුවට විතරක් නොවෙයි. උපකුලපති පත් කිරීමේ ක්‍රියාවලියේදී විශාල කාර්යභාරයක් විශ්වවිද්‍යාල සනාතන සභාවෙන් සිදු කරනවා. එතකොට මීට වඩා දියුණු වෙන්න නම් අපේ විශ්වවිද්‍යාල පද්ධතියත් මීට වඩා දියුණු වෙන්න ඕනෑ. විශ්වවිද්‍යාල පද්ධතිවල සිටින අපේ ආචාර්යවරු, අපේ පීඨාධිපතිවරු, අපේ සනාතන සභාවල සිටින නියෝජිතයන් කියන මේ සියලු දෙනාගේම මැදිහත්වීම අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, විශ්වවිද්‍යාලයේ ගුණාත්මකභාවය වැඩි කිරීම වෙනුවෙන් සිදු කරන්න වෙනවා. අවසාන පත් කිරීමේ බලය තිබෙන ජනාධිපතිට විතරක් හෝ UGC එකට විතරක් කරන්න බැහැ. ගරු සභාපතිතුමනි, ඒක නිසා මේ ක්‍රියාවලිය මීට වඩා ශක්තිමත් කරන්නේ කොහොමද කියලා අපි සාකච්ඡා කරමින් සිටිනවා. අපට දැනට තිබෙන ක්‍රමවේදය තුළ, මේ වෙලාවේ UGC එක ඉතා හොඳින් ඔවුන්ගේ වගකීම තේරුම් අරගෙන තිබෙනවා කියලා අපි හිතනවා.

ගරු සභාපතිතුමනි, ගොඩාක් අය English medium education එක ගැන කථා කළා. අපේ වාගේ රටකට English medium educationවලට විශාල ඉල්ලුමක් තිබෙන බව අපි පිළිගන්නවා. ඒකට අපට ලොකු කතන්දරයක් කියන්නත් පුළුවන්. ගරු සභාපතිතුමනි, හැබැයි අපේ රටේ හැම තිස්සේම වෙච්ච වැරැද්ද තමයි අපි ප්‍රශ්නයේ මුලට යන්නේ නැතිව තමයි විසඳුමක් හොයන්නේ. අපි හැමෝම කියනවා English medium education දෙන්න ඕනෑ කියලා. හරි, ඒක අපි භාර ගන්නවා කියමු. නමුත් ඒකට පාසල්වල තිබෙන සූදානම හරියට නැත්නම්, ගුරුවරුන්ගේ සූදානම නැත්නම්, නැවත වතාවක් අපි ඒ දරුවන්ට කරන්නේ වැරැද්දක්, ගරු සභාපතිතුමනි.

Science, Englishවලින් ඉගැන්වූවා කියලා English ඉගෙන ගන්නේ නැහැ. එතකොට science ඉගෙන ගන්නේත් නැහැ; English ඉගෙන ගන්නේත් නැහැ. අපි හරියට ඒ ගුරුවරුන් හදා ගන්න ඕනෑ. ඒ ගුරුවරුන් හදලා ඒ භාෂාවත් උගන්වන්න පුළුවන් විධියට ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය වර්ධනය කළාම තමයි

[ගරු හරිනි අමරසූරිය]

අපට මේකත් ක්‍රමානුකූලව විසඳාගෙන යන්න පුළුවන් වෙන්නේ. ගරු සභාපතිතුමනි, English mediumවලින් උගන්වන්න කියන අයගේ ආණ්ඩු කාලයේ තමයි Post Graduate Institute of English වැනි ගුරුවරුන් පුහුණු කරන තැන්වලට ලබාදෙන මුදල් කප්පාදු කළේ; ඒවා ලාභ ලබන ආයතන බවට පත් විය යුතුයි කියලා නිර්දේශ දුන්නේ. ඒ, ගුරු පුහුණුව කරන තැන්. එහෙම කථා කරලා දැන් English medium education අවශ්‍යයි කියන එක එච්චර තාර්කික නැහැ කියලා මම හිතනවා. හැබැයි ඒ අදහස, යෝජනාව අපි භාර ගන්නවා. ඒ වෙනුවෙන් ක්‍රමානුකූලව මැදිහත් වෙන්න අපි සැලසුම් කරගෙන යනවා.

ගරු සභාපතිතුමනි, පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය ගැනත් මෙතැනදී කථා කළා, මොකක්ද පහේ ශිෂ්‍යත්වයට වෙන්නේ කියලා. ඔබතුමා දන්නවා, පහේ ශිෂ්‍යත්ව විභාගය එන්නේ පාසල් අතර තිබෙන විෂමතාව නිසා කියලා. දක්ෂ දරුවන්ට හොඳයි කියන පාසලකට ඇතුළු වෙන්න තිබෙන අවස්ථාවක්, ඒක. මේ තිබෙන තත්ත්වය තුළ ඒ සම්බන්ධයෙන් අපට ලොකු වෙනස්කමක් කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතන්නේ නැහැ. අපි උත්සාහ කරන්නේ පාසල් අතර විෂමතාව ක්‍රමානුකූලව නැති කරලා හොඳ පාසල්, හොඳ නැති පාසල්, ජාතික පාසල්, ජාතික නොවන පාසල් වැනි විශේෂයෙන්ම ගුණාත්මකභාවයෙන් විෂමතා තිබෙන පාසල් ක්‍රමය වෙනස් කරන්න. ඒකට අපට යම්කිසි කාලයක් යයි. එතෙක් කල් අපට පහේ ශිෂ්‍යත්ව විභාගය පවත්වන්න වෙනවා. නමුත් ඒ පහේ ශිෂ්‍යත්ව විභාගය තුළින් එන මානසික පීඩනය අවම කරන්න තමයි අපි උත්සාහ කරන්නේ. ඒ සඳහා අපි එන අවුරුද්දේ විශේෂඥ කමිටුවක් පත් කරන්න නියමිතයි. බොහෝ දුරට ඒ මානසික පීඩනය ළමයින්ට දෙන්නේ නැති විභාගයක් 2028දී විතර අපට ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. නමුත් ඇත්තටම පාසල් අතර තිබෙන ගුණාත්මකභාවයේ විෂමතාව අපි නැති කළාට පස්සේ තමයි මේකට විසඳුම එන්නේ. ඒක අපේ දීර්ඝ කාලීන සැලැස්ම තුළ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි කිසිසේත්ම මුල් ළමා විය අධ්‍යාපනය කියන එක අමතක කරලා නැහැ. දහතුන් වසරක අධ්‍යාපනයට අමතරව අවුරුදු දෙකක මුල් ළමා විය අධ්‍යාපනය පිළිබඳවත් අපි සැලසුම් කරගෙන යනවා. ගරු සරෝජා පෝල්රාජ් අමාත්‍යවරිය කියූ පරිදි, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයත්, අපේ අමාත්‍යාංශයත් දෙකම එකතු වෙලා ඒ පිළිබඳවත් වැඩ කරගෙන යනවා.

Inclusive education කියන එකත් අපට අතිශයින්ම වැදගත් දෙයක්. කිසි කෙනෙක් අත නොහරින, කාවවත් මහ හැරෙන්නේ නැති අධ්‍යාපන පද්ධතියක් නිර්මාණය කරන්න තමයි අපි උත්සාහ කරන්නේ. ඒ වෙනුවෙනුත් අවශ්‍ය යටිතල පහසුකම්, ගුරු පුහුණුව යන මේ සියල්ලම අපි සැලසුම් කරගෙන යනවා.

ගරු සභාපතිතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කිව යුතුයි. ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමා කිව්වා, "Education must be seen as the heart and soul of a country" කියලා. ඒකට මම සියයට 100ක් එකඟයි. අධ්‍යාපනය කියන්නේ රටක හදවත; රටක අධ්‍යාත්මය තීරණය වෙන තැන. ඒ නිසා මේක අපි කොහොම හරි කළ යුතුයි. අපි දන්නවා, කාලයක් තිස්සේ කඩා වැටුණු system එකක්, කාටවත් සෑහීමකට පත් වෙන්න බැරි system එකක් තමයි අපි මේ වෙනස් කරමින් යන්නේ කියලා. එම නිසා ඒ වෙනස් කිරීම සඳහා තමයි අපි මේ මැදිහත් වෙන්නේ. මේ පළමුවැනි අය වැය තුළින් අපි ඉදිරිපත් කර තිබෙන්නේ ඒකේ මූලික පියවරක්. හැබැයි, අපට යන්න තව පියවර ගණනාවක් තිබෙනවා. අපි ඒ පියවර ගන්නේ අධිෂ්ඨානයෙන් යුතුව සහ විශ්වාසයක් ඇතිවයි. එම නිසා විපක්ෂයේ අපට බොහෝ හොඳ අදහස් දුන් ඒ සියලුම මන්ත්‍රීවරුන්ටත් මම ආරාධනා කරනවා, මේ ගමන යන්න අපිත් එක්ක එකතු වෙන්න කියලා. මේක අපි රටක් වෙනුවෙන්, අපේ අනාගත පරපුර වෙනුවෙන් කරන දෙයක්. මෙතැන දේශපාලන වෙනසක් නොවෙයි, කවුරු රට බාර ගත්තත් හොඳ අධ්‍යාපන ක්‍රමයක් තිබෙන්න ඕනෑ. හැබැයි, හොඳ අධ්‍යාපන ක්‍රමයක් තිබෙනවා නම් මොන වාගේ සමාජයක් ද අපට ඕනෑ කියන vision එකක් තිබෙන්න ඕනෑ. අපට අවශ්‍ය වන්නේ තරගකාරීව හැමදේම මුදල්වලින් තීරණය කරන රටක්ද, එහෙම නැත්නම් ඊට වඩා සානුකම්පිත සාමූහික හැඟීමක් තිබෙන රටක්ද කියන එකත් අපි තීරණය කරන්න ඕනෑ. එතැන තමයි අපේ වෙනස තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ අවශ්‍ය පරිවර්තනය කිරීම සඳහා අපේ ආණ්ඩුව විසින් මේ වෙලාවේ ගත් පියවර අපි තවත් ශක්තිමත් කරමින් ඉදිරියට යමු කියන යෝජනාව කරනවා. ඒ වාගේම මේ විවාදයට සම්බන්ධ වුණු සියලු දෙනාටත්, මේ සඳහා සහභාගී වෙමින් සහයෝගය දක්වපු නිලධාරී මණ්ඩලයේ සියලු දෙනාටත් නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින්, මට කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නතර වෙනවා, ගරු සභාපතිතුමනි.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

MINISTRY OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

Recurrent	Rs. 206,000,000,000
Capital	Rs. 65,000,000,000

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, on behalf of the Minister of Finance, I move the following Amendment for the Ministry of Education, Higher Education and Vocational Education at the Committee Stage of the Budget, 2025.

"In page 25, leave out all words in lines 2 and 3 and insert:

'Recurrent	Rs. 207,200,000,000
Capital	Rs. 65,700,000,000' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Does the Committee agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 207,200,000,000 දක්වා වැඩි කළ මූදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 65,700,000,000 දක්වා වැඩි කළ මූදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 207,200,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 65,700,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 207,200,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 65,700,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

126 වන ශීර්ෂය.- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 39,360,000,000; මූලධන වියදම, රු. 3,910,000,000

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 76,425,000,000; මූලධන වියදම, රු. 49,545,000,000

தலைப்பு 126.- கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 39,360,000,000; மூலதனச் செலவு, ரூபாய் 3,910,000,000

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 76,425,000,000; மூலதனச் செலவு, ரூபாய் 49,545,000,000

HEAD 126.- MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 39,360,000,000; Capital Expenditure, Rs. 3,910,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 76,425,000,000; Capital Expenditure, Rs. 49,545,000,000

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I move the following Amendment to Head 126.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Does the Committee agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"In page 25, leave out all words in lines 6 and 7 and insert:

'Programme 01
Operational Activities Rs. 40,360,000,000 Rs. 3,910,000,000

Programme 02
Development Activities Rs. 76,625,000,000 Rs. 50,245,000,000' "

[The Hon. (Dr.) Harini Amarasuriya]

(The effect of this Amendment is to increase the Recurrent provisions and Capital provisions for Expenditure Head No. 126 by Rs. 1,200,000,000 and Rs. 700,000,000 respectively, allocated to implement Budget Proposal Nos. 15, 26, 44 and 46.)

"126 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 40,360,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"126 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 3,910,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"126 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 76,625,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"126 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 50,245,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 40,360,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 3,910,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 76,625,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 50,245,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 40,360,000,000, for Head 126, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 126, Programme 01, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the sum of Rs. 3,910,000,000, for Head 126, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 126, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 76,625,000,000, for Head 126, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 126, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 50,245,000,000, for Head 126, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 126, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

212වන ශීර්ෂය.- විභාග දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 11,610,000,000

"212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 11,610,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 750,000,000

"212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 750,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

213 වන ශීර්ෂය.- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 115,000,000

"213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 115,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 55,000,000

"213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 55,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

214 වන ශීර්ෂය.- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 75,200,000,000

"214 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 75,200,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

214 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 10,500,000,000

"214 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 10,500,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

214 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

215 වන ශීර්ෂය.- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 350,000,000

"215 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 350,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

215 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 15,000,000

"215 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 15,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

215 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංචර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 2,870,000,000

"215 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 2,870,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

215 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 215,000,000

"215 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 215,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

215 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

335 වන ශීර්ෂය.- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 70,000,000

"335 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 70,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

335 වන ශීර්ෂයෙහි01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 10,000,000

"335 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 10,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

335 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

තලෙප්පු 212.- පාරීට්සෙකල් තිණෙක්කලම්

නිකළ්ච්සිත්තිට්ටම 02.- අපිවිරුත්තිච් සෙයර්පාටුකල් - මීන්ටුවරුඤ් සෙලවු, රූපාය් 11,610,000,000

“තලෙප්පු 212, නිකළ්ච්සිත්තිට්ටම් 02, මීන්ටුවරුඤ් සෙලවුක්කාන රූපාය් 11,610,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක” එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්ර්‍රුක් කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 212, නිකළ්ච්සිත්තිට්ටම් 02, මීන්ටුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

නිකළ්ච්සිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් සෙයර්පාටුකල් - මූලතනච් සෙලවු, රූපාය් 750,000,000

“තලෙප්පු 212, නිකළ්ච්සිත්තිට්ටම් 02, මූලතනච් සෙලවුක්කාන රූපාය් 750,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක” එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්ර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 212, නිකළ්ච්සිත්තිට්ටම් 02, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

தலைப்பு 213.- கல்வி வெளியீட்டுத் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 115,000,000

“தலைப்பு 213, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 115,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 213, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 55,000,000

“தலைப்பு 213, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 55,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 213, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

தலைப்பு 214.- பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 75,200,000,000

“தலைப்பு 214, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 75,200,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 214, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 10,500,000,000

“தலைப்பு 214, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 10,500,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 214, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

தலைப்பு 215.- தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சித் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 350,000,000

“தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 350,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 15,000,000

“தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 15,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,870,000,000

"தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,870,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 215,000,000

"தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 215,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

தலைப்பு 335.- தேசிய கல்வி ஆணைக்குழு

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 70,000,000

"தலைப்பு 335, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 70,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 335, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 10,000,000

"தலைப்பு 335, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 10,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 335, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 212.- DEPARTMENT OF EXAMINATIONS

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 11,610,000,000

Question, "That the sum of Rs. 11,610,000,000, for Head 212, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 212, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 750,000,000

Question, "That the sum of Rs. 750,000,000, for Head 212, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 212, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 213.- DEPARTMENT OF EDUCATIONAL PUBLICATIONS

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 115,000,000

Question, "That the sum of Rs. 115,000,000, for Head 213, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 213, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 55,000,000

Question, "That the sum of Rs. 55,000,000, for Head 213, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 213, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 214.- UNIVERSITY GRANTS COMMISSION

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 75,200,000,000

Question, "That the sum of Rs. 75,200,000,000, for Head 214, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 214, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 10,500,000,000

Question, "That the sum of Rs. 10,500,000,000, for Head 214, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 214, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 215.- DEPARTMENT OF TECHNICAL EDUCATION AND TRAINING

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 350,000,000

Question, "That the sum of Rs. 350,000,000, for Head 215, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 215, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 15,000,000

Question, "That the sum of Rs. 15,000,000, for Head 215, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 215, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 2,870,000,000

Question, "That the sum of Rs. 2,870,000,000, for Head 215, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 215, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 215,000,000

Question, "That the sum of Rs. 215,000,000, for Head 215, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 215, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 335.- NATIONAL EDUCATION COMMISSION

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 70,000,000

Question, "That the sum of Rs. 70,000,000, for Head 335, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 335, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 10,000,000

Question, "That the sum of Rs. 10,000,000, for Head 335, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 335, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

අ.භා. 6.21ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 11වන අඟහරුවාදා.

பி.ப. 6.21 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 மார்ச் 11, செவ்வாய்க்கிழமை.

At 6.21 p.m., the Chairman left the Chair to report Progress.

Committee report Progress; to sit again on Tuesday, 11th March, 2025.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශීර්ෂ අංක 126 සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 212 සිට 215 දක්වා සහ ශීර්ෂ අංක 335 සංශෝධන රහිතව ද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

වයඹ පළාත සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම
வடமேல் மாகாணத்தை சுற்றுலாத் தலமாக அபிவிருத்தி செய்தல்
DEVELOPMENT OF NORTH-WESTERN PROVINCE AS A TOURIST DESTINATION

[අ.භා. 6.22]

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කරන මේ කරුණ කෙරෙහි සභාවේ අවධානය යොමු කරවනවා. වර්තමාන රජය විසින් ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක 2025 අවුරුද්දේ මේ වන විට ලක්ෂ 5කට ආසන්න සංචාරකයින් පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණෙන්න පටන්ගෙන තිබෙනවා. අපේ රටට සංචාරකයින් මෙලෙස පැමිණීමත් එක්ක අපේ රටේ සංචාරක ව්‍යාපාරයේ දැවැන්ත දියුණුවක් දකින්න තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ අවස්ථාවේදී අපේ රටේ ආකර්ෂණීය බව දිවයින පුරාම ප්‍රචලිත විය යුතුයි කියලා. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයේදී වයඹ පළාත පිළිබඳව දක්වන ආකල්පය, වයඹ පළාත පිළිබඳව දක්වන උනන්දුව අඩු බව අපට පෙනෙන්න තිබෙනවා. ඒ නිසා තමයි මා මේ යෝජනාව ගේන්නේ.

2025 අවුරුද්දේ මේ දක්වා ලංකාවට ලක්ෂ 5කට ආසන්න සංචාරකයින් පිරිසක් පැමිණියත්, ඒ අතරින් සියයට 2කට ආසන්න පිරිසක් තමයි වයඹ පළාත නැරඹීමට පැමිණ තිබෙන්නේ. ලංකාව තුළ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේදී සංචාරකයින් විශාල පිරිසකට බොහොම හොඳ තෝතැන්නක් වෙච්ච, ලස්සන පරිසරයක් තිබෙන, ඒ වාගේම කිසිදු බාධාවකින් තොරව සංචාරකයින්ට ඇවිල්ලා ජීවත් වෙන්න පුළුවන් වපසරියක් තිබෙන ශ්‍රී ලංකාවේ වැදගත්ම පළාතක් වන වයඹ පළාත තුළ සංචාරක ව්‍යාපාරය හොඳින් ස්ථාපිත නොවීම පිළිබඳව කරුණු පැහැදිලි කිරීම තමයි මට අද අවශ්‍ය වෙලා තිබෙන්නේ.

මෙහිදී මම විශේෂයෙන්ම අවධානය යොමු කරවනවා, වයඹ පළාතේ තිබෙන විශාල මුහුදු තීරයට. ඒ, පුත්තලම ආශ්‍රිත මුහුදු තීරයයි. මේ මුහුදු තීරය වෙන්නප්පුවෙන් පටන් ගන්නවා. විශේෂයෙන්ම කල්පිටියේ ඉඳලා කිලෝමීටර 28ක් දක්වා මේ මුහුදු තීරය තිබෙනවා. ඒ ප්‍රදේශයේ සංචාරකයින්ට ආකර්ෂණීය ස්ථාන ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම උච්චමුණිය, පල්ලිවාසල්තුරේ වාගේම අවසානයේ අපට හමු වෙනවා, බත්තලන්ගුණ්ඩුව දූපත. ඒ දූපතට යන්න මුහුදේ කිලෝමීටර 28ක් යන්න ඕනෑ. මේ ප්‍රදේශයේ විශේෂයෙන්ම සංචාරකයින් විශාල වශයෙන් ආකර්ෂණය වෙන තැනක් තිබෙනවා. හැබැයි, අපි ඒක ප්‍රයෝජනයට අරගෙන නැහැ. ඒ වාගේම තබ්බෝව වැව වැනි විශාල වාරි කර්මාන්තත් මේ පළාත තුළ තිබෙනවා. මේ කටයුත්ත කරගෙන යද්දී විශේෂයෙන්ම අපට අවධානය යොමු කරන්න පුළුවන්, විශාල වන ගහනයක් තිබෙන විල්පත්තුව පිළිබඳවත්. මෙවැනි ප්‍රදේශ සම්බන්ධව අපි සංචාරකයින්ට නිසි මහපෙන්වීමක් ලබා දීලා නැහැ. නමුත් වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් බවට අපි පත් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ පළාත තුළ තවත් විශේෂ ස්ථාන තිබෙනවා. විජය රජු වැනි රජවරු ලංකාවට පැමිණි තැන ඉඳලා රාජධානි පහක නෂ්ටාවශේෂ වයඹ පළාත තුළ තිබෙනවා. විශේෂයෙන්ම දඹදෙණිය, යාපහුව, කුරුණෑගල වැනි විශාල රාජධානි වයඹ පළාත තුළ පැවත තිබෙනවා. හැබැයි, මේ රාජධානි සම්බන්ධයෙන් ලෝක ප්‍රජාවට, සංචාරකයින්ට මනා දැනුවත්භාවයක් නැහැ. ඒ නිසාම මේ වෙනකොට වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය අපි සංචාරක ව්‍යාපාරය සඳහා සූදානම් කරමින් ඉන්නවා. විශේෂයෙන් දොඩම්ගස්ලන්ද සහ මාවතගම වැනි ආසනවල තිබෙන ස්වභාව සෞන්දර්යයත්, ඒ කදු පන්තියත්, ඒ ප්‍රදේශවල තිබෙන ආකර්ෂණීය ස්ථානත් කියන සියල්ලම වයඹ පළාත තුළ තිබෙන සංචාරකයින් ආකර්ෂණය වන ස්ථාන ලෙස ස්ථාපිත කරලා, සංචාරක ව්‍යාපාරයට යහපත් නිකේතනයක් බවට වයඹ පළාත පත් කරන්න වයඹ ආණ්ඩුකාරතුමා එක්ක අපි සූදානම් වෙනවා. මේ වෙනුවෙන් අපි කේබල් කාර් වැඩ පිළිවෙළක්, වැව ආශ්‍රිතව දැවැන්ත සංවර්ධන වැඩ පිළිවෙළක් මේ වෙනකොට සකස් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ලෝක ප්‍රජාව දැනුවත් කරලා, වයඹ පළාත සංචාරක නිකේතනයක් බවට පත් කරන්න සූදානම් කරගන්න කියන ඉල්ලීම කරන්න අද මම මේ යෝජනාව මේ සභාවට ගෙනෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Sujeewa Dissanayake to second the Adjournment Motion. You have three minutes.

[අ.භා. 6.27]

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල්තබන අවස්ථාවේ ගෙනෙන ලද යෝජනාව මම ස්ථිර කරනවා. විශේෂයෙන්ම පුත්තලමත්, කුරුණෑගලත් කියන දිස්ත්‍රික්ක දෙක එකතු කරගත් වයඹ පළාත නිර්මාණය වෙන්නේ 1845දී Colin Campbell ආණ්ඩුකාරයාගේ පාලන කාලයේදීයි. අර්ධ ශුෂ්ක, වියළි, තෙත්, අතරමැදි වශයෙන් සංචාරක ආකර්ෂණයට ඉතාම හිතකර දේශගුණ කලාප 4ක් කුරුණෑගල සහ පුත්තලම කියන දිස්ත්‍රික්ක දෙකෙහි තිබෙනවා. මම හිතන විධියට "A" ශ්‍රේණියේ මාර්ග දෙකක් එකිනෙකට මුණ ගැසෙන ලංකාවේ එකම නගරය කුරුණෑගල නගරයයි. පුත්තලම සිට මහනුවර දක්වාත්, අඹේපුස්ස සිට ත්‍රිකුණාමලය දක්වාත් කතිර ස්වරූපයෙන් එකිනෙකට මුණ ගැසෙන මාර්ග දෙකක් තිබෙන නගරයක් ලංකාවේ තිබෙනවා නම්, ඒ කුරුණෑගල නගරයයි. මහනුවර යුගයේදී බත් කෝරළය ලෙස, එහෙම නැත්නම් සත් කෝරළය ලෙස හඳුන්වපු භූමියත්, ඒ වාගේම වන්නි හත්පත්තුවත් මේ ප්‍රදේශයට අයිති වෙනවා.

අපි ඉතිහාසය ගත්තොත්, සංචාරකයින්ට බලන්න පුළුවන් ඉතිහාසය හා සම්බන්ධ බොහෝ ස්ථාන මේ ප්‍රදේශය තුළ තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ පොම්පරිප්පු කියන ස්ථානය ගත්තාම, විශේෂයෙන්ම බරණි සුසාන ක්‍රමය හා සම්බන්ධ සාධක මේ බිමේ අපට දකින්නට පුළුවන්. ජනප්‍රවාද ගත්තාම, රාවණා රජ්ජුරුවන් හා සම්බන්ධ කථා පුවත, වාත වේගයෙන් ගිය රිය නතර කළ පොළ "වාත රිය පොළ" එහෙම නැත්නම් "වාරියපොල" වූ බවත්, ඒ වාගේම රාම-රාවණා යුද්ධයේදී අපට අහන්න ලැබෙන දොළුකන්ද ජන කථාව නිවැරදි නම් එම ප්‍රදේශයත් වයඹ පළාත තුළ පිහිටා තිබෙන ඓතිහාසික ප්‍රදේශ වනවා. ඒ වාගේම කුවේණියගේ ඥාතීන්ගේ රාජධානිය වන සිරස වස්තුව, ඒ වාගේම ඇය සහ විජය රජ්ජුරුවන් ජීවත් වුණාය කියලා හිතන විල්බාවත් වයඹ පළාත තුළ පිහිටා තිබෙන, ජනප්‍රවාද එක්ක සම්බන්ධ ප්‍රදේශයි. ඒ වාගේම විජය රජු ගොඩ බැස්සාය කියන සංචාරක ආකර්ෂණය සහිත තම්මැන්නාවත් වයඹ පළාතේ මුහුදු තීරයේ තමයි පිහිටා තිබෙන්නේ. එමෙන්ම කුවේණිය විලාප දුන්නාය කියන විලාකටුපොත, ඇය ළතෝනි දුන්නාය කියන ළතෝනිගල වාගේම යක්දෙස්සාගල කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වයඹ පළාතේ පිහිටා තිබෙන සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන. ඒ වාගේම රාජධානි පහක් - පරාක්‍රම පුරය, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, නාථගනේ - තිබෙනවා. නාථගනේ කියන්නේ ලංකාවේ අවසාන රාජධානිය, 1848 අරගළය වෙලාවේදී. ලංකාවේ විතරක් නොවෙයි, දකුණු ආසියාවේ තිබෙන හොඳම ගජසිංහ රූපය සහිත ස්ථානය තමයි යාපහුව. දළදා මාළිගයට තිබෙන අලංකාර ශෛලමය පියගැට පෙළ, ලෝකයේ ප්‍රසිද්ධ යාපහුව සිංහ රූප දෙක සංචාරක ආකර්ෂණය සහිත ප්‍රදේශ. ඒ වාගේම තබ්බෝව, මාගල්ල, බතලගොඩ, මී වැව වාගේ පැරණි වැව්, අනෙක් පැත්තෙන් ගත්තාම ඉහිණිමිටිය, හක්වටුනාඔය, දැදුරු ඔය ජලාශය ආදී නූතන ජලාශ, නුවරකන්ද, වැල්ලෑගල, නාථගනේ, වඳුරාගල, ඇතාගල, කුරුවෙණියාගල, ඉබ්බාගල, ආඳාගල, අංගන්ගල වාගේ හුදෙකලා කඳු වැටි සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන. එමෙන්ම කහටගහ පතල, පුත්තලම ලුණු ලේවාය වාගේම අනෙක් පැත්තෙන් සිමෙන්ති සංස්ථාව එම පළාත තුළ පිහිටා තිබෙනවා. අපේ රටේ ඛනිජ සම්පත් බොහෝ ප්‍රමාණයක් තිබෙන පළාතක් තමයි වයඹ පළාත කියන්නේ. ඒ වාගේම කරගහගෙදර, පනාවිටිය වැනි ඓතිහාසික අම්බලම් ඒ ප්‍රදේශය තුළ තිබෙන සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන. එමෙන්ම යාපහුව, කුරුණෑගල නගර ආශ්‍රිතව වසර ගණනාවක් තිස්සේ පැවැත එන සංචාරක ආකර්ෂණය සහිත සංස්කෘතික පෙරහැර, දළදා පෙරහැර අද දක්වා පැවැත්වෙනවා. සද්ධර්ම රත්නාවලිය, සිදත් සඟරාව, පන්සියපනස් ජාතක පොත, දළදා සිරිත, දළදා පූජාවලිය වැනි ඓතිහාසික පොත පත රචනා වෙච්ච ප්‍රදේශ වයඹ පළාතේ පිහිටා තිබෙනවා. ඒ නිසා අපේ ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ, සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉතා වැදගත් යෝජනාවක්. දේශීය සංචාරකයන්ට වාගේම විදේශීය සංචාරකයන්ටත් සංචාරයේ යෙදෙන්න පුළුවන් තැනක් බවට, ගමනාන්තයක් බවට වයඹ පළාත පත් කරන්න කියලා අපි සංචාරක අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Ashoka Gunasena. You have three minutes.

[අ.භා. 6.30]

ගරු අශෝක ගුණසේන මහතා
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, අපේ ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව තුළ තිබෙන්නේ වයඹ පළාත තුළ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සම්බන්ධයෙනුයි. අපේ රටේ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රධාන ස්ථානයක් ගන්නා සංචාරක ව්‍යාපාරය ගැන, සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේදී ඓතිහාසික නගර කේන්ද්‍ර කර ගත්ත සැලසුමක් ගැන අපේ ජනාධිපතිතුමා විසින් කරන ලද කථාවේදී පවා කරුණු ඉදිරිපත් කරනු ලැබුවා. අපි දන්නවා, වයඹ පළාත තුළ ඓතිහාසික නගර ගණනාවක් තිබෙන බව. කාලයත් එක්ක වැළලිලා ගිය, වයඹ පළාතේ සිටින මිනිස්සු නොදන්නා ගොඩක් ස්ථාන දැනටමත් අපි කණ්ඩායමක් යොදවා සොයාගෙන තිබෙනවා. උදාහරණයක් ලෙස කිව්වොත්, දඹදෙණිය රාජධානිය කේන්ද්‍ර කර ගත්ත, සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගත්ත විශේෂ ස්ථාන කිහිපයක් අපේ ගවේෂණ කණ්ඩායමක් විසින් හෙළිදරව් කරගෙන තිබෙනවා. රෑනගල, තුන්දොල ජලාශය, මහමෙව්නාව, බඹරගල රජමහා විහාරස්ථානය, මා ඔය හරහා වැටී තිබෙන, කෑගල්ල දිස්ත්‍රික්කය සහ කුරුණෑගල දිස්ත්‍රික්කය යා කරන සංගිලි පාලම, වයඹ පළාත තුළ අවසාන කඳු පන්තිය විධියට තිබෙන හක්බෙලිකන්ද, මාරගල වාගේ විශේෂ සුන්දරත්වයක් ගන්නා ස්ථාන ගණනාවක් අපි විසින් හෙළිදරව් කරගෙන තිබෙනවා. අපි ඉදිරියේදී මේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු කරනකොට ඒ පිළිබඳව අවධානය යොමු කරනවා. වයඹ පළාත තුළ රාජධානි පහක් කේන්ද්‍ර කර ගත්ත ස්ථාන ගණනාවක් තිබෙනවා. ඒ පිළිබඳව සංචාරක අමාත්‍යාංශයේ අවධානය යොමු කරවනවා. ඒ වාගේම අපේ රටේ ආර්ථිකය දියුණු කිරීමේදී වයඹ පළාත ඉතා වැදගත් ස්ථානයක් ලෙස සලකමින් කටයුතු කරමු කියා යෝජනා කරමින්, මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Prof.) Ruwan Ranasinghe. You have five minutes.

[අ.භා. 6.33]

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු කථානායකතුමනි, ඉතාම කාලෝචිත, අතිශයින් වැදගත් යෝජනාවක් අද දින සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කිරීම පිළිබඳව මම ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, අපේ රටේ සංචාරක කර්මාන්තය විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙන බව. ඒ කෙසේ වෙතත්, අපේ මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා වාගේ වයඹ පළාත, කුරුණෑගල සහ පුත්තලම ප්‍රදේශ සංචාරක ක්ෂේත්‍රයේ ඒ තරම් ප්‍රතිලාභ ලබන ප්‍රදේශ බවට පත්වෙලා නැහැ කියන එක අපි දන්නවා. එහි ඓතිහාසික පදනම මම හිතන විධියට අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉතා හොඳට විග්‍රහ කළා.

ඊළඟට, මේ පළාතේ ස්වාභාවික පිහිටීම ගැන බැලුවොත්, වෙන්නප්පුවෙන් ආරම්භ වෙලා උතුරට යනකොට කල්පිටිය ප්‍රදේශය සහ විල්පත්තුව ජාතික වනෝද්‍යානය තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න මේ ප්‍රදේශවල ඉතා හොඳ විභවතාවක් තිබෙනවා. අපි මේවා හඳුනාගෙන තිබෙනවා. රිදී විහාරය, ගල්ගමුව ප්‍රදේශයේ හත්ථිකුච්චි විහාරය, ඇත්කඳ විහාරය වාගේ විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් අපේ රටේ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ව්‍යාපෘතියක් ආරම්භ කළා, "වයඹ සංස්කෘතික චතුරශ්‍රය" කියලා. මධ්‍යම සංස්කෘතික අරමුදල තමයි ඇත්තටම ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ, ඒ ලැබෙන ප්‍රතිපාදන අනුව. මේ ව්‍යාපෘතියේ කැණීම් කටයුතු සහ සංරක්ෂණ කටයුතු හරහාත් අපට යම්කිසි ඓතිහාසික වැදගත්කමක් ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා, සංචාරක කර්මාන්තය දියුණු කරන්න. මේ වසරේ අපි අලුත් වැඩසටහනක් ආරම්භ කරනවා. ඒ වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව පුරාම පිහිටි සංචාරක ආකර්ෂණ සහිත ස්ථාන 100ක් හඳුනාගෙන, ඒ එක සංචාරක ආකර්ෂණයකට රුපියල් මිලියන 10 බැගින් ආයෝජනය කරලා මූලික පහසුකම් සංවර්ධනය කරන වැඩ පිළිවෙළක් අපි මේ වසරේ ක්‍රියාත්මක කරනවා. අපේ ගරු මන්ත්‍රීවරුන්ට මම ආරාධනා කරනවා, තමන්ගේ ප්‍රදේශයෙන් ආසන්න වශයෙන් සංචාරක ආකර්ෂණ ස්ථාන 10ක් පමණ අපට හඳුන්වා දීම සඳහා ඉදිරිපත් කරන්න කියලා. අපි මේ වෙනකොටත් ඒ ඉල්ලීම් පළාත් මට්ටමින් යවා තිබෙනවා.

අපි 2024 වර්ෂයේ ආරම්භ කළා, වයඹ පළාතේ ප්‍රධාන සංචාරක සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීමේ කටයුත්ත. 2025 වසරේ අපි ඒ කටයුත්ත අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි මේ වසරේදී රුපියල් මිලියන 8ක් වෙන් කරලා තිබෙනවා. මේ වසරේ වයඹ පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශය වෙනුවෙනුත් පළාත් සභාව හරහා රුපියල් මිලියන 100කට අධික මුදලක් වෙන් කරලා තිබෙනවා, සංචාරක සංවර්ධනයට සහ ප්‍රවර්ධනයට. ඊටත් අමතරව මම අර කියපු ව්‍යාපෘතිය හරහා අපට රුපියල් මිලියන ගණනාවක් වයඹ පළාත වෙනුවෙන් වෙන් කරන්න පුළුවන්.

මේ සියලු කාරණා වාගේම විශේෂයෙන් අපේ මන්ත්‍රීවරු සඳහන් කළා වාගේ ස්වාභාවික පිහිටීම, සංස්කෘතිය සහ ඓතිහාසික උරුමය කියන කාරණා කේන්ද්‍ර කරගෙන මේ වසරේ ආකර්ෂණය කර ගන්න බලාපොරොත්තු වන ලක්ෂ 30ක සංචාරකයින්ගෙන් යම්කිසි ප්‍රමාණයක් මේ ප්‍රදේශයට ආකර්ෂණය කර ගන්නට අපි කල්පනා කරනවා. විශේෂයෙන්ම මම සඳහන් කරන්න අවශ්‍යයි, විල්පත්තු ජාතික වනෝද්‍යානය ලෝක ප්‍රකට සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙමින් තිබෙන බව. ඊයේත් අපි මන්නාරම ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වුණා, පරිසර නියෝජ්‍ය ඇමතිතුමාත් එක්ක. ඉදිරියේදී එළුවන්කුලම ප්‍රදේශයෙන්, පුත්තලම දිසාවෙන් විල්පත්තු ජාතික වනෝද්‍යානයට ප්‍රවේශ මාර්ගයක් සැලසුම් කරන්න - නිර්මාණය කරන්න - අපි බලාපොරොත්තු වෙනවා. අපි කල්පනා කරනවා, මේ කටයුතු හරහා වයඹ පළාත කේන්ද්‍ර කර ගනිමින් සංචාරකයින් විශාල ප්‍රමාණයක් ආකර්ෂණය කර ගන්න අපට පුළුවන් වෙයි කියලා.

අපි කල්පිටිය සංචාරක සංවර්ධන ප්‍රදේශයක් විධියට ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. මේ වෙනකොටත් ආයෝජකයින් දූපත් ගණනාවක් ලබාගෙන තිබෙනවා. ඒවායේ සංවර්ධන කටයුතු ආරම්භ වෙලා තිබෙනවා. මේ කියන සංවර්ධන වැඩත් එක්ක අපේ රජය ගෙන යන සහභාගිත්ව සංචාරක ආර්ථිකයක් - inclusive tourism economy, තිරසර සංචාරක ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා වයඹ පළාත කේන්ද්‍ර කර ගනිමින් වැඩසටහන් ගණනාවක් සැලසුම් කරලා ක්‍රියාත්මක කරමින් සිටිනවා. ගරු මන්ත්‍රීවරුන් යෝජනා කරන පරිදි අපි කල්පනා කරනවා, වසර කිහිපයක් යනකොට අපේ රජය අපේක්ෂා කරන පරිදි, මෙතෙක් ප්‍රදේශ කිහිපයකට, එහෙම නැත්නම් ව්‍යාපාර කිහිපයකට, පුද්ගලයින් කිහිපදෙනෙකුට කේන්ද්‍ර වෙලා තිබෙන සංචාරක කර්මාන්තය මුළු රටටම ව්‍යාප්ත කරන්න. ඒ වාගේම අපේ ආර්ථිකයේ නිසි ප්‍රතිලාභයක් නොලබන කණ්ඩායම්වලට මේ කර්මාන්තය හරහා ආර්ථික අවස්ථා උදා කරන්නත්, අපේ ඓතිහාසික උරුමයන් හා ස්වාභාවික සම්පත් ඉතා ඵලදායී ලෙස සංචාරක කර්මාන්තයට යොදා ගන්නත් අවශ්‍ය සැලසුම් සහ වැඩ පිළිවෙළ අපි සංචාරක අමාත්‍යාංශය විධියට ක්‍රියාත්මක කරමින් ඉන්නවා. මේ වැඩසටහන් හරහා අපි කල්පනා කරන සංචාරක ආර්ථිකය නිර්මාණය කිරීමත්, පුළුල් ලෙස ගත්තොත්, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ලෙස අපේ රටේ පුරවැසියන්ට උදා කරන ජාතික ජන බලවේගය රජයේ අපේ දැක්ම ළඟා කර ගන්නත් මේ ක්ෂේත්‍රයෙන් අවශ්‍ය දායකත්වය ලබා ගැනීමට අපි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඉන්නවාය කියන පණිවුඩය ලබා දෙන්න මම කැමැතියි.

විශේෂයෙන්ම මම මතක් කරන්න අවශ්‍යයි, මේ සඳහා අපිත් එක්ක රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතන ගණනාවකට වැඩ කරන්න සිදු වෙලා තිබෙන බව. ඒ සියලුදෙනාට මම ආරාධනා කරනවා අපි සහයෝගයෙන්, අවශ්‍ය නැමියාවන්, අනුග්‍රහයන් දක්වමින් මේ කටයුතු සිදු කරමු කියලා.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන්, ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.38ට, 2025 පෙබරවාරි 21වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 11වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.38க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 11, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.38 p.m. until 9.30 a.m. on Tuesday, 11th March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 318 - இல. 11
Volume 318 - No. 11

2025 මාර්තු 11වන අඟහරුවාදා
2025 மார்ச் 11, செவ்வாய்க்கிழமை
Tuesday, 11th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 11වන අඟහරුවාදා
2025 மார்ச் 11, செவ்வாய்க்கிழமை
Tuesday, 11th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව [පිටුව 1909]

අමාත්‍යාංශගත උපදේශක කාරක සභා වාර්තා [පිටුව 1910]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [පිටුව 1911]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 1912-1927]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය සඳහා විසඳුම් [පිටුව 1927]

වෛද්‍ය වෘත්තිකයන්ගේ හිඟය හේතුවෙන් මන්නාරම සහ චාවකච්චේරි ප්‍රදේශවල සෞඛ්‍ය සේවාවලට සිදුවන බලපෑම [පිටුව 1932]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [දහඅටවන වෙන් කළ දිනය]:

[ශීර්ෂය 196 (විද්‍යා සහ තාක්ෂණ); ශීර්ෂ 186, 227 (ඩිජිටල් ආර්ථික)] - කාරක සභාවේදී සලකා බලන ලදී [පිටු 1933-2080]

කල්තැබීමේ යෝජනාව:

මඩකලපුව ගුවන් තොටුපළ පුළුල් කිරීමේදී ලබා දී ඇති විකල්ප ඉඩම් සඳහා ඔප්පු ලබා දීම [පිටු 2081-2092]

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 1909]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 1910]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1911]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1912-1927]

தனி அறிவித்தல் மூல வினா:

பட்டதாரிகளின் வேலையின்மைக்கான தீர்வுகள் [ப: 1927]

மருத்துவ நிபுணர்கள் பற்றாக்குறை காரணமாக மன்னார் மற்றும் சாவக்சேரியில் சுகாதார சேவைகளில் தாக்கம் [ப: 1932]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட பதினெட்டாம் நாள்]:

[தலைப்பு 196 (விஞ்ஞான மற்றும் தொழில்நுட்பம்); தலைப்புக்கள் 186, 227 (டிஜிட்டல் பொருளாதாரம்)] – குழுவில் ஆராயப்பட்டது [ப: 1933-2080]

ஒத்திவைப்புப் பிரேரணை:

மட்டக்களப்பு விமான நிலைய விஸ்தரிப்பின்போது வழங்கப்பட்ட மாற்றுக் காணிகளுக்கு உறுதிகளை வழங்குதல் [ப: 2081-2092]

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT [Col. 1909]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1910]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1911]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1912-1927]

QUESTION BY PRIVATE NOTICE:

Solutions for Unemployment of Graduates [Col. 1927]

Impact on Healthcare Services in Mannar and Chavakachcheri Due to Shortage of Medical Consultants [Col. 1932]

APPROPRIATION BILL, 2025 - [Eighteenth Allotted Day]:

Considered in Committee - [Head 196 (Science and Technology); Heads 186, 227 (Digital Economy)] [Cols. 1933-2080]

ADJOURNMENT MOTION:

Grant of Deeds for Alternative Lands Provided for Expansion of Batticaloa Airport [Cols. 2081-2092]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 11වන අඟහරුවාදා
2025 மார்ச் 11, செவ்வாய்க்கிழமை
Tuesday, 11th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දසවන පාර්ලිමේන්තුව සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයක් ස්ථාපනය කිරීම සඳහා 2025 පෙබරවාරි 27 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී හිමි වූ අනුමතිය අනුව, එහි සමාරම්භක රැස්වීම 2025 මාර්තු 11 අඟහරුවාදා, එනම් අද දින අපර භාග 3.00ට කාරක සභා කාමර අංක 01හිදී පැවැත්වීමට නියමිත බව දන්වන අතර, ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට එම රැස්වීම සඳහා සහභාගි වන ලෙස කාරුණිකව ආරාධනය කරනු කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LVI කොටස;
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LIX කොටස; සහ
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXVIII කොටස මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

The Note on Supplementary Allocations from the "Development Activities Programme" appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 01.01.2025 to 28.02.2025 as per Clause (e) of the Motion for the Vote on Account passed by Parliament on 06.12.2024. - [The Hon. (Dr.) Harini Amarasuriya]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2020/2021 වර්ෂය සඳහා මාන්නායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(ii) 2015/2016 වර්ෂය සඳහා සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව;

[ගරු චතුරංග අබේසිංහ මහතා]

(iv) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2022 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි;

(ii) 2012 අංක 12 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු 2013 අංක 12 දරන මුදල් පනතේ 12 වගන්තිය යටතේ නියෝගය; සහ

(iii) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ නියෝග

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

Hon. Speaker, I present -

(1) a petition from Mr. M.D.K. Maldeniya of No. 147/C, Muththettuwatta, Hiswella, Kirindiwela; and

(2) a petition received from Mr. S.A.P.K. Dayananda of No. 155, Ihalagama, Gampaha.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පාලටුව, තල්ගහගොඩ, හිරිමුල්ලගෙවත්ත යන ලිපිනයෙහි පදිංචි කොඩිතුවක්කුගේ පැන්ටිස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතර, වල්ගම මැද, උඳුපියලිය වත්ත, 'සංදීප' යන ලිපිනයෙහි පදිංචි එස්.කේ. ඉනෝකා තුෂාරි මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමිල ප්‍රසාද් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, දියතලාව, පහළ කඳුරුගමුව, ඇල්බැද්දේගල පාර යන ලිපිනයෙහි පදිංචි ටී.එම්. දීපා ශ්‍රියාකාන්ති මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு தினிந்து சமன்)
(The Hon. Dinindu Saman)

ගරු කථානායකතුමනි, වැලිගම, වැල්ලක්ක, අංක 121/55 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.එල්. රංජිත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2010 සිට කුකුළු මස් ආනයනය සහ අපනයනය: විස්තර
2010 முதல் கோழி இறைச்சி இறக்குமதி மற்றும் ஏற்றுமதி: விபரம்
IMPORT AND EXPORT OF CHICKEN MEAT FROM 2010: DETAILS

9/2024

1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කුකුළු මස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළදී කුකුළු මස් අපනයනය කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම කාල සීමාව තුළදී කුකුළු මස් ආනයනය කර තිබේද;

(v) එසේ නම්, එම ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ශ්‍රී ලංකාවේ කුකුළු මස් කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கையின் கோழி இறைச்சி உற்பத்தியானது ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியில் கோழி இறைச்சி ஏற்றுமதி செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அந்த அளவு ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி காலப்பகுதியில் கோழி இறைச்சி இறக்குமதி செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அந்த அளவு ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(vi) இலங்கையில் கோழி இறைச்சி தொழிற்றுறையை மேம்படுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the volumes of chicken produced in Sri Lanka from the year 2010 up to now, separately in respect of each year;

(ii) whether chicken meat was exported during the period concerned;

(iii) if so, the quantities, separately in respect of each year;

(iv) whether chicken meat was imported during the period concerned;

(v) if so, the quantities, separately in respect of each year; and

(vi) the measures that will be taken to improve the chicken meat industry in Sri Lanka?

(b) If not, why?

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

වර්ෂය	කුකුළු මස් නිෂ්පාදනය (මෙට්‍රික්ටොන්)
2010	104,160
2011	116,760
2012	137,390
2013	144,540
2014	150,320
2015	164,450
2016	182,690
2017	200,980
2018	214,200
2019	224,010
2020	216,160
2021	236,670
2022	228,130
2023	236,110
2024	257,930
2025	283,580**

** අපේක්ෂිත නිෂ්පාදනය.

(ii) ඔව්.

(iii)

වර්ෂය	අපනයනය කළ කුකුළු මස් ප්‍රමාණය (මෙට්‍රික්ටොන්)
2010	2,309.60
2011	1,812.03
2012	969.60
2013	1,524.46
2014	1,964.66
2015	1,080.32
2016	1,473.03
2017	1,995.82
2018	3,727.89
2019	3,664.17
2020	1,597.58
2021	770.68
2022	502.76
2023	1,812.52
2024	2,487.99

(iv) ඔව්.

(v)

වර්ෂය	ආනයනය කළ කුකුළු මස් ප්‍රමාණය (මෙට්‍රික්ටොන්)
2010	1,235.74
2011	1,952.13
2012	844.51
2013	352.46
2014	354.00
2015	591.58
2016	252.59
2017	271.52
2018	277.16
2019	195.85
2020	128.58
2021	54.73
2022	140.46
2023	231.50
2024	65.79

(vi) කුකුළු මස් නිෂ්පාදනය පූර්ණ ලෙසම පෞද්ගලික අංශය මඟින් සිදු කෙරේ. රාජ්‍ය අංශය මඟින් නිෂ්පාදනය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, නියාමන කටයුතු සහ අදාළ පහසුකරණයන් සිදු කරනු ලබයි.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

කුකුළු මස් කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග:

- "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව වර්තමාන කුකුළු මස් නිෂ්පාදනය 2029 වසර වන විට දෙගුණ කිරීම සඳහා සැලසුම් කර ඇත.
- කුකුළු මස් නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය සත්ත්ව ආහාර සඳහා බහුලව භාවිත කරන අමුද්‍රව්‍ය බඩ ඉරිහු වන අතර, සෑම වසරකම බඩ ඉරිහු ආනයනය සඳහා වැඩි විදේශ විනිමයක් වැය කිරීමට සිදු වේ. එබැවින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් දැනට ක්‍රියාත්මක කර ඇති "භෝග නිෂ්පාදන වැඩසටහන" සඳහා හඳුනාගත් භෝගයක් ලෙස දේශීය බඩ ඉරිහු වගාවට මුල් තැන දී ඉලක්කගත වැඩසටහනක් දියත් කර ඇත.
- ඒ අනුව 2025 වසරේ යල කන්නයේ දී හෙක්ටෙයාර 20,000ක් වගා කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව පසු ගිය වසරට වඩා බඩඉරිහු මෙට්‍රික්ටොන් 100,000ක වැඩි අස්වැන්නක් මෙම වසරේදී අපේක්ෂා කෙරේ.
- සත්ත්ව ආහාර නිෂ්පාදනයට අවශ්‍ය සම්පූර්ණ බඩඉරිහු ප්‍රමාණය දේශීය නිෂ්පාදනය මඟින් සපුරා ගත නොහැකි බැවින්, පවතින හිඟතාව මහඟරවා ගැනීම සඳහා මෙම වසරේදී බඩඉරිහු මෙට්‍රික්ටොන් 250,000ක් ආනයනය කිරීමට සැලසුම් කර ඇත.
- දේශීය අවශ්‍යතාව සපුරා ගනිමින් විදේශීය වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් නිෂ්පාදනයක් සඳහා වර්තමාන කුකුළු මස් නිෂ්පාදනය වැඩි කිරීමටත්, හඳුනාගත් විදේශීය වෙළෙඳ පොළ සඳහා ඇතුළුවීමට එම රටවලට (උදාහරණ: චීනය, සිංගප්පූරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි) අදාළ ආනයනය සඳහා සම්මත අවශ්‍යතාවන් පරිපූර්ණ කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී.
- කුකුළු ආහාර නිෂ්පාදනයේ දී අත්‍යවශ්‍ය වන අමුද්‍රව්‍ය හා කර්මාන්තයේ දියුණුවට අවශ්‍ය උපකරණ හා අමතර කොටස් ආනයනයේ දී අවශ්‍ය තීරු බදු සහන ලබා දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් අවශ්‍ය නිර්දේශ ලබා දීම සහ ඒ සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- මුතුන්මිතු (grandparent) හා මවුපිය (parent) ගොවිපළ සඳහා දිනක් වයසැති සතුන් ආනයනය කිරීම සඳහා පහසුකරණය කිරීම.
- වාර්ෂික නිෂ්පාදන සැලසුම් අධ්‍යයනය කර නිෂ්පාදන පුරෝකථන සිදු කිරීම.
- නිෂ්පාදන තත්ත්ව මාසිකව ඇස්තමේන්තු කිරීම මඟින් නිෂ්පාදන මට්ටම සැලසුම් කර ගැනීම සඳහා නිෂ්පාදකයන්ට සහාය වීම.
- මුතුන්මිතු (grandparent) හා මවුපිය (parent) ගොවිපළවල ජෛව ආරක්ෂණ විධිවිධාන වාර්ෂිකව පරීක්ෂා කිරීම සහ ගොවිපළ සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය මාසික වාර්තා මඟින් ඇගැයීම.
- සෑම කාර්තුවකට වරක්ම බීජ රක්කනාගාරවල රෝග පරීක්ෂාවන් සිදු කිරීම මඟින් යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු දිනක් වයසැති කුකුළු පැටවුන් වාණිජ කුකුළු ගොවිපළ වෙතට නිකුත් කරන බව තහවුරු කිරීම.
- සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා නිර්දේශ ලබා දීම සහ අදාළ පහසුකරණය කිරීම.
- ඉහළ ගුණාත්මයෙන් යුතු කුකුළු මස් නිෂ්පාදන අපනයන කිරීමට අදාළ පහසුකරණයන් සිදු කරයි. මේ යටතේ ගොවිපළ නිරීක්ෂණ, විගණන සහ රසායනාගාර පරීක්ෂණ පහසුකම් සැපයීමත්, සත්ත්ව සෞඛ්‍ය සහතික මඟින් එම තත්ත්වයන් තහවුරු කිරීමත් සිදු කරයි.
- සුළු පරිමාණ ගොවීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති පශු විමර්ශන මධ්‍යස්ථාන සහ ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනය මඟින් අවශ්‍ය රෝග විනිශ්චය, රසායනාගාර සේවා හා උපදෙස් සැපයීම.
- කුරුලු උණ රෝගයෙන් තොර රටක් ලෙස, එම තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමස්ත දිවයිනම ආවරණය වන පරිදි කුරුලු උණ රෝග ආවේක්ෂණ කටයුතු පවත්වා ගෙන යාම.
- දැනට කරගෙන යනු ලබන නියාමන කටයුතු සහ පහසුකරණය සඳහා අවශ්‍ය ආයතනික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

(ආ) පැන නොනඟී.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, අපේ රටේ කුකුළු මස් කර්මාන්තය කියන්නේ සාමාන්‍ය ජනතාව වැඩියෙන් ප්‍රතිලාභ ලබන කර්මාන්තයක්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාල සීමාවේ මේ කර්මාන්තයේ පැවති තත්ත්වය පිළිබඳව දළ අදහසක් ගන්න තමයි මම ඔබතුමාගෙන් ඒ සංඛ්‍යා දත්ත පිළිබඳව විමසුවේ. ඒ අනුව ගරු කථානායකතුමනි, අපට පැහැදිලිව පේනවා, වසරින් වසර යම්කිසි වර්ධනයක් වෙනවා වාගේම යම් ප්‍රමාණයක ආනයනය කිරීමක් ද සිදු කර තිබෙන බව. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. ඇත්තටම අපේ රටේ කුකුළු මස් කර්මාන්තය කරන්න කිසිම අපහසුතාවක් නැහැ. මේ කර්මාන්තය තුළ පැන නැඟිලා තිබෙන ප්‍රශ්නවලට සැබෑ උත්තර ටිකක් දෙනවා නම් කුකුළු මස් ආනයනය කිරීමක් කරන්න අවශ්‍ය වෙන්නේම නැහැ. මම හිතනවා, අපට අපනයනය කරන්න පුළුවන් වෙයි කියලා. මේ දවස්වල ඌරුමස් supply කරන කර්මාන්තකරුවෝ හමු වෙන්න ඇමතිතුමා වත්තල ගිහින් තිබුණා ඊයේ පෙරේදා මම දැක්කා. ඒකේ වීඩියෝ එකක් තිබුණා. එහෙම ගිහිල්ලා ඉද්දී ඇමතිතුමාට ටිකක් කේන්ති ගිහිල්ලා තද ප්‍රකාශයක් කරන වීඩියෝ එකක් එහෙමත් අපට හම්බවෙලා තිබෙනවා. ඒ විධියට නොවෙයි, සැබැවින්ම මේ ප්‍රශ්නයට හරි ආමන්ත්‍රණයක් කරන්න ඕනෑ. මොකද, මේ ව්‍යාපාරිකයෝත් එක එක වෙලාවට තමන්ට හිතෙන පරිදි මිල වැඩි කරනවා. රජයෙන් ආපහු මිල පාලනය කරන්න උත්සාහ කරනවා. මේ සඳහා වන ස්ථිරසාර වැඩසටහනක් වෙනුවෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි. ඒක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම එක කාරණයක් නිවැරදි කරන්න ඕනෑ. සූකර කර්මාන්තයට අදාළව අපි මැදිහත් වුණා. ඒගොල්ලන් එක්ක සාකච්ඡා කළා, හමු වුණා, ඒ කොටු බලන්නත් ගියා. නමුත් වත්තල කියන ප්‍රදේශයට මම ගියේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, ඔබතුමා කියන කාරණය හරි. අපේ රටේ බිත්තර කර්මාන්තය සහ මස් කර්මාන්තයෙන් අපේ රටේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න පුළුවන්. බිත්තරවලින් කොහොමත් අපේ රට ස්වයංපෝෂිත වෙලා තිබුණේ. ඒ තත්ත්වය තුළ තමයි බිත්තර රටින් ගේන තැනට මේ කර්මාන්තය කඩා වැටිටුවේ.

මස් සම්බන්ධයෙන් ගත්තාම, ඇත්තටම කුකුළු මස් සැලකිය යුතු ප්‍රමාණයක් අපි නිෂ්පාදනය කරනවා. මාලදිවයින, අරාබිය වාගේ රටවලට අපි කුකුළු මස් යම් ප්‍රමාණයක් අපනයනය කිරීමකුත් කරනවා. ඒ වාගේම කුකුළු මස් ආනයනය කිරීමකුත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම විදේශ දූත මණ්ඩල වාගේම චීනයේ සිට මෙහේ ආපු අය ඉන්නවා. ඒ අයගේ පරිභෝජනය සඳහා යම් ප්‍රමාණවලින් කුකුළු මස් ආනයනය කරලා තිබෙනවා. ඒ වාගේම අගය එකතු කරලා ප්‍රතිඅපනයනය කිරීම සඳහා ආනයනය කිරීම් සිදු කරලාත් තිබෙනවා, පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන්. රාජ්‍ය අංශයේ මැදිහත්වීමකින් නොවෙයි එය සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ අනුව ඉදිරියේදී කුකුළු මස්වලින් අපේ රට ස්වයංපෝෂිත තත්ත්වයකට ගෙන ඒම සඳහා අපි සැලසුමක් හදලා තිබෙනවා. විශේෂයෙන්ම මේ වෙනකොට චීනය, වියට්නාමය, සිංගප්පූරුව, මලයාසියාව, ජපානය වාගේ රටවල් 8කින් අපි ඉල්ලලා තිබෙනවා, අපේ රටේ තිබෙන කුකුළු මස් ඒ රටවලට අපනයනය කිරීම සඳහා ඉඩකඩ ලබා දෙන්න කියලා.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට එතුමාට පුළුවන් නම් උත්තර දෙන්න කියලා මම කියනවා. මොකද, එය මේ ප්‍රශ්නයට අදාළ එකක් නොවෙයි. අපේ රටේ මේ දවස්වල තිබෙන ලොකු ගැටලුවක් තමයි සහල් පිළිබඳ ප්‍රශ්නය. දැන් එය පොඩ්ඩක් අමතක වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා,-

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. එතුමා කැමති නම් කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට උත්තර දෙන්න කියලා මම කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නයක් අහනවා නම් කරුණාකර ස්ථාවර නියෝග 33 (1) යටතේ අහන්න පුළුවන්.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය අහනවා. නමුත්, එතුමා අකැමති නම් එයට උත්තර දෙන්න ඕනෑ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එතුමා කැමති වුණත්, නොවුණත් එතුමාටත් එවැනි ප්‍රශ්නයකට උත්තර දෙන්න බැහැ. මොකද, එතුමාගෙන් අහලා තිබෙන මුල් ප්‍රශ්නයට අදාළව තමයි උත්තර දෙන්න වෙන්නේ. ඒ නිසා කරුණාකර අපි ඒ විධියට කටයුතු කරමු, ගරු මන්ත්‍රීතුමනි.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

නැහැ, නැහැ. මම අහන්න හදපු ප්‍රශ්නය මේකයි. ඔබතුමා කලබල වුණා නේ. කුකුළු මස් ගැන නේ මම මුල් ප්‍රශ්නය ඇහුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, කුකුළු මස් ගැන විතරයි.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

කුකුළු මස් නිෂ්පාදනය සඳහා සහල් නිෂ්පාදනයත් අදාළ වෙනවා නේ. කුකුළු කෑම හදන්න සහල් අවශ්‍ය වෙනවා නේ. හොඳයි, මම එහෙම අහන්නම්කෝ. මම අහනවා, කුකුළු කෑම අවශ්‍යතාව supply කරන්න පුළුවන් ආකාරයේ,- *[බාධා කිරීමක්]* කථානායකතුමාගේ ප්‍රශ්නය මේ අහන්නේ. මගේ ප්‍රශ්නය නොවෙයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ගැටලුවක් ඇති. මොකද, මේ වෙලාවේ මීනිසුන්ටත් කන්න හාල් නැහැ නේ. මම අහනවා, ඒ වෙනුවෙන් මේ අවස්ථාව වනවිට වී අලෙවි මණ්ඩලයේ ගඩබාවල වී එකතු කිරීමේ කාර්යය සාර්ථකව සිදු වෙනවාද, එහෙම නැත්නම් මේ ගැටලුවට උත්තරයක් සොයා ගන්න යම් වැඩසටහනක් තිබෙනවාද කියලා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

කැරකිලා කැරකිලා කුකුළා කොහොම හරි වී පැදුරට ආවා නේ. මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමා. ඇත්තටම ඒ ප්‍රශ්නයේදී අපි ගොවියාගේ ප්‍රශ්නය බේරලා තිබෙනවා. මොකද, ගොවියාගේ වීවලට හොඳ මිලක් ලැබිලා තිබෙනවා. වීවලට මිලක් නැහැ, වී විකුණා ගන්න බැහැ කියලා ගොවීන් දැන් කොතැනකවත් උද්ඝෝෂණය කරන්නේ නැහැ; කෑ ගහන්නේ නැහැ. ගොවියාගේ ප්‍රශ්නය අපි බේරලා තිබෙනවා. අමාත්‍යාංශයක් විධියට අපේ මූලික කාරණය වන්නේ ගොවියා. ඒ නිසා ගොවියාගේ ප්‍රශ්නය අපි බේරලා තිබෙනවා. මේ වෙනකොට ගොවි ජනතාව වී අලෙවි මණ්ඩලයටත් යම් යම් ප්‍රමාණවලින් වී ගෙනැත් දෙන්න පටන්ගෙන තිබෙනවා; ඒ වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මුලින් තිබුණු තත්ත්වය මේ වෙනකොට වෙනස් වෙමින් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -482/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -486/2025- (1), ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

වලවේ ගඟ හරහා ලියන්ගස්තොට පාලම ඉදිකිරීම: වර්තමාන තත්ත්වය

லியன்கஸ்தொட்ட பால வளவை கங்கைக்குக் குறுக்காக நிர்மாணம்: தற்போதைய நிலை

CONSTRUCTION OF LIYANGASTOTA BRIDGE ACROSS WALAWE RIVER : CURRENT STATUS

509/2025

4. ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයට ආසන්නව හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලවේ ගඟ හරහා ලියන්ගස්තොට පාලම ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය සහ අවසන් කිරීමට නියමිතව තිබූ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාලමේ ඇස්තමේන්තුගත වටිනාකම කොපමණද;

(iv) එවකට එම පාලමේ ඉදිකිරීම් භාරව කටයුතු කරන ලද අමාත්‍යාංශය/ආයතනය කවරේද;

(v) එය ඉදිකරන ලද කාලයේදී අදාළ අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයා කවුරුන්ද;

(vi) මේ වනවිට එම පාලමේ වැඩ අවසන් කර තිබේද;

(vii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමඟ නතර කර තිබේ නම්, ඒ හේතුවෙන් විනාශ වී ඇති ද්‍රව්‍ය කවරේද;

(viii) ඒවායේ වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தை அண்மித்ததாக அம்பாந்தோட்டை மாவட்டத்தில் வளவை கங்கைக்குக் குறுக்காக லியன்கஸ்தொட்ட பாலம் நிர்மாணிக்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி பாலத்தின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்பட்ட திகதி மற்றும் நிறைவு செய்யப்படவிருந்த திகதி வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி பாலத்துக்கான மதிப்பீட்டுப் பெறுமதி எவ்வளவு என்பதையும்;

(iv) அப்போது குறித்த பாலத்தை நிர்மாணிப்பதற்குப் பொறுப்பாகச் செயற்பட்ட அமைச்சு/நிறுவனம் யாது என்பதையும்;

(v) பாலம் நிர்மாணிக்கப்பட்ட காலப்பகுதியில் குறித்த அமைச்சுக்குப் பொறுப்பாக இருந்த அமைச்சர் யாரென்பதையும்;

(vi) இன்றளவில் மேற்படி பாலத்தின் நிர்மாணப் பணிகள் நிறைவடைந்துள்ளனவா என்பதையும்;

(vii) மேற்படி பாலத்தின் நிர்மாணப் பணிகள் இடைநிறுத்தப்பட்டிருப்பின், அதன் காரணமாக நாசமடைந்துள்ள பொருட்கள் யாவை என்பதையும்;

(viii) அவற்றின் பெறுமதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) whether he is aware that the Liyangastota Bridge has been constructed across the Walawe River within the Hambantota District, close to the Ratnapura District;

(ii) the date on which the construction of the said bridge was commenced and the date on which it was to be completed, separately;

(iii) the estimated cost of the said bridge;

(iv) the Ministry/institution that had been in charge of the construction of the said bridge at that time;

(v) the name of the Minister who was in charge of the relevant Ministry at the time it was being constructed;

(vi) whether the construction of the said bridge has been completed by now;

(vii) if the construction of the said bridge has been halted midway, the materials that have been destroyed as a result; and

(viii) the value of those materials?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ලියන්ගස්තොට පාලමෙහි ඉදිකිරීම් කටයුතු අංක 17/2617/702/002-XXXI හා 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව මඟින් සිදු කර ඇති අතර, පාලමේ භෞතික ප්‍රගතිය සියයට 75ක් ලෙස දළ වශයෙන් ඉදිරිපත් කළ හැක.

මෙම පාලම හම්බන්තොට දිස්ත්‍රික්කයට හා රත්නපුර දිස්ත්‍රික්කයට මායිම්ව වලවේ ගඟ හරහා පිහිටි පාලමක් වේ. පාලම විවර 5කින් යුක්ත - with five spans - දිග මීටර් 16.5ක් හා පළල මීටර් 11ක් වන කුලුනු 4කින් සමන්විත - with four piers - හා ආධාරක යා බැම් දෙකකින් - two abutments - යුක්ත වේ.

(ii) 2017 දෙසැම්බර් 25 දින ආරම්භක දිනය වේ.

අවසන් කිරීමට නියමිතව තිබූ දිනය - 2019 ජූනි 03.

අංක අමප/20/0861/206/037 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැඩ අවසන් කිරීමට නියමිත දිනය 2022.07.21 ලෙස සංශෝධනය කර ඇත.

(iii) ආරම්භක කොන්ත්‍රාත් වටිනාකම - රුපියල් මිලියන 270,948,715.11කි.

2020 වර්ෂයේදී සිදු කරන ලද ඉතුරු වැඩ සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තුවේ වටිනාකම - රුපියල් මිලියන 194,894,221.37කි.

ඉතුරු වැඩ සම්පූර්ණ කිරීම සඳහා 2025 වර්ෂයට අදාළව ඇස්තමේන්තුව මේ වනවිට සකස් කරමින් පවතී.

(iv) 2017 ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේදී අංක 17/2617/702/002-XXXI හා 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත පරිදි පාර්ශ්වකරුවන් තීරණය කර ඇත.

(1) සේවාලාභියා - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය)

(2) උපදේශක - මාර්ග සංවර්ධන අධිකාරිය (එවකට මහාමාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය)

(3) කොන්ත්‍රාත්කරු - රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය)

2020 දී ලබාගත් අමාත්‍ය මණ්ඩල තීරණ අංක CP/20/861/206/037 අනුව පහත පරිදි පාර්ශ්වකරුවන් සංශෝධනය වී ඇත.

(1) සේවාලාභියා - මාර්ග සංවර්ධන අධිකාරිය (මහාමාර්ග අමාත්‍යාංශය)

(2) උපදේශක - මාර්ග සංවර්ධන අධිකාරිය (මහාමාර්ග අමාත්‍යාංශය)

(3) කොන්ත්‍රාත්කරු - රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව SD&CC (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය)

(v) 2017දී නිටපු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතා

2020දී අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පසුව නිටපු මාර්ග හා මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

(vi) පාලමේ භෞතික ප්‍රගතිය සියයට 75කි. පාලමේ කුලුනු බැම් මුදුන තෙක් සම්පූර්ණ කර ඇත. පාලමේ විවර දෙකකට අදාළ කොන්ක්‍රීට් පමණක් අතුරා සම්පූර්ණ කර ඇත.

කොන්ත්‍රාත්කරු විසින් 2023 ජනවාරි මස ඉදිකිරීම් අතරමඟ නවතා ඇත. මේ වනවිට mutual termination ගිවිසුම් අවලංගු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

(vii) පාලමේ අමුද්‍රව්‍ය, සිදුකරන ලද සියයට 75 පමණ වූ ඉදිකිරීම් සඳහා භාවිත කර ඇත. සිදු කර ඇති ඉදිකිරීම් ද හොඳ තත්ත්වයේ පවතින අතර විනාශ වීමක් සිදු වී නොමැත.

(viii) විනාශ වෙච්ච එකේ වටිනාකම අදාළ වෙන්නේ නැහැ.

(ආ) අදාළ නොවේ.

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, පසුගිය ආණ්ඩුවේ හිටපු ඇමතිවරයාත් මෙතැන සිටියදී තමයි මම මේ ප්‍රශ්නය වර්තමාන ඇමතිතුමාගෙන් අහන්නේ. මේ වෙනකොට මෙම පාලම නිසා ඒ ප්‍රදේශයට අනාරක්ෂිත බවක් ඇතිවෙලා තිබෙනවා. පසුගිය සතියක වාගේ කාලය ඇතුළත මෙම පාලමේ ඉදිකිරීම් සඳහා ගෙනිහින් දාපු යම් යම් කොටස් ඉවත් කර ගැනීමකුත් සිදුවෙලා තිබෙනවා. 2025 ජනවාරි මස 25 හෝ 26 දින හෝ ඊට ආසන්න දිනක "සිරස" ප්‍රවෘත්ති විකාශයේත් මේ සම්බන්ධයෙන් තොරතුරු පළ වුණා. පසුගිය කාලයේ විපක්ෂය පැත්තෙනුත් මතයක් ආවා, පරණ ඒවා ගැන කථා කරන්න එපා, අලුත් ඒවා ගැන කථා කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, රට පුරා මෙවැනි ව්‍යාපෘති ගණනාවක් මහ නතර වෙලා තිබෙනවා. ඒවාට විශාල මුදල් කන්දරාවකුත් ගෙවන්න වෙලා තිබෙනවා. ජනතාව අපෙන් ප්‍රශ්න කරනවා, අපි මේ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා. ගරු ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි, වසර ගණනක් නිස්සේ වැඩ අවසන් නොකරමින් අතරමඟ නතර කර දමා තිබෙන මෙවැනි ව්‍යාපෘති තව කොපමණ ප්‍රමාණයක් තිබෙනවා ද කියා ඔබතුමා දැනුවත් ද කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මේ පාලමේ ඡායාරූපත් අප සතුව තිබෙනවා. ඇත්තටම 2019 අවුරුද්දේ අවසන් කරන්න තිබුණු පාලමේ වැඩ තමයි තවමත් අවසන් වෙලා නැත්තේ. මේ පාලමේ වැඩ කටයුතු තවම ගඟ මැද්දේ නතර වෙලා තිබෙනවා. අවුරුදු 6කට ආසන්න කාලයක් තිස්සේ ඒ පාලම නාස්ති වෙමින් තිබෙන්නේ. මේ දක්වා ඒ කරපු දේවලුත් නාස්ති වෙමින් තිබෙන්නේ.

නමුත්, මේ පාලමේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා 2025 වර්ෂයට අදාළව අපි දැනට ඇස්තමේන්තු සකස් කරමින් සිටිනවා. ඔබතුමා යෝජනා කරපු දේවල් වාගේ ගොඩක් දේවල් තිබෙනවා. ඊයේ හෝ ඊට කලින් දවසේත් මම කරුණු ඉදිරිපත් කළා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ එවැනි පාලම් විසි ගණනක් තිබෙනවා කියලා. ඒ සමහර පාලම් හදලා තිබෙනවා පාරවල් නැති තැන්වල. පාරක් නැහැ, නමුත් පාලම හදලා තිබෙනවා. හම්බන්තොට හැම තැනම ඒ වාගේ පාලම් තිබෙනවා. ඒවායින් අවශ්‍ය ඒවා විසඳන්න අවශ්‍යයි, ගරු කථානායකතුමනි.

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, ස්ථාවර නියෝගවලට අනුව හිටපු ඇමතිවරයෙකුගෙන් අතුරු ප්‍රශ්න අහන්න බැරිද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බැහැ.

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
වර්තමාන ඇමතිතුමාගෙන්ම තමයි අහන්න වෙන්නේ, නේද?

[ගරු උපුල් කිත්සිරි මහතා]

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ගත්තොත්, විශාල චෝදනා ප්‍රමාණයක් තිබෙනවා. මේ පාලමේ ඉදිකිරීම්වලට ඒ මොහොතේ සල්ලි ඇවිල්ලා තිබෙනවා. එතකොට හිටපු ඇමතිවරයා හෝ එතුමාගේ ලේකම්වරු විසින් මේ පාලමේ කොන්ත්‍රාත්තුවට අදාළ මුදල් ලබාගෙන ඒ මුදල් අවභාවිත කළා කියලා චෝදනා තිබෙනවා. මේ ව්‍යාපෘති නතර වෙන්න හේතුව වශයෙන් ජනතාව අතර තිබෙන්නේ එවැනි මතයක්.

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් යම් විගණනයක් හෝ යම් වාර්තාවක් කැඳවීමට බලාපොරොත්තු වෙනවාද? මොකද, ඒ ජනතාව කියන කාරණා අනුව පරස්පරතා තිබෙනවාද, නැද්ද කියලා අපි දැනගන්න කැමැතියි.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපට ඒ සම්බන්ධව විගණනයක් කරන්න පුළුවන්. මම මේ ලිපි ලේඛනත් මන්ත්‍රීතුමාට ලබා දෙන්නම්, පාර්ලිමේන්තුවේ සභාගත කළාට පසුව. ඔබතුමන්ලා සතුව නිශ්චිතව එහෙම චෝදනාවක් තිබෙනවා නම් අපට ඒ පිළිබඳ විගණනයක් කරන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(මාණ්පුමිකු සජිත් පිරේමදාස - එදිර්ක්කට්සි මුදල්වර්)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මොකද, එවකට නිවාස හා ඉදිකිරීම් ඇමතිවරයා හැටියට කටයුතු කළේ මමයි. නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයෙන් අපි ලබා ගත් අරමුදල්වලින් තමයි මේ ව්‍යාපෘතිය කළේ, පෞද්ගලික සමාගම් එක්ක නොවෙයි. ඇත්ත වශයෙන්ම වළවේ ගඟ හරහා පාලම ඉදිකිරීම තුළින් ජනතාවට පහසුකම් සපයන්නට අපට ඕනෑ වුණා. ඒ වාගේම රාජ්‍ය ආයතනයක් වන SD&CC ආයතනයට, NEMO, SEC වාගේ ආයතනවලට තමයි අපි ඒ ඉදිකිරීම් කටයුතු භාර දුන්නේ. ඒ ව්‍යාපෘතිය හොඳට කරගෙන ආවා. ඒක අතරමඟ නතර වෙන්න ප්‍රධානම හේතුව, 2019 ජනාධිපතිවරණයෙන් පසුව බලයට පත් වුණු ගෝඨාභය රාජපක්ෂ රජය ඒ සම්පූර්ණ පාලම් ව්‍යාපෘති වැඩසටහන නතර කිරීමයි. පැහැදිලිවම, 2019 ජනාධිපතිවරණයෙන් පසුව බලයට පත් වුණු ගෝඨාභය රාජපක්ෂ රජය ඒ සම්පූර්ණ පාලම් ව්‍යාපෘති වැඩසටහන නතර කිරීම නිසා තමයි අවුරුදු ගණනාවක් ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක නොවුණේ. ඒ පාලම් ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් සියල්ලක්ම ක්‍රියාත්මක කළේ රාජ්‍ය ආයතන, පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් නොවෙයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන වටය.

මවුලවි සහතිකය පිරිනැමීම: පොදු විභාගය
மௌலவி சான்றிதழ் வழங்கல்: பொதுப் பரீட்சை
AWARD OF MOULAVI CERTIFICATE: COMMON EXAMINATION

482/2025

2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ අරාබි විදුහල් ලියාපදිංචි කර නඩත්තු කරන බවත්;

(ii) මවුලවි සහතිකය ලබා දීම සඳහා එම එක් එක් අරාබි විදුහල් වෙන වෙනම විභාග පවත්වන බවත්;

එතුමා දන්නේද?

(ආ) මවුලවි සහතිකය ලබා දීම සඳහා රජය විසින් පොදු විභාගයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முஸ்லிம் சமய மற்றும் கலாசார அலுவல்கள் திணைக்களத்தின்கீழ் அரபுக் கல்லூரிகள் பதிவுசெய்யப்பட்டு பராமரிக்கப்படுகின்றன என்பதையும்;

(ii) மௌலவிச் சான்றிதழை வழங்குவதற்காக மேற்படி ஒவ்வோர் அரபுக் கல்லூரியும் வெவ்வேறாக பரீட்சைகளை நடாத்துகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மௌலவிச் சான்றிதழை வழங்கும்பொருட்டு அரசாங்கத்தால் பொதுப் பரீட்சை ஒன்றை நடாத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Is he aware that -

(i) Arabic colleges are registered with and maintained under the Department of Muslim Religious and Cultural Affairs; and

(ii) each of these Arabic colleges conducts separate examinations for awarding the Moulavi Certificate?

(b) Will he inform this House whether the Government will take steps to conduct a common examination for awarding the Moulavi Certificate?

(c) If not, why?

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (කලානිති) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අරාබි විද්‍යාල සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කළමනාකරණය කරනු ලබන්නේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් වන අතර, ඊට අදාළ සියලු කටයුතු අධීක්ෂණය කිරීමද සිදු කරනු ලබයි.

(ii) වර්තමානයේ සෑම අරාබි විද්‍යාලයක්ම තමන්ගේම අවසාන විභාගයක් පවත්වන අතර ඒ ඒ අරාබි විදුහල්වලට ආවේණික වූ සහතික නිකුත් කරයි. කෙසේ වෙතත් නව ක්‍රමය යටතේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සංශෝධිත විෂය නිර්දේශය සහ විෂය මාලාව මත පදනම්ව ඒකාබද්ධ විභාගයක් හඳුන්වා දීම තුළින් පොදු විභාගයක් පැවැත්වීමට කටයුතු කරනු ඇත.

ඔව්.

(ආ) විෂය නිර්දේශය හා විෂය මාලාවේ කෙටුම්පත සම්පූර්ණ කර සමාලෝචනය හා අනුමැතිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලැබුණු පසු යාවත්කාලීන කරන ලද විෂය මාලාව සහ පොදු විභාගය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත; (**ඇමුණුම් 01,** 02** සහ 03**** බලන්න.)

(ඇ) අදාළ නොවේ.

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඇති "රෙජීඩේල් වත්ත"ඉඩම: විස්තර
தேசிய மிருகக்காட்சிசாலைகள் திணைக்களத்தின் கீழுள்ள 'ரெஜிடேல்' தோட்டம்: விபரம்
REGIDALE ESTATE UNDER DEPARTMENT OF NATIONAL ZOOLOGICAL GARDENS: DETAILS

486/2025

3. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා වෙනුවට)
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Lakshman Nipuna Arachchi)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහපොල පිහිටා ඇති `රෙජීඩේල් වත්ත' නමැති ඉඩම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින්නේද;

(ii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iii) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට එම ඉඩමේ සිදු කරනු ලබන කටයුතු කවරේද;

(iv) එම ඉඩම සම්බන්ධයෙන් ඉදිරි වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கெஸ்பேவ பிரதேச செயலாளர் பிரிவில், கஹபொலவில் அமைந்துள்ள 'ரெஜிடேல் வத்தை' எனும் காணியானது தேசிய மிருகக்காட்சிசாலைகள் திணைக்களத்தின்கீழ் உள்ளதா என்பதையும்;

(ii) மேற்படி காணியின் பரப்பளவு எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி காணியில் இன்றளவில் தேசிய மிருகக்காட்சிசாலைகள் திணைக்களத்தினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி காணி தொடர்பாக ஏதேனும் எதிர்கால வேலைத்திட்டம் உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether the land named "Regidale Estate" situated in Kahapola within the Kesbewa Divisional Secretary's Division is under the Department of National Zoological Gardens;

(ii) the area (size) of the land concerned;

(iii) the activities conducted by the Department of National Zoological Gardens on the land concerned at present; and

(iv) whether there is a future plan regarding the land concerned?

(b) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහපොල පිහිටා ඇති "රෙජීඩේල් වත්ත" නමැති සම්පූර්ණ ඉඩම අක්කර 77ක් වන අතර, අක්කර 72 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරා තිබේ. ඉතිරි අක්කර 05 බුද්ධ ශාසන අමාත්‍යාංශය වෙත පවරා ඇත.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

අදාළ ඔප්පුවේ සහතික කරන ලද පිටපත **ඇමුණුම 01**** මඟින් දක්වා ඇත.

අංක අමප/16/1733/730/009 හා 2016.09.14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සහ අංක අමප/16/2216/730/009-1 හා 2016.11.09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය **ඇමුණුම 02**** මඟින් දක්වා ඇත.

අංක අමප/20/1493/305/004 දරන 2020.11.03 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය **ඇමුණුම 03**** මඟින් දක්වා ඇත.

(ii) අක්කර 72කි. (ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත්) ඉඩමෙහි සැලැස්ම **ඇමුණුම 04**** මඟින් දක්වා ඇත.

(iii) ජාතික සත්වෝද්‍යානයේ සංරක්ෂණ අභිමතාර්ථයන්ට අනුකූලව පාරිසරික සංචාරක කර්මාන්තයේ සේවාවන් සපයන ප්‍රධාන ආයතනයක් වශයෙන් රජයට වැය බරක් ඇති නොවන ආයතනයක් වශයෙන් පවත්වා ගැනීම සඳහා, සත්වෝද්‍යානයේ ප්‍රධානම අවශ්‍යතාව වන සතුන් සඳහා ආහාර සපයන ගොවිපොළක් පවත්වා ගත යුතු ය. ඒ සඳහා මෙම ඉඩම යොදා ගැනීමට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. පවත්නා අරමුදල මඟින් මෙම ඉඩමේ කොටසක CO4 තෘණ, කෙසෙල්, වෙනත් ආහාරමය ශාක වගාවන් හා එළවලු වගාවන් වගා කිරීම සඳහා යොදාගෙන ඇත. වගාව පුළුල් කරමින්, දෙහිවල සත්වෝද්‍යානයේ සතුන්ගේ සම්පූර්ණ තණකොළ අවශ්‍යතාව ඉදිරි වසරේදී සම්පූර්ණ කර ගැනීමට මෙමඟින් අපේක්ෂිතය.

(iv) පරිසර අමාත්‍යාංශය සහ බුද්ධ ශාසන අමාත්‍යාංශය ඒකාබද්ධ වැඩ පිළිවෙළක් සකස් කිරීමට කටයුතු කර ඇත.

ඔව්.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ගරු විපක්ෂ නායකතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය සඳහා විසඳුම්
பட்டதாரிகளின் வேலையின்மைக்கான தீர்வுகள்
SOLUTIONS FOR UNEMPLOYMENT OF GRADUATES

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

රැකියා විරහිතභාවය සහ අධ්‍යාපන ක්‍රමයේ ඇති සබඳතාවේ විෂම චක්‍රය තවමත් නොවිසඳුණු ගැටලුවකි. දේශපාලනයේ අතකොළු පමණක් වන රැකියා විරහිත උපාධිධාරීන්ගේ ගැටලුව යළිත් ප්‍රධාන මාතෘකාවක් වී ඇති පසුබිමක පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරන අතර, ඒ සඳහා නිවැරදි පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙමි.

1. නිදහස් අධ්‍යාපනය යටතේ ප්‍රාථමික, ද්විතියික හා තෘතියික යන එක් එක් මට්ටමේ අධ්‍යාපන කඩඉම් වෙනුවෙන් රජය විසින් වාර්ෂිකව එක් ශිෂ්‍යයෙකු සඳහා කොපමණ මුදලක් වැය කරන්නේද? මේ සම්බන්ධයෙන් රජය විසින් පිළිගත් අධ්‍යයනයක් සිදු කර තිබේද?

2. උසස් පෙළ කලා, වාණිජ, විද්‍යා හා තාක්ෂණ යන විෂයය ක්ෂේත්‍රවලින් අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයන් උපාධිය අවසන් කරනු ලබන දිනයේ සිට රැකියාවක් සොයා ගැනීමට ගත වන කාලය පිළිබඳව රජය විසින් සිදු කර ඇති අධ්‍යයනයන් මොනවාද? එසේ නම් එසේ ගත වන කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද?

ගරු අධ්‍යාපන ඇමතිතුමියනි, දැනටත් උපාධිය අවසන් කළ දේශීය වෛද්‍ය උපාධිධාරීන් 580ක් ඉන්නවා. ඒ අයට සීමාවාසික පුහුණුව ලබා දෙන්නට රජය තවම කටයුතු කරලා නැහැ. මේ උපාධිධාරීන්ට සීමාවාසික පුහුණුව ලබාදීමේ රජයේ වැඩ පිළිවෙළ මොකක්ද?

3. වර්තමානයේ රැකියා විරහිත උපාධිධාරීන් කොපමණ ප්‍රමාණයක් සිටීද? එම උපාධිධාරීන් අතර සිටින බාහිර, අභ්‍යන්තර, විවෘත හා පෞද්ගලික විශ්වවිද්‍යාල උපාධිධාරීන් ගණන කොපමණද? එම උපාධිධාරීන් ප්‍රමාණය ඔවුන් ලබා ගෙන ඇති උපාධිය අනුව වෙන් වෙන් වශයෙන් දැක්විය හැකිද? රැකියා වෙළෙඳ පොළ තුළට පිවිසීමට නොහැකිව ඔවුන් රැකියා විරහිතව සිටින්නේ කුමන හේතු මතද? මේ පිළිබඳව රජය විසින් සිදු කර ඇති අධ්‍යයනයන් මොනවාද? ඒවා සභාගත කරන්නේද?

4. ජාතික ජන බලවේග ප්‍රතිපත්ති ප්‍රකාශයේ 72වන පිටුවේ රැකියා විරහිත උපාධිධාරීන් 35,000කට විධිමත් ක්‍රමවේදයක් යටතේ කඩිනමින් රැකියා ලබා දීම සඳහා පියවර ගන්නා බව සඳහන්ව ඇත.

එහි " 20,000ක් ගුරු වෘත්තියට; විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත - STEM - උපාධිධාරීන් 3,000ක් සහ STEM නොවන උපාධිධාරීන් 9,000ක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට; දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගු දෙපාර්තමේන්තුවට, විදේශ සේවාවට, සංචාරක කර්මාන්තයට තවත් 3,000ක්" වශයෙන් සඳහන් වෙනවා. මේ ආදී වශයෙන් 35,000ක් වෙනුවෙන් රැකියා ලබා දෙන ආකාරයක් ප්‍රතිපත්ති ප්‍රකාශයේ 72වන පිටුවේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා.

ඒ අනුව මෙම වසරේ රැකියා සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත උපාධිධාරීන් ගණන කොපමණද? ඒ කුමන ක්ෂේත්‍ර සඳහාද? ඒ සඳහා මෙවර අය වැයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද? රැකියා අවශ්‍යතාව අනුව රජය විසින් ඔවුන්ව බඳවා ගැනීමට අපේක්ෂා කරන්නේ යම් කුසලතා පදනමක් මතද? නොඑසේ නම් තරග විභාගයක් මඟින්ද?

5. කලා උපාධිධාරීන් බොහොමයක් උපාධිය ලැබීමෙන් පසු රැකියා සොයා ගැනීමේ අර්බුදයක සිටින හෙයින්, මේ තත්ත්වය අවසන්කොට මේ රැකියා විරහිත උපාධිධාරීන්ට නිරසර විසඳුමක් ලබා දෙන්නට යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කවරේද?

ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා පොරොන්දු වුණා, මේ උපාධිධාරීන්ට වයස අවුරුදු 45 වන තෙක් රජයේ තරග විභාග සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනවා කියලා. නමුත් ඒ වෙනුවෙන්වත් තවම පියවරක් ගෙන නැහැ. ඒ නිසා උපාධිධාරීන්ගේ වයස් සීමාව නොසලකා තරග විභාගවලට පෙනී සිටීමට ඉදිරියේදී අවස්ථාව ලබා දෙන්නට රජය කටයුතු කරනවාද?

ඒ වාගේම විශේෂයෙන්ම මම වගකීමෙන් කියන්නට කැමැතියි, මේ කාරණයත්. මේ රැකියා විරහිත උපාධිධාරීන්

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

වෙනමම සංවිධානය කරලා, දේශපාලනික වශයෙන් වෙනමම ඒක රාශි කරලා ඔබතුමන්ලා එදා ලොකු කටයුත්තක් කරගෙන ගියා. මම හිතන විධියට මේ ගැන මටත් වඩා ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා දන්නවා. එතුමා පුරෝගාමීව තමයි එම කර්තව්‍යය ඉෂ්ට කළේ. ඒ වාගේම මෙහි මාධ්‍ය කැඳවුම්කරු හැටියට මහේෂ් අබේපිටිය කියන මහත්මයෙකුත් කටයුතු කළා කියලා මේ උපාධිධාරින්ම අපට තොරතුරු ලබා දුන්නා.

ඉතින් ඇත්ත වශයෙන්ම දැන් මේ රැකියා විරහිත උපාධිධාරින්ට මේ ඇමතිවරුන්ව සම්බන්ධ කර ගන්නවත්, ඒ සම්බන්ධීකරණය කරපු නිලධාරින්ව සම්බන්ධ කර ගන්නවත් හැකියාවක් නැහැ. ඒ නිසා ගරු අග්‍රාමාත්‍යතුමියගේ මූලිකත්වයෙන් මේ උපාධිධාරින්ව කැඳවා ඒ අයට ලබා දෙන විසඳුම ඉදිරිපත් කිරීම යෝග්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම මගේ ප්‍රශ්නවලටත් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට අපි සතියක් ඇතුළත පිළිතුරු ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්විචුනා මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් ප්‍රශ්නයකට උත්තර දෙන්න කාලය ඉල්ලුවාම අපි ප්‍රායෝගිකව, සාධාරණව ඒ සඳහා කල් දෙනවා. මම අහන්න කැමැතියි, මේ රැකියා විරහිත උපාධිධාරින් 35,000ට මොනවාද කරන්නේ කියන එක ඔළුවේ තියාගෙන නේද අය වැය හැදුවේ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි නේ, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉතින් මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න තවත් කල් ගන්න දෙයක් නැහැ නේ, ගරු ඇමතිතුමනි. ඒ කියන්නේ මේ උපාධිධාරින් 35,000 පිළිබඳව ඔළුවේ තියාගෙන නොවෙයි ද මේ අය වැය හැදුවේ? ඒකයි මම අහන්නේ. ඇයි, මේකට කල් ගන්නේ? ඒකයි මම අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි නේ, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේක අහන්නේ මම ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නයට අදාළවයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ප්‍රශ්නය කියෙව්වා. ඒක තමයි ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමා අසා තිබෙන්නේ. ඉතින් එම ප්‍රශ්නය කියෙව්වාට පස්සේ අමතරව, -

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Standing Ordersවල 27(2) ප්‍රශ්නය කියන්නේ ජාතික අවශ්‍යතාවක් මත අසනු ලබන ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) කියවන්න. කෘතහස්ත දේශපාලන මන්ත්‍රීවරුන් වන ඔබතුමන්ලා මේ විධියට හැසිරෙනවා නම් ප්‍රශ්නයක් නේ. Standing Orders ගැන ඔබතුමන්ලා දැන් කථා කරනවා. *[බාධා කිරීම්]* ඔව්, කියන්න ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම සාධාරණ ප්‍රශ්නයක් ඇහුවේ. මේ අහපු හැම ප්‍රශ්නයකටම උත්තර දෙන්න කාලය ඉල්ලපු හැම වෙලාවකම අපි කිව්වා, එය සාධාරණයි, ප්‍රශ්නයක් නැහැ කියලා. මම මේ අහන්නේ රැකියා විරහිත උපාධිධාරින් 35,000කට රස්සා දෙන එක ගැනයි. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න කල් ඉල්ලනවා. දැන් අය වැය කථාව ඉදිරිපත් කරලා ඉවරයි. මේ අය වැය කථාව තුළ තිබෙන්න ඕනෑ, මේ 35,000ට දෙන විසඳුම මොකක්ද කියලා. ඇයි, මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න මෙච්චර කල් ගන්නේ? ඒ කියන්නේ ඔබතුමන්ලා අය වැය කථාවේදී නොසලකා හැරලා තිබෙනවා, මේ රැකියා විරහිත උපාධිධාරින්ගේ ගැටලුව.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න වවාගෙන, වණ කරගෙන දේශපාලනය කරන්න ඕනෑ නම් මෙහෙම කථා කර කර ඉන්න පුළුවන්. මේ ප්‍රශ්නයට අධ්‍යාපන අමාත්‍යාංශය නොවෙයි, මුදල් අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවක තොරතුරු හොයාගෙන නිවැරදිව ස්ථිරසාර විසඳුමක් ලබා දිය යුතු නිසා අපි ඒ ගැන සාකච්ඡා කරමින් ඉන්නවා. කොහොමත් අපි අය වැය විවාදයේ මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන දවසේ මේ සම්බන්ධව වැඩිදුර විස්තර කියනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ආණ්ඩුව හැටියට මේ සම්බන්ධයෙන් අපි කැබිනට් අනුකමිටුවක් පත් කරලා, ලේකම්වරුන් සම්බන්ධ කරලා තවත් කමිටු පත් කරලා මේ ගැන යම් ක්‍රියාවලියක් කරගෙන යනවා. මෙයට අදාළ සමහර තොරතුරු ගන්න අමාත්‍යාංශ කිහිපයක් සම්බන්ධීකරණය කරගන්න ඕනෑ. ඒ නිසා තමයි උත්තර දෙන්න සාධාරණ කාලයක් ඉල්ලුවේ.

මේ ප්‍රශ්නයට උත්තර දෙන්න සතියක් යන්නේත් නැහැ, ඊට කලින් අපි උත්තර දෙනවා. මෙහෙම කලබල වෙලා කෑ ගහන්න ලැහැස්ති වෙන්න එපා. මේක ජාතික වැදගත්කමක් සහිත ප්‍රශ්නයක් තමයි. නමුත්, හදිසියි කියලා නිකම් උත්තරයක් දීලා හරියන්නේ නැහැ. මේවාට විසඳුම් දෙන්නයි අපි ආවේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩු මේවාට විසඳුම් දුන්නේ නැහැ. මේ, ඊයේ pass out වෙච්ච උපාධිධාරීන් නොවෙයි. වසර ගණනාවක් තිස්සේ එකතු වෙලා, එකතු වෙලා ඒ අයව නොසලකා හැරලා, පැත්තකට කරලායි තිබුණේ. අපි ඒ අයට සාධාරණ විසඳුමක් ලබා දීමට තමයි කටයුතු කරමින් ඉන්නේ. ඒ නිසා කලබල වෙන්න දෙයක් නැහැ. මේ කටයුත්තේදී රජයේ තිබෙන පුරප්පාඩු ප්‍රමාණය බලන්න ඕනෑ, රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවත් බලන්න ඕනෑ, ඒ වාගේම මේ අයගේ උපාධිය මොකක්ද, තිබෙන පුරප්පාඩුවලින් මේ අයට ගැළපෙන එක මොකක්ද කියලාත් බලන්න ඕනෑ. පෝලිම් ගස්සලා, උස නම් security වැඩට ගන්නවා, මිටි නම් කම්කරු ලෙස ගන්නවා කිව්වොත් මේ ගැන දවසින් කියන්න පුළුවන්. නමුත්, එහෙම වැඩක් නොවෙයි නේ මේක. මේක, ඊට වඩා බැරුම්ම්ව, විද්‍යානුකූලව කරන්න ඕනෑ වැඩක්. ඒ නිසා තමයි සාධාරණ කාලයක් ගන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Good morning, Hon. Speaker! May I exercise my right to speak in Tamil? I will finish it within one minute.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
No, you have to read what you have submitted in writing.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I am going to say the same thing I have written in that letter. Let me speak in Tamil. I will finish it within one minute. I promise you, Sir.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
I think it will take a lot of time because there are two pages.

II

වෛද්‍ය වෘත්තිකයන්ගේ හිඟය හේතුවෙන් මන්නාරම සහ චාවකච්චේරි ප්‍රදේශවල සෞඛ්‍ය සේවාවලට සිදුවන බලපෑම

மருத்துவ நிபுணர்கள் பற்றாக்குறை காரணமாக மன்னார் மற்றும் சாவக்சேரியில் சுகாதார சேவைகளில் தாக்கம்

IMPACT ON HEALTHCARE SERVICES IN MANNAR AND CHAVAKACHCHERI DUE TO SHORTAGE OF MEDICAL CONSULTANTS

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Speaker.

නිලෙයියර් කට්ටළෙ 27(2)ඉන් කීලාන ඉන්දක් කේල්වියෙ නාන් සුකාතාරම් මර්‍රුම් වෙකුසන ඌටක අමෙච්චර් මාණ්පුමිකු (වෛත්තියර්) නළින්ද ජයතිස්ස අවර්කළිඩම් කේට්කින්රේන්.

சாவகச்சேரி ஆதார வைத்தியசாலையில் acting Consultant Paediatricianஆகப் பணிபுரிகின்ற கஸ்தூரி தனகராஜா என்ற வைத்தியரை SR listஇன்படி இடமாற்றம் செய்வதற்கு 2022ஆம் ஆண்டு அனுமதி வழங்கப்பட்டது. 2024ஆம் ஆண்டு நான் அந்த வைத்தியசாலையில் MSஆக இருக்கும்போது, Director General of Health Services, வைத்தியர் அசேல குணவர்தன அவர்களுடைய கடிதத்தின் அடிப்படையில் அவருடைய இடமாற்றத்தைச் செய்திருந்தேன். அவருடைய சகோதரர் GMOA எனப்படுபவர், இப்பொழுது அரசாங்கத்துக்குப் பிரச்சினையாக இருக்கின்ற ஒரு தொழிற்சங்கத்தினுடைய Consultants' Transfer Boardஇன் Northern Province member ஆவார். அதன் காரணமாக அவர், 2022ஆம் ஆண்டு அனுப்பப்பட்ட கடிதத்தின் அடிப்படையிலும் transfer பண்ணப்படவில்லை. 2024ஆம் ஆண்டு நான் எழுதிய கடிதத்தின் அடிப்படையிலும் transfer பண்ணப்படவில்லை. 2025ஆம் ஆண்டு - தற்போதுகூட, Director General of Health Services, வைத்தியர் அசேல குணவர்தன அவர்களுடைய கடிதம் சாவகச்சேரி வைத்தியசாலைக்குச் சென்றிருக்கிறது. எனினும், அவர் transfer பண்ணப்படவில்லை. அவர் திட்டமிட்ட ரீதியில் கிட்டத்தட்ட 2 வருடங்கள் வைத்தியசாலைக்குப் போகாமல் இருந்திருக்கிறார். அவருடைய transfer மன்னார் வைத்தியசாலைக்கானது. இதனால் சாவகச்சேரியிலுள்ள மக்கள் மட்டுமல்ல, மன்னாரிலுள்ள மக்களும் பாதிக்கப்படுகின்றார்கள். தற்பொழுது மன்னார் வைத்தியசாலையில் Consultant Paediatrician இல்லை. நான் கௌரவ சுகாதார அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்வது என்னவென்றால் -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ලබා දී තිබෙන ප්‍රශ්නය කියවන්නකෝ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඒක තමයි මම කියන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඒක නොවෙයි නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්ඩුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම වෙන එකක් කියන්නේ නැහැ. Hon. Minister of Health, Dr. Nalinda Jayatissa, ඔබතුමාගෙන් මම මේ කාරණය අහනවා. එතුමිය transfer කරන්න Director General of Health Services ලියුමක් යවලාත් අද වෙනකල් transfer කරලා නැහැ. මන්නාරෙයි සේරුන්ත එංකළුටෙය මතිප්පුක්කුරිය පාරාළුමන්ර උරුප්පිනර් අමිර්තනාතන් අටෙක්කලනාතන් අවර්කළ්කූට සොල්ලියිරුන්තාර්, මන්නාර් වෛත්තියසාලෙයිල් Consultant Paediatrician ඉල්ලෙයෙන්රු. අන්ත මූන්රු කඩිතංකළෙයුම් නාන් උංකළුක්කු අනුප්පි ඉරුක්කිරේන්. තයවුසෙය්තු, අවරෙ transfer පණ්ණුවතර්කුරිය නටවඩික්කෙකළෙ එටුක්ක වේණ්ටුමෙන අන්පුටන් කේට්ටුක් කොළ්කින්රේන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්ඩුමිකු (වෛත්තියර්) නළින්ත ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට නිශ්චිතවම මම හෙට දවසේ උත්තරයක් ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, දහඅටවන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-[ප්‍රගතිය: මාර්තු 10]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 10]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 10th March]
[HON. SPEAKER in the Chair.]

196 වන ශීර්ෂය.- විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 230,000,000

තලෙප්පු 196.- විඞ්ඤාන මර්‍රුම් තොළිල්නුට්ප අමෛච්චර්

නිකළ්ච්චිත්තිට්ටම් 01.- සෙයල්මුරෛච් සෙයර්පාටුකළ් - මීණ්ටුවරුඞ් සෙලවු, රූපාය් 230,000,000

HEAD 196.- MINISTER OF SCIENCE AND TECHNOLOGY
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 230,000,000

186 වන ශීර්ෂය.- ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 239,000,000

තලෙප්පු 186.- ටිජිට්ටල් පොරුළාතාර අමෛච්චර්

නිකළ්ච්චිත්තිට්ටම් 01.- සෙයල්මුරෛච් සෙයර්පාටුකළ් - මීණ්ටුවරුඞ් සෙලවු, රූපාය් 239,000,000

HEAD 186.- MINISTER OF DIGITAL ECONOMY
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 239,000,000

ගරු සභාපතිතුමා
(මාණ්ඩුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය - වැය ශීර්ෂය අංක 196; ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 186 සහ 227.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.11වන අහඹරුවාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 196, 186 සහ 227 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, විවාදය ආරම්භ කරමින් අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාව ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමාට ලබා දෙනවා.

ගරු සභාපතිතුමා
(මාණ්ඩුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
The Hon. Dilith Jayaweera. You have 25 minutes.

[පූ.භා. 10.11]

ගරු දිලිත් ජයවීර මහතා
(මාණ්ඩුමිකු තිලිත් ජූයවීර)
(The Hon. Dilith Jayaweera)
ගරු සභාපතිතුමනි, පළමුව මම ස්තුතිවන්ත වනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මා මිත්‍ර ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට. අපේ මව් බිම වන මේ ලංකාවේ අනාගතය පිළිබඳ ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක් වන විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය හා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය පිළිබඳව සිදු වන මේ විවාදයේදී මට කරුණු දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි.

මෙම ජාතික ජන බලවේග රජය පත් වීමට හේතු වුණු ඔවුන්ගේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳව අපි සංවාදයට ලක් කළ

[ගරු දිලිත් ජයවීර මහතා]

යුතුයි. මන්ද යත්, අපි උත්සාහ කරන්නේ සාධනීය සංවාදයක් තුළින් අපේ මව් බිම ඉස්සරහට ගෙන යන්නයි. එම නිසා මෙම විවාදයේදී හුදු විරෝධාකල්ප අර්ථයෙන්ම කරුණු නොදක්වා මෙය සාධනීය සංවාදයක් කර ගැනීමයි අපේ අරමුණ. ගරු සභාපතිතුමනි, ජාතික ජන බලවේග ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු 7ක් වෙන් කර තිබෙනවා, විද්‍යා හා තාක්ෂණ විෂයය සංවාදයට ලක් කරමින්, විශේෂයෙන්ම research and development කියන විෂයය සම්බන්ධයෙන්.

ඒ පිළිබඳව විශාල සංවාදයක් මැතිවරණ කාල සීමාවේදී තිබුණා. මහාචාර්ය ගෝමික උඩුගමසූරිය මැතිතුමා එහෙම ඇවිල්ලා, අපි මේ විෂයය කොතරම් අමතක කරලා දාලා තිබෙනවාද කියලා සංවාදයක් තිබුණා. ඔබගේ චින්තනයට බලපෑ පසුබිම හැටියට ඔබ දක්වා තිබෙන්නේ ලංකාවේ අපි මේ R&D සඳහා වියදම් කරන ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 0.12 කියන එකයි. "මැලේසියාව සියයට 1ක්, තායිලන්තය සියයට 1.2ක්, දකුණු කොරියාව සියයට 4.6ක්, ජපානය සියයට 3.6ක්, ඇමෙරිකාව සියයට 3.5ක්, චීනය සියයට 3ක් ලෙස වෙන් කරමින් ශීඝ්‍රයෙන් දියුණු වූ රාජ්‍ය බවට පත්ව ඇත" කියලා ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන්ව තිබෙනවා. ඒ වාගේම "ශ්‍රී ලංකාව තුළ සිදු කරන සීමිත පර්යේෂණ වුවද, ආර්ථික හා සමාජීය සංවර්ධනයට නිසි පරිදි දායක කරගෙන නොමැත" කියාත් එහි තවදුරටත් සඳහන්ව තිබෙනවා. ඒ සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු හතක් වැය කරලා තිබෙනවා. ඔබතුමන්ලාගේ රජයේ මංගල අය වැයෙන් මේ සඳහා වන ආයතන 17ක් සඳහා වියදම් කිරීමට රුපියල් බිලියන 5ක් වෙන් කරලා තිබෙනවා. ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් බැලුවාම, මේ රුපියල් බිලියන 5න් වැඩියෙන්ම වියදම් කරන්නට බලාපොරොත්තු වන්නේ පුනරාවර්තන වියදම් සඳහායි; මූලධන වියදම් සඳහා නොවෙයි. එතකොට අපිට මේකෙන් සොයා ගන්නට බැහැ, ඔබගේ ඒ දේශපාලන වේදිකාවේ කථා කරපු දර්ශනය සඳහා අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කෙරෙන ආකාරය පිළිබඳව. මම මේක හරියට කියවා බැලුවා. ඒ අනුව මෙහි තිබෙන්නේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් රුපියල් මිලියන 10ක් සහ හැකියා වර්ධනය සඳහා රුපියල් මිලියන 7ක් වශයෙනුයි. අනෙකුත් සියල්ල මට පෙනෙන්නේ නැහැ. විශාල අනාගත දැක්මක් පිළිබඳව මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් සාකච්ඡා වෙනවා. ඒ සඳහා මුදලක් වැය වෙනවා.

ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය තුළ අපි සංවාදයට ලක් කළ යුතුයි, අපි අද මුවහමට මෙන් තළමින් කථා කරන පසුගිය රජයන් විසින් නොගත්තා යැයි කියන ඒ උපාය මාර්ගික තීරණ දැන් ආණ්ඩුව වෙනස් වෙලා ගන්නේ කොහොමද කියන එක ගැන. ගරු සභාපතිතුමනි, මේ දත්ත එලෙසම නිවැරදි නොවුණත්, ආසන්න වශයෙන් අපේ රටේ මිනිස්සු සියයට 68ක්, සියයට 70ක් ගරු ජනාධිපතිතුමාගේ වචනයෙන්ම කිව්වොත්, "දුගී සහ අන්තදුගී" කියලා කියනවා. දුගී සහ අන්තදුගී. ගරු සභාපතිතුමනි, මේ රටේ මිනිස්සු මෙවැනි තත්ත්වයකට පත්වීම මොන තරම් පව්ද? මේකට හේතුව වෙලා තිබෙන්නේ අපේ මව්බිමේ ශක්‍යතා, විභවතා, අපේ මිනිස්සුන්ගේ හැකියාව අපි හඳුනා නොගෙන අවතක්සේරු කරලා මේ විධියට කටයුතු කිරීමයි. අපේ ජාතික ආදායමෙන් සියයට 68ක් අද ණය සහ පොලී ගෙවන්න යොදා ගන්නවා නම් ඉතුරු වෙච්ච සියයට 32ක් වන ප්‍රතිශතයෙන් විශාල ප්‍රමාණයක් අපේම අපනයනකරුවන් අපනයන කරන ආදායම ලංකාවට ගේන්නේ නැත්නම්, බහුජාතික සමාගම් විසින් අපේ මේ ධනය අරගෙන යනවා නම් අපේ මිනිස්සු ජීවත් කරවන්න ඉතුරු වෙලා තිබෙන්නේ මොන තරම් සොච්චමක්ද? මේ මිනිස්සු දුගී, අන්තදුගී වුණේ ඒ නිසා නොවේද? ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලාගේ රජය - NPP රජය - බලයට එන්නේ මෙවැනි තත්ත්වයක් තුළ, වෙනසක් කිරීම සඳහා, මේ මිනිස්සු දුගී දුප්පත්භාවයෙන් මුදාගෙන සුඛිත මුදිත කිරීම සඳහා. ඒ සඳහා කොයි විධියටද, අපි මේ අය වැය යොදාගෙන තිබෙන්නේ? මේ අය වැයේ කොතැනද තිබෙන්නේ, අපි ධනෝත්පාදනයක් කරන බව, ධනෝත්පාදනය වෙන විධිය, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග සහ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය තුළින් නව පර්යේෂණ කරලා, ඒ පර්යේෂණ තුළින් කෘෂිකර්මාන්තයේ කාර්යක්ෂමතාව දියුණු කරගන්නා නව භෝග වර්ග, නව බීජ වර්ග හොයා ගන්නේ කොහොමද කියලා.

අපි දැක්කා, ඉන්දියාවේ මුදල් අමාත්‍යවරිය ඇයගේ අය වැය ප්‍රකාශනයේ කියනවා, මේ පර්යේෂණ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරනවා කියලා. That is, to identify new varieties of rice. They want to be more efficient in their agricultural practices. අපට එහෙම එකක් තිබෙනවාද? නැහැ. ඉතින් අද අපි ණය අරගෙන, ණය ගෙවන ආර්ථිකයක් මිසක් ණය අරගෙන නව ප්‍රාග්ධනයක් නිර්මාණය කරන ආර්ථිකයක් නොවෙයි නම්, ඒ සඳහා කිසිදු දිශානතියක් අපට මේ අය වැය තුළ පෙනෙන්නේත් නැත්නම්, කෙතරම් සාධනීය ලෙස අපි ඔබ සමඟ, මේ NPP රජය සමඟ ගනුදෙනු කරන්නට උත්සාහ කළත්, මේ සාධාරණ විවේචනය නොකරම බැහැ. මේ රටේ අහිංසක ජනතාවගේ දෘෂ්ටි කෝණයෙන් බැලුවොත්, මේ අය වැයේ කොතැනද, ඔවුන්ට බලාපොරොත්තු තියා ගන්නට පුළුවන්? ඔවුන්ගේ ජීවිතය සතුටු වන ආකාරයේ තීන්දු, තීරණ කොහොමද, කොතැනින්ද එන්නේ? ඒක අපි සොයා බැලිය යුතු කරුණක්.

මේ අය වැය දෙස හොඳට බැලුවොත්, මෙය කිසිසේත්ම නිර්මාණශීලී නොවී, IMF අවශ්‍යතාව සඳහා කටයුතු කර තිබෙන බව පෙනෙනවා. ක්‍රිස්ටලීනා මැතිනිය ළඟදී අපේ ජනාධිපතිතුමාට ශුභාශිංසන සහ ප්‍රාර්ථනා එකතු කරලා තිබුණා. අපේ ජනාධිපතිතුමා හොඳ ළමයෙක් කියලා කියා තිබෙනවා, IMF එකේ වැඩේ හොඳටම කරගෙන යනවාය කියලා. මොකක්ද මේ IMF එකේ වැඩේ? IMF එකේ වැඩේ තමයි අපේ රටේ ආදායම මත බදු පනවමින්, මේ රටේ මිනිස්සු ඉතාම දුෂ්කර තත්ත්වයට පත් කරමින් ඔවුන්ගේ වැඩේ කරගන්න එක. ඔවුන්ගේ පැත්තෙන් ඒක සාධාරණයි. ඔවුන්ට, ඔවුන්ගේ ඒ ආයතනයට තිබෙනවා, අපේක්ෂාවක්; they have their own objective. Through this, they are achieving their objective and are thanking our President for helping them achieve their objective. There is something radically wrong here. What happens in the process, Hon. Chairman, is that we are becoming poorer by the day.

අපේ ගරු අගමැතිතුමිය හැරුණාම අපි සියලු දෙනාම නිදහස් අධ්‍යාපනයෙන් බිහි වුණු ශ්‍රී ලාංකික පුරවැසියන්. අපට ලොකු වගකීමක් තිබෙනවා, අපේ රටේ දෘෂ්ටි කෝණයෙන් අපේ රට ගොඩ ගන්නේ කොහොමද කියලා කල්පනා කරන්නට, නිර්මාණශීලීව කටයුතු කරන්නට, උපාය මාර්ගිකව හා උපායශීලීව කටයුතු කරන්නට. එසේ කටයුතු කරමින් අපට මොන බාහිර බලපෑම් ආවත්, අපි අපේ මිනිස්සු බේරා ගන්නේ කොහොමද, අපේ රට බේරා ගන්නේ කොහොමද කියලා කල්පනා කරන්න ඕනෑ. NPP රජයේ අපේ ඇමතිතුමන්ලා විටින් විට ප්‍රභූ දේශපාලනය, ප්‍රභූන්ගේ දේශපාලනය යන වචන පාවිච්චි කරනවා. මට තේරෙන්නේ නැහැ, ඒ වචන කොහොමද එතැනට එන්නේ කියලා. මේ බොහෝ දෙනා මගේ මිතුරන්. අපි ඔක්කොම නිර්ප්‍රභූ. අපි ඔක්කොම නිර්ධන. අපි ආවේ එවැනි පවුල් පසුබිමකින්. අපට

විශාල වගකීමක් තිබෙනවා, අපි ආපු පසුබිමේ ඉන්න සියයට 70කටත් වඩා වැඩි මිනිසුන් වෙනුවෙන් කටයුතු කරන්නට. එහෙම නැතිව IMF එක වෙනුවෙන් කටයුතු කරන්ට නොවෙයි. ක්‍රිස්ටලීනා අපේ අගමැතිතුමිය නොවෙයි නේ. එහෙම බලාපොරොත්තුවකුත් නැහැ නේ. එහෙම නම් අපි අපේ රටේ මිනිස්සු වෙනුවෙන් මේ ආර්ථිකය මෙහෙයවන්නේ කොහොමද? ඒ මෙහෙයවීම සඳහා අපේ හෘදය සාක්ෂියට එකඟව කටයුතු කිරීමේ වගකීමක් අපට තිබෙනවා.

NPP එකේ මගේ මිත්‍රයින් දන්නවා, මම දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන්ට ආශීර්වාද කරපු පුද්ගලයෙක් හැටියට, ඔවුන් එක්ක සමීපව වැඩ කරපු පුද්ගලයෙක් හැටියට, මම කෙතරම් නිර්ව්‍යාජව, අවංකව, විවිධ අවස්ථාවලදී මතු වුණු විවිකිච්ඡාවන්, සැකයන් පසෙකලා ඔවුන් සමඟ හැම විටම විශ්වාසයක් ඇතිව කටයුතු කළාද කියලා. මටත් බලාපොරොත්තුවක් තිබුණා, අපේ රට කවදා හෝ ගොඩ එනවා දකින්නට. ඒ නිසා තමයි අපි දිගින් දිගටම ලැබුණු හැම අවස්ථාවකදීම දේශපාලන මැදිහත්වීම් කරමින් මේ රට ඉදිරියට ගෙනයන්නට පුළුවන් ආකාරයෙන්, නිවැරදි දිශානතියක් කරා ගෙනයන්නට පුළුවන් ආකාරයෙන් සහාය ලබා දෙන්නට, හුදු පෞද්ගලික අභිමතාර්ථයන් පමණක් වෙනුවෙන් පෙනී නොසිට යම් කිසි නිස්සරණාධ්‍යාශයක යෙදෙමින් මේ රට වෙනුවෙන් පෙනී සිටින්නට කටයුතු කළේ. ඒත් මට කනගාටුවක් තිබෙනවා, ගරු සභාපතිතුමනි, අපේ පරණ මිතුරන්ම මට පහර ගහනවා.

ඒක හොඳ නැහැ. මම හතුරෙක් නොවෙයි, මම ඔබේ මිතුරෙක්. අපේ දේශපාලන දර්ශනයත් ඔබගේ ඒ මූලික දේශපාලන දර්ශනය වුණු සමාජ ප්‍රතිසංස්කරණවාදය, සමාජවාදය තමයි.

දැන් ඔබ කොතරම් වෙනස් වුණත්, මොන වචනය පාවිච්චි කරලා ඔබ නියෝ-ලිබරල් පාරක ගියත්, අපි ආශීර්වාද කරන, අපි දකින ඒ දේ වෙනුවෙන් ඔබ නිවැරදි වෙනවා දකින්න අපි තවමත් ආසයි. ඔබ එදා නියෝජනය කරපු ඒ නිර්ධන පන්තිය, අපේ මව්බිමට ආදරය කරන මේ රටේ සුවහසක් මිනිසුන්ගේ සිහින වෙනුවෙන් ඔබ පෙනී සිටිනවා දකින්නට අපි තවමත් ආසයි. ගරු සභාපතිතුමනි, මෙහි සිටින බොහෝ දෙනා අවංකවම තවමත් ඒක විශ්වාස කරනවා ඇති කියලා මම හිතනවා. නමුත් අවාසනාවකට වාගේ මේ බොහෝ දෙනාගේ සිහින ඉෂ්ට නොවන බව අද අපට පැහැදිලිව දකින්නට පුළුවන්.

ඔබ දැන් පත්වෙලා තිබෙන තත්ත්වය අපට තේරෙනවා. මේ අය වැය දැන් ඔබට සාධාරණීකරණය කරන්න සිද්ධවෙලා තිබෙනවා. මේ අය වැය පිට රටින් ආනයනය කරන ලද අය වැයක්. මේ අය වැයේ කොතැනකවත් සඳහන් වෙලා නැහැ, ඔබ ඔබේ දේශපාලන වේදිකාවේ කථා කරපු නිෂ්පාදන ආර්ථිකය හැදෙන ආකාරය හෝ පසුව ඔබ භාවිත කරන්න පටන් ගත් කාරණය වන ඒ ව්‍යවසායකත්වයන් දියුණු කරන විධිය. විශේෂයෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ නව නිර්මාණ සහ නවෝත්පාදන සඳහා විශාල මුදලක් වෙන් කරයි කියලා අපි බලාපොරොත්තු වුණා. එහෙම වුණා නම් ඒ තුළින් විශාල ගමනක් යයි කියලා අපට බලාපොරොත්තු තබා ගන්නට තිබුණා. හැබැයි ඒක එහෙම වෙලා නැහැ.

අද අපි ඉදිරිපත් කරන කරුණු ඔබ නිර්වචනය කරන්නේ, "මේගොල්ලෝ මේ මොනවාද කථා කරන්නේ, මේගොල්ලෝ ඇවිල්ලා මේ කියන කරුණු මොනවාද?" ආදී වශයෙනුයි. විශේෂයෙන් මගේ මිත්‍රයා මට කිව්වා, මම ප්‍රාදේශීය සභාවකටවත් ගිහිල්ලා නැතුව මෙතැනට ඇවිල්ලා උපදෙස් දෙන්න හදනවා කියලා. මම දන්නවා, එතුමා මා ගැන දන්න නිසා ඒක හිතලා කිව්වේ නැහැ කියලා. ඒ කොහොම වුණත්, මේක ප්‍රාදේශීය සභාවකට ගිහිල්ලා විසඳා ගන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. ජාතියක් හැටියට අපට අවශ්‍යයි, ගෝලීය තරගකාරීත්වයට මුහුණ දෙන්නට පුළුවන් තරම් වූ විශාල නිර්මාණශීලිත්වයක්, අවදානම් ගැනීමේ හැකියාවක්.

ජාතියක් හැටියට අපට අවශ්‍යයි, අපි අද මුහුණ දෙන ගෝලීය අභියෝගයන්ට කොතරම් දුරට උපායශීලීව මුහුණ දෙනවාද කියන එක ගැන අවබෝධයෙන් කටයුතු කරන්න. මගේ මිත්‍රයාට අමතක වුණා, මෙතැන ඉන්න බහුතරයක් ඇමතිවරුත් ප්‍රාදේශීය සභාවකටවත් ගිහිල්ලා නැහැ කියන එක. මම සන්තෝෂ වෙනවා, ප්‍රාදේශීය සභාවකට නොගිහින් මගේ ගොඩාක් මිත්‍රයෝ වෙනත් අත්දැකීම් ලබාගෙන මේ පාර්ලිමේන්තුවට ආපු එක ගැන. අපේ මිත්‍රයා ඇමෙරිකාවේ හිටියා නම් අද අපේ ට්‍රම්ප් මහත්තයාට chance එකක් නැහැ. මොකද, එතුමා ප්‍රාදේශීය සභාවකට ගිහිල්ලා නැහැ. ඉන්දුනීසියාව අවුරුදු 10ක් පාලනය කරපු ජෝකෝ විඩෝඩෝ වඩු කාර්මික ශිල්පියෙක් වෙලා, පසුව ව්‍යාපාරිකයකු වෙලා ඒ රටේ ගෘහ භාණ්ඩ අපනයනය කරපු කෙනෙක්. ඔහු තමයි ඉන්දුනීසියාව අදටත් සමරන්නේ ඒ රටේ පහළ වුණු දක්ෂතම නායකයා හැටියට. ඒ වාගේම ලී-ක්වාන් යූ මහත්මයාත් ප්‍රාදේශීය සභාවකට ගිහිල්ලා තිබුණේ නැහැ. ඒ නිසා අපි කරුණු කිව්වාම, "එතුමා ප්‍රාදේශීය සභාවකටවත් ගිහිල්ලා නැහැ" කියලා, ඒ තත්ත්වයට පත් කරන්න හොඳ නැහැ.

විශේෂයෙන් මම ජාතික ආරක්ෂාව පිළිබඳව කරුණු කිහිපයක් ගෙන හැර දැක්වුවා. "සෙනෙහසින් කියන්නේ, වැරදියට වටහා ගන්න එපා" කියන එකත් මම කිව්වා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මම ඉදිරිපත් කරපු කරුණු අතර මම කිව්වා, intelligence briefing එකේ ප්‍රශ්නයක් තිබෙනවා, මේ ආධුනික බව නිසා කියලා. තරහකින් නොවෙයි කිව්වේ. ඒ වාගේම අපේ National Security Council එකේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා කිව්වා. තරහකින් නොවෙයි කිව්වේ. මම විසඳුමකුත් කිව්වා, අපි National Security Adviser වාගේ තනතුරක් හදලා හොඳ කෙනෙක් දාමු කියලා. ඔබතුමන්ලාගේ පාක්ෂිකයෙක් වුණත් කමක් නැහැ. කිහිප දෙනෙක් ඉන්නවා. මට නම් කරලා දෙන්නත් පුළුවන්. අපේ නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා. ඒකට අපට හොඳින් උදව් කරන්න පුළුවන්. හැබැයි අපේ ජනාධිපතිතුමා ඇවිල්ලා මොකක්ද කිව්වේ? "ඔව්, අලුත් තමයි අපි බලාගන්නම්" වාගේ මොකක්ද කියලා ගියා. එහෙම නොවෙයි මේක වෙන්නට ඕනෑ. මේක හොඳ සංවාදයකින් විසඳෙන්න ඕනෑ.

අද, හිටපු පොලිස්පතිතුමා හොයා ගන්න නැහැ. මම ඕක තමයි කිව්වේ. දැන් වෙලා තිබෙන්නේ බුද්ධි තොරතුරු රැස්කිරීමේ ප්‍රශ්නයක් නොවෙයිද? එහෙම නැත්නම් අපේ ජනාධිපතිතුමා දන්නා කොහේ හරි තැනකද එතුමා ඉන්නේ? එහෙම නැත්නම් බුද්ධි තොරතුරුවල ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි විශ්වාස කරන මේ රටේ නිර්මාණශීලී ශක්‍යතාව, ඓතිහාසිකව අපි වර්ධනය කරගෙන ආ ඒ බුද්ධිමත් බව, තර්කානුකූල බව, විද්‍යාත්මකව සිතීමේ හැකියාව අපට ඓතිහාසිකව උරුම වුණු දෙයක්. ඒ උරුමය තුළ කටයුතු කරමින් මේ රට ඉදිරියට ගෙනයන්නට අපි උත්සාහ කරන්න ඕනෑ. අපි විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය කියූ පළියට, ඒක බටහිර විද්‍යාව එක්ක පටලවා ගන්න නරකයි. අපේ ශ්‍රේෂ්ඨ සංස්කෘතිය, සභ්‍යත්වය තුළ අපි බොහොම විද්‍යාත්මක මිනිස්සු. "යේ ධම්මා හේතුප්පභවා", මේක තමයි අපි කිව්වේ හේතුඵලවාදය කියලා. ඒක තමයි තාර්කිකව සිතීමේ හැකියාව. මෙවැනි හැකියාවක් තිබුණු අපි අද මේ Budget එක පිට රටින් හදලා ගේන්නේ ඇයි? පිට රට සුදු මැනිනියක් කිව්වාම "ඔබ හොඳට වැඩේ කරලා

[ගරු දිලිත් ජයවීර මහතා]

තිබෙනවා" කියලා, ඇයි, අපි අද උදාන වාක්‍ය කියන්නේ? අපේ ජනාධිපතිතුමා ඒක අපට කියන්න දෙන්න ඕනෑ. එතුමාට ඒක අපියි කියන්න ඕනෑ. ඔබතුමා තඹුත්තේගම ඉඳලා ඇවිල්ලා, කැලණිය විශ්වවිද්‍යාලයට ගිහිල්ලා, නිර්ධන පන්තිය වෙනුවෙන් ගොඩක් කැප කිරීම් කරලා ජනාධිපති පුටුවේ වාඩි වෙලා, මේ රටේ මිනිස්සු බේරා ගන්න, මේ රටේ මිනිසුන්ගේ සතුට නිර්මාණය කරන්න ඔබ මෙන්න මේ මේ විධියට මහන්සි වුණා කියලා අපට කියන්න දෙන්න. ඒ සඳහායි ඔබතුමා කටයුතු කළ යුත්තේ. ඔබතුමා දිගින් දිගටම හිතනවා නම්, "අපි උගුලකට හසුවෙලා නැහැ, අපි බොහොම හොඳට වැඩේ කරගෙන යනවා" කියලා, ඒ ගැන මම බොහොම කනගාටු වෙනවා. ගරු සභාපතිතුමනි, අපි අපේ සතුරා හඳුනා ගත යුතුයි.

ගරු සභාපතිතුමනි, මම ප්‍රධාන වශයෙන් කියන්න උත්සාහ කළේ මේ අය වැය තුළ අපේ රට ඉස්සරහට යන කිසිම සේයාවක්, කිසිම වැඩ පිළිවෙළක් නැහැ කියන එකයි. ඒ වාගේම මම කියන්න ඕනෑ මේ ඩිජිටල් වැඩේ ගැනත්. ඒකටත් පිටුවක් වෙන් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. නමුත්, මේක පොඩ්ඩක් පැටලිලා වාගේ මට හිතෙන්නේ. කොහොම වුණත්, මේක දෙකකට බෙදා ගන්නට ඕනෑ. ඒ තමයි, ඩිජිටල්කරණය සහ ඩිජිටල් ආර්ථිකය.

ඩිජිටල්කරණය ගැන මම ඩිජිටල් කියන වචනය ගැන දන්නා දවසේ සිට කථා කළා. මම කිව්වා, මේ රට digitalize කරන්නට ඕනෑ කියලා. මේ digitalize කරනවා කියන එකේදි මම විශ්වාස කරන විධියට අර අනන්‍ය අංකය නිකුත් කරමින් සියලු පුරවැසියන් එකම user interface එකකට ගෙනැල්ලා එකම අංකයකින් කටයුතු කරන්නට ඕනෑ. නමුත්, මේ Budget එකෙන් ප්ලාස්ටික් කාඩ් ගහන්න මම හිතන විධියට රුපියල් බිලියන දෙකක් විතර වෙන් කර තිබෙනවා. MOSIP එක, මම හිතන විධියට ඒක ඉන්දියාවෙන් ලැබෙයි. ඒ නිසා ඒකට Budget එකෙන් නැති වුණාට කමක් නැහැ. හැබැයි, මම මේ කාරණය කියන්න ඕනෑ. අපි මේ ගැන කථා කරනකොට අපේ ජනාධිපතිතුමා අපිත් එක්ක උරණ වුණා. එතුමා කිව්වා, ඉන්දියාවෙන් මෙහේ දත්ත හොරකම් කරන්න හදනවා, ඒක නිසා මේක කරන්න දෙන්න බැහැ. ඇයි මේ ජීව දත්ත හැඳුනුම් අංකයකට ඇතුළත් කරන්නේ කියලා. එතුමා ඒ කථා කරපු විධියට අපි හිතුවා මේක නිර්මාණය කරන්න එතුමා අපේ දේශීය ව්‍යවසායකයින්ට අවස්ථාවක් දෙයි කියලා. එහෙම වුණා නම් හොඳයි. හැබැයි දැන් එතුමාත් පිළිගෙන තිබෙනවා,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මට විනාඩි පහක් ලබා දෙන්න, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තවත් විනාඩි පහක කාලයක් ලබා දෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාට ස්තුතියි.

ඒකට විරුද්ධ වුණ නිසා මේ කටයුත්ත කරන්න කොච්චර පරක්කු වුණාද? ඒක ඒ තරම් පරක්කු වුණු නිසා අද අපට නිවැරදිව බදු ආදායම එකතු කරගන්නට බැරිවෙලා තිබෙනවා. අපනයනයෙන් පිට රට යන, ඒ නවතින ආදායම ගෙනෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසාම අපි කොච්චර දුප්පත් වෙලා තිබෙනවාද?

ගරු සභාපතිතුමනි, මේ අය වැය තුළ මුදල් වෙන් කර තිබෙන ආකාරයත්, major investment projects සහ ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති තුළ මේ ඩිජිටල්කරණය කියන කරුණුත් අපි අරගෙන බලමු. ඇත්තටම මේකේ කියන විධියටම, මේක පරණ ව්‍යාපෘතියක්. මොකද, මේකේ ආරම්භක දිනය වශයෙන් දාලා තිබෙන්නේ 2021. මුදල් වැය කිරීමට බලාපොරොත්තු වන ආකාරය දෙස බැලුවාම අවුරුදු 5ම මේක ඇදගෙන යන බවක් පෙනෙනවා. අපේ උපාය මාර්ගික වැඩ පිළිවෙළ තුළ අපි යෝජනා කළා මේක මාස හයෙන් කරමු කියලා. අපි ජාතියම පෙළගස්වලා, මේ Clean Sri Lanka වාගේ වැඩ පිළිවෙළක් තුළ කටයුතු කරමු. නරකත් නැහැ. ඒ සඳහා රුපියල් මිලියන 50ක් වෙන් කරලා තිබුණා ජනාධිපති වැය ශීර්ෂය යටතේ. හැබැයි, දැන් බලනකොට ඒක රුපියල් මිලියන 5,050යි. අන්න ඒ සල්ලි ටිකත් මේකට අරගෙන කටයුතු කරමු. ඇත්තටම Clean Sri Lanka හදන්න නම්, we need to bring in this Unique ID Number. That should be the priority, Hon. Chairman.

ඒක තමයි ප්‍රමුඛ වෙන්න ඕනෑ. එහෙම නැතුව Clean Sri Lanka කියලා මිනිස්සු ටිකක් අල්ලාගෙන ගිහිල්ලා වෙරළ සුද්ද කරලා හරියන්නේ නැහැ, කුණු අහුලලා හරියන්නේ නැහැ. Clean Sri Lanka හදන්න නම් අපි Unique Digital ID එක වහාම ගෙනෙන්න ඕනෑ. ඒක අවුරුදු පහකින් ගෙනැල්ලා වැඩක් නැහැ. ඉතින් අපි යෝජනා කරනවා අපේ NPP ඇමතිතුමන්ලාට, ඒ විෂයයට අදාළව ඉන්න ඇමතිතුමන්ලාට, ඒ ගැන බලන්න කියලා. ඒ ගැන බලලා ඉක්මනට මොනවා හරි කරන්න.

ගරු සභාපතිතුමනි, දෙවැනි එක තමයි ඩිජිටල් ආර්ථිකය. ඩිජිටල් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා ඔබගේ අපේක්ෂා මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඔබ කියලා තිබෙනවා. ඩිජිටල් ආර්ථිකයක් ගොඩනගා ගැනීම සඳහා ඩිජිටල් ව්‍යවසායකයන් හඳුනා ගනිමින් ඔවුන්ට උදව් කරනවා වෙනුවට, ඔවුන්ට බද්දක් පනවලා තිබෙනවා. දැන් ඒ බද්ද අය කරපු එක සාධාරණීකරණය කරමින් ඉන්නවා. ඒ ගැන ඇහුවාම කියන්නේ, හැමෝම බදු ගෙවන්න ඕනෑ කියලායි. හැබැයි අප හඳුනාගත් ක්ෂේත්‍ර ඉදිරියට ගෙන යමින් අපේ රටට ඩොලර් උත්පාදනය කිරීම සඳහා ඒ ක්ෂේත්‍රවලට විශේෂ දිරිමත් කිරීමක් ලබා දෙන්න අවශ්‍ය නම්, අප ඒ අයට අවුරුද්දක් දෙකක් යම් බදු සහනයක් දුන්නාට වරදක් නැහැ. එතකොට අපට තව ඩොලර් ටිකක් ගෙනෙන්න පුළුවන් වෙනවා විතරක් නොවෙයි, ඒ ඩිජිටල් ව්‍යවසායකයන්, විශේෂයෙන්ම start -ups, apps හදලා පිට රටට විකුණන අය උනන්දු කරන්න පුළුවන්. හැබැයි ඒ අයට මේ දුන්නු පණිවුඩය ඉතාම නරකයි. මේ දුන්නු පණිවුඩය ඉතාම නරකයි. ඒකෙන් අපේ දේශීය ව්‍යවසායකයන්ගේ, විශේෂයෙන්ම තරුණයන්ගේ දෘෂ්ටි කෝණයෙන් බැලුවොත්, ඔවුන්ගේ සිහින කඩා වැටෙනවා මිස බලාපොරොත්තු ඇති වෙන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම නැවතත් යෝජනා කරනවා, තෝරාගත් ක්ෂේත්‍රයක් හැටියට ඩිජිටල් ව්‍යවසායකයන් විසින් නිර්මාණය කරන ලද සේවාවලට බදු අය කිරීමෙන් වළකින ලෙස.

ගරු සභානායකතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා කියපු යම් ප්‍රකාශයක් නිසා මගේ හිත පොඩ්ඩක් රිදුණා. එතුමා සඳහන් කළා, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ - construction industry එකේ - පාඩුවක් වුණාම, කොන්ත්‍රාත්කරුවන් claims ඉල්ලීම සඳහා පාවිච්චි කරන ආයතන ගැන, about the professional institutions they use to get their claims justified.

එතුමා කිව්වා පොලීසියෙන් දාලා අල්ලනවා කියලා, ඒ ආයතන. ඒ කියන්නේ, මේ professional ආයතනවලට තර්ජන කළා; ඒ claims සකස් කරලා ඉදිරිපත් කරන ආයතනවලට තර්ජන කළා. මම නීතිඥයෙක්. අපරාදේ කියන්න බැහැ, උසාවි යන්නේ නැති නිසා මම බේරෙනවා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු දිලිත් ජයවීර මහතා
(මාණ්පුමිකු දිලිත් ජූයවීර)
(The Hon. Dilith Jayaweera)
Please, give me one more minute, Sir.

It is very wrong of him to say that. I, in fact, seek a clarification on that and I think he should apologize to them. They are all professionals. In fact, they bring in billions of money from abroad by working as professionals. So, I must actually draw your attention to that.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Member, please wind up now.

ගරු දිලිත් ජයවීර මහතා
(මාණ්පුමිකු දිලිත් ජූයවීර)
(The Hon. Dilith Jayaweera)
Sir, give me a few seconds.

Chandana Jayalath, whom you have appointed as the Chairman of CIDA, has written this book, arguing about construction claims. මේ, දැන් ඔබතුමන්ලාත් එක්ක ඉන්න එතුමා ලියපු පොත. මේක අනුව තමයි ඒ claims දාන්නේ. ලංකාවේ ඉන්න ව්‍යවසායකයෝ ඔක්කෝම හොරු කියන සංකල්පය නිසා,-

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Member, please wind up.

ගරු දිලිත් ජයවීර මහතා
(මාණ්පුමිකු දිලිත් ජූයවීර)
(The Hon. Dilith Jayaweera)
Give me just a few seconds, Sir.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
No, I cannot.

ගරු දිලිත් ජයවීර මහතා
(මාණ්පුමිකු දිලිත් ජූයවීර)
(The Hon. Dilith Jayaweera)
ලංකාවේ ඉන්න ව්‍යවසායකයෝ ඔක්කෝම හොරු කිය කියා, මේ විධියට කටයුතු කිරීම ගැන බලවත් කනගාටුව ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබාදීම ගැන ගරු විපක්ෂ නායකතුමාටත්, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

Thank you very much.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Chrishantha Abeysena. You have 20 minutes.

[පූ.භා. 10.41]

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (வைத்தியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Dr.) Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු සභාපතිතුමනි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතන 12ක් ක්‍රියාත්මක වෙනවා. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව - NASTEC - තිබෙනවා. පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඉටු කිරීමේ අපේක්ෂාවෙන් නවීන තාක්ෂණය පිළිබඳව ආතර් සී. ක්ලාක් ආයතනය, ජාතික මූලික අධ්‍යයන ආයතනය - NIFS, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - NERD, ඒ වාගේම නැනෝ තාක්ෂණ ආයතනය - SLINTEC - ජීව තාක්ෂණ ආයතනය තිබෙනවා. තවද, පර්යේෂණ ප්‍රධාන අරමුණ කර ගත් ජාතික පර්යේෂණ සභාව - NRC, විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා හා පර්යේෂණ **ප්‍රදාන** දෙනු ලබන ජාතික විද්‍යා පදනම - NSF සහ නව නිපැයුම්කරුවන් ප්‍රවර්ධනය අරමුණු කර ගත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම - SLIC - අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනවා. ඊට අමතරව ලංකාවේ සිදු වෙන සමස්ත නවෝත්පාදන පද්ධතිය - National Innovation System - ප්‍රවර්ධනය සඳහා ජාතික නවෝත්පාදන ආයතනය - National Innovation Agency - පිහිටුවා තිබෙනවා.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට හා ඒ යටතට ගැනෙන ආයතන සඳහා රුපියල් මිලියන 5,000කට වැඩි මුදලක් වෙන් කර තිබෙනවා. ඊට අමතරව තව රුපියල් මිලියන 1,000ක් පර්යේෂණ සොයා ගැනීම් වාණිජකරණය කිරීමට නවෝත්පාදන නව නිපැයුම් අරමුදලක් නිර්මාණය කිරීම සඳහා අප අමාත්‍යාංශයට වෙන් කර තිබෙනවා. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ නොවුණත්, වෙනත් අමාත්‍යාංශ යටතට එන අදාළ ආයතන තිබෙනවා. ඒ ඔක්කෝම ගත්තාම, විද්‍යාව හා තාක්ෂණය කියන විෂයයට රජය විසින් රුපියල් බිලියන 20.9ක් allocate කර තිබෙනවා, මේ අය වැයෙන්.

මීට අමතරව සමස්ත Science, Technology, and Innovation Ecosystem නහාසිටුවීම සඳහා මුදල් අමාත්‍යවරයා වශයෙන් අය වැය ප්‍රකාශය තුළ ඉතා සාධනීය යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබීමත්, ඊට අදාළව ප්‍රතිපාදන වෙන් කර තිබීමත් පිළිබඳව ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වීමට මා මෙය අවස්ථාවක් කර

[ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

ගන්නවා. ජනාධිපතිතුමාට වසර ගණනාවකට පෙර සිටම ජාතික ආර්ථිකය නහාසිටුවන්නේ කෙසේද යන්න පිළිබඳව අනාගතවාදී දැක්මක් තිබුණා. රටක් සංවර්ධනය කරා යන ගමනේදී පර්යේෂණ හා සංවර්ධනය තුළින් ලබා ගත හැකි දායකත්වය පිළිබඳව එතුමාට සුබවාදී බලාපොරොත්තු තිබුණා. ඒ අනුව අනාගතයේදී පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ දිශානතිය තීරණය කිරීම සඳහා Research and Development Policy එක කෙටුම්පත් කිරීමට අවශ්‍ය නායකත්වය දුන්නා. එහි ප්‍රතිඵලයක් ලෙස මේ වනවිටත් හඳුනා ගත් ප්‍රමුඛ ක්ෂේත්‍ර ගණනාවකට මෙම අය වැයෙන් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර තිබෙනවා. මගේ අතේ තිබෙන මේ "Science & Technology: Policy Framework on Research and Development for Public Consultation" කියන පොතේ ඒ පිළිබඳව සඳහන් කර තිබෙනවා. මට මතක හැටියට අපි මේක ඉදිරිපත් කළේ 2023 සැප්තැම්බර් මාසයේ. මේකේ සම්පිණ්ඩනයක් තමයි අපේ මැතිවරණ ප්‍රකාශනයට දැම්මේ.

ඒ වාගේම, R&D Policy එක සකස් කිරීමේදී විදේශීය රටවල වෙසෙන ශ්‍රී ලාංකීය විද්‍යාඥයන්ගේ පර්යේෂණ අත්දැකීම් ලබා ගැනීමට අපි සමත් වුණා. විශේෂයෙන්ම මහාචාර්ය ගෝමික උඩුගමසූරිය මහත්මයා ගැන මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න ඕනෑ. ඒ හරහා collaborative researches කිරීමටත්, විදේශීය මානව හා භෞතික සම්පත් මේ රටට ගලා ඒමේ ක්‍රමයක් සකස් කිරීමටත් අපි බලාපොරොත්තු වුණා. එය යථාර්ථයක් බවට පත් කිරීමට අද වනවිට අපට හැකියාව ලැබී තිබෙනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් සඳහන් කර තිබෙන විධියට, අපේ රටේ සම්පත් ගොඩක් තිබෙනවා. ඒ සම්පත් පිට රටට විකුණන්නේ නැතුව ඒවාට අගය එකතු කර නිෂ්පාදන කරලා ඒවායෙන් අපට විදේශ විනිමය උපයා ගැනීමේ හැකියාවක් තිබෙනවා කියලාත් අප සඳහන් කළා.

අපේ රටේ සභ්‍යත්වය, ඉතිහාසය පිළිබඳවත් අපි කථා කළා. අපි පිළිගන්නවා ඒක. අපේ රට තුළ එදා ඉඳලාම තාක්ෂණය තිබුණා. ඉංජිනේරු තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව යනාදි ඒ හැම දෙයක්ම තිබුණා. අපේ රටේ ඕනෑ තරම් විද්‍යාඥයෝ ඉඳලා තිබෙනවා. ඒ වාගේම ලෝක ප්‍රසිද්ධ අපේ විද්‍යාඥයෝ පිට රටවල දැනුත් ඉන්නවා, ලංකාවේත් ඉන්නවා. අපි ඒ හැමදෙනාම එකතු කරගෙන තමයි මේ ගමන යන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, අපේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය, Research and Development Policy එක NASTEC හරහා අමාත්‍යාංශයේ නායකත්වයෙන් update කරන්නත්, ඒක ජාතික ප්‍රතිපත්තිය කරන්නත්. එමෙන්ම, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව - NASTEC - හරහා වර්තමාන ශ්‍රී ලාංකීය සමාජයේ පවත්නා ගැටලුවලට විසඳුම් ලබා දීමට, අඩු ආයෝජනයකින් ඉහළ ප්‍රතිඵල ලබා ගැනීමට අපි research priority areas හඳුනා ගන්නවා. අපි list එකක් හදලා හැම ක්ෂේත්‍රයකටම වෙන වෙනම ප්‍රමුඛතාව දෙනවා. ඒ අනුව research agenda එකක් සකස් කර 2026 වර්ෂයේ සිට පර්යේෂණ ආයතනවලට මහා භාණ්ඩාගාරය හරහා ප්‍රතිපාදන ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීමට නායකත්වය ලබා දීමට බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, දැනටමත් ස්ථාපිත කර ඇති National Initiative for Research and Development Commercialization හරහා විශේෂ කාර්යභාරයක් ඉටු කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

එමඟින් වාණිජකරණයේ ඉහළ ප්‍රතිලාභ කඩිනමින් ලබාගත හැකි පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය කර එහි ප්‍රතිඵල ජනතාවට අත්පත් කරදීමට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය හැටියට කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ සඳහා, එනම් නවෝත්පාදන හා ව්‍යවසාය සංවර්ධනය සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. මෙමඟින් වාණිජකරණය කළ හැකි පර්යේෂණ සොයා ගැනීම් ගණනාවක් ඇති බවත්, පර්යේෂණ ආයතන මෙහෙයවීම හා වාණිජකරණයට විභවයක් සහිත පර්යේෂණ ධාරාවට ගෙන ඒමට මධ්‍යගත ආයතනික යන්ත්‍රණයක් අවශ්‍ය බවත් අප ප්‍රකාශ කරනු ලැබුවා. අප අමාත්‍යාංශය ලෙස මෙම වැඩ පිළිවෙළට උපරිම ශක්තියක් ලබා දීමට දැනටමත් අප විසින් කටයුතු කරනු ලබනවා. එම කාර්යයන් හා ඉදිරියේ දී සැලසුම් කර ඇති කාර්යයන් හා ඒකාබද්ධ වෙමින් විශාල කාර්යභාරයක් ඉටු කළ හැකි බව විශ්වාස කරනවා.

පසුගිය වසර පහක කාලය තුළ විද්‍යාව, පර්යේෂණ සහ නවෝත්පාදන වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් තිබුණේ නැහැ. අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය වැනි විෂයයන් ඇතුළත් විශාල අමාත්‍යාංශයක අංශයක් ලෙස පැවතීම හේතුවෙන් අමාත්‍යාංශයක් සතු මානව හා භෞතික පහසුකම් නොමැති අමාත්‍යාංශයක් භාර ගැනීමට අපට සිදු වුණා. ඒ වාගේම නිසි අධීක්ෂණයක්, මඟ පෙන්වීමක් නොමැති වීම හේතුවෙන් මෙම ක්ෂේත්‍රයේ මහඟුරුණු කාරණාවන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ සියල්ල අධ්‍යයනය කරමින්, සාකච්ඡා පවත්වමින් ඉදිරි වසර කිහිපයේ දී විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීමට සැලසුම් සකස් කරමින් පවතිනවා. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් දැනටමත් සිදුකර ඇති පර්යේෂණ ප්‍රතිඵලයන් වාණිජකරණය කිරීම සඳහා අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා වට ගණනාවක්ම මේ වන විට - පසුගිය මාස තුන හතරක කාලය තුළ - පවත්වා තිබෙනවා. මේ සාකච්ඡා මඟින් වාණිජකරණය කළ හැකි ව්‍යාපෘති හඳුනා ගැනීමත්, වාණිජකරණය කිරීමේ දී පවත්නා බාධා වෙතොත් ඒවා හඳුනාගෙන පිළියම් යෙදීමට අදාළ වන අනෙකුත් ආයතන අතර සම්බන්ධීකරණය කරදීමටත් අප කටයුතු කරමින් සිටිනවා. මේ ක්‍රියාවලිය හරහා දැනට සිදුකර ඇති, ජාතික ගැටලුවලට විසඳුම් ලබා දෙන පර්යේෂණ කිහිපයක් මේ වසරේ දී වාණිජකරණය කිරීමට බලාපොරොත්තු වෙනවා. එසේම NIFS එක විද්‍යාඥයින්ගේ පර්යේෂණ මඟින් සොයාගත් supercapacitors වාණිජකරණය කිරීම සඳහා සුදුසු ආයෝජකයෙකු හරහා එම පර්යේෂණවල ප්‍රතිඵල නව නිපැයුමක් ලෙස වර්ධනය කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට අමාත්‍යාංශය මැදිහත් වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්ද ඇතුළත මේ rechargeable batteriesවලින් වාහන හදන්න. ඉලෙක්ට්‍රික් වාහනයක් මේ අවුරුද්ද ඇතුළත හැදීමට අපි බලාපොරොත්තු වෙනවා.

මීට අමතරව NRC එක හා බාහිර පෞද්ගලික පාර්ශ්ව සමඟ ඒකාබද්ධව ලංකාවේ antivenom නිෂ්පාදනය කිරීම සඳහා සාර්ථකව සිදුකර ඇති පර්යේෂණවල ප්‍රතිඵලය වාණිජකරණය කිරීමේ විභව සලකා බැලීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයක් දරන පිරිසක් කමිටුවක් ලෙස පත් කරනු ලැබුවා. මෙම වසර අවසාන වන විට පෞද්ගලික ආයෝජනයක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේද අනුමැතිය සහිතව antivenom ලංකාවේ දී නිෂ්පාදනය කිරීමේ හැකියාව අධ්‍යයනය කරමින් ඉන්නවා. මීට අමතරව, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතට ගැනෙන වෙනත් පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් විසින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ රසායනික පොහොර භාවිතය අඩු කිරීම සඳහා සිදුකර ඇති පර්යේෂණ කෘෂි ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයක් දරන විශේෂඥයන් ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා

දුන්නා. ඒ අනුව කෙටි කලක් තුළ වාණිජකරණය කළ හැකි හා තවදුරටත් පර්යේෂණයන් කළ යුතු පර්යේෂණ හඳුනා ගනු ලැබුවා. ඒ අනුව ඉදිරි කාලයේ දී මෙවා ජාතික වැදගත්කමක් සහිත පර්යේෂණ බවට පත් කිරීම අඛණ්ඩව පසු විපරම් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. විවිධ ක්ෂේත්‍රවල සිදුවන පර්යේෂණ එක වේදිකාවක් - platform එකක් - හරහා අන්‍යෝන්‍ය සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

ලංකාවේ භාවිත කරනු ලබන triple superphosphate and rock phosphate පොහොර විශාල විදේශ විනිමයක් වැය කරමින් ලංකාවට ආනයනය කරනු ලබනවා. එසේ වුවද, පොස්පේට් පොහොර භාවිතය පිළිබඳ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සතුව විවිධ අදහස් පවතින බවත්, දේශීය පොස්පේට් පොහොර භාවිතය පිළිබඳව විශාල පර්යේෂණ ප්‍රමාණයක් සිදුව ඇති බව අප විසින් කරනු ලබන සාකච්ඡාවලදී අනාවරණ වුණා. අපි දන්නවා bio-phosphate තිබෙන බව. Biofertilizers, nano fertilizers, single superphosphate පොහොර අදටත් ලංකාවේ හදනවා. ඒ අනුව ඉදිරි කාලයේ දී මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ මෙහෙයුම් සිදු කිරීමටත්, කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වී ජාතික පොහොර ප්‍රතිපත්තියක් සකස් කිරීමට සහයෝගය දීමටත් බලාපොරොත්තු වෙනවා. අපිට ඕනෑ evidence-based fertilizer policy එකක්. අපි ඒකට අදාළව සාක්ෂි - evidence - ඉදිරිපත් කරනු ලබනවා. තවද, කර්මාන්ත අංශය සමඟ ඒකාබද්ධ වී අප රට තුළම පොස්පේට් පොහොර නිෂ්පාදනය තවදුරටත් වර්ධනය කිරීමට අපේක්ෂා කරනවා.

එසේම, ලංකාවේ සෘජුවම විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පරීක්ෂණ සිදු කරනු ලබන රාජ්‍ය ආයතන 41ක් විවිධ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වෙන අතර, මෙම පර්යේෂණ ආයතන අතර සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීමට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වැඩ පිළිවෙළක් සැකසීමට බලාපොරොත්තු වෙනවා. ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය වාගේ ආයතන ගොඩක් තිබෙනවා. ඒ තුළින් විශාල විදේශ විනිමයක් වැය වන පර්යේෂණ සඳහා උපකරණ මිලදී ගැනීමට වැය වන වියදම අවම කිරීමටත්, පර්යේෂණ ද්විත්වකරණය වළක්වා ගැනීමටත්, පර්යේෂණ ඒකාබද්ධව තම ආයතනවල විශේෂඥභාවය අනුව කෙටි කලක් තුළ සිදු කිරීමටත්, එමඟින් ඉහළ ප්‍රතිපාදන ලබා ගැනීමටත් අපි අපේක්ෂා කරනවා. තවද, අප අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතන හරහා පාසල්වල Generation Z, දරු දැරියන්ගේ නවෝත්පාදන දැනුම, හැකියාව වැඩි දියුණු කිරීමටත්, විද්‍යා දැනුම ප්‍රචලිත කිරීම සඳහාත් "Inventors' Club", "Science Club", "Inventors' Lab" ලෙස විවිධ සංසද ක්‍රියාත්මක වෙමින් පවතිනවා. රටේ දරුවන් විද්‍යා අධ්‍යාපනයට නැඹුරු කර ගැනීම වැදගත්. මොකද, විද්‍යා අධ්‍යාපනය ලබන දරුවන්ගේ ප්‍රතිශතය ඉහළ නැංවීම රටක් සංවර්ධනය කිරීමට අත්‍යවශ්‍යම කරුණක්. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ නව අධ්‍යාපන ප්‍රතිපත්තිවලට සමගාමීව අධ්‍යාපන අමාත්‍යාංශයේ මනා සම්බන්ධීකරණය හා සහයෝගයෙන් වැඩ පිළිවෙළක් සකස් කිරීමේ වැදගත්කම හඳුනා ගෙන තිබෙනවා. එම වැඩසටහන පාසල තුළ ප්‍රචලිත කිරීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වන විද්‍යා සම්පත් මධ්‍යස්ථාන 334ක රාජකාරී කටයුතු කරන විද්‍යා නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අමාත්‍යාංශය යටතේ ගැනෙන NSF, NIA, SLIIT, Arthur C. Clarke Institute for Modern Technologies, Sri Lanka Planetarium හරහා, කාර්යසාධන ඉලක්ක පාදක කර ගත් strategic plan එකක් හරහා එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනවා.

STEM අධ්‍යාපන ප්‍රවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළින් කොළඹ නගරයේ ජනප්‍රිය පාසල්වල දරු දැරියන්ට වාගේම ඈත පිටිසර - ගම්බද - දරුවන්ටත් ඉහළ විද්‍යා අධ්‍යාපනයක් ලබා දීමේ වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අත්වැල් බැඳගෙන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. අමාත්‍යාංශය යටතේ පවතින විද්‍යා සම්පත් මධ්‍යස්ථාන හරහා ගම් මට්ටමින් විද්‍යාව, තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා මෙම නිලධාරීන් සිදු කරනු ලබන කාර්යභාරය ඇගයීමටත්, ගමට විද්‍යාව හා තාක්ෂණය රැගෙන යාමේ වැඩ පිළිවෙළක් සැකසීමටත් අමාත්‍යාංශය බලාපොරොත්තු වෙනවා. එහි මුල් අදියර වශයෙන් පළාත් කිහිපයක හෝ business incubation centres ස්ථාපනය කිරීමටත්, ඒ සඳහා දැනටමත් විද්‍යා සම්පත් මධ්‍යස්ථානවල පවත්නා සම්පත්, විශ්වවිද්‍යාලවල පවත්නා සම්පත් හා මානව සම්පත් යොදා ගැනීමටත් සැලසුම් කර තිබෙනවා. රාජ්‍ය සේවයේ ව්‍යාපාර ප්‍රවර්ධනය පිළිබඳ අත්දැකීම් සහිත නිලධාරීන්ගේ, ආයෝජකයන්ගේ සහයෝගය ලබා ගැනීමටත් අපි කටයුතු කරනවා. විද්‍යා සම්පත් මධ්‍යස්ථාන ජාලය අමාත්‍යාංශය යටතේ පැවතීම නිසා ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් එම ක්ෂේත්‍රයේ ධනාත්මක වෙනසක් සිදු කිරීම සඳහා විද්‍යා නිලධාරීන් කාර්යක්ෂමව යොදා ගැනීමට බලාපොරොත්තු වෙනවා. මීට අමතරව විද්‍යා සම්පත් මධ්‍යස්ථාන හරහා සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයන්ගේ භාණ්ඩවල ප්‍රමිතීන් ඉහළ නැංවීමට විශාල කාර්යභාරයක් ඉටු කළ හැකියි. විද්‍යා අංශය හරහා කාර්ය සාධක දර්ශක පදනම් කර ගත් උපාය මාර්ගික සැලැස්මක් තුළින් මෙය ඉටු කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් නහාසිටුවීම සඳහා විද්‍යා හා තාක්ෂණ අංශයෙන් ලබා දිය හැකි සහයෝගය ප්‍රශස්ත ලෙස ලබා දීම සඳහා අමාත්‍යාංශය යටතේ දැනටමත් පිහිටුවා ඇති රුහුණු, රජරට, කිලිනොච්චි, වයඹ NERDC සහ technology incubation centres, විද්‍යා සම්පත් මධ්‍යස්ථාන, විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන, පරීක්ෂණ ආයතන සම්බන්ධ කර ගන්නවා. විද්‍යා හරහා ක්‍රියාත්මක කිරීමට යෝජිත business incubation centres හා දැනට පවතින technology incubators සම්බන්ධීකරණය යටතේ කටයුතු කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකසනවා. දැනට මෙම technology incubatorsවල සේවාවන් විශ්වවිද්‍යාලවලට පමණක් සීමා වී තිබෙනවා. ඒවා සාමාන්‍ය ජනතාවටත් ප්‍රතිලාභ ලබා ගත හැකි අයුරින් නව මුහුණුවරකින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යයි.

එසේම රජයේ විශ්වවිද්‍යාල පරීක්ෂණ වාණිජකරණය පිළිබඳ University Business Linkage - UBL - Cells ක්‍රියාත්මක වෙනවා. තාක්ෂණ පීඨවල පර්යේෂණ සිදු කිරීමට නවීන විද්‍යාගාර ඇතත්, ඒවා ඌන උපයෝජන තත්ත්වයේ පවතින බව දැනගැනීමට ලැබී තිබෙනවා. මේ වන විටත් -ලබන සතියේ- තාක්ෂණ පීඨවල පීඨාධිපතිවරුන් කැඳවා ඒ සම්බන්ධව සාකච්ඡා කිරීමට සැලසුම් කර තිබෙනවා. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ අනෙකුත් පර්යේෂණ සිදු කරන පීඨ දක්වා පුළුල් කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විවිධ රටවල් සමඟ බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික MoUs අත්සන් කර තිබෙනවා. එසේ වුවද, බොහෝ සහයෝගිතා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත අත් කර ගත හැකි ප්‍රතිලාභ බොහොමයක්ම මහ හැරී තිබෙනවා. මේ සියල්ල නැවත අධ්‍යයනය කර රටට විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට අප කටයුතු කරනවා. දැනට ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අත්සන් කර ඇති

[ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

සහයෝගිතා එකඟතාව අපි සක්‍රියව ක්‍රියාත්මක කරනවා. ඒ අනුව, ඉන්දු-ශ්‍රී ලංකා පර්යේෂණ වැඩසටහන යටතේ පර්යේෂණ යෝජනා 430ක් හා පර්යේෂණ වැඩමුළු 208ක් ලැබී තිබෙන අතර, ඉන්දියානු හා ශ්‍රී ලාංකික විද්‍යාඥයන් දෙපිරිසගේම දැනුම යොදාගෙන රටවල් දෙකටම ප්‍රතිලාභ ලැබෙන පර්යේෂණ වැඩමුළු වසර දෙකක් තුළ නිම කිරීමටත් සැලසුම් කර තිබෙනවා. මෙහිදී අපේ රටේ ආර්ථිකයට ගැළපෙන ව්‍යාපෘති හඳුනා ගැනීමටත් වැඩි ප්‍රමුඛතාවක් ලැබී තිබෙනවා.

එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ තිබෙන පර්යේෂණ සඳහා සහයෝගය දෙන ආයතන සමඟ සාකච්ඡා කර ඒ සඳහා ලබාගත හැකි සහයෝගය ලබා ගැනීමටත් අපි කටයුතු කරනවා. මෙහි මූලික අදියරක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයක් වන, United Nations Industrial Development Organization වැනි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ නිරන්තර සංවාදයක යෙදෙමින් ශ්‍රී ලංකාවේ STI ecosystem එක දියුණු කර ගැනීමට පසුගිය මාස තුන, හතරක කාලය තුළ විශාල මෙහෙවරක් ඉටු කිරීමේ පදනම දමා ගැනීමට අප අමාත්‍යාංශයට හැකිව තිබෙනවා. ඒ වාගේම අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවල විශාල රාජ්‍ය ආයෝජන සිදු කර ස්ථාපිත කරන ලද, නමුත් ඌන උපයෝජිතව පවතින රසායනාගාර පහසුකම් රජයේ වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙසත්, එම පහසුකම් විදේශිකයන්ගෙන් ඉටු කර ගැනීමේදී වැය වන විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත් අවශ්‍ය වන ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟත්, ඒවා යටතට ගැනෙන ආයතන සමඟත් සාකච්ඡා වට කිහිපයක්ම මේ වන විටත් පවත්වා තිබෙනවා. ඒ අනුව කාර්මික තාක්ෂණ ආයතනයේ දැනටමත් ස්ථාපිත කර ඇති ITI එකේ petroleum testing facility එක වර්තමාන අවශ්‍යතා අනුව ගළපා ගනිමින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා බලශක්ති අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම අතර මූලික සාකච්ඡා අපි පැවැත්වූවා. ගරු සභාපතිතුමනි, අපේ ගල්අඟුරුවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ඉන්දියාවටයි යවන්නේ. දැන් අපේ ITI ආයතනය දැනුම් දී තිබෙනවා, අපේ ආයතන තුළ ගල්අඟුරුවල තත්ත්වය පරීක්ෂා කිරීමේ හැකියාව තිබෙනවා කියලා. ඒකත් අපි ඉදිරියේදී බලශක්ති අමාත්‍යාංශය හරහා කර ගනු ලබනවා.

ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමඟ සිදු කරන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ITI Pharmaceutical Testing Laboratory එක රජය පිළිගත් පර්යේෂණාගාර පහසුකමක් ලෙස NMRA එක පිළිගෙන ඇති අතර, අදාළ MoUs මේ වන විටත් සකස් කර අවසාන අතර, නුදුරු දිනක අත්සන් කිරීමට බලාපොරොත්තු වනවා. අපි දන්නවා, නියමිත ප්‍රමිතියෙන් තොර බාල ඖෂධ පිළිබඳව කතිකාවක් තිබෙන බව. මේක තෙවැනි පාර්ශ්වයේ lab එකක්. එම නිසා අපට ඒ ITI Lab එක පාවිච්චි කරන්න පුළුවන්, ඖෂධවල ප්‍රමිතිය පරීක්ෂා කරන්න.

ආහාර සම්බන්ධව ගත්තොත්, අපට food sampling කිරීමත් අවශ්‍යයි. Clean Sri Lanka වැඩසටහන යටතේ ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. අපි සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක ඒ සම්බන්ධව කථා කළා. අපේ ආයතන මඟින් food sampling කිරීමේ හැකියාව තිබෙනවා. ඒ සඳහා ඉදිරියේදී Food Act එක වෙනස් කරන්නත් අපි බලාපොරොත්තු වනවා. ස්තූතියි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)

The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have 13 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්පුමිකු (වෛද්‍යර්) රිස්වි සාලී] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[மு.ப. 11.02]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற டிஜிட்டல் பொருளாதார அமைச்சு, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு ஆகியவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்து கொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

டிஜிட்டல் மயமாக்கல் என்பது நவீன பொருளாதாரத்தின் அடித்தளமாகும். ஒரு நாட்டில் ஊழலற்ற அரச நிர்வாக முறைமையை நடைமுறைப்படுத்துவதற்கும் பொது மக்களுக்குச் சிறந்த சேவையை வழங்குவதற்கும் அரசாங்கத்தின் அனைத்துத் துறைகளிலும் டிஜிட்டல் மயமாக்கல் மிகவும் முக்கியமானதாகும். உலகில் வளர்ச்சியடைந்த நாடுகளில் பொது மக்களுக்கான சேவைகள் அனைத்தும் டிஜிட்டல் மயப்படுத்தப்பட்டுள்ளன. இன்று நவீன டிஜிட்டல் மயமாக்கலில் கண்ணால் பணத்தைப் பார்க்காமலேயே கொடுக்கல்வாங்கல் நடைபெறுகின்றது. வங்கி நடைமுறைகளில் ஏற்பட்ட டிஜிட்டல் புரட்சியே இதற்குக் காரணமாகும்.

டிஜிட்டல் முறை பாதுகாப்பானது; விரைவானது; நேரவிரயமற்றது; சிக்கனமானது; ஊழலற்ற நிர்வாக நடைமுறையை ஏற்படுத்தக்கூடியது. இலங்கையில் குறிப்பட்ட சில துறைகள் ஏற்கெனவே டிஜிட்டல் மயமாக்கப்பட்டுள்ளன. எனினும், அனைத்துத் துறைகளிலும் டிஜிட்டல் மயமாக்கல் படிப்படியாக நடைமுறைப்படுத்தப்படல் வேண்டும். அந்த வகையில், இந்த அரசாங்கத்தின் 'கிளீன் ஸ்ரீ லங்கா' வேலைத்திட்டத்தில் முக்கிய அங்கமாக டிஜிட்டல் மயமாக்கல் உள்வாங்கப்பட்டுள்ளது. அத்துடன், 2025ஆம் ஆண்டுக்கான பாதீட்டில் 21.8 பில்லியன் ரூபாய் டிஜிட்டல் மயமாக்கலுக்காக ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. அதில் 7.1 பில்லியன் ரூபாய் டிஜிட்டல் பொருளாதார அமைச்சுக்கும் 14.7 பில்லியன் ரூபாய் ஏனைய அமைச்சுக்களுக்கும் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது.

சுகாதாரம், கல்வி, போக்குவரத்து, உணவுப் பாதுகாப்பு, சுற்றுச்சூழல் பாதுகாப்பு மற்றும் சமூக நலன்புரி ஆகிய துறைகளில் டிஜிட்டல் மயமாக்கலுக்காக நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. பின்வரும் துறைகளில் முன்னுரிமை அடிப்படையில் டிஜிட்டல் மயமாக்கல் செய்யப்படல் வேண்டும் என்பதைத் தெரிவித்துக் கொள்கின்றேன். முதலாவது, உள்ளூராட்சி மன்றங்களின் வருமானம் மற்றும் சொத்து வரி அறவீடு தொடர்பானது. உள்ளூராட்சி மன்றங்களின் வருமானத்தை அதிகரிப்பதற்கான ஏற்பாடுகளைச் செய்வதனூடாக அச்சபைகள் தமது சொந்த வருமானத்தில் கிடைக்கின்ற நிதியிலிருந்து கிராமிய

அபிவிருத்தியைச் செய்துகொள்ள முடியும். இதுவே நிலைபேறான அபிவிருத்தி ஆகும். இதற்காக உள்ளூராட்சி மன்றங்களின் வருமான மூலங்களான சொத்து வரி அறவீடு, வருமான வரி அறவீடு என்பன டிஜிட்டல் மயப்படுத்தப்பட வேண்டும்.

உள்ளூராட்சி அதிகாரசபைகளின் தரவுத் தளத்தை நிறுவுவதற்காக 0.05 பில்லியன் ரூபாய் வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. ஆனாலும், எமது மாவட்டங்களில் குறிப்பாக பிரதேச சபைகளில் பல வட்டாரங்களிலும் சொத்து மதிப்பீடு செய்யப்படாமல் இருப்பதனால் ஆதன வரி அறவீடு செய்யப்படுவதில்லை. எனவே, அங்கு மேலதிகமாக மதிப்பீட்டாளர்களை ஈடுபடுத்தி, சொத்து மதிப்பீட்டைச் செய்ய வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். இன்றும் எமது மாவட்டங்களில் நகர சபை, பிரதேச சபைகளுக்கு நேரடியாகச் சென்றே ஆதன வரியைச் செலுத்த வேண்டியுள்ளது. வங்கி நடைமுறைகள் போன்று வரி செலுத்தும் நடைமுறையையும் டிஜிட்டல் மயப்படுத்தினால் பொதுமக்கள் தங்களின் கைத்தொலைபேசி ஊடாகவே வரியைச் செலுத்தக்கூடியதாக இருக்கும்.

இரண்டாவது, காணி நிர்வாகம் தொடர்பானது. இலங்கையின் அரச நிர்வாகத் துறைகளில் மிகவும் தாமதமாக இயங்குகின்ற துறையென்றால், அது காணி நிர்வாகம்தான். சில காணிப் பிரச்சினைகளைத் தீர்க்க 20 - 25 வருடங்கள் செல்கின்றன. இதனால் காணி உரிமையாளரின் இறப்புச் சான்றிதழைச் சமர்ப்பித்து காணி உரிமத்தைப் பெற்றுக் கொள்ளும் அவலநிலை காணப்படுகின்றது. எனவே, முன்னுரிமை அடிப்படையில் காணி நிர்வாகம் சார்ந்த துறையில் டிஜிட்டல் முறைமையை உடனடியாக நடைமுறைப்படுத்தி, குறித்த செயற்பாட்டை விரைவுபடுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

மூன்றாவது, போக்குவரத்து விதிகளை மீறுபவர்களுக்கான தண்டப்பணம் தொடர்பானது. இலங்கையில் அதிக வீதி விபத்துகள் நிமித்தம் பலர் உயிரிழக்கின்றார்கள்; பலர் அங்கவீனம் ஆக்கப்படுகின்றார்கள். இதற்குப் பல காரணங்கள் இருந்தாலும், போக்குவரத்து விதிமுறைகளைச் சரியாக மக்கள் பின்பற்றாமையே முக்கிய காரணமாகும். இதற்கு பொது மக்கள் மட்டும் காரணமல்ல, போக்குவரத்து விதிமுறைகளைக் கண்காணிக்கும் பொஸிசாரும் காரணமாகும். ஏனெனில், அவர்கள் போக்குவரத்து விதிமுறைகளைச் சரியாக நடைமுறைப்படுத்துவதில்லை.

வீதிச் சட்டங்களை மீறுவோருக்கு எதிராக அறவிடப்படும் தண்டப்பணம் செலுத்தப்படும் முறைமை இன்று பாரிய பிரச்சினையாக மாறியுள்ளது. போக்குவரத்துப் பொலிஸார் விரும்பினால் மட்டுமே தண்டப்பணம் அறிவீடு செய்ய முடியும். வாகன ஒட்டுநருக்கும் கடமையிலுள்ள பொலிஸாருக்கும் இடையில் நடைபெறும் பேரம் பேசலானது, விதிமுறைகளை மீறியவர்கள் இலகுவாகத் தண்டனையிலிருந்து தப்பித்துக் கொள்ள வழிவகுக்கின்றது. நான் இங்கு அனைத்துப் பொலிஸாரையும் குற்றம் சொல்ல விரும்பவில்லை. வளர்ச்சியடைந்த நாடுகளில் உள்ளது போன்று வீதிகளின் முக்கியமான இடங்களில் கண்காணிப்புக் 'கமரா'க்கள் பொருத்தப்பட வேண்டும். விதிகளை மீறுவோருக்கு எதிராக டிஜிட்டல் மயப்படுத்தப்பட்ட கட்டண அறவீடு நடைமுறைப்படுத்தப்படல் வேண்டும். தொடர்ச்சியாக விதிகளை மீறுவோரின் சாரதி அனுமதிப்பத்திரங்கள் இரத்துச் செய்யப்பட வேண்டும். வடக்கு மாகாணத்திலிருந்து தூர இடங்களுக்குப் பிரயாணம் செய்யும்போது விதி மீறலொன்று நடைபெற்றால், பொலிஸார் அந்த இடத்திலேயே சாரதியிடமிருந்து licenceஐப் பெற்றுக் கொள்கின்றார்கள். எனினும், அந்தச் சாரதி தண்டப்பணத்தைச் செலுத்திவிட்டு, மீண்டும் நீண்ட தூரம் பிரயாணம் செய்து, குறித்த பொலிஸ் பிரிவுக்கு வந்துதான் தனது licenceஐப் பெறவேண்டி இருக்கின்றது. இது பல அசௌகரியங்களை ஏற்படுத்துகின்றது.

அடுத்து, சுகாதாரம் சம்பந்தமான record-keeping என்பது பாரிய பிரச்சினையாகக் காணப்படுகின்றது. குறிப்பிட்ட ஆண்டுகளுக்கு நோயாளிகள் சம்பந்தமான recordsஐ வைத்திருக்கவேண்டி இருக்கின்றது. இதற்குப் பாரிய இட வசதி ஒவ்வொரு வைத்தியசாலையிலும் தேவைப்படுகின்றது. Health recordsஆனது digitalize பண்ணப்படுமாக இருந்தால், நிச்சயமாக இந்தப் பாரிய சுமை குறையும். இன்னொரு முக்கியமான விடயத்தையும் சொல்ல வேண்டும். அதாவது, சுகாதாரத் துறையில் வீண்விரயம் நடைபெறுகின்றது. உதாரணத்துக்கு, CT scan பரிசோதனையை எடுத்துக் கொள்வோம். எங்களுடைய சுகாதார சேவை வழங்கலின்படி ஒரு நோயாளி தான் விரும்பிய எந்த வைத்தியசாலைக்கும் போகலாம். ஒரு நோயாளி கொழும்பு தேசிய வைத்தியசாலையில் admitஆகி செலவுகூடிய பல investigationsஐச் செய்துவிட்டு, அடுத்த கிழமை யாழ்ப்பாண வைத்தியசாலையில் admitஆகினால், செலவுகூடிய அதே investigations மீண்டும் அவருக்குச் செய்யப்படுகின்றது. இது மிகவும் வீண்விரயமான ஒரு செயலாகும்.

இன்று பல நாடுகளில் health recordsஆனது digitalized பண்ணப்பட்டு இருக்கின்றது. குறித்த patientக்குரிய uniqueஆன numberஐ வைத்து, அவரது நோய்நிலைமை தொடர்பான அனைத்துத் தகவல்களையும் இதன்மூலம் உடனடியாகப் பெற்றுக்கொள்ள முடியும். ஒரு கிழமைக்குள் மீண்டும் பாரிய நிதியைச் செலவழித்து, அந்த patientக்குரிய investigationஐச் செய்யத் தேவையில்லை. அதேபோல் ஒரு நோயாளி ஒரு வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டு சிகிச்சை பெற்ற பிற்பாடு, இன்னொரு வைத்தியசாலைக்கு any time போகலாம். அவ்வாறு போகும்போது, ஏற்கெனவே சிகிச்சை பெற்ற வைத்தியசாலையில் இருக்கின்ற health records புதிதாகப் பார்க்கின்ற வைத்தியருக்குத் தெரியாது. அதைச் சொல்லக் கூடிய நிலைமையில் சிலநேரம் நோயாளியும் இருக்க மாட்டார். எனவே, இந்த விடயத்தில் digitalization என்பது மிகவும் முக்கியமானது.

அடுத்து, கல்வித்துறையை எடுத்துக்கொள்வோம். இன்றைக்கு எங்களுடைய மாணவர்கள் A/L exam எழுதிவிட்டு, கிட்டத்தட்ட ஒரு வருடம் results வரும் வரை காத்திருக்க வேண்டும். Results வந்த பிறகு, university செல்வதற்கு more than one year wait பண்ண வேண்டும். Universityஇல் ஒரு வைத்திய மாணவர் final exam எழுதி விட்டு, 1-1½ வருடங்கள் internஇற்காக wait பண்ண வேண்டும். ஒருவர் O/L இலிருந்து universityஇல் பட்டப்படிப்பை முடித்து வேலை கிடைக்கும் வரை 5 வருடங்களுக்கும் மேல் 'சும்மா' இருக்கவேண்டி இருக்கிறது. A/L exam results வந்த பிறகு re-correctionக்கு விண்ணப்பித்தால், அதற்குரிய பதில் வருவதற்கு எத்தனையோ மாதங்கள் செல்கின்றன. இந்தியாவில் ஒரு மாணவன் re-correctionக்கு போட்டால், அவனுடைய புள்ளியிடப்பட்ட answer paper உடனடியாக emailஇல் அனுப்பப்படுகின்றது. இப்படித்தான் நாங்கள் marks போட்டு இருக்கிறோம் என்று. Immediately, they send by email or WhatsApp. So, there is no waste of time. எனவே, எங்களுடைய நாட்டின் பொருளாதாரத்தையும் ஏனைய துறைகளையும் கட்டியெழுப்புவதற்கு digitalization என்பது மிகவும் முக்கியமானது.

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

இந்த Budgetஐப் பற்றி பலர் பல குறைகளைச் சொன்னாலும், என்னைப் பொறுத்தவரையில் விரலுக்கு ஏற்ற வீக்கம்தான் இருக்க வேண்டும். எங்களுடைய நாட்டில் இப்போது இருக்கின்ற பொருளாதாரத்தை வைத்து, how best we can do that? என்று சிந்திப்பதுதான் மிகவும் முக்கியமானது. அந்த அடிப்படையில், ஒரு பாதீட்டை முன்வைப்பதற்கு நீங்கள் முயற்சி செய்துள்ளீர்கள் என நான் நினைக்கின்றேன்.

இது இந்த அரசாங்கத்தின் முதலாவது வரவு செலவுத்திட்டமாகும். இதிலிருந்து முன்னோக்கிச் செல்ல வேண்டும். எங்களுடைய mindஇல் glorifying திட்டங்கள் நிறைய இருக்கலாம். நாங்கள் YouTubeஇல் பார்த்திருப்போம்; வாசித்திருப்போம்; வெளிநாடுகளுக்குப் போயிருப்போம். எங்களிடம் நிறைய ideas இருக்கின்றன. எனினும், 75 வருடங்களாக மோசமான பொருளாதாரப் பாதைக்குள் சென்று கொண்டிருந்த இந்த நாட்டின் தற்போதைய பொருளாதார நிலையில் அந்த ideas எல்லாவற்றையும் உடனடியாக நடைமுறைப்படுத்த முடியாதென்பது எல்லோராலும் ஏற்றுக்கொள்ளப்படவேண்டிய ஒரு விடயமாகும். நாட்டைக் கட்டியெழுப்புவதற்கு எங்களிடம் இருக்கின்ற resourcesஐ வீண்விரயம் இல்லாது சிக்கனமான முறையில் பயன்படுத்துவதற்கு digitalization is very important. நீங்கள் அதற்கு முக்கியத்துவம் கொடுத்துள்ளீர்கள். அதற்கு எனது நன்றியையும் பாராட்டுகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்து, science and technology. நவீன உலகில் உலக ஒழுங்குடன் இணைந்து பயணிப்பதற்கு விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அறிவென்பது இன்றியமையாதது. இன்று உலக அரங்கில் பொருளாதார ரீதியில் வளர்ச்சியடைந்த நாடுகளில் விஞ்ஞானம் மற்றும் தொழில்நுட்ப அறிவு மட்டமானது மிகவும் உயர்ந்தளவில் காணப்படுகின்றது. எமது நாடும் இந்தத் துறையில் உயர்வடைந்தால் பொருளாதார வளர்ச்சியை அடைய முடியும். பாடசாலைக் கல்வியாலும் பல்கலைக்கழகக் கல்வியாலும் மட்டும் தொழில்வாய்ப்பைப் பெற்றுவிட முடியாது. அதற்குச் சமாந்தரமாக தொழிற்கல்விலும் இளைஞர்கள் ஈடுபட வேண்டும். கடந்த காலங்களில் தொழிற்கல்வியில் செய்யப்பட்ட மறுசீரமைப்பானது, - vocational training reform - சர்வதேச ரீதியில் வேலை வாய்ப்பைப் பெறக்கூடிய தரமான தொழிற்கல்வியை எமது இளைய சமுதாயத்துக்கு ஓரளவு வழங்கி வருகின்றது. இதற்குக் காரணம், தரமான பாடவிதானங்கள், செயன்முறைப் பயிற்சிகள் மற்றும் தொழிலோடு இணைந்த வெளிக்களப் பயிற்சிகள் வழங்கப்படுவதே ஆகும்.

விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அபிவிருத்திக்காக இவ்வருட பாதீட்டில் 6.05 பில்லியன் ரூபாயே ஒதுக்கப்பட்டுள்ளது. இலங்கையில் தொழிற்கல்விக்கான ஒழுங்குபடுத்தும் அமைப்பாக மூன்றாம் நிலைக்கல்வி ஆணைக்குழு - Tertiary and Vocational Education Commission - செயற்பட்டு வருகின்றது. எனினும், மூன்றாம் நிலைக்கல்வி - tertiary and vocational education - தொடர்பான விழிப்புணர்வு பாடசாலை மட்டத்தில் மிகவும் குறைவாகவே காணப்படுகின்றது. எனவே, பாடசாலை மட்டத்தில் tertiary and vocational education சம்பந்தமான விழிப்புணர்வை ஏற்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. தேசிய தொழில் தரத்திலான சான்றிதழ் - NVQ certificate - பயிற்சி முடிவில் வழங்கப்படுகின்றது. தொழிற்பயிற்சி சம்பந்தமான விடயத்தில் practical knowledgeஐ அவர்கள் பெற்றுக்கொள்ளக்கூடிய வகையில், நாங்கள் விஞ்ஞான மற்றும் தொழில்நுட்பம் தொடர்பான பல விடயங்களைப் பிரயோகிக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் இங்கு குறிப்பிட்டதுபோல, விவசாயம், சுகாதாரம் உட்பட ஏனைய சகல விடயங்களிலும் நாங்கள் தொழில்நுட்பத்தையும் விஞ்ஞானத்தையும் பயன்படுத்தும் அதேநேரம், digitalizationஐயும் செய்தால் நிரந்தரமான, பாதுகாப்பான, படிப்படியான பொருளாதார வளர்ச்சி முறைமைக்குள் போவதற்கு அது பாரிய உதவியாக இருக்குமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chathuranga Abeysinghe, you have 11 minutes.

[பூ.ஈ 11.16]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ලංකාවේ ආර්ථිකය පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය වන ඉතා වැදගත් වැය ශීර්ෂ දෙකක් ගැන තමයි අද අපි මේ විවාදය පවත්වන්නේ. ලංකාවේ ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 100ක හිර වෙනවාද, එහෙම නැත්නම් ඉදිරි වසර 10 ඇතුළත ඩොලර් බිලියන 200ක්, 250ක් කරනවාද කියන තීරණාත්මක සාධකය මේ වැය ශීර්ෂ දෙකෙන් නිර්මාණය වෙනවා.

විශේෂයෙන්ම ඩිජිටල් ආර්ථිකය ගැන කථා කරනකොට, ලෝකය ඩිජිටල්කරණයෙන් ඉස්සරහට ගිහිල්ලා, අනෙක් රටවල් ආර්ථික, කර්මාන්ත කාර්යක්ෂම කරගෙන, ඒ ඩිජිටල්කරණයෙන් ඇති වෙච්ච තොරතුරුවලින්, දත්තවලින්, දත්ත විද්‍යා පදනම් කරගෙන තීරණ ගන්නකොට; ඒ වාගේම, ඒ රටවල්වල වංචාව, දූෂණය වළක්වා විනිවිදභාවය ඇති කර ගන්නකොට, අපේ රට ඉතා ප්‍රාථමික තැනක තබා ගන්න හිතා මතාම වැඩ කළේ මේ අපි ඉදිරියේ ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරු. මොකද, ඔවුන් කරන වංචාව, දූෂණය වළක්වා ගන්න, COPE හා COPA කියන කමිටුවලට ඇවිල්ලා සාකච්ඡා කරන තත්ත්වයට පත් කරන්න වුණේ, ඔවුන් ඩිජිටල්කරණයට භය වෙච්ච නිසා. කර්මාන්තවලත් එහෙමයි, ආර්ථිකයේත් එහෙමයි, ආණ්ඩුකරණයේදීත් එහෙමයි. ඒ නිසා මේ අලුත් වෙනසත් එක්ක ආර්ථිකය ඉදිරියට යනකොට, ඩිජිටල්කරණය සහ ඩිජිටල් ආර්ථිකය කියන එක අපේ ප්‍රධාන අංගයක් බවට පත් වෙනවා.

සමහර ව්‍යවසායකයෝ හිතාගෙන ඉන්නවා, ව්‍යවසායකත්වය කියන්නේ, ලාභ ලබන කර්මාන්තයක් කිරීම, ලාභ ලබන ව්‍යාපාරයක් කරන එක කියලා. ඒ වාගේම, ඒ ගොල්ලන් හිතාගෙන ඉන්නවා, එහෙම ලාභ ලබන ව්‍යාපාරයක් කළාම, ඒ විධියට දේශපාලනයත් කරන්න පුළුවන් කියලා. දේශපාලනය කියන්නේත් ව්‍යවසායකත්වයක් තමයි. ඒ කියන සමහර ව්‍යවසායකත්ව දේශපාලනඥයන්ට කියන්න තිබෙන්නේ, බලන්න, පොඩ්ඩක් ඉගෙන ගන්න, ජාතික ජන බලවේගය කොහොමද ගොඩ නැඟුණේ, මොකක්ද market එකේ තිබුණු gap එක, ඒ gap එක සොයා ගෙන කොහොමද කණ්ඩායමක් විධියට සමස්ත ඉතිරි තරගකරුවන් ඔක්කොම පරද්දලා රටේ බලය අත් පත් කර ගත්තේ කියලා. ඒක තමයි, ව්‍යවසායකත්වය කියන්නේ. ඒ නිසා රටේ ව්‍යවසායකත්වය ගැන, ආර්ථිකයේ ව්‍යවසායකත්වය ගැන කථා කරන්න කලින් ප්‍රාදේශීය සභාවක්වත් දිනා ගන්න පුළුවන් වෙන්න ඕනෑ.

අනෙක් පැත්තෙන් ගත්තාම, කාර්මීකරණය හතරවැනි අදියරට ඇවිල්ලා, හතරවැනි කාර්මික විප්ලවය පසු කරගෙන යන වෙලාවේ, ලෝකය දැන් පස්වැනි කාර්මික විප්ලවයකටත් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම, digital supply network කියන එක ඩිජිටල් අගයදාමයකට, නැත්නම් chain එකක් ඇතුළේ තමයි කර්මාන්තකරණය හා නිෂ්පාදනය කියන සියල්ල සිද්ධ වෙන්නේ. නමුත්, අපේ රටේ කර්මාන්තකරුවන්ට ඒ විභවය ලබා දෙන්න පසු ගිය පාලකයන්ට බැරි වුණා. ඒ ආරම්භය තමයි, අපි මේ ලබා ගන්න උත්සාහ කරන්නේ. ඒ වාගේම, පසු ගිය කාලයේ කථා කරමින් සිටියා, ඩිජිටල්කරණය කර ගත්තේ නැත්නම්, ඒකට නැඹුරු වුණේ නැත්නම්, අපි වෙළෙඳ පොළට relevant වෙන්නේ නැහැ, එහෙම නැත්නම් අපි ඒකට සුදුසු වෙන්නේ නැහැ කියලා.

නමුත් දැන් තත්ත්වය තමයි, ඒ relevancy එකෙන් එහාට ගිහිල්ලා ඩිජිටල් තාක්ෂණය හරහා වෙළෙඳ පොළ disruption එකක් වෙන එක. ඒ කියන්නේ තමන්ට තිබෙන සමස්ත වෙළෙඳ පොළ අවස්ථාව අහිමි වෙනවා, ඩිජිටල්කරණයේ එන නවෝත්පාදන නිසා. ඒ නිසා ඉතා වැදගත් ක්ෂේත්‍රයක් තමයි මේ ඩිජිටල් ආර්ථිකය සහ ඩිජිටල්කරණය කියලා කියන්නේ. වචනත් පටලවා ගන්න හොඳ නැහැ. ඩිජිටල්කරණය -digitization- කියලා කියන්නේ ඇනලොග්වලින් ඩිජිටල්වලට මාරු වෙන එක. ඒක ඕනෑම රටක්, ඕනෑම තැනක්, ඕනෑම ආයතනයක් සිදු කළ යුතු අනිවාර්ය අංගයක්. ඩිජිටල් පරිවර්තනය කියලා කියන්නේ තමන්ගේ පද්ධති, සේවකයන්, කර්මාන්තය ඇතුළු සමස්තයම මේ ඩිජිටල් තාක්ෂණය භාවිත කරගෙන පරිවර්තනය කරගන්න එක.

මේ ඩිජිටල් ආර්ථිකය සම්බන්ධයෙන් කොටස් දෙකක් මේ අය වැයේ කථා කරනවා. මුලින්ම මේ digital industry එක ගැන අපි කථා කළොත්, ලංකාවේ ඩිජිටල් ආර්ථික සේවා සැපයීම නැත්නම් ඩිජිටල් සම්බන්ධ මේ industry එක ඩොලර් බිලියන 1.6ක පමණ හිර වෙලා තිබෙනවා, කාලයක් තිස්සේ. මේක ඩොලර් බිලියන 1.2ට තිබුණා. නමුත් අනෙක් රටවලට සාපේක්ෂව ඉතා හෙමින් වර්ධනය වුණේ. ලෝකයේ අගය එකතු කරන මේ ඩිජිටල් ආර්ථිකය නැත්නම් ඩිජිටල් කර්මාන්තයේ පංගුවක් ළඟා කරගන්න ලංකාව කොහොමද වෙනස් වෙන්න ඕනෑ, ඒකට අවශ්‍ය කරන සේවක සංඛ්‍යාව, යටිතල පහසුකම්, ඒකට අවශ්‍ය වෙන positioning එක හදාගන්න අපේ අය වැයේ විශේෂ අවධානයක් යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම digital services, BPO serviceවලින් එහාට ගිහිල්ලා අගය එකතු කරන සේවාවන්, Fintech, cloud computing and cyber security කියන ක්ෂේත්‍රවලට ලංකාව විශේෂ විභවතාවක් දරාගෙන තිබෙනවා. ඒ නිසා ඒ ක්ෂේත්‍රවල ඉන්න ව්‍යාපාරවලට උදව් කරන්නත්, ඒ ව්‍යාපාරවලට කැඳවන්නත් දැවැන්ත වැඩ පිළිවෙළක් මේ අය වැයේ යෝජනා වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි, අපි digital solutions සපයන ප්‍රධානතම රටක් විධියට, සන්නාමයක් විධියට ඉදිරියට එන්න අවශ්‍ය කරන වැඩ කටයුතුත් මේ strategy එක ඇතුළේ තිබෙනවා. ඒ වාගේම අපි කථා කළා, startup ecosystem එක නැත්නම් අලුතෙන් ආරම්භ වෙන ඩිජිටල් ආර්ථික ව්‍යාපාර පිළිබඳ ඒ අවශ්‍ය සහයෝගය මේ දක්වා අපේ ආර්ථිකයේ තිබුණේ නැහැ කියන එක. මේකට අවශ්‍ය කරන හරි පද්ධතියක් - ecosystem එකක් - නිර්මාණය කළේ නැහැ. ඒ නිසා ඒකට තිබෙන මූලික ගැටලු හඳුනාගෙන, මේ අය වැය තුළ ඒ startupsවලට අවශ්‍ය කරන funding හදාගන්න මුලින්ම මිලියන 300කුත්, ඊළඟට IFC ආයතනයත් එක්ක එකතු වෙලා Fund of Funds එකක් හදලා මේ digital ecosystem එකට invest කරන්න angel investor network එකක්, high-net-worth investorsලා ලංකාවට ගේන්නේ කොහොමද කියන ක්‍රියාවලියට ආරම්භයක් අපි මේ අවුරුද්දේ ගන්නවා. ඊට පස්සේ මේ අංකුර ව්‍යාපාරවලට coach කරන්නේ කොහොමද, ඒ ගොල්ලන්ට අවශ්‍ය කරන space එහෙම නැත්නම් ඒ ගොල්ලන්ට අවශ්‍ය කරන භූමිය, යටිතල පහසුකම් හදලා දෙන්නේ කොහොමද කියන ව්‍යාපෘතිය පෞද්ගලික සහ රාජ්‍ය මැදිහත්වීමෙන් කරන්න හදනවා.

ඒ වාගේම, digital nomads කියන එක ගත්තොත්, IT districts නැත්නම් IT cities හදන්න අපි උත්සාහ කරනවා. ඒ වාගේ ලංකාවේ අලුතෙන් කර්මාන්ත ආරම්භ කරන ව්‍යවසායකයන්ට වාගේම freelancersලාට, වෙනත් රටවලින් සංචාරකයෝ විධියට ලංකාවට ඇවිල්ලා තමන්ගේ කර්මාන්තය කරන අයට digital nomad visa ක්‍රමයක් අපි නිර්මාණය කරනවා. කොළඹ දිස්ත්‍රික්කයේ දැනටත් පෞද්ගලික ආයතන කීපයක් ඉතාම හොඳින් මේ කාර්යභාරය කරගෙන යනවා. එතකොට ඒකට රාජ්‍ය සහයත් ලබාදීලා, විවිධ පළාත්වල technology districts නැත්නම් tech cities හදන්න අපේ සැලැස්මක් තිබෙනවා. ලංකාවේ freelancersලා ගොඩක් ඉන්නවා. මේ ක්‍රමයට නැත්නම් මේ වෘත්තිකයන්ට කිසිම වෘත්තීයභාවයක්, පිළිගැනීමක් මේ රටේ තිබුණේ නැහැ. ඒ සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළ යටතේ registration ක්‍රමයක් හරහා ඔවුන්ව බැංකු පද්ධතියට හඳුන්වලා දීලා, ඔවුන් ඒ බැංකු පද්ධතිය සමඟ යම් කාලයක් වැඩ කරගෙන යනකොට, ඩොලර් උත්පාදනය කරනකොට ඔවුන්ට ණය පහසුකම් විශේෂයෙන්ම පෞද්ගලික ණය පහසුකම් ලබා දෙන්න, ඒ අවශ්‍ය recognition එක ලබාදෙන්න, මේ වෙනකොටත් අපි බැංකු ක්ෂේත්‍රයත් එක්ක කථා කරමින් යනවා. ඒ වාගේම අන්තර්ජාල සහ යටිතල පහසුකම් සැපයීම තුළින් මේ freelancing කියන එක තවදුරටත් promote කරන්න සාකච්ඡා කරමින් යනවා.

ඩිජිටල් සේවා බද්ද ගැනත් කථා කළා. ඒ පිළිබඳව අපි ඇති තරම් කරුණු පැහැදිලි කරලා තිබෙනවා. ඒකෙන් වාසියක් මිස අවාසියක් මේ කර්මාන්තයට සිද්ධ වෙන්නේ නැහැ කියන එක කර්මාන්තයේ ප්‍රවීණයන් සහ කර්මාන්තයේ නියැළෙන අය මේ වෙනකොට හොඳට අවබෝධ කරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි, අන්තර්ජාතික වශයෙන් ඩිජිටල්කරණයේ ඉදිරියට වේගයෙන් පිම්මක් පැනපු ඉන්දියාව, සිංගප්පූරුව වැනි රටවල් සමඟ ඒකාබද්ධව වැඩ කරන්න අපේ ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිවරයාත්, ආචාර්ය හාන්ස් මහත්මයාගෙන් සැදුම්ලත් කණ්ඩායමත් වේගයෙන් වැඩ කරමින් සිටිනවා. මොකද, අපිට මේ technology පැත්ත reinvent කරන්න බැහැ, නැවත නැවත experiment කරන්න වෙලාවක් නැහැ.

මොනවාද, ලෝකයේ හොඳටම හදලා තිබෙන්නේ, ඒ වාගේම ඒක අපට සුදුසු නම්, අපි ඒක අරගෙන ඉදිරියට ගිහිල්ලා වේගයෙන් මේ ඩිජිටල්කරණයට ආණ්ඩුකරණයත්, අපේ කර්මාන්තත් පත් කර ගන්න ඕනෑ.

අවසාන වශයෙන් අපි ඩිජිටල් ආර්ථිකයක කර්මාන්තකරණය ගැන කථා කළොත්, අපේ විවිධ කර්මාන්ත තිබෙනවා, තවම ඩිජිටල් තාක්ෂණය භාවිත කරගෙන නැති.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chathuranga Abeysinghe, you have two more minutes.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
බොහොම ස්තුතියි.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

ඒ නිසා ඒ ගොල්ලන්ගේ ඵලදායීතාව අඩුයි; තොරතුරු අඩුයි; අගය දාමයන්වලට, supply chain එකට යෑමේ හැකියාවක් නැහැ. ඒ නිසා මේ කර්මාන්තවලට ඩිජිටල්කරණය ළඟා කර දෙන්න තිබෙන වැඩ පිළිවෙළ කොහොමද කියන එක වැදගත්. ඉතින් හතරවෙනි කාර්මික විප්ලවයෙන් ඔබ්බට යන වැඩ පිළිවෙළක් කර්මාන්ත අමාත්‍යාංශයත්, ඩිජිටල් අමාත්‍යාංශයත් ඒකාබද්ධව සිද්ධ කරන්න අපි කටයුතු සූදානම් කර තිබෙනවා. එතකොට අපේ ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය හරහා පද්ධති දියුණු කිරීමත් වැදගත්. "People, Process, Technology" කියන තුන පිළිබඳව තමයි හතරවෙනි කාර්මික විප්ලවයේ අපි කථා කරන්නේ. ඒක උඩට අද AI තාක්ෂණය ඇවිල්ලා ඒවා තවදුරටත් කාර්යක්ෂම කරමින් තිබෙනවා. ඉතින් අපි තෝරා ගත්ත agriculture, ධීවර සහ සමහර නිෂ්පාදන කර්මාන්ත ඒ තාක්ෂණය භාවිත කරලා පරිවර්තනයට ලක් කරන්නට - transform - ; ගෝලීය පරිවර්තනයකට ලක් කරන්නට මේ වෙනකොට කටයුතු සකස් කරමින් යනවා.

ඒ වාගේම සමස්තයක් විධියට ව්‍යාපාර කරන අයට, කර්මාන්තකරුවන්ට "Ease of Doing Business" එක වැඩි වෙන්නේ මේ ඩිජිටල්කරණය වේගවත් කිරීම හරහායි. මෙතෙක් පැවැති රජයන්වලට මේක කර ගන්න බැරි වුණා. ඉතින් ඒ ගැන ඔබතුමන්ලා කනගාටුවට පත් වෙලා වැඩක් නැහැ; අඩලා වැඩක් නැහැ. අපට හම්බ වෙච්ච අවස්ථාවේ අපි ඒක වේගයෙන් කරනවා.

ඒ වාගේම බදු එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහාත්, බදු ක්‍රමයේ කාර්යක්ෂමතාව සඳහාත්, අපේ රටට අවශ්‍ය වන බදු පදනම පුළුල් කර ගැනීම සඳහාත් අපි ඩිජිටල් තාක්ෂණය භාවිත කරලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට උපරිම සහාය දෙනවා. එවිට ඔවුන් බදු ක්‍රමය ඇතුළට අනිවාර්යයෙන් එකතු වෙනවා. ඒ ක්‍රමය හරහා ඔවුන්ට විවිධාකාර සහායන් දෙන්නට මේ අමාත්‍යාංශ දෙකම ඒකාබද්ධව කටයුතු කරන්න සූදානම් වෙලා තිබෙනවා. මේ ක්‍රියාවලිය ඇතුළේ සාධාරණ බිමක්, සම බිමක්, කුඩාම කර්මාන්තකරුවාටත්, ඉහළම ධනයක් තිබෙන කර්මාන්තකරුවාටත්, විදේශ ආයෝජකයාටත්, විදේශ කර්මාන්තවලටත් නැත්නම් බහු ජාතික සමාගම්වලටත් නිර්මාණය වෙනවා. ඔවුන් හැමෝටම මේ රටේ සම බිමක් නිර්මාණය වෙනවා, මේ ඩිජිටල්කරණය හරහා.

ඒ වාගේම ඩිජිටල්කරණයට සම්බන්ධ නවෝත්පාදනයට දැවැන්ත සහායක් ලබා දෙන්න ආයතන තුනක් මේ වෙනකොට ක්‍රියාත්මක වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chathuranga Abeysinghe, your time is up.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Sir, give me 30 seconds, please.

ඉතින් මම කියන්නේ ලංකාවේ ඩිජිටල්කරණයේ යෙදී සිටින කර්මාන්තකරුවාටත්, මේ ක්ෂේත්‍රයට එන්න ඉන්න දුවා දරුවන්ටත් මීට වඩා හොඳ අය වැයක්, වැඩ පිළිවෙළක් මීට කලින් අපි දැක තිබුණේත් නැහැ. විශේෂයෙන් මේ විෂය පරිණත දැනුම සහිත අමාත්‍යවරුන් ඔබලාට කවදාවත් හමු වෙලා කථා කරන්නවත් අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ නිසා මම අවසාන වශයෙන් කියන්නේ අපි එකතු වෙලා මේ රට හදමු. මේ අමාත්‍යාංශ දෙක හරහා පමණක් අපට පුළුවන් හරියට ක්‍රියාත්මක කළොත්, ඩොලර් බිලියන 200ක විතර ආර්ථිකයකට ඉතා වේගයෙන් ගමන් කරන්න. ඒ නිසා මේ අය වැය සම්මත කරලා අපි ඒ සහාය ලබා දෙමු කියා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Ravi Karunanayake. You have 18 minutes.

[11.27 a.m.]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Chairman, I am happy to speak while you are presiding over.

I stood up to speak on the Votes of two very important Ministries taken up for discussion today. I would like to speak about taking Sri Lanka out to the tech -world and beyond and would like to highlight certain examples in the fast-developing world relevant to the fields we are discussing today. Sir, these are two very futuristic Ministries which could propel the country towards a rapid economic recovery process after the very traumatic times that Sri Lanka went through and it is time that we pull ourselves together and take the country forward.

May I now show, Hon. Chairman, how disconnected we are from the world? I recently saw the military expenditures of ten countries in the world and some of which happen to be the US, the military expenditure of which is US Dollars 811 billion, China, US Dollars 298 billion and India, US Dollars 81 billion. Likewise, the total military expenditure of the rest of the ten countries - Saudi Arabia, Russia, the United Kingdom, Germany, France, Japan and South Korea - is tantamount to US Dollars 1,625 billion. Why did I quote all that? Only to show the military expenditures around the world and how we, as a country, struggle to secure just US Dollars16 million in order to ensure that we stay afloat.

Ministry of Digital Economy සඳහා වෙන් කර තිබෙනවා රුපියල් බිලියන 13.5යි. එයින් පුනරාවර්තන වියදම්වලට රුපියල් බිලියන 7.5යි, ප්‍රාග්ධන වියදම්වලට රුපියල් බිලියන 6යි. Ministry of Science and Technology සඳහා රුපියල් බිලියන 5යි - පුනරාවර්තන වියදම්වලට රුපියල් බිලියන 2.8යි, ප්‍රාග්ධන වියදම්වලට රුපියල් බිලියන 2.2යි. So, out of the projected Rs. 8.7 trillion expenditure, only 0.0001 per cent is for research and digitalization. If you look at the military expenditures around the world, why on earth are such harmful expenses being made at this moment, when I am sure 90 per cent of the countries are faced with the same predicament that we are facing?

The world is becoming frightfully tech-freak. The human element is being replaced fast by technologies like artificial intelligent, Grok 3 and you name it, they have it. My IT or the tech knowledge is not as savvy as of those who are leading these two Ministries, but I certainly

thought, with my financial background and past experience, I would contribute to this effort to ensure that we make use of these technologies for a better tomorrow. We must use technology for our advancement, to make people's lives happier, more secure and quality time-oriented. But, is it the case? It certainly is not. On that particular basis, we must ensure that we utilize this knowledge to take Sri Lanka towards a better tomorrow.

Science and technology cannot replace biology. They can enhance our understanding of the application of biological principles, but they cannot substitute it. A human being - a man or a woman - cannot and would not be substituted. How could a robot replace a man or a woman? That would not happen, a man would be a man and a woman would be a woman. And what about a child? There is no way you could change it. A child born cannot be replaced by a robot. A man could be sent to the moon, but when nature calls, he has to answer. You cannot apply a technological circuit into that. A government has to be run by humans; you cannot use artificial intelligence to run a government. So, all I want to show is that there is a human element which cannot be substituted. However, technology could be brought in to supplant the areas with deficiencies.

I call the Government to make the expenditure on the digital economy and science and technology fully tax-exempt. Unfortunately, I do not see that happening. The IMF has given a prescription thinking that it is a panacea for all ills, but it is not the case. Therefore, again, I would call the Government and the Hon. Minister to ensure that we have the taxes on such expenditures, whether it be on research and development, digital software, royalty, capital expenditure on hardware, costs of labour or whatever, exempted fully.

Even when I was Minister of Finance, on certain qualifying expenditures, we gave 200 per cent to 300 per cent tax deductions in order to boost expenditures in that particular area. Why I mention this is because this is the way or the direction that the country should move forward. Allocating 3 to 5 per cent of GDP on research and development is the hallmark of successful governments which have transformed their nations from what they were to what they are today. Korea, the USA, India, the UK and Singapore are success stories of such transformation. We must be able to emulate such strategic decisions because the expenditure on research and development may, sometimes, be 60 per cent effective, with the other 40 percent being wasted. But, that is the investment which needs to be made in today's context.

Sir, my intention here is to show whether Sri Lanka, after 77 years of independence, has really managed to achieve economic independence. We have lost out on many opportunities; we have missed opportunities. In 1956, we missed the opportunity with the adoption of the Sinhala only policy, where we should have embraced Sinhala, Tamil and English to connect with the world. Then, in 1977, thanks to the Hon. J.R. Jayewardene, we managed to open our economy. But, there again, there have been distortions and reinterpretations in various ways to its approach and eventually, we missed out the opportunity at that moment.

Digitization and all that are loosely used words. But, do we have the competence to ensure that this technology is used to catch up with the opportunities we have missed out by the younger generation who would provide leadership in the future? Sir, in achieving that, we must have sincerity. While we would like to see 3 to 5 per cent of GDP allocated on research and development, expending only 0.01 per cent of the Budget on that would not be walking the talk.

Why do we want to have such digitalization, a digital platform or a digital economy? Because we need to have development in national digital infrastructure, to create the backbone of the economy and to have the mindset of the people attuned to the changing world because there is a resentment that development basically means moving away from the normal traditional approach. That is a wrong notion. We must be able to take that risk to step into the unkown world. Otherwise, we would be like frogs in the well being unable to move forward with the rest of the world. We must look at success stories and not do it just for the sake of talking.

Then, in order have national digital infrastructure development, we need to build its backbone with high-speed Internet and ensure that the 5G concept is there to take the country forward. National data centres and the adoption of the Cloud are areas which could take us to a better tomorrow.

Then, e-governance and a digited Public Service. I think that is a key success story we need to look at in taking our country forward. The Aadhaar system, the unique identification number, transformed India from a backward country to a fast-moving country in the world. Prime Minister Narendra Modi, with his sagacity, managed to ensure that the backward India was transformed into a future-oriented nation in the world. When I was the Minister of Finance in 2015, under the auspices of the then Prime Minister Ranil Wickremesinghe and President Maithreepala Sirisena, we also tried our very best to bring about that unique identification system. But, stiff resistance came up from the bureaucracy and basically defeated that purpose.

And, I tell this Government - the enthusiasm is there and words are spoken of - that if you do not walk the talk, it would be the same story and the history would record that you tried, but there was no participation in the process. So, I call upon the Government to put your money where your mouth is and ensure that the Unique Identification Number is brought into the process. That process would certainly ensure that social security contributions, which are being misused today, are effectively used. Today, if you take "*Aswesuma*", there are 2.3 million families who are getting it, while those who rightfully should get it do not get it and those who should not, getting it. So, that is the reason why the digitization process should be introduced and it will certainly help eradicate inefficiency and corruption in the process. So, let us ensure that we have it.

Then, Sir, the next one we must ensure is a paperless government. This has been spoken about for the last 15

[ගරු රවී කරුණානායක මහතා]

years. It is not an unkown concept, but is simply not being looked at. I am happy that a fairly knowledgeable team is there now, taking it forward. Ensure that it is taken to the next step. Do not allow the bureaucracy to take that decision; it has to be led politically. Out of ten people, nine may be right and one may be wrong. But, dare take on the system. If you sit back and expect everything to happen, it would never happen and I am saying this from my experience. So, a paperless government is absolutely necessary. We must implement a blockchain governance system for secure and transparent document management.

Now, we are talking of artificial intelligence. Ensure that we take advantage of it. Look at Donald Trump. He got elected on the 21st of January, three months ago, and today, with the Department of Government Efficiency under Elon Musk, he is transforming his country. There is a sense of urgency to cut US Dollars 2 trillion in expenditure. He is not only pruning down irrelevant costs to save that US Dollars 2 trillion but is also diverting that money into more efficient areas. It is so dearly required. That is also another aspect this Government must look at. While Rs. 8.7 trillion is the projected expenditure under this Budget, the relevant Capital Expenditure is only Rs. 1.3 trillion. If we take the actual application and implementation of the process, we have already lost three months; we are already in March. So, Sir, our intention should be, while there is enthusiasm and the way-forward is known, to implement the process as soon as possible.

Then, connected digital government is something which should have been done yesterday, not tomorrow. A classic example is the area of exports, where we have a lot of problems. The ASYCUDA system is something which could unite all the government departments together in this process. Unfortunately, the Sri Lanka Customs, when issuing export licenses, the Department of Commerce, when issuing Certificates of Origin, and the banks do not synchronize and work together. So, I request the Hon. Minister who is leading the Ministry and his Deputy Minister, who is very knowledgeable, to cut the red tape that is there. Bureaucracy wants political leadership because when they take something in the right direction and if it goes wrong, they fear that they would have to go before the FCID or some body like that. They are people who have gone through harassments. Therefore, we must ensure that we give them freedom to deliver what is best for the country to go forward.

Then, during the COVID-19 pandemic, the country was functional even though it was closed for five to six months. That shows that human intervention is required where necessary, but it is not necessary everywhere. At that time, you had the passport office, the Department of Immigration and Emigration and the health system operating while the country was closed. So, that again shows that technology could take us to a better tomorrow.

Ten years ago, people were flying from one end to the other end of the world to participate in meetings and conferences. Today, in the digitalized world, with Zoom technology you are able to attend all meetings virtually. Even President Anura Dissanayake speaks with the Managing Director of the IMF virtually. Earlier, either the IMF Managing Director had to come to Sri Lanka or our President had to go there. But, today, virtual meetings have shrunk the world and it is necessary for cost reduction and to take optimum advantage out of the resources we have.

Having said that, I will take an example from the CEB. I was also Minister of Power and Energy for a short period. There were 29,000 people working in the CEB and 3,900 electricity meters readers. If we have a digitization process, we would have smart metering in place and smart metering would not allow tampering with or human intervention and also the CEB to have direct link with the consumer. Then, you would know your monthly electricity bill, the costs would be reduced and efficiency would be improved ten times over. But, the fear that the 3,900 meter readers would go on strike basically retarded the digitalization process of the CEB. Therefore, I tell the Government that if you want these areas to be foolproof, that is the way forward.

Then, look at the expressways. Now, you see revenue coming in from expressway, but you still have manual intervention in issuing tickets. You have five, six counters at the entrance to the expressway, where a person issues a ticket, and two or four hours later, at the exit, another person collects money issuing another receipt. And, ETCs are functional only on the Colombo-Katunayake Expressway. These are the areas where the world is going forward and we have been retarded. I am not asking you to throw those employees out. You can use them for more productive purposes like for the beautification process of expressways, revenue-gaining methods, ensuring that they are used humanely for better jobs rather than being at a particular counter of one end of the expressway issuing tickets or collecting money at the other end. ETC cards do the job with lesser human intervention and derive more revenue. You saw that when there was trade union action by those ticket counter employees, the revenue from the expressways went up by 30 per cent with the Army running the place.

So, you could see that there is distortion. The Minister of Justice and National Integration is here, who has been very vocal and very active these days. Ensure that these types of things are brought in. We do not need to send government servants on retirement. We have 1.6 million government servants, which figure is one of the highest in the world.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Ravi Karunanayake, you have only two more minutes.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, the Hon. Gayantha Karunathilleka will give me three minutes extra.

So, on those 1.6 million, we have to have a cost benefit analysis; we must have value for money, ensure that we get the maximum for what we spend on the government service**.** There is no point in just saying that we have 1.6 million government servants when you could use them for a better future.

Then, as regards to the digital economy, you must give tax incentives for digital start-ups. Forget about the problems that would come up with the IMF in giving tax incentives. We need to give tax incentives. If we do not give tax incentives to investors, you would basically discourage them investing in Sri Lanka.

Sir, the next one is the cashless economy. Ensure that we have a cashless economic drive in the country. The more we meddle with money moving, the more we would basically be looking at the dead past. But, if you look at going forward with the digital economy, the cashless economy, we need to bring the formal economy in and then, our revenue would be much greater. You are called upon to earn a revenue of five trillion rupees, which is 15 per cent of GDP, and to have a 5 per cent growth every year. So, unless you have the digitalization process in place, which would basically help increase revenue, be more user-friendly as well as improve the efficacy of collecting revenue, how are you going to achieve that?

The other area is agriculture, where the digitalization process could be used in an extremely profitable way. I am happy to see that the Bank of Ceylon has come forward to support agriculture. At this moment, I would like to quote from an article in the "Business Today" magazine of March, 2025. In page 40, it states,

> "Drones are transforming agriculture in Sri Lanka, supported the Bank of Ceylon (BOC). Professor Buddhi Marambe, an expert in climate-smart agriculture from the University of Peradeniya, has been a key player in these initiatives."

Why do I mention this? Where there is initiative and it has been shown that there is a way forward in the correct direction, we need to recognize them. Today, many do such findings, go unnoticed without the talent being exposed. Always a politician comes forward instead of giving the credit to the person who really initiated it. Therefore, I think that technology is laudable and ensure that it is taken forward for a better tomorrow.

වී අස්වැන්න තමයි අපට තිබෙන ලොකුම ප්‍රශ්නය. අපි නිෂ්පාදන වියදම ගැන කථා කරනවා. වී කිලෝවකට රුපියල් 130ක්, 140ක් ගෙවනවා කියලා අපි මෙතැන කථා කරනවා. අපි මොනවා කථා කළත්, වඳුරෝ කෑවා කිව්වත්, මොනරු කෑවා කිව්වත් අන්තිමට හාල් කිලෝ එකක මිල රුපියල් 250ට, 260ට, 270ට වැඩි වෙනවා. ඒ නිසා ඵලදායීතාව වැඩි කරන එක තමයි අවශ්‍ය වෙන්නේ. වියට්නාමය, කාම්බෝජය, තායිලන්තය, මැලේසියාව අක්කරයකින් කිලෝග්‍රෑම් 6,000ක, 6,500ක, 7,000ක අස්වැන්නක් ගන්නකොට ලංකාව අක්කරයකින් ගන්නේ කිලෝග්‍රෑම් 4,000යි, 4,500යි. You can use artificial intelligence for weather reporting. එහෙම නේද, ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමනි? මම දැක්කේ නැහැ, ඔබතුමා මේ සභාවේ ඉන්නවා. ඔබතුමා ඒක පාවිච්චි කරන්න. Radical reform එකක් ඇති කරන එක ගැන මම එදා Ministerial Consultative Committee එකට ඇවිල්ලා කිව්වා. මම අවුරුදු 27ක් පාර්ලිමේන්තුවේ ඉඳලා හැම අවුරුද්දේම මෙතැන කථා කරන දේවල් ඇහුවා. එහෙම ඇහුවත් අන්තිමට ඒවායින් සියයට 2යි ක්‍රියාවට පරිවර්තනය වෙන්නේ. "එදාත් මේක වුණා, මෙදාත් මේක වෙනවා" කියලා තමයි අන්තිමට කියන්නේ. එහෙම කියලා හරියන්නේ නැහැ, අපි ලංකාව වෙනස් ආකාරයකට අරගෙන යන්න අවශ්‍යයි. දැන් කලින් හිටපු නැති ආණ්ඩුවකුත් ඇවිල්ලා තිබෙනවා. "උන් හොඳ නැහැ, මුන් හොඳ නැහැ වාගේ දැන් උඹලත් හොඳ නැහැ" කිව්වොත්, ඒක රටට හොඳ නැහැ නේද? ඒ නිසා අපි ඔක්කෝම ඒක රාශි වෙලා මේ රට ගැන කථා කරලා කටයුතු කරමු. අපි සුද්දාගෙන් බලය ගත්තාට පස්සේ, 1948 ඉඳලා කරපු සංවර්ධනය සමහර විට මේ දවස්වල අපට පෙනෙන්නේ නැහැ. ඒ නිසා හිතනවා, සුද්දාට කරන්න පුළුවන් දේ ඇයි අපි කරලා නැත්තේ කියලා. These are the areas in which we must take advantage of artificial intelligence and the digitization process. මේක තමයි කෘෂිකර්මය සඳහා තිබෙන හොඳම අවස්ථාව. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මොකද, ඒ තුළින් තමයි අපට මේ රට ඉදිරියට අරගෙන යන්න පුළුවන් වෙන්නේ.

Then, industrial automation is also required. Today, labour is very costly. But, if you go for the industrial automation process, that would help you take the country forward for a better tomorrow.

Then, I move on to education. My digital literacy is far less than that of my daughters. When they tell us something about digitalization, we look dumbstruck. But, the actual situation is, the world is moving forward and we have to adapt ourselves to that. Just because we do not have digital literacy, that does not mean we should stop behind. Then, we give the unknown the opportunity and the leadership as well. I think it is necessary to give political leadership and experience in this regard is also important. The only way forward is to lead the government servants to do their job in the manner required.

There are many promises made by you. And, you all have to be given time to ensure that you fulfil those. But, after one year, do not come back and still blame the past 76 years. Then, you would also be part of the 77 years of the non-delivery of those promises. ඒ නිසා තමයි මම කියන්නේ, අපි රට භදනවා නම් මේ රටේ තිබෙන දුර්වලතා සහ අවුරුදු 76ක්, 77ක් තිස්සේ සිදු වූ දේශපාලනීකරණය වීම විතරක් නොවෙයි, මේ රට තුළ තිබෙන රාජ්‍ය ත්‍රස්තවාදයත් නිවැරදි කරන්න අවශ්‍යයි කියලා. ඒ සඳහා artificial intelligence and digitization process එක තුළින් අකාර්යක්ෂමතාව නැති කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් කියන එක තමයි මට මේ අවස්ථාවේ කියන්න අවශ්‍ය වෙන්නේ.

Then, coming back to education and digital literacy, I can remember the change that the Hon. Ranil Wickremesinghe made when he was Minister of Education. I also can remember the revolutionary change the Hon. Lalith Athulathmudali made, bringing in the computer. At that time, looking at computers, people were saying that they were going to cause impotency. But, today, you cannot live without computers and that does not mean that there is an impotent world. So, Sir, all I want to basically say at this particular moment is that let us ensure that we have a target of taking this country to a growth rate of 5 to 6 per cent.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Karunanayake, you have exhausted your additional time too.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I will certainly heed your request. Just give me a few more seconds.

Then, there is STEM education. With that, we can create our future. In that regard, coding and related subjects, artificial intelligence and robotics must be taught. Today, about 176,000 students succeed at the Advanced Level Examination, out of about 240,000 students. But, only 55, 000 students get into government universities. So, ensure that we have private universities to take them to a better tomorrow.

Finally, while ensuring these are done, also bring in data protection laws. Hon. Minister, I request you to ensure that data protection laws are brought in and our court system goes into that. I heard you saying that one million cases are pending.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, could you please wind up now?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The next is to have a cybercrime taskforce. Ensure that we give them the necessary assistance and that we have a 70 per cent success story instead of only a 5 per cent talk story.

Finally, ensure that we take Sri Lanka to a better tomorrow. Thank you very much, Sir.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Nihal Abeysinghe. You have 12 minutes.

[ප.භා. 11.51]

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
ගරු සභාපතිතුමනි, ස්තූතියි.

කාරක සභා අවස්ථාවේ විවාදයේදී විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

ඉදිරි පස් වසර තුළ අපි මේ කටයුතු ආරම්භ කරන්නේ කොහොමද, මොන වාගේ කටයුතුද විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සැලසුම් කරලා තිබෙන්නේ කියන එක ගැන අපේ ගරු විද්‍යා හා තාක්ෂණ ඇමතිතුමා මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම අය වැයෙන් මුදල් වෙන් කිරීම පිළිබඳවත් එතුමා කථා කළා. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඉතාම වැදගත් ආයතන 12ක් තිබෙන බවත්, මෙතෙක් ඉතිහාසයේ විද්‍යා හා තාක්ෂණ විෂය පිළිබඳව කටයුතු කළ එම ආයතන 12 මේ වෙනකොට එක වහලක් යටට, ඒ කියන්නේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතට ගෙනැල්ලා තිබෙනවා කියන එකත් එතුමා අපට, මේ ගරු සභාවට දැනුම් දුන්නා. ඒක, ජාතික ජන බලවේගය ආණ්ඩුව ගත්ත ඉතාම හොඳ තීරණයක් කියලා මම හිතනවා. ඒ අවශ්‍ය කරන සැලසුම් සකස් කරන්නට පළමුවරට මේ සියලු ආයතන එක ස්ථානයකට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම මේ සමහර ආයතන විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය පිහිටුවන්නට පෙර බිහි වූ ආයතන වෙනවා. ඉතින්, මේ ආයතනවලට විවිධ අරමුණු සහ ඒ ඒ කාලසීමාවල ලබා ගත් ඉලක්ක තිබෙනවා. මේ ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීමෙන් සහ මේ ආයතන පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගැනීමෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු ඒ කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්නට පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒ නිසා මේ ආයතන review කරලා, මේ ආයතනවල අරමුණු අපේ ප්‍රතිපත්තිමය දිශාවට සකස් කරගෙන වඩා හොඳට මෙහෙයවා ගැනීමට අපි කල්පනා කරනවා. මේ වෙනකොට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව තුළ අපි මේ පිළිබඳව සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා.

ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන සැලැස්මට සම්බන්ධ කරගත හැකි විශිෂ්ට විද්‍යාඥයින්, වෘත්තිකයින්, තාක්ෂණවේදීන් සහ ව්‍යවසායකයින් විධියට මිලියන තුනකට ආසන්න ශ්‍රී ලාංකිකයන් පිරිසක් මේ වෙනකොට විවිධ රටවල සේවය කරමින් සිටින බව අපි දන්නවා. පසුගිය මැතිවරණ කාලසීමාවල ඒ අය අපිත් එක්ක පැවැති සාකච්ඡා හරහා දැන් අපිත් එක්ක මේ කටයුත්තට සහභාගි වෙන්න ඔවුන් සූදානම් වෙමින් සිටිනවා කියලා අපි හිතනවා. අපි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට මැදිහත් වෙන්නේ අපේ රටේ ඉතාම තීරණාත්මක මොහොතක. අපි බරපතළ ආර්ථික අර්බුදයක ප්‍රතිඵල භුක්ති විඳිමින් සිටිනවා. සමාජයීය, දේශපාලන හා සංස්කෘතිකමය වශයෙන් අපේ රට නොයෙක් අර්බුදවලට ගොදුරු වෙච්ච වෙලාවක තමයි ජාතික ජන බලවේගය නව රජයේ අපි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ මේ කටයුතු කිරීමට උත්සාහ කරමින් සිටින්නේ. ආහාර සුරක්ෂිතභාවය ඉතාම වැදගත් කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා විද්‍යා හා තාක්ෂණ දැනුම, ඩිජිටල්කරණය හරහා අපට ලැබෙන අවස්ථාව ප්‍රයෝජනයට ගන්න ඕනෑ.

පසුගිය කාලයේ වී පිළිබඳව ගැටලු සහගත තත්ත්වයක් තිබුණා. ඒ නිසා වී අස්වැන්න වැඩිකර ගැනීමට නව තාක්ෂණය සහ අපට තිබෙන දැනුම පාවිච්චි කරමින් තීරණාත්මක ලෙස මැදිහත්වීමට සිදු වෙලා තිබෙනවා. පිරිවැය අඩු කර ගන්න ඕනෑ. ඒ වාගේම අපට අවශ්‍ය පොහොර මේ රට තුළ නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය කරන තාක්ෂණය සහ දැනුම ලබා දී ඒ ක්‍රියාවලියට අපි මැදිහත් වෙන්න ඕනෑ. මම අපේ කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා එක්ක සාකච්ඡා කළා. හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම් 4,000ක් - 4,500ක් විතර තමයි අපි වී අස්වැන්න ලබන්නේ. නමුත් එතුමා මට කිව්වා, හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම් 6,000ක විතර අස්වැන්නක් ලබා ගන්න ඉලක්ක කරනවා කියලා. ඒ නිසා මේ අමාත්‍යාංශය හරහා අපි කරමින් සිටින ඒ කාර්යයට නව තාක්ෂණික දැනුම අපට ප්‍රයෝජනවත් වේවි කියා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, භාණ්ඩ හා සේවා අපනයනය වර්ධනය කර ගැනීමට අපනයන භෝග වගාවන්හි අස්වැන්න, ගුණාත්මකභාවය තරගකාරී වෙළෙඳ පොළට ගැළපෙන විධියට සකස් කර ගැනීමට අපේ විද්‍යා හා තාක්ෂණ දැනුම භාවිත කරන්න ඕනෑ. ඒවාගේම වන සතුන්ගෙන් වන හානි, පසු අස්වනු හානි වළක්වා ගන්නට මේ දැනුම භාවිත කරන්න ඉතාම හොඳ අවස්ථාවක් දැන් අපට ලැබිලා තිබෙනවා.

අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ගැන බැලුවොත්, අපි මේ ආණ්ඩුව භාර ගන්නකොට අපේ රටේ ජනතාව ඉතාම දුක්ඛිත තත්ත්වයක හිටියේ කියලා අපි දන්නවා. ඒ කියන්නේ සියයට 26ක ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වෙනවා. මේ අයට මොන ප්‍රතිපාදන ලැබුණත්, ආණ්ඩුවෙන් සහනාධාර ලැබුණත් මේ අයගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්නට අපට නව දැනුම, තාක්ෂණය යොදා ගන්න වෙනවා. ඒ සඳහා නිශ්චිත කාර්යයක් අපට මේ අමාත්‍යාංශය හරහා ඉදිරියේදී සිදු කරන්නට තිබෙනවා.

ඒ වාගේම යටිතල පහසුකම් දියුණු කර ගැනීමට අවශ්‍යයි. විශේෂයෙන්ම ආපදාවලට ඔරොත්තු දෙන ගොඩනැඟිලි, කල් පැවැත්ම ඇති මාර්ග පද්ධති ඉදිකිරීමට අවශ්‍යයි. මෝටර් රථ නිෂ්පාදනයට අවශ්‍ය කරන දැනුම එක්තැන් කරන්නට, ඒ වාගේම ආබාධ සහිත තැනැත්තන්ට පහසුවෙන් ගමන් යා හැකි රථ වාහන නිෂ්පාදනයට දිරිදීමට, fossil fuel වෙනුවට පුනර්ජනනීය බලශක්ති ප්‍රභව - සූර්ය බලය සහ සුළං බලය - පාවිච්චි කරලා, තාක්ෂණික දැනුම පාවිච්චි කරලා අපේ සංවර්ධනයට ඒවා හවුල් කර ගැනීමට මැදිහත් වෙන්න මේ අමාත්‍යාංශයට ලොකු වගකීමක් තිබෙනවා.

ජනතාවට සෞඛ්‍ය පහසුකම් ලබා දීමේදී නව තාක්ෂණය හරහා විවිධ පර්යේෂණ, විවිධ පරීක්ෂණ, විවිධ සොයාගැනීම් ඔස්සේ එම කාර්යය කිරීමට අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැන් ඉහළ තලයකට ඇවිල්ලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයත් සමඟ එකතුව විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය හරහා ඒ ඖෂධ නිෂ්පාදනය වඩාත් හොඳ තත්ත්වයකට ගෙන ඒමේ කටයුත්තට මැදිහත් වෙන්න අපට මේ කාල සීමාව වැදගත් වෙනවා.

කලින් සඳහන් වුණා වාගේම දැන් අධ්‍යාපනයත් නවීකරණය වෙලා තිබෙනවා. වර්තමානයේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම ඇත්තටම සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවලට වඩා වෙනස් තත්ත්වයක් දකින්න තිබෙනවා. පරිගණක භාවිතය, අන්තර්ජාල භාවිතය, zoom තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික තාක්ෂණය හරහා online learning process දැන් ගොඩක් ව්‍යාප්ත වෙලා තිබෙන්නේ. සියලු දරුවන්ට මේ අවස්ථාව උදා කිරීමට අපට මේ තාක්ෂණ කටයුතු මෙහෙයවා ගන්න අවශ්‍ය වෙලා තිබෙනවා.

පණිවුඩ හුවමාරුවේදී නවීන තාක්ෂණය යොදා ගන්න දැන් අපට ලොකු අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඒ සඳහා leapfrogging opportunities ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, landline telephone එකක් පාවිච්චි කළේ නැති අයට mobile phone එකක් පාවිච්චි කරන්න, ඒ වාගේම fossil fuel පාවිච්චි කිරීමට ගැටලු තිබුණු අයට දැන් renewable energy පාවිච්චි කරන්න, digitization හරහා mobile payment එකක් කරන්න, කෘෂිකාර්මික වැඩ කටයුතුවලට drones පාවිච්චි කරන්න, ඈත පිටිසර ගම්මානවලට විදුලිය සැපයීමට අප්‍රිකාවේ වාගේ mini-grid system එකක් භාවිත කර ගන්න අපට පුළුවන් වුණොත් මේ නව තාක්ෂණය හරහා අපි හිතනවා, අපට ඉදිරි පිම්මක් සහිතව අපේ රට සාර්ථකව ඉදිරියට ගෙන යන්න පුළුවන් වේවි කියලා.

එදිනෙදා ජීවිතයට විද්‍යාව භාවිත කිරීම, ප්‍රචලිත කිරීම අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා හරිම වැදගත් වෙනවා. එදා මම ශිෂ්‍යත්වලාභියෙකු ලෙස පැල්මඩුල්ල, ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලයේ හයේ පන්තියට ඇතුළත් වුණා. අපේ 6 - C පන්තියේ සිටියා, ශිෂ්‍යත්වලාභීන් 32ක්. මගේ විද්‍යාව ගුරුවරිය අපට කිව්වේ, අප අවට පරිසරයේ තිබෙන, පරිසරයේ සිදුවන දේවල් පිළිබඳව ක්‍රමානුකූලව ඉගෙන ගන්න, නිරීක්ෂණය කරන්න, ඒ පිළිබඳව ප්‍රශ්න කරන්න, ඒක තමයි scientific approach එක කියලා. අපට හැම දරුවෙකුටම ඒකාකාරීව අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන් නම්, විද්‍යා හා තාක්ෂණ දැනුම ගමට ගෙන ගොස් අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වයන් මීට වඩා දියුණු කර ගන්න අපට පුළුවන් වෙනවා.

ඇත්තටම මම පාසලෙන් විද්‍යාව ඉගෙන ගත්තත්, වෛද්‍ය විද්‍යාලයේදී වෛද්‍ය විද්‍යාව ඉගෙන ගත්තත්, යමක් මහ හැරුණා කියා මා හිතනවා. සමස්තය හැටියට මම සාමාන්‍ය විද්‍යාව ඉගෙන ගත්තා. නමුත් ඉන් පසුව අපි රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව වැනි විද්‍යාවන් වෙන වෙනම ඉගෙන ගන්න ගිහිල්ලා සමස්තය තුළින් ලබා ගන්න තිබුණු දැනුම අපට අහිමි වුණා කියලායි මට හිතෙන්නේ. නමුත් වෛද්‍යවරයෙකු හැටියට මට ඒ ලබා ගන්න බැරි වෙච්ච දැනුම පසුව මම මහජන සෞඛ්‍ය ඉගෙන ගන්නකොට ලබා ගත්තා. පසුව මම statistics ඉගෙන ගත්තා, කළමනාකරණය ඉගෙන ගත්තා, networking ඉගෙන ගත්තා, epidemiology ඉගෙන ගත්තා. ඇත්තටම විද්‍යාව අපේ එදිනෙදා ජීවිතයට සම්බන්ධ කරගන්නේ කොහොමද කියන දැනුම මේ නිසා අපට ලැබුණා. මෙන්න මේ විධියට අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කරලා, අපේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයත් සමඟ එකතුව සාමාන්‍ය විද්‍යාවට අදාළ විද්‍යාත්මක චින්තනය දරුවන්ට ගොඩනඟන ඉදිරි අධ්‍යාපන සැලැස්මක් තුළ දරුවන්ට ඒ දැනුම ලබා දෙන්න උත්සාහ කළොත් මම හිතනවා, අපේ මේ සිතන පතන ආකාරයත් වෙනස් වෙලා මේ රට වඩාත් සංවර්ධිත රටක් කරගන්න අපට අවස්ථාව ලැබෙයි කියලා. ඒ සඳහා අප සියලුදෙනාට ඉදිරි කාල සීමාව තුළ විශාල වගකීමක් පැවරිලා තිබෙනවා. ඒ නිසා පරීක්ෂණ, නිරීක්ෂණ, විශ්ලේෂණ හරහා අපි ලබා ගන්නා දැනුම පොදුවේ රටේ යහපතට යොදවා ගන්න එක තමයි අපට කරන්න තිබෙන්නේ. මේ සඳහා තිබෙන තොරතුරු පාවිච්චි කරලා අපට descriptive studies කරන්න පුළුවන්. ඒ වාගේම මෙතෙක් සිදු වුණු දේ පිළිබඳව අපට case control studies කරන්නත් පුළුවන්.

Cohort එකක් අරගෙන ඒ තුළින්, සිදු වන දෙය පිළිබඳව අධ්‍යයනය කරන්නත් අපට පුළුවන්. Ecological studies පාවිච්චි කරලා ඉතිහාසය පුරාම සිදු වූ දේ පිළිබඳව අධ්‍යයනය කරලා අපි දන්නා, අපි පාවිච්චි කරන විද්‍යාත්මක තොරතුරු භාවිතයෙන් මේ රටේ සංවර්ධනයට අවශ්‍ය කරන ඒ මාවත එළි පෙහෙළි කර ගන්න හොඳ අවස්ථාවක් දැන් ලැබිලා තිබෙනවා. ඒ වෙනුවෙන් ජාතික ජන බලවේගයේ අමාත්‍ය මණ්ඩලය විද්‍යාත්මකව අපි සකස් කරගෙන තිබෙනවා. එම නිසා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයටත්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයටත් මේ සම්බන්ධව විශාල වගකීමක් පැවරෙනවා, සාමූහිකව මේ ජයග්‍රහණ අප වෙත අත්පත් කර ගන්න.

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Harsha de Silva. You have 18 minutes.

[12.03 p.m.]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Chairman. I was going to speak in the evening, but thank you for giving me the opportunity now.

ගරු සභාපතිතුමනි, අද ඉතාම වැදගත් අමාත්‍යාංශයකට අදාළව ඩිජිටල් ආර්ථිකය ගැනත් කථා කරනවා. බොහෝ දේවල් කථා කරන්න තිබුණාට, එක මූලික කාරණාවක් සම්බන්ධයෙන් මගේ කාලය යොදවන්න කැමැතියි. ඊට කලින් මම මේ කාරණයත් කියන්න කැමැතියි.

ජනාධිපතිතුමා ගත් තීරණයකට අනුව Dr. Hans Wijesuriya වාගේ අය ගෙනැල්ලා ඒ අයව ජනාධිපති උපදේශකවරුන් හැටියට පත් කරලා, ඒ අයගේ දැනුම එකතු කරගෙන මේ ගමන යන්න පටන් ගත්ත එක ගැන අපි සන්තෝෂ වෙනවා. මොකද, දේශපාලන පක්ෂය කුමක් වුවත්, digital public infrastructure මේ රටේ හැදෙන්න ඕනෑ. අපි මැතිවරණයට ඉදිරිපත් වෙනකොටත් අපේ ප්‍රතිපත්තියේ තිබුණු foundation එකක් තමයි, digital public infrastructure කියන එක. අපි ඒක බොහෝ කාලයක් තිස්සේ කරන්න උත්සාහ කළාට, නොයෙකුත් හේතු මත අපට අවශ්‍ය තරමට මේ digital public infrastructure හදාගන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඉන්දියාවේ Aadhaar ක්‍රමය වාගේ ක්‍රමයක් අපට මීට කලින් ගේන්න පුළුවන්කම තිබුණා නම්, අපට public finance පැත්තෙන් නාස්ති වෙන මුදල් ඉතුරු කර ගන්න සහ හරියටම target කරලා පුද්ගලයන්ට අවශ්‍ය subsidy එක ලබා දීම සම්බන්ධයෙන් මීට වඩා ගොඩක් දේවල් කරන්න තිබුණා. අද දේශපාලන භේදයකින් තොරව අපි ඩිජිටල් ආර්ථිකයට යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් සහයෝගය දෙන්න බලාපොරොත්තු වෙනවා.

මට තිබෙන ප්‍රශ්නය මෙයයි. කාලයක් තිස්සේ e-NIC එකක් පටන් ගන්න බොහෝ අය ලැහැස්ති වෙලා හිටියා. අපට දැන් National Identity Card එකක් තිබෙනවා නේ. මගේ National Identity Card එක මා ළඟ තිබෙනවා. මගේ පළමුවැනි National Identity Card එක නැති වෙලා, දෙවැනියට සාදා ගත් National Identity Card එක තමයි මේ තිබෙන්නේ. මේ National Identity Card එකේ තිබෙන පින්තූරයේ මගේ කොණ්ඩය තිබෙනවා. මොකද, ඒක තරුණ කාලයේ ගත්ත පින්තූරයක්. මේ National Identity Card එකේ සඳහන් තොරතුරු අතින් තමයි ලියා තිබෙන්නේ. මේ National Identity Card එකේ මගේ නම තිබෙනවා, ගිනිගේ මහේන්ද්‍ර හර්ෂ ද සිල්වා කියලා. ඒ වාගේම, address එක ලියා තිබෙනවා. ඊට අමතරව "ආර්ථික විශේෂඥ" කියලා ලියා තිබෙනවා. ඕනෑ නම් කෙනෙකුට තමන්ගේ National Identity Card එක වෙනස් කරන්න පුළුවන්. ඒකට වෙන අයගේ පින්තූර දා ගන්නත් පුළුවන්; නොයෙකුත් දේවල් කරන්න පුළුවන්. මේකේ security එක බොහෝදුරට අඩුයි. මේක electronic NIC එකක් කරන්න අවශ්‍යයි කියන එක අපි කවුරුත් පිළිගන්නවා. කාලයක් තිස්සේ බොහෝ අය මේක කරන්න උත්සාහ කළා. මේක පටන් ගත්තේ මේ රජය නොවෙයි, මීට කලින් රජයත් නොවෙයි, ඊටත් කලින් රජයත් නොවෙයි. කාලයක් තිස්සේ මේ Sri Lanka Unique Digital Identity - SLUDI - කියන concept එක අවශ්‍යයි කියලා තීරණය වෙලා තිබුණා.

අපි මෙහෙම හිතමු. මේ පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් විධියට ඉන්නවා, අපේ හංස අබේරත්න මැතිතුමා. මෙතුමා වෙන කෙනෙකු වෙන්න බැහැ. මෙතුමා, මෙතුමාම වෙන්න ඕනෑ. යම් විධියකට මෙතුමා tax ගෙවනකොට, මෙතුමා tax ගෙව්වා කියන එක authenticate වෙන්න ඕනෑ. ඒක authenticate වෙන්න නම් මෙතුමාගේ biometrics ගන්න ඕනෑ. ඒ සඳහා ඇසේ iris එක ගන්න පුළුවන්; facial recognition එක ගන්න පුළුවන්; එහෙම නැත්නම් අපි මේ සභාවේදී ඡන්දය පාවිච්චි කරනවා වාගේ fingerprint එක ගන්න පුළුවන්. ඒවා එක තැනක store කරන්න පුළුවන්. ඒවා එක තැනක store කළාම මෙතුමා යම්කිසි transaction එකක නියැළෙනවා නම්, ඒ මෙතුමාමයි කියන එක authenticate කරන්න අපට පුළුවන් වෙනවා, අර Aadhaar වාගේ database එකක් හදලා ලංකාවේ ඉන්න සියලු පුද්ගලයන්ගේ biometrics එතැන store කළාම. ඒ වාගේම වෙන transaction එකක් කරනකොටත් ඒක කළේ මේ පුද්ගලයාමද කියන එක instantly, nanosecond එකෙන් දැනගන්න පුළුවන් විධියේ system එකක් තමයි මේ Sri Lanka Unique Digital Identity එක හරහා හැදෙන්නේ.

සමහර රටවල vendor-specific ඒවා තිබෙනවා; Google තිබෙනවා; එහෙම නැත්නම් Apple තිබෙනවා. හැබැයි, ලෝකයේ සමහර රටවල vendor-specific යන්නේ නැතුව open source ක්‍රමවේදය යටතේ system එකක් හදලා තිබෙනවා. ඉන්දියාව වාගේ රටක් තමයි ඉස්සෙල්ලාම ඒ open source ක්‍රමවේදය යටතේ මෙවැනි system එකක් හැදුවේ. මොකද, මම ඒ system එක බලන්න ගියා. එක වතාවක් මට මංගල සමරවීර හිටපු ඇමතිතුමා කිව්වා, පොඩ්ඩක් ගිහිල්ලා මේ ගැන හොයා බලන්න, අපි මේක ලංකාවේ establish කරන්න ඕනෑ කියලා. එවකට හිටපු ඩිජිටල් ඇමති හරින් ප්‍රනාන්දු මැතිතුමාත්, ICTA එකේ සභාපතිතුමිය වන මුබාරක් මහත්මිය සහ තවත් කණ්ඩායමක් සමඟ අපි ඉන්දියාවේ Aadhaar එකට කථා කරලා, උදේ එහාට ගිහිල්ලා, ඒක study කරලා, හැන්දෑවේ ඇවිල්ලා මම ඒ ගැන report එකකුත් ඉදිරිපත් කළා. ඒකත් එක්ක තමයි මේ සම්බන්ධයෙන් මගේ දැනුම වර්ධනය කර ගන්න මම මුලින්ම පටන් ගත්තේ. එතකොට ඉන්දියාවේ හදපු system එක කිසි විධියකට vendor-specific නැහැ. Vendor-specific නැති Modular Open Source Identify Platform - MOSIP - කියලා system එකක් තමයි ඉන්දියාවයි, ලංකාවයි අතර ගනුදෙනුවක් විධියට කරන්න එකඟ වුණේ, දැනට අවුරුදු තුන හතරකට කලින්. එතකොට Aadhaar වාගේ ඒ MOSIP system එක හරහා අපට හැකියාවක් ලැබෙනවා, අපේ citizensලාගේ biometrics store කරන්න. මේ ගරු සභාවේ ලොකු කථාවක් මතු වුණා, මෙහෙම biometrics store කළාම ඉන්දියාව ඇවිල්ලා අපේ biometrics හොරකම් කරගෙන යයි කියලා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා වෛද්‍යවරයෙක් නිසා මම ඔබතුමාට කාරණයක් කියන්නම්. 2015 මැතිවරණයෙන් පස්සේ අපි එකතු වෙලා ලංකාවේ ambulance service එකක් පටන් ගත්තා. ඔබතුමා හොඳටම දන්නවා, "1990 සුව සැරිය" ambulance service එක ගැන. ඔබතුමාට මතක ඇති, එතකොට මට කොච්චර ප්‍රහාර එල්ල කළාද කියලා. මම ඉන්දියාවේ intelligence ඒජන්තයෙක්, ලංකාවේ biometrics අරගෙන ඉන්දියාවට ගෙනියන්න හදනවාය කිව්වා. මෙතැන මාව criticize කරපු කට්ටියට කොච්චර නම් මම කිව්වාද, එහෙම කරන්න හැකියාවක් නැහැ කියලා. නමුත්, ඔවුන් ඒක පිළිගත්තේ නැහැ. හැබැයි, අද වෙනකොට ඔවුන් ඒක පිළිගෙන තිබෙනවා. ඒ වාගේම වැඩක් තමයි මේ වෙන්න යන්නේ. සමහර කට්ටිය national security ගැන කියලා ලොකු බිල්ලෙක් මවලා කියනවා, මේ ටික අරගෙන වෙන කොහේට හරි යන්නයි හදන්නේ කියලා. එහෙම කරන්න බැහැ. අද වෙනකොට අපි ළඟ 1990 ambulance සේවාවෙන් සේවය ලබා ගත් පුද්ගලයින් ලක්ෂ 20කට වඩා කට්ටියගේ information තිබෙනවා. නමුත්, ඒ information එකක්වත් වෙන රටකට ගිහින් නැහැ. ඒ නිසා මේ MOSIP system එක යටතේ agree වෙලා, තිබෙන ක්‍රමවේදයට අනුව මේ

කට්ටියයි, ලංකාවයි එකතු වෙලා මේ design and develop කරන්න යනවා, foundational digital ID system එකක්. මේ foundational digital ID system එක තමයි basic එක. ඒකේ කොටස් දෙකක් තිබෙනවා. එකක් තමයි, biometrics back කරපු ID එක. අනෙක් එක තමයි, අර credential එක authenticate කරන්න පුළුවන් ක්‍රමවේදයක් තිබීම.

ඊයේ හාන්ස් විජයසූරිය මැතිතුමා විසින් presentation එකක් කළා. එතුමා මෙහි තිබෙන වැදගත්කම ගැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ව දැනුවත් කළා. මේක physical and digital credentials couple කරන එකක්, unique key එකක් තිබෙන එකක්, national data exchange එකක්, best-in-class and highly secured එකක්, vendor independent එකක් කියලා එතුමා කිව්වා. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. මේක හොඳයි. මේක කරන්න ඕනෑ. මේක කරන අතරවාරයේ තව parallel වැඩකුත් වෙනවා. ඒ parallel වැඩේ මොකක්ද? ඒ parallel වැඩේ තමයි, මම අර කලින් පෙන්වපු මගේ ID එක digital කරන්න යන එක. දැන් ඒකයි, මේකයි දෙකම කරන්න හදනවා. මේක අවශ්‍ය නැහැ. I am submitting to this House that it is a waste of money. දැන් ඒ digital ID එක අවශ්‍යමද කියලා අපි ඇහුවාම, එතුමාගේ අදහස වුණේ එහෙම අවශ්‍යම නැහැ කියන එකයි. ඕනෑ නම් ඉන්දියාවට ගිහිල්ලා ත්‍රී වීලර් එකක යනකොට ඒ පුද්ගලයාගෙන් අහන්නකෝ, ඔබතුමාගේ Aadhaar card එක card එකක් හැටියට wallet එකේ තිබෙනවාද කියලා. අවශ්‍ය නැහැ. මම දවසක් ඉන්දියාවට ගිය වෙලාවක ත්‍රී වීලර් පදවන පුද්ගලයෙකුගෙන් ඒ ගැන ඇහුවා. එතකොට ඔහු කිව්වා, "සර්, මට ඕනෑ නම් communication එකකට ගිහින් මගේ ID එකේ printout එකක් අරගෙන කරේ දමා ගන්න පුළුවන්" කියලා. හැබැයි, ඒක කරන්නම ඕනෑ නැහැ. ID එකක් අවශ්‍ය මොකද කියලා අපි ඇහුවාම, අපට ලැබෙන උත්තරය තමයි culturally අපි මේක පාවිච්චි කරලා තිබෙනවා කියන එක. ඉන්දියාවේ අපේ වාගේ ප්‍රචලිත National Identity Card එකක් තිබුණේ නැහැ.

ලංකාවේ එහෙම නොවෙයි. ලංකාව ඊට වඩා දියුණුයි. අපට birth certificates තිබෙනවා; National Identity Cards තිබෙනවා. අපි ඒවා පාවිච්චි කරන අවස්ථා ගොඩක් තිබෙනවා. නමුත් ඒකෙන් කියන්නේ නැහැ, දැනට තිබෙන National Identity Card එක digital ID එකක් බවට හරවන්නම අවශ්‍යයි කියලා. අපි හිතමු, cultural practice එකට අනුව එහෙම කරන්න අවශ්‍යමයි කියලා. එහෙම කරනවා නම් දැන් මේ කරන විශාල expense එක කරන්න ඕනෑ නැහැ. දැන් මේ මොකක්ද කරන්නේ? Polycarbonate card එකක් ගෙනෙන්න හදනවා. මම හිතන විධියට, ඒ polycarbonate cards ලක්ෂ ගණනක් හෝ මිලියන ගණනක් අරගෙන තිබෙනවා. මම ඒ ගැන දන්නේ නැහැ. ඇමතිතුමා උත්තර දෙනකොට ඒ ගැන කියාවි. දැන් තවත් polycarbonate cards ලක්ෂ ගණනක් හෝ මිලියන ගණනක් ගන්න හදනවා. මගේ proposal එක මේකයි. අපි හිතමුකෝ, මේක cultural practicesවලට අවශ්‍යයි කියලා, ගරු සභාපතිතුමනි. එහෙනම් අපි මේක නිකම් PVC card එකක් කරමු. මොකද, මම ඊයේ රෑ මේ කථාව හදන්න research කරනකොට ChatGPT එකෙන් ඇහුවා, polycarbonate card එකේ සහ PVC card එකේ වෙනස මොකක්ද කියලා. එතකොට මට කිව්වා, polycarbonate card එකේ ලේසර් ප්‍රින්ට් කරන්න පුළුවන්, PVC card එකේ ලේසර් ප්‍රින්ට් කරන්න බැහැ, ඕනෑ නම් ලේසර් ප්‍රින්ට් එකක් අලවන්න පුළුවන් කියලා. හරි, අපි එහෙම කියමුකෝ. එහෙම වුණත් polycarbonate card එකේ cost එක සමහර විට ඇමෙරිකානු ඩොලරයක්, එකහමාරක්, දෙකක් විතර වෙනවා, හැබැයි, PVC card එක වෙන්නේ ඇමෙරිකානු ඩොලර් සත දහයයි. එහෙනම් මගේ proposal එක මේකයි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට තමයි මම මේ යෝජනාව කරන්නේ. අපට එහෙනම් පුළුවන්, PVC card එකකට යන්න. මොකද, ඒක අත්‍යවශ්‍ය නැති නිසා. මොකද, ඔය කරන්න යන parallel job එකෙන් කරන්න හදන්නේ, expensive card එකක් ගෙනෙන එක. හැබැයි, ඒකේ කිසිම chip එකක් නැහැ; කිසිම biometric එකක් ඒකේ register වෙන්නේ නැහැ. ඒ ඔක්කොම register වෙන්නේ අර මම කලින් කියපු foundational digital ID එක තිබෙන MOSIP එකත් එක්ක ආණ්ඩුව හදන්න යන database එකේ. ඒ නිසා මේකට high-tech අවශ්‍ය නැහැ. එම නිසා lower-tech card එකක් දෙන්න තිබුණාම ඇති.

අනෙක් කාරණය මේකයි. දැන් මේගොල්ලන් biometrics එකතු කරන්න යනවා නේ, මිලියන 15ක් වන අපේ මිනිසුන්ගෙන්. එතකොට ඒ කට්ටිය දැනටමත් biometrics එකතු කරන්න - e-NIC කට්ටිය, ඒ කියන්නේ Department of Registration of Persons - මිලියන ගණනකට equipment අරගෙන තිබෙනවා; servers අරගෙන, data capture කරන්න උපකරණ අරගෙන තිබෙනවා. මොකද, ඒ කටයුතු සිදු වෙන්නේ පොලීසිය භාර අමාත්‍යාංශය හරහා. මේ කටයුතු සිදු වෙන්නේ ජනාධිපතිතුමාට අයත් අමාත්‍යාංශයක් හරහා. දැන් මෙතැන අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ cohesiveness එකක්, overlap එකක්. අපට අවශ්‍ය නැහැ, සල්ලි නාස්ති කරන්න. අපි ආවේ wastage එක අඩු කරන්න නම්, දේශපාලන පක්ෂ භේදයකින් තොරව දෙකක් parallelly කරන්නේ නැතුව එකක් විතරක් කරන්න අපි එකඟ වෙමු. මම ඒ ගැන හොයා බැලුවා. ගරු සභාපතිතුමනි, iris එක, fingerprint එක, facial recognition වාගේ දේවල්වලින් data එකතු කරනවා නේ. දැන් අර MOSIP එකෙන් කරන foundational digital ID එක හදන තැන වැඩ කරන අයට ගොඩක් authentication කරන්න තිබෙනවා; ඒ කට්ටියට වැඩ ගොඩක් කරන්න තිබෙනවා. Qualitatively කියනවා නම්, it is a much more complex task that the MOSIP people are going to do with the Ministry of Digital Economy to create that database. මේ කරන්න යන්නේ simple දෙයක්. එක තැනකින් data එකතු කළාම ඒ එකතු කරන data ඕනෑ නම් Department of Registration of Persons එකටත් පාවිච්චි කරන්න පුළුවන්. ඒ නිසා කිසිම අවශ්‍යතාවක් නැහැ, Department of Registration of Persons එකට equipment අරගෙන, කාඩ් අරගෙන, ඒ process එකේ යන්න. මොකද, මේ process එකේ යනකොට මේකෙන් externality එකක් හැටියට කිසිම cost එකක් නැතුව Department of Registration of Persons මඟින් අවශ්‍ය දත්ත ලබා ගන්න පුළුවන්; ඔබතුමන්ලාත් මම හිතන විධියට ඒක හොඳටම දන්නවා. ඒ නිසා මගේ යෝජනාව වෙන්නේ මේ දෙකම කරන්න එපා කියන එකයි. අපි අවුරුදු පනස් ගණනක්, හැත්තෑ ගණනක් තිස්සේ මෙන්න මේ මගේ අතේ තිබෙන ID එක තියාගෙන හිටියා. අපි කාටත් තිබෙන්නේ මෙන්න මේ ID එක. ඒ නිසා තව අවුරුද්දකින් මේ ID එක වෙනුවට කාබන් කාඩ් එකක් දෙන්න. හදිස්සියක් නැහැ. අපට තව අවුරුද්දක් ඉන්න පුළුවන්, මේ ID එකත් එක්ක. අවුරුද්දක් ඉන්න බැරි නම්, අපි නිකම් PVC card එකක් දෙමු. මොකද, PVC card එකට chip එකක් ගහන්න අවශ්‍යතාවක් නැහැ.

ඉතින් මම කියන්නේ, අපි මේක ගැන හරියට හිතලා බලමු කියලායි. ඔබතුමන්ලා කියයි "මේක අපේ අදහසක්, අපි unique ID කරන්න යනවා" කියලා. හැබැයි, අපි කවුරුත් දන්නවා මේක අවුරුදු ගාණක් තිස්සේ කථා වෙච්ච දෙයක් බව. ඒ වාගේම කවුරුත් දන්නවා අමාත්‍යාංශ දෙක අතර තමයි මේකේ ප්‍රශ්නය තිබුණේ කියලා. කලිනුත් මේක කර ගන්න බැරි වුණේ, එක අමාත්‍යාංශයක් එකක් කියනවා, අනෙක් අමාත්‍යාංශය තව එකක් කියනවා. මෙතැන national security features තිබෙනවා නම් ඒවා වෙනම බලා ගනිමු. නමුත් මේ කටයුත්ත කරන්න ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට දෙන්න. මොකද, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය කියන්නේ - security වෙන්න පුළුවන්, trade වෙන්න පුළුවන්,

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

agriculture වෙන්න පුළුවන්, health science වෙන්න පුළුවන්, වෙන ඕනෑම එකක් වෙන්න පුළුවන්, - ලංකාවේ digital economy එක කරන්න අවශ්‍ය infrastructure එක දමන්න උත්සාහ කරන කණ්ඩායම. So, there are many users that these people will have. But the issue is, there is no need to duplicate the process and waste so much of money; two parallel projects, in my view, are completely unnecessary and it is a waste of money. Because, අපිට රුපියල් බිලියන 20ක් යනවා නම් මේක කරන්න, ඒකෙන් රුපියල් බිලියන දහයහමාරක්ද කොහේද දෙනවා කියා තිබෙනවා ඉන්දියාවෙන් grant එකක් හැටියට. ඉතුරු බිලියන 10 තමයි අපි දමන්න ඕනෑ. එතකොට ඒ බිලියන 10 එන්නේ කොහොමද? ගරු සභාපතිතුමනි, ඉන්දියාවේ තිබෙනවා National Institute for Smart Government කියලා එකක්. ඒගොල්ලන් තමයි ඒකේ project manager හැටියට ඉන්නේ. අනෙක් පැත්තෙන් තිබෙනවා ඒගොල්ලන්ගේ MOSIP එක හරහා ඒක develop කරන්න. මේ සල්ලි හම්බ වෙන්නේ ඒ වැඩේට. ඒක ඇතුළේ main system integrator කෙනෙක් ඉන්නවා. ඒ main system integratorට පුළුවන් වෙනවා අවශ්‍ය නම් ඒගොල්ලන්ගේ hardware ලබා ගන්න. එතකොට අපි මේකෙන් සම්පූර්ණයෙන් exclusive වුණු වෙනම project එකකට මේකෙන් hardware ලබාගෙන වෙනම data collect කරන්න යනවා නම්, ඒ cost එක මෙතැනින් cover කරන්න යනවා නම් මේ project එක ඇතුළේ අවුලක් සිද්ධ වෙනවා. පොඩි ගාණක් - සියයට 2ක්, 3ක්, 5ක්- නම් කමක් නැහැ කියලා අත හැරලා දාන්න පුළුවන්. I do not know what the cost estimate is. But, what I am saying is, there is absolutely no need to replicate it because, then, it is redundant.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Harsha de Silva, you have two more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you.

අනෙක් කාරණය මේකයි. දැන් මේ system එක හදපු පළියට Sri Lanka Stack එකක් හැදෙන්නේ නැහැ නේ. දැන් හැමෝම කථා කරන්නේ India Stack එක ගැන. Hon. Deputy Minister, India Stack කිව්වාම, everybody knows about India Stack. ඒකේ DigiValet එකක් තිබෙනවා, DigiLocker එකක් තිබෙනවා. ඒකේ PhD certificate එක දාගෙන තියාගෙන ඉන්න පුළුවන්, income tax certificate එක දාගෙන ඉන්න පුළුවන්. එතකොට තමන්ගේ දේවල්, -documents මොනවා හරි- තමන්ට ඕනෑ වෙලාවක, තමන්ගේ අනුදැනුම යටතේ වෙන කාට හරි හැකියාවක් තිබෙනවා කුමක් හෝ transaction එකක් සඳහා verify කරන්න. මේ ඔක්කෝම කරන්න ලොකු අවස්ථාවක් ලැබෙනවා. ලංකාවේ සහ පිට රට startupsලාට, immediate future එකේ ලොකු අවස්ථාවක් ලැබෙනවා India Stack එක develop කළා වාගේම Sri Lanka Stack එකත් develop කරන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I will take two minutes and finish.

එතකොට ඒක කරනකොට, -අද Budget එක නිසාම කියන්න ඕනෑ- ඒ software opportunitiesවලට දැන් අලුතෙන්ම බද්දකුත් වදිනවා. ඒක ගැනත් පොඩ්ඩක් කථා කරන්න ඕනෑ, වේලාව නැති වුණාට. නමුත් මේ integration එක හැරුණාම customize කරන්න ඕනෑ මේ foundational ID structure එක. මොකද, මේක හදපු පළියට, අර authentication එක කරපු පළියට, verification එක වෙච්ච පළියට services develop වෙන්නේ නැහැ, services customize කරන්න ඕනෑ. ඉතින් ඒවාට vendorsලා සොයා ගන්න ඕනෑ, ඒවාට, proper procurement proceduresවලට යන්න ඕනෑ. නමුත් මේ පෙනෙන කාරණය, දැනට තිබෙන ground reality එක බැලුවාම ඒ පිළිබඳව ප්‍රශ්න මතු වෙනවා.

මම one minuteවලින් මගේ කථාව අවසන් කරන්නම්. මට තව එක point එකක් ගැන කියන්න ඕනෑ. ඒ තමයි, අපි digital infrastructure හදනකොට cross-border e-commerce ගැන ගොඩක් අවධානය යොමු කරන්න ඕනෑ.

මොකද, ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. බලන්න, අපේ mobile phone එකට දිගට හරහට එක එක online marketplaces ගැන විස්තර එනවා. ඒවායෙන් නොයෙකුත් ලොකු ලොකු දේවල් විකුණන්න හදනවා. හැබැයි, මේවා register වෙලා නැහැ; මේ cross-border e-commerceවලට clearing channel එකක් නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Harsha de Silva, your time is up.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Yes, Sir, my time is up.

De minimis structure එකක් නැහැ. Technology ගෙනැල්ලා, ඉදිරිපත් කරලා වැඩේ ඉස්සරහට අරගෙන යන්න කොච්චර ඕනෑකම තිබුණත්, ගොඩක් legislative changes ඕනෑ වෙනවා. ඒකට අපේ කිසිම විරුද්ධත්වයක්, විවාදයක් නැහැ. Legislative changes ගෙනෙන්න නම් අපි එක තැනකට එමු, අර parallel system එක නවත්වා, සල්ලි නාස්ති කරන එක නවත්වා Ministry of Digital Economy මඟින් කරන, MOSIP එකයි, ආණ්ඩුවයි කරන වැඩේට එකතු වෙලා කටයුතු කරමු කියන කාරණය ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
Hon. Chairman, I want to clarify some points made by the (Dr.) Harsha de Silva.

First of all, the Department of Registration of Persons is under our Ministry. So, there would not be any duplication. The development of MOSIP and the e-NIC Project is also done by the same Ministry. So, there would not be any duplication of work.

At the same time, we are also currently evaluating issuing of low-cost PVC cards. However, the previous attempt to issue a PVC card had not been successful because of the quality of the card and the lifetime of it was only two years. Therefore, if we are to issue a PVC card, it would be something which lasts, at least, for five to ten years. Otherwise, people would keep on asking for renewal of ID cards, which would create a bottleneck for the Department. So, those are two things I would like to clarify.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I have just one small matter to raise.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Member?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you, Sir.

Hon. Deputy Minister, I appreciate your answer. The point is, if you are doing it together and if you are already evaluating the purchase of PVC cards, then why are you again floating another tender to purchase more plastic carbon cards? Also, if the law says that the card is valid for ten years, we can change the law because technology is changing so fast. We must update the law to change with the times we are living in. For example, you need to create a Single Window system in the Sri Lanka Customs, but the Customs Ordinance is 207 years old! So, unless you change the Customs Ordinance, you cannot create a Single Window in the Sri Lanka Customs. So, none of the digital infrastructure you are building, none of the authentication, verification or SL Stack, nothing is going to work unless we change the law.

Sir, I am with him. If it is done under one Ministry, that is better, but let us think outside the box. Let us not get restricted because the law says ten years. When that law was written, technology was not this advanced. Technology is so advanced today that the laws need to facilitate technology.

Thank you very much.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Lasith Bhashana Gamage. You have 10 minutes.

[අ.භා. 12.25]

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
ගරු සභාපතිතුමනි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ ඉදිරිපත් කළ අය වැයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැනත් විවාද කරන මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි, ආණ්ඩුව බලයට පත් වෙලා ඇත්තටම විද්‍යාත්මක ක්‍රමවේදය ආරම්භ කරපු, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාවට නංවපු අවස්ථාව මේ ඇමති මණ්ඩලය පත් කිරීමයි කියන කාරණය. මොකද, මම හිතන විධියට මෑත ඉතිහාසය තුළ විද්‍යාත්මකව පත් කරපු ඇමති මණ්ඩලය ජාතික ජන බලවේගයේ ඇමති මණ්ඩලයයි. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වාගේම විශේෂයෙන්ම ලංකා ඉතිහාසය තුළ පළමු වතාවට ඇති කළ Ministry of Digital Economyත් කාලීන අවශ්‍යතාවක් සහිත අමාත්‍යාංශයි. ඒ නිසා නව රජයේ; ජාතික ජන බලවේගය ආණ්ඩුවේ නව වැඩ පිළිවෙළට අදාළ කරන, විශේෂයෙන්ම ඩිජිටල්කරණ වැඩ පිළිවෙළට අදාළ කරන වැඩ කටයුතු කරගෙන යන්න වෙනමම ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයක් පිහිටුවීම සිදු කර තිබෙනවා. ඒ අනුව මම හිතනවා, එතැනින් තමයි අපි විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව වැඩ කටයුතු ආරම්භ කර තිබෙන්නේ කියලා.

අපේ රටේ මහ ලොකු සම්පත් නැහැ. හැබැයි, අපට හොඳ මානව සම්පතක් තිබෙනවා. මෙන්න මේ මානව සම්පත හරියට කළමනාකරණය කිරීමට මෙච්චර කාලයක් රට පාලනය කළ පාලකයෝ කිසිදු දැක්මක් අනුව කටයුතු කර නැහැ. මේ රටේ ආර්ථිකය අපි කොතැනට අරගෙන යන්න ඕනෑද, එසේ ආර්ථිකය ඉදිරියට අරගෙන යා යුත්තේ මොන මොන අංශවලින්ද, ඒ ඒ අංශවලට ආර්ථිකය ගෙන යන්න මොන වාගේ මානව සම්පතක් දායක කර ගන්න ඕනෑද, එසේ දායක කර ගන්නා මානව සම්පතට මොන වාගේ අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑද කියන කාරණා ගැන කිසිදු දැක්මක් නැතුව තමයි එම පාලකයෝ කටයුතු කර තිබෙන්නේ.

අපි STEM අධ්‍යාපනය ගැන කියනවා. හැබැයි, STEM අධ්‍යාපනයට කොපමණ සිසුන් ප්‍රමාණයක් බඳවා ගන්න ඕනෑද, ඒ සිසුන් බඳවා ගන්නේ මොන මොන අවශ්‍යතාවලටද කියන දේවල් සම්බන්ධයෙන් කිසිදු වැඩ පිළිවෙළක් නැති තත්ත්වයක් තමයි මේ වන විට අපේ රටේ තිබෙන්නේ. මම හිතනවා, එහිදී අපි ඉදිරි අවුරුදු 15කට, 20කට, 50කට පමණ සරිලන සැලසුම් සකස් කරන්න ඕනෑ කියලා. ඒ කියන්නේ, අපි මොන වාගේ අංශවලින් මේ රට ඉදිරියට ගෙන යා යුතුද කියා සැලසුම් කරන්න ඕනෑ. මානව සම්පත කළමනාකරණය කිරීම අනිවාර්යය කටයුත්තක්. ඒක විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වාගේම අනෙකුත් අමාත්‍යාංශත් ඒකාබද්ධව කළ යුතු දෙයක්. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, Ministry of Digital Economy කියන මේ අමාත්‍යාංශ දෙකෙන්ම අනෙකුත් සෑම අමාත්‍යාංශයකටම අවශ්‍ය සේවා සපයනු ලබනවා. ඒ කියන්නේ අනෙකුත් අමාත්‍යාංශවලට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම වාගේ කටයුතු සිදු කරමින් එම අමාත්‍යාංශ ජාතික ආර්ථිකයට දැවැන්ත පිටුවහලක් සපයනවා.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය ගත්තාම, මීට කලින් කථා කළ රවී කරුණානායක මන්ත්‍රීතුමාත් සඳහන් කළ පරිදි, අපි කෘෂි කර්මාන්තයට තාක්ෂණය ගෙනෙන්න ඕනෑ. මම විශ්වාස කරනවා, ඉදිරියේදී ආහාර හිඟයක් ආවොත් එහෙම වෙන්නේ අපේ තරුණ පරම්පරාව කෘෂි කර්මාන්තයෙන් ඉවත්වීම නිසායි කියලා. මොකද, අද වන විට තරුණ පරම්පරාව කෘෂි කර්මාන්තයෙන් ශීඝ්‍ර ලෙස ඉවත් වෙනවා. ඒකට හේතුව මොකක්ද? යල් පැන ගිය කෘෂි practices තමයි තවම අපේ රටේ

[ගරු ලසිත් භාෂණ ගමගේ මහතා]

තිබෙන්නේ. අපේ ගම්වලට තාක්ෂණය ගෙනැල්ලා නැහැ. තරුණයෝ කැමැති නැහැ, පරණ ක්‍රමයට කර්මාන්ත කරන්න. ඒ අය කෘෂි කර්මාන්තයට අකැමැති වෙලා තිබෙන්නේ මෙන්න මේ කාරණාත් එක්කයි. අපි කථා කරනවා, blockchain technology ගැන, robotics technology ගැන. හැබැයි අවශ්‍ය මූලික පහසුකම, මූලික තාක්ෂණය අපේ රටේ කෘෂි කර්මාන්තය තුළට ගෙනෙන්න තවම අපට බැරි වෙලා තිබෙනවා. ඩ්‍රෝන තාක්ෂණය ගැන, ජල සම්පාදන තාක්ෂණය ගැන, පොහොර තාක්ෂණය ගැන, nano fertilizers ගැන අපි කියනවා.

හැබැයි, අපි මේවා හරියාකාරව කළමනාකරණය කරලා ගමට, ගොවීන් අතරට ගෙන යන්න කටයුතු කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. මොකද, ලංකාව වර්ග කිලෝමීටර 65,000ක් තිබෙන කුඩා රටක්. නමුත් අපේ රටටත් වඩා කුඩා රටක් වන නෙදර්ලන්තය වැනි රටක් ගැන අපි කථා කළොත්, කෘෂි කර්මාන්තයෙන් විතරක් ඔවුන් කොච්චර නම් ඉහළින් ඉන්නවාද? නෙදර්ලන්තයේ තිබෙන්නේ වර්ග කිලෝමීටර 41,000යි. ඒ අයගේ workforce එකෙන් සියයට 4යි කෘෂි කර්මාන්තයේ යෙදෙන්නේ. හැබැයි, ඒ අය, නැත්නම් කෘෂි කර්මාන්තයෙන් GDP එකට සියයට 6ක දායකත්වයක් ලබා දෙනවා. ලංකාව ගත්තොත්, කිලෝමීටර 65,000ක භූමියක්; සම්පූර්ණ ජනගහනයෙන් සියයට 27ක් කෘෂිකාර්මික කටයුතුවල නියැළෙනවා. නමුත්, අපි GDP එකට කෘෂි කර්මාන්තයෙන් දක්වන දායකත්වය සියයට 7.4යි. ඉතින්, මොන වාගේ පහළ තැනකද අපේ රටේ කෘෂි කර්මාන්තය තිබෙන්නේ? අපි මේ ක්ෂේත්‍රය ඉහළට ඔසවා තබන්න ඕනෑ. මේ තාක්ෂණය ගමට ගෙන යන්න ඕනෑ, ගොවියාට ගෙන යන්න ඕනෑ. මම හිතනවා, ඒ සඳහා විදාතා සම්පත් මධ්‍යස්ථානවල නිලධාරීන් පුහුණු කරලා හොඳ ශක්තිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මේ තාක්ෂණය ලබා දෙන්න, ඒ වාගේම තරුණයන්ට, කාන්තාවන්ට මේ තාක්ෂණය කියලා දෙන වැඩසටහනක්, ගමට මේ තාක්ෂණය අරගෙන යන ක්‍රමවේදයක් ඉක්මනින්ම, ක්‍රමවත්ව අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Sitting is suspended for lunch till 1.00 p.m.

Hon. Lasith Bhashana Gamage, you may continue with your remaining five minutes after the lunch break.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පඩි, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දිවා ආහාර විවේකයට පෙර මම කථා කරමින් සිටියේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි. 2025 අය වැයෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට රුපියල් බිලියන පහක් -මිලියන 5,000ක්- වෙන් කර තිබෙනවා. පසුගිය අවුරුදු කිහිපය ගත්තොත්, මේ අමාත්‍යාංශයට 2019දී රුපියල් මිලියන 1,867යි estimate කරලා තිබෙන්නේ; 2020දී රුපියල් මිලියන 1,912යි; 2021දී රුපියල් මිලියන 2,354යි; 2022දී රුපියල් මිලියන 2,653යි; 2023දී රුපියල් මිලියන 5,697යි. නමුත් වියදම් කරලා තිබෙන්නේ 2023දී රුපියල් මිලියන 1,873යි; 2024දී රුපියල් මිලියන 3,070යි; 2025දී මේ අමාත්‍යාංශයට විතරක් රුපියල් මිලියන 5,000ක් අපි වෙන් කරලා තිබෙනවා. අද මේ විවාදය ආරම්භ කරමින් කථා කළ ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා කිව්වා, මෙම අමාත්‍යාංශයට වෙන් කරපු රුපියල් මිලියන 5,000න්, පර්යේෂණ කටයුතුවලට පහසුකම් සලසන්න රුපියල් මිලියන 10යි වෙන් කරලා තිබෙන්නේ කියලා. එතුමා දැකලා නැහැ. ප්‍රධාන පර්යේෂණ ආයතන සහ ඊට අදාළ යෝජිත වියදම් විධියට රුපියල් බිලියන 7.78ක් වෙන් කර තිබෙනවා කියන එක. ඒ වාගේම, ප්‍රධාන පර්යේෂණ ක්‍රියාකාරකම්වලට රුපියල් බිලියන 11.16ක් වෙන් කරලා තිබෙනවා. අපේ ඇමතිතුමාත් ප්‍රකාශ කළා, රුපියල් බිලියන 20කට අධික ප්‍රමාණයක් තාක්ෂණ අමාත්‍යාංශයට අනුබද්ධිත ක්‍රියාකාරකම්වලට හා පර්යේෂණවලට යොදවා තිබෙනවා කියලා. ඒ වාගේම, සෞඛ්‍ය අමාත්‍යාංශය වෛද්‍ය පර්යේෂණ සඳහා රුපියල් මිලියන 760ක් වෙන් කරලා තිබෙනවා. මේවා අර පැණි බීලා මුට්ටි වීසි කරන විධියේ පර්යේෂණ නොවෙයි. මේ විධියට හැම අංශයක්ම, හැම Ministry එකක්ම මේ පර්යේෂණ කටයුතු සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා.

ඊළඟට මම කියන්න ඕනෑ, ජාන තාක්ෂණය - gene technology - ගැන. මීට දශක කිහිපයකට පෙර කාලය ගත්තොත්, ජාන කොල්ලයක් මේ රටේ සිද්ධ වුණා. මේ ජාන කොල්ලය නිසා මේ රටට අහිමි වෙච්ච ධනය අපට මිල කරන්න බැහැ. කොයි තරම් ධනයක්, වැදගත්කමක් තිබෙන ජාන සම්පතක් අපට, මේ රටට අහිමි වෙලා තිබෙනවාද? මේ ජාන සම්පත කොල්ලකෑම ගැන මේ රටේ හිටපු පාලකයෝත් වග කියන්න ඕනෑ. අපට සැකයක් තිබෙනවා, ඒ අයත් මේකට සම්බන්ධ ද කියලා.

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ගත්තොත්, මම ඒ ගැන කලිනුත් කථා කළා. විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් තමයි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ස්ථාපිත වෙලා තිබෙන්නේ. ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමා ලෙස අපේ එරංග වීරරත්න මැතිතුමාත්, ඩිජිටල් ආර්ථිකය පිළිබඳ ප්‍රධාන උපදේශක විධියට Dr. Hans Wijayasuriya මහතාත් කටයුතු කරනවා. ඒ වාගේම තවත් දක්ෂ නිලධාරී මණ්ඩලයක් ඉන්නවා, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ. මේක මේ රටේ කාලීන අවශ්‍යතාවක්. මේ රටේ මිනිස්සු, මේ රටේ තරුණයෝ බලාපොරොත්තු වෙච්ච ඒ වෙනස ඇති කිරීම සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයෙන් ගන්න ඕනෑ සෑම පියවරක්ම අපි ගත යුතුයි. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට අපි වෙන් කර තිබෙනවා, රුපියල් බිලියන 7.1ක්. ඒ වාගේම, අනෙකුත් අමාත්‍යාංශවල ඩිජිටල්කරණ ව්‍යාපෘති සඳහා මේ අය වැයෙන් රුපියල් බිලියන 14.7ක් වෙන් වෙලා තිබෙනවා. වැඩි කාලයක් යන්නේ නැතුව මේ රට බංකොලොත්භාවයෙන් මුදා ගෙන ගෙනා පළමුවැනි අය වැයෙන් අපට හැකි වෙලා තිබෙනවා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයටත්, ඩිජිටල් ආර්ථික

අමාත්‍යාංශයටත් වැඩි මුදලක් වෙන් කරන්න. ඉස්සර මේ අමාත්‍යාංශ දෙකම එකයි. ඒකට වෙන් කරපු මුදලකුත් තිබුණා. දැන් එය අමාත්‍යාංශ දෙකක් බවට පත් කරලා, ඒ අමාත්‍යාංශ දෙකට දැවැන්ත මුදලකුත් අපි වෙන් කර තිබෙනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයත් පෙන්වමින් මීට පෙර මන්ත්‍රීතුමෙක් ප්‍රකාශ කළා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන targetsවලට යන්න මුදල් වෙන් වෙලා නැහැ කියලා. මම දන්නේ නැහැ එතුමා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවලාද ඒක කියන්නේ කියලා. එහෙම නැත්නම් මේ අය වැයට අදාළ කාරණා කියවලාද ඒ ප්‍රකාශය කළේ කියලා මට සැකයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මේ ඩිජිටල්කරණය ගැන සාකච්ඡාවේදී මම හිතනවා, මේක අපි පාර්ලිමේන්තුවෙනුත් යම් ප්‍රමාණයකින් පටන් ගන්න ඕනෑ කියලා. මම උදේ ඇවිල්ලා මේ පුටුවේ ඉඳගත්තා. මගේ දකුණු අත පැත්තේ තිබෙනවා, ලොකු පොත් ගොඩක්. වම් අත පැත්තේ තිබෙනවා, laptop එකක්. මේ පොත් ගොඩේ තිබෙන ටික මේ laptop එකට ගන්න බැරි ඇයි? මේ පොත් මුද්‍රණය කරන්න විශාල මුදලක් යනවා, විශාල කොළ ප්‍රමාණයක් නාස්ති වෙනවා. ඒ නිසා මේ පොත්වල තිබෙන දේවල් අපි මේ laptop එකට ගනිමු. මේ laptop එක දැක්කාම ඇත්තටම මට ලජ්ජාවක් ඇති වුණා. මොකද, මේකේ lock එකක් තිබෙනවා. මොකද මේකේ lock එකක් තිබෙන්නේ? සාමාන්‍යයෙන් සභා ගර්භය ඇතුළේ තිබෙන දෙයක් නැති වෙන්නේ නැහැ නේ. මට හිතෙනවා, මීට කලින් laptops පවා පරිස්සම් කරන්න වෙලා තිබෙනවා කියලා. ඒ හින්දා ද දන්නේ නැහැ, මේවාට locks දාලා තිබෙන්නේ. මේක අභිමානය පිළිබඳ ප්‍රශ්නයක්. ඇත්තටම අපි මේ කරන්නේ මොකක්ද? අපට හම්බ වෙන වැටුපෙන්ද අපේ අභිමානය රැකෙන්නේ, එහෙම නැත්නම් අපේ භාවිතාවෙන්ද, අපේ ක්‍රියාවලින්ද? ඒ සඳහා සාකච්ඡාවක් කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
මම ඉක්මනින්ම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඩිජිටල්කරණය සම්බන්ධයෙන් අපි පාර්ලිමේන්තුවේදීත් යම් ක්‍රියාවලියකට අවතීර්ණ වෙන්න ඕනෑ. මේ කටයුත්ත කරන්න, මේ මානව සම්පත සංවර්ධනය කරන්න, ඒ සඳහා policy එකක් හදන්න අපේ රටේ විද්වතුන් -අපේ ආචාර්යවරු, මහාචාර්යවරු- විශාල ප්‍රමාණයක් අපිත් එක්ක එකතු වෙලා හිටියා. විශේෂයෙන්ම Dr. Hans Wijayasuriya, Prof. Gomika Udugamasooriya වාගේ අය අපිත් එක්ක එකතු වෙලා ඉන්නවා. විශ්වවිද්‍යාලවලදී අපට උගන්වපු මහාචාර්යවරු විශාල ප්‍රමාණයක් මේ වෙද්දී අපිත් එක්ක එකතු වෙලා ඉන්නවා. ඒ වාගේම අනෙකුත් උගත්, බුද්ධිමත් සියලු ආචාර්යවරුන්ට, මහාචාර්යවරුන්ට මම ආරාධනා කරනවා, නිදහස් අධ්‍යාපනයෙන් අපි ඉගෙන ගත්තා වාගේම, මේ රට වෙනුවෙනුත් යමක් කරන්න, මේ මානව සම්පත සංවර්ධනය කරන්න අපිත් එක්ක එකතු වෙන්න කියලා. මේ රටේ විද්‍යා හා තාක්ෂණ ක්‍රමය ගම දක්වා අරගෙන යන්න අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කරන්න අපට සහාය වෙන්න කියලා ආරාධනා කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.07]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තොරතුරු තාක්ෂණය පිළිබඳ හිටපු ඇමතිවරයකු හැටියට මට අද දින මේ විෂයය පිළිබඳ කථා කරන්න ලැබීම සතුටක්. මම ඒ ධුරය දැරුවේ මාස 8ක කාලයක් පමණයි. 2019 ජනවාරි මාසයේ 4වැනි දා මම ඒ අමාත්‍යාංශයේ කටයුතු විධිමත් ලෙස භාර ගැනීමෙන් පස්සේ, මේ රටේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා අවශ්‍ය වන නෛතික පරිසරය ගොඩනැඟීමට වැදගත් වූ කාරණා දෙකක් කෙටුම්පත් කරන්න පටන් ගත්තා.

ඉන් එකක් තමයි, data protection නීතිය. ඒ කියන්නේ, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත. අනෙක, cybersecurity නීතිය. 2019දී අලුත් ජනාධිපතිවරයෙක් බලයට පත් වෙලා අපි විපක්ෂයට යනකොට එම පනත් දෙකම කෙටුම්පත් කරලා, ඒවා පරිවර්තනය කරලා, අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරලා තිබුණේ. නමුත්, පාලකයන් වෙනස් වීමත් එක්ක, මේ රටේම විශේෂඥයන් හදපු, නිසි ලෙස ජාත්‍යන්තර ප්‍රමිතියට සකස් කරපු ඒ පනත් කෙටුම්පත් දෙක සම්මත වීම ප්‍රමාද වුණා. අඩුම ගණනේ පසුගිය ආණ්ඩුව කාලයේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට හැකි වීම පිළිබඳව මා සතුටු වෙනවා. නමුත්, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත තවමත් සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ප්‍රමාණවත් නැහැ. ඒ සඳහා අවශ්‍ය වන පත් කිරීම් සම්පූර්ණ කරලා නැහැ. එම නිසා පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත නිසි ලෙස ක්‍රියාත්මක කරලා මේ රටේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමිතිය ඉහළ නංවන්නට කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. ඒක ප්‍රමුඛ කාර්යයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, cybersecurity පිළිබඳත් මේ රටට නීතියක් අවශ්‍යයි; අපේම නීතියක් අවශ්‍යයි. ඒ පිළිබඳව කෙටුම්පත් කරපු නීතිය සම්මත වීම දිගින් දිගටම ප්‍රමාද වනවා. කරුණාකරලා cybersecurity law එක ඉක්මනින් සම්මත කර ගන්න. එම නීතිය කෙටුම්පත් කිරීම අවසන් වෙලා තිබෙන බව මම දන්නවා. ඒ නිසා ප්‍රමාද කරන්න හේතුවක් නැහැ. එ්ක මේ රටේ ප්‍රමුඛත්වයක් දිය යුතු ක්ෂේත්‍රයක්. මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න පුළුවන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය හරහා තමයි. අපි මේ රට පොහොසත් කරනවා නම්, ඉතාම පහසුවෙන් හා ඉක්මනින් වැඩි මුදලක්, වැඩි ආදායමක් උපයා ගන්න පුළුවන් ක්ෂේත්‍රය, මේක. ඒ ක්ෂේත්‍රයේ ප්‍රගමනයට අවශ්‍ය වන

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ආයෝජකයන් ගෙන්වා ගැනීමට දිරි ගන්වන තොරතුරු ආරක්ෂා කරන cybersecurity law එක කරුණාකරලා ඉක්මනින් සම්මත කර ගන්න. ඒ ක්‍රියාවලියට සම්බන්ධ වූ කෙනෙකු හැටියට මම කනගාටු වෙනවා, ඒ ධුරයෙන් මම ඉවත් වෙලා වසර හයකට ආසන්න වුණත් තවමත් එම නීතිය පාර්ලිමේන්තුව සම්මත නොකිරීම ගැන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ රටේ ආණ්ඩුව දුප්පත්. පොහොසත් මිනිස්සු බදු ගෙවන්නේ නැහැ. ගෙවන කෙනාත් අඩුවෙන් ගෙවන්නේ. ඒ වාගේම අපේ බදු අය කර ගැනීමේ ක්‍රමය විධිමත් නැහැ. ආකෘති පත්‍ර පිරවීම තවම ගල් යුගයේ තිබෙන්නේ. මේ ආකෘති පත්‍ර පුරවන එක අපහසුයි, අපැහැදිලියි. ඒකෙන් යම් ආකාරයකට බදු ගෙවීම අධෛර්යවත් කිරීමක් කරන්නේ. ගිය වසරේ ඒ කටයුතු යම් ආකාරයට ඩිජිටල්කරණයට ලක් වුණ එක වැදගත් පියවරක්. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ රටේ තිබෙන්නට ඕනෑ පුද්ගල ආදායම් බද්ද ආකෘති පත්‍ර පිරවීමෙන් තොරව ලබා ගැනීමක්. පුද්ගලයාගේ ආදායම සහ වියදම මත පදනම්ව, සරල බදු ප්‍රතිශත, සරල බදු ක්‍රම අනුගමනය කරලා මුදල් වර්ෂය අවසානයේ ඒ පුරවැසියා ගෙවිය යුතු බදු ප්‍රමාණය පුරවැසියාගේ ජංගම දුරකථනය වෙත රජය විසින් එවන ස්වයංක්‍රීය - automated - ක්‍රමයක් අවශ්‍යයි. එවැනි ක්‍රම ලෝකයේ ක්‍රියාත්මක වෙනවා.

ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ සභාවට පැමිණෙන මොහොතේම මේ කාරණය සඳහන් කරන්න ලැබීම වටිනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බදුකරණය පිළිබඳ ඉතා හොඳ ආකෘතියක් තමයි ෆින්ලන්තයේ ක්‍රියාත්මක වෙන්නේ. ෆින්ලන්ත රජය බොහොම කැමැත්තෙන් හිටියා ඔවුන් පාවිච්චි කරන ඒ ක්‍රමය අපට දෙන්න. ෆින්ලන්තයේ ආකෘතිපත්‍ර පෞද්ගලිකව පුරවන්නේ නැහැ, පෞද්ගලික බදුකරණය තුළ. එය ඉතාම පැහැදිලි, සරල බදු ක්‍රමයක්.

ඒක නිසා පුරවැසියා ගෙවන බදු ප්‍රතිශතය අඩු වෙනවා. හැබැයි, හැමෝම තමන් උපයන මුදලට බදු ගෙවනවා. ඒ වාගේම, උපයන මුදලට වඩා වැඩි මුදලක් වියදම් කරන්න බැරි නිසා, ඒවා digitally පරීක්ෂාවට ලක් වෙන නිසා, සොරකම් කිරීමේ ප්‍රයෝජනයක් නැහැ. මොකද, දූෂණයෙන්, අල්ලසෙන් හෝ වෙනත් ක්‍රමයකට අයුතු ලෙස උපයා ගන්නා ධනය රට තුළ පරිහරණය කිරීමට අවකාශයක් නැහැ. ෆින්ලන්තයේ ක්‍රියාත්මක වෙන ඒ ක්‍රමය අපට පහසුවෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ තාක්ෂණය අපට ඉතා හුරු බව මට කියන්න පුළුවන්. ඒ නිසා මේ බදුකරණය පිළිබඳව ගත්තොත්, බදු ආදායම වැඩි කර ගන්නා ක්‍රමවේදය විධිමත් කරන්න, හැම පුරවැසියාම තමන් උපයන මුදලට සාධාරණ බද්දක් ගෙවන තත්ත්වයක් ඇති කරන්න අවශ්‍යයි. අද වෙලා තිබෙන්නේ, බොහෝ ධනවත් අය බදු ගෙවීම පැහැර හරින එක. එහෙම නැත්නම් බදු ගෙවන්නේම නැහැ. ඒ වාගේම අද මධ්‍යම පාන්තිකයා සහ පෞද්ගලික අංශයේ සේවය කරන විධායකයින් අධික ලෙස බදු ගෙවීමට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා මේ අසාධාරණ තත්ත්වය ඉවත් කිරීම සඳහා මේ බදු ක්‍රමය ස්වයංක්‍රීය කිරීම අත්‍යවශ්‍යයි, එය කළ හැකියි; කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය කරන අත්හදා බැලීම් ලෝකයේ කරලා සාර්ථක වෙලා තිබෙනවා, අපට තිබෙන්නේ ඒවා අනුගමනය කිරීමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තවත් වැදගත් දෙයක් කියන්න තිබෙනවා. අපි ආරම්භ කරපු ව්‍යාපෘතියක් තිබෙනවා, තවම එය ක්‍රියාත්මක වෙන බව කිව්වා. ඒ තමයි, National Data and Identity Interoperability Platform කියන ව්‍යාපෘතිය. එතැනදී සිද්ධ වෙන්නේ, එක් එක් පුරවැසියාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයන් අනුගමනය කිරීමයි. මේ රජය ඩිජිටල් අනන්‍යතාව පිළිබඳ කාරණයට ප්‍රමුඛතාවක් දීලා තිබෙන එක මම අගය කරනවා. එය වැදගත් දෙයක්; නිවැරදි දෙයක්; ඉක්මනින් කළ යුතු දෙයක්. අද ඇති වෙලා තිබෙන ගැටලුව තමයි, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බැංකු හා රක්ෂණ ආයතන සමඟ ගනුදෙනු කරද්දී, තොරතුරු හුවමාරු කර ගැනීමේදී, ඒවායේ සත්‍යතාව පරීක්ෂා කරද්දී, විශාල ගැටලුවලට මුහුණ දෙන්න සිදුවී තිබීම. දැඩි අකාර්යක්ෂමතාවක් තිබෙනවා. මෙහිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්; ශ්‍රී ලංකා රේගුව වෙන්න පුළුවන්; මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්; ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්; ලංකා විදුලිබල මණ්ඩලය වෙන්න පුළුවන්; Ceylon Petroleum Corporation එක වෙන්න පුළුවන්; LECO එක වෙන්න පුළුවන්, ඒ රාජ්‍ය ආයතනවල තිබෙන තොරතුරු අවශ්‍ය ප්‍රමාණයට, අවශ්‍ය නිසි ක්‍රමවේදයන්ට හුවමාරු කර ගැනීමේ හැකියාව - interoperability - අපි ලබා ගත යුතුයි. ඒ හරහා රාජ්‍යයට තමන්ගේ කටයුතු ඉතා පහසු වෙනවා. ඒ නිසා, මේ National Data and Identity Interoperability Platform කියන ව්‍යාපෘතිය සමස්ත ඩිජිටල්කරණ ක්‍රියාවලිය තුළ ඉක්මනින්, සාර්ථකව අවසන් කර ගැනීමට ශක්තිය ලැබෙන්න කියලා මා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම, ඒවායේ තිබුණු ගැටලු ගැන අපිට තිබෙන අත්දැකීම් හුවමාරු කර ගැනීමට අපි සතුටුයි.

මීට දශක ගණනාවකට කලින් මේ රටේ තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කරන්න, ඒ වාගේම රාජ්‍ය අංශය තුළ තොරතුරු තාක්ෂණය භාවිතය වැඩි දියුණු කරන්න ICTA එක පිහිටෙව්වා. හිටපු අමාත්‍ය ඉරාන් වික්‍රමරත්න මැතිතුමා එහි පළමු සභාපතිවරයා වුණා. පෞද්ගලික අංශයේ වාගේම ජාත්‍යන්තර අත්දැකීම් තිබෙන විද්වතෙක් වශයෙන් එතුමාව එහි සභාපතිවරයා වශයෙන් පත් කළා. එතුමා පුරෝගාමී සේවයක් කළාට පසුව, අනෙකුත් සභාපතිවරුත්, අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩලයත්, එහි කාර්ය මණ්ඩලයත් සැලකිය යුතු සේවයක් කරලා තිබෙනවා. නමුත්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ICTA එකේ ආකෘතිය අද කාලයට ගැළපෙන්නේ නැහැ. ICTA එක වෙනුවට අද කාලයට ගැළපෙන, අද අවශ්‍යතාවලට ගැළපෙන ආයතනයක් හෝ ආයතන කිහිපයක් පිහිටුවිය යුතුව තිබෙනවා. ICTA එක අවසන් කිරීම පිළිබඳව වෘත්තිකයන් අතර එකඟතාවක් තිබුණත්, විවිධ ප්‍රායෝගික හේතු මත, ICTA එක විධිමත් ලෙස ඇවර කරලා, ඉන්පසුව විකල්ප ආයතන ගොඩනැඟීම ප්‍රමාද වෙලා තිබෙනවා. මම සතුටු වෙනවා, ඒ ප්‍රතිපත්තිය තුළ මේ රජය ඉන්නවා කියලා මට ඊයේ දැන ගන්න ලැබුණා. නමුත්, ඒක ඉක්මනින් කරන්න. මොකද, ඒක අපේ රටට වැදගත්. මේ තිබෙන පරණ ක්‍රමවේදයෙන් අලුත් ක්‍රමවේදයකට මාරුවීම ඉතා වැදගත්. ඒ නිසා අවශ්‍ය නීතිමය සංශෝධනයක් කළ යුතුව තිබෙනවා. අලුත් නීති අරගෙන එන්න පුළුවන්. ඒවා එකකින් පසුව එකක් නොවෙයි, එකිනෙකට සමාන්තරව මේ කටයුතු කරන්න පුළුවන්. මොකද, නෛතික කටයුතු පිළිබඳව නෛතික පරිසරය සකස් කිරීමේ කටයුත්තත් තාක්ෂණික කාරණයක්. එකිනෙකට වෙනස් පිරිසක් කරන්නේ. ඒ නිසා ICTA එකේ කටයුතු විධිමත් ලෙස අවසන් කරලා, නවීන අවශ්‍යතාවන්ට ගැළපෙන ආයතන ගොඩනැඟීම කළ යුතුයි. එය මේ රටේ ඩිජිටල්කරණය පිළිබඳ මේ රජයේ දැක්ම සාර්ථක කර ගැනීමට ඉමහත් හේතුවක් වෙනවා. එය කඩිනම්ව සිදු කිරීම ඉතාම වැදගත්.

ඒ වාගේම, අපේ රටේ අධිකරණය තිබෙන තත්ත්වය ගැන අපි බොහෝ කනගාටු වෙනවා. මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය ගත්තාම අපට ලැබිලා තිබෙන නීති පද්ධතියේ උරුමය පිළිබඳව, අපේ ඉතිහාසය පිළිබඳව නීතිඥවරයෙක් වශයෙන් මම එක අතකින් සතුටු වෙනවා. යුක්තිය පසිඳලීම පිළිබඳව ලෝකයේ

බොහෝ රටවලට වඩා හොඳ ඉතිහාසයක් ඒ වාගේම ගුණාත්මකභාවය පිරිච්ච ඉතිහාසයක් අපට තිබෙනවා. හැබැයි අධිකරණ ක්ෂේත්‍රයේ නවීන තාක්ෂණය භාවිතය පිළිබඳව අපි ඉන්නේ ඉතාම පසුපසින්. අපේ ආසියානු කලාපයේ මලයාසියාව, සිංගප්පූරුව වාගේ අපි සමඟ සංසන්දනය කරන්න පුළුවන් රටවල, ඒ වාගේම තායිලන්තයේ පවා අද අධිකරණ ක්ෂේත්‍රයේ automation ඉතාම ඉහළින් සිද්ධ වෙලා තිබෙනවා. ඒවා සාර්ථකව ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒවා සාර්ථක වෙලා තිබෙනවා. ඒ හරහා යුක්තිය පසිඳලීමේ කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ ගිහිල්ලා, ප්‍රමාදය අතිශයින් අඩු වෙලා තිබෙනවා. මලයාසියාවේ මීට වසර 10කට කලින් මිනීමැරුම් නඩුවක් ඒ මිනීමැරුම සිදු වුණු දවසේ ඉඳලා විභාග කරලා අවසන් කරන්න වසර 10කට වැඩි කාලයක් ගත වුණා. එහි අපරාධ යුක්තිය පිළිබඳව automation හඳුන්වා දීමෙන් පස්සේ මිනීමැරුම් නඩුවක් සිදුවීම සිදු වූ දිනයේ සිට වසර එකහමාරක් තුළ අභියාචනා කටයුතුත් අවසන් කරන්න පුළුවන් මට්ටමකට ඒ කාර්යක්ෂමතාව දියුණු වෙලා තිබෙනවා. ඒ නඩු තීන්දු දෙන්නේ මිනිස්සු වුණාට, ඒ නඩු තීන්දු දීමට අවශ්‍ය කරන පරිසරය, අවශ්‍ය සාධක, සාක්ෂි කළමනාකරණය සහ සාක්ෂි ලබා ගැනීම වැනි කටයුතුවලට ඉතා පහසුවෙන් automation යොදාගන්න පුළුවන්. ඒ වාගේම අපරාධ නීතියටත්, සිවිල් නඩු කටයුතු ඇතුළු සියල්ලට එය යොදාගන්න පුළුවන්. මොකද, මේවා සාර්ථක වෙලා, අත්හදා බලලා, වැරදීම් සිදු වෙලා නැවත සකස් කරගෙන තිබෙන ක්ෂේත්‍ර.

ගරු නියෝජ්‍ය සභාපතිතුමීයනි, අපේ රටේ මේ court automation ව්‍යාපෘතිය ආරම්භ වෙලා දැන් සෑහෙන දවසක් වෙනවා. තැනින් තැන විවිධ අධිකරණවල ඉතාම සුළු මට්ටමින් මෙය ක්‍රියාත්මක වෙනවා. නමුත් මේක අත්හදා බලන්න කාලයක් නොවෙයි. මේ පිළිබඳව කටයුතු කරන්න අද තරුණ නීතිඥ මහත්ම මහත්මීන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට ඇතුළු වෙන්න සූදානම්. වැඩිහිටි අපිත් ඒ අභියෝගය භාරගන්න ලෑස්තියි. ඒ වාගේම, විනිශ්චයකාරවරුත් මේ අභියෝගය භාරගත යුතුයි. මේක court automation පිළිබඳව තිබෙන ඉතාම පරිණත මට්ටමට පත් වෙච්ච mature project එකක්. මෙයට ප්‍රමුඛත්වය ලබා දෙන්න. මෙය වසරක්, දෙකක් ඇතුළත අවසන් කරන්න පුළුවන්; ඉක්මනින් අවසන් කරන්න පුළුවන්. මේ සඳහා යන වියදම රටේ සාමාන්‍ය වියදමෙන් ඉතාම සුළු ප්‍රමාණයක් බව මම කියන්න ඕනෑ. ඒ නිසා කරුණාකරලා court automation සඳහා ප්‍රමුඛතාව ලබා දෙන්න. එය වැදගත් දෙයක්. එය හුදු අධිකරණ ක්ෂේත්‍රයට පමණක් නොවෙයි, රටේ ආර්ථිකය දියුණුවීමේදී ඒ රටේ අධිකරණ කටයුතුත් එයට බලපානවා. විශේෂයෙන්ම ගිවිසුමක් ක්‍රියාත්මක වීම පිළිබඳව ගැටලුවක් මතු වුණාම ඒ ගිවිසුම කොපමණ කාලයකින් අධිකරණය මඟින් ක්‍රියාත්මක කරවා ගැනීමට පුළුවන්ද කියන පරීක්ෂණය රටකට ආයෝජකයෙක් පැමිණීමට අතිශයින් වැදගත් වන දෙයක්. අපි හැම දාම මේ පරීක්ෂණයෙන් අසමත් වෙනවා. ඒකෙදි අපි බොහොම පිටුපසින් ඉන්නේ. ඒ නිසා මේ court automation කියන mature project එක කරුණාකරලා ඉක්මනින් ක්‍රියාත්මක කරන්න, ප්‍රමුඛතාවෙන් ක්‍රියාත්මක කරන්න. මෙවර අය වැය කථාවේදීම මේ සඳහා අවස්ථාව ලැබෙයි කියලා මම බලාපොරොත්තු වුණා. නමුත් මම පසුව දැනගත්තා, අනෙකුත් අරමුදල්වලින් මේක කරන්න පුළුවන් කියලා. එයට ප්‍රමුඛත්වය දෙන්න, ඒක මූලික දෙයක් වශයෙන් සලකන්න, ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ හෝ ඔබතුමාගේ අමාත්‍යාංශයේ project management unit එකක් ආරම්භ කරන්න. මෙය කළ යුතුයි; ඉක්මනින් කළ යුතුයි. මේක රටේ සමස්ත සංස්කෘතිය වෙනස් කිරීමට අවශ්‍ය දෙයක්. මේ රටේ යුක්තිය පසිඳලීම පිළිබඳව තිබෙන අවිශ්වාසය සත්‍ය අවිශ්වාසයක්. ප්‍රමාදය පිළිබඳ ප්‍රශ්නයත් බැරෑරුම් ප්‍රශ්නයක්. මේ සඳහා තිබෙන විසඳුම automation සිදු කිරීම. Automationවලට ගියාම ඉතුරු කාරණා, නීති ක්ෂේත්‍රයේ තිබෙන අනෙකුත් සංස්කෘතික කාරණා ඉතාම ඉක්මනින් වෙනස් වෙයි. එහෙම වෙනස් නොවුණු අයට ක්ෂේත්‍රයෙන් එළියට යන්න වෙනවා. ඒ නිසා මේ නවීකරණය වීම හැර වෙනත් තෝරා ගැනීමක් නැහැ. මේ court automation සඳහා ප්‍රමුඛතාව ලබාදෙන්න කියලා මම රජයට යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රටේ දුරකථන ක්ෂේත්‍රයේ, ඩිජිටල්කරණ ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව සාර්ථක වෙච්ච විද්වතෙක් වන ආචාර්ය හාන්ස් විජයසූරිය මහත්මයාට මේ පිළිබඳව නායකත්වයක් පවරලා තිබෙනවා කියලා අපි දන්නවා. අපි ඒ ගැන සතුටු වෙනවා. තාක්ෂණය පමණක් නොවෙයි, කළමනාකරණය දන්න කෙනෙක් මේ විෂය භාර ගැනීම වැදගත් දෙයක්. හැබැයි තවමත් ICTA ආයතනයේ ආකෘතිය සකස් වෙලා නැහැ. අමාත්‍යාංශයට තවමත් ස්ථිර ලේකම්වරයෙක් නැහැ. ඒ වාගේම හාන්ස් විජයසූරිය මහත්මයා ස්ථානගත වෙන්නේ කොතැනද කියලා මට නම් තවම පැහැදිලි නැහැ. එතුමා මේ රාජ්‍ය තේරාවලියේ ඉහළින්ම ඉන්න ඕනෑ. මේ විෂය භාර ඇමතිවරයෙක්ව සිටි නිසා මම දන්නවා, මේක අමාත්‍යාංශ ගණනාවක් අතර සිදු වෙන දෙයක් කියලා.

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට පමණක් මේ කටයුත්ත කරන්න බැහැ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය ආදී වශයෙන් අමාත්‍යාංශ සියල්ලේම වාගේ එකිනෙක හරහා යන විෂයයක් තමයි, මේ ඩිජිටල්කරණය. ඒ නිසා මේ ඩිජිටල්කරණය පිළිබඳ වගකීම දරන, නායකත්වය දෙන තැනැත්තා මේ රාජ්‍ය තේරාවලියේ ඉහළින්ම ස්ථානගත කරන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමා මගේ කථාව අහගෙන ඉන්නවා නම්, මම එතුමාට යෝජනා කරන්න කැමැතියි, හාන්ස් විජයසූරිය මහත්තයා උපදේශක මට්ටමෙන් ඔබ්බට ගෙනිහිල්ලා ස්ථානගත කරන්න කියලා. මොකද, ලෝකයේ ඩිජිටල්කරණය ඉක්මනින්ම සාර්ථක වෙච්ච සෑම රටකම එක්කෝ ජනාධිපතිවරයා මේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය මෙහෙයවුවා. එක්කෝ, අගමැතිවරයා මෙහෙයවුවා. එහෙම නැත්නම් ඒ හා සමාන කෙනෙක් - ජනාධිපති හෝ රටේ රාජ්‍ය නායකයා ආසන්නයෙන්ම ඉන්න කෙනෙක් - තමයි මේ ඩිජිටල්කරණ විප්ලවය මෙහෙයවුයේ. ඒ නිසා තවමත් මේ ස්ථානගත නොවීම මම දකින්නේ අඩුපාඩුවක් හැටියටයි. ඒක විසඳාගත හැකි අඩුපාඩුවක්; දින කිහිපයකින්, සති කිහිපයකින් විසඳාගත හැකි අඩුපාඩුවක්. අමාත්‍යාංශයේ ඒ අදාළ පත්වීම් සහ විජයසූරිය මහත්තයා ස්ථානගත කිරීම හරියට කර ගන්න. ඒක අවශ්‍යයි. මොකද, අභියෝග එන්නේ දැන් නොවෙයි. අභියෝග එන්නේ ඔබතුමා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ ගනුදෙනු කරද්දීයි. "ඔයගොල්ලන් කවුද, අපට කියන්න? අපේ අමාත්‍යාංශය වෙන එකක්" කියලා අහනකොට ඊට ඉහළින් කෙනෙක් ඉන්න ඕනෑ. මට ඒ අත්දැකීම තිබෙනවා. ඒ වාගේම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අපේ තොරතුරු හුවමාරු කර ගන්න බැහැ කියනකොට, මැතිවරණ දෙපාර්තමේන්තුව අපේ තොරතුරු හුවමාරු කර ගැනීමේ දුෂ්කරතා ගැන කථා කරනකොට, මුදල් අමාත්‍යාංශය තොරතුරු හුවමාරු කර ගැනීම ප්‍රතික්ෂේප කරනකොට, මහ බැංකුව ඔවුන්ගේ පද්ධති ගැන ප්‍රවේශය ලබා දෙන්න බැහැයි කියනකොට, ඩිජිටල්කරණය පිළිබඳ නායකත්වය ලබා දෙන තැනැත්තා ඊට ඉහළින් ඉන්න ඕනෑ. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳා ගැනීමට මේ පරිපාලන ව්‍යුහය ස්ථානගත කිරීම වැදගත් වනවා. ඒ සඳහා නීතියක් සම්මත කරන්න ඕනෑ නම් විපක්ෂය හැටියට අපි සූදානම්, ඒ අවශ්‍ය සහයෝගය ලබා දෙන්න. මොකද, දැනට තිබෙන structure එක මේ වැඩේට ප්‍රමාණවත් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම වැදගත් වන තව ක්ෂේත්‍රයක් තිබෙනවා. අපේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ආර්ථිකය ඩොලර් බිලියන 3.4ක් විතර කියලා අපට දැනගන්න ලැබුණා. ඇත්ත වශයෙන්ම මෙහි වටිනාකම ඊට වඩා වැඩියි. ආර්ථික අර්බුදයක් පැවති පසුගිය කාලයේ මේ රටේ ආර්ථිකය නොමැරී පැවතුණේ මේ අපට නොපෙනන, ගිණුම්වල නොමැති අපේ රටේ දස දහස් ගණනක් විද්වත් වෘත්තිකයන්, තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් උපයන මුදලත් එක්කයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය වාගේ කාන්තාවන් විශාල පිරිසක් මේ ක්ෂේත්‍රයේ ඉන්නවා. නමුත් සාපේක්ෂව ගත්තොත්, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ සහභාගිත්වය අඩුයි. ඒ ක්ෂේත්‍රයට අදාළ දුෂ්කරතා එක්කයි මේ තත්ත්වය මතු වෙලා තිබෙන්නේ. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සිටින කාන්තාවන්ගේ ආරක්ෂාවට, ඒ වාගේම කාන්තාවන් තුළ තොරතුරු තාක්ෂණ දැනුම ප්‍රවර්ධනය කිරීමට, ඒ වාගේම ඔවුන්ගේ වෘත්තීය නිපුණතා ඉහළ නැංවීමට "Women in Digital" යනුවෙන් ඩිජිටල් ක්ෂේත්‍රයේ සිටින කාන්තාවන්ගේ වෘත්තීමයභාවය වැඩිදියුණු කිරීම සඳහා යම් සංවිධානගත ව්‍යුහයක් කලින් තිබුණා. දැන් ඒක අකර්මණ්‍ය වෙලා තිබෙනවා. එය නැවත පිනිටුවන්න කියා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට ලැබී තිබෙන සීමිත කාලය අවසන් නිසා මගේ කථාව අවසන් කරනවා. අවසාන වශයෙන්, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවශ්‍ය සෑම සහයක්ම රජයට ලබා දීමට අපේ පක්ෂය සූදානම් බව ප්‍රකාශ කරමින් මා නතර වෙනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.25]

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විද්‍යාව හා තාක්ෂණය පිළිබඳව කථා කරන්න අද මම බලාපොරොත්තු වෙනවා. අපි අසා තිබෙනවා කියමනක්, "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී" කියලා. එය කුමාරතුංග මුනිදාස ශූරීන් කියපු අදහසක්. අපි දන්නවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන තේමාවෙන් යුතුව යන මේ ගමනේදී, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන විධියට අපට ඉතාම වැදගත් දෙයක් තමයි, research and development කියන එක. ඉතින් ඒකේදි මුලින්ම කථා කරන්න වෙනවා, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව. මීට කලින් කථා කළ අපේ සහෝදර මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා. එදාත් මේ සම්බන්ධයෙන් කෙනෙක් ප්‍රශ්නයක් මතු කරපු නිසා එදාත් මම ඒකට උත්තරය දුන්නා. අපේ ව්‍යවසායකයන් ගැන කථා කරපු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. නමුත් එතුමා කිව්වා, අය වැය කථාව තුළ බොහොම පොඩි කාරණා ටිකක් පමණයි තිබෙන්නේ කියලා. ඒ වාගේම එතුමා කිව්වා, නව ව්‍යවසායකයන් වෙනුවෙන් රුපියල් මිලියන 1,000ක් තමයි වෙන් කරලා තිබෙන්නේ කියලා. මේ අය වැය කථාව තුළ ඒ සමස්තය නැහැ. ඒක එදාත් මම පැහැදිලි කළා. අය වැය කථාවේ තිබෙන්නේ, නවෝත්පාදන සහ නව නිපැයුම් අරමුදලක් නිර්මාණය කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට යෝජනා කරන බව. නමුත් ඒක නොවෙයි, සමස්තය.

මම හිතන විධියට, ඉතිහාසයේ වැඩිම මුදලක් පර්යේෂණ සඳහා වෙන් කර තිබෙන්නේ මෙවරයි. ඒ අනුව, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා රුපියල් බිලියන 20.9ක් වෙන් කරලා තිබෙනවා. ඒ මුදල් වියදම් වන ආකාරයත් වෙන වෙනම සඳහන් කරලා තිබෙනවා.

අපි මේ අය වැය සකස් කරන්න ඉස්සෙල්ලා R&D සඳහා වියදම් කරලා තිබුණේ කොයි විධියටද? දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 0.12ක් තමයි ඒ සඳහා වැය කරලා තිබුණේ. විපක්ෂයෙන්ම ඒ සම්බන්ධ දත්ත කියලා තිබුණා; ජපානයේ සියයට 3.6ක්, දකුණු කොරියාවේ සියයට 4.6ක්, ඒ විතරක් නොවෙයි, තායිලන්තය වාගේ රටකුත් සියයට 1.2ක් වෙන් කරලා තිබෙනවා කියලා කිව්වා. අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කළ යුතුය කියන තැන අපිත් හිටියා. අපි පියවරෙන් පියවර එතැනට යනවා. විද්‍යා හා තාක්ෂණ විෂයය සම්බන්ධ පර්යේෂණ සඳහා වන ඉලක්කයටත් අපි පියවරෙන් පියවර යනවා. ඒකේ පෙර ලකුණු තමයි මෙවර අය වැය යෝජනා තුළ තිබෙන්නේ.

නව නිපැයුම් ගැන කථා කරනකොට, ඒ සම්බන්ධව විශේෂ ආයතන දෙකක් තිබෙනවා. ඒ තමයි, NSF එක සහ NRC එක. එම ආයතන දෙකෙන් grants ලබා දෙනවා, පර්යේෂණ සිදු වෙනවා. ඒ කටයුතු තවදුරටත් ඉදිරියට ගෙනිහිල්ලා PhD එකක් කරන්න, MPhil එකක් කරන්න දෙන grants වැඩි කරන්න ඕනෑ. පසුගිය කාලයේ එහෙම grants දෙනකොට යම් යම් අඩු පාඩු තිබුණා කියලා කථා වුණා. අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේදී විශේෂයෙන් ස්තුතිවන්ත වුණා, ඒ සඳහා මෙවර වැඩි මුදලක් වෙන් කිරීම ගැන. ඒ වාගේම තිබුණු අවිධිමත්භාවය, මේවා සුළු පිරිසක් අතර බෙදියෑම සහ මේ ආයතන දෙක අතර කටයුතු overlap වෙනවාද කියන කාරණා ගැනත් එහිදී කථා කළා. ඒකෙන් තව අලුත් අදහස් ආවා. ඒ වාගේම අපි මේ සම්බන්ධව යම් සැලසුම් සකස් කරලා තිබෙනවා.

පර්යේෂණ කරනකොට නොයෙක් උපකරණ පාවිච්චි වෙනවා. ඒ උපකරණ මිල අධිකයි. සමහර වෙලාවට එක විශ්වවිද්‍යාලයකට යම් ආයතනයකින් උපකරණයක් දෙනවා. ඒ විශ්වවිද්‍යාලයටම තව ආයතනයකින් එම උපකරණයම දෙනවා. එම නිසා අපි ඒවා ගැනත් සුපරීක්ෂාකාරීව බලන්න ඕනෑ. ඒ වාගේම උපකරණ තිබෙන, ඒ සම්බන්ධව පුහුණු තාක්ෂණවේදීන් ඉන්න, ආචාර්යවරුන් ඉන්න පර්යේෂණ ආයතනයක් කොළඹ කේන්ද්‍ර කරගෙන පිහිටුවීම ගැනත් අපි හිතනවා. එතකොට යාපනයේ ඉඳන් ආවත්, බදුල්ලේ ඉඳන් ආවත්, දකුණු පළාතේ ඉඳන් ආවත්, කොතරම් ඈත පළාතක ඉඳන් ආවත් අවශ්‍ය නේවාසික පහසුකම් ලබා දෙන්න අපට හැකිවනවා. ඒ සඳහා වෙනම restroom අවශ්‍ය වනවා.

ඊළඟට, මෙතෙක් කරපු පර්යේෂණවලින් කොපමණ ප්‍රමාණයක් වාණිජකරණය වුණාද, ඒවා ඵලදායී වුණාද, ඒවා මේ රටට වැදගත් වුණාද කියා සොයා බලන්න ඕනෑ. ඒක තමයි විශේෂම කාරණය. එලෙසින් වැදගත් වුණා නම්, අපට අපේ ජාතික ධනය ගොඩක්දුරට ඉතිරි කරගන්න පුළුවන් වෙනවා. මොකද, හැම ක්ෂේත්‍රයක් මීට සම්බන්ධ වනවා. විශේෂයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රය ගත්තාම, විවිධ භෝග වර්ග තිබෙන බව අපි දන්නවා. අපි උදාහරණයක් ගනිමුකෝ. දැන් වී ගැන කථා වුණා නේ. අපි සුළු අපනයන භෝගයක් ගැන සිතමු. අපි ගම්මිරිස් ගැන බැලුවොත්, ගොඩක් වෙලාවට ගම්මිරිස් අස්වැන්න ලැබෙන්න ගත වෙන්නේ අවුරුද්දයි. නමුත් දැන් ගොඩක් තැන්වල අවුරුදු එකහමාර, අවුරුදු දෙක මේ සඳහා ගත වෙනවා. එතකොට ඉක්මනින් අස්වැන්න ලබා දෙන ප්‍රභේදය මොකක්ද කියලා සොයා ගන්න පර්යේෂණ කරන්න ඕනෑ. සමහර ප්‍රදේශවල

ගම්මිරිස් වගාවට දිලීර රෝගවලින් හානි සිදුවනවා. එවැනි දිලීර රෝගවලට ඔරොත්තු දෙන ප්‍රභේදය මොකක්ද, ඒ ඒ ප්‍රදේශවලට ඔරොත්තු දෙන ප්‍රභේදය මොකක්ද කියා සොයා බැලීමටත් පර්යේෂණ කරන්න වෙනවා.

ඒ වාගේම සතුන්ගෙන් වන හානි සම්බන්ධයෙනුත් කථා වුණා. අලින්ගෙන් සිදුවන හානි, රිළවුන්ගෙන් සිදුවන හානි සම්බන්ධයෙන් දැනටමත් පර්යේෂණ කරලා තිබෙනවා. ඒ හානි වැළැක්වීමට යොදාගත හැකි සමහර උපකරණත් නිපදවා තිබෙනවා. ඉතින්, මේවා ඉදිරියට නොගෙනාවේ ඇයි? ඒ වාගේම නිපදවන දේවල් වාණිජකරණය නොවුණේ ඇයි? පසුගිය කාලයේ කරපු research ගැන වෙනම පසුවිපරමක් කරන්න ඕනෑ. ඒවා කොයි තරම් ඵලදායී වුණාද, ඒවා වාණිජ වශයෙන් කොයි තරම් වැදගත් වුණාද, රටට වැදගත් වුණාද කියා සොයා බලන්න ඕනෑ. ඵලදායී දේවල් තිබිලාත් ඒවා ඉදිරියට ගියේ නැත්නම්, ව්‍යවසායකයන්ට ඒවා ඉදිරියට ගන්න බැරි වුණා නම්, ඒකට තිබුණු බාධා මොනවාද කියලා අපි හඳුනාගන්න ඕනෑ. ඒක තමයි මේ රජයේ වැඩ පිළිවෙළ. අපි කරන ගොඩක් දේවල් බොහෝ අයට හිතාගන්න බැහැ. දැන් මේ රටට එන සංචාරකයින් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන් ජනවාරි මාසයේදී සංචාරකයින්ගේ පැමිණීම ඉහළ අගයක් ගත්තා. ඒ වාගේම අපේ අපනයන ආදායමත් දැන් ඉහළ යමින් තිබෙනවා. අපට නොපෙනුණත්, මේ විධියට හැම පැත්තකින්ම අපි ඉදිරියට යනවා. ඉතින්, ඒ වාගේම මේ ක්ෂේත්‍රයෙනුත් අපි ඉදිරියට යනවා.

ඒ වාගේම සමහර අය අහනවා, දැන් තුනෙන් දෙක තිබෙනවාද කියලා. අපි දැක්කා, පසුගිය EDCS මැතිවරණයේදී තුනෙන් දෙකත් නොවෙයි, හතරෙන් තුනත් නොවෙයි, හයෙන් පහත් නොවෙයි, විසිපහෙන් විසිහතරක් ලැබුණු ආකාරය. ගණන් හදලා බලන්න, විසිපහෙන් විසිහතරක් ලැබුණා. ඒ විශ්වාසය තුළ තමයි මේ කටයුතු අපි ඉදිරියට ගෙන යන්නේ.

නව සොයා ගැනීම් ගැන කථා කරද්දි පේටන්ට් බලපත්‍ර ගැන බැලුවොත්, 2020 වර්ෂයේදී පේටන්ට් බලපත්‍ර 272ක් අරගෙන තිබෙනවා.

ඒවායින් 223ක් වඩා වැදගත්, අනේවාසික. 2021දී 194ක්; 2022දී 190ක්; 2023දී 199ක් සහ 2024දී 187ක්. මේවායින් 147ක් අනේවාසික. ඒ පේටන්ට් බලපත්‍රලාභීන්ට තමන්ගේ බලපත්‍රය වාණිජමය වශයෙන් වඩා වැදගත් තැනකට ගන්න පුළුවන්ද කියන එක තමයි ඊළඟ කාරණය. ඒ වාගේම ඒ සියලු කාරණා සඳහා රජයක් හැටියට අපි උදවු කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මම කෘෂි ක්ෂේත්‍රය ගැන කිව්වා. ඒ වාගේම දැන් සූර්ය විදුලිය ගැන කථා කළා. මේ ගරු සභාවේදී බොහෝ මන්ත්‍රීවරු අදහස් දැක්වූවා, smart grid සහ smart meters ගැන. ඒ සම්බන්ධයෙනුත් පර්යේෂණ කරන්නට ඕනෑ. Smart grid සහ smart meters හඳුන්වා දෙන්නට ඕනෑ. එතකොට තමයි අපේ නිවෙස්වල වහල මත තිබෙන සූර්ය පැනලයෙන් ලැබෙන සූර්ය විදුලිය control room එකෙන් පෙනෙන්නේ. ඒවා දියුණු කර ගන්නට ඕනෑ. ඒ වාගේම සූර්ය පැනල නිෂ්පාදනය කරන එකත් දේශීයව කිරීමට උත්සාහ කරන්න ඕනෑ. මේ සියලු දේවල් සඳහා AI තාක්ෂණය යොදා ගන්න ඕනෑ. අපි සූර්ය විදුලිය ගැන විශ්වාසය තැබුවාට, එකවර වලාකුළක් ආවොත් එය විදුලිය නිෂ්පාදනයට බලපානවා. ඒ වාගේ දේවල්වලට AI තාක්ෂණය යොදා ගන්නට ඕනෑ.

කෘෂි කාර්මික ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි. ඊළඟට, වාහන හැසිරවීම ගත්තොත්, පැරණි colour lightsවලටත් AI තාක්ෂණය යොදා ගන්නට ඕනෑ. අන්න එතැනට තමයි අපි යන්න ඕනෑ. වනඅලි ගැටලුව සම්බන්ධයෙනුත් ඒ කියන කාරණාවම අදාළ වෙනවා. ඒ වාගේම අපට දැනටත් අදහස් ඉදිරිපත් වෙනවා, නිවාස හදනකොටත් අපි AI තාක්ෂණය භාවිත කරන්නට ඕනෑ කියලා. අපි වතු නිවාස 5,000ක් හදන්න යනවා. අපි වතු නිවාස 5,000ක් හදනකොට සිමෙන්ති කොට්ට 20,000ක් ඉතුරු කර ගන්න පුළුවන්, compacted soil යොදා ගත්තා නම්. ඒ කියන්නේ සිමෙන්ති වෙනුවට බ්ලොක් ගල්, ගඩොල් වෙනුවට compacted soil යොදා ගන්නට පුළුවන්. ඒ වාගේ පර්යේෂණ මේ රටේ සිදු වෙනවා. ඒවා ඉදිරියටත් සිදු කරලා ඒවාට අත දෙන්නට ඕනෑ. රජයක් ලෙස ඒ අත දීම කරන්න ඕනෑ. ඔන්න ඔය කාරණා විශේෂයි.

ඒ වාගේම නොයෙකුත් පර්යේෂණ කටයුතු සඳහා grants ලබා දෙන්න ඕනෑ. එමෙන්ම අපි මොන තත්ත්වයේ සිටියත් h-index එක බලලා අපි ඒවා rank කරන්න ඕනෑ. ඒවා සම්බන්ධයෙන් ඇගැයීම් කරන්න ඕනෑ. ඒ වාගේ අපට ඵලදායී දේවල් ලැබෙනකොට ඒවා සම්බන්ධයෙන් ඇගැයීම් කරන්න ඕනෑ. අන්න ඒක තමයි මේ නව රජයේ දැක්ම. ඉතින්, ඕනෑ කෙනෙකුට අර විධියට කියන්න පුළුවන්. අපි "ඇන්ටිජන්" කථාව ගත්තොත්, ඇන්ටිජන් වුණත් දේශීයව නිෂ්පාදනය කරන්න පුළුවන් මට්ටමට අපට එන්න තිබුණා. ඒකයි ව්‍යවසායකත්වය කියන්නේ. ඒ තැනට තමයි අපි එන්න ඕනෑ. ඒ තැනට තමයි නවෝත්පාදනය එන්න ඕනෑ. ඒ සඳහා තමයි මෙච්චර මුදලක් වැය කරන්න ඕනෑ. මීට කලින් කිව්වා, මේවා සඳහා මුදල් වෙන් කරනවා කියලා. හැබැයි, ඒ මුදල් ඉතුරු වෙනවා. ඒ නිසා මම කියනවා, විද්‍යාව හා තාක්ෂණය තමයි රටක ඉදිරි පැවැත්ම තීරණය කරන්නේ කියලා. ඒ යටතේ අපි පාසල්වලට ගිහිල්ලා, පාසල්වලත් විවිධ නවෝත්පාදන සම්බන්ධයෙන් විවිධ සංගම් ඇති කරලා, දරුවන් තුළ අධ්‍යාපනයේදී කළ යුතු වෙනස්කම් කරන්න ඕනෑ. අපි නිෂ්පාදන ආර්ථිකයකට යනවා නම් දරුවා නිර්මාණශීලී දේවල් කරන්න ඕනෑ කියන කාරණය ඒ දරුවාගේ මනස තුළම තියන්න ඕනෑ. ශිෂ්‍යත්ව විභාගය වාගේ විභාගවලට එන කමත් භාෂාව, රජවරුන්ගේ නම් වාගේ කාරණාවලින් එහාට ගිහිල්ලා දරුවන් තුළත් අලුත් විධියට හිතලා අලුත් දේවල් හදන මානසිකත්වය ඇති කරන්න ඕනෑ. ඒක තමයි මේ රටේ අද සිද්ධවෙලා තිබෙන වෙනස. ඒක තමයි system change එක. අන්න ඒක තමයි අද දවසේ විශේෂයෙන්ම අපි මේ ගරු සභාවේදී කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඒ වෙනුවෙන් තමයි මේ අය වැය තුළින් විද්‍යාව හා තාක්ෂණය පැත්තෙන් අපි අලුත් යෝජනා ගෙනැල්ලා තිබෙන්නේ. ගොඩක් අදහස් ඉදිරිපත් වුණු නිසා සහ මට ලැබුණෙත් කෙටි කාලයක් නිසා මම ඩිජිටල්කරණය ගැන කථා කළේ නැහැ. ඒ වෙනුවෙන් තමයි අපි මේ ශක්තිය යොදවන්නේ කියන කාරණයත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.35]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඇත්තවශයෙන්ම බරපතළ කාරණාවක් පිළිබඳවයි මම කරුණු එළිදක්වන්නට බලාපොරොත්තු වන්නේ. වාර්තා වුණු ආකාරයට, ඊයේ රාත්‍රියේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අනුරාධපුර ශික්ෂණ රෝහලේ රෝහල් පරිශ්‍රය තුළදී වෛද්‍යවරියක් බරපතළ හිංසනයට ලක්වෙලා තිබෙනවා. මේක සිද්ධවෙලා තිබෙන්නේ ඊයේ දිනයේ ඇමතුම් රාජකාරි කටයුතු සිදු කරන අතරතුර. ඒ කියන්නේ, on-call duty කරන අවස්ථාවේ. ඒක සිදුවෙලා තිබෙන්නේ එතුමිය තම ඇමතුම් රාජකාරි කාමරයට - on-call room එකට - යන අතරතුර. බාහිර පුද්ගලයෙක් ඒ වෛද්‍යවරියට පිහියක් පෙන්වලා, බියගන්වලා, ගැට ගසලා ඇමතුම් කාර්යාලය තුළදී බරපතළ ලිංගික හිංසනයකට ලක් කර තිබෙනවා. විශේෂයෙන්ම මේ වාගේ සිද්ධියක් අපේ රටේ රෝහල් පද්ධතිය තුළ සිදුවෙලා තිබෙනවාය කියලා අපි නම් මෑත කාලයේදී අහලා නැහැ.

අනුරාධපුර ශික්ෂණ රෝහල කියන්නේ විශාල පිරිසක් ගැවසෙන ස්ථානයක් වාගේම මෙරට තිබෙන විශාලතම රෝහලක්. මෙම සිද්ධියට මේ වෛද්‍යාචාර්යතුමිය මුහුණ දෙන්නේ රාජකාරිය සිදු කරන අතරතුර. එවන් ස්ථානයකදී බාහිර පුද්ගලයෙකු මෙවන් අපරාධයක් සිදු කිරීම ඇත්ත වශයෙන්ම බරපතළ තත්ත්වයක්. මේ තත්ත්වය යටතේ අපේ රටේ රෝහල් පද්ධතිය තුළ වෛද්‍යවරියන්ගේ ආරක්ෂාව පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් උද්ගතවෙලා තිබෙනවා.

අනුරාධපුර ශික්ෂණ රෝහල තුළ තරමිවත් ආරක්ෂාවක් නැති රෝහල් සිය ගණනක් අපේ රටේ තිබෙනවා. මේ වාගේ තත්ත්වයන් තුළ අපේ රටේ වෛද්‍යවරියන් විශාල ප්‍රමාණයක් දැඩි කම්පනයකට, භීතියකට සහ තිගැස්මකට ලක් වෙලා සිටිනවා. අපි දැක්කා, පසුගිය කාල වකවානු පුරාවට වෛද්‍යවරුන්, වෛද්‍යවරියන් ඇතුළුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බොහෝ දෙනෙකුට විරුද්ධව සංවිධානාත්මක උසිගැන්වීම් සිදු වුණු ආකාරය. ප්‍රකෝපකාරී ක්‍රියා සිදු වුණා. වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඒ තර්ජනවලටත් මුහුණ දෙන්න සිදු වෙලා. ඇත්ත වශයෙන්ම වර්තමානයේ සිදු වුණු මේ සිදුවීම - විශේෂයෙන්ම ඒ වෛද්‍යවරියට සිදු වුණු හිංසනය - අපි තරයේ හෙළා දකිනවා. ඒ විතරක් නොවෙයි. ජනතාවගේ ආරක්ෂාව හා ජාතික ආරක්ෂාව ගැන කථා කරනකොට හැම තිස්සේම විහිළු කරනවා. අපි දැක්කා, ඒවා කාටූන්වලත් සඳහන් කරලා තිබෙනවා. නමුත්, මේක කාටූන් එකක් නොවෙයි. ඒ වෛද්‍යවරියට සිදු වුණු බරපතළ ලිංගික හිංසනය තුළ රාජ්‍ය සේවයේ නිරත වී සිටින නිලධාරිනියන්ට තමන්ගේ සේවාව ඉෂ්ට කිරීමේ කර්තව්‍යය අද අපහසු තත්ත්වයට පත් වෙලා.

ඒ වාගේම සැබැවින්ම ජාතික ආරක්ෂාව, ජනතාවගේ ආරක්ෂාව පිළිබඳව අද බරපතළ ගැටලුවක් උද්ගත වෙලා තිබෙනවා. විශේෂයෙන් අපි දැනගන්නට ඕනෑ, වෛද්‍යවරියක් මේ වාගේ බරපතළ ලිංගික අතවරයකට, හිංසනයකට ලක් වුණු කාරණාව ගැන රජය දන්නවාද, ඒ ගැන දැනගත්තේ කොයි වෙලාවේද, විශේෂයෙන්ම ඒ පිළිබඳව ගන්නා පියවර මොකක්ද කියලා. මොකද, අපි පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. වෛද්‍යවරියන් ඇතුළු ව්‍යාත්තීය ක්ෂේත්‍රයේ නිරත වී සිටින සමස්ත කාන්තාවන්ට මුහුණ දෙන්න සිදු වී තිබෙන මේ ගැටලු පිළිබඳව දින කිහිපයකට පෙර ජාත්‍යන්තර කාන්තා දිනයේදී හැමෝම කථා කළා. උත්සවත් පැවැත්වුවා; ප්‍රිය සම්භාෂණත් පැවැත්වුවා. නමුත් අවසානයේ මේ වාගේ සිද්ධියක් වීම තුළ රටේ කාන්තාව අසරණයි. මටත් දුවෙක් ඉන්නවා. මේ සභාවේ සියලුදෙනාටම මේ සිදු වුණු සිද්ධිය පිළිබඳව බරපතළ හැඟීමක් තිබෙනවා. නමුත්, හැඟීම් තිබුණාට මදි. මේ රටේ වෛද්‍යවරියන් ඇතුළු කාන්තා පාර්ශ්වය සුරකින්නට, ආරක්ෂා කරන්නට, ඔවුන්ට රැකවරණය ලබා දෙන්නට අපි මීට වඩා වැඩි කාර්යභාරයක් ඉෂ්ට කරන්නට ඕනෑ. විශේෂයෙන් මම රජයෙන් දැනගන්න කැමැතියි, මේ සිද්ධිය සම්බන්ධයෙන් රජය ගන්නා වූ පියවර මොනවාද කියලා. ඒ වාගේම වෛද්‍යවරියන්, රෝහල් කාර්ය මණ්ඩලවල නිරත වෙලා ඉන්න නිලධාරින් ඇතුළු රාජ්‍ය ක්ෂේත්‍රයේත්, රාජ්‍ය නොවන ක්ෂේත්‍රයේත් සේවයේ නිරත වෙලා ඉන්න කාන්තාවන්ට ලබා දෙන රැකවරණය - ආරක්ෂාව - මොකක්ද? මේවාට වග කියන්නේ කවුද? මොකද, මේක රාජකාරී ස්ථානයක සිදු වුණු මිලේච්ඡ ක්‍රියාවක්. ඒ නිසා මේ පිළිබඳව දැඩි පියවර ගන්න කියලා රජයට අපි ප්‍රකාශ කර සිටිනවා. මේ මිලේච්ඡ, තිරිසන්, නිහීන ක්‍රියා කරන අයට දැඩි දඬුවම් පමුණුවන්න දැඩි නීති-රීති ගෙන එන්නටත් අපේ සහයෝගය ලබා දෙන්න සූදානම්. විශේෂයෙන්ම මේ සභාවට ඇවිල්ලා මේ සිද්ධිය පිළිබඳව වාර්තා කරලා, ඒ කරුණු - කාරණා හෙළිදරව් කිරීම රජය සතු යුතුකමක්. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.41]

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අනෙක් අමාත්‍යාංශවලට වඩා දීර්ඝ කාලයක පටන් අඛණ්ඩව, අවිච්ඡින්නව මේ විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයට ක්‍රියාත්මක වෙන්න බැරි වෙලා තිබුණා. එක්තරා අවධියකදී මේ අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙනවා; නැවත මෙම අමාත්‍යාංශය අහෝසි වෙනවා; නැවත මේ අමාත්‍යාංශයේ නම් වෙනස් වෙමින්, විවිධ නම් මේකට එකතු වෙමින් ඇවිත්, 2022 වර්ෂය වන විට මෙම අමාත්‍යාංශය සම්පූර්ණයෙන්ම නතර වෙලා තිබුණා.

2005 වර්ෂයෙන් පසුව 2006, 2007 වර්ෂ වන විට විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය කැබිනට් අමාත්‍යාංශවලින් ඉවත් වෙනවා. 2012, 2013 වර්ෂ වන විට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විධියට මෙය එකතු වෙනවා. 2016 වන විට "තාක්ෂණ" කියන කොටස ගැලවිලා, "විද්‍යා හා පර්යේෂණ අමාත්‍යාංශය" විධියට වෙනම නමකින් හඳුන්වනවා. 2019 වන විට නැවත "විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය" හැටියට කැබිනට් නොවන අමාත්‍යවරයකු යටතට පත් වෙනවා. 2022 වන විට නැවත මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක වීමක් නැහැ. එහෙම නම් වරින් වර අමාත්‍යාංශයේ තිබුණු අඛණ්ඩ, අවිච්ඡින්න පැවැත්ම තුළම ඒ අමාත්‍යාංශ අනෙක් අමාත්‍යාංශ වාගේ සංවර්ධනය වෙමින් ඉදිරියට යන ස්වභාවයක් අපට දකින්න ලැබෙන්නේ නැහැ. නව ආණ්ඩුවේ ගරු වෛද්‍ය ක්‍රිෂාන්ත අබේසේන අමාත්‍යවරයා බාර ගත්තේ එවැනි තත්ත්වයක් යටතේ තිබුණු අමාත්‍යාංශයක්. දැන් අපි බලමු, මෙහෙම වෙන්නේ ඇයි කියලා. මේක නිකම්ම අහේතුකව වෙන දෙයක් නොවෙයි.

මම පාසල් යන අවධියේදී අපේ පාසලේ ලාංඡනය තුළ තිබුණා, හොඳ උද්ධෘත පාඨයක් "විද්‍යා දදාති විනයං" කියලා - විද්‍යාවෙන් තමයි විනය දිවුලන්නේ. එහෙම නම් මේ විද්‍යාව තුළින් විශාල හැකියාවක් තිබෙනවා විනය ඇති කරන්න. හැබැයි, මේ විද්‍යාවේ තිබෙන අනෙක් පැත්ත තමයි මිථ්‍යාව. මේ මිථ්‍යාව ඉතිහාසය තුළ ක්‍රියාත්මක වෙන්නේ ජනතාවගේ නොදන්නාකම නිසා, ජනතාව භීතියට පත් වුණු නිසා. මේ විධියට මිථ්‍යාවෙන් පෙළෙන ජනතාවක් ක්‍රමානුකූලව, විද්‍යානුකූලව හිතන්න පුරුදු වෙනවා. හැබැයි, අද වන විට මේ මිථ්‍යාව ක්‍රියාත්මක වෙන්නේ සුළුතරයක් අතේ, ජනතාව රවටිටාගෙන ක්‍රියාත්මක වීමක් තුළ. ඒ

නිසා අපි දකිනවා, 2005 වර්ෂයෙන් පසුව ක්‍රමානුකූලව විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ තිබෙන විෂය පථයන් ගලවමින්, නම් වෙනස් කරමින්, අක්‍රිය කරමින් ආපු දුර කියන්නේ, ඒ ඒ අමාත්‍යාංශයේ අවශ්‍යතා මත, ඒ ඇමතිවරුන්ගේ ප්‍රබලතාව මත මෙවැනි අමාත්‍යාංශයක් අහෝසි කරන්න තිබෙන වුවමනාවයි. එහෙම වෙන්නේ ඇයි?

ඒ ඒ අමාත්‍යාංශවල විෂය පථය තුළදී, ඒ ඒ අමාත්‍යාංශවල සිටින විද්වතුන්, ඒ සම්බන්ධව ඉන්න මහාචාර්යවරු මැදිහත් වෙලා ඒ අමාත්‍යාංශයට දැවැන්ත සේවාවක් ඉෂ්ට කරනවා. හැබැයි, මේ අමාත්‍යාංශය තුළ විෂය පථය හැදිලා තිබෙන්නේ, ඒ අමාත්‍යාංශය ඉස්සරහට යාම වෙනුවෙන්. හැබැයි, සමස්ත ජාතික ප්‍රතිපත්තියක් අනුව අපි වැඩ කරද්දී, මේ තුළින් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. අපි හිතමු, කෘෂිකර්ම අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශයත් එක්ක බද්ධ වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ තාක්ෂණය සම්බන්ධ ගැටලුවකදී, මිලදී ගැනීමක් සම්බන්ධ ගැටලුවකදී, කෘෂිකර්ම යෙදවීමක් සම්බන්ධ ගැටලුවකදී එම අමාත්‍යාංශ තුළින් පමණක් තීන්දු තීරණ අරගෙන මේක බේරා ගන්න අමාරුයි. අන්න ඒ වුවමනාව මත සියලු ආයතන රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුව ක්‍රියාත්මක වෙන්න, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය ඉතා ඉහළ ක්‍රියාවලියක් ඉෂ්ට කරනවා. එසේ කටයුතු කරද්දී යම්කිසි අවධියකදී මේ ආකාරයට මධ්‍යගත ස්වභාවයකින් අමාත්‍යාංශ ක්‍රියාත්මක කරන එක ඒ ඒ අමාත්‍යාංශවල ඉන්න ප්‍රබල ඇමතිවරුන්ට බාධාවක් වෙලා තිබුණා. ඔවුන්ට ඒ අමාත්‍යාංශ තුළ තනිවම නිතුවක්කාර ලෙස තීන්දු තීරණ ගැනීමේ වුවමනාවක් තිබුණා. සමහර විට මිලදී ගැනීම්වලදී, සමහර විට වෙනත් තාක්ෂණික අවශ්‍යතාවලදී ඔවුන් ගන්නා තීරණය, පිටතින් අභියෝගයකට ලක් කරන්න බැරි වෙන්න විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය ගලවනවා. එහි විෂය පථය වෙනස් කරනවා. ඒකට අදාළ පරීක්ෂණ ආයතන එක එක අමාත්‍යාංශයට එල්ලනවා. ජාතික ප්‍රතිපත්තියක් නැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා, විද්‍යා සහ තාක්ෂණික අමාත්‍යාංශය මේ රටේ සැබෑ පුනරුදයක් වෙනුවෙන් මේ නව අය වැය තුළින් ඉතාමත් ඉහළ සැලකිලිමත්භාවයක් ලබාගෙන තිබෙනවා කියන එක. මීට පෙර ඉදිරිපත් කරපු විපක්ෂයේ කථාවලදී මේකට වඩා සම්පූර්ණ භාත්පසින් වෙනස් දෙයක් තමයි ඉදිරිපත් කළේ.

හැබැයි, රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධව සලකද්දී මේක ඇතුළේ තිබෙන විෂය පථය ඒ ඒ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ඊට සම්බන්ධ සංස්ථා හා මණ්ඩලවලට මහ පෙන්වන පහන් තරුවක් තමයි, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය කියන්නේ. තනි තනිව ස්වාධීන තීරණ ගන්න පුළුවන් හැකියාව තිබෙනවා වාගේම, ඒ සම්බන්ධව අවසන් විද්‍යානුකූල නිර්ණායක සහ නිර්දේශය විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයෙන් ලබා ගන්න ඕනෑ. හැබැයි ඒ සඳහා හදිසි ගමනක් යන්න බැහැ. මොකද, ඉතාම කෙටි කාලයක් තුළ - මේ අඛණ්ඩ, අවිච්ඡින්න පැවැත්ම තුළම- ඒ සම්බන්ධ පුහුණුවක්, පෙරහුරුවක් දැකලා නැහැ. ඒ වෙනුවෙන් පුනරාවර්තන ව්‍යදම් විධියට රුපියල් මිලියන 2,800ක මුදල් ප්‍රමාණයක් අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. හැබැයි, මේ වෙනකොට ඒකාබද්ධ කර තිබෙන විවිධ ආයතන ටික නඩත්තු කරමින් ඉස්සරහට යන්න පෙරහුරුවක් කරන්න සිද්ධ වෙනවා.

මේකට මූලධන, ප්‍රාග්ධන ව්‍යදම් විධියට රුපියල් මිලියන 2,200ක ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා, මේ සංවර්ධන ව්‍යාපෘතිවලින්. 2005න් පසුව අවුරුදු ගණනාවක් සංවර්ධනය නොවුණු අමාත්‍යාංශයකට මෙවැනි ප්‍රාග්ධන ව්‍යදමක් වෙන් කර තිබෙන්නේ අඩුම තරමින් ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළව වැඩ කරන විද්වතුන්ට, පරීක්ෂකයින්ට, ඒ ආයතනවල සිටින නිලධාරීන්ට තමන්ගේ සේවා ස්ථානවල යටිතල පහසුකම් ටික සංවර්ධනය කරගෙන ඉස්සරහට යන්නයි. ඒ විතරක් නොවෙයි. විසර්ජන පනත් කෙටුම්පතෙහි ජනාධිපතිතුමාගේ මහ දැක්වීම තුළ National Quality Infrastructure Systems -NQI- එක වෙනුවෙන් තවත් රුපියල් මිලියන 750ක් වෙන් කර තිබෙනවා. ඒ සියලු ආයතන ඒකාබද්ධ කරගෙන අපේ රටේ ගුණාත්මකභාවය ඉහළ දැමීම වෙනුවෙන් ඒ ආයතනවල යටිතල පහසුකම් ශක්තිමත් කරන්න රුපියල් මිලියන 750ක මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අර විසිරිලා, පැතිරිලා තිබුණු අමාත්‍යාංශ ටික, - මේවා ජනතාවගෙන් බොහොම පරිබාහිර වෙච්ච ආයතන. ඒ නිසාම මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරන්න මට පොඩි වෙලාවක් දෙන්න.

හන්තානේ තිබෙන ජාතික මූලික අධ්‍යාපන ආයතනය -NIFS - ගත්තොත්, විද්වතුන් විශාල ප්‍රමාණයක් එකතු වෙලා පරීක්ෂණ කරන ආයතනයක් විධියට දීර්ඝ කාලයක් ස්වාධීනව, දේශපාලන දැක්මක් නැතිව ගමන් කරපු ආයතනයක්. පසු වුණු වකවානුව තුළ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම තමන්ට ඕනෑ විධියට ශක්තිමත්ව ඒ ඒ තැන්වල සිටින නව නිර්මාණකරුවන් සොයාගෙන ගිහිල්ලා, පාසල්වල ඒ නව නිර්මාණකරුවන් සොයාගෙන ගිහිල්ලා, මේ රටේ නව නිපැයුම්කරුවන්ට යම් ක්‍රියාවලියක් සොයන්න බරපතළ උත්සාහයක යෙදිලා තිබුණා. ඒකට දේශපාලන දැක්මක්, අවධානයක් අමාත්‍යාංශ මට්ටමින් දක්වා තිබුණේ නැහැ.

ඒ වාගේම, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පරීක්ෂණ සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව, ජාතික විද්‍යා පදනම ගත්තාම, ඒ ආයතන ඉතාම විශේෂයි. මොකද, විද්‍යාව ගැන කථා කරද්දී අපට පුළුවන්කම තිබෙනවා, විෂයානුබද්ධිත විද්‍යාව ඉගෙන ගන්න. හැබැයි, අපි ජනතාව එක්ක බද්ධ වෙලා fundamental science සම්බන්ධ වුවමනාව ජනතාව තුළ ප්‍රචලිත කරන්නේ කොහොමද? අන්න, ඒ වුවමනාව වෙනුවෙන් NSF ආයතනය, ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය, ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් පිළිබඳ අරමුදල, ජාතික විද්‍යා හා තාක්ෂණික කොමිෂන් සභාව, Sri Lanka Institute of Nanotechnology (Pvt) Ltd., Sri Lanka Institute of Biotechnology, විද්‍යා හා තාක්ෂණික මධ්‍යස්ථානය, කාර්මික තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය, විදාතා සම්පත් මධ්‍යස්ථානය තිබෙනවා.

මෙවැනි මධ්‍යස්ථාන, ආයතන ගණනාවක් එක්ක ඒකාබද්ධව වැඩ කරද්දී මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි ඒ සම්බන්ධව නිවැරදි දැක්මක්, දේශපාලනයේ හැසිරවීම සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් අනෙක් අමාත්‍යාංශයත් එක්ක තිබෙන ඒකාබද්ධතාව. මෙන්න මේ වෙනුවෙන් වෙනම මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. නව නිපැයුම් රටේ ප්‍රමුඛතම කාර්යයක් බවට පත් කරගන්න ඒ සම්බන්ධව රුපියල් බිලියනයකට ආසන්න -මිලියන 1,000කට වැඩි- මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා අපි දකිනවා. එහෙම නම් දැන් තිබෙන්නේ බිම් මට්ටමින් මේ විද්‍යාව සම්බන්ධ පුනරුදයත්, මිථ්‍යාවෙන් ජනතාව ගලවාගෙන, විද්‍යාවෙන් ජනතාව පෝෂණය කරන පුනරුද යුගයක් බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ විධියට කථා කරද්දී, පාසල් අධ්‍යාපනය තුළ විෂය මූලික අධ්‍යාපනය පාසල් දරුවන්ට විද්‍යාව තුළින් ලබා දෙනවා අපි දකිනවා. හැබැයි, වෙනත් විෂය ධාරා අධ්‍යයනය කරන අයට ඒ අවස්ථාව ගොඩක් අඩු වෙනවා. අන්න ඒ අය සඳහා මූලික විද්‍යාව සම්බන්ධ අවබෝධයක් ලබා දෙන්න, ඒ සම්බන්ධව එකිනෙකා අතර සංවාදයක් ඇති කරගන්න, ඒ සම්බන්ධව මූලිකත්වයක් දෙන්න විද්‍යා සමිති හදන්න, එහෙම නැත්නම් Science Clubs හදන්න අපට පුළුවන්කම තිබෙනවා. යම් යම් පාසල්වල මේ කටයුත්ත යම් මට්ටමකට සිදු වෙමින් පැවතුණත්, සමස්ත පාසල් පද්ධතිය තුළම එය මූලික අවශ්‍යතාවක් විධියට හඳුනාගෙන, - ගරු අමාත්‍යතුමා තමන්ගේ කථාව තුළ මේකට මූලිකත්වය දෙමින් කථා කරනවා මම දැක්කා. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව තුළ මේකට මූලිකත්වය දෙමින් කටයුතු කරනවා. මම පුංචි උදාහරණයක් කියන්නම්. විෂය මූලික විද්‍යාව සම්බන්ධ අධ්‍යයනයේදී ඒ සම්බන්ධව තිබෙන න්‍යායන්, ඒ සම්බන්ධව තිබෙන තාක්ෂණයන් අපි ඉගෙන ගන්නවා. හැබැයි, විද්‍යාව භාවිතයේදී මැටි කළයක වතුර සීතල වන්නේ ඇයි, ඇලුමිනියම් කළයේ වතුර උණුසුම් වන්නේ ඇයි, වැනි සරල දේවල් ජනතාව තුළ ප්‍රචලිත කරන්න සිද්ධ වෙන්නේම පාසල් පද්ධතිය තුළින්.

ඒ නිසා NSF එක මඟින් ඒ සම්බන්ධව විවිධ ආකාරයෙන් කටයුතු කරන්න මුදල් වෙන් කරලා තිබෙනවා. විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ක්‍රියාත්මක වීම සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා - "දැනට ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘති හයක් සඳහා අරමුදල් නිදහස් කිරීම, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ සම්පූර්ණ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති වාණිජකරණය සහ බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සඳහා පහසුකම් සැලසීම." ඒක හරි වැදගත් කාරණයක්. අපි මේ රටේ නව නිපැයුමක් කරන්න පුන පුනා බලා සිටින ජනතාවට, ඒ වෙනුවෙන් බලා සිටින ශිෂ්‍යයන්ට ආරාධනා කරනවා, මේ පැමිණ තිබෙන්නේ ඔබේ වාරය. ඔබගේ නව සොයා ගැනීමක් තරගකාරිත්වය තුළ ඉස්සරහට එනවා නම්, නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් ඒකට අදාළ සම්මාන පිරිනමනවා නම්, ඔවුන් රැක බලාගෙන ඒක වාණිජ නිෂ්පාදනයක් දක්වා පෙරට ගෙන එන්න විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. ඔවුන් ආරක්ෂා කරගෙන මූල්‍යමය වශයෙන්, සමාජයීය වශයෙන්, වාණිජමය වශයෙන් ඔවුන් රැක බලාගෙන ඉදිරියට තල්ලුවක් දෙන්න නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, NSF එක සහ තවත් ආයතන ගණනාවක් තිබෙනවා. ඒ නිසා මේ පැමිණ තිබෙන්නේ අපේ රටේ නව නිපැයුම්කරුවන්ට අවස්ථාවක් කියලා අපි හඳුනා ගන්නවා. ඒක බොහොම හොඳ දෙයක්. ඒ සම්බන්ධව මේ උවමනාව පෙරදැරිව මේ අය වැය තුළ විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා, මේ ආයතන ශක්තිමත් කරන්න කටයුතු කිරීම සම්බන්ධව අපි අමාත්‍යවරයාටත්, ජනාධිපතිවරයාටත් ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

Order, please! ගරු මන්ත්‍රීවරුනි, රජයේ වියදම් ඇස්තමේන්තු 2025 සහ පුරවැසි අය වැය සරල කරමින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික අය වැය දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කරන ලද "ප්‍රධාන වියදම් සංවරක, අය වැය ඇස්තමේන්තු 2025 (අය වැය යෝජනා ඇතුළත්ව) නමැති වාර්තාව ඔබතුමන්ලාගේ පරිශීලනය සඳහා සභා මේසය මත තබා ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි.

මීළඟට, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.55]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඩිජිටල්කරණය සහ ඩිජිටල් ආර්ථිකය ගොඩනැඟීම සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුව විශාල අවධානයක් යොමු කරලා තිබෙන බව අපට පෙනෙනවා. හැබැයි ඉතින් ඔබතුමන්ලා අනුගමනය කරන ප්‍රතිපත්ති එක්ක ඒකේ ගැළපීමක් නැති බවකුත් සමහර අවස්ථාවලදී දකින්න තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා අපේක්ෂා කරනවා, ඩිජිටල් ආර්ථිකයෙන් රුපියල් බිලියන 5ක්-15ක් අතර ආදායමක් ලබා ගන්න. හැබැයි ඩිජිටල් ආර්ථිකයෙන් රුපියල් බිලියන 5ක්-15ක් අතර ආදායමක් අපේක්ෂා කරනකොට ඒකට සියයට 15ක බද්දක් පැනෙව්වාම, ඒ එන ආයෝජන ප්‍රවර්ධනය කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අවධානය යොමු විය යුතුයි. මොකද, වර්තමානයේ බදු පනවා නැතුවත් අපට ඩිජිටල් ආර්ථිකයෙන් එන ආදායම රුපියල් බිලියන1කට, 1.2කට ඔසවා ගන්න ඉතා අපහසු වෙලා තිබෙනවා. මොකද, ඩිජිටල් ආර්ථිකය හසුරුවන ලෝකයේ එකම රට ලංකාව නොවෙයි. අද එක රටකට සීමා වෙලා ඩිජිටල් ආර්ථිකය හැසිරෙන්නේ නැහැ. මොකද, ලෝකයේ ඕනෑම තැනකට වෙලා තමන්ගේ ව්‍යාපාර කරගෙන යන්න පුළුවන් ආකාරයට මේ ලෝකය පරිවර්තනය වෙලා තිබෙනවා. බොහෝ වෙලාවට මේ ඩිජිටල් ආර්ථිකය රඳා පවතින්නේ, එක් එක් රටවල් ඒ එක් එක් ක්ෂේත්‍රයන්ට දෙන බදු සහන සහ lifestyle එක මතයි. හැබැයි lifestyle එකක් - ජීවන රටාවක් - ලැබෙන්නේ නැත්නම්, අනෙක් පැත්තෙන් බදුවලින් සහනයක් ලැබෙන්නේ නැත්නම්, ඔබතුමන්ලාට රුපියල් බිලියන 5ක් නොවෙයි, තිබුණු රුපියල් බිලියනයත් බේරා ගන්න බැරි වෙන තැනට ඊළඟ වසර ඇතුළත ඩිජිටල් ආර්ථිකය පරිවර්තනය වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. වසර ගණනාවක් තිස්සේ මේ SL-UDI එක, නැත්නම් Citizens' Services Digitalization කියන කාරණය පිළිබඳව හැම ආණ්ඩුවක්ම අවධානය යොමු කළා; පසුගිය ආණ්ඩුව කාලයේත් අවධානය යොමු වුණා. මම අමාත්‍ය ධුරයේ හිටපු අවුරුදු දෙකහමාර ඇතුළත අපි ඉන්දියානු රජයෙනුත් grant එකක් අරගෙන SL-UDI එක ක්‍රියාත්මක කිරීමේ කටයුත්ත tender process එක දක්වා ගෙන ගියා. හැබැයි, අපේ ආණ්ඩුව මාරු වුණාට පසුව ඒක අඩියකින් පසුපසට ගියා. මම හිතනවා; මම විශ්වාස කරනවා, ඔබතුමන්ලා එය ක්‍රියාත්මක කරයි කියලා. හැබැයි ඒක ක්‍රියාත්මක කිරීම තුළ අපි දකින ප්‍රායෝගික කාරණා කිහිපයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු විය යුතුයි කියලා මම හිතනවා. එකක් තමයි Data Protection Agency එකක් ඇති කිරීම. Data Protection Agency එකක් ඇති කරන්නේ ඇයි? මේ රටේ ජනතාවගේ දත්ත ආරක්ෂා කරන්න.

අද සමාජයේ ලොකු කතිකාවක් ගොඩ නහන්න උත්සාහ කරනවා. ඔබතුමන්ලාමයි විපක්ෂයේ ඉන්න කාලයේ ඒක හැදුවේ. ඒක අපි හදපු එකක් නොවෙයි. එදා අපි මේ දත්ත විකිණීමක් කරන්නේ නැහැයි කියලා කියද්දී, ඔබතුමන්ලා තමයි කිව්වේ වෙන රටවලට දත්ත විකුණන්න උත්සාහ කරනවා කියලා. ඒක ඔබේ දේශපාලන ව්‍යාපාරය ඇතුළේ තිබුණු ප්‍රධාන සටන් පාඨයක්. අද ඔබතුමන්ලාට වගකීමක් සහ අභියෝගයක් තිබෙනවා ඔබතුමන්ලා විසින් හදපු සටන් පාඨය වැරදියි කියලා සමාජගත කරන්න. ඒක ඔබතුමන්ලා සතු අභියෝගයක්, අපිත් ඒකට උදව් කරනවා. මොකද, අපි දන්නවා එහෙම එකක් නැහැ කියලා. Data Protection Authority එකක් පත් කරලා නීත්‍යානුකූල රාමුවක් හැදුවාම ඔය කියන විධියට දත්ත විකුණන

එක, දත්ත හොරකම් කරන එක පහසු වෙන්නේ නැහැ. එහෙම කරන්න ඕනෑ කෙනෙක් ඉන්නවා නම් ඒකට UID එකක් අවශ්‍යත් නැහැ. ඒක කරන්න ඕනෑ අයට ඕනෑ තරම් ක්‍රම තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා පළමු කාර්යය විධියට data protection සම්බන්ධ ඒජන්සිය පිහිටුවන්න. ඒ අවශ්‍ය රෙගුලාසි, නීති රීති සම්පාදනය කරන කාරණා ක්‍රියාත්මක කරන්න.

අනික් පැත්තෙන් ගත්තාම, මොන සේවාද ඔබතුමන්ලා digitalize කරන්නේ? මම විශ්වාස කරනවා කාලානුරූපව සියලු රාජ්‍ය සේවා digital platformsවලට පරිවර්තනය වෙන්න ඕනෑ කියලා; e-Courts ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ; අධිකරණ පද්ධතිය digitalize කරන්න ඕනෑ, ගරු අමාත්‍යතුමනි. ඔබතුමා ඒ වගකීම භාර ගන්න. අලි සබරි ඇමතිවරයා මම තාක්ෂණ ඇමතිවරයා ලෙස සිටි කාලයේ ඒක ආරම්භ කළා. ඒක බොහොම හොඳයි; හොඳ දෙයක්. එතකොට motions දාලා උදේ පාන්දර ඉඳන් ගිහින් උසාවිවල රස්තියාදු වෙන්න ඕනෑ නැහැ, ඒක අපරාධයක්. දැන් උදේ ඉඳන් හවස් වෙනකම් client උසාවියේ ඉන්නත් ඕනෑ, lawyer රස්තියාදු වෙන්නත් ඕනෑ. ඒ නිසා e-Courts ව්‍යාපෘතිය කඩිනම් කළ යුතුයි.

ගරු අධිකරණ ඇමතිතුමනි, අනෙක් පැත්තෙන් ඔබතුමාම මැදිහත් වෙන්න ගරු මුදල් අමාත්‍යවරයා එක්ක, procurements භදන්න, e-procurementsවලට පරිවර්තනය වෙන්න. ඊළඟට, competitive e-biddingsවලට යන්න. මොකද, අද reverse bidding concept එක ලෝකයේ පාවිච්චි වෙනවා. හැබැයි අපේ රටේ reverse bidding concept එක පාවිච්චි වෙන්නේ නැහැ, තවමත් පාරම්පරික bidding procedure එකට තමයි යන්නේ. ඒ තුළ තමයි වංචා, දූෂණ - corruption - පිළිබඳව මහා ලොකු කථා ගොඩ නැහෙන්නේ. හැබැයි, අපි මේ mechanism එක e-procurementsවලට ගෙනිව්වොත්, අනෙක් පැත්තෙන් අපි reverse biddingsවලට ගියොත් මම හිතනවා, මේ කටයුතු transparent වෙයි කියලා. එතකොට, රජයේ ව්‍යාපෘතියක් වෙන්න පුළුවන්, ඒ ඕනෑම කාරණයකදී tender procedure එකක් යනකොට එහි විනිවිදභාවය ආරක්ෂා වෙනවා. ඒ විනිවිදභාවය ආරක්ෂාවීම තුළ වුණත් මම විශ්වාස කරන විධියට, අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට හෝ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන එක නතර වෙන එකක් නැහැ, මේ දේශපාලන රාමුව ඇතුළේ. නමුත් ඒක අඩු වෙයි. ඒ අඩුවීම හොඳයි කියන එක තමයි මම විශ්වාස කරන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එහෙම නොවුණොත්, අපි මේ රටේ කටයුතු කොච්චර digitalize කළත්, ඒ digitalization එක ඇතුළේ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ. ඒ වාගේම මේ රටේ නීති පද්ධතිය සකස් වෙන්න ඕනෑ ඩිජිටල් ක්‍රමයට අනුගත වෙන්න. වක්‍රලේඛයකින් ඒක කරන්න බැහැ, ගරු අමාත්‍යතුමනි. දැන් e-signature එක පාවිච්චි කරන්න පුළුවන් Electronic Transactions Act එක යටතේ. හැබැයි බොහෝ වෙලාවට අපි දකිනවා රාජ්‍ය ආයතන ඒක පාවිච්චි කරන්නේ නැති බව. ඒක පාවිච්චි නොකරන හේතුව තමයි ඒක නීතියක් නොවන නිසාත්, ඒක අවශ්‍ය නම් පමණක් පාවිච්චි කරන්න කියන නිසාත්. ඒ නිසා උප්පැන්න, මරණ, විවාහ සහතික online ගන්න පුළුවන් වුණත්, නැවත වතාවක් ඒ සහතිකය අරගෙන ලේකම් කාර්යාලයට යන්න ඕනෑ අත්සන ගහගන්න. මොකද, අපි digital signature එකට අනුගත වෙන්න තිබෙන මැළිකම නිසා. ඒ මැළිකම වළක්වන්න පුළුවන් ක්‍රමය තමයි ඒකට අවශ්‍ය නීති සම්පාදනය කරලා ඒක අනිවාර්ය කිරීම, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඊළඟට, payment gateway එක. ඒකට ආණ්ඩුවේ මුදල් පනත් වෙනස් වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, single window payment gateway එකක් ආණ්ඩුවට දෙන්න ඕනෑ. අද වෙනනම් ආණ්ඩුවට single window payment gateway එකක් නැහැ. විදේශ රැකියාවකට යන කාන්තාවක් තැන් හයකට හතකට ගිහිල්ලා payments කරන්න ඕනෑ. සමහරවිට රුපියල් 750, රුපියල් 500 වාගේ payments කරන්නත් තැන් තැන්වලට යන්න ඕනෑ. පොලිස් වාර්තාව ගන්න, ඒ payment එක කරන්න පවා එතැනට යන්න ඕනෑ. ඉතින්, මේක single window payment system එකකට පරිවර්තනය කරන්න පුළුවන් නම්, මුදල් අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, තාක්ෂණ අමාත්‍යාංශය සහ මහ බැංකුව ඒකාබද්ධව මේ ක්‍රම ටික හඳුන්වා දීලා කටයුතු කරන්න පුළුවන් නම්, ඔබතුමන්ලා අපේක්ෂා කරන්නා වූ ඩිජිටල් ආර්ථිකය කෙසේ වෙතත්, අඩුම ගණනේ ජනතාවගේ සේවා ටික ඩිජිටල්කරණයට පරිවර්තනය කරන්න හැකියාව ලැබෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ rollout එක කඩිමුඩියේ කරන්න පුළුවන් කාරණයක් නොවෙයි. මොකද, මේ සඳහා biometrics ගන්න ඕනෑ, facial recognition ගන්න ඕනෑ, eye scanning කරන්න ඕනෑ, fingerprints ගන්න ඕනෑ. සමහරු හිතාගෙන ඉන්නවා මේක එක අමාත්‍යාංශයකට ලඝු වෙච්ච කාරණයක් කියලා. නැහැ, මේක එක අමාත්‍යාංශයකට ලඝු වෙන්න ඕනෑ කාරණයක් නොවෙයි. මම විශ්වාස කරනවා, මෙය ජනාධිපතිතුමා හෝ ජනාධිපතිතුමා හා සමාන බලතල තිබෙන ඒජන්සියක් හරහා විය යුතු කාරණයක් කියලා. ඒ සඳහා ආයතන 40කට වඩා එක තැනකට ගේන්න ඕනෑ. අමාත්‍යාංශ 30න් අඩුම ගාණේ අමාත්‍යාංශ 20ක් මේකට සම්බන්ධ වෙන්න ඕනෑ. එක් එක් ආයතනවල තිබෙන ආයතන සංග්‍රහය, ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කරන ආකාරවලින් මේක මිදෙන්න ඕනෑ. එහෙම නැතිව ඔබතුමන්ලා කොතරම් දක්ෂ නිලධාරීන් ගෙනැල්ලා දැම්මත් මේක කරන්න බැහැ. මොකද, මේ හැමෝම තුන් හතර පැත්තට අදිනකොට අවසානයේ වෙන්නේ මොකක්ද? පසුගිය අවුරුදු පහක්, දහයක් තිස්සේම සාකච්ඡා කළේ UID එකේ, digital identity card ව්‍යාපෘතියේ අයිතිකාරයා කවුද කියන එක. ජාතික හැඳුනුම් පත නිකුත් කරන කට්ටිය කියනවා, ඒක අපේ කියලා. පාස්පෝට් කාර්යාලයේ අය කියනවා, නැහැ, data අපට ඕනෑ කියලා. Defence Ministry එකෙන් කියනවා, නැහැ, ජනතාවගේ data ආරක්ෂා වෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ කියලා.

මම විශ්වාස කරන්නේ මේ සියල්ලම එක රාමුවක් ඇතුළට ගෙනෙන්න ඕනෑ කියලායි. National Data Protection Authority එකට මේ සම්පූර්ණ බලතල ටික දෙන්න ඕනෑ. එහෙම වුණොත් පමණයි මේ හැම ආයතනයක්ම ඒකාබද්ධ කරගෙන මේ කාරණය කරන්න පුළුවන්. එහෙම නැතුව කොච්චර උත්සාහ කළත්, පෞද්ගලික අංශයේ ඉන්න දක්ෂ නිලධාරීන් පත් කළත් ඔබතුමන්ලාට මේක කරගන්න හම්බ වෙන්නේ නැහැ, ඒ නිලධාරීන්ට අවශ්‍ය නෛතික රාමුව සහ නීත්‍යනුකූල බලතල දුන්නේ නැත්නම්. මේ සඳහා රාජ්‍ය ආයතන කැඳවන්න ඕනෑ, ඒ නිලධාරීන් කැඳවන්න ඕනෑ, වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරන්න ඕනෑ. එහෙම සාකච්ඡා නොකර මේක කරන්නත් බැහැ. හැබැයි සාකච්ඡා කළත්, ඒ අයට තීන්දු ගන්න බලතල නැත්නම් කරන්නත් බැහැ කියන එකත් මතක තබා ගත යුතුයි. අතිගරු ජනාධිපතිතුමා මේ සඳහා උත්සාහ කරන එක හොඳයි. මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා මේ සඳහා හොඳ දක්ෂ නිලධාරීන් පෞද්ගලික අංශයෙනුත් ගෙනැල්ලා තිබෙනවා. Dr. Hans Wijayasuriya වාගේ අය ඉන්නවා; හොඳ කණ්ඩායමක් ඉන්නවා. හැබැයි, ඒ අයට අවශ්‍ය බලතල ටික දෙන්න. එහෙම නැතුව ඒ අය වාඩි කරගෙන සාමාන්‍යයෙන් රාජ්‍ය සේවය තුළ තීන්දු තීරණ ගන්නා ක්‍රමයටම මේ digitalization ක්‍රියාත්මක කළොත්, මේ අවුරුදු පහ තුළ නොවෙයි, ඊළඟ අවුරුදු 15 තුළදීවත් මේක කරගන්න හම්බ වෙන්නේ නැහැ කියන එකත් මම මතක් කරන්න ඕනෑ. ඒ නිසා එම නිලධාරීන්ට අවශ්‍ය බලතල දෙන්න.

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි ඩිජිටල් ආර්ථිකය ගැන කථා කරනකොට එකට අදාළ ලෝකයේ නව ප්‍රවණතා තිබෙනවා. 2021 වසරේ අපි මුදල් අමාත්‍යාංශයටත්, Central Bank එකටත් යෝජනා කළා, අලුත් digital currencies accept කරන්න පුළුවන් රෙගුලාසි ටික හදන්න කියලා. ඒක IMF එකත් එක්ක, World Bank එකත් එක්ක, ADB එකත් එක්ක අනුගත නොවෙන්න පුළුවන්. හැබැයි, ලෝකයේ යම් ප්‍රවණතාවක් තිබෙනවා. මේ ප්‍රවණතාවට අලුත් පරම්පරාව මාරු වෙනවා. අලුත් පරම්පරාව මේ ප්‍රවණතාවට මාරු වෙනකොට, අපේ system එකේ තිබෙන රෙගුලාසි මාරු වෙන්නේ නැත්නම් අවසානයේ හැදෙන්නේ, පිරමීඩ. පිරමීඩ හැදුණාට පසුව මොකක්ද වෙන්නේ? සමස්ත blockchain industry එකටම මඩ ගහනවා. එහෙම නැත්නම් සමස්ත digital currency industry එකටම මඩ ගහනවා. එහෙමත් නැත්නම් වැරදි නාමයක් ගොඩනැගෙනවා. ඒ නිසා ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, එක පැත්තකින් citizen-centric services digitalize කරන්න, අනෙක් පැත්තේ මේ digital industry එකට ලෝකයේ තිබෙන අලුත් ප්‍රවණතා හඳුනා ගන්නට.

දැන් creators' economy එක ලෝකයේ වේගයෙන්ම ව්‍යාප්ත වන ආර්ථිකය බවට පරිවර්තනය වෙලා තිබෙනවා. අද වනවිට ලංකාවේ කොහේ හිටියත් - කොළඹ හිටියත්, යාපනයේ හිටියත්, කරුවලගස්වැව හිටියත්, තඹුත්තේගම හිටියත්, මැදමුලනේ හිටියත් - ඒ ඕනෑම තැනක ඉන්න තරුණයෙකුට, තරුණියකට creators' economy එක තුළ ලෝක ආර්ථියකත් එක්ක ගනුදෙනු කරන්න පුළුවන්. හැබැයි, ඒකට අවශ්‍ය ප්‍රතිපාදන සැලසිය යුතුයි. මුදල් ප්‍රතිපාදන නොවෙයි, නීතිමය ප්‍රතිපාදන සැලසිය යුතුයි. එහිදී inward remittances ගෙනෙන්නේ කොහොමද, ඒ අය තමන්ගේ wallet එකට, එහෙම නැත්නම් තමන්ගේ payment gateway එකට මේක ගෙනෙන්නේ කොහොමද කියා සොයා බැලිය යුතුයි. අපේ අවසාන සැලැස්ම තමයි UID introduce කරලා individual wallet එකක් හදන එක. හැම පුරවැසියෙකුටම තමන්ගේ wallet එකක් තිබෙන්න ඕනෑ. ඒ wallet එක තුළ biometricsවලින්, facial recognitionවලින් කෙනෙකුගේ උප්පැන්න සහතිකය, විවාහ සහතිකයේ සිට සියලු සහතික, පාසල්වල තොරතුරු, බැංකු ගිණුම් තොරතුරු යනාදී සියල්ලම තිබෙන්න ඕනෑ. හැබැයි, එතැනට පරිවර්තනය වෙන්න යම් කාලයක් යනවා. ඒ කාලය තුළ මේ creators' economy එකෙන්, ලෝකයේ වේගයෙන්ම ව්‍යාප්ත වන ආර්ථිකය තුළින් ලැබෙන ප්‍රතිලාභ අපේ රටේ දරුවන්ට ලබා දෙන්නේ කොහොමද කියන නීතිමය රාමුවත් මේ ආණ්ඩුව ඉතාම කඩිනමින් හදන්න ඕනෑ.

හැබැයි, ඒත් එක්කම මම නැවත මතක් කරන්න ඕනෑ, ඔය remittancesවලට, ඔය එන ආදායමට සියයට 15ක් බදු ගැසීම තුළ සිද්ධ වෙන්නේ මේ රටේ තිබෙන ගිණුම් ටික වෙනත් රටවල විවෘත කරන එක විතරයි කියන එකත්. ඒක IMF නිසා වෙනවා කියලා අපට හිත හදා ගන්න පුළුවන්. හැබැයි, ප්‍රායෝගිකව මේ දරුවෝ කිසි කෙනෙක්, මේ ව්‍යාපාරිකයෝ කිසි කෙනෙක් ඔවුන්ට අවශ්‍ය lifestyle එක ලංකාවෙන් ලැබෙන්නේ නැත්නම් මේ රටේ ඉන්නේ නැහැ. දැන් බලන්න, ලක්ෂ 12කට වාහනයක් ගන්න හිතපු කෙනාට මෝටර් සයිකලයක් නේ ගන්න වෙන්නේ. ලක්ෂ 12කට කාර් එකක් ගන්නත් බැහැ නේ. ඉතින් මෝටර් සයිකලයේ යන්නේ නැහැ නේ, ඩොලර් 5,000ක්, 10,000ක්, 15,000ක් හම්බ කරන දරුවෙක්. ඒ අය වෙන රටකට ගියොත්, අර ඒ කාලයේ ඔබතුමන්ලා කිව්වා වාගේ ලැම්බෝගිනියක්ම ගන්න පුළුවන් නේ. ඒ අයට එවැනි lifestyle එකක්වත් මේ රට තුළ ලබා දෙන්නේ නැත්නම්, අනෙක් පැත්තෙන් ගෙනෙන ආදායමටත් සියයට 15ක් බදු ගහනවා නම්, එතැනින් එහාට මේ ආර්ථිකයේ සංවර්ධනය ගැන, මේ ඩිජිටල් ආර්ථිකයේ ව්‍යාප්තිය ගැන කථා කරලා වැඩක් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ නිසා අපි ආණ්ඩුවෙනුත් ඉල්ලන්නේ මේ citizen-centric services digitalize කරන එකත්, ඩිජිටල් ආර්ථිකයත්, creators' economy එකත් කියන මේ තුන පටලවා ගන්න එපා කියලායි. මේ අංශ තුන පටලවා ගත්තොත් වෙන්නේ ඒවායේ ප්‍රතිලාභ කිසිවිටෙක ලැබෙන්නේ නැති එක. මොකද, ආණ්ඩුවේ digitalization campaign එක කියන්නේ digital economy එක නොවෙයි, ඒකේ backbone එක. ඒක හරි. Digitalization campaign කියන්නේ එකේ backbone එක, මූලික අඩිතාලම. හැබැයි, creators' economy එක ඇතුළේ එන creations එක්ක, අනෙක් පැත්තෙන් ඩිජිටල් ආර්ථිකය ඇතුළේ හැදෙන අලුත් ප්‍රවණතා එක්ක එන ආර්ථිකය කියන්නේ වෙනස්ම ආර්ථිකයක්. ඒ පිළිබඳවත් ඔබගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊයේ පෙරේදා වෙච්ච සිදුවීමක් ගැනත් මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. මම දැක්කා අදත් කතරගම කිරිවෙහෙරේ නායක හාමුදුරුවන්ගෙන් කට උත්තරයක් ගන්න ගෙනිහින් තිබුණා. ඊයේ නිලමේතුමා කට උත්තර දෙන්න ගිහින් තිබුණා. කට උත්තර ගන්න එන්න කියන එක නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ප්‍රශ්නය. කිරිවෙහෙරේ නායක හාමුදුරුවෝ කතරගම ඉඳලා කොළඹට වැඩලා, CID එකට ගිහිල්ලා කට උත්තරයක් දෙනවා.

සාමාන්‍යයෙන්, ගිහිල්ලා උන්වහන්සේගෙන් කට උත්තරයක් ගත්තත් ප්‍රශ්නයක් නැහැ කියලා මම හිතනවා. හැබැයි, අනෙක් පැත්තෙන් නිලමේතුමාගේ ගෙදරට යනවා, රෑට. රෑ ගියේ කොහොමද? පොලීසිය භාර අමාත්‍යවරයාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ඔබතුමාට පුළුවන් මේක වැරදි නම් නිවැරදි කරන්න. දැන ගත යුතු කාරණයක් නිසායි මේ අහන්නේ. නිලමේතුමාගේ නිවසට ගියා, කණ්ඩායමක්. නිවසට ගියේ කොහොමද? ගියේ සිවිල් පිට. සිවිල් පිට ගිහිල්ලා අවුරුදු 84ක් වන නිලමේතුමාගේ මෑණියන්ගෙන් ප්‍රශ්න කළා. ප්‍රශ්න කරලා, කරදරයක් වුණේ නැහැ කියලා ලියාගෙන එනවා. හැබැයි, ඒ යනකොට ගමේ පොලීසිය දන්නේ නැහැ. ගමේ පොලීසිය දන්නේත් නැතිව, කොළඹින් CID එකේ කණ්ඩායමක් search warrant එකක්වත් නැතිව, සිවිල් පිට රෑ 10ට, 12ට විතර ගිහිල්ලා ගෙයක් search කරනවා. දැන් දේශබන්දු මහත්මයාට තිබෙන චෝදනාවත් ඒකම නොවෙයි ද? දේශබන්දු මහත්තයාට තිබෙන චෝදනාවත් search warrant එකක් නැතිව කොළඹින් ගිහිල්ලා search එකක් කරනකොට යම් වෙඩි හුවමාරුවක් සිද්ධ වෙච්ච කාරණාවක් නේ. මම වැරදියි නම් ඔබතුමා නිවැරදි කරන්න. හැබැයි, දැන් මෙතැන වෙන්නේත් ඒකම නේ. දැන් දේශබන්දු මහත්මයා හොයන්න යන්නේත් එයා වැරැද්ද කරපු විධියටම නේ. එයා හොයන්න ගියාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. මම කියන්නේ, මේ කියන කාරණේ නේ. හැබැයි, එතුමා හොයන්න ගිය විධියත් එතුමා කරපු වැරැද්ද විධියමයි. අනෙක් පැත්තෙන්, ඒ නිවසේ CCTV තිබෙනවා නම්, ඒ CCTV පරීක්ෂා කරලා බලන්න පුළුවන් ඔය කියන නිලධාරියා - ඔය කියන පොලිස්පතිවරයා - ඒ ගෙදරට ඇවිල්ලා තිබෙනවාද, නැද්ද කියලා. ඒකට රෑ 12.00ට යන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලා ඩිජිටල් ආර්ථිකයක් ගැන කථා කරනවා නේ. නිලමේතුමාට ඊට පහුව දා කට උත්තරයක් දෙන්න එන්න කියලා තිබෙනවා. ඉතින් කට උත්තරයක් දෙන්න එන්න කියලා තිබියදී, රෑ දොළහට ගෙදරට යන්නේ ඇයි? ඒක අවශ්‍ය නැහැ නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඉතින් මෙවැනි කාරණා සිදු වෙනවා. මම දන්නේ නැහැ, සමහර නිලධාරීන් ඔබතුමන්ලා අපහසුතාවට පත් කරන්න මෙහෙම කරනවාද කියලා. හැබැයි, මේවායින් වෙන්නේ අවසාන වශයෙන් පළිගැනීමේ චේතනාවෙන් කරන ක්‍රියාමාර්ග විධියට මේවා සමාජගත වෙන එක. ඒක හොඳ නැහැ; හරි නැහැ. මොකද, එක

පැත්තකින් ඔබතුමන්ලා ඩිජිටල් ආර්ථිකයක් ගැන කථා කරනවා, අලුත් දේශපාලන සංස්කෘතියක් ගැන කථා කරනවා, වැරදි කරපු අයට දඩුවම් දෙන්න කථා කරනවා. අනෙක් පැත්තෙන්, වැරැද්දක් කළා කියලා ඔබතුමන්ලා විශ්වාස කරන පුද්ගලයෙක් හොයන්න යනවා, ඔහු වැරැද්ද කරපු ආකාරයටම. අඩුම ගණනේ ඒවා නිවැරදි කරගෙන යන්නකෝ. උසාවි නියෝගයක් අරගෙන ගිහිල්ලා ඒක කරන්න පුළුවන් නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එහෙමත් කළේ නැහැ. පොලීසිය භාර අමාත්‍යතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා, අධිකරණය භාර අමාත්‍යතුමා ඉන්නවා. ගරු අග්‍රාමාත්‍යතුමියත් ඉන්නවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමියගේත්, ඔබතුමන්ලාගේත් අවධානයට මම මේ කාරණය යොමු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම ඔබතුමන්ලාට කියන්නේ, ඔව්, රටේ ඩිජිටල් ආර්ථිකයක් ගොඩනැඟිය යුතුයි. ඩිජිටල් ආර්ථිකයක් ගොඩනඟනවා නම් අවශ්‍ය නීති රෙගුලාසිය අපි හදන්න ඕනෑ. ඒ සඳහා ඒ අවශ්‍ය නිලධාරීන්ට, ඒ අවශ්‍ය institutionsවලට අවශ්‍ය පූර්ණ බලතල දෙන්න, නිදහස දෙන්න. සාම්ප්‍රදායික රාමුවක් ඇතුළේ ඩිජිටල් ආර්ථිකයක් ගොඩනඟන්න බැහැ. Procurement system එක ආණ්ඩුවෙන් මාරු කරන්න. Competitive biddingවලට යන්න. අඩුවෙන්ම එන price එකට - lowest price එකට - පමණක් සීමා වෙන්න එපා. Quality එක ගැන අවධානය යොමු කරන්න. Reverse biddingවලට යන්න. Reverse biddingවලට යෑම තුළින් මම හිතනවා ඔබතුමන්ලාට හොඳ product එකක්, හොඳ price එකක් ගන්න පුළුවන් කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව විනාඩියයි ඕනෑ වන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මේ රටේ ඩිජිටල් ආර්ථිකයක් ගැන ඔබතුමන්ලා අවධානය යොමු කරනකොට, මේ pillars තුන පිළිබඳව අවධානය යොමු කරන්න. Creators' economy එකට අවධානය යොමු කරන්න. ඒ තරුණ පිරිස බලාගන්න. YouTube blogs සහ අන්තර්ජාලයට සම්බන්ධ වෙලා නිෂ්පාදනය කරන ඒ තරුණ පිරිස ගැන අවධානය යොමු කරන්න. ඒ අයට දෙන බදු සහනය පිළිබඳ ඔබතුමන්ලා කතිකාවක් ගොඩ නඟන්න; ඒ අය එක්ක සාකච්ඡා කරන්න. මොකද, ඒ හැමෝම ඔබතුමන්ලාගේ මැතිවරණවලට බොහොම මහන්සි වෙච්ච අය. එහෙම නැතිව, අපේ මැතිවරණවලට නොවෙයි. හැමෝම කිව්වොත් වැරදියි, බොහෝ අය.

ඒ වාගේම තවත් පැත්තකින් industry එක ආරක්ෂා කරන්න. Industry එක ආරක්ෂා කරන්න මැදිහත් වෙන්න වාගේම, citizen -centric services digitalize කිරීමට ඔබේ අවධානය යොමු කරන්න. විපක්ෂයේ සිටියත් මම විශ්වාස කරනවා අද තිබෙන technology එක අද implement වෙන්න ඕනෑ කියලා. අද තිබෙන තාක්ෂණය තව අවුරුදු පහකින් implement වෙලා වැඩක් නැහැ. තවත් අවුරුදු 5කින් මේක AI-based system එකකට යනවා, අනිවාර්යයෙන්ම. ඒ නිසා අද ඔබතුමන්ලා ගන්නා තීන්දු තීරණ මතක තියා ගන්න. මොකද, තව අවුරුදු 5කින් ලෝකය තවත් ඉස්සරහට යනවා. එතැනට යන්න පුළුවන් පරිවර්තනයක් එක්ක මේ ඩිජිටල් ආර්ථිකය ගොඩනංවන්න කරන්න කියන ඉල්ලීමත් කරමින්, ඔබතුමන්ලා සියලුදෙනාම මේ සඳහා අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[2.11 p.m.]

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)
Hon. Deputy Chairperson, it is very important for us to understand the approach of the Government to facilitate the activities, initiatives and strategies of the Ministry of Science and Technology and the Ministry of Digital Economy and the critical areas the Government has paid attention to. Let me start with the approach relating to connecting Sri Lanka to the world. An important aspect to understand is that Sri Lanka is no longer an isolated entity, an isolated country or an isolated community. The approach of the Budget is to ensure that we are provided with adequate resources to take the country forward and to connect Sri Lanka to the global economy. In order to achieve that objective, several approaches and several initiatives have been made and started.

The second important element is by creating ease of doing business for local entrepreneurs, investors and global investors who want to invest in Sri Lanka and based on our destination and geographical position, there are several advantages we can offer to the world. But, for foreign investors to come into Sri Lanka and our investors to invest more in the industries, we need to facilitate them by creating ease of doing business. Digitization is a platform which would take Sri Lanka on that journey. So, a lot of efforts are being made and attention is paid in the Budget to connect the digitization process with the requirements of the nation.

The third pillar in that journey is efficiency in providing services to the citizens of this country by ensuring not only there is facilitation for businesses, but also that the required types of services provided by the Government are delivered in a seamless manner to them through government offices in their respective districts and provinces without having to come all the way from their remote villages to Colombo. So, that is another key objective to be achieved with this digitization map being rolled out and provisions being made in the Budget.

The fourth important pillar in this journey is minimizing room for corruption.

Madam, through a digital platform, it is expected to minimize person-to-person connections and at the same time, to increase the efficiency of the delivery of services

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

in a manner that would minimize room for corruption, improve revenue to the Government and also facilitate faster and efficient delivery of services. With those pillars in place, to achieve economic objectives, several improvements and facilitations have been made.

Madam, in order for the economy to move to the next level, we need to ensure that every citizen and every business contribute proportionately to the revenue of the Government. Currently, the challenge is, many are evading or escaping without paying the fair share of taxes they are supposed to pay. Therefore, digitization would bring in solutions to bridge this gap and to ensure that our citizens and businesses are seamlessly connected to the tax payment system. So, instead of payment of taxes becoming a burden, the system is designed to make it easier for citizens, to get themselves connected to the tax payment system. In facilitating this task, another important element is the transformation of the informal economy into the formal economy. This journey is strengthened to utilize digitization to the maximum level.

I will give you a few examples as we move forward, which shows that digital transformation is paramount for our economy to strengthen its activities. In the Budget, 2025, Rs. 4,752 million has been allocated for Recurrent Expenditure while Rs. 4,351 million has been allocated for Capital Expenditure of the Ministry of Digital Economy. A notable item under that, Madam, is the increase in allocation from Rs. 355 million last year to Rs. 640 million in the current year for the Information and Communication Technology Agency - ICTA - of Sri Lanka, a significant improvement. Further, in the Budget Estimates for 2025, compared to the allocation of Rs. 5,345 million last year for Recurrent Expenditure, the present Government has allocated Rs. 6,752 million for the same, which is a significant increase in terms of expenditure. In the same way, compared to the allocation of Rs. 6,446 million last year for Capital Expenditure, Rs. 6,871 million has been allocated for this year. As a result, the increase in the total allocation to support digital infrastructure and the digital economy has been from Rs. 11,791 million to Rs. 13,623 million.

මේ අය වැය හරහා ඩිජිටල් ආර්ථිකය සවිමත් කරවමින් රටවැසියාට, ව්‍යාපාරිකයාට, ආයෝජකයාට අවශ්‍ය සහයෝගය ලබා දීමේ වැඩ පිළිවෙළක් අංශ ගණනාවකින් ක්‍රියාත්මක කරන්න සැලසුම් කර තිබෙනවා. මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, Digital Services Tax එක නිසා තිබිච්ච ආදායමත් කඩා වැටෙන්න යනවා කියලා. මට හිතෙනවා, මේ විෂයය පිළිබඳව නිසි ලෙස නොදැන සමාජය තුළ දුර්මත ප්‍රචලිත කිරීමේ අධිෂ්ඨානයෙන්දෝ ඒ වාගේ ප්‍රකාශ කරන්නේ කියලා. මේ පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගන්න මම යම් පැහැදිලි කිරීමක් කරන්නම්. පසුගිය රජය IMF එකත් එක්ක සම්බන්ධ වෙලා සියයට 30ක් දක්වා වැඩි කරපු Digital Services Tax එක වර්තමාන ආණ්ඩුව සියයට 15 දක්වා අඩු කළා. ඒ කියන්නේ, සියයට 50කින් අඩු කරවීමක්. මේ නිසා තමයි අපි කිව්වේ, IMF එකත් එක්ක සාකච්ඡා කරලා අවශ්‍ය විධියට අවශ්‍ය සහනය ලබා දෙනවා කියලා. ඒකට හේතුව තමයි, අපේ strategy එකේ මේ ඩිජිටල් ආර්ථිකයට රජය තබා තිබෙන බර තැබීම. ඒ බද්ද සියයට 30 සිට සියයට 15 දක්වා අඩු කළා විතරක් නොවෙයි, ඊට සාපේක්ෂව ඩිජිටල් තාක්ෂණය හරහා සේවා සපයන අපේ තරුණ තරුණියන්ට, ව්‍යාපාරිකයන්ට තවත් අංශ 7කින් අපි අවස්ථාව සලසා තිබෙනවා. මම ඒ කිහිපයක් නම් කරන්නම්.

පළමුවැනි එක තමයි, double taxation treaties හරහා ලැබෙන සහනය. ඒ කියන්නේ, ද්විත්ව බදු ගිවිසුම් හරහා ලංකාවට ලැබෙන සහනය. අපි රටවල් 46කට වැඩි සංඛ්‍යාවක් එක්ක මේ ද්විත්ව බදු ගිවිසුම් අත්සන් කර තිබෙනවා. මේ තුළින් IT ක්ෂේත්‍රයේ යම්කිසි අපනයනකරුවෙක්, සේවා අපනයනකරුවෙක් ඒ රටකට අපනයනයක් කළා නම්, ඒ අවස්ථාවේදී ඒ රටේදී ගහපු බදු අඩු කර ගන්නට අවශ්‍ය වාසිය ලැබෙනවා, නැවත වතාවක් ලංකාවේදී බදු ගෙවනකොට.

දෙවැනි කාරණය මෙයයි. සාමාන්‍ය විධියට employerගෙන් employeeට වැටුප ගෙවනකොට, එහෙම නැත්නම් සේවා ආයතනයෙන් තමන්ගේ සේවකයාට වැටුප දෙනකොට උපයන විට ගෙවන බද්ද - PAYE Tax එක - අඩු කරගෙන කරන ගෙවීමක් නොවෙයි මෙතැන තිබෙන්නේ. ඩිජිටල් තාක්ෂණය තුළින් ආදායම ලබා ගත් පුද්ගලයාට තමන්ගේ ආදායම උපයා ගන්නට ගිය වියදම අඩු කරන්නට මේ තුළින් සහනයක් ලබා දී තිබෙනවා. ඒ කියන්නේ අපේ තරුණ තරුණියන්ට computer එකක්, laptop එකක්, media equipment, lighting equipment ගන්නකොට යන වියදම්, internet එකට යන ගාස්තුව, proportionately electricity බිල ගෙවීම යනාදී වියදම් අඩු කරගෙන ඉතිරි ප්‍රමාණයට තමයි මේ tax එක බලපාන්නේ, ගරු මන්ත්‍රීතුමනි. එහෙම නැතිව සමස්ත මුදලටම නොවෙයි. ඒ, දෙවැනි කාරණය. තුන්වැනි කාරණය මෙයයි. මේ ගෙවන බද්ද සියයට 15ක උපරිමයකට යටත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, සාමාන්‍ය ආදායම් බදු ගෙවන පුරවැසියෙකුගෙන් සියයට 6 සිට සියයට 18, 24, 30, 36 දක්වා ඒ බද්ද අය කරනවා. නමුත්, මේ ඩිජිටල් තාක්ෂණය හා සම්බන්ධ වෙලා අපනයන කරන අපේ තරුණ තරුණියන්ට මේ බද්ද cap කරලා තිබෙනවා, සියයට 15ට. සියයට 15න් එහාට බද්ද ගෙවන්න අවශ්‍ය වන්නේ නැහැ.

ඊළඟ කාරණය තමයි, කොහෙන්ද මේ සියයට 15 සීමාව ආවේ කියන එක. අපි රජයක් විධියට හිතුමතේට තීරණය කළා නොවෙයි, සියයට 15 සීමාවේ මේ බද්ද තිබිය යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

Global minimum taxation කියලා system එකක් ලෝකය තුළ develop වෙගෙන එනවා. අන්න ඒ ක්‍රමවේදය අනුව තමයි අපි මේ සියයට 15 සීමාව නිර්ණය කරලා තිබෙන්නේ. ඒ වාගේම තමයි ඒ ආදායම බැංකුවට ලැබෙනකොට බැංකුවේදී කිසිම අඩු කර ගැනීමක් කරන්නේත් නැහැ. සමස්ත මුදලම ඒ අපනයනකරුට, සේවා සපයන්නාට ලබා දෙනවා. තමන්ට තමයි quarterly system එකට බද්ද ගෙවීමේදී සහ ඊට අමතරව වාර්ෂික බදු ගෙවීමේදී මේ declaration එක කරලා එයට අදාළ නිර්ණයන්ට අනුව බදු ගෙවීම කරගෙන යන්න තිබෙන්නේ.

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා, රජයේ මිලදී ගැනීමේ ක්‍රියාවලිය digitize කිරීමට අවශ්‍ය වැඩ

පිළිවෙළ ක්‍රියාත්මක කළ යුතුයි කියලා. මේ වෙනකොටත් රජයට අවශ්‍ය සුළු මිලදී ගැනීම් කරන සියලුම ආයතන ඩිජිටල් තාක්ෂණයට සම්බන්ධ කරලා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර දී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි බලාපොරොත්තු වෙනවා, මේ වර්ෂය අවසාන වෙනකොට goods procurement, services procurement, works procurement and consultancies මේ system එක හරහා සම්බන්ධ කරන්න.

ඒ කියන්නේ, භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රමවේදය, සේවා මිලදී ගැනීමේ සහ සැපයීමේ ක්‍රමවේදය, කොන්ත්‍රාත් පදනම මත consultancy විධියට රජයට අවශ්‍ය සේවා සපයා දීමේ ක්‍රමවේදය ඩිජිටල් තාක්ෂණය තුළින් ක්‍රියාත්මක කිරීමත්, මිලදී ගැනීම සහ procure කර ගැනීම විනිවිදභාවයක් තුළින් එන වැඩ පිළිවෙළකින් ක්‍රියාත්මක කිරීමත් සිදුවන බව.

ඊළඟට, SVAT සම්බන්ධයෙනුත් අපේ අපනයනකරුවන්ට සමාජය තුළ වැරදි මතයක් හදන්න උත්සාහ කරනවා. නමුත්, ඩිජිටල් තාක්ෂණය සම්බන්ධ කරගෙන එම ක්‍රියාවලිය නිසි ලෙස digitization කරලීමෙන් පසුව තමයි existing SVAT mechanism එක, දැනට පවතින SVAT mechanism එක, refund system එක හරහා transfer වෙන්නේ. මේ තුළින් රජය බලාපොරොත්තු වෙන්නේ කිසිම අපනයනකරුවෙකුට අසාධාරණයක් නොවන විධියට, කාරක ප්‍රාග්ධනයට - working capital එකට - වන බලපෑම අවම වන විධියට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නයි. ඒ වාගේම මේකේ utilization and monitoring හා implementation කියන සෑම stage එකකදීම රජයේ මැදිහත්වීමෙන් මේ වැඩ කටයුතු සාර්ථකව ඉදිරියට කරගෙන යන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න සූදානමින් සිටින බවත් මම මතක් කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ආනන්ද විජේපාල - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මීට ස්වල්ප වේලාවකට පෙර ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා යම් කාරණාවක් මතු කළා. ඒ සම්බන්ධව මා පිළිතුරක් ලබා දිය යුතුයි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විශ්වාස කටයුතු මාර්ගයෙන් ලැබුණු තොරතුරක් අනුව ස්ථානීය පරීක්ෂණ සිදු කිරීම මේ දිනවල සිදු කරමින් පවතිනවා. ඒ ආකාරයට පසුගිය දවස්වල මාතර ප්‍රදේශයේ නිවසක් පරීක්ෂාවට ලක් කළා. ඒ පරීක්ෂාවට ලක් කරන ලද්දේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විශ්වාස කටයුතු මාර්ගයෙන් ලැබුණු තොරතුරක් පදනම් කරගෙනයි. සාමාන්‍යයෙන් එවැනි පරීක්ෂා කිරීම් සිදු කරන අවස්ථාවලදී එම ප්‍රදේශයේ පොලිසිය දැනුවත් කිරීමක් සිදු කරනු ලබන්නේ නැහැ. එහෙත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එම නිවසේ හිමිකරුවන්ට තමන් කවුද කියලා පැහැදිලිව හඳුන්වා දීලා, ඔවුන්ගේ හැඳුනුම්පත් ඉදිරිපත් කරලා, ඔවුන් පැමිණි කාරණය පිළිබඳව එම නිවසේ අය දැනුවත් කරලා තිබෙනවා. ඔවුන්ගේ එකඟත්වය අනුව තමයි එම පරීක්ෂාව සිදු කර තිබෙන්නේ. පරීක්ෂාවක් සිදු වුණාට පසුව සාමාන්‍යයෙන් කරන්නේ, එම නිවසේ සිටින කෙනෙකුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමයි. එම නිලධාරීන් ඒක කරලා තිබෙනවා. ඉදිරියේදී එලෙස නිවාස පරීක්ෂා කරන හැම අවස්ථාවකදීම අපි ඒ ආඥාපනයේ ඇති අධිකරණයට කරුණු වාර්තා කරන්නත් කටයුතු කරනවා. ඉදිරියේදී ඒ පිළිබඳව එම මහෙස්ත්‍රාත් වෙත කරුණු වාර්තා කරන්නත් අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊට අමතරව ඊයේ දිනයේ සිදු වූ අවාසනාවන්ත සිදුවීමක් පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් අද ප්‍රශ්න කරනු ලැබුවා. ඒ තමයි, අනුරාධපුර රෝහලේ වෛද්‍යවරියකට බරපතළ ලෙස ලිංගික වශයෙන් බලහත්කාරකමක් සිදු කිරීම සම්බන්ධ කාරණාව. පොලිසිය වහාම මැදිහත් වෙලා ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. එම විමර්ශන දිගටම සිදු කරමින් පවතිනවා. මේ වන විට සැකකරු හඳුනාගෙන තිබෙනවා. ඔහු හමුදාවෙන් පලා ආ පුද්ගලයෙක්. ඔහු දැනට ජීවත් වන ප්‍රදේශය, මේ අවස්ථාවේ ඉන්නේ කුමන ප්‍රදේශයේද කියලා මේ වනකොට සොයාගෙන තිබෙනවා. ඔහුව අත්අඩංගුවට ගන්න පොලිස් කණ්ඩායම් 5ක් යොදවා තිබෙනවා. මම හිතනවා, ඔහුව කඩිනමින් අත්අඩංගුවට ගන්න හැකියාව ලැබෙයි කියලා. මේ පිළිබඳ විමර්ශන කඩිනම් කරලා එම සිද්ධියට වගකිවයුතු පුද්ගලයන් නීතියේ රැහැනට හසු කර ගන්න අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.26]

ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, டிஜிட்டல் பொருளாதார அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த நாட்டினுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு இந்த அரசாங்கம் பல முன்னோடி நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது. அதற்காக அரசாங்கத்துக்கு எனது நன்றிகளைத் தெரிவிக்கின்ற அதேநேரம், அவை வெற்றியளிக்க வேண்டுமெனவும் பிரார்த்திக்கின்றேன்.

இந்த நாட்டினுடைய பல கட்டமைப்புகளை முன்னெடுப்பதற்கான அத்தியாவசிய காரணிகளை அல்லது கல்வி சார்ந்த விடயங்களை பாடசாலை மட்டத்திலிருந்து ஆரம்பிக்கவேண்டிய கட்டாயத் தேவை இருக்கின்றது. இன்று பல்கலைக்கழகம் செல்கின்றவர்கள் மொழித்திறனைப் பெற்றுக்கொள்ளாத வகையிலும், டிஜிட்டல் உலகை நோக்கிச் செல்ல முடியாத வகையிலும், வெறுமனே பட்டதாரிகளாக வெளியேறக்கூடிய வகையிலேயே பல்கலைக்கழகக் கல்வி காணப்படுகின்றது. தற்பொழுது 30,000 பட்டதாரிகளுக்கு வேலைவாய்ப்பு வழங்கும் திட்டமொன்று முன்னெடுக்கப் படுகின்றது. டிஜிட்டல் தொழில்நுட்பத்துக்கு ஊடாக பட்டதாரிகளுக்கு மேலதிக பயிற்சிகளை வழங்குவதன்மூலம் அவர்களுக்கு வெளிநாடுகளில் தொழில்வாய்ப்புகளைப் பெற்றுக்கொடுப்பதற்கும் இந்த நாட்டின் பாரிய சுமையைக் குறைப்பதற்குமான ஒரு சிறந்த திட்டமாக இத்திட்டம் அமையுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

[ගරු එම්.ඒ.එම්. නාහීර් මහතා]

இந்த நாட்டில் இருக்கின்ற தனியார் நிறுவனங்களாக இருக்கலாம் அல்லது அரச நிறுவனங்களாக இருக்கலாம், அவற்றில் பணிபுரிகின்ற சில அலுவலர்களுக்குக் கணினியை உபயோகிக்கத் தெரியாது. இவ்வாறான சூழலில், இந்த நாட்டை டிஜிட்டல் மயமாக்கி, எவ்வாறு மக்களுக்கு நன்மைகளைக் கொண்டுசேர்க்க முடியும்? அல்லது எவ்வாறு இந்த நாட்டினுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முடியும்? என்ற கேள்வி எழுகின்றது. இவ்வாறான திட்டங்களினூடாக இந்த நாட்டு மக்கள் நன்மைகளைப் பெறுவதற்குத் தயாராக இருக்கின்றார்களா? என்பதை நாங்கள் அறியவேண்டிய தேவை இருக்கின்றது. இன்று சாதாரண மக்களிடம் கைத்தொலைபேசிகள் இருந்தாலும்கூட, இந்த வேலைத்திட்டங்களைச் செயற்படுத்துவதற்கான அறிவுத்திறன் அவர்களிடம் இருக்க வேண்டும். அவ்வாறு இருந்தால்தான் அவர்கள் எங்களோடு இணைந்து பயணிப்பதற்கான சந்தர்ப்பம் ஏற்படும். எனவேதான் இந்த வேலைத்திட்டங்களை மாணவர்களிலிருந்து ஆரம்பிக்க வேண்டுமெனச் சொல்கின்றோம். குறிப்பாக, பல்கலைக்கழகங்களில் கலை, வர்த்தகம், விஞ்ஞானம் போன்ற துறைகளுக்கான மாணவர்களின் எண்ணிக்கையை மட்டுப்படுத்தி, தகவல் தொழில்நுட்பத் துறைக்கான மாணவர்களை அதிகப்படுத்தி, அவர்களுடைய தேவைகளை அடையாளங்கண்டு, பல்கலைக்கழகங்களை அதிகரிப்பதன் மூலம் இவ்வாறான வேலைத்திட்டங்களை அரசாங்கம் வெற்றிகரமாகக் கொண்டுசெல்வதற்கு வாய்ப்பு ஏற்படும்.

இன்று வெளிவாரிப் பட்டதாரிகளில் பெரும்பாலானோர் கலைப் பிரிவில்தான் தங்களுடைய பட்டப்படிப்பைப் பூர்த்தி செய்வதை நாங்கள் பார்க்கின்றோம். ஏனைய துறைகளில் செல்லத் தவறியவர்கள்தான் இந்தத் துறையில் தங்களது பட்டப்படிப்பை இலகுவாக நிறைவுசெய்கின்றார்கள். விஞ்ஞானத் துறை, வர்த்தகத் துறையில் பட்டப்படிப்பைத் தொடர முடியாத சந்தர்ப்பத்தில், கலைப் பிரிவில் இலகுவாக score பண்ணி, தங்களது பட்டப்படிப்பை நிறைவு செய்கின்றவர்களைத்தான் இன்று நாங்கள் அதிகமாகப் பார்க்கின்றோம். அவர்களை நாங்கள் தொழில்நுட்பத் துறையில் பயிற்றுவிப்பதன்மூலம் இந்த நாட்டின் பல தேவைகளை நிவர்த்தி செய்யலாம்.

இன்று அரசாங்கமானது, இணையவழி ஊடாக கட்டணங்களைச் செலுத்துவதற்கு GovPay எனும் வசதியைச் செய்திருக்கிறது. எமது நாட்டில் தனியார் துறைசார்ந்த வியாபார நிலையங்களும் வேறு அமைப்புகளும் இருக்கின்றன. அவற்றிடம் இந்த முறைமையை எவ்வாறு கொண்டுசெல்ல முடியும் என்ற விடயத்தையும் நாங்கள் கவனிக்க வேண்டும். அவற்றுக்கு இவ்வாறான appsஐ விற்பனை செய்வதன்மூலம் அல்லது தொழில்நுட்ப வசதிகளைச் செய்து கொடுப்பதன்மூலம் அரசாங்கத்துக்கு கூடிய வருமானத்தை ஈட்ட முடியும். இன்று இந்தியா, சிங்கப்பூர், மலேசியா போன்ற நாடுகள் டிஜிட்டல் துறையூடாகத் தங்களது வருமானத்தின் பெரும் பகுதியைப் பெற்றுக்கொள்வதற்கான வாய்ப்புகளைப் பெற்றிருக்கின்றன. எமது நாடும் இந்த வாய்ப்புகளைப் பெறுவதற்கான செயற்பாடுகளை பல்கலைக்கழகங்கள் மூலமாக மேற்கொள்ள வேண்டும். குறிப்பாக, டிஜிட்டல் சார்ந்த தொழில்நுட்ப அறிவைப் பெறக்கூடிய வகையில் பல்கலைக்கழகங்களை அபிவிருத்தி செய்ய வேண்டும். இந்தியாவில் இருக்கின்ற பெங்களூர் பல்கலைக்கழகத்துக்கு ஈரான், சீனா போன்ற நாடுகளில் இருந்து மாணவர்கள் அந்தக் கல்வியைக் கற்பதற்காக வருகின்றார்கள். இவ்வாறான வேலைத்திட்டங்களை ஏன் எமது நாட்டில் முன்னெடுக்க முடியாது? என்ற கேள்வியை நான் இச்சபையில் முன்வைக்கின்றேன்.

நேற்றைய தினம் இச்சபையில் கல்வி அமைச்சின் குழுநிலை விவாதம் இடம்பெற்றது. எனினும், அதில் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைக்கவில்லை. எனவே, கல்வி அமைச்சு தொடர்பான சில விடயங்களையும் நான் இந்த நேரத்தில் பேசலாமென நினைக்கின்றேன். ஆசிரியர்களின் இடமாற்ற விடயமென்பது தொடர்ந்தும் பிரச்சினையாகவே காணப்படுகின்றது. சில பிரதேசங்களுக்கு ஆசிரியர்கள் தேவையாக இருக்கின்றார்கள். இன்னும் சில பிரதேசங்களிலிருந்த ஆசிரியர்களைத் தூர இடங்களுக்கு இடமாற்றம் செய்கின்றார்கள். நாட்டின் தற்போதைய பொருளாதாரச் சூழலில், அவர்களுக்குக் கிடைக்கின்ற சம்பளத்தைக்கொண்டு அவர்கள் அங்கு தங்கியிருந்து மாணவர்களுக்குக் கல்வியைப் போதிப்பதென்பது மிகவும் கஷ்டமான ஒரு காரியமாகும். வாழ்க்கைச் செலவு அதிகரித்திருக்கின்ற இந்தக் காலத்தில், மிகத் தூர இடங்களிலுள்ள பாடசாலைகளுக்குச் சென்று வருவதற்கு அல்லது அங்கு தங்கியிருந்து மாணவர்களுக்குக் கல்வியைப் போதிப்பதற்கு தற்போது வழங்கப்படுகின்ற சம்பளம் போதாத நிலையில் ஆசிரியர்கள் பொருளாதார ரீதியாகக் கஷ்டப் படுகின்றார்கள். அதேபோல், ஏனைய உத்தியோகத்தர்களும் கஷ்டப்படுகின்றார்கள். அவர்களுடைய ஊதியத்தில் மூன்றில் ஒரு பகுதி போக்குவரத்துக்குச் செலவாகின்றது. இவ்வாறான சூழலில் அதிக தூரம் சென்று திரும்புகின்ற அல்லது தங்கியிருந்து கடமையாற்றுகின்ற ஆசிரியர்கள் மற்றும் ஏனைய உத்தியோகத்தர்களின் இடமாற்ற விடயத்தில் ஒரு மாற்றத்தைக் கொண்டுவர வேண்டிய தேவை இருக்கின்றது.

ஐந்து வருடங்கள் கட்டாயம் குறித்த இடத்தில் கல்வி நடவடிக்கைகளை அல்லது அலுவலகப் பணிகளைச் செய்ய வேண்டும் என்று இருக்கின்ற நிலையில், ஆறாவது வருடம் அவர்கள் கோருகின்ற இடத்துக்கு இடமாற்றத்தைக் கொடுக்கின்றோமா? என்றால், அதுவும் இல்லை! இதனால் transferஇல் செல்லக்கூடிய மனநிலை சகல அதிகாரிகளிடமும் இல்லாத நிலை காணப்படுகின்றது. எனவே, அவர்கள் மூலமாகச் சிறந்த பயனை அல்லது அடைவை எங்களால் பெறமுடியாத சூழ்நிலை இருக்கின்றது. இவ்வாறான சோர்வு மனநிலையில்தான் ஒவ்வொரு பாடசாலையிலும் கல்விச் செயற்பாடுகள் முன்னெடுக்கப்படுகின்றன. எனவே, இவர்களுடைய இடமாற்றம் சம்பந்தமாக அரசாங்கம் சிறந்ததொரு தீர்வைப் பெற்றுத்தர வேண்டுமெனக் கோருகின்றேன்.

இன்று பல பாடசாலைகளில் அடிப்படை வசதிகள் மிகக் குறைவாகவே காணப்படுகின்றன. அது தேசியப் பாடசாலைகளாக இருக்கலாம் அல்லது மாகாணப் பாடசாலைகளாக இருக்கலாம்! அங்கு உட்கட்டமைப்பு வசதியின்மையானது மாணவர்களுடைய கல்வி நிலையில் மிக மோசமான பாதிப்பை ஏற்படுத்துகின்றது. நான் ஏற்கெனவே பொத்துவில் பாடசாலை சம்பந்தமாகப் பேசியிருக்கிறேன். அங்கு மிகவும் கஷ்டமான சூழ்நிலை இருப்பதை நான் அங்கு சென்று பார்த்தபோது அறிந்து கொண்டேன். எட்டு அடி உயரமான தகரக் கொட்டகையில் அருகருகே ஆறு வகுப்பறைகள் காணப்படுகின்றன. ஒரு வகுப்பறையில் கல்வி கற்பிக்கும் ஆசிரியரின் சத்தமானது, அடுத்த

வகுப்பறையிலுள்ள மாணவர்களுக்கு கல்வி கற்றுக்கொடுக்க முடியாதளவுக்கு மிகவும் இடைஞ்சலாக இருக்கின்றது. இவ்வாறு அம்பாறை மாவட்டத்திலுள்ள பல பாடசாலைகளில் வகுப்பறைகள் தகரக் கொட்டகைகளிலும், மரத்தடியிலும் இயங்கி வருவதைக் காணக்கூடியதாக இருக்கின்றது. எனவேதான் கல்வித்துறைக்கு கடந்த காலத்தைவிட மிகக் கூடுதலான நிதி இந்த வருட வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்டுள்ளது.

இந்தியாவின் நிதி உதவியைக்கொண்டு கிழக்கு மாகாணத்தில் பல பணிகளைச் செய்யவுள்ளதாக மாண்புமிகு சனாதிபதி அவர்கள் தெரிவித்திருந்தார். அங்குள்ள பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்துவதற்கு இந்த நிதியில் கூடுதலான பகுதியைப் பயன்படுத்த வேண்டும். இந்த நாட்டில் ஆரோக்கியமான சமூகத்தைக் கட்டியெழுப்புவதற்கான - சிறந்த பிரஜைகளை உருவாக்குவதற்கான - ஆரம்பப் படிகளை பாடசாலை மட்டத்திலிருந்து நாங்கள் ஆரம்பிக்கவேண்டிய தேவையிருக்கின்றது. இன்று பல மாணவர்கள் பல்வேறு கஷ்டங்களுக்கு மத்தியில் தூரப் பாடசாலைகளுக்குச் செல்கின்றார்கள். அண்மையிலுள்ள பாடசாலைகளில் அடிப்படை வசதிகள் இல்லாத காரணத்தால், அவர்கள் தூர இடங்களிலுள்ள வசதியான பாடசாலைகளுக்குச் செல்கின்றார்கள். இன்று சாதாரணமாக பாடசாலைகளில் கதிரை, மேசைகளுக்குக்கூட காசு அறவிடப்படுவதை நாங்கள் காண்கின்றோம். மாணவர்களுடைய பெற்றோரின் பொருளாதார நிலையைக் கருத்திற்கொண்டு இவ்வாறான விடயங்களைத் தவிர்க்க வேண்டும். இதில் அரசாங்கம் கூடுதல் கவனமெடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய அம்பாறை மாவட்டத்தைப் பொறுத்தவரையில், அங்குள்ள பல பாடசாலைகளில் ஆசிரியர்களுக்கான தேவைப்பாடு இருக்கின்றது. இவ்வாறு இருக்கையில், எங்களுடைய மாவட்டத்தைச் சேர்ந்த ஆசிரியர்களை திருகோணமலை, மட்டக்களப்பு மாவட்டங்களிலுள்ள பாடசாலைகளுக்கு அனுப்புகின்றார்கள். இச்செயற்பாட்டை எதிர்வரும் காலங்களில் குறைக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். ஆசிரியர்கள் மட்டுமல்ல, ஏனைய அலுவலர்களும் இவ்வாறு தூர இடங்களுக்கு இடமாற்றப்படுகின்றார்கள். குறிப்பாக, பெண்கள் சேவை நிமித்தம் ஏனைய மாவட்டங்களுக்கு இடமாற்றம் செய்யப்படுகின்றார்கள். மொழி ரீதியான பிரச்சினை ஏற்படக்கூடியவாறு, சிங்கள மொழிமூல பாடசாலைகளுக்குத் தமிழ் மொழியைத் தாய் மொழியாகக் கொண்ட ஆங்கில பாட ஆசிரியர்களை இடமாற்றம் செய்திருப்பதை நாங்கள் பார்க்கின்றோம்.

கடந்த கால அரசாங்கங்களின் ஊழல், மோசடிகள் என்பவற்றை மையப்படுத்தி வேலைத்திட்டங்களை முன்வைத்ததனால்தான் அதிகமான மக்கள் தேசிய மக்கள் சக்திக்கு ஆதரவாக கடந்த இரண்டு தேர்தல்களிலும் வாக்களித்து, சனாதிபதியாக மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களையும் 159 பாராளுமன்ற உறுப்பினர்களையும் தெரிவுசெய்து இருக்கிறார்கள். பாராளுமன்றத்தில் தேசிய மக்கள் சக்திக்கு தனித்து 159 ஆசனங்கள் இருப்பதென்பது, இந்த நாட்டிலுள்ள எல்லாச் சட்டங்களையும் மாற்றியமைத்து, எதிர்காலத்தில் இந்த நாட்டின் வளர்ச்சிக்காகச் சிறந்ததொரு பணியை முன்னெடுப்பதற்கு ஏதுவாக இருக்கும். நாட்டைக் கட்டியெழுப்புவதற்காக மக்கள் உங்களுக்கு வழங்கிய ஆணையை வைத்து நீங்கள் எவ்வாறான செயற்பாடுகளைச் செய்யப்போகின்றீர்கள் என்பதை முழு நாடும் பார்த்துக்கொண்டு இருக்கின்றது. பலர்மீது குற்றம் சுமத்துவதும், பலரைத் தேடுவதும், பலரைக் கைதுசெய்வதும், அவர்களைக் கைதுசெய்த அன்றைய தினமே பிணையில் விடுதலை செய்வதும் என ஒரு நாடகம் இந்த நாட்டில் நடைபெறுகின்றதா? என்பதை மக்கள் உன்னிப்பாகப் பார்த்துக்கொண்டு இருக்கின்றார்கள்.

எதிர்வருகின்ற தேர்தலுக்காக இவ்வாறான செயற்பாடுகளை நீங்கள் முன்னெடுக்கின்றீர்களா? என்பதையும் மக்கள் பார்த்துக்கொண்டுதான் இருக்கின்றார்கள். இவ்வாறான செயற்பாடுகளைத் தவிர்த்து, சிறந்ததொரு பொருளாதாரத்தைக் கட்டியெழுப்பக்கூடிய வகையில், நாட்டு மக்களின் வாழ்வாதாரத்தை முன்னேற்றக்கூடிய வகையில், பொருட்களின் விலைவாசியைக் குறைப்பதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த நாட்டு மக்களைப் பொருளாதார ரீதியாக மேம்படுத்துவதற்கு நீங்கள் எடுக்கின்ற நடவடிக்கைகளை நாங்கள் பாராட்டுகின்றோம். உதாரணத்துக்கு, நீங்கள் வீண்விரயங்களைக் குறைத்து வருகின்றீர்கள். செலவுகளைக் குறைப்பதனால் மட்டும் இந்த நாட்டைக் கட்டியெழுப்ப முடியாது. பொருட்களின் விலைவாசியைக் குறைப்பதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும். அதுமாத்திரமன்றி, உத்தியோகத்தர்களுக்கான சம்பளத்தையும் அதிகரிக்க வேண்டும். மக்களுடைய சிறப்பான வாழ்க்கையையும் மகிழ்ச்சியையும்தான் நாங்கள் நாட்டின் அபிவிருத்தியாகக் கருத முடியும். நீங்கள் நிகழ்ச்சிநிரலுக்கு ஏற்ப பல வேலைத்திட்டங்களை முன்னெடுத்தாலும், அதனூடாக அரசியல் செய்கின்றீர்களா? என்பதை நாட்டு மக்கள் பார்த்துக்கொண்டுதான் இருக்கின்றார்கள். நீங்கள் மறைமுகமாகப் பாரியதோர் அரசியலைச் செய்துகொண்டு இருக்கின்றீர்கள். அது மக்களுக்கு நன்மை பயக்கக்கூடியதாக இருக்குமாக இருந்தால், நாங்கள் உங்களுடன் இணைந்து பயணிப்பதற்குத் தயாராக இருக்கின்றோம். இந்த நாட்டு மக்களுடைய பிரச்சினைகள் தீர வேண்டுமென்றால், பொருளாதார முன்னேற்றம் ஏற்பட வேண்டும். அதற்கு விலைவாசி குறைப்பு, சம்பள அதிகரிப்பு போன்ற செயற்பாடுகள் முன்னெடுக்கப்பட வேண்டும். எனவே, இவற்றைச் செய்ய வேண்டுமென விநயமாகக் கேட்டு, வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු නලීන් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.

[අ.හා. 2.42]

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ පැවැත්වෙන්නේ අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය වුණත්, අපි සුදානම් වෙලා ආවේ ඒ විවාදයට වුණත්, ඒ ගැන කථා කිරීමට ප්‍රථම මම කාරණයක් කියන්න ඕනෑ. ඉතාම කම්පනයෙන් යුතුවයි මේ කථාව ආරම්භ කරන්නේ. මම හිතන විධියට, අපි සියලු දෙනාම එහෙමයි. ගරු මහජන ආරක්ෂක ඇමතිවරයා අදහස් දැක්වූවා වාගේම අනුරාධපුර රෝහලේ වෙච්ච සිද්ධිය අපි සියලු දෙනා කම්පනයට පත් කරවන සිදුවීමක්. රෝහල් පරිශ්‍රය තුළ, නැත්නම් රෝහලේ තමන්ගේ on-call room එක තුළ තරුණ වෛද්‍යවරියක් ඒ වාගේ අපරාධයකට ලක්වීම මෙතෙක් කාලයක් එවැනි රෝහල්වල වැඩ කරපු වෛද්‍යවරයෙකු විධියට පෞද්ගලිකව මමත්, අපි හැමෝමත් ඉතාම කම්පනයට පත් කරන සිදුවීමක්. ඒ වාගේම මහජන ආරක්ෂක ඇමතිතුමා කියූ විධියට ඒ පරීක්ෂණ කටයුතු කඩිනමින් සිද්ධ වෙනවා සහ එසේ වනු ඇතැයි කියාත් අපි බලාපොරොත්තු වනවා.

විශේෂයෙන් මගේ බිරිඳත් නිවසින් බැහැර වෙලා ඒ ආකාරයට on-call roomsවල නැවතිලා සේවය කරන වෛද්‍යවරියක්; මගේ සොයුරියත් එහෙම වැඩ කරන වෛද්‍යවරියක්. ඒ නිසා මේක අපි හැමෝටම ඉතාම බරපතළ විධියට දැනෙන සහ හැමදාම අසන්නට ලැබෙන්නේ නැති ආකාරයේ අපරාධයක්. ඒ නිසා මේකට අදාළ ක්‍රියාමාර්ග සියල්ල කඩිනමින් ගනිමින්, නීතිය උපරිමයෙන් ඉෂ්ට කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා. අපි ආණ්ඩුවක් විධියටත් දැඩිව ඒ ක්‍රියාවලිය වෙනුවෙන් පෙනී සිටිනවා. අපි මහජන ආරක්ෂක ඇමතිතුමා එක්ක කථා කරද්දීත්, ඒ සම්බන්ධව පෞද්ගලිකව අපට ලොකු විශ්වාසයක් ආවා.

මෙවැනි සිද්ධීන් නැවත නොවෙන්න, ඒ අදාළ ආරක්ෂක තත්ත්වයන් සම්බන්ධයෙනුත් අපේ අවධානය යොමු කළ යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක හුදෙකලා සිදුවීමක් වෙන්න පුළුවන්. නමුත් මෙවැනි සිදුවීම්වලට හේතු වුණු පසුබිම සොයා බලා, එක පැත්තකින් අපි රෝහල් භූමියේ ආරක්ෂක තත්ත්වය, රෝහල් ඇතුළේ ආරක්ෂක තත්ත්වය වාගේම ඒවායේ වැඩකටයුතු සිද්ධ වෙන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් නැවත සිතා බැලීමක්, මැදිහත්වීමක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කළ යුතුයි; කරන්න නියමිතයි. රෝහල්වල නිල නිවාසවල, මේ on-call roomsවල සිටින නිලධාරීන් ඇතුළු සියලු සෞඛ්‍ය සේවකයන්ගේ ආරක්ෂාව තහවුරු වෙන ආකාරයට මේ සඳහා මැදිහත් විය යුතුයි. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, මේ සිද්ධියෙන් අපි පාඩමක් ඉගෙන ගෙන රජයේ සේවකයන් ඇතුළු සියලු සේවකයන්ගේ, රාජ්‍ය ආයතනවල ආරක්ෂක තත්ත්වය තහවුරු කරන්න කටයුතු කළ යුතුයි. ඊ වැඩ මුරවල නිරත කාන්තාවන් වැනි විශේෂයෙන් ආරක්ෂාවක් අවශ්‍ය කාන්තාවන්ට ඒ ආරක්ෂාව තවදුරටත් වැඩි කරන්නට අදාළ ක්‍රියාමාර්ග ගන්න කටයුතු කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝහල් පද්ධතිය ගැන අපට තිබෙන අත්දැකීම ගත්තොත්, අවුරුදු 10, 15, 20, 30 පරණ නවාතැන් තමයි තිබෙන්නේ. මම අන්තිමට වැඩ කරද්දී, නැවතිලා හිටියා, අවුරුදු 35ක් විතර පරණ quarters එකක. ඒ වාගේ තත්ත්වයක් ඔබ ඕනෑම රෝහලකට ගියොත් දකින්න පුළුවන්. බොහෝ රෝහල්වල ඉස්සරහ පැත්ත හොඳට තිබුණාට, වෛද්‍යවරුන්ට, හෙද හෙදියන්ට, අනෙකුත් සේවකයන්ට නැවතී සිටින්නට තිබෙන නවාතැන් - quarters - බොහොම පරණ ඒවා. මේ කාරණයේදී මාත් එක්ක හැමෝම එකඟ වෙයි. බොහොම පරණ, පිළිසකර නොකරපු, පිටිපස කැලෑ වැවුණු තත්ත්වයක් තමයි ඒවායේ තිබෙන්නේ. ඒවායේ එහෙම තත්ත්වයක් තමයි අපි මේ රට භාර ගනිද්දී තිබුණේ. මම හිතන විධියට, අය වැය විවාදයේදීත් අපේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා ඉතා පැහැදිලිව කිව්වා, මේ අවුරුද්දේ විශාල මුදලක් රෝහල්වල නිල නිවාස සහ ඒ on-call rooms ආදිය ප්‍රතිසංස්කරණය කරන්න වෙන් කර තිබෙනවා කියලා. මේ සිදුවීමත් එක්ක ඒ ක්‍රියාවලිය තවදුරටත් කඩිනම් කරලා අවශ්‍ය නම් තව මුදල් වෙන් කරලා ඒ කටයුතු කරගෙන යාවි කියලා අපට බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි මැදිහත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම එන්නම්, අද දවසට අදාළ විවාදයට. අද දවසේ විවාදය ආරම්භ කරපු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා දීර්ඝ අදහස් දැක්වීමක් කළා. මම එතුමා ඉදිරිපත් කරපු කරුණු දෙක තුනකට පිළිතුරු දීලා ඉදිරියට යන්නම්. මම හිතන විධියට, අපි මේ අය වැය විවාදයේදී ඒවා සම්බන්ධව යම් ආකාරයකට කථා කළා. එතුමා එක තැනකදී මතු කළා, මේක ආණ්ඩුවේ සැලැස්මක් නොවෙයි, IMF එකේ සැලැස්මක් අනුව ඉදිරිපත් කරපු අය වැයක්ද කියන කාරණය. ඒකද මේ වෙන්නේ කියලා ඇහුවා. IMF එකේ සැලැස්මක් අනුව තමයි, මේ අය වැය එන්නේ සහ මේ දේවල් වෙන්නේ කියලා කිව්වා. ඇත්තටම අපි ඒ ප්‍රශ්නයට උත්තර දීලා තිබෙනවා. හැබැයි, නැවතත් කිව්වොත්, මේ කිසිවක් අපේ තෝරා ගැනීමක් නොවෙයි. 2024 සැප්තැම්බර් 21වැනි දා පැවැති ජනාධිපතිවරණයෙන් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා පත් වෙලා, මේ රට භාර ගැනීමේදීත්, ඊළඟට, 2024 නොවැම්බර් 14වැනි දා පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් අපි ජයග්‍රහණය කරද්දීත්, මේ රට අරගෙන ඇවිල්ලා හිර වෙලා එක තැන තිබුණු තත්ත්වයක් තිබුණා. ඒ තමයි, ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ programme එකක් ඇතුළේ තිබුණු රටක් වීම. අවුරුදු දෙකකට කලින් බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කළාට පස්සේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ programme එකක අවුරුදු දෙකක් ගිය රටක්; එහෙම යමින් තිබුණු රටක්, මේක. ජනාධිපතිවරණයට දවස් දෙකකට කලිනුත් රනිල් වික්‍රමසිංහ මහත්මයා පෞද්ගලික බැඳුම්කර හිමියන් සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවකට ආපු රටක් තමයි අපිට ලැබුණේ. මේ අපේ දුක කියනවා නොවෙයි. ඒක තමයි යථාර්ථය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට ඒ යථාර්ථයේ සිට තමයි, අපිට වැඩ කරගෙන යන්න වෙන්නේ. එහෙම නැතුව අහසේ ඉඳන් වැඩ කරන්න බැහැ. අපි මැතිවරණයේදී කිව්වේ ඒක තමයි. මැතිවරණයේදී අපි ජනතාවට ඒ ඇත්ත කිව්වා. මේක තමයි තිබෙන තත්ත්වය, අධ්‍යාපනය සම්බන්ධයෙන් අපේ ප්‍රතිපත්තිය මේක, සෞඛ්‍ය සම්බන්ධයෙන් අපේ ප්‍රතිපත්තිය මේක කියලා අපි කිව්වා.

ඒ වාගේම, ජනාධිපතිතුමා අපේක්ෂකයෙක් විධියට සිටියදී පැහැදිලිව අද මේ ප්‍රස්තුත කාරණාව වුණු ඩිජිටල්කරණය පිළිබඳ මාතෘකාව ගැන කථා කළා. ඒ සම්බන්ධව තිබෙන අපේ ප්‍රතිපත්තිය මේකයි කියන එක අපි කිව්වා. හැබැයි, ඒ සියල්ල කියද්දී අපිට පටන් ගන්න වෙන්නේ කොතැනින්ද කියන එකත් අපි පැහැදිලිව කිව්වා. ඒ ගැන ඉතාම නිරවුල් අදහසක් අපි කියලා තිබෙන්නේ. IMF ගිවිසුමක් ඇතුළේ අපි ඉන්නේ, අපි ක්‍රමානුකූලව මේ රටේ නිෂ්පාදනය වැඩි කරලා, 2028 වෙද්දී මේ රටේ ණය අර්බුදයෙන් එළියට එන්න පුළුවන් විධියේ, මේ රටේ ණය ගෙවන්න පුළුවන් විධියේ සැලැස්මක් ඇතුළේ, IMF එකත් එක්ක නැවත සාකච්ඡා කරමින්, ජනතාවට වඩාත් හිතකර කොන්දේසිවලට අදාළ තත්ත්වයන් ලබා ගන්න සාකච්ඡා කරමින්, ඉස්සරහට යනවා කියන එක තමයි අපි කිව්වේ. අපි ජනතාවට පොරොන්දු වුණේ ඒක. ඒ අතරවාරයේ -අර රනිල් වික්‍රමසිංහ මහත්මයා ඔහේ ගියා වාගේ නොවෙයි- රටේ ආර්ථිකය

ගොඩනංවන්න, 2028 වෙද්දී මේ අර්බුදයෙන් එළියට එන්න, අදාළ ආර්ථිකයක් හදන්න මැදිහත්වීම කරන ගමන්, මේ programme එකේ යනවා කියන එක තමයි අපි කිව්වේ. ඒක හරිම පැහැදිලියි. ඒක තමයි මේ කරලා තිබෙන්නේ.

ඒ කාරණා දෙකට උදාහරණ කිව්වොත්, එකක් තමයි, මෙවර අය වැයෙන් වියදම් කරන්න පුළුවන් මුදල කොපමණද කියන එක අපි තීරණය කරන එකක් නොවෙයි. ඒක තීරණය වෙලා තිබෙන්නේ. හැබැයි, ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව, මොනවාටද වියදම් කරන්නේ, මොනවාටද වැඩිපුර වියදම් කරන්නේ, කොච්චරක්ද වියදම් කරන්නේ කියන එක තීරණය කරන්න පුළුවන්. ඒක අපි පෙන්වා තිබෙනවා. ඒ අනුව, අධ්‍යාපනයට, සෞඛ්‍යයට, පොදු ප්‍රවාහනයට ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, මේ රටේ අනෙකුත් අංශවල සුබසාධනයට, ළමයින් වෙනුවෙන්, කාන්තාවන් වෙනුවෙන් වෙන් කරන මුදල අපි කියලා තිබෙනවා. එතකොට, මේ රටේ මොන පැත්තටද මේක වැඩ කරන්නේ කියන එක අපි කියලා තිබෙනවා, පෙන්වා තිබෙනවා. අනෙක් පැත්තෙන්, IMF එකත් එක්ක සාකච්ඡා කරලා, වෘත්තිකයන්ගේ බදු සීමාව රුපියල් එක්ලක්ෂ පනස්දහස දක්වා වැඩි කරන්න, ඒ වාගේම, Digital Services Tax එක සියයට 30ක් ලෙස එකඟ වෙලා තිබුණු එක සියයට 15 දක්වා අඩු කරන්න, කෘෂිකර්මය, කර්මාන්ත වාගේ ක්ෂේත්‍රවලට ඒ අදාළ රාජ්‍ය ආයෝජන කරන්න අවශ්‍ය මැදිහත්වීම අපි කරලා තිබෙනවා. ඒ නිසා මේක ගැන එහෙම වෙනස් අදහසක් හදන්න එපා. අපි කථා කරපු සහ කියපු දේ තමයි මේ කරන්නේ.

ඊළඟට, දිලිත් ජයවීර මැතිතුමා තවත් කාරණාවක් මතු කළා. මට තිබෙන සීමිත වෙලාවේදී ඒ ගැනත් කියන්න ඕනෑ. එතුමා Digitl ID එක ගැන කිව්වා. Digital ID එක ගැන කථා කරලා එතුමා කරුණු දෙකක් ඉදිරිපත් කළා. ඒක ඉක්මනට කරන්න ඕනෑ, හැමදාම කථා කරනවා විතරයි කියලාත් කිව්වා. ඒ වාගේම, ඉන්දියාවට තොරතුරු යනවා කියලා මාස ගණනාවක් තිස්සේ එක එක්කෙනා කියන කථාවම එතුමාත් මෙතැන කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ වැඩමුළුවක් තිබුණා. මේ ප්‍රශ්නය නිසාම, ඩිජිටල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ විවාදයට කලින්, ඊයේ දවසේ පැය දෙකක් වෙන් කරලා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශයේ එක් එක් ආයතනවල -මේ අමාත්‍යාංශය යටතේ ආයතන හයක් තිබෙනවා- බලධාරීන්, අධ්‍යක්ෂවරුන් ඇතුළු සියලුදෙනා ගෙන්වලා සියලු පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ ගැන අදහසක් ලබා ගන්න අදාළ වැඩමුළුවක් තිබුණා. මොකද, ඒ වැඩමුළුව පැවැත්වූයේ කෘෂිකර්ම අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය වාගේ නොවෙයි, මේක අලුත් අමාත්‍යාංශයක් නිසායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න.

මේ අමාත්‍යාංශය අපිට විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවේ මීට පෙර හිටපු මන්ත්‍රීවරුන්ටත් අලුත් අමාත්‍යාංශයක්. ඒ ගැන අදහස් ලබා ගන්න, ඒ ගැන තිබෙන ප්‍රශ්න නිරාකරණය කර ගන්න තමයි ඒ වැඩමුළුව තිබුණේ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් අඩු ප්‍රමාණයක් තමයි ඒකට සම්බන්ධ වුණේ. හැබැයි, ඒ අතර මම කියන්න ඕනෑ, සමහර මන්ත්‍රීවරුන් ඇවිල්ලා ඉතා හොඳ මැදිහත්වීමක් කළ බව. එතුමන්ලා ඒ අදාළ කරුණු නිරවුල් කර ගත්තා.

එතැනදී මේ සම්බන්ධයෙන් ඉන්න ප්‍රවීණයන් කථා කළා. Dr. Hans Wijayasuriya ඇවිල්ලා කථා කළා, මොකක්ද වෙන්නේ, ඉන්දියාවට තොරතුරු යනවා කියන කථාව මොකක්ද කියලා. ඉතින් ඒ අවස්ථාව පාවිච්චි නොකර, නැවතත් වෙනත් අදහස් මෙතැනට ඉදිරිපත් කරන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. ඩිජිටල්කරණය සම්බන්ධයෙන් වන ආණ්ඩුවේ ව්‍යාපෘතිය ගැන අද මට වැඩිදුර කරුණු දක්වන්න බැරි වුණත්, ඉදිරි විවාදයකදී අපේ ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු පිරිස මේ සම්බන්ධයෙන් නිරවුල් නොවෙච්ච තවත් කාරණා ඉදිරිපත් කරාවි. අද ඒ සම්බන්ධයෙන් යම් නිරවුල්භාවයක් ඇති වෙයි කියලා බලාපොරොත්තුවෙන් මගේ කථාව අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.51]

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය හා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් පැවැත්වෙන විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි මේ රටේ තිබෙන ප්‍රශ්න ගැන සලකා බැලුවොත්, එහි ප්‍රමුඛතාව පෙළ ගැස්සුවාම එහි ඉහළින්ම තිබෙන කාරණා තමයි මේ රටේ හොරකම, දූෂණය, වංචාව අවම කිරීම සහ රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම කියන කාරණා. ඒකට එකම විසඳුම ඩිජිටල්කරණය කියන එක ආණ්ඩු පක්ෂය වාගේම විපක්ෂයේ අපිත් පිළිගන්නා කාරණාවක්. 2001දී තමයි මේ ඩිජිටල්කරණය ගැන ලෝකයේ කථාබහට ලක්වෙන්නේ. ඒ අනුව එදා ලංකාවේත් ICTA කියන ආයතනය බිහි කරලා ඒ තුළින් මේ රටේ ඩිජිටල්කරණය ආරම්භ කළත්, ඒ අරමුණ ඉෂ්ට වුණේ නැහැ, මේ රටේ පත් වෙච්ච පාලකයන් නිසා. එම නිසා මේ වෙනකොට ICTA එක වහන මට්ටමට ඇවිල්ලා තිබෙනවා.

ලෝකය 2001දී ඩිජිටල්කරණය ගැන කථා කළාට, මේ මොහොත වන විට ලෝකයේ AI යුගයක් බිහි වෙලා තිබෙන්නේ. අපි තවමත් ඩිජිටල්කරණ යුගයක් ගැන තමයි කථා කරන්නේ. ඒ කෙසේ වුණත්, සතුටු වෙන්න පුළුවන් කාරණාව තමයි වර්තමාන රජයත්, ජනාධිපතිතුමාත්, ජනාධිපතිතුමා යටතේ පත් වෙලා ඉන්න කණ්ඩායමත් මේ විෂය සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් දැක්වීම. ඒක හොඳ කාරණාවක්. විපක්ෂය විධියට අපිත් ඒ සඳහා ලබාදෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබාදෙන්න සූදානම්. මේ ආණ්ඩුව ගත්ත මේ පියවර සම්බන්ධයෙනුත්, මේ අමාත්‍යාංශය ජනාධිපතිවරයා යටතට පත් කර ගැනීමත්, ඒ විෂය සම්බන්ධ දැනුම තිබෙන කණ්ඩායමක් පත්කර ගැනීමත්, ඒ විෂය සම්බන්ධයෙන් ප්‍රවීණයන් කණ්ඩායමකට වගකීම දීම සම්බන්ධයෙනුත් රජයට අපි ගෞරවය හා ස්තුතිය පුද කරනවා.

[ගරු චතුර ගලප්පත්ති මහතා]

ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් මේ ආකාරයටම වැඩි ප්‍රමුඛතාවක් දීලා තමයි ඩිජිටල්කරණය ආරම්භ කළේ. නමුත් මාස 6ක් යනකොට එදා IT ක්ෂේත්‍රයේ ඉන්න පතාක යෝධයෝ විධියට හඳුනාගත්ත Dr. Sanjeewa Weeraratne වාගේ මැතිතුමන්ලා පවා මාස 6ක් යනකොට මේ කාර්යයෙන් අයින් වුණා. ඒ නිසා වර්තමාන රජයට එවැනි තත්ත්වයක් උදා නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මොකද, මේ රට හදන්න තිබෙන ප්‍රධානතම අමාත්‍යාංශය තමයි මේක. මේ රට වෙනස් කරන්න මේ රටේ මිනිස්සු system change එකක් බලාපොරොත්තු වෙනවා නම්, ඒ system change එක කරන්න පුළුවන් ප්‍රධානම අමාත්‍යාංශය විධියටයි මම මේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය දකින්නේ. ඒ නිසා වර්තමාන රජයට ඒ සඳහා කරන කටයුතු සාර්ථකව කරගෙන යන්න ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ඩිජිටල්කරණය යථාර්ථයක් කිරීමේදී එකේ පදනම විධියට රජය හඳුනාගෙන තිබෙන්නේ digital ID එක. ඔව්, අපිත් විශ්වාස කරනවා ඒක තමයි, මේ ඩිජිටල්කරණය සහ මේ system එක හදන්න base එක වෙන්නේ කියලා. එතැනදී දැනටත් පාවිච්චි කරන National Identity Card එක සහ digital ID එක අතර වෙනස ගත්තොත්, ඒකට ඩිජිටල් අංකයක්, එහෙම නැත්නම් උපතේදී ලබාදෙන අංකයක් ඇතුළත් වෙනවා කියලා ඊයේ දැනගන්න ලැබුණා. කෙසේ වුණත්, ඒක මොකක් හෝ අංකයක් නේ. ඒකේ ගැටලුවක් නැහැ. මෙතැනදී ඒකට එක් කරන අලුත් data තමයි biometric data ටික. Biometric data කිව්වාම ඒවා පුද්ගලයෙකුට අනන්‍ය වෙච්ච ඇඟිලි සලකුණු වෙන්න පුළුවන්, මුහුණ, ඇස් වැනි features scan කරලා ගන්න code එකක් වෙන්න පුළුවන්. ඒ අනුව පුද්ගලයෙකුට අනන්‍ය වෙච්ච biometric data තමයි මේකට අතුළු කරන්නේ. අද බොහෝදෙනෙකුගේ කථාබහට ලක් වෙලා තිබෙනවා, මේ biometric data සම්බන්ධව. මේ data වෙන අය අතට ගියොත් මේ රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් මොන වාගේ තත්ත්වයක්ද ඇති වෙන්නේ කියලා කතිකාවක් තිබෙනවා. ඒ නිසා මමත් ඒ ගැන පොඩි සඳහනක් කරන්නම්. Biometric data කියනකොට, අතිගරු ජනාධිපතිතුමාගේ data වෙන්න පුළුවන්, අගමැතිතුමියගේ data වෙන්න පුළුවන්, මේ රටේ ආරක්ෂක අංශයේ ඉන්න ඉහළම නිලධාරීන්ගේ data වෙන්න පුළුවන් මේ හැමෝගෙම තොරතුරු තමයි අපි store කරන්න හදන්නේ. මම මේ කාරණාව කියන්නේ ඇත්තටම අපි මේ පිම්ම පනින්න ඕනෑ නිසායි. ඒ සඳහා හරිම හරි තීන්දුව අපි ගන්නම ඕනෑ. මේ රටේම ජනතාවගේ පෞද්ගලික සංවේදී තොරතුරු හා දත්ත වෙන අය අතට ගියොත් එතැන ඇතිවිය හැකි තත්ත්වය ගැනයි අපි සාකච්ඡා කළ යුත්තේ.

එතකොට මේ data සියල්ල centralized තැනක තිබුණොත්, කෙනෙකුට access කරන්න තිබෙන පහසුව සහ ඒක decentralized කරලා තිබුණොත් ඒකට තිබෙන අපහසුතාව පිළිබඳවයි අපි සාකච්ඡා කරන්න ඕනෑ. ඇත්තටම මේ දත්ත පද්ධතිය hack වෙන්නේ නැහැ කියලා කාටවත් කියන්න හැකියාවක් නැහැ. අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාත් සභාවේ ඉන්නවා. අපි ජනාධිපතිතුමාගෙන් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් Dr. Hans Wijayasuriyaගෙන් වෙන්න පුළුවන් - ඒ ඕනෑ කෙනෙකුගෙන්- මේ dataවලට access කරන්න වෙනත් අයට හැකියාවක් තියෙයිද නැද්ද කියලා ඇහුවොත්, ඒක හරියට කියන්න බැහැ. කෙනෙක් කියයි ඒ සඳහා Data Protection Authority එක හදනවා, අලුත් අධිකාරියක් හදනවා කියලා. ඔව්, ලෝකයෙත් එවැනි දේවල් ඇති වෙලා තිබෙනවා.

මම මේ ගැන උදාහරණ කිහිපයක් කියන්නම්. 2013දී LexisNexis එක hack කරලා තිබෙනවා. LexisNexis කියන්නේ නීතිමය හා පොදු වාර්තා තොරතුරු පිළිබඳ ලොව විශාලතම විද්‍යුත් දත්ත ගබඩාව. ඒක 2013දී hack කරලා තිබෙනවා. ඊට පසුව 2015දී CIA, Directorගේ පෞද්ගලික e-mail account එක hack කරලා තිබෙනවා, පාසල් යන ශිෂ්‍යයෙක්. ඒ වාගේම Dutch Intelligence Services එකෙන් රුසියානු විදේශ බුද්ධි සේවය hack කරලා තිබෙනවා, 2022දී. සාමාන්‍යයෙන් රුසියානු බුද්ධි සේවය කියන්නේ ලෝකයේ තිබෙන ප්‍රධානතම highly secured තැනක්. නමුත් ඒකත් hack කරලා තිබෙනවා 2022දී Dutch Intelligence Services එකෙන්. ඒ වාගේම 2024දී චීන hackersලා ඇමෙරිකානු භාණ්ඩාගාරය hack කරලා තිබෙනවා. ඒ වාගේම චීන hackersලා ඇමෙරිකාවේ විදේශ ආයෝජන තක්සේරු කරන රජයේ කාර්යාලය hack කරලා තිබෙනවා, 2025 ජනවාරි 10වැනි දා. මේ අවුරුද්දේ ජනවාරි 10වැනි දා. ඒ වාගේම මම මේ දැන් දැක්කා, 40,000ක් විතර ඉන්න "X" සමාජ මාධ්‍ය ජාලයේ බිඳ වැටීමක් තිබෙනවා. Elon Musk සඳහන් කරලා තිබෙන්නේ, මේක සයිබර් ප්‍රහාරයක් කියලා. මම මේ කිව්වේ ලෝකයේ දැවන්ත ආයතනවලට ඇති වෙච්ච සයිබර් ප්‍රහාර ගැන. ලංකාවේ සිද්ධියක් මට මතකයි. ඒක වුණේ ගිය අවුරුද්දේද කියලා මට මතක නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයේ G.C.E A/L resultsවලට access කරන්න එවැනි උත්සාහයක් අරගෙන තිබෙනවා කියලා මට ආරංචියක් ලැබුණා. ලංකාවේ වෙච්ච ප්‍රධානම කාරණාවක් තමයි NMRA එකේ දත්ත මගඩිය. එතකොට මේ රටේ සංවේදී තොරතුරුවලට, විශේෂයෙන් Lanka Government Cloud එකට access කරලා data වෙනස් කිරීම නිසා මේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් එල්ල වුණා. බොහෝදෙනෙකුට ජාතික ආරක්ෂාව පිළිබඳ අවබෝධයක් ලැබෙන්නේ නැහැ, තමුන්ට ප්‍රශ්නයක් වෙනකම්. ඒ නිසා මේ කාරණාව ඉතා වැදගත්.

ඒ වාගේම මට තව සිදුවීමක් කියන්න පුළුවන්. මගේ විශ්වවිද්‍යාල ජීවිතයේ මගේ junior batch එකේ ශිෂ්‍යයෙක් කොළඹ විශ්වවිද්‍යාලයේත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේත් systems hack කරලා තිබුණා. ඒ වාගේ උදාහරණ ඕනෑ තරම් ලංකාවෙන් දෙන්න පුළුවන්. මම විශේෂයෙන් විදේශීය උදාහරණ ගණනාවක් කිව්වේ ඒකයි. අපි කොච්චර කිව්වත්, මේවා ආරක්ෂිතයි, මේවා hack කරන්නේ නැහැ කියලා, මොකක් හරි අවස්ථාවක කොහේ හරි අඩු පාඩුවක් තිබෙන්න පුළුවන්. ඒ තුළින් ඒ hackersලාට data access කරන්න පුළුවන්. විශේෂයෙන් Google, Microsoft කියන ආයතන පවා යම් product එකක් හරි, system එකක් හරි හදනවා නම් ඒක hack කරනවා කියන අදහසින් තමයි ඒ product එක හදන්න කටයුතු කරන්නේ.

මේ කාරණාව ඉෂ්ට වෙන්න, මේ කාරණාව යථාර්ථයක් බවට පත් කරන්න කටයුතු කිරීමේදී ප්‍රමුඛතාව අනුව පළමුවැනියට කළ යුතු කාරණාව හැටියට cybersecurity framework එක හදලා ඉවර කරන්න ඕනෑ. ඒක තමයි ප්‍රධාන කාරණාව. මේ සඳහා SLCERT ආයතනය තිබෙනවා. SLCERT ආයතනයේ ඒකට හැකියාව තිබෙන කණ්ඩායමක් ඉන්නවා. මෙච්චර කල් වෙලා නැත්තේ ඔවුන්ට අවශ්‍ය බලය ලැබිලා නැති නිසායි. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, SLCERT ආයතනය, Data Protection Authority එක වාගේම, දැන් රජයෙන් හදන්න යන අලුත් ආයතන, අලුත් අධිකාරියට මේ කටයුතු භාර දෙන්න කියලා. මෙන්න මේ ආයතනවලට දිය හැකි උපරිම බලය දෙන්න ඕනෑ. ඊයේ පැවැති මේ පිළිබඳ වැඩමුළුවේදී දැනගන්න ලැබුණා, ඉදිරියේදී cybersecurity සඳහා Bills දෙකක් ගේන්න හදනවා කියලා. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් Ministry of Defence එකට අදාළ Bill එකක් සහ මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් Ministry of Digital Economy එකට අදාළ Bill එකක් ඉදිරිපත් කරනවා කියලා ඊයේ දැනගන්න ලැබුණා. ඒක බොහොම හොඳ දෙයක්.

කාරණාව තිබෙන්නේ වගකීම ලබා දීමයි. මේ කටයුතු අමාත්‍යාංශ ලේකම් කෙනෙකුට දීලා බැහැ. මේක අමාත්‍යාංශ ලේකම්වරයෙකුට බලයක් දීලා නඩත්තු කරන්න පුළුවන් තැනක් නොවෙයි. ඒ සඳහා ඔබතුමන්ලා නිර්මාණය කරන අධිකාරිය වෙන්න පුළුවන්, ඒ අධිකාරියේ ප්‍රධානීන්ට නිසි බලය දිය යුතුයි. මොකද, වගකීම තමයි මෙතැන ප්‍රධානම දේ. ඒ කටයුත්ත කළොත් digital ID එකට අදාළ biometric data collect කරන්න කලින් මුලින්ම cybersecurity framework එක හදලා අදාළ අයට බලය ලබා දිය යුතුයි කියන එක තමයි මම යෝජනා කරන්නේ. එතැනදී biometric data අවශ්‍ය වෙන්නේ ඇයි කියලා කෙනෙක් අහන්න පුළුවන්. සාමාන්‍යයෙන් biometric data අවශ්‍ය වෙන්නේ කෙනෙක් හඳුනාගන්න. Authentication purposesවලට තමයි biometric data ඕනෑ වෙන්නේ.

එතකොට තව කෙනෙක් අහන්න පුළුවන්, දැනටත් අපි passport එක හදන්න යනකොට fingerprints ගන්නවා නේද, බැංකුවල තිබෙන Apps හරහා online payments කරනකොට අපේ fingerprint එක scan කරනවා නේද, අපරාධකාරයෙක් අහු වුණාම පොලීසියෙන් ඔවුන්ගේ fingerprints ගන්නවා නේද කියලා. ඒ විධියට ඇඟිලි සලකුණු ගන්නවා නම්, මේකත් ප්‍රශ්නයක් නැහැ නේද, ඒ ගොල්ලන්ගේ ඇඟිලි සලකුණුත් වෙන වෙනම ගන්නවා නේද කියලා අහන්නත් පුළුවන්. ඔව්. මෙච්චර කල් සාමාන්‍යයෙන් ඒ ඒ ආයතනවලට තමයි ඒ data ටික අදාළ වෙන්නේ. උදාහරණයක් විධියට කිව්වොත්, passports හදපු අයගේ fingerprints විතරයි දැනට ඒ ආයතනය සතුව තිබෙන්නේ. ඒ වාගේම බැංකුවලට අදාළ ඇඟිලි සලකුණු ටික බැංකු පද්ධතිය තුළ තිබෙනවා. පොලීසියෙන් ගනු ලබන ඇඟිලි සලකුණු පොලීසියේ තිබෙනවා. ඒවා වෙන වෙනම තිබෙන තාක්කල් hackersලාට අවශ්‍යතාවක් නැහැ, data access කරන්න. හොඳම උදාහරණය තමයි, මෙච්චර ලොකු බැංකු පද්ධතියක් තිබුණත්, ඒ බැංකු පද්ධතියට hackersලාගේ උනන්දුවක් නැහැ. ඒ ඇයි? ඔවුන්ට තිබෙන data ප්‍රමාණය මදි. ඒ hack කරන අය බලාපොරොත්තු වන දේ ඉටු කර ගන්න ඒ data ප්‍රමාණවත් නැහැ. හැබැයි, මට මතක විධියට "HelaPay" කියන system එකට මීට අවුරුදු දෙකකට විතර කලින් තමයි hack කළේ. මොකද, data විශාල ප්‍රමාණයක් එක්ක engage වෙලා තිබෙන නිසා තමයි hackersලා උනන්දු වෙන්නේ එය hack කරන්න.

එම නිසා දත්ත කොච්චර වැදගත්ද කියන එක තමයි අපි මේකෙන් ගන්න ඕනෑ පණිවුඩය. දත්තවල ඇති වැදගත්කම පැහැදිලි කරනකොට මම මීට කලිනුත් මේ සභාවේදී කිව්වා, මගේ විශ්වවිද්‍යාල මිත්‍රයෙක් ඉන්නවා, සුජීව් රාජකුලේන්ද්‍රන් කියලා. එතුමා මගේ විශ්වවිද්‍යාලයේම හිටපු, ගරු ඉම්රාන් මහරූප් මන්ත්‍රීතුමාගේත් කාලීනයෙක්. ඔහුට එක්තරා ආයතනයකින් Singaporeවල interview එකක් තිබුණා. ඔහුට offer එකක් දුන්නා. ඔහුට ඕනෑම භාණ්ඩයක් ඩොලර් 1ට ලබා දුන්නා, ලංකාව තුළ අවශ්‍ය ගණනකට විකුණන්න. එතකොට, අඩුම මුදලකට ලංකාව තුළ ඒ භාණ්ඩ විකුණුනොත්, ලංකාවේ සියලුදෙනාම සොයාගෙන එන්නේ ඒ ආයතනය. එතැනදී ඒ අය දාපු එකම condition එක තමයි -වෙන මොකවත් නොවෙයි- ඒ සියලු තොරතුරු ඔවුන්ට අවශ්‍යයි කියන එක. ඒක තමයි ඔහුට දාපු එකම condition එක. ඒ නිසා ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, මේ dataවල කොච්චර වැදගත්කමක් තිබෙනවාද කියලා. බොහෝ දෙනෙකුට dataවල තිබෙන වැදගත්කම පිළිබඳව හරි අවබෝධයක් ලැබිලා නැහැයි කියන එක තමයි මගේ තර්කය.

ඒ අනුව, මම මේ සියලුදෙනාගෙන්ම ඉල්ලීමක් කරන්න කැමැතියි. මෙම ව්‍යාපෘතිය යථාර්ථයක් කර ගැනීම තමයි ඔබගේ වාගේම අපි හැමෝගේම බලාපොරොත්තුව. මේ ව්‍යාපෘතිය ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවී කරන්න පුළුවන් නම් තමයි ජයග්‍රහණය තිබෙන්නේ. ඒ නිසා මේ ගන්න තීරණය එක්වරක් නොවෙයි, දෙවතාවක් නොවෙයි, සිය වතාවක් හිතලා ගත යුතුයි කියන තර්කය තමයි මම මේ වෙලාවේ ඉදිරිපත් කරන්නේ. ඇයි අපි එහෙම කියන්නේ? රටක දත්ත, විශේෂයෙන්ම පුද්ගල දත්ත වෙනත් පාර්ශ්වයක් අතට ගියොත් මොන වගේ දේවල්ද වෙන්න පුළුවන්? උදාහරණයක් විධියට ගත්තොත්, ඒක ලංකාවේ සම්පූර්ණ පාලනය ඔවුන් අතට ගියා හා සමානයි. කෙනෙකුට මේ කාරණා කිව්වාට දැනෙන්නේ නැති වෙයි. සම්පූර්ණ control එක ඒ අය අතට යනවා.

AI තාක්ෂණයත් අද ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම AI තාක්ෂණයත් එක්ක අනාගතයේ ඇති වෙන්න තිබෙන disinformation කියන ප්‍රධාන අර්බුදය හමුවේ අපට විශාල අර්බුද ගණනාවකට මුහුණ දෙන්න වෙනවා. ලංකාවේ රාජ්‍ය තොරතුරු, ඒ වාගේම අපේ සංවේදී තොරතුරු වෙනත් පාර්ශ්වයක් අතට ගියොත් ඒ වාගේ ගැටලු ඇති වන්නට පුළුවන්. විශේෂයෙන්ම එහෙම වුණොත් පුද්ගලයෙකුගේ banking system එකට ඇතුළු වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ data use කරලා loans ගන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, credit cardsවල තොරතුරු වෙනත් පාර්ශ්වයක් අතට ගියොත් මොන වගේ දෙයක් වෙන්න පුළුවන්ද කියන එක තමුන්නාන්සේලාට තේරුම් ගන්න පුළුවන්. විශේෂයෙන්ම මම කලින් කිව්වා වාගේ රාජ්‍ය තොරතුරු සඳහා විශේෂයෙන්ම අනාගතයේදී AI තාක්ෂණයත් එනවා. AI තාක්ෂණය අපට පිළිගන්න වෙනවා. අපට ඒකෙන් බැහැර වෙන්න බැහැ. එදා, 2001දී තමයි ඩිජිටල්කරණය ගැන කථා කළේ. නමුත් දැන් AI යුගයක් තිබෙන්නේ. එතකොට අපි රාජ්‍යයේ අනාගතය ගොඩනහන්නට ඕනෑ AI තාක්ෂණය හරහා කියන එක පැහැදිලියි. හැබැයි, AI තාක්ෂණය භාවිතයේදී අපට විවිධ අභියෝග එනවා. අන්න ඒ අභියෝගවලටත් අපි දැන්ම ඉඳලා සූදානම් වෙන්න ඕනෑ.

ඒ අනුව මෙය යථාර්ථයක් කිරීම සඳහා මගේ යෝජනාව තමයි, පළමුව අපි cyber security framework එක හදලා, සුදුසු අයට ඒ බලතල ලබා දෙන්න ඕනෑය කියන එක. ඊළඟට, පුළුවන් නම් ඒක මාස හයෙන් හයට testingවලට භාජන කරන්න ඕනෑ. ඒ වාගේම bug bounty communities එක්ක අපට එකට වැඩ කරන්න වෙනවා. ඒ වාගේම security features free check කරන ආයතන තිබෙනවා. ඒ අයට ගෙවීමක් කරන්න ඕනෑ, bug එකක් අහුවුණොත් විතරයි. ඒ වාගේ ආයතන ලෝකය පුරා තිබෙනවා. එවැනි ආයතනත් එක්ක අපි එකට වැඩ කරන්න ඕනෑ. එහෙම කළොත්, ඉස්සෙල්ලාම අපේ security framework එක හදාගෙන, එතැනින් පස්සේ විශේෂයෙන්ම digital ID එකත් එක්කම රාජ්‍ය ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ආරම්භ කරලා අපට කටයුතු කරගෙන යන්න පුළුවන්.

එක් පැත්තකින් security framework එක හදන ගමන් අපි නිකම් ඉන්න අවශ්‍යතාවක් නැහැ. අනෙක් පැත්තෙන් digital ID එක හරහා රාජ්‍ය ඩිජිටල්කරණය ආරම්භ කරනවා. හැබැයි, ඒ රාජ්‍ය ඩිජිටල්කරණය ආරම්භ කරනකොට biometric data නැතුව යන්න පුළුවන් උපරිම දුර ගිහිල්ලා, එතැනින් පස්සේ අපි කල්පනා කරමු, biometric data මොන වාගේ කටයුත්තක් සඳහා පාවිච්චි කරන්න ඕනෑද කියලා. මොකද biometric data පාවිච්චි කරන්නේ authentication purpose එකට නම්, විවිධ කාරණා, විවිධ හැකියා තිබෙනවා authentication purpose සඳහා පාවිච්චි කරන්න. ඒ නිසා රාජ්‍ය ආරක්ෂාව පැත්තෙන් හිතලා යන්න පුළුවන් උපරිම දුර ගිහිල්ලා, එතැනින් පස්සේ අපි කල්පනා කරමු. අපි cyber security framework හදා ගත්තාට පස්සේ ඒක ඒ තරම් අපහසු කාරණාවක් වෙන්නේ නැහැ.

අපි ඉදිරියට යන්න හිතුවොත්, පළමුවෙන්ම මුළු පද්ධතියක් බදා ගන්නේ නැතුව, මුලින්ම pilot project විධියට විශේෂයෙන්

[ගරු චතුර ගලප්පත්ති මහතා]

stakeholder engagement එකක් කරලා ඊට පස්සේ මුළු පද්ධතිය ගැන හිතන්න ඕනෑ. අපේ නියෝජ්‍ය ඇමතිතුමා මේ කාරණාව දන්නවා. මම කාල වේලාව යන නිසා ඒ ගැන කියන්නේ නැහැ. Stakeholder engagement එකක් කරලා, pilot projects දෙකක්, තුනක් කරලා ඒවායේ අඩු පාඩු බලලා එතැනින් එහාට මුළු පද්ධතිය ගැනම හිතනවා නම් හොඳයි කියන එක තමයි මට මේ වෙලාවේ යෝජනා කරන්න තිබෙන්නේ. විශේෂයෙන්ම ඩිජිටල්කරණයේ පදනම වෙච්ච digital ID එක යථාර්ථයක් බවට පරිවර්තනය කිරීම සඳහා තමයි මම ඒ යෝජනාව ගෙනාවේ.

මට ඊළඟට කරන්න තිබෙන යෝජනාව තමයි, ඒ IT industry එකේ තිබෙන ගැටලුවකට අදාළ යෝජනාවක්. 2022 economic crisis එක වෙච්ච වෙලාවේ survive වෙලා හිටියේ IT ක්ෂේත්‍රයේ ඉන්න අය පමණයි. මොකද, online පහසුකම යටතේ ගෙවල්වල ඉඳගෙන හෝ ඔවුන්ට රාජකාරි කරන්න පුළුවන් වුණා. අනෙක් සියලු ක්ෂේත්‍ර කඩා වැටෙද්දී IT ක්ෂේත්‍රයේ ඉන්න අයට තමයි යම් මට්ටමකට ඒ කටයුතු කරගෙන යන්න හැකියාව ලැබුණේ. ඒ නිසා සමාජයේ මතයක් ඇති වුණා, අනාගතයේදී IT field එකට තමන්ගේ දුවා, පුතා එක් කළොත්, ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවයක් ඇති වෙයි කියලා. ඒකේ ප්‍රතිඵලයක් තමයි, economic crisis එක වෙලාවේ බොහෝ දෙනෙක් රාජ්‍ය විශ්වවිද්‍යාලයට වාගේම, පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ගොස් IT උපාධියක් ලබා ගත්තේ. ඒ නිසා තවම internship එක ගන්න බැරුව, ආයතනවලට ඇතුළත් වෙන්න බැරුව බොහෝ දෙනෙක් ඉන්නවා.

අද තිබෙන තිත්තම කාරණාව මෙයයි. කවදාවත් IT graduatesලා දේශපාලනඥයන් ගාවට එන්නේ නැහැ. ඉතිහාසයේ කවදාවත් එහෙම වුණේ නැහැ. දැන් ප්‍රවණතාවක් ඇවිල්ලා තිබෙනවා දේශපාලනඥයන් ගාවටත් IT graduatesලා ඇවිල්ලා job ඉල්ලන. ඒකට හේතුව තමයි IT field එකේ - IT industry එකේ - growth එකක් අවුරුදු කිහිපයක ඉඳලා තිබීම. ඒ නිසා ඒකට ඉක්මනින්ම විසඳුමක් දෙන්න ඕනෑ. විශේෂයෙන්ම එහෙම කරන්න තව හේතුවක් තමයි AI යුගයක් බිහි වෙලා තිබීම. AI අනුව සාමාන්‍යයෙන් ආයතනයකට දක්ෂ වැඩකාරයෝ දෙන්නෙක්, තුන්දෙනෙක් හිටියා නම් හොඳටම ප්‍රමාණවත්. අද AI තාක්ෂණය යටතේ software engineersලාගේ අවශ්‍යතාව අඩු වෙලා තිබෙනවා. මේ අභියෝගය ජයගන්න ඉක්මනින්ම රජය කටයුතු කරන්න ඕනෑ. ඒකට උදාහරණ දෙකක් ගත්තොත්, startupsවලට උදව් කරද්දී විශේෂයෙන්ම රජය invest කළ යුතුමයි. ඒක කරන්න බැරි දෙයක් නොවෙයි. රජය ඒ කටයුත්ත කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. Startupsවලත් service-oriented projects තිබෙනවා. ඒ වාගේම, product-based oriented projects තිබෙනවා. Product-based oriented projectsවලට invest කරන එක තමයි රජය මේ වෙලාවේ ගත යුතු ඉක්මන්ම පියවර.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ඊයේ සාකච්ඡාවේදී කියවුණා, "විස්සෙන් එකක් වාගේ projects තමයි ඉස්සරහට යන්නේ. අනෙක් ඒවා වැටෙනවා. ඒක තමයි ගැටලුව" කියලා. ඇමෙරිකාවේ සිලිකන් වැලි එකේ දෙසීයෙන් එකක් විතර තමයි ඉස්සරහට යන්නේ. නමුත් ඔවුන් ඒ වෙනුවෙන් invest කරනවා. විශේෂයෙන් මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. Facebook, WhatsApp වාගේ දැවැන්ත ආයතන බිහි වුණේ startups විධියට. ලංකාවේ තිබෙනවා, WSO2 ආයතනය. මේ වාගේ ආයතනවලට දෙන්න පුළුවන් උපරිම උදව් දෙන්න ඕනෑ. විශේෂයෙන් startups වලට. ඒ නිසා බය නැතුව ආයෝජනය කරන්න කියන කාරණය රජයට කියනවා. විවිධ ආයතන - institutions - ඩිජිටල්කරණය කිරීම වෙනුවෙන් ගන්නා පියවර වැදගත්. ICTA ආයතනය වහනවා කිව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. අවසන් කරන්න.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අලුතින් ඇති කරන අධිකාරිය හරහා ඉක්මනින් මේ අවශ්‍ය requirements හඳුනාගෙන, guidelines දීලා, ඒ projects ලංකාවේ ළමයින්ට දෙන්න පුළුවන් නම් ලංකාවේ තිබෙන රැකියා ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ සඳහා පළමුවෙන්ම ගත යුතු පියවර තමයි National Digital Procurement Portal එකක් ඇති කිරීම. ඒ වෙනුවෙන් රජය උනන්දු වෙයි කියලා මම විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාගේ ප්‍රකාශය කිරීමට විනාඩි 3ක කාලයක් ලබා දෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair, and THE HON.(PROF.) SENA NANAYAKKARA took the Chair.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් තමයි මා මෙම විශේෂ ප්‍රකාශය සිදු කරන්නේ. ඊයේ රාත්‍රියේදී අනුරාධපුර මහ රෝහලේ අවාසනාවන්ත සිද්ධියක් වෙලා තිබෙනවා. ඒ අවාසනාවන්ත සිද්ධියට මුහුණපෑවේ ඒ වෙලාවේ සක්‍රිය සේවයේ යෙදී සිටි වෛද්‍යවරියක්. ඇය රෝහලේ කටයුතු කරමින් ඉඳලා රාත්‍රී ආහාරය ගැනීමට on-call room එකට ගිය වෙලාවේදී තමයි මේ

අවාසනාවන්ත සිද්ධියට මුහුණ පා තිබෙන්නේ. ඒ සිද්ධිය දැනගත් මොහොතේම අපි රජය වශයෙන් පොලිස් දෙපාර්තමේන්තුව, අනෙකුත් ආරක්ෂක අංශ සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගන්න පුළුවන් හැම පියවරක්ම ගත්තා. ඒ වාගේම රෝහලේ ආරක්ෂාව තහවුරු කිරීමටත්, රෝහල අවට ආරක්ෂාකාරී පරිසරයක් හදන්නත් අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ගත් මේ වෙනකොට අරගෙන තිබෙනවා. ඒ වාගේම පොලිසිය විසින් ඒ සැකකරු මේ වන විට හඳුනාගෙන තිබෙනවා. ඔහු අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. අනෙක් පැත්තෙන්, අපි අමාත්‍යාංශයක් විධියට මේක නිකම්ම නිකම් හුදෙකලා සිද්ධියක් විධියට විතරක් දකින්න සූදානම් නැහැ. මේ පිළිබඳව සොයා බලන්න විශේෂයෙන්ම අපේ ඉහළ පෙළේ නිලධාරීන් අනුරාධපුරයට යවා තිබෙනවා. මෙතැනදී අමාත්‍යාංශය පැත්තෙන් නිවැරදි කර ගත යුතු යම් යම් දේවල් තිබෙනවා නම් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් අපි අපේක්ෂා කරනවා. මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මෙවැනි තත්ත්ව තවදුරටත් ඇති නොවේවි කියලා අපි හුදෙක්ම විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.13]

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉතාම කම්පනයට පත් වන සිදුවීමක් අනුරාධපුරය මහ රෝහලින් අපට වාර්තා වෙලා තිබෙනවා. අපි කාන්තා දිනය සමරලා දවස් දෙකකට පස්සේ තමයි මෙවැනි අතිශය සංවේදී, කම්පනයට පත්වන සිදුවීමක් අපට වාර්තා වුණේ. මහජන ආරක්ෂක අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු අපි සියලු දෙනාම ආණ්ඩුවක් වශයෙන් එවැනි කටයුතු නිවැරදි කරන්නට උත්සාහ ගන්න ඕනෑ. ඒ සිදුවීම සම්බන්ධව ආණ්ඩුවක් විධියට අපේ පැත්තෙන් සිදුවිය යුතු සියලුම විමර්ශන කටයුතු නිසියාකාරව සිදු කරලා, ඇයටත්, සමස්ත කාන්තා ප්‍රජාවටත් යුක්තිය ඉෂ්ට කරලීම සඳහා අපි මැදිහත් වෙන බව මම ප්‍රකාශ කරනවා.

අද දවසේ අපට විවාද කරන්න තිබෙන්නේ, 2025 වර්ෂයට අදාළව ජාතික ජන බලවේගය ආණ්ඩුව විසින් ඉදිරිපත් කළ අය වැයෙහි කාරක සභා අවස්ථාවේ ඉතාම වැදගත් අමාත්‍යාංශයන් දෙකක වැය ශීර්ෂ පිළිබඳවයි. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සහ විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව තමයි අපි අද විවාද කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රටක් විධියට 20වන සියවස මහහැර ගත් ජාතියක් හැටියටයි මම දකින්නේ. ඒකට හේතුව, අපිත් එක්කම නිදහස ලබා ගත්, අප හා සමගාමීව නිදහස ලබා ගත් ඉන්දියාවත් අද වන විට සඳ තරණය කරපු රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙනවා. තාක්ෂණික අංශයෙන් අපි කොතරම් පසුගාමී තැනක ද ඉන්නේ කියලා ඒ තුළින් අපට පෙනෙනවා. අද වන විට අපේ රටේ පුරවැසියන් හැම කෙනෙකුම ඒවායේ වින්දිතයන් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා අපට රජයක් විධියට තිබෙන ප්‍රමුඛම කාර්යය තමයි, අපට ළඟාවීමට අපොහොසත් වෙච්ච අන්න ඒ සියවස පළමුකොටම අත්පත් කර ගැනීමේ පදනම අප විසින්ම ලබා ගැනීම. විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය විධියට අපි හඳුනා ගත් ප්‍රධාන ගැටලුවක් තමයි, අපට රටක් විධියට විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධව නිසි ප්‍රතිපත්තියක්, රාජ්‍ය දැක්මක් කවදාවත් තිබුණේ නැහැ කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධව තිබුණු ප්‍රතිපත්ති ගත්තොත්, ඒවා අපේ රටේ හිටපු ජනාධිපතිවරුන්ගේ පුත්තුන්ට රොකට් යවන්න තිබුණා වාගේ තාක්ෂණයක්. එවැනි ප්‍රතිපත්ති තමයි අපේ රටේ මෙච්චර කාලයක් විද්‍යාව හා තාක්ෂණය කියලා තිබුණු ප්‍රතිපත්ති විධියට අපි දැකලා තිබෙන්නේ.

ඒ නිසා පළමුකොටම රජයක් විධියට අපට නිසි ප්‍රතිපත්තියක් සකසා ගන්න ඕනෑය කියන එක අපි විශ්වාස කරනවා. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ අපට මූලික වශයෙන් ආයතන 12ක සැකැස්මක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් ආණ්ඩු යටතේ පැවැති මේ අමාත්‍යාංශය ගත්තොත්, මේ අමාත්‍යාංශයට යටත් විය යුතු යැයි අපි සලකන විවිධ ආයතන වෙනත් අමාත්‍යාංශ යටතේ තමයි පැවතිලා තිබෙන්නේ. විශේෂයෙන්ම කලින් තිබුණු අමාත්‍යාංශය තුළ තිබුණු ගොඩක් දේවල් අද වෙද්දී අපි විධිමත් විධියට, විද්‍යාත්මකව ඩිජිටල් අමාත්‍යාංශයත් එක්ක බද්ධ කරලා තිබෙනවා. විශේෂයෙන්ම අද අපේ ආණ්ඩුව තුළ විද්‍යා හා තාක්ෂණ කැබිනට් අමාත්‍යාංශය යටතේ තිබෙන ගොඩක් ආයතන කලින් ආණ්ඩුවල අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තමයි තිබිලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වෙන්න ප්‍රධාන හේතුවක් විධියටත් අපට මේක හඳුනාගන්න පුළුවන්. ඒ කියන්නේ, ආයතන මට්ටමින් කිසිම විද්‍යාත්මක බැඳීමක්; විද්‍යාත්මක සම්බන්ධයක් තිබිලා නැහැ. ඒ නිසා පළමුකොටම අපි හඳුනාගත් දෙයක් තමයි ආණ්ඩුවක් විධියට මෙන්න මේ ආයතන අතර සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අප විසින් කළ යුතුයි කියන එක.

"Why Nations Fail" කියන කෘතියේ සඳහන් වෙනවා රටක ආයතන පද්ධතිය බිඳ වැටුණාම රාජ්‍ය යන්ත්‍රණයත් බිඳ වැටෙනවා, එවිට සමස්ත රාජ්‍යයේම ක්‍රියාකාරිත්වයත් බිඳ වැටෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක න්‍යායාත්මකව විතරක් නොවෙයි, ප්‍රායෝගිකව ගත්තාමත් අපට පෙනෙනවා, මේ ආයතන අතර සම්බන්ධයක් නොමැති වීම කියන එකේ, ප්‍රතිපත්තියක් නොමැති වීම කියන එකේ වින්දිතයෝ බවට පත් වෙලා තිබෙන්නේ මේ රටේ පුරවැසියෝ බව. සාමාන්‍ය මනුස්සයෙක් තමන්ගේ වැඩක් කරගන්න ආයතනයකට ගියාම; කර්මාන්තයක් සඳහා වේවා, තමන්ගේ patent එකක් ලබා ගැනීම සඳහා වේවා, ලියාපදිංචියක් වාගේ ඉතාම සරල කාරණාවකදී පවා අතැනින් මෙතැනට, මෙතැනින් අතැනට යමින්, රස්තියාදු වෙමින් තමන්ගේ සමහර කටයුතු කරගන්න සිදු වෙලා තිබෙනවා, අපි දැක තිබෙනවා. ඇතැම් අවස්ථාවලදී රාජ්‍ය ආයතන ඇත්තටම තමන්ගේ කර්තව්‍යය එලෙසින්ම සිද්ධ කරනවා. ඔවුන් තමන්ගේ උපරිමය සිද්ධ කරනවා කියලා අපි දන්නවා. හැබැයි, සමහර විට මේ ආයතන අතර ගන්නා තීන්දු තීරණවලදී නිසි සම්බන්ධීකරණයක් නොමැති වීම තුළින් ඒ සිද්ධ කරන දේ පිළිබඳව කාර්යක්ෂමතාව හා ඵලදායිත්වය නැතිවෙලා යනවා. මෙන්න මෙක ප්‍රතිපත්ති අතර අපි දැකපු ගැටලුවක්. ඒ නිසා තමයි පළමුකොටම මේ ආයතනික සැකැස්ම තනි ව්‍යූහයක් යටතට ගන්න අපි මෙවර උත්සාහ කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවේචන කරපු අපේ විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු මොනවාද කිව්වේ? බෝතල් පළාගෙන නයි එළියට ආපු ඒ අයගේ විද්‍යාව ගැන නම් අපි දන්නවා නේ. අපට හොඳට තේරුම් ගන්න පුළුවන්, එතුමන්ලා මොන science එක අනුවද ඒ කථා කරන්නේ කියලා.

නිෂ්පාදන ආර්ථිකය කියන දැක්මත් එක්ක අපි යනවා නම්, අනිවාර්යයෙන්ම ඒ නිෂ්පාදන ආර්ථිකයට අපේ ග්‍රාමීය ප්‍රජාව

[ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය]

සම්බන්ධ කරගන්න ඕනෑ. ඒ නිසා තමයි අපි විශේෂයෙන්ම ආයෝජන ගමට අරගෙන යන්න, ඒ වාගේම ගමේ ප්‍රජාව දිරිමත් කිරීම සඳහා මේ ආයතනවලට මුදල් සැපයුම් ලබා දීලා තිබෙන්නේ. අපට රටක් විධියට වාණිජකරණයෙන් අත්පත් කරගන්න දේවල් ගොඩක් තිබෙනවා. ඒ ප්‍රතිඵල බිම් මට්ටමට රැගෙන යෑම ආණ්ඩුවක් විධියට අපි මේ අය වැය තුළින් ක්‍රියාත්මක කරනවා. ඒ නිසා තමයි අපි ජාතික පර්යේෂණ මාර්ග සිතියමක් සකස් කරලා, විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තීන්ට අනුකූලව වැඩසටහන් සම්පාදනය කරන්න මේ ආයතනවලට මුදල් ගලා යෑමක් සිද්ධ කරලා තිබෙන්නේ. අපේ සැලසුම් ඉතාම විද්‍යානුකූලයි. උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු වාගේ විද්‍යාත්මක ක්‍රමවේදවලට නොවෙයි, නිවැරදි විද්‍යාත්මක ක්‍රමවේද හරහා තමයි මේ ආයතනවලට මුදල් ගලා යෑම සිද්ධ කරලා තිබෙන්නේ. අත්පත් කරගන්න බැරි වෙච්ච ඒ ආර්ථික පුනරුදය අත්පත් කර ගැනීම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විධියට විද්‍යාව හා තාක්ෂණය උපරිම වශයෙන් ගමට අරගෙන යන්න අපට අවශ්‍යව තිබෙනවා. ගමේ ජනතාවට ඒ ප්‍රතිලාභ ලැබෙන විධියේ සැකැස්මක් ඒ ආයතන බලගැන්වීම හරහා සිද්ධ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දිරිගැන්වීම සඳහා NERDC එකට රුපියල් මිලියන 518ක් වෙන් කරලා තිබෙනවා. මේ සෑම දෙයකටම NERDC එක බලගැන්වීම අපි සිද්ධ කරලා තිබෙනවා. ඒ වාගේම තමයි NSF එකට රුපියල් මිලියන 661ක් වෙන් කර තිබෙනවා. පර්යේෂණවලින් එහාට ගිහින් ඒ පර්යේෂණ ක්‍රියාත්මකභාවයට පත් කිරීම සඳහා, එහි ප්‍රතිලාභ ගමට අරගෙන යෑම සඳහා විද්‍යාගාරයේ සිට වෙළෙඳ පොළට, මිනිස්සුන්ට මේවායේ ප්‍රතිලාභ ලැබෙන විධියට තමයි NSF එකටත් මේ වියදම් කළමනාකරණය කරන්න අපි සැලසුම් හදලා තිබෙන්නේ.

ඒ වාගේම කාන්තාවක් විධියටත් මම මේ දේ කියන්න ඕනෑ. විද්‍යාව හා තාක්ෂණය ගැන කථා කරනකොට අපි STEM අධ්‍යාපනය කියන එකත් විශේෂයෙන්ම සලකන්න ඕනෑ. තාක්ෂණයට තිබෙන බිය, විද්‍යාවට තිබෙන බිය, ඩිජිටල්කරණයට තිබෙන බිය නැති කරන්න නම් අපි අනිවාර්යයෙන්ම STEM අධ්‍යාපනය වැඩිදියුණු කරන්න ඕනෑ. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල තුළ STEM අධ්‍යාපනය හදාරන ශිෂ්‍යාවන් සියයට 49ක් පමණ සිටියත්, STEM ක්ෂේත්‍රය, එහෙම නැත්නම් science and technology ක්ෂේත්‍රවලින් රැකියා වෙළෙඳ පොළට ඔවුන්ගේ ඉදිරිපත් වීම ඊට වඩා සියයට 20කින් විතර අඩුයි. ඒ නිසා අපි මේ සමස්ත අය වැය තුළ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විධියට STEM අධ්‍යාපනය නහාසිටුවීමේ කාරණය සම්බන්ධවත් සංවේදී වෙලා තිබෙනවා. ඉතින් මම හිතන විධියට අපි ඉන්න තැනින් මේ රට ඉහළට ඔසවා තැබීම සඳහා වන පදනම තමයි මේ දමාගෙන යන්නේ. අපේ පළමු අවුරුද්දේ පළමු අය වැය විධියට තමයි අපි පළමුකොටම මාස අටක් සඳහා ඉදිරිපත් කළ මේ අය වැය තුළින් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඒ සඳහා පදනම දමාගෙන යන්නේ. ඉතින් තවත් මොනවාද මේ කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? නිසි ප්‍රතිපත්තියක් තිබෙනවා නම්, ඒ නිසි ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න රාජ්‍ය යන්ත්‍රණය බලගන්වනවා නම්, ඒ වාගේම ඒ ප්‍රතිපත්ති ගමට ගෙන යන්න, ක්‍රියාත්මක කරන්න අවශ්‍ය යන්ත්‍රණය හදනවා නම්, එහි තිරසර බවක් තිබෙනවා නම්, මම හිතන විධියට ඒක තමයි හරිම විද්‍යාව. ඒ විද්‍යාවේ පදනම අපේ අමාත්‍යාංශය යටතේ, ජාතික ජන බලවේගයේ මේ අය වැය තුළ අපට හොඳින්ම දැකගන්න පුළුවන්.

බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ කාලයෙනුත් විනාඩි 4ක් මට ලබා ගන්න කිව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට වෙන් වූ කාලය අවසන් වෙලා තිබෙන්නේ.

[අ.භා. 3.22]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මම හිතන විධියට, අපේ අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාගේ කාලය තිබෙනවා, ඒ ගැන බලලා කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේත්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව අද දින පැවැත්වෙන අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී ඒ සම්බන්ධව කරුණු දක්වන්න මම බලාපොරොත්තු වෙනවා. අප සියලුදෙනාම පිළිගන්නවා, ඩිජිටල් ආර්ථිකයක් මේ රටට අවශ්‍යයි කියලා. ඒක ඇත්ත. ඒ ගැන විවාදයක් නැහැ. එතැනදී විශේෂයෙන්ම මූල්‍ය අංශයේ ඩිජිටල්කරණයක් අපට ඕනෑ වෙලා තිබෙනවා, අපේ රටේ සිදුවන වංචා, දූෂණ අවම කර ගන්න; මුදල්වලින් කරන ගනුදෙනු අවම කර ගන්න. ඒ නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඒ සියලු දත්ත ගන්න පුළුවන්, තොරතුරු ගන්න පුළුවන් ක්‍රමවේදයක් හදලා, මූල්‍ය ඩිජිටල්කරණය සිදු කිරීම අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙනවා. අපි දැක්කා, ඒ මූල්‍ය ඩිජිටල්කරණය හරහා අපේ හැඳුනුම්පත ඩිජිටල් කිරීම සඳහාත් දැන් යම් පියවර අරගෙන තිබෙන බව. අපේ හැඳුනුම්පත - National Identity Card එක - ඩිජිටල් කිරීමේ වරදක් නැහැ. අපේ ජීව දත්ත - bio data - එකතු කරන එකේ වරදක් නැහැ. ඒ ගැන අපි කාගේවත් ප්‍රතිවිරුද්ධ අදහසකුත් නැහැ.

අපි දන්නවා, පසුගිය ආණ්ඩුව ඩිජිටල්කරණය නමින් ජෛව දත්ත - biometrics - එකතු කරන්න පටන් ගත් බව. ජෛව දත්ත එකතු කරනවාය කියන්නේ අපේ ඇඟිලි සලකුණු, අපේ මුහුණේ තිබෙන ලක්ෂණ, අපේ ඇහේ තිබෙන ලක්ෂණ යනාදී සියලු දේවල් එකතු කිරීම. ආණ්ඩුව මේ වෙනකොට ඒ සඳහා අවශ්‍ය centres හදාගෙන යනවා. මේ තත්ත්වය අද වෙනකොට ලෝකයේ යම් කිසි ආකාරයේ විවාදයකට තුඩු දීලා තිබෙන තත්ත්වයක්. මොකද, මේ දත්ත විකුණන්න පුළුවන්. මේ දත්ත එළියට ගියොත්, විශාල ප්‍රශ්නයක් පැන නඟින්න පුළුවන්. මගේ ඇඟිලි සලකුණු එළියට ගියොත් එහෙම ඒ ඇඟිලි සලකුණු වෙන අයට පාවිච්චි කරන්න පුළුවන්. අපේ මුහුණේ තිබෙන ලක්ෂණ එළියට ගියොත්, ඒවා වෙන අයට පාවිච්චි කරන්න පුළුවන්.

අද ලෝකය දියුණු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම AI තාක්ෂණය අනුව හුහක් දේවල් වෙන්න පුළුවන්; අපට ප්‍රතිවිරුද්ධ දේවල් වෙන්න පුළුවන්. ඒ නිසා දැන් මේ දත්ත පාවිච්චි කරන්නේ කුමන අවස්ථාවකදීද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

මොකටද මේ දත්ත එකතු කරන්නේ? මේ දත්ත එකතු කිරීමේ අරමුණ මොකක්ද? ඒක අපට තවම පැහැදිලි නැහැ. අද ආණ්ඩුව මේ වැඩේට අතගහලා තිබෙනවා. අද centres හදාගෙන තිබෙනවා, අපේ ජෛව දත්ත එකතු කරන්න. ඒ ගැන ආණ්ඩුව පැත්තෙන් හරියාකාරව පැහැදිලි කිරීමක් කරන්නේත් නැහැ. මොකක්ද, මේකේ අරමුණ? National Identity Card එක ඩිජිටල් කිරීම එකක්. ඒක අපි දන්නවා. අපේ National Identity Card එකේ number එක දමන්න පුළුවන්, driving licence එකේ number එක දමන්න පුළුවන්; ඒ ඔක්කෝම එකතු කරලා එක number එකක් හදලා අපට දෙන්න පුළුවන්. එතකොට National Identity Card එක ඕනෑත් නැහැ, number එක දුන්නත් ඇති.

නමුත්, ජෛව දත්ත එකතු කරන්නේ ඇයි? මේ දත්ත එකතු කරලා ගබඩාවක් ඇති කිරීම තුළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදයටත් ප්‍රශ්නයක් එනවා. ඒ වාගේම පෞද්ගලික අයිතීන් ද උල්ලංඝනය වෙනවා. මොකද, අපේ තිබෙන හැම පෞද්ගලික දෙයක්ම මේ දත්ත ගබඩාවට ඇතුළත් වෙනවා. ඒක අපේ පෞද්ගලිකත්වය පිළිබඳ ප්‍රශ්නයක්. මම හිතනවා, ඉතාම භයානක තැනකට ඒ දත්ත තුළින් ගමන් කරන්න පුළුවන් කියලා.

ඒ වාගේම අපි දන්නවා, මේ ජෛව දත්ත - biometrics - විකුණන්න පුළුවන් බව. අපි දැක්කා, ඇමෙරිකාව, ඉන්දියාව, දකුණු කොරියාව වාගේ රටවල දැන් මේ දත්ත leak වෙලා තිබෙනවා; දත්ත එළියට ගිහිල්ලා තිබෙනවා. පසුගිය කාලයේ අපේ රටේ NMRA එකේ දත්ත delete වුණා, දත්ත එළියට ගියා. අපි දැක්කා, පොලීසියේ website එක hack කළා. රජයේ මුද්‍රණාලයේ website එක hack කළා. අඩුම ගාණේ අපට තවම ඒවාවත් ආරක්ෂා කර ගන්න බැහැ. පොලීසියේ website එක hack කරනවා කියන එක විශාල ප්‍රශ්නයක්. අපට ඒවා ආරක්ෂා කර ගැනීමේ ක්‍රමවේදයක්වත් නැතිව අපි එක එක්කෙනාගේ පෞද්ගලික ජෛව දත්ත එකතු කරන එක ඒ තරම්ම හොඳ දෙයක් නොවෙයි කියලා මම හිතනවා. අපේ පෞද්ගලික දත්ත පිට නොවෙනවා කියලා මොකක්ද දෙන guarantee එක? මේ දත්ත පිටමං වුණොත්, එළියට ගියොත් ඒ වගකීම භාර ගන්නේ කවුද? කවුරු හරි ඒවායේ වගකීම භාර ගන්නවාද? දැන් මේවාට සම්බන්ධ වෙන්නේ පෞද්ගලික ආයතන. අපි දැක්කා, 2023දී මේ සම්බන්ධව ටෙන්ඩර් කැඳෙව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි 3ක කාලයක් ඔබතුමාට ලැබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
බොහොම ස්තුතියි, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2023දී මේ ව්‍යාපෘතිය කරන්න ටෙන්ඩර් කැඳෙව්වා. එහිදී අන්තිමට සමාගම් දෙකක් ඉතුරු වුණා. ඒ සමාගම් දෙකෙන් අඩුම ලංසුව දැම්මේ Madras Security Printers කියන සමාගම. නමුත්, ඒ සමාගමට බරපතළ චෝදනාවක් ආවා. ඒ සමාගමට තමයි මත්පැන් බෝතල්වල ස්ටිකර් එක issue කිරීමේදී විශාල ගැටලුවක් ඇති වුණේ. ඒ පිළිබඳව විශාල විරෝධයක් ආ නිසා පසුගිය ආණ්ඩුව ඒ ටෙන්ඩර් එක ලබා දීම cancel කළා. ඒ ටෙන්ඩර් එක cancel කළාම මොකක්ද වෙන්න ඕනෑ? අලුතෙන් ටෙන්ඩර් කැඳවන්න ඕනෑ නේ. නමුත් දැන් ඒ ව්‍යාපෘතිය දීලා තිබෙනවා. ඒකට ටෙන්ඩර් කැඳවලා තිබෙනවාද? මම ඒක ඇමතිතුමාගෙන් අහනවා. පසුගිය ආණ්ඩුව කැඳවපු ටෙන්ඩර් එක cancel කරලා ඉවරයි, ඉතින් අලුතෙන් ටෙන්ඩර් කැඳෙව්වාද? මම දන්නා තරමින් නම් අලුතෙන් ටෙන්ඩර් කැඳවලා නැහැ. ටෙන්ඩර් නොකැඳවා එහෙම නම් කොහොමද මේ ව්‍යාපෘතිය දුන්නේ? මොකක්ද ක්‍රමවේදය? මම දන්නා විධියට නම් මේකෙදි එක ක්‍රමවේදයක් වුණා. ජනාධිපතිතුමා ඉන්දියාවේ ගිය අවස්ථාවේදී එකඟත්වයකට ඇවිල්ලා තිබෙනවා, ඉන්දියානු සමාගමකට ඒ ව්‍යාපෘතිය දෙන්න. මෝදි අගමැතිතුමා නිකම් නොවෙයි නේ ජනාධිපතිතුමාගේ කරට අතදාගෙන ගියේ. මෝදි කරට අතදාගෙන ගිහින්, කර ගත්ත එක වැඩක් තමයි ඕක. විදේශ කටයුතු ඇමති විජිත හේරත් මහත්මයා පුවත් පත් සාකච්ඡාවකදී පැවසුවා, ඉන්දියාවේ ඉල්ලීම පරිදි, ඒ කියන්නේ ඉන්දියාව කියන සමාගමකට මේ ව්‍යාපෘතිය දෙන්න කැමැතියි කියලා ආ බව. ඒක "The Sunday Times" පුවත් පත්තේ පළ වුණා.

එතකොට මොකක්ද මේ කරන්නේ? අපේ දත්ත ටික අපි දෙනවා ඕනෑම කෙනෙකුට. මොකක්ද මෙහි තිබෙන ආරක්ෂිත බව? එතකොට අපට පෙනෙන්න තිබෙනවා, එක පැත්තකින් ඉන්දියාව මේ ව්‍යාපෘතියට රුපියල් බිලියන 4ක ආධාරයක් දෙනවා, ඒක දීලා අනෙක් පැත්තෙන් ඉන්දියානු සමාගමකුත් දෙනවා මේ වැඩේ කරන්න. ආධාරයක් හැටියට රුපියල් බිලියන 4ක් ඉන්දියාවෙන් ලැබෙනවා, ඒක දීලා ඉන්දියාව කියනවා, ඒගොල්ලන්ගේ සමාගමක් මේ වැඩේට ගන්න කියලා. එතකොට සල්ලිත් ආයේ ඉන්දියාවටම යනවා, අපේ දත්තත් ඉන්දියාවට යනවා. මට තේරෙන්නේ නැහැ, මේකේ තිබෙන විනිවිදභාවය ගැන, අපේ රටේ ජනතාවගේ දත්තවලට තිබෙන ආරක්ෂාව මොකක්ද කියන එක ගැන. මම හිතන විධියට, මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක්.

ඉන්දියානු සමාගමක් මේ ව්‍යාපෘතිය කරනවා නම් කොතැනට වෙනකම්ද ඔවුන් මේක කරන්නේ? මොකක්ද, extent එක? මේකේ extent එක කොපමණද? ඒගොල්ලන් කොතැනට වෙනකම්ද, මේ ව්‍යාපෘතිය කරන්නේ?

ජනාධිපතිතුමා පෞද්ගලික රූපවාහිනී නාළිකාවක පැවැති වැඩසටහනකට ඇවිත් කිව්වා, දත්ත ඇතුළත් කිරීමේ ව්‍යාපෘතිය කරන්නේ ලංකාවේ සමාගමක් කියලා. මොකක්ද, ඒ ලංකාවේ සමාගම? ලංකාවේ ඒ කියන සමාගමට එම කටයුත්ත භාර දෙන්න ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කළාද? ටෙන්ඩර් කැඳෙව්වාද? ලංකාවේ එම සමාගම තෝරා ගත්තේ කොහොමද? මේ පිළිබඳව විශාල නිශ්ශබ්දතාවක් තිබෙනවා. ඒ නිසා තමයි අපි මේ ගැන මතු කරන්නේ. මොකද, අපේ ජෛව දත්ත එකතු කරනවාය කියන්නේ බරපතළ කාරණාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලෝකය අද පවතින්නේ දත්ත මත. මේ දත්ත විකුණන්න පුළුවන්; මේ දත්ත වෙන වෙන දේවල්වලට පාවිච්චි කරන්න පුළුවන්; මේ දත්ත පාවිච්චි කර වෙන වෙන ක්‍රියාමාර්ගවලට යන්න පුළුවන්. ඒ නිසා අපේ ජෛව දත්ත එකතු කරනවාය කියන එක ඒ තරම් සරල කාරණයක් හැටියට සලකන්න එපා. ඒක බරපතළ කාරණාවක්.

ජනාධිපතිතුමා අර පෞද්ගලික රූපවාහිනී නාළිකාවේ පැවැති සාකච්ඡාවේදී කියනවා මම අහගෙන හිටියා, එතුමා විශ්වාස කරන්න කියලා. එතුමා විශ්වාස කර දෙන්න කිව්වා. ඒ වාගේම එතුමා කිව්වා, මේ project එක සම්බන්ධව, ඩිජිටල්කරණය සම්බන්ධව විෂයානුබද්ධ දැනුමක් තිබෙන හාන්ස් විජයසූරිය මහත්මයාව විශ්වාස කරන්න කියලා. ජනාධිපතිතුමා කොහොමද, හාන්ස් විජයසූරිය ගැන චරිත සහතික දෙන්නේ? එහෙම චරිත සහතික දෙන්න පුළුවන්ද? ජනාධිපතිතුමා විශ්වාස කරන්න පුළුවන්. මොකද, ජනාධිපතිතුමාට මේ රටේ ජනතාව ඡන්දය දීලා තිබෙනවා. ඒක හරි. එතුමා යම් ජනතා විශ්වාසයක් මත බලයට

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ආපු කෙනෙක්. නමුත්, හාන්ස් විජයසූරිය කියන්නේ එහෙම කෙනෙක් නොවෙයි නේ. ඉතින් ජනාධිපතිතුමා රූපවාහිනී නාළිකාවකට ඇවිල්ලා කියන්නේ කොහොමද, "මාව විශ්වාස කරන්න එපා, හාන්ස් විජයසූරියව විශ්වාස කරන්න" කියලා? අපි කොහොමද ඔහුව විශ්වාස කරලා දත්ත දෙන්නේ? මතක තබා ගන්න, ඔහු ඩයලොග් සමාගමේ CEO හැටියට සිටියදී, තාජුඩීන් ඝාතනයට අදාළ තොරතුරු සෙවීමේදී අවශ්‍ය වුණු telephone numbers ටික ලබා දුන්නේ නැහැ. ජනාධිපතිතුමා කියන ඔය පුද්ගලයා; ඔය ආර්ථික උපදේශක තමයි එවකට ඩයලොග් සමාගමේ CEO වෙලා හිටියේ. ඔහු තොරතුරු වසන් කළා, තාජුඩීන්ගේ ඝාතනය සම්බන්ධයෙන් අවශ්‍ය වුණු telephone numbers නොදී. එවැනි අයව විශ්වාස කරන්න කියලා ජනාධිපතිතුමා අපට කියනවා නම්, ඒක විහිළුසහගත, බරපතළ කාරණයක්.

අපිට credibility එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඔහුගේ විෂයානුබද්ධ දැනුම ගැන අපට ගැටලුවක් නැහැ. ඔහු තමයි මේ subject එක සම්බන්ධව ලංකාවේ ඉන්නා හොඳ දැනුමක් තිබෙන කෙනා. ඒක ගැන විවාදයක් නැහැ. නමුත් පසුගිය කාලයේ ඒගොල්ලන් ප්‍රධාන සමාගම්වල ප්‍රධානීන් හැටියට වැඩ කරනකොට කටයුතු කළේ කොහොමද? මේ රටේ සිදු වුණු මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධව සොයා බැලීමට ඔවුන්ගේ සමාගමෙන් නිකුත් කරන ලද දුරකථන අංකවල විස්තර ඉල්ලුවාම ඒ අවශ්‍ය කරුණු ලබා දුන්නේ නැහැ, ඒවා වැහුවා. මොකද, ඒගොල්ලන්ට එදා හිටපු පාලකයන් එක්ක, එදා හිටපු ඒ පවුලත් එක්ක විශාල සම්බන්ධකම් තිබුණා. එහෙම සම්බන්ධකම් තිබුණු නිසා ඒවා ලබා දුන්නේ නැහැ. ඉතින් එවැනි අය ගැන විශ්වාස කරන්නය, credibility එක ගැන අවුලක් නැහැය කියලා ජනාධිපතිතුමා අපට කියනවා. එහෙම කියන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ මිලියන 22ක ජනතාවගේ ජෛව දත්ත එකතු කරනවා නම්, ඒ අය ගැන අපට විශ්වාසයක් තිබෙන්න ඕනෑ. ඒවා එහෙම දෙන්න බැහැ. ඒ නිසා මම කියනවා, මේක ඉතාම බරපතළ කාරණයක් බව.

අපේ රටට National Identity Card එක හඳුන්වා දුන්නේ 1972 වර්ෂයේදී. නමුත් 1988-89 කාලයේ ඇතැම් කණ්ඩායම් විසින් National Identity Card එකතු කළා. ඇයි, National Identity Card එකතු කළේ? ඒ, වෙන මොකටවත් නොවෙයි, National Identity Card එක කියන්නේත් එක පැත්තකින් මර්දනය සඳහා පාවිච්චි කරන්න පුළුවන් දෙයක්. ඒකයි එදා Identity Cards එකතු කළේ. වෙන මොකවත් නිසා නොවෙයි. මර්දනය සඳහා Identity Card එක පාවිච්චි කරන්න පුළුවන්. එහෙම නම් අපි මේ ජෛව දත්ත එකතු කරන්නේ මොකටද? ජෛව දත්ත පාවිච්චි කරන්නත් පුළුවන්, අපට විරුද්ධව. මගේ ඇඟිලි සලකුණු වෙන අයට පාවිච්චි කරන්න පුළුවන්. එහෙම කරලා මම යම් දෙයක් කළා කියලා යම් යම් දේවල්වලට අපිව ගාවා ගන්න පුළුවන්. ඒකයි මේකේ තිබෙන බරපතළ කාරණාව. අද ලෝකයේ රටවල් 19ක් මේ කටයුත්ත කර තිබෙනවා. නමුත් ඒ රටවල් 19න් මේ biometrics information leak නොවුණු එක රටක් ගැන කියන්නකෝ. හැම රටම leak කරගත්තා. ඒ නිසා තමයි අපි කියන්නේ මේක ගැන සමාජ සංවාදයක් ඇති කරන්න ඕනෑ කියලා. මේක හදිසියේ කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ පිළිබඳව සමාජ සංවාදයක් ඇති කරන්න කියලා අපි රජයෙන් ඉල්ලනවා. මේ කටයුත්ත කරන්න හදිසි වෙන්න එපා. මේ කටයුත්ත කරන්න. මේ රටේ සමාජය තුළ මේ පිළිබඳව සංවාදයක් ඇති වෙන්න ඕනෑ; මේ ක්ෂේත්‍රයේ ඉන්නා අය මේ පිළිබඳව කථා කරන්න ඕනෑ.

ආණ්ඩුව පත් කර ගත්ත උපදේශකයෝ විතරක් නොවෙයි, මේ විෂයය සම්බන්ධව දැනුම තිබෙන තව හුඟක් අය ඉන්නවා. ඒගොල්ලන් ඇවිල්ලා මේ අයගෙන් අදහස් අහන්න ඕනෑ. එම නිසා ඒ සියලුදෙනාගෙන්ම අදහස් අහන්න. හදිසියේ මේක කරන්නේ නැතිව මේ පිළිබඳව සංවාදයක් ඇති කරන්න කියලා මම ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, NIC එක ඩිජිටල්කරණය කිරීමේදී අවශ්‍ය වන උපකරණ ඔක්කොම දැන් අරගෙන ඉවරයි. Automated Biometric Identification System එක දැන් මිලදී ගෙන ඉවරයි. අපි දැනගන්න කැමතියි, මෙවා මිලදී ගැනීම් කළේ කොහොමද, ටෙන්ඩර් ක්‍රියා පටිපාටියකට ගියාද, කොහොමද මේ ටෙන්ඩර් කැඳෙව්වේ, මෙවා කරලාද මිලදී ගැනීම් කළේ කියන එක. *[බාධා කිරීමක්]* කලින් ආණ්ඩුව එහෙම කරලා තිබුණා නම් ඔබතුමන්ලා හැම දාම විරුද්ධ කරන ලැයිස්තු ටික අරගෙන ඇවිල්ලා කියවන්න ඕනෑ. ඔබතුමන්ලාගේ පොලීසිය භාර ඇමතිතුමාගෙන් පාස්පෝට් ප්‍රශ්නය ගැන ඇහුවාම වෙන මොකක්දෝ එකක් ගැන කියනවා. ඒ වෙච්ච දූෂණය ගැන කියන්නේ නැහැ. මම කියන්නේ මේකයි. ඔබතුමා කලින් ලැයිස්තු ටිකක් කියෙව්වා නේ. ඒ ලැයිස්තු ටික කියෙව්වා වාගේ කලින් ආණ්ඩුව ටෙන්ඩර් නැතිව දීපු ඒවා ටිකත් කියන්න. *[බාධා කිරීම්]* Controller General බන්ධනාගාරගත කළේ පසුගිය ආණ්ඩුව කාලයේ. අධිකරණයෙන් තමයි ඔහුව ඇතුළට දැම්මේ. ඔහුව ඇතුළට දමන්න වුණේ අපේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් - එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමායි, රවුෆ් හකීම් මන්ත්‍රීතුමායි, චම්පික රණවක මන්ත්‍රීතුමායි - ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දමපු නිසායි. ඒකයි එතුමා ඇතුළට ගියේ. එහෙම නැතිව මේ ආණ්ඩුවෙන් ඔහුව ඇතුළට දැම්මේ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
2015දී දාපු නඩු ටික ඔක්කොම යන්නේ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahman)
2015දී දාපු නඩු නොවෙයි, පාස්පෝට් ප්‍රශ්නය සම්බන්ධව නේ මෙතුමා කථා කරන්නේ. ඒ නිසා තමයි අපි කියන්නේ දැන් මේකවත් අපිට කියන්න කියලා. ඒ inquiry එක කරන්න. අපි කියන්නේ මේකයි. කලින් ආණ්ඩුව යටතේ වෙච්ච බරපතළ කරුණු කාරණා හුඟක් තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මිත්‍රයා නිසා කරන්නේ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා දැන් උපකරණ ගෙනාවාය කියන්නේ අපි ගෙනාවා වාගේ නේ. ඒ machines පසුගිය ආණ්ඩුවෙන් programme එකට අදාළව ගෙනැල්ලා තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahman)
මම අහන්නේ, ඒ උපකරණ කලින් ආණ්ඩුව ගෙනාවේ ටෙන්ඩර් කැඳවීමක් කරලාද කියායි. ඒක හොයලා මට කියන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පසුගිය ආණ්ඩුවෙන් කියලා ඔබතුමා කිව්වේ නැහැ නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
නැහැ. නැහැ. මම කිව්වේ පසුගිය ආණ්ඩුවෙන් කියලා. ඔබතුමා කිව්වා නේ, පසුගිය ආණ්ඩුවෙන් කියලා. මම අහන්නේ ඒක පසුගිය ආණ්ඩුවෙන් කළා නම් ටෙන්ඩර් කැඳවීමකින් කළා ද, නැද්ද කියන එකයි. මොකද, මේවා රුපියල් මිලියන ගණනින්, බිලියන ගණනින් යන බිල්. ඒවා විනිවිදභාවයකින් කළාද කියන එක මට කියන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඒ ගැන පැහැදිලි කරලා කියන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාගේ යහළුවෙක් නේ හිටියේ. හරින් නේද හිටියේ?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
හරින් නොවෙයි හිටියේ. ඒ හිටපු කෙනා ඔබතුමන්ලාගේ හොඳ යාළුවෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණයත් වැදගත්. අපි ලංකාවේ මොබයිල් සමාගමකින් telephone number එකක් ගන්නවාය කියලා හිතමු. ඒක ඩයලොග් වෙන්න පුළුවන්; මොබිටෙල් වෙන්න පුළුවන්; හච් වෙන්න පුළුවන්. අපි ඒ telephone number එක ගන්නේ මුදල් ගෙවලා. මම අවුරුදු 20ක් තිස්සේම එකම telephone number එක තමයි පාවිච්චි කරන්නේ. මේ ගරු සභාවේ ඉන්න ඔක්කොම අය වාගේ අවුරුදු ගණනක් එකම telephone number එක පාවිච්චි කරනවා. වෙනත් මොබයිල් ආයතනයකින් මොනවා හෝ පහසුකමක් දීලා තිබෙනවා නම් අපිට ඒ number එක මාරු කර ගන්න අවශ්‍ය වුණත්, ඒ number එක මාරු කර ගන්න බැහැ. අපි පාවිච්චි කරන number එක cancel කරන්න ඕනෑ. ඒක වැරදියි. මොකද, ඒ number එක මගේ identification එක. ඒ number එක අයිති මටයි. ඒ නිසා මම ආණ්ඩුවට කියනවා, මේක වෙනස් කරන්න නීති ගෙනෙන්න කියලා. මොකද, කවුරුන් හෝ කෙනෙක් මුදල් ගෙවලා mobile phone number එකක් ගත්තාම ඒකේ අයිතිය තිබෙන්නේ ඒ පුද්ගලයාට, සමාගමටම නොවෙයි. මොකද, අපි ඒ number එක වෙනුවෙන් සමාගමට ගෙවීමක් කරනවා. ඒ නිසා මේ නීති වෙනස් වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම digital identity card එක සම්බන්ධව මේ සමාජය තුළ සංවාදයක් ඇති කරන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. එවැනි සංවාදයක් ඇති කිරීම තුළ තමයි අපි මොකක්ද කළ යුත්තේ කියන කරුණු කාරණා පිළිබඳව අපිට තීන්දුවක් ගන්න පුළුවන් වන්නේ.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[3.39 p.m.]

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
Hon. Presiding Member, I think this is a great opportunity for me to speak about the Budget Proposals for the Ministry of Digital Economy at the Committee Stage Discussion. Sir, first of all, let me start with this quotation: "Digitalization is not just a tool, but a shield against corruption. It is a gateway to transparency and the foundation of good governance." Therefore, the more we embrace technology, there would be less room for exploitation.

ඉතා හරවත් සංවාදයක් ඇති කර ගන්න ඕනෑ මොහොතක වාගේම තාක්ෂණිකව වැදගත් වන කරුණු සාකච්ඡා කරන්න ඕනෑ මොහොතක මේ විවාදය ඇත්තටම හරවත් විවාදයක් නොවීම පිළිබඳව මම කනගාටු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දැක්කා, අද මෙතැනදී විවිධ කරුණු කාරණා ඉදිරිපත් වුණු ආකාරය. මම හිතන විධියට මෙතැන මූලිකම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ඉන්දියාවේ ගරු මෝදි අගමැතිතුමා අපේ ජනාධිපතිතුමාගේ කරට අත දමා ගෙන ගිය එකද දන්නේ නැහැ. අපට විරුද්ධව දැවැන්ත මඩ ප්‍රහාර, අවලාද එල්ල කර තිබුණා; සෑහෙන අපහාස කරලා තිබුණා. නමුත් අපි ජාත්‍යන්තර සබඳතා ඉතාම හොඳ ආකාරයෙන් පවත්වාගෙන යන එක මේකෙන් ඔප්පු වෙනවා. අද සමහර අයට ඒ ගැන පොඩි කැක්කුමක් තිබෙනවා.

සමහර අය යම් යම් කරුණු කාරණා ඉදිරිපත් කරද්දී තාක්ෂණය සම්බන්ධව කිසිසේත්ම සැලකීමට ගත්තේ නැහැ කියන එක නම් හොඳටම පේනවා. Digitalization process එකට යන ලෝකයේ පළමු රට ලංකාව නොවෙයි. ඇත්තටම අපි දුක් වෙන්න ඕනෑ. අපි රටක් විධියට අතීතකාමයෙන්ම තමයි ජීවත් වෙලා තිබෙන්නේ. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ, ජාත්‍යන්තර ආර්ථිකයේ ඒ ඒ අවස්ථා තුළ අපි අත්පත් කර ගත්ත ප්‍රතිශතය, ඒ පංගුව ඉතාම අඩුයි. අවුරුදු 500, 1,000, 1,500, 2,000, 2,500 පැරණි -පෞරාණික- ඉතිහාසයක් තමයි තවමත් අපට කථා කරන්න ඉතිරි කරලා තිබෙන්නේ. හැබැයි, අපට පසුව ලෝක සිතියමේ තනි රටවල් විධියට සඳහන් වෙච්ච රටවල් ඉතාම වේගයෙන් ලෝකයේ ආර්ථිකය අත්පත් කරගෙන තිබෙනවා. වෙළඳාම් ක්ෂේත්‍රය අත්පත් කරගෙන තිබෙනවා. බොහෝ රටවලින් මේ රටට එන දූත පිරිසත් එක්ක අපි සාකච්ඡා කරද්දී එතුමන්ලා, එතුමියලා තමන්ගේ රට පසුගිය අවුරුදු 50ක, 40ක, 30ක, 20ක කාලය තුළ, පසුගිය අවුරුදු 10ක, 05ක පමණ කෙටි

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

කාලය තුළ අත්පත් කර ගත්ත ජයග්‍රහණ ගැන කථා කරද්දී අපි කථා කරන්නේ අතීතය ගැනයි. මම හිතන විධියට, ඒක දැන් වෙනස් වෙන්න පටන්ගෙනයි තිබෙන්නේ. විශේෂයෙන් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් විධියට අපි ඒ සම්බන්ධයෙන් ඉතාම හරවත් සාකච්ඡාවක් ලබා ගත්තා. විශේෂයෙන් ඩිජිටල්කරණය හරහා රටක් විධියට ඉතාම වේගයෙන් ඉස්සරහට යන්න පුළුවන් අවස්ථා, ඉඩකඩ දැන් අපට ලැබී තිබෙනවා.

මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා ඩිජිටල්කරණය සම්බන්ධව, ඒ හැදුනුම්පත් ක්‍රමය සම්බන්ධව තුට්ටු දෙකටවත් ගණන් ගත්තේ නැති විධියටයි කථා කළේ. විපක්ෂයෙන් මේ වාගේ සංවාද, සාකච්ඡා මතු වීම ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ලෝකයේ, biometric information leak නොවුණු රටක් නැහැ කිව්වා. එහෙම නැහැ. තැන් තැන්වල අවස්ථා කිහිපයක් තියේවි. නමුත් ලෝකයේ success stories ගොඩක් තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල ඉතාම සාර්ථකව මේ කටයුත්ත කරගෙන යනවා. දැන් AI තාක්ෂණය පාවිච්චි කරගෙන මීටත් වඩා කඩිනමින් ඉස්සරහට යන රටවල් ගොඩක් තිබෙනවා. අපේ රටේ හැදුනුම්පත් සම්බන්ධව ගත්තොත්, අපි විශ්වාස කරනවා එය ඉතාම වේගයෙන්, ඉතාම කඩිනමින් කටයුතු කරන්න ඕනෑ ක්ෂේත්‍රයක් බව. මේකත් එක්ක අනෙකුත් ප්‍රශ්න විසඳෙයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. විශේෂයෙන් දූෂණ, වංචා, නාස්තිය ඇතුළු බොහෝ දේවලට අපට තිතක් තියන්න පුළුවන් පළමු මුල් ගල තමයි මේ ඩිජිටල් හැදුනුම්පත් ක්‍රමය.

ඊළඟට, ජෛව දත්ත සම්බන්ධව දැනුවත් නැති විධියට මේ සභාව තුළ විවිධ කරුණු කාරණා ඉදිරිපත් කළා. ඇත්තටම දුකයි. අපි ඉදිරිපිට තිබෙන මේ fingerprint machine එකෙත් අපි fingerprint එක තබනවා. ඕනෑම තැනකදී අපේ ජෛව දත්ත අපි ඉදිරිපත් කරනවා. නමුත් ඊටත් වඩා ආරක්ෂා සහිත ක්‍රමයක් තමයි අපි ඉදිරිපත් කරන්නේ. මේක තවත් සරල භාෂාවෙන් කිව්වොත්, මේකට කියන්නේ encryption, encoding කියලායි. මේවා ලෝකයේ බොහෝ රටවල, බොහෝ ආයතනවල ඉතාම සාර්ථකව පරීක්ෂණයට පත් වූ දේවල්. හැබැයි, අපි තවම අතීතයේ ජීවත් වෙන්නේ. ඒ නිසා මේක අපි වෙනස් කරමු. මේ මානසිකත්වයෙන් අපි එළියට එමු. මේ තාක්ෂණය - digitalization - පාවිච්චි කරමින් අපට පුළුවන් අපේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයට ලොකු දායකත්වයක් ලබා දෙන්න. පසුගිය කාලයේ සහල් ප්‍රශ්න, පොල් ප්‍රශ්න මතු වෙන්න ප්‍රධානම කාරණාව තමයි අපි සතුව හරියාකාර දත්ත, තොරතුරු නැතිකම.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 2ක් පමණයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(මාණ්පුමිකු අරුණ් හේමච්චන්ද්‍රා)
(The Hon. Arun Hemachandra)
හොඳයි, මම අවසන් කරන්නම්.

ඒක අපි වෙනස් කරන්න ඕනෑ. ඒ සම්බන්ධව අපි analysis එකක් කරන්න ඕනෑ. අපි ලංකාවේ ධීවර ක්ෂේත්‍රය ගත්තොත්, මාළු අස්වැන්න මොන මොන කාලවල, කුමන කුමන ආකාරයටද නෙළා ගන්නේ කියන එක සම්බන්ධයෙන් තවම දත්ත, තොරතුරු නැහැ.

මේවාට AI තාක්ෂණය තවම හරියට පාවිච්චි කරලා නැහැ. නමුත් ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි මේ සම්බන්ධව සාකච්ඡා කරද්දී, කතිකාවක් මතු කරද්දී, සමහර අය නිකරුණේ විවේචන ඉදිරිපත් කරන එක නම් අපි කිසිසේත්ම ගණන් ගන්න ඕනෑ නැහැ. අපේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, ප්‍රවාහන ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, පශු සම්පත් ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, ඒ වාගේම අපේ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, ඒ සියලු ක්ෂේත්‍රවලට නිසැකයෙන්ම ඉතාම හොඳ දායකත්වයක් ලබා දෙන්න පුළුවන් ක්‍රියාවලියක් තමයි ඩිජිටල්කරණය. දැන් අපි භාවිත කරන GovPay කියන system එක ඉතා හොඳ ආකාරයෙන් ක්‍රියාත්මක වනවා. දෛනිකව අලුත්, අලුත් ආයතන අපිත් එක්ක එකතු වෙමින්, මේ වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන යන්න කටයුතු කරනවා.

මගේ අමාත්‍යාංශය ගත්තොත්, අපි තවදුරටත් අතීතයේ ජීවත් වන්නේ නැතුව තාක්ෂණය හොඳාකාරයෙන් යොදා ගනිමින් ඉදිරියට යන්න තමයි සූදානම් වෙලා ඉන්නේ. විශේෂයෙන්ම විදේශ රැකියා සඳහා වන අපේ selection process එකටත් අපි ඩිජිටල් තාක්ෂණය පාවිච්චි කරනවා. ඊළඟට, consular service එක. අපි ඩිජිටල්කරණය හරහා එම අංශයේ වැඩ සෑහෙන්න පහසු කරලා තිබෙනවා. කෙටි කාලයක් තුළ මේ වාගේ බොහෝ දේවල් අපට අත්පත් කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. මෙවැනි ජයග්‍රහණ අත්පත් කර ගන්න දැන් අපට අවස්ථාව සහ ඉඩකඩ ලැබෙද්දී ඒ සම්බන්ධව කිසි අගය කිරීමක් නැතුව කෙරෙන විපක්ෂයේ විවේචන අපි ගණන් ගන්න ඕනෑ නැහැ. ඩිජිටල්කරණ ක්‍රියාවලිය අපි ඉතාම වේගයෙන් සම්පූර්ණ කරන්නට ඕනෑ. ආණ්ඩුව විධියට ඒ සඳහා අපි කැප වෙනවා. අපට පුළුවන් single-window platform එකක් හරහා ඉතා වේගයෙන් ආයෝජකයෝ මේ රටට කැඳවලා, ඉතා වේගයෙන් සංවර්ධන මාවතකට මේ රට අරගෙන යන්න.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 3.47]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(මාණ්පුමිකු ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதம் டிஜிட்டல் பொருளாதார அமைச்சு, மற்றும் விஞ்ஞான, தொழில்நுட்ப அமைச்சு ஆகியவை சம்பந்தமானதாக இருக்கிறது. இந்த டிஜிட்டல் பொருளாதாரம் என்பது நவீன பொருளாதாரத்தில் ஒரு முக்கிய பகுதியைக் கொண்டிருக்கின்றது அல்லது அது நவீன பொருளாதாரத்தின் முதுகெலும்பு என்று சொல்வதில் எந்தத் தவறும் இருக்க முடியாது. ஆகவே, டிஜிட்டல் பொருளாதாரக் கட்டமைப்பை விருத்திசெய்ய வேண்டிய அவசியம் இருக்கின்றது. அபிவிருத்தியடைந்த நாடுகளை எடுத்துக்கொண்டால், அந்த நாடுகளில் டிஜிட்டல் பொருளாதார முறைமை வெற்றிகரமானதாக அமைந்திருக்கின்றது; முன்னேற்றகரமான நிலையிலும் காணப்படுகின்றது. ஆகவே, இந்த டிஜிட்டல் பொருளாதாரக் கட்டமைப்பை நாங்களும் பின்பற்ற வேண்டுமென்ற எண்ணத்தை ஒரு சிறந்த தீர்மானமாகக் கொள்ள முடியும்.

இந்த டிஜிட்டல் பொருளாதார முறை புதிய தொழில் வாய்ப்புகளைப் பெறுவதற்கும் புதிய சந்தை வாய்ப்புகளை ஏற்படுத்திக்கொள்வதற்கும் புதிய வகையான தொழில்களைப் பெற்றுக்கொள்வதற்கும் இணையச் சேவை மூலமாகப் பயண நெருக்கடிகள் இல்லாமல் வீடுகளிலிருந்து பணியாற்றவும் வணிகத் துறையின் முன்னேற்றத்திற்கும் கைத்தொழிற்றுறை, விவசாயத்துறை போன்ற துறைகளை மாத்திரமல்லாமல், மருத்துவத்துறை, போக்குவரத்துத்துறை போன்ற பல்வேறு துறைகளிலும் அதன் பரிமாணத்தைக் கொண்டுசெல்வதற்கும் உதவுகின்றது. ஆனால், இந்த முறைமையின் பிரயோகம் வெறுமனே நகரங்களுக்குள் மாத்திரம் முடங்கிக் கிடக்கக் கூடாது. நாட்டின் 70 சதவீதமான மக்கள் கிராமப் பகுதிகளிலேயே வாழுகின்றனர். அந்த வகையில், இந்த டிஜிட்டல் பொருளாதார முறைமையை எமது நாட்டின் கிராமப் பகுதிகளுக்கும் கொண்டுசெல்ல வேண்டியிருக்கின்றது. இன்றும்கூட நாட்டின் சில பகுதிகளில் தொலைத்தொடர்பு வசதிகளை ஏற்படுத்த முடியாத நிலை காணப்படுகின்றது. குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தில் கட்டுமுறிவு, பூலாக்காடு, பன்சேனை, பாவற்கொடிச்சேனை போன்ற இடங்களையும் அதேபோன்று. வடக்கில் அனலைதீவு போன்ற பிரதேசங்களையும் உதாரணமாகச் சொல்லலாம். அந்த இடங்களில் தொலைத்தொடர்புகளை ஏற்படுத்துவது என்பது சிரமமாகக் காணப்படுகின்றது. டிஜிட்டல் பொருளாதாரத்தைப் பற்றிச் சிந்திக்கின்ற நாங்கள் இந்த இணையவழித் தொடர்புகளை மிகவும் நெருக்கமாக ஏற்படுத்திக்கொள்ள வேண்டிய தேவை இருக்கின்றது. டிஜிட்டல் பொருளாதார முறையை எதிர்க்கவோ, மாற்றுக் கருத்துகளைச் சொல்லவோ நாங்கள் முன்வரவில்லை. ஆனால், கிராமங்கள்தோறும் இந்த சேவை விஸ்தரிக்கப்பட வேண்டும் என்பதையே குறிப்பிட விரும்புகிறேன்.

”கணினியைக் கல்லான் காலத்தை வெல்லான்” அல்லது “கணினியைக் கல், காலத்தை வெல்” என்று சொல்வார்கள். நாங்கள் வேட்டை யுகம் கடந்து, விவசாய யுகம் கடந்து, கைத்தொழில் யுகம் கடந்து, இப்போது தகவல் தொழில்நுட்ப யுகத்தில் இருக்கின்றோம். இந்த யுகத்தில் நாங்கள் டிஜிட்டல் பொருளாதாரம் பற்றிச் சிந்திக்காமல் இருக்க முடியாது. அரசாங்கம் இந்த டிஜிட்டல் பொருளாதார முறைமையை அறிமுகப்படுத்தி, அதற்கு ஓர் அமைச்சை ஏற்படுத்தியிருந்தாலும் இதனை அமுல்படுத்துகின்ற விடயம் மிகவும் முக்கியமானது. இந்த அரசாங்கம் அதைக் கையாள்வது என்று முடிவெடுத்திருக்கின்றது. இந்தக் கையாளுகை என்பது நாட்டின் பல பாகங்களுக்கும் கொண்டு செல்லப்பட வேண்டும். இதன்மூலமாக நாங்கள் பல நன்மைகளைப் பெற முடியும். ஆகவே, டிஜிட்டல் பொருளாதார முறைமைக்கு ஏற்ப, பாடசாலைகளிலிருந்து இந்தக் கல்வி மாணவர்களுக்கு வழங்கப்பட வேண்டும்.

இன்று மனித வளங்களை எடுத்துக்கொண்டால், எமது நாட்டில் வகுக்கப்பட்ட பாடத்திட்டங்களுக்கு அமைவாகக் கற்றுக்கொண்ட பட்டதாரிகள், குறிப்பாக கலைப் பட்டதாரிகள், தொழில் வாய்ப்புகள் இல்லாமல் தெருக்களில் நிற்கின்றார்கள். கலைப் பிரிவில் கல்வி கற்ற மாணவர்கள், உள்வாரிப் பட்டப்படிப்பு என்றாலும் சரி, வெளிவாரிப் பட்டப்படிப்பு என்ற ரீதியிலும் சரி, பட்டச் சான்றிதழ்களைப் பெற்றுக்கொண்டு இப்போது தெருக்களில் தொழில்களுக்காகப் போராடிக் கொண்டிருக்கிறார்கள். நான் இங்கு வருகின்றபோதும்கூட என்னைச் சந்தித்த சில பட்டதாரி மாணவர்கள், “Sir, நாங்கள் பட்டப் படிப்பை முடித்துவிட்டு, பல ஆண்டுகளாகத் தொழில்களுக்காகக் காத்துக்கொண்டு இருக்கின்றோம்” என்று சொன்னார்கள். அப்படியென்றால், அவர்களுக்கு வகுக்கப்பட்ட பாடத்திட்டம் என்பது தற்போதைய தொழில் உலகத்திற்கு ஏற்ற வகையில் அமைக்கப்படவில்லை என்பதுதான் உண்மையாக இருக்கின்றது. எனவே, பாடத் திட்டத்திலும், கற்கவேண்டிய பாட விடயங்களிலும் நாங்கள் மாற்றங்களை ஏற்படுத்த வேண்டும்.

பல்கலைக்கழகங்கள் தொழில் உலகம் சம்பந்தமாக ஆய்வு செய்து, என்னென்ன தொழில் வாய்ப்புகள் இருக்கின்றன என்பதை அறிந்து, அதற்கேற்ற கல்வியைக் கொடுத்து, பட்டச் சான்றிதழைக் கொடுக்கின்றபோதுதான் அந்தப் பட்டச் சான்றிதழைக் கொண்டு அவர்கள் தொழில் வாய்ப்புகளைப் பெறக்கூடிய ஏதுநிலை காணப்படும். அவ்வாறில்லாமல், நாங்கள் பாரம்பரியமான பாடங்களைக் கற்பித்துவிட்டு, பட்டச் சான்றிதழையும் கொடுத்துவிட்டு, அவர்கள் தொழில் தேடித் திரிகின்றபோது, உங்களது பட்டச் சான்றிதழிலுள்ள பாடங்கள் தொழில் வாய்ப்புகளைப் பெறுவதற்கு லாயக்கற்றவை என்று கூறுகின்றபோது, அந்தக் கலைத் திட்டத்தை வகுத்தவர்கள் யார்? இந்தப் பாடங்களைத்தான் படிக்க வேண்டும் என்று சொன்னவர்கள் யார்? என்ற கேள்விகளெல்லாம் எழுகின்றன. ஆகவே, பாடவிதானத்தில் மாற்றத்தை ஏற்படுத்த வேண்டும்.

இப்பொழுது மாற்றத்தை நோக்கித்தான் நாங்கள் செல்லுகின்றோம் என்றால், கலைப் பிரிவில் படிக்கின்ற மாணவர்களை எடுத்துக்கொண்டாலும் சரி, ஏனைய மாணவர்களை எடுத்துக்கொண்டாலும் சரி, digital பொருளாதாரத்திற்கு ஏற்ற விதத்தில் இசைவாக்கம் அடைவதற்கு அல்லது தகவல் தொழில்நுட்ப அறிவைப் பெற்றுக்கொள்வதற்கு ஏற்ற விதத்திலான பாடங்கள் அவர்களுக்கு வழங்கப்பட வேண்டும். அவ்வாறான முறையில் கற்று வெளியேறுகின்றபோது, சிலவேளைகளில் சுயமாகக்கூட அவர்கள் தங்களுடைய தொழில் வாய்ப்புக்களைப் பெற்றுக்கொள்ளக்கூடியதாக இருக்கும் அல்லது தனியார் துறைகளில் தொழில் வாய்ப்புகளைப் பெற்றுக்கொண்டு வேலைவாய்ப்புக்காக அரசுக்கு நெருக்கடி கொடுக்காமல் வாழப் பழகிக்கொள்வார்கள். ஆனால், இன்றைய நிலையில் கலைப் பட்டதாரிகள், வணிகப் பட்டதாரிகள், ஏன் விஞ்ஞானப் பட்டதாரிகள் மற்றும் பொறியியல் துறையில் பட்டப் படிப்பை முடித்தவர்கள்கூட தொழில் வாய்ப்புகள் இல்லாதிருக்கின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. பொறியியலாளராகப் பட்டம் பெற்று வெளியேறிய அதிகஷ்டப் பிரதேசத்தைச் சேர்ந்த ஒருவர் என்னைச் சந்தித்தபோது, தான் பொறியியல் துறையில் கற்றல் செயற்பாட்டை முடித்துவிட்டு இரண்டு வருடங்களாக வேலைக்காகக் காத்துக்கிடப்பதாகச் சொன்னார். ஆகவே, இப்படியான மனித வளங்களை நாங்கள் தொழில் உலகத்திற்கு ஏற்ற விதத்தில் உருவாக்க வேண்டும் அல்லது பழக்கி எடுக்க வேண்டும்.

இன்று குறிப்பாக, விஞ்ஞானம், கணிதம் மற்றும் தகவல் தொழில்நுட்பம் போன்ற பாடங்களைப் பாடசாலைகளில் கற்பிப்பதற்கு ஆசிரியர் பற்றாக்குறை காணப்படுகின்றது. அதிலும் கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களில் இந்த ஆசிரியர் பற்றாக்குறையென்பது மிக அதிகமாகக் காணப்படுகின்றது. அதனால், இந்த மாணவர்கள் ஏதோ தங்களுக்குக் கிடைக்கின்ற வசதிக்கேற்ப கலைத்துறை சார்ந்த பாடங்களைக் கற்றுவிட்டு, குறிப்பாகப் பாரம்பரியமான சமயப் பாடமாக இருக்கலாம் அல்லது மொழிப் பாடங்களாக இருக்கலாம் அல்லது சமூகவியல் சார்ந்த பாடங்களாக இருக்கலாம், அதில் '3As' சித்திகளைக்கூடப் பெற்றுக்கொண்டு பல்கலைக்கழகம்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

செல்கின்றார்கள். அங்கும் அவர்கள் சிறப்பாகக் கற்று, Second Class (Upper Division), First Class அல்லது Second Class (Lower Division) என்ற கல்வித் தகைமையைப் பெற்றுவிட்டு, வெளியில் வந்த பின்னர் தொழில் வாய்ப்பைப் பெற்றுக்கொள்வதில் மிகவும் கஷ்டமான சூழ்நிலை காணப்படுகிறது. எனவேதான், தயவுசெய்து நான் சொல்லக்கூடிய விடயம் என்னவென்றால், இந்த மாணவர்களுக்கு secondary level என்று சொல்லப்படுகின்ற 2ஆம் தர நிலையிலிருந்து விஞ்ஞானக் கல்வி, தொழில்நுட்பக் கல்வி மற்றும் தகவல் தொழில்நுட்பம் சார்ந்த கல்வி என்பன நிறைவாக வழங்கப்படுகின்ற போதுதான், எங்களுடைய digital பொருளாதாரம் என்ற அந்த எண்ணத்திற்கேற்ற விதத்தில், அவர்களை நாங்கள் வடித்தெடுக்க முடியும் அல்லது பயிற்றுவிக்க முடியும் அல்லது அந்த அறிவாற்றலைக் கொடுக்க முடியும் என்பதுதான். அவ்வாறு கொடுக்கின்றபோதுதான் நாங்கள் பல நன்மைகளைப் பெறலாம்.

இன்றைய நிலையில் வேலையற்ற பட்டதாரி என்று சொல்லப்படுகின்ற 40 வயதிற்கு மேற்பட்டவர்கள் தொழில் வாய்ப்பினைப் பெற்றுக்கொள்ள முடியாது கூலித் தொழிலைச் செய்யும் நிலையில் காணப்படுகின்றார்கள். என்னைச் சந்தித்த சிறிமாரிமுத்து என்ற ஒரு பல்கலைக்கழக மாணவன் "Sir, நாங்கள் பட்டப் படிப்பை முடித்து விட்டோம். இப்பொழுது bakeryஇல் தொழில் செய்கின்றோம்" என்று சொன்னார். எனவே, பட்டதாரிகளாக இருக்கின்றவர்கள்கூடத் கூலித் தொழிலாளிகளாகச் செல்லக்கூடிய அளவுக்கு வேலையற்ற நிலை இருப்பதென்பது எமது நாட்டுக்கு ஒரு நல்ல சகுனமாக இருக்க முடியாது. ஏனென்றால், தொழில் வாய்ப்புக்கள் இல்லாமல் இருக்கின்றபொழுதுதான் மாணவர்கள் அல்லது அந்த வேலைதேடும் படையினர் விரக்தியடைந்து அரசுக்கு எதிராக மாறிய நிலைமைகள் கடந்த காலத்தில் தோற்றம் பெற்றிருந்தது. ஆகவே, இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டுமென்று நான் உங்களை மிகவும் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்த விடயம், விஞ்ஞானம், தொழில் நுட்பம் சார்ந்த பாடங்களை பாடசாலைகளில் ஒரு theoryயாக - கருத்தியலாகக் கற்பிப்பதைவிட, practicalலாக - செய்முறை சார்ந்த விதத்தில் கற்பிக்கின்றபோதுதான் மாணவர்கள் திறன்களைப் பெறக்கூடியவர்களாக இருப்பார்கள். இன்று மாணவர்கள் அறிவைப் பெறுகிறார்கள்; திறன்களைப் பெறுவதில்லை. அறிவை மாத்திரம் வைத்துக்கொண்டு பாடங்களை மனனம் செய்து, பரீட்சையில் சித்தியடைந்து சான்றிதழ்களைப் பெற்றுக்கொண்டபோதிலும் திறன்களற்ற தொழிற்படையாக இருப்பதனால் தொழில் வாய்ப்புக்களைப் பெற முடியாமல் இருக்கின்றது. எனவே, மாற்றத்தை ஏற்படுத்த வேண்டும், புதிய யுகத்தை உருவாக்க வேண்டுமென்ற அடிப்படையில் செயற்படுகின்ற நீங்களாவது கலைத்துறை, வணிகத்துறை சார்ந்தவர்களும்கூட இந்த தகவல் தொழில்நுட்பப் பாடங்களில் அறிவைப் பெற்று, digital பொருளாதாரக் கட்டமைப்பிற்கு ஏற்ற விதத்தில் தொழில் வாய்ப்புகளைப் பெறக்கூடியதாகப் பழைய பாடத்திட்டங்களில் மாற்றங்களை ஏற்படுத்த முயற்சிக்க வேண்டும்; அதற்குரிய செயற்பாடுகளை நடைமுறைப்படுத்த வேண்டுமென்று இந்த இடத்தில் நான் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், தொழிலற்று இருக்கின்ற பட்டதாரிகளுக்குத் தொழில் வாய்ப்புகளைக் கொடுப்பதற்கு ஏற்ற முன்னெடுப்புக்களைச் செய்யவேண்டும். நான் இங்கு குறிப்பிட்டதுபோல விரக்தியடைகின்ற மனித வளங்கள் வேண்டாத செயல்களில் ஈடுபடுகின்ற நிலைமைகள் கடந்த காலத்தில் அவதானிக்கப்பட்டிருக்கின்றது. ஏன், தேசிய மக்கள் சக்தி சார்ந்த நீங்கள்கூட உங்களது அமைப்பின்மூலம் கடந்த காலத்தில் பொருளாதாரக் கட்டமைப்பு சரியாக அமையவில்லை அல்லது இளைஞர்கள் சரியாக வழிப்படுத்தப்படவில்லை என்று 1971ஆம் ஆண்டு காலத்தில் ஒரு புரட்சியைச் செய்திருந்தீர்கள். அதேபோன்று, 1988 - 1989ஆம் ஆண்டு காலங்களிலும் நாட்டில் ஓர் ஆயுதப் புரட்சியின்மூலமாக மாற்றங்களை ஏற்படுத்த வேண்டுமென்ற வகையில் செயற்பட்டீர்கள். அதற்குப் பின்னர் நீங்கள் ஜனநாயக வழிக்கு வந்து, மாற்றங்களை ஏற்படுத்தக்கூடிய விதத்தில் 2/3 பெரும்பான்மையுடன் 159 ஆசனங்களோடு அதுவும் கலப்பில்லாத தேசிய மக்கள் சக்தி அரசாங்கமாக இன்று ஆட்சி செய்து கொண்டிருக்கின்றீர்கள். ஆகவே, இந்த விடயங்களை நீங்கள் சரியாகக் கையாண்டு மனித வளங்களான பட்டதாரிகளுக்குத் தொழில் வாய்ப்புக்களை வழங்க வேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

நான் இன்னும் சில குறிப்புகளைச் சொல்ல வேண்டும். அது இந்தத் துறை சார்ந்ததாக இல்லாவிட்டாலும் மக்கள் எதிர்பார்க்கின்ற விடயங்களாக அமைகின்றன. குறிப்பாக, ஐந்தாம் தரப் புலமைப்பரிசில் பரீட்சை முடிவுகள் வெளிவந்துள்ள நிலையில், எந்தெந்தப் பாடசாலைக்கு எந்தளவு வெட்டுப்புள்ளி என்பதை எதிர்பார்த்துக்கொண்டு பாடசாலைகளில் அனுமதிகளைப் பெற்றுக்கொள்வதற்காக மாணவர்கள் காத்திருக்கின்றார்கள். இன்னும் இந்த வெட்டுப்புள்ளிகள் வெளியிடப்படாததனால் அவர்கள் சில பரீட்சைகளிலும் தமிழ்த் தினப் போட்டிகள், சிங்கள தினப் போட்டிகள் போன்றவற்றிலும் கலந்துகொள்ள முடியாமல் இருக்கின்றார்கள். எனவே, மிக விரைவில் அதற்கும் ஆவன செய்யவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, 3ஆம் தர அதிபர் சேவைக்கான பரீட்சை நடைபெற்று கணிசமானளவு அதிபர்களுக்கு நியமனம் வழங்கப்பட்டாலும்கூட, இன்னும் 384 கடமை நிறைவேற்றும் அதிபர்கள் அதிபர் சேவை நியமனத்தை எதிர்பார்த்துக் கொண்டிருக்கின்றார்கள். அதிபர் வெற்றிடங்கள் இருக்கின்றன; ஆனால் அவர்கள் அதிபர்களாக நியமிக்கப்படாத ஒரு சூழ்நிலை காணப்படுகின்றது. மிகுதியாக உள்ள 384 பேருக்கும் தொழில் வாய்ப்பை வழங்க வேண்டுமென்று நீதிமன்றத்தினால் தீர்ப்பும் வழங்கப்பட்டிருக்கின்றது. எனவே, இந்த விடயத்தையும் சம்பந்தப்பட்ட அமைச்சரின் கவனத்திற்குக் கொண்டு வருகிறேன்.

மேலும், புகையிரத சேவை சம்பந்தமான ஒரு விடயத்தையும் குறிப்பிட வேண்டும். மட்டக்களப்பிலே இருந்து கொழும்பு நோக்கி கடந்த காலங்களில் பிற்பகல் 7.00 மணிக்குப் புறப்படும் புகையிரதம் முற்பகல் 3.50க்குச் சென்றடையக் கூடிய சூழ்நிலை காணப்பட்டது. தற்போது அந்த புகையிரத நேர ஒழுங்கானது பிற்பகல் 6.15 ஆகவும் கொழும்பைச் சென்றடையும் நேரம் 3.30 ஆகவும் மாற்றப்பட்டதனால் பயணிகள் பல அசௌகரியங்களைச் சந்திக்கின்றார்கள். அலுவலகங்களுக்குச் செல்கின்ற நேரங்கள் குழப்பமடைகின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, give me one more minute, please.

අත්‌තුදන්, කොලුම්පිලිරුන්තු තර්පෝතු ඉරවු 11.00 මණික්කුප් පුරප්පඩුකින්ර පුකෙයිරතම් කාලෙ 8.30 මණික්කු වන්තු සේරුකින්රපඩියාල් උත්තියෝකත්තර්කළ් අලුවලකම් සෙල්වතු අල්ලතු අංකිරුන්තු පයණිකළ් අම්පාරෙ නෝක්කිච් සෙල්වතු එල්ලාම් සිරමමාක ඉරුක්කින්රපඩියාල්, ඒර්කනවේ ඉරුන්ත පුකෙයිරත timetable - නේරසූසියෛප් පින්පර්රුමාරු පයණිකළ් කේට්ටුක් කොළ්කින්රාර්කළ්. මේලුම්, ඉන්තප් පුකෙයිරතත්තිල් උරංකල් ඉරුක්කෙ ඉල්ලාතු සෙය්යප්පට්ටු මුතලාම් වකුප්පු, ඉරණ්ටාම් වකුප්පු ආසනංකළ් මාත්තිරම් ඉරුක්කින්රපඩියාල්, තූරප් පයණම් සෙල්කින්රවර්කළ්, අටුත්ත නාළ් පල වේලෛකළෛ මුටික්ක වේණ්ටියවර්කළුක්කු අතු අසෞකරියමාක ඉරුක්කින්රතු එන්ර විටයත්තෛයුම් ඉංකු තෙරිවිත්තුක් කොළ්කින්රේන්.

ඉරුතියාක, උංකළුටෙය digital පොරුළාතාරම් මර්රුම් විඥ්ඤාන කෛත්තොළිල් අමෛච්චුක්කුරිය විටයංකළින් අමුලාක්කත්තෛ මක්කළුක්කුප් පයනටෙයක්කූටිය විතත්තිල් සරියාක මේර්කොණ්ටු, ඉන්ත digital මයම් පෝන්ර විටයංකළ් ඒළෛ එළිය මක්කළ් වාළුකින්ර කිරාමප්පුරප් පිරතේසංකළුක්කුම් සෙන්රටෙය වේණ්ටුමෙන්රු කූර්, එනතු උරෛයෛ නිර්‍රෙවුසෙය්කින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.01]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ අය වැය ලේඛනයත් එක්ක එන ඉතාම වැදගත් මාතෘකාවක් තමයි අපි අද සාකච්ඡාවට ගන්නේ. මේ රටේ ජනතාව, විශේෂයෙන්ම මේ රටේ තරුණ තරුණියන් මේ ආණ්ඩුවෙන් විශාල පරිවර්තනයක් බලාපොරොත්තු වුණා; අපේක්ෂා කළා. එම පරිවර්තනයට මුල් වන අමාත්‍යාංශයක ප්‍රතිසංස්කරණ ගණනාවක් පිළිබඳ සාකච්ඡා කරන විවාදයක් තමයි අද පැවැත්වෙන්නේ. ඒක තමයි මේ digitalization කියන ක්‍රියාවලිය. එහෙම නැත්නම් ඩිජිටල්කරණය කියන ක්‍රියාවලිය. ඇත්තටම මේ ඩිජිටල්කරණය කියන ක්‍රියාවලිය අපේ රටේ පොදු මහජනතාවට අලුත් මාතෘකාවක්. මේක අපේ ජන සමාජයට අලුත් මාතෘකාවක් බවට පත් වුණාට, ලෝකය ඇතුළේ අලුත් මාතෘකාවක් නොවෙයි. ඒ නිසා මේ රජයට තිබෙන පළමුවැනි වගකීම තමයි, රටේ පොදු මහජනතාව අතරට මේ මතවාදය විශ්වාසනීය ලෙස ගෙනයෑම. ඩිජිටල්කරණ ක්‍රියාවලිය කියන්නේ මොකක්ද කියා දැනුවත් කිරීම අතිශය වැදගත් කියන එකයි මගේ අදහස. බොහෝ ජනතාවක් මේ පිළිබඳ අදහසක් නැතිව ඉන්නේ. මේ කාර්යය සඳහා රුපියල් කෝටි 300ක මුදලක් වෙන් කරලා තිබෙනවා මම දැක්කා. මගේ පෞද්ගලික අදහස නම් ඒ මුදල ප්‍රමාණවත් නැහැ කියන එක. නමුත් ආරම්භයක් ලෙස ඒ වෙන් කරන ලද මුදල් ප්‍රමාණය හැකිතාක් ඒ දැනුවත් කිරීමේ සිට බොහෝ කාර්යයන් සඳහා යොදා ගන්නට ඕනෑය කියන යෝජනාව මම කරනවා. මීට වඩා වැඩි මුදලක් ඒ වෙනුවෙන් වෙන් කරන්න හැකියාවක් තිබෙනවා නම්, ඒකෙන් අපි අපේක්ෂා කරන පොහොසත් රටක් නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය පිම්ම ලබාගන්න පුළුවන් කියලාත් මම යෝජනා කරනවා. ඒ නිසා හැකියාවක් තිබෙනවා නම්, තව මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න කියන යෝජනාව මම නැවත කරන්න කැමතියි.

මොකක්ද මේ digitalization කියන්නේ? ඩිජිටල්කරණය කියන ක්‍රියාවලිය කොටස් තුනකින් විස්තර කරන්න පුළුවන්. එකක් තමයි digital governance කියන එක. මේ ඩිජිටල් ක්‍රියාවලියත් එක්ක අලුත් නීති, පනත් හදන්නට සිද්ධ වෙනවා. ඒ නීති රීති හැදෙන්නේ නැතිව කිසිම ආකාරයකින් මේ ක්‍රියාවලිය ශක්තිමත් කරගන්න බැහැ.

දෙවැනි එක තමයි digitalization කියන ක්‍රියාවලිය. ඒක ඇතුළේ තමයි ඔය passport එකේ ප්‍රශ්නය, ID එකේ ප්‍රශ්නය තිබෙන්නේ. මම දැක්කා, මේ ගරු සභාවේ බොහෝ වේලාවක් ඒ පිළිබඳ සාකච්ඡා කරනවා. ගොඩක් වෙලාවට සාකච්ඡා කෙරුණ කරුණක් තමයි, ජීවදත්ත ඇතුළත් කරන ලද ID එකක තිබෙන ජීවදත්ත වෙනත් රටකට යන්න පුළුවන් කියන කාරණාව. ඒක ඇත්ත. මම ඒකට පොඩි අදහසක් කියන්නම්. මේ වෙනකොට ලෝකයේ වැඩිම වටිනාකමක් සහිතව හුවමාරු භාණ්ඩයක් බවට දත්ත පත් වෙලා තිබෙනවා. ඉතින්, දත්තවල ආරක්ෂාව පිළිබඳ වගකීමක් ගන්නට සිද්ධ වෙනවා. ඒ නිසා ඒක කරන්නේ කොහොමද, ඒ කරන විධිය පිළිබඳ හැකිතාක් සැලකිලිමත් වෙන්න ඕනෑ. නමුත් මේක කළ යුතුයි. අපේ දත්ත ගබඩා කරන ස්ථානයේ ආරක්ෂාව සහ දත්තවල ආරක්ෂාව පිළිබඳ වගකීම ගන්නේ කවුද කියන එක තමයි ගොඩක් වෙලාවට සාකච්ඡාවට ගත්තේ. ඒ පිළිබඳව මම වැඩිදුර විස්තර කථා කරන්න යන්නේ නැහැ. ඒ පිළිබඳ ආණ්ඩුවේ අදහස, ආණ්ඩුවේ වගවීම පිළිබඳව අපට විශ්වාසයක් තියන්න සිද්ධ වෙනවා, මේ ක්‍රියාවලිය පවත්වාගෙන යන්න නම්.

තුන්වැනි එක තමයි මේ ක්‍රියාවලිය ඇතුළේ තිබෙන online අළෙවිකරණය පිළිබඳ අදහස. ඒක තමයි වැඩිපුර තිබෙන කොටස. ඒ කොටසත් එක්ක තමයි මේ කාරණය වැඩිපුර සාකච්ඡාවට ගන්නේ. online platform එකක් හරහා කොහොමද මේ රටේ අලුත් රැකියා අවස්ථා නිර්මාණය කර ගන්නේ, එහෙම නැත්නම් භෞතිකව සිද්ධ වෙන වෙළෙඳාමට කොහොමද online platform එකක් භාවිතයට ගන්නේ කියන කාරණය. මෙන්න මේ කාරණා තමයි මේ digitalization කියන ක්‍රියාවලිය තුළ තිබෙන්නේ. ඩිජිටල්කරණය කියන සමස්ථ ක්‍රියාවලියෙන්ම පැහැදිලි වෙන කතන්දරය තිබෙන්නේ ඔය කොටස් තුන ඇතුළේ.

රාජ්‍ය සේවයට ඩිජිටල්කරණය අත්‍යවශ්‍යයි. මම මේ කාරණය මීට කලිනුත් කියලා තිබෙනවා. ඇයි රාජ්‍ය සේවයට ඩිජිටල්කරණය අවශ්‍ය වන්නේ? අපි තවම පරක්කු වැඩි නැහැ. මේ, මම නිරන්තරයෙන්ම කියන දෙයක්. දිගින් දිගටම ඔබතුමන්ලා කියන හැත්තෑහය අවුරුදු ශාපය පිළිබඳ ඇත්ත මාතෘකා මේවා තමයි.

ඒ ගෙවුණු අවුරුදු 76 ඇතුළේ ගෙවුණු අවුරුදු 20ක් තුළ ඇත්තටම කළ යුතුව තිබුණු ප්‍රතිසංස්කරණ ඒවා. ඔන්න ඔය මාතෘකාව පිළිබඳව ඔබතුමන්ලා සාකච්ඡා කරන ඕනෑ තැනක මම

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඔබතුමන්ලා එක්ක එකඟ වෙනවා. අපට ඒක කරන්න තිබුණේ 2002, 2003 හා 2005 අවුරුදුවල විතර. මේක අවුරුදු 20ක් විතර පරක්කු වුණු ව්‍යාපෘතියක්. මම දන්න තරමින් 2002 ආණ්ඩුවේ මිලින්ද මොරගොඩයි, රනිල් වික්‍රමසිංහයි එකතු වෙලා මේ සඳහා අලුත් ආරම්භයක් ගන්න උත්සාහ කළා. හැබැයි, ඒ ක්‍රියාවලිය මේ රට ඇතුළේ පණ ගන්වලා ගෙනෙන්න නොහැකි වුණා. මෙන්න, ප්‍රමාද වෙලා තිබෙන ක්‍රියාවලිය. මේ ප්‍රමාදවෙලා තිබෙන ක්‍රියාවලිය තමයි මේ රටේ අකාර්යක්ෂමතාව ඉහළ නංවන්න හේතුවක් වෙලා තිබෙන්නේ.

අද driving licence එකක් ගන්න ගියාම දිගු වෙලාවක් පෝලිමේ ඉන්න වෙනවා. Driving licence එක ගන්න ගියාම ඒක පොලීසියත් එක්ක සම්බන්ධ වෙන්නේ නැහැ; පරණ වැරදි තිබෙනවාද කියලා බලාගන්න විධියක් නැහැ. ඒවා තවම documentsවලින් කෙරෙන්නේ. ඒ නිසා ප්‍රමාදයි. පොලිස් සහතිකයක් ගන්න ගියාම ඒක ලැබෙන්න පරක්කුයි. මෙන්න මේ වාගේ ප්‍රායෝගික අකාර්යක්ෂමතාවලට ඩිජිටල්කරණයේ ප්‍රමාදය බලපා තිබෙනවා. මම දැක්කා ගිය සතියක හම්බන්තොට ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ඇති වෙච්ච ප්‍රශ්නයක්. උප්පැන්න සහතිකයක් ගන්න ගියාම, ඒක ගන්න බැරි වෙනවා. මෙන්න මේ අකාර්යක්ෂමතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්න අය ළඟවත් උත්තර නැහැ. හේතුව, ඒ ආයතන ආයතන අතර තිබෙන පණිවුඩ හුවමාරුව දුර්වලයි, ඒ ලියවිලි ලැබෙන්න ගත වන කාලය වැඩියි. සමාජයේ ඉන්නේ විවිධ දැනුම් මට්ටම්වල පුද්ගලයෝ. ඒ අයට තිබෙන කාර්යයන් අතරතුර ඇවිල්ලා ඉක්මනින් මේ වැඩ කරගෙන යන්න හදනවා. හැබැයි, එහෙම ආවාට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඒ වැඩේ කාර්යක්ෂමව වෙන්නේ නැහැ. එහෙම වෙන්න ඇත්ත හේතුව තමයි, ඩිජිටල්කරණය කියන ක්‍රියාවලිය අපේ රටේ ක්‍රියාත්මක වීම පරක්කු වෙලා තිබීම. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් රටේ මහ ජනතාවගේ විරෝධතාවක් තිබෙන්නේත්, documents විධියට, එහෙම නැත්නම් කොළ කෑලි විධියට තවමත් මේ ක්‍රියාවලිය සිද්ධ වීම නිසා. මම පෙර විවාදයකදීත් මේ කාරණය සඳහන් කළා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව පවා ඩිජිටල්කරණයට ලක් කරන්න ඕනෑ. ආරම්භයක් ලෙස, නියමු පරීක්ෂාවක් විධියට ඒ සඳහා පාර්ලිමේන්තුව යොදා ගන්න කියලා මම කිව්වා.

ඒකට හේතුව, මේ පාර්ලිමේන්තුව ඇතුළේ සිටින අයට ඒ පිළිබඳව උනන්දුවක්, වුවමනාවක් තිබෙනවා. ඒ වාගේම කැපවීමක් තිබෙනවා. ඒ අයව මේ වැඩේට යොදා ගන්න පහසුයි. ඒ නිසා වර්තමාන රජයට පුළුවන්, මෙතැනින් ආරම්භයක් ගන්න. පාර්ලිමේන්තුවේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරපු දවසේත් මම මේ ගැන කථා කළා. මේ ඩිජිටල්කරණය කියන ක්‍රියාවලිය රාජ්‍ය අංශයට ගෙනාවාම කාර්යක්ෂමතාව ඉහළ යනවා. ඒක අනිවාර්යයි. ඒක රටක් විධියට මරු. හැබැයි, සහවන්න දෙයක් නැහැ. ඩිජිටල්කරණය කියන ක්‍රියාවලිය හරහා මේ රටේ රජයේ රැකියා විශාල ප්‍රමාණයක් කප්පාදුවට ලක් වෙනවා. බොරු කියලා ප්‍රතිසංස්කරණ කරන්න බැහැ. සමහර රැකියා අවශ්‍ය වෙන්නේ නැහැ. ඒකට හේතුව, ඒ අතර පවතින සබඳතා ටික පරිගණකගත කර ගත්තාට පස්සේ, සමහර අයගේ රැකියා අඩු වෙනවා. මේ රජය ඒ පිළිබඳව අදහසක් ඉදිරිපත් කරයි කියලා මම හිතුවා. මම නැවත නැවතත් කියන්නේ, සහවාගෙන රටක ප්‍රතිසංස්කරණ කරන්න බැහැ කියලායි. රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම පිළිබඳව කථා කරන හැම වෙලාවකම මම කියන දේ තමයි, ඒ රැකියාවල කප්පාදුවත් එක්ක ඉතුරු වන මුදල රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩිවීමට යොදා ගත හැකියි කියන එක. මම එහෙමයි හිතුවේ. හැබැයි අපි පිළිගත්තත්, නැතත්; කැමැති වුණත්, අකමැති වුණත් ඩිජිටල්කරණය හරහා මේ රටේ රාජ්‍ය සේවයේ සැලකිය යුතු රැකියා කප්පාදුවකට යන්න පුළුවන්කම ලැබෙනවා. රාජ්‍ය සේවයේ ප්‍රමාණය වැඩියි. අපි ඒක පිළිගන්න ඕනෑ. එසේ කප්පාදුවට ලක් කරනකොට, රාජ්‍ය සේවයේ කොයි කොයි තැන්වලද වැඩිපුර සේවක පිරිස් ඉන්නේ, කොයි කොයි තැන්වලද අඩු පිරිසක් ඉන්නේ කියන දේවල් ගැන සොයා බලා, අන්න ඒ අඩු තැන්වලට ඒ වැඩි තැන්වල සිටින අයව සම්බන්ධ කරන්න. ඊට අමතරව, අතිරික්ත රැකියා විශාල ප්‍රමාණයකුත් තිබෙනවා. මගේ පෞද්ගලික අදහස නම් ඒකමයි.

ඔබතුමන්ලා මූලික වැටුප වැඩි කරලා, පෙන්ෂන් එකට ඉහළ අගයක් ලබා දීලා, ඩිජිටල්කරණ ක්‍රියාවලිය හරහා රැකියා කප්පාදුවට ලක් වෙද්දී, රාජ්‍ය සේවයේ අය ලොකු විශ්‍රාම වැටුපක් එක්ක විශ්‍රාම යයි. ඒ යනකොට රාජ්‍ය සේවයේ ප්‍රමාණය - පංගුව - රාජ්‍ය සේවයේ බර අඩු කර ගන්න පුළුවන් කියලා අදහසක් මට තිබුණා. හැබැයි, කිසිම ඇමතිවරයෙක් ඒ පිළිබඳව සඳහනක් කළේ නැහැ. ඒ වුණාට ඒක හොඳ උපක්‍රමයක් කියලා මම හිතනවා. ඔබතුමන්ලා මූලික වැටුප වැඩි කළා, දැන් පෙන්ෂන් එක වැඩියි. රාජ්‍ය සේවයේ ඩිජිටල්කරණයත් එක්ක, කප්පාදුවට ලක් වෙන අයට හොඳ විශ්‍රාම වැටුපක් එක්ක කලින්ම පෙන්ෂන් යන්න පුළුවන්. ඒ හරහා අපිට රාජ්‍ය සේවයේ ඉන්න ප්‍රමාණය අඩු කර ගැනීම මෙන්ම, රාජ්‍ය සේවකයාව අමනාප කර ගන්නේ නැතුව විශ්වාසනීයත්වයකින් යුක්තව ඔහුව රැකියාවෙන් ඉවතට අරගෙන, ඒගොල්ලන්ට පෞද්ගලික අංශයේ රැකියාවක් කරන ගමන් විශ්‍රාම වැටුපේ හිමිකමත් ලබා ගැනීමේ හැකියාව ඇති කරදෙන්න පුළුවන් වෙනවා. ඒ නිසා මේ ඩිජිටල්කරණය කියන්නේ නියම වැඩක්. ඔබේ ආණ්ඩුව හරහාමයි මේවා කර ගන්න වෙන්නේ. හේතුව, අපි වාගේ දක්ෂිණාංශික ව්‍යාපාරයක් මේ වාගේ ඒවා කරන්න ගිය ගමන්, මම හැමදාම කියනවා වාගේ ඔබතුමන්ලා මිනිස්සුන්ව අවුස්සනවා. රැකියා ටික නැති වෙන්න යනවා කියලා කියනවා. පොඩි ප්‍රතිසංස්කරණයක් කරන්න ගියත් විනාශ කරනවා නේ.

පසුගිය දවස්වල ආර්ථික කළමනාකරණය කරන්න ගිය අවස්ථාවේ "EPF එක විනාශ කරනවා, බැංකු පද්ධතිය කඩා වැටෙනවා" කියලා නැටුවේ ඔබතුමන්ලා නේ. අපි නටන්නේ නැහැ. අපි ඒකේ සත්‍ය තත්ත්වය පිළිබඳව කියනවා. මේ රටේ මහජනතාවට ඇත්ත කියනවා. බොරු කරලා මේ ප්‍රතිසංස්කරණ කරන්න බැහැ කියලා කියනවා. හැබැයි, අපි කොයිම අවස්ථාවකවත් රැකියා කප්පාදුවට ලක්වූවන්ගේ සංගමය වාගේ එකක් හදාගෙන, ඔබතුමන්ලාට විරුද්ධව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා මේක ඔබතුමන්ලා හරහාම කර ගත යුතු දෙයක්. 2029 අවුරුද්දෙන් පස්සේ ඔබතුමන්ලා මේ රට පොහොසත් රටක් කළාට පස්සේ, මම නිරන්තරයෙන්ම කියනවා වාගේ ඒ රටේ දේශපාලනය කරන්න, ඒ රටේ රාජ්‍ය බලය ගන්න බලාපොරොත්තුවෙන් සිටින ප්‍රධාන දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපිට මේ රටේ ඉදිරියට පිම්ම, පිම්ම පැන පැන යන්න නම්, ඔබතුමන්ලා ලවා මේ වැඩ ටික කර ගන්න ඕනෑ. ඒ නිසා ඔබතුමන්ලා භය නැතුව අඩිය තියන්න. ඩිජිටල්කරණ ක්‍රියාවලිය ඇතුළේ රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නංවා ගන්න පුළුවන් ඔබතුමන්ලා වාගේ දේශපාලන ව්‍යාපාරයක් හරහා පමණයි. සමාජවාදී දේශපාලන ව්‍යාපාරයක් විධියට රැකියා සියල්ල පවතින්න ඕනෑ, රාජ්‍ය අංශය විසින් මේ ඔක්කොම කරන්න ඕනෑ කියලා කියන ඔබතුමන්ලා විපක්ෂයේ හිටියොත්, අපිට මේ දේ කර ගන්න බැහැ. ඒ නිසා මේ ගෙවෙන අවුරුදු පහක කාලසීමාව තුළ ඔබතුමන්ලා හැකිතාක් මේ වෙනුවෙන් මුදල් යොදලා, *[බාධා කිරීමක්]* මේ ප්‍රතිසංස්කරණ කරන්න ඕනෑ. අපට ප්‍රතිසංස්කරණ පිළිබඳව විශ්වාසය තිබෙනවා නේ.

ගරු එරංග වීරරත්න මහතා
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු එරංග වීරරත්න මහතා
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා මෙතැනදී picture එකක් හදන්න හදනවා, අපි මේ කරන digitalization එකෙන් රාජ්‍ය සේවකයින්ට ඔවුන්ගේ jobs නැති වෙනවා කියලා. ඒක සම්පූර්ණයෙන් වැරැදි කථාවක්. මොකද, අද රාජ්‍ය ආයතනවලට ගිහිල්ලා බැලුවොත්, සෑහෙන්න පෝලිම් තිබෙනවා. රජයේ ආයතනයකින් සේවයක් කරගන්න සෑහෙන්න කාලයක් ගත වෙනවා. අපි මේ කරන digitalization එකෙන් වෙන්නේ ඒ පෝලිම් අඩු වෙලා, ඒ කරන වැඩේ පහසු කිරීම, ඉක්මන් කිරීම සහ කඩිනම් කිරීම මිසක්, රජයේ සේවකයන්ගේ රැකියා නැති කිරීම නොවෙයි. මේ ගරු මන්ත්‍රීතුමා පෙන්වන්න හදන්නේ වැරදි ප්‍රතිරූපයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ මහජනතාව ඒකට රැවටෙන්න ඕනෑ නැහැ කියලා මම හිතනවා.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ ක්‍රියාවලිය අවසන් වුණාම ඔබතුමාටම පණිවුඩය ලැබෙයි, දැන ගන්න ලැබෙයි ඒක වෙනවාද නැද්ද කියලා. ඩිජිටල්කරණයයි, රැකියා වැඩි ප්‍රමාණයක් අතිරික්තව තියාගෙන ඉන්න එකයි කරන්න බැහැ. එහෙම පුළුවන්ද කියලා අපි ඒ වෙලාවට බලමු. මම ඒක නැවත කියනවා. මම බොරු නොවෙයි කියන්නේ. ඩිජිටල්කරණය හරහා මේ රටේ රැකියා යම් ප්‍රමාණයක් කප්පාදුවට ලක් වෙනවාමයි. ඩිජිටල්කරණය සිද්ධ වෙච්ච හැම රටකම ඒක වෙලා තිබෙනවා. සමාජවාදී ආණ්ඩුවක් හරහා විතරයි අපිට මේක කර ගන්න පුළුවන් කියලා මම කිව්වේ ඒකයි. ඔබතුමන්ලා ආණ්ඩුවෙන් එළියේ හිටියා නම්, ඔය විධියටම අවුස්සනවා. අපි එහෙම අවුස්සන්නේ නැහැ. ඒ නිසා අපි ඒක බලමු. ඒ ක්‍රියාවලිය අවසන් වෙනකොට ඔබතුමා දැන ගනීවි, මම කියපු කථාව ඇත්තද, ඔබතුමා කියන කථාව ඇත්තද කියලා. රැකියා කප්පාදුවට ලක් වුණාට ප්‍රශ්නයකුත් නැහැ කියන එකයි මම කිව්වේ. මොකද, දැන් රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප වැඩි කරලා තිබෙනවා, ලොකු පෙන්ෂන් එකක් ලැබෙනවා. මම මිනිස්සුන්ව අපහසුතාවට පත් කළෙත් නැහැ, භය කළෙත් නැහැ. ඒගොල්ලන්ට ලොකු පෙන්ෂන් එකක් ලැබෙනවා. පෞද්ගලික අංශයේ රැකියාවක් කරන්නත් පුළුවන්, දෙකම එකතු කරලා හොඳ තැනකට යන්න පුළුවන්. මම මිනිස්සුන්ව රවට්ටන්නේ නැහැ, මිනිස්සුන්ව භය කරන්නේ නැහැ, ඒ කිසිදෙයක් කරන්නේ නැහැ. සත්‍ය, සත්‍ය විධියට තමයි කියන්නේ. මට හැඟෙන සත්‍ය මම පැහැදිලි කරනවා.

ඩිජිටල්කරණ ක්‍රියාවලිය හරහා ඒක සාර්ථක කරලා බලන්නකෝ. මේ ක්‍රියාවලියේ කොච්චර අතිරික්ත අය ඉන්නවාද, මොකද කරන්න වෙන්නේ, ඒගොල්ලන්ට ඔය වාගේ විශ්‍රාම දිවියකට යන්න වෙනවාද කියලා එතකොට ඔබතුමන්ලාට තේරෙයි. මම දන්නා කාරණා තමයි මම කිව්වේ. මම බොහොම සද්භාවයෙනුයි මේවා කියන්නේ. අවුස්සන්නවත්, දේශපාලන බලය ලබාගන්නවත් නොවෙයි. අපි ළඟ ඒ වාගේ විකාර දේවල් නැහැ. මේවා මේ රට ඉදිරියට ගෙනයන්න කරගත යුතු ප්‍රතිසංස්කරණ. අවුරුදු 76ක් ඇතුළේ වෙච්ච නැති දේවල් තමයි පටන් ගන්නකොටම මම කිව්වේ. ඔබතුමන්ලා ඒවා ගැන කථා කරන කිසිම වෙලාවක මම ඒවාට විරුද්ධ වෙන්නේ නැහැ නේ. අන්න, ඇත්ත හේතු. බොරු බොරු හේතු කිව්වොත් තමයි මම ඒවාට විරුද්ධව කථා කරන්නේ. මේවා කළ යුතු දේවල් සහ කළ යුතුව පැවති නමුත් කරගන්න බැරි වෙච්ච දේවල්.

ගරු එරංග වීරරත්න මහතා
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weerarathna)
Allocate කරන්න දේවල් තිබෙනවා නේද?

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒවා ගැන ඔබතුමාගේ කථාවේදී කියන්න.

මම මේ අදහස නේ, ඉදිරිපත් කළේ. මේ වැඩේ හොඳයි. මම දිගින් දිගටම කියන්නේ මේ වැඩේ හොඳයි කියලායි. ඒකේ ප්‍රශ්නයක් නැහැ. මොකද, ලංකාවේ මිනිස්සුන්ගේ බදු මුදල් අනවශ්‍ය පරිදි රාජ්‍ය සේවයට යනකොට ඒක පාලනය කරලා අනෙක් අයගේ වැටුප් වැඩි කරගන්න පුළුවන්. මේක මම බොහොම සද්භාවයෙන් කියපු දෙයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මම ගොඩක් දේවල් කියන්න හිතාගෙන ආවේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවාට ගන්න තිබ්බිව්ව මගේ කාලය අපරාදේ.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ තව කාරණාවක් තිබෙනවා. Digital economy එක ගැන කථා කරද්දි online businessesවලට අමතරව freelance කටයුතු කරන අය මේ රටේ ඉන්නවා. ඔබතුමන්ලාත් එක්ක සාකච්ඡා කරන ගමන් මේක ලොකු මාතෘකාවක් විධියට මට ගන්න තිබුණා. මම වෙන මාතෘකාවල බොහෝ වෙලාවක් රැඳිලා හිටියේ අපරාදේ. මෙතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි, මේ AI තාක්ෂණය පැමිණීමත් එක්ක ලෝකයේ freelance කටයුතු කරන අයට, විශේෂයෙන්ම logo එකක් හදන කෙනෙකුට, එහෙම නැත්නම් මොකක් හරි design එකක් කරන කෙනෙකුට තමන්ගේ ඒ රැකියා අහිමි වෙමින් පවතින එක. ඒ අය දැනට කරමින් සිටින රක්ෂා ඒගොල්ලෝ බොහොම නිදහසේ කරනවා. ලංකාව ඇතුළේ ඉඳගෙන විදේශීය මුදල් ලංකාවට ගෙනෙන තරුණ තරුණියන් ලක්ෂ 5ත්, 10ත් අතර ප්‍රමාණයක් මේ රටේ ඉන්නවා. මෙන්න මේ කණ්ඩායමේ සමහර රැකියා මේ AI තාක්ෂණය දියුණුවීමත් එක්කම නැති වෙනවා. ඒ අයව වෙනත් අංශවලට shift කරන්න, අලුත් පුහුණුවක්, අලුත් දේවල් ටිකක් දෙන්න වෙනවා. ඒ වෙනුවෙන් මුදල් වෙන් කරන්න කියන යෝජනාවත් මම කරන්න කැමැතියි. හේතුව, ඒ අය තාක්ෂණිකව ඉදිරියට යද්දි, - ලෝකය මොහොතින් මොහොත වෙනස් වෙනවා- ඒ අතරතුර තමන්ගේ රැකියා අහිමි වෙනකොට ඒ අයව වෙන වෙන

[ගරු අමිල ප්‍රසාද් මහතා]

අංශවලින් නැවත සැරයක් මේ වෙළඳ පොළ ඇතුළේ රඳවාගන්න පුහුණුව සඳහා මුදල් අවශ්‍ය වෙනවා. අන්න ඒ සඳහා මුදල් වෙන් කරන්න කියන යෝජනාව තමයි මම කරන්නේ.

ඒ වාගේම, මම තව කාරණයක් දැක්කා. VAT register වෙලා සිටින අයට POS machines ක්‍රියාත්මක කරන්න කියලා ඔබතුමන්ලා යෝජනා කරලා තිබෙනවා. ඒක ඉතාම හොඳ යෝජනාවක්. ඒ හරහා පෞද්ගලික අංශයේ වෙළෙඳ සැල්වල කාර්යක්ෂමතාව වැඩි කරන්න පුළුවන්. ගබඩාව පවත්වාගෙන යන ආකාරය පිළිබඳව; කොච්චර භාණ්ඩ තිබෙනවාද වාගේ දේවල් "ෆුඩ් සිටි"වල තිබෙන ආකාරයට මැෂින් එකෙන් සම්පූර්ණයෙන් බලාගන්න පුළුවන්. ඒවා ඉතාම හොඳ වැඩ. හැබැයි ආණ්ඩුව පැත්තෙන් ඔබට යමක් කරන්න සිද්ධ වෙනවා. ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල සිටින, වෙළෙඳ සැල් පවත්වාගෙන යන අයටත් ඒ වාගේ පුහුණුවක් ලබා දෙන්න සිද්ධ වෙනවා. ඒ වාගේම මැෂින් ගන්නත් අපිට යම්කිසි මුදලක් වෙන් කරන්න සිද්ධ වෙනවා. ඒ වාගේම ඒ කාර්යය පිළිබඳව විශ්වාසය තහවුරු කරන්නත් සිද්ධ වෙනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ රජයේ අවධානය යොමු කරලා පුළුවන් තරම් ඒ අයට ඒ පුහුණුව ලබා දීම සඳහා කටයුතු කරන්න කියන යෝජනාව මම කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002දී වාගේ ආරම්භ කරපු ICTA එක පිළිබඳවත් මම පොඩි අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. මේක බොහොම සද්භාවයෙන් ආරම්භ කරලා ඉහළ වැටුප් ප්‍රමාණයක් පවත්වාගෙන යන ආයතනයක්. නමුත් මගේ අදහස තමයි, මේ රටට අපේක්ෂා කරන ප්‍රතිඵලය ඒ ආයතනය හරහා එන්නේ නැහැ කියන එක. ඒ අය වෙනත් ඒකාධිකාරයක් පවත්වාගෙන යන්න උත්සාහ කරනවා. එක්කෝ, මේ ආයතනය ප්‍රතිව්‍යුහගත කරන්න, එහෙම නැත්නම්, මේ ආයතනය වහලා අලුත් ආයතනයක් ආරම්භ කරන්න කියලා මම ආණ්ඩුවට, විශේෂයෙන්ම ජනාධිපතිතුමාට යෝජනා කරනවා. හේතුව, අපේක්ෂා කරපු අරමුණ ඒ ආයතනය හරහා සිද්ධ වුණේ නැති එක. ඒ නිසා ICTA එක පිළිබඳව ඔබතුමන්ලා අලුතෙන් අවධානය යොමු කරන්න කියලාත් මම යෝජනා කරනවා.

IT ක්ෂේත්‍රයේ freelance කටයුතු කරන අයට පසුගිය දවස්වල අලුතෙන් tax එකක් හඳුන්වා දෙනවා මම දැක්කා. මගේ අදහස නම්, IT ක්ෂේත්‍රයට මේ වෙලාවේ ඒ වැඩේ කරන්න යන්න එපා කියන එකයි. හේතුව, දැන් මේ වැඩේ කරපු ගමන් විශාල පරිමාණයේ ආයතන මේකට එන්නේ නැතිව යනවා. එතැනදි ඔබතුමන්ලා කියනවා, පහළ ආදායම් ලබන අය කලබල වෙන්න එපා කියලා. නැහැ, බොහෝ IT ආයතනවල ආදායම ඒ tax එකට අහුවෙන සීමාවේ තිබෙන්නේ. මේ රට ගොඩනඟාගන්න දරන වෑයමක් ඒවායේ තිබෙන්නේ. ඒ නිසා IT ක්ෂේත්‍රයේ අයට රට ඇතුළට එන්න උනන්දුව ඇති කරවන ආකාරයට, ඔවුන්ට මේක ඇතුළට එන්න පුළුවන් විධියට පහසුකම් සලසන්න. ඒ නිසා මේ මොහොතේ ඔය tax එකට යන්න එපා. ඒ ආයෝජකයන් අපේ රටට ආවොත්, ඒ tax එකෙන් ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක්, වැඩි රැකියා ප්‍රමාණයක්, වැඩි මුදල් ප්‍රමාණයක් මේ රටට ගෙන්වාගන්න පුළුවන්. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා විශේෂයෙන් මම ඔබතුමන්ලාට කියනවා. Online, එහෙම නැත්නම් සමස්ත ඩිජිටල්කරණය පිළිබඳ ප්‍රතිපත්තියක් NPP එකේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා මම දැක්කා. ඔය youth centres හරහා, එහෙම නැත්නම් තරුණ තරුණියන් හරහා ඒ පිළිබඳව අලුත් සමාජ කතිකාවතක් ආරම්භ කරන්න, ඒක ජාතික ප්‍රතිපත්තියක් බවට පත් කරන්න ඔබතුමන්ලාට පුළුවන්. දේශපාලන ව්‍යාපාරයක් ලෙස බලය ලබා ගැනීම උදෙසා තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට ඇතුළත් කරපු කරුණු ටික ජාතික ප්‍රතිපත්තියක් බවට පත් කිරීම සඳහා ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

මගේ කථාව අවසානයේදී මේ කාරණයත් මම කියන්න ඕනෑ. තාක්ෂණය දියුණු වෙන්න දියුණු වෙන්න, විද්‍යාව දියුණු වෙන්න දියුණු වෙන්න, රටක් සංවර්ධනය වෙන්න සංවර්ධනය වෙන්න සමහර සංස්කෘතික අංග අපිට අයින් කරන්න සිද්ධ වෙනවා.

ඒවා පවත්වාගෙන යන්න සිද්ධ වුණොත් අනිවාර්යයෙන්ම අපට ඒකට වැඩි ගෙවීමක් කරන්න සිද්ධ වෙනවා. මම අර කියපු අදහස ඇතුළේ ඒක තිබෙනවා. මේ රට දියුණු වෙනවා නම්, ඩිජිටල්කරණය වෙනවා නම්, ආර්ථික වශයෙන් සංවර්ධනය වෙනවා නම්, රාජ්‍ය සේවය අඩු කරන්න වෙනවාමයි. සමහර විටෙක email එකෙන්, telephone එකෙන්, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. ඒ නිසා ඔබතුමාට කථාව නවත්වන්න වෙනවා.

ගරු අමිල ප්‍රසාද් මහතා
(මාණ්පුමිකු අමිල පිරසාත්)
(The Hon. Amila Prasad)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) ඉරාමනාදන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට විනාඩි 20ක කාලයක් තිබුණා නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
දැන් ඔබතුමාට විනාඩි 16යි ඉතිරි වෙලා තිබෙන්නේ.

[අ.භා. 4.18]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) ඉරාමනාදන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හැමදාම ඒක නේ වෙන්නේ. කමක් නැහැ.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முதலில் முக்கியமானதொரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, நேற்றைய தினம் அநுராதபுர வைத்தியசாலையில் வைத்தியர் ஒருவர் பாலியல் தொந்தரவுக்கு உள்ளாக்கப்பட்டு இருக்கிறார். அதற்கு என்னுடைய கண்டனத்தைத் தெரிவித்துக் கொள்கின்றேன்.

நான் இங்கு முக்கியமான மூன்று விடயங்களைச் சொல்ல வேண்டும். முதலாவதாக, கிளிநொச்சி, கரைச்சிப் பிரதேச சபையின் அடாவடித்தனங்கள் பற்றிச் சொல்ல வேண்டும். அதனால் கிளிநொச்சி சந்தையில் - marketஇல் - இருக்கின்ற வியாபாரிகள் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டு இருப்பதாகச் சொல்லப்படுகிறது. இதனை நான் சம்பந்தப்பட்ட அமைச்சரின் கவனத்துக்குக் கொண்டு

වරුකිරෙන්. නාර්පදු මිල්ලියන් රූපාය් සෙලවිල් කට්ටිමුදික්කප්පට්ටුල්ල එට්ටුක් කටෙකලුම් තිට්ටමිට්ට රීතියිල් තලා 10 මිල්ලියන් රූපාය් එන්ර උයර් පෙරුමතික්කු විලෙකූරල් කෝරප්පට්ටුල්ලදු. ඉතන්මූලම් නිරන්තර වාළ්වාතාරම් ඉල්ලාත, සිරු සිරු තොළිල්කළ්මූලම් වරුමානත්තෛ ඊට්ටුකින්ර වියාපාරිකළෛ ඉන්රු කරෛච්චිප් පිරතේස සපෛ නටුවීතික්කුක් කොණ්ටුවන්තු ඉරුක්කිරදු.

ඉරණ්ටාවතාක, යාළ්ප්පාණත්තිලුළ්ල සාවකච්චේරි පිරතේස සෙයලාළර් තොටර්පිල් කිටෛක්කප් පෙර්රුල්ල මුරෛප්පාටුකළ් පර්රි කූර වේණ්ටුම්. නාන් ඉන්ත විටයත්තෛ GA පිරතීපන් අවර්කළින් කවනත්තුක්කුක් කොණ්ටු වරුකිරේන්. අවරුම් අතර්කු උටන්පාටු එන්රු සොල්කිරාර්. අංකුළ්ල කාණිප් පිරිවු මර්රුම් ICT පිරිවිල් වේලෛසෙය්කින්ර උත්තියෝකත්තර්කළ් 'සුම්මා' ඉරුක්කිරාර්කළ්. අතුමාත්තිරමන්රි, අංකු වරුකින්ර මක්කළ් තිරුප්පි අනුප්පප්පටුවතාකවුම් මුරෛප්පාටු කිටෛත්තිරුක්කිරදු.

මූන්රාවතාක, ඉන්රෛය තිනම් ඉච්චපෛයිල් online උටන් චම්පන්තප්පට්ට අමෛච්චින් විවාතම් ඉටම්පෙරුවතාල් පින්වරුම් විටයත්තෛ මුන්වෛක්කින්රේන්. අතාවතු, කිළිනොච්චියිලුළ්ල ඉරාමනාතපුරම්, මායනූර් එනුම් පකුතියිල්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පටි අකර්රප්පට්ටුල්ළදු.]
[Expunged on the order of the Chair.]

එනච් චොල්ලප්පටුකින්රදු. අන්තප් පෙණ් තන්නුටෛය TikTok චමූකවලෛත්තළම් මූලමාකවුම් YouTube චමූකවලෛත්තළම් මූලමාකවුම් විපච්චාරම් චෙය්කින්ර විටයංකළෛ පොදුවෙළික්කුක් කොණ්ටුවරුකිරාර්. අතර්කු උටන්තෛයාක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පටි අකර්රප්පට්ටුල්ළදු.]
[Expunged on the order of the Chair.]

ඉරුක්කිරාර්. නාන් ඉන්ත විටයත්තෛ පාදුකාප්පු අමෛච්චරිනදුම් පොලිස්ෆාක්කුප් පොරුප්පාන අමෛච්චරිනදුම් කවනත්තුක්කුක් කොණ්ටුවරුකින්රේන්.

අටුත්තු, ටි.කේ. කාර්ත්තික් චම්පන්තමාකච් චොල්ල වේණ්ටුම්. ඉවර් ඔරු YouTuber!

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පටි අකර්රප්පට්ටුල්ළදු.]
[Expunged on the order of the Chair.]

ඉවර් එන්නෛක් කොලෛ චෙය්වතාකච් චොල්ලියිරුක්කිරාර්. ඉතෛයුම් නාන් කෞරව පොදු මක්කළ් පාදුකාප්පු අමෛච්චරින් කවනත්තුක්කුක් කොණ්ටුවරුකින්රේන්.

නේර්රෛය තිනම් ඉච්චපෛයිල් හිස්පුල්ලාහ් එන්ර උරුප්පිනර් ඉරාමනාතන් අර්ච්චුනාවෛ මරුත්තුවප් පරිචෝතනෛක්කු උට්පටුත්ත වේණ්ටුමෙනච් චොල්ලියිරුන්තාර්. මර්රෛයවර්කළෛ මරුත්තුවප් පරිචෝතනෛක්කු උට්පටුත්ත වේණ්ටුමෙනච් චොල්කින්ර අවරෛ මරුත්තුවචාලෛක්කු අනුප්ප වේණ්ටුම්. නාන් ඉංකු හිස්පුල්ලාහ් පර්රි ඔරු වාර්ත්තෛකළෛච් චොල්ල විරුම්පුකින්රේන්. නාන් ඉස්ලාම් මතත්තුක්කු එතිරානවන් අල්ලන්.

මම කවදාවත් කථා කළේ නැහැ, අපේ රටේ තිබෙන ඉස්ලාමික මාර්ගය වැරදියි කියලා. මම කවදාවත් ඒක කිව්වේ නැහැ. මම කිව්වා, අවුරුදු 9, අවුරුදු 8 දරුවෝ බන්දලා දෙනවා නම්, ඒක වැරදියි කියලා. අපි වෙන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පටි අකර්රප්පට්ටුල්ළදු.]
[Expunged on the order of the Chair.]

ඒක වැරදියි කියලා මම කිව්වා. ඒක මගේ ආගම වෙන්න පුළුවන්, බුද්ධාගම වෙන්න පුළුවන්, ක්‍රිස්තියානි වෙන්න පුළුවන්, ඉස්ලාම් වෙන්න පුළුවන්. ළමයි බන්දලා දෙනවා නම්, ඒක වැරදියි කියලා මම කිව්වා. මේ තිබෙන්නේ එක රටක්. අපි දෙමළ මිනිස්සු. අපි අවුරුදු 30ක් ආයුධ අරගෙන රණ්ඩු වෙච්ච මිනිස්සු. අපි කියනවා, මේ රට එක රටක් වෙන්න ඕනෑ කියලා. එතකොට සමහර අය කියනවා නම්, මේ රට ඇතුළේ වෙන නීතියක් ඒගොල්ලන්ට තිබෙන්න ඕනෑ කියලා, ඒක සම්පූර්ණයෙන් වැරදියි. මම කවදාවත් ඉස්ලාම් ආගම ගැන කිසි වරදක් කථා කළේ නැහැ. හැබැයි, ළමයි ගැන හිතලා බලන්න, අවුරුදු 9, අවුරුදු 8 ඔයගොල්ලන්ගේ දරුවන්, පව්.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I rise to a point of Order.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order දෙන්න බැහැ. මේක මගේ කථාව. මගේ වෙලාව දෙන්න එපා. මම කථා කරලා ඉවර වුණාට පස්සේ දෙන්න. මගේ වෙලාව ගන්න බැහැ. *[බාධා කිරීමක්]* එතකොට මේක සම්පූර්ණයෙන් වැරදියි.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පටි අකර්රප්පට්ටුල්ළදු.]
[Expunged on the order of the Chair.]

එතැනින් එහාට තියෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* මේක අපේ රට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ගරු පාර්ලිමේන්තුවට මේ මන්ත්‍රීතුමා, ඔය රීයේ කියපු කථාව නැවතත් කියලා නිස්බුල්ලාහ් මන්ත්‍රීතුමාගේ නමත් කියලා, ඉස්ලාම් ධර්මය ගැනත් මේ කියන කථාවට කරුණාකර ඉඩ දෙන්න එපා. ඩිජිටල්කරණයේදී මෙවැනි අසත්‍ය සහ ජනතාව අතර වෛරය වපුරන කථා කියන්න ඉඩ දෙන්න එපා කියලා ඉතා ගෞරවයෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මෙතුමාට මම දෙයක් කියන්න කැමැතියි. ඔබතුමාත් දන්නවා, මේ අයගේ ප්‍රදේශවල

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පටි අකර්රප්පට්ටුල්ළදු.]
[Expunged on the order of the Chair.]

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

මම කිව්වා, පන්සල කඩන්න එපා කියලා. යාපනයේ ඔක්කෝම ඇමතිලා කියනකොට, ඉතුරු MPsලා ඔක්කෝම කියනකොට පන්සල කඩන්න ඕනෑ කියලා මම කිව්වා, මේ රටේ පන්සල් කඩන්න බැහැ, මේ රටේ ආගමික කිසි ප්‍රශ්නයක් ගේන්න බැහැ කියලා. හැබැයි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

කවුරු වුණත්, මම මැරුණත් මම භය නැහැ. ඒක වෙනස් කරන්න ඕනෑ කියලා මම කියනවා. *[බාධා කිරීමක්]* මගේ වෙලාව ගන්න දෙන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපි විෂයයට අදාළව කථා කරමු.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අභිංසක දරුවෝ කොහොමද බන්දලා දෙන්නේ? මේ, අවුරුදු 8, අවුරුදු 9 බබාලා? ඒගොල්ලෝ හිතනවාද, ඒගොල්ලෝ දන්නවාද, හෙට උදේ වෙනකොට ඒගොල්ලන්ට පාසල් යන්න බැහැ කියලා? ඒ නිසා මේක සම්පූර්ණයෙන් වැරදියි. කවුරු කළත් වැරදියි. මෙතුමා නොවෙයි, මෙතුමාගේ සම්පූර්ණ ආගම ඇවිල්ලා මට කිව්වත්, මාව මරලා දැම්මත්, වැරදි නම් වැරදියි. ඔබතුමා නොවෙයි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

එයාගේ අම්මා, තාත්තා දන්නවා. තාත්තා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ඒ කියන්නේ, - *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, -

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඒ කියන්නේ හිස් කියලා.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(මාණ්පුමිකු සනාතිපති චට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I rise to a point of Order.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order දෙන්න එපා. ඔබතුමාට කොහොමද point of Order දෙන්නේ? ඔබතුමා වාඩිවෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(මාණ්පුමිකු සනාතිපති චට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්)
(The Hon. M. Nizam Kariapper, PC)
හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා ගැන කියපු සියලු කථා හැන්සාඩ් වාර්තාවෙන් කපා දමන ලෙස ඉතා ගෞරවයෙන් අයද සිටින අතර, දිගින් දිගටම අනික් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවන විධියට මෙතුමා කථා කළොත්, ඒ කථාව නවත්වන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා විෂයයට අදාළව කථා කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම දැන් කියන්නේ මේ රට එකම රටක් කියලායි. මේ රටේ ඉන්න මිනිස්සුන්ට අවුරුදු 9, අවුරුදු 8 බබාලා බන්දලා දෙන්න බැහැ. ඒක වැරදියි. ඒක ප්‍රභාකරන් කිව්වත් වැරදියි, මම කිව්වත් වැරදියි, AKD කිව්වත් වැරදියි. හිතලා බලන්න. අපේ දරුවන් - අවුරුදු 9 බබාලා - යම් කෙනෙකුට බන්දලා දීලා හෙට උදේ වෙනකොට ඒ දරුවාට school යන්න බැරි නම්, ඒක කොච්චර වැරදිද කියන්නකෝ. ඒක සම්පූර්ණයෙන් වැරදියි. මම මරලා දැම්මත්, සහරාන් වාගේ කෙනෙක් මගේ ගෙදරට ඇවිල්ලා බෝම්බ දැම්මත්, වැරදියි නම් වැරදියි. මම ඒ කථාව ඉවර කරනවා.

இந்த நாட்டில் 1983ஆம் ஆண்டு இனக் கலவரம் உருவாகியது. அன்றிலிருந்து 1990ஆம் ஆண்டுவரை எங்களுடைய இனம் சில இனத்தவர்களால் வெட்டிக்கொலை செய்யப்பட்டது. அதாவது, எங்களுடைய உறவுகள் வெட்டிக் கொலை செய்யப்பட்டன. அப்போதுதான் நாங்கள் ஆயுதம் தூக்கினோம். 1990களில் என்னுடைய தேசியத் தலைவன், "உங்களுடைய உடைமைகளுடன் வெளியேறுங்கள்" என்று இவர்களுக்குச் சொல்லியிருக்கிறார். உடைமைகளை எடுக்க வேண்டாம் என்று அவர் சொல்லவில்லை. "ஒரு நாள் கால அவகாசம் கொடுத்திருக்கிறோம்; உடைமைகளுடன் வெளியேறுங்கள்!" என்று சொன்ன பிரபாகரனின் வரலாறுதான் இது. நாங்கள் இவர்களைக் கொலை செய்யவில்லை. கிழக்கு மாகாணம் முழுவதும் எங்களுடைய தமிழ் மக்களின் இரத்தம் ஆறாக ஓடியிருக்கிறது. அதுமட்டுமல்ல, எங்களுடைய அம்மன் கோயிலை இடித்து, அந்த இடத்தில் மீன் market கட்டிய

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

பிழை என்றால் பிழைதான்! அது யார் செய்தாலும் சரியே!

நான் இன்னொரு விடயத்தையும் சொல்கிறேன். நாங்கள் பாவப்பட்ட ஓர் இனம்! 2009ஆம் ஆண்டு வரை எங்களுக்கு நடந்த சம்பவம் உங்களுக்குத் தெரியும்! அண்மையில் அல்-ஜெஸீரா தொலைக்காட்சி அலைவரிசையில் இடம்பெற்ற நேர்காணலில் கலந்துகொண்ட உங்களுடைய முன்னாள் சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள், இராவணனின் தங்கை சூர்ப்பணகை மூக்கறுபட்டது போன்று மிகத் தெளிவாக மூக்கறுபட்டு இருக்கிறார். 2009ஆம் ஆண்டு எங்கள்மீது இனப் படுகொலை மேற்கொள்ளப்பட்டது. என்னுடைய அப்பா, சகோதரன் உட்பட பலர் காணாமலாக்கப்பட்டார்கள். எனினும், இன்றுவரை சிங்கள சமூகம் எங்களுக்கான நீதியைப் பெற்றுத்தரவில்லை.

அடுத்து, எங்களுடைய தம்பி இளங்குமரன் அவர்களது கருத்தை நான் இங்கு சொல்ல விரும்புகின்றேன். அதாவது, சர்வதேச விசாரணை இந்த நாட்டில் தேவையில்லை எனச் சொல்லியிருக்கிறார். என்னுடைய யாழ்ப்பாண சமூகம் உங்களுக்கு வாக்குப்போட்டது தங்களுக்கு நியாயம் கிடைக்கும் என்ற ஒரே நோக்கத்தின் அடிப்படையில்தான். தம்பி இளங்குமரன்தான்

[இලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

கட்சியோடு இருக்கிறார் என்று வைத்துக்கொள்வோம். கட்சித் தலைமை சொல்வதைத்தான் தம்பி இளங்குமரன் சொல்ல வேண்டும். பாவம் அவன்! ஆனால், எங்களோடு எதிர்க்கட்சியில் இருக்கின்ற தமிழ்த் தேசியக் கூட்டமைப்பு எனப்படுகின்ற

[இලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

அரசியல் கட்சியானது, எங்களை 16 வருடங்களாக

[இලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

செய்திருக்கிறது. உள்ளூராட்சி மன்றத் தேர்தலிலும் மாகாண சபைத் தேர்தலிலும் ஒவ்வொரு வாக்கும் இந்தத் தமிழ் தேசியக் கூட்டமைப்புக்குத்தான். இங்கு சுமந்திரன் என்ற ஒருவர் இருந்தார். இப்பொழுது சிறீதரன் என்ற ஒருவர் இருக்கிறார். இவர்கள் ரணிலுடன் சேர்ந்து 2022ஆம் ஆண்டு "Gota, go home!" என்ற விடயத்தைக் கொண்டுவந்தபோது, மக்கள் எதிர்பார்த்தது system changeஐத்தான்.

அதனால்தான் இன்று 159 பேர் ஆளுங்கட்சியில் இருக்கிறார்கள். ரணிலுடன் சேர்ந்து - அவருக்கு support பண்ணி - சர்வதேச விசாரணையை இழிவுபடுத்திய சுமந்திரனை எங்களுடைய சமூகம் இந்தச் சபையிலிருந்து துரத்தி இருக்கிறது. பரவாயில்லை! நாங்கள் கந்தக காற்றைச் சுவாசித்தவர்கள். அம்மா இறந்த பின்னர் அவளுடைய முலைப் பாலைக் குடிக்கும் படங்கள் முகப்புத்தகத்தில் இருக்கின்றன. பாருங்கள்! 'ஷெல்' அடிபட்டு தாய் இறந்த பிறகு, இலையான் மொய்க்கின்ற அவளது உடம்பிலிருந்து பாலை அருந்தியவன் இன்று வெளிநாட்டில் இருப்பதனால்தான் நான் பாராளுமன்றுக்கு வந்திருக்கிறேன். வெளிநாட்டிலுள்ள என்னுடைய சகோதரர்கள் போட்ட பிச்சையால்தான் நான் மூன்று மாதத்திலேயே பாராளுமன்றத்துக்கு வந்தேன். நான் மிகவும் தெளிவாக இந்த அரசாங்கத்திடம் கேட்பது என்னவெனில், 2009இல் இடம்பெற்ற நிகழ்வு தொடர்பில் மட்டுமல்ல, சஹ்ரானுடைய, இந்த இனவாதிகளுடைய சகல விடயங்களையும் சர்வதேச நீதிமன்றத்துக்குக் கொண்டுபோக வேண்டும் என்றுதான். எல்லா அரசியல்வாதிகளும் deal அடிப்பார்கள் என்பது உங்களுக்கு நன்றாகத் தெரியும்!

இந்த நாட்டில் 'நல்லாட்சி' ஒன்று ஏற்பட்டது. அதற்குப் பின்னர் என்ன நடந்தது? 2022இல் கோட்டாபய ராஜபக்ஷ விரட்டி அடிக்கப்பட்டார். அதற்குப் பின்னர் ரணில் வந்தார். எந்தச் சமூகமும், எந்த மக்கள் கூட்டத்தினரும் என்னுடைய அழிக்கப்பட்ட இனத்துக்கு இதுவரை எந்த நியாயத்தையும் பெற்றுத்தரவில்லை. அதனுடைய ஓர் அங்கமாக AKD சொல்லியிருப்பது என்னவென்றால், தான்கூட சர்வதேச விசாரணைக்குப் போகமாட்டேன் என்றுதான். யாழ்ப்பாணத்தில் AKDஇன் கட்சிக்கு வாக்குகள் விழுமாக இருந்தால், அது என்னுடைய தலைவனுக்கும் 44,000 போராளிகளுக்கும் இப்போது மீதமிருக்கின்ற என்னுடைய இனத்துக்கும் எதிரான கோடரிக்காம்புகளாக இருக்கும் என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். எங்களுடைய புதுமாத்தளன் வைத்தியசாலை உட்பட சகல hospitalsமீதும் shell தாக்குதல், artillery தாக்குதல், புக்காரா விமானக் குண்டுத் தாக்குதல் நடத்தப்பட்டு இருக்கின்றன என்ற உண்மையை அல்-ஜெஸீரா தொலைக்காட்சி அலைவரிசையில் இடம்பெற்ற நேர்காணலின்போது எங்களுடைய முன்னாள் சனாதிபதி ஒப்புக்கொண்டு இருக்கிறார். உங்கள் சார்பாகவும் நான் கதைக்கிறேன். உங்கள் குரலாகவும் நான் இருப்பதற்குத் தயாராக இருக்கிறேன். பட்டலந்த படுகொலை எனப்படுகின்ற உங்களுடைய 88,000 சகோதரர்களை - ரோஹண விஜேவீர உட்பட பலரை - சுட்டுக்கொன்ற, பொரளை கனத்தை மயானத்தில் உயிரோடு எரித்த வரலாற்றைக்கொண்ட ரணிலை நீங்கள் கைதுசெய்யாமல் இருப்பது உங்களுடைய அரசியல் கலாசாரம் என்றால், நான் அரசியலில் ஒரு புலியாகவே இருக்க விரும்புகின்றேன்.

ஜெனரல் சவேந்திர சில்வா எனப்படுபவர் blacklist பண்ணப்பட்ட ஓர் இராணுவ commando என்பது உங்களுக்குத் தெரியும்! அவர் மனித உரிமைகளை மீறியிருப்பதாக UN Human Rights Commision சொல்லியிருக்கிறது. நேற்றைய தினம்கூட, UN Human Rights Commisionஉடன் "Zoom" தொழில்நுட்பத்தினூடாக online கலந்துரையாடல் ஒன்று நடந்தது. இந்தப் பாராளுமன்றத்தில் எனக்குக் கதைப்பதற்குச் சந்தர்ப்பம் தரவில்லை என்பதை UN Human Rights Commision முறைப்பாடாக எடுத்திருக்கிறது. எனக்கு இந்தப் பாராளுமன்றத்தில் 77 நாட்கள் கதைப்பதற்குச் சந்தர்ப்பம் தரவில்லை என்ற விடயத்தை நான் UN Human Rights Commisionக்கு கொண்டுபோய் இருக்கிறேன்.

இன்று காஸாவில் நடக்கின்ற போர் பற்றி உங்கள் எல்லோருக்கும் தெரியும்! காஸாவில் போர் நடக்கும்போது அமெரிக்காவால் சொல்லப்பட்ட விடயம் ஒன்று இருக்கிறது. அதாவது, கோட்டாபய ராஜபக்ஷவும் முன்னாள் சனாதிபதி மஹிந்த ராஜபக்ஷவும் எவ்வாறு எங்களுடைய மக்களை பாதுகாப்புப் பிரதேசத்துக்குள் போகுமாறு சொல்லிவிட்டு குண்டுத் தாக்குதல்களை மேற்கொண்டார்களோ, அதுபோன்று காஸா மக்களையும் கொலை செய்ய வேண்டுமென வலதுசாரி அமெரிக்க அமைப்பொன்று இஸ்ரேலுக்குச் சொல்லியிருப்பதாக மஹ்தி ஹஸன் சொல்லி இருக்கிறார். UN Human Rights Commision சொல்கிறது, எங்களுடைய 40,000 சகோதரர்கள் அழிக்கப்பட்டு இருக்கிறார்கள் என்று. இப்போது இருக்கும் தமிழர்களின் ஒரே குரலாக இருப்பதற்கு எனக்கு

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

ஆசை இருக்கிறது. எனக்குச் சாவதற்குப் பயமில்லை. நீங்கள் எனக்குப் பாதுகாப்புத் தரவில்லை. அது எனக்குத் தேவையுமில்லை. என்னுடைய கைகள் என்னைப் பாதுகாத்துக் கொள்ளட்டும்! இல்லாவிட்டால், எனது உடலை என்னுடைய சகோதரர்களிடம் அனுப்பி வையுங்கள்! எங்களுடைய 44,000 உறவுகளும் பார்த்துக் கொண்டுதான் இருக்கின்றன. உங்களுடைய அரசாங்கம் தருகின்ற பாதுகாப்பில் வாழ்வதைவிட, என்னுயிரை இழந்து என் சகோதரர்களுடன் போய் இருப்பது சிறந்தது. அதற்கு நான் தயாராகத்தான் இருக்கின்றேன்.

மிகவும் கவலை என்னவென்றால், ஓரிரண்டு முஸ்லிம் உறுப்பினர்கள் எங்களைப் பார்த்துச் சொல்கின்ற விடயங்கள்தான். நாங்கள் எந்த இனத்துக்கும் எதிரானவர்கள் அல்லர். ஒரு நாளில் யாழ்ப்பாணத்தைவிட்டு உடைமைகளுடன் வெளியேறுமாறு சொன்ன தலைவன் என்னுடைய தலைவன்! இவர்கள் எனக்கு மூளை சரியில்லை என்று சொல்லி இருக்கிறார்கள்.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

හරියටම නම දාලා තිබෙනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

සිංහලෙන් නම දාලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා කට වහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* සද්දේ වැඩියි. Shut up! you, shut up!.Sit down and shut up!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපි මේ විවාදය විනයානුකූලව ගෙන යා යුතුයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට මන්ත්‍රී අයිතිවාසිකම් තිබෙනවා. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරලා කියපු එකට උත්තර දෙන්න මට අයිතියක් තිබෙනවා. තව එක දෙයක් කියන්න තිබෙනවා. මම ඒක සිංහලෙන් කියන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙනත් මන්ත්‍රීවරයෙකුට අපහාස වන අයුරින් කථා කරනවා නම් මට ඔබතුමාගේ කථාව නවත්වන්න වෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව කොච්චර වේලාවක් තිබෙනවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මන්ත්‍රීවරයෙකුට හෝ වෙනත් කාට හෝ අපහාස වන පරිදි කථා කරනවා නම් මට ඔබතුමාගේ කථාව නවත්වන්න සිද්ධ වෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම සඳහන් කරලා මාව පිස්සෙක් කියලා කියා තිබෙනවා. දැන් එතුමා කොහේද ගියේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා විවාදයට සම්බන්ධ වෙන්න. ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තිබුණු කාලය අර පැත්තෙන් අරගෙන තිබෙනවා. ඒ නිසා මට වරදක් කරන්න එපා. Paedophilia කියන්නේ, පොඩි ළමයි එක්ක sex කරන ලෙඩක්. පොඩි දරුවෙක් දැක්කාම එයාත් එක්ක sex කරන්න ඕනෑ කියලා හිතෙනවා නම්, ඒක paedophilia.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

එහෙම නැත්නම් එතුමා වැරදියි කියපු එකට මම පිස්සෙක්ද කියලා මම මේ ජනතාවගෙන් අහනවා.

ඊට අමතරව මම මේ කාරණයත් කියන්න කැමැතියි. මම තත්පරයකින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වෙනත් කෙනෙකුගේ කාලය අරගෙන කථා කරන්න මට කිසිම වුවමනාවක් නැහැ. මට ලැබිය යුතු කාලය දෙන්නේ නැහැ කියලා මම UN High Commissioner for Human Rightsට complain කරලා තිබෙනවා. ඒක පස්සේ බලා ගනිමු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මාතෘකාවට අදාළව කථා කරපු නැති නිසා නිකම්ම කාලය ගෙවිලා ගියා. එම නිසා කරුණාකරලා තව විනාඩියකින් කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට වේලාව දෙන්නේ මට ඕනෑ විධියට සහ මගේ ජනතාවට ඕනෑ දේවල් කථා කරන්න. මම කථා කරන්නේ මොනවාද කියලා decide කරන්න ඔබතුමාට බැහැ. ඔය පුටුවට මම respect කරනවා. ඒ නිසා මගේ වෙලාව නාස්ති කරන්න එපා.

"Major Public Investment Projects" කියලා පොතක් තිබෙනවා. මේ පොත ගැන මම කෙටියෙන් කියලා කථාව ඉවර කරන්නම්.

என்னிடமுள்ள இந்த "Major Public Investment Projects" என்ற புத்தகத்தில் நீங்கள் வடக்கு, கிழக்கு மாகாணங்களின் general educationக்கு ஒதுக்கியிருப்பது 0 சதவீதம். வடக்கிலுள்ள பல்கலைக்கழகத்துக்கு ஒதுக்கியிருப்பது 0.28 சதவீதம். கிழக்கிலுள்ள பல்கலைக்கழகத்துக்கு ஒதுக்கியிருப்பது 0.8 சதவீதம். இளைஞர்களுடைய விளையாட்டுத்துறைக்கு ஒதுக்கியிருப்பது 0 சதவீதம். பெண்களுடைய பாதுகாப்புக்கு ஒதுக்கியிருப்பது 0 சதவீதம். religious, cultural and heritage sector 2,350 மில்லியன் ரூபாயைப் பயன்படுத்தி இருக்கிறது. ஆனால், இந்தப் புத்தகத்தில் வடக்கு, கிழக்குக்கு ஒதுக்கப்பட்டு இருப்பது பூஜ்யம். Northern Province agriculture and livestockக்காக 18 பில்லியன் ரூபாயும் 25 பில்லியன் ரூபாயும் பயன்படுத்தப்பட்டு இருக்கிறது. வடக்கில் tourismக்கு ஒதுக்கப்பட்டு இருப்பது பூஜ்யம்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පර කීපයක් දෙන්න.

ඒ විධියට Northern Province එකේ මුල්ලිවයික්කාල් පාලම හදන්න රුපියල් මිලියන 500ක් දීලා තිබෙනවා. අන්ද 500 මිල්ලියන් ரூபாய் என்பது நீங்கள் வடக்குக்கு ஒதுக்கிய மொத்த நிதியின் 1.37 சதவீதமாகும். இவ்வாறு நீங்கள் 1 சதவீதம், 0 சதவீதமான நிதியை ஒதுக்கிவிட்டு, வடக்கு மக்களுடைய வாக்குகளைப் பிச்சையாகக் கேட்டு -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
என்னுடைய இனத்தை நீங்கள் அவமதிப்பீர்களாக இருந்தால், எதிர்வருகின்ற உள்ளூராட்சி மன்றத் தேர்தலில் வடக்கில் உங்களுக்குப் போடப்படுகின்ற ஒவ்வொரு voteஉம் எனக்கு எதிரானதல்ல. மாறாக, என்னுடைய தமிழ் இனத்தின் எதிர்காலத்துக்குரியது. தயவுசெய்து, ஒவ்வொரு தமிழ் மகனும் சிந்திக்க வேண்டும் நாங்கள் யார்? என்று. நாங்கள் தமிழர்! இன்னோர் இனத்தை ஒரு நாளில் ஒழுங்காக வெளியே போ என்று சொன்ன தமிழர்கள்தான் நாங்கள்! நாங்கள் கொத்துக் கொத்தாக கொலை செய்யவில்லை; வீடு வீடாகச் சென்று கொலை செய்யவில்லை. ஏன் என்றால், நான் யாழ்ப்பாணத்து தமிழன்! Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ කථාවේදී මෙම සභාවේ වෙනත් මන්ත්‍රීවරයෙකුට හෝ කිසියම් ආගමකට හෝ අපහාසයක් සිදු වන වචන සඳහන් කර තිබේ නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන බව නිවේදනය කරමි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. මට point of Order එක දෙන්නේ නැද්ද? අපට කථා කරන්න දෙන්නේ නැහැ නේ. එතකොට මගේ වෙලාව එතුමාට දුන්නේ කොහොමද? මම නම සඳහන් කළේ නැහැ. ඔබතුමන්ලා වරදක් කරන්නේ. ඔබතුමන්ලා කරපු වැරදි නිසා තමයි මේ පාර්ලිමේන්තුවට මෙහෙම වෙලා තිබෙන්නේ.

[අ.භා. 4.35]

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
2025 වර්ෂය සඳහා වූ අය වැයෙහි කාරක සභා අවස්ථාවේදී විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේත්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභානායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මගේ කථාවේදී වැඩිපුරම මම අවධානය යොමු කරන්නේ විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය පිළිබඳවයි. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සම්බන්ධයෙනුත් මම යම් කාරණයක් කියන්නට ඕනෑ. විශේෂයෙන්ම ඉතාලියේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ගේ රියදුරු බලපත්‍රය සම්බන්ධයෙන් ගැටලුවක් මතුවෙලා තිබෙනවා. අපේ රජය පත් වුණු විගසම ඒ සම්බන්ධයෙන් රජය පැත්තෙන් ගත යුතු පියවර අරගෙන එම ක්‍රියාමාර්ග පිළිබඳව ඉතාලි රජයට දන්වලා තිබෙනවා. එසේ දැනුම් දීම මත ඉදිරියේදී ඉතාලි රජය පැත්තෙන් අදාළ කටයුතු සූදානම් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එම නිසා ඒ ගැටලුව ඉතා ඉක්මනින් විසඳෙයි කියලා රජයක් හැටියට අපි බලාපොරොත්තු වෙනවා.

අපි හැමෝම දන්නවා, ශ්‍රී ලංකාව කියන්නේ ස්වභාවික සම්පත්වලින් බොහොම පොහොසත් රටක් බව. අපේ රට, සාගරය, ගොඩබිම, විවිධ දේශගුණික කලාප එක්ක මහා ජෛව විවිධත්වයක් පවතින රටක්. ඒ වාගේම පිරිසිදු ඛනිජ සම්පත්වලිනුත් මධ්‍යම ප්‍රමාණයෙන් පිරි රටක් හැටියට අපේ රට ප්‍රසිද්ධයි. විශේෂයෙන්ම අපේ රට මිනිරන්වලට ඉතා ප්‍රසිද්ධයි.

මෙහෙම ස්වාභාවික සම්පත් -ජීව වෙන්න පුළුවන්, ඛනිජ වෙන්න පුළුවන්- යම් ප්‍රමාණයකට අපේ රටේ තිබුණත් වෙනත් රටවල් එක්ක බලනකොට රටක් හැටියට අපේ රට දුප්පත්. ඒක 2022 අප්‍රේල් මාසයේ 12වැනි දා අපි රටක් හැටියට ප්‍රකාශයට පත් කළා. අපේ රට ස්වාභාවික සම්පත්වලින් පොහොසත් රටක් වුණත් අපි දැන් දුප්පත්. මේකට හේතුව මොකක්ද කියලා ජාතික ජන බලවේගය විධියට අපි හඳුනාගෙන තිබෙනවා. විශේෂයෙන් ස්වාභාවික සම්පත් ගැන පර්යේෂණ කරලා, නිවැරදි පර්යේෂණ

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

හරහා ඒ සම්පත් රටේ ආර්ථිකයට යොදවා ගන්නේ කොහොමද කියලා අපි නිවැරැදි පරීක්ෂණ සිදු කරලා නැහැ. අපි රජයක් හැටියට ඒ පර්යේෂණ සඳහා විශාල වශයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. පසුගිය වසරට වැඩිය මේ වසරේදී ඒ පර්යේෂණ සඳහා යොමු කරන ලද මුදල් ප්‍රමාණය දෙගුණයකටත් වඩා වැඩි කරලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට අපට ඒ පර්යේෂණ සිදු කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා.

අපි රජයක් හැටියට විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය, අපේ අමාත්‍යාංශ විසි දෙකෙන් එකක් බවට පරිවර්තනය කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත්. ඒ අමාත්‍යාංශ දෙකේ වැදගත්කම හඳුනා ගැනීම නිසා තමයි ජාතික ජන බලවේගය රජය එවැනි මුදල් ප්‍රමාණයක් වෙන් කර දීලා තිබෙන්නේ. විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයට අපේ රජය කොපමණ දායකත්වයක් දක්වලා තිබෙනවාද කිව්වොත් මේ රටේ පුරවැසියන් වෙච්ච ලෝකයේ ඉන්න හොඳම විද්‍යාඥයෝ අපි ඒ උපදේශක මණ්ඩලයට දායක කරගෙන තිබෙනවා. මහාචාර්ය ගෝමික උඩුගමසූරිය එවැනි කෙනෙක්. ඒ වාගේම දේශීය පැත්තෙන් ගත්තොත් මහාචාර්ය ඔලිවර් ඉලේපෙරුම වාගේම තවත් මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, පර්යේෂකයන් - researchers - විශාල වශයෙන් දායක කර ගත් උපදේශක මණ්ඩලයක් පිහිටුවා තිබෙනවා. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් එහෙමයි. හාන්ස් විජේසූරිය වාගේ ලෝකයේ ප්‍රසිද්ධම විශේෂඥයන් ඒ වෙනුවෙන් අපි උපයෝගී කරගෙන තිබෙනවා. අපි විශේෂඥයන්, researchersලා එක්ක පර්යේෂණ ඉදිරියට කරගෙන යන්න ඕනෑ.

අපට එජ්පාවල පොස්ෆේට් නිධිය තිබෙනවා. එජ්පාවල පොස්ෆේට් නිධිය 1971 වර්ෂයේදී තමයි හොයා ගන්නේ. 1973 වර්ෂයේදී අඹරලා, කුඩු කරලා, පොහොර හැටියට භාවිත කරන්න එය පාවිච්චි කරනවා. හැබැයි, කියන්න කනගාටුයි, එතැන් සිට අද දක්වාම ඒ ආකාරයෙන්ම ඒ කටයුතු සිදු වෙනවා. ඒ වාගේම 1957 වර්ෂයේදී පුල්මුඩෙ තිබෙන බනිජ වැලි නිධිය හොයා ගන්නවා. පුල්මුඩෙ තිබෙන බනිජ වැලි නිධියෙන් 1962 වර්ෂයේදී ප්‍රථම තොගය ජපානයට අපනයනය කරනවා. අදත් ඒ ආකාරයෙන්ම අපනයනය කරනවා. මේකට හේතුව මොකක්ද? මේ වෙනුවෙන් කරනු ලබන පර්යේෂණ කිසිවක් හරියට, නිසියාකාරව සිදු කරලා නැතිකම. පර්යේෂණ කරලා තිබෙනවා. හැබැයි, අපේ ආර්ථිකයට හරියන පරිදි, ආර්ථිකයට ඒක උත්පාදනය කර ගන්නේ කොහොමද කියන ආකාරයේ පරීක්ෂණ ප්‍රමාණයක් සිදු කරලා නැහැ.

විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයට විශාල වගකීමක් පැවරී තිබෙනවා. ජෛව විවිධත්වය පදනම් කරගෙන තිබෙන දැවැන්ත සම්පත් ප්‍රමාණය අපේ ආර්ථිකයට අපි උපයෝගී කර ගන්නේ කොහොමද කියලා විශාල වශයෙන් පර්යේෂණ ප්‍රමාණයක් සිදු කරන්න අපට අවශ්‍යව තිබෙනවා. අපි මෙවර අය වැයෙන් මෙහි ගුණාත්මකභාවය වැඩි කිරීම වෙනුවෙන් පසුගිය අවුරුද්දට වැඩිය දෙගුණයක මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ලෝකය ඉස්සරහට යන්නේ පර්යේෂණ මත. ඒ වාගේම ලෝකය විශාලම අවධානයක් යොමු කරලා තිබෙන්නේ, rare-earth elementsවලට. මේ අවුරුද්දේම අපේ රටේ තිබෙන rare-earth elements පිළිබඳව ගවේෂණයක් සිදු කරලා, ඒවා කොහොමද අපේ ආර්ථිකයට බද්ධ කරන්නේ කියන එක පිළිබඳව පර්යේෂණ සිදු කරන්න අපේ විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය සූදානමින් ඉන්නවා.

අපේ මේ rare-earth elementsවල වටිනාකම කොහොමද කියනවා නම් අපේ phonesවල එහෙම නැත්නම් electric vehiclesවල මහා විප්ලවීය වෙනසක් සිදු කරන්න පටන් ගත්තේ මෙන්න මේ rare-earth elements ඒවාට එකතු කර ගැනීමත් සමඟයි. ලෝකයේ ඉදිරි දශකය ගත්තොත් rare-earth elements තමයි එහි තිබෙන තීරණාත්මක මූලද්‍රව්‍ය, අමුද්‍රව්‍යයක් හැටියට පත් වෙන්නේ. මේ විධියට අපේ තිබෙන ස්වභාවික සම්පත් හා ඒ වෙනුවෙන් කරනු ලබන පර්යේෂණ අපේ ආර්ථිකයට බද්ධ කරගන්නේ කොහොමද?

ඒ වාගේම පොහොසත් රටක් නිර්මාණය කර ගැනීමේදී, අපේ පොහොසත් පාරිසරික දත්ත, පොහොසත් පාරිසරික සම්පත් අපි මේකට දායක කර ගන්නේ කොහොමද කියන එක තමයි අපි මෙවර අය වැයේදී මතු කර ගන්න සූදානමින් සිටින්නේ.

මම මේ කාරණාවත් මතක් කරන්න ඕනෑ. මීට දින දෙකකට විතර පෙර අපේ ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා කිහිප වතාවක්ම, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ලබා දෙන වතුර මහජනතාව පාවිච්චි කිරීමේදී ඔවුන්ට යම් දෙගිඩියාවක් ඇතිවන ආකාරයේ ප්‍රකාශ කිහිපයක්ම කළා. අවස්ථා කිහිපයකදීම එතුමා එවැනි ප්‍රකාශ සිදු කළා. මේ අවස්ථාවේදී මම ඒ පිළිබඳවත් යම් ප්‍රකාශයක් සිදු කරන්න ඕනෑ. මොකද, එතුමාගේ ඒ ප්‍රකාශ නිසා ජලසම්පාදන මණ්ඩලය මඟින් නිකුත් කරන ජලය සම්බන්ධයෙන් මහජනතාව තුළ අවිශ්වාසයක් ඇති වෙන්න පුළුවන්. විශේෂයෙන් එතුමා මතු කළා, හුණුවල - limeවල - තිබිය යුතු ක්‍රෝමියම් ප්‍රමාණය වැඩියි කියලා. ඇත්තටම ලෝකයේ එක එක රටවල නිෂ්පාදනය කරන limeවල තිබිය යුතු ක්‍රෝමියම් ප්‍රමාණය පිළිබඳ විවිධ, විවිධ නිර්ණායක තිබෙනවා. අපේ රටෙත් සියයට 1 සිට සියයට 10 දක්වා උපරිමයක් දාලා තිබෙනවා. හැබැයි, එතුමා මතු කරන්නේ කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම් 12ක් තිබෙන ප්‍රමාණය වැඩියි කියලායි. ඇත්තටම ගත්තොත්, යම් සීමාවකට වැඩි වුණත් ඒවා තවම අපි පාවිච්චි කරලා නැහැ. හැබැයි, එතුමා මේක පටලවනවා. එතුමා මේක පටලවන්නේ කොහොමද? පානීය ජලය -drinking water - ලීටරයක තිබෙන්න ඕනෑ ක්‍රෝමියම් ප්‍රමාණය මිලිග්‍රෑම් 0.05යි. ඒක තමයි WHO එකේ තිබෙන standard එක. එතකොට එතුමා කියනවා, limeවල තිබෙන ක්‍රෝමියම් ප්‍රතිශතය කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම් 12යි කියලා. ඒ ජලය පාවිච්චි කළොත් අපට පිළිකා හැදෙන්න පුළුවන්, අපේ kidneys සම්පූර්ණයෙන්ම නරක් වෙන්න පුළුවන් කියන ආකාරයේ මතයක් එතුමා ඉදිරිපත් කළා.

මම ඊයේ-පෙරේදා මේ සම්බන්ධයෙන් සොයා බැලුවා. අපේ ලොකුම ජල පවිත්‍රාගාරය තිබෙන්නේ අඹතලේ. අඹතලේ ජල පවිත්‍රාගාරය ඊයේ සහ පෙරේදා දින දෙක තුළ පාවිච්චි කර තිබෙන්නේ, හුණු - lime - කිලෝග්‍රෑම් 1,200යි. අපි හිතමු, කිලෝග්‍රෑම් 1,500යි කියලා. අඹතලේ ජල පවිත්‍රාගාරයෙන් දිනකට වතුර ඝන මීටර් -කියුබික් මීටර්- ලක්ෂ පහමාරක් නිකුත් කරනවා. ඒ සඳහා ඔවුන් දිනකට පාවිච්චි කරන්නේ, හුණු කිලෝග්‍රෑම් 1,200යි. ඒක කිලෝග්‍රෑම් 1,500යි කියලාම අපි ගණන් හදමුකෝ. දැන් මේ ක්‍රෝමියම් ප්‍රමාණය කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම් 12ක් තිබෙන හුණු අපි පාවිච්චි කරන්නේ නැහැ, ඒවා පැත්තකින් තියලා තිබෙනවා. හැබැයි, කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම් 12ක් ක්‍රෝමියම් තිබෙන හුණු පාවිච්චි කරලා වතුර පිරිසිදු කර ගත්තත්, -ගරු සභානායකතුමනි, ඔබතුමා දන්නවා, මේ හුණු සියයට 100ක්ම වතුරේ දිය වෙන්නේ නැහැ කියලා- අපි සියයට 100ක්ම එය දිය වෙනවා කියලා ගත්තත්, ගණන් හදලා බැලුවාම බොන වතුරේ තිබෙන ක්‍රෝමියම් ප්‍රමාණය එන්නේ සියයට 0.0003යි. අන්න එවැනි ඉතා කුඩා ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. ඒක WHO එක කියන ප්‍රමාණය එක්ක බලද්දී විශාල වශයෙන් අඩු ප්‍රමාණයක්.

නමුත් මේ විධියට අපේ රටේ මහජනතාව බියවද්දා, ජනතාව තුළ අවිශ්වාසය ඇති කරලා තමුන්ගේ දේශපාලනය තහවුරු කර ගන්න යනවා නම්, ඒක තමයි මේ රටේ අභාග්‍යය. මම හිතනවා, එවැනි තැනකදී ජනතාව නිවැරදි තොරතුරු දැන ගත්තාම ඒකේ ප්‍රතිඵලය අනෙක් පැත්තට ලැබෙනවා. පසුගිය මැතිවරණවලදී ඔවුන් ඒක අත්වින්දා. මොකද, ජාතික ජන බලවේගය බලයට ආවොත් බුද්ධාගමට මොකක්ද කරන්නේ කියලා මහා බොරුවක් සමාජගත කරන්න ඔවුන් උත්සාහ කළා. අන්න ඒ බොරුව එළි වුණාට පසුව තමයි, පසුගිය මැතිවරණයේදී මහජනතාව විසින් එවැනි පිළිතුරක් ලබා දුන්නේ. ඒ නිසා තමාගේ දේශපාලන දුප්පත්කම වසා ගන්න මෙවැනි ආකාරයට කටයුතු කිරීම; ජලසම්පාදන මණ්ඩලය හරහා ලබාදෙන පානීය ජලය කෙරෙහි අවිශ්වාසයක් ගොඩ නැඟීමට විපක්ෂය විසින් මෙවැනි ආකාරයේ අසත්‍ය ප්‍රකාශ කිරීම ගැන මම ඉතා කනගාටු වෙනවා. මොකද, අපි මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න ඕනෑ ප්‍රතිපත්තිමය තීන්දු-තීරණ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නයි. විපක්ෂය එවැනි පහළ තැනකට වැටීම සම්බන්ධයෙන් මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ගරු සභානායකතුමනි, මගේ කථාව තුළින් මම කියන්න උත්සාහ කරන්නේ මෙයයි. අපේ රටේ දැවැන්ත ස්වාභාවික සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. මෙන්න මේ ස්වාභාවික සම්පත් තුළින් අපේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න, අපේ රට පොහොසත් රටක් බවට පරිවර්තනය කරගන්න අවශ්‍ය කරන අඩිතාලම යොදාගන්න ඕනෑ. එහිදී ආර්ථිකය ගොඩනඟන පර්යේෂණ සිදු කිරීම සඳහා අපි පියවරෙන් පියවර, පියවරෙන් පියවර ඉස්සරහට ගන්න ඕනෑ. අන්න, එහෙම කටයුතු කළොත් තව අවුරුදු කිහිපයකින් අපි බලාපොරොත්තු වන, ආර්ථිකමය වශයෙන් ඉහළ තලයකට ඔසවා තබන්න පුළුවන් වන ආකාරයේ රටක් හැටියට අපට මේ රට පරිවර්තනය කරගන්න පුළුවන් කියා මම හිතනවා. මොකද, ලෝකයේ පර්යේෂණ - research - කරන ප්‍රමාණය අනුව තමයි ඔවුන්ගේ ඉදිරි අනාගතය; ඔවුන්ගේ ඉදිරි ආර්ථිකය කොතැනද තිබෙන්නේ කියන එක තීරණය වෙන්නේ. මම හිතනවා, විද්‍යා හා තාක්ෂණ කටයුතු අමාත්‍යාංශයට ඒ සඳහා විශාල වගකීමක් තිබෙනවා කියලා. ඒ සඳහා රජයෙන් විශාල වශයෙන් සහයෝගය දෙනවා. ඒ වෙනුවෙන් අපි ඉදිරියට පෙළගැසිලා වැඩ කරමු කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක් ලැබෙනවා.

[4.47 p.m.]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Presiding Member, I rise today to make the winding up speech on behalf of the Opposition at the Committee Stage Discussion on the Votes of the Ministry of Digital Economy and the Ministry of Science and Technology.

Sir, digital economy is not just a concept, but it is our present and our future. The basic principle, as I understand, is seamless integration of digital technology into the economy. Digital technology has become an essential part of our daily lives. Whether we acknowledge it or not, the digital economy is the reality, with or without a dedicated Ministry. It influences every sector - finance, justice, transport, parliamentary affairs and even cultural affairs. We no longer operate in isolation; we live in a digital world.

As we discuss the Budgetary allocations, it is crucial to recognize the role of digital transformation in driving economic growth, improving governance and enhancing service delivery for our people. Within the time allotted to me, I wish to highlight some of the essential applications of digital technology which could create significant economic benefits without imposing additional financial burdens on the National Budget.

Let me begin with railway transport and the challenges faced by that sector. The recent elephant-train collisions in our country have raised serious concern, Sir. However, is the solution not quite simple, something that could even be developed by a student with basic computer knowledge? For instance, if we integrate the entire railway network with Google-based tracking and install a simple device on every train engine, the central operating system could monitor train movement in real time, something, I believe, is already in place. Additionally, we already know the areas where elephants and other animals frequently cross railway tracks. By utilizing CCTV cameras capable of capturing night-time movements, live footage of these animals could be displayed on a screen installed in every railway engine, providing an early warning to train services. Simultaneously, the central monitoring system could oversee such situations, ensuring timely intervention to prevent any collisions. Once this network is in place, every railway station would have a display screen showing the real-time arrival of the next train. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වනඅලි සහ දුම්රිය ගැටුම අපට ඒ විධියට නවත්වන්න පුළුවන්.

Now, moving on to the legal system which has already been prepared for digital integration through the passage of necessary laws, I believe the Ministry must allocate funds to equip all courts with the required digital infrastructure. More importantly, a well-connected network should be established between the higher and lower courts. That network must also be linked to other relevant departments such as the Attorney-General's Department, the Legal Draftsman's Department, the Department of Government Analyst and of course, the Parliament, which is responsible for enacting laws. Additionally, officers should be provided with specialized training programmes to effectively use this technology. Sir, I also propose the establishment of a dedicated unit within the Ministry - I hope the Hon. President would take note of this - to oversee the implementation of the digital economy across all the governmental departments.

Now, I wish to address the current election process, which, in my view, undermines the President's efforts to implement the digital economy. Sir, you would be surprised to hear this. As the Secretary of the Sri Lanka Muslim Congress, I requested for necessary documents to field candidates for 90, just 90, local authorities and when my secretary went to collect them, he informed me that

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

he would need to hire a lorry to transport all the paperwork! My seven-seater vehicle, even with two seats folded, was not sufficient to accommodate the documents. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන 90ක අපේක්ෂකයන් සඳහා අවශ්‍ය ලේඛන ගෙනෙන්න කිව්වොත් ලොරියක් ඕනෑ වෙනවා. පුදුමයි නේද? ඒ ඔක්කොම වත්කම් ප්‍රකාශ. පළාත් පාලන ආයතන 90ක අපේක්ෂකයන්ගේ වත්කම් ප්‍රකාශ ටික එකතු කර ගන්න ලොරියක් ඕනෑ වෙනවා නම්, පළාත් පාලන ආයතන 350ක අපේක්ෂකයන්ගේ වත්කම් ප්‍රකාශ ගේන්න කන්ටේනරයක් ඕනෑ වෙයි! නූතන තාක්ෂණය භාවිත වන කාලයක මේක මහා විහිළුවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. So, why can we not have digital forms for candidates with only a single-page printout for affidavits? The law already recognizes digital documentation as legally binding. Therefore, there is no justification for this outdated, paper -heavy process. In fact, subject to correction, Section 87 of the Anti-Corruption Act provides for this.

අපේ පාර්ලිමේන්තුවේ තත්ත්වයත් එහෙමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනාධිපතිතුමා මන්ත්‍රීවරු කන කෑමවල ගණන වැඩි කරලා, ජනතාවගේ බදු මුදල් පරිස්සම් කරලා දෙනවා. ඒ වාගේම හැන්සාඩ් වාර්තා මුද්‍රණයට, කමිටු වාර්තා මුද්‍රණයට, එතැනින් එහාට අනෙකුත් මුද්‍රණ කටයුතු සඳහා විශාල වියදමක් වැය වෙනවා. ඒ ගැනත් අපි ටිකක් සලකා බලන්න ඕනෑ. It is a shame that Parliament still relies on the printed copy of Hansard, Order Papers and Committee repots. While it is true that these documents must be printed as per the Standing Orders, there is no requirement that the printed copies should be provided to each Hon. Member. We can certainly make a transition to e-copies displayed on computer screens. I have spoken about this earlier also. As I have proposed, installing a pop-up screens at every Hon. Member's table would be a practical solution. I am confident that the money saved from the reduction of printouts for just one year would be more than sufficient to install those screens and upgrade the system with an efficient processor. එම නිසා නූතන තාක්ෂණය - digital technology - භාවිත කරලා එවැනි සරල ක්‍රමවේදයකට වැඩ කරන්න පුළුවන් අවස්ථාවක - එවැනි අවස්ථා දහස් ගණනක් ලංකාවේ තිබෙනවා - අනිවාර්යයෙන්ම අපට බිලියන ගණනකින් වියදම අඩු කර ගන්න පුළුවන්. ඒ ගැනත් පොඩ්ඩක් සැලකිලිමත් විය යුතු බව මා කියා සිටිනවා.

Now, I wish to focus on defence and public security and highlight the shameful state of our police. While we discuss digitalization in various sectors, integration of digital technology into public security, which is an urgent need, remains far below the expectations. In every country, whether rich or poor, priority is given to modernizing public security with digital technology before extending it to other sectors. However, in our case, this crucial aspect has been largely neglected.

බලන්න, පොලිස් දෙපාර්තමේන්තුව පොලිස්පතිවරයා අත්අඩංගුවට ගන්න බැරිව දහලනවා. මේක මහා පුදුම, ලජ්ජාසහගත තත්ත්වයක්. අපේ ගම්වල ඔය පොඩි පොඩි අපරාධවලට සම්බන්ධ අය අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කළාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පුද්ගලයාව අධිකරණයට ඉදිරිපත් කිරීමට මෝස්මක් ඉදිරිපත් කරනවා. එහෙම මෝස්මක් ඉදිරිපත් කරනකොට අදාළ පොලීසියෙන් උසාවියට ඇවිල්ලා ඉන්න පොලිස් නිලධාරි මහත්මයාට ඒ ගැන දැනුම් දෙනවා. ඒ පොලිස් නිලධාරියා කියනවා, "හා ප්‍රශ්නයක් නැහැ, ඉදිරිපත් කරන්න" කියලා. එහෙම කියලා හෙමින් සැරේ OICට call එකක් දීලා message එක pass කරනවා. ඊට පසුව සැකකරු අධිකරණය ඇතුළට එනකොටම අල්ලලා වරෙන්තු පිට හිටපු සැකකරු සෑහෙන මහන්සි වෙලා අල්ලා ගත්තාය කියලා අධිකරණයට කරුණු දක්වනවා. ඇප දීමටත් විරුද්ධ වෙනවා. ඒ පොලිස් නිලධාරියා digital technology එක පාවිච්චි කරන්නේ, ජංගම දුරකථනයෙන් OIC මහත්මයාට message එක pass කරන්න විතරයි.

දැන් බලන්න කෝ, අපේ වැඩනොබලන පොලිස්පතිතුමාව අත්අඩංගුවට ගැනීම වළක්වා ගන්න නියෝගයක් ඉල්ලලා, අභියාචනාධිකරණයට රිට් ඉල්ලීමක් ඉදිරිපත් කරලා තිබෙනවා. අභියාචනාධිකරණයට රිට් ඉල්ලීමක් ඉදිරිපත් කරන්න දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ දිවුරුම් ප්‍රකාශය සාමදාන විනිශ්චයකාරතුමා ඉදිරිපිට තමයි අත්සන් කරන්නේ. ඒ ලේඛන ඔක්කොම දැන් අධිකරණයේ තිබෙනවා. පොඩ්ඩක් හොයා බැලුවා නම් ඔය සාමදාන විනිශ්චයකාරතුමාගේ නම, මේ වෙට්ටු දමන පොලිස්පතිතුමා අල්ලා ගන්න පුළුවන්. ඔහු ඉස්සරහ නේ ගිහිල්ලා අත්සන් කරලා ඇත්තේ. පොඩ්ඩක් මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. මම දන්නේ නැහැ, අපේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මොනවා වෙලාද කියලා. වරෙන්තුව පිට ඉන්න පොලිස්පතිවරයා අල්ලන්න බැහැ; මහමොළකාරුවෝ අල්ලන්න බැහැ; මහමොළකාරියෝ අල්ලන්න බැහැ; ජනපති මන්දිරය නැවත ගන්න බැහැ; හැංගිලා ඉන්න මහ බැංකු හොරු අල්ලන්න බැහැ; පොලීසිය තුළ ඉන්න සැකකරුවන්, මරපු පුද්ගලයන් අල්ලන්න බැහැ. ඉතින් වෙලාවකට හිතෙනවා, මේ එකකටවත් උදවු නොවන digital technology අනෙක් ක්ෂේත්‍රවලට ඕනෑමද කියලා.

මට පොඩි කථාවක් මතක් වුණා. "යුද්ධයට නැති කඩුව කොස් කොටන්නද" කියලා කථාවක් තිබෙනවා නේ. ගරු අගමැතිතුමියත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. මට මෙහෙම අහන්න හිතුණා; "මහජන ආරක්ෂාවට නැති තාක්ෂණය TikTok දමන්නද?" එහෙම අලුත් කථාවක් මට මතක් වුණා. මට හිතෙනවා මෙහෙම ගියොත්, ජනතාව තුළ අප ගැනත් අප්‍රසාදයක් ඇති වෙන්න පුළුවන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් වැදගත් කාරණයක් මට කියන්න වෙනවා, දෙමළ භාෂාවෙන්.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முன்னைய அரசாங்கத்தினால் கொண்டுவரப்பட்ட இஸ்லாமிய மதப் புத்தகங்களின் தடை அல்லது கட்டுப்பாடுகளை ஏன் இன்னும் இந்த அரசாங்கம் மீளப்பெறவில்லையென்றதொரு முக்கியமான வினாவை நான் பெப்ருவரி மாதம் 07ஆம் திகதி பாராளுமன்றத்தில் எழுப்பியிருந்தேன். அதற்கு பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் அவர்கள், அது சம்பந்தமாக உரிய அறிக்கையைப் பெற்றதன் பின்னர் அத்தடையை அகற்றுவதற்கு நடவடிக்கை எடுப்பதாகச் சொன்னார். அதன்படி நேற்று முன்தினம் குறித்த கட்டுப்பாடு நீக்கப்பட்டதாக நாங்கள் ஊடகங்கள் மூலம் அறிந்து கொண்டோம். அதனடிப்படையில், தடுத்து வைக்கப்பட்டுள்ள தப்ஸீர் குர்ஆன்களையும் விடுவிப்பார்களென்று நான் நம்புகின்றேன். என்னுடைய வேண்டுகோளைக் கருத்திற்கொண்டு இந்த முடிவை எடுத்தமைக்காக உரிய அமைச்சருக்கும் அரசாங்கத்திற்கும் நன்றி தெரிவிப்பதற்கு நான் விரும்புகின்றேன். In fact,

මම මේ අවස්ථාවේදී ඒ ඇමතිතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමා අද මේ සභාවේ සිටියේ නැහැ. නමුත්, මම අද lift එකේ එනකොට එතුමා දැකලා මම එතුමාට මගේ පෞද්ගලික ස්තුතිය පළ කළා.

අටුත්තු, එංගලුඩෙය කෙළරව පාරාලුමන්ර උරුප්පිනර් ටාක්ටර් ඉරාමනාතන් අර්ච්සුනා අවර්කළ් ඉන්තච් සපෙයිල් අටික්කටි මර්රෙය සමූකත්තෛප් පුණ්පටුත්තුම් වකෙයිල් පේසියමෙ පර්රි ඔරුසිල වාර්ත්තෛකළෛ අවරුක්කුච් සොල්ල වේණ්ටුම්. කමක් නැහැ, මම හැන්සාඩ් එකට ලස්සන දෙමළ ටිකක් කියන්නම්. මේක තේරුම් යයිද දන්නේ නැහැ අනෙක් කට්ටියට. නාම් පේසුම් වාර්ත්තෛකළිල් ඉනිමෙ ඉරුක්ක වේණ්ටුම්; වාය්මෙ ඉරුක්ක වේණ්ටුම්; සොල්වාණ්මෙ ඉරුක්ක වේණ්ටුම්. අතිලුම් වාය්මෙ මිකවුම් මුක්කියම්! තිරුක්කුරළිල් තිරුවළ්ළුවර් වාය්මෙ පර්රි ඉව්වාරු සොල්ලියුළ්ළාර්.

'වාය්මෙ එනප්පටුවතු යාතෙනින් යාතොන්රුම්

තීමෙ ඉලාත සොලල්' - (අතිකාරම් 30 කුරළ් 291)

කාලඤ්චෙන්ර කලෛඤර් තිරු. මු. කරුණානිති අවර්කළ් ඉතු තොටර්පාක විළක්කම් කොටුක්කුම්පෝතු, පිරරුක්කු එළ්මුනෛයළවු තීමෙයුම් ඒර්පටාත ඔරු සොල්ලෛච් සොල්වතුතාන් වාය්මෙ එනප්පටුමෙන අළකාකච් කුරිප්පිට්ටුළ්ළාර්. පිරරුක්කු, පිර මතඞ්කළුක්කු, පිර උරුප්පිනර්කළුක්කු එළ්ළළවිලාන තීමෙකූට තන්නුටෙය සොල්ලිල් ඉරුක්කක්කූටාතු එන්පතෛත්තාන් තිරුවළ්ළුවර් තිරුක්කුරළිල් සොල්ලියුළ්ළාර්.

'කෙළරව පාරාලුමන්ර උරුප්පිනර්' එන්රු නාඞ්කළ් එඞ්කළෛ අළෛත්තුක්කොළ්වෝම්. "ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී" කියලා නේ අපට කථා කරන්නේ. මේ ගරුත්වය අපි බෙරාගන්න එපා යැ. අතේපෝන්රු, තිරුක්කුරළිල් තිරුවළ්ළුවර් ඔළුක්කම් සම්පන්තමාකක් කූරිය ඔරු කුරළෛ නාන් සොල්ල විරුම්පුකින්රේන්.

'ඔළුක්කම් විළුප්පන් තරලාන් ඔළුක්කම්

උයිරිනුම් ඔම්පප් පටුම්'

එන අවර් කුරිප්පිට්ටුළ්ළාර්.

අතාවතු, ඔරුවරුක්කු උයර්වු තරක්කූටියතු ඔළුක්කම් එන්පතනාල්, අන්ත ඔළුක්කමේ උයිරෛවිට මේලානතු එන තිරුවළ්ළුවර් කූරුකින්රාර්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒක සිංහලට translate කරන්නම්. "තිරුක්කුරල්" එකේ විනය පිළිබඳව කියනකොට කියනවා, මනුස්සයෙකුගේ චරිතයේ විනය තබා ගැනීම ජීවිතයට වඩා වටිනා දෙයක් කියලා. ඒ නිසා අපි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට පොඩ්ඩක් හිතා බලලා කථා කරන්න ඕනෑ. අනෙක් සමාජයට, අනෙක් ආගම්වලට, මෙතැන ඉන්න අනෙකුත් ගරු මන්ත්‍රීවරුන්ගේ හිත රිදවන විධියේ කථා කියන එක මම හිතන හැටියට දෙමළ පාරම්පරික සාහිත්‍යයේත් නැති දෙයක්. ආකවේ, කෙළරව පාරාලුමන්ර උරුප්පිනර් එන්ර වකෙයිල්, අර්ච්සුනා අවර්කළුම් තමිළ්ප් පණ්පාට්ටෛක් කටෛප්පිටික්ක වේණ්ටුම්.

ඇත්තටම අපේ හිතට හරිම වේදනාවක් දැනෙනවා. මම සමහරවිට කල්පනා කරනවා, එතුමා මේ කියන්නේ ඇත්තටම එතුමාගේ දේශපාලන අරමුණ ඉෂ්ට කරගන්නද, එහෙම නැත්නම්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු (පේරාසිරියර්) සේන නාණායක්කාර අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES took the Chair.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්)
(The Hon. M. Nizam Kariapper, PC)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මේ ගරු සභාවේදී දේශපාලනය වෙනුවෙන් ගහගන්නවා තමයි. ඒක වෙනම දෙයක්. නමුත්, එතැනදී විනය කඩ කිරීම පිළිබඳවත් අපි බලන්න ඕනෑ. ඒ කියන්නේ ඕනෑම දෙයක් විෂය පථයෙන් පිට කථා කරන්න තිබෙන වරප්‍රසාද පාවිච්චි කරලා සමහර මන්ත්‍රීවරු, විශේෂයෙන් මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා, - එතුමා මෙතැන නැති නිසා මම ඒ ගැන කථා කරන්න කැමැති නැහැ- ඉතා පහත් විධියට කථා කරන එක දිගින් දිගටම කළොත්, මම ඔබතුමියගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා ස්ථාවර නියෝග 79 යටතේ - මා හිතන හැටියට ස්ථාවර නියෝග 79 වෙන්න ඕනෑ - කටයුතු කරන්න කියලා. එහෙම නැත්නම් අපට සිද්ධ වෙනවා එතුමාට විරුද්ධව විශේෂ යෝජනා සම්මුතියක් ගෙනෙන්න. කොහොම වෙතත්, මම ඒ ගැන කථා කරන එක මෙතැනින් නවත්වනවා.

ඩිජිටල් ආර්ථිකය පිළිබඳව කථා කරන මේ අවස්ථාවේදී නැවත නැවතත් මම මේකත් කියන්න කැමැතියි. ඔය ඩිජිටල්කරණය කියන විෂයයට දීර්ඝ අර්ථකථන දීදී අනවශ්‍ය ලෙස විශාල වියදම් කරනවාට වඩා හොඳ නැද්ද, අපි පුළුවන් තරම් තිබෙන නීති පද්ධතිය හරහා කටයුතු කරන එක? Actually, I told the Hon. Minister of Justice that Section 87 of our Anti-corruption Act provides for a centralized, digitalized system for Declaration of Assets and Liabilities. But, recently I was asked to bring a lorry to load the Declaration of Assets and Liabilities forms needed for only 95 local authorities! Imagine the situation had we contested for 350 local authorities!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්)
(The Hon. M. Nizam Kariapper, PC)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එබැවින් මේ කාරණා සියල්ලක්ම හිතට අරගෙන, අනාගතයේදී ඇති වෙන කාරණා කෙසේ වෙතත්, වර්තමානයේ තිබෙන තාක්ෂණය භාවිත කරලා අපි ඩිජිටල්කරණයට යමු කියන යෝජනාව කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය පවත්වන මේ අවස්ථාවේ මම කැමැතියි, digitization, digitalization සහ digital transformation ගැන කරුණු ඉදිරිපත් කරන්න.

Digitizationවලදී, ඇත්තටම අපිළඟ තිබෙන data ටික computer එකට දාලා ඒක ඩිජිටල් ස්වරූපයට ගන්න එක පමණයි සිද්ධ වෙන්නේ. සරලව කිව්වොත්, data ටික computer එකට දාන එක. Digitalization කියන්නේ, අපි ඉස්සර බිලක් ගෙව්වා නම් manually ගිහිල්ලා, බිල කඩන ඒ ක්‍රියාවලිය විතරක් පරිගණකගත කරන එකයි. නමුත් digital transformation කියන්නේ මේ ක්‍රියාවලි සියල්ල ඒකාබද්ධ කිරීමක්. ඒ හරහා මුදල් ගෙවීම් කරන්න පුළුවන්, පළාත් පාලන ආයතනයක වරිපනම් කොච්චර ප්‍රමාණයක් ගෙවලා තිබෙනවාද කියලා බලා ගන්න පුළුවන්. ඊට පස්සේ ඒ මත තීන්දු තීරණ ගන්න පුළුවන්කම තිබෙනවා, අඩු පාඩු තැන් හදා ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ එක්කම අපට හොඳ දත්ත පද්ධතියක් ලැබෙනවා. ඒ හරහා තීන්දු තීරණ ගන්න පුළුවන් වෙන විධියේ සමස්ත ක්‍රියාවලිය transform කරන එක තමයි සරලව මෙතැනදී කෙරෙන්නේ. ඒක සරලව රටට තේරෙන විධියට කරන්න තමයි අපි මූලික වශයෙන් බලාපොරොත්තු වෙන්නේ මේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය හරහා.

ඇත්තටම එයින් අපි බලාපොරොත්තු වෙන්නේ මොනවාද? කාර්මික හා සේවා අංශයේ ඵලදායිතාව ඉහළ දැමීම, ආර්ථික අවස්ථා ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය සේවා සැපයීම වැඩි දියුණු කිරීම, පාලනය හා රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය ඉහළ දැමීම වැනි දේවල් තමයි එයින් බලාපොරොත්තු වන්නේ. මේවා ඍජුවම ආර්ථික වර්ධනයට, ආර්ථිකයේ ප්‍රසාරණයට බලපානවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ජනාධිපතිතුමා රටට පොරොන්දු වුණා මේ දේ කරනවා කියලා. අපි ඒක serious ලෙස අරගෙන තිබෙන්නේ. ඒ නිසා තමයි අමාත්‍යාංශයක් හදලාම ජනාධිපතිතුමා මේ වැඩේට බැහැලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් මොනවාද අරගෙන තිබෙන ක්‍රියාමාර්ග? High-tech and good practices සැලකිල්ලට අරගෙන තිබෙනවා. එහෙම නැත්නම් උසස් තාක්ෂණය සහ යහ භාවිතාව රට ඇතුළට අරගෙන තිබෙනවා, ඉන්දියානු දැනුම, ඉන්දියානු අත්දැකීම් ලබාගෙන SLUDI එක ක්‍රියාත්මක කරන්න. පසුගිය දෙසැම්බර් මාසයේ 31වෙනි දා වෙනකොට ඒකෙන් සියයට 15ක් විතර අවසන් කරලා තිබෙනවා.

ඊළඟ එක තමයි, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. ඒ වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ? දත්ත ආරක්ෂණ අධිකාරියක් - DPA එකක් - පිහිටුවන්න මිලියන 160ක් වෙන් කරලා තිබෙනවා. ඊට පස්සේ GovPay පද්ධති ගොඩ නැඟීම. මේ අමාත්‍යාංශයට පුළුවන් වෙලා තිබෙනවා දෙසැම්බර් 31වන දා වෙනකොට ඒකෙන් සියයට 85ක් වැඩ අවසන් කර ගන්න. සමස්ත ඇස්තමේන්තුවෙන් මිලියන 13,623ක් මේ කථාව ඇතුළේ තිබෙනවා; මේ වුවමනාව ඇතුළේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙවැනි කාරණා හරහා බලාපොරොත්තු වෙන්නේ citizen and human-centric approach එකක් අරගෙන, ඒ මඟින් ආණ්ඩුවේ සේවා සැපයීම මෙහෙයවා ගත යුතු තැනකට අරගෙන එන්නයි. විශේෂයෙන්ම පුරවැසියා මධ්‍යගත කර ගත්ත ක්‍රමයකට. ඒ සඳහා අපට life event-based strategy එකක් පාවිච්චි කරන්න වෙනවා. අපේ ජීවිත ඇතුළේ ඇත්තට සිද්ධවෙන දේවල් digital world එක ඇතුළේ කර ගන්න පුළුවන් වෙන්න ඕනෑකම තිබෙනවා. ඒක තමයි අපේ approach එක බවට පත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපට මේක සරලව කරන්න බැහැ. ඒ සඳහා නෛතික බලයක් හා නියාමනයක් අවශ්‍ය වෙනවා. ඒ නිසා අවශ්‍ය රාමු සැකසීම් කරන්න වෙනවා. අපට මේ කටයුතු බලාත්මක කරලා ක්‍රියාත්මක කර ගන්න නම් personal dataවල ආරක්ෂාව, පෞද්ගලිකත්වයේ ආරක්ෂාව - privacy, digital transactions සඳහා තිබෙන ආරක්ෂාව, online user safety එක, සංවිධාන විසින් වග කිව යුතු ලෙස දත්ත හසුරුවා ගන්න අවශ්‍ය රාමුවක් කියන, මෙන්න මේ නීති සම්පාදනය කර ගන්න ඕනෑ. එනම් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත හරියටම ක්‍රියාත්මක කර ගන්න වෙනවා, ඒ වෙනුවෙන් වැඩ කරන්න වෙනවා, නෛතික ප්‍රතිපාදන හදා ගන්න වෙනවා. ඒ වාගේම තමයි ඩිජිටල් ආරක්ෂණ පනත් කෙටුම්පතේ framework develop කරන්න අමාත්‍යාංශය විධියට නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඇමතිතුමාත් මැදිහත් වෙලා සිටිනවා. මේ ඔක්කෝම හදා ගත්තාට පස්සේ අපි සයිබර් ප්‍රහාරවලින් ආරක්ෂා කර ගන්න ඕනෑ, මේ පද්ධතිය. එය ආරක්ෂා කර ගන්න අවශ්‍ය protocols හදන්න සහ ජාතික ආරක්ෂාව තහවුරු කර ගන්න වැඩ පිළිවෙළට යන්න අවශ්‍යයි.

ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒක තමයි අපේ නෛතික පැත්ත. ඊළඟට, cyber events සඳහා අවශ්‍ය කරන ප්‍රතිචාර දැක්වීම සහ protocols හදන එක මේක ඇතුළේ ක්‍රියාත්මක වෙනවා. උදාහරණයක් විධියට අපේ power grid එක අපි ආරක්ෂා කරගන්න ඕනෑ. අපිට digitize වුණාට පසුව රටේ power grid එකට attack එකක් ආවොත් ඒක වළක්වා ගන්න අපට ක්‍රමයක් තිබෙන්න ඕනෑ; financial and banking system එක ආරක්ෂා කරගන්න අපට ක්‍රමයක් තිබෙන්න ඕනෑ. ඉතින්, මේ වෙනුවෙන් අපේ රාජ්‍ය සේවය - සමස්ත රාජ්‍ය සේවයම - ඵලදායී හා කාර්යක්ෂම කිරීමට බිලියන 15.77ක් වෙන් වෙලා තිබෙනවා.

සමාජවාදය, රාජ්‍ය සේවය, ඩිජිටල්කරණය කියන කාරණා එකට යන්නේ නැහැ වාගේ කථාවක් ටිකකට කලින් අර සිඟිති විවාද කණ්ඩායමේ අය කියනවා මට ඇහුණා. ඒක නිකම් අල කිරි හොදි, නට බෝල්ට් වාගේ කථාවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

ඇත්තටම අපි මේ ඩිජිටල්කරණය කියන කටයුත්ත කරන්නේ ඇයි කියා දන්නවාද? ඒකට හේතු තිබෙනවා. මම ඒකට එක උදාහරණයක් දක්වන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරිත්වය පිළිබඳව 2022 මාර්තු 10 වැනි දින විගණකාධිපතිවරයා ලබා දීපු වාර්තාවෙන් කොටසක් මම දැන් උපුටා දක්වන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "4.1.10 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා පුරාවිද්‍යා සහායකයින් (කම්කරුවන්) 2,271ක් සහ මුරකරුවන් 1,130ක් වශයෙන් සේවකයින් 3,401ක් බඳවා ගැනීමට 2017 ඔක්තෝබර් 17 දින පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දින වනවිට බඳවා ගත් මුළු සේවක සංඛ්‍යාව පුරාවිද්‍යා සහායකයින් (කම්කරුවන්) 713ක් සහ මුරකරුවන් 376ක්ද වශයෙන් එකතුව 1089ක් වූ අතර 2019 සැප්තැම්බර් 30 දින වනවිට පුරාවිද්‍යා සහායකයින් (කම්කරුවන්) 934ක් සහ මුරකරුවන් 553ක්ද වශයෙන් එකතුව 1,487ක්ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් බඳවාගෙන තිබුණි. 2021 පෙබරවාරි මාසය වනවිට ද ඉන් 1,415ක් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙහි සේවයේ යොදවා තිබුණි. රජයේ වෙනත් දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් වෙනුවෙන් වෙනත් රජයේ ආයතනයකට සේවකයින් බඳවා ගැනීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබියදී ඉහත සඳහන් පරිදි පුරාවිද්‍යා

දෙපාර්තමේන්තුව සඳහා පුරාවිද්‍යා සහායකයින් (කම්කරුවන්) සහ මුරකරුවන් වශයෙන් සේවකයින් බඳවා ගෙන 2018 වර්ෂය සඳහා රුපියල් 479,356,993ක් සහ 2019 දෙසැම්බර් 31 දිනට රුපියල් 581,773,108ක් අරමුදල විසින් වැටුප් ගෙවා තිබුණි."

මේ කවුද? අන්න අර සිහිනි විවාද කණ්ඩායමේ උස නම් සිකියුරිටි, මිටිනම් කම්කරු කියපු කට්ටියගේ කෙරුවාව තමයි මේ. මෙන්න මේ වාගේ තක්කඩිකම් නවත්වන්න, මේ වාගේ හොරකම් නවත්වන්න තමයි රාජ්‍ය සේවය තුළට ඩිජිටල්කරණය එන්නේ. අපි ඒක බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

මේ සඳහා ලෝකයේ ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. බාර්සිලෝනා ගන්න. බාර්සිලෝනා නගරය smart city එකක්. ඒ අය නාගරික අභියෝග ජය ගන්න, දේශගුණික විපර්යාස, බලශක්ති අර්බුදය, තිරසර සංචරණය වැනි කාරණා වෙනුවෙන් ඩිජිටල්කරණය භාවිත කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම කථාව අවසන් කරන්නම්. ඒගොල්ලන් පාවිච්චි කළේ Twitter feed එක. Twitter feed එක පාවිච්චි කරලා ඒගොල්ලන් බැලුවා public transportation එක revamp කරන්නේ කොහොමද, parking හදන්නේ කොහොමද, වීථි ආලෝකකරණය - street lighting - කරන්නේ කොහොමද, කසළ කළමනාකරණය - waste management - කරන්නේ කොහොමද කියලා. එහෙම බලලා, big data මත පදනම් වෙලා digital transformation එකට ගියා. එහෙම ගිහිල්ලා ඒගොල්ලන් මොනවාද කරගත්තේ? Cost එක effective විධියට manage කළා; වියදම් අඩු කරගත්තා; ජීවිතවල ගුණාත්මකභාවය - quality of life - වැඩි කරගත්තා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එහෙම කරලා ඒගොල්ලන්ගේ රට නව තාක්ෂණික පරිණාමයේ මධ්‍යස්ථානයක් බවට පත් කරගත්තා. අපිටත් තිබෙන්නේ එතැනට යන්නයි. ගරු අමාත්‍යතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, අපේ ආණ්ඩුවත් මේ මැදිහත්වෙමින් තිබෙන්නේ අන්න ඒ කාරණයට. ඒ නිසා ඔය සිහිනි විවාද කණ්ඩායම්වල සාමාජිකයෝ කියන කථාවලට ජනතාව බය වෙන්න ඕනෑ නැහැ. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 24ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.12]

ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ස්තුතියි. අද දින ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 186 හා 227 පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී පිළිතුරු කථාව කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ අමාත්‍යාංශය සම්බන්ධ ප්‍රධාන කථාවට එන්න ප්‍රථම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගෙන් නැගුණු චෝදනා සහ යෝජනා පිළිබඳව මම පොඩි විග්‍රහයක් කරන්න කැමැතියි.

විපක්ෂය පැත්තෙන් ප්‍රධාන වශයෙන්ම මතු වුණා, digital ID එක ගැන කථාවක්. සමහරු කියනවා, digital ID ලංකාවට අවශ්‍යයි; අපි හරියට, නිවැරදිව අපේ පුරවැසියන් හඳුනා ගන්න අවශ්‍යයි; දූෂණ, වංචා වාගේ දේවල් නැති කරන්න එය අවශ්‍යයි කියා. නමුත් digital ID එක හරහා පුරවැසියන්ගේ අයිතිවාසිකම් නැති වෙන්න පුළුවන්, data කොල්ල කන්න පුළුවන්, data විකුණන්න පුළුවන්, ඉන්දියාවට data යනවා කියලා තවත් සමහරු මේ පාර්ලිමේන්තුව තුළ අභූත චෝදනා නැඟුවා; එවැනි තත්ත්වයකුත් උද්ගත වුණා.

මම දකින විධියට, මේකට ප්‍රධාන වශයෙන්ම හේතු වෙන්නේ මොවුන්ගේ නොදැනුවත්කමයි. මොකද, මේක තාක්ෂණික කාරණයක්. මේ digital ID කියන්නේ මොකක්ද කියන එක ගැනත්, එය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක දැන ගැනීමටත් යම් කිසි තාක්ෂණික අවබෝධයක් වාගේම මෙය සිදු වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව අවබෝධයක් ගන්නත් උනන්දුවක් තිබෙන්න ඕනෑ. මොකද, මේ digital ID එක නුසුදුසුයි කියන කිසිම කෙනෙක් අපේ ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට ඇවිල්ලාත් නැහැ. ඒ වාගේම අපි ඊයේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට අදාළව workshop එකක් කළා. විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඒකට ඇවිල්ලා හිටියා. ඒ අයගෙන් හොඳ අදහස් හා යෝජනා ආවා. ඒ එකකටවත් එන්නේ නැතිව, තාක්ෂණිකව කිසිම දැනීමක් නැතිව මෙතැනට ඇවිල්ලා බොරුවට කථා කරනවා තමයි මම දැක්කේ. ඒ කරුණ හරහා සමාජයට වැරදි අවබෝධයක් ඇති කරන්නත්, ඔවුන් බිය ගන්වන්නත්, ප්‍රධාන වශයෙන් පටු දේශපාලන අරමුණු ඉටු කර ගන්නත් ගන්නා උත්සාහයක් විධියට තමයි මම මෙය දකින්නේ.

මේ ගරු සභාවේ සිටින සමහර මන්ත්‍රීවරු කිව්වා, ඒ අයගේ ආණ්ඩුව කාලයේ ඒ අය මේක කරන්න උත්සාහ කළා, නමුත් කර ගන්න බැරි වුණා කියලා. ඒ නිසා එතුමන්ලා කියනවා, අපිට හෝ මේක හරියට කරන්න කියලා. මොකද, එතුමන්ලා උත්සාහ කළ අවස්ථාවලදී සමහරු කකුලෙන් ඇද්දා, එක එක රාජ්‍ය ආයතන භාර එක එක ඇමතිවරු මේක කරන්න දුන්නේ නැහැ කියලා තමයි ඒ අය කියන්නේ. ඒ නිසා මේ ඩිජිටල්කරණය රටට අවශ්‍යයි. අපට කරන්න පුළුවන්. මොකද, මම දකින විධියට එතුමන්ලාත් පිළිගන්නවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන් විතරයි මේක කරන්න පුළුවන් කියලා. මේ සිටින කණ්ඩායම එකාවන්ව, එක අරමුණක් කරා වැඩ කරන කණ්ඩායමක්. අපි දන්නවා මේ ආණ්ඩුව හොඳ නායකත්වයක් යටතේ තමයි තිබෙන්නේ කියලා. එතකොට රජයේ ඒ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න පුළුවන් කියලා සියලු දෙනාටම විශ්වාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය කරන්න පුළුවන් අපේ ආණ්ඩුවට විතරයි. හැම අමාත්‍යාංශයක්ම බලාපොරොත්තු වෙනවා මේ ඩිජිටල්කරණය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය හරහා, ඒ නායකත්වය හරහා සිද්ධ වෙන්න ඕනෑ බව. ඒක අනෙකුත් අමාත්‍යාංශත්, අනෙකුත් ආයතනත් පිළිගන්නා කාරණයක්. නමුත්, මම පොඩ්ඩක් සඳහන් කරන්න ඕනෑ biometric data ගැන. මේ ගැන විවිධ විධියට කියන්න ගත්තා. ඒ biometric data නැති වෙන්න පුළුවන්, ඒවා කවුරුන් හරි hack කරලා ගන්න පුළුවන්, ඒවා ගන්න ඉන්දියාවට access තිබෙනවා, ඒ වාගේම ආණ්ඩුවට පුළුවන් biometric data පාවිච්චි කරලා එක එක කට්ටියව වැරදිවලට හසු කරන්න කියලා ලොකු චෝදනාවක් ආවා. ඒක තනිකරම තාක්ෂණය දන්නේ

[ගරු එරංග වීරරත්න මහතා]

නැතිකමෙන් කරන අභූත චෝදනාවක්. මේ biometrics කියන්නේ මොකක්ද? උදාහරණයක් විධියට fingerprint එක ගත්තොත්, fingerprint එක දුන්නාට පස්සේ ඒක database එකේ save වෙන්නේ hash code එකක් විධියටයි. ඒක එක පැත්තකට විතරක් ක්‍රියාත්මක කරන්න පුළුවන් කේතයක් හරහා ගිහිල්ලා ඒ කේතය තමයි අන්තිමට database එකේ ලියැවෙන්නේ. ඒ කේතය කිසිම ලෙසකින් ආපස්සට හරවලා fingerprint එක හදන්න බැහැ. ඉතින්, මේක අපි එළියේ කොච්චර කියලා තිබුණත්, කොච්චර කට්ටිය පිළිගත්තත්, සමහර විට අද කථා කරපු සමහර මන්ත්‍රීවරුන්ගේ ඔළුවට යන්නේ නැතිව ඇති. මොකද, ඒ මන්ත්‍රීවරුන්ගේ මොළයේ ප්‍රමාණය ඒ අනුව හිතා ගන්න පුළුවන්. ඒ නිසා, මම පොඩි කාලයේ පාසලේ දී ඉගෙන ගත්ත පොඩි උදාහරණයකින් ඒක පැහැදිලි කළොත් ඒ අයගේ ඔළුවට යයි කියලා මම හිතනවා. අපි උදාහරණයක් විධියට සැමන් ටින් මාළු ගනිමු. මැෂින් එකක් තිබෙනවා. ඒකට සැමන් මත්ස්‍යයා දැම්මාට පස්සේ කැපිලා-කෙටිලා, අනෙක් පැත්තෙන් සැමන් ටින් එකක් එළියට එනවා. නමුත්, කවුරුන් හෝ සැමන් ටින් එක හොරෙන් අරගෙන ගිහිල්ලා මේකෙන් සැමන් මත්ස්‍යයා හදන්න පුළුවන් කියලා ඒකට උත්සාහ ගත්තොත්, ඔහුට කවදාවත් සැමන් මත්ස්‍යයා හදන්න බැහැ. මොකද, සැමන් ටින් එක ඇතුළේ ඉන්නේ එකම මත්ස්‍යයෙක් නොවෙයි. ඒ මත්ස්‍යයෝ ගොඩකගේ කැලි එක ටින් එකක තිබෙන්න පුළුවන්. ඒ නිසා කිසිම විධියකින් නැවතත් සැමන් මත්ස්‍යයෙක් හදන්න බැහැ. අන්න, ඒ වාගේ තමයි මේ ඩිජිටල්කරණයේදී biometricsවලට ගිහිල්ලා, අන්තිමට database එකේ save වන hash code එක. ඒ නිසා මේක ආපස්සට අරගෙන fingerprint එකක්වත්, මුහුණේ හැඩරුවවත්, ඒ වාගේම iris scan එකක්වත් හදන්න බැහැ. එහෙම හදලා වැරදි දෙයකට පාවිච්චි කරන්නත් බැහැ.

මම මේ කිව්වේ data leak එකක් වුණත් ඇතිවන තත්ත්වයයි. නමුත්, අපේ අමාත්‍යාංශයෙන් සහ අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන Sri Lanka CERT ආයතනය හරහා අපි බලාපොරොත්තු වෙනවා, උපරිම වශයෙන් security implement කරලා මේ සඳහා හොඳ ආරක්ෂිත පද්ධතියක් ලබා දෙන්න. ඒ අනුව මේ පද්ධතියේ data කවදාවත් එළියට නොයන්න අපි වගබලා ගන්නවා. ඒ සඳහා හැම උත්සාහයක්ම, හැම පියවරක්ම අපි ගන්නවා. සමහර වෙලාවට කියනවා නේ, websites hack කරනවා කියලා. ඒ අනුව සමහරුන් උපකල්පනය කරනවා, මේ පද්ධතියත් hack කරන්න පුළුවන් කියලා. ඇත්තටම මෙතැනදී රජයට ලොකු ගැටලුවක් තිබෙනවා. Sri Lanka CERT ආයතනයට, security වාගේ දේවලට රජයේ අනෙක් ආයතනවලට උපදේශන සේවා සපයන්න පුළුවන් වුණාට, ඒවා බලාත්මක කරන්න - enforce කරන්න - බැහැ. මොකද, ඒ ආයතනය හදලා තිබෙන නීති රාමුව අනුව ඒ ආයතනයට කරන්න පුළුවන් වෙන්නේ උපදෙස් දීම පමණයි. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, ඉන් ඔබ්බට ගිහිල්ලා ඒක බලාත්මක කරන්න. අනෙක් ආයතන මොකක් හරි ඩිජිටල් කාර්යයක් කරනවා නම්, අනිවාර්යයෙන්ම මේ කියන security methods implement වෙන්න ඕනෑ, මේ measures ගන්න ඕනෑ කියන එක ensure කරන්න අපි Cyber Security Bill එකක් ගේන්නත් බලාපොරොත්තු වෙනවා. ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, website එකක වුණත් හැම security feature එකක්ම කවදාවත් hack නොවී implement කරන්නයි. අන්න ඒ වාගේ සුබදායී වෙනස්කම් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට කථා කළා, Madras Security Printers ගැන. අපි දන්නවා, පසුගිය රජයකින් මේ Madras Security Printers කියන ආයතනයට අපේ digital ID එක හදන ව්‍යාපෘතිය දෙන්න හදපු බව. ඒක දෙන්න හැදුවේ පසුගිය රජයක්. ඒ කියන්නේ, ලංකා රජයක් තමයි එය දෙන්න හැදුවේ. ඉන්දියානු Aadhaar ක්‍රමය හරහා අපට එන digital ID එකට මේකේ කිසිම විධියක සම්බන්ධයක් නැහැ. මොකද, ඒක ලංකා රජයෙන් කරන්න හදපු project award එකක්. ඒ නිසා මේකේ කිසිම සම්බන්ධයක් නැහැ. ඒ ඔක්කෝම බොරු බිල්ලෙක් මවාපාන්න ගන්නා උත්සාහයන්. ඉතින් ඔන්න ඔය වාගේ දේවල් තමයි, digital ID එක ගැන කථා කරන්න තිබෙන්නේ.

ඊළඟට මම තව කාරණයක් සඳහන් කරන්න කැමැතියි. උදේම කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, අපේ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ඉතාම හොඳයි කියලා. ඒ ප්‍රතිපත්ති හදන්න මුල් වෙච්ච කෙනෙක් විධියට මම බොහෝ සතුටු වෙනවා, ඒ කථාව අහන්න. මොකද, අපේ ප්‍රතිපත්ති ඉතාම හොඳින් අපි නිර්මාණය කර තිබෙනවා. අපි සෑහෙන්න සාකච්ඡා තියලා, සෑහෙන්න පර්යේෂණ කරලා අවුරුදු ගණනාවක් තිස්සේ ගත් උත්සාහයක ප්‍රතිඵලයක් තමයි ජාතික ජන බලවේගයේ ආර්ථික ප්‍රතිපත්තිය. එතුමා කිව්වා, අපේ ප්‍රතිපත්ති තිබුණාට ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ කියලා. නමුත් එතුමා දන්නේ නැහැ, වර්ෂ 5ක ප්‍රතිපත්තියක් තමයි අපි එළිදක්වා තිබෙන්නේ කියලා. ඒක මාස 3කින් implement කරලා ඉවර කරන්න පුළුවන් ප්‍රතිපත්තියක් නොවෙයි. ඒක, එක එක targets දීලා වර්ෂ 5ක් දක්වා අපි ක්‍රමානුකූලව implement කරන ප්‍රතිපත්තියක්. ඒක ක්‍රියාත්මක කරන්න අපි බැඳී සිටිනවා. ඒ වැඩ පිළිවෙළෙහි ඩිජිටල් යටිතල පහසුකම් කියන එක ප්‍රධාන අංගයක් වෙනවා. එහිදී digital ID එකට අපි ප්‍රමුඛස්ථානයක් දෙනවා. ඒ නිසා මම අවධාරණයෙන් කියන්න කැමැතියි, මෙහෙම බොරු ප්‍රචාර දීලා මේ project එක නවත්වන්න බැහැ, ජනතාවට මේ project එක ගැන හරි අවබෝධයක් ලබා දෙන්න අපට ගන්න පුළුවන් සියලුම පියවර අපි ගන්නවා කියන එක. එක එක්කෙනාගේ පටු දේශපාලන අරමුණු උදෙසා ජනතාව නොමඟ යවලා මේ කරන ඩිජිටල් වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න අපි කිසිවිටෙක කාටවත් අවස්ථාව දෙන්නේ නැහැ.

සමහරුන් කිව්වා, ඩිජිටල්කරණය හරියට කරන්න බැහැ, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ structure එක හොඳ මදි කියලා. මොකද, ඔවුන් කියන්නේත් ඒ දවස්වල ඔවුන් කරන්න හදපු එක එක ඩිජිටල් ක්‍රියාකාරකම්වලට එක එක්කෙනා කකුලෙන් ඇද්දා, කරන්න දුන්නේ නැහැ, ඒ නිසා මේ හැම අමාත්‍යාංශයකටම වඩා ඉහළින් ඉන්න පුද්ගලයෙක් හරහා තමයි මේ කටයුත්ත සිද්ධ වෙන්න ඕනෑ කියලා. නමුත් ඔවුන් සියලුදෙනාම අමතක කර තිබෙනවා, මේ අමාත්‍යාංශයේ අමාත්‍යතුමා විධියට ඉන්නේ ජනාධිපතිතුමා බව. එතුමා ඉන්නේ හැම අමාත්‍යාංශයකම ඉන්න අමාත්‍යතුමන්ලා සහ අමාත්‍යතුමියලාට වඩා ඉහළ මට්ටමක. ඒ තිබෙන බල අධිකාරයත් එක්කම තමයි මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක වන්නේ.

ඒ වාගේම ඔවුන් අමතක කරලා තිබෙනවා, මේ ජාතික ජන බලවේගයයි කියන එක. මේක සජබයවත්, UNP එකවත්, පොහොට්ටුවවත් නොවෙයි, මේ ජාතික ජන බලවේගය. අපි ජාතික ප්‍රතිපත්තියක් අනුව එකට වැඩ කරන කණ්ඩායමක්. අනෙක් සියලු අමාත්‍යවරුන් අපේ අමාත්‍යාංශය මූලික කරගෙන එම අමාත්‍යාංශවල කටයුතු ඩිජිටල් කිරීමේ කාර්යය සිදු කරනවා. ඒ නිසා එතුමන්ලා ඔය හිතන විධියේ කකුලෙන් ඇදීමක්වත්, කොකු දැමීමක්වත්, "මේක මගේ, එම නිසා මේවාට ඇඟිලි ගහන්න ඔබතුමන්ලා එන්න එපා" කියන විධියේ වාතාවරණයක්වත් නොවෙයි මෙතැන තිබෙන්නේ. එතුමන්ලාගේ අත්දැකීම් අනුව එහෙම හිතුවාට ඒක අපට එච්චර අදාළ වන්නේත් නැහැ.

අනෙක් කාරණය මෙයයි. අපි දැන් digital ID එක හදනකොට ඒකට PVC card එකක් නොගෙන polycarbonate

card එකක් ගන්නේ ඇයි කියලා සමහර මන්ත්‍රීවරුන් ප්‍රශ්න කළා. මම හිතන විධියට, ඔවුන් එම ප්‍රශ්නය විමසුවේ ඇත්තටම අපට ඒ සම්බන්ධව අදහසක් දෙන්න වෙන්න පුළුවන්. නමුත් එහිදී අපි බලන්න ඕනෑ, කල් පැවැත්ම පිළිබඳව. ID එක විධියට PVC card එකක් යොදා ගැනීමට මීට අවුරුදු කිහිපයකට පෙරත් උත්සාහ අරගෙන තිබෙනවා. ඇත්තටම PVC card එකක ආයු කාලය තිබෙන්නේ වසර දෙකක් විතර වාගේයි. වසර දෙකක් ඇතුළත එය fade වෙලා, කැඩිලා බිඳිලා යනවා. හැමදෙනාටම PVC card එකක් දුන්නොත් අපට සිදු වෙනවා, අවුරුදු දෙකක් පාසා IDs මාරු කරන්න. එම නිසා අපි polycarbonate card එකක් දෙනවා. නමුත්, අපි digital ID එකට යනකොට, මේ රටේ සියලුදෙනාගේ IDs අලුතෙන්ම digital ID එකක් බවට පරිවර්තනය කරනකොට, physical card එකක් විධියට ගැනීමේ අවශ්‍යතාව නැති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. දැනට යම් පුද්ගලයෙකුට ID එකක් තිබෙනවා නම්, ඔහු කැමැති නම් දිගටම එම IDම එක පාවිච්චි කරන්න, ඔහුට digital ID එකක් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ලබා දෙනවා. නමුත්, ඔහුට තිබෙන plastic ID card එක මාරු කරන්න අවශ්‍ය නැහැ. ඒක ඒ විධියටම ඔහුට දිගටම පාවිච්චි කරන්න පුළුවන්. නමුත්, අලුතෙන් ID එකක් ගන්න හැම කෙනෙකුටම අපි digital ID එකක් දෙනවා, plastic ID card එකක් විධියට. මේ අනුව මාස හයක් වැනි කාලයක් ඇතුළත digital ID එක introduce කරන්න අපි බලාපොරොත්තු වෙනවා. හැබැයි, අපි digital ID එකක් හඳුන්වා දුන්නාට මේ රටේ තිබෙන අනෙකුත් ආයතනවල systems හැදිලා නැහැ, digital ID එකක් digital විධියටම පිළිගන්න සහ authenticate කරන්න. ඔවුන්ට තවමත් අවශ්‍ය ID එකේ තිබෙන photograph එක සහ එන පුද්ගලයාගේ මුහුණ බලලා verification එක කරන්න. ඒ තත්ත්වය වෙනස් වෙලා වාතාවරණය හැදෙන තෙක් අපට interim period එකක් අවශ්‍ය වෙයි, plastic ID card එකයි, digital ID එකයි දෙකම parallelly පාවිච්චි කරන්න. නුදුරු අනාගතයේදී digital ID එක දුන්නාට පස්සේ අපට plastic ID card එක ඉවත් කරලා තනිකරම digital ID එක පාවිච්චි කරන්න පුළුවන් වෙයි. එය තමන්ගේ mobile phone එකේ DigiLocker කියන App එකක් හරහා save කරලා තියාගන්න පුළුවන්. මේ අනුව තනිකරම digital ID එකකට අපට යන්න පුළුවන් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒකට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් හදන්න අපේ අමාත්‍යාංශය මේ දවස්වල කටයුතු සූදානම් කරමින් ඉන්නේ.

මම තව එක කාරණයක් විතරක් සඳහන් කරන්න කැමැතියි. චෝදනාවක් කළා, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධාන ඩිජිටල් උපදේශක Dr. Hans Wijayasuriya ගැන. ඔවුන් කිව්වා, CD හදන ප්‍රශ්නයක් ගැන. ඇත්තටම ඒ කියන චෝදනා සියල්ලක්ම අසත්‍යයක්. එම ආයතනය CDs retrieve කරලා ඒ අවශ්‍ය නීති ක්‍රියාත්මක කරන්න ආයතනවලට ලබා දීලා තිබෙනවා. AG's Department එකේත් සඳහන් වනවා, CD එකක් දුන්නා කියලා. එම නිසා ඒ කියන චෝදනා සත්‍ය නොවෙයි. අවුරුදු හයකට පමණ පෙර වූ CD ප්‍රමාදයක් ගැන තමයි ඔය investigation එක කෙරිලා තිබෙන්නේ. ඒ CDs retrieve කරන්න යම්කිසි කාලයක් ගත වෙලා තිබෙනවා. මොකද, ඒ කියන CDs retrieve කරන්න tape recorders වාගේ ඒවා අලුතෙන් ලබා ගැනීමක් වෙලා තිබෙනවා.

ඒ හරහා වෙච්ච delay එකක් මිසක් මේ CDs ලබා දීමේ ගැටලුවක් තිබිලා නැහැ. ඒක කිව්ව මන්ත්‍රීතුමාට අවශ්‍ය නම් ඒ ගැන AG's Department එකෙන් තවදුරටත් විස්තර දැනගන්න පුළුවන්. මට අය වැය විවාදයේදී කථා කරන්න තිබෙන කාලය ඔය අභූත චෝදනාවලට පිළිතුරු දීම සඳහා මිඩංගු කරන්න මම තවදුරටත් බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ නිසා මම, මගේ ප්‍රධාන කථාවට ප්‍රවිෂ්ට වෙන්නම්.

මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මහජන හිතෛෂී ආණ්ඩුවක් විධියට, මහ ජනතාවට වග කියන රජයක් විධියට, කඩිනම් සංවර්ධනයක් කරා මේ රට මෙහෙයවීමේදී, ඩිජිටල්කරණයට ප්‍රමුඛ ස්ථානයක් ලබා දීලා තිබෙනවා. එහිදී අපි රාජ්‍ය සහ පෞද්ගලික යන දෙපාර්ශ්වයේම කාර්යක්ෂමතාව වැඩි කරන්න, ධාරිතාව වැඩි කරන්න, නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි කරන්න, වියදම් හා නාස්තිය අවම කරන්න, දත්ත මත පදනම්ව තීරණ ගැනීම, නිලධාරිවාදය නැති කිරීම හා දූෂණ, වංචා අවම කිරීමේ හැකියාව ඇති කිරීම කියන කාරණා ඩිජිටල්කරණයෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, වෙන කිසිම දෙයක් අපි ක්‍රියාත්මක නොකළත්, ඩිජිටල්කරණයෙන්ම පමණක් අපේ ආර්ථිකය සියයට 1ත්, 3ත් අතර ප්‍රමාණයකින් ප්‍රසාරණය කරන්න අපිට පුළුවන්. මොකද, අපි දන්නවා, අපේ රටේ මේ ඩිජිටල්කරණය නැතිවීම නිසා ගොඩක් මිනිසුන් රාජ්‍ය සේවා ලබා ගන්න සෑහෙන වෙලාවක් පෝලිම්වල සිටින බව. ඒ වාගේම, මිනිසුන් සෑහෙන කාලයක් පෝලිම්වල ඉන්න වෙලාව නාස්ති කරනවා. එමෙන්ම දවස් කිහිපයක් ඇවිල්ලා කාර්යාල කිහිපයක වේලාව ගත කරනවා. ඒ වාගේම, ඒකෙන් අපේ වේලාව සහ සම්පත් නාස්ති කිරීමක් වෙනවා. ඩිජිටල්කරණය හරහා ඒ සියල්ල අපිට නැති කර ගන්න පුළුවන්. ඒ නිසා අපේ ගරු ජනාධිපතිතුමා මේ රට දියුණු කරන්න හදන ප්‍රධාන කාරණා තුනෙන්, එක කාරණයක් බවට ඩිජිටල්කරණය පත් වෙනවා. එම නිසා ඒ කර්තව්‍යය කැපවීමෙන්ම කරන්න අපි මේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය හදලා තිබෙනවා.

ඩිජිටල්කරණය අපි මූලධර්ම පහක් ඔස්සේ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඉන් පළමුවන මූලධර්මය තමයි, ඩිජිටල් රාජ්‍යකරණය. ඒ යටතේ රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය සේවා ඩිජිටල්කරණයට පරිවර්තනය කරලා, ඒවායේ කාර්යක්ෂමතාව වැඩි කරන්න, කඩදාසි රහිත, නිලධාරිවාදය අඩු, විනිවිදභාවයෙන් යුතු සහ සෑම පුරවැසියෙකුටම එක සේ ප්‍රවිෂ්ට විය හැකි රාජ්‍ය සේවා සැපයීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ මඟින් අපි බලාපොරොත්තු වෙනවා, රජය සහ ජනතාව අතර තිබෙන අන්තර් ක්‍රියාකාරකම් පහසු කරන්නත්, ජනතාවට විනිවිදභාවයෙන් යුතුව සේවා ලබා ගැනීමට හැකියාව ඇති කිරීමටත්.

දෙවන මූලධර්මය තමයි, ඩිජිටල් කර්මාන්තය. අපි දන්නවා, නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය පෝෂණය කිරීම තුළින් තොරතුරු, සේවා, මෘදුකාංග සංවර්ධනය සහ ඩිජිටල් අළෙවිකරණය හා රැකියා නිර්මාණය කිරීම තුළින් අපේ රටට විශාල වශයෙන් විදේශ විනිමය ගෙන එන්න මේ ඩිජිටල් කර්මාන්ත හරහා අපිට පුළුවන් බව. දැනට ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක වාගේ විදේශ විනිමයක් අපි මේ කර්මාන්තය හරහා උපයා ගන්නවා. ඒක අපි ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් දක්වා වර්ධනය කරන්න සැලසුම් සකස් කරමින් යනවා. එහිදී අපිට අවශ්‍ය වෙනවා, නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය ඇති කරන්න. අපි දන්නවා, අපේ රටේ නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වයට අවශ්‍ය වාතාවරණය හැදිලා තිබෙන ප්‍රමාණය ඉතා අඩු බව. රාජ්‍ය අනුග්‍රහය සහිතව පෞද්ගලික අංශය, ලෝක බැංකුව, IFC වාගේ ආයතන එකතු කරගෙන, රුපියල් මිලියන 50ක fund of funds, ඒ කියන්නේ අරමුදල්වල අරමුදලක් ඇති කිරීම හරහා ඒ අලුතින් එන අපේ product innovations, ideas, entrepreneurships වර්ධනය කර ගන්නේ කොහොමද කියන එක බලන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, digital freelancersලා ගැන ඉස්සෙල්ලාත් අදහස් ඉදිරිපත් වුණා. මේ freelancersලා ලංකාව වෙනම පිරිසක් විධියට හඳුනාගෙන නොතිබුණත්, ඔවුන් විශාල වශයෙන් ලංකාවට ඇමෙරිකානු ඩොලර් ගෙනෙන කණ්ඩායමක්. අපි ඔවුන්ව

[ගරු එරංග වීරරත්න මහතා]

ලියාපදිංචි කරලා, ඔවුන්ගේ ආදායමට සරිලන විධියට බැංකු ණය වැනි මූල්‍යමය අවශ්‍යතා ලබා දීම සඳහා ක්‍රමවේදයක් හදන්නේ කොහොමද කියන එක පිළිබඳවත් මේ දවස්වල සලකා බලමින් ඉන්නවා.

තුන්වන මූලධර්මය තමයි, ඩිජිටල් ආර්ථිකය. ඒ කියන්නේ, digital payments, e-commerce සහ fintech මූල්‍ය තාක්ෂණයන් භාවිත කරගෙන කරන ගනුදෙනු තමයි ඩිජිටල් ආර්ථිකයට එන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, දැනට තිබෙන ඇමෙරිකානු ඩොලර් බිලියන 3.45, ඇමෙරිකානු ඩොලර් බිලියන 15 දක්වා වර්ධනය කරන්න.

ඇත්තටම ඩිජිටල් ආර්ථිකය ගත්තාම එය අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5ක වාගේ ඉතා අවම ප්‍රමාණයක තමයි මේ අවස්ථාව වනවිට තිබෙන්නේ. දියුණු රටක් ගත්තාම, ඒ ප්‍රමාණය සියයට 30ක්, 40ක් වාගේ ලොකු අගයක් ගන්නවා. නමුත් අපි ඉතා අඩු අගයකයි ඉන්නේ. ඩිජිටල් ආර්ථිකය ඩොලර් මිලියන 15ක් දක්වා වර්ධනය කරගන්න පුළුවන් නම් එය අපේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 12ක වාගේ ප්‍රමාණයක් දක්වා වැඩි කරගන්න පුළුවන්. අපි ළඟදී GovPay කියන සේවාව launch කළා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, LANKAQR කියන payment system එකත් පාවිච්චි කරලා ඉතා කඩිනම් විධියට digital paymentsවලට ගිහිල්ලා පාර අයිනේ තිබෙන පොඩි කඩේකට වුණත් ඩිජිටල් මාධ්‍ය හරහා ගෙවීම කරන්න. අපි digital paymentsවලට යන්න ඕනෑ. මොකද, මේ රටේ රුපියල් ට්‍රිලියන 1.5කට ආසන්න ප්‍රමාණයක් මුදල් විධියට ගැවසෙනවා. අඩුම තරමින් මේ මුදල්වලින් 1/3ක් අපේ financial system එකට ගේන්න අපිට පුළුවන් නම් ඒ මුදල් රජයේ සහ පෞද්ගලික අංශවල ආයෝජනය කරන්න පුළුවන් වෙනවා. ඒ හරහා අපිට ඇත්තටම ආර්ථික වර්ධනය තවත් වැඩි කරන්න පුළුවන්. ඒ වාගේම, මුදල් සංසරණය සම්බන්ධයෙන් අපේ රජයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.25ක වාගේ ප්‍රමාණයක වියදමක් තිබෙනවා. මොකද, අලුත් මුදල් නෝට්ටු print කරන්න, පරණ මුදල් නෝට්ටු ආපහු අරගෙන අලුත් නෝට්ටු දෙන්න කියන system එකට සෑහෙන වියදමක් යනවා. මුදල් නෝට්ටු විධියට පාවිච්චි කරන එක අඩු කරන්න අපිට පුළුවන් නම් ඒවාත් රජයට ඉතිරියක් වෙනවා. එතකොට අපිට පුළුවන්, ඒ මුදල් අපේ අනෙක් ආර්ථික කටයුතුවලට යොදවන්න.

හතරවන මූලධර්මය තමයි, උපාය මාර්ගික කර්මාන්තය. ඒ කියන්නේ, ඩිජිටල්කරණය හරහා කෘෂි, සංචාරක, ධීවර හා නිෂ්පාදන කර්මාන්තය යන ඒවායේ ඵලදායීතාව වැඩි කරන්නේ කොහොමද කියන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

ගරු එරංග වීරරත්න මහතා
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මම තව තත්පර කීපයකින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

පස්වන මූලධර්මය තමයි, ඩිජිටල් ශ්‍රම බලකාය වර්ධනය කිරීම. අපට දැනට ඉන්න 85,000ක විතර ඩිජිටල් ශ්‍රම බලකාය ලක්ෂ 2ක් දක්වා වර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. රාජ්‍ය සහ පෞද්ගලික කියන අංශ දෙකේම අධ්‍යාපන ආයතනත් එක්ක එකතු වෙලා රටට සහ ලෝකයට අවශ්‍ය ඩිජිටල් තාක්ෂණික ඉංජිනේරුවන් හදන්නේ කොහොමද කියන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හරහා අපි බලාපොරොත්තු වෙනවා, දැනට ඉන්න ඉංජිනේරුවන්ගේ දැනුම, හැකියාව වර්ධනය කිරීමට සහ අලුතින් එන ඉංජිනේරුවන් වැඩදායී සහ ඉතාම high-value tech entrepreneur level එකට ගෙනියන්න. මෙවැනි දැවැන්ත ඩිජිටල්කරණයක් හරහා රටේ අනාගතය සුබ පැත්තට ගෙනියන්න අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.03]

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. අපේ හිතවත් නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මේ විවාදය තුළ මන්ත්‍රීවරුන්ට කථා කරන්නත් හරිම අපහසු තත්ත්වයක් තිබෙන්නේ. මොකද, මේ ආණ්ඩුව මැතිවරණ කොමිසමට බලපෑම් කරලා අය වැය විවාදය පැවැත්වෙන කාලයේදීම නාම යෝජනා භාරදීමත් කැඳවා තිබෙන නිසා මන්ත්‍රීවරු ඉතාම අමාරුවෙන් තමයි පාර්ලිමේන්තුවටත් ඇවිල්ලා කථා කරන්නේ. මම අද පාර්ලිමේන්තුවේ ඉන්නවා; හෙට ඉන්නවා; අනිද්දා ඉන්න වෙන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ජනතාවගේ ඡන්දයෙන් තේරී පත්වෙලා ඇවිල්ලා ජනතාවගේ වරම අපිට හරියට ඉෂ්ට කරන්න බැරි වෙන ආකාරයෙන් මේ ක්‍රියා කලාපය සිදුවීම ඉතාම අවාසනාවන්තයි.

අනාගතයේදී මේ රටේ ආර්ථිකය ගොඩනැඟීම පිළිබඳව විශාල වගකීමක් තිබෙන අමාත්‍යාංශයක් තමයි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය. ඒකට හේතුව මෙයයි. අපි දකුණු ඉන්දියාව ගත්තොත්, දකුණු ඉන්දියාවේ ප්‍රාන්ත - southern states - විශාල ප්‍රමාණයක් තිබෙනවා. බැංගලෝර් ගත්තොත් තනිකර IT ක්ෂේත්‍රයෙන් තමයි ඒවායේ ආර්ථිකය ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ. මම නම් හිතන්නේ අපි අවුරුදු 10ක්, 15ක්, 20ක් විතර පරක්කුයි කියායි. We are catching up; we have a lot of catching up to do because we have missed the bus.

හැබැයි, IT ක්ෂේත්‍රය හරහා ඉදිරියේදී රටේ ආර්ථිකය ගොඩනඟන්න පුළුවන් යටිතල පහසුකම් මේ ආණ්ඩුව මැදිහත් වෙලා හදලා දෙයි කියන බලාපොරොත්තුව මත විශාල පිරිසක් මේ ආණ්ඩුවට ඡන්දය දුන්නා. නමුත්, මේ පළමුවැනි මාස කීපය ඇතුළත අපට දැකගන්න තිබෙනවා, මේ ආණ්ඩුව IT ක්ෂේත්‍රය තුළ ඉන්න ඉතාම බිම් මට්ටමේ, නැත්නම් පහළ මට්ටමේ කණ්ඩායමට තමයි පහරදීලා තිබෙන්නේ කියලා.

ඇත්ත වශයෙන්ම දිගින් දිගටම අපේ ප්‍රතිපත්තිය නම්, රටක ආර්ථිකය හදන්න බදු පැනවීම අවශ්‍යයි, රටේ ආදායම වැඩි කර ගන්න බදු පැනවීම අවශ්‍යයි කියන එකයි. හැබැයි, දැනට ඉන්න

මුදල් සම්බන්ධ නියෝජ්‍ය ඇමතිවරයෙකු පසුගිය ආණ්ඩුව සමයේ දමා තිබුණු post එකක් මම දැක්කා. 2023 ඔක්තෝබර් මාසයේ 31වැනි දා දමා තිබෙනවා, "බදු සමතුලිතතාවය පැන ඇත. තව බදු වැඩි කිරීමෙන් පරිභෝජනය හා ඉතුරුම් අඩුවී ආර්ථිකය දරුණු ලෙස කඩා වැටෙනු ඇත. Screenshots ගහ ගන්න" යනුවෙන් post එකක්. දැන් ඉන්න මුදල් සම්බන්ධ නියෝජ්‍ය ඇමතිවරයෙක් බදු ගහන එක වැරදියි කියලා 2023දී දාපු post එකක් මෙක. එතකොට රටේ ජනතාවගේ, මේ කර්මාන්තයේ නියැළෙන අයගේ ප්‍රශ්නය වන්නේ, මෙවන් කථාවක් කියලා බලයට ආවාට පස්සේ බදු පැනවීම ගැනයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ පාර්ලිමේන්තුවේ මේ අය වැය විවාදය පටන් ගත්ත දවසේ ඉඳලා මම දිගටම මේ ප්‍රශ්නය මතු කළා. මහා පරිමාණයේ බදු සහන දුන් ආයතනවලට මේ ආණ්ඩුව තුළිනුත් ඒ බදු සහනය දීලා තිබෙනවා. මම හිතන විධියට, 2024 වර්ෂය අවසාන වනවිට රුපියල් බිලියන 966ක බදු සහන ලබා දුන්නා. දැන් මේ ආණ්ඩුව තුළිනුත් අන්න ඒ බදු සහනම දෙනවා. මොකද, ඒවා cancel කරනවා කියලා කොහේවත් කියලා නැහැ. ඒවා cancel කරන්න බැහැ කියලාත් නැහැ. ගරු ඇමතිතුමනි, මේ රුපියල් බිලියන 966 ඇතුළේ ඉන්නවා, IT ක්ෂේත්‍රයට සම්බන්ධ මහා පරිමාණයේ ආයතනත්. මේ බදු ආදායම ගණනය කරනකොට මම දැක්කා, ලක්ෂ එකහමාරක් ඇතුළත මාසික ආදායමක් ගන්න පුද්ගලයෙකුට බදු ගහන්නේ නැහැ. එතැනින් එහාට bracket එකක් තිබෙනවා. හැබැයි, මේ කට්ටියට බදු සහන දීලා තිබෙන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. අනික් අය ගෙවනවා වාගේ බදු ගෙවනවා නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මහා පරිමාණයේ IT companiesවලට දීලා තිබෙන බදු සහන ඉවත් කරන්නේ නැතුව, මේ ආණ්ඩුවේ බදු ගැසීමේ ප්‍රතිපත්තිය පිළිබඳව ජනතාව අතරේ විශාල අප්‍රසාදයක් ඇති වෙලා තිබෙනවා.

ඊළඟට දිගින් දිගටම අපිත් මේ පාර්ලිමේන්තුවේ කියලා තිබෙනවා, PayPal එක ගැන. Online ක්‍රමයට කරන ව්‍යාපාර තුළ භාණ්ඩ විකුණද්දී ඒ භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විශ්වාසයක් customerට නැත්නම්, PayPal හරහා ඒ අදාළ payment එක කළොත්, හදිසියේ හෝ ඒ භාණ්ඩයේ ප්‍රශ්නයක් තිබෙනවා නම් PayPal ක්‍රමය හරහා නැවත ඒ මුදල්, ඒ ගෙවන මනුෂ්‍යයාට අය කරගන්න පුළුවන් ක්‍රමවේදයක් තිබෙන නිසා විශාල වශයෙන්ම සංවර්ධනය වෙන රටවල, ඒ කියන්නේ දකුණු ආසියාවේ තිබෙන ගොඩක් රටවල මේ PayPal ක්‍රමය හරහා IT කර්මාන්තය පමණක් නොවෙයි, Internet එක base කරලා විශාල ව්‍යාපාර ප්‍රමාණයක් ගොඩනැඟිලා තිබෙනවා. අපි බලාපොරොත්තු වුණේ මේ ආණ්ඩුව බදු ගහන එක පැත්තකින් තියලා මෙන්න මේ PayPal වාගේ ක්‍රමවේද ලංකාව තුළට ගෙනෙන වැඩ පිළිවෙළක් ආරම්භ කරයි කියලායි. නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරු කථාවේ එහෙම දෙයක් තිබුණේ නැහැ. අද මීට පෙර ඇමතිවරයෙක් මේ ගැන පැහැදිලි කිරීමක් කළා ද දන්නෙත් නැහැ. හැබැයි, PayPal හරහා ලංකාව තුළට payment එකක් ගන්න පුළුවන් ක්‍රමවේදයක් ගැන කොහේවත් සාකච්ඡා වෙලා නැහැ. එතකොට මේ රට තුළ දැනට වැඩ කරන මිනිස්සුන්ට, දැනට IT ක්ෂේත්‍රයත් එක්ක සම්බන්ධ වෙලා ඉන්න ජනතාවට මේ ආණ්ඩුව හරහා ලැබී තිබෙන එකම දේ මේ බදු ගැසීම පමණයි.

නැවත වාරයක් මම කියනවා, මේ බදු ගැසීම පිළිබඳව අපි විරුද්ධ නැහැ කියන එක. හැබැයි මේ පිළිබඳව සමාජ මාධ්‍යයේ තිබුණු comments වගයක් මම කියෙව්වා. මොකද, මීට දවස් දෙක තුනකට පෙර, කාන්තා දිනයේදී මන්ත්‍රීවරියන්ට සමාජ මාධ්‍යයේ තිබුණු comments වගයක් සභානායකතුමා කියවා තිබුණා මම දැක්කා. ඊට පස්සේ මේ බදු ප්‍රතිපත්තිය ගැන සමාජ මාධ්‍යයේ තිබෙන comments මොනවාද කියලා මම බැලුවා. එක comment එකක තිබෙනවා, "පොඩි එකාගේ බයික් එකට, පොඩි කාර් එකට බදු කෙළලා ධනවතුන්ට විතරක් වාහනයක් ගන්න සැලැස්සුව එක ගැන මාර සතීපයක් දැනෙන්නේ" කියලා. මේ comments බැලුවොත්, ඇත්තටම මට ලජ්ජයි ඒ තිබෙන comments කියවන්න. නමුත් මගේ හිතට වැඩිපුරම ආකර්ෂණය වුණු comment එකක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හොඳයි.

ඒකේ තිබෙන්නේ, "මුගේ talk ..." කියලා. ඊළඟ වචනය මම කියන්න කැමැති නැහැ. ඊළඟට තිබෙනවා, "දැන් අපේ විධියට ඉඳපන් කියලා නේ මේ කියන්නේ. මේ වාගේ comments තව ටිකයි ඕනේ, ආයේ සියයට 3 වෙන්න" යනුවෙන්. ඒ කියන්නේ, ආණ්ඩුවේ ක්‍රියාකලාපය ගැන. නැවත වාරයක් සියයට 3ට වැටෙන්න මෙන්න මේ ඇමතිවරයාගේ ප්‍රකාශ සහ ඒකට වැටිලා තිබෙන comments ටික තිබ්බොත් ඇති. ඒකෙන් හිතා ගන්න, අද රටේ ජනතාව මේ ආණ්ඩුවට දීලා තිබෙන තැන.

මෙතැනින් එහාට තව ගොඩක් කාරණා කියන්න තිබුණාට කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට, මුලසුනේ ඉන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමිය කාලය කළමනාකරණය කිරීමට දක්ෂ මන්ත්‍රීවරියක්. ඒ නිසා වැඩිපුර වේලාව දෙන්නේ නැති වෙයි. ඒ නිසා මේ මාතෘකාවට සම්බන්ධ නොවුණත් තව කාරණා දෙක තුනක් කියලා කථාව අවසන් කරන්නම්. මොකද, ගරු අග්‍රාමාත්‍යතුමිය සභාවේ ඉන්නවා. මම දැක්කා, එතුමිය පසුගිය දවසක රැස්වීමකදී කථාවක් කර තිබෙනවා. එතුමිය අහනවා පොලීසියෙන්, "මෙන්න මෙයාව නිදහස් කරන්න කියලා කවුරු හරි කථා කර තිබෙනවාද, ඔයගොල්ලන්ට බලපෑම් කරලා තිබෙනවාද? නැත්නම් මෙන්න මේ දේ කරලා දෙන්න කියා අපේ පැත්තෙන් කවුරු හෝ පොලීසියට බලපෑම් කර තිබෙනවාද?" යනුවෙන්. ගරු අග්‍රාමාත්‍යතුමියට මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, - මම කලිනුත් පාර්ලිමේන්තුව තුළ මේක ප්‍රකාශ කළා- ඔබතුමියලාගේ පක්ෂයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ සංවිධායකවරුන්ගේ ක්‍රියාකලාපය ඉතාම පහත් බව.

ඔබතුමියගේ පක්ෂයෙන් ඉන්න මන්ත්‍රීවරයාට -කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමාට- මේ ගැන සඳහන් කළාම එතුමා කියනවා, "එයා අපේ පක්ෂයේ සංවිධායකවරයෙක් නොවෙයි" කියලා. ඊට පසුව ඔබතුමන්ලාගේ District Development Committee එකේ Chairman අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමාට කිව්වා, "මෙන්න මෙහෙම එකක් තිබෙනවා, පොඩ්ඩක් බලන්න" කියලා. නමුත් කිසිම action එකක් ගත්තේ නැහැ. අද උදැසන ඔබතුමියගේ පක්ෂයේ සංවිධායකවරයෙක් preschool ගුරුවරියකට පහර දෙන්න ගිහිල්ලා දැන් පොලීසියේ entry එකක් දාලා තිබෙනවා. මීට සති කිහිපයකට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම්ට තර්ජනය කරලා, අන්තිමට එතුමා ඔබතුමියලාගේ මන්ත්‍රීතුමාට කථා කරලා කියා තිබෙනවා, මේක කරන්න එපා කියලා. ප්‍රාදේශීය සභාවට ගිහින් බලපෑම් කරනවා. රෝහලට ගිහින් බලපෑම් කරනවා. දැනට සති තුනකට පෙර මම මේ කියන සංවිධායකවරයා ගමේ ආරවුලක් ඇති කරලා ගුටි කාලා රෝහලට ගිහින් admit වුණා. හොඳටම බීලා; කන පැලෙන්න බීලා. පස්සේ ඒගොල්ලන්ම පොලීසියේ දාපු entry එක අයින් කරගෙන තිබෙනවා. මොකද, පොලීසිය hospital report එක ගත්තාම,-

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හොඳයි.

Hospital එකට ගිහින් බැලුවොත් බීමතින් හිටියේ කියලා අහුවෙන නිසා entry එකත් අයින් කරගෙන තිබෙනවා. මම නැවත වතාවක් ඉල්ලන්නේ කරුණාකරලා දුන්න පොරොන්දු ඉෂ්ට කරන්න කියලායි. පිල්ලෙයාන්ලාටත් වඩා හපන් විධියට තමයි මඩකලපුවේ ඔයගොල්ලන්ගේ පක්ෂයේ කට්ටිය දැන් හැසිරෙන්නේ. ඉතාම අශෝභන ලෙස හැසිරෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මඩකලපුව දිස්ත්‍රික්කයට අපි ඔබතුමියලාගේ පක්ෂයෙන් බලාපොරොත්තු වුණේ කොම්පියුටර් එකක් අල්ලපු නැති ළමයින්ට කොම්පියුටර් ටිකක් දෙයි; පාසල්වලට කොම්පියුටර් ටිකක් දෙයි කියලා. හැබැයි, අන්තිමට වෙලා තිබෙන්නේ ඔබතුමියලාගේ පක්ෂයේ සංවිධායකවරු ඇවිල්ලා අපේ ජනතාවට තර්ජනය කරන එකයි.

ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ වැඩ පිළිවෙළ සාර්ථක වෙන්න කියා මම සුබ පතනවා. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක්. අපෙන් අවශ්‍ය ඕනෑම සහයෝගයක් අපි ලබා දෙනවා. PayPal සහ අනෙකුත් දේවල් පිළිබඳ උනන්දු වෙන්න. ඒ වාගේම මහා පරිමාණයෙන් බදු සහන දීලා තිබෙන ආයතනවලට ඒවා කොළඹින් පිට උතුරට, නැඟෙනහිරට සහ වතුකරයට -competitive areasවලට- ගිහින් ස්ථාපනය කළොත් මේ බදු සහන දෙන එක සාධාරණයි. නමුත් දැන් ඒගොල්ලන් කොළඹ ඉඳලා කොළඹ අනෙක් companiesවල ඉන්න කට්ටිය උදුරා ගන්නවා, මේ බදු සහනය පාවිච්චි කරලා.

විනාඩියක් වැඩිපුර ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමියට ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.45]

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Dr.) Chrishantha Abeysena - Minister of Science and Technology)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ වෙලාවේ මට ඇත්තටම කනගාටුවක් දැනෙනවා. ඒක මම මුලින්ම කියන්න ඕනෑ. අය වැය කාරක සභා අවස්ථාවේ අද දවසේ විවාදයට ගෙන තිබෙන්නේ අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වැය ශීර්ෂයි. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරු හැමෝම වාගේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අදහස් දැක්වීමක් කළේ නැහැ. ඇත්තටම ඒ ගැන පුදුම වෙන්න දේකුත් නැහැ. මොකද, විපක්ෂය දේශපාලනය කරන්නේ අවිද්‍යාවෙන්ම තමයි. වඳ කොත්තු, ඳාණක්කා ළඟට ගිය ඒවා, වඳ යට ඇඳුම්, ධම්මික පැණිය ගැන අපි දන්නවා. මේගොල්ලන් අවිද්‍යාවෙන් ඉන්න අය නිසා ඇත්තටම පුදුම වෙන්න දෙයකුත් නැහැ. මොකද, ඒගොල්ලන්ට විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ දැක්මක් නැහැ. ඒ නිසා මෙහි ඇති වැදගත්කම ගැන කියන්න අදහසක් නැහැ.

ජාතික ජන බලවේගය හැටියට අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය එදා එළිදැක්වුවා. අද ඒක අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය බවට පත් කරලා තිබෙනවා. අපට ඒකට දැක්මක් තිබෙනවා. මොකක්ද දැක්ම? අපි විද්‍යාව හා තාක්ෂණයට වියදම් කරන මුදල ආයෝජනයක් වෙනවා. අපි ඒ මුදල්වලින් හොඳ research කරනවා. ඒ හැම පරීක්ෂණයක්ම - research එකක්ම - රටේ ආර්ථිකයට බද්ධ වෙච්ච පරීක්ෂණ. එමඟින් රටේ ජාතික ආදායම වැඩි කරගන්න පුළුවන්. අපට ඩොලර් හොයන්න පුළුවන්. ඒ වාගේම මෙච්චර කල් පිට රටින් ගෙනාපු දේවල් නවත්වලා ඒවා අපට අපේ රටේම හදාගන්න පුළුවන්. වැඩිපුර හදන දේ පිටරටට දෙන්න පුළුවන්. එවැනි දැක්මක් ඇතිව තමයි අපි විද්‍යාව හා තාක්ෂණය මෙහෙයවන්නේ.

අපි පර්යේෂණ - research - අංශය ගත්තොත්, හැම ක්ෂේත්‍රයකම තිබෙන ප්‍රමුඛතා මොනවාද කියලා බලනවා. අපි ප්‍රමුඛතා ලැයිස්තු හදනවා. ඒ ලැයිස්තු අනුව තමයි අපි අනාගතයේදී පරීක්ෂණ වෙනුවෙන් මුදල් දෙන්නේ. ඒ විතරක් නොවෙයි. ඒවා පිළිබඳ නිවැරදි, විද්‍යාත්මක ඇගැයීමක් කරන්න ඕනෑ. එහෙම නැතිව මොකක් හරි නමක් ගහලා පරීක්ෂණයක් කළාට ඒකෙන් හොඳ ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ. නිවැරදි විද්‍යාත්මක ක්‍රමයකට ඒ protocols හදන්න ඕනෑ. අපි ඒ විධියට නිවැරදි ඇගැයීමක් කරලා තමයි මේ කටයුත්ත කරන්නේ. ඒ විතරක් නොවෙයි. අපි නව නිපැයුම්වලට විශේෂ තැනක් දෙනවා. ඒවා වාණිජකරණය කිරීම සඳහා විශාල මුදලක් -රුපියල් මිලියන 1,000ක්- අපි මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. එහෙම තමයි අපි අපේ ප්‍රතිපත්ති හදලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. අපි ඉස්සෙල්ලා කථා කළා වාගේ අපේ ආයතන ගොඩක් තිබෙනවා.

ඒ ආයතන ස්වාධීනව වැඩ කරපු ආයතන. ස්වාධීනව වැඩ කරපු ආයතන වුණත්, සමහර කාර්යයන් ගත්තොත්, එකම කාර්යය ආයතන දෙක තුනකින් වෙනවා. එම නිසා අපේ ප්‍රධාන කාර්යය තමයි, ආයතන අතර සම්බන්ධීකරණය ගොඩනැඟීම. ඒක administratively කරන සම්බන්ධතාවක් විතරක් නොවෙයි, ඒක research පැත්තෙන් ප්‍රායෝගිකව කරන සම්බන්ධතාවක්. ඒ විතරක් නොවෙයි, අනෙක් අමාත්‍යාංශ යටතේත් විවිධ ආයතන තිබෙනවා. එම ආයතන මඟිනුත් පරීක්ෂණ සිදු කරනවා. මොකද, අපේ ආයතන දන්නේ නැහැ, ඒ ආයතන කරන්නේ මොනවාද කියලා. ඒ ගොල්ලන් කරන දේ අපි දන්නේ නැහැ, අපි කරන දේ ඒ ගොල්ලන් දන්නේ නැහැ. එම නිසා ඉදිරියේදී, සියලු අමාත්‍යාංශ යටතේ තිබෙන research ආයතන අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා අපි මේ වෙනකොටත් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒකට මම උදාහරණයක් කියන්නම්.

අපි අලි වැට ගැන research එකක් කළා. අලි වැට ගැන නොයෙකුත් පර්යේෂණ තිබෙනවා. ඒවායේ හොඳ ප්‍රතිඵල තිබෙනවා. දැන් අපට සිදුවෙලා තිබෙන්නේ, ඒවායෙන් ලැබෙන සාක්ෂිවල සත්‍යතාව බැලීමයි. අපි ඒවායේ ඇති සත්‍යතාව සොයා බැලුවා. හොඳ පරීක්ෂණ සිදුවෙලා තිබෙනවා. ඒවා ප්‍රතිපත්ති - policy - මට්ටමට ගැනීම තමයි දැන් අපට කරන්න තිබෙන්නේ. ඒවා හොඳ සාක්ෂි. ඒ සඳහා අපි පරිසර අමාත්‍යාංශයට ආරාධනා කළා. අපි එම අමාත්‍යාංශයේ නිලධාරීන් එක්ක කථා කළා. ඔවුන් එක්ක එකතුවෙලා කථා කරලා අලි-මිනිස් ගැටුමට විසඳුම් හෙව්වා. ඉදිරියේදී අපි ඒවා සම්පිණ්ඩනය කරලා ඒ ඒ අමාත්‍යාංශ

එක්ක කටයුතු කරනවා. මොකද, ඒවා implement කරන්න තිබෙන්නේ එම අමාත්‍යාංශ යටතේ. අපට තිබෙන කාර්යය තමයි, සාක්ෂි - evidence - සොයලා, එම සාක්ෂි සත්‍යයද, නැද්ද කියලා කියන එක. ඒක විතරයි අපට කරන්න තිබෙන්නේ.

ඒ වාගේම එක් මන්ත්‍රීවරයෙක් අලි-දුම්රිය ගැටුම ගැනත් කථා කළා. අදාළ ආයතන සියල්ලම කැඳවලා අපි ඒ සම්බන්ධව ඇති researches පිළිබඳව කථා කළා. Sri Lanka Railways එකත් එක්ක කථා කළා. ඒ වාගේම අපි එකට ගිහිල්ලා evidence හොයලා ඒවා ලබා දීමේ වැඩ පිළිවෙළක් දැනටමත් පටන්ගෙන තිබෙනවා. ඒ වාගේම අපි Sri Lanka Railways එක ගෙන්වුවා. Sri Lanka Railways එකත් එක්ක අපේ Arthur C. Clarke Institution for Modern Technologies, ඒ වාගේම NERD එක ඇතුළු අපි තුන්ගොල්ලන්ම එකතුවෙලා මේ සඳහා මොකක්ද කරන්න පුළුවන් කියලා සාකච්ඡා කළා. අපි එතැනදී තේරුම් ගත්තා, දුම්රියවල brake system එක පිට රටින් ගේන්න ඕනෑ නැහැ, ඒක අපේ රටේම හදන්න පුළුවන් කියලා.

ඒ වාගේම රේල් ගේට්ටු ගැන කථා කළොත්, බොහෝ තැන්වල රේල් ගේට්ටු නැහැ කියලා අපි දන්නවා. මිනිස්සු දුම්රියවල හැප්පෙනවා. එම නිසා රේල් ගේට්ටු තාක්ෂණය දියුණු කිරීම අපි තුන්ගොල්ලෝම එකතු වෙලා කරන්න පුළුවන් කියලා අපි තීරණයකට ආවා. ඒ වාගේම පුහුණුව සම්බන්ධයෙන් කථා කළොත්, එකිනෙකා අතර අන්‍යෝන්‍ය පුහුණුවක් ඇති කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ සම්බන්ධතාවත් අපි ඇති කළා.

ඒ විතරක් නොවෙයි. ධීවර කර්මාන්තයේ ඵලදායීතාව වැඩි කරන්නත් අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා නොයෙකුත් පරීක්ෂණ කරනවා, ප්‍රතිඵල තිබෙනවා. ඉදිරි කාලයේ ඒ අදාළ නිලධාරීන් ඔක්කෝම එක තැනකට ගෙනැල්ලා අපි policy brief එකක් හදන්න තීරණය කළා.

ඒ වාගේම අපේ රටේ ඖෂධ සම්බන්ධයෙන් කථා කළොත්, අපට හොඳ හෙළ වෙදකමක් තිබෙනවා. ඒ හෙළ වෙදකම තුළ දැනටමත් හොඳ ඖෂධ - traditional medicines - තිබෙනවා. නමුත් ඒවා ඔප්පු කරන්න අපට සාක්ෂි නැහැ. එම නිසා research කරලා අපට ඊට අවශ්‍ය සාක්ෂි හදන්න - generate කරන්න - පුළුවන්. අපි වෙනම කණ්ඩායමක් යොදවා එවැනි වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කර තිබෙනවා. හෙළ වෙදකම පිළිබඳව පරීක්ෂණ කරලා, ඒ මඟින් අපේ රටට වාගේම අනෙක් රටවල්වලටත් අපේ හෙළ වෙදකමේ හාස්කම් ලබා දෙන්න හැකියාව තිබෙනවා. ඒ විතරක් නොවෙයි, බටහිර වෙදකම ගත්තත්, නව ඖෂධ, ඒ වාගේම medical devices හදපු අය අපට ඉන්නවා. නමුත් ඒවා උඩට එන්නේ නැහැ; වාණිජකරණය වෙන්නේ නැහැ. දැන් අපි ඒ පැත්ත ගැනත් සොයා බලා තිබෙනවා.

ඒ වාගේම පුනර්ජනනීය බලශක්තිය ගත්තොත්, එය අපි දැනටමත් ප්‍රධාන පද්ධතියට එකතු කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට අපි solar power ගැන කථා කරනවා. ඒ විතරක් නොවෙයි, අපට thermal power තිබෙනවා. ඒ සඳහා අපට හොඳ evidence තිබෙනවා. ඒවා ඉහළට අරගෙන ඒවායින් ප්‍රයෝජන ගන්න තමයි දැන් අපට තිබෙන්නේ. අපි ඒ වාගේ පැති ගැනත් බලනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Dr.) Chrishantha Abeysena)
ඒ වාගේම අපි food technology පිළිබඳවත් සොයා බලා කටයුතු කරනවා. අපේ රටේ malnutrition බහුලව තිබෙනවා. අපේ රටේ patientsලා ගොඩක් වැඩියි. එම නිසා අපි දැනටමත් high protein biscuits හදලා තිබෙනවා.

අපට ඒවා වාණිජකරණය කරන්න පුළුවන්. ඒ පැත්තත් තිබෙනවා. Technology එක පාවිච්චි කරලා ආබාධ සහිත අයට නොයෙකුත් විධියේ උපකරණ හදන්න පුළුවන්; සමහර ඒවා හදලාත් තිබෙනවා. නමුත් ඒවා හැංගිලා තිබෙන්නේ. ඒක තවත් concept එකක් හැටියට අරගෙන ඒ දේවලුත් ඉදිරියට ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ හැම දෙයකටම අනෙකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධතාව ඇති කරනවා. විද්‍යා සම්පත් මධ්‍යස්ථාන හරහා ගමට තාක්ෂණය ගෙන යන්නේ කොහොමද කියන එක ගැන මම කථා කළා. ඒ වැඩේත් අපි කරන්න ඕනෑ. ඒකත් කරන අතරතුර අපට අවශ්‍ය වෙනවා, හොඳ මාධ්‍ය ඒකකයක්. ඒක නිසා හැම ආයතනයකටම මාධ්‍ය සංවිධායකවරයෙක් පත් කරලා ජනතාවට තේරෙන භාෂාවෙන් විද්‍යාව හා තාක්ෂණය දෙන්නේ කොහොමද කියන එක ගැන අපි කථා කරනවා.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය කියන්නේ හුදෙකලා වෙච්ච අමාත්‍යාංශයක් නොවෙයි. අපි ඔක්කෝම සමඟ එකට වැඩ කරන අමාත්‍යාංශයක්. ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ එක්ක - Sri Lanka Railways එකත් එක්ක, එහෙම නැත්නම් පරිසර අමාත්‍යාංශයත් එක්ක - කටයුතු කරන්න MoUs අවශ්‍ය නැහැ. මොකද අපි team එකක්; අපි කරන්නේ teamwork එකක්. සියලුදෙනාම අපේ අය. නමුත්, නිලධාරීන්ට එය අවශ්‍ය වෙලා තිබෙනවා.

ඉදිරියටත් අපේ අමාත්‍යාංශය ඉතා ශක්තිමත් අමාත්‍යාංශයක් හැටියට, ආර්ථිකයට දායක කරගන්න පුළුවන් අමාත්‍යාංශයක් හැටියට කටයුතු කරන බව මේ අවස්ථාවේදී මා සඳහන් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු අගමැතිතුමියටත්, ගරු ඇමතිවරුන්ටත්, සියලුම මන්ත්‍රීවරුන්ටත්, අපේ අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පුද කරනවා.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
MINISTRY OF SCIENCE AND TECHNOLOGY

පුනරාවර්තන	රු. 2,800,000,000
මූලධන	රු. 2,200,000,000

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Dr.) Chrishantha Abeysena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"30 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය අදේශ කළ යුතු ය:

'මූලධන රු. 2,950,000,000' "

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

"මූලධන වියදම සඳහා රු. 2,950,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධනජ් චෙලවුක්කාන අතිකරික්කප්පට්ට රූපාය් 2,950,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

මූලධනජ් චෙලවු තිරුත්තප්පට්ටවාරු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, "That the increased sum of Rs. 2,950,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"196 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 230,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

196 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 25,000,000

"196 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 25,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

196 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

තලෛප්පු 196, නිකළ්ච්චිත්තිට්ටම් 01, මීණ්ටුවරුඞ් චෙලවුක්කාන රූපාය් 230,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 196, නිකළ්ච්චිත්තිට්ටම් 01, මීණ්ටුවරුඞ් චෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

නිකළ්ච්චිත්තිට්ටම් 01.- චෙයල්මුරෛච් චෙයර්පාටුකළ් - මූලධනජ් චෙලවු, රූපාය් 25,000,000

"*තලෛප්පු* 196, නිකළ්ච්චිත්තිට්ටම් 01, මූලධනජ් චෙලවුක්කාන රූපාය් 25,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 196, නිකළ්ච්චිත්තිට්ටම් 01, මූලධනජ් චෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 230,000,000, for Head 196, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 196, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 25,000,000

Question, "That the sum of Rs. 25,000,000, for Head 196, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 196, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන -

පුනරාවර්තන වියදම, රු. 2,570,000,000;
මූලධන වියදම, රු. 2,175,000,000

නිකළ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් චෙයර්පාටුකළ් - මීණ්ටුවරුඞ් චෙලවු, රූපාය් 2,570,000,000; මූලතනච් චෙලවු, රූපාය් 2,175,000,000

Programme 02.- Development Activities -

Recurrent Expenditure, Rs. 2,570,000,000;
Capital Expenditure, Rs. 2,175,000,000

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) කිරිෂාන්ත අපේසේන)
(The Hon. (Dr.) Chrishantha Abeysena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, 196 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
තීරණය කරන ලදී:
Resolved:

"30 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

'වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 2,570,000,000 රු. 2,925,000,000' "

[ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ වැය ශීර්ෂ අංක 196 සඳහා අයවැය යෝජනා අංක 24 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු. 750,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"196 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,570,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

196 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"196 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,925,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

196 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"*තලෛප්පු* 196, නිකළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ටුවරුඞ් චෙලවුක්කාන රූපාය් 2,570,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 196, නිකළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ටුවරුඞ් චෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

"தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 2,925,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,570,000,000, for Head 196, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 196, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 2,925,000,000, for Head 196, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 196, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුනරාවර්තන	රු. 6,752,000,000
මූලධන	රු. 6,871,000,000

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Dr.) Chrishantha Abeysena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"28 වන පිටුවේ, 19 වන ජේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

'මූලධන රු. 9,871,000,000' "

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"මූලධන වියදම සඳහා රු. 9,871,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

ගරු මන්ත්‍රීවරු
(මාණ්ඩලික උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"29 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය අදේශ කළ යුතු ය:

'වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 4,513,000,000 රු. 7,330,000,000' "

[ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ වැය ශීර්ෂ අංක 186 සඳහා අයවැය යෝජනා අංක 10 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු. 3,000,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"186 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,513,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

186 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"186 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 7,330,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

186 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" තලෙප්පු 186, නිකළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් චෙලවුක්කාන රූපාය් 4,513,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එණුම් විණා විටුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප් පට්ටතු.

තලෙප්පු 186, නිකළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් චෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

"තලෙප්පු 186, නිකළ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් චෙලවුක්කාන අතිකරික්කප්පට්ට රූපාය් 7,330,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එණුම් විණා විටුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප් පට්ටතු.

තලෙප්පු 186, නිකළ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් චෙලවු තිරුත්තප්පට්ටවාරු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 4,513,000,000, for Head 186, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 186, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 7,330,000,000, for Head 186, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 186, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

227 වන ශීර්ෂය.- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,000,000,000

"227 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,000,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

227 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 2,520,000,000

"227 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,520,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

227 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 227.- ஆட்களைப் பதிவுசெய்யும் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,000,000,000

"தலைப்பு 227, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,000,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 227, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 2,520,000,000

"தலைப்பு 227, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 2,520,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 227, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 227.- DEPARTMENT OF REGISTRATION OF PERSONS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 2,000,000,000

Question, "That the sum of Rs. 2,000,000,000, for Head 227, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 227, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 2,520,000,000

Question, "That the sum of Rs. 2,520,000,000, for Head 227, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 227, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
(මාණ්ඩලික (වෛද්‍යවර්) කිරිෂාන්ත අපේසේන)
(The Hon. (Dr.) Chrishantha Abeysena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයි ද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අ.භා. 5.58ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස ගරු නියෝජ්‍ය සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 12වන බදාදා

பி.ப. 5.58 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகன்றார்கள்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 மார்ச் 12, புதன்கிழமை.

At 5.58 p.m., the Deputy Chairperson left the Chair to report Progress.

Committee report Progress; to sit again on Wednesday, 12th March, 2025.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ශීර්ෂ අංක 186 සහ 196 සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 227 සංශෝධන රහිතව ද කාරක සභාවේදී සම්මත වූ බව දන්වනු කැමැත්තෙමි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Dr.) Chrishantha Abeysena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාගීවිය කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

මඩකලපුව ගුවන් තොටුපළ පුළුල් කිරීමේදී ලබා දී ඇති විකල්ප ඉඩම් සඳහා ඔප්පු ලබා දීම
மட்டக்களப்பு விமான நிலைய விஸ்தரிப்பின்போது வழங்கப்பட்ட மாற்றுக் காணிகளுக்கு உறுதிகளை வழங்குதல்
GRANT OF DEEDS FOR ALTERNATIVE LANDS PROVIDED FOR EXPANSION OF BATTICALOA AIRPORT

[பி.ப. 5.58]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பின்வரும் ஒத்திவைப்புப் பிரேரணையை நான் முன்மொழிகின்றேன்:

"யுத்த காலத்தில், 1985இல் மட்டக்களப்பு விமான நிலையம் பாதுகாப்பு என்ற போர்வையில் திடீரென பாரியளவு விஸ்தரிக்கப்பட்டது. அதன் காரணமாக வலையிறவு, புதூர், சேத்துக்குடா, திமிலதீவு, திருப்பெருந்துறை போன்ற கிராமத்தவர்களின் வீடுகள், குடியிருப்புக் காணிகள், வயற்காணிகள், மயானம், வாணிப நிலையங்கள், பாதைகள், பாடசாலைகள் என கணிசமான பகுதிகள் அரசினால் கையகப்படுத்தப்பட்டன; பின்னர் அவை சுவீகரிக்கப்பட்டன. இதனால் சுமார் 300க்கும் மேற்பட்ட குடும்பங்கள் நிர்க்கதியாக்கப்பட்டன.

அதன் பின்னர், சுமார் 250 குடும்பங்களுக்குப் பதில் காணிகள் வழங்கப்பட்டன. அவை வழங்கப்பட்டு, ஏறத்தாழ 30 ஆண்டுகள் கடந்துள்ளன. அக்காணிகளுக்கு இன்னும் உறுதியான ஆவணங்கள் வழங்கப்படவில்லை. மக்களின் காணிகளைச் சுவீகரித்துவிட்டு, ஆவணங்கள் தருவதாயின் வழங்கப்பட்ட காலப்பகுதிக்கு குத்தகையாகப் பெருந்தொகைப் பணம் செலுத்தப்பட வேண்டுமென அதிகாரிகள் ஏற்கனவே சொத்துக்களை இழந்த மக்களிடம் வற்புறுத்தி வருகின்றனர்.

வறுமையின் பிடியில் தத்தளிக்கும் மக்களிடமிருந்து நில புலங்களைச் சுவீகரித்துவிட்டு, பதிலீடாக வழங்கப்பட்ட காணிகளுக்குக் குத்தகை கோருவது, உறுதிகள் வழங்காது இருப்பது நியாயமற்ற செயல் என்பதைச் சுட்டிக்காட்டுவதுடன், அவர்களுக்கான உறுதிகளை நிபந்தனை இல்லாமல் வழங்குமாறு உரிய அமைச்சரிடம் கோரிக்கை விடுக்கின்றேன். விமான நிலைய விஸ்தரிப்புக்காக தற்காலிகமாக மூடப்பட்ட பாதையைத் திறக்குமாறு மக்கள் சார்பாக வேண்டுகோள் விடுக்கின்றேன். பழைய பாதையைத் திறக்க முடியாவிட்டால், விமான நிலைய வேலி ஓரமாகவுள்ள பாதையையாவது திறந்து மக்களின் சிரமங்களைத் தீர்க்குமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன்"

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 1985ஆம் ஆண்டு வடக்கு, கிழக்கில் யுத்தம் நடைபெற்றது என்பதை நீங்கள் அறிவீர்கள். அந்தக் காலத்தில் அங்கு இருந்த சூழ்நிலை காரணமாக சிறிதாகக் காணப்பட்ட அந்த விமான நிலையம் பாரியளவில் விஸ்தரிக்கப்பட்டது. இதன்போது ஐந்து கிராமங்களைச் சேர்ந்த மக்கள் பாதிக்கப்பட்டனர். திடீரென அந்த மக்கள் தங்களது இடங்களிலிருந்து வெளியேற்றப்பட்டனர். அதன் பின்னர், அவர்களுக்குத் தற்காலிகமாகத் தங்குவதற்குக் காணிகள் கொடுக்கப்பட்டதுடன், அந்தக் காணிகள் பின்னர் நிரந்தமாக அவர்களுக்குப் பதில் காணிகளாகத் தரப்படும் என்ற உத்தரவாதமும் அளிக்கப்பட்டது. அதற்கமைவாக அந்த மக்கள் அந்த இடத்தில் வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். தற்போது அந்தக் காணிகளுக்கு அவர்களிடமிருந்து குத்தகை கேட்கின்றார்கள்.

(ii) வட மாகாணத்தை மையமாகக்கொண்டு அண்மையில் அறிமுகப்படுத்தப்பட்ட புதிய தென்னை முக்கோண வலயத்தினூடாக இலங்கையின் தெங்கு உற்பத்திக்குக் கிடைத்துள்ள பங்களிப்பு யாதென்பதையும்;

(iii) இலங்கையில் வருடாந்த தேங்காய் நுகர்வு யாதென்பதையும்;

(iv) தேங்காய்த் தட்டுப்பாட்டைக் குறைக்க மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether he is aware that a scarcity of coconuts prevail in the Sri Lankan market at present;

(ii) the contribution that has been made to Sri Lanka's coconut production through the New Coconut Triangle recently introduced, centred in the Northern Province;

(iii) the annual coconut consumption of Sri Lanka; and

(iv) the steps that have been taken to minimize the scarcity of coconuts?

(b) If not, why?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ දී උතුරු පළාත කේන්ද්‍ර කරගෙන ආරම්භ කරන ලදී. ඒ අනුව මේ වන විට පොල් අක්කර 10,000ක, එනම් පොල් පැළ 640,000ක් පමණ වගා කර ඇත. 2025 වසරේදී මෙම ව්‍යාපෘතිය යටතේ අක්කර 16,000ක් වගා කරනු ලබන අතර, ව්‍යාපෘතියේ සමස්ත ඉලක්කය 2027 වර්ෂය වන විට උතුරු පළාතේ පොල් අක්කර 50,000ක් වගා කිරීම වේ. ඒ අනුව 2030 වන විට උතුරු පොල් ත්‍රිකෝණය තුළින් ජාතික පොල් නිෂ්පාදනයට දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු:

i. වාර්ෂික පොල් අස්වැන්න ගෙඩි මිලියන 135කට ආසන්න ප්‍රමාණයකින් වැඩි කිරීම.

ii. ආහාර සුරක්ෂිතතාව ඉහළ නංවමින් දේශීය ගෘහස්ථ පරිභෝජනයට අවශ්‍ය පොල් සැපයුම සහතික කිරීම.

iii. පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් ලැබෙන ආදායම වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් මිලියන 70ක් ඉහළ නැංවීම.

iv. පොල් මඟින් උපයන ආදායම වැඩි කිරීම තුළින් උතුරේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

v. පොල් ආශ්‍රිත කර්මාන්ත මෙම ප්‍රදේශ තුළ ස්ථාපනය කිරීම. ඒ සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන්ට අවස්ථාව ලබා දීම.

vi. පොල් ඉඩම්වල අතුරු භෝග වගාව ප්‍රවර්ධනය හා ඒ තුළින් පොල් ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීම.

(iii) මෙරට සාමාන්‍ය වාර්ෂික පොල් අස්වැන්න ගෙඩි මිලියන 3,000ක් පමණ වේ. ඉන් ගෙඩි මිලියන 1,800ත් 1,900ත් අතර ප්‍රමාණයක් (සියයට 60) දේශීයව පරිභෝජනය කරනු ලබන අතර, ගෙඩි මිලියන 1,100ත් 1,200ත් අතර ප්‍රමාණයක් (සියයට 40) පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යොදා ගැනේ.

(iv) අප අමාත්‍යාංශය විසින් පොල් වගාවේ සහ කර්මාන්තයන්ගේ ඵලදායීතාව, නිෂ්පාදනය හා ගුණාත්මකභාවය ඉහළ නංවමින් සමස්ත අගයදාමය සංවර්ධනය කිරීම සඳහා පහත වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් පවතී.

කෙටි කාලීන ක්‍රියාමාර්ග

- දේශීය පොල් ඵලදාව අඩු වීම හා ඉල්ලුම ඉහළ යාමත් සමඟ පොල් මිල ඉහළ යාම නිසා දේශීය පාරිභෝගිකයාට සහ පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා සිදු වන බලපෑම අවම කිරීම සඳහා, පොල් මද ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තායතන වෙත සෘජුවම ශීත කළ පොල් මද, පොල් කිරි/පිටි කළ පොල් කිරි, දීසිඳි පොල් ප්‍රතිඅපනයනය සඳහා බදු විරාම පදනම (TIEP) මත, පොල් ගෙඩි මිලියන 200කට සමාන ධාරිතාවකින් යුත් ප්‍රමාණයක් ආනයනය කිරීමට අවසර ලබා දීම
- පොල් ඵලදාව අඩු වීම හේතුවෙන් දේශීය පොල්තෙල් කර්මාන්තයට සිදු වන බලපෑම අවම කිරීම සඳහා, පොල්තෙල් නිෂ්පාදකයන්ට පොල් සංවර්ධන අධිකාරියේ නියාමනය යටතේ කැබලි කර වියළන ලද කුරුට්ට සහිත පොල් (කොප්පරා නොවන) සෘජුවම හෝ රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC) හරහා ආනයනයට අවසර ලබා දීම
- ලෝක ආහාර වැඩසටහන යටතේ රුසියානු රජයේ ප්‍රදානයක් ලෙස ලද මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර මෙට්‍රික්ටොන් 27,500ක ප්‍රමාණය, APM(W) පොල් පොහොර මිශ්‍රණයක් ලෙස සකස් කර අක්කර 300,000ක භූමි ප්‍රමාණයක් සඳහා, APM(W) 50kg පොහොර බෑගයක් රුපියල් 4,000.00 වැනි සහන මිලකට බෙදා හැරීමට පියවර ගැනීම
- පොල් වගාව සඳහා පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුව කෘත්‍රිම පොහොර යෙදීමට හා නිෂ්පාදනය කිරීමට වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- පොල් වගාවේ රෝග හා පළිබෝධ පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. එහිදී, සහනදායී මිලට යෙදවුම් ලබා දීමත්, රෝග හා පළිබෝධ පාලනය හා වැළැක්වීම සඳහා ගත යුතු පියවර පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම
- පොල් වගාවේ නාක්ෂණික කටයුතු පිළිබඳ ව්‍යාප්ති දැනුම ජනමාධ්‍ය, සමාජ මාධ්‍ය මඟින් පොල් වගාකරුවාට ලැබීමට සැලැස්වීම
- ගෙවතුවල පවතින පොල් ගස්, පුනරුත්ථාපනය කර ගෘහස්ථ පරිභෝජනයට අවශ්‍ය පොල් ගෙවත්තෙන් සපුරා ගැනීම සඳහා පාරිභෝගිකයන් යොමු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පවතින පොල් ඉඩම්වල ජල සම්පාදන පද්ධති ඉදිකිරීම තුළින් කෙටිකාලීනව පොල් අස්වැන්න ඉහළ නංවා ගැනීම
- ගෘහස්ථ පරිභෝජනයේ දී සිදු වන පොල් නාස්තිය අවම කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය හරහා මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රජය සතු පොල් ඉඩම් මඟින් (පොල් වගා කිරීමේ මණ්ඩලය, හලාවත වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම, පොල් පර්යේෂණ ආයතනය) සමුපකාර තොග වෙළඳ සංස්ථාව (ලංකා සතොස) හරහා සහ සෘජුවම පාරිභෝගිකයාට සහන මිලට පොල් ලබා දීම

මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

- පවතින පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම
- වයස්ගත පොල් ගස් වෙනුවට නව පොල් පැළ පොල් ඉඩම්වල රෝපණය කිරීම, හීඩැස් පිරවීම
- ප්‍රශස්ත ඵලදායී භූමි පරිභෝජනයක් හා ඉහළ ආර්ථික ප්‍රතිලාභ උදෙසා පොල් ආශ්‍රිත අපනයන කෘෂි භෝග අතුරු භෝග වගා ප්‍රදර්ශනාත්මක ආදර්ශන ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- රෝග පළිබෝධ පාලන වැඩසටහනට අදාළව පහත ක්‍රියාමාර්ග ගැනීම
  - සහනදායී මිලට මයිටා පරපෝෂිත පැකට් ලබා දීම, මයිටා පාලනය සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයම ආවරණය වන පරිදි වගාකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
  - සුදු මැස්සා මර්දනය සඳහා දියර ඉසින යන්ත්‍ර අවශ්‍ය අවස්ථාවලදී නොමිලේ භාවිත කිරීමට වගාකරුවන්ට අවස්ථාව ලබා දීම
  - රතු/කළු කුරුමිණි පෙරමෝන වයල් සහනදායී මිලට ලබා දීම හා ඒකාබද්ධ රතු හා කළු කුරුමිණි පාලන වැඩසටහන් පැවැත්වීම. රතු කුරුමිණි පාලනය සඳහා මොනක්‍රොටපස් එන්නත් කිරීම

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

- පොල් දළඹු පරපෝෂි නළ සහනදායී මිලට ලබා දීම
- බ්‍රොන්ට්ස්පා පාලනය සඳහා රෝගී ගස් හඳුනා ගැනීම හා එන්නත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වැලිගම කොළ මැළවීමේ රෝග මර්දනය සඳහා රෝගී කලාපය තුළ හඳුනාගත් රෝගී ගස් එන්නත් කිරීම හා ඉවත් කිරීම
- රෝග හා පළිබෝධක මර්දන වැඩසටහන් ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කිරීම
- පොල් වගාවේ ඇති වන හදිසි තත්ත්වයන් පාලනය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවා එමඟින් පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

දීර්ඝ කාලීන ක්‍රියාමාර්ග

- රට තුළ ඵලදායී පොල් ගස් ගණනක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සහිතව සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල පොල් වගාව ව්‍යාප්ත කිරීම - උතුරු පොල් ත්‍රිකෝණය තුළ ඉදිරි වර්ෂ 3ක කාලසීමාව ඇතුළත (2025-2027) පොල් වගා කිරීමට අපේක්ෂිත මුළු භූමි ප්‍රමාණය අක්කර 40,000ක් පමණ වේ.
- පොල් ක්ෂේත්‍රයේ නියැළෙන කර්මාන්තකරුවන් සඳහා පොල් සංවර්ධන අධිකාරිය (කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය වැනි) හා කප්රුක අරමුදල මඟින් ක්‍රියාත්මක සහනදායී ණය යෝජනා ක්‍රම හරහා අවශ්‍ය මූල්‍ය සහයෝගය ලබා දීම
- 2030 වන විට රටෙහි පොල් අවශ්‍යතාව වන ගෙඩි මිලියන 4,200ක් සැපයීම සහ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක් දක්වා ඉහළ නැංවීම ප්‍රධාන අරමුණු කර අප අමාත්‍යාංශය මඟින්, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) සමඟ ක්ෂේත්‍රයේ සියලු පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් පොල් ක්ෂේත්‍රය සඳහා දස අවුරුදු මාර්ග සැලැස්මක් හා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් සකස් කරමින් පවතී.
- පොල් ඵලදාව ඉහළ නැංවීම සඳහා පොල් වගා කරන භූමි තුළ තෙතමන සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- පොල් අස්වැන්නට වනසතුන්ගෙන් සිදු වන හානිය වළක්වා ලීම සඳහා අදාළ ආයතන සම්බන්ධීකරණයෙන් පොදු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ගෘහස්ථ පරිභෝජනයට අවශ්‍ය පොල් අවශ්‍යතාව ගෙවත්තෙන් සපුරා ගැනීම සඳහා ගෙවතු පොල් වගා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

(ආ) අදාළ නොවේ.

පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන: ආරක්ෂාව
தொல்லியல் முக்கியத்துவம்வாய்ந்த இடங்கள்: பாதுகாப்பு
SITES OF ARCHAEOLOGICAL VALUE: PROTECTION

210/2024

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) එම ස්ථානවල ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත වස්තූන් ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இன்றுவரை இனங்காணப்பட்டுள்ள தொல்பொருளியல் ரீதியில் பெறுமதிவாய்ந்த இடங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவ்விடங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) அவ்விடங்களிலுள்ள தொல்பொருளியல் ரீதியில் பெறுமதிவாய்ந்த பொருட்களைப் பாதுகாப்பதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the number of sites of archaeological value that have been identified in Sri Lanka, as of now;

(ii) the names of those sites; and

(iii) the measures that have been taken to protect the objects of archaeological value found at these sites?

(b) If not, why?

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 5,085කි.

(ii) එම ස්ථානවල නාම ලේඛනය ඇමුණුම** මඟින් ඉදිරිපත් කර ඇත.

***** ප්‍රශ්නකාලයේ තබා ඇත.***
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** * Placed in the Library.*

(iii) 1. පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීම - 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනත ප්‍රකාරව පුරාවිද්‍යා තහනම් ඉඩම් (වෙන් කළ පුරාවිද්‍යා ප්‍රදේශ) ප්‍රකාශයට පත් කිරීම හා පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ප්‍රකාශයට පත් කිරීම. මෙසේ පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනුයේ එහි පැවැත්මට තර්ජනයක් එල්ල විය හැකි හෝ පෞද්ගලික සන්තකයේ ඇති ස්ථාන සඳහා වන අතර, මෙසේ ප්‍රකාශයට පත් කිරීම සඳහා තෝරාගත් නිර්ණායක 05ක් ඔස්සේ සුදුසු ස්මාරක පමණක් ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම නිර්ණායක වන්නේ නිර්මල බව, දුර්ලභ බව, සෞන්දර්යාත්මක අගය, ඓතිහාසික අගය හා පර්යේෂණ ශක්‍යතාවයි.

2. පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක හඳුනා ගැනීම, කැණීම් හා සංරක්ෂණ කටයුතු සිදු කිරීම, පුරාවිද්‍යා ගවේෂණ මඟින් හඳුනා ගනු ලබන පුරාස්ථාන කැණීම් මඟින් මතු කර ගැනීම හා ඒවාට සිදු වී ඇති හායනකාරක හඳුනා ගැනීම, ස්වාභාවික හා මානව බලපෑම් මඟින් සිදු වී ඇති හානි හඳුනා ගැනීම හා වර්තමාන අනුවර්තිත තත්ත්වය අනුව සුදුසුම සංරක්ෂණ ක්‍රමවේදය ආදේශ කොට ස්මාරක යථාවත් කිරීම.

3. පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීමේ ක්‍රියා දාමයට අමතරව එම ස්ථාන නඩත්තු කිරීම හා පවත්වාගෙන යෑම. මේ සඳහා ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මඟින් පත්වාගෙන යනු ලබන නඩත්තු කලාප හරහා මෙම ස්ථාන පවත්වාගෙන යෑම.

4. සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා මහ ජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා කටයුතු කිරීම.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නැවත විවෘත කිරීම
இலங்கை பிக்கு பல்கலைக்கழகத்தை மீளத் திறத்தல்
REOPENING OF BHIKSU UNIVERSITY OF SRI LANKA

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු කථානායකතුමනි, අද වන විට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පැන නැඟී ඇති ගැටලු රාශියක් හේතුවෙන් එහි කටයුතු සම්පූර්ණයෙන් අකර්මණ්‍ය වී එය වසා දමා තිබෙනවා. ඒ පිළිබඳව ගරු අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාතුමියගේ අවධානය යොමු කරවමින් පහත සඳහන් ප්‍රශ්නවලට මා පැහැදිලි පිළිතුරු අපේක්ෂා කරනවා.

01. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ එක් එක් වසරේ දැනට අධ්‍යාපනය ලබන භික්ෂු සිසුන් සංඛ්‍යාව කොපමණ ද?

02. එම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද?

03. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය දැනට මාස දෙකක පමණ කාලයක සිට වසා දමා ඇති බව ඔබතුමිය දන්නේද? එසේ නම් එලෙස විශ්වවිද්‍යාලය වසා දැමීමට හේතු වූ කාරණා කවරේද?

04. මෙම ආයතනයේ අකාර්යක්ෂමතා මෙම වසා දැමීමට හේතු පාදක වී තිබේ ද?

05. එසේ නම්, එකී අකාර්යක්ෂමතා වෙනස් කර, නැවත ආයතනය විවෘත කර එහි කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට ඔබතුමිය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේ ද? අද වන විට එහි ප්‍රගතිය කවරේදැයි මෙම ගරු සභාවට දන්වන්නේ ද?

06. විශ්වවිද්‍යාලය වසා දමා තිබෙන කාලයේදී ශිෂ්‍ය හිමිවරුන්ට උපාධිය ලබා දීමේ ප්‍රමාදය වළක්වා ගැනීම අරමුණ යැයි පවසමින් අධ්‍යයන වර්ෂ 03ක් සඳහා පැවති සමාසික පරීක්ෂණ සියල්ල මාර්ගගත ක්‍රමයට - online ක්‍රමයට - පැවැත්වීමේදී අක්‍රමිකතා රැසක් සිදු වූ බව ඔබතුමිය දන්නේද? ඒ සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01.

අධ්‍යයන වර්ෂය	දේශීය	විදේශීය
2022/2023	164	01
2021/2022	137	-
2020/2021	131	-
2019/2020	37	-
	469	01

02.

අනු අංකය	විස්තරය	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
01	අධ්‍යයන කාර්ය මණ්ඩලය	66	58	08
02	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	111	94	17
	එකතුව	177	152	25

03. ඔව්.

ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය හිමිවරුන් විසින් ප්‍රථම වසර ශිෂ්‍ය හිමිවරුන්ට සිදු කළ නවක වද ක්‍රියාකාරකම් හේතුවෙන් සහ වෙනත් විනය හේතු මත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු 2024.07.19 දින සිට පාලක සභාවේ අනුමැතිය මත අභ්‍යන්තර සිසුන් සඳහා පමණක් වසා ඇත.

ඉහත ක්‍රියාකාරකම්වලට සම්බන්ධ ශිෂ්‍ය හිමිවරුන් විනය දඬුවම්වලට යටත්ව 2024.08.05 දින අදියර වශයෙන් නැවත විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමට පාලක සභාව කටයුතු කර ඇත. ශිෂ්‍ය හිමිවරු 10දෙනෙකුට පන්ති තහනමක් පැනවීමට පාලක සභාව තීරණය කර ඇත. 2022/2023 අධ්‍යයන වර්ෂයේ පැවැත්වීමට නිබූ විභාග වර්ජනය කිරීම මත නැවත 2025.01.10 දිනැතිව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් විශ්වවිද්‍යාලය තාවකාලිකව වසා දැමීමට තීරණය කර ඇත.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

04. ආයතනයේ අකාර්යක්ෂමතාවක් නොව, නවකවදයට විනය ක්‍රියාමාර්ග ගැනීම තුළින් තමයි මේ තත්ත්වය ඇති වුණේ. පාලන අධිකාරිය ඒ වෙනුවෙන් කටයුතු කිරීම මත තමයි එවැනි තත්ත්වයක් මතු වුණේ.

05. මේ පිළිබඳව නැවත ශිෂ්‍ය හිමිවරු සමඟ සාකච්ඡා කිරීමෙන් පසු ගැටලුව සඳහා විසඳුමකට දෙපාර්ශ්වය පැමිණ ඇති අතර, 2025.03.15 වන දින සිට නැවත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට කටයුතු යොදා ඒ පිළිබඳව ශිෂ්‍ය හිමිවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. 2025.02.27 වන දින මා සමඟත් සාකච්ඡා කර ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තාවකාලිකව හදාගත්ත අට්ටාල ඉවත් කරන්නත් එකඟ වුණා.

06. 2025.02.10 වන දින මාර්ගගතව ඇරඹී 2022/2023 අධ්‍යයන වර්ෂයේ දෙවන සමාසිකාන්ත පරීක්ෂණයේදී ඒ ඒ දිනයේ විභාග ශාලාධිපතිවරුන් විසින් වාර්තා කර ඇති සැක කටයුතු සිදුවීම් සම්බන්ධයෙන් අවධානය යොමු කර විභාග ඇගයීම් කටයුතු සිදු කරන ලෙස ආචාර්යවරුන්ට උපදෙස් දී ඇත.

ඒ අනුව මේ සම්බන්ධයෙන් විභාග පරීක්ෂකවරුන්ගේද වාර්තා සැලකිල්ලට ගනිමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. 2025.03.15 දින සිට විශ්වවිද්‍යාලය විවෘත කිරීමෙන් පසුව මෙම පරීක්ෂණ ආරම්භ වනු ඇත.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මම අපොස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ පොළොන්නරුව ගල්අමුණ මහා විද්‍යාලයේ දු දරුවෝත්, ඒ වාගේම මැදිරිගිරිය ජාතික පාසල් දු දරුවෝත්, දෙමව්පියනුත් පාර්ලිමේන්තු ගැලරියට පැමිණ සිටිනවා. මම මේ අවස්ථාවේ ඒ සියලුදෙනා පිළිගන්නවා.

මීළඟට, අමාත්‍යාංශ නිවේදන.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, ඊට පෙර මට පොඩි කාලයක් ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, ඊයේ අනුරාධපුර රෝහලේ සිදුවූ අවාසනාවන්ත සිද්ධිය සමාජයේ දැඩි කථා බහකට භාජන වෙලා තිබුණා. මෙම ගරු සභාවේදීත් ඒ පිළිබඳව ප්‍රශ්න නඟනු ලැබුවා. මා ඒ අවස්ථාවේ මේ සභාවට දැනුම් දුන්නා, පොලිස් කණ්ඩායම් පහක් ඒ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා යොදවා තිබෙනවා කියලා. මම මේ ගරු සභාවට දැනුම් දෙන්න කැමතියි, මීට ස්වල්ප මොහොතකට පෙර ඒ සැකකරු ගල්නෑවේදී අත්අඩංගුවට අරගෙන තිබෙන බව. අපි ඊයේ පොරොන්දු වුණා වාගේම, ඔහු නීතිය ඉදිරියට පමුණුවලා අවශ්‍ය කටයුතු කරන්න සියලු විධිවිධාන සලස්වා තිබෙනවා. ඒ පිළිබඳ මම මේ සභාව දැනුවත් කරන්න කැමතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳ රජයේ ස්ථාවරය: අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

பயங்கரவாதத் தடைச் சட்டம் தொடர்பான அரசாங்கத்தின் நிலைப்பாடு: நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரினது கூற்று

GOVERNMENT STANCE ON THE PREVENTION OF TERRORISM ACT: STATEMENT BY HON. MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා ස්ථාවර නියෝග 27(2) යටතේ 2025.01.08 දින අසන ලද ප්‍රශ්නයට පිළිතුරයි මා මේ ඉදිරිපත් කරන්නේ.

1. 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත එවකට ශ්‍රී ලංකාව තුළ පැවැති තත්ත්වයට මුහුණ දීම සඳහා, එනම් ත්‍රස්තවාදී ක්‍රියා වැළැක්වීම, යම් පුද්ගලයකු, සංගමයක් හෝ සංවිධානයක් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් ලංකාව තුළ හෝ ඉන් පිටත කරනු ලබන නීති විරෝධී ක්‍රියා වැළැක්වීමේ අරමුණින් යුක්තව සම්මත කර ගන්නා ලද පනතක් වේ. මෙකී පනත විවිධ සංශෝධනයන්ට භාජන වෙමින් වසර 46කට ආසන්න කාලයක් පුරා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වී ඇත.

එනම්, 1988 අංක 22 දරන පනත, 2022 අංක 12 දරන සංශෝධන මඟින් මෙකී පනතට මානව අයිතිවාසිකම් හා ශ්‍රී ලංකාව අන්තර්ජාතික වශයෙන් බැඳී ඇති සම්මුතීන්ට හා පිළිගත් න්‍යායන්ට අනුරූපී මුහුණුවරක් ලබා දීමේ අරමුණින් සංශෝධන ඉදිරිපත් කර තිබෙන බව නිරීක්ෂණය වේ.

විවිධ රජයන් මෙම පනත පරිවර්තන්න කොට නව පනතක් ඉදිරිපත් කිරීම සඳහා පියවර ගෙන තිබූ බව පෙනී යයි. එවැනිම උත්සාහයක් පසුගිය රජය විසින්ද ගෙන ඇති අතර, එලෙස සකස් කරන ලද පනත් කෙටුම්පත ගැසට් පත්‍රයෙහි 2023.09.15 දින පළ කරන ලද අතර, එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණයේ එහි ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව නඩු පවරා ඇති බවද නිරීක්ෂණය වේ. එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම සඳහා සිදු කළ යුතු සංශෝධන ශ්‍රේෂ්ඨාධිකරණය එකී තීන්දුවේදී පැහැදිලිව දක්වා තිබේ. තවද, මෙම පනත් කෙටුම්පත එවකට පැවැති ආංශික අධීක්ෂණ කමිටුවේ දින දෙකක් සාකච්ඡාවට භාජන වී ඇත.

මෙකී පනත් කෙටුම්පත තවදුරටත් අධ්‍යයනය කර ඒ සඳහා නිරීක්ෂණ, නිර්දේශ ලබාදෙනු පිණිස අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතුව කමිටුවක් පත් කිරීම සඳහා මා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. එකී කමිටු නිර්දේශ ලද පසු ඉහත පනත අහෝසි කර නව පනතක් ගෙන ඒම හෝ වෙනත් කවරාකාර සුදුසු පියවරක් ගැනීමට නියමිතය.

ප්‍රශ්න අංක 2, 3 සහ 4 සඳහා පිළිතුරු.

පොලිස් ත්‍රස්ත මර්දන විමර්ශන කොට්ඨාසය විසින් 2025.01.08 දිනැති ලිපිය මඟින් එවා ඇති තොරතුරු ඇමුණුම 01 ලෙස **සභාගත*** කරමි.

**** සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
** Document tabled:*

ඇමුණුම 01

අනු අංක 02 -

ත්‍ර.වැ.පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව - 4327

අනු අංක 03 -

ත්‍ර.වැ.පනත යටතේ අත්අඩංගුවට ගෙන නඩු පවරා ඇති සංඛ්‍යාව - 1418
නඩු පැවරීමේ ප්‍රතිශතය - 32.7%
නඩු පැවරීමක් සිදු නොකරන ලද සැකකරුවන් සංඛ්‍යාව - 2909

අනු අංක 04 -

අධිකරණ ක්‍රියාවලියෙන් පසු පුනරුත්ථාපනයට යොමු කර ඇති සංඛ්‍යාව - 1734

වර්ෂය	පුනරුත්ථාපනයට යොමු කල සැකකරුවන් සංඛ්‍යාව
2007	760
2009	25
2010	06
2011	388
2012	461
2013	22
2014	25
2015	44
2016	2
2018	1
එකතුව	**1734**

ත්‍ර.වැ.පනත යටතේ අත්අඩංගුවට ගෙන නිදොස් කොට නිදහස් කර ඇති සංඛ්‍යාව - 144

ප්‍රශ්න අංක 5, 6 සඳහා පිළිතුරු මෙසේයි.

2022 අංක 22 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත මඟින් පැය 72ක කාලයකට රඳවා තබා ගැනීමේ කාල සීමාව හඳුන්වා දී ඇති බව නිරීක්ෂණය කරමි. ඊට පෙර තිබුණු තත්ත්වය අනුව ඕනෑම පුද්ගලයෙකු රැඳවුම් නියෝගයක් මත රඳවා ගැනීමට තිබූ හැකියාව හා ඉන් සිදුවන මානව හිමිකම් කඩවීම් මෙම සංශෝධන මඟින් වළක්වා ඇති බව පෙනී යයි.

කෙසේ වෙතත්, මා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇති පත්‍රිකාවට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව විද්වත් කමිටුව පත් කිරීමට කටයුතු කරමින් පවතින බවත්, එම කමිටු නිර්දේශ සලකා බලා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පරිච්ඡේදීන්න කර ඒ වෙනුවට අලුත් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම මෙම රජයේ අරමුණ බවත් දන්වා සිටිමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මෙම කෙටි පැහැදිලි කිරීම සඳහා මා ඔබතුමාගෙන් කලින් අවසරය ඉල්ලා සිටියා. ඒ සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය පෙබරවාරි මාසයේ 27වැනි දා මා විසින් මෙම ගරු සභාවට 2023, 2024 හා 2025 වර්ෂවලට අදාළව හිටපු කථානායකවරුන්ගේ වියදම් සහ කථානායක නිල නිවසේ වියදම් මෙන්ම හිටපු කථානායක, හිටපු නියෝජ්‍ය කථානායක සහ හිටපු නියෝජ්‍ය කාරක සභාපති භාවිත කළ වාහන හා ඉන්ධන වියදම් සම්බන්ධයෙන් යම් තොරතුරු ප්‍රමාණයක් ඉදිරිපත්කොට සභාගත කරනු ලැබුවා. ඉන් පසුව 2023, 2024 වර්ෂවල කථානායක ධුරය හෙබවූ මහින්ද යාපා අබේවර්ධන මහතා එම තොරතුරු ව්‍යාජයන් බවට හැඟවෙන ආකාරයෙන් සහ මා විසින් එම තොරතුරු වගකීම් විරහිතව ඉදිරිපත් කළ බව හැඟවෙන ආකාරයෙන් විවිධ මුද්‍රිත මාධ්‍ය හා වෙබ් අඩවි ඔස්සේ ප්‍රකාශ සිදු කර තිබුණා. ගරු කථානායකතුමනි, කෙසේ නමුත් මම එදින මෙම සභාවට ඉදිරිපත් කරනු ලැබුවේ, ඔබතුමාගෙන් නිල වශයෙන් ලිඛිතව ඉල්ලා සිට ඔබතුමාගේ කාර්යාලයෙන් ලබා ගන්නා ලද තොරතුරු වාර්තා පමණයි.

එය ඉදිරිපත් කරන අවස්ථාවේදීත් මම ප්‍රකාශ කළා, අවශ්‍ය ඕනෑම අයෙකුට ඉල්ලීමක් කොට ඔබතුමාගේ අනුමැතිය මත තොරතුරු ලබාගත හැකි බව. ගරු කථානායකතුමනි, අද දින මෙම සභාව ඇමතීම මඟින් ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු සම්බන්ධයෙන් වැඩිදුර කරුණු පැහැදිලි කිරීමක් සිදු කිරීමට අපේක්ෂා කරනවා. එසේම, කරුණු වැඩිදුරටත් නිවැරදි බව තහවුරු කරගනු පිණිස විගණනයක් මඟින් හෝ මූල්‍යමය වගකීමක් දරන නිලධාරීන් මඟින් සහතික කරන ලද තොරතුරු ලබාදෙන මෙන් මා විසින් ඔබතුමාගේ කාර්යාලයෙන් ඉල්ලීමක් කරනු ලැබුවා. එම තොරතුරු මා වෙත ලබා දීමට කටයුතු සැලසීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

සෑම රාජ්‍ය ආයතනයකම මෙන්ම මෙම පාර්ලිමේන්තුව තුළත් වියදම් සඳහා භාවිත කරන්නේ ජනතාවගේ මුදල්, ගරු කථානායකතුමනි. එම නිසා මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ පරිපාලන වියදම් සම්බන්ධයෙනුත් ජනතාවට වගකිව යුතුව තිබෙනවා. අන් සෑම රාජ්‍ය ආයතනයක් මෙන්ම පාර්ලිමේන්තුවේද වියදම් විගණනයට බඳුන් කිරීමට ඔබතුමා විසින් ගෙන ඇති තීරණය අප ඉතාම අගයකොට සලකනවා. මාගේ දැනීමේ හැටියට එය Staff Advisory Committee එකේදීත් අනුමත වුණා. ජනතා නියෝජිතයන් ලෙස හැකි සෑම මට්ටමකින්ම ජනතාවට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම අපට අත් හළ නොහැකි වගකීමක් වෙනවා. එබැවින්, ගරු කථානායකතුමනි, මා විසින් ඔබතුමාගේ කාර්යාලයෙන් කරන ලද ඉල්ලීම අනුව පාර්ලිමේන්තුවේ මූල්‍ය අධ්‍යක්ෂකතුමා විසින් සහතික කර මා වෙත ලැබුණු වාර්තා ඔබතුමාගේ අවසරය මත සභාගත කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලබන වාර්තා අතර තිබෙනවා, 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා සහ 2024 ජනවාරි 01 දින සිට 2024 සැප්තැම්බර් මස දක්වා හිටපු කථානායකවරුන්, හිටපු නියෝජ්‍ය කථානායක අජිත් රාජපක්ෂ සහ හිටපු නියෝජ්‍ය කාරක සභාපතිවරයා වූ අංගජන් රාමනාදන් යන මහත්වරුන්ගේ ඉන්ධන වියදම් පිළිබඳ වාර්තාව, 2024 නොවැම්බර් 21 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කථානායකවරයාගේ, නියෝජ්‍ය කථානායකවරයාගේ සහ නියෝජ්‍ය කාරක සභාපතිවරුන්ගේ ඉන්ධන පිළිබඳ වාර්තාව, 2025 ජනවාරි 01 දින සිට 2025 ජනවාරි 31 දින දක්වා සහ 2025 පෙබරවාරි 01 දින සිට 2025 පෙබරවාරි 25 දින දක්වා වර්තමාන කථානායක ඔබතුමාගේත්, නියෝජ්‍ය කථානායකතුමාගේත්, නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේත් ඉන්ධන පිළිබඳ වාර්තාව.

ඊළඟට, 2024 ජනවාරි මස 01 දින සිට 2024 නොවැම්බර් මස 20 දින දක්වා කාලය තුළදී හිටපු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා භාවිත කළ කථානායක නිල නිවසේ ජලය,

[ගරු බිමල් රත්නායක මහතා]

විදුලිය හා දුරකථන ගාස්තු පිළිබඳ වාර්තාවක් සහ 2023 වර්ෂයට සහ 2024 වර්ෂයට අදාළව ආහාර වියදම් පිළිබඳ වාර්තාවක් ද තිබෙනවා. පාර්ලිමේන්තුවේ මූල්‍ය අධ්‍යක්ෂ, සරත් කුමාර මහතා විසින් සහතික කරන ලද මෙම වාර්තා ද සභාගත කරන්න මම බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, මෙම වාර්තා සම්බන්ධයෙන් කෙටියෙන් කාරණා කීපයක් කියන්න මට සුළු වේලාවක් ලබා දෙන්න. මම එදා නිශ්චිතවම මේ පිළිබඳව පැහැදිලි කළා. ඒ නිසා මේ අවස්ථාවේදී ඉන්ධන වියදම් පිළිබඳව චිතරක් සභාව දැනුවත් කරන්න මම කැමැතියි. පාර්ලිමේන්තුවත් ජනතාවට සියයට සියයක්ම වග කියන්න ඕනෑ; ජනතා මුදල්වලට වග කියන්න ඕනෑ. ජනතාවගේ මුදල් බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ගරු කථානායකතුමනි, එම නිසා මම හිතනවා, පාර්ලිමේන්තුවේ ඔබතුමා ඇතුළු අප සියලුදෙනාම අනෙකුත් රජයේ නිලධාරීන්ටත් වඩා වැඩියෙන් අරපිරිමැස්මෙන් යුතුව මූල්‍ය භාවිත කිරීම පිළිබඳ පරමාදර්ශයක් ලබා දිය යුතුයි කියලා. එම නිසා ඔබතුමා දරන උත්සාහය මා අගය කරනවා. මම ඉතාම ඉක්මනින් කියන්න කැමැතියි, හිටපු කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා 2023 ජනවාරි මාසයේ ඉඳලා 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ නවවැනි පාර්ලිමේන්තුවේ වාහන 8ක් භාවිත කර තිබෙන බවත්, ඒ සඳහා රුපියල් මිලියන 26ක ඉන්ධන භාවිත කර තිබෙන බවත්. එය පාර්ලිමේන්තුවේ මූල්‍ය අධ්‍යක්ෂතුමා සහතික කර තිබෙනවා. එම වාර්තාවත් සභාගත කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, 2023 සම්පූර්ණ වර්ෂයේම නියෝජ්‍ය කථානායක විධියට හිටියේ අජිත් රාජපක්ෂ මහතා. එතුමා වාහන 6ක් භාවිත කර තිබුණා. එතුමා රුපියල් මිලියන 14ක ඉන්ධන වියදම් ලබාගෙන තිබෙනවා. ඊට පස්සේ නවවැනි පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කාරක සභාපතිවරයා වාහන 4කට රුපියල් මිලියන 7.8ක -රුපියල් ලක්ෂ 78ක- ඉන්ධන භාවිත කර තිබෙනවා. 2024 වර්ෂයේදී හිටපු කථානායකතුමා වාහන 9ක් සහ රුපියල් මිලියන 33ක ඉන්ධන භාවිත කොට තිබෙනවා.

2024 වර්ෂයේ පළමුවෙනි මාස 9ට, වර්තමාන ආණ්ඩුව එනතෙක් හිටපු නියෝජ්‍ය කථානායකතුමා රුපියල් මිලියන 13ක ඉන්ධනත්, වාහන 6කුත් භාවිත කර තිබෙනවා. 2024 වර්ෂයේ පළමුවෙනි මාස 9ට හිටපු නියෝජ්‍ය කාරක සභාපතිතුමා වාහන 4ක් සමඟ රුපියල් මිලියන 7.2ක ඉන්ධන භාවිත කර තිබෙනවා. මේ සියල්ලම පාර්ලිමේන්තුවේ Director (Finance), Mr. G. Sarath Kumara විසින් සනාථකොට තිබෙනවා.

වර්තමාන පාර්ලිමේන්තුවේ තොරතුරුත් කියලාම මම මේ පැහැදිලි කිරීම අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි. 2024 වර්ෂයේ පළමුවෙනි මාස එකහමාරට නව කථානායකතුමා විසින් පාවිච්චි කරන ලද ඉන්ධන සඳහා වියදම රුපියල් 123,000යි; නියෝජ්‍ය කථානායකතුමාගේ ඉන්ධන වියදම එම කාලයට රුපියල් 45,000යි; නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ ඉන්ධන වියදම රුපියල් 18,000යි. ගරු කථානායකතුමනි, 2025 වර්ෂයේ ජනවාරි මාසයේ ඔබතුමාගේ ඉන්ධන වියදම රුපියල් 218,000යි; නියෝජ්‍ය කථානායකතුමාගේ ඉන්ධන වියදම රුපියල් 23,000යි, නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ ඉන්ධන වියදම රුපියල් 81,000යි. ගරු කථානායකතුමනි, පෙබරවාරි 25වන දා දක්වා ඔබතුමාගේ ඉන්ධන වියදම රුපියල් 123,000යි; නියෝජ්‍ය කථානායකතුමාගේ ඉන්ධන වියදම රුපියල් 25,000යි. මේ තොරතුරු ඇතුළත් වාර්තා සියල්ල මම **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගරු කථානායකතුමනි, වාර්තා ඉදිරිපත් කිරීම පමණක් නොවෙයි, ඔබතුමන්ලා ආදර්ශයෙනුත් අපට පෙන්වා තිබෙන දේ අපි අගය කරනවා. ඒ වාගේම අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාගේ අභිමතය පරිදි, විගණනයෙන් ලැබෙන තීරණ මත නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුළුවන් නම් ඒ පිළිබඳවත් කල්පනා කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, දහනවවන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: මාර්තු 11]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 11]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee.- [Progress: 11th March]
[HON. SPEAKER in the Chair.]

118 වන ශීර්ෂය.- කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,858,000,000

தலைப்பு 118.- கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 3,858,000,000

HEAD 118.- MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 3,858,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 118, 281, 282, 285 සිට 289, 292 සහ 327.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. Nalin Bandara Jayamaha. You have 18 minutes.

[පූ.භා. 10.06]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.12වන බදාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 118, 281, 282, 285 සිට 289, 292 සහ 327 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව

එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, ඉතා වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අපේ බොහොම ප්‍රසිද්ධ කියමනක් තිබෙනවා, "මඩ සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුසුයි" කියලා. ගොවියා සම්බන්ධයෙන් කථා කරද්දී මම කියන්න කැමතියි, ගොවියා නිසා රජෙකුට, රාජ්‍ය නායකයෙකුට ගෙදර යන්නත් සිද්ධ වුණාය කියන එක. රටේ ජනතාව පෙළ ගැහිලා මේ රටේ හිටපු රාජ්‍ය නායකයෙක් පලවා හැරියා. ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව කඩාගෙන වැටෙන්න ප්‍රධාන හේතුව වුණේ ගෝඨාභය රාජපක්ෂ-පාදෙනිය විසින් රසායනික පොහොර තහනම් කරලා, කාබනික වගාවට පැය 24න්, එක රැයින් - overnight - ගිහිල්ලා කරපු ඒ විනාශයයි. ඒ නිසා මහ කන්නයේ අස්වැන්න සියයට 37කිනුත්, යල කන්නයේ අස්වැන්න සියයට 30කිනුත් අඩු වුණා.

කෘෂිකර්ම ඇමතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ඇවිල්ලා කරපු හානිය තවමත් කෘෂි කර්මාන්තයට බලපා තිබෙනවා. තේවල එලදාව තවමත් අඩුයි. ඒකට හේතුව, ඒ අවුරුදු තුනක විතර කාලය තුළ පොහොර තහනම නිසා ඇති වූ බලපෑමයි. අද රටේ පොල් හිඟයක් තිබෙනවා. ඒ පොල් හිඟයටත් එදා පොහොර තහනම බලපෑවා කියලා නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා. ගෝඨාභය රාජපක්ෂගේ සංක්‍රාන්තියට - පැමිණීමට - එක පැත්තකින් ඔබතුමන්ලාත් දායක වුණා. ඒ ගැනත් පොඩ්ඩක් මම සිහිපත් කරන්න ඕනෑ. කෘෂි කර්මාන්තයේ විනාශයට හේතු වුණු, රටේ බංකොලොත්භාවයට හේතු වුණු ගෝඨාභය රාජපක්ෂ බලයට ගේන්න ඔබතුමන්ලාත් දායක වුණා කියන එක මම මතක් කරන්න ඕනෑ. ඔබතුමන්ලා හැමදාම කියනවා, අවුරුදු 76ක ශාපයක් ගැන. මේ ශාපයට කෘෂි කර්මාන්තය සහ වාරි කර්මාන්තය කිසිසේත්ම අදාළ නැහැ. අපේ රටේ කෘෂි කර්මාන්තය සහ වාරි කර්මාන්තය ගැන කථා කරද්දී ඔය "ශාපය" කියන කෑල්ල ඒ වරහන් තුළින් ඉවත් කරන්න.

ගරු සභාපතිතුමනි, 1948 අවුරුද්ද වනවිට මේ රටේ ජනගහනය මිලියන 6.5යි -ලක්ෂ 65යි. අද රටේ ජනගහනය මිලියන 23.1ක්. එදා ඒ ලක්ෂ 65න්, සියයට 35කට ආසන්න පිරිසකට ප්‍රමාණවත් සහල් නිෂ්පාදනයක් තමයි අපේ රටේ තිබුණේ. 1948 අවුරුද්දේ ඉඳන් 20වැනි ශත වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ විශේෂයෙන්ම 2000 අවුරුද්ද ආසන්න වනවිට අප රට සහලින් ස්වයංපෝෂිත වුණා.

රටේ ජනතාවට අවශ්‍ය සහල් ටික ලබා දෙන්න පුළුවන් තත්ත්වයට අපි පත් වුණා. ඒ කටයුත්ත පටන් ගන්න දායක වුණේ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමායි. ඩී.එස්. සේනානායක මැතිතුමා නොහිටින්න අද වනකොට අම්පාර කියලා දිස්ත්‍රික්කයක් නැහැ. ඩී.එස්. සේනානායක මැතිතුමා එදා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගරා වැටුණු වැව් ටික ප්‍රතිසංස්කරණය කරන්න පටන් ගන්නකොට -පොළොන්නරුවේ අපේ කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගම් 18යි තිබුණේ. ඒවා පාරම්පරික ගම්. අපේ ගරු මන්ත්‍රීතුමා ඇතුළු දිස්ත්‍රික්කයේ අනිබහුතරයක් වෙනත් දිස්ත්‍රික්කවලින් ඒ දිස්ත්‍රික්කයට ගිය අය. දිස්ත්‍රික්කයටම තිබුණේ ගම් 18යි. "මින්නේරිය දෙයියෝ" කියලා තමයි ඩී.එස්. සේනානායක මැතිතුමාට කියන්නේ. මේ අවුරුදු 76දී සිද්ධ වෙච්ච දේවල් මම මේ සිහිපත් කරන්නේ, ගරු සභාපතිතුමනි. ඒ වාගේම සී.පී. ද සිල්වා මැතිතුමා, ඩඩ්ලි සේනානායක මැතිතුමා සහ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් දක්වපු දායකත්වය මම සිහිපත් කළ යුතුයි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා කඩිනම් මහවැලිය ව්‍යාපාරය හැදුවා. 1961දී තමයි මහවැලි ව්‍යාපාරය සැලසුම් කරන්න පටන් ගත්තේ. අපේ රටේ dry zone එක සියයට 30ක් තිබෙනවා. මහවැලි ව්‍යාපාරයෙන් ඒ dry zone එකෙන් සියයට 57ක් ආවරණය වෙනවා; රටේ සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් සියයට 30කට ආසන්න ප්‍රමාණයකට ජලය ලබා දෙනවා. ඒ වාගේම මහවැලි ව්‍යාපාරය ආරම්භ කරලා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එය අවසන් කළා. දැන් ගොඩක් වෙලාවට අපි මතක් කරන්නේ මහවැලි ව්‍යාපාරය තුළ සිදු වන විදුලිබල නිෂ්පාදනය ගැනයි. විදුලිබල නිෂ්පාදනය නොවෙයි, ඇත්තටම මහවැලි ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණ වුණේ අපේ රටේ dry zone එක පෝෂිත කලාපයක් බවට පත් කිරීමයි; එම ප්‍රදේශය වගා කළ හැකි බිම් බවට පත් කිරීමයි. ඒ නිසා ලාල් කාන්ත ඇමතිතුමනි, අවුරුදු 76ක ශාපයට කෘෂිකර්මය, වාරි කර්මාන්තය අදාළ කර ගන්න එපා. ශාපයට හේතු වුණු කරුණු කාරණා ගණනාවක් තිබෙනවා.

ඒ වාගේම තාක්ෂණික පැත්තෙන් කෘෂි කර්මාන්තයේ වුණු දියුණුව බලන්න. 1948 වනකොට අක්කරයකින් ගත්තේ වී කිලෝ 700යි, 800යි, නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ ප්‍රමාණය කිලෝ 3,500ට වැඩි වුණා. ඒක ශාපයක් වෙන්න බැහැ, ගරු අගමැතිතුමියනි. ඒ නිසා මේ "ශාපය" කියන එක හැම එකටම අදාළ කර ගන්න එපා. එහෙම කළොත් ඒක ඩී.එස්. සේනානායක මැතිතුමාට, ඩඩ්ලි සේනානායක මැතිතුමාට, සී.පී. ද සිල්වා මැතිතුමාට, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට කරන අගෞරවයක්. ඒ ව්‍යාපෘති, ඒ ගත්ත ක්‍රියාමාර්ග වාගේම ගල්ඔය ව්‍යාපාරයෙන් පටන් අරගෙන කරගෙන ගිය වැඩ පිළිවෙළ නිසා තමයි අපේ රට අද වනකොට සහලින් ස්වයංපෝෂිත වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය අරගෙන බලන්න. ඔබතුමන්ලාගේ මේ මැතිවරණ ප්‍රකාශනය, ඔබතුමන්ලාගේ අය වැයෙන් පිළිබිඹු වෙනවාද? මට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය ඒකයි. මේ මැතිවරණ ප්‍රකාශනයත්, ඔබතුමන්ලාගේ අය වැය කථාවත් සමාන්තරද? සමපාත වෙනවාද? අපිට පෙනෙන්නේ නැහැ, ඒක. මම හිතන විධියට, ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රකාශනය පැලවත්තෙන් සකස් කරන්න ඇති. හැබැයි, ඔබතුමන්ලාගේ අය වැය කථාව හැදුවේ රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ කාලයේත් හිටපු මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් ටික. ඒ නිසා මේ දෙක සමපාත වෙන්නේ නැහැ කියන එක නම් බොහොම පැහැදිලියි. ඒකට හොඳම උදාහරණයක් මම කියන්නම්. මම මේ කියන කාරණය ගැන නාමල් කරුණාරත්න මහත්මයායි, මමයි මැතිවරණ සමයේත් රූපවාහිනී නාළිකාවක බොහොම ලොකුවට වාද කළා. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 112හි සඳහන් කර තිබෙනවා, ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික ඉඩම් අක්කරයකින් වාර්ෂිකව රුපියල් මිලියන තුනක් උපයා ගැනීමට කටයුතු කරන බව. රුපියල් මිලියන තුනක් එක අක්කරයකින් ගන්නවා ලු, ගරු සභාපතිතුමනි. ඔබතුමාට කුඹුරු හෝ ගොඩඉඩම් හෝ තිබෙනවා නම් මට පොඩ්ඩක් පැහැදිලි කරන්න, එහෙම රුපියල් මිලියන තුනක් හොයන්නේ කොහොමද කියලා.

මම දන්නා විධියට මේ ගරු සභාවේ ඉන්නවා, හොඳම ගොවියෙක්. ඒ තමයි අපේ රාධක්‍රිෂ්ණන් මැතිතුමා. අල ගොවීන්ට ඉඳලා හිටලා ස්වීප් එකක් ඇදිලා වාගේ නම් රුපියල් මිලියන තුනක විතර ආදායමක් අක්කරයකින් ලැබෙන අවස්ථා ඇති. නමුත් සාමාන්‍යය - average එක - රුපියල් මිලියන තුනක් කියන එක පට්ටපල් බොරුවක්. අපේ රටේ තිබෙන ඉඩම්වලින් අනිබහුතරයක් කුඹුරු ඉඩම්. කුඹුරු ඉඩම්වල කන්න දෙකම වගා කළත් ගරු සභාපතිතුමනි, රුපියල් ලක්ෂ පහක ලාභයක් නොවෙයි, එහෙම ආදායමක්වත් උපයන්න බැහැ. ඒ නිසා රුපියල් මිලියන තුනක ආදායමක් ගන්න පුළුවන් කියා ගණන් හදපු පැලවත්තේ කෘෂිකර්ම විශාරදවරු කවුද කියලා ලාල් කාන්ත මහත්තයා පොඩ්ඩක් හොයා බලන්න. මොකද, ඒ විධියට අක්කරයකින් රුපියල් මිලියන තුනක ආදායමක් ලබා ගන්න පුළුවන් වුණොත්, අපේ කෘෂි කාර්මික ඉඩම් අක්කර ප්‍රමාණය ඒ මුදලින් වැඩි කරලා බැලුවාම, ඉඩම් අක්කර ලක්ෂ හයකින් ලබන ආදායම රුපියල් බිලියන 18,000 ඉක්මවනවා. රුපියල් බිලියන 18,000ක්! එහෙම වුණොත් ආර්ථිකය නහාසිටුවන්න වෙන මුකුත්

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

කරන්න ඕනෑ නැහැ, බිමල් රත්නායක ඇමතිතුමනි. මේ වැඩෙන් පුළුවන්, රට ගොඩ දමන්න. නමුත් මේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එක හුදු සුන්දර ළමා කථාවක්, එහෙම නැත්නම් සුරංගනා කථාවක් වාගේ තමයි අපට පෙනෙන්නේ.

ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ වාගේම ඔබතුමන්ලාගේ අය වැය ලේඛනය තුළත් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. වගා හානි සඳහා ඔබතුමන්ලා මුදල් වෙන් කර තිබෙනවාද? අපි දකින්නේ නැහැ, වගා හානි සඳහා මුදල් වෙන් කර තිබෙනවා කියලා. 2024 අවුරුද්දේත් වගා හානි සඳහා රනිල් වික්‍රමසිංහ සීයා මුදල් වෙන් කර තිබුණා. හැබැයි, අපේ ජනාධිපති සහෝදරයා වගා හානි සඳහා මුදල් වෙන් කර තිබෙන බවක් අපිට පෙනෙන්නේ නැහැ. ඒ නිසා පුනරුදයේ මංගල පස් පිඬැල්ල කපන මේ මංගල අය වැයේ අපට පෙනෙන්නේ නැහැ, ඒ පුනරුද යුගය සඳහා ගමන් කරන මාර්ගය විවර වෙනවා කියන කාරණය. ඔබතුමන්ලා කිව්වා, ජාතික ප්‍රතිපත්තියක් බවට පත් කරනවා කියලා ඔබතුමන්ලාගේ මේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය.

හැබැයි කෝ, ඒකට මුදල් වෙන් කරලා? කොයි කෙලවරේද තිබෙන්නේ? පිටුවක දාරයකවත් තිබෙනවාද, නැත්නම් පිටකවරයේ වැහිලා තිබෙනවාද? මුදල් වෙන් කරලා තිබෙනවා කියලා අපිට පෙනෙන්නේ නැහැ. වචන හරඔයක් විතරයි තිබෙන්නේ ඔබතුමන්ලාගේ මේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ.

දැන් අපේ නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා 15වැනි දාට වඳුරු සංගණනය කරන්න යොදාගෙන තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා මේ වඳුරු සංගණනයක් කරන්න තීරණය කරන්න කලින් වඳුරන් සම්බන්ධව යම් යම් තීන්දු තීරණ ගත්තා. *[බාධා කිරීමක්]* ඔව්, මම එළියට එනවා. මොකද, මගේ වත්තෙත් ගණන් කරන්න එපා යැ.

ලාල් කාන්ත ඇමතිතුමා ඉස්සෙල්ලාම කිව්වා, එන සතුන්ට ඕනෑ දෙයක් කරන්න ගොවීන්ට බලය දෙනවා කියලා. ඒ කියන්නේ, "ෂොට්" එක දුන්නාට කමක් නැහැ කියලා කිව්වා. හැබැයි, මේ සංගණනය කරන්න තීරණය කරන්න කලින් ඒක කිව්වේ. ඊට පස්සේ කිව්වා, ඒ සතුන් අල්ලලා කූඩුවලට දමනවා කියලා. ටීවී එකෙන් දවසක් දෙකක් දැක්කා නේ, ඒ සතුන් අල්ලලා කූඩුවලට දාලා තැන් තැන්වලට ගෙනියනවා. ඊට පස්සේ වන්ධ්‍යාකරණය කරනවා කිව්වා. හැබැයි, මේ ඔක්කොම කිව්වේ සංගණනය කරන්න තීරණය කරන්න කලින්. දැන් අපිට තිබෙන ප්‍රශ්නය, මේ සංගණනය කළායින් පස්සේ කරන්නේ මොකක්ද කියන එකයි. ඒ නිසා සංගණනයෙන් පස්සේ මොකක්ද කරන්නේ කියලා අපිට පොඩ්ඩක් කියන්න. ඒ වාගේම මේ වඳුරු සංගණනය පිළිබඳ අදහස ඔබතුමන්ලාට දුන්නේ කවුද කියලාත් නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, රටට පොඩ්ඩක් පැහැදිලි කරන්න. මොකද, මේක හොඳටම fail, utter fail case එකක් කියලා තමයි රටේ ජනතාව, බුද්ධිමතුන් කියන්නේ.

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සත්ව සංගණනයට හසු වෙන්නේ දවල්ට හානි කරන සතුන් විතරයි. නමුත් රාත්‍රී කාලයේ වගාවන්ට හානි කරන සතුනුත් ඉන්නවා නේ. වල්ඌරන් ඉන්නවා, ඉත්තෑවන් ඉන්නවා. ඒ සතුන් අතහැරියේ, ඒ සතුන් NPP එකේ නිසාද කියලාත් මට පොඩි සැකයක් තිබෙනවා. වල්ඌරායි, ඉත්තෑවායි NPPවත්ද? ඒ සතුන් මේකෙදි අතහැරලා තිබෙනවා.

අනික ගරු සභාපතිතුමනි, සතුන් වගා භූමිවලට එන්නේ වගා භූමියේ තිබෙන තත්ත්වයත් එක්ක. බඩඉරිඟු කරල හැදෙන කාලයට සතුන් එනවා මිසක්, අනෙක් කාලයට සතුන් එතැනට එන්නේ නැහැ. අඹ ගහේ ගෙඩි තිබෙනවා නම් තමයි වඳුරා අඹ ගහට නඟින්නේ. රඹුටන් ගහේ ගෙඩි තිබෙනවා නම් තමයි දඹුලේනා, වවුලා එන්නේ. ඒ තත්ත්වයන් එක්ක තමයි ඒ සතුන් එන්නේ. අනික, විනාඩි පහෙන් මේ සතුන් ගණන් කරන්නේ කොහොමද? මම ස්ථාන පහක්, දහයක් කියන්නම්, නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා මට කියන්නකෝ, විනාඩි පහෙන් ගණන් කරන්නේ කොහොමද කියලා.

සීගිරිය ගත්තොත්, විනාඩි පහෙන් එතැන ඉන්න සතුන් ගණන් කරන්නේ කොහොමද කියලා මට පොඩ්ඩක් පැහැදිලි කරන්න. ඒ වාගේම කලා වැවේ බන්ට් එකේ ඉන්න සතුන් කොහොමද විනාඩි පහෙන් ගණන් කරන්නේ? දඹුල්ලේ ලෙන් විහාරය ළඟ ඉන්න සතුන් කොහොමද විනාඩි පහෙන් ගණන් කරන්නේ? පොළොන්නරුවේ නටබුන් භූමියේත් එහෙම ගණන් කරන්නේ කොහොමද? කතරගම පූජා භූමියේ කිරි වෙහෙර වටේ ඉන්න වඳුරන් විනාඩි පහෙන් ගණන් කරන්නේ කොහොමද? කලින් ගණන් කර තිබෙනවාද?

ලොකු වගා භූමි තමයි අපේ රටේ ගොඩාක් තිබෙන්නේ. මම හිතන විධියට, අපේ රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමාගේ එළවලු වගා භූමි ගත්තොත්, අක්කර 50ක්, 60ක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වගා භූමියට හානි කරන්නේ රෑට එන සතුන් නේද? *[බාධා කිරීමක්]* වල්ඌරන් ඉන්නවා. ඔබතුමාට විනාඩි පහෙන් ගණන් කරන්න බැහැ නේ. වල්ඌරා NPP නිසා අයින් කරලා දාලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, එතුමාගේ වගාවට වැඩියෙන් හානි කරන්නේ, වල්ඌරන්. අපට පෙනෙන්නේ නැහැ, මේ දත්ත නිවැරදිව ගණනය කරන වැඩ පිළිවෙළක්. එවැනි වැඩ පිළිවෙළක් මෙතැන නැහැ. ඇත්තටම, ඔබතුමන්ලාට සංගණනය කරන්න තිබෙන්නේ ඕවා ගැන නොවෙයි. ඔබතුමන්ලා ළඟ හරියට data තිබෙනවාද, මිරිස් ගොවීන් කොපමණ ඉන්නවාද, වාර්ෂිකව කොච්චර මිරිස් ප්‍රමාණයක් වගා කරනවාද, අල කොච්චර වගා කරනවාද, කැරට්, බෝංචි කොච්චර වගා කරනවාද කියලා? ඔබතුමන්ලාට තිබුණා අන්න ඒවාට අදාළ දත්ත එකතු කරන්න. අපි දන්නවා, මේ රටේ නීත්‍යානුකූල නොවන කෘෂි රසායන ද්‍රව්‍ය තිබෙන බව. ඒවා ඉන්දියාවෙන් බෝට්ටුවෙන් එනවා. ඒ නීත්‍යානුකූල නොවන කෘෂි රසායන ද්‍රව්‍ය විකුණන කඩ තිබෙනවා. අන්න ඒවා කොච්චර තිබෙනවාද කියලා සංගණනය කරන්න ඔබතුමන්ලාට තිබුණා. ඒ database එක ගන්න ඔබතුමන්ලා කටයුතු කරන බවක් අපට පෙනෙන්නේ නැහැ.

අනික, ඔබතුමන්ලා කෘෂිකර්ම අමාත්‍යාංශයට තමයි මේ සත්ව සංගණනය කරන්න භාර දී තිබෙන්නේ. නමුත්, වනජීවී දෙපාර්තමේන්තුවට, පරිසර අමාත්‍යාංශයට මේ වගකීම භාර දෙන්න තිබුණා. මේ, සංගණනය කරන්න බැරි දෙයක් නොවෙයි. නාක්ෂණය පාවිච්චි කරලා මේවා කරන රටවල් තිබෙනවා; කරපු රටවල් තිබෙනවා. ඒ අත්දැකීම් පාවිච්චි කරනවා. මුළු රටේම ගන්න ඕනෑ නැහැ, Samples ටිකක් ගන්න තිබුණා. නිශ්චිත samples ටිකක් අරගෙන photographyවලින්, censusවලින් ගණනය කරලා ඒ මත පදනම්ව ඔබතුමන්ලාට database එකක් හදා ගන්න තිබුණා. ඔය කරන වැඩේ නම් කොහොමත් සියයට සියයක් හරි වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ඔය ගන්න එකනේ සියයට 50ක්වත් හරියන්නේ නැහැ නේ. ඒ නිසා ඔය සත්ව සංගණනය සඳහා ඔයිට වඩා නිවැරදි ක්‍රමයක් අනුගමනය කරන්න තිබුණා. පැහැදිලිවම අපි දකිනවා, මේක අසාර්ථක වැඩ පිළිවෙළක් කියලා.

අපි දන්නවා, මේ රටේ සහල් හිඟයක් ඇති වුණු බව. ඒ සහල් හිඟයට විසඳුමක් ලෙස මොකද කළේ? තීන්දු කළා, සහල් පිටරටින් ගේන්න. අපි දන්නවා අපේ රටේ රුපියල් 60ක, 65ක බද්දක් සහල් මත පනවා තිබෙන බව. ඒ මොකද? සහල් ආනයනය අධෛර්යවත් කරන්න. හැබැයි, හිඟයක් ඇති වුණාම ඉතිහාසයේ හැමදාමත් කළේ ඒ බද්ද අඩු කරපු එක. 2024 ජනවාරි මාසයේදී ඒ රුපියල් 65ක බද්ද රුපියල කළා, සහල් හිඟයක් ඇති වුණාම. දැන් ඔබතුමන්ලා කියනවා, බද්ද අඩු කරන්නේ නැත්තේ ගොවියා ආරක්ෂා කරන්න කියලා. සහල් හිඟය ඇති වුණු කාලයේ ගොවියා ළඟ වී තිබුණේ නැහැ. එහෙම නේද කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා? හිඟ කාලයේ ගොවියා ළඟ වී නැහැ. හිඟ කාලෙට වී තිබෙන්න පුළුවන් මහා පරිමාණ මෝල්වල, මහා පරිමාණ ව්‍යාපාරිකයා ළඟ.

ගරු සභාපතිතුමනි, හිඟය කාලයේ ගොවියා ළඟ වී නැහැ. කිලෝ එක රුපියල් 80ට, 85ට ගත්තු වීවල සහල්වලට තමයි ඔබතුමන්ලා රුපියල් 220ක සහනික මිල තිබුණු එකට තව රුපියල් 10ක් එකතු කරලා රුපියල් 230 කරලා ව්‍යාපාරිකයන්ට විකුණන්න අවස්ථාව දුන්නේ. එදා ඔබතුමන්ලා ඒ රුපියල් 10 වැඩි කර දීමෙනුත්, රුපියල් 65ක ආනයන බද්ද අඩු නොකිරීමෙනුත් වාසිය අත් වුණේ මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට. ඉස්සර කථාවක් තිබුණා, "ඩඩ්ලිගේ බඩේ මසල වඩේ" කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට තව විනාඩි කිහිපයක් දෙන්න, ගරු සභාපතිතුමනි.

දැන් අපට කියන්න වෙන්නේ, "ඩඩ්ලිගේ බඩේ මාලිමාව" කියලා තමයි. මසල වඩේ නොවෙයි. *[බාධා කිරීමක්]* ගැළපෙන්නේ නැති වුණාට ගළපලා ගන්න පුළුවන්. ඔබතුමන්ලා බද්ද අඩු නොකිරීමෙනුත්, රුපියල් දහයක් වැඩි කිරීමෙනුත් වාසිය වුණේ මහා පරිමාණ වී මෝල් ව්‍යාපාරිකයන්ට පමණයි. පැහැදිලිව කිව්වොත්, ඔබතුමන්ලා මේ රටේ ගොවියාට වාසියක් වන තීන්දු - තීරණ ගත්තේ නැහැ. ඔබතුමන්ලා පනවපු රුපියල් 65ක ආනයන බද්දෙන් රුපියල් බිලියන 10ක ආදායමක් ලැබුවා. එතැනදී බලාපොරොත්තු වුණේ බදු ආදායම නොවෙයි. එදා ඒ වෙලාවේ ඒ බද්ද අඩු කළා නම් -රුපියල් 65 රුපියල දක්වා අඩු කරන්න නොවෙයි, යම් මුදලක් අඩු කළා නම්- වෙළෙඳපොළ තුළ ආනයනික සහල්වල මිල අඩු වෙනවා. එතකොට ඒ හරහා දේශීය මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට දැවැන්ත ලාභයක් ලබා ගන්න ලැබෙන්නේ නැහැ. ඔවුන්ටත් වෙළෙඳපොළ තුළ තමන්ගේ මිල යම් මට්ටමකට පහළට ගෙනෙන්න සිද්ධ වනවා. ඔබතුමන්ලා ඒක කළේ නැහැ. ඒ වෙනුවට කළේ, මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට ශක්තිය දීම. හැබැයි කිව්වේ, බද්ද අඩු කළේ නැත්තේ ගොවියා නිසා කියලා. ගොවියා ළඟ වී ඇටයක්වත් නැහැ. එදා ඔබතුමන්ලා එම සහනය දුන්නෙත් මහා පරිමාණ ව්‍යාපාරිකයන්ටයි කියන එක අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. ඒ වාගේම අපි දන්නවා ඔබතුමන්ලා ඔය කියන, අවුරුදු 76ක් පුරා ශාපයක් කළා යැයි කියන ආණ්ඩු කවදාවත් මේ විධියට කටයුතු කරලා නැහැ කියලා.

ගරු සභාපතිතුමනි, වාරිමාර්ග අමාත්‍යාංශය ගැන කථා කරනකොට කියන්නම ඕනෑ කාරණයක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා වයඹ ඇළ ව්‍යාපෘතිය ගැන. දැනට එම ව්‍යාපෘතියට වියදම් කරලා තිබෙනවා රුපියල් බිලියන 22කට ආසන්න මුදලක්. රුපියල් බිලියන 22ක් වියදම් කරලා ඒ කිලෝමීටර 85න් හදලා තිබෙන්නේ කිලෝමීටර 20ක්, 25ක් පමණයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කිහිපයක් ලබා දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩි 2ක කාලයක් ලබා දෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ස්තුතියි.

හැබැයි, වයඹ ඇළ ව්‍යාපෘතියට වියදම් කරපු මුදල්වලින් අද ප්‍රයෝජනයක් නැහැ. මොකද, වයඹ ඇළේ ප්‍රධාන පිවිසුම තිබෙන බෝවතැන්න ජලාශයේ සිට වැමැඩිල්ල ජලාශයට කිලෝමීටර 12ක tunnel එකක් හැදෙන්න ඕනෑ. ඒ tunnel එක හදලා නැහැ. තව ඩොලර් මිලියන 370ක් විතර ඕනෑ වෙනවා ව්‍යාපෘතිය අවසන් කරන්න.

ඒ කියන්නේ, අපේ වයඹට වතුර ගේන්න; පොල්පිතිගමට වතුර ගේන්න; ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ ගම් ප්‍රදේශයට වතුර ගේන්න. හැබැයි, ඒකට අවශ්‍ය මුදල් සොයා ගන්න ඔබතුමන්ලා කටයුතු කරනවා ද? අපට එවැන්නක් පෙනෙන්නේ නැහැ. ඒ නිසා වහාම වයඹ ඇළ ව්‍යාපෘතිය අවසන් කරන්න අවශ්‍ය වැඩ කටයුතු කරන්න කියන ඉල්ලීම මා කරනවා.

මට තවත් ගොඩක් දේවල් ගැන කථා කරන්න තිබෙනවා. හැබැයි, මට අද ලබා දී තිබෙන මේ වෙලාව ඇත්තටම කොහොමටවත් ප්‍රමාණවත් නැහැ. නමුත්, මගේ ප්‍රදේශවල ජනතාවටත් බලපාන ප්‍රශ්නයක් නිසා, බිත්තර කර්මාන්තයත් ගැන කියලා තමයි මට කථාව අවසන් කරන්න වෙන්නේ. අද බිත්තර කර්මාන්තය කඩා වැටිලායි තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ගිය අවුරුද්දට කලින් අවුරුද්ද වනකොට එක පුරවැසියෙකු වාර්ෂිකව පාවිච්චි කළේ බිත්තර 100ක්, 120ක් වාගේ ප්‍රමාණයක්. අද වනකොට එම වාර්ෂික බිත්තර පරිභෝජනය 168, 170 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒක හොඳයි. මොකද, අඩුම මිලකට වැඩිම ප්‍රෝටීන් ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් ආහාරයක් තමයි බිත්තර කියන්නේ. බිත්තරයෙන් ගන්නා පෝෂණය, කුකුළු මස්වලින් ගන්න ගියොත් ග්‍රෑම් 80ක් අවශ්‍යයි. දැන් මිලත් එක්ක බලනකොට, කුකුළු මස් ග්‍රෑම් 80ක් ගන්න රුපියල් 100ක් විතර යනවා. හැබැයි, අද බිත්තරයක් රුපියල් 30යි. බිත්තරයක් රුපියල් 50ට වැඩි වුණත් කමක් නැහැ. බිත්තර කර්මාන්තය රැක ගන්න කටයුතු කරන්න ඕනෑ, ගරු ලාල් කාන්ත ඇමතිතුමනි. අද එම කර්මාන්තය වැටිලා. බිත්තරයක් farm එකෙන් ගන්නේ රුපියල් 25ක්, 28ක් වාගේ මිලකට. ඒ මදිවාට ඔබතුමන්ලා බිත්තරයට VAT ගහලා. ඇයි, බිත්තරයට VAT ගහලා තිබෙන්නේ? ඔබතුමන්ලා ගහනකොට ගහලා තිබෙනවා, ගොවියාටයි, රටටයි සේරටම වදින විධියට, ලැබුණු ප්‍රෝටීන් ටිකත් නැති වෙලාම යන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු සභාපතිතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්. මට කථා කරන්න වෙලාව මදි. මම ඒ ගැන කනගාටු වෙනවා.

කරුණාකර ඔබතුමන්ලා මේ බිත්තර මත පනවා තිබෙන VAT එක ඉවත් කරන්න. මට තේරෙන්නේ නැහැ, එහි තිබෙන value addition එක මොකක්ද කියලා. මොකද, ගොවි පොළෙන් එන බිත්තරය තමයි වෙළෙඳ පොළට යන්නේ. එතකොට කඩේ ඉන්න මනුෂ්‍යයාට VAT එක ගහන්න බැහැ. Supermarkets තිබෙනවා නේ. ඔබතුමන්ලා ඒවාට VAT ගැහුවාට කමක් නැහැ. එහිදී ඒවා pack කරලා පිළිවෙළට යනවා. හැබැයි, අනෙක් තැන්වල එහෙම නැහැ. Unprocessed product එකක් විධියට තමයි බිත්තරය තිබෙන්නේ. ඒ නිසා බිත්තරය මත පනවා ඇති VAT එක ඉවත් කරන්න කියා මම ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිනවා.

වාරිමාර්ග අමාත්‍යාංශය සම්බන්ධයෙන් කරුණු කාරණා විශාල ප්‍රමාණයක් කථා කරන්න තිබුණත්, කාලය ප්‍රමාණවත් නැහැ. ගරු ඇමතිතුමනි, මම මේ අහපු ප්‍රශ්නවලට ඔබතුමන්ලාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. K.D. Lal Kantha. You have 25 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

අතුන්පිරකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 10.27]

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට මහවැලියත් එකතු කළාට පසුව මේ සභාවට වාගේම රටටත් වැටහෙනවා, මේක දැවැන්ත අමාත්‍යාංශයක් බව. ඒ අනුව විශාල කාර්යභාරයක් පැවරෙන විශාල අමාත්‍යාංශයක් හැටියට අපට මෙය නම් කරන්න පුළුවන්. අපේ ගරු ජනාධිපතිතුමා මේ ආයතන ටික ඔක්කෝම එක තැනකට එකතු කරගත්තේ, එක තැනකට එකතු කරලා එක අමාත්‍යාංශයක් බවට පත් කළේ කෘෂිකර්ම සහ පශු සම්පත් ක්ෂේත්‍රයට අවශ්‍ය කරන සෑම කාර්යයක්ම මේ ආයතන එකට එකතු කරගත්තාට පස්සේ කරගන්න පුළුවන් කියන විද්‍යාත්මක ගණන් බැලීමක් සහිතවයි. ඒ නිසා මම මුලින්ම අපේ මුදල් ඇමතිතුමා වන ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, අමාත්‍යාංශ ගණනාවක් යටතේ තිබුණු, ඇමතිවරුන් ගණනාවක් යටතේ තිබුණු, රාජ්‍ය ඇමතිවරුන් විශාල පිරිසක් යටතේ තිබුණු, බෙදිලා විසිරිලා ගිය කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ආයතන, දෙපාර්තමේන්තු ඇතුළු ඔක්කෝම එක තැනකට අරගෙන එක් අමාත්‍යාංශයක් හැටියට ගොඩනැඟීම ගැන. ඊළඟට මම ස්තුතිවන්ත වෙනවා, අපේ රටේ ගොවි ජනතාවට. මොනවා වුණත්, අපේ රටේ ගොවි ජනතාව දුක් කරදර විඳිමින් අපේ රටේ ජනතාවට කන්න බත සපයලා තිබෙනවා. අඩු පාඩුකම් තිබෙන බව ඇත්ත. ඒ අඩු පාඩුකම්වලට විවිධ හේතු තිබෙනවා. නමුත්, පොදුවේ ගත්තාම යල මහ කන්න දෙකම දුක් විඳිමින්, ඇතැම් වෙලාවට අමතර කන්නවලත් වැඩ කරමින් අපේ රටේ ජනතාවට ආහාර ටික ලබා දෙන්න කටයුතු කරන ගොවි ජනතාව මම මුලින්ම බොහොම ආදරයෙන් සහ ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි.

අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගත්තාම, එහිත් අඩුපාඩු තිබෙනවා. දැනුත් දිනපතා අපට ඒවා වාර්තා කරනවා. එහි තිබෙන විවිධ අඩුපාඩුකම් ගැන ජනතාවත් වාර්තා කරනවා, ගොවි ජනතාවත් වාර්තා කරනවා, ආයතනය ඇතුළේ කටයුතු කරන නිලධාරි මහත්ම මහත්මීනුත් වාර්තා කරනවා.

සමහර අකටයුතුකම්, අකාර්යක්ෂමතා දිනපතා වාර්තා වෙනවා. අපි ඒවා මඟ හරවන්න ඕනෑ. ඒවා මඟ හැරවීමේ අධිෂ්ඨානයකයි ඉන්නේ. නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ඒ අදාළ වගකිව යුතු නිලධාරි මහත්ම මහත්මීන් අපේ රටේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් ඉෂ්ට කර තිබෙනවා. ඩඩ්ලි සේනානායක මැතිතුමා ගැනත් මෙහිදී කියැවුණා. ඒ වාගේ මහත්වරුන් වාගේම තවත් එහෙම මැදිහත් වෙච්ච දේශපාලනඥයෝත් යම් කාර්යභාරයක් කරලා තිබෙනවා. අපි ඒවා අගය කරනවා. ඒ වාගේම මෑත යුගයේ දේශපාලනඥයන් මේ ක්ෂේත්‍රය විනාශ කරපු බව ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාත් පිළිගනීවි කියලායි මා හිතන්නේ. මම ඒවා ගැන ගොඩක් කියන්න යන්නේ නැහැ. මගේ වගකීම වන්නේ, අතීතයට දොස් පවර පවරා ඉන්න එක නොවෙයි. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්, වාරිමාර්ග අමාත්‍යාංශය රටේ ජනතාවට අවශ්‍ය කරන ආහාර නිෂ්පාදනය සඳහා, ආහාර සුරක්ෂිතභාවය සඳහා මෙහෙයවන එකයි, මගේ වගකීම. ඒ නිසා මම ගොඩක් වෙලාවට අතීතය ගැන කථා කරන්න එච්චර කැමැති නැහැ. නමුත් අතීතයේ අත්දැකීම් සැලකිල්ලට ගන්න තිබෙනවා. එය කරන්න ඕනෑ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වාගේම අපේ පශු සම්පත් ක්ෂේත්‍රය වෙනුවෙන් දැනට මැදිහත් වෙලා ඉන්න සියලු දෙනාත් මේ වෙලාවේ සිහිපත් කරලාම කථාව පටන් ගන්න ඕනෑ කියලායි මා හිතන්නේ. වැඩ කරන්න යන කොට පෙනෙන, එම ක්ෂේත්‍රයට අදාළ ආයතනවලත් පුරප්පාඩු ගොඩක් තිබෙනවා. පශු වෛද්‍යවරුන් නැහැ කියලා කිව්වත් කමක් නැහැ. නැතිම තරම්! පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. තමන්ගේ කාර්යයන් ඉෂ්ට කරන්න එක්කෙනෙකුට, දෙන්නෙකුට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ක්ෂේත්‍රයේ ඉන්න අයට විශාල කාලයක් වැය කරලා ලොකු කැපකිරීමක් කරන්න සිදු වෙලා තිබෙනවා. මෑත කාලයේ සූකර උණ රෝගය ඇති වුණා. ඒ වෙලාවේ මේ තත්ත්වය හොඳටම දකින්න පුළුවන්කම ලැබුණා. ඒ කර්මාන්තය මුළුමනින් විනාශ වෙලා ගියා. එය මුල ඉඳන්ම, අලුතින්ම පටන් ගන්න වෙලා තිබෙනවා. ඒ නිසා අපේ පශු සම්පත් ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලවල පුරප්පාඩු ඉක්මනින් පුරවා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ අය වැයෙනුත් ඒ සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, වාරිමාර්ග සහ ඉඩම් ක්ෂේත්‍රය විශාල දායකත්වයක් ලබා දීලා තිබෙනවා, අපේ කෘෂි කර්මාන්තයේ දියුණුවට. ඒ වාගේම ප්‍රශ්න ගොඩක් ද තිබෙනවා. පසුගිය

අවුරුද්දේ අග අප මේ අමාත්‍යාංශය භාර ගන්න කොටම, අපේ ආණ්ඩුව බලයට ආ විටම ආවා, ප්‍රශ්නයක්. ඒ ආපු පළමුවෙනිම ප්‍රශ්නය තමයි, සහල් ප්‍රශ්නය.

දැවැන්ත ලෙස හාල් හිඟයක් ඇති වුණා. ඒ වෙලාවේ අපේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ඇමති ගරු වසන්ත සමරසිංහ මැතිතුමා කාර්යක්ෂමව විශාල මැදිහත්වීමක් කළා; දැවැන්ත මැදිහත්වීමක් කළා. ඒ මැදිහත්වීමේ ප්‍රතිඵලයක් විධියට මේ වනකොට රටේ හාල් හිඟයක් නැහැ. ඇත්ත තමයි, අපේ රට කෘෂි කාර්මික රටක් කිව්වාට පිට රටින් හාල් ගේන්න අපට සිද්ධ වුණා. ඒක කනගාටුදායක තත්ත්වයක්. නමුත් අවශ්‍ය වන ඕනෑම මොහොතක ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් සහ අවශ්‍යතාව වෙනුවෙන් අපි විදේශ රටවලින් ආහාර ගෙන්වනවා. ගෙන්වන්නේ නැහැ කියලා කියන්නේ නැහැ; ගෙන්වනවා. නමුත් බොහොම පැහැදිලිව අපේ සම්පූර්ණ උත්සාහය, අපේ සම්පූර්ණ ව්‍යායාමය වී තිබෙන්නේ අපේ රටේ නිෂ්පාදනය කර ගන්න පුළුවන් දේවල් පුළුවන් තරම් නිෂ්පාදනය කර ගැනීමයි. ඒ පැත්තට තමයි අප මේ අවුරුද්දේ මූලික බර තැබීම් කරලා තිබෙන්නේ. විශේෂයෙන් මේ එළඹෙන යල කන්නය අපි ඉදිරියට අරගෙන තිබෙනවා. පසුගිය කාලයේ වර්ෂාපතනයෙන් සහ කාලගුණයෙන් හානි සිද්ධ වුණත්, අපට මේ වනකොට ජලය තිබෙනවා. ප්‍රමාණවත් ජලය ප්‍රමාණයක් අපට තිබෙන නිසා, ජලාශ පිරිලා තිබෙන නිසා අපි කල්පනා කළා යල කන්නය ටිකක් මෙහාට අරගෙන ඉක්මන් කරලා වගා කරන්න. දැන් ඒ වෙනුවෙන් මැදිහත් වීම් කරමින් තිබෙනවා. මා දැන් කියපු නැති තවත් ආයතන ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ගැන මේ විවාදය අවසානයේ පිළිතුරු කථාවේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මට කියාගන්න ඕනෑ වුණේ මේ ආයතන මොන තරම් ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දුන්නත්, යම් යම් කාලවල දේශපාලන අකටයුතුකම් සහ වංචා දූෂණවලට ගොදුරු වුණත්, අකාර්යක්ෂමතාවලට ගොදුරු වුණත් මේ ආයතනවල නිලධාරි මහත්ම මහත්මීන් කැපවීමෙන් විශාල කාර්යභාරයක් කර තිබෙන බවයි. ඒක ඒ ආයතනවලට ගිය වෙලාවේදීත් මම කිව්වා. ඒ වෙනුවෙන් එතුමන්ලාට මේ වෙලාවේ මගේ ප්‍රශංසාව හිමි වෙනවා. සමහර වෙලාවට අය වැය විවාදයේදී නිලධාරි මහත්ම මහත්මීන්ට ප්‍රශංසා කිරීම අන්තිමට තමයි කරන්නේ. නමුත් මම කල්පනා කළා ඒක මුලටම ගන්න ඕනෑ කියලා.

ගොවි ජනතාවගේ පැත්තෙන් කාලයක් තිස්සේ අපට ලොකු ප්‍රශ්නයක් තිබුණා. ඒ කාලයේ අපේ නාමල් කරුණාරත්න මන්ත්‍රී සහෝදරයා, *-[බාධා කිරීමක්]* නාමල් සහෝදරයා සහ ගොවි ජනතාව,- *[බාධා කිරීමක්]* දැනුත් සහෝදරයා තමයි. ඇවිත් ළඟට වෙලා ඉන්නේත් ඒකයි. Support එකක් දෙන්න ඇවිල්ලා ඉන්නේ. ගොවි ජනතාවගේ ප්‍රශ්න කථා කරද්දී, වී ගොවීන්ගේ ප්‍රශ්න කථා කරද්දී ඒ සහෝදරයා හැම දාම කිව්වා, නිෂ්පාදන පිරිවැයට වඩා වැඩි මුදලක් වී ගොවිතැනින් ලැබුණේ නැත්නම්, ගොවීන්ට සාධාරණය ඉෂ්ට වන්නේ නැත්නම්, ගොවි ජනතාව වී ගොවිතැන අත් හරිනවා, ගොවි ජනතාව ගොවිතැනින් අයින් වෙනවා කියලා. ඒ නිසා අපි වැඩ භාර ගත්තු දවසේ සිට මේ මොහොත දක්වාත් කල්පනා කරලා වැඩ සැලසුම් කරලා තිබෙනවා. අපට උපායක් තිබෙනවා. සාමාන්‍යයෙන් උපාය කියන්නේ නැහැ නේ. අපට උපක්‍රමත් තිබෙනවා. ඒවාත් කියන්නේ නැහැ නේ. කිව්වොත් ඒවා උපක්‍රම වෙන්නේ නැහැ නේ.

ඒ නිසා පසුගිය කාලයේදීත්, ඉදිරියේදීත් අපි තදින්ම ඉන්නවා. ඉස්සෙල්ලාම, ගොවිතැනේ යෙදී සිටින ගොවියා ලාභයක් ලබන කෙනෙක් බවට පත් කළ යුතුමයි. පාරිභෝගිකයා ගැන කථා කරන්න කළින් ගොවියා ගැන කථා කරන්න ඕනෑ. හාල් මිල ගැන කථා කරන්න කලින් වී මිල ගැන කථා කරන්න ඕනෑ. ඒක අත්‍යවශ්‍යයි. එතැනින් පටන් අරගෙන උඩට ඇවිල්ලා තමයි හාල් මිල වාගේම, ඕනෑම එළවලුවක මිල සම්බන්ධයෙන් පියවර ගත යුත්තේ. මුලින් හාල් මිල තීරණය කරලා ඉවරවෙලා, අන්තිමට ගොවියාගේ පැත්තට හැරිලා වැඩක් නැහැ. එම නිසා මේ කටයුත්තේදී කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය එහෙම හිතනවා. මේ මාස් කන්නය ඉවර වීගෙන යන නිසා මම මෙවා කියන්නේ. 2024-2025 මාස් කන්නයේ වී මිල අඩුයි කියලා, නිෂ්පාදන වියදමට වඩා අඩුවට වී විකුණන්න වෙන්නේ කියලා, විකුණන මිල පාඩුයි කියලා ගොවි ජනතාවගේ පැත්තෙන් හඬක් ආවේ නැති කන්නයක් බවට මේ කන්නය පත්වෙලා තිබෙනවා. ගොවි ජනතාව කොතැනකදීවත් කියන්නේ නැහැ, වී විකුණනකොට පාඩුයි කියලා. වී කිලෝ එකක නිෂ්පාදන වියදමට තව සියයට 30ක් එකතු කරලා අපි මිලක් නියම කළා. අපි මෙවර සහතික මිලක් ප්‍රකාශ කළේ නැහැ. අපි ඒ "සහතික මිල" කියන කථාවෙන් අයින් වුණා. වී අලෙවි මණ්ඩලය වී මිලදී ගන්නේ මෙන්න මේ මිලට කියලා අපි කිව්වා. සහතික මිලක් කිව්වා නම්, ඒක සීල් එකක් ගැහුවා වාගේ රටේ තිබෙන්නට ඕනෑ නේ. ඒක අඩු වැඩි වෙන්නත් බැහැ නේ. එම නිසා අඩුවීම්වලට නොවෙයි, වැඩි වීම්වලට ඉඩ තියලා තමයි අපි මිල නියම කළේ. ඒ නියම කරපු මිල ගත්තොත්, ඒක පිරිවැයට සියයට 30ක් එකතු කරලා ප්‍රකාශ කරපු මිලක්. ඒ නිසා 2024-2025 මහ කන්නයේදී වී ගොවියා දුකට පත් වුණේ නැහැ. ඔහු ජයග්‍රහණය කළා. ඒක වටිනා දෙයක්. මම ගොවියාගේ මුළු ඉතිහාසයම දන්නේ නැති නිසා, මීට කලින් මාස් කන්නවල එහෙම වෙලා තිබෙනවාද නැද්ද කියලා කියන්න යන්නේ නැහැ. මම සාමාන්‍යයෙන් නොදන්න ඒවා කියන්නේ නැහැ. දන්න ටික විතරයි කියන්නේ. මේ මහ කන්නයේ ලාංකික වී ගොවි ජනතාව සාර්ථකයි. ඔවුන්ට සාධාරණ මිලක් ලැබුණා. ඒ සඳහා අපිත් උපක්‍රම සහ උපායමාර්ග පාවිච්චි කළා. ඒවා කියන්නේ නැහැ කියලා කිව්වේ, කිව්වොත් ඒවා උපක්‍රම වෙන්නේ නැහැ නේ. අපට ඉදිරියේදීත් පාවිච්චි කරන්න ඒවා ඕනෑ වෙනවා.

ඊළඟ කාරණය තමයි, බඩ ඉරිඟු ගොවියාගේ ප්‍රශ්නය. බඩ ඉරිඟු මිලත් ගොවියාට සාධාරණ වන විධියට තීරණය වුණා. ඒ නිසා මේ ගෙවුණු කාලය තුළ කිසිම වගාකරුවෙක්, වගා කිරීමෙන් තමන්ට පාඩුයි කියලා කියන වචනයක් ඇහුණේ නැහැ. ඒ වෙනුවෙන් මැදිහත් වෙච්ච අපේ නිලධාරීන්, අපට උපදෙස් දෙමින් කටයුතු කරපු අය, ව්‍යාපාරිකයෝ, මගේ නියෝජ්‍ය ඇමතිවරු දෙන්නා, මගේ කාර්ය මණ්ඩල ඇතුළු ඒ හැම කෙනෙක්ම මම මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරනවා.

හාල් ප්‍රශ්නය ආපු වෙලාවේ බොහෝ දෙනෙක් කථා කළා, සංඛ්‍යාලේඛනවල, දත්තවල ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඇත්තටම සංඛ්‍යාලේඛනවල, දත්තවල ප්‍රශ්නයක් තිබෙනවා කියලා අපිත් විශ්වාස කරනවා. නමුත් සංඛ්‍යාලේඛන, දත්ත ලබා දෙන ක්‍රමයක් තිබෙනවා. යම් යම් අඩුපාඩුකම් සිද්ධ වුණත් ඒ සංඛ්‍යාලේඛන, දත්ත මත පදනම් වෙලා තමයි අපට වැඩ කරන්න සිද්ධ වෙන්නේ ඊට වඩා කාර්යක්ෂම, නිවැරැදි දත්ත පද්ධතියක් නිර්මාණය කර ගන්න කල්. ඒ නිසා ඒ දත්ත සියයට 100ක් නිවැරැදි නොවුණත් ආසන්න වශයෙන් නිවැරැදියි. එතකොට ප්‍රශ්නයක් ආවා, "වී ප්‍රමාණවත් විධියට නිෂ්පාදනය වෙලා තිබෙනවා නම්, නිලධාරීන් එහෙම ප්‍රකාශ කරනවා නම්, මෙහෙම ප්‍රශ්නයක් ආවේ ඇයි?" කියලා. මොකද, ප්‍රමාණවත් වී නිෂ්පාදනයක් තිබෙනවා කියලා ප්‍රකාශ වුණා නේ. නමුත් මෑතකදී කරපු සාකච්ඡාවකදී අපට අලුත් සූත්‍රයක් හදාගන්න වුණා.

අතිරික්ත නිෂ්පාදනයක් තිබෙනවා කියන කාලවලදී ආහාර ප්‍රමාණවත් වුණා. අතිරික්තයක් තිබෙනවා කියන කාලවලදී. ඊළඟට, ප්‍රමාණවත්ව තිබෙනවා කියලා කියන කොට, මදි වුණා.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

එතකොට, ප්‍රමාණවත් නම් මදි වෙනවා, අතිරික්තයක් තිබුණොත් ඇති වෙනවා. එහෙම තත්ත්වයක් සහ එහෙම සූත්‍රයක් තමයි අපට දැන් ලැබිලා තිබෙන්නේ. ඒ නිසා අපි බලනවා නිතරම අතිරික්තයක් පැත්තට යන්න. එතකොට ප්‍රමාණවත් වෙනවා. සමහරු ප්‍රශ්න කළා, හාල්වලින් යම් ප්‍රමාණයක් වෙනත් වෙනත්, වෙනත් නිෂ්පාදනවලට යනවා කියලා. මට නම් හාල්වලින් වෙනත්, වෙනත්, වෙනත් නිෂ්පාදන කෙරෙනවා කිව්වාම පුදුම සතුටක් තිබෙන්නේ. නමුත් අපි රටේ නීති පනවලා තිබෙනවා, හාල් සමහර නිෂ්පාදනවලට ලබා ගැනීම තහනම් කරලා. අපේ රටේ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනයක් වෙච්ච වී, එහෙම නැත්නම් හාල්වලින් අතුරු නිෂ්පාදන තව තවත් බෝ වෙනවා නම් තමයි හොඳ.

තව තවත් බිහි වෙනවා නම් හොඳයි. වැඩි වැඩියෙන් බිහි වෙනවා නම්, අතුරු නිෂ්පාදනවලට ගන්න පුළුවන් නම්, අගය එකතු කර කර යන්න පුළුවන් නම් හොඳයි. බිස්කට්, කේක්වලට ගන්නවා වාගේම, මම නම් කියන්නේ මත්පැන් සඳහාත් ගන්න පුළුවන් නම් හොඳයි. මම නම් කියන්නේ, මත්පැන් කියන්නේත් ආහාරයක්, මගේ තර්කයට අනුව. වෛද්‍යවරු මොනවා කිව්වත්, තව අය මොනවා කිව්වත්, මම කියන්නේ ඒකත් එක්තරා පිරිසකට ආහාරයක්. මත්පැන් නිෂ්පාදනයට සහල් හොරෙන් යනවා, අච්චර යනවා, මෙච්චර යනවා, බියර් හදන්න යනවා කියනවා. මම නම් කියන්නේ, ඒවාට ගන්නා තරමට හොඳයි. ඒ නිසා අපි සමත් වෙන්න ඕනෑ ප්‍රමාණවත් ලෙස අමතර ඒවාටත් එක්ක නිෂ්පාදනය කරන්න. ඒකට අපි සමත් වෙන්න ඕනෑ. හැබැයි, එතැනදී අවශ්‍ය නීති තිබෙනවා. එහෙම තමයි තිබෙන්නේ.

යම් පිරිසක් මගෙන් ඉඩම් ඉල්ලන්න ආවා සෝගම් වගා කරන්න. මම ඇහුවා, මොකටද කියලා. යම් නිෂ්පාදනයකට කිව්වා; බියර් හදන්න කොම්පැනියක් ආවා. මම කිව්වා, හා කරමු, ප්‍රශ්නයක් නැහැ කියලා. හැබැයි, එතකොටම රටේ හාල් හිඟයක් ආවා. ඊට පස්සේ ආවා දේශපාලන ප්‍රශ්නයක්. එතකොට අපේ නලින් බණ්ඩාර මහත්මයා එහෙම, දාන්න පුළුවන් සාහිත්‍ය දාලා ඒ ගැන කථා කරනවා. අදත් එතුමාට කථා කරන්න වෙලාව මදි වුණා. සාහිත්‍ය දාන්න ගිහිල්ලා නේ ඇත්තටම එතුමාට වෙලාව මදි වුණේ. ඒක නේ ඇත්ත කථාව. අපි ඒ වෙලාවේ සෝගම් වගාවට ඉඩම් වෙන් කළා නම් කියනවා, හාලුත් හිඟ වෙලාවේ බලන්නකෝ NPP එක වෙනත් බෝගවලට ඉඩම් වෙන් කරලා වගා කරන්න යනවා කියලා. ඒ නිසා අපි ඒක ප්‍රමාද කළා. අපි බලාපොරොත්තු වෙනවා ඉදිරියේදී ඒක කරන්න. තවත් ඉඩම් අක්කර 200ක්, 300ක් ඉල්ලාගෙන ආවා කෙලින්ම විදේශ රටවලට යවන්න, දූරියන් වවන්න. අපි එකඟයි. නමුත්, පසුගිය කාලයේ නරක විධියට ඉඩම් පරිහරණය කරලා තිබුණු නිසා, ඉඩම් අක්කර සිය ගණන්, දහස් ගණන් වංචාකාරීව පරිහරණය කරලා තිබුණු නිසා, සමහර වෙලාවට ලබා දුන් ඉඩම් පාවිච්චි කරලා නැති නිසා, අපට මේ ගෙවුණු කාලයේ සිද්ධ වුණා, ඉඩම් ලබා දීමේදී සැලකිලිමත් වෙන්න. ඒ නිසා ටික කාලයක් ගන්න වෙනවා ඉඩම් ලබා දීමේදී. ඇත්තටම කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙනුවෙන් ආයෝජකයෝ ආපු තරමට මේ ගෙවුණු කාලය තුළ අපට බැරි වුණා, ඒ ආයෝජකයන්ට අවස්ථාව දෙන්න, ඒ ඇති වෙලා තිබුණු ප්‍රශ්න පිළිබඳව සොයා බලන්න සිද්ධ වෙලා තිබුණු නිසා. ඉඩම් ක්ෂේත්‍රය කියන්නේ විශාල වශයෙන් වංචා, දූෂණ සිද්ධ වෙලා තිබෙන ක්ෂේත්‍රයක්. ඒ නිසා අපට සිද්ධ වුණා ඇත්තටම ඒවා ගැන විමර්ශනාත්මකව මැදිහත් වෙමින් කටයුතු කරන්න. මම දැන් වෙලාව ටිකක් ඉතිරි කරගන්න බලනවා, හවසට කථා කරන්න.

රිළා ප්‍රශ්නය ගැනත් කියපු නිසා මම ඒ ගැනත් සඳහන් කරන්න ඕනෑ. ඇත්තටම, මේක කවුරුත් කරලා නැහැ.

පළමුවෙනි වතාවෙන්ම මේක සියයට සියයක් සාර්ථක වෙනවා කියලා මම කියන්නේ නැහැ. අපට අවස්ථා කිහිපයක්ම මේක කරන්න වෙනවා. ඒ ගැන කථා කරන එක හොඳයි. වනසතුන් සම්බන්ධයෙන් සමීක්ෂණයක් අපට කිහිප වතාවක් කරන්න වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය මේකට කර ගැහුවේ ගොවියාට කෙළින්ම මේ ප්‍රශ්නය සම්බන්ධ නිසායි. නමුත්, මේක කවුරුත් කරන්නේ නැහැ, අත් හැරලා දාලා. වනජීවී කළමනාකරණය කියන මාතෘකාව ලංකාවේ නැහැ. ලජ්ජයි! මේ අවුරුදු 76ට. වනජීවී කළමනාකරණය කියලා මාතෘකාවක් නැහැ. අපට වනජීවී කළමනාකරණයක් ඕනෑ. වනජීවී කළමනාකරණය කරන්න බැහැ, වනජීවීන්ගේ ප්‍රමාණය පිළිබඳ සාපේක්ෂ අදහසක්වත් ගන්නේ නැතිව. කළමනාකරණය කරන්න නම් ප්‍රමාණය ගැන අදහසක් තිබෙන්න ඕනෑ. ප්‍රමාණය කවුද දන්නේ? දන්න කෙනෙක් නැහැ, ලංකාවේ. වනජීවී එක දන්නෙත් නැහැ. දන්න කිසිම කෙනෙක් නැහැ. මේ කරන වැඩ අත්දැකීමක් වෙලා අනාගතයේ දවසක වඩාත් හොඳට කරගන්න නම් වැරදි වැරදී හෝ පටන් ගන්න ඕනෑ. ඒකයි මේක පටන් ගත්තේ. වෙන මොකක්වත් නිසා නොවෙයි. ගුවන්යානය එකපාරටම උඩ ගියේ නැහැ නේ. ඒ කාලයේ විශේෂඥයෝ, විද්‍යාඥයෝ කඳු උඩට නැඟලා, තටු බැඳගෙන කුරුල්ලෝ වාගේ පියාඹලා, කඩාගෙන වැටිලා, මැරිලා ඒ දේවල් සිද්ධ වෙලා තමයි ගුවන්යානය හදා ගත්තේ. වනජීවී සංගණනයත් ඒ වාගේ දෙයක් කියලා ඔබතුමන්ලා හිතන්න. එච්චරයි. අපි මේක එක වතාවෙන් නවත්වන්නේ නැහැ. මෙහි අඩුපාඩු බලමින්, තව තව හොයමින් අපි කටයුතු කරනවා.

මගේ අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරු මට අය වැය කථාවක් හදලා දුන්නා. ඒ, සම්ප්‍රදායිකව හැම දාම හදන නිසා වෙන්න ඇති. නමුත්, ඒ කථාව මට හරියන්නේ නැහැ. මගේ කථාව තමයි මම කළේ. ඒ වුණාට ඒ කථාව හදලා දුන් මහත්ම මහත්මීන්ට මම බොහොම ගරු කරනවා, ඒ අයට මම ස්තුතිවන්ත වෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, මට පොඩි ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
අහන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, ඔබතුමා නිලධාරීන් හදලා දුන් කථාව කියවන්නේ නැතිව ඔබතුමාගේ කථාවක් කරන එක ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. නිලධාරීන් හදලා දුන් අය වැය නැතිව අනුර කුමාරගේ අය වැය ආවා නම් මරු!

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මම ඕවාට පිළිතුරු දෙන්න කාලය ගන්න කැමැති නැහැ, ගරු මන්ත්‍රීතුමා.

කෙසේ වුවත්, අපි හඳුනාගත් මූලික ගැටලු ටිකක් තිබෙනවා. අපි තවම යැපුම් කෘෂි කර්මාන්තයෙන් සෑහීමකට පත් වෙලා ඉන්නේ. අපි කිව්වාට, ගොඩක් ගොවියෝ. යැපුම් කෘෂි කර්මාන්තයෙන් එහාට ගිහිල්ලා හිතන අය ඉන්නේ ඉතාම සීමිත පිරිසක්. ඒ අයට ප්‍රශ්න ගොඩයි. හැකියාව තිබෙනවා, ඕනෑකම තිබෙනවා. ඒගොල්ලන්ට ප්‍රාග්ධනයක් තිබෙනවා. ඒගොල්ලන්ට

යම් යම් දේවල් කරන්න ඕනෑ. හැබැයි, ඒගොල්ලන්ට ඒ දේවල් කරන්න අපි ඉඩම් ලබා දෙන්න ඕනෑ. ඒ අදාළ දේවල් සම්පූර්ණ කරන්න ඕනෑ. ඒ අයට තමයි මේක යැපුම් කෘෂි කර්මාන්තයෙන් එහාට ගෙනියන්න වැඩිම විභවතාව තිබෙන්නේ. ඒ, පෞද්ගලික අංශය. අපේ ශ්‍රී ලාංකිකයෝ, ව්‍යාපාරිකයෝ, ධනවත්තු. ඒ නිසා මේ ධනවත් අය ගොවියෝත් එක්ක සම්බන්ධ කරලා, ගොවීන්ගේ ඉඩම් එක්ක සම්බන්ධ කරලා කෘෂි කාර්මික ක්ෂේත්‍රයට ඒ අය යොමු කර ගන්න අපි විශාල උත්සාහයක් දරනවා. මේ ඉන්න ගොවි මහත්මයා ඒ විධියටම තියන්නේ නැතිව ඒ අය සහ ඒ අයගේ ඉඩම් පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධ කරන වැඩසටහන් ඉදිරියේදී ඇති කරන්න අපි ලොකු උත්සාහයක් ගන්නවා.

අනික් කාරණය තමයි, නව තාක්ෂණය හා යාන්ත්‍රීකරණයේ අවම භාවිතය. ගොවි මහත්වරු මේ කුඩා කුඩා ඉඩම් කැබැලි වගා කරලා,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, you have only two more minutes.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මම අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

මේ වාගේ කරුණු කාරණා ගොඩක් තිබෙනවා. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙකු අද මේ ක්ෂේත්‍රය පිළිබඳ කථා කරන්න ඉන්නවා. විපක්ෂයේ කථික ලැයිස්තුවත් මා ළඟ තිබෙනවා. මම දෙපාර්ශ්වයටම ආරාධනා කරනවා, මේ පිළිබඳව හරබර විවාදයක් කරමු කියලා. මොකද, අපේ කෘෂි කර්මාන්තය සෑහෙන ප්‍රශ්නවලට මුහුණ දෙනවා නේ. වෙන ඕනෑම ක්ෂේත්‍රයකට වඩා කාලගුණයේ බලපෑමට ලක් වන ක්ෂේත්‍රයක්, මේක. මේ ක්ෂේත්‍රය හැම දාම කාලගුණයේ බලපෑමට ලක් වෙනවා. ඒ නිසා විපක්ෂයේ අයටත්, ආණ්ඩු පක්ෂයේ අයටත් අමාත්‍යාවරයා විධියට මම යෝජනා කරනවා, සාහිත්‍ය ටිකක් අඩු කරලා, විෂයත් එක්ක සාකච්ඡා කරන විවාදයක් බවට මේක පත් කර ගන්න සම්බන්ධ වෙන්න කියලා. ඒ ඔක්කොම මම අහනවා. ඒ වාගේම මම අවසානයේදී හැකි පමණ ඒවාට උත්තර දෙනවා. උත්තර දෙන්න බැරි වුණොත්, හැන්සාඩ්ගත වන දේවල් අධ්‍යයනය කරලා, කෘෂි කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් සම්බන්ධ කරගෙන කටයුතු කරන්න මම බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa. You have 15 minutes.

[පූ.භා. 10.52]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අමාත්‍යතුමාටත් යෝජනා ඉදිරිපත් කරන්නට මේ අවස්ථාව යොදා ගන්න මම කැමැතියි, ගරු සභාපතිතුමනි. ඔබතුමන්ලා විශ්වාස කරනවා නම් මේ යෝජනා රටේ කෘෂි කර්මාන්තයට වටිනාකමක් එකතු කරයි කියලා, ඒවා ක්‍රියාවට නංවන්නට කටයුතු කරන්න.

පළමුවැනි කාරණය, අපේ රටේ ජාතික කෘෂි කාර්මික ප්‍රතිපත්තියක් නැහැ. කාලයෙන් කාලයට වෙනස් වෙන ප්‍රතිපත්ති වෙනුවට ජාතික ප්‍රතිපත්තියක් අපි ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ ප්‍රතිපත්තියේ පළමුවැනිම කාරණය තමයි ගොවිතැනේ නියැලී සිටින ප්‍රජාවට වටිනාකමක් දෙන එක. ඒ වාගේම ගොවිතැනට වටිනාකමක් දෙන්නට ඕනෑ; පිළිගැනීමක් දෙන්නට ඕනෑ; ඇගැයීමක් දෙන්නට ඕනෑ. සමහර කණ්ඩායම් කෘෂි කර්මාන්තය අසාර්ථකයි, කෘෂි කර්මාන්තය පාඩු ලබන ක්‍රියාවලියක්, එයින් වැඩියෙන් ඵලක් සිදු වෙන්නේ නැහැයි කියලා ගොවි ජනතාව වෙනතකට, වෙනත් දිශාවකට යොමු කරන්නට උත්සාහ දරනවා. ඉතින් මේ නව ලිබරල්වාදී සංකල්පවලට ඉදිරියට යන්නට නොදී කෘෂි කර්මාන්තය ශක්තිමත් කරන්නට ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍යයි. ගොවිතැනට නිසි ඇගැයීමක් අවශ්‍යයි, ගොවිතැනේ නියැලෙන ගොවි ජනතාවට ගෞරවයක්, වටිනාකමක් ලබා දිය යුතුයි.

ජාතික ප්‍රතිපත්තියක් නොමැතිකම තුළ ගොවිතැන කියන නිෂ්පාදන චක්‍රය හැම අතකින්ම අවුල් වෙලා, හැම අතකින්ම අකාර්යක්ෂම වෙලා තිබෙනවා. මේ නිෂ්පාදන චක්‍රය දිහා බැලුවාම යෙදවුම්, ඒ කියන්නේ inputs, නිෂ්පාදන ක්‍රියාවලිය, ඒ කියන්නේ production process එක, තාක්ෂණය, අළෙවිය, වෙළෙඳ පොළ - දේශීය සහ අපනයන - යන මේ හැම අවස්ථාවක් වෙනුවෙන්ම අපේ රටේ පැහැදිලි ප්‍රතිපත්තියක් නැහැ, පැහැදිලි වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසාම ගොවිතැනට විරුද්ධ සමහර අන්තවාදී, නව ලිබරල්වාදී න්‍යාය පත්‍ර ඉස්මතු වෙනවා. ගොවිතැනේ, නිෂ්පාදන ක්‍රියාවලියේ අර, මම ප්‍රකාශ කළ අංශ සියල්ලක්ම කාර්යක්ෂම - efficient - කරන්නට ඕනෑ කියලා මේ අවස්ථාවේ මම යෝජනා කරනවා. විශේෂයෙන්ම ගොවිතැනේ නියැලෙන කණ්ඩායම්වලට නවීකරණය, නවෝත්පාදනය, නව තාක්ෂණය, නව වගා කිරීමේ ක්‍රමවේද, අලුත් උපකරණ සහ නිෂ්පාදන ධාරිතාව වැඩි කරන සියලු කරුණු කාරණාවලට ලොකු ශක්තියක් දෙන්නට ඕනෑ.

අපි හැමෝම දන්නවා, මේ මොහොත වන විට තරුණ පරපුර කෘෂි කර්මාන්තයෙන් ඈත් වෙලා තිබෙන බව. හැබැයි, සුහුරු කෘෂි කර්මාන්ත ක්‍රමවේද - smart agricultural practices - හරහා, කාර්යක්ෂම කෘෂි කර්මාන්ත ක්‍රමවේද හරහා මේ කෘෂි කර්මාන්තය ශක්තිමත් කරන්න අපට පුළුවන්. අපි හැමෝම දන්නවා, ආහාර සුරක්ෂිතභාවයේ - food security - ඉලක්ක කරා යන්නට කෘෂි කර්මාන්තය අත්‍යවශ්‍ය බව. ඒ වාගේම අපට ජය ගන්නට අභියෝග රැසක් තිබෙනවා.

වනඅලි-මිනිස් ගැටුම; වනසතුන්-මිනිසුන් අතර ගැටුම අද වන විට බරපතළ ගැටලුවක් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම දැනට පවතින වගා හානි වැළැක්වීමේ ක්‍රමවේද පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න පුළුවන් ද? ජීවිත හානි, දේපළ හානි වෙනුවෙන් ලබා දෙන වන්දි පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න පුළුවන් ද? ලෝකයේ විවිධ රටවල් බොහොම සාර්ථක ක්‍රමවේද ක්‍රියාත්මක කරනවා, වනසතුන්-මිනිසුන් අතර ඇති වන ගැටුම්, වනඅලි-මිනිස් ගැටුම් අවම කරන්න. අපි ඉස්සෙල්ලාම කරන්න ඕනෑ මොකක්ද? රටටම හඳුන්න ඕනෑ, Land Use Plan එකක්. ඒ කියන්නේ, ඉඩම් පරිහරණය කිරීමේ, එහෙමත් නැත්නම් ඉඩම් යෙදවීමේ ජාතික වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. රක්ෂිත මොනවාද, වනෝද්‍යාන මොනවාද, අභය භූමි මොනවාද, ජනපද බිහි වෙන්නේ කොතැනද, වනසතුන්ට අවශ්‍ය මංකඩ මොනවාද යනාදී දේවල් පිළිබඳව ඉඩම් පරිහරණ ජාතික වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කලාපීය රෙගුලාසි - zoning regulations, ඒ වාගේම කොස්ටාරිකා රාජ්‍යය වාගේ ගත්තොත් payments for ecosystem services, ඒ කියන්නේ පරිසරයේ සුරක්ෂිතභාවය තහවුරු කරන වැඩ පිළිවෙළට ප්‍රජාවට ගෙවීම් කටයුතු කරනවා. Early warning and monitoring systems භාවිත කරනවා. බොට්ස්වානා, ඉන්දියාව වැනි රටවල් artificial intelligence පාවිච්චි කරලා වනසතුන්ගෙන් වන හානි අවම කරනවා, වනඅලි-මිනිස් ගැටුම අවම කරන්නට වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. GPS tracking systems, ප්‍රජා සහභාගිත්වය - community participation - යනාදිය ද මේ සඳහා යොදා ගන්නවා. ඒ වාගේම වන්දි ලබා දීම්, රක්ෂණ ක්‍රමවේද ආදිය තිබෙනවා. විශේෂයෙන්ම අලි-මිනිස් ගැටුම අවම කරන්නට සමහර රටවල් මීමැසි කොටු - beehive fences - කියන ක්‍රමවේදය පාවිච්චි කරනවා. ඒ වාගේම මිරිස් කොටු - chilli fences - කියන ක්‍රමවේදය පාවිච්චි කරනවා. India, Africa, Kenya, Tanzania වැනි රටවලත් මෙවැනි උපක්‍රම පාවිච්චි කරනවා. විදුලි වැට, විදුලි වැට ආශ්‍රිත පරිසර හිතකාමී අගල් ඇති කිරීම ආදී ක්‍රමවේදවලට අමතරව තවත් ක්‍රමවේද රැසක් මේ සඳහා තිබෙනවා. මේ සාර්ථක ක්‍රමවේද තුළින් එම රටවල් උගත් පාඩම් අපිත් ඉගෙන ගන්නට ඕනෑ.

ඒ වාගේම අපේ කෘෂි කර්මාන්තය අසාර්ථකයි කියන කණ්ඩායම්වලට මම මේ කාරණයත් කියන්න කැමැතියි. අපට ඉගෙන ගන්න හොඳ පාඩමක් තිබෙනවා, නෙදර්ලන්තයෙන් - Hollandවලින්. හරිතාගාර ගොවිතැන, නිර්වද්‍ය කෘෂි කර්මාන්තය, කාර්යක්ෂම හා නව්‍ය කෘෂිකාර්මික අංශ කියන මේ හැම පැත්තකින්ම නෙදර්ලන්තය ලෝකයේ කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනවලින් ඩොලර් බිලියන 115ක වාර්ෂික ආදායමක් ලබනවා. අපි සංඛ්‍යාලේඛන දිහා බැලුවොත්, ලෝකයේ කෘෂිකාර්මික ඉඩම්වලින් 0.1යි නෙදර්ලන්තයට තිබෙන්නේ. හැබැයි, ලෝකයේ මුළු එළවලු අපනයනයෙන් සියයට 20කට වඩා ඔවුන් නිෂ්පාදනය කරනවා. නෙදර්ලන්තය ඉදිරියට ගිහිල්ලා තිබෙන්නේ කොහොමද? විවිධ වැඩ පිළිවෙළ හරහා ඔවුන් ඉදිරියට ගිහින් තිබෙනවා. පොදු කෘෂිකාර්මික ප්‍රතිපත්ති, ඉඩම් ඒකාබද්ධ කිරීම්, මැන්ෂොල්ට් සැලැස්ම, කිරි කෝටාව, අලුත් පොහොර පනත්, Programma Aanpak Stikstof - PAS - කියන අලුත් වැඩ පිළිවෙළ ඒ අතර තිබෙනවා. තාක්ෂණික නවෝත්පාදනය, විශේෂීකරණය සහ අගය එකතු කිරීම, කාර්යක්ෂම සම්පත් කළමනාකරණය, තිරසර පිළිවෙත්, ධාරිතා වර්ධනය, අධ්‍යාපනය, අලුත් වෙළෙඳ පොළ ප්‍රවේශය, වෙළෙඳාම කියන මේ වැඩසටහන්වලින් අපි රටක් හැටියට පාඩම් ඉගෙන ගන්නට ඕනෑ.

විශේෂයෙන්ම පර්යේෂණ ක්ෂේත්‍රයෙන් අපි ඉදිරියට යන්නට ඕනෑ. මම නැවත වරක් කියන්න කැමැතියි, නෙදර්ලන්තයේ වැගෙනින්ගන් විශ්වවිද්‍යාලය සහ එම පර්යේෂණ අංශය විශාල වශයෙන් පර්යේෂණ කරලා, drone systems වැනි නව තාක්ෂණ ක්‍රමවේද අද කෘෂි කර්මාන්තයට ගෙනැල්ලා තිබෙන බව. ඒ වාගේම GPS තාක්ෂණයත් අද කෘෂි කර්මාන්තයට ගෙනැල්ලා තිබෙනවා. අඩු පිරිවැයකින් වැඩි නිෂ්පාදනයක්, ගුණාත්මකභාවයෙන් ඉහළ නිෂ්පාදනයක් ලබාගත හැකි නව උපකරණ සොයාගෙන තිබෙනවා. දැන් කිව්වා නේ, පිරිවැය කේන්ද්‍ර කරගෙන ගොවියාට හොඳ මිලක් ලැබුණාය කියලා. මොහොතකටවත් හිතලා බැලුවාද, අක්කරයක නිෂ්පාදන ධාරිතාව ගැන? ගොවියා කොච්චර ස්වාභාවික ආපදාවලට මුහුණ දුන්නාද? ඒ ආපදා නිසා කොච්චර වගා හානි සිද්ධ වුණාද? ඇත්තම කියනවා නම් කනගාටුදායක තත්ත්වය තමයි, ඒ ආපදාවලින් සිදු වුණු හානිවලට ඔබතුමන්ලා තවමත් වන්දි ගෙවා නොතිබීම. ඉතින් මම කියනවා, වගා හානියත් එක්තරා මට්ටමක පිරිවැයක් කියලා. ඒ කියන්නේ ගොවියා කන කර උකස් කරලා, සීමිත සම්පත් උපයෝගී කරගෙන වගා කටයුතු කළ පසු ආපදා නිසා ඒ වගාව විනාශ වෙලා තිබෙනවා. එතකොට ඒකත් පිරිවැයේ කොටසක්. ඒ පිළිබඳවත් හොඳ අවබෝධයක් ලබා ගන්නට ඕනෑ.

ඊළඟට මේ සංගණනය පිළිබඳ කාරණාව ගන්න. මගේ අතේ තිබෙනවා, ඔබතුමන්ලා නිකුත් කළ නිවේදනය. ඉතින් ඇත්ත වශයෙන්ම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට මේක හුදෙකලාව කරන්න බැහැ. වනජීවී ක්ෂේත්‍රයට, වන සංරක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන හා තවත් ක්ෂේත්‍රවලට අයත් ආයතන ගණනාවක් ඒකාබද්ධ වෙලා තමයි සංගණනයක් සාර්ථක කරගන්න කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම මේ නිවේදනයේ සඳහන් කරලා තිබෙනවා, සතුන් ගණනාවක් ගැන. මේ වැඩසටහනේ දුර්වලතා තිබෙනවා. ඇත්තටම කෘෂිකර්ම අමාත්‍යාංශයට, වනජීවී සංගණනයක් කිරීමේ expertise නැහැ; ඒ විශේෂඥ දැනුම නැහැ. මේ කටයුත්ත සාර්ථක කර ගන්න නම්, ඒක ඒකාබද්ධ ක්‍රියාවලියක් වෙන්න ඕනෑ. ඉතින් ඇත්ත වශයෙන්ම පසුගිය කාල වකවානුව දිහා බැලුවොත්, අලින් පිළිබඳ සංගණන පවත්වා තිබෙනවා. ඒ බොහෝ සංගණන අසාර්ථක වෙලාත් තිබෙනවා. නමුත් හරියට කරපු ඒවායෙන් නිවැරදි ප්‍රතිඵල ලබාගෙනත් තිබෙනවා. ඒ නිසා සංගණනයක් කරනවා නම්, එය නිසි ලෙසට, නිසි ආකාරයට ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ විෂයය පිළිබඳ වගකීම දරන අමාත්‍යතුමා කිව්වා, මේ තරම් සතුටුදායක කාල වකවානුවක් ගොවිතැනේ නියැළෙන ජනතාව අත්විඳලා නැහැ කියලා.

ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා ඔය කියන, අක්කරයකට වැය වන පිරිවැය නිවැරදිද? බොහෝ විශේෂඥයන් කියනවා, ඒක යථාර්ථවාදීත් නොවෙයි, සත්‍යවාදීත් නොවෙයි, ඒක වායු සමනය කරපු කාමරවල ඉඳගෙන නිර්මාණය කරපු සූත්‍රයක්ය කියලා. ඒකට වගා හානිය අදාළ කරගෙන නැහැ; නිෂ්පාදන ධාරිතාව අඩු වීම ගණන් අරගෙන නැහැ. අනෙක් එක, මේ මිල සූත්‍ර ක්‍රියාත්මක කිරීමේදී ඔබතුමන්ලා පොඩ්ඩක් හිතලා බලන්න, ප්‍රදේශයෙන් ප්‍රදේශයට තිබෙන තත්ත්වයන් වෙනස් නේද කියලා. මේ සම්බන්ධව ප්‍රදේශයෙන් ප්‍රදේශයට බලපාන බරපතළ ගැටලු තිබෙනවා. ඔබතුමන්ලා දැන් ලොකුවට කියනවා, මහ කන්නයේ වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක කරන්නට ලොකු මුදලක් - රුපියල් මිලියන 5,000ක්; බිලියන 5ක්- වෙන් කර තිබෙනවා කියලා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
අපි කිව්වේ නැහැ, ලොකු මුදලක් කියලා. ඔබතුමා නේ කියන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආ! හොඳයි. එහෙම නම්, සාමාන්‍ය මුදලක් වෙන් කර තිබෙනවා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
අමතර ඒවා පසුව ගන්නවා කියලා,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතකොට ඊළඟ යල කන්නයට කොහෙන්ද සල්ලි එන්නේ?

කෝ, ඒකට සල්ලි වෙන් කරලා? ඒ කියන්නේ ඊළඟ යල කන්නයේ නිෂ්පාදනය ලබා ගන්න ආපසු පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනෙනවාද? මොකද, මහ කන්නය ගැන විතරයි කථා කරලා තිබෙන්නේ. නමුත් අය වැයක් වසර පුරාවටම අදාළ වන විධියටයි සකස් කරන්නට ඕනෑ. මම ප්‍රගතිශීලී අන්දමට මේ අඩුපාඩුකම් පෙන්වා දෙන්නේ, ඒ අඩුපාඩුකම්, ප්‍රශ්න ඔබතුමන්ලාට නිවැරදි කර ගන්නයි.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)

වී තොගයක් රැස් කර ගත්තාම, ඒ වී තොගය බැංකුවකට තියලාත් මුදල් ගන්න පුළුවන්. අමාත්‍යාංශයේ තිබෙන මුදල්වලින් වෙන් කර ගන්නත් පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. ඒකට ඉඩ තියලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)

මම මේ ඔබතුමාට යෝජනා ඉදිරිපත් කරන්නේ. ඒවා නිවැරදියි කියලා හිතෙනවා නම් භාර ගන්න; වැරදියි කියලා හිතෙනවා නම් ප්‍රතික්ෂේප කරන්න. *[බාධා කිරීමක්]* හරි, ඔබතුමා ඒ තීන්දුව ගන්න. ඔබතුමා මේ ක්ෂේත්‍රය භාර ඇමතිතුමා නේ. ඔබතුමා කිව්වා, විපක්ෂයට ප්‍රගතිශීලීව සහභාගි වෙන්නය කියලා. ඒ නිසායි අපි මෙහෙම ප්‍රගතිශීලීව සහභාගි වන්නේ; යෝජනා ඉදිරිපත් කරන්නේ. *[බාධා කිරීමක්]*

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)

සමහර දේවල් එවෙලේම ඉවර කරගෙන ගියාම ලෙහෙසියි නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)

ඔබතුමාගේ කථාවේදී ඔබතුමා ඒවාට උත්තර දෙන්න, ගරු ඇමතිතුමනි. අපේක්ෂිත ආදායම රුපියල් ලක්ෂ 30යි -මිලියන 3යි. හැබැයි, මේ මුදලින් මිලදී ගන්න පුළුවන්කම ලැබෙන්නේ මෙට්‍රික්ටොන් 40,000යි. ඒක ප්‍රමාණවත්ද? අස්වැන්නෙන් සියයට 1.3ක් අරගෙන යහපත් මිල පාලනයකට යන්න පුළුවන්ද? ඇත්තවශයෙන්ම ඔබතුමා දන්නවා, මේක සාර්ථකව ක්‍රියාත්මක වෙන්නට නම් අඩුම ගණනේ අස්වැන්නෙන් සියයට 7ක්, සියයට 10ක් වාගේ ප්‍රමාණයක් මිලදී ගන්නට ඕනෑ බව. ඒක තමයි අත්දැකීම. ඒක අත්හදා බලපු ක්‍රමයක්. ඒත් මම කියනවා, මේ ක්‍රමවේදය සාර්ථක නැහැ කියලා. මේ නිෂ්පාදන චක්‍රයත් එක්ක නිර්මාණය වෙලා තිබෙන සූත්‍ර අපි වෙනස් කරන්නට ඕනෑ. ඒ නිසා වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය පමණක් නොවෙයි, ලොකු ලූනු ගොවියා වෙනුවෙනුත්, අර්තාපල් ගොවියා වෙනුවෙනුත්, ඒ වාගේම අනෙකුත් වගා කටයුතුවල නියැලී සිටින ජනතාව වෙනුවෙනුත් ඉලක්ක සහිතව ජාතික සැලැස්මක්, ජාතික වැඩ පිළිවෙළක් සකස් වෙන්න ඕනෑ. කුඩා පරිමාණයේ, සුළු හා මධ්‍ය පරිමාණයේ, මහා පරිමාණයේ ඒ වාරි පද්ධති ඒකාග්‍රතාවෙන් යුක්තව -එක්සත් කරලා- මේ ජාතික කෘෂි කාර්මික වැඩ පිළිවෙළ, ඒ සැලැස්ම ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු ආකාරයට අපි මේ අවස්ථාවේ ප්‍රගතිශීලීව යෝජනා ඉදිරිපත් කළා.

ඊළඟට මම කියන්න කැමැතියි, වාරි ක්ෂේත්‍රය ගැනත්. අපි ඇත්ත කථා කළොත් ඔව්, අපේ රට තුළ විශාල වාරි කර්මාන්තයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ වාගේම තව හිස් තැන්, අඩු තැන් ගණනාවක් තිබෙනවා. ඇත්තවශයෙන්ම, අහසින් වැටෙන සෑම දිය පොදක්ම මුහුදට ගලා යන එක අදටත් නතර වෙලා නැහැ. ඒ සඳහා අලුත් වාරි ශිෂ්ටාචාරයකට, අලුත් වාරි කර්මාන්තයකට මුල පුරන්නට ඕනෑ. ඒ විතරක් නොවෙයි, පැරණි වාරි කර්මාන්තය පුනරුත්ථාපනය කිරීමේ - rehabilitation of irrigation system - වැඩසටහනක් ඕනෑ. ඒක ග්‍රාමීය මට්ටමේ තිබෙන කුඩා වැවේ ඉඳලා පටන් ගන්නට ඕනෑ. කුඩා, සුළු, මධ්‍ය, මහා වාරි, ගොවිජන සේවා වාරි යනාදී වශයෙන් විවිධාකාරයට මේවා නම් කර, වෙන් කර තිබෙනවා.

ඒ වාගේම මධ්‍යම ආණ්ඩුවෙත්, පළාත් ආණ්ඩුවෙත්, විවිධ රාජ්‍ය ආයතනවලත් මේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ දැවැන්ත පිරිස් සම්පතක් ඉන්නවා. රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන් විශාල පිරිසක් ඉන්නවා. මේ සියලුදෙනාට හොඳ චේතනයක් ලබා දෙමින් ඒ අයගේ සේවාව කාර්යක්ෂමව ලබා ගත්තොත් අපිටත් බැරිකමක් නැහැ, මේ යෝජනා ක්‍රියාත්මක කිරීමත් සමඟ පුංචි නෙදර්ලන්තයක් බවට පත් වෙන්න. අපිටත් බැරිකමක් නැහැ, සමහර අන්තවාදී, නව ලිබරල්වාදී, අන්ත දක්ෂිණාංශක, ලුම්පන් ධනවාදී trickle-down economics අනුගමනය කරන ඒ කණ්ඩායම්, කෘෂි කර්මාන්තය විනාශ කරන්නට මාන බලන කණ්ඩායම් බොරුකාරයන් කරලා, කෘෂි කර්මාන්තය ශක්තිමත් කරලා, අභිමානවත් අපනයන කේන්ද්‍රීය රටක් බවට අපේ රට පත් කරන්න. දේශීය නිෂ්පාදනය, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරනවා වාගේ, අපනයන කේන්ද්‍රීය කෘෂි කර්මාන්ත රටක් බවට අපේ රට පත් කිරීම ඒ තරම් අපහසු කාරණාවක් නොවන බව අප විශ්වාස කරනවා. ජාතික කෘෂි කාර්මික ප්‍රතිපත්තියක වැදගත්කම සහ නවෝත්පාදනය, නවීකරණය, අලුත් තාක්ෂණය, තරුණ කොටස් එකතු කිරීම, ගොවිතැනේ නියැලී සිටින අයගේ කාර්යක්ෂමතාව ඉහළ දැමීම, ගුණාත්මක නිෂ්පාදනයක්, තරගකාරී නිෂ්පාදනයක් නිර්මාණය කිරීම යනාදී කරුණු කාරණා අලළා මේ යෝජනා ඉදිරිපත් කළේ සැබැවින්ම අපේ රට කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ පාරාදීසයක් බවට පත් කරන්නයි කියන කාරණාව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ස්තුතියි.

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු සභාපතිතුමනි, පොඩි නිවැරදි කිරීමක් කරන්න තිබෙනවා. විපක්ෂ නායකතුමා ප්‍රකාශ කළා, වගා හානි වෙච්ච ගොවීන්ට තවමත් වන්දි මුදල් ගෙවලා නැහැ කියලා. ඉතිහාසයේ පළමුවැනි වතාවට, කන්න අවසන් වෙන්නත් කලින් එම වන්දි මුදල් අපි ගෙවලා අවසානයි. මේ වනවිටත් අදාළ ගොවීන්ට රුපියල් ලක්ෂ 9,520ක වන්දි මුදල් ගෙවලා අවසානයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)

ගරු සභාපතිතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමන්ලා ඒ වැඩි කරපු රුපියල් 25,000ක පොහොර සහනාධාර කලට වේලාවට ලබා දුන්නාද? ඔබතුමා දන්නවාද, ගොවීන්ගෙන් සමහර කොටසකට රුපියල් 15,000ක් ලැබිලා තිබෙන බව? තවත් කොටසකට රුපියල් 10,000ක් ලැබිලා තිබෙනවා. අදටත් ඔබතුමන්ලාට ඒ කාර්යය ඉෂ්ට කර ගන්න බැරි වෙලා තිබෙනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ඊට අදාළ ගැටලුවක් තිබෙන බව අපි මුලින්ම ප්‍රකාශ කළා. මෙතෙක් ආපු system එකට තමයි අපි කටයුතු කළේ. අපි ඊළඟ කන්නයේදී ඒ කටයුත්ත නිවැරදි කිරීමට අදාළ සියලු වැඩකටයුතු මේ වෙනකොට සැලසුම් කරමින් පවතිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මේ කාරණාව පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමියත් මේ ගරු සභාවේදී කරුණු ඉදිරිපත් කළා. එතුමියගේ පිළිතුරෙන්ම බොහොම පැහැදිලියි, මේ වැඩසටහන තවමත් අසම්පූර්ණයි කියන එක, ගරු තියෝජ්‍ය අමාත්‍යතුමනි. මම මේ බොරුවට කරුණු ඉදිරිපත් කරනවා නොවෙයි. හොයලා බලලා මේ අඩුපාඩුව නිවැරදි කරන්න.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

පොදුවේ මේ අදාළ වන්දි මුදල්, පොහොර සහනාධාරය ලබා දීලා තිබෙනවා. ඊට අදාළව වෙනත් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒක මට මේ වෙලාවේ ප්‍රකාශ කරන්න බැහැ. ඊට අදාළ පරීක්ෂණයක් මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Gnanamuththu Srineshan. You have nine minutes.

[மு.ப. 11.16]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினத்தில் முக்கியமான விடயங்கள் சம்பந்தமான அமைச்சின் விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இந்த விவாதத்தில் முதலாவதாக நான் நீர்ப்பாசனத்தோடு சம்பந்தப்பட்ட ஒரு செயற்றிட்டம் பற்றி கதைக்கலாம் என்று நினைக்கின்றேன். அதாவது, எங்களுடைய 'முந்தனை ஆற்றுத் திட்டம்' பற்றி அமைச்சர் அவர்கள் கூடுதலாகக் கவனம் செலுத்த வேண்டுமென்று நான் எதிர்பார்க்கின்றேன். இந்த 'முந்தனை ஆற்றுத் திட்டம்' 2017ஆம் ஆண்டு காலப்பகுதியில் அறிமுகம் செய்யப்பட்டது. ஆனால், தற்போது 2025ஆம் ஆண்டாகியும் அந்தத் திட்டம் பற்றிய சிந்தனை குறைந்து வருகின்ற ஒரு நிலைமையைத்தான் நான் பார்க்கின்றேன். இந்தத் திட்டத்திற்கான நிதியை French DevelopmentAgency - AFD - வழங்குவதாகக் கூறப்பட்டது. கிட்டத்தட்ட 170 மில்லியன் யூரோ டொலரை அந்த Agency இலகு கடன் மூலமாக வழங்குவதற்குத் தயாராக இருக்கின்றது. ஆனால், இத்திட்டம் படிப்படியாகக் கைநழுவிப்போகின்றதோ என்ற எண்ணம் எமது மட்டக்களப்பு மற்றும் அம்பாறை பிரதேச மக்கள் மத்தியில், குறிப்பாக விவசாயிகள் மத்தியில் ஏற்பட்டிருக்கின்றது. இதனை நடைமுறைக்குக் கொண்டு வருவதன் மூலமாக நிறையப் பலாபலன்களை அடைய முடியும் என்று அங்கிருக்கின்ற விவசாயிகள் மற்றும் புத்திஜீவிகள் கருதுகின்றார்கள்.

உறுகாமம் மற்றும் கித்துள் குளங்களை இணைப்பதன் மூலமாகச் செயற்படுத்தப்படவுள்ள இந்த முந்தனை ஆற்றுத் திட்டம், விவசாயிகளுக்குக் கூடுதலான நிலங்களில் பயிர் செய்யக்கூடிய வசதியை ஏற்படுத்தக்கூடியதாக அமையும். ஏற்கெனவே, மகா ஓயா நீர்த்தேக்கத் திட்டம் AFDஇன் உதவியுடன் செய்து முடிக்கப்பட்டிருக்கின்றது. உறுகாமம், கித்துள் போன்ற குளங்களை இணைத்து இந்தத் திட்டத்தைச் செயற்படுத்துகின்றபோது, மூவின விவசாயிகளும் பலனை அடையக்கூடியதாக அமையும். இதனால் மட்டக்களப்பு மாவட்ட விவசாயிகள் மாத்திரமல்லாமல், அம்பாறையில் இருக்கின்ற விவசாயிகளும் பலனடைவார்கள். இத்திட்டத்தின் மூலம் கிட்டத்தட்ட 25,000 ஏக்கர் காணிகளுக்கு நீர் வழங்கக்கூடிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது.

அதுமட்டுமல்லாமல், கித்துள், உறுகாமம் குளப் பிரதேசம் பதுளை வீதியை அண்டியதாக இருப்பதுடன், அவை ஓர் உயர்ந்த நிலமாகக் காணப்படுகின்றது. அந்தப் பிரதேசத்தில் குடிநீர்த் தட்டுப்பாடு அதிகமாகக் காணப்படுகின்றபடியால், அந்தக் குளத்தை நாங்கள் விருத்தி செய்கின்றபோது, அந்த உயர் நிலப் பிரதேசத்தில் காணப்படுகின்ற மக்களுக்குக் குடிநீரை வழங்கக்கூடிய வசதி ஏற்படுமென்று அங்கிருக்கின்ற ஆய்வாளர்கள் கூறுகின்றார்கள். அதுமட்டுமல்லாமல், அங்கு நன்னீர் மீன்பிடித் துறையை வளர்த்தெடுக்கக்கூடிய வாய்ப்பும் இருக்கின்றது. இன்னும் சொல்லப்போனால், 12 சிறு குளங்களுக்கு நீரை வழங்கக்கூடிய விசாலமான நீர்ப் பரப்பளவும் அங்கு காணப்படுகின்றது. அதைவிட, கரடியனாறில் ஒரு விவசாயப் பண்ணை இருக்கின்றது. அங்கே விதை உற்பத்தி நிலையம் காணப்படுகின்றது. இந்த விதை உற்பத்தி நிலையத்திற்கும் இந்தக் குளத்தின் மூலமாக நீரை வழங்கக்கூடியதாக இருக்கும். அத்துடன், அது பார்ப்பதற்குக் கவர்ச்சியான ஓர் இடமாக இருக்கின்றபடியால், சுற்றுலாத் துறைக்கும்கூட பங்களிக்கக்கூடியதாக இருக்கும். எனவே, ஒரு கல்லில் பல மாங்காய்களை வீழ்த்துவதைப் போன்று, இந்த முந்தனை ஆற்றுத் திட்டத்தை அமுல்படுத்துகின்றபோது, நிச்சயமாக நாங்கள் பன்முக நன்மைகளை அடையக்கூடிய வாய்ப்புகள் இருக்கின்றபடியால், தயவுசெய்து எங்களுடைய கௌரவ அமைச்சர் இந்த விடயத்தில் மிகவும் கவனமெடுக்க வேண்டும்.

இந்தத் திட்டத்திற்கு அந்த AFD அமைப்பு மானியமாகவும் உதவி செய்யத் தயாராக இருக்கின்றது. அதேபோன்று, குறைந்த இலகு வட்டிக் கடன் மூலமாகவும் உதவிசெய்வதற்கு இந்த அமைப்பு தயாராக இருக்கின்றது என்பதை எமது பகுதி விவசாயிகளும் புத்திஜீவிகளும் என்னிடம் அடிக்கடி வலியுறுத்திக் கொண்டிருக்கின்றபடியால், தயவுசெய்து அந்த AFD அமைப்பின் மூலமாக இத்திட்டத்தைச் செய்தால் இந்தக் குளம் ஒரு தரமான நீர்ப்பாசனக் குளமாக அமைவதோடு மட்டுமல்லாமல், நீண்டகாலத்திற்கு அதனைப் பயன்படுத்தக் கூடிய ஒரு வசதியும் இருக்குமென்பதை எமது பகுதி விவசாய அமைப்புகளின் சார்பாகத் தங்களுக்கு மிகவும் அழுத்தம் திருத்தமாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

எமது நாட்டில் கடந்த காலத்தில் நாட்டைக் கட்டியெழுப்புவதற்காக எமது ஆட்சியாளர்கள் வலதுசாரிக் கொள்கையைப் பின்பற்றியது உங்களுக்குத் தெரியும். இதனைத் தாராண்மைவாதச் சிந்தனை - capitalism என்றும் சொல்வார்கள். இந்தச் சிந்தனையைப் பயன்படுத்தி நாங்கள் வெற்றி காணவில்லை; ஒரு வகையில் நாங்கள் தோற்றிருக்கின்றோம் என்றுதான் சொல்ல வேண்டும். இப்போது மாற்றுச் சிந்தனையாக நீங்கள் ஓர் இடதுசாரி சிந்தனையைக் கொண்டுவந்திருக்கிறீர்கள்! அந்த இடதுசாரிச்

சிந்தனைமூலம் சமத்துவ அடிப்படையில் சகலருக்கும் வாய்ப்புகள் வழங்கப்படும் வகையில் சகல பகுதிகளையும் அபிவிருத்தி செய்யவேண்டுமென்ற அடிப்படையில் நீங்கள் சிந்திப்பீர்கள் என்று நினைக்கின்றேன். உறுகாமம் - கித்துள் குளத்தை இணைக்கின்ற முந்தனை ஆற்றுத் திட்டத்தின்மூலம் 6 வகையான நன்மைகள் கிடைக்கின்றன; 25,000 ஏக்கருக்கும் அதிகமான நிலப்பரப்புக்கு இரண்டு போகங்களுக்கும் நீர்ப்பாசனம் வழங்கக்கூடிய வசதிகள் இருக்கின்றன. இதற்கு AFD என்ற அமைப்பு உதவி செய்வதற்கும் தயாராக இருக்கின்றது. இதனை அமுல்படுத்துவதில் கடந்த காலத்தில் தவிர்ப்புகள், காலதாமதங்கள் செய்யப்பட்டன. நீங்கள் இந்தத் திட்டத்தைத் தட்டிக்கழித்துவிடாமல் நடைமுறைப்படுத்துவதன் மூலமாக விவசாயத்தில் மறுமலர்ச்சியை ஏற்படுத்தலாம். நான் இங்கு குறிப்பிட்டவாறு நன்னீர் மீன்பிடியைக்கூட ஊக்குவிக்கும் நிலை இருக்கின்றபடியால் எங்களுடைய மாவட்ட மக்கள் இத்திட்டம் தொடர்பில் மிகவும் எதிர்பார்ப்புடன் இருக்கின்றார்கள். உங்களது கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களிடமும் இந்த விடயம் பற்றிச் சொல்லியிருக்கிறார்கள். அவர்கள் சிலவேளை கட்சியின் கட்டுப்பாடுகள் அல்லது கொள்கைகளால் இதைப்பற்றிப் பேசுவதற்குத் தயங்கினாலும் எதிர்க்கட்சியில் இருக்கின்ற நாங்கள் இந்த விடயத்தைச் சொல்லிவைக்க விரும்புகின்றோம்.

அடுத்ததாக, காணி மற்றும் கால்நடைகள் பற்றிய சில பிரச்சினைகளைச் சொல்ல விரும்புகின்றேன். மயிலத்தமடு, மாதவனை பிரதேசத்தில் பல தசாப்த காலங்களாக எங்களுடைய கால்நடைப் பண்ணையாளர்கள் தமது கால்நடை வளர்ப்புத் தொழிலைப் பாரம்பரியமாகச் செய்து வருகின்றார்கள். அந்த இடத்தில் சட்டவிரோதமான முறையில் அயல் மாவட்டங்களிலிருந்து வந்த மக்கள் குடியேற்றப் பட்டிருக்கிறார்கள். இந்த விடயத்தை முறைப்படி சட்டரீதியில் அணுகுவதற்காக நீதிமன்றத்துக்குச் சென்றபோது, சட்டவிரோதமாகக் குடியேறியவர்களை வெளியேற்றும்படியும், தேவையற்ற, இன நல்லிணக்கத்திற்கு எதிரான தன்மைகளை அங்கிருந்து களைந்துவிடுமாறும் நீதிமன்றம் இரண்டு - மூன்று தடவை தீர்ப்புகளை வழங்கியும் இன்னமும் அந்த விடயம் கையாளப்படாமல் இருக்கின்றது. கடந்த காலத்தில் தவறுகள் நடைபெற்றுள்ளதன் காரணமாகத்தான் வடக்கு, கிழக்கு மக்கள் இம்முறை உங்களுக்கு வாக்களித்திருக்கிறார்கள். எனவே, மயிலத்தமடு, மாதவனை மேய்ச்சல் தரையில் சட்டவிரோதமாகக் குடியேறி, அங்கிருக்கின்ற இன நல்லுறவைப் பாதிக்கக்கூடிய விதத்தில் பிரச்சினைகளை உருவாக்கிக் கொண்டிருக்கின்றவர்களை வெளியேற்றுவதற் குரிய நடவடிக்கைகளை நீங்கள் செய்யவேண்டுமென்று இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, விவசாயிகளைப் பொறுத்தமட்டில் தமது உற்பத்திகளைச் சந்தைப்படுத்துகின்றபோது அதற்குரிய நியாயமான உத்தரவாத விலை கிடைப்பதில்லை என்பது அவர்களுக்குள்ள பிரச்சினை! இருந்தாலும், உங்களுடைய காலத்தில் ஓரளவு உத்தரவாத விலை கொடுக்கப் பட்டிருக்கிறது; அதனை நான் வரவேற்கின்றேன். அதுபோன்று, விவசாய உற்பத்தியில் ஈடுபடும்போது ஏற்படுகின்ற நட்டங்களுக்கான ஈடுகள் உரிய காலத்தில் வழங்கப்படாத நிலை காணப்படுகின்றது. கடந்த காலத்தில் உரம் சம்பந்தமாக ஏற்பட்ட தடுமாற்றம்தான் ஆட்சி மாற்றத்துக்குக்கூட வழிவகுத்திருந்தது. எனவே, விவசாயிகளுக்கான உர வசதி மற்றும் நட்டஈடுகளை உரிய காலத்தில் வழங்குதல், அவர்கள் எதிர்பார்க்கின்ற குளங்களை அபிவிருத்தி செய்தல் ஆகியவற்றை நீங்கள் செய்ய வேண்டும்.

அதேபோன்று, அங்குள்ள கண்டியனாறு மற்றும் அடைச்சகல் குளங்களில் நீர் தேங்கக்கூடியதாக இருந்தாலும், தண்ணீர் வீணாகக் கடலுக்குச் செல்கின்ற நிலை காணப்படுகின்றது.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, give me one more minute.

வெள்ளப்பெருக்கு ஏற்படுகின்றபோது அந்தப் பிரதேசம் முற்றாக நீரில் அமிழ்ந்து போகின்றது. வீணாகக் கடலுக்குச் செல்கின்ற இந்த நீரைச் சேகரித்து வைப்பதன்மூலம் விவசாயத் துறையைக் கட்டியெழுப்பி நாட்டை அபிவிருத்தி செய்யக் கூடிய வாய்ப்பு அதிகமாகக் காணப்படுகிறது. எனவே, தயவுசெய்து நீர் வீண் விரயமாவதைத் தடுப்பதோடு, வெள்ளப்பெருக்கினால் மக்கள் பாதிக்கப்படுவதையும் தடுக்கக்கூடிய விதத்தில் உரிய திட்டங்களை அமுல்படுத்துவதுடன், நான் இங்கு குறிப்பிட்ட முந்தனை ஆற்றுத் திட்டத்தை நடைமுறைப்படுத்தல், விவசாயிகளுக்குரிய நட்டஈடு, சந்தைப்படுத்தும் வசதி, உற்பத்திகளுக்கு நியாயமான விலை வழங்கப்படுதல், மயிலத்தமடு, மாதவனை பிரதேசத்தில் சட்டவிரோதமாகக் குடியேறியுள்ள மக்களை நீதிமன்றத் தீர்ப்பின் அடிப்படையில் வெளியேற்றுதல் போன்ற விடயங்களுக்குரிய பதிலை நீங்கள் வழங்குவீர்கள் என்ற எதிர்பார்ப்போடு எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Susantha Kumara Nawarathna. You have 12 minutes.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Deputy Minister?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු සභාපතිතුමනි, ගරු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමාගේ කථාවේදී මුන්දෙනි ආරූ ව්‍යාපෘතිය සහ මයිලත්තමඩු තෘණ භූමි පිළිබඳව කිව්වා. ඒ පිළිබඳව මම ඒ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි මුන්දෙනි ආරූ ව්‍යාපෘතිය අමතක කරලා නැහැ. මේ අය

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

වැයෙන් මුන්දෙනි ආරූ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා, ඉඩම් අත්පත් කර ගැනීම සහ දැනට පවතින කටයුතු කරගෙන යන්න. එතුමා කිව්වා වාගේ AFD ආයතනයයි ආධාර කරන්නේ. ප්‍රංශ ආධාරයක් තමයි ලැබෙන්නේ. ඒ ණය මුදල තවමත් තහවුරු වෙලා නැහැ. නමුත්, අපි රජයක් විධියට AFD ආයතනයත් එක්ක ගනුදෙනු කරන්න සාකච්ඡා පවත්වමින් සිටිනවා. ඒත් එක්කම, ඒ ගරු මන්ත්‍රීතුමාගේ පැත්තෙන් චෝදනාවක් ආවා, මුන්දෙනි ආරූ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් සාකච්ඡා කරලා තිබෙනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට එතුමන්ලා එයට සම්බන්ධ කර ගත්තේ නැහැ කියලා. ඒක එහෙම නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. අපේ රජයේ මන්ත්‍රීවරුන් මුන්දෙනි ආරූ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් friendly talk එකක් තමයි සිදු කළේ. ඒ සම්බන්ධයෙන් AFD ආයතනයෙන් තහවුරුවක් ආ ගමන් - මුන්දෙනි ආරූ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අරමුදල් සූදානම් වූ සැණින් - ඔබතුමන්ලා සම්බන්ධ කර ගන්න අපි කිසිසේත් පැකිළෙන්නේ නැහැ කියන පණිවුඩය මම ලබා දෙන්න කැමැතියි.

ඊළඟට, මයිලත්තමඩු තෘණ භූමි සම්බන්ධ ප්‍රශ්නය ගත්තොත්, අපි ඒක සංවේදීව දකිනවා. අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් ඉන්නවා කියන කාරණයත් මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Susantha Kumara Nawarathna, you may start now. You have 12 minutes.

[පූ.භා. 11.27]

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය විවාදයට ගන්නා මේ වෙලාවේ අපි දන්නවා, අපේ රටේ පවතින අමාත්‍යාංශවලින් වැඩි වශයෙන් ජනතාව අතර කථා බහ වන අමාත්‍යාංශයක් බවට කෘෂිකර්ම අමාත්‍යාංශය පත් වෙලා තිබෙන බව. ගරු සභාපතිතුමනි, විපක්ෂය පැත්තෙන් එන යෝජනා, චෝදනා අහගෙන ඉන්න කොට වෙලාවකට අපට හිතෙනවා, පසුගිය කාලයේ -මේ ගෙවුණු කාලය පුරාවට- ආණ්ඩු කෙරුවේත් අපි ද කියලා. කැලි කැලිවලට කඩලා, තැන් තැන්වලට වීසි කරලා, අමාත්‍ය කාර්යාල 7ක් ලෙස පවත්වා ගෙන ගිය මේ අමාත්‍යාංශය අද අපි එක මිටකට ගෙනැල්ලා අපේ රටේ මහ පොළොවත් එක්ක පොර බදන ගොවි ජනතාවගේ ඇත්ත ප්‍රශ්න ටික විසඳීම වෙනුවෙන් විද්‍යාත්මකව, ක්‍රමානුකූලව පියවරෙන් පියවර ඉස්සරහට යමින් තිබෙනවා.

මේ අමාත්‍යාංශයේ ප්‍රධාන විෂයයක් ගැන අවධානය යොමු කරන්න මම කැමැතියි. ඒ තමයි, පශු සම්පත් ක්ෂේත්‍රය. අපේ රටේ අවුරුදු 2,500කට එහා ඉතිහාසය සැලකිල්ලට ගන්න කොට, අපේ රටේ ජනාවාස ආරම්භ කරන කොට ඒ ජන ජීවිතයත් එක්ක එකටම ගැට ගැහිච්ච, ජීවිතයේ කොටසක් බවට පත් වුණු ක්ෂේත්‍රයක් තමයි පශු සම්පත් ක්ෂේත්‍රය. එය ජනතාවගේ ජීවිතයේ කොටසක් බවට පත් වුණා. අද වන විට එය ක්‍රමානුකූලව කර්මාන්තයක් බවට පත් වෙලා තිබෙනවා. කර්මාන්තයක් බවට පත් වුණත්, එය අපේ රටේ ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන කර්මාන්තයක් බවට පත් කරන්නේ කොහොමද කියන කාරණයට අදාළ සැලසුම්සහගත වැඩ පිළිවෙළක් ඉතිහාසය පුරාවට තිබුණේ නැහැ.

පසුගිය කාලයේ -2022 වර්ෂය වනකොට- අපේ රටේ ආර්ථිකය කඩා වැටුණා. හැබැයි, පශු සම්පත් ක්ෂේත්‍රය එක්ක ජීවත් වෙච්ච බොහෝ දෙනා අපේ රටේ ආර්ථිකය අල්ලා ගෙන ගිය පංගුව බවට පත් වුණා. සාපේක්ෂව ගත්තොත්, පශු සම්පත් ක්ෂේත්‍රයත් එක්ක ජීවත් වෙච්ච ජනතාවගේ ආර්ථිකය කඩා වැටුණේ නැහැ. එවන් ක්ෂේත්‍රයක් තමයි පශු සම්පත් ක්ෂේත්‍රය.

අපි දන්නවා පශු සම්පත් ක්ෂේත්‍රය නඟා සිටුවනවා කියලා ආපු, පසුගිය කාලයේ හිටපු බොහෝ ඇමතිවරු කටයුතු කළේ කොහොමද කියලා. හිටපු අමාත්‍ය හැරිසන් මැතිතුමා කළේ මොකක්ද? කිරි කර්මාන්තය විශේෂයක් කරලා ගත්තොත්, විජිත් විජිතමුණි ද සොයිසා වැනි හිටපු ඇමතිවරු මේ රටේ ගොවි ජනතාවට බෙදන්න ජනතාවගේ සල්ලිවලින් ගෙනාපු හරක් ටික තමතමන්ටත් බෙදා ගත්තා. ඒ වෙන් කරපු සහනාධාර පංගුව විජිත් විජිතමුණි සොයිසලා ගත්තා. කිරි කර්මාන්තය හදනවා වෙනුවට හිටපු ඇමති හැරිසන් ඇතුළු අය පසු ගිය කාලයේ කිරි කර්මාන්තය විනාශ කරන තැනට පත් කළා; අපේ රටට ගැළපෙන්නේ නැති හරක් ගෙනැල්ලා ඒ කර්මාන්තය විනාශ මුඛයට ඇද දැම්මා. එය වෙනස් කිරීමේ වගකීම අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව භාරගෙන තිබෙනවා.

විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කියනවා, අපට ප්‍රතිපත්තියක් නැහැ කියලා. ගරු සභාපතිතුමනි, අපි ඉතාම සැලසුම් සහගත ප්‍රතිපත්තිමය තීරණ තමයි අරගෙන තිබෙන්නේ.

සත්ව සමීක්ෂණය ගත්තොත්, පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය හා ආරක්ෂක අංශයත් සම්බන්ධ කරගෙන කමිටුවක් හදලා තමයි එම කටයුත්ත පටන් අරගෙන තිබෙන්නේ. එහෙම නැතිව, අඳුරේ අතපත ගානවා නොවෙයි. ආරම්භයක් තබන්න ඕනෑකම තිබෙනවා. ආරම්භය නිසි විධියට තබා තිබෙනවා. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන සංකල්පය වැඩ පිළිවෙළක් බවට පත් කර තිබෙනවා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන වැඩ පිළිවෙළ මත පදනම්ව තමයි අපේ රටේ ජාතික ප්‍රතිපත්තිය ගොඩනැඟීම වෙනුවෙන් ආරම්භයක් තබා තිබෙන්නේ. ඔව්, අපි විශ්වාස කරනවා, ජාතික ප්‍රතිපත්තියක් ඕනෑ කියලා. ඒ ජාතික ප්‍රතිපත්තියේ ආරම්භය අපි තබා තිබෙනවා.

අපේ රටේ පශු සම්පත් ක්ෂේත්‍රයේ මේ වන විට දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය සියයට 1.4යි. නමුත්, ඉන්දියාව පශු සම්පත් ක්ෂේත්‍රය හරහා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5කට ආසන්න පංගුවක් අත් පත් කරගෙන තිබෙනවා. අපේ රටේ පශු සම්පත් ක්ෂේත්‍රයේ කිරි කර්මාන්තයේ නියැළී සිටින ලක්ෂ 4කට ආසන්න ගොවි ජනතාව රටේ අවශ්‍යතාවෙන් සියයට 45ක් පමණ සපුරනවා. එම කර්මාන්තයේ නියැළී ඉන්න සියලුදෙනා ඒ දායකත්වය සපයනවා. දේශීය කිරි අවශ්‍යතාවෙන් සියයට 55කට ආසන්න ප්‍රමාණයක් අප සපුරා ගන්නේ ආනයනය කරලායි. එම නිසා අපේ භාණ්ඩාගාරයේ තිබෙන ඩොලර් ටික පිට රටවලට යවන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දේශීය කිරි කර්මාන්තය බිඳ වැටිලායි තිබෙන්නේ. එය ගොඩනහන්න ඕනෑ බව ඇත්ත. නමුත්, කොහොමද ගොඩනහන්නේ? අපි කොහොමද කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට පශු සම්පත් ක්ෂේත්‍රය සංවර්ධනය කරන්නේ? අපේ රටේ කිරි කර්මාන්තය වෙනුවෙන් දායක වන ගොවියෝ විසිරිලායි ඉන්නේ. රජයට අනුබද්ධ මිල්කෝ

ආයතනය තිබෙනවා. ඒ වාගේම තවත් පෞද්ගලික සමාගම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. තැන් තැන්වල විසිරිලා තිබෙන ඒ සමාගම්වලට කිරි ටික සපයන ගොවි ජනතාව එකතු කරලා -අපේ රටේ සියලු ගොවි ජනතාව එකතු කරලා- ග්‍රාමීය මට්ටමින් සමිති ගොඩනඟන්න අපි තීරණය කරලා තිබෙනවා. ඒ ගොවි ජනතාවට පහසුකම් ටික ලබා දෙන යන්ත්‍රණය අපි ශක්තිමත් කරන්න ඕනෑ. එම සමිති ග්‍රාමීය මට්ටමින් ගොඩනඟලා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොඩනඟලා, ජාතික මට්ටම දක්වා ගෙනැල්ලා තිබෙනවා; අපේ රටේ කිරි කර්මාන්තයේ නියැළී ඉන්න ලක්ෂ 4ක් වෙච්ච ගොවි ජනතාව ශක්තිමත් කිරීම වෙනුවෙන් එම යන්ත්‍රණය විධිමත්ව ශක්තිමත් කරන්න ඕනෑ කියලා තීරණය කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ කිරි කර්මාන්තයට අදාළව කිසිම පසුවිපරමක් කරලා නැහැ; කිරි ලීටර් 10ක් දෙන්නේ දෙනුන් කොච්චරක්ද කියලා හඳුනාගෙන නැහැ; කිරි ලීටර් 20ක් සපයන ගොවි පොළ මොකක්ද කියලා හඳුනාගෙන නැහැ. අපි ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. අවම වශයෙන් කිරි ලීටර් 10ක් ලබා දෙන්න පුළුවන් කිරි දෙනුන් ඉන්නේ කොයි ගොවි පොළේද කියලා අපි හඳුනාගෙන තිබෙනවා. ඒ කිරි දෙනුන් වෙන වෙනම හඳුනා ගෙන අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, කිරි කර්මාන්තය ටිකෙන් ටික දියුණු කරන්න ඕනෑ, ශක්තිමත් කරන්න ඕනෑ කියලා. කිරි ලීටර් 100ක් ලබා දෙන ගොවි පොළ මොකක්ද කියලා හඳුනාගෙන ඒ කිරි ලීටර් 100 ලබා දෙන ගොවි පොළ කිරි ලීටර් 200ක් ලබා දෙන ගොවි පොළක් බවට පත් කරන්නේ කොහොමද කියලා අපි විධිමත් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා.

අපේ රටේ කිරි කර්මාන්තයේ නියැළී ඉන්න ගොවීන්ට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, සත්ව ආහාර ප්‍රශ්නය. අද සත්ව ආහාර අධික මිලකට ගන්නයි සිද්ධ වෙලා තිබෙන්නේ. ගොවි ජනතාව බඩ ඉරිහු කර්මාන්තයේ නියැළී ඉන්නවා. හැබැයි, අද සත්ව ආහාර බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. තණකොළ ටිකක් සිටුවා ගන්න අද ගොවි ජනතාවට තෘණ භූමියක් නැහැ. එම නිසා ආණ්ඩුව විධියට අපි තීරණය කර තිබෙනවා, අපේ රටේ කිරි කර්මාන්තයේ නියැළී ඉන්න ගොවි ජනතාව -ඒ සූක්ෂ්ම කර්මාන්තයේ යෙදී ඉන්න ගොවි ජනතාව- හඳුනාගෙන එම ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. තණකොළ ටිකක් සිටුවා ගන්න අවම වශයෙන් තමන්ගේ ඉඩමෙන් අක්කර කාලක්, භාගයක් වෙන් කර ගන්න පුළුවන් නම්, චතුර මෝටරයක් නැත්නම් චතුර මෝටරයක් දෙන්න, චතුර බට නැත්නම් ඒ බට ටික දීලා අවශ්‍ය පහසුකම් හදලා දෙන්න ඕනෑ කියලා ආණ්ඩුව විධියට අපි තීරණය කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ කිරි අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමේදී තිබෙන තවත් ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, උසස් ආරයේ දෙනුන් නොමැතිකම. අපි දන්නවා, අපට කිරි වැඩිපුරම නිෂ්පාදනය කරලා දෙන්නේ මධ්‍යම පළාත බව. හැබැයි, රටට අවශ්‍ය කිරි ටික සපයා දීම සඳහා මධ්‍යම පළාතේ ඉන්න ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඉතිහාසය පුරාවට පුළුවන්කමක් ලැබිලා නැහැ. හැබැයි, අපි සැලසුම් කර තිබෙනවා ඒ පහසුකම් ටික ලබා දෙන්න. එහි ප්‍රධාන කාර්යයක් තමයි, උසස් ආරයේ දෙනුන් හදා ගැනීම. ඒ වෙනුවෙන් කෘත්‍රිම සිංචනය තවත් පුළුල් කරන්නේ කොහොමද කියන කාරණය කෙරෙහි අපි අවධානය යොමු කර තිබෙනවා. පිට රටින් sexed semen ආනයනය කරලා අපේ රටේ උසස් ආරයේ ගැහැනු සතුන් බිහි කරගෙන, අපේ කිරි කර්මාන්තයට උර දෙන ගොවීන්ට ඒ උසස් ආරයේ ගැහැනු සතුන් භාර කරන වැඩ පිළිවෙළ අපි සැලසුම් සහගතව ආරම්භ කර තිබෙනවා. එවැනි වැඩ පිළිවෙළක් අනුව යමින් අපේ කිරි කර්මාන්තය දියුණු කරන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා.

අපේ රටේ මහවැලි අධිකාරිය සතු ගොවි පොළවල් 17ක් තිබෙනවා. ඒවා අතරින් ගොවි පොළවල් 10ක් තෝරාගෙන, කිරි කර්මාන්තය, කුකුළු කර්මාන්තය හා සූකර කර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් එම ගොවි පොළවල් පාවිච්චි කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. එම ගොවි පොළවල් 10 සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් අපි හදලා තිබෙනවා.

ඒ වාගේම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය තිබෙනවා. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව තිබෙනවා ගොවිපළවල් 32ක්. ඒ වාගේම, ඉඩම් තිබෙනවා අක්කර 28,802ක්. ඒ ඉඩම් ටික කළමනාකරණය කරලා, මේ කර්මාන්තය වෙනුවෙන් පාවිච්චි කරන්නේ කොහොමද කියලා අපි සැලසුම් හදලා තිබෙනවා. අපට ප්‍රධාන ප්‍රශ්නය තිබෙන්නේ, අභිජනන ගොවිපළවල් සම්බන්ධයෙන්. පසු ගිය කාලයේ ඒ බොහෝ දේවල් තිබුණා, ඒවා දැන් විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා අපි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව තිබෙන ගොවිපළවලින් එක පළාතකට එක ගොවිපළක් බැගින් තෝරා ගෙන, ඒක අභිජනන ගොවිපළක් ලෙස සංවර්ධනය කරලා, ඒ පළාතේ, ඒ දිස්ත්‍රික්කයේ මේ කර්මාන්තයේ නියැළෙන ජනතාවට දියුණු ආරේ ගැහැනු සතෙක් බාර කරන්නේ කොහොමද, අපි කොහොමද මේ කර්මාන්තයට දායක කර ගැනීම වෙනුවෙන් දියුණු ආරේ සතෙක් හදන්නේ කියන අදහස ඇතිව අභිජනන වැඩ පිළිවෙළ විධිමත් ලෙස නහා සිටුවීම සඳහා සැලසුම් හදලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය බවට පත් වෙන්නේ, අපේ රටේ ගොවි ජනතාවට දැනුම ලබා දීම හා ව්‍යාප්ති සේවයයි. ඒ ක්ෂේත්‍ර වෙනුවෙනුත් අපි අවධානය යොමු කරලා තිබෙනවා. මේ කර්මාන්තය නහා සිටුවීමේදී ඊළඟට අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මේකයි. අපේ රටේ පශු වෛද්‍ය කාර්යාල විශාල ප්‍රමාණයක් තිබුණත්, ඒවාට අවශ්‍ය පශු වෛද්‍යවරු නැහැ. පශු වෛද්‍ය පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. අපේ ගරු ඇමතිතුමාගේ කථාවේදී ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම, සත්ව සංවර්ධන උපදේශකවරු අවශ්‍ය ප්‍රමාණය අපට නැහැ, ඒ පුරප්පාඩුත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා, අපේ රටේ රාජ්‍ය යන්ත්‍රණයේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව විධියට අපි ඒ ගැන අවධානය යොමු කරලා, අවශ්‍යතාව මත, ප්‍රමුඛතාව මත අනාගතයේදී පශු වෛද්‍යවරුන් බඳවා ගෙන, සත්ව සංවර්ධන උපදේශකවරුන් බඳවා ගෙන, ඒ අයට අවශ්‍ය පහසුකම් සපයලා, මේ කර්මාන්තය නහා සිටුවන්නේ කොහොමද කියලා වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා.

ඒ වාගේම අපට ඊළඟට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, කුකුළු කර්මාන්තයට තිබෙන ප්‍රශ්න. අපේ රටේ මේ වන විට කුකුළු කර්මාන්තයේ නියැළෙන ගොවි ජනතාව බරපතළ පීඩාවට පත් වෙලා තිබෙනවා. අද ගොවියාට බිත්තරයක් හදා ගන්න යන නිෂ්පාදන පිරිවැය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අද බිත්තරය අළෙවි කරන්න වෙලා තිබෙන්නේ ලාභයක් නැති විධියට. මස් කර්මාන්තයත් එහෙමයි. අපි මේ වන විට කුකුළු කර්මාන්තය වෙනුවෙන් පියවර කිහිපයක් අරගෙන තිබෙනවා. අපි කුකුළු මස් ටික අපනයනය කිරීම වෙනුවෙන් චීනයත් එක්ක පවා අවබෝධතා ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. අපි මේ කර්මාන්තය දියුණු කරන්න ඕනෑ, ඒකට අවශ්‍ය පහසුකම් ටික සපයන්න ඕනෑ. කුකුළු කර්මාන්තයේ ඉන්න ගොවි ජනතාවගේ ප්‍රධාන ප්‍රශ්නය තමයි, ඒ සතුන්ට අවශ්‍ය ආහාර ටික සපයා ගන්නා එක. අද ඒක බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා බඩ ඉරිහු වගාව දියුණු කරලා, ඒ ගොවි ජනතාවට පහසුකම් ටික දීලා, අවශ්‍ය ඉඩම් ටික වෙන් කරලා දීලා, කුකුළු කර්මාන්තය සහ සත්ව පාලනයේ යෙදිලා ඉන්න ගොවි ජනතාවගේ සතුන්ට අවශ්‍ය ආහාර ටික නිෂ්පාදනය කිරීම වෙනුවෙන් වැඩි අවධානය යොමු කරලා තිබෙනවා.

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

පසු ගිය කාලයේ සූකර කර්මාන්තයත් අවාසනාවන්ත ලෙස බිඳ වැටුණා. ඒ නිසා සූකර කර්මාන්තය නහා සිටුවීම වෙනුවෙන් අවධානය යොමු කරලා, අපේ රටේ මස් අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන්, පෝෂණ ඌනතාව මඟ හරවා ගැනීම වෙනුවෙන්, මේ කර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඉතා සැලසුම් සහගත ලෙස අපේ රටේ කිරි කර්මාන්තය, සූකර කර්මාන්තය, කුකුළු කර්මාන්තය ක්‍රියාත්මක වුණා. ඒ වාගේම, එළු ගොවිපළවල් විශාල ප්‍රමාණයක් බොහෝ පළාත්වල, බොහෝ දිස්ත්‍රික්කවල තිබුණා. නමුත්, මේ වෙනකොට සාමාන්‍ය ගොවියෙකුට දෙන්න, අපේ රටේ රජයේ ගොවිපළක් සතුව හොඳ ආරේ එළුවෙක් සොයා ගන්න නැති තැනට පත් වෙලා තිබෙනවා. ඒ නිසා, අපි ඒ සෑම ක්ෂේත්‍රයක් ගැනම අවධානය යොමු කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. අපේ රටේ පෝෂණ ඌනතාව මහඟරවා ගැනීම වෙනුවෙන් සහ අනෙක් පැත්තෙන් ගත්තාම කිරි කර්මාන්තය නහා සිටුවීම වෙනුවෙන් -මේ හැම ක්ෂේත්‍රයක්ම නහා සිටුවීම ගැන- අවධානය යොමු කරලා, ඒ මැදිහත්වීම කරමින් සිටිනවා.

අපේ රටේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් හා ඒ රාජ්‍ය ආයතන නියෝජනය කරන නිලධාරී මහත්වරුන්ගෙන් ඉල්ලා සිටිනවා, අපි එකතු වෙලා මේ කර්මාන්තය ගොඩ නඟමු කියලා. ඒ වෙනුවෙන් හදලා තිබෙන මේ වැඩ පිළිවෙළ බිම් මට්ටම දක්වා ගෙන යමින්, ඒක අපේ රටේ ජාතික සංවර්ධනයේ පංගුවක් බවට, දළ දේශීය නිෂ්පාදිතයේ පංගුවක් බවට පත් කර ගැනීම වෙනුවෙන්, මේ බොහෝදෙනාගේ දායකත්වය අපි ඉල්ලා සිටිනවා. ඒ දායකත්වයත් ලබා ගනිමින්, අපි ආණ්ඩුවක් විධියට ඉතාම විධිමත්ව මේ කර්මාන්තය ඉදිරියට ගෙනියන්න සැලසුම් කරලා තිබෙනවා කියන පණිවුඩය මේ මොහොතේදී ලබා දෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Kins Nelson. You have 13 minutes.

[පූ.භා. 11.39]

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු සභාපතිතුමනි, අද අය වැය කාරක සභා අවස්ථාවේදී කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් දක්වන්න ලැබීම ගැන සතුටු වෙනවා. මට පෙර කථා කරපු ගරු ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා, මේ වෙනකොට වගා හානි වෙච්ච ගොවීන්ගට සියලු ආධාර ලබා දීලා තිබෙන්නේ කියලා. ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරලා, වගා හානි වෙච්ච ගොවීන්ට ඒක හරියට ලැබිලා තිබෙනවාද කියලා සොයා බලා කථා කළොත් හොඳයි කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

මම නියෝජනය කරන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගොවි ජනපදයක්. ගරු සභාපතිතුමනි, මේ වෙනකොට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවියාට පොරොන්දු වෙච්ච විධියට වගා හානිවලට වන්දි ලබා දීලා නැහැ. ගොවියාට කියපු විධියට, වගා හානි වුණොත් හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂයක වන්දියක් ලබා දෙනවා කියලා තමයි ප්‍රකාශ කරලා තිබෙන්නේ. හැබැයි එහෙම නොවෙයි වෙන්නේ. මෙතැනදී වැරදි පණිවුඩයක් ගොවියාට ගිහිල්ලා තිබෙනවා. ඒක නිවැරදි කරන්න ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා හෝ ඒ වගාව සම්බන්ධව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කවුරු හරි නිලධාරි මණ්ඩලයක් පත් කරලා තිබෙනවා නම් ඒ හරහා හෝ කටයුතු කරන්න ඕනෑ. මේක මෙහෙම නොවෙයි වෙන්නේ, මෙන්න මේ ආකාරයට තමයි වෙන්නේ කියලා ගොවියාට පැහැදිලි කරලා දීලා නැහැ. දැන් ගොවියා බලාපොරොත්තුවෙන් ඉන්නවා, වගාවට හානි වෙලා තිබෙනවා නම් හෙක්ටෙයාරයකට රජයෙන් රුපියල් ලක්ෂයක් දෙයි කියලා; ඒ විශ්වාසයෙන් ඉන්නේ. නමුත් ඇත්තටම එහෙම වෙන්නේ නැහැ. ගොයමට මාසයක වාගේ කාලයක් නම් සියයට 40යි; රුපියල් 40,000ක් දෙනවා. ගොයමට මාස දෙකක් නම් සියයට 60ක්, රුපියල් 60,000ක් දෙනවා. හෙක්ටෙයාරයක ගොයම සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙනවා නම් රුපියල් ලක්ෂයක් දෙනවා. හැබැයි මේ පණිවුඩය හරියට ගොවියාට ගිහිල්ලා නැහැ. ඒ නිසා අද ගොවියා බලාපොරොත්තුවෙන් ඉන්නවා, වගා හානි වෙච්ච, ගංවතුරවලට යට වෙච්ච කුඹුරුවලට රජය රුපියල් ලක්ෂයක් ලබා දෙයි කියලා. ඒ නිසා ගරු ඇමතිතුමාට මම විශේෂයෙන්ම කියනවා, මේ ගැන අදාළ බලධාරීන්ට, නිලධාරීන්ට කියලා මේක නිවැරදි කරලා, ඇත්තටම දෙන වන්දිය මෙන්න මේකයි කියලා ගොවියාට කියන්න කියලා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ පාලන කාලයේත් අපි දිගින් දිගටම කිව්වේ මේ රටේ ජාතික ආර්ථිකයට ශක්තියක් වෙන මේ ගොවි ජනතාවට ඇත්ත කියන්න කියලායි. රජයට අමාරු වෙන්න පුළුවන්; කෘෂිකර්ම අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රතිපාදන නැතිවෙන්න පුළුවන්. හැබැයි රජයක් විධියට ගොවියාට ඇත්ත කිව්වා නම්, ගොවියා ඒකට සූදානම් වෙනවා. ඒ නිසා පසුගිය කාලයේ වෙච්ච විධියටම මේ කාලයේත් ඒක නොකෙරෙයි කියලා අපි විශ්වාස කරනවා. රටේ ජනතාව ඔබතුමන්ලාට බලයක් දුන්නේ වැරදි නිවැරදි කරගෙන හොඳ විධියට ගොවියාට ගොවිතැන කරන්න පුළුවන් වෙයි කියන විශ්වාසයෙන්.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ ඇති වෙච්ච ගංවතුරත් එක්ක පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අක්කර 800ක විතර ගොවිතැන සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙනවා. ඒ වාගේම, ගල්අමුණ අක්කර 250ක ගොවිතැන විනාශ වෙලා තිබෙනවා. මේ කියන්නේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විතරක් තොරතුරු. ඒ වාගේම, පඹුරාන, පල්ලියගොඩැල්ල ප්‍රදේශයේ අක්කර 400ක කුඹුරු මේ වෙනකොට සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මහවැලි බී කලාපයේ, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දම්මින්න ප්‍රදේශයේ මේ වෙනකොට අක්කර 1,500ක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. අදත් වහිනවා ඒ ප්‍රදේශයට. මේ වෙනකොට ඒ ගොයම් කපාගන්න විධියක් නැහැ, සම්පූර්ණයෙන්ම ගංවතුරෙන් යට වෙලා තිබෙනවා. කිසිම නිලධාරියෙක් මේ ගැන කථා කරන්න ඇවිල්ලාත් නැහැ. මහවැලි නිලධාරීන්ට දැනුම් දුන්නත්, ඒ අය ඇවිල්ලාත් නැහැ.

ගරු සභාපතිතුමනි, තිබෙන ලොකුම ප්‍රශ්නය මෙයයි. එදා අක්කරයක ගොයම් කපන්න අපට රුපියල් 35,000ක වාගේ මුදලක් තමයි ගියේ. දැන් මේ වරුසාවත් එක්ක මැෂින් එකක් කුඹුරට දාගන්න විධියක් නැහැ. ගොයම් කපන යන්ත්‍රයක් සඳහා දැන් අක්කරයකට රුපියල් 50,000ක්, 60,000ක් ඉල්ලනවා. ඒ නිසා එක පැත්තකින් ගොවියාට ගොයම් කපාගන්න විධියක් නැතුව ඉන්නවා. අනෙක් පැත්තෙන්, කුඹුරු ටික යට වෙලා ගොවියා බලාගෙන ඉන්නවා, රජය ඒකට ගන්න වැඩ පිළිවෙල මොකක්ද කියලා. කෘෂිකර්ම ඇමතිතුමා විධියට ගරු ලාල් කාන්ත ඇමතිතුමා වාගේම, නියෝජ්‍ය ඇමති නාමල් කරුණාරත්න මැතිතුමාත් ගොවියෝ ගැන බොහොම වුවමනාවෙන් කථා කරපු අය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි ඒ

කාලයේ දැක්කා, ඔබතුමා පොළොන්නරුවේ කුඹුරකට බැහැලා ගොයම් කාලත් පෙන්නුවා, මෙන්න මෙහෙමයි වෙන්න ඕනෑ කියලා. ඔබතුමා ගොවියාත් එක්ක බොහොම සමීපව කටයුතු කරපු කෙනෙක්. මට මතකයි, එදා ගෝඨාභය රාජපක්ෂ රසායනික පොහොර කප්පාදු කරනකොට, රසායනික පොහොර නවත්වලා කාබනික පොහොර දෙනකොට, "මේක කරන්න එපා. අපට පුළුවන් වී කිලෝවකට රුපියල් 154ක් ගොවියාට ලබා දෙන්න" කියලා ඔබතුමා කිව්වා. *[බාධා කිරීමක්]* ගරු සභාපතිතුමනි, මගේ කාලය මට අවශ්‍ය වෙනවා, කරුණු රාශියක් ඉදිරිපත් කරන්න තිබෙන නිසා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, මම ගොයම් කන්නේ නැහැ. මම කවදාවත් ගොයම් කාලා නැහැ. ඒ නිසා වැරදි ප්‍රකාශ කරන්න එපා. හරක් පැන්නාම ගොයම් කනවා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

වරදකට නොවෙයි මම ඒක කිව්වේ. ගරු සභාපතිතුමනි, ඒක වරදකට නොවෙයි මම කිව්වේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ගොයම් කරල් අතට අරගෙන කාලා පෙන්නලා, ඇයි මේ වීවලට මුදලක් දෙන්නේ නැත්තේ කියලාත් ඇහුවා.

ඔබතුමා එහෙම කළා. *[බාධා කිරීමක්]* වරදකට නොවෙයි ඒක කිව්වේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම හොඳක් කිව්වේ. ඒ නිසා ඒක ක්‍රියාත්මක කරන්න. *[බාධා කිරීමක්]*

ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்புப் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. T.B. Sarath?

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු මන්ත්‍රීතුමා, අර අමුවෙන් මාළු කාපු එක තමයි ඔබතුමා ඔය දැකලා තිබෙන්නේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මම මේ කිව්වේ, ඔබතුමා එහෙම කළේ ගොවි ජනතාව වෙනුවෙන් කියන එක.*[බාධා කිරීමක්]* ඔබතුමා කියපු විධියට මේ රටේ ගොවි ජනතාවට මේ වන්දිය ලබා දෙයි කියා මම විශ්වාස කරනවා. *[බාධා කිරීමක්]* ගරු සභාපතිතුමනි, මේ අය වගා ණය අරගෙන තිබෙනවා. නමුත් මේ අයට දැන් වගා ණය ගෙවා ගන්න විධියක් නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ වගා ණය සියයට 100ක් කපන්න බැරි වුණත්, අඩුම ගණනේ සියයට 50ක් හරි කපා දෙන්න වෙනවා, මේ ගොල්ලන්ට සහනයක් විධියට. මොකද, මේ ගොල්ලන්ට දැන් වගා ණය ගෙවා ගන්න විධියක් නැහැ. මහ කන්නය ගත්තත්, අද උදේ තිබුණු වර්ෂාව එක්ක අපට බලාපොරොත්තු වෙන අස්වැන්නක් ලබා ගන්න බැරි වෙයි කියා මා විශ්වාස කරනවා. ඒ නිසා මේ වගා ණය සියයට 50කින්වත් කපා හැරලා අපේ ගොවීන්ට සහනයක් ලබා දෙන්න කියලා තමයි මම යෝජනා කරන්නේ.

අපේ රටේ තිබෙන බීජ ගොවිපළවල් ගැන කථා කළොත්, අද වෙළෙඳ පොළේ වෙළෙන්දන්ට හිතෙන හිතෙන ගණන්වලට තමයි ගොවියාට බිත්තර වී ලබා දෙන්නේ. බිත්තර වී විතරක් නොවෙයි, අනෙක් සියලු බීජ ගත්තාමත් එහෙමයි. හිතා ගන්න බැරි මිලකට අද බීජ මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අපේ බීජ ගොවිපොළ ගත්තොත්, එහි අක්කර 498ක භූමි ප්‍රමාණයක් තිබෙනවා. අපට එයින් අක්කර 300ක වාගේ ප්‍රමාණයක වී වගා කරන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, හැබැයි මේ ගොවිපොළේ සිටින කම්කරුවන් සහ සේවකයන් ගැන කථා කළොත්, දැන් අවුරුදු 10ක් වෙනවා, ස්ථිර කම්කරුවන් මේ ගොවිපොළට බඳවාගෙන නැහැ. ඒ නිසා දැනට සිටින සේවකයන් දවස් හතම වැඩ කරනවා. නමුත් ඒ ගොල්ලන්ට අමතර දීමනාවක් කිසිම අවස්ථාවක ලබා දෙන්නේ නැහැ. ඉතින් මේ විධියට ගියොත්, අපේ රටේ බීජ ගොවි පොළවල් වහන්න සිද්ධ වෙයි. අපි බිත්තර වී ගැන කථා කරනවා; බීජ ගැන කථා කරනවා. රජය සතුව තිබෙන සම්පත් අපට ආරක්ෂා කරන්න වෙනවා. මෙවර අය වැය හරහා අපේ මේ බීජ ගොවිපොළවල් ටික ආරක්ෂා කරන්නය කියන එක තමයි මම විශේෂයෙන්ම කියන්නේ.

පොහොර සහනාධාරය ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. වත්මන් ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා විධියට පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 35,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 35,000ක් වෙන් කරන එක හොඳයි. හැබැයි, අපේ රටේ සමස්ත ගොවි ජනතාව ගත්තොත්, කවදාවත් ගොවියා නොමිලයේ පොහොර ඉල්ලලා නැහැ, ගරු ඇමතිතුමා. පාලන බලයට පත්වීමේ විශ්වාසයෙන් යුතුව ඉන්න අය, පත් වෙච්ච අය, පසුගිය කාලයේ බලයට පත් වෙච්ච අය තමයි පොහොරවලට මිලක් දුන්නේ. මට මතකයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා රුපියල් 350ට පොහොර දෙනවා කියලා කිව්වා. ඊට පස්සේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ආවේ නොමිලයේ පොහොර දෙනවා කියලා. නමුත් ගොවියා කවදාවත් පොහොර නොමිලයේ ඉල්ලුවේ නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම යෝජනා කරනවා, ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් රුපියල් 5,000ට දෙන්න අපට පුළුවන් කියලා. මේක ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා වෙළෙඳ පොළට යවන්න පුළුවන්. කෘෂිනාශකවලට පාලන මිලක් දාලා මිල අඩු කරලා, ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවියාට අවශ්‍ය කරන පොහොර ටික ලබා දුන්නොත්, අපට වීවලට ඉබේම මිලක් හැදෙනවා. එහෙම නම් වීවලට මිලකුත් ලැබෙනවා. බත් කන පාරිභෝගිකයාට සහල්වලට මිලකුත් ලැබෙනවා.

ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා, වෙළඳපොළේ සහල්වල අඩුපාඩුවක් නැහැ කියලා. අද කීරි සම්බා නැහැ. අද කීරි සම්බා වෙළඳපොළේ කොහේවත් සොයා ගන්න නැහැ. කීරි සම්බාවලට සහතික මිලක් දීලා තිබුණත්, අද වී තිබෙන ප්‍රධාන පෙළේ මුදලාලිලා ටික කියනවා, "ඔව්, අපට කීරි සම්බා රුපියල් 260ට දෙන්න පුළුවන්" කියලා. ඉතින් අද පාලන මිලක් තිබෙද්දී, වෙළෙන්දා ඒ මිලට පාරිභෝගිකයාට සහල් දෙන්නේ කොහොමද? මේ රටේ රජයක් තිබෙනවා, ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශයක් තිබෙනවා, හොඳ ඇමතිවරු දෙන්නෙක් ඉන්නවා. ඉතින් මේ රටේ සහල් මිල, වී මිල අපේ රටේ තිබෙන මෝල්වල මුදලාලිලාට පාලනය කරන්න දෙන්න එපා. මේක තමයි අපි හැමදාම දිගින් දිගටම කියන්නේ. අපට පුළුවන්. ඇයි, අපට බැරි?

[ගරු කිංස් නෙල්සන් මහතා]

ගොවිජන සේවා මධ්‍යස්ථානත් තිබෙනවා නම්, කෘෂිකර්ම අමාත්‍යාංශය තිබෙනවා නම්, රුපියල් මිලියන 35,000කුත් පොහොර සහනාධාරය සඳහා වෙන් කරලා තිබියදී, අපට දෙන්න බැරි ඇයි? ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් ගොවියාට රුපියල් 5,000ට අපට දෙන්න බැරි ඇයි?

අපි එක කාලයක රුපියල්ල් 350ට පොහොර මිටිය දුන්නා නේ. ඒ නිසා මම යෝජනාවක් කරනවා. ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් අපි ගොවියාට දුන්නොත්, වීවලට ඉබේම මිලක් ලැබෙනවා.

ගරු ඇමතිතුමා බඩ ඉරිහු වගාව ගැනත් කථා කළා. ගරු ඇමතිතුමනි, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුවත්ත කියන ගම්මානයේ අය ජීවත් වෙන්නේම බඩ ඉරිහු වගා කරලා. මේ වෙනකොට අක්කර 8,000ක විතර බඩ ඉරිහු වගා කරලා තිබුණත්, මේ අයගේ පොහොර සහනාධාරය සම්පූර්ණයෙන් කප්පාදු කරලා තිබෙනවා. එයින් අක්කර 2,000කට විතර දිලීර රෝගයක් හැදිලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් බලන්න කිසිම නිලධාරියෙක් මේ ගමට ඇවිත් නැහැ. මේ අයගේ එකම ජීවන මාර්ගය තමයි බඩ ඉරිහු වගාව. එක වතාවක් සේනා දළඹුවා නිසා කඳු වත්ත කියන ගම්මානයේ බඩ ඉරිහු වගාව විනාශ වුණා. දැන් ඇවිත් තිබෙන දිලීර රෝගය අක්කර 2,000කට වැඩිය පැතිරිලා තිබෙනවා. ඉතිරි ටිකටත් මේක පැතිරේවි. ඒ නිසා ඔබතුමන්ලා මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා තමයි මම ඉල්ලා සිටින්නේ.

ගරු සභාපතිතුමනි, මාදුරු ඔය දකුණු ඉවුර ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 38,500ක් වෙන් කරලා තිබෙනවා. මේ ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙන්නේ 2021දී. මේ ව්‍යාපෘතිය ආරම්භ කරලා ඇළ මාර්ගයේ කිලෝමීටර 34ක් හදන්න තිබුණත්, මේ වෙනකොට එක කිලෝමීටරයයි හදලා තිබෙන්නේ. මේ වෙනකොට ඒ ව්‍යාපෘතිය නැවතිලා තිබෙනවා. මම හිතන විධියට දකුණු ඉවුර ව්‍යාපෘතිය අපට ආරම්භ කළොත්, හෙක්ටෙයාර 17,000ක් වගා කරන්න ගොවීන්ට අවස්ථාව උදාකරලා දෙන්න පුළුවන්. මේක හොඳ වැඩසටහනක්. ඒ නිසා එය කඩිනමින් ආරම්භ කරන්න කියලා මම යෝජනා කරනවා.

දැන් මහ කන්නයේ වී අස්වැන්න ගොවියා ගෙදරට ගෙනෙනවා. එතකොට නැවතත් අලි-මිනිස් ගැටුම ගැන කථා කරන්න වෙනවා. දේපළ හානි වෙනවා, මිනිස්සු මැරෙනවා, අලි මැරෙනවා. ඒ නිසා මම යෝජනාවක් කරනවා. පසුගිය අය වැය විවාදය අවස්ථාවේත් මම මේ යෝජනාව කළා, ගරු ඇමතිතුමා. මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න. ගොවියාට වෙනම ගබඩා නැහැ, වී ටික ගෙනැවිත් ගබඩා කරලා තියාගන්න. දැන් අලි පුරුදු වෙලා තිබෙන්නේ, ගේ ඇතුළේ වී තිබෙනවා නම් ඇවිත් ගේ කඩලා වී ටික කාලා යන්න. එතකොට එක පැත්තකින් ගොවියාට වී ටිකත් නැති වෙනවා. අනෙක් පැත්තෙන් ගොවියාගේ ගෙයත් විනාශ වෙනවා. ඒ නිසා ඔබතුමන්ලා අය වැයෙන් යම් මුදලක් වෙන් කරලා, වී ගබඩා කරන ගොවීන් තෝරා ගන්න. ගොවි සංවිධානත් එක්ක කථා කරලා ගමේ වී ගබඩා කරන ගොවීන් කවුද කියලා සොයා ගන්න. හැම ගොවියාටම මේක කරන්න බැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Kins Nelson, your time is up now.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

වී ගබඩා කරන ගොවීන් හඳුනාගෙන ඒ අයට කන්ටේනර් ලබා දුන්නොත්, මේ ප්‍රශ්නය විසඳෙනවා. අලියාට කන්ටේනර් කඩන්න බැහැ. ඒක ඔවුන් වත්තේ කෙළවරක තියා ගනිවි. ඒ නිසා දේපළ හානි සහ අලි-මිනිස් ගැටුම නවත්වන්න වී ගොවියාගේ වී ටික සුරක්ෂිතව තියාගන්න කන්ටේනර් ටිකක් ලබා දෙන්න කියා මම යෝජනා කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. මේ කාරණය දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළයි. මාදුරු ඔය ව්‍යාපාරය ඇති වෙනවාත් එක්කම මාදුරු ඔය ජලාශ රක්ෂිතයේ ධීවරයින්ව පදිංචි කළා. දැන් අවුරුදු 35කට වැඩි කාලයක් ඒගොල්ලන් එතැන ජීවත් වෙනවා. එතැන පවුල් 50ක්, 60ක් වාගේ සංඛ්‍යාවක් ජීවත් වෙනවා. අලි-මිනිස් ගැටුමත් එක්ක ධීවරයින් හැම වෙලාවේම ලොකු ප්‍රශ්නයකට මැදි වෙලා ඉන්නේ. මොකද, ඒ ඉඩම්වලට බලපත්‍ර නැති නිසා අලි වැටක් ගහන්නත් බැරි වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අවුරුදු 30කටත් වැඩි කාලයක් තිස්සේ එම වැව් රක්ෂිතයේ පදිංචිවෙලා සිටින ධීවරයින්ගේ ඉඩම්වලට නිසි බලපත්‍ර ලබා දෙන්න කියා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමන්කඩුව නව නගරයේ පදිංචිව සිටින ධීවරයින්ටත් තිබෙන්නේ ඔය ප්‍රශ්නයමයි. ගරු ඇමතිතුමනි, ඔවුන්ගේ ඉඩම්වලට බලපත්‍රයක්වත් නොමැති ප්‍රශ්නය කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරලා එම ඉඩම්වලටත් බලපත්‍ර ලබා දුන්නොත් ඔවුන්ට නීත්‍යානුකූලව එම ඉඩම්වලම ජීවත් වෙමින් තම වෘත්තිය කරගෙන යා හැකියි කියා මා විශ්වාස කරනවා.

මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Gayantha Karunathilleke. You have 18 minutes.

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු සභාපතිතුමනි, -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මූලාසනයෙන් කිව්වේ මගේ නම.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Let us allow the Hon. Gayantha Karunathilleke to finish his speech and then, I will give you the chance, Hon. Deputy Minister. Hon. Gayantha Karunathilleke, you may start your speech now.

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු සභාපතිතුමනි, මට පොඩි වෙලාවක් ලබා දෙන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Please, ගරු නියෝජ්‍ය ඇමතිතුමා වාඩිවෙන්න.

[පූ.භා. 11.54]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, ඉතාම වැදගත්, ඒ වාගේම ජනතාවට බොහොම සමීප අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් ගැනයි අද අපි විවාද කරන්නේ. එම වැය ශීර්ෂය යටතේ කථා කරන්න අද කථිකයෝ රාශියක් ඉන්නවා. එම නිසා අද කථික ලැයිස්තුව හදන එකත් බරපතළ ප්‍රශ්නයක් වුණා. හිටපු ඉඩම් ඇමතිවරයෙකු හැටියට ඉඩම් අමාත්‍යාංශයට සම්බන්ධ කරුණු කිහිපයක් පිළිබඳව මේ වෙලාවේ මම ඉතාම කෙටියෙන් කථා කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අපට මතකයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති වෙලා මුදල් ඇමති හැටියට මේ සභාවට ඇවිත් අය වැය කථාව ඉදිරිපත් කළ ආකාරය. එතුමා එදා ඒ අය වැය කථාවේදී ප්‍රකාශ කළා, මේ රටේ සිටින ලක්ෂ 20කට පමණ සින්නක්කර ඔප්පු ලබා දෙන "උරුමය" වැඩසටහන ක්‍රියාත්මක කරන බව. ඒ අනුව පසු කාලයක එතුමා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. අද අපි දැනගන්න කැමැතියි, වත්මන් රජය යටතේ උරුමය වැඩසටහනට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මොකද, විශාල පිරිසක් මේ ගැන විමසිල්ලෙන් ඉන්නවා. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
කරුණාකරලා මගේ කථාවෙන් පස්සේ ඔබතුමා උත්තර දෙන්න.

අපට ලැබී තිබෙන තොරතුරු අනුව සින්නක්කර ඔප්පු ලබා දීමේ "උරුමය" වැඩසටහන 2024 නොවැම්බර් මාසයෙන් පස්සේ නතර වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, "උරුමය" වැඩසටහන යටතේ සින්නක්කර ඔප්පුවක් ලබා ගැනීම සඳහා 70,000ක පමණ පිරිසක් තමන් සතුව තිබුණු දීමනා පත්‍ර සහ බලපත්‍ර රජයට භාර දීලා තිබෙනවා. ඒ පිරිස අතරින් මේ වෙද්දි දීමනා පත්‍ර ලබා දීලා තිබෙන්නේ 10,000ක පමණ පිරිසකට විතරයි. හිටපු ජනාධිපතිතුමා තවත් උරුමය දීමනා පත්‍ර 10,000ක් පමණ අත්සන් කරලා තිබෙනවා. ඒ ප්‍රමාණයෙන් 8,000ක් පමණ මහජනතාවට බෙදා දෙන්න කියලා ප්‍රාදේශීය ලේකම්වරුන්ට ලබා දී තිබෙන බව අපට දැනගන්න ලැබී තිබෙනවා. ඊට අමතරව හිටපු ජනාධිපතිතුමා අත්සන් කරපු තවත් දීමනා පත්‍ර 3,000ක් පමණ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තිබෙන බවටත් අපට ආරංචියක් ලැබී තිබෙනවා. ඒ වාගේම අපට දැනගන්න ලැබුණු විධියට තවත් 45,000ක පමණ පිරිසක් උරුමය ඔප්පු ලබා ගන්න තමන් අතේ තිබුණු බලපත්‍රය හෝ දීමනා පත්‍රය රජයට භාර දී තිබෙනවා. එම දීමනා පත්‍ර මේ වෙනකොට අවලංගු වෙලා තිබෙනවා. සින්නක්කර ඔප්පුවත් නැතුව, තිබුණු බලපත්‍රයත් අවලංගු වුණු තත්ත්වය මත ඒ පිරිස අද අසරණ වෙලා බලාගෙන ඉන්නවා, මේ "උරුමය" වැඩසටහන සම්බන්ධයෙන් ආණ්ඩුව ගන්න පියවර මොකක්ද කියලා. ගරු ඇමතිතුමනි, එම නිසා ඒ වැඩසටහනට මොකක්ද වෙන්නේ කියලා මේ අවස්ථාවේදී නැතුව ඔබතුමාගේ කථාවේදී පැහැදිලි ප්‍රකාශයක් කළොත් හොඳයි කියා මා හිතනවා.

සින්නක්කර ඔප්පු ලබා දීමට මම ඉඩම් ඇමති වශයෙන් හිටපු යහ පාලන රජය කාලයේත් බොහොම මහන්සි වෙලා කටයුතු කළා. එතකොට රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වශයෙනුයි කටයුතු කළේ. එතුමාත්, මමත් කැබිනට් පත්‍රිකාවක් දාලා එම වැඩසටහනට කැබිනට් අනුමැතියක් ගත්තත්, ඒ වෙලාවේ ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් සමහරුන් උසාවි ගිය නිසා අපට ඒක කර ගන්න බැරි වුණා. නමුත් එතුමා ජනාධිපති වුණාට පස්සේ ඒ වැඩ පිළිවෙළ නැවත පටන් ගත්තා. මම ඒකට දිගටම ආශීර්වාද කළා. අපි දෙපැත්තක සිටියත්, ඒකට දේශපාලන භේදයක් අවශ්‍ය නැති නිසා එම ඔප්පු බෙදා දීමේ උත්සවයට පවා මම සහභාගි වුණා. *[බාධා කිරීමක්]* මම එහෙම කරපු එක හොඳයි කියන එක හැමෝටම ඇහෙන්න ඔබතුමා mike එකෙන් කිව්වා නම් වඩාත් හොඳයි.

ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, මම රජයෙන් ඉල්ලන්නේ මෙයයි. ඔබතුමා යම් විධියකින් නැවත "උරුමය" වැඩසටහන ආරම්භ කරනවා නම්, එහි තිබෙන අඩු පාඩු නිවැරදි කරලා විධිමත් ආකාරයෙන් එය සිද්ධ කරන්න ඔබතුමාට දැන් අවස්ථාව ලැබී තිබෙනවා. මම එහෙම කියන්නේ, සින්නක්කර අයිතිය ලබා දෙන වැඩසටහනට යම් යම් නීතිමය ප්‍රශ්න තිබෙනවා කියලා නිලධාරීන් අතර මතයක් තිබෙන නිසායි.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගරු මන්ත්‍රීතුමනි, එම වැඩසටහන නැවැත්වූවා. මොකද, එහි අඩුපාඩු ගොඩක් තිබෙනවා. දැන් ඒ සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ අඩුපාඩුවලටත් උත්තර සහිතව ඒ කමිටුවේ නිර්දේශ ලැබුණු ගමන් අලුත් ආකාරයකට අපි එය ක්‍රියාත්මක කරනවා. පසුගිය කාලයේ කරගෙන ගිය වැඩ පිළිවෙළ දැන් නවත්වලා තිබෙන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
බොහෝදෙනෙක් බලාපොරොත්තුවෙන් හිටියා, මේකට මොකක්ද වෙන්නේ කියලා දැනගන්න. කමිටුවක් පත් කරලා එහි අඩු පාඩු හොයන එක බොහොම හොඳයි. එම අඩු පාඩු නිවැරදි කරගෙන විධිමත් ක්‍රමයකට එම වැඩසටහන ඉදිරියට කරගෙන යනවා නම්, ඉස්සරහට ඒක තවත් හොඳ වෙයි.

මේ සම්බන්ධව යම් යම් නීතිමය ප්‍රශ්න තිබෙනවා කියලා නිලධාරීන් අතර මතයක් තිබෙනවා. තවත් සංවාදයක්, කථාබහක් සමාජයේ පැවතුණා, මේ විධියට සින්නක්කර ඔප්පු දුන්නාම ඒ මිනිස්සු මේ ඉඩම් විකුණයි, එහෙම වුණොත් ඉඩම් අහිමි ජනතාවට ඉඩම් හිමි සුළු පිරිසකගේ කුලීකාරයන් බවට පත් වීමේ අවදානමක් තිබෙනවා කියලා. මීට අමතරව කුඹුරු ඉඩම්වලටත් විවිධ ප්‍රශ්න ඇති වෙයි කියන තර්කයක් සමාජය තුළ පවතිනවා. එම නිසා සමාජයේ පවතින සියලු මතවලට සවන්දීලා, ඒ පිළිබඳව සැලකිලිමත් වෙලා, දැනට තිබෙන නීතිමය ගැටලු සහ අඩු පාඩු හඳුනාගෙන, මහජනතාවට වඩාත් ඵලදායී සින්නක්කර ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. එතකොට "උරුමය" බැරි නම් "පුනරුදය" කියලා හරි නම වෙනස් කළාට කමක් නැහැ. හැබැයි,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

උරුමය තමුන්නාන්සේලා කරුමයක් නම් කර ගන්න එපා කියලා මම ඉල්ලනවා. මේ වැඩේ කොහොම හරි කරන්න. මොකද, ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මේ ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. ඉඩම් විෂයයට බලපාන නීති-රීති, අණ පනත් රාශියක් තිබෙනවා. ඇමතිතුමා ඒ ගැන හොඳටම දන්නවා. ඒවායෙන් වැඩි ප්‍රමාණයක් මීට වර්ෂ ගණනාවකට පෙර සම්මත කර ගත් අණ පනත්. ගරු ඇමතිතුමනි, එම බොහොමයක් අණ පනත්, නීති වර්තමානයට ගැළපෙන්නේ නැති බවත් දැන් මේ අමාත්‍යාංශයේ වැඩ කරනකොට ඔබතුමාට හොඳටම තේරිලා ඇති. මම ඉඩම් ඇමති වශයෙන් සිටි කාලයේ වටහා ගත්තා, මේවා සංශෝධනය කළ යුතු බව. ඉඩම් සංවර්ධන ආඥාපනතත්, ඉඩම් අත්කර ගැනීමේ පනතත්, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතත් සංශෝධනයට අවශ්‍ය කටයුතු අපි ආරම්භ කරලා කරගෙන ගියා. නමුත්, අපේ රජය වෙනස් වුණත් එක්ක අපට ඒවා ඊළඟ ආණ්ඩුවට භාර දෙන්න සිදු වුණා.

ඊට අමතරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට නීත්‍යානුකූලභාවයක් ලබා දීම සඳහාත්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් පනත් කෙටුම්පතක් අලුතින් හඳුන්වා දීම සඳහාත් අපි කටයුතු ආරම්භ කළා. ඒවා ආණ්ඩු වෙනස් වීමත් එක්ක අපට අවසන් කරන්න බැරි වුණා. මම කියන්න කැමැතියි, මට පසුව පත් වූ චන්ද්‍රසේන මැතිතුමා ඉඩම් ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ ඉඩම් සංවර්ධන ආඥාපනතේ සංශෝධන මේ සභාවට ඉදිරිපත් කළ බව. කෙසේ හෝ අවුරුදු තුනකට පස්සේ ඒවා සම්මත කර ගත්තා. අපිත් ඒකට බොහොම කැමැත්තක් දැක්වූවා. නමුත් මගෙන් පසුව ඉඩම් ඇමතිවරු දෙදෙනෙක් හිටියත්, වසර පහක කාලයක් ගත වුණත් ඒ අයට නව පනතක් සම්මත කර ගන්නටත්, අනෙක් පනත් දෙකේ සංශෝධන කර ගැනීමටත් බැරි වුණා. මම ප්‍රාර්ථනා කරනවා, ලාල් කාන්ත ඇමතිතුමා ප්‍රායෝගිකව කටයුතු කරන පොළොවේ පය ගහලා ඉන්න කෙනෙක් නිසා ඔබතුමාගේ ධුර කාලය ඇතුළත මේ අණ පනත් සහ නීති-රීති වර්තමානයට ගැළපෙන ආකාරයට සංශෝධනය කරලා සම්මත කර ගන්න හැකි වෙයි කියලා.

ඉඩම් විෂයයට අදාළ අණ පනත්, නීති-රීති වාගේම එම කාර්යයන් ඉටු කරන නිලධාරීන් සහ ආයතන ගැනත් ඔබතුමා අවධානය යොමු කළ යුතුම වෙනවා. ගරු ඇමතිතුමනි, මම අත්දැකීමෙන් දන්නවා, ඔබතුමන්ලා වුණත් අත්දැකීමෙන් දන්නවා ඇති, මහජන හමුවක් තිබුණොත්, ජංගම සේවයක් පැවැත්වූවොත් වැඩි හරියක් එන්නේ ඉඩම් ගැටලු බව. උසාවිවල තිබෙන නඩුවලින් වැඩි හරියක් තිබෙන්නේත් ඉඩම් නඩු. ඒ සමහර නඩුවලට තුන්වැනි පරම්පරාවත් පැටලිලා. සමහරු මැරිලා යනවා, විසඳුමක් නැතුව. පොලිස් පැමිණිලි පොත් බැලුවොත් වැඩියෙන්ම තිබෙන්නේ ඉඩම් ආරවුල් ගැන සටහන් කරපුවා. ඒකට හේතුව යල් පැන ගිය නීති-රීති, අණ පනත් වාගේම රට පුරාම මේ ඉඩම් විෂයය සම්බන්ධ මනා දැනුමක් සහිත කාර්යක්ෂම නිලධාරීන්ගේ හිඟයක් පැවතීම.

ඉඩම් විෂයයට සම්බන්ධ තවත් කාරණයක් මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි, ගරු සභාපතිතුමනි. පසුගිය කාලයේ රට තුළ ඇතිවුණු ආර්ථික අර්බුදයත් එක්ක, රට බංකොලොත් වීමත් එක්ක පසුගිය රජයන් සැලසුම් කරලා තිබුණු සංවර්ධන ව්‍යාපාරවල වැඩ අතරමඟ නතර කිරීමට සිදු වුණා. නමුත්, මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න මහජනතාවගේ පෞද්ගලික ඉඩම් හා දේපළ රජය අත්පත් කර ගත්තා. එම ව්‍යාපෘති බොහොමයක් ක්‍රියාත්මක කිරීම රජය අතරමඟ නතර කළා. එම ව්‍යාපෘතිවල වැඩ නතර කිරීමත් සමඟ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියත් අතරමඟ නතර කරලා තිබෙනවා. මේ නිසා ජනතාවට තමන්ගේ ඉඩම් හා දේපළ අහිමි වුණා. ඒවායෙන් ලැබුණු ආදායමත් අහිමි වුණා. ඒ දේපළ රජයට අත්පත් කර ගත් නිසා ලබා දෙන වන්දි මුදලත් ඔවුන්ට ලැබිලා නැහැ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේත් නැහැ, ඒ මිනිස්සුන්ට ඉඩම බුක්ති විඳින්න හැකියාවක් ලැබිලාත් නැහැ. වන්දියක් ලැබිලාත් නැහැ. එවැනි ව්‍යාපෘති එකක්, දෙකක් ගැන මම මතක් කරන්නම්. මට මේ අවස්ථාවේදී මතක් වෙනවා, කොළඹ නගරාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය කියලා කැලණිවැලි දුම්රිය මාර්ගය කනු මතින් දුවන දුම්රිය මාර්ගයක් ලෙස සංවර්ධනය කරන්න කියා ඉඩම් අත්පත් කර ගත්ත ආකාරය. දෙමටගොඩ ඉඳලා නුගේගොඩ දක්වා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යම් යම් නිවේදන නිකුත් කළා. එහෙම නිවේදන නිකුත් කළාම පනතේ විධිවිධාන අනුව ඉඩම් හිමියාට ඒ ඉඩම සංවර්ධනය කරන්නත් බැහැ; විකුණන්නත් බැහැ; බදු දෙන්නත් බැහැ; උකස් කරලා ණයක් ගන්නත් බැහැ. පසුගිය ආණ්ඩු ඒ ව්‍යාපෘතිවල වැඩ නතර කළා. ඒ හේතුව නිසා එම ඉඩම් හිමියන් අද වනකොට අසරණ වෙලා තිබෙනවා, ඒ එකක්වත් නැතුව. හරි නම්, අදාළ ව්‍යාපෘතිය කෙරෙන්නේ නැත්නම් ඒ ඉඩම් නැවත ඉඩම් හිමියන්ට පවරා දිය යුතුව තිබෙනවා. එහෙම නැත්නම් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙනිහින් ඉඩම්වලට වන්දි ගෙවන්නට ඕනෑ. මේ දෙකම සිදු කළේ නැති නිසා මේ ඉඩම් හිමියන් අන්ත අසරණ තත්ත්වයකයි අද ජීවත් වෙන්නේ.

ඒකම තමයි රුවන්පුර අධිවේගී මාර්ගයට වෙලා තිබෙන්නේත්. අත්පත් කර ගත්ත ඉඩම්වල ඉඩම් හිමියන්ට අද ප්‍රශ්න ගොඩකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. බොහොම සශ්‍රීක වගාවන් සහිත ගොඩ-මඩ ඉඩම් වාගේම නේවාසික ඉඩම් රාශියක් මහ ජනයා ඒ ව්‍යාපෘතිය වෙනුවෙන් රජයට පවරා දීලා තිබෙනවා. දැන් ඒ මිනිස්සුන්ට වන්දිත් නැහැ, ඉඩම්වල ආදායම ගන්නත් බැහැ. බොහෝ ඉඩම් පස් දමා ගොඩ කරපු නිසා දැන් ඒ මිනිස්සුන්ට අලුතින් ගංවතුර උවදුරකුත් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරලා ඒ ඉඩම් ලබා දුන් ජනතාවට සාධාරණයක් ඉටු කරන්න කියලා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඉඩම් පවරාගෙන වන්දිත් නොගෙවා අතරමඟ නතර කරපු මේ වාගේ ව්‍යාපෘති තව බොහොමයක් තිබෙනවා. ඒවා කියන්න ගියොත් ගොඩක් වෙලාව ගත වෙනවා. හබරණ දුම්රිය මාර්ගය සඳහාත් ඒ වාගේ ඉඩම් පවරපු ඒවා අපට දකින්න තිබෙනවා.

ඊළඟට, මේ අමාත්‍යාංශයේ තවත් වැදගත් අංශයක් වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම ගැනත් කථා කළ යුතුව තිබෙනවා. අපි දන්නවා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම -LRC එක - ගැන කථා කරනකොට විශේෂයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ අක්කර 50ට වැඩි ඉඩම් රජය සතු වුණු බව. ඒවා LRC එක සතු වුණා. ඒ ඉඩම්වල මුල් හිමිකරුවන්ට ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ නැවත හිමි විය යුතු ඉඩම් තවමත් නොලැබුණු පවුල් 500ක්, 600ක් විතර ඉන්නවා. මම දවසක් අතුරු ප්‍රශ්නයක් අහනකොට ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් මේ ගැන අවධානය යොමු කරන්න කිව්වා. ඉඩම් ඇමති වශයෙන් හිටපු කාලයේ මමත් දැනගත්තා, එවැනි පවුල් 500ක්, 600ක් තවමත් ඉතුරු වෙලා ඉන්නවා කියලා. තලංගම LRC එකට, හොඳට ඉඩකඩම් තිබුණු, යාන වාහන තිබුණු, හොඳ වැදගත් මිනිස්සු බස්වලින් එනවා. ඔවුන් අසරණ තත්ත්වයෙන් එන හැටි ඔබතුමන්ලාට, අපට දකින්න ලැබෙනවා. ඒ අයට මම දින වකවානු දාලා කිව්වා, අහවල් දවස වෙනකොට මේ මිනිස්සුන්ගේ මේ ප්‍රශ්නය අවසන් කරමු කියලා. නමුත්, ආණ්ඩුව වෙනස් වුණා. ඒ නිසා එම කටයුත්ත කරන්න බැරි වුණා. ඊට පස්සේ ආපු ඇමතිවරුන්ට කිව්වා, නමුත් වැඩක් වුණේ නැහැ.

පින්සිද්ධ වෙන වැඩක් ඒක. ඒ මිනිස්සුන්ට ඒ ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ හිමි විය යුතු ඉඩම් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලනවා. සමහර අය හොඳටම වයසටත් ගිහින්, අසනීප වෙලා ඉන්නවා. හුඟක් අය මේ මත්තේම නඟිනවා. කරුණාකර ඒකට විසඳුමක් ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි. LRC එක දන්නේ නැහැ, LRC එකට තිබෙන ඉඩම් ප්‍රමාණය ගැන. ඒ තත්ත්වය හරිම කනගාටුදායකයි. එම ඉඩම්වල තොරතුරු යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. වැවිලි සමාගම්වලට පාලනයට දීපු LRC ඉඩම් ප්‍රමාණයට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් වැවිලි සමාගම් භුක්ති විඳිනවා. මේ නිසා නඩුත් ගිහින් තිබෙනවා, දෙගොල්ලන්. වතු සමාගම් සහ LRC එක හැම දාම උසාවි යනවා. ඒකට විසඳුමක් නම් තවම ලැබිලා නැහැ. මට මතකයි, මම ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ LRC එක, වතු සමාගම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ඉඩම් අමාත්‍යාංශය කියන ඔක්කොම ඒවායේ නිලධාරීන් ගෙන්වලා එකඟතාවකට ආවා, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යොදවලා කඩිනමින් ඒ ඉඩම් මැනලා, මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න කියලා. ඒවා ගැන ඔබතුමන්ලාවත් බලන්න. පසුගිය කාලවල නම් ඒවාට උනන්දුවක් තිබුණේම නැහැ. හුඟක් අයට වෙන වෙන ඒවාට තමයි LRC එකේ ඉඩම් ගැන ආසාව තිබුණේ. මම හිතන්නේ නැහැ අපට, ඔබතුමන්ලාට එහෙම ප්‍රශ්න තිබුණාය කියලා. ඒ වාගේම, ගරු ඇමතිතුමනි, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන මැනුම් කටයුතුවල පවතින ප්‍රමාදයන් ගැන වාර්තා වෙනවා. ඒ ගැනත් අවධානය යොමු කළොත් හොඳයි.

තවත් කාරණයක් මම කිව යුතුයි. ඉඩම් කළමනාකරණ කටයුතු විවිධ ආයතනවලින් සිද්ධ වෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, නාගරික සංවර්ධන අධිකාරියෙනුත් - UDA එකෙනුත් - ඉඩම් කටයුතු කරනවා. නිවාස සංවර්ධන අධිකාරියත් ඉඩම් කටයුතුවලට මැදිහත් වෙනවා. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවත් ඉඩම් රාජකාරි කරනවා. ඊට අමතරව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවත් මේ කටයුතු කරනවා. මම කියන්නේ, දැන් ප්‍රබල අමාත්‍යාංශ කිහිපයක් තිබෙනවා නේ. විශේෂයෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් විය යුතු, එක එක තැන්වල තිබුණු කැලි-කැලි දැන් එක තැනකට ගෙනාපු එක හොඳයි.

ඉඩම් පිළිබඳවම තිබෙන ඉඩම් අමාත්‍යාංශය යටතට මේ ඔක්කොම ගත්තොත් වඩාත් හොඳ සේවාවක් ඉෂ්ට කරන්න පුළුවන් වෙයි කියා මම විශ්වාස කරනවා. මහජනයාගේ පැත්තෙන් ගත්තත්, නිලධාරීන්ගේ පැත්තෙන් ගත්තත් හොඳක් වනවා මිසක් ඒකෙන් අයහපතක් වන එකක් නැහැ. ඉඩම් විෂයයට අදාළ වන වැදගත් දෙයක් තමයි, ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කිරීම. නමුත්, අවාසනාවට තවම ඒක සකස් කර ගන්න බැරි වුණා. ඒකට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළු ඒ ඔක්කොමත් බලපානවා. ඉඩම් පිළිබඳව පළාත් සභාවලින් එක එක තීන්දු ගන්නවා; එක එක පළාත් සභාව එක එක තීන්දු ගන්නවා. ඒකේ ඒකීයභාවයක් නැහැ. නමුත්, ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් රටටම බලපාන විධියට ක්‍රියාත්මක කරන්න වාගේම සියලු පළාත්වලට එකම ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කරන්න හැකි වෙනවා, ජාතික ඉඩම් කොමිෂන් සභාවක් පිහිටුවීමට කටයුතු කළොත්. මට ලැබිලා තිබෙන්නේ සීමිත කාලයක් නිසා මම මීට වඩා ඉඩම් අමාත්‍යාංශය ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මට තව කොච්චර කාලයක් තිබෙනවාද දන්නේ නැහැ; how many minutes more do I have, Sir?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
You have two more minutes.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Sir, give me four minutes, please.

ඒ වාගේම තවත් ඉතා වැදගත් අමාත්‍යාංශයක් හැටියට කෘෂිකර්ම අමාත්‍යාංශය ගැනත් අද හැමෝම කථා කළා. වී ගොවිතැන ගැන හුඟදෙනෙකු කථා කළා. අපි දන්නවා, ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් ආසියානු කලාපයේ රටවල වෙසෙන බව. ඒ හැම රටකම අපේ රටේ වාගේම වී ගොවිතැනට ඉතා විශාල අවධානයක් යොමු වෙලා තිබෙනවා. අපේ රට තුළ සෑම දිස්ත්‍රික්කයකම අඩු-වැඩි වශයෙන් වී වගාව කරනවා. මිනිස්සු ගොවිතැන් කරනවා. මම දන්නා තරමින් වැඩිම බිම් ප්‍රමාණයක වී වගා කිරීම සිදු වෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ. අඩුවෙන්ම වී වගාව කරන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ. හැබැයි, හැම දිස්ත්‍රික්කයකම වී වගාව කරනවා. කොළඹ ගත්තත් වී වගාව සිද්ධ වනවා.

අතීත රජ දවස සිටම "පෙරදිග ධාන්‍යාගාරය" ලෙසයි අපේ රට හැඳින්වුයේ. ඒ වුණත් පසුගිය රජය කෘෂි කර්මාන්තය විනාශ කළා. විශේෂයෙන්ම ගෝඨාභය රාජපක්ෂ රජය යටතේ රසායනික පොහොර ගෙන්වීම තහනම් කළා. අපි - විපක්ෂයේ සියලු දෙනාම- කියපු ඒවා ඔබතුමන්ලා ශත පහකට ගණන් ගත්තේ නැහැ. අමනෝඥ, හිතුවක්කාර තීන්දු නිසා අවසානයේ භාණ්ඩාගාරයත්, ධාන්‍යාගාරයත් දෙකම හිස් වුණා. රසායනික පොහොර තහනම් කරලා කාබනික පොහොර නාඩගමක් නිසා තේ, පොල්, රබර් සහ අනෙකුත් කෘෂි භෝගවලටත්, විශේෂයෙන් වී ගොවිතැනටත් විශාල පහරක් වැදුණා. අවසානයේ ඒ අමනෝඥ තීන්දු නිසා ගොවීන් කුඹුරෙන් මහ පාරටත්, ජනතාව පෝලිම්වලටත් තල්ලු වුණා. අන්තිමට ඒගොල්ලන්ට ගෙදර යන්නත් සිද්ධ වුණා. අවසානයේ විශාල ජන වරමක් එක්ක තමුන්නාන්සේලාට ආණ්ඩුවක් ගන්නත් මේවා බලපෑවා.

මේ කෙටි කාලය තුළ කෘෂි කර්මාන්තය පැත්තෙන් ගත්තොත්, තමුන්නාන්සේලාගේ රජයෙනුත් ජනතාවට ගැටලු රාශියකට මුහුණ දෙන්න සිද්ධ වුණා කියන එක රහසක් නොවෙයි. නිසි වෙලාවට පොහොර සහනාධාරය දෙන්න බැරි වුණාම ප්‍රශ්න ඇති වුණා. පොරොන්දු වෙච්ච පරිදි ගොවි වන්දි ලබා දීමට බැරි වුණා; වීවලට සහතික මිල නියම කරන්න ප්‍රමාද වුණා; කැකුළු හාල් හිඟයක් ඇති වුණා; මිනිස්සුන්ට හාල් ගන්න පෝලිමේ යන්න සිද්ධ වුණා; පොල් ගෙඩියටත්, හාල්වලටත් ඉතිහාසයේ වැඩිම මිල ගෙවන්න සිද්ධ වුණා. මේ කෙටි කාලය තුළ ජනතාවට ඒවාට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒවායින් ජනතාව පීඩාවට පත් කළා විතරක් නොවෙයි, ඒවායේ වින්දිතයන් බවට බල්ලෝ, වඳුරෝ, රිළවි පවා තමුන්නාන්සේලා නම් කළා. බල්ලෝ බත් කන නිසා හාල් හිඟයි, රිළවි පොල් කන හින්දා පොල් හිඟයි කියන එකත් සමාජගත වුණා.

ශ්‍රී ලංකාවේ ඉඩම් භාවිතය ගැන නිශ්චිත තොරතුරු නැති එකත් මම හිතන විධියට මේ අමාත්‍යාංශ දෙකටම බලපාන කාරණාවක්. මහ බැංකු වාර්තාවල එකක් කියනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය කියන්නේ තව එකක්. මේවා පිළිබඳව අහනකොට විවිධ සංඛ්‍යාලේඛන තමයි දකින්න තිබෙන්නේ. කෙසේ වුවත්, ශ්‍රී ලංකාවේ වැවිලි හා කෘෂි කාර්මික ඉඩම් දළ වශයෙන් අක්කර ලක්ෂ 60ක් විතර පවතිනවා කියායි අපට තොරතුරු ලැබෙන්නේ. ඒ වාගේම වැඩ කරන ජනතාව අතරින් සියයට 30කට වඩා කෘෂි කාර්මික අංශයේ රැකියාවල තමයි නිරත වෙලා ඉන්නේ. ශ්‍රම බලකායෙන් සියයට 30ක්ම කෘෂි කර්මාන්තයට සම්බන්ධ අය බව අපට අමතක කරන්න බැහැ.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඒ වාගේම ගරු ඇමතිතුමනි, ඉඩම්වල නිසි අයිතිය නැති වීම නිසා ඒ ඉඩම් බුක්ති විඳින අයට ඒවා ඵලදායීව භාවිත කිරීමට බාධාවක් ඇති වෙලා තිබෙනවා. කෘෂි කර්මාන්තයේ නවීකරණයටත් ඒක බෙහෙවින් බලපා තිබෙනවා. ගරු ඇමතිතුමාත් කිව්වා, නවීකරණය ගැන. අද වනවිටත් අපේ ගොවිතැන නවීකරණයට භාජන වී තිබෙන්නේ බොහොම සුළු වශයෙන්. අපේ විශ්වවිද්‍යාලවල කෘෂිකර්ම පීඨවල උගන්වන තාක්ෂණයයි, ගොවි ජනතාව පාවිච්චි කරන තාක්ෂණයයි අතර ලොකු වෙනසක් තිබෙනවා. අපේ රටේ ගොවීන් බහුතරයක් තවමත් සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයේ තමයි නිරත වෙන්නේ. ඒ හේතුව නිසා ගොවි පවුල්වල ආදායම අඩු වෙලා තිබෙනවා.

ආදායම් අඩු වීම නිසා අපේ තරුණ පරම්පරාව ගොවිතැනෙන් ඈත් වෙන ගතියක් අද වෙනකොට හොඳටම පේන්න තිබෙනවා. මේ වන විටත් රට පුරා ගොවි ජනතාව විවිධ මැසිවිලි නගන හැටි තමයි අපට රෑට ප්‍රවෘත්ති බලනකොට රූපවාහිනී තුළින් දකින්න ලැබෙන්නේ. ගොවීන් කියන්නේම මැසිවිලි තමයි. අස්වනු නෙළන කාලයට වී මිල පහත වැටෙන එක ඔවුන්ට බරපතළ ප්‍රශ්නයක්. අස්වැන්න ලැබෙන කාලයට එළවළු මිල අඩු වෙන ඒකටත් ඔවුන්ට මුහුණ දෙන්න වෙනවා. විශේෂයෙන් ගොවිතැන කියන්නේ අවදානම් කර්මාන්තයක් බව අපි මතක තියා ගත යුතුව තිබෙනවා. ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා මේකට කාලගුණික ප්‍රශ්න බලපාන හැටි. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අනපේක්ෂිත දේවල් සිදු වෙනවා. විශේෂයෙන් විටෙක අනපේක්ෂිත නියහ එනවා, තවත් විටෙක අනපේක්ෂිත මහ ගංවතුර උවදුරකට මුහුණ දෙන්න වෙනවා, විවිධ ලෙඩ රෝගවලට මුහුණ දෙන්න වෙනවා, වනසතුන්ගේ බලපෑම්වලට ලක් වෙන්න වෙනවා. ඒ විතරක් නොවෙයි කුඩා කෘමීන්ගෙන් පවා අනපේක්ෂිත අවදානම් මේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේදී බලාපොරොත්තු වෙන්න වෙනවා. මේ සියලු දේවලින් සිදු වෙන්නේ ගොවි ජනතාවගේ ආදායම අඩුවීමත්, ඔවුන් පීඩාවට පත්වීමත් විතරයි.

ලෝකයේ අනෙකුත් බොහෝ රටවල කෘෂි කර්මාන්තය සමඟ සංසන්දනය කරලා බැලුවොත්, අපේ රටේ කෘෂි කර්මාන්තය තවමත් සතුටු වෙන්න පුළුවන් තැනක නැති බව අපි දෙගොල්ලන්ටම පිළිගන්න වෙනවා. මේ රජයට කෘෂි කර්මාන්තය සම්බන්ධව නිසි වැඩ පිළිවෙළක් තිබේද යන්න ගැන ජනතාව අවදියෙන් ඉන්නවා. විශේෂයෙන් තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්නකොට ගොවි ජනතාව මෙහෙයවමින්, ඒ අයට නායකත්වය දෙමින් කටයුතු කරපු හැටි මිනිස්සුන්ට හොඳට මතකයි. ඒ නිසා ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ පිළිබඳව කවුරුත් අවදියෙන් ඉන්නවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have exhausted your additional time, too.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මම අවසන් කරනවා ගරු සභාපතිතුමනි.

අවසාන වශයෙන් මම තව එක කාරණයක් කියන්නම්. අපි දැක්කා පසුගිය රාජපක්ෂ පාලන කාලයේදීත් කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් එක එක වැඩසටහන් පටන් ගත්ත ආකාරය. විශේෂයෙන් ගෙවතු වගා වැඩසටහන්. "දිවි නැහුම" කිව්වා, "අපි වවමු - රට නඟමු" කිව්වා, ඒ වාගේ එක එක නම් දමමින් වැඩසටහන් පටන් ගත්තා. නමුත් ඒ එකකවත් අවසානයක් දැක්කේ නැහැ. ඒ වැඩසටහන් බොහොමයක් දේශපාලන ප්‍රචාරක වැඩසටහන් හැටියට තමයි අවසන් වුණේ. මාධ්‍ය සංදර්ශනවලට ඒවා සීමා වුණා. ඒ නිසා රටක් හැටියට අපට වාණිජ කෘෂි කර්මාන්තයට යන්නත්, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරන්නත් තවම බැරි වෙලා තිබෙනවා. මේ සියල්ලම නිවැරදි මගට යොමු වුණු දවසකට තමයි තමුන්නාන්සේලාට, "මඩ සෝදා ගත් කල ගොවියා රජකමටත් සුදුසුයි" කියලා ආණ්ඩුවක් හැටියට කියන්න පුළුවන් වෙන්නේ කියන එක මතක් කරමින්, මට කාලය ලබා දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Anuradha Jayaratne. You have 14 minutes.

[අ.භා. 12.16]

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු සභාපතිතුමනි, අද විවාදයට ගැනෙන්නේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක් වන කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂයයි. කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, මහවැලි කියන විෂයයන්වලට පසුගිය රජයන්වලදී වෙන වෙනම අමාත්‍යාංශ තිබුණා. අද මේ සියල්ලම පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ විශේෂයෙන් මා සඳහන් කරන්න ඕනෑ මේ අමාත්‍යාංශයට නායකත්වය දෙන ගරු අමාත්‍යතුමා ගැන. දේශපාලන වශයෙන් අපි පක්ෂ දෙකක, අදහස් දෙකක් දැරුවාට එතුමා මහනුවර මන්ත්‍රීවරයෙක් හැටියට අද මේ අමාත්‍යාංශයට නායකත්වය දීම ගැන විශේෂයෙන් මම සතුටු වෙනවා.

මේ අමාත්‍යාංශය නිවැරදිව මෙහෙයවීම තුළ, මේ අමාත්‍යාංශයෙන් කෙරෙන වැඩ කොටස් නිවැරදිව ඉස්සරහට අරගෙන යාම තුළ ක්ෂණිකව මේ රටට ප්‍රතිඵල ගේන්න පුළුවන් ව්‍යාපෘති, වැඩසටහන් ගණනාවක් තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. සමහර ව්‍යාපෘති, සමහර සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරලා අවුරුදු ගණනාවක් ඉස්සරහට ගියාට පස්සේ තමයි එහි ප්‍රතිඵල ආර්ථිකයට එකතු වෙන්නේ. හැබැයි, මේ අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන සමහර ව්‍යාපෘති ගත්තාම, ඒවා අවසාන වුණු දිනයට පසු දින ඉඳලාම ඒවායේ ප්‍රතිඵල මේ රටේ ආර්ථිකයට, මේ රටේ සංවර්ධනයට එකතු කරන්න පුළුවන්.

මේ කාරණයේදී මා විශේෂයෙන් සිහිපත් කළ යුතු දෙයක් තිබෙනවා. අපි සමස්ත කෘෂි කර්මාන්තය ගැනම අලුතෙන් සිතිය යුතුයි කියලා මම විශේෂයෙන් මේ සභාවට යෝජනා කරනවා. ඒ වෙන මොනවත් නිසා නොවෙයි, ගරු සභාපතිතුමනි. මමත් පාර්ලිමේන්තු දෙකක ඉඳලා එහා පැත්තේ අදහස්, මෙහා පැත්තේ අදහස් අහලා තිබෙනවා, පක්ෂ, විපක්ෂ වශයෙන්. හැබැයි, සමස්ත කෘෂි කර්මාන්තය දිහා විවෘතව වෙනස් විධියකින් බැලිය යුතු කාලයක් අද එළැඹිලා තිබෙනවා. මේ අමාත්‍යාංශ සියල්ල එකට එකතු වීමත් එහෙම වෙනස්ව හිතලා, වෙනස් විධියකට වැඩ ටික කරන්න යම් විධියක ආශීර්වාදයක් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, අද අපේ සමස්ත දළ ජාතික නිෂ්පාදිතයට - GDP එකට - සියයට 8ක් එකතු වෙනවා කෘෂි කාර්මික නිෂ්පාදනවලින්. අපේ සමස්ත GDP එක ඩොලර් බිලියන 80-85

කියලා ගත්තොත්, කෘෂි කර්මාන්තයෙන් එකතු වෙන ප්‍රමාණය සියයට 8ක් කියලා කියන්නේ ඩොලර් බිලියන 7ක් අපි එකතු කරනවා කියන එකයි. මේ රටේ සමස්ත ශ්‍රම බලකායෙන් ලක්ෂ 23ක් අද ඉන්නේ කෘෂි කර්මාන්තයත් එක්ක. කර්මාන්ත ක්ෂේත්‍රයෙන් දළ ජාතික නිෂ්පාදනයට සියයට 25.3ක් එකතු වෙනවා, ඒ කියන්නේ ඩොලර් බිලියන 22ක උත්පාදනයක් තිබෙනවා. ශ්‍රම බලකායෙන් ඒකට යොමු වෙලා තිබෙන්නේ සියයට 26යි.

එහෙම නම් අද මේ සම්බන්ධයෙන් අලුත් විධියකට හිතන්න අවශ්‍ය වෙනවා. මම කියන්නේ, කෘෂි කර්මාන්තයට තිබෙන තැන නැති වෙනවා, වගාව නැති කරනවා, එහෙම නැත්නම් භූමි ප්‍රමාණය අඩු කරලා මේවා කර්මාන්තකරුවන්ට දෙනවා කියන කාරණය නොවෙයි, ගරු සභාපතිතුමනි. නිකමට හිතලා බලන්න, අපේ සමස්ත ශ්‍රම බලකාය ලක්ෂ 80ක්, 85ක් ඉන්නවා. ඒ ශ්‍රම බලකායෙන් සියයට 26ක් ඉන්නේ කෘෂි කර්මාන්තයත් එක්ක. හැබැයි, ලංකාවේ වැඩ කරන force එකෙන් සියයට 26ක් කෘෂි කර්මාන්තයට වැඩ කරලා, රටේ දළ ජාතික නිෂ්පාදිතයට එකතු කරලා තිබෙන්නේ ඩොලර් බිලියන 7යි. ඒ විධියට අපට තව කොච්චර ඉස්සරහට යන්න පුළුවන්ද? මේකට අවශ්‍ය කරන අලුත් තාක්ෂණය, අලුතෙන් අවශ්‍ය කරන බීජ ටික, එහෙම නැත්නම් අද වන විට සමහර යන්ත්‍ර සූත්‍ර විවිධ රජයන්, විවිධ කණ්ඩායම් හඳුන්වා දීලා තිබෙනවා. හැබැයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, අද කෘෂිකාර්මික ඉඩම් ටික තුනට, හතරට, පහට කැඩිලා ගිහිල්ලා තිබෙන එක. එතකොට භාවිත කරන සමහර යන්ත්‍ර සූත්‍ර, ගන්න පුළුවන් සමහර දේවල්, නවීන තාක්ෂණය යොදා ගන්න බැහැ. ගරු ඇමතිතුමනි, අපේ මහනුවර වුණත් එහෙමයි. නැවත මේ වගා බිම් ඒකාබද්ධ කරන වැඩසටහනකට අපි යා යුතුම වෙනවා. එහෙම නැති වුණොත්, තිබෙන සමහර නව තාක්ෂණය, නව ක්‍රමවේද මේ රටට හඳුන්වා දෙන්නත් බැරි වෙලා යනවා.

AI පිළිබඳව ගරු ලාල් කාන්ත ඇමතිතුමා මතක් කළා මම දැක්කා. ඒ වාගේම, ඔබතුමන්ලා රජය හැටියට economy එක digitize කරන එක පිළිබඳව කථා කළා. හැබැයි, ඔබතුමන්ලා දන්න ටික අරගෙන බලන්න. අස්වැන්න කොතැනින්, කොච්චර එනවාද, දිස්ත්‍රික්කයක් හැටියට කොච්චර අස්වැන්නක් එනවාද කියන සංඛ්‍යාලේඛන ටික ඇහුවොත්, අද ඒක දෙන්න පුළුවන්ද කියලා ඔබතුමන්ලා බලන්න. එහෙම නම් මේක වෙනස් වෙලා මේක digitize වෙන්නම අවශ්‍යයි. නැත්නම් අපට හැමදාම ආණ්ඩු මාරු වෙනකොට අරලියටයි - ඩඩ්ලිටයි, රත්නටයි, නිසුනටයි බැණ බැණ ඉන්නවා හැරෙන්න, මේ තුළින් නිවැරදි වැඩ පිළිවෙළක් සිද්ධ වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, එම නිසා අපි මේ සම්බන්ධයෙන් අලුතෙන් හිතලා, මේ සඳහා අවශ්‍ය කරන තාක්ෂණය, දැනුම, නව අස්වැන්න දෙන්න පුළුවන් බීජ ටික හඳුන්වා දීලා, අලුත්ම ක්‍රමවේදයකට අපේ රටේ කෘෂි කර්මාන්තය ගැන හිතන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා. මොකද, මෙය වෙනස් කළ රටවල් තිබෙනවා.

මම මේක සංසන්දනය කරන්න, අද උදේ නිකමට නෙදර්ලන්තයේ තිබෙන සංඛ්‍යාලේඛන ටික ගත්තා. ගරු සභාපතිතුමනි, ඒකේ යම් සංසන්දනයක් විතරක් මම කියන්නම්. අපි වගාවට වෙන් කර තිබෙන මුළු භූමිය හෙක්ටෙයාර මිලියන 1.37යි. නෙදර්ලන්තයේ තිබෙන මුළු භූමි ප්‍රමාණය හෙක්ටෙයාර මිලියන 2.2යි. හැබැයි, ඒගොල්ලන් පාවිච්චි කරන මුළු ශ්‍රම බලකායේ ප්‍රමාණය ලක්ෂ 2යි. අපිට වඩා දෙගුණයකට ආසන්න භූමියක් වගා කරන්න ශ්‍රම බලකාය ලක්ෂ 2යි ඒ රටේ යෙදවෙන්නේ. හැබැයි, ඒ අය වගා කරන භූමියෙන් භාගයක් වගා කරන්න අපි පාවිච්චි කරනවා, ලක්ෂ 3ක ශ්‍රම බලකායක්. එහෙම නම් ඒ සංසන්දනය එක්ක නිකමට හිතලා බලන්න, අපට ඉදිරියේදී තව කොච්චර දුරකට අලුත් තාක්ෂණය අවශ්‍ය වනවාද, අලුත් වැඩ පිළිවෙළකට යා යුතුව තිබෙනවා ද කියලා.

නෙදර්ලන්තය කෘෂිකාර්මික අපනයන අතින් ලෝකයේ තුන්වැනියට සිටින රට බවට පත් වෙලා තිබෙනවා. අපට එවැනි තැනකට පත් වෙන්න නම්, ඒ ඉලක්කවලට යන්න අපට පුළුවන්කම තිබෙන්න ඕනෑ. එහෙම නම් ඒකට අවශ්‍ය කරන වෙනස්කම් පිළිබඳව අලුතෙන් අපි හිතුවේ නැත්නම්, කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉන්න කර්මාන්තකරුවා එක පැත්තකින් නැති වෙනවා. අපේ රටේ තිබෙන ගාමන්ට් එකක් හෝ ෆැක්ටරියක් ගත්තොත් ඕනෑම වෙලාවක ඒ හැම තැනකම දැන්වීම් අලවා තිබෙනවා, "සේවක පුරප්පාඩු ඇත" කියලා. හැබැයි, අපේ රටේ ශ්‍රම බලකායෙන් සියයට 26ක් කෘෂි කර්මාන්තයට නැඹුරු වෙලා හිටියාට, රටට දායකත්වයකුත් නැහැ; ඔවුන්ට කුඹුරු ටික වගා කරන්න යන වියදම සොයා ගන්නත් බැහැ; අවසානයේදී සහල් ටිකත් විකුණා ගන්නත් බැරිව ඔවුන් බරපතළ අර්බුදයකට පත්වෙලා තිබෙනවා.ඒ නිසා මේ කාරණය මීට වඩා ගැඹුරින් අරගෙන, ආදායම් සොයන්න පුළුවන් ප්‍රායෝගික ක්‍රමවේදයකට අපේ කෘෂි කර්මාන්තය යොමු කරවන්න කියලා විශේෂයෙන්ම මේ වෙලාවේදී මා යෝජනා කරනවා. මොකද, අපි ලක්ෂ 3ක ශ්‍රම බලකායක් යොදවලා ඩොලර් බිලියන 7ක් උපයනකොට, නෙදර්ලන්තය ලක්ෂ 2ක ශ්‍රම බලකායක් යොදවලාඩොලර් බිලියන 20ක් සොයනවා. නෙදර්ලන්තය අපි වාගේ තුන් ගුණයක ආදායමකට ගිහිල්ලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා අපි මේ පිළිබඳව අලුතෙන් හිතලා, අලුතෙන් කටයුතු කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට අපි දකින බරපතළ ප්‍රශ්නයක් තමයි, වනසතුන්ගෙන් සිදුවන හානි. වනසතුන්ගෙන් සිදුවන හානි පිළිබඳව ගරු ඇමතිතුමා පාර්ලිමේන්තුවේදීත්, පිටතදීත් හොඳ, නමුත් දරුණු, ගත යුතු තීන්දු තීරණ සම්බන්ධයෙන් විවෘත ප්‍රකාශයක් කළා. අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. මොකද, ගරු සභාපතිතුමනි, අපි තුස්තවාදීන් දැකලා, ඒ තුස්තවාදියාත් මනුෂ්‍යයෙක් කියලා බණ කිය කියා ඉන්න ගියොත්, මේ රටේ අහිංසක පුරවැසියන් සිය දහස් ගණනාවක් නැති වෙලා තමයි නතර වෙන්නේ. මම අවුරුදු ගණනාවක් දැකලා තිබෙනවා, අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේදී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් මේ ගැන අහනවා. ඔවුන් හැමදාම සංඛ්‍යාලේඛනයක් ඉදිරිපත් කරනවා. එතුමන්ලාට බැණලා වැඩක් නැහැ; එතුමන්ලා නියම සංඛ්‍යාලේඛනය දෙනවා. ඔවුන් කියනවා, "වනසතුන්ගෙන් සිදුවන හානිය මෙච්චරයි, රටට අහිමි වුණු මුදල මෙච්චරයි" කියලා.

ඊළඟට අපි අහනවා, මොකක්ද විසඳුම කියලා. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේදී හැමදාම වාගේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බණිනවා; එක්කෝ තවත් කාටහරි බණිනවා. ඒ ප්‍රශ්නය විසඳන්න එතැනින් එහාට කවදාවත්, කාටවත් වැඩ පිළිවෙළක් තිබිලා නැහැ. ඒක තමයි ඇත්ත. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා හෝ බණ නොකියා නිසි වැඩ පිළිවෙළක් යෙදුවේ නැත්නම් මේ ප්‍රශ්නය තවත් උග්‍ර වෙනවා. දිනක් ආණ්ඩු පක්ෂයේ ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේදී කිව්වා වාගේ එදා අපේ ආණ්ඩුව අපට අහිමි වෙන්න ඒ කාරණයත් එක හේතුවක් වුණා. මම අදටත් ඒක විශ්වාස කරනවා. ගම්වලට ගිහිල්ලා බලන්න. ඒ අහිංසක මිනිසුන්ට අද එක වගාවක්වත් කර ගන්න බැහැ. පොල් වගා කරලා තිබෙනවා නම්, එහි මුළු අස්වැන්නම අහිමි කරලායි තිබෙන්නේ. අපේ ආණ්ඩුව වෙනස් කරන්න තරම් ඒ ප්‍රශ්නය බලපෑවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම නැවත වතාවක් කියනවා ඒ ප්‍රශ්නය විසඳන්න යම්කිසි වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම් බරපතළ ප්‍රතිවිපාක අත් වන බව. මෙතෙක් කල් කළේ මොකක්ද? නිලධාරීන් අතරින් කවුරු හරි කෙනෙක් සංගණනයක් කරනවා; ආයෙත් වතාවක් වාර්තාව

[ගරු අනුරාධ ජයරත්න මහතා]

හදනවා; හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයෙන් ලස්සන වාර්තාවක් සභාගත කරනවා; අපි දෙපැත්ත බෙදිලා තුන්හතර පාරක් ඒක ගැන තර්ක කරනවා; එහෙම කරලා ආයෙත් පාරක් එතැනින් නතර වෙනවා. එහෙම නම් ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ. අපි ත්‍රස්තවාදීන්ට බණ කියන්නේ නැහැ නේ. ඒ වාගේ මේ ප්‍රශ්නය විසඳන්නත් අවශ්‍ය වැඩ පිළිවෙළ ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්න, ගරු අමාත්‍යතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. අපි අවංකවම ඒකට සහයෝගය දෙනවා. සමහර විට මහා කතන්දර කියන කණ්ඩායම් එළියේ ඉඳීවි. හැබැයි, මේ රටට බත සපයන, ආහාර භෝග සපයන මිනිසුන් ගැන බලන්න ඒ කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැහැ. අද ඒ මිනිස්සු අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ඒ සඳහා උදාහරණයක් වන සංඛ්‍යාලේඛනයක් මම කියන්නම්, ගරු සභාපතිතුමනි. 2022 වසරේ මුල් භාගය ඇතුළත විතරක් පොල් ගෙඩි මිලියන 93ක් එසේ විනාශ කර තිබෙනවා. ඒ සංඛ්‍යාලේඛනයට අනුව පොල් ගෙඩියක මිල රුපියල් 71යි. රුපියල් 71 ගණනේ බැලුවත් පාඩුව රුපියල් මිලියන 6,638යි. ඒ වාගේම, 2022 අවුරුද්දේ සෙසු භෝගවලට අදාළව සිදු වෙලා තිබෙන හානිය, රුපියල් මිලියන 30,215යි. මේ කියන්නේ, සියලු භෝග ඇතුළත්වයි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මූලික වෙලා තමයි මේ වාර්තාව හදලා තිබෙන්නේ. හානිය විතරක් රුපියල් බිලියන 30කට වැඩියි. ගරු සභාපතිතුමනි, මෙය, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරපු දත්ත එකතු කරලා හදපු සංඛ්‍යාලේඛනයක්. හැබැයි ඊට අමතරව සිදු වෙච්ච හානිය කොච්චරද කියලා නිකමට හිතලා බලන්න. මේ ප්‍රශ්නය විසඳීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ හැදුවේ නැත්නම්, එක පැත්තකින් ඒක ආණ්ඩුවේ විනාශය බවට පත් වෙයි, අනෙක් පැත්තෙන් මේ රටේ මහ ජනතාවට කන්නත් නැතිව යයි. දැනට කෘෂි කර්මාන්තයේ යෙදී සිටින ගොවීන් පිරිසත් අන්ත අසරණ වෙලා තමයි නවතින්නේ. ඒ නිසා ආණ්ඩුව තනිවම නොවෙයි, පක්ෂ, විපක්ෂ අප සියලුදෙනා එකතු වෙලා මේ වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියා මම මෙහිදී විශේෂයෙන් යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, ගරු කෘෂිකර්ම ඇමතිතුමා සභාවේ සිටින මේ වෙලාවේ මා එතුමාගේ අවධානයට එක කාරණාවක් යොමු කරනවා. 2020දී විතර වගා ආරක්ෂාව සඳහා දීපු තුවක්කුවලට භාවිත කරන පතරොමක් දුන්නේ රුපියල් 140කට විතර. නමුත්, ඩොලර් එකේ අගය වැඩි වෙයි කියලා අනුමාන කරලා අද පතරොමක් දෙන්නේ රුපියල් 450කට. හැබැයි, ඩොලරයේ අගය රුපියල් 300යි කියලා ගත්තොත්, ඒ අනුපාතයටම වැඩි වුණා නම් අද පතරොමක මිල වෙන්න ඕනෑ රුපියල් 210යි. ලෝකයේ භාණ්ඩ මිල වැඩි වීම අනුව ඒවායේ මිල යම් ප්‍රතිශතයකින් වැඩි වීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ? තුවක්කුව දුන්නාට වැඩක් වෙන්නේ නැහැ, පතරොම් මිල අධික නම්. ගරු අමාත්‍යතුමනි, පතරොම් 20, 30 ගන්න කියනවා, රුපියල් 5,000ට; 7,500ට. ඒ ගණන්වලට ඒ මිනිසුන්ට ඒවා මිල දී ගන්න බැහැ. ගරු ඇමතිතුමනි, මම මේ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මම මේ යෝජනාව කරන්න හේතුවක් තිබෙනවා. ඩොලරයේ අගය වැඩි වීම පදනම් කරගෙන පතරොමක මිල වැඩි කළා නම් ඩොලරයේ අගය රුපියල් 300ක් පමණ වන අද පතරොමක මිල රුපියල් 210න් එහාට යන්න විධියක් නැහැ, ගරු ඇමතිතුමනි. හැබැයි ඒවා ගෙන්වන අය අද රුපියල් 450ක් වාගේ මිලකට තමයි පතරොමක් විකුණන්නේ. වගා හානි වළක්වා ගන්න තුවක්කුවක් භාවිත කරන ගොවියෙකු ඉන්නවා නම්, ඒ ගොවියාට අද ඒ තුවක්කුව පාවිච්චි කරන්න පුළුවන්කමක් නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරවනවා; ආරක්ෂක අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් කණ්ඩායම් එක්ක මේ පිළිබඳව සාකච්ඡා කරලා, සුදුසු වැඩ පිළිවෙළක් හදන්න කියාත් ඉල්ලා සිටිනවා.

ගරු අමාත්‍යතුමනි, පසු ගිය කාලයේ මමත් වාරිමාර්ග විෂය භාර රාජ්‍ය ඇමතිවරයෙකු හැටියට කටයුතු කළා. එම ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය ව්‍යාපෘති ගණනාවක් මේ රටේ ක්‍රියාත්මක වෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, රජයන් වෙනස් වනකොට, ආණ්ඩු මාරු වනකොට ඒ ක්‍රියාත්මක කරගෙන ආපු සමහර අත්‍යවශ්‍ය ව්‍යාපෘති කොතෙක් දුරට ඉදිරියට යනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. මහවැලි ව්‍යාපාරය තුළ තිබුණු, කඩිනම් මහවැලි ව්‍යාපාරය තුළ තිබුණු සමහර ව්‍යාපෘති යෝජනාවලට අදාළ ඉදිකිරීම් අවසන් වුණේ පසුගිය අවුරුද්දේයි. තවත් සමහර ව්‍යාපෘති - ඇළ පද්ධති හදන සමහර ව්‍යාපෘති- අවසන් වෙලා නැහැ. හැබැයි එහෙම වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ හින්දා තමයි එක පැත්තකින් ඒ ක්ෂේත්‍රය කඩා වැටිලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා, උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය කෙරෙහි; ඒ වාගේම, වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය කෙරෙහි. උතුරු මැද පළාත් මහ ඇළ කියන්නේ කිලෝමීටර 94ක් විතර දිග ඇළ පද්ධතියක්. වැව් විතරක් ගත්තොත්, වැව් 1,350කට වතුර දෙන්න පුළුවන්.

2024-2025 වර්ෂ වන කොට එම කටයුතු මොන ක්‍රමයෙන් හෝ අවසන් කරන්න අපි කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන ගියා. හැබැයි, ආර්ථික වශයෙන් සියල්ල කඩාගෙන වැටෙනකොට එයත් නතර වුණා. අදාළ සියලු අමාත්‍යාංශ එකතු වෙලා තිබෙන මේ වෙලාවේ ඒ අත්‍යවශ්‍ය කඩිනම් ව්‍යාපෘති ටික ක්‍රියාත්මක කරන්න, ගරු අමාත්‍යතුමනි. ඔබතුමන්ලාට මන්ත්‍රී ආසන 150 ගණනක් තිබෙන පාර්ලිමේන්තුවක් මේක; ඔබතුමන්ලාට 2/3ක බලයක් තිබෙන පාර්ලිමේන්තුවක් මේක. ඒ නිසා මා මුලින් සඳහන් කළ ව්‍යාපෘති රටේ මුදල් යෙදවිය යුතුම ව්‍යාපෘති බවට පත් කරලා ඒවායේ කටයුතු කඩිනමින් අවසන් කරන්න. එසේ කළොත්, හෙට දවසේ මේ රටේ ආර්ථිකයට මුදල් එකතු කරන ව්‍යාපෘති බවට ඒවා පත් වෙයි. එහෙම නැති වුණොත්, ඒ කාලයේ කරන්න කථා කරපු මහවැලිය ව්‍යාපෘති ගැන අපි හෙටත් කථා කරාවි.

අපි බොහෝ කාලයක් තිස්සේ උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය ගැන කථා කරනවා; ඉරණමඩු වැව, හුරුළු වැව, මහ කනදරාව වැව ආදි වැව්වලට වතුර අරගෙන යන වැව් ටික දිහා බලාගෙන ඉන්නවා. නමුත්, තවම අපට ඒ වැව් 1,350ට වතුර දෙන්න බැරි වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, වයඹ පළාත් මහ ඇළ ගත්තොත්, එම ඇළ මාර්ගය කිලෝමීටර 90ක් පමණ දිගයි; වැව් 350කට වතුර දෙනවා. හැබැයි, අපි ආණ්ඩු 3කට, 4කට වැඩි කාලයක් තිස්සේ ඒවා ගැන කථා කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘති පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා මා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමනි, අපි පසුගිය කාලවල වැව් ටික මනින්න වැඩ පිළිවෙළක් හැදුවා. වැව් ටික මනින කටයුත්තට මිනින්දෝරු දෙපාර්තමේන්තුව මැදිහත් වුණත්, එම මැනුම් කටයුතු සියල්ල කවදාවත් අවසන් කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. එහෙම වෙන්න හේතුවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ට බැණලා වැඩක් නැහැ. කාර්යාංශ වශයෙන් ශ්‍රම දායකත්වය ලබා දිය හැකි ඔවුන් සතු මානව සම්පත ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අපි පසුගිය කාලවල විශ්වවිද්‍යාලවල ඒ අදාළ විභාගය සමත් වුණු ශිෂ්‍යයන් බඳවාගෙන ඔවුන්ගේ දායකත්වය ලබා ගත්තා, වැව් ටික

මනින්න. අපි පසුගිය කාලයේ අවුරුදු එකහමාරක් ඇතුළත වැව් 1,740ක් හැදුවා. ඒ වාගේම වැව් විශාල ප්‍රමාණයක මැනුම් කටයුතු අවසන් කරන්න අපි කටයුතු කළා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම යෝජනාවක් කරනවා, විශ්වවිද්‍යාලවල ඒ අදාළ විභාග සමත් වෙච්ච, උපාධිය අවසන් කරපු දරුවන් නැවත වතාවක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අරගෙන වාරිමාර්ග ක්ෂේත්‍රය තුළ තිබෙන වැව් අමුණු, ඇළ මාර්ග ආදියේ මැනුම් කටයුතු කඩිනමින් කරන්න කියලා. ඒ සඳහා එම කණ්ඩායම් ටික යොදවා ගන්න. මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ අවුරුදු 3ක් විතර එම ක්ෂේත්‍රයේ කටයුතු කළාම, ලයිසන් එකක් තිබෙන මිනින්දෝරුවන් බවට පත් වෙන්නත් ඒ අයට පුළුවන්කම ලැබෙනවා. මා හිතන විධියට ඒ හරහා ඒ ළමයින්ට ව්‍යාත්මය වශයෙන් ඉස්සරහට යන්න පුළුවන්කමක් ලැබෙනවා. අනෙක් පැත්තෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශය කේන්ද්‍ර කරගත් වාරිමාර්ග, මහවැලි ව්‍යාපාරය ආදි ක්ෂේත්‍රවල තිබෙන සම්පත් ටික ආරක්ෂා කරගන්නත්, වැව් අමුණු සියල්ල ආරක්ෂා කරගන්නත්, මැනුම් කටයුතු සිදු කර ඒවා නිශ්චිත විධියට හඳුනාගන්නත් පුළුවන්කම ලැබෙනවා. මම ඒ කාරණාවත් ගරු අමාත්‍යතුමාට මතක් කරනවා. ගරු අමාත්‍යතුමනි, ඒ කාරණාවලට ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Anuradha Jayaratne, your time is up.

ගරු අනුරාධ ජයරත්න මහතා
(මාණ්පුමිකු අනුරාත ජයරත්න)
(The Hon. Anuradha Jayaratne)
මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ, ගරු සභාපතිතුමනි.

ගරු අමාත්‍යතුමනි, ප්‍රධාන මාර්ග දෙපස තිබෙන වැව් පිළිබඳවත් අවධානය යොමු කරන්න. මොකද, ඒවායෙන් රටේ ආර්ථිකයට, සංචාරක කර්මාන්තය ආදි සියලු ක්ෂේත්‍රවලට දායකත්වයක් ලබා ගන්න පුළුවන්. ඒවා පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියා නැවතත් ඉල්ලා සිටිමින්, මට වෙලාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය]සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පඩි, අමාර්වු පි.ව. 1.00 මණිවරෙ ඉඩෙනිරුත්තප්පට්ටු මීණ්ඩුම් තොටංකිර්රු. කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු (තිරුමති) හේමාලි වීරසේකර] තලෙමෙ වකිත්තාර්කළ්.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.00]

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்த ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்திலே கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சுக்கு 216.97 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது என்பதை இந்தச் சபையில் தெரிவித்துக் கொள்கின்றேன். இந்த நிதியிலே விவசாயத் துறைக்கு 113.5 பில்லியனும், நீர்ப்பாசனத் துறைக்கு 87.5 பில்லியனும், காணித் துறைக்கு 13.7 பில்லியனும், கால்நடை உற்பத்தி மற்றும் சுகாதாரத் திணைக்களத்திற்கு 2,139 மில்லியனும் ஒதுக்கப்பட்டுள்ளது. இதைவிட, பால் உற்பத்தித் துறையை மேம்படுத்துவதற்காகவும் பாலைப் பதப்படுத்துவதற்காகவும் 'மில்கோ' நிறுவனத்தினுடைய உட்கட்டுமானப் பணிகளை மேற்கொள்வதற்காகவும் 19.5 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளதென்பதையும் இந்தச் சபையிலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இலங்கையிலே இதுவரை காலமும் கால்நடைத் துறையானது மிகவும் மந்தகதியிலே இயங்கியதுடன், மிகவும் அபிவிருத்தியடையாத ஒரு நிலையிலேயே காணப்பட்டது. கடந்த காலங்களிலே கால்நடை உற்பத்தி மற்றும் சுகாதாரத் திணைக்களத்திற்குப் போதியளவு கால்நடை வைத்தியர்கள் இல்லாத காரணத்தினாலும், அலுவலகங்களிலே ஏனைய உத்தியோகத்தர்களின் பற்றாக்குறை காரணமாகவும் இந்தத் துறையானது மிகவும் வீழ்ச்சியுற்ற நிலையிலே காணப்பட்டது. அதேபோல, கால்நடை வைத்திய அலுவலகங்களுக்கு வழங்கப்பட்டுள்ள வாகனங்கள் ஏறக்குறைய 30 வருடங்களுக்கும் மேற்பட்ட பழையவை என்பதுடன், அவர்களுக்கான எரிபொருள் ஒதுக்கீடும் மிகக் குறைந்தளவாகவே காணப்பட்டது. இந்தக் கால்நடை வைத்தியர்கள் கால்நடை வைத்திய சேவைகளை மட்டுமல்லாமல், தமது அலுவலகங்களின் நிர்வாகக் கடமைகளையும் மேற்கொள்கின்றனர். இவ்வாறான அதிகாரிகளுக்குப் போதியளவு கொடுப்பனவுகளோ அல்லது மேலதிகக் கொடுப்பனவுகள் எதுவுமோ இதுவரை காலமும் வழங்கப்படவில்லை. அந்த வகையில், எமது அரசாங்கம் இவர்களுக்கு இவற்றை வழங்குவதற்கு ஆலோசித்து இருக்கின்றதென்பதை இந்த உயரிய சபையிலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இந்த நாட்டிலே வாழுகின்ற கிராமப்புற மக்கள் கால்நடை வளர்ப்பு மற்றும் விவசாயத்தையே மேற்கொள்கின்றனர். இந்த மக்களுடைய பொருளாதாரமானது மிகவும் நலிவுற்ற நிலையிலேயே காணப்படுகின்றது. காரணம், அவர்களுடைய உற்பத்திப் பொருட்களைச் சந்தைப்படுத்த முடியாத நிலையும், அந்த உற்பத்திப் பொருட்களைப் பெறுமதிசேர் பொருட்களாக மாற்றமுடியாத நிலையும் காணப்படுவதாகும். இதனால், இடைத்தரகர்கள்தான் இதிலே பெருமளவு இலாபமீட்டுகின்றார்கள். உதாரணமாகச் சொல்லப்போனால், பாற்பண்ணையாளர் ஒருவர் ஒரு லீற்றர் பாலை 165 ரூபாய்க்கு விற்பனை செய்கின்றார். ஆனால், அந்த ஒரு லீற்றர் பாலானது சந்தையிலே 480 ரூபாய்க்கு விற்கப்படுகின்றது. அதேபோல, இலங்கையிலே நெல் சந்தைப்படுத்தல் மற்றும் நெல்லைக் களஞ்சியப்படுத்தல் போன்ற விடயங்களில் விவசாயிகள் பல்வேறு சிரமங்களுக்கு உட்பட்டுள்ளனர். இதனால் எமது அரசாங்கமானது, Department of Co-operative Development ஊடாக நெல்லைச் சந்தைப்படுத்தும் முறையொன்றை அறிமுகப்படுத்தவிருக்கின்றது. அதேபோல், 'மில்கோ'

[ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

නිරුවනත්තිනූටාග මක්කළ් පාලෙ ඉලකුවාකච් චන්තෛප්පටුත්තුවතර්කුම්, අතනෛක් කූටිය විලෙයිලේ විර්පනෛ චෙය්වතර්කුම් එමතු අරචාංකමානතු උත්තරවාතම් අළිත්තුළ්ළතු.

ඉලංකෛයිලේ කාල්නටෛ වළර්ප්පිල් 2 විතමාන මුරෛකළ් කාණප්පටුකින්රන. ඔන්රු, නවීන මුරෛ; මර්රෛයතු, පාරම්පරිය මුරෛ. නවීන මුරෛයිලේ කාල්නටෛ වළර්ප්පිල් ඊටුපටුපවර්කළ්, පෙරියළවිල් අතාවතු මිකප් පරන්තළවිල් පණ්ණෛයෛ විස්තරිප්පුච් චෙය්තාල්තාන් අතිලේ ඉලාපමීට්ටක්කූටිය නිලෛ කාණප්පටුකින්රතු. උතාරණමාකච් චොල්ලප්පෝනාල්, අතික පාල් තරුම් කාල්නටෛකළෛ ඉලංකෛයිලේ වළර්ක්ක වේණ්ටුමානාල්, චිරන්ත තොළිල්නුට්ප මුරෛකළෛ නාංකළ් පයන්පටුත්ත වේණ්ටුම්. අප්පෝතුතාන් අතිලිරුන්තු ඉලාපත්තෛප් පෙර්රුක්කොළ්ළක්කූටියතාක ඉරුක්කුම්.

කටන්ත කාලංකළිල් අවුස්තිරේලියා, නියූසිලාන්තු පෝන්ර නාටුකළිලිරුන්තු කාල්නටෛකළ් ඉලංකෛක්කු ඉරක්කුමති චෙය්යප්පට්ටන. අන්තක් කාල්නටෛකළ් චිරන්ත තේකාරෝක්කියමුළ්ළතාකවෝ, චිරන්ත තරමුළ්ළතාකවෝ කාණප්පටවිල්ලෛ. අතේපෝන්රු 2017ආම් ආණ්ටු 5,000 කරවෛප් පචුක්කළ් ඉරක්කුමති චෙය්යප්පට්ටන. අවර්රිනුටෛය මොත්තප් පෙරුමති 2,317 මිල්ලියන් අමොික්ක ටොලරාකුම්. අව්වාරු කොණ්ටුවරප්පට්ට කාල්නටෛකළ් උලර් වලයංකළුක්කුම් අනුපවමර්ර ඒනෛය පණ්ණෛයාළර්කළුක්කුම් වළංකප්පට්ටතන් කාරණමාක, අනේකමානවෛ ඉරන්තුවිට්ටන. වවුනියාවිල් ඕමන්තෛයිලුළ්ළ ඔරු පණ්ණෛයාළරුක්කු 50 කරවෛප් පචුක්කළ් වළංකප්පට්ටන. අව්වාරු වළංකප්පට්ට ඔරු පචුකූටත් තර්පෝතු අංකේ ඉල්ලෛ. අනෛත්තුම් කුළි තෝණ්ටිප් පුතෛක්කප්පට්టුවිට්ටන. ඒනෙනිල්, උලර් වලයමාන වන්නි මර්රුම් කිළක්කු මාකාණත්තින් කාලනිලෛයානතු මිකවුම් වරට්චියානතාක කාණප්පටුවතාකුම්. අන්තප් පිරතේචංකළුක්කු උකන්ත ඉනංකළෛ වළංකාමෛයේ අන්තත් තිට්ටම් චෙයලර්රුප් පෝනතර්කුක් කාණරමාකුම්.

අත්තෝටු, ඉලංකෛයින් වටක්කු, කිළක්කු මාකාණංකළිලේ පිරතානමාක පාරම්පරිය මුරෛයිලේතාන් කාල්නටෛකළෛ වළර්ත්තු වරුකින්රාර්කළ්. අවර්කළ් නාට්ටු මාටුකළ් මර්රුම් උළ්ළූර් එරුමෛ මාටුකළෛයේ වළර්ත්තු වරුකින්රාර්කළ්. මනිතන් කාට්ටිල් වාළ්න්තු වන්ත කාලම් තොට්ටු ඉන්රුවරෛ අවර්කළ් තංකළුටන් ඉන්තක් කාල්නටෛකළෛයුම් පේණිවරුකින්රාර්කළ්. ඉන්තක් කාල්නටෛකළ්තාන් අවර්කළුටෛය වාළ්වාතාරමාකක් කාණප්පටුකින්රතු. ඉව්වාරු වාළ්වාතාරමාකක් කාණප්පටුකින්ර කාල්නටෛකළෛප් පෝන්රු ඉරක්කුමති චෙය්යප්පටුම් කාල්නටෛකළෛ උළ්ළක වළර්ප්පු - intensity - මුරෛයිල් වළර්ක්ක මුටියාතු. අන්තක් කාල්නටෛකළ් අංකු කුරෛන්තළවු පාල් උර්පත්තියෛයේ තරුකින්රන. ආනාල්, පාරම්පරිය මුරෛයිල් වළර්ක්කප්පටුම් කාල්නටෛකළාන්තු අන්තච් චූළලුක්කු ඉසෛවාක්කප්පට්ටතාකවුම් මිකවුම් කූටිය වයතු කාලම් ඉනප්පෙරුක්කත්තන්මෛ කොණ්ටතාකවුම් වළර්ප්පුච් චෙලවු කුරෛන්තනවාකවුම් කාණප්පටුකින්රතු. මේර්පටි කාල්නටෛකළිලිරුන්තු පෙර්රුක්කොළ්ළුම් පාලාන්තු ආරෝක්කියමානතාකවුම් මූලිකෛත්තන්මෛ කොණ්ටතාකවුම් කාණප්පටුකින්රතු.

වටක්කු, කිළක්කිලේ වාළුකින්ර තමිළ් මක්කළ් කලාචාර රීතියිල් ඉන්තක් කාල්නටෛකළෛ වළර්ත්තු වරුකින්රාර්කළ්. උතාරණමාක, තෛප්පොංකලුක්කු අටුත්තනාළ් කොණ්ටාටප්පටුම් පට්ටිප් පොංකලන්රු කාල්නටෛකළුක්කුප් පොංකල් චෙය්තු, මිකවුම් චන්තෝචමාක අන්තක් කාල්නටෛකළුක්කු නන්රි චෙලුත්ති වරුකින්රාර්කළ්. ඉන්තක් කාල්නටෛකළුක්කුරිය මේය්ච්චල් තරෛ ඉතුවරෛ කාලමුම් වළංකප්පටවිල්ලෛ. 1885ආම් ආණ්ටින් 10ආම් ඉලක්ක, කාටුකළ් කට්ටළෛච් චට්ටත්තින්කීළ් තාපික්කප්පට්ට කාට්ටුත් තිණෛක්කළත්තිනාල් ඉලංකෛයිලේ කාණප්පටුකින්ර අනේකමාන ඉටංකළ් කෛයකප්පටුත්තප්පට්ටුළ්ළන. කාලංකාලමාක මේය්න්තු වන්ත කාල්නටෛකළ් ඉප්පෝතු අංකේ චෙන්රු මේය්වතර්කු ඉටමළික්කප්පටුවතිල්ලෛ. ආනාල්, 1937ආම් ආණ්ටු 02ආම් ඉලක්ක, තාවර, විලංකිනප් පාතුකාප්පු කට්ටළෛච් චට්ටත්තින්කීළාන ඒර්පාට්ටිලේ කාල්නටෛකළ් Department of Wildlife Conservation ඉනුටෛය පිරතේචංකළිල් චෙන්රු මේය්ච්චලිල් ඊටුපට ඉටමළික්කප්පට්ටිරුක්කින්රතු. එනවේ, එතිර්වරුම් කාලංකළිලේ ඉන්තක් කාල්නටෛකළ් වන ඉලාකාවිනුටෛය පිරතේචංකළිලුම් මේය්ච්චලිල් ඊටුපටුවතර්කු එමතු අරචාංකම් ඔරු වළිවකෛයෛච් චෙය්ය වේණ්ටුමෙන්රු කේට්ටුක්කොණ්ටු, විටෛපෙරුකිරේන්. නන්රි!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිචාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.10]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි නාමල් රාජපක්ෂ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ කඳවුරත්, අපේ කඳවුරත් නිරන්තරයෙන්ම ගොවි ජනතාව වෙනුවෙන් පෙනී හිටපු අය. එදා, 2005දී ඔබතුමන්ලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එක්ක ආණ්ඩුව හදනකොට ඔබතුමන්ලාට මතක ඇති, වී කිලෝවක් රුපියල් 8යි. එදා ගොවි මහත්වරු වහ බිව්වා. ඒ ගොවියාට නිසි ගෞරවය ලබා දෙන්නත්, හොඳ ආදායමක් ලබා දෙන්නත් එදා ආණ්ඩුව කටයුතු කළා. කාලානුරූපව රුපියල් 350ට පොහොර දෙන්න කටයුතු කළා. ඒ අනුව අපේ රට හාල්වලින් ස්වයංපෝෂිත වෙන්න පටන් ගත්තා. 2015දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ජනාධිපතිවරණයෙන් පරදිනකොටත් එවකට හිටපු ආණ්ඩුව - තමුන්නාන්සේලා කොටස්කරුවන් - වී ගබඩා කරන්න තැනක් නැහැ කියලා මත්තල ගුවන් තොටුපොළෙන් වී ගබඩා කළා. ඒ බව ඔබතුමන්ලාට මතක ඇති. ඒ කෙසේ වෙතත්, පසුගිය කාල සීමාවේත් ආපු හැම ආණ්ඩුවක්ම අඩු වැඩි වශයෙන් ගොවි ජනතාව වෙනුවෙන් කථා කළා. තමුන්නාන්සේලාත් විපක්ෂයේ සිටි කාලයේ ගොවි මහත්වරු වෙනුවෙන් විශාල සටනක් කරපු අය. ඉතින්, ඔබතුමන්ලා ආණ්ඩුවේ සිටින අමාත්‍යවරුන් විධියට ගොවි ජනතාවගේ සටන අත්හරින්නේ නැතිව ඔවුන් වෙනුවෙන් දිගටම කටයුතු කරගෙන යයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම එදා පොරොන්දු වෙච්ච දේවල් ඉෂ්ට කරන්න කටයුතු කරයි කියලාත් බලාපොරොත්තු වෙනවා.

වී කිලෝවක් අඩුම වශයෙන් රුපියල් 150ක්, 154ක් වෙන්න ඕනෑ කියලා එදා ඔබතුමන්ලා විශ්වාස කළා. නේද, ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමනි? එදා ඔබතුමන්ලා සංඛ්‍යාලේඛන හැදුවේ එහෙමයි.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඒ, පොහොර නැති කාලයේ.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔව්, පොහොර නැති කාලයේ. හැබැයි, එදාත් පොහොර සහනාධාරය දුන්නා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. ඒ පොහොර සහනාධාරය දීලා එක කන්නයකට තමයි රසායනික පොහොර දුන්නේ නැත්තේ. කන්න දෙකකට රසායනික පොහොර දුන්නා. හැබැයි, එදා පොහොර දීලාත් රුපියල් 154ට තමයි වී කිලෝවක් තිබුණේ. නමුත් අද රුපියල් 120 දක්වා අඩු වෙලා තිබෙනවා. වී කිලෝවක් රුපියල් 130ට, රුපියල් 135ට මිල වැඩි කර දෙන්න පුළුවන් නම් ඒකෙන් මේ වෙලාවේ ගොවියාට සාධාරණයක් ඉෂ්ට වෙයි කියලා මම හිතනවා.

ආණ්ඩුවෙන් වී මිලදී ගන්න ඔබතුමන්ලා රුපියල් බිලියන 5ක මුදලක් වෙන් කළා. අපි දන්නවා, ඒ මුදලින් වී කිලෝවක් රුපියල් 120 ගණනේ මෙට්‍රික් ටොන් 41,000ක් වාගේ ප්‍රමාණයක් තමයි මිලදී ගන්න හැකියාව ලැබෙන්නේ කියලා. හැබැයි, මේ ක්ෂේත්‍රය තුළ මෝල් හිමියන් එක්ක තමුන්නාන්සේලා නිරන්තරයෙන් හැප්පෙනවා අපි දකිනවා. ජනාධිපතිතුමා නම්, 'එහෙම මාෆියාවක් නැහැ' කියලා කිව්වා. හැබැයි, තමුන්නාන්සේලා යම් අවස්ථාවලදී එහෙම කියලා තිබෙනවා. ඒ කෙසේ වෙතත් රුපියල් බිලියන 5කින් වී මෙට්‍රික් ටොන් 41,000ක් අරගෙන මේ රටේ ආණ්ඩුවක් විධියට මේ මිල පාලනයට මැදිහත් වෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලා දෙපොළට මේකට චෝදනා කරලා වැඩක් නැහැ. මොකද, ආණ්ඩුව අනෙක් පැත්තෙන් බඳු ආදායම උත්පාදනය කරන්න හොයනවා. ඒ නිසා තමයි හාල් පිටරටින් ගෙනෙනකොට රුපියල් 65ක බද්දක් ගහලා තිබෙන්නේ. ආණ්ඩුවේ ආදායම වැඩි කර ගන්න IMF රෙගුලාසි එක්ක යනකොට IMF එකට ආදායම පෙන්වන්න ලෙහෙසිම ක්‍රමවේදය තමයි පිටරටින් හාල් ගෙනැල්ලා, ඒකට රුපියල් 65ක බද්දක් ගහලා රාජ්‍ය ආදායම පෙන්වන එක. ඒක එළවලු, පලතුරුවලටත් අනුගත වුණොත් ආණ්ඩුවේ ආදායම වැඩි වෙනවා. හැබැයි, අනෙක් පැත්තෙන් ගොවියාගේ ආදායම පිළිබඳව යම් ගැටලුවක් පැනනඟිනවා. ගොවියාගේ ආදායම පිළිබඳව පැහැදිලි ප්‍රශ්නයක් ඇති වෙනවා.

පසුගිය කාලයේ -2023, 2024 අවුරුදුවල- රුපියල් බිලියන 50ක, රුපියල් බිලියන 54ක මුදලක් ආණ්ඩුව පොහොරවලට වෙන් කළා. තමුන්නාන්සේලා වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 35යි. හෙක්ටෙයාරයකට රුපියල් 25,000ක පොහොර සහනාධාරයක් දෙනවා කියලා තිබෙනවා නේද? හැබැයි, ඒ වෙනුවෙන් රුපියල් බිලියන 35යි වෙන් කරලා තිබෙන්නේ. තමුන්නාන්සේලා රුපියල් 154ට වී කිලෝවක් ගන්න කියපු පසුගිය අවුරුදු දෙකේ කාල සීමාව තුළදී රුපියල් බිලියන 50ක, රුපියල් බිලියන 54ක මුදලක් වෙන් කරලා තිබුණා. හැබැයි, අද වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 35ක වාගේ මුදලක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රුපියල් බිලියන 35ක මුදල ගොවි ජනතාව අතර සාධාරණ විධියට අවශ්‍ය ප්‍රමාණයට බෙදන්නේ කොහොමද? හැබැයි, අපි පිළිගත යුතු කාරණයක් තිබෙනවා. එදා 2005 ඉඳලා ආපු ගමන තුළ අපි අස්වැන්න වැඩි කළා; ගොවියාගේ ආදායම වැඩි කළා. නමුත්, අපි තාක්ෂණය බද්ධ කිරීම තුළ යම් පසුබෑමක් තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ කාරණාවක්. අද ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා. Soil testing කරන්න ඕනෑ. මේ වෙනකොටත් soil testing පිළිබඳව තමුන්නාන්සේලාගේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ තිබෙන SLINTEC වැනි ආයතනවල පරීක්ෂණ කටයුතු සිදු වෙලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරන්න. එතකොට පොහොර දෙනකොට භූමියට අවශ්‍ය ප්‍රමාණයට පමණක් පොහොර ටික දෙන්න පුළුවන්. එතකොට සමහර විට රුපියල් බිලියන 35 කළමනාකරණය කර ගන්න හැකියාව ලැබේවි. හැබැයි, අනෙක් පැත්තෙන් අලුත් භූමියකින් වැඩි අස්වැන්නක් ලබා ගන්න බලන්න.

ඔබතුමන්ලා දන්නවා, වියට්නාමය වාගේ රටවල හාල් නිෂ්පාදනය ඉතාම සරුවට සිදු වෙන බව. හැබැයි තාක්ෂණික පරිවර්තනයක් අපි කරන්න ඕනෑ. ඒ තාක්ෂණික පරිවර්තනය කරන්න නම් ආණ්ඩුව වාගේම පෞද්ගලික ක්ෂේත්‍රයත්, ගොවි ජනතාවත් මේකත් එක්ක බද්ධ කරගන්න ඕනෑ. තමුන්නාන්සේලාට අපෙන් හානියක් නැහැ. මොකද, අපි ගොවියෝ අවුස්සලා පාරට බස්සලා, උද්ඝෝෂණය කරලා ආණ්ඩු විරෝධයක් ගොඩනඟන්න යන්නේ නැහැ, ගොවියාට හොඳක් වෙනවා නම්. ඒකට තමුන්නාන්සේලාට අවස්ථාවක් තිබෙනවා, ගොවි ජනතාවත් එක්ක වාගේම රාජ්‍ය ආයතනත් සම්බන්ධ කරගෙන තාක්ෂණය බද්ධ කරන්න. මොකද, අපි polytunnels ගැන කථා කරනවා. drip irrigation ගැන කථා කරනවා. මේවාට යම් ප්‍රාග්ධනයක් වැය කරන්න ඕනෑ. හැබැයි, ප්‍රාග්ධනයක් වැය කරන්න මේ තිබෙන ආර්ථික රාමුව ඇතුළේ තමුන්නාන්සේලාට යම් මුදලක් වෙන් කරන්න පුළුවන්ද, බැරිද කියන ප්‍රශ්නය තිබෙනවා. හැබැයි අනෙක් පැත්තෙන්, අඩු භූමියකින් වැඩි අස්වැන්නක් ලබා ගන්න පුළුවන් බීජවලට අපි පරිවර්තනය කරන්න ඕනෑ.

ලංකාවේත් මේ පරීක්ෂණ සිද්ධ වෙනවා. අපි බොහෝ වෙලාවට දකිනවා, ප්‍රායෝගිකව ඒ පරීක්ෂණ කටයුතු අවසන් වුණත් ඒ බීජ මාර්කට් එකට එන්නේ නැහැ කියලා. එහෙම නැත්නම් අදාළ අමාත්‍යවරයා ඒ පිළිබඳව දැනුමක් ලබා දෙන්නේ නැහැ. ඒ කාරණාවලටත් ඔබේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද, මේ වෙලාවේ ඒ තාක්ෂණික පරිවර්තනය රාජ්‍ය සේවයට වාගේම කෘෂිකර්මාන්තයටත් වෙන්න ඕනෑ. එක පැත්තකින්, polytunnelsවලට යන්න පුළුවන් නම්, drip irrigationවලට යන්න පුළුවන් නම්, වෙනත් තාක්ෂණික ක්‍රමවේදවලට ගොස් අස්වැන්න වැඩි කරගන්න පුළුවන් නම් ඒක කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. ඒ සඳහා මූලික ප්‍රාග්ධනය ලබා දෙන්න ආණ්ඩුවට අමාරු නම්, සමුපකාර බැංකු ක්‍රමය ශක්තිමත් කරමින්, ග්‍රාමීය බැංකු ක්‍රමය ශක්තිමත් කරමින් සක්‍රිය ණය ක්‍රමවලට යටත්ව ගොවි ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන්න තමුන්නාන්සේලා කටයුතු කරන්න. ඒ තාක්ෂණික පරිවර්තනය අවශ්‍යයි.

මේ විෂයයට සම්බන්ධ නොවුණත්, පොලීසිය භාර අමාත්‍යවරයා මේ අවස්ථාවේදී ගරු සභාව තුළ නොහිටියත් මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, පොලිස් නිලධාරීන්ගේ quarters සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒවායේ අවුරුදු 5කට වඩා හිටපු අයට යන්න කියලා තිබෙනවා. ඒ පිළිබඳව සානුකම්පිතව බලන්න. ඒ අය, ඒවායේ අවුරුදු ගණනාවක් හිටපු අය. ඔවුන්ගේ දරුවන් ඉස්කෝලවලට දාලා තිබෙනවා. මම හිතන විධියට නිවාස 1,500ක් විතර එතැන තිබෙනවා. ඒක ආණ්ඩුවේ ප්‍රතිපත්තියක්. ඒකට අභියෝග කරන්න අපට බැහැ. ඔවුන්ට මාස 6කින් අයින් වෙන්න කියලා ඔබතුමන්ලා කියලා තිබෙනවා. සාමාන්‍යයෙන් එහෙමයි quarters

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

දෙන්නේ. හැබැයි, ඒ අය අවුරුදු ගණනක් තිස්සේ ඒවායේ පදිංචිව ඉන්නවා. ඔවුන්ගේ ළමයි ඉස්කෝලවලට දාලා තිබෙනවා. සමහරුන්ට GCE A/L Exam එක ලියන්න තව අවුරුද්දයි, දෙකයි තිබෙන්නේ. සමහරු සාමාන්‍ය පෙළ විභාගය ලියනවා. ඒ නිසා එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න යම් කාලයක් දෙන්න. ගෝඨාභය මහත්මයාගේ පොහොර ප්‍රතිපත්තිය වාගේ එක අවුරුද්දෙන්ම කරන්නේ නැතුව මේ සඳහා ප්‍රායෝගික කාලයක් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. පොලිසියේ නිලධාරීන් 1,500ක් විතර ඒ නිවාසවල පදිංචි වෙලා ඉන්නවා.

ඒ වාගේම ජර්මානු කාර්මික විද්‍යාලයේත් මේ වෙනකොට යම් අර්බුදයක් මතුවෙලා තිබෙනවා. ඒ, ගරු අග්‍රාමාත්‍යතුමියගේ විෂයය. එතුමිය ඒ සඳහා මැදිහත් වෙයි කියලා මම විශ්වාස කරනවා. අවසාන වශයෙන් ඔබතුමන්ලා දෙපොළටම මම සුබ පතනවා, 15වැනිදා ට රිළවු, වඳුරන්, දඩු ලේනුන් හරියට ගණන් කරන්න ලැබෙවා කියලා. අපිත් උපරිම support එක දෙන්නම්. අපේ වතුවල ඉන්න රිළවු ටිකයි, දඩු ලේනුන් ටිකයි, කුරුල්ලෝ ටිකයි ගණන් කරලා note එකක් එවන්නම්.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[පි.ප. 1.17]

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நான் முதலில் கௌரவ பிரதம அமைச்சரும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரிடம் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, நேற்றைய தினம் வெளியாகியுள்ள "Ceylon Today" newspaperஇல் முக்கியமான news ஒன்று வெளிவந்திருக்கிறது. It states,"MP V. Radhakrishnan urges Government to bring Indian teachers".

මම එහෙම කියලා නැහැ. මම කිව්වේ, 2017දී Indian ගුරුවරු ගෙන්වන්න උත්සාහ කරනකොට JVP එක, ඒකට oppose කළා, ඒ නිසා අපි ගෙන්නුවේ නැහැ කියලායි. එච්චරයි මම කිව්වේ. මේකේ සඳහන් වෙන්නේ අනෙක් පැත්තට. ඔවුන් ගෙන්වන්න මම ආණ්ඩුවෙන් ඉල්ලීම් කළා කියලායි මේකේ සඳහන් වෙන්නේ. ඒක වැරදි කථාවක්. ඒ ගැන මම පළමුවෙන්ම කියන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. මේ නිසා YouTube channels ඔක්කොම මට විරුද්ධව මඩ ගහනවා. ඒ ප්‍රශ්නය මට අදාළ නැහැ.

நானும் ஒரு விவசாயி என்ற அடிப்படையில், இன்றைய தினம் நடைபெறுகின்ற கமத்தொழில் அமைச்சு சம்பந்தமான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு சில விடயங்களைச் சொல்ல விரும்புகின்றேன். கௌரவ அமைச்சர் அவர்கள் நிறைய விடயங்களைச் செய்து வருகின்றார். උඩ රට ගොවීන් ගැනත් හිතන්න ඕනෑ. ඔබතුමන්ලා උඩ රටටත් එන්න ඕනෑ. උඩ රටට ඇවිල්ලා අපි ගැනත් බලන්න. දවස් 365 පුරාම එළවලු වවන එකම ප්‍රදේශය තමයි නුවරඑළිය. ඒ ප්‍රදේශයේ ගොවීන්ට තිබෙන ප්‍රශ්න ගැනත් හොයලා බලන්න. විශේෂයෙන්ම මෙහේ අර්තාපල් ගලවන කාලයට ඔයගොල්ලන් ඒවා import කරනවා. ගිය ආණ්ඩුවත් ඒක කළා. ඒක කළේ commission එකට. මේ ආණ්ඩුව එහෙම කරන්නේ නැහැ කියලා අපි බලාපොරොත්තු වෙනවා. ගිය වර ඔක්කොම කළේ commissionවලට නේ. මොනවා import කළත් ඒකට commission එකක් ගන්නවා. මේ ආණ්ඩුව එහෙම නොකර ගොවියා ගැන හිතලා වැඩ කටයුතු කරාවි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, දැන් රුපියල් 800ට කැරට් විකුණනකොට මිනිස්සු අනෙක් පැත්තෙන් බණිනවා. ඒකට හේතුව මොකක්ද කියලා පොඩ්ඩක් හොයලා බලන්න. රුපියල් 800ට නුවරඑළියේ කැරට් විකුණලා ඒවා කොළඹට එනකොට රුපියල් 1,000ක් වෙනවා. එහෙම නැත්නම් කොහොමද ඒ මිනිස්සු කන්නේ? Hotelsවලට කොහොමද දමන්නේ? ඒකට හේතුව මොකක්ද? ඒ කටයුතු හරියට කළමනාකරණය කර නැහැ. Department of Agriculture, ඒක හරියට කළමනාකරණය කරන්නේ නැහැ. කැරට් බීජ වැඩියෙන් විකිණෙනවා නම් කැරට් මිල අඩු වෙනවා කියලා හිතන්න ඕනෑ. කැරට් බීජ විකිණෙන්නේ නැත්නම් කැරට්වලට වැඩි මිලක් එනවා කියලා හිතන්න ඕනෑ.

එහෙම නැත්නම් එතැන දේශගුණික ප්‍රශ්නයක් තිබෙනවා. මේවා ගැන හිතලා මේ දේවල් හරියට කළමනාකරණය කරන්න කියලා මම කියනවා.

ඊළඟට, ගොවීන්ට pH අගය check කරන්න, soil test කරන්න අවස්ථාවක් දෙන්න. ඒක කරන්නේ නැහැ. උඩරට ඒක කරන්නේ නැහැ. බදුල්ලේ කරන්නේ නැහැ, නුවරඑළියේ කරන්නේ නැහැ. ඒ වාගේම වැලිමඩත් කරන්නේ නැහැ. මේ ගැන හිතලා බලලා ඉස්සරහට වැඩ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මම ඔබතුමන්ලා කාටවත් දොස් කියන්නේ නැහැ. ඔබතුමන්ලාට දොස් කියන්න මට බැහැ. ඔබතුමන්ලා ආණ්ඩුව අරගෙන තවම ගතවෙලා තිබෙන්නේ මාස හතරක්, පහක් වාගේ කාලයක්. කලින් ආණ්ඩුවට නම් අපට දොස් කියන්න පුළුවන්. එම ආණ්ඩුව කරපු වැඩ නිසා තමයි අපි මේ තත්ත්වයට වැටිලා ඉන්නේ. රසායනික පොහොර ගෙන්වීම එක දවසින් නැවැත්වූවාට පස්සේ අපට කොච්චර අමාරු වුණාද? එම නිසා ඒ ගැන හිතලා බලලා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අල කිලෝග්‍රෑම් එකක් හදන්න රුපියල් 200ක් යනවා. එය මම ඔබතුමන්ලාට කියන්න ඕනෑ. අල කිලෝග්‍රෑම් එකක් රුපියල් 250ටවත් වික්කොත් තමයි ඒ ගොවීන්ට යම්කිසි ලාභයක් තිබෙන්නේ. හැබැයි, සියයට පහක හෝ හයක yield එකක් තිබුණොත් ඒත් පාඩුයි. එම නිසා April, May, June වනකොට අල import කරන එක පුළුවන් තරම් නවත්වන්න. නැත්නම්, tax එක වැඩි කරන්න. ඒ සම්බන්ධව ඔබතුමන්ලා මොනවා හෝ කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

නුවරඑළියේ ඉන්න ජනතාවගේ අමතර ආදායම් මාර්ගය - additional income එක - තමයි, සත්ව ගොවිපොළ කටයුතු. ඒ කියන්නේ, කුකුළු පැටව්, ගවයෝ ඇනි කරන එක. ඒකට පසුගිය දවස්වල නම් පොදු පට්ටියක් හදලා දුන්නා. මොකද, තනි තනිව එක එක්කෙනාට පට්ටි හදන්න බැහැ. එම නිසා පොදු පට්ටියක් හදලා, ඒ පොදු පට්ටියට ගවයෙක් දානවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්ඩලික පිරිතිත් නියෝජිතයා)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) වී.එස්. රාධාකෘෂ්ණන් මහතා
(මාණ්ඩලික (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
දැන් නේ කථාව පටන් ගත්තේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්ඩලික පිරිතිත් නියෝජිතයා)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට විනාඩි 7ක් තිබුණා, ඒකෙන් දැන් විනාඩි 5ක් අවසන්.

ගරු (ආචාර්ය) වී.එස්. රාධාකෘෂ්ණන් මහතා
(මාණ්ඩලික (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
පොදු පට්ටි ගැනත් හොයා බලා ඒ අයට පහසුකම් හදලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. Additional income එකක් නැති නිසා තමයි ඒගොල්ලන්ගේ ආර්ථික තත්ත්වය පහළ වැටිලා තිබෙන්නේ.

නාන් තමිළිලුම් කොඤ්චම් පේස වේණ්ඩුම්. ඉල්ලාවිට්ටාල් එන්මීතු කුරෙ සොල්වාර්කළ්. නුවරෙලියා මාවට්ටත්තිල් අතිකමාකප් පාල් උර්පත්ති සෙය්‍යප්පටුවතු මස්කෙලියා, පොකවන්තලාවෙ පෝන්ර පිරතේසංකළිල් ආකුම්. ඉන්ත ඉටංකළිල් veterinary surgeons මිකක් කුරෙවාකවේ ඉරුක්කින්රාර්කළ්. ඉතනාල් අවර්කළුටෙය සේවෙ අංකුළ්ළ මක්කළුක්කුප් පෝතාමල් ඉරුක්කින්රතු. එනවේ, අංකු veterinary surgeonsඉර්කාන තේවෛයෛප් පූර්ත්තිසෙය්තු කොටුත්තු, අවර්කළුටෙය සේවෛකළෛප් පෙර්රුක්කොටුප්පතන්මූලම් අංකු පාල් උර්පත්තියෙ අතිකරික්කලාම් එන්පතෛ නාන් ඉන්ත නේරත්තිල් උංකළුක්කුත් තෙරිවිත්තුක් කොළ්කින්රේන්. මේලුම්, ඉලංකෛයිල් 365 නාට්කළුම් විවසායම් මේර්කොළ්ළප්පටුකින්ර නුවරෙලියා, පතුළෛ, වෙලිමටෛ පෝන්ර පකුතිකළිලුළ්ළ විවසායිකළින් පිරච්සිනෛකළෛත් තීර්ප්පතර්කු නටවටික්කෛ එටුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්.

කටන්ත වාරම් ඉර්රන් නෝක්කිප් පයණිත්ත පස්සිල් ඒර්පට්ට ඔරු පිරච්සිනෛක්කු උටනටියාක නටවටික්කෛ එටුත්තතර්කාක නාන් කෞරව අමෛච්චර් පිමල් රත්නායක්ක අවර්කළුක්කු නන්රි තෙරිවික්කින්රේන්. සම්පන්තප්පට්ට conductorසෙ සේවෛයිලිරුන්තු ඉටෛනිරුත්තියතු මට්ටුමල්ල, අන්ත මාණවනිටම් මන්නිප්පුක් කේට්කවුම් සෙය්තිරුක්කිරාර්. අතු අවරුටෙය පෙරුන්තන්මෛයෛක් කාට්ටුකින්රතු. අතර්කු නාංකළ් මතිප්පලික්කින්රෝම්. අන්ත මාණවන් කුරිත්ත සම්පවත්තෛ 'වීඩියෝ' එටුත්තු සමූකවලෛත්තළත්තිල් ඉට්ටතනාල්තාන් ඉන්තප් පිරච්සිනෛක්කු මුර්රුප්පුළ්ළි වෛක්කප්පට්ටතු. අතර්කාක අන්ත මාණවනුක්කුම් නාංකළ් නන්රි සොල්ලක් කටමෛප්පට්ටු ඉරුක්කින්රෝම්. ඉන්නුමොරු සන්තර්ප්පම් කිටෛක්කුම්පොළුතු, ඉන්නුම් නිරෛය විටයංකළෛප් පේසුවේන් එන්රු කූරි, විටෛපෙරුකින්රේන්. නන්රි, වණක්කම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්ඩලික පිරිතිත් නියෝජිතයා)
(The Hon. Deputy Chairperson)
ගරු ටී.බී. සරත් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.24]

ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික ඊ.පි. සරත් - වීටමෛප්පුප් පිරති අමෛච්චර්)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදයේදී අත්‍යවශ්‍ය කරුණු ගණනාවක් මතු කරන්න මම බලාපොරොත්තු වනවා.

විපක්ෂය පැත්තෙන් කරුණු මතු කිරීමේදී කියා සිටියා, පසුගිය කාලයේ ඇති වුණු ගංවතුර තත්ත්වය නිසා හානියට පත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අක්කර 1,200ක් සඳහා තවමත් වන්දි මුදල් ලබා දීලා නැහැ කියලා. එතුමන්ලාට ලැබිලා තිබෙන්නේ වැරදි තොරතුරක්. අපි අක්කර 9,058.9ක් වෙනුවෙන් ගොවීන් 6,234කට රුපියල් මිලියන 103.2ක වන්දි මුදලක් ලබා දීලා තිබෙනවා.

ඉතිහාසයේ පළමුවන වතාවට තමයි, වගා හානියක් වෙලා මාසයක් ඇතුළත ආණ්ඩුවක් මෙහෙම වන්දි මුදල් ගෙවලා තිබෙන්නේ. මම විපක්ෂයට අභියෝග කරනවා, පසුගිය වසර 20ක කාල පරිච්ඡේදය ඇතුළේ මේ විධියට වන්දි ගෙව්වා කියලා පුළුවන් නම් මේ ගරු සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා. එතුමන්ලාට එහෙම වාර්තාවක් ඉදිරිපත් කරන්න බැහැ. අපි ගොවි සටන්වල හිටපු නායකයෝ. අපි හැමදාම ඒ ගොවි සටන් කළේ ඇයි? කිසියම් කන්නයකට ගංවතුරෙන් හානි වුණාම, ඒ වන්දිය අපි ඊට පසුව නියහයක් ආ වෙලාවේදීත් ඉල්ලනවා. හැබැයි, එතකොට නියහයෙනුත් වගා හානි සිද්ධ වෙන වෙලාව. අවුරුදු ගණන් පහු වෙලාත් වගා හානි වෙනුවෙන් වන්දි ඉල්ලා අපි සටන් කළා. ඒ නිසා විපක්ෂය මේ විවාදයේදී ඉදිරිපත් කරන සමහර කරුණු අපි සැලකිල්ලට ගන්නවා වාගේම, සමහර අසත්‍ය කරුණු නම් අපි සැලකිල්ලට ගන්නේ නැහැ. ඒ නිසා මේ වෙලාවේ දේශපාලන වාසි තකා මේ ගරු සභාවට අසත්‍ය කරුණු ප්‍රකාශ කරන්න එපා කියා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, වී සඳහා සාධාරණ මිලක් ලබා දීම සම්බන්ධයෙන් පසුගිය කාලයේ නාමල් කරුණාරත්න සහෝදරයා ඇතුළු අපි ගොවි සංවිධාන විධියට සටන් කරද්දී එකම එක කන්නයකයි වී කිලෝවකට රුපියල් 150ක් ඉල්ලුවේ. හැබැයි, ඒ කන්නයේදී ගොවියෝ පොහොර මිටියකට රුපියල් 40,000ක් වියදම් කරලා තමයි නිෂ්පාදනයට දායක වුණේ. අන්න ඒ කන්නයේදී අපි වී කිලෝවකට රුපියල් 150ක් ඉල්ලුවා. හැබැයි, එදා අපි හිටපු සටන් පාඨය මොකක්ද? අපි හැමදාම හිටපු සටන් පාඨය තමයි, සෑම කන්නයකදීම හෙක්ටර් කොඹ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයෙන් නිෂ්පාදන වියදම ගණනය කරලා, ඒ එන නිෂ්පාදන වියදම තුනෙන් බෙදලා, ඒ එන එක කොටසක් ලාභයට එකතු කරන්න ඕනෑය කියන එක. උදාහරණයකට, නිෂ්පාදන වියදම රුපියල් 90 නම්, ඒක තුනෙන් බෙදුවාට පස්සේ රුපියල් 30යි, ඒක එකතු වෙලා එන්න ඕනෑ ලාභයට කියන එකයි එදා අපි කිව්වේ. ගොවියාගේ ජීවිතය සුරක්ෂිත කිරීමට එහෙම මුදලක් ලැබෙන්න ඕනෑය කියන ස්ථාවරයේ තමයි අපි එදාත් හිටියේ. ඒ තමයි, අවමය. තව ඊට වඩා ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. නමුත්, ඒක තමයි අවමය. මේ කන්නයේත් අපි වී මිල තීන්දු කරලා තිබෙනවා. හෙක්ටර් කොඹ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය ඇතුළු මේ සඳහා සම්බන්ධ වන සියලු ආයතන විසින් වී කිලෝවක නිෂ්පාදන වියදම ගණනය කරලා තිබෙනවා, රුපියල් 87යි කියලා. ඒක අපි රුපියල් 90යි, කියමුකෝ. රුපියල් 90 තුනෙන් බෙදුවාම, රුපියල් 30යි, ඒකට ලාභය එකතු කරලා රුපියල් 120ක් දීලා

[ගරු ටී.බී. සරත් මහතා]

තිබෙනවා. එතකොට රුපියල් 120 තමයි අවම මිල. ඊට උපරිම මිලකට වී මිලදී ගන්න පුළුවන් ඕනෑම පෞද්ගලික ආයතනයකට අපි වී මිලදී ගැනීමේ අවස්ථාව උදා කරලා තිබෙනවා. අපි ඒගොල්ලන්ට බාධා කරලා නැහැ. ඉතිහාසයේ පළමුවැනි වතාවට ගොවිබිමවල ගොවියෝ කියනවා, මේ තමයි ඔවුන් ලබපු ඉහළම ආදායම කියලා. ඒක ගොවි ජනතාවගේ මතය. විපක්ෂය ඒ ගැන සතුටු වෙන්නේ නැති බව අපි දන්නවා. විපක්ෂය කොහොමත් සතුටු වෙන්නේ නැහැ නේ; විපක්ෂයට සතුටු වෙන්න බැහැ නේ ඒකට. ඒ නිසා ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි, එවැනි මුදලක් ගොවි ජනතාවට මේ කන්නයේ ලැබෙමින් තිබෙන්නේ. ඒක හොඳම එක කියලා අපි කියන්නේ නැහැ. නමුත්, මේ මොහොතේ තිබෙන යථාර්ථයට අනුව ගොවි ජනතාවගේ ප්‍රශ්නය විසඳන්න අපි මැදිහත් වෙමින් සිටිනවා. මහා භාණ්ඩාගාරයේ තිබෙන මුදල් ප්‍රමාණයත් අනුව, ඒ වාගේම අනෙකුත් භෞතික සාධක සියල්ලට සාපේක්ෂව මේ වෙලාවේදී අපට දෙන්න පුළුවන් ඉහළම මිල ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම පොහොර සහනාධාරය සඳහා වෙන් කරපු මුදල ප්‍රමාණවත් නැහැ කියනවා. පොහොර සහනාධාරය සඳහා ගිය කන්නයේදී රුපියල් බිලියන 18කට ආසන්න මුදලක් අපි ලබා දීලා තිබෙනවා. මාස් කන්නයේ ප්‍රමාණයම යල කන්නයේ වගා වෙන්නේ නැහැ. අපි රුපියල් බිලියන 35ක් වෙන් කරලා තිබෙනවා. රුපියල් බිලියන 54ක් වෙන් කරලා, රුපියල් බිලියන 18ක් වියදම් වුණා නම්, අනිවාර්යයෙන්ම ඒක පිළිබඳව නැවත සොයා බලන්න ඕනෑ, ඉතිරි ඒවා කොහේටද ගියේ කියලා. අපි මේ කන්නයේ වී වගා කරන සෑම ගොවියෙකුටම පොහොර සහනාධාරය ලබා දුන්නා. ඒ සඳහා ගියේ රුපියල් බිලියන 18ක් නම්, රුපියල් බිලියන 54ක් වියදම් වුණේ මොනවාටද කියා සොයා බලන්න ඕනෑ.

නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් හොයා බලන්න ඕනෑ, තමන් නියෝජ්‍ය ඇමති වශයෙන් සිටින කාලයේ රුපියල් බිලියන 54ක් වියදම් වුණේ මොනවාටද කියලා. අපි හොයා බලමු, එවැනි මුදල් ප්‍රමාණයක් වියදම් වුණේ කොහොමද කියලා. අපේ රටේ කෘෂි කර්මාන්තය නඟාසිටුවීම සඳහා වන අපේ ප්‍රධානම අරමුණ තමයි, පළමුවැනි වසර තුන ඇතුළත ගොවි ජනතාව විධියට වස විස නැති ආහාර වේලක් මේ රටේ පොදු ජනතාවට ලබා දෙන්නේ කොහොමද කියන එක. ඒ වෙනුවෙන් ගොවි ජනතාව මෙහෙයවන එක තමයි අපේ ආණ්ඩුවේ පළමු වසර දෙක, තුන ඇතුළත අපට තිබෙන අභියෝගය. අපේ රටේ වස විසෙන් පිරුණු කෘෂි කර්මාන්තයක් තිබෙන්නේ. ඒක වස විස නැති කෘෂි කර්මාන්තයක් බවට පත් කරන්නේ කොහොමද, ඒ වෙනුවෙන් තිබෙන අපේ පර්යේෂණ මොනවාද, ඒ වෙනුවෙන් මොකක්ද අපි කරන්නේ? ඉදිරියේදී අපේ රටේ ගොවියා තමන්ගේ ගොවි බිමට කෘමිනාශක, වල්නාශක, දිලීරනාශක පාවිච්චි කරනකොට ඒක දැනුම තිබෙන නිලධාරියෙක් විසින් සහතික කරන්න ඕනෑ. අපි සාමාන්‍යයෙන් වෛද්‍යවරයෙක් ළඟට ගිහිල්ලා බෙහෙත්-හේත් ටිකක් ගන්නකොට වෛද්‍යවරයා සහතික කළේ නැත්නම් අපිට ෆාමසියෙන් ඒ බෙහෙත් දෙන්නේ නැහැ. කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේදීත් අපි එවැනි තැනකට යන්න ඕනෑ. වස විසෙන් තොර කෘෂි කර්මාන්තයක් හදන්න නම් කෘෂි කර්මාන්තයට එකතු කරන කෘමිනාශක, දිලීරනාශක, වල්නාශක කියන ඒවා යොදන්න ඕනෑද, නැද්ද, මේ කෘමියාට මේ කෘමිනාශකය යොදන්න ඕනෑද, නැද්ද කියන එක සහතික කරන නිලධාරියෙක් සිටින්න ඕනෑ. අන්න එතැනට අපි කෘෂි කර්මාන්තය පරිවර්තනය කරනවා.

අපේ රටේ කෘෂි කර්මාන්තයේ නියැළෙන ගොවියා මුහුණ දෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි, බීජ පිළිබඳ ප්‍රශ්නය. ඔවුන්ට සහතික කරපු, වැඩිදියුණු කළ බීජ ටිකක් ගන්න අපේ රටේ හරියට ආයතනයක් නැහැ. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ කථාවලදී මතු වුණා, අපි බීජ පර්යේෂණ ක්‍රියාවලියට දායක වෙන්නේ නැහැ කියලා. ඒ නිසා අපි මේ වතාවේ බීජ පර්යේෂණ කරන ගොවිපළවල් 29ක බීජ පර්යේෂණ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. පොළොන්නරුවේ, අරලගංවිල බීජ ගොවිපළේ මේ මොහොත වනවිටත් ඊළඟ කන්නය සඳහා බීජ වැපිරීම ආරම්භ කරලා තිබෙනවා. රුපියල් බිලියන 1.2ක් වෙන් කරලා තිබෙනවා, බීජ පර්යේෂණයට. අපි ඉදිරි කන්නයේ මෙට්‍රික්ටොන් 40,000කට වැඩි ප්‍රමාණයක බිත්තර වී හදන්න අවශ්‍ය කරන ප්‍රතිපාදන වෙන් කරලා එහි වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම, අනෙකුත් බීජ වර්ග ටොන් 700කට වඩා නිෂ්පාදනය කරන්න අපි වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. එමෙන්ම නව බීජ නිෂ්පාදනය සඳහාත් අපි වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම, සියලු කෘෂි කාර්මික නිෂ්පාදනයන් අගය එකතු කළ කර්මාන්ත බවට පත් කරන්න අපි රුපියල් මිලියන 2,000කට වඩා වෙන් කරලා තිබෙනවා. ලෝක බැංකුවෙන් රුපියල් මිලියන 600කුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් රුපියල් මිලියන 600කුත්, මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,200කුත් විධියට අපි රුපියල් මිලියන 2,400ක් වෙන් කරලා තිබෙනවා, කෘෂි කාර්මික භාණ්ඩවලට අගය එකතු කිරීමේ කර්මාන්ත දක්වා යන්න.

ඊළඟට, ප්‍රවාහන පද්ධතිය දියුණු කරන්න, වෙළෙඳ පොළ තුළ සාධාරණ මිලක් ලබා දීම සඳහා කටයුතු කරන්න, නවීන තාක්ෂණය කෘෂි කර්මාන්තයට එකතු කරන්න, ඉදිරි කන්නයේ අපේ රටේ තරුණ ගොවි ව්‍යාපාර හදන්න, ගොවි සංවිධාන වාගේම සමුපකාර ගොවි සමිති හදන්න අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා.

අද අපේ රටට බඩ ඉරිහු ගෙන්වනවා. ඒ සඳහා වසරකට ඇමෙරිකානු ඩොලර් මිලියන 120කට වඩා වියදම් වෙනවා. අපි ඉදිරි කන්න දෙක ඇතුළත ලංකාවේ බඩ ඉරිහු අවශ්‍යතාව සම්පූර්ණ කරන්න අවශ්‍ය කරන වැඩකටයුතු හදලා තිබෙනවා. ඒ යටතේ බඩ ඉරිහු වගාව පෝෂණය කරන්න, සංවර්ධනය කරන්න අවශ්‍ය කරන මුදල් වෙන් කරලා තිබෙනවා. හෙක්ටෙයාර 30,000කට ආසන්න නව බඩ ඉරිහු වගාවක් ආරම්භ කරන්නත් අපි මේ මොහොතේ භූමි සකස් කරමින් ඉන්නවා. ඒ අනුව කෘෂි කර්මාන්තයේදී හැම පැත්තකින්ම ගොවියා මුහුණ දෙන මේ ඇත්ත, සාධාරණ ගැටලුවලට අවශ්‍ය පිළියම් යොදන්න අපි කටයුතු කරමින් ඉන්නවා. බහුතරයක් ගොවි ජනතාව මේ ආණ්ඩුව බලයට ගේන්න වාගේම ඇත්ත ගොවි නායකයෝ මේ පාර්ලිමේන්තුවට ගේන්නත් විශාල බලාපොරොත්තුවකින් යුතුව කටයුතු කළා. ඔවුන් ඒ ජයග්‍රහණය අත්පත් කරලා දුන්නා. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියනවා, මේ රටේ ගොවි ජනතාවගේ ස්වර්ණමය යුගය ඉදිරි අවුරුදු පහ ඇතුළත උදා කරන බව. ඒ වෙනුවෙන් අවශ්‍ය කරන මුදල් වෙන් කරලා ගොවි ජනතාව ඒ ස්වර්ණමය යුගයට රැගෙන යන්නත්, මේ රටේ දෙකෝටි විසිලක්ෂයක් වන සාතිශය බහුතරයක් ජනතාවට සුරක්ෂිත ආහාර වේලක් ලබා දෙන්න අපි අනිවාර්යයෙන් කටයුතු කරන බවත් සඳහන් කරමින් මගේ කථාව මම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.36]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මේ වෙලාවේ ගරු ඇමතිතුමා සභාවේ ඉන්නවා. මාර්තු 15වැනි දා රිළවු ගණන් කිරීම කොහොමද කරන්නේ, මගේ ගෙවත්තේ ඒ වැඩේ කොහොමද කරන්නේ, මේ සත්තු එහාට මෙහාට පනින නිසා කණ්ඩායමක් එකතු කරගෙන අලුත් ක්‍රමයකට මේ වැඩේ කොහොමද හරියට කරලා දෙන්නේ කියලා තමයි මම මේ කල්පනා කරමින් හිටියේ.

අද කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වවන ස්වල්පයක් කථා කරන එක ඉතාම වැදගත්. ගරු කෘෂිකර්ම ඇමතිතුමා මේ ගරු සභාවේ හිටියා. නමුත් එතුමා දැන් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හරි එතුමාට මම මේ මතු කරන කාරණය ගැන කියන්න. මම අද කථා කරන්නේ ජාතික තලයේ ප්‍රශ්නයක් ගැන නොවෙයි. එය මගේ දිස්ත්‍රික්කයට අදාළ වන ප්‍රශ්නයක්. මගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. අපේ දිස්ත්‍රික්කයේ යටියන්තොට, දැරණියගල මැතිවරණ කොට්ඨාසයේ ප්‍රශ්නයක් ඇති වුණා, වාරිමාර්ග අමාත්‍යාංශය එක්ක. වාරිමාර්ග අමාත්‍යාංශය දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු-අදියර ව්‍යාපෘතියක් ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරලා, පසුගිය අවුරුදු කිහිපය තුළම එය ක්‍රියාත්මක කරන්න සූදානම් කරලා තිබුණා. ඒ තමයි, යටියන්තොට වී ඔය ජලාශය සකස් කිරීමේ ව්‍යාපෘතිය. මෙම ව්‍යාපෘතිය ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් කරන ව්‍යාපෘතියක්. වී ඔය ජලාශ ව්‍යාපෘතිය හරහා ඒ ප්‍රදේශය අවට ජීවත් වන ගම්වාසීන්ට - ප්‍රජාවට - තමන්ගේ ජීවන මාර්ගවලට, දේපළවලට සිදු වන අලාභය පිළිබඳව ලොකු ගැටලුවක් ඇති වෙලා තිබුණා. අපි පසුගිය කාලයේ දිගටම මේ වෙනුවෙන් මැදිහත් වුණා. ඊට අදාළ ඇමතිවරුන්ට කථා කළා. ඒගොල්ලන්ට කිසිම හානියක් නොවන විධියට වන්දි ගෙවලා, අලාභයක් සිදු නොවෙන්න කටයුතු කරන බවට ඒ වෙලාවේදී ඔවුන් තහවුරු කළා. හැබැයි, අමාත්‍යාංශයේ නිලධාරීන් එක්ක සාකච්ඡා කළාම ඔවුන් මේ ගම්වාසීන්ට -පවුල් 200කට වැඩි ප්‍රමාණයකට- විකල්ප ඉඩමක්, විකල්ප ආදායම් මාර්ගයක් දෙනවා කියන එක ගැන කථා කරන්නේ නැහැ. ඒ වාගේම ව්‍යාපෘතියේ ප්‍රගතිය ගැන කථා කරන්නේත් නැහැ. මේ ව්‍යාපෘතිය හරහා ඔවුන්ට ආර්ථික, සංස්කෘතික, සමාජයීය බලපෑම් සිදු වෙන්න පුළුවන්. මොකද, දැන් ඒගොල්ලන් අස්ථාවරයි. ඒගොල්ලන්ට තිබෙන ඉඩමේ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් වගාවක් කරන්න බැහැ. මොකද, හෙට මේ ඉඩම් ටික පවරා ගනීද, නැද්ද කියලා දන්නේත් නැහැ. ඒ නිසා ඒගොල්ලන්ට ඉඩම් දියුණු කරන්නත් බැහැ. එතකොට මේක සාධාරණ නැහැ. මේ ව්‍යාපෘතිය කරනවා නම් මේ ප්‍රශ්න අවම කිරීම සඳහා කටයුතු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. මොකද, ලෝක බැංකුව මුදලුත් වෙන් කරලා තිබෙනවා නම් මේ ගැන සාකච්ඡා කරලා නිලධාරීන්ට නියෝග ලබා දෙන්න. මේ ගම්මුන්ට මොකක්ද කරන්න යන්නේ, ඉඩම් දෙනවාද, ඒගොල්ලන්ට විකල්ප ආදායම් මාර්ග ලබා දෙනවාද, ඒගොල්ලන් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය, වියදම දෙනවාද කියන එක සම්බන්ධයෙන් විශේෂයෙන්ම ඔවුන් දැනුවත් කරන එක ඉතා වැදගත්. ඒ වාගේම වන්දි ගෙවීමේ ක්‍රමවේදය ගැන දැනුවත් කිරීම වැදගත්.

ඒ වාගේම එක වෙලාවක ඒ නිලධාරීන් කියලා තිබුණා, ජනතා වතු සංවර්ධන මණ්ඩලය - JEDB එක - අදාළ වතුවලින් අවශ්‍ය තේ වගා කරන ඉඩම් ටික ලබා දෙනවාය කියලා. මොකද, මෙතැන පදිංචි වෙලා ඉන්න ගම්වාසීන්ගෙන් බහුතරයක් කුඩා තේ වතු හිමියන්. ඔවුන්ට තිබෙනවා, අක්කර දෙක තුනක වාගේ කුඩා තේ වතු. මේ ඉඩම් ටික නැති වෙලා මේ අයට මුඩු ඉඩමක් දුන්නාට වැඩක් වෙන්නේ නැහැ. එහෙනම් ඒ හා සාපේක්ෂව හොඳ ඉඩම් ටිකක් මේගොල්ලන්ට ලබා දිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

දැන් තවත් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඔය පැත්තේ නිලධාරීන් කියලා තිබෙනවා, මේ මාසය තුළ එම ව්‍යාපෘතිය කරන්නේ නැහැ කියලා. මම ගරු ඇමතිතුමාගෙන් අහන ප්‍රශ්නය මෙයයි. මේ ව්‍යාපෘතිය කරනවාද, කරනවා නම් කවදාද එය කරන්නේ, නොකරනවා නම් ඒ ගැන දැනුවත් කරන්න. මොකද, මේ නිසා මෙම මිනිසුන්ගේ ජීවිතය බොහොම අස්ථාවර තත්ත්වයකයි තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.40]

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම අය වැය කාරක සභා අවස්ථාවේ වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂය පිළිබඳව කෙරෙන විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව කරුණු කාරණා රාශියක් කියන්න තිබුණත්, කාල වේලාවත් කළමනාකරණය කරගෙන අත්‍යවශ්‍ය කාරණයක් පිළිබඳව මතක් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

මේ ආණ්ඩුව බලයට පත් වුණු අවස්ථාවේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් හැටියට වනසතුන්ගෙන් සිදුවන වගා හානි සම්බන්ධව දැඩි අවධානයක් යොමු කරනවා කියලා ඒ දවස්වල කථා කළා. ආණ්ඩුව බලයට පත් වුණු මුල් දවස්වල රිළවුන් ගහනය අඩු කරන්න රිළවුන් අල්ලා වෙනත් තැන්වලට ගිහින් භාර දෙන්න යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. නමුත් මේ වනවිට ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඊයේ පෙරේදා, ගරු අමාත්‍යතුමා නිවේදනයක් කළා, වගාවට හානි කරන වනසතුන් සම්බන්ධව සංගණනයක් කරන්න කටයුතු කරනවා කියලා. ඒ සත්ව සංගණනයෙන් යම්කිසි ප්‍රයෝජනයක්, එහෙම නැත්නම් වගා හානියට යම්කිසි ක්ෂණික විසඳුමක් ලබා දෙන්න පුළුවන්කමක් ලැබෙයිද කියලා අපට කියන්න හැකියාවක් නැහැ.

ගරු ඇමතිතුමනි, 2015 සිට 2020 දක්වා පැවැති ආණ්ඩුවේ මමත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළා. සමහරවිට ඔබතුමන්ලා කල්පනා කරන්න ඇති, අපේ කාල සීමාවේ මේ ප්‍රශ්නයට විසඳුමක් දුන්නේ නැහැ නේද කියලා. 2015 සිට 2019 දක්වා කාලයේ මම කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වෙලා හිටියා. කෑගල්ල දිස්ත්‍රික්කය තමයි මේකෙන් වැඩියෙන්ම වගා හානියට ලක් වෙන ප්‍රදේශය හැටියට

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

තිබෙන්නේ. අනෙක් දිස්ත්‍රික්කවලත් මේ තත්ත්වය තිබෙනවා. නමුත් කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩි වශයෙන් තිබෙනවා. ඒ කාලයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්වතුන් කණ්ඩායමක් ඇවිත් අපට මේ සම්බන්ධව උපදෙස් මාලාවක් දුන්නා. ගරු ඇමතිතුමනි, ඒ උපදෙස් මාලාවේ ප්‍රධාන වශයෙන් කිව්වේ මෙයට විසඳුමක් වශයෙන් අනිවාර්යයෙන් මේ සතුන් වන්ධ්‍යාකරණයට ලක් කරන්න ඕනෑය කියන එකයි. ඒක පළමුවැනි කාරණාව. ඒ අය තව කාරණයක් මතු කළා. එනම්, ඒ සතුන් වෙනත් සුදුසු ප්‍රදේශවලට ගෙන ගොස් මුදා හරින්න යෝජනා කළා. මේ කාර්යය කරන්න ලොකු පිරිවැයක් දරන්න වෙනවා. ඒ නිසා තමයි හුහක් අවස්ථාවලදී ඒ සම්බන්ධව දිගින් දිගට ක්‍රියාත්මක වුණේ නැත්තේ. නමුත් මම කියන්නේ මේ සතුන් සිදු කරන වගා හානිය දෙස බලනකොට, මේකට යම්කිසි පිරිවැයක් දැරුවත් කමක් නැහැ, වර්තමාන රජයේ ඔබතුමන්ලා හෝ මේ කාර්යය ඉටු කරන්න කියායි. මේ සමීක්ෂණ, සංගණන කරනවාට වඩා ඒක හොඳයි.

මම දැක්කා ඊයේ "අරුණ" පුවත් පතේ තිබෙනවා, වාර්ෂිකව පොල් ගෙඩි මිලියන 100ක් විතර රිළවුන් නිසා අපට අහිමි වෙනවා කියලා. ඒ වාගේම අනෙකුත් වගාවලටත් මේ සතුන්ගෙන් බලපෑම් ඇති වෙනවා කියලා අපි දන්නවා. සමස්තයක් වශයෙන් ගත්තාම සිදුවන පාඩුව රුපියල් බිලියන ගණනක් වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මේකට යම්කිසි පිරිවැයක් දරලා, අඩුම තරමින් රිළවෙකු අල්ලා දෙන කෙනෙකුට රුපියල් 500ක්, 1,000ක්වත් දෙනවා කියලා හෝ මේ සතුන් අල්ලා කූඩු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එහෙම නැතිව වෙන කරන්න දෙයක් නැහැ. අපට මේ සතුන් සංහාරයට ලක් කරන්න පුළුවන්කමකුත් නැහැ, ගරු ඇමතිතුමනි. එහෙම කරන්න ගියොත් පරිසර සංවිධාන, අනෙක් අය මේකට විරුද්ධව නැඟී සිටිනවා. වන්ධ්‍යාකරණය කිරීම වුණත්, විශාල මුදලක් වැය කරන්න පුළුවන් නම්, දිගු කාලීනව බලනකොට පාඩු නැහැ. මේ කටයුත්ත කවුරුවත් කළේ නැහැ. අපේ ආණ්ඩුව කාලයේ වුණෙත් නැහැ. පසුගිය ආණ්ඩුව කාලසීමාව තුළත් එහෙමයි. හැමදාම කථා කළා විතරයි. මේ කටයුත්ත කරන්නේ නැතිව ඔබතුමන්ලා කරන්න බලාපොරොත්තු වන කෘෂිකර්මය නඟා සිටුවීමේ වැඩ පිළිවෙළ, ගෙවතු වගාව නඟා සිටුවීමේ වැඩ පිළිවෙළ කවදාවත් ඔබතුමන්ලාට ක්‍රියාත්මක කරන්න ලැබෙන්නේ නැහැ කියන එක තමයි මට මේ අවස්ථාවේ කියන්න තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, කාල වේලාව නැතිව වුණත් මේ අවස්ථාවේ ඉඩම් ප්‍රශ්නය සම්බන්ධවත් කථා කරන්න ඕනෑ. ඉඩම් කියන්නේ ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයට අයත් ප්‍රධානම අංශයක්. ඉඩම් අමාත්‍යාංශය ගත්තොත්, ඔප්පු ලබාදීම සම්බන්ධව අද්දත් නොවිසඳුණු කරුණු කාරණා රාශියක් තිබෙනවා. ඉඩම් සම්බන්ධව ගත්තාම වන සංරක්ෂණයට අයිති ඉඩම්, ඒ වාගේම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති පරිසර සංවේදී ඉඩම් රාශියක් තිබෙනවා, මම නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ දැරණියගල සහ කෑගල්ලේ. අනෙක් ප්‍රදේශවලත් එවැනි ඉඩම් තිබෙනවා. නමුත් මේ ඉඩම් ආරක්ෂා කිරීම සම්බන්ධව වැඩ පිළිවෙළක් නැහැ. පසුගිය දවස්වල අපි දැක්කා, සංචාරක ව්‍යාපාරයට මුවා වෙලා පරිසරයට සම්බන්ධ ලස්සන ඉඩම් ටික මොනයම් හෝ ආකාරයකින් අල්ලා ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණු බව. පසුගිය ආණ්ඩුව කාලයෙත් ඒක වුණා. විවිධ දේශපාලන බලපෑම් එහෙමත් තිබුණා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. අපි පරිසරය ආරක්ෂා කරගන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරය දියුණු වෙන්නත් ඕනෑ. ඒක ඇත්ත. නමුත් පරිසර සංවේදී කලාපවල තිබෙන ඉඩම් ටික ආරක්ෂා කරගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ඉඩම් ටික හඳුනා ගනිමු; identify කර ගනිමු. පරිසර සංවේදී කලාප ටික identify කර ගනිමු. නීතියක් තිබෙනවා ගරු ඇමතිතුමනි, LRC එකට හිතුමතේ ඉඩම් දෙන්න පුළුවන් කියලා. LRC එකට අදාළ නැහැ, මේවා පරිසරයට සංවේදී කලාප ද, පරිසරයට හිතැති කලාප ද කියලා. ඒගොල්ලන්ට තිබෙන නීතිමය බලතල අනුව කාට හරි කමක් නැහැ, ඉල්ලුවොත් ලබා දීමේ හැකියාව තිබෙනවා. ඒකට නීතිමය බාධාවක් නැහැ. නමුත් අපි මේ ඉඩම් ටික හඳුනාගෙන, ඒවා ගැසට් කරලා, මේවාට අත තියන්න පුළුවන්කමක් නැති විධියට මේවා ආරක්ෂා කරගත යුතුයි. මේ ඉඩම් ටික මතු පරම්පරාව වෙනුවෙන් අපි රැකගන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. ඒ නිසා ඔබතුමාගේ අවධානය කඩිනමින් ඒ සම්බන්ධව යොමු කරන්න.

විශේෂයෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයටත් අයිති ඉඩම් තිබෙනවා. එකක් තමයි යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ නාගස්තැන්න, කන්දල්ඔය වත්ත කියන එක. ඔබතුමා මේ පිළිබඳව සටහන් කර ගත්තොත් හොඳයි. ගරු ඇමතිතුමනි, මේ කන්දල්ඔය කියන වත්තට අක්කර 1,001ක් අයිතියි. අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ; සුදු මහත්වරුන් වතු පාලනය කළ කාලයේ ඒ වත්තේ තනිකරම එනසාල් තමයි වගා කර තිබෙන්නේ. පසුව එම වගා කටයුතු අත හැරලා. දැන් වනවිට එය හොඳ කැලෑ ප්‍රදේශයක් බවට පත් වෙලා තිබෙනවා, ඇත්තටම පරිසරයට හිතෛෂී ප්‍රදේශයක් හැටියට. නමුත් අපි දන්නවා, ජනතා වතු සංවර්ධන මණ්ඩලයටත් නීතිමය ප්‍රශ්නයක් නැහැ, කාට හෝ මේක බදු දෙන්න ඒගොල්ලන්ට ඕනෑ නම්, එහෙම නැත්නම් වෙනත් දෙයකට දෙන්න ඒගොල්ලන්ට ඉඩකඩ තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ඉඩම ගැනත් බලන්න කියලා. මොකද, ජනවසමට හෝ මොකකට අයිති වෙලා තිබුණා වුණත්, අවසානයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව තමයි ඒවායේ සැබෑ අයිතිකාරයා වන්නේ, 1972 පැනවූ නීතිය අනුව. ඒ නිසා ඒ සම්බන්ධව මැදිහත්වීමේ හැකියාවක් ඔබතුමාට තිබෙනවා. ගරු ඇමතිතුමනි, නාගස්තැන්න, කන්දල්ඔය වත්තේ යක්දෙස්ස කොටස කියලා සටහන් කර ගත්තා නම්, මේ සම්බන්ධව සොයා බලන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, තව කාරණයක් කියන්න ඕනෑ. අපේ ගරු කබීර් හෂීම් මැතිතුමා සඳහන් කළේත් ඉතාම වැදගත් ප්‍රශ්නයක් ගැන. ඒක, මම නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ කාරණයක්. මම හිතන විධියට මෙම යෝජනාව ඉදිරිපත් වුණේ 2016 වසරේදී. ඒ කාලයේ මංගල සමරවීර මහත්මයා අය වැය වාර්තාවෙන් යෝජනා කර තිබුණා, ජලාශ කිහිපයක්ම. එකක් තමයි වී ඔය ජලාශය. අනෙක, යටියන්තොට නවට ජලාශය. ඒ වාගේම හොලොම්බුව කියලා ජලාශයකුත්, දැරණියගල upper කොටසේ ජලාශයත් වශයෙන් ජලාශ 4ක් යෝජනා කර තිබුණා. පරිසර හානි අවම කරන්නත්, ගංවතුර උවදුර පාලනය කරන්නත්, කොළඹ ප්‍රදේශයට අවශ්‍ය කරන පානීය ජලය ලබා දීම සඳහාත් වන ව්‍යාපෘතියක් හැටියටත් තමයි ලෝක බැංකු ආධාර යටතේ එම ව්‍යාපෘතිය ආරම්භ කරන්න කටයුතු කර තිබුණේ. මම හිතන විධියට මේ වෙනකොට එම ව්‍යාපෘතිය යෝජනා කර අවුරුදු 8කට වැඩි කාල සීමාවක් ගත වී තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ සම්බන්ධයෙන් වුණු සාකච්ඡාවලට විවිධ රජයන් යටතේ මමත්, කබීර් හෂීම් මැතිතුමාත්, ඒ වාගේම වෙනත් ඇමතිවරුත් සම්බන්ධ වුණා. එහෙම වුණත්, අද්දත් තවම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවාද, නැද්ද කියන එක ගැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. වී ඔය ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා නම්, එම ප්‍රදේශයෙන් ප්‍රදේශවාසී පවුල් 300ක්, 400ක් විතර ඉවත් කරන්න තීරණය කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වුණා. නමුත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවාද, නැද්ද කියලා ජනතාව තවමත් දෙගිඩියාවෙන් ඉන්නේ.

අපට දැන ගන්න ලැබී තිබෙනවා, ඔබතුමන්ලාගේ පක්ෂයේම දේශපාලනඥයෝ කියලා තිබෙනවා, "අපි මේක ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ" කියලා. නමුත් සමහර වෙලාවට ප්‍රාදේශීය සභා මැතිවරණය එන නිසා එහෙම කිව්වාද කියලා දන්නේ නැහැ. මොකද, අපට මතකයි අපි බලයේ ඉන්නකොටත් ප්‍රාදේශීය සභා මැතිවරණය වෙලාවේ මේ යෝජනාව ආවා. එහෙම එනකොට එවකට ආණ්ඩුවේ හිටපු මැති ඇමතිවරු කිව්වේත් "අපි මේක ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ" කියලා. එහෙම කියලා ඡන්ද ව්‍යාපාරයට වාසියක් කර ගත්තා. මේකත් එවැනි වැඩ පිළිවෙළක්ද කියලා ජනතාව අතර සැකයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම නිසා මම කියන්නේ එවැනි තත්ත්වයක් ඇති කරන්නේ නැතුව මේක ක්‍රියාත්මක කරනවාද නැද්ද කියලා ස්ථාවරව කියන්න. මේ සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ ජනතාව බොහොම අමාරුවෙන් කැමති කරවාගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් තැනකට අපි ගෙනාවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මගේ කාලය අඩු කරන්නේ නැත්නම් ඔබතුමාට අවස්ථාව දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
කබීර් හෂීම් මැතිතුමාත් ඔය ප්‍රශ්නය නැඟුවා. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාත් එම ප්‍රශ්නය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළා. වී ඔය ජලාශය හදන එකට ඔබතුමන්ලා එකඟද? ඒක ක්‍රියාත්මක කරන්න කියලාද කියන්නේ?

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
එකඟතාව ලබා දුන් නිසා තමයි ඔය ව්‍යාපෘතිය ඔච්චර දුරට අරගෙන යන්න පුළුවන් වුණේ. සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නයි අපට ඕනෑ.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මම නම් කියන්නේ මේකයි. එම ව්‍යාපෘතියෙන් ප්‍රතිඵල ලැබෙන්නේ කැලණිය පැත්තට නේ. හැබැයි, කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට අසාධාරණයක් වෙනවා නම් අපි ඒකට එකඟ වෙන්නේ නැහැ. ඒ මිනිසුන්ගේ ඉඩම් ටික අරගෙන, ඒ මිනිසුන්ට ඉන්න තැනක් නැති වන ව්‍යාපෘතියක් කරනවා නම්, අනිවාර්යයෙන්ම අපි විරුද්ධ වෙනවා. ඒ අයට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ.

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
විවිධ අවස්ථාවලදී මේ සම්බන්ධව කථා කළා. ඒ ජනතාවට අවශ්‍ය කරන ඉඩම් ටික දෙන්න පොරොන්දු වුණා. ඒ වාගේම මෙය ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් නිසා විශේෂ ගණයේ ඇස්තමේන්තු සකස් කරලා අවශ්‍ය කරන වන්දි ටික ලබා දෙනවා කියලා පොරොන්දු වෙලා තිබෙනවා. ඉතින්, ඔබතුමන්ලා මේවා සම්බන්ධයෙන් කල්පනා කරලා බලන්න. මොකද, ඒ අය එකම ගමේ ඉන්න කට්ටිය. ගරු ඇමතිතුමනි, ඒ අය බලාපොරොත්තු වෙනවා, නාගස්තැන්න හෝ වෙන කොහේ හෝ ළඟ පාත වෙනත් වත්තකින් ඉඩම් ලබා දෙයි කියලා. මෙතුමා කිව්වා වාගේ කුඩා තේ වතු හිමියෝ තමයි වැඩි පිරිසක් ඉන්නේ. ඒගොල්ලන් කැමැතියි, තමන්ට අවශ්‍ය ඉඩම් ටික එක තැනකින් ලබා දෙන එකට. මොකද, බොහෝ වෙලාවට ඥාතීන් ඉන්නේ. ඒ නිසා එක ස්ථානයකට ගිහිල්ලා පදිංචි වෙන්න ඒ අය කැමැතියි. එවැනි වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ අය මේකට විරුද්ධ වෙන්නේ නැහැ. මුලදී විරුද්ධ වෙලා සිටියා. ඒ වාගේම ඒ කාලයේ හිටපු දේශපාලනඥයෝ ඔවුන්ව ඇවිස්සුවා. අවුස්සලා දේශපාලන වාසි ගන්න හැදුවා. අපි එහෙම කරන්නේ නැහැ. ඔබතුමන්ලා මේ වැඩේ කරනවා නම්, අර මිනිසුන්ට සාධාරණයක් කරන්න. ඔබතුමන්ලාගේ දේශපාලනඥයෝ ගිහිල්ලා තමයි කියන්නේ, ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැ කියලා. එහෙම කියලා දේශපාලන වාසියක් ගන්න හදනවා. ඉතින් මම කියන්නේ, ඒ කටයුත්ත කරන්න ඉඩ දෙන්න එපා කියලායි. මේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ කාලයේ ඔබතුමන්ලා යම් යම් ව්‍යාපෘතිවලට විරුද්ධ වුණාට අපි ඒ මතයේ නැහැ. අපි කියන්නේ සංවර්ධන ව්‍යාපෘති, ගංවතුර පාලනය කරන ව්‍යාපෘති, පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියායි. ඒවා ක්‍රියාත්මක කරනකොට අපේ ජනතාවට කරදයක් නොවෙන්න, ඒ ජනතාවට අසාධාරණයක් නොවෙන්න, ඒ අයට නිසියාකාරයෙන් ඉඩ කඩම් ටික ලබා දීලා කටයුතු කරන්න ඕනෑ. ගරු ඇමතිතුමා ඒ ප්‍රදේශයට ඇවිල්ලා ඊට මැදිහත් වුණා නම් හොඳයි. ඒ කණ්ඩායම කැඳවලා ඔබතුමන්ලා සහතිකයක් දෙනවා නම්, ඒ සම්බන්ධයෙන් කිසි ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. ඒක කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්. වැඩිපුරත් විනාඩියක කාලයක් ලබා දුන්නා.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
හොඳයි, එහෙම නම් බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු මන්ත්‍රීතුමනි, වී ඔය ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න කියලා ඔබතුමා කිව්වා. නමුත්, කබීර් හෂීම් මන්ත්‍රීතුමා ඒක හරියට කිව්වේ නැහැ. වටේ ගිහිල්ලා වෙන වෙන දේවල් කිව්වේ. නමුත් මේකයි තත්ත්වය. වී ඔය ජලාශය සම්බන්ධයෙන් තත්ත්වය මගේ කථාවේදී කියන්නම්. වාරිමාර්ග ක්ෂේත්‍රය හා සම්බන්ධ bottlenecks ටිකක් තිබෙනවා. අපේ ප්‍රධාන අරමුණ එම bottlenecks ටික clear කරන එක. වී ඔය ජලාශය පිළිබඳ කාරණය එකක්. ඒ සම්බන්ධයෙන් විරෝධයක් තිබෙනවා. එතැන බැලූ බැල්මට පරිසර හානියක් සිද්ධවෙයි කියලා අපි හිතනවා. නමුත්, වගකිව යුතු රජයක් විධියට අපි ඒ ජනතාවත් එක්ක කථා කරලා, ජනතාවට සහන දීලා, ඔවුන්ව ඉවත් කරන්න ඕනෑ වුණොත් ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරලා තමයි එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. ඒක තමයි අපේ ප්‍රවේශය. එම ව්‍යාපෘතිය විතරක් නොවෙයි, රට පුරා ව්‍යාපෘති ගොඩක් තිබෙනවා. වැඩ අනපු ව්‍යාපෘතිත් තිබෙනවා. ඒ හැම එකකදීම ජනතාවගේ පැත්තෙන් බලලා සාධාරණත්වයෙන් යුතුව තමයි අපි කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්නේ. වී ඔය ව්‍යාපෘතියත් එහෙමයි. මේ වෙනකොට අපි සාකච්ඡා ගණනාවක් පවත්වලා තිබෙනවා.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම කියන්නේ, එහෙම නම් මේ ප්‍රශ්නයට අදාළ ජනතාව කැඳවලා ඔබතුමන්ලා ඒ වාගේ සහතිකයක් දෙන්න. ඒක කරන්නේ නැහැ නේ. සමහර වෙලාවට "මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ, අපි මේක ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ" කියලා ඔබතුමන්ලාගේ පාර්ශ්වයේම දේශපාලනඥයෝ ගිහිල්ලා කියන අවස්ථා තිබෙනවා. එම නිසා ජනතාවට ඒ ඉඩම්වල කිසිම වැඩක් කරන්න බැහැ, ඔවුන්ට නැවත වගාවක් කරන්න බැහැ, ඒ අයගේ ඉඩ කඩම් ටික දියුණු කර ගන්න හැකියාවක් නැහැ. එම නිසා ඔබතුමන්ලා සහතිකයක් දෙන්න, අවශ්‍ය කරන වන්දිය නියමානුකූලව දෙනවා, ඉඩකඩම් ටික හරියාකාරව ලබා දෙනවා, අසාධාරණයක් වෙන්නේ නැහැ කියලා. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවාද, නැද්ද කියලා හරියට කියන්න. එච්චරයි අපි බලාපොරොත්තු වෙන්නේ.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
එම කාරණය මතු කළාට බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඇත්තටම මම ඒකයි කියන්න උත්සාහ කළේ. මේ සම්බන්ධයෙන් විවාදයක් තිබෙනවා; විරෝධයක් තිබෙනවා; ජනතාවගේ අප්‍රසාදයක් තිබෙනවා. ඒ කියන්නේ, කලින් මේ වාගේ ක්‍රියාත්මක කරපු ව්‍යාපෘති ජනතාවට හිතකර මට්ටමින් නොව, ජනතාවට පීඩාවක් සහිතව තමයි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒ නිසා මෙහිදී අපි ජනතාව එක්ක කථා කරමින් හරිම සංවේදීව තමයි කටයුතු කරන්නේ. අපි රජයක් විධියට නැවත වී ඔය සම්බන්ධයෙන් පරිසර අධ්‍යයන වාර්තා ලබා ගනිමින්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අදහස් විමසමින් දැනට සාකච්ඡා කිහිපයක් පවත්වා තිබෙනවා. එහි ඊළඟ පියවර තමයි ජනතාව එක්ක සාකච්ඡා කරන එක. මා හිතන විධියට, ඒ ව්‍යාපෘතිය පිළිබඳව ජනතාව දැනුවත් කරලා තිබෙනවා. නැවත ජනතාව හමුවට ගිහින් සාකච්ඡා කරලා තමයි ඊළඟ පියවරට යන්නේ. ඒ කටයුතු ඒ ආකාරයට ක්‍රියාත්මක වෙයි. ජනතාව පීඩාවට පත් වන, පරිසරයට හානියක් සිදු වන බහුකාර්ය යෝජනාවක් හෝ වෙනත් කිසිදු ව්‍යාපෘතියක් අප ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන්නේ නැති බවට මම සහතිකයක් දෙන්නම්. ජනතාව ඒවාට සම්බන්ධ වෙන්න ඕනෑ. ඒ අදහසත් එක්ක තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.54]

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දවසේ අය වැය කාරක සභා අවස්ථාවේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයට සම්බන්ධ වන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. අපි උදේ ඉඳලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ උපදෙස්, ඒ වාගේම අනුශාසනා ගොඩක් අහගෙන හිටියා. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. අප හිතාගෙන හිටියා ඇත්ත වශයෙන්ම එතුමන්ලා ඒවා සම්බන්ධව දන්නේ නැතුව තමයි කටයුතු කළේ කියලා. දැන් අපට තේරෙන කාරණය තමයි එතුමන්ලා ඒවා ගැන දැනගෙනත් අවශ්‍ය කටයුතු කරලා නැහැ කියන එක. ඇත්ත වශයෙන්ම අපේ කෘෂි කර්මාන්තය කඩා දමපු, කලින් අපට උපදෙස් දීපු විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට මේ ප්‍රශ්නය ගෙදරදී විසඳන්න තිබුණා. උදාහරණයක් වශයෙන්, රසායනික පොහොර භාවිතය නවත්වපු වෙලාවේ අපි විශ්වවිද්‍යාලවල, පර්යේෂණ ආයතනවල ඒ සම්බන්ධව මහා විශාල අරගළයක් කළා, රටේ කෘෂි කර්මාන්තය සම්පූර්ණයෙන් කඩා වැටෙනවා කියලා. නමුත්, එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ එතුමන්ලාට ගෙදරදී තමන්ගේ බාප්පලාට, ඒ ඥාතීන්ට කියලා ඒ ප්‍රශ්නය විසඳන්න හැකියාව තිබියදීත් ඒක කරන්නේ නැතිව, කෘෂි කර්මාන්තය කඩාකප්පල් වුණාට පසුව, කෘෂිකර්මය වළ පල්ලට ගියාට පසුව, ඒ system එක වෙනස් කරපු අපට දැන් උපදෙස් දෙන එක ගැන අපි සතුටු වෙනවා.

ඇත්ත වශයෙන්ම අපි පොඩි කාලයේ, ඉස්කෝලේ ගිය කාලයේ ලංකාව හැඳින්වූයේ "කෘෂිකාර්මික රටක්" කියලා. ලංකාව කෘෂිකාර්මික රටක් යැයි කියන්න එදා බොහෝ හේතු තිබුණා. අපි බොහෝ ආහාරවලින් ස්වයංපෝෂණය වෙලා සිටියා. අපි ගොඩක් ආහාර ද්‍රව්‍ය පිට රටින් ගෙනාවේ නැහැ. රටේ ජනතාවගෙන් විශාල පිරිසක් කෘෂි කර්මාන්තයේ නියැළිලා ඉතාම ආඩම්බරකාරී, අභිමානවත් ගොවීන් විධියට ජීවිතය ගත කළා. හැබැයි, වුවමනාවෙන්ම ඒ ගොවීන්ගේ කකුලෙන් ඇදලා, ඒගොල්ලන්ගේ ජීවිත කඩා වට්ටලා, රසායනික පොහොර භාවිතය නතර කරලා, අනෙක් රසායනික ද්‍රව්‍ය භාවිතය ද නතර කරලා, කෘෂි කර්මාන්තයට විශාල වශයෙන් හානි කරලා, කෘෂි කර්මාන්තයේ යෙදී සිටින අයගේ අභිමානය නැති වන ආකාරයට

කටයුතු කළා. අද අපි ඉස්කෝලවල, විශ්වවිද්‍යාලවල දකිනවා, කෘෂිකර්ම ක්ෂේත්‍රයට දරුවන් එන්නේ නැති තත්ත්වයක්. මොකද, කෘෂි කර්මාන්තය කියන එක ඒ තරමට කොන් වෙච්ච, ආකර්ෂණය නොවන රස්සාවක් බවට පසු ගිය කාලයේ මේ රට පාලනය කළ පාලකයෝ පත් කළා. ඇත්ත වශයෙන්ම අපි දැන් ඒක වෙනස් කරලා තිබෙනවා. අපි ඒ system එක වෙනස් කරලායි තිබෙන්නේ. කලින් පැවැති system එක නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, අද අපට උපදෙස් දෙන විධියට කටයුතු කරන්න, ඒ උපදෙස් ක්‍රියාත්මක කරන්න ඒ කාලයේ බැරි වෙන්න ඇති. මා හිතන විධියට, මීට පසුවවත් ඒගොල්ලන්ට ඒක ක්‍රියාත්මක කරන්න බැරි වෙයි. මොකද, මේ system එක අනුව ඒක කරන්න බැහැ. අපි ඇත්ත වශයෙන්ම දැන් system change එකක් කරලායි තිබෙන්නේ. පැවැති ක්‍රමවේදය වෙනස් කරන්න හැකියාවක් තිබෙන, වුවමනාවක් තිබෙන, දැක්මක් තිබෙන කණ්ඩායමක් දැන් ඉන්නේ. ඒ කාලයේ අපි දැක්කා, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ තිබෙන ආයතන පුංචි පුංචි කොටස්වලට වෙන් කරලා තමන්ගේ හිතවතුන්ට, තමන්ගේ ඥාතීන්ට, එක් එක් හෙංචයියන්ට ඒවායේ අවස්ථා ලබා දීලා, කිසිම දැක්මක් නැති කට්ටිය ඒ ආයතනවල නායකයින් කරලා, ඒ ආයතන සම්පූර්ණයෙන් කඩා වැටෙන්න සලස්වපු හැටි. අපි දැන් ඒ ක්‍රමය වෙනස් කරලා තිබෙනවා. අපි කෘෂි කර්මාන්තය සම්බන්ධව තිබෙන ආයතනවලට ඒ කාර්යයන් කරන්න හැකියාවක් තිබෙන, දැනුමක් තිබෙන, දැක්මක් තිබෙන විශිෂ්ට පුද්ගලයන් පත් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා මේ ආයතන ව්‍යූහය හරහා කෙටි කාලයක් ඇතුළත කෘෂි කර්මාන්තය ගොඩ නඟන්න අපට පුළුවන් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අප දන්නා කාරණයක් තමයි, අප ආණ්ඩුව භාරගන්නා කාලය වනකොට -ගිය අවුරුද්ද වන කොට- කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයෙන් රටේ ජාතික ආදායමට සිදු කරන දායකත්වය සියයට 8ටත් වඩා පහළ බැස තිබුණා කියන එක. රටේ ජනගහනයෙන් සියයට 30ක් විතර කෘෂි කර්මාන්තයෙන් ජීවත් වුණා. අනෙක් රැකියා කරන අය එක්ක එකට පැහෙන්න බැරි මට්ටමේ දුප්පත්කමකට කෘෂි කර්මාන්තයේ යෙදෙන ජනතාව ඇද දමලායි තිබුණේ. අප කාලයක් තිස්සේ එක එක කෘෂි කර්මාන්ත යුග පහු කරගෙන ඇවිල්ලායි තිබෙන්නේ. දඩයම් යුගයේ ඉඳලා හේන් වගාවට ගිහිල්ලා, ඊට පස්සේ අවුරුද්දකට කන්නයක් වගා කරන තත්ත්වයට ආවා. දැන් වනකොට අවුරුද්දට කන්න දෙකක් වගා කරනවා. ඒත් අපට මදි. මොකද, ඉඩම් සීමා වෙලා තිබෙන නිසා අපේ රටේ ජනතාව පෝෂණය කරන්න නම් වැඩි යෙදවුම් හරහා ඒකක බිමකින් වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් ලබා ගන්න අවශ්‍යයි. ඒ නිසා අද අපට සිද්ධ වෙලා තිබෙනවා, අලුත් තාක්ෂණය, අලුත් ක්‍රම භාවිත කරලා අස්වැන්න වැඩි කර ගන්න. මෙහිදී ඇත්ත වශයෙන්ම අපි සතුටු වෙනවා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගැන. එය, අපේ රටේ තිබෙන පැරණිම දෙපාර්තමේන්තුවක්. මට මතක විධියට, 1912දී තමයි එය ස්ථාපනය කර තිබෙන්නේ. එය, අවුරුදු 100කටත් වඩා පැරණි දෙපාර්තමේන්තුවක්. මහා විශාල හැකියාවකින් යුක්ත කණ්ඩායමක් ඒ දෙපාර්තමේන්තුවේ ඉන්නවා. ඒ වාගේම කෘෂිකර්ම පර්යේෂණ ආයතනවල, විශ්වවිද්‍යාලවල අය ද ඇතුළුව විශාල හැකියාවකින් යුක්ත බොහෝ පිරිසක් අපේ කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වෙනවා. හැබැයි, පසුගිය කාලයේ ඒ අයට ක්‍රියාත්මක වෙන්න වුවමනාවෙන්ම ඉඩ දුන්නේ නැහැ. කෘෂි කර්මාන්තය වුවමනාවෙන්ම තමයි කඩා වට්ටලා තිබෙන්නේ. මා කියන්න යන්නේ මේකයි. ඒ අය මහන්සි වෙලා, අලුත් ප්‍රභේද හදලා, අලුත් ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම සොයාගෙන, වැඩි අස්වනු ලැබෙන ක්‍රම සොයාගෙන, රෝග හා පළිබෝධවලට ප්‍රතිකාර සොයාගෙන අස්වැන්න වැඩි කරන්න උපාය මාර්ග භාවිත කළත්, පසුව ඒගොල්ලෝත් කලකිරීමට පත් වුණා, ඒ පාලකයන් අත්තනෝමතික විධියට කටයුතු කරලා කෘෂි කර්මාන්තය කඩා වට්ටපු නිසා; නිසි පරිදි තමන්ට ඒ ක්ෂේත්‍රවල වැඩ කරන්න ඉඩ දුන්නේ නැති නිසා.

දැන් අපේ ක්‍රමය යටතේ විද්‍යාඥයන්ට, පර්යේෂණ ආයතනවල නියැළෙන අයට, ඒ වාගේම විශ්වවිද්‍යාලවලට ඒ කටයුතු කරන්න අවස්ථාව අපි දැන් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ ක්‍රමය හරහා කෙටි කාලයක් තුළ අපේ අරමුණුවලට ළඟා වෙන්න පුළුවන් කියලා.

අද වනකොට අලුත් අභියෝග ගොඩක් තිබෙනවා. එකක් තමයි, දේශගුණික විපර්යාස හරහා රෝග හා පළිබෝධ වැඩි වෙලා තිබීම. අනෙක් පැත්තෙන් ගත්තොත්, නිතරම ඇති වන ජල ගැලීම්, නියං වාගේ විවිධාකාරයේ ස්වාභාවික ආපදා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, වෙනත් හේතු නිසා ද කෘෂි කර්මාන්තයට තිබෙන අභියෝග වැඩි වෙලා තිබෙනවා. අද අපට අවශ්‍යයි, ඒ ඔක්කෝටම මුහුණ දෙන ගමන් අපේ රටේ කෘෂි කර්මාන්තය නඟා සිටුවන්න. ඒ නිසා අපි මේ අය වැයෙන් ඒ වෙනුවෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, මේ ක්‍රමය වෙනස් කිරීම සඳහා අප හඳුනාගත් ක්ෂේත්‍රවලට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ද අපි ඉතාම පරෙස්සමෙන් ලබා දී තිබෙනවා.

මෙහිදී විශේෂයෙන් බීජ ක්ෂේත්‍රය ගැනත් කිව යුතුයි. අපේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි, අපේ ගොවීන්ට අවශ්‍ය හොඳ බීජ නොමැතිකම. ඒකට හේතුව තමයි, පසුගිය ආණ්ඩු බීජ ගොවි පොළවල් වුවමනාවෙන්ම කඩා වට්ටලා, ඒවා වසා දමලා, බීජවල අධිකාරිය එක එක ආයතන වෙත බෙදී යෑමට ඉඩ සැලැස්වීම. ඒ නිසා ගොවීන්ට කිසිම වගකීමක් නැහැ, තමන් ලබා ගන්නා බීජ සම්බන්ධව. ඒවායෙන් ගස් හැදෙනවා ද, කරල් හැදෙනවාද කියා ඒ අයට නිසි අවබෝධයක් නැහැ. ඒ නිසාම කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි ලොකු ගැටලුවක් තිබුණා. කෙසේ වෙතත්, අපි මේ අවුරුද්දේ අය වැයෙන් ඉදිරි මාස 8ක කාලයට විශාල ප්‍රමාණයක් මුදල් වෙන් කර තිබෙනවා, බීජ ගොවිපළවල් 29ක් සංවර්ධනය කරන්න.

බීජ පනත ගැනත් මෙහිදී කියන්න ඕනෑ. මට මතක විධියට 2003දී තමයි එය ගෙන ආවේ. ඒ සම්බන්ධව ලොකු සංවාදයක් ඇති වී තිබුණා, බීජ පනත හරහා දේශීය බීජ නැති වෙයි කියලා. නමුත්, බීජ පනත හරහා අපට පුළුවන් වනවා ගොවීන්ට හොඳ බීජ ලබා දිය හැකි විධියේ වැඩසටහනක්, වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ නිසා බීජ පනත ක්‍රියාත්මක කරන්නත්, ඒ හරහා ගොවීන්ට සහතික කළ හොඳ බීජ ලබා දෙන්නත් පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අනෙක් අතට, මෙවර අය වැයෙන් අපි වැඩිපුර අවධානය යොමු කර තිබෙන්නේ පර්යේෂණ ක්ෂේත්‍රයටයි. ඇත්ත වශයෙන්ම රටක් දියුණු වෙන්න නම් පර්යේෂණ කිරීම අවශ්‍යයි. පර්යේෂණ තුළින් තමයි අලුත් ප්‍රභේද හැදෙන්නේ, අලුත් තාක්ෂණය ගොඩ නැඟෙන්නේ. ඒ හරහා තමයි කෘෂි කර්මාන්තය දියුණු කරන්න අපට පුළුවන් වෙන්නේ. ලංකාවේ හැම භෝගයකටම වාගේ පර්යේෂණ ආයතන තිබෙනවා, හොඳ ආයතන ව්‍යූහයක් තිබෙනවා, හොඳ පර්යේෂකයන් ඉන්නවා. හැබැයි, පසුගිය ආණ්ඩු ආවාට ගියාට පර්යේෂණ කිහිපයක් සිදු කළත්, අවශ්‍ය ප්‍රතිපාදන ලබා නොදීම හරහා අලුත් තාක්ෂණය එක් කරගන්න, අලුත් ප්‍රභේද බිහි කර ගන්න අපට බැරි වුණා. ඇත්ත වශයෙන්ම අපි මේ අය වැයෙන් විශාල මුදලක් වෙන් කර දී තිබෙනවා, පර්යේෂණ කරන්න. පර්යේෂණ ක්ෂේත්‍රයේ අප දැකපු තවත් දුර්වලකමක් තමයි, පර්යේෂණ ආයතන අතර ඒකාබද්ධතාවක් නොතිබීම. ආවාට ගියාට පරීක්ෂණ කරනවා; එකම පර්යේෂණය කිහිප තැනක කරනවා. නමුත්, අපේ රටේ හොඳ ආයතන ව්‍යූහයක් තිබෙනවා. මේ විධියට ඒකාබද්ධ කරන්න පුළුවන් ආයතන ව්‍යූහයක් තිබෙනවා. උදාහරණ වශයෙන් ගන්න පුළුවන්, SLCARP එක, HARTI එක වාගේ ආයතන.

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

මේ ආයතන හරහා කෘෂි කාර්මික පර්යේෂණවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතරම, ඒකාබද්ධ යන්ත්‍රණයක් හදලා, පර්යේෂණ සඳහා වූ මානව වේදිකාවක් - interactive human platform එකක් - හදලා ඒවා සංවාදයකට ගෙනැල්ලා කෘෂිකර්මයට අවශ්‍ය පර්යේෂණ කරන්න අවස්ථාව සලසා දෙනවා.

මට නියමිත කාලය අවසන්ව තිබෙන නිසා අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. අද උදේ ඉඳලා කිහිප අවස්ථාවකම කියැවුණා, වනසතුන් ගණන් කිරීම පිළිබඳව. ඇත්ත වශයෙන්ම මෙක ගොඩක් කට්ටියට විහිළුවක් වාගේයි පේන්නේ. නමුත්, මෙක ලෝකයේ භාවිත කරන විද්‍යාත්මක ක්‍රමයක්. ඇත්තටම මේක සංගණයක් නොවෙයි. ඒ සිංහල වචනයේ පොඩි ගැටලුවක් තිබෙනවා. "සංගණනය" කියන වචනය සිංහල භාෂාවෙන් භාවිත වෙන්නේ හැමෝම ගණන් කරනවා කියන එකට. නමුත් මේක හැමෝම ගණන් කිරීමක් නොවෙයි, mapping එකක්, මොන ප්‍රදේශවලද වැඩිපුරම මේ ප්‍රශ්න තිබෙන්නේ කියලා බලන්න. රිළවා කියන සතාගේ සාමාන්‍ය ජීවිත කාලය අවුරුදු 20ක්. මේ අපේ රිළවු නොවෙයි. රනිල් වික්‍රමසිංහලා හිටපු ආණ්ඩුවලින් හදපු රිළවු තමයි තවම ඉන්නේ. ඇත්ත වශයෙන්ම මීට අවුරුදු 12කට ඉස්සෙල්ලා ඒ ආණ්ඩු මේ වෙනුවෙන් මැදිහත්වීමක් කළා නම් අද මේ වාගේ ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ. අද ඕස්ට්‍රේලියාව වාගේ රටවල වැඩිපුර එකෙක් දෙන්නෙක් ආවත් . ඒ සත්තු පරිසර පද්ධතියෙන් අයින් කරනවා. නමුත් අපට ඒක එහෙම කරන්න බැහැ. දැන් විශාල වශයෙන් මේ ප්‍රශ්නය ඔඩු දුවලා තිබෙන්නේ. ඒ නිසා අපට ලොකු ගැටලුවක් තිබෙනවා. ඒ සඳහා අපි මේ වෙලාවේ මූලික පියවර අරගෙන තිබෙනවා. ලෝකයේ තිබෙන ක්‍රම භාවිත කරලා, විද්‍යාත්මක ක්‍රම භාවිත කරලා සතුන් ඉන්න ප්‍රදේශ හඳුනා ගෙන මොන ප්‍රදේශවලටද අපි අවධානය යොමු කළ යුත්තේ කියන කාරණය තමයි මේ countingවලින් කරන්නේ. ඒ නිසා මේක අපි සාමාන්‍යයෙන් කරන සංගණනයක් වාගේ සත්තු ඔක්කෝම ගණන් කරන එකක් නොවෙයි. අපි විශ්වාස කරනවා අපට මේ හරහා ඒ සතුන් ඉන්න ප්‍රදේශ ගැන යම්කිසි අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. ඒ අවබෝධය තුළින් කෘෂිකර්මයට මතු වෙලා තිබෙන බාධාවලට, ප්‍රශ්නවලට ඉදිරි කෙටි කාලයක් තුළ විසඳුම් ලබා ගන්න පුළුවන් වෙයි කියලා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[පි.ප. 2.04]

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(මාණ්පුමිකු අමිර්තනාතන් අඩෙක්කලනාතන්)
(The Hon. Amirthanathan Adaikkalanathan)
නන්‍රි, කෞරව පිරතිත් තවිසාලර් අවර්කළේ!

இன்றைய தினம் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சுத் தொடர்பாக நடைபெறும் விவாதத்திலே நானும் கலந்துகொள்ள விழைகிறேன். எமது கால்நடைப் பண்ணையாளர்கள் இன்று மிகவும் சிரமத்துக் குள்ளாகி இருக்கிறார்கள் என்ற விடயத்தை இங்கு நான் முதலாவதாகக் குறிப்பிட விரும்புகின்றேன். அவர்களுடைய கால்நடைகளுக்கு மேய்ச்சல் தரை இல்லாத காரணத்தால், அவர்கள் விவசாயம் செய்கின்ற நாட்களிலே பல மைல் தூரம் கால்நடைகளை நடத்திச் சென்று வேறோரிடத்தில் வைத்துப் பராமரிக்கின்ற நிலை காணப்படுகின்றது. அவ்வாறான சந்தர்ப்பத்தில் அந்தக் கால்நடைகள் காணாமற்போகின்ற, வேறு மிருகங்களுக்குப் பலியாகின்ற சூழல் தொடர்ந்து கொண்டிருக்கின்றது. கடந்த அரசாங்கங்கள் மேய்ச்சல் தரை சம்பந்தமாகக் கதைத்தாலும்கூட எந்தவொரு நடவடிக்கையும் எடுக்காத சூழலில், இந்தப் புதிய அரசாங்கம் எங்களுடைய கால்நடைப் பண்ணையாளர்களுக்குத் தேவையான மேய்ச்சல் தரைகளைத் துரித கதியிலே ஒதுக்கிக் கொடுத்து, அவர்கள் தங்களுடைய இடங்களிலேயே தமது கால்நடைகளை மேய்ப்பதற்கான வழிமுறையை ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்தப் பிரச்சினை யுடன் தொடர்புடைய Department of Forest Conservation, Department of Wildlife Conservation ஆகியவையும் இந்த அமைச்சின்கீழ்தான் இயங்கி வருகின்றன. கடந்த காலங்களில் இந்த இரண்டு திணைக்களங்களினூடாகவும் பல அக்கப்போர்கள் நடந்ததை நாங்கள் பார்த்தோம். இந்த இரண்டு திணைக்களங்களும் நிலங்களை விடுவிப்பதாகச் சொல்கின்றன; ஆனாலும் விடுவிக்க மறுக்கின்றன. இவை ஜனாதிபதியின் தலைமையில் இயங்குகின்ற அரசாங்கத் திணைக்களங்கள்தான். அவை அந்த நிலங்களை விடுவிப்பதற்கு ஏன் மறுக்கின்றனவெனத் தெரியவில்லை. அவற்றுக்குத் தனியான சட்டங்கள் இருக்கின்றதா, அவை வலுவான சட்டங்களாக இருக்கின்றனவா என்பது எங்களுக்குத் தெரியவில்லை. எமது பிரதேசத்திலுள்ள விவசாய நிலங்களாக இருக்கலாம் அல்லது மேய்ச்சல் தரையாக இருக்கலாம், இவை Department of Forest Conservation, Department of Wildlife Conservation ஆகியவற்றின் கீழேதான் இருக்கின்றன. கடந்த அரசாங்கத்தின் காலத்திலும் அவற்றை விடுவிப்பதாக ஒத்துக்கொண்டாலும் இற்றைவரைக்கும் விடுவித்த வரலாறே இல்லை. ஆகவே, இந்த இரண்டு திணைக்களங்களுடைய சட்டங்களும் ஏனைய அனைத்துச் சட்டங்களையும்விட வலுவான சட்டங்களா? அரசாங்கம் உத்தரவிட்டால்கூட, அதைச் செய்ய மறுக்கின்ற அதிகாரிகள் இன்றைக்கும் அங்கு இருக்கின்ற சூழலினால்தான் அந்த விவசாயிகளுடைய பிரச்சினை தீர்க்கப்பட முடியாதிருக்கின்றது.

அங்குள்ள பல விவசாய நிலங்கள் இராணுவத்தினதும் முப்படைகளினதும் கட்டுப்பாட்டிலேயே இருக்கின்றன. அந்த நிலங்களில் அவர்கள் விவசாயம் செய்வதோடு, கால்நடைகளை வளர்த்து உற்பத்திகளையும் செய்கிறார்கள். மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பதவிக்கு வந்தவுடனேயே இராணுவம் பிடித்திருக்கின்ற மக்களுடைய காணியை விடுவிப்பதாக ஓர் உத்தரவாதத்தை வழங்கியிருந்தார். இன்னும் அதை மக்கள் எதிர்பார்த்திருக்கின்றார்கள். அந்த வகையில், இந்தக் கால்நடை விவசாயிகளுக்கு முட்டுக் கட்டையாக இருக்கின்ற இந்த இரண்டு திணைக்களங்கள் தொடர்பில் உடனடியாக நடவடிக்கை எடுத்து, அந்தக் காணிகளை விவசாயிகளிடம் கையளிக்காவிடின் நெல்லுக்குப் பஞ்சம் ஏற்படுவதற்கான வாய்ப்பு இருக்கிறது.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய பகுதியில் இருக்கின்ற விவசாயிகளைப் பொறுத்தமட்டில் அவர்கள் வசதியானவர்களல்லர், இலட்சாதிபதிகள் அல்லர். இங்கே கௌரவ அமைச்சர் அவர்களும் இருக்கிறார்; அவருக்கும் அது தெரியும். அந்த விவசாயிகள் தங்களுடைய கால்நடைகளை விற்றுத்தான் விவசாயத்தைச் செய்கிறார்கள். அதுபோல், தங்களுடைய நகைகளை விற்று அல்லது

அடமானம் வைத்து விவசாயத்தைச் செய்கிறார்கள். தமிழ் மரபுப்படி ஒரு பெண் கணவன் இறந்தால்தான் தனது தாலியைக் கழற்றுவாள். ஆனால், எங்களுடைய விவசாயிகள் வறுமைக் கோட்டின்கீழ் இருக்கின்றபடியால், புருஷன் இருக்கும்போதே அந்தத் தாலிக்கொடியைக் கழற்றி வங்கி களிலே அடமானம் வைக்கின்ற நிலை இப்பொழுதும் இருந்து கொண்டிருக்கின்றது. அவர்கள் வைத்த அடமானத்தை மீள முடியாமலும் வங்கியிலே வாங்கிய கடனைக் கட்ட முடியாமலும் இருக்கிறார்கள்.

நெல்லுக்கான விலை நிர்ணயம் இப்பொழுதுதான் செய்யப்பட்டுள்ளது. இப்பொழுது இயற்கை அனர்த்தங்கள் தொடர்ந்து நடைபெறுகின்றன. அதனால் விவசாயிகள் திண்டாடிக்கொண்டிருக்கிறார்கள். இதனால் உரிய காலத்திற்கு முன்னரே நெல்லைப் பச்சையாக அறுவடை செய்யக்கூடிய சூழல் ஏற்பட்டது. இப்படி விவசாயிகள் தொடர்ந்தும் பாதிக்கப்பட்டுச் சொல்லொண்ணாத் துயரத்தில் இருக்கின்றார்கள். இந்த நாட்டில் விவசாயமும் கடற்றொழிலும் முக்கிய பங்கை வகிக்கின்றது. அந்த வகையில், அமைச்சரவர்கள் இந்த விடயத்தைக் கவனத்திற்கொண்டு, விவசாயிகளுக்குத் தேவையான வசதிகளைப் பெற்றுக் கொடுக்க நடவடிக்கை எடுக்க வேண்டும். கால்நடைகளுக்கான மேய்ச்சல் தரையை ஒதுக்கிக் கொடுக்க வேண்டும். விவசாயிகள் நெல்லைக் காய வைப்பதற்காக machine அல்லது தளங்களை உருவாக்குவதன்மூலம் roadஇல் அவர்கள் நெல்லைக் காய வைக்கும் நிலையை மாற்ற முடியும். நெல்லை roadஇல் காயவைக்கும்போது, தாரில் காணப்படுகின்ற chemical ஆனது புற்றுநோயை உருவாக்குகின்ற நிலைமையை ஏற்படுத்துகின்றதென வைத்தியர்கள் சொல்கின்றார்கள். அதுமட்டுமல்ல, சில இடங்களில் காலாவதியான மருந்துகள் கொடுக்கப்படுகிறன. விவசாயிகள் தொடர்ந்தும் அந்த மருந்தினைத் தெளிப்பதால், நெல் நஞ்சாக மாறக்கூடிய சூழ்நிலை காணப்படுகின்றது. ஆகவே, விவசாய மருந்து வகைகளை ஒரு நெறிப்படுத்தல் முறைக்குள் கொண்டுவர வேண்டுமென்பது எனது கோரிக்கையாக இருக்கிறது.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நீர்ப்பாசன அமைச்சு சம்பந்தமாகவும் சில விடயங்களைச் சொல்ல வேண்டும். எங்களுடைய வன்னி மாவட்டத்தில் நன்னீர் தொடர்பாகப் பல பிரச்சினைகளை மக்கள் சந்தித்து வருகின்றார்கள். மன்னார் நகரத்திற்கு முருங்கனில் இருந்து தான் குழாய்களூடாகத் தண்ணீர் கொண்டு செல்லப்படுகிறது. அரசாங்கம் தேசிய நீர் வளங்கள் மற்றும் வடிகாலமைப்புச் சபை, நீர்ப்பாசனத் திணைக்களம் என்பவற்றோடு கலந்தா லோசித்து உடனடித் தீர்வாக நீர்தேக்க அணையிலிருந்து நீரைப் பெறுகின்ற ஒரு திட்டத்தை ஏற்றுக்கொண்டுள்ளது. அந்தத் திட்டத்தை உடனடியாக நடைமுறைப்படுத்தி, மாவட்டத்தின் அனைத்து இடங்களுக்கும் நன்னீரைக் கொடுப்பதன்மூலம் மக்கள் நோய்த் தாக்கங்களிலிருந்து விடுபடுகின்ற நிலையேற்படும்.

தொடர்ந்தும் குழாய்க் கிணற்றுத் தண்ணீரை நம்பி இருக்க முடியாது. ஏனென்றால், பல இடங்களிலும் ஆழத்திலுள்ள நன்னீர் உறிஞ்சப்படுகின்றபோது கிணறுகள் வற்றிப் போகின்ற சூழல் இருக்கின்றது. அத்துடன், குழாய்க் கிணற்றின் ஊடாகப் பெறப்படுகின்ற தண்ணீருடைய வளம் மற்றும் அளவுகளில் மாற்றம் ஏற்படும். எங்களுடைய மன்னார் மாவட்டத்தில் நீர் வளங்கள் தடைப்படுகின்ற நிலை ஏற்படும். இப்படியான நிலை தொடர்ந்தும் ஏற்படாவண்ணம் நீர்தேக்க அணையிலிருந்து நன்நீரைப் பெறுகின்ற திட்டத்தை நடைமுறைப்படுத்தி, மக்களுக்கு நன்னீரை வழங்க வேண்டும்.

அதேபோன்று முல்லைத்தீவு, வவுனியா போன்ற இடங்களில், மிக முக்கியமாக வவுனியாவில் கூடுதலாக கல்சியம் கலந்த நீர்தான் காணப்படுகின்றது. இதனால் மன்னார், வவுனியா, முல்லைத்தீவு போன்ற மாவட்டங்களில் சிறுநீரக நோயாளர்கள் பெருமளவாகக் காணப்படுகிறனர். ஆகவே, இந்த நன்னீர் வழங்குகின்ற விடயத்தில் கவனம் செலுத்த வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.13]

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ ජනතාවගේ එදිනෙදා ජීවිතයට දැඩි ලෙස සම්බන්ධ ක්ෂේත්‍රයක් වන කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශ පිළිබඳව අදහස් දක්වන්නට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ගොවි ජනතාව නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයෙක්. එම නිසා ගොවි ජනතාවගේ ඉඩම් ගැටලු සම්බන්ධයෙන් කථා කරද්දී, ඔවුන්ගේ ඉඩමකට බලපත්‍රයක්, දීමනා පත්‍රයක් හෝ ඔප්පුවක් ලබා ගැනීමේ අවශ්‍යතාව ඔවුන්ට තිබෙනවා. අපේ මොනරාගල දිස්ත්‍රික්කයට මේක විශේෂයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නය කියලා අපේ ඇමතිතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේ වෙනකොටත් සෑම කන්නයකම වර්ෂා කාලය එනකොට මොනරාගල දිස්ත්‍රික්කයේ ඉඩම්වලට, ඉඩම්වල මායිම්වලට විශාල වශයෙන් ගැටලු ඇති වෙනවා. ඉඩමකට බලපත්‍රයක් නොමැතිව අවුරුදු 10ක්, 15ක්, 20ක්, 25ක් තිස්සේ එම ඉඩම් භුක්ති විඳිද්දී, එම ඉඩම සම්බන්ධයෙන් ආරවුලක් ඇතිවෙලා ප්‍රාදේශීය ලේකම්ළඟට හෝ පොලීසියට ගිය අවස්ථාවකදී, සමහර විට එම ඉඩම භුක්ති විඳින්ද සුදුසු පුද්ගලයාට ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් හෝ පොලීසියෙන් එම ඉඩම ලැබෙන්නේ නැහැ. ඒ නිසා බලපත්‍ර, දීමනා පත්‍ර, ඔප්පු ලබාදෙන වැඩ පිළිවෙළ නැවත වාරයක් කඩිනමින් ක්‍රියාත්මක කරන්නය කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම "උරුමය" ඔප්පු ලබා ගන්න ගිය අය විශාල පිරිසක් මේ වෙනකොට අසරණ තත්ත්වයට පත්වෙලා සිටිනවා. සමහර අයට බලපත්‍ර තිබුණා. ජයභූමි, ස්වර්ණ භූමි, රන්භූමි වාගේ දීමනා පත්‍ර තිබුණා. මේ වෙනකොට ඒ අයට "උරුමය" ඔප්පු ලබා දෙන්න බලාපොරොත්තුවෙන් ප්‍රාදේශීය ලේකම්වරු මේ අයගේ එම ඔප්පු අවලංගු කරලා, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හරහා ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා යවපු ඔප්පු තිබෙනවා. මම හිතන විධියට මාස 6කට, 7කට, අවුරුද්දකට වඩා වැඩි කාලයක් ගත වෙච්ච ඔප්පු තිබෙනවා. මේ වෙනකොට යම් පුද්ගලයන්ට ඔප්පුවක හෝ දීමනා පත්‍රයක අවශ්‍යතාව ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම දීමනා පත්‍රය. තමන්ගේ දරුවාට මේ ඉඩමෙන් කොටසක් පවරන්න, නැත්නම් විවාහ වන අවස්ථාවකදී තම දරුවාට මේ ඉඩම පවරන්න, එහෙම නැත්නම් ඉඩම බැංකුවට තියලා ණය මුදලක් ලබා ගන්න මේ අයට තිබෙන අවශ්‍යතාව දැඩි ලෙස මතුව තිබෙනවා. පසුගිය දවසක අපි අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ කතා කරනකොට එතුමා ප්‍රකාශ කළා මට

[ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා]

මතකයි, මේ වනකොට "උරුමය" ඔප්පු ලබාදෙන එක නතර කර තිබෙනවා කියලා. ගරු ඇමතිතුමනි, "උරුමය" ඔප්පු ලබාදෙන එක නතර කර තිබෙනවා නම්, ඒ අයට තිබුණු බලපත්‍ර, දීමනා පත්‍ර නැවත වලංගු කර ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමනි, "උරුමය" ඔප්පු ලබා දුන්නත්, නැතත්, මේ අයට සින්නක්කර ඔප්පුවක් ලබාදීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු ඇමතිතුමනි, ඉඩම් ගැන තව කථා කරන්න දේවල් තිබුණත්, මට නියමිත කාලය සීමිත නිසා ඉඩම් ගැන මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගොවිජන සේවා ගැන, කෘෂිකර්මය ගැන කථා කරනකොට තමුන්නාන්සේලා අපි එක එක ආණ්ඩු සම්බන්ධයෙන් විවේචන කරනවා තමයි. ඔබතුමන්ලා 76 වසරක් ගැනත් විවේචන කරනවා. හැබැයි, මේ 76 වසර තුළ තමයි යෝධ වැව, තඹෝව වැව, මීනිපේ යන අපේ වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය කරලා, වික්ටෝරියා, රන්දෙණිගල වැනි ජලාශ මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය හරහා අලුතින් ආරම්භ කරලා, පසුකාලීනව මොරගහකන්ද වැනි ජලාශත් අලුතින් ආරම්භ කළේ. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මේවා අවසන් කරලා, 80 දශකය වනතෙක් මේ රටට සහල් ආනයනය කරපු එක නතර කරලා, මේ රට සහලින් ස්වයංපෝෂිත කළා කියලා මම විශ්වාස කරනවා. 80 දශකයෙන් පස්සේ අපේ රට සහලින් ස්වයංපෝෂිත වුණා. හැබැයි, පසුගිය කාලසීමාව තුළ අපේ රටේ සහල් හිඟයක් ආවා. ඔබතුමන්ලා, අපි අද මේ කථා කරන විධියට මේ රටේ කෘෂිකර්මය දියුණු කරලා හරියට පවත්වාගෙන ගියොත් මේ රට දීර්ඝ කාලීනව සහලින් ස්වයංපෝෂිත තත්ත්වයෙන් පවත්වාගෙන යන්න පුළුවන් කියන විශ්වාසය මට තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. ගොවි ජනතාව නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයකු විධියට මම ගොවි ජනතාව වෙනුවෙන් තමුන්නාන්සේලාගෙන් ඒ ඉල්ලීම කරනවා.

තමුන්නාන්සේලාට පොහොර සහනාධාරය කලට වේලාවට දෙන්න බැරි වෙන්න ඇති. ඇත්තටම වෙලාවට පොහොර දෙන්න බැරි වුණා. සමහර තැන්වල පරක්කුවීමක් සිද්ධ වුණා. ලබන කන්නයේදීවත්; මේ ආරම්භ කරන කන්නයේදීවත් එවැනි අතපසුවීම් සිදුවීම නතර කර දෙන්නය කියන ඉල්ලීම කරනවා. පොහොර සහනාධාරය දෙනකොට සමහර තැන්වලට රුපියල් 3,000, 4,000 වාගේ කොටස් වශයෙන් ගෙවපු තැන් තිබෙනවා. කොටස් වශයෙන් ගෙවනකොට සමහර අසරණ පුද්ගලයන්ට පොහොර හොණ්ඩරයක් එකවර මිලදී ගැනීමට නොහැකි වුණු අවස්ථා තිබෙනවා. අන්න ඒ නිසා ඒ ගැනත් කල්පනා කරලා ගොවි ජනතාවට, ගොවිතැන් කරන පුද්ගයන්ට නිසි වේලාවට තමන්ගේ පොහොර සහනාධරය නිසි ආකාරයෙන් ලබා දෙන්නය කියන ඉල්ලීම කරනවා.

1817දී අපි ජීවත් වුණු ඌව වෙල්ලස්ස ඉංග්‍රීසීන් විසින් විනාශ කළා. ඩී.එස්. සේනානායක මැතිතුමා විසින් සේනානායක සමුද්‍රය හදලා, මොනරාගල අපට නැවත කෘෂිකර්මය දියුණු කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරලා දුන්නා. හැබැයි සේනානායක සමුද්‍රයේ, ගල්ඔය ව්‍යාපාරයේ ජලයෙන් වැඩිම ප්‍රයෝජනය ගන්නේ නැගෙනහිර පළාතේ, නැත්නම් අම්පාර දිස්ත්‍රික්කයේ අය. සේනානායක සමුද්‍රය හැදුවාට පස්සේ හිටපු වෙනත් නායකයෝ ලුණුගම්වෙහෙර, මුතුකණ්ඩිය, උඩවලව වැනි ජලාශ හදලා මොනරාගලට විශාල සේවාවක් කළා. අන්න ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. පසුගිය රජය කාලයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වුණු අවධියේ මොනරාගල නක්කල අමුණ කියන ව්‍යාපාරයට මුල්ගල තැබුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ව්‍යාපාරය මොනරාගලට හදලා දුන්නොත් මොනරාගල තිබෙන ප්‍රධාන ජලාශය බවට මේ නක්කල අමුණ, නැත්නම් කුඹුක්කන්ඔය ව්‍යාපාරය පත් වෙනවා. ඒ තුළින් මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5කට හිඟතාවකින් තොරව ජලය ලැබිලා අනිවාර්යයෙන්ම සංවර්ධනය වෙනවා. ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මුල්ගල තියපු ඒ ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කරලා දෙන්න කියන ඉල්ලීම මම කරනවා. ඒ වාගේම ඒ ජලාශයෙන් සියඹලාණ්ඩුව, මඩුල්ල, මොනරාගල, බඩල්කුඹුර, බුත්තල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පානීය ජල අවශ්‍යතාව සියයට 100ක් සම්පූර්ණ කර ගන්න පුළුවන්කම ලැබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ඒ ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කර දෙන්න කියලා.

ඒ වාගේම පසුගිය කාල සීමාව තුළ විශාල කලබගෑනියකට ලක් වුණා, යාල අභය භූමියේ රක්ෂිතවල ජීවත් වන ජනතාව. ඒ ජනතාවට වන සතුන්ගෙන් කරදර සිදු වෙනවා. විශේෂයෙන්ම වනඇලින්ගෙන් ඒ ජනතාවට විශාල වශයෙන් කරදර සිදු වෙනවා. හැබැයි ඒ කරදර මැද්දේ අවුරුදු 30-40 වගා කටයුතු කරපු, ගොවිතැන් කරපු ජනතාවගේ ඉඩම් පසුගිය ආණ්ඩු කාලයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරාගෙන තිබෙනවා. ඒ ඉඩම්වලින් පුංචි කොටසක් නැවත ගොවීන්ට ලබා දෙන්න තීරණය කරලා තිබෙනවා. මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අපේ මුතුන් මිත්තන් පවා ගොවිතැන් කරපු ඒ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස් කරලා නැවත ඒ ජනතාවට ලබා දෙන්න කියලා. ඇත්තටම මොනරාගල දිස්ත්‍රික්කයෙන් සෑම වර්ෂයකම මේ රටේ බඩඉරිඟු අවශ්‍යතාවෙන් විශාල ප්‍රමාණයක් සැපයුවා. අද ඒ තත්ත්වය නැතිවෙලා තිබෙනවා. ඒ වාගේම මුං ඇට, කව්පි ඇතුළු අතුරු භෝග වර්ග රාශියක් අපේ දිස්ත්‍රික්කයෙන් මේ රටට නිෂ්පාදනය කර දීලා තිබෙනවා. ඒ ගොවිතැන් කරපු ජනතාව ඇත්තටම මේ වෙනකොට අසරණ වෙලා ඉන්නවා, ගරු අමාත්‍යතුමනි. ඒ නිසා ඒ අයට ඒ ගොවිතැන් කටයුතු ටික කර ගන්න ඒ ඉඩම් ටික නැවත නිදහස් කරලා දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රිළවුන්, මොනරුන් වැනි සතුන්ගෙන් සිදුවන කරදර ගැන මම කථා කරන්නේ නැහැ. ඒ සතුන්ගෙන් අනන්ත අප්‍රමාණ කරදර සිදු වෙනවා. නමුත් ජීවිත හානි සිදු කරන වනඇලි ගැටලුව කඩිනමින් විසඳන වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න. අද විදුලි වැට තිබෙනවා. ශක්තිමත් විදුලි වැටක් හදලා හරි අලින්ගේ ජීවිත වාගේම මිනිසුන්ගේ ජීවිතත් ආරක්ෂා කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර දෙන්න කියන ඉල්ලීම කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ගරු නියෝජ්‍ය සභාපතිතුමියට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු අරුණ පනාගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.24]

ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද අපේ ආණ්ඩුවේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය

ශීර්ෂය විවාදයට ගන්නවා. කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණත් මම කියන්න ඕනෑ, අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව කොළඹ දිස්ත්‍රික්කයෙන් කෘෂි කර්මාන්තයට සපයන දායකත්වය අඩු බව. නමුත්, කොළඹ දිස්ත්‍රික්කයේ අපටත් කෘෂි කර්මාන්තය නහාසිටුවීම වෙනුවෙන් විශාල දායකත්වයක් සපයන්න පුළුවන්. මම පෞද්ගලිකවම දන්නවා, කොළඹ දිස්ත්‍රික්කයේත් ගොවිජන සේවා මධ්‍යස්ථාන නවයක් ක්‍රියාත්මක වන බව. මම ජීවත් වන්නේ හෝමාගම ආසනයේ. එහි ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක් ක්‍රියාත්මක වෙනවා. දැවැන්ත කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් තිබෙන දිස්ත්‍රික්කයක් හැටියටත් කොළඹ දිස්ත්‍රික්කය හඳුන්වන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, නමුත් අපි දැක්කා, පසුගිය කාලයේ ආණ්ඩු කරපු අයට කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු බස්නාහිර පළාතේ කුඹුරු ගොවිතැන, කෘෂි කර්මාන්තය පිළිබඳව තිබුණු අදහස මොකක්ද කියලා. කුඹුරු ඉඩම් වගා කරන්න කියනවා වෙනුවට කුඹුරු ඉඩම් ගොඩ කරන්න කියපු ජනාධිපතිවරු පුමුඛ ආණ්ඩු තමයි ඒ කාලයේ තිබුණේ. නමුත්, අද ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. අපි රජයක් විධියට කල්පනා කරනවා, කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන පුරන් කුඹුරු සඳහා ගැළපෙන කෘෂිකාර්මික ක්‍රම යොදාගෙන ඉදිරි කාලයේදී ඒවා යම් මට්ටමකට සශ්‍රීක කරන්න.

කාලයක් පුරා විවිධ අඩන්තේට්ටම්වලට, විවිධ හිරිහැරවලට, විවිධ බාධාවලට, විවිධ අසාධාරණවලට ලක් වුණු ගොවීන් තමයි මේ ආණ්ඩුව හදන්න පසුගිය කාලයේ දායකත්වය දුන්නේ, ඉඩහසර ලබා දුන්නේ. ඒ නිසා වගකිව යුතු ආණ්ඩුවක් විධියට කෘෂි කර්මාන්තය නහාසිටුවීම වෙනුවෙන් -ගොවියාගේ ප්‍රශ්න තේරුම් ගෙන, හඳුනාගෙන, ගොවියාත් දායක කරගෙන මේ රට ගොඩනඟන කෘෂි කර්මාන්තයක් දක්වා- මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙනියන්න තමයි අපි කල්පනා කරන්නේ. විශේෂයෙන්ම ජන සහභාගිත්ව සංවර්ධනයක් පිළිබඳව තමයි අපි ගොඩක් වෙලාවට කථා කළේ. අන්න ඒ නිසා කෘෂි කර්මාන්තය නහාසිටුවීමේදී ජනතාව සහභාගි කර ගැනීම, ඔවුන් එම සංවර්ධන කටයුතු වෙනුවෙන් දායක කර ගැනීම අවශ්‍යයි. ඒ වාගේම ගොවියා මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමේදීත් ගොවියාගේ දායකත්වය එකතු කර ගැනීම අවශ්‍යයි.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන අද උදේ වරුවේ ඉදලාම විපක්ෂය පැත්තෙන් මේ ගැන විවිධ අදහස්, යෝජනා, චෝදනා ගොඩක් ඉදිරිපත් වූ බව අපි දැක්කා. විශේෂයෙන්ම මෙතැනදී සාකච්ඡාවට බඳුන් වුණා, 15වැනි දා උදේ කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වෙලා කරන්න යන සත්ව සංගණනය පිළිබඳව. ඒ පිළිබඳ විවිධ අදහස්, මත පළ වුණා. නමුත් අපි හිතනවා, වැදගත් තීරණයක් තමයි පහු වෙලා හෝ අරගෙන තිබෙන්නේ කියලා. මොකද, අපේ රටේ ගොවීන්ගේ අස්වැන්නට වනසතුන් විශාල වශයෙන් හානි කරනවා. අද වන විට වනසතුන්ගෙන් එල්ල වන පීඩා, කරදර වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා එම ගැටලුව නිරාකරණය කිරීම සඳහා කිසියම් වෙලාවක හෝ ආරම්භයක් ගන්න ඕනෑ. මොකද, අපේ ගොවීන් හැම දාම ඉතා දුක් මහන්සි වෙලා වගා කටයුතු කරනවා. නමුත් වනසතුන්ගෙන් ඔවුන්ගේ වගාවලට බරපතළ හානි සිදු වෙනවා. පසුගිය කාලයේම මේ ගැටලුව නිරාකරණය කිරීම සඳහා කිසිදු ප්‍රවේශයක් ගත්තේ නැහැ. මම හිතන විධියට මේ ආණ්ඩුව ගොවි ජනතාවගේ ගැටලු හඳුනාගෙන, ඔවුන්වත් දායක කරගෙන මේ ගැටලුව නිරාකරණය කරන්න තමයි වගාවට හානි කරන සතුන්ගේ සංගණනයක් කරන්නේ. මේ වෙනකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරි වසම් හරහා ඒ සංගණනය සඳහා අවශ්‍ය පෝරම බෙදා හැර ජනතාව ඒකට සම්බන්ධ කරගෙන, මේ කටයුත්තට කිසියම් ප්‍රමාණයකින් ප්‍රවේශයක් ගන්න කටයුතු කර තිබෙනවා. ඒකට කැමැති අයත් ඉන්නවා, අකැමැති අයත් ඉන්නවා. කොහොම නමුත් අපි රජයක් විධියට ජනතාවගේ ගැටලු හඳුනාගෙන ඔවුන්වත් දායක කරගෙන මේ ප්‍රශ්නය විසඳීමට ආරම්භයක් තමයි මේ ගන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වගාවට හානි කරන දඩු ලේනා, මොනරා, රිළවා, වඳුරා ආදී සතුන් පිළිබඳව තමයි මේ සංගණනය කරන්නේ. එහිදී ජනතාවට දන්වා තිබෙන කාල වකවානුව තුළ එම සංගණන කටයුතු නිවැරදිව කළ යුතුයි.

ඒ වාගේම මට පෞද්ගලිකව තිබෙන අත්දැකීමක් ගැනත් මෙතැනදී සඳහන් කරන්න කැමැතියි. අපි කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ආසනයේ වුණත්, අපේ ප්‍රදේශයේ සිටින ගොවි ජනතාව ඇතුළු සියලුදෙනාට බලපාන මේ වාගේම සිදුවීමක් තිබෙනවා. ඒ තමයි අපේ ආසනයේ ග්‍රාම නිලධාරි වසම් 5ක්-6ක් මූලික කරගෙන නාගරිකව දැවැන්ත මුව ගහනයක් ඇති වී තිබීම. එම ගැටලුව නිරාකරණය කරගන්නට අපි අවුරුදු ගණනක් තිස්සේ සාකච්ඡා කළා, විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා. මේ පිළිබඳව අපි කථා කළාට පසුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේකට උත්තරයක් හැටියට යම් ප්‍රවේශයක් ගෙන තිබෙනවා, එම සතුන් එම ප්‍රදේශයෙන් ඉවත් කිරීමට. ඒ ප්‍රදේශයෙන් ඉවත් කරනවා නම් ඒ සතුන්ට මොකක්ද කරන්න යන්නේ? ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් හදන්න නම් ඒ සතුන් කොච්චර ප්‍රමාණයක් ඉන්නවාද කියලා අපි කලින් දැනගන්න ඕනෑ. ඒ නිසා මම මුලින් සඳහන් කළ සංගණනයට කලින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් මැදිහත් වෙලා අපේ ආසනයේ සිටින මුව ගහනය කොච්චරක් ද කියලා ගණනය කරන්න යම් සමීක්ෂණයක් පටන් ගෙන තිබෙනවා. අපට තොරතුරු ලැබී තිබෙනවා, 1,500ත්-2,500ත් අතර මුව ගහනයක් හෝමාගම නගරය ආශ්‍රිතව ග්‍රාම නිලධාරි වසම් 5ක පමණ ගොවි ජනතාවගේ සියලු භෝග විනාශ කරමින් ඉන්නවා කියලා. ඒ නිසා අපි තීරණය කර තිබෙන්නේ ඉදිරි කාලයේදී ඔවුන් ආරක්ෂිතව අල්ලාගෙන, සුදුසු ප්‍රදේශයකට මුදා හරින්නයි. ලබන 15වැනි දා සිදු කරන සත්ව සංගණනයත් ඒකට වැදගත් වෙනවා, තොරතුරු එකතු කරගන්න. මොකද, වර්තමාන රජයට ඒ සම්බන්ධ තොරතුරු නැහැ. පසුගිය කාලයේ පම්පෝරි විතරයි තිබුණේ. කයිය තිබුණා, වැඩ නැහැ. ඒ නිසා කයිය ගහන ඒ මහත්වරුන්ටත් අපි කියනවා, කයිය ගහනවා වෙනුවට එකතු වෙලා මේ කටයුත්තට යම් මැදිහත්වීමක් දායකත්වයක් ලබා දෙන්න කියලා. ඒකට ප්‍රවේශයක් තමයි අපි මේ අරගෙන තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පවතින තත්ත්වය වඩා හොඳින් තේරුම් ගෙන, ගොවියා මුහුණ දෙන ගැටලුවලට විසඳුමක් හැටියට තමයි අපි මේ ප්‍රවේශය ගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන නිසා අපි දන්නවා, ඉඩම් අමාත්‍යාංශයේ, LRC එකේ මොන තරම් ගැටලු ප්‍රමාණයක් තිබෙනවාද කියලා.

පසුගිය කාලය පුරාවට අපි දැක්කා LRC ඉඩම්වලට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. LRC ඉඩම් කිසිම වග විභාගයක් නැතුව සමහර අමාත්‍යවරු තමන්ගේ නමට ලියාගෙන තිබෙනවා. මගේ ආසනයේත් එවැනි ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. මම පසුගිය සතියේ මේ ගරු සභාවේදී ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. අපේ ආසනයේ ඉතා වටිනා තැනක තිබෙන ඉඩමක් පෞද්ගලික කෙනෙකුගේ නමට ලියාගෙන තිබෙනවා. මම ඒ ගැන හොයලා බැලුවා. මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ ගැන හොයා බලනකොට හෙළිදරව් වුණා, Cabinet approval එකකින් 393දෙනෙක් පෞද්ගලිකව අපේ රටේ ඉඩම් 393ක් ලියාගෙන තිබෙන බව. අපේ රටේ ඉඩම්වලට සිද්ධ වෙලා තිබෙන්නේ මේකයි. තමන්ගේ නමට පර්වසයක් නැතිව අහිංසක මිනිස්සු හූල්ලද්දී, ඇමතිවරු, මන්ත්‍රීවරු, දේශපාලන වශයෙන්

[ගරු අරුණ පනාගොඩ මහතා]

උදවු ලබන බොහෝ පිරිසක් මේ LRC ඉඩම් අක්කර ගණනින් තමන්ගේ නමට ලියාගෙන තිබෙනවා. ඒ නිසා මේක ඉදිරි කාලයේදී නිවැරදි කරන්න අවශ්‍යයි. කොළඹ දිස්ත්‍රික්කයේ ඉතා වටිනා තැන්වල තිබෙන ඉඩම් වැඩිපුර ප්‍රමාණයක් පසුගිය කාලයේ ආණ්ඩු කරපු කට්ටිය තමයි තමන්ගේ නම්වලට ලියාගෙන තිබෙන්නේ. මෙහෙම තත්ත්වයක් තුළ තමයි මේ රට නිවැරදි පැත්තට අරගෙන යන්න අද අපට සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙන්න මේ තත්ත්වය තේරුම් අරගෙන කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට ගොවියා මුහුණ දෙන ඇත්ත ගැටලු ටික ඉදිරි කාලයේදී නිවැරදිව හඳුනා ගනිමින්, ගොවියාට වාගේම පාරිභෝගිකයාටත් සාධාරණයක් ඉෂ්ට වන ආකාරයේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලියකට මේ රට ඉතා වේගයෙන් ඉස්සරහට අරගෙන යන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන් ඔබතුමිය දන්නවා, අපට ලැබුණේ බංකොලොත් කරපු රටක් බව. මේ බංකොලොත් කරපු රට ආර්ථික වශයෙන් ශක්තිමත් කරද්දී ආහාර සුරක්ෂිතතාව කියන එක ඉතාම වැදගත්. ඒ නිසා ග්‍රාමීය වශයෙන් ගොවි ජනතාව ශක්තිමත්ව නහාසිටුවමින් කෘෂි කර්මාන්ත ක්‍රියාවලියට ඔවුන් දායක කරගෙන, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික සපයලා, ගොවිජන සේවා මධ්‍යස්ථානවල වාගේම පශු වෛද්‍ය කාර්යාලවල තිබෙන අඩුපාඩුකම් ටික නිවැරදි කරලා, ගොවියාට සාධාරණව සහන ලැබෙන විධියේ ක්‍රියාවලියකට අපි අමාත්‍යාංශය විධියට ඉදිරි කාලයේදී කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. ඒ තුළින් ගොවි ජනතාවට යම් සාධාරණයක් ඉෂ්ට කරනවා වාගේම එහි ප්‍රතිලාභ සාධාරණ ලෙස ජනතාවට බුක්ති විඳින්න පුළුවන් වන විධියටත්, ඔවුන්ට සාධාරණ මිලකට කෘෂිකාර්මික නිෂ්පාදන මිලදී ගැනීමේ හැකියාවක් නිර්මාණය කිරීමටත් අපි කටයුතු කරනවා කියන කාරණයත් මම මතක් කරනවා.

මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[පි.ප. 2.34]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான பாதீட்டின் மீதான குழுநிலை விவாதத்தில் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சுத் தொடர்பாக எனது கருத்துகளை இந்த அவையிலே எடுத்துரைக்க விழைகின்றேன். இந்த அரசால் முன்வைக்கப்பட்டுள்ள பாதீட்டில் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சுக்கு மீண்டெழும் செலவுக்காக 83.9 பில்லியன் ரூபாயும் மூலதனச் செலவுக்காக 133 பில்லியன் ரூபாயுமாக மொத்தமாக 216.9 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இது கடந்த ஆண்டைவிட 62 பில்லியன் அதிகமாகும்; இது வரவேற்கத்தக்கது. எனினும், விவசாய மற்றும் கால்நடைத் துறைக்கான ஒதுக்கீடானது கடந்த ஆண்டைவிட 2.6 சதவீதத்தால் குறைக்கப்பட்டுள்ளது. அத்தோடு இதன் அபிவிருத்திக்கான ஒதுக்கீடு 5.76 சதவீதத்தால் குறைக்கப்பட்டுள்ளது. அதுபோல, நீர்ப்பாசனத் திணைக்களத்தினூடான அபிவிருத்திக்கான ஒதுக்கீடானது கடந்த ஆண்டைவிட இந்த ஆண்டு 22.4 சதவீதத்தால் குறைக்கப்பட்டுள்ளது. இக்குறைப்புகள் நாட்டின் அரிசி உற்பத்தியில் தன்னிறைவு காணவேண்டுமென்ற அரசின் நோக்கத்திற்கு ஏற்புடையதல்ல.

அண்மைக் காலத்தில் இலங்கையில் அரிசி விலை ஏற்றம் மற்றும் அரிசித் தட்டுப்பாடு ஆகியன முதன்மையான சிக்கல்களாகக் காணப்படுகின்றன. கேள்விக்கேற்ப நிரம்பல் இல்லாதவிடத்துப் பொருள் விலையேறும் என்பதை அனைவரும் அறிவர். அரிசியின் நிரம்பல் குறைவாக இருப்பதே அதன் விலை ஏற்றத்துக்கு முதன்மையான காரணமாகும். ஒரு காலத்தில் அரிசியை ஏற்றுமதி செய்த எமது நாட்டுக்கு, இன்று இறக்குமதி செய்யவேண்டிய நிலை ஏன் ஏற்பட்டிருக்கின்றது என்பதற்கான மூல காரணத்தைக் கண்டறிந்து அதைத் தீர்க்க அரசு முனைய வேண்டும். அரிசி உற்பத்திக் குறைவுக்கு வெள்ளம், வரட்சி முதலிய இயற்கைப் பேரிடர்கள் காரணமாக இருந்தாலும், திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில் போர்க் காலத்தில் கைவிடப்பட்ட 205 சிறு குளங்களும் 25 அணைக்கட்டுகளும் புனரமைக்கப்பட்டு, மீண்டும் நெற்செய்கைக்குப் பயன்படுத்தாமல் இருப்பதே முதன்மையான காரணியாகும். இவற்றை மீண்டும் நெற்செய்கைக்குப் பயன்படுத்துவதன்மூலம், ஏறத்தாழ 12,000 ஏக்கர் நிலத்தில் நெற்செய்கை பண்ண முடியும். இதன்மூலம், 24,000 மெற்றிக் தொன் நெல் உற்பத்தியை அதிகரிக்கவும் முடியும்.

இவ்வாறு நெல் உற்பத்தியை அதிகரிக்கத் தடையாக இருப்பவர்களில் முதன்மையானவர்கள் வனத்துறை அதிகாரிகளும், வன விலங்குத்துறை அதிகாரிகளும் ஆவர். இவர்கள் வேறு ஒரு நாட்டைக் கைப்பற்றுவதைப்போல விவசாயிகளது நிலங்களைக் கைப்பற்றி விவசாயம் செய்யவிடாமல் தடுத்து வருகின்றனர். இவர்கள் நாட்டின் நெல் உற்பத்தியைப் பெருக்க வேண்டும் என்னும் அரசின் கொள்கைக்கு எதிரானவர்கள்போலச் செயற்பட்டு வருகின்றனர். இவ்விடயத்தில் அமைச்சர் கூடுதல் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்திலுள்ள வெருகல் பிரதேச செயலாளர் பிரிவின் பரப்பளவு 32,042 ஏக்கர் ஆகும். இதில், வனவிலங்குத் துறையினர் 25,242 ஏக்கர் நிலத்தைத் தமக்குரியது எனவும், வனத்துறையினர் 11,906 ஏக்கர் நிலத்தைத் தமக்குரியது எனவும் சொந்தம் கொண்டாடி வருகின்றனர். மொத்தம் 32,042 ஏக்கர் பரப்பளவு நிலத்தைக் கொண்ட வெருகல் பிரதேச செயலாளர் பிரிவில் எப்படி 37,148 ஏக்கர் நிலத்தைக் கைப்பற்றினார்கள்? இப்படியான திறமை இந்த நாட்டிலுள்ள வனத்துறை மற்றும் வனவிலங்குத்துறை அதிகாரிகளுக்குத்தான் இருக்கின்றதென்று மக்கள் கேலியாகப் பேசிக்கொள்வதைக் காணமுடிகின்றது. அதுபோல, திருகோணமலை மாவட்டத்திலுள்ள குச்சவெளி பிரதேச செயலாளர் பிரிவில் 29,430 ஏக்கர் நிலத்தை வனத்துறை கையகப்படுத்தி வைத்துள்ளது. மேலும் 28,372 ஏக்கர் நிலத்தைக் கையகப்படுத்த முனைகிறது. வனவிலங்குத் துறை 7,330 ஏக்கர் நிலத்தைக் கையகப்படுத்தியுள்ளது. தொல்பொருள் துறை 1,087 ஏக்கர் நிலத்தைக் கையகப்படுத்தியுள்ளது. புத்தபிக்குகள் 'பூஜா பூமி' - "Pooja grant" என்ற பெயரில் 3,820 ஏக்கர் நிலத்தைக் கையகப்படுத்தியுள்ளார்கள். இதன்மூலம் 1985ஆம் ஆண்டுக்கு முன்பு மக்கள் விவசாயம் செய்த 70,039

ஏக்கர் நிலத்தில் நெல் உற்பத்தி தடுக்கப்பட்டுள்ளது. இதனால் ஒரு போகத்தில் 140,000 மெற்றிக்தொன் நெல் உற்பத்தி குறைகின்றது.

மேலும், யான் ஓயா என்ற ஆறு குச்சவெளி பிரதேச செயலாளர் பிரிவில் உள்ளடங்கும் திரியாய் கிராமத்தினூடாகப் பாய்ந்து கடலில் கலக்கின்றது. இந்த ஆற்றுக்குக் குறுக்கே அணை கட்டி நீரைத் தேக்கி விவசாயத்திற்குப் பயன்படுத்தி வருகின்றனர்; அது ஒரு நல்ல விடயம். எனினும் யான்ஓயா ஆற்றின் நீரானது அணைக்கட்டிலிருந்து 20 கிலோமீற்றர் தொலைவிலேயுள்ள பதவிசிறிபுர பிரதேச செயலாளர் பிரிவில் அடங்குகின்ற குளங்களுக்குக் கொண்டு செல்லப்படுகின்றது. அதேயளவு தூரமுள்ள கோமரங்கடவெல பிரதேச செயலாளர் பிரிவிலுள்ள குளங்களுக்கும் கொண்டு செல்லப்படுகின்றது. ஆனால், யான்ஓயா ஆற்றின் கரையிலே அமைந்துள்ள நீலப்பணிக்கன் குளத்திற்கு அந்த நீர் வழங்கப்படுவதில்லை. இது ஒரு மாற்றான் தாய் மனப்பாங்கு காண்பிக்கும் செயற்பாடாகும். யான்ஓயா நீரை நீலப்பணிக்கன் குளத்திற்கு வழங்குவதன்மூலம் 5,000 ஏக்கர் நிலத்தை இரு போக நெற்செய்கைக்குக் கொண்டுவர முடியும். அதன்மூலம் 10,000 மெற்றிக்தொன் நெல் உற்பத்தியைப் பெருக்க முடியும்.

அதேபோல, மூதூர் பிரதேச செயலாளர் பிரிவிலுள்ள பெரு நீர்ப்பாசனத் திணைக்களத்துக்குச் சொந்தமான கங்குவேலிக்குளம், மேன்காமம் குளம், பெரியவெளிக் குளம், கிளிவெட்டிக் குளம், கிரான்குளம் முதலியவை தனி நபர்களால் அத்துமீறிப் பிடிக்கப்பட்டு வருகின்றன. நீர்ப்பாசனத் திணைக்களம் இக்குளங்களை முறையாகப் பராமரிக்கவோ அல்லது அவற்றை அத்துமீறிக் கையகப்படுத்துபவர்களைத் தடுக்கவோ நடவடிக்கை எடுப்பதாகத் தெரியவில்லை. இக்குளங்களை நீர்ப்பாசனத்திற்குக் கொண்டுவருவதன்மூலம் கைவிடப்பட்ட 3,000 ஏக்கர் நிலத்தை மீண்டும் நெற்செய்கைக்குக் கொண்டுவரலாம் என்பதோடு, இதன்மூலம் ஆண்டுக்கு 6,000 மெட்றிக் தொன் நெல்லையும் உற்பத்திசெய்ய முடியும். மாண்புமிகு ரணில் விக்ரமசிங்ஹ அவர்களது ஆட்சிக் காலத்தின்பொழுது, 1985ஆம் ஆண்டுக்கு முன்னர் நெற்செய்கைக்குப் பயன்படுத்திய நிலங்களை நெற்செய்கைக்கு விடுவிக்கும்படி ஓர் அரச ஆணை பிறப்பிக்கப்பட்டிருந்தது. எனினும், அந்த ஆணை இதுவரையில் செயற்படுத்தப்படவில்லை. "ஆசாரி விடைகொடுத்தாலும் பூசாரி விடைகொடுக்க மாட்டார்" என்பதுபோல, அரசாங்கம் முடிவு எடுத்தாலும் அதிகாரிகள் அதனைச் செயற்படுத்துவதாயில்லை. இதன்மூலம் இவர்கள் நாட்டின் நெல் உற்பத்தியை அதிகரிக்க விடாமல் தடுத்து அரசாங்கத்திற்கு நெருக்கடியை ஏற்படுத்துகின்றார்களோ என்று எண்ணத் தோன்றுகின்றது. இதனை அமைச்சர் தன்னுடைய கவனத்திற் கொள்ள வேண்டும்.

அதேபோல, தொல்பொருள் திணைக்களமும் மக்கள் விவசாயம் செய்த நிலங்களை எல்லைக் கற்களை போட்டுத் தடுத்து வைத்துக்கொண்டு, அதற்குள் தொல்பொருள் சின்னங்களைக் கண்டு பிடிக்க முடியாமலும், மக்களை விவசாயம் செய்யவிடாமலும் தடுத்து வருகின்றார்கள். உதாரணமாக, திரியாய் கிராமத்திலுள்ள ஏறத்தாழ 1,000 ஏக்கர் விவசாய நிலத்தைக் கையகப்படுத்தி எல்லைக் கற்களைப் போட்டு மூன்று - நான்கு ஆண்டுகளாகப் பிடித்து வைத்துள்ளார்கள். எனினும் அப்பகுதியில் இருந்து எந்தவிதமான தொல்பொருள் சின்னங்களையும் அவர்களால் கண்டுபிடிக்க முடியவில்லையென்பதோடு, அந்த நிலத்தை மீளவும் மக்களுக்கு வழங்கவும் விருப்பமின்றி இருக்கின்றார்கள். இதனால் அப்பகுதியில் நெல் உற்பத்தி கடுமையாகப் பாதிக்கப்படுகின்றது.

திருகோணமலை மாவட்டத்திலே 1985ஆம் ஆண்டுக்கு முன்பு விவசாயம் செய்த 118,710 ஏக்கர் நிலத்தை வனத்துறையினரும், 111,619 ஏக்கர் நிலத்தை வனவிலங்குத் துறையினரும், 2,599 ஏக்கர் நிலத்தை தொல்பொருள் துறையினரும் 3,820 ஏக்கர் நிலத்தை 'பூஜா பூமி' - 'பூஜாக்கொடை' என்ற பெயரில் புத்தபிக்குமாருமாக மக்கள் விவசாயம் செய்த மொத்தம் 236,748 ஏக்கர் நிலத்தை விவசாயம் செய்யவிடாமல் தடுத்து வருகின்றார்கள். இதன்மூலம் ஒரு போகத்தில் மட்டும் ஏறத்தாழ ஐந்து இலட்சம் மொற்றிக் தொன் நெல் உற்பத்தி இல்லாமல் போகின்றது. இதனை அமைச்சர் கருத்திற்கொண்டு செயற்பட வேண்டும். நாட்டில் அரிசி விலை அதிகரிக்கும்போது அரசுக்கு மக்களின் செல்வாக்குக் குறையும். அரசு தன்னைத் தான் காத்துக்கொள்ள வேண்டுமெனில், 1985ஆம் ஆண்டுக்கு முன்பு மக்கள் விவசாயம் செய்த காணிகளை விடுவித்து, நெல் உற்பத்தியைப் பெருக்க முன்வர வேண்டுமென்று வேண்டிக் கொள்கின்றேன்.

மேலும், வெருகல் பிரதேச செயலாளர் பிரிவில் முதன்மையான சிக்கலாக மேய்ச்சல் தரைப் பிரச்சினை காணப்படுகின்றது. வனவிலங்குத் துறையானது மக்கள் மரபுவழியாகப் பயன்படுத்தி வந்த அங்கோடை, மாவிலாறு உள்ளிட்ட மேய்ச்சல் தரைகளைப் பிடித்து வைத்துக்கொண்டு, அவ்விடத்தில் காட்டு விலங்குகள் மட்டும் மேயலாம், வீட்டு விலங்குகள் மேய முடியாது என்று தடுத்து வருகின்றது. 2008ஆம் ஆண்டிலே அங்குள்ள 600 கால்நடை வளர்ப்பாளர்களிடம் 28,000 கால்நடைகள் காணப்பட்ட இடத்திலே, போதிய உணவின்மையாலும் நோயினாலும் பாதிக்கப்பட்டுச் சில ஆயிரம் கால்நடைகள் இறந்து போயுள்ளன. இப்போது 15,200 கால்நடைகள் மட்டுமே எஞ்சியுள்ளன. கால்நடைகளின் இழப்பிற்கும், கால்நடை வளர்ப்பாளர்களின் பொருளாதார இழப்புக்கும் பொறுப்புக் கூறுவது யார்? இத்தகைய சிக்கல்கள் திருகோணமலை மாவட்டத்தில் உள்ள தம்பலகாமம், கிண்ணியா, குச்சவெளி, மொரவெவ ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளிலும் உள்ளன என்பது குறிப்பிடத்தக்கது.

எனவே, கமத்தொழில் கால்நடை வளங்கள் காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மேற்கூறிய விடயங்களைக் கவனத்தில் எடுத்து, 1985ஆம் ஆண்டுக்கு முன்பு மக்கள் விவசாயம் செய்த நிலங்களையும் கால்நடைகளுக்குரிய மேய்ச்சல் தரைகளையும் விடுவித்து, நீர்ப்பாசனத் திட்டங்களைச் சீர்செய்து, நாட்டின் நெல் உற்பத்தியையும், கால்நடைகளின் வளத்தையும் பெருக்க ஆவன செய்ய வேண்டுமென்று கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 09ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.42]

ගරු බී. ආරියවංශ මහතා
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන මේ වෙලාවේ ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ සිටිනවා. මෙය ඉතාම වැදගත් අමාත්‍යාංශයක් බව කියන්න

පුළුවන්. කෘෂි කර්මාන්තය කියන්නේ අපේ රටේ දෙකෝටි විසිලක්ෂයකට අධික ජනතාවක් ජීවත් කරවන අමාත්‍යාංශය කියලා අපට කියන්න පුළුවන්. රටේ ශ්‍රම බලකායෙන් සියයට 36කුත්, ඒ වාගේම රටේ ජනතාවගෙන් සියයට 75ක් පමණත් කෘෂි කර්මාන්තයේ නියැළෙනවා.

අද අපි කථා කළා වී ගොවිතැන පිළිබඳව. ඒ වාගේම එළවලු ගොවියා, පලතුරු ගොවියා, සුළු අපනයන භෝග -විශේෂයෙන් ගම්මිරිස්, කුරුඳු හා පොල් ඇතුළු වගාකරුවන්- සියල්ලක්ම කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයට අයිති වනවා. අද රටේ ගොවීන් විශාල අර්බුද රාශියකින් පෙළෙමින් ජීවත් වන බව අපි දකිනවා. ඒ අයගේ කෘෂි කර්මාන්ත කටයුතු කරගෙන යෑම සඳහා විවිධ බාධා තිබෙනවා. විශේෂයෙන්ම ඉඩම් සීමාවීම ඒ අයට බලපාන ප්‍රධාන ගැටලුවක්. ඒ වාගේම ගංවතුර, නියහය, අද කථා කරන වනසත්ව හානිය -ඒ පිළිබඳව ගොඩක් අද කථා කරනවා- ගුණාත්මක බීජ නොමැති වීම, බීජ සහ කෘෂි රසායනික ද්‍රව්‍යවල මිල ඉහළ යෑම කියන කාරණා ඒ අයට බලපානවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පොහොර සහනාධාරය ලැබෙන්නේ වීවලට පමණයි. එතකොට එළවලු ගොවියාට, පලතුරු ගොවියාට - විශේෂයෙන්ම කෙසෙල්, ගස්ලබු ඇතුළු පලතුරු වගා කරන ගොවීන්- අවශ්‍ය පෙහොර ටික මිලදී ගැනීම සඳහා විශාල මුදලක් වැය කරන්න සිදු වෙලා තිබෙනවා.

ඒ වාගේම නිෂ්පාදන අළෙවි කර ගැනීමට නොහැකි වීමත් ඒ අයට තිබෙන ගැටලුවක්. විශේෂයෙන් එළවලු, පලතුරුවලින්- සියයට 30ක් පමණ විනාශ වනවා. මේ තත්ත්වය උඩ ගොවීන් ප්‍රශ්න රාශියකට මුහුණ දෙනවා. අපි දන්නවා කෘෂිකර්ම අමාත්‍යාංශය මෙතෙක් කල් යම් යම් ප්‍රශ්න මත තමයි කටයුතු කළේ කියලා. අද කෘෂිකර්ම අමාත්‍යාංශය මේ අය වැය තුළින් මේ ප්‍රශ්නවලට යම් විසඳුමක් ලබා දෙන්න කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

අද නාඩු වී කිලෝ එකට රුපියල් 120ක අවම මිලක් රජය විසින් තීරණය කරලා තිබෙනවා. මේ වනකොට ගොවීන්ගෙන් ව්‍යාපාරිකයන් වී මිලදී ගන්නේ රුපියල් 135, 140 වාගේ මිලකට. යම් යම් ස්ථානවල අපි ඒක දැක්කා. මෙහිදී අපි ගොවියාත්, පාරිභෝගිකයාත් ආරක්ෂා වන ක්‍රමයක් සකස් කරන්න වනවා. මොකද, මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට පත් වනකොට නාඩු සහල් කිලෝ එකක මිල තිබුණේ රුපියල් 170කට. මේ වනකොට රුපියල් 50කින් මිල වැඩි වෙලා තිබෙනවා. රුපියල් 50කින් මිල වැඩි වෙලා, සහල් කිලෝ එක රුපියල් 220 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. පසුගිය කාලයේ රුපියල් 230 සිට රුපියල් 300 දක්වා සහල් මිල ඉහළ ගියා. එතකොට වෙළඳපොළේ අළෙවි වුණේ, පාරිභෝගිකයා මිලදී ගත්තේ, ව්‍යාපාරිකයා රුපියල් 85ත් - 100ත් අතර මිලකට ලබා ගත් වීවලින් නිෂ්පාදනය කරපු සහල්. එහෙම නැතුව කිලෝ එක රුපියල් 120ට, 130ට, 140ට ගත්ත වීවලින් නිෂ්පාදනය කරපු සහල් නොවෙයි, රුපියල් 280ට, 300ට පාරිභෝගිකයාට ලබා දුන්නේ. රුපියල් 135ට, 140ට වී මිලදී ගැනීම තුළින් ඉදිරි කාලයේදී පාරිභෝගිකයාට රුපියල් 220 වාගේ පාලන මිලක් යටතේ සහල් සපයන්න පුළුවන් වෙයිද කියන ප්‍රශ්නය තිබෙනවා. මේ පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

පලතුරු වගාව ගත්තොත්, රත්නපුර දිස්ත්‍රික්කයේ මම ජීවත් වන ඇඹිලිපිටිය ප්‍රදේශයේ, විශේෂයෙන් කෙසෙල් වගාවෙන් ජීවත් වන විශාල පිරිසක් ඉන්නවා. අද ඇඹුල් කෙසෙල් කිලෝවක් රුපියල් 60යි. ඒ වාගේම කෝලිකුට්ටු කෙසෙල් කිලෝවක් රුපියල් 140කට වාගේ තමයි අළෙවි වෙන්නේ. මේවා කොළඹට එනකොට මේ ප්‍රදේශවල පාරිභෝගිකයන්ට ලබා ගන්න වෙන්නේ ඒ වාගේ තුන්ගුණයක මිලකට. අද ඇඹුල් කෙසෙල් කිලෝවක් කොළඹින් ගන්න වෙන්නේ රුපියල් 180ක වාගේ මිලකට. එකට තුන්ගුණයක් පමණ මිලකට තමයි පාරිභෝගිකයාට ලැබෙන්නේ. නමුත් ගොවියාට ලැබෙන්නේ ඉතාම සුළු මුදලක්.

ඒ වාගේම අද මේ පලතුරු වර්ග ඉදවනවා. ඒත්‌ල් කියන රසායන ද්‍රව්‍ය එහෙම නැත්නම් එතෝන් කියන රසායන ද්‍රව්‍ය යොදලා තමයි මේ පලතුරු වර්ග ඉදවන්නේ. මේවා ඉතාම විෂ සහිත ද්‍රව්‍ය. දැනට වෙළඳ පොළේ තිබෙන සෑම පලතුරක්ම - විශේෂයෙන් ගස්ලබු, කෙසෙල්, අඹ- ඒත්‌ල් කියන රසායනික ද්‍රව්‍ය යොදලා තමයි ඉදවන්නේ. ඇඹිලිපිටියෙන් කෙසෙල් ලොරියට පටවන්නේ ඒ රසායනික ද්‍රව්‍ය යොදලා. ඊට පහුව දා එළි වෙනකොට, කොළඹට එනකොට ඒ කෙසෙල් ඉදිලා. ඒ වාගේ වස විස මිශ්‍ර පලතුරු තමයි අපට අද පරිභෝජනයට ලැබිලා තිබෙන්නේ. ඒ රසායනික ද්‍රව්‍ය යෙදුවාම ඉක්මනින්ම පලතුරු ඉදිලා විනාශ වෙනවා. ඉක්මනින්ම පර වෙලා, කන්න බැරි තත්ත්වයකට පත් වනවා. අපි දන්නවා එදා ගම්වල මිනිස්සු කෙසෙල් ඉදෙව්වේ, කැප්පෙටියා කොළ වාගේ දේවල් අතුරා දුම් ගහලා. ඒ වාගේ විවිධ ක්‍රම උපයෝගි කරගෙන කෙසෙල් ඉදෙව්වාම අඩුම තරමින් සතියක් විතර ඒ පලතුරු තියා ගන්න පුළුවන්. නමුත් රසායනික ද්‍රව්‍ය යෙදීම නිසා පලතුරු ඉක්මනින් විනාශ වෙනවා. ඒ වාගේම පාරිභෝගිකයාට අවශ්‍ය පරිදි ඒ පලතුරු පාවිච්චියට ගන්න නොහැකි වෙලා තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා, විෂකාරක ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවන එක නැවැත්වීමේ විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ කුරුඳු, ගම්මිරිස් ගොවීන් ඉන්නවා. පුවක්වලින් කරුංකා නිෂ්පාදනය කරලා පිට රට යැවීම තුළින් අපට විශාල වශයෙන් අපනයන ආදායමක් ලැබෙනවා. අපි පසුගිය කාලයේ දැක්කා, ගම්මිරිස් සම්බන්ධයෙන් ප්‍රශ්න මතු වුණු ආකාරය. වියට්නාමය ආදි රටවලින් අපේ රටට ගම්මිරිස් ගෙනැල්ලා ප්‍රතිඅපනයනය කිරීම නිසා ගම්මිරිස් මිල පහළ බැස්සා. මේ වන කොට කරුංකා විකුණා ගන්න බැරි වෙලා තිබෙනවා. කරුංකා කිලෝවක මිල රුපියල් 500ක් වාගේ මිලකට පහළ බැහැලා. මේ ගැන මම මීට ඉස්සෙල්ලාත් කථා කළා. අපි ඉන්දුනීසියාවෙන් අපේ රටට කරුංකා ගෙන්වලා ඉන්දියාවට යවනවා. ඒ වැඩ පිළිවෙළ නිසා පසුගිය කාලයේ කරුංකා මිල අඩු වුණා. රුපියල් 1,000ට, 1,500ට තිබිච්ච කරුංකා කිලෝව අද රුපියල් 550යි. ඒ අපනයනකරුවන් සමඟ අපි කථා කළා. ඒ අය කියන්නේ, ඉන්දුනීසියාවෙන් අපේ රටට කරුංකා විශාල ප්‍රමාණයක් ගේනවා කියලායි. අපේ රටේ කරුංකා ඉන්දියාවට ගන්නේ නැහැ. ඉන්දුනීසියාවෙන් ඉන්දියාවට කරුංකා ගෙන්වන වැඩ පිළිවෙළක් සකස් කර ගෙන තිබෙනවා. ඒ නිසා අපේ කරුංකා ගොවියා ඉතා අසරණභාවයට පත් වෙලා තිබෙනවා. මෙහිදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

ගරු බී. ආරියවංශ මහතා
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තවත් තත්ත්පර කීපයක් දෙන්න.

අපේ රටේ පසු ගිය කාලය තුළ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අළෙවි මණ්ඩලය මඟින් කුළු බඩු අළෙවි සැල් 29ක් පවත්වා ගෙන ගියා. ඒ අමාත්‍යාංශය මඟින් මේ රටේ ජනතාවට උසස් තත්ත්වයෙන් යුතු කුළු බඩු ලබා දුන් ඒ වෙළෙඳ සැල් මේ වන කොට වැසී ගොස් තිබෙනවා. එවැනි වෙළඳ සැල් 24ක් වැහිලා තිබෙනවා. තවත් කඩ 4ක්, 5ක් වාගේ තමයි මේ රටේ පවත්වා ගෙන යන්නේ. ඒ නිසා විශාල පිරිසකට රැකියා අහිමි වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට පත් වුණු පසු වැසී ගිය එකම රාජ්‍ය ආයතනය බවට පත් වෙලා තිබෙනවා, කුළු බඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අළෙවි මණ්ඩලය. වෙළෙඳ ව්‍යාපාරිකයන්ගෙන් ලබාගත් කුළු බඩු වෙනුවෙන් රුපියල් මිලියන ගණනක් ගෙවන්නත් තිබෙනවා. මා ඉහත කී පරිදි රාජ්‍ය සේවකයන් පිරිසකට ද රැකියා අහිමි වෙලා තිබෙනවා. ඒ සමහර අය ස්ථිර කරන්නේ නැතුව ඉන්නවා. ඔබතුමන්ලා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියලායි අපි කියන්නේ. පසුගිය ආණ්ඩු කාලයේ එම ආයතනය තුළ දූෂණ, වංචා රාශියක් සිදු වෙලාත් තිබෙනවා. සමන්ත විද්‍යාරත්න මැතිතුමා තමයි දැන් මේ අමාත්‍යාංශය භාරව ඉන්නේ. එකී දූෂණ, වංචා ගැන පරීක්ෂණයක් පවත්වන්න. ඒ වාගේම, අපේ රටේ -දේශීය- කුළු බඩු ජනතාවට විධිමත්ව, පහසුවෙන් මිල දී ගත හැකි ආකාරයේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මා ඉල්ලා සිටිනවා. කථා කරන්න තවත් දේවල් තිබුණත් මට ලැබී තිබෙන කාලය අවසන් වී තිබෙනවා.

දීර්ඝ කාලයක සිට ගොවි ජනතාව සමඟ එක්ව එම ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් ගැටුණු දෙපළක් තමයි අද කෘෂිකර්ම විෂය භාර ඇමතිවරයා සහ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට ඉන්නේ. ඔබතුමන්ලා, මේ රටේ ගොවි ජනතාවගේ ප්‍රශ්න -ගැටලු- රාශියක් දන්නා, හඳුනන ඇමතිවරු දෙපළක්. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කෘෂි කර්මාන්තය වෙනුවෙන්, ගොවි ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන් ඉදිරියේදී කරගෙන යන වැඩසටහන්වලට විපක්ෂයේ මන්ත්‍රීවරුන් වශයෙන්, දුප්පත් ජනතාව වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරුන් වශයෙන් අපි අපේ සහයෝගය ඕනෑම අවස්ථාවක ලබා දෙනවා කියා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුසිල් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.53]

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

වගාවට හානි කරන වන සතුන්ගේ සමීක්ෂණය පැවැත්වෙනවා, මාර්තු 15වැනි දා. මේ දවස්වල ඒ ආශ්‍රිත තවත් සංගණනයක් පැවැත්වෙනවා. ඒ තමයි, ඒ සමීක්ෂණයට බාධා පමුණුවන මන්ත්‍රීවරුන්ගේ සංගණනය. අපේ ගරු විපක්ෂ නායකතුමාත් අද උදේ ඒකට හසු වුණා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා නම් ඒකට හසු වුණේ නැහැ.

අපේ ගරු ඇමතිතුමාත් උත්තරයක් දුන්නා, "උරුමය" නමින් ක්‍රියාත්මක වෙච්ච නිදහස් දීමනා පත්‍ර ලබා දීමේ වැඩසටහන සම්බන්ධයෙන්. මම මුලින්ම ඒ පිළිබඳව නැවතත් යම් අදහසක් කියන්නම්. ඒ වැඩසටහන පිළිබඳව පාර්ශ්ව කිහිපයක් අපිත් එක්ක අදහස් හුවමාරු කර ගත්තා. නිදහස් දීමනා පත්‍ර ලබා දීමේ වැඩසටහන නවත්වන්න කියලා තමයි ඒ ක්ෂේත්‍රයේ විද්වතුන් බොහෝදෙනෙකුගෙන් අපට උපදෙස් ලැබුණේ. ඒ වාගේම, තවත් කණ්ඩායමක් කිව්වා, ඒක සංශෝධන සහිතව ක්‍රියාත්මක කරන්න කියලා. තවත් පිරිසක් කිව්වා, ඒක මේ තිබෙන විධියටම ක්‍රියාත්මක කරන්න කියලා. ඒ නිසා අපි කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සහිතව මේ ක්ෂේත්‍රයේ විද්වතුන් 9 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර තිබෙනවා, ඒ වැඩසටහන පිළිබඳව සොයා බලා එය ක්‍රියාත්මක කරනවාද, නැද්ද කියන එක සම්බන්ධයෙන් නිර්දේශයක් ලබා දෙන්න කියලා. දැනට ඒ කමිටුව පත් කර තිබෙනවා. ඔවුන් හමු වෙනවා. තවත් දවසක් දෙකක් ඇතුළත ඒකට උත්තරයක් ලැබෙයි. ඒ අනුව තමයි, නිදහස් දීමනා පත්‍ර ලබා දීමේ වැඩ පිළිවෙළ සංශෝධන සහිතව කරගෙන යනවා ද, තවදුරටත් ඒ විධියටම ක්‍රියාත්මක වෙනවා ද, නතර වෙනවා ද කියන එක තීරණය කරන්නේ. මේ දක්වා නිකුත් කරන ලද බලපත්‍ර සඳහා කරන්නේ කුමක්ද කියන කාරණය සඳහා අපට නිර්දේශයක් ලැබෙයි. ඒ අනුව කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ, ඉඩම් සහ වාරිමාර්ග විෂය මට පැවරිලා තිබෙන නිසා, මගේ කථාවේදී මම වැඩිමනත් විධියට ඒ විෂයයන් කෙරෙහි අවධානය යොමු කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වාරිමාර්ග ක්ෂේත්‍රය ගත්තාම, අවුල් කරපු, වැඩ නතර වුණු, ප්‍රශ්න ගොඩ ගැසුණු, ප්‍රශ්න සහිත වාරිමාර්ග ව්‍යාපෘති ගොඩක් තිබෙනවා. මේ අය වැයේදී අපේ සැලැස්ම වී තිබෙන්නේ, අපේ ප්‍රධාන අරමුණ වී තිබෙන්නේ, ඒ ව්‍යාපෘති ටික පිළිවෙළක් කරන එකයි, ඒවායේ කටයුතු අවසන් කරන එකයි. ව්‍යාපෘති 7ක් තිබෙනවා. ඒ 7න් 5ක් කොහොම හරි මේ අවුරුද්දේ අවසන් කිරීම තමයි අපේ බලාපොරොත්තුව. මේ අය වැයෙන් ඒ සඳහා සල්ලි වෙන් කරලා තිබෙනවා. යාන් ඔය ජලාශ ව්‍යාපෘතියත් තිබෙනවා. යාන් ඔය ජලාශ ව්‍යාපෘතියේ බොහෝ වැඩ අවසන් කර තිබෙනවා. නමුත් එතැන ප්‍රශ්න, ගැටලු, අවුල් ගොඩයි. ඒවා විසඳන්න රුපියල් මිලියන 2,350ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. එහි කටයුතු මේ අවුරුද්දේ අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, උමා ඔය ව්‍යාපෘතිය ගැනත් කිව යුතුයි. ඒ සම්බන්ධයෙන් ද කරුණු ගොඩක් කථා කරලා තිබුණා. එම ව්‍යාපෘතිය ආන්දෝලනයට තුඩු දී තිබෙනවා. උමා ඔය ව්‍යාපෘතියේ කොටස් දෙකක් තිබෙනවා, උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය සහ උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය වශයෙන්. උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය ගත්තාම, එය වඩාත් ආන්දෝලනයට තුඩු දුන් බහුකාර්ය යෝජනා ක්‍රමයක් කියලායි මා හිතන්නේ. එහිත් ගැටලු ගොඩක් තිබෙනවා. ඒ ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කළ යුතු තවත් වැඩ තිබෙනවා. ඒ වැඩ අවසන් කිරීම සඳහා රුපියල් මිලියන 1,920ක් අපේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ බහුකාර්ය යෝජනා ක්‍රමය නිසා පීඩාවට පත් වුණු ජනතාවක් ඉන්නවා. ඉඩම් සම්බන්ධයෙන්, පානීය ජලය සම්බන්ධයෙන්, නිවාස හානි වීම සම්බන්ධයෙන් සහ වන්දි සම්බන්ධයෙන් පීඩාවට පත් වුණු ජනතාවක් ඉන්නවා. ඒ ජනතාව ගැන සොයා බලා නිර්දේශ කිරීමට, දැනටමත් කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් කැබිනට් අනුකමිටුවක් පත් කර තිබෙනවා. ඔවුන් දැනට ඒ කටයුතු කරගෙන යනවා. නුදුරේදීම එහි නිර්දේශ ලබා දෙයි. ඒ නිර්දේශ අනුව උමා ඔය ව්‍යාපෘතිය නිසා පීඩාවට

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

පත් ජනතාවට සහන ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා ඇති. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ උමා ඔය බහුකාර්ය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ගැටලු ගොඩක් තිබෙනවා. ඒවා නිරාකරණය කිරීම සඳහා අපි කටයුතු යොදමින් තිබෙනවා. ඒ වාගේම තමයි, උමා ඔය පහළ නිමින කොටසේ සිද්ධ වන සංවර්ධන යෝජනා ක්‍රමය. එහි සමහර වැඩ අවසන් වෙලා තිබෙනවා; සමහර වැඩ භාගෙට ඇන හිටලා තිබෙනවා; ප්‍රශ්න තිබෙන කොටස් ද තිබෙනවා. ඒවා සඳහාත් අපි මුදල් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. එවැනි අවුල් සහගත, ගැටලු පැන නැඟී ඇති එම ව්‍යාපෘතිය අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම තමයි, ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය සහ මහ කනදරාව වැවට ඒරු වැවේ සිට වතුර ගෙන එන ඇළ මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතිය. ඒකත් භාගෙට ඉදි කරමින් තිබෙන්නේ. එහිත් වැඩ කොටසක් කිරීමට තිබෙනවා. ඒ ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේමයි, පහළ මල්වතු ඔය ව්‍යාපෘතිය; අනුරාධපුරයේ ඉදි වන ජලාශය. ඒකෙන් මන්නාරම ප්‍රදේශයට තමයි ප්‍රතිලාභ ලැබීමට නියමිතව තිබෙන්නේ. ඒ සඳහාත් මුදල් වෙන් කර තිබෙනවා. එතැනත් ගැටලු රාශියක් තිබෙනවා. ඒක කල් ඇදුණු ව්‍යාපෘතියක්. ඒ ව්‍යාපෘතියත් පිළිවෙළක් කිරීම සඳහා අපි බලාපොරොත්තු වෙනවා. මේ අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඒකත් පිළිවෙළක් කරන්න ඕනෑ.

ඊට පස්සේ ප්‍රධානම ව්‍යාපෘතිය විධියට තිබෙන්නේ, උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය. එතැනත් අවුල් ගොඩක් තිබෙනවා. ලංකාවේ දිගම උමඟ එතැන ඉදි වෙනවා. එහි දිග කිලෝමීටර 28යි. ඒක හබරණ නගරය යටින් යන්නේ. ඒ උමඟ ඉදි කිරීමේ කටයුතු දැන් සම්පූර්ණ වෙන්න ආසන්නයි. ඒ සඳහා මහා විශාල ධනස්කන්ධයක් වියදම් කරලා තිබෙනවා. නමුත්, මොරගහකන්දේ ඉඳලා උමඟ දක්වා වතුර එන්නේ නැහැ, උමඟ කෙළවරේ ඉඳලා හුරුළු වැවට හා මහකනදරාව වැවට වතුර යන්නේත් නැහැ. ඒ නිසා මේ ව්‍යාපෘතිය පිළිවෙළක් කරන්න අපි අය වැයෙන් රුපියල් මිලියන 32,500ක් වෙන් කරලා තිබෙනවා, මහා ධනස්කන්ධයක් වියදම් කරලා තිබෙන මේ ව්‍යාපෘතිය පිළිවෙළක් කරලා අපේ රටේ ආර්ථිකයට දායක කරගන්න. මේ විධියේ ව්‍යාපෘති 5ක් තිබෙනවා, ඉවර කරන්න. එයින් ව්‍යාපෘති දෙකක් පිළියෙල කරලා මුදල් වෙන්කරලා තිබෙනවා, නුදුරු අනාගතයේදී ඉවර කිරීම සඳහා. ඒ වාගේම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආයතන හරහා වාරිමාර්ග ක්ෂේත්‍රයේ වාරිමාර්ග නඩත්තු කටයුතු, ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවෙනවා. සාමාන්‍යයෙන් එදිනෙදා සිදු වන ඒ කටයුතු සඳහා රුපියල් මිලියන 4,000ක් වෙන්කරලා තිබෙනවා. ඒ වාගේම, ආපදාවලදී හානියට පත්වෙන ඇළ වේලි ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන්කරලා තිබෙනවා. මහවැලි අධිකාරියට අයත් ඇළ වේලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තවත් රුපියල් මිලියන 1,000කට ආසන්න මුදලක් වෙන්කරලා තිබෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වාරිමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක වෙන ASMP, IWWRMP, වැව් ගම් පුබුදුව සහ නකල්ස් කියන ව්‍යාපෘති හරහා විශාල මුදලක් වාරිමාර්ග ක්ෂේත්‍රය සඳහා වෙන් කරලා තිබෙනවා. දළ වශයෙන් ගත්තොත් වැව් ඉදිකිරීම්, වාරිමාර්ග ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රුපියල් මිලියන 60,000ක විතර මුදල් ප්‍රමාණයක් මේ අය වැයෙන් වෙන්වෙලා තිබෙනවා. මේක විශාල මුදලක්. මේවා විශාල සංවර්ධන වැඩකටයුතු. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ එන මේ වැඩ තොගය හරහා රැකිරක්ෂා උත්පාදනයක් සහ ආර්ථිකයට යම් දායකත්වයක් ලැබෙයි කියලා. වාරිමාර්ග ක්ෂේත්‍රයේ තිබෙන bottlenecks ටිකත් clear වෙනවා, මේ ව්‍යාපෘති ඉවර කිරීම හරහා.

මට ලැබිලා තිබෙන කාලය අනුව හැම ක්ෂේත්‍රයක්ම ආවරණ වෙන විධියට කථා කරන්න ඕනෑ. ඉඩම් ක්ෂේත්‍රය ගැන සාකච්ඡා කරලා බැලුවොත් අපි දන්නවා, කෙනෙක් ජීවත් වෙන ඉඩමට, කෙනෙකුගේ නිවස තිබෙන ඉඩමට බලපත්‍රයක්, දීමනාපත්‍රයක්, ඔප්පුවක් ගන්න ගියාම ඒක ලොකු ගැටලුවක් වෙලා තිබෙනවා කියලා. ලක්ෂ ගණනක ජනතාවක් ඉන්නවා, ඔප්පුවක් නැතුව, බලපත්‍රයක් නැතුව, කිසිදු කඩදාසියක් නැතුව. ඒවාට තිබෙන නීති සංකීර්ණයි. ඒවායේ ක්‍රියාදාමය දිගුයි. එතැනදී ජනතාව කරපු වැරදිත් කොටසක් තිබෙනවා. නිලධාරීන්ගේ පැත්තෙන් වෙච්ච සමහර අඩුපාඩුත් තිබෙනවා. ඒක නිසායි මේක හරි සංකීර්ණ ගැටලුවක් වෙලා තිබෙන්නේ. ඒ නිසා ලක්ෂ ගණනක ජනතාවකට ඔප්පුවක් නැහැ, බලපත්‍රයක් නැහැ, කිසිදු ලියවිල්ලක් නැහැ. මහවැලිය ඇතුළේ හිර වෙලා තිබෙනවා එවැනි ඔප්පු කොටසක්. ඒවා මහවැලියෙන් ලබාදිය යුතුව තිබෙනවා. තව කොටසක් LRC එක ඇතුළේ හිර වෙලා තිබෙනවා. තවත් ඔප්පු කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගොඩගැහිලා තිබෙනවා. මේ නිසා ලක්ෂ ගණනක ජනතාවක් පීඩාවට පත් වෙලා ඉන්නවා. අපි බලාපොරොත්තු වෙනවා මෙන්න මේ ඉඩම් ක්ෂේත්‍රය තුළ විශේෂයෙන්ම මේ ඉඩම් ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය, හිමිකමක් ලබාදීමේ ක්‍රියාවලිය විධිමත් කරන්න සහ වේගවත් කරන්න. ඒ සඳහා නව ක්‍රමයක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා මේ අය වැය තුළින් අපි උත්සාහයක් දරලා තිබෙනවා.

ඒ වාගේම, ඉඩම් සම්බන්ධයෙන් තිබෙන ප්‍රධාන කාරණයක් දීර්ඝ කාලීනව අපි සලකා බැලිය යුතුයි. අපට ඉඩම් ප්‍රතිපත්තියක් ඕනෑ. අපට ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් ඕනෑ. අපේ රටේ පිළිවෙළකට නගර ඉදිවෙන්න ඕනෑ, පිළිවෙළකට නිවාස ඉදිවෙන්න ඕනෑ, පිළිවෙළකට වැව් සහ රක්ෂිත සඳහා ඉඩම් වෙන්වෙන්න ඕනෑ. ඒවා ආරක්ෂා කිරීම සඳහා වන අණපනත් ඕනෑ. ඒ වාගේම කර්මාන්ත සඳහා ඉඩම් වෙන්වෙන්නත් ඕනෑ. අපේ ජනාධිපතිතුමා අය වැය කථාවේදීත් කිව්වා, "මේක දූපතක්. මේකේ ඉඩම් සීමිතයි. ඒ නිසා ඉදිරියේදී නිවාස සඳහා ඉඩම් සීමාව සාධකයක් වෙනවා. හැම බිම් අහලක්ම අපි ප්‍රයෝජනයට ගන්න ඕනෑ, රටේ ආර්ථිකයට දායක වෙන" යනුවෙන්. ඒ නිසා අපට ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ, ඉඩම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

මේ ඉඩම් ගැන කථා කරද්දි ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් අද උදේ මේ අදහස මතු කළා. LRC එක ගැන එතුමා කරුණු ගොඩක් දැක්වුවා, හිටපු ඉඩම් අමාත්‍යවරයකු විධියට. ඇත්තටම LRC එක ගත්තොත්, එහි ප්‍රශ්න ගොඩයි, අවුල් ගොඩයි. නිරාකරණය කරගත යුතු දේවල් ගොඩක් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, Land Reform Commission එකටත්, LRC එකටත්, ප්‍රතිසංස්කරණයක් - reform එකක් - ගේන්න. එහෙම නැතුව මේවා පිළිවෙළක් කරන්න බැහැ. ඒ සඳහා අපි කටයුතු කරමින් තිබෙනවා, ඒ ප්‍රශ්න හඳුනා ගනිමින් තිබෙනවා.

ඒ වාගේම මම තව විශේෂ යමක් කියන්න ඕනෑ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සම්බන්ධයෙන්. අපට බලය හම්බ වුණේ, අපේ රජය පිහිටෙව්වේ විශාල වෙනසක් බලාපොරොත්තුවෙන්. ඒ වාගේම රටේ හැම ක්ෂේත්‍රයකම වෙනසක් බලාපොරොත්තුවෙන්. කෘෂිකර්ම අමාත්‍යාංශය විධියටත් අපෙන් බලාපොරොත්තු වෙනවා, විශාල වෙනසක්. අපිත් බලාපොරොත්තු වෙනවා, අපේ රටේ කෘෂි කර්මාන්තයේ විශාල වෙනසක් කරන්න. කෘෂි කර්මාන්තයට අලුත් තාක්ෂණය ගේන්න ඕනෑ. කෘෂි කර්මාන්තයට නව ක්‍රම හඳුන්වලා දෙන්න ඕනෑ. කෘෂි කර්මාන්තයට තරුණයෝ කැන්දන්න ඕනෑ. කෘෂි කර්මාන්තයට නව බීජ හඳුන්වා දෙන ඒවා, භෝග විවිධාංගීකරණය කරන ඒවා, අස්වැන්න වැඩි කරන ඒවා කරන්න ඕනෑ.

ගොඩක් දේවල් තිබෙනවා, කරන්න. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය කියන්නේ අපේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දැවැන්ත වැඩකොටසක් කරන්න පුළුවන් ආයතනයක්. ඇත්තටම කෘෂිකර්ම ක්ෂේත්‍රය ආශ්‍රිතව තිබෙන දැවැන්තයෙක්. නමුත් පසුගිය කාලයේ මේ දැවැන්තයා, මේ යෝධයා බිමට ඇද වටිටලා තිබුණේ. දේශපාලන අධිකාරිය බැලුවේ, මහවැලිය සතු ඉඩම් ලියා ගන්න, දේපළ අත්පත් කර ගන්න සහ මේ හරහා වෙන වෙන වාසි ගන්න. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට නැවත පණ දෙන්න. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පුනරුදයක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මහවැලි අධිකාරිය හරහා අපේ රටේ කෘෂිකර්මාන්තයේ දැවැන්ත වෙනසක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි දැනටමත් "මහවැලි පුනරුද සතිය" කියලා වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා. මේ රටේ මහවැලි කලාප 10ක් තිබෙනවා. මේ වෙනකොට 7වෙනි කලාපයේ මහවැලි පුනරුද සතිය ක්‍රියාත්මක වෙනවා. මේ සතියේදී, අපි මහවැලි පුනරුද සතිය වැඩසටහන හරහා වැඩ දහසක් සම්පූර්ණ කරනවා.

විශේෂයෙන්ම මේ වැඩසටහන හරහා අපි බලාපොරොත්තු වුණා, මහවැලි අධිකාරියෙන් ඈත් වෙමින් ඉන්න ගොවියා, මහවැලි අධිකාරියෙන් ඈත් වෙමින් ඉන්න ජනපදිකයා නැවත මහවැලි අධිකාරිය වටා ගොනු කරන්න. ඒ හරහා මහවැලි අධිකාරිය සහ ගොවියා සම්බන්ධ කරන්න, නැවත හොඳ බැම්මකින් බඳින්න අපි බලාපොරොත්තු වුණා. මේ වැඩසටහන හරහා ඒක ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ශ්‍රමදාන හරහා ජනතාවගේ සහභාගිත්වයෙන් වැඩ ගොඩක් සිද්ධ වෙලා තිබෙනවා. මේ මහවැලි පුනරුද සතිය හරහා විශාල වැඩ කොටසක් සිද්ධ වෙලා තිබෙනවා, කෘෂිකර්ම ක්ෂේත්‍රයට. ඉතින් මේ විධියට කෘෂිකර්ම ක්ෂේත්‍රයේ මෙන්ම, ඉඩම් හා වාරිමාර්ග ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්න හඳුනා ගනිමින්, දීර්ඝ කාලීන සැලැස්මක් සහිතව මේ තිබෙන අවුල් සහ ප්‍රශ්න ඇති ව්‍යාපෘති නිදහස් කර ගනිමින්, ඒවා clear කර ගනිමින් වැඩකටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

තවත් විශේෂ කාරණයක් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
මට තත්පරයක් දෙන්න.

අපට මේ වැඩකටයුතු කරගෙන යනකොට විවිධ ආයතනවල සම්බන්ධීකරණය ඉතා වැදගත් වෙනවා. කෘෂිකර්ම ක්ෂේත්‍රය ගත්තොත්, මධ්‍යම ආණ්ඩුවේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන තිබෙනවා. පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන ආයතන තිබෙනවා. ඒ වාගේම තවත් විවිධ ආයතන තිබෙනවා. මේ ආයතන සම්බන්ධීකරණය කර ගැනීම සඳහා අපි විශේෂ වැඩපිළිවෙළක් හදලා තිබෙනවා. ඒක අපට කරන්න පුළුවන්. අපි සියලුදෙනා එක ප්‍රතිපත්තියක, එක වැඩපිළිවෙළක වැඩ කරන කණ්ඩායමක් නිසා මේ ආයතන සම්බන්ධීකරණය කරලා ජාතික වශයෙන් එක වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අපට ලේසියි. කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් අපේ ජාතික වැඩසටහනක් තිබෙනවා. පශු සම්පත් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපේ ජාතික වැඩසටහනක් තිබෙනවා. ඉඩම් සම්බන්ධයෙන් අපි වැඩපිළිවෙළක් සකසන්න බලාපොරොත්තු වෙනවා. ඒ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා කියමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු පී. සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 3.07]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி!

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சோடு சம்பந்தப்பட்ட எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற பிரச்சினைகளை நான் இங்கு குறிப்பிடலாமென நினைக்கின்றேன். கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இங்கு பேசும்போது, ஒவ்வோர் அங்குல காணியையும் இந்த நாட்டின் பொருளாதார அபிவிருத்திக்குப் பயன்படுத்த வேண்டுமெனக் குறிப்பிட்டிருந்தார். அதைத்தான் நாங்களும் விரும்புகின்றோம். இந்த நாட்டினுடைய சொத்துக்கள் இந்நாட்டின் அபிவிருத்திக்காகப் பயன்படுத்தப்பட வேண்டும். குறிப்பாக, உற்பத்திப் பொருளாதாரத்துக்கு எங்களுடைய காணிகள் பயன்படுத்தப்பட வேண்டும்.

நான் வாழுகின்ற வவுனியா மாவட்டத்தில் அல்லது வன்னிப் பிரதேசத்தில் யுத்தத்தால் இடம்பெயர்ந்த மக்கள் மீளக்குடியேறும்போது, அவர்களுடைய பெருமளவான வயல் காணிகளில் அரச திணைக்களங்கள் எல்லைக் கற்களை நாட்டி இருப்பதால் அவர்களால் அந்தக் காணிகளில் விவசாயம் செய்ய முடியாத ஒரு சூழ்நிலை காணப்படுகின்றது. குறிப்பாக, வனவளப் பாதுகாப்புத் திணைக்களம், வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் என்பன இவ்வாறு எல்லைக் கற்களை நாட்டி இருக்கின்றன. அதனால், ஏற்கெனவே மக்களால் பயன்படுத்தப்பட்ட பெருமளவான காணிகள் பயன்படுத்தப்பட முடியாத நிலையில் இருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் கூடிய கவனம் செலுத்தி இந்த விவசாயக் காணிகளை மக்கள் பயன்பாட்டுக்கு மீளவும் வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மேலும், இந்தத் திணைக்களங்களால் எல்லைக் கற்கள் நாட்டப்பட்டதனால், ஏற்கெனவே மக்களால் பயன்படுத்தப்பட்ட சிறிய நீர்ப்பாசனக் குளங்களைக்கூட பயன்படுத்த முடியாத சூழல் காணப்படுகின்றது.

எங்களுடைய பிரதேசத்தில் சிறிய நீர்ப்பாசனக் குளங்கள் 30 ஆண்டுகளுக்கும் மேலாக தூர்வாரம் செய்யப்படாமல் - திருத்தப்படாமல் - முறிப்புக் குளங்களாகக் காணப்படுகின்றன. அதாவது, நீரைத் தேக்க முடியாத குளங்களாகக் காணப்படுகின்றன. நீங்கள் இந்த முறை வரவு செலவுத்திட்டத்தில் நிறைய விவசாயக் குளங்களைத்

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

திருத்துவதற்கு நிதி ஒதுக்கி இருக்கிறீர்கள். திருத்தப்படவேண்டிய குளங்களின் பெயர்ப் பட்டியலை எங்களால் சமர்ப்பிக்க முடியும். அந்தக் குளங்களைத் திருத்தி, அதன்மூலம் நாட்டின் தேசிய உற்பத்தியை அதிகரிப்பதற்குரிய நடவடிக்கையை கௌரவ அமைச்சர் அவர்கள் எடுப்பாரென நான் நம்புகின்றேன்.

இன்னுமொரு முக்கியமான விடயத்தை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். எங்களுடைய பிரதேசத்தில் மகாவலி 'எல்' வலயம் இருக்கின்றது. கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இங்கு குறிப்பிட்டதுபோல, மகாவலி 'எல்' வலயம் என்பது அரசியலுக்காகப் பயன்படுத்தப்பட்ட ஒரு முக்கிய திட்டமாகும். எங்களுடைய வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களை உள்ளடக்கி, மகாவலி 'எல்' வலயம் உருவாக்கப்பட்டுள்ளது. ஆனால், இதுவரை மகாவலியின் ஒரு துளி நீர்கூட எங்களுடைய பிரதேசத்துக்கு வரவில்லை. மகாவலி 'எல்' வலயத்தைப் பயன்படுத்தி, வேறு பிரதேசங்களிலிருந்து மக்களைக் கொண்டுவந்து அங்கு குடியமர்த்தி, எங்களுடைய பிரதேசத்தின் இனப் பரம்பலை மாற்றுகின்ற செயற்பாடு கடந்த காலங்களில் இடம்பெற்றது. அந்தச் செயற்பாடு தொடரக்கூடாது என நான் கௌரவ அமைச்சர் அவர்களிடம் மிகவும் தாழ்மையாகக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதி அமைச்சர் அவர்கள் கீழ் மல்வத்து ஓயா திட்டம் தொடர்பாகவும் குறிப்பிட்டார். அந்தத் திட்டமானது எங்களுக்கு மிகவும் பிரயோசனமான ஒரு திட்டமாகும். கடந்த அரசாங்கங்கள் செய்த அதே பிழையை நீங்கள் செய்யமாட்டீர்களென நான் நம்புகின்றேன். இந்தத் திட்டத்தினூடாக, தங்களுடைய காணியைவிட்டு வெளியேற வேண்டிய அநுராதபுர மாவட்ட மக்களைக் கொண்டுவந்து வவுனியாவில் குடியமர்த்துவதற்குரிய ஏற்பாட்டை கடந்த காலத்தில் செய்திருந்தார்கள். தயவுசெய்து, இன முரண்பாட்டை ஏற்படுத்தக்கூடிய, எங்களது பிரதேசத்தின் இனப்பரம்பலை மாற்றக்கூடிய இந்தச் செயற்பாட்டைத் தொடரக்கூடாதென நான் கௌரவ அமைச்சர் அவர்களை கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய பிரதேசத்தில் தென்னை மரங்களில் ஏற்படுகின்ற வெண் ஈக்களின் தாக்கம் மிக மோசமாகக் காணப்படுகின்றது. இன்று எமது நாட்டில் ஏற்படுள்ள தேங்காய் உற்பத்தி வீழ்ச்சிக்கு இந்த நோய்த் தாக்கமும் ஒரு முக்கிய காரணமாகும். அதைக் கட்டுப்படுத்துவதற்குரிய மருந்தை விசுறுவதற்கு விவசாயிகளால் முடியாமல் இருக்கிறது. அந்த மருந்தை விசுறுவதற்குப் பயன்படுத்தப்படுகின்ற rocker pumps கிட்டத்தட்ட ஐந்து இலட்சம் ரூபாய் பெறுமதியுடையது. அதனைச் சிறு உற்பத்தியாளர்களால் கொள்வனவு செய்ய முடியாத சூழல் இருக்கிறது. கௌரவ அமைச்சர் அவர்களே, APCs ஊடாகவோ அல்லது கமநல அபிவிருத்தித் திணைக்களத்தின் ஊடாகவோ இந்த rocker pumpsஐ கொள்வனவு செய்து, அதனை விவசாயிகளுக்கு வாடகைக்குக் கொடுப்பதன்மூலம் தெங்கு உற்பத்தியைப் பெருக்கலாமென்ற ஆலோசனையை நாங்கள் உங்களிடம் முன்வைக்கின்றேன்.

அடுத்து, உர மானியம் பற்றி கூற வேண்டும். ஒரு ஹெக்டேயாருக்கு 25,000 ரூபாய் என்ற அடிப்படையில், ஓர் ஏக்கருக்கு 10,000 ரூபாய்தான் உரமானியத்துக்கு ஒதுக்கப்பட்டுள்ளது. ஓர் ஏக்கருக்கான உர மானியத்தை 20,000 ரூபாயாக அதிகரிக்கும்படி விவசாயிகள் கோரிக்கை விடுக்கின்றார்கள். எங்களுடைய மாவட்டமானது உளுந்துச் செய்கைக்கு மிகவும் பிரபல்யமானது. அண்மையில் ஏற்பட்ட வெள்ள அனர்த்தத்தால் உளுந்துச் செய்கை மேற்கொள்ளப்பட்ட 10,000க்கும் மேற்பட்ட ஏக்கர் நிலங்கள் முற்றுமுழுதாக அழிவடைந்தன. எனினும், அந்த விவசாயிகளுக்கு இதுவரை நட்டஈடு எதுவும் வழங்கப்படவில்லை என்பதை நான் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டு வருகின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து, எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

உர மானியத்தை காசாக வழங்காமல் APCs ஊடாக உரமாகவே வழங்குமாறு விவசாயிகள் கோருகின்றார்கள். உர மானியத்துக்கு காசு வழங்கினால், private sectorஇல் உரத்தை வாங்கும்போது தரம் குறைந்த உரம் வழங்கப்படுவதாக குற்றச்சாட்டு இருக்கின்றது. உர மானியம் பெறுபவர்களுக்கான இலவசக் காப்புறுதியை எல்லா விவசாயிகளுக்கும் வழங்குமாறும் காப்புறுதித் தொகையை அதிகரித்துத் தருமாறும் அவர்கள் கேட்கின்றார்கள். நான் இந்த விடயங்களை கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன். நன்றி.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම විනාඩියක් ගන්නම්.

පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පිළිගැනීමේ නිලධාරියෙකු විධියට කටයුතු කළ ඒ.එච්.එල්. කීර්තිරත්න මැතිතුමා දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ සේවය කරපු කෙනෙක්. එතුමා අවුරුදු 37යි, මාස 7ක් පාර්ලිමේන්තුවේ සේවය කර තිබෙන අතර, කථානායකවරුන් 11 දෙනෙකු යටතේ වැඩ කරලා තිබෙනවා. 2025.03.12 වෙනි දින, එනම් අද දින එතුමා විශ්‍රාම යනවා. පාර්ලිමේන්තුව විධියට අපි සියලුදෙනාම එතුමාගේ විශ්‍රාම දිවියට සුභ පතන ගමන්, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවට අවුරුදු 37ක් කරපු සේවය වෙනුවෙන් එතුමාට අපේ ගෞරවය පුද කරනවා.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු එම්.ඒ.එම්. තාහීර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.15]

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சின் விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்வடைகிறேன். காரணம், நான் சார்ந்திருக்கின்ற பிரதேசம் இந்த அமைச்சினுடைய முக்கிய வகிபாகங்களைக் கொண்டிருக்கின்றது. அந்தப் பிரதேசத்தில் இருக்கின்ற பிரச்சினைகளைப் பல தடவை நான் இந்த அவையிலே முன்வைத்திருக்கின்றேன். குறிப்பாக, அம்பாறை மாவட்டம் இந்த நாட்டினுடைய நெல் உற்பத்தியில் மிகக் கூடுதலான பகுதியை - கிட்டத்தட்ட நான்கிலொரு பகுதியைக் கல்லோயாத் திட்டத்தின்மூலமாக வழங்குகின்ற நீரைப் பயன்படுத்தி உற்பத்தி செய்து வருகின்றது. 1949ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டு 1953ஆம் ஆண்டில் நிறைவடைந்த இந்தத் திட்டம் இந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுடைய விவசாயத்துக்கு மிகவும் பயனுள்ளதாக அமைந்திருக்கின்றது. இருந்தாலும், குறித்த சில காலங்களில் ஏற்பட்ட பாரிய வெள்ள அனர்த்தங்கள் மற்றும் ஏனைய பாதிப்புகள்மூலம் அங்குள்ள விவசாயிகள் மிகக் கூடுதலாகப் பாதிக்கப்பட்டிருந்ததை நாங்கள் அறிவோம். இந்தப் பாராளுமன்றம் தொடங்கிய காலத்தில்கூட அவ்வாறான ஒரு பிரச்சினைக்கு நாங்கள் எல்லோரும் முகங்கொடுத்த வரலாறு இருக்கின்றது.

இந்த நாட்டினுடைய பாரிய நீர்நிலைகளில் ஒன்றாகக் காணப்படுகின்ற சேனாநாயக்க சமுத்திரம் 120,000 ஏக்கர் விவசாய நடவடிக்கைக்கு நீரை வழங்குகின்றது. ஆயினும், 1953ஆம் ஆண்டு முடிவுறுத்தப்பட்ட இந்த வேலைத்திட்டம் தொடர்பில் இதுவரை எந்தவிதமான அபிவிருத்திப் பணிகளும் மேற்கொள்ளப்படாத நிலை காணப்படுகின்றது. கடந்த 2014ஆம் ஆண்டு மஹிந்த ராஜபக்ஷ அரசாங்கத்தின்மூலம் அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற மகா ஓயா, பதியத்தலாவ போன்ற பிரதேசங்களுக்குப் பிரயோசனம் அளிக்குமுகமாக ரம்புக்கன ஓயா திட்டம் ஆரம்பிக்கப்பட்டுப் பல அபிவிருத்திகள் நடந்தேறியிருக்கின்றன. ஆனால், அதையும்விடப் பழைமைவாய்ந்த சேனாநாயக்க சமுத்திரம் எந்தவிதமான அபிவிருத்திப் பணிகளும் இல்லாமல் காணப்படுகின்றது. சில காலங்களில் இந்த நீர்நிலையில் நீர் அதிகமாக இருப்பதால் அவசரமாகத் திறந்துவிட வேண்டிய அபாயகரமான சூழ்நிலை ஏற்படுகின்றது. எனவே, இந்த சேனாநாயக்க சமுத்திரத்தை இன்னும் ஆழமாகத் தோண்டி, கூடுதலான நீரைச் சேமிப்பதற்கான வழிமுறையை இந்த அமைச்சு மேற்கொள்ள வேண்டுமென நான் எதிர்பார்க்கின்றேன்.

குறிப்பாக, இந்த நீர்நிலை இந்த நாட்டில் விவசாயத்துக்குத் தேவையான 15 வீதமான நீர்த் தேவையைப் பூர்த்தி செய்கின்ற பணியைச் செய்துகொண்டிருக்கின்றது. இதனைப் பாதுகாக்காத காரணத்தால் கடந்த 10 வருடங்களாக இந்தப் பிரதேச மக்கள் பாரிய நட்டங்களை அனுபவித்திருக்கின்றார்கள். அதிகமான காலங்களிலே நீரைத் திறந்துவிட்ட பிறகு மழை வீழ்ச்சி இல்லாது வரட்சியினால் பாதிக்கப்பட்டிருக்கிறார்கள். அதேபோன்று, நீரைத் திறந்துவிட்டால் அடுத்த முறை விவசாயம் செய்வதற்கு நீர் இல்லாமல் போய்விடுமென எண்ணி நீரைச் சேமித்தபோது, மீண்டும் வெள்ளப் பெருக்கினால் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். இவ்வாறான சூழ்நிலை அங்கே தொடர்ச்சியாகக் காணப்படுகின்றது. வெள்ள அனர்த்தத்தின்மூலமாகப் பாதிக்கப்பட்ட bundகள், வாய்க்கால்கள், பாதைகள் போன்றவற்றைப் புனரமைப்பதற்கான நிதி தற்போது ஒதுக்கப்பட்டு இருந்தபோதிலும், அது தொடர்பான தொழில்நுட்ப ரீதியான மதிப்பீட்டு அறிக்கைகளைத் தயாரிப்பதில் எமது அம்பாறை மாவட்டம் கஷ்டப்படுகின்றது. காரணம், தற்போது மேற்கொள்ளப்படும் பணியாளர்களின் வேலை நிறுத்தம் அதற்குத் தடையாக இருப்பதாக நாங்கள் அறிகின்றோம். எனவே, அடுத்த போகம் விவசாயம் செய்வதற்கு முன்னர் இந்த மதிப்பீட்டு அறிக்கையைத் தயாரித்து, உடனடியாக அந்த வேலைத்திட்டங்களை முன்னெடுப்பதற்கு கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்தவேண்டுமென்று இச்சந்தர்ப்பத்திலே நான் கேட்டுக்கொள்கின்றேன்.

எங்களுடைய பிரதேசத்தில் அதிகமான சிறு குளங்கள் காணப்படுகின்றன. குறிப்பாக பொத்துவில், பாணமை, திருக்கோவில் போன்ற பிரதேசங்களில் காணப்படுகின்ற சிறு குளங்களைப் புனரமைப்பதன்மூலம் அந்தப் பிரதேசத்தில் ஒரு போகம் மாத்திரம் செய்யப்படும் விவசாயத்தை இரண்டு போகங்களிலும் செய்யும் வகையில் அங்குள்ள காணிகளைப் பயன்படுத்த முடியும். இதன்மூலம் இந்த நாட்டில் ஏற்படும் அரிசி மற்றும் ஏனைய தானியங்களின் தட்டுப்பாட்டை நீக்க முடியுமென்பதோடு, இறக்குமதியையும் கட்டுப்படுத்தலாம். எனவே, இந்த விடயம் தொடர்பில் கூடுதலாகக் கவனம் செலுத்தவேண்டிய தேவை இருக்கின்றது.

அப்பகுதியில் மேற்கொள்ளப்பட எதிர்பார்த்துள்ள 'ஹெட ஓயா' நீர்ப்பாசனத் திட்டம் என்பது மிக நீண்டகாலத் திட்டமாகும். 2017ஆம் ஆண்டு அதற்கான அமைச்சரவையின் அங்கீகாரம் வழங்கப்பட்டு, 68 மில்லியன் US Dollars பெறுமதியான அந்த வேலைத்திட்டத்தை ஆரம்பிப்பதற்கான சந்தர்ப்பங்கள் இருந்தும் இதுவரைக்கும் அது ஆரம்பிக்கப்படாமல் இருக்கின்றது. இந்த அரசை நம்பி வாக்களித்த அந்தப் பிரதேசத்தில் இருக்கும் விவசாயிகளும் ஏனையவர்களும், ஒரு சிறந்த வழிமுறையினூடாக விவசாயத்தின்மூலம் இந்த நாட்டை அரசாங்கம் கட்டியெழுப்புமென மனப்பால் குடித்துக்கொண்டு இருக்கிறார்கள். அவர்களின் எதிர்பார்ப்பை ஈடேற்றும் வகையில் நிச்சயமாக நீங்கள் இந்தத் திட்டத்தை நடைமுறைப்படுத்த வேண்டிய தேவை இருக்கின்றது. பொத்துவில், மொனராகலை ஆகிய பிரதேசத்தில் இதுவரைக்கும் 1,250 ஏக்கர் நிலத்தில்தான் விவசாயச் செய்கை பண்ணப்படுகின்றது. இந்தத் திட்டத்தை ஒழுங்குபடுத்துவதன்மூலம் 5,000 ஏக்கர் நிலத்தை விவசாயத்துக்காகப் பயன்படுத்த முடியும். அத்தோடு, பொத்துவில் பிரதேசத்தில் இன்றுவரை காணப்படுகின்ற குடிநீர் பிரச்சினையைத் தீர்ப்பதற்கும் இந்தத் திட்டம் வழிவகுக்கும் என்று இச்சந்தர்ப்பத்திலே நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, எமது பிரதேசத்திலே 29 கமநல சேவை நிலையங்கள் காணப்படுகின்றன. அதிலே தமிழ் மொழி பேசுகின்ற மக்களை அடிப்படையாகக்கொண்டு 17 நிலையங்களும், சிங்கள மக்களுடைய பிரதேசங்களில் 12

[ගරු එම්.ඒ.එම්. හාෆීර් මහතා]

நிலையங்களும் காணப்படுகின்றன. தமிழ்மொழி அடிப்படையிலான இந்த 17 நிலையங்களிலும் தமிழ்பேசும் கமநல உத்தியோகத்தர்கள் நால்வர் மாத்திரமே கடமை புரிகின்றார்கள். அவர்களில் தரம் 1இல் கடமைபுரிகின்ற ஒரு கமநல உத்தியோகத்தர் வருகின்ற ஏப்பிரல் மாதத்தில் கடமையிலிருந்து ஓய்வுபெற இருக்கின்றார். இவ்வாறான ஒரு சூழலிலே 14 நிலையங்களில் வெற்றிடங்கள் காணப்படுகின்றன. அங்கிருக்கின்ற 3 பேரும் 17 கமநல சேவை நிலையங்களின்கீழ் உள்ள அந்த விவசாயிகளுக்கு எவ்வாறு பணி செய்வார்கள் என்கின்ற விடயத்தை இந்த அமைச்சு கவனத்திற்கொள்ள வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், கமநல சேவை நிலையங்களிலே 71 விவசாய ஆராய்ச்சி உற்பத்தி உதவியாளர்களுடைய வெற்றிடங்கள் காணப்படுகின்றன. இந்த நாட்டில் அபிவிருத்தியை ஏற்படுத்தி நாட்டினுடைய பணிகளைச் சிறப்பாகச் செய்ய வேண்டும் என்கின்ற எதிர்பார்ப்புடன், உற்பத்திகளை அதிகரிப்பதன்மூலம் வெளிநாட்டு இறக்குமதியைக் குறைப்போம் என்கின்ற ஒரு நோக்கினை நாம் முன்னெடுத்திருக்கின்றோம். அப்படியிருக்கின்றபோது, இவ்வகையான உத்தியோகத்தர்கள் இல்லாமல், விவசாயிகளுக்கு எந்தவகையான ஆலோசனைகளை, அறிவூட்டல்களை, ஏனைய விடயங்களை வழங்க முடியும்? எனவே, இந்த அமைச்சு உடனடியாக இந்த விடயத்தைக் கவனத்திலெடுத்து, இவ்வெற்றிடங்களுக்கான appointmentஐ வழங்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்திலே நான் கேட்டுக் கொள்கின்றேன்.

இந்த நாட்டிலேயிருக்கின்ற நீர் நிலைகளை இணைப்பதன்மூலம் நீர் முகாமைத்துவத்தை மேம்படுத்த முடியும். அதன்மூலமாக, வெறுமனே கிடக்கின்ற பல விவசாயக் காணிகளைப் பயன்படுத்தக்கூடியதாக இருக்கும். கௌரவ உறுப்பினர் ஒருவர் இங்கே பேசுகின்றபோது, தாம் சார்ந்த சில இடங்களிலே சோளம் மற்றும் ஏனைய பயிர்களைச் செய்கை பண்ணுவதற்கான ஏற்பாட்டை இந்தப் பாதீட்டில் செய்திருப்பதாகக் கூறினார்.

குறிப்பாக, அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற விவசாயிகள் நெற் பயிர்ச்செய்கையைத் தவிர வேறு பயிர்ச் செய்கை எதனையும் செய்வதை நாங்கள் காண முடிவதில்லை. அவர்களுடைய காணிகளிலும் சோளம், பாசிப்பயறு போன்ற தானியங்களை உற்பத்தி செய்வதற்கான சந்தர்ப்பம் இருக்கின்றது. குளங்கள், ஏனைய நீர்ப்பாசனத் திட்டங்களை ஒழுங்குபடுத்துவதன்மூலம் மூன்று போக விவசாயம் செய்வதற்கான சந்தர்ப்பத்தை இந்த நாட்டில் ஏன் உருவாக்க முடியாது? நான்கு பக்கமும் நீரினால் சூழப்பட்ட இந்த நாட்டில் பெய்கின்ற மழை நீர் கடலில் போய்ச் சேருகின்ற நிலைதான் காணப்படுகிறது. எனவே, இதற்கான மாற்றுத் திட்டங்களை நாங்கள் கண்டுபிடிக்க வேண்டும். சிறிய குளங்கள் காணப்படுகின்ற பிரதேசங்களில் ஒரு போகம் செய்வதை இரண்டு போகங்களாகச் செய்வதற்கும், இரண்டு போகங்கள் செய்கின்ற பிரதேசங்களில் மூன்று போகங்களாகச் செய்வதற்கும் அல்லது இடைக்காலப் பகுதியில் உப பயிர்களைச் செய்வதற்குரிய வேலைத் திட்டங்களையும் அமைச்சு முன்னெடுக்க வேண்டும்.

இந்த நாட்டில் 76 வருட காலங்களாக நீங்கள் ஆட்சி அதிகாரத்தில் இருக்கவில்லை என்ற விடயத்தை முன்வைத்தீர்கள். அதனை ஏற்று, உங்கள்மீது கொண்ட நம்பிக்கையின் அடிப்படையில்தான் இன்று மிகப் பாரிய பாராளுமன்ற அதிகாரத்தை மக்கள் உங்களுக்கு வழங்கியுள்ளார்கள். எனவே, கடந்தகால அரசியலைக் குற்றஞ்சாட்டிய நீங்கள் எதனைச் செய்யப் போகின்றீர்கள்? என்ற விடயத்தை மக்களும் நாங்களும் எதிர்பார்க்கின்றோம். இங்கிருக்கின்ற அத்தனைபேரும் கொள்கைவாதிகளாகத்தான் அரசியலுக்கு வந்திருக்கிறார்கள். வெறுமனே தங்களை அலங்கரிப்பதற்கோ, தமது ஆசாபாசங்களைப் பூர்த்தி செய்வற்காகவோ வரவில்லை.

எனது தந்தை சாதாரண ஒரு விவசாயி. விவசாயி ஒருவர் வெயில் அடித்தாலும் கவலைப்படுவார்; மழை பெய்தாலும் கவலைப்படுவார். ஏனென்றால், அவர்கள் எதிர்பார்க்கின்ற காலத்தில் மழை வருவதுமில்லை, எதிர்பார்க்கின்ற காலத்தில் வெயில் எறிப்பதுமில்லை. இவ்வாறு கஷ்டப்பட்டு உற்பத்தி செய்த நெல்லை ஒவ்வொரு பிடியாகக் கட்டி, வீட்டுக்குக் கொண்டுவந்து அடுக்கிவைத்துப் பார்க்கின்றபோது ஏற்படுகின்ற சந்தோஷம்தான் ஒரு விவசாயிக்கு அவர் பட்ட கஷ்டத்தினுடைய பலன். அவர்கள் அறுவடை செய்த நெல்லை வீடு வரைக்கும் கொண்டுவந்து சேர்ப்பதில் பல இன்னல்களை, கஷ்டங்களை அனுபவிக்கின்றனர். உற்பத்திகளை அதிகரிப்பதன் மூலம்தான் இந்த நாட்டைக் கட்டியெழுப்ப முடியும். அதற்கான வழிகளை, அதற்கான தேவைகளை நிறைவேற்றும் திட்டங்களை நாங்கள் கண்டறிய வேண்டும். இன்று நாட்டில் இருக்கின்ற குரங்குகள் மற்றும் ஏனைய செல்லப் பிராணிகளுடைய எண்ணிக்கையைக் கண்டறிவதில் மிகக் கூடுதலான கவனம் செலுத்துகின்ற நீங்கள், இந்த நாட்டில் இருக்கின்ற விவசாயம் சார்ந்த பிரச்சினைகளை ஏன் கண்டறியவில்லை? என்ற விடயத்தை இந்தச் சபையில் உங்களிடம் முன்வைக்க விரும்புகின்றேன்.

எமது அம்பாறை மாவட்டம் ஏனைய பிரதேசங்களைவிட விவசாயம், கடற்றொழில், கல்வி போன்ற எல்லாத் துறைகளிலும் சிறந்து விளங்குகின்ற பிரதேசமாகக் காணப்படுகின்றது. இப்போது கிழக்கு மாகாணத்தை நீங்கள் புறந்தள்ளிவிட்டீர்கள் என்ற விடயத்தை அதிகமான பாராளுமன்ற உறுப்பினர்கள் மிகக் கூடுதலாக இந்தச் சபையில் பேசியதைக் கேட்டுக் கொண்டிருந்தோம். உண்மையில் சுகாதாரம், கல்வி, விவசாயம் போன்ற எல்லாத் துறைகளிலும் கிழக்கு மாகாணத்தை நீங்கள் புறந்தள்ளியிருக்கின்றீர்கள் அல்லது இலங்கையில் இருக்கின்ற எல்லா மாவட்டங்களையும்விட அபிவிருத்தியடைந்த மாவட்டமாக கிழக்கை நீங்கள் கண்டிருக்கின்றீர்களா? என்பது எங்களுக்குப் புரியாமல் இருக்கின்றது. எனவே, ஏன் இவ்வாறு ஒதுக்கினீர்கள்? அது இனரீதியான ஒதுக்கமா? கிழக்கு மாகாணம் முஸ்லிம், தமிழ், சிங்கள மூவின மக்களும் வாழ்கின்ற பிரதேசம்; கூடுதலாக முஸ்லிம் மக்கள் வாழ்கின்றார்கள். அந்த முஸ்லிம் மக்களை நீங்கள் புறந்தள்ளுகின்றீர்களா?

எனவே, எதிர்காலங்களில் இவ்வகையான பிரிவுகள், ஒதுக்கங்களை எங்கள்மீது திணிக்காமல் கிழக்கு மாகாணத்துக்கு, குறிப்பாக அம்பாறை மாவட்டத்திற்கு கூடுதலான நிதியை ஒதுக்கீடு செய்யவேண்டுமென்று இந்த சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்வதோடு, குரங்குகள், வீட்டிலிருக்கின்ற ஏனைய செல்லப் பிராணிகளைக் கணக்கெடுப்புச் செய்து கொண்டிருக்கின்ற நீங்கள், இங்கு பாராளுமன்ற உறுப்பினர்கள் பேசுகின்ற விடயங்களைக் கவனத்திற்கொண்டு, இந்த நாட்டின் அபிவிருத்திக்காக என்னென்ன வளங்கள் இருக்கின்றன என்பதைக் கண்டுபிடித்து உற்பத்தியை அதிகரிப்பதற்கான

நடவடிக்கைகளைச் செய்யுங்களென்று கூறிக் கொள்கின்றேன்.

பொதுவாக இந்த நாட்டில் வருடத்தின் 12 மாதங்களில் மூன்று - நான்கு மாதங்கள்தான் விவசாயம் செய்யப்படுகின்றது. ஏனைய மாதங்களில் அந்த நிலங்கள் வெறுமையாகத்தான் காணப்படுகின்றன. அக்காலப்பகுதியில் அந்த நிலங்களில் எந்த வகையான வேலைத் திட்டங்களை முன்னெடுக்க வேண்டுமென்ற விடயத்தை இந்த அரசு கவனத்திற்கொள்ள வேண்டும். உங்களிடத்தில் பல படையணிகள் இருப்பதை இன்று தோன்றுகின்றது. காரணம், கடந்த அரசாங்கங்கள் எங்களுடைய கல்வியில், பொருளாதாரத்தில், வர்த்தகத்தில் பாரிய நாங்கள் பார்க்கின்றோம். உங்களுடைய கட்சியைச் சார்ந்தவர்கள் கிராமிய அபிவிருத்தித் திட்டத்தின்மூலம் வீதிகள் புனரமைக்கப்பட்டுள்ளதென்று கூறிக்கொண்டு ஒவ்வொரு வீடு வீடாக, ஒழுங்கை ஒழுங்கையாகச் சென்று வீதிகளை அளந்து அரசியல் செய்கின்ற விடயத்தையும் நாங்கள் பார்க்கின்றோம்.

ஏன், இந்த நாட்டில் இருக்கின்ற வளங்களை அடையாளங் காண்பதற்கு இவர்களை volunteerஆக பாவிக்க முடியாது? உங்களுடைய அத்தனை வேலைத்திட்டங்களிலும் மிகக் கூடுதலான அரசியல் சாயம் இருக்கின்றது என்பது பற்றி நான் நேற்றும் பேசியிருந்தேன். இவ்வாறான அரசியலிலிருந்து நீங்கள் விடுபட வேண்டும். கடந்த அரசாங்கங்கள் செய்த அரசியலைவிட நீங்கள் உள்ளார்த்தமான அரசியலை முன்னெடுக்கிறீர்கள். ஒவ்வொரு ஒழுங்கையிலும் உள்ள வீடுகளுக்கும் சென்று, அங்கிருக்கின்ற உரிமையாளர்களைச் சந்தித்து, "நாங்கள் உங்களுடைய பாதைகளைப் புனரமைத்து தரப்போகின்றோம், கான்களைக் கட்டித் தரப்போகின்றோம், எதிர்வரும் உள்ளூராட்சி சபைத் தேர்தலிலே எங்களுடைய கட்சிக்கு நீங்கள் வாக்களிக்க வேண்டும்" எனக் கூறுகின்ற நிலைமையைப் பார்க்கின்றோம்.

நான் பிரதேச சபையில் மூன்று தடவை - தொடர்ச்சியாக 14 வருடங்கள் மக்களுடைய பிரதிநிதியாக, தவிசாளராக இருந்து பல கடமைகளைச் செய்திருக்கிறேன். ஆனால், ஒருபோதும் இவ்வாறான கீழ்த்தரமான வேலைகளைச் செய்ததுமில்லை; அவ்வாறான இடத்துக்குச் சென்று அளந்ததுமில்லை. அதற்காகத் தொழில்நுட்ப உத்தியோத்தர்கள் இருக்கின்றார்கள். அவர்கள்மூலம் அளவீடு செய்து அந்த வேலைத்திட்டங்களை முன்னெடுக்க முடியும். நாட்டினுடைய ஜனாதிபதி அவர்களை நாங்கள் மதிக்கின்றோம். அவருடைய கௌரவத்துக்கும் கட்சியினுடைய செயற்பாடுகளுக்கும் மக்கள் தந்த அங்கீகாரத்துக்கும் எதிரான இவ்வாறான செயற்பாடுகளில் இருந்து தவிர்ந்து கொள்ளுமாறு உங்களுடைய கட்சி சார்ந்தவர்களுக்குக் கட்டளையிடுங்கள்! இந்த நாட்டிலே உடைந்து, தகர்ந்து மக்களுக்குப் பிரயோசனம் இல்லாது காணப்படுகின்ற குளங்கள், குட்டைகள், வாய்க்கால் மற்றும் ஏனைய இடங்களை அடையாளம் கண்டு, அவற்றை முன்னிலைப்படுத்தியதான புனரமைப்பு வேலைத்திட்டங்களை முன்னெடுங்கள்! அது சிரமதானப் பணியாக இருந்தாலும் சரி, நாங்கள் அதற்குப் பரிபூரணமான - 100 சதவீதமான - ஒத்துழைப்பை வழங்குவோம். இலங்கையிலே முதன்முதலாக Clean Sri Lanka திட்டம் நிந்தவூர் பிரதேச சபையிலேதான் ஆரம்பிக்கப்பட்டது. கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஆதம்பாவா அவர்களும் நானும் சேர்ந்துதான் அந்தத் திட்டத்தை ஆரம்பித்து வைத்தோம். எனவே, உங்களுடைய சிறந்த வேலைத்திட்டங்கள் அனைத்துக்கும் நாங்களும் ஒத்துழைப்பு வழங்குவதற்குத் தயாராக இருக்கின்றோம். நாங்கள் அதற்காகத்தான் பாராளுமன்றத்துக்கும் வந்தோம். எதிர்க்கட்சியில் இருந்துகொண்டு உங்களுடைய அத்தனை திட்டங்களையும் நாங்கள் எதிர்ப்பதற்கு வரவில்லை. நீங்கள் நல்ல விடயங்களைச் செய்தால், நாங்கள் உங்களோடு முன்னின்று இந்த நாட்டு மக்களுக்கும் எங்களுடைய சமூகத்துக்கும் பணி செய்வதற்குக் தயாராக இருக்கின்றோம்.

எங்கள் மத்தியில் சந்தேகம் ஒன்று இருக்கின்றது. அதையும் கூறிவிட்டு நான் விடைபெறலாம் என நினைக்கின்றேன். அதாவது, அம்பாறையில் இருக்கின்ற கூடுதலான விவசாயக் காணிகள் முஸ்லிம் பிரதேசங்களிலே காணப்படுகின்றன. சேனாநாயக்க சமுத்திரம், உடைந்த கட்டமைப்புகள், bunds போன்றவற்றைத் திட்டமிடப்பட்ட வகையில் புனர்நிர்மாணம் செய்யாமலிருப்பது, இந்த முஸ்லிம் சமூகத்தினுடைய பொருளாதாரத்தைச் சீர்குலைப்பதற்காகவா அல்லது அழிப்பதற்காகவா? என்ற சந்தேகம் எங்களுடைய உள் மனதிலே பாதிப்புக்களை ஏற்படுத்தியது. எங்களுடைய சமூகத்தில் படித்தவர்களுக்கு உரிய இடங்களை வழங்கவில்லை.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

இந்த நாட்டிலே இருக்கின்ற உயர் சபையின், அமைச்சுகளின் செயலாளர்களாகப் பல காலம் எங்களுடைய முஸ்லிம் சமூகத்தைச் சேர்ந்தவர்கள் இருந்தார்கள். கல்வி அமைச்சில் இருந்தார்கள், விவசாய அமைச்சில் இருந்தார்கள், சுகாதாரத் துறையில் இருந்தார்கள். இன்று எல்லா இடங்களிலிருந்தும் முஸ்லிம்கள் தூக்கி எறியப்பட்டிருக்கிறார்கள். அதேபோன்று எங்களுடைய வர்த்தகர்களின் கடைத்தொகுதிகள் தீக்கிரையாக்கப்பட்டன. இவ்வாறு கடந்த அரசாங்கங்கள் எங்களுடைய மக்களின் பொருளாதாரத்துக்கு எதிராக எத்தனையோ விடயங்களைச் செய்தது. அதேபோன்று எங்களுடைய விவசாயத்திலும் கை வைக்கின்ற நிலைமையாகவே bunds மற்றும் குளங்களைப் புனர்நிர்மாணம் செய்யாமல் விட்டிருக்கின்ற செயற்பாட்டை நாங்கள் பார்க்கின்றோம். எனவே, கௌரவ அமைச்சர் அவர்களிடம் நான் விநயமாகக் கூறிக்கொள்வது, மாற்றத்தை வேண்டி வந்திருக்கின்ற நீங்கள் இவ்வாறான விடயங்களைத் தவிர்த்து, எங்களுடைய பிரதேசத்தை அழகான முறையிலே வடிவமைப்பதுடன், மக்களையும் இந்த நாட்டையும் உயர்ந்த இடத்துக்குக் கொண்டுவருவீர்கள் என்ற நம்பிக்கையோடு விடைபெறுகிறேன். நன்றி!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

[අ.භා. 3.32]

ගරු සුදත් බලගල්ල මහතා
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුළුමහත් අය වැය විවාදයම ගත්තොත් ඉතාම වැදගත් අමාත්‍යාංශයක් පිළිබඳව තමයි අද විවාද කරන්නේ. මොකද, මේ අමාත්‍යාංශය සමඟ අපේ රටේ දෙකෝටි විසිලක්ෂයක් ජනතාව බැඳිලා ඉන්නවා. රාජ්‍ය සේවකයින්ගෙන් අතිබහුතරයක් මෙම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඉන්නවා. මුළු රටේම සිටින සත්ත්ව ගහනය මෙම අමාත්‍යාංශයට අයිති වෙනවා. ඒ වාගේම මුළු රටේම තිබෙන පරිසරය මේ අමාත්‍යාංශයට අයිති වෙනවා. උතුර, නැඟෙනහිර, බටහිර, දකුණු ප්‍රදේශවල වාගේම දුෂ්කර ගම්මානවල සිටින රාජ්‍ය සේවකයින් ඇතුළු සියලු මිනිසුන් කොළඹ තිබෙන මෙම අමාත්‍යාංශය වටා ගැට ගැසෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හැබැයි වැරදිලාවත් අර විපක්ෂයේ සිටින මහත්වරු ටික අද මේ ආණ්ඩුව පැත්තේ හිටියා නම් මේ අමාත්‍යාංශය කොහොම තිබේවිද? එහෙම වුණා නම්, වැවට එක ඇමතියි; ඇළට එක ඇමතියි; පොල් ගහට එක ඇමතියි; තේ ගහට එක ඇමතියි; කුකුළාට එක ඇමතියි; හරකාට එක ඇමතියි. එහෙම ඇමතිකම් බෙදාගෙන දැවැන්ත ඇමති මණ්ඩලයක් එක්ක තමයි මේ කටයුතු කරන්න වෙන්නේ. හැබැයි, අද එහෙම නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ලාල් කාන්ත සහෝදරයාගේ මූලිකත්වයෙන් මේ අමාත්‍යාංශය ඉතාම හොඳ, පුළුල් විෂය පථයක් එක්ක ගැට ගැසිලා තිබෙනවා.

මෙම අමාත්‍යාංශය යටතේ පුළුල් විෂය පථයක් තිබෙන නිසා ඉඩම් විෂයය සම්බන්ධ කාරණා කිහිපයක් පිළිබඳව විතරයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. අපේ රට ඉතාම වාසනාවන්ත රටක්. මේ රටේ ගිනි කඳු නැහැ; නාය යෑම් නැහැ; මහා සුළි කුණාටු නැහැ; මහා භූමි කම්පා නැහැ; අයිස් කඳු නැහැ. ඒ නිසා මේ රට වාසනාවන්ත රටක්. රට වටේටම මහ මුහුදු; මධ්‍යම කඳුකරය තිබෙනවා. දවස් 365න්, දවස් 275ක් වහිනවා. එහෙම වාසනාවන්ත රටක් මේක. හැබැයි, අපට තිබෙන්නේ වර්ග කිලෝමීටර් 65,610ක පුංචි බිමක්. එම භූමියෙන් කඳුවලට, ඇළ මාර්ගවලට, වැව්වලට අයත් කොටස ඉවත් කළාට පස්සේ මිනිසුන්ට ජීවත් වෙන්න තිබෙන කොටස බොහොම සීමිතයි. ඒ නිසා මම හිතනවා, අමාත්‍යාංශයක් විධියට ඉතාම හොඳ කළමනාකාරිත්වයකින් යුතුව තමයි අපේ රටේ භූමිය අපි භාවිත කරන්න ඕනෑ කියලා. මොකද, ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට ආවා කියලා මහියංගනයේ සිටින සිරිපාලගේ අක්කරය, අක්කර දෙක වුණේ නැහැ. දකුණේ සිටින මනුස්සයාගේ අක්කරය, අක්කර දෙක වුණේ නැහැ. කොළඹ ඉන්න මනුස්සයාගේ පර්චස් 10, පර්චස් 20ක් වුණේ නැහැ. ඒ නිසා අපට මොකක්ද කරන්න තිබෙන්නේ? මේ භූමිය ඉතා හොඳ ඵලදායිත්වයකින් යුතුව ඉදිරියට පවත්වාගෙන යන්න ඕනෑ. එදා අපේ ගොවියා අක්කරයකින් ගත් ආදායම රුපියල් ලක්ෂයයි නම්, ඒක රුපියල් ලක්ෂ 10ක් දක්වා වැඩි කිරීම තමයි අපේ ජාතික ජන බලවේග ආණ්ඩුවේ වගකීම. අපි ඒක කරන්න සූදානම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වාගේම මේ භූමිය මානව සම්පත වන මිනිසුන්ගේ පදිංචියට, කෘෂි කර්මාන්තයට වාගේම වන සතුන්ට බෙදලා තිබෙනවා. එම නිසා මේ භූමිය කෘෂි කර්මාන්තයට, කාර්මික කටයුතුවලට, මිනිසුන්ගේ පදිංචියට සහ වන සතුන්ට ජීවත් වෙන්න ආදී වශයෙන් ප්‍රධාන කාරණාවලට පාවිච්චි කරන්න අපට සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එයින් වඩා වැදගත් වෙන්නේ කෘෂි කර්මාන්තය. "හුණුවටයේ කතාව" ලියපු බර්ටෝල් බ්‍රෙෂ්ට් කියනවා වාගේ "…. ගොවි දන මනාවූ දිනිය යුතු වූ සේම ගම් බිම්...". ඔව්, අපි විශ්වාස කරනවා, ගොවීන්ට ඉඩම් අයිති විය යුතුයි කියලා. එලෙස අයිති වන ඉඩමට ඉතා හොඳ ඵලදායිතාවක් එක් කිරීමේ වගකීම අපේ අමාත්‍යාංශයට පැවරී තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. හැබැයි, පසුගිය ආණ්ඩු කාලයේ මේ ඉඩම් ඒ විධියට පාවිච්චි කළාද? නැහැ. අද අපේ මහ පොළොව මිනිසුන් වාගේම ලෙඩ වෙලා තිබෙන්නේ; අසාධ්‍ය තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ; වසවිසෙන් පුරවලා තිබෙන්නේ; නාය යෑමට, සෝදා පාළුවට ලක් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ අමාත්‍යාංශයෙන් මේ අවුරුදු පහ ඇතුළත මේ මහ පොළොවට වහාම ප්‍රතිකාර කළ යුතුයි. මේ පස නැවත පරීක්ෂා කරන්න ඕනෑ. මේ විනාශ වෙලා තිබෙන මහ පොළොවට නැවත ජීවය ලබා දෙන්න ඕනෑ. අපි ඒක කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා අපි යෝජනා කරනවා, මේ මහ පොළොවේ පස් sample අරගෙන පරීක්ෂාවට ලක් කරලා, මේ මහ පොළොවේ තිබෙන ලෙඩ රෝගවලට අපි උත්තරයක් ලබා දෙමු කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අනෙක් පැත්තෙන් මේ මහ පොළොව අවභාවිතයට පත් කළා. 2004 කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට අනුර දිසානායක මැතිතුමා මහියංගනයේ කෘෂි උපකරණ අළෙවි මධ්‍යස්ථානයට මුල්ගල් තැබුවා. විපක්ෂ නායකතුමා මීට කලින් ජනාධිපති අපේක්ෂකයා වෙනකොට එතුමාගේ නිවේදකයා විධියට හිටපු කෙනා තමයි මහියංගනය ප්‍රාදේශීය සභාවේ සභාපති විධියට හිටියේ. විපක්ෂ නායකතුමන්ලාගේ අනුදැනුම මත මහියංගන ගොවි සංවිධාන දහස් ගණනකට අයිති වෙන්න තිබුණු, කෘෂි උපකරණ අළෙවි මධ්‍යස්ථානයට තිබුණු ඉඩම් කැබැල්ල පසුගිය කාලයේ සභාපතිතුමාගේ නමට ලියා ගත්තා. අද මෙතුමන්ලා ඇවිත් කථා කළාට, එතුමන්ලාගේ බලය පාවිච්චි කරලා, ගොවීන්ට තිබුණු ඉඩම් කැබලි ලියා ගත්තා. එවැනි දේශපාලන නායකයින් මේ ඉන්නේ. ඒ නිසා මම අපේ කෘෂිකර්ම අමාත්‍යතුමාට සහ ඉඩම් අමාත්‍යතුමාට යෝජනාවක් කරනවා, කරුණාකරලා මිනිපේ ව්‍යාපාරයේ, මහවැලි ව්‍යාපාරයේ, බන්මැඩිල්ල ව්‍යාපාරයේ, කෝමාරික ව්‍යාපාරයේ, දම්බරාව ව්‍යාපාරයේ, නාගදීප ව්‍යාපාරයේ, සොරබොර ව්‍යාපාරයේ, මාපාකඩ ව්‍යාපාරයේ ගොවීන්ට අයිති කෘෂි උපකරණ අළෙවි මධ්‍යස්ථානයේ ඉඩම නැවත අපට ලබා දෙන්න කියලා.

ඒ වාගේම මහවැලිය ගත්තොත්, අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්ව විධියට කලාප 10ක් තිබෙනවා. මම නියෝජනය කරන්නේ මහවැලි "සී" කලාපය. මහවැලි "සී" කලාපයට ආපු මිනිස්සු නිකම් ආවේ නැහැ. බඳන්න බැරි කොස් ගස් දාලා ආවේ. අහස උසට නැඟුණු පොල් ගස් දාලා ආවේ. කරල්ලියද්ද පැත්තෙන්, වැලිමඩින්, ඌව පරණගමින් මහියංගනයට පල්ලම් බැස්සේ. අලි, කොටි, වලස්සු හිටපු ගම්මානයකට ආවේ. ඒ මිනිස්සු ඒ දුෂ්කර බිම අවුරුදු ගණනක් තිස්සේ අස්වැද්දුවා. හැබැයි, තවම ඉඩම් බලපත්‍රයේ අයිතිය දීලා නැහැ. 2005 අවුරුද්දේ මම පළාත් සභාවේ ඉන්නකොට අම්මා කෙනෙක් ඉඩම් බලපත්‍රය ගන්න ආවා. එතකොට ඒ අම්මාගේ වයස අවුරුදු 54යි. පසුගිය ජනවාරි මාසයේ 15වැනි දාත් ඒ අම්මා ආවා, ඒ ඉඩම් බලපත්‍රය ගන්න. දැන් ඒ අම්මාගේ වයස අවුරුදු 75යි. අවුරුදු 21කට පසුවත් ඉඩම් බලපත්‍රය ලැබිලා නැහැ. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ඉඩම් බලපත්‍රය ඇයට නැති වුණාට මහවැලි ව්‍යාපාරයේ ඉඩම් ගත්ත

කට්ටිය ඕනෑ තරම් ඉන්නවා. අපි ඒකත් දන්නවා. මේකත් හරියට ලංගම වාගේ. මහවැලියත් ලංගම වාගේ දේශපාලනීකරණයට ලක් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මහවැලි අධිකාරියේ නිලධාරින්ට කියනවා, අපි ඔබට උපරිම සහයෝගය ලබා දෙනවා කියලා. අපට මහවැලි ඉඩම් අවශ්‍ය නැහැ. හැබැයි, ගොවීන්ට අවශ්‍ය දේ කරන්න නිලධාරින් මැදිහත් වෙයි කියන විශ්වාසය අපි ළඟ තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වාගේම මගේ මහවැලි "සී" කලාපයේ ගිරාදුරුකෝට්ටේ කොටසේ වැව් 56ක් තිබෙනවා. අවුරුදු 20ක් ගත වෙලාත් අද වෙනකම් මහවැලි "සී" කලාපයේ එක වැවක් ප්‍රතිසංස්කරණය කරලා නැහැ. 2005 අවුරුද්දේ කෘෂිකර්ම අමාත්‍යවරයා "වැව් දහසක්" ව්‍යාපෘතිය යටතේ බතලයාය වැව ප්‍රතිසංස්කරණය කළා. ඒ හැරෙන්න එක වැවක්වත් ප්‍රතිසංස්කරණය කරලා නැහැ. ඒ නිසා මහවැලි අමාත්‍යාංශය භාර අපේ ගරු අමාත්‍යතුමාට මම යෝජනා කරනවා, ඉදිරි කාලය තුළ මේ සියලු වැව් ටික ප්‍රතිසංස්කරණය කරමු කියලා. මොකද, දැන් මේ වැව් මඩවලින් පිරිලා අභාවයට යමින් තිබෙන්නේ. අපේ මහා ජලාශය තමයි වික්ටෝරියා ජලාශය. සාමාන්‍යයෙන් කියන්නේ එහි තුනෙන් එකක් මඩවලින් පිරිලා කියායි. යෝධ වැව, සොරබොර වැව, මහා පරාක්‍රමබාහු සමුද්‍රය, මින්නේරිය වැව, කලා වැව යන වැව් තවමත් ජීවමානව තිබෙනවා. ඒ වැව් ජීවමානව තිබෙනකොට අවුරුදු 30කට, 40කට කලින් හදපු වැව් ටික අභාවයට යමින් තිබෙනවා. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා, නැවත ඒ වැව් ටික ඉතා හොඳින් හදලා අපේ රටේ ගොවීන්ට ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහවැලි ව්‍යාපාරය හදනකොට ඔවුන්ට බලාපොරොත්තු ගොඩක් තිබුණා. ඔවුන්ගේ අධ්‍යාපනය මහවැලි ව්‍යාපාරය ඇතුළේ ඉෂ්ට සිද්ධ කළේ නැහැ. මහවැලි "සී" කලාපය ඇතුළේ පාසල් තිබෙනවා. හැබැයි, දරුවෙකුට විද්‍යාව, ගණිතය ඉගෙනගෙන වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවෙක් වෙන්න පුළුවන් එක පාසලක් නැහැ. අධ්‍යාපනය එහෙමයි දීලා තිබෙන්නේ. සෞඛ්‍යයත් එහෙම තමයි. මිනිස්සු ඇවිදින මළ කඳන් ගාණට වැටිලා ඉන්නේ. සෞඛ්‍යයත් එහෙම තමයි. මහවැලි ව්‍යාපාරය හදනකොට එහි යටිතල පහසුකම් ගොඩක් හදන්න තිබුණා. ඒවා මේ අවුරුදු 40ක කාල සීමාව තුළ සිද්ධ වෙලා නැහැ. ගොඩනැඟිලි ගත්තොත්, 930ක් තිබෙනවා. ඒවායින් සාමාන්‍යයෙන් ගොඩනැඟිලි 200ක්, 300ක් විතරයි පාවිච්චි කරන්නේ. ඉතිරි ගොඩනැඟිලි සියල්ල අභාවයට පත් වෙමින් යන්නේ. මේවා මහජනතාවගේ මුදල්. "මේක හැදුවේ අපි" කියලා මහ ලොකුවට පම්පෝරි ගැහුවාට, නැහැ, අපි සියල්ල ණය කරලා ගත්ත ඩොලර් බිලියන ගණන්වලින් හදපු දේපළක් මේ තිබෙන්නේ. අවුරුදු 76ක් තිස්සේ ඒ දේපළ ටික ටික විනාශ කරපු පාලකයන් ටිකක් සිටියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා අපි ඉතාම අවධාරණයෙන් කියනවා, අපි මුලදී කිව්වා වාගේම දැන් අපේ රටේ කෘෂි කර්මාන්තයට මේ මහ පොළොවේ ඵලදායීතාව වැඩි කරන්න ඕනෑ. අපි ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් හැදුවා. අපි "සී" කලාපයේ ඒ තිබෙන බිමට; මහියංගනයේ තිබෙන ඒ බිමට; ඒ බිමේ මිනිස්සුන්ට, තමන්ගේ කෘෂි භෝගවලට නව අගයන් එකතු කරන කර්මාන්තවලට යන්න ඕනෑ. අපි ඒක කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අනුව ඉදිරි කාලය ඇතුළත ලංකාවේ කෘෂි කර්මාන්තයේ නව පුනරුදයක් අපි අරගෙන එනවා.

ඇයි, අපි එහෙම කියන්නේ? අපි හැම දාම කියනවා වාගේම, අපි ගොවියා එක්ක හිටපු මිනිස්සු. ගොවියාට යම් අසාධාරණයක් සිද්ධ වෙනකොට ඒ වෙනුවෙන් අරගළ බිමේ හිටපු මිනිස්සු. ඒ නිසා අපට ඒ අයගේ වේදනාව, කැක්කුම දැනෙනවා. අපට ගොවීන්ගේ පීඩාව හොඳට තේරෙනවා. මෙතැන සිටින අපේ මන්ත්‍රීවරුන් අතිබහුතරයකගේ අත්වල කරගැට තිබෙනවා. ඇයි? අපට කැත්ත, උදැල්ල හොඳට හුරුයි. ඒ නිසා කැත්ත, උදැල්ල හුරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වැඩි කණ්ඩායමක් ඉතිහාසයේ පළමු වතාවට මේ සභාව තුළ සිටිනවා. ඒ නිසා කෘෂි කර්මාන්තයේ යෙදෙන ගොවියාට දැනෙන වේදනාව හොඳින් දන්නා නිසාම ඉදිරි අවුරුදු 5 අපේ රටේ ගොවීන්ගේ, කෘෂි කර්මාන්තයේ නව පුනරුදයක්, විප්ලවීය වෙනසක් කරන වසර 5ක් බවට අපි පත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ඉඩම් ප්‍රශ්නයත් සැලකිය යුතු ප්‍රශ්නයක්. මොකද, ඉඩම කියන්නේ අපේ ජීවිතයත් එක්ක බැඳුණු දෙයක්. හැබැයි, අපේ රටේ ඉඩම් බලපත්‍රයක් ලබා ගන්න ගියාම ඒ වෙනුවෙන් විඳින වදය තරම් වදයක් වෙන කොහේවත් නැහැ. ඉඩම් බලපත්‍රයක් නිලධාරියෙකුගේ මේස ලාච්චුව ඇතුළේ තිබෙනවා කියන්නේම සහෝදරත්වය ඉවරයි; අම්මා, තාත්තා අමතකයි. ඒ ෆයිල් එක ලාච්චුව ඇතුළේ තිබෙනවා කියන්නේ වැට මායිමේ ප්‍රශ්නය බේරා ගන්නේ කැත්තෙන්, උදැල්ලෙන්. ආසියාවේ රටවල මිනිස්සු ඉඩමට හරි ආදරෙයි. සමහරවිට අම්මාට, තාත්තාට වඩා ඉඩමට ආදරෙයි. ඒ නිසා අපි රාජ්‍ය සේවකයින්ගෙන් ඉල්ලා සිටිනවා, ඉතා ඉක්මනින් ඒ ඉඩම් ප්‍රශ්න බේරා දෙන්න කියලා. අපි වැඩ පිළිවෙළක් යොදනවා, ඉතා කෙටි කාලයක් ඇතුළත බදුල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් බලපත්‍ර ලබා දෙන්න. ඒකට නීති-රීති, යම් ක්‍රමවේද අඩු කරන්න වෙයි. ඉතා හොඳින්, ඉතා ක්‍රමිකව සහ විධිමත්ව, කෙටි කාලයක් ඇතුළත ඉඩම් බලපත්‍ර ලබා දීමේ කටයුත්ත අපි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් කියන්න ඕනෑ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය කියන්නේ මේ රටේ දෙකෝටි විසිලක්ෂයක් වන ජනතාව එක්ක, අතිබහුතරයක් රාජ්‍ය සේවකයන් එක්ක බැඳුණු අමාත්‍යාංශයක් බව. මේ අමාත්‍යාංශය තුළින් ඉතා හොඳ සේවාවක් කරන්න අවශ්‍ය ශක්තිය, ධෛර්ය අපේ අමාත්‍යතුමාට ලැබේවායි ප්‍රාර්ථනා කරන අතරම, ඒ සඳහා අපේත් උපරිම කැපකිරීම් ලබා දෙනවාය කියා පවසමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Next, the Hon. K. Kader Masthan. You have 13 minutes.

[ப.ப. 3.43]

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்கு எனக்கும் நேரம் ஒதுக்கித் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

நான் கடந்த சில நாட்களுக்கு முன்னர் மத விவகாரம் மற்றும் தனிப்பட்ட விவகாரம் சம்பந்தமாக வெளிநாட்டுக்குச் சுற்றுப் பயணம் சென்றிந்தபோது, இங்கு என்னைப் பற்றிய பிழையான கருத்தொன்று சொல்லப்பட்டு இருக்கின்றது. நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்கள்மீது எந்தளவுக்கு நம்பிக்கையும் நன்மதிப்பும் வைத்திருக்கிறோம் என்பதை கடந்த காலங்களில் கூறியிருக்கிறோம். அப்படி

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

இருக்கும்போது, கௌரவ வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர் அருண் ஹேமச்சந்திரா அவர்கள் இந்தப் பாராளுமன்றத்தில் என்னைப் பற்றிய பிழையான அறிக்கையொன்றைச் சமர்ப்பித்திருக்கிறார்; table பண்ணியிருக்கிறார். அந்த விடயம் அனைத்து ஊடகங்களினூடாகவும் பகிரங்கப்படுத்தப்பட்டு இருக்கின்றது. சாதாரணமாக ஓர் அறிக்கையை அல்லது விபரங்களை அதிகாரிகளோ அல்லது வேறு யாராவதோ தந்தால், முதலில் அதன் உண்மைத் தன்மையை ஆராய்ந்து பார்க்க வேண்டும். அப்படியில்லாமல், எழுதித் தருவதையெல்லாம் சமர்ப்பிக்கக் கூடாது. மற்றவர்களைப் பற்றியும் சிந்திக்க வேண்டும். மற்றவர்களை அவமானப்படுத்துவதையும் அவர்கள் தொடர்பில் பிழையான தோற்றப்பாட்டை ஏற்படுத்துவதையும் தவிக்க வேண்டும்.

நான் விடயத்தைச் சொல்கின்றேன். நான் பாராளுமன்றத்துக்கு வந்தபிறகு, எனதும் என்னுடைய சகோதரர்களின் பெயர்களிலும் இரண்டு எரிபொருள் நிரப்பு நிலையங்களை எடுத்திருப்பதாகச் சொல்லியிருக்கிறார். ஒன்று, Masthan Traders. மற்றையது, M S Enterprises. இவை இரண்டும் நான் அரசியலுக்கு - பாராளுமன்றத்துக்கு - வருவதற்கு முன்னர் எடுக்கப்பட்டவை. Masthan Tradersக்கான licence 1998ஆம் ஆண்டு எடுக்கப்பட்டது. M S Enterprisesக்கான licence 2015ஆம் ஆண்டு எடுக்கப்பட்டது. இவற்றை நாங்கள் அரசியலுக்கு வந்தபிறகு எடுத்தாக ஒரு பிழையான கருத்தை கௌரவ பிரதி அமைச்சர் அவர்கள் தெரிவித்திருந்தார். தயவுசெய்து, இவ்வாறு மற்றவர்களை அவமானப்படுத்துகின்ற, மற்றவர்களுக்குச் சேறுபூசுகின்ற விடயங்களை எதிர்காலத்தில் செய்யாதீர்கள்! ஏனென்றால், நான் உங்களுடைய அரசாங்கத்தின்மீது முழுமையான நம்பிக்கையை வைத்திருக்கின்றேன். நீங்கள் ஊழலற்ற ஆட்சியை உருவாக்குவீர்கள் என்ற எதிர்பார்ப்புடன் நாங்கள் இருக்கின்றோம். எனவே, கடந்த காலங்களில்போன்று சிறு பிள்ளைத்தனமாக விடயங்களைக் கையாள வேண்டாம் என்று நான் கௌரவ பிரதி அமைச்சர் அவர்களை இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். அவருடைய அந்தக் கருத்தை நான் மறுக்கின்றேன். நான் அரசியலுக்கு வந்த பிறகு, எந்தவோர் எரிபொருள் நிரப்பு நிலையத்துக்கான licenceஐயும் எடுக்கவில்லை. எனது குடும்பம் வர்த்தகம் சார்ந்த ஒரு குடும்பமாகும். அரசியலுக்கு வருவதற்கு முன்னர், நானும் ஒரு வர்த்தகராகத்தான் இருந்தேன். அரசியலுக்கு வந்த பின்னர், முழு நேர அரசியல்வாதியாக இருக்கின்றேன். எனது சகோதரர்கள் அந்த எரிபொருள் நிலையங்களை நடாத்தி வருகின்றார்கள் என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 30 வருட யுத்தம் நடைபெற்ற காலத்தில்கூட, தமிழ் - முஸ்லிம் உறவு பாதிக்கப்படாத வகையிலேயே அன்றைய தலைவர்கள் கருத்துகளை முன்வைத்தனர்; உரிமைகளுக்காகப் போராடினர். ஆனால், இன்று இந்தச் சபையில் அப்பட்டமாக இனவாதக் கருத்துகளைக் கண்மூடித்தனமாக முன்வைக்கின்றார்கள். வடக்கில் இன ஒற்றுமையை முதன்மைப்படுத்தி பணியாற்றும் நாம், உண்மையிலேயே இந்தக் கீழ்த்தரமான அரசியலை வன்மையாகக் கண்டிக்கின்றோம். ஏதாவது ஒரு சமயம் அல்லது சமூகம் சார்ந்த விடயங்களை சரியாகத் தெரிந்துகொண்ட பின்னர், அது தொடர்பில் கருத்துகளைச் சொன்னால், இவ்வாறான முரண்பாடான நிலை ஏற்படாதென நான் நினைக்கின்றேன். நான் கடந்த சில நாட்களாக பாராளுமன்றத்துக்கு வருகை தரவில்லை. என்றாலும், இங்கு வாதப் பிரதிவாதங்கள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. இந்த நாட்டில் சமூகங்களுக்கு இடையில் ஓர் அழகான உறவு இருக்கிறது. எதிர்காலத்தில் அதற்குப் பாதிப்பு ஏற்படாத வண்ணம் பார்த்துக்கொள்ள வேண்டிய பொறுப்பு சகல தரப்பினருக்கும் இருக்கின்றது. அது தமிழ் தரப்பாக இருக்கலாம், முஸ்லிம் தரப்பாக இருக்கலாம், சிங்களத் தரப்பாக இருக்கலாம்!

MMDAஇல் திருத்தம் மேற்கொள்ளும்போது, எமது 'ஷரீஆ' சட்டத்துக்கு மாற்றமான திருத்தங்களுக்கு எந்த வகையிலும் உடன்பட இயலாது என்பதை நாங்கள் கடந்த காலங்களில் இருந்து மிகத் தெளிவாகக் கூறி வருகின்றோம். இன்று 'ஷரீஆ' சட்டம் நடைமுறையிலுள்ள எந்த நாட்டிலும் அது பிழையாக அமைந்ததில்லை. எமது இஸ்லாமிய கோட்பாடுகள் - கொள்கைகள் - மிகவும் பழைமை வாய்ந்தவை. அவற்றில் மிகவும் அழகாக இன்றைய நவீன யுகத்துக்கு ஏற்ற மாதிரியான விடயங்கள் இருக்கின்றன. அவற்றை நீங்கள் எந்த விதத்திலும் ஆராய்ந்து பார்க்கலாம். சிறிய, சிறிய விடயங்களை வைத்து, முழு இஸ்லாமியர்களையும் பாதிக்கும் வகையில் கருத்துகளை வெளியிடுவது உண்மையிலேயே மிகவும் வேதனைக்குரியது.

அண்மையில் வெளியிடப்பட்ட உலக நாடுகள் சார்ந்த அறிக்கை ஒன்றில், இலங்கையில் கடந்த வருடம் குறைந்த வயதில் கருவுற்றவர்களின் எண்ணிக்கை 240 எனக் குறிப்பிடப்பட்டு இருக்கின்றது. அந்த 240 பேரில் எத்தனை முஸ்லிம் சிறுமிகள் இருக்கின்றார்கள்? என்பதைச் சொல்லுமாறு நான் கேட்கின்றேன். இலங்கையில் இப்போது இருக்கின்ற சதவீதத்துக்குள்கூட முஸ்லிம்கள் வரமாட்டார்கள். இதுதான் உண்மை நிலைமை! இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர், ஒருசில அமைச்சர்கள் இந்த விடயத்தைப் பூதாகரமாக்குகின்றார்கள். கடந்த காலங்களிலும் இந்தப் பிரச்சினை இருந்தது. அந்த அரசாங்கத்தில் நாங்களும் இருந்தோம். எனினும், இவ்வாறான நிலைமை உருவாகாமல் நாங்கள் பாதுகாத்தோம். எந்தவொரு சமயத்தவரின் உரிமைகளையும் பாதிக்காத வண்ணம் அரசு நடந்துகொண்டால், எதிர்காலத்தில் நாட்டில் பிரச்சினைகள் குறையும் என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன்.

கடந்த அரசாங்க காலத்தில் எமது பகுதிகளில் விவசாய அமைச்சால் முன்னெடுக்கப்பட்ட செயற்றிட்டங்களை நீங்கள் தொடர்ந்து செயற்படுத்தி வருவதென்பது உண்மையிலேயே வரவேற்கத்தக்க ஒரு விடயமாகும். குறிப்பாக, கட்டுக்கரை குளத்துக்கும் அகத்தி முறிப்புக் குளத்துக்கும் கீழ்மல்வத்து ஓயா திட்டத்தின் ஊடாக நீரைக் கொண்டுவருகின்ற செயற்பாட்டை தொடர்ந்து மேற்கொள்வதற்காக 6,014 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளமை வரவேற்கக்கூடிய விடயமாகும். இதன்மூலம் நாங்கள் 30,000 ஏக்கரில் நெல் விதைப்பை அதிகரிக்கக் கூடியதாக இருக்கும். ஏனைய மேட்டுப் பயிர்ச்செய்கைக்கும் இந்த நீர் வரத்து பாரிய நன்மை பயக்கக்கூடியதாக இருக்கும். முசலி, நானாட்டான், மாந்தை மேற்கு, மடு போன்ற பகுதிகளில் பல விவசாய நிலங்கள் வனப் பிரதேசமாக gazette பண்ணப்பட்டு இருப்பதனால் அங்குள்ள மக்கள் அதிகளவில் பாதிக்கப்பட்டுள்ளனர். யுத்த காலத்தில் அந்தப் பிரதேசங்களிலிருந்து மக்கள் இடம்பெயர்ந்ததனால் அங்கு பாரிய மரங்கள் முளைத்திருக்கின்றன. இந்த நிலையில், அங்குள்ள அதிகாரிகளின் ஒத்துழைப்பு இல்லாமல் GPS தொழில்நுட்பத்தைப் பயன்படுத்தி அவற்றையும் சேர்த்து காடாக gazette பண்ணியதால், அங்குள்ள பாரிய விவசாய

නිලංකලෙහි පයිර්ච්සෙය්කෙ සෙය්ය මුදියාත නිලෙමෙ එර්පට්ටු ඉරුක්කින්රතු. කටන්ත කාලංකලිල් නාංකළ් ඉතු තොටර්පිල් පල මුයර්සිකලෙ එටුත්තු, අන්තක් කාණිකලෙ විටුවික්කක්කූටිය නිලෙමෙක්කුක් කොණ්ටුවන්තු ඉරුක්කින්රෝම්.

1985ආම් ආණ්ටුක්කුප් පිරකු, සරියාන මුරෙයිල් gazette පණ්ණප්පටාත නිලංකලෙ විටුවිප්පතර්කුරිය එර්පාටුකළ් කටන්ත කාලත්තිල් නටෙපෙර්රු, අවෙ විටුවික්කප්පටුකින්ර අළවුක්කු නිලෙමෙ එර්පට්ටතු. අවර්රෙ විටුවිත්තු, අන්තප් පකුති මක්කළුක්කු වළංකුවතන්මූලම් පාරියතොරු විවසායප් පුරට්සියෙ නාංකළ් අන්තප් පකුතිකලිල් එර්පටුත්තලාම්. අන්ත නිලංකලිල් නවීන මුරෙකලිල් විවසායත්තෙච් සෙය්වතර්කු එර්ර වකෙයිල් නීංකළ් සරියාන තිට්ටංකලෙ වකුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්. කටන්ත කාලංකලිල් නාන් ඉරාජාංක අමෙච්සරාක ඉරුක්කුම්පෝතු, එමතු පකුතිකලිල් ඉන්ත වේලෙත්තිට්ටත්තෙච් සරියාකච් සෙය්වතර්කුප් පල තිට්ටංකලෙ වකුත්තිරුන්තේන්. අවර්රිලුළ්ළ නල්ල විටයංකලෙ නීංකළ් තොටර්න්තු සෙය්තාල් අතු පිරයෝසනමාක අමෙයුම් එන්පතෙක් කූරික් කොළ්කින්රේන්.

මුක්කියමාක, පාලියාරුත් තිට්ටත්තෙ නටෙමුරෙප්පටුත්තුවතර්කාන ආරම්පක්කට්ටමාක අටික්කල් නාට්ටප්පට්ටතු. ඉත්තිට්ටත්තින්මූලම් යාழ්. මාවට්ට මක්කළිනතුම් මන්නාර් මාවට්ට මක්කළිනතුම් කුටිනීර්ප් පිරච්සිනෙයෙත් තීර්ක්ක මුටියුම් එන්පතෝතු, අංකිරුක්කින්ර විවසායිකළුක්කුත් තේවෙයාන නීරෙයුම් වළංකක්කූටියතාක ඉරුක්කුම්. එනිනුම්, අතර්කුරිය නිති එර්පාටු ඉම්මුරෙ වරවු සෙලවුත්තිට්ටත්තිල් ඉරුප්පතාකත් තෙරියවිල්ලෙ. කට්ටායම් අතර්කුරිය නිති එර්පාට්ටෙච් සෙය්තුකොටුත්තු, අන්තත් තිට්ටත්තෙ නටෙමුරෙප්පටුත්ත වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්. ඒනෙනිල්, ඉන්රු යාழ්. මාවට්ට මක්කළුක්කුක් කුටිනීර්ප් පිරච්සිනෙ එන්පතු පාරිය පිරච්සිනෙයාක ඉරුක්කින්රතු. අතුමට්ටුමල්ල, එමතු මන්නාර් මාවට්ටත්තිල් මුසලි, නානාට්ටාන්, මාන්තෙ මේර්කු පෝන්ර පිරතේසංකළිල් පාරිය කුටිනීර්ප් පිරච්සිනෙ ඉරුක්කින්රතු. ඉතෙ නිවර්ත්තිසෙය්වතර්කාන ඔරු වේලෙත්තිට්ටමාකත්තාන් ඉන්තප් පාලියාරු තිට්ටම් ආරම්පික්කප්පට්ටතු. නීණ්ට කාලම් feasibility study මේර්කොළ්ළප්පට්ටු, ඉන්තත් තිට්ටත්තෙච් සෙයර්පටුත්තුවර්කුරිය එර්පාටුකළ් සෙය්යප්පට්ටු ඉරුක්කින්රන. එනවේ, ඉතර්කුරිය නිති එර්පාටුකළෙ නීංකළ් සෙය්තුකොටුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්.

මුල්ලෛත්තීවු, වවුනියා, මන්නාර් පෝන්ර මාවට්ටංකලිල් කටන්ත කාලංකලිල් වෙළිනාට්ටු නිති උතවියෝටු පල වේලෙත්තිට්ටංකළ් ආරම්පික්කප්පට්ටන. අතු ඔරු පකුතියිල් නටෙපෙරුකින්රතු. ඉන්නුම් සිල පකුතිකලිල් කුළංකළ් තොටර්පාන වේලෙකළ් නටෙපෙරුකින්රන. විවසාය වීතිකළ් අමෛත්තල්, වාය්ක්කාල් අමෛත්තල් එන්පවර්රුක්කුප් පාරියළවු නිති තේවෛප්පටුකින්රතු. වටක්කු, කිළක්කුප් පිරතේසම් 30 වරුට යුත්තත්තාල් පාතික්කප්පට්ට පිරතේසම් එන්පතු උංකළුක්කුත් තෙරියුම්! අන්තප් පාතිප්පෛ නිවර්ත්තිසෙය්යුම් විතත්තිල් පල වේලෙත්තිට්ටංකළුක්කු නිති ඔතුක්කීටු සෙය්යප්පට්ටු ඉරුන්තාලුම්, විවසායත්තුරෛයිල් පුරට්සියොන්රු එර්පට වේණ්ටුමෙන අංකුළ්ළ මක්කළ් එතිර්පාර්ක්කින්රාර්කළ්. ඉන්ත අරසාංකම් කට්ටායම් විවසායිකළුක්කුරිය එර්පාටුකළෛච් සෙය්තුකොටුක්ක වේණ්ටුම්. අප්පටිච් සෙය්තාල් එමතු පකුතිකලිලුළ්ළ විවසායිකළ් නන්මෛ අටෛවාර්කළ්. ඉන්ත වරුටත්තුක්කාන Budgetඉල් අතර්කාන එර්පාටුකළ් ඉරුන්තාලුම්, අතිල් සිල කුරෛපාටුකළ් ඉරුක්කින්රන. එතිර්කාලත්තිල් අවර්රෛ නිවර්ත්തි සෙය්තු, අන්තත් තිට්ටත්තෛච් සරියාක මුන්නෙටුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්. නෙටුංකේණි, මටු පෝන්ර පිරතේසංකළිල් විවසාය වීතිකළ් ඉන්මෛයාල් එංකළුටෛය විවසායිකළ් තූරප් පිරතේසංකළිල් ඉරුන්තු නෙල් මර්රුම් උරත්තෛ තෝළිල් සුමන්තුකොණ්ටු වරවේණ්ටිය නිලෛ කාණප්පටුකින්රතු. අවර්කළුක්කුක් කිටෛක්කින්ර වරුමානත්තින් පෙරුම්පකුති අතර්කුච් සෙලවාකින්රතු. එනවේ, නීංකළ් එතිර්කාලත්තිල් එංකළුටෛය පිරතේසංකළිල් විවසාය වීතිකළ් මර්රුම් වාය්ක්කාල්කළෛ විසේට නිති එර්පාට්ටින් මූලමාවතු අල්ලතු වෙළිනාට්ටු උතවිකළෛප් පෙර්රාවතු අමෛත්තුක් කොටුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රෝම්.

කටන්ත කාලත්තිල් මීள්කුටියේර්රම්, පුනර්වාழ්වළිප්පු සම්පන්තමාක ඔර් අමෛච්සේ ඉරුන්තතු. අන්ත අමෛච්සින්මූලම් පල වේලෛත්තිට්ටංකළ් මුන්නෙටුක්කප්පට්ටන. පින්නර් අවර්රුක්කාන නිති වේරු අමෛච්සුක්කළුක්කු ඔතුක්කප්පට්ටු, අවර්රින්මූලම් සිල වේලෛකළ් නටෙපෙර්රාලුම්, අවර්රෛප් පූරණප්පටුත්තුවතිල් පාරිය තාමතම් කාණප්පටුකින්රතු. එනවේ, එතිර්කාලත්තිල් අතර්කුත් තේවෛයාන නිති එර්පාටුකළෛච් සෙය්තු කොටුත්තු, ඉනිමේල් මීள්කුටියේර්රම්, පුනර්වාழ්වළිප්පුප් පණිකළ් ඉල්ලෛ එන්රළවුක්කු අන්තප් පණිකළෛ මුටික්කින්ර ඔර් අරසාංකමාක ඉන්ත අරසාංකම් අමෛය වේණ්ටුමෙනක් කේට්ටු, සන්තර්ප්පත්තුක්කු නන්රි කූරි, නිරෛවු සෙය්කින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අපේ ගොවියාට තමන්ගේ කන්නය පටන් ගනිද්දී කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් ඉස්සෙල්ලාම හිතට එන සිතිවිල්ල තමයි, ඒ කන්නයට අදාළ බීජ ටික සොයා ගන්නේ කොහොමද කියන එක. ඊළඟට රජයත්, කෘෂි කර්මාන්තයත් සම්බන්ධව සිහි වෙද්දී ඔහුට මතක් වෙන්නේ, පොහොර ගැනයි. පොහොර ශාක පෝෂක විධියට පොළොවට යෙදුවාම ගසේ මූල මණ්ඩලයට ඒවා උරා ගැනීමේ හැකියාව තිබෙන්න ඕනෑ. ඒකට පසේ තිබෙන පාංශු තත්ත්වය යහපත් ආකාරයෙන් පැවතිය යුතුයි. පාංශු වාතය, පාංශු ජලය, පාංශු ජීවීන් යහපත් ආකාරයට තිබුණේ නැත්නම් ඒ මූල මණ්ඩලයෙන් ශාක පෝෂක උරා ගැනීමේ හැකියාව අහිමි වෙනවා. දීර්ඝ කාලයක් පුරා කෘත්‍රිම රසායනික අපේ මහ පොළොවට යෙදීමේ ප්‍රතිඵලයක් විධියට යම් යම් තැන්වල පාංශු තත්ත්වය අබණ්ඩ ලෙස බෙහෙවින් දුර්වල වෙලා තිබෙනවා; අපේ microbial biome එක damage වෙලා තිබෙනවා. මේ පාංශු තත්ත්වය දුර්වල වෙලා අස්වැන්න අඩු වීමේ ප්‍රතිඵලයක් විධියට අපි නැවත නැවතත් වැඩිවැඩියෙන් කෘත්‍රිම රසායනික පොහොර අපේ පොළොව මතට මුදා හරිනවා. පොළොව මතට මුදා හරින කෘත්‍රිම රසායනික නිසා මූල මණ්ඩලය ශක්තිමත් වීම අඩු වුණාට පස්සේ අපේ ශාකය විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වෙනවා. ඒ ලෙඩ රෝග ගොවියාට ප්‍රදර්ශනය වෙන්නේ ශාකයේ අඩු පෝෂණ තත්ත්වයක් විධියටයි. ඒ නිසා මූල මණ්ඩලය ශක්තිමත් වෙන්න කියලා නැවතත් ඒ ශාක පෝෂක යොදනවා.

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

මූල මණ්ඩලයේ සුවිශේෂ අවයවයක් තිබෙනවා. අපි ඒකට කියනවා, "කිරි මුල" කියලා. ඒක ඉතා වැදගත්. කිරි මුල සක්‍රියව තිබුණොත් තමයි මූල මණ්ඩලය ක්‍රමානුකූලව වර්ධනය වන්නේත්, අවශෝෂණය සිදු වන්නේත්. ඒ අවශෝෂණ ක්‍රියාවලිය ඉතාම සංකීර්ණ රසායනික ක්‍රියාවලියක්. අපි ඒකට කියනවා, rhizosphere ක්‍රියාවලිය කියලා. ඒ rhizosphere ක්‍රියාවලිය පසේ තිබෙන microbial biome එක - කඩියා, කුඹියා, ගැඩවිල් පණුවා, ක්ෂුද්‍ර ජීවීන් ආදි ජීවීන්ගෙන් සමන්විතව - වාතයත් සමඟ සිදු වන සංකීර්ණ රසායනික ක්‍රියාවලියක්. ඒ රසායනික ක්‍රියාවලිය නිසා තමයි කිරි මුල වර්ධනය වෙලා ශක්තිමත් වෙන්නේ. කිරි මුලට "කිරි මුල" කියලා කියපු මිනිස්සු ඉන්න රටක්, අපේ රට. කිරි අම්මා, කිරි අප්පා, කිරි දරුවා, කිරි දත් වාගේම කිරි මුල වැදගත් වුණා. දවසේ පැය 24ම අපේ රටේ කිරි මුල සක්‍රියයි. අපේ රටේ අවුරුද්දේ මාස 12ම කිරි මුල සක්‍රිය වෙලා තිබෙනවා. බොහෝ රටවල එහෙම නැහැ. උෂ්ණාධික නම් දහවල් කාලයේ කිරි මුල අක්‍රියයි; සීතල වැඩි නම් ශීත කාලයේදී කිරි මුල අක්‍රියයි. හැබැයි, අපේ රටේ දවසේ පැය 24ම කිරි මුල සක්‍රියයි; අවුරුද්දේ මාස 12ම කිරි මුල සක්‍රියයි.

මෙවැනි microbial biome එකක් සහිත පොළොවකට දීර්ඝ කාලයක් තිස්සේ රසායනික පොහොර දැම්මා මිස ඒ භෝගයට අවශ්‍ය පොහොර ප්‍රමාණය කොච්චරක්ද කියලා සංඛ්‍යාත්මකව සොයාගෙන ඒ අනුව පොහොර යෙදුවේ නැහැ. පොහොර application එකට dose එකක් දෙන්න පසු ගිය වකවානුව තුළම අපි අසමත් වුණා. හැබැයි, මේ රජය ඒ සඳහා වන වැඩ පිළිවෙළක් දැන් ආරම්භ කර තිබෙනවා; පාංශු සෞඛ්‍ය කාඩ්පතක් - soil health card එකක් - නිකුත් කිරීමේ කටයුත්ත ආරම්භ කර තිබෙනවා. ඒකට මේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. මේ වනකොටත් මහවැලි "H" කලාපය තුළ ගොවීන් පිරිසක් හඳුනාගෙන, ඒ ගොවීන් පිරිසට අවශ්‍ය රසායනික පරීක්ෂාවන් කරලා, පොළොවේ තිබෙන health එක මොකක්ද කියා බලලා, ඊළඟ කන්නයේදී කොතරම් ප්‍රමාණයක් පොහොර නිර්දේශ කළ හැකි ද, ඒකේ dose එක මොකක්ද යනාදිය සම්බන්ධයෙන් නිර්ණායක හදලා තිබෙනවා. 2025 වර්ෂය තුළ එවැනි soil health cards 15,000ක් ලබා දීමේ ඉලක්කයක් තිබෙනවා.

මැරෙමින් පවතින අපේ පොළොව නැවත පණ ගස්වා ගන්න මේ පොළොවේ අසනීප තත්ත්වය කොච්චර ද කියලා ශ්‍රී ලංකාවේ සංගණනයක් කරන, සමීක්ෂණයක් කරන පළමුවෙනි අවස්ථාව තමයි මෙය. සත්ත්ව ගහනය සම්බන්ධව කරන සමීක්ෂණය වාගේම සමීක්ෂණයක් ආරම්භ කර තිබෙනවා, මහවැලි "H" කලාපයේ තඹුත්තේගම ප්‍රදේශයේ. ඒක ඉතාම වටිනවා. වසර ගණනාවක් තිස්සේ කාබනික කෘෂි කර්මාන්තයට ඇල්මක්, කැක්කුමක් සහිතව මේ microbial biome එක ආරක්ෂා කරගෙන, ඒ වාගේම පොළොවේ තිබෙන පාංශු තත්ත්වය ආරක්ෂා කරගෙන, අපේ ජල ගෝලය ආරක්ෂා කරගෙන ගොවිතැන් කරන්න වුවමනාවක් තිබුණු මිනිසුන්ට මේ තත්ත්වය ලොකු ආස්වාදයක් වෙලා තිබෙනවා.

Soil health card එකක් issue කරනවා කියන්නේ සරල දෙයක් නොවෙයි. ඒ soil health card එකත් එක්ක පුළුවන්කම තිබෙනවා, ඊළඟ කන්නයේදී පොළොවට නයිට්‍රජන් කොච්චර අඩු වෙලා තිබෙනවාද, ඊළඟ කන්නයේදී පොස්පරස් කොච්චර අඩු වෙලා තිබෙනවාද කියලා සොයාගන්න. මේ මාස කිහිපය ඇතුළතදී 350ක වගා බිම් ඉලක්කයක් තිබුණා, මහවැලි "H" කලාපයේ. දැන් අපි ඉතාම සතුටින් කියනවා ඒ 350ක ඉලක්කය සපුරා තිබෙන බව. ඉදිරි කාල පරිච්ඡේදයේදී ලංකාව පුරාම ඒ ඉලක්කසහගත 15,000ම සපුරන්න පුළුවන්.

ඒ වාගේම, ගොවියාට හුරුවක් වෙලා තිබුණේ පොහොර ටික සපයා ගන්නේ කොහොමද කියන එක. එක පැත්තකින් පොහොර දමන එක සීමාසහිත වෙලා. ගොවියාට microbiome එක improve කරගන්න තව ක්‍රම ගණනාවක් තිබෙනවා. ඒකට ගොවියා පොලඹවන්න රසායනික පොහොරවලට පමණක් ලබා දුන් පොහොර සහනාධාරය විවෘත කර දීලා තිබෙනවා, ගොවියාට කැමැති පොහොර වර්ගයක් අරගෙන පොළොව සශ්‍රීක කරගන්න, අස්වැන්න වැඩි කරගන්න, අත්හදා බැලීම් කරන්න. ඒක හොඳ දෙයක්. කාබනික කෘෂි කර්මාන්තය ගැන විශ්වාසය තබපු බොහෝ අයට මේක ලොකු ආදර්ශයක් බවට පත් වෙලා තිබෙනවා. මේ රටේ බොහෝ ගොවීන් කාබනික කෘෂි කර්මාන්තය අතහැර දැම්මා, පැය 24න් රටම කාබනිකයි, රසායනික පොහොර ගෙන්වන්නේ නැහැ කිව්වාට පස්සේ. ඒ නිසා නැවත ගොවියා දැනුවත් කරලා microbiome එක හදාගෙන ඉස්සරහට යෑමේ අවශ්‍යතාවක් නැති වුණා. ඒ වෙලාවේ කෘෂි කර්මාන්තයෙන් අයින් වෙලා ගොවියා කාබනික පොහොර හදන තැනට විතරක් තල්ලු වුණා, ව්‍යාපාරික පරමාර්ථයෙන්. නැවත ඒ ගොවීන්ට අපි ආරාධනා කරනවා තමන්ගේ ගොවි බිම් සුළු වශයෙන් හෝ පාර්ශ්වීය වශයෙන් lateral spreading කරන්න හෝ මැදිහත් වෙලා ඒකට ක්‍රමානුකූලව කාබනික කෘෂි කර්මාන්තයේ අත්දැකීම් එකතු කරන්න කියලා. එක් පැත්තකින් කෘත්‍රිම රසායනික මත පමණක් යැපෙමින් අස්වැන්න වැඩි කරගන්න සටන් කරන ගොවියා ඉන්දැද්දීම, තව පැත්තකින් කාබනිකව microbiome එක improve කරමින් ඉස්සරහට යන ගොවියා නිර්මාණය කරපුවාම අපට මැද තැනකට එන්න පුළුවන්කම ලැබෙනවා. ඒක සියයට 30:70 කලවම් කෘෂි කර්මාන්තයද, සියයට 100ක් කාබනික කෘෂි කර්මාන්තයද කියන නිර්ණායකය මතු වෙයි ඉස්සරහට. ඒ පරමාර්ථයෙන් කටයුතු කරද්දී අපි දැක්කා උපදේශක කාරක සභාව තුළදී බොහෝ සංවාද ඇති වුණ බව. ඒක විවෘත සංවාදයක් බවට පත් වෙලා තිබුණා. මෙන්න මෙවැනි තත්ත්වයක් නිර්මාණය වෙන රටක් තුළ කෘෂි කර්මාන්තයේ පුනරුදයක් ඇති වීම කාටවත් වළක්වන්න බැහැ. ඒක අලුත් හිතුවක්කාරකමක් නොවෙයි. නිකම්ම නිකම් තවත් ප්‍රදර්ශන පාඨයකුත් නොවෙයි. මෙන්න මෙවැනි ක්‍රියාවලියක් තුළ කෘෂි කර්මාන්තයේ කිරිමුලත් එක්ක බැඳුණු මිනිස්සු අපි. කිරි අම්මා, කිරි අප්පා, කිරි දරුවා, කිරි දත් කියනවා වාගේ කිරිමුලට, කිරිමුල කිව්ව මිනිස්සු අපි. අන්න ඒ කිරිමුල ආරක්ෂා කරගෙන අස්වැන්න වැඩි කර ගත්තාම, ඒ හැදෙන අස්වැන්න ගොවියාටත්, පාරිභෝගික ජනතාවටත් සනීපවත්, නිරෝගී සම්පන්න ජීවිතයකට ඉවහල් වෙනවා.

මෙන්න මෙහෙම කෘෂි කර්මාන්තයකට සම්බන්ධ වීම ගැන අපටත් ඇත්තටම තිබෙන්නේ ආශ්වාදයක්. අවුරුදු 20කට වැඩි කාල පරිච්ඡේදයක් තිස්සේ මෙවැනි කෘෂි කර්මාන්තයක් බලාගෙන, ඒ වෙනුවෙන් ගොවීන් ඒකරාශි කරගෙන බිම් මට්ටමේ වැඩ කරපු අපට මෙන්ම, අපේ ගොවි ප්‍රජාවට දැවැන්ත ආශ්වාදයක් ඇති වෙලා තිබෙනවා මේ වැඩ පිළිවෙළ තුළින්.

මේ මොහොතේදී මා වෙත තොරතුරු ප්‍රමාණයක් ලැබුණා. විවිධ අවස්ථාවල විපක්ෂයෙන් හඬ නැඟුණා, වන්දි මුදල් නිසියාකාරව ලැබුණේ නැහැ කියලා. ඒක වැරදියි. හරියට වන්දි මුදල් ලැබුණු පළමුවෙනි අවස්ථාව තමයි පසුගිය මාස කිහිපය. මම කෙටියෙන් ඒ වාර්තාව ඉදිරිපත් කරන්නම්. 2024 වර්ෂයේ සම්පූර්ණයෙන්ම ගෙවූ මුළු වන්දි ප්‍රමාණය රුපියල් මිලියන 2,557යි. ජාතික රක්ෂණ භාර අරමුදලින් - National Insurance Trust Fund එකෙන් - ලැබිලා තිබෙනවා මිලියන 1,557ක්. රජයේ දායකත්වයෙන් ලැබිලා තිබෙනවා රුපියල් මිලියන 1,000ක්. මේ 2024 වසරේ වන්දි මුදල සම්පූර්ණයෙන්ම. දැන් මම ඔබතුමන්ලාට ඉදිරිපත් කරනවා, 2025 වර්ෂයේ වාර්ෂික අය වැය ඇස්තමේන්තුවලින් වෙන් කළ ප්‍රතිපාදන, රුපියල් මිලියන

1,500යි; මේ පොඩි කාලයට. NITF එකේ අපේක්ෂිත දායකත්වය රුපියල් මිලියන 1,500ට වැඩියි. 2025 වර්ෂය තුළ ආවරණය කළ හැකි මුළු රක්ෂණය රුපියල් මිලියන 3,000කට වැඩියි. ඒ අනුව, 2025.01.01 සිට 2025.03.12වෙනි දා දක්වා ගෙවන ලද වන්දි මුදල රුපියල් මිලියන 952යි. 2024 ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 2,557යි. හැබැයි, මේ මාස කිහිපයට විතරක් අපි ගෙවලා තිබෙනවා රුපියල් මිලියන 952ක මුදලක්. ගොවියා අසරණභාවට පත් නොවී බේරා ගැනීම වෙනුවෙන් මේ නව රජය රුපියල් මිලියන 952ක් ගෙවලා තිබෙනවා. ඊට අදාළ ගොවීන් සංඛ්‍යාව 53,511යි, අක්කර ගණන 61,071යි.

ආසන්න කාලයේ පැවති ගංවතුර උවදුරේ වන්දි ප්‍රමාණය දැනට ඇස්තමේන්තු කරමින් පවතී. ගෙවීමට සිදු වේ යැයි අපේක්ෂිත මුදල රුපියල් මිලියන 550යි. අදාළ අක්කර ගණන 20,000යි. නව ආණ්ඩුව පත්වීමෙන් පසු වියදම, - 2024 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා - රුපියල් මිලියන 682යි. අදාළ ගොවීන් සංඛ්‍යාව 29,106යි, අක්කර ගණන 41,393යි. එහෙම නම් එක පැත්තකින් ගොවියා ආර්ථිකව ශක්තිමත් වෙනවා. පොහොර සහනාධාරය සියලු තැන්වලට ව්‍යාප්ත වෙමින් බෙදා හැරෙනවා, ඕනෑම විධියට.

සමහර විට soil health card පත නිසා පොහොර මිල අඩු වෙන්න පුළුවන්. හැබැයි පොහොර මිල අඩු වුණාට රජයෙන් ඒ මුදල අඩු කරන්නේ නැහැ. ඒකට වෙනම ක්‍රමයක් තිබෙනවා. ඒ microbial biome එක improve කරන්න පාංශු සහ සංරක්ෂණ ක්‍රම අනුගමනය කරන්න පුළුවන්. එහෙම නැත්නම් සීසානකොට අඩුවෙන් සීසාලා microbial biome එක improve කරන ක්‍රමයක් තිබෙනවා නම්, ඒ පොහොර සහනාධාරය ඒකට යොමු කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධව දීර්ඝ ලෙස පැහැදිලි කළා. මේ කුමන ආකාරයෙන් හෝ අපට පුළුවන්කම ලැබෙනවා අපේ රටේ පොළොව සුවපත් කර, ගොවියා සුවපත් කර, රටට සුව හදන ලාංකීය ආදර්ශය අපේ මාතෘ භූමිය තුළින් නිර්මාණය කර ගන්න. ඒ සඳහා සියලුදෙනාටම ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. M. Nizam Kariapper. You have eight minutes.

[ප.ව. 4.08]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I will take the maximum, Hon. Presiding Member.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் கல்முனையைச் சேர்ந்தவன். அது நான் பிறந்த மண்! அந்த மண் இந்த நாட்டு மக்களின் பசியைத் தீர்த்த நெல் விளைந்த பூமி! அதை நாங்கள் 'கரவாகுவட்டை' என்று அழைப்போம். அது பொன் விளைந்த பூமி! எங்கள் ஊரைச் சேர்ந்த சர்வதேச புகழ்பெற்ற மகாகவி 'சோலைக்கிளி' அவர்கள் இதை "பொன்னாலே புழுதி பறந்த பூமி" என வர்ணித்தார். அந்த விவசாய பூமிதான் இன்று என்னை இந்தப் பாராளுமன்றத்தில் ஒரு சனாதிபதி சட்டத்தரணியாக நிறுத்தியிருக்கிறது. அதுதான் உண்மை! ஏனென்றால், எங்கள் பிரதேசத்தினுடைய வளமான பொருளாதாரத்தின் பின்புலம் அந்தக் 'கரவாகுவட்டை'தான். பொன் விளைந்த பூமியான கரவாகுவட்டை இன்று தண்ணீரால் நிறைந்த ஒரு கரவாகு ஆறாக மாறிவிட்டது.

முன்னாள் பிரதம மந்திரி டி. எஸ். சேனாநாயக்க அவர்கள் கேற் முதலியார் எம். எஸ். காரியப்பரின் ஒத்துழைப்புடன் உருவாக்கிய சேனாநாயக்க சமுத்திரமானது பாரிய நீர்ப் பாசனத் திட்டமாகும். அம்பாறை மாவட்டத்தில் பல்லாயிரக் கணக்கான புன்னிலங்களை அல்லது வறண்ட பயனற்ற நிலங்களை அது நெற்கதிர் விளையும் வயற் காணிகளாக்கியது. இன்று கரவாகுவட்டையிலுள்ள 3,000 ஏக்கருக்கும் மேற்பட்ட காணிகள் ஆறாக மாறி பயனற்ற நிலமாகியுள்ளன. இதுதான் கல்முனை மக்கள் அதற்குக் கொடுத்த விலை! மீண்டும் எங்களுடைய கரவாகுவட்டையை பொன் விளையும் பூமியாக மாற்றுவதற்குக் காலம் கனிந்துள்ளதாகவே நான் கருது கின்றேன். Madam, for generations, a paddy land called Karavakuvattai, which is the backbone of the economy of Kalmunai, had been supplying paddy to this country in large quantums. This Karavaku Kandam covering about 3,000 acres was once a thriving paddy cultivation, sustaining countless farming families. However, with the construction of the Gal Oya Dam and the reconstruction of the Kalmunai-Chavalakadai Road, this agricultural landscape was drastically altered. What was once a fertile and self-sustaining region is now facing a crisis due to flooding, loss of irrigational infrastructure and destruction of the natural drainage system.

Madam, the Ampara District has long been a key contributor to Sri Lanka's national economy. Historically, it has been a major grain producer. And, even during the British rule, irrigation development was prioritized there to ensure sustained agricultural growth. Today, Ampara contributes 3.2 per cent to our national GDP with an annual growth rate of 6 per cent in 2012/2013. This district recorded a remarkable 10.5 per cent of growth primarily due to the increased paddy and sugar production. Over 65 per cent of the economy of Ampara depends on the primary sector, which includes paddy, coconut, sugar, livestock and fisheries. More than 32.5 per cent of the local workforce is employed in agriculture. There is a myth that we are traders. No, that is not so.

The agriculture in Ampara remains highly dependent on the availability of water. Without proper irrigation infrastructure, production would decline, food prices would rise and thousands of families would suffer. The average income of a thousand households in Ampara is already lower than the national level, standing at Rs. 32,537 compared to the national average of Rs. 45,878. We cannot afford to let this crisis continue. Madam, the problems in that region are not natural, they are man-made and could be rectified, if stiff actions are taken.

Now, I would like to point out the losses we had. In Panrithivu Mel Kandam, out of a 472 cultivated acreage, 220 acres are affected. In Panrithivu Kilal Kandam, out of a 492 cultivated acreage, 350 acres are affected. In Kalmunaiar Kandam, out of a 300 cultivated acreage, the entire 300 acres are affected; අක්කර 300ම අපට වගා කරන්න බැරි තත්ත්වයකයි තිබෙන්නේ. In Kudakkarai

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

Kandam Mel, out of a 480 cultivated acreage, 250 acres are affected. In Sevakapathu Kandam, out of a 602 cultivated acreage, 400 acres are affected. In Iraya Velikandam, out of a 270 cultivated acreage, the entire 270 acres are affected. In Munaiya Velikandam - Kilal, which is the southern part, out of a 300 cultivated acreage, 282 acres are affected. That is, 90 per cent of that area is affected! In Needa Karai Kandam, out of a 600 cultivated acreage, 480 acres are affected.

ගරු ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා ඇත්ත වශයෙන්ම මම මේ ටික කියන්නම ඕනෑ. Gal Oya Dam එකේ downstream irrigations තමයි අපට තිබෙන විශාලම අභියෝගය. අපට මේ සම්බන්ධයෙන් කෙටිකාලීන විසඳුම් තිබුණාට, දීර්ඝ කාලීන විසඳුමක් හැටියට මේ වෙනුවෙන් ද්විතීයික dam එකක් හදන්නම ඕනෑ, ගරු ඇමතිතුමා. ඒ කියන්නේ, Gal Oya Dam එක හැදුවාට පස්සේ catchment area එකේ ඉඳලා එන වතුර ටික ඒකට පිරෙනවා. Climatic changes එක්ක දැන් එන වතුර ප්‍රමාණය අතිවිශාලයි. ඊට අමතරව අපේ ප්‍රදේශවල දැන් වෙනදාටත් වඩා වැඩියෙන් වැහි වතුර එකතු වෙනවා. ඒ ප්‍රදේශ ඔක්කෝම පිරුණාට පස්සේ අඩුම ගාණේ ඒ වතුර ටික hydropowerවලට හරි, නැත්නම් irrigation සඳහා යොදවන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. දැන් වෙන්නේ ඒ වතුර overflow වුණු ගමන් - ඇරපු ගමන් - කඩාගෙන බිඳගෙන ඒ වතුර ටික ඔක්කෝම කරවාහුපත්තුවලට එන එකයි. කල්මුණේ, කල්ලඩි පාලම ඉදිකිරීම හරහා අපට කිට්ටංගියට වතුර flow වෙන්නේත් නැහැ. මම කල්මුණේ නගරාධිපති වශයෙන් සිටි කාලයේදී JICA plan එකක් ගෙනාවා. එතැන කියලා තිබුණේ ද්විතීයික dam එකක් හදන්න ඕනෑ කියලායි. ද්විතීයික dam එකක් හැදුවාම ගල්ඔය, හබරණ සේනානායක සමුද්‍රයේ overflow වෙන වතුර ටික irrigations හරහා hydropower සඳහා පාවිච්චි කරලා ද්විතීයික dam එකට ගේනවා. මම හිතන විධියට ඒක තමයි Japanවලත් කරන ක්‍රමවේදය. ද්විතීක dam එකේ තියා ගන්නවා. නැත්නම්, නියහ කාලයේදී ඒක වේලෙනවා, වැහි කාලයේ පිරෙනවා. වතුර පිරුණාට පස්සේ ක්‍රම දෙකක් තිබෙනවා. එකක් තමයි, නැවත hydropower උපදවන්න ඕනෑ නම් වතුර ආපහු ඉහළට pump කරලා නැවත යවන්න පුළුවන්. නැත්නම්, එතැන තියාගෙන අවශ්‍ය විධියට ඒ වතුර ටික පහළට යවන්න පුළුවන්. එතකොට කරවාහුපත්තුවල අක්කර 3,000ක් එක කන්නයක වගා කරන ඒ කුඹුරු ටික කන්න දෙකක් වගා කරන්න පුළුවන්.

ඇත්තටම මම මෙතැන ඉන්නේ කරවාහුපත්තුවල මගේ සීයාගේ තිබුණු ඒ කුඹුරුවලින් උපයපු මුදල්වලින් ඉගෙන ගත්ත නිසයි. ඒ මුදල්වලින් ඉගෙනගෙන තමයි අපේ තාත්තාත් Law College ගිහිල්ලා නීතිඥවරයෙකු වුණේ. ඒක තමයි අපේ ආර්ථිකයේ පසුබිම. ගරු ඇමතිතුමනි, අවම වශයෙන් ප්‍රතිපත්තියක් හැටියට මේක පිළිගෙන - මොකද, මේක රුපියල් බිලියන ගණනක් වියදම් වෙන වැඩක්. මේක අද-හෙට අවසන් කරන්න බැරි වැඩක් - ප්‍රදේශ, ජාති, ආගම්වලින් ඔබ්බට ගිහිල්ලා අපට මේක කරගන්න පුළුවන් නම් ඒක ගොඩක් වටිනවා. අපේ අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු ඇමතිතුමාත් මේ ගැන දන්නවා. මේක ප්‍රතිපත්තියක් හැටියට පිළිගත්තොත් අනාගතයේදී යම්කිසි විදේශීය රටක ආධාරයකින් වුණත් මේ ටික කර ගන්න අපට පුළුවන් වේවි. මොකද, ද්විතීයික dam එකක් හදනවා කියන එක අත්‍යවශ්‍යයි. අනාගතයේ මේ climatic changes එක්ක ඇතිවෙන වෙනස් වීම් අපට පාලනය කරන්න පුළුවන් එකම ක්‍රමය එයයි කියලා කියමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රියාස් ෆාරූක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.16]

ගරු රියාස් ෆාරූක් මහතා
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2025 අය වැය කාරක සභා විවාදයේදී කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරන්නට කාලය වෙන් කර දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. අපේ ආණ්ඩුව යටතේ ගරු ලාල් කාන්ත ඇමතිතුමා මේ සභාවේ සිදු කළ පළමුවැනි කථාවේදී ප්‍රකාශයට පත් කළ වැඩ දෙකක් ගැන මම කිව්වොත් හොඳයි කියලා හිතනවා. එතුමා එහිදී මුලින්ම සඳහන් කර සිටියා රිළවුන් නිසා සිදු වන ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙනවා කියලා. දෙවැනි කාරණය විධියට අකුරණ ප්‍රදේශයේ ඇති වන ගංවතුර ප්‍රශ්නයට මැදිහත් වෙලා, ඒ සම්බන්ධවත් සොයා බලා ඒ ප්‍රශ්නයත් අවසන් කරන බව කිව්වා.

ඇත්තටම ඇයි මම මේ ගැන කියන්නේ? දැනට දවස් කිහිපයකට ඉස්සර වෙලා නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා අකුරණ ගංවතුර තත්ත්වය ගැන කථා කළා. ලාල් කාන්ත ඇමතිතුමා එදා අකුරණ ගංවතුර ප්‍රශ්නය ගැන කථා කළාට පස්සේ දිගින් දිගටම විපක්ෂයේ මන්ත්‍රීවරු අකුරණ ගංවතුර ප්‍රශ්නය ගැන කථා කරනවා. ඇත්තටම අකුරණ ප්‍රදේශයේ ගංවතුර ඇතිවෙන්න පටන් ගත්තේ ඇයි? විපක්ෂයේ නොයෙකුත් පක්ෂ අය අවුරුදු 76ක් තිස්සේ විටින් විට ආණ්ඩු කළා. ඒකෙන් භාගයක්, අවුරුදු 35ක් විතර කාලයක් තිස්සේ ඒ ගොල්ලන්ට වැඩ කරපු අයට අකුරණ ඇළ අයින කපලා පුරවන්න ඉඩ දුන්නා. ඊට පස්සේ ඒ ස්ථානවල ලීවලින් තාවකාලික ගොඩනැඟිලි හදන්න ඉඩ දුන්නා. ඊට පස්සේ කොන්ක්‍රීට්වලින් හැදුවා. හදන්න ඕනෑ මොන ක්‍රමයටද කියලා ඒ ගොල්ලන්ම තමයි කියලා දුන්නේ. ඒ දේශපාලනඥයෝ ඒ ඇළ තියාගෙන අවුරුදු 35ක් විතර දේශපාලනය කළා. ඒ කොහොමද කිව්වොත්, උසාවිය නිවාඩු දවස් ගැන ඒ ගොල්ලන් කියා දෙනවා. උදාහරණයක් විධියට කිව්වොත්, අප්‍රේල් සිංහල අලුත් අවුරුදු කාලයේදී, ඊළඟට දෙසැම්බර් Christmas නිවාඩුව කාලයේදී උසාවියට සති දෙකක් නැත්නම් තුනක් නිවාඩු තිබෙනවා. ඒ කාලයට එතැන හදාගන්න කියලා ඒ අයට කියා දෙනවා. ඒ ගොල්ලන් කැබිනට් අමාත්‍යවරු විධියට මෙතැන හිටියා. ඒ ගොල්ලන්ගේ තවත් කණ්ඩායමක් පළාත් සභාවල හිටියා. තවත් කණ්ඩායමක් ප්‍රාදේශීය සභාවල සභාපතිවරු විධියට හිටියා. ඒකට විරුද්ධව කවුරු හරි පැමිණිල්ලක් කළොත්, නැත්නම් ප්‍රාදේශීය සභාවට පැමිණිලි කළොත්, ඒකට විරුද්ධව කටයුතු කරන්නේ නැහැ. තාවකාලික ගොඩනැඟිලි තමයි හදලා තිබෙන්නේ, ඒකට තමයි අවසර දීලා තිබෙන්නේ කියලා මොනවා හරි කියලා ෂේප් කරලා යවනවා. ඒ වාගේම සමහර තැන්වල - ලාල් කාන්ත ඇමතිතුමාත් දැකලා ඇති, ළඟදී අපේ මන්ත්‍රීවරු කණ්ඩායමක් එතැන බලන්න ගියා. රජයේ නිලධාරිනුත් ගියා - ඇළෙන් එගොඩත් ඒ ගොල්ලන්ට support කරපු කට්ටිය, මෙගොඩත් ඒ ගොල්ලන්ට support කරපු කට්ටිය; දෙගොල්ලන්ම බිල්ඩින් හැදුවා; ඇළ පොඩි වුණා. දැන් ඇළවල්වල නම් කිව්වා. වහගල ඔය, පිගා ඔය ගැන කිව්වා. ඇත්තටම මගේ මහ ගෙදර ඉස්සරහම තමයි වහගල ඔය තිබෙන්නේ. ඊට පස්සේ මගේ කඩය තිබෙනවා ටවුමේ. ඒකට ඉස්සරහ තමයි පිගා ඔය තිබෙන්නේ. වහගල ඔයේ වතුර block වෙලා තමයි පිගා ඔය උතුරන්නේ.

ඇත්තටම මෙච්චර කල් මේ ගොල්ලන් මොකක්ද කළේ? රවුල් හකීම් මන්ත්‍රීතුමා මගේත්, ලාල් කාන්ත මැතිතුමාගේත් නම් කිව්වා. අපි ආණ්ඩුව භාර අරගෙන තවම මාස තුනයි. වැඩේ පොඩ්ඩක් ඉක්මන් කරන්න කිව්වා. වැඩේ යන්න ලැහැස්තියි. පොඩ්ඩක් ඉක්මන් කරන්න කිව්වා. ඒ ගොල්ලන් අවුරුදු 30ක්-35ක් ඒ ඇළ තියාගෙන දේශපාලනය කරලා මේ තත්ත්වය ඇති කරලා, දැන් අපට ඉක්මන් කරන්න කියනවා. එතුමා මගේ අතේ තිබෙන මේ පොතත් පෙන්වුවා. අකුරණ ගංවතුර තත්ත්වයට හේතු වූ කරුණු ඇතුළත් මේ පොත මම **සභාගත*** කරනවා.

එතුමා දන්නවා ඇති මම මේ පොත පෙන්වලා කථා කරයි කියලා. මේ පොතේ ඇතුළතත්, පිටතත් ගංවතුරේ photos තිබෙනවා. පිටත ගංවතුරේ photos තිබෙනවා. ඇතුළත ජමියතුල් උලමා සංවිධානය, පල්ලියේ අය, අනෙකුත් සංවිධාන, රජයේ නිලධාරීන්ගේ කමිටු ආදියෙන් දක්වපු කරුණු, අරවා මේවා ඔක්කෝම තිබෙනවා. මේ පරණ photos ටිකක් ඇතුළත් කරලා අන්තිම ඡන්දයට ගහපු පොත. මේ වාගේ පොත් කිහිපයක් තිබෙනවා. හැම ඡන්දයකදීම මේ වාගේ පොත් ගහනවා. කොහොමද? "අකුරණ ගංවතුරට විසඳුම" කියලා. දැන් දෙල්තොට ගියොත් එහෙත් බොන්න වතුර නැහැ. එතකොට එහෙ බොන්න වතුර දෙනවා කියනවා. ඒවා තියාගෙන තමයි දේශපාලනය කළේ. ඇත්තටම මම කියන්න කැමැතියි, අපි මේ වැඩේට බැහැලා ඉන්නේ. අපි ආයතන කිහිපයකටම මේ වැඩේ භාර දීලා තිබෙන්නේ. ඒ ගොල්ලන්ගේ නිරීක්ෂණ අපි ගන්නවා. අන්තිමට Peradeniya University එකේ ඉංජිනේරු කණ්ඩායමටත් මේ ගැන නිරීක්ෂණ දෙන්න කියලා අපි කියා තිබෙනවා. ඒ ටික හම්බ වුණු ගමන් අපි වැඩේ කරනවා. දැනටමත් SLLDC එකෙන් මේකට ශක්‍යතා වාර්තාව ගන්නට රුපියල් මිලියන 22ක් pass කර තිබෙනවා. ඒ වාගේම හකීම් මැතිතුමා කිව්වා, අකුරණ ඉංජිනේරු කණ්ඩායමකගේ වාර්තාවක් තිබෙනවා, ඒක අන්තිමට තිබුණු නුවර DCC meeting එකට ඉදිරිපත් කළා කියලා. ඇත්තටම ඒගොල්ලන් ගංවතුර ගැටලුවට විසඳුමක් ලබා දුන්නේ නැති හින්දා කාලයකට ඉස්සෙල්ලා අකුරණ ඉන්න Dr. Lariff ප්‍රමුඛ කණ්ඩායමක් වාර්තාවක් හදා දුන්නා. ඒ වාර්තා තිබෙනවා. එතුමා DCC එකේ පළමු රැස්වීමට තමයි ඒ වාර්තාව දුන්නේ. ඒ, කාලයකට ඉස්සෙල්ලා. නමුත් හකීම් මැතිතුමා ඒ කාරණා ඉදිරිපත් කළේ ඒ ප්‍රශ්නයට දැන් විසඳුමක් ලබා දිය යුතුයි වාගේයි. ඇත්තටම ලාල් කාන්ත ඇමතිතුමාත්, අපිත් රජයක් විධියට මේ කාරණයට මැදිහත් වෙලා තිබෙන්නේ. ඒ නිසා පුළුවන් ඉක්මනට අපි මේ ගංවතුර ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙනවා කියන කාරණය සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම සඳහන් කරන්න ඕනෑ, දෙල්තොට ප්‍රදේශයේ ජනතාවට බොන්න වතුර නැහැ කියන කාරණයත්. අපි ඒ ගැටලුවටත් විසඳුමක් ලබා දෙනවා. පසුගිය කාලයේ ඒ ගැටලුවත් තියාගෙන දේශපාලනය කර කර හිටියා. නමුත් අපි ඒ ගැටලුවටත් විසඳුමක් ලබා දෙනවා. දැන් ඒ ගැන කථාවක් නැහැ. ඒ ගැන දැන් කියපු නිසා ඒකටත් මැදිහත් වෙයිද දන්නේ නැහැ. කොහොම වුණත් කමක් නැහැ, අපි පුළුවන් තරම් ඉක්මනට ඒ කටයුත්තත් කරනවා කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 4.24]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන සියයට 25ක් පමණ වන ගොවි ජනතාව ගැනයි අද අපි කථා කරන්නේ. අපි දන්නවා, මේ රටේ අතීතය ගත්තොත් කෘෂි කර්මාන්තය තුළ විශාල ආර්ථිකයක් ගොඩනැඟී තිබුණු බව. 1994 වර්ෂය වෙනකොට මේ රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 20ක පංගුවක් තිබුණා, කෘෂිකර්මයට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ඒක සියයට 8කට අඩු වෙලා තිබෙනවා. ඒකෙන් තේරෙන්නේ දවසින් දවස මේ රටේ ගොවියා; කෘෂිකර්මයේ නියැළෙන්නා දුප්පත් වෙලා තිබෙනවා කියන එකයි. අවුරුදු ගණනකින් කෘෂිකර්ම ක්ෂේත්‍රය නවීකරණය වෙලා නැහැ; අපේ අස්වැන්න වැඩි වෙලා නැහැ; අක්කරයකින් ගන්නා වී කිලෝ ගණන වැඩි වෙලා නැහැ, බඩඉරිඟු කිලෝ ගණන වැඩි වෙලා නැහැ; කෘෂිකර්මයේ ඵලදායීතාව වැඩි වෙලා නැහැ. එහෙම නම් අද අපි බලන්න ඕනෑ, ගොවීන් ගොඩනහන්නේ කොහොමද කියලායි.

මෙවර අය වැය දිහා බැලුවාම අපට පෙනී යනවා, ගොවියාට පොහොර සහනාධාරය වෙනුවෙන් වෙන්කර තිබෙන්නේ, රුපියල් බිලියන 35ක් බව. මට මතකයි, මීට අවුරුදු 20කට පමණ පෙරත් පොහොර සහනාධාරයට රුපියල් බිලියන 35ක් වෙන් කළ බව. අපි දැක්කා, මීට මාසයකට පමණ ඉස්සෙල්ලා අගමැතිතුමියගෙන් අහපු ප්‍රශ්නයකට එතුමිය පිළිතුරු ලබා දී තිබුණා, මේ රුපියල් බිලියන 35නුත් රුපියල් බිලියන 10යි - රුපියල් බිලියන 9.9ක් පමණ - ගෙවා තිබෙන්නේ කියලා. ඉතිරි මුදල ගෙවලාත් නැහැ. මේ රටේ සිටින ගොවි පවුල් විසිපස් ලක්ෂයෙන්, වී වගා කරන්නේ පවුල් ලක්ෂ 10යි. එහෙමනම් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් ලක්ෂ 10කට විතරයි පොහොර සහනාධාරය දෙන්නේ. බඩඉරිඟු වවන ගොවියාට, තේ, රබර්, පොල් වවන ගොවියාට, අල, ලූනු වවන ගොවියාට තමුන්නාන්සේලාගේ රජයෙන් පොහොර සහනාධාරය ලබා දෙන්නේ නැහැ. උක් වවන ගොවියාටත් පොහොර සහනාධාරය ලබා දෙන්නේ නැහැ. තමුන්නාන්සේලා ගොවීන්ගෙන් සියයට 40කට විතරක් පොහොර සහනාධාරය දීලා මෙතැනට ඇවිත් මහ ලොකුවට පුරාජේරු කථා කියනවා.

මට මතකයි, අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ ඕනෑම ගොවියෙකුට රුපියල් 1,500ට කිලෝ 50ක පොහොර මිටියක් ගන්න පුළුවන්කම තිබුණු බව. අද අමතරව පොහොර ගන්නවා නම් රුපියල් 8,500ක් පොහොර මිටියකට - පොහොර හොණ්ඩරයකට - ගෙවන්න ඕනෑ. අපි තමුන්නාන්සේලාගෙන් අහනවා, මෙහෙමද මේ කටයුතු කරන්නේ කියා. වී ගොවියා දිහා බලන්න. අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා, අපේ මිත්‍රයා බලයට එන්න ඉස්සෙල්ලා කිව්වේ වී කිලෝවකට රුපියල් 152ක් ගෙනවා කියලා. දැන් ගෙවන්නේ රුපියල් 115යි. මම අහනවා, ඇයි මෙහෙම කරන්නේ කියා. එක පැත්තකින් අපි ගොවියා ආරක්ෂා කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන් පාරිභෝගිකයා ආරක්ෂා කරන්නත් ඕනෑ. අද තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ මොකක්ද? එක පැත්තකින් ගොවියා දුක් විඳිනවා. තමුන්නාන්සේලා කිව්වා, ආරක්ෂිත වී සංචිතය සියයට 10ක් කරනවා කියලා. ඒ කියන්නේ, මෙට්‍රික් ටොන් ලක්ෂ 30න් ලක්ෂ 3ක් සංචිතයට ගන්නවා කියලා. තමුන්නාන්සේලා වී මිලදී ගන්න වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 5යි. රුපියල් බිලියන 5ට ගන්න පුළුවන් වන්නේ වී මෙට්‍රික් ටොන් 40,000යි. හාල් නම් මෙට්‍රික් ටොන් 24,000යි. දවස් ගණනකට ඕනෑ හාල් ටික තමයි එතැන තිබෙන්නේ. කෘෂිකර්ම ඇමැතිතුමාගෙන් මම අහනවා, තමුන්නාන්සේලා දැන් වී මෙට්‍රික් ටොන් කීයක් අරගෙන

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

තිබෙනවාද කියලා. අද තමුන්නාන්සේලාට ගොවියා වී ටික දෙන්නේ නැහැ. ඔවුන් අද වී ටික නොදෙන්නේ තමුන්නාන්සේලා කියපු මිල නොදුන් නිසායි. අද පෞද්ගලික හාල් මෝල් හිමියෝ වී ටික ගන්නවා. මේකෙන් වෙන්නේ ගොවියා දුප්පත් වෙද්දී පාරිභෝගිකයාටත් වැඩි මිලකට හාල් ටික ගන්න සිද්ධවීමයි. පසුගිය ජනවාරි පළමුවෙනි දා කිරිබත් කන්න හාල් තිබුණේ නැහැ. තිබුණේ, ඉන්දියාවෙන් ගෙන්වපු ඇලෙන හාලක්. අපි අහනවා, ඉදිරියේ එන අලුත් අවුරුද්දටවත් හොඳ කිරිබත් ටිකක් කන්න පුළුවන් වෙයිද කියලා. නැවත මේ මාෆියාව එනවා.

තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා කිව්වා, වී මෝල් ඇතුළට ගිහිල්ලා වී තොග එළියට දානවා කියලා. නමුත්, දැමීමේ නැහැ. හැබැයි, එතුමා මේසයට ගහලා ඒක කියපු ගමන් හාල් මිල නම් රුපියල් 10කින් වැඩි වුණා. රුපියල් 10කින් නොවෙයි, හාල් මිල දැන් රුපියල් 60කින්, 70කින් වැඩි වෙලා. නමුත් ඒ සහනය හම්බුණේ නැහැ, ගොවියාට. තමුන්නාන්සේලා උදව් කරපු හාල් මෝල් හිමියන්ට තමයි ඒ සහනය දුන්නේ. අපි කියනවා, හාල් කිලෝවක ආනයන බද්ද රුපියල් 65 ගණනේ හාල් මෙට්‍රික් ටොන් 167,000කින් - හාල්වලින් විතරක් - තමුන්නාන්සේලා රුපියල් මිලියන 1,000ක විතර ලාභයක් ලබා තිබෙන බව. අපි අහනවා, තමුන්නාන්සේලා කටයුතු කරන්නේ එහෙමද කියලා. අපි තමුන්නාන්සේලාගෙන් පොහොර සහනාධාරය ඉල්ලනවා. ඇයි ගොවියාට මේ විධියට සලකන්නේ? තමුන්නාන්සේලාගේ වාර්තාවල තිබෙනවා, පොල් අස්වැන්න අඩුවෙලා තිබෙන්නේ පොහොර දැමීමේ නැති නිසා කියලා. දැන් ඉස්සෙල්ලා කථා කළ මන්ත්‍රීතුමා කාබනික පොහොර ගැන කථා කළා. මට බයත් හිතුණා. මොකද, ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ කාබනික පොහොර වගාවට ආපහු යන්න හදනවාවත් ද කියලා. අපේ ගොවියා ඒකෙන් හොඳටම බැට කෑවා. අපි ඉල්ලා සිටිනවා, අනෙක් ගොවියන්ටත් පොහොර දෙන්න කියලා.

මම ඉන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ. මොනරාගල, අනුරාධපුරය, අම්පාර කියන ප්‍රදේශවල ගොවියෝ අක්කර 150,000ක බඩඉරිඟු වවනවා. හැබැයි ඒ ගොවියා පොහොර ගන්න ඕනෑ, රුපියල් 8,500ටයි. තමුන්නාන්සේලා මොනවාද කළේ? දැන් බඩඉරිඟු අස්වැන්න ලැබෙනවා. තමුන්නාන්සේලා බලපත්‍ර දීලා තිබෙනවා, බඩඉරිඟු මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකක් ආනයනය කරන්න. රුපියල් 60ට තිබුණු බඩඉරිඟු කිලෝව දැන් රුපියල් 110යි. ගොවියෝ අද මැසිවිලි නඟනවා. මේ රටේ බඩඉරිඟු නැති වෙලාවට විතරයි ආනයනය කරන්නේ. අපේ බඩඉරිඟු අවශ්‍යතාව මෙට්‍රික් ටොන් ලක්ෂ භයක්. ඒකෙන් ලක්ෂ හතරක් රට තුළ නිෂ්පාදනය කරනවා. තමුන්නාන්සේලා මොනවාද කළේ? බඩඉරිඟු අස්වැන්න එන වෙලාවට බඩඉරිඟු පිට රටින් ගෙනාවා. බඩඉරිඟු කිලෝව දැන් රුපියල් 110යි. ගොවියාට ට්‍රැක්ටර් ගාස්තුව වැඩියි. රුපියල් 5,000ට තිබුණු කිලෝ 5 බීජ පැකට් එක දැන් රුපියල් 20,000යි. බඩඉරිඟු ගොවියන් කියන්නේ රටේ ඉන්න දුප්පත්ම මිනිස්සු ටික. අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා, කරුණාකරලා ඒ අයට අවශ්‍ය පොහොර ටික ලාභෙට දෙන්න කියලා. ඒ වාගේම බඩඉරිඟුවලට සහතික මිලක් ලබා දෙන්න. අද ඒකත් පාලනය කරන්නේ පෞද්ගලික අංශයෙන්. කරුණාකරලා බඩඉරිඟු ගොවීන්ට සහතික මිලක් දෙන්න කියලා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේලා දැන් කථා කළා, අවුරුදු 76ක ශාපයක් ගැන. 1948දී අපි නිදහස ලබන කොට මේ රටට අවශ්‍ය හාල්වලින් සියයට 34යි නිෂ්පාදනය කරලා තිබුණේ. සියයට 66ක් අපි පිට රටින් ගෙනාවා. ඩී.එස්. සේනානායක මැතිතුමා, ඩඩ්ලි සේනානායක මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමා කියන අය එකතු වෙලා මින්නේරිය ව්‍යාපාරයෙන් පටන් ගන්නා මිනිපේ ව්‍යාපාරය, ගල් ඔය සේනානායක සමුද්‍රය, මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය හදලා 1994 වර්ෂය වෙනකොට මේ රට සහලින් ස්වයංපෝෂිත කළා.

ඒකද ශාපය? විදුලිය අද මෙච්චර ලාභයට ගන්නේ ඒ නිසායි. ජලවිදුලි ඒකකයක් නිපදවන්න වැය වෙන්නේ රුපියල් 3.50යි. තාප විදුලි ඒකකයක් නිපදවන්න වැය වෙනවා රුපියල් එකසිය ගණනක්. එදා අපේ නායකයෝ -ඩඩ්ලි සේනානායකලා, ජේ.ආර්. ජයවර්ධනලා- කරපු මහවැලි ව්‍යාපාරය ඇතුළු අනෙක් ව්‍යාපාර නිසා තමයි මේවා තිබෙන්නේ. අපි වැව් අමුණු හැදුවා. තමුන්නාන්සේලාගේ ජනාධිපති හිටියා, පරිවාස ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමති වශයෙන්. පුළුවන් නම් නැඟිටලා කියන්න, එතුමා හදපු එක වැවක් ගැන. පුළුවන් නම් එතුමා හදපු එක වැවක නමක් කියන්න. කථා කරනවා විතරයි.

මම කථා කරන්න ඕනෑ, උක් කර්මාන්තය ගැනත්. ලංකාවේ තිබෙන ලොකුම උක් කර්මාන්තශාලා හතරෙන් තුනක්ම තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ. ගල්ඔය සීනි සමාගම -උක් කර්මාන්තශාලාව- පටන් ගත්තේ ඩී.එස්. සේනානායක මැතිතුමා. සෙවනගල සීනි සමාගම පටන් ගත්තේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. පැල්වත්ත සීනි සමාගම පටන් ගත්තේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. මට මතකයි, 1988දී ඉන්දියාවේ මෝතා සමාගම අපේ රටට ආවා. ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රදේශයේ මෝතා සමාගමෙන් සීනි සමාගමක් පටන් ගන්න හැදුවා. මොනවාද තමුන්නාන්සේලාගේ JVP එක එදා කළේ? ඒ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීනි සමාගමක් හදලා ආර්ථිකය නංවන්න හදනකොට, බන්සාල්, ගෝඨා කියන ඉන්දියානු ආයෝජකයෝ අපේ රටට ආවා මට මතකයි. ලංකාවේ හිටපු ඉඩම් කොමසාරිස් සිංහ සේනානායක මහත්මයා තමුන්නාන්සේලා මැරුවා. ඒ අයගේ නෝනලාත් මරලා පිච්චුවා. 76 ශාපය ඒක. අද සීනි කර්මාන්තය දියුණු කරන්න මොනවාද කරලා තිබෙන්නේ කියලා මම අහනවා. පසුගිය කාලයේ සීනි කර්මාන්තශාලාවල සිටින තමුන්නාන්සේලාගේ කට්ටිය ස්ට්‍රයික් කළා. දැන් එතනෝල් ටික විකුණා ගන්න විධියක් නැහැ. සීනි ටික විකුණා ගන්න විධියක් නැහැ. අද සීනි සමාගම්වල සේවකයන්ට පඩි ගෙවන්න විධියක් නැහැ. මේවාට ක්‍රියාමාර්ග ගන්න කියලා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අවුරුදු 76ක ශාපය තුළ ඔහොමයි වුණේ. තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. පොල් ගැනත් කියන්න තිබෙනවා. නමුත් ඒ ගැන කියන්න වෙලාව නැති නිසා මගේ කථාව නවත්වනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.35]

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම විපක්ෂයෙන් පැනනැඟුණු ප්‍රශ්න කිහිපයකට පිළිතුරු ලබා දීලාම මට ලැබී තිබෙන මේ කෙටි කාලය තුළ මගේ අදහස් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. නාමල් රාජපක්ෂ මැතිතුමා මතු කළා

වාගේම රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගෙනුත් මේ කාරණය යම් ප්‍රමාණයකට මතු වුණා. ඒ තමයි, පොහොර සඳහා මුදල් වෙන් කිරීමේදී පෙරට වඩා අඩු මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා කියන කාරණය. ඒක එහෙම පෙනෙන්නේ මෙන්න මේ නිසායි. පොහොරවලට අදාළව ණය අරගෙන, ඒ ණය වාරික සහ පොලී වාරික ගෙවමින් තිබෙනවා. 2023 අවුරුද්දේත් රුපියල් මිලියන 17,554ක් ගෙවලා තිබෙනවා. 2024 අවුරුද්දේත් මුදල් ගෙවලා තිබෙනවා. ඒ මුදලුත් එකතුවෙලා තමයි පොහොර සහනාධාරයට අදාළ මුදල් වෙන්වෙලා ඒ ඉලක්කම ලොකුවට පෙනෙන්නේ. අංක එක හැටියට, ඊට අදාළ පැහැදිලි කිරීම තමයි ඒක.

විශේෂයෙන්ම නාමල් රාජපක්ෂ මැතිතුමාගෙන් වාගේම රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ පැත්තෙනුත් මතු වුණු තවත් කාරණයක් තමයි, ආනයනික හාල්වලට පනවා තිබෙන රුපියල් 65ක බද්ද. ඒක අපි ගහපු බද්දක් නොවෙයි. ඒ, කලින් තිබුණු බද්ද. හැබැයි, අපිත් මේ බද්ද පවත්වාගෙන යනවා. මේ බද්ද ගැන කථා කරනකොට එතුමා අද උදේ කිව්වා, මේ බද්ද රුපියල් 2ට අඩු කරලා ජනතාවට සහන දුන්නා කියලා. මම ඒකට උත්තරයක් දෙන්න ඕනෑ. ඔව්, ඒ බද්ද රුපියල් 2ට අඩු කළා. රුපියල් 2ට බද්ද අඩු කරනකොට එදා මමත්, අපේ බලගල්ල මන්ත්‍රීතුමාත් හිටියේ ගින්නෝරුව ව්‍යාපාරයේ කුඹුරු යායක ගොවියෝත් එක්ක. අපි පැය 3ක් යන්න කලින් මහියංගනයට මාධ්‍යවේදීන් කැඳවලා ප්‍රකාශයක් කළා. "රුපියල් 65 බද්ද රුපියල් 2ට අඩු කරලා තිබෙනවා, මේ නිසා ගොවියාගේ වී ටික තූට්ටු දෙකට බහිනවා, මේ වෙනකොට අස්වනු නෙළන්න පටන්ගෙනයි තිබෙන්නේ, මේ බද්ද අඩු කළේ වෙන මොකකටවත් නොවෙයි, හිර වෙච්ච හාල් ප්‍රමාණයක් තිබෙන නිසා ඒ හාල් ටික ගේන්නයි, ඒ හාල් ටික ගෙනාවාට පසු මේ බද්ද නැවත ගහනවා, ගොවියායි, පාරිභෝගිකයායි දෙදෙනාම මේකෙන් මංකොල්ල කනවා" කියලා එදා අපි කිව්වා. ඒක මාධ්‍යවල පළ වුණා. ඒක ඒ විධියටම සිද්ධ වුණා. ඒ රුපියල් 65ක බද්ද රුපියල් දෙක හැටියට සනියක්වත් තිබුණේ නැහැ කියන එක නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට අපි කියන්න ඕනෑ. සුදු ලූනු වංචාවෙන්, සීනි බදු වංචාවෙන් වාගේම එදා හාල්වලින් ගැහුවේත් අන්න ඒ විධියට. එහෙම වංචා කරන්න අපි ඉඩ තියන්නේ නැහැ. අපි ඒක කරන්නේ නැහැ. ඒක, එක කාරණයක්.

ඊළඟ කාරණය මෙයයි. රත්නපුර දිස්ත්‍රික්කයේ ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, අපි බලයට එනකොට සහල් කිලෝව රුපියල් 170ට තිබුණේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සහල් කිලෝවකට පාලන මිලක් තිබෙනවා. දැනුත් පාලන මිලක් තිබෙනවා. දැන් පාලන මිලට කලින් නාඩු සහල් කිලෝවක පාලන මිල හැටියට තිබුණේ රුපියල් 220යි. ඒ, රුපියල් 220 තමයි රුපියල් 230 වුණේ. ඒ නිසා ඒක සම්පූර්ණයෙන් අසත්‍ය කථාවක්.

ඊළඟට, ගරු විපක්ෂ නායකතුමා මතු කළා, වීවල සහතික මිල ගැන. සහතික මිල ගණන් හැදීම සීතල කාමරවල ඉඳන් නිලධාරීන් කළාය කිව්වා. එතුමා එසේ ප්‍රකාශ කිරීම ගැන අපි කනගාටු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සෑම අවුරුද්දකම වීවල නිෂ්පාදන වියදම ගණන් හදනවා. ඒ කාලයේ අපිත් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විධියට වීවල නිෂ්පාදන වියදම ගණන් හැදුවා. රජයත් ගණන් හදනවා. රජය හදන ගණනේයි, අපි හදන ගණනේයි ලොකු වෙනසක් නැහැ. පසුගිය වතාවේ රුපියල් 5ක වෙනසක් තිබුණේ. දැන් අපි ඒක පැත්තකින් තියමු. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය බුද්ධි මාරඹේ මැතිතුමා මේ නිෂ්පාදන පිරිවැය ගණන් හදලා රටට කිව්වා. එතුමා ඒ විෂයයේම ඉන්න මහාචාර්යවරයෙක්. රජයේ ගණන් බැලීමයි, එතුමාගේ ගණන් බැලීමයි අතර ලොකු පරාසයක් නැහැ. බොහොම පොඩි පරාසයක් තිබෙන්නේ. මෙන්න මෙකත් එක්ක ආයතන 5ක් එකතු වෙලා ගොවි බිමේ තිබෙන ප්‍රායෝගික අත්දැකීම් සියල්ල අරගෙන තමයි අපේ නිලධාරි මණ්ඩල වීවල නිෂ්පාදන පිරිවැය ගණන් හැදුවේ කියන කාරණය මේ අවස්ථාවේදී අපි විපක්ෂ නායකතුමාට මතක් කරන්න ඕනෑකම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ වනකොට වැඩ පිළිවෙළක් සකස් කරලා, ඉදිරිපත් කර තිබෙනවා. අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමා ඊට අවශ්‍ය ප්‍රවේශය ගත්තා. අපේ නියෝජ්‍ය අමාත්‍ය ගරු සුසිල් රණසිංහ ඇමතිතුමාත් ඒ ගැන කිව්වා. ඒ වාගේම අපේ අනෙකුත් මන්ත්‍රීවරු, ඇමතිවරු මේ පිළිබඳ අදහස් රාශියක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අතිරේක ලේකම්තුමන්ලා සහ ලේකම්තුමියන්ලා, කොමසාරිස්තුමන්ලා, අධ්‍යක්ෂ ජනරාල්තුමන්ලා සහ අධ්‍යක්ෂ ජනරාල්තුමියන්ලා, සභාපතිවරු, ආයතන ප්‍රධානීන්, අධ්‍යක්ෂ මණ්ඩල මේ ආදී වශයෙන් අමාත්‍යාංශයට සම්බන්ධ ඒ සියලුදෙනා අපේ ඉලක්කවලට ගමන් කිරීම සඳහා මේ වනකොට විශාල පරිශ්‍රමයක් දරනවාය කියන එක ඒ අයට ගරු කිරීමක් විධියට මම මේ වෙලාවේ මතක් කරනවා.

මේ කෙටි කාලය තුළ විශේෂයෙන්ම ගොවි ජනතාවගේ මූලික ප්‍රශ්නවලට අපි උත්තර සපයමින් තිබෙනවා. දැන් ගොවියා මහ පාරට බහින කතන්දර ටිකක් තිබෙනවා. මේ කාලයේ ගොවියා පාරට බහින කාරණා දෙකක් තිබුණා. ඒ දෙකම දැන් අපි නවත්වා තිබෙනවා. හැබැයි, ඒ නැවැත්වූයේ නීතිය හමුවට ගිහිල්ලා හෝ මර්දනය කරලා නොවෙයි. උදාහරණයක් විධියට ගත්තොත් දැන් මහ කන්නයේ අස්වනු නෙළනවා. වෙන දා මේ කාලය වනකොට ගොවි ජනතාව මහ පාරේ උද්ඝෝෂණ කරනවා. පාරවල් දිගේ මාධ්‍යවලට voice-cuts දෙනවා. විවිධ ප්‍රකාශ කරනවා. "වීවලට සාධාරණ මිලක් නැහැ. රුපියල් 60ට, 70ට වී ටික මංකොල්ල කනවා"ය කියන චෝදනාව ගොවීන්ගෙන් එනවා. අන්න ඒ චෝදනාව අපි නවත්වලා තිබෙනවා. දැන් ගොවියාගෙන් එහෙම හඬක් එන්නේ නැහැ. ඒ සටනට අපි නැවතීමේ තිත තබා තිබෙනවා, ප්‍රායෝගික උත්තරයක් එක්ක. අපි ගොවියාගේ පැත්තෙන් අපේ සාර්ථකත්වය ප්‍රදර්ශනය කර තිබෙනවා. මොකද, අපේ වගකීමක් තමයි ගොවියා රකින එක. ඉතා හොඳ, සාධාරණ මිලක් අද ගොවියාගේ වීවලට ලැබිලා තිබෙනවා. රුපියල් 130 ගණන්වලට, රුපියල් 140 ගණන්වලට ගොවියා අද වී විකුණන්නේ අපි ඒ උපක්‍රම පාවිච්චි කරපු නිසායි.

ඒ එක්කම උද්ඝෝෂණවල එන සටන් පාඨයක් තමයි, "වී අලෙවි මණ්ඩලය විකුණන්න එපා. ඇවර කරන්න ලෑස්ති වෙන්න එපා. ඒක වවුලන්ට, පරෙවියන්ට දෙන්න එපා. කැලෑ වද්දන්න එපා. ඒක සක්‍රිය කරන්න. වී අලෙවි මණ්ඩලයට වී ගන්න" කියන එක. ඒ සටන් පාඨය ගොවියාගෙන් ආවා. අද ඒ සටන් පාඨය නැහැ. අද වී අලෙවි මණ්ඩලයට පණ දීලා තිබෙනවා. වී අලෙවි මණ්ඩලයේ සභාපතිතුමා මේ අවස්ථාවේ මේ නිලධාරි කුටියේ ඉන්නවා. අඩු කාර්ය මණ්ඩලයක් සහිතව එතුමා ඒ කටයුත්තට අද උර දීලා තිබෙනවා. අද වී අලෙවි මණ්ඩලය සක්‍රිය ආයතනයක් බවට පත් කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. මේ වෙනකොට පැන නඟින තවත් උද්ඝෝෂණයක් තිබෙනවා. ඒ උද්ඝෝෂණයත් අපි නවත්වලා තිබෙන්නේ. මොකක්ද ඒ උද්ඝෝෂණය? පිට පිට වාර දෙකක් මේ රටේ ගොවි ජනතාවගේ වගාවලට හානි සිද්ධ වුණා. ඒ හානි සිද්ධ වුණාම, ගොවියාට වන්දි ලැබෙන්නේ නැහැ. ඒ ලැබුණත් ලැබෙන්නේ සොච්චමයි. ඊටත් වඩා, ඒක ලැබෙන්න අවුරුදු ගණන් ප්‍රමාද වෙනවා. සමහර වෙලාවට ගෙවන්නේම නැහැ. එහෙම නම්, අන්න ඒ ප්‍රශ්නයටත් අපි උත්තරයක් දීලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, පසු ගිය කාලයේ ගොවි ජනතාවගෙන් ලබා ගත් අස්වනු සඳහා සල්ලි ගෙව්වේ නැහැ. අර්තාපල්වලට සල්ලි ගෙව්වේ නැහැ,

[ගරු නාමල් කරුණාරත්න මහතා]

ලොකු ලූනු බීජවලට සල්ලි ගෙව්වේ නැහැ, කෝටි ගණන් ගෙව්වේ නැහැ. ඒ වාගේම, වන්දි ගෙව්වේ නැහැ. ගිය අවුරුද්දේ යල කන්නයේදී ගොවියාට ලැබෙන්න ඕනෑ වන්දි මුදල් ගෙවලා තිබුණේත් නැහැ. එහෙම නම්, ඒ වන්දි මුදල් ටිකත් අපේ ආණ්ඩුව ආපු ගමන් ගෙවලා තිබෙනවා. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු නිලධාරි කණ්ඩායම, මේ නිලධාරි කුටිවල ඉන්නවා. ලක්ෂවලින් ගත්තොත්, රුපියල් ලක්ෂ 1,420ක් යල කන්නයේදී ගිය ආණ්ඩුව විසින් ගෙවන්න තිබුණු වන්දි මුදල් අපේ ආණ්ඩුව විසින් ගෙව්වා. ඒක ගිය ආණ්ඩුව ගෙවන්න තිබුණු එකක්. ඒ විතරක් නොවෙයි. මේ මහ කන්නය ආරම්භයේදීම ගොවි ජනතාවට සිද්ධ වෙච්ච හානියට, මහ කන්නය ගත වෙන්නත් කලින් ඉතිහාසයේ පළමුවැනි වතාවට රුපියල් මිලියන 952ක් -ලක්ෂ 9,520ක්- වන්දි ගෙවලා අවසන් කළා. විපක්ෂ නායකතුමා උදේ කිව්වා, වන්දි ගෙව්වේ නැහැ කියලා. සම්පූර්ණ බොරුවක් ඒ කිව්වේ. මේ වෙනකොට ඒ අදාළ ගොවි ජනතාවට වන්දි ගෙවලා ඉවරයි. වෙනදාට සිද්ධ වෙන්නේ, ගොවි ජනතාව වන්දි ඉල්ලා පාරට බහිනවා, උද්ඝෝෂණය කරනවා. ඒ වන්දි ගෙවන්නේ නැති වුණාම, මේ කථා කරන අපිත් දහස් ගණන් ජනතාව අරගෙන ඇවිල්ලා වන්දි ඉල්ලා අපි දැන් ඉන්න අමාත්‍යාංශය වටලා තිබෙනවා. අන්න ඒ සටන් පාඨවලට ප්‍රායෝගික උත්තරත් එක්ක අපි නැවතීමේ තිත තබා තිබෙනවා.

ඊළඟට, පසු ගිය කාලයේ තිබුණු සටනක් අපි නවත්වා තිබෙනවා. ඒ සටන මොකක්ද? මේ වෙනකොට මිල්කෝ ආයතනයේ වාගේම, NLDB එකේ ගොවි බිම් අක්කර 28,802ක් තිබෙනවා. ඒවා මේ රටේ සාරවත් ඉඩම්. එතැනින් අක්කර 13,000ක් පොල් ඉඩම්. ඒවායේ එළ හරක්, මී හරක්, එළුවන්, බැටළුවන්, ඌරන්, අභිජනන කුකුළන් ඇතුළු සතුන් විශාල ප්‍රමාණයක් -59,614ක්- ඉන්නවා. ඒ වටිනා සම්පත් තුට්ටු දෙකට විකුණන්න නිර්දේශ කරලා තිබුණා. අපි ආණ්ඩුව භාරගෙන, අමාත්‍යාංශය භාරගෙන, ඒවා බේරා ගෙන තිබෙනවා. ඒවා ලෝකයේ වෙනත් රටක සමාගමකට දෙන්න තීරණය කරලා තිබුණේ. අපි ඒවා ආරක්ෂා කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මිල්කෝ ආයතනයේ සභාපතිතුමාත් මේ නිලධාරි කුටියේ ඉන්නවා. අපි මිල්කෝ ආයතනය භාර ගන්නා විට ගොවියාට ණය ගෙවන්න තිබුණා. රුපියල් මිලියන 540ක් පොලු තියලා තිබුණේ; ගොවියාට ගෙවලා තිබුණේ නැහැ. මේ වෙනකොට ඒ සල්ලි සියල්ල ගෙවලා ඉවරයි. ඒ වාගේම රුපියල් මිලියන 4,280ක් ණය ගෙවන්න තිබුණා. ඒකෙන් රුපියල් මිලියන 1,690ක් මේ වෙනකොට ගෙවලා ඉවරයි. පාඩු ලබමින් තිබුණු මිල්කෝ ආයතනය ලාභ ලබන තැනට මේ වෙනකොට පරිවර්තනය කරලා තිබෙනවා කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑකම තිබෙනවා.

ඊළඟට, කාලය කෙටි නිසා මම අවසාන වශයෙන් කියන්න තෝරා ගත්තේ, අපේ ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා මතු කරපු කාරණයක් පිළිබඳවයි. ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන රූපවාහිනී වැඩසටහනකදීත් අපි දෙන්නා සෑහෙන්න සංවාද කළා. ඔබතුමා ඒ ගැන මතක් කළා. අපේ වැඩ පිළිවෙළ ඇතුළේ තිබෙනවා, අක්කරයකින් රුපියල් මිලියන 3ක ආදායමක් ගන්නා ඉලක්කයක්. ඔබතුමා මේකට ලොකු තර්ක ගෙනාවා. ගරු මන්ත්‍රීතුමනි, ඒක ඉලක්කයක්. හැම අක්කරයකින්ම අවුරුද්දකට රුපියල් මිලියන තුනක් ආදායම ගන්නවා කියන එක නොවෙයි ඒකෙන් කියන්නේ. ඒක අපේ ඉදිරි ඉලක්කයක්. අපි මුළු අක්කර ප්‍රමාණයෙන් ගන්නා මුළු ආදායම ඒ අක්කර ප්‍රමාණයෙන් බෙදුවාට පස්සේ, ඒකේ මැද අගය තමයි මේ කියන ගණන. 2025 වසරේ මහ කන්නය, 2026 වසරේ යල කන්නය වෙනකොට අපි ඒ ඉලක්කයට යනවා කියන එක නොවෙයි මේ කියන්නේ. අපේ target එක ඒක. ඒ ඉලක්කයට අපි අනිවාර්යයෙන් යනවා. උදාහරණයක් විධියට, එක පොල් ගහකින් පොල් ගෙඩි 80ක් ගන්නවා කියලා අපේ ඉලක්කයක් තිබෙනවා. ඒ කියන්නේ, හැම පොල් ගහකින්ම පොල් ගෙඩි 80ක් ගන්නවා කියන එක නොවෙයි. එක පොල් ගහකින් අවුරුද්දකට පොල් ගෙඩි 40ක් ගන්න පුළුවන්, 50ක් ගන්න පුළුවන්. තව සමහර ගහකින් 100ක් ගන්න පුළුවන්. ඊට වැඩියෙනුත් ගන්න පුළුවන්. මේකේ මැද අගය පොල් ගෙඩි 80යි. ඒක තමයි අපේ ඉලක්කය. අපේ අසෝක රන්වල මන්ත්‍රීතුමා මේ ගැන ප්‍රවේශයක් ගත්තා, විශේෂයෙන් පස පරීක්ෂා කරලා පසට ගැළපෙන උචිත විධියට මේ ක්‍රියාවලිය ඉස්සරහට ගෙනයන්න. අන්න ඒකත් එක්ක අපි කියන්නේ මේකයි. එකක් තමයි, පස පරීක්ෂා කරලා පොටෑසියම්, පොස්පරස්, නයිට්‍රජන් කියන මූලද්‍රව්‍ය පසට ගැළපෙන විධියට, වගා කරන භෝගයට ගැළපෙන විධියට යොදවන එක. අනෙක් එක තමයි, තාක්ෂණිකව වගා කරන එක. ඊළඟ එක තමයි, හොඳම බීජ ගොවි ජනතාවට ලබාදෙන එක.

ඊළඟට, විශේෂයෙන්ම අස්වැන්න වැඩි කර ගැනීමට අදාළව අනුගමනය කළ යුතු තව ක්‍රියාමාර්ග ගණනාවක් තිබෙනවා. ඒ සියලු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ඇතුළේ අනිවාර්යයෙන්ම අස්වැන්න වැඩි තැනකට ගෙනයන්න පුළුවන්.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Hon. Presiding Member, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා මගේ නම සඳහන් කළා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ 112වැනි පිටුවේ තිබෙන්නේ, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් අක්කරයකින් වාර්ෂිකව රුපියල් මිලියන 3ක් උපයා ගැනීමට කටයුතු කරනවා කියලායි. ඔබතුමා ඒකටත් එහා ගිහිල්ලා දැන් කියනවා, ඒක average එකක් කියලා. ඒ කියන්නේ -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කරුණ point of Order එකක් නොවෙයිනේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මගේ නම සඳහන් කළා. මට විනාඩියක් දෙන්න.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
නැහැ නැහැ. දැන් ඔබතුමාත්- *[බාධා කිරීමක්]* පැහැදිලියි. හරි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම ඒක අහන්න හැදුවා විතරයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණය තත්පර 30ක් ඇතුළත ඉක්මනින් සඳහන් කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අපි දෙන්නා යාළුවෝ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දැන් එතැනිනුත් එහාට ගිහිල්ලා ඒක average එකක් කියලා කියනවා. ඔබතුමා පොඩ්ඩක් පැහැදිලි කරන්න ඒ ඉලක්කයට යන විධිය. ඔබතුමා දැන් කිව්වා, "එක පොල් ගහකින් අවුරුද්දකට පොල් ගෙඩි 40ක්, 45ක් තමයි ගන්න පුළුවන්. ඒක 80ට ගෙනයනවා" කියලා. එහෙම ගෙනයන්න තිබෙනවා නම් හොඳයි. ඔබතුමන්ලා පොල් ගෙඩි මිලියන 200ක් පිටරටින් ගේනවා කියලා කිව්වා. ඒකවත් ගෙනාවේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලාගේ ඉලක්කයට යන විධිය පැහැදිලි කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණු පැහැදිලියි ගරු මන්ත්‍රීතුමනි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මෙහෙමයි. අපේ ඉලක්කය තාක්ෂණිකව අපේ කෘෂි බිම්, ගොවි බිම් දියුණු කිරීම. දැන් "එක මිටට - ගොවි බිමට" කියලා වැඩසටහනක් පටන් ගෙන තිබෙනවා. මේ කියන්නේ, අර පුරන් කුඹුරු අස්වද්දන එක නොවෙයි. ඒක මේකේ පොඩි කොටසක් විතරයි. ඊට එහා ගිය ලොකු පරාසයක් එක්ක තමයි මේ වැඩසටහන පටන් ගත්තේ. අපේ ගොවිජන සංවර්ධන කොමසාරිස්තුමන්ලා මෙතැනට ඇවිල්ලා ඉන්නවා. මෙන්න මේ සමස්ත ක්‍රියාවලිය ඇතුළේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අනෙකුත් දෙපාර්තමේන්තු ඇතුළු ආයතන සියල්ල -තව ආයතන ගෙඩක් තිබෙනවා- එකතු වෙලා අපි යන්න හදන ඉලක්කය තමයි අන්න ඒ ඉලක්කය. එතැනට යන්න නම් අනිවාර්යයෙන්ම අපි අඩු භූමියකින් වැඩි ඵලදාවක් ගන්න පුළුවන් විධියට අපේ ගොවි බිම සකසුරුවම් කරන්න ඕනෑ. ඊට අදළ මූලික ප්‍රවේශය දැන් අපි අරගෙන තිබෙන්නේ. ඊට අදාළ මූලික අත්තිවාරම දැන් දමන්න පටන් ගෙන තිබෙන්නේ. ඒක මීට අදාළව විතරක් නොවෙයි, කිරි ක්ෂේත්‍රය, පශු සම්පත් ක්ෂේත්‍රය ඇතුළු හැම ක්ෂේත්‍රයකටම අදාළව තමයි කරන්නේ. අපේ අවසාන ඉලක්කය තමයි එතැනට යන එක. ඒ ඉලක්කයට අනිවාර්යයෙන්ම ගමන් කරන්න අපි උපරිම උත්සාහ ගන්නවා. ඔන්න ඔය තත්ත්වයත් එක්ක තමයි අපි වැඩ කරගෙන යන්නේ.

විශේෂයෙන්ම මේ වෙලාවේ මේ කාරණයත් මතු කරන්න ඕනෑකම තිබෙනවා. අපි මේ වෙනකොට ඉතා සැලසුම්සහගතව අපේ කාර්ය මණ්ඩල සියල්ලේම සහයෝගය අරගෙන සියලු දේවල් සැලසුම් කරලා තිබෙනවා. අපට ලොකු අභියෝගයක් තිබෙනවා. විශාල මුදල් ප්‍රමාණයක් අපේ අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙනවා. මාස 8කට, 9කට කිට්ටු කාලයක් ඇතුළත මේ මුදල් වියදම් කරන්න තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක ඒ ඒ වියදම් කරමින්, නිසි කළමනාකරණයකට භාජන කරමින් අපි මේ කටයුත්ත ඉතා සාර්ථකව ඉදිරියට ගෙනයනවා කියන කාරණය සඳහන් කරනවා. විශේෂයෙන් මේ රටේ ගොවි ජනතාවගෙන් අපි ආයාචනය කරනවා ඔබේ තිබෙන යෝජනා, අදහස් හැම එකක්ම අපට දෙන්න, විවේචන තිබෙන ඒවාත් දෙන්න කියලා. ඒවා භාරගන්න අපි සූදානම්. ඔබත් එක්ක ඉතාම සහයෝගයෙන් මේ රට කෘෂිකාර්මික වශයෙන් ඉදිරියට ගෙන ඒම සඳහා අනිවාර්යයෙන්ම අපට කළ හැකි උපරිම දේ කරන්න අපි මැදිහත් වෙනවා කියන කාරණයත් මතක් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, සියලුදෙනාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Imran Maharoof. You have seven minutes.

[பி.ப. 4.52]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இந்த நாட்டில் முக்கியமான அமைச்சாகக் கருதப்படுகின்ற கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு சம்பந்தமான விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பமளித்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த நாட்டின் பொருளாதாரத்துக்கு முதுகெலும்பாகக் காணப்படுகின்ற விவசாயம் தற்போது எந்த நிலையில் இருக்கின்றது என்பதுபற்றி எங்களுக்குத் தெரியும். குறிப்பாக, நெல்லுக்கு அதிக விலை கொடுத்து விவசாயிகளைப் பாதுகாப்பதாகக் கூறிய அரசாங்கம், இன்று ஆலை முதலாளிகளிடம் சரணடைந்துள்ளது. கூடிய விலைக்கு நெல்லை வாங்குவதற்குகூட அரசாங்கம் தயாராக இருக்கின்ற இந்த நிலையில், ஆலை முதலாளிகள் வயலுக்கே சென்று நெல்லைக் கொள்வனவு செய்து களஞ்சியப்படுத்துவதன் காரணமாக அரிசியின் விலை அதிகரித்துச் செல்கின்றது. அதனால்தான் அரிசித் தட்டுப்பாடு ஏற்பட்டு, இந்தியாவிலிருந்து இறக்குமதி செய்யவேண்டிதொரு நிலை எங்களுக்கு ஏற்பட்டுள்ளது. தன்னிறைவுப் பொருளாதாரம் இப்பொழுது இறக்குமதிப் பொருளாதாரமாக மாறியுள்ளது.

இந்த விவசாயத் துறையை நாங்கள் எடுத்துப் பார்க்கின்றபோது, கோட்டாபய ராஜபக்ஷ அரசாங்கத்தினுடைய வீழ்ச்சிக்கு, விவசாயத் துறையினுடைய வீழ்ச்சி ஒரு பிரதான காரணமாகக் காணப்பட்டது. குறிப்பாக, சேதனப் பசளை என்று கூறி, உர மானியம் வழங்குவதில் ஏற்பட்ட சிக்கல்கள் காரணமாக அரசாங்கம் வீழ்ச்சியடைந்து, சனாதிபதி அவர்கள் நாட்டை விட்டுச்செல்ல வேண்டியதொரு நிலைக்குத் தள்ளப்படக் காரணமான இந்த விவசாயத் துறையை மிகவும் கவனமாகக் கையாள வேண்டிய நிலைப்பாடு இந்த அரசாங்கத்திற்குக் காணப்படுகின்றது. எனவே, இந்த விடயத்தில் மிகவும் கவனஞ்செலுத்தி, விவசாயம் மற்றும் விவசாயிகளுக்கான விடயங்களைச் சிறந்த முறையில் முன்னெடுக்க வேண்டுமென்பதை நாங்கள் அரசாங்கத்திடமும் அமைச்சரவர்களிடமும் வலியுறுத்துகின்றோம்.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

අතේපෝන්று, කால්නடையும் எமது நாட்டினுடைய பெரும் வளமாகக் காணப்படுகின்றது. இன்று பால் மாவை இறக்குமதி செய்கின்ற நாடாக நாங்கள் இருக்கின்றோம். ஆனால், கால்நடை வளங்களைக் குறைக்கின்ற செயற்பாட்டினைத்தான் இங்கு நாங்கள் பார்க்கக்கூடியதாகவுள்ளது. நான் பிரதிநிதித்துவப்படுகின்ற திருகோணமலை மாவட்டத்தில் கால்நடைகளுக்கான முறையான மேய்ச்சல் தரை இல்லாத பிரச்சினை காணப்படுகின்றது. ஆகையால், கந்தளாய் சீனித் தொழிற்சாலைக் காணியின் ஒரு பகுதியை மேய்ச்சல் தரையாக மாற்றி கிண்ணியா, கந்தளாய், தம்பலகாமம், முள்ளிப்பொத்தானை போன்ற பல்வேறு பிரதேசங்களை உள்ளடக்கிய இடங்களிலுள்ள கால்நடைகளைப் பராமரிக்கின்ற ஒரு நிலையை, குறிப்பாக மாரி காலத்திலாவது உருவாக்குவற்கான நடவடிக்கைளை அரசாங்கம் முன்னெடுக்க வேண்டும். அதேபோன்று, இந்த மேய்ச்சல் தரைக்கான இடங்கள் அடையாளப்படுத்தப்பட வேண்டுமென்பதையும் நாங்கள் இந்த இடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றோம். சில பிரதேசங்களில் காணப்படுகின்ற கால்நடைகளை இன்னுமொரு பிரதேசத்தில் உள்ள மேய்ச்சல் தரைகளில் மேய்வதற்கு விடுகின்ற காரணத்தினால், எங்களுடைய மாவட்டத்தில் இனவாதத்தை ஏற்படுத்துகின்ற ஒரு செயலாகவும் இந்த மேய்ச்சல் தரை விடயம் தலைதூக்கியுள்ளது. ஆகையால், கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயம் தொடர்பாக கவனஞ்செலுத்தி, எங்களுடைய பிரதேசத்தில் காணப்படுகின்ற கால்நடைகளுக்கு எவ்வாறான பிரதேசத்தை மேய்ச்சல் தரையாக ஒதுக்க வேண்டும் என்பதில் தீர்வினை வழங்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, கந்தளாய் சீனித் தொழிற்சாலைக் காணிகள் எப்படி மக்களுக்கு பகிர்ந்தளிக்கப்பட்டுள்ளது என்ற விடயத்தை நாங்கள் கேட்கின்றோம். குறிப்பாக, அந்தக் காணிகளில் வசித்ததன் அடிப்படையில் மக்களுக்குக் காணிகள் வழங்கப்பட்டுள்ளதா அல்லது அடாவடித்தனத்தின்மூலமாகக் காணிகளைச் சுவீகரித்தவர்களுக்கு அந்தக் காணிகள் வழங்கப்பட்டுள்ளதா அல்லது அந்தக் காணிகளில் விவசாய நடவடிக்கைகளை மேற்கொண்டவர்களுக்கு வழங்கப்பட்டுள்ளதா? என்பதை நீங்கள் தெளிவுபடுத்த வேண்டுமென்பதை இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், கந்தளாய் சீனித் தொழிற்சாலைக் காணி என்பது திருகோணமலை மாவட்டத்தினுடைய முக்கிய வளமாகும். இதனைப் பாதுகாப்பதென்பது எல்லோருடைய பொறுப்பாகவும் காணப்படுகின்றது. அந்த அடிப்படையில், அதற்கென ஒரு சரியான திட்டத்தை வகுத்து, அதன்படி அவற்றை வழங்க வேண்டுமென்று நாங்கள் கேட்டுக் கொள்கின்றோம்.

இந்த நாட்டிலே இருக்கின்ற மிக முக்கியமான பிரச்சினைகளில் ஒன்றாக காணிப் பிரச்சினைகளைக் குறிப்பிட முடியும். நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு பிரதேச செயலாளர் பிரிவுகளின் எல்லைகள் பற்றிய பிரச்சினை கூடுதலாகக் காணப்படுகின்றது. குறிப்பாக, கிண்ணியா பிரதேச செயலாளர் பிரிவின் எல்லை எது, கந்தளாய் பிரதேச செயலாளர் பிரிவின் எல்லை எது, குச்சவெளி பிரதேச செயலாளர் பிரிவின் எல்லை எது, கோமரங்கடவல பிரதேச செயலாளர் பிரிவின் எல்லை எது என்ற பிரச்சினைகள் காணப்படுகின்றன. இந்த எல்லைப் பிரச்சினை காரணமாக அந்தப் பிரதேசங்களில் இன்று பல முறைகளில் விடயங்கள் முன்னெடுக்கப்படுகின்றன. ஆகையால், இவற்றின் எல்லை சம்பந்தமான பிரச்சினைகளுக்கும் தீர்வினை வழங்க வேண்டுமெனக் கௌரவ அமைச்சர் அவர்களிடமும் இந்த அரசாங்கத்திடமும் வலியுறுத்துகின்றோம்.

எங்களுடைய பிரதேசங்களிலே பொதுமக்கள் பயிர் செய்துவந்த பல காணிகள், குறிப்பாக யுத்தம் காரணமாக மக்கள் வெளியேறிய பின்னர், இன்று வனப் பாதுகாப்புத் திணைக்களத்துக்குரிய காணிகளாகச் சொல்லப்படுகின்றது. அதேபோன்று தொல்பொருள் திணைக்களத்துக்குச் சொந்தமான காணிகள் என்று சொல்கிறார்கள்; இலங்கைத் துறைமுக அதிகாரசபைக்குச் சொந்தமானதென்று சொல்கிறார்கள்; இலங்கை சுற்றுலா அபிவிருத்திச் சபைக்குச் சொந்தமான காணிகள் என்று சொல்கிறார்கள்; வன ஜீவராசிகள் திணைக்களத்துக்கு சொந்தமான காணிகள் என்று சொல்கிறார்கள்; இலங்கை கடலோரப் பாதுகாப்புத் திணைக்களத்துக்குச் சொந்தமானதென்று சொல்கின்றார்கள். இவ்வாறு காணிகளை எல்லாம் இந்தத் திணைக்களங்கள் சொந்தம் கொண்டாடினால், எப்படி மக்கள் அங்கே வசிப்பதென்ற விடயத்தை நீங்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

மேலும், யானை - மனித மோதல் காரணமாகவும் அங்கு பல பிரச்சினைகள் காணப்படுகின்றன. ஆகையால், நீங்கள் அதற்கான தீர்வையும் காண நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்ளுகிறேன்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய கப்பல்துறைக் கிராமப் பகுதியிலும் காணி சம்பந்தமான பல பிரச்சினைகள் இருக்கின்றன. நான் துறைமுகங்கள் சம்பந்தமான அமைச்சின் குழுநிலை விவாத்திலும் இது தொடர்பில் பேசியிருந்தேன். அங்கு விவசாயம் செய்தவர்கள், நிரந்தரமாக வசித்தவர்களுடைய காணிகள் இன்று பறிபோகின்ற நிலை காணப்படுகின்றது. அது சம்பந்தமாகப் பத்திரிகையில் வெளிவந்த கட்டுரையை நான் ***ஹன்சாட்*** பதிவுக்காகச் *சமர்ப்பிக்கிறேன்.

திருகோணமலை மாவட்டத்திலே காணப்படுகின்ற இவ்வாறான காணிப் பிரச்சினைகளுக்கு இந்த அரசாங்கம் சிறந்ததொரு தீர்வை வழங்குவதற்கு முன்வர வேண்டுமென்பதையும் கேட்டுக் கொள்ளுகிறேன்.

சென்ற காலங்களிலே காணிகளுக்கு உறுதிப்பத்திரம் வழங்கியபோதும்கூட சில பிரதேசங்கள் புறக்கணிக்கப்பட்டிருக்கின்றன. குறிப்பாக, குச்சவெளிப் பிரதேசம்! அந்தப் பிரதேச காணிகளுக்கு permitஇனை வழங்குவதற்கான நடவடிக்கைகளையும் இந்த அரசாங்கம் முன்னெடுக்க வேண்டுமென்று இவ்விடத்திலே கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 5.00]

ගරු ඊ.එම්. බස්නායක මහතා
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගොඩනඟා ගැනීමේ ඒ ජාතික වැඩපිළිවෙළ සාක්ෂාත් කර ගන්න යන අවස්ථාවේදී, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡා කරන මේ මොහොත ඉතාම වැදගත්. එවන් වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡාවට එකතු වෙන්න මටත් අවස්ථාවක් ලැබීම පිළිබඳව සතුටු වෙනවා වාගේම, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාරක සභා අවස්ථාවේ මේ වැය ශීර්ෂ විවාදයට සම්බන්ධ වෙන්න කලින් මට පොඩ්ඩක් අපේ විපක්ෂය ගැන පොඩි කාරණාවක් කියන්න අවශ්‍ය වෙලා තිබෙනවා. අතීතයේම ඉපදිලා, අතීතයේම ජීවත් වෙලා, අතීතයේම මියැදෙන විපක්ෂයක් බවට අද විපක්ෂය පත් වෙලා තිබෙනවා. රට ගොඩනඟන්න ඉතාම විද්‍යාත්මක අය වැයක් සකස් කරලා, ඒකේත් ඉතාම වැදගත් අමාත්‍යාංශයක කාරක සභා විවාදය තිබෙන වෙලාවේ සභ අනික් අමාත්‍යාංශවල විවාද ඇතුළෙදීත් මම දැක්කේ නැහැ, පොදුවේ විපක්ෂයෙන් මේවාට සාධනීය කාරණයක් හෝ තාර්කික යෝජනාවක් ඉදිරිපත් වූ බවක්. අපි එහෙම එකක් දැක්කේ නැහැ. ඒ වාගේම විපක්ෂයේ ඉඳගෙන හැමදාමත් තිබුණු ආණ්ඩුවලට - පසුගිය කාලයේ තිබුණා වාගේ - පුරුද්දට විරුද්ධ වෙන, පුරුද්දට මඩ ගහන, පුරුද්දට බොරු කියන විපක්ෂයක් බවට අද විපක්ෂයත් පත් වෙලා තිබෙනවා.

අපේ ආණ්ඩුව කරගෙන යද්දී, විපක්ෂයේ ඔබතුමන්ලාගෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, ඔබතුමන්ලාගේ සහයෝගය ඇතිව මේ රට ගොඩනඟා ගැනීමට හැකියාවක් තිබෙනවාද කියන එකයි. ඉතින් දවසින් දවස යනකොට අපට දැනෙන දේ තමයි ඔබතුමන්ලා හරිම සාම්ප්‍රදායික, අතීතකාමයෙන් ජීවත් වෙන මිනිස්සු බවට ඔප්පු කරමින් ඉන්නවාය කියන එක. ඉතින්, ඒ ගැන කනගාටුව හැර, අනුකම්පාව හැර වෙන කියන්න දෙයක් ඇත්තේ නැහැ.

අද විවාදයට අරගෙන තිබෙන, සාකච්ඡාවට අරගෙන තිබෙන අමාත්‍යාංශය කියන්නේ ඉතා වැදගත් අමාත්‍යාංශයක්. මනුෂ්‍යයෙක්, එහෙම නැත්නම් ජීවියෙක් මේ ලෝකයට ඉපදුණාට පස්සේ, ඊළඟ අවශ්‍යතාව තමයි ආහාරපාන කියන්නේ. ඉතින් මිනිස්සු වෙච්ච අපට මේ ලෝකයේ එහෙම නැත්නම් අපේ රට ඇතුළේ මේ අමාත්‍යාංශයේ වැදගත්කම කොච්චරද කිව්වොත්, ඒ ආහාරපාන ටික සපයා ගන්න තිබෙන අමාත්‍යාංශය මේක. මේ අමාත්‍යාංශයට තිබෙනවා, දෙපාර්තමේන්තු 9ක්. ඒ වාගේම ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය ආයතන 10ක්. ස්වයං මූල්‍ය ආයතන 7ක් සහ රාජ්‍ය මූල්‍ය ආයතන දෙකක්. ඒ වාගේ විශාල ආයතන ප්‍රමාණයකින් පරිපූර්ණ වෙච්ච, රට පුරාම විහිදිච්ච, හැම කෙනාගේම ජීවිතයට බද්ධ වෙච්ච අමාත්‍යාංශයක විවාදයක් තමයි අපි අද මේ කරමින් ඉන්නේ. අනාගත පරම්පරාවට අවශ්‍ය ආහාරපාන ටික නිෂ්පාදනය කිරීම, ඒ ආහාරපාන ටික ඉතාම යහපත් ලෙස පරිභෝජනය කිරීම, අනාගතයට සුරක්ෂිත කිරීම තමයි අපේ වගකීම බවට පත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙහි මූලික කාරණයක් තමයි ඉඩම් කියන්නේ. අපේ මේ අමාත්‍යාංශයේ මූලිකම පදනම බවට පත් වෙලා තිබෙන්නේ ඉඩම්. ඉතින් අපි මේ ඉඩම් ගැන හිතුවොත්, කල්පනා කළොත්, ලංකාව පුරාම LRC එකට අදාළ විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. මේ වෙනකොට අපි සොයාගෙන තිබෙනවා, ඒ ඉඩම් ඇතුළේ ඉඩම් කට්ටි 28,000ක් මැනුම් අවසන් කර ගත්ත. ඒ වාගේම මැනුම් කර ගන්න ඉඩම් කට්ටි 78,000ක් විතර තිබෙනවා. අපි දැනට සොයාගෙන තිබෙන තොරතුරු අනුව ව්‍යාපෘති සඳහා බෙදා දීම සඳහා හෙක්ටයාර් 3,160ක ප්‍රමාණයක් තිබෙනවා. මේ සංඛ්‍යා දත්ත ගත්තාම, අපට දැනෙන දේ මොකක්ද? ඉතිහාසය පුරාවට සාම්ප්‍රදායික විපක්ෂය මෙතැනට ඇවිල්ලා මොනවා කිව්වත්, මේ තිබෙන ගණන් අනුව මේවා ඉතාම ප්‍රයෝජන සහිතව ඵලදායී ලෙස මේ රටේ ජන ජීවිතයට භාවිත කරපු නැති එක නොවෙයිද, මේ කාරණාවලින් පෙනේනේ? ඒක නොවෙයිද මේකෙන් පෙනෙන්නේ?

ඉතින්, මෙතැනට ඇවිල්ලා අපට කියන්නේ මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ කෘෂිකර්ම ඇමතිතුමාට - අපේ ලාල් කාන්ත සහෝදරයාට - මම යෝජනා කරනවා, මේ ඉඩම් ටික ඉතාම ඵලදායී ලෙස අනාගත පරම්පරාවට ප්‍රයෝජන ගැනීම සඳහා, අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කඩිනමින් වැඩ පිළිවෙළක් හදලා ඒ ඉඩම් ටික ව්‍යාපාර සඳහා, කර්මාන්ත සඳහා යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කරලා දෙන්න කියලා.

ඉඩම් ප්‍රශ්නය ගැන සලකා බැලුවාම, මේ රටේ ඉඩම් අයිතිය සම්බන්ධව, එහෙම නැත්නම් ඉඩම් බෙදා දීම සම්බන්ධව ගත්තාම පසුගිය කාලය පුරාම සිද්ධ වෙලා තිබෙන දේ අපි දන්නවා. අවශ්‍ය ව්‍යාපෘති සඳහා ඉඩම් ඵලදායී ලෙස යොදා ගන්නවා වෙනුවට, බලය තිබුණු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ඵලදායීතාව සඳහා අක්කර ගණන් තුට්ටු දෙකට වෙන් කර ගත්ත අතීතයක් අපේ රටේ තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. රාජ්‍ය ආයතන යටතේ පැවතුණ, රාජ්‍ය ආයතන පවත්වාගෙන යන ඉඩම් අත්පත් කර ගත්ත දේශපාලකයන් ඉන්න රටක් වාගේම, දේශපාලකයන් හිටපු රටක් මේක. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ගොඩ නඟනකොට මෙන්න මේ සීමිත ඉඩම් ටික ඉතාම ඵලදායී ලෙස යොදා ගැනීමට අදාළ කටයුතු සූදානම් කරමින් තිබෙන බව මම මේ ගරු සභාවට කියන්න කැමතියි. මම මේ කියන්නේ රාජ්‍ය ආයතන පවත්වා ගෙන යන ඉඩම් ගැන. උඩුදුම්බර ආසනයේ ගමනාගමන මණ්ඩලයට අයිති ඉඩමේ ගමනාගමන මණ්ඩලයේ කටයුතු ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ ඉඩමේ පාර වටේට තිබුණු ඉඩම් ටික පසුගිය කාලයේ හිටපු දේශපාලකයන් මාරුවෙන් මාරුවට අල්ලා ගත්තා. ඒ විතරක් නොවෙයි. "උරුමය" වැඩසටහන යටතේ ඉඩම් දෙනකොට නුවර දිස්ත්‍රික්කයේ ප්‍රබල දේශපාලකයෙකුගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් ඒ ඩිපෝව ඇතුළේ තිබෙන පර්චස් ගණනක් තමන්ගේ නෝනාට තිබෙනවා කියලා මැණුම්කරණයේ දමලා තිබෙනවා. ඒ කියන්නේ, රාජ්‍ය ආයතන ඇතුළේ තිබෙන දේපළ, ඒ ඉඩම් කැබලි අල්ලා ගන්න දේශපාලන නායකත්වය දීපු විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ විධියට තමයි කටයුතු කරලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. උඩුදුම්බර ආසනයේ හසලක වැව තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයකු වන තිස්ස අත්තනායක මැතිතුමා පසුගිය කාලයේ ඔය හසලක වැවේ රොන් මඩ ගොඩ දමනවා කියලා ඒකට මිලියන ගණනක් වෙන් කරගෙන රොන් මඩ අයින් කරනවා වෙනුවට ඒ වැවේ මැණික් හාරපු එක තමයි කළේ. ඒ කටයුතුවලට නායකත්වය දීපු විපක්ෂය අද මෙතැන ඉඳගෙන අපට ඵලදායී ලෙස මේ ඉඩම් යොදාගන්නා ක්‍රම ගැන කියනවා. ඉතින්, මෙවැනි තත්ත්වයක තමයි අපේ රටේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නය තිබෙන්නේ.

[ගරු ඊ.එම්. බස්නායක මහතා]

මට තව කාරණාවක් කියන්න තිබෙනවා, විශේෂයෙන් වනසත්ව උවදුර ගැන. අපි අපේ රටේ කොච්චර ආහාර භෝග නිෂ්පාදනය කළත්, ගණනය කරලා තිබෙන විධියට ඒ නිෂ්පාදනයෙන් සියයට 35ක, 40 ප්‍රමාණයක් වනසතුන් පරිභෝජනය කරනවා කියලා අපි දන්නවා. අලියාගෙන් විතරක් නොවෙයි. රිළවා, වඳුරා, දඩුලේනා, ඌරා, ඉත්තෑවා, මුවා, කෑදැත්තා ආදි සියලු සතුන්ගෙන් සිද්ධ වන හානිය වළක්වා ගන්නේ කොහොමද කියලා ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපේ කෘෂිකර්ම ඇමතිතුමා පළමුවැනි කථාවේදීම සාකච්ඡා කළා. අද ඒ සාකච්ඡාව ඵලදායි ලෙස ගොඩ නැඟිලා තිබෙනවා. අද අලියා, රිළවා ගැන කථා කරනවා වාගේම, මේ රටේ වනසතුන්ගෙන් ආහාරවලට, ජන ජීවිතයට වන හානිය ප්‍රධාන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ තැනට අපි මේ සංවාදය ගෙනාවා. අද ඒ වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනම විශේෂ කමිටුවක් හදලා ඒ කමිටුවේ නිර්දේශ අනුව සතුන් ගණනය කරනකොට, නලින් බණ්ඩාර මන්ත්‍රීතුමන්ලා අපට කෝටොක් කරන්න එනවා; විහිළු කරන්න එනවා. ඒකයි මම කිව්වේ මේ අය තවමත් අතීතයේ ජීවත් වෙන්නේ කියලා. ලෝකයේ දියුණු තාක්ෂණයත් එක්ක ඒ ගණනය කිරීම් කරනවා තමයි. ඔබතුමන්ලා ඒවා පිළිබඳව හදාරන්න. ඒවා පිළිබඳ අවබෝධයක් ලබාගන්න. සංගණනය කරලා ඒ සංගණනවල ප්‍රතිඵල අනුව තමයි අවශ්‍ය ක්‍රියාමාර්ග තෝරන්න වෙන්නේ. මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා, අපේ ඇමතිතුමා ඒ සඳහා වෙනම විශේෂ කමිටුවක් හදලා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඊ.එම්. බස්නායක මහතා
(මාණ්පුමිකු ඊ.එම්. පස්නායක්ක)
(The Hon. E.M. Basnayaka)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපේ ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් වෙනම විශේෂ කමිටුවක් පත් කරලා පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා පොලිසිය, Navy එක ආදී ඒකට අදාළ සියලු රාජ්‍ය ආයතන ටික එකතු කරලා, අර ව්‍යාපෘතිය එන්න කලින් ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් හැදුවා. හැබැයි, ඒ ව්‍යාපෘතිය භාර ගැනීමට කෙනෙක් නැතිව සිටියා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය දංගල්ල මහත්මයා දැන් ඒ ක්‍රියාවලිය භාර අරගෙන, ඒකට අත්සන තබලා අනුමැතිය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට එවලා තිබෙනවා. ඒ අනුමැතිය ලබාගෙන ඉතාම සාර්ථක සහ විද්‍යාත්මක ක්‍රියාවලිය එන්න කලින් තාවකාලිකව මේ ප්‍රශ්නයට උත්තර සොයන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අපි සාකච්ඡා කරමින් ඉන්නවා. ඒක නිසා, මේ අවුරුදු 5 අවසන් වෙනකොට මේ රටේ ජන ජීවිතයට බලපාන මූලික ප්‍රශ්නවලින් සැලකිය යුතු ප්‍රමාණයක් විසඳන්න පුළුවන් කියන විශ්වාසය තබමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) සුසිල් රණසිංහ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට කලින් කථා කරපු විපක්ෂයේ ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා කන්තලේ සීනි කර්මාන්තශාලාවට අයිති ඉඩම් මොන පදනමින්ද ගොවීන්ට ලබා දුන්නේ කියන ප්‍රශ්නය මතු කළා. ඇත්තටම, අපේ ගරු ජනාධිපතිතුමා සීනි කර්මාන්තශාලාව සතු භාවිත නොකරන ඉඩම් ගොවීන්ට ලබා දෙන්න ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තා. නමුත්, සමහර ගොවීන් එහි අනවසරයෙන් වගා කරන්න ගත්තා. පසුව එය විධිමත් කරලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් applications call කරලා ඉඩම් අවශ්‍ය බව දැනුම් දුන් ගොවීන්ට මිනුම් කටයුතු කිරීමෙන් පසු වාර්ෂික බදු පදනම මත එම ඉඩම් ලබා දීලා තිබෙනවා. තොරතුරු වාර්තා වන විධියට මේ වෙනකොට ගොවීන් 1,300කට ඉඩම් ලබා දීලා තිබෙනවා. තවත් ගොවීන් පිරිසක් ඉඩම් බලාපොරොත්තුවෙන් ඉන්නවා. එම කටයුතු ඉදිරියට ගෙන යන්න අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඉල්ලුම් කළ පරිදි සාධාරණ විධියට තමයි එම ඉඩම් ලබා දීලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Next, the Hon. M.S. Uthumalebbe. You have ten minutes.

[ප.ව. 5.12]

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் மிக முக்கியமான அமைச்சொன்றின் விவாதத்திலே பேசிக்கொண்டிருக்கின்றோம். உண்மையிலேயே விவசாயம், கால்நடை, காணி போன்ற மிக முக்கியமான துறைகள் சார்ந்த அமைச்சு இது. கடந்த கால அரசாங்கம் விவசாயிகளுக்குரிய பணிகளைச் சரியாகச் செய்யாத காரணத்தினால் அவர்கள் ஆட்சியிலிருந்து அகற்றப்பட்ட வரலாற்றை நாங்கள் கண்டிருக்கிறோம். ஆகவே, நீங்கள் எமது நாட்டின் விவசாயத் துறையை முன்னேற்றுவதற்கான, விவசாயிகளுக்கு நன்மைகள் கிடைக்கின்ற பணிகளைச் செய்ய வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதி அமைச்சர் நாமல் கருணாரத்ன அவர்கள் பேசும்போது, அரசாங்கம் நெல்லுக்கான உத்தரவாத விலையைத் தீர்மானித்திருக்கின்றதெனச் சொன்னார். அதற்காக நாங்கள் அரசாங்கத்துக்கு நன்றி சொல்லுகின்றோம். ஆனால், வடக்கு, கிழக்கு மாகாணத்தில், குறிப்பாக, அம்பாறை மாவட்டத்தில் 70 - 80 சதவீதமான நெல் அறுவடை முடிந்த பிறகுதான் அரசாங்கத்தால் நெல்லுக்கான நிர்ணய விலை தீர்மானிக்கப்பட்டது. எனவே, எதிர்காலத்தில் கௌரவ அமைச்சர் லால் காந்த மற்றும் பிரதி அமைச்சர் ஆகிய இரண்டுபேரும் சேர்ந்து அம்பாறை, மட்டக்களப்பு மாவட்டங்கள் உட்பட வடக்கு, கிழக்கு மாகாணங்களில் வேளாண்மை அறுவடை செய்கின்ற காலத்திலேயே நெல்லுக்கான நிர்ணய விலையைத் தீர்மானிக்க வேண்டுமென்று கிழக்கு மாகாண மக்கள் சார்பிலே நான் கேட்டுக் கொள்கிறேன்.

அடுத்து, இன்னுமொரு விடயம் பற்றி சொல்ல வேண்டும். அண்மைக்காலமாக இந்தப் பாராளுமன்றத்தின் கௌரவத்தை உறுப்பினர்களே பாதுகாக்காத சூழ்நிலையைக் காண்கின்றோம். இது ஒரு வேதனையான விடயம். இந்த

நாட்டிலே ஓர் ஆட்சி மாற்றம் ஏற்பட்டு, ஜனாதிபதி அவர்களின் தலைமையிலான அரசாங்கத்தில் புதியவர்களும் கல்விமான்களும் அறிஞர்களும் அவ்வாறே எதிர்கட்சியிலே நீண்டகால அரசியல் அனுபவம் உள்ளவர்களும் இந்தப் பாராளுமன்றத்திலே உறுப்பினர்களாக இருந்து கொண்டிருக்கின்றார்கள். கடந்த ஆட்சிக் காலத்தில் நாட்டிலே இனவாதம் இருந்தது. ஆனால், பாராளுமன்றத்திலே உறுப்பினர்கள் மிகவும் கவனமாக நடந்துகொண்டதை நாங்கள் கண்டிருக்கின்றோம். இந்த நாட்டுக்கு நல்ல விடயங்களைச் செய்கின்ற இந்தப் பாராளுமன்றத்தினுடைய - உயர்ந்த சபையினுடைய - கௌரவத்தை நாங்கள் பாதுகாக்க வேண்டும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இனிமேல் இந்தப் பாராளுமன்றத்திலே இனவாதம் பேசுகின்றவர்களை, பாராளுமன்ற உறுப்பினர்களை அகௌரவமாகப் பேசுகின்றவர்களை அவ்வாறு பேச நீங்கள் அனுமதிக்கக்கூடாதென்று மிக அன்பாக நான் கேட்டுக் கொள்கிறேன். ஏனென்றால், கடந்த காலத்தில் மக்கள் இங்கிருந்த 225 பாராளுமன்ற உறுப்பினர்களையும் நிராகரிக்க வேண்டுமென்று கூறினார்கள்.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ගරු මන්ත්‍රීතුමා කිව්වා, වී මිල තීරණය කරන්න ඉස්සෙල්ලා වී අස්වැන්න ආවා, එම නිසා ඒගොල්ලන්ට පාඩු වුණා කියලා. එහෙම නොවෙයි සිදු වුණේ. අපි වී මිල තීරණය කරන්න ඉස්සෙල්ලා, මුලින්, මුලින් නෙළපු අස්වැන්නට හොඳ මිලක් ලැබුණා. ඉහළ මිලක් ලැබුණා. කිලෝවකට රුපියල් 140ක වාගේ මිලක් ලැබුණා. ඒ මිල පහළට වැටෙයි කියලා තමයි අපි රුපියල් 120ක් ලෙස අවම මිල තීරණය කළේ. රුපියල් 120න් පහළට යන එක වළක්වන්න තමයි අපි එහෙම කළේ. එම නිසා ඔබතුමාගේ තර්කය පදනම් විරහිතයි.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ගරු ඇමතිතුමනි, මමත් ගොවියෙක්. අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමාත් දැන් මේ සභාවේ ඉන්නවා. අම්පාර දිස්ත්‍රික්කයේ ගොයම් කපලා ඉවර වෙලා මාසයකට පසුව තමයි ඔබතුමන්ලා - ආණ්ඩුව - වී සඳහා අවම මිල තීරණය කළේ. ඒ නිසා තමයි අපට පාඩු සිදු වුණේ. එම නිසා ඊළඟ වතාවේ මිල තීරණය කරනකොට නැඟෙනහිර පළාත ගැනත් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා තමයි අපි ඉල්ලා සිටින්නේ.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඔබතුමාගේ ගම අක්කරෙයිපත්තුව නේද?

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ඔව්.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

අපි වී මිල තීරණය කරන්න කලින් ඔබතුමන්ලාගේ ප්‍රදේශයේ ගොයම් කැපුවා නේ?

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ඔව්.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඔබතුමා ගොවියෙක් නිසා ඔබතුමා කියන්නකෝ වී කිලෝ එකක් වික්කේ කීයටද කියලා?

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

අපි ගොයම් කපනකොට ඔබතුමන්ලා වීවල අවම මිල නියම කරලා තිබුණේ නැහැ. වී මිලදී ගන්නේ මෙන්න මේ ගාණට කියලා කිව්වේ නැහැ, ගරු ඇමතිතුමා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

වී කිලෝවක ආණ්ඩුවේ අවම මිල රුපියල් 120යි කිව්වා. ඔබතුමා රුපියල් 120ට වඩා අඩුවෙන් වික්කාද?

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ඊට වඩා අඩුවෙන් තමයි වික්කේ. අවශ්‍ය නම් මම ඒක prove කරන්න ඊළඟ meeting එකට ගොවියෝත් එක්කගෙනම ඔබතුමා ළඟට එන්නම්.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

එන්නකෝ, එන්නකෝ.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

අඩු මිලට වී අළෙවි කරපු අම්පාර දිස්ත්‍රික්කයේ මිනිස්සු ඉන්නවා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඔබතුමා සම්පූර්ණයෙන් අසත්‍ය ප්‍රකාශයක් කරන්නේ. මේ කන්නයේ කලින් වී නෙළපු ප්‍රදේශවල ගොවීන්ට ඉහළ මිලක් ලැබුණා.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

නැහැ, ඇත්තම කියනවා නම් ඔබතුමා වී සඳහා අවම මිල ප්‍රකාශ කළාට පසුව තමයි අපේ ගමේ මිනිසුන්ට ලාභයක් ලැබුණේ. අක්කරෙයිපත්තු, අඩ්ඩාලවේනෙ, පාලමුනෙ ප්‍රදේශවල ගොවීන්ට පාඩු වුණා. මම ඇත්ත කියන්නේ. එම නිසා ඔබතුමන්ලා ඊළඟ සැරේ වීවල price එක ප්‍රකාශ කරනකොට ගොයම් කපන්න කලින් ප්‍රකාශ කරන්න කියලා තමයි ගොවි ජනතාව වෙනුවෙන් මම ඉල්ලා සිටින්නේ.

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

අදුත්ततාක, இந்தப் பாராளுமன்றத்திலே கடந்த காலங்களைவிட இம்முறை முஸ்லிம் சமூகம் தொடர்பான விடயங்கள் பகிரங்கமாகப் பேசப்படும் காட்சியை நாங்கள் காண்கின்றோம். ஓர் உறுப்பினர் பகிரங்கமாகவே ஏனைய உறுப்பினர்களைத் தாக்குகின்றார். ஆளும் கட்சி அமைச்சர் ஒருவர் எதிர்க்கட்சி உறுப்பினரைப் பார்த்து 'நாய்' என்று சொல்லுகின்றார்; எதிர்க்கட்சி உறுப்பினர் அவரைப் பார்த்துக் 'கரடி' என்று சொல்லுகின்றார். உண்மையிலே இது கவலைப்பட வேண்டிய விடயம். இது system changeஇனை ஏற்படுத்த வந்த அரசாங்கமாகும்! அந்த வகையில், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தயவுசெய்து இந்த விடயத்தைக் கௌரவ சபாநாயகர் அவர்களிடம் முன்வைத்து, இனிமேல் இந்தச் சபையிலே கௌரவ உறுப்பினர்களையும் அவர்களது குடும்பத்தையும் அவமானப்படுத்துகின்றவாறு யாரும் பேசாத வகையிலும், ஆளும் கட்சியிலோ, எதிர்க்கட்சியிலோ இருக்கின்ற 225 உறுப்பினர்களின் மரியாதை, சுய கௌரவத்தைப் பாதுகாக்கக்கூடிய வகையிலும் நடவடிக்கை மேற்கொள்வதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

முப்பது வருடகாலம் நடைபெற்ற யுத்தத்தினால் எல்லா இனங்களும் பாதிக்கப்பட்டிருக்கின்றன. தமிழ்ச் சமூகம் கூடுதலாகப் பாதிப்பட்டிருக்கின்றது. சிங்கள சமூகம் பாதிக்கப்பட்டிருக்கின்றது. வடக்கு, கிழக்கு மாகாணத்திலே யுத்தத்தையே ஆதரிக்காத எங்களுடைய முஸ்லிம் சமூகம் அநியாயமாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. இப்போது இவற்றைச் சொல்லி இங்கே இனவாதத்தைப் பேச வேண்டிய தேவையில்லை. புதிய அரசாங்கம் வந்திருப்பது இனங்களுக்கிடையில் ஒற்றுமையை ஏற்படுத்துவதற்கு. எனவே, அதற்கேற்ற வகையில் உறுப்பினர்கள் இந்தச் சபையில் பேசவேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன். இல்லையென்றால், எங்களுடைய எதிர்பார்ப்புகள் நிறைவேற முடியாத சூழ்நிலை ஏற்படுமென்று உங்களிடம் நான் அன்பாகச் சொல்லிக் கொள்கிறேன்.

அடுத்து, கௌரவ நீர்ப்பாசன அமைச்சரிடம் சில விடயங்களைச் சொல்ல வேண்டும். அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுவின் தலைவர் கௌரவ வசந்த பியதிஸ்ஸ அவர்களும், பிரதி அமைச்சர் அவர்களும் இங்கே இருக்கின்றார்கள். கடந்த அரசாங்கக் காலத்தில் அம்பாறை மாவட்டத்தில் பாரிய நீர்ப்பாசனத் திட்டமான 'ஹெட ஓயா' நீர்ப்பாசனத் திட்டத்தை மேற்கொள்வதற்காக அது தொடர்பான சாத்தியவள ஆய்வு அறிக்கை, செலவு மதிப்பீட்டு அறிக்கை ஆகியவை பெறப்பட்டு, அமைச்சரவைப் பத்திரமும் அனுமதிக்கப்பட்டிருக்கின்றது. மொனராகலை, அம்பாறை மாவட்டங்களின் பொருளாதாரம் விவசாய உற்பத்தியால் ஊக்கமளிக்கப்பட்டாலும், உத்தேச பிரதேசத்துக்கான பயிர் தீவிரம் மகா பருவத்தில் 1.0ஆக இருந்தாலும், யால போகத்துக்கான பயிர் தீவிரம் 0.2 முதல் 0.5 வரை மாறுபடும். 2015ஆம் ஆண்டுக்கான அம்பாறை மாவட்ட செயற்றிறன் அறிக்கையிலே பொத்துவில் மற்றும் லகுகல பிரதேச செயலாளர் பிரிவுகளுக்கான குடிநீர் இருப்பு முறையே 65 மற்றும் 68 ஆகவும், மொத்த மக்கள் தொகையிலே நிரந்தர தங்குமிடங்களைக் கொண்டுள்ளவர்களின் வீதம் முறையே 62 மற்றும் 36 ஆகவும் தெரிவிக்கப்பட்டிருந்தது. இந்த இரண்டு DS divisionஇலே பௌதிக அமைப்புகள் - நிலம், நீர் மற்றும் மனித வளங்கள் - இருந்தாலும் அவை மக்களின் முன்னேற்றத்துக்குப் போதுமானளவில் பயன்படுத்தப்படவில்லை. இந்த நிலைமையை மாற்றி சியம்பலாண்டுவ, லகுகல மற்றும் பொத்துவில் பிரதேச மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்காக, அந்த மக்களின் பொருளாதாரத்திற்காக இந்த நீர்ப்பாசனத் திட்டத்தைக் கௌரவ அமைச்சர் அவர்கள் ஆரம்பித்து உதவி செய்ய வேண்டும்.

ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමාත්, අපිත් දිස්ත්‍රික් meetingවලදී මේ ගැන තීන්දුවක් ගත්තා. පොළොන්නරුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් මාත් එක්ක කථා කළා, ගරු ඇමතිතුමා සමඟ විශේෂ meeting එකක් දාගන්න, එතුමන්ලාත් එන්නම් කියලා. අම්පාර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා එක්ක එකතු වෙලා මේ Heda-Oya scheme එක ඔබතුමා පටන්ගන්න ඕනෑ කියලා මම ඉල්ලීමක් කරනවා, ඇමතිතුමනි.

நான் இருப்பது அட்டாளைச்சேனையில். இந்த கல்ஓயா திட்டத்தினால் அட்டாளைச்சேனை, அக்கரைப்பற்று, ஆலையடிவேம்பு, திருக்கோவில் பிரதேசங்களில் இருக்கின்ற தங்கம் போன்று நெல் விளைகின்ற சுமார் 8,500 உறுதிக் காணிகள் நீண்ட காலமாக நீரிலே மிதந்துகொண்டிருக்கின்றது. ஒரு விசேட அபிவிருத்தித் திட்டத்தின் கீழ் நீங்கள் அந்தக் காணிகளை மீட்க வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன். இந்த நீர் வடியும் பாதையை அகலமாக்கி, நீரைக் கடலுக்குக் கொண்டுசெல்கின்ற பணிக்காக உலக வங்கி முதற்கட்டமாக 30 மில்லியன் பணத்தை ஒதுக்கியுள்ளது. ஆயினும், இரண்டு வருட காலமாக நீர்ப்பாசனத் திணைக்களத்தினர் அந்தப் பணத்தைச் செலவு செய்யாமல் இருக்கின்றார்கள். அது சம்பந்தமாக நாங்கள் பிரதி அமைச்சரின் தலைமையில் நடைபெற்ற கூட்டத்தில் குறிப்பிட்டிருந்தோம். பிரதேச சபைகள், பிரதேச செயலாளர்கள், விவசாயிகள் அனைவரும் அதற்குத் தேவையான இடங்களைத் தாங்கள் தருவதாகச் சொல்கின்றார்கள். அதனைச் செய்யாமல் இருப்பதனால் அட்டாளைச்சேனை, அக்கரைப்பற்று, ஆலையடிவேம்பு, திருக்கோவில் ஆகிய பிரதேசங்களிலே ஒவ்வொருமுறை வெள்ளம் வரும்போதும் மக்கள் பாதிக்கப்படுகின்றனர். வயற் காணிகள் சேதமடைகின்றன. எனவே, உலக வங்கி வழங்கிய பணத்தினை இன்னும் பயன்படுத்தாமல் இருப்பது சம்பந்தமாக நடவடிக்கை எடுக்க வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මොකද, මගේ ප්‍රදේශයේ මිනිස්සුන්ගේ ප්‍රශ්න ගැන පොඩ්ඩක් කියන්න තිබෙනවා.

කරුණාකරලා මේ සම්බන්ධව ඔබතුමන්ලා උනන්දු වෙලා පියවරක් ගන්න කියලා මම කියනවා. අනික් එක, Kaliodai River එක තිබෙනවා. දීඝවාපි ඉඳලා කලිඕඩය වෙනකල් කිලෝමීටර 4ක් තිබෙනවා, main canal එක. ඒක හැම අවුරුද්දකටම වරක් කඩාගෙන යනවා. එහෙම කඩාගෙන ගිහින් අඩ්ඩාලච්චෙනයි, අක්කරෙයිපත්තු, තිරුක්කෝවිල්, තම්බිලුවිල් කියන ප්‍රදේශවල අක්කර 1,000ක් 2,000ක්, 3,000ක් විතර ඉඩම් යට වෙනවා. ඊට පස්සේ ආයෙත් ඒක හදන්න සල්ලි වෙන් කරනවා. Irrigation Department එකෙන් සල්ලි ටිකක් දීලා, වැලි ටිකක් දානවා. ඊට පස්සේ ආයෙත් ගංවතුර එනවා, ආයෙත් කඩාගෙන යනවා. රුපියල් කෝටි ගණන් වියදම් කරනවා, මේ ගැන ස්ථිර තීන්දුවකට එන්න බැරිකමක් තිබෙන නිසා. ඒ නිසා ඒ කිලෝමීටර 4ත් හදලා

දෙන්න. අපි මෙය ඉල්ලන්නේ ගොවියා වෙනුවෙන්. කරුණාකරලා මේ ප්‍රධාන canal එකත් හදන්න, දීසවාපිවල ඉඳලා කලිඕඩය වෙනකල්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් දෙන්න.

இதேபோன்று சம்மாந்துறையில் ஆஸ்பத்திரிச்சேனை என்று சொல்லப்படுகின்ற நெய்னாகாடு என்ற இடத்தில் இருக்கும் பிரதான வாய்க்கால் உடைந்தால், பல்லாயிரக்கணக்கான ஏக்கர் காணிகள் பாதிக்கப்படும். அந்த வாய்க்காலை கௌரவ அமைச்சர் உட்பட எல்லோரும் வந்து பார்த்திருக்கிறீர்கள். இந்த வாய்க்கால் உடைப்பினால் சாய்ந்தமருது, கல்முனை, நிந்தவூர், அட்டப்பள்ளம் போன்ற பிரதேசங்களில் குடிநீர் பிரச்சினையும் ஏற்படுகின்றது. எனவே, இந்த இரண்டு கால்வாய்களையும் புனரமைத்தால், அரசாங்கத்துக்கு ஆதாயம்; ஒவ்வொரு முறையும் பணம் செலவழிக்கத் தேவையில்லை என்பதை அம்பாறை மாவட்ட மக்கள் சார்பிலே நான் சொல்கிறேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක්, දෙකක් දෙන්න.

பொத்துவில் பிரதேசத்தில் கடந்த 30 ஆண்டுகாலமாக நெற்செய்கையில் ஈடுபட்டவர்களுடைய காணிக்குள் யுத்தம் காரணமாக அவர்களால் போக முடியாமல் இருந்தது. ரணில் விக்கிரமசிங்க அவர்கள் ஜனாதிபதியாக இருந்த காலத்தில், அந்தக் காணிகளை அவர்களுக்கு வழங்குவதாகக் கூறிப் பல கூட்டங்களை நடத்தி அவர்களை ஏமாற்றினார். குறிப்பாக, பொத்துவில் பிரதேசத்தில் இருக்கின்ற ஆமைவெட்டுவான், வேகாமம், கச்சிக்கொடி தீவு, துக்வெல, தாராம்பளை, கிரான்கோவை போன்ற பகுதிகளிலுள்ள விவசாயக் காணிகளை இன்னும் விடுவிக்காமல் இருக்கின்றார்கள். அவர்கள் அரசியலுக்காகத்தான் அந்த விவசாயிகளின் காணிகளை விடுவிக்கமால் இருந்தார்கள். இப்பொழுது வந்திருக்கின்ற புதிய அரசாங்கம் உண்மையாகவே அங்கு விவசாயம் செய்தவர்களின் காணிகளை விடுவிப்பதற்கான ஏற்பாடுகளைச் செய்யவேண்டும். அரசாங்கத்தினுடைய காணிகளைப் பிடிப்பவர்களுக்காக நாங்கள் பேசவில்லை. அவர்கள் அங்கு உண்மையாகவே விவசாயம் செய்தார்கள்; பயங்கரவாதம் இருந்தது; வயலுக்குப் போகவிடாது தடுத்தார்கள். எனவே, அந்த விடயத்தில் கவனம் செலுத்துங்கள்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාගේ කථාව ඉක්මනින් අවසන් කරන්න.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
තව විනාඩියක් දෙන්න.

அதேபோன்று வட்டமடுக் காணிப் பிரச்சினையும் தீர்க்கப்படாமல் இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, வட்டமடுவில் தமிழ் மக்களும் கால்நடை வைத்திருக்கின்றார்கள்; முஸ்லிம் மக்களும் கால்நடை வைத்திருக்கின்றார்கள். அதேபோன்று, முஸ்லிம் மக்களும் நெற்செய்கை செய்கின்றார்கள்; தமிழ் மக்களும் நெற்செய்கை செய்கின்றார்கள். அங்கே நீண்டகாலமாகப் பிரச்சினை இருந்துகொண்டே இருக்கின்றது. எனவே, இரண்டு சமூகங்களோடும் பேச்சுவார்த்தை நடத்தி, இரண்டு சமூகங்களின் இணக்கப்பாட்டுடன் அதற்கான தீர்வைக் காண வேண்டும். ஏனென்றால், முஸ்லிம்களுக்குச் சொந்தமான 300 ஏக்கர் காணியில் முஸ்லிகளுக்கு விவசாயம் செய்வதற்கு அனுமதி வழங்கிவிட்டு, திடீரென வேளாண்மை செய்ய வேண்டாமென மறு அறிவித்தல் வந்திருக்கின்றது. எனவே, நீங்கள் இந்த விடயத்திலும் அக்கறை காட்ட வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.26]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෛරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, காணி விடயங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் மற்றும் பிரதி அமைச்சர் அவர்களின் கவனத்துக்குக் காணிகள் பற்றிய விடயத்தில் எமது மக்களினதும் எனதும் கருத்துகள் சிலவற்றைக் குறிப்பிடுகின்றேன். முன்னைய ஆட்சியில் திணைக்களத்தால் காணித் திருட்டுக்கள் நடைபெற்றது; உங்களுடைய ஆட்சியில் இவை நீக்கப்பட வேண்டும். வன்னிப் பெருநிலப்பரப்பு காடுகளை அதிகமாகக்கொண்ட பிரதேசமாகவே காணப்படுகின்றது. இங்குள்ள மக்களின் வாழ்வு தொன்றுதொட்டு இயற்கையோடு இணைந்ததொன்றாகவே காணப்படுகின்றது. அந்த மக்கள் என்றும் இயற்கையோடு முரண்பட்டுக் கொண்டதில்லை, காடுகளை அழித்ததில்லை. 2009ஆம் ஆண்டுவரை வெட்டப்பட்ட மரக்குற்றிகள் நிரப்பப்பட்ட கனரக வாகனங்கள் எம் வீதியால் சென்றதை நாங்கள் கண்டதில்லை. மரம் அரிகின்ற இயந்திர வாள்களின் கொடூர ஓசையை நாம் கேட்டதில்லை. 2009ஆம் ஆண்டுவரை வனவள பாதுகாப்புத் திணைக்களமும் வன ஜீவராசிகள் திணைக்களமும் எமது இடத்தில் இருக்கவில்லை. ஆனாலும் விடுதலைப் புலிகளின் வனவளப் பிரிவு இருந்தது. இயற்கையை நேசித்த வன்னியர்களின் வாழ்க்கைமுறை இருந்தது. இதனால் வனப்பகுதிகள் அழிக்கப்படவில்லை. காடுகள் அழிக்கப்பட்டு, மரங்கள் வெட்டு மரங்களாகவும் விறகுத் தேவைகளுக்காகவும் பெரும் நகரங்களை நோக்கி ஏற்றிச் செல்லப்படவில்லை. காடுகள் மிகக் கவனமாகக் காவல் செய்யப்பட்டன. 2010ஆம் ஆண்டிலும் அதன் பின்னரும்தான் வனவனத் திணைக்களத்தினதும் வனஜீவராசிகள் திணைக்களத்தினதும் நிர்வாகம் இங்கு நிலைநிறுத்தப்பட்டது. கௌரவ

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதன் பின்னர்தான் வன்னிப் பெருநிலப்பரப்பின் காடுகள் சூறையாடப்பட்டன.

மன்னாரில் முசலி உட்பட குறிப்பிட்ட சில இடங்களிலும் வவுனியாவில் பம்பைமடு உட்படச் சில இடங்களிலும் அடர்காடுகள், ஒதுக்கப்பட்ட வனப்பகுதிகள் ஈவு இரக்கமற்றுக் கனரக இயந்திரங்களால் மூர்க்கத்தனமாகச் சிதைக்கப்பட்டன. இது வனவளத் திணைக்களத்தின் அபகரிப்புகள் அல்லது திருட்டுகளாகவே கருதப்பட வேண்டும். Google Earth timeline ஊடாக பார்க்கும்போது 2009ஆம் ஆண்டுக்கு முன்பு வன்னிப் பெருநிலப்பரப்பின் வனவளம் எவ்வாறு பாதுகாக்கப்பட்டது என்பதையும், 2009ஆம் ஆண்டின் பின்பு வனப்பகுதிகள் எவ்வாறு சூறையாடப்பட்டது என்பதையும் அறிய முடியும். இன்றுவரை வனவளத் திணைக்களத்தின் செயற்பாடுகள் மிகவும் ஊழல் நிறைந்ததாகவே காணப்படுகின்றன. இதேபோன்றுதான் வனஜீவராசிகள் திணைக்களமும் அங்கு செயற்படுகின்றது. இவ்வாறு வனப்பகுதிகள், இயற்கை வாழ்விடங்கள் என்பன சூறையாடப்படுவதற்குக் காரணமாக இருக்கும் இத்திருட்டுத் திணைக்களங்கள் 2010ஆம் ஆண்டின் பின் எங்கள் வீட்டு முற்றங்களையும், வயல் நிலங்களையும், தோட்டம் துரவுகளையும், ஏன் வீதிகளையும், இடுகாடுகள், சுடுகாடுகள் போன்றவற்றையும் திருடத் தொடங்கிவிட்டன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2009ஆம் ஆண்டின் பின், தற்போது நாட்டில் நடைமுறையில் உள்ள சட்டங்களையும் விதிகளையும் புறக்கணித்து, மாவட்டச் செயலாளருக்கோ பிரதேச செயலாளருக்கோ தெரியப்படுத்தாது நில அளவைத் திணைக்களத்தின் ஊடாக வரைபடங்களையும் பெற்றுக்கொள்ளாது முல்லைத்தீவு மாவட்டத்தில் மட்டும் 167,487ஏக்கர் நிலப்பரப்பு வனவளத் திணைக்களத்தால் வனப்பிரதேசமாக வர்த்தமானியில் அறிவிக்கப்பட்டுள்ளதாக முல்லைத்தீவு மாவட்டப் பிரதேச செயலகப் புள்ளிவிபரங்கள் தெரிவிக்கின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Give me two minutes, please.

அவ்வறிக்கையின் பிரகாரம், 1983ஆம் ஆண்டு தொடக்கம் 2009ஆம் ஆண்டுவரை உள்நாட்டுப் போர் காரணமாக இடம்பெயர்ந்த மக்களின் குடியிருப்புக் காணிகள், முத்தையன் கட்டுக்குள நீர்ப்பாசனத் திட்டம் மற்றும் தண்ணிமுறிப்புக் குள நீர்ப்பாசனத் திட்டம் என்பவற்றின்கீழ் மக்களுக்குப் பிரித்து வழங்கப்பட்ட வயல் நிலங்கள், இன்னும் கமநலசேவைத் திணைக்களத்தின் நிர்வாகத்தின் கீழ் இருக்கும் நீர்ப்பாசனக் குளங்கள், அவற்றின் கீழ் இருக்கும் வயல் நிலங்கள் என்பன வனவளத் திணைக்களத்தினால் விதிகளை மீறிய வர்த்தமானி அறிவித்தலின்மூலம் ஒதுக்கப்பட்ட வனவளப் பிரதேசங்களாகப் பிரகடனப்படுத்தப்பட்டு இருக்கின்றன என்பதனை மாவட்டச் செயலகப் புள்ளிவிபரங்கள் தெரிவிக்கின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
தயவுசெய்து எனக்கு மேலும் ஒரேயொரு நிமிடம் தாருங்கள்!

கால்நடைகள் விடயத்தில் ஒரு புள்ளிவிபரத்தைச் சொல்கின்றேன். மேய்ச்சல் தரை இல்லாத காரணத்தினால் மன்னாரில் கிட்டத்தட்ட 140,000, வவுனியாவில் 130,000, முல்லைத்தீவில் 100,000 மாடுகள் roadஇல்தான் கிடக்கின்றன. இதனைக் கருத்திலெடுத்து, தயவுசெய்து இந்த மாடுகளுக்கான மேய்ச்சல் தரையை ஒதுக்க ஏதாவது ஒரு சிறந்த வழியை மேற்கொள்ளுங்கள்! வன்னிப் பிரதேசத்தைப் புறந்தள்ளிவிடாமல், தயவுசெய்து இந்தக் குறைகளை நிவர்த்தி செய்வதற்கேற்ற வகையில் உங்களுடைய செயற்பாடுகள் இருக்கவேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා. ඔබතුමාගේ පැහැදිලි කිරීමට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මම මේ සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, පෙරේදා සවස 6.30ත් - 7.00ත් අතර කාලයේදී අනුරාධපුර

ශික්ෂණ රෝහලේ නේවාසිකාගාර පරිශ්‍රය තුළ වෛද්‍යවරියකට සිදු වූ බරපතළ ලිංගික හිංසනය පිළිබඳව. මේ වෙනකොට ඒ පිළිබඳව මේ සභාවත්, රටත් තොරතුරු දන්නවා. අපේ රටේ මෙවැනි ආකාරයේ ලිංගික හිංසන දිනකට කිහිපයක්ම සිදු වුණත්, මේ සිදුවීමට ඊට වඩා අවධානයක් සමාජයේ ඇති වුණා; කම්පනයක් ඇති වුණා. විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරියන්ගේ සිට සියලු කාන්තාවන් මේ පිළිබඳව යම් කම්පනයකින්, ආතතියකින් සිටින බව මම දන්නවා. ඒ නිසාම මේක අපි ඉතා බැරෑරුම් ලෙස සලකනවා. මේ සිදුවීම සිදු වෙලා පැය 36ක් ගතවන්නට මත්තෙන් සැකකරු අත්අඩංගුවට ගන්නට පොලීසිය සමත් වුණා. මේ වෙනුවෙන් වැඩබලන පොලිස්පතිතුමාගේ මෙහෙයවීම යටතේ උතුරු මැද පළාත භාර ජ්‍යෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බුද්ධික සිරිවර්ධන මහත්මයාගේ අධීක්ෂණයෙන් පොලිස් කණ්ඩායම් 5ක් කටයුතු කළා. ඊයේත් මේ පුද්ගලයා ඉන්නවාය කියන සැකසහිත ප්‍රදේශයක් පොලීසිය ගිහින් පරීක්ෂා කළත් එතැනදී ඔහු අල්ලා ගන්න බැරි වුණා. නමුත්, අද උදෑසන ඔහු අත්අඩංගුවට ගත්තා.

දැන් ඒ සම්බන්ධ පරීක්ෂණ සිදු වෙමින් පවතිනවා. අපි දන්නවා, අපේ රටේ ඉතිහාසයේ සිදු වුණු සේයා සදෙවිමී ඝාතනය වාගේ දේවල්වලදී මෙවැනි දේවල් නාටකයක් හැටියට සිද්ධ වුණේ කොහොමද කියලා. නමුත්, මේ සැකකරු පැය 36ක් යන්න කලින් අත්අඩංගුවට ගන්නට පොලීසිය සමත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙවැනි සිදුවීමක් වුණාට පස්සේ අපේ රටේ සමාජ මාධ්‍යවල, මාධ්‍යවල හැසිරීම පසුගිය කාලයේ එතරම් යහපත් වෙලා තිබුණේ නැහැ. ඒ නිසාම මම ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට සියලු මාධ්‍යවලින් ඉල්ලීමක් කළා, මේ සිදුවීමේදී චින්දිතයෙකු බවට පත් වූ මේ වෛද්‍යවරියගේ අනන්‍යතාව හෙළිදරව් නොකරන ලෙසට. මම ඒ සියලු මාධ්‍යවලට ස්තුතිවන්ත වෙනවා, මෙතෙක් ඒ වගකීම ආරක්ෂා කර තිබීම ගැන. මම හිතන විධියට, පළමුවැනි වතාවට රටේ සියලු මාධ්‍ය චින්දිතභාවයට පත් වෙච්ච තැනැත්තියගේ - වෛද්‍යවරියගේ - අනන්‍යතාව හෙළිදරව් නොකරන ආකාරයට කටයුතු කළා. යම් කෙනෙක් වැරදි කෙනෙකුගේ රූපයක් දාලාත් තිබුණා. ඉදිරියටත් ඒ ආකාරයටම මාධ්‍ය හැසිරෙයි කියලා මම බලාපොරොත්තු වනවා. මම හිතනවා, රජයක් හැටියට අපි ඒකට මැදිහත් විය යුතුයි, ඒ ඉල්ලීම කළ යුතුයි කියා. මොකද, ශිෂ්ට සම්පන්න සමාජයක මෙවැනි දේවල් යළිත් ඇති නොවන්නට නම් මාධ්‍ය හැසිරීමත් එලෙස තිබිය යුතුයි.

ඒ වාගේම ඊයේ දවසේදීත්, අද උදෑසනත් යම්කිසි ආකාරයකට කම්පනයට පත් වෙලා ඉන්න අපේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට ආරක්ෂාව ලබා දීලා, ඔවුන්ගේ සුරක්ෂිතභාවය ඇති කිරීම සඳහා රජය හැටියට විශාල මැදිහත්වීමක් කළා. විශේෂයෙන් මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, උතුරු මැද පළාතේ අපේ ආණ්ඩුකාර විශ්‍රාමික මහාධිකරණ විනිසුරු වසන්ත ජීනදාස මහතා ප්‍රමුඛ අපේ රජයේ නිලධාරින්ට. ඔවුන් ඊයේ දවසේත්, අදත් සැලකිය යුතු මහන්සියක් මේ වෙනුවෙන් දක්වා තිබෙනවා. මම ඊයේ රාත්‍රියේම ඒ ප්‍රදේශයට ගියා. අද උදෑසන ඉඳලා පෞද්ගලිකව මේ අයගේ ආරක්ෂාව පිළිබඳවු සොයා බැලුවා. ඒ වාගේම ඊයේ උදේම අපි සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සේවා අධ්‍යක්ෂතුමිය සහ අපේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් ප්‍රමුඛ කණ්ඩායමක් ඒ ප්‍රදේශයට පිටත් කර හැරියා. ඒ අනුව, පවතින අඩුපාඩුකම් සොයා බලා දැන් ඉන්න කණ්ඩායමට ආරක්ෂාව සැපයීම සඳහා කටයුතු සූදානම් කර තිබෙනවා.

විශේෂයෙන්ම ගත්තොත්, අනුරාධපුරය වාගේ තැනක මේ ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඉඳලා සාමාන්‍ය වෛද්‍යවරු, හෙද හෙදියන් ඇතුළු සේවය කරන අය සාමාන්‍ය පරිසරයක් යටතේ නොවෙයි සේවය කරන්නේ. යම් කෙනෙකුට විදේශීය පුහුණුව අවසන් වෙලා මේ කටයුතු කරන එක එතරම් පහසු නැහැ. ඒ නිසා ඔවුන්ට වෙනත් විකල්ප තිබෙනවා. ඔවුන්ට යළි රට අත්හැර යන්න පුළුවන්. එහෙම නැත්නම් පෞද්ගලික සේවයට එන්න පුළුවන්කම තිබෙනවා. නමුත්, ඒ අය මේ දුෂ්කරතා දරාගෙන කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා ඔවුන්ට සුවපහසු, සුරක්ෂිත වටපිටාවක් නිර්මාණය කළ යුතුමයි. ඒ නිසාමයි අපි රජයක් හැටියට මේ වෙනුවෙන් විශාල වශයෙන් මැදිහත්වීමක් කළේ.

මෙතැනදී අපි හඳුනා ගත් අඩුපාඩු කිහිපයක් තිබෙනවා. ඒ ගැනත් මම කියන්න ඕනෑ. මොකද, මේ සිදුවීමට කලින් -මේ තරම් බරපතළ නොවුණත්- පසුගිය වසර කිහිපය තුළ රෝහල් පරිශ්‍රයේ, නිල නිවාස ආසන්නයේ, මේ ඉඩම්වල මීට ආසන්න සිදුවීම් කිහිපයක් සිදු වෙලා තිබෙනවා. සමහර විට භාණ්ඩ පැහැර ගැනීමක්, තර්ජනය කිරීමක්, රාත්‍රී කාලයේ වෛද්‍යවරයෙකුගේ room එක ඇතුළේ අනවසර පුද්ගලයෙකු ඉඳලා භය කිරීමක් වාගේ දේවල් සිදු වෙලා තිබෙනවා. මේවා සෞඛ්‍ය අමාත්‍යාංශය මට්ටමින් විසඳා ගන්න ඕනෑ ප්‍රශ්න නොවෙයි. රෝහල් පරිපාලනය මැදිහත් වෙලා ඒකට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුයි. නමුත්, අපි දකිනවා, පසුගිය වසර කිහිපය තුළ මේ වැඩබලන අධ්‍යක්ෂවරයා සහ රෝහල් පරිපාලනය මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන නැති බව. ඒ සිදුවීම් වර්ධනය වෙලා, වර්ධනය වෙලා ඕනෑ කෙනෙකුට මේ තැනට ඇතුළු වෙන්න පුළුවන් මට්ටමට තත්ත්වය නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, ඒ අයගේ වගකීම හරියට ඉටු කළා නම්, මේ තරම් මේ සිද්ධි දුර දිග යන්නේ නැහැ කියලා.

ඊළඟට, රෝහලේ දැනට ඉන්න ආරක්ෂක සේවාවේ අඩුපාඩු තිබෙනවා. අපේ ලාල් කාන්ත ඇමතිතුමා හොඳටම දන්නවා, මේ රෝහල වැඩිදියුණු වීමේදී ඒකේ යම් සුවිශේෂත්වයක් තිබෙන බව. යම් අනවසර පදිංචිකරුවන් ඉන්නවා නම්, නැත්නම් නීති විරෝධී ක්‍රියා යම් තැනක වාර්තා වනවා නම්, ඒකට එරෙහිව කටයුතු කිරීමට සමත් විධියට රෝහල් ආරක්ෂක සේවාව කාර්යක්ෂම කළ යුතුව තිබුණා. නමුත්, ඒක කරලා තිබුණේ නැහැ. ඒ නිසා විශේෂයෙන්, රෝහල් පරිපාලනයේ අඩුපාඩුකම් සහ රෝහලේ ආරක්ෂක සේවාවේ අඩුපාඩුකම් පිළිබඳව අපි ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්න බලාපොරොත්තු වනවා, සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට. ඒ වාගේම මම කලින් කිව්වා වාගේ දුෂ්කර තත්ත්වයන් යටතේ වැඩ කරන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට අවශ්‍ය නිල නිවාස පහසුකම් සහ ආරක්ෂාවට අදාළ දේවල් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කඩිනමින් සපයන බව කියන්න කැමැතියි.

අපි මේ සියලු දේවල් කරලා ආරක්ෂාව සහතික කරමින් ඉන්න අතරේ තමයි, දිවයින පුරා පැය 24ක වැඩ වර්ජනයක් පිළිබඳව අපට දැනුවත් වෙන්න ලැබුණේ, ඊයේ රාත්‍රී 10.30ට පමණ. ඇත්තටම වැඩ වර්ජනය කැඳ වූ වෘත්තීය සමිතිය කලින් කිව්වේ, අද උදෑසන 8.00 වනකොට සැකකරු අත්අඩංගුවට ගත්තේ නැත්නම් ඊළඟට, උතුරු මැද පළාතේම වර්ජනයක් දියත් කරනවා කියායි. එහෙමත් කළේ නැත්නම් තමයි පැය ගාණකට පස්සේ, දවසකට පස්සේ රට පුරා වර්ජනයක් දියත් කරනවා කිව්වේ. නමුත් ඊයේ රාත්‍රියේ හදිසියේ දැනගන්න ලැබුණා දිවයින පුරා පැය 24ක අඛණ්ඩ වැඩ වර්ජනයක් දියත් කරනවා කියලා. ඒකෙන් රෝගීන් දැඩි අපහසුතාවට පත් වුණා. සමහර රෝගීන් දුරබැහැර ඉඳලා රාත්‍රියේ බස්වලට නැඟලා තමයි සායනවලට, ප්‍රතිකාර ගන්න, OPD එකට ඇවිල්ලා තිබෙන්නේ. අද ඒ අයත් අපහසුතාවට පත් වෙලා තිබෙනවා.

අපි රජයක් හැටියට අනුරාධපුරයේ වූ සිදුවීම ඉතා බැරෑරුම් ලෙස සලකලා ක්‍රියාමාර්ග ගණනාවක් ගනිමින් සිටියදීම මේ විධියට පැය 24ක වර්ජනයක් දියත් කිරීම යුක්තිසහගත නැහැ කියලා මම හිතනවා. විශේෂයෙන් ඒ පුද්ගලයා -සැකකරු-

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

අත්අඩංගුවට ගත්තාට පසුවත් ඕනෑ නම් ඒ වැඩ වර්ජනය කැඳවීම නතර කිරීමේ හැකියාව තිබුණා. මොකද, අපි සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව ගැන කල්පනා කරනවා වාගේම, අපෙන් ප්‍රතිකාර ලබා ගන්නා, අපට වැටුප් ලබා ගන්න බදු ගෙවන ඒ සාමාන්‍ය ජනතාව පිළිබඳවත් සහකම්පනයෙන් කටයුතු කළ යුතුයි. ඒ ජනතාව නිසා තමයි රටක් ඉස්සරහට යන්නේ. ඒ නිසා මම හිතනවා අද වුණත්, දැන් වුණත් මේ වැඩ වර්ජනය කැඳවීම නතර කිරීමේ හැකියාවක් තිබෙනවා කියලා.

මම මේ මොහොතේ මේ කාලය ගත්තේ වෙන මොනවත් නිසා නොවෙයි, මේ කාරණය කියන්නයි. මේ රටේ රජයේ රෝහල්වලට පැමිණෙන රෝගී ජනතාව පිළිබඳ කම්පනයක් අපට තිබෙන්නට ඕනෑකම තිබෙනවා. වෛද්‍ය වෘත්තිකයන් ඇතුළු සියලු සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පහසුකම් සහ ආරක්ෂාව ලබා දීම වෙනුවෙන් රජය මැදිහත් වෙමින් සිටින වෙලාවක මේ වැඩ වර්ජනය තවදුරටත් ඇදගෙන යෑම යුක්තිසහගත නැහැ කියන එක මම ඒ අයට කියන්න කැමැතියි. අපිත් එක්ක සාකච්ඡා කරලා ඕනෑ දෙයක් කරන්න පුළුවන්. ඔබට දැනෙන්න ඕනෑ අපි කරන වැඩවල තිබෙන විශ්වසනීයත්වය පිළිබඳව. ඒ නිසා මේ වැඩ වර්ජනය නතර කරලා ඒ සේවාව අපේ රටේ මහ ජනතාවට ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ වේලාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.40]

ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2024 වසරේ අය වැය කථාව ඉදිරිපත් කරමින් රනිල් වික්‍රමසිංහ මහත්මයා මෙහෙම කියා තිබෙනවා.

"ගරු කථානායකතුමනි, නිදහසින් පසු අවුරුදු 75ක් තිස්සේ හුහක් වෙලාවට අපි ආදායමට සරිලන ලෙස වියදම් කළේ නැහැ. මම මෙහෙම කිව්වාම මේ රටේ ආණ්ඩු නාස්තිකාර වියදම් කළා කියලා කෙනෙකුට කියන්න පුළුවන්. ආණ්ඩු විතරක් නොවෙයි, අපි හැමෝම ඒ වැරැද්ද කළා. රස්සාවල් දුන්නේ, පඩි වැඩි කළේ, නිකම් හාල් දුන්නේ එක්කෝ ණය වෙලා නැත්නම් සල්ලි අච්චු ගහලා."

අවුරුදු 75ක් රට පාලනය කළ පාලක පන්තියේ නායකයෙක් කියනවා, රස්සාවල් දුන්නේ, වැටුප් වැඩි කළේ, නිකම් හාල් දුන්නේ එක්කෝ ණය වෙලා, නැත්නම් සල්ලි අච්චු ගහලා කියලා. එවැනි ආර්ථික පදනමක් ඉතුරු කළාට පස්සේ වර්තමාන රජයේ අපේ ජනාධිපතිතුමා මුදල් අමාත්‍යතුමා ලෙස ඉතිහාසයේ පළමු වතාවට එහෙම ණය නොවී, එහෙම බදු බරක් ජනතාව මත පටවන්නේ නැතිව, සල්ලි අච්චු ගහන්නේ නැතිව අපේ ගොවි ජනතාවටත්, රටේ පොදු ජනතාවටත් මෙතරම් සුවිශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් දෙන්න සමත් වුණා දින 100ක් ඇතුළත අපේ රාජ්‍ය කළමනාකරණය, ආණ්ඩු කළමනාකරණය තුළ. විපක්ෂයේ මහත්වරු කියපු ඒ දේවල්වලට උත්තරයක් ලෙසයි මම මේක කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම 2022 වසරේ අය වැය කථාව ඉදිරිපත් කරමින් බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යවරයා කියා මෙහෙම තිබෙනවා.

"ගරු කථානායකතුමනි, අපි මේ පසු කරමින් සිටින්නේ මානව ශිෂ්ටාචාරයේ වේදනාකාරීම යුගයයි. එකී සත්‍ය අවබෝධ කර ගත නොහැකි කෙනෙකු සිටී යැයි මා සිතන්නේ නැහැ."

එහෙම නම්, මානව ශිෂ්ටාචාරයේ වේදනාකාරීම යුගය ඇති කළේ කවුද? ඒගොල්ලන්ගේ වචනවලින්ම කියන විධියට ඒ පාලක පන්තියම තමයි. එහෙම ආර්ථිකයක්, එහෙම දේශපාලන සංස්කෘතියක්, සදාචාරයක් ඉතුරු කළාට පස්සේ වර්තමාන රජය එතැන් සිට උඩුගං බලා පිහිනන ගමන් මගක තමයි මේ යන්නේ. ඒක තුළ ඉතිහාසයේ කවදාවත් නැති තරම් ධනාත්මක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපේ රජය සමත් වුණා. ඒ වාගේම මේ වෙලාවේ මට මතක් වෙනවා, බැසිල් රාජපක්ෂ මහත්මයා එක රැස්වීමකදී වට්ටක්කා ගැන කියපු කථාවක්. එතුමා ඒ කථාවේදී කිව්වා, "වට්ටක්කා විකුණා ගන්න බැහැ කියලා ගොවි ජනතාව උද්ඝෝෂණ කරනවා; කෑ ගහනවා. හේනට යන එන ගමන්, කුඹුරට යන එන ගමන් වට්ටක්කා ඇට ටිකක් වීසි කරගෙන යනවා. ඊට පස්සේ මාස 03කින් විතර ඇවිල්ලා වට්ටක්කා කඩනවා. ඊට පස්සේ වට්ටක්කා විකුණා ගන්න බැහැ කියලා කෑ ගහනවා; උද්ඝෝෂණ කරනවා. කවුද වට්ටක්කා කන්නේ? මළගෙවල්වල තමයි වට්ටක්කා කන්නේ. මම නම් වට්ටක්කා කන්නේ නැහැ" කියලා. පසුගිය කාලයේ ගිය ඒ recording එක අහපු අපේ ජනතාව අනන්තවත් ඇති. අපි ගාවත් ඒ recording එක තිබෙනවා. මේ රටේ ගොවි ජනතාවට නායකත්වය දීපු එහෙම නායකයෝ, එහෙම මුදල් ඇමතිලා, එහෙම පාලකයෝ තමයි අපේ රටේ ගොවි ජනතාව මේ විනාශය කරා ඇදගෙන ගියේ; මේ රටේ ආර්ථිකයට මෙවැනි තත්ත්වයක් උදා කළේ.

පසුගිය නොවැම්බර් මාසයේ මහා වර්ෂාවක් ඇදහැළුණා. ඒ වර්ෂාව නිසා විශාල ගොවි ජනතාවක් පීඩාවට පත් වුණා. ඔවුන්ගේ වගා බිම් විශාල ප්‍රමාණයක් විනාශ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2025.03.11වැනි දා වනකොට ගොවි පවුල් 53,511කට, ඔවුන් වගා කළ අක්කර 61,071කට අදාළව රුපියල් මිලියන 952ක් වන්දි දීලා අවසන් කරන්න අපේ රජය සමත් වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ වීය.

අතන්පිටකු, මාණ්පුමිකු (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and HON. SPEAKER took the Chair.

ගරු වසන්ත පියතිස්ස මහතා
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)

ගරු සභාපතිතුමනි, 2024-2025 මහ කන්නයට අදාළව අම්පාර දිස්ත්‍රික්කයට විතරක් රුපියල් දොළොස්කෝටි විසිඑක්ලක්ෂ අසූහත්දහස් දෙසියවිස්සක් ගෙවා අවසානයි. 2024 යල කන්නයේ සල්ලි ගෙවන්න තිබෙනවා. ඒ වනවිට තිබුණේ කලින් ආණ්ඩුව. රුපියල් දහනවලක්ෂ ගණනක් ගෙවන්න තිබෙනවා. 2023-2024 මහ කන්නයේ වන්දි ගෙවන්නත් තිබෙනවා. 2023 යල කන්නයේ රුපියල් 6,795,000ක් වන්දි ගෙවන්න තිබෙනවා. ඒ වාගේම, 2022 යල කන්නයේ රුපියල් 5,364,000ක් ගෙවන්න තිබෙනවා. එවැනි ඉතිහාසයක් තිබියදී අපට පුළුවන්කම ලැබුණා, විශාල වන්දි මුදල් ප්‍රමාණයක් ඒ පීඩාවට පත් වෙච්ච ජනතාව අතට ලබා දෙන්න.

ඒ වාගේම, අපේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු කිව්වා, නැහෙනහිර පළාතට අඩුවෙන් සලකනවා කියලා. එහෙම නැහැ. ගල්ඔය ව්‍යාපාරයේ පහළ නිම්නයේ ඇළවේලි හදන්න, කැඩුණු අමුණු හදන්න, ප්‍රතිසංස්කරණය කරන්න, දුර්වල තැන් ශක්තිමත් කරන්න, මෙවර අය වැයෙන් රුපියල් මිලියන 7,000ක් වෙන් කර තිබෙනවා. ඒ සියලු කටයුතු කරන්න අපට පුළුවන්කම ලැබෙනවා මේ මාර්තු 21න් පස්සේ. ඒ වාගේම හුරුළුවැව ව්‍යාපාරය, මින්නේරිය ව්‍යාපාරය ආදී ව්‍යාපාරවලටත් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒවා වඩා ශක්තිමත්ව ප්‍රතිසංස්කරණය කර තැබීමෙන්, හදිසි ව්‍යසනයකදී ඒවාට සිද්ධ වෙන්න පුළුවන් හානි වැළැක්වීම නිසා ඒ ගොවි ජනතාව අපහසුතාවට පත්වීම වළක්වා, වන්දි ගෙවීම් නතර කරන්නත්, වන්දි ප්‍රමාණය අඩු කරන්නත් පුළුවන්කමක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මුන්දෑනි ආරු ව්‍යාපාරය සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරලා, අම්පාර දිස්ත්‍රික්කයේත්, මොනරාගල දිස්ත්‍රික්කයේත් ගොවි පවුල් 10,000කට ඒ හරහා සෙත සලසා තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රදේශයේ මේ ස්ථානය තිබෙන්නේ. හෙක්ටෙයාර 6,500ක අලුත් සහ පවතින ඉඩම් සඳහා වාරි පහසුකම් සැපයීමට අපි මේ හරහා කටයුතු කර තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු වසන්ත පියතිස්ස මහතා
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
ගරු සභාපතිතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල පවුල් 31,000කට පානීය ජලය සැපයීමට, පහළ නිම්නයේ ගංවතුර පාලනයට, ජලාශ දෙකෙහිම මිරිදිය ධීවර අස්වැන්න වසරකට මෙට්‍රික්ටොන් 800කින් වැඩි කිරීමට එමඟින් පුළුවන්කම ලැබෙනවා. එවැනි මහා පරිමාණ ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඒ අනුව මෙවර අය වැය තුළින් ගොවි ජනතාවට විශාල සහනයක් ලබා දීම වෙනුවෙන් විශාල ප්‍රාග්ධනයක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම දෛනිකව ගොවි ජනතාව මුහුණ දෙන සියලු ගැහැට, වන අලින් ඇතුළු වන සතුන්ගෙන් සිදු වන සියලු ගැහැට නිමා කිරීම සඳහා සැලැස්මක් සහිතව, ප්‍රතිපත්තියක් සහිතව මුදල් වෙන් කරමින් මැදිහත් වෙන්න අපි කටයුතු කරමින් ඉන්නවා. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීතුමනි, ඒක මොනරාගල දිස්ත්‍රික්කය සහ අම්පාර දිස්ත්‍රික්කය ඒකාබද්ධව කරන්න ඕනෑ දෙයක්. ඒ නිසා අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් තීරණයක් ගත්තා. මොනරාගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් මේ ගැන තීරණයක් ගෙන තිබෙනවා. නමුත්, ඒක අතරමග නතර වෙලා තිබෙනවා. ඒ නිසා අපි පාර්ශ්ව දෙකම ඒකාබද්ධ වෙලා සාකච්ඡා කරලා ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගවලට යා යුතුයි කියා අපි විශ්වාස කරනවා. එය කළ යුතු දෙයක් කියාත් අපිත් විශ්වාස කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.50]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු සභාපතිතුමනි, මගේ කථාවේදී කෘෂි කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කරන්න කලින්, අනුරාධපුර ශික්ෂණ රෝහලේදී වෙච්ච සිදු වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා කළ ප්‍රකාශයට අවධානය යොමු කරන්න කැමැතියි. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමනි, මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, එම තත්ත්වය ඇති වූ වෙලාවේ ඔබතුමා හැසිරුණු ආකාරය මෙන්ම මාධ්‍යයෙන් කරපු ඉල්ලීම වෙනුවෙන්. ඔබතුමා මාලිමාව ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු වුණාට, මගේ සමාජ මාධ්‍ය පිටුවක පවා මම ඔබතුමාගේ රූපයත් එක්ක ඒක share කළා. ඒ වාගේම අපි බෙහෙවින් සතුටු වෙනවා, එම සිදුවීම පිළිබඳ print media ඇතුළු රටේ තිබෙන සියලු මාධ්‍යවල හැසිරීම සම්බන්ධයෙන්. හැබැයි ගරු සභාපතිතුමනි, එහිදී සමාජ මාධ්‍යයේ හැසිරීම පිළිබඳව නම් අපට ලොකු සතුටක් නැහැ. අනුරාධපුරයේ එම සිදුවීම පිළිබඳව "හිරු" මාධ්‍යයෙන් පළ කරපු ඒ ප්‍රවෘත්තිය දැනට ඉන්න වෙනත් වෛද්‍යවරියකගේ රූපය යොදලා සමාජ මාධ්‍ය හරහා පළ කරපු නිසා එය ලංකාව පුරා පැතිර යනවා අපි දැක්කා. ඒවා නොවිය යුතුයි. ඒ වාගේම, ඒවා සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක විය යුතුයි.

ඒ වාගේම අපි දැක්කා, එම සිදුවීම සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කියපු කාරණය. හෙට උදේ 8 දක්වා වර්ජනයක් ක්‍රියාත්මක වෙනවා. ගරු නලින්ද ජයතිස්ස මැතිතුමනි, රෝගීන් අපහසුතාවට පත් කිරීම පිළිබඳව අපි සතුටු වන්නේ නැහැ. ඒ දුෂණ ක්‍රියාවට සම්බන්ධ පුද්ගලයා අත් අඩංගුවට ගෙන තිබෙනවා. ඒක ඉතා හොඳ තත්ත්වයක්. හැබැයි ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ, ගරු අමාත්‍යතුමනි. මේක මම ඔබතුමාට එල්ල කරන චෝදනාවක් නොවෙයි. කලින් පැවැති ආණ්ඩු, රෝහල් පරිපාලනය ඇතුළු සියලුදෙනා මේ තත්ත්වයට වග කියන්න ඕනෑ.

අද වෛද්‍යවරු රාශියක් දුරකථනයෙන් මා අමතා කරුණු කිව්වා. ගරු ඇමතිතුමනි, වැඩි ඇතක යන්න ඕනෑ නැහැ, කළුබෝවිල රෝහලට ගිහිල්ලා බලන්න, on-call roomsවල තත්ත්වය. සමහර වෙලාවට සමහර වෛද්‍යවරුන්ට උදේ 8 ඉඳලා ඊට පහුව දා උදේ 8 දක්වා එක දිගට පැය 24ක් වැඩ කරන්න වෙනවා. තමන්ගේ ගෙදර ළඟපාතක තිබුණත් ඒ පැය 24 තුළ ඒ වෛද්‍යවරුන්ට හැකියාවක් නැහැ, ගෙදරට ගිහිල්ලා ආරක්ෂිතව ඉන්න. ඒ වෙනුවට ඔවුන්ට සිදු වෙනවා, facilities කොහොම වුණත් රෝහලේ තිබෙන යම්කිසි කාමරයක නැවතිලා ඉන්න. අද මා දැන ගත්තු තොරතුරු අනුව වැඩි හරියක් රෝහල්වල තිබෙන

[ගරු ඩී.වී. චානක මහතා]

on-call roomsවල අඩුම තරමින් lock එකක්වත් නැහැ. මෙච්චර කාලයක් ඔවුන් ඒ ගැන වැඩි සැලකිල්ලක් දක්වා නැහැ. ඒ, මෙවැනි තත්ත්වයක් ඇති වුණේ නැති නිසා. ඒ සමහර ඒවායේ ජනේල නැහැ; සමහර ඒවායේ locks නැහැ. කලුබෝවිල රෝහලේ පවා සමහර කාමර flood වෙනවා. වැහැලා flood වුණාම වෛද්‍යවරයාම තමයි කොස්සකින් වතුර ටික එළියට දමාගෙන නිදා ගන්න ඕනෑ. ඒ, කොළඹ තිබෙන ප්‍රධාන රෝහලක්. හැබැයි ගමේ රෝහල්වල තිබෙන්නේ ඊටත් වඩා බරපතළ තත්ත්වයක්. අපි දැක්කා අද සමාජ මාධ්‍යවල පළ වුණු ප්‍රවෘත්ති. GMOA එක strike කරන්නේ ඇයි කියලා ප්‍රශ්න කරනවා. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය strike කරපු වෙලාවට හැමදාම වාගේ House Officersලා, පළමුවැනි පත්වීම ලබාගෙන වැඩ කරන වෛද්‍යවරු එයට විරුද්ධව තමයි මත පළ කළේ. Registrarsලා හැම දාම වාගේ මත පළ කළේ එයට විරුද්ධවයි. හැබැයි, පළමුවෙනි වතාවට රටේ සමස්ත වෛද්‍ය සේවයේම අය - වෛද්‍යවරුන් සියලුදෙනාම- එකතු වෙලා කියනවා මම දැක්කා, "අපි වැඩ වර්ජනයකට යා යුතුයි" කියලා. මොකද, දැන් වෛද්‍යවරියන්ගේ අම්මලා ඉන්නේ බයෙන්, බිරිඳ වෛද්‍යවරියක් නම් ඇයගේ ස්වාමියා ඉන්නේ බයෙන්. මා හිතන විධියට, අපේ රටේ වෛද්‍ය සේවය ගත්තාම, සියයට 60කට ආසන්න පිරිසක් ඉන්නේ වෛද්‍යවරියන්. සාමාන්‍යයෙන් අපේ රටේ සවස 6න් පසුව වැඩ කරන්නේ ඉතාම සීමිත කාන්තාවන් පිරිසක්. ඒ අය අතරින් එක කණ්ඩායමක් තමයි වෛද්‍යවරියන් කියන්නේ. අද ඒ වෛද්‍යවරියන් මහත් භීතියට පත් වෙලා ඉන්නවා.

ගරු නලින්ද ජයතිස්ස සෞඛ්‍ය අමාත්‍යතුමනි, මෙවර අය වැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් වුණා. ඒක ඉතාම හොඳ දෙයක්. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ අයට ආරක්ෂාව සපයන්න කියලා. එහිදී private security, government security ආදි වශයෙන් දෙන්න පුළුවන් උපරිම ආරක්ෂාව සපයා දෙන්න. ඒ වාගේම, ඒ අය නවාතැන් ගෙන සිටින තැන්වල තිබෙන අඩු පාඩු ටික සම්පූර්ණ කරලා ඒ අයට අවශ්‍ය පහසුකම් වාගේම සුරක්ෂිතභාවය ලබා දෙන්න.

අපේ රටේ අග්‍රාමාත්‍ය ධුරය දරන්නේත් කාන්තාවක්. පාර්ලිමේන්තු ඉතිහාසයේ වැඩිම කාන්තා මන්ත්‍රී නියෝජනය තිබෙන මේ වෙලාවේ මේ ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ. මා හිතනවා, ඔබතුමියට ඒ කටයුත්ත කරන්න පුළුවන් කියලා. පිරිමි අය ඒ සිදුවීම්වලට වග කියන්න ඕනෑ නැහැ කියන එක නොවෙයි මා කියන්නේ, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාත් සභායට ඉන්නවා. මේ වෙලාවේ රට තුළ වෛද්‍යවරුන් කෙරෙහි තිබෙන වෛරය නැති කරන්න, ඒ අය කරන වර්ජනය සාධාරණීකරණය කරන්න මම මේ විධියට කියනවා නොවෙයි. හැබැයි, පැහැදිලි බයක් අද ඒ අයට ඇති වෙලා තිබෙනවා; රාත්‍රී කාලයේ hospital එකට යන්න බයක් ඇති වෙලා තිබෙනවා. වෛද්‍යවරියන්ගේ අම්මලාට දියණිවරුන් ගැන බයක් ඇති වෙලා තිබෙනවා. වෛද්‍යවරියන්ගේ ස්වාමිපුරුෂයන්ට බයක් ඇති වෙලා තිබෙනවා. ඒ අයගේ සහෝදරයන්ට බයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම, වෛද්‍යවරියන්ටත් රෝහල්වලට යන්න බයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේ හමුදාව ඇතුළු සියලු දේ පාවිච්චි කරලා ඒ අයගේ ආරක්ෂාව තහවුරු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.
அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.
Accordingly, Parliament resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් අවශ්‍ය කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. -
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பட்டது. -
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee. -
[THE HON.SPEAKER in the Chair.]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමිය මේ වෙලාවේ මේ ගරු සභාවේ සිටින නිසා මේ කාරණයත් කියන්න ඕනෑ. පාසල්වල උත්සවවලට දේශපාලකයන් ගෙන්වීම තහනම් කියලා ගරු අග්‍රාමාත්‍යතුමිය කියපු බවක් මාධ්‍ය වාර්තා කර තිබෙනවා අපි දැක්කා. මා ළඟ ඒ වාර්තාවකුත් තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලාගේම පාර්ශ්වයේ කෙනෙකු වන අසෝක රන්වල මහත්මයා -හිටපු කථානායකවරයා- අද හේනේගම මධ්‍ය මහා විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උළෙලට සහභාගි වනවා අපි දැක්කා. ගරු අග්‍රාමාත්‍යතුමිය, මා අහන්නේ තවම ඒ නීතිය තිබෙනවාද කියලායි. නැත්නම් විපක්ෂයට විතරක් දමපු නීතියක්ද ඒ තිබෙන්නේ? එහෙම නැත්නම් සියලු දේශපාලනඥයන්ට ද ඒ නීතිය? එහෙමත් නැත්නම් ආණ්ඩුවට නීතියයි, විපක්ෂයට නීතියයි විධියට නීති දෙකක්ද තිබෙන්නේ? අපි ඒ ගැන දැනගන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, නාමල් රාජපක්ෂ මැතිතුමා වී මිල ගණන් කිපයක් ගැන- *[බාධා කිරීමක්]* සහල් මිල ගණන් කිපයක් ගැන කියපු කාරණයක් ගැන නාමල් කරුණාරත්න මහත්මයා - *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු සභාපතිතුමනි, මා කිව්වාය කියන කාරණයක් ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා සඳහන් කළා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියපු එවැනි නීතියක් නැහැ. මම කොහේවත් එවැනි නීතියක් පනවා නැහැ. මම කිව්වේ පාසල් පද්ධතිය දේශපාලනයට පාවිච්චි කරන එකෙන් වැළකී ඉන්න අපි සියලුදෙනා මැදිහත් විය යුතුයි, අපි සියලුදෙනාට ඒ දැපිළිබ වගකීමක් තිබෙනවා කියන එකයි. එහෙම නැතුව කාටවත් ඉස්කෝලවලට යන්න තහනමක් පැනෙව්වේ නැහැ. එහෙම නීතියක් නම් අලුතින් ඇති කළේ නැහැ. ඒ මාධ්‍ය වාර්තාව වැරදියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, කථානායකතුමා ඒ වාගේ දේකට සහභාගි වනවා නම් සහභාගි වෙන්නේ ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා විධියට. දේශපාලන පක්ෂයක නියෝජිතයෙකු විධියට නොවෙයි.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
නැහැ, නැහැ, ඔබතුමා ගැන නොවෙයි මම කිව්වේ. හිටපු කථානායකතුමා ගැන කිව්වේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හිටපු කථානායකතුමා වුණත්, කථානායකතුමා.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
නැහැ, එතුමා දැන් මන්ත්‍රීවරයෙක්. හිටපු කථානායකතුමා දැනට මන්ත්‍රීවරයෙක්. එතුමා දැන් කථානායකවරයා වෙන්නේ නැහැ.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය කියපු දේ අපි නම් ඇහුවා. අපි මේ මාස 5දී ම එවැනි කිසිම උත්සවයකට ගියේ නැහැ. හැබැයි, ඔබතුමන්ලා අවවාදයට- *[බාධා කිරීම්]* ගිහින් තිබෙනවා. ඕනෑ නම් ඒ ගිය ඒවා- *[බාධා කිරීම්]* එහෙම ගිය ඒවාට ඉස්කෝලවලින් ස්තුති කරපු අවස්ථාත් - videos පවා - තිබෙනවා. හැබැයි ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමියලාගේ පක්ෂයෙන්ම ඒ ආදර්ශය පටන් ගත්තොත් හොඳයි.

නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, හාල් කිලෝව රුපියල් 180ට තිබුණා කියලා නාමල් රාජපක්ෂ මහත්මයා කියපු බවක්. මම හිටියේ නැහැ, ඒ වෙලාවේ. මොකද, මැතිවරණය කරන්නයි, පාර්ලිමේන්තු එන්නයි කණ්ඩායම් බෙදිලා තමයි දැන් යන්න වෙන්නේ. ඒක හින්දා මම ඒ වෙලාවේ හිටියේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, පාලන මිල තිබුණේ රුපියල් 220ට, කොහොමද රුපියල් 180ට හාල් දෙන්නේ කියලා. මම හිතන විධියට, පාලන මිල කියන්නේ එකක්. රටේ මිල කියන්නේ තවත් එකක්. පාලන මිල කියන්නේ උපරිම සිල්ලර මිල මිසක්, එවෙලේ තිබෙන මිල නොවෙයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාමත් එක සතියක් විතරක් රුපියල් 190ට වී මිල ඉහළ ගියා. රුපියල් 220 කියන්නේ පාලන මිල. රටේ ජනතාවට රුපියල් 280ටත් හාල් ගන්න සිදු වුණා.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමනි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා එහෙම කිව්වා කියලා මම කිව්වේ නැහැ. එතුමා නොවෙයි කිව්වේ. මම කිව්වේ, රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් එහෙම කිව්වා කියලායි. හාල් කිලෝ එක රුපියල් 170යි කියලා එතුමා කිව්වා. අපි බලය ගන්නකොට නාඩු හාල් කිලෝ එකේ පාලන මිල රුපියල් 220යි කියන කාරණය තමයි මම කිව්වේ. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට අදාළව නොවෙයි මම ඒක කිව්වේ.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම කලින් කිව්වා වාගේ පාලන මිල කියන්නේ එකක්, රටේ මිල කියන්නේ තවත් එකක්. Central Bank එකේ Report එක අරගෙන බැලුවත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ reports අරගෙන බැලුවත්, ඔබතුමන්ලා ආණ්ඩුව ගන්නකොට නාඩු සහල්, රතු සහල් රුපියල් 180ත්, රුපියල් 190ත් අතර තමයි තිබුණේ. ඒ වාගේම ඔබතුමන්ලා බලයට ආවාට පස්සේ මාසයක්, දෙකක් යනකොට, අසාර්ථක පාලනය නිසා සහල් කිලෝව රුපියල් 280ට ගියා.

ගරු සභාපතිතුමනි, මට අද තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මට ඔබතුමන්ලාගේ කථාවලදී කියනවා ඇහුණා, ගිය සැරේ වී මිල රුපියල් 80යි, රුපියල් 90යි. හැබැයි, මේ සැරේ වී කිලෝවක අවම මිල රුපියල් 120ට දැම්මාම, රුපියල් 130ට, රුපියල් 140ටත් වී ගත්තා කියලා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, හැබැයි, මට දැන් ප්‍රශ්නයක් ආවා. රුපියල් 130ට, රුපියල් 140 වී අරගෙන, රුපියල් 220, රුපියල් 230 පාලන මිලට හාල් දෙන්න දෙන්න පුළුවන් නම්, ඔබතුමන්ලා කියපු විධියටම එදා රුපියල් 80ට, රුපියල් 90ට ගත්ත වී ටිකට ජනාධිපතිතුමා ඇයි රුපියල් 10ක් වැඩි කරලා දුන්නේ? රුපියල් 130ට වී අරගෙන පුළුවන් නම් රුපියල් 230ට හාල් දෙන්න,- ඔබතුමන්ලා නාඩු සහල් කිලෝව රුපියල් 230 කළා නේ. ඇයි ඒක වැඩි කළේ? දැන් රුපියල් 40ක් වැඩියෙන් දීලා වී අරගෙන රුපියල් 230ට හාල් විකුණන්නට පුළුවන් නම්, රුපියල් 80කට ගත්ත වීවලට ඇයි රුපියල් 10ක් වැඩි කළේ? සාමාන්‍යයෙන් රටේ ජනතාව දවසකට සහල් කිලෝ ලක්ෂ 65ක් අනුභව කරනවා. එතකොට සාමාන්‍යයෙන් රටේ ජනතාව එක දවසට රුපියල් කෝටි හයහමාරක් පාඩු වෙනවා. එක මාසයකට කෝටි 190 කට වැඩිය පාඩු වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මම අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

මේ මාස තුනට විතරක් රටේ ජනතාවට රුපියල් කෝටි 550කට වැඩිය පාඩු වෙලා තිබෙනවා හාල් මිල රුපියල් 10ක් වැඩි කරපු එකෙන්. මට තේරෙන්නේ නැහැ ඒකට හේතුව මොකක්ද කියලා. ඒ ලාභය කාටද ගියේ? රුපියල් 80ට ගත්ත වීවලට ඇයි රුපියල් 10ක් වැඩි කළේ? රුපියල් 130ට වී අරගෙන රුපියල් 230ට සහල් විකුණන්න පුළුවන් නම්, රුපියල් 80ට ගත්ත වීවලට රුපියල් 10ක් වැඩි කළාම ඒ මිලට විකුණන්න බැරි ඇයි? කාටද ඒ ලාභය ගියේ කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමතියි.

ගරු ඇමතිතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු ඔබතුමන්ලාට සුබ පතනවා, රටේ කෘෂිකර්මාන්තය දියුණු කරන්න කටයුතු කරන්න ලැබේවා කියලා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු කේ.ඩී. ලාල්කාන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.02]

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු සභාපතිතුමනි, මට ලැබී තිබෙන්නේ පොඩි වෙලාවක් නිසා කරුණු කිහිපයක් පමණක් කියන්න ඕනෑ. ඇත්තටම මට ස්තුති කරන්නයි තිබෙන්නේ, ගොඩක් අයට. ඉස්සෙල්ලාම මම ස්තුතිවන්ත වෙනවා, නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාට. මොකද, මේ විවාදයේදී ඉතාම රසවත් කරුණු දැක්වීමක් කරලා මේ විවාදයට ආරම්භයක් ලබා දුන්නාට. ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, ගයන්ත කරුණාතිලක මැතිතුමාත් ඉතාම හරබර කරුණු කාරණා ගණනාවක්ම මේ විවාදයට එකතු කළා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ප්‍රමාණවත් වැදගත් කරුණු ඉදිරිපත් කළාය කියලා මම හිතන්නේ නැහැ. ඒ නිසා හරවත් සාකච්ඡාවක් ගොඩනහන්න විපක්ෂය පැත්තෙන් දායක වුණාය කියන හැඟීමක් මට නැහැ. නමුත් ඒ අයට තිබෙන්න පුළුවන්. ඩී.වී. චානක මන්ත්‍රීතුමා වුණත් හොඳ කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් කළා.

නමුත් සෞඛ්‍ය කාරණා සම්බන්ධයෙන් නම් මට ප්‍රශ්නයක් තිබෙනවා. වෛද්‍යවරු හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිරත අය මීට කලින් ඔය ආරක්ෂාව ගැන කථා කළේ නැහැ නේ. මම නම් අහලා නැහැ. මාත් වෘත්තිය සමිති ව්‍යාපාරයේ ඉඳලා තිබෙනවා. පූර්වයෙන් ඒගොල්ලන්ගේ ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක් මතු කරලා යම්කිසි ආකාරයක කථා බහක් කෙරිච්ච බවක් අපි දන්නේ නැහැ. ඒ නිසා, මෙහෙම සිද්ධියකට රජය ඉතාම වගකීමෙන් මැදිහත් වෙලා තිබෙනකොට මහජනයා අපහසුතාවට පත් වෙන විධියට වැඩ වර්ජන කිරීම මම නම් කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ. ඒක වැරදියි. මොකද, මමත් හොඳ වෘත්තිය සමිති නායකයෙක්. මම කියන්නේ, ඔය වැඩ වර්ජනය දැන් නවත්වන්න, මහජනතාව අපහසුතාවට පත් කරන්නේ නැතුව. ගරු චානක මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඒ කාරණය මතු කරපු එක ගැන බොහොම ස්තුතියි.

මගේ නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනා ඇතුළු ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු ඉතාම හරබර විධියට කරුණු ඉදිරිපත් කළා, මේ විවාදය මැනවින් ඉදිරියට ගෙන යන්න. ඒ ගැන එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමන්ලා, ලේකම්තුමියලා වාගේම, මේ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්, ආයතනවල සභාපතිවරු සහ අධ්‍යක්ෂ මණ්ඩල, කාර්ය මණ්ඩල ලොකු කැප කිරීමක් කරනවා -අපේ අමාත්‍යාංශයේ තිබෙන විශාලත්වයත් එක්ක- මේ අමාත්‍යාංශයේ කටයුතු ඉදිරියට ගෙන යන්න. ඒ කැප කිරීමටත් මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා.

ගොවි ජනතාවට අපිත් එක්ක ලොකු සම්බන්ධයක් තිබෙනවා, දීර්ඝ කාලීනව. අතීතයේ අපි කරපු සටන්, අරගළ එක්ක ගොවි ජනතාවට විශ්වාසයක් තිබෙනවා, ඔවුන්ට මේ රජයෙන් සාධාරණයක් ඉෂ්ට වෙයි කියලා. ඒ සාධාරණය ඉෂ්ට කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. දේශපාලනඥයන් විධියට අපි ඒ මුදල් හරියට කළමනාකරණය කරලා මෙහෙයවන්නත්, ඒ කටයුතු ඵලදායී ලෙස සාර්ථක කර ගන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් අපේ අමාත්‍යාංශයේ නිලධාරි මහත්ම මහත්මීන් ඇතුළු හැම කෙනෙක්ම කාර්යක්ෂමව කටයුතු කරන්න සූදානමින් ඉන්නවා. අපි මේ වෙනකොටත් කථා බහ කරලා ඒ වැඩ කටයුතු සාර්ථක කර ගෙන තිබෙනවා.

ඒ වාගේම මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ පළාත් කෘෂිකර්මාන්තය ගැනත්. අද පළාත් ගැන කථා වුණේම නැහැ. පළාත් සභාව යටතේත් කෘෂිකර්මාන්තයට අදාළ කාර්යභාරයක් තිබෙනවා. දැන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී මේ සම්බන්ධයෙන් වෙන දාට වඩා හොඳට සාකච්ඡා ගොඩ නැඟී තිබෙනවා. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවලට සම්බන්ධ වෙන මන්ත්‍රීවරු, දිසාපතිවරු, අතිරේක නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා මේ වෙනුවෙන් ඉතාම සක්‍රිය දායකත්වයක් සපයමින් මේ ක්ෂේත්‍රය ජයග්‍රහණය කර ගැනීම සඳහා කාර්යක්ෂමව වැඩ කටයුතු කරනවා. අද වෙනකොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පවා මේ කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධයෙන්, මහවැලි කටයුතු සම්බන්ධයෙන්, ඉඩම් සම්බන්ධයෙන්, පශු සම්පත් සම්බන්ධයෙන් සක්‍රියව දායක වෙන බව අපට වාර්තා වෙනවා. පළාතේ ප්‍රධාන ලේකම්තුමන්ලා, ආණ්ඩුකාරතුමන්ලා මේ කටයුතුවලට බොහෝ දායක වන බව අපි මැනවින් දන්නවා.

ඒ වාගේම තමයි ජනමාධ්‍ය ක්ෂේත්‍රයත්. කෘෂිකර්මාන්තයේ තිබෙන සමහර අඩුපාඩුකම් ගැන ඒ අය අපට දැනුම් දෙනවා; වගකීමෙන් කටයුතු කරනවා. ඉතින්, ඒ නිසා මේ වාගේ විශාල මැදිහත් වීමක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග වෙනුවෙන් තිබෙනවා. වාරිමාර්ග කිව්වාම මහවැලිය ගැනත් කියන්න ඕනෑ. කාලයක් මහවැලි සංවර්ධනය වෙනුවෙන්ම පත් කළ තනි ඇමතිවරු හිටියා. වාරිමාර්ග කියපු ගමන් එකවරම මහවැලිය ගැන මතක් වෙන්නේ නැති නිසායි මම මේ වෙනම ම ඒ ගැන මතක් කළේ. මේ සෑම සියලු ක්ෂේත්‍රයකම සියලුදෙනා ඉතාම මැනවින් වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ අනුව ඉදිරි මාස 8 සඳහා අය වැයෙන් වෙන් කර තිබෙන මුදල් කාර්යක්ෂමව සහ වගකීම් සහගතව ඵලදායීව යොදවන බවට මේ රටේ ජනතාවටත්, මේ ගරු සභාවටත් අපි පොරොන්දු වෙනවා.

ඒ වාගේම, මේ කටයුතුවලදී පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය අපට දෙන සහයෝගයත් මේ අවස්ථාවේ මතක් කරනවා.

අවුරුදු 5ක ජන වරමක් තමයි අපට තිබෙන්නේ. අපි අවුරුද්දක, එහෙම නැත්නම් මාස 8ක අය වැයක් ගැන තමයි මේ සාකච්ඡා කරන්නේ. අපි දීපු පොරොන්දු මේ අවුරුදු 5ක කාලය තුළ මුළුමනින්ම සම්පූර්ණ කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙනුවෙන් අපි ඒ දැවැන්ත කැප කිරීම කරනවා.

අපේ කැබිනට් අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම මේ වෙනුවෙන් ලොකු කැපවීමකින් කටයුතු කරන බව මා දන්නවා. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකා වෙනුවෙන් අපි කැබිනට් මණ්ඩලය තුළ හොඳ සංවාද ගොඩනැඟුවා. විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනෑ, ජනාධිපතිතුමාට මෙම විෂයය ගැන පරිණත දැනුමක් තිබෙන බව. අපි වුණත් යම් ප්‍රශ්නයක්, ගැටලුවක් මතු වනකොට එතුමාත් එක්ක සාකච්ඡා කරනවා. එතුමා මීට කලින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්, වාරිමාර්ග අමාත්‍යාංශයේ ඇමති ධුරය දරද්දි සාර්ථක මැදිහත් වීමක් කළා. ඒ කාලයේ මහවැලිය එම අමාත්‍යාංශය යටතේ තිබුණේ නැහැ. එතුමාට මේ සම්බන්ධයෙන් අත්දැකීම් ගොඩක් තිබෙනවා. අපට ඒක -විශේෂයෙන් මට- මේ කාර්යයන් සම්පූර්ණ කර ගැනීමේදී ලොකු උදව්වක් බවට පත් වෙලා තිබෙනවා.

It being past 6.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.32 p.m. until 9.30 a.m. on Friday, 14th March 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

නව පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නිර්මාණය කිරීම: නිර්ණායක
புதிய உள்ளூராட்சி மன்றங்கள் மற்றும் பிரதேச செயலகப் பிரிவுகளைத் தாபித்தல்: அளவுகோல்கள்
CREATION OF NEW LOCAL AUTHORITIES AND DIVISIONAL SECRETARIES' DIVISIONS: CRITERIA ADOPTED

610/2025

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පෙර පැවති පරිපාලනයන් යටතේ, ඇතැම් පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ස්ථාපිත කරන ලද්දේ දේශපාලන අරමුණු මඟින් මෙහෙයවන ලදැයි චෝදනා කෙරෙන ජන වාර්ගික හේතු මත බව දන්නේද;

(ii) නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නිර්මාණය කිරීමේදී වත්මන් රජය අනුගමනය කරනු ලබන නිර්ණායක කවරේද;

(iii) නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නිර්මාණය කිරීමේදී ජන වාර්ගික සංයුතිය නිර්ණායකයක් ලෙස සලකන්නේද;

(iv) පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නිර්මාණය කිරීම ජන වාර්ගික හෝ දේශපාලන කාරණාවලට වඩා ජනගහන ඝනත්වය, භූගෝලීය සාධක සහ පරිපාලන ශක්‍යතාව (නිල ලේඛනවල පරිපාලන භාෂාව ද ඇතුළු) වැනි විෂයබද්ධ නිර්ණායක මත පදනම් වී බව සහතික කිරීමට රජය ගන්නා පියවර මොනවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுநிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முன்னைய நிர்வாகங்களின்கீழ், அரசியல் நோக்கங்களுக்காகச் செயற்படுத்தப்பட்டதாகக் குறிப்பிடப்படும் இனத்துவக் கருதுகோள்களின் அடிப்படையில் சில உள்ளூர் அதிகாரசபைகள் மற்றும் பிரதேச செயலாளர் பிரிவுகள் நிறுவப்பட்டதை அவர் அறிவாரா என்பதையும்;

(ii) புதிய பிரதேச செயலாளர் பிரிவுகளைத் தாபிப்பதில் தற்போதைய அரசாங்கம் பின்பற்றும் தெரிவுடிப்படைகள் யாதென்பதையும்;

(iii) புதிய பிரதேச செயலாளர் பிரிவுகளைத் தாபிப்பதில் இன ஆக்கவமைவு ஒரு தெரிவுடிப் படையாகக் கருதப்படுகின்றதா என்பதையும்;

(iv) உள்ளூர் அதிகாரசபைகள் மற்றும் பிரதேச செயலாளர் பிரிவுகளைத் தாபிப்பதில் இன அல்லது அரசியல் கருதுகோள்களைவிட, சனத்தொகை அடர்த்தி, புவியியற் காரணிகள் மற்றும் நிர்வாகச் சாத்தியவளம் (உத்தியோகபூர்வ பதிவுகளின் நிர்வாக மொழி உள்ளடங்களாக) போன்ற புறநிலைத் தெரிவுப்படையாக அமைவதை உறுதிப்படுத்துவதற்கு அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he is aware that under previous administrations, certain local authorities and Divisional Secretary's Divisions were established based on ethnic considerations, allegedly driven by political objectives;

(ii) the criteria that the current Government would follow in creating new Divisional Secretary's Divisions;

(iii) whether ethnic composition is considered a criterion in the creation of new Divisional Secretaries' Divisions; and

(iv) the steps that the Government is taking to ensure that the creation of local authorities and Divisional Secretaries' Divisions is based on objective criteria such as population density, geographical factors and administrative feasibility (including the administrative language of official records) rather than ethnic or political considerations?

(b) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

(අ) (i) එලෙස අනාවරණය වීමක් සිදු වී නොමැත.

(ii) පෙර පැවති සීමා නිර්ණය කමිටුවලදී ජනගහනය, භූමි ප්‍රමාණය ප්‍රධාන නිර්ණායක ලෙස සලකා බලා ඇති අතර, නාගරික බව හා ග්‍රාමීය බව මෙන්ම භූවිෂමතාව හා පාරිසරික සාධක පිළිබඳව ද සලකා බලා ඇත. මහ ජනතාව විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්, අදහස් හා යෝජනා සම්බන්ධයෙන් හා කාලීන වශයෙන් වැදගත් සාධක පිළිබඳව ද අවධානය යොමු කර වඩාත් සුදුසු නිර්ණායක තෝරා ගැනීම රජයේ අපේක්ෂාවයි.

(iii) ඉහත (ii)හි සඳහන් කරුණු නිර්ණායක වශයෙන් සලකා බැලීමට අපේක්ෂා කරනු ලැබේ.

(iv) නව පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ පවත්නා පළාත් පාලන ආයතන උසස් කිරීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් සකස් කිරීමට සාමාජිකයින් 12දෙනෙකුගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත්කර ඇති අතර, එම විද්වත් කමිටුව විසින් 1999 වර්ෂයේ පළ කරන ලද පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ -1999 අංක 1 දරන සැසි වාර්තාව- නිර්දේශයන් ද සැලකිල්ලට ගනිමින් පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම හා උත්ශ්‍රේණිගත කිරීම සඳහා පහත නිර්ණායක සකස් කර ඉදිරිපත් කර ඇත.

1. ජන සංඛ්‍යාව හා ජන ඝනත්වය
2. නිවාස ප්‍රමාණය හා ඝනත්වය
3. සේවා සම්පාදනය හා යටිතල පහසුකම්වල දියුණුව
4. වාණිජ්‍ය හා කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය
5. සේවා නියුක්තිය
6. යෝජිත ආයතන බල ප්‍රදේශයේ ස්වයං ජනිත ආදායම

ඉහත නිර්ණායක සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට CP/2017/22 හා 2017.07.06 දිනැතිව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා 2017.07.25 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබී ඇති බව අංක අමප/17/1521/744/015 හා 2017.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම මඟින් දන්වා ඇත.

ඒ අනුව පළාත් පාලන ආයතන සංස්ථාපනය හා උත්ශ්‍රේණිගත කිරීමේ කටයුතු ඉහත නිර්ණායක පදනම් කරගෙන සිදු කරනු ලබන අතර, ඒ සඳහා ජන වාර්ගික හෝ දේශපාලන කාරණා අදාළ කර නොගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ) අදාළ නොවේ.

(அ) (i) அவ்வாறான எந்தவொரு வெளிப்படுத்தலும் இடம்பெறவில்லை.

(ii) முன்னர் இருந்த எல்லை நிர்ணயக் குழுக்களில் சனத்தொகை, நில அளவு என்பன முக்கிய அளவுகோல்களாகக் கருதப்பட்டதுடன், நகர்ப்புற மற்றும் கிராமப்புறம், புவியியல் மற்றும் சுற்றுச்சூழல் காரணிகளும் கருத்திற் கொள்ளப்பட்டன. பொதுமக்களால் முன்வைக்கப்பட்ட கோரிக்கைகள், கருத்துகள் மற்றும் முன்மொழிவுகள் சம்பந்தமாகவும் காலத்துக்கேற்ற முக்கிய காரணிகள் சம்பந்தமாகவும் கவனம் செலுத்தி, மிகவும் பொருத்தமான அளவுகோல்களைத் தெரிவுசெய்ய வேண்டும் என்பதே அரசாங்கத்தின் எதிர்பார்ப்பாகும்.

(iii) மேற்படி iiஇல் குறிப்பிடப்பட்டுள்ள காரணிகள் அளவுகோல்களாகக் கருதப்படும் என்று எதிர்பார்க்கப்படுகின்றது.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(iv) புதிய உள்ளூர் அதிகாரசபைகளை அமைத்துருவாக்கல் மற்றும் காணப்படுகின்ற உள்ளூர் அதிகாரசபைகளைத் தரமுயர்த்துவதற்காக அங்கீகரிக்கப்பட்ட முறையியல் ஒன்றைத் தயார்செய்யும் பொருட்டு 12 உறுப்பினர்களைக் கொண்ட கல்விமான்கள் குழுவொன்று நியமனம் செய்யப்பட்டுள்ளதுடன், மேற்படி கல்விமான்கள் குழுவால் 1999ஆம் ஆண்டு வெளியிடப்பட்ட உள்ளூராட்சி மறுசீரமைப்பு பற்றிய விசாரணை ஆணைக்குழுவின் அறிக்கையின் (1999இன் 1ஆம் இலக்க கூட்டறிக்கை) சிபாரிசுகளையும் கவனத் திற்கொண்டு உள்ளூர் அதிகாரசபைகளை அமைத் துருவாக்கல் மற்றும் தரமுயர்த் துவதற்காகப் பின்வரும் அளவுகோள்கள் தயார்செய்யப் பட்டுள்ளன.

1. சனத்தொகை மற்றும் மக்கள் தொகை அடர்த்தி
2. வீடுகளின் எண்ணிக்கை மற்றும் அடர்த்தி
3. சேவை வழங்கல் மற்றும் உட்கட்டமைப்பு வசதிகளின் முன்னேற்றம்
4. வணிக மற்றும் கைத்தொழில் நிறுவனங்கள் வியாபித்துள்ள முறை
5. தொழில்வாய்ப்பு
6. உத்தேச நிறுவன அதிகாரப் பிரதேசத்தின் சுய உருவாக்க வருமானம்

மேலுள்ள அளவுகோள்களுக்கு அமைச்சரவையின் அங்கீகாரத்தைப் பெற்றுக் கொள்வதற்காக CP/2017/22ஆம் இலக்க 2017.07.06ஆம் திகதிய அமைச்சரவை விஞ்ஞாபனம் சமர்ப்பிக்கப்பட்டதுடன், அதற்கு 2017.07.25ஆம் திகதி நடைபெற்ற அமைச்சரவைக் கூட்டத்தில் அங்கீகாரம் கிடைத்துள்ளது என அவி/17/1521/744/015ஆம் இலக்க, 2017.08.02ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானங்களை அறிவிப்புச் செய்வதன்கீழ் அறியத் தரப்பட்டுள்ளது.

அதற்கமைய உள்ளூர் அதிகாரசபைகளை அமைத்துருவாக்கல் மற்றும் தரமுயர்த்தும் நடவடிக்கைகள் மேலுள்ள அளவுகோள்களை அடிப்படையாகக்கொண்டு மேற்கொள்ளப்பட்டு வருவதுடன், அதற்கு இன ரீதியான அல்லது அரசியல் ரீதியான காரணிகள் ஏற்புடையதாக்கிக் கொள்ளப்படுவதில்லை என்பதை தயவுடன் அறியத் தருகின்றேன்.

(ஆ) ஏற்புடையதன்று.

(a) (i) No such disclosure has been made.

(ii) At previous Delimitation Committees, population and area had been the main criteria considered and urbanisam, rurality, topography and environmental factors as well had been considered. It is the expectation of the Government to select the proper criteria by paying attention to the requests, suggestions and proposals of the public and the timely important factors.

(iii) The factors specified under (ii) above are expected to be considered as the criteria.

(iv) An expert committee consisting of 12 members has been appointed to formulate an accepted methodology on establishment of new local authorities and upgrading of existing local authorities and the following criteria have been prepared and presented by the said expert committee for establishment of new local authorities and upgrading of existing local authorities, considering the recommendations of the Report (Session Report No.1 of 1999) of the Commission of Inquiry on Local Government Reforms published in year 1999.

1. Population and density
2. Housing and density
3. Improvement in supply of services and infrastructure facilities
4. Distribution of commercial and industrial factories
5. Employment
6. Self-generating income of the proposed authority area

A Cabinet Memorandum by No. CP/2017/22 dated 06.07.2017 had been submitted for obtaining approval of the Cabinet of Ministers for the above criteria and it had been notified through Notification of Cabinet Decisions No. අමප/17/1521/744/015 dated 02.08.2017 that approval therefor had been received at the meeting of the Cabinet of Ministers held on 25.07.2017.

Accordingly, the activities of establishment and upgrading of local authorities are carried out based on the above criteria and it is kindly informed that neither ethnic nor political matters are made relevant therefor.

(b) Not Relevant.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 318 - இல. 13
Volume 318 - No. 13

2025 මාර්තු 14වන සිකුරාදා
2025 மார்ச் 14, வெள்ளிக்கிழமை
Friday, 14th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 14වන සිකුරාදා
2025 மார்ச் 14, வெள்ளிக்கிழமை
Friday, 14th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 2289]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 2292-2318]

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව:
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2318]

වෛද්‍ය වෘත්තිකයන්ගේ භීෂය හේතුවෙන් මන්නාරම සහ වාවකච්චේරි ප්‍රදේශවල සෞඛ්‍ය සේවාවලට සිදුවන බලපෑම්:
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2324]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [විසිවන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 135, 293, 337 (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම්)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 2325-2449]

ඇල්කඩුව වැවිලි සමාගම:
වාර්ෂික වාර්තා (2012, 2013, 2014, 2015, 2016 හා 2017) [තීරුව 2450]

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව:
වාර්ෂික වාර්තාව (2017) [තීරුව 2450]

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව:
වාර්ෂික වාර්තාව (2018) [තීරුව 2451]

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව:
වාර්ෂික වාර්තාව (2019) [තීරුව 2451]

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව:
වාර්ෂික වාර්තාව (2020) [තීරුව 2451]

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම:
වාර්ෂික වාර්තාව (2020/2021) [තීරුව 2452]

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය:
වාර්ෂික වාර්තාව (2020) [තීරුව 2452]

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය:
වාර්ෂික වාර්තාව (2021) [තීරුව 2453]

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය:
වාර්ෂික වාර්තාව (2022) [තීරුව 2453]

ශ්‍රී ලංකා තේ මණ්ඩලය:
වාර්ෂික වාර්තාව (2022) [තීරුව 2453]

කල්තැබීමේ යෝජනාව:
අර්තාපල් අස්වනු නෙළන සමයේදී අර්තාපල් ආනයනය පාලනය කිරීම [තීරු 2454-2462]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 2289]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2292-2318]

பட்டலந்த வீடமைப்புத் திட்டத்தில் உள்ள சித்திரவதைக் கூடங்கள், சட்டரீதியற்ற தடுப்பு நிலையங்களை நிறுவுதல், பராமரித்தல் ஆகியவற்றை விசாரணை செய்த ஆணைக் குழுவின் அறிக்கை:
போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று [ப: 2318]

மருத்துவ நிபுணர்கள் பற்றாக்குறை காரணமாக மன்னார் மற்றும் சாவக்சேரியில் சுகாதார சேவைகளில் தாக்கம்:
சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று [ப: 2324]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட இருபதாம் நாள்]:
[தலைப்புக்கள் 135, 293, 337 (பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள்)] – குழுவில் ஆராயப்பட்டது [ப: 2325-2449]

எல்கடுவ பெருந்தோட்டக் கம்பெனி:
வருடாந்த அறிக்கைகள் (2012, 2013, 2014, 2015, 2016 மற்றும் 2017) [ப: 2450]

இலங்கை அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம்:
வருடாந்த அறிக்கை (2017) [ப: 2450]

இலங்கை அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம்:
வருடாந்த அறிக்கை (2018) [ப: 2451]

இலங்கை அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம்:
வருடாந்த அறிக்கை (2019) [ப: 2451]

இலங்கை அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம்:
வருடாந்த அறிக்கை (2020) [ப: 2451]

களுபோவிட்டியான தேயிலைத் தொழிற்சாலை கம்பெனி லிமிரெட்:
வருடாந்த அறிக்கை (2020/2021) [ப: 2452]

இலங்கை தேயிலை ஆராய்ச்சி நிறுவனம்:
வருடாந்த அறிக்கை (2020) [ப: 2452]

இலங்கை தேயிலை ஆராய்ச்சி நிறுவனம்:
வருடாந்த அறிக்கை (2021) [ப: 2453]

சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபை:
வருடாந்த அறிக்கை (2022) [ப: 2453]

இலங்கை தேயிலைச் சபை:
வருடாந்த அறிக்கை (2022) [ப: 2453]

ஒத்திவைப்புப் பிரேரணை:
உருளைக்கிழங்கு அறுவடை காலத்தில் அதன் இறக்குமதியைக் கட்டுப்படுத்துதல் [ப: 2454-2462]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Value Added Tax (Amendment) Bill: Petition to the Supreme Court [Col. 2289]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2292-2318]

REPORT OF THE COMMISSION OF INQUIRY INTO THE ESTABLISHMENT AND MAINTENANCE OF PLACES OF UNLAWFUL DETENTION AND TORTURE CHAMBERS AT THE BATALANDA HOUSING SCHEME:
Statement by Minister of Transport, Highways, Ports and Civil Aviation [Col. 2318]

IMPACT ON HEALTHCARE SERVICES IN MANNAR AND CHAVAKACHCHERI DUE TO SHORTAGE OF MEDICAL CONSULTANTS:
Statement by Minister of Health and Mass Media [Col. 2324]

APPROPRIATION BILL, 2025 - [Twentieth Allotted Day]:
Considered in Committee - [Heads 135, 293, 337 (Plantation and Community Infrastructure)] [Cols. 2325-2449]

ELKADUWA PLANTATION LIMITED:
Annual Reports (2012, 2013, 2014, 2015, 2016 and 2017) [Col. 2450]

SRI LANKA STATE PLANTATION CORPORATION:
Annual Report (2017) [Col. 2450]

SRI LANKA STATE PLANTATION CORPORATION:
Annual Report (2018) [Col. 2451]

SRI LANKA STATE PLANTATION CORPORATION:
Annual Report (2019) [Col. 2451]

SRI LANKA STATE PLANTATION CORPORATION:
Annual Report (2020) [Col. 2451]

KALUBOWITIYANA TEA FACTORY LIMITED:
Annual Report (2020/2021) [Col. 2452]

TEA RESEARCH INSTITUTE OF SRI LANKA:
Annual Report (2020) [Col. 2452]

TEA RESEARCH INSTITUTE OF SRI LANKA:
Annual Report (2021) [Col. 2453]

TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY:
Annual Report (2022) [Col. 2453]

SRI LANKA TEA BOARD:
Annual Report (2022) [Col. 2453]

ADJOURNMENT MOTION:
Control of Potato Imports during Potato Harvesting Season [Cols. 2454-2462]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 14වන සිකුරාදා
2025 மார்ச் 14, வெள்ளிக்கிழமை
Friday, 14th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

පාරාළුමන්ත්‍රම் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
VALUE ADDED TAX (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "එකතු කළ අගය මත බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the Buddhist and Pali University of Sri Lanka for the year 2023.

I move that this Report be referred to the Relevant Sectoral Oversight Committee.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බදුල්ල, කයිලගොඩ, ශ්‍රී රතනපාල මාවත, අංක 10 - ඒ දරන ස්ථානයෙහි පදිංචි ජේ.එම්. සේනාධීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පට්ටියගෙදර, කිරින්ද, කොස්ගොල්ල යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්. ගුණසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

Hon. Speaker, I present a petition from Mr. S. K. Kiriella of No. 5/4, Nungamuwa, Pallewela.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, ගම්පහ, මුදුන්ගොඩ, අංක 131/14 දරන ස්ථානයෙහි පදිංචි ටෙරන්ස් ප්‍රියන්ත තිරිමාන්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

ගරු කථානායකතුමනි, මාලබෙ, හෝකන්දර උතුර, කහන්තොට පාර, අංක 259/2 ඊ දරන ස්ථානයෙහි පදිංචි ජේ.කේ.එම්. දර්ශිණී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, පන්නිපිටිය, කලල්ගොඩ පාර, අංක 63/ඊ/1 දරන ස්ථානයෙහි පදිංචි ජී.ජේ. චමල්කා ද සිල්වා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2024.01.01 දින සිට ලබා ගත් IMF ණය: විස්තර
01.01.2024 முதல் IMFஇடமிருந்து பெற்றுக்கொண்ட கடன்கள்: விபரம்
LOANS OBTAINED FROM IMF FROM 01.01.2024: DETAILS

126/2024

1. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024.01.01 දින සිට 2024.09.21 දින දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති මුළු ණය මුදල කොපමණද;

(ii) 2024.09.21 දින සිට මේ දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති මුළු ණය මුදල කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් ණය මුදල ලබා ගන්නා ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය මුදල් ලබා ගන්නා ලද අරමුණ කවරේද;

(v) එම ණය මුදල් සඳහා අය කරනු ලබන පොලී ප්‍රතිශතය කවරේද;

(vi) එම ණය වාරික ආපසු ගෙවීම ආරම්භ කළ යුතු දිනය සහ ගෙවා අවසන් වන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නිති, තිට්ටමිටල් මත්‍රුම් පොරුළාතාර අපිවිරුත්‍රි අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) 2024.01.01ஆம் திகதி தொடக்கம் 2024.09.21 ஆம் திகதி வரை சர்வதேச நாணய நிதியத்திலிருந்து இலங்கை பெற்றுக்கொண்டுள்ள மொத்தக் கடன் தொகை எவ்வளவென்பதையும்;

(ii) 2024.09.21ஆம் திகதி தொடக்கம் தற்போது வரை சர்வதேச நாணய நிதியத்திலிருந்து இலங்கை பெற்றுக்கொண்டுள்ள மொத்தக் கடன் தொகை எவ்வளவென்பதையும்;

(iii) மேற்படி (ii) இல் குறிப்பிடப்பட்டுள்ள கடன் தொகை எத்தனை சந்தர்ப்பங்களில் பெற்றுக் கொள்ளப்பட்டுள்ளது என்பதையும்;

(iv) மேற்படி கடன் தொகைகள் பெறப்பட்டதன் நோக்கம் யாதென்பதையும்;

(v) மேற்படி கடன் தொகைகளுக்காக அறவிடப் படும் வட்டி விகிதம் யாதென்பதையும்;

(vi) மேற்படி கடன் தவணைகளை திருப்பிச் செலுத்த ஆரம்பிக்கவேண்டிய திகதி மற்றும் செலுத்தி முடிக்கப்படவேண்டிய திகதி வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) total amount of loans that Sri Lanka has obtained from the International Monetary Fund during the period from 01.01.2024 to 21.09.2024;

(ii) total amount of loans that Sri Lanka has obtained from the International Monetary Fund during the period from 21.09.2024 to date;

(iii) number of occasions on which the amount of loans referred to in (ii) above were obtained;

(iv) purpose for which the said loans were obtained;

(v) interest rate that is charged on those loans; and

(vi) date on which the repayment of the loan installments of those loans should be commenced and the date on which the loans would be completely paid off, separately?

(b) If not, why?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) තුන්වන වාරිකය - විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) මිලියන 254

(එ.ජ.ඩො. මිලියන 336ක් පමණ) (විනිමය අනුපාතිකය USD: LKR 1:301.952)

(ii) හතරවන වාරිකය - විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) මිලියන 254

(එ.ජ.ඩො. මිලියන 334ක් පමණ) (විනිමය අනුපාතිකය USD: LKR 1:295.347)

(iii) එක් අවස්ථාවකි.

(iv) ශ්‍රී ලංකා ආර්ථිකය තුළ අය වැය හා ගෙවුම් ශේෂය/බාහිර අංශය සම්බන්ධය ප්‍රතිපත්තිමය ගැළපුම් සිදු කිරීමට මෙම ණය ලබා ගන්නා ලදී. එම මුදල රජයේ අය වැය හිඟය පියවීම සඳහා යොදා ගන්නා ලදී.

(v) මෙම ණය මුදල සඳහා අය කරනු ලබන වාර්ෂික පොලී අනුපාතය වෙළෙඳ පොළ සාධක මත තීරණය වන විදේශ ගැනුම් හිමිකම් පොලී අනුපාතය -SDRi- සහ ආන්තිකය - දැනට එම ආන්තිකය පදනම් අංක 60ක් වේ- විදේශ ගැනුම් හිමිකම් පොලී අනුපාතය සතිපතා ගණනය කරනු ලබන අතර එය https://www.imf.org/external/np/fin/data/sdr_ir.aspx වෙතින් ලබා ගත හැක.

2025 වසරේ මාර්තු පළමු සතිය සඳහා විස්තීර්ණ ණය පහසුකමෙහි මූල්‍යන සඳහා ඵලදායී පොලී අනුපාතය 3.143 + 0.6 = 3.743%කි.

2024 වසරේ නොවැම්බර් 01 දිනට පෙර, මෙම ආන්තිකය පදනම් අංක 100ක් ලෙස පැවතුණි. විදේශ ගැනුම් හිමිකම් පොලී අනුපාතය සතිපතා තීරණය වන බැවින් එහි පුරෝකථන ලබා දිය නොහැක.

(vi)

	ගෙවීම් ආරම්භය	ගෙවීම් සම්පූර්ණ කිරීම
තුන්වන වාරිකය	2028 දෙසැම්බර්	2034 මැයි
හතරවන වාරිකය	2029 සැප්තැම්බර්	2035 පෙබරවාරි

(ආ) පැන නොනඟී.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ආර්ථික වර්ධනයට සාපේක්ෂව මුදල් මුද්‍රණය කරන්න ඕනෑ, දළ වශයෙන් සියයට 3ත්, 5ත් අතර ප්‍රමාණයක්. ශ්‍රී ලංකා මහ බැංකු පනත අනුව දැන් මුදල් මුද්‍රණය කිරීම සම්පූර්ණයෙන් තහනම් කර තිබෙනවා, මේ ක්‍රියාදාමයත් එක්ක. දේශීය බැංකු භාණ්ඩාගාර බිල්පත් ගැනීම සඳහා මුදල් යෙදවීම තමයි දැනට කරන්නේ. මේක නතර වුණොත් ඇති වන ප්‍රශ්නය තමයි, පොලී අනුපාතය වැඩිවීමත් එක්ක ඇති වන තත්ත්වය. ඒ අනුව මම අහන්න කැමැතියි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පස්සේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා කොපමණ ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවාද කියලා. ඒ වාගේම අර මම කියපු වර්ධනයට සාපේක්ෂව මුදල් මුද්‍රණය කරන්නේ නැත්නම් ඔබතුමන්ලා ශ්‍රී ලංකා මහ බැංකු පනත සංශෝධනය කරන්න බලාපොරොත්තු වනවාද? එහෙම නැත්නම්, මේ විධියටම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවාද?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

පළමුවෙන්ම මම මේක කියන්න ඕනෑ. පොලී අනුපාතය වැඩි වන බව ඔබතුමා කිව්වා. නමුත්, ඒක නිවැරදි විය යුතුයි, ගරු මන්ත්‍රීතුමා. එහෙම වැඩි වෙන්නේ නැහැ. ඒ වෙනුවට පොලී අනුපාතය,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ආර්ථික වර්ධනය. පොලී අනුපාතය නොවෙයි.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ආර්ථිකය වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය කරන සාධක ගණනාවක් තිබෙනවා. මුදල් සැපයුම එහි එක අංගයක් පමණයි. නිසි ලෙස ආර්ථිකය කළමනාකරණය කර ගැනීම, අවශ්‍ය අංශයන්ට වුවමනා සහාය රජයේ ප්‍රතිපත්ති මඟින් ලබාදීම යනාදී කරුණු ගණනාවකින් තමයි ඒක වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

එහෙම නැතිව, මුදල් සැපයුම මතම පදනම් වෙලා නොවෙයි. නමුත් මේ මුදල් සැපයුම කළමනාකරණය කරන විධිය අනුව ලොකු සහායක් ලැබෙනවා ආර්ථිකයේ වර්ධනයට. ඒ තුළින් තමයි අර මම කිව්වා වාගේ පොලී අනුපාතය අඩු වේගෙන එන්නේ.

ඔබතුමා තව කාරණයක් ඇහුවා, දේශීය වශයෙන් කොපමණ ණය ප්‍රමාණයක් ලබාගෙන තිබෙනවාද කියලා. ඒ ප්‍රමාණය සොයා බලා දැනුවත් කරන්න අවශ්‍යයි, specific number එකක් එතැනට ඕනෑ නිසා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ. මම ඔබතුමාගෙන් ඇහුවේ වර්ධනයට සාපේක්ෂව මුදල් මුද්‍රණය කරනවාද කියලායි. Headphone එක දාගෙන අහගත්තා නම් ලේසියි, ඔබතුමාට. හොඳයි, කමක් නැහැ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලාගේ අය වැය Summary එකේ අය වැය හිඟය රුපියල් බිලියන 2,200ක් දක්වා තිබෙනවා. ඒ වාගේම foreign borrowings දාලා තිබෙනවා රුපියල් බිලියන 700ක්. ඒ වාගේම නැවත ණය ගෙවීම - debt repayment එක - සම්බන්ධව දාලා තිබෙනවා, රුපියල් බිලියන 625ක්. එතකොට ඇත්ත වශයෙන්ම total foreign financing තිබෙන්න ඕනෑ රුපියල් බිලියන 75ක් පමණයි, රුපියල් බිලියන 700න් රුපියල් බිලියන 625ක් අඩු කළාට පස්සේ. නමුත් ඔබතුමන්ලා අය වැය ඇස්තමේන්තුවල දාලා තිබෙනවා රුපියල් බිලියන 375ක්. එහෙම වුණොත් අය වැය හිඟය රුපියල් බිලියන 2,500ක් වෙනවා. මේක numbersවල වැරැද්දක්ද, නැත්නම් ඇත්තම කාරණයද කියලා ඔබතුමාට පොඩ්ඩක් කියන්න පුළුවන් නම් හොඳයි. මොකද, අපට දීලා තිබෙන "Summary of the Budget Estimates, 2025"හි බොහොම පැහැදිලිව මේක තිබෙනවා, ගරු කථානායකතුමනි. මේකේ තිබෙන්නේ වැරදි ඉලක්කමක්ද? කරුණාකරලා මට ඒක කියන්න පුළුවන්ද? ගරු කථානායකතුමනි, මේ රුපියල් බිලියන 375ක් කියලා සඳහන් කර තිබුණාට, total foreign financing තිබෙන්න ඕනෑ රුපියල් බිලියන 75යි. නමුත් මේකට තව රුපියල් බිලියන 300ක් add වෙලා තිබෙනවා. එතකොට රුපියල් බිලියන 300ක් එකතු වීමෙන් සිදු වන්නේ අනිවාර්යයෙන් රුපියල් බිලියන 2,200 ඉඳලා 2,500ට අය වැය හිඟය වැඩි වෙන එකයි.

එතකොට තව රුපියල් බිලියන 300ක වෙනසක් තිබෙනවා. මම අහන්න කැමැතියි, ඔබතුමා මේ සම්බන්ධයෙන් දරන මතය මොකක්ද කියලා. ඒ ගැන ටිකක් පැහැදිලි කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු මන්ත්‍රීතුමනි, අය වැය හිඟය පියවා ගැනීම සඳහා ණය ගැනීම - foreign borrowings - විතරක් නොවෙයි තිබෙන්නේ. ඒකට අවශ්‍ය කරන අරමුදල් විවිධාකාරයෙන් සපයා ගන්නවා. ප්‍රදානවලින් ලැබෙන ප්‍රමාණයන් තිබෙනවා; දේශීය වශයෙන් ආදායම් උපයා ගැනීමේදී ලබා ගන්නා ක්‍රමවේද තිබෙනවා. අමතරව තමයි ණය ලබා ගැනීම තිබෙන්නේ. ඒකත් විදේශීය ණය සහ දේශීය ණය යනාදී වශයෙන්. මේ projection එක තිබෙන්නේ, ඉදිරි කාලසීමාවට දැනට ලබාදී තිබෙන තොරතුරු පදනම් කරගෙනයි. ඒ නිසා දැනට ලබාදී තිබෙන තොරතුරුවලට අනුව මෙහි කිසිම වරදක් නැහැ. නමුත්, implementation stagesවලට යනකොට අවශ්‍ය projects සඳහා වෙන් වන මුදල් ප්‍රමාණය දිහා බැලුවාම, ලබාදෙන ප්‍රමාණය - disbursements - දිහා බලලා ඒක manage කරගන්නට පුළුවන්කම තිබෙනවා. එහෙම ගැටලුවක් Budget එකෙන් කිසිම වෙලාවක මතුවෙලා නැහැ.

සූර්ය සහ සුළං බල උත්පාදනය සම්බන්ධව අදානි සමාගම සමඟ ගිවිසුම: විස්තර
சூரிய மற்றும் காற்றாலை மின் உற்பத்தி தொடர்பில் அதானி நிறுவனத்துடனான ஒப்பந்தம்: விபரம்
AGREEMENT WITH ADANI GROUP ON SOLAR AND WIND POWER GENERATION: DETAILS

155/2024

2. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සුළං විදුලි බලය සහ සූර්ය විදුලි බලය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දියාවේ අදානි සමාගම හෝ එහි උප සමාගමක් සමඟ ගිවිසුමකට එළැඹ තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම ඉදිරිපත් කරන්නේද;

(iii) එම ගිවිසුමේ මූලික අරමුණු කවරේද;

(iv) තරගකාරී ටෙන්ඩර් කැඳවීමකින් තොරව ඉහත සමාගමට ශ්‍රී ලංකාව තුළ විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලද පදනම කවරේද;

(v) ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව "රජයක් සහ රජයක් අතර" (Government to Government) යන අර්ථයට ඉහත සඳහන් සමාගම අයත් නොවන බව පිළිගන්නේද;

(vi) එම ගිවිසුම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වලුසක්ති අමාත්‍යාංශ ලේකම් විසින් කේට්ට විනා:

(අ) (i) ඉලංගෙයිල් කාට්‍රාලෙ මින් සක්තියෙයුම් සූරිය මින් සක්තියෙයුම් අදිකිරිප්පදර්කාග ඉන්දියාවින් අදානි නිරුවනත්තුඩන් අල්ලදු අදන් තුණෙ නිරුවනත්තුඩන් ඉලංගෙ අරසාංගම් උඩන්පඩික්කෙ නිරෙවේට්රි උල්ළදා එන්බදෙයුම්;

(ii) ආමෙනිල්, මේර්පඩි උඩන්පඩික්කෙයෙච් සමර්ප්පිප්පාරා එන්බදෙයුම්;

(iii) අන්ද උඩන්පඩික්කෙයින් අඩිප්පඩෙ නෝක්කංගළ් යාවෙයෙන්බදෙයුම්;

(iv) පෝට්ටිනිලෙ විලෙමනුක් කෝරලින්රි එන්ද අඩිප්පඩෙයිල් මේර්පඩි නිරුවනත්තුක්කු

இலங்கையில் மின்சாரத்தை உற்பத்தி செய்வதற்கான வாய்ப்பு வழங்கப்பட்டது என்பதையும்;

(v) இலங்கை மின்சாரச் சட்டத்துக்கு இணங்க "ஓர் அரசாங்கத்துக்கும் மற்றுமோர் அரசாங்கத்துக்கும் இடையில்" (Government to Government) என்ற வரையறைக்குள் மேற்படி கம்பனி உள்ளடங்காது என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(vi) மேற்படி உடன்படிக்கை குறித்து அரசாங்கத்தின் கொள்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether the Government of Sri Lanka has entered into an agreement with the Adani Group of India or any of its subsidiaries to promote wind power and solar power in Sri Lanka;

(ii) if so, whether the aforesaid agreement will be submitted;

(iii) the primary objectives of the aforesaid agreement;

(iv) the basis on which the aforesaid company was given the opportunity to generate electricity in Sri Lanka without calling for competitive tenders;

(v) whether he admits that the aforesaid company does not fall within the meaning "government to government" as per the Sri Lanka Electricity Act; and

(vi) the policy of the Government regarding the aforesaid agreement?

(b) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) එම අවබෝධතා ගිවිසුම ඇමුණුම 1 ලෙස ඉදිරිපත් කරමි.

(iii) මෙම ගිවිසුමේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකා රජයේ ඉලක්කයක් වන 2030 වසර වන විට බලශක්ති අවශ්‍යතාවෙන් සියයට 70ක් පුනර්ජනනීය ප්‍රභවයන් මඟින් ලබා ගැනීම සඳහා මන්නාරම සහ පුනරින් යන ප්‍රදේශවල මෙගාවොට් 484ක සුළං බලාගාර ව්‍යාපෘතියක්, ඉන්දීය අදානි සමාගමේ ආයෝජනයක් ලෙස මෙරටට ලබා ගැනීමයි. තවද, මෙම ගිවිසුමට සම්බන්ධ පාර්ශ්ව 6ටම අදාළ කාර්යභාරය වෙන වෙනම පැහැදිලි කිරීම මෙම ගිවිසුමේ අරමුණ වේ.

(iv) මේ සඳහා 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතෙහි වගන්ති අංක 43(4)(ඇ)(i) පදනම් වී ඇත. මීට අදාළ අමාත්‍ය මණ්ඩල සන්දේශය සහ අමාත්‍ය මණ්ඩල තීරණය ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

(v) 2023.08.28 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අදානි ග්‍රීන් එනර්ජි ආයතනය ඉදිරිපත් කළ යෝජනාව රජයක් සහ රජය ක්‍රියාත්මක කරන යෝජනාවක් ලෙස පිළිගැනීමට තීරණය කර ඇත. අදාළ අමාත්‍ය මණ්ඩල සන්දේශය සහ අමාත්‍ය මණ්ඩල තීරණය ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

(vi) මෙම ව්‍යාපෘති පිළිබඳව නැවත ඇගයීමක් සිදු කිරීමට 2024.12.30 දින කැබිනට් මණ්ඩලය තීරණය කර ඇත. එමඟින් ව්‍යාපෘති කමිටුවක් සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කිරීමටත්, ඒ හරහා පිළිබිඹු වන රජයේ ස්ථාවරය නීතිපති වෙත දැනුම් දෙන ලෙසටත් දැනුම් දී ඇත. ඒ පිළිබඳව ඇමුණුම 03හි දක්වා ඇත. ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

ව්‍යාපෘතියෙන් ඉවත් වන බවට ඉන්දියාවේ අදානි සමාගම විසින් 2025.02.12 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත දැනුම් දී ඇත. ව්‍යාපෘතිය පිළිබඳව ශ්‍රී ලංකාවේ ආයතන සමඟ කටයුතු කරන ලද්දේ Adani Green Energy SL Limited සමාගම විසිනි. එනිසා ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යෑම පිළිබඳව එම සමාගමේ ස්ථාවරය බලශක්ති අමාත්‍යාංශය විසින් 2025.02.24 දින ලිඛිතව විමසීමක් කර ඇත. එම සමාගම විසින් ඒ සඳහා ලිඛිත ප්‍රතිචාර දක්වා ඇත.

මේ සතියේ අපට එය ලැබී තිබෙනවා. ඒ පිළිබඳව මේ වන විට අධ්‍යයනය කරමින් පවතිනවා.

(ආ) අදාළ නොවේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමා, ඉන්දියානු රජය කියන්නේ, ඉන්දියානු රජය, අදානි සමාගම නොවෙයි. ශ්‍රී ලංකා රජය කියන්නේ, ශ්‍රී ලංකා රජයයි. ජනාධිපතිවරණයේ සහ පාර්ලිමේන්තු මැතිවරණයේ ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල පැහැදිලිව කිව්වා, මේ ගිවිසුම අවලංගු කරනවා කියලා. ඉන්දියාව සමඟ හෝ අදානි සමඟ අපට ගැටලුවක් නැහැ. නමුත්, මෙය තරගකාරී ක්‍රමවේදයකට වුණා නම්, විදුලි ඒකකයක් ඇමෙරිකානු ඩොලර් ශත 826ක් වැනි -දෙගුණයක් පමණ වැඩි- මුදලකට ගන්න සිද්ධ වෙන්නේ නැහැ. මේ ගැන සැකයක් නැතුව පිළිතුරක් දෙන්න ඔබතුමාට පුළුවන්කම තිබෙන්න ඕනෑ. මේක රජය සහ රජය අතර ගිවිසුමක් නොවෙයි; government to government - G2G - නොවෙයි. නමුත්, ඔබතුමා එහෙම සෘජුව කියන්නේ නැහැ. මම දන්නේ නැහැ, ඒකට හේතුව මොකක්ද කියලා.

මම ඔබතුමාගෙන් අහන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපි මාධ්‍යවලින් දැනගත් පරිදි අදානි සමාගම නිවේදනයක් නිකුත් කර තිබුණා, "අපි මේ ව්‍යාපෘතියෙන් ඉවත් වෙනවා" කියලා. ඊට පසුව ඔබතුමා කියා තිබුණා, "නැහැ, තවම මේක අවසන් නැහැ" කියලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

දැන් ඔබතුමා පළමුවෙනි වතාවට කියනවා, අදානි සමාගම ලිඛිත දැනුම් දීමක් කර තිබෙනවා කියලා. අපි දැනගන්න කැමැතියි, ජාතික වැදගත්කමක් ඇති මේ කාරණය පිළිබඳව අදානි සමාගම රජයට එවා තිබෙන ඒ ලිපියේ අන්තර්ගතය මොකක්ද කියලා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මා මීට ප්‍රථම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා මෙම ව්‍යාපෘතිය අවලංගු කර නැහැ කියලා. අමාත්‍ය මණ්ඩලය හරහා 2023.08.28 දින මෙම ගිවිසුම අත්සන් කරන්න ගත් තීරණය තමයි අපි revoke කර තිබෙන්නේ; අවලංගු කර තිබෙන්නේ.

සමාලෝචනයක් කරන්න තමයි අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ කැබිනට් මණ්ඩලය ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ඒ අනුව තමයි කටයුතු කරගෙන යමින් සිටින්නේ. ඒ අතරතුර තමයි එතුමන්ලා - අදානි සමාගම - ආයෝජන මණ්ඩලය වෙත ලිපියක් එවා තිබෙන්නේ, 'අයින් වෙන්න අවශ්‍යයි' කියන එක දන්වමින්. ඒ ඇරෙන්න අපට තවම පැහැදිලි උත්තරයක් නැහැ. ලංකාවේ තිබෙන ඒගොල්ලන්ගේ සමාගම අපට ලියුමක් එවා තිබෙනවා. ඇත්තටම ප්‍රශ්නයක් විධියට විධිමත්ව ඉදිරිපත් කළොත් ඒ ලියුම ඉදිරිපත් කරන්න මට පුළුවන්. අද මම එය ගෙන ආවේ නැහැ, ප්‍රශ්නවලට අදාළ නැති නිසා. අපි එය අධ්‍යයනය කරලා ඉදිරියේදී කටයුතු කරනවා. ඇත්තටම මේක government to government - G2G - කියලා පිළිගෙන තිබෙන්නේ කලින් ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයයි; අපි නොවෙයි. ඒක නිවැරදි කරන්න තමයි අවශ්‍ය කටයුතු කැබිනට් මණ්ඩලය හරහා අප කරගෙන යමින් පවතින්නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, මම බලාපොරොත්තු වෙනවා ඔබතුමා ඒ ලිපිය සභාගත කරයි කියලා. මොකද, එය අදාළ නැති එකක් නොවෙයි; අතිශයින්ම අදාළයි. ඔබතුමාගේ පිළිතුරෙන්මයි එය කියැවුණේ.

ගරු කථානායකතුමනි, මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි. මේ රටේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සඳහා -සුළං විදුලිය වෙන්න පුළුවන්, සූර්ය විදුලිය වෙන්න පුළුවන්- තරගකාරී ටෙන්ඩර් ආරම්භ කරපු කෙනා මමයි. 2015දී විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ විෂයය මට භාර වුණා. මේ රටේ අනාගතය තිබෙන්නේ පුනර්ජනනීය බලශක්තිය මතයි. ඒ වාගේම, හරි මිල සොයා ගන්නත් ඕනෑ. හරි මිල සොයා ගන්න පුළුවන් වන්නේ දේශීය සහ ජාත්‍යන්තර ආයෝජකයන් කැඳවා ගැනීමෙන් පමණයි කියන කාරණයට කවුරුත් එකඟයි කියලායි මා හිතනවා. ඔබතුමාත් එයට එකඟ ඇති, ගරු ඇමතිතුමනි. ප්‍රශ්නය මෙකයි. මන්නාරමේ ව්‍යාපෘති කරන්න පුළුවන් අදානිට පමණක් නොවෙයි. මන්නාරමේ ව්‍යාපෘති කරන්න පුළුවන් ඉන්දියානු ආයෝජකයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඉන්දියාවේ අදානි සහ තවත් සමාගම් අතර ඇති වෙලා තිබෙන හොඳ තරගය නිසා අද ඇමෙරිකානු ඩොලර් ශත 82 නොවෙයි, සාමාන්‍යයෙන් ඇමෙරිකානු ඩොලර් ශත 4ත්, 5ත් අතර ගණනකට ඉන්දියාවේ ඕනෑම සුළං බල ව්‍යාපෘතියක් යනවා. සූර්ය විදුලි බල ව්‍යාපෘතිත් එහෙමයි. මේ කාරණයේදී අපට ඉන්දියාව පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ඉන්දියාව සමඟ සුහදතාවත් ආරක්ෂා කරගෙන, උතුරේ සහ මේ තිබෙන සුළං විදුලි බල උත්පාදන අවස්ථා සහ සූර්ය විදුලිබල උත්පාදන අවස්ථා සම්බන්ධයෙන් තරගකාරී ක්‍රමවේදයකට ඉක්මනින්ම ගිහින්, එම තරගකාරී ක්‍රමවේදය හරහා විදුලිය මිලට ගැනීමේ කටයුතු විනිවිදභාවයෙන් සිදු කළ යුතු වෙනවා. ගරු ඇමතිතුමනි, දේශීය සහ විදේශීය ආයෝජකයන්ට, ඒ වාගේම හවුල් ව්‍යාපාරවලට අවස්ථාව ලැබෙන පරිදි, රට පොහොසත් වන පරිදි මේ කටයුත්ත පටන් ගන්නේ නැත්තේ ඇයි?

අදානි කියන්නේ, මේ ව්‍යාපෘතියට සම්බන්ධ කෙනෙක් විතරයි. හැබැයි, මේ රටේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය වර්ධනය කර විදුලිය නිෂ්පාදනය කිරීමේ අවස්ථා උපරිම ප්‍රමාණයක් ලබා ගන්න ඕනෑ. එය රටේ දියුණුව වෙනුවෙන් අත්‍යවශ්‍ය දෙයක්. එතකොට, මේ කාරණයට ඔබතුමන්ලාගේ රජය ටෙන්ඩර් කැඳවන්නේ නැත්තේ ඇයි? ඇයි, අලුතින් ටෙන්ඩර් කැඳවන්නේ නැත්තේ? අලුතින් ටෙන්ඩර් කැඳවන්න. ඇයි මෙච්චර පරක්කු කරන්නේ? ඔබතුමන්ලා බලයට ඇවිල්ලා දැන් මාස 6ක් වෙනවා. පරණ ටෙන්ඩර්වල මිල ගණන් ගැන තමයි ඔබතුමන්ලා කථා කරන්නේ. මම මේ ගැන කථා කරන්නේ අවංකවම මිසක්, දේශපාලන පක්ෂයක් හෝ වෙනත් කාරණයක් නිසා නොවෙයි. මේ ක්ෂේත්‍රයේ යම් පුරෝගාමී වැඩක් කරලා, බොහොම දුෂ්කරතා යටතේ තරගකාරී ක්‍රමය හඳුන්වා දුන් කෙනෙකු හැටියටයි මම මේ ගැන කථා කරන්නේ. ඇයි, ඔබතුමන්ලා අලුත් ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් කැඳවන්නේ නැත්තේ? ඒ වාගේම මන්නාරමේත් ඉතුරු කොටස් සඳහා, උතුරු පළාත් මුහුදු ආශ්‍රිතව බලශක්ති උත්පාදනයට තිබෙන අවස්ථා සඳහා ඇයි ටෙන්ඩර් කැඳවන්නේ නැත්තේ? ඇයි මේ තරගකාරී ක්‍රියාදාමය පටන් ගන්නේ නැත්තේ? ඇයි සරල ටෙන්ඩර් කාර්යපටිපාටි හඳුන්වා දෙන්නේ නැත්තේ? මෙන්න මේ කාරණාවලට ඔබතුමා පිළිතුරු දෙනවාද?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, පුනර්ජනනීය කිව්වාම සුළං වාගේම සූර්ය බලශක්තියත් අදාළ වෙනවා. අපි සූර්ය බලශක්තියට අදාළ කටයුතු කරගෙන යනවා. මේ සඳහා අනවශ්‍ය විධියට ඉඩම් දීලා තිබෙනවා. ඒ වාගේ පැටලිලි ගොඩක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ අපි කොහොමත් තරගකාරී මිල ගැනුම්වලට තමයි අනිවාර්යයෙන්ම යන්නේ. අපි G2G හැර unsolicited විධියට යන්නේ නැහැ. අපි ඒකට තමයි යන්න ඕනෑ. හැබැයි, එහි තිබෙන පැටලිලි ටික අපි බේරාගන්න ඕනෑ. දැන් ඒකට මාස 3යි දවස් ගණනක් ගිහිල්ලා තිබෙනවා. අපි ඉක්මනින්ම ඒ කටයුත්ත කරනවා. විශේෂයෙන්ම සූර්ය බලශක්ති පැත්ත.

මන්නාරම ගත්තාම, විභවය තිබෙන්නේ සුළං බලශක්තියට. ඒ අධ්‍යයනවලින් තහවුරු කරගෙන තිබෙන්නේ, මෙගාවොට් 400ක්. CEB එකෙන් දැනටමත් ක්‍රියාත්මක වන මෙගාවොට් 103ක බලාගාරයක් අපට තිබෙනවා. තව මෙගාවොට් 50ක ව්‍යාපෘතියක් CEB - Ceylon Electricity Board - එක හරහා ක්‍රියාත්මක වෙන්න නියමිතයි. එතකොට තව මෙගාවොට් 250ක් තමයි අවශ්‍ය. ඒ මෙගාවොට් 250 ආදානි සමාගම හරහා ලබා ගන්නයි තිබෙන්නේ. නමුත් ඒ සම්බන්ධ නඩු තිබෙනවා. එ නිසා අපට නොවෙයි, ඒගොල්ලන්ටවත් ඒ වැඩ ටික කරන්න බැරි වෙයි. මොකද, ඊළඟ නඩු දිනය තිබෙන්නේ මැයි මාසයේ. එම නිසා ඒ කටයුතු ආරම්භ කරන්න ඒගොල්ලන්ටත් බැහැ. ඒ ප්‍රශ්නය විසඳෙන කල් අපටත් බැහැ. ඒ නිසා යම් සීමාවක් ඇති වෙලා තිබෙනවා.

ඊළඟට, මෙම ව්‍යාපෘතිය යටතේ ම පුනරීන්වලත් මෙගාවොට් 234ක සුළං බලශක්ති ව්‍යාපෘතියක් තිබෙනවා. දැනට අදානි සමාගමටම MoU එකක් හරහා ව්‍යාපෘතිය භාර දීලා තිබෙනවා. ශ්‍රී

ලංකා රජය විසින් කරපු දේවල් ම තමයි අපට දැන් විසඳා ගන්න වෙලා තිබෙන්නේ. ඒකට යම් කාලයක් ඕනෑ. අපි ලංකාවේ තිබෙන ආදානි සමාගමට දන්වා තිබෙනවා ඉක්මනින්ම අපට ඒ ගැන දැනුම් දෙන්න කියලා. මොකද, ඒගොල්ලන් ඒක කරන්නේ නැත්නම් අපි ඊළඟ මිල කැඳවුම්වලට ගිහිල්ලා ව්‍යාපෘතිය ඉක්මනින්ම ආරම්භ කරන්න ඕනෑ.

විදුලි ගාස්තු සංශෝධනය: විස්තර
மின் கட்டணத் திருத்தம்: விபரம்
ELECTRICITY TARIFF REVISION: DETAILS

190/2024

3. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) විදුලි ගාස්තු සංශෝධනය කරන බව රජය විසින් විවිධ අවස්ථාවලදී ප්‍රකාශයට පත් කර තිබෙන බව දන්නේද;

(ii) අවසන් වරට විදුලි ගාස්තු සංශෝධනය කරන ලද දිනය කවරේද;

(iii) ඉදිරියේදී විදුලි ගාස්තු සංශෝධනය කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) විදුලි ගාස්තු සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් දීර්ඝ කාලයක් ගනු ලබන බවට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කරනු ලබන ප්‍රකාශය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(v) විදුලි ගාස්තු තවදුරටත් සංශෝධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වලුසක්ති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) மின் கட்டணத்தைத் திருத்துவதாக அரசாங்கம் பல சந்தர்ப்பங்களில் அறிவித்தமை பற்றி அவர் அறிவாரா என்பதையும்;

(ii) இறுதியாக மின் கட்டணம் திருத்தப்பட்ட திகதி யாதென்பதையும்;

(iii) எதிர்காலத்தில் மின் கட்டணம் திருத்தப்படு மாயின், அது தொடர்பிலான விபரங்கள் யாவை என்பதையும்;

(iv) மின் கட்டணத்தைத் திருத்துவதற்கான முன்மொழிவுகளைச் சமர்ப்பிப்பதற்கு இலங்கை மின்சார சபை நீண்ட காலத்தை எடுத்துக் கொள்வதாக இலங்கை பொதுப் பயன்பாடுகள் ஆணைக்குழுவால் தெரிவிக்கப்படுகின்ற கூற்றுத் தொடர்பில் எடுக்கப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) மின் கட்டணத்தை மேலும் திருத்துவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that the Government has announced on various occasions that the electricity tariff would be revised;

(ii) the date on which the electricity tariff was last revised;

(iii) if the electricity tariff is to be revised in the future, the details of the revision;

(iv) the steps that will be taken regarding the statement made by the Public Utilities Commission of Sri Lanka that the Ceylon Electricity Board is taking a long time to submit their proposals for electricity tariff revision; and

(v) the measures that will be taken to further revise the electricity tariff?

(b) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. විදුලි ගාස්තු සංශෝධනයට අදාළ වන අමාත්‍ය මණ්ඩල තීරණ පහත දක්වා ඇත.

රජය විසින් විදුලි කර්මාන්තය සඳහා වූ පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශවල සඳහන් විදුලි අයකුම වගන්ති පහත පරිදි කැබිනට් සන්දේශ මඟින් සංශෝධනය කර ඇත.

- 2023.01.02 දිනැති කැබිනට් පත්‍රිකා අංක 23/0010/621/002 යටතේ ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමා සහ ගරු විදුලි හා බලශක්ති ඇමතිතුමාගේ ඒකාබද්ධ සන්දේශය - සෑම මාස 6කට වරක් විදුලි ගාස්තු සංශෝධනය.
- 2023.10.28 දිනැති කැබිනට් පත්‍රිකා අංක 23/2066/621/092 යටතේ ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමා සහ ගරු විදුලි හා බලශක්ති ඇමතිතුමාගේ ඒකාබද්ධ සන්දේශය - සෑම මාස 3කට වරක් විදුලි ගාස්තු සංශෝධනය.
- 2024.12.05 දිනැති කැබිනට් පත්‍රිකා අංක 24/2155/825/011 යටතේ ගරු බලශක්ති අමාත්‍යතුමාගේ සන්දේශය සඳහා ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ නිරීක්ෂණ. (2024.12.18 දිනැති ලිපි අංක MF/PE/CM/2024/195) - සෑම මාස 3කට වරක් විදුලි ගාස්තු සංශෝධනය ස්ථිර කර ඇත.

(ii) 2025 ජනවාරි 18.

(iii) විදුලි කර්මාන්තය සඳහා වූ වර්තමාන පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ යටතේ සෑම මාස 3කට වරක් විදුලි ගාස්තුව සංශෝධනය කළ යුතුය. ඒ අනුව, ඉදිරි කාර්තුව සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මඟින් අනුමත කරන ලද විදුලි අයකුම ක්‍රමයට - tariff methodology - අනුව විදුලි

[ගරු කුමාර ජයකොඩි මහතා]

අයක්‍රම සංශෝධන යෝජනාව ලංකා විදුලිබල මණ්ඩලය විසින් මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට නියමිතය.

(iv) විදුලි ගාස්තු සංශෝධන යෝජනාවක් සකස් කිරීම සඳහා ප්‍රායෝගිකව යම් කාලයක් අවශ්‍ය වේ. 2025.01.18 දින සිට ක්‍රියාත්මක වන, 2025 ජනවාරි විදුලි ගාස්තු සංශෝධනය, බිල්පත් පද්ධතිය තුළ සම්පූර්ණයෙන් පිළිබිඹුවීමට ආසන්න වශයෙන් මාස එකහමාරක් පමණ අවශ්‍ය වේ. එතෙක්, පාරිභෝගික බිල්පත්වල ගාස්තු අනුපාත දෙකක මිශ්‍රණයක් අඩංගු වේ. සම්පූර්ණයෙන්ම නව සංශෝධිත ගාස්තු ඇතුළත් බිල්පත පාරිභෝගිකයාට ලැබෙන්නේ පෙබරවාරි මස මැද භාගයේ සිටය. නමුත්, අයක්‍රම සංශෝධනය සඳහා සලකනු ලබන්නේ කැලැන්ඩර් මාස වන බැවින් සම්පූර්ණයෙන්ම නව සංශෝධිත ගාස්තු ඇතුළත් කැලැන්ඩර් මාසය වන්නේ මාර්තු මාසයයි. එම නිසා මාර්තු මාසය අවසන් වී අප්‍රේල් මැද භාගය වන විට මෙම විදුලි අයක්‍රම සංශෝධනයේ මුළු බලපෑම පිළිබඳ පුළුල් තක්සේරුවක් කළ හැක. ලංකා විදුලිබල මණ්ඩලය එසේ පුළුල් අධ්‍යයනයකින් අනතුරුව 2025 සඳහා වූ දෙවන විදුලි ගාස්තු සංශෝධන යෝජනාව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

(v) වත්මන් විදුලි ගාස්තුවෙන් ලැබෙන ආදායම ඉන්ධන ලබා ගැනීමේ හැකියාව හා ඒවායේ මිල ගණන්, විදුලි ජනනය කරන බලාගාර ආශ්‍රිත ජලාශවලට ලැබෙන වර්ෂාපතනය හා ජල ධාරිතාව පිළිබඳ පුරෝකථන, බලාගාරවල නඩත්තු කිරීම් හා එකතු කිරීම්, පොලී අනුපාත, ප්‍රක්ෂේපිත ආර්ථික ප්‍රකෘතිය, අපේක්ෂිත බලශක්ති ඉල්ලුම, අනුමත ආදායම සඳහා ගැළපීම් හා රජයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ වැනි සාධක මත පදනම් වීවාට අදාළ ඇස්තමේන්තු ඇතුළත් කරමින්, 2025 සඳහා වූ දෙවන විදුලි ගාස්තු සංශෝධන යෝජනාව ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකසමින් පවතියි.

(ආ) අදාළ නොවේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා පත්වෙන්න කලින් මැතිවරණ වේදිකාවේදී කිව්වේ මොකක්ද? අපේ ජනාධිපතිතුමා කිව්වා තුනෙන් එකකින් විදුලි බිල අඩු කරනවාය කියලා. ඒ අනුව රුපියල් 3,000 විදුලි බිල රුපියල් 2,000 කරනවා කිව්වා. රුපියල් 9,000ක විදුලි බිල රුපියල් 6,000ක් කරනවා කිව්වා. හැබැයි ඒ සූත්‍රයට නොවෙයි දැන් කටයුතු වෙන්නේ. ජනවාරි මාසයේ ඩොලර් 77ට තිබුණු බොරතෙල් බැරලයක මිල දැන් ඩොලර් 67ට අඩුවෙලා තිබෙනවා. අපේ නොරොච්චෝලේ මෙගාවොට් 900ක විදුලි බලාගාරය ක්‍රියාත්මක වෙන්නේ ගල්අඟුරුවලින්. ගිය නොවැම්බර්වල ගල්අඟුරු මෙට්‍රික්ටොන් එක තිබුණේ ඩොලර් 150ට. මාස 6කට ආසන්න කාලයකදි ඒක ඩොලර් 101 දක්වා අඩු වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ මැතිවරණ ව්‍යාපාරයේදී දුන් පොරොන්දුව අනුව ඔබතුමන්ලා ජනතාවට ආදරය කරන ආණ්ඩුවක් නම්, මහජන උපයෝගිතා කොමිසමත් එක්ක එකතු වෙලා ඔබතුමන්ලාට ඊළඟ අවස්ථාවේදී ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න පුළුවන්. ඒ, තුනෙන් එකකින් විදුලි බිල අඩු කරනවාය කියලා දීපු ඔබතුමන්ලාගේ මැතිවරණ පොරොන්දුව එක්ක එය සංසන්දනය කරන්න පුළුවන්. විදුලි බිල සංශෝධනය කරන ඊළඟ අවස්ථාවේදී ඔබතුමන්ලාගේ මැතිවරණ පොරොන්දුවට අනුව මේ සූත්‍රය ගළපන්න කටයුතු කරනවාද කියන එක මම ගරු ඇමතිතුමාගෙන් අහනවා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ඒක එක ප්‍රශ්නයක් වුණාට ඒකේ පොඩි කොටස් තුනක් විතර තිබෙනවා. අපි මැතිවරණ වේදිකාවේදී සියයට 30කින් විදුලි බිල අඩු කරනවා කියලා කිව්වේ වසර තුනක් ඇතුළත. කාර්තුවෙන් කාර්තුවට අඩු වෙනවා, වැඩිවෙනවා වාගේ මට්ටමක් නොවෙයි අපි එතැනින් බලාපොරොත්තු වෙන්නේ. මේක සියයට 30කට පහළ මට්ටමක දිගටම පවත්වාගෙන යන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. මොකද, ආර්ථිකයට සහ ජනතාවට අවශ්‍ය වෙන්නේ ඒකයි.

ඒ වාගේම ඉන්ධන ගැනත් කිව්වා. ඉන්ධනවල මිල පොඩි පොඩි ප්‍රමාණවලින් විවල්‍ය වුණාට අපි පාවිච්චි කරන්නේ පොසිල ඉන්ධනවලින් බොහොම අඩු ප්‍රතිශතයක් නිසා, මේ දිනවල පවතින විදුලි මිලට එහි බලපෑම බොහොම අඩුයි. අනෙක් එක තමයි ගල් අඟුරු. අවුරුද්දකට වතාවක් අවුරුද්දටම අදාළ ගල් අඟුරු තොග සඳහා ටෙන්ඩර් කරනවා. එතකොට අතරමඟ වෙන විවල්‍යයන් අපට අදාළ කර ගන්න අමාරුයි. මොකද, අපි අර මිලට තමයි දිගටම යන්නේ. එහෙම නැති වුණොත්, ගොඩ බෑමේ ප්‍රශ්න වාගේ ගොඩක් ප්‍රශ්න මතු වෙනවා. ඉතින් සීමාවන් තිබෙනවා. ඒ අනුව තමයි කටයුතු කරන්නේ. විදුලි මිල අඩු කිරීම ක්‍රියාත්මක කරන්න තමයි අපි හැම තිස්සේම උත්සාහ කරන්නේ. අවුරුදු තුනක් ඇතුළත ස්ථාවරව, සියයට 30කින් මිල පහළට ගැනීම තමයි අපේ අරමුණ වන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් විශාල සංඛ්‍යාවක් එක්තරා කාලයක මෑන්පවර් සේවකයන් විධියට සිටියා. මෙතැන සිටින අපේ ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාටත් මතක ඇති, මෑන්පවර් සේවකයෝ උද්ඝෝෂණයක් කරපු වෙලාවේ, එදා අපේ ජනාධිපති අපේක්ෂක වශයෙන් සිටි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව මම එතැනට එක්කගෙන ගිහිල්ලා, ඒ උද්ඝෝෂණය වෙලාවේ ඒ අයට පොරොන්දුවක් ලබා දුන්නා. ඒ අනුව 2015 යහ පාලන ආණ්ඩුවේ ප්‍රථම රාජකාරිය එම සේවකයන් ස්ථිර කිරීම බවට පත් කරගෙන අපි එදා ඒ කටයුත්ත කළා. මට ඒ ගැන සතුටුයි. හැබැයි, අපි ඒ අය ස්ථිර කරලා පත්වීම් දෙන උත්සවය පිටිපස්සේ ඉඳගෙන රන්ජන් ජයලාල් මහත්මයා forms පුරවාගෙන ඔබතුමන්ලාගේ වෘත්තීය සමිතිවලට ඒ අය බඳවා ගත්තා. ඒකත් පොඩ්ඩක් සිනිපත් කරන්න ඕනෑ. මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලයේ නැවත සේවක නිහයක් තිබෙන බව අපි දන්නවා. ඉතින්, මේ සේවක නිහය පියවා ගන්න මණ්ඩලය විධියට, ඒ වාගේම අමාත්‍යාංශය විධියට ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඔබතුමන්ලා නැවත මෑන්පවර් සේවකයන් ගන්නවාද? එහෙම නැත්නම් ස්ථිර සේවයට සේවකයන් ගන්නවාද? ඔබතුමන්ලාගේ

විදුලිබල මණ්ඩලයේ තිබෙන සේවක ප්‍රශ්නය විසඳීම සඳහා අනුගමනය කරන ක්‍රමවේදය මොකක්ද කියලා ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි.

ගරු කුමාර ජයකොඩි මහතා
(මාණ්ඩලික කුමාර ජයකොඩි)
(The Hon. Kumara Jayakody)

ඇත්තටම සුළු සේවක හිඟයක් තිබෙනවා. අපි මේ දවස්වල යම් සේවක ප්‍රමාණයක් බඳවා ගන්න අයදුම් පත්‍ර කැඳවලා තිබෙනවා. හැබැයි, ඔබතුමා ඔය කියන පරිදි 2016දී මෑන්පවර් සේවකයන් බඳවා ගත්තාට පසුව Cabinet එකෙන් තීරණයක් අරගෙන තිබෙනවා, නැවත බඳවා ගන්නේ නැහැ, manpower පාවිච්චි කරන්නේ නැහැ කියලා. අපි ඒක ඇත්තටම practice එකක් විධියට ගන්නවා. මොකද, මෙතැන පහළ මට්ටම විතරයි විශාල වෙලා තිබෙන්නේ. පහළ මට්ටමේ සේවක අතිරික්තයක් තිබෙනවා. මටත් define කර ගන්න බැරි සමහර තනතුරු තිබෙනවා. දේශපාලන වුවමනාවටම දැම්මා වාගේ තමයි තේරෙන්නේ. සමහර divisionsවල divisions 4ක් ගත්තොත්, සේවකයින් දෙසිය ගණන් excess ඉන්නවා. ඒගොල්ලන් පහළ මට්ටමේ අය. ඇත්තටම ඉහළ මට්ටමේ technical staff පැත්ත තමයි අඩු වෙලා තිබෙන්නේ. පහළ මට්ටමේ ලොකු අඩුපාඩුවක් නැහැ. ඒ නිසා බාහිරින් පහළ මට්ටමට බඳවා ගන්න අවශ්‍ය නැහැ. ඉහළ මට්ටමේ engineersලා, ESsලා, ඒ මට්ටමේ තමයි අඩුවක් තිබෙන්නේ. අපි මේ දවස්වල අපේ website එක හරහා ඒ පුරප්පාඩුවලට බඳවා ගැනීම සඳහා අයදුම් පත් කැඳවලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකර් අවර්කල්)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -293/2024- (1), ගරු නීතිඥ රවුල් හකීම් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

පාසල්වල පළමු ශ්‍රේණියට සහ රජයේ සහ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සිසුන්: විස්තර

தரம் 1 மற்றும் அரச, தனியார் பல்கலைக்கழகங்களுக்குச் சேர்த்துக்கொள்ளப்பட்ட மாணவர்கள்: விபரம்

STUDENTS ENROLLED TO GRADE ONE AND GOVERNMENT AND PRIVATE UNIVERSITY ENTRANTS: DETAILS

302/2024

5. ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජයේ සහ පෞද්ගලික අංශයේ පාසල්වල පළමුවැනි ශ්‍රේණියට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් වන ආකාරයට පසුගිය වසර පහ තුළ ඇතුළත් කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වසර තුන තුළ අ.පො.ස. (සා/පෙ) සහ අ.පො.ස. (උ/පෙ) විභාග සඳහා පෙනී සිටි සහ සමත් වූ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව සහ පෞද්ගලිකව විභාගයට පෙනී සිටි තැනැත්තන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් සමත්ව රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට වෙන් වෙන් වශයෙන් දන්වන්නේද?

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ එහෙත් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට වරම් නොලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වසර පහ තුළ උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වූ ශිෂ්‍යසංඛ්‍යාව සහ විදේශ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා වාර්ෂික ඇස්තමේන්තුගත වියදම වෙන් වෙන් වශයෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් සහ ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණද;

(iv) පසුගිය වසර පහ තුළ අධ්‍යාපනය සඳහා වන මුළු වෙන්කිරීම් සහ එය දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) வருடாந்தம் அரசாங்க மற்றும் தனியார் பாடசாலைகளில் தரம் 1க்கு அனுமதிக்கப்படும் மாணவர்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) மேலே குறிப்பிடப்பட்ட (i)க்கு அமைவாக கடந்த ஐந்து ஆண்டுகளில் அனுமதிக்கப்பட்ட மாணவர் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) கடந்த மூன்று ஆண்டுகளில் க.பொ.த (சா/த) மற்றும் க.பொ.த (உ/த) பரீட்சைகளுக்குத் தோற்றிய மற்றும் சித்தியடைந்த பாடசாலை மற்றும் தனிப்பட்ட பரீட்சார்த்திகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) மேலே குறிப்பிடப்பட்ட க.பொ.த (உ/த) பரீட்சார்த்திகளில் சித்தியடைந்து அரசாங்கப் பல்கலைக்கழகங்களுக்குத் தகுதிபெற்று அனுமதி கிடைக்கப்பெற்ற மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு வெவ்வேறாக அறிவிப்பாரா?

(ஆ) (i) பல்கலைக்கழக அனுமதிக்காகத் தகுதி பெற்றி ருந்தும் பல்கலைக்கழகங்களுக்கு அனுமதி கிடைக்கப்பெறாத மாணவர்களுக்காக எடுக்கப் பட்ட நடவடிக்கைகள் யாதென் பதையும்;

(ii) இலங்கையிலுள்ள தனியார் பல்கலைக்கழகங் களில் பதிவுசெய்துகொண்ட அத்தகைய மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) உயர் கல்விக்காக வெளிநாடுகளுக்குச் செல்லும் மாணவர்களின் எண்ணிக்கையுடன், கடந்த ஐந்து வருடங்களில் வெளிநாட்டுப் பல்கலைக்

[ගරු රවී කරුණානායක මහතා]

கழகங்களில் கல்விகற்கும் மாணவர்களுக்காக மதிப்பிடப்பட்ட வருடாந்தச் செலவை இலங்கை ரூபாய் மற்றும் ஐக்கிய அமெரிக்க டொலர்களில் யாதென்பதை வெவ்வேறாகவும்;

(iv) கடந்த ஐந்து வருடங்களில் கல்விக்கான மொத்த ஒதுக்கீட்டுத் தொகை மற்றும் மொத்த உள்நாட்டு உற்பத்தியில் அதன் சதவீதம் யாதென்பதை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she separately inform this House the number of -

(i) grade one students admitted annually to government and private schools;

(ii) students admitted as per (i) above over the last five years;

(iii) school and private students who sat for and passed the GCE (O/L) and GCE (A/L) Examinations in the past three years; and

(iv) students who qualified for and gained admission to government universities from the above GCE (A/L) candidates?

(b) Will she also inform this House the -

(i) steps taken with regard to students who qualified for university admission but did not secure entry;

(ii) number of such students who enrolled in private universities in Sri Lanka;

(iii) number of students who went overseas for higher education and annual estimated cost in Sri Lankan Rupees and US Dollars for students studying at foreign universities over the past five years, separately; and

(iv) total allocation for education and its percentage of Gross Domestic Product over the past five years, separately?

(c) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) රජයේ පාසල්වල පළමුවැනි ශ්‍රේණියට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 287,639යි.

පෞද්ගලික අංශයේ පාසල්වල පළමුවැනි ශ්‍රේණියට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 11,153යි. -මෙම සංඛ්‍යාවට ආධාර ලබන හා ආධාර නොලබන පාසල් ඇතුළත් අතර, ජාත්‍යන්තර පාසල් ඇතුළත් නැත.

පිරිවෙන් - වයස 5, 6 - 167යි.

මුළු ඇතුළත් කර ගැනීම් -රජයේ, පෞද්ගලික හා පිරිවෙන්- 298,959යි.

(ii)

වසර	පසුගිය වසර පහ තුළ පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව (රජයේ, පෞද්ගලික හා පිරිවෙන්)
2023	298,959
2022	303,868
2021 (රාජ්‍ය හා පෞද්ගලික පාසල් පමණක්)	315,363
2020 (රාජ්‍ය හා පෞද්ගලික පාසල් පමණක්)	330,571
2019 (රාජ්‍ය හා පෞද්ගලික පාසල් පමණක්)	343,912

(iii) පසුගිය වසර තුන තුළ අපොස (සාමාන්‍ය පෙළ) සහ අපොස (උසස් පෙළ) විභාග සඳහා පෙනී සිටි සහ සමත් වූ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව සහ පෞද්ගලිකව පෙනී සිටි තැනැත්තන් සංඛ්‍යාව.

අපොස (සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය	පාසල් අපේක්ෂකයන්		පෞද්ගලික අපේක්ෂයන්		සමස්ත අපේක්ෂකයන්	
	විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්	සාමාන්‍ය පෙළ සමත් අපේක්ෂකයන්	විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්	සාමාන්‍ය පෙළ සමත් අපේක්ෂකයන්	විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්	සාමාන්‍ය පෙළ සමත් අපේක්ෂකයන්
2023	329,006	245,878	15,213	7,304	344,219	253,182
2022	325,008	238,043	15,315	7,393	340,323	245,436
2021	318,680	234,251	15,235	7,993	333,915	242,244

අපොස (උසස් පෙළ) විභාගය

වර්ෂය	පාසල් අපේක්ෂකයන්		පෞද්ගලික අපේක්ෂයන්		සමස්ත අපේක්ෂකයන්	
	විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්	විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්	විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්	විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්	විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්	විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්
2023	229,057	151,343	40,556	22,101	269,613	173,444
2022	232,797	149,487	31,136	17,451	263,933	166,938
2021	236,035	149,946	36,647	21,551	272,682	171,497

(iv) ඉහත අපොස (උසස් පෙළ) විභාගයෙන් සමත්ව රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව:

වර්ෂය	සමස්ත අපේක්ෂකයන්	
	විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්	විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්
2023	269,613	173,444
2022	263,933	166,938
2021	272,682	171,497

(ආ) (i) 2023/2024 උසස් පෙළ සඳහා සිසුන් 269,613ක් පෙනී සිට ඇති අතර, ඉන් 173,444ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇත. ඉන් සිසුන් 87,776ක් විශ්වවිද්‍යාල සඳහා ඉල්ලුම් කර ඇති අතර ඉන් 42,282ක් රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා තෝරාගෙන ඇත.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ, එහෙත් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට වරම් නොලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් යම් පිරිසක් උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වන අතර, තවත් පිරිසක් බාහිර උපාධි සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට යොමුවන අතර, තවත් පිරිසක් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලින් උපාධිය ලබා ගැනීම සඳහා යොමු වේ. එසේම උසස් තාක්ෂණ ආයතනය, වෘත්තීය අධ්‍යාපන ආයතනය හා විද්‍යාපීඨ වෙත ද තවත් පිරිසක් ඇතුළත් වේ.

ඒ අනුව,

2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 7,500යි.

2023 වර්ෂයේ රජයේ විශ්වවිද්‍යාල සඳහා බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 19,204යි.

2023 වර්ෂයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය යටතේ බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 11,964යි.

2023 වර්ෂයේ තාක්ෂණ විද්‍යායතනය (මොරටුව විශ්වවිද්‍යාලය) බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 772යි.

2023 වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනයෙහි බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 470යි.

2023 වර්ෂයේ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව 49,146යි.

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ දැනට පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතන 28හි 2024 වර්ෂය සඳහා එක් එක් දේශීය උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වී සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ආයතන මඟින් ලබා ගත් දත්ත අනුව 49,146ක් පමණ වේ.

(iii) උසස් අධ්‍යාපනය සඳහා සිසුන් විදේශගත වීම් පෞද්ගලිකව සිදුවන බැවින්, ඒ සඳහා වැය වූ විදේශ විනිමය ගණනය කිරීමට මෙම අමාත්‍යාංශයට හැකියාවක් නොමැත.

නමුත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය මඟින් පසුගිය වසර 5 තුළ උසස් අධ්‍යාපනය සඳහා සිසුන් 511දෙනෙකුට ශිෂ්‍යත්ව ලබා දී ඇති අතර, ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් 7,535ක් වැය කර ඇත. එය ශ්‍රී ලංකා මුදලින් රුපියල් 1,825,011.31කි.

(iv)

වසර	**වෙන් කිරීම් (රුපියල් බිලියන)**	**ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස**
2020	340	2.2
2021	347	2.0
2022	390	1.6
2023	446	1.6
2024 (සත්‍ය)	493	1.6
2025 (ඇස්තමේන්තුගත)	622	1.9

(ඇ) අදාළ නොවේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. මේ පිළිතුරෙන් ඉස්මතු වන කරුණක් තමයි 173,000ක් පමණ උසස් පෙළ විභාගය සමත් වෙලා විශ්වවිද්‍යාලයට යන්න සුදුසුකම් ලබනවාය කියන එක. ඔබතුමා කිව්වා, එයින් 87,000ක් පමණ විශ්වවිද්‍යාල සඳහා ඉල්ලුම් කර තිබෙනවාය කියලා. නමුත්, ඒ 173,000ටම අයිතියක් තිබෙනවා, විශ්වවිද්‍යාලයට යන්න. ඒ අතරින් රජයේ විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නේ 42,000ක් පමණ කියලා තමයි මේ අවස්ථාවේදී ඔබතුමා පෙන්වා දුන්නේ. 2025 වර්ෂයේ අය වැයෙන් ඔබතුමන්ලා මේ විශ්වවිද්‍යාල පද්ධතියට රුපියල් කෝටි 13,500ක් වියදම් කරනවා. ඒක අවුරුදු 4කට බැලුවොත්, එක ළමයෙකුට රුපියල් 613,000ක් තමයි වියදම් වන්නේ. 40,000ක විතර පිරිසක් විදේශ අධ්‍යාපනය සඳහා පිට රට යනවා. ඔවුන්ට අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කරන්න අවුරුදු 3ක් ගත වෙනවා. 120,000ක් පිටින් ඉන්නවා. ගරු අගමැතිතුමියනි, මේ සම්බන්ධයෙන් රුපියල් බිලියන 300ක් -රුපියල් කෝටි 30,000ක් - වියදම් කරන එක මේ අවස්ථාවේදී බැංකු ක්ෂේත්‍ර තුළින් ඔප්පු වෙලාත් තිබෙනවා. මම බොහොම සතුටු වෙනවා, NPP එකේ ඇමතිවරුන්ගේ ළමයිනුත් පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යන එක සම්බන්ධයෙන්. ඒක බොහොම හොඳයි; ඒක කළ යුතුමයි. ඒ සම්බන්ධයෙන් අපට මේ විශ්වවිද්‍යාල පද්ධතිය මීට වඩා දිරිගන්වන්න බැරිද? ඇයි, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැත්තේ? අපේ කාලයේ අපි පොලී රහිත ණය ලබා දීලා, මේක තවත් ප්‍රචලිත කළා.

ඇයි, ඒක කරන්න බැරි වෙන්නේ? මම මේ ඔක්කොම ඒක රාශි කළේ මේ ප්‍රශ්නයේ ඉතාම වැදගත් කරුණු ගණනාවක් තිබෙන නිසායි, ගරු කථානායකතුමනි.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මම කෙටි පැහැදිලි කිරීමක් කරන්නම්. අපේ රටේ විශ්වවිද්‍යාල සඳහා සාමාන්‍යයෙන් අයදුම් කරන සංඛ්‍යාව 87,000ක් විතර වෙනවා. ඒ ප්‍රමාණයෙන් සියයට 65ක් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට තමයි අයදුම් කරන්නේ. මේ රජයේ විශ්වවිද්‍යාලවලට අමතරව UGC එකට සම්බන්ධ නොවන රාජ්‍ය විශ්වවිද්‍යාලත් තිබෙනවා. උදාහරණයක් විධියට, NSBM එක, KDU ආදිය ගන්න පුළුවන්. විශ්වවිද්‍යාලවලට අයදුම් කරන ප්‍රමාණයෙන් සියයට 65ක්ම අධ්‍යාපනය ලබන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලින්. සාමාන්‍යයෙන් පාස් වන ප්‍රමාණය සියයට 50ක් කියලා අපි ගත්තොත්, ඒකෙන් සියයට 70ක් අයදුම් කළොත් එයින් සියයට 65ක්ම රජයේ විශ්වවිද්‍යාලවලින් තමයි අධ්‍යාපනය ලබන්නේ. ඒ ප්‍රමාණය තමයි සාමාන්‍ය සංඛ්‍යාත්මක දත්ත අනුව තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, අපේ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල - non-State universities - 28ක් දැනට තිබෙනවා. ඊළඟට, affiliated universities කියලා කොටසකුත් තිබෙනවා. දැනට අපිට ඒ පිළිබඳ හරියටම සංඛ්‍යා දත්ත නැහැ. නමුත් එවැනි විශ්වවිද්‍යාල 130ක් විතර තමයි තිබෙන්නේ. ලංකාව ගත්තොත්, අනුබද්ධ විශ්වවිද්‍යාලවල - affiliated universitiesවල - මුල් ශාඛාව ගොඩක් වෙලාවට තිබෙන්නේ පිට රටවල; නම ගිය විශ්වවිද්‍යාලවල. අපි cash outflow එකක් ගැන, currency outflow එකක් ගැන කල්පනා කළොත්, ඇත්තටම අනුබද්ධ විශ්වවිද්‍යාලවල වැඩි මුදල් ප්‍රමාණයක් යන්නේ, පිට රටට. එතකොට අපිට ඒක rationalize කරන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ක්‍රමය ප්‍රචලිත කළා නම් ඔය ප්‍රශ්නය වෙන්නේ නැහැ. ඒකයි මම මේ කියන්න හදන්නේ. ඔබතුමා රජයේම කියන්න ඕනෑ නැහැ. ළමයි 173,000ක් පමණ උසස් පෙළ විභාගය සමත් වුණා නම්, ඒ 173,000ටම විශ්වවිද්‍යාලයට යන්න මානව අයිතිවාසිකම් තිබෙනවා. ඇයි, ඒ අවස්ථාව ලබා දෙන්නේ නැත්තේ? මේකට රජය ගාවා ගන්න එපා. පෞද්ගලික අංශයත් බොහොම හොඳට ඒ කටයුතු කරගෙන යනවා. ඒකයි මම මේ කියන්නේ.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, අපි විශ්වවිද්‍යාල පමණක් නොවෙයි, මේ සම්බන්ධයෙන් බලන්නේ. මම කථා කළේ විශ්වවිද්‍යාල ගැන විතරයි. ඊට අමතරව, අපි කියපු වෘත්තීය අධ්‍යාපන ආයතනවලට ලොකු පිරිසක් එනවා. සාමාන්‍යයෙන් 26,000ක් විතර මේ අවස්ථාවේදී SLIATE එකේ ඉගෙන ගන්නවා. 7,500ක් විතර යනවා. අපි මූලික කර ගන්නේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය විතරක් නොවෙයි. මේ මොහොතේ අපි වෘත්තීය අධ්‍යාපනයත් ගෝලීය ප්‍රවණතා එක්ක එකතු කර ගන්නවා නේ. එතකොට වෘත්තීය අධ්‍යාපනය සහ අධ්‍යාපනය සම්බන්ධවත් align කරපු ලොකු ප්‍රමාණයක් තිබෙනවා.

ඔබතුමා කියන තර්කය හරි. නමුත් මෙතැන තිබෙන ගැටලුව ලෙස අවස්ථා අහිමිවීමක් ගැන ඔබතුමා හිතනවා නම්, ඒ අවස්ථා අහිමිවීම ප්‍රමාණාත්මකව අවමයි. ඒ කියන්නේ ශිෂ්‍යයා private university එකක්, රජයේ university එකක්, නැත්නම් වෘත්තීය අධ්‍යාපනයක් තෝරා ගන්නවා කියන එක අවස්ථා අහිමිවීමක් කියලා මතුපිටට පෙනුණාට ඇත්තටම එය අවස්ථා අහිමි වීමක් නොවෙයි.

ඊළඟ කාරණය මේකයි. සාමාන්‍යයෙන් මතයක් හැදෙමින් පවතිනවා, පිට රට විශ්වවිද්‍යාලවලට යන්නේ උපාධි අවශ්‍යතාව නිසා පමණක් කියලා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නැතිව යන අවස්ථාත් තිබෙනවා. අන්න ඒකයි තිබෙන ප්‍රශ්නය.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගොඩක් හේතු මත නේ එහෙම පිට රට විශ්වවිද්‍යාලවලට යන්නේ. අපි කියන්නේ මේකයි. මේක education hub එකක් කළත් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට නේ ළමයි පිට රටින් එන්නේ. ඒ සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය strengthen කරන්න ඕනෑ. Private universitiesවලත් කාර්යභාරයක් තිබෙනවා; role එකක් තිබෙනවා. ඒක අපි පිළිගන්නවා සමහර විෂය ධාරා පෞද්ගලික විශ්වවිද්‍යාලවල විතරයි තිබෙන්නේ, ඒක හරි. නමුත් පොදුවේ ගත්තොත් ඔබතුමා නහන තර්කයට අනුව අවස්ථා හිමියි කියන එකයි මම කියන්නේ. ඒ අවස්ථා ගුණාත්මකව වැඩි කළ යුතුයි කියන අදහස මත තමයි අය වැය ඉදිරිපත් වෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

NCMC එකේ වුණා වාගේ ප්‍රශ්න ඇති නොවෙන විධියට ඔබතුමන්ලා මේ ක්‍රමය භය නැතිව ප්‍රචලිත කරන්න. ඒක තමයි කරන්න අවශ්‍ය වෙන්නේ.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බලන්න, හෙට දින රජ කරන තරුණ තරුණියන් පාර්ලිමේන්තු මහජන ගැලරියේ සිටිනවා. ඔබතුමාගේ උත්තරය තුළින් සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ළමයි සම්බන්ධයෙන් 2023 සංඛ්‍යාලේඛන තමයි ලබා දුන්නේ. නමුත් මම දන්නවා, 2015 අවුරුද්දේදී මම මුදල් ඇමති වශයෙන් ඉන්නකොට පළමුවන ශ්‍රේණියට ළමයි 421,000ක් ඇතුළත් වුණු බව. ඒ ළමයි 421,000ක ප්‍රමාණය අද 279,000කට අඩු වෙලා තිබෙනවා. ඒක භයානක තත්ත්වයක්. ඒ විතරක් නොවෙයි. අපට පාසල් 10,315ක් තිබෙනවා. ගුරුවරුන් 218,000ක් සිටිනවා. හිඟයකුත් තිබෙනවාය කියනවා. මේ විධියට පළමුවන ශ්‍රේණියට ළමයි ඇතුළත් වීම පිළිබඳව පවතින භයානක අඩුවීම ඉදිරියේදී පුරෝකථනය කරන්න ඔබතුමා බලාපොරොත්තු වෙන්නේ කොහොමද? 2015 අවුරුද්දේදී ළමයි 421,000ක් පළමුවන ශ්‍රේණියට ඇතුළු කරලා, අද වනකොට ඒ ප්‍රමාණය 279,000ට අඩු වෙලා තිබෙනවා නම් ඒක භයානක ස්වරූපයක් නොවෙයිද?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, ඔව්. ගැටලුවක් තිබෙනවා. අපේ රටේ පාසල්වල පළමුවන ශ්‍රේණියට දරුවන් ඇතුළත්වීමේ අඩුවීමක් තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් කර තිබෙනවා. මේකට එක හේතුවක් තමයි, demographic changes. ඒ කියන්නේ, ජනගහනය දෙස බලද්දී පැහැදිලිවම birth rate එකේ අඩුවීමක් තිබෙනවා. Birth rate එක අඩුවීමත් එක්ක පාසල්වලට ඇතුළත්වීමේ ප්‍රමාණයේ අඩුවීමක් වෙන්න පුළුවන්. ඊළඟට, ඉතිරි සාධක සම්බන්ධයෙන්, සමාජ සාධක සම්බන්ධයෙන් අපි සෑහෙන්න වැඩ කටයුත්තක් කරනවා. විශේෂයෙන් පාසලට ළමයින් ආකර්ෂණය කර ගන්න අවශ්‍යයි. ඔය කාරණාව තමයි තිබෙන්නේ. විශේෂයෙන්ම අපි අධ්‍යයනය කරමින් පවතිනවා, මේ සම්බන්ධයෙන් තිබෙන හේතූන් මොනවාද කියලා. Birth rate එකේ ලොකු අඩුවීමක් තිබෙනවා; උපත් ප්‍රමාණයේ අඩුවීමක් තිබෙනවා. ඒ වාගේම, අනෙකුත් කාරණා සම්බන්ධයෙනුත් අවධානය යොමු කරමින් තමයි පවතින්නේ. නමුත්, දරුවන් පාසලට ආකර්ෂණය කර ගැනීම විශේෂයෙන්ම අවශ්‍යයි. මොකද, එහෙම නැතිව අපට ළමයා බලෙන් පාසලට ගෙන්වා ගන්න විධියක් නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 37 යටතේ මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, අපි වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන යම් ප්‍රශ්නයක් නොගැළපෙනවා නම්, එම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සුදුසු නැත්නම් ගරු කථානායකතුමා ස්ථාවර නියෝග 37 යටතේ එම ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න අවසර දෙන්නේ නැහැ. අපට තිබෙන ප්‍රශ්නය මෙකයි. අපි ප්‍රශ්න ඉදිරිපත් කරන පිළිවෙළක් තිබෙනවා. ඒ විධියට අපි ප්‍රශ්න ඉදිරිපත් කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 37 යටතේයි මම අවස්ථාව ඉල්ලා සිටින්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 37 යටතේ ඔබතුමා කියන්නේ මොකක්ද?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, අපේ ප්‍රශ්න ඉවත් කරනවා නම් ඉවත් කරන්න බලය තිබෙන්නේ ඔබතුමාටයි. ස්ථාවර නියෝග 37හි තිබෙන්නේ ඒක. ගරු කථානායකතුමාට පුළුවන් නම් ඒක කියවන්න. සාමාන්‍යයෙන් ගත්තොත්, මම ප්‍රශ්න අංක 1 සිට 100ක් දක්වා විතර දීලා තිබෙනවා. හැබැයි ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නවලින්, 1, 2, 3, 4, 5, ... 10 දක්වා වූ ප්‍රශ්න ඇහෙන්නේ නැහැ. නමුත්, ප්‍රශ්න අංක 10න් පස්සේ 12, 13, 14, ප්‍රශ්න ඇහෙනවා. මම පොඩි කාලයක් ගත්තේ සමහර වෙලාවට ප්‍රශ්න ඉදිරිපත් කරලා අමාත්‍යාංශයෙන් පිළිතුර,-*[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන්,-*[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අවසන් කරනකම් ඉන්නකෝ. ප්‍රශ්නය මැදින් අවසන් කරන්න එපා ඔබතුමා. ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා එන්නේ නැතිව, ප්‍රශ්න අංක 12, 13 න්‍යාය පත්‍රයට එනකොට අපි කල්පනා කළා, මාස තුන හතරක් යනකොටවත් මුල් ප්‍රශ්න න්‍යාය පත්‍රයට එයි කියලා. එහෙමත් නැහැ. ඔබතුමා ඒ ප්‍රශ්න ඉවත් කළා කියලා අපට දන්වලාත් නැහැ. අංක 1 සිට 10 දක්වා වූ ප්‍රශ්න ගත්තොත්, පසුගිය කාලය තුළ සිදු වෙච්ච මහා පරිමාණ වංචා ගැන තමයි ඒවායින් මම අසා තිබෙන්නේ; සුදු ලූනු වංචාව, බැදුම්කර වංචාව වැනි දේවල් සම්බන්ධයෙන් තමයි මම ඒ ප්‍රශ්න අසා තිබෙන්නේ. එතකොට, මේ සම්බන්ධයෙන් අපට සැකයක් තිබෙනවා. මොකද, ගිය ආණ්ඩුව තමන්ට අහිතකර දේවල් තිබෙන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ නැහැ. ඒක බලපෑම් කරලාම දැම්මේ නැහැ. මේ ආණ්ඩුව එහෙම වෙන්න බැහැ නේ. මොකද, වංචා දූෂණ පිළිබඳව විශාල ලෙස කථා කරපු අය තමයි මේ ආණ්ඩුවේ ඉන්නේ. හැබැයි මම ඉදිරිපත් කර තිබෙන අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න -මහ බැංකු බැදුම්කර වංචාව, සුදු ලූනු වංචාව ඇතුළු ඒ වංචා ටික සම්බන්ධ ප්‍රශ්න- විතරක් න්‍යාය පත්‍රයට ඇතුළත් වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි ඒ වංචා, දූෂණ පිළිබඳව අහනවා නම්, ඒවා නිසි වේලාවට නිසි කලට න්‍යාය පත්‍රයට එන්නේ

[ගරු චමින්ද විජේසිරි මහතා]

නැත්නම්, ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා අපට පවසන්න ඕනෑ. ඔබතුමා ඒ ප්‍රශ්න ඉවත් කර තිබෙනවා ද, නැද්ද කියලා අපට දැනුම් දෙන්න ඕනෑ. නමුත්, ප්‍රශ්න අංක 12, 13 න්‍යාය පත්‍රයට එනවා. මම අසා තිබෙන සමහර ප්‍රශ්නවලට දැන් මාස 6ක් විතර ගතවෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන බලන්නම්.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
අන්න හරි. දැන් බලන්න පුළුවන්, ගරු කථානායකතුමනි. මම කාරණය කිව්වාට පස්සේ ඔබතුමාට පුළුවන් ඒක බලලා කියන්න. මම භාගෙට කියාගෙන යද්දී ඔබතුමා ඒක බලන්න යන්න එපා. එතකොට වෙන දෙයක් බලයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මුල් ප්‍රශ්න ටික නැහැ කියන නිසා මම අනිවාර්යයෙන් ඒ ගැන හොයා බලනවා. ඔබතුමා ප්‍රශ්නය පටන් ගන්නකොටම මට තේරුණා, මොකක්ද මේ කියන්නේ කියලා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ පහසුව සඳහා මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන Parliamentary Business Committee එකේදී අපි ප්‍රශ්න කළා, මේ ප්‍රශ්න ලැබෙන පිළිවෙළ පිළිබඳව. එතැනදී ඒ නිලධාරීන් කිව්වේ, න්‍යාය පත්‍රයට ඇතුළත් වන්නේ ප්‍රශ්න ලැබෙන පිළිවෙළට කියලායි. දැන් මෙතුමා කියන කාරණය ඊට වඩා වෙනස්. *[බාධා කිරීමක්]* එහෙම තමයි උත්තර දුන්නේ එදා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
හරිම අසාධාරණයි, මේක.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන වටය.

කල්මුනේ, අෂ්රෆ් අනුස්මරණ රෝහල: 2024 වර්ෂයේ ඇති වූ ගංවතුරෙන් සිදු වූ හානිය
கல்முனை, அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலை: 2024 இல் ஏற்பட்ட வெள்ள சேதம்
ASHROFF MEMORIAL HOSPITAL, KALMUNAI: DAMAGE CAUSED BY FLOODS IN 2024

293/2024

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රවුෆ් හකීම් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரஊப் ஹகீம் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rauff Hakeem)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2024 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අධික වැසි නිසා ඇති වූ ජල ගැලීම් හේතුවෙන් කල්මුනේ, අෂ්රෆ් අනුස්මරණ රෝහලේ ශල්‍යාගාර, දැඩි සත්කාර ඒකක, නේවාසික වාට්ටු, බාහිර රෝගී අංශය, සායන, ඖෂධ ගබඩා ඇතුළු රෝහල් පරිශ්‍රය සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වූ බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලේ කටයුතු අකර්මණ්‍ය වූ බවත්;

(iii) රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන රෝහල් පරිශ්‍ර වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යා යුතු බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) එම රෝහල ජලයෙන් යට වීම නිසා සිදු වූ හානිය තක්සේරු කර තිබේද;

(ii) එසේ නම්, එම හානිය කොපමණද;

(iii) එම හානිය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ගනු ලැබූ පියවර කවරේද;

(iv) මින් ඉදිරියට එවැනි තත්ත්වයක් ඇති නොවීමට සහ රෝහල් පරිශ්‍රය වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යෑම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024 நவம்பர் மாதம் இலங்கையில் பெய்த கடும் மழையால் ஏற்பட்ட வெள்ளம் காரணமாக கல்முனை, அஷ்ரப் ஞாபகார்த்த வைத்திய சாலையின் சத்திரசிகிச்சைக் கூடம், தீவிர சிகிச்சைப் பிரிவு, நோயாளர் தங்கும் அறைகள், வெளிநோயாளர் பிரிவு, சாய் சாலைகள், மருந்துக் களஞ்சியங்கள் உட்பட வைத்தியசாலை வளாகம் முற்றாக நீரில் மூழ்கியது என்பதையும்;

(ii) அதன் காரணமாக மேற்படி வைத்தியசாலையின் நடவடிக்கைகள் செயலிழந்தன என்பதையும்;

(iii) நோயாளர்களுக்குச் சிகிச்சையளிக்கும் வைத்திய சாலை வளாகத்தை மேலும் பாதுகாப்பாகப் பேணிவர வேண்டும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி வைத்தியசாலை நீரில் மூழ்கியதன் காரணமாக ஏற்பட்டுள்ள சேதம் மதிப்பீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி சேதம் எவ்வளவு என்ப தையும்;

(iii) மேற்படி சேதத்தை வழமைக்குக் கொண்டு வருவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

(iv) எதிர்காலத்தில் அவ்வாறான நிலைமை ஏற்படா திருப்பதற்கு மற்றும் வைத்தியசாலை வளா கத்தை மேலும் பாதுகாப்பாகப் பேணிவருவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he admit that the -

(i) premises of the Ashroff Memorial Hospital in Kalmunai including its surgical wards, intensive care units, general wards, outpatient departments, clinics, and pharmaceutical warehouses were inundated due to the heavy floods caused by heavy rainfall which occurred in November, 2024 in Sri Lanka;

(ii) hospital became defunct because of that; and

(iii) hospital premises where patients receive treatment must be safeguarded?

(b) Will he inform this House -

(i) whether the losses caused to the hospital by the floods have been assessed;

(ii) if so, the damage concerned;

(iii) the steps taken to restore the damages; and

(iv) the steps that will be taken to prevent such occurrences in the future and safeguard the hospital premises more?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2024 නොවැම්බර් මාසයේ ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් කල්මුනේ, අෂ්රෆ් අනුස්මරණ රෝහලට යාබද ඇළ මාර්ගයේ (ඉරයිවෙල්ලිකන්දම් ඇළ) ජලය පිටාර ගැලීම හේතුවෙන් එම රෝහලෙහි ශල්‍යාගාරය, දැඩි සත්කාර ඒකකය සහ රුධිර කාන්දුකරණ ඒකකය ජලයෙන් යට විය.

(ii) ගංවතුර බැස යන තෙක් රෝහලේ කටයුතුවලට බාධා ඇති විය.

(iii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) රුධිර කාන්දුකරණ යන්ත්‍ර අලුත්වැඩියාව - රු.580,000.00

විදුලිජනක යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු - රු.330,250.00

හානි වූ මුළු මුදල - රු.910,250.00

(iii) * ලංකා විදුලිබල මණ්ඩලයේ සහාය ඇතිව විදුලි සැපයුම කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම.

* රුධිර කාන්දුකරණ යන්ත්‍ර, විදුලි ජනක යන්ත්‍ර සහ අපජල පවිත්‍රාගාරය කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

(iv) * අම්පාර දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති වීම වැළැක්වීම සඳහා රෝහලට යාබද ඉරයිවෙල්ලිකන්දම් ඇළ පිටාර ගැලීම වැළැක්වීමට කල්මුනේ ප්‍රාදේශීය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයාගේ තාක්ෂණික උපදෙස් මත කටයුතු කිරීම.

* විදුලි ජනක යන්ත්‍ර ස්ථාපිත කර ඇති කාමරවල බිම් මට්ටම ඉහළ නැංවීමට පියවර ගැනීම.

* අපජල පවිත්‍රාගාරය වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු බිමල් රත්නායක මහතා.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව : ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

பட்டலந்த வீடமைப்புத் திட்டத்தில் உள்ள சித்திரவதைக் கூடங்கள், சட்டரீதியற்ற தடுப்பு நிலையங்களை நிறுவுதல், பராமரித்தல் ஆகியவற்றை விசாரணை செய்த ஆணைக்குழுவின் அறிக்கை: போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று

REPORT OF THE COMMISSION OF INQUIRY INTO THE ESTABLISHMENT AND MAINTENANCE OF PLACES OF UNLAWFUL DETENTION AND TORTURE CHAMBERS AT THE BATALANDA HOUSING SCHEME: STATEMENT BY MINISTER OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් සැලකිය යුතු සංවාදයක් ඇති වී තිබෙන, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයේ ස්ථාවරය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

- 1977දී හයෙන් පහක බහුතරයක් සහිතව බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව,
- ජනමත විචාරණයකින් තොරවම විධායක ජනාධිපති ක්‍රමය ස්ථාපිත කළ බවත්,
- බලයට පත්වූ 1977 වසරේම ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාවට හා විරුද්ධ දේශපාලන පක්ෂ සාමාජිකයන්ට එරෙහිව දැවැන්ත ප්‍රචණ්ඩත්වයක් මුදාහළ බවත්,
- බලය ලබාගෙන වසරක් ගතවනවාත් සමඟම 1978දී ත්‍රස්තවාදය මර්දනය කිරීමේ පනත් වැනි අති මර්දනකාරී පනත් ගෙනැවිත් ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති ක්‍රියාවට නැගීම ආරම්භ කළ බවත්,
- 1980දී වෘත්තීය අරගළයක් කළ රාජ්‍ය සේවකයන් ලක්ෂයකගේ රැකියා අහෝසි කළ බවත්, 1981දී යාපනයේ පැවැති සංවර්ධන සභා ඡන්දය අමු අමුවේ මංකොල්ල කෑ බවත්,
- එහිම ප්‍රතිඵලයක් ලෙස යාපනය පුස්තකාලයට ගිනි තබා විනාශ කළ බවත්,
- නිසි කලට පැවැත්විය යුතු පාර්ලිමේන්තු මැතිවරණය නොපවත්වා, ජනමත විචාරණයක් නමින් ලංකා ඉතිහාසයේ දූෂිතම මැතිවරණය ලෙස මැතිවරණ නිලධාරීන් විසින්ම වාර්තා කරන ලද ජනමත විචාරණ මංකොල්ලයක් හරහා පාර්ලිමේන්තුවේ බලය පැහැර ගෙන තවත් අවුරුදු හයකට නීති විරෝධීව දිගු කරගත් බවත්,
- මෙරට ප්‍රජාතන්ත්‍රවාදී වෘත්තීය සමිති, ජනමාධ්‍යවේදීන්, ශිෂ්‍ය සංගම්, සාහිත්‍යවේදීන්, ආගමික නායකයන් මර්දනය කරමින් පැමිණ 1983 කළු ජූලියේදී දෙමළ ජනතාවට එරෙහි ජාතිවාදී සංහාරයක් එවකට පැවති ආණ්ඩුවේ නායකත්වයෙන්ම මෙහෙයවා රට දශක තුනක සිවිල් යුද්ධයකට ඇද දැමූ බවත්,
- එවක එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ඇමතිවරුන් විසින්ම සිදු කරන ලද කළු ජූලියම යොදා ගෙන ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු වාමාංශික පක්ෂ කිහිපයක් තහනම් කර ඒවායේ අයිතිවාසිකම් උල්ලංඝනය කර, ජනමත විචාරණ මංකොල්ලයට එරෙහි ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර සහෝදරයා විසින් ගොනු කර තිබුණු පෙත්සම නිෂ්ප්‍රභ වන පරිදි කටයුතු කළ බවත්,
- 1983න් ආරම්භ කරන ලද නීතිවිරෝධී, ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දනකාරී පාලනය ක්‍රමයෙන් රාජ්‍ය ත්‍රස්තවාදය එකම පාලන ක්‍රමය බවට පත් කරගත් මිනිමරු ඒකාධිපති පාලනයක් ලෙස කටයුතු කළ බවත්,

එවකට සිටි පාලකයන් විසින් කෙතරම් තදින් වළලා දමන්නට උත්සාහ කළද, කෙතරම් තදින් ඉතිහාසය විකෘති කර ලියා තිබුණද,

ජනතාව විසින් ජනතාවගේ ඉතිහාසය ලිවීම ආරම්භ කර ඇති යුගයක් පසුගිය සැප්තැම්බර් 21වැනි දායින් පසු උදා වී තිබෙන බව ඔබතුමා ද හොඳින් දන්නා කරුණකි.

එම ඒකාධිපති භීෂණකාරී 1987-1990 සිවිල් යුද වකවානුවේ එම ආණ්ඩුවේ මැදිහත්වීමෙන් කරන ලද දහසකුත් එකක් අපරාධ අතරින් බටලන්දේ පවත්වා ගෙන යන ලද මහ පරිමාණ ඝාතකාගාරයක් පිළිබඳව සිදු කරන ලද ජනාධිපති කොමිෂන් වාර්තාව පිළිබඳව මේ වනවිට ජාතික හා ජාත්‍යන්තර උනන්දුවක් ඇති වී තිබේ.

ගරු කථානායකතුමනි, 1977 සිට 1994 දක්වා පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පරාජයට පත් කර 1994දී සිදු වූ ආණ්ඩු පෙරළියේ සාරය වූයේම මෙම නීති විරෝධී ප්‍රජාතන්ත්‍ර විරෝධී, ඒකාධිපති භීෂණකාරී පාලනය බිඳ දමා, එම දාහත් වසරක ඝාපයට එරෙහිව යළි ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමයි. එම දාහත් වසරක අඳුරු යුගය තුළ රාජ්‍ය ත්‍රස්තවාදය විසින් මරා දමන ලද දස-දහස් ගණන් ජනතාවට යුක්තිය ඉටු කිරීමයි.

සූරියකන්ද වැනි සමූහ මිනී වළවල් පිළිබඳවද, බටලන්ද ආදී වධකාගාර පිළිබඳවද එවකට සිටි නායකයන් ඒ ස්ථානවලටම ගොස් හෙළිදරව් කිරීමේදී ජනතාව බලාපොරොත්තු වූයේ එම යුක්තිය ඉටු කර ගැනීමයි. තම ආදරණීයයන්ට සිදු වූයේ කුමක්ද යන්න දැන ගැනීමයි. එම ඝාතකයන් නීතිය හමුවට පැමිණවීමයි. එම කෲර, පාදඩ දේශපාලන සංස්කෘතිය සදහටම අවසන් කිරීමයි.

ඒ අනුව 1995 සැප්තැම්බර් මස 21වන දින, 1948 අංක 14 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2වන වගන්තිය ප්‍රකාරවද, නැවතත් 1995 දෙසැම්බර් මස 15වන දින නව අධිකාරී පත්‍රයක් මඟින්ද, 1995 දෙසැම්බර් මස 19වන දින අංක 902/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින්ද මෙම, "බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වා ගෙන යාම පිළිබඳ පර්යේෂණ කොමිෂන් සභාව" එවකට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියගේ නියෝගයකින් ස්ථාපිත කෙරුණි.

කොමිසමේ කාලසීමාව වරින් වර දීර්ඝ කිරීමෙන් පසුව එහි අවසන් වාර්තාව 1998 මැයි මස 21වන දා එම කොමිෂන් සභාවේ ලේකම් ජී.කේ.ජී. පෙරේරා මහතා විසින් ජනාධිපති ලේකම්වරයා අමතා යවා තිබෙන මෙම ලිපියෙන් සනාථ වෙයි.

උපුටා ගැනීම:

"ජනාධිපති ලේකම්,

බටලන්ද ජනාධිපති පර්යේෂණ කොමිෂන් සභාවට අදාළ ලිපි ගොනු හා ලේඛන යනාදිය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට භාරදීම.

මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පිටපතක් ද ඇතුළුව අදාළ ලිපිගොනු හා ලේඛන යනාදිය 1998 මැයි මස 20 වන දින ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත මවිසින් භාර දෙන ලදි.

එම භාර දීමේ ලැයිස්තුවේ පිටපතක් හා franchise පෝරමයේ පිටපතක් ද අවශ්‍ය කටයුතු කිරීම සඳහා මේ සමඟ එවා ඇති බව කරුණාවෙන් දන්වමි.

ජී.කේ.ජී. පෙරේරා,

ලේකම්, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව"

ගරු කථානායකතුමනි, මෙම වාර්තාව ද, එයට පදනම් වූ පිටු දහස් ගණනක සාක්ෂි සටහන් ද වැඩිපුර සමන්විත වී තිබෙන්නේ, මෙම වධකාගාර තුළ අනන්ත වද වේදනා විඳි, එමෙන්ම තමා සාක්ෂි දෙන මොහොතේදී පවා එම වධකයන් බලවත් තනතුරුවල විරාජමානව සිටියදීත්, ඔවුන්ගේ පන්ති මිතුරන් පැහැදිලිවම එකී වධකයන් රකිමින් සිටියදීත්, දහස් ගණන් පුද්ගලයන් ජීවිත අනතුරු සහිතව සිටිය ද එම ජීවිත අනතුරු නොසලකමින් මෙම කොමිසමට පැමිණ සාක්ෂි දීමට ඉදිරිපත් වූ නිසා බව ඔබතුමා හොඳින් දනී. එමෙන්ම තම පියා, පුතා, සහෝදරයා, සහෝදරිය සාහසික ලෙස පැහැරගෙන ගොස් දෙතිස් වද දී ඝාතනය කිරීමේ වේදනාව හදවත පතුලේ රඳවාගෙන, එය සඳහටම අමතක කිරීමේ අමාරු උත්සාහයක සිටි මනෝරානී සරවනමුත්තු ඇතුළු දහස්ගණන් අම්මාවරුන්, පියවරුන්, දූ දරුවන්, පෙම්වතුන්, පෙම්වතියන්, සොයුරු සොයුරියන් එම තුවාල නැවත නැවතත් පාරා ගනිමින්, මෙම කොමිෂන් සභා ඉදිරියට පැමිණ ක්ලාන්ත වී වැටෙමින් මෙම කොමිසම් මඟින් තම ආදරණීයයන්ට යුක්තිය ඉටු වෙය යන විශ්වාසයෙන් යුතුව සාක්ෂි දුන් නිසා බව ඔබතුමා පිළිගනු ඇතැයි මම සිතමි.

ඒ අනුව, බටලන්ද කොමිෂන් සභාවේ අවසන් වාර්තාව 1998 මැයි මස 22වන දිනට පෙර දිනක එවකට ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියට කොමිෂන් සභාව මඟින් භාර දී තිබිය යුතු බව පැහැදිලි වේ. එසේ වුවද, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට පවා පිටපතක් යවා ඇති මෙම වාර්තාවේ පිටපතක් ඇය විසින් නීතිපතිවරයාට යොමු නොකළ හේතුව එවකට අපැහැදිලි වුවත් අද අහස සේ පැහැදිලිය.

එමෙන්ම, වර්ෂ 2000 මාර්තු මස 16වන දින රජයේ මුද්‍රණාලයාධිපති අමතමින් ජනාධිපති අතිරේක ලේකම් ඩබ්ලිව්.ජේ.එස්. කරුණාරත්න මහතා විසින් ම යවන ලද ලිපියකින් පැහැදිලි වන්නේ කුමක්ද?

උපුටා ගැනීම:

"අතිගරු ජනාධිපතිතුමියගේ උපදෙස් පරිදි වාර්තාවේ සිංහල හා දෙමළ පරිවර්තන සැසි වාර්තාවක් ලෙස මුද්‍රණය කර ප්‍රසිද්ධ කිරීම සඳහා මේ සමඟ එවමි. සිංහල හා දමිළ පරිවර්තන අඩංගු diskettes දෙක බැගින් හතරක් ඔබ වෙත එවා ඇත. වාර්තා මුද්‍රණය කර සිංහල පිටපත් පන්සියයක් සහ දෙමළ පිටපත් 250ක් මාර්තු 27 දිනට ප්‍රථම මා වෙත එවන ලෙස කාරුණිකව දන්වමි."

ගරු කථානායකතුමනි, නමුත් පුදුමයක මහත වන්නේ, එම මුද්‍රිත වාර්තා 750න් එකක් හෝ නීතිපතිවරයාට යොමු කර නොමැති වීම ය.

එම නිසා මෙම වාර්තාව කැඳවූ අයම එමඟින් නිර්දේශිත සැබෑ අපරාධකරුවන්ට දඬුවම් දීම හෝ එහි සඳහන් වැදගත් නිර්දේශ ක්‍රියාත්මක නොකර එය මැතිවරණවලදී දේශපාලන පන්දුවක් ලෙස යොදා ගත් බව පැහැදිලි ය.

එමෙන්ම කොමිසමේ ප්‍රධාන චූදිතයාම මැතකදී අල් ජසීරාවට ප්‍රකාශ කළ පරිදි එය පාර්ලිමේන්තුවට හෝ ඉදිරිපත් කර නොමැත.

ගරු කථානායකතුමනි, ජීවිත අනතුරු දරා ගනිමින්, හදවතේ ගැඹුරුම තැන්වල පිහිටි තුවාල නැවත නැවතත් පාරා ගනිමින් සාක්ෂි දීමට පැමිණි දසදහස් ගණන් මිනිසුන්ගේ සහ ගැහැනුන්ගේ අතිශය සාධාරණ අභිලාෂයන් සහ ගැඹුරුතම මානුෂීය හැඟීම් පාවා දෙන ලද්දේත්, මරා දමන ලද්දේත් එපරිද්දෙනි.

ගරු කථානායකතුමනි, 1990 සිට වසර 35ක් ද, කොමිෂන් සභාව අරඹා වසර තිහක් ද, කොමිෂන් සභාවේ වාර්තා නිකුත් කර වසර විසිපහක් ද ගත වී ඇති මොහොතක මාගේ පක්ෂය සහ කැබිනට් මණ්ඩලය විසින් මා වෙත පරපුරක හෘදය සාක්ෂිය කැටි වී ඇති මෙම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, එය ජනගත කිරීමටත් වගකීම පවරා ඇත.

අරගළ කළ පරපුරක කඳුළුත්, ඔවුන් විඳි මහ පොළොව නුහුලන වද වේදනාවල ප්‍රමාණය හා සසඳද්දී ඒවාට අලගු තැබීමටවත් මෙම පිටු දෙසියඅටකින් යුත් වාර්තාවට නොහැකි වන බව අපි දනිමු. මෙම වාර්තාව මරා දමන ලද යෞවනයන්ගේ හා ඔවුන්ගේ ආදරණීයයන්ගේ වද වේදනාවන්ගෙන් හා සුසුම්වලින් අංශුමාත්‍රයක් නියෝජනය කරන වාර්තාවක් වුවද, එය හැකි තරම් සාධාරණව සකස් කිරීමට දායක වූ කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන් හා එයට සහයෝගය දුන් සියලුදෙනාට ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමු.

එමෙන්ම ඉතිහාසයේ පොදු ජනතාවට එරෙහිව අපරාධ කළ අයම එම පොදු ජනතාව මර්දනයෙන්, ධනයෙන් හා බලයෙන් යට කොට තිස්පස් වසරක්ම තම අපරාධ රකිමින්, තමන්ට නීතියේ රැහැනින් ගැලවී යෑමට හැකි වන පරිද්දෙන් සියලු දේ සකස් කර ක්‍රියාත්මක කර තිබුණි. එහෙත්, 2024 සැප්තැම්බර් 21වන දා සියවස් ගණනක් මෙරට පොදු ජනයා දුටු සිහිනය සැබෑ වීමත් සමඟ ජනාධිපති ලේකම් කාර්යාලයේ අඳුරු ගබඩාවක සැඟවී තිබූ මෙම වාර්තාව වසර 25කට පසු අද හිරු එළිය දැක තිබේ.

අපගේ මාතෘ භූමියේ ආධ්‍යාත්මයේ ගැඹුරුම තැන්වල තැන්පත්ව ඇති, සියවස් ගණනක් මෙරට පොදු ජනයා දුටු සිහිනය සැබෑ කිරීමේ අරමුණ දිනවීම වෙනුවෙන් මරණය වැළඳගත් විජයදාස ලියනආරච්චි සහෝදරයා ඇතුළු පරම්පරාවක දුක්, වේදනා සහ ඔවුන්ගේ අරගළය පිළිබඳ මහත් බරකින් යුත් මෙම වාර්තාව මම දැන් පාර්ලිමේන්තුවේ **සභාගත*** කරමි.

ගරු කථානායකතුමනි, දකුණු ඇමෙරිකාවේ අන්දීස් ප්‍රදේශයේ අධිරාජ්‍ය විරෝධී ජාතික විමුක්ති ව්‍යාපාරයේ නායකයෙකු වූ Túpac Amaru සිය නිස ගසන ගහලයන් ඉදිරියේ ප්‍රකාශ කළ පරිදිම, "I will return and I will be millions!" ; "මම නැවත එමි. ඒ මා වැනි මිලියන ගණනක් සමඟිනි."

එම අවංක හා ප්‍රතිපත්තිගරුක මිනිසුන් හා ගැහැනුන් මරා දමා හරියටම පරම්පරාවකට පසු මිලියන ගණනක් ශ්‍රී ලාංකිකයන් එක් වී අපගේ අතීත පරම්පරාව ආරම්භ කළ සටනේ පළමු අදියර ජයග්‍රහණය කර ඇති නිසාවෙන්ම අද මෙරට ජනතාවටත්, ලොවටමත් දැන ගැනීමට හැකි වන පරිදි මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබී තිබේ.

ගරු කථානායකතුමනි, මෙම වාර්තාව මාතෘ භූමියේ අයිතිය පැහැර ගත්, මව් බිමේ හිස ගැසීමට උත්සාහ කළ ගහලයන් පිළිබඳ, ඔවුන්ගේ කෲරත්වය පිළිබඳ වාර්තාවක් පමණක්ම නොවෙයි. මෙම වාර්තාව තම දේශපාලන වුවමනාව වෙනුවෙන් රටක් යුග ගණනාවක් මුළුල්ලේ විනාශ කරන ලද්දේ කෙසේද යන්නත්, ඒ විනාශය හෙළිදරව් කිරීමට ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ලැබුණු ජනවරමක් තම පන්ති මිතුරන් වෙනුවෙන් පාවා දෙන්නේ කෙසේද යන්නත් පිළිබඳ ජීවමාන සාක්ෂියක් ද වෙයි.

එමෙන්ම විසිපස් වසරක් හිරු එළිය පවා නොවැටෙන ගබඩාවක තිබූ වාර්තාවකට නීතියේ හා යුක්තියේ ආලෝකය ලැබීම තුළින් එම වාර්තාවේ නිර්දේශයන්ට සාධාරණත්වය ඉටු කරන්නේ කෙසේද යන්න පිළිබඳව අනාගත පරම්පරාවන්ට සාක්ෂියක් ද වනු ඇතැයි මම උදක්ම විශ්වාස කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, 1989දී රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු දසදහස් ගණන් සහෝදර සහෝදරියන්, හිතවතුන් ඝාතනය කිරීමෙන් පසු මගේ මනසේ හා හදවතේ තැන්පත් වූ විශාල ගල් පර්වතයක් තරම් වූ බරක් තිබේ. එය මාගේ පමණක් නොව, අප පක්ෂයේ ලක්ෂ සංඛ්‍යාත සාමාජිකයන්ගේ, හිතවතුන්ගේ පමණක් නොව, ඉතිහාසයේ නිවැරදි පැත්තේ සිටගෙන සිටින දසලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය, සාධාරණ ශ්‍රී ලාංකිකයන්ගේ ද හිත්වල තැන්පත් වූ විශාල බරක් බව මම දනිමි.

2024 සැප්තැම්බර් 21 එම ගල් පර්වතයේ බරින් සැලකිය යුතු කොටසක් අප සියලුදෙනා විසින්ම නිදහස් කරගෙන තිබේ. නමුත්, ඒ බර සම්පූර්ණයෙන් නිදහස් කර ගත හැක්කේ ඒ ඝාතන පොදු ජන අරගළය වෙනුවෙන් දිවි දුන් සහ අනේකවිධ දුෂ්කරතාවන්ට මුහුණ දුන් සෑම කෙනෙකුටම යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීමෙන් පමණි.

එය කළ හැක්කේ ජනමත විචාරණය නම් නීති විරෝධී ඡන්ද මංකොල්ලයකින් ශ්‍රී ලංකා රාජ්‍යයේ බලය පැහැරගෙන, මුළු රටම එකම විශාලා මහනුවරක් කළ බටලන්දේ ප්‍රධාන වධකයා ඇතුළු ප්‍රධාන අපරාධකරුවන්ට නීති මඟින් කටයුතු කිරීමෙනි; එමෙන්ම, 1987-1990 කාලයේ මහා සිවිල් යුද්ධයකට මැදි වී, එහිදී විවිධ දේශපාලන පැති ගැනීමට සිදු වූ විවිධ දේශපාලන පක්ෂවලට සම්බන්ධ හා සම්බන්ධ නැති පොදු ජනතාවට මේ මහා සිවිල් යුද්ධයේ මූල හේතුව තේරුම් කර දෙමින් ද, පොදු ජනයා අතර දේශපාලන පක්ෂ භේදයෙන් තොරව මාතෘ භූමිය ගොඩනැඟීමට මේ මොහොතේ ඇති වී තිබෙන පොදු උනන්දුව තවත් ශක්තිමත් වන පරිදි ද සංහිඳියාවේ හා සමාව දීමේ යෝධ දැත්වලින් එම ගල් පර්වතය මාතෘ භූමියේ හෘදය සාක්ෂියෙන් බිමට ගෙන මේ මාතෘ භූමිය සදහටම එම හෘදය සාක්ෂියේ බරෙන් නිදහස් කිරීමෙනි.

එම නිසා, මෙම මහා සංහාරයන්හි සැබෑ ඝාතකයන් නීතිය ඉදිරියට පැමිණවීමටත්, එම ඝාතකයන් තම බලය රැක ගැනීම උදෙසා කරන ලද නීති විරෝධී, කෲර දේශපාලන උපක්‍රම නිසා එම කාලයේදී විවිධ පැති ගැනීමට සිදු වූ පොදු ජනයා අතර සංහිඳියාව හා සහෝදරත්වය තව තවත් ශක්තිමත් කිරීමටත්, නැවත කිසි දිනක අපගේ මාතෘභූමිය තුළ එවන් ඝාතනික යුගයක් ඇති නොවන පරිදි කටයුතු කිරීමටත් අධිෂ්ඨාන කරගෙන, මෙම බටලන්ද වාර්තාව පිළිබඳව කටයුතු කිරීමට ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේ.

ගරු කථානායකතුමනි, ඒ අනුව මෙම වාර්තා නීතිපතිවරයා වෙත යොමු කිරීමටත්, මෙම කොමිෂන් සභා වාර්තාව පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරීම පිළිබඳ උපදෙස් යෝජනා කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් විශේෂ කම්ටුවක් පත් කිරීමටත්, එමෙන්ම සුදුසු අවස්ථාවක මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ දින දෙකක විවාදයක් පැවැත්වීමටත් අපි බලාපොරොත්තු වෙමු.

මා විසින් සභාගත කරන ලද මෙම බටලන්ද කොමිෂන් සභා වාර්තාව සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම මන්ත්‍රීවරුන්ගේ සහ පොදු ජනතාවගේ පරිහරණය සඳහා මුද්‍රණය කළ යුතු යයි ද ඔබතුමාට යෝජනා කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

එමෙන්ම එම කොමිසමට අදාළ සාක්ෂි සහිත වෙළුම් 28ක් ද ඉදිරියේදී මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මම අදහස් කරමි. මාතෘභූමිය දරා සිටින මෙම මහා හෘදය සාක්ෂි බර සම්පූර්ණයෙන් නිදහස් කිරීම සඳහා යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කරන සෑම කෙනාටම ආරාධනා කරමින් මගේ කථාව අවසන් කරමි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

වෛද්‍ය වෘත්තිකයන්ගේ හිඟය හේතුවෙන් මන්නාරම සහ චාවකච්චේරි ප්‍රදේශවල සෞඛ්‍ය සේවාවලට සිදුවන බලපෑම: සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

மருத்துவ நிபுணர்கள் பற்றாக்குறை காரணமாக மன்னார் மற்றும் சாவகச்சேரியில் சுகாதார சேவைகளில் தாக்கம்: சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று

IMPACT ON HEALTHCARE SERVICES IN MANNAR AND CHAVAKACHCHERI DUE TO SHORTAGE OF MEDICAL CONSULTANTS: STATEMENT BY MINISTER OF HEALTH AND MASS MEDIA

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 (2) යටතේ රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා විසින් 2025.03.11 වන දින අසන ලද ප්‍රශ්නයට මම පිළිතුර ඉදිරිපත් කරනවා.

වෛද්‍ය කස්තුරි තනගරාජා මහත්මිය, Associate Specialist Paediatrician, වෙත සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් මන්නාරම දිස්ත්‍රික් මහ රෝහල වෙත ස්ථානමාරු නියෝග නිකුත් කර ඇත. එසේ වුවත්, එම වෛද්‍යවරිය වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරමින් ලෙඩ නිවාඩු වාර්තා කර ඇත. ගරු කථානායකතුමනි, අද උදෑසන වනවිටත් එම වෛද්‍යවරිය සේවයට වාර්තා කරලා තිබුණේ නැහැ.

ඉදිරි ස්ථාන මාරුවීම් මඟින් චාවකච්චේරි රෝහල සඳහා වෛද්‍යවරයෙකු පත් කිරීමට නියමිත අතර, වෛද්‍ය කස්තුරි තනගරාජා මහත්මියගේ ලෙඩ නිවාඩු අවසානයේදී මන්නාරම දිස්ත්‍රික් රෝහල වෙත ඇය සේවයට වාර්තා කළ යුතුය.

ඒ අනුව ඇයගේ ස්ථානමාරු නියෝගය අවලංගු නොකරන බව ගරු පාර්ලිමේන්තුවට අවධාරණය කර සිටිමි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2025, විසිවන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: මාර්තු 12]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 12]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee.- [Progress: 12th March]
[HON. SPEAKER in the Chair.]

135 වන ශීර්ෂය.- වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාවරයා
01වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,702,000,000

தலைப்பு 135. - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,702,000,000

HEAD 135.- MINISTER OF PLANTATION AND COMMUNITY INFRASTRUCTURE
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,702,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 135, 293 සහ 337.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. Gayantha Karunathilleka. You have 20 minutes.

[පූ.භා. 10.39]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.14වන සිකුරාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 135, 293 සහ 337 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, වැදගත් අමාත්‍යාංශයක් වන වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයට ගන්නා මේ අවස්ථාවේ විපක්ෂය වෙනුවෙන් ආරම්භක කථාව කරන්නට මට අවස්ථාවක් ලැබීම ගැන අතිශයින්ම සතුටු වෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ වැවිලි කර්මාන්තය ඉතා දිගු ඉතිහාසයකට හිමිකම් කියනවා.

යටත් විජිත සමයේ බ්‍රිතාන්‍යයන්ගේ ආර්ථික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අපේ රට තුළ අනුගමනය කරපු ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් හැටියට ශ්‍රී ලංකාවේ වතු වැවිලි අංශයේ ආරම්භයත්, විකාශනයත් සිදුවී තිබෙනවා. වර්ෂ 1840දී විතර රජයේ ඉඩම් අත් පත් කර ගැනීමේ ආඥා පනත මඟින් මුඩු බිම්, කැලෑ සහ වගා නොකළ ඉඩම් රජයට පවරා ගෙන අඩු මිලකට වතු වැවිලි ව්‍යාපාරිකයන්ට විකිණීමත් සමඟම වැවිලි කර්මාන්තයේ ඉතා ශීඝ්‍ර වර්ධනයක් ආරම්භ වෙලා තිබෙනවා. එවන් පසුබිමක් යටතේ යටත් විජිත පාලන සමයේ සිට 1977 ජේ.ආර්. ජයවර්ධන රජය විසින් විවෘත ආර්ථිකය හඳුන්වා දෙන තුරුම, ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට අපනයන ඉපැයුම්, සේවා නියුක්තිකයන් වාගේම රජයේ ආදායමටත් අතිවිශාල දායකත්වයක් වැවිලි ක්ෂේත්‍රය හරහා ලැබුණා.

ගරු සභාපතිතුමනි, මීට අවුරුදු 158කට පෙර වර්ෂ 1867දී බ්‍රිතාන්‍යයන් විසින් අපේ රටේ ප්‍රථම තේ ගස සිටුවා තේ කර්මාන්තය ආරම්භ කළා කියන එක අපි අසා තිබෙනවා. ඒ වෙනකොට කෝපි වගාව යම් පසුබෑමකට ලක් වෙලා තිබුණා. නමුත් තේ වගාව රටේ ප්‍රධාන වැවිලි භෝගය ලෙස වර්ධනය වෙන්නට පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම, අපේ රට තුළ පොල් වගාව ආරම්භ වෙලාත් අවුරුදු 185ක් වෙනවා. වර්ෂ 1840දී තමයි පොල් ගසක් සිටුවා මේ කර්මාන්තය ආරම්භ වුණේ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ රටේ ප්‍රධාන වගාවක් වෙච්ච රබර් වගාව බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කළේ මීට අවුරුදු 150කට ඉස්සෙල්ලා. ලබන අවුරුද්දට තමයි අවුරුදු 150 පිරෙන්නේ.

ගරු සභාපතිතුමනි, මෙන්න මේ වැවිලි ක්ෂේත්‍රයේ වර්ධනයත් සමඟම, ඊට සමගාමීව අපේ රට තුළ තවත් බොහෝ දේ ආරම්භවීම සිදු වෙලා තිබෙනවා. ගරු සභානායකතුමනි, ඊට පස්සේ රට තුළ මහා මාර්ග ඉදි වෙන්න පටන් ගත්තා; දුම්රිය මාර්ග ඇති වෙන්න පටන් ගත්තා; බැංකු, රක්ෂණ සේවා ඇති වෙන්න පටන් ගත්තා; ප්‍රවාහනය වැනි ක්ෂේත්‍රවල විශාල පරිවර්තනයක් මෙන්ම සංවර්ධනයක් ඇති වෙන්න පටන් ගත්තා. ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි, තේ, රබර්, පොල් අපනයනය හරහා ලැබුණු ආදායමින් රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ, කාර්මික භාණ්ඩ ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක් ආනයනය කරන්නත් හැකියාව ලැබුණා.

ඒ හරහා ආනයන, අපනයන ආර්ථිකයට පදනම වැටුණා. ගරු සභාපතිතුමනි, එවැනි කීර්තිමත් අතීතයක් තිබුණු අපේ රටේ වැවිලි කර්මාන්තයට අද වෙනකොට අභියෝග රැසකට මුහුණ පාන්න සිදුවී තිබෙනවා. ඒ අභියෝග දේශීය වශයෙන් වාගේම ජාත්‍යන්තර වශයෙනුත් පවතිනවා, ඇමතිතුමනි. ගරු සභාපතිතුමනි, දේශය වශයෙන් වැවිලි ක්ෂේත්‍රයට බලපාන ප්‍රධාන අභියෝග තමයි ශ්‍රමිකයන්ගේ හිඟය, පෞද්ගලික හා රාජ්‍ය අංශ අතර පවතින පරිපාලනමය ගැටලු, දේශගුණික විපර්යාස, නිෂ්පාදන වියදම් ඉහළ යාම. එවැනි අභියෝග රැසක් අපේ රට හමුවේ තිබෙන බව අපි දකිනවා. ජාත්‍යන්තරව ගත්තාම, ආසියාතික සහ අප්‍රිකානු රටවල් සමඟ අපේ රටේ නිෂ්පාදනයට විශාල තරගකාරී වෙළෙඳ පොළක් නිර්මාණය වී තිබීම ප්‍රධාන ගෝලීය අභියෝග හැටියට අපි දකිනවා.

ගරු සභාපතිතුමනි, මම කැමතියි තේ කර්මාන්තය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න. ලෝකයේ බොහෝ රටවලට නැති වාසනාවක් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සම්බන්ධයෙන් අපට තිබෙනවා. ඒක තමයි දේශගුණික තත්ත්වය. ගරු සභාපතිතුමනි, දේශගුණික බලපෑම් නිසා තේ වගා කරන සමහර රටවල ඵලදාව ගන්න පුළුවන්කම තිබෙන්නේ මාස හයක් වැනි කාලයක් විතරයි. නමුත් අපේ රට ඊට වඩා වාසනාවන්තයි. අපේ රටේ තේ කර්මාන්තය පැත්තෙන් ගත්තාම, මාස 12ම, දවස් 365ම ඵලදාව ලබන්න පුළුවන්කම අපට තිබෙනවා.

ගරු සභාපතිතුමනි, වසරකට ලෝක තේ නිෂ්පාදනය මෙට්‍රික්ටොන් මිලියන 6,500ක්. නමුත් ශ්‍රී ලංකාවේ වසරකට තේ නිෂ්පාදනය කරන්නේ මෙට්‍රික්ටොන් මිලියන 250යි. හරියට ගණනය කළොත්, ඊටත් වඩා අඩුයි කියලා මම කල්පනා කරනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඒ කියන්නේ ලෝක තේ නිෂ්පාදනයට අපි දායක වෙන්නේ සියයට 3.9ක් වාගේ කුඩා ප්‍රමාණයකින්. "Ceylon Tea" කියන කීර්තිනාමය තිබුණු රට අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ලෝකයේ තේ නිපදවන අනෙක් රටවල් ඒ, ඒ රටවල රජයන්ගෙන් සහාය ලබාගෙන තේ නිෂ්පාදනයේ ශීඝ්‍ර දියුණුවක් ලබාගෙන තිබෙන හැටි අපි දකිනවා. අවාසනාවට අපේ රටේ තේ නිෂ්පාදනය දවසින් දවස පසු බසිනවා. පසුගිය රජය විසින් ඇති කරපු රසායනික පොහොර තහනම, කාබනික පොහොර නාඩගම නිසා තේ කර්මාන්තයේ විශාල පසුබෑමක් සිදු වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අවුරුදු 32කට ඉස්සෙල්ලා තිබුණු තැනට අපේ තේ කර්මාන්තය පල්ලම් බැහැලා තිබෙනවා, මේ තත්ත්ව නිසා. අද තේ කර්මාන්තය දෙස බලනවිට රටේ තේ නිෂ්පාදනයෙන් වැඩිම කොටසක් නිෂ්පාදනය කරන්නේ අපේ රටේ කුඩා තේ වතු හිමියන් විසින්. තේ නිෂ්පාදනයෙන් සියයට 75ක් නිපදවීමේ ගෞරවය කුඩා තේ වතු හිමියාට හිමි විය යුතුව තිබෙනවා.

මහ වතු, අලංකාර වතු, රජය සතු වතු, සමාගම් වතු කියන මොන විධියේ වතු තිබුණත් කුඩා තේ වතු හිමියා තමයි තේ කර්මාන්තයේ ප්‍රධානම කොටස්කරුවා බවට පත් වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, කුඩා තේ වතු හිමියා කිව්වාම සියයට 85ක් ඉන්නේ අක්කර කාලක්, භාගයක්, එකහමාරක්, දෙකක් තිබෙන - අක්කර දෙකට අඩු - උදව්ය. අද වනවිට සාමාන්‍ය ජනතාව තමයි තේ කර්මාන්තයේ කොටස්කරුවන් වෙලා තිබෙන්නේ. හැබැයි, කුඩා තේ වතු පවා හරි අමාරුවෙන් නඩත්තු වෙන්නේ. කම්කරු ගාස්තු උහුලන්න බැහැ. වල්නාශක, පළිබෝධකනාශකවලට මුදල් යොදවන්න අමාරු වෙලා තිබෙනවා. පොහොරවලට ලබා දෙන මුදල ඔරොත්තු දෙන්නේ නැහැ. හොඳ ගුණාත්මක පොහොර මිටියක් ගන්නවා නම් රුපියල් 9,000ක් විතර වෙනවා. සහනාධාරයට දෙන පොහොර මිටියත් රුපියල් 5,750ක් වෙනවා.

සමහර කුඩා තේ වතුහිමියෝ කියනවා අපට ඇහෙනවා, තමන්ගේ වත්තක් නඩත්තු කරනවාට වඩා කුලී වැඩකට ගියා නම් ආදායම ඊට වඩා වැඩි ප්‍රමාණයක් ලැබෙනවා කියලා. අද වෙනකොට තේ කර්මාන්තයට බලපාන ප්‍රධානම කරුණක් තමයි නැවත වගාවට යොමු වෙන පිරිස ඉතාම අඩු වීම, ගරු ඇමතිතුමනි. 1984 - 2005 කාලය තමයි ලංකාවේ තේ කර්මාන්තයේ ස්වර්ණමය යුගයක් හැටියට තිබුණේ. කුඩා තේ වතු හිමියෝ ලක්ෂ ගණනින් ඇති වුණේ ඒ කාල සීමාව තුළදීයි. ඒ කාලය තුළ නැවත වගාව වැඩි වුණා. දැන් නැවත වගාවට යොමු වෙනවා බොහොම අඩුයි. මම බැලුවාම සියයට එකක් වාගේ තමයි නැවත වගාවට යොමු වී තිබෙන්නේ. ඒක අනාගත තේ කර්මාන්තයට විශාල අභියෝගයක් වෙන්න පුළුවන්. තේ, පොල්, රබර්, කුරුඳුවලින් ඇමෙරිකන් ඩොලර් බිලියන 3.5ක ආදායමක් ලබන්න පුළුවන් වුණු නිසා ඒ අංශවලට ස්තුතිවන්ත වෙනවා කියලා 2023 ඔක්තෝබර්වල අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් ගහලා තිබුණා, මම දැක්කා. ගරු සභාපතිතුමනි, තේ කර්මාන්තයට රජයේ අවධානය යොමු කරලා අත දුන්නොත් තව වසර පහක් යනකොට තේවලින් විතරක් ඒ ආදායම ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. අවාසනාවකට, කිසි කෙනෙක් මේක හරියට වටහාගෙන නැති බවයි අපට පෙනෙන්නේ. වතු රජයට පවරා ගැනීමත් එක්ක, හොඳට තිබුණු තේ වගා ක්ෂේත්‍රයට, වැවිලි ක්ෂේත්‍රයට කන කොකා හැඩුවා. වතු හොඳ පාලනයක තිබුණා. ඒවා රජයට ගත්තාට පස්සේ දේශපාලනීකරණය වුණා. එයට විවිධ හේතු බලපෑවා. අද වෙනකොට වතු ක්ෂේත්‍රයේ, වැවිලි ක්ෂේත්‍රයේ අවාසනාවන්ත තත්ත්වයක් තමයි ඇති වී තිබෙන්නේ. වතු සමාගම්වලට වතු ලැබුණා, කර්මාන්තශාලා ලැබුණා, කම්කරුවෝත් ලැබුණා. නමුත් ඒවා හරියට පාලනය කර ගන්නට, ඒ වතු හරියට නඩත්තු කර ගන්නට ඒ සමාගම් අපොහොසත් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා ගිහිල්ලා බැලුවොත් පෙනේවි, වතුවල පාරවල් ටික හරියට නඩත්තු වෙන්නේ නැහැ. කම්කරුවන්ගේ නිවාස ටිකවත් සමාගම්වලින් හරියට නඩත්තු කරලා දෙන්නේ නැහැ. හරියට නඩත්තු කරන, පාලනය කරන සමාගම් තිබෙන්නේ බොහොම අතළොස්සයි. හරියට නඩත්තු කරන්නේ නැති වතු බදු ක්‍රමයට හරි ජනතාවට වගා කරන්න අවස්ථාවක් ලබා දුන්නොත් ඒ හරහා විශාල පිරිසකට අලුතින් ආදායම් මාර්ග ඇති වෙනවා. රටට විදේශ විනිමය ලබන්නත් පුළුවන්කම ලැබෙනවා. අපි, සමගි ජන බලවේගය ජනාධිපතිවරණය වෙලාවේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කළා, අපට බලයක් ලැබුණොත් පාවිච්චියට නොගන්නා ඉඩම් ඒ වාගේ වැඩ පිළිවෙළක් යටතේ කම්කරුවන්ට හා කුඩා තේ වතු හිමියන් වැනි පිරිසකට ලබා දීලා අලුත් වැඩ පිළිවෙළක් කරනවා කියලා. ඒ ගැන අවධානය යොමු කළොත් හොඳයි කියලා මම රජයට කියනවා.

අපට පහළින් හිටපු ලෝකයේ තේ නිෂ්පාදනය කරපු රටවල් අද වනකොට අපි අබිබවා ගිහින් තිබෙනවා. ඒක අපට ලොකු තර්ජනයක්. චීනය, ඉන්දියාව වාගේ රටවල තේ නිෂ්පාදනය කළාට, ඒ නිපදවන තේ ඒ රට තුළ පරිභෝජනයට ගන්නවා විතරයි. ඒ අයත් නිෂ්පාදනය වැඩි කරලා ජාත්‍යන්තර වෙළෙඳපොළ තරණය කළොත්, එය අපට විශාල අභියෝගයක් වෙනවා. ඒක නිසා අපි මේවා කල් ඇතුව හඳුනාගෙන යම් වැඩ පිළිවෙළක් ඇති කළ යුතු වෙනවා. කර්මාන්තශාලා අතරත් අද ලොකු තරගයක් ඇති වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, තේ කර්මාන්තශාලා 709ක් විතර අපට තිබුණා. මේ වනකොට එයින් 124ක් වැහිලා තිබෙනවා. ඉතුරු 585ත් බොහොම අමාරුවෙන් තමයි පවත්වාගෙන යන්නේ. ඒකට ප්‍රධාන හේතුවක් වුණා, පොහොර අර්බුදය නිසා ඇති වුණු දලු හිඟය. අදටත් ඒවාට ඔළුව ඔසවන්න අමාරුයි. ගරු ඇමතිතුමාට මේ ගැන අවබෝධයක් තිබෙනවා.

ඒ කාලයේ තිබුණු ආණ්ඩුවලට අපි මේවා කිව්වාම ගණන් ගත්තේ නැහැ. කර්මාන්තශාලාවට අවශ්‍ය දලු ධාරිතාව සොයන්න අද ලොකු තරගයක් තිබෙනවා. ඒ වාගේම බැංකු සහ මූල්‍ය ආයතනවලින්, ඒ වාගේම බ්‍රෝකර් සමාගම්වලින් අධික පොලියට ණය අරගෙන අද ඒ මිනිස්සු ලොකු අමාරුවක වැටිලා තිබෙනවා. ඊට අමතරව ඉන්ධන මිල, විදුලිය ගාස්තු, කම්කරු වැටුප්, නිෂ්පාදන වියදම්, මේ සියල්ලම තේ කර්මාන්තයට අද බරපතළ ලෙස බලපානවා. ගරු ඇමතිතුමනි, හොඳ තේ නිෂ්පාදනය කරන්න නම් කර්මාන්තශාලාවලට හොඳ තේ දලු දිය යුතු බව අපි දන්නවා. හොඳ දලුවලින් විතරයි හොඳ තේ නිෂ්පාදනය කරන්න පුළුවන්. හොඳ තේ නිෂ්පාදනය කළොත් විතරයි ලෝක වෙළෙඳ පොළේ හොඳ මිලක් ගන්න පුළුවන්. හොඳ මිලක් ලැබුණොත් විතරයි කුඩා තේ වතු හිමියාටත් හොඳ මිලක් ලැබෙන්නේ. එම නිසා තීරයයි, කොළ දෙකයි ගත්තොත් හොඳයි කියන එක තමයි හැම තැනම කියැවුණේ. නමුත් අද තේ කර්මාන්තශාලා අතර තිබෙන අනවශ්‍ය තරගය නිසා තේ ගසේ සර්වාංගයම ගෙනැවිත් දුන්නත් භාර ගන්නා කර්මාන්තශාලා තිබෙනවා. Turnover එක පෙන්වන්න ඕනෑ නිසා, ඒ වාගේම දලු හිඟය නිසා අද කර්මාන්තශාලාවලට ගුණාත්මක තේ නිෂ්පාදනය කිරීමට බැරිවෙලා තිබෙන බව අපට පෙනෙනවා.

අපි දන්නවා, සෙස් අරමුදලින් නඩත්තු වන ආයතන කිහිපයක් තිබෙන බව. Sri Lanka Tea Board එක, TSHDA එක, TRI එක වාගේම, NIPM එකත් සෙස් අරමුදලින් තමයි නඩත්තු වෙන්නේ.

හැබැයි, මේවා එකකට එකක් සම්බන්ධීකරණය වෙලා නැහැ. තේ කර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් තිබෙන එම ආයතන දම්වැලක පුරුක් වාගේ එකකට එකක් සම්බන්ධ වෙනවා නම් හොඳයි කියලායි මම කල්පනා කරන්නේ.

ගරු සභාපතිතුමනි, තේවලට පස්සේ අපේ රටේ තිබෙන ප්‍රධාන අපනයන භෝගයක් තමයි පොල්. අපේ රටේ බොහෝ දෙනෙක් පොල් ගස හඳුන්වන්නේ "කප්රුක" කියලා. ඒ තරමටම පොල් ගස ජන ජීවිතවලට වැදගත්. ඒ නිසා තමයි පොල් ගසට "කප්රුක" කියන්නේ. අපි දන්නවා, අදටත් අපේ ගම්වල පොල් සම්බෝලයි, බතුයි කියන්නේ ඉතාම රසවත් මෙන්ම ජනප්‍රිය ආහාරයක් බව. වර්තමානයේ පොල් ගෙඩියක මිල බැලුවාම, පොල් සම්බෝලයත් තමුන්නාන්සේලාගේ කාලයේ සුබෝපභෝගී ආහාරයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා.

මෑතක් වන තුරුම අපේ රටේ පොල් ත්‍රිකෝණය ලෙස හැඳින්වූයේ කුරුණෑගල, පුත්තලම සහ ගම්පහ කියන දිස්ත්‍රික්ක තුන. පසුගිය රජය කාලයේ තවත් පොල් ත්‍රිකෝණයක් ලෙස උතුරු පළාතේ මන්නාරම, යාපනය සහ මුලිතිව් කියන දිස්ත්‍රික්ක තුන හඳුන්වා දෙන්න කටයුතු කළා. ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ පොල් වගාව ගත්තාම, සාමාන්‍යයෙන් හෙක්ටෙයාර 440,000ක පොල් වගා කර තිබෙනවා. ඒ භූමි ප්‍රමාණය තුළ පොල් ගස් මිලියන 60ත්, 65ත් අතර ප්‍රමාණයක් තිබෙනවා. එවැනි පසුබිමක් තුළ අපේ රටේ වාර්ෂික පොල් ඵලදාව පොල් ගෙඩි මිලියන 3,000 ඉක්මවා තිබෙන බව තමයි සංඛ්‍යාලේඛනවලට අනුව පෙන්වා දී තිබෙන්නේ. ඒ වාගේම පොල් පරිභෝජනය වසරකට පොල් ගෙඩි මිලියන 1,850ක් පමණ වෙනවා. ගරු සභාපතිතුමනි, මේ විධියට බැලුවාම අපේ රටේ එක පුද්ගලයෙක් අවුරුද්දකට පොල් ගෙඩි 100ක් පරිභෝජනය කරන බව තමයි සංඛ්‍යාලේඛන අනුව අපට පෙනෙන්නේ. පළමු පොල් ගස සිටුවලා අවුරුදු 185කට පස්සේ ඉතිහාසයේ වැඩිම පොල් මිල වාර්තා වුණේ තමුන්නාන්සේලාගේ රජය ආවාට පසුවයි. එක එක සයිස් එකේ පොල් ගෙඩිවල මිල රුපියල් 180, 250 වාගේ ගණන්වලට ගියා. එම නිසා අද පොල් ගෙඩියේ මිල ඇහුවාම ජනතාවට එලොව පොල් පෙනෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ.

මේ වෙනකොට අපේ රට තුළ පොල් පරිභෝජනයේ විශාල අඩුවක් සිදුවෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, දිනකට පොල් ගෙඩි මිලියන 5ක් පරිභෝජනය කරපු අපේ රටේ දැන් වෙනකොට දිනකට පරිභෝජනය කරන්නේ පොල් ගෙඩි මිලියන 3ක් වාගේ ප්‍රමාණයක්. ඒ කියන්නේ, ශ්‍රී ලංකාවේ පොල් පරිභෝජනය දවසකට පොල් ගෙඩි මිලියන 2කින් විතර අඩුවෙලා තිබෙනවා. මේ තත්ත්වය ඇති වෙන්න ප්‍රධාන වශයෙන්ම බලපා තිබෙන කරුණු දෙකක් තමයි, දීර්ඝ කාලයක් තිස්සේ පොල් වගාවට පොහොර නොයොදා සිටීම සහ පොල් ගස් විවිධ රෝගවලට හා පළිබෝධ හානිවලට ලක්වීම. ඒ වාගේම වන සතුන්ගෙන් සිදු වන හානි වැනි කරුණුත් පොල් වගාවේ ශීඝ්‍ර බිඳ වැටීමට හේතුවෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය නිසා පොල් පාරිභෝගිකයන් විතරක් නොවෙයි, පොල් ආශ්‍රිත කර්මාන්තකරුවනුත් අපහසුතාවට පත්වෙලා සිටිනවා. මේ තත්ත්වය තුළ පොල් හිහය පියවාගන්න දීර්ඝ කාලීන මෙන්ම කෙටි කාලීන වැඩ පිළිවෙළක් තිබිය යුතුයි, ගරු ඇමතිතුමනි. ඒ සඳහා පොල් වගාවට පොහොර සහනාධාරයක් ලබා දීම අත්‍යවශ්‍ය වෙනවා.

රෝග හා පළිබෝධවලින් පොල් වගාව වළකා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව තිබෙනවා. ඒ වාගේ කරුණු පිළිබඳව මීට වඩා අවධානයක් රජය විසින් යොමු කරලා, එම ක්‍රියාමාර්ග මේ රටේ ක්‍රියාත්මක කරන්න දැන් කාලය ඇවිත් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි, රබර් කියන්නේත් අවුරුදු 150ක විතර දීර්ඝ ඉතිහාසයක් තිබෙන වගාවක්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
හොඳයි, ගරු සභාපතිතුමනි.

රබර් වගාවට යොමු වෙච්ච දිස්ත්‍රික්ක කිහිපයක්ම තිබෙනවා. මා නියෝජනය කරන දිස්ත්‍රික්කය ගත්තත්, රබර් වගාව හොඳින් තිබෙන දිස්ත්‍රික්කයක්. ඒක හොඳ වැවිලි භෝගයක්. නමුත්, එක පැත්තකින් රබර් වගාව ස්වාභාවික මරණයට ලක් වෙමින් පවතින බවක් තමයි අද පෙනෙන්න තිබෙන්නේ. මේ තත්ත්වය ඇති වෙන්නත් හේතු ගණනාවක් බලපා තිබෙනවා. එකක්, අයහපත් කාලගුණික තත්ත්වය. අපේ ප්‍රදේශවලටත් හැම දාම වාගේ වැස්ස තිබෙනවා. ඒක රබර් වගාවට බලපානවා. ඒ වාගේම නිසි මිලක් නොමැති වීමත් රබර් වගාවට බලපා තිබෙනවා. ශ්‍රමිකයන්ගේ භිඟය වැනි කාරණාත් රබර් කිරි අස්වැන්න අඩුවීමට බලපා තිබෙනවා. අද බොහෝ වතු සමාගම් රබර් වගාවෙන් ඈත් වෙලා කටුපොල් වැනි වගාවලට තමයි යොමු වෙන්නේ. ඒකත් බලපෑමක් වෙලා තිබෙනවා, රබර් වගාවට. මේ තත්ත්වයන් ගැන රජය අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

මම කැමැතියි, කුරුඳු වගාව ගැනත් යමක් කියන්න. මොකද, කුරුඳු වැඩියෙන්ම වවන දිස්ත්‍රික්කය තමයි මා නියෝජනය කරන්නේ. විශේෂයෙන්ම කරන්දෙනිය, අම්බලන්ගොඩ, මීටියාගොඩ, බටපොල, බලපිටිය, ඉඳුරුව, ඇල්පිටිය වාගේ ප්‍රදේශවල කුරුඳු වගාව බහුලව සිද්ධ වෙනවා. "Ceylon Cinnamon" කියන සන්නාමය යටතේ ලෝකයේම ගුණාත්මක කුරුඳු නිපදවන්නේ අපේ රටෙය කියන පිළිගැනීම ලෝකය පුරා තිබෙනවා. අපේ රටේ සාමාන්‍යයෙන් අක්කර 75,000ක්, 100,000ක් අතර ප්‍රමාණයක කුරුඳු වගා කර තිබෙනවා. මේ කුරුඳු කර්මාන්තය හරහා සෘජු හා වක්‍රව යැපෙන පවුල් ලක්ෂ 3ක්, 4ක් සිටිනවා. ශ්‍රී ලංකාවට ආවේණික කුරුඳුවලට ලෝක වෙළෙඳ පොළ තුළ සැලකිය යුතු පංගුවක් අත්පත් කර ගන්න රජය විශේෂ උනන්දුවකින් ක්‍රියා කළ යුතුවම තිබෙනවා, ගරු ඇමතිතුමනි. අද වෙනකොට අපේ ප්‍රදේශවල සිටින කුරුඳු ගොවීන්ට ප්‍රශ්න ගොඩක් තිබෙනවා. රබර් මිල නිතරම ඉහළ පහළ යනවා. ඒ මිනිස්සුන්ට කුරුඳුවලට ස්ථාවර මිලක් ලැබෙන්නේ නැහැ. කම්කරු ගාස්තු, උදලු ගාන්න යන මිල, පොහොර දැමීම, නඩත්තුව කුරුඳු ගොවියාට දැන් හරි අමාරු වෙලා තිබෙනවා. දැන් කුරුඳු තළන මිනිස්සුන්ට ආදායමකුත් නැහැ, වගා කරන මිනිස්සුන්ට ආදායමකුත් නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මට තව විනාඩි දෙකක් ලබා දෙන්න, ගරු සභාපතිතුමනි. මම ඒක විපක්ෂයේ ඉතිරි කාලයෙන් හදලා දෙන්නම්.

බොහෝදෙනෙක් දැන් මේ කුරුඳු ඉඩම් කැබලි කරලා විකුණනවා. ඒ වාගේම අද වෙද්දි සාම්ප්‍රදායික ක්‍රමයට කුරුඳු තැළීම තමයි සිද්ධ වෙන්නේ. මේ කර්මාන්තයේ නිරත වන පිරිසගේ ජීවන තත්ත්වය උසස් වෙලාත් නැහැ. ඒ නිසා මේ වන

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

විට තරුණ පරම්පරාව මේ වගාවට, මේ කර්මාන්තයට යොමු නොවන තත්ත්වයට පත්ව තිබෙනවා.

අපේ රටේ අවධානයට ලක් නොවුණු තවත් කර්මාන්තයක් ගැන කියලා මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි. ඒ තමයි, කිතුල් කර්මාන්තය. කිතුල් පැණි, කිතුල් හකුරුවලට දේශීය වශයෙනුත්, විදේශීය වශයෙනුත් හොඳ ඉල්ලුමක් තිබෙනවා. කිතුල් ආශ්‍රිතව නිපදවෙන පැණි, හකුරු බොහොම රසවත් වුණත්, ඒ ආශ්‍රිතව ජීවනෝපාය කරන අයගේ ජීවිත පැණි, හකුරු මෙන් රසවත් නැහැ, ඇමතිතුමනි. කිතුල් කර්මාන්තයේ යෙදෙන අය විශාල අවදානමක් අරගෙන තමයි සමහර වෙලාවට කටයුතු කරන්නේ. ඒ වාගේම විශාල වෙහෙසක් දරන්න වෙලා තිබෙනවා, ඒ නිෂ්පාදන කරන්නත්. මේ කර්මාන්තයේ නිරත වෙලා ඉන්න ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙනුත් තමුන්නාන්සේලා රජයක් හැටියට අවධානය යොමු කරන්න කියා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, මගේ කාලය අවසන් කියලා ඔබතුමා කියන නිසා මම මීට වඩා කාලය ගන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, තේ කර්මාන්තය, රබර් කර්මාන්තය, පොල් කර්මාන්තය, කුරුඳු කර්මාන්තය, අනෙක් අපනයන භෝග ආදී මේ හැම එකක්ම ඔබතුමාගේ අමාත්‍යාංශයට තමයි අයිති වෙන්නේ. ඒ නිසා මේක විශාල වැඩ කොටසක් තිබෙන අමාත්‍යාංශයක්; ජන ජීවිතයට වාගේම රටේ ආර්ථිකයටත් බලපාන අමාත්‍යාංශයක්. ඔබතුමාට ඒ සියලු විෂයයන් ගැන අවබෝධයක් ඇතිව හොඳ වැඩ කොටසක් කරන්න අනාගතයේදී හැකියාව ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින්, මට කාලය ලබා දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. K.V. Samantha Viddyarathna. You have 23 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.01]

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු සභාපතිතුමනි, අපේ නව රජයේ මංගල අය වැයේ කාරක සභා අවස්ථාවේදී වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා ලෙස මට මේ අවස්ථාවේ කරුණු ගණනාවක් අවධාරණය කරන්න තිබෙනවා. අද මේ විවාදය ආරම්භ කළ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මම කියන්න ඕනෑ කරුණුවලින් සැලකිය යුතු කරුණු ප්‍රමාණයක් කිව්වා. මේ අමාත්‍යාංශයට අයිති ප්‍රධාන වැවිලි භෝගවලට අද අත්වෙලා තිබෙන ඉරණම සම්බන්ධයෙන් ඔබතුමා කථා කළා, ගරු මන්ත්‍රීතුමනි. ඒ අභියෝගය අපි නව රජයක් හැටියට භාර ගන්න සූදානම්. ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශයට රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල 29ක් අයිතිව තිබෙනවා. මේ ආයතන 29 තුළ මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් තමන්ගේ ජීවිතය පවත්වාගෙන යන්න රැකීරක්ෂා කරනවා, විවිධ ක්‍රියාකාරකම්වල නිරත වෙනවා.

අපේ රටේ රබර් අක්කර 246,520ක් තිබෙනවා, තේ අක්කර 667,500ක් තිබෙනවා, පොල් අක්කර 1,180,000ක් තිබෙනවා. මේ තුළ තමයි සියලු මිනිසුන්ගේ ජීවිත පවත්වාගෙන යන්නේ. අපේ ජාතික ආර්ථිකයටත්, සමාජ සංවර්ධනයටත් මේ සියල්ලෙන් දායකත්වය ලැබී තිබෙනවා. එම වගා ප්‍රදේශ ආශ්‍රිතව විවිධ සංස්කෘතික අනන්‍යතා ඇති ජනතාව ජීවත් වනවා. ඒ නිසා මේ අමාත්‍යාංශයේ විෂය පථයන්, කාර්යයන් සියල්ලම මේ රටේ සියලු ජනතාවට විශාල බලපෑමක් කරනවා කියන එක මම මතක් කරන්න ඕනෑ.

මම ස්තුතිවන්ත වෙනවා, ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාට. පසුගිය කාල එක්ක සසඳා බැලුවාම, මෙවර මේ අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මුළු වෙන් කිරීම රුපියල් මිලියන 17,888ක්. ඒ රුපියල් මිලියන 17,888න් ප්‍රාග්ධන වියදම් හැටියට, සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 12,038ක් වෙන් කර තිබෙනවා. ඉතිහාසය එක්ක බැලුවාම මේක විශාල මුදලක්.

ගරු සභාපතිතුමනි, මට ලැබී තිබෙන කාලය තුළ ප්‍රධාන විෂයයන් කිහිපයක් සම්බන්ධයෙන් මම අවධානය යොමු කරනවා. එහිදී, එක් එක් වැවිලි භෝගය සම්බන්ධයෙන් අපි ඉතිහාසයේ හිටියේ කොතැනද, අද අපට අත්වෙලා තිබෙන ඉරණම මොකක්ද, නව රජයේ ඉදිරි ඉලක්කය මොකක්ද, ඒ ඉලක්කය සපුරා ගන්න අපි යන්න හදන ගමන මොකක්ද කියා කෙටියෙන් හෝ කථා කරන්න මම කැමැතියි.

මේ වෙලාවේ රටේ ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වෙලා තිබෙන පොල් වගාව සම්බන්ධයෙන් වැඩිපුර කථා කරන්න මම කැමැතියි. අපේ පොල් සම්බන්ධ ඉතිහාසය බොහොම ඈතට දිවෙනවා. ලෝකය එක්ක ගත්තාම, අපේ පොල් කර්මාන්තය බොහොම ඉහළින් තිබුණා. පොල් කර්මාන්තය ගත්තත්, තේ කර්මාන්තය ගත්තත්, රබර් කර්මාන්තය ගත්තත් අපි ඉහළින් තමයි හිටියේ. නමුත්, දැන් අපි ඒ හැම ක්ෂේත්‍රයකම පහළට වැටිලා තිබෙනවා. ඒකට බලපෑවේ දේශගුණික හේතුම නොවෙයි. මේ ක්ෂේත්‍රවලින් එක් රටක් ඉහළට යන්නත්, තවත් රටක් පහළට යන්නත් හේතුව මොකක්ද? ඒ කියන්නේ කොතැන හෝ වැරදීමක් වෙලා තිබෙන්න පුළුවන්. සමහර විට සැලසුම් වැරදිලා ඇති, එහෙම නැත්නම් ප්‍රතිපත්ති තීන්දු හරියට ගන්නේ නැතිව ඇති. ප්‍රධාන වශයෙන්ම එවැනි කාරණා තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. දේශපාලන අධිකාරිය මේ ක්ෂේත්‍ර හරියට මෙහෙයවුයේ නැති වුණාම මේ කටයුතු සාර්ථකව කරගන්න බැහැ. මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ අපට දැනෙන කාරණයක් තිබෙනවා. අපේ අමාත්‍යාංශයේ දක්ෂ නිලධාරීන් ඉන්නවා. විෂය අවබෝධය හොඳින් තිබෙන නිලධාරීන් ඉන්නවා. ඔවුන්ට මේ සම්බන්ධව වුවමනාවකුත් තිබෙනවා. එම නිසා හොඳ ප්‍රතිපත්තියක්, සැලැස්මක් හදලා නිසි මෙහෙයවීමක් තිබුණොත් මේ ක්ෂේත්‍ර ඉහළට ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

ඉතිහාසය ඉගෙන ගන්නකොට අපේ ප්‍රධාන අපනයන ආදායම් ලැබෙන භෝග විධියට කිව්වේ තේ, පොල්, රබර් කියන ඒවා.

නමුත් අද රටේ ජනතාවට කන්නවත් පොල් නැහැ. ඒක මේ ආණ්ඩුවේම වරදක් නොවෙයි කියලා ජනතාව තේරුම් ගනීවි කියලා මා හිතනවා. මොකද, අපට මාස 3ක් ඇතුළත පොල් ඵලදාව ක්ෂණිකව වැඩි කරන්න පුළුවන්කමක් නැහැ. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා වාගේ වසර 5කින් පොල් ගස්වලට පොහොර දාලා නැත්නම්, පොහොර අර්බුදයක් ආවා නම්, පොල් නිෂ්පාදනය සම්බන්ධව ගැටලු මතුවනවා. පොල් ගහකට පොහොර ටිකක් දැම්මොත් ඒකේ ප්‍රතිඵලයක් ලැබෙන්න නම් අවුරුදු එකහමාරක්වත් යනවා. අද පොහොර දැම්මා කියලා මාස 3න් පොල් කඩන්න පුළුවන්කමක් නැහැ. අපි කනගාටු වනවා, ජනතාව මේ තත්ත්වයට පත් වීම සම්බන්ධයෙන්. පොල් අපනයනය කරපු අපට අද පොල් ආනයනය කරන්න තීන්දු ගන්න සිද්ධ වුණා. අද අපි පොල් තෙල් ගෙනෙනවා, පොල් මද ආශ්‍රිත දේවල් ගෙනෙනවා, නිෂ්පාදනයට අදාළව පොල් ගෙනෙන්නත් වෙලා තිබෙනවා. අපි දකින විධියට මේ තත්ත්වයට නිසි සැලැස්මක්, මෙහෙයවීමක් රටේ තිබුණේ නැහැ. දේශපාලන අරමුණුවලට මේක අරගෙන ගියා. ඒ නිසා මේ සම්බන්ධව දේශපාලනය පැත්තෙන් වැරදුණු තැන් එකක් දෙකක් මම කියන්නම්.

හලාවත වැවිලි සමාගම අපේ අමාත්‍යාංශයට අයිති සමාගමක්. ඒක ප්‍රධාන වැවිලි සමාගමක්. 2023 අවුරුද්දේ හලාවත වැවිලි සමාගමේ සමස්ත ආදායම රුපියල් මිලියන 796.68යි.

හැබැයි, 2023 අවුරුද්දේ ඒ ආදායම ගන්නකොට ඒ කාලයේ තිබුණු ආණ්ඩුව නීති විරෝධීව වැලි කණින්න දේශපාලනඥයන්ට සහ හිතවතුන්ට අවස්ථාව ලබා දුන්නා. ඒ වැලි කැණීම්වලින් රජයට වෙච්ච අවාසිය, පාඩුව විගණකාධිපතිතුමා පෙන්වා දීලා තිබෙනවා, රුපියල් මිලියන 746.6ක් කියලා. එතකොට ආදායම රුපියල් මිලියන 756යි. නීති විරෝධී වැලි කැණීම්වලින් රජයට අහිමි වුණු ගණනත් ඒ හා සමානයි; එය රුපියල් මිලියන 746.6යි. ඉතින් කොහොමද හලාවත වැවිලි සමාගම ඉස්සරහට ගෙනියන්නේ? මේවා රජයට ලැබෙන්න ඕනෑ දේවල්. මේ වාගේ දේවල් වුණා.

කුරුණෑගල වැවිලි සමාගම කියන්නේ සාරවත් පොල් ඉඩම් තිබෙන, හොඳින් නඩත්තු කරගෙන එන සමාගමක්. එම වැවිලි සමාගමේ අක්කර 76ක් එවකට ඒ පැත්තේ හිටපු අමාත්‍යවරයෙක් ගත්තා. හිරියාල ගොවිජන සමාගම කියලා සමාගමක් හදලා, එවකට හිටපු සාලින්ද දිසානායක ඇමතිතුමා ඒකේ සභාපති වෙලා, ඒ වැවිලි සමාගමේ තිබුණු සාරවත් අක්කර 76ක් ඔහුගේ සමාගමට ගත්තා. අද එතුමා නැතත් එතුමාගේ නෝනා තමයි ඒ සමාගමේ සභාපති. ඉතින් කොහොමද ඇමතිව පත් කරන්නේ ඒ ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න? වගාව සරු වුණේ නැති වුණාට ඇමතිතුමන්ලා සරු වුණු බව මේ ලිපි ලේඛන පරීක්ෂා කිරීමේදී පෙනී යනවා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාම අත්සන් කරලා අරුන්දික ප්‍රනාන්දුගේ ළඟම හිතවතෙකුට කුරුණෑගල වැවිලි සමාගමේ සාරවත් ඉඩම් අක්කර 21, රූඩ් 1, පර්චස් 13ක් ලබා දීලා තිබෙනවා, ඒවා "නිසරුයි" කියලා. ඉතින් කොහොමද වැවිලි කර්මාන්තය ගොඩ එන්නේ? ඒකේ වවලා තිබෙන්නේ තේ, පොල්, රබර් නොවෙයි වෙනත් දේවල්.

ගරු සභාපතිතුමනි, කොහොම නමුත් අපේ ඉලක්කය මේකයි. අපි සූදානම්, මේ වෙනුවෙන් නිසි සැලැස්මක් හදන්න. දැන් අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ UNIDO එකත් එක්ක එකතු වෙලා, පොල් කර්මාන්තය ඉස්සරහට ගේන්න අවුරුදු 10ක සැලැස්මක් හදනවා. ඒ අනුව සමස්ත අමාත්‍යාංශයට ජාතික වැවිලි ප්‍රතිපත්තියක් හදලා, ඒ ජාතික වැවිලි ප්‍රතිපත්තිය අපි ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනවා. ඒ අනුව ප්‍රතිපත්තියක් හදනවා, මේ වැවිලි කර්මාන්තයට. ඒකට අනුකූලව පොල් කර්මාන්තයටත් දස අවුරුදු සැලැස්මක් හදනවා. අපි ඒවා අනුමත කරගෙන ඉදිරියේදී වැඩ පටන් ගන්න සූදානමින් ඉන්නවා.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම කියන්න කැමතියි, 2024දී අපි පොල් ගෙඩි මිලියන 2,754යි නෙළා ගත්තේ කියන එක. පොල් පර්යේෂණ ආයතනයේ දත්ත අනුව මම මේ කියන්නේ. අපට වාර්ෂිකව පොල් ගෙඩි මිලියන 3,000ක් ඕනෑ. ඒ අනුව ඔබතුමා කියපු සමහර සංඛ්‍යා වැරදියි. ඔබතුමා කිව්වා, පොල් පරිභෝජනය දවසකට ගෙඩි මිලියන 2කින් විතර අඩු වෙලා තිබෙනවාය කියලා. නමුත් අපට අඩු වුණේ ඇත්තටම ගෙඩි මිලියන 250ක විතර ප්‍රමාණයක්. අපේ ඉලක්කය මම මේ කියන්නේ. 2025 වසරේ අපි එය ගෙඩි මිලියන 2,900ට ගේන්න බලාපොරොත්තු වෙනවා. ඒත් ගෙඩි මිලියන 3,000ට ගේන්න බැහැ, තිබෙන තත්ත්වය අනුව. හැබැයි, 2030 අවුරුද්ද වනවිට, අපේ ආණ්ඩුවේ පළමුවැනි වටයේ කාලය අවසන් වෙනකොට අපි ඒක ගෙඩි මිලියන 4,200ට ගේන්න සැලසුම් කරලා තිබෙනවා.

අපනයන ආදායම ගත්තොත්, 2023 අවුරුද්දේ පොල් නිෂ්පාදන අපනයනය කරලා අපට ලැබුණේ ඩොලර් මිලියන 700.47යි. අපි මේ අවුරුද්දේ බලාපොරොත්තු වෙනවා, එය ඩොලර් මිලියන 900 දක්වා වර්ධනය කරන්න; ඒකේ වර්ධනයක් ලබා ගන්න අපි සැලසුම් කරලා තිබෙනවා; ඒක පුරෝකථනය කරලා තිබෙනවා. අපේ ආණ්ඩුවේ මෙවර වසර 5 අවසන් වෙනකොට අපි සැලසුම් කරලා තිබෙනවා, ඒ ප්‍රමාණය ඩොලර් මිලියන 1,500ක් දක්වා වර්ධනය කරන්න. 2030 වෙනකොට ඒක ඩොලර් මිලියන 1,500ට අපි ගේනවා. දැන් අපි නිලධාරි මහත්වරුන් එක්ක ඒ ගැන සාකච්ඡා කරමින් ඒකට අදාළ සැලසුම් සකස් කරමින් සිටිනවා. ඒ වෙනුවෙන් මේ අවුරුද්දේ නව වගා ආරම්භ කරන්න, පාළු හිටවන්න, ගෙවතු වගා කරන්න සූදානම් කරලා තිබෙනවා. අපි මෙවර අක්කර 36,000ක පොල් වගා කරන්න සැලසුම් කරලා තිබෙනවා. නිකම්ම අක්කර ගාණ දාලා බැහැ. ඒ සඳහා අපි බීජ තවාන් ටික සකස් කරන්න ඕනෑ. ඒ සඳහා පොල් පැළ අවශ්‍යයි. අපි ඒ සඳහා පොල් පැළ තවාන් මේ වෙනකොට සූදානම් කරලා තිබෙනවා; ඒ සියල්ල සූදානම්. අපි පැළ මිලියන 2.56ක තවාන් සූදානම් කරලා තිබෙනවා. අපි ස්තුතිවන්ත වෙනවා, රුසියානු සමූහාණ්ඩුවට. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, අවුරුදු 5ක් පොහොර දැම්මේ නැහැ කියලා. මේ ආණ්ඩුව ආවාට පස්සේ රුසියානු සමූහාණ්ඩුවත් එක්ක සාකච්ඡා කරලා පොහොර නැවක් සහනාධාර ක්‍රමයට ලංකාවට ගෙන්වා ගත්තා. ඒ ගෙනාවේ MOP පොහොර. ඒක පොල් පොහොර බවට පත් කරලා, මේ මාසය අවසානයේ ඉඳලා ගොවි ජනතාවට සහනාධාර ක්‍රමයට රුපියල් 9,000ක් වන පොහොර මිටිය රුපියල් 4,000ට ලබා දෙන්න සූදානම්. ඒ අනුව අපි ජනතාවට දෙන සහනය මුදලින් තක්සේරු කළොත් ඒක රුපියල් මිලියන 5,670ක්. මේ වසරේ පොල් ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දෙන්න රුපියල් මිලියන 5,670ක් වෙන් කර තිබෙනවා. අපට පොහොර මෙට්‍රික් ටොන් 56,700ක් තිබෙනවා, සහනාධාර ක්‍රමයට බෙදන්න. මේ මාසයේ අපි පටන් ගන්නවා, අක්කර 5ට අඩු කුඩා පොල් වතු හිමියන්ට ඒ පොහොර ලබා දෙන්න. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ රටේ පොල්, රබර්, තේ වගාවන් සක්‍රිය කරලා තිබෙන්නේ කුඩා වතු හිමියෝ. පොල් ක්ෂේත්‍රයෙන් සියයට 82ක්ම කුඩා පොල් වතු හිමියෝ තමයි ඉන්නේ. ඔවුන්ට අපි මේ පොහොර ටික ලබා දෙනවා.

ඒ වාගේම පොල් වගාවට බලපා තිබෙන රෝග මර්දනය සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කර තිබෙනවා. අපේ රටේ පොල් කර්මාන්තයේ නියැළෙන අය මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, "සුදු මැස්සා" රෝගය. ඒ වාගේම දකුණු පළාතේ වැලිගම තිබෙනවා, පොල් කොළ මැලවීමේ රෝගය. ඒ රෝගය මඩින්න පසුගිය ආණ්ඩු එක ගසකට දුන්නේ රුපියල් 3,000යි. අපි සූදානම්

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

වෙනවා, මේ වසරේදී ඒ මුදල රුපියල් 10,000 දක්වා වැඩි කරන්න. ඒ සඳහා රුපියල් මිලියන 110ක් වෙන් කරන්න අපි සූදානම් කර තිබෙනවා. ඒ වාගේම, ජනාධිපතිතුමාත් මේ සභාවේදී කියපු කාරණයක් ගැන අපි සතුටින් කියන්න කැමැතියි. උතුරු පළාත අවුරුදු 30කට වැඩි කාලයක් යුද්ධයක නියැළුණා. ඔවුන්ට සංවර්ධනය බොහොම අඩුවෙන් තමයි ගලාගෙන ගියේ. අපි මේ වතාවේ උතුරු පොල් ත්‍රිකෝණයේ නව ඉඩම් අක්කර 16,000ක් පොල්වලින් සංවර්ධනය කරන්න සූදානම් කර තිබෙනවා. ඒ වෙනුවෙන් අපි රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. එ් සියලුම පොල් පැළ නොමිලේ ලබා දෙනවා. ඒ සඳහා පොල් පැළ 1,024,000ක් සූදානම් කර තිබෙනවා. පොල්වලට අවශ්‍ය පොහොරත් අපි උතුරේ ජනතාවට නොමිලයේ ලබා දෙනවා. ඒ පොහොර සහනාධාරය ලබා දෙන්න අපි රුපියල් ලක්ෂ 819ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, උතුරේ පොල් ත්‍රිකෝණයට අයත් ඉඩම්වලට drip irrigation ක්‍රමය යටතේ කුඩා ජල පද්ධති ලබා දෙන්න අක්කරයකට රුපියල් 13,000 ගාණේ, අක්කර 9,608කට මුදල් වෙන් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ පොල් ගසකින් ලබන්න පුළුවන් අස්වැන්න වාර්ෂිකව ගෙඩි 55යි. හැබැයි, දකුණු ඉන්දියාව පොල් ගසකින් වාර්ෂිකව ගෙඩි 80ක අස්වැන්නක් ලබනවා. උතුරු පොල් ත්‍රිකෝණය සහ දකුණු ඉන්දියාව අතර ටිකක් සමදේශගුණික තත්ත්වයන් තිබෙන්නේ. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, වාර්ෂිකව පොල් ගෙඩි 55ක් ලෙස ලබන ඵලදාව, පොල් ගෙඩි 80 දක්වා වැඩි කරන්න. උතුරේ විතරක් නොවෙයි, 2030 වනකොට රට පුරාම පොල් ඵලදාව වැඩි කරන්න අවශ්‍ය කටයුතු අපි සිදු කරනවා. ඒකට තෙතමනය ආරක්ෂා කර ගන්න ඕනෑ. රෝග ටික මර්දනය කර දෙන්න ඕනෑ. පොහොර ටික දෙන්න ඕනෑ. නව රජය හැටියට මේ තිබෙන අමරු මූල්‍ය තත්ත්වය යටතේ වුණත් ඒ වෙනුවෙන් කටයුතු කරන්නට අපි සූදානම් කියන එක මම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම, මේ වසරේ පොල් කර්මාන්තය වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් හැටියට පොල් සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 750ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. අපි උතුරේ අක්කර 16,000ක් පොල් වගා කරනකොට, අනෙක් පළාත්වලත් අක්කර 20,000ක පොල් වගා කරන්න සැලසුම් කර තිබෙනවා. ඒ වාගේම, පොල් පර්යේෂණ ආයතනයට පර්යේෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 100ක් මේ වතාවේ වෙන් කළා. "කප්රුක" අරමුදලට රුපියල් මිලියන 20ක් වෙන් කළා. අය වැයෙන් වෙන් කර තිබෙන මුදල්වලට අමතරවයි ඒ මුදල් වෙන් කර තිබෙන්නේ. අපේ ආයතන සතුවත් වෙනත් අරමුදල් තිබෙනවා. ඒවාත් අරගෙන අපි මේ අවුරුද්දේ මුදල් යොදවන්න සූදානම් කර තිබෙනවා. ඒ වාගේම, 2025 වසර තුළ පොල් සංවර්ධන අධිකාරිය හරහා රුපියල් මිලියන 554.39ක් පොල් වගාව වෙනුවෙන් යොදවන්න සූදානම්. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රුපියල් මිලියන 1,936.67ක් මේ සඳහා යොදවන්න සූදානම්. හලාවත වැවිලි සමාගම පොල් කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 1,235ක් යොදවන්න සූදානම්. ඒ නිසා අපි මේ කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් වැඩ කරන්න සූදානම් වෙලා ඉන්නවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, තේ කර්මාන්තය ගැනත් මම කථා කරන්න ඕනෑ. ඔබතුමන්ලා කිව්වා වාගේ එක් යුගයක, "Ceylon Tea" කිව්වාම ලංකාව, ලෝකය හඳුනා ගත්තේ ඒ තේ නාමයෙන්. මේක ලෝකයේ තේ රජු හැටියට හිටපු රට. වතුරවලට පස්සේ තවමත් ලෝකයේ මිනිස්සු වැඩියෙන්ම පානය කරන්නේ තේ. තේ කියන්නේ එතරම් ජනප්‍රිය පානයක්. අපි තේ කර්මාන්තයෙන් ලෝකයේ අංක එකට හිටපු රට. නමුත්, 1962 අවුරුද්ද වනකොට අපේ රට තේ කර්මාන්තයෙන් ලෝකයේ දෙවැනි ස්ථානය දක්වා පහත වැටුණා. අද වනවිට අපි තේ නිෂ්පාදනය අතින් ලෝකයේ 4වැනි ස්ථානය දක්වා පහත වැටිලා ඉන්නවා. 1962 අවුරුද්දේදී තේ නිෂ්පාදනය අතින් අපි ලෝකයේ දෙවැනි ස්ථානයේ ඉන්නකොට, කෙන්යාව හිටියේ 16වැනි තැන. අද කෙන්යාව 3වැනි ස්ථානයට ඇවිල්ලා, අපි 4වැනි ස්ථානය දක්වා පහත වැටිලා තිබෙනවා. එහෙනම්, අපට කොතැන හරි වැරදිලා තිබෙනවා. සැලසුම් වැරදිලා තිබෙනවා; නායකත්වය වැරදිලා තිබෙනවා. ඒ නිසා අපි සූදානම්, මේ කඩාගෙන වැටුණු තේ කර්මාන්තය ක්‍රමානුකූලව ඉහළට නග්ගන්න. හැබැයි, ඒක දවසකින්, දෙකකින් කරන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. අර්බුද, අභියෝග විශාල ප්‍රමාණයක් තිබෙනවා. තේ කර්මාන්තයේත් ඇත්තම පංගුකාරයා විධියට විශාල කාර්යභාරයක් කරන්නේ, ශක්තියක් දෙන්නේ කුඩා තේ වතු හිමියෝ. තේ කර්මාන්තයේ සිටින අයගෙන් සියයට 75ක් ඉන්නේ කුඩා තේ වතු හිමියෝ. ඔවුන්ට මම ස්තුතිවන්ත වෙනවා. අපේ තේ කර්මාන්තය මෙවැනි තත්ත්වයකට පත් වුණේ ඇයි? මම මුලින් කිව්වා වාගේ අපේ සැලසුම්වල, ප්‍රතිපත්තිවල ප්‍රශ්නයක් තිබෙනවා. අපි සූදානම්, ඒක වෙනස් කරලා මේ කර්මාන්තය ඉදිරියට ගන්න. ඒ සඳහා අපි දැන් තේ කර්මාන්තයට අවශ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සැලසුම් සකස් කරමින් ඉන්නවා. අපේ තේ කර්මාන්තයට මෙහෙම වෙන්න අපේ අමාත්‍යාංශ ගත්ත වැරදි තීන්දු බලපෑවා. වංචා, දූෂණ මේවා ඇතුළේ පිරිලා තිබෙනවා කියන එක මට ඔබට කියන්න ඕනෑකම තිබෙනවා. මේ රටේ පාලකයන්ගේ තිබුණු දෝෂ, සමහර නිලධාරීන්ගේ තිබුණු දෝෂ මේවාට බලපෑවා.

ගරු සභාපතිතුමනි, අද මම සන්තෝෂයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මේ කර්මාන්තය නිවැරදිව ඉදිරියට ගෙනියන්න දේශපාලන නායකත්වය දෙනකොට, අපේ රාජ්‍ය නිලධාරිනුත් අවංකව වැඩ කරන්න සූදානම්. දැන් අපේ අමාත්‍යාංශවල සිටින සමහර නිලධාරීන් රාත්‍රී 10.00, 11.00 විතර වෙනකම් වැඩ කරන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. අපි ඔවුන්ට ඒ ගරුත්වය දෙන්න කැමැතියි. ඔවුන් ඒ සඳහා කැප වෙනවා; ඇප වෙනවා. ඉතිහාසය බැලුවාම අපට පේනවා, පසුගිය කාල වකවානුවේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශාල මුදලක් තිබුණු බව. අළෙවි ප්‍රවර්ධනයට කියලා ඔවුන් වැඩසටහන් හැදුවා. ඒ සඳහා පසුගිය කාලයේ රුපියල් මිලියන 4,953.83ක් වැය කර තිබෙනවා. අළෙවි ප්‍රවර්ධනයට හැදුවා, නිර්මාණාත්මක රූපවාහිනී දැන්වීමක්. අවුරුදු 8ක් යනකල් එය ප්‍රචාරය කරන්න බැරි වුණා. ඔන්න තත්ත්වය! ඒවායේ දූෂණ, වංචා පිරිලා තිබෙනවා. COPE එකේදී මේවා ගැන ප්‍රශ්න කරලා තිබෙනවා. මේකට වෙබ් පිටුවක් හදන්න තීන්දු කරලා තිබෙනවා. එය ඉංග්‍රීසි භාෂාවෙන් හදන්න ඩොලර් ලක්ෂයක් යොදවා තිබෙනවා. ඊළඟට, භාෂා පරිවර්තනයටත් - තවත් භාෂා හතකට පරිවර්තනය කරන්න - ඩොලර් ලක්ෂය ගණනේ යොදවා තිබෙනවා. ඒ අනුව වෙබ් පිටුව හදන්න වෙන් කළ මුළු මුදල රුපියල් ලක්ෂවලින් ගත්තොත්, 1,729ක්. හැබැයි ඒක පරිශීලනය කරලා තිබෙන්නේ, වසර තුනක් ඇතුළත, 165,656දෙනායි. එයිනුත් සියයට 73ක් ශ්‍රී ලාංකිකයන්. තේ ප්‍රවර්ධනය කරන්න ඕනෑ, විදෙස් රටවලට. නමුත් ඔන්න ඔහොමයි කෙරුණේ! දැන් ඒවාට පරීක්ෂණ යන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. වගාව වර්ධනය කරන්න හරි, නිෂ්පාදනය ප්‍රවර්ධනය කරන්න හරි දායක නොවුණාමයි කියලා මම කියන්නේ නැහැ. නමුත් විශාල වංචා, දූෂණ සිදුවෙලා තිබෙනවා.

අපේ අමාත්‍යාංශයට ලැබුණු මුදල් පසුගිය කාලයේ, සෑහෙන්න අපතේ ගිහිල්ලා තිබෙනවා. වංචා, දූෂණවලට ලක්වෙලා තිබෙනවා. එක ව්‍යාපෘතියකට - ASMP එකට - අපි ලෝකයෙන් ණයක් ගත්තා, ගරු සභාපතිතුමනි. ඒ ව්‍යාපෘතියෙන් අපේ රටේ ආයෝජකයන්ට, ව්‍යවසායකයන්ට උදව් කළා. කවුද ඒ

සල්ලි ගන්නේ? එවකට හිටපු ප්‍රාථමික කර්මාන්ත ඇමති දයා ගමගේ මහත්මයාගේ බිරින්දෑ අනෝමා ගමගේ රුපියල් ලක්ෂ 140ක් ගන්නවා, කෘෂි ව්‍යාපෘතියකට; දම්පු තැනක් නැහැ; හොයන්න බැහැ. මේ, වැවිලි භෝග සංවර්ධනයට දීපු සල්ලි. ඉතින් කොහොමද රටක් හදන්නේ? හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩට -අපි දැන් ඒ ණය ගෙවනවා, ලෝකයට- රුපියල් ලක්ෂ 180ක් දීලා තිබෙනවා, ව්‍යාපෘතියක් කරන්න. හිටපු අමාත්‍යාංශ ලේකම්තුමා බන්දුල වික්‍රමාරච්චි, තමන්ගේ පුතාගේ නම දමලා රුපියල් ලක්ෂ 82ක් අරගෙන තිබෙනවා. එතකොට කොහොමද කුඩා තේ වතු හදන්නේ? කොහොමද රබර් වගාව කරන්නේ? කොහොමද පොල් වගාව කරන්නේ? ඔන්න ඔහොමයි ඒ කට්ටිය වගාව කරලා තිබෙන්නේ. වැරදුණු තැනුයි මම ඒ පෙන්වා දුන්නේ. මේවා ද්වේෂයෙන්, වෛරයෙන් කියන කථා නොවෙයි. මේවා රටත් දැන ගන්න ඕනෑ, ඔබතුමන්ලාත් දැන ගන්න ඕනෑ. අපි දේශපාලන නායකත්වය දෙන්නේ එතැනට නොවෙයි, ගරු සභාපතිතුමනි.

STaRR Project කියලා එකක් ආවා, තේ වගාව, රබර් වගාව ප්‍රවර්ධනය කරන්න. රුපියල් මිලියන 8,003ක් වෙන් කළා. ඒකෙන් යමක් නොවුණාය කියලා මම කියන්නේ නැහැ. හැබැයි ආපස්සට බලනකොට වෙලා තිබෙන්නේ මොකක්ද? අපි දැන් පරීක්ෂණයක් තීන්දු කරලා තිබෙනවා, ඒ සම්බන්ධයෙන්. තේ වගාව කෝ කියලා අහනකොට සමහරු ගිහිල්ලා තේ වගාව කියලා බෝංචි වගාව පෙන්වනවා. රබර් වගාවට අදියර තුනක් යටතේ ණය ආධාර දීලා තිබෙනවා. පළමුවැනි අදියර දීලා බලලා තමයි දෙවැනි අදියර දෙන්න ඕනෑ; තුන්වැනි අදියර දෙන්න ඕනෑ. නමුත් දේශපාලනඥයෝ ලැයිස්තු යැව්වා, මේ මේ කට්ටියට දෙන්න කියලා. නිලධාරින්ට බලපෑම් කළා. බලනකොට රබර් වගා කරපු ඉඩම හොයා ගන්න නැහැ. රබර් නැහැ. රුපියල් මිලියන 8,003ක් ඒ විධියට වැය කළා. යමක් නොවුණාය කියන්නේ නැහැ. නමුත් දේශපාලනය බලපෑවේ ඒ විධියට. එතකොට කොහොමද ගරු සභාපතිතුමනි, වගාවක් -වැවිල්ලක්- ලෝකයේ අංක එකට ගෙනෙන්නේ? කොහොමද, නිෂ්පාදනය ඉහළ දමන්නේ? කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් මම සන්තෝෂයෙන් කියනවා, අපි තේ කර්මාන්තයේ ඉලක්කය වෙනස් කරනවා. පසුගිය වසරේ -2024- තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 262.15යි. අපි ඒක 2025දී - මේ අවුරුද්දේදී- කිලෝග්‍රෑම් මිලියන 275ට ගෙනෙන්න සූදානම්. මේ අවුරුද්දේ කිලෝග්‍රෑම් මිලියන 275ට ගෙනෙනවා. ඔබතුමන්ලාට අපි කියන්න සූදානම්, වසර පහක් අවසාන වෙනකොට අපි ඒ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 400 දක්වා ඉහළට ගෙන යන්න සැලසුම් කරලා තිබෙන බව. ගිය අවුරුද්දේ ආදායම තිබුණේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 1.4යි. අපි ඒක මේ අවුරුද්දේ ඩොලර් මිලියන 1.7ට ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා; පුරෝකථනය කරලා තිබෙනවා. 2030දී ආදායම ඩොලර් බිලියන 2.5ට ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා; ඩොලර් මිලියන 2,500ට ගෙනෙන්න සැලසුම් කරනවා. අපි අනිවාර්යයෙන්ම ඒ ඉලක්කයට යන්න සැලසුම් කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි.

අවුරුදු පහක උපාය මාර්ගික සැලැස්මක් මේ වෙනකොට අපි සකස් කරමින් ඉන්නවා. මේ අවුරුද්දේදී -2025දී- එහි ආරම්භය විධියට අපි කුඩා තේ වතු හිමියන්ට පොහොර ටික දෙන්න, තේ වතු හිමියන්ට පොහොර ටික දෙන්න, පසුගිය අවුරුදුවල තිබුණු සංකීර්ණ ක්‍රම වෙනස් කරන්න දැන් සාකච්ඡා කරනවා; සරල ක්‍රමයකට නොපමාව පොහොර ටික දෙන්න සැලසුම් කරනවා; ප්‍රමිතියෙන් යුතු පොහොර ටික දෙන්න සැලසුම් කරනවා. ඒ වාගේම එක සමාගමකින් පොහොර ගත්ත එක වෙනුවට වෙළෙඳ පොළේ තිබෙන අනෙක් සමාගම්වලටත් ඒ කටයුත්ත විවෘත කරන්න අපි දැන් සාකච්ඡා කරමින් ඉන්නවා. මේ අවුරුද්දේ අය වැයෙන් අපි පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 800ක් වෙන් කළා. ඒ සඳහා අපි ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් රුපියල් මිලියන 2,000ක් බලාපොරොත්තු වෙනවා. ගිය වසරේත් ඔවුන් තමයි ඒ සඳහා දායකත්වය දුන්නේ. ඒ අනුව අපි රුපියල් මිලියන 2,800ක් පොහොර සහනාධාරයට වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ඔබතුමන්ලා කිව්වා වාගේම, දලුවල ගුණාත්මකභාවය වැඩි කරන්න ඕනෑ; එලදායීතාව වැඩි කරන්න ඕනෑ. ඒවාට අපි නව රජයක් හැටියට සැලසුම් සකස් කරනවා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම ප්‍රංශ තාක්ෂණික ආධාර මත ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් අපි "Ceylon Tea" නාමය සඳහා යුරෝපය තුළ GI certification එක, භූගෝලීය දර්ශකය ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. එතකොට අපට ලෝකයේ විශේෂ තැනක් එනවා, අපේ අනන්‍යතාවට තැනක් එනවා, අපේ සංස්කෘතියට තැනක් එනවා.

අපි මේ අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 35ක මුදලක් වෙන් කර තිබෙනවා, තේ කර්මාන්තය සඳහා අවශ්‍ය ප්ලාස්ටික් කූඩ ලබා දෙන්න, නයිලෝන් බෑග් ලබා දෙන්න. ඒ වාගේම අධි ඝනත්ව වගාව සඳහා රුපියල් මිලියන 60ක්, සුහුරු දලු නෙළීමේ කාර්යය සඳහා මිලියන 35ක්, තේ පර්යේෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 61.2ක්, තේ නැවත වගාව සඳහා රුපියල් මිලියන 585.21ක්, තේ නව වගාව සඳහා රුපියල් මිලියන 275.1ක් සහ තේ වගා පුනරුත්ථාපනය වෙනුවෙන් රුපියල් මිලියන 550.33ක් වශයෙන් අපි මුදල් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, ඌන උපයෝජිත වතු සම්බන්ධවත්. ගරු ජනාධිපතිතුමාත් මේ ගැන කිව්වා. ඌන උපයෝජිත වතු කිව්වාම, ඒවා රජයේ වතු වෙන්න පුළුවන්, පෞද්ගලික වතු වෙන්නත් පුළුවන්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Samantha Viddyarathna, you have two more minutes.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු සභාපතිතුමනි, මට වෙන් කර තිබෙන සම්පූර්ණ වෙලාවෙන් තව විනාඩි 5ක් විතර ලබා දෙන්න කියා ඉල්ලනවා.

ඌන උපයෝජිත වතු ටික පෞද්ගලික අංශය වෙත ලබා දෙන්න අපි කටයුතු සූදානම් කර තිබෙනවා. මේවා නිකම් ඉඩම් විධියට තියන්න පුළුවන්කමක් නැහැ. රටට ආදායමක් ගෙනෙන්න පුළුවන් නම්, අපේ දිළිඳු ජනතාව ශක්තිමත් කරන්න පුළුවන් නම් ඒ වතු ලබා දෙන්න අපි සූදානම්. අපි දැන් ඊට අදාළ තොරතුරු ගණනය කරමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, රබර් වගාවත් තේ වගාව හා සමානයි. අපේ රටේ රබර්වලට ලොව ප්‍රබල පෙළේ තැනක් තිබුණා. රබර්වලට අපේ රටේ ඉතිහාසයක් තිබුණා. ලෝකයේ පළමුවෙනි රබර් පර්යේෂණ ආයතනය ශ්‍රී ලංකාවේය කියනවා. නමුත් අද අපේ රබර් කර්මාන්තය කඩා වැටිලා තිබෙන්නේ. දැන් අපි ලෝකයේ 4වැනි තැනින් 12වැනි තැනට වැටී තිබෙනවා. ඉතිහාසයේ අපි රබර් කර්මාන්තය අතින් ලෝකයේ 4වැනි තැන සිටියේ. දැන් අපි 12වැනි තැන ඉන්නේ. ඒකටත් වුණේ අර අභාග්‍යසම්පන්න සිදුවීමම තමයි.

අද වෙනකොට දේශීය රබර් නිෂ්පාදනය ටොන් 65,000ක්. හැබැයි, අපේ රටේ නිෂ්පාදන කර්මාන්තවලට රබර් ටොන්

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

150,000ක් අවශ්‍යයි. දැන් අපි රබර් අපනයනය කරනවා නොවෙයි, වැඩි හරියක් ආනයනය කරනවා. කොහොම නමුත් අපි සූදානම් මේක වෙනස් කරන්න. ඒ සඳහා සැලැස්ම හැදෙනවා. ඇත්තටම දැන් රබර් කර්මාන්තයට කුඩා ගොවීන් තමයි වැඩිම දායකත්වය දෙන්නේ. සියයට 75ක් රබර් නිෂ්පාදනයේ නියැළෙන්නේ කුඩා ගොවීන්. ගරු සභාපතිතුමනි, 2024 අවුරුද්දේ අපනයන ආදායම විධියට තිබුණේ ඩොලර් මිලියන 990යි. නමුත් අපි මේ අවුරුද්දේ රබර්වලින් එන ආදායම ඩොලර් මිලියන 1,070ට වැඩි කරන්න ඉලක්ක කර තිබෙනවා; පුරෝකථනය කර තිබෙනවා. 2030 වසර වෙනකොට; මේ වසර 5 අවසන් වෙනකොට එම ආදායම ඩොලර් බිලියන 2ට ගෙනෙන්න අප සැලසුම් කරනවා. මේ වනවිට තේ, පොල්, රබර් කියන තුනෙන්ම ඩොලර් බිලියන 3ක විතර තමයි ආදායම එන්නේ. එම ආදායම මේ වසර 5 අවසන් වනවිට බිලියන 6ට ගෙනෙන්න අදාළ සැලසුම් සකස් වෙමින් තිබෙනවා. ඒ සඳහා අපි සූදානම් කියන පණිවුඩයත් අපි ලබා දෙනවා.

අපි මේ රබර් කර්මාන්තයත් ඉස්සරහට ගෙනෙන්න සූදානම්. අපි අද අලුතින් රබර් ගස් හිටෙව්වාට අවුරු 5ක්වත් යනකම් අපට ඒවායෙන් කිරි කපන්න වෙන්නේ නැහැ. ඒකට කාලයක් ගත වෙනවා. නමුත් තිබෙන ගස්වලින් කිරි ලබා ගන්න පුළුවන්. ඉහෝක් රබර් වතුවල කිරි කැපෙන්නේ නැහැ. රත්නපුර, කෑගල්ල ආදී ප්‍රදේශවල තිබෙන රබර් වතු නැවත කිරි කපන තත්ත්වයට අපි ගෙනෙන්න ඕනෑ. ඒ සඳහා කිරි කපන්නන් පුරුදු කරන්න ඕනෑ, වැසි ආවරණ දෙන්න ඕනෑ. පසුගිය අවුරුදුවල රබර් කර්මාන්තයට අවශ්‍ය පොහොර දුන්නේ නැහැ. නමුත් අපි මේ අවුරුද්දේ සහනාධාරයක් හැටියට පොහොර ලබා දෙන්න සූදානම්. ඒ වාගේම අපි මේ අවුරුද්දේ අක්කර 1,640ක නව වගාව ඇති කරනවා. නැවත වගා කරනවා, අක්කර 860ක්. පැළ නිෂ්පාදනයට වෙන් කර තිබෙනවා, රුපියල් මිලියන 146ක්. වැසි ආවරණ දීමට මිලියන 60ක් වෙන් කර තිබෙනවා. රබර් වගාවට අවශ්‍ය සහනාධාර ලබා දීමට අපි මිලියන 3,336.1ක් වෙන් කර තිබෙනවා. පොහොර සහනාධාරයට මිලියන 43ක් වෙන් කර තිබෙනවා. රබර් කර්මාන්තයට අදාළ පර්යේෂණවලට මිලියන 204ක් අපි වෙන් කර තිබෙනවා. ඒ අනුව ගරු සභාපතිතුමනි, අපි රබර් කර්මාන්තය වෙනුවෙන් සැලකිය යුතු වැඩ කොටසක් කරනවා.

අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන අනෙක් ප්‍රධාන කාර්යය තමයි ප්‍රජා යටිතල පහසුකම් සැලසීම. ඇත්තම ගත්තොත්, මේ රටේ සිටින විශාල පිරිසක් තේ කර්මාන්තයේ නියැළෙනවා. හැබැයි, ඔවුන්ගේ ජීවිතය තේ තරම් රසවත් නැහැ. තවම ඒ අයට ඉඩමක් නැහැ, නිවසක් නැහැ. විශේෂයෙන්ම අපේ මලයගම් ප්‍රජාවට, වතුකරයේ ප්‍රජාවට ලිපිනයක් නැහැ, උප්පැන්නයක් හරියට නැහැ. අයිතියක් නැහැ. අපි සූදානම්, ඒ දේවල් ලබා දීමට. මෙහිදී අපි ඉන්දියාවටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, ඉන්දියානු ආධාර ක්‍රමය යටතේ අපි මෙවර අලුත් නිවාස 4,700ක් ඉදිකරනවා. පසුගිය අවුරුද්දේ නිවාස 1,300ක වැඩ පටන් ගෙන තිබෙනවා. නමුත් ඒවායේ වැඩ අවසන් නැහැ. එම නිවාස 1,300හි වැඩ කටයුතුත් අපි මේ අවුරුද්දේ අවසන් කරනවා. ඒ අනුව අපි නිවාස 6,000ක් සම්පූර්ණ කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, මේ සියල්ල වෙනුවෙන් -වතුකර ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් වෙනුවෙන්, ව්‍යක්තීය පුහුණුව ලබා දීම වෙනුවෙන්- රුපියල් මිලියන 1,800ක් වෙන් කර තිබෙනවා. වතුකරයේ දරුවන්ට සුහුරු පන්ති කාමර ලබා දෙන්න රුපියල් මිලියන 600ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම වැඩ නිම නොකළ නිවාසවල වැඩ අවසන් කරන්න රුපියල් මිලියන 763ක් වෙන් කර තිබෙනවා. නව නිවාස ඉදිකරන්න ඉන්දියානු ආධාර යටතේ රුපියල් මිලියන 3,500ක් වෙන් කර තිබෙනවා. වතුකරයේ දරුවන්ගේ පෝෂණ තත්ත්වය වෙනුවෙන්, ඔවුන්ගේ ළමා සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 650ක් වෙන් කර තිබෙනවා.

ඊළඟට, කුරුඳු, තල්, කජු, කිතුල් යනාදී කර්මාන්තවලටත් අපි අවධානය යොමු කර තිබෙනවා. පසුගිය අවුරුද්දේ කුරුඳු අපනයනයෙන් අපේ රටට උපයාගෙන තිබෙන්නේ ඩොලර් මිලියන 176යි. අපි මේ 2025 අවුරුද්දේ එම ආදායම ඩොලර් මිලියන 260ට ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා වගාව වෙනස් කරන්න ඕනෑ; ඒවාට අවශ්‍ය තාක්ෂණය ලබා දෙන්න ඕනෑ. ඒවාට අත හිත දෙන්න අපි සූදානම්. උතුරේ තිබෙන තල් වගාව සංවර්ධනය කරන්න අපි සූදානම්. මෙන්න මෙවැනි සැලසුමක් සහිතව අපි කටයුතු කරනවා. අපි තමුන්නාන්සේලාගේ සහාය ඉල්ලනවා මේ කාර්යභාරය කරගෙන යෑම සඳහා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Sajith Premadasa. You have been allotted six minutes.

[පූ.භා. 11.26]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු සභාපතිතුමනි, මා ඉදිරිපත් කරන්නට යන ජාතික ප්‍රශ්නය සාමාන්‍යයෙන් විපක්ෂ නායකවරයාට උදේට ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත්, සම්ප්‍රදායානුකූලව තිබුණු එම අවස්ථාව අද වන කොට අහිමි වෙලා තිබෙන නිසා මෙම වැය ශීර්ෂ සාකච්ඡාවට භාජන කරන අවස්ථාවේ එම කාරණාව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මහජන ආරක්ෂාව තහවුරු කරන කුලුනුවලින් එකක් තමයි පොලීසිය. අනෙක් එක, අධිකරණය. අද මේ වනවිට මේ කුලුනු දෙකම භයානක තර්ජනයකට මුහුණ දීලා තිබෙනවා. අධිකරණ ශාලාවට ඇවිත් සැකකරුවන්ව ඝාතනය කරනවා. අධිකරණය ගැන, විනිසුරුවන් ගැන තිබෙන බිය සැක, ගරුත්වය සම්පූර්ණයෙන් නැති වෙලා ගිහින් තිබෙනවා. උසාවි කුඩුවට ඇවිත් වෙඩි තියන කොට විනිසුරු පුටුවේ ඉන්න විනිසුරු විනිසුරුවරියන්ට ඇති වන කම්පනය වචනවලින් කියන්නට බැහැ. ඇත්ත වශයෙන්ම නැවතත් මේ වාගේ දේවල් සිදු නොවේවි කියලා මේ රජයට රටටත්, ජනතාවටත්, විනිසුරුවන්ටත් ලබා දෙන්න පුළුවන් සහතිකය මොකක්ද? අධිකරණය තුළ සිදු වුණු එම මීනී මැරුම; එම ඝාතනය සැලසුම් කරපු කාන්තාව මේ මොහොත වන විටත් සොයා ගන්නට බැරි වෙලා තිබෙනවා. එවකට පොලිස්පති උසාවි නියෝගයෙන් බෙරෙන්න මේ මොහොත වන විට හැංගිලා ඉන්නවා. පොලීසියේ අයටවත් බැහැ පොලිස්පති හොයා ගන්න. මේක ලොකු විහිළුවක්.

මුළු රටේම මහජන ආරක්ෂාව අවුල් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මා සඳහන් කරන්න කැමැතියි, ඊයේ දවසේ වුණු සිදුවීම් ගැන පමණක්. අපට ඒවා සුළුකොට තකන්නට බැහැ. ඊයේ මොනවාද වුණේ? බුද්ධ බන්ධනාගාරයේ සේවය කරපු, විශ්‍රාමික බන්ධනාගාර අධිකාරිවරයා මිලේච්ඡ ලෙස, අමු අමුවේ ඝාතනය

කළා. ගම්පහ, වැලිවේරිය ප්‍රදේශයේ තවත් වෙඩි තැබීම් ගණනාවක් සිද්ධ වුණා. අහුණුකොළපැලැස්ස ප්‍රදේශයෙන් තරුණයෙකුගේ මළ මිනියක් හමු වුණා. ඒ වාගේම මීගහකිවුල, තල්දෙන, මුතුර් වැනි බල ප්‍රදේශවල මිනිස් ඝාතන සිද්ධ වුණා; ජීවිත අහිමිවීම් සිද්ධ වුණා. ඉතින් මෙවන් තත්ත්වයක් තුළ අපේ රටේ මහජන ආරක්ෂාව සම්පූර්ණයෙන්ම පහළ මට්ටමකට වැටිලා තිබෙනවා. මේ රජය මෙහි වගකීම භාර ගන්නට ඕනෑ. අද වන විට අපේ රටේ තුන්බිය රජයන විශාලාමහනුවරක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒක තමයි සත්‍ය කථාව. මහපාරේ බැහැලා යන්නට බැහැ. ප්‍රචණ්ඩත්වය, මිලේච්ඡත්වය, මැරකම්, විවිධ කල්ලි කණ්ඩායම් ක්‍රියාත්මක කරන ත්‍රස්තවාදය මුළු සමාජයම වෙළාගෙන තිබෙනවා. අපි කියන්නේ නැහැ මේවා මැඩ පවත්වන්නට අපෙන් ටියුෂන් ගන්න කියලා. කාගෙන් හරි ටියුෂන් අරගෙන මේ ඝාතන රැල්ල, මේ මිලේච්ඡත්වය, මේ මිනී මැරුම් සංස්කෘතිය නතර කරන්න රජය පියවර ගන්න ඕනෑ. දැන් හිර ගෙවල්වල, බන්ධනාගාරවල සේවය කරන නිලධාරීන්ට විශ්‍රාම ගියාට පස්සේත් තර්ජන එල්ල වෙනවා නම්, ඒ අය රාජකාරි කරන්නේ කොහොමද? පොලීසිය ඇතුළු ආරක්ෂක අංශවල නිලධාරීන් රාජකාරි කරන්නේ කොහොමද?

ඒ නිසා මේ මිලේච්ඡ, මිනීමරු සංස්කෘතිය නතර කරන්න ජාතික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මේ මිනීමරු සංස්කෘතිය ඉවත් කරන්න, පරාජය කරන්න විපක්ෂයක් හැටියට අපේ උපරිම සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. කොහොමද නීතියේ ආධිපත්‍යය රජ වෙනවා කියන්නේ, හිටපු පොලිස්පති සොයා ගන්නට බැරි නම්; අධිකරණය තුළ සිදු කරපු ඝාතනය සැලසුම් කරපු කාන්තාව තවමත් සොයා ගන්නට බැරි නම්? ඒක බරපතළ තත්ත්වයක්. මම විශේෂයෙන්ම නීතිය හා සාමය විෂය භාර අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිනවා, මේ ඉදිරිපත් කරන කරුණු කාරණා විභිළුවට ලක් කරන්නේ නැතුව, සමච්චලයට ලක් කරන්නේ නැතුව කරුණාකර අවශ්‍ය කටයුතු කරන්න කියලා. මොකද, මෙය, මිනිස් ජීවිත පිළිබඳ ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් මේ රජය ලබා දෙන විසඳුම, උත්තරය රටට සහ මේ ගරු සභාවට වහාම ඉදිරිපත් කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Chamara Sampath Dasanayake. You have 16 minutes.

[පූ.භා. 11.32]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, අද වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ, එනම් අපේ පළාතේ ඇමතිවරයෙකුගේ අමාත්‍යාංශයට අයත් වැය ශීර්ෂ ගැනයි කථා කරන්නේ. මමත් බොහොම සතුටින් ඒ ගරු ඇමතිතුමාගේ කථාව අහගෙන හිටියා. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමා බලාපොරොත්තු වෙච්ච දේවල් අද ඉෂ්ට වෙලා නැහැ. ඒ දේවල් තවම ඉෂ්ට කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඔබතුමාගේ විසිල් විතරයි; තවම බල්ටි නැහැ. බල්ටි ගහලාත් පෙන්වන්න. විසිල් වගේම බල්ටිත් අවශ්‍යයි. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා තමයි ඒ දවස්වල අපට කිව්වේ, "ඔබතුමන්ලාගේ ආණ්ඩුව විසිල් විතරයි, බල්ටි නැහැ" කියලා. ඔබතුමාගේත් තවම විසිල් විතරයි, බල්ටි නැහැ. ඔබතුමා ඔය අමාත්‍යාංශය භාර ගත්තාට පසුව තමයි, එදා රුපියල් 100ට තිබුණු පොල් ගෙඩිය මේ රටේ ඉතිහාසයේ පළමුවරට අද රුපියල් 200ට ජනතාව ගන්නේ. ඒක ඔබතුමාගේ අවාසනාව. ඔබතුමා ගිහින් පොල් හැදුවේත් නැහැ, පොල් කැඩුවේත් නැහැ, පොල් වික්කේත් නැහැ. ඒක ඔබතුමාගේ අවාසනාව. ඔබතුමා ඔය අමාත්‍යාංශය භාර ගත්තාට පසුව ඉතිහාසයේ පළමුවෙනි වතාවට පොල් ගෙඩිය රුපියල් 100කින් වැඩි වෙලා තිබෙනවා. ඔබතුමාගේ වෙලාව හොඳ නැද්ද දන්නේ නැහැ. හදහන බලවාගන්න. අද පොල් ගෙඩියක මිල රුපියල් 100කින් වැඩි වෙලා තිබෙනවා. පොල් ගෙඩියක මිල රුපියල් 100කින් වැඩි වුණේ ඔබතුමා ඔය අමාත්‍යාංශය භාර ගත්තාට පසුවයි. ඒක ඔබතුමාට පිළිගන්න වෙනවා.

ගරු සභාපතිතුමනි, හරි නම් හෙට අපට පාර්ලිමේන්තුව නිවාඩු දෙන්න ඕනෑ. මොකද, හෙට උදේ 8.00 ඉඳන් 8.05 වනකල් සංගණනය තිබෙනවා. රිළා, වඳුරු සංගණනයට අපිත් යන්න ඕනෑ. එහෙම නැත්නම් අප 225දෙනාත් එකතු කරලා දමයි ඒ ගණනට. මේ 225ත් එකතු කරන්න කියාවි ඒ ගණනට. මේ රටේ විශාල වියදමක් කරලා සංගණනයක් කරන කොට අපේ වතුවල, අපේ ඉඩම්වල, අපේ ගෙවත්තේ ඒවා කවුද ගණන් කරන්නේ; අපි 225දෙනාගේ ඉඩම්වල ඒවා කවුද ගණන් කරන්නේ? ඒ නිසා අපටත් හෙට පාර්ලිමේන්තුව නිවාඩු දෙන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ අමාත්‍යාංශය භාර ගන්න කොට මාධ්‍ය ඉදිරියේ යම් යෝජනාවක් ගෙන ආවා මට මතකයි. හැබැයි, ඒ යෝජනාව යට ගියා; උඩට ආවේ නැහැ. අපිත් බලාගෙන හිටියා ඔබතුමාගේ යෝජනාව ක්‍රියාත්මක වෙයිද කියලා. ඔබතුමා කිව්වා, ලොකු ඉඩමක් අරගෙන ගෑනු රිළවු සහ පිරිමි රිළවු වෙනම දාලා මොකක්ද එකක් කරනවා කියලා. හැබැයි, ගෑනු රිළවු සහ පිරිමි රිළවු, ගෑනු වඳුරන් සහ පිරිමි වඳුරන් වෙනම දාලා තවම මොකක්වත් පටන් ගත්තේ නැහැ. අපි බලාපොරොත්තුවෙන් හිටියා ගෑනු රිළවු සහ පිරිමි රිළවු, ගෑනු වඳුරන් සහ පිරිමි වඳුරන් ගෙනැල්ලා ඔබතුමා මොකක් හරි වැඩ පිළිවෙළක් හදයි කියලා. අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා, ඔබතුමා ඒ කටයුත්ත කරාවි කියලා. මොකද දැන් රිළවුන්, වඳුරන් මරන්නත් බැහැ. ඔබතුමන්ලා දළ දා වහන්සේ ප්‍රදර්ශනය කරන්න හදද්දී ඒ සතුන් මරන්න කියලා උපදෙස් දෙන්න බැහැ නේ. ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා ඒ කාලයේ කියලා තිබුණා නේ, බොරුකාරයාගේ, තක්කඩියාගේ අවසාන තැන පන්සල කියලා. බොරුකාරයාගේ, තක්කඩියාගේ අවසාන තැන පන්සල කියලා තමයි ජනාධිපතිතුමා ඒ කාලයේ කිව්වේ. නමුත්, ඉතින් අපි කියන්න යන්නේ නැහැ දළ දා වහන්සේ, දළ දා මාළිගාව කාගේ තැන ද කියලා.

ගරු ඇමතිතුමනි, මේ අමාත්‍යාංශය හොඳයි. ඔබතුමා ජනාධිපතිතුමාටත් ස්තුති කළා, රුපියල් මිලියන දොළොස්දහස් ගණනක් දුන්නා කියලා. හැබැයි, මේ අමාත්‍යාංශයට මීට කලින් - ගිය වර- එකතු වෙලා තිබුණා, පැල්වත්ත, සෙවනගල සීනි කම්හල්; ඊට අමතරව එකතු කරලා තිබුණා තවත් කොටස් ගොඩක්. හැබැයි, දැන් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ එම ආයතන නැහැ. ඔබතුමා ඒක පිළිගන්න. ඉඩම්, වාරිමාර්ග කියන අංශ ඔක්කොම තිබෙන්නේ, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේයි. කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග ආදි හැම එකක්ම ඒකේ තිබෙනවා. ඒවා ගැන කථා කළා පෙරේදා අයවැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී. මම එය අහගෙන හිටියා. හැබැයි, මේ අමාත්‍යාංශය යටතේ එම ක්ෂේත්‍ර නැහැ.

ඔබතුමා දක්ෂයි නේ. ඔබතුමාගේ කථා අහන්න මේ රටේ මිනිස්සු කැමැතියි. ඔබතුමා විපක්ෂයේ හිටපු කාලයේ ලස්සනට කථා කළා නේ. ඔබතුමා දක්ෂයා නේ. ඔබතුමා මේ ආණ්ඩුව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා නේ. පසුගිය කාලයේ කාන්තාවෝ ඔබතුමාගේ කථා ඇහුවේ හිනා වෙවී නේ. හරියට

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ගුත්තිල හා මූසිලගේ වාදනය අහගෙන ඉන්නවා වාගේ නේ; කන්වල දෙබර බැඳුණු ඇත්තු ගුත්තිලගේ වීණා වාදනය අහගෙන ඉන්නවා වාගේ නේ. වීණා වාදනය අහන්න මුහුදේ මාළු ඉවුරට ආවා වාගේ මිනිස්සු ඇවිල්ලා අහගෙන හිටියා නේ, ඔබතුමාගේ කථා. නේද? ඔබතුමා ලස්සනට කථා කරන්න දක්ෂයි. ඔබතුමා හොඳ කථිකයා; ලස්සනට කථා කළා. එම නිසා ඔබතුමාට හොඳ අමාත්‍යාංශයකුත් දෙන්න ඕනෑ. මේ අමාත්‍යාංශයෙන් කරන්න පුළුවන් දේවල් මොනවාද කියලා මම දන්නවා. JEDB එක හැර අනෙක් වතු ඔක්කෝම කොම්පැනිවලට අයිතියි. ඉන්දියන් සහනාධාර යටතේ ඉන්දියාව කෙහොමත් නිවාස ආධාර දුන්නා. තොණ්ඩමන් මැතිතුමා මේ විෂයය භාරව ඉන්නකොටත් දුන්නා; දිගම්බරම් මැතිතුමා ඉන්නකොටත් දුන්නා. කොහොමත් ඒ ගෙවල් 4,000 හැදුවා. ගෙවල් 4,000ක්, 5,000ක් හදන්න ඉන්දියාව ආධාර දුන්නා. උඩරට පළාත නියෝජනය කළ තොණ්ඩමන් සීයාගේ ඉඳන් ඒගොල්ලෝත් අවුරුදු 70ක් තිස්සේ පුළුවන් විධියට ඒ වැඩ කරගෙන ආවා.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් වතුවල - இப்ப தோட்டத்தில சம்பளம் எவ்வளவு? 1,350 ரூபாய். ඒගොල්ලන්ගේ දෛනික පඩිය ගෙනාවා රුපියල් 1,350ට. හැබැයි, ඉල්ලන්නේ 1,750 ரூபாய் - රුපියල් 1,750ක් ඉල්ලනවා. මෙතුමන්ලාත් ඒ වෙනුවෙන් ලොකු සටනක් දුන්නා. රුපියල් 1,750ක පඩිය ලබා ගන්න දිගම්බරම් මන්ත්‍රීතුමන්ලා, තොණ්ඩමන් මන්ත්‍රීතුමන්ලා ලොකු සටනක් දුන්නා. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, දැන් ඒගොල්ලන්ට දොස් කියන්න එපා. ඔබතුමාගේ කථාව මම අහගෙන හිටියා. ඔබතුමා කථාව කරනකොට ඔබතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරු එළියේ හිටියේ. ඔබතුමාගේ කථාව කරනකොට ඔබතුමාත් එක්ක බදුල්ලෙන් ආපු හයදෙනා එළියේ හිටියේ. හැබැයි, මම අහගෙන හිටියා. මම ඒ කථාව හොඳට අහගෙන හිටියා. මොකද, පළාත් සභාවේ හිටපු කාලයේ ඔබතුමාගේ කථාව මම අහගෙන ඉන්නවා. මගේ කථාව ඔබතුමා අහගෙන ඉන්නවා. අපි දෙන්නා එදා ඉඳන් කරන දෙයක් නේ ඒක. ඉතිහාසයේ කවදාවත් නුවරඑළිය, මස්කෙළිය අපි පැරදිලා නැහැ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ, මස්කෙළිය, වලපනේ, කොත්මලේ, හපුතලේ හා පස්සර කියන ආසනවල තමයි උඩරට දෙමළ මිනිස්සු වැඩිපුරම ජීවත් වෙන්නේ. ඒ ආසන ඔක්කෝම ඔබතුමන්ලා පාර්ලිමේන්තු මැතිවරණයේදී ජයග්‍රහණය කළා. හැබැයි, ජනාධිපතිවරණයේදී අනුර කුමාර මහත්තයාට ඡන්දය දුන්නේ නැහැ නුවරඑළියේයි බදුල්ලේයි ජනතාව. ජනාධිපතිවරණයේදී ඒ ආසන ඔබතුමන්ලා පැරදුණා. සජිත් ප්‍රේමදාස මහත්මයා බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්ක දිනුවා. හැබැයි, පාර්ලිමේන්තු මැතිවරණයේදී වතුකරයේ ජනතාවගෙන් බහුතරයක් ඡන්දය දුන්නා, මාලිමාවට. ඒ ඉතිහාසයේ පළමු වතාවට. ඒ මිනිස්සු තමුන්නාන්සේලා ප්‍රතික්ෂේප කළේ නැහැ. දැන් ඒ මිනිසුන් බලාගෙන ඉන්නවා වතුවල තිබෙන ප්‍රශ්න විසඳන කල්.

වතුවල ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපි කියමු, බදුල්ල ටවුමේ අජිත් අයියාගේ පොල් කඩේ කියලා. ඒ කඩේ පොල් ගෙඩියක් රුපියල් 175ට තිබුණාට මඩොල්සිමට යනකොට පොල් ගෙඩිය රුපියල් 225යි. ලුණුගල හද්ද පිටිසර ගම්වලට යනකොට, මැටිගහතැන්න ඇකිරියට යනකොට පොල් ගෙඩිය රුපියල් 225යි. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා මිනිස්සු හරි දුකක් විඳිනවා. වතුකරයේ මිනිසුන්ට රොටියි, පොලුයි නැතුව ජීවත් වෙන්න බැහැ. එදිනෙදා උදේ වරුවේ සිට රත්තේ වැඩ කරන මිනිස්සු ඒවායින් තමයි ජීවත් වෙන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඒවා ගැනත් බලන්න වනවා. මෙතුමන්ලා මහන්සි වුණා වාගේම අනිවාර්යයෙන්ම දෛනික පඩිය රුපියල් 1,750ට ගෙනෙන්න මහන්සි වෙන්න. වතුකරයේ ජනතාව දැන් බලාපොරොත්තුවෙන් ඉන්නවා, මේ ආණ්ඩුව රුපියල් 1,750ක දෛනික පඩිය දෙයි කියලා. ඒ නිසා ඒ ගැන ලොකු වගකීමෙන් ඉන්න.

ඊළඟට ගරු ඇමතිතුමනි, අමු තේ දලු කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 40කින් අඩු වෙලා තිබෙනවා. ඒ, ඔබතුමා අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ. ඒක ඔබතුමා පිළිගන්න. වැස්ස නිසා මිල ගණන් අඩු වුණාද, ගුණාත්මකභාවයේ ප්‍රශ්නයක් නිසා මිල අඩු වුණාද කියලා මම දන්නේ නැහැ. දැන් අමු තේ දලු කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 40කින් අඩු වෙලා. පහත රට සහ උඩරට අමු තේ දලු කිලෝග්‍රෑම් එකක් වනකොට රුපියල් 40කින් අඩු වෙලා තිබෙනවා. ඒකත් ඔබතුමාගේ කර මත තමයි පැටවිලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, මේ අමාත්‍යාංශය හොඳ අමාත්‍යාංශයක්; වැඩ කරන්න පුළුවන් අමාත්‍යාංශයක්. මේ අමාත්‍යාංශය භාරව සිටි ඇමතිවරුන්ගෙන් වැඩියෙන්ම පොල් පැළ හිටවන්න කටයුතු කරපු ඇමතිවරයා තමයි ජගත් පුෂ්පකුමාර මැතිතුමා. එතුමා රාජ්‍ය ඇමතිවරයා හැටියට සිටි කාලයේ තමයි වැඩිම පොල් පැළ ගණනක් හැදුවේ. ජගත් පුෂ්පකුමාර රාජ්‍ය ඇමති හැටියට හිටපු කාලයේ තමයි වැඩිම පොල් පැළ ප්‍රමාණයක් හැදුවේ කියලා මම මේ පාර්ලිමේන්තුවේ කියනවා. පසුගිය කාලයේ රමේෂ් පතිරණ ඇමතිතුමා උතුරේ පොල් ත්‍රිකෝණයක් හදලා පොල් පැළ ලක්ෂ 10ක් හිටවලා පොල් වගාව දියුණු කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒකත් අපි මතක් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඇමති ධුරය බදුල්ලේ කෙනෙකුට ලැබීම ගැන අපි සතුටු වනවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත් එක්ක ජීවත් වන්නේ අපි නියෝජනය කරන බදුල්ලේ සහ නුවරඑළියේ ජනතාව. හැබැයි, ඒ ජනතාවගේ ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා.

1994 අවුරුද්දෙන් පස්සේ තමයි, කුඩා තේ වතු නව මුහුණුවරක් ගත්තේ. 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ තමයි, තේ ශක්ති අරමුදල පිහිටුවලා, තේ ශක්ති ව්‍යාපාරය ඉස්සරහට ගිහිල්ලා, කහටරුප්ප තේ ශක්ති ව්‍යාපාරය, කිරින්ද තේ ශක්ති ව්‍යාපාරය, නෙළුව තේ ශක්ති ව්‍යාපාරය ඇති වුණේ. කුඩා තේ වතු හිමියෝ ඉදිරියට ආවේ, 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවත් එක්ක තමයි. ඒ තමයි කුඩා තේවතුවලට විශාල ජයග්‍රහණ ලැබුණු අවුරුද්ද. එදා සංගම් හැදුවා, ලොරි ආවා, කුඩා තේ වතුහිමියන්ගේ දලු එකතු කරන්න පටන් ගත්තා. අද වෙනකොට වැසුණු ෆැක්ටරි ටික ටික ඇරෙනවා. ගරු ඇමතිතුමනි, මම ඉන්න කාලයේත් ඇටම්පිටියේ දලු එකතු කරන අය මගෙන් ඉල්ලීමක් කළා. මම එතකොට ඇමතිවරයා නොවෙයි. ඇටම්පිටියේ දලු එකතු කරන අය ඇටම්පිටියේ වහලා තිබෙන ෆැක්ටරිය ඉල්ලනවා. ගරු ඇමතිතුමනි, ඇටම්පිටියේ මහා පරිමාණයෙන් තේ දලු එකතු කරන පෞද්ගලික ආයතන, පෞද්ගලික ව්‍යාපාරිකයෝ ඉන්නවා. දැන් උෟව, හල්පෙ වත්ත හොඳට කරගෙන යනවා. අබේරත්න මහත්තයලා, "98 Acres"ලා උෟව හල්පෙ වත්ත තේ කර්මාන්තශාලාව කරනවා. ඒවා හොඳට කරගෙන යනවා. පෞද්ගලික අයගේ ඒ තේ ෆැක්ටරි හොඳට කරගෙන යනවා. ඒ වාගේම, දැන් වහලා තිබෙන තේ ෆැක්ටරි ගොඩක් තිබෙනවා. ඒවා මේ කොම්පැනිකාරයෝ කාටවත් අල්ලන්න දෙන්නේත් නැහැ, හදන්න දෙන්නේත් නැහැ, කරන්න දෙන්නේත් නැහැ, පටන් ගන්නේත් නැහැ. දෙමෝදර ගල්වළ ගාව පාර අයිනේ තිබෙනවා, තේ ෆැක්ටරියක්. ඒකට විදුලි බලයත් තිබෙනවා. ඒක ජල විදුලියෙන් වැඩ කරපු තේ ෆැක්ටරියක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා යනකොට බලාගෙන යන්න. දෙමෝදර කෝච්චිය කැරකෙන තැනින් ඒ ගේන වතුර ලයින් එකෙන් හදන ජල විදුලියෙන් තමයි ඒක සුද්දන්ගේ කාලයේ වැඩ කළේ. මෑතක්

වනතුරු ඒ ජල විදුලියෙන් ඒ තේ ෆැක්ටරිය වැඩ කළා. හැබැයි, දැන් වැඩක් නැහැ. දැන් එකෙන් ප්‍රයෝජන ගන්නේ නැහැ. ඒ නිසා පෞද්ගලිකව තේ දලු එකතු කරන ව්‍යාපාරිකයන්ට ඒවා භාර දෙන්න. දැන් පස්සර තිබුණු කර්මාන්තශාලාව භාර දුන්නා. ඒවා දැන් කරගෙන යනවා.

බදුල්ල දිස්ත්‍රික්කයේ බහුතර ජනතාව තේ ගහත් එක්ක ජීවත් වෙන්නේ. ඒ නිසා අපි තේ ගහට ගරු කරලා, තේ ගහ හදලා, ඒක පෝෂණය කරලා, දලු උපරිම මිලට ගේන්න ඕනෑ. අද බදුල්ල දිස්ත්‍රික්කයේ කොහේ ගියත්, උදේ වරුවට අපට රැස්වීමක්වත් තියා ගන්න බැහැ. "තේ වත්තේ, තේ වත්තේ, තේ වත්තේ" කියලා තමයි හැමෝම කියන්නේ. තේවලින් විශාල ආදයමක් රටට ගෙනෙන පළාතක තමයි අපි ජීවත් වෙන්නේ. ඒ නිසා ඒකට සාධාරණය ඉෂ්ට කරන්න. ඔබතුමාට දැන් අමාත්‍යාංශය ලැබිලා තිබෙනවා. ඔබතුමා කිව්වා, උණුගොල්ලවත්තේ ගේ ගත්තා කියලා. ඒක හොඳයි. ඇටම්පිටියේ ගේ ගත්තා කිව්වා. ඒවා හොඳයි. මොකද, කොම්පැනිවලට වත්තක් දුන්නාම, තිබෙන ගස් ටිකත් කපා ගන්නවා. මහනුවර හන්තානේ සංවේදී කලාපයක් තිබෙන්නේ. හන්තාන වතුයායේ ගස් කපලා ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. හන්තානේ සංවේදී කලාපයේ සමෝච්ච රේඛා 3,000ට වැඩි උඩින් තිබෙන ඒවායේ ගස් කපන්න තහනම්. එසේ තිබියදීත් ගස් කපලා විනාශයක් ඇති කරලා තිබෙනවා. හන්තානේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, මහවැලි නදිය අවට, දොළුව කොටසේ ගස් කපලා විනාශයක් ඇති කළා කියලා තිබෙනවා. ඒ ගැන මට ලැබුණු මේ ලිපිය ඔබතුමාට එවනවා.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(මාණ්පුමිකු කේ.වී. සමන්ත විත්‍යාරත්න)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමා, හන්තානේ සිද්ධියට නම්, අපි අදාළ ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ. අපි මේ වෙනකොට ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරලා, හිටපු වතු අධිකාරිගේ වැඩ තහනම් කරලා, අදාළ පරීක්ෂණ කරනවා. ඒ අදාළ ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(මාණ්පුමිකු චාමර සම්පත් දසනායක)
(The Hon. Chamara Sampath Dasanayake)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. මටත් ඒ ආරංචිය ආවා. මම අද උදේ එනකොටත් කිව්වා, දැනටමත් ඒ අය අත්අඩංගුවට අරගෙන තිබෙනවා කියලා. නමුත්, මේ ලිපිය මම ඔබතුමාට එවනවා.

ඒ වාගේම, සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, ඉස්සර වැල්ලවායෙන්, මහවැලි "සී" කලාපය හදන කාලයේ ඒ පැත්තෙන් තමයි දර ගෙනාවේ. දැන් දර එහෙන් ගෙනෙන්නේ නැහැ. දැන් වත්තේ තිබෙන ගහම කපලා, වත්තම විනාශ කරලා, වත්තේ දර ගෙනැල්ලා ළිපට දමන්න තමයි, ඒගොල්ලෝ බලාගෙන ඉන්නේ. ඒගොල්ලෝ දෙපැත්තකින් වත්තෙන් ලාභ ගන්න බලනවා. එක පැත්තකින් ගස් ටිකෙන් ලාභ ගන්නවා, අනෙක් පැත්තෙන් තේ ගහෙන් ලාභ ගන්නවා. ඊළඟට, ඔබතුමා කිව්වා වාගේ පොහොර දමන්නේ නැහැ වතුවලට. බලන්න වතුවලට ගිහිල්ලා. දැන් වත්ත සුද්ද කරන්නේ නැහැ, සොරඬ ගාන්නේ නැහැ, ඒ කිසි දෙයක් කරන්නේ නැහැ. ඉස්සර එහෙම නොවෙයි. වතු කොම්පැනිවලට දුන්නාට පස්සේ තමයි මේ ප්‍රශ්න ඔක්කොම ආවේ. වතු ජනවසමට අයිති කාලයේ වතුවල කානු කැපුවා, එරමුදු හැදුවා, සොරඬ ගෑවා, පොහොර දැම්මා. දැන් ඒ මොනවත් කෙරෙන්නේ නැහැ. දැන් කරන්නේ මොනවාද? දඩ බඩ ගාලා ගිහිල්ලා මාසයකට වරක් වල් බෙහෙත් ටික ගහනවා. වල් බෙහෙත් ටික ගහලා, තේ දලු ටික කඩා ගන්නවා. ඒ නිසා ඒ වතු අභාවයට යනවා. අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දැන් වතුකරයේ ජනතාව ඉගෙන ගන්නවා. දැන් වතුකරයේ ජනතාව, විශාල වශයෙන් තරුණ ජනතාව, වත්තට එන්න කැමැති නැහැ. වත්තේ තිබෙන division එකක දැන් වැඩ කරන්නේ 100යි, 50යි, 60යි; එක division එකක වැඩ කරන්නේ 50යි, 60යි. ඇල්ල පැත්තේ නම් කොහොමවත් නැහැ. කිනලන් වත්තේ වැඩ කරන්නේම නැහැ. නිව්බර්ග් වත්ත පැත්තට එද්දි වැඩ කරන්නේම නැහැ. ඇල්ලේ මිනිස්සු සංචාරක ව්‍යාපාරයට පුරුදු වෙලා ඒ අය දැන් ඇල්ල පැත්තේ වතුවලට නම් කොහොමවත් වැඩට යන්නේ නැහැ. ඒ නිසා මඩොල්සිම පැත්තේ, ලුණුගල පැත්තේ, නුවරඑළිය පැත්තේ වතුවලට වැඩට එන මිනිස්සු ඉන්නවා. මොකද, ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ.

තොණ්ඩමන් මන්ත්‍රීතුමන්ලාට union එකක් තිබෙනවා වාගේම ශ්‍රී ලංකා කම්කරු ප්‍රජා සංගමය කියලා මගේත් union එකක් තිබෙනවා. Unionsවල forms දානකොට දැන් වත්තේ තිබෙන තත්ත්වය අපි දන්නවා. දැන් මිනිස්සු වතුවල වැඩ කරන්නේ නැහැ. සමහර වතුවල ඉස්සර 500ක් හිටපු division එකක දැන් 50ක් නැහැ, ගරු ඇමතිතුමනි. ඒ නිසා දැන් වතු ලොකු අවදානමකට ගිහිල්ලා තිබෙනවා. ඒ ඇයි? තරුණයෝ මඩොල්සිම පැත්තේ වතුවලට වැඩට යනවා. ඡන්දේ දවසට බලන්නකෝ, සිංහල අවුරුද්දට බලන්නකෝ, පස්සරට බස් 50ක් එනවා. ඇයි? නමුණුකුල, පස්සර ඔක්කෝම වැඩ කරන්නේ කොළඹ. බදුල්ලෙන් වැඩිම ශ්‍රමිකයෝ ප්‍රමාණයක් ඉන්නේ කොළඹ. ගෙවල්වල, අරහේ මෙහේ වැඩට ඉන්නේ අපේ මිනිස්සු. අපේ තිබුණු දුප්පත්කම නිසා ඉතිහාසයේ ඉඳලාම අපිට ඒක සිද්ධ වුණා. අපි ඒක විඳලා. අපි ඒක තවත් විඳිනවා. බදුල්ලේ සිංහල, දෙමළ, මුස්ලිම් කියලා එකක් නැහැ. අපේ මිනිස්සු තමයි කොළඹ භාගෙට භාගයක් කඩවල්වල, අරවායේ මේවායේ වැඩ කරන්නේ. කොළඹ ආවාම කන්න බොන්න දීලා මසක වැටුප රුපියල් 60,000යි, රුපියල් 70,000යි. එතකොට අපේ මිනිස්සු හිතනවා, වත්තේ රුපියල් 1,350ට වැඩ කරනවාට වඩා ඒක ලාභයි කියලා. ඒ නිසා ඔක්කෝම කොළඹ පටවනවා. සිංහල අලුත් අවුරුද්දට බලන්න. මාර්ග අංක 99 බස් තමයි වැඩියෙන්ම ධාවනය වෙන්නේ. ඒ කාලයට බස් මදි. මොකද, බදුල්ල දිස්ත්‍රික්කයේ මිනිස්සු ශ්‍රම බලකායට ඕනෑ තරම් ඉන්නවා. අපි නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමාට මොන දොස් කිව්වත් සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, ඉස්පිරිතාලෙට වැඩ කරන්න ආවේ කවුද? අනුන්ගේ කකුලක් හෝදන්න හරි ආවේ බදුල්ලේ මිනිස්සු. සෞඛ්‍ය අමාත්‍යාංශයේ රැකියාවලට 17,000ක්, 20,000ක් ආවේ ඇයි? අපේ මිනිස්සුන්ට රැකියා නැති නිසා. ගම්පහ දිස්ත්‍රික්කයේ මිනිස්සු සෞඛ්‍ය කම්කරු එනවාද? කුරුණෑගල මිනිස්සු සෞඛ්‍ය කම්කරු එනවාද? නැහැ. අපේ මිනිස්සු ආර්ථික වශයෙන් වැටුණේ සුද්දෝ ගහලා, නැති කරලා, අපිව විනාශ කළ නිසා. අපේ මිනිස්සුන්ට තිබුණු වතු ටික තමයි දැන් රටේ කොම්පැනිවලට දීලා තිබෙන්නේ. අපේ මිනිස්සුන්ට පොල් ගහක් හදන්න, කුඹුරක් හදන්න මොනවාද තිබෙන්නේ? මොනවත් නැහැ. ඒ නිසා තමයි මිනිස්සු අද කොළඹට ඇදිලා එන්නේ. මේක කොයි රටෙත් එහෙම තමයි. තායිලන්තයේ බැංකොක් නුවරට එන්නේ පිටස්තර පළාත්වලින්. වියට්නාමයේ නගරයට එන්නේත් පිටස්තරව ඉන්න දුක් විඳින මිනිස්සු. ඒ නිසා අපි අද දියුණුයි කියලා හිතන්න එපා.

ගරු ඇමතිතුමනි, මේ විධියට මේ විධියට කළා, මෙහෙම කළා කියලා ඔබතුමා කිව්වා. ඒවා දැන් වැඩක් නැහැ. චාමර කරපුවා වැඩකුත් නැහැ, නිමල් සිරිපාල ද සිල්වා කරපුවා වැඩකුත් නැහැ. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා බල්ටිය ගහන්න. බල්ටිය ගහලා පෙන්වන්න. විසිල් විතරක් වැඩක් නැහැ. මම කිව්වා වාගේ දැන් ලස්සනට කථා කළාට වැඩක් නැහැ, වැඩේ කරලා පෙන්වන්න. ගරු ඇමතිතුමනි, ඊළඟ මැතිවරණය ඔබතුමාට dangerous. පසුගිය මැතිවරණයේ ඔබතුමාට danger එකක් තිබුණේ නැහැ.

දැන් එන්න එන්න ඔබතුමාට dangerous. මොකද, සමන්ත විද්‍යාරත්න මහත්මයා අපේ පළාතට මොනවාද කරන්නේ කියලා දැන් දෙලක්ෂ නවදාහක් ජනතාව බලාගෙන ඉන්නවා. දැන් නිමල් සිරිපාල ද සිල්වා මහත්තයා ගෙදර. චාමර විතරක් විපක්ෂයේ ඉන්නවා. ඔක්කෝගේම ගැලවුම්කාරයා විධියට දැන් පාර්ලිමේන්තුවේ ඉන්නේ ඔබතුමා. ඒ නිසා ඔබතුමාට මේක ලොකු ප්‍රශ්නයක්. ඔබතුමාට ඔය තනතුර ලැබුණු එක ගැන මම සතුටු වෙනවා. මොකද, ඔබතුමාටත් අපිට ආපු ප්‍රශ්න එන්න ඕනෑ. ඔබතුමාගේ ඔළුවට ඔය බර එන්න ඕනෑ. ඒ ප්‍රශ්න ආවාම තමයි ඔබතුමාටත් දැනෙන්නේ. ඔබතුමා අපේ පළාතේ කෙනෙක්. ඔබතුමා අපේ පළාතේ බොහොම පොඩි පවුලකින් ආපු මනුස්සයෙක්. අපි ඒ ගැන සතුටු වෙනවා. අපේ හදවතේ මොනවත් නැහැ. අපි හදවතින් කියන්නේ ඔබතුමාට මේ අමාත්‍යාංශය කරගෙන යන්න ශක්තිය, ධෛර්යය ලැබෙන්න ඕනෑ කියලා. හැබැයි අනුර කුමාර ජනාධිපතිතුමා මේකත් එක්ක ඉඩම් අමාත්‍යාංශයත් ඔබතුමාට දීලා තිබුණා නම් මීට වැඩිය වටිනවා. ඔබතුමාට සලකලා නැහැ. පොඩ්ඩයි සලකලා තිබෙන්නේ.

මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Danushka Ranganath. You have nine minutes.

[ප.භා. 11.50]

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
ගරු සභාපතිතුමනි, 2025 අය වැය පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදයේදී වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කථා කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, තම තමන් බල්ටි ගහපු කාලයේ කරගන්න බැරි වෙච්ච දේවල් විවේචන විධියට දැන් ඉදිරිපත් කරනවා. මේ අය වැඩිපුර බල්ටි ගැහුවේ මොනවාටද කියලා මේ රටේ ජනතාව ඉතාම හොඳින් අවබෝධ කරගෙන ඉන්න කාලයක්, මේක. ඒ නිසා, මේ අයට ඊළඟ වතාවේ පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වෙයිද කියන එකත් ජනතාවම තමයි තීරණය කරන්නේ. ගරු සභාපතිතුමනි, සත්තු ගැන කථා කරලා සමහරු කථාව ආරම්භ කළ නිසා මමත් සත්තු ගැන පොඩි කථාවක් කියලා මගේ කථාව ආරම්භ කරන්නම්. කැලේ නායකයා තමයි සිංහයා. සිංහයා මුළු කැලේම හිටපු සත්තුන්ට ආරාධනා කරලා සිංහයාගේ උපන් දිනයට පාටි එකක් දමන්න තීරණය කළා. ඉතින් සිංහයා යෝජනා කළා, හැම ආකාරයේම කෑම බීම දීලා මේ එන සත්තු සතුටු කරලා යවන්න. ඒ පාටි එක දවසේ හැම වර්ගයකම සත්තු ඇවිල්ලා කාලා බීලා සතුටු වෙලා සිංහයාටත් ස්තුති කරලා ගියා, කාලයකින් තමයි අපි රහට කෑවේ කියලා. හැබැයි, ඔය අතරේ එක සතෙක් හිටියා, මොන තරම් රස කෑම එතැන තිබුණත් ඒ සතා කිව්වේ, "මේ කෑම කිසි රහක් නැහැ, කිසි වැඩක් නැහැ" කියලායි. එහෙම තමයි ඒ සතා කිව්වේ. ඒ සතා තමයි ඌරා. ඌරා කුණු කන්න තමයි ප්‍රිය. මොන තරම් හොඳ දේවල් තිබුණත්, මොන තරම් හොඳ කෑම තිබුණත්, ඒ සතා හොයන්නේ කුණුම තමයි.

ගරු සභාපතිතුමනි, දැන් මම අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයට ප්‍රවිෂ්ට වෙන්නම්. විශේෂයෙන්ම "නිරසර වැවිලි ආර්ථිකයක් - පොහොසත් රටක්" කියන දැක්ම අනුව, වැවිලි කර්මාන්තයේ නිරසරභාවය ප්‍රවර්ධනය හා නව්‍යකරණය තුළින් අපනයන ආර්ථිකය ඉහළ නැංවීම හා වැවිලි ප්‍රජාවගේ සමාජයීය සහ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම වෙනුවෙන් තමයි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට මේ අය වැයේදී වැඩි අවස්ථා යොමු කරලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම දළ දේශීය නිෂ්පාදිතයේ කොටස්කරුවන් ලෙස වැවිලි ක්ෂේත්‍රය මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීමට දායකත්වයක් ලබා දෙන බව අපි දන්නවා. ඒ වාගේම මේ රටේ සමස්ත ජනගහනයෙන් සියයට 10කට ආසන්න ප්‍රමාණයක් සෘජු සහ වක්‍ර රැකියා මේ ඔස්සේ ලබා ගෙන තිබෙනවා. ඒ වාගේම මේ වැවිලි ප්‍රජාවගේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන ප්‍රජා යටිතල පහසුකම් විෂයත් මීට අයත් වනවා. නමුත් ප්‍රජා යටිතල පහසුකම් විෂය කලින් තිබුණේ වැවිලි අමාත්‍යාංශය යටතේ නොවෙයි. හැබැයි, වැවිලි ආශ්‍රිත ප්‍රජාවගේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙනුත්, ඒ පහසුකම් ලබාදීම වෙනුවෙනුත් එම විෂයය 2024.11.25වන දින අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් වැවිලි අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර ගෙන තිබෙනවා. මෙතෙක් එම විෂයය වැවිලි අමාත්‍යාංශය යටතට තිබුණේ නැහැ. ඉතින් මේ විෂය වැවිලි අමාත්‍යාංශය යටතට ගෙනැල්ලා, වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව සිටින ප්‍රජාවගේ යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම වෙනුවෙන් ආණ්ඩුව මැදිහත්වීමක් කරලා තිබෙන මොහොතක්, මේක.

ගරු සභාපතිතුමනි, වැවිලි ක්ෂේත්‍රය පිළිබඳව කථා කරද්දී, මම එක භෝගයක් පිළිබඳව කථා කරන්න කැමැතියි. විශේෂයෙන්ම මා ජීවත් වෙන කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ආසනය ප්‍රසිද්ධ වන්නේ රබර් වගාව සම්බන්ධයෙන්. රබර් පර්යේෂණායතනය පිහිටා තිබෙන්නේත් අගලවත්ත ආසනයේ. ගරු සභාපතිතුමනි, රබර් වගාව මූලික කරගෙන ප්‍රධාන වශයෙන් සාම්ප්‍රදායික දිස්ත්‍රික්ක තුනක් තිබෙනවා. එහි එක දිස්ත්‍රික්කයක් තමයි කළුතර දිස්ත්‍රික්කය. රත්නපුරය සහ කෑගල්ල තමයි අනෙක් දිස්ත්‍රික්ක දෙක. මේ දිස්ත්‍රික්ක තුන මූලික කර ගෙන දිස්ත්‍රික්ක 16ක් පුරාවට දැන් රබර් වගාව සිද්ධ වෙනවා. රබර් වගාව එම ප්‍රධාන දිස්ත්‍රික්ක තුනෙන් ඉවත් වෙලා යද්දී, ඒ කියන්නේ රබර් වගා කරන සාම්ප්‍රදායික දිස්ත්‍රික්ක තුනෙන් රබර් වගාව ඉවත් වෙලා යද්දී, ක්‍රමානුකූලව අනෙක් දිස්ත්‍රික්කවලට රබර් වගාව ව්‍යාප්ත කරමින් යන මොහොතක තමයි අපි මේ ඒ ගැන කථා කරන්නේ. විශේෂයෙන්ම රබර් වගා කරන සාම්ප්‍රදායික දිස්ත්‍රික්කවලින් ඔබ්බට ගිහිල්ලා, ලංකාවේ දිස්ත්‍රික්ක 16ක පර්යේෂණාත්මකව රබර් වගා කරමින් පවතින වාතාවරණයක් යටතේ තමයි මේ අය වැයෙන් විශාල ඉඩ ප්‍රස්තාවක් මේ කර්මාන්තයට ආණ්ඩුව විසින් ඇති කරලා තිබෙන්නේ. ඒ අනුව 2025 වර්ෂයට අදාළව රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 78ක ඉලක්කයක් ඇතුව වැඩ කරගෙන යනවා. ඒ වාගේම අපනයන ආදායම රුපියල් බිලියන 1,017ක -ඇමෙරිකානු ඩොලර් බිලියන 1.07ක - ඉලක්කයක් සහිතවත්, නැවත වගා කරන කුඩා රබර් වතු හෙක්ටෙයාර 345ක ඉලක්කයක් සහිතවත්, නව වගාව සඳහා කුඩා වතු හෙක්ටයාර් 655ක ඉලක්කයක් සහිතවත් මේ ආණ්ඩුව වැඩ කටයුතු සිදු කරමින් පවතිනවා. ඒ වාගේම රබර් කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්, ව්‍යාපෘති රැසක් තිබෙනවා. ඒ අතර හෙක්ටෙයාර 655ක රබර් වගා කිරීමට, හෙක්ටෙයාර 345ක රබර් නැවත වගා කිරීමට ගුණාත්මක, බද්ධ රබර් පැළ 581,000ක් නිෂ්පාදනය කර බෙදා හැරීමට, හෙක්ටෙයාර 1,500ක වැසි ආවරණ යෙදීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ආදායම් විවිධාංගීකරණ වැඩසටහන යටතේ හෙක්ටෙයාර 250ක ව්‍යාපෘතියක් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

රබර් වගාව ආශ්‍රිතව මතු වෙලා තිබෙන ගැටලුවක් තමයි, නව පත්‍ර පතන රෝගය. එම රෝගය මර්දනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට මැදිහත් වෙන්න ආණ්ඩුව ඉදිරි කාලයේදී බලාපොරොත්තු වනවා. ඒ වාගේම පර්යේෂණ සහ සොයා ගැනීම් තුළින් කුඩා රබර් හිමියන්ගේ ඵලදාව ඉහළ නැංවීම සඳහා මේ ආණ්ඩුව මෙම අය වැයෙන් වැඩි මැදිහත් වීමක් සිදු කරමින් සිටින මොහොතක්, මේක. ගරු සභාපතිතුමනි, සාම්ප්‍රදායිකව රබර් වගා නොකරන ප්‍රදේශවල 2025 වර්ෂයේදී රබර් වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීමට මේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. රබර් වගා නොකරන ප්‍රදේශවල හෙක්ටෙයාර 5,000ක භූමිය පිළිබඳව පර්යේෂණ කරමින්, දැන් එම ප්‍රදේශවල රබර් වගා කරන්නත් සූදානම් වනවා. රබර් වගා කරන ප්‍රදේශවල තිබෙන රබර් ඉඩම් සංවර්ධනය කිරීමටත් මේ ආණ්ඩුව වැඩි වශයෙන් අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

අවසාන වශයෙන් මම තවත් කරුණක් සඳහන් කරන්න කැමැතියි, ගරු සභාපතිතුමනි. විශේෂයෙන් මේ ක්ෂේත්‍රය තුළ වතු යටිතල පහසුකම්, නැත්නම් වතු ප්‍රජාවගේ පහසුකම් සම්බන්ධයෙනුත් මේ අමාත්‍යාංශය වැඩි දායකත්වයක් සපයනවා. ගරු අමාත්‍යතුමනි, එවැනි මොහොතක වතු ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ පහසුකම් නහාසිටුවීමට වැඩි අවස්ථාවක් ලබා දෙන්න කියලා අපි ඉල්ලනවා.

ගරු සභාපතිතුමනි, යම් ගැටලුවක් මතු කරන්නත් මම මේ මොහොත යොදා ගන්නවා. මෙය අගලවත්ත ආසනයේ පාලින්දනුවර ප්‍රදේශයේ මූලිකව තිබෙන ගැටලුවක්. ගරු අමාත්‍යතුමනි, පසුගිය කාලයේ තමන් විසින් තමන්ගේම ගෙවල් ගිනි තියාගෙන ජනතාවගේ මුදල් රුපියල් කෝටි ගණන් වන්දි ලබා ගත් පිරිස් ඉන්නවා. ඔවුන් වන්දි ලබා ගත්තා විතරක් නොවෙයි, නිවාසත් ලබා ගත්තා. එහෙම නිවාසත් ලබාගෙන අද ඔවුන් ජනතා මුදලින් යැපෙනවා. 2017 වර්ෂයේදී පාලින්දනුවර, 835, මාරගහදෙණිය වතු යාය, මාරගහදෙණිය අංක 2 වත්තේ ගෙවල් 17ක් නාය යාමේ අවදානමකට ලක් වුණා. 2017.05.26වැනි දා සිට තමයි ඒ අවදානම තිබෙන්නේ. වසර අටක් ගිහිල්ලාත් මේ ජනතාවගේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාවත් දැනුවත් කරලා තිබෙනවා. අපි මේ ගැටලුව පිළිබඳව සොයා බලා කටයුතු කරන්න ඉදිරියේදී මැදිහත්වීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට නැවතත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 18 minutes.

[මධ්‍යාහ්න 12.00]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මේ අමාත්‍යාංශයේ ගරු කැබිනට් ඇමතිතුමා මීට පෙර විපක්ෂයේ ඉන්න කාලයේ මාධ්‍ය සාකච්ඡාවලට, විවාදවලට සම්බන්ධ වෙමින් කළ ප්‍රකාශ ආශාවෙන් රසවිඳපු පුද්ගලයෙක්, මම. මොකද, එදා එතුමා කියපු දේවල් අද ප්‍රායෝගිකව කරන්න පුළුවන් නම් හොඳයි. මම හිතන විධියට මේ වෙනකොට ඇමතිතුමා එක්කෝ ඒ දේවල් ප්‍රායෝගික නැති දේවල් කියලා තේරුම් අරගෙන තිබෙනවා. එහෙම නැත්නම් ඒ කියපු දෙවල් කරන්න බැහැ කියන එක තේරුම් අරගෙන තිබෙනවා. අද ගරු ඇමතිතුමා කළ කථාව මම අහගෙන හිටියා. ගරු ඇමතිතුමා, පොල් වගාව සංවර්ධනය කිරීම පිළිබඳව කරුණු කිහිපයක් කිව්වා.

ගරු අමාත්‍යතුමනි, මා නියෝජනය කරන මඩකලපුව දිස්ත්‍රික්කය උදාහරණයක් වශයෙන් අරගෙන, ඔබතුමාගේ කථාව තුළ ඔබතුමාට කියන්න බැරි වෙච්ච කාරණා කිහිපයක් මම කියන්නම්. ඔබතුමා කිව්වා, උතුරු පළාතේ පොල් කර්මාන්තය සංවර්ධනය කරන්න රුපියල් මිලියන 5,500ක් වෙන් කර තිබෙනවා කියලා.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
රුපියල් මිලියන 500ක්.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
රුපියල් මිලියන 500ක්. මම හිතන විධියට, ඒ අක්කර 5,500ක් සඳහා.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
අක්කර 16,000ක්.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු අමාත්‍යතුමනි, අක්කර 16,000ක්, රුපියල් මිලියන 500ක්, පොල් පැළ කීයක්ද?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
පොල් පැළ දස ලක්ෂ ගණනක්.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමා කියනවා, පොල් පැළ දස ලක්ෂ ගණනක් කියලා. ගරු අමාත්‍යතුමනි, මගේ දිස්ත්‍රික්කය උදාහරණයට අරගෙන මේ ගැන මම කියන්නම්. මඩකලපුව දිස්ත්‍රික්කයේ දැනට පොල් පැළ ලක්ෂ අටක් තිබෙනවා. ඒ පොල් පැළ ලක්ෂ අටෙන් මේ වන විට whitefly උවදුර - whitefly disease එක - පොල් පැළ ලක්ෂ හතරකට බෝ වෙලා තිබෙනවා. ඒ whitefly disease එක ඉස්සෙල්ලාම හඳුනා ගත්තේ 2021 අවුරුද්දේ. ඒ කාලයේ මඩකලපුව දිස්ත්‍රික්කයට ඒ effect එක ආවේ නැහැ. හැබැයි, 2024 අවුරුද්ද වෙනකොට මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන පොල් පැළ ලක්ෂ හතරක් පමණ දරුණු ලෙස ඒ උවදුරට ලක් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා අලුතින් පොල් පැළ ලක්ෂ ගණනක් දෙනවා කිව්වා. ඔබතුමාත් දන්නවා නේ, ඒ පොල් පැළවල ගෙඩි එන්න අවුරුදු හයක්, හතක්, අටක් ගත වෙනවා කියලා. ඒ වෙනකොට ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තිබේවිද දන්නේත් නැහැ. කෙසේ වෙතත්, දැන් පොල් පැළ ලක්ෂ ගණනක් පැළ කළත්

[ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

වැඩක් නැහැ. දැනට පොල් පැළ ලක්ෂ අටක් මඩකලපුවේ තිබෙනවා. ඒකෙන් පොල් පැළ ලක්ෂ හතරකට ඊළඟ මාස කිහිපයේදී හෝ අවශ්‍ය බෙහෙත් යෙදුවේ නැත්නම් ඒ ගස් මැරෙනවා. මේ උවදුර ආවේ, ඔබතුමා විෂයය භාර ඇමති වශයෙන් සිටි කාලයේදී නොවෙයි. ඔබතුමන්ලාගේ ජනාධිපති බලයට පත් වෙලා මාස හයක් වෙනවා. ඔබතුමා ඇමති වෙලා මාස හතරක් වෙනවා. හැබැයි, මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන මේ උවදුර පාලනය කරන්න 'வேப்ப எண்ணெய்' කියන තෙල් වර්ගයෙන් ලීටර් 50ක් එවලා තිබෙනවා. ඒකට සිංහලෙන් කියන්නේ මොකක්ද කියලා මම දන්නේ නැහැ. පොල් පැළ ලක්ෂ හතරක් ඒ උවදුරට ලක් වෙලා තිබෙනවා, ඒ පොල් පැළ ටික ඒ උවදුරෙන් ගලවා ගන්න ඒ තෙල් වර්ගයෙන් ලීටර් 50ක් එවලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට බොරුවට මාධ්‍යයට සහ ජනතාවට කියනවා, පොල් ත්‍රිකෝණය හදලා, පොල් පැළ ලක්ෂ ගණනක් හිටවන්න යනවා කියලා. හැබැයි ඔබතුමන්ලා ළඟ වැඩ පිළිවෙළක් නැහැ, මඩකලපුවේ තිබෙන ඒ පොල් පැළ ලක්ෂ අටෙන් උවදුරට ලක් වෙලා තිබෙන පොල් පැළ ලක්ෂ හතර ආරක්ෂා කරගන්න. මම මේ කියන්නේ මඩකලපුව ගැන විතරයි. ඔබතුමාගේ අමාත්‍යාංශය සහ ඒ යටතේ තිබෙන මේ ආයතන පොල් සම්බන්ධ කාරණයේදී ෆේල්. දැනට තිබෙන පොල් පැළ ආරක්ෂා කරගන්නත් ඔබතුමන්ලාට බැහැ.

මම දැක්කා අය වැය ලේඛනයේ කියලා තිබෙනවා, අක්කර පහට අඩු පොල් ඉඩම් හිමියන්ට පොහොර දෙනවා කියලා. මම කථා කරලා බැලුවා, මඩකලපුව දිස්ත්‍රික්කයට පොහොර කිලෝග්‍රෑම් 5,000යි දැනට එවලා තිබෙන්නේ. මම ඇහුවා, මීන් ඉදිරියට තව කිලෝ කීයක් හරි එවනවාද කියලා. එහෙම නැත්නම් මේ මාසයේ මෙච්චරක් එනවා, ඊළඟ මාසයේ මෙච්චරක් එනවා, ඊට පස්සේ මාසයේ මෙච්චරක් එනවා කියලා මොනවා හරි ලේඛනයක් එවලා තිබෙනවාද කියලා. එහෙම මොකුත් නැහැ. ගරු අමාත්‍යතුමනි, සමාවෙන්න, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ගොඩක් ආයතන තිබෙනවා. ඔබතුමාට මම මේ කාරණා කියන්නේ ඔබතුමා විෂයය භාර අමාත්‍යතුමා නිසායි. කිලෝග්‍රෑම් 3 බැගින් දෙනවා නම් ඔබතුමන්ලා එවා තිබෙන පොහොර ප්‍රමාණවත් වෙන්නේ ගස් 1,250කටයි. පොල් පැළ ලක්ෂ අටක් තිබෙන දිස්ත්‍රික්කයක පොල් පැළ ලක්ෂ හතරක් උවදුරට ලක් වෙලා තිබෙනවා. පොල් කර්මාන්තය නහාසිටුවනවා කියලා මාධ්‍ය ඉස්සරහා ලොකුවට statements දෙනවා, පොල්වලින් අරහෙම කරනවා, මෙහෙම කරනවා කියලා. හැබැයි, මඩකලපුව දිස්ත්‍රික්කය උදාහරණයක් හැටියට ගත්තාම පොල් පැළ ලක්ෂ අටෙන් පොල් පැළ 1,250කට තමයි පොහොර එවලා තිබෙන්නේ. ඒ දිස්ත්‍රික්කයේ ඉන්න RM මේක කොහොමද බෙදා දෙන්නේ?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, එකක් තමයි, ඔබතුමා පොඩි වරද්දා ගැනීමක් කරගෙන තිබෙනවා. අපි රුසියානු සහනාධාර යටතේ ලබා දෙන පොහොර ඇත්තටම තවම නිකුත් කළේ නැහැ. වෙන මොකක් හරි පොහොරක් ගැනයි ඔබතුමා ඔය කියන්නේ. අපි අක්කර පහට අඩු පොල් වතු හිමියන්ට මෙම පොහොර සහනාධාරය ලබා දෙනවා. මඩකලපුවේද, එහෙම නැත්නම් උතුරේද, දකුණේද කියලා අදාළ නැහැ, ඒක දෙනවා. මෙට්‍රික් ටොන් 56,700ක් ඒ සඳහා තිබෙනවා. දැන් ඒවා ඇසුරුම් කරන කටයුතු අවසන් කරමින් ඉන්නේ. මේ මාසය අවසානයේ එම පොහොර බෙදනවා කියලා මගේ කථාවේදී කිව්වා. තවම බෙදාහැරියේ නැහැ. ඒකට වෙනම application එකක් එවනවා, පොල් ඉඩම් අක්කර පහට අඩු අයට. ඒක පුරවලා දුන්නාම ඒ අදාළ නිලධාරින් ඒක කරයි.

"සුදු මැස්සා" රෝගය සහ වැලිගම ප්‍රදේශයේ තිබෙන පොල් කොළ මැලවීමේ රෝගය ගැනත් මම කිව්වා. අපි ඒ සඳහා පොල් පර්යේෂණ ආයතනයට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒකට ජනතාවගේ සහාය අවශ්‍යයි. අපට ඉන්න නිලධාරින් ප්‍රමාණයත් එක්ක ඔක්කෝම දේවල් කර ගන්න බැහැ. ගොවියෝත් ඒකට මැදිහත් වෙන්න ඕනෑ. වියදමක් ආණ්ඩුවෙනුත් දරන්න ඕනෑ. ඒ වාගේම පොල් වතු හිමියන්ටත් මෙහිදී යමක් කරන්න වේවි. මේ සඳහා ආණ්ඩුව මැදිහත් වෙනවා. අපි ඊට අදාළ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ජනතාවගේ සහයෝගයත් අරගෙන එම කටයුතු කරන්නම්. ඔබතුමා කියපු මඩකලපුවේ කාරණය සම්බන්ධයෙන් විශේෂ හොයා බැලීමක් කරවන්නම්.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඔබතුමා කියනවා, පොහොර කිලෝග්‍රෑම් 5,000ක් දෙන එක ඔබතුමන්ලාගේ අලුත් ව්‍යාපෘතිය යටතේ නොවෙයි ඇවිල්ලා තිබෙන්නේ කියලා. මම දන්නා තරමින් කිලෝග්‍රෑම් 5,000, කිලෝග්‍රෑම් 3 ගණනේ දෙන්න කියපු වෙනත් කිසිම යෝජනාවක් තිබුණේ නැහැ. මීට පෙර එහෙම කිසිම යෝජනාවක් තිබුණේ නැහැ. එහෙම නම් ඔබතුමන්ලා මඩකලපුවට කිලෝග්‍රෑම් 5,000ක් වෙන් කරලා ඇති. එහෙම වෙන් කරලා තිබෙනවා නම් බොහොම ස්තුතියි. එහෙම නම් මඩකලපුවේ තිබෙන පැළ ලක්ෂ 8ටම පොහොර දෙන්න. ඒ ගැන අපි සතුටු වෙනවා.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

අක්කර 5ට අඩු භූමි ප්‍රමාණයක පොල් වගා කරන අයට දෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

අක්කර 5ට අඩුවෙන් පොල් වගා කරන අයට දෙන්න. මොකද, ඒ ප්‍රදේශයේ අක්කර 5ට අඩු පොල් ඉඩම් තමයි තිබෙන්නේ. කමක් නැහැ. ඔබතුමන්ලාට එහෙම දෙන්න පුළුවන් නම් හොඳයි. අපිත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා නේ. ඉදිරි අවුරුද්ද ඇතුළත අපි ඒ ගැන සොයා බලන්නම්. ඉදිරි කාලයේ මේ කටයුත්ත සම්බන්ධයෙන් තිබෙන වර්ධනය අපි අධ්‍යයනය කරන්නම්. හැබැයි, පොල් කර්මාන්තය නහාසිටුවීම සම්බන්ධයෙන් මේ රජය ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න බැහැ කියන එක තමයි මගේ මතය. මොකද, පසුගිය කාලයේ ඇමතිවරු පොල් සම්බන්ධව කියපු දේවල් අපි දැක්කා. පොල් සම්බෝලයි, කිරි හොදියි කන නිසා තමයි පොල් හිඟය ඇති වුණේ කියලා කිව්වා. පොල් පැළ බෙදීම තුළින් පොල් කර්මාන්තය නහාසිටුවන්න බැහැ. ඔබතුමා දන්නවා, පොල් ගහක් හොඳට හැදෙන්න අවුරුදු 5ක්, 7ක්, 8ක් වාගේ කාලයක් ගත වන බව. මටත් පොල් වතු තිබෙන නිසායි මම එහෙම කියන්නේ. ඔබතුමා දන්නවා, අනෙක් සියලුම ක්ෂේත්‍රවලට එක එක සහනාධාර ලැබෙන බව. හැබැයි, පොල් කර්මාන්තයේදී අඩුම තරමින් අවුරුදු කිහිපයකට - අවුරුදු 5කට, 8කට - support කළේ නැත්නම් ඒ කටයුතු පවත්වාගෙන යන්න බැහැ. මොකද, එච්චර කාලයක් අතේ තිබෙන මුදල් යට කරලා එම කර්මාන්තය කරගෙන යන්න බැහැ. ඒක ඉතාම අමාරු කර්මාන්තයක්.

පොල් පැළ බෙදා දෙන එක ගැන කිව්වොත්, රජයේ ආයතනවලට පොල් පැළ දෙක බැගින් දෙනවා කියලා තව යෝජනාවක් තිබුණා. මම හිතන විධියට, hybrid පොල් පැළ තමයි එහෙම දෙන්නේ. නමුත් මධකලපුව දිස්ත්‍රික්කයට ඒවා ලැබෙන්නේ නැහැ. ඉතින්, පොල් කර්මාන්තය නඟාසිටුවන්න ඔබතුමාට මීට වඩා දේවල් කරන්න පුළුවන් කියලා මම හිතනවා. මම මේක කියන්න හේතුව මේකයි. මොකද, හැම දෙයක් සම්බන්ධයෙන්ම මැතිවරණයට පෙර ඔබතුමන්ලාගේ ස්ථාවරයයි, මැතිවරණයෙන් පසු ස්ථාවරයයි වෙනස්.

වතුකරයේ දෙමළ ජනතාවගේ දෛනික වැටුප ගත්තාම, ඔබතුමන්ලාගේ trade union එක කිව්වා, කිසිම හේතුවක් මත එය රුපියල් 2,300කට අඩුවෙන් එකඟ වෙන්න බැහැ කියලා කිව්වා. ගරු ජීවන් තොණ්ඩමන් මැතිතුමා, දිගම්බරම් මැතිතුමා, මනෝ ගනේසන් මැතිතුමා ඒ දවස්වල රුපියල් 1,300ක සහ රුපියල් 1,350ක allowance එක ගැන කථා කරනකොට රුපියල් 2,300න් අඩු කිසිම ගණනකට එකඟ වෙන්නේ නැහැ කියලා තමුන්නාන්සේලා කිව්වා. අම්බිකා සාමුවෙල් මන්ත්‍රීතුමියත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. රුපියල් 2,300ට වඩා අඩුවෙන් එකඟ වෙන්නේ නැහැ කියලා තමුන්නාන්සේලා කිව්වාට, රුපියල් 1,700ක් දෙන්න කියලා තමයි මේ අය වැයෙන් කියන්නේ. ඒකත් කවදා ඉඳලා දෙනවාද කියලා කාලයක් සඳහන් කරලා නැහැ. රජයේ සේවකයින්ට අප්‍රේල්වලින් පස්සේ වැටුප් වැඩි කරනවාය කිව්වා. කෑමට පෙර සහ කෑමට පසු වාගේ මැතිවරණයට පෙර සහ මැතිවරණයට පසු ඔබතුමන්ලා කියපු අදහස්වල විශාල පරස්පරයක් තිබෙනවා. අනාගතයේදී ජනතාව මේවා තේරුම් ගනීවි.

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම තව විශේෂ කාරණයක් මතු කරන්න ඕනෑ. වඩක්කු මාකාණත්තිලුම් සරි. මට්ටක්කළප්පු මාවට්ටත්තිලුම් සරි, පයිර්ච්චෙය්කෙයිල් ඈටුපටුකින්‍ර මක්කළ් අතිකමාක ඉරුක්කින්‍රාර්කළ්. අවර්කළිල් නෙල් උර්පත්තියිල් ඈටුපටුකින්‍රවර්කළ් PLRඉන්කීළ් පතිවු චෙය්යප්පට්ටු ඉරුප්පතනාල්, අවර්කළුක්කු අරසාන්ක්කත්තාල් උර මානියම් උට්පට පල නිවාරණන්කළ් වළන්කප්පටුකින්‍රන. ආනාල්, වෙන්කායම්, මිළකාය් පෝන්‍ර පයිර්ච්චෙය්කෙයිල් ඈටුපටුකින්‍රවර්කළුක්කු අරසාන්ක්කත්තාල් එන්තවිතමාන සලුකෙයුම් වළන්කප්පටුවතිල්ලෙ. ඉතුපර්රි කේට්ටාල්, "ඉවෙ ඉරණ්ටුම් එන්නුටෙය තුරෙසාර්න්ත අමෙච්සුක්කුක්කීළ් වරුකින්‍ර විටයන්කළ් අල්ල; විවසාය අමෙච්සුක්කුක්කීළ් වරුකින්‍ර විටයන්කළ්" එන නීන්කළ් සොල්ලලාම්. නීන්කළ් ඉවර්‍රෙ මෙයප්පටුත්ති ඉන්ත අමෙච්සින්කීළ් ඔරු තිණෙක්කළත්තෙ උරුවාක්ක වේණ්ටුමෙන නාන් ඉන්ත ඉටත්තිල් මුන්මොළිකින්‍රේන්. ඒනෙන්‍රාල්, එන්කළුටෙය පිරදේසත්තිල් අරසාන්ක්කත්තිනුටෙය කූටුතලාන කවනම් නෙල් උර්පත්තියාළර්කළ් මීතුතාන් ඉරුක්කින්‍රතු. අතාවතු, අරසාන්ක්කත්තාල් වළන්කප්පටුකින්‍ර කොටුප්පනවුකළාක ඉරුක්කට්ටුම් අල්ලතු මානියන්කළාක ඉරුක්කට්ටුම්, අවෙ අනෙත්තුම් නෙල් උර්පත්තියාළර්කළුක්කු වළන්කප්පටුකින්‍රනවේ ඔළිය, කොච්චි මිළකාය්, වෙන්කායම් පෝන්‍ර පයිර්ච්චෙය්කෙයිල් ඈටුපටුකින්‍රවර්කළුක්කු වළන්කප්පටුවතිල්ලෙ.

නාන් පිරතිනිතිත්තුවප්පටුත්තුම් මට්ටක්කළප්පු මාවට්ටත් තිලුළ්ළ කළුතාවළෙ එන්‍ර පිරදේසම් කොච්චි මිළකාය් පයිර්ච්චෙය්කෙක්කුප් පෙයර්පෝන ඉටමාකුම්. කෞරව අමෙච්සර් අවර්කළේ, උන්කළුටෙය අමෙච්සින්කීළ් ඉවර්‍රෙක් කොන්ටුවාරුන්කළ්! ඉන්‍රු greenhouse මුරෙයිල් කොච්චි මිළකායෙප් පයිරිට්ටාල් විළෙච්චලෙප් පත්තු මටන්කාල් අතිකාරික්කලාම් එන්පතු උන්කළුක්කුත් තෙරියුම්! ඉව්වාරාන විටයන්කළෙත්තාන් නාන්කළුම් එන්කළුටෙය මක්කළුම් උන්කළුටෙය අමෙච්සිනූටාක අල්ලතු ඉන්ත අරසාන්ක්කත්තිනූටාක එතිර්පාර්ක්කින්‍රෝම්.

නාන් ඒර්කෙනවේ සොන්නතුපෝල, ඉන්‍රු එන්කළුටෙය මාවට්ටත්තිල් නාන්කු ඉලට්චම් තෙන්නෙ මරන්කළ් පාතික්කප්පට්ටු, අළිවටෙයක්කූටිය නිලෙයිල් ඉරුක්කින්‍රන. PLRඉන්කීළ් පතිවුචෙය්යප්පට්ටවර්කළුක්කු මානියන්කළ් වළන්කප්පටුකින්‍රන. ආනාල්, HLRඉන්කීළ් පතිවුචෙය්යප් පට්ටවර්කළුක්කු එතුවුම් ඉල්ලෙ. ඉන්ත විටයත්තිලුම් කෞරව අමෙච්සර් අවර්කළ් තනතු කවනත්තෙච් චෙලුත්ත වේණ්ටු මෙනක් කේට්ටුක් කොළ්කින්‍රේන්. නාන් ඉන්කු ඉන්නුමොරු මුක්කියමාන විටයත්තෙච් චොල්ල වේණ්ටුම්.

පසුගිය කාලයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හරහා මහා පරිමාණයේ වංචාවක් නැහෙනහිර පළාතේ සිදු වුණා. මම ඉල්ලා සිටිනවා, වංචාව, දූෂණය නවත්වන්න ඉතාම කැමති කණ්ඩායමක් වශයෙන් ඔබතුමන්ලා මේ ගැනත් උනන්දුවක් දක්වන්න කියලා. පසුගිය කාලයේදී නැහෙනහිර පළාතේ, ත්‍රිකුණාමලයේ මුතූර් කියන ප්‍රදේශයේ මිරිස් වවන්න ඉඩම් ලබා දී තිබෙනවා. මම ඇයි මේක ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් වෙනවාය කියන්නේ? ඒ අවස්ථාවේදී මේ සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් නිර්දේශයක් ලබා දී තිබෙනවා. මම දන්නේ නැහැ, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය කොහොම ඒකට මැදිහත් වුණාද කියලා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශයක් හරහා තමයි මුතූර් ප්‍රදේශයේ, සාම්පූරවල විශාල ඉඩම් ප්‍රමාණයක් මිරිස් වගාවට දීලා තිබෙන්නේ. මහවැලි ගඟෙන් වතුර අරගෙන මිරිස් වගාවක් කරනවා, ඒ නිසා මහවැලි ගඟේ වතුර එන්න රොන් මඩ අයින් කරන්න ඕනෑය කියා තමයි ඒ මහා පරිමාණයේ වංචාව සිදු කර තිබෙන්නේ. ඔබතුමා හෝ මේකට මැදිහත් වෙන්න, ගරු ඇමතිතුමනි. මොකද, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් නිර්දේශයක් ලබා දීලා තිබෙනවා, මේ මිරිස් වගාව කරන්න. ඔබතුමා නොවෙයි එතකොට ඇමතිවරයා වශයෙන් සිටියේ. මිරිස් වගාව කරනවා කියලා මහා පරිමාණයේ වංචාවක්, දූෂණයක් නැහෙනහිර පළාතේ සිදු වුණා. මේ පිළිබඳ විශාල කතිකාවක් පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුව තුළත් ඇති කළා. මට මතකයි, මේ පිළිබඳව කථා කළා. මේකට සම්බන්ධයි, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාත්. මම හිතන විධියට එතුමාගේ නම සජ්ජන ද සිල්වා. මේ සියලුදෙනා එකතු වෙලා මිරිස් වගාවක් කරනවා කියලා plan කරලා තමයි ඒ වංචාව සිදු කළේ. මේ සජ්ජන ද සිල්වා කියන පුද්ගලයා ඔබතුමන්ලාගේ වර්තමාන රජයේ පරිසර නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කරන ඇන්ටන් ජයකොඩි මහත්මයාගේ වැඩ තහනම් කළා. එතුමාගේ වැඩ තහනම් කිරීම අසාධාරණ දෙයක් කියලා මමත් මේ පාර්ලිමේන්තුවේ හඬ නැඟුවා. ඊට අමතරව වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාත් ඒ ගැන කථා කළා. ඊට පස්සේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ බැනරයකුත් ගැහුවා මගේ photo එකයි, අනුර කුමාර දිසානායක මැතිතුමාගේ photo එකයි එකතු කරලා. මිරිස් වගාවක් කරනවා කියන මුවාවෙන් කරන මේ වංචාවට විරුද්ධව කථා කරපු නිලධාරීන්ගේ වැඩ තහනම් කිරීම ගැන පාර්ලිමේන්තුවේ කථා කරලා, ඒ සජ්ජන ද සිල්වාට විරුද්ධව පරීක්ෂණයක් ආරම්භ කිරීම පිළිබඳව ස්තුති කරලා, මගේයි, අනුර කුමාර දිසානායක මැතිතුමාගේයි photos දෙක දෙපැත්තේ ගහලා ඒ ආයතනයේ බැනරයක් ගහලා තිබුණා. හැබැයි, වංචාව, දූෂණය නවත්වනවා කියලා බලයට ආපු ඔබතුමන්ලාගේ රජය යටතේ නැවත වාරයක් මේ සජ්ජන ද සිල්වා කියන පුද්ගලයාට හොඳ තනතුරක් දීලා තිබෙනවා. ඔහුට ඒ තනතුර දෙන්න එපා කියලා Attorney-General's Department එකෙන් "Appointment to the post of Senior Director (Mines)" කියන caption එක යටතේ ලියුමක් එවා තිබෙනවා. That letter states, I quote:

> "Mr. Sajjana de Silva was previously holding the post Director General of Geological Survey & Mines Bureau. His appointment was subsequently quashed by the judgment of Court of Appeal Writ Application 140/2021..... In this context, Mr. de Silva cannot claim to be entitled to 'revert' to the post of Senior Director (Mines)."

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ගරු ඇමතිතුමනි, ඔබතුමා වංචාවට, දූෂණයට විරුද්ධ පුද්ගලයෙක් නිසා මේ කාරණය පිළිබඳව සොයා බලන්න. ඔබතුමන්ලාගේ රජය යටතේ කොහොමද මේ වංචාවට, දූෂණයට ඉඩ දෙන්නේ? මේ වාගේ, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශ නැතිව මිරිස් වගාවට කියලා ඉඩම් දීලා, ඒ මිරිස් වගාවට වතුර ගන්නවා කියලා මහවැලි ගඟේ වැලි අයින් කරලා තිබෙනවා. මා ළඟ තිබෙනවා, වෙල්ලනාවල් පාලමේ report එක. මේ වෙල්ලනාවල් පාලමේ වත්මන් තත්ත්වය ගත්තොත්, එක පැත්තකින් මේ පාලම දැන් කඩාගෙන වැටෙන තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. මේ කාරණය පිළිබඳව ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් මැදිහත් වීමක් කරන්න. මේ පුද්ගලයා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සිටියදී ඔබතුමන්ලාගේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශයක් හරහා ඉඩම් අරගෙන, විශාල වශයෙන් වංචා, දූෂණවල නිරත වෙලා හිටපු කෙනෙක්. දැන් ඔහු නැවත වාරයක් එම කාර්යාංශයේ තනතුරකට පත් කරලා තිබෙනවා. මම හිතන විධියට, මේ පුද්ගලයා දැනට Director, Mines වාගේ තනතුරක ඉන්නේ. ගරු අමාත්‍යතුමනි, ඕනෑ නම් මම මේ ලේඛන ඔබතුමාට එවන්නම්. "Uptown Ventures" කියලා ආයතනයක් තමයි මිරිස් වගා කරන්න ඉඩම් අක්කර විශාල ප්‍රමාණයක් ගත්තේ. මේ ඔක්කොම reports මා ළඟ තිබෙනවා. මම ඒවා ඔබතුමාට එවන්නම්. ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ දැනටත් මෙවන් දූෂිතයන්ව ආරක්ෂා කරනවා නම් ඒක විශාල ගැටලුවක්. මොකද, මේක එක් වංචාවක් නොවෙයි, වංචා 10ක්. මිරිස් වගා කරන්න කියලා බොරු කියලා, මහවැලි ගඟෙන් වතුර ගන්න ඕනෑ කියලා මහවැලි ගඟේ තිබෙන වැලි අයින් කරපු නිසා දැන් ඒ පාලමත් කඩාගෙන වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඔහුව ඒ තනතුරින් ඉවත් කළාට පසුව, Attorney-General's Department එකෙන් කියලා තිබෙනවා, ඔහුට ඒ නව තනතුර දෙන්න එපා කියලා. දැන් ඔහු නැවත ඒ ආයතනයේ වෙනත් තනතුරක ඉන්නවා.

පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාද කරන දිනයේදී මම මේ පිළිබඳව ගොඩක් කරුණු කථා කරන්න බලාපොරොත්තුවෙන් හිටියේ. හැබැයි, මට ඒ කරුණු කථා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මොකද, එදාට මම පාර්ලිමේන්තුවේ නැති වෙයි. හැබැයි, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශයක් හරහා කරපු එකට ඔබතුමා හෝ මැදිහත් වෙලා, ඔබතුමන්ලාගේ politburo එකට හරි කියලා කටයුතු කරන්න. ඔහු මේ තනතුරට පත් කර තිබෙන්නේ ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයේ පුද්ගලයෙක්ද දන්නේ නැහැ; ඔබතුමන්ලාගේ පක්ෂයේ කවුරුන් හෝ කෙනෙකු ද දන්නේ නැහැ. එහෙම නැතිව මේ තනතුරුවල ඉන්න බැහැ නේ. මොකද, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ දැන් ඉන්න පරිසර නියෝජ්‍ය ඇමතිවරයාගේ වැඩ තහනම් කළේ මේ සජ්ජන ද සිල්වා. එතකොට අද එතුමා පරිසර නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දීත්, එතුමාගේ වැඩ තහනම් කරපු මේ වංචනික පුද්ගලයා තවදුරටත් එම ආයතනයේම තනතුරක කටයුතු කරනවා නම් ඒ පිළිබඳව අපට පැහැදිලි සැකයක් ඇති වෙනවා. මොකද, මම මීට පෙරත් කිව්වා, ඔබතුමන්ලාගේ පක්ෂයේ ඉන්න ඔක්කොම පිරිසිදු අත් තිබෙන අය නොවෙයි කියලා. හොරකම් කරපු අයත් ඉන්නවා, වංචනික වැඩ කරපු අයත් අය ඉන්නවා. මම මීට පෙරත් මේ ගැන කිව්වා. යම් යම් රජයේ ආයතනවල වැඩ කරලා, වැඩ තහනම් වෙලා තිබෙනවා. මම මගේ කථාවේදීත් කිව්වා. අපි හිතුවා, ආණ්ඩුව මැදිහත් වෙලා හෝ ඒ ඇමතිවරයාට ඉල්ලා අස් වෙන්න කියයි කියලා. හැබැයි, ඒ ඇමතිවරයාට තවම ඉල්ලා අස් වෙන්න කිව්වෙත් නැහැ. ඒ ඇමතිවරයා තවම කැබිනට් එකේ ඉන්නවා. ඒ නිසා මෙවන් වංචා මින් ඉදිරියටත් ඔබතුමන්ලාගේ රජය යටතේ වෙන්න දෙන්න එපා. ගරු ඇමතිතුමනි, මම මේක ඔබතුමාට කියන්නේ, මාධ්‍ය ඉස්සරහා ඔබතුමා වංචා, දූෂණවලට විශාල හඬක් නඟපු පුද්ගලයෙක් නිසායි. ඒ වාගේම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අදාළ දෙයක් නිසායි ඔබතුමා සභාවේ ඉන්න වෙලාවේ මම මේක මතු කරන්නේ. ඒ නිසා කරුණාකරලා මේ පිළිබඳව ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි නම් කියන්න. මගේ වෙලාවේදීම කියන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have one more minute.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඔබතුමාගේ වෙලාව ඉවරයි නේ.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නැහැ, විනාඩියක් තිබෙනවා. කමක් නැහැ කියන්න, ගරු ඇමතිතුමා.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු සභාපතිතුමනි, මෙතුමා මතු කරන කාරණය සම්බන්ධයෙන් හොයන්න ඕනෑ. එක කාරණයක් මම පැහැදිලි කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, මෙවර ආණ්ඩු පාර්ශ්වයේ හොරු, වංචනිකයෝ, දූෂිතයෝ නැහැ. මොනයම් හෝ අඩුපාඩුවක් සිද්ධ වුණොත්, රජය ඇතුළේ වුණත් තරාතිරම නොබලා අපි අදාළ ක්‍රියාමාර්ග ගන්නවා. හැබැයි, විපක්ෂය පැත්තේ තවම දඬුවම් ලැබිය යුතු කට්ටිය ඉන්නවා. ඒ අදාළ පරීක්ෂණ කෙරෙමින් යයි. ඒවා අධිකරණයෙන් ගන්න තීන්දු නේ. අපට ඒක කියන්න බැහැ. හැබැයි, ඔබතුමා මතු කළ, නිලධාරීන් සම්බන්ධයෙන් වුවත් -නිලධාරීන් අතරෙත් සුළු පිරිසක් වංචනිකයෝ, දූෂිතයෝ නැතුවා නොවෙයි- දඬුවමක් දෙනවා නම් දඬුවම් දෙන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදයට අදාළ පරීක්ෂණ කරලා, ඒ දේවල් කරන්න සූදානම්.

ඔබතුමා කියපු මිරිස් වගාව සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශයෙන් නිර්දේශ කරපු දෙයක් තිබෙනවා නම්, ඒක කොහෙන්ද කෙරුණේ කියන විස්තර හොයන්න අපි සූදානම්. ඒක අපි භාර ගන්නම්. ඒකට ඒ උත්තරය තමයි මට දෙන්න තිබෙන්නේ. ඔබතුමා ඉස්සෙල්ලා නඟපු පොහොර ප්‍රශ්නය සම්බන්ධයෙන් කියනවා නම්, අපි සූදානම් කරන පොහොරවලින් කිලෝග්‍රෑම් ලක්ෂ 4ක් මඩකලපුවට වෙන් කර තිබෙනවා. පොහොර මිටියක් රුපියල් 9,000ක් වෙනවා. හැබැයි, අපි දෙන්නේ රුපියල් 4,000ක් අය කරගෙන, රුපියල් 5,000ක් සහනාධාර ක්‍රමයට.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු සභාපතිතුමනි, තව එක කාරණයක් කියලා මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Member, you may continue and wind up.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ අවස්ථාවේ අභියෝගයක් කරනවා. ඔබතුමා කිව්වා, වංචා, දූෂණවලට චෝදනා ලබපු අය කවුරුත් ඔබතුමන්ලාගේ පැත්තේ නැහැ කියලා. හිටියොත් තරාතිරම නොබලා action ගන්නවා කියලා කිව්වා. ඔබතුමා ඒක වගකීමෙන් කිව්වේ. මම ඔබතුමාට ලිඛිතව දෙන්නම්. පසුගිය කාලයේ වංචා, දූෂණවලට සම්බන්ධ වෙලා තනතුර අහිමි වෙලා උසාවි ගිහිල්ලා, උසාවියෙන් නඩුව පැරදිලා, ඊට පස්සේ ඒ තනතුරෙන් ඉල්ලා අස් වෙච්ච පුද්ගලයෙක් දැන් ඔබතුමන්ලා කැබිනට් එකට පත් කර තිබෙනවා. මේ දැනුත් එතුමා ගරු සභාව ඇතුළේ වාඩි වෙලා ඉන්නවා. ඒ නිසා මම අභියෝග කරනවා, ඔබතුමා කියපු විධියට තරාතිරම නොබලා එතුමා ඉවත් කර පෙන්වන්න කියලා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Chanaka Madugoda. You have ten minutes.

[අ.භා. 12.20]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු සභාපතිතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන විවාද කරන මේ මොහොතේ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කථා කරන්න ලැබීම පිළිබඳව මම සතුටු වනවා වාගේම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මම නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ ගැටලුවකටත් අදාළ වැය ශීර්ෂයක් ගැන තමයි අද දවසේ කථා කරන්නේ. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ කුඩා තේ වතු හිමියන් 90,000කට වඩා පිරිසක් අද ගාල්ල දිස්ත්‍රික්කයේ ඉන්නවා. ඒ වාගේම ලක්ෂ එකහමාරකට අධික පිරිසක් කුරුඳු කර්මාන්තය ආශ්‍රිතව කටයුතු කරනවා. ඒ නිසායි මම ගාල්ල දිස්ත්‍රික්කයට අදාළව අද දවසේ කථා කරන්න ඉඩක් ලැබීම පිළිබඳව විශේෂයෙන්ම සතුටු වෙන්නේ. ඒ වාගේම මම මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ, වත්මන් ආණ්ඩුව වැවිලි ක්ෂේත්‍රය වෙනුවෙන් යම් සාධනීය කාර්යභාරයන් රැසකට මේ අය වැය ලේඛනයෙන් ඉඩ වෙන් කර තිබෙන බව. නමුත් අපි ඒ ඉඩ පිළිබඳව කිසිසේත් සතුටු වෙන්නේ නැහැ. ඒකට හේතුව තමයි, ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු කර්මාන්තය සහ කුරුඳු කර්මාන්තය වෙනුවෙන් මේ අය වැයෙන් වෙන් වුණු මුදල කිසිසේත් ප්‍රමාණවත් නොවීම. ඒ කාරණය පළමුවෙන්ම මේ සභාව හමුවේ පවසන්න ඕනෑ.

මෙවර අය වැය ලේඛනයෙන් පසුගිය ආණ්ඩුව ආරම්භ කළ උතුරු පොල් ත්‍රිකෝණය ඉදිරියට ගෙනයන්න රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒක ඉතාම හොඳ කාරණයක්. ඒ හරහා අලුතෙන් අක්කර 16,000කට වැඩි ප්‍රමාණයක් නැවත සංවර්ධනය කරලා පොල් වගාව වෙනුවෙන් කටයුතු කරන්න හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම නව ප්‍රභේද, උසස් තත්ත්වයේ පොල් පැළ ලබා දෙමින් ඒ කාර්යය කරන්න මේ මොහොත වන විට රජයක් විධියට කටයුතු කරමින් ඉන්නවා. මීට පෙර කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි පොල් වගාව ආශ්‍රිතව පසුගිය කාලයේ උද්ගත වුණු විවිධ රෝගාබාධ නිසා, -විශේෂයෙන්ම "සුදු මැස්සා" රෝගය සහ වැලිගම, මාතර ආශ්‍රිතව තිබෙන රෝගාබාධ නිසා- පොල් වගාව ඉතාම අහිතකර බලපෑමට ලක් වුණා. අපි මේ මොහොතේ යම් ස්තුතියක් කරන්න ඕනෑ පොල් සංවර්ධන මණ්ඩලයට සහ එහි නිලධාරීන්ට. ඒ තත්ත්වයන් යම්තාක් දුරකට සමනය කරන්න ඒ නිලධාරීන් පසුගිය කාලය තුළ සුවිශේෂී කාර්යභාරයන් රැසක් ඉටු කළා කියන කාරණය මේ මොහොතේ මා සිහිපත් කරන්න ඕනෑ. එසේ නොවන්නට, මේ මොහොත වන විට පොල් වගාව ආශ්‍රිත ඒ උවදුරු තවත් තීව්‍ර වෙන්න තිබුණා. ඒ පිළිබඳවත් මේ අවස්ථාවේදි සිහිපත් කරනවා.

ගරු ඇමතිතුමාගේ කථාවේදී මට අහන්න ලැබුණා විශේෂයෙන් පොල් වගාව වෙනුවෙන් පොහොර සහනාධාරයක් ලබා දෙනවා කියලා.ඒක ඉතාම වැදගත් කාරණයක්. මම විශ්වාස කරනවා පසුගිය ආණ්ඩු, වත්මන් ආණ්ඩුව පොල් වගාව වෙනුවෙන් විශේෂ කාරණා රැසක් ඉෂ්ට කර තිබෙනවා කියලා. නැවත වගාව සඳහා පැළ විශාල සංඛ්‍යාවක් ලබා දීලා තිබෙනවා. හැබැයි ඒවායින් ප්‍රතිඵල ලබා ගන්න අවුරුදු තුන හතරක් යනවා. අපට ඉතාම ඉක්මනින් ඒ ප්‍රතිඵලය ලබා ගැනීම වෙනුවෙන් පොල් වගාව සඳහා පොහොර සහනාධාරයක් ලබා දෙන්න පුළුවන් නම් මම විශ්වාස කරනවා මේ මොහොතේ රට තුළ තිබෙන පොල් පැළවලින් තව සියයට 20කින්, 30කින් පමණ අස්වැන්නක් අපට ලබා ගන්න හැකියාවක් තිබෙනවා කියලා. ඒ පොහොර සහනාධාරය ලබා දීම තුළ පොල් වගාව සම්බන්ධයෙන් උද්ගත වෙලා තිබෙන මේ ගැටලු ඉතාම කෙටි කාලයකින් විසඳා ගන්න පුළුවන් වෙයි.

ඒ වාගේම මම සිහිපත් කළයුතු තවත් වැදගත් කාරණයක් තිබෙනවා. 1972දී පිහිටුවන ලද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවති කුරුඳු වගාව සම්බන්ධයෙන් 2023 වසරේදී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම විශ්වාස කරනවා 1972දී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ කුරුඳු වගාව තිබෙනකොට තමයි කුරුඳු වගාවේ සශ්‍රීකම, ස්වර්ණමය යුගය තිබුණේ කියලා. නමුත් 2023 වසරේ හිටපු ආණ්ඩුව ගත්තු ක්‍රියාමාර්ගය ඔවුන් සද්භාවයෙන් ගත් ක්‍රියාමාර්ගයක් නමුත්, මේ මොහොත වන විට ඒක අසාර්ථක වෙලා තිබෙනවා. ගොඩනැඟිල්ල සඳහා මාසික කුලිය ලක්ෂ හතරහමාරක් බැගින් ලබා දෙමින් අද ඒ අලුත් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ සඳහා මාසිකව ලක්ෂ හතරහමාරක මුදලක් වියදම් කරනකොට වාර්ෂිකව මිලියන 5.4ක මුදලක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම විශ්වාස කරනවා කුරුඳු වගාව වෙනුවෙන් නව සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම තුළින් අද විශාල අර්බුද රාශියක් උද්ගත වෙලා තිබෙනවා කියලා.

විශේෂයෙන්ම 2023 වර්ෂයේදී ඔය දෙපාර්තමේන්තුවේ කටයුතු ආරම්භ කරනකොට මුළු ව්‍යාපෘතිය සඳහාම විද්‍යාත්මක සේවාවේ නිලධාරීන් හිටියේ හතර දෙනයි ඒ දෙපාර්තමේන්තුව තුළ. අනෙකුත් නිලධාරීන්, කිසිම තාක්ෂණ නිලධාරියෙක් ඒ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරලා නැහැ. කිසිදු සූදානමකින් තොරව ආරම්භ කළ මේ දෙපාර්තමේන්තුව අද සුදු අලියෙක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, සුදු අලියෙක් බටව පත් වෙලා තිබෙන මේ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු නැවත වරක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන්න පුළුවන් නම් වටිනවා කියන කාරණය විශේෂයෙන්ම මම සිහිපත් කරනවා. කුරුඳු වගාව සම්බන්ධව ගන්නා සමහර තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්න බැරි තැනකට ඒ දෙපාර්තමේන්තුව අද පත් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අද කුඩා තේ වතු කර්මාන්තය ගාල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා. හැබැයි, අද තේ කර්මාන්තය සඳහා වැඩි පිරිවැයක් දරන්න සිදු වෙලා තිබෙනවා. තේ කර්මාන්තය සඳහා වැඩි පිරිවැයක් දරන්න

[ගරු චානක මාදුගොඩ මහතා]

සිදු වීම නිසා කුඩා තේ වතු හිමියන් අද ඒ ක්ෂේත්‍රවලින් ඉවත් වෙමින් සිටිනවා. ගරු ඇමතිතුමනි, එම නිසා පුළුවන් නම් එම කර්මාන්තය තුළ තිබෙන ගැටලු විසඳා දෙන්න.

විශේෂයෙන්ම නැවත තේ වගා කිරීම සඳහා හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 6ක පමණ මුදලක් රජය ආධාර වශයෙන් ලබා දුන්නා. හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 6ක ආධාරයක් ලබා දුන්නාට, භෞතිකව, සත්‍ය වශයෙන්ම හෙක්ටෙයාරයක් වගා කරන්න රුපියල් ලක්ෂ 50කට අධික මුදලක් වැය වෙනවා. ගරු ඇමතිතුමනි, රජය විධියට හෙක්ටෙයාරයකට ලබා දෙන මුදල වන රුපියල් ලක්ෂ 6 රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කර දෙන්න පුළුවන් නම් වටිනවා. රටට සුවිශේෂී කාර්යභාරයක් ඉෂ්ට කරන කුඩා තේ වතු හිමියන්ට ඒක ඉතා සුවිශේෂී අස්වැසිල්ලක් වෙයි. ඒ වාගේම, රජයේ පොහොර සමාගම් හරහා තේ පොහොර ලබා ගැනීමේදී, එම කටයුතු සිදු කර ගැනීමේදී විවිධ බාධක, අපහසුතා ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමාත් සභාවේ සිටින මේ මොහොතේ මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා, පුළුවන් නම් රජයේ මිලටම විවෘත වෙළෙඳ පොළෙනුත් තේ පොහොර ලබා ගත හැකි ක්‍රමවේදයක් සකස් කර දෙන්න කියලා. එසේ කරන්න පුළුවන් නම් වටිනවා. කුඩා තේ වතු හිමියන්ට, කුරුඳු වගාව සිදු කරන අයට, අනෙකුත් භෝග වගා කරන උදවියට මතුව තිබෙන යම් යම් බාධක ඉවත් කර දෙන්න පුළුවන් නම්, මේ රට, මේ රටේ ආර්ථිකය ගොඩ නහන්න ඔබතුමන්ලා සිදු කරන ඒ කාර්යභාරය වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික්කය විධියට අපටත් සභායක් ලබා දෙන්න පුළුවන් කියන කාරණයත් මම මේ මොහොතේ මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, අප අද කථා කරමින් ඉන්නේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන ආකාරය පිළිබඳවයි. අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න කථා කරන මේ මොහොතේ, විශේෂයෙන්ම අපේ වතු කම්කරුවන්ට තිබෙන වැටුප් ප්‍රශ්නය පිළිබඳවත් කථා නොකර ඉන්න බැහැ. රජය විධියට අද ඔබ වතු කම්කරුවාගේ දෛනික වැටුප රුපියල් 1,350ක මුදලකට එකඟ කරගෙන තිබෙනවා. හැබැයි, පසුගිය ආණ්ඩුව රුපියල් 1,700ක එකඟතාවකටයි ආවේ. ඒ එකඟතාව වෙනස් කරමින් අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව වතු කම්කරුවාගේ දෛනික වැටුප රුපියල් 1,350ක් කරන්න එකඟ වෙලා තිබෙනවා. හැබැයි, එකඟතාවට පැමිණි ඒ මුදල ප්‍රමාණවත්ද කියන ප්‍රශ්නය අපි මේ මොහොතේ විමසන්න ඕනෑ.

විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ජනතාව විශාල පිරිසක් ඉන්නවා. ඔවුන්ගේ නිවෙස්වල, ඔවුන් භාවිත කරන මාර්ගවල, ඒ ප්‍රදේශවල තිබෙන යටිතල පහසුකම්වල අඩු පාඩු රාශියක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒවා කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න පුළුවන් නම් හොඳයි.

අද ගාල්ල දිස්ත්‍රික්කය ආශ්‍රිත කුඩා තේ වතු හිමියන්ට තවත් ගැටලු රාශියක් තිබෙනවා. පැළ තවාන්කරුවන් ද ඇතුළුව කුඩා තේ වතු හිමියන්ට, එම කර්මාන්තයට සම්බන්ධ පිරිසට තම කර්මාන්තය කරගෙන යෑමේදී -විශේෂයෙන් පස් ලබා ගැනීම සම්බන්ධයෙන්- අද විශාල බාධක රාශියක් තිබෙනවා. පස් ලබා ගැනීම සම්බන්ධයෙන් තිබෙන රජයේ නිර්ණායක ආදි සියල්ල නිසා අද වන විට තේ කර්මාන්තය විවිධ බාධකවලට මුහුණ පා තිබෙනවා. මා ඉහත කී කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න පුළුවන් නම් වටිනවා, ගරු ඇමතිතුමනි.

අද වන විට ගාල්ල දිස්ත්‍රික්කයේ තේ වගාව, කුරුඳු වගාව ඇතුළු වගාවන් සම්බන්ධයෙන් පවතින ප්‍රශ්න, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයා විධියට මම ඔබතුමාගේ අවධානයට නැවත වරක් යොමු කරනවා. විශේෂයෙන් ගාල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන කෙරෙන අනෙකුත් අපනයන භෝග වගාවන් සම්බන්ධයෙනුත් විවිධ ගැටලු තිබෙනවා. ඒවා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා විසඳාගත යුතුයි. මා මුලින් යෝජනා කළ පරිදි කුරුඳු වෙනුවෙන් ස්ථාපනය කරපු, කුරුඳු වෙනුවෙන් ආරම්භ කරපු අලුත් ආයතනය නැවත වරක් සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව හරහාම ක්‍රියාත්මක වන තැනකට ගෙන එන්න ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න පුළුවන් නම් හොඳයි .

පොල් කර්මාන්තය ආශ්‍රිතවත් ගැටලු තිබෙනවා, ගරු ඇමතිතුමනි. විශේෂයෙන් කුඩා පොල්වතු හිමියන් ඇතුළු අනෙකුත් වගාකරුවන්ට යම්කිසි පොහොර සහනාධාරයක් ලබා දෙන්න. මොකද, පොල් කර්මාන්තයේ නියැළෙන ජනතාව අද පොහොර පිළිබඳව වැඩි උනන්දුවක් දක්වන්නේ නැහැ.

ජනතාව ඒ පිළිබඳව උනන්දුවක් නොදක්වන වෙලාවේ රජය විධියට ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා, එය සමාජමය කාරණයක් විධියට සලකා ඒ පිළිබඳ අවබෝධයක් ලබා දෙමින්, පොල් කර්මාන්තය තවත් ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරන්න. පොල් කර්මාන්තයේ පවතින බාධක ඉවත් කරලා දෙන්න කටයුතු කරනවා නම් ඒක ඉතාම වටිනවා, ගරු ඇමතිතුමනි.

ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ මේ කටයුතු ඉතාම සාර්ථකව ඉදිරියට කරගෙන යන්න ශක්තිය ලැබේවා කියා මම මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම, අපේ ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන ගැටලු නිරාකරණය කිරීම සඳහා ඔබතුමන්ලාගේ අය වැය ලේඛනයෙන් යම්කිසි ප්‍රතිපාදනයක් වෙන් කර දීම ගැන සිතන්න කියන ඉල්ලීමත් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Sitting is suspended till 1.30 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය]සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පසු, අමාර්තු පි.ව. 1.30 මණිවරෙ இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මගේ කථාවේදී කියැවුණු කරුණක් නිවැරදි කිරීමට අවස්ථාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මගේ කථාවේදී කියැවුණා, පොල් සංවර්ධන අධිකාරියට ස්තුතිවන්ත වෙනවා කියලා. ඇත්තටම එය නිවැරදි විය යුතුයි. පසුගිය කාලයේ මේ රටේ පොල් වගාව මුහුණ දුන් තත්ත්වය සමනය කරන්න, සුදු මැස්සා ආසාදනය ඇතුළු පොල් වගාවට බලපෑ රෝගාබාධ කළමනාකරණය කරන්න මේ දක්වා සුවිශේෂ කැප කිරීමක් කළේ, පොල් වගා කිරීමේ මණ්ඩලයේ සමස්ත නිලධාරි මණ්ඩලය. මගේ අතින් ඒ ආයතන දෙකේ නම් පැටලුණා. ඒ නිසා මම මෙය අවස්ථාවක් කර ගන්නවා, පොල් වගා කිරීමේ මණ්ඩලයේ සමස්ත කාර්ය මණ්ඩලයට ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වෙන්න.

ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය කථා කරන්න.

[பி.ப. 1.32]

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமை யிட்டு நான் மிகுந்த மகிழ்ச்சியடைகின்றேன்.

எமது மலையக சமூகத்தைச் சார்ந்த இந்த அமைச்சின் குழுநிலை விவாதத்தில் பல விடயங்கள் பற்றி பேசவேண்டி இருப்பினும், மிக முக்கியமான ஒரு விடயத்தை இங்கு பேசலாமென நினைக்கின்றேன். அதாவது, தேசிய மக்கள் சக்தி ஆட்சிக்கு வருவதற்கு முன்னரே நாங்கள் நன்கறிந்த மலையக மக்களுடைய பிரதான பிரச்சினைகளில் ஒன்றான வீடமைப்புப் பிரச்சினை குறித்து நான் இங்கு பேசலாமென நினைக்கின்றேன். இன்று இங்கு பேசிய எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களில் அநேகமானோர் குறிப்பிட்ட விடயம் என்னவெனில், இந்திய அரசாங்கத்தின் உதவியின்கீழ் மலையக மக்களுக்கான வீடமைப்புத் திட்டம் வரப்போகின்றது என்றுதான்.

இன்று எமது மக்கள் மிகவும் பழைமைவாய்ந்த, சூரிய ஒளிகூட உட்பிரவேசிக்க முடியாத, காற்றோட்டமற்ற, பல உப குடும்பங்கள் வாழ்கின்ற வீடுகளில்தான் வசித்துக்கொண்டு இருக்கின்றார்கள். அந்த மக்கள் எதிர்நோக்குகின்ற பல பிரச்சினைகளுக்கு அவர்கள் வசிக்கின்ற வீடுகள்தான் முக்கிய காரணியாக இருப்பதை நாங்கள் காணலாம். உதாரணத்துக்கு, துஷ்பிரயோகங்களுக்கு உள்ளாகுதல், பாதுகாப்பற்ற தன்மை, தனிப்பட்ட குடும்ப வாழ்க்கை முறை, சுகாதார வசதிகள் அற்ற நிலைமை, பிள்ளைகளின் கல்விச் செயற்பாட்டுக்கு இடையூறு என்பவற்றைக் குறிப்பிடலாம். நான் இந்த இடத்தில் இந்திய அரசுக்கு நன்றி தெரிவிக்க வேண்டும். ஏனெனில், இவை குறித்து இந்திய அரசாங்கம் அக்கறை செலுத்தி, மலையக மக்களுக்குப் பல்வேறு உதவிகளை அளித்திருக்கிறது; அளித்துக்கொண்டும் இருக்கின்றது.

கடந்த காலங்களில் இந்த அமைச்சை ஒரு சாராரே வைத்திருந்தார்கள். 2016ஆம் ஆண்டிலிருந்து 2024ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் இந்த அமைச்சைப் பொறுப்பேற்று நடத்தியவர்கள், இவ்வமைச்சுக்குக் கிடைத்த நிதியை என்ன செய்தார்கள் என்பது குறித்து நான் ஆராய்ந்து பார்த்தேன். 2023 டிசம்பர் 31ஆம் திகதியில் முடிவடைந்த ஆண்டுக்கான நீர் வழங்கல் தோட்ட உட்கட்டமைப்பு அபிவிருத்தி அமைச்சின் நிதி அறிக்கையின்படி, 2023ஆம் ஆண்டின் செயல் நடவடிக்கைத் திட்டத்தின்மூலம் இனங்கண்டிருந்த வீடமைப்பு நிகழ்ச்சித்திட்டத்தின் அலுவல்கள் செயற்படுத்தல் மற்றும் பரிசோதனை அலுவல்களுக்காக இரண்டு மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. எனினும், அந்தச் செயற்பாடுகள் அவ்வப் போது அப்படியே நிறுத்தப்பட்டு இருக்கின்றன. அதையும் தாண்டி, எதிர்பார்த்த செயற்பாடுகள் தடைப்பட்டு இருப் பதுடன், அவை தாமதமாக்கப்பட்ட செயற்றிட்டங்களாகவே காணப்படுகின்றன. பெருந்தோட்ட மனித அபிவிருத்தி நம்பிக்கைப் பொறுப்பை எடுத்துக்கொள்வோம். பெருந்தோட்ட மனித அபிவிருத்தி நம்பிக்கைப் பொறுப்பு மற்றும் உரிய சங்க அமைப்புடன் அணுகியிருந்த உடன்படிக்கைக்கு இணங்க 2016, 2017, 2018, 2019, 2020 மற்றும் 2021 ஆகிய ஆண்டுகளில் ஆரம்பிக்கப்பட்டிருந்த 62 வீடமைப்புச் செயற்றிட்டங்கள் 2023 டிசம்பர் 31ஆம் திகதியளவிலும் பூர்த்திசெய்யப்பட்டு இருக்கவில்லை. எனினும், அந்தச் செயற்பாட்டுக்காக ஒப்பந்தக்காரர்களுக்குச் செலுத்துவதற்கு 846.85 மில்லியன் ரூபாயும் மேற்பார்வை மற்றும் முகாமைத்துவ அலுவல்களுக்காக 51.37 மில்லியன் ரூபாயும் பெருந்தோட்ட மனித அபிவிருத்தி நம்பிக்கைப் பொறுப்புக்கு அமைச்சினால் செலுத்தப்பட்டிருந்தது. இதுபோல இன்னும் பல தகவல்கள் அதில் இருக்கின்றன.

எமது மக்களுக்கு இந்திய அரசாங்கத்தின் நிதி உதவியின்கீழ் வீடமைப்புத் திட்டம் வந்தது உண்மை! ஆனால், அந்த வீடுகள் இன்றுவரை அரைகுறையாகவே காணப்படு கின்றன. அதாவது, எல்லா வசதிகளுடனும் கூடிய முழுமை யான வீடுகளாக அவை இல்லை. அவை இன்னும் எமது மக்களிடம் ஒப்படைக்கப்படவில்லை. சில இடங்களில் வீடுகள் அமைத்திருக்கிறார்கள். எனினும், அங்கு உட்கட்டமைப்பு வசதிகள் எதுவுமே இல்லை. உதாரணத்துக்கு, பாதைகள் இல்லை; நீர் வசதி இல்லை. இவ்வாறான பல குறைபாடு களுடன் கூடிய ஒரு திட்டமாகவே இந்த வீட்டுத்திட்டம் காணப்படுகின்றது. இம்முறை வரவு செலவுத்திட்டத்தில் குறிப்பிடப்பட்டுள்ளவாறு, தேசிய மக்கள் சக்தி அரசாங்க மானது, இந்திய அரசாங்கத்தின் நிதி உதவியோடு எல்லா விதமான உட்கட்டமைப்பு வசதிகளையும் கொண்ட 10 பேர்ச்சஸ் காணி மற்றும் காணி உரித்துப் பத்திரத்துடன்கூடிய ஒரு வீடமைப்புத் திட்டத்தையே ஆரம்பிக்க இருக்கின்றது. கடந்த காலங்களில் அரசியல்வாதிகளால் அரசியல் எதிர்பார்ப்புகளை நோக்கமாகக்கொண்டு, தங்களது உறவினர் களுக்கும் கட்சி சார்ந்தவர்களுக்குமே அந்த வீடுகள் பகிர்ந்தளிக் கப்பட்டன. ஆனால், எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கமானது மக்களுடைய நன்மை கருதி, குறிப்பாக அனர்த்தத்துக்கு உட்பட்ட, உட்படப்போகின்ற மக்களுக்கான வீடமைப்புத் திட்டத்தையே மேற்கொள்ள இருக்கின்றது.

இதன் அடிப்படையில், இம்முறை 6,000 வீடுகளை அமைப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது. எதிர்க்கட்சியினர் எப்பொழுதுமே சொல்லிக்கொண்டு இருக்கிறார்கள், "நீங்கள்

[ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය]

சொல்வதெல்லாம் செயற்பாட்டில் இல்லை" என்று. நாளை காலை 9.30 மணியளவில் கபரகலையில் இதற்கான அடிக்கல் நாட்டப்பட இருக்கின்றது. அங்கு மண்சரிவால் பாதிக்கப்பட்டு இரண்டு வருடங்களாக தொழிற்சாலைகளில் அகதிகளாக இருக்கின்ற 50 குடும்பங்களுக்கு கடந்த அரசாங்கம் செய்யாததை எங்களுடைய அரசாங்கம் செய்யப் போகின்றது. நாங்கள் நடைமுறை ரீதியாகச் செயற்பட்டுக்கொண்டு இருக்கின்றோம். மேலும், இந்திய அரசாங்கத்தின் நிதி உதவி ஊடாக வீடுகள் அமைத்திருப்பதாக எதிர்க்கட்சியினர் சொன்னார்கள். அவற்றில் 1,300 வீடுகள் இன்னும் சம்பூரண மாக்கப்படாத நிலையில் உள்ளன. அவற்றைப் பூரணப்படுத்த வேண்டிய பொறுப்பும் எங்களுடைய தலையில்தான் சுமத்தப்பட்டு இருக்கின்றது. அவற்றையும் சேர்த்துத்தான் 6,000 வீடுகள் எனக் குறிப்பிட்டேன்.

மேலும், "கிளீன் ஸ்ரீ லங்கா" திட்டத்தின்மூலம் எமது அரசாங்கம் 75 'லயன்' குடியிருப்புகளைத் திருத்தியமைக்க இருக்கின்றது. அதன்மூலம் ஆயிரத்துக்கும் மேற்பட்ட மக்கள் பயன்பெறப் போகிறார்கள். அந்த மக்களைத் தொடர்ந்தும் 'லயன்' அறைகளிலா வாழவைக்கப் போகின்றீர்கள் என்று நீங்கள் கேட்கலாம். அவர்களுக்குத் தனி வீடுகளைக் கட்டிக் கொடுக்கும் வரைக்கும் அவர்களுக்குச் சிறந்ததொரு வீட்டைப் பெற்றுக் கொடுக்கவேண்டிய பொறுப்பு மலையக அரசியல் வாதிகளாகிய எங்களுக்கு இருக்கின்றது.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට ලබා දී තිබෙන කාලය අවසන්.

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்னும் இரண்டு நிமிடங்கள் தாருங்கள்!

இன்று 'பிரஜா சக்தி' நிலையங்கள் பராமரிக்கப்படாத நிலையில் காணப்படுகின்றன. அதாவது, இளைஞர், யுவதி களுக்கு தொழிற்பயிற்சியை வழங்கக்கூடிய நிலையங்கள் இன்று நிர்வகிக்கப்படாத நிலையில் மூடப்பட்டுள்ளன. இன்றையதினம் இச்சபையில் பேசிய உறுப்பினர் ஒருவர் கூறினார், மலையக இளைஞர், யுவதிகள் வேலைவாய்ப்புத் தேடி கொழும்புக்குப் போகிறார்கள் என்று. அந்த நிலையை மாற்றக்கூடிய வகையில், எங்களுடைய மலையக இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்பைப் பெற்றுக்கொடுப்பதற்கு 2,450 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இவ்வாறு எமது இளைஞர், யுவதிகளுக்கு நல்ல முறையில் பயிற்சிகளை அளித்து, அவர்களுடைய வாழ்வாதாரத்தை உயர்த்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමිය, දැන් ඔබතුමියගේ කථාව අවසන් කරන්න.

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
பேசுவதற்கு இன்னும் பல விடயங்கள் இருந்தபோதிலும், நேரம் போதாமையால் எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු පලනි දිගම්බරම් මහතා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 12ක කාලයක් වෙන් කර තිබෙනවා.

[பி.ப. 1.40]

ගරු පලනි දිගම්බරම් මහතා
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, சகோதரி அம்பிகா சாமிவேல் அவர்களுக்குப் பின்னர் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இன்றையதினம் இச்சபையில் பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதம் நடைபெறுகின்றது. இந்த வரவு செலவுத்திட்டம் தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் முதலாவது வரவு செலவுத்திட்டம் என்பதால் மக்கள் மத்தியில் பெரும் எதிர்பார்ப்பிருந்தது. இந்த வரவு செலவுத்திட்டத்தில் எமது சமூகத்தை 'மலையகத் தமிழர்' எனக் குறிப்பிட்டுள்ளமை மகிழ்ச்சி அளிக்கின்றது. அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு மலையக மக்கள் சார்பாக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். வெறுமனே வார்த்தை அளவில் மட்டும் நின்றுவிடாமல், செயலளவில் வேலைத்திட்டங்களை முன்னெடுங்கள்! எங்களைக் குறைசொல்லிக்கொண்டு இருக்க வேண்டாம். எங்களுக்கு அதிகாரம் கிடைத்த காலத்தில் எங்களால் முடிந்தளவு மலையக மக்களுக்குச் சேவை செய்துள்ளோம்.

'நல்லாட்சி' அரசாங்க காலம்தான் மலையக மக்களுக்குப் பொற்காலம்! மலையக மக்களின் பிரச்சினை என்பது 200 வருட காலப் பிரச்சினை! அதனை ஓர் இரவில் மாற்ற முடியாது. அதேபோல், ஓர் ஆட்சிக் காலத்தில் மாத்திரமும் மாற்ற முடியாது. அதற்குத் தொடர்ச்சியான வேலைத் திட்டங்கள் அவசியம். மலையக மக்களின் ஒட்டுமொத்த பிரச்சினைகளையும் தீர்ப்பதற்கு நீங்கள் உங்களுடைய காலத்தில் நடவடிக்கை எடுத்தால், அதற்கு நாங்கள் முழுமையான ஒத்துழைப்பைத் தருவோம். எதிர்க்கட்சி யிலிருந்து அழகாக மக்கள் விரும்பும் வகையில் பேசிப் பேசி ஆட்சிக்கு வந்துள்ள உங்களுக்கு இப்போது யதார்த்தம் புரியும்! இந்திய வீடமைப்புத் திட்டம் ஆரம்பிக்கப்படாத நிலையில், 2016ஆம் ஆண்டு இந்திய அரசாங்கத்துடன் ஒப்பந்தம் செய்த 4,000 வீட்டுத்திட்டத்தில் 59 கிராமங்களே உருவாக்கப்பட்டன. அதுமட்டுமல்லாமல், இந்தியாவின் 10,000 வீட்டுத்திட்டத்துக்கான ஒப்பந்தம் 2018ஆம் ஆண்டு செய்யப்பட்ட நிலையில், 200 கிராமங்களை அமைப்பதற்கான வேலைத்திட்டமும் இடம்பெற்றது. அதற்குப் பிறகு, எங்களுடைய ஆட்சி இருக்கவில்லை. எமது ஆட்சிக் காலத்தில் அதிகமான வீடுகள் இயற்கை அனர்த்தங்களால் பாதிக்கப் பட்ட மக்களுக்காகவே அமைக்கப்பட்டன. எங்களுடைய ஆட்சிக் காலத்தில் நுவரெலியா மாவட்டத்தில் நான்கு புதிய பிரதேச சபைகள் உருவாக்கப்பட்டன. அத்துடன், தோட்ட மக்களுக்குச் சேவை செய்யும் வகையில் பிரதேச சபைகள் சட்டமும் திருத்தப்பட்டது.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ සමහර කට්ටිය කියනවා අපි වතු ජනතාව රැවැට්ටුවා, අපි මුකුත් කරලා නැහැ, අරහෙමයි මෙහෙමයි කියලා. ඇත්තටම මේගොල්ලන් දැනගන්න ඕනෑ, මම වත්තේ ඉපදුණු කෙනෙක් බව. වත්තේ ඉපදිලා පළමුවෙන්ම Cabinet Minister වුණේ මමයි. වෙන කවුරුවත් එහෙම වුණේ

නැහැ. මම ඇත්තටම අවංකව වැඩ කරලා තිබෙනවා. කිසිම හොරකමක් කරලා නැහැ. 2015-2019 වෙනකන් ඔබතුමා දැනට ඉන්න Ministry එකේ මම තමයි ඇමති වෙලා හිටියේ. ඔබතුමා check කරලා බලන්න, ඒ Ministry එකේ කිසිදු හොරකමක් කරලා තිබෙනවාද කියලා. මම පිරිසිදුව දේශපාලනය කරලා තිබෙනවා. මට බය නැතිව ඒක කියන්න පුළුවන්. මොකද, මම වත්තේ ඉපදුණු නිසා මම දන්නවා වත්තේ මිනිස්සුන්ගේ දුක කොහොමද කියලා. ඒක නිසා තමයි මම දේශපාලනයට ආවේ. කාටවත් ඇවිල්ලා කටින් වඩ පුච්චන්න බැහැ. ඔබතුමාට නොවෙයි, මම කියන්නේ. අපේ කට්ටියටයි කියන්නේ. ඒ ගැන ඔබතුමන්ලා දැන ගන්න. ඔබතුමන්ලාට දැන් කාලය ඇවිල්ලා තිබෙනවා, වැඩ කරලා පෙන්වන්න. බොරුවට අපට දොස් කියමින් ඉන්න එපා. ඔබතුමන්ලා රැල්ලට ආපු කට්ටිය. අපි එහෙම නොවෙයි. අපි මේ පාර පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. අපි රැල්ලට ආවේ නැහැ. මම බොහොම සතුටෙන් තමයි කියන්නේ, අපි වැඩ කරලා තිබෙනවා කියලා. මම තමයි පළමු වතාවට වතු ජනතාවට පර්වස් 7 බැගින් දීලා ගෙවල් ටික හදලා දුන්නේ. ඔබතුමා දන්නවා, ප්‍රාදේශීය සභා මැතිවරණය පවත්වලා, ඒ සභාව - ඒ ලැබුණු සල්ලිවලින් ජනතාවට වැඩ කරන්න බැහැ. උඩ පළාතට - නුවරට - වතුර ටැංකියක් අරගෙන දුන්නා කියලා ඒ සභාව dissolve කළා. එතැන නීති ගැටලුවක් තිබුණා. ඒ නීති ගැටලුවක් තිබුණු නිසා අපි පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනල්ලා පාස් කරලා දුන්නා. වර්තමාන ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා, ගරු විජිත හේරත් අමාත්‍යතුමා එදා අපිට සහයෝගය ලබා දුන්නා. ඒ වාගේ අපි හුඟාක් වැඩ කරලා තිබෙනවා. දැන් බලන්න, ඔය ගොල්ලන් list එකක් හදනවා. පෙට්ටල් ෂෙඩ් අරගෙන තිබෙනවා, බංගලා අරගෙන තිබෙනවා, ආණ්ඩුවේ ගෙවල් අඩුවට අරගෙන තිබෙනවා කියලා. අපේ එක්කෙනෙකුගේ නමක් ඒ list එකේ තිබෙනවාද බලන්න. ඔබතුමන්ලා හොයලා බලන්න. එක නමක්වත් නැහැ. මම, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා, ගරු රාධාකෘෂ්ණන් මන්ත්‍රීතුමා වතුකරයේ පිරිසිදුව දේශපාලනය කරපු අය. *[බාධා කිරීමක්]*

ඔබතුමන්ලා ඕනෑ නම් check කරලා බලන්න. මමත් වත්තේ ඉපදුණු කෙනෙක්. සමන්ත විද්‍යාරත්න මැතිතුමාත් බදුල්ල දිස්ත්‍රික්කයේ. ඔබතුමා වතුකරය ගැන හොඳට දන්නවා. වතුකරයේ ජනතාවට හරියට වැඩක් කරයි කියලා ඔබතුමා ගැන අපට විශ්වාසයක් තිබෙනවා. මම කියන්නේ මේකයි. අපිට දොස් කියලා වැඩක් නැහැ. ආණ්ඩුව සල්ලි වෙන් කරන්නේ කීයද? රුපියල් බිලියන 2ක් වෙන් කළොත් මේ වතුකරය සංවර්ධනය කරන්න පුළුවන්ද? කොච්චර ද කරන්න පුළුවන්? දැන් බලන්න, රුපියල් මිලියන 9,000ක් අයින් කරලා තිබෙනවා. ඉන්දියන් ආණ්ඩුවත් රුපියල් මිලියන 4,500ක් වෙන් කරලා තිබෙනවා. ඉතිරි රුපියල් මිලියන 2,800 තමයි ආණ්ඩුවෙන් දෙන්නේ. ඒ රුපියල් මිලියන 2,800න් මොනවද කරන්න පුළුවන් වැඩ? අපි ඔබතුමාට දොස් කියලා වැඩක් නැහැ. ජනාධිපතිතුමා සල්ලි වෙන් කරලා තිබෙන්නේ කොච්චරද, ඒ අනුව තමයි ඔබතුමාට වැඩ කරන්න පුළුවන් වෙන්නේ. ඉතින් මේ ගැනවත් දන්නේ නැහැ. දැන් මේගොල්ලෝ තුන් දෙනෙක් ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රීවරු 9 දෙනෙක් හිටියා. හැම තිස්සේම කියන්නේ මේ මන්ත්‍රීවරු 9 දෙනා වැඩ කරලා නැහැ කියලා. අපි හදපු පාරවල්වල තමයි මේ අය යන්නේ, ප්‍රචාරය කරන්න.

ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමියගේ වත්තට අල්ලපු වත්තේ ලක්ෂ 10ක වැඩ කළා. ඔබතුමා estimate කරලා බලන්න. රුපියල් ලක්ෂ 10කට මාළිගා හදන්න බැහැ. මම ගෙවල් 157ක් හදලා දුන්නේ පක්ෂය බලලා පක්ෂයට ඡන්දය දෙයි කියලා බලාපොරොත්තුවෙන් නොවෙයි. ඒගොල්ලන් අපේ පක්ෂයේ අය නොවෙයි. ඔක්කොම හදලා දීලා තිබෙන ඒවා ගත්තා. ගරු ඇමතිතුමා, මම හුඟාක් වතුවලට වැඩ කරලා දීලා තිබෙනවා. ඔබතුමන්ලා check කරලා බලන්න. මම කියන්නේ මේකයි. ඔබතුමන්ලා අපිට බොරුවට දොස් කියන්න එපා. ඔබතුමන්ලාට බලය හම්බවෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා එකතු වෙලා වැඩ කරලා පෙන්වන්න. වැඩ කරලා පෙන්නුවොත් ඔබතුමන්ලාට ඡන්දය දෙයි. එහෙම නැත්නම්, ඊළඟ මැතිවරණයේ දී දෙමළ මිනිස්සු ඡන්දය දෙන්නෙත් නැහැ, සිංහල මිනිස්සු ඡන්දය දෙන්නෙත් නැහැ. ඒක දැනගන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා වතුකරයේ ජනතාව ගැන ටිකයි කථා කළේ. Plantation sector එක දියුණු කරන ඒවා ගැන තමයි වැඩියෙන්ම කථා කළේ. ඔබතුමා වතුකරයේ ජනතාව ගැන වැඩියෙන් අවධානය යොමු කරන්න. අපි සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. මොකද, අපිට කුහකකමක් නැහැ; අපි jealous නැහැ. කවුරුවත් හිතුවේ නැහැ, අපි මේ පාර පාර්ලිමේන්තුවට එයි කියලා. පරදිනවා කියලායි අපිත් හිතුවේ. නමුත්, අපේ මිනිස්සු අපිට ඡන්දය දුන්නා. ඡන්ද 58,000කට වැඩිය දැම්මා. ඊළඟ වතාවේදී අපි දිනනවා. අපි රැල්ලට ආවේ නැහැ. ඔබතුමන්ලා, ජනාධිපතිතුමන් සමඟ එකතු වී මේ කටයුතු නිවැරදිව කරන්න. අපි ඒ සඳහා අනිවාර්යයෙන් සහයෝගය ලබා දෙන බව පවසමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.47]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පලනි දිගම්බරම් මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලැබුණා. මේ අවස්ථාවේ ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. ඒ ගැන සතුටුයි. මෙතුමාගේ කථාවේ හරයම තමයි මමත් තහවුරු කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඔබතුමන්ලා මන්ත්‍රී ධුර 159ක් හිමි බලවත් ආණ්ඩුවක්. ඒ ගැන අපට සතුටුයි. ඒ නිසා, ඒ බලවත්කම පාවිච්චි කරලා, මේ රටේ ඉතාම අඩුවෙන් දියුණු වෙච්ච, කොන් වෙච්ච, පැත්තකට තල්ලු වෙච්ච, හුදකලා වෙච්ච ජන කණ්ඩායමක් වන මලයගම් ජනතාව සම්බන්ධයෙන් කටයුතු කරන්න. ශ්‍රී ලාංකික මලයගම් දමිළ ජනතාව හැමෝම වතුවල ජීවත් වෙන්නේ නැහැ. ලක්ෂ 8ක්, 9ක් විතර වතුවල ජීවත් වෙනවා. ඉතුරු අය නගරවල ජීවත් වෙනවා. කොළඹත් ඉන්නවා, හැම තැනම ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ හැමෝම වතුවල වැඩ කරන්නේ නැහැ. වැඩ කරන්නේ කී දෙනෙක්ද කියලා ඔබතුමා දන්නවා නේ, ඇමතිතුමා. ලියාපදිංචි කම්කරුවන් 150,000ක් තමයි වැඩ කරන්නේ. ඉතුරු අය එතැන ජීවත් වෙනවා, පිට වැඩ කරනවා. ඒක අවබෝධ කර ගන්න ඕනෑ. නිකම් කථා කරන්න බැහැ. දැන් මෙතුමා කියපු කාරණය මමත් තහවුරු කරන්න ඕනෑ. මෙතුමා තමයි මඩකුඹුර වත්තේ ඉපදිච්ච, ඒ පොළොව ගැන දන්න, දහඩිය සුවඳ හඳුනන දේශපාලනඥයා. මෙතුමා පළාත් සභාවට ඇවිල්ලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා කැබිනට් මණ්ඩලයට ආවා. ඒක තමයි දැන් අපි ඔක්කෝම එකට ඉන්නේ. දෙමළ ජාතික සන්ධානය කිව්වාම මනෝ ගනේසන්, පලනි දිගම්බරම්, රාධාකෘෂ්ණන් - අපි තුන්දෙනාම - ඉන්නවා. ප්‍රශ්නයක් නැහැ, බලවත් සන්ධානයක් ඒක. ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපට මේ රටේ ජනාධිපතිකම නැහැ නේ; අගමැතිකම

[ගරු මනෝ ගනේසන් මහතා]

නැහැ නේ. අපි කොන් වෙච්ච, තල්ලු වෙච්ච ජන කණ්ඩායමක් නියෝජනය කරන්නේ. අපට හිතෙන දේ කරන්න බැහැ. ආණ්ඩු පක්ෂයේ සිටියත්, විපක්ෂයේ සිටියත් සටන් තමයි හැම දාම.

මම මෙන්න මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබේ ආණ්ඩුව හරහා පත් වෙච්ච මලයගම් ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් ඉන්නවා, කැබිනට් ඇමතිවරයෙක් ඉන්නවා, නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නවා. ඒක හොඳයි. අපි මුල ඉඳලාම ඒ අයට සහයෝගය ලබා දෙන්නම් කිව්වා. අපි ඒ අයට සුබ පතනවා. ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒගොල්ලන්ට සමහර වෙලාවට අමතක වෙනවා, මේක පාර්ලිමේන්තුව කියලා. මේක වේදිකාව නොවෙයි; මේක මැතිවරණ වේදිකාවක් නොවෙයි. ඒ අය දැන් governance mode එකට එන්න ඕනෑ, විද්‍යාරත්න ඇමතිතුමා; ඒ අය ඒ mode එකට එන්න ඕනෑ. ඒගොල්ලන් තවම ඉන්නේ විපක්ෂ mode එකේ. එහෙම ඉන්න ඕනෑ නැහැ, governance mode එකට එන්න. මේ, ඔබේ ආණ්ඩුව. ඔබට බලය තිබෙනවා, කටයුතු කරන්න. අපට ඕනෑ කරන්නේ ඒක තමයි.

බලන්න, අපි තමයි 2015න් පසුව කැබිනට් පත්‍රිකාවක් මඟින් කඳුකර දම්ළ ජනතාවට පර්චස් 7ක ඉඩම් ප්‍රමාණයක් ලබා දෙන්නට අවශ්‍ය ගමන පටන් ගත්තේ. ඒ ගැන මන්ත්‍රීතුමියක් කථා කළා. එතුමිය දන්නේ නැහැ, මොකක්ද වුණේ කියලා. එතුමියට ඒවා ගැන සොයා බලා දැනගන්න කියන්න. අපි ඒ කටයුතු පටන් ගත්තා. ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා තමයි එවකට විෂය භාර ඇමතිතුමා. අපේ ඉල්ලීම පරිදි, TPA එකේ ඉල්ලීම පරිදි, එතුමා ඒ කටයුත්ත කර දුන්නා, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව. පර්චස් 5ක් දෙන්න ඒගොල්ලන් තීරණය කළා. එදා අපි තමයි කෑ ගහලා එම ප්‍රමාණය පර්චස් 7ක් කර ගත්තේ. එකින් එකට කෑ ගහලා තමයි අපට ඒවා කරගන්න පුළුවන් වුණේ. නිකම් නම් දෙන්නේ නැහැ. පර්චස් 7ක්ද, 2ක්ද, 3ක්ද කියලා කථා කරනවා. පර්චස් එකක්වත් ගන්න අමාරුයි. නමුත් අපි ඒක කරගත්තා.

ඊට පසුව දීර්ඝ කාලයක් ඉන්දියානු ණය ක්‍රමය යටතේ ගෙවල් හදන ක්‍රමය - plan එක - held up වෙලා තිබුණා. අපි කථා කරලා ඒකත් කරගත්තා. එතකොට දිගම්බරම් මැතිතුමා තමයි විෂය භාර ඇමතිවරයා. අපි කථා කරලා ඒකත් කරගත්තා. එතුමා අපට සහාය දුන්නා. සාකච්ඡා කරලා අවබෝධතා ගිවිසුමක් අත්සන් කළා. විෂය භාර ඇමතිවරයාත්, ඉන්දියානු තානාපතිතුමියත් අත්සන් කරලා තමයි එම කටයුත්ත පටන් ගත්තේ. එම අමාත්‍යාංශයේ නම මොකක්ද? අපි ඉල්ලලා ගත්තේ ඒක. "නව ගම්මාන" කියලා නම දැම්මා. ඒ නම නැහැ නේ, දැන්. වතුවලට ගම්මානත් අවශ්‍යයි. වතුවල ජීවත් වෙන්න බැහැ, නව ගම්මාන අවශ්‍යයි. புதிய கிராமங்கள் - new villages - අවශ්‍යයි. "යටිතල පහසුකම්" කියලායි ඒ අමාත්‍යාංශයේ නම තිබුණේ. අපි ඒ නම වෙනස් කළා. නම වෙනස් කිරීම කියන්නේ නිකම් වෙනස් කිරීමක් නොවෙයි. සිවාජී ගනේසන්, ජෙමිනි ගනේසන් කියලා නම වෙනස් කරන එක නොවෙයි, මනෝ ගනේසන් කියලා නම වෙනස් කරන එක නොවෙයි. නව ගම්මාන කියනකොට, අර්ථයක් තිබෙනවා නේ, තේරුමක් තිබෙනවා නේ. අවුරුදු 200ක් තිස්සේ වතුවල ජීවත් වන අයට ගම්මානවල ජීවත් වෙන්න අපි අවස්ථාව ලබා දුන්නා, ඒ නමින්.

ඊට පසුව අපි කරපු තුන්වැනි කටයුත්ත තමයි, තනි ගෙවල් හදා දීම. තනි ගෙවල් හදා දුන්නා. තට්ටු නිවාස නොවෙයි. අපි ඒ කාලයේ ඒක යෝජනා කළා. රනිල් වික්‍රමසිංහ මහත්මයා තට්ටු නිවාස හදමුද ඇහුවාම මම කිව්වා, නැහැ, ඒවා කොළඹ හදමු කියලා. කොළඹ හදා දුන්නා. හැබැයි, එහේ එහෙම හදන්න එපා කියලා අපි කිව්වා. මොකද, එතැන භූමිය සමඟ; පොළොව සමඟ මලයගම් ජනයාට සම්බන්ධතා ඇති කරන්න ඕනෑ. ඒගොල්ලන්ට තනි ගෙවල් හදා දුන්නාට පසුව අවශ්‍ය නම් ඒ ගෙවල්වලට තට්ටුවක් හදාගන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ අයිතිය ඕනෑ, ඒගොල්ලන්ට. එතකොට තමයි ඒගොල්ලන් ගම්මානයක් බවට පත් වෙන්නේ. අපි ඒක කළා.

ඒ වාගේම අපි ඒ අයට පර්චස් 7ක් ලබා දුන්නා. තවම ඔයගොල්ලන්ගේ ආණ්ඩුවෙන් නිල වශයෙන් අපට කියා නැහැ, පර්චස් කීයක්ද දෙන්න යන්නේ කියලා. පර්චස් 7ද? පසුගිය ආණ්ඩුව කාලයේ පර්චස් 7, පර්චස් 10 වුණා. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තව කථාවක් තිබුණා. පර්චස් 10ද දෙන්නේ, හදන නිවාස මොන වාගේද, තට්ටු නිවාසද, තනි නිවාසද කියලා නැහැ. තවම කවුරුවත් ඒ ගැන කියලා නැහැ. හැබැයි, නියෝජ්‍ය අමාත්‍ය ප්‍රදීප් සහෝදරයා ඒ ගැන කිව්වා. ඇමතිතුමනි, නමුත් මට ඔබතුමාගේ කටින්ම ඒ ගැන දැනගන්න ඕනෑ, නැත්නම් අනුර කුමාර දිසානායක සහෝදරයාගේ කටින් ඒ ගැන පිට වෙන්න ඕනෑ. මම එච්චරයි කියන්නේ. ඒ කාලයේ හදපු ඒ ගෙවල් සහිත ප්‍රදේශ "නව ගම්මාන" හැටියට අපි නම් කළා. අපි මලයගම් ජනතාව වෙනුවෙන් පක්ෂ භේදයකින් තොරව පෙනී සිටි හැම පක්ෂයකම හිටපු නායකයන්ගේ නම්වලින් -ඒ කාලයේ හිටපු නායකයන්ගේ නම්වලින්- පසු කාලීනව ගම්මාන හැදුවා. ඒවා තිබෙනවා.

ඊට පසුව අපි ප්‍රාදේශීය සභා 6ක් එකවර හැදුවා. ඒක කාටවත් හිතාගන්න බැරි වුණා. රාධාකෘෂ්ණන් මන්ත්‍රීතුමාත් ඒ ගැන දන්නවා. අඹගමුවේ ලක්ෂ දෙකහමාරක ජනතාවක් සිටියා. නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලක්ෂ දෙකහමාරක් සිටියා. 1987 සිට 2015 වෙනකම් බලන්න. අවුරුදු 35ක් පමණ එහෙම හිටියා. කවුරුවත් ගණන් ගත්තේ නැහැ. 15,000ක්, 20,000ක් ඉන්න රටේ සමහර ප්‍රදේශවලත් ප්‍රාදේශීය සභා පිහිටුවා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. කවුරුවත් අර අයව ගණන් ගත්තේ නැහැ. හිතා බලන්න. බලංගොඩ මායිමේ ඉඳලා බොගවන්තලාව පැත්තේ ඉඳලා ගිනිගත්හේනට එන්න ඕනෑ. ඒක කරන්න පුළුවන්ද? ඒ නිසා අපි කෑ ගහලා ඒකත් අරගත්තා. මට අදටත් මතකයි, විශේෂ කැබිනට් සාකච්ඡාවක් තිබුණු අවස්ථාවකදී රනිල් වික්‍රමසිංහ මහත්මයා හැම දාම වාගේම ඒ වතාවේත් ඒක කල් දමන්න උත්සාහ කළා, පස්සේ බලමු කියලා. මම කෑ ගැහුවා, පස්සේ බලන්න බැහැ, ඕනෑමයි කියලා. මට මතකයි, සුසිල් ප්‍රේමජයන්ත හිටපු ඇමතිතුමාත් එතැන හිටියා. එතුමා කිව්වා, මේ ඇමතිතුමා කියන එක සාධාරණයි නේ, ඒක ගැන අපි දැනගෙන හිටියේ නැහැ නේ, ඒ ගැන ලජ්ජා වෙනවා කියලා. එතුමා ඇත්ත කිව්වා. එතකොටත් රනිල් වික්‍රමසිංහ මහත්තයා මේක කල්දමන්න බැලුවා. මම නැඟිටලා පුටුවට පයින් ගැහුවා. පයින් ගහලා, යනවා කියලා මම එතැනින් නැඟිටලා ආවා. දිගම්බරම් මැතිතුමාත් හිටියා. එතුමාත් මාත් එක්ක ආවා. නැහැ, නැහැ, දිගා ඉන්න කිව්වා. ඊට පස්සේ දිගම්බරම් මැතිතුමා කථා කළා. ඒ තර්ජනයෙන් පසුව තමයි ප්‍රාදේශීය සභා 6ක් අපට ලැබුණේ. හැමෝම කියනවා නේ අපි වැඩ කළේ නැහැ කියලා. ඒ නිසා හොඳට අහගන්න.

நன்றாகக் கேட்டுக்கொள்ளுங்கள்! நாங்கள் செய்த வற்றைத் தெரிந்து கொள்ள வேண்டும். අපි පක්ෂ භේද ගැන කථා කරන්නේ නැහැ. අපට පක්ෂ, විපක්ෂ භේදයක් නැහැ. මම නියෝජනය කරන්නේ සුළු ජනතාව. අපි ආණ්ඩුවේ ඉන්නකොට සටන් කරලා තමයි ප්‍රාදේශීය සභා 6ක් ගත්තේ. ඊට සාපේක්ෂව ප්‍රාදේශීය ලේකම් කාර්යාල හදන්නත් පටන් ගත්තා. ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයක් නිකුත් කළා. ඒ අනුව තමයි නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හදලා තිබෙන්නේ. හැබැයි, ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හැටන්වලට ගන්න හදනවා ලු. එදා මම පාර්ලිමේන්තුවේදී ඒ ගැන කථා කළා නේ. ඒ

සම්බන්ධයෙන් මම සභාව කල්තැබීමේ යෝජනාවක් ගෙනාවා. ඒකට ඇමතිතුමා ඇහුම්කන් දුන්නා. ඒක කරන්න එපා කියන්න. සමහර උදවියට, නිලධාරින්ට නෝර්වුඩ්වලට ගමන් කරන්න බැරි නිසා, ඔවුන්ගේ පහසුවට ඒ කාර්යාලය ගෙනෙන්න හදනවා, හැටන්වලට. කාර්යාල තිබෙන්නේ, සභාව තිබෙන්නේ, ආණ්ඩුව - රජය- තිබෙන්නේ, ජනතාව වෙනුවෙන්. ජනතාව ළඟට ඔවුන් යන්න ඕනෑ. මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ, නිලධාරින්ගේ පහසුවට වැඩ කරන්න බැහැ. ඒක තමයි සිද්ධාන්තය. ඒක තමයි අර්ථය. අපි ඒක කළා.

ඒ වාගේම දිගම්බරම් මැතිතුමාත් මේ කාරණය සඳහන් කළා. Pradeshiya Sabhas Act එකේ 33 වෙනි Clause එකේ මොකක්ද තිබෙන්නේ? මැතිවරණයකින් ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීවරුන් පත් කරන්න පුළුවන්. නමුත්, ඒ මන්ත්‍රීවරුන්ට මුදල් වෙන් කරලා ඒ වතුවල development වැඩ කරන්න බැහැ. මොන අපරාධයක්ද, මේක? ඒ වතුවලට මුදල් වෙන් කළා කියලා මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභාවක් dissolve කළා. අපි ඒක වෙනස් කළා. කවුරුවත් එහෙම කළේ නැහැ. අපි - TPA එක - ඒක වෙනස් කළා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අයින් කරලා, වෙනස් කරලා තමයි අයිතිය ලබා දුන්නේ. දැන් ප්‍රාදේශීය සභා යටතේ තමයි වතු ප්‍රදේශ තිබෙන්නේ. ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාත් ඒ ගැන ළඟදී කථා කළා. ඔක්කෝම පාරවල් තිබෙන්නේ, ප්‍රාදේශීය සභාව යටතේ. ඒ පාරවල් ගොඩක් පාවිච්චි කරන්නේ, වතු හාමිපුතුන්. ඒ පාරවල ඒගොල්ලන්ගේ factoriesවලට වාහන යනවා, ඒගොල්ලන්ගේ පෞද්ගලික වාහන යනවා. ඉතින්, ඒගොල්ලන්ගෙන් tax එකක් ගන්න. ඒගොල්ලන්ට ඒ සඳහා මුදල් වෙන් කරන්න කියන්න. වෙනම මුදලක් ඒගොල්ලන්ගෙන් ගන්න, ඒවා හදන්න. ආණ්ඩුව හදලා දෙනවා, ඒගොල්ලන් පාවිච්චි කරනවා. එහෙමයි කළේ. ඒ වාගේම NVDA කියලා වතු ප්‍රදේශ වෙනුවෙන් විශේෂයෙන් නිර්මාණය කරපු Authority එකක් තිබෙනවා. ඒක දැන් නිකම් තිබෙනවා. වැඩක් වෙන්නේ නැහැ. ඒක හරියට පාවිච්චි කරන්නේ නැහැ. Act එක අරගෙන බලන්න.

ඒ වාගේම ගරු රාධාකෘෂ්ණන් මැතිතුමා අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා වශයෙන් සිටියදී කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ තමයි, වතු පාසල් 300ක් සඳහා ඒ ළඟ පාත තිබෙන ඉඩම් අක්කර 2ක් අවශ්‍යයි කියන යෝජනාව. ඉඩම් ඕනෑ නේ. Playground එකක් ඕනෑ, buildings හදන්න ඕනෑ. කැබිනට් මණ්ඩලයේම එකඟත්වයෙන් ඒක සම්මත කර ගත්තා. අපි නිකම් හිටියේ නැහැ. පොල් ගෑවේත් නැහැ, බම්බු ගැහුවේත් නැහැ, අපි වැඩ කළා. ඒක තේරුම් ගන්න. ඒ නිසා අපට බණින්න එපා කියන්න. අපිත් බණින්න පටන් ගත්තාම මේක ඉවර වෙයි. ගරු ඇමතිතුමනි, මේක ඔබතුමාට කියනවා නොවෙයි. අදාළ උදවියටයි කියන්නේ. හරි නම් තොප්පි දමා ගන්න කියන්න. මේක, එච්චර ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා මෙහෙම කරන්න එපා. අපි මේ වෛරයෙන් කථා කරනවා නොවෙයි. අපි නියෝජනය කරන්නේ, සාමාන්‍ය, දුගී දුප්පත්, නැති බැරි, අහිංසක, කොන්වෙච්ච ජනතාව. ඒ ජනතාව වෙනුවෙන් කථා කරන්න අපට කොයි ආණ්ඩුව ආවත්, කොයි ජනාධිපතිතුමා ආවත්, කොයි අගමැති ආවත් කමක් නැහැ. අපි ඔයගොල්ලන් එක්ක වැඩ කරන්න කැමැතියි. අපි ඉන්න තැනක ඉඳලා වැඩ කරන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි එන්න. දැනගන්න, ඔයගොල්ලන් ආණ්ඩුවේ ඉන්නවා කියන එක. විපක්ෂයේදී වාගේ නොවෙයි. විපක්ෂයේදී කථා කළා වාගේ දැන් කථා කරන්න එපා. අඬන්න එපා. தமிழில் 'ஒப்பாரி வைத்தல்' என்று சொல்வார்கள். ஒப்பாரி வைக்க வேண்டாம்.' ඔප්පාරි'වලට කියන සිංහල වචනය මොකක්ද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා අඬන්න එපා. කථා කරන්න. මොකක්ද කරන්නේ කියලා කියන්න. මාස 6ක් ගත වෙලා නේ ඔයගොල්ලන් ඇවිල්ලා.

ඒ වාගේම අපි සජිත් ප්‍රේමදාස මැතිතුමා එක්ක ගිය සැරේ - මැතිවරණ කාලයේ- අවබෝධතා ගිවිසුමක් අත්සන් කළා. එතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, එතුමා ප්‍රතිපත්තියක් විධියට පිළිගත්තා, වතු කම්කරු ජනතාව කියන්නේ, කම්කරුවන් නොවෙයි, කොටස්කරුවන් කියන එක. தொழிலாளியாக அல்ல, பங்காளியாக மாறவேண்டும் என்று. TPA හැටියට අපි වතු ජනතාවගේ වැටුප්වලට කවදාවත් සම්බන්ධ වෙන්නේ නැහැ. ඒවායේ ඉලක්කම පොඩ්ඩක් වැඩි වුණා කියලා අපි වෙනස් වෙන්නේ නැහැ. ඒගොල්ලන් මේ ක්ෂේත්‍රයේ කොටස්කරුවන් වෙන්න ඕනෑ. ඔබතුමාට යෝජනා කරන්නම්, cooperative system හැටියට ඒගොල්ලන් වෙනස් කරන්න ඕනෑ. කොටස්කරුවන් වෙන්න ඕනෑ. වැටුප් වෙනස් වෙන්න බැහැ. ඒගොල්ලන්ට රුපියල් 1,700ක දෛනික වැටුපක් ලබා දෙන්නම් කියලා අනුර ජනාධිපතිතුමා පොරොන්දු වුණා. ඒකට කවදාවත් එකඟ වෙන්නේ නැහැ, මේ වතු හාමිපුතුන්. අපි දන්නවා, ඒක. ඒ කටයුත්ත කිරීමට පොරොන්දු වීම සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට අපි සුබ පතනවා. නමුත්, වතු හාමිපුතුන් ඒකට එකඟ වෙන්නේ නැහැ. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කිට්ටන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? දෛනික වැටුප රුපියල් 2,000ට වඩා අඩු නම් අත්සන් කරන්නේ නැහැ කියලා නැඟිටලා ආවා. දැන් ලැබුණාද? නැහැ නේ. අපිට ඕනෑ නම් ඒ ගැන කියන්න පුළුවන්. නමුත් අපි ඒවා කියන්නේ නැහැ. ඒක තේරුම් ගන්න. ඒ නිසා මේ කම්කරු ජනතාව වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මට තව මිනිත්තුවක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ අය කම්කරුවන් වෙන්න බැහැ, කොටස්කාරයන් වෙන්න ඕනෑ. අවුරුදු 200ක් තිස්සේ ඒ අය දුක් විඳිනවා. ඔබතුමන්ලා කියනවා නේ, අවුරුදු 76ක ශාපයක් කියලා. අපේ ශාපය අවුරුදු 200ක ශාපය. අවුරුදු 125ක් සුද්දන්ගේ ශාපය; සුද්දන් යටතේ හිටියා. දැන් කළු සුද්දන්ගේ යටතේ ඉන්නවා. ඒ නිසා දැන් බැණ බැණ ඉන්නේ නැතුව වැඩ කරන්න පටන් ගන්න. අපි ඒ සඳහා සහයෝගය ලබා දෙනවා. වැඩ පෙන්වන්න. වැඩ කරලා ඔප්පු කරන්න.

ආණ්ඩුව පටන් ගත්ත ගමන් කිව්වා නේ, හිටපු මන්ත්‍රීවරු, හිටපු ඇමතිවරු මොනවත් කළේ නැහැ කියලා. නැහැ, නැහැ. අපි හොරු නොවෙයි. වයින් ස්ටෝර්ස් දුන්නු අයගේ ලැයිස්තුවද, බාර් පර්මිට් දුන්නු අයගේ ලැයිස්තුවද, ජනාධිපති අරමුදලෙන් සල්ලි ගත්ත අයගේ නම් ලැයිස්තුවද, බංගලා ගත්ත අයගේ ලැයිස්තුවද කිව්වා නේ. ඒ කිසිම ලැයිස්තුවක මනෝ ගනේසන්ගේ නම නැහැ; දිගම්බරම්ගේ නම නැහැ; රාධාකෘෂ්ණන්ගේ නම නැහැ. ඒක තේරුම් ගන්න. අපි හොරු නොවෙයි. අපට හොරකම් කරන්න බැහැ. අපි හොරකම් කරන්න දන්නේ නැහැ. ඒකයි අපේ අඩුපාඩුව.

ස්තුතියි.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු දිගම්බරම් මන්ත්‍රීතුමාත්, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් මතු කළ කාරණා කිහිපයක් ගැන පැහැදිලි කිරීමක්

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

කළා නම් හොඳයි කියලා මම හිතුවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා කේන්ති ගන්න අවශ්‍ය නැහැ. මොකද, ඔබතුමන්ලා වැරදි නොකළා නම් කේන්ති ගන්න අවශ්‍ය නැහැ. අදාළ කට්ටිය තොප්පි දා ගනීවි. ඔබතුමන්ලා අනවශ්‍ය විධියට තොප්පි දා ගන්න අවශ්‍ය නැහැ. කොහොම වුණත් ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය කිව්වේත් අපි කියන කාරණයමයි. ඉන්දියානු නිවාස වැඩ පිළිවෙළ යටතේ අපේ අම්බිකා මන්ත්‍රීතුමිය නායකත්වය දෙන හපුතලේ ආසනයේ නිවාස හදන්න අපි හෙට මුල්ගල් තබනවා. එම නිවාස නාය ගිහින් අවුරුදු දෙකක් වනවා. ඒ නිසා තේ factory එකක දරු පැටවු එක්ක තවම පවුල් 51ක් ජීවත් වනවා. ඒ කාලයේ ඒ මිනිසුන්ට නිවාස ටික හදලා දුන්නේ නැහැ.

කෑගල්ලේ සාමසර කන්ද නාය යෑම නිසා 2014 අවුරුද්දේ ඉඳන් කුඩාරම්වල පවුල් 22ක් ජීවත් වනවා. ඒ නිවාස හදන්නත් අපි ළඟදී පටන් ගන්නවා. නිවාස හැදුවේ නැතුව නොවෙයි නේ. ඒවා කවුරු කළාද කියලා අපි කථා නොකළත් අසරණ මිනිහෙකුට නේ ඉස්සෙල්ලා නිවාස දෙන්න ඕනෑ. නමුත්, එහෙම දුන්නේ නැහැ. සමහර අයට නිවාස දුන්නා, දේශපාලන හිතවත්කමට; ඥාති හිතවතුන්ට නිවාස දුන්නා. මම ළඟදී වැලිමඩ කැප්පෙටිපොළ නිවාස 50ක් හදපු තැන බලන්න ගියා. නිවාස ලබා දීපු පවුල්වලින් පවුල් 7යි ඉන්නේ. සමහරු නිවාස විකුණලා. සමහරු කොළඹ ඇවිල්ලා. ඒ වාගේ දේවල් තිබෙනවා. ඒවා අපි අත්විඳින දේවල්. ඔබතුමන්ලාත් මේවා දන්නවා. ඒ නිසා මේ වතාවේ අපි නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා තීන්දු කළා, දේශපාලන භේදයක් නැතිව ලංකාවේ කිසියම් ස්ථානයක් අධික ලෙස නාය යනවා කියලා NBRO එක report එකක් නිකුත් කරලා තිබෙනවා නම් ඒ නිවාස ටික හදනවාය කියලා. එතකොට සාධාරණයි නේ. බදුල්ල දිස්ත්‍රික්කයේ පවුල් 2,000 ගණනක් වතුකරයේ ලැයිම් කාමරවල ඉන්නවා. ඒ ලැයිම් කාමර අධික ලෙස නාය යනවා. එම නිසා පසුගිය දා පැවති බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී අපි අනුමත කළා, ඒ අයගේ නිවාස හදලා දෙනවාය කියලා.

2014 අවුරුද්දේ හල්දුම්මුල්ලේ, මීරියබැද්දේ නිවාස 34ක් නාය ගියා. ඒ කට්ටියගේ ලැයිම් කාමර නාය යනවා කියලා 2007 NBRO එකේ report එකේ තමයි තිබෙන්නේ; අවුරුදු 7කට ඉහතදී. නමුත්, නිවසක් හදලා දෙන්න කෙනෙක් හිටියේ නැහැ. ඒ ගැන හෙව්වේ බැලුවේ නැහැ. ඒ නිසා ජීවිත 34ක් නැති වුණා. අපේ කාලයේ එහෙම දේවල් වනවා දකින්න අපි කැමැති නැහැ. එම නිසා අපි ඒ නිවාස ටික හදනවා.

අනෙක් කාරණය මෙකයි. ඔබතුමන්ලා කිව්වා, "කොන් වුණා. නොසලකා හැරියා" කියලා. අපි නම් එහෙම නැහැ. මලයගම් ප්‍රජාවට ඒ ගරුත්වය, ඒ අයිතිවාසිකම දෙනවා කියලා අපි කිව්වා. ඉඩම් පර්චස් 7ක් නොවෙයි, පර්චස් 10ක් තමයි හෙට දෙන්නේ. අපි තට්ටු නිවාස සෑදීම ගැන මේ අවුරුද්දේ හිතන්නේ නැහැ. දැන් හදන ඔක්කොම නිවාස තනි තට්ටුවේ ඒවා. ඔබතුමා කිව්වා වාගේ පොළොවක් දීලා, තනි නිවසක් තමයි හදන්නේ. බොහොම ස්තුතියි.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමනි,-

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විවාදයකට යන්න ඕනෑ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මගේ නම සඳහන් කළා නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්ව කාරණය සම්බන්ධයෙන් මම සතුටු වනවා. ප්‍රශ්නය මේකයි. අපි ගමනක් යන්න පටන් අරගෙන තිබෙනවා. ඒ ගමන ඔබතුමන්ලා ඉදිරියට අරගෙන යන්න. මම කේන්තියෙන් කථා කළේ නැහැ. දුකෙන් කථා කරන්නේ. මම ඇයි ඔබතුමන්ලා එක්ක කේන්ති ගන්නේ? ඔබතුමා එක්ක ඇයි මම කේන්ති ගන්නේ? ඔබතුමා මගේ මිත්‍රයා නේ; සහෝදරයා නේ. අපි දේශපාලන භේදයෙන් කථා කරනවා නොවෙයි. මම කථා කළේ දුකෙන්. අපි ගමනක් යන්න පටන් අරගෙන තිබෙනවා. ගමන පටන් අරගෙන තිබෙනවා කියලා අවබෝධ කර ගන්න. ඒක recognize කරන්න. මොකද, ඉන්දියානු අගමැති නරේන්ද්‍ර මෝදි මහතා සමඟ අපි සාකච්ඡා කළා; හිටපු තානාපතිවරු සාකච්ඡා කළා. එහෙම සාකච්ඡා කරලා තමයි නිවාස 10,000ක් හදන්න පොරොන්දුව අපි ලබා ගත්තේ. අපි නේ, ඒ කටයුත්ත පටන් ගත්තේ. ඔව්, ඒක ඔබතුමන්ලා පටන් ගත්තා, අපි ඒ වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යනවා කියන්න. මොකද, ඒක වැරදිද? ප්‍රශ්නයක් නැහැ නේ. අපි දොස් කියන්නේ නැහැ නේ. ඔබතුමන්ලා පටන් ගන්න එක ලබන වතාවේ අපි ඉදිරියට ගෙන යනවා. ප්‍රශ්නයක් නැහැ. අපි කථා කරන්නේ කේන්තියෙන් නොවෙයි. වරද්දා ගන්න එපා. අපි දුකෙන් කථා කරන්නේ. ඔබතුමන්ලාට සුබ පතනවා, ඒ වැඩකටයුතු කරගෙන යන්න කියලා. හොඳයි. දැන් 10 perches දෙනවා කිව්වා නේ. ඒක දෙන්න. හොඳයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.04]

ගරු අජිත් අගලකඩ මහතා
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි. අය වැය කාරක සභා අවස්ථාවේ අද අපි විවාදයට ලක් කරන්නේ අපේ රටේ තවත් ඉතාම වැදගත් අමාත්‍යාංශයක් වන වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි.

මේ අමාත්‍යාංශයත් අපේ රටට ඉතා වැදගත් අමාත්‍යාංශයක්. මම එහෙම කියන්නේ ඇයි? ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, අපි රටක් විධියට පසුගිය කාලයේ පත් වෙච්ච තත්ත්වයට බලපෑ ප්‍රධාන හේතුවක් වුණේ, අපිට විදේශ විනිමය නැතිකම - ඩොලර් හිඟකම - බව. අතීතයේ නම් අපේ රටට ඩොලර් අරගෙන එන ප්‍රධාන මාවත් තිබුණේ වැවිලි කර්මාන්තය හරහායි. අදත් අපිට විදේශ විනිමය සොයා ගන්න වැවිලි කර්මාන්තය ඉතා වැදගත් කාර්යභාරයක් ඉෂ්ට කරනවා. ඒ වාගේම, අපේ රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් ඒවායේ නිෂ්පාදන කටයුතුවලට සම්බන්ධ වෙමින් හා සේවා සපයමින් ඊට සහසම්බන්ධ වෙනවා. රටේ විශාල පිරිසක් මේ කර්මාන්තයට සම්බන්ධ වෙච්ච නිසාත් මේ අමාත්‍යාංශය වැදගත් අමාත්‍යාංශයක් විධියට අපි සලකනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලෝකයේ රටවලට අනන්‍යතා හැදෙන විවිධ හේතු තිබෙනවා. එහෙම ගත්තාම, අපේ රටේ නම ජාත්‍යන්තරයට අරගෙන යන්නත් වැවිලි කර්මාන්තය

හේතු වෙලා තිබෙනවා. "Ceylon Tea", "Ceylon Cinnamon" කිව්වාම ලෝකයේ බොහෝදෙනෙක් දන්නවා. සමහර විට මේ රට තිබෙන තැන දන්නේ නැහැ. හැබැයි, අපිට අනන්‍ය වූ නාමයක් හැදිලා තිබෙනවා, මේ වැවිලි කර්මාන්තය හරහා. ඒ නිසා වැවිලි කර්මාන්තය අපේ රටේ ආර්ථිකයට ඉතා වැදගත් ක්ෂේත්‍රයක්. අතීතයේත් එහෙම වුණා. අතීතයේ මේ වැවිලි කර්මාන්තය නිසාම අපිට කරදරවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. 1505දී ලොරෙන්සෝ ද අල්මේදා කුරුඳු සහ කුළු බඩු සොයා ගෙන යන ගමනේදී අහම්බෙන් තමයි ලංකාවට ගොඩ බැස්සේත්. යුරෝපීය වෙළෙඳ පොළේ ඒ වෙලාවේ කුරුඳු සහ කුළු බඩුවලට තිබුණු අධික ඉල්ලුම නිසාත්, සැපයෙන ප්‍රමාණය මදි නිසාත්, ඒවායේ නිජබිම් සොයා ගෙන ගිහිල්ලා නිෂ්පාදනය කරලා අරගෙන එන්න ඕනෑ කියන අර්ථයෙන් තමයි, ඒගොල්ලන් මේවා නිෂ්පාදනය කරන්න නිජබිම් සොයා ගෙන යන ගමනේදී ලංකාවට ගොඩබැස්සේ. එලෙස ලංකාවට ගොඩ බැහැලා කුරුඳු නිෂ්පාදනය අපනයනය කරලා, පෘතුගීසි ජාතිකයෝ අධික මුදල් ඉපැයීමක් කර ගත්තා. ලන්දේසීන් 1658දී ලංකාවට ආවේත් කුරුඳු සහ කුළු බඩු වර්ග සොයාගෙනයි. ඒගොල්ලන් කැලෙන් කුරුඳු ටික කපාගෙන රට යවනවා වෙනුවට පළමුවැනි වතාවට කුරුඳු වගා කරන්න පටන් ගත්තා. කොළඹ කුරුඳුවත්ත, කදිරාන, ඇවරියවත්ත වාගේ ප්‍රදේශවල තමයි ඉස්සෙල්ලාම කුරුඳු වගාව පටන් ගත්තේ. ඊට පස්සේ ඉංග්‍රීසි ජාතිකයින් ලංකාවට ආවේත් මේ හේතුව නිසාමයි. ඒගොල්ලන් හිටපු කාලයේ කුරුඳු වගාව පාඩු නිසා කෝපිවලට, තේවලට මාරු වුණා. ඒ නිසා වැවිලි කර්මාන්තය වෙනස් වෙලා ගියා. අද වනකොට අපි තේ, පොල්, රබර්, කුරුඳු, තල්, කිතුල් ආදී වැවිලි භෝග වගා කරනවා, අපේ ආර්ථිකය මෙතැනින් එහාට අරගෙන යන්න පුළුවන් වන විධියට. ඒ තරම් වැදගත් ක්ෂේත්‍රයක් තමයි, වැවිලි කර්මාන්තය කියන්නේ. අපේ රට මේ දුක්ඛිත තත්ත්වයට පත් නොවී පවත්වාගෙන යන්න අවශ්‍ය විදේශ විනිමය සොයා ගන්න පුළුවන් වුණු මේ කර්මාන්තය පසුගිය කාලයේ නිසි සැලසුමක් නැතුව, නිසි දැක්මක් නැතුව, නිසියාකාරයෙන් අවධානය යොමු කරන්නේ නැතුව කටයුතු කළ නිසා මේ වනවිට අභාවයට ගිහිල්ලා තිබෙනවා. ඒකට මැදිහත් වෙච්ච අපේ ආණ්ඩු, පසුගිය කාලයේ ඒවායේ හිටපු සමහර දේශපාලන නායකයෝ මෙවායේ අක්කරයක් රුපියල් 3.50ට ගත්ත කථා අපි අහලා තිබෙනවා. තේ හා පොල් අක්කරයක් රුපියල් 3.50ට තමන්ගේ නමට ලියාගෙන තිබෙනවා. මම ජීවත් වෙන්නේ මොනරාගල ප්‍රදේශයේ. ඒ ප්‍රදේශයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ඉඩම් අක්කරය ශත ගණන්වලට ලියා ගත්ත අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා අපිට ඉතාම සුවපහසුව ජීවත් වෙන්න පුළුවන් හොඳ ශක්තිමත් ආර්ථිකයක් හදා ගන්න තිබුණු අවස්ථා පසුගිය කාලයේ සිදු වෙච්ච අඩුපාඩු නිසා අපට නැති වෙලා ගියා.

මම නියෝජනය කරන්නේ මොනරාගල දිස්ත්‍රික්කයයි. අපිට මේ අමාත්‍යාංශය යටතේ වැවිලි භෝග විධියට ප්‍රධාන වශයෙන් කථා කරන්න වෙන්නේ රබර් සහ කුරුඳු ගැනයි. 1876දී තමයි පළමුවැනි රබර් පැළය අපේ රටේ රෝපණය කරලා තිබෙන්නේ. බෙල්ජියම තමයි රබර්වල නිජබිම හැටියට සැලකෙන්නේ. අපේ දිස්ත්‍රික්කයේ මොනරාගල, බිබිල මැදගම, මඩුල්ල, බුත්තල, වැල්ලවාය, සියඹලාණ්ඩුව, බඩල්කුඹුර වාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉතා හොඳින් මේ රබර් වගාව අපි කරගෙන යනවා. ගොවීන් 15,000ක්, 18,000ක් වාගේ ප්‍රමාණයක් ඒ කර්මාන්තයේ නියැළිලා ඉන්නවා. දිස්ත්‍රික්කයේ දේශගුණය වෙනස් වෙන්න පවා බලපාන මට්ටමට, ඉතා හොඳින් අපි මේ රබර් වගා කිරීමේ කටයුතුවල නිරත වෙලා ඉන්නවා. සමස්තයක් විධියට ගත්තොත්, ලංකාවේ අක්කර 246,520ක රබර් වගා කරනවා. ඒකෙන් පසුගිය වසරේ රබර් මෙට්‍රික් ටොන් 69,000ක් තමයි, අපිට අස්වැන්න ලෙස ගන්න පුළුවන් වුණේ. අපි මේ අවුරුද්දේ බලාපොරොත්තු වෙනවා, අපේ රජය යටතේ ඒක මෙට්‍රික් ටොන් 78,000ක් දක්වා වැඩි කර ගන්න. ඒ වාගේම, මේ වෙනකොට ඵලදායීතාව ලෙස අපි අක්කරයකින් ගන්නේ කිලෝග්‍රෑම් 944යි. අපි ඒක කිලෝග්‍රෑම් 1,017ක් දක්වා වැඩි කර ගන්න අවශ්‍ය කටයුතු කරන්නත් බලාපොරොත්තු වෙනවා. අපට අපනයනවලින් ආදායම ලැබුණේ ඩොලර් මිලියන 990යි. අපි මේ අවුරුද්ද අන්තිම වෙනකොට මේ ආදායම ඩොලර් මිලියන 1,070ක් බවට පත් කරගන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි විශාල ඇස්තමේන්තුවක් හදලා තිබෙනවා, රුපියල් මිලියන 17,808ක, මේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් මේ වසර පුරා වියදම් කරන්න. ප්‍රාග්ධන වියදම් විධියට ඒකෙන් අපි රුපියල් මිලියන 12,038ක දැවැන්ත මුදලක් ආයෝජනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපේ ගරු ඇමතිතුමාත් සභාවේ ඉන්න වෙලාවේදී මම මේ යෝජනාව කරනවා. මොනරාගල දිස්ත්‍රික්කය ඉඩම්වලින් පොහොසත් දිස්ත්‍රික්කයක්. හැබැයි දැන් තනි තනි පුද්ගලයෝ විධියට මේ වගාවන් කරගෙන යන්න පුළුවන් ප්‍රමාණය අඩුයි. ඒ නිසා අපේ රජය සතු ඉඩම් ව්‍යාපෘතියක් විධියට අරගෙන ඇවිල්ලා හෙක්ටෙයාර 250ක, 300ක ප්‍රමාණයක් වගා කරන්න අපි අලුතෙන් ව්‍යාපෘතියක් හදමු, ඒ හරහා අලුත් පිරිසක් මේකට එකතු කර ගනිමු කියලා මම යෝජනා කරනවා, ගරු ඇමතිතුමනි. කොහොමටත් ලබන අවුරුද්දේ අපේ ඉලක්කය විධියට තිබෙනවා, හෙක්ටෙයාර 655ක් අලුතෙන් වගා කරන්න. මේකෙන් හෙක්ටෙයාර 250ක, 300ක විතර ව්‍යාපෘතියක් මොනගරාල දිස්ත්‍රික්කයේ අපි හදමු, මොනරාගල දිස්ත්‍රික්කයේ රබර් වගාව ඉදිරියට ගෙනියන්න. ඒ වාගේම තමයි, අලුතෙන් රබර් වගා කරන්න යනකොට පැළවල හිඟතාවක් තිබෙනවා. පැළ 581,000ක් මේ අවුරුද්ද ඇතුළත අපි අලුතෙන් හදාගන්න බලාපොරොත්තු වෙනවා පැළ තවාන්වලින්. මෙවර අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. මොනරාගලට අදාළව පදියතලාව සහ කුඹුක්කන පැළ තවාන් දෙකක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, පදියතලාවේ පැළ තවානෙන් පැළ 50,000ත්, 60,000ත් අතරත්, කුඹුක්කන තවානෙන් පැළ ලක්ෂ 3කුත් විතර තමයි ගන්න පුළුවන්. මේ දෙකේම ධාරිතාව තව වැඩි කරන්න පුළුවන්. ඒ නිසා අපි මේ රුපියල් මිලියන 12,038ක ප්‍රාග්ධන වියදමින් සැලකිය යුතු මුදලක් වෙන් කරලා පැළ තවාන් දෙකේ ධාරිතාව වැඩි කරගෙන මොනරාගලින් අවශ්‍ය පැළ ටික හදාගනිමු කියන යෝජනාව මම කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මොනරාගල, කුමාරදොළවත්තේ අපිට තිබුණා, රබර් ෆැක්ටරියක්; රබර් කර්මාන්තශාලාවක්. අපි crepe rubber තමයි එතැන හැදුවේ. සේවකයෝ 30ක්, 40ක් මේ කාර්මාන්තශාලාවේ කලින් වැඩ කළා. අපජලය පිරිපහදු කරන පද්ධතියේ දෝෂයක් නිසා මේ කර්මාන්තශාලාව වැහිලා ගිහිල්ලා තිබෙනවා. අපි මේකෙන් රබර් කිලෝ 4,000ත්, 5,000ත් අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කරගත්තා, දවසකට. දැනට කුමාරදොළවත්තෙන් විතරක් දවසකට රබර් කිලෝ 2,000ක් ලැබෙනවා. අපි දියර විධියට; කිරි විධියට තමයි මේ අවස්ථාව වෙනකොට මේවා විකුණමින් ඉන්නේ. ගරු ඇමතිතුමාට මම යෝජනා කරන්න කැමැතියි, එතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, කුමාරදොළවත්තේ අපේ රබර් කර්මාන්තශාලාව අපි ආපහු පටන් ගනිමු කියලා. එහෙම වුණොත්, ලෝකයට අපේ නම අරගෙන යන්න, ලංකාවේ අපේ නිෂ්පාදනවලට පාවිච්චි කරන්න ඉතා උසස් තත්ත්වයේ රබර් නිෂ්පාදනය කර දෙන්න අපට පුළුවන්කම ලැබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු අජිත් අගලකඩ මහතා
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මොනරාගල දිස්ත්‍රික්කයේත් අපේ මලයගම් ජනතාව ඉතා විශාල පිරිසක් පදිංචි වෙලා ඉන්නවා. ඒගොල්ලන්ටත් නිවාස ප්‍රශ්න, අධ්‍යාපන ප්‍රශ්න, සනීපාරක්ෂක ප්‍රශ්න, හැඳුනුම්පතේ, උප්පැන්න සහතිකයේ ඉඳලා සියලු ප්‍රශ්න තිබෙනවා. ඒ ජනතාවගේ නිවාස සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට මෙවර අය වැයෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ කටයුතු සියල්ල ඉතා සාර්ථකව කරගෙන යන්න මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.13]

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சுமீதான விவாதத்தில் கலந்துகொண்டு, அந்த அமைச்சு சம்பந்தமாகச் சில விடயங்களைக் கூறுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

පළමුවෙන්ම මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, අපේ වතු කම්කරුවන්ට පර්චස් 10ක තනි ගෙයක් බැගින් හදලා දෙනවා කියලා ඔබතුමා මෙතැන පොරොන්දු වුණා. ඒකට මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා.

මේ අමාත්‍යාංශය ගැන කොටස් දෙකකට බෙදලා කථා කරන්න ඕනෑ. එකක් තමයි, tea industry එක සම්බන්ධ වැවිලි අමාත්‍යාංශය - Ministry of Plantation. අනෙක් එක, Community Infrastructure අමාත්‍යාංශය. වැවිලි අමාත්‍යාංශය ගැන මම ඉස්සෙල්ලා කථා කරන්නම්. Ministry of Plantation ගැන කථා කරනකොට 1992ට ඉස්සෙල්ලා මේ වතුවල තිබුණේ සුද්දන්ගේ පාලනය. ඊට පස්සේ SLSPC, ජනවසම කියලා දෙකට බෙදලා තිබුණා. ඊට පස්සේ විවිධ ආණ්ඩු මේ රට පාලනය කරනකොට තම තමන්ට ඕනෑ මිනිස්සුන්ට ඉඩම් බෙදන්න පටන් ගත්තා. අක්කර 50ක්, අක්කර 100ක් වාගේ බෙදන්න පටන් ගත්තා. ඒ අනුව තමයි ජනවසම, උසවසම, NADSA, SLSPC වශයෙන් බෙදලා එක එක්කෙනාට දෙන්න පටන් ගත්තේ. ඉතින් මේක නවත්වන්න ඕනෑ කියලා තමයි ඒ දවස්වල හිටපු නායකයින් කිව්වේ. විශේෂයෙන්ම සෞම්‍යාමූර්ති තොණ්ඩමන් මැතිතුමා ඉන්නකොට මේ වතු ආපසු privatize කරන්න ඕනෑ කියලා අදහසක් ගෙනාවා. ඒ අදහස නිසා තමයි අද කොම්පැනි 23කට මේ වතු බෙදලා දීලා තිබෙන්නේ. එහෙම කළේ නැත්නම් අදත් වතු නැහැ. හැටන් ප්‍රදේශය උදාහරණයට ගන්න. හැටන්වල SLSPC එකේ estate එකකුයි, company එකේ estate එකකුයි අරගෙන බලන්න. ජනවසමට අයත් මවුන්ට ජීන් වත්ත, ඒ වාගේම කුඩා ඔය, ආගිල් වතු ඉවරයි. වතු නැහැ. බෙදලත් නැහැ; තේ වගාවත් නැහැ; මොකුත් නැහැ. ඒ තත්ත්වයට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ඒ කට්ටියට අපි දොස් කියන්න හොඳ නැහැ. 1992දී මේ ආකාරයට කළේ නැත්නම් අදත් මේ සියලු වතු නැති වෙනවා. මේ වතු අද ආරක්ෂා වෙලා තිබෙන්නේ ඒ මිනිස්සු නිසා. අන්ත විඩයම් උංකලුක්කු නන්රාකත් තෙරියුම්. ආකවේ, තෝට්ටප්පුරංකළිල් ඉරුක්කින්ර විවසාය නිලංකළ් උණ්මෙයිල් පාතුකාක්කප්පට වේණ්ටුම්. තේ වතු නැත්නම් අපිත් ඉවරයි; මිනිස්සුත් ඉවරයි. ඒ හින්දා අනිවාර්යයෙන් තේ වතු ආරක්ෂා කරන්න ඕනෑ. තේ වතු ආරක්ෂා කරන්න නම්, ඒ මිනිස්සු එක්ක තමයි වැඩ කරන්න ඕනෑ. මොකද, අපට වඳුරොත් එක්ක චිතරක් ගිහිල්ලා වැඩ කරන්න බැහැ. ගිහිල්ලා, මිනිස්සු එක්ක වැඩ කරන්න වෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, කරුණාකරලා තේ වතු ආරක්ෂා කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, අද ඔබතුමාගේ කථාව මම අහගෙන හිටියා. ඔබතුමාගේ කථාවේදී වැඩි හරියක් කියැවුණේ පොල් වගාව ගැන. පොල් වගාව වැදගත් එකක්. ඒ කටයුතුත් අනිවාර්යයෙන් කරන්න ඕනෑ. නමුත් තේ වතු, රබර් වතු ගැනත් හිතලා බලලා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, මට තව ප්‍රශ්නයක් තිබෙනවා. අවුරුදු 50කට වතු lease කරලා දීලා තිබෙනවා. ඒකෙන් දැන් අවුරුදු 30ක් ඉවරයි. තව අවුරුදු 20යි ඉතුරුව තිබෙන්නේ. නමුත් මේ අවුරුදු 20 තුළ කිසිම වත්තක් develop කරන්නේ නැහැ. ඇයි, ඒ ගොල්ලන් දන්නවා, තව අවුරුදු 20කින් මේ වතු අත්හරින්න වෙනවා කියලා. ඒ හින්දා කිසිම development එකක් කරන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා ඉදිරියට මේගොල්ලන්ගේ ගිවිසුම්වල කොන්දේසි දිගු කරනවාද, නැත්නම් අහෝසි කරනවාද කියලා ඒගොල්ලන්ටත් කියලා, ඒගොල්ලන් එක්ක කොන්දේසියක් ඇති කරලා ගනුදෙනුවකට යන්න අවශ්‍යයි. මොකද, දැන් මේ වතුවලට පොහොර දාන්නේ නැහැ, බෙහෙත් ගහන්නේ නැහැ. ඇයි, ඒගොල්ලන් දන්නවා, තව අවුරුදු 20කින් මේකෙන් යනවා කියලා. තේ ගසක වටිනාකම අනුව අවුරුදු 50, 100 එහෙම තමයි කාලය යන්නේ. ඒක නිසා ඔබතුමන්ලා මේකට ඇහුම්කන් දෙයි කියා මම බලාපොරොත්තු වෙනවා. මේ වතුවල ඉදිරිය ගැන කල්පනා කරලා, ඒ අයට මේ වතුවල ගිවිසුම්ගත වෙලා තිබෙන කොන්දේසි දිගු කරනවාද, නැත්නම් අහෝසි කරලා වතු රජයට ගන්නවාද කියලා තියන්න. නමුත් රජයට පවරා ගෙන මේ වතු කරන්නම බැහැ. ඒ නිසා මේ ගිවිසුම් කාලය දිගු කරනවා නම්, ඒ වැඩේ දැන්ම පටන් ගන්න, මෙන්න මේ විධියට තමයි යන්න ඕනෑ කියලා.

එහෙම පටන් ගන්නවා නම්, මේකත් අනිවාර්යයෙන් කරන්න ඕනෑ. මොකද, දැන් වතු අධිකාරි තමයි සුද්දාටත් වැඩි තත්ත්වයෙන් ඉන්නේ. කිසිම දෙයක් වතුවල ජනතාවට කරන්නේ නැහැ. මම උදාහරණයක් කියන්නම්. Bogawana Estate කියලා වත්තක් තිබෙනවා, බොගවන්තලාවේ. ඒ Bogawana Estate එකේ factory එක ළඟින් යන පාර දැන් superintendent විසින් නවත්වලා තිබෙනවා ලු. ඒ පාරේ යන්න එපා කියලා කියනවා ලු. ඔහුට මොකක්ද, ඒ සඳහා තිබෙන අයිතිය? එයා කවුද? එයා වත්තේ lease එක අරගෙන තිබෙනවා. එතකොට එයා කොහොමද කියන්නේ බොගවාන වත්තේ පාරේ යන්න එපා කියලා? ඒක ගැන බලන්න. ඒ නිසා මේ වාගේ කොන්දේසි දානකොට මේගොල්ලන්ට සීමාසහිත කොන්දේසි දෙන්න. මේ විධියට කටයුතු කරන එක අඩු කරන්න. මෙහෙම කරන්න එපා, මේ මිනිස්සු හරි පව්. බස් එකේ ඒ පාරේ යන්න බැහැ.

அதேபோல, වතුවල electricity ගත්තොත්, ඒගොල්ලන් ඒ සඳහා තවම superintendent ළඟට තමයි යන්න ඕනෑ. ගිහිල්ලා, අත් දෙක බැඳගෙන ඉන්න ඕනෑ, අපට electricity අරන් දෙන්න කියලා. ඒ අයට CEB එකට ලියුමක් දෙන්න කියලා වතු අධිකාරිගෙන් ඉල්ලීම කරන්න

වෙලා තිබෙනවා. මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. තෝට්ටක් කුඩියිරුප්පුකළුක්කු electricity connection පෙරුවතෙත් තටුප්පතර්කු අවර්කළ් යාර්? ආකවේ, ඉන්ත මුරෙමෙයිල් මාර්රංකළෛක් කොණ්ටුවර වේණ්ටුමෙන නාන් අන්පාකක් කේට්ටුක් කොළ්කිරේන්. අතුමට්ටුමල්ල, නීංකළ් තෝට්ටත් තොළිලාළර්කළින් සම්පළම් පර්රි එන්නතාන් පේසිනාලුම්, මුතලාළිමාර් සම්මේළනම් ඉණක්කම් තෙරිවිත්තාල් මාත්තිරමේ 1,700 රූපාය් අට්ටිප්පටෛච් සම්පළත්තෛ වළංක මුටියුම්. ආකවේ, අතෛ වළංකුවතර්කාන තකුන්ත මුයර්සිකළෛ එටුක්ක වේණ්ටුමෙන්පතෛ නාංකළ් සොල්ලික්කොළ්ළ විරුම්පුකින්රෝම්.

පෙරුන්තෝට්ටප් පකුතියිල් ඉන්රු කිට්ටත්තට්ට 64,740 තනි වීටුකළ් ඉරුක්කින්රන; 28,082 twin cottages ඉරුක්කින්රන; 70,444 single barrack line rooms ඉරුක්කින්රතු; double barrack line rooms 65,679 ඉරුක්කින්රතු; තර්කාලික කොට්ටිල්කළ් - temporary sheds 10,891 ඉරුක්කින්රතු. මුන්නාළ් අමෛච්චර් සන්තිරසේකරන් අවර්කළින් කාලත්තිල්තාන් මලෛයකත්තිල් තනි වීට්ටුත් තිට්ටම් ආරම්පික්කප්පට්ටතු. අව්වාරානතොරු තිට්ටත්තෛ නීංකළුම් අමුල්පටුත්තුවතු නල්ලතෙන නාන් නිනෛක්කින්රේන්. කටන්ත කාලංකළිලුම් ඉන්ත වීටුකළෛප් පර්රි කෙළරව තිකාම්පරම් අවර්කළ් පේසිනාර්, කෙළරව මනෝ කණේසන් අවර්කළ් පේසිනාර්. එනවේ, අතෛයේ නානුම් පේසුවතර්කු විරුම්පවිල්ලෛ. ආනාල්, තෝට්ටප් පකුතිකළුක්කු වීටුකළ් තේවෛ එන්පතෛක් කරුත්තිර්කොණ්ටු උංකළතු සෙයර්පාටුකළෛ මේර්කොළ්ළුංකළ්.

අතුපෝල, තෝට්ටච් සේවෛයාළර්කළුක්කු - estate staffක්කු - වීටු කොටුප්පතර්කාන ඔරු planඉක් කොණ්ටු වාරුංකළ්. ඒනෙන්රාල්, අවර්කළුම් තෝට්ටත්තිලිරුන්තු වෙළියේරිනාල් සෙය්වතර්කු ඒතුමිල්ලෛ. අතේපෝන්රු, තෝට්ටප් පකුතියිල් ඉරුක්කින්ර ආසිරියර්කළුක්කුම් වීට්ටුත් තිට්ටංකළෛක් කොණ්ටුවර වේණ්ටුමෙන්රු නාංකළ් ඉන්ත නේරත්තිල් උංකළිටම් අන්පාක වේණ්ටික් කොළ්කින්රෝම්. අතුපෝල්, පෝෂාක්කුක් කුරෙන්ත කුළන්තෛකළින් ආරෝක්කිය නිලෛයෛ උයර්ත්තුවතර්කාන නටවටික්කෛයෛ නීංකළ් එටුක්ක වේණ්ටුමෙන්පතෛයුම් නාංකළ් සොල්ලික්කොළ්ළ විරුම්පු කිරෝම්.

ඉන්රු නුවරෙලියා මාවට්ටත්තිලුම් ඉලංකෛයින් ඒනෛය මාවට්ටංකළිලුම් උළ්ළ 163 තොළිර්චාලෛකළ් මූටප්පටිරුක්කින්රන. වහපු factories 163ක් තිබෙනවා. මා හිතන විධියට මට වැඩිය, ඔබතුමාට වැඩිය, මේ කාටත් වැඩිය අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්තයා දන්නවා මේ විෂ්තර ඔක්කෝම. ජනතාවගේ ප්‍රශ්න එතුමා දන්නවා. එතුමා කියලා තිබෙනවා, "වතුකරයේ මෙච්චර ප්‍රශ්න තිබෙනවා. දැන් වතුකරයේ පිරිමි ළමයි - කොල්ලෝ - ගිහිල්ලා hotelsවල වැඩ කරනවා; ගෙවල්වල වැඩ කරනවා. ඒක නතර කරන්න ඕනෑ" කියලා. ඒක කරන්න ඔබතුමා කටයුතු කරන්න. වහපු factories ටික රජයට අරගන්න; කර්මාන්තශාලා ඇති කරන්න. මා හිතන විධියට දැනටමත් factories 163ක් වහලා තිබෙනවා. ඒවායින් කීයක් හරි, 25ක් හරි රජයට ගන්න. 25ක් හරි අරගෙන කර්මාන්තශාලා පිහිටුවන්න. එතකොට එහේ මිනිස්සුන්ට කොළඹට එන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ කටයුත්ත කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒත් එක්කම මම තව දෙයක් කියන්න ඕනෑ. ජනාධිපතිතුමාගේ සංකල්පයක් හැටියට අපේ වතුකරයේ ජනතාවට "වතුකරයේ ජනතාව" කියන්නේ නැතුව "මලයගම් ජනතාව" කියලා කියනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන කොට කුඩා තේ වතු ගැන වැඩිපුර කිව්වා. ඒක හරි හොඳයි. මොකද, අද smallholdersලා තමයි සියයට 70ක් produce කරන්නේ; වතු companies සියයට 30යි produce කරන්නේ. ඒක නිසා ඒ කට්ටියත් කුඩා තේ වතු හිමියන් හැටියට සලකන්න අවශ්‍ය කටයුතු කරන්න; ඒකට mechanism එකක් හදන්න. අක්කරයක් දෙන්න පුළුවන්ද, අක්කර දෙකක් දෙන්න පුළුවන්ද, lease එකක් දෙන්න පුළුවන්ද, මොන ක්‍රමයට එය කරගෙන යන්න පුළුවන්ද කියලා පොඩ්ඩක් බලන්න. එහෙම කළොත් ඒගොල්ලොත් කුඩා කර්මාන්ත කොටසට අයිති වෙනවා. කරුණාකර ඒක කරන්න කියලා අපි කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අනෙක් කාරණය මේකයි. දැන් වතුවල සියලුම දේවල් කරන්නේ ආණ්ඩුව; පාරවල් හදන්නේ ආණ්ඩුව, ඉස්පිරිතාල හදන්නේ ආණ්ඩුව, පාසල් හදන්නේ ආණ්ඩුව. ඒ ඔක්කොම කරන්නේ ආණ්ඩුව. වතු කොම්පැනි නිකම් ඉඳලා තේ දලු කඩලා, අඹරලා, විකුණලා සල්ලි ගන්නවා. ඒගොල්ලන් එච්චරයි කරන්නේ. ඉතින් මේකට විකල්පයක් දෙන්න. ඒගොල්ලන්ටත් වතුවල යම්කිසි වැඩක් කරන්න කියන්න. දැන් කිසිම දෙයක් කරන්නේ නැහැ.

ජනතාව මේ පාර ගොඩක් විශ්වාස කරලා NPP ආණ්ඩුව හැදුවා. නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් විතරක් එම පක්ෂයෙන් මන්ත්‍රීවරු පස් දෙනෙක් එවන්න ඡන්දය දීලා තිබෙනවා. සිංහල, දෙමළ ඔක්කෝම ඡන්දය දීලා තිබෙනවා. ඒ, විශ්වාසය නිසා. ඒ විශ්වාසය කඩ කරන්න එපා. බදුල්ලෙන් දෙන්නෙක් එවන්න ඡන්දය දීලා තිබෙනවා. අම්බිකා මැතිනියට ඡන්දය දීලා තිබෙනවා. ඒ විශ්වාසය කඩ කරන්නේ නැතිව වැඩ කරන්න. ඒකයි අපි ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වෙන්නේ. ඒ කටයුතු කරන්න අපිත් උදව් කරන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ. අපේ ජනතාවට මොනවා හරි හොඳක් කරනවා නම් අපි උදව් කරන්නම්. අපට ගැටලුවක් නැහැ. *[බාධා කිරීමක්]* අනිවාර්යයෙන්. ඔබතුමාත් වතුවලින් ආපු ඇමතිවරයෙක්. ඉතින්, ඔබතුමාත් ඒක කරන්න ඕනෑ. ඔබතුමන්ලා වතුවල ඉන්න ජනතාව වෙනුවෙන් කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වතුවල මිනිස්සුන්ට ගොඩක් ප්‍රශ්න තිබෙනවා. අංකේ වීඩමප්පුප් පිරච්චිනෛ අංකේ වීඩමප්පුප් පිරච්චිනෛ, සුකාතාරප් පිරච්චිනෛ, සමූකප් පාතුකාප්පුප් පිරච්චිනෛ, කල්විප් පිරච්චිනෛ, අට්ටිප්පටෛ උට්කට්ටමෛප්පු වසතිකළ් ඉල්ලාත පිරච්චිනෛ එනප් පල පිරච්චිනෛකළ් ඉරුක්කින්රන. ඉප්පෝතු තේයිලෛත් තෝට්ටංකළ් තුප්පුරවු සෙය්යප්පටුවතිල්ලෛ. Clean Sri Lanka එන්ර තිට්ටත්තිනූටාක 90 'ලයන්'කළෛ මට්ටුම් සුත්තම් සෙය්වතර්කාන තිට්ටත්තෛක් කොණ්ටුවන්තිරුක්කිරීර්කළ්; අතු 90ඇ, 900ඇ එන්රු තෙරියවිල්ලෛ; 90 එන්රු නිනෛක්කිරේන්. ආකවේ, Clean Sri Lanka තිට්ටත්තින් අට්ටිප්පටෛයිල් 90 'ලයන්'කළෛ මට්ටුම් සුත්තම් පණ්ණි, ඉලංකෛයින් තෝට්ටප් පකුතිකළෛ clean පණ්ණ මුටියාතු. ඉන්රු තෝට්ටංකළ් කාටාක මාරියිරුක්කින්රතු. අතු පුලි, සිංකම්, කරටි, කුළවි පෝන්ර පල්වේරු ජීවරාසිකළ් වාළ්වතර්කාන ඉටමාක මාරියුළ්ළතු. ආකවේ, ඉවර්රෛ එල්ලාම් මාර්රුවතර්කාකවුම් Clean Sri Lanka තිට්ටත්තෛප් පාවිත්තු නටවටික්කෛ එටුක්කලාම් එන්පතෛ නාන් ඉන්ත නේරත්තිලේ සොල්ලික් කොළ්ළ විරුම්පුකිරේන්.

තෝට්ටංකළිල් පල්වේරු අපිවිරුත්තිකළ් සෙය්යප්පට වේණ්ටුමෙන්පතු ජනාතිපති අවර්කළුටෛය සින්තනෛයාක ඉරුක්කින්රතු. නීංකළ් smart classroomඉප් පර්රිප් පේසිනීර්කළ්. තෝට්ටප් පකුතිකළිලේ smart classroom වසතිකළෛච් සෙය්වතර්කු නටවටික්කෛ එටුක්කප්පට වේණ්ටුම්. ඉන්තිය අරසාංකම් අන්තත් තිට්ටත්තුක්කාකප්

[ගරු (ආචාර්ය) වී.එස්. රාධකෘෂ්ණන් මහතා]

පෙරුන්තොකෙයාන නිතියෙ ඔතුක්කියිරුක්කින්රතු. නීංකළුම් ඔරු තොකෙ නිතියෙ වළුංකි පෙරුන්තෝට්ටප් පකුතියිල් ඉරුක්කින්ර පාඨසාලෙකළුක්කු smart classroom වසතිකළෙච් සෙය්වතර්කාන නඩවඩික්කෙයෙ එටුක්ක වේණ්ටුම්. අත්තෝටු, අංකිරුක්කින්ර 365 පාඨසාලෙකළුක්කු එංකළුටෙය කාලත්තිල් ඉරණ්ටු ඒක්කර් වීතම් කාණිකළෙක් කොටුත්තෝම්. අතුපෝල්, තේවෙප්පටුකින්ර පාඨසාලෙකළුක්කු මේලුම් ඉරණ්ටු ඒක්කර් කාණිකල් වීතම් කොටුප්පතර්කාන නඩවඩික්කෙකළෙ නීංකල් එටුක්ක වේණ්ටුමෙන ඉන්ත නේරත්තිලේ සොල්ලික්කොළ්ළ විරුම්පුකිරෝම්.

ඉන්රු නාට්ටිල් එන්ත නාළුම් කොලෙ, කොළ්ළෙ පෝන්ර පල්වේරු විටයංකළ්තාන් අතිකමාකප් පේසප්පටුකින්රන. ඉවර්රෙ නිරුත්තුවතර්කාන නඩවඩික්කෙකල් එටුක්කප්පට වේණ්ටුම්. අණ්මෙයිල් Facebookඉල් පතිවිටප්පට්ටිරුන්ත ඔරු විටයත්තෙප් පාර්ත්තේන්. අතිල්, ඉන්ත නාට්ටින් මුන්නාල් IGP තේසපන්තු තෙන්නකෝන් අවර්කළෙක් කාණවිල්ලෙ එන්රුම්, අතේපෝල, සෙව්වන්තියෙක් කාණවිල්ලෙ එන්රුම්, නීංකල් Oppositionඉලේ ඉරුන්තිරුන්තාල් අවර්කල් ඉන්නේරම් පිටිපට්ටිරුප්පාර්කල් එන්රුම් සොල්ලප්පට්ටිරුක්කිරතු. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නවා නම් ඒ මිනිස්සු දැනටමත් අල්ලලා ලූ. දැන් ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයේ ඉන්න නිසා අල්ලන්නේ නැහැ කියලා තමයි කියන්නේ. ඒ කියන්නේ මොකක්ද දන්නේ නැහැ. ඒක ජෝක් එකක්ද, ඇත්තද, නැත්තද කියලා අපි දන්නේ නැහැ. නමුත් ෆේස්බුක් එකේ එහෙම දාලා තිබෙනවා.

ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කොට හුහක් කථා කළා; හුහක් දේවල් හදුනා ගත්තා; හුහක් දේවල් අල්ලලා දුන්නා. ඇයි, ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට ඒක කරන්නේ නැත්තේ? දැනුත් ඒක කරන්න. අපි උදව් කරන්නම්. හොඳ දෙයක් කරනවා නම් ඕනෑම වෙලාවක ඔබතුමන්ලාට උදව් කරන්න අපි කැමැතියි. මම වැඩිපුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. අවසාන වශයෙනුත් මම කියන්නේ - පර්වස් 10යි; තනි තනි ගෙවල්. එච්චරයි මට ඕනෑ වෙන්නේ. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.28]

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(මාණ්පුමිකු ඩබ්ලියූ.එච්.එම්. තර්මසේන)
(The Hon. W.H.M. Dharmasena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ රටේ ආර්ථිකය වාගේම ජන ජීවිතයට ද විශාල වටිනාකමක් තිබෙන වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. වැවිලි කර්මාන්තය ගත්තාම, තේ, පොල්, රබර්, ගම්මිරිස් වැනි භෝගවලින් රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න ගොවි ජනතාව විශාල වශයෙන් දායකත්වයක් ලබා දෙනවා. ගොවි ජනතාව විධියට ඒ ලබා දෙන දායකත්වයට සරිලන සහයෝගයක් අපි ලබා දෙනවා ද කියන එක දිගින් දිගටම තිබුණු ප්‍රශ්නයක්.

ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කය ගත්තාම, එහි රබර් කර්මාන්තය කරන අයට සහන ලබා දෙනවා. ඒ සහනය දැනුත් ලබා දෙනවා; එම සහනය ලබා දීමේ කටයුත්ත පෙර පටන්ම කරගෙන ආවා. මොනරාගල දිස්ත්‍රික්කයේ රබර් වගාව දියුණු තත්ත්වයටත් පත් වෙලා තිබෙනවා. එය ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් අප ක්‍රියාත්මක කළ යුතුයි කියන අදහස තමයි මට තිබෙන්නේ. මොකද, මේ වන කොටත් කොළ කහ ගැන්වෙන රෝගය වැලඳී ඇති සමහර ස්ථාන තිබෙනවා. අපි ඒවා ගැනත් සොයා බලා අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

විශේෂයෙන්ම පොල් වගා කරන ගොවියන්ට යම්කිසි අසාධාරණයක් සිදු වෙනවා. මා එහෙම ප්‍රකාශ කරන්නේ හේතුවක් ඇතිවයි. ඒ අය වගා කරන පොල් පැළ පුංචි සන්ධියේදී ඉත්තෑවෝ විනාශ කරනවා. ලොකු වුණාට පස්සේ වුණත් -අවුරුදු 10, 12, 15 වයස පොල් ගස් වුණත්- වන අලින් විසින් පෙරළා විනාශ කර දමනවා. විශාල වශයෙන් ඵලදාව තිබෙන පොල් ගස් විනාශ කළාට පස්සේ හෝ පොල් වගා කරන අයට වටිනා කියන වන්දියක් ලබා දෙන ක්‍රමවේදයක් හදන්න කියන ඉල්ලීමත් මා කරනවා.

මොනරාගල දිස්ත්‍රික්කය ගත්තොත්, එහි උක් වගා කර්මාන්තය සිදු වෙනවා. ලංකා සීනි සමාගම විසින් පැල්වත්ත, සෙවනගල කර්මාන්තශාලා දෙකේ සීනි නිෂ්පාදනය කරනවා. ගල්ඔය වැවිලි සමාගම විසින් හිඟුරාන සීනි කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදනය කරනවා. ඒ වාගේම තමයි, ඇතිමලේ සීනි සමාගම විසින් ඇතිමලේ කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදනය කරනවා. ඒවායෙන් රටේ සීනි අවශ්‍යතාවෙන් සියයට 25ක්වත්- සියයට 15ක්වත් - නිෂ්පාදනය වෙන්නේ නැහැ කියන එකයි මගේ විශ්වාසය වී තිබෙන්නේ. හැබැයි, එසේ නිෂ්පාදනය කරන සීනි අළෙවි කර ගන්න හොඳ මිලක් නොලැබෙන එක තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. මේ වන කොටත් පැල්වත්ත සීනි සමාගම ඉතා අසීරුවෙන් තමයි පවත්වාගෙන යන්නේ. ඒ සීනි සමාගම්වලින් නිෂ්පාදනය කරන සීනි හොඳ මිලකට අළෙවි කර ගන්න අවස්ථාව හදලා දෙන්න කියන ඉල්ලීම මම කරනවා. මේ වන කොට සීනිත් අඩු මිලකටයි විකිණෙන්නේ. ඒ වාගේම, මේ වන කොට ස්ප්‍රීතු පවා අඩු මිලකටයි විකිණෙන්නේ. ඒ නිසා මේ ගැන හිතා බලා පැල්වත්ත කර්මාන්තශාලාව රැක ගන්න කටයුතු කරන්න ඕනෑ. පැල්වත්ත කර්මාන්තශාලාවේ සේවකයෝ 4,000කට ආසන්න ප්‍රමාණයක් සේවය කරනවා. ඒ වාගේම සෙවණගල සේවකයන් 1,300ක් පමණ සේවය කරනවා. ගරු ඇමතිතුමා, ඒ ආයතන ටික එක තැනක, එක අමාත්‍යාංශයක් යටතේයි තිබුණේ.

සමහර විෂයයන් ඔබතුමාගෙන් ගැලෙව්වේ මොකද කියන්න මම දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය මේ ගැන හිතලා බලලා මේ කාරණා ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න.

පැල්වත්ත සමාගමේ සේවකයන් 4,000කට ආසන්න ප්‍රමාණයක් සේවය කරනවා. සෙවණගල සමාගමේ සේවකයන් 1,300ක් පමණ සේවය කරනවා. ඒ සේවකයන්ට බෙහෙත් ලබා ගැනීමට වෛද්‍ය රක්ෂණයක් තිබුණා. දැන් ඒ රක්ෂණය නතර කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ වාගේම, මෙතෙක් කල් දෙසැම්බර් මාසය අවසානයේ දීපු දිරි දීමනාවත් නතර කරලා තිබෙනවා. ඒත් එක්කම, ඉතිරි කර ගත් අසනීප නිවාඩුවලට ලබා දීපු ගෙවීම් නතර කරලා තිබෙනවා. ඒ වාගේම, ඒ සේවක සේවිකාවන්ගේ උසස්වීම් නතර කරලා තිබෙනවා. ඒ නිසා මේවා ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඔබතුමා දැන් අපේ පළාතේ සිටින ප්‍රධානම අමාත්‍යවරයෙක්. අපේ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, මේක ඔබතුමාගේ විෂයය නොවුණත්, මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(මාණ්පුමිකු කේ.වී. සමන්ත විත්‍යාරත්න)
(The Hon. K.V. Samantha Viddyarathna)
අවධානයට නම් ගන්නම්, ගරු මන්ත්‍රීතුමා. මේ අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නැති කාරණයක් තමයි ඔබතුමා කිව්වේ.

කර්මාන්ත අමාත්‍යාංශයට තමයි මේ සීනි කර්මාන්ත ටික අයිති. නමුත් ඔබතුමා දැන් කියපු නිසා අපි ඒ ගැන අවධානය යොමු කරන්නම්. ඒ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අවස්ථාවේ අදහස් දැක්වුවා නම් ඔබතුමාට ඵලදායී උත්තරයක් ගන්න පුළුවන්.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(මාණ්පුමිකු ඩප්ලියූ.එච්.එම්. තර්මසේන)
(The Hon. W.H.M. Dharmasena)

ඔබතුමා මේ ගැන හිතලා බලන්න. අද මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න බැරි වුණත්, ඔබතුමා ඌව පළාතේ ඉන්න, මේ ආණ්ඩුවේ ඉන්න ප්‍රධානම අමාත්‍යවරයෙක් නිසා මේ ප්‍රශ්නය අදාළ අමාත්‍යතුමාට යොමු කරලා අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වසර ගණනාවක් තිස්සේ අනියම් සේවකයන් විධියට හිටපු අය සහ කොන්ත්‍රාත් පදනම මත සේවය කරපු අයත් මේ කර්මාන්තශාලාවල ඉන්නවා. ඔවුන් අවුරුදු 5, 10 වැඩ කරපු අය. ඒ අයගේ සේවය නතර කරන්න සූදානම් වෙනවා කියන ආරංචිය තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. ඒ අය ඒ ප්‍රදේශයේම ජීවත් වන අය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අයගේ දෙමව්පියන් පැල්වත්ත සීනි සමාගම වෙනුවෙන් වැඩ කටයුතු කරන අය. ඒ නිසා ඒ අය සේවයෙන් ඉවත් නොකර පැල්වත්ත ආයතනය තුළ රඳවාගෙන සේවය කරන්න අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීමත් කරනවා.

ඊළඟට සෙවණගල සීනි සමාගම ගත්තොත්, ඒ කර්මාන්තශාලාවේ සේවය කරන සේවකයන් 1,008දෙනෙකුට අවුරුදු දෙකක කාලයක් තිස්සේ ගෙවපු මූලික වැටුප 2025.01.25 දින සිට අඩු කරලා තිබෙනවා. රටේ කොහේවත් ආයතනයක සේවකයන්ට දීපු මූලික වැටුප නැවත අඩු කරන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි? එහෙම කරන්න පුළුවන්ද කියලා මම දන්නේ නැහැ. නමුත් ඔවුන්ගේ මූලික වැටුප අඩු කරලා තිබෙනවා. මේ මූලික වැටුප අඩු කරන එක ඉතාම අසාධාරණයි. මොකද, ඔවුන් ඒ වැටුපට හුරුවෙලා හිටපු අය. එම නිසා ඒ මූලික වැටුප නැවත ලබා දෙන්න කියන ඉල්ලීමත් කරනවා.

ඒ වාගේම, මේ ආයතනවල සීනි ස්ථාවර මිලකට විකුණන්නත්, ස්ප්‍රිතු ටික ස්ථාවර මිලකට විකුණන්නත් කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)

ගරු ක්‍රිෂ්ණන් කලෙයිවෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[ප.ප. 2.35]

ගරු ක්‍රිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය
(මාණ්පුමිකු (සෙල්වි) කිරුෂ්ණන් කලෛච්චෙල්වි)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இந்தப் பாராளுமன்றத்தில் பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சின் விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கும் வேளையில், எனது மக்களான மலையக மக்கள் -தேயிலைத் தோட்டத் தொழில் துறை மக்கள்- தொடர்பாகப் பேசுவதையிட்டு உண்மையிலேயே பெருமகிழ்ச்சி அடைகின்றேன்.

இந்த மக்களை எடுத்துக்கொண்டால், உண்மையிலேயே இவர்களுக்குப் பிரதான பிரச்சினைகள் பல இருக்கின்றன. முதலாவது, பொருளாதாரப் பிரச்சினை! அதையொட்டி அவர்களுக்கு வீட்டுப் பிரச்சினை! Road பிரச்சினை! கல்வி, சமூக, கலாசார பிரச்சினை! அதைவிட, இந்த மக்களுக்குப் பல்வேறு உயிரினங்களினால் பிரச்சினை! இவை மாத்திர மல்ல, தோட்டத்தில் வாழும் கர்ப்பிணிப் பெண்களை எடுத்துக்கொண்டால், அவர்களில் 11.4 சதவீதத்தினர் இரத்தச் சோகையால் பாதிக்கப்பட்டவர்கள். அதுபோல், மலையகத்தில் பிறந்து வாழ்கின்ற குழந்தைகளை எடுத்துக்கொண்டால், அவர்களில் 23.7 சதவீதத்தினர் மந்தபோசணையுடையவர்கள். இவ்வாறு அவர்களுக்குச் சகலதும் பிரச்சினைகளாகவே இருக்கின்றன. உண்மையிலேயே எங்களது உறுப்பினர் அம்பிகா சாமிவேல் அவர்கள் கூறியதுபோல், எதிர்க்கட்சியில் இருக்கின்ற உறுப்பினர்கள், அவர்களை நாங்கள் ஏசுகின்றோம், குறை கூறுகின்றோம் என்று கூறினாலும், மீண்டும் ஒருமுறை நாங்கள் அந்தக் குறையைக் கூற வேண்டியுள்ளது. ஏனென்றால், இந்த நாட்டில் எமது மலையக மக்களின் வரலாறு 2025ஆம் ஆண்டுவரை 202 வருடங்கள்! ஆனால், ஆரம்ப காலத்திலிருந்து இன்றுவரையும் வெள்ளை யர்கள் கட்டிக்கொடுத்த அந்த 8 அடி 'காம்பரா'க்களிலேயே வாழ்ந்துகொண்டிருக்கின்ற அளவுக்குத்தான் அவர்களது வாழ்க்கை நிலை காணப்படுகிறது.

இவர்கள் சம்பந்தமாக இதுவரை இருந்த அரசாங்கங்கள், அரசியல் கட்சிகள், அரசியல் தலைவர்கள் சிற்சில தீர்மானங்களை எடுத்திருந்தாலும், 21ஆம் நூற்றாண்டிலும் நாம் மலையக மக்களின் வீடுகளைப் பற்றிப் பேச வேண்டிய சூழ்நிலைக்குத் தள்ளப்பட்டுள்ளோம்; அவர்களின் கல்வியைப் பற்றிப் பேசுவதற்குத் தள்ளப்பட்டுள்ளோம்; அவர்களின் சுகாதாரத்தைப் பற்றிப் பேசுவதற்குத் தள்ளப்பட்டுள்ளோம். எனவே, நான் இந்த 10ஆவது பாராளுமன்றத்தில் பெருந் தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு தொடர்பான விவாதத்தில் விசேடமாக ஒன்றைக் கூறுகின்றேன். உண்மையிலேயே 1948ஆம் ஆண்டுக்குப் பிறகு இந்த 2025ஆண்டுக்கு முன்னர் வரை இந்த நாட்டை ஆட்சி செய்த அனைத்து ஆட்சியாளர்களும் மலையக மக்களிடம் மன்னிப்புக் கேட்க வேண்டும். இதை நான் ஏன் கூறுகின்றேன் என்றால், தொடர்ச்சியாக மலையகத்தைப் பிரதிநிதித்துவம் செய்யும் அனைத்து உறுப்பினர்களும் இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கத்திடம் மலையக மக்களின் பிரச்சினையைத் தீர்ப்பதற்கான கோரிக்கைகளை முன்வைத்துக் கொண்டிருக்கின்றார்கள். ஆனால், அவர் களுடைய ஆட்சிக் காலத்தில் இந்த மக்களின் தேவையை அறிந்து என்ன விதமான தீர்வைக் கொடுத்திருக்கிறார்கள்? என்ற கேள்விக்குறி இருக்கின்றது. ஆகவே, மலையக மக்களிடம் மன்னிப்புக் கேட்க வேண்டும் என்று இன்று எதிர்க்கட்சியிலிருந்து சத்தமிடும், சண்டைபோடும் உறுப்பினர்களிடம் நான் கேட்கிறேன்.

இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஆட்சியில் இருக்கின்றது. இந்த மலையக மக்களின் பிரச்சினைகளைச் சரியான முறையில் கண்டறிந்து, சரியான தீர்வினைப் பெற்றுக்கொடுப்பது எங்களது தேவையாகும். குறிப்பாக, அங்குள்ள மாணவர்களுக்குச் சரியான கல்வியைப் பெற்றுக் கொடுப்பதாக இருக்கட்டும், அவர்களது வீட்டு உரிமையாக இருக்கட்டும், நில உரிமையாக இருக்கட்டும், அவை சரியான முறையில் அவர்களைச் சென்றடைவதற்கான வேலைத் திட்டங்களை நாங்கள் ஆரம்பித்துள்ளோம்.

அதனடிப்படையில், 2025ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டத்துடன், இதற்கு முன்னரான 2023ஆம், 2024ஆம் ஆண்டுகளுக்குரிய வரவு செலவுத்திட்டங்களை

[ගරු කිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය]

ඔප්පිට්ටු නාන් තොටර්ච්චියාක අවතානිත්තුක්කොණ්ටුතාන් ඉරුක්කින්රේන්. ආනාල්, මලෙයකත් තෝට්ට මක්කළුටෙය පිරච්චිනෙකළෙච් චරියාකක් කණ්ටරිනිත්තු, අවර්කළතු තේවෙකළුක්කු ඒර්රවාරු එන්ත විතමාන අපිවිරුත්ති නටවටික්කෙකළෙ ඉවර්කළ් තමතු ආට්චික් කාලත්තිල් මුන්වෙත්තුළ්ළාර්කළ්? එන්ර කේල්වික්කුරි ඉරුක්කින්රතු. අතනටිප්පටෙයිල් පාර්ක්කුම්පෝතු, එමතු තේචිය මක්කළ් චක්ති අරචාංකත්තිනාල් 2025ආම් ආණ්ටු වරවු චෙලවුත් තිට්ටත්තිල් තේයිලෙ පුතිය නටුකෙ, මීළ් නටුකෙ මර්රුම් නිරප්පුතල් ආකියවර්රුක්කාන මානියත් තිට්ටංකළින්මූලම් චිරුතේයිලෙච් චාකුපටියෙ ඌක්කුවිප්පතර්කාක 750 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටුළ්ළතු. මලෙයක මක්කළින් වීටමෙප්පු මර්රුම් උට්කට්টමෙප්පු අපිවිරුත්තික්කු 4,267 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටුළ්ළතු. අතුමාත්තිරමල්ල, වේලෙයර්ර ඉළෙඤර්කළුක්කුත් තොළිර් පයිර්චිකළෙ වළංකුතල්, උණවුප් පොරුට්කළෙ වළංකුතල්, කාණි උරුතිකළෙ වළංකුතල්, වීට්ටු අලකුකළුක්කුක් කූරෙත් තකටුකළෙ වළංකුතල් පෝන්රවර්රුක්කාක 1,800 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටුළ්ළතු. පෙරුන්තෝට්ටප් පාටචාලෙකළිල් 'ස්මාර්ට්' වකුප්පරෙකළෙත් ස්තාපිප්පතර්කාක 600 මිල්ලියන් රූපාය් ඔතුක්කීටු චෙය්යප්පට්ටුළ්ළතු.

අතේපෝන්රු, මලෙයක මක්කළින් චම්පළප් පිරච්චිනෙ, වීට්ටුප් පිරච්චිනෙ, කාණිප් පිරච්චිනෙ පෝන්ර අනෙත්තුප් පිරච්චිනෙකළෙයුම් තේචිය මක්කළ් චක්තියාකිය නාංකළුම් පෙරුන්තෝට්ට මර්රුම් චමූක උට්කට්টමෙප්පු වචතිකළ් අමෙච්චුම් චරියාන මුරෙයිල් කණ්ටරිනිත්තු, ඉන්ත වරුටත්තිල් චෙය්යක්කූටිය අපිවිරුත්ති වේලෙකළුක්කාක ඉන්ත වරවු චෙලවුත්තිට්ටත්තිල් - විකිතාචාරප්පටි චොල්වතර්කු නේරමිල්ලාවිට්ටාලුම් - පිරතාන පංකීටුකළ් චෙය්යප් පට්ටුළ්ළතන් අටිප්පටෙයිල් මක්කළින් පිරතිනිතිකළ් එන්ර අටිප්පටෙයිල් නාම් මිකවුම් චන්තෝෂමටෙකින්රෝම්.

අතුමාත්තිරමල්ලාතු මේලුම් ඔරු විටයමොන්රෛක් කූරවේණ්ටියුළ්ළතු. ගරු නියෝජ්‍ය චභාපතිතුමියනි, ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමාට මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. එතුමා නිතරම කථා කරන දෙයක් තමයි, නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ - Norwood Divisional Secretariat එකේ - වැඩ කරන සේවකයින් නිසා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හැටන් නගරයට ගෙනෙන්න අපි සූදානමින් ඉන්නවාය කියන කාරණය. මම එතුමාට එක කාරණයක් කියන්න කැමැතියි. අපි ඒක තනිවම ගත්ත තීන්දුවක් නොවෙයි. දිස්ත්‍රික්කය තුළ සම්බන්ධීකරණ කමිටුවක් තිබෙනවා. 2025 ජනවාරි මාසයේ 31වැනි දා එම සම්බන්ධීකරණ කමිටුව පැවැත්වුණා. නියෝජ්‍ය ඇමතිතුමාත් එක්ක ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු 5දෙනෙක්, ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් තිදෙනෙක් එම කමිටුවේ ඉන්නවා. හැබැයි, මේ තීන්දුව ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරුන් විසින් ගත් තීන්දුවක් නොවෙයි. මේක ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක්. මම මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුම මන්ත්‍රීවරුන්ට, විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ට කියනවා, නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කර්යාලයට ගිහිල්ලා පොඩ්ඩක් නිරීක්ෂණය කරලා බලන්න කියලා. එම ප්‍රාදේශීය ලේකම් කර්යාලය, සාමාන්‍යයෙන් ග්‍රාම නිලධාරි මහත්මයෙකුට කාර්යාලයක් පවත්වාගෙන යන්න පුළුවන් තරමේ පොඩි ඉඩ ප්‍රමාණයක් තිබෙන තැනක්. එම නිසා එහි නිලධාරින්ගේ සහ දිස්ත්‍රික්කයේ හැමෝගේම, - ඒ ප්‍රදේශයේ ජන්දයට කෑ ගහන අයගේ නොවෙයි, සාමාන්‍ය ජනතාවගේ - ඉල්ලීමක් තිබුණා, එතැන ඉඩ මදියි කියලා. ඇත්තටම එතැන තිබෙන ඉඩ ප්‍රමාණය මදියි. අපේ ජනතාව; අපේම වතුකරයේ ජනතාව වැඩිපුර පිරිසක් තමන්ගේ එදිනෙදා කටයුතු කර ගන්න ඒ Divisional Secretariat එකට යනවා. හැබැයි, මහ වැසි කාලයේ ඒ ජනතාවට ඉන්න තැනක් නැහැ. එම නිසා මේ තීරණය, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යෝජනාවක් ගෙනැල්ලා සියලුදෙනාම එකතුවෙලා ගත්ත තීරණයක්. එතැන රජයේ නිලධාරීන් සිටියා, අනෙකුත් රජයේ සේවකයින් සිටියා, දිස්ත්‍රික් ලේකම්තුමිය සිටියා, ආණ්ඩුකාරතුමා සිටියා. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරු කිසිවෙක් සිටියේ නැහැ. ඒක සම්බන්ධීකරණ කමිටුවේදී ගත් තීන්දුවක් නිසා මෙතැනට ඇවිල්ලා කඳුකරයේ ජනතාවගේ ජන්දය ගන්න ඒගොල්ලන් අතර වෙනස් විධියට ජාතිවාදය අවුස්සන්න කටයුතු කරන්න එපා කියලා මම මේ මන්ත්‍රීවරුන්ගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(මාණ්පුමිකු (කලානිති) වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතුමිය කිව්වා, ඒක තීරණය කළේ DCC meeting එකේදී කියලා. මම දහවල් 1.00 වෙනකල් DCC meeting එකේ සිටියා. එතෙක් මේ තීරණය ගත්තේ නැහැ. මන්ත්‍රීවරු එකතු වෙලා ඊට පස්සේ මේ තීරණය අරගෙන ඇති. නමුත් දිස්ත්‍රික්කයේ යම් දෙයක් සම්බන්ධයෙන් තීරණයක් ගන්නකොට අනිවාර්යයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන් එක්කත් එකතුවෙලා ඒ තීරණය ගන්න ඕනෑ. විපක්ෂයේ මන්ත්‍රීවරු නැතුව තීරණ ගන්නවා නම්, ඒක ඔබතුමන්ලාගේ ඒකමනික තීරණයක් වෙනවා. ඔබතුමන්ලාගේ ඒකමනික තීරණයට අපි එකඟ නැහැ. මේක හැටන්වල කරන්න බැහැ, නෝර්වුඩ්වල කරන්න කියලා ඒක තමයි අපි පාර්ලිමේන්තුවේත් නිතරම කථා කරන්නේ. මොකද, දැන් හැටන්වලට වියදම් කරන මුදල නෝර්වුඩ්වලට වියදම් කරන්න, එච්චරයි. මිනිස්සුන්ට පහසුකම් දෙන්න. එච්චරයි අපට ඕනෑ කරන්නේ. මමත් එතැන සිටියේ නැහැ, ජීවන් තොණ්ඩමන් මැතිතුමා සිටියෙත් නැහැ, පලනි දිගම්බරම් මැතිතුමා සිටියෙත් නැහැ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ විපක්ෂය වෙනුවෙන් ඉන්නේ අපි තුන්දෙනා විතරයි. අපි තුන්දෙනාම එදා එතැන සිටියේ නැහැ. ලබන මාසයේ කැඳවනවා නම් ලබන මාසයේ කැඳවා අපි තීරණය කරමු.

ගරු කිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය
(මාණ්පුමිකු (චෙල්වි) කිරුෂ්ණන් කලෙච්චෙල්වි)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඇත්තටම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අපි ආරාධනා කරන්නේ නැහැ, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට. නව ගොඩනැඟිල්ලක් හදාගන්නකල් එම කාර්යාලය තාවකාලිකව හැටන්වලට ගෙනෙනවා කියන පදනමින් තමයි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම්තුමිය, -දිසාපතිතුමිය- ආණ්ඩුකාරතුමා කියන සියලු දෙනාම හිටපු තැන කථා කරලා තීන්දුවක් ගත්තේ. එතැනට මෙතුමන්ලා ආවේ නැති එක සම්බන්ධව අපට වගකියන්න බැහැ. හැබැයි, මේ මන්ත්‍රීවරුන්ගෙන් අපි එක ඉල්ලීමක් කරනවා. දැන් මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ මන්ත්‍රීවරු ගිහිල්ලා ඒගොල්ලන්ට කථා කරනවා; වෙනම කථා කරනවා; ජාතිවාදී විධියට කථා කරනවා, අපි අහගෙන ඉඳලා තිබෙනවා. ඒක කරන්න එපා කියලා අපි මේ සභාවේදී ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිචාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)

ගරු ජීවන් තොණ්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 23ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.46]

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
நன்றி, கௌரவ பிரதித் தவிசாளர் அவர்களே!

අවසාන වශයෙන්, කුරුඳු කර්මාන්තය වෙනුවෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, කුරුඳු කර්මාන්තයේ නියැළිලා ඉන්න අය. අද කුරුඳු මිල පිළිබඳවත් නොයෙකුත් ආකාරයේ අර්බුද තිබෙනවා. ඒ කෙසේ වෙතත් අපි දන්නවා, පසුගිය කාලයේ කුරුඳු සංවර්ධනය සඳහා වෙනම ආයතනයක් -කුරුඳු දෙපාර්තමේන්තුව කියලා එකක්- පිහිටුවන්න කටයුතු කරලා තිබුණු බව. ඉතින් ඒ අයට දැන ගන්න අවශ්‍ය වෙලා තිබෙනවා, ඒ දෙපාර්තමේන්තුව තවදුරටත් පවත්වාගෙන යනවාද කියලා, ගරු ඇමතිතුමනි. ඒක අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන්න ඉල්ලීමක් තිබෙනවාය කියලා දැන ගන්න ලැබී තිබෙනවා. කුරුඳු කියන්නේ ලංකාවටම ආවේණික දෙයක්. විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයන කර්මාන්තයක්. ඒ වාගේම ව්‍යාපාරයක්. ඒ නිසා ගරු අමාත්‍යතුමනි ඒ අය ඉල්ලා සිටින්නේ, ඒක වෙනම තියා ගන්න කියලායි. ඒක වෙනම තියාගෙන, කුරුඳු අපනයනකරුවන්ට තිබෙන ගැටලු පිළිබඳව, ඒවායේ මිල පිළිබඳව, කුරුඳු අපනයනයේදී මතුවන ප්‍රශ්න පිළිබඳව හොයා බලන්න. ඒ ආයතනය අධිකාරියක් බවට පත් කරන්න කටයුතු කරන්න කියලා තමයි ඉල්ලීමක් කරන්නේ. ඒ සඳහාත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

කාල වේලාව ඉක්මවා ගිහින් තිබෙන නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. අපි ගරු ඇමතිතුමාට සුබ පතනවා. ඔබතුමා සාධනීය කරුණු රාශියක් ඉදිරිපත් කළා. ඒ සඳහා අවශ්‍ය මුදල් ලැබිලා, ඒ සංවර්ධන කටයුතු, වතු කම්කරු ජනතාවගේ අවශ්‍යතා, පඩි වැඩිකිරීම්, නිවාස ප්‍රශ්නය විසඳන්නත්, ඔබතුමා බලාපොරොත්තු වෙන ආකාරයට ඒ කටයුතු ඉටු කර ගන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.37]

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙන මේ මොහොතේ, මට ඉතා කෙටි කාලයක් ලැබී තිබෙන නිසා විශාල ක්ෂේත්‍රයක් නියෝජනය කරන තේ කර්මාන්තය ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කය, අසල්වැසි ගාල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක කියන්නේ මේ ලෝකයට තේ සපයන ප්‍රධාන දිස්ත්‍රික්ක තුන. ඒ මර්මස්ථානයේ තමයි අපි ජීවත් වෙන්නේ. වතු කම්කරු ජනතාව විශාල ප්‍රමාණයක්, ලක්ෂ පහකට වැඩි ප්‍රමාණයක් ඒ දිස්ත්‍රික්ක තුන ආශ්‍රිතව ජීවත් වෙනවා. ඒ නිසා අපි ඔවුන්ගේ දුක සැප හඳුනනවා. අපි ඉතිහාසය පුරාම ඔවුන් වෙනුවෙන්, විශේෂයෙන්ම තේ කර්මාන්තයේ යෙදෙන ජනතාව වෙනුවෙන් අපට කළ හැකි හැම සටනක්ම, අරගළයක්ම පාරේදී, හැම තැනකදීම කරලා තිබෙනවා. විපක්ෂයේ සමහර මහත්වරු කියන විධියට අපි ඒ කිසිවක් නොදැන මේ අය වැයට දායක වුණා නොවෙයි. අපි ඒ සියලු අත්දැකීම්, ඉතිහාසය පුරා ලැබූ සියලු අත්දැකීම් එක්ක තමයි මේ අය වැය සකසා තිබෙන්නේ.

විශේෂයෙන් තේ කර්මාන්තය ගැන කථා කරනකොට මම සඳහන් කරන්න කැමැතියි, අපි කාලයක් තිස්සේ කරපු අරගළ තුළ, විශේෂයෙන්ම ජනතාවත් එක්ක ඒකාබද්ධව ජීවත්වීම තුළ තේ කර්මාන්තය තුළ තිබෙන ප්‍රධාන කරුණු කිහිපයක් හඳුනා ගත්ත බව. ඒ සියල්ලට හේතු වුණේ මෙතෙක් මේ රට පාලනය කරපු පාලකයන් විසින් තේ කර්මාන්තයත්, ඒ ආශ්‍රිතව ජීවත් වන, ඍජුව හා වක්‍රව තේ කර්මාන්තය මත යැපෙන ලක්ෂ 30ක් පමණ වන ඒ ජනතාවත් අමතක කර ගත්ත තීන්දු සහ තීරණයි. පෞද්ගලික පටු පරමාර්ථ, දේශපාලන අරමුණු ඔස්සේ අය වැය ලේඛන සැකසීම, ඡන්ද කාලයක් එනකොට මුදල් බෙදීම වැනි කටයුතු නිසා මේ කර්මාන්තය කඩා වැටුණා.

අපි හඳුනා ගත්ත ප්‍රධාන කාරණා අතර තිබෙන පළමුවැනි කාරණය තමයි කම්කරු හිඟය. අද වෙනකොට මේ ක්ෂේත්‍රය තුළ දැඩි කම්කරු හිඟයක් තිබෙනවා. ඒ නිසාම නිෂ්පාදන ව්‍යයම ඉහළ ගොස් තිබෙනවා. තේ කර්මාන්තශාලාවෙන් නිමි තේ කිලෝ එකක් නිෂ්පාදනය කරන්න යන පිරිවැයේ වැඩිවීමක් අපට දකින්නට තිබෙනවා. මේ සඳහා විසඳුම් සහිත අය වැයක් නිර්මාණය කරන්න අපට වුවමනා වෙලා තිබුණා.

ඊළඟට, දෙවැනි කාරණය තමයි පොහොර සහ අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය පිළිබඳව තිබෙන ගැටලුව. කාලයක් තිස්සේ තේ ගොවියා ඒ සඳහා විශාල අරගළයක් කර දිනා ගත් ඒවායේත් ප්‍රමිතියක් තිබුණේ නැහැ. ඒ අයට කාලයක් තිස්සේ ප්‍රමිතියෙන් තොර පොහොර ලැබෙන්න පටන් ගත්තා. ඒ විතරක් නොවෙයි, සමහර අවස්ථාවල හිතුමතයට ගත්ත අමනෝඥ තීරණ තේ කර්මාන්තය කඩා වැටෙන්න හේතු වුණා. කාබනික පොහොර පිළිබඳව එක් පුද්ගලයෙකුට තිබුණු සිහිනයක් ඉටු කරගන්න ගිහිල්ලා මේ වගාව සම්පූර්ණයෙන්ම විනාශ වෙන්න පටන් ගත්තා. වාණිජ භෝගයක් වන තේ වගාව කාලයක් ඒ විධියට විනාශ වුණා.

ස්වාභාවික විපත් නිසාත්, කාලගුණික විපර්යාස නිසාත් තේ කර්මාන්තයට යම් යම් බලපෑම් ඇති වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ කිසි අවස්ථාවක සෙස් අරමුදලින් ගෙවනු ලබන වගා සහනාධාරයෙන් මුදල් වියදම් කරලා තේ ගොවියා රැකබලා ගත් බවක් අපි දැක්කේ නැහැ; ඉතිහාසය පුරා ඉතා හොඳින් ඒ කටයුතු සිද්ධ වුණු බවක් අපි දැක්කේ නැහැ. ඒ නිසා අපට ඒවා හරියාකාරව කළමනාකරණය කරගෙන ඒ කටයුතු ගැනත් සොයා බලන්න සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කර්මාන්තයේ තිබෙන වැදගත්ම දේ තමයි මෙය වාණිජ වගාවක් වීම. ඒ වාගේම තේ කියන්නේ, නිෂ්පාදනයෙන් බහුතර ප්‍රමාණයක් පිට රටට අපනයනය කරන භෝගයක්. ඒ නිසා අපට ජාත්‍යන්තර වෙළෙඳ පොළ -ජගත් වෙළෙඳ පොළ- ගැනත් අවබෝධයක් තිබෙන්න ඕනෑ. අපට පෙනෙන විධියට ඉතිහාසය පුරා මේ කර්මාන්තයට යම් යම් මුදල් ප්‍රමාණ වෙන් කළත්, තේ මණ්ඩලය හරහා යම් යම් කාර්යයන් ඉටු කරන්න උත්සාහ කළත් එවකට සිටි පාලකයන් ඒවා හරියට සිදු කර නැහැ. මේ ආයතනවල සිටි සමහර නිලධාරීන් දැවැන්ත මුදල් නාස්තියක් සිදු කර තිබෙනවා. තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ පර්යේෂණ ආයතනය ආදියේ දක්ෂ, අවංක නිලධාරීන් විශාල ප්‍රමාණයක් කාලයක් තිස්සේ හිටියා. හැබැයි, ඔවුන්ට අවශ්‍ය පහසුකම් නොදීම නිසා, ඔවුන්ට අවශ්‍ය ඇඟයීම නොකරපු තත්ත්වය නිසා, ඒ පර්යේෂණ සඳහාත්, නොයෙක් කාරණා සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා නොදීම නිසාත් මේ සේවය හොඳින් දෙන්න පුළුවන් විද්‍යාඥයන් විශාල ප්‍රමාණයක්, පර්යේෂකයන් විශාල ප්‍රමාණයක් මේ කර්මාන්තයට අදාළ පර්යේෂණ කටයුතුවලින් ඈත් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දැන් අපට ඒවා පිළිබඳවත් විශාල අවධානයක් යොමු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ අය වැයෙන් එම පර්යේෂණ කටයුතු සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම වසර 153කට වැඩි ඉතිහාසයක් තිබෙන තේ කර්මාන්තය තුළින් අප ලබාගෙන තිබුණු සන්නාමය, "Ceylon Tea" කියන සන්නාමය අපි අමතක කළා. අන්තර්ජාතික වෙළෙඳ පොළ තුළ අපේ තේ නිෂ්පාදනය ව්‍යාප්ත කරන්න, නව තාක්ෂණය භාවිත කරලා මේ සන්නාමය තවත් ඉස්සරහට ගෙනියන්න එවකට සිටි පාලකයන් කටයුතු කළේ නැහැ. ඒ නිසා අපට බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එවකට සිටි පාලකයන්ගේ අදූරදර්ශී තීරණ නිසා ලෝකයම පිළිගන්නා පානයක්, ජලයට පමණක් දෙවැනි පානයක් වන තේ නිෂ්පාදනය ජාත්‍යන්තරය තුළ අලෙවි කරගෙන රට සංවර්ධනය කිරීමට අවශ්‍ය ඩොලර් රටට ගෙනෙන්න තවමත් හරියට බැරි වෙලා තිබෙනවා.

ඒ වාගේම දැනට පවතින කර්මාන්තශාලා ගත්තාම, ඒවාට අවශ්‍ය පහසුකම් දෙන්න ඕනෑ. ඒවා නවීකරණය කරන්න ඕනෑ. අදටත් ඒවා යල්පැන ගිය ආකාරයෙන්ම පවත්වා ගෙන යන ආකාරයක් ඉතා අභාග්‍ය සම්පන්න ලෙස අපට දකින්න තිබෙනවා. මේ ගැටලු නිරාකරණය කිරීම සඳහා වූ අරමුණකින් අපට මේ අය වැය සැකසීමේදී තීන්දු, තීරණ ගන්න සිද්ධ වුණා.

ඒ වාගේම තවත් බරපතළම කාරණයක් වන්නේ නැවත වගාවයි. නැවත වගාව, අලුතින් වගා කිරීම, එහෙම නැත්නම් තිබෙන වගාවේ අඩුපාඩුකම් සපුරා ඒ වගාව යාවත්කාලීන කිරීමේ කටයුතු හරියාකාරව කෙරුණේ නැහැ. අද අපි දන්නවා, සමහර ප්‍රදේශවල තේ වගා කරන ගොවියෝ තේ පැළ නැවත වගා කරන්න ලඟි ලඟියේ බලා සිටියාට ඔවුන්ට අවශ්‍ය පොහොර, ඒ පැළ ටික ලැබෙන්නේ නැති බව. ඒ පැළ තවාන් අද නැහැ. ඒ නිසා මේ සියල්ල සලකා බලා තමයි මේ සඳහා මුදල් වෙන් කරන්න සිද්ධ වුණේ. ගරු ඇමතිතුමා කිව්වා වාගේ, තේ පැළයක් රෝපණය කරපු පළමු අවස්ථාවේ ඉඳලා නිමි තේ නිෂ්පාදනය කරලා පිට රට පටවන තුරු සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අය වැය හදන්න අපට ලොකු කැපකිරීමක් කරන්න වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

රට දැවැන්ත අර්බුදයක තිබෙනවා; රට ආර්ථික අර්බුදයක තිබෙනවා. අවුරුදු 153ක් පැරණි තේ සන්නාමය අමතක කර දමලා තිබෙනවා. ඒ සඳහා ගත්ත පියවර ඉතා නරක විධියට අපයෝජනය කරලා තිබෙනවා. ඒ සියල්ල එක්ක අපට ඉතාම පරිස්සමින් තමයි මෙවැනි අය වැයක් හදන්න සිද්ධ වුණේ. මේ අය වැය තුළින් අපි හිතන පරමාර්ථ ඉටු කර ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. මේ, මාස 8ක වැඩක්; මාස 8ක අය වැයක්. මේ අය වැය තුළින් තේ කර්මාන්තයේ යෙදෙන සියලු දෙනාට අවශ්‍ය පරිදි, ඔවුන් ප්‍රාර්ථනා කරන පරිදි සියල්ල සියයට සියයක් ඉටු කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. නමුත්, අපි රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට, වැවිලි කර්මාන්තය වෙනුවෙන් මේ අය වැය තුළින් ඉතාම හොඳ පියවරක් තබා තිබෙනවා කියලා අපට විශ්වාසයි. ඒ නිසා අපි ජනතාවගෙනුත්, තේ කර්මාන්තයේ නියැළී සිටින සියලු දෙනාගෙනුත්, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙනුත් ඉල්ලා සිටිනවා, මේ සත්කාරය කිරීමට අපට දායක වෙන්න කියලා. අපි කොහොමත් මේ රටේ වැවිලි කර්මාන්තය ඉහළින්ම ඔසවා තැබීමට කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.45]

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ විවාදය වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මම තේ වගාව ගැන කථා කරන්න ඉස්සෙල්ලා කටුපොල් වගාව ගැන කථා කරන්න ඕනෑ. කටුපොල් ලංකාවේම වගා කරන්න නිර්දේශ වෙලා තිබෙන්නේ හෙක්ටෙයාර 2,000යි. දැන් ඒ හෙක්ටෙයාර 2,000 වගා කරලා ඉවරයි. මේ ළඟකදී කර්මාන්ත හිමියෝ ඇවිල්ලා අමාත්‍යාංශය සමඟ ඒ ගැන සාකච්ඡා කළා. ඒගොල්ලෝ බලන්නේ කටුපොල් වගාව ව්‍යාප්ත කරන්නයි. කටුපොල් වගාව ඉතා ලාභ ලබන ව්‍යාපාරයක්. හැබැයි, කම්කරුවන්ට රක්ෂා නැති වෙන ව්‍යාපාරයක්. පරිසරවේදීන්ගේ වාර්තා අනුව නියඟයට බලපාන ලොකුම උවදුරක් තමයි කටුපොල් වගාව. මම ඒකේ අමිහිරි වේදනාව අත්විඳපු පුද්ගලයෙක්. මම මතුගම, දොඩන්ගොඩ සංවර්ධන කමිටුවේ අවුරුදු 5ක් සභාපති ලෙස කටයුතු කළා. ඒ දවස්වල චක්‍රලේඛයක් ආවා, කටුපොල් වගා කරන්න තහනම් කියලා. මම ප්‍රාදේශීය ලේකම් හරහා මේ චක්‍රලේඛයේ පිටපත් හැම වැවිලි සමාගමකටම යැව්වා. ඊට පස්සේ

[ගරු ජගත් විතාන මහතා]

මොකද වුණේ? මේවා අහන්නේ නැතිව වතු සමාගම් වගා කරන්න ගත්තා. Namunukula Plantationsහි වගා කරපු ඉඩමකට ජනතාව බලහත්කාරයෙන් කඩා පැන්නා. ඒ මිනිස්සුන්ගේ ළිං හිඳිලා, රස්සා නැහැ. සංවර්ධන කමිටුවේ සභාපති වශයෙන් මම ඒ ස්ථානයට යන්න කලින් මතුගම පොලිස් ස්ථානයට ගිහිල්ලා පැමිණිල්ලක් දාලා තමයි ගියේ. පොලිස් ජීප් එකත් එතැනට ආවා. මේ සත්‍ය කථාවක් මම කියන්නේ. මේ සංවර්ධන කමිටුවල සිටින සභාපතිවරු දැන ගන්න ඕනෑ, මේක මහා භාරදූර කාර්යයක් බව. එතැනට ගියාට පස්සේ අර මිනිස්සු ඒ ගස් ටික ගැලෙව්වා. ඒක නවත්වා ගන්න පොලීසියටත් බැරි වුණා. ඒක නවත්වලා අපි ඊට පස්සේ ආයෙත් ලියුමකින් දැනුම් දුන්නා, මේක කරන්න එපා කියලා. අන්තිමට මට මහෙස්ත්‍රාත් අධිකරණයේ පෞද්ගලික නඩු දෙකක් වැටුණා. කොහොම හරි මම නීතිඥ උපදෙස් අරගෙන ඒ නඩු දෙකට පෙනී ඉඳලා ඒ නඩුවලින් නිදහස් වුණාට පස්සේ, High Court එකේ නඩුවක් වැටුණා. මට පොලීසියෙන් දැනුම් දුන්නා, පොදු දේපොළ පනත යටතේ මා අත්අඩංගුවට ගන්නවා කියලා. මේක සත්‍ය සිදුවීමක්. දැන් ඒ නඩුව යනවා. ඒ නඩුවේදී මම විතරක් තනි වෙලා. දැන් ප්‍රාදේශීය ලේකම්වරුත් නැහැ, පන්සලේ හාමුදුරුවෝත් නැහැ, ජනතාවත් නැහැ. සංවර්ධන කමිටුවේ සභාපති නිසා මම මේවාට මුහුණ දෙනවා. මම කියන්නේ මෙන්න මේ වාගේ අසාධාරණකම් අපට වෙන්න දෙන්න එපා කියලායි. මම දැන් ඒ අධිකරණයේ තිබෙන නඩුවට පෙනී සිටිනවා. ඒ, මම වරදක් කරලාද? චක්‍රලේඛයක් තිබෙනවා, කටුපොල් වගා කරන්න තහනම් කියලා. හැබැයි, කළුතර දිස්ත්‍රික්කයට නිර්දේශිත කටුපොල් අක්කර ප්‍රමාණයත්, නිර්දේශිත ප්‍රමාණයටත් වඩා වැඩි ප්‍රමාණයකත් දැන් කටුපොල් වගා කරලා ඉවරයි. වතු සමාගම්වල නියෝජිතයන් හරි කැමැතියි, මේ වැවිල්ලට. හෙක්ටෙයාර 2,000කටත් වඩා වවා තිබෙන මේ කටුපොල් වගාව තවත් ව්‍යාප්ත වෙන්න දෙන්න එපා, ගරු ඇමතිතුමනි.

මම ප්‍රායෝගිකවම තේ වගාකරුවෙක්. මට තේ ඉඩම් තිබෙනවා. මම නගරයට එනකොට දකිනවා, පොඩි පොඩි වැන්වලින්, ලොරිවලින් ඇවිල්ලා තේ පැළ විකුණන ආකාරය. අනේ, අගලවත්ත, මතුගම පැත්තේ මිනිස්සු - අගලවත්ත විශේෂයි - මීදුලේ පවා තේ පැළ හිටවා තිබෙනවා. දැන්, තේ ශක්ති අරමුදල පිහිටුවා තිබෙනවා. ඒ වාගේම, තේ සම්බන්ධ උපදේශකවරුන් ඉන්නවා, ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවා තිබෙනවා. මේ සම්බන්ධයෙන් පුළුල් දැනුමක් තිබෙන අය ඒ තැන්වල ඉන්නවා. ඒ එක්කෙනෙක්වත් අර ලොරියක් ළඟට ගිහිල්ලා බලා තිබෙනවාද ඒ තේ පැළ ප්‍රමිතියෙන් යුතු ඒවාද කියලා? අනේ, අර මිනිස්සු පොළේ යන ගමන් මල්ලක දාලා තිබෙන ඒ තේ පැළ ටිකක් අරගෙන ගිහින් ගෙවතුවල හිටවනවා. ඒ පැළයක ආයු කාලය අවුරුදු 5යි, 6යි, උපරිම අවුරුදු 8යි. නියමිත ප්‍රමිතියෙන් යුක්ත තේ පැළයකට අවුරුදු 20ක් ආයුෂ තිබෙනවා. ඉතින්, මේ මිනිස්සු සූරාකෑමට ලක් වෙනවා. ඇයි ඒ? මම දන්නා තරමින් "තේ ශක්ති අරමුදල" කියලා ලොකු අරමුදලක් තිබෙනවා. අපනයනය කරන හැම තේ කිලෝවකින්ම ශත 50ක් යනවා, ඒ අරමුදලට. රුපියල් බිලියන ගණනක අරමුදලක් එතැන තිබෙනවා. මම දන්නා තරමින් EPF එකට, ETF එකට වඩා, එහෙම නැත්නම් ඒ හා සමානවම අරමුදලක් එතැන ගොඩ නැඟී තිබෙනවා. ඇයි, ඒ අරමුදලින් ප්‍රයෝජන ගන්න බැරි? ඇයි කර්මාන්තශාලා හිමියන්ට ඒවායෙන් පහසුකම් දෙන්න බැරි?

මා ළඟ තිබෙනවා, භීෂණ සමයේ රටට අහිමි වූ වටිනා කර්මාන්තශාලා කිහිපයක ඡායාරූප. තරහා වෙන්න එපා, මේක තමයි ඇත්ත. ඒ භීෂණ සමයේ අපේ රටේ ගිනි තබපු කර්මාන්තශාලා ටික මේ ස්ථානවල තමයි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඒ, බදුරලිය ලත්පදුර ඩැල්කිටි රබර් ෆැක්ටරිය, අස්වැලි වත්ත ෆැක්ටරිය, අඹේතැන්න වත්ත ෆැක්ටරිය, මිරිස්වත්ත රාජ්‍ය වතුයායේ කළුතර දිස්ත්‍රික්කයේ හොඳම තේ ෆැක්ටරිය ඉත්තපාන - මාලබේ, හොරණ වගවත්ත රබර් ෆැක්ටරිය, හල්වතුර තේ-රබර් ෆැක්ටරිය, සිරිකඳුර තේ ෆැක්ටරිය සහ රබර් ෆැක්ටරිය, පිඹුර වත්ත රබර් ෆැක්ටරිය, ගී කියන කන්ද රබර් ෆැක්ටරිය, තුඩුගල ඇල්ල ළඟ රබර් ෆැක්ටරිය. මේ ඔක්කෝම ගිනි තබා තිබෙනවා. මම ඒ කර්මාන්තශාලා කිහිපයක ඡායාරූප අරගෙන ආවා. එම ඡායාරූපත්, ඊට අදාළ ලේඛනයකුත් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මම මේ දේවල් කියන්නේ ඒ කර්මාන්තශාලා ගිනි තබපු අයට දඬුවම් දෙන්න කියන්න නොවෙයි. බටලන්ද කොමිසමේ වාර්තාව ගැන හොයන්න පුළුවන් නම්, ඒ වැරදිකරුවන් ගැන හොයන්න පුළුවන් නම් මෙන්න මේ ගොඩනැඟිලි පිළිබඳවත් සොයා බලා, ඒවා අලුත්වැඩියා කරන්න. මොකද, ඒ ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම තවමත් කරන්න පුළුවන්. ව්‍යාපාරිකයෝ ඉන්නවා, ඒවා භාරගන්න. කොයි තරම් සාර්ථක ව්‍යාපාර ගෙන ගිය කර්මාන්තශාලාද මේ ගිනි තබා තිබෙන්නේ? ඒක ජනතා විමුක්ති පෙරමුණ කළාද, මාලිමාව කළාද, ඒ දෙකම එකතු වෙලා කළාද කියලා අපි හොයන්න යන්නේ නැහැ. අපට ඕනෑ සංවර්ධනය සඳහා මේ ගොඩනැඟිලි දායක කර ගන්නයි. ඒ නිසා මේ ගැන පරීක්ෂණයක් කරන්න. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමාට වගකීමක් තිබෙනවා. මේවා කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන රජය සතු කර්මාන්තශාලා.

අපේ පැත්තේ LRC එකට අයත් ඉඩම් තිබෙනවා. කොහොමද LRC එක ඉඩම් බෙදන්නේ? අක්කර 100, 150, 200 ආදී වශයෙන් බොහෝ ඉඩම් ව්‍යාපාරිකයන්ට බෙදා දුන්නා. තව ඉතිරි වෙච්ච ටිකක් තිබෙනවා. තාඹුගල කියලා, LRC එකේ ලොක්කෙක් හිටියා. ඔහු ඇවිල්ලා ඒ ඉඩම් ඔක්කෝම දුන්නා, ඔහුට අවශ්‍ය අයට, බහුජාතික සමාගම්වලට, කොළඹ කෝටිපති ව්‍යාපාරිකයන්ට. ඊට වඩා හොඳ නැද්ද, රජයේ අයිතිය තබාගෙන අහිංසක මිනිස්සුන්ට අක්කර භාගයක්, අක්කරයක්, අක්කර එකහමාරක් බෙදා දීලා එම ඉඩම් රටේ සංවර්ධන කටයුතුවලට දායක කරගත්තා නම්? එතකොට අපේ අපනයන ආදායම වැඩි වෙන්නේ නැද්ද? මෙන්න මේවා තමයි මේ රට වෙනුවෙන් අපට කරන්න පුළුවන් යුතුකම්. මේ දිස්ත්‍රික්කය පුරාම තිබෙන ඉඩම් ටික හදුනා ගන්න. LRC එක දන්නේ නැහැ, ඒ ආයතනයට අයත්ව තිබෙන ඉඩම් ප්‍රමාණය. මම හිතන විධියට, ඒකට නිලධාරීන් මදි ඇති. හැම ප්‍රශ්නයක්ම ප්‍රාදේශීය ලේකම්ට යොමු කරනවා. හැබැයි, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඒ පැත්ත පළාතේ යන්නේ නැහැ. සංවර්ධන කමිටුවල සභාපතිවරු ඉන්නවා. අපි ඔවුන් එක්ක සම්බන්ධ වෙන්නම්. මන්ත්‍රීවරුන් ඉන්නවා, හිටපු මන්ත්‍රීවරුන් ඉන්නවා, ප්‍රදේශයේ ප්‍රභූවරු ඉන්නවා. ඒ නිසා මේ ගැන සංගණනයක් කරන්න. මේක කොච්චර දියුණු කරන්න පුළුවන් කර්මාන්තයක්ද?

තේ කර්මාන්තය ගත්තොත්, ගැටලු ගොඩක් තිබෙනවා. ඒ ගැන කියන්න කාලය ඇති වේවිද දන්නේ නැහැ. කවුරු හරි මන්ත්‍රීවරයෙකුත් මට කාලය ලබා දුන්නා.

කළුතර දිස්ත්‍රික්කයේ තේ දලු ටික ගෙනියන්න රත්නපුරෙන් එනවා, ගාල්ලෙන් එනවා, මාතරින් එනවා. රුපියල් 5ක්, 10ක් වැඩිපුර ගෙවලා තේ දලු ටික අරගෙන ඔවුන් පිටත් වෙනවා. හැබැයි, ඒක තහනම්. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නීති රීති අනුව ඒක තහනම්. හැබැයි, ඒ නියෝගය ක්‍රියාත්මක කරන්නේ නැහැ.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

නමුත්, ඒක ඉතාම පහසුවෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන් නියෝගයක්. ඔවුන් තේ දලු මිශ්‍ර කරනවා. විශේෂයෙන්ම ගාල්ල, මාතර හා රත්නපුරය කියන දිස්ත්‍රික්කවල වැවෙන තේ ගසේ දල්ල ඉතාම ගනකම්. අපේ කළුතර දිස්ත්‍රික්කයේ වැවෙන තේ ගසේ දල්ල ඉතාම තුනීයි. ඒගොල්ලෝ ඒක දැනගෙන, හිතාමතාම ඒ තේ දලු කලවම් කරලා, වේළලා, අඹරලා තේ නිෂ්පාදනය කරන්න තමයි කටයුතු කරන්නේ. එතකොට අපේ කර්මාන්තශාලා ටිකට මොකක්ද වෙන්නේ? මේ වනකොට පෞද්ගලික තේ කර්මාන්තශාලා හිමියෝ කිහිපදෙනෙකුගේ කර්මාන්තශාලා වැහිලා. ඔබතුමන්ලා දන්නවාද කර්මාන්තශාලා කොච්චර වැහිලා ගිහින් තිබෙනවාද කියලා? කර්මාන්තශාලා 1,250කින් 780ක් විතරයි දැන් ක්‍රියාත්මක වෙන්නේ. අනෙක් කර්මාන්තශාලා වැහිලා. ඒ මිනිසුන්ගේ ජීවනෝපාය නැවතිලා. බැංකු ණය ගෙවා ගන්න නොහැකිව ඒ තේ කර්මාන්තශාලා හිමියෝ කොපමණ අසරණ වෙලාද? ඇයි, ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් පනවා තිබෙන දිස්ත්‍රික් නීතිය ක්‍රියාත්මක නොකරන්නේ? ඒකට වෙන බලයක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ සඳහා ආරක්ෂක ඇමතිතුමා හරහා පොලීසියට නියෝගය දුන්නා නම්, උපදෙස් දුන්නා නම් හරි. එතකොට ඒ අයට border එකෙන් එහාට යන්න බැහැ, ඒ පැත්තෙන් එන ලොරිවලට යන්නත් බැහැ, මේ පැත්තෙන් ඒ පැත්තට තේ අරගෙන යන්නත් බැහැ. එතකොට තේ කර්මාන්තශාලා ටිකත් රැකෙයි, මිනිස්සුන්ටත් ජීවත් වෙන්නත් පුළුවන් වෙයි. තේ කර්මාන්තය හරහා අද කොපමණ පිරිසක් ජීවත් වනවාද? වක්‍ර වශයෙන් කොපමණ පිරිසකට රස්සා හම්බ වෙලා තිබෙනවාද? නමුත් මේ වාගේ වැරදි දේවල් වුණොත් අපේ තේ කර්මාන්තය අනතුරේ. එම කර්මාන්තශාලාවලටම කියලා පැළ තවානක් හරියට දමා ගන්න බැරි ඇයි? දිරි දීමනාවක් දීලා හරි ඒ කටයුත්ත කරන්න අවශ්‍යයි. එහෙම නැත්නම් තේ මණ්ඩලය සතු ඉඩම් තිබෙනවා, කාර්යාල තිබෙනවා, වාහනත් තිබෙනවා. එහෙම නම් හොඳ තේ පැළ තවානක් හදන්න. හදලා, ප්‍රමිතියෙන් යුතු තේ පැළ ලබා දෙන්න. නිකම් නොවෙයි, මුදලට දෙන්න. දැන් මට තේ පැළ ටිකක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒත් ගන්න තැනක් නැහැ. දැන් මම හොයනවා, තේ පැළ ගන්නේ කොහෙන්ද කියලා. මොකද, මමත් වවනවා. මම හැම දාම වවන මනුස්සයෙක්. මේ කර්මාන්තය සාර්ථකව කරගෙන යන්න නම්, ඊට අවශ්‍ය ධෛර්යය හා සහනාධාර ලබා දෙන්න ඕනෑ. එහෙම නැතිව මේක කරන්න බැහැ. පොහොර සමාගමෙන් දෙනවා කිව්ව සහනාධාර පොහොරවල ප්‍රමිතියක් නැහැ, ගරු ඇමතිතුමනි. ගොවියාගෙන් අහලා බලන්න. ඒ පැකට් එක ඇතුළේ කැට කැට වාගේ තිබෙනවා. ගොවියෝ දැන් ඒවා පාවිච්චි කරන්නේ නැහැ. දැන් ගොවියෝ ගන්නේ රුපියල් නවදහස් ගණනට දෙන පොහොර මිටිය. ගරු ඇමතිතුමනි, එම නිසා සහනාධාර පොහොරවල ප්‍රමිතිය පිළිබඳව අනිවාර්යයෙන්ම පරීක්ෂා කර බලන්න. එහෙම නැත්නම් මෙම කර්මාන්තය ඉස්සරහට ගෙන යන්න අමාරු වෙයි. මොකද, දැන් මිනිස්සු තේ වගාව සඳහා යොමු වෙන්නේ නැහැ.

දැන් බලන්න, තේ නිෂ්පාදනය අඩු වෙලා. නැවත වගා ප්‍රතිශතය අඩු වීම නිසා ඉදිරියේදී තවදුරටත් එලදාව අඩු වෙන්න පුළුවන්. ඒ වාගේම ගුණාත්මක තේ පැළ හිඟවීමත් අපට තිබෙන ප්‍රශ්නයක්. නිෂ්පාදන පිරිවැයට සමගාමීව තේ දලු මිල ඉහළ නොයෑම නිසා ගොවීන් වගාවෙන් ඈත් වෙලා තිබෙනවා. අලුතින් ගොවීන් වගාවට යොමු වන්නේ නැහැ. ඒකත් බරපතළ ඛේදවාචකයක්. තේ කර්මාන්තය වෙනුවෙන් ඇති ශ්‍රී ලංකා තේ මණ්ඩලයට, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට, තේ පර්යේෂණ ආයතනයට අවශ්‍ය මූල්‍ය ශක්තිය හා කාර්ය මණ්ඩලය නොමැතිකමත් තේ කර්මාන්තයේ කඩා වැටීමට බලපානවා. නමුත් එම ආයතන තේ කර්මාන්තයට විශාල ශක්තියක්. අද වන විට ලියාපදිංචි තේ කර්මාන්ත සංඛ්‍යාව 1,600යි, ක්‍රියාත්මක සංඛ්‍යාව 725යි. මේ තමයි ඇත්ත. මේවා ඇත්ත බව ඔබතුමන්ලා පිළිගන්න ඕනෑ. මෙම කර්මාන්තශාලා තවදුරටත් වැහීගෙන වැහීගෙන ගියොත්, තේ දලු ටික අඹරන්නේ කොහොමද? කවුද තේ ටික ගන්නේ? ගරු ඇමතිතුමනි, මේ දේවල් මම අශුභවාදීව කියනවා නොවෙයි. මේ ඔබතුමා භාර ගත්ත අමාත්‍යාංශය. දැන් කම්කරුවෝ කොච්චර හිඟද? දැන් තේ දලු කඩන්න අලුතින් කවුරුවත් යොමු වන්නේ නැහැ. දැන් අවුරුදු 50, 60, 70 හා 75 අයත් තේ දලු කඩනවා. කම්කරුවන් පුහුණු කරලා, ඒ අයට දිරි දීමනාවක් ලබා දීලා ඒ වෙනුවෙන් මොකක් හරි ක්‍රමයක් හදන්න ඕනෑ. එහෙම නොවුණොත් මේ කර්මාන්තයට මොකක්ද වෙන්නේ?

ඊළඟ ප්‍රශ්නය තමයි, ලෝක වෙළෙඳ පොළේ "Ceylon Tea" සඳහා වන ප්‍රචාරය අවම මට්ටමක පැවතීම. මේ වන විට ප්‍රචාරය කරන්නේම නැති තරම්. මේ සඳහා අපනයනය කරන තේ කිලෝග්‍රෑම් එකකින් රුපියල් 3.50ක් අය කරගෙන දැන් විශාල අරමුදලක් තිබෙනවා. නමුත්, ප්‍රචාරණයක් නම් සිදු වන්නේ නැහැ. අපනයනය කරන තේ කිලෝග්‍රෑම් එකකින් රුපියල් 3.50ක් සෙස් බද්ද කියලා අය කරනවා. කෝ, ඒවායෙන් මොකක්ද වන්නේ? කොහේද ඒ මුදල් තිබෙන්නේ? එක්කෝ නිලධාරීන්ගේ හිඟකම, එක්කෝ ඒවාට අවශ්‍ය පහසුකම් නොමැතිකම තේ කර්මාන්තයේ කඩා වැටීමට බලපානවා. ඒ නිසාඅවශ්‍ය පහසුකම් සපයලා අපි තේ කර්මාන්තය දිරිමත් කරන්න වැඩ පිළිවෙළක් සකස් කරමු. එහෙම නැති වුණොත් තේ කර්මාන්තය කඩා වැටීම නවත්වන්න බැහැ.

දැන් බලන්න, අපේ ප්‍රදේශවල කුරුඳු වගා කෙරෙනවා. හැබැයි, කුරුඳු සඳහා ලැබෙන සහනාධාරය මදි. වර්තමානයේ හොඳ කුරුඳු පැළ හොයා ගන්නත් අමාරුයි.

තේ නිෂ්පාදනයෙන් සියයට 73ක් කුඩා තේ වතු හිමියන් තමයි කරන්නේ. තේ කර්මාන්තයේ නියුතු මිනිස්සු කර්මාන්තයෙන් ඈත් වුණොත් මොකක්ද වන්නේ? අපේ රටේ සම්පූර්ණ අපනයන ආදායමින් සියයට 24ක් ලබා දෙන්නේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයෙන්. ශ්‍රම බලකායෙන් සියයට 16ක් රැකියා කරන්නේ එම ක්ෂේත්‍රයේ. හැබැයි, සමස්තයක් වශයෙන් ගත්තාම මේ ක්ෂේත්‍රය අඩු සැලකිල්ලක් ලැබුණු ක්ෂේත්‍රයක්. මෙම අය වැයෙන් රුපියල් බිලියන 17කට ආසන්න මුදලක් වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට වෙන් කිරීම ගැන අපි ස්තුතිවන්ත වනවා. ඒක නොකියා ඉන්න ඕනෑ නැහැ. මෙවර අය වැයෙන් ඒ වෙනුවෙන් සැහෙන මුදලක් වෙන් කරලා තිබෙනවා. එම නිසා ඒ මුදලින් අපි කාර්යක්ෂමව ඒ කටයුතු කර ගන්න ඕනෑ. අපි ඒ මුදල්වලින් මේ කර්මාන්තවලට පහසුකම් සපයන්න ඕනෑ.

තේ විතරක් නොවෙයි. පොල් කර්මාන්තය ගත්තොත්, පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයක් කළුතරත් තිබෙනවා. හැබැයි, පොල් පැළයක් ගන්න තැනක් නැහැ. සල්ලිවලට පොල් පැළ ඉල්ලනවා. මම පොල් වගා කරනවා. පොල් වගා කරන අපට තිබෙන ලොකු බාධකයක් තමයි, ඉත්තෑවෝ. පොල් පැළය හිටෙව්වාට පස්සේ ඉත්තෑවෝ ඇවිල්ලා කනවා. ඒ නිසා පොල් පැළයත් එක්කම මොකක් හරි බැරල් එකක් සපයා දෙන්නත් ඕනෑ. පොල් පැළය පැළ වෙලා මුල පොළොවට අල්ලලා ටිකක් ලොකු වනතුරු බැරල් එකේ තිබෙන්න ඕනෑ. දැන් අපි ඒ සඳහා බැරල් පාවිච්චි කරනවා. ඒවා මිල අධිකයි. අපි බැරල් අරගෙන ගිහිල්ලා දෙකට කපලා ඒවා ඇතුළේ තමයි පැළය සිටුවන්නේ. මම දන්නේ නැහැ, පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඉන්න නිලධාරීන් ප්‍රමාණවත්ද කියලා. අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සිටින නිලධාරීන් ගොවීන් දිරිමත් කරනවා මදි. කලින් හිටපු නිලධාරීන් නම් වතුවලට ගිහිල්ලා පොල් සහනාධාරය ගැන ගොවීන් දැනුවත් කළා. ඔවුන් පොල් පැළ බෙදා දීමත් කළා. දැන් ගරු ඇමතිතුමා කිව්වා, නොමිලේ පොල් පැළ සැහෙන ප්‍රමාණයක් බෙදා දෙන්න කටයුතු කරනවා කියලා.

[ගරු ජගත් විතාන මහතා]

ගරු ඇමතිතුමනි, අපේ දිස්ත්‍රික්කයටත් පොල් පැළ බෙදා දෙන්න. අපේ දිස්ත්‍රික්කයේත් ජනතාව පොල් වගා කරන්න ලෑස්තියි. අපේ දිස්ත්‍රික්කයේ පොල් වගාවට සිදු වන උවදුර තවම අඩුයි. ඒ නිසා අපේ මිනිස්සු පොල් වගා කරන්න කැමැතියි. නමුත් මටවත් පොල් පැළ ටිකක් ගන්න බැරි වෙලා තිබෙනවා. පොල් වගාකිරීමේ මණ්ඩලයේ කළුතර ප්‍රාදේශීය කාර්යාලයෙන් අපට පොල් පැළ සල්ලිවලටවත් ගන්න විධියක් නැහැ. ඒ නිසා මේ ගැන තීන්දු තීරණ අරගෙන, ඒ මිනිස්සු ධෛර්යවත් කරන්න අවස්ථාවක් ලබා දෙන්න. නිලධාරීන් හා අපි ඈත් වෙන්න හොඳ නැහැ. එම නිසා ඒ සඳහා අවස්ථාවක් ලබා දෙන්න. ඉස්සර එහෙම තිබුණා. නිලධාරීන් අප සොයාගෙන ආවා. ඔවුන් අප සොයාගෙන ඇවිල්ලා, අපි එක්ක සාකච්ඡා කළා. එහෙම පිරිසක් හිටියා. දැන් ඒගොල්ලන් විශ්‍රාම ගිහිල්ලා. ඒ අය විශ්‍රාම ගියාට පස්සේ, අලුතින් එන පරම්පරාවේ හැටිද, එහෙම නැත්නම් නිලධාරීන් නැතිකමද කියලා මම දන්නේ නැහැ, ගොවීන් හා නිලධාරීන් අතර ඒ සහසම්බන්ධය දැන් නැහැ. ඒක විශාල අඩුපාඩුවක්. මම මේ නිලධාරීන්ට කියන්නේ මෙකයි. මේවා අපි තරහට කියනවා නොවෙයි. ප්‍රායෝගික මනුස්සයෙක් වශයෙන්, මේ ප්‍රායෝගිකව තිබෙන තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. එහෙම නැතුව කිසි දවසක මේ කර්මාන්තය දියුණු කරන්න බැහැ. මම කියපු ඒ ගිනි තියපු factories ගන්න ව්‍යාපාරිකයෝ බලාගෙන ඉන්නවා. ඔබතුමන්ලා ඇවිල්ලා ඒවා ඇස්තමේන්තු කරලා, grace period එකක් දීලා, අවුරුදු පහක් ඇතුළත ඒ කර්මාන්ත පටන් අරගෙන ගෙවා ගෙන යන්න ක්‍රමයක් හැදුවොත්, කොයි තරම් කර්මාන්ත දියුණු වෙනවාද කියලා බලන්නකෝ. තේ විතරක් නොවෙයි නේ. ඒවායේ පොල් තෙල් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ආරම්භ කරන්න පුළුවන්; රබර් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ආරම්භ කරන්න පුළුවන්; කුරුඳු කර්මාන්තශාලාවක් ආරම්භ කරන්න පුළුවන්. ඒ වාගේ කොයි තරම් කර්මාන්තශාලා ආරම්භ කරන්න පුළුවන් ගොඩනැඟිලි ටිකක් මේ රට වටේම තිබෙනවාද? තවත් හැංගුණු ඒවා ඇති. මම ඊයේ-පෙරේදා තමයි, සමීක්ෂණයක් කරලා මේ තොරතුරු ටික ලබා ගත්තේ. ඒ නිසා මේ වෙලාවේදී මම අසුබවාදී කථාවක් නොවෙයි කියන්නේ. මේක තමයි ඇත්ත කථාව.

තමුන්නාන්සේලා සියලුදෙනාටම මම කියන්න කැමතියි, දැන් අපේ රටේ රබර් කර්මාන්තයට ලොකු උවදුරක් ඇවිල්ලා තිබෙන බව. දැන් යුරෝපා සංගමයේ රටවලට රබර් ආනයනය කිරීමට නොහැකි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒකට සහතිකයක් අවශ්‍ය වෙනවා. අන්න ඒ සහතිකය ආණ්ඩුව විසින් ලබා දෙන්න කටයුතු කරන්න. එහෙම නැති වුණොත් රබර් නිෂ්පාදනය කළාට පිට රට යවන්න බැරි වෙනවා. එම නිසා ඒ කාරණයත් සිහි තබා ගන්න. අනෙක් රටවල් ඒකට ලෑස්ති වෙලා තිබෙනවා. ඒකට වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මවටමින් කළ යුතු මැදිහත්වීම කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් මේ කර්මාන්තය කඩාගෙන වැටෙනවා. කොහොම කිව්වත් කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රබලව තිබුණේ රබර් කර්මාන්තය. රබර් කර්මාන්තයට දැන් subsidy එක තිබෙනවාද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. රබර් වවපු අය දැන් වවන්නේ නැහැ. මම දන්නා තරමින් ඔවුන් රබර් අක්කරයක්වත් සිටුවන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දැන් වැවිලි සමාගම් පවා රබර් වගාවෙන් ඈත් වෙලා. පෞද්ගලික ගොවියෝත් රබර් සිටුවන්නේ නැහැ. හැබැයි, රබර් වගාව හොඳයි. මොනරාගල ප්‍රදේශයේ රබර් වගාව දියුණු වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශයට දැන් පායන කාලය. දැන් අපට වැස්ස වැඩියි. අපි ඉන්නේ තෙත් කලාපයේ නේ. ඒ නිසා වැසි ආවරණ - guard - යොදාගෙන, රබර් වේළලා ඔවුන් ධෛර්යවත් කරන කාලයක් තිබුණා.

අපේ පැත්තේ ඩාර්ටන්ෆීල්ඩ් වත්ත තිබෙනවා. ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය පිහිටලා තිබෙන්නේ අපේ ප්‍රදේශයේ. හැබැයි, ඩාර්ටන්ෆීල්ඩ් වත්තේ පිහිටලා තිබෙන රබර් පර්යේෂණායතනයෙන් වැඩක් ගන්නවාද, එහෙම නැත්නම් ඒකෙන් වැඩක් කරනවාද කියන එක අපට හිතා ගන්න බැහැ. බොහොම උසස් විධියට quarters එහෙම හදාගෙන, බොහොම හොඳට ජීවත් වන කණ්ඩායමක් ඉන්නවා. නමුත්, එළියට බැහැලා ඇවිල්ලා අපේ මිනිස්සුන්ට ඒ කර්මාන්තය පිළිබඳ දැනුවත් කිරීමට ඔවුන් පෙලඹෙන්නේ නැහැ කියන එක මම කියනවා. ඒක අපට පෙනෙන දෙයක්. අපේ අගලවත්ත, මතුගම ජනතාව බලාපොරොත්තු වන සේවය එතැනින් ලැබෙන්නේ නැහැ. හැබැයි, ඒ පර්යේෂණ ආයතනය තිබෙනවා. මම දන්නා තරමින් සෑහෙන මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තමයි, ඒ කටයුතු කරගෙන යන්නේ. ලංකාව වටේම ඒ වාගේ දේවල් ඇති. විශේෂයෙන්ම අපේ ප්‍රදේශයේ පිහිටි ඩාර්ටන්ෆීල්ඩ් වත්තේ තිබෙන්නේ ලංකාවේ පළමුවැනි වතාවට පටන් ගත්ත රබර් පර්යේෂණ ආයතනය.

හැබැයි, වටේම තිබෙන රබර් ගස් ටික කපාගෙන, උගුල්ලාගෙන යනවා. ඊට පස්සේ රබර් නැහැ. මේක විය යුතු දෙයක්ද? රබර් අපනයනය කළාම අපට කොයිතරම් විදේශ විනිමයක් ගේන්න පුළුවන්ද? මේ රබර් ආශ්‍රිතව යටි භෝග වගාව දාන්නත් පුළුවන්. කොච්චර යටි භෝග වගා තිබෙනවාද? මම එහෙම යටි භෝග වගාව දාලා තිබෙනවා. මම ඒ දවස්වල රබර් වත්තේ තේ හිටෙව්වා. දැන් තේ දලු කැඩෙනවා. මම දන්නේ නැහැ, ඒක කොයිතරම් විද්‍යානුකූලද කියලා. ප්‍රායෝගිකව ගත්තොත් මට තේ අස්වැන්න ලැබෙනවා. එම නිසා ඒ වාගේ අතුරු භෝගයක් දාන්නවත් සැලැස්මක් කියලා දෙන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ මුදල් ජනතාව අතරට යන්න ඕනෑ. විශේෂයෙන් VAT එක අයින් කරලා දෙන්න. VAT එක අයින් කරලා දුන්නොත් මේ ප්‍රශ්න ඔක්කොම ඉවරයි. මම දන්නේ නැහැ, ඒකට භාණ්ඩාගාරයෙන් අවසර ලැබෙයිද, මුදල් අමාත්‍යාංශයෙන් අවසර ලැබෙයිද කියලා. විශේෂිත වූ වැවිලි ආර්ථිකයට බලපාන මේ පොහොර මිල අධික වීම අඩු නොකළොත්, වැවිලි කර්මාන්තය නැත්තටම නැති වෙනවා. වැවිලි කර්මාන්තය නැති වුණොත් අපට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේක තමයි ඇත්ත. මිනිස්සු පොහොර දාන්නේ නැහැ. අක්කරයකට පොහොර මිටි දෙකහමාරක් කලින් දැම්මත් දැන් පොහොර මිටියයි දාන්නේ. කලින් මාසයකට වතාවක් පොහොර දැම්මා නම් දැන් දාන්නේ මාස දෙකකට වතාවක්. සමහර කට්ටිය පොහොර දාන්නේම නැහැ. තිබෙන අස්වැන්න ලබාගෙන නිකම් ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඇවිල්ලා මේවා ගැන බලන්න ඕනෑ. ඔබතුමන්ලා ඇවිල්ලා මේවායේ රවුමක් යන්න. නිලධාරිනුත් එන්න; ඇවිල්ලා බලන්න. අපි වගා කරපුවා පෙන්වන්නම්. ඒවා පෙන්වූවාට පස්සේ අවශ්‍ය විසඳුම් ලබා දෙන්න. මේක මම සද්භාවයෙන් කරන ඉල්ලීමක්. ඒ නිසා මේ ඉල්ලීමට ඇහුම්කන් දෙන්න. අපි බිම් මට්ටමේ ඉන්න ගොවියෝ. ගොවියෝත් එක්ක තමයි අපි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රධාන කරුණු ටික විතරයි මම කියාගෙන ගියේ. කටුපොල් වගාව ව්‍යාප්ත කරන්න ඉඩ දෙන්න එපා. කටු පොල් අක්කර ගණනක් - හෙක්ටෙයාර 2,000 ගණනක් - වවලා තිබෙනවා; ඊටත් වඩා වවලා තිබෙනවා. ඒ හොඳටෝම ඇති, ලංකාවට. මේ කටුපොල්වලින් නිෂ්පාදනය කරන තෙල් ටික පොල් තෙල්වලට කලවම් කරලා අමුතු මිශ්‍රණයක් හදලා තමයි අපි පරිභෝජනය කරන්නේ. මේවා නිෂ්පාදනය ලංකාවේදී කරනවා. එහෙම නැත්නම් පිට රටවලට යවලා එහෙන් නිෂ්පාදනය කරලා මෙහාට එවනවා. මේක තමයි ඇත්ත. දැන් අපේ රටේ පිරිසිදු පොල් තෙල් නැහැ. මේ දෙක එකට එකතු කරන නිසා තමයි අපේ මිනිසුන්ට පිළිකා රෝග හැදෙන්නේ. එහෙම නැත්නම් හොයා ගන්න බැරි වෙනත් රෝග හැදෙන්නේ. මලයාසියාවේ තහනම් කරපු කටුපොල් වගාව තමයි

අපි මෙහේට අරගෙන ආවේ. කටුපොල් වගාව නිසා මම තරම් වේදනා විඳින පුද්ගලයෙක්, දේශපාලකයෙක් ලංකාවේ තවත් නැතුව ඇති. මට නඩුවකට මහාධිකරණයට පවා යන්න සිද්ධ වෙලා තිබෙනවා, මේ කටුපොල් වගාව නවත්වන්න කටයුතු කරලා. මට මහාධිකරණයට යන්න සිදු වුණේ මගේ පෞද්ගලික වැඩකට නොවෙයි, කුමන හෝ රජයකින් ලැබිච්ච උපදේශ ක්‍රියාත්මක කරන්න කටයුතු කළ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වෙලාවේ මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මට කථා කරන්න හැකි තරම් වෙලාව ලබා දීම පිළිබඳව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.06]

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சினுடைய வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகிறேன். இந்த அமைச்சின் விடயங்களை இரண்டு விதமாகப் பார்க்கலாம். ஒன்று, பெருந்தோட்டம் சம்பந்தமானது. அதாவது, தேயிலை, இறப்பர், தென்னை சார்ந்த விடயங்களாகும். இரண்டாவது, அந்த உற்பத்தியில் ஈடுபடுகின்ற அல்லது அந்தத் தொழிலில் ஈடுபடுகின்ற மக்களுக்கான சமூக உட்கட்டமைப்பு வசதிகள். குறிப்பாக, இவ்வளவு காலமும் ஆட்சியில் இருந்த அரசாங்கங்கள் இந்த விடயங்களைக் கையாண்ட அமைச்சுக்கு அல்லது எங்களுடைய மக்களுக்கான தேவைகளுக்கு மிகக் குறைந்தளவான நிதியையே ஒதுக்கியிருந்தது. ஆனால், எங்களுடைய அரசாங்கம் இம்முறை வரவு செலவுத் திட்டத்தினூடாக கிட்டத்தட்ட 16,738 மில்லியன் ரூபாயை ஒதுக்கி இந்த மக்களுக்கு பாரிய நன்மையைச் செய்திருக் கின்றது.

அதுமட்டுமல்லாது, பெருந்தோட்டப் பயிர்கள் மற்றும் நிறுவனங்களின் முதலீடு போன்ற துறைசார் அபிவிருத்திக்காக கிட்டத்தட்ட 8,815 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறது. மலையக மக்களின் சமூக உட்கட்டமைப்பு அபிவிருத்திக்காக 7,923 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கின்றது. வேலையற்ற இளைஞர், யுவதிகளுக்கான தொழிற் பயிற்சி, காணி உறுதிப்பத்திரம் வழங்கல் மற்றும் வீட்டு அலகுகளுக்குக் கூரைத்தகடுகள் வழங்குதல் போன்றவற்றுக்காக கிட்டத்தட்ட 1,800 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கின்றது. மலையகப் பகுதிகளிலே பாடசாலைச் சிறார்களின் சுகாதாரம், போஷாக்கு என்பவை திருப்தியற்ற நிலையில் காணப்படுகின்றது. அங்கு போஷாக்குக் குறைவான அதிகளவான மாணவர்கள் இருக் கின்றார்கள். எனவே, அவர்களின் போஷாக்கை அதிகரிப் பதற்கான பல்வேறு திட்டங்கள் இந்த வரவு செலவுத் திட்டத்தின்மூலமாக எமது அரசாங்கம் நடைமுறைப்படுத்தக் காத்திருக்கின்றது. அத்துடன், ஐந்து வயதுக்குக் குறைந்த 21,000 பிள்ளைகளின் நலன் கருதி போஷாக்கு வேலைத்திட்டத்துக்காக கிட்டத்தட்ட 650 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறோம். இந்த நிதியானது 'திரிபோஷ' திட்டத்துக்கு மேலதிகமாக ஒதுக்கப்பட்டதென்பது குறிப்பிடத் தக்க விடயமாகும்.

அடுத்து, மலையக வாழ்வியலில் மறக்க முடியாத ஒரு கறுப்புப் பக்கம் தொடர் வீடுகளாகும். அதன் அவல நிலைகளை நான் நன்கறிவேன். அங்கு வெறுமனே 120 சதுர அடிக்குள் மக்கள் முடக்கப்பட்டிருக்கின்றார்கள். இலங்கை யிலேயே மிகப் பெரிய தொடர் வீட்டைக் கொண்ட ஒரு பிரதேசம்தான் நான் வசிக்கும் காவத்தை, ஓபாவத்தை பகுதியாகும். இது 60 அறைகளைக் கொண்ட ஒரு தொடர் குடியிருப்பாகும். இங்கு வாழும் மக்களின் நிலைமையும் அவர்களின் அன்றாட வாழ்க்கையையும் நான் நன்கறிந்தவன். எனவே, தனி வீடு எவ்வளவு முக்கியமானதென எனக்கு நன்கு தெரியும். எனவே, இதற்கான தீர்வாகவே தனி வீட்டுத் திட்டம் கொண்டுவரப்பட்டுள்ளது. கடந்தகால ஆட்சியில் வழங்கப் பட்ட, நிறைவு செய்யப்படாத இந்திய அரசின் தனி வீட்டுத் திட்டத்தைப் பார்வையிட்டபோது, எவ்வளவு மோசமான கட்டுமானப் பணிகள், அரசியல் தலையீடுகள், பயனாளி களைத் தெரிவுசெய்ததில் ஏற்பட்ட பிழைகள், முழுமையாக நிறைவு செய்யப்படாத உட்கட்டமைப்பு வசதிகள் எனப் பல்வேறு குளறுபடிகளை அவதானித்தோம். அவற்றைக் களைந்து, மலையக மக்களின் தனி வீடு மற்றும் காணிப் பிரச்சினையைத் தீர்ப்பதற்காக இந்திய அரசின் 10,000 வீட்டுத் திட்ட உதவியுடன் இலங்கை அரசும் 4,267 மில்லியன் ரூபாயை இம்முறை ஒதுக்கியிருக்கின்றது. இதன்மூலம் கிட்டத்தட்ட 4,700 புதிய வீடுகளின் கட்டுமானப் பணிகளை ஆரம்பிப்பதுடன், 1,300 வீடுகளை முழுமையாகப் பூர்த்தி செய்வதற்கான சவாலையும் நாங்கள் ஏற்றிருக்கிறோம். அந்த வகையில், இந்த வருடத்துக்குள் மொத்தமாக 6,000 வீடுகளைக் கட்டி முடிப்பதற்கு உத்தேசித்துள்ளோம். இலங்கை வரலாற்றிலே மலையகத் தமிழ் மக்களுக்கு மிக அதிகமான வீடுகள் இம்முறைதான் கட்டப்பட இருக்கின்றதென்பதை நான் இந்த நேரத்திலே கூறிக்கொள்ள விரும்புகிறேன்.

அடுத்து, பெருந்தோட்டப் பிராந்தியத்திற்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபையை - NEVIDA - மீள உயிரூட்டுவதற்காகவும், சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றத்தின் அபிவிருத்திக்காகவும் 417 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறோம். இதனூடாக மலையக வேலையற்ற இளைஞர், யுவதிகளுக்குப் புதிய தொழிற் பயிற்சிகளை வழங்குவதோடு, அவர்களது கற்கைநெறியைச் சர்வதேச மட்டத்துக்குக் கொண்டுசெல்வதற்கான திட்டங் களையும் தீட்டியிருக்கின்றோம். இதனைக் கூர்ந்து அவதானிக்கும்போது, கடந்த காலங்களைவிடத் தற்போதைய எமது அரசாங்கம் சுமார் 2,800 மில்லியன் ரூபாய்க்கும் மேலதிகமான நிதியை எமது மலையக உறவுகளுக்காக ஒதுக்கி யிருப்பதை எண்ணி நாங்கள் மகிழ்ச்சியடைகின்றோம்.

மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற கலை, கலாசார, பாரம்பரிய அம்சங்களை அடக்கிய கற்றைநெறி பல்கலைக்கழகங்களில் பாடமாக்கப்பட்டு, அவற்றுக்கான விசேட பட்டங்கள் வழங்கப்பட வேண்டும். இதற்காகத் தேசிய பல்கலைக்கழகங்களைக் கலாசார நிலையங்களுடன் இணைப்புச் செய்து, அதற்குரிய விசேட பட்டங்களை வழங்கு வதற்கு நாங்கள் திட்டங்களைத் தீட்டியிருக்கின்றோம். அந்த வகையில், இறம்பொடை கலாசார மண்டபம், நோர்வூட் மைதானம் என்பனவற்றை நவீன மயப்படுத்தி மலையகச் சொந்தங்களுக்குப் பயனுள்ள இடங்களாகவும் களங்களாகவும் மாற்றியமைப்பதற்கான வழிவகைகளைச் செய்து வருகின்றோம்.

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

මලையகத்தில் கணிதம், விஞ்ஞானம் மற்றும் தகவல் தொழில்நுட்பப் பாட ஆசிரியர்களுக்கான விசேட பயிற்சிகளை வழங்குவதற்கும் நாங்கள் தீர்மானித்திருக்கின்றோம். மேலும், பாடசாலைகளில் இன்னும் முழுமையாகத் தீர்வு காணப்படாத பிரச்சினையாக குடிநீர் மற்றும் மலசலகூடம் இன்மை நிலவுகின்றது. இதனைத் தீர்ப்பதற்கும் நாங்கள் நடவடிக்கை மேற்கொள்வோம். அத்துடன், 800க்கும் மேற்பட்ட பாடசாலை களுக்குக் காணிகள் உள்ளபோதிலும் அந்தக் காணிகளுக்கான உறுதிப்பத்திரம் இதுவரைக்கும் வழங்கப்படவில்லை. எனவே, மிக விரைவிலே மலையகப் பகுதியில் இருக்கின்ற பாடசாலைகளுக்குக் காணி உரிமை வழங்கப்படும் என்பதை நாங்கள் கூறிக்கொள்ள விரும்புகின்றோம்.

இயற்கை அனர்த்தங்களினால் மலையக மக்களின் வீடுகளுக்கு ஏற்படும் சேதங்களுக்கு நிவாரண நிதியாக வெறுமனே பத்தாயிரம் ரூபாய்தான் வழங்கப்படுகின்றது. எனவே, நாங்கள் சட்டங்களை மாற்றி, ஏனைய மக்களுக்குக் கிடைக்கின்ற அளவான தொகையை அந்த மக்களுக்கும் வழங்குவதற்கு ஏற்பாடு செய்யத் தீர்மானித்துள்ளோம். மேலும், மலையகப் பகுதிகளில் குப்பைகளை அகற்றுவதற்கான முறையான வேலைத்திட்டங்கள் இன்னும் கிடையாது. இதனால் மக்கள் சுகாதார ரீதியாகப் பல்வேறுபட்ட அசௌகரி யங்களை எதிர்கொள்கின்றார்கள். எனவே, முறையாகக் குப்பைகளை அகற்றும் திட்டங்களை நாங்கள் நடைமுறைப் படுத்தத் தீர்மானித்திருக்கின்றோம்.

பெருந்தோட்டங்களை மையமாகக்கொண்டு இயங்கி வருகின்ற மற்றும் மூடப்பட்ட தோட்ட வைத்தியசாலைகளை அரசின் கீழ்க் கொண்டுவருவதற்கான முயற்சிகள் மேற் கொள்ளப்பட்டு வருகின்றன. இதனூடாக வைத்தியசாலைகள் ஒவ்வொரு பிரதேசங்களின் தேவையை அறிந்து செயலாற்றக் கூடிய நிலை ஏற்படும். உதாரணமாக, நான் இருக்கும் காவத்தை, ஓபாவத்தை பகுதியிலுள்ள தோட்டங்களில் இருக்கின்ற மக்களுக்கும் அந்தக் கிராமத்தில் இருக்கின்ற சிங்கள மக்களுக்கும் மிகவும் பயனுள்ளதாக இருந்த வைத்தியசாலை இன்று விசேட அதிரடிப்படை முகாமாக மாற்றப்பட்டு, மூடப்பட்டிருக்கின்றது. இவ்வாறான வைத்திய சாலைகளை உடனடியாக அரசு பொறுப்பேற்று, அங்கு MBBS வைத்தியரை நியமித்து மக்களுக்குச் சேவையாற்ற வேண்டும். எனவே, இந்த வருடத்திற்குள் அதையும் நாங்கள் செய்து முடிக்க எண்ணியுள்ளோம் என்பதையும் கூறிக்கொள்ள விரும்புகின்றோம்.

மலையகத்தில் மூடப்பட்ட மற்றும் மூடும் நிலைமைகளில் காணப்படும் சிறுவர் முன்பள்ளி நிலையங்களைப் புனர் நிர்மாணம் செய்து இயங்குநிலைக்குக் கொண்டுவரவுள்ளோம். அதுமட்டுமல்லாது, ஏற்றுமதி வருமானத்திற்குப் பங்களிப்புச் செய்யும் எமது மலையகத் தாய்மார்கள் ஓய்வெடுக்கும் இடங்களில் குடிநீர் மற்றும் மலசலகூட வசதிகளை அமைப் பதற்கான திட்டமிடல் ஆலோசனைகளை மேற்கொண்டு வருகின்றோம்.

மலையகத்தில் பாதை அபிவிருத்தி ஒரு முக்கிய தேவையாக உள்ளது. அதேபோன்று வீதி, மின்சாரம் ஆகிய முக்கிய தேவைகளையும் இந்த நிதி ஒதுக்கீட்டின் ஊடாக மக்களுக்கு நாங்கள் செய்யவிருக்கின்றோம். மாகாண சபையின் நிதி ஒதுக்கீட்டிலும் வீதி அபிவிருத்தி அதிகாரசபையின் நிதி ஒதுக்கீட்டிலும் மலையகப் போக்குவரத்துப் பாதைகளை அபிவிருத்தி செய்வதற்கான நிதி ஒதுக்கீடுகள் இடம் பெற்றுள்ளன. இருப்பினும், இனிவரும் காலங்களில் இதன் தேவையறிந்து போக்குவரத்துப் பாதைகள் மேலும் விருத்தி செய்யப்படும்.

சொந்த வீட்டில் வாழ வேண்டுமென்ற எண்ணம் மலையகத் தமிழ் மக்களின் ஏக்கமாகும். அதனை நிறைவேற்றுவதற்காக எத்தனையோ தாய், தந்தை மற்றும் சகோதர, சகோதரிகள் கொழும்பிலும் வேறு பிரதேசங்களிலும், ஏன் வெளிநாடு களிலும்கூட வேலை செய்கின்றார்கள். இவர்களது கடின உழைப்பால் கட்டப்பட்ட எத்தனையோ வீடுகளுக்குக் காணி உறுதி கிடையாது. அதனைப் பெற்றுத்தருவதிலும், அதேவேளை தொடர் குடியிருப்புகளில் வாழும் அரச உத்தியோகத்தர்களுக்குத் தனிக்குடியிருப்புகளைப் பெற்றுத் தருவதிலும் அக்கறை செலுத்தி வருகின்றோம். அதாவது, இன்று மலையகப் பகுதிகளிலே மக்களால் அவர்களுடைய சொந்த உழைப்பிலே கட்டப்பட்ட வீடுகள் தொடர்பில் சிலநேரம் தோட்ட நிருவாகம் அவர்களுக்கு எதிராக வழக்குத் தாக்கல்செய்து அந்த வீடுகளை எடுத்துக்கொள்கின்ற நிலை காணப்படுகின்றது. இது அந்த மக்களுக்கு இழைக்கப் படுகின்ற பாரிய அநீதியாகும். கேட்டால், அத்துமீறி வீடு கட்டியதாகக் கூறுகிறார்கள். எனவே, அந்த மக்கள் கட்டிய வீட்டை அவர்களுக்குச் சொந்தமாக வழங்க வேண்டும் என்பது எமது குறிக்கோளாகும். நிச்சயமாக அதையும் நாங்கள் செய்வோம் என்று கூறிக்கொள்ள விரும்புகின்றோம்.

அதுமட்டுமல்ல, மலையகத்தில் குடிநீர் 80 சதவீதம் இருக்கின்றது எனப் புள்ளிவிபரங்களில் காட்டப்பட்டாலும், தொற்றுநீக்கிய சுத்தமான - சுத்திகரிக்கப்பட்ட - குடிநீர் கிடைப்பது பேரிழிவாகக் காணப்படுகின்றது. மலையகம் என்று சொன்னால், அது நீர் வளம் பொருந்திய பிரதேசம். ஆனால், அந்த மலையக மக்கள் குடிப்பதற்குச் சுத்தமான நீரைப் பெற்றுக்கொள்வதில் இடர்படுகிறார்கள். அவர்கள் அசுத்தமான நீரை அருந்துவதன் காரணமாகப் பல்வேறுபட்ட நோய்த் தொற்றுகளுக்குள்ளாகி, சுகாதார ரீதியாகப் பாதிக்கப் படுவதை நாங்கள் அவதானித்திருக்கின்றோம். அங்குள்ள 50 சதவீதமான பாடசாலைகளுக்குக் குடிநீர் வசதியில்லை. உலக வங்கி கிட்டத்தட்ட 80 கோடி ரூபாய் செலவில் கட்டிடங் களைக் கட்டிக் கொடுத்தாலும், அங்கு இதுவரைக்கும் நீர் வசதி வழங்கப்படாமையை இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அதுமட்டுமல்லாது, முறையான தொலைத்தொடர்பு வசதி அங்கு காணப்படவில்லை. அஞ்சல் வலையமைப்பு மலையகத்தில் எட்டாக்கனியாகவே இருக்கின்றது. இன்று Ceylon Tea' என்ற வர்த்தக நாமம் எல்லோருக்கும் தெரியும். 'Ceylon Tea' ஊடாக இலங்கையை உலகத்திற்கு அறிமுகம் செய்தவர்கள் எமது மலையகத் தமிழ் மக்கள். ஆனால், இவர்களுக்கு ஒரு கடிதம் சென்றடைவதற்கு இதுவரைக்கும் ஒரு முகவரி வழங்கப்படவில்லை. எனவே, நாங்கள் அவர்களுக்கு Clean Sri Lanka ஊடாக ஒரு முகவரியை வழங்குவதற்குத் தீர்மானித்திருக்கிறோம். இது அந்த மக்களுக்குக் கிடைத்த மிகப்பெரிய வெற்றியாகும் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மலையகத்தில் 525 தோட்ட வைத்தியசாலைகள் காணப் பட்டபோதும், தற்போது பல வைத்தியசாலைகள் இழுத்து மூடப்பட்டிருப்பதை நாங்கள் அவதானித்திருக்கின்றோம். கிட்டத்தட்ட மொத்தமாக 10,000 படுக்கைகளைக் கொண்ட வைத்தியசாலைகள் மலையகத்தில் இருந்தன. இன்று தனியார் மயப்படுத்தப்பட்ட பிறகு அவை எங்கு சென்றதென்று யாருக்கும் தெரியாது. மேலும், பிரசவத்திற்கு ஏற்ற வைத்திய சாலைகள் தோட்டப் பிரதேசங்களில் காணப்படுவதில்லை.

தோட்டப்புறங்களில் பட்டம்பெற்ற வைத்தியர்களும் இல்லை. கிளங்கன் வைத்தியசாலையில் 275 தாதியர் வெற்றிடங்கள் காணப்படுகின்றன. மலையகத்தில் குள்ளமாதல் எண்ணிக்கை அதிகரித்தே செல்கின்றது. அது கிட்டத்தட்ட 44 சதவீதமாகும். தற்கொலை, வலதுகுறைவு, பட்டினி போன்றன அதிகம் நிறைந்த இடமாக எமது மலையகம் காணப்படுகின்றது. இப்படியான நிலையில், ஒவ்வொரு நிமிடத்திலும் மலையகம் வாழ் மக்களைப்பற்றிக் கூறுவதற்கு எண்ணிலடங்காத விடயங்களும் தீர்வுகாணப்படாத பல பிரச்சினைகளும் காணப்படுகின்றன. எனவே, இவை தொடர்பில் தேசிய மக்கள் சக்தி அரசு தீவிரமாகக் கவனம் செலுத்தி வருவதோடு, அவற்றுக்கான தீர்வுகளையும் கட்டங்கட்டமாகப் பெற்றுத் தருவதற்கு எத்தனிக்கின்றோம்.

வடக்கு, கிழக்குப் பகுதிகளை எடுத்துக்கொண்டால், கடந்த காலங்களில் அந்த மக்களுடைய வருமானத்திற்கு மிக முக்கியமாகக் காணப்பட்டது பனை மரம். பனை என்பது விசேடமாகத் தமிழர்களுடைய ஓர் அடையாளமாகக் காணப்படுகின்றது. யுத்த காலங்களிலே பல இலட்சம் பனை மரங்கள் அங்கே சேதமாக்கப்பட்டன. இன்று வடக்கு, கிழக்கிலே கிட்டத்தட்ட 15 மில்லியன் பனை மரங்கள் காணப்படுகின்றன. இந்தப் பனை உற்பத்திகளினூடாக நாங்கள் அதிக வருவாயை இலங்கைக்குக் கொண்டு வருவதற்குத் திட்டமிட்டிருக்கின்றோம். அதாவது, புலம்பெயர்ந்த இலங்கையர்கள் இந்தப் பனை உற்பத்தியிலே முதலீடு செய்வதற்குப் பல்வேறுபட்ட பேச்சுவார்த்தைகளில் ஈடுபட்டிருக்கிறார்கள். தேயிலை, இறப்பர், தென்னை போன்று பனையினூடாகவும் இந்த நாட்டுக்கு அதிக வருவாயைக் கொண்டுவருவதற்கு இந்த அரசாங்கம் திட்டமிட்டிருக்கின்றது.

இறுதியாக நான் ஒன்றைக் கூறிக்கொள்ள விரும்பு கின்றேன். எதிர்க்கட்சியினர் பேசவேண்டும் என்பதற்காகச் சில விடயங்களை இன்று பேசிக்கொண்டிருக்கின்றனர். இனவாதத்தையும் மதவாதத்தையும் நாட்டு மக்கள் முற்றாகத் துடைத்தெறிந்த நிலையில், ஒருசிலர் ஓர் இனத்தைப் புண்படுத்தும் வகையிலே இன்றும் பேசிக்கொண்டிருப்பது உண்மையில் மக்களுக்கு எதிரான அரசியல் என்று நாங்கள் கூறுகின்றோம். அவர்கள் இனவாதத்தையும் மத வாதத்தையும் தூண்டிவிட்டு மறுபடியும் ஆட்சியைக் கைப்பற்றலாம் என்று நினைக்கின்றார்கள். இலங்கையில் இது இனி ஒருநாளும் நடக்காது! அந்த அரசியல் கலாசாரத்தை இந்த நாட்டு மக்கள் மாற்றியிருக்கிறார்கள். எனவே, எதிர்க்கட்சி யினர் தங்களுடைய நிலைகளைப் புரிந்துகொண்டு செயற்பட வேண்டுமென்று கூறிக்கொண்டு, சந்தர்ப்பமளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Mohamed Sali Naleem. You have 14 minutes.

[பி.ப. 4.21]

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் நடைபெறுகின்ற Ministry of Plantation and Community Infrastructureஇன் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமைக்கு முதலில் இறைவனுக்கு நன்றி கூறுகின்றேன்.

எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தில் மட்டுமல்ல, முழு நாட்டிலும் 'கஜு' உற்பத்தியில் கணிசமான பங்களிப்பை வழங்கிய ஊர்தான் எங்களுடைய ஏறாவூர். 'கஜு' என்றாலே ஏறாவூர் என்றுதான் சொல்வார்கள். ஏறாவூரில் மரமுந்திரிகை மரங்களில் ஏற்படுகின்ற பல்வேறு விதமான நோய்களைத் தடுப்பதற்கான நடவடிக்கைகளைச் சம்பந்தப்பட்ட திணைக்களங்கள் மேற்கொள்ளாததன் காரணத்தால், அவை நாளடைவில் அழிவடைந்து, அந்தப் பிரதேசத்திலுள்ள பிள்ளைகள் 'கஜு' என்றால் என்னவென்று கேட்டும் அளவுக்கு நிலைமை மாற்றமடைந்து செல்கின்றது. இந்த அரசாங்கம் 'கஜு' உற்பத்தியை மேம்படுத்துவதற்கான உள்ளீடுகள் மற்றும் மரக்கன்றுகளை வழங்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். 25,000 மெற்றிக்தொன் 'கஜு' தேவையாக இருக்கின்ற இந்தக் காலகட்டத்தில், 10,000 மெற்றிக்தொன் 'கஜு'தான் இலங்கையின் அனைத்து மாவட்டங்களிலிருந்தும் உற்பத்தி செய்யப்படுகின்றது. நாங்கள் கிட்டத்தட்ட 15,000 மெற்றிக்தொன் 'கஜு'வை தன்சானியா போன்ற நாடுகளிலிருந்து இறக்குமதி செய்கின்றோம். எனவே, நீங்கள் 'கஜு' உற்பத்திக்கு முன்னுரிமை வழங்கி, அதற்கான நிதி உதவிகளை வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கடந்த காலங்களில் குறிப்பிட்ட ஒரு சிலருக்குத்தான் 'கஜு' இறக்குமதிக்கான அனுமதிப்பத்திரங்கள் வழங்கப்பட்டு இருந்தன. இதனால் 'கஜு' சார்ந்த சிறு சிறு வியாபாரங்களை மேற்கொள்கின்ற வர்கள் பாரிய அசௌகரியங்களைச் சந்திக்கின்றார்கள். 'கஜு'வை இறக்குமதி செய்கின்றவர்கள் பாரிய இலாபத்தின் அடிப்படையில்தான் இவ்வாறான சிறிய வியாபாரிகளுக்கு 'கஜு'வை வழங்குகின்றார்கள். எனவே, இதனை நிவர்த்தி செய்வதற்கு உரிய நடவடிக்கைகளை மேற்கொள்ளுமாறு வேண்டிக் கொள்கின்றேன்.

எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தில் வெள்ளப் பெருக்கு ஏற்படுகின்ற ஒவ்வொரு முறையும் பல்லாயிரக் கணக்கான ஏக்கர் விவசாய நிலங்கள் பாதிக்கப்படுகின்றன. இதனால் ஏழை விவசாயிகளின் உற்பத்திகள் அழிவடைந்து, அவர்களுடைய பொருளாதாரம் கேள்விக்குறியாக்கப்பட்டு, அவர்கள் விவசாயத்தைக் கைவிடுமளவுக்கு நிலைமை மாறுகின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பிரான்ஸ் நாட்டின் நிதி உதவியின்கீழ் - AFD வங்கியினூடாக சுமார் 150 மில்லியன் யூரோவும் மானியமாக 12 மில்லியன் யூரோவும் என மொத்தமாக 162 மில்லியன் யூரோ நிதி உதவியின்கீழ் - மேற்கொள்ளப்படும் முந்தனை ஆறு ஆற்றுப்படுக்கை அபிவிருத்தி வேலைத்திட்டம் மூலமாக - கித்துள், றூகம் குளங்களின் இணைப்பு மூலமாக - மகோயாவில் 80 MCM அளவிலானதொரு குளத்தை உருவாக்கும் பாரிய அபிவிருத்தி வேலைத்திட்டம் முன்னெடுக் கப்பட்டது. அதற்கான Feasibility Study Report தயாரிக்கப்பட்டுள்ள நிலையில், தற்பொழுது அந்தத் திட்டம் இடைநிறுத்தப்பட்டுள்ளது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயத்தை உடனடியாகக் கவனத்திலெடுத்து, அந்த வேலைத்திட்டத்தை முன்னெடுக்குமாறு நான் இந்த உயரிய சபையில் வேண்டிக் கொள்கின்றேன். இந்தத் திட்டம் நிறைவேறுமாக இருந்தால், எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தில் மேலதிகமாக சுமார் 18,000 ஏக்கர் காணியில் விவசாயம் செய்ய முடியும்; அந்தப் பிரதேசத்தை வெள்ள

[ගරු මොහමඩ් සාලි නලීම් මහතා]

අනර්த்தத்திலிருந்து பாதுகாக்க முடியும்; மீனவர்களுடைய வாழ்வாதாரத்தை மேம்படுத்த முடியும்; மட்டக்களப்பு மாவட்டத்தின் ஒட்டுமொத்த குடிநீர் தேவையையும் பூர்த்தி செய்ய முடியும்; நெல் உற்பத்தியை அதிகரித்து, அதனூடாகத் தேசிய வருமானத்தை அதிகரித்து, இந்த நாட்டில் பாரிய அபிவிருத்திப் பணிகளை மேற்கொள்ள முடியும். எனவே, நீங்கள் இதனைக் கருத்திற்கொண்டு இந்தத் திட்டத்தை அவசரமாகச் செயற்படுத்த வேண்டுமென வேண்டிக் கொள்கின்றேன்.

ஏறாவூர் ஆதார வைத்தியசாலையிலும் ஆயுர்வேத வைத்தியசாலையிலும் பல்வேறு குறைபாடுகள் இருக்கின்றன. கடந்த 2-3 வருட காலமாக ஆயுர்வேத வைத்தியசாலையில் acupuncture சேவை இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. அதனைத் தொடர்ந்தும் முன்னெடுப்பதற்குரிய நடவடிக்கை களை எடுக்குமாறு நான் அந்த மக்கள் சார்பாக வேண்டிக் கொள்கின்றேன். கடந்த காலங்களில் நான் இந்தச் சபையில் அபிவிருத்தி சார்ந்த பல கோரிக்கைகளை முன்வைத்தேன். அவற்றில் சில நிறைவேற்றப்பட்டு இருக்கின்றன. உதாரணத்துக்கு, ஏறாவூர் ஆதார வைத்தியசாலைக்கான generator வழங்கப்பட்டு இருக்கிறது. மீராகேணி வீதி புனரமைக்கப்பட்டு இருக்கிறது. இவ்வாறு பல விடயங்கள் நிறைவேற்றப்பட்டு இருக்கின்றன. அதற்காக நான் இந்த அரசாங்கத்துக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நான் இங்கு இன்னும் சில கோரிக்கைகளை விடுக்க விரும்புகின்றேன். ஏறாவூர் பிரதான வீதி மற்றும் காதியார் வீதி புனரமைப்புச் செய்யப்பட வேண்டும். அதேபோல், ஏறாவூர் வைத்தியசாலையிலுள்ள குறைபாடுகள் தீர்க்கப்பட வேண்டும். மேலும், ஏறாவூர் அலிகார் பாடசாலையின் காணிப் பிரச்சினை, எல்லை நிர்ணயப் பிரச்சினை, மஜ்மாநகர் யானை வேலிப் பிரச்சினை, மிச்சிநகர் காணி எல்லைப் பிரச்சினை என்பனவும் தீர்க்கப்பட வேண்டும். அதேபோல், சுமார் 40 வருடங்களாக காணி உறுதி இல்லாமல் அவதிப்படுகின்ற மீராகேணி மக்களுடைய பிரச்சினை தீர்க்கப்பட வேண்டும். மீராகேணியில் ஆரம்ப சிகிச்சை நிலையமாகக் காணப் படுகின்ற வைத்தியசாலை சகல வசதிகளுடன்கூடிய ஒரு வைத்தியசாலையாகத் தரமுயர்த்தப்பட வேண்டும். 'அந்நூர் சொ ிட்டி'யினால் கட்டப்பட்ட வீடுகளுக்கான மின் இணைப்பு, குடிநீர் வசதி என்பன ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டும்.

என்னை நம்பி கட்சியின் தலைமையால் ஒப்படைக்கப்பட்ட தேசிய ரீதியான பொறுப்பை, எனக்கு அங்கீகாரம் வழங்கிய எனது மண்ணின் மக்களுக்கும் கட்சிக்கும் சமர்ப்பணம் செய்த ஒரு வரலாற்றுச் செயலை நான் இந்த உயரிய சபையில் நிறைவேற்றிய பெருமையுடன், எனது பாராளுமன்ற உறுப்பினர் பதவியை இராஜினாமா செய்கின்றேன். பதவியைத் தக்கவைக்கவும் தன்னை நிலைநிறுத்தவும் விசுவாசத்தையும் நம்பிக்கையையும் காற்றிலே பறக்கவிட்டு, அற்ப சலுகைகளை எதிர்பார்த்து, கட்சிக்கும் பிறந்த மண்ணுக்கும் வாக்களித்த மக்களுக்கும் தலைகுனிவை உண்டாக்கியோர் வரிசையில் சேராது, எடுத்த அமானிதத்தைச் சரிவர நிறைவேற்றிய மக்கள் பிரதிநிதியாகத் தலை நிமிர்ந்து இந்த உயர் சபையிலிருந்து விடைபெறுகின்றேன். *அல்ஹம்துலில்லாஹ்!*

பதவி, பணம், அற்ப சலுகை என்பன ஓர் உறுதியான அரசியல் கொள்கை, நேர்மை, ஊழல் சுரண்டலற்ற தெளிவான பாதையைக் கொண்டவனுக்குத் தேவையற்றவை. நான் எனது மாவட்ட மக்களுக்கும் தேசிய ரீதியில் முஸ்லிம் சமூகத்துக்கும் சிறந்ததொரு செய்தியைச் சொல்லியிருக்கிறேன். அரசியல் பதவிகள்மூலம் கிடைக்கும் ஊதியம், சலுகைகள் என்பன என்னை அங்கீகரித்த மக்களுக்கு உரித்தான ஒன்றாகும். அதனைத் துளியளவும் எனக்காகப் பயன்படுத்தாமல் மக்களுக்கு வழங்கும் நடைமுறையை 2018ஆம் ஆண்டு உள்ளூராட்சி மன்றப் பிரதிநிதியாக ஏறாவூர் நகர சபையில் முன்னெடுத்து, இன்று ஒரு பாராளுமன்ற உறுப்பினராகவும் இருந்து அதனை நடைமுறைப்படுத்தி இருக்கின்றேன். பாராளுமன்ற உறுப்பினராகப் பதவி வகித்த 3 மாத காலப்பகுதியில் கொடுப்பனவாகப் பெற்றுக்கொண்ட 7 1/2 இலட்சம் ரூபாயையும் எனக்கு வாக்களித்த மக்களுக்காக நான் பகிர்ந்தளித்திருக்கின்றேன். *அல்ஹம்துலில்லாஹ்!*

என்னுடைய தேசியத் தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்கள், கட்சியின் செயலாளர், அதியுயர்பீட உறுப்பினர்கள் மற்றும் பிரதித் தலைவர்கள் உட்பட அனைவருக்கும் நான் இந்த இடத்தில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். ஏனெனில், தேசியப்பட்டியல் ஊடான பாராளுமன்றப் பிரதிநிதித்துவத்தை எனது மண் சார்பாகவோ, நான் சார்பாகவோ யாருமே கேட்காத நிலையில், என்மீது நம்பிக்கை கொண்டு அவர்கள் எனக்குத் தந்தார்கள். கடந்த காலங்களில் எங்களுடைய கட்சி சார்பாக அளிக்கப்பட்ட அபரிமிதமான வாக்குகள் மூலம் பாராளுமன்றப் பிரதிநிதித் துவத்தைப் பெற்றுகொண்டு, கட்சியால் கௌரவிக்கப்பட்டு, உயர்நிலையில் வைக்கப்பட்டு பின்னர் கட்சிக்குத் துரோகம் செய்துவிட்டு பிழையான கருத்துகளைக் கூறி மக்களைப் பிழையாக வழிநடத்தியவர்களின் வரிசையில் சேர்ந்து விடாமல், கட்சிக் கொள்கையை ஏற்றுக்கொண்டவன் என்ற அடிப்படையில், தலைமைத்துவம் என்மீது கொண்டிருந்த நம்பிக்கைக்கேற்ப எனக்குத் தந்த பாராளுமன்றப் பிரதிநிதித் துவத்தை நான் ஒருபோதும் கட்சிக்குத் துரோகம் செய்யும் வகையில் பயன்படுத்தியதில்லை.

கடந்த காலத்தில் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் வழங்கிய பாராளுமன்றப் பிரதிநிதித்துவத்தின் மூலமாக கட்சிக்குத் துரோகம் செய்தவர்கள் இருக்கையில், அந்தப் பழியைத் துடைத்தெறிபவனாக, கட்சிக்கு விசுவாசமுள்ளவனாக, கட்சியால் வழங்கப்பட்ட பாராளுமன்றப் பிரதிநிதித்துவத்தை கட்சி கேட்கின்ற நேரத்தில் கொடுப்பவனாக, கட்சியால் எடுக்கப்படுகின்ற அனைத்து நடவடிக்கைகளுக்கும் தலைசாய்த்தவனாக நான் இந்தப் பாராளுமன்றப் பிரதிநிதித் துவத்தை மீளவும் கட்சியிடம் ஒப்படைக்கும் வகையில் என்னுடைய பதவியை இராஜினாமா செய்கின்றேன். என்னுடைய கட்சி வேண்டிக்கொண்டதற்கு இணங்க, அக்கட்சி சார்பாக எதிர்வரும் உள்ளூராட்சி மன்றத் தேர்தலில் ஏறாவூர் நகர சபைக்கான ஒரு வேட்பாளராக நான் நிற்பேன். *இன்ஷா அல்லாஹ்!* என்னுடைய ஏறாவூர் மக்கள் ஒருபோதும் இந்தக் கட்சிக்கு துரோகம் செய்ய மாட்டார்கள் என்றும் அவர்கள் இந்தக் கட்சிக்காக என்றுமே கடமைப்பட்டவர்கள் என்றும் அவர்கள் இந்தக் கட்சிக்கு வெற்றியைப் பெற்றுத் தருவார்கள் என்றும் கூறி, இந்தப் பாராளுமன்றத்திலிருந்து இன்றுமுதல் விடைபெறுகின்றேன். *வஸ்ஸலாம்!*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය. ඔබතුමියට මිනිත්තු 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.33]

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ අවස්ථාව ලබා ගත්තේ අනුරාධපුර රෝහලේ වෛද්‍යවරියකට සිදුවූ ලිංගික හිංසනය සම්බන්ධව, කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩකාරී අපරාධ සම්බන්ධව මගේ අදහස් දැක්වීමටයි. අපි ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් හැටියටත්, රජය හැටියටත් -ආණ්ඩුව හැටියටත්- මේ සිදුවීම දැඩි ලෙස හෙළා දකිනවා. මේ විධියේ හිංසාකාරී අපරාධ කිසිම ගැහැනියකට සිදු නොවිය යුතු බව අපි ඉතාම දැඩිව විශ්වාස කරනවා. ඒ වාගේම කාන්තාවන් සහ දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා ඉතාම වගකීම් සහගතව කටයුතු කරන දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි මේ සිදුවීම කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ. අපි විශේෂයෙන්ම මේ අවස්ථාවේ කියන්න ඕනෑ, අපි ඒ වෛද්‍යවරිය කිසිසේත්ම තනිකරලා නැහැ කියලා. අපි එතුමියත් එක්ක ඉන්නවා. පක්ෂයක් හැටියටත්, විශේෂයෙන් මේ පාර්ලිමේන්තුවේ කාන්තාවන් හැටියටත් අපි මේ සිදුවීමට දැඩිව අපේ විරෝධය ප්‍රකාශ කරනවා. මේ සිදුවීම වෙනුවෙන් අපට ගන්න පුළුවන් උපරිම ක්‍රියාමාර්ග අපි ගන්නවා. ඒ අපරාධකරුවා සොයා යෑමේ සිට ඇයට යුක්තිය ඉෂ්ඨ කර දීම දක්වා වන අඛණ්ඩ ක්‍රියාවලියේදී අපි ඇයත් එක්ක හරි හරියට ඉන්නවා. තවදුරටත් මේ රටේ කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් අපි පෙනී ඉන්නවා. ඇය මේ අපරාධයට ලක් වෙන්නේ ඇය යම් කිසි විශේෂිත ව්‍යක්තියක් නියෝජනය කරන නිසා නොවෙයි, ඇත්තටම ඇය ජීව විද්‍යාත්මකව ගැහැනියක් නිසායි. ඇය මෙවැනි ලිංගික හිංසනයකට ලක් වෙන්නේ ඇයගේ ජීව විද්‍යාත්මක ස්ත්‍රීත්වය නිසායි. ඇයට සිදුවූ හිංසනය වාගේම, සේයා සදෙව්මී දියණිය, මීගමුව රෝහලේ මිය ගිය කාන්තාව, විද්‍යා සිවලෝගනාදන් දැරිය වැනි එදා සිට අද වනවතුරු නොයෙක් ආකාරයේ හිංසනවලට හා අපරාධවලට ලක් වෙච්ච කාන්තාවන් පිළිබඳවත් අපි කථා කරලා තිබෙනවා.

ඒ වාගේම ලිංගික හිංසනයකින් පසුව මරා දමන ලද සිදුවීම් තිබෙනවා. පසුගිය කාල පරාසය තුළ නිවසක ගෘහ සේවය සඳහා පැමිණ මියගිය ඉෂාලිනි දැරිය වෙනුවෙන්, රාජකුමාරි කියන කාන්තාව වෙනුවෙන්, කොළඹ නගරයේ ගෘහ සේවය සඳහා පැමිණ පහරදීමෙන් මිය ගිය කාන්තාවන් -මේ සියලු දෙනා- වෙනුවෙන් අපි පෙනී සිට තිබෙනවා; කථා කර තිබෙනවා. මේ හැම කෙනාටම යුක්තිය අවශ්‍යයි. ඒ යුක්තිය ගැන කථා කරන්න, ඒ සාධාරණය ඉල්ලන්න අපි මේකත් තවත් අවස්ථාවක් කර ගන්න ඕනෑ. දිනෙන් දින, අතෝරක් නැතිව මේ ලැයිස්තුවට දිගින් දිගටම එකතු වෙනවා. ඒ ලැයිස්තුවට අද ඒ වෛද්‍යවරිය එකතු වුණා වාගේම, අපි ඒ ගැන කථා බහට ලක් කරනවා වාගේම හෙට දවසේ තවත් කාන්තාවකට, ස්ත්‍රියකට මේ දේ සිද්ධ වෙන්න පුළුවන්. ඒත් යුක්තිය ඉල්ලා සිටීමට තිබෙන අයිතිය අපි කිසිම හේතුවක් මත නැති කර ගන්නේ නැහැ.

ඒ වාගේම, මේ අපරාධයෙන් පස්සේ මේ සිද්ධිය මාධ්‍ය වාර්තා කරපු ආකාරය පිළිබඳව, එහෙම නැත්නම් අපරාධ වාර්තාකරණය පිළිබඳව අපට තිබෙන්නේ දැඩි කනස්සල්ලක් වාගේම පිළිකුළක්. සමහර මාධ්‍යවලින් මේ අපරාධය වාර්තා කරපු විධියට, මේ හිංසනයට යුක්තිය සොයා යෑමේදී අගතියට පත් කෙනාට, එහෙම නැත්නම් චින්දිතයාට යුක්තිය ඉල්ලා සිටින්නට තිබෙන ධෛර්ය බිඳ වටිටනු ලබනවා. ඒ මඟින් අපට යුක්තිය වෙනුවෙන් සටන් කරන්නට තිබෙන අයිතිය නැවත වතාවක් පාගා දමනු ලබනවා. ඒ නිසා එකම අපරාධය නොයෙක් ආකාරයෙන්, නොයෙක් විධියට කාන්තාවන්ට අගරු වන විධියට, එහෙම නැත්නම් ඒ වෙනුවෙන් පෙනී සිටීමට තිබෙන ධෛර්ය බිඳ හෙළන විධියට කරන වාර්තාකරණය අපි ඉතාම ඉක්මනින් අවසන් කළ යුතු වෙනවා. අපි දන්නවා, යම් අපරාධයක් සිද්ධ වුණාම, විශේෂයෙන්ම ලිංගික අපරාධයක් සිද්ධ වුණාම, ඒ ජුගුප්සාජනක, අප්‍රසන්න අත්දැකීම වාර්තාකරණයේදී නැවත නැවත මාධ්‍ය හරහා හුවා දක්වන බව. ඒ හුවා දැක්වීම ඇතුළේ ඒ පුද්ගලයාගේ අනන්‍යතාව හෙළි කරන්නේ නැහැ කියන එකේ තේරුම, නම, වයස, ගම කියන එක විතරක් සඟවා ඉතුරු සියල්ල ප්‍රකාශ කිරීම නොවෙයි. වාර්තාකරණයේදී තිබිය යුතු අවම සදාචාරයවත් ආරක්ෂා කරලා නැහැ කියන එක මේ මෑත සිදුවීම හරහා අපි දැක්කා. ඒ සිදුවීමෙන් පස්සේ ඇය විසින් ලබා දෙන ලද කට උත්තරය තවත් කාන්තාවක් ලවා හඬ කවා, ඒ ලබා දෙන සාක්ෂි නැවත මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීම තුළින් ඒ චින්දිතයාටම තව තවත් අගතියක් සිද්ධ වෙනවාය කියලා අපි විශ්වාස කරනවා. අන්න ඒ අගතියට එරෙහිව අපි සියලු කාන්තාවන් එකතු වෙලා ඉන්නවා. මෙවන් අපරාධ වළක්වා ගන්න වාගේම, ඒ අපරාධයෙන් පස්සේ යුක්තිය ඉල්ලා සිටීමේදී, ප්‍රචණ්ඩත්වයට හා හිරිහැරවලට ලක් වෙච්ච, ඒවාට මුහුණ දුන් කාන්තාවන්ට සවියක් වෙන්න, සහායක් වෙන්න මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලු කාන්තාවෝ එකට ඉන්නවාය කියන පණිවුඩයත් මේ අවස්ථාවේ මා ලබා දෙනවා.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, ඒ වෛද්‍යවරියට සිදුවුණු මේ අකටයුත්තට පස්සේ, මේ හිසංනයට පස්සේ ලංකාවේ සියලු පුරවැසියෝ ඇයත් එක්ක එකට හිට ගත්ත බව. ඒ වාගේම, මේ සිදුවීම කිසිම හේතුවක් නිසා සාධාරණ කළ නොහැකි බව මේ ලංකාවේ සියලුදෙනාම පිළිගන්නා සත්‍යයක්. ඒ වාගේම අපි මේ වෙලාවේ නැවත නැවතත් කියනවා, ඇයට යුක්තිය ලබා දීම වෙනුවෙන්, ඇයගේ මනසට සවියක් වීම වෙනුවෙන්, ඇය සහ මෙවන් අගතිවලට පත් වෙන සෑම ගැහැනියක්ම වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව හඬක් බවට පත් වෙලා තිබෙන බව. ඇය වාගේම මෙවැනි අවස්ථාවලට මුහුණ දෙන, මෙවැනි සිදුවීම්වලට මුහුණ දෙන තවත් ගැහැනුන් සිටිනවා. මහ පාරේදී, වැඩ බිමේදී, සේවා ස්ථානයේදී, බස් රථයේදී ඔවුන් මුහුණ දෙන ඒ ප්‍රචණ්ඩත්වය හා හිංසනය පිළිබඳ හොඳම සංවේදනයක් තිබෙන පාර්ලිමේන්තුවක් තමයි දැන් තිබෙන්නේ. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ, මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න අපි හැම කෙනාම මෙන්න මේ හිංසනයට, ප්‍රචණ්ඩත්වයට වාගේම, ඒ අපරාධ වාර්තාකරණයේ තිබෙන කැතකමට අපි විරුද්ධයි කියලා. ඒක කැතයි. ඒ වාර්තාකරණය ඇතුළේ ඒ සිද්ධියට මුහුණ දුන් කාන්තාවගේ ධෛර්යය බිඳ වැටෙනවා; විශ්වාසය බිඳ වැටෙනවා; නීතිය පිළිබඳව වන පිළිගැනීම හා විශ්වාසය නැති වෙනවා. නීතිය ඉදිරියට ඇවිල්ලා කෙනකුට යුක්තිය ඉල්ලන්න තිබෙන ඒ අයිතිය, ඒ විශ්වාසය බිඳ වැටීම නැවත කිසිම පුද්ගල හඳවතක් තුළ ඇති කරන්න බැහැ. ඒ නිසා මේ වෙලාවේ ඒ අගතියට පත් වූ කෙනා වෙනුවෙන් වඩාත්ම වැදගත් වෙන්නේ, අපි මේ අපරාධය පුනරුච්චාරණය කරනවා වෙනුවට, තරාතිරම නොබලා වඩාත් ඉක්මනින් ඒ අපරාධකරුවන්ට දඬුවම් දීමට කටයුතු කිරීමයි. ඒ වාගේම, මෙවැනි හිංසනයට ලක් වෙන කෙනෙකුට ඒ සිදුවීමෙන් ඉක්මනින් මිදිලා, ඒ සිදුවීමෙන් පසු ඇති වන සංකූලතාවලින් මිදිලා, මනසට ඇති වෙන පීඩනය, සමාජයීය වශයෙන් ඇති වන කැළැල, පවුල ඇතුළේ ඇති වන හුදකලා බව සහ කලකිරීම යන සියල්ලෙන් මිදිලා, නැවත වඩාත් හොඳින් සමාජගත වෙන්න පුළුවන් ව්‍යුහයක්, යන්ත්‍රණයක් අපි රට තුළ හදන්න ඕනෑ. අන්න එතකොට තමයි කෙනෙකුට වෙච්ච හිංසනයෙන් පස්සේ නැවත පුද්ගලයකු හැටියට නැගිටින්න මේ සමාජය අත දුන්නා කියන විශ්වාසයක් ඇති වෙන්නේ. අන්න එහෙම විශ්වාසය ඇති කරන සමාජයක් වෙනුවෙන් තමයි අපි මේ කටයුතු කරන්නේ; කථා කරන්නේ. ඒක නීතියෙන් විතරක් කරන්න බැහැ. ඒකට මාධ්‍ය

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

සභාය ඕනෑ. ඒ වාගේම සමාජ ආකල්පවල ලොකුම හයියක් අපට ඕනෑ. ඒ වෙනුවෙන් පළමුකොටම අපි ඉල්ලා සිටිනවා, මේ අගතියට පත් වෙච්ච කාන්තාව එක්ක, ඒ වෛද්‍යතුමියත් එක්ක අපි හැම කෙනාම එකට හිට ගනිමු කියලා. ඒ සිද්ධිය අපි හෙළා දකිනවා වාගේම, ඒ වෙනුවෙන් යුක්තිය ඉල්ලා සිටීමටත්, මේ මාධ්‍යවලින් කරන අපරාධය වැළැක්වීමටත් අපි හැම කෙනාගේම හඬ අවදි කරන්න ඕනෑ. ඇය වෛද්‍යවරියක් වීම නිසා විතරක් නොවෙයි, ඇය ගැහැනියක් වීම නිසා තමයි මෙය අපට වඩාත් සංවේදී වෙන්නේ. අද ඇයට සිදු වුණු දේ තව කෙනෙකුට සිදු නොවෙන්න වග බලා ගන්න නම්, ඒ සඳහා නීතිමය ආවරණය වාගේම, ආකල්ප අතිනුත් අපට වගකීමත් තිබෙනවා.

ඒ වාගේම, මාධ්‍යවලට අපි මේ සඳහා වන නීති ක්‍රියාත්මක කළ යුතුයි. ඒ සඳහා අපට තිබෙන්නේ ඒක නීතියෙන් ආවරණය කරන එක, නීතියෙන් දණ්ඩනය පවරන එක විතරක් නොවෙයි. ඒ සඳහා අපි අවම සදාචාරයවත් බලාපොරොත්තු වෙනවා. ජනතාව හැටියට අපට ලොකු වගකීමක් තිබෙනවා, ඒ මාධ්‍ය නියාමනය කිරීමේ කාර්යභාරය පිළිබඳව. මාධ්‍ය නියාමනය කිරීමේ කාර්යභාරයේදී, නීති පනවනවාට වඩා, එවන් මාධ්‍ය ප්‍රතික්ෂේප කිරීමේ වගකීමක් අපට තිබෙනවා. මේ මාධ්‍ය කලාව ඇතුළේ අපි එවන් දේ අනුමත කරන්නේ නැහැ කියන ප්‍රතිචාරය සෑම පුරවැසියෙක් තුළම ඇති විය යුතුයි.

ඒ වාගේම, පොලීසියට, අධිකරණයට ලබා දුන්නු ඒ කට උත්තරය නැවත මාධ්‍යවලට ගියේ කොහොමද කියන එක අපි සොයා බැලිය යුතුයි. ඒ වාගේම ඒක මාධ්‍යවලට ලබා දුන්නේ කොයි විධියටද? ඒ සඳහා තිබුණු නීතිමය පසුබිම මොකක්ද? ඇයගේ අනන්‍යතාව හෙළි කරන්න එපා කියලා අපේ ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉල්ලා තිබියදී පවා, නැවත ඇයගේ කටඋත්තරය මේ ආකාරයට පළ කිරීමට තිබෙන නීතිමය වටපිටාව මොකක්ද? කොයි විධියටද මේක නැවත වාර්තා කළේ කියන කාරණා ගැන අපි හැම කෙනාම අවබෝධයෙන් හා අවදියෙන් ඉන්න ඕනෑ. මේ අපරාධ වැළැක්වීමේ ක්‍රියාවලිය ඇතුළේ අපරාධයෙන් පසුව ඒ අපරාධයට ලක් වෙච්ච කෙනා යහපත්ව නැවත සමාජගත වීමේ ක්‍රියාවලිය දක්වා වූ වැඩ පිළිවෙළ තුළ රජයට, ආණ්ඩුවට ලොකු වගකීමක් තිබෙනවා. ඒ වගකීම වෙනුවෙන් අපි එකාවන්ව කටයුතු කරනවා කියන එක අපි කියනවා. ඒ වාගේම මේ මොහොතේදී මේ විශේෂිත වූ සිදුවීම -මේ වෛද්‍යවරියට සිදු වූ අකටයුත්ත- පිළිබඳව ඇය නියෝජනය කරන්න මේ රටේ කාන්තාවන්, මේ රටේ ජනතාව -අපි හැම කෙනාම- එකාවන්ව එක්ව සිටියදී, මේ වෘත්තිය සමිතිවල ක්‍රියාමාර්ගත් එක්ක ඇය අත්හරින්න අපි කිසිසේත්ම සූදානම් නැහැ. අපි දන්නවා, මෙතැන පරස්පරයක් තිබෙන බව. ඇය අයිති කරගන්නට, ඇයට සිදුවූ අගතිය මතින් වෙනත් ක්‍රියාවලියකට, එහෙම නැත්නම් වෙන වෙන වාසි ප්‍රයෝජන ලබා ගන්න උත්සාහ කළත්, "ඇය කාන්තාවක්, ගැහැනියක්, අයට මේ දේ සිදුවිය යුතු නැහැ. ඒක නිසා අපි සියලුදෙනාගේ වගකීම ඇය වෙනුවෙන් පෙනී ඉන්න එක" කියන ස්ථාවරයේ අපි පැහැදිලිව ඉන්නවා. මේ අවස්ථාව දඩමීමා කරගන්නට උත්සාහ දරන අයට ඒ දේට ඉඩ දීලා අපි ඇය අත්හරින්න සූදානම් නැහැ කියන එක, ඇය වෙනුවෙන් අපි ඉන්නවා කියන එක අපි ප්‍රකාශ කරන්න ඕනෑ. ඇය වාගේම අගතියට පත් වෙන අද මේ කථා කරන මොහොත වනවිටත් බස් රථය තුළ, වැඩපොළ තුළ, වතුවලදී, ඇඟලුම් කම්හල්වලදී, සේවා ස්ථානවලදී වාචිකවත්, ශාරීරිකවත්, මානසිකවත් හිංසනයට ලක් වෙන, ඒ වාගේම සයිබර් අවකාශය තුළ හිංසනයට ලක් වෙන හැම ගැහැනියක්ම, දරුවෙකුම වෙනුවෙන් අපි අලුත් නීති පද්ධතියකට යෑමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ නීති පද්ධතිය අපි ශක්තිමත් කළ යුතු වෙනවා. ඒ නිසාම මේ විශේෂිත අවස්ථාවේ මේ සිදුවීම මතින්ම අපි එකට එකතු වෙලා මේ රටේ ප්‍රචණ්ඩත්වයට ලක් කරන ලද කාන්තාවන්ගේ පෞද්ගලිකත්වය විනාශ කරමින්, ඔවුන්ට නීතිය ඉදිරියේ පිළිසරණ පතා එන්නට තිබෙන ධෛර්යය බිඳ හෙළමින්, නීතිය පිළිබඳව විශ්වාසය පලුදු කරමින් මේ කටයුතු කරන ක්‍රමය අවසන් කරමු. හිංසනයත්, ඒ හිංසනයට ලක් වුණු කෙනා මර්දනය කිරීමටත් ගෙන යමින් තිබෙන මේ කැත සංස්කෘතිය අවසන් කරන්න අපි හැම කෙනාම එකතු වෙමු කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, ලංකාවේ පවතින නීති ක්‍රියාත්මක කරන ආයතනවලටත්, විශේෂයෙන්ම පොලීසිය, මාධ්‍ය ඇතුළු අපි හැම කෙනාටම එක සාමූහික වගකීමක් තිබෙනවා. ඒ වාගේම අපට සහකම්පනයෙන් යුතු සමාජයක් ඕනෑ කරනවා. නීතියෙන් පමණක් මේ කටයුතු කරන්න බැහැ කියන එකත් අපි විශ්වාස කරනවා. ඒ සහකම්පනයෙන් යුතු සමාජය හදන එක අපේ රටේ අධ්‍යාපනයේ සිට සෑම තරාතිරමක, සෑම සමාජ ස්ථරයකම වගකීමක් වෙනවා. ඒ වෙනුවෙන් අපි අලුත් සිතිමේ රටාවක් නිර්මාණය කර ගත යුතුයි. මේ අවස්ථාවට මුහුණ දුන් ගැහැනියගේ වේදනාව මොන වාගේද කියන එක අපි හැම කෙනෙකුම හෘදය සාක්ෂියට එකඟව ඒ දෘෂ්ටි කෝණයෙන් සිතා බැලිය යුතුයි. ඇය වාගේම ඉතිහාසය පුරාවටම මෙවන් අවස්ථාවලට මුහුණ දුන් සෑම ගැහැනියක්ම සමාජයට වෛර කරන කෙනෙකු බවට පත් වෙනවා නම්, සමාජය පිළිබඳ විශ්වාසය නැති කෙනෙකු බවට පත් වෙනවා නම්, නීතිය පිළිබඳ විශ්වාසයක් නැති වෙනවා නම්, තමාගේ ළඟ සිටින අනෙකා ගැන විශ්වාසයක් නැති සමාජයක් නිර්මාණය වෙනවා නම් අපි රටක් හැටියට පරාජිතයි. ඒක නිසා තමයි අපි කියන්නේ, මේක කාන්තා හිංසනයෙන් විතරක් නවතින දෙයක් නොවෙයි කියලා. මේක කාන්තා හිංසනය කියන වචනයකට විතරක් ලඝු කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ සමාජය ඇතුළේ මනුෂ්‍යත්වය බිඳ වැටීම පිළිබඳ උපරිම නිර්ණායකයක් හැටියට තමයි මේක දකින්න වෙන්නේ. ඒ මනුෂ්‍යත්වය බිඳවැටීමේ නිර්ණායකවලින් එකක් තමයි මේ හිංසනයෙන් පිරි සමාජය. ඒක නිසා අපි නැවත නැවතත් කියනවා, මේ ප්‍රතිසංස්කරණවලට අපි යන්න ඕනෑ කියලා. මාධ්‍යයට, නීතියට, අධ්‍යාපනයට ඒ වාගේම විශේෂයෙන්ම වාර්තාකරණයේදී අලුත් ප්‍රතිසංස්කරණවලට ගිහිල්ලා මේ රටේ ජනතාවට, කාන්තාවන්ට ඒ සඳහා වන විශ්වාසය ඇති කිරීමේ කටයුත්ත අපි කළ යුතු වෙනවා. ආරක්ෂිත සේවා ස්ථානයක වැඩ කරන්න හැම කෙනෙකුටම අයිතිය තිබෙනවා. ඒ අයිතිය ලබා දීම සඳහා ජාත්‍යන්තරය පිළිගත් කම්කරු නීති ක්‍රියාත්මක කළ යුතුයි. වැඩ බිමේදී හිංසනයට ලක් වෙන කාන්තාවන්ට එයට එරෙහිව නැඟී සිටීම සඳහා ජාත්‍යන්තර කම්කරු නීති, වැඩ බිමේදී සුරක්ෂාව ඇති කිරීම සඳහා වන ජාත්‍යන්තර කම්කරු නීති ලංකාවේත් පිළිගැනීමට ලක් කරලා ඒ තුළින් ඒ අයට ආරක්ෂාව ලබා දිය යුතු බවට අපි රජයක් හැටියට විශ්වාස කරනවා. අපි ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. අපි අනිවාර්යයෙන් ඒ සඳහා වන නීති ඉදිරියේ දී සම්පාදනය කරනවා කියන පොරොන්දුවත් මේ අවස්ථාවේ දී ලබා දෙනවා.

இவ்வாறான நிகழ்வுகள் காரணமாக இந்த நாட்டு மக்கள் சட்டத்தின்மீது கொண்டுள்ள உண்மையான நம்பிக்கை இழக்கப்படுகின்றது. பாலியல் வன்முறைகளுக்கு முகங் கொடுத்த பெண்கள் தங்களுக்கு நடந்த அநீதிக்கு நீதியைத்தான் எதிர்பார்க்கின்றார்கள். சட்டத்தின்முன் நிறுத்தப்பட்டு, குற்றவாளிக்குத் தண்டனை வழங்கப்படுகின்ற அதேநேரம், தனக்கு நியாயம் கிடைக்கும் என்ற எதிர்பார்ப்புடன் இருக்கும் பெண்கள் நம்பிக்கை இழக்கிறார்கள். அதுமட்டுமல்ல, இவ்வாறான சம்பவங்களால் பாதிக்கப்பட்ட வர்களுக்குத் தீமை விளைவிக்கும் வகையிலும், குறித்த அநியாயத்தைச் செய்தவர்களுக்குச் சாதகமாகவும்

අලික්කප්පඩුකින්ර සාට්සියන්කළ් ඌටකන්කළ් වායිලාක වෙළිප් පඩුත්තප්පඩුවතනාල්, ඉව්වාරාන නිකළ්වුකළුක්කු මුකන් කොඩුත්තවර්කළ් නීතියෛක් කෝරුවතර්කු අච්චප්පඩු කින්රාර්කළ්.

කටන්ත කාලන්කළිල් පාරාළුමන්ර උරුප්පිනර්කළින් වීටුකළිල් කොලෙසෙය්යප්පට්ට සිරුමිකළිලිරුන්ත වේලෛ වාය්ප්පුත් තේටි වීටුකළුක්කුච් චෙන්ර පෙණ්කළ් වරෛ අනීතික්කු උළ්ළාක්කප්පට්ටුළ්ළනර්. අතුමාත්තිරමන්රි, පොතුප් පෝක්කුවරත්තින්පෝතුම් පෙණ්කළ් පාතික්කප් පඩුකින්රනර්. මලෛයකත්තිලුළ්ළ තෝට්ටන්කළිලාක ඉරුක්කලාම්, ඒනෛය වේලෛත්තලන්කළිලාක ඉරුක්කලාම්, ඉව්වාරු පාතිප්පුකළුක්කු උළ්ළාකින්ර පෙණ්කළුක්කුච් චට්ට රීතියාක මට්ටුමල්ලාමල්, චමූක රීතියාකවුම් පාතුකාප්පු වළුන්කක්කූටිය වකෛයිල් නාන්කළ් චට්ටන්කළෛප් පලප් පඩුත්තුවෝම්. අනීති ඉළෛක්කප්පට්ටවර්කළුක්කු නීතියෛප් පෙට්රුක්කොටුප්පතර්කාක නාන්කළ් මුම්මුරමාකච් චෙයර් පඩුවෝම් එන්පතෛ ඉන්ත ඉටත්තිල් සොල්ලිවෛක්ක විරුම්පුකින්රෝම්. කටන්ත කාලන්කළිල් නටන්ත ඉව්වාරාන නිකළ්වුකළාල් පාතික්කප්පට්ටවර්කළුක්කු නීතියෛප් පෙට්රුක් කොටුප්පතර්කුම් නාන්කළ් පෝරාටුවෝම් එන්පතෛ ඉන්කු උරුතියාකක් කූරික්කොළ්කින්රේන්.

අනියායන්කළුක්කු මුකන්කොටුක්කින්ර පෙණ්කළ් තන්කළුක්කාන නීතියෛප් පෙරුවතර්කු අච්චප්පඩුකින්ර චූළ්නිලෛයිල්, අන්ත අච්චත්තෛප් පෝක්කි, නියායත්තුක්කාකප් පෝරාටුම් අළවුක්කු අවර්කළෛප් පලප්පඩුත්තු වතර්කාකත්තාන් නාන්කළ් ඉන්තප් පාරාළුමන්රත්තුක්කු වන්තිරුක්කින්රෝම්. ඉව්වාරාන නිකළ්වුකළ් එන්තවොරු චමුතායත්තිල් නටන්තාලුම් චරි, අරචාන්කම් එන්ර වකෛයිල් නාන්කළ් පාතික්කප්පට්ටවර්කළුක්කුක් කට්ටායම් නීතියෛප් පෙට්රුක් කොටුප්පෝම්. අන්ත වකෛයිල්, අනුරාතපුර වෛත්තියචාලෛ විටුතියිල් පාතික්කප්පට්ට වෛත්තියරුක්කුම් අතර්කු මුන්නර් ඉව්වාරාන අනීතිකළුක්කු මුකන්කොටුත්ත අනෛත්තුප් පෙණ්කළුක්කුම් නියායත්තෛප් පෙට්රුක් කොටුප්පතර්කාක නාන්කළ් කට්ටායම් පෝරාටුවෝම් එන්පතෛ ඉව්වේළෛයිල් කූරික්කොළ්කින්රෝම්.

අකතියට පත් සියලු කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් අපි පෙනී ඉන්නවා. ඒක තමයි අපේ පාර්ලිමේන්තු නියෝජනයේ විශේෂත්වය. අපි ඒ සඳහා සංවේදී වන පාර්ලිමේන්තුවක්. අපේ පාර්ලිමේන්තුව තුළට ඇවිත් සිටින 22කින් සමන්විත කාන්තාවන් පිරිස, මේ රටේ දුක් විඳින ගැහැනුන්ගේ සහ දරුවන්ගේ වේදනාවට සංවේදී පිරිසක්. ඒ නිසාම අපි අනිවාර්යයෙන්ම ඔවුන්ගේ තත්ත්වය හෝ තරාතිරම නොබලා කටයුතු කරනවා. මේ වාගේ සිද්ධි සම්බන්ධයෙන් ආයතනයක් නියෝජනය කරමින්, ජන සමාජයක් නියෝජනය කරමින් හෝ වෘත්තියකට සීමා වෙමින් කටයුතු නොකර, කොන්දේසි විරහිතව අපි ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ වෙනුවෙන් අපට මාධ්‍ය, නීති ක්‍රමය හා පොලිසිය සමඟ අලුත් ප්‍රතිසංස්කරණ බොහෝමයකට යන්න කාලය ඇවිත් තිබෙනවා. ඒ සඳහා අනිවාර්යයෙන් කටයුතු කරන පාර්ලිමේන්තුවක් බවට මේ පාර්ලිමේන්තුව පත් වෙනවාය කියන සහතිකය අපි ලබා දෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.50]

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
(මාණ්පුමිකු (කලානිති) නන්තන මිල්ලකල)
(The Hon. (Dr.) Nandana Millagala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

වගාව කියන්නේ නිකම්ම නිකම් ගහක් සිටුවලා, ඒකෙන් ඵලය නෙළාගෙන, ඒක අළෙවි කරලා යම් මුදලක් උපයාගන්න එක විතරක්ම නොවෙයි. ඒක ඇතුළේ තිබෙනවා, ඉතා ගැඹුරු මානවීය සංස්කෘතිය පිළිබඳ පදනම; මිනිසා ශිෂ්ටාචාරගත වීම පිළිබඳ පදනම. ඒ ඓතිහාසික අත්දැකීම් සම්භාරය එහි තිබෙනවා. වැවිලි බෝග වගාව ආශ්‍රිතව මේ රට ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති මාලාව සහ ඒකට අදාළ අය වැය ඇස්තමේන්තුව අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ අන්න ඒ කියන ගැඹුරු ප්‍රතිපත්තිමය දැක්ම සහිතවයි. මිනිසා පිළිබඳව, මිනිසාගේ දියුණුව පිළිබඳව, රටක අනාගතය පිළිබඳව තීරණය කරන ප්‍රබල සාධකයක් විධියට සලකලා තමයි වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයට අදාළ අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු පෝල්රාජ් අමාත්‍යතුමිය අදහස් ඉදිරිපත් කරපු මොහොතේ මට එක් කාරණයක් සිහියට නැඟුණා. මා සේවා සපයන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ආසනයට. යටියන්තොට ආසනයේ වතු ආශ්‍රිත පේළි නිවාසයක ජීවත් වුණු වයස අවුරුදු 16ක දැරියක් මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා ජීවිතය නැති කර ගන්නවා; සියදිවි හානි කර ගන්නවා. ඇය ලිපියක් ලියලා තිබුණා. ඒ ලිපියේ සඳහන් කරලා තිබුණේ, ඇයගේ මව සහ පියා අඹු සැමියන් විධියට ජීවත් වෙන ආකාරය දිගින් දිගටම දකින්න අකැමැති නිසා, ඒක දරාගන්න බැරි නිසා ඇය මරණයට පත් වෙනවා කියලායි. ඒ නිසා තමයි ඒ තරුණිය ජීවිතය නැති කරගෙන තිබුණේ. වතු ආශ්‍රිත ජනතාවගේ ජීවන යථාර්ථයට එය පොඩි නිදර්ශනයක්. ඒ වාගේ නිදර්ශන ඕනෑ තරම් අපට ඉදිරිපත් කරන්න පුළුවන්. අපි විමසා බැලුවොත් කුඩු, ගංජා හෝ වෙනත් මත් ද්‍රව්‍යවලට වැඩිපුරම ඇබ්බැහි වෙලා ඉන්න බාල වයස්කාර දරුවන් ඉන්න කලාප මොනවාද කියලා, මගේ ආසනය ගත්තත්, ලංකාවේ වෙනත් දිස්ත්‍රික්කවල ආසන ගත්තත් මේ කියන වතු ආශ්‍රිත ජනතාව තමයි ඒවායේ වින්දිතයෝ බවට, පීඩිතයෝ බවට වැඩි වශයෙන් පත් වෙලා සිටින්නේ.

අධ්‍යාපනයේ දුර්වල අවස්ථා එක්ක ජීවිතය කඩා බිඳ දා ගත්, බිඳ වැටුණු ජීවිත සහිත අය කොහේද ඉන්නේ කියලා විමසා බැලුවොත්, වතු ආශ්‍රිත ජනතාව අතරින් අපට ඕනෑ තරම් නිදර්ශන හමු වෙනවා. ඒ වාගේම සමාජයේදී වුණත් ඔවුන් ඉතාම පීඩාකාරී ජීවිතවලට තමයි මුහුණ දෙන්නේ. මෙන්න මේ තත්ත්වය ඉතා ගැඹුරින් තේරුම් ගත් අපේ ආණ්ඩුව විසින් මේ අමාත්‍යාංශය හරහා වතු නිවාස වැඩසටහන සඳහා කාරණා දෙකක් ඔස්සේ මුදල් වෙන් කරලා තිබෙනවා, රුපියල් මිලියන 923.65ක් සහ රුපියල් මිලියන 840ක් වශයෙන්. ඒ මුදල් වෙන් කරලා තිබෙන්නේ ඔවුන්ගේ ජීවිත ඇතුළේ තිබෙන මේ අර්බුදය, මේ ගැටලුව, මේ පීඩාකාරී ප්‍රශ්න විසඳීම සඳහායි.

මෙවර අය වැයෙන්, ළමා සංවර්ධන මධ්‍යස්ථාන නවීකරණයට රුපියල් මිලියන 56ක් වෙන් කරලා තිබෙනවා. ඔවුන් ජීවත් වෙන්නේ අවුරුදු සිය ගණනක් පැරණි පේළි නිවාසවල. ඒ නිවාසවල වහල සෙවිලි කිරීම සඳහා රුපියල් මිලියන 62ක්, පොදු සනීපාරක්ෂක පහසුකම් ලබා දීම සඳහා

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

රුපියල් මිලියන 30ක් වෙන් කරනවා. මම එක පේළි නිවාසයක් පරීක්ෂා කරන්න ගියා. ඒ පේළි නිවාසයේ පවුල් 21ක් ජීවත් වෙනවා. ඒ පවුල් 21ටම තිබෙන්නේ වැසිකිළි 3ක් පමණයි.

ඒ වාගේම ඒ මාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 108ක් ආදී වශයෙන් අපි සැලසුම් සහගතව මුදල් වෙන් කරලා තිබෙනවා, ඔවුන්ගේ ජීවිත නහාසිටුවීම සඳහා. මේ මුදල් වෙන් කරන්නේ හුදෙක් ගෙයක් හදලා දෙන්න විතරක් නොවෙයි. ඒ ගෙදර එක්ක බැඳුණු සංස්කෘතික ජීවිතයක් ඔවුන්ට තිබෙනවා. අන්න ඒ සංස්කෘතික ජීවිතය ගොඩ නහමින් ඔවුනුත් මේ රටේ සමාන අයිතිවාසිකම් සහිත පුරවැසියන් විධියට ජීවත් විය යුතුයි කියන ගැඹුරු දැක්ම සහිතවයි අපි මේ වෙන් කිරීම් කරලා තිබෙන්නේ. මෙන්න මේ පණිවුඩය දෙමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.57]

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரව තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළේ, පෙරුන් තෝට්ට මற්றුම් සමූහ උට්කට්ටමෛප්පු වසතිකළ් අමෛච්චරින් නිතියොතුක්කීටුකළ්මීතාන කුழුනිලෛ විවාතත්තිල් උරෛයාற්றුවතර්කු එනක්කු නේරම් තන්තෛමෛක්කු මුතලිල් නන්රියෛත් තෙරිවිත්තුක් කොළ්කින්රේන්. කුරිප්පිට්ට මාවට්ටංකළිල් මට්ටුම්තාන් පෙරුන්තෝට්ටප් පයිර්ච් චෙය්කෛක්කුරිය තිට්ටංකළ්, අතර්කුරිය ඒර්පාටුකළ් කටන්ත කාලංකළිල් චෙය්යප්පට්ටුක්කොණ්ටිරුන්තතු. අතෛ මාර්රුම් විතමාක, කටන්ත අරසිල් නාංකළ් ඊර වලයත්තුක්කු මට්టුම් මට්ටුප්පුපටුත්තප්පට්ටිරුන්ත ඉරප්පර් චෙය්කෛයෛ උලර් වලයත්තිර්කුම්, කුරිප්පාක මොනරාකලෛ පෝන්ර පිරතේසංකළුක්කුම් කොණ්ටුචෙන්රු, අංකු ඉරප්පර් මරංකළ් නාට්ටප්පට්ටුත් තර්පෝතු අතු වෙර්රිකරමාක මූලප් පොරුට්කළෛප් පෙරක්කූටියළවුක්කු අංකු උරුවාක්කප් පට්ටිරුක්කින්රතු එන්පතෛක් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්.

අතුපෝල්, නාංකළ් වට මාකාණත්තිල් තෙන්නෛක්කෙන්රු ඔරු වලයත්තෛයේ උරුවාක්කිත් තෙන්නෛච් චෙය්කෛක්කුරිය ඒර්පාටුකළෛච් චෙය්තිරුන්තෝම්. අන්ත අටිප්පටෛයිල් ඉන්ත Budgetඉලුම් 16,000 ඒක්කර් පුතිය තෙන්නඞ් කාණිකළෛ අමෛප්පතර්කු, අතාවතු, වට මාකාණ තෙන්නෛ අපිවිරුත්තික්කාක නිති ඒර්පාටු චෙය්යප්පට්ටිරුක්කින්රතු. උණ්මෛයිල් අතර්කු එනතු පාරාට්ටුකළෛ ඉන්ත ඉටත්තිල් නාන් තෙරිවිත්තුක් කොළ්කින්රේන්. තෙන්නෛ අපිවිරුත්තියෛ මේර්කොළ්වතෛප්පෝල්, අංකේ පනෛ අපිවිරුත්තියෛයුම් නීංකළ් මේර්කොළ්ළ වේණ්ටුම්. කටන්තකාල යුත්තත්තිනාල් අංකිරුන්ත ඉලට්චක්කණක්කාන පනෛ මරංකළ් අழික්කප්පට්ටිරුක්කින්රන. අතනෛ ඊටුකට්ටක්කූටිය විතත්තිල් පනෛ මරංකළෛයුම් නාංකළ් අංකු උරුවාක්කුවතන්මූලම් පල්වේරු වේලෛවාය්ප්පුකළෛ අංකුළ්ළ මක්කළුක්කු වழඞ්කක්කූටියතාක ඉරුක්කුම්. තර්පෝතු ඉරුක්කින්ර පනෛකළිලිරුන්තු පෙරප්පටුකින්ර මූලප් පොරුට්කළිලිරුන්තු මක්කළුටෛය මුයර්චියිනාල් පල පොරුට්කළ් උර්පත්ති චෙය්යප්පට්ටු, අවෛ ඉන්රු චන්තෛක්කු වරුකින්රන. ආයිනුම්, අතු අංකුළ්ළ මක්කළුක්කුප් පෝතියළවු වරුමානත්තෛ ඊට්ටිත් තරක්කූටියතාක ඉල්ලෛ. ආකවේ, අංකු පනෛ අපිවිරුත්තික්කාන වේලෛත්තිට්ටඞ් කළෛයුම් එතිර්කාලංකළිල් නීංකළ් කොණ්ටුවර වේණ්ටු මෙන්රු කේට්ටුක් කොළ්කින්රේන්. ඒනෙන්රාල්, එමතු මක්කළුටෛය තේවෛප්පාටුකළ් අතිකමාකුම්.

කටන්ත කාලංකළිල් තෙන් පකුතික්කුම් ඒනෛය පකුති කළුක්කුම් අපිවිරුත්තික්කාක ඔතුක්කප්පට්ට නිතිකළුටන් ඔප්පිටුකෛයිල් වටක්කුක්කු මිකවුම් කුරෛන්තළවු නිතියේ ඔතුක්කප්පට්ටිරුන්තතු. යුත්තම් මර්රුම් අන්තක් කාලත්තිල් ඉරුන්ත පල පිරච්චිනෛකළ් අව්වාරාන නිලෛක්කුක් කාරණමාක ඉරුන්තතු. ආනාල්, ඉන්රු අව්වාරාන නිලෛ ඉල්ලාතතාල් පාරිය අපිවිරුත්තිකළෛයුම් පෙරුන්තෝට්ටප් පයිර්ච්චෙය්කෛ අපිවිරුත්තිකළෛයුම් අන්තප් පකුතිකළුක්කුක් කොණ්ටුවර වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කිරේන්.

පෙරුන්තෝට්ටප් පයිර් එන්රාල්, තෙන්නෛ, ඉරප්පර්, තේයිලෛ ආකියවෛ එන්රුතාන් නාංකළ් නිනෛක්කිරෝම්. ආනාල්, අතර්කීටාක මාර්රමාන පයිර්කළෛයුම් පෙරුන් තෝට්ටප් පයිර්ච්චෙය්කෛයාක මේර්කොළ්ළ වේණ්ටුම්. කුරිප්පාක කරුවා, මිළකු, චාතික්කාය් එන්රු මට්టුප් පටුත්තප්පට්ට උර්පත්තියෝටු නිරුත්තිවිටාමල්, ඉන්තියා පෝන්රු පෙරුන්තෝට්ටප් පයිර්කළාකප් පුතුවකෛප් පයිර්කළෛ අරිමුකප්පටුත්ති වළර්ච්චි කාණ වේණ්ටුම්. කුරිප්පාක, කටුකු එණ්ණෛය්ත් තයාරිප්පුක්කාකක් කටුකෛයුම්, චූරියකාන්ති එණ්ණෛය්ත් තයාරිප්පුක්කාකච් චූරියකාන්තියෛයුම් පාරියළවිල් උර්පත්ති චෙය්තු අන්ත නාටු පෙරුම් මුන්නේර්රම් කණ්ටිරුක්කින්රතු. අව්වාරාන උර්පත්තිකළෛ නාමුම් මේර්කොළ්වතර්කුප් පෝතියළවු පොරුත්තමාන ඉටංකළ් වට මාකාණත්තිල් ඉරුක්කින්රතෙන්රු නාන් නිනෛක් කින්රේන්. ඉන්රු අත්තනෛ ඉටංකළෛයුම් forest එන්රු අටෛයාළප්පටුත්ති ඉරුක්කිරාර්කළ්. අංකුළ්ළ අතිකාරි කළුටෛය, මක්කළුටෛය ආලෝචනෛකළෛප් පෙරාතු, helicopterඉල් චෙන්රු GPS මූලමාක අළන්තු gazette පණ්ණප්පට්ට අන්ත ඉටංකළෛ විටුවිප්පතර්කුක් කටන්ත ආට්චික් කාලත්තිල් මේර්කොළ්ළප්පට්ට මුයර්චිකළ් ඉරුතිත් තරුවායෛ එට්ටියිරුන්තතු. අතාවතු, 1985ආම් ආණ්ටුක්කුප් පිරකු gazette පණ්ණප්පට්ට, අටර්න්ත කාටුකළාක ඉල්ලාත පකුතිකළෛ විටුවිත්තු මක්කළුක්කුක් කොටුප්පතෙනත් තීර්මානම් මේර්කොළ්ළප්පට්ටතු. ආකවේ, කට්ටායම් අවර්රෛ විටුවිත්තු, අංකු කටුකු, චූරියකාන්ති පෝන්ර පුතිය පයිර්කළෛප් පයිරිටුවතන්මූලම් අන්ත මක්කළ් වරුමානත්තෛ ඊට්టුවතර්කුරිය වழිවකෛකළෛච් චෙය්යවේණ්ටුම්. අන්ත අටිප්පටෛයිල් නීංකළ් අන්ත නිලංකළෛප් පයන්පටුත්තු වතර්කාන ඒර්පාටුකළෛච් චෙය්යවේණ්ටුමෙන්ර කෝරික්කෛයෛ මුන්වෛක්කිරේන්.

ඒනෙන්රාල්, අංකේ අනුපවමුළ්ළවර්කළ් ඉරුක්කින්රාර්කළ්. 1983ආම් ආණ්ටු නටන්ත ඉනක් කලවරත්තිනාල් වෙළියේරිය පෙරුම්පාලාන මලෛයක මක්කළ් එමතු මාවට්ටංකළිල් ඉරුක්කින්රාර්කළ්. අංකු වන්ත අවර්කළ් පෙරුන්තෝට්ටප් පයිර්ච්චෙය්කෛ උට්පටච් චකල පයිර්ච් චෙය්කෛයිලුම් ඊටුපට්టු වරුවතෝටු, චිරන්ත තොළිල් මුයර්චියාළර්කළාකවුම් ඉරුක්කින්රාර්කළ්. ඉන්නුම් අන්තප්

பகுதியிலுள்ள ஒருசில மலையக மக்களுக்குக் காணிகள் வழங்கப்படவில்லை. அவர்களுக்குக் காணிகளை வழங்குவதற்கு Forest என்ற பிரச்சினை தடையாக இருக்கின்றது. ஆகவே, காடாக அடையாளப்படுத்தப்பட்டிருக்கின்ற அங்குள்ள காணி களை விடுவித்து, அவற்றை அந்த மக்களுக்கு வழங்கினால், ஈர வலயத்துக்கென மட்டுப்படுத்தப்பட்ட பயிர்களை எமது பகுதிகளிலும் உற்பத்தி செய்வதற்கான வாய்ப்புகள் ஏற்படும். கௌரவ அமைச்சர் அவர்கள் இவற்றைக் கருத்திலெடுத்து, மலையகப் பகுதிகளில் பயிர்ச்செய்கை அனுபவங்களைப் பெற்றுக்கொண்டு எமது பகுதிகளுக்கு வந்திருக்கும் மலையக மக்களுக்கு இடங்களை மாத்திரம் வழங்குங்கள்! அவர்கள் அழகான முறையில் அங்கு இப்பயிர்ச்செய்கைகளை மேற்கொள்வார்கள் என்பதைக் குறிப்பிட விரும்புகின்றேன்.

அடுத்து, இங்கு 'மலையகத் தமிழ் மக்கள்' என்ற வார்த்தை அடிக்கடி பேசப்படுவதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. நாங்கள் அவ்வாறு அவர்களைப் பிரித்துப் பார்க்கத் தேவை யில்லை. மலையக மக்களில் எல்லா இனங்களைச் சேர்ந்தவர் களும் இருப்பார்கள். அந்த அடிப்படையில் எதிர்காலங்களில் அவ்வாறான பிரிவினைவாத வார்த்தைப் பிரயோகங்கள் இல்லாமல், இந்த அரசு தகுதியானவர்களுக்கு உரியதைக் கொடுக்கும் என்ற நிலைப்பாட்டில் இருக்கின்ற நீங்கள், 'மலையக மக்கள்' என்று கூறுங்கள்! ஓர் இனத்துக்குரிய தனிப்பட்ட வார்த்தைகளைப் பயன்படுத்தத் தேவையில்லை என நான் நினைக்கிறேன்.

எமது பகுதியிலுள்ள தமிழ் பேசும் மக்கள் கடந்த காலங்களில் நிறுவப்பட்ட காணாமற்போனோர் குறித்து விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழு தொடர்பில் பாரிய எதிர்பார்ப்பைக் கொண்டிருந்தார்கள். அந்த ஆணைக் குழுவை நியமித்ததால் என்ன நடந்திருக்கின்றது? அந்த ஆணைக்குழுவின் அறிக்கை பாராளுமன்றத்தில் table பண்ணப் பட்டிருக்கின்றது. ஆனால், ஒன்றுமே நடைபெறவில்லை. அவர்களுக்குரிய நீதி கிடைக்க வேண்டும். அதற்குக் காரணகர்த்தாக்களாக இருந்தவர்கள் தண்டிக்கப்பட வேண்டும். காணாமல் ஆக்கப்பட்டவர்கள் தொடர்பான ஆணைக்குழு அறிக்கையின்படி அதற்குரிய நடவடிக்கைகள் எதிர்காலத்தில் எடுக்கப்பட வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

அதுபோல், திருகோணமலையில் Campus அனுமதியை எதிர்பார்த்திருந்த பிள்ளைகள் மற்றும் 11 பேர் கொலை செய்யப்பட்டது பற்றிய விசாரணை ஆணைக்குழு அறிக்கையும் பாராளுமன்றத்தில் table செய்யப்பட்டுள்ளது; எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. எனவே, அந்த விடயம் தொடர்பாகவும் அரசாங்கம் கட்டாயம் உரிய நடவடிக்கை களை எடுக்கவேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். அவ்வாறான மிலேச்சத்தனமான செயற்பாட்டில் ஈடுபட்ட வர்கள் தொடர்பான தகவல்களை வெளிக்கொணர்ந்து, அவர்கள் தண்டிக்கப்பட வேண்டுமென்று கூறிக் கொள்கின்றேன்.

மேலும், Ministry of Transport, Highways, Ports and Civil Aviationஇன் வரவு செலவுத்திட்ட குழுநிலை விவாதத்தில் என்னால் கலந்துகொள்ள முடியவில்லை. இருந்தாலும், புத்தளத்திலிருந்து - மன்னார் மறிச்சுக்கட்டிக்கூடாக யாழ்ப் பாணத்திற்குப் போகின்ற பாதை விரைவாகப் புனரமைப்புச் செய்யப்பட்டுத் திறந்து வைக்கப்பட வேண்டுமென்று நாம் தொடர்ச்சியாக முன்வைத்து வருகின்ற கோரிக்கையை இச்சந்தர்ப்பத்திலும் விடுக்க விரும்புகின்றேன். கொழும்பி லிருந்து அநுராதபுரம் - வவுனியாவுக்கூடாகப் பயணிப்பதை விட இந்தப் பாதையைப் பயன்படுத்துவதன்மூலம் கிட்டத்தட்ட 78 கிலோமீற்றர் தூரம்வரை மிச்சப்படும். அதேபோல, கடந்த காலங்களில் விரட்டியடிக்கப்பட்ட சமூகம், குறித்த பாதை திறக்கப்படுமாகவிருந்தால் மீள்குடியேற்றப்படுவார்கள். அந்த அடிப்படையில், இப்பாதை விரைவாகப் புனரமைக்கப்பட்டுத் திறந்துவைக்கப்பட வேண்டுமென்று பல சந்தர்ப்பங்களில் கேட்டிருக்கிறோம். மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் தீர்மானம் எடுக்கப்பட்டபோதும் கடந்த காலங்களில் நடவடிக்கை எடுக்கப்படவில்லை. அரசியல் காரணமாக, "அங்கிருந்து ஒரு குழு போகின்றது. இங்கிருந்து ஒரு குழு போகின்றது" என்று சில தீயசக்திகள் அதைக் குழப்பிவிட்டார்கள். இப்பொழுது மாண்புமிகு சனாதிபதி அவர்களிடமும் கேட்டிருக்கின்றோம். கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் environmental services team ஒன்றை அமைத்துச் சரியான நடவடிக்கையை எடுப்பதாகச் சாதகமான பதிலைச் சொல்லியுள்ளார். அதற்காக இந்த இடத்தில் அவருக்கு எனது நன்றியைக் கூறி, உரையை நிறைவுசெய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

Order, please!

මේ අවස්ථාවේදී ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු (කලානිති) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[අ.භා. 5.08]

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ විවාදයට එකතු වීමට මට කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන තේමාව යටතේ අපේ රට පොහොසත් කරන්න නම්, මිනිසුන්ගේ ජීවිත ලස්සන කරන්න නම්, වැවිලි අංශය අමතක කරලා අපට කටයුතු කරන්න බැහැ. එම නිසා වැවිලි අංශය අපේ රටේ ප්‍රධාන කොටසක් වෙනවා. ඒ අතරින් තේ සහ කුරුඳු ප්‍රධාන තැනක් ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ සහ කුරුඳු අපේ රටට ඩොලර් ගෙනෙන ප්‍රධාන භෝග දෙකක් වෙනවා. අපේ රටේ තේවලට ලොකු ඉතිහාසයක් තිබෙනවා. අද විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු අපේ රටේ තේ කර්මාන්තය, කුරුඳු කර්මාන්තය, පොල් කර්මාන්තය, වැවිලි භෝග අනතුරට පත් වෙච්ච විධිය සහ එය අභියෝගයට ලක් වෙච්ච විධිය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට කියන්න අවශ්‍ය මෙච්චරයි. ඔබතුමන්ලා ඒක කියන්න ඕනෑ කණ්ණාඩියක් ඉස්සරහට

[ගරු නිශාන්ත පෙරේරා මහතා]

ගිහිල්ලායි. අද වනවිට අපේ රටේ තේ කර්මාන්තය දැවැන්ත අර්බුදයකට ලක් වෙලා තිබෙන බව අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉංග්‍රීසි ජාතික ජේම්ස් ටේලර් 1867දී ලංකාවේ ලූල්කඳුරවත්තට මුල්ම තේ පැළය අරගෙන ආවේ අහම්බෙන් නොවෙයි. අපේ රටේ හැදෙන කළු තේ - black tea - ලෝකයේ වෙන කොහේවත් රටක හැදෙන්නේ නැහැ. ඒක හැදෙන්නේ ලංකාවේ. ලංකාවේත් හැදෙන්නේ මාතර දිස්ත්‍රික්කයේ තේ ත්‍රිකෝණය කියලා හඳුන්වන දෙනියාය ප්‍රදේශයේ. ලෝකයේ කොහේවත් රටක ස්වාභාවිකව කළු තේ හැදෙන්නේ නැති නිසා තමයි ජේම්ස් ටේලර් ලංකාවට ඒ තේ පැළය අරගෙන ආවේ. ඒ තේ පැළය අරගෙන ඇවිල්ලා තමයි අපේ රටේ තේ කර්මාන්තයක් විධියට ඒ කටයුත්ත කරන්න පටන් ගත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේ වෙනකොට තේ කර්මාන්තය දැවැන්ත අර්බුදයකට - දැවැන්ත විනාශයකට - ලක්වෙලා තිබෙනවා. ඒ විනාශය ගැන කියද්දී මම ඒකයි කිව්වේ, විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඒක කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා කියන්න කියලා. ඇත්තටම මේ ගැන කරුණු කියන්න අපට වෙලාවක් නැහැ. මා සතුව ඇති මේ පොතේ තිබෙන්නේ අපේ රටේ තේ කර්මාන්තය අභියෝගයට ලක් වෙච්ච විධිය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, කුඩා තේවතු සංවර්ධන අධිකාරිය, තේ ශක්ති අරමුදල කියන ආයතන සම්බන්ධයෙන් මේ පොතේ පිටු ගණන්වලින් තමයි සඳහන්ව තිබෙන්නේ. මෙවැනි අය වැය ලේඛන තුළින් තේ ශක්ති අරමුදලට වෙන් කරපු මුදල්වලට මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක ගැන මේ පොතේ සඳහන්ව තිබෙනවා. කුඩා තේවතු සංවර්ධන අධිකාරියට වෙන් කරපු මුදල්වලට මොකක්ද වෙලා තිබෙන්නේ, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට වෙන් කරපු මුදල්වලට මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක මේ පොතේ සඳහන්ව තිබෙනවා. තේ promote කරන්න පිට රට ගෙනිගිහිල්ලා මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක ගැනත් මේ පොතේ සඳහන්ව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒ විස්තර කියන්න මට වෙලාවක් නැහැ.

විශේෂයෙන්ම ගාල්ල කොටුවේ තිබුණු කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ බිල්ඩින් එක බදු දෙන්න ගිහිල්ලා අන්ත දූෂිත ක්‍රියා සිදු වී ඇත කියලා විගණන වාර්තාවල සඳහන්ව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලෝකයේ හොඳම කළු තේවලට අද මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක ගැන අපි කියන්න ඕනෑ. අද වනකොට එය භයානක තැනක තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ආණ්ඩුවේ අපි දන්නවා ඒ අභියෝග ගැන. වර්තමාන රජයේ ගරු ජනාධිපතිතුමා ප්‍රධාන අපේ ගරු සමන්ත විද්‍යාරත්න අමාත්‍යතුමා ඇතුළු අපි මේ අභියෝගය හොඳට හඳුනාගෙන තිබෙනවා. මේ තේ කර්මාන්තය උඩට ගන්න ඕනෑ. අපට මතකයි, රසායනික පොහොරවලින් කාබනික පොහොරවලට ගිහිල්ලා තේ කර්මාන්තය දැවැන්ත අභියෝගයකට ලක් කළා. අපි ඒ අභියෝගය හඳුනාගෙන රුපියල් ලක්ෂ 8,000ක මුදලක් තේ කර්මාන්තය සඳහා වෙන් කරලා තිබෙනවා. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට රුපියල් ලක්ෂ 8,000ක් සහ තේ පර්යේෂණ කටයුතු සඳහා රුපියල් ලක්ෂ 7,000ක් වෙන් කරලා තිබෙනවා. තේ තවාන් සංවර්ධනය සහමුලින් නතර කරලා තිබුණා. නැවත ඒ කටයුතු කරන්න අපේ රජය රුපියල් ලක්ෂ 175ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම නැවත වගාව නතර කරලා තිබුණා. දැන් විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා, නැවත වගාව කරන්න ඕනෑ කියලා. ඒ ගොල්ලන් නැවත වගාව නතර කරලා තිබුණේ. නැවත වගාව සඳහා අපේ රජය රුපියල් ලක්ෂ 2,742ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම පාළු වගාවත් නතර කරලා තිබුණේ. පසුගිය ආණ්ඩුවලින් ගත්ත තීන්දුව නිසා පාළු වගා සහනාධාරය ලබා දුන්නේ නැහැ. අපේ රජය පාළු වගා සහනාධාරය සඳහා රුපියල් ලක්ෂ 5,500ක් ද, ඍජු තේ වගාව සඳහා රුපියල් ලක්ෂ 600ක් ද, යාන්ත්‍රීකරණය සඳහා රුපියල් ලක්ෂ 625ක් ද වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, නිෂ්පාදනයේදී කර්මාන්තකරුවන්ට විශාල වැය බරක් දරන්න වුණා; නිෂ්පාදන වියදම වැඩි වුණා. අපි බලයට පැමිණ විදුලි බිල අඩු කළා. ඒ වාගේම, ඉන්ධන මිල අඩු කළා. ඒ සහන දුන්නා වර්තමාන රජයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ කර්මාන්තය සම්බන්ධව තව කියන්න ගොඩක් දේවල් තිබුණත් වෙලාව නැති නිසා මගේ කථාව සීමා කරනවා. - ගොඩක් කරුණු කථා කරන්න තිබුණත්, වෙලාව නැති නිසා කථා කරන්න විධියක් නැහැ.

ඊළඟට කුරුඳු ගත්තොත්, ලෝකයේ හොඳම කුරුඳු - cinnamon - තිබෙන්නේ ලංකාවේ. ගාල්ල දිස්ත්‍රික්කයේ, මීටියාගොඩ ප්‍රදේශයේ තමයි තිබෙන්නේ. දැන් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව අයින් කරන්න ඕනෑ කියලා. නැහැ. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව ඇත්තටම වෙන් කරලා පවත්වාගෙන යන එක වටිනවා. එතුමා කිව්වා, මේක සුදු අලියෙක් කියලා. එහෙම නැහැ. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉතා අවංකව මැදිහත් වෙනවා මේ දෙපාර්තමේන්තුව ඉස්සරහට අරගෙන යන්න. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කුරුඳු ලෝකයට ගෙනයන්න කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවත්, අමාත්‍යාංශයත් එක්ව දැවැන්ත වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. එය කෙටි කාලීන වාගේම දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක්. ඒ වැඩ පිළිවෙළ අපි ඉස්සරහට අරගෙන යනවා. අපි ස්තුතිවන්ත වෙනවා, එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට. විශාල සම්පත් අඩුවක් ඇතුළේ එතුමන්ලා අතිදැවැන්ත කැප කිරීමක් කරනවා. ඒකටත් ස්තුතිවන්ත වෙමින්, මට කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.14]

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. මම හිතන හැටියට මේක ඉතාම වැදගත් විවාදයක් වෙයි. විශේෂයෙන් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කියන ක්ෂේත්‍රය ගත්තොත්, ඒක ඉතාම වැදගත් ක්ෂේත්‍රයක්. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය ගත්තොත්, ඒක සංස්කෘතික සම්බන්ධතාව ඇති කරන ක්ෂේත්‍රයක්. උතුරේ තල් වෙන්න පුළුවන්, වයඹ සහ දකුණේ පොල් වෙන්න පුළුවන්, වතුකරයේ තේ කර්මාන්තය වෙන්න පුළුවන් ඒ පළාත්වලට අදාළ බොහෝ සංස්කෘති ඒක රාශි කරන ක්ෂේත්‍රයක් තමයි වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය.

අපි දන්නවා, පසුගිය කාල වකවානුව තුළ දැවැන්ත අක්‍රමිකතා නිසා, දැවැන්ත නොසැලකිල්ල නිසා මේ ක්ෂේත්‍රය මුළුමනින් කඩා වැටිලා තිබුණා. අපේ පොල් වෙන්න පුළුවන්, තල් වෙන්න පුළුවන්, අනෙකුත් භෝග වෙන්න පුළුවන්, තේ වෙන්න පුළුවන් ඒවාට ලෝකයේ අපට හිමි තැන ඇත්තටම අපට ලැබුණේ නැහැ. දෙනිකව මේ ක්ෂේත්‍ර කඩා වැටුණු එක තමයි වුණේ. ඒ වාගේම, පසුගිය කාල වකවානුව තුළ මේ ක්ෂේත්‍රවලට අදාළව යම් යම් ප්‍රශ්න මතු වෙනකොට, විපක්ෂය ඒවා උස්සාගෙන ආණ්ඩුවට විරුද්ධව මඩ ගසමින් අවලාද නැඟුවා. ඒ මොහොතේ තිබුණු ඒ උනන්දුව එතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ මේ ක්ෂේත්‍ර ගොඩනැඟීම සඳහා යම්කිසි ආකාරයකින් පාවිච්චි කරලා තිබුණා නම් මේ රටට මේ ඉරණම අත් වෙන්නේ නැහැ කියන එක මම කියන්න කැමැතියි.

පසුගිය කාලයේ දැවැන්ත පොල් අර්බුදයක් නිර්මාණය වෙලා තිබුණා. ඒකට විවිධ කරුණු කාරණා බලපා තිබෙනවා. එක පැත්තකින් ගත්තොත් පොල් ඉඩම් ටික හරියාකාරයෙන් පාවිච්චි කළේ නැහැ. අදාළ වටිනාකම් දෙන්නේ නැතිව ඒ ඉඩම් කටිටි කරලා විවිධ දේවලට පාවිච්චි කළා. ඒ මඟින් පොල් වගාවට තිබුණු වටිනාකම මුළුමනින්ම කඩා වැටුණා. ඒ වාගේම තවත් විවිධ කාරණා හේතු වෙලා තිබුණා. එවැනි එකක් තමයි, පසුගිය කාලයේ එක රැයින් රසායනික පොහොර තහනම් කිරීම. ඒකත් ප්‍රබල හේතුවක් වුණා. ඒ නිශ්චිත වෙලාවේත් අපි කිව්වා, අනිවාර්යයෙන් මේ decision එක reverse කරන්න, එහෙම නැත්නම් රටක් විධියට අපට දැවැන්ත ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙයි කියලා. නමුත් ඇත්තටම ගත්තොත් එදා ඒ ගත්ත තීරණය මේ පොල් අර්බුදය නිර්මාණය වෙන්න ඉතා දැඩි ලෙස බලපා තිබෙනවා.

ඒ වාගේම තවත් කාරණාවක් තිබෙනවා. ඒ තමයි සතුන්ගෙන් සිදුවන හානිය. ඒ සඳහා ලෝකයේ විද්‍යාත්මක පරීක්ෂණ ගණනාවක් කරලා විද්‍යාත්මක ක්‍රම ගොඩක් සොයාගෙන තිබෙනවා. එකක් තමයි, Lincoln-Petersen method කියන එක. ඒ Lincoln-Petersen method කියන එක අනුව තමයි අපි මේ දවස්වල මේ රටේ සත්ව සංගණනයක් කරගෙන යන්නේ. ඒ වාගේ විද්‍යාත්මක ක්‍රම හඳුන්වා දෙනකොට ඒවායේ අඩු පාඩු ඇති, ඒ සමහර ක්‍රම පැරණි ඒවා වෙන්න ඇති, ඒවා ලෝකය තාක්ෂණිකව දියුණු වෙන්න කලින් හඳුන්වා දීපු ක්‍රම වෙන්න ඇති. නමුත් ඇත්තටම අපි කොතැනින් හරි පටන් ගන්නට ඕනෑ. අපි දන්නවා, රටක් විධියට අපි කොතැනද ඉන්නේ කියලා. දැන් තමයි අපි බංකොලොත්භාවයෙන් ක්‍රමානුකූලව ගොඩ එන්නේ. ඒ නිසා අපි කොතැනින් හරි පටන් ගන්න ඕනෑ.

මේ රටේ තිබෙන දැවැන්තම ප්‍රශ්නය තමයි අපේ ළඟ සංඛ්‍යාලේඛන -දත්ත- නැතිකම. වී ප්‍රශ්නය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, අනෙකුත් දේවල් සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රශ්න සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, කෘෂිකර්මාන්තයට අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, වැවිලි කර්මාන්තයට අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, ඒ හැම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ම ගත්තොත් අපේ ළඟ හරි දත්ත -තොරතුරු- නැති ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ කටයුත්ත කොතැනින් හරි පටන් ගන්න ඕනෑ කියලා. නමුත් ඒ විද්‍යාත්මක ක්‍රමය හඳුන්වා දෙනකොටම ඒක විහිළුවට ලක් කරමින්, නින්දා අපහාස කරමින්, මුළුමනින්ම කඩාකප්පල් කරන ක්‍රියාවලියක තමයි විපක්ෂය හිටියේ. මම හිතන්නේ තවදුරටත් ඒක වලංගු නැහැ කියන එක අද ඔප්පු වෙලා තිබෙනවා. ජනතාවත් ඉතා හොඳ ආකාරයෙන් සහභාගි වෙලා මේ වැඩ කටයුත්ත අද පටන් ගත්තා. අපි හිතනවා, ඒක හොඳ ආරම්භයක් කියලා. රටක් විධියට අපි හරියාකාරයෙන් සංඛ්‍යාලේඛන -දත්ත- තබා ගත්තොත් පමණයි, ඉතුරු ටික අපට කර ගන්න පුළුවන් වෙන්නේ; අපි ලබාදෙන ස්ථිර විසඳුම මොකක්ද කියලා කියන්න පුළුවන් වෙන්නේ.

ඒ වාගේම අපේ තල් කර්මාන්තය ගත්තත් විශාල ගැටලු ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන් උතුරේ යුද්ධය නිසා දැවැන්ත හානියක් තල් කර්මාන්තයට සිද්ධ වෙලා තිබුණා. ඒ වාගේම තල් කර්මාන්තය ආශ්‍රිතව අපි value addition එකකට ගියේ නැහැ. ගියා නම් සීමිත ප්‍රමාණයකට තමයි ගිහිල්ලා තිබුණේ. නමුත් එහෙම නැතුව දැන් අපි ඒ සම්බන්ධයෙන් ඉතා හොඳට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒකට අදාළ හොඳ සැලසුමක් ආණ්ඩුවක් විධියට අපට තිබෙනවා. ඒ ක්ෂේත්‍රයට හිමි තැන අපි අනිවාර්යයෙන් ලබා දිය යුතුයි. ඒ ක්ෂේත්‍රය ඉතා හොඳට දියුණු කරන්න පුළුවන් ක්ෂේත්‍රයක්. ඇත්තටම තල් ආශ්‍රිතව ලෝක වෙළෙඳ පොළේ අපට ලොකු තරගයක් නැහැ. ලෝකයේ බොහෝ රටවල තල් ගස් නැහැ. ඒ නිසා මේක වෙන මාර්කට් එකක්. අපට දැන් හොඳ සැලසුමක් තිබෙනවා. දැන් තල් සංවර්ධන මණ්ඩලයට අපි හොඳ කණ්ඩායමක් පත් කරලා තිබෙනවා. කලින් සිදු කළ ආකාරයේ දේශපාලන පත්වීම් නොවන, ඒ ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් තිබෙන ඉතා හොඳ කණ්ඩායමක් පත් කරලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඒ ක්ෂේත්‍රයත් අපට ඉතා වේගයෙන් ඉස්සරහට අරගෙන යන්න පුළුවන් කියලා. අපට විදේශ විනිමය ලබා ගන්න පුළුවන් ක්ෂේත්‍රයක් විධියට ඒ ක්ෂේත්‍රය පත්කර ගන්න පුළුවන්.

ඒ වාගේම තවත් කාරණයක් තිබෙනවා. අනිවාර්යයෙන්ම අපි ඒ ගැන කථා කරන්නම ඕනෑ. ඇත්තටම මේ අමාත්‍යාංශය ඉතා විශේෂ අමාත්‍යාංශයක්. මොකද, තේ කර්මාන්තය සම්බන්ධව වාගේම ඒ යටිතල පහසුකම් සම්බන්ධවත් මේ අමාත්‍යාංශයට යම් කිසි කාර්යභාරයක් තිබෙනවා. ඒ ගැන ඉතාම සතුටුයි. මීට කලින් මේ විධියට විද්‍යාත්මක විධියට විෂයයන් බෙදා තිබුණේ නැහැ. වැවිලි කර්මාන්තය වෙනමත්, යටිතල පහසුකම් වෙනමත් තමයි බෙදා තිබුණේ. නමුත් දැන් ඇත්තටම ඉතාම විද්‍යාත්මක විධියට කටයුතු කරගෙන යනවා.

අපි දන්නවා, විශේෂයෙන්ම ඒ මලයගම් ජනතාව අවුරුදු 200ක් විතර තිස්සේ දැවැන්ත පීඩාවකට, දැවැන්ත ගැටලුවලට මුහුණ දෙන බව.

හරියට ගත්තොත්, තමන්ගේ ගෙදරට ලිපියක් ගෙන්වා ගන්න බැරි අය විධියට, ඒ කියන්නේ ගෙදරට address එකක් නැති අය විධියට තමයි ඒ ජනතාව මේ වන කල්ම ජීවත් වන්නේ. ඒ නිසා අපට දැවැන්ත වගකීමක් තිබෙනවා, ඒ ජනතාවට හිමි ඒ මූලික අයිතිවාසිකම් ලබා දෙන්න. ඒ වාගේම තමයි අපි ඒ ක්ෂේත්‍රයත් ආරක්ෂා කරන්නට ඕනෑ. එක්තරා පාර්ශ්වයක් තරහා කරගෙන ඒ ක්ෂේත්‍රය දියුණු කර ගන්න එක නොවෙයි කළ යුත්තේ. ඒ ක්ෂේත්‍රය රැකගැනීම තුළ තමයි ඒ ජනතාවගේ ජීවිතයත් රැක ගන්න හැකි වන්නේ. ඒ නිසා අපි ඒ ක්ෂේත්‍රයත් අනිවාර්යයෙන් රැකගන්නට ඕනෑ.

පසුගිය කාල වකවානුව ගත්තොත්, අපේ තේ කර්මාන්ත ක්ෂේත්‍රය ඉතාම වේගයෙන් කඩා වැටුණු ක්ෂේත්‍රයක් විධියට තමයි අප දකින්නේ. අපි ඒ ක්ෂේත්‍රය ඉතාම වේගයෙන් ගොඩනඟන්න ඕනෑ. ඒ වාගේම, ඒ ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන්නත් ඕනෑ. ඒ අයගේ ඉඩම් අයිතිවාසිකම් වෙන්න පුළුවන්, නිවාස අයිතිවාසිකම් වෙන්න පුළුවන්, අධ්‍යාපන අයිතිවාසිකම් වෙන්න පුළුවන්, ඒ සියලු අයිතිවාසිකම් ලබා දීම සඳහා ආණ්ඩුවක් විධියට මැදිහත් වෙලා, ඒවාට අදාළ නිශ්චිත උත්තරයක්, නිශ්චිත විසඳුමක් අපි ලබා දිය යුතුයි.

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

ඒ වාගේම, කුරුඳු වගාව ගැනත් කියන්න ඕනෑ. අපි දන්නවා, කුරුඳු ගත්තොත්, ලෝකයේ හොඳම කුරුඳු - cinnamon - තිබෙන්නේ ලංකාවේ බව. තව cassia කියා වර්ගයක් තිබෙනවා. Cassia වාගේ නොවෙයි, cinnamon. ලංකාවේ කුරුඳු - cinnamon - ගත්තොත්, ඒකට ඉතාම හොඳ මාර්කට් එකක් ලෝකයේ තිබෙනවා. හැබැයි, අවාසනාවකට වාගේ අගය එකතු කිරීමට - value addition - අදාළව නිශ්චිත බරක් දමලා කටයුතු කරන්න පසුගිය කාලයේ අපට බැරි වෙලා තිබුණා. අපි විශ්වාස කරනවා, ජාතික ජන බලවේගය ප්‍රමුඛ මේ ආණ්ඩුව, මේ රට පාලනය කරන මේ කාලය තුළ "Ceylon Cinnamon" කියන brand එක, ඉතාම හොඳ brand එකක් විධියට ලෝකයට හඳුන්වා දෙන්න පුළුවන් වෙයි කියලා. ඒ සඳහා ලොකු මාර්කට් එකක් තිබෙනවා. නමුත්, අපට ලොකු තරගකාරිත්වයක් නැහැ. කරන්න පුළුවන් අවම දේවල් කරනවා නම් ඒ වෙළෙඳ පොළ අත්පත් කරගන්න අපට අනිවාර්යයෙන්ම පුළුවන්.

කෞරව තලෙමෙතාඞ්කුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්‍රෙය තිනම් මික මුක්කියමානතාකුම්. පෙරුන්තෝට්ට මර්‍රුම් සමූක උට්කට්ටමෙප්පු වසතිකළ් අමෙච්චානතු ඉලඞ්කෙයින් වටක්කාකවෝ, තෙර්කාකවෝ, මලෙයක මාකවෝ ඉරුක්කලාම්, අනෙත්තුප් පිරතේසඞ්කළෙයුම් ඔන්‍රිණෙක්කුම් ඔර් අමෙච්චාකත්තාන් ඉරුක්කින්‍රතු. කුරිප්පාක තෙන්නෙයාක ඉරුක්කලාම්, පනෙයාක ඉරුක්කලාම්, තේයිලෙයාක ඉරුක්කලාම්, ඉන්ත අනෙත්තු උර්පත්තිකළෙයුම් ඔන්‍රිණෙත්තුප් පයණික්කුම් ඉන්ත අමෙච්චු චම්පන්තමාන විවාතත්තිල් පඞ්කෙටුප්පතිල් නාන් මිකුන්ත මකිල්ච්චියටෙකින්‍රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(මාණ්පුමිකු අරුණ් හේමච්චන්දිරා)
(The Hon. Arun Hemachandra)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කුරිප්පාක, ඉන්ත මක්කළ් එතිර්නෝක්කුකින්‍ර පල්වේරු තරප්පට්ට පිරච්චිනෙකළුක්කු නාඞ්කළ් ඉන්ත අමෙච්චින් මූලමාක එමතු කාලප්පකුතියිල් තීර්වුකළෙප් පෙර්‍රුක් කොටුප්පතර්කු එණ්ණුකින්‍රෝම්. තෙන්නෙ උර්පත්ති චාර්න්ත විටයඞ්කළාක ඉරුක්කලාම්, පනෙ උර්පත්ති චාර්න්ත විටයඞ්කළාක ඉරුක්කලාම්, මලෙයත්තිල් තේයිලෙ උර්පත්ති මාත්තිරමල්ලාතු අන්ත මක්කළින් වාළ්ක්කෙක්කුරිය අටිප්පටෙ වසතිකළ් චම්පන්තප්පට්ට විටයඞ්කළාක ඉරුක්කලාම්, ඉවෙ අනෙත්තුක්කුම් නිරන්තරත් තීර්විනෙප් පෙර්‍රුක්කොටුප්පතර්කු නාඞ්කළ් කටමෙප්පට්ටුල්ළෝම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.24]

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
(මාණ්පුමිකු තර්මප්පිරිය තිසානායක්ක)
(The Hon. Dharmapriya Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන අද දිනයේ ඒ සමස්තය සම්බන්ධයෙන් බොහෝ කරුණු ඉදිරිපත් වුණා. ඇත්තටම කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට, පොල් ත්‍රිකෝණයට සම්බන්ධ භූමියක ජීවත් වන පුද්ගලයෙකු විධියට මම මේ අවස්ථාවේ පොල් කර්මාන්තය ආශ්‍රිතව කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම ලංකාවේ තේ, පොල්, රබර් මත පදනම් වූ ආර්ථිකයක් සහිත ඉතිහාසයක් තිබුණා. ඒ වගා අතුරින් පොල් වගාව අපට විශේෂයි. මොකද, මම පොල් වැවෙන භූමියක ජීවත් වන කෙනෙක්. රජය විධියට අපි බලාපොරොත්තු වෙනවා, මෙම අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා යොමු කරන්න. ලංකාවේ පොල් අස්වැන්න ලෙස ගෙඩි මිලියන 3,000කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න මේ වන කොට වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. මෙතෙක් පොල් අපනයනය කරලා අපට වසරකට ලැබුණේ රුපියල් බිලියන 247කට ආසන්න මුදලක්. එය මේ වසර තුළ රුපියල් බිලියන 265 දක්වා වර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මුලින් කී සංඛ්‍යාව ඩොලර්වලින් ගත්තොත්, ඩොලර් මිලියන 825ක්. එය ඩොලර් 900 දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. පොල් වගාව වැඩිදියුණු කරන්නත්, පොල් වගාව සඳහා අලුතින් ඉඩම් ප්‍රමාණයක් එකතු කර ගන්නත්, යටි වගාව දියුණු කරන්නත් අපි කටයුතු කරනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ විධියට පොල් වගාව වෙනුවෙන් දැවැන්ත වැඩ පිළිවෙළක් මේ මංගල අය වැය යටතේ සකස් කරන්න බලාපොරොත්තු වෙනවා.

පොල් සම්බන්ධව දැන් තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි පොල් හිඟය. පොල් හිඟය සම්බන්ධයෙන් කථා කරද්දී විවිධ පාර්ශ්ව බොහෝ කරුණු කාරණා කියනවා. අද පොල් වගාවට වෙච්ච විනාශය ගැන කථා කරනවා, වනසතුන්ගෙන් වන හානිය ගැන කථා කරනවා. හැබැයි, අවුරුදු 76ක් තිස්සේ පැවැති රජයන් පොල් වගාවට කළ හානිය ගැන අපි මේ ගරු සභාව දැනුවත් කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. පසුගිය කාල සීමාවේ කුරුණෑගල වැවිලි සමාගම - Kurunegala Plantations Limited - සතුව තිබුණු ඉඩම් මහා විශාල ප්‍රමාණයක් හිටපු මැති ඇමතිවරුන් පිරිසක් මේ වන කොට ඔවුන් සතු කරගෙන තිබෙනවා. සාලින්ද දිසානායක හිටපු ඇමතිවරයා 1992දී අක්කර 76ක් සතු කරගත්තා. එය ඔහු සතු ඉඩම් ප්‍රමාණයක් බවට පත් වෙලා තිබුණා. ඒ වාගේම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අක්කර 17කුත්, අක්කර 20කුත් එම භූමියෙන් අරගෙන පෞද්ගලික හිතවතුන්ට දීලා තිබෙනවා. ඒ වාගේම 2024 අවුරුද්දේ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා අක්කර 50ක් විශේෂ කාරණයකට කියලා - කොතලාවල වෛද්‍ය පීඨයට කියලා- වෙනම අරගෙන තිබෙනවා. නමුත් මේ වන කොට කිසිදු පදනමක් නැතුව ඒ ඉඩම රජයට අයත් නැති පෞද්ගලික ඉඩමක් බවට පත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල් වගාවට වුණු තවත් විනාශයක් තිබෙනවා. තේ, රබර් සහ පොල් වතු කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලය - Fragmentation Board - ඇති කර තිබෙන්නේ ඉඩම් කැබැලි නොකිරීම වෙනුවෙන්. ඒක රබර් වතු, තේ වතු, පොල් වතුවලට අදාළව පිහිටුවපු ආයතනයක්.

හැබැයි, පසුගිය කාලසීමාවේ දී ඉඩම් කැබලි කිරීම නැවැත්වීම වෙනුවෙන් හදපු මේ ආයතන විශාල විධියට පොල් ඉඩම් විනාශ

කිරීමට කටයුතු කරපු ආයතන බවට පත්වෙලා තිබුණා. මම විශ්වාස කරනවා වර්තමානයේ ඒක සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙනවා කියලා. ඉඩම් වෙන්දේසි කිරීම ලංකාවේ පොල් නිෂ්පාදනය සෑහෙන දුරට නවතින්න බලපෑ කාරණයක් බවට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුණෑගල නගරය ආසන්නයේ ඉඩම්වලට විශාල වටිනාකමක් තිබෙනවා. අක්කර 5ට වැඩි ඉඩම් කැබලි කරන්න අවසරයක් දෙන්න බැහැ. හැබැයි, අදාළ නිලධාරීන් විසින් විවිධ හේතු මත අක්කර 20ක ඉඩමක් සම්පූර්ණයෙන් විනාශයට පත්කර තිබුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා මේ සතුන්ගෙන් වන හිරිහැරය වාගේම, පසුගිය කාල සීමාවේ හිටපු මැති ඇමතිවරුන්ගේ කටයුතුත් මේ පොල් වගාවට විශාල විනාශයක් වුණා කියලා. අපි රජයක් විධියට බලාපොරොත්තු වෙනවා, මේ විනාශයට උත්තරයක් විධියට මේ පොල් ඉඩම්වලට අලුතින් පොහොර සහනාධාරයක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් විශේෂ කාරණයක් තිබෙනවා. සාමාන්‍යයෙන් පොල් ගහක ආයු කාලය අවුරුදු 70ක්. ඒ ආයු කාලයෙන් අවුරුදු 50ක් විතර ගෙවුණාට පස්සේ යටි වගාවක් කරන්න අවශ්‍යයි. ඒ යටි වගාව කරන්න නම් ඇත්තටම වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. පසුගිය කාල සීමාව තුළ එහෙම වැඩ පිළිවෙළක් කිසිදු රජයක් යොදලා තිබුණේ නැහැ. පොල් වගාව පොල් ඉඩම් හිමියන්ට එපා වෙලා තිබුණා. පොල් ඉඩම් හිමියන් පොල් වගාවෙන් ඉවත් වෙලා හිටියා. ඒ ඉවත් වීම නිසා පොල් වගාව කැමැත්තෙන් කළේ නැහැ. ඒ නිසා ඔවුන්ගේ පොල් ඉඩම් විකුණලා ඒ මුදල් ටික තියාගෙන ඒවායෙන් වෙනත් වෙනත් කටයුතු කරන්න ඔවුන් සූදානම් වෙලා හිටියා. හැබැයි, මේ වෙනකොට ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. දැන් රජය සතු වැවිලි සමාගම් -කුරුණෑගල වැවිලි සමාගම, හලාවත වැවිලි සමාගම වාගේ වැවිලි සමාගම්- මේ වෙනකොට ඒ ඉඩම්වල අතුරු බෝග වගා කරලා දැවැන්ත වැඩ කටයුත්තක් පටන් අරගෙන තිබෙනවා. මේ ඉඩම් හරියට සංවර්ධනය වෙනවා නම්, ඒවාට නිසියාකාරයෙන් පොහොර ටික ලැබෙනවා නම්, නිසියාකාරයෙන් සැලකිල්ලක් තිබෙනවා නම් අපට නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන්. පසුගිය කාල සීමාවේ මේ ඉඩම්වල තිබුණු ජල පහසුකම මේ වෙනකොට නැති වෙලා තිබෙනවා. පොල් ඉඩම්වලට ආදරයෙන් වැඩ කරන පොල් ඉඩම් හිමියන් පසුගිය කාලයේ හිටියේ නැහැ. පොල් ගෙඩියක මිල ගත්තොත්, සාමාන්‍යයෙන් රුපියල් 120ත්, රුපියල් 150ත් අතර මිලක් තමයි වෙන්නේ. එහෙම වුණොත් තමයි පොල් ඉඩම් හිමියාත්, පොල් ආශ්‍රිත නිෂ්පාදනකයාත් යනාදී ඒ සියලුදෙනා සතුටට පත් වෙන්නේ. පොල් එක්ක අතුරු නිෂ්පාදන විශාල ප්‍රමාණයක් තිබෙනවා. පොල් ආශ්‍රිතව දැවැන්ත කර්මාන්තයක් මුළු ලංකාව තුළ ක්‍රියාත්මක කරන්න පුළුවන්, විශේෂයෙන් වයඹ පළාතේ. ඒ වෙනුවෙන් රජය මේ අය වැයෙන් දක්වන ලද සහයෝගයට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අද ලංකාවේ මූලික ප්‍රශ්නයක් වෙච්ච පොල් ප්‍රශ්නයට උත්තරයක් ඉදිරියේදී ලැබෙන බවට සහතික වෙමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.32]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයක ඉන්න මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ, පොල් ත්‍රිකෝණයේම ඉන්න කෙනෙකුට කථා කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකයේ පොල් සඳහා ලොකු demand එකක් තිබෙනවා. අද ඒ demand එක, ඒ වෙළෙඳ පොළ අත්පත් කර ගන්න අපි විශාල කාර්යභාරයක් කළ යුතුව තිබෙනවා. පොල් වතුර, පොල් කිරි, පොල් තෙල්, ඩීසී සහ පොල් ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන හැම දෙයකටම මිලක් නියම කරන්න පුළුවන්. පොල් ගහ කිව්වාම -කජ්රුක කිව්වාම- ඒ හැම දෙයකටම මිලක් තිබෙනවා. ඒ වාගේම ඒවායින් අගය එකතු කරන්න පුළුවන් භාණ්ඩ නිෂ්පාදනය කරන්න පුළුවන්. අද අපේ අපනයනකරුවන් අද විශාල අර්බුදයක වැටිලා තිබෙනවා, මේ පොල් හිඟය නිසා. වියට්නාමය, පිලිපීනය වාගේ රටවල් එක්ක අපට තරග කරන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමන්ලා අවධානය යොමු කරලා තිබෙනවා, මේ ක්ෂේත්‍රයේ SVAT එක පිළිබඳව. ඒ SVAT එක ඉවත් කරලා මේ පොල් කර්මාන්තය රැක ගන්න අවශ්‍ය මූලික පියවර තිබ්බොත් මේ කර්මාන්තකරුවන්ට විශාල හයියක් ලැබෙයි. ඒ වාගේම ඒ අයට අඩු පොලියට ණය දෙන්න පුළුවන් නම් හොඳයි. මොකද, මේ කට්ටිය ඔක්කෝම ඩොලර් ගෙනෙන අය. අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ 2024දී ඩොලර් මිලියන 800කට ආසන්න මුදලක් ගෙනාවා. මේ කර්මාන්තයේ යෙදී සිටින අයගේ ඉලක්කය ඒක ඩොලර් මිලියන 1,000කට - US Dollars 1 billionවලට - අරගෙන යන්නයි.

එහෙම නම් ඔවුන්ට ශක්තිය ලබා දෙන්න ඕනෑ. මීට මාස හය, හතකට කලින් රුසියාවෙන් අපට ලැබුණා, MOP පොහොර මෙට්ක්ටොන් 55,000ක්. මම දන්න විධියට ඒකෙන් මෙට්ක්ටොන් 27,000ක් තේවලට දුන්නා. අනෙක් මෙට්ක්ටොන් 27,500 තිබෙනවා, පොස්පේට් සහ යූරියාත් එකතු කරලා පොල් වගාවට බෙදා හරින්න. මම දන්නේ නැහැ ඒ ටික බෙදන්න තිබෙන ප්‍රමාදය මොකක්ද කියලා. මේකේ ඇත්ත නැත්ත මොකක්ද කියලා මම දන්නේ නැහැ. දූෂමාන ආරංචියක් තිබෙනවා, ඡන්දය ළං වෙනකොට බෙදන්න බලාගෙන ඉන්නවා කියලා. ඒ පොහොර ටික බෙදන්න ඕනෑ වැස්සට කලින් මිසක්, ඡන්දෙට කලින් නොවෙයි ගරු ඇමතිතුමා. වැස්සට කලින් බෙදුවොත් තමයි පොල්ගස්වලට මේ පොහොර ටික වඩා ප්‍රයෝජනවත් වෙන්නේ. ඡන්දෙට කලින් බෙදන්න ගිහිල්ලා වැස්ස ඉක්මන් වුණොත් පොහොර ටික හෝදාගෙන යනවා. ඒ නිසා ගරු ඇමතිතුමා,-

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමා කියපු කාරණයට යම් පැහැදිලි කිරීමක් කරන්නයි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ පොහොර බෙදීම පමා වෙන්න හේතුව ඡන්දේ ප්‍රශ්නයක් නොවෙයි. රුසියාවෙන් නොමිලේ ලැබිච්ච ඒ පොහොරවලට පොස්පේට් සහ යූරියා දෙවර්ගය කලවම් කිරීමේදී මුදලක් වැය වන නිසාත්, එය සහනාධාර මිලකට දෙන්න වෙන නිසාත්, ඒකට රුසියාවෙන් එකඟතාව ගැනීමේ අවශ්‍යතාවක් තිබුණා. අන්න ඒ එකඟතාව ගත්තේ මීට සති දෙකකට උඩදී. දැන් ඒ ටික පොහොර සංස්ථාවේ කලවම් වෙලා, බෑග් කරලා මේ මාසයේ අන්තිමේ ඉඳලා බෙදනවා. ඔබතුමා කිව්වා වාගේම පැළේට ඕනෑ වෙලාවට පොහොර ටික ලබා දෙනවා. ඒකේ කිසි ගැටලුවක් නැහැ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

වැස්සට කලින් දෙනවා නම් හොඳයි. ඒ උත්තරයක් ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පොල් පැළ ගත්තොත් ගරු ඇමතිතුමනි, සමස්තයක් වශයෙන් ලක්ෂ 30ක් විතර තමයි පෞද්ගලික අංශයත් එක්ක CRI එකෙන් පොල් පැළ නිෂ්පාදනය වෙන්නේ. පොල් පැළ මිලියන 10ක් - ලක්ෂ 100ක්වත්- වාර්ෂිකව එළියට ආවොත් තමයි පොල් ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති වෙලා වැඩි අස්වැන්නක් ගන්න පුළුවන් වෙන්නේ. යහ පාලන රජය කාලයේත් උතුරු පළාතේ දෙවැනි පොල් ත්‍රිකෝණය පිළිබඳව කථා කළා. ඉතින්, පොල් ත්‍රිකෝණය ගැන කථා කරලා හරියන්නේ නැහැ. ඒකට අවශ්‍ය වටපිටාව හදන්න ඕනෑ. මම දන්නවා, ඔබතුමන්ලා මේ පොහොර ටික දෙන්න යන්නේත් අක්කර භාගයක් හෝ අක්කර 5, 4 -අක්කර 5ට අඩු- ප්‍රමාණයකට කියලා. ඒක හොඳයි. මොකද, ගෙවත්තේ තමයි පොල් ගස් වැඩියෙන්ම තිබෙන්නේ. ගරු අගමැතිතුමියනි, පොල් වැඩියෙන්ම තිබෙන්නේ ගෙවතුවල මිසක්, මහා පරිමාණ වතුවල නොවෙයි. හැබැයි, ගෙවත්තට පොහොර ටික ලැබෙන්නේ නැහැ. ගෙවත්තේ ඉන්න කෙනා බලන්නේ ගෙවත්තෙන් පොල් ටික කඩාගෙන පරිභෝජනය කරන්න. ඊට එහා දෙයක් ඔවුන් හිතන්නේ නැහැ. නමුත් ගෙවත්තේ පොල් ගසේ තමයි අස්වැන්න අඩුවෙන්ම ලැබෙන්නේ. ඒ නිසා ගෙවත්තට පොහොර ටික ලබා දීම ඉතාම වටිනවා. ඒ වාගේම නව තාක්ෂණය යොදා ගෙන අලුත් පොල් ප්‍රභේද හඳුනා ගෙන තිබෙනවා. මම දන්නේ නැහැ CRI එක පසුගිය කාලය පුරා අලුතින් සොයා ගත්තු පොල් ප්‍රභේද මොනවාද කියලා. හැබැයි, අපි ඔවුන් තවත් ශක්තිමත් කරන්න ඕනෑ. ඔවුන්ට සම්පත් නැත්නම්, තාක්ෂණය නැත්නම් අපි ඒවා ලබා දිය යුතුයි. පිලිපීනය, ඉන්දුනීසියාව පොල්ගස්වලින් වැඩි ඵලදාවක් ලබනවා. ඒකට හේතුව තමයි, ඔවුන් අවුරුදු 5ට, 15ට, 20ට සැලසුම් කරපු ව්‍යාපෘති ක්‍රියාත්මක කරන එක.

ගරු අමතිතුමනි, කන්තලේ සීනි කර්මාන්තශාලාව ආශ්‍රිත ඉඩම් පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඒවා අයත් වෙන්නේ, කර්මාන්ත අමාත්‍යාංශයට වෙන්න පුළුවන්. නමුත්, ඔබතුමාත් අවධානය යොමු කරන්න. ඒ ඉඩම් පාවිච්චි කරපු ගොවි පවුල් 250ක්, 300ක් පමණ ඉන්නවා. මේ ඉඩම් කට්ටි වගා කරන්න දෙන්නේ, තාවකාලිකව. නැතුව පදිංචියට නොවෙයි. ඔබතුමන්ලා ඒවා වෙනත් පුද්ගලයන්ට ලබා දෙනවා. මම කියන්නේ නැහැ NPP එකේ අයට දෙනවා කියලා. හැබැයි, ඒ ඉඩම් පාරම්පරිකව පාවිච්චි කරපු අය යම් ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට සාධාරණය ඉෂ්ට කරලා එතැනින් එහාට ඔබතුමන්ලා සාධාරණව ඒ කටයුත්ත කරන්න කියන එකත් මතක් කරනවා.

මේ අමාත්‍යාංශයට අදාළ නොවුණත් මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. බටලන්ද වාර්තාව ගැන ගරු සභානායකතුමා කථා කළා. බටලන්දේ වෙච්ච දේවල් අපි අනුමත කරන්නේ නැහැ. හැබැයි, බටලන්දවල් හැදුණේ, බටලන්දවල් බිහි වුණේ මොකද කියලා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. 1988, 1989 කාලයේ මේ රටේ භීෂණයක් තිබුණා; ත්‍රස්තවාදයක් තිබුණා. ඒ ත්‍රස්තවාදය නිසා මේ දෙකොට්ඨාසයේම 60,000ක් විතර මැරුණා. අහිංසක ග්‍රාම නිලධාරී මහත්වරු, ස්වාමීන් වහන්සේලා, වෛද්‍යවරු, විදුහල්පතිවරු, පොලිස් නිලධාරීන්, හමුදා සෙබළුන් ඉතා මිලේච්ඡ විධියට ඝාතනය වුණා. ඒ නිසා බටලන්ද සම්බන්ධව සාධාරණයක් ඉෂ්ට කරනවා වාගේම, 1988,1989 කාලයේ මිලේච්ඡ විධියට ඝාතනය වුණු මේ රටේ අහිංසක මිනිස්සු, ඒ අයගේ දරුවන් විශාල පිරිසකුත් ඉන්නවා.

දැන් ඔබතුමන්ලාගේ රණ විරුවෝ ඉන්නවා. ඔබතුමන්ලාගේ ත්‍රිවිධ හමුදා සාමූහිකයේ රණවිරුවෝ ඉන්නවා. සමහර විට එම සාමූහිකයේ ඇති, ත්‍රස්තවාදින් මර්දනය කිරීම සඳහා රජය පැත්තෙන් දායක වෙච්ච අය. මෙය බොහොම සංවේදී කාරණයක්. ඔබතුමන්ලා එක්තරා අවස්ථාවක එම ඉතිහාසය වළලා දැම්මා. මම දන්න විධියට මේ ආණ්ඩුවට බටලන්ද වධකාගාරයත් මතක් වුණේ දැන්. මේ ආණ්ඩුව බලයට පත් වෙලා පසුව දාම මතක් වෙන්න ඕනෑ කාරණා තමයි මේවා. රෝහණ විජේවීර මහත්මයාත් අමතක වෙච්ච එකේ ඉතින්, බටලන්ද අමතක වෙච්ච එක ගැන නම් ගරු අගමැතිතුමියනි එච්චර ලොකු ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි අල් ජසීරා එක මතක් කළාට පස්සේ තමයි ආණ්ඩුවට බටලන්ද මතක් වුණේ. මේ සංවේදී කාරණය සම්බන්ධව සොයා බැලීම, ඒකට සාධාරණය ඉෂ්ට කිරීම කළ යුත්තක්. හැබැයි, ඒ සාධාරණය ඉෂ්ට වීම එක පාර්ශ්වයකට විතරක් වෙන්න බැහැ. ජනතා විමුක්ති පෙරමුණෙන් ඝාතනය වූ අහිංසක පවුල්වල උදවියටත් සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. අපේ ගම්වල තවමත් ඉන්නවා, ඒ ඝාතනය වූ අයගේ දරුවෝ, මුණුබුරු මිණිබිරියෝ සහ බිරින්දෑවරු, ස්වාමි පුරුෂයෝ. ඒ අය ඝාතනය කරන්න හේතුව මොකක්ද? ග්‍රාම නිලධාරී මහතා රාජකාරි කිරීම, ගමේ පන්සලේ හාමුදුරුවෝ බණ දේශනා කිරීම, පොලිස් නිලධාරියා රාජකාරියට යෑම හා තැපැල් මහත්මයා ලියුම් බෙදීම. අපි දන්නවා, රිවඩ් ද සොයිසා වාගේ මාධ්‍යවේදීන්, අපේ විජය කුමාරණතුංග මහතා වැනි දේශපාලනඥයන් විශාල පිරිසක් ඝාතනය වුණු බව. ඒ කාලයේ 60,000ක් විතර ඝාතනය වුණා කියනවා. ඒ සංඛ්‍යාලේඛනවත් නිවැරදිද දන්නේ නැහැ. ඝාතනය වූ ඒ සියලුදෙනා වෙනුවෙන් සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. බටලන්දෙන් එහා ගිය පුළුල් පරීක්ෂණයක්, පුළුල් විභාගයක්, පුළුල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා ඒ සත්‍ය සොයා ගැනීම ඉතාම වැදගත්. ඒ නිසා බටලන්දට විතරක් කොටු වෙන්න එපා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු ඇමතිතුමනි, මෙම අමාත්‍යාංශයේ කටයුතු කරද්දී ලොකු වගකීමක් තිබෙනවා. අපි පාසල් යන කාලයේ අපේ රටේ වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රධාන ආදායම් මාර්ග විධියට අපි දැක්කේ තේ, පොල් හා රබර්. හැබැයි, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට පුළුවන් වුණා එම ප්‍රධාන ආදායම් මාර්ග ඉක්මවා යන ක්ෂේත්‍ර එතුමාගේ විවෘත ආර්ථික ක්‍රමයත් එක්ක ගෙනෙන්න. ඒ ගැන අපි සතුටු වෙනවා. ඒ හරහා එක පැත්තකින් සංචාරක කර්මාන්තය ඉස්සරහට ආවා. අනෙක් පැත්තෙන් ඇඟලුම් කර්මාන්තය ඉස්සරහට ආවා. තවත් පැත්තකින්, අපේ රටේ ශ්‍රමිකයන්, අපේ රටේ බුද්ධිමතුන් පිට රටවලට ගිහිල්ලා එවන විදේශ ප්‍රේෂණ ලැබුණා. ඒ කියන්නේ, තේ, පොල් හා රබර් ඉක්මවා ගිහිල්ලා ආදායම් ක්ෂේත්‍ර තුනක් 1977 සමයේ ඉස්සරහට ආවා. නමුත්, අපේ ප්‍රධාන අපනයන භෝග කියන්නේ අපට වැදගත් භෝග. කුරුඳු වෙන්න පුළුවන්, අනෙකුත් කුළු බඩු වෙන්න පුළුවන්, ඒ හැම ක්ෂේත්‍රයකටම අගය එකතු කරන දාම අපි ක්‍රියාත්මක කරලා තිබෙනවා. විදේශ වෙළෙඳ පොළ ආක්‍රමණය කරලා තිබෙනවා. මට මතකයි, මම නියෝජ්‍ය ඇමතිවරයා විධියට සිටිද්දී අපි "Ceylon Spices" කියන සන්නාමය හඳුන්වා දුන්නා. එම නිසා මේ රටේ අපනයන භෝග අපේ රටේ ආදායමට තවදුරටත් ශක්තියක් ලබා දෙන්න පුළුවන්.

අපේ රටේ වැවෙන තේ නිසා තමයි උඩරට දුම්රිය මාර්ග පද්ධතියේ හැදුණේ. ඒ උඩරට දුම්රිය මාර්ග පද්ධතිය අද අපේ රටේ ප්‍රවාහනයට එහා ගිහිල්ලා සංචාරක කර්මාන්තයට විශාල ශක්තියක් දෙනවා. එදා, ඒ ජාතිකයන් අපේ රට ආක්‍රමණය කරගෙන හිටියත් ඔවුන් දුන්න යම් යම් දේවල් තවදුරටත් අපේ ආර්ථිකයට ශක්තියක් දෙනවා. තේ කර්මාන්තයේ දියුණුව වාගේම, තේ කර්මාන්තය නිසා වසර 200කට පෙර මේ රටට ආපු ජනතාවත් අපට අමතක කරන්න බැහැ. අපේ ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය ඉන්නවා. කඳුකරයේ ජනතාවගේ ජීවිතය ගතවූ වසර 200ම ලැයිම් කාමරවල ගතවුණේ. අලුත් දෙයක්

එකතු වුණා නම් එම ලැයිම් කාමරයට ලයිට් ලැබුණු එක විතරයි ගරු අගමැතිතුමියනි සිදු වුණේ. ඒ අය තවමත් පීල්ලෙන් නාන්නේ; පීල්ලෙන් වතුර බොන්නේ. ඒක ලැයිමේ කාමරයකට කොටු වුණු කුටුම්භයක්. දරුවෝ තුන් හතරදෙනා එක්ක එක කාමරයකට කොටු වුණු ජීවිතයක් තමයි ඒ අය ගතකරන්නේ. එම නිසා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය තුළින් ඔබතුමන්ලා ඒ ලැයිම් කාමරයෙන් එහා ගිය ජීවිතයක් කඳුකරයේ ඉන්න, අපේ රටට ඩොලර් ගෙනෙන්න දායක වන අපේ ආදරණීය ජනතාවට අත්පත් කරලා දෙන්නත් දැඩි අවධානය යොමු කරන්න කියලා මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.44]

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය අවසානයේදී මතු කරන්න ඕනෑ කාරණා දෙක තුනක් තිබෙනවා.

පෙර දිනක විවාදයකදීත් අපේ අමාත්‍යාංශයට අදාළ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අළෙවි මණ්ඩලය පිළිබඳ ප්‍රකාශයක් කරලා තිබුණා, ඒ මණ්ඩලයේ කඩ වහගෙන යනවා, ඒ සේවකයන්ගේ රක්ෂා නැති කරනවා කියලා. නමුත්, ඒ කරුණ සාවද්‍යයි. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අළෙවි මණ්ඩලය කියන එකත් දේශපාලනීකරණයට ලක් වෙච්ච ආයතනයක්. ඒකේ වෙළෙඳ සැල් 34ක් තිබුණා. නව සභාපතිවරයා එය භාර ගන්නා විට වෙළෙඳ සැල් 17ක් විතරයි ඉතුරු වෙලා තිබුණේ. ඉතිරි ටික වසා දමා තිබුණා. එයින් වෙළෙඳ සැල් 17ක්ම තිබුණේ, එවකට හිටපු ඇමතිතුමාගේ දිස්ත්‍රික්කය වන රත්නපුර දිස්ත්‍රික්කයේ. දැන් වෙනකොට ඒ වෙළෙඳ සැල් හතරක් විතරයි තිබෙන්නේ. මොකද, පාඩු ලබන කඩ ටික වසා දමන්න සිද්ධ වුණා. මේ වෙනකොට එම ආයතනය රුපියල් මිලියන 56ක් පාඩු ලබන ආයතනයක්. නමුත් ඒ කිසිදු සේවකයෙකු ඉවත් කළේ නැහැ, ඔවුන්ට කොළඹ මූලස්ථානයට වාර්තා කරන්න කිව්වා. ඒකට සේවකයන් 150දෙනෙකු බඳවා ගෙන තිබෙන්නේ, කිසිම බඳවා ගැනීමේ අනුමැතියකින් තොරවයි. ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගන්න ඕනෑ. නමුත්, දේශපාලනයෙන් බඳවා ගෙන තිබෙනවා. මේ ආයතනයට අදාළ තත්ත්වය එහෙම වුණත්, මේ ආයතනය වසා දමන්න අපේ කිසිසේත්ම බලාපොරොත්තුවක් නැහැ.

ඊළඟට, මෙතැනදී මතු වූ කරුණු කාරණා ගැන යමක් කථා කරන්න ඕනෑ. අපේ අමාත්‍යාංශයට අදාළ නොවුණත්, මට පෙර කථා කරපු මන්ත්‍රීවරුන් දෙදෙනෙක්ම factories ගිනි තබපු සිද්ධි හා බටලන්දේ කාරණය ගැන කථා කළා. ඒ කර්මාන්තශාලා ගිනි තියලා මොනවා හරි අනතුරක් වුණා නම්, ඒවා ගොඩනහන්න වසර 30 ගණනක් තිබුණා. හැබැයි, ගෙවල් ගිනි තිබ්බාට පස්සේ, ඒ වන්දිය මාස ගණනක් යනකොට ගත්තා. ඒ නිසා අර කර්මාන්තශාලා හදන්නේ නැතුව, දේශපාලනය මතු කරමින් කථා කරපු එක ගැන අපි කනගාටු වෙනවා. කොහොම නමුත්, බටලන්ද සිද්ධිය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. ඒ කාලයේ ඇත්තටම තිබුණේ රාජ්‍ය ත්‍රස්තවාදයක්. රජයට අයිති නැහැ වධ කඳවුරු පවත්වා ගෙන යන එක. රටේ නීතියක් කියලා එකක් තිබෙනවා, අධිකරණයක් කියලා එකක් තිබෙනවා. ඒවායෙන් දඬුවම් දෙන්නේ නැතුව, දේශපාලනඥයන් දඬුවම් දෙන්න ගිය තැනක් ගැන තමයි අද ඒ වාර්තාවෙන් හෙළිදරව් කළේ. ඒකටත් උත්තරයක් දෙන්න ඕනෑ.

ඊළඟට, මෙතැනදී ඉදිරිපත් කරපු කරුණු කාරණා දිහා බැලුවාම, අපි උදේ ඉදිරිපත් කරපු කරුණුම උපුටා දක්වමින්, ඒ කරුණු ගැනම නැවත නැවත ප්‍රශ්න කරන ස්වභාවයක් පෙන්නුම් කළා. ඒවාට උත්තර දීපු වෙලාවේ මන්ත්‍රීවරුන් හිටියේ නැද්ද දන්නේ නැහැ. ඒවා නැවත නැවත ඇහුවා. ඒ නිසා මම නැවත නැවත ඒවාට උත්තර දෙන්න ඕනෑ නැහැ කියලා කල්පනා කරනවා. කොහොම නමුත්, මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, අඩු ගණනේ පොල් පැළ මිලියන 10ක්වත් රටේ තිබෙනවා නම් තමයි මේ කර්මාන්තය දියුණු කරන්න පුළුවන් වෙන්නේ කියලා. නමුත්, අපේ රටේ තිබෙන බීජ ප්‍රමාණය අනුව ගත්තාම, බීජ පොල් මිලියන 10කට යන්න පුළුවන්කමක් නැහැ. අපට මෙවර තිබෙන්නේත් මිලියන 2.56යි. ඒකට අදාළ බීජ ප්‍රමාණය නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු සභාපතිතුමනි, මම කියමින් සිටියේ මේ රටේ පොල් වගාව අපි ඉදිරියට ගෙන එන්න ඕනෑ කියන එකයි. දැනට තිබෙන තත්ත්වය අනුව ඒකට අදාළ සැලසුම් අපි කරලා තිබෙනවා. ඒ අනුව අපට ප්‍රමිතියෙන් යුක්ත බීජ පොල් සපයා ගන්න පුළුවන් වෙන්නේ, මිලියන 2.56යි. ඒ ඉලක්කයට යන්න අපි සැලසුම් කරලා තිබෙනවා. මීට පෙර ඔය විධියට දේශපාලන වුවමනාවට වැඩිපුර පොල් වගා කරන්න උත්සාහ ගත්ත අවස්ථාවලදී, නුසුදුසු බීජ පාවිච්චි කරලා සමහර කාලවලදී පොල් පැළ නොවෙයි පොල් ගස් තමයි සිටුවා තිබුණේ. ඒවාට අදාළ වීඩියෝ, ඡායාරූප අපි ළඟ තිබෙනවා. අපි එවැනි තත්ත්වයකට නැවත මේ කර්මාන්තය ගෙන යන්න කැමැත්තක් නැහැ.

කොහොම නමුත්, මේ විවාදයේදී අපට සාධනීය යෝජනා ගණනාවක් මතු වුණා. ඒවා අපේ අමාත්‍යාංශයේ ඉදිරි කටයුතුවලට අපි ලබා ගන්නවා. ඒ යෝජනා ඉදිරිපත් කළ පක්ෂ - විපක්ෂ මන්ත්‍රීවරුන්ට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මේ අවස්ථාවේදී මම ගෞරවයෙන් මතක් කළ යුතුව තිබෙනවා,-

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි, -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔව්, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, SVAT එක ගැන ඔබතුමන්ලා යම් ක්‍රියාමාර්ගයක් ගන්නවාද? මොකද, අපනයනකරුවන් මේ SVAT එක නිසා විශාල ප්‍රශ්නයක ඉන්නේ. ඔබතුමන්ලා ඒ ගැන අවධානය යොමු කරලා තිබෙනවාද?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඔව්, අවධානය යොමු කරලා තිබෙනවා. මෙතැනදී මතු වෙච්ච අදහස්වලදීත් සමහරු SVAT එක තියා ගන්න ඕනෑ කියනවා; සමහරු ඒක තියා ගන්න ඕනෑ නැහැ කියනවා. එහෙම මත දෙක තුනක් තිබෙනවා. ඒ වාගේම, අපේ කර්මාන්තයේ සිටින පාර්ශ්වකරුවන්ගේත් ඒ ගැන විවිධ අදහස් තිබෙනවා. කොහොම නමුත්, දැනට SVAT එක තිබෙනවා. ඒ වාගේම ඒකට බලපාන රටේ ආර්ථිකය පැත්තෙන් කරුණු කාරණාත් තිබෙනවා. මොකද, මුදල් අමාත්‍යාංශය පැත්තෙනුත් ඒකට වැඩි බරක් තිබෙනවා. ඒ නිසා ඒක දැන් ගන්න ඕනෑ තීන්දුවක් නොවෙයි, ඉදිරියේදී අදාළ පාර්ශ්ව එක්ක කථා කරලා ගත යුතු තීන්දුවක්. නමුත්, දැනට ඒක වෙනස් කිරීමේ තීන්දුවක් නැහැ.

අපි වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය ආරම්භ කරලා, අපේ නව රජයේ ප්‍රථම අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් තමයි අද සාකච්ඡා කරන්නේ.

මම උදේත් කිව්වා වාගේ මේ අය වැය සකස් කිරීමේදී පසුගිය අවුරුදුවලට වඩා විශාල මුදලක් අපේ අමාත්‍යාංශයට ලබා දීලා තිබෙනවා. මම විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාටත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙනවා, මේ ක්ෂේත්‍රය ගැන කල්පනා කරලා මේ වාගේ ප්‍රතිපාදනයක් අපට ලබා දීම වෙනුවෙන්. කොහොම නමුත්, වර්තමාන අපේ රජය සැලසුම් කරලා තිබෙනවා, 2025 වසරේ අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3ත්, 3.5ත් අතර ප්‍රමාණයකට ඔසවා තබාගන්න; වැඩි කරගන්න; වර්ධනය කරගන්න. ඒ සඳහා බලපාන අමාත්‍යාංශයක් තමයි අපට තිබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය මුදල් ලබා දීම වෙනුවෙන් මම නැවතත් ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්වරුන්, අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂවරුන්, සභාපතිවරුන් ඇතුළු සියලු නිලධාරි මණ්ඩලයටත් මේ අවස්ථාවේදී මා ස්තුතිවන්ත වෙනවා. බොහොම වුවමනාවක් සහිතව මෙවාට ඇප කැප වෙමින් කටයුතු කරන නිලධාරීන් විශාල පිරිසක් අපි හඳුනාගෙන තිබෙනවා. මම උදේත් කිව්වා වාගේ ඒ බොහෝදෙනෙක් දැන් රැ දවල් නැතුව වැඩ කරන ස්වභාවයකට පත් වෙලා තිබෙනවා. ඔවුන් හැඟීමකින් යුතුව කටයුතු කරනවා. අද කියපු මේ කාර්යයන් සාර්ථක කරගන්න ඔවුන්ටත්, නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු අපි හැමෝටම බරක් තිබෙනවා. මම ඒ හැමදෙනාට ස්තුතිවන්ත වෙනවා, මේ කාර්යය සාර්ථක කරගන්න ලබා දෙන සහයෝගයට.

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. අපේ ආයතනයේ සභාපතිවරුන් කිහිපදෙනෙක් ඉන්නවා. ඒ හැමෝටම දීමනාවක්, වැටුපක්, වාහනයක් නැතිව වැඩ කරන්න බැහැ. ඔවුන්ට කරන්න විශාල කාර්යභාරයක් තිබෙනවා. නමුත්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති රාජ් ඔබේසේකර මහත්මයා කැපවීමක් කරලා නොමිලේ සේවය කරන කෙනෙක්; ස්වේච්ඡාවෙන් සේවය කරන කෙනෙක්. ඒ වාගේ අයත් අප අතර ඉන්නවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ වර්තමාන ලේකම්තුමා රාජ්‍ය සේවයේ අවුරුදු 20ක් ගතකරලා ඊට පස්සේ අපේ අමාත්‍යාංශය වන වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට එකතු වුණා. අපේ අමාත්‍යාංශයට එකතු විය යුතු තව කොටසක් තිබෙනවා. ඒ තමයි, වැවිලි සම්පත් මානව භාරය. එතුමා ලේකම් ධුරයට අමතරව වැවිලි සම්පත් මානව භාරයේ සභාපතිවරයා හැටියටත් වැඩ කරනවා. මාසික දීමනාව විධියට රුපියල් ලක්ෂ දෙකක් එතුමාට හිමියි. නමුත් එතුමා ඒක ප්‍රතික්ෂේප කරලා වැඩ කරනවා. මම ඒකත් විශේෂ කොට සලකා මේ අවස්ථාවේදී එතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාටත්, අපේ මහලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මණ්ඩලයටත් මේ අවස්ථාවේදී මා ස්තුතිවන්ත වෙනවා, අපට ලබා දුන් මේ සහයෝගයට. ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ටත් මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මා ස්තුතිය පිරිනමන්න ඕනෑ. මේ අමාත්‍යාංශය මේ විධියට පවත්වාගෙන එන්නේ, යම් ඩොලර් ප්‍රමාණයක් රටට එන්නේ මේ අමාත්‍යාංශයට සම්බන්ධ විවිධ පාර්ශ්වකරුවන් පිරිසක් ඉන්න නිසායි. ඒ සඳහා ප්‍රධාන වතු සමාගම්වල ඉඳන් පහළම කොටස දක්වා වූ විශේෂ කණ්ඩායමක් ඉන්නවා. ඔවුන්ටත් අපේ ස්තුතිය පිරිනමන්න ඕනෑ. මම මුලිනුත් කිව්වා, තේ, රබර්, පොල් සහ අනෙකුත් භෝග ගත්තාම, කුඩා පරිමාණයේ ගොවීන් තමයි විශාල වශයෙන් ඒ වගාවල යෙදිලා ඉන්නේ කියලා. ඒ හින්දා බිම මට්ටමේ ඉන්න කුඩා පරිමාණ ගොවීන් නැත්නම් අද තේ කර්මාන්තයවත්, රබර් කර්මාන්තයවත්, පොල් කර්මාන්තයවත් ඉතිරි වෙන්න විධියක් නැහැ. පොල් කර්මාන්තයේ සියයට 82ක් ඉන්නේ කුඩා පරිමාණ ගොවීන්. තේ කර්මාන්තයේ සියයට 75ක් ඉන්නේ කුඩා පරිමාණ ගොවීන්. රබර් කර්මාන්තයේ සියයට 65ත්, 70ත් අතර ප්‍රමාණයක් ඉන්නේ කුඩා පරිමාණ ගොවීන්. ඔවුන්ටත් අපි ස්තුතිවන්ත වෙනවා, ඔවුන් ඉටු කරන කාර්යය වෙනුවෙන්.

ඒ වාගේම අපට අමතක කරන්න බැරි විශේෂම කණ්ඩායමක් ඉන්නවා. ඒ තමයි මේ ප්‍රජාව ඇතුළේ ඉන්න කම්කරු ජනතාව. දහඩිය, කඳුළු හෙළලා බොහොම දුක්බර ජීවිතයක් ගත කරමින් මේ අමාත්‍යාංශය බබළවන්න, රට බබළවන්න අදත් ශ්‍රමය වගුරන ඔවුන්ටත් මේ වෙලාවේ මගේ ස්තුතිය පිරිනමනවා. මේ සියලු පාර්ශ්වයන්ට ඒකාබද්ධව පොර බැඳීමක් තිබෙනවා, අපි හඳාගත් ජාතික සැලසුම්වලට අනුව, උපාය මාර්ගික සැලසුම්වලට අනුව, අපි අද උදේ කියපු සැලසුම්වලට අනුව ඒ ඉලක්කයට යන්න. ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා, නිලධාරි මණ්ඩලය ඇතුළු සියලු පාර්ශ්ව එකතු වෙලා සහයෝගයෙන් එතැනට මේ රට ගේන්න සූදානම් කියන පණිවුඩය මා මේ මොහොතේ දෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, කොහොම නමුත් අපි සතුටු වෙනවා, මේ ක්ෂේත්‍රය මේ දක්වා බිඳ වැටිලා තිබුණත්, නැවතත් හිස ඔසවන්න පටන් ගෙන තිබෙන එක ගැන. අලුතින් බෙදාගත් වතුයායවල් ගත්තාම, ඒ සංස්ථාවල සභාපතිවරු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ

නිලධාරින්, ඒවා භාරගත් මොහොතට වඩා දැන් ඒවායෙන් යම් ප්‍රගතියත් අත්පත් කර ගනිමින් තිබෙනවා. ඒ හින්දා අපි විශ්වාස කරනවා, අපට අපේ ඉලක්කයට යන්න පුළුවන් කියලා. මේ කාර්යයට අතහිත දීපු සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින් ඉදිරියටත් අපේ ඉලක්කයට යන්න සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

මට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு
MINISTRY OF PLANTATION AND COMMUNITY INFRASTRUCTURE

පුනරාවර්තන	රු. 5,450,000,000
මූලධන	රු. 11,288,000,000

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"26 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'මූලධන රු. 12,038,000,000' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"මූලධන වියදම සඳහා රු. 12,038,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධනීය වියදම සඳහා රු. 12,038,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පට්ටුමාහ" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

මූලධනීය වියදම තිරුත්තප්පට්ටවාරු අට්ටවණෙයින් පකුතියාහ ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, "That the increased sum of Rs.12,038,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"135 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,702,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

135 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 69,000,000

"135 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 69,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

135 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 135, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,702,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 135, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 69,000,000

"தலைப்பு 135, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 69,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 135, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs.1,702,000,000, for Head 135, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 135, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 69,000,000

Question, "That the sum of Rs. 69,000,000, for Head 135, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 135, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,183,000,000; මූලධන වියදම, රු. 10,269,000,000
நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 3,183,000,000; மூலதனச் செலவு, ரூபாய் 10,269,000,000
Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 3,183,000,000; Capital Expenditure, Rs. 10,269,000,000

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, 135 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්ඩලික උපදේශකයින්)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
තීරණාත්මක විය:
Resolved:

"26 වන පිටුවේ, 7 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 3,183,000,000 රු. 11,019,000,000' "

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ වැය ශීර්ෂ අංක 135 සඳහා අය වැය යෝජනා අංක 29 හා 41 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු.750,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"135 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,183,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

135 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"135 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 11,019,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

135 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලෛප්පු 135, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් සෙලවුක් කාන රූපාය් 3,183,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 135, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

"තලෛප්පු 135, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් සෙලවුක්කාන අතිකරික්කප්පට්ට රූපාය් 11,019,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප් පට්ටදු.

තලෛප්පු 135, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් සෙලවු තිරුත්තප්පට්ටවාරු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 3,183,000,000, for Head 135, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 135, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 11,019,000,000, for Head 135, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 135, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

293 වන ශීර්ෂය.- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 423,000,000

"293 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 423,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

293 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 545,000,000

"293 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 545,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

293 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

337 වන ශීර්ෂය.- කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 142,000,000

"337 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 142,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

337 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 405,000,000

"337 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 405,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

337 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

තලෛප්පු 293.- ඉරප්පර් අපිවිරුත්තිත් තිණෛක්කළම්

නිකුළ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් සෙයර්පාටුකළ් - මීණ්ඩුවරුඤ් සෙලවු, රූපාය් 423,000,000

"තලෛප්පු 293, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් සෙලවුක් කාන රූපාය් 423,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 293, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

නිකුළ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් සෙයර්පාටුකළ් - මූලතනච් සෙලවු, රූපාය් 545,000,000

"තලෛප්පු 293, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් සෙලවුක්කාන රූපාය් 545,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 293, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

තලෛප්පු 337.- කරුවා තොළිර්ට්රුරෛ අපිවිරුත්තිත් තිණෛක්කළම්

නිකුළ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් සෙයර්පාටුකළ් - මීණ්ඩුවරුඤ් සෙලවු, රූපාය් 142,000,000

"තලෛප්පු 337, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් සෙලවුක් කාන රූපාය් 142,000,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.

තලෛප්පු 337, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටදු.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 405,000,000

"தலைப்பு 337, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 405,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 337, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 293.- DEPARTMENT OF RUBBER DEVELOPMENT

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 423,000,000

Question, "That the sum of Rs. 423,000,000, for Head 293, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 293, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 545,000,000

Question, "That the sum of Rs. 545,000,000, for Head 293, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 293, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 337.- DEPARTMENT OF CINNAMON DEVELOPMENT

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 142,000,000

Question, "That the sum of Rs. 142,000,000, for Head 337, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 337, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 405,000,000

Question, "That the sum of Rs. 405,000,000, for Head 337, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 337, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු සභාපතිතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අ.භා. 5.56ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 15වන සෙනසුරාදා.

பி.ப. 5.56 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 மார்ச் 15, சனிக்கிழமை.

At 5.56 p.m., the Chairman left the Chair to report Progress.

Committee report Progress; to sit again on Saturday, 15th March, 2025.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගීර්ෂ අංක 135 සංශෝධන සහිතව ද, ගීර්ෂ අංක 293 සහ 337 සංශෝධන රහිතව ද කාරක සභාවේ දී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 11 දක්වා ඉදිරිපත් කිරීම, ගරු අමාත්‍යතුමා.

ඇල්කඩුව වැවිලි සමාගම: වාර්ෂික වාර්තා (2012, 2013, 2014, 2015, 2016 සහ 2017)
எல்கடுவ பெருந்தோட்டக் கம்பெனி: வருடாந்த அறிக்கைகள் (2012, 2013, 2014, 2015, 2016 மற்றும் 2017)
ELKADUWA PLANTATION LIMITED: ANNUAL REPORTS (2012, 2013, 2014, 2015, 2016 AND 2017)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිය යටතේ 2023.11.23 දින ඉදිරිපත් කරන ලද පිළිවෙළින් 2012.12.31, 2013.12.31, 2014.12.31, 2015.12.31, 2016.12.31 සහ 2017.12.31 දිනයන්ගෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඇල්කඩුව වැවිලි සමාගමේ 2012, 2013, 2014, 2015, 2016 සහ 2017 වර්ෂවල වාර්ෂික වාර්තා අනුමත කළ යුතු ය.

(හාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව: වාර්ෂික වාර්තාව (2017)
இலங்கை அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2017)
SRI LANKA STATE PLANTATION CORPORATION: ANNUAL REPORT (2017)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(හාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව: වාර්ෂික වාර්තාව (2018)

இலங்கை அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2018)

SRI LANKA STATE PLANTATION CORPORATION: ANNUAL REPORT (2018)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව: වාර්ෂික වාර්තාව (2019)

இலங்கை அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2019)

SRI LANKA STATE PLANTATION CORPORATION: ANNUAL REPORT (2019)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව: වාර්ෂික වාර්තාව (2020)

இலங்கை அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2020)

SRI LANKA STATE PLANTATION CORPORATION: ANNUAL REPORT (2020)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2024.02.09 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම: වාර්ෂික වාර්තාව (2020/2021)

களுபோவிட்டியான தேயிலைத் தொழிற்சாலை கம்பெனி லிமிரெட்: வருடாந்த அறிக்கை (2020/2021)

KALUBOWITIYANA TEA FACTORY LIMITED: ANNUAL REPORT (2020/2021)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.24 දින ඉදිරිපත් කරන ලද 2021.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2020/2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය: වාර්ෂික වාර්තාව (2020)

இலங்கை தேயிலை ஆராய்ச்சி நிறுவனம்: வருடாந்த அறிக்கை (2020)

TEA RESEARCH INSTITUTE OF SRI LANKA: ANNUAL REPORT (2020)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ 2024.01.23 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය: වාර්ෂික වාර්තාව (2021)
இலங்கை தேயிலை ஆராய்ச்சி நிறுவனம்: வருடாந்த அறிக்கை (2021)
TEA RESEARCH INSTITUTE OF SRI LANKA: ANNUAL REPORT (2021)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ 2024.01.23 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය: වාර්ෂික වාර්තාව (2022)
சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபை: வருடாந்த அறிக்கை (2022)
TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY: ANNUAL REPORT (2022)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2022)
இலங்கை தேயிலைச் சபை: வருடாந்த அறிக்கை (2022)
SRI LANKA TEA BOARD: ANNUAL REPORT (2022)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

අර්තාපල් අස්වනු නෙළන සමයේදී අර්තාපල් ආනයනය පාලනය කිරීම
உருளைக்கிழங்கு அறுவடைக் காலத்தில் அதன் இறக்குமதியைக் கட்டுப்படுத்துதல்
CONTROL OF POTATO IMPORTS DURING POTATO HARVESTING SEASON

[අ.භා. 5.59]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"උඩරට කෘෂි කර්මාන්තයෙන් ජීවත්වන ගොවීන්ගේ ප්‍රධාන වගාව වන අර්තාපල් වගාව අනාදිමත් කාලයක සිට ඔවුන්ගේ ජීවනෝපාය වී ඇත. බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල, හපුතලේ, හාලිඇල, වැලිමඩ, ඌව පරණගම හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් විශාල පිරිසක් උඩරට අර්තාපල් වගාවේ නිරත වන අතර, අර්තාපල් බීජ, කෘෂි රසායන ද්‍රව්‍ය හා කම්කරු ශ්‍රමය සඳහා වැයවන අධික පිරිවැය හේතුවෙන්, විශාල වියදමක් දරා අර්තාපල් වගා කර, අස්වැන්න නෙළා වෙළෙඳ පොළට ගෙන ඒමේදී, වී ගොවියාටද වඩා අධික පාඩුවක් අල ගොවියාට විඳීමට සිදුව ඇත. එම හේතුව නිසා උඩරට අර්තාපල් අස්වැන්න නෙළන කාල වකවානුව තුළ පැවති හැම රජයකටම අල ගොවියාගේ දුක්ගැනවිල්ල ඇසීමට සිදුව ඇත. ඒ ඒ වකවානු තුළ පැවැති සමහර රජයන් ගොවියාගේ දුක්ගැනවිල්ල අසා යම් යම් ක්‍රියාමාර්ග ගත් අතර, එම ක්‍රියාමාර්ග තුළින් ගොවියාට තාවකාලික සහන ලැබුණි.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

චර්තමාන රජයෙන්ද මා ඉල්ලා සිටීමට බලාපොරොත්තු වන්නේ, මේ මාර්තු මාසයේ සිට උඩරට අර්තාපල් වගාවේ අස්වැන්න නෙළීමට පටන් ගන්නා බැවින්, අල ගොවියාට සාධාරණය ඉෂ්ට වන පරිදි, මාර්තු මාසයේ සිට ආනයනය කරන අර්තාපල් සඳහා සැලකිය යුතු බද්දක් පනවන ලෙසත්, නොඑසේ නම් අර්තාපල් ආනයනය මාස කිහිපයකට නතර කරන ලෙසත් ය.

එබැවින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන උඩරට අල ගොවීන්ට සාධාරණයක් ඉෂ්ට කර දීමට චර්තමාන රජය මැදිහත් වේ යැයි උඩරට අල ගොවිතැනේ යෙදෙන සියලුදෙනා අපේක්ෂා සහගතව බලා සිටී.

උක්ත කරුණු සලකා බලා මෙම ජනතාවගේ සාධාරණ බලාපොරොත්තු ඉටු කර දෙන මෙන් වෙළෙඳ අමාත්‍යවරයා හරහා රජයෙන් ඉල්ලා සිටිමි."

ගරු කථානායකතුමනි, උඩරට අල ගොවියා වී ගොවියා හා සමානයි. අද බීජ අල හොණ්ඩරයක් රුපියල් 37,500ක් වෙනවා. Polandවලින් තමයි ඒවා ගෙන්වන්නේ. කෘෂි රසායනික ද්‍රව්‍ය, පොහොර, ශ්‍රමය ඇතුළු සියල්ල එකතු වුණාම උඩරට අල ගොවියාට රුපියල් 130,000ක විතර වියදමක් දරන්න වෙනවා, බීජ අල හොණ්ඩරයක් ලබා ගන්න. මුල් කාලයේ නම් බීජ අල හොණ්ඩරයකින් අල හොණ්ඩර 20ක වාගේ ප්‍රමාණයක් ගැලෙව්වා. දැන් පසේ තිබෙන ප්‍රශ්නත් එක්ක උඩරට අල ගොවියාට බීජ අල හොණ්ඩරයකින් අල හොණ්ඩර 10ක් වාගේ තමයි ගලවන්න පුළුවන්. මේ වනවිට වැලිමඩ ප්‍රදේශයේ අල ගලවනවා. අල කිලෝවක් රුපියල් 230ට තමයි මේ දවස්වල වැලිමඩ, කැප්පෙටිපොළ වැනි ප්‍රදේශවලදී මිලදී ගන්නේ. දැන් මේ අල ගොවියා මුහුණ දී තිබෙන ගැටලුව මේකයි.

වී ගොවියාට සාධාරණය ඉෂ්ට වුණත් අල ගොවියාට සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. අල හොණ්ඩර 10ක් ගැලෙව්වාම රුපියල් 130,000ක්, රුපියල් 140,000ක් වාගේ ප්‍රමාණයක මුදලක් තමයි අල ගොවියාට ලැබෙන්නේ. දේශීය අල නිෂ්පාදනයෙන් සියයට 50ක දායකත්වයක් ලබා දෙන්නේ වැලිමඩ, නුවරඑළිය වැනි ප්‍රදේශවල ඉන්න අල ගොවීන්. නමුත් දේශීය අල ගොවීන්ට සාධාරණත්වය ඉෂ්ට වෙලා නැහැ. හැම ආණ්ඩුවක්ම අල ගලවන කාලයට විදේශවලින් ආනයනය කරන අලවලට බදු පනවලා හෝ දේශීය අල නිෂ්පාදකයාට සහනයක් වෙන විධියට ඒ සාධාරණය ඉෂ්ට කරලා තිබෙනවා.

මම අද බලාපොරොත්තු වුණා, වෙළෙඳ ඇමතිතුමා හෝ කෘෂිකර්ම ඇමතිතුමා මේ අවස්ථාවට සහභාගි වෙයි කියලා. ඒ අයට සහාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳව දැනුම් දීලා තිබෙනවා. නමුත් කෘෂිකර්ම ඇමතිවරයාවත්, වෙළෙඳ ඇමතිවරයාවත් මේ ගරු සභාවට ඇවිත් නැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේදී ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, වී ගොවියාට සාධාරණය ඉෂ්ට වෙනවා වාගේම, එළවලු ගොවියාටත් සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ කියලා. මේ රටේ නිෂ්පාදනය කරන අලවලින් පිරිසිදු, රසවත්, ගුණදායක අල තිබෙන්නේ වැලිමඩ අපේ ප්‍රදේශයේ. අල ගොවියා දැනට සිටින තැනින් පහළට වැටුණොත් ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වනවා. ගොවියා ගොවිතැනින් අයින් වෙනවා කියන්නේ ඒක මේ රටට ලොකු අභාග්‍යයක්. ගොවියා ගොවිතැනට පුළුවන් තරම් කැප වෙනවා. වැලිමඩ, ඌව පරණගම, හපුතලේ, බණ්ඩාරවෙල, හාලිඇල වාගේ ප්‍රදේශවල අල ගොවිතැන වෙනුවෙන් විශාල කැප කිරීමක් කරන ගොවි ජනතාවක් ඉන්නවා. ඒගොල්ලන්ට වෙන විකල්පයක් නැහැ. ඒගොල්ලන් ජීවත් වෙන්නේ අල ගොවිතැනත් එක්ක. ඔවුන් දරුවෝ පාසල් යවන්නේ, අනෙක් සියලු දේවල් කරන්නේ අල හොණ්ඩරයක්, දෙකක් හදලා. වැලිමඩ, ඌව පරණගම, හපුතලේ, බණ්ඩාරවෙල ගොවීන් විශාල ප්‍රමාණයක් මාලිමා රජයට උදව් කරලා සහයෝගය දීපු අය. ඒගොල්ලන් බලාපොරොත්තුවෙන් ඉන්නවා, ඒ අයට සාධාරණය ඉෂ්ට වෙයි කියලා. හැබැයි, තව වනතුරු ඒ අයට සාධාරණය ඉෂ්ට වෙලා නැහැ. දැන් කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානය රුපියල් 230ට අල කිලෝව ගන්නේ. මේ වනකොට රුපියල් 220ට, රුපියල් 230ට අල කිලෝව කිරනවා. අපේ අල පාරිභෝගික ජනතාවටත් සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ කියලා අපි කියනවා. නමුත්, උඩරට අල ගොවියාට සාධාරණයක් ඉෂ්ට වෙන්න නම් අනිවාර්යයෙන් අල ආනයනය කිරීම නතර කරන්න ඕනෑ. එහෙම නැත්නම් ආනයනික අලවල බද්ද පොඩ්ඩක් වැඩි කරන්න ඕනෑ. මාස තුනක් වැනි කෙටි කාලයකට ඒක කරන්න ආණ්ඩුවට පුළුවන්, බැරි නැහැ. හැම ආණ්ඩුවක්ම මේ කාලය තුළ ඒ සහනය උඩරට අල ගොවීන්ට ලබා දීලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, උඩරට අල ගොවීන්ට මේ ආණ්ඩුවත් ඒ සහනය ලබා දෙයි කියලා. හැබැයි, තවම ඒ සහනය ලබා දුන්නේ නැහැ. පසුගිය වතාවේ අල ගැලවෙන කාලයේ තමයි ජනාධිපතිවරණය පැවැත්වුවේ. ඒ වෙලාවේදීත් ගොවීන් ඉල්ලීම් කළා, අල ගොවියාට සාධාරණය ඉෂ්ට කරන්න කියලා. පසුගිය වාරයේදීත් අල ගොවියාගේ අල ටික හරියට විකුණා ගන්න බැරි වුණා. ඒ නිසා අල ගොවියාට සාධාරණයක් ඉෂ්ට වුණේ නැහැ. මේ මාර්තු මාසයේ අල ගලවන්න පටන්ගෙන තිබෙනවා. ඒ නිසා මම මේ වෙලාවේ රජයෙන් ඉල්ලීමක් කරනවා. වෙළෙඳ ඇමතිවරයාට තමයි මේ කාර්යය කරන්න පුළුවන්. මොකද, එතුමා තමයි ආනයනික අල සඳහා බද්ද ගහන්නේ, පිටින් අල ගෙන්වනවාද, නැද්ද කියලා කියන්නේ. ඒ නිසා කැබිනට් මණ්ඩලයට ගිහින් හෝ ඒ බද්ද වැඩි කරලා, දේශීය අල ගොවියා නැති කර ගන්නේ නැතිව ආරක්ෂා කරගන්න ඕනෑ. පාරිභෝගිකයාට සාධාරණය ඉෂ්ට වෙනවා වාගේම දේශීය අල ගොවියා ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළකුත් ආණ්ඩුවට අවශ්‍ය වෙනවා. ඒ නිසා තමයි මම සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙනාවේ. මේ යෝජනාව කලින් කලට මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ මැති-ඇමතිවරු ගෙනැත් තිබෙනවා. එස්.ඒ.ආර්. මද්දුම බණ්ඩාරලා, දෙලුන්ගහවත්තලා වැනි පාර්ලිමේන්තුවේ හිටපු පැරණි උදවියත් මේ පාර්ලිමේන්තුවේ අල ගොවියා වෙනුවෙන් කථා කරලා තිබෙනවා. ඒ නිසා මම මේ වෙලාවේ මේ රජයෙන් ඉල්ලීමක් කරනවා. මේ රජය නියෝජනය කරන වෙළෙඳ ඇමතිතුමා, කෘෂිකර්ම ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ නොසිටියත් ගරු කථානායකතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට පිළිතුරු දෙන්න වෙළෙඳ නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
එහෙම නම් අල ගැලවෙන මේ මොහොතේ අල ගොවියාගේ අතට සාධාරණ මිලක් එන විධියට කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීමට සහයෝගය දැක්වූ ගරු කථානායකතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. You have five minutes.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, මා එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Dinindu Saman. You have six minutes.

[අ.භා. 6.07]

ගරු දිනිඳු සමන් මහතා
(மாண்புமிகு தினிந்து சமன்)
(The Hon. Dinindu Saman)

ගරු කථානායකතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයේ අපේ වාමර සම්පත් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද මේ යෝජනාව සාම්ප්‍රදායිකව බැලුවොත් ඉතා හොඳ යෝජනාවක්. හැබැයි, සමහර යෝජනා තිබෙනවා, ඒ යෝජනාව කළ යුත්තේ මොනවා හරි ගැටලුවක් ආවාට පසුවයි. ඉදිරියේදී ගැටලුවක් අපේක්ෂා කරනවා නම්, අන්න ඒ වාගේ අවස්ථාවලදී තමයි මේ වාගේ යෝජනා ගෙනෙන්නේ. අල ගැලවෙන කාලයේ මේ පාර්ලිමේන්තුවට මේ වාගේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. අල ගොවීන් දැඩි අසාධාරණයට සහ අසීරුතාවට පත් වුණාම ඒ විධියට යෝජනා ගෙනෙනවා. හැබැයි, එතුමාට මම මේ කාරණය මතක් කරලා දෙන්න ඕනෑ. එතුමාගේ යෝජනාවේ සඳහන් වුණා, මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ අදාළ බදු පැනවීම් කළේ නැහැ, ජනාධිපතිතුමාට අවස්ථා කීපයකදීම ඒ ගැන මතක් කළා, නමුත් වැඩේ කළේ නැහැ කියලා. හැබැයි, මේ රටේ ගොවි ජනතාවට අපි මේ කාරණය මතක් කරන්න ඕනෑ.

ලංකා ඉතිහාසයේ ආනයනික අල සඳහා වැඩිම බද්ද පනවා තිබෙන්නේ මේ ආණ්ඩුව ආවාට පසුවයි. 2024.10.02 දින අල කිලෝවකට රුපියල් 60ක බද්දක් පනවා තිබෙනවා. ඒවා අමතක නිසායි මම මේ නැවත මතක් කරන්නේ. 2024.11.30 දින නැවතත් අල කිලෝවකට රුපියල් 60ක බද්දක් පනවා තිබෙනවා, විශේෂ ගැසට්ටුවක් මඟින්. 2024.12.31 ඉඳන් අද දක්වා අල කිලෝවකට රුපියල් 60ක බද්දක් පනවා තිබෙනවා. කිලෝවකට රුපියල් 60ක බද්ද තමයි මෑත අවුරුදු පහේ අල කිලෝවකට පනවා තිබෙන වැඩිම බද්ද. එතුමන්ලා බලයේ හිටපු පසුගිය ආණ්ඩුව කාලයේත් අලවලට අදාළ ප්‍රශ්නය ඔය විධියටම තිබුණා. මම සතුටු වෙනවා, ඒ ප්‍රශ්නය ඇති කරපු ඒ ආණ්ඩුවේ හිටපු ඇමතිවරයෙක් අද සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවකින් අල සම්බන්ධ මාතෘකාව කථා කිරීම ගැන. බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව මේ කාරණා ගැන දැනගන්න ඕනෑ. අපි දන්නවා, උඩරට අල ගොවියෝ තමයි ලංකාවට අවශ්‍ය අල විශාල ප්‍රමාණයක් වගා කළේ කියලා. නමුත් ඒ ගොවි ජනතාව බිඳ වටින්න පසුගිය ආණ්ඩුව නිතාමතාම කටයුතු කළා. සමහර අය බදු ගහන්න කියලා ඉල්ලනවා, ගොවියා පැත්තේ හිටගෙන, ගොවියාට සාධාරණයක් කරන්න.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්නම්. වාමර සම්පත් මැතිතුමා හිටපු ආණ්ඩුව 2021.02.08වැනි දා අල කිලෝවකට රුපියල් 50ක බද්දක් පනවා තිබෙනවා, මාස හයකට ගැසට්ටුවක් ගහලා. එතුමන්ලාගේ ආණ්ඩුව 2021.02.11වැනි දා ඒ රුපියල් 50ක බද්ද නැවත රුපියල් 15ට අඩු කරනවා. ඊට පස්සේ 2021.04.27වැනි දා නැවත රුපියල් 50ට ඒ බද්ද වැඩි කරනවා. මේවා කරන්නේ ගොවියාට තිබෙන ආදරයට නොවෙයි. බද්ද අඩු කරලා ඒ ව්‍යාපාරිකයන්ට පිට රටින් ගෙනෙන අල තොග එකතු කරගන්න සලස්වලා, ඒකේ ලාභය ව්‍යාපාරිකයාට දීලා, නැවතත් ගොවියා අසරණ කරන වැඩ තමයි ඒ ආණ්ඩුව කළේ. ඒ වාගේම එතුමාට මම මතක් කරන්න ඕනෑ, උෟව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ අඩුම අල අස්වැන්න එතුමන්ලා හිටපු කාලයේ තමයි වාර්තා වුණේ කියලා. අපේ පරිභෝජනයට අල මෙට්‍රික්ටොන් ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයක් ඕනෑ. ඒ මෙට්‍රික්ටොන් ලක්ෂ දෙකෙන් සියයට 60ක් අපි පිටරටින් ගෙන්වනවා. සියයට 40ක් ලංකාවේ නිෂ්පාදනය කරනවා.

ගරු කථානායකතුමනි, එතුමන්ලාගේ පාලන කාලය තුළ අල මෙට්‍රික්ටොන් 168,185ක් පිට රටින් ගෙනාවා. සමස්තයක් විධියට ගත්තාම මුළු අස්වැන්නෙන් සියයට 80.5ක් තමයි එතුමන්ලා ගෙන්වලා තිබෙන්නේ. ඒ ගැන ඔබතුමන්ලා පොඩ්ඩක් ආපස්සට හැරිලා බලන්න. දැන් ඒක පාරාවළල්ලක් වෙලා තිබෙන්නේ. කරන, කරන දේ එතුමන්ලාට නැවත එනවා. 2023 අවුරුද්දේ ලංකාවේ අල නිෂ්පාදනය කරලා තිබෙන්නේ මෙට්‍රික්ටොන් 40,789යි; සියයට 19.5යි. ඒකට හේතුව වෙන මොනවාත් නොවෙයි. එතුමන්ලාගේ ආණ්ඩු බරපතළ විධියට අල ගොවීන්ට අදාළ පහසුකම් කප්පාදු කළා. ගොවියාට අවශ්‍ය බීජ අර්තාපල්වල මිල අතිවිශාල ලෙස වැඩි වෙන්න ඉඩ දුන්නා, වෙළෙඳ මාෆියාව පවත්වාගෙන යෑමේ වුවමනාව නිසා. ඒ වාගේම ඒ කාලයේ පොහොරවලට, උපකරණවලට අධික මිලක් පනවා තිබුණා. ඒකේ ප්‍රතිඵලයක් විධියට ගොවියා අල වගාවෙන් ඈත් වෙලා තිබෙනවා. එහෙම වටපිටාවක තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුවට මේ ආර්ථිකය ගොඩනහන්න සිදු වෙලා තිබෙන්නේ.

නව තාක්ෂණය භාවිත කිරීම සඳහා එතුමන්ලාගේ ආණ්ඩුව කිසිම වැඩ පිළිවෙළක් කරලා නැහැ. අද බීජ අර්තාපල් හොණ්ඩරයක ගණන ගැන කථා කරනවා. බීජ අර්තාපල් නිෂ්පාදනය කරන ගොවිපොළවල් ලංකාවේ තිබෙනවා. හැබැයි, ඒ ගොවිපොළවලට අදාළ තාක්ෂණය ලබා දෙන එක, ඒ ගොවිපොළවලට අදාළ පහසුකම් දෙන එක අවුරුදු ගණනක් එතුමන්ලාගේ ආණ්ඩුව විසින් ආපස්සට යවා තිබෙනවා.

ඒ නිසා අපි මේ රටේ ගොවි ජනතාවට කියනවා, ඔබේ නිෂ්පාදන ගැන හිතලා ආණ්ඩුවක් විධියට අපි ආනයනික අර්තාපල් අල කිලෝ එකකට රුපියල් 60ක පාලන බද්දක් පනවා තිබෙන බව. එතුමා අර කියපු ගණනත් වැරදියි. එතුමා කිව්වා, අල කිලෝවක් විකිණෙන්නේ රුපියල් 230ක් වාගේ මිලකට කියලා. අද අර්තාපල් කිලෝ එකක් රුපියල් 280ක තොග මිලකට විකිණෙනවා. වැලිමඩ ප්‍රදේශයේ ගොවි ජනතාව ඒක දන්නවා. කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානයේ අද හොඳ අර්තාපල් අල කිලෝවක් රුපියල් 280ට විකිණෙනවා. අද ගොවියාට හොඳ මිලක් ලැබෙනවා. වෙන දා මේ කාලය වෙද්දී ගොවියා උද්ඝෝෂණ කරනවා. හැබැයි, ගොවියා මෙවර උද්ඝෝෂණ කළේ නැහැ. අපි කියනවා, ගොවියාට සාධාරණය ඉෂ්ට විය යුතුයි කියලා. ගොවියාට සාධාරණය ඉෂ්ට වෙනවා වාගේම, වෙළෙඳ මාෆියාවට අත වනන ක්‍රියාකාරකම් ද නතර විය යුතුයි. ගොවියාට සාධාරණය ඉෂ්ට වෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ආණ්ඩුවක් විධියට අපි සකස් කරලා තිබෙන්නේ. ඔවුන්ට අවශ්‍ය අලුත් තාක්ෂණය ලබා දෙන්න ඕනෑ, අවශ්‍ය බඩුවල මිල අඩු කරලා දෙන්න ඕනෑ. ඒ වාගේම බෙහෙත් ටික, පොහොර ටික සාධාරණ මිලකට ලබා දෙන්න ඕනෑ. පාංශු සංරක්ෂණය කරන වැඩ පිළිවෙළක් හදලා අඩු වගාවක් ඇතුළේ වැඩි අල අස්වැන්නක් ගන්න අලුත් ක්‍රම අපි ගොවියාට හදලා දෙන්න ඕනෑ. අල නිෂ්පාදනය සඳහා බදුල්ල ඇතුළු උෟව පළාතේ ගොවියා දිරිමත් කරන වැඩ කටයුත්ත කරන්න ඕනෑ. ඒ සඳහා ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි මැදිහත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ කාරණය මතක් කර දීම පිළිබඳව එතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අපි ගොවි ජනතාවට කියනවා, ඔබ දිනවන්න අවශ්‍ය කාර්යය ජාතික ජන බලවේගය රජය සූදානම් කරලා ක්‍රියාත්මක කරමින් තමයි යන්නේ කියලා. ඒ සඳහා අපි කැප වෙනවාය කියන කාරණයත් මතක් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උපාලි සමරසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. You have nine minutes.

[අ.භා. 6.14]

ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ගරු වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ඇමතිතුමා මේ මොහොතේ සභාවේ නැති නිසා ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට අදාළව කරුණු ඉදිරිපත් කරන්න මම සූදානම්.

විශේෂයෙන් අර්තාපල් වැඩියෙන් වගා කරන ප්‍රදේශයක ජීවත් වන ගරු මන්ත්‍රීවරයකු විධියට ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය මේ සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ වාගේම එම ගොවීන් පිළිබඳ හැඟීමක්, දැනීමක් සහ ඔවුන්ගේ ආර්ථිකය නඟා සිටුවීමේ වුවමනාවක් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වඩා අපට තිබෙන බව සිහිපත් කරන්න ඕනෑ.

විශේෂයෙන් වාර්ෂිකව මේ කාලයේදී -මාර්තු මාසයේදී- පොදුවේ ගොවියාට එන ප්‍රශ්න සඳහා වූ කෙටි කාලීන උත්තර කිහිපයක් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තුළ තිබුණා. එකක් තමයි බදු පැනවීම. දෙවැනි කාරණය තමයි පිට රටින් අල ගෙන්වීම නැවැත්වීම. විශේෂයෙන් එතුමාගේ ප්‍රශ්නය ඇතුළේ නුවරඑළිය, බදුල්ල සහ බණ්ඩාරවෙල දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් වැඩියෙන් කරුණු මතු කරලා තිබෙනවා. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවාද කියලා මම දන්නේ නැහැ, උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේත් අල නිෂ්පාදනය සඳහා සැලකිය යුතු මට්ටමකින් ගොවි ජනතාව මැදිහත් වෙන බව.

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණය ගත්තොත්, මේ අවුරුද්දේ විතරක් නොවෙයි, ඔබතුමා කිව්ව පරිදි පසුගිය අවුරුදු කිහිපය පුරාම -සෑම අවුරුද්දකම වාගේ- දේශීය අල නිෂ්පාදකයාට නිෂ්පාදන වටිනාකම නොලැබෙන නිසා මේ ගැටලුව මතු වුණා. වර්තමාන ආණ්ඩුවේ මූලික ප්‍රතිපත්තිය තමයි, නිෂ්පාදන ආර්ථිකයක් කරා මේ රට ගෙනයෑම. මේ කාරණයේදී වර්තමාන ආණ්ඩුව දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරන ගමන් ගුණාත්මක මෙන්ම සාධාරණ මිලකට පාරිභෝගිකයාට ආහාර ලබා දීමේ කටයුත්තත් පදනම් කරගෙන කටයුතු කරනවා. ඒ වාගේම වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයත්, අනෙකුත් සියලු අමාත්‍යාංශත්, පෞද්ගලික ආයතනත් එකතුව මේ රටේ ජනතාවට අවශ්‍ය ආහාර සහ බඩු භාණ්ඩ හිඟයකින් තොරව ලබා දීමේ මූලික අරමුණ ඇතිව තමයි අපි, මේ ආණ්ඩුව වාර්ෂික සැලසුමක් හදලා තිබෙන්නේ. නිෂ්පාදන ක්‍රියාවලියේ වියදමත් එක්ක දීර්ඝ කාලීනව ඇතිවෙලා තිබෙන මේ ප්‍රශ්නයට විසඳුම් වශයෙන් අපට කෙටිකාලීන සහ දිගුකාලීන වැඩ පිළිවෙළකට යන්න වෙනවා. එම නිසා, අපේ රටේ ජනතාවට වාර්ෂිකව අවශ්‍ය අල ප්‍රමාණය අපේ රට තුළ නිෂ්පාදනය කෙරෙනවාද කියලා අපි බලන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම මේ සභාව දැනුවත් කරන්න කැමැතියි අපේ රටේ යම් දත්ත ප්‍රමාණයක් පිළිබඳව. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා රේගුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාලේඛන අනුව, දේශීය අල පරිභෝජනය සම්බන්ධව, තිබෙන හිඟය පිළිබඳව වසර කිහිපයක කරුණු මම මේ සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි. පොදුවේ ගත්තොත්, වාර්ෂිකව අල මෙට්‍රික්ටොන් ලක්ෂ 2ක ප්‍රමාණයක් අපේ රටේ ජනතාව පරිභෝජනය සඳහා ඉල්ලා සිටිනවා; බලාපොරොත්තු වෙනවා. හැබැයි, 2019 වසරේ යල සහ මහ කියන කන්න දෙකේදීම අපට අල නිෂ්පාදනය කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ මෙට්‍රික්ටොන් 101,642යි.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අවශ්‍ය අල ප්‍රමාණයෙන් සියයට 45ක්, 50ක් තමයි උඩරට අල ගොවියාට දෙන්න පුළුවන්. ඔබතුමා කියන දත්ත සම්පූර්ණයෙන් නිවැරදියි. හැබැයි, අපි කියන්නේ මේකයි. අල ගැලවෙන කාලය තිබෙනවා නේ. උඩරට අල ගැලවෙන කාලයේ ඒ ටික වෙළෙඳ පොළට එනකොට, ඒ අයට සාධාරණය ඉෂ්ට කරන්න. අපි කියන්නේ නැහැ, බදු ගහන එක හෝ පිට රටින් අල ගෙන්වන එක නවත්වන්න කියලා. අපි කියන්නේ, ඒ අල ගොවියාගේ අල ටික වෙළෙඳ පොළට එනකොට අඩුම වශයෙන් මාසයක, එකහමාරක, දෙකක කාලයක් තුළ ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්න කියලා. නැතුව අපි කියන්නේ නැහැ, අල ගෙන්වන්න එපා, අලවලට ගහන tax එක අඩු කරන්න කියලා. එහෙම කථාවක් නැහැ, මෙතැන. ගොවියාගේ අල ටික වෙළෙඳ පොළට එන මාසයද, දෙකද, එකහමාරද කියන කාලය ගැන තමයි මෙතැන කියන්නේ. මම ඊට වැඩිය කියන්නේ නැහැ. අද මට මේ යෝජනාව දුන්නේ අල ගොවියෝ. රුපියල් 280ට අල ගන්නවා නම් ඒ ගොවියෝ මට මේ යෝජනාව දෙයිද? අද කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානයේ අල කිලෝව ගන්නේ රුපියල් 230ට. අහන්න, කැප්පෙටිපොලින්. ඒකයි මම කියන්නේ. පසුගිය ආණ්ඩු ගැන කියලා වැඩක් නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ නිසා නේ ඌව පරණගම, වැලිමඩ මිනිස්සු ඔයගොල්ලන්ට ඡන්ද පුරවලා දුන්නේ. ඒ නිසා ඒ ආණ්ඩු ගැන කියන්න එපා, වැඩක් නැහැ. ඒ ආණ්ඩු කාලයේත් අපි මේ ගැන කථා කරන්න ඉදිරිපත් වුණා; අල ආනයනය කරද්දී tax ගහන්න කිව්වා. අපි ආණ්ඩුවේ සිටියත්, විපක්ෂයේ හිටියත් ඒක කියනවා.

ගරු උපාලි සමරසිංහ මහතා
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)

කිසි ගැටලුවක් නැහැ, තර්කයක් නැහැ. අපේ වුවමනාව තිබෙන්නේත් ඔබතුමා කියනවා වාගේ ඉතිහාසය ගැන අවබෝධ කර ගනිමින් වර්තමානයේ රට ඉදිරියට ගෙන යෑමයි. ඒ නිසා අපි ඒක ලොකු තර්කයක් කරගන්න ඕනෑ නැහැ.

මම මතු කරමින් සිටියේ මේකයි, ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ පරිභෝජනයට අවශ්‍ය අල ප්‍රමාණය රට තුළ නිෂ්පාදනය කරගන්න බැරි නම් අනිවාර්යයෙන් විදෙස් රටවලින් අල ගෙන්වන්න සිද්ධ වෙනවා. හැබැයි, එහෙම අල ගෙනෙන අතරතුර, ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරගන්නත් ඕනෑ. ඒ වාගේම පාරිභෝගිකයාට සාධාරණ මිලකට අල දෙන්නත් ඕනෑ, ගුණාත්මකභාවයෙන් යුතු අල දෙන්නත් ඕනෑ. 2019 ඉඳලා අපි දැකපු දේ අනුව, 2019දී අපට සියයට 40ක් අල නිෂ්පාදනය කරගන්න පුළුවන් වුණා නම්,-

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

උඩරට අල තමයි ගුණාත්මක. පිට රටින් ගෙන්වන අල නොවෙයි.

ගරු උපාලි සමරසිංහ මහතා
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)

ඔව්. ගරු මන්ත්‍රීතුමනි, 2019 අවුරුද්දේ අපේ රටේ ගොවි ජනතාවට සියයට 50ක් අල නිෂ්පාදනය කරගන්න පුළුවන්කම තිබුණා. හැබැයි, පසුගිය වසර 4, 5 ඇතුළත අමාත්‍යාංශවල හිටපු නිලධාරීන්, ඇමතිවරු සහ ඒ පාලකයන්ගේ පරිපාලනය ඇතුළේ අල නිෂ්පාදනය සියයට 20 දක්වා පහත වැටී තිබෙනවා. මෙන්න මේ කාරණයේදී අපට වගකීමක් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ මාර්තු මාසයේ පටන්ගන්නා වූ මේ අල ප්‍රශ්නය ගත්තොත්, අපි

කොහොමද මේ ගොවියා ආරක්ෂා කරගන්නේ කියන කාරණය ගැන අපි සැලකිලිමත් වෙන්න ඕනෑ.

ඇත්තටම ගරු කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමාත් මුලින් සඳහන් කළා, මේ අල සම්බන්ධව තිබෙන බදු ප්‍රතිපත්තිය ගැන. පසුගිය කාලය තුළ -2023ට පෙර- මේ රටේ ආනයනික අල කිලෝවකට බද්ද තිබුණේ රුපියල් 20යි. හැබැයි, පසුගිය කාලයේ පැවැති රජය 2023.03.08වැනි දා ඒ බද්ද රුපියල් 50ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඊට පස්සේ නිෂ්පාදන වියදමත් බලලා, අපේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ 2024.10.02වැනි දින රුපියල් 60 දක්වා රුපියල් 10කින් ඒ බද්ද වැඩි කර තිබෙනවා.

අපි හිතනවා දැනුත් අපේ රටේ අලවල නිෂ්පාදන වියදම වැඩියි කියලා. ඒ නිසා එය අඩු කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඉදිරි වසරවලදී අපේ රටේ අල ගොවියාගේ නිෂ්පාදන වියදම අඩු කරගන්න නව තාක්ෂණය, නව බීජ ප්‍රභේද, නව දැනුම දෙන්න ඕනෑ. ඒ සඳහා මේ වන කොටත් ඌව සහ මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගොවීන් දැනුවත් කරනවා; සහනාධාර පදනම යටතේ උපකරණ ලබා දෙනවා; උසස් බීජ ලබා දෙනවා. අපි එවැනි ක්‍රියාවලට ගිහින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ ගෙනැවිත් තිබෙන අය වැය වර්තමාන ආණ්ඩුවේ පළමුවැනි අය වැය. හැබැයි අපි උත්සාහ කරනවා අවුරුදු 76ක් තිස්සේ මෙන්න මේ කියපු විධියට කඩා වැටුණු අපේ කෘෂි කර්මාන්තය ගොඩ ගන්නට. අපේ රටේ තිබෙන මේ පැරණි තාක්ෂණය අපි 2026, 2027, 2028 වන කොට අත් හැරලා ලෝකයේ නව තාක්ෂණය ගෙනැල්ලා, නව බීජ ප්‍රභේද හඳුන්වා දීලා, ගොවීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපයා දීලා, ගොවීන්ට අවශ්‍ය ගබඩා පහසුකම් සපයා දීලා, අල විතරක් නොවෙයි සියලු නිෂ්පාදන ගොඩ ගැනීම සඳහා මැදිහත් වෙනවාය කියන කාරණය මේ ගරු සභාවට දැනුම් දෙන්න මම කැමැතියි.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 6.24ට, 2025 පෙබරවාරි 21වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 15වන සෙනසුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி, பி.ப. 6.24 மணிக்கு பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 21ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 15, சனிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.24 p.m. until 9.30 a.m. on Saturday, 15th March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 318 - இல. 14
Volume 318 - No. 14

2025 මාර්තු 15 වන සෙනසුරාදා
2025 மார்ச் 15, சனிக்கிழமை
Saturday, 15th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 15 වන සෙනසුරාදා
2025 மார்ச் 15, சனிக்கிழமை
Saturday, 15th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහමඩ් සාලි නලීම් මහතාගේ ඉල්ලා අස්වීම [පිටුව 2463]
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ක්‍රමය පත්‍රයේ ලැයිස්තුගත කිරීමේ අනුපිළිවෙළ [පිටුව 2464]
අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [පිටුව 2465]
ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 2466-2488]
පාසල් දහසක් සඳහා සුහුරු පුවරු සහ අනෙකුත් උපකරණ ලබා දීම:
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [පිටුව 2488]
විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [විසිඑක්වන වෙන් කළ දිනය]:
[ශීර්ෂය 112 (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක)] - කාරක සභාවේදී සලකා බලන ලදී [පිටු 2491-2626]
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය:
වාර්ෂික වාර්තාව (2021) [පිටුව 2626]
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය:
වාර්ෂික වාර්තාව (2021) [පිටුව 2627]
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල:
වාර්ෂික වාර්තාව (2021) [පිටුව 2627]
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය:
වාර්ෂික වාර්තාව (2021) [පිටුව 2627]
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය:
වාර්ෂික වාර්තාව (2022) [පිටුව 2628]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு மொஹமட் சாலி நழீமினது இராஜினாமா [ப: 2463]
வாய்மூல விடைக்கான வினாக்களை ஒழுங்குப் பத்திரத்தில் பட்டியலிடும் வரிசை [ப: 2464]
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 2465]
வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2466-2488]
ஆயிரம் பாடசாலைகளுக்கு "ஸ்மார்ட் போர்ட்" மற்றும் பிற உபகரணங்களை வழங்குதல்:
மாண்புமிகு பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 2488]
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட இருபத்தோராம் நாள்]:
[தலைப்பு 112 (வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை)] - குழுவில் ஆராயப்பட்டது [ப: 2491-2626]
இலங்கை சுற்றுலா மற்றும் ஹோட்டல் முகாமைத்துவ நிறுவகம்:
வருடாந்த அறிக்கை (2021) [ப: 2626]
இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபை:
வருடாந்த அறிக்கை (2021) [ப: 2627]
இலங்கை சுற்றுலா அபிவிருத்தி நிதியம்:
வருடாந்த அறிக்கை (2021) [ப: 2627]
இலங்கை சுற்றுலா ஊக்குவிப்புப் பணியகம்:
வருடாந்த அறிக்கை (2021) [ப: 2627]
இலங்கை சுற்றுலா ஊக்குவிப்புப் பணியகம்:
வருடாந்த அறிக்கை (2022) [ப: 2628]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Resignation of Hon. Mohamed Sali Naleem, Member of Parliament [Col. 2463]
Order of Listing Questions for Oral Answers in the Order Paper [Col. 2464]
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 2465]
ORAL ANSWERS TO QUESTIONS [Cols. 2466-2488]
PROVISION OF SMART BOARDS AND OTHER EQUIPMENT FOR 1,000 SCHOOLS:
Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 2488]
APPROPRIATION BILL, 2025 - [Twenty-first Allotted Day]:
Considered in Committee - [Head 112 (Foreign Affairs, Foreign Employment and Tourism)] [Cols. 2491-2626]
SRI LANKA INSTITUTE OF TOURISM AND HOTEL MANAGEMENT:
Annual Report (2021) [Col. 2626]
SRI LANKA TOURISM DEVELOPMENT AUTHORITY:
Annual Report (2021) [Col. 2627]
SRI LANKA TOURISM DEVELOPMENT FUND:
Annual Report (2021) [Col. 2627]
SRI LANKA TOURISM PROMOTION BUREAU:
Annual Report (2021) [Col. 2627]
SRI LANKA TOURISM PROMOTION BUREAU:
Annual Report (2022) [Col. 2628]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 15 වන සෙනසුරාදා
2025 மார்ச் 15, சனிக்கிழமை
Saturday, 15th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.


නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහමඩ් සාලි නලීම් මහතාගේ ඉල්ලා අස්වීම
பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு மொஹமட் சாலி நழீமினது இராஜினாமா
RESIGNATION OF HON. MOHAMED SALI NALEEM, MEMBER OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහමඩ් සාලි නලීම් මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය වෙත භාර දී ඇති බවත්, ඒ අනුව දසවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වූ බවත් පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. එම ලිපිය දැන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් කියවනු ලැබේ.

අනතුරුව පහත සඳහන් ලිපිය මහ ලේකම් විසින් කියවන ලදී:
அதன்பிறகு, செயலாளர் நாயகம் பின்வரும் கடிதத்தை வாசித்தார்:
Whereupon the Secretary-General read the following letter:



15.03.2025

Secretary General,
Parliament

Resignation from the Position of Member of Parliament – M. S. Naleem (National List, Sri Lanka Muslim Congress)

I hereby tender my resignation as a Member of Parliament, as I intend to contest the Local Authorities Election in 2025.

Please accept my resignation accordingly.

Mohamed Sali Naleem, MP

II
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයේ ලැයිස්තුගත කිරීමේ අනුපිළිවෙල
வாய்மூல விடைக்கான வினாக்களை ஒழுங்குப் பத்திரத்தில் பட்டியலிடும் வரிசை
ORDER OF LISTING QUESTIONS FOR ORAL ANSWERS IN THE ORDER PAPER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා විසින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවල අනුපිළිවෙල නොසලකමින් න්‍යාය පත්‍රයට ඇතුළත්කොට ඇතැයි සඳහන් කරමින් 2025.03.14 දින මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව මේ සම්බන්ධයෙන් මා විසින් සභාලේඛන කාර්යාංශයෙන් වාර්තාවක් කැඳවන ලදී. ඒ අනුව එතුමා විසින් ප්‍රශ්න ලබා දී ඇති අනුපිළිවෙළ අනුවම අදාළ න්‍යාය පත්‍ර සඳහා එතුමාගේ ප්‍රශ්න ඇතුළත් කිරීම සිදු කර ඇත.

එබැවින්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා විසින් වාචික පිළිතුරු ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් නඟන ලද චෝදනා පදනම් විරහිත බවත්, සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සාධාරණ අයුරින් ඔවුන් විසින් ලබා දී ඇති අනුපිළිවෙළ අනුවම ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති බවත් මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

III

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ තේරීම් කාරක සභාවේ රැස්වීම්

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டமும் தெரிவுக் குழுக் கூட்டமும்

MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මාර්තු 15 සෙනසුරාදා, එනම් අද දින පූර්ව භාග 11.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් සහ එය අවසන් වූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක් කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, අදාළ රැස්වීම් සඳහා පැමිණ සහභාගි වන ලෙස සියලුම සාමාජික මන්ත්‍රීවරයන්ට දැනුම්දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

Amendments to the List of Proposed Alterations in the Legends of Draft Estimates - 2025 submitted on 27th February, 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, 2021 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්

மனுக்கள்

PETITIONS

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, පැලෑටියාව, අංක 520 දරන ස්ථානයෙහි පදිංචි එච්.ජී. සෝමවන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
(මාණ්පුමිකු (කලානිති) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු කථානායකතුමනි, තලවතුගොඩ, උතුවම්කන්ද පාර, අංක 174/එෆ්/1 දරන ස්ථානයෙහි පදිංචි ඊ.ඒ.ඩී.එන්. ධම්මික එදිරිසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)

ගරු කථානායකතුමනි, මීගමුව, සාන්ත ජෝන්ස් පාර, අංක 11 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.සී. නිශාන්ත කොස්තා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

ගාල්ල, "වලහන්දුව වත්ත" ඉඩමෙහි සැලසුම් කර ඇති ව්‍යාපෘති: වර්තමාන තත්ත්වය

காலி, வலஹன்துவ தோட்ட காணியில் திட்டமிடப்பட்டுள்ள கருத்திட்டங்கள்: தற்போதைய நிலைமை

PROJECTS PLANNED ON LAND OF WALAHANDUWA ESTATE, GALLE: CURRENT STATUS

255/2024

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, නුගවුව, "වලහන්දුව වත්ත" ඉඩම කැබලි කර විවිධ ව්‍යාපෘති සඳහා ලබා දීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එක් එක් ව්‍යාපෘතියේ අවශ්‍යතාව හා අපේක්ෂිත ප්‍රතිලාභ හඳුනාගෙන තිබේද;

(v) ඒ අනුව, අත්‍යවශ්‍ය ව්‍යාපෘති කවරේද;

(vi) ඒ අතරින් ඇතැම් ව්‍යාපෘති මේ වනවිට අතරමඟ නතර වී තිබේ නම්, එම ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමේ හැකියාවක් තිබේද;

(vii) නොඑසේ නම්, එම ව්‍යාපෘති වෙනුවෙන් දැරීමට සිදුවන අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழිල්, කාල්නடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தில் நுகதூவ, 'வலஹன்துவ' தோட்ட காணியைத் துண்டாக்கிப் பல்வேறு கருத்திட்டங்களுக்காக வழங்குவதற்கு திட்டமிடப்பட்டிருந்ததை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டங்களின் தற்போதைய நிலைமை யாதென்பதையும்;

(iii) மேற்படி கருத்திட்டங்களுக்காக இதுவரையில் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(iv) ஒவ்வொரு கருத்திட்டத்திற்குமான தேவை மற்றும் எதிர்ப்பார்க்கப்படும் நன்மைகள் இனங்காணப்பட்டுள்ளனவா என்பதையும்;

(v) அதன்படி, அத்தியாவசியமான கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(vi) அவற்றுள் சில கருத்திட்டங்கள் இன்றளவில் இடைநிறுத்தப்பட்டிருப்பின், அவற்றை மீள ஆரம்பிக்க முடியுமா என்பதையும்;

(vii) இன்றேல், மேற்படி கருத்திட்டங்களால் ஏற்க நேரிடும் நட்டம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that the land of Walahanduwa Estate in Nugaduwa of Galle District was planned to be subdivided and allocated for various projects;

(ii) the present status of those projects;

(iii) the amount of money that has been spent on those projects so far;

(iv) whether the need for and the expected benefits of each project have been identified;

(v) accordingly, which of the projects are essential;

(vi) if some of those projects have now been halted midway, whether there is a possibility of restarting those projects; and

(vii) if not, the loss those projects will incur?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ගාල්ල, වලහන්දුව වත්ත නමැති ඉඩමට අදාළව විකිණීමේ හා බදු පදනම යටතේ පහත සඳහන් බැහැර කිරීම් සිදු කර ඇත.

අ.අ	බැහැර කිරීම	ප්‍රමාණය			බැහැර කරන ලද දිනය
		අක්:	රූ:	පර්:	
01	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා සේවකයින් සඳහා (විකිණීමෙන්)	5	0	00	2017.03.09
02	අක්මීමණ විවිධ සේවා සමුපකාරය (විකිණීමෙන්)	3	3	04	1980 වර්ෂයේ
03	සුජීවා නිශාන්ති මය (බදු පදනම මත)	0	1	20	2017.01.01

(ii) ඉහත අංක 01 හා 02 යන කරුණු සින්නක්කරව විකිණීමෙන් බැහැර කිරීම් වේ. අංක 03 දරන කරුණ යටතේ වූ අක්:00 රූ:01 පර්:20ක බිම් ප්‍රමාණය දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී ඇත.

උක්ත පියවරයන්ට අතිරේකව වලහන්දුව වත්ත ඉඩම විෂයෙහිලා පහත සඳහන් කාර්යය කටයුතු ඉටු කිරීම සඳහා පියවර ගෙන තිබූ අතර නැවත ප්‍රසිද්ධ ගැසට් පත්‍ර අංක 2271/25 හා 2022.03.15 දිනැති ගැසට් පත්‍රය මඟින් හෙක්:401කින් සමන්විත වූ වලහන්දුව වත්ත නැමැති ඉඩම රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වී ඇති බැවින් එකී කටයුතු සඳහා ඉදිරි පියවර ගෙන නොමැත.

- සමුද්‍රික පුරාවිද්‍යා පර්යේෂණ හා සංරක්ෂණ රසායනාගාරයක් ඉදි කිරීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත පවරාදීම.
  කො/570 යටතේ ප්‍රකාශිත වලහන්දුව වත්ත ඉඩමේ අක්කර 01 රූඩ් 0 පර්චස් 2.78ක ප්‍රමාණයක් බලයලත්

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

මිනින්දෝරු යූ.ජී. නන්දා මාලනී ජයවර්ධන මහත්මියගේ අංක 1423 හා 2021.03.22 දිනැති පිඹුර මඟින් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ලබා දීම සඳහා මැනුම් කර ඇත. ඊට අදාළව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත තක්සේරු වටිනාකම ගණනය කර ඇත. ඒ අනුව අදාළ තක්සේරු වටිනාකම වන රුපියල් 17,017,091.87 ප්‍රමාණය ගෙවීම් කරන ලෙස ද මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත දැනුම් දී ඇත. මෙම ඉඩම 1958 අංක 4 දරන පනත අනුව පිහිටුවන ලද රාජ්‍ය වැවිලි සංස්ථාවට 1994.04.21 දිනැතිව අංක 815/10 දරන ගැසට් පත්‍රය මඟින් හෙක්ටෙයාර 401ක ප්‍රමාණයක් පාලනය හා කළමනාකරණය සඳහා පවරා දී ඇත. පසුව, 2019.05.24 දිනැතිව අංක 2124/40 දරන ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරා දී තිබූ ප්‍රතිෂ්ඨාව ප්‍රත්‍යාදිෂ්ඨ කරගෙන ඇත. ඒ අනුව හෙක්ටෙයාර 401ක ප්‍රමාණයම නැවත කොමිෂන් සභාව සතු වී ඇත. කරුණු එසේ තිබියදී නැවත 2271/25 හා 2022.03.15 දිනැති ගැසට් පත්‍රයක් මඟින් 2019.05.24 දිනැතිව අංක 2124/40 දරන ගැසට් පත්‍රය අවලංගු කර ඇත. ඒ අනුව නැවත හෙක්ටෙයාර 401ක ප්‍රමාණය රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වී ඇත. මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් නිතර නිතර ඉල්ලීම් කරමින් අදාළ තක්සේරු මුදල ගෙවීමට කම්ටුවේ අනුමැතිය ලැබී ඇති බැවින් ඒ සඳහා අවස්ථාව සලසා දෙන ලෙස දැනුම් දී ඇත. එහෙත් රාජ්‍ය වැවිලි සංස්ථාව එම මුදල එම ආයතනය වෙත ගෙවීම් කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපතිතුමා වෙත 2024.08.20 දිනැතිව ලිපියක් යොමු කරමින් ඉහත ඉඩම් කොටස මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ලබා දීම සඳහා ප්‍රත්‍යාදිෂ්ඨ කර ගැනීම සඳහා එකඟතාව විමසා ඇත. එහෙත් ඒ සඳහා එකඟ නොවන බව පවසා ඉහත ඉඩම මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ලබා දීම රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් සිදු කළ හැකි බව 2024.11.16 දිනැතිව දැනුම් දී ඇත. ඒ අනුව, එම බැහැර කිරීම සිදු වී නොමැති බව කාරුණිකව දන්වමි.

- වලහන්දුව සමෘද්ධි ප්‍රජා මූල බැංකුව වෙත පවරා දීම.ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වලහන්දුව වත්ත නැමැති ඉඩමේ පර්චස් 20ක ප්‍රමාණයක් බලයලත් මිනින්දෝරු යූ.ජී.එන්.එම්. ජයවර්ධන මහතා විසින් මැනුම් කර අංක 1654 හා 2022.05.12 දිනැති පිඹුරේ කැබලි අංක 03 දැක්වෙන ප්‍රමාණය වලහන්දුව සමෘද්ධි ප්‍රජා මූල බැංකුව වෙත ලබා දීම සඳහා මැනුම් කර ඇත. එම ඉඩම් කොටස සඳහා තක්සේරු වටිනාකම වශයෙන් රුපියල් 5,006,483.13ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවන ලෙස දැනුම් දී ඇතත් ගෙවීම් කර නොමැත. එම මුදල රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ගෙවන ලෙස සමෘද්ධි ප්‍රජා මූල බැංකුවට දැනුම් දී ඇත. සමෘද්ධි බැංකුව විසින් අප ආයතනයෙන් ඔප්පුව ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව එම බැහැර කිරීම ද සිදු වී නොමැති බව මෙයින් දන්වමි.

- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මෙම ආයතනය වෙත බැහැර කිරීමක් සිදු වී නොමැත.

- තවද, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව රජයේ පොදු සංවර්ධන කටයුතු සඳහා වලහන්දුව වත්ත නැමැති ඉඩමෙන් ඉඩම් අත්පත් කර ගැනීමෙහිලා එකඟතාව ලබා දී ඇති ඉඩම් විස්තර ඇමුණුම වශයෙන් ඉදිරිපත් කරමි.
  අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වලහන්දුව වත්ත වර්තමානය වන විට රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත 2271/25 හා 2022.03.15 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පවරා දීමට ඉඩම් කොමිෂන් සභාව විසින් කටයුතු කර ඇති බව දන්වා සිටිමි.

ගරු කථානායකතුමනි, සාරාංශයක් වශයෙන් කිව්වොත්, මෙහිදී සිදු වෙලා තිබෙන්නේ වලහන්දුව වත්ත කියන ඉඩමෙන් හෙක්ටෙයාර 401ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට - LRC එකට - තිබිලා නැවත රාජ්‍ය වැවිලි සංස්ථාවට අයිති කරගෙන, නැවතත් එය LRC එකට අයිති කරගෙන තිබෙනවා. ඊට පසුව ඒ ගැසට් එක cancel කරලා දැනට රාජ්‍ය වැවිලි සංස්ථාවට තමයි මේ ඉඩම අයිති වෙලා තිබෙන්නේ. ඒ නිසා ඉල්ලීම් ගොඩක් ලැබිලා තිබෙනවා. මේ ඉඩම රාජ්‍ය වැවිලි සංස්ථාවට ලැබී තිබෙන නිසා එතැන පටලැවිල්ලක් තිබෙනවා.

(iii) ඉඩම් අත්කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක බැවින් මෙතෙක් වන්දි ගෙවා නොමැත.

(iv) ඔව්.

(v) ඇමුණුමෙහි සඳහන් කාර්යයන් සඳහා.

ඒ වලහන්දුව වත්තෙන් ඉල්ලා තිබෙන ඉඩම් අයිතම 42ක් යටතේ සඳහන්ව තිබෙනවා.

(vi) ඉඩම් අත්කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක වේ.

(vii) නැත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, ඇමුණුම සභාගත* කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, ඒ තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් මේ ප්‍රශ්නයට ප්‍රස්තුත වෙච්ච වලහන්දුව වත්ත කියන සම්පූර්ණ ඉඩම මේ ව්‍යාපෘතිවලට භාවිත කරනවා වාගේම මේ තුළ අනවසර අත්පත් කරගැනීම් සැලකිය යුතු ප්‍රමාණයකුත් තිබෙනවා. මේ හෙක්ටෙයාර 401ක භූමියෙන් ඉතිරි ප්‍රමාණය පිළිබඳව හෝ යම් සැලකිය යුතු අදහසක් තිබෙනවාද කියන කාරණයත් අහන ගමන්, අනවසර අත්පත් කරගැනීම් සහ අනීතික ලෙස ඉඩම් බෙදා දීම් වැනි කටයුතු කිහිපයක්ම ඒ තුළ සිදුවෙලා තිබෙනවා කියලාත් දැනෙනවා; ඒ සම්බන්ධව ඔබ අමාත්‍යාංශයෙන් ගත හැකි පියවර කවරේද කියන ප්‍රශ්නය තමයි මම මූලිකව ඉදිරිපත් කරන්නේ.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමා, LRC එක සම්බන්ධයෙන් කලිනුත් පාර්ලිමේන්තුවේ ඔය වාගේ ප්‍රශ්න ඉදිරිපත් කර තිබෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයින් සඳහා මේ ඉඩමෙන් අක්කර 5ක් දීලා තිබෙනවා, නිවාස සඳහා කියලා. ඊළඟට ඉල්ලීම් 42ක් තිබෙනවා, රාජ්‍ය ආයතන සහ විවිධ ව්‍යාපෘති සඳහා. ඒවා දෙන්න බැරි වුණා කියලා තමයි වාර්තා කර තිබෙන්නේ. නමුත්, මේ පිළිතුරේ සඳහන් වෙන්නේ නැහැ අනවසරයෙන් අල්ලා ගැනීමක් සම්බන්ධව. ඒ සම්බන්ධයෙන් මන්ත්‍රීතුමා කරුණු වාර්තා කරනවා නම් මට විමසීමක් කරන්න පුළුවන්; ඒ සඳහා පියවර ගන්න පුළුවන්. ඔය කියන ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ පිළිතුරේ නිශ්චිතව වාර්තා කර නැහැ.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔය භූමියෙන්ම Galle Techno Park එක සඳහාත්, ඒ වාගේම සම්මන්ත්‍රණ ශාලාවක් ගොඩ නැඟීම සඳහාත් ඉඩම් වෙන් කරලා තිබෙනවා. නමුත්, ඒ ඉඩම් මේ වන විට භාවිත වෙන්නේ නැහැ. ඒ සම්බන්ධව ඉදිරියේදී සොයා බලා කටයුතු කරන්න අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද කියන ප්‍රශ්නයත් මම අහනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඒකට පොදු පිළිතුරක් තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මේ ඉඩම් සම්බන්ධයෙන් ව්‍යාකූලත්වයක් තිබෙනවා. දිස්ත්‍රික්ක ගණනාවක මෙවායේ ප්‍රාදේශීය කාර්යාල 18ක් තිබෙනවා. සමහර ඉඩම් සම්බන්ධයෙන්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවටත් අදහසක් නැහැ. එම ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන ඉන්නවාද, හාර දුන් ව්‍යාපෘතිවල ඒවා ක්‍රියාත්මක වනවාද කියන කාරණා සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් නැහැ. ඒ සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරීන් ඉන්නවා තමයි. නමුත් ඒ සම්බන්ධයෙන් ව්‍යාකූලත්වයක් තිබෙනවා. අපි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවත් එක්ක මේ ගැන කථා කළා. අපි වැඩ පිළිවෙළක් සකස් කරමින් සිටිනවා; කොමිෂන් සභාවෙන් ලබා දුන් ඉඩම්වල එම නිශ්චිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනවාද, ඒක ක්‍රියාත්මක වෙන්නේ නැද්ද, ඒවා සංවර්ධනය කරලාද තිබෙන්නේ, නැද්ද කියන කාරණය පිළිබඳව සොයා බලන්න සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම් අනවසරයෙන් භුක්ති විඳිනවාද, අල්ලා ගැනීම් සිද්ධ වෙලා තිබෙනවාද කියන කාරණා සම්බන්ධයෙන් සොයා බලන්න වැඩ පිළිවෙළක් අපි සකස් කරමින් සිටිනවා. ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්නේ ඒ සම්බන්ධයෙන්. ඒ පොදු කටයුතු වෙනුවෙන් අපි වැඩසටහනක් හදාගෙන යනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -275/2024- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -382/2025- (1), ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -429/2025- (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

උනකන්ද සහ අන්නාසිගල ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිත විදුලි ව්‍යාපෘති: විස්තර

உனகந்த மற்றும் அன்னாசிகல பிரதேசங்கள் உள்ளடங்கும் வகையில் செயற்படுத்தப்படவுள்ள மின்சார கருத்திட்டங்கள்: விபரம்

POWER PROJECTS TO BE IMPLEMENTED COVERING UNAKANDA AND ANNAASIGALA: DETAILS

437/2025

5. ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බදුල්ල සහ මොනරාගල යන දිස්ත්‍රික්ක දෙකට මායිම්ව සිංහලයාගම, උනකන්ද හා අන්නාසිගල ප්‍රදේශ ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලබන විදුලි ව්‍යාපෘතිය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත්තේ කවුරුන් විසින්ද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන් විසින්ද;

(iii) එම අනුමතිය ලබා දෙන ලද ක්‍රමවේදය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අදාළ රේඛීය අමාත්‍යාංශය සහ අදාළ වෙනත් ආයතනවලින් නිසි අවසරය ලබා ගෙන තිබේද;

(vi) එසේ නම්, අවසරය ලබා ගන්නා ලද දින වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) ඊට අදාළ ලේඛනවල පිටපත් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වලුසක්ති අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) පතුළේ මට්රුම් මොනරාකලේ මුදලිය ඉරණ්ඩු මාවට්ටංකළිණ් එල්ලෙප් පිරදේසංකළිලුළ්ළ සිංකළයාකම, උනකන්ද මට්රුම් අන්නාසිකල ආකිය පිරදේසංකළෙ උළ්ළඩක්කුම් වකෙයිල් අමුලාක්කප් පට්ටුවරුම් මින්සාර කරුත්තිට්ටත්තිර්කාන කෝරික්කෙයෙ මුන්වෙත්තවර් යාරෙන් පතෙයුම්;

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

(ii) மேற்படி கருத்திட்டத்திற்கு அங்கீகாரம் வழங்கியவர் யாரென்பதையும்;

(iii) மேற்படி அனுமதி பெற்றுக்கொடுக்கப்பட்ட நடைமுறை யாதென்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்திற்குச் செலவிடப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்தை அமுலாக்கும்போது, வனப் பாதுகாப்புத் திணைக்களம், சம்பந்தப்பட்ட நிரல் அமைச்சு மற்றும் சம்பந்தப்பட்ட பிற நிறுவனங்களின் முறையான அனுமதி பெற்றுக்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அனுமதி பெற்றுக்கொள்ளப்பட்ட திகதி வெவ்வேறாக யாவை என்பதையும்;

(vii) இவற்றுடன் தொடர்புடைய ஆவணங்களின் பிரதிகளைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he state -

(i) the names of persons who requested for the power projects to be implemented covering the Sinhalayaagama, Unakanda and Annaasigala areas bordering Badulla and Monaragala Districts;

(ii) the name of the person who has given approval for the said project;

(iii) the procedure that has been followed in granting such approval;

(iv) the amount spent on the said project;

(v) whether due permissions have been obtained from the Department of Forest Conservation, the relevant Line Ministry and other relevant institutions for implementing the said projects;

(vi) if so, the dates on which the said permissions were obtained, separately; and

(vii) whether the copies of the relevant documents will be presented?

(b) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) විදුලි ව්‍යාපෘති දෙකක් තිබෙනවා.

<u>අන්නාසිගල විදුලි ව්‍යාපෘතිය</u>

මේ සම්බන්ධයෙන් අන්නාසිගල ගම්මානයේ ගොවීන් පිරිසක් එවකට ගරු ජනාධිපතිතුමා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීම ජනාධිපති කාර්යාලයේ එවකට අධ්‍යක්ෂ ජනරාල් කීර්ති තෙන්නකෝන් මහතා විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත එවා ඇත. එම ඉල්ලීම එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු විසින් 2022.10.10 දිනැති ලිපිය මඟින් ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වෙත යොමු කර ඇත.

<u>උනකන්ද අඹකොළඅාර ව්‍යාපෘතිය</u>

හිටපු කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය සහ බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් 2023.02.18 දිනැති ලිපිය මඟින් ලංකා විදුලිබල මණ්ඩලයේ ඌව පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

(ii) මෙම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලයේ ගැමී විදුලි ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 2024.05.07 වන දින ලබාගෙන ඇත. (ඇමුණුම 01)

(iii) මෙම විදුලි ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික විමර්ශනයක් සිදු කර තාක්ෂණික ශක්‍යතාව සඳහා නිර්දේශ ලබාගෙන ව්‍යාපෘතිය සඳහා සම්මත වැය ඇස්තමේන්තුවක් සකස් කර ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ඒ අනුව අදාළ අනුමැතිය ලැබී ඇත.

(iv) අන්නාසිගල විදුලි ව්‍යාපෘතිය සඳහා - රුපියල් 36,644,504.99

උනකන්ද අඹකොළඅාර විදුලි ව්‍යාපෘතිය සඳහා - රුපියල් 36,229,038.28

මතභේදාත්මක තත්ත්වයක් හේතුවෙන් මෙම විදුලි ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවා ඇති අතර, අත්හිටුවන අවස්ථාවේ අන්නාසිගල විදුලි ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 60ක් ද, උනකන්ද විදුලි ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 75ක් ද විය.

(v) විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ගස් ඉවත් කර ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2024.07.30 දින ඉල්ලුම් කර ඇත. (ඇමුණුම 02)

මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගනී.

(vi) ඊට ප්‍රතිචාර වශයෙන් 2024.08.12 දින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගස් ඉවත් නොකර මැනුම් කරන ලද ඉඩම් හරහා විදුලි මාර්ග ඉදි කරන ලෙස උපදෙස් දී ඇත. (ඇමුණුම 03)

(vii) මෙම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලයේ ගැමී විදුලි ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ලබාගත් ලංකා විදුලිබල මණ්ඩලයේ 2024.07.05 **දිනැති** අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අදාළ ලිපියෙහි (ඇමුණුම 01), ඌව පළාත් ප්‍රධාන ඉංජිනේරු (තැනීම්-ඌව) විසින් යොමු කරන ලද අංක: DGM(UVA)CEC/CI/24038-21039 හා 2024.07.30 දිනැති ලිපියෙහි (ඇමුණුම 02) සහ වන සංරක්ෂක ජනරාල් වෙනුවට ජී.ආර්.පී.බී. සේනාරත්න මහතා, වන සංරක්ෂණ, (පරිසර කළමනාකරණ හා භූ සම්පත්) යොමු කරන ලද අංක FD/EM&GR/EIA/TLP/MISC/2024 හා 2024.08.12 දිනැති ලිපියෙහි (ඇමුණුම 03) පිටපත් මේ සමඟ අමුණා ඇත.

ඇමුණුම 01, 02 සහ 03 **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**** ප්‍රශ්නකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)
ගරු කථානායකතුමනි, මා ගරු අමාත්‍යතුමා වෙත යොමු කරන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පසුගිය කාලයට අදාළව මේ වාගේ තවත් විදුලි ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති කියා මම හිතනවා. ඔබතුමාගේ පිළිතුරට අනුව අපට පෙනෙනවා එකී විදුලි ව්‍යාපෘති දෙක සඳහා රුපියල් මිලියන 36 බැගින් වියදම් දරා තිබෙන බව. මේ වාගේ විශේෂ විදුලි ව්‍යාපෘති විශේෂ අනුමැතියකින් ක්‍රියාත්මක කර තිබෙනවා. හැබැයි, ඒ විශේෂ විදුලි ව්‍යාපෘති බොහෝ විට ක්‍රියාත්මක කර තිබෙන්නේ ප්‍රමුඛතාව සැලකිල්ලට ගන්නේ නැතුව, ඒවායේ නීත්‍යානුකූලභාවය සැලකිල්ලට ගන්නේ නැතුව දේශපාලන අධිකාරියේ සහ එවකට හිටපු බලවතුන්ගේ වුවමනාව පරිදියි. මෙවැනි විදුලි ව්‍යාපෘති ලංකා විදුලිබල මණ්ඩලයට අදාළව තවදුරටත් ක්‍රියාත්මක වෙනවා ඇති කියා මම විශ්වාස කරනවා.

ඒ පිළිබඳව ඔබතුමන්ලා සොයා බැලීමක් කරනවාද කියා සහ ඉදිරියේදී මේ වාගේ හරස් ගනුදෙනු හරහා මෙවැනි විදුලි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැළැක්වීම සඳහා ආයතනික වශයෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඇත්තටම එම විදුලි ව්‍යාපෘතිය ක්‍රමවත් නොවන විධියට කරගෙන යෑම පිළිබඳව ආරංචි වූ වහාම එය තාවකාලිකව අත්හිටුවා පරීක්ෂණයක් කිරීමට මා විසින් උපදෙස් ලබා දී තිබෙනවා. ඒ වාගේම ඊට පසුව අප ලබාගත් තොරතුරු අනුව අදාළ ගම්වාසීන්ගේ ඉල්ලීම සලකා බලා ගම්වාසීන් සඳහා අවශ්‍ය විදුලිය ලබා දීමට පමණක් මේ වන කොට උපදෙස් දී ඒ අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතිනවා.

අවසාන වශයෙන් මතු කරපු කාරණාව ගැන කියනවා නම්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවන පරිදි අපි අනිවාර්යයෙන් කටයුතු කරනවා. ඉදිරියේදී කොහොමටත් දේශපාලන මැදිහත්වීම් මත හෝ අක්‍රමවත් විධියට මේ ආකාරයට විදුලි බලය ලබා දෙන්න අපි කටයුතු කරන්නේ නැහැ. අපි ඒ ගැන අනිවාර්යයෙන් සහතික වෙනවා.

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු ලංකාව පුරා හුදකලා ගම්මාන සහ තනි තනි ඒකක විධියට විදුලිය නැති නිවාස ප්‍රමාණයක් හඳුනා ගන්න පුළුවන්. මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය ඒ නිවාස හඳුනාගෙන තිබෙනවාද? ඒ නිවාසවලට විදුලිය ලබා දීමට ඔබතුමන්ලාගේ පැත්තෙන් කරන කඩිනම් මැදිහත්වීම කුමක්ද කියා දැන ගන්න කැමැතියි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඇත්තටම එකී හඳුනා ගැනීමේ කාර්ය ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා හෝ එකී ප්‍රදේශයේ අදාළ අංශ හරහා අපට ලැබෙන්න ඕනෑ. මොකද, ලංකා විදුලිබල මණ්ඩලය පාරිභෝගිකයන් සොයාගෙන යෑම හෝ සංගණනය කිරීමක් කරන්නේ නැහැ. ලැබෙන ඉල්ලීම් අනුව පාරිභෝගිකයන් සඳහා විදුලිය ලබා දීමට අපි අනිවාර්යයෙන් කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

IDH සිට කොළොන්නාව මංසන්ධිය දක්වා මාර්ගය: සංවර්ධනය

IDH தொடக்கம் கொலன்னாவை சந்தி வரையான வீதி: அபிவிருத்தி

ROAD FROM IDH TO KOLONNAWA JUNCTION: DEVELOPMENT

275/2024

2. ගරු කිංස් නෙල්සන් මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)
(மாண்புமிகு கிங்ஸ் நெல்சன் - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Kins Nelson on behlaf of the Hon. S.M. Marikkar)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අයි.ඩී.එච්. සිට කොළොන්නාව මංසන්ධිය දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

(iii) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) `නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஐ.டீ.எச். தொடக்கம் கொலன்னாவை சந்தி வரையிலான வீதியை அபிவிருத்தி செய்வதற்கான வேலைத்திட்டமொன்று முன்மொழியப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வேலைத்திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு எதிர்பார்க்கும் காலப்பகுதி யாதென்பதையும்;

(iii) மேற்படி வீதியை அபிவிருத்தி செய்வதற்கான நிதி எவ்வாறு பெறப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) whether a course of action has been proposed for the development of the road running from the IDH to the Kolonnawa Junction;

(ii) if so, the expected timeframe for the implementation of the course of action concerned; and

(iii) the method in which necessary provisions will be secured for the development of the above-mentioned road?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii)

මාර්ග කොටස	අනු කොටස්	දුර	වර්තමාන තත්ත්වය
පළමු කොටස - කිලෝ මීටර් 2 මීටර් 770 සිට කිලෝ මීටර් 3 මීටර් 100 දක්වා		කිලෝ මීටර් 2 සිට කිලෝ මීටර් 3 මීටර් 100 දක්වා	ද්විත්ව මංතීරු දක්වා පුළුල් කර සංවර්ධනය කර ඇත.
දෙවන කොටස - කිලෝ මීටර් 0 සිට කිලෝ මීටර් 2 මීටර් 770 දක්වා	02(a)	කිලෝ මීටර් 1 මීටර් 200 සිට කිලෝ මීටර් 1 මීටර් 800 දක්වා (මීටර් 600)	අබලන්ව ඇත
	02(b)	කිලෝ මීටර් 0 සිට කිලෝ මීටර් 1 මීටර් 200 සහ කිලෝ මීටර් 1 මීටර් 800 සිට කිලෝ මීටර් 2 මීටර් 770	අබලන්ව ඇති මීටර් 600 කොටස දෙපස ඇති මෝටර් රථ ගමන් කළ හැකි තත්ත්වයේ පවතින කොටස

ඉහත වගුවෙහි සඳහන් පරිදි කිලෝ මීටර් 0 සිට කිලෝ මීටර් 2 මීටර් 770 දක්වා කොටස තුළ පවතින මීටර් 600 (කිලෝ මීටර් 1 මීටර් 200 - කිලෝ මීටර් 1 මීටර් 800) දැඩි ලෙස අබලන්ව ඇති අතර මෙම කොටස ප්‍රතිසංස්කරණය කිරීම 2025 වැඩ සැලැස්මට ඇතුළත් කර ඇත. දැනට පවතින මාර්ගය වාහන යා හැකි පරිදි නඩත්තු කිරීම සිදු වේ.

කොළොන්නාව මංසන්ධියේ සිට ගොතටුව හංදිය දක්වා දිවෙන මාර්ගයෙහි අවසාන කොටස වන ගොතටුව හංදිය ආශ්‍රිත කිලෝ මීටර් 2 මීටර් 770 සිට කිලෝ මීටර් 3 මීටර් 100 දක්වා කොටස ද්විත්ව මංතීරු දක්වා පුළුල් කර සංවර්ධනය කර ඇත. (**ඇමුණුමෙහි**** දක්වා ඇත.)

තවද, පවතින වාහන ධාරිතාව අනුව මෙම මාර්ගය (කිලෝ මීටර් 0 - කිලෝ මීටර් 2 මීටර් 770 දක්වා කොටස) සම්මත ද්විත්ව මංතීරු දක්වා පුළුල් කර සංවර්ධනය කළ යුතු අතර, ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 2026 වසරේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මෙම ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසුව මාර්ගය පුළුල් කිරීමට අදාළව ප්‍රතිපාදන 2027 වර්ෂයේදී වෙන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය.

(iii) භාණ්ඩාගාරය මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත, මාර්ග නඩත්තු කටයුතු සඳහා ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන යටතේ මෙම සංවර්ධන කටයුතු සිදු කිරීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ සමෘද්ධි කළමනාකරුවන්: විස්තර
சமூர்த்தி அபிவிருத்தி அலுவலர்கள் மற்றும் சமூர்த்தி முகாமையாளர்கள்: விபரம்
SAMURDHI DEVELOPMENT OFFICERS AND SAMURDHI MANAGERS: DETAILS

382/2025

3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිත අබේගුණවර්ධන මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohitha Abegunawardhana)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව සහ මේ වනවිට එම තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු සඳහා නව නිලධාරීන් බඳවා ගන්නේද;

(iii) මේ වනවිට සේවය කරනු ලබන සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව සහ වැඩ ආවරණය කරනු ලබන සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වනවිට විශ්‍රාම ගොස් ඇති සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සහ සමෘද්ධි කළමනාකරුවන්ගේ කාර්යභාරය එක සමාන වන්නේද;

(ii) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට සහ සමෘද්ධි කළමනාකරුවන්ට උසස්වීමේ ක්‍රමයක් තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට පිහිටුවා ඇති සමෘද්ධි බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) සමෘද්ධි ව්‍යාපාරය සම්බන්ධයෙන් සැලසුම් කර ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் பணிபுரிகின்ற சமுர்த்தி அபிவிருத்தி அலுவலர்களின் எண்ணிக்கை மற்றும் அந்தப் பதவியில் தற்போது காணப்படும் வெற்றிடங் களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(ii) அத்தகைய வெற்றிடங்களுக்குப் புதிய அலுவலர்கள் நியமிக்கப்படுவார்களா என்பதையும்;

(iii) இன்றளவில் பணிபுரிகின்ற சமுர்த்தி முகாமையாளர்களின் எண்ணிக்கை மற்றும் பதில் கடமை புரிகின்ற சமுர்த்தி முகாமையாளர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iv) தற்போது ஓய்வுபெற்றுள்ள சமுர்த்தி அபிவிருத்தி அலுவலர்களினதும் சமுர்த்தி முகாமையாளர் களினதும் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(v) இவர்களுக்கு ஓய்வூதியம் வழங்கப்படுகிறதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சமுர்த்தி அபிவிருத்தி அலுவலர்களினதும் சமுர்த்தி முகாமையாளர்களினதும் பணிப் பொறுப்பு சமமானதா என்பதையும்;

(ii) சமுர்த்தி அபிவிருத்தி அலுவலர்களுக்கும் சமுர்த்தி முகாமையாளர்களுக்கும் பதவி உயர்வு வழங்குவதற்கான வழிமுறை காணப்படுகிறதா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வழிமுறை வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இதுவரை தாபிக்கப்பட்டுள்ள சமுர்த்தி வங்கிகளின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(ii) சமுர்த்தி இயக்கம் தொடர்பில் திட்டமிடப் பட்டுள்ள வேலைத்திட்டங்கள் யாவையென் பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House -

(i) the number of Samurdhi Development Officers in service at present and the number of vacancies existing in the post concerned at present, separately;

(ii) whether new officers will be recruited for the vacancies concerned;

(iii) the number of the Samurdhi Managers who are in service at present and the number of those who cover the duties of Samurdhi Managers, separately;

(iv) the number of the Samurdhi Development Officers and the Samurdhi Managers who have retired by now, separately; and

(v) whether they are paid pensions?

(b) Will he also inform this House -

(i) whether the functions of Samurdhi Development Officers and those of Samurdhi Managers are similar;

(ii) whether Samurdhi Development Officers and Samurdhi Managers have promotion schemes; and

(iii) if so, the respective schemes, separately?

(c) Will he further inform this House of the -

(i) number of Samurdhi Banks that have been established by now; and

(ii) course of action planned for the Samurdhi programme?

(d) If not, why?

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)

(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 2025.01.31 දිනට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව - 17,624කි.

2025.01.31 දිනට සමෘද්ධි සංවර්ධන නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව - 2,513කි.

(ii) ඔව්. බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල බඳවාගැනීම් සමාලෝචන කමිටුව වෙත යොමු කර ඇත.

(iii) 2025.01.31 දිනට සේවය කරනු ලබන සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව - 2,093කි.

2025.01.31 දිනට වැඩ ආවරණය කරනු ලබන සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව - 192කි.

(iv) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත 2014 වර්ෂයේ සිට 2024.12.31 දක්වා වන කාල සීමාව තුළ,

විශ්‍රාම ගොස් ඇති සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව - 2,756කි.

විශ්‍රාම ගොස් ඇති සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව - 190කි.

ඒ අනුව, එම තනතුරුවලට අදාළ මුළු සංඛ්‍යාව -2,946කි.

(v) විශ්‍රාම වැටුප් ලබන මුළු සංඛ්‍යාව 2024.12.31 දිනට - 2,481කි.

සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව - 2,332කි.

සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව - 149කි.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ගෙවීමට ඇති විශ්‍රාම වැටුප් ගොනු 465ක් අතරින්, 2025.03.01 දින වන විට විශ්‍රාම වැටුප් ගොනු 278 කට ආසන්න සංඛ්‍යාවක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉතිරි විශ්‍රාම වැටුප් ගොනුවල පවතින අඩුපාඩු සකස් කරමින් පවතී. (මූල්‍ය බැඳීම්, ගොනුවල ලේඛන අඩු පාඩු, 60% ගෙවා නොමැති ආදී කරුණු හේතුවෙන්)

(ආ) (i) නැත. සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ ආසන්නම අධීක්ෂණ නිලධාරියා සමෘද්ධි කළමනාකරු වේ.

සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ කාර්යභාර්ය:

ප්‍රජාව සවිබලගැන්වීම, අඩු ආදායම්ලාභීන් හඳුනා ගැනීම, සමෘද්ධි බැංකු තැන්පතු එකතු කිරීම, ණය ලබාදීම, ණය අය කර ගැනීම, සමාජ ආරක්ෂණ කටයුතු හා ප්‍රජා මූල සංධාන පිහිටුවීම ආදිය ප්‍රධාන කාර්යයන් වේ.

සමෘද්ධි කළමනාකරුවන්ගේ කාර්යභාර්ය:

සමෘද්ධි බැංකු අධීක්ෂණය, කළමනාකරණය, ප්‍රජාව සවිබලගැන්වීම සඳහා නිලධාරීන් යොමු කිරීම හා පහසුකම් සැලසීම ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. සමෘද්ධි බැංකු සාමාජිකයන්ගේ ජීවනෝපාය සංවර්ධනයට අදාළ ණය පහසුකම් සැලසීම ආදිය ප්‍රධාය කාර්යයන් වේ.

(ii) ඔව්.

(iii) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා උසස්වීමේ ක්‍රමය

උස්සවීම් සඳහා බඳවා ගන්නා ක්‍රම 02ක් වේ. (තරග විභාගයක් මගින් බඳවා ගැනීම් සිදු කර උසස්වීම් ක්‍රියාත්මක කරනු ලබයි.)

01 ක්‍රමය - කළමනාකරණ සහකාර තනතුර සඳහා (MN -02)

කොටස් 02කි.

i සීමිත බඳවා ගැනීම් යටතේ උසස්වීම්.

භාෂාව සහ ගණිතය ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එක්වර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවක් වේ.

සහ

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත MN -01, MA 1-1 වැටුප් ක්ත අංක යටතේ වැටුප් ලබන සේවයක/තනතුරක අවම වශයෙන් වසර (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම.

හෝ

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත MN -01, MA 1-1 වැටුප් ක්ත අංක යටතේ වැටුප් ලබන සේවයක/තනතුරක අවම වශයෙන් වසර දහයක (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම.

ii කුසලතා පදනම මත බඳවා ගැනීම් යටතේ උසස්වීම්.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත MN -01, MA 1-1 වැටුප් ක්තයට අයත් තනතුරක පළමු ශ්‍රේණියේ නිලධාරියකු වීම.

02 ක්‍රමය - කළමනාකරු තනතුර සඳහා (MN -04)

i සීමිත බඳවා ගැනීම් යටතේ උසස්වීම්.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

සහ

වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(MN -02 වැටුප් කාණ්ඩය යටතේ වැටුප් ලබන පරිපාලන නිලධාරි, ප්‍රධාන ලිපිකරු, කළමනාකරණ සහකාර හා MN -01 වැටුප් කාණ්ඩය යටතේ වැටුප් ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා MT-01 වැටුප් කාණ්ඩය යටතේ වැටුප් ලබන තොරතුරු තාක්ෂණ නිලධාරීන්, මාධ්‍ය සහකාර, අභ්‍යන්තර විගණන නිලධාරී, විගණන සහකාර, වීඩියෝ කැමරාකරු / සංස්කාරක, පොත් තබන්නා, පරිගණක සහකාර, කාර්මික නිලධාරීන්, ගිණුම් සහකාර හා භාෂා පරිවර්තක නිලධාරීන්)

හෝ

වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(MN -02 වැටුප් කාණ්ඩය යටතේ වැටුප් ලබන පරිපාලන නිලධාරි, ප්‍රධාන ලිපිකරු, කළමනාකරණ සහකාර හා MN -01 වැටුප් කාණ්ඩය යටතේ වැටුප් ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා MT-01 වැටුප් කාණ්ඩය යටතේ වැටුප් ලබන තොරතුරු තාක්ෂණ නිලධාරීන්, මාධ්‍ය සහකාර, අභ්‍යන්තර විගණන නිලධාරි, විගණන සහකාර, වීඩියෝ කැමරාකරු/ සංස්කාරක, පොත් තබන්නා, පරිගණක සහකාර, කාර්මික නිලධාරීන්, ගිණුම් සහකාර හා භාෂා පරිවර්තක නිලධාරීන්)

සමෘද්ධි කළමනාකරුවන් සඳහා උසස්වීමේ ක්‍රමය.

උසස්වීම් සඳහා බඳවා ගන්නා ක්‍රම 02ක් වේ. (තරග විභාගයක් මගින් බඳවා ගැනීම් සිදු කර උසස්වීම් ක්‍රියාත්මක කරනු ලබයි.)

01 ක්‍රමය - සමෘද්ධි කළමනාකරු (MN -7) (විශේෂ ශ්‍රේණිය තනතුර සඳහා)

කොටස් 02 කි.

i සීමිත බඳවා ගැනීම් යටතේ උසස්වීම්.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ MN -6, MN -4, MA -5-2 හා MA -3 වැටුප් ක්තය යටතේ වැටුප් ලබන ස්ථිර තනතුරක වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ස්ථිර කළ නිලධාරීන්

ii කුසලතා පදනම මත බඳවා ගැනීම් යටතේ උසස්වීම්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ MN -6, MN -4, MA -5-2හා MA -3 වැටුප් ක්ත අංක යටතේ වැටුප් ලබන I වන ශ්‍රේණියේ නිලධාරීන්.

02 ක්‍රමය- විධායක සේවා ගණය (SL-01) තනතුර සඳහා උසස්වීම්

කොටස් 02කි.

i සීමිත බඳවා ගැනීම් යටතේ උසස්වීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

සහ

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තුගත MN -7, JM 1-2, MN -6, MA 5-2, MN -4, MA -3, MT -01, MN -2, MA 1-2 වැටුප් ක්ත අංක යටතේ වැටුප් ලබන සේවයක/තනතුරක අවම වශයෙන් වසර (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම,

හෝ

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත MN -7, JM 1-2, MN -6, MA 5-2, MN -4, MA -3, MT -01, MN -02, MA 2-1 වැටුප් ක්ත අංක යටතේ වැටුප් ලබන තනතුරක අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම,

ii කුසලතා පදනම මත බඳවා ගැනීම් යටතේ උසස්වීම්.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ MN-7, JM 1-2, වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන තනතුරක අවම වශයෙන් වසර 15කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම,

(ඇ) (i) සමෘද්ධි බැංකු සංගම් සංඛ්‍යාව 1,097කි.

(ii) සමෘද්ධි ව්‍යාපාරය යටතේ පහත වැඩසහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

I. අඩු ආදායමලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන යටතේ, ප්‍රතිලාභ ලබන පවුල් සහ අඩු ආදායමලාභී පවුල් ආර්ථික, සමාජීය හා මානසික යන අංශවලින් සවිබලගන්වා, තිරසර හා උසස් ජීවන මට්ටමක් අත්කර ගත් පවුල් ඒකක බවට පත් කිරීම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

ඉලක්කගත ප්‍රතිලාභීන් - 2025 සිට 2029 වර්ෂ 05ක කාලය තුළ, අඩු ආදායමලාභී පවුල් ලක්ෂ 20ක් සවිබලගැන්වීම.

පවුල් සවිබලගැන්වීම ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හරහා සිදු කෙරේ.

i. ජීවනෝපාය ප්‍රවර්ධනය
ii. මූල්‍ය අන්තර්කරණය
iii. මනෝසමාජීය සවිබලගැන්වීම
iv. සමාජ ආරක්ෂණය
v. පුහුණුව හා මහපෙන්වීම

සවිබලගැන්වීමේ වැඩසටහන දිවයින පුරා සියලුම දිස්ත්‍රික්ක, සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ සියලුම වසම් ආවරණය පරිදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

සුදුසු පවුල් තෝරා ගැනීම සමෘද්ධි සංවර්ධන නිලධාරි හා ග්‍රාමීය කමිටුව මඟින් සිදු කෙරේ.

තෝරා ගනු ලබන සෑම පවුලක් සඳහාම පවුල් සංවර්ධන සැලසුමක් සකස් කෙරෙන අතර, ජීවනෝපාය හා ආර්ථික සංවර්ධන කාර්යයන්හි නිරත වන පවුල් සඳහා ව්‍යාපාර සංවර්ධන සැලස්මක් සකස් කිරීමට කටයුතු කෙරේ.

ඉහත පවුල් සංවර්ධන සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන සැලසුම් තුළින් හඳුනා ගනු ලබන ක්ෂේත්‍රයන් හරහා පවුල් සවිබලගැන්වීම සිදු කෙරේ.

II. " සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන

අඩු ආදායමලාභී පවුල්වල උසස් පෙළ හදාරණ සිසුන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම අරමුණු කරගෙන මාසිකව රු.1,500 බැගින් ඉගෙනුම ලබන වසර දෙකක කාලය තුළ එක් සිසුවකුට රු. 36,000ක ශිෂ්‍යත්ව ආධාර මුදලක් ලබා දීම සිදු කෙරේ.

ඒ අනුව, 2025 වර්ෂය තුළ අඩු ආදායමලාභී පවුල්වල උසස් පෙළ හදාරණ දරුවන් 56,000ක් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

III. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන

අඩු ආදායමලාභී පවුල්වල ජීවනෝපාය සංවර්ධනය, ආදායම් උත්පාදන කටයුතු, නිවාස වැඩිදියුණු කිරීම, පාරිභෝගික අවශ්‍යතා, ආපදා අවශ්‍යතා වැනි කාර්යයන් වෙනුවෙන් රු. 50,000ක සිට රු. 5,000,000 දක්වා සහන පොලී අනුපාතයන් යටතේ සමෘද්ධි බැංකු හා බැංකු සමිති හරහා ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම සිදු කෙරේ.

2025 වර්ෂය තුළ ප්‍රතිලාභීන් ලක්ෂ 3ක් සඳහා ණය ලබාදීමට සැලසුම් කර ඇත.

බැංකු සාමාජිකයන්ගේ ණය අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අවශ්‍ය අරමුදල් සොයා ගැනීම වෙනුවෙන් බැංකු සාමාජිකයන්, සාමාජික නොවන හා ළමුන් ඇතුළු සියලු ගනුදෙනුකරුවන්ගේ තැන්පතු රාශිකරණය කර ගැනීමට ද වැඩසටහනක් දියත් කිරීමට අපේක්ෂිතය.

(ඇ) අදාළ නොවේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ අපේ මන්ත්‍රීවරු නවවැනි පාර්ලිමේන්තුවට විශාල වශයෙන් මහජන පෙත්සම් ඉදිරිපත් කළා. එතැනදී සාධාරණයක් ඉෂ්ට වුණේ නැහැ. මේ දසවැනි පාර්ලිමේන්තුවේත් බහුතරයක් මන්ත්‍රීරු රැස්වීම් දිනවල උදෑසන පෙත්සම් ඉදිරිපත් කරනවා මම දැක්කා. පෙත්සම් ඉදිරිපත් කළාට මේ පෙත්සම් ඉදිරිපත් කරන අයට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ. පමණක් වෙලාවට මේ පෙත්සම් විභාග කරන්නෙත් නැතිව නිකම්ම අතහැරලා දමනවා. අපි උදේ මේ ගරු සභාවට ඇවිත් පෙත්සම් ඉදිරිපත් කරන එකෙන් ඵලක් නැහැ, ගරු කථානායකතුමනි මේවා නිසි විධියට ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්. අපි මේ මාස දෙකහමාර තුළ පෙත්සම් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානය මේ සඳහා යොමු කරවනවා. අපි මේ පෙත්සම් ඉදිරිපත් කරන්නේ මේ ප්‍රශ්න ගමේදී විසඳෙන්නේ නැති නිසායි. ඒ නිසා පාර්ලිමේන්තුවෙන් සාධාරණයක් බලාපොරොත්තුවෙන් තමයි අපි සියලුදෙනා මේ පෙත්සම් ඉදිරිපත් කරන්නේ. අපි දසවැනි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පෙත්සම් සම්බන්ධයෙන් නවවැනි පාර්ලිමේන්තුවේ සිදු වුණු ආකාරයට නොවෙයි, නිවැරදි ආකාරයට කටයුතු කරන්න කියා ගරු කථානායකතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය වැදගත් ප්‍රශ්නයක්. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව සොයා බලා මේ ගරු සභාවට වාර්තා කරන්න මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට අවස්ථාව ලබා දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා සභාවේ ඉන්නවා. එතුමාට මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු කථානායකතුමනි, නවවැනි පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා විමසා නැති පෙත්සම් 543ක් තිබෙන බව මහජන පෙත්සම් පිළිබඳ කාර්යාංශය විසින් වාර්තා කරලා තිබෙනවා. දසවැනි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පෙත්සම් 351ක් තිබෙනවා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුකොටගෙන

[ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා]

නවවැනි පාර්ලිමේන්තුවේ පෙත්සම් ඉවත් වෙලා තිබෙනවා. ඒවා නැවත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වෙනවා. ඒ වාගේම දැනට පෙත්සම් 52ක වාර්තා කැඳවලා, ඒවා ඇවිල්ලා තිබෙනවා. පසුගිය ටිකේම අපි එක දිගට දින යොදාගෙන පෙත්සම් විභාග කිරීමේ කටයුතු කළා. ගරු කථානායකතුමනි, මේ වෙනකොට දසවැනි පාර්ලිමේන්තුවේ පෙත්සම් 34ක් විභාග කරලා කටයුතු අවසන් කරලා තිබෙනවා. ආපහු දිගටම පෙත්සම් කාරක සභාව රැස්වීමට දින යොදාගෙන තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා සමඟ මෑතකදී මේ ප්‍රශ්නය සාකච්ඡා කළා. අපටත් මෙම අත්දැකීම තිබෙනවා. මොකද, මමත් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ඒ ගරු මන්ත්‍රීතුමා මතු කරන ප්‍රශ්නය හරි. මොකද, පෙත්සම් කාරක සභාවට එන පෙත්සමක් විභාග කරන්න සැලකිය යුතු කාලයක් යනවා. පෙත්සම් අතිවිශාල ප්‍රමාණයක් එනවා. ඒ නිසා මම හිතන්නේ නැඟූ කිසිම පාර්ලිමේන්තුවක් තමන්ට ලැබුණු පෙත්සම් ප්‍රමාණයෙන් සියයට 50ක්වත් අවසන් කළා කියලා, ඒ පාර්ලිමේන්තු කාල සීමාව තුළ.

ඒ නිසා ගරු කථානායකතුමනි, සභාපතිතුමා ඇතුළු පෙත්සම් කාරක සභාවට අපි යෝජනා කළා, එකම අමාත්‍යාංශයකට අදාළ වන පරිදි අනුකමිටු පිහිටුවන්න. අපි උදාහරණයක් විධියට හිතුවොත්, ආරක්ෂක අමාත්‍යාංශයට එන පෙත්සම් යම්කිසි ගොනුගත කිරීමක් කරලා ඒ පෙත්සම් විභාග කිරීම සඳහා අනුකමිටු කිහිපයක් මහජන පෙත්සම් කාරක සභාවෙන් හදන්න කියන එකත්, ඒ අනුකමිටුවලින් ඒ පෙත්සම් විභාග කරලා සියයට 99ක්ම විසඳුම අරගෙන ඒක අවසාන විසඳුම සඳහා ප්‍රධාන පෙත්සම් කාරක සභාවට යොමු කරනවා නම් අපට වැඩි ප්‍රමාණයක් විභාග කරන්න පුළුවන් කියන යෝජනාවත් අපි සභාපතිතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමා ඇතුළු ඒ කාරක සභාවෙන් ඒ තීන්දු ගත යුතුයි. එවැනි අනුකමිටු කිහිපයක් ඇති කළොත් මන්ත්‍රීතුමා කියන සේවය ලබා දෙන්න පුළුවන්. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ලේකම් මණ්ඩලය හරහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට අවශ්‍ය නිලධාරි මහත්වරු, නෝනලා ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කින්නියා ප්‍රාදේශීය සභා බලප්‍රදේශය: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ලෙස නම් කිරීම

தோப்பூர் உப பிரதேச செயலகப் பிரிவு மற்றும் கிண்ணியா பிரதேச சபை ஆளுகைப் பிரதேசம்: பிரதேச செயலகப் பிரிவுகளாக பெயரிடல்

THOPPUR SUB-DIVISIONAL SECRETARY'S DIVISION AND KINNIYA PRADESHIYA SABHA AREA: DESIGNATION AS DIVISIONAL SECRETARIES' DIVISIONS

429/2025

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ඉම්රාන් මහරූෆ් මහතා වෙනුවට)
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක - මාණ්පුමිකු இம்ரான் மஹ்ரூப் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Imran Maharoof)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මූතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ස්ථාපිත කර වසර කිහිපයක් ගත වී තිබුණද, මේ වනතෙක් තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් බවට පත් කර නොමැති බවත්;

(ii) කින්නියා ප්‍රාදේශීය සභා බලප්‍රදේශය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් බවට පත් කිරීමේ යෝජනාව පළාත් පාලන කොමිෂන් සභාව විසින් අනුමත කර තිබුණද, එම යෝජනාව මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් බවට පත් කිරීමට සහ කින්නියා ප්‍රාදේශීය සභා බලප්‍රදේශය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් බවට පත් කිරීමට ඇති බාධා වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සමහර ග්‍රාම නිලධාරි වසම්වල පවුල් 1000කට අධික සංඛ්‍යාවක් ජීවත් වන අතර සමහර ග්‍රාම නිලධාරි වසම්වල පවුල් 100ක් පමණක් ජීවත් වන බව දන්නේද;

(ii) එසේ නම්, මෙම අසමතුලිත තත්ත්වය යථාවත් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைப் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தில், மூதூர் பிரதேச செயலகப் பிரிவுக்கு உட்பட்ட தோப்பூர் உப பிரதேச செயலகப் பிரிவு தாபிக்கப்பட்டு பல வருடங்கள் கடந்துள்ளபோதிலும், இதுவரை தோப்பூர் உப பிரதேச செயலகப் பிரிவு தனியானதொரு பிரதேச செயலகப் பிரிவாக நிறுவப்படவில்லை என்பதையும்;

(ii) கிண்ணியா பிரதேச சபை ஆளுகைப் பிரதேசத்தை தனியானதொரு பிரதேச செயலகப் பிரிவாக நிறுவுவதற்கான பிரேரணையை உள்ளூராட்சி ஆணைக்குழு அங்கீகரித்துள்ளபோதிலும், இப்பிரேரணையானது இதுவரையில் நடைமுறைப்படுத்தப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) தோப்பூர் உப பிரதேச செயலகப் பிரிவை தனியானதொரு பிரதேச செயலகப் பிரிவாகவும், கிண்ணியா பிரதேச சபை ஆளுகைப் பிரதேசத்தை தனியானதொரு பிரதேச செயலகப் பிரிவாகவும் நிறுவுவதில் காணப்படும் தடைகள் வெவ்வேறாக யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) திருகோணமலை மாவட்டத்தின் சில கிராம உத்தியோகத்தர் பிரிவுகளில் 1,000இற்கும் மேற்பட்ட குடும்பங்கள் வசிக்கின்ற அதேவேளை சில கிராம உத்தியோகத்தர் பிரிவுகளில் 100 குடும்பங்கள் மாத்திரமே வாழ்கின்றன என்பதை அறிவாரா;

(ii) ஆமெனில், இந்த சமநிலையற்ற நிலைமையை சீர்செய்வதற்கான நடவடிக்கைகளை மேற்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) despite the lapse of several years since the establishment of the Thoppur Sub-Divisional Secretary's Division, which is part of the Trincomalee District's Muttur Divisional Secretary's Division, it has not been designated as a separate Divisional Secretary's Division yet; and

(ii) although the proposal to make the Kinniya Pradeshiya Sabha area a separate Divisional Secretary's Division has been approved by the Local Government Commission, the proposal has not yet been implemented?

(b) Will he inform this House, separately, the obstacles to designate the Thoppur Sub-Divisional Secretary's Division into a separate Divisional Secretary's Division and the Kinniya Pradeshiya Sabha area into a separate Divisional Secretary's Division?

(c) Will he also inform this House -

(i) whether he is aware that more than 1,000 families reside in certain Grama Niladhari Divisions of the Trincomalee District, whilst around 100 families reside in other Grama Niladhari Divisions;

(ii) if so, whether steps will be taken to rectify this imbalance?

(d) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) පළාත් පාලන කොමිෂන් සභාව යනුවෙන් ආයතනයක් ක්‍රියාත්මකව නොපවතී.

(ආ) තෝප්පූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ප්‍රමාණවත් පවුල් සංඛ්‍යාවක් නොසිටීම මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් බවට පත් කිරීමට 2012 සීමා නිර්ණය කමිටු නිර්දේශ ලැබී නොමැති අතර, 2012 වර්ෂයෙන් පසුව මේ වන තෙක් නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීම සඳහා නව සීමා නිර්ණය කමිටුවක් පිහිටුවා නැත. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා අපේක්ෂා කෙරේ.

(ඇ) (i) ඔව්.

පවුල් 1000ට වැඩි සංඛ්‍යාව - 40

පවුල් 100ට අඩු සංඛ්‍යාව - 05

(ii) කාලානුරූපීව ජනගහන වර්ධනය, ජන සංක්‍රමණ, නාගරීකරණය, පාරිසරික සාධක හා සමාජ විද්‍යාත්මක සාධක යනාදී හේතූන් මත ග්‍රාම නිලධාරී කොට්ඨාසයන්හි ජනගහනය හා පවුල් සංඛ්‍යාව වෙනස් වීමට ලක්වන අතර එම වෙනස්වීම් අනුව ජනගහනය, පවුල් සංඛ්‍යාව හා අනෙකුත් නිර්ණායක මත පදනම්ව නව ග්‍රාම නිලධාරී කොට්ඨාස ඇති කිරීමට හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාස හකුළුවාලීමට අවශ්‍ය පියවර සීමා නිර්ණ කමිටුවක් පත් කිරීම මඟින් ඉදිරියේදී සලකා බැලීමට හැකියාවක් පවතී.

(ඈ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

පාසල් දහසක් සඳහා සුහුරු පුවරු සහ අනෙකුත් උපකරණ ලබා දීම: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

ஆயிரம் பாடசாலைகளுக்கு “ஸ்மார்ட் போர்ட்” மற்றும் பிற உபகரணங்களை வழங்குதல்: மாண்புமிகு பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

PROVISION OF SMART BOARDS AND OTHER EQUIPMENT FOR 1,000 SCHOOLS: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, පාසල් පද්ධතිය සඳහා පද්ධතිගත සුහුරු පන්ති කාමර ලබා දීම මඟින් අධ්‍යාපනය පහසුකරණය කිරීමේ අරමුණින් තෝරාගත් පාසල් 1,000ක් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුදල් භාවිත කරමින් සුහුරු පුවරු සහ අනෙකුත් උපකරණ ලබා දීමට අදාළව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වන අංක අමප/24/0385/601/027 හා 2024 මාර්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය හිමි වී ඇත.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අංක අමප/24/0978/630/009 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2024 මැයි 14 දිනැතිව වැඩිදුරටත් ඉදිරිපත් කර ඇති අතර, එමඟින් යෝජනා කර ඇත්තේ චීන රජය විසින් යෝජිත පාසල් ඩිජිටල්කරණ ව්‍යාපෘතියට සමපාතීව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටයි. චීන රජයේ එම ව්‍යාපෘතිය මඟින් මධ්‍යගත පාලන මැදිරියක් සහ චිත්‍රාගාරයක් ඉදිකිරීමටත්, අමතර සුහුරු පුවරු 500ක් ලබා දීමටත් යෝජනා වී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘති දෙක ඒකාබද්ධ කිරීම මඟින් පාසල් 1,500ක් සඳහා ජාලගත සුහුරු පන්ති කාමර ඇති කිරීමට යෝජනා වී ඇත.

මෙම ව්‍යාපෘති දෙක ඒකාබද්ධ කිරීම සඳහා චීන රජය විසින් ලබා දීමට යෝජිත සුහුරු පුවරුවල පිරිවිතරයන්ට සමාන වන අයුරින්ම ශ්‍රී ලංකා රජය විසින් මිලදී ගනු ලබන සුහුරු පුවරුද මිලදී ගතයුතු බවට ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් තීරණය වී ඇත.

2024 මැයි 14 දිනැති ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා රජය විසින් මිලදී ගැනීමට යෝජිත වූ සුහුරු පුවරු 1,000ක් මිලදී ගැනීමේ කටයුතු 2024 ජූලි මාසයේදී ආරම්භ කර ඇත. නමුත්, එම මිලදී ගැනීමේ කටයුතු ආරම්භ වන විටද චීන රජය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිය සාකච්ඡා මට්ටමේ පැවති ඇති අතර, ඔවුන් විසින් ලබා දීමට යෝජිත සුහුරු පුවරුවල පිරිවිතරයන් සම්බන්ධයෙන් කිසිදු නිල එකඟතාවකට එළඹ නොතිබුණු බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත්, පැහැදිලි නොවන මූලාශ්‍ර ඔස්සේ ලබා ගත් සහ චීන රජය විසින් නිල වශයෙන් තහවුරු නොකළ පිරිවිතරයන් උපයෝගී කර ගනිමින් විවෘත මිල ගණන් කැඳවීමකින් තොරව එක් සැපයුම්කරුවෙකු වෙතින් මිල ගණන් ලබාගෙන ශ්‍රී ලංකා වාණිජ විවිධ නීතිගත සංස්ථාව හරහා අදාළ මිලදී ගැනීම සිදු කර ඇත.

ඒ සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් වැය කර ඇති සම්පූර්ණ මුදල රුපියල් බිලියන 1.7කි. ඊට අමතරව සේවා හා සවි කිරීමේ ගාස්තු ලෙස රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව වෙත රුපියල් මිලියන 430ක පමණ මුදලක් තවදුරටත් ගෙවීමට ගිවිසුම්ගතව ඇත. ඉහත මිලදී ගැනීම, මෙවැනි ඉහළ අගයකින් යුත් මිලදී ගැනීමක් සිදු කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය හා සංසන්දනය කරන විට අස්වාභාවික ලෙස වේගවත්ව සිදු කර ඇති බව නිරීක්ෂණය වේ. එනම්, 2024 ජූලි 05වන දින මිල ගණන් කැඳවා, එම මිල ගණන් 2024 ජූලි 15වන දින විවෘත කර 2024 ජූලි 16වන විට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වාර්තාව ඉදිරිපත් කිරීම ද අවසන් කර ඇත. අදාළ වාර්තාව අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් 2024 ජූලි 17 සහ 18 යන දිනයන්හි සලකා බැලීමෙන් පසු එදිනම සිය නිර්දේශ ලබා දී ඇත. ඉහත නිර්දේශයන් 2024 ජූලි 23 දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා අනුමැතිය 2024 ජූලි 30 දින ලැබීමෙන් පසුව මිලදී ගැනීමේ ඇණවුම 2024 අගෝස්තු 05 දින සැපයුම්කරු වෙත නිකුත් කර ඇත. ඒ කියන්නේ මුළු ක්‍රියාවලියටම ගිහිල්ලා තිබෙන්නේ මාසයයි.

මෙම මිලදී ගැනීමේදී සුහුරු පුවරු 1,000ක් සඳහා CIF අගය වන ඇමෙරිකානු ඩොලර් 3,135,392.50ක වටිනාකමක් Huawei ආයතනයේ නියෝජිතයා ලෙස දැක්වෙන Intelligent Express Limited, Hong Kong වෙත ණයවර ලිපියක් විවෘත කිරීම මඟින් ගෙවා ඇති අතර, Huawei ආයතනය චීන ආධාර ව්‍යාපෘතිය යටතේ සුහුරු පුවරු සපයන නිෂ්පාදකයා ලෙස අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ දක්වා තිබුණ ද, මේ දක්වා එවැනි සැපයුම්කරුවෙකු මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගැනීම සම්බන්ධයෙන් චීන රජය සනාථ කර නොමැත.

ඉහත ඇණවුම පරිදි අදාළ සුහුරු පුවරු සහ අනෙකුත් උපකරණ 2024 ඔක්තෝබර් මාසයේදී පමණ අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබී ඇති අතර, ඒවා දැනට පත්තල ගෙදර ගුරු අභ්‍යාස විද්‍යාලයේ ගබඩා කර ඇත. ශ්‍රී ලංකා රජය විසින් මිලදී ගනු ලැබූ ඉහත සුහුරු පුවරු මිලදී ගැනීම අවසන් කර තිබුණ ද චීන රජය ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ අදාළ ව්‍යාපෘතියේ කොටස මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති අතර, ඒ සඳහා අවසන් එකඟතාවන්ට ද එළඹ නොමැත.

චීන රජය විසින් ලබා දීමට යෝජිත වූ ජාලගත කිරීමේ පහසුකම සහ මධ්‍යගත පද්ධතිය පිළිබඳව අවසන් එකඟතාවට එළඹීමට පෙර මෙම සුහුරු පුවරු මිලදී ගැනීම හේතුවෙන් සිදු වී ඇත්තේ අපේක්ෂා කළ කාර්යයට කිසිසේත්ම එම උපකරණ යොදා ගැනීමට නොහැකි වීමයි. දැනට ද සාකච්ඡා මට්ටමේ පවතින චීන ආධාර ව්‍යාපෘතිය මෙම වසර අවසාන වන තෙක්වත් කාලය ගතවන බව අපේක්ෂා කළ හැකිය. එසේම ඒ සඳහා තෝරාගනු ලබන සැපයුම්කරු පිළිබඳව කිසිදු තීරණයක් මෙතෙක් නිල වශයෙන් දක්වා නොමැත.

මෙම තත්ත්වය මත දැනට ගබඩාව වෙත ලැබී ඇති මෙම සුහුරු පුවරු 1,000 සහ අනෙකුත් උපකරණ පාසල් වෙත බෙදා හැරීම සිදු කරන්නේ නම්, එය භාවිත කළ යුතු ආකාරය පිළිබඳව නිශ්චිත උපදෙස් විදුහල්පතිවරයාට ලබා දිය යුතු අතර, චීන ආධාර මත ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක නොවීම තුළින් මෙම උපකරණ සවි කිරීම සහ භාවිත කළ යුතු ආකාරය පිළිබඳ නිශ්චිත උපදෙස් ලබා දීමට නොහැකි වී ඇත.

මෙම අවස්ථාවේදී අදාළ සුහුරු පුවරු ජාලගත කිරීම සිදු කළ නොහැකි වන හෙයින් ඒවා භාවිත කළ හැකි වන්නේ තනි පන්ති කාමර වශයෙන් පමණි. එමඟින් මෙම ව්‍යාපෘතියේ අරමුණු කිසිසේත් ඉටු නොවන අතර, මේ දක්වා කර ඇති රුපියල් බිලියන 1.7ක ආයෝජනය ඌන උපයෝජනයක් ලෙස දැකිය හැකිය.

මෙම මිලදී ගැනීම සම්බන්ධයෙන් මුදල් හෝ ක්‍රමවේදයේ අක්‍රමිකතා සිදු වී ඇතිද යන්න සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් ආරම්භ කර ඇති අතර, මේ සම්බන්ධයෙන් දැනට චීන රජය සමඟ ද සාකච්ඡා කරනු ලබන අතර, හැකි ඉක්මනින් චීන රජය වෙතින් යෝජිත පහසුකම් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

කාලය ලබා දීම පිළිබඳව බොහොමත්ම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, විසිඑක්වන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: මාර්තු 14]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 14]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee.- [Progress: 14th March]
[HON. SPEAKER in the Chair.]

112 වන ශීර්ෂය.- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,190,000,000

தலைப்பு 112.- வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,190,000,000

HEAD 112.- MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,190,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය - වැය ශීර්ෂය අංක 112.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. Hector Appuhamy. You have 20 minutes.

[පූ.භා. 10.03]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.15 සෙනසුරාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශයට අදාළ අංක 112 දරන වැය ශීර්ෂයෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අද ඉතාම වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂය සම්බන්ධව පළමු කථාව කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වනවා වාගේම, ගරු විපක්ෂ නායකතුමා ප්‍රමුඛ විපක්ෂයට ඒ සඳහා මගේ ස්තුතිය පළ කරනවා. අද පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් සංඛ්‍යාව අඩුයි. ඒකට හේතුවක් තිබෙනවා. මම හිතන විධියට, මන්ත්‍රීවරුන් රාජකාරිය හරියට ඉෂ්ට කරන්න ගිහිල්ලා තිබෙනවා. රිළවුන් සහ වදුරන් ගණනය කිරීමේ වැඩසටහනට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධ වෙලා තිබෙනවා. මන්ත්‍රීවරුන් ආණ්ඩුවේ ඉල්ලීම අකුරටම ඉෂ්ට කර තිබෙනවා. ඒ නිසා මන්ත්‍රීවරුන් අද පාර්ලිමේන්තුවට පැමිණ නැහැ. මොකද, ඊට වඩා වැදගත් කාර්යයක් හැටියට ඒක සලකන නිසා.

ඒ කාරණයත් මතක් කරමින්, මගේ කථාව පටන් ගන්නම්. අපේ රට දුප්පතක්. අපි සම්පත් ගොඩක් තිබෙන දුප්පතක ජීවත් වන ජන කණ්ඩායමක්. ලෝකයේ අනෙක් සියලු රටවලට වඩා එක පැත්තකින් අපේ මානව සම්පත, අපේ රටේ භෞතික සම්පත්, අපේ රටේ පරිසරය සහ අපේ රටේ දේශගුණය ඇතුළු මේ සියලු දේවල් එකතු කරලා ගත්තාම අපි ඉන්නේ වැදගත් තැනක. ප්‍රශ්නය තිබෙන්නේ, වැදගත් තැනක ඉන්න කණ්ඩායමක් වන අපි ඒ වැදගත් තැන හරියට හඳුනා ගත්තා ද කියන එකයි. ඒ වටිනාකම හඳුනාගෙන, ඒ වැදගත් තැනින් නියම ප්‍රයෝජනය අපේ රටේ සමස්ත ජනතාවට ලබා ගන්න අවශ්‍ය මෙහෙය අපේ දේශපාලනික කණ්ඩායම් විසින් කාලයක් තිස්සේ කොතරම්දුරට ඉෂ්ට කළාද, ඒකේ ප්‍රගතිය කොච්චරද කියන එක පිළිබඳව අපි ආපසු හැරී බලන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා.

පක්ෂයක් හැටියට විශේෂයෙන්ම අපි විශ්වාස කරන්නේ, අපි බහුපාර්ශ්වීය විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුයි කියන එකයි. ඒක තමයි අපේ න්‍යාය. ඒකේ තේරුම තමයි, අපි හැම කෙනෙක් එක්කම හිතවත්කමින් කටයුතු කරන්න ඕනෑය කියන එක. හැබැයි, අපි ස්වෛරී රාජ්‍යයක්. අපි කාටවත් බැඳිච්ච රාජ්‍යයක් නොවෙයි. අපි කාටවත් යටත් වෙන රාජ්‍යයකුත් නොවෙයි. හැබැයි, අපි එතැන ඉඳගෙන මිත්‍රශීලිභාවයෙන් අනෙක් රටවල් එක්ක වැඩ කරන්නේ කොහොමද? මේක තමයි අපි හඳුනාගත යුතු මූලික කාරණාව.

මම අද කනගාටු වෙනවා, මෙවැනි විශේෂ අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් වෙනුවෙන් මීට පෙර පැවති ආණ්ඩුවලින් ඒ කරගෙන ආපු වැඩසටහන්වලට අමතරව කිසිදු ආදායමක් ගැන හෝ වියදමක් ගැන සඳහනක් මේ අය වැයේදී සිද්ධ කරලා නැති එක ගැන. මම දැන් යෝජනා කරන්නම්, මොනවාද අපි කළ යුත්තේ කියලා. මොකද, අපි බොහෝ වෙලාවට ලෝකයේ තිබෙන අනික් රටවල් එක්ක බැඳෙන්නේ සම්මුතීන් එක්ක. ඊළඟට, අපි බැඳෙන්නේ මානව අයිනිවාසිකම් එක්ක මානව හිමිකම් සම්බන්ධයෙන්. විශේෂයෙන්ම අපට ලෝකයේ අනික් රටවල තිබෙන ප්‍රඥප්ති එක්ක එ් හා සමානවම සංවිධාන සහ ගිවිසුම් තිබෙනවා. මේවාට බැඳිලා තමයි බොහෝ වෙලාවට අපි කටයුතු කරන්නේ. මේ අය වැය ලේඛනයේ තිබෙනවා මම දැක්කා, අපි ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කරන්න යනවා කියලා. හැබැයි, ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කරද්දී ඒක විදේශ කටයුතු සම්බන්ධයෙන් ඉතාම වැදගත් වෙනවා. විදේශ රටවල් එක්ක අපි කරන ගනුදෙනුවලදී සහ විදේශ රටවල් එක්ක කරන අනෙකුත් සේවාවලදී විශේෂයෙන්ම ඩිජිටල් ආර්ථිකය ඉතාම වැදගත් වෙනවා කියලා මම විශ්වාස කරනවා. අපි කොහොමද මේක ගොඩනඟා ගන්නේ? පළමුවෙන්ම තිබිය යුත්තේ විදේශ රටවල් සමඟ අපේ මිත්‍රත්වයයි. ඊළඟට, ඒ මිත්‍රත්වයත් එක්ක ආර්ථික වශයෙන් ඒ රටවල් එක්ක අපි කොහොමද ගනුදෙනු කරන්නේ කියන එක ගැන හිතන්න ඕනෑ. මොකද අපි සම්පත් ගොඩක් තිබෙන රටක් වුණාට, අපට අත්‍යවශ්‍ය බොහෝ දේවල් ආනයනය කළ යුතුව තිබෙනවා. ඒ වාගේම අපට පිට රටින් ලබා ගන්න අවශ්‍ය කරන බොහෝ සේවාත් තිබෙනවා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ඊළඟට, අපට අවශ්‍ය ආයෝජන මෙන්ම විදේශීය වශයෙන් ඒ සේවා ලබා ගන්නකොට අපේ අපනයන ක්ෂේත්‍රය, ආනයනය, සෞඛ්‍ය ක්ෂේත්‍රය වාගේම අධ්‍යාපනය සම්බන්ධව රටවල් දෙකක් අතර දේවල් share කර ගන්නකොට එතැනදී ඉතාම වැදගත් කාරණා ටිකක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මතක තියා ගන්න, මේක සරල කථාවක් නොවෙයි කියන එක. ඔබතුමා ගනුදෙනු කරන්නේ විදේශ රටවල් එක්ක. ඔබතුමා සුද්දෙක් එක්ක ගනුදෙනු කරද්දී ඒ සරලකම ඔබතුමා ළඟ විතරක් තියා ගන්න ඕනෑ. හැබැයි, එතැනදී බෙදා හදා ගනිද්දී සුද්දාට ඕනෑ විධියටත් යම් ආකාරයකට මිත්‍රශීලිභාවය ඇති කර ගන්න. එතැනදී ඔබතුමාගේ නිල නිවස තමයි අංක එක වෙන්නේ. මොකද, ඔබතුමාට ගොඩක් කාර්යයන් තිබෙනවා, විදේශ රටවල් එක්ක කරන්න. ඒකට පෑහෙන විධියට ඔබතුමා වාඩි වෙන්න ඕනෑ. ඔබතුමා ඒ ගනුදෙනුව කරන්න ඕනෑ, ඒ රටේ අයගේ හිත දිනා ගනිමින්. ඇයි, ඔබතුමා ඒ අයගේ හිත දිනා ගන්න ඕනෑ? ඔබතුමා හිත දිනා ගන්න ඕනෑ වෙනත් කාරණාවක් නිසා නොවෙයි. ශ්‍රී ලංකාවට ඒ රටවලින් ලබා ගන්න තිබෙන සේවා ලබා ගනිද්දී හිත දිනා ගැනීම ඉතාම වටිනා දෙයක්. ඒක නිකම් නීත්‍යානුකූල ලිපියක් ලියලා කෙනෙකුට කර ගන්න බැහැ.

මොකද, අපේ රටේ ඉතිහාසයේ හිටපු නායකයන් දිහා බැලුවාම, ඉතිහාසයේ හිටපු විදේශ ඇමතිවරු දිහා බැලුවාම ඔවුන් බොහෝ වෙලාවට බොහෝ දේවල් කරගෙන තිබෙන්නේ, ඒ රටවල් එක්ක තිබෙන මිත්‍රශීලීභාවයෙන්. තානාපතිවරුනුත් එහෙමයි. එහෙනම් ඒ සේවා ලබා ගනිද්දී ඊළඟට අපි මතක් කර ගත යුතු කාරණා කිහිපයක් තිබෙනවා. අපි දන්නවා, ලංකාව වෙනුවෙන් ඒ රටවල තානාපති සේවය තිබෙනවාය කියන එක. විදේශ කටයුතුවලදී තානාපති සේවයත් එක්ක තමයි අපි වැඩකටයුතු කරන්නේ. තානාපති සේවාවේදී ඒ තානාපතිවරයා ලංකාවේ ජනාධිපතිවරයා -the Hon. President- තමයි නියෝජනය කරන්නේ. ඊළඟට, ඒ තානාපති සේවාවේ විශේෂත්වයක් තිබෙනවා. ඒකට හේතුව මේකයි. සමහර වෙලාවට අමාත්‍යවරයාට වෙන්න පුළුවන්, ආණ්ඩුවට වෙන්න පුළුවන්, ජනාධිපතිවරයාට වෙන්න පුළුවන්, සම්බන්ධ වෙන්න බැරි පාලම නිර්මාණය කරන්නේ තානාපති සේවාවෙන්. එහෙනම් ඔබතුමා පළමුවෙන්ම බලන්න ඕනෑ, ඒ තානාපති කාර්යාල සහ තානාපති සේවාවල ප්‍රගතිය. අවුරුදු ගණනක් තිස්සේ ඒ කරපු සේවාවලින් රටට ලැබුණු ඵලය මොකක්ද, රටට ලැබුණේ නැති දේවල් මොනවාද සහ කළ යුතු දේවල් මොනවාද, ඒ වාගේම සැලසුම් හැදිය යුත්තේත් මොනවාටද කියලා බලන්න ඕනෑ. ඒ සඳහා ඔබතුමා සල්ලි වෙන් කළ යුතුම වෙනවා.

ඊළඟට, මේ තීන්දු තීරණ ගැනීමත් එක්ක තිබෙන අනික් කාරණාව තමයි විදේශ වෙළෙඳ පොළ හඳුනා ගැනීම. ඒක ඉතාම වැදගත්. මොකද, අතීතයේදී අපේ අපනයන ක්ෂේත්‍රය තේ, පොල්, රබර් සඳහා සීමා වුණත්, සම්පත් ගොඩක් තිබෙන රටක් හැටියට අද අපි අපේ නිර්මාණ, අපේ නිෂ්පාදන, අපේ කර්මාන්ත සඳහා විදේශ වෙළෙඳ පොළ හඳුනා ගන්න ඕනෑ.

අපනයන ක්ෂේත්‍රය තුළ ඒ ආකාරයෙන් කටයුතු කරන්න නම් අපට විදේශ වෙළෙඳ පොළක් තිබෙන්න ඕනෑ. ඒ වෙළෙඳ පොළ හඳුනා ගැනීම සඳහා තානාපති සේවාත් සම්බන්ධීකරණය කර ගනිමින්, අනෙක් අමාත්‍යාංශත් සම්බන්ධ කර ගනිමින් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයට කරන්න විශාල වැඩ කොටසක් තිබෙනවා. හැබැයි, ගරු විජිත හේරත් ඇමතිතුමනි, ඒ කටයුතු කරන්නේ කොහොමද කියලා ඔබතුමන්ලා මේ අය වැයෙන් ඉදිරිපත් කර නැහැ. මෙතැන නිකම් ලස්සන කථාවක් කරලා වැඩක් නැහැ. මේවා ප්‍රායෝගිකව වෙන්න ඕනෑ. මේ දේවල් ප්‍රායෝගිකව වුණේ නැත්නම් රටක් හැටියට අපට මේ ගමන යන්න බැහැ.

ඊළඟට, අපි බලන්න ඕනෑ තව විශේෂ කාරණාවක් තිබෙනවා. අපි ඩිජිටල් ආර්ථිකයක් හදද්දී, අද වනවිට ලෝකය තොරතුරු තාක්ෂණය පැත්තෙන් කොපමණ දුරක් ගිහින් තිබෙනවාද කියන කාරණයත්, අපි එතැනට සම්බන්ධ වන්නේ කොහොමද කියන එකත් බලන්න ඕනෑ. මම හිතුවා, ඩිජිටල් ආර්ථිකයත් එක්ක බැඳුණු ඉතුරු ක්‍රියාවලිය සිදු කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයත් එක්ක යම්කිසි සම්බන්ධීකරණයක් ඇති කර ගනීවි කියලා. හැබැයි, එහෙම කිසි දෙයක් සම්බන්ධව ඔබතුමන්ලා මුදල් වෙන් කරලා යම්කිසි වැඩ පිළිවෙළක්, සැලැස්මක් ඉදිරිපත් කර නැති එක ගැන අපි කනගාටු වෙනවා.

ඒ වාගේම කිව යුතු තවත් විශේෂ කාරණාවක් තිබෙනවා. ලෝකයේ තිබෙන රටවල් ගත්තාම, අපිට ඒ රටවල් වෙන් වෙන් වශයෙන් හඳුනා ගන්න පුළුවන්. යුරෝපය වෙනම ගන්න පුළුවන්, ඒ වාගේම ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, ජපානය, කොරියාව, මැද පෙරදිග රටවල් සහ අනෙකුත් රටවල් අපට එසේ වෙන් වෙන් වශයෙන් හඳුනා ගත හැකියි. එම රටවලට සපයන තානාපති සේවාව තුළ පවතින රාජකාරිවලත් වෙනස්කම් පවතිනවා. එහෙම නම් කොහොමද අපි ඒ වැඩ කටයුතු ටික කරන්නේ? මම ඉදිරියේදී පෙන්වා දෙන්නම්, අපිට කරන්න බැරි වුණු කොච්චර දේවල් ඒ තුළ තිබෙනවාද, කොච්චර දේවල් අපි අතපසු කරගෙන තිබෙනවාද කියලා.

ගරු සභාපතිතුමනි, තිරසාර සංවර්ධනය - sustainable development - සම්බන්ධයෙන් ලෝකයේ රටවල් සම්මුති ඇති කරගෙන බොහොම කැපවීමෙන් කටයුතු කරනවා. ලෝකයේ දැනට තිබෙන ප්‍රබලම ප්‍රශ්නයක් තමයි ageing problem එක. ඒ කියන්නේ අද වනවිට ලෝකයේ ගොඩක් රටවල ජීවත් වන ජනතාවගේ ආයු කාලය වැඩියි. ජපානය ගත්තාම ජපන් වැසියන්ගේ ආයු කාලය ගොඩක් වැඩියි. හැබැයි, දරු උපත් ප්‍රමාණය ඉතා අඩුයි. අපේ රටෙත් එවැනි තත්ත්වයක් පවතින්නේ. මට මතක විධියට අපේ රටෙත් එක අවුරුද්දක දරු උපත් ප්‍රමාණය ලක්ෂයකින්ද කොහේද අඩු වෙලා තිබුණා. එහෙම උපත් සංඛ්‍යාව අඩු වෙමින්, ආයු ප්‍රමාණය වැඩි වෙනවා නම්, ඉදිරි කාලයේදී අපට සිද්ධ වෙනවා, වයසට ගිය අය බලා ගැනීම සඳහා වැඩසටහන් හදන්න. හැබැයි, අපි මේක ලෝකයත් එක්ක බද්ධ කරගන්නේ කොහොමද?

අපේ රටේ දැනට සිදු කරන සංචාරක ව්‍යාපාරයට, විදේශ රැකියා ක්ෂේත්‍රයට සහ ආයෝජන වැඩසටහන්වලට ප්‍රබල ආයෝජනයක් වෙනවා, ලෝකයේ රටවල්වල සිටින විශ්‍රාමික අයව බලා ගන්න වැඩ පිළිවෙළක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කරන්න පුළුවන් නම්. අද ලෝකය තුළ ඒ සම්බන්ධව විශාල ඉල්ලුමක් තිබෙනවා. ශ්‍රී ලංකාව හොඳ රටක් හැටියට නම් කරගෙන තිබෙනවා, ඒ සම්බන්ධව. ඒ නිසා මම හිතනවා, ඒ ගැනත් සිතා බැලිය යුතුයි කියලා.

ඒ වාගේම අපිට food security සම්බන්ධවත් කටයුතු කරන්න පුළුවන්. ආහාර සුරක්ෂිතතාව ගැන කථා කළාම, බොහෝ දෙනෙක් හිතන්නේ ගෙදර පැළයක් හිටෙව්වාම ආහාර සුරක්ෂිතතාව සිදු වෙනවා කියායි. එහෙම නැහැ.

ජනගහනයට අවශ්‍ය කරන ආහාර ටික නිෂ්පාදනය කරලා ඉතිරිය අපනයනය කරන්න බැරි වුණාම ඉදිරි කාලයේදී ලෝකයේ රටවලට බරපතළ ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ නිසා අපේ කියලා නිෂ්පාදනයක් අපට තිබෙන්න ඕනෑ. ඉදිරි අවුරුදු

ගණනකට අපේ රටේ මිනිස්සුන්ට කන්න අවශ්‍ය දේ අපි හදා ගන්නවා කියන ස්ථීර අරමුණක් තිබෙන්න ඕනෑ. ඒක තමයි ආහාර සුරක්ෂිතතාව කියන්නේ. එහෙම නැතිව නිකම් පැළයක් හිටවන එක නොවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරි මහත්මයෙකුට හෝ ග්‍රාම නිලධාරි මහත්තයාට කියලා පැළයක් හිටවලා මේ කටයුත්ත කරන්න බැහැ. ඒ සඳහා සැලැස්මක් සකස් වෙන්න ඕනෑ. ඒ සැලැස්ම ජාත්‍යන්තරයත් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. මම කියපු ආකාරයේ තිරසාර සංවර්ධනයකට යන්න නම් ලෝකයේ අනෙක් රටවල තිබෙන, විශේෂයෙන්ම child harassment, female harassment, gender-based violence වාගේ දේවල් සම්බන්ධව ඉතා හොඳ අධ්‍යයනයක් අපිත් කළ යුතු වෙනවා. මොකද, අපි කෙනෙක්ව නීරෝගීව වයසට ගෙනියන්න නම්, ප්‍රථමව අධ්‍යාපනයත්, සෞඛ්‍යයත්, පවුල් ජීවිතයත්, සමාජයීය ජීවිතයත්, රටේ විනයත් කියන මේ සියල්ල එකට ඒක රාශි විය යුතුයි. අවුරුදු 80ක් ගත වුණත් තමන්ට තනිව වැඩ කළ හැකි පුද්ගලයෙක් අපි බිහි කරන්න ඕනෑ. එතැනට අපි පුද්ගලයෙකු ගෙනියන්නේ කොහොමද? අපිට ඒ වෙනුවෙන් උදවු කරන්න ලෝකයේ ආයතන ගොඩක් කැමැත්තෙන් සිටිනවා. අපිට ඒ දේවල් කියලා දෙන්න විතරක් නොවෙයි, අපිට පහසුකම් සපයන්නත් ආයතන ගොඩක් කැමැත්තෙන් සිටිනවා. හැබැයි, අපි ඒවාත් එක්ක යම්කිසි බද්ධ කිරීමක් කරගෙන තිබෙනවාද කියන එක විශේෂයෙන්ම විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයෙන් අහන්න ඕනෑ.

විශේෂයෙන්ම ලෝකයේ රටවල වෙළෙඳ පොළ හඳුනා ගැනීමේදී විදේශගත ශ්‍රී ලාංකිකයා ඉතාමත් ප්‍රබලයි කියන එක මතක තියා ගන්න. අපි විදේශගත ශ්‍රී ලාංකිකයින්ගෙන් ගන්නේ සල්ලි ටික විතරයි. ඔවුන්ට කරන සේවාවක් නැහැ. අනෙක් කාරණය මෙයයි. ඔවුන්ගෙන් ගන්න පුළුවන් දේ අපි හඳුනාගෙනත් නැහැ. ඒ අයගේ හැකියාව හඳුනාගෙනත් නැහැ. විශේෂයෙන්ම ඒ අයගේ නිර්මාණශීලීභාවය, පළපුරුද්ද, ඒ අයට කරන්න පුළුවන් ආයෝජන සහ අපනයන වැඩසටහන් සම්බන්ධව අපි හඳුනාගෙනත් නැහැ. ඔබතුමන්ලා බොහෝ වෙලාවට කරන්නේ ගිහිල්ලා ඡන්ද ටික අරගෙන එන එකයි. එහෙම නැත්නම් මැතිවරණ කරන්න අවශ්‍ය කරන මුදල් ටික අරගෙන එන එකයි. හැබැයි, ඊට වඩා එහා ගිය සම්පත් තිබෙන ශ්‍රී ලාංකිකයෝ විදේශගත වෙලා ඉන්නවා. මේ වනකොට සමහර අය ශ්‍රී ලාංකිකයෝ නොවෙයි. හැබැයි, ඒ අය ශ්‍රී ලංකාවට උදවු කරන්න බොහොම කැමතියි. ඒ අය ළඟ සම්පත් ගොඩක් තිබෙනවා. ඒ සම්පත් අපි තවමත් පරිහරණයට - ප්‍රයෝජනයට - අරගෙන නැහැ කියන එක මම විශේෂයෙන්ම ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ. ඒ සම්බන්ධව ඔබතුමන්ලාගේ යම්කිසි දැනුවත් කිරීමක් නැහැ කියන එක කනගාටුවෙන් වුණත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මොකද, ඔබතුමන්ලා තමයි විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ඡන්ද ටික වැඩිපුර ගත්තේ. ඒ දුන්නු පොරොන්දු ටික තමුන්නාන්සේලාට දේශීය වශයෙන් ඉෂ්ට කරන්න බැරි වෙලා තිබෙන බව දැන් ඔප්පු වෙලා තිබෙනවා. හැබැයි, විදේශීය වශයෙන් ඒගොල්ලන් එක්ක සම්බන්ධීකරණ කටයුතු කරන්න වැඩ පිළිවෙළක් අපට හදා ගන්න පුළුවන් නම් එය ඉතා වැදගත් බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ලෝකයේ රටවල් අතරින් ඉතාලිය ගත්තොත්, රෝමය වෙන්න පුළුවන්, මෙසීනා, කතානියා, නාපෝලි, මිලානෝ, වෙරෝනා, මෝදනා, ෆිරෙන්ස්, ලූකා, වෙනිස්, පාදුවා වෙන්න පුළුවන්, මේ citiesවල ශ්‍රී ලාංකිකයන් විශාල වශයෙන් ජීවත් වෙනවා. ලංකාව හඳුන්න පුළුවන් කණ්ඩායමක් එතැන ඉන්නවා. අපි MoU එකක් අත්සන් කරලා තිබුණා, driving licence එක සම්බන්ධයෙන්. අවුරුදු 5ක් ඇතුළත ශ්‍රී ලාංකිකයෙක් ඒ රටට ගියා නම් ඔහුගේ driving licence එක මාරු කර ගන්න පුළුවන් ඉතාලියේ driving licence එකකට. හැබැයි, ඉතාලියේ driving licence එකක් ගන්නකොට ඉතාලි භාෂාවෙන් විභාගය ලියන්න හරි අමාරුයි. ඒක ඉතාලි ජාතිකයෙකුටත් අමාරුයි. හැබැයි, අපට තිබුණු අවස්ථාව අපි නැති කර ගත්තා 2022දී. ඊට පසුව ඒක දීර්ඝ කර ගන්න බැරිව ගියා. තවම ඒ කටයුත්ත කරගන්න බැරි වෙලා තිබෙනවා. මම විදේශ කටයුතු අමාත්‍යාංශයට ගිහිල්ලා හිටපු විදේශ කටයුතු ඇමතිතුමා එක්කත්, නියෝජ්‍ය ඇමතිතුමා සහ ඒ අමාත්‍යාංශයේ නිලධාරීන් එක්කත් ඒ සම්බන්ධව සාකච්ඡා කළා. ඒ විතරක් නොවෙයි. ඒ රටේ හිටියා, අපේ රට විකුණන තානාපතිවරයෙක්. ඔහු ගැන මේ පාර්ලිමේන්තුවේ බරපතළ විධියට කථා කරලා අන්තිමට ඔහුගේ අවස්ථාව නැති වුණාට පස්සේ අලුත් තානාපතිතුමා එනකොට මම අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයට නිල වශයෙන් ගිහිල්ලා එතුමා එක්ක පැය 2ක සාකච්ඡාවක් කළා ඉතාලිය ගැන. සාකච්ඡා කරලා, ඒ දැනුම් දීමත් කළා. ඊළඟට, එතුමා ඒ රටට ගියාට පස්සේ මම ගියා ඉතාලියේ තිබෙන තානාපති කාර්යාලයට. ඒ තානාපති කාර්යාලයට ගිහිල්ලා සාකච්ඡා කළා ඉතාලියේ ජීවත් වෙන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රශ්න ගැන.

ඒ වාගේම ලංකාවේ ඉතාලි තානාපතිතුමා මටත්, අපේ ජී.එල් පීරිස් මැතිතුමාටත් -මම ස්තුතිවන්ත වෙනවා- ආරාධනා කළා, දවල් ආහාරය ගන්නත්, අපේ රට ගැන, ඉතාලිය ගැන, ශ්‍රී ලාංකිකයන් ගැන සාකච්ඡා කරන්නත් එන්න කියලා. මේ හැම මොහොතකම අපි කථා කළේ driving licence එක ගැනයි. මම අද සම්බන්ධතා පවත්වා ගෙන ඉන්නවා, ඒ රටේ විදේශ කටයුතු අමාත්‍යාංශයේත්, අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේත් සමහර අය එක්ක. ඒ වාගේම විශේෂයෙන් ඒ රටේ ජීවත් වෙන අපේ ශ්‍රී ලාංකිකයන් සම්බන්ධ වෙච්ච මෝටර් රථ දෙපාර්තමේන්තුවේ කණ්ඩායම් එක්ක. මම දන්නවා එතැන සිද්ධ වෙන දේවල්. අදටත් driving licence එක සම්බන්ධයෙන් අපේ රටෙන් යම් වැඩ පිළිවෙළක් හදලා යැවිවත් එහි ඊළඟ පියවර සිද්ධ වෙලා නැහැ. ඒක ඔබතුමන්ලා කරන්න. ඒකට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. මොකක් හරි සහයෝගයක් අවශ්‍ය නම් කියන්න. මොකද, මේ නිසා සාමාන්‍යයෙන් මාසයකට යුරෝ 2,000ක්, 2,500ක්, එහෙම නැත්නම් 3,000ක් විතර පඩි ගන්න අපේ ශ්‍රී ලාංකිකයන්ට අවස්ථාව ලැබිලා නැහැ. උදේට වාහනයක් පැදගෙන වැඩට යන්න බැහැ, සීතලේ බයිසිකලය පැදගෙන වැඩට යන්න ඕනෑ. එහෙම නැත්නම් බස් එකේ යන්න ඕනෑ, සීතලේ ගැහි ගැහී. ඔවුන්ට වාහනයක් ගන්න විධියක් නැහැ. මොකද, මේ driving licence එකේ ප්‍රශ්නය නිසා තමුන්ට වාහනයක් පාවිච්චි කරන්න බැරි නිසා. මෙවැනි ප්‍රශ්න ගොඩක් තිබෙනවා.

ඔබතුමාට තව විශේෂ කාරණාවක් මතක් කරන්න තිබෙනවා, ගරු ඇමතිතුමනි. දැන් අලුත්ම ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, පෝලන්තයේ. අද ශ්‍රී ලාංකික රියැදුරන්ට ලෝකයේ රටවල් ගණනාවකින්ම විශේෂ ඉල්ලුමක් තිබෙනවා. හංගේරියාව, චෙකොස්ලෝවැකියාව, ලිතුවේනියාව, සර්බියාව, රුමේනියාව, ජර්මනිය, ඔස්ට්‍රියාව හා ස්පාඤ්ඤය ඇතුළු සියලු රටවල ශ්‍රී ලාංකික රියැදුරන්ට විශේෂ අවස්ථාවක් තිබෙනවා. අපේ රියැදුරන්ට ඒ රටවල යුරෝ 2,000 ඉඳලා 6,000 දක්වා පඩියක් ගන්න පුළුවන්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ෙහරාරි?

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඒක මට අදාළ නැහැ.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

වියානා සම්මුතිය අනුව විශේෂයෙන් පෝලන්තය 2023 ඔක්තෝබර් මාසයට පෙර තිබුණු අපේ driving licence එකට පෝලන්තයේ licence එක මාරු කරලා දුන්නා. හැබැයි, 2023 ඔක්තෝබර් මාසයෙන් පසුව අපේ රටේ නිකුත් කරපු licenceවලට ඒගොල්ලන් ඒ රටේ licence මාරු කරන්න කැමැති නැහැ. මොකද, මේකේ expire වන date එක නැහැ. ඒ කියන්නේ, licence එක අවසාන වන date එකක් නැහැ. දැන් ඩිජිටල් driving licence එක නිර්මාණය කරන්න යනවා. මම විදේශ කටයුතු විෂය භාර ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලනවා-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 5ක කාලයක් ලබා දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට විනාඩි 4ක කාලයක් ලබා දෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
විනාඩියක් කැපුවා. කමක් නැහැ.

ගරු ඇමතිතුමනි, කරුණාකරලා මේ සම්බන්ධව පෝලන්තයේ ඉන්න තානාපති එක්ක කථා කරන්න. මම හිතන විධියට, එහි තානාපති හැටියට ඉන්නේ අපේ ශ්‍රී ලාංකික කාන්තාවක්. එතුමියත් එක්ක කථා කරලා, පෝලන්ත ආණ්ඩුවත් එක්ක කථා කරලා කරුණාකර මේ සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න. මම මේ සම්බන්ධව කථා කළා. රියැදුරු බලපත්‍රය ඩිජිටල්කරණය කළාට පසුව පෝලන්තයත් කැමති විධියට එය හදන්නේ කොහොමද කියලා මම කථා කළා. ඒකට යම්කිසි වැඩ පිළිවෙළක් ඔබතුමන්ලාට ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න කියලා මම විශේෂයෙන් ඉල්ලනවා.

ඊළඟට ගරු ඇමතිතුමනි, මතක තබා ගන්න, මුදල් එවද්දී ඒ හැම කෙනෙක්ම මුදල් එවන්නේ උණ්ඩියල් ක්‍රමය හරහා බව. ඒගොල්ලන්ට බැංකු සේවාවක් සපයලා නැහැ. වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ. බැංකු හරහා මුදල් එව්වත් එන්නේ Indian App එකකින්. එහෙම නැත්නම් Kenyan App එකකින්. ඒ වාගේ මොනවා හෝ App එකකින් තමයි එන්නේ. ඩිජිටල්කරණය කරන්න අපි සූදානම් වනවා වාගේම, ඒ දේවල්වලටත් සූදානම් වෙන්න ඕනෑ. මේ අය ශ්‍රී ලංකාවට මුදල් ටික එවන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලනවා මේ දේවල් සම්බන්ධ වැඩකටයුතු ටික හරියට කරන්න කියලා. ඉතාලියේ ඉන්න ශ්‍රී ලාංකිකයන්ගේ ලයිසන් එක සම්බන්ධ කාරණය වාගේම පෝලන්තයේ ඉන්න 2,000කට වැඩි පිරිසකුත් දැනට ලයිසන් එක නැතිව රියැදුරු රැකියාව කරගන්න බැරිව ඉන්නවා. මේ සම්බන්ධව කථා කරලා විසඳුමක් දෙන්න කියලා විශේෂයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, කාරණය මේකයි. සංචාරක ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා අද අපට වැඩකටයුතු රාශියක් කරන්න තිබෙනවා. ලංකාවට සංචාරකයෙක් එනකොට අපි හඳුනා ගන්න ඕනෑ ඒ සංචාරකයා ලංකාවට එන්නේ ඇයි, ඒ අය කැමැති මොනවාටද, මොන වාගේ දේවල් බලන්නද ඒ අය එන්නේ කියලා.

අපි ඒක හඳුනා ගැනීම ඉතා වැදගත්. ගරු ඇමතිතුමනි, මම විශ්වාස කරනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා ඒ සම්බන්ධව යම් ආයතනයක් නිර්මාණය කරයි කියලා. එක පැත්තකින් විදේශ කටයුතු සම්බන්ධ වැඩ වාගේම, සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධවත් මේ හඳුනා ගැනීම ඉතා වැදගත්. ඒ වාගේම, අපි මේ රටේ සම්පත් ප්‍රයෝජනයට අරගෙන, සංචාරකයින් මේ රටට ගෙන්වන්න, ඒ අයව ආකර්ෂණය කර ගන්න මොනවාද කරන්න අවශ්‍ය වැඩසටහන් කියන එක හඳුනා ගන්න ඕනෑ. ඒක ඉතා වැදගත් කාරණාවක්. මම දැක්කා, ඔබතුමන්ලා ඉලක්ක කරලා තිබෙනවා, සංචාරක ව්‍යාපෘතිවලින් මේ රටේ සංවර්ධනය සඳහා විශාල මුදලක් අය කර ගන්න. හැබැයි, මතක තබා ගන්න, මේ සංචාරක ක්ෂේත්‍රය ගත්තාම, සමහර වෙලාවට වඩේ කාලා, පයින් යන සුද්දෝ ලංකාවට එනවා. ඒ වඩේ කාලා, පයින් යන සුද්දන්ගෙන් සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න බැහැ. අද වැඩිපුර ලංකාවට එන්නේ ඒ වාගේ කණ්ඩායම්. ඒ නිසා, අපි එතැනින් වෙනත් තැනකට මාරු වෙන්න ඕනෑ. ඒ මාරුවීම සම්බන්ධව ඔබතුමන්ලා විශේෂ වැඩ පිළිවෙළක් කරන්න ඕනෑ. අපි ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන්නේ කොහොමද? අපිට පුළුවන්, health ගැන, ආයුර්වේදය ගැන වැඩ පිළිවෙළක් හදන්න. අපිට පුළුවන් ආයුර්වේදය සංචාරක ව්‍යාපාරයේ හොඳම වැඩ පිළිවෙළක් හැටියට ගේන්න. අද ලෝකයේ බොහෝ universities තිබෙනවා. විශේෂයෙන් සතුන් ගැන කරන සමහර අධ්‍යයන කටයුතුවලදී, අලි සම්බන්ධව, අලින්ගේ ප්‍රජනන ක්‍රියාවලිය ඇතුළු ඒ සමස්ත ක්‍රියාවලිය පිළිබඳව ඉගෙන ගන්න, ලෝකයේ ගොඩක් රටවල් ශ්‍රී ලංකාව නම් කරන අවස්ථා තිබෙනවා. ලෝකයේ ගොඩක් රටවල් අපිට ඒ හරහා සම්බන්ධ කරගන්න පුළුවන්. අලින් ගැන අපි ප්‍රශ්න කියනවා. හැබැයි, අපිට අලියාව සංචාරක ක්ෂේත්‍රයේ හොඳම ආදායම් මාර්ගයක් හැටියට නිර්මාණය කරන්න පුළුවන්.

ඊළඟට, අපි විශේෂයෙන්ම මතක තබා ගත යුතු කාරණාවක් තිබෙනවා. අපේ රටේ හෝටල් ක්ෂේත්‍රය ගත්තාම, මම දකින විධියට අපේ රටේ පුහුණු ආයතන සියල්ල අසමත්. අපි ඒ සම්පූර්ණ පුහුණු ක්‍රමවේදය වෙනස් කරන්න ඕනෑ. ජාත්‍යන්තරයට යන පුහුණු ශ්‍රමිකයෙකු බිහි කිරීම සහ ශ්‍රී ලංකාවේ සේවය කරන පුහුණු ශ්‍රමිකයෙකු බිහි කිරීම කියන දෙකටම අපට අවශ්‍ය කරන හොඳ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. තවම නියමිත පරිදි ඒ සේවාවන් සපයන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ රජයෙන් කරලා නැහැ. අපි කරලා තිබෙන්නේ, හැම තිස්සේම පෞද්ගලික අංශය කරන කාර්යය යම්කිසි ආකාරයකට කඩාකප්පල් කිරීමක් විතරයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have another two minutes.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
හොඳයි.

මම මේ වෙලාවේ විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. අපි දන්නවා, විදේශ රටවල රැකියා සම්බන්ධව අපි පුහුණුවීම් සිදු කරන බව. දැන් මැදපෙරදිග රටවලට යන ගෘහ සේවිකාවන්ගේ පුහුණුව ගත්තොත්, අපි ඒ පුහුණුව කරන්නේ වැරදි විධියට. ඒක වෙනස් කළ යුතුයි. ඒ පුහුණුව කරලා යවන කෙනා යන්නේ ඩුබායි නම්, එයා ඩුබායි විධියට එතැනට යන්න ඕනෑ. එයා

යන්නේ කුවේට් නම්, කුවේට් විධියට එතැනට යන්න ඕනෑ. එතකොට තමයි, එතැන හදුනා ගැනීම් ඇති වෙන්නේ. එතැන නීතිය ගැන වෙන්න පුළුවන්, සමාජ ක්‍රමය ගැන වෙන්න පුළුවන්, එතැන පවුල් ඒකකය ගැන වෙන්න පුළුවන්, ඊළඟට, නිවසක් තුළ ජීවත් වෙන ආකාරය වෙන්න පුළුවන්, ඊළඟට, electric බඩු පරිහරණය කිරීම සම්බන්ධව වෙන්න පුළුවන්, ගමන් බිමන් යෑම වෙන්න පුළුවන්, මුදල් පරිහරණය වෙන්න පුළුවන්, දුරකථනය පාවිච්චි කරන විධිය වෙන්න පුළුවන්, ඉවුම් පිහුම් සම්බන්ධව වෙන්න පුළුවන්, භාෂාව සම්බන්ධව වෙන්න පුළුවන්, මේ සියල්ල සම්බන්ධව නිසි පුහුණුවක් ලබා දීම සඳහා අපි යම්කිසි විධියක වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි.

ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා, එකී පුහුණුව සම්බන්ධයෙන් දැනට පවතින වැඩ පිළිවෙළ වෙනස් කරන්න කියලා. ඒ වාගේම, ඒ රටෙදී ඒ අය බලාකියා ගැනීම ගැන පසු විපරමක් කරන්නත් ඕනෑ. එසේ නිසි පසු විපරමක් නොකිරීම සම්බන්ධයෙන් තානාපති කාර්යාලවලට විශාල වශයෙන් ඇඟිල්ල දිගුකිරීම් සිදු වනවා. මොකද, එහි විශාල අඩුපාඩුකම් තිබෙනවා. ඒ සම්බන්ධවත් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඔබතුමාට පුළුවන්, ගරු ඇමතිතුමනි. අප කරන්න හැදුවේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඒකකය හැටියට අරගෙන එතැන ඉඳන්ම තානාපති කාර්යාලය දක්වා සහ ඒ වැඩ කරන නිවස දක්වාම සම්බන්ධීකරණය කරන්නයි. ඒ සම්බන්ධීකරණය නිසා ඉතා වේගයෙන් විසඳුමක් ලබා ගන්න අපට අවස්ථාව ලැබෙනවා. ඒ නිසා කරුණාකර එවැනි වැඩ පිළිවෙළක් හදන්න. අපටත් පුළුවන්, ඔබතුමන්ලාත් එක්ක සාකච්ඡා කරන්න, ඒ වැඩ පිළිවෙළ හදන්න අවශ්‍ය තොරතුරු මොනවාද කියන එක ගැන. ඔබතුමන්ලා අහංකාර නැත්නම්, -අපේ විදේශ කටයුතු ඇමතිතුමා අහංකාර නැහැ කියලායි මට හිතෙන්නේ- අපේ සමහර තොරතුරු එකතු කර ගන්න ඔබතුමන්ලා කැමති නම් මම හිතනවා සාකච්ඡා කරලා රටේ ගොඩක් දේවල් වෙනස් කරන්න අපට පුළුවන් කියලා.

ඔබතුමන්ලාට තවත් මතක් කිරීමක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, මට තවත් තත්පර කීපයක් දෙන්න.

අද විශේෂයෙන් චීනයෙන් tourist visa අරගෙන එන සමහරු අපේ රටේ කර්මාන්ත කරන, අපේ රටේ අපනයන ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරන, export කරන අපේ අයට විශාල, බරපතළ හානියක් කරනවා. මොකද, ඒගොල්ලෝ වෙළෙඳ පොළ සම්බන්ධව මේ රටේ තිබෙන ආයතන සියල්ල කඩා වට්ටමින් තනිවම ඒ කටයුතු කරනවා. ඒ නිසා විශේෂයෙන් සංචාරක වීසා අරගෙන ලංකාවට එන විදේශිකයන් ලංකාවේ කරන වැඩසටහන් සම්බන්ධව විශේෂ විමසීමක් කරලා, පරීක්ෂණයක් කරලා ඒ කටයුතු සම්බන්ධව නිසි වැඩ කටයුත්තක් සකස් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Vijitha Herath. You have 20 minutes.

[පූ.භා. 10.27]

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතු යැයි යෝජනා කරලා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය පිළිබඳව වැදගත් යෝජනා කීපයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, විදේශ අමාත්‍යාංශයත්, සංචාරක අමාත්‍යාංශයත්, විදේශ රැකියා පිළිබඳ ආයතනයත් ඒකාබද්ධ කරලා මේ අමාත්‍යාංශය ගොඩ නැඟුවේම පවතින ආර්ථික අර්බුදයට කඩිනම් විසඳුමක් සෙවීම ඉලක්ක කරගෙනයි. අපි දන්නවා, අපේ රට බංකොලොත් වෙලා තිබුණා කියලා. අපට භාර දුන්නේම බංකොලොත් වෙච්ච රටක්. මේ රට ඒ බංකොලොත්භාවයෙන් මුදා ගැනීම සඳහා තාවකාලික පිළියමක් විධියට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක වැඩසටහනකට යන්න සිද්ධ වුණා.

අපි කෙටි කාලයක් තුළ සමත් වුණා, රටක් විධියට, ආණ්ඩුවක් විධියට ඒ වැඩසටහන තුළින් අපේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණය කරන්න. ඒ වාගේම අපි මේ දිනවල ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කිරීම කරමින් යනවා, විවිධ රටවල් හා අවබෝධතා ගිවිසුම් අත්සන් කරමින්. අපි දැන් ඒ කටයුත්තත් අවසන් කරමින් යනවා. ඉතින් අපේ රට මුහුණ දීලා තිබෙන මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න නම්, අපට විදේශ මුදල් අත්‍යවශ්‍ය වෙනවා; අපේ සංචිතය වැඩි කර ගත යුතු වෙනවා. සංචිතය වැඩි කර ගන්න කෙටි කාලීනව අපට යන්න පුළුවන් ඉලක්කයක් තමයි සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායමත්, විදේශ රැකියා හරහා ලැබෙන ප්‍රේෂණත් වැඩි කර ගැනීම. එය ඉලක්ක කරගෙන තමයි විදේශ කටයුතු අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ කරලා නව අමාත්‍යාංශයක් විධියට මේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය පිහිටෙව්වේ.

විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට අපේ මූලික වගකීමක් වනවා, ආර්ථික වශයෙන් කඩා වට්ටපු රට, දේශපාලන වශයෙන්, සංස්කෘතික වශයෙන් ජරාජීර්ණ තත්ත්වයට වට්ටලා තිබුණු රට ලෝකය හමුවේ ඉහළ පිළිගැනීමක් සහිත රටක් බවට පත් කිරීම. අපේ රට පසුගිය කාලය පුරාම ආර්ථික වශයෙන් බංකොලොත් වෙලායි තිබුණේ; ඒ වාගේම වංචා, දූෂණ, හොරකම්, නාස්තිය වාගේම විවිධ සමාජ අපරාධවලට ලක් වෙච්ච රටක් විධියට තමයි ලෝකය තුළ සනිටුහන් වෙලා තිබුණේ. අපට අභියෝගයක් භාර දීලා තිබෙනවා, ඒ තත්ත්වයෙන් මේ රට මුදාගෙන, ශ්‍රී ලංකාව කියන අපේ මේ පුංචි රට ලෝකය තුළ අභිමානවත් රටක් බවට පරිවර්තනය කරන්න.

පසුගිය ජනාධිපතිවරණයත්, මහ මැතිවරණයත් අවසන් වන කොට ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ඉතාම සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ දෙකක් පවත්වා අපි ලෝකයට පෙන්නුවා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නේ කොහොමද, ඒ ආදර්ශය ලබා දෙන්නේ කොහොමද කියලා. ඒ නිසා අද මුළු ලෝකයම පිළිගන්නවා, ශ්‍රී ලංකාව කියන අපේ මේ පුංචි රට ජාතික සමගිය ගොඩ නැඟීම ඉලක්ක කර ගත්තු, ඒ සඳහා වෙච්ච ජාතික සංහිඳියාව ඉලක්ක කර ගත්තු වැඩසටහන් ක්‍රියාත්මක

[ගරු විජිත හේරත් මහතා]

කරමින්, තනි රටක් විධියට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදි සියලු ජාතිකත්වයන් ඒකාබද්ධ කරගෙන අලුත් ගමනක් යන රටක් බව. එම කාරණය අද ලෝකය හමුවේ ඔප්පු වෙමින් යනවා. ඒ වාගේම වැටිච්ච මේ ආර්ථිකය ක්‍රමානුකූලව ගොඩ ගනිමින්, ඒ ආර්ථිකය පියවර ගණනාවකින් ඉදිරියට යන වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරනවා. ඒ නිසා ඒ විශ්වාසයත් ලෝකය තුළ ඇති වෙලා තිබෙනවා. ඉතින් අපි එතැනදී අපේ රටේ භෞමික අඛණ්ඩතාවත්, ස්වෛරීත්වයත් ආරක්ෂා කර ගනිමින් තමයි විදේශ රටවල් එක්ක ගනුදෙනු කරන්නේ.

ඒක අපේ මූලික ප්‍රතිපත්තියයි. Mutual respect for territorial integrity and sovereignty කියන එක අපි කිසිසේත් බැහැර කරන්නේ නැහැ. එය ආරක්ෂා කර ගනිමින් තමයි ලෝකයේ රටවල් එක්ක ගනුදෙනු කරද්දී අපි අපේ විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවට නහන්නේ. ආර්ථික වශයෙන් කොච්චර බංකොලොත් වුණත්, දේශපාලන වශයෙන් ලෝකයට පිටුපසින් සිටියා වුණත් අපි අපේ භෞමික අඛණ්ඩතාව, අපේ ස්වෛරීත්වය කිසිසේත් පරදුවට තියන්නේ නැහැ. එය ආරක්ෂා කර ගනිමින් තමයි අපි සියලු විදේශ සම්බන්ධතා ඉදිරියට ගෙන යන්නේ. ඒ වාගේම ඒ ඒ රටවල් එක්ක පවත්වා ගෙන යා යුතු අන්‍යෝන්‍ය සහයෝගිතාව - mutual cooperation, සාමකාමී සහජීවනය ආරක්ෂා කර ගනිමින් තමයි අපි විදේශ කටයුතු පවත්වා ගෙන යන්නේ. එහිදී අපි ඉතාම සතුටින් කියන්න කැමැතියි, අසල්වැසි ඉන්දියාව, මහජන චීන සමූහාණ්ඩුව, රුසියාව, ඇමෙරිකාව, ජපානය, මැද පෙරදිග කලාපයේ සියලු රටවල්, අප්‍රිකානු කලාපයේ රටවල් ආදි වශයෙන් ලෝකයේ සියලු රටවල් එක්ක අපි ඉතාම කිට්ටු රාජ්‍ය තාන්ත්‍රික මිත්‍ර සම්බන්ධතාවත් පවත්වාගෙන යන බව. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට, ඒ සියලු රටවල් යාළුකම්, මිතුරුකම් අප කෙරෙහි උපරිමයෙන් දක්වා තිබෙනවා. ඒ නිසා අපි සතුටින් කියන්න කැමැතියි, හැම රටක්ම රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් අප දිහා බලන්නේ සුබවාදී දැක්මෙන් බව. අපි කිසිදු පැත්තකට බර වෙලා නැහැ. අපි දන්නවා, ඉතිහාසයේ විවිධ ආණ්ඩු එක පැත්තකට බර වෙලා විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඹූ බව. ඒකේ ආදීනව අපි රටක් විධියට භුක්ති වින්දා. අපි එක එක කඳවුරුවලට ගැති වුණා; නතු වුණා. එහි ආදීනව අපි භුක්ති වින්දා. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියන්න කැමැතියි, අපේ විදේශ ප්‍රතිපත්තිය ලෝකයේ සියලු රාජ්‍යයන් එක්ක මිත්‍රශීලිව, මා කලිනුත් කියපු ආකාරයට සාමකාමී සහජීවනය -peaceful coexistence - මත ක්‍රියාවට නහන බව. අපි ඉතා සීරුමාරුවෙන් ඒ කටයුත්ත කරගෙන යන බව මුළු රටම දකිනවා; මුළු ලෝකයම දකිනවා. ඒ වාගේම, මේ වන කොට සියලු රටවල් එක්ක කරන රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනු හරහා ආර්ථික වශයෙන්, දේශපාලන වශයෙන් විශාල වාසි ප්‍රමාණයක් අපි දැනටමත් අත් කරගෙන තිබෙනවා.

අපි අසල්වැසි ඉන්දියාවත් එක්ක ඉතාම කිට්ටු සම්බන්ධතාවක් ගොඩනඟාගෙන තිබෙනවා. ඒ නිසාම අපේ ආණ්ඩුව පත් වුණාට පසුව පළමුවෙනි රාජ්‍ය තාන්ත්‍රික ගමන සඳහා ඉන්දියාවෙන් අපට ආරාධනාවක් ලැබුණා. ඒ ගමන හරහා අපි විවිධ ආර්ථික සහයෝගිතා ගිවිසුම් ගණනාවකට එළඹුණා. ඉන්දියානු අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා අප්‍රේල් මුල වන කොට ශ්‍රී ලංකාවට පැමිණෙනවා. එතුමා ශ්‍රී ලංකාවට පැමිණෙන විට අප අතර අලුත් අවබෝධතා ගිවිසුම් කිහිපයක් අත්සන් කරන්න අපි කටයුතු යොදාගෙන තිබෙනවා. ඒ වාගේම අපි සාම්පූර් සූර්ය බල ව්‍යාපෘතිය විවෘත කරනවා. මීට කලින් අපට ණයක් විධියට ලැබිලා තිබුණු මහව ඉඳලා අනුරාධපුරය දක්වා වූ දුම්රිය මාර්ගයේ සංඥා පද්ධතිය සම්පූර්ණයෙන් ප්‍රදානයක් විධියට ඉන්දියාව අපට ලබා දෙනවා. ඒක ණයක් නොවෙයි. ඒවා, ඉන්දියානු ගමනෙන් අප ලබා ගත්තු වාසි; ජයග්‍රහණ. ගරු මෝදි අග්‍රාමාත්‍යතුමා ලංකාවට පැමිණියාම අපි නිල වශයෙන් ඒ විවෘත කිරීම් කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලය තුළ එකඟතාවලට ආවා අපේ රටේ විවිධ ආගමික ස්ථාන සඳහා සූර්ය බලශක්ති පද්ධති ලබා දෙන්න. එය තවත් වැඩි කර ගනිමින් අපි අවබෝධතා ගිවිසුම්වලට එළඹුණා. අපි ඒ කටයුත්තත් තවත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යමින් තිබෙනවා. ඒ වාගේම, වතුකරයේ ජනතාවට නිවාස ලබා දීම සඳහා වන ආධාර තවත් වැඩි කරමින් අපි ඒ ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යනවා. අපේ මිත්‍රත්වය මත මේ කෙටි කාලය තුළ ඒ සියලු උදවු තවත් ශක්තිමත් කර ගනිමින් ඉදිරියට ගෙන යමින් තිබෙනවා.

මහජන චීන සමූහාණ්ඩුවට ගිය ඒ රාජ්‍යතාන්ත්‍රික ගමනත් එක්ක අපි විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් ලබා ගත්තා. අපි අවබෝධතා ගිවිසුම් 15කට අත්සන් තැබුවා. ඒ අනුව 2025 අවුරුද්දට පාසල් දරුවන්ට නොමිලයේ නිල ඇඳුම් ලබා දෙන්න චීනය මැදිහත් වී සිටිනවා. 2026 අවුරුද්ද සඳහාත් පාසල් දරුවන්ට මුළුමනින් නොමිලයේ නිල ඇඳුම් ලබා දෙන්න චීනය අපට එකඟතාව පළ කළා. ඒ වාගේම Colombo Port City එක තුළ අලුත් සමන්ත්‍රණශාලාවක් ඉදි කිරීම සඳහා වන මූලික අධ්‍යයන කටයුතු කරන්න දැනටමත් මුදල් වෙන් කර තිබෙනවා. පෑලියගොඩ, මොරටුව, කොට්ටාව කියන ප්‍රදේශවල නිවාස 1,896ක් අලුතින් ඉදි කිරීමට එකඟ වෙලා තිබෙනවා, සම්පූර්ණ ප්‍රදානයක් හැටියට. නාගරික ප්‍රදේශවල ජීවත් වන අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස හදලා දෙන්න චීනය අපට එකඟතාව පළ කරලා දැනටමත් අපි ඒ වැඩ ආරම්භ කරලා, ඉදි කිරීම් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ හරහා මේ රටේ කලා, සංස්කෘතික ක්ෂේත්‍රයේ නියුතු අයටත් නිවාස ලබා දෙන්න අපි කටයුතු කරමින් සිටිනවා.

මේ වෙනකොටත් චීන සයිනොපෙක් සමාගම හම්බන්තොට ප්‍රදේශයේ refinery එකට ඩොලර් බිලියන 3.7ක ආයෝජනයකට එකඟතාව පළ කරලා, එහි මූලික කටයුතු සිද්ධ කරමින් පවතිනවා. එක්සත් අරාබි එමීර් රාජ්‍යයට සිදු කරන ලද අපේ විදේශ ගමන හරහා -රාජ්‍ය තාන්ත්‍රික ගමන හරහා- අවුරුදු ගණනාවක් තිස්සේ සම්පූර්ණ කර ගන්න බැරුව තිබුණු එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව අතර ආයෝජන ප්‍රවර්ධන සහ ආයෝජන ශක්තිමත් කිරීම සඳහා වූ ඒ කොමිසම ස්ථාපිත කළා. ඒ සඳහා අපි අත්සන් තැබුවා. මෙතෙක් කල් UAE රාජ්‍යය අපේ රටේ ආයෝජනය කරන්න බයෙන් හිටියා, විශ්වාසය නැතුව හිටියා, ඒ ආයෝජනවලට සහතිකයක් නැති හින්දා. දැන් අපි ඒ කටයුත්ත අවසන් කරලා ඒ කොමිසම හරහා ඒ අයට විශ්වාසය ඇති කරලා තිබෙනවා. ඒ හරහා මැද පෙරදිග රාජ්‍යයන් බොහෝ ප්‍රමාණයක විදේශ අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු පසුගිය කෙටි කාලය තුළ ලංකාවට ඇවිල්ලා අපේ රට තුළ ආයෝජනය කරන්න එකඟතාව පළ කර තිබෙනවා.

දැනටමත් ආර්ථික වශයෙන් ලෝක වෙළෙඳපොළේ අපේ පංගුව වැඩි කර ගැනීම සඳහා refineries හතරක් සඳහා අපි රටවල් හතරකට යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. සපුගස්කන්දේ අපි අලුතින් refinery එකක් හදන්න යෝජනා කරලා තිබෙනවා. කැබිනට් මණ්ඩලය අනුමත කරලා තිබෙනවා, හම්බන්තොට එක වාගේම නවීන තාක්ෂණයෙන් යුක්ත refinery එකක් සපුගස්කන්දේ පිහිටුවන්න. ඒ වාගේම ත්‍රිකුණාමලයේත් එවැනි එකක් පිළිබඳව අපි යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ශක්තිමත්ව ඉදිරියට ගෙන යමින් තිබෙනවා.

පසුගිය කාලය තුළ ආන්දෝලනයට ලක් වෙච්ච කටුනායක ගුවන් තොටුපොළේ ඊළඟ කොටස ඉදිකිරීම ජපානය නතර කරලා තිබුණා, ඒ කාලයේ තිබුණු විවිධ ප්‍රශ්නත් එක්ක. ඔබතුමන්ලාටත් මතක ඇති, ඒක මුළු රටම දන්නවා. දැන් ජපානය

නැවත එකඟතාව පළ කරලා ඒ මූලික කටයුතුවලට අඩිතාලම දාලා තිබෙනවා, ඒ කටයුත්ත සාර්ථකව අවසන් කරන්න. ඒ විධියට ලෝකයේ සියලු රටවල් එක්ක විවිධ එකඟතා, සම්මුතිවලට ඇවිල්ලා අපි ඒ කටයුතු ශක්තිමත්ව ඉදිරියට ගෙන යමින් තිබෙනවා. මම ඒ එකක්, දෙකක් මතක් කරන්නම්. අපේ ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය කැබිනට් මණ්ඩලය අනුමත කරලා, එය අත්සන් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ඉදිරි දිනවලදී කරන්න සූදානමින් තිබෙනවා. ඒ වාගේම, පැරීසියේ UN Ocean Conference එක ලබන ජූනිවල පැවැත්වෙනවා. ඒකට සහභාගි වීම හරහා අපි විශාල වාසි ප්‍රමාණයක් ලංකාවට ලබා ගන්නට බලාපොරොත්තු වෙනවා. ආසියානු සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අපි ඉතා පැහැදිලිව මැදිහත් වෙලා, දැනටමත් ඒ සඳහා ඉල්ලුම් කරලා, එහි සාමාජිකත්වය ලබා ගැනීමේ මූලික පියවරවලට මැදිහත් වෙමින් තිබෙනවා.

ඒ වාගේම BRICS සමූළුව පැවැත්වුණා, අපි බලයට ආපු විගසම. අපි නිලධාරි මට්ටමින් ඒකට සම්බන්ධ වුණා. අපි එහි සාමාජිකත්වය ඉල්ලා සිටියා. නමුත් ඔවුන් තීරණයක් අරගෙන තිබෙනවා, සාමාජිකත්වය පුළුල් කරන්නේ නැහැ කියලා. නමුත් සාමාජිකත්වය ඉල්ලපු අපේ ඒ ඉල්ලීම ඒ විධියටම තිබෙනවා. අපි විතරක් නොවෙයි, තව රටවල් කිහිපයක් සාමාජිකත්වය ඉල්ලා තිබෙනවා. එසේ තිබියදී BRICS සමූළුව හරහා ක්‍රියාත්මක වන NDB බැංකුව සාමාජිකත්වයට ගන්නා හැටියට අපි ඉල්ලා තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියත් එක්ක අපි ඒ කටයුත්තත් ඉදිරියට ගෙන යමින් තිබෙනවා. මේ ආකාරයට තමයි අපි ලෝකයේ විවිධ කලාපත් එක්ක, විවිධ මහද්වීපත් එක්ක අන්‍යෝන්‍ය වශයෙන් විවිධ සම්බන්ධතා පවත්වාගෙන යන්නේ.

ඒ වාගේම යුරෝපා සංගමය GSP Plus පිළිබඳ සමාලෝචනය දැන් පටන් අරගෙන තිබෙනවා. ලබන අප්‍රේල් මාසය වන විට ඒ නියෝජිත කණ්ඩායමක් ලංකාවට එනවා ඒ සමාලෝචන කටයුතු කරන්න. ඊට අවශ්‍ය මූලික පදනම අපි සකස් කරමින් යනවා. දැනට ඒ සාකච්ඡා අපි ඉතා සාර්ථකව ඉදිරියට ගෙන යමින් තිබෙනවා.

අපි අලුතින්ම මුහුණ දුන් ප්‍රශ්නය තමයි, ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ අලුත් බදු ප්‍රතිපත්තිය. ඒ හරහා ලෝකය තුළ අපට මුහුණ දෙන්න සිදු වන ගැටලු රාශියක් තිබෙනවා. ඇත්තටම ගත්තොත්, අපි ඇමෙරිකාවට ඩොලර් බිලියන 3ක විතර අපනයන කරනවා. අපි ඇමෙරිකාවෙන් ඩොලර් මිලියන 368ක විතර ආනයන ප්‍රමාණයක් තමයි කරන්නේ. අපට විශාල අපනයන වෙළෙඳ පොළක් තිබෙනවා. ඉතින්, ඔවුන්ගේ බදු ප්‍රතිපත්තිය හරහා අපට මුහුණ දෙන්න සිදු වන තත්ත්වයට අපි කොහොමද ලැස්ති වෙන්නේ කියලා පසුගිය දිනවල විවිධ ක්ෂේත්‍රවල විද්වතුන්, පෞද්ගලික අංශයේ ව්‍යාවසායකයන් එකතු කරගෙන සාකච්ඡා කරලා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය හරහා අපි උපායමාර්ගික වැඩ පිළිවෙළකට යන්න මූලික අඩිතාලම දැම්මා. ක්‍රියාකාරී කාර්ය සාධක බලකායක් -action task force එකක්- හදලා, ඒ හරහා මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියලා සොයා බලන්න අපි මූලික මැදිහත්වීම් කරමින් ඉන්නවා. ඒ විධියට අප්‍රිකානු කලාපය තුළ global market එකේ පංගුව වැඩි කර ගැනීම සඳහා අපි කටයුතු කරනවා. එය අලුත් ආයෝජන කලාපයක්. අලුත් වෙළෙඳ ගිවිසුම් හරහා අපේ අපනයන අප්‍රිකානු කලාපයට අලුතින් ප්‍රවේශ කරන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි අලුතින් හිතලා ඒ සඳහා මූලික මැදිහත්වීම් කරමින් තිබෙනවා. ආයෝජන ගෙන්වා ගැනීම වාගේම, IT තාක්ෂණය හරහා ඒ කටයුතු පළල් කර ගන්නේ කොහොමද කියලා සොයා බලන්න දැන් අපි මූලික කටයුතු සිද්ධ කරමින් ඉන්නවා.

මම, SLASSCOM IT හරහා සිදු වන දේ පිළිබඳව කියන්න කැමැතියි. කොහොමත් අපේ ආණ්ඩුව digitalization programme එකේ ඉන්නවා. අපි ඇවිල්ලා පොඩි කාලයක් තුළ -මාස දෙකක් ඇතුළත- මුළු ලෝකයේම තිබෙන සියලු තානාපති කාර්යාල සහ මහ කොමසාරිස් කාර්යාල හරහා ලංකාවෙන් ඒ රටවලට ගිහිල්ලා රැකියාවල නියුතු අයගේ, ඒ අයගේ දරුවන්ගේ උප්පැන්න සහතික, විවාහ සහතික, මරණ සහතික -ඒ සහතික තුනම- ඒ රටවල්වල ඉඳලා online ක්‍රමයට ලබා ගන්න පුළුවන් ක්‍රමය දැන් අපි සකස් කරලා තිබෙනවා.

ලෝකයේ ඕනෑම රටක ඉන්න ශ්‍රී ලාංකිකයන්ට ඒ සඳහා දැන් ලංකාවට එන්න ඕනෑ නැහැ. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මාස දෙකෙන් මුළු ලෝකයේම තිබෙන අපේ සියලු තානාපති කාර්යාලවල, මහ කොමසාරිස් කාර්යාලවල ඒ පහසුකම ඇති කරලා තිබෙනවා. ඒ නිසා ඩිජිටල්කරණය වචනයෙන් නොවෙයි, අපි වැඩවලින් ප්‍රායෝගිකව ඔප්පු කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. පාස්පෝට් එක ගන්නත් දැනට ලංකාවට එන්න ඕනෑ. ඒකටත් අපි IOM එක හරහා දැන් මූලික පියවරවලට ගිහින් තිබෙනවා. ඒක කැබිනට් මණ්ඩලයෙන් අනුමත කළාම, ඒ කටයුත්තත් ඒ රටවල සිටම කරගන්න පුළුවන් තත්ත්වය තිබෙනවා.

විශේෂයෙන්ම මතු කරපු ප්‍රශ්නයක් නිසා, මම මේ ඩිජිටල්කරණයත් එක්ක ඉතාලි driving licence පිළිබඳ ප්‍රශ්නය ගැනත් කරුණු ඉදිරිපත් කරන්නම්. ඇත්තටම ඒ ගිවිසුම් අවුරුදු 5න්, 5ට අලුත් කළ යුතුයි. 2017දී අත්සන් කළ ගිවිසුම 2022 වෙනකොට අවසන් වුණා. 2022 ඉඳලා මේ වෙනකල් ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. ඒක අපේ වරදක් නොවෙයි. ඇත්තටම ගත්තොත්, හිටපු තානාපතිවරු -නම සඳහන් කළේ නැති වුණාට- ඒකට අදාළ කරුණු කිව්වා. එහෙම ප්‍රශ්න වෙලා තිබෙනවා. නමුත්, අපි ඇවිල්ලා ඒ පිළිබඳ සාකච්ඡා ආරම්භ කළා. ගිය අවුරුද්දේ අග භාගයේ -ඔක්තෝබර්වල- පාකිස්තානය, බංග්ලාදේශය, ශ්‍රී ලංකාව කියන රටවලට ඉතාලි වීසා දෙන එක නතර කරලා තිබුණේ; තහනම් කරලා තිබුණේ. මේ වර්ෂයේ මාර්තු 04වැනි දා අපි සමත් වුණා ශ්‍රී ලංකාවට පනවා තිබුණු ඒ තහනම ඉවත් කරගන්න. දැන් අපට ඉතාලි රාජ්‍යය වීසා පහසුකම් ලබා දෙනවා; work visa ලබා දෙනවා. *[බාධා කිරීමක්]* පස්සේ කියන්න. මට පොඩි වෙලාවයි තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමාට කියන්න සතුටුයි, ඉතාලි driving licences ගැනත් පසුගිය 11වැනි දා ඉතාලි රාජ්‍යයෙන් අපට දැනුම් දුන්නා. ඇත්තටම ඒ driving licences පිළිබඳ ගිවිසුමට අදාළ කටයුතුවල දැන් ප්‍රමාදය තිබෙන්නේ, ලංකාවෙන් අපි නිකුත් කරන licencesවල තාක්ෂණික වෙනස්කම් ගොඩක් තිබෙන නිසා. දැනට licences වර්ග 5ක් විතර නිකුත් කරලා තිබෙනවා. ඉතාලි ආණ්ඩුව අපට කියලා තිබෙනවා මේවා හඳුනා ගැනීමේදී ගැටලුවක් තිබෙනවා, මොකක් හෝ එක ක්‍රමයකට දෙන්න කියලා. එතැනදී ඉතාලි ආණ්ඩුවේ ප්‍රශ්නයක් තිබෙන්නේ. ඉතින්, අපි ඒ සම්බන්ධයෙන් කථා කළාට පස්සේ, ඔවුන් දැන් එකඟතාව පළ කරලා තිබෙනවා. අපට 11වැනි දා ඒ ලියුම ආවා. ඒ කාරණය නිල වශයෙන් දැනුම් දුන්නා අපේ තානාපති කාර්යාලයට; 13වැනි දා අපේ අමාත්‍යාංශයට දැනුම් දුන්නා. අපි දැන් RMV එකට දැනුම් දීලා තිබෙනවා, ඒ අවශ්‍ය categoriesවල වෙන්න ඕනෑ වෙනස්කම් මොනවාද කියලා. ඒ ටික අවසන් වුණාට පස්සේ ඉතාලියේ driving licences පිළිබඳ ප්‍රශ්නය අවසන් කරන්න පුළුවන්. එය දැන් අවසන් අදියරේ තිබෙනවා. මම ඉතාම සතුටින් එය දැනුම් දෙන්න කැමැතියි, ඉතාලියේ ජීවත් වන සියලුදෙනාට.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයේදී රටක් විධියට අපි මුහුණ දී තිබෙන අභියෝගයක් තිබෙනවා. ලංකාව සම්බන්ධ යෝජනාවක් මීට පෙර ඒ කවුන්සලයට ඉදිරිපත් කර තිබුණා.

[ගරු විජිත හේරත් මහතා]

ලබන සැප්තැම්බර් මාසයේ එය ඡන්ද විමසීමට ලක් කරනවා. මේ වෙනුවෙන් අපේ රට විධියට අපි උපරිම මැදිහත්වීම කරමින් ඉන්නවා. ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කරන්න දේශීය යන්ත්‍රණයක් ඇතුළේ අපේ රටේ නීතියේ ආධිපත්‍යය තහවුරු කරමින්, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින්, ජාතික සමගිය සඳහා ඒ reconciliation process එක ඉස්සරහට යවමින්, අපි කොහොමද ඒක කරන්නේ කියන එක සම්බන්ධයෙන් දැනටමත් ඒ ආයතන ශක්තිමත් කරන්න පියවර අරගෙන තිබෙනවා. අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයට ඉතා වගකීමෙන් යුක්තව දැනුම් දුන්නා, අපි ඒ කටයුත්ත දේශීය යන්ත්‍රණයක් තුළ ඉතා පැහැදිලිව, ප්‍රායෝගිකව ක්‍රියාවට නඟලා සනාථ කරන්න සූදානම් කියලා. ඒ නිසා අපි මේ රටේ ජනතාවටත් කියනවා, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලය හරහා පසුගිය කාලයේ අපට ඇති වෙච්ච තත්ත්වය වෙනස් කර ගැනීම සඳහා වූ ජාතික සමගිය ගොඩ නැඟීම හරහා මානව හිමිකම් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාවට නහන්න අපි දැනටමත් තීන්දු අරගෙන ක්‍රියාත්මක වෙමින් තිබෙන බව.

කෙටියෙන් හෝ සංචාරක කර්මාන්තය පිළිබඳවත් මම කියන්නම්. අපි ඉලක්ක කළ පරිදි ගිය අවුරුද්දේ සංචාරකයන් මිලියන 2ක් ආවා. මේ අවුරුද්දේ ඉලක්කය මිලියන 3යි. ඒ ඉලක්කය සම්පූර්ණ කරන්න අනිවාර්යයෙන්ම අපි කටයුතු කරනවා. මේ ජනවාරි, පෙබරවාරි මාස 2ක පමණ කාලය ඇතුළත විතරක් ලක්ෂ 5කට වැඩි විදේශිකයන් පිරිසක් ආවා. දවසකට හත් අටදහසක විදේශිකයන් ප්‍රමාණයක් ලංකාවට පැමිණෙනවා. ඒ අයට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණාත්මකව විතරක් නොවෙයි, ගුණාත්මක මට්ටමෙන් ලබා දීම සඳහාත්, ඉහළ මට්ටමේ අයව ගෙන්වා ගැනීම සඳහාත් වූ වැඩසටහන් අපි ආරම්භ කර තිබෙනවා. සංචාරක කර්මාන්තයට directly සහ indirectly සම්බන්ධ වෙලා සිටින සියලු ක්ෂේත්‍ර නඟා සිටුවීම සඳහා පුහුණු වැඩසටහන් ගණනාවක් අපි ආරම්භ කර තිබෙනවා. ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය මෙතෙක් කල් අපට ලබා දුන්නේ ඩිප්ලෝමා පාඨමාලාව. අපේ UGC එක දැනට එකඟ වෙලා තිබෙනවා, උපාධියක් -degree එකක්- අපට ලබා දෙන්න. සංචාරක කර්මාන්තය ගුණාත්මකව ඉහළ නැංවීම සඳහා වූ ක්‍රියාමාර්ගත් අපි අරගෙන තිබෙනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම අපේ විදේශ රැකියා ක්ෂේත්‍රය පිළිබඳවත් කෙටියෙන් හෝ මම කියන්නම්. දැනට බිලියන 6.57ක ආදායමක් අපි හොයලා තිබෙනවා. මේ අවුරුද්දේ අපි ඒක බිලියන හතහමාරක් දක්වා වැඩිකර ගන්න බලාපොරොත්තු වනවා. අපේ skilled labourersලා රට යවන්න කටයුතු කරනවා. Low-skilled labourersලා රට යවන එක සියයට 28 සිට 25ට අඩු කරන ගමන්, අපේ skilled labourersලා සියයට 72 සිට සියයට 75 දක්වා වැඩි කර ගනිමින් එම ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා පියවර ගණනාවක් අපි අරගෙන තිබෙනවා. ප්‍රධාන වශයෙන්, එයට තිබුණු දේශපාලන මැදිහත්වීම අහෝසි කරලා, කිසිදු දේශපාලන බලපෑමක්, මැදිහත්වීමක් නැතිව අපේ රටේ තරුණ තරුණියන්ට ඕනෑම රටක රැකියාවක් කිරීම සඳහා අවස්ථාව ලබා දීමේ තත්ත්වය අපි ඇති කර තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ කෙටි කාලය තුළ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විධියට අපි ඉතා ශක්තිමත් ගමනක් ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුන් යෝජනා ලබා දෙමින්, සහයෝගය ලබා දෙමින් කටයුතු කිරීම පිළිබඳව එතුමන්ලාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(මාණ්පුමිකු හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න පුළුවන්ද?

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාරණ් අවර්කළ්)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමාට නියමිත කාලය නම් අවසන්.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
එතුමාට අවස්ථාව දෙන්න, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාරණ් අවර්කළ්)
(The Hon. Chairman)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(මාණ්පුමිකු හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු driving licences සම්බන්ධ කාරණයට අදාළවයි මම මේ කියන්නේ. මම කියපු රටවල් ගණනාවටම driving licence එකේ මුහුණත ප්‍රශ්නය බලපානවා, ඒකේ ඒ අවශ්‍ය කරන කරුණු ටික. ඔබතුමන්ලා ඩිජිටල් ක්‍රමය අනුව එය හදනකොට ඒ සම්බන්ධ වැඩ කටයුත්තක් කරන්න. ඒ වාගේම තව විශේෂ කාරණාවක් තමයි, ඉතාලියේ refugeesලා ලෙස සිටින සමහර අයට sojourn එකක්, ඒ කියන්නේ වීසා බලපත්‍රයක් දෙනවා, විශේෂ කරුණක් හේතුවෙන් ඒ රටේ වැඩ කරන්න. ඒ කියන්නේ තමන්ට අසනීප නම්, ගෙදර ඉන්න අම්මා තාත්තා අසනීප නම්, ඒගොල්ලන්ට සල්ලි නැත්නම්, සල්ලි නැති නිසා එයාට වැඩ කරන්න ඒක දෙනවා. හැබැයි, එයාට පාස්පෝට් එකක් නිකුත් කරන්නේ නැහැ. එයාට වීසා බලපත්‍රය ගන්නත් අවශ්‍ය කරන documents ටික විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් තමයි certify කර යවන්නේ; එක්කෝ අම්මලා, තාත්තලාගේ, නැත්නම් දරුවන්ගේ ලියවිලි certify කරලා යවන්නෙත් එතැනින්. හැබැයි, පාස්පෝට් එකක් නිකුත් කරන්නේ නැහැ. ඊට පස්සේ සම්පූර්ණයෙන්ම එයා එතැන අකර්මණ්‍ය වෙනවා, ඒ රටෙන් වීසා එක දුන්නත් අපෙන් පාස්පෝට් එක දෙන්නේ නැති නිසා. ඒ නිසා මේ කාරණාව විශේෂ කාරණාවක් ලෙස ඔබතුමා සලකන්න. මොකද, ඒ ආකාරයේ විශාල පිරිසක් - කණ්ඩායමක් - ඉතාලියේ රැඳිලා ඉන්නවා, මේ කාරණාව කරගන්න බැරිව.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
හොඳයි, ඔබතුමාට බොහොම ස්තුතියි. Driving licence එකේ ප්‍රශ්නය හරි. ඔබතුමා මතු කළේ පාස්පෝට් එක පිළිබඳ තිබෙන සමහර තාක්ෂණික ගැටලු. අපි ඒවා විසඳන්න මැදිහත් වෙනවා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාරණ් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa, Leader of the Opposition. You have 12 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

අතුන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්පුමිකු (වෛද්‍යර්) රිස්වි සාලි] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 10.51]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු සභාපතිතුමනි, විදේශ කටයුතු සහ විදේශ රැකියා ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මට කථාව ආරම්භ කරන්න සිද්ධ වෙන්නේ දේශීය ප්‍රශ්නයකින්. ඊයේ දිනයේත් මම අපේ රටේ මහජනතාවගේ ආරක්ෂාව ගැන කථා කළා. අක්මීමන සිදු වූ ඝාතනය, තල්දෙන, මීගහකිවුල, අහුණකොලපැලැස්ස යන ප්‍රදේශවල සිදු වූ ඝාතන, වැලිවේරියේ වෙඩි තැබීම, මුතූර් බලප්‍රදේශයේ ජීවිත අහිමිවීම වැනි සිදුවීම් වෙලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමා දන්නවා ඇති, ඊයේ දිනයේදී අම්බලන්ගොඩත් ඝාතනයක් සිද්ධ වෙලා තිබෙන බව. කොළඹ ග්‍රෑන්ඩ්පාස් බලප්‍රදේශයේත් ඝාතන දෙකක් සිද්ධ වෙලා තිබෙනවා. අද මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ මහජන ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය අපේ රටේ ජනතාවට බලපානවා. ඒ වාගේම, සෘජුව සහ වක්‍රව අපේ සංචාරක ක්ෂේත්‍රයටත් බලපානවා. ඇත්ත වශයෙන්ම මේ රටේ ක්‍රියාත්මක වෙන මේ මිලේච්ඡ මිනීමරු සංස්කෘතිය නැති කර දමන්නට කඩිනම් වැඩ පිළිවෙළක් ඔබ රජයේ නීතිය හා සාමය ක්ෂේත්‍රය තුළින් අනිවාර්යයෙන්ම අවශ්‍යයි.

ගරු සභාපතිතුමනි, ඊයේ දවසේත් මම මේ ප්‍රශ්නය මතු කළා. අදත් මතු කරන්න සිද්ධ වෙනවා. තවම අපේ රටේ හිටපු පොලිස්පතිව සොයා ගන්නට බැහැ. ඒ වාගේම, උසාවියේදී සිදු කළ මිනීමැරුම සංවිධානය කළා යැයි කියන ඒ කාන්තාව තවමත් සොයා ගන්නට බැරි වෙලා තිබෙනවා. දිනපතාම සිදුවන මේ මිලේච්ඡ මිනීමරු සංස්කෘතියට නැවතීමක් නැද්ද? මේකට විසඳුමක් නැද්ද? මේ වාතාවරණය තුළ අපේ රටේ ජනතාව දැඩි අනාරක්ෂිත තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. කරුණාකර මේ පිළිබඳව ඔබතුමාගේ අවධානයත්, ජනාධිපතිවරයා ප්‍රමුඛ රජයේ අවධානයත් යොමු කරලා යම්කිසි පැහැදිලි විසඳුමක් ලබා දෙන්න. ඒ වාගේම, ඒ විසඳුම මොකක්ද කියන එක රටට ඉදිරිපත් කරන්නට කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සතුව සුවිශේෂී වගකීමක් තිබෙන බව මම දකිනවා. ඒ සුවිශේෂී වගකීම පිළිබඳව මම කරන්නට යන විග්‍රහය ගැන ඔබතුමා එකඟ නොවන්නට පුළුවන්. ඔබතුමා පැහැදිලිව කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය ආයතනත් සමඟ, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් සමඟ, විශේෂයෙන්ම මේ අවස්ථාවේ ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන් සමඟ අවබෝධතා, එකඟතා, ගිවිසුම් අත්සන් කරගෙන යනවා කියලා. මම ඔබතුමාට කියන්න කැමතියි, මේ කෙරෙන හැම ක්‍රියාවලියක් තුළම අවසානයේ සාර්ථකත්වය තීන්දු වෙන්නේ 2028දී අපේ රටට ණය ගෙවීමේ හැකියාව සාර්ථක කර ගන්න පුළුවන් ද, බැරිද කියන කාරණාව මත බව.

මේ කාරණයත් ගරු විජිත හේරත් ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න මම කැමැතියි. ඔබතුමන්ලා බලයට එන්න පෙර කිව්වේ, අලුත් debt sustainability agreement එකකට ගිහිල්ලා මේ IMF රාමුව තුළ අලුත් වැඩ පිළිවෙළකට යනවා කියලායි. ඒ කියපු දේ හරි. මොකද, මේ ඇති කර ගත්ත IMF ගිවිසුමේ රටට අහිතකර, රටට අගතිගාමී අඩු පාඩුකම් රාශියක් තිබෙනවා. සරලව කිව්වොත්, එකක් තමයි දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ප්‍රාථමික වියදම් - primary expenditures - සියයට 13ක් බවට පත් කර ගැනීම කියන එක. ඒ වාගේම, එකඟ වුණු ඒ ණය scenario එක සම්පූර්ණයෙන්ම වැරදියි කියන එක අද තීන්දු වෙලා තිබෙනවා. Macro-linked bonds ක්‍රමවේදය, ඒ කියන්නේ ආර්ථිකය වර්ධනය වෙන්න, වර්ධනය වෙන්න ණය හිමිකරුවන් ණය කපා හැරලා අපට ලබාදෙන සහනය අඩු වෙන සූත්‍රය අරුම පුදුම සූත්‍රයක්. ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී කියපු දේ හරි.

හැබැයි, වැරැද්ද වෙලා තිබෙන්නේ කොතැනද? ඔබතුමන්ලා, මැතිවරණ දිනපු අවස්ථාවේ පැවති ආණ්ඩුව ගෙන ගිය ප්‍රතිපත්තිමය නැවත සිප වැලඳගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, debt sustainability curve එක දිහා බැලුවොත්, අද වන විට අපි එයින් බැහැරවයි ඉන්නේ කියන එක. තිරසර ණය චක්‍රයේ අපි නැහැ. අපේක්ෂිත ආර්ථික වර්ධනය සිදු වෙනවාද, නැද්ද, අපේක්ෂිත රාජ්‍ය ආදායම ලැබෙනවාද, නැද්ද කියන එක ගැන ඔබතුමා පොඩ්ඩක් හොයා බලන්න. හොයා බලා, විදේශ කටයුතු ඇමතිවරයා හැටියට ඔබතුමා සතු කුසලතාව, දක්ෂතාව, නිපුණතාව උපයෝගී කරගෙන ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන්, ඒ වාගේම ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන්, ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය ආයතනත් සමඟ අලුත් ඝාතවිඡාවකට ප්‍රවේශ වෙලා, 2028 වර්ෂය දක්වා පසුගිය රජය නිර්මාණය කරපු අසාර්ථක, යථාර්ථවාදී නොවන, සම්පූර්ණ කර ගන්න බැරි ඉලක්ක ටික වහාම වෙනස් කර ගන්න කටයුතු කරන්න. නැත්නම්, මට පෙනෙන විධියට 2028දී බොහොම අමාරු තත්ත්වයක් නිර්මාණය වෙනවා. මම හිතනවා, ඔබතුමා මම කියන දේ හදවතින්ම විශ්වාස කරයි කියලා. ගරු ඇමතිතුමනි, අසත්‍ය දත්ත, අසත්‍ය සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරලා දේශපාලන ලකුණු දමා ගන්න දරන උත්සාහයක් නොවෙයි, මේක. මම මේ කථා කරන්නේ ඇත්ත. ඒ නිසා විදේශ කටයුතු ඇමතිවරයා හැටියට ඔබතුමාගේ රාජ්‍ය තාන්ත්‍රිකභාවය උපයෝගී කරගෙන, පසුගිය රජය ගිවිසුම්ගත වෙලා මේ රටට කළ මහා අපරාධය වළක්වන්න කටයුතු කරන්න. වැරදි ඉලක්ක, වැරදි scenarios එක්ක මේ මුළු රටම අන්දලා ජනාධිපතිවරණයක් වෙනුවෙන්, "ඔව්, අපි කුසලානය දිනාගත්තා" කියලා ගහපු ඩීල් එක, ගහපු ගිවිසුම රටට අහිතකරයි, ජනතාවට අහිතකරයි. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. කරුණාකරලා 2028 වර්ෂය වෙනකල් බලාගෙන ඉන්න එපා. අපට මේ ආර්ථික සංවර්ධන ඉලක්ක, රාජ්‍ය ආදායම් ඉලක්ක සම්පූර්ණ කර ගන්න බැරි වුණොත් බරපතළ ප්‍රශ්න රැසකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

ඒ වාගේම මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, 1975න් පසුව IMF ගිවිසුම් 75ක් පිළිබඳව විශ්ලේෂණය කරලා බැලුවොත්, පළමු ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන්ම සාර්ථක වෙලා තිබෙන්නේ ඒ රටවල් 75න් සියයට 41ක් පමණයි කියන එක. සියයට 59ක් රටවලට දෙවැනි, තුන්වැනි, හතරවැනි ප්‍රතිව්‍යුහගතකරණවලට යන්නට සිද්ධ වෙලා තිබෙනවා. මම ප්‍රාර්ථනා කරනවා, අපි සියයට 41 ගොඩට වැටෙන්න කියලා. මොකද, දෙවැනි, තුන්වැනි ප්‍රතිව්‍යුහගතකරණවලට - restructuringවලට - යන්න වුණොත්, මුළු රටම අමාරුවේ වැටෙනවා. එහෙම වුණොත් එටේ ලක්ෂ 220ටම බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා. ඒ නිසා බොහොම පිරිසිදු සිතිනුයි මම ඔබතුමාට මේ යෝජනාව කරන්නේ. මේ යන විධියට ගියොත්, අපේ රට ලොකුම ලොකු අමාරුවක වැටෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඉක්මන් පියවර ගන්න.

අවසාන වශයෙන් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අපි රටක් හැටියට ප්‍රමාණවත්ව බාහිර පරිසරය - external environment - ගැන අවධානය යොමු කරනවාද කියලා. World Trade Organization - WTO, General Agreement on Tariffs and Trade - GATT - කියන ක්‍රමවේද තුළ තමයි ලෝක ආර්ථික රටාව, වෙළෙඳ රටාව නිර්මාණය වෙලා තිබෙන්නේ. හැබැයි, ඒ වෙළෙඳ සැලැස්ම තුළ නිදහසේ සේවා සහ භාණ්ඩ හුවමාරු කිරීම - free flow of goods and services - කියන ප්‍රතිපත්තිය තමයි ප්‍රධාන න්‍යාය වන්නේ. හැබැයි බොහොම පැහැදිලියි, අද ලෝකයේ බරපතළ tariff war එකක්, එහෙම නැත්නම්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

වෙළෙඳාම මත පටවන බදු කේන්ද්‍රීය යුද්ධයක් - බදු යුද්ධයක් - ක්‍රියාත්මක වන බව. ඒ බදු යුද්ධය - tariff war එක - තුළ අපේ රටට තිබෙනවා, දැඩි අනාරක්ෂිතභාවයක්. ඒ මොකද? අපේ රටේ අපනයන ගමනාන්ත තිබෙන්නේ, යම් සීමාසහිත රටවල් කිහිපයකයි. අපට බැරි වෙලා තිබෙනවා, අපනයන ගමනාන්ත විවිධාංගීකරණයකට ලක් කරන්න; we have failed to diversify our export destinations.

ඒ නිසා මම යෝජනා කරනවා, අප්‍රිකාව පමණක් නොවෙයි, ආසියාව, ලතින් ඇමෙරිකාව, දකුණු ඇමෙරිකාව ආදී බල ප්‍රදේශ සියල්ලේම අපේ අපනයන ප්‍රවර්ධනය ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත් කියලා. මොකද, මේ පවතින තත්ත්වය තුළ මේ tariff war එකත් ක්‍රියාත්මක වුණොත්, අපේ රටේ විදේශ විනිමය ආදායමට, අපේ අපනයනවලට, අපේ රටේ තිබෙන ඩොලර් සංචිතයට එය සෘජුවම බලපානවා. එහෙම වුණොත්, 2028දී අපේ ණය ගෙවීමේ තත්ත්වය ලොකු අභියෝගයක් බවට පත් වෙනවා.

ඒ වාගේම අපි විශේෂයෙන්ම ඉන්දියාව සමඟ අපට තිබෙන සම්බන්ධතාව ඉතාම ශක්තිමත් කර ගන්නට ඕනෑ. ඒකට හේතුවක් තිබෙනවා. පසුගිය කාලයේ අපට මුහුණ දෙන්න සිදු වූ කොරෝනා තත්ත්වය තුළත්, Easter Sunday terrorist attack එකෙන් පසුවත්, රට බංකොලොත්වීමත් කියන මේ ත්‍රිත්ව ඛේදවාචකය තුළ අපේ රට දැඩි අනාරක්ෂිතභාවයට ලක් වෙනකොට, අපේ රටට මුදල්මය වශයෙන් වැඩිම ආධාර ප්‍රමාණයක් - මම හිතන විධියට ඇමෙරිකානු ඩොලර් බිලියන 6කට ආසන්න ප්‍රමාණයක් - ලබා දුන්නේ ඉන්දියාවයි. අපේ රටේ නිෂ්පාදන ඉන්දියානු වෙළෙඳ පොළ තුළට ප්‍රවේශ කර ගැනීමේ මාර්ගය අපි විවෘත කර ගන්න ඕනෑ; අපි නිදහස් වෙළෙඳ ගිවිසුමකට යන්න ඕනෑ. ඒ වාගේම අපි පිළිගන්නවා, චීනය සමඟත් අපි නිදහස් වෙළෙඳ ගිවිසුමකට ප්‍රවේශ වෙන්න ඕනෑ බව. ඇයි, ඉන්දියාව සහ චීනය ගැන අපි කථා කරන්නේ? ඒ රටවල් දෙක ලෝකයේ වැඩිම ජනගහනයක් සිටින රටවල් දෙකක්. ඒ නිසා ඒ රටවල වෙළෙඳ පොළට අපේ ප්‍රවේශය - access to market - අතිශයින්ම වැදගත් වනවා.

අපි බලාපොරොත්තු වන විධියට 2028දී ණය ගෙවන්නට නම්, අපේ ආර්ථික වර්ධන ඉලක්ක කරා යන්නට නම් අනිවාර්යයෙන්ම සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කර ගන්න ඕනෑ. මම මේ අවස්ථාවේදී යෝජනාවක් කරනවා. කලාපීය මට්ටමින්, Indian industrial zones for Indian industries, Japanese industrial zones for Japanese industries and Japanese investments වශයෙන් චීනය, ඉන්දියාව ආදී රටවලට අවස්ථාව සලසා දී අපේ රටට ඒ රටවල සම්පත් දායකයින්ගෙන්, ආයෝජකයින්ගෙන් ඒ ආයෝජන ලබා ගන්න අපට පුළුවන් නම්, එහෙම නැත්නම් විදේශීය රටවල් කේන්ද්‍රීය කර්මාන්ත කලාප - country-dedicated industrial zones - වැඩසටහනට යන්න අපට පුළුවන් නම් ඒක රටට අගය එකතු කිරීමක් කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි, සෘජු විදේශ ආයෝජනවලට අපි මුල්තැනක් දෙන්න ඕනෑ බව; පහසුකම් සපයන්න ඕනෑ බව. ඒ විතරක් නොවෙයි. නිදහස් වෙළෙඳ ගිවිසුම්වලටත් අපි යා යුතුයි. හැබැයි, නිදහස් වෙළෙඳ ගිවිසුම් කිව්වාම, FTAs කියපු පළියට නැතුව අපි calculation එකක් කරන්නට ඕනෑ, සාපේක්ෂ වාසිය - comparative advantage එක - පිළිබඳව. ඒ ගණනය කිරීම තුළ අපේ රටට සාපේක්ෂ වාසි - comparative advantages - ලැබෙන නිෂ්පාදන හා සේවාවලට අපි මුල්තැන දෙන්න ඕනෑය කියන එක, ඒ වෙළෙඳ ගිවිසුම්වලට ප්‍රවේශ වන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, කෙටි කාලයයි මට ලැබුණේ. ඒ කෙටි කාලය තුළ මම ඉහත සඳහන් කළ කරුණු තුන ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කළා. එකක්, රට ඇතුළත තිබෙන ආරක්ෂාව. දෙවැනි කාරණාව, මේ තිබෙන ඉෂ්ට කරන්නට බැරි ඉලක්ක ටික ගැන සාකච්ඡා කර නැවතත් වරක් එය සංශෝධනය කරගන්න කියන එක; විශේෂයෙන්ම IMF සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් සමඟ වන ගිවිසුම. තුන්වැනි එක තමයි, බාහිර පරිසරය - external environment එක - තුළ අද සිදු වන දැවැන්ත පෙරළිය තුළ, බදු යුද්ධය තුළ අපේ රට කොහොමද survive වෙන්නේ, අපේ රට කොහොමද රැකෙන්නේ, අපේ රට කොහොමද ආරක්ෂා වෙන්නේ සහ ඒ සඳහා ගත හැකි ක්‍රමෝපායික වැඩසටහන කුමක්ද කියන එක.

ඒ වාගේම අපි යෝජනා කරනවා, ඉතාම වැදගත් දෙයක්. ට්‍රම්ප් ජනාධිපතිතුමා සමඟ, ධවල මන්දිරයේ සිටින අදාළ වැදගත් නිලධාරීන් සමඟ ඉතාම සමීප සම්බන්ධතාවක් තිබෙන්නට ඕනෑ, විශේෂයෙන්ම US Trade Representative සමඟ, ඒ වාගේම United States Secretary of Commerce සමඟ, ඒ වාගේම White House Chief of Staff සමඟ, National Security Adviser සමඟ. ගරු විජිත හේරත් ඇමතිතුමනි, ඒ තුළ තිබෙන වැදගත්කම ඔබතුමාත් දන්නවා. එසේ පෞද්ගලික සම්බන්ධතා ඇති කරගෙන, ගෝලීයව ඇති වී තිබෙන tariff යුද්ධයෙන් ශ්‍රී ලංකාව - අපේ රට - ආරක්ෂා කරගන්නේ කොහොමද කියන කර්තව්‍යය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ සඳහා වන නිසි විසඳුම් - නිසි පිළිතුරු - මේ සභාවට ලබා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 11 minutes.

[පූ.භා. 11.06]

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තූතියි, ගරු සභාපතිතුමනි.

අද දිනයේ අපි කථා කරන්නේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි. ඒ ගැන කථා කිරීමට අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයක්කොට සලකනවා. මොකද, මේ අමාත්‍යාංශය ලංකාවේ ආර්ථිකයට, සමාජ, දේශපාලනික තත්ත්වයන්ට වැදගත් ලෙස බලපාන අමාත්‍යාංශයක්. මම අද දිනයේ කථා කරන්න බලාපොරොත්තු වන විශේෂිත මාතෘකාව තමයි විදේශගත ශ්‍රමිකයන් කියන අංශය. COPE එකේදී සිදු කරන ලද ඉතා බැරෑරුම් හෙළිදරව් කිරීම් ගණනාවක්ම පසුගිය දවස්වල ප්‍රවෘත්ති පත්‍රවල වාර්තා වෙලා තිබුණා අපි දැක්කා. මම ඒ ටික කෙටියෙන් කියන්නම්. 2024 අවුරුද්දේදී පමණක් බාල වයස්කාර දරුවන් 683දෙනෙක් ගෘහ සේවිකාවන් ලෙස විදෙස්ගත කරලා තිබෙනවා. 2013 අවුරුද්දේ රිසානා නෆීක් කියන දැරිවිය මරණ දණ්ඩනයට නියම වෙලා තිබුණු වෙලාවේදීවත්, ඒ වෙනුවෙන් යම්කිසි පියවරක් ගන්න ලංකා රජයට බැරි වුණු බව අපි දන්නවා.

ඒ වාගේම හෙළි වුණා, විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ රැකියා ඒජන්සි 900ක වාගේ ප්‍රමාණයක්, පුහුණු මධ්‍යස්ථාන, Immigration and Emigration Department සමඟ එකතු වෙලා මේක වංචා දැලක් විධියට ක්‍රියාත්මක වෙලා තිබෙනවාය කියලා.

ඒ වාගේම රුපියල් 75,000ක් වාගේ මුදලකට වංචාසහගත සහතික දීලා 28,165ක පිරිසක් පුහුණුව රහිතව පිට රට යවා තිබෙනවා. අපිට දිනපතා අහන්නට ලැබෙනවා, විශේෂයෙන් මැද පෙරදිග සේවය කරන කාන්තාවන් සහ පිරිමින් විවිධ අතවරවලට, හිරිහැරවලට ලක් වෙලා තිබෙන බව. ඒ වාගේම අපේ තානාපති කාර්යාලවල සහාය නැතිව ඔවුන් දුක් විඳින ආකාරය ගැනත් අපිට පැමිණිලි අනන්තවත් ලැබෙනවා. අද උදේත් මට ඒ වාගේ පැමිණිල්ලක් ලැබුණා. රජයක් හැටියට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අපි ආණ්ඩුව පිහිටුවන්න කලින් ඉදිරිපත් කරද්දි විදේශගත ශ්‍රමිකයන් වෙනුවෙන් විශේෂිත සැලසුමක් සහ ප්‍රතිපත්තියක් ඉදිරිපත් කළා. ඒ ප්‍රතිපත්තියේ තිබුණු පළමුවැනිම කාරණය තමයි මේ විදේශගත ශ්‍රමිකයන් පිළිබඳව දක්වන නොසැලකිල්ල. වංචා, දූෂණ හේතුවෙන් මේ විදේශගත ශ්‍රමිකයන් මුහුණ දෙන බැරෑරුම්, දුෂ්කර තත්ත්වයන්ට අපි පිළිතුරු හොයනවා කියන එකෙන් තමයි අපේ විදේශගත ශ්‍රමිකයන් පිළිබඳ ප්‍රතිපත්තිය සකස් වෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, ආණ්ඩුවක් ලෙස අපි මේ සියලු ප්‍රශ්නවලට එකින් එක විසඳුම් හොයන්න ලැහැස්ති වෙලා ඉන්නවා කියන කාරණය. විදේශගත ශ්‍රමිකයන් මහන්සි වෙලා හම්බ කරලා උපයන මුදල් නියමාකාරයෙන් රටේ සංවර්ධනයට යොදා ගනිමින් අපේ ආර්ථිකය වැඩිදියුණු කරන්න අපි උත්සාහ කරනවා. ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7ත්, 8ත් අතර ප්‍රමාණයක් තමයි මේ විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ලංකාවේ 2020 අවුරුද්දේ ඉඳලා මේ වනතෙක් වාර්තා වුණු වැඩිම විදේශ ප්‍රේෂණ ප්‍රමාණය 2024 දෙසැම්බර් මාසයේදී වාර්තා වුණා. ඒ ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 613.8ක්. 2025 අවුරුද්දේ මේ වනතෙක් අපිට ලැබිලා තිබෙනවා, ප්‍රේෂණ වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 1,121ක්. මේකෙන් කියන්නේ වෙන මුකුත් නොවෙයි, ගරු සභාපතිතුමනි. අපේ විදේශගත ශ්‍රමිකයන්ට මේ රජය ගැන කොයි තරම් විශ්වාසයක් තිබෙනවාද කියන එකයි මේකෙන් කියන්නේ. ඒ අය හම්බ කරන මුදලට නිසි වටිනාකමක් ඒ අයගේ පවුල්වල අයට ලැබෙයි කියන විශ්වාසයෙන් තමයි ඔවුන් මේ ප්‍රේෂණ එවන්නේ. අපි ප්‍රතිපත්තියක් ලෙස මේ කටයුත්ත කරගෙන යනවා. මම හිතන විධියට, ගරු ඇමතිතුමාත් එතුමාගේ කථාව පටන් ගනිද්දී කිව්වා, අපේ විදේශ සේවා දූත මණ්ඩලවල කාර්යයන් විධිමත් කරනවා, ඒ වාගේම රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා කියලා. අපි 2025 අවුරුද්දේ ඒ වෙනුවෙන් පියවර ගනිමින් ඉන්නවා. ශ්‍රී ලංකාව, International Convention on the Protection of the Rights of All Migrant Workers and Members of Their Families කියන UN Convention එකේ පාර්ශ්වකරුවෙක්. ඒකේ ප්‍රතිඵලයක් ලෙස අපි පැහැදිලිවම බැඳී සිටිනවා වාගේම ඒ වෙනුවෙන් පොරොන්දුවක් දීලා තිබෙනවා, විදේශගත ශ්‍රමිකයන් විතරක් නොවෙයි, ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ගෞරවය සහ යහ පැවැත්ම වෙනුවෙන් 2025 වර්ෂයේදී ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරනවාය කියලා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත සංශෝධනය කරන්න. ඒ වාගේම සංක්‍රමණ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ විගමනික සම්පත් මධ්‍යස්ථානය පිහිටුවන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වෙනුවෙන් අපි රුපියල් මිලියන 25ක් මේ වසරේ වෙන් කර තිබෙනවා. අපි දන්නවා, විවිධ දේශපාලනඥයින් සහ ඔවුන්ගේ අතවැසියන් තම පවුල්වල අයගේ අරමුණු සඳහා ගම්වලින් එන තරුණ තරුණියන්ගෙන් මුදල් ගන්න බව. අපි ඒකට කියනවා, human trafficking කියලා. මිනිස් ජාවාරමේ වින්දිතයන් බවට ඔවුන් පත් වෙලා තිබෙනවා. අපට ඕනෑ, ඒක නවත්වන්න. අපි ඒ වෙනුවෙන් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වාගේම අපේ අරමුණ තමයි නුපුහුණු ශ්‍රමිකයන්ට වඩා පුහුණු ශ්‍රමිකයන් රට යැවීම. ඒ සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ සඳහා අදාළ අමාත්‍යාංශ පහකින් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් අපි දැන් පිහිටුවන්න කටයුතු කරමින් සිටිනවා.

අපි හැම දාම වාගේ මුහුණ දෙන ඊළඟ ප්‍රශ්නය තමයි, විදේශගත වෙලා රැකියාව කරලා නැවත ලංකාවට පැමිණෙන අය වෙනුවෙන් අපි මොකක්ද ගන්න පියවර කියන එක. එලෙස විදේශගත වෙලා නැවත ලංකාවට පැමිණෙන විශාල පිරිසක් සිටින බව අපි දන්නවා. උදාහරණයක් හැටියට ගත්තොත්, මගේ පවුලේත් එලෙස විදේශගත වෙලා රැකියා කරලා නැවත ලංකාවට ආපු අය ඉන්නවා. කොරියාවේ ගිහිල්ලා, වැඩ කරලා හම්බ කරන මුදල්වලින් සමහර වෙලාවට ඔවුන් ගෙවල් හදනවා. නමුත්, ඔවුන් ලංකාවට ආවට පස්සේ මොනවාද කරන්නේ? ඔවුන් ව්‍යාපාරයක් කරන්නේ කොහොමද? ඒකට පටන් ගැන්ම කොතැනද තිබෙන්නේ? ආයෝජනයක් කරන්න පුළුවන් තැනක් තිබෙනවාද? අඩුම තරමින් ඒගොල්ලන් පිට රට ඉඳලා එනකොට ඒ අයට සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් වැනි දෙයක්වත් නැහැ. ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න අපි ආණ්ඩුව හැටියට බලාපොරොත්තු වෙනවා. ඒකට යම් කාලයක් ගත වෙයි. නමුත් මම හිතනවා, ඒක කළ යුතු දෙයක් කියලා. අපි සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ගැන දැන් කථා කරමින් යනවා. විදේශගත වෙලා නැවත අපේ රටට එන අයට EPF, ETF, gratuity ආදී මොනවත් නැහැ. ඒ නිසා පිට රට යම් කාලයක් වැඩ කරලා ලංකාවට එනකොට ඒගොල්ලන්ට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයක් ලබා දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් දැනට අපි සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම ඔවුන් සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන් රාශියක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඒකට අදාළ නිලධාරියෙක් හෝ නිලධාරිනියක් ඉන්නවා. හැබැයි, අපට පෙනෙනවා, ඒ නිලධාරියාට හෝ නිලධාරිනියට ඒ වැඩ ගැන අවබෝධයක් නැති බව. සමහර වෙලාවට ඒ වැඩ ගැන, වෙන් කරලා තිබෙන ප්‍රතිපාදන ගැන ඔවුන් දන්නේත් නැහැ; ගමේ මිනිස්සු දන්නේත් නැහැ. සමහර වෙලාවට රට ගිහිල්ලා ආපු තරුණ තරුණියන් අපේ ළඟට එනවා, මම දැන් මොකක්ද කරන්නේ කියලා අසමින්. ඒ අය වෙනුවෙන් සංවිධානාත්මකව ගමට යන වැඩ පිළිවෙළක් අපි යෝජනා කරලා තිබෙනවා. විශේෂයෙන් පිට රට රැකියා කර මෙරටට පැමිණෙන අය වෙනුවෙන් සමාජ ආරක්ෂණ වැඩසටහනට අමතරව විවිධ සහයෝගිතා කටයුතු සඳහා -පවුලේ අය සඳහා, දරුවන් සඳහා, ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා - අපි මුදල් වෙන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ වසරේ පමණක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙලා රැකියා සඳහා විදේශගත වී යැයි ඉලක්කගත සංඛ්‍යාව පිළිබඳව දත්ත අපි සකස් කරලා තිබෙනවා. ඒ අනුව එම ප්‍රමාණය 344,000ක්. ඒකෙන් පුහුණු ශ්‍රමිකයන් සියයට 75කුත්, අඩු පුහුණු ශ්‍රමිකයන් සියයට 25කුත් පිට රටවලට යවන්නත් තමයි ඇස්තමේන්තුගත කර තිබෙන්නේ. හැබැයි, අපට අවශ්‍ය වෙන්නේ අඩු පුහුණු කියන මේ සියයට 25 කොටස තවත් අඩු කරමින් වැඩිපුර පුහුණු ශ්‍රමිකයන් පිට රටවලට යැවීමටයි. ඒ සඳහා පුහුණු වැඩසටහන් රාශියක් වෙනුවෙන් අපි මුදල් වෙන් කර තිබෙනවා. කාර්යාංශ අරමුදල්වලින් රුපියල් මිලියන 433.97ක් වෙන් කරලා තිබෙන්නේ ඇත්තටම පුහුණු ශ්‍රමිකයන් රට යැවීමේ අරමුණ සඳහායි. පුහුණු ශ්‍රමය කියන්නේ, අපේ රටේ විදේශ විනිමය ලබා ගැනීමේ හොඳම සහ සාධාරණ ක්‍රමය. නුපුහුණු ශ්‍රමිකයන් පිට රට ගියාම හැම තිස්සේම අපට අහන්න ලැබෙන්නේ එක එක අතවරවලට ලක් වෙලා, රැකියාවේ විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමේ සිද්ධියි. ඊට පස්සේ ඒගොල්ලන් කරන්නේ මොකක්ද? නියමිත, හොඳ රැකියා කොන්දේසි තිබෙනවාද කියන එක ගැන ප්‍රශ්න ඇති වෙලා තමයි ගොඩක් වෙලාවට ඔවුන් නැවත මේ රටට එන්නේ. ඒ නිසා අපි ඉදිරිපත් කරපු, ජාතික ජන

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

බලවේගය ප්‍රතිපත්තියේ තිබෙන පුහුණු ශ්‍රමිකයන් වැඩි කිරීමේ වැඩසටහන තමයි අපි මේ කරමින් සිටින්නේ. ඊට අමතරව ලංකාවට ආවාට පසුව ඒගොල්ලන්ට කරන්න පුළුවන් දේවල් මොනවාද කියා අපි සොයා බලනවා. දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දෙන්න අපි රුපියල් මිලියන 24ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අඩු පොලී අනුපාත බහුකාර්ය ණය ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 360කුත්, ඊට අමතරව තම නිවාස ඉදි කර ගැනීම සඳහා බැංකු මඟින් ණය පහසුකම් ලබා දීම වෙනුවෙන් ණය පොලී මුදලින් කොටසක් ගෙවීම පිණිස රුපියල් මිලියන 175කුත් අපි වෙන් කරලා තිබෙනවා.

නිෂ්පාදන ආර්ථිකය තමයි අපේ රජයේ මූලික ආර්ථික ප්‍රතිපත්තිය. නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීමේ අරමුණට දායක විය හැකි ආකාරයට අපනයනය ප්‍රමුඛ කර ගත් ව්‍යාපාර සඳහා පසුගිය අවුරුදුවලට වඩා සියයට 43කින් අපි මුදල් වැඩි කරලා තිබෙනවා.

ඒ කියන්නේ, මෙවර අය වැයෙන් රුපියල් මිලියන 744ක් වෙන් කරලා තිබෙනවා, විදේශගත වෙලා සිට නැවත ලංකාවට එන ශ්‍රමිකයන් වෙනුවෙන් අපනයන ප්‍රමුඛ ව්‍යාපාර පටන් ගන්න. ඊට අමතරව ස්වයං රැකියා, පාසල් උපකරණ ලබා දීම සඳහා, ආබාධ සහිත තත්ත්වයට පත් වෙලා එන අය වෙනුවෙන් නව නිවසක් හදා ගැනීම සඳහා මුදල් වෙන්කිරීම් ආදී වශයෙන් විවිධ වෙන් කිරීම් කරලා තිබෙනවා. කොහොම වුණත්, මට කියන්න අවශ්‍ය මේකයි, ගරු සභාපතිතුමනි. අපි මූලික වශයෙන්ම අපේ විදේශගත ශ්‍රමිකයන් සලකන්නේ අයිතිවාසිකම් රහිත, එහෙම නැත්නම් දුර්වල කොට්ඨාසයක් ලෙස නොවෙයි. අපි ඒ අයට සලකන්නේ, ඒ අයත් මේ රටේ ආර්ථිකයට හොඳින් දායක වන, තම ශක්තියෙන්, ශ්‍රමයෙන් දායක වන, ආර්ථිකයේ ප්‍රධාන පංගුකරුවන් ලෙසයි. ඒ අයට මානව අයිතිවාසිකම් සහිත, ගෞරවයක් සහිත පුරවැසියන් ලෙස සමාජයේ, රටේ ජීවත් වෙන්න අවශ්‍ය අපේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ වෙනුවෙන් අපේ රජය කැපවී වැඩ කරන බව කියමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon.Shanakiyan Rajaputhiran Rasamanickam. You have 15 minutes.

[11.18 a.m.]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Chairman, I think I have 18 minutes. You can check with the Office of the Leader of the Opposition; the ASG can check with that Office. Another three minutes have to be added.

Hon. Chairman, thank you for the opportunity given to speak on the Votes of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism at the Committee Stage Discussion. I rise to speak, Sir, with utter disappointment about this Government's policy on accountability. The Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism spoke just a short while ago and in his speech, he very briefly mentioned about accountability. He was very brief and took only about a minute. All he had to say was that there would be a domestic mechanism which would look into the gross violations of human rights.

Now, this is precisely the problem, Sir. The State, whoever that is in power, always protects the State. I would like to refer to former President Hon. Ranil Wickremesinghe's recent Al Jazeera interview. I do not understand why he is defending the Government previous to his. The Hon. Namal Rajapaksa is here. His father was the then President and Minister of Defence. The Hon. Ranil Wickremesinghe, who sat in the Opposition at that time and who seemed to be a champion of human rights, has gone on Al Jazeera and defended the Government he himself was opposed to. That is precisely the problem in this country: the State will always protect itself. And, now, this Government is no different; this Government is also trying to protect itself, the State. Why I say that is because of what has been reported as having been said by former President on hospitals being bombed during the war: "…Wickremesinghe acknowledged that aid had been blocked to war victims and that some hospitals had been bombed. However, he refuted claims that such bombings were part of a systematic strategy, stating, 'There had been occasions where the Air Force had bombed hospitals and action was taken against some of them. But on a large-scale, ... I wouldn't say that.' " That was his response to Al Jazeera's statement on hospitals being bombed.

Then, Sir, I have an article here with me from the Human Rights Watch titled "Sri Lanka: Repeated Shelling of Hospitals, Evidence of War Crimes", which states, I quote:

> "Patients, medical staff, aid workers, and other witnesses have provided Human Rights Watch with information about at least 30 attacks on permanent and makeshift hospitals in the combat area since December 2008. One of the deadliest took place on May 2, when artillery shells struck Mullaivaikal hospital in the government-declared "no-fire zone," killing 68 persons and wounding 87."

Sir, I **table*** this article in the interest of time.

Let me read another paragraph from it. This is the statement of an aid worker who was there at the Valayanmadam Hospital in the no-fire zone on 02nd April. I quote:

> "I was in the hospital. Right after 12:30 p.m., I noticed a Sri Lanka military drone conducting reconnaissance above the hospital. The people in the hospital suspected that an attack was imminent, so they lay down on the ground. Shortly thereafter, we heard a loud explosion in the air, followed by several smaller explosions on the ground. One of the explosions took place only a couple of meters from me. One of the doctors, who was lying just next to me, was killed by a shrapnel piece that hit him in the head. Four or five people were killed and more than 30 were wounded in the attack."

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

This article goes on to state the number of hospitals that were attacked. I quote:

> "A medical worker told Human Rights Watch that when the Putumattalan hospital came under heavy shelling around midnight on April 20, he immediately sought cover in a bunker. He described what he saw after he left the shelter early in the morning:"

This is what he saw.

> "The roof of the building was destroyed and tiles had fallen into the room. There were eight dead bodies in Ward 5, and five dead bodies in the admission ward, …"

So, there is clear evidence that hospitals were bombed during the last stages of the war. There is clear evidence! I have more articles with witnesses' evidence, which I can table. So, these have been recorded; these have been published, which stated that there was a big Red Cross flag put on the hospital premises so that the Army could see that that was a hospital.

A civilian who later went into the army-controlled area had confirmed that from one kilometre away he could see the Red Cross flag, which indicated it was a hospital. But, it was bombed. However, former President Ranil Wickremesinghe, who was not even responsible for the attack, was going on Al Jazeera and defending that previous Government or the person who is accused of it. So, that is the problem in this country: the State would always defend itself.

And, the Hon. Vijitha Herath, the Minister of Foreign Affairs, and his Government are no different. At least, the people of the North and the East never voted for Rajapaksas because they knew that they would never get justice under their Government, which is why they voted for you. The entire Northern Province voted for you. Is this how you repay their faith, the faith they had in the Government? Is this how you repay them? Shame on this Government! The Hon. Minister went to Geneva and only spoke about whatever mechanisms that are already in place and about a domestic mechanism. The Tamil people have rejected any domestic mechanism because 16 years later, there has not been a single case you have solved.

One day ago you all tabled the Batalanda Commission Report. I wish the Hon. Speaker was in this House while I speak so that I could see whether he would be as compassionate when I speak about the Tamil people who were killed and the atrocities against the Tamil people as he was when the Batalanda Commission Report was presented. We saw him being so compassionate, very good. We are also compassionate on that. For the Batalanda Commission Report to be tabled is good. You investigate into that and take action, but the problem is, on all these reports that are generally tabled, we never see any action being taken. The Paranagama Commission was tabled; the Udalagama Commission was tabled, but what action, not this Government but the previous Governments had taken? This Government also had enough time. The incumbent President has been in that office for six months now. If his position was to investigate and take action on these reports, he would have started it by now. Nothing! So, again, what we are going to see is that the Tamil people would be denied justice in this country. If the former President is defending his nemesis on foreign media, what faith could we have in this particular Government? And the Hon. Minister has given nothing in his speech today for us to have even an ounce of faith that this Government would do justice to the Tamil people.

Now, let me move on to another matter, to torture, because the Batalanda Commission is also about torture. Sir, let me bring to your attention a report that JDS has published, which talks about 219 torture sites which existed in this country during the war! Now, we are speaking about the Batalanda Commission. I am all for justice being served on the accused or the perpetrators, but there had been 219 torture sites, civil torture sites, in Sri Lanka! When are we going to investigate into all the atrocities that happened in those torture sites? Those are very recent ones. The Batalanda incidents were in 1989. These had been in 2008, 2009 and even in 2010 and 2011. So, when are you going to investigate into those? Then, there was an article published in "The Hindu" titled "Sri Lankan Tamil men accuse government of torture, rape"; that was published in 2017. A number of witnesses have come forward and given their statements about how they were tortured, how they were beaten up with plastic poles filled with sand, how they were burnt with cigarettes and about the gunsite camp in Trincomalee and the Joseph camp in Vavuniya. You know that the Udalagama Commission very clearly stated about the ACF case, the Trinco Five case and abduction of 11 Tamil youth; they stated how the State is responsible. But, what action have you all taken? So, when it comes to the Tamil people, about all these Commission reports, you all do not want to talk, but only about the Batalanda Commission Report. It has been tabled and I do not see any action being taken against those responsible.

බටලන්ද කොමිෂන් සභා වාර්තාව සභාගත කළාට එහි සඳහන් වැරැදිකරුවන්ටවත් දඬුවම් දෙයි කියලා මට කිසිම විශ්වාසයක් නැහැ. මොකද, මම දන්නා විධියට ජේවීපී එකේ දැන් ඉන්න නායකයන් ඔක්කෝටම ඒ දවස්වල වයස අවුරුදු 18යි, 19යි, 20යි. බටලන්ද කොමිෂන් සභාවේ වාර්තාව සභාගත කළා වාගේම 1988 -1989 කාලයේ ජේවීපී එකෙන් කරපු ඝාතන පිළිබඳවත් දැන් lists එළියට එනවා. ඒවා ගැනත් පරීක්ෂණ කරන නිසා ජේවීපී එකේ ඉන්න ගොඩක් අයත් කැමැති වුණේ නැහැ, එම වාර්තාව සභාගත කරනවාට. ඒ නිසා එය හරහා මෙතැනින් එහාට කිසිම දෙයක් වෙන්නේ නැහැ. සභාගත වීම පමණයි. බටලන්ද කොමිෂන් සභාවේ වාර්තාවටත් එච්චරයි වෙන්නේ. මම අද එය කැට තියලා කිව්වා කියලා හිතා ගන්න.

බටලන්ද කොමිෂන් සභාවේ වාර්තාව table කළේ ඇයි? ඒක table කළේ නැත්නම්, කුමාර් ගුණරත්නම්ගේ පෙරටුගාමී සමාජවාදී පක්ෂය - the Frontline Socialist Party - ජේවීපී එක තව කැලි 10කට කඩනවා. ඒ බයටයි ඒ වාර්තාව table කළේ. ඒ මිස, ඒ බටලන්ද කොමිෂන් සභාවේ වාර්තාව සම්බන්ධයෙන් මෙතැනින් එහාට කිසිම දෙයක් වෙන්නේ නැහැ. මම දැක්කා, ගරු කථානායකතුමා ඊයේ ඒ වාර්තාව ඉදිරිපත් කළ අවස්ථාවේ සංවේදී වුණා. අපිත් සංවේදීයි, මේ වාගේ දේවල්වලට. හැම දෙයටම සංවේදී වෙනවා නම් හොඳයි.

Sir, there is a lot more to be said about how people were tortured in this country, but let me now move on to

[ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

another important topic, which is rape. As you know, very recently a doctor was raped in Anuradhapura. We condemn that; we are opposed to violence against women. We condemn that and the accused should be punished. Now, let us talk about the Tamil women who were raped and killed; let us talk about them as well.

இந்த நாட்டிலே ஆயிரக்கணக்கான தமிழ்ப் பெண்கள் பாலியல் துஷ்பிரயோகம் செய்யப்பட்டுக் கொல்லப்பட்டனர். அநுராதபுரத்திலே பாலியல் தொந்தரவுக்கு உட்படுத்தப் பத்தப்பட்ட பெண்ணுக்கு நீதி வேண்டும் என்பதில் எந்த மாற்றுக் கருத்தும் இல்லை. ஆனால், இந்த நாட்டில் எத்தனையோ ஆயிரக்கணக்கான தமிழ் பெண்கள் பாதுகாப்புப் படையினரால் பாலியல் தொந்தரவுக்கு அல்லது பாலியல் வன்முறைக்கு ஈடுபடுத்தப்பட்டிருக்கிறார்கள். இந்த நடவடிக் கைகளில் ஈடுபட்டவர்களுக்கு எதிராக நடவடிக்கை எடுக்க வேண்டுமென்று ஏன் இந்த நாட்டில் இருக்கும் மக்களோ, அரசாங்கமோ கொந்தளிக்கவில்லை? இனவாதம் இல்லையென்று சொல்லும் இந்த அரசாங்கம்தான் மிகமோசமான அரசாங்கம்!

கடந்த காலத்திலே இருந்த அரசாங்கங்கள் தங்களை இனவாதிகளாகவே அடையாளப்படுத்திக்கொண்டு தங்களுடைய செயற்பாடுகளை முன்னெடுத்தன. ஆனால், இந்த அரசாங்கம் "இனவாதம் இல்லை, இனவாதம் இல்லை" என்று சொல்கிறது; ஆனால் முழுக்க முழுக்க இனவாதத்தில் ஈடுபடுகின்றது. எப்படியென்றால், இந்த நாட்டிலே தமிழ் மக்களுக்குக் கிடைக்க வேண்டிய நிரந்தர அரசியல் தீர்வைத் தருவதற்கு மறுக்கிறது. இந்த நாட்டிலே பொறுப்புக்கூறல் விடயத்திலே கௌரவ அமைச்சருடைய உரையிலே தமிழ் மக்கள் சார்பிலே எதுவும் சொல்லப்படவில்லை. அவருடைய நிலைப்பாட்டையே அவர் சொல்லியிருக்கின்றார்.

அண்மையிலே அநுராதபுரத்திலே நடந்த சம்பவத்தை நாங்களும் வன்மையாகக் கண்டிக்கின்றோம். ஆனால், ஆயிரக்கணக்கான தமிழ்ப் பெண்கள் கற்பழிக்கப்பட்டு, பாலியல் வன்முறைக்குட்படுத்தப்பட்டுக் கொல்லப்பட்டனர். இதற்கு இசைப்பிரியா கொல்லப்பட்டதை ஓர் உதாரணமாகச் சொல்லலாம். இசைப்பிரியா படையினரால் பிடிக்கப்பட்டு உயிரோடு இருந்ததற்கான ஆதாரங்கள் எத்தனையோ இருக்கின்றன. அதனைத் தொடர்ந்து கைகள் பின்னால் கட்டப்பட்டு, அரைகுறை உடுப்புடன் - ஒரு துணியுடன் - இருந்த இசைப்பிரியா, பிறகு ஓர் உடுப்பும் இல்லாமல் இருந்த காணொளிகள் வெளிவந்தன. அப்படியானால் இசைப்பிரியா ஒரு பெண் இல்லையா? இசைப்பிரியாவின் மரணத்துக்கு இந்த நாட்டில் நீதி தேவையில்லையா?

Let me read from an article I have here with me about Isaipriya, which states, "Isaipriya is sitting in a swamp. She is only partly clothed. She looks dazed and confused. There is no clue as to how on earth she got there and why she is all alone. Some speculate that she had been trying to escape the bloody final showdown. She is helped to her feet and looks completely uninjured. This is an important observation, because she was not to remain so for long. The soldiers think she is the Tamil rebel leader's daughter. She is not, she says. They find a length of white cloth to wrap around her. It is the same cloth that shrouds her in a photograph Channel 4 News later obtained from a Sri Lankan soldier. In his photograph, dated later that same day, 18th May, Isaipriya is dead. Her hands are tied behind her back. There is also now a long and jagged cut across her face. That grim footage comprises part of the notorious 'executions video' which shows the shooting dead..... You do not need much of an imagination to figure out what has happened." It is very clear that Isaipriya was well and alive. Later, her hands were bound behind her back and she was found dead. It very clearly shows that she was not playing scrabble. Clearly, the people who had her in captivity did not play scrabble with her; they had played something else with her.

Why is the Government not ready to even acknowledge these accusations? These are all accusations. If you have the courage, investigate them. When the Good Governance Government co-sponsored Resolutions, there was at least some discussion about a hybrid mechanism, where the victim community could have some trust in the process. But, there is nothing from this Government. There is a lot more to be highlighted. Isaipriya's case is one great example I gave you because you could start from there. Also, in August, 2013, a woman from Pooneryn was raped and reportedly left to die by two men wearing khaki pants and green shirts. After treatment at the Kilinochchi Hospital, military personnel escorted her to the local camp and provided her with dry rations. In 2010, a 22-year old woman from Vishwamadu was gang raped by four military personnel. The reason why I point out these things is because the Hon. Minister in charge of Public Security said that an army deserter was accused of the rape in Anuradhapura. There have been so many accusations against army deserters with the sprees of violence they have been engaged in like shootings and killings. That is what the Minister said. Today, 16 years later, if an army deserter is accused of raping a doctor in broad daylight or raping a doctor in a hospital, imagine the extent of gross violations they would have committed during the last stages of the war when there was no media coverage, no international observers and outsiders! Imagine! So, our community is only asking you to investigate into those incidents. If you are not guilty, investigate into those. Why are you shying away from an inquiry? The reason why you are shying away from an inquiry is because the State always protects the State. That is your first interest. So, Hon. Minister of Foreign Affairs, the NPP Government has also failed to address this concern. You all are betraying the Tamil people, the trust that the people of the North and the East, except for the people of Batticaloa, placed in you. The people of Batticaloa did not trust you and they will never trust you. So, that is what I have to say regarding accountability.

Then, on tourism as well, Hon. Minister, there are a few things I need to point out.

සංචාරක අමාත්‍යාංශය පිළිබඳවත් මට කියන්න තිබෙනවා. මේ ආණ්ඩුව හරහා acountability නැහැ කිව්වාම, වංචා, දූෂණ හරි නැතිවෙයි කියලා අපි බලාපොරොත්තු වුණා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා. Nilaveli coast එකේ Pigeon Island එක ඉස්සරහා mineral explorations කරන්න පසුගිය ආණ්ඩුවෙන් විශාල ක්‍රියාමාර්ගයක් අරගෙන ගිය බව. මම ළඟ තිබෙනවා, ඒ සඳහා Board meeting එකේ ගත්ත තීරණත්. ඒ දිස්ත්‍රික්කයේ

ජනතාව මට දැන් කියනවා, "ඔබතුමා මන්ත්‍රී වෙන්න කලින් මේක ගැන හරි උනන්දුවෙන් හිටියා. නමුත් දැන් ඔබතුමා මේක ගැන බලන්නේවත් නැහැ" කියලා. නිලාවේලි සිට කුඹුරුපිටි නැඟෙනහිර දක්වා වෙරළ සීමාවේ මීටර් 300ක වපසරියකින් යුත් රජයේ ඉඩම් ජේම්ස් ග්ලෝබල් පුද්ගලික සමාගම වෙත දීර්ඝ කාලීනව බදු දීමට අනුමැතිය ලබා ගැනීම කියන කාරණය මෙහි තිබෙනවා. මෙක 2024 ජූනි 27වැනි දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී සාකච්ඡාවට ගත්ත කාරණයක්. ගරු සංචාරක කටයුතු ඇමතිතුමනි, කුච්චවේලිවල තිබෙන මේ ඉඩම් Sri Lanka Tourism Development Authority එකට තමයි අයිති. ගරු ඇමතිතුමනි, ලංකාව පුරාම minerals explore කරන්න කියලා permits දීලා තිබෙනවා. ඒවා exploration permits විතරයි. ලංකාවේ තවම mining permits එකක්වත් දීලා නැහැ. හැබැයි ඔබතුමන්ලා බලයට ආවාට පස්සේ මේ වෙනකොට, පසුගිය සතිය ඇතුළත ජේම්ස් ග්ලෝබල් පුද්ගලික සමාගමට පළමුවැනි permit එක දෙන්න දැඩි බලපෑම් කරන බව අපට දැනගන්න ලැබිලා තිබෙනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, හම්බන්තොට ෂැන්ග්‍රි-ලා එක ඉස්සරහා ඉඩම්වලටත් දෙන්න බලනවා. ගරු ඇමතිතුමනි, මා ළඟ ඒ සිතියම් ටික තිබෙනවා. මේවා සංචාරක කර්මාන්තයට අවශ්‍ය ඉඩම්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir. Just give me only a more minute, please. I will show this map to the Hon. Minister and wind up.

ගරු ඇමතිතුමනි, මේ map එකේ තිබෙන ආකාරයට හම්බන්තොට ෂැන්ග්‍රි-ලා එක තිබෙන ඉඩම් ඔක්කෝම හදුනාගෙන තිබෙනවා. බලන්න, මේ තිබෙන්නේ හම්බන්තොට ඉඩම්. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් මේ ගැන බලන්න. හම්බන්තොට ෂැන්ග්‍රි-ලා එක ඉස්සරහා explorations කරන්න දීලා තිබෙන මේ ඉඩමේ දැන් miningවලට permits දෙන්න යනවා. බලන්න, මේ තිබෙන්නේ තිස්සමහාරාම ඉඩම්. මේ තිබෙන්නේ තලෙයිමන්නාරම ඉඩම්. තලෙයිමන්නාරමේ ඔක්කෝම ඉඩම් explorationsවලට දීලා තිබෙන්නේ. ඒවායේත් miningවලට permits දෙන්න යනවා. මේකට සම්බන්ධ වෙලා ඉන්න සංජය පෙරේරා කියන පුද්ගලයා මීට කලින් Environment Ministry එකේ GSMB එකේ සභාපති හැටියට හිටියේ. ඔහු පසුගිය රජය කාලයේ එහි සභාපති වුණා. දැන් ඔහු තමයි මේ ජේම්ස් ග්ලෝබල් පුද්ගලික ආයතනයේ consultant. Therefore, it is a conflict of interest. මේ ආණ්ඩුව යටතේ මේ permit එක දෙන්න යනවා. මේ විධියට ලංකාවේ වෙරළ තීරයේ තිබෙන ඔක්කෝම ඉඩම් explorationsවලට දුන්නොත් tourismවලට එක ඉඩමක්වත් නැති වෙයි. උතුරු-නැඟෙනහිර දැනටමත් tourism නැහැ. මොකද, ඔබතුමන්ලා ඒ airport එක දියණු කරන්නේ නැහැ, තලෙයිමන්නාරමේ ferry service එක හදන්නේ නැහැ. ඉන්දියාවත් එක්ක land connectivity එපා කියනවා. ත්‍රිකුණාමලයේ Harbour එක develop කරන්නේ නැහැ. ඒ නිසා touristsලාට එන්න විධියකුත් නැහැ. Touristsලාට ඇවිල්ලා ඉන්න හෝටල් හදන්න පුළුවන් ඉඩම් ටිකත් දැන් දෙන්න යනවා. එතකොට මේ ඔක්කෝම විනාශයි.

අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා මම අහගෙන හිටියා, මේ අවුරුද්දේ මේ වෙනකොට touristsලා ලක්ෂ 5ක් ලංකාවට ආවා කියලා. ඔබතුමන්ලා තවම ගණනය කරන්නේ එක tourist කෙනෙක් ලංකාව තුළ ඩොලර් 180ක් දවසකට වියදම් කරනවා කියලායි. ඒක 2018 දී කරපු සමීක්ෂණයකින් ආපු ගණනක්. නමුත් ඒක වැරදියි. ඒ නිසා අද වෙනකොට - අවුරුදු 7කට පස්සේ - tourist කෙනෙක් ලංකාව තුළ වියදම් කරන මුදල් ප්‍රමාණය ගණනය කරන්න ඔබතුමන්ලා වැඩ පිළිවෙළක් පටන් ගන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rasamanickam, you are exceeding your time.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am sorry, Hon. Chairman. I am winding up.

ඒක ගණනය කරන්න. මොකද, foreign exchange income එක ඔබතුමන්ලා වැරදියටයි ගණනය කරන්නේ. අද අපි දකිනවා ලංකාවට එන සුද්දෝ අතරින් රුපියල් 100ක් දීලා ත්‍රීවීලර් එකේ යන්න කැමති නැති සුද්දොත් ඉන්නවා කියලා. ඒ නිසා සුද්දෝ ලක්ෂ 5ක් එනවා කියන එකෙන් වැඩක් නැහැ. ඒ නිසා මේ රටේදී මුදල් වියදම් කරන සුද්දෝ එනවාද, සුද්දෝ ඇවිල්ලා වියදම් කරන ප්‍රමාණය කොච්චරද කියලාත් බලන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගරු විජිත හේරත් ඇමතිතුමනි, ඔබතුමා කෙරෙහි අපි විශාල විශ්වාසයක් තැබුවා. දැනටත් ඒක තිබෙනවා. මොකද, ඔබතුමා විපක්ෂයේ ඉඳලා විශාල කාර්යභාරයක් කරලා තමයි ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණයකදී ගත්ත වැඩිම ඡන්ද අරගෙන පාර්ලිමේන්තුවට ආවේ. ඒ නිසා ඔබතුමා දන්නවා accountability පිළිබඳ මම මේ කියපු සියලු කාරණා සාධාරණ දේවල් කියලා. ඔබතුමන්ලා කරුණාකරලා politburo එකේ ඉන්න කට්ටියට කථා කරලා, convince කරලා, මේ ගැන affected community එක බලාපොරොත්තු වෙන විධියේ විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලා සිටිමින්, මට වෙලාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Lakshman Nipuna Arachchi, please. You have 14 minutes.

[පූ.භා. 10.38]

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු සභාපතිතුමනි, අද සාකච්ඡාවට භාජන වෙන මේ වැය ශීර්ෂය ඇතුළේ විදේශ රැකියා ක්ෂේත්‍රය මූලික කරගෙන යම් කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් කරන්නයි මා සූදානම් වෙන්නේ.

අපි දන්නවා, මේ රට කරගෙන යන්න ධනය හොයලා දෙන ප්‍රධාන මනුෂ්‍ය කොට්ඨාසයක් තමයි විදෙස්ගත ශ්‍රමිකයන් කියන්නේ.

අපේ රටේ තිබුණු තේ, පොල් හා රබර් මත පදනම් වූ ආර්ථිකය පස්සට ඇද දමලා, කඩා වට්ටවලා, 1977න් පස්සේ ක්‍රියාත්මක වුණ නව ලිබරල් ආර්ථිකය ඇතුළේ මානව ශ්‍රමය තමයි අපේ රට

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

ජීවත් කරවන්න ක්‍රියාත්මක වුණේ. ඒ නව ලිබරල් ආර්ථිකය අපේ රටේ ක්‍රියාත්මක වීමේදී හැම පැත්තකින්ම ඒ ආරම්භ කළ වැඩ පිළිවෙළ විශාල අපිළිවෙළකින් තමයි පටන් ගත්තේ. දැන් අපට සිද්ධ වෙන්නේ ආණ්ඩුවක් හැටියට ඒ අපිළිවෙළ තත්ත්වය වෙනස් කරලා මේ රට ගොඩනැඟීමේ කාර්යභාරය යම් පිළිවෙළක් ඇති කරමින් ඉස්සරහට අරගෙන යන එකයි. ඒ නිසා මා විශ්වාස කරනවා, විදේශ කටයුතු විෂයය යටතේ ඇති විදේශ රැකියා කියන කොටසට අදාළව අමාත්‍යවරයාට විශාල වැඩ කොටසක් පැවරිලා තිබෙනවා කියලා.

විපක්ෂයේ ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා මීට පෙර කථා කළා. එතුමා දැන් ගරු සභාවේ නැහැ. එතුමා බොහෝ කරුණු කාරණා කිව්වේ, "මේ ආණ්ඩුවට මතක් කරනවා, මේ ආණ්ඩුවට මම මතක් කරනවා" කියලා. මේ ආණ්ඩුවට මතක් කරනවා, මතක් කරනවා කියනකොට අපට හිතෙනවා, මේ ආණ්ඩුව ආවාට පස්සේ කලින් ආණ්ඩු කළ අය කරපු හොඳ දේවල් මේ ආණ්ඩුවට අමතක වෙලා කියලා. අමතක වෙලා නිසා ඒවා කරන්නේ නැහැ කියලා කෙනෙකුට හිතෙනවා. බොහෝ විට හිතෙන්නේ එහෙමයි. දැන් එතුමන්ලා කියනකොට, "අපි ආණ්ඩුවට මතක් කරනවා. අපි ආණ්ඩුවට මතක් කරනවා" කියලා ගරු සභාපතිතුමනි, මේවා ගැන දන්නේ නැති කෙනෙක් හිතන්නේ, කලින් හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරිලා තිබෙනවා, නමුත් දැන් මේ අලුතින් පත් වෙච්ච ආණ්ඩුවට ඒවා අමතක වෙලා, ඒ හොඳ දේවල් කරන්නේ නැහැ කියලා. ඒ නිසා එතුමා එහෙම නොවෙයි, කියන්න ඕනෑ. "අඩුම ගණනේ කරන්න තියා හිතුවේවත් නැති දේවල් කරන්න කියලා අපි මේ ආණ්ඩුවට කියනවා" කියලායි. අන්න එහෙම කිව්වා නම් හරි. එහෙම නැත්නම්, "අපට කරන්න තියා අපට හිතන්නවත් බැරි වූ දේවල්, අපි කරන්න තියා හිතුවේවත් නැති දේවල් කරන්න කියලා අපි මේ ආණ්ඩුවට කියනවා" කිව්වා නම් හරි. මම හිතන හැටියට, අන්න ඒ විධියට තමයි කියන්න ඕනෑ.

විශේෂයෙන්ම 1977න් පසු කාලයේ විදෙස් රැකියා සඳහා මේ රටේ ජනතාව යවන්න පටන් ගත්තේ කිසිදු වැඩ පිළිවෙළක් සහිතව නොවෙයි. එම නිසා බොහෝ වෙලාවට සිදු වුණේ මැද පෙරදිග මූලික කරගෙන මේ රටේ කාන්තාව රට යවන එකයි; එහෙම තමයි ප්‍රධාන වශයෙන් කටයුතු වුණේ. ඇත්තටම ගරු සභාපතිතුමනි, ඒ ආණ්ඩුව එදා යම් වැඩ පිළිවෙළක් සහිතව මේ රටේ පුහුණු ශ්‍රමිකයන් විදේශගත කරන්න කටයුතු කළා නොවෙයි. ඒකට හේතුව බවට පත් වුණේ බොහෝ වෙලාවට මේ රටේ ගම්වල තිබුණු දරිද්‍රතාව. ඒ දරිද්‍රතාව මත ඒ ජීවිතය ඇතුළේ මොනවාද කරන්නේ කියලා හිතා ගන්න බැරි තත්ත්වයකට ඔවුන් පත් වෙලා හිටියේ. ඒ නව ලිබරල් ආර්ථිකය හඳුන්වා දීමත් එක්ක මුදල් ප්‍රසාරණ තත්ත්වයක් ඇති වෙලා යම් පිරිසක් ඒකේ ප්‍රතිලාභ භුක්ති විඳින්න ගත්තා.

යම් කොටසකගේ දියුණුවක් දැක්කා. නමුත්, එදා ගම්වල හිටපු, ග්‍රාමීය දරිද්‍රතාවෙන් පෙළුණු ජනතාවට ඒක උත්තරයක් බවට පත් වුණේ නැහැ. නමුත් ඒ අය විශ්වාස කළා දැන් ආර්ථිකය විවෘත කරලා තිබෙනවා, ඕනෑම කෙනෙකුට විදෙස්ගත වෙලා රක්ෂාවක් සොයා ගන්න ක්‍රමයක් ආණ්ඩුව හදලා දීලා තිබෙනවා, ඒ නිසා දැන් පිටරට යන්න පුළුවන් කියලා. ඇත්තටම බැලුවාම, වෘත්තීමය වශයෙන් වඩු බාසුන්නැහේලා හිටියා නම්, මේසන් බාසුන්නැහේලා හිටියා නම් අන්න ඒ අයට මැද පෙරදිග රටවලට ගිහිල්ලා රස්සාවක් කර ගන්න ඉඩ කඩ තිබුණා. නමුත්, එහෙම වෘත්තීය පුහුණුවක් නැති අයට යම් වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ නිසා, මැද පෙරදිග රටවල ගෘහ සේවය සඳහා කාන්තාවන් අරගෙන යන්න පටන් ගත්තා. ඒ අනුව ගම්වල කොස් තම්බ තම්බ හිටපු, බත් තම්බ තම්බ හිටපු අපේ අම්මලා තමයි විදෙස්ගත කළේ. මම ඒ අයට අගෞරව කරන්න මෙහෙම කියනවා නොවෙයි. ඒ අය තමයි පිටරට යැව්වේ. ඒ අය ගියාට පස්සේ තමයි අර්බුදය ආවේ. ඒ අය විදෙස්ගත වුණාට පස්සේ, ඒ රටවල ගෙවල්වල ලොකු ප්‍රශ්නවලට මුහුණ දීලා, සමහර වෙලාවට ඇත්තටම ජීවිතයත් නැති වෙලා තමයි ඒ ගොල්ලන්ට නැවත එන්න සිද්ධ වුණේ. සමහර අයගේ අත පය කපලා, ඒ තත්ත්වයට පත් වෙලා තමයි එන්න වුණේ.

ගරු සභාපතිතුමනි, එතැනින් තමයි මේ බෙදවාචකය පටන් ගන්නේ. ඒ කාන්තාව විදෙස්ගත වීමත් එක්ක පවුල අර්බුදයට යනවා. ඒ වාගේම, ඒ ආර්ථික ක්‍රමය ඇතුළේ රටත් අර්බුදයට යනවා. මේ පවුල හා රට කියන දෙකම එකයි. ගරු සභාපතිතුමනි, පෞද්ගලික කුටුම්බ ජීවිතයක් ගත කරපු ඒ පවුලේ බිරිඳ එකපාරටම රට යන්න ගත්තා. ඊට පස්සේ සැමියාට මොකද වුණේ? එයාට අර ගම්වල තිබෙන කිතුල් රා ගහ යට නතර වෙන්න සිද්ධ වුණා. අන්න ඒ සිද්ධීත් එක්ක, මහාචාර්ය සුනිල් ආරියරත්න මහත්මයා ඒ අය ගැන ලිව්වා, අමු සින්දුවක්. ඒ සින්දුව හරි අමුයි. ඒ සින්දුව අමුවෙන් ලියන්න සිද්ධ වුණේ, ඒ අයට තේරෙන භාෂාවෙන් ලියන්න ඕනෑ වුණු නිසා. ඒ නිසා මහාචාර්ය සුනිල් ආරියරත්න මහත්මයා සෞන්දර්යය දැම්මා, පැත්තකට. සෞන්දර්යය පැත්තකට දාලා, "මත්පැනින් අයින් වෙන්න පියාණෙනි" කියලා ලියන්නේ නැතුව, "බුදු තාත්තේ බොන්න එපා" කියලා ලිව්වා. ඒ ගීතය ගායනා කළා නන්දා මාලනී මහත්මිය. එතුමිය "බුදු තාත්තේ බොන්න එපා" කියන ගීතය ගායනා කළා. මොකද, ඒ අමු සින්දුව ඒ වෙලාවේ ඕනෑ වුණා.

අපි විශ්වාස කරනවා, ඒ අමු සිංදුව ඒ පවුල්වල අයට වැදුණා කියලා. මොකක්ද මේ කියන්නේ? මොකක්ද මේ කථාව? ඇත්තටම ඒකෙන් කියන්නේ මොකක්ද කියලා ඒ අයට වැටහුණා. ගෙවල්වල හිටපු අර පුංචි ගැහැනු දරුවන්ට, පිරිමි දරුවන්ට තමන්ගේ අම්මා නැහැ; අම්මා ගෙදර නැහැ; අම්මා රට ගිහිල්ලා. ඒ වාගේම තාත්තා බීබී ඇවිදිනවා. මෙන්න මෙවැනි බෙදවාචකයක් තමයි එදා නිර්මාණය වුණේ. එතකොට, ඒ ආර්ථික ක්‍රමය ඇතුළේ එම බෙදවාචකය තවදුරටත් වැඩිදියුණු කළා. ඒ කොහොමද? අන්න එතකොට තමයි රටට විවිධ මන්ද්‍රව්‍ය ආවේ. ඒවා රට ඇතුළට එන්න ගත්තා. එතකොට ඒ මන්ද්‍රව්‍ය පාවිච්චි කරන්න customer කෙනෙක් ඉන්නවා. ඒ කවුද? අර තාත්තාගේ පුතා. තාත්තා බොන්න ගත්තා, පුතා මත්ද්‍රව්‍යට ඇබ්බැහි වෙන්න ගත්තා. ගරු සභාපතිතුමනි, ඇත්තටම දැන් සින්දුවක් ලියනවා නම් ලියන්න වෙන්නේ, "බුදු පුතේ අයිස් එපා" කියලායි. මේ තමයි වර්ධනය වෙච්ච තැන. "බුදු පුතේ අයිස් එපා; බුදු දුවේ... එපා" මම ඒ වචනය කියන්නේ නැහැ, එතැනට තිත් පේළියක් දානවා. ඔන්න ඔතැනට තමයි මේ බෙදවාචකය නිර්මාණය වුණේ. ඒ නිසා අපට සිද්ධ වෙනවා මේ අමාත්‍යාංශය යටතේ මේක නිවැරදි කරන්න; හොඳ තත්ත්වයක් හදන්න.

ගරු සභාපතිතුමනි, අපේ රටෙන් විදෙස්ගත ශ්‍රමිකයන් හැටියට යවන්න පුළුවන් පුහුණු ශ්‍රමිකයන් අපි නිර්මාණය කර ගන්න ඕනෑ. ඒකට ඇත්තටම මේ කොටස් දෙක සම්බන්ධ වෙනවා; විශේෂයෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශය සහ විදේශ රැකියා කොටස. ඒ වාගේම ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වාගේ ආයතනත් මේකට සම්බන්ධ කර ගන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සහ අනෙකුත් විෂයන්වලට ඇතුළත් වුණු බොහෝ ආයතන මේකට එකතු කර ගන්න වෙනවා.

ගරු සභාපතිතුමනි, එක කාලයක අපි පිලිපීනයට ගියා. ඒ වෙලාවේ මම පළාත් සභාවේ හිටියේ. එහි ගිණුම් කාරක සභාව නියෝජනය කරමින් තමයි අපි ඒ රටට ගියේ. ඒ වෙලාවේ පිලිපීනයේ මුදල් අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් අපි ඇහුවා,

"ඔයගොල්ලන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග කුමක්ද?" කියලා. ඒගොල්ලන් කිව්වා, "අපි කරන වැඩේ තමයි nursesලා පිටරට යවන එක" කියලා. අපිත් හිතුවා, එහෙම නම් ඇත්තටම nursesලා hospitalsවලට යවනවා වෙන්න ඇති කියලා. නැහැ. ඒගොල්ලන් nursesලා විධියට ඒ අවශ්‍ය පුහුණුව දීලා අර ගෘහ සේවයටම තමයි යවන්නේ, ගරු සභාපතිතුමනි. එතකොට අපේ කෙනෙක්, අපේ කාන්තාවක් ඒ ගෙදර සේවයේ ඉන්නවා. ඒ වාගේම පිලිපීනයේ කාන්තාවකුත් ඒ ගෙදර සේවයේ ඉන්නවා. නමුත් පිලිපීනයේ කාන්තාවට වැටුප වැඩියි. ඇයි? මොකද, එයා nurse. අපි යවලා තිබෙන්නේ නුපුහුණු ශ්‍රමිකයෙක්. නමුත් දෙන්නාම එකම වැඩේ කරන්නේ. ගරු සභාපතිතුමනි, අන්න ඒක තමයි වෙනස.

පිලිපීනයට ඒ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ දෙවන ලෝක යුද්ධයෙන් පසුව බව අපි දන්නවා. විශේෂයෙන්ම යුද්ධයට සම්බන්ධ වෙච්ච නිසා පිලිපීනයේ පිරිමි අය අඩු වුණා. ගරු සභාපතිතුමනි, පිලිපීනය වාගේ රටක කාන්තාවන් හතර දෙනෙකුට එක පිරිමියායි ඉන්නේ. ඒ නිසා කාන්තාව මත, ඒ හරහා තමයි සම්පූර්ණයෙන්ම ඒගොල්ලන්ගේ ආර්ථිකය රඳා පවතින්නේ. මොකද, ගැහැනු පිරිමි භේදය කෘත්‍රිමව වෙනස් කරන්න බැහැ නේ, උපදින තත්ත්වයත් එක්ක.

ගරු සභාපතිතුමනි, ඉතින් අපට තවමත් බැරි වෙලා තිබෙනවා, ඒ සේවාව විධිමත් කරන්න. අපි දැන් ඒක කරන්න ඕනෑ කියා මම විශ්වාස කරනවා. ඒ සඳහා බොහෝ දේවල් මේ අය වැය ඇතුළේ අන්තර්ගත වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අපේ අමාත්‍යතුමාට මම උදාහරණයක් කියන්නම්. විදෙස්ගත වෙලා සයිප්‍රස් රටේ සිටින අපේ කාන්තාවන්ට ලොකු අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, සයිප්‍රස් රටේ සේවය කරපු, අවුරුදු 60 ඉක්මවපු සමහර අය දැන් මැරිලා ගිහිල්ලා. හැබැයි, ඒ මිනිස්සුන්ට ගන්න සමාජ ආරක්ෂණ අරමුදලක් කියලා එකක් තිබෙනවා, සයිප්‍රස් රටේ. කලින් සයිප්‍රස්වලට ගියේ අවුරුදු 4කට. අවුරුදු 4ට තමයි ඒගොල්ලන් වීසා දුන්නේ. දැන් ඊට වැඩි කාලයකට වීසා දෙනවා. සයිප්‍රස්වල සේවය කරන අපේ කාන්තාවක් වෙන්න පුළුවන්, පිරිමි කෙනෙක් වෙන්න පුළුවන්, එයා සමාජ ආරක්ෂණ අරමුදලට සම්බන්ධ වෙලායි තිබෙන්නේ. ඒ රටේදී තමන්ට ලැබෙන වැටුපෙන් සියයට 7.5ක් මාසිකව ඒකට කපනවා, ගරු සභාපතිතුමනි. එහෙම වැටුපෙන් සියයට ගණනක් කපලා ඒක දාන්නේ සමාජ ආරක්ෂණ අරමුදලට. ඒ වාගේම තමයි, එහේ සිටින හාම්පුතාගෙනුත් සියයට 7.5ක් ඒකට ගන්නවා.

හාම්පුතාගෙන් සියයට 7.5ක් අරගෙන ඒකත් සමාජ ආරක්ෂණ අරමුදලට දමනවා. එතකොට විදේශගත වෙලා සිටි අපේ ශ්‍රමිකයින්ට ලැබෙන්න ඕනෑ සියයට 15ක් සමාජ ආරක්ෂණ අරමුදලේ තිබෙනවා. මේක ගැන පසුගිය කාලයේ අපේ රටේ හිටපු විදේශ ඇමතිවරු, විදේශ රැකියා සම්බන්ධ අමාත්‍යවරු එක්ක කථා කළා. මම නියෝජනය කරන "එතෙර අපි" සංවිධානයෙන් වැඩ පිළිවෙළක් හදලා ඔය මුදල් ටික ගන්න පුළුවන් ක්‍රමය පිළිබඳ දැනුවත් වෙලා, අපි ලබා ගත්ත තොරතුරු ටික විදේශ කටයුතු සම්බන්ධව සිටින ඇමතිවරුන්ට ලබා දුන්නා, ගරු සභාපතිතුමනි. ඇත්තටම කියන්න කනගාටුයි, අපේ රටේ මෙතෙක් හිටපු මාරපනලා වෙන්න පුළුවන්, ගුණවර්ධනලා වෙන්න පුළුවන්, අතුකෝරලලා වෙන්න පුළුවන්, පෙරේරලා වෙන්න පුළුවන් රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් ෆේල්. ඒ නිසා ඇත්තටම අපේ විජිත හේරත් ඇමතිවරයාට ලොකු අභියෝගයක් තිබෙනවා. අපි දැන් හෝ ඒ මුදල් ටික ගන්න ඕනෑ. ඇත්තටම ගත්තොත්, මෙතැන විශාල මුදලක් තිබෙනවා. මේ, අපේ රටට ලැබෙන්න තිබෙන විදේශ විනිමය, ගරු සභාපතිතුමනි. මම විශ්වාස කරන විධියට මේකට එක හේතුවක් බවට පත් වෙලා තිබෙනවා, අපට තානාපති කාර්යාලයක් සයිප්‍රස්වල නොතිබීම. මම අපේ අමාත්‍යවරයාට විශේෂයෙන් කියනවා, මේ සම්බන්ධයෙන් ඉක්මනින් කටයුතු කරලා ඒ මුදල් ටික අපේ රටට ගෙන්වා ගන්න කියලා. ඇත්තටම මේකෙදි සිද්ධ වෙලා තිබෙන්නේ ලොකු අසාධාරණයක්.

පසුගිය කාලයේ මේ රටේ හිටපු අගමැතිවරයෙක් සයිප්‍රස්වලට ගියා. ඔන්න, අපේ හිටපු අගමැතිවරුන්ගේ තත්ත්වය. එතුමා සයිප්‍රස්වලට ගිහින් ඒ ආණ්ඩුවට කිව්වා, "මෙච්චර වැටුපක් දෙන්නේ ඇයි, මේ වැටුප දෙන්නෙකුට දෙන්න පුළුවන් නේ" කියලා. අන්තිමේ සයිප්‍රස්වල හිටපු සේවකයින් ඒ අගමැතිවරයාට බිත්තරවලින් ගැහුවා, ගරු සභාපතිතුමනි. කුණු බිත්තරවලින් ගැහුවා, ඒ අගමැතිවරයාට. ඒ කියන්නේ සයිප්‍රස් වාගේ රටක සිටින අපේ ශ්‍රමිකයින් විඳින දුක අපේ පාලකයින්ට තේරුම් ගන්න බැහැ, ගරු සභාපතිතුමනි. ඔවුන් උෂ්ණ කාලයේදී දැඩි ලෙස පීඩාවට පත් වෙනවා. සීත කාලයේදීත් එහෙමයි. සීත කාලයට වැඩ කරද්දී අත් පැලෙනවා, ගරු සභාපතිතුමනි. අත් පුපුරනවා, අල්ල පුපුරනවා. පුදුම දුකක් ඔවුන් විඳින්නේ. ඔවුන් එහෙම දුක් විඳලායි මේ රටට මුදල් එවන්නේ. මේ රටේ ආර්ථිකයට මුදල් එවන්නේ, ගරු සභාපතිතුමනි. නමුත් ඒ රටට ගිය අපේ ඒ අගමැතිවරයා කිව්වේ, ඒ මිනිසුන්ට ගෙවන පඩිය වැඩියි කියලායි. එහෙම වුණාම ඇත්තටම කුණු බිත්තරවලින් ගහන්න වෙනවා. අන්න එහෙම ත්ත්වයක් තිබුණේ.

ඒ නිසා මේ අමාත්‍යාංශයට නිවැරදි කරන්න ගොඩක් දේවල් තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඒවා නිවැරදි කරලා මේ රටේ ආර්ථිකයට -අපට- ලැබිය යුතු විදේශ විනිමය ටික ලංකාවට ගෙන්වා ගැනීම සඳහා අපට ලොකු කාර්යභාරයක් කරන්න තිබෙනවා. අපේ ආණ්ඩුව යටතේ මේ අමාත්‍යාංශයේ ඇමතිවරයාටත්, නියෝජ්‍ය ඇමතිවරයාටත් - තරුණ නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නේ - ඒ කාර්යභාරය කිරීමට හැකියාව ඇතැයි කියා මම විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Minister?

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු සභාපතිතුමනි, සයිප්‍රස්වල තානාපති කාර්යාලය විවෘත කරන්න අවශ්‍ය මූලික කටයුතු දැනටමත් කරලා තිබෙනවා. මුදල් වෙන් කිරීම් කරලා තිබෙනවා. තව සතියක්, දෙකක්, තුනක් ඇතුළත සයිප්‍රස්වල තානාපති කාර්යාලය විවෘත කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Namal Rajapaksa. You have 15 minutes.

[පූ.භා. 10.54]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, අද දවසේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි කථා කරන්නේ. අපේ රටේ වාගේම ලෝකයේ ඕනෑම රටක පැවැත්ම සහ ඒකීයත්වය පිළිබඳව සලකා බලන විට විදේශ කටයුතු අමාත්‍යාංශය සහ විදේශ ප්‍රතිපත්තිය තමයි ඒ රටේ ආරක්ෂාව සහ ආර්ථික ප්‍රතිපත්තියත් එක්ක බැඳී පවතින්නේ. නමුත් අවාසනාවකට, අපේ රටේ ඉතිහාසයේ ඉඳන් බැලුවාම, බොහෝ අවස්ථාවල විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඒ හා බැඳුණු කාරණා පිළිබඳව රජයේ සහ දේශපාලන භූමිකාව තුළ අඩු අවධානයක් තමයි යොමු වෙලා තිබෙන්නේ. විශේෂයෙන් යුද සමයෙන් පසුව පත්වුණු බොහෝ ආණ්ඩුවල විදේශ ප්‍රතිපත්තිය කියන කාරණය හුදෙකලා විෂයයක් විධියට තමයි දැක්කේ. හැබැයි, රටේ විදේශ ප්‍රතිපත්තිය මත තමයි රටේ ආර්ථික ප්‍රතිපත්තිය රඳා පවතින්නේ. ඒ වාගේම වර්තමානයේ රටේ ජාතික ආරක්ෂාව රඳා පවතින්නෙත් තමන්ගේ විදේශ ප්‍රතිපත්තිය තුළ තමන් අසල්වාසින් සහ අනෙකුත් රටවල් එක්ක ගනුදෙනු කරන්නේ කොහොමද කියන කාරණය මතයි. ගරු සභාපතිතුමනි, අපේ රටේ ඉතිහාසයේ අසීරු අවස්ථාවල අපි නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළා; මිත්‍රශීලි ප්‍රතිපත්තියක් අනුගමනය කළා.

ඒ හින්දා අපි ත්‍රස්තවාදීන් එක්ක සටන් කරනකොටත්, පසු කාලීනව සුනාමිය අවස්ථාවේදීත්, කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළත්, ඒ වාගේම මෑත කාලයේ වූ ආර්ථික අර්බුදයේදීත්, අරගළය සමඟ ගොඩ නැඟුණු ආර්ථික අවපාතය අවස්ථාවේදීත් කියන අපි මුහුණ දීපු සෑම අභියෝගයකදීම අපිත් එක්ක මිත්‍රශීලීව කටයුතු කළ බොහෝ රටවල් ආර්ථික හා සමාජයීය වශයෙන් අපේ රට ස්ථාවර කරන්න එදා උදව් කළා. ඒක මේ අවස්ථාවේ විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. පසුගිය කාලයේ ඉන්දියාව ඩොලර් බිලියන 4ක් අපට ලබා දුන්නා, ඒ වාගේම චීනය ඩොලර් බිලියන 2ක credit line එකක් අපට ලබා දුන්නා, කොවිඩ්-19 වසංගතය වෙලාවේ vaccines ටික දුන්නා. ඒ අනුව හැම තිස්සේම නොබැඳි විදේශ ප්‍රතිපත්තිය සහ මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තිය ඇතුළේ කටයුතු කරපු රාජ්‍යයක්, අපි.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අද ඔබතුමන්ලා ඉතාම ආඩම්බරයෙන්, සතුටෙන් කථා කරනවා, විදේශ ආයෝජන සම්බන්ධයෙන්. අද විවිධ රටවල අග්‍රාමාත්‍යවරුන් ලංකාවට ඇවිල්ලා විවිධ ව්‍යාපෘතිවලට මුල් ගල් තියනවා කියලා ඔබතුමන්ලා ආඩම්බරයෙන් සහ සතුටෙන් කථා කිරීම පිළිබඳව මම එක පැත්තකින් සතුටු වෙනවා. හැබැයි ඔබතුමන්ලා ඔය මතවාදයම මීට අවුරුදු 10කට, 15කට කලින් අනුගමනය කළා නම්, ඔය ආයෝජන අපේ රටට එන්නේ මීට අවුරුදු 20කට විතර කලින්. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාට මතක ඇති, දේශපාලන බලවේගයක් විධියට ඔබතුමන්ලා නිරන්තරයෙන් ඉන්දියානු විරෝධී බලවේගයක් විධියට කටයුතු කළ ආකාරය. ඒ වාගේම ඔබතුමන්ලා විදේශ ආයෝජන දිහා වපර ඇහැකින් බලපු දේශපාලන පක්ෂයක්. හැබැයි, අද ඔබතුමන්ලා රාජ්‍ය බලයට ඇවිල්ලා තිබෙනවා. බලයට එන්න පෙර සහ ඒ එන ගමන තුළ ඔබතුමන්ලා පක්ෂයක් විධියට විදේශ ආයෝජන දිහා බලපු විධිය සහ දැන් ආණ්ඩුවක් විධියට ඒ ආයෝජන දිහා බලන විධිය වෙනස් වෙලා තිබෙනවා. මීට අවුරුදු 20කට කලින් ඔය ප්‍රතිපත්තිය ඔබතුමන්ලා අනුගමනය කළා නම් ඔය සාම්පූර් බලාගාරය ඇතුළු ඔබතුමන්ලා අද යෝජනා කරන බොහෝ සංවර්ධන යෝජනා ක්‍රම මේ වෙනකොට යථාර්ථයක් බවට පත් වෙලා පමණක් නොවෙයි, ඒවායේ ප්‍රතිලාභ පවා මේ රටේ දරුවන්ට, දෙමව්පියන්ට, ඊළඟ පරම්පරාවට ලැබෙන තැනට පරිවර්තනය වෙන්න තිබුණා. හැබැයි, අවාසනාවකට ඔබතුමන්ලාගේ දේශපාලන ප්‍රතිපත්තිය තුළ එදා මේ විදේශ ආයෝජන දැක්කේ වපර ඇහෙන්. නමුත්, අද ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා කියලා අපට පේනවා. ඒ ගැන මම සතුටු වෙනවා, සුබ පතනවා, ආශීර්වාද කරනවා.

ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ඔබතුමන්ලා මේ රටට අහිතකර ගිවිසුම්වලට එකඟ නොවේවි කියලා. මොකද, පසුගිය කාලයේ හම්බන්තොට වරාය විදේශ සමාගමකට විකුණන්න හදනකොට අපි ඒකට විරුද්ධ වුණා, ඒ ගිවිසුමේ සඳහන් සමහර කොන්දේසි නිවැරදි නොවන නිසා. ඒ හින්දා ඔබතුමන්ලා යම් ව්‍යාපෘතියකට ගිවිසුම්ගත වෙනකොට, ඒ ගිවිසුම් අපේ රටට ගැළපෙන ආකාරයට සකස් කළ යුතුයි කියා මම හිතනවා.

අද ගෝලීය දේශපාලනය වෙනස් වෙමින් පවතිනවා. විශේෂයෙන්ම ඇමෙරිකානු ජනාධිපතිවරණයේ ප්‍රතිඵලයත් එක්ක අද ගෝලීය දේශපාලනයේ යම් වෙනසක් සිද්ධ වෙමින් පවතිනවා. ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපතිවරයා බවට පත් වෙන කාල සීමාව තුළ සහ ඔබතුමන්ලා 159දෙනෙක් පාර්ලිමේන්තුවට පත් වෙන කාල සීමාව තුළ තිබුණු ගෝලීය දේශපාලනයට වඩා හාත්පසින් වෙනස් ප්‍රතිපත්ති මාලාවක් සහ වෙනස්වීම් රාශියක් අපේ කලාපය තුළ වාගේම ගෝලීය දේශපාලනය තුළ වර්තමානයේ සිද්ධ වෙනවා. මම විශ්වාස කරනවා, ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට ඒ පිළිබඳව අවධානය යොමු කර ඇති කියලා. ඒ වාගේම ඔබතුමන්ලා ඒකට අනුකූල වෙමින්, අනුගත වෙමින් සිටිනවා කියලාත් මම විශ්වාස කරනවා. මොකද, එක පැත්තකින් tariff war එක තිබෙනවා. අපේ විපක්ෂ නායකතුමාත් ඒ ගැන සඳහන් කළා, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමනි. ලෝකයේ නොයෙක් රටවලට නොයෙක් ආකාරයේ වෙනස්වීම් tariff එකත් එක්ක trade and commerce පැත්තෙන් සිදු වෙනවා. ඒ හින්දා අපේ රට ඒකට අනුගත විය යුතු ආකාරය පිළිබඳව ඔබතුමන්ලා හොඳටම අධ්‍යයනය කළ යුතුයි. අපේ අනන්‍යතාව සහ ඒකීයත්වය ආරක්ෂා කර ගනිමින් ගනුදෙනු කිරීම තුළ අපේ ව්‍යාපාරිකයන්ට, ව්‍යවසායකයන්ට සහ මේ රටේ මහ ජනතාවට උපරිම සාධාරණයක් කර ගන්න පුළුවන් වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය අවධානය යොමු කළ යුතුයි. මෙහිදී අපි දකින දේ තමයි, බොහෝ වෙලාවට ඒක මුදල් අමාත්‍යාංශය පැත්තට හෝ මහ බැංකුව පැත්තට බැර වෙන බව. ගරු අමාත්‍යතුමනි, මම විශ්වාස කරනවා, විදේශ කටයුතු අමාත්‍යාංශයට මේ සම්බන්ධයෙන් විශාල වගකීමක් තිබෙනවා කියලා. ඒ හින්දා මේ කාරණයේදී මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව එක්ක ඔබතුමා සෘජුවම මැදිහත් විය යුතුයි, ගරු ඇමතිතුමනි. ඒ වාගේම ලෝකයේ යන tariff war එක අතර වැඩි ප්‍රතිලාභයක් - transshipmentවලින් වෙන්න පුළුවන්, tradeවලින් වෙන්න පුළුවන් - ලබා ගන්න පුළුවන් ක්‍රමවේදයකට අනුගත වෙන්නේ කොහොමද කියලාත් අපි බලන්න ඕනෑ.

අද කොළඹ වරාය නගරය බිහි කරලා තිබෙනවා. එදා ඔබතුමන්ලා කිව්වා, සීගිරි ගල කඩලාවත් මේක හදා ගන්න බැරි වෙයි කියලා. හැබැයි, සීගිරිය කඩන්නේ නැතිව වරාය නගරය හැදුවා. යහ පාලන ආණ්ඩුව කාලයේ ඔබතුමන්ලා පරීක්ෂණ කරන්න කියලා මෙහි වැඩ නැවැත්වූවා, ඊට පසුව ආයෙත් පටන් ගත්තා. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමනි, කෙසේ වෙතත් අද ඔබතුමන්ලාට අවස්ථාවක් ලැබී තිබෙනවා. මම දැක්කා, ඔබතුමා පසුගිය කාලයේ Port City එකේ මුල් ගලක් තියනවා, Marina එක හදන්න. ඒක බොහොම හොඳයි.

ඔබතුමන්ලාගේ ඒ ප්‍රතිපත්ති අද වෙනස් වෙමින් පවතින එක ගැන අපි සතුටු වෙනවා. හැබැයි, ඒක transactionsවලට හදපු

තැනක්; ඒක ගනුදෙනුකරණයට ගොඩනඟපු තැනක්. ඒ පිළිබඳව වපර ඇහෙන් බලන්නේ නැතුව විවෘත මනසකින් බලා කටයුතු කරන්න. ලෝකයේ වෙනත් රටවල තිබෙන මේ වාගේ මූල්‍ය නගර එක්ක ගැටෙන්න පුළුවන් මට්ටමට අපිත් ගොඩනැඟෙන්න ඕනෑ. කොහොම වුණත්, ගනුදෙනුකරණය තුළ අපි ගනුදෙනුකරුවන්ට හොඳම offer එක දෙන්නේ කොහොමද කියන තැනට එම නගරය පරිවර්තනය කිරීමේ වගකීම ඔබතුමන්ලාට තිබෙනවා. Global tariff war එක නිසා කොළඹ වරාය නගරයට සහ අපේ රටට සුවිශේෂී අවකාශයක් ලැබී තිබෙනවා, transaction hub එකක් වෙන්න. Transshipment විතරක් නොවෙයි, transactionsවලත් - ගනුදෙනුකරණයේත් - කේන්ද්‍රස්ථානයක් බවට මෙය පත් කර ගන්න පුළුවන්.

අපේ රට දියුණු කළ හැකි තවත් පැත්තක් තමයි, සංචාරක කර්මාන්තය. අද වන විට සංචාරක ව්‍යාපාරයේ යම් ප්‍රබෝධයක් ඇති වී තිබෙනවා. රුපියල්වලින් අපි ආදායම් උත්පාදනය කරලා පෙන්නුවත්, dollar-wise අපි තවම 2018ට පෙර පැවති ගණනට ගිහිල්ලාද, නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ පිළිබඳව තමයි ගරු ඡාණක්කියන් මන්ත්‍රීතුමාත් සඳහන් කෙරුවේ. ගරු සභාපතිතුමනි, අපි ඉදිරි කාල සීමාව තුළ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන්න ඕනෑ නම්, අනිවාර්යයෙන්ම අපේ airports expand කරන්න ඕනෑ. යහ පාලන ආණ්ඩුව කාලයේදී ඔබතුමන්ලාත් සම්බන්ධ වෙලා කටුනායක ගුවන් තොටුපොළේ දෙවන අදියර සම්බන්ධයෙන් යම් වංචාවක් සිදුව තිබෙනවා කියලා ඒක හොයන්න ගියා; හෙව්වා. ඒ සඳහා කොමිසමකුත් පත් කළා, රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ කාලයේත්. ඒ චෝදනාවලින් නිදහස් වෙලා අවුරුදු 10ක්, 12ක් පරක්කු වෙලා හරි හෙමින් හෙමින් ඒ කටයුතු දැන් සිදු වෙනවා. මම හිතනවා, අපේ රට අඩුම ගණනේ passengersලා මිලියන 80කට, 100කට සේවා සපයන තැනක් බවට පරිවර්තනය විය යුතුයි කියලා. සංචාරක ව්‍යාපාරය පහසුවෙන් ප්‍රවර්ධනය කරන්න පුළුවන් වන්නේ තමන්ගේ රටේ සපයන airport servicesවලින්. Passengersලා ප්‍රමාණයෙන් සියයට 16ක්, 20ක් තමයි සංචාරකයින් විධියට රටක් ඇතුළට එන්නේ. ගරු සභාපතිතුමනි, ඩුබායි, සිංගප්පූරුව, මලයාසියාව වාගේ හැම රටකම ඒ ආකාරයට තමයි එය ගණනය කරන්නේ. මිලියන 10කට වැඩි සංචාරකයින් පිරිසක් ගෙන්වා ගත හැකි ආකාරයට අපේ සංචාරක ව්‍යාපාරය පරිවර්තනය වෙන්න ඕනෑ නම් මිලියන 50කට වැඩි passenger service එකක් අපි සපයන්න ඕනෑ. කටුනායක දෙවන අදියර ක්‍රියාත්මක වුණත් අපට යන්න පුළුවන් වන්නේ මිලියන 22ක් වාගේ ප්‍රමාණයකටයි. මත්තල ගුවන් තොටුපොළ සහ යාපනය ගුවන් තොටුපොළ කේන්ද්‍ර කරගෙන අපේ රටට ගැළපෙන model එකකට අනුගත වෙලා, පෞද්ගලික අංශයත් එකතු කරගෙන ඒවා දියුණු කරන්න ඕනෑ. අඩුම ගණනේ මිලියන 80කට, 100කට සේවා සපයන මධ්‍යස්ථානයක් බවට අපේ රටේ ගුවන් තොටුපොළවල් ඊළඟ අවුරුදු 15 ඇතුළත පරිවර්තනය විය යුතුයි. ඊළඟ අවුරුදු 15දී ඒ market එක tap කරන්න නම් ඊළඟ අවුරුදු 20දී ලෝකයේ ඇතිවන වෙනස්වීම් ගැනත් කල්පනා කරන්න ඕනෑ. විශේෂයෙන් ඉන්දියාවේ expand වන ගුවන් සේවාව ගැනත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. ඊළඟ අවුරුදු පහට අලුත් ගුවන් යානා දාහකට වැඩි සංඛ්‍යාවක් Indian market එකට එනවා.

මැද පෙරදිග ගත්තොත්, මැද පෙරදිගට පැමිණෙන සංචාරකයින්ගෙන් සියයට 10ක් වාගේ ප්‍රමාණයක් ඉන්දියානු සංචාරකයින්. මැද පෙරදිගින් ඉන්දියාවට යන ගුවන් යානා ප්‍රමාණයට ඉදිරියේදී යම් අභියෝගයක් එල්ල වෙනවා. මොකද, ඉන්දියානු ගුවන් සේවා ව්‍යාප්ත වීමත් එක්ක, අලුතින් ගුවන් යානා Indian market එකට පැමිණීමත් එක්ක මැද පෙරදිගට සෘජුවම ඒ ගුවන් ගමන් ක්‍රියාත්මක කරවන්න ඔවුන් උත්සාහ කරනවා. ඒ තුළින් අපේ රටට අලුත් අවකාශයක් ලැබෙනවා. ඒ අලුතින් ඇති වන අවකාශයේ ප්‍රතිලාභ ලබන්න අපි සූදානම් වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ සඳහා දැන් ඉඳලාම සූදානම් නොවී, ඒ සූදානම ඊළඟ අවුරුදු පහ ඉක්මවා කළොත් අපට ඒ chance එක miss වෙනවා. අපි විශ්වාස කරනවා, ඉදිරි අවුරුදු පහ ඇතුළත අඩුම ගණනේ ඒ road map එක ඇතුළේ අපට මිලියන 100කට යන්න බැරි වුණත්, අවම වශයෙන් මගීන් - passengersලා - මිලියන 50ක් දක්වා යන්නට අපේ ගුවන් සේවා සැපයීම පරිවර්තනය කෙරුවොත්, අපට ඊළඟ අවුරුදු පහ ඇතුළත මිලියන පහක, හයක සංචාරක ව්‍යාපාරයකට ලේසියෙන්ම පරිවර්තනය කරන්න පුළුවන් කියා.

පසුගිය කාල සීමාව තුළ විදේශ රැකියාවලින් විශාල මුදල් ප්‍රමාණයක් අපේ රටට ලැබුණා. ලංකාවට සල්ලි එවන්න ඒ අයට යම් උත්තේජනයක් දෙන්න ඕනෑ. ඒ එවන මුදලටත් බද්දක් වැදෙනවා නම්, ඒ අය එවන ඩොලර්වලටත් බදු වැදෙනවා නම්, ඒ අය නැවත වතාවක් black market එකෙන් මුදල් එවන්න උත්සාහ කරනවා. ඒක නවත්වන්න බැහැ. ඒ, ලෝකයේ හැටි. බැංකුකරණය තුළ රෙගුලාසි වැඩි නම්, බැංකුකරණයේ තිබෙන පහසුකම් අඩු නම්, බැංකුවකින් අහන ප්‍රශ්න ප්‍රමාණය වැඩි නම් නිරායාසයෙන්ම ඒ පුද්ගලයෝ කළු කඩ ක්‍රමයෙන් මුදල් එවන්න උත්සාහ කරනවා. ඒක නවත්වන්න බැහැ. එහෙම නම් අපි කරන්න ඕනෑ, මේ system එක ඇතුළේ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසන එකයි.

මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා පිලිපිනය ගැන කථා කළා. පිලිපිනයේ හිටපු ජනාධිපතිවරයාව human rights violations සම්බන්ධ පරීක්ෂණ කටයුතුවලට ගෙන යන්න උත්සාහ කරනවා. අපේ රටෙත් organized crimes සම්බන්ධයෙන් විශාල ගැටලුවක් තිබෙනවා. ඒ ජනාධිපතිවරයා ඒ කාලයේ ගැටුණේ ඒ රටේ පාතාලය එක්ක, drug mafia එකත් එක්ක.

අද ඔබතුමන්ලාට හැප්පෙන්න තිබෙන්නේත් අපේ රටේ drug mafiaවත් එක්කයි. ඒ හින්දා තමයි මම කිව්වේ, මේ ලෝකයේ වෙනස් වන විදේශ ප්‍රතිපත්තියත් එක්ක අපි අනුගත විය යුතුයි සහ අපේ රටේ ඒකීයත්වය ආරක්ෂා කරන්න කටයුතු කළ යුතුයි කියා. මගේ මිත්‍ර ගරු ඡාණක්කියන් මන්ත්‍රීතුමා සඳහන් කළා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා රාජපක්ෂලා ආරක්ෂා කළා කියලා. එහෙම වුණේ නැහැ. අපට වැඩිපුරම නඩු දැම්මේ රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා සහ තමුන්නාන්සේලා. වර්තමානයේ අමාත්‍යාවරයෙක් වන දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ එවකට හිටපු අධ්‍යක්ෂ ගරු ආනන්ද විජේපාල මැතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා තමයි අපට වැඩිපුරම නඩු දැම්මේ. අපි අධිකරණය ඉදිරියේ ඒවායින් නිදොස්කොට නිදහස් වුණා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි මහ මොළකාරයා. ඒක නැහැයි කියන්න බැහැ. හැබැයි, අපි සතුටු වෙනවා, එතුමා ජාත්‍යන්තර මාධ්‍ය ඉදිරියට ගිහිල්ලා ලංකාව පාවා දුන්නේ නැති එක ගැන. ඉස්සර අපි ඒ චෝදනාව නැඟුවා. හැබැයි, අද එතුමා ජාත්‍යන්තර මාධ්‍ය ඉදිරියට ගිහිල්ලා ලංකාව පාවා දුන්නේ නැහැ. අපි අතර තිබෙන දේශපාලන වෙනස්කම් වෙනම කාරණයක්. දෙදහස් ගණන්වල ඔබතුමන්ලා සහ අපි අතර යාළුකම් තිබුණා. 2005දී අපි එක වේදිකාවේ සිටියා. 2015දී ඔබතුමන්ලායි, රනිල් වික්‍රමසිංහ මහත්මයායි එක වේදිකාවේ සිටියා. දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ එකට කටයුතු කළා. ඔබතුමන්ලා දැන් Batalanda Commission Report එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළත්, එදා Batalanda Commission Report එක හංගාගෙන සිටියා. 2005දී මහින්ද මහත්මයාට උදව් කරනවා කියලා ඔබතුමන්ලා එතුමා එක්කත් ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුමේ සඳහන් කළේ නැහැ, බටලන්ද කොමිෂන් සභා වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. ඔබතුමන්ලා

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කැබිනට් මණ්ඩලයේත් සිටියා. එතකොටත් ඒ කැබිනට් මණ්ඩලය බටලන්ද කොමිෂන් සභා වාර්තාව අනුමත කළේ නැහැ. හැබැයි, විදේශ රටක මාධ්‍යවේදියෙක් ඒ ගැන ඇහුවාම ඒක අද කැබිනට් මණ්ඩලයේදී අනුමත කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කාරණය ගැන වෙනම විවාදයක් යනවා නම්, අපි එදාට ඒ ගැන කථා කරමු. හැබැයි, අපි ආරක්ෂා කළ යුත්තේ රාජ්‍යය. අපේ රාජ්‍යයේ හිටපු නායකයෙක් විදේශ රටකට ගිහිල්ලා අපේ රටේ රණ විරුවන් යුද අපරාධ කළා කියලා ප්‍රසිද්ධියේ පිළිගන්න තැනට පරිවර්තනය වුණොත්, කඩා වැටෙන්නේ මහින්ද රාජපක්ෂවත්, රනිල් වික්‍රමසිංහවත් නොවෙයි, මේ රට.

ඡාණක්කියන් මන්ත්‍රීතුමා එක පැත්තකින් මේ රටේ රණ විරුවන්ට දැඩි චෝදනාවක් නහනවා. රණ විරුවන් යුද අපරාධ කළා විතරක් නොවෙයි, ස්ත්‍රී දූෂණ කළාය කියාත් කිව්වා. යම් සිදුවීමක් සිද්ධවෙලා ඇති, හිටපු army deserter කෙනෙක් එක්ක. හැබැයි, එක පුද්ගලයෙකුගේ ක්‍රියාදාමයක් සමස්ත හමුදාවටම ලඝු කරන්න එපා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, පාතාලය සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඔබතුමා ඒකට මැදිහත් වෙන්න. ඒකට මැදිහත් වෙලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. හැබැයි, ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමේදී අපි ඔබව ආරක්ෂා කරනවා කියන එක අපි වගකීමෙන් කියනවා.

කවුරුන් හෝ නායකයෙක් පාතාලය මර්දනය කරන්න, ත්‍රස්තවාදය මර්දනය කරන්න ක්‍රියාමාර්ගයක් ගන්නවා නම් - අපි විපක්ෂයේ මන්ත්‍රීවරු වෙන්න පුළුවන් - පිලිපිනය කළා වාගේ ඔබතුමන්ලා මානව හිමිකම් උල්ලංඝනය කළා කියලා අධිකරණයකට යවන්න අපි ඉඩ තියන්නේ නැහැ. මොකද, එහෙම වුණොත් අවසානයේ කඩා වැටෙන්නේ රාජ්‍යය. එම නිසා රාජ්‍යය ආරක්ෂා කරන්න අපි මැදිහත් වෙනවාය කියන එකත් මතක් කරමින්, ඡාණක්කියන් මන්ත්‍රීතුමා නහපු චෝදනා කාලෝචිත ඒවා නොවෙයි කියන කාරණයත් මම කියනවා. මොකද, රණ විරුවෝ එදා යුද කළා. යම් සිදුවීමක් වෙලා තිබෙනවා නම් ඒ ගැන පරීක්ෂණයක් කරන එක නොවෙයි දැන් තිබෙන ගැටලුව. හැබැයි, මේක දේශපාලන මාතෘකාවක් කර ගනිමින් වසර ගණනාවකට පස්සේ,- බටලන්ද මාතෘකාව ආවේත් අවුරුදු ගණනාවකට පස්සේ.

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමනි, අපි ජාතීන් අතර ඇති සමගිය ගැන කථා කරනවා. 1988 සිද්ධි 2028දීත් කථා කරනවා නම්, 2009 සිද්ධි 2048දීත් කථා කරන්න අපි ලැහැස්ති වෙනවා නම්, ඒ තුළින් මේ සමාජයේ වෛරය උත්පාදනය වන එක කවදාවත් නතර වෙන්නේ නැහැ. මොකද, මේ රට තුළ වෛරයෙන් තොර දේශපාලනයක් ගොඩනඟන්න කථා කරනවා නම්, "රාජ්‍යය" කියන කාරණයේදී අපි සියලුදෙනාම එක මතයක සිටිය යුතුයි කියලා මම හිතනවා.

ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමනි, මේ විධියට බලනකොට ඔබට මුහුණ දෙන්න තිබෙන්නේ විශාල අභියෝගයකට. ඒ අනුව ඔබ මෙතෙක් කල් විශ්වාස නොකරපු ප්‍රතිපත්තිවලට ඔබේ පක්ෂය ඇතුළේ ඔබට අනුගත වෙන්න සිද්ධ වෙනවා. ඔබේ පක්ෂය මෙතෙක් කල් ආශ්‍රය නොකරපු රටවල් තමුන්නාන්සේලාට ආශ්‍රය කරන්න වෙනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන් global tariff war එකක් ඇතුළේ අපි victim කෙනෙක් වෙන්නේ නැතුව, ඒකේ beneficiary කෙනෙක් වන තැනට මේ රටේ විදේශ ප්‍රතිපත්තිය පරිවර්තනය කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Ananda Wijepala?

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් කිව්වා, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා හැටියට සිටිමින් මම එතුමන්ලාට වැඩියෙන් නඩු දැම්මා කියලා. ඇත්ත වශයෙන්ම දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයට එන පැමිණිලි භාර ගැනීම තමයි අපි සිද්ධ කළේ. පොලිසියේ විමර්ශන කටයුතුවලින් පසු නඩු දැමීමේ කාර්යය සිද්ධ කළේ නීතිපති දෙපාර්තමේන්තුව. එම කාර්යාලයට ලැබුණු පැමිණිලි අනුව තමයි අපි ක්‍රියාත්මක වුණේ. ඔබතුමන්ලාට එරෙහිව වැඩිපුර පැමිණිලි ලැබුණා නම්, ඒ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන්න ඇති. එහෙම නැතුව ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා හෝ එතුමාගේ පවුලේ කිසිවෙකු සම්බන්ධයෙන් අපි විශේෂයෙන් කටයුතු කළේ නැහැ. එම කාර්යාලයට ලැබුණු පැමිණිලි අපි CID එකට, FCID එකට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමු කළා.

ඒ හරහා විමර්ශන කටයුතු සිද්ධ වෙලා, නීතිපති හරහා තමයි අධිකරණ ක්‍රියාමාර්ගයට යන්නේ. ඒ නිසා කවුරුවත් පාදක කරගෙන ඒ කාර්යාලය ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ කාර්යාලයට ලැබුණු පැමිණිලි ඉදිරිපත් කිරීම තමයි සිද්ධ වුණේ.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Namal Rajapaksa, you can have a minute.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
Thank you, Hon. Chairman.

ගරු ඇමතිතුමනි, ඒ පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. හැබැයි, එදා පැමිණිලි බොහොමයක් දාපු අය ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලයේ අද වාඩිවෙලා ඉන්නවා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඒ කාර්යාලයට ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ හිටපු අයත් ඇවිල්ලා පැමිණිලි ඉදිරිපත් කළා. විවිධ පක්ෂවල අය ඇවිල්ලා පැමිණිලි ඉදිරිපත් කළා. දේශපාලන පක්ෂවල අය, සිවිල් ජනතාව, සිවිල් සංවිධාන වැනි විවිධ අය ඇවිල්ලා පැමිණිලි ඉදිරිපත් කළා. ඒකට බාධාවක් තිබුණේ නැහැ. ඒ විධියට තමයි පැමිණිලි ඉදිරිපත් වුණේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Harshana Suriyapperuma. You have 13 minutes.

[12.11 p.m.]

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)
Hon. Chairman, it is a privilege to speak on the Votes of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism and about the approach of the present Government to develop and take this country forward to the next level.

Our approach is based on global connectivity, connecting Sri Lanka to the global value chain. Sri Lanka is no longer in isolation. As a nation, we need to connect our citizens and businesses to the global system. In this process, Sri Lanka has become a signatory to several global conventions. Our objective or intention is to continue with those engagements and to harness more benefits from those arrangements we, as a country, have entered into.

It is important to understand and emphasize the approach the present Government has made with regard to these foreign relationships in order to attract investments to Sri Lanka. Be it local or foreign direct investments, we need a proper framework to safeguard the investors coming into Sri Lanka. That is why the Budget has, for the first time, proposed to implement investment protection Acts. Those Acts would provide certainty to investors to come to Sri Lanka and invest in Sri Lankan businesses, enterprises and new ventures. Also, our aim is to a have zero tolerance approach for corruption when investors come into Sri Lanka.

ගරු සභාපතිතුමනි, මීට මොහොතකට කලින් ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කථා කරද්දි කිව්වා, ඉතිහාසයේදී ආයෝජනවලට විරුද්ධ වුණාය කියලා. ආයෝජනවලට නොවෙයි ගරු මන්ත්‍රීතුමනි, විරුද්ධ වුණේ. විනිවිදභාවයකින් තොරව ව්‍යාපෘති ලබා දෙනවාටයි විරුද්ධ වුණේ. අපි අහලා තිබෙනවා, "Mr. Ten Per centලා", "Mr. Twenty Per centලා" කොමිස් - commission - අරගෙන ව්‍යාපෘති පිළිබඳව එළිපිට සාකච්ඡා කරපු දේවල්. රටට plan එකක් නැතිව ආයෝජන ගෙනෙන එකටයි ගරු මන්ත්‍රීතුමනි, රටක් විධියට පුරවැසියෝ විරුද්ධ වුණේ. ඒ වාගේම, deal මත පදනම් වුණු ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම සම්බන්ධවයි රටක් විධියට විරුද්ධ වුණේ. මේවාට තමයි වර්තමාන ආණ්ඩුව අවශ්‍ය වැඩ පිළිවෙළ සූදානම් කරලා, නිසි ක්‍රමවේදයක් සහිතව, විනිවිදභාවයකින් යුතුව, වගවීමක් සහිතව, national plan එකකට අනුබද්ධව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න, ආයෝජන කැඳවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සූදානම් කරලා තිබෙන්නේ.

Hon. Chairman, that is why about two weeks back, I, along with the Hon. Minister of Industry and Entrepreneurship Development, visited Jaffna. We identified locations and sites where we could invite investors to come and start new ventures, taking part in this journey. In this process, the former Kankesanthurai - KKS - Cement Factory premises, which has been abandoned for several decades, the Paranthan chemical zone which could be developed into an industrial zone and the Mankulam area, which could also be developed into an industrial zone, have been identified. We were accompanied by the Chairman of the Board of Investments as well. We engaged with the politicians from the Northern Province to get their views as to what would be the best approach to develop their areas. So, it is in consultation that we conduct our processes; it is with transparency that we advocate and champion our approach.

In addition to that, let us take our approach on Foreign Policy. As far as the way we conduct business with the international community, prior to the Presidential Election itself, we clearly indicated to the global community that we will not derail from the IMF Programme. Sir, we kept our promise and within the IMF Programme, we negotiated for the best benefits, wherever possible. Then, with regard to debt restructuring, we clearly had a different arrangement, a beneficial arrangement, but two days before the election, an MoU was signed. As a responsible Government, we wanted to give confidence to the international community. We wanted to act in a responsible manner to create stability within the local economy and to attract investors. That is why after a lot of deliberation, a particular path was chosen. Similarly, the Official Creditor Committee's - OCC's - intense discussions are going on as we speak to finalize the debt agreements. As of now, several agreements have been signed. We have been blessed with the support extended by Japan and India as Co-chairs of the OCC to expedite the arrangements we have at present.

In the economic front, there are several types of diplomacies we need to use: economic diplomacy, security diplomacy, particularly considering the location we are in the global framework and the maritime significance that Sri Lanka holds, exchange of intelligence, particularly considering the way the drug menace is spreading across the globe, social, science and technological diplomacy, political diplomacy, cultural diplomacy and people's diplomacy. Hon. Chairman, I will elaborate on people's diplomacy. We need to create a positive image about Sri Lanka among the global community, among global citizens. Through that exercise, we will be able to promote tourism, to bring in more tourists to Sri Lanka. Tourism is not only to earn money,

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

but we want to educate tourists as to how this civilized country existed 2,500 years ago.

Sri Lanka was a nation developed to the extent that we had our own maritime fleet sailing across oceans taking our commodities and goods to other nations, built structures, built judicial systems and hospitals where surgeries were conducted 2,500 years before. The archaeological evidence is a testimony to the existence of those. Our irrigation system was so advanced that across a vast distance, water was allowed to flow along a canal with an inclination of an inch per mile. That is the rich history and culture we had before.

So, we welcome the global citizens and provide them the opportunity to experience the warmth and hospitality that the smiling Sri Lankan people offer along with a wide range of other offerings. As a result of our efforts, Sri Lanka has been identified as a safest place for solo travellers, a destination for families to travel to, one of the best destinations with beaches, sunlight and fresh air to breathe and a clean country. We have also collectively embarked on a journey through the Clean Sri Lanka Programme to engage people in this exercise.

In this process, our relationships with foreign nations have been helpful to strengthen our multilateral relationships and bilateral engagements during the limited time the Government has been in operation. The World Bank has extended further support and funding; the Asian Development Bank has extended further support and funding; Japan has already started reactivating the projects that were stalled before and China has committed US Dollars 3.7 billion of investments to Sri Lanka. With India, we have ongoing discussions to materialize several other investments. So, our relationships through strategic arrangements are to get the best commercial benefits while maintaining our position as a sovereign nation.

We want to focus on our investments, exports and employment creation, particularly on knowledge transfers. Foreign earnings are an important element that has been focused on in the Budget. Foreign remittances are also an important segment. Similarly, Sri Lankan businessmen have invested in businesses overseas, generating us profits. We want to support those engagements and local businessmen to go out of Sri Lanka and invest elsewhere, making use of their knowledge. There are several arrangements in the Budget to facilitate that. We are targeting to increase the earnings from exports from US Dollars 19 billion to US Dollars 40 billion within the next five years. In order to do that, we need to diversify our markets, products and the entrepreneurs engaged in exports. Currently, it is concentrated, Sir. So, we need to engage more districts in the export value addition equation. Through these arrangements, we want to develop our relations with other foreign countries by entering into mutual agreements for trade facilitation. International trade is not a one-way journey; it applies both ways with Sri Lanka exporting to other countries and other countries wanting to export to Sri Lanka as well. That is why the National Single Window is to be created, facilitating and ensuring smoother operations at the Port, the Sri Lanka Customs and for businesses to actively engage in this process.

International relations not only facilitate trade, but we, as a country, want to strengthen the extradition treaties we have. Local criminals are habouring in different nations, conducting criminal activities. So, we need to ensure that our international relations are taken to a level that we would be able to bring those criminals back to Sri Lanka to take them through the due judicial process we have in place.

Promotion of tourism is an important element that the Budget is focusing on with the Votes of the Ministry concerned being discussed today. That is where destination promotion arrangements come in and large sums of money have been allocated to promote identified destinations across the country, making sure that development does not concentrate only on known locations, but that opportunity is given to multiple locations.

At the same time, city branding activities would go on. Particularly in the Colombo City, we have several high-end hotels and high-value-adding hotels. Unfortunately, there are limited activities for city tourism. Therefore, we want to ensure that we provide, with intervention of the Government, enough opportunities and support to promote city-based activities. So, when families from other countries visit Colombo or while they are in transit to other locations, there would be several engagements they could take part in.

There are various other areas that we need to focus on. Focusing on science and technological diplomacy that I mentioned earlier, connecting Sri Lanka to the global value chain in terms of knowledge is also important. We know that as far as climate change is concerned, our initiatives relating to climate-resilient activities and contribution by Sri Lankan scientists to those efforts need to be taken to the next level.

Sir, if we take global challenges, during the energy transformation process, we want to showcase Sri Lanka's leadership in renewable energy so that we do not hurt Mother Earth. On those trends, we want to invite investors to come to Sri Lanka with the level-playing field we would create for investments, the transparency we operate with and the efficiency we provide in delivering the services to the enterprises engaged in that sector. The Budget has allocated several resources for this journey and if I am to highlight a few, one allocation has increased from Rs. 16,000 million in 2023 to Rs. 21,463 million in 2025 and another from Rs. 19,000 million in 2024 to Rs. 21,463 million in the year 2025.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Harshana Suriyapperuma, your time is up.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
Sir, I will take one more minute and finish very quickly.

Several key areas of spending we have focused on are, rehabilitation and improvement of capital assets that we have overseas, acquisition of new capital assets, capital transfers, capacity building of our staff members who are engaged in foreign missions and other capital expenditure purposes and also specific allocations have been made for the tourism sector, the National Oceanic Affairs Committee Secretariat and the Lakshman Kadirgamar Institute for International Relations and Strategic Studies. There are significant improvements on those allocations as well. We are determined not to limit ourselves to allocation of funds, but also to ensure swift implementation of those in order to give the best economic opportunities and benefits to our citizens.

Thank you very much, Sir.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Ruwan Wijeweera. You have eight minutes.

[අ.භා. 12.25]

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු සභාපතිතුමනි, අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී අද දවසේ අපි විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි කථා කරන්නේ. මෙම විවාදයට එක්වීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

රටක විදේශ ප්‍රතිපත්තිය ගැන කථා කරන විට කිව යුතු විශේෂ කරුණක් තිබෙනවා. රටක විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමේදී බලපාන විවිධ සාධක අතර ගෝලීය වශයෙන් ඒ රට උපාය මාර්ගිකව පිහිටා තිබෙන ස්ථානය, ඒ රට සතුව පවතින භෞතික සහ ස්වාභාවික සම්පත්වල ස්වභාවය, සමාජ ආර්ථික වටිනාකම්, ඒ වාගේම මානව සම්පත්වල ස්වභාවය ඉතා වැදගත් භූමිකාවක් නිරූපණය කරනවා.

රටක් වශයෙන් අපේ රටේ ඓතිහාසික පරිණාමයේදී අප දකින ප්‍රධාන කාරණයක් තිබෙනවා. ඉතිහාසයේ ඉඳලාම අපේ රට කලාපීය සහ ගෝලීය වශයෙන් තමන්ගේ අනන්‍යතාව ස්ථාපිත කර ගත්තු, ස්ථාවර කර ගත්තු, සුරක්ෂිත කර ගත්තු රටක් බවට පත්ව තිබුණා. අපේ රටට "සෙරන්ඩිබ්" කිව්වත්, "සීලාන්" කිව්වත්, "සිලෝන්" කිව්වත්, "රත්නදීප" කිව්වත්, ඒ මොන නමකින් අපේ රටට ආමන්ත්‍රණය කළත්, අපේ රටේ විදේශ ප්‍රතිපත්තියත් එක්ක ගෝලීය වශයෙන් අපේ රටට හිමි විය යුතු තැනක් තිබුණා. ඒ තැන අපේ රටට නිශ්චිත වශයෙන් හිමි වෙලා තිබුණා. නමුත්, අපේ රටේ විදේශ ප්‍රතිපත්තිය භාවිත කළ ආකාරය, ඒ විදේශ ප්‍රතිපත්තිය තුළ යම් යම් ප්‍රතිපත්ති නිර්මාණය කළ ආකාරය දිහා බැලුවාම අපට පෙනෙනවා, පසුගිය කාලයේ අපේ රටේ ඉතාම දුර්වල විදේශ ප්‍රතිපත්තියක් පවත්වාගෙන ගිය - maintain කරපු - ආකාරය. ඒ විදේශ ප්‍රතිපත්තිය කොච්චර දුර්වල ද කියනවා නම්, විදේශ සේවාව, විදේශ රැකියා, සංචාරක යන සියලු කාරණා ගත්තාම බරපතළ විධියට දේශපාලනීකරණය වෙච්ච ස්වභාවය, බරපතළ විධියට පවුල්වාදය, තමන්ගේ ගජ මිතුරන්ට වාසි සැපයීම කියන සියල්ල අපි ඒ විදේශ ප්‍රතිපත්තිය තුළ දැක්කා.

මීට සුළු මොහොතකට පෙර මම අන්තර්ජාලයට ගිහින් බැලුවා, browse කළා nepotism and cronyism සඳහා අපේ රටේ දේශපාලනය සම්බන්ධ වෙලා තිබෙන්නේ කොහොමද කියලා. එවිට මෙන්න මේ report එක තිබෙනවා මම දැක්කා. "The Sunday Times" පත්තරේ තිබුණු article එකකින් මම මේ තොරතුරු ලබා ගත්තේ. මේකේ තිබෙන topic එක තමයි ඉතා වැදගත් වන්නේ. “Foreign service or family service?” කියලායි මෙහි අහලා තිබෙන්නේ. That article states, “An unprecedented number of positions in Sri Lanka’s once-respected diplomatic corps has been parcelled out to friends, relatives and loyalists of the ruling party, the Sunday Times has found.” එහි සඳහන් කාරණාව තමයි, අපේ රටේ එක අවස්ථාවක බොහොම ගෞරවයට පාත්‍ර වෙලා තිබුණු විදේශ සේවාව පවුලේ අයට, ඥාතීන්ට, හිතවතුන්ට අයත් විදේශ සේවාවක් බවට පත් වීම. මෙහි දාලා තිබෙනවා ambassador position එකෙන් එහාට ගිය, ambassador position එකේ නොවන වෙනත් විදේශ සේවාවල ඉන්න පිරිසකගේ - 43කගේ - නාම ලේඛනයක්. ඒ නාම ලේඛනයේ සඳහන් නම් කිහිපයක් මම කියන්නම්. DCM, with Ambassador rank, Vienna - Mr. Srimal Wickramasinghe දාලා තිබුණා. මේකේ සම්බන්ධය තමයි, Frist Lady Shiranthi Rajapaksa’s brother. ඊළඟට, Mr. H.N.B. Rathnayake, Second Secretary, Moscow - son of Minister C.B. Rathnayake; Mr. Pradeep Jayawardena, Consul General, Frankfurt - grandson of former President J. R. Jayewardene; Miss. Chamithri Rambukwella, Second Secretary, New York - daughter of Minister Keheliya Rambukwella; ඊළඟට, Mr. Osanda Yapa Abeywardana, First Secretary, Melbourne - son of Lakshman Yapa Abeywardena. ඒ කාලයේ මෙහෙම තමයි nepotism කියන එක use කළේ; මෙහෙම තමයි තමන්ගේ පවුලේ කට්ටිය පත් කරගෙන විදේශ සේවාවේ තිබෙන quality එක නැති කළේ. If they were able to maintain the quality of the Service, it would have been okay. But, unfortunately, they could not meet the expected goals and the standards of the Foreign Service. That is the issue with regarde to these appointments. එවැනි ගෝත්‍රික තැනකට තල්ලු කරලා තිබුණු ලංකාවේ විදේශ සේවාව අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ගෝත්‍රිකත්වයේ ඉඳන් ශිෂ්ටත්වයට ගෙනැල්ලා තිබෙනවා. ගෝත්‍රිකත්වයේ ඉඳලා ශිෂ්ටත්වයට අපි අපේ විදේශ ප්‍රතිපත්තිය ගෙනැල්ලා තිබෙනවා; විදේශ සේවාව ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව විධියට අපි ජනතාවට දෙන පොරොන්දුව තමයි, අපේ පවුලේ අය, පවුලේ ඥාතීන් කිසි කෙනෙකු ඒ විධියට විදේශ සේවාවලට පත් කර ගන්නේ නැහැ කියන එක.

එමඟින් මේ රටේ මිනිසුන්ගේ අයිතිවාසිකම්; සුදුසුකම් සහිත මිනිසුන්ගේ - qualified මිනිසුන්ගේ - අවශ්‍යතා වාගේම, ඔවුන්ට ලබා දිය යුතු තැන අපි ඔවුන්ට තහවුරු කරලා තිබෙනවා.

විදේශ සේවාව ගැන කිව්වාට පසුව මම මේ වෙලාවේ කියන්න කැමැතියි අපේ රටේ සංචාරක කර්මාන්තය ගැන. මා නියෝජනය කරන්නේ මොනරාගල දිස්ත්‍රික්කයයි. මොනරාගල දිස්ත්‍රික්කය උඟව පළාතේ තිබෙන දිස්ත්‍රික්කයක්. සාමාන්‍යයෙන් අපේ රටේ දළ ජාතික නිෂ්පාදිතයට උඟව පළාතෙන්ම දෙන දායකත්වය සියයට 4ක් වාගේ ප්‍රමාණයක්. ඒ අනුව බැලුවාම, මොනරාගල දිස්ත්‍රික්කයෙන් දෙන දායකත්වය ඊටත් වඩා අඩුයි. නමුත්, දිස්ත්‍රික්කයක් විධියට ගත්තාම මොනරාගල දිස්ත්‍රික්කය සංචාරක

[ගරු රුවන් විජේවීර මහතා]

කර්මාන්තය, කෘෂි කර්මාන්තය ඇතුළු බොහෝ ආර්ථික ප්‍රභවයන්ට, විභවතාවන්ට තෝතැන්නක් වෙච්ච දිස්ත්‍රික්කයක්. ඒ නිසා අප ළඟ potential එක තිබෙනවා; there is potential for the district to contribute to the GDP and the economy of the country.

ගරු සභාපතිතුමනි, රුබේරු නමැති ඉතිහාසඥයාගේ ප්‍රකාශයක් එක්ක මම ඉතා කෙටියෙන් ඉදිරිපත් කරන්නම්, අපේ රටේ ඇති වටිනාකම. රුබේරු කියන ඉතිහාසඥයා කියනවා, "ඉතා කුඩා රටක් වූ ශ්‍රී ලංකාවේ තරම් සාරයක් බ්‍රසීලය, අරාබිය, පර්සියාව, ඉන්දියාව, සියම, චීනය ආදී කවර විශාල රටකවත් ඇත්ද? මේ රට ස්වර්ගය යැයි කියන්නවුන් එසේ කියන්නේ එහි ඇති සාරවත් බව නිසා හෝ එහි ඇති සුන්දරත්වය හා සැපදායක බව නිසා හෝ නොවේ. රට කුඩා තරමටම මේ සියල්ල එහි ඇති නිසා යැයි මම කල්පනා කරමි" කියලා. එහි ඇති ඉතා වැදගත්ම කොටස තමයි, මේ රට කුඩා තරමටම සැපදායක බව, සුන්දරත්වය, ආර්ථික හැකියාව, මානව ප්‍රාග්ධනය ආදි සියල්ල එහි කැටිව තිබෙනවා කියන එක. ඒ හැම දෙයක්ම එකට කැටි වුණු භූමියක් මේ ලෝකයේ තිබෙනවා නම්, ඒ තැන, ඒ top level එකේ තබන්න පුළුවන් රටක් විධියට ලංකාව හඳුනාගෙන තිබෙනවා.

හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ එතැන නොවෙයි. ඉස්සෙල්ලාත් කථා කළා untapped potential එක ගැන. ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ මෙච්චර කාලයක් - විශේෂයෙන් නිදහසින් පසුව - ඒවා නිවැරදිව භාවිතයට ගන්න බැරි වී තිබීමයි.

ගරු සභාපතිතුමනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මත පදනම්ව සංචාරක අමාත්‍යාංශය යටතේ මොනරාගල දිස්ත්‍රික්කය - අපේ දිස්ත්‍රික්කය - දියුණු කරන්න අපි දැන් කටයුතු කරනවා. අපේ ආණ්ඩුව city branding concept එක ක්‍රියාත්මක කරනවා. කතරගම කියලා කියන්නේ a multicultural and multireligious city in Sri Lanka. කතරගම, city branding concept එක යටතේ develop කරන ප්‍රදේශයක් විධියට, සංචාරක ආකර්ෂණයක් එක්ක බද්ධ වෙච්ච තැනක් විධියට මොනරාගල ප්‍රදේශය develop කරන්න අවශ්‍ය කටයුතු plan කරලා තිබෙනවා. ඊයේ දවසේත් එහි ප්‍රධාන රැස්වීමක් කතරගමදී පැවැත්වුණා. අප මේ කියන්න උත්සාහ කරන්නේ අපි එවැනි දේවල් කරමින් තිබෙන බවයි.

ඊළඟට මා කිව යුතුයි, සංචාරක කලාප ගැන. නව සංචාරක කලාප රට පුරා ස්ථාපනය කරන්නත්, දැනට තිබෙන සංචාර කලාප දියුණු කරන්නත් අපි කටයුතු කරනවා. අපේ ගරු ඇමතිතුමා පැවසුවා, වසරකට එන මිලියන දෙකක් පමණ වන සංචාරකයන් සංඛ්‍යාව, මේ වසර අවසානය වන විට මිලියන 3ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබෙන බව. ඒ මිලියන 3ට වුවමනා කරන quality service එක සපයන්න අවශ්‍ය කරන නව සංචාරක කලාප ඉදි කරන්නත්, ඒ වාගේම තිබෙන සංචාරක ස්ථාන සංවර්ධනය කරන්නත් අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. මම විශේෂයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. යාල වනෝද්‍යානයේ තිබෙන තදබදය අවම කිරීම සඳහා මාළිගාවිල ප්‍රදේශයෙන් විශේෂ entrance එකක් දමන්නත් කටයුතු කරනවා. මොකද, මාළිගාවිල ප්‍රදේශයේ ඓතිහාසික වටිනාකමකුත් තිබෙනවා. මේ සියල්ල මත පදනම්ව මොනරාගල දිස්ත්‍රික්කය සුවිශේෂ සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ මරගල කඳු වැටිය පිහිටා තිබෙනවා; යුද්ධනාව චෛත්‍යය ඇතුළු ඓතිහාසික ස්මාරක ද පිහිටා තිබෙනවා. ඒ වාගේම සියඹලාණ්ඩුව, පොතුවිල් base කරලා,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Sir, give me one more minute, please.

ඒ සියල්ල එකතු කරලා සංචාරක කර්මාන්තය තුළින් මේ රටේ economy එක develop කරන්න අපි කටයුතු කරනවා. In developing the economy, we believe that tourism could do a lot. Therefore, I would like to invite all the people, the citizens of this country - this should be a team effort - to get together to develop this country. In that, the participation of everyone, not only of the politicians, but of all the citizens, is needed. Therefore, I would like to invite all - the Sinhalese, the Tamils, the Muslims and all the communities - to get together and develop this country to a wonderful nation.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Sitting is suspended for lunch till 1.00 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් නිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Dayasiri Jayasekara. You have 15 minutes.

[අ.භා. 1.00]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. එත්මන් ආණ්ඩුවේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන කාරණා කිහිපයක් දැන් මතක් කළා. තානාපති සේවය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග ලෙස එහි සඳහන් වන කරුණුවලින් කිහිපයක් ගැන මම මෙතැනදී මූලිකවම කියන්න කැමැතියි.

"විදේශ සේවය සඳහා වෘත්තීය විශිෂ්ටත්වය, සදාචාරාත්මක හැසිරීමේ ඉහළම ප්‍රමිතීන් සහ රාජ්‍ය තාන්ත්‍රික විචක්ෂණ බුද්ධිය සහිත සුදුසුකම්ලත් නිලධාරීන් පත් කිරීම. වෘත්තීය විශිෂ්ටත්වය, සදාචාරාත්මක හැසිරීමේ ඉහළම ප්‍රමිතීන් සහ කුසලතා පදනම මත

සුදුසුකම්ලත් නිලධාරීන් විදේශ සේවය සඳහා පත් කිරීම. ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් ලෙස ප්‍රත්‍යක්ෂ වාර්තා සහිත වෘත්තීය රාජ්‍ය තාන්ත්‍රිකයන් පත් කිරීම."

මේවා තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අන්තර්ගත වුණේ. ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි, එහෙම එකක් දැන් තිබෙනවාද? මම දැක්කා, මීට කලින් අපේ මන්ත්‍රීවරයෙකුත් මේ ගැන කථා කළා. ඉතිහාසයේ කරපු දේවල් කරන්න නොවෙයි තමුන්නාන්සේලාට මේ ආණ්ඩුව දුන්නේ. අපේ විදේශ කටයුතු, විදේශ රැකියා ඇමතිතුමාත් සභාවට ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා ඒ පත්කිරීම් පිළිබඳව මම ඉස්සර වෙලාම කථා කරන්නම්. ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා බලයට පත්වුණු ගමන්, ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට ආපු ගමන්, ඊට කලින් ආණ්ඩුව විදේශ සේවයට යවපු 16දෙනෙක් නැවත ගෙන්වුවා. ඒ අය ගෙන්වනකොට, ඒ වෙලාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා විධියට වැඩ කරපු අපේ විජිත හේරත් මැතිතුමා කිව්වා ඒ අය පිළිබඳව සමීක්ෂණයක් කරලා නැවත පත් කරන්න කටයුතු කරනවා කියලා. මේ රටේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී විධියට වැඩ කළ, ඒ වාගේම විශ්‍රාමලත් නාවික හමුදාපතිවරයකු වූ අද්මිරාල් රවින්ද්‍ර විජේගුණවර්ධන පාකිස්තානයේ සිට නැවත ගෙන්වුවා. එතුමාගේ මෙරට service එක අවුරුදු 40ක්. ඒ වෙනුවට යවලා තිබෙන්නේ, තමුන්නාන්සේලාගේ ජාතික ජන බලවේගයේ හමුදා ඒකකයේ වැඩ කරපු රියර් අද්මිරාල් ෆ්‍රෙඩ් සෙනෙවිරත්න. එයා කලින් හිටපු නිලධාරියාට වඩා නිල දෙකක් පහළින් ඉන්න කෙනෙක්. ඉතින් මම අහන්න කැමැතියි, වෘත්තිය විශිෂ්ටත්වය, සදාචාරාත්මක හැසිරීමේ ඉහළම ප්‍රමිතීන් සහ රාජ්‍ය තාන්ත්‍රික විචක්ෂණ බුද්ධිය සහිත අයද මේ පත්කරලා තිබෙන්නේ කියලා. කියුබාවේ හිටියේ හිටපු නාවික හමුදාපති, අද්මිරාල් නිශාන්ත උලුගෙතැන්න. ඒ වෙනුවට යැව්වා, ජාතික ජන බලවේගයෙන් තරග කරලා මැතිවරණයෙන් පරාජය වෙච්ච මහින්ද රත්නායක. ඔහු "රාවය" පත්තරේ ලේඛකයෙක්. අවුරුදු 65ක ද්වීපාර්ශ්වික සම්බන්ධතා තිබෙන කියුබාව වාගේ රටකට පත් කළේ, විදේශ සේවය පිළිබඳව අල්පමාත්‍ර දැනුමක් නැති පුද්ගලයෙක්. මේවා දේශපාලන පත්වීම් නොවෙයි නම්, මම අහන්න කැමැතියි මේවා මොනවාද කියලා. ඊළඟට, එක්සත් රාජධානියේ මහ කොමිසාරිස් විධියට පත් කරනවා, නිමල් උපාලි සේනාධීර. ඔහු රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් හදාරමින් ඉන්නවා, ස්කොට්ලන්තයේ. මම කැමැති නැහැ කියන්න, මනුස්සයෙකුගේ රස්සාව ගැන. එහේ ඉන්න අය දන්නවා, එයා මොනවාද එක්සත් රාජධානියේ කරමින් හිටියේ කියලා. ඔවුන් රාජ්‍ය තාන්ත්‍රික සේවයේ හිටපු විශිෂ්ටයන් නොවෙයි. ඒ වාගේම ඔබතුමාගේ පෞද්ගලික ලේකම්වරයා ගැනත් ප්‍රශ්නයක් තිබෙනවා. ඔහු දකුණු අප්‍රිකාවේ කෙන්යාවේ කටයුතු කිරීමේදී ජ්‍යෙෂ්ඨ තානාපති නිලධාරිනියන්ට අතවර කිරීම සම්බන්ධ චෝදනා ගණනාවක් තිබෙන කෙනෙක්. සාමාන්‍යයෙන් විජිත හේරත් මැතිතුමා කොළේ ඉරාගෙන ඉන්න කෙනෙක් නොවෙයි. හැබැයි එතුමාගේ පෞද්ගලික ලේකම් කොළේ ඉරාගෙන ඉන්න කෙනෙක්. ඒ නිසාම දැන් විදේශ සේවයේ ඉන්න කාන්තාවන් විශාල භීතියකින් පසු වෙනවා. දැන් මේ ඊයේ පෙරේදාත් අපේ වෛද්‍යවරියක් දූෂණය වුණා. ඒවාත් එක්ක දැන් විදේශ සේවයේ ඉන්න නිලධාරිනියනුත් විශාල භීතියකින් ඉන්නවා. විශේෂයෙන්ම පළිගැනීම්වලට ලක් වෙයි කියලා බයට.

ඒ වාගේම විදේශ සේවයේ පළමු පන්තියේ නිලධාරීන් ඉන්නවා, 60ක්. ඒ, 1996 වසරේ ඉඳලා විදේශ සේවය පටන් ගත්ත අය. තානාපති කාර්යාල තිබෙන්නේ 50යි. Consulate General Offices තිබෙන්නේ 10යි. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඉතිහාසයේ කරපු දේවල් කරන්න නොවෙයි මේ රටේ ජනතාව තමුන්නාන්සේලා බලයට පත්කළේ. ඒ නිසා ඉතිහාසයේත් එහෙම ඒවා කළා කියලා ඒ ගැන කථා කරන්න එපා. මොකද, අපිත් ඒ සමහර කාරණාවලට විරුද්ධව කථා කරපු අය. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා මේ සම්බන්ධව සොයා බලන්න, නිවැරදිව කටයුතු කරන්න, නිවැරදි නිලධාරීන් පිරිසක් පත් කරන්න කියලා.

ඊළඟට මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, සංහිඳියාව හා සත්‍ය සෙවීම පිළිබඳව. අපි accountability එක ගැන විශාල වශයෙන් කථා කළා. අතුරුදහන්වූවන් සෙවීමට 2015දී කොමිසමක් පිහිටෙව්වා. ඒකට 17,000කගේ විතර තොරතුරු ඇවිල්ලා තිබුණා. විශේෂයෙන්ම 5,000ක් missing in action විධියට හමුදාවේ ලැයිස්තුවක් තිබුණා. මේ විධියට පෙරලා, පෙරලා එකතු කළාට පස්සේ, 12,000ක් විතර 1988-89 කාලයේ යගේත්, 2013දී සුදු වෑන්වලින් අතුරුදහන් කළ අයගේත් තොරතුරු ලැබුණා. ඒවා පිළිබඳ විමර්ශන කටයුතු කරන්න 2022දී මුදල් ලබා දුන්නා. ඒ එක්සත් ජාතීන්ගේ 30/1 යෝජනාව අනුව අතුරුදහන්වූවන් පිළිබඳ සොයා බැලීමට අදාළ කොමිසම නැවත කටයුතු පටන් ගත්තා. රටවල් 25කින් ලැබෙන මුදල් දීලා තමයි SLAP එකට මේ සාක්ෂි එකතු කරලා ගත්තේ. විශේෂයෙන්ම Sri Lanka Accountability Project එක, ඒ වැඩ පිළිවෙළ Resolution 46/1 එක යටතේ තමයි ගෙන ගියේ. 2015දී මේක ක්‍රියාත්මක කරන්න හැදුවත්, එවකට සිටි ජනාධිපතිතුමා ඒකට විරුද්ධවීමත් එක්කම මේක ප්‍රශ්නයක් බවට පත් වුණා.

අද වනවිට මේ රටේ කථා බහට ලක් වන බටලන්ද කොමිෂන් වාර්තාවත් එක්ක විශාල වශයෙන් කථා කරන කාරණයක් තමයි සත්‍ය සෙවීමේ කොමිසම පිහිටුවන්න කියන එකත්. මොකද, ඉතිහාසයේ කරපු හැම දෙයක්ම, විශේෂයෙන්ම 1971, 1983, 1988-89 කාලයේ ඉඳලා ඇති වුණු කලබලත් එක්ක පටන් ගත් ජනවාර්ගික අර්බුදය සහ යුද්ධය, ඊළඟට, සුදු වෑන්වලින් ගෙනිහින් මරලා දමපුවා කියන මේ සියල්ලම එකතු කරලා සත්‍ය සෙවීමේ කොමිසමක් පිහිටුවා කටයුතු කරන්න තමයි අපේ බලාපොරොත්තුව තිබෙන්නේ. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, මේ ආණ්ඩුවවත් අඩුම තරමින් ඒ සඳහා කටයුතු කරන්න කියලා. මොකද, මේක අපි දිගින් දිගටම කථා කරපු කාරණයක්. අපි හැම අවස්ථාවකම කථා කළේ සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් කියලා වෙනසක් කරන්නේ නැතුව මේ රටේ පැවැති යුද්ධයෙන් අනාථ වුණු මිනිසුන්ට, අම්මා-තාත්තා නැති වුණු අයට, දු දරුවන් නැති වුණු අයට සාධාරණයක් කරන්න කියලායි. ඊයේ බිමල් රත්නායක ඇමතිතුමා කිව්වා, මේ වාගේම තත්ත්වයක් තමයි උතුරේත් තිබෙන්නේ කියලා. උතුරේ අයගේත් අම්මලා, තාත්තලා නෑදෑයෝ, පෙම්වතිය, පෙම්වතා අරගෙන ගිහිල්ලා මරලා දැම්මා. මේක දෙපැත්තේම වුණා. ඒ නිසා මේක එක තැනක ප්‍රශ්නයක් නොවෙයි. එල්ටීටීඊ එක, එක පැත්තකින් මැරුවා. හමුදාව වෙන කට්ටියක් මැරුවා. JVP එක තව කට්ටියක් මැරුවා. ඊළඟට, අතුරු හමුදා හදලා ඒ අය තව කට්ටියක් මැරුවා. ඒ විධියට මරපු ඉතිහාසයක් අපේ රටේ තිබෙන්නේ. ඒ නිසා තමයි අපි මේවා කියන්නේ. සත්‍ය සෙවීමේ කාර්යාලය දැන් වහලා තිබෙන්නේ. දැන් අඩුම තරමින් ඔබතුමන්ලා හෝ ඒ සඳහා අවශ්‍ය කටයුතු ටික කරන්න. ඒ වෙනුවෙන් පනතක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ ක්‍රියාමාර්ග අරගෙන තිබුණා නම් අද තිබෙන ප්‍රශ්න මතුවෙන්නේ නැහැ. බලන්න, අද ශවේන්ද්‍ර සිල්වා මහත්තයලාට ඇමෙරිකාවට යන්න බැහැ. අද ජෙනරාල් ෆොන්සේකලාට යන්න බැහැ, ඇමෙරිකාවට. ඒ අය කැමැතියි, සත්‍ය සෙවීමේ කොමිසම ඉදිරියට ඇවිල්ලා සාක්ෂි දීලා නිර්දෝෂී වෙන්න. මොකද, මේ සිද්ධවෙන සියල්ලම රටක් විධියට අපි විශාල අර්බුදයකට තල්ලු වෙන ක්‍රියාදාමයක්.

දකුණු අප්‍රිකාව ඒ විධියට වැඩ කරලා තමයි ප්‍රශ්නවලින් එළියට ආවේ. ඒ නිසා මේවා ආයෙත් වෙන්නේ නැහැ, මේ වාගේ ක්‍රියාදාම ආයෙත් සිද්ධ වෙන්නේ නැහැ, එහෙම මිනී මැරුම් සිද්ධ

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

වෙන්නේ නැහැ කියලා කිව්වාට හරියන්නේ නැහැ. ඒ දේවල් ඔප්පු කර පෙන්වන්න වැඩ පිළිවෙළක් අපට අවශ්‍යයි. ඒ වාගේම බලහත්කාරයෙන් හෝ ස්වේච්ඡාවෙන් සිදු කරන ලද අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායමට - Working Group on Enforced or Involuntary Disappearances - තමයි මහින්ද රාජපක්ෂලා, වාසුදේව නානායක්කාරලා ගිහිල්ලා ඒ කාලයේ අතුරුදහන් වුණ තරුණයන්ගේ විස්තර දුන්නේ. ඒ වාගේම නාඳුනන තුවක්කුකරුවන්ගේ විස්තරත් දුන්නා. ඒ අය මරා දමපු අය සම්බන්ධ විස්තරත් දුන්නා. මනෝරි මුත්තෙට්ටුවේගම කොමිසම ගත්තොත්, එතුමිය ලංකාව වටේම උතුර, නැඟෙනහිර, දකුණ කියන හැම තැනකම ගිහිල්ලා අතුරුදහන් වූ 22,000කගේ විතර තොරතුරු සොයා ගත්තා. Amnesty International එක කියනවා, 60,000ක් විතර මැරිලා කියලා. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය ඒ අය අතරින් 5,000කගේ විතර තොරතුරු එවා තිබෙනවා, මෙන්න මේ අය සම්බන්ධයෙන් වැඩ කටයුතු කරන්න කියලා. ඒ වාගේම තවත් 16,000කගේ විස්තර ඔවුන් අතේ තිබෙනවා. ඒවා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඔවුන්ගේ ඒ ක්‍රියාමාර්ගය තුළ එකතු කරගත් තොරතුරු. ඒවා 1988-89 කාලයේ ඉඳලා යුද්ධය අවසාන වන තෙක්ම සිද්ධ වුණු කාරණා.

ඒ වාගේම අපි මතක තබා ගන්න ඕනෑ, ඉරාකයට පසුව වැඩිම ප්‍රමාණයක් අතුරුදහන් වෙච්ච රට ලංකාව බව. ඒ නිසා විශේෂයෙන්ම LLRC වාර්තාව, පරණගම වාර්තාව, රායප්පු ජෝශප් පියතුමා එකතු කරගත් ලැයිස්තු යනාදී මේ සියල්ල එකතු කරලා අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ දී ගරු මංගල සමරවීර මැතිතුමාව මතක් කරන්න කැමැතියි. හානිපූරණය සඳහා අවසාන විසඳුමක් දෙන තුරු යම් ප්‍රතිපාදනයන් සකස් කරන්න එතුමා මූලික වෙලා වැඩ පිළිවෙළක් හැදුවා. ඒ අනුව මරණ සහතිකය නැත්නම්, අතුරුදන් වීමේ සහතිකයක් - Certificate of Absence - මේ රටේ මිනිස්සුන්ට ලබා දිය යුතු වෙනවා. මොකද, දකුණේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරු, උතුරේ දමිළ ජනතාව, නැඟෙනහිර මුස්ලිම් ජනතාව, විශේෂයෙන් හමුදාවේ විශාල පිරිසක් අතුරුදන් වෙලා තිබෙනවා. ඔවුන්ගේ මරණය පිළිබඳව හෝඩුවාවක් තවමත් හොයා ගන්න බැහැ. අම්මලා තවමත් කල්පනා කරනවා. ඔවුන් කියන්නේ, "නැහැ, නැහැ. මැරිලා කියලා සහතික දෙන්න එපා. මගේ පුතා තවමත් කොහේ හරි ජීවත් වෙනවා" කියලායි. මෙහෙම අඬන අම්මලාගේ, තාත්තලාගේ, තරුණයන්ගේ, පෙම්වතියන්ගේ විශාල පිරිසක් අතුරුදන් වෙලා ඉන්නවා. ඔබතුමන්ලාගෙන් මම ඉල්ලනවා certificate of absence එකක් දෙන්න වැඩ පිළිවෙළක් පටන් ගන්න කියලා. මොකද, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා බලයට ආවාට පස්සේ මේක නැවැත්තුවා. අතුරුදන් වුණු අයගෙන් යම් ප්‍රමාණයකට - යාපනයේ 1,000කට විතර - හම්බ වෙලා තිබෙනවා. ගාල්ල, මාතර, හම්බන්තොට සමහර අයට මේක ලැබිලා නැහැ. විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ යටතේ 2000ට පෙර අතුරුදහන් වුණු අයට 2023 දී ගෙවීම් කරලා තිබෙනවා. රුපියල් ලක්ෂ දෙකක් ගෙවන්න හිටියත්, පසුව රුපියල් 6,000 ගණනේ අතුරුදන් වුණු අයගෙන් යම් ප්‍රමාණයකට ගෙවීම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම 1990-1995 කාල සීමාව තුළ දකුණෙන් මුහුදු ගිහිල්ලා LTTE එකෙන් මරලා දමපු විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට දැන් ක්‍රමානුකූලව වන්දි ගෙවා ගෙන යනවා. 2024දී මේ සම්බන්ධව වන්දි ගෙවීමේ කාර්යාලයටත් - Office for Reparations, OR - මුදල් වෙන් කරලා තිබුණා.

ගරු විජිත හේරත් මැතිතුමාගෙන් මම අහන්න කැමතියි, 2025දී කොයි තරම් මුදලක් මේ වන්දි ගෙවීම් සඳහා වෙන් වෙලා තිබෙනවාද කියලා. මට නම් පෙනෙන වැඩ පිළිවෙළක් ඒ තුළ තිබුණේ නැහැ. 2023දී මේ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. 2024දී රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා, පවුල් 4,000කට ලක්ෂ දෙක ගණනේ ගෙවලා තිබෙනවා. නාවකාලික දීමනාව වශයෙන් කොළඹ පවුල් 23කට දීලා තිබෙනවා. කරුණාකරලා මේ සඳහා අවශ්‍යකරන ප්‍රතිපාදන වෙන් කරන්න. විදේශ කටයුතු අමාත්‍යාංශය මේ වෙනුවෙන් කටයුතු කරලා තිබෙනවා මම නම් දැක්කේ නැහැ. ඒ කියන්නේ, මුදල් වෙන් කරලා නැහැ. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. කරුණාකරලා මේ සම්බන්ධව පියවර ගන්න කියලා. මොකද, ඔබතුමා ජිනීවාවලට ගිහිල්ලා මේ ක්‍රියාදාමය පිළිබඳ කළ කථාව ඇහුවා. එහිදී ඔබතුමා හොඳ කථාවක් කළා. ඔබතුමා කිව්වා, "අපි මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු කරනවා" කියලා. මම ආණ්ඩුවේ තමුන්නාන්සේලාට කියන්න කැමතියි මේක උතුරේද, නැඟෙනහිරද, බටහිරද කියලා කල්පනා කරන්න එපා කියලා. මේ ප්‍රශ්නය තිබෙන්නේ ජේවීපී එකෙන් මරපු අය ගැන විතරක් නොවෙයි. එහෙම නැත්නම්, හමුදාවෙන් මරපු ජේවීපී අය ගැන විතරක් නොවෙයි. උතුරේ දමිළ ජනතාව ඉන්නවා. මේ අය ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේම යුද්ධයේදී අපේ හමුදාවේ සොල්දාදුවන් විශාල ප්‍රමාණයක් -5,000ක් විතර- අතුරුදන් වෙලා තිබෙනවා. කරුණාකරලා මේ අය සම්බන්ධවත් කථා කරන්න කියන ඉල්ලීම මම කරන්න කැමතියි.

තමුන්නාන්සේලා බටලන්ද කොමිසම ගැන කථා කළා. මේ ගරු සභාවේ දී අපේ ගරු බිමල් රත්නායක මැතිතුමා ඉතාම සංවේගජනක කථාවක් කළා. පළමු වතාවට ගරු කථානායකතුමා මෙතැනදී ඇඬුවා. මට හිතා ගන්න බැහැ. මේකට අඬ අඬා ඉඳලා හරියන්නේ නැහැ. මේ බටලන්ද කොමිසම පටන් ගත්තේ, චන්ද්‍රිකා මැතිනිය බලයට පත් වූ 1994 කාලයේදියි. තමුන්නාන්සේලා චන්ද්‍රිකා මැතිනියට උදව් කළා. කවුරුවත් කථා කළා ද, බටලන්ද කොමිසමක් ගෙනෙන්න? නැහැ. ඊළඟට, 2004දී චන්ද්‍රිකා මැතිනිය සමඟ ආණ්ඩු කළා. තමුන්නාන්සේලා කථා කළා ද, බටලන්ද කොමිසමක් ගැන? නැහැ. 2005දී මහින්ද රාජපක්ෂ මහත්තයා සමඟ ආණ්ඩු කළා. එහිදීත් තමුන්නාන්සේලා කථා කළා ද, බටලන්ද කොමිසමක් ගැන? නැහැ. ඊයේ රනිල් වික්‍රමසිංහට කථා කළේ, "වධකයා" කියලා. 2015දී වධකයාත් එක්ක ආණ්ඩු කළා. වධකයා ගෙනෙන්න තමයි තමුන්නාන්සේලා කථා කළේ. 2015දී වධකයාත් එක්ක ඉඳගෙන, වධකයාත් එක්ක ආණ්ඩු කළා; වධකයාත් එක්ක වැඩ කළා. නමුත්, එදා බටලන්ද කොමිසමක් ගැන කථා කළාද? මරලා දමපු මිනිස්සු ගැන, බටලන්ද කොමිසම ගැන තමුන්නාන්සේලා කථා කරනවා නම් "වධකයා" කියලා කථා කරන රනිල් වික්‍රමසිංහ මහත්තයා එක්ක හරි නම් ආණ්ඩු කරනවා නොවෙයි, අඩුම තරමේ පුටුවක ඉඳගන්න හොඳ නැහැ. ඒ කාලයේ තමුන්නාන්සේලාගේ හොඳම යාළුවා, රනිල් වික්‍රමසිංහ. දැන් අද මොකද කියන්නේ? අද මේ ක්‍රියාදාමය තුළ තමුන්නාන්සේලා කල්පනා කරනවා, මේ හීනෙන් ඇහැරිලා වාගේ මේක පාවිච්චි කරලා ඉදිරි මාස එකහමාරේ දේශපාලනය කරන්න. ඉදිරි මාස එකහමාරේ මැතිවරණය කරන්න, තමන්ගේ ගමේ සිටින ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයාව ඇහැරවන්න පුළුවන් වැඩ පිළිවෙළක් තමයි තමුන්නාන්සේලා මේ කරන්නේ. මේ බටලන්ද වධකාගාරය ගැන පමණක් නොවෙයි කියන්නේ. එළියකන්දේ, මාතලේ, මහනුවර, කොළඹ නීති පීඨයේ වධකාගාර තිබුණා. මට මතකයි, අපි කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට යනකොට බිත්තිවල ලේ වැක්කෙරිලා තිබුණේ.

කොළඹ රේස්කෝස් එකෙත් වධකාගාරයක් තිබුණා. වධකාගාර 46ක් ගැන කථා කරනවා. ඒ වාගේම විජේවීර ඝාතනය ගැනත් හොයන්න. ගරු සභාපතිතුමනි, මේ බටලන්ද කොමිසම

ගැන විතරක් කථා කරලා වැඩක් නැහැ. ඒ වාගේ කොමිෂන් සභා 46ක් දමන්න ඕනෑ. මොකද, ලංකාවේ වධකාගාර 46ක් තිබුණා. දැන් තමුන්නාන්සේලා අල්ලා ගෙන ඉන්නේ, බටලන්ද කොමිසම. මොකද, බටලන්ද කොමිසම ගැන තමයි අල්ජසීරා එකෙන් මතු වුණේ. ඒක මතු වුණාම ඉක්මනින්ම ඒ වාර්තාව සභාගත කළා. ඊළඟට committee එකක් පත් කරනවා. මේවා හැම එකක් ගැනම හොයන්න තමුන්නාන්සේලා කොමිෂන් සභාවක් පත් කරන්න. බටලන්ද ගැන විතරක් නොවෙයි, සමස්තය ගැනම හොයන්න. විශේෂයෙන්ම මතක තියාගන්න, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් මරලා දාපු අය ගැන. ඒ අය මරා දැම්මේ, අපරාධකරුවන් හා ස්ත්‍රී දූෂකයෝ කියලායි. හැබැයි, Dr. Gladys Jayawardene අපරාධකරුවෙක්ද, ස්ත්‍රී දූෂකයෙක්ද? Dr. Stanley Wijesundera අපරාධකරුවෙක්ද, ස්ත්‍රී දූෂකයෙක්ද? ඒ වාගේම චිත්‍රපට අධ්‍යක්ෂක කේ. ගුණරත්නම්, නීතිඥ අමර වෙල්ලප්පුලි, මහාචාර්ය පටුවත විතාන, මොරටුව ඉංජිනේරු පීඨයේ හිටපු උපකුලපති ඩී.සී. අකුකෝරල යන අයත් ඝාතනය කළා. ඒ වාගේම දයා පතිරණ ඝාතනය කළා. ඒ, මේ රටේ ශිෂ්‍ය නායකයෙක්. බෙල්ල කපලායි මරලා දැම්මේ. ඊළඟට දයා සේපාලි සේනාධීර, එස්.වී. අමරසිරි - එතුමිය එම්.එස්. අමරසිරි මැතිතුමාගේ නෝනා- මරලා දැම්මා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, your time is up.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

හබරාදුව මන්ත්‍රී ජී.වී.එස්. ද සිල්වා මැතිතුමා මරලා දැම්මා. තමුන්නාන්සේලා විජය කුමාරණතුංග මැතිතුමාට වෙඩි තියලා මරලා දැම්මා. මේ, ජනතා විමුක්ති පෙරමුණ. ඒක කළේ "ටාසන්" නොහොත් ලයනල් රණසිංහ. ලයනල් රණසිංහව බලා ගත්තේ කවුද? තමුන්නාන්සේලාගේ අද ජාතික ජන බලවේගයේ ලේකම්. එතුමා තමයි කළුතරදී ලයනල් රණසිංහව බලා ගත්තේ. එකසිය ගණනක් වෙඩි තියලා මැරුවා. ඒ අයව බලා ගත්තේ තමුන්නාන්සේලා. එතකොට කොමියුනිස්ට් පක්ෂයේ පණ්ඩිත මැතිතුමා, ලෙස්ලි රණගල මැතිතුමා, ලෙස්ලි යටත්වල මැතිතුමා, ලයනල් ජයතිලක මැතිතුමා, මෙරිල් කාරියවසම් මැතිතුමා, Fr. Michael Paul Rodrigo, වැල්ලේතොට පඤ්ඤාදස්සි නායක හාමුදුරුවෝ, කොටිකාවත්තේ සද්ධාතිස්ස නායක හාමුදුරුවෝ, පෝද්දරමුල්ලේ ප්‍රේමාලෝක නායක හාමුදුරුවෝ, ඒ වාගේම බුද්ධශාසන ඇමතිවරයෙක් වූ ඩබ්ලිව්.එම්.ජී.ඩී. බණ්ඩා මැතිතුමා වාගේ විශාල පිරිසක් තමුන්නාන්සේලාගේ නාඳුනන තුවක්කුකරුවන් විසින් මරලා දැම්මා. ඒ නිසා කාටවත් ඇඟිල්ල දිගු කරලා හරියන්නේ නැහැ. මම කියන්නේ,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, could you please wind up now?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, රුසියාවේ අපේ ලාංකිකයන්ගේ ප්‍රශ්නය ගැනත් ඔබතුමාට මතක් කරන්න මම කැමැතියි. මේ අර්බුදය ගැන මම ඇමතිතුමාත් එක්ක කථා කළා. ලංකාවෙන් තුන්දහසකට අධික පිරිසක් රුසියාවට ගිහිල්ලා තිබෙනවා. ඔවුන් ගිහිල්ලා අවුරුද්දක් ගත වෙලාත් ඉවරයි. ඔවුන්ගේ ඒ නියමිත කාලය ඉවරයි. කාලය ඉවර වුණත් ඔවුන්ට ලංකාවට එන්න දෙන්නේ නැහැ. ඔවුන්ගේ වැටුප දෙන්නේ නැහැ. රුසියාවේ යුද්ධයට ගිහිල්ලා ඔවුන්ගෙන් 47දෙනෙක් දැන් මැරිලා තිබෙනවා. මේක රුසියාවත් එක්ක අපි බේරා ගනිමු. ඉන්දියාවට පුළුවන් වුණා, ඒ රටේ හිටපු ඔවුන්ගේ සියලුදෙනාම ගෙන්වා ගන්න. මම ඔබතුමාගෙන් ඉල්ලනවා මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා එම ලාංකිකයන් මුදාගන්න කටයුතු කරන්න කියලා. එදා ඉඳලාම මම මේ ඉල්ලීම කරනවා.

ඊළඟට, ඉතාලියට 120ක් යවන්න අවශ්‍ය කරන කටයුතු ලෑස්ති කරලා තිබුණා. දැනට කාන්තාවන් විතරක් 86දෙනෙක් ගිහිල්ලා තිබෙනවා. තව 8දෙනෙක්, documentsවල තිබිච්ච ප්‍රශ්න නිසා නතර වෙලා තිබෙනවා. එය G2G වැඩ පිළිවෙළක්. මේ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරන අතර, ඔබතුමාට මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙනියන්න අපේ ශක්තිය ලබා දෙන බවත් ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Ravi Karunanayake. You have 17 minutes.

[1.19 p.m.]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Have the 18 minutes I had earlier been reduced, Hon. Chairman? I hope you, also representing the Colombo District, would be magnanimous.

ගරු සභාපතිතුමනි, අපි මේ වෙලාවේ කථා කරන්නේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක් ගැන. මේ රට විදේශ විනිමය පැත්තෙන් ඉතාම අමාරු තත්ත්වයක සිටින මේ මොහොතේ ඉතාම වැදගත් ක්ෂේත්‍ර 3කට නායකත්වය දෙන අපේ විජිත හේරත් ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ ගැන කථා කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා.

ප්‍රථමයෙන්ම, විදේශ ශ්‍රමිකයන් සම්බන්ධයෙන් කථා කළොත්, මම හිතන විධියට මේ සම්බන්ධයෙන් අපි කළ යුතු දේ තමයි පුළුවන් තරම් නිල අගයක් - value එකක් - එකතු - add - කරලා, vocational skills develop කරලා ඒ අය පිටරට යැවීම. ගෘහ සේවකයින් වශයෙන් ගිහිල්ලා විදේශ විනිමයක් උපයනවාට වඩා තාක්ෂණයක් එකතු කරලා යවන එක හොඳයි. ඒ ගැන අපි කථා කරනවා වාගේම ක්‍රියාවට නංවන්නත් අවශ්‍යයි. ඒ වාගේම ඔවුන්ට අපි ඉංග්‍රීසි දැනුම දුන්නොත් ඉතා වටිනවා. පිලිපීනය ලෝකය තරණය කළා වගේ මේ ක්‍රමය අපි අනුගමනය කළොත්, ඒක රටටත් ඔබිනවා. මම හිතන විධියට එය විදේශ විනිමය ලබා ගන්න පුළුවන් හේතුවක් වේවි.

ගරු සභාපතිතුමනි, 2024 අවුරුද්දේ විදේශගත ශ්‍රමිකයින්ගෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 6.58ක විදේශ විනිමය ප්‍රමාණයක් අපට ලැබී තිබෙනවා. ඊට පෙර අවුරුද්දේ සියයට 5.97ක් ලැබිලා තිබෙනවා. ඊටත් පෙර අවුරුද්දේ සියයට 3.79ක් ලැබිලා තිබෙනවා. මේ අවුරුද්දේ මාසයකට ඩොලර් 700ක් හෝ 750ක් ලැබෙනවා කියන්නේ අවුරුද්දකට ඩොලර් බිලියන 8ක් විතර ලැබෙනවා. එහෙම නම් මේ අවුරුදු පහේ

[ගරු රවී කරුණානායක මහතා]

සැලැස්ම තුළ - අඩු ගණනේ 2030 අවුරුද්ද වනකොට - ඇමෙරිකානු ඩොලර් බිලියන 15ක ඉලක්කයක් තිබිය යුතුයි. මේ කථා කරන මොහොත වනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 128ක් non-resident Indiansලාගෙන් ඒ රටට ලැබෙනවා. ඒක ආදර්ශයට අරගෙන මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා අපි කටයුතු කරමු.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravi Karunanayake, you got extra three minutes.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you very much, Hon. Chairman.

ගරු ඇමතිතුමනි, මේ රටට විදේශ විනිමය එවන ශ්‍රමිකයන් දිරිගැන්වීමට කිසිම දෙයක් කරලා නැහැ. අපි මේ රටේ අපනයනකරුවන්ට යම් දෙයක් දෙනවා වාගේම, විදේශගත ශ්‍රමිකයින්ටත් යම් සහන ලබා දිය යුතුයි. මොකද, ඒ අයට airport එකේදී ලබා දෙන ඇමෙරිකානු ඩොලර් 150ක, 200ක duty-free allowance එක විතරයි ලැබෙන්නේ. එම නිසා විදේශගත ශ්‍රමිකයින් දිරිගැන්වීම සඳහා සහන ලබා දීම අවශ්‍යයි. හැබැයි, ඒ ඩොලර් 1,000ක් වැනි ප්‍රමාණයක් ගෙනෙන අයට නොවෙයි. ඩොලර් ලක්ෂයක් හෝ ලක්ෂ එකහමාරක් පමණ ගෙනෙන අයව දිරිගැන්වීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම අවශ්‍යයි. ඒ වාගේම Airport එකේදී ලබා දෙන duty-free allowance එකේ සීමාව වැඩි කිරීමත් අවශ්‍යයි. මොකද, අපි එවැනි සහන ලබා දුන්නේ නැත්නම් කොහොමත් අනෙක් රටවලින් ලංකාවට seep වනවා. අපට පුළුවන් නම් එය VIP service එකක් වාගේ කළ හැකියි.

ගරු ඇමතිතුමනි, බැංකු ක්ෂේත්‍රය හරහා රටට නීත්‍යානුකූලව ඩොලර් ගෙනෙන්න පුළුවන් නම් ඒක නිල වශයෙන් රටට එකතු වන ආදායමක්. එය රටට ඔබින වැඩ පිළිවෙළක් බවත් මම මේ අවස්ථාවේ යෝජනා කරනවා. රටට විදේශ විනිමය ලැබෙන වැදගත් ක්ෂේත්‍රයක් තමයි, remittances. මේ අවුරුද්දේ රටට ඩොලර් බිලියන 7ක විතර remittances ලැබේ යැයි අපේක්ෂා කරනවා. එම නිසා ඒ සඳහා දිරිගැන්වීමක් ලබා දීම කළ යුතුමයි.

ඊළඟට, රටට විදේශ විනිමය උපයා දෙන ඉතා වැදගත් ක්ෂේත්‍රයක් තමයි, tourism. 2024දී අපේ රටට ලක්ෂ 21ක පමණ විදේශ සංචාරකයින් පිරිසක් ඇවිත් තිබෙනවා. ඒ මඟින් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5ක් උපයාගෙන තිබෙනවා. 2025 අවුරුද්දේ විදේශ සංචාරකයින් ලක්ෂ 25ක් පමණ එයි කියලා පුරෝකථනය කර තිබෙනවා. ඒ මඟින් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.5ක් ලැබේ යැයි අපේක්ෂා කරනවා. ඒ පුරෝකථනය - prognosis එක - අනුව 2030 අවුරුද්ද වනකොට සංචාරකයින් මිලියන 10ක් එන ලෙස සංචාරක කර්මාන්තය දියුණු කරන්න පුළුවන් නම් එය අපේ රට ණයගැතිභාවයෙන් එළියට ගන්න පුළුවන් ලොකුම කටයුත්තක් බව මම මේ අවස්ථාවේ මතක් කරනවා. 2030 අවුරුද්ද වනකොට සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 12ත්, 15ත් අතර ඉලක්කයක් කරා ගෙන යන්න පුළුවන් නම්, - ගෙන යන්න පුළුවන් නොවෙයි, ගෙන යන්න ඕනෑකමක් තිබෙනවා නම් - ඒ වෙනුවෙන් අපි වැඩ කරන්න අවශ්‍ය වන්නේ කොහොමද? මේ සම්බන්ධයෙන් හුඟක් දුර්වලතා තිබෙනවා, ගරු ඇමතිතුමනි.

මේ රටේ තිබෙන airports සංවර්ධනය කරන්න ඕනෑ. අපට international airports තුනක් තිබුණාට ඒවායේ තත්ත්වය කොහොමද? අද කටුනායක තිබෙන Bandaranaike International Airport එකේ ලොකු තදබදයක් තිබෙනවා. දැන් එම ගුවන් තොටුපොළ සංවර්ධනය කරගෙන යන බව අපි දන්නවා. නමුත්, JICA එකෙන් ලබා දෙන ණය පුළුවන් තරම් ඉක්මනට අපි ලබාගත යුතුයි. ඔවුන් ණය දෙනවා කියලා අත්සන් කරලා තිබෙනවා. එම ගුවන් තොටුපොළේ වැඩ ඉක්මනින් අවසන් නොකළහොත්, සංචාරකයන් එන්න පටන් ගත්තාම Airport එකෙන් ඔවුන්ට එළියට එන්න දැනට පවතින තත්ත්වය ඔරොත්තු නොදේවි.

දැනට මේ රටට එන්නේ airlines 38යි. අපි frequencies වැඩි කරන්න අවශ්‍යයි. සුමානයකට, Qatar Airways flights 15ක්, 16ක් විතර එනවා. අපෙන් ඈත් වෙලා තිබුණු KLM, Air France වැනි airlines නැවත ගෙන්වා ගන්න අපට පුළුවන් නම්, ඒකෙන් අපේ රට ගැන හොඳ සංඥාවක් ලෝකය වටේට යනවා, මෙන්න ලංකාවට මේ වාගේ airlines එනවා කියලා. හැබැයි, ඒ වාගේම අපි domestic airlines ඇති කරන්නත් ඕනෑ. Hon. Chairman, අද Singaporeවල සිට Jet Airways එකෙන් පුළුවන්, රුපියල් 40,000ට සහ 50,000ට ගමන් කරන්න. මාලදිවයිනේත් රුපියල් 55,000ට එය කරන්න පුළුවන්. නමුත්, කොළඹ ඉඳන් domestic airlinesවලින් යාපනයට, මඩකලපුවට හෝ හම්බන්තොටට යන්න අවශ්‍ය නම් ඒකට රුපියල් 75,000ක් යනවා. මේ, domestic airlines. ඒ සඳහා අපට companies 09ක් තිබුණාට අද ක්‍රියාත්මක වෙන්නේ 02යි. අවශ්‍ය වනකොට ඒගොල්ලන්ගේ ගමන යනවා මිසක්, scheduled flights ඇති කරලා එම සේවාව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. Loss leader policy නිසා අභ්‍යන්තර ගුවන් ගමන්වලට කිසිම බාධාවක් ඇති වෙන්නේ නැහැයි කියා මම හිතනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා වැඩ කරන්න පුළුවන් ඇමතිවරයෙක්. එම නිසා ඔබතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා එක පැන් පහරින් domestic airlines වෙනුවෙන් අවශ්‍ය පියවර ගන්න කියලා. Helitours දේශීය ගුවන් ගමන් සේවා තිබුණා. ඒ කාලයේ දේශීය ගුවන් ගමන් සිදු වුණාට Sri Lanka Air Force එකට දැන් එය ක්‍රියාත්මක කරගෙන යන්න බැරි තත්ත්වයක් මතුව තිබෙනවා. ඒක පෞද්ගලික company එකක් වශයෙන් ලියාපදිංචි කරලා ක්‍රියාත්මක කළොත්, සංචාරක කර්මාන්තයට ඉතාම වැදගත් වනවා. එදා මම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් Booking.com ගැන කථා කළා.

Agoda.com වෙන්න පුළුවන්, Airbnb.com වෙන්න පුළුවන්, Booking.com වෙන්න පුළුවන්, ඒවා ලියාපදිංචි කරන්න. අද ඒ තුළින් එන සල්ලි ඒ රටේ තිබෙනවා මිසක්, මේ රටට සියයට 10ක්, 12ක් විතර තමයි ලැබෙන්නේ. සංචාරකයෝ ආවාට, ඔළු ගෙඩි ටික දැක්කාට, ඩොලර් ටික තවම රටින් පිට තිබෙන එක තමයි, අපට තිබෙන ලොකුම බාධාව. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දැකලා ඇති, මේ සම්බන්ධයෙන් නොයෙකුත් ප්‍රවෘත්ති පළ වී තිබෙන ආකාරය. කරුණාකරලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. ඒ විතරක් නොවෙයි.

මේ රටට සංචාරකයෙකු ආවාට පස්සේ සිද්ධ වෙන දේ අපි වෙනත් රටවල් එක්ක ආදේශ කරලා බලමු. සිංගප්පූරුව, තායිලන්තය, මලයාසියාව වාගේ රටවලත්, පුකේට්, බාලි වැනි දූපත්වලත් airport එකෙන් බැස්සාට පස්සේ, අපට ඒ රටේ, එහෙම නැත්නම් දූපතේ ඇවිදින්න යන්න තිබෙන්නේ කොහේද, මොනවාද කරන්න තිබෙන්නේ කියලා දැනුවත් කරන්න, information centre එකක් තිබෙනවා. අපේ රටේ ජාත්‍යන්තර ගුවන් තොටුපොළවලත් එවැනි centre එකක් ඇති කළොත්, ඒක රටට ඔබිනවා. විදේශ සංචාරකයින්ටත් ඒක වටිනවා. හැමදේම අපි social mediaවලින් බල බලා යන්නේ නැතිව, hard copy එකක් එක්ක කටයුතු කරන එක මා හිතන විධියට සංචාරක කර්මාන්තයට වැදගත් වෙනවා. ඒ වාගේම credit card එකක් දීලා මෙන්න මේ ප්‍රමාණය ගන්න පුළුවන් කියනවා නම් හොඳයි. ගරු

ඇමතිතුමනි, අද තිබෙන ලොකුම බාධකය තමයි, මේ සංචාරකයින් Cultural Triangle එකට ගියාම, ඒ තැන්වලදී නොයෙක් ගසාකෑම් සිදුවීම. ඒ සම්බන්ධයෙන් නොයෙකුත් ප්‍රශ්න අපට පෙනෙන්න තිබෙනවා. එවැනි තැනකදී විදේශීය සංචාරකයෙකු ඇමෙරිකානු ඩොලර් 150ක් ගෙවනකොට, ඔහුට වෙනත් අනවශ්‍ය ප්‍රශ්න නිසා තවත් රුපියල් ලක්ෂ 150ක් පමණ වියදම් කරන්න සිද්ධ වෙනවා. එම නිසා සංචාරකයින් යන එන තැන්වල කටයුතු ලෙහෙසි කරලා තිබුණා නම්, රටට repeat tourism ඇති කර ගන්න පුළුවන්.

ඒ වාගේම තමයි, මේ රටේ යටිතල පහසුකම් සම්බන්ධයෙන් පවතින තත්ත්වයත්. කොළඹ ඉඳන් වෙනත් ප්‍රදේශයකට යනවා නම්, ඉතා සීමිත hotels ප්‍රමාණයකට තමයි ඒ ගමන තුළදී ඔවුන් යන්නේ. සාමාන්‍යයෙන් touristsලා ආවාම, යම් quality එකක් maintain කරනවා. ඒ අයට යන්න සුදුසු toilets නැහැ, ඒවා තිබෙන තැන් සොයා ගන්න අවශ්‍ය තොරතුරුත් නැහැ. මම හිතන විධියට මේ දේවල් තමයි අපි යෝජනා කළ යුත්තේ. ඔබතුමන්ලා දේශීය නිෂ්පාදන ගැන කථා කරනවා, ව්‍යවසායකයන් ගැන කථා කරනවා. මෙන්න, ඒ අය දිරි ගන්වන්න පුළුවන් අවස්ථා ගණනාවක් මේ තුළ තිබෙනවා. අපි මේ සංචාරක කර්මාන්තය තුළින් ඒ අවස්ථා ඇති කරන්න අවශ්‍යයි.

ඒ වාගේම අද හෝටල් කර්මාන්තය තුළ යම් කඩා වැටීමක් දක්නට තිබෙනවා. ඒ කඩා වැටීමක් දක්නට තිබෙන්නේ, සංචාරකයින් ආවාට ඔවුන්ට නවාතැන් ගන්න තිබෙන hotelsවල ඉතා පැරණිභාවයක් තිබෙන නිසායි. There is wear and tear in items of those hotels. ඒක අද බහුලව පෙනෙන්න තිබෙන දෙයක්. ඒ නිසා පුළුවන් තරම් ඉක්මනට මේ ඉඩම් ටික hotels හදන්න companiesවලට ප්‍රදානය කරන්න පුළුවන් නම්, නැත්නම් auction කරන්න පුළුවන් නම්, නැත්නම් කුමන හෝ ක්‍රමයකට ඒවා ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. ගරු ඇමතිතුමනි, මට මතකයි, ඔබතුමා ගාල්ල ප්‍රදේශයේ හෝටලයක් විවෘත කරන අවස්ථාවකට සහභාගි වෙලා කියපු දේවල්. මම හිතන විධියට අන්න ඒ විධියට මේ ගැනත් සොයා බලා ඔබින තැන්වලට ඒ ඉඩම් දෙන්න පුළුවන් නම්, ඒ ආයෝජකයන්ට ඒක දිරි ගැන්වීමක් වෙනවා.

අද ලංකාවේ පුද්ගලයෙකුට ලෙහෙසියෙන් ඉඩමක් ගන්න හැකියාවක් නැහැ. නමුත්, පිටරට කෙනෙක් ඇවිල්ලා කල් බදු ක්‍රමය යටතේ - leasing system එක යටතේ - 99 අවුරුද්දකට ඉඩම් බදු ගන්නවා. නමුත්, ඔවුන් නිසි ලෙස බදු ගෙවන්නේ නැහැ. 99 අවුරුද්දකට සුද්දට රට භාර දීලා, අන්තිමට වෙන්නේ මේ රටට නිල වශයෙන් ලැබිය යුතු බදු මුදල නොලැබී යෑමයි. මොකද, ඒ අයට ඕනෑ විධියට කටයුතු කරන තත්ත්වයක් දැන් ඇති වී ගෙන යනවා. ඒ නිසා දේශීය ව්‍යවසායකයාට අවශ්‍ය දිරිගැන්වීම් ලබා දෙන්න අවශ්‍යයි. පුළුවන් තරම් ඒ කටයුතු මේ රටේම සිටින ව්‍යවසායකයන් හරහා ප්‍රචලිත කරන්න පුළුවන් නම්, මා හිතන විධියට ඒක ඔබින තත්ත්වයක් වෙනවා.

ඒ වාගේම මා හිතන විධියට හෝටල් grade කිරීමත් අවශ්‍යයි. අද යම් විධියකින් හෝටල් 25,800ක් තමයි grade කරලා තිබෙන්නේ. නමුත්, ඊට වැඩිය සංචාරකයෝ ප්‍රමාණයක් රට තුළට එන නිසා, ඒවා ලියාපදිංචි කළ යුතුමයි. නමුත්, ඒ ගැන කියන්න හරිම කනගාටුයි. Sri Lanka Tourism Development Authority එක තුළින් ඒක mandatory කරන්න අවශ්‍යයි. මේවා ලියාපදිංචි කළ යුතුමයි, ශ්‍රේණිගත කළ යුතුමයි. මොකද, අපට repeat tourismවලට යම් විධියකින් ඒක අවශ්‍ය වෙනවා. ඒ වාගේම social media හරහා අද එක තැනක වැරැද්දක් වුණොත්, ලෝකයම දැනුවත් වෙන්න පටන් ගන්නවා. හැබැයි, හොඳ දේවල් සම්බන්ධයෙන් ලෝකය දැනුවත් වෙන්න පටන් ගන්නේ ඉතාම හිමින් සිරුවේ. ඒ නිසා කරුණාකරලා මේ දේවල් කරන්න පටන් ගන්න. මොකද, අපේ රටට ණය බරින් නිදහස් වෙන්න අවශ්‍ය සහාය දෙන්න පුළුවන් ලොකුම කර්මාන්තයක් තමයි ඔබතුමාට භාර වෙලා තිබෙන්නේ, ගරු ඇමතිතුමනි. ඒ නිසා අපි ඒක හරියට පාවිච්චි කරමු. එදා රනිල් වික්‍රමසිංහලා, හරින් ප්‍රනාන්දුලා නිර්හීතව රට වැටිලා සිටින අවස්ථාවක ආරම්භ කරලා ගිය ගමන, නිවැරැදි කරලා තව දුර යන එක තමයි මා හිතන විධියට කරන්න අවශ්‍ය වන්නේ.

ඒ වාගේම අපේ රට promote කිරීමත් අවශ්‍යයි. අද "Incredible India" කියයි, ඉන්දුනීසියාවට ගියොත්, "Miracle of Asia" කියයි. අපටත් ඒ වාගේ නාමයන් තිබෙනවා. ලෝකයේ හොඳම රටක් ලෙස, පසුගිය මාස 12 තුළ නොයෙක් awards අපේ රට දිනලා තිබෙනවා. නමුත්, අපේ රට promote කිරීම පැත්තෙන් ගත්තාම, අපේ ක්ෂේත්‍රය තුළ එහෙම නැත්නම් අපේ tourist industry එකේ ඉන්න අය ඉතා පසුගාමී ස්වරූපයෙන් තමයි ගමන් කරන්නේ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා ඒ අයව කැඳවලා, ඒකට දේශපාලන නායකත්වයක් දිය යුතුයි කියන එක මම මේ අවස්ථාවේදී හෙළිදරව් කරනවා.

ගරු ඇමතිතුමනි, කවුරුන් හෝ කෙනෙක් ඕනෑම රටකට ගිහිල්ලා ආපසු මේ රටට එනකොට duty-free facility එක පාවිච්චි වෙනවා. මේ රටේ Airport එකේ ක්‍රියාත්මක වන rent එක ඉතාම අධික මට්ටමකයි තිබෙන්නේ. අපේ රටට සාපේක්ෂව බැලුවොත් ඩුබායිවල හෝ සිංගප්පූරුවේ හෝ තායිලන්තයේ එය සියයට 25ක්, 30ක් අඩුවෙනුයි තිබෙන්නේ. අපට අවශ්‍ය වන්නේ මේකයි. අපේ Airport එකේ ක්‍රියාත්මක වන quantity එක පුළුවන් තරම් වැඩි කරන්න හැකියාව තිබුණා නම් එය ඉතාම වැදගත්. පිටරට අයට - ලංකාවේ අයට නොවෙයි - ඇවිල්ලා limit එකක් නැතුව කොළඹින් බඩු අරගෙන යන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ වාගේම, යාපනයේ තිබෙන international Airport එකට ඉන්දියාවේ ඉඳලා කට්ටිය ආවාම ඒ අයට මත්පැන්, රත්තරන් වාගේ දේවල් ගන්න අවස්ථාව ඇති කරලා දීම තමයි අපේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන්න පුළුවන් වැඩ පිළිවෙළවල්. නමුත් එහෙම කරන බවක් අපට පෙනෙන්නේ නැහැ. මේවා සම්බන්ධයෙන් රජයේ නිලධාරීන් මීට වැඩිය ඕනෑකමින් වැඩ කරන්න ඕනෑ. එවැනි වැඩ පිළිවෙළවල් ඇති කරන එක තමයි අවශ්‍යව තිබෙන්නේ.

කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යෑම තුළින් සංචාරක කර්මාන්තය වර්ධනය වෙනවාය කියලා අපි කිව්වොත්, ඔව්, default strategy එක යනවා. හැබැයි, අද කැසිනෝ ව්‍යාපාර හැම තැනම තිබෙනවා නේ. අද මාලදිවයින, සවුදි අරාබිය වාගේ රටවලත් මම දන්නා විධියට කැසිනෝ තිබෙනවා නේද, අපේ නිස්බුල්ලාහ් මන්ත්‍රීතුමනි? මේවා ගැන අපි අහලා තිබෙනවා. දැන් ඒ වාගේ රටවලුත් වෙනස් වෙලා තිබෙනවා. මේක දැන් රටවල් සුළු ප්‍රමාණයකට විතරක් සීමා වෙලා තිබෙන දෙයක් නොවෙයි. අද ඔක්කොම රටවල් මේ සඳහා විවෘත වෙමින් යනවා. ඒ නිසා අපි මීට වැඩිය ඕනෑකමින් අපේ සංචාරක කර්මාන්තය ඉදිරියට ගෙනියන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන්න අවශ්‍යයි.

ඒ වාගේම තමයි hotels විවෘත කළාම ගන්න අමාරුම එක තමයි මත්පැන් බලපත්‍රය. මම සිගරට්, මත්පැන් බොන්නේ නැති නිසා මට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේවා බොන කට්ටියට ප්‍රශ්නයක්. සංචාරක කර්මාන්තයට ආයෝජනය කරන කට්ටිය කියන්නේ, මේවා ලියාපදිංචි කරන්න අවුරුදු දෙක, තුනක් ගත වනවා කියායි.

ගරු ඇමතිතුමනි, සංචාරක කර්මාන්තය හරහා මේ රටට ඩොලර් මෙච්චර ප්‍රමාණයක් ගේන්න පුළුවන් නම් ඔබතුමා භය

[ගරු රවී කරුණානායක මහතා]

නැතුව ඒ වෙනුවෙන් යම් විධියක මුදල් ප්‍රමාණයක් අරගෙන ලයිසන් එක දෙන්න. කොහොම වුණත්, ඉල්ලීම් කරලා මාස 6ක් තිබුණොත්, කොහේට හරි ගෙවලා ඔය ලයිසන් එක ගන්නවා. මේ රටට සංචාරකයින් ගේනවා නම්, නිල වශයෙන් ඊට වැඩිය යමක් කිරීම තමයි අවශ්‍ය වෙන්නේ. මා මේවා කියන්නේ ඉදිරි දැක්මක් සහිතවයි.

අපි අවුරුදු 27ක්, 28ක් තිස්සේ පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කරනවා. අවුරුද්දෙන් අවුරුද්ද ගෙනෙන අය වැය විවාදවලදී ඉදිරිපත් කරන අදහස්වලින් අපට පෙනෙන්නේ, අවුරුදු ගණනාවක් එකම දේ කථා කරනවා, නමුත් ප්‍රශ්නය ඒ ආකාරයෙන්ම හිර වෙලා තිබෙනවා කියන එකයි. ඒ නිසා අපි වෙනසක් ඇති කරන්න අවශ්‍යයි. මා හිතන විධියට මේක තමයි අවශ්‍ය වන්නේ.

මේ රටට වීසා ලබා ගන්න ක්‍රමය ගැනත් මම කියන්න ඕනෑ. එදා හරින් ප්‍රනාන්දු මැතිතුමා මේ රටට එන සංචාරකයන් සඳහා visa-free තත්ත්වයක් ඇති කළාම ඔවුන් තුළ යම් විධියකට ප්‍රබල උනන්දුවක් ඇති වුණා, ලංකාවට එන්න ඕනෑ කියලා. Visa-free is a very important facility, especially for European tourists who feel that going to an embassy and getting a visa is a difficulty they have to face. As a result, visa-on-arrival is something which even we would like to have. Say, if we are going to Singapore, there is no visa problem. So, utilize that as a selling factor. I am sure that these are ways through which we could encourage and increase the number of tourists coming to this country.

මේකේ තව negative පැත්තක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. වීසා එකක් අරගෙන ලංකාවට ඇවිල්ලා සිටින රුසියානු කාන්තාවක් -ඇය විවාහ වෙලා ඉන්නේ ලාංකිකයෙක්- පැලවත්ත පැත්තෙන් රෝහලට යන පාර අයිනේ බත් පැකට් විකුණනවා. මේකත් සංචාරක කර්මාන්තයේ කොටසක්ද? මෙන්න මේ වාගේ negative පැත්තකුත් තිබෙනවා. එම නිසා වීසා නිකුත් කිරීම නැති කරන එක නොවෙයි කරන්න තිබෙන්නේ. නමුත් මේ ක්‍රියාවලිය පරිපාලනය කිරීම තමයි අවශ්‍ය වන්නේ. මම නම් හිතන්නේ ලෙහෙසි visa system එකක් ඇති කළ යුතුයි කියායි. මේ ක්‍රමය වැඩිය දරුණු කරන්න ගියොත් අපට ලැබෙන්න තිබෙන ඒවාත් නැති වෙනවා. මේ සම්බන්ධයෙන් අපිට කරන්න තිබෙන්නේ ක්‍රමවේදයක් ඇති කරන එකයි. අපි මේ රටේ දකුණු පළාතට ගිහිල්ලා point-of-saleහීදී බිලක් ගෙව්වොත්, ඒ මුදල මහ බැංකුව යටතේ තිබෙන බැංකු පද්ධතියට යන්නේ නැහැ; රුසියාවට හෝ ඊශ්‍රායලයට හෝ වෙනින් රටක බැංකුවකට තමයි ඒ මුදල් ප්‍රමාණය යන්නේ. මේ රටේ VAT එක වෙන්න පුළුවන්, Cess එක වෙන්න පුළුවන්, PAL එක වෙන්න පුළුවන්; අපේ ලාංකිකයන් සියයට 25ක බැංකු පොලියකුත් ගෙවලා, අන්තිමට සංචාරකයා කිසිම බද්දක් ගෙවන්නේ නැතුව ඒ අයගේ සල්ලි මේ රටෙන් පිටට අරගෙන යන එකයි වෙන්නේ. ඒකෙන් අපේ රටට හානියක් වෙන්නේ නැද්ද? මේ සම්බන්ධයෙන් ප්‍රායෝගික දැනුමක් තිබෙන නිසායි මම මේ කාරණය කියන්නේ. අපට අවශ්‍ය වන්නේ මෙයයි. මේ රටේ ණය බරතාව ගත්තොත්, 2028 අවුරුද්දේ ඉඳලා අවුරුද්දකට US Dollars 8ක්, 9ක් ගෙවන්න තිබෙනවා. නමුත් මේ සම්බන්ධයෙන් කටයුතු කරනකොට භාණ්ඩ හා සේවා අපනයනය හරහා චිතරක් නොවෙයි, සංචාරක කර්මාන්තයෙන් උපයන බදු තුළින් තමයි අපට පුළුවන් තරම් ඉක්මනින් මේ තත්ත්වයෙන් එළියට එන්න පුළුවන් වන්නේ, ගරු ඇමතිතුමනි.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, සීගිරිය අද ජාත්‍යන්තර awards දිනලා තිබෙන බව. ඒ සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මම කාරණයක් කියනවා. ජනවාරි 16වැනි දා "Daily Mirror" පත්තරේ සඳහන් කරලා තිබුණා, "Sigiriya not open for night visits" කියලා. ගරු ඇමතිතුමනි, අපේ පැරණි රජවරු තමයි සීගිරිය හදලා තිබෙන්නේ. එදා ගොඩනඟපු මේ සීගිරිය අද අපට සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා යොදා ගන්න පුළුවන් තැනකට විවෘත වෙලා තිබෙනවා. නමුත් අපේ ඉන්න රජයේ නිලධාරීන් කියනවා, සීගිරිය නරඹන්න සවස 6.00න් පසුව යන්න බැහැ කියලා. මේ වාගේ දේවල් කියන්නේ ඇයි? ඔබතුමා හෙටම එක පැන් පහරින් අත්සන් කරලා, එතැන ඒ කටයුතු සඳහා වෙනම කොමිපැනියක් විවෘත කරන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හොල්මන් ඉන්නවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොල්මන්ලා විධියටයි රජයේ නිලධාරීන් කටයුතු කරන්නේ! මම කියන්නේ සීගිරිය නැරඹීම සඳහා පැය 24ම විවෘත කරන්න කියන එකයි. උදේ සීගිරිය නරඹන්න යන කෙනාගෙන් ඩොලර් 5ක් අය කරනවා නම්, රෑ යන කෙනාගෙන් ඩොලර් 50ක් අය කරන්න. එහෙම නැතුව, සීගිරිය නැරඹීම සඳහා විවෘත කරන්න බැහැ කියන්නේ ඇයි? එහෙම කියනවාට වැඩිය හොඳයි, පැය 24ම විවෘත කරලා රජයේ සේවකයින් වැඩිපුර ඉන්න තැන්වලින් අරගෙන ඒ කට්ටිය ඒ කටයුතු සඳහා යොදවන එක. ගරු සභාපතිතුමනි, අපට එදා හිනා වුණා, CWE එක පැය 24 වැඩ කළාම. නමුත් අද ඒක තමයි පැවැත්ම. අද හැම supermarket එකක්ම ඒ ක්‍රමයේ තමයි ගමන් කරන්නේ. අපි අවුරුදු 15කට ඉස්සෙල්ලා කියපු විධියට කොවිඩ් වසංගතය ආවාම ඒ තුළින් අපේ රට කඩාගෙන වැටුණා නොවෙයිද? අවුරුදු 25කට ඉස්සෙල්ලා විය යුතු දේවල් මේ රටට ගෙනාවාම, ඒක ශාපයක් ලෙස සලකන්න එපා. ඒක ඉදිරි දැක්මක් ලෙස සලකන්න. පුළුවන් නම් වහාම සීගිරියේත් light and sound shows වාගේ දේවල් කරන්න ඕනෑ. මේවා තමයි ඊජිප්තුවේ කයිරෝවලත් තිබෙන්නේ. මේ වාගේ දේවල් ලෝකයේ වරප්‍රසාද වශයෙන් තමයි ලබා තිබෙන්නේ.

මම දැක්කා, "Travelwire" කියන website එකේ පළවෙලා තිබෙනවා, " 'Sigiriya', Sri Lanka's Majestic Rock Fortress and Surrounding Wonders" කියලා වාර්තාවක්; ඒ වාගේම Sigiriya has been named "World's Most Welcoming City for 2025" by Booking.com. සීගිරිය මුල් කරගෙන awards 10ක් මේ මාස 12 තුළ ලංකාවට ලැබිලා තිබෙනවා. අපේ රට බංකොලොත් වුණා. නමුත් මේ බංකොලොත් රට බලන්නත් සංචාරකයෝ එන එකම මා හිතන්නේ හරි විධියට market කිරීමට කටයුතු කරන්න ඕනෑ බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, මා හිතන විධියට අපි පුළුවන් තරම් entertainment පැත්ත දියුණු කරන්න ඕනෑ. මේවා වැරදි විධියට අර්ථ කථනය කිරීම නොවෙයි කළ යුත්තේ. නමුත් ලංකාව රෑ 8.00න්, 9.00න් පසුව වසා දමනවා නම්, සුද්දෙක් මේ රටට එයිද? අපට අවශ්‍ය වන්නේ නිල වශයෙන් නිවැරදි මට්ටමට මේවා ගෙන ඒමයි. මොකද, අනික් රටවල් සංවර්ධනය කරා ගිය ඒ වාගේ හොඳ ගුණාංග පාවිච්චි කරන එක වැදගත්. මොකද, රෑ 10.00ට, 11.00ට මේ රට වහලා දානකොට මොනවාද ඒ අය කරන්නේ? ඒ ඉතුරු වෙලාව වෙනුවෙන් යම් විධියකින් සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් ගෙන එන්න අවශ්‍යයි. ඒ නිසා මෙහි cultural shows වෙන්න පුළුවන්, වෙනත් entertaining groups වෙන්න පුළුවන්. මා හිතන විධියට ඒවා ඇති කිරීම තමයි අපට මෙහි කරන්න තිබෙන හොඳම අවස්ථා වන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravi Karunanayake, you have two more minutes.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Chairman, the Hon. Gayantha Karunathilleka gave me another four minutes from the time allotted to the Opposition.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒවා දියුණු කිරීම සම්බන්ධයෙන් මා හිතන විධියට අපි Facebook එක පාවිච්චි කරන්න අවශ්‍යයි. මොකද, බොහෝ තැන්වලට ගියාම අද මේවා ඉන්ස්ටග්‍රෑම්වල, ෆේස්බුක්වල තිබෙනවා. ඒ නිසා මම හිතනවා, අපි negative විය යුතු නැහැ කියලා. මා හිතන විධියට මේවා අපි negative විධියට ගත යුතු නැහැ. මොකද, පිටරට මෙන්න මේ වාගේ sitesවලට ගියාම, මෙවැනි දේවල් තිබෙනවා. අපිත් ඒවා පාවිච්චි කරන්න ඕනෑ.

ඒ වාගේම high-value tourismවලට අපි යා යුතුයි. අද සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ එකහමාරක්, දෙකක් වියදම් කරන සංචාරකයෙකු අපි ඒ තැනට තල්ලු කරන්න අවශ්‍යයි. අසල්වැසි Maldivesවල දවසකට ඇමෙරිකානු ඩොලර් 500ක්, 600ක් පාවිච්චි කරනකොට ඒ සංචාරකයා ලංකාවට ඇවිල්ලා ඇමෙරිකානු ඩොලර් 50, 75 වියදම් කරන්නේ. මොකක්ද, මේ දෙක අතර තිබෙන වෙනස? ඒ රටත් දූපතක්. එහේ තිබෙන්නේ මුහුදු විතරයි. හැබැයි, අපේ රටේ හැම දෙයක්ම තියාගෙන, සියයට 10කට වැඩිය අඩුවෙන් ගෙන්නේ. මේ මොන අපරාධයක්ද කියන ප්‍රශ්නය අපි අහනවා.

ඒ වාගේම shopping ගැන කිව්වොත්, තායිලන්තයට හෝ සිංගප්පූරුවට හෝ මලයාසියාවට යනවා කිව්වොත්, එතැන යම් විධියක වෙළෙඳාම් ස්වරූපය ඇති වෙනවා. අපිත් මේ වාගේ දේවල් ඇති කරන්න අවශ්‍යයි. සිංගප්පූරුව, තායිලන්තයේ ෆුකේට්වල තිබුණු night markets වාගේ දේවල් අපිත් emulate කරන්න ඕනෑ. නමුත් අද ඒවා සම්පූර්ණයෙන්ම ගල් ගැහිලා, හොර ගුහාවක් ඔවට පරිවර්තනය වෙලා තිබෙනවා කියන එක තමයි අද සංචාරකයෝ කියන්නේ. ඒ නිසා අපි මේක upmarket කරමු. අපි මේවා වැඩිදියුණු කරලා හරියාකාරව සංචාරකයන් මේ රටට ගෙන්වා ගැනීම තමයි අවශ්‍ය වන්නේ. එතකොට MICE - Meetings, Incentives, Conventions and Exhibitions - tourism වැදගත්. ඒවා නැවත අපි ලංකාවට ගේන්නම අවශ්‍යයි. මේවා තුළින් තමයි අපි මේ කර්මාන්තය වැඩිදියුණු කළ යුත්තේ.

Then, Hon. Minister, I get back to the most important subject you represent, which is foreign affairs. I think this is the bridge with which you could connect Sri Lanka to the world. I guess the talented Minister basically knows how to get the message across to the world. But, what is important is, we must have the thrust to take this country forward. Sri Lanka's Foreign Policy must be dynamic, proactive, robust, forward-thinking and centered on national interests. After all, we must be friends to all and enemies to none. By prioritizing economic diplomacy, regional leadership and global strategic partnership, Sri Lanka could enhance its position in the world. This is where our Foreign Policy is important. Our Foreign Policy should be fashioned according to our domestic policy requirements.

The most important thing, I think, Sir, is the strategic nonalignment and pragmatic approach. Let us not only talk of nonalignment, but ensure that we project and leverage our country with our geographical location. In order to ensure that we take the maximum use of our location, now we must engage with superpowers like our neighbour, which is economically galloping forward. It could be said that, at the moment, India is a lion roaring, not a lumbering elephant. So, on India, China, the European Union, the USA, Japan and Korea, let us not put barriers and say, "This country is leftist; this one is rightist and the other one is centric." We must embrace the world as one and take Sri Lanka forward so that we could position ourselves to exploit the opportunities before us. Look at Singapore. They had nothing 30 or 40 years ago. They looked at Sri Lanka in 1977 and said, "Look at what JR is doing ". But, Lee Kuan Yew came to Sri Lanka in 1978 and when he saw the strikes that were on, he said, "I wanted Singapore to be like Sri Lanka 20 years ago. But, for God's sake, let us not be like what Sri Lanka is today". And now, strikes are something of the past; I hope strikes will never repeat. So, we must ensure that we exploit that opportunity to bring in investments.

Then, look at regional economic integration. We must look at joining the ASEAN, the BIMSTEC, the BRICS, the Indian Ocean Rim Association and the Regional Comprehensive Economic Partnership for more market access. Today, you have the free world led by Donald Trump for the second time. The world was talking about globalization 10, 15 years ago, but, today, he is talking about deglobalizaton. Let us look at market access and export of our textiles to USA, which bring us in the biggest earning. You would not need aid. Trade with America helps us to ensure direct and indirect employment to almost 800,000 people. So, we have got to focus on what is going on. When we have tariff wars, we have to basically focus on non-tariff barriers on other areas. I heard you mentioning today that we are in a globalized world. I am happy to see that you all have embraced that thinking and that is the way we have to take. There is no point in cursing the darkness; let us light a candle to give us light to take Sri Lanka out to the world.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravi Karunanayake, you have one more minute left out of your extra four minutes.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Chairman, I am sure, with your affinity to the Colombo District, I could get one to three minutes more so that I could get my message across, which, in turn, will help you all to get across our message to the world.

[ගරු රවී කරුණානායක මහතා]

All I want to say is, ensure that we use Sri Lanka as a diplomatic hub. Today, we must have a close relationship with India. After all, we are at a distance from India which could be travelled by air in just one hour. There is no point in frowning upon India or having differenes of opinion with them and trying to be friends with those who are at a distace which could be travelled in 10, 15 or 20 hours. Let us ensure that we have economic friends, regional friends and we that we are friends with the world at large. As I said, we must be friends to all and enemies to none. On that policy, let us see how we could move forward.

Then, look at economic diplomacy and trade diversification. This is the best time for you to look at branding Sri Lanka so that we could come out of bankruptcy. Now, we have a wonderful opportunity to ask to the world, when Donald Trump is talking about deglobalization, to help our country, which is poor financially, but which has rich human values.

So, let us project ourselves as a country which could position itself on the world map through the trading process and export diversification. After all, we are talking of Sri Lanka. We might be having different political agendas, we might be in different political corridors, but end of the day, Sri Lankans have got to come out of economic bankruptcy as they have been suffering for too long. It has been 77 years since we got Independence from our colonial masters, but whether we have got economic freedom is the question that many people ask, Sir.

Then, free-trade agreements. Market access is the best way forward. When you all were in the Opposition, you had a different opinion. We were basically accelerating that process seeking more market access. When the unit cost comes down, we would become more competitive. More competitive means more exports, more exports mean more dollars and more dollars mean less bankruptcy and that it would be quicker for us to come out of bankruptcy. So, on that basis, we are a nation suffering from poverty in an ocean of prosperity. So, Sir, in the manner that we always speak to Sri Lankans on political platforms, we must ensure that we come out of bankruptcy. Sir, I can see that you are trying to get the message across to me that my time is up.

Let us use tourist diplomacy and financial diplomacy to their best. I know that the IMF Programme is hard to accept and is not a panacea for all ills. But, when you go into bankruptcy, it is the IMF which needs to give its endorsement that you have come out of it. So, now, let us use financial diplomacy and tourism diplomacy for economic integration like Singapore did with trade agreements and investment promotion, like South Korea did with export diversification and like Germany did with private-public partnerships.

The United Arab Emirates, which basically did not have water, but only camels and the desert, is a standing example which marketed themselves to become a vibrant hub today and around 80 million tourists travel to the Dubai International Airport on an annual basis. Then, look at China's Belt and Road Initiative. Look at India. They are going to have US Dollars 10 billion worth of trade by 2030. If Sri Lanka could achieve even 1 to 2 per cent of that, Sir, you life and mine would so much happier, we could go on and on winning the Colombo District and ensure that Sri Lanka is on the path to progress and that all Sri Lankans would have a better tomorrow. So, let us unite to get the country out of bankruptcy. We have got to be proactive. Let us be radical and ensure that tourism is used progressively. Also, ensure that government servants are told to not live in the dead past but in the unborn future, adopting new strategies. That is how Sri Lanka could come out of this crisis. So, let us not just be rhetoric; let us walk the talk.

Sir, I thank you for giving me all that extra time.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Aboobucker Athambawa. You have eight minutes.

[பி.ப. 1.47]

ගරු අබූබකර් අතම්බාවා මහතා
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ தவிசாளர் அவர்களே, வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சின் விவாதத்திலே கலந்துகொள்வதையிட்டுப் பெருமகிழ்ச் சியடைகின்றேன். இந்த அமைச்சுக்கான நிதி ஒதுக்கீடு மொத்தம் ரூபாய் 21,463 மில்லியன் ஆகும். இது மூன்று பிரிவாக வகுக்கப்பட்டு நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. வெளிநாட்டு அலுவல்களுக்கு மொத்தமாக 19,456 மில்லியன் ரூபாயும், வெளிநாட்டு வேலைவாய்ப்புக்கு 872 மில்லியன் ரூபாயும், சுற்றுலாத்துறை ஊக்குவிப்புக்கு 1,135 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டுள்ளது.

இந்த ஆட்சி மிளிர்ந்ததன் பிற்பாடு நாட்டிலிருக்கின்ற அனைத்து மக்களும் ஒன்றாக, நிம்மதியாக வாழக்கூடிய நிலைமை இப்போது ஏற்பட்டிருப்பதை நாங்கள் காண்கின் றோம். உலகத்திலே இந்த நாட்டினுடைய நிலைமைகள் மற்றும் போக்குகள் பற்றி பேசப்படுவதன் காரணமாகவும் நாட்டிலே நிலவுகின்ற அமைதி காரணமாகவும் வெளிநாடுகளில் இருக்கின்ற, இலங்கையை இரசிக்கின்ற சுற்றுலாப் பயணிகள் எமது நாட்டை வந்தடைகின்ற அளவு அதிகரித்த வண்ணமாக இருக்கின்றது. இலட்சக்கணக்கான சுற்றுலாப் பயணிகள் எமது நாட்டை வந்தடைந்திருப்பதாகத் தகவல்கள் கூறுகின்றன.

எமது நாடு இயற்கை வளம் நிறைந்ததும் பல்லின மக்கள் வாழ்கின்றதுமான சிறப்பான நாடாகத் திகழ்கின்றமையால், இந்த நாட்டுக்கு வருகை தருகின்ற சுற்றுலாப் பயணிகளை இன்முகத்தோடு வரவேற்கின்ற தன்மை காணப்படுகின்றது. எமது நாட்டில் சுற்றுலாத் துறையானது அதிகளவு அந்நியச் செலாவணியை ஈட்டித்தருகின்ற, பொருளாதார அபிவிருத் திக்குக் காரணமாக இருக்கின்ற துறையாக அடையாளம் காணப்பட்டுள்ளது. எனவே, இந்த உல்லாசப் பயணத் துறையானது நீடித்து நிலைபெறக்கூடிய துறையாக மிளிர

வேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். Our country needs sustainable tourism development. அந்த அடிப்படையிலே, இந்த நாட்டிலே சுற்றுலாத் துறைக்கு வசதியான பல்வேறு வளங்கள் காணப்படுவதை நாங்கள் பார்க்கின்றோம். நாட்டிலே சுத்தமான கரையோரப் பிரதேசங்கள் காணப்படுகின்றன. அதுமாத்திரமல்ல, சுற்றுலாப் பயணிகளைக் கவரக்கூடிய நீர் விளையாட்டுக்கள் உட்பட உள்ளக, வெளியக விளையாட்டுத் துறைகளும் காணப்படுகின்றன. அதுபோல், மலைநாட்டிலுள்ள நீர்வீழ்ச்சிகள் மற்றும் tea estates போன்றவை மிகவும் சிறந்த சுற்றுலாத்தலங்களாகக் காணப்படுகின்றன. மேலும், நவீன சந்தை வாய்ப்புகள் காணப்படுகின்றன; பழைமைவாய்ந்த நகரங்கள் காணப்படுகின்றன. அதேபோன்று, கலாசார நிகழ்வுகள் காணப்படுகின்றன. இலங்கையில் காணப் படுகின்ற விலங்குகள், தாவரங்கள் மற்றும் கண்டல் தாவரங்கள் போன்றவற்றின் பல்வகைமை இந்த நாட்டுக்கு ஓர் அழகை ஏற்படுத்துகின்றது.

இந்த அமைச்சுக்குப் பொறுப்பாக இருக்கும் கௌரவ விஜித ஹேரத் அவர்கள் கிழக்கு மாகாண மக்களையும் அந்தப் பிரதேசத்தையும் நன்கறிந்த ஒருவராக இருக்கிறார். அவர் கடந்த காலத்தில் அங்குள்ள எல்லாப் பிரதேசங்களுக்கும் சென்று மக்களைச் சந்தித்து, அவர்களின் நிலைப்பாட்டை நன்கறிந்தவராகவும் இருக்கிறார். அந்த வகையில், கிழக்கு மாகாணத்தின் சுற்றுலாத் துறை பற்றி இங்கு நாங்கள் குறிப்பிடாமல் இருக்க முடியாது. NPP ஆட்சி வந்ததன் பிரகாரம், இந்த நாட்டினுடைய பொருளாதாரம் படிப்படியாக வளர்ச்சியடைய ஆரம்பித் திருப்பதை நாங்கள் பார்க்கின்றோம். ஆனால், எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் தொடர்ந்தும் குறை கூறுபவர்களாகவே இருக்கின்றார்கள்; இனவாதம் பேசக்கூடியவர்களாகவே இருக்கின்றார்கள். நாட்டினுடைய வளர்ச்சிக்காவும் நாட்டைப் பற்றியும் அவர்கள் குறைந்தளவிலேயே பேசுவதைக் காணக்கூடியதாக இருக்கின்றது.

கிழக்கு மாகாணத்தில் இருக்கின்ற திருகோணமலை, மட்டக்களப்பு, அம்பாறை ஆகிய மாவட்டங்களில் பல இடங்கள் சுற்றுலாத் துறைக்கு ஏற்றவையாகக் காணப்படுகின்றன. குறிப்பாக, திருகோணமலையில் நிலாவெளி கடற்கரை - Nilaveli Beach - காணப்படுகின்றது. மட்டக்களப்பில் இருக்கின்ற பாசிக்குடா சுற்றுலாவுக்கு மிகவும் பிரசித்தமான இடமாகக் காணப்படுகின்றது. பொத்துவில் பிரதேசத்தில் உள்ள அறுகம்பை surfing என்ற விடயத்திற்கு மிகவும் உலகப் பிரசித்தி பெற்றதாகக் காணப்படுகின்றது. ஆகவே, கிழக்கு மாகாணத்தின் சுற்றுலாத் துறையை மென்மேலும் அபிவிருத்தியடையச் செய்ய வேண்டுமென்றால், பொத்துவில் பிரதேசத்தில் ஒரு விமான ஓடுபாதையை அமைத்து, உள்ளூர் விமான நிலையத்தை அமைப்பதன்மூலமாக அங்கு உல்லாசப் பயணிகளை அதிகளவு கவர முடியுமென்பதை நான் இந்தச் சந்தர்ப்பத்திலே ஓர் ஆலோசனையாக முன்வைக்கின்றேன். அதற்காக பொத்துவில் பிரதேசத்தில் இருக்கின்ற திணைக்களத் தலைவர்களைச் சந்தித்துப் பேசி, விமான ஓடுபாதையை அமைப்பதற்கான ஏற்பாடுகளைச் செய்வதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம்.

அத்தோடு, அங்குள்ள பறவைகள் சரணாலயம் அமைந் திருக்கும் குமண போன்ற பிரதேசங்கள் உல்லாசப் பயணத் துறையை விருத்தி செய்வதற்குச் சிறந்த வாய்ப்புகளை வழங்குகின்றது. பெரும்பாலான உல்லாசப் பயணிகள் நாட்டுக்கு வருகை தருகின்றபோது திருகோணமலைக்குச் செல்கின்றார்கள். அதன் பிற்பாடு அறுகம்பை பிரதேசத்திற்குச் செல்வதற்கு விரும்புகிறார்கள். ஆனால், அதற்கான போக் குவரத்து வசதிகள் மிகவும் குறைவாகவே காணப்படுகின்றது. அவர்கள் தனியார் போக்குவரத்தைப் பயன்படுத்துகின்றபோது அதிகளவான பணத்தைச் செலவழிக்க வேண்டியுள்ளதாகச் சொல்கின்றார்கள். ஆகவே, மட்டக்களப்பிலிருந்து பொத் துவில் - அறுகம்பைக்கான புகையிரதப் பாதையை அமைப் போமாக இருந்தால், சுற்றுலாப் பயணிகள் மட்டுமன்றி, கிழக்கு மாகாணத்தில் வாழ்கின்ற மக்களும் அதைப் பயன்படுத்தி பொத்துவில், குமண போன்ற பிரதேசங்களுக்கு இலகுவாகப் பயணத்தை மேற்கொள்ளக்கூடியதாக இருக்கும் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்கிறேன்.

கல்முனைப் பிரதேசத்தில் வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம் ஒன்று இயங்கி வந்தது. தற்போது அது அங்கில்லை. கடந்தகால இனவாத ஆட்சியாளர்கள் அதை வேறோர் இடத்திற்கு மாற்றி விட்டார்கள். இதன் காரணமாக அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்கள் பல்வேறு இன்னல்களை அனுபவித்து வருவதைக் காணக்கூடியதாக இருக்கின்றது. இன்று சுற்றுலாத் துறையானது, இந்த நாட்டுக்கு அதிகளவு வருமானத்தைக் கொண்டுவருகின்ற ஒரு துறையாகக் காணப்படுகின்றது.

கடந்த காலங்களில் தேர்தல் பிரசாரத்தின்போது, "தேசிய மக்கள் சக்தியினருக்கு வெளிநாடுகளில் மதிப்பில்லை, இவர்களைப் பற்றி அங்கு பேசுவதுமில்லை, எதிர்காலத்தில் இவர்கள் ஆட்சியைக் கைப்பற்றினால், எவ்வாறு இவர்கள் நாட்டைக்கொண்டு செல்வார்கள்?" என்று சிலர் மேடைகளில் பேசியதை நாங்கள் கேட்டோம். ஆனால், இன்று சர்வதேசத்தில் அதிகளவு பேசப்படுகின்ற நாடாக எமது நாடு உள்ளதை அவதானிக்கக்கூடியதாக உள்ளது. இதன் காரணமாக இந்த நாட்டைக் கண்டுகளிப்பதற்காக அரபு நாடுகளில் இருந்து பெரும்பாலான அரேபியர்கள் வருகின்றார்கள். அதேபோன்று, ஐரோப்பிய நாடுகளிலிருந்தும் அதிகளவான சுற்றுலாப் பயணிகள் வருகின்றார்கள். இந்தக் கட்சி நாட்டினுடைய ஆட்சியைக் கைப்பற்றுகின்றபோது வங்குரோத்தடைந்த பொருளாதார நிலைமையில்தான் நாடு இருந்தது. இன்று வெளிநாடுகளிலிருந்து வருகின்ற உல்லாசப் பிரயாணிகளுடைய வருகை காரணமாக இந்த நாட்டுக்கு நன்மதிப்பு ஏற்பட்டிருப்பதுடன், இந்த நாட்டினுடைய வருமானமும் அதிகரித்துச் செல்வதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது.

வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சின் பிரதி அமைச்சராகக் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த எங்களுடைய கௌரவ அருண் ஹேமச்சந்திரா அவர்கள் பதவி வகிக்கின்றார். அவர் கிழக்கு மாகாணத்திலுள்ள பிரதேசங்கள் பற்றி நன்கறிந்தவராகவும் இருக்கின்றார். அந்த வகையில், எதிர்காலத்திலே அவருடைய சேவை கிழக்கு மாகாணத்திலுள்ள எல்லா மக்களுக்கும் சென்றடைய வேண்டும் என்று இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கின்றேன்.

குறிப்பாக, நான் இங்கு குறிப்பிட்டவாறு திருகோணமலை மாவட்டத்திலே பல்வேறு வளங்கள் காணப்படுகின்றன. அந்த வளங்களைக் கண்டுகளிப்பதற்காக வெளிநாடுகளிலிருந்து அதிகளவான உல்லாசப் பயணிகள் வருகின்றார்கள். திருகோணமலைக்குச் செல்கின்ற உல்லாசப் பயணிகள் அடுத்து மட்டக்களப்பு மாவட்டத்திற்கு வருகின்றார்கள். மட்டக்களப்பிலும் உல்லாசப் பயணிகளுக்கு ஏற்றவாறு பாசிக்குடா போன்ற பல பிரதேசங்கள் இருப்பதுடன், அங்கு

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

30ක්‌කුම් අධිකමාන three-star hotel එන්‌රු සොල්ලප්පටක්‌කූඩිය තරත්තිලාන hotels කාණප්පටුකින්‌රන. කුරිප්පාක, පොත්තුවිල් පෝන්‌ර පිරතේසංකළිල් උල්ලාසප් පිරයාණිකළෛක් කවර්න්තිළුක්‌කුම් වකෛයිලේ නූර්‌රුක් කණක්‌කාන සිරියළවිලාන මර්‌රුම් පෙරියළවිලාන hotels කාණප්පටුකින්‌රන. අන්‌ත වකෛයාන hotelsක්‌කුත් තේවෛයාන වසතිකළෛ එතිර්කාලත්තිල් සෙය්‌තු කොටුප්පතන් මූලමාක, කිළක්‌කු මාකාණත්තිලුම් සිරන්‌ත මුරෛයිල් උල්ලාසප් පයණත් තුරෛයෛක් කොණ්‌ටු සෙල්ලලාමෙන්‌රු කූර්, විටෛපෙර්‌රුක් කොළ්කින්‌රේන්. නන්‌රි!

ගරු සභාපතිතුමා
(මාණ්‌පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Rauff Hakeem. You have 24 minutes.

[පි.ප. 1.57]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්‌පුමිකු සට්ටත්තරණි රஊப් ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

கௌரவ தவிசாளர் அவர்களே, வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சின்மீதான இந்த விவாதத்தில் நான் பேசுவதில் பெருமகிழ்ச்சியடைகிறேன். முதலில், நேற்றைய தினம் பிற்பகல் எமது கட்சியின் பாராளுமன்ற உறுப்பினரான சகோதரர் எம்.எஸ்.எம். நழீம் அவர்கள் தன்னுடைய பதவியை இராஜினாமா செய்து உள்ளூராட்சிச் சபைத் தேர்தலில் போட்டியிடுவதற்கு முன்வந்திருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், அவருடைய இந்தத் தியாக மனப்பான்மையை, கட்சிக்கான அர்ப்பணிப்பை நான் இந்தச் சபையினூடாகப் பாராட்ட விரும்புகின்றேன். பாராளுமன்றத்துக்கு வந்து 4 மாதங்களுக்குள்ளாக இந்தச் சபையிலே மிகச் சுறுசுறுப்பாக இயங்குகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினராகவும், தன்னுடைய பிரதேசத்துப் பிரச்சினைகளை எடுத்துரைத்த ஒரு பாராளுமன்ற உறுப்பினராகவும் இருந்தது மாத்திரமல்லாமல், கட்சி நடவடிக்கைகளில் தலைமைத்துவத்திற்குப் பக்கபலமாகப் பல விடயங்களிலே ஈடுபட்ட அவருக்கு, அவருடைய அரசியல் வாழ்வு மென்மேலும் சிறக்க வேண்டுமன்று நான் பிரார்த்தித்துக் கொள்கின்றேன். அவருடைய பாராளுமன்றப் பிரவேசத்தை அவர் நினைத்த சந்தர்ப்பத்தில் மீண்டும் அவருக்கு வழங்குவதற்குக் கட்சி தயாராக இருக்கிறது என்பதையும் நான் இங்கு பதிவிட விரும்புகின்றேன்.

அதுமாத்திரமல்ல, கட்சியினுடைய பாராளுமன்றப் பதவியை விரும்புகின்ற ஏனைய பிரதேசத்து உறுப்பினர்களுக்கு நான் சொல்ல விரும்புவது என்னவென்றால், அவரைப் போன்று, அவரைப் பின்பற்றித் தங்களுடைய அர்ப்பணிப்பான அரசியலைச் செய்வதற்கு அவர்கள் முன்வர வேண்டும் என்பதைத்தான். குறிப்பாக, அமைப்பாளர்கள், முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள், முன்னாள் தவிசாளர்கள், வட்டாரத்திலே போட்டியிட்டு, கட்சிக்கு வெற்றியீட்டித் தந்த பிற்பாடு, பாராளுமன்ற ஆசனத்திற்கான தங்களுடைய கோரிக்கையை முன்வைத்தால், நிச்சயமாகக் கட்சி அதைப் பரிசீலிக்கும் என்பதையும் நான் இங்கு சொல்லிவைக்க விரும்புகின்றேன்.

මම මගේ කථාවේ මුල් කොටසින් මුලින්ම කියන්න අදහස් කරනවා, විශේෂ කාරණයක් පිළිබඳව. ගරු අමාත්‍යතුමනි, මේ කාරණය ගැන ඔබතුමාත් දන්නවා. ඔබතුමාත් මේ ගැන පාර්ලිමේන්තුවේදී කථා කළා. මේ රටේ සිදු වෙන්න නියමිතව තිබූ විශාලතම වංචාවක් වැළැක්වීම සඳහා මම පාර්ලිමේන්තුවේදී මුලින්ම කථා කළා. ඉන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තහනම් නියෝගයක් අරගෙන ඒ online visa වංචාව නැවැත්තුවා. ඊට පසුව එවකට පැවැති රජයට සිදු වුණා ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න. විශේෂයෙන්ම ගුවන් තොටුපොළේ තිබුණු ඒ තදබදය ඉවත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය ක්ෂණිකව තීරණයක් ගත්තා. ඒ තමයි, රටවල් 35කට visa නොමිලයේ ලබා දීම. ඒ අනුව visa නැතිව මේ රටට එන්න පුළුවන් වාතාවරණයක් ඇති කළා. නමුත් ඊයේ පෙරේදා මට මැද පෙරදිග රටක තානාපතිතුමෙක් කියා සිටියා එතුමාගේ රටත් ඒ රටවල් ලැයිස්තුවට ඇතුළත් වුණත් ඒ රටේ සංචාරකයන්ට මෙහේට එන්න තවමත් visa ගන්න සිදු වෙලා තිබෙනවා කියලා; එහෙම නැත්නම් on-arrival visa විතරයි ලැබෙන්නේ කියලා. Visa-free travel තවම තහවුරු වෙලා නැති බව මම විශේෂයෙන් සඳහන් කරනවා.

Particularly, the Ambassador to the United Arab Emirates brought to my attention that though the country has already announced that 35 countries would be allowed visa-free entry to the country, his country's nationals still have to process visa or to come with on-arrival visa. So, that is a matter which the Hon. Minister must take immediate steps to rectify.

Having said that, Sir, I would like to refer to another serious matter. The diplomats of another Middle Eastern country or rather a popularly known far-Eastern country which helps our country, which helped us with the Uma Oya Project, Iran, are now unable to open bank accounts or even obtain a credit card from a bank in this country. It is a very serious situation. The Vienna Convention on Diplomatic Relations makes it possible for all these diplomats to have these facilities. Has Sri Lanka become a lapdog of the imperialists? Do we deny those diplomats the right to open a bank account in our country? So, it is a very serious matter, Hon. Minister. Though the diplomats have met the Secretary to the Ministry of Finance, Planning and Economic Development, still, they are unable to open a bank account. So, what is this serious situation? It is a shame! I think the Hon. Minister would certainly look into it and get this rectified fast because Iran is a country which has stood with us at every international fora; on every issue, they stood with us. Even in the United Nations Human Rights Council, every time they voted in support of us. And, now, the diplomats of such a country in Sri Lanka are denied the basic facility of opening a bank account. So, please look into this matter and get it rectified without any delay.

Having said that, Sir, may I now turn to the Votes of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism. Today, I draw your attention to the critical concerns in our foreign affairs: bilateral relations with neighbours and partners, regional cooperation, peace, security, human rights and multilateralism in the Indian Ocean region. So, I want to deal with those subjects.

Sri Lanka must adopt a modern, balanced and proactive Foreign Policy to address challenges and embrace opportunities for national progress. Our Foreign Policy, however, continues to lack a clear, goal-oriented

approach. We still cotton on to terms like “strategic”, “neutral” or “non-aligned” when it comes to our Foreign Policy. What do we mean by those? The same outdated methods, practices that were prevalent during the times of Gotabaya and Ranil Wickremesinghe as Presidents still persist. So, what specific aspects in the Foreign Policy and foreign relations stand out this Government from its immediate predecessors? That is what I am asking.

Our Foreign Policy approach concerning the Indian Ocean region remains very ambiguous. Is the Government making it overly security-focused, so much so that peaceful activities which may benefit the country would be lost over a period of time? Between development and security, where do we draw the line when it comes to the Indian Ocean and also on a number of other issues? It is a sad reality that the Government has no clear plan on advancing equitable exploration and exploitation of marine resources, identifying responsible and considerate partners for mutually beneficial cooperation. This imbalance may undermine national interests, which today put premium on economic advancement and sustainable development.

Sir, on the 25th of February, 2025, the Hon. Vijitha Herath, the Minister of Foreign Affairs, Foreign Employment and Tourism, addressed the 58th Session of the United Nations Human Rights Council. It was Sri Lanka’s first high-level statement made by the new Government at the UN. As I stated previously, the decision to engage with the Council and the Office of the High Commissioner for Human Rights is a very positive step - I congratulate the Hon. Minister on that - signaling a shift from the confrontational tone of previous years. Tone and tenor matters, but it is not something that would differentiate your stance from that of the previous governments in substantive terms.

Hon. Minister, your emphasis on collaboration with the Council and progress in human rights supplemented by technical assistance is welcome. This approach is crucial for a nation recovering from economic instability. Efforts towards reconciliation such as infrastructure development and recruitment of Tamil-speaking police officers as well as upgrading the Jaffna Library need to be commended, as it does the idea of holding “Sri Lanka Day” celebrations this year. These are all good to create a positive vibe, but will remain only symbolic steps, if you do not substantively address the bureaucratic mindset of some of the officials, who are very hostile to these concepts. So, you have to bring in a change in the mindset of the bureaucrats of this country.

Sir, questions remain. The Government must clarify its plans for strengthening domestic institutions like the Office on Missing Persons and the Truth and Reconciliation Commission. Practical measures and sound policy frameworks are essential to ensure meaningful progress. Delays in addressing accountability have led to international criticism and the establishment of the Sri Lanka Accountability Project. Hon. Minister, I would like to quote from the "Update on Office of the United Nations High Commissioner for Human Rights Sri Lanka Accountability Project". This document was out last evening on Sri Lanka time and is now on the website. The Hon. Minister said that at next September sittings, they are getting ready to talk about the advances they have made with the Sri Lanka Accountability Project.

Hon. Minister, you talked about a domestic process, well and good; වෙනසක් ඇති කිරීම සඳහා ප්‍රවේශයක් ගන්නා බව ඔබතුමා කියා සිටියා. ඔබතුමා එහෙම කිව්වත්, I have to tell you that you have to look at this particular Update, which has now been put out by the Office of the United Nations High Commissioner for Human Rights. That Update reports under different subheadings: “Mandate"; "Collecting, consolidating, analysing, and preserving information and evidence, Main Achievements"; "Collecting, consolidating, analysing, and preserving information and evidence, Priorities until September, 2025"; "Supporting relevant judicial and other proceedings, including in Member States, with competent jurisdiction"; "Advocating for the agency and support of victims and survivors"; "Developing possible strategies for future accountability processes” and so on and in the same breath, also talks about “How to support?” It will be good to note what it states under "How to support?" I quote:

> “OHCHR acknowledges the Government of Sri Lanka’s rejection of the mandate provided in Resolution in 51/1 and subsequent resolutions but has encouraged the Government of Sri Lanka to engage constructively with OSLap in its accountability-related efforts.
>
> Other UN Member States can play a vital role in supporting OSLap’s mandate by engaging with the Government of Sri Lanka to encourage its cooperation and to foster an environment conducive to accountability efforts.
>
> Member States can also leverage OSLap’s full potential by sharing data and information, submitting requests for assistance in investigating and prosecuting alleged perpetrators, and promoting opportunities for justice in national, regional, or international courts.”

So, this is a very far-reaching approach to ensure that our past mistakes are corrected. Under "How to support", they talk about supporting when the Government would engage to comply with all these requirements, particularly regarding the civil society organizations. In that, the High Commissioner’s Office states, I quote:

> “CSOs can contribute by collecting and submitting reports, testimonies, and other relevant information to assist OSLap’s investigations, ensuring that the broader context of human rights violations and abuses in Sri Lanka is documented. When submitting information, CSOs are encouraged to follow established protocols and use OHCHR’s secure digital tools to protect sensitive data. Providing concise summaries of evidence will enable OSLap to promptly access its relevance….”

So, in that, so many things have been stated. Therefore, make sure that your intelligence operatives do not make surveillance on all these civil society organizations which are going to assist the Government in its efforts to find the truth. Also, set up the truth-finding mechanism, which is important. The Muslims themselves have suffered in various conflicts; they have their grievances. The others - the Tamils and the Sinhalese - also have suffered. So, this would be a good way to get out of this mess and see that we comply with the UN Human Rights Commission’s requirements.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

Then, key issues such as the Prevention of Terrorism Act, the establishment of a Public Prosecutor's Office and the implementation of the Thirteenth Amendment were notably absent from the Minister's statement at the Council. Additionally, the lack of updates on justice for the Easter Sunday attacks also a matter of concern. We saw the ham-fisted approach by former President Ranil Wickremesinghe in his Al Jazeera interview, how he, very dismissively, dealt with some of the issues. I think he messed up the whole interview for himself, but yet, there are some who praise him. Today, we saw the Hon. Namal Rajapaksa praising him. But, it was a sorry state of affairs; for all of us who watched him, it was very discomforting to see him getting pummelled like that. Sir, instead of making progress in its efforts to bring the masterminds of the Easter Sunday attacks to justice, the Government Ministers have created an avoidable national frenzy over a bogey of religious extremism in the Eastern Province.

I am very happy that the Hon. Minister in charge of law and order is here. Some print and digital media warmongers as well as anti-Muslim hawkish social media had an open season over the last ten days, creating panic and decrying the alleged existence of a so-called potentially dangerous group of Muslim youths in Kalmunai. They described these youths varyingly as fundamentalists, as violent extremists and as potential terrorists.

Sir, the people in Kalmulaini are very peace-loving. As a matter of fact, with regard to the Sainthamaruthu incident after the Easter Sunday attacks, where the suicide bombers had blasted themselves, information was given by the local people. They would cooperate with the Government, if there is any violent activity. If this particular individual, who is following his convoluted religious practices, is a threat to the society, you take legal action rather than telling that in the public media and insulting the entire region and the people of that peace-loving community. There is no evidence of him turning to violence, as yet. If he is having some extremist religious ideas in particularly following his religious precepts and practices, the community leaders will have to approach him, deal and engage with him. But, labelling him as a potential terrorist or a terrorist would only make way for unnecessary speculation and even prevent tourists from coming to this country. So, this is an unnecessary thing and I think an unnecessary bogey has been created. So, we, as Muslim leaders, are very responsibly saying in this House that if the Government wants to investigate, do it very discretely, but do not openly make statements in the public and insult the entire community. The community feels enraged and outraged on what has already been said. This group and its existence have been known for several years; we have been watching them. In every community, we have such people who have very fundamentalist ideas; every religion has these groups. You saw a pastor who was hounded. He has been insulting other religions and was hauled up for hate speech. So, if that Muslim also does that, you go and haul him up, use the local laws and then, take action against him rather than trying to create an unnecessary bogey and an unnecessary fear psychosis. Some of the Sinhala media have carried very serious insulting stories which are virtually inciting violence and hatred against the Muslims. So, that should be prevented, Sir.

The Government is under severe strictures nowadays for its apparent failure to uphold law and order and to ensure national security. It could demonstrate that it does all it could to assure the public that law and order and national security are not compromised; it could ensure that all who committed serious offences, including the masterminds of the Easter attacks as well as all those involved in emblematic cases, are apprehended without further delay and justice is meted out to them expeditiously. Going by what is happening, I dare ask, is it to divert public and international focus away from this cardinal failure of the Government that the bogey of an extremist group in the East has been made the talk of the town today?

Sir, the community felt a deep sense of panic and are deeply concerned and hapless. Yet, it remained and continues to remain extraordinarily calm amidst the barrage of stereotyping and scapegoating that Government narratives have caused. The Government should demonstrate that it has evidence to substantiate its claim by apprehending and neutralizing them, if they are violent extremists or potential terrorists. If you look at some of the interviews of this particular person, he is blaming me also. But, I am not getting unnecessarily outraged about it because these are people who have their own convoluted ideas. Then, you have a particular Member of Parliament who is also talking extremism in this House, but that is his Parliamentary Privilege. Rather than extremism, sometimes, he makes insults to other communities as well, all of which is being tolerated. Since it is Parliamentary Privilege, those could be tolerated. But, if they are made outside Parliament, you can take action. There are local laws to haul them up before courts. So, the Kalmunai community is ever more extraordinarily resilient and patient, committed to cooperate and go the whole distance with the investigators. They are also committed to investigate the alleged links to so-called violent extremism, if any, in full transparency, working with the independent, multi-ethnic civil societies and professional organizations visiting the region. Sir, interestingly, the Government talks about people-led transformation day in and day out. Hon. Minister, you have made that point in your statement at the Human Rights Council in Geneva. What is the meaning of being "led by the people" when the Government creates unnecessary narratives that implicate a community and make it look as if it was not a part of the people that the Government keeps in view? A serious lack of diversity and inclusion in Government and State institutions, on the one hand, and a seemingly deliberate attempt at exclusion of a community from the national mainstream by shedding negative light on it, on the other, appear to erase the concept of people-led transformation of its true meaning! There is no time for word play, Sir, but genuine action is needed to rebuild trust and credibility, both domestically and internationally.

The challenges faced by the fisher folk in the Northern Province due to unsustainable fishing practices such as bottom trawling in the Palk Strait are deeply concerning. These practices deplete marine resources and damage their livelihoods, threatening the future of our fishing communities who have already endured decades of hardship. Sri Lanka and India remain engaged in discussions to address this issue with a joint working group and an arrangement for dialogue between Northern and Tamil Nadu fisher folk. However, these mechanisms have yielded limited results and the genuine concerns of our fisher folk remain unresolved.

ගරු සභාපතිතුමා
(மாண்புமிகுதவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rauff Hakeem, you have only two more minutes.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகுசட்டத்தரணிரஊப்ஹகீம்)
(The Hon.Rauff Hakeem, Attorney-at-Law)
Sir, I will take the time of the Hon. Nizam Kariapper as well because he is not coming.

Sri Lanka's laws prohibit illegal fishing and ban bottom trawling altogether. Therefore, we must seek India's cooperation to enforce these laws effectively. A constructive step could be empowering the Governor of the Northern Province to engage with Tamil Nadu authorities to emphasize the urgency of finding a solution to this issue. Sir, additionally, it is imperative to convene the India-Sri Lanka Joint Commission as a priority with fisheries cooperation as a key item on the agenda . Failures of the joint working group must be escalated to a higher political level for timely resolution. Sir, this is not just a political issue; it is a humanitarian challenge. Livelihoods are at stake, and SDG 14 compels us to act responsibly to conserve marine resources. Therefore, we propose exploring innovative solutions to this problem. They range from cooperative fishing or a joint management mechanism involving Sri Lanka, India and Tamil Nadu. Such initiatives could ensure sustainable fishing practices and equitable benefit-sharing.

Then, Sir, I would like to cite a news item which appeared in an Indian newspaper this morning and which states, I quote:

"கச்சதீவு அந்தோனியார் ஆலய திருவிழா - ராமேசுவரத்தில் இருந்து 3ஆயிரம் பேர் பங்கேற்பு"

ශාන්ත අන්තෝනි දෙවිමැදුරේ උත්සවය පිළිබඳව ඒ ප්‍රවෘත්තියේ මෙහෙම කියලා තිබෙනවා. මම ඒක දෙමළ භාෂාවෙන් කියවන්නම්:

"தொடர்ந்து பெரிய சிலுவையை இந்தியா, இலங்கையைச் சேர்ந்தவர்கள் சுமந்து, ஆலயத்தைச் சுற்றி 14 இடங்களில் வைக்கப்பட்டு சிலுவைப் பாதை திருப்பலி நடந்தது. தேரை இலங்கை கடற்படையினருடன் இரு நாட்டைச் சேர்ந்தவர்களும் தூக்கி ஆலயத்தைச் சுற்றி வந்தனர். இந்த தேர் பவனியும் விமரிசையாக நடந்தது. படகுகளில் இருந்து பத்திரமாக மக்கள் இறங்குவதற்குத் தேவையான ஏற்பாடுகளை இலங்கை கடற்படையினர் செய்திருந்தனர். ஒவ்வொரு படகையும், ரோந்துப் பணியில் ஈடுபட்டிருந்த இந்திய கடலோர காவல் படை மற்றும் இந்திய கடற்படைக் கப்பல்கள் கண்காணித்தன. கச்சதீவு கடல் பகுதியை 20க்கும் மேற்பட்ட இலங்கை ரோந்துப் படகுகள் மற்றும் அந்நாட்டுக் கப்பல்கள் கண்காணித்தது குறிப்பிடத்தக்கது"

What a nice cooperative exercise this is for a religious festival! If you can do that for a religious festival, why can you not do it for your own fishermen who are violating laws? Well, both countries, in cooperation, do it perfectly. So, I would like you to take an example from this St. Anthony's Church festival in Kachchativu, where facilities had been provided by both Governments and for which 3,000 people have come from India to participate. A lot of facilities had been provided by both Governments to make sure that it happens without any problem. So, in a similar way, you can approach this issue of the fishermen and resolve it by having very friendly discussions.

Having said that, Sir - there are a lot of items I needed to take up - I would now like to deal with another important matter relating to the tourism sector. In the tourism sector, Sir, there are several issues. Particularly, I must congratulate the Minister for having appointed Mr. Buddhika Hewawasam as Chairman of both the Sri Lanka Tourism Development Authority and the Sri Lanka Tourism Promotion Bureau. Your Chairman is a very experienced expert in the field. Earlier, he was Country Manager of IATA. So, you have selected a very good individual for this job and I would like to congratulate him and also the Minister for his good selection. There are so many things that need to be done to improve tourism in this country. We see there are about 53,900 registered hotel rooms. But, in the informal sector, there are several people who are supplying unregistered rooms. So, see that they are also brought under some registered process so that there could be proper monitoring of the facilities given to the tourists. Then, there are several boutique hotels. Already, they are talking about 48 boutique hotels, but that is a very small number. It must be larger than that since there are several boutique hotels. But, whether they had been properly registered is the question. These boutique hotels bring in high-value tourists. Sometimes, some of the boutique hotels charge more than US Dollars 1,000 per night; such hotels are there in this country. So, try to promote that aspect of it.

Then, I would like to ask the Hon. Minister to make sure that the United Nations World Tourism Organization holds its next annual tourism conference in Sri Lanka. Try to approach them and see whether you could get the UNWTO Annual Conference to be held here. An international surfing competition should also be organized by the Sri Lanka Tourism Promotion Bureau. Earlier, the SriLankan Airlines used to support it, but, now, the SriLankan Airlines is in a very difficult situation. But, yet, in promoting tourism, I am sure, they would come forward to assist and have the surfing competition again in Arugam Bay. It has not happened for a few years. So, try to revive it.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

As many tourists are willing to fly directly from Colombo to other destinations, we have to essentially develop domestic flight services. Particularly, the seaplane dock at Arugam Bay has been dismantled and I would like to ask you to reconstruct that seaplane dock. It is only Cinnamon Air which operates seaplanes. So, if it would be reconstructed, it would be a big boom to tourism. Various other seaplane operators would also come into play, if seaplane docks are developed in Arugam Bay and Pasikuda. The Hon. Hizbullah is here. The Batticaloa District has the largest number of lagoons in this country; there are several lagoons all over the Batticaloa District. You can always allow these seaplanes to land there. A massive acreage is covered by the lagoons. So, those could be used for seaplane landing. Of course, an Hon. Member suggested that an airport be built in Pottuvil. But, we already have an airport in Ampara. So, improve that runway and make sure that larger planes could land in Ampara.

Then, Batticaloa has been declared an international airport already.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
But, it has been stopped.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Yes, it has been stopped. With a lot of pomp and fanfare, the earlier Minister announced that Batticaloa had been declared as an international airport. But, if you look at the runway, you would see that with all those potholes, it is very difficult for any international plane to land there.

Then, I would like to refer to the India-Sri Lanka ferry service. At the KKS Harbour, there are no terminal facilities. But, look at the other end. On the Indian end, there is a perfect terminal facility. But, here, passengers have no terminal to come to and for their arrival facilitation. So, terminal facilities at the KKS Harbour have to be improved. Also, there had been a talk about a Mannar-India ferry service. Even for that, we need to build a terminal facility. Particularly with regard to cruise tourism, I would say even the Colombo Port does not have a proper cruise terminal. Therefore, try to see that you have a well-equipped cruise terminal built there because cruise tourism has brought in so many tourists. Similarly, at the Ashraff Jetty of the Trincomalee Harbour also - Trincomalee is a deep-sea port and one of the best natural harbours in the world - make sure that you have a proper passenger terminal. It was in the name of my former leader and Minister, the late Hon. M.H.M. Ashraff, and in his honour that that jetty had been named. In that jetty, you could create a proper passenger terminal so that the tourists who arrive by cruise ships could benefit.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Ships come, but there is no terminal.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Yes, several ships come, but there is no terminal. This is the problem.

It is also suggested that all tourist service providers operating in the informal sector - tourist drivers, tuk-tuk drivers, tourist vendors, tourism shopkeepers, tourist facilitators et cetera who are providing services to tourists - be trained and issued with an identity card by the Tourism Development Authority or some other authority. Identification of such relevant informal sector tourist service providers could be done by the Tourist Police until relevant arrangements are made. So, those are some of the ideas I would like to share with the Hon. Minister on tourism development.

Having said that, Hon. Minister, I would also like to deal with the issue of Israel's cultural and military presence in Sri Lanka. It needs our attention. When the Hon. Prime Minister has stated that no permission has been granted or will be granted for the establishment of Jewish religious centres - We have no problem with synagogues being set up, but they have to be set up according to the law of the land - how has this happened? The Prime Minister has said that no permission had been granted for the establishment of Jewish religious centres. The accuracy of the assertion remains to be demonstrated. There are STF personnel assigned to protect those centres. How does the State give STF protection to some religious premises unless there is permission?

Sir, improved ties between our defence sector and Israel dates back to the post-conflict period. That is perfect. When Sri Lanka received crucial weaponry support during trying times, all that was accepted. It is, perhaps, this connection that may explain Israel's occasional security presence. In 2009, Sri Lanka initiated a labour migration scheme with Israel, allowing seasonal farm workers to earn substantial salaries in Israel. Attempts to involve the International Organization for Migration in legitimizing this scheme was unsuccessful. The International Organization for Migration did not want to give any certificate for that because they know these people are being taken to farms in Israel, from where the poor Palestinians have been ousted and to which they have been denied access. They are day labourers from the Occupied Palestine who have been working in Israeli farms. With the serious situation in Gaza, several things have happened. We have not even decried Israel for what has happened there, the war crimes. Brazil, South Africa and even Bangladesh have condemned Israel's action and even petitioned to the International Criminal Court. They said that Israel Prime Minister Netanyahu and his cohorts must be hauled up for war crimes.

But, we are keeping mum. This Government has more responsibility and a duty because they have been in the forefront - I know that my Friend, the Leader of the House, was President of the Sri Lanka-Palestine Parliamentary Friendship Association - to stand up

against these atrocities and talk about them openly. There is nothing wrong in doing that because we are not going to unnecessarily offend people, but we have to speak the truth. If the South African President can say it, if the Brazilian President can say it and Bangladesh - our neighbouring country - can say it, why not Sri Lanka? Why do you not openly criticize them?

Then, regional leadership is also important. Actively participating in Indian Ocean and Indo-Pacific norm building to secure shared prosperity is imperative. The Hon. Minister said today that we are going to get ASEAN membership. That is a pipe dream, Sir. During our economic troubles, we wanted to become a sectoral partner and we were allowed in. So, we are now enjoying the status of a sectoral partner. If we are admitted to that position alone, it would suffice for us. But, what is happening now is, the Hon. Minister is claiming that we are going to get its membership. That is a pipe dream, Sir. All who know the process, know that.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
A sectoral partner.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Yes, that is right. The Hon. Minister accepts that.

Hon. Minister, last year, the BIMSTEC established an Eminent Persons' Group. As a result of a recommendation made by the Foreign Ministers at the BIMSTEC Summit held in Colombo in 2022, the governments were asked to nominate an Independent Eminent Expert to the group in order to help charter a new vision and a strategy for the BIMSTEC. All member states, except Sri Lanka, nominated independent experts who are knowledgeable and experienced as well as well-accomplished in their chosen fields. Sri Lanka, however, nominated three different persons to the three meetings of the Group. Consequently, there was no serious input from Sri Lanka at the first session of the Group held in Dhaka. Hon. Foreign Minister, it is possible that you have already decided to attend the BIMSTEC Summit in Bangkok from 01st to 03rd of April, 2025; I am sure the Hon. Vijitha Herath is going to attend that Summit. You must avail yourself of the opportunity to demonstrate that Sri Lanka takes BIMSTEC seriously. You must put the house in order to be able to initiate, follow up and coordinate effectively all BIMSTEC activities. It is time to make our Foreign Service think innovatively and come up with practical and meaningful proposals in consultation with relevant ministries, agencies and experts, which could enrich BIMSTEC's output and its quality of service.

Sir, economic integration is an important priority, if the country would like to increase and strengthen trade and investment ties globally and regionally while advocating and avoiding the overlaps and inefficiencies currently taking place on a possible China-Sri Lanka Free Trade Agreement. What is happening to that? It is a matter that requires participation of all business and other stakeholders. Also, what is the status of progress with regard to the already signed Singapore-Sri Lanka Free Trade Agreement? Are we still seeking revision to that Agreement and if so, to what extent have we advanced in that direction? Not implementing it or renegotiating it continues to send out negative signals to the world and the region, especially to ASEAN that Sri Lanka remains unworthy of economic trade and investment cooperation. Therefore, the issues with regard to the Singapore-Sri Lanka Free Trade Agreement as well as the China-Sri Lanka Free Trade Agreement have to be concluded as fast as possible so that we could benefit from the concessions derived from those agreements as well.

Having stated that, I would congratulate the Minister for having conducted our country's foreign affairs up to now. In his statement to the UN Human Rights Council, our position is very clear, but do not go back on your promises engaged with the UN Human Rights Council. And, make sure that we come out of this mess as fast as possible. Thank you.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Hon. Member, as far as the issue of free visa is concerned, the Government has already taken a decision to offer free visas for 39 countries. There is another new proposal to add Pakistan also to that list. The Gazette Notification will be submitted to Parliament. Then, you can vote for that.

Then, the other issue with regard to opening bank accounts here by Iranian diplomats has already been sorted out. There was such an issue a year ago and now it has been sorted out. I think they do not know about that

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Yesterday, at the *Iftar*, I heard that.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
We will check on that.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Please, do.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Prof.) Ruwan Ranasinghe. You have 14 minutes.

Order, please! The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

[අ.භා. 2.38]

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඉදිරිපත් කරන කාරණා, එතුමන්ලා ගෙනෙන යෝජනා ගැන මේ සභාවේ වාඩිවෙලා අහගෙන ඉන්නකොට අපට හිතෙන්නේ මොකක්ද? සමහර අය දීර්ඝ කාලයක් දේශපාලනයේ නිරත වෙලා, අමාත්‍ය ධුර දරලා, ඒවා හාලා දැන් අපට උපදෙස් දෙනවා, "මෙහෙම කරන්න, අරහෙම කරන්න" කියලා. ඒවායෙන් ගන්න හොඳ දේවලුත් තිබෙනවා. අපි ඒවා පිළිගන්නවා.

Hon. Presiding Member, I would like to mention that we took over a country, about which the world had a bad perception. Our country was known for corruption, Ministers asking for commission and for tourists being murdered. That was the perception world tourism had about this country. Madam, I also would like to mention that within this short period, our country has again received tourist attraction. Sri Lanka has been enlisted in databases of numerous tourism-related agencies only within the last three months. I would like to mention a few. The Colombo-Badulla train journey has been ranked as one of the best in the world by Lonely Planet. That has been during the last three months. Then, Sri Lanka shines on BBC Travel's "25 Best Places to Travel in 2025". Travel and Tour World recognized Sri Lanka as a "Top Destination for Families with Young Children - Generation Beta". Then, Sigiriya has been declared "World's Most Welcoming City for 2025". "Experience the Magic of Sri Lanka's Most Scenic Train Ride" reports the "National Geographic". Also, Sri Lanka has been listed in the "World Travel" magazine as one of the 25 best destinations in the world and the Pekoe Trail was listed yesterday by "The Times" magazine as one of the greatest places to visit. Those are very recent tourism acclaims we have earned. This shows that we are taking forward the country on the right track. Therefore, I think some of these claims made by our Friends in the Opposition need to be denied.

මේ සභාවේදී සමහර මන්ත්‍රීවරු සඳහන් කළා, උතුර, නැඟෙනහිර පළාත්වල tourism වෙනුවෙන් අපි මොනවත් කරන්නේ නැහැ කියලා. ඇත්තටම එතුමන්ලාගේ කාලයේ එහෙම කළේ නැහැ. අපි උතුර, නැඟෙනහිර සංචාරක කර්මාන්තය දියුණු කරන්න වැඩ පටන් අරගෙන තිබෙනවා. අපි පසුගිය දවසක ඊට අදාළ නිලධාරීන් සියලුදෙනා කැඳවා මන්නාරම, තලෙයිමන්නාරම ප්‍රදේශවල නිරීක්ෂණ චාරිකාවක් ගියා. එහි තිබෙනවා, වෙඩිතලතිව් coral reefs. මම හිතනවා, එතැන ඉතාම හොඳ සංචාරක ආකර්ෂණයක් සහිත ස්ථානයක් විධියට දියුණු කරන්න පුළුවන් කියලා. Wilpattu National Park එකට තව entrance එකක් ලබා දෙන්න ඕනෑ. මඩු වනාන්තරය තුළ අපට wildlife safari කරන්න අවස්ථාවක් තිබෙනවා.

මෙතැනදී කිහිප අවස්ථාවක සඳහන් වුණා, තලෙයිමන්නාරම - රාමේෂ්වරන් ferry service එක ගැන. එතැන තිබෙන ජැටිය අවුරුදු ගණනක් පාවිච්චි කරන්නේ නැතිව දිරලා ගිහිල්ලා තිබෙනවා. ඒ ජැටිය හදන්න ඉතා විශාල ආයෝජනයක් කරන්න අවශ්‍යයි. ඒ ජැටිය දියුණු කළාට පස්සේ අපට තලෙයිමන්නාරම සහ රාමේෂ්වරන් අතර තිබෙන ferry service එක ආරම්භ කරන්න පුළුවන්. අපි ඒ විධියට උතුර, නැඟෙනහිර සංචාරක කර්මාන්තය දියුණු කරන්න පියවර අරගෙන තිබෙනවා.

සමහර මන්ත්‍රීවරු සඳහන් කළා, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතු ඉඩම් වැලි කැණීම්වලට ලබා දීලා කියලා. මොනවා හරි අසත්‍ය තොරතුරු ටිකක් ලබා දීලා තිබෙනවා. ඔය කියන්නේ කුච්චවේලි ඉඩම් සම්බන්ධව. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට කුච්චවේලිවල ඉඩම් අක්කර 510ක් තිබෙනවා. ඒ වාගේම ඒ ප්‍රදේශවල පුද්ගලික අයගේ ඉඩම් තිබෙනවා. හැබැයි, අපේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතු ඉඩම් එක අක්කරයක්වත්, එක බිම් අඟලක්වත් වැලි කැණීම්වලට ලබා දීලා නැහැ කියන එක මේ සභාවට මම දැනුම් දෙන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි, අපි රජයක් විධියට සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න, ආයෝජන පහසුකම් සලසන්න කටයුතු කරලා තිබෙනවා.

2024 වර්ෂය ගත්තොත්, ඒ වර්ෂය පුරාවටම සංචාරක ක්ෂේත්‍රයට ආයෝජන ඇවිත් තිබුණේ ඩොලර් මිලියන 22යි. හැබැයි, මේ අවුරුද්දේ පෙබරවාරි 18වැනි දා වෙනකොට -මාස දෙකහමාරකට විතර- ඩොලර් මිලියන 20කට වැඩිය විදේශ ආයෝජන සංචාරක ක්ෂේත්‍රයට ඇවිත් තිබුණා. මෙයින් කියැවෙන්නේ අපේ සංචාරක ක්ෂේත්‍රයට විදේශ ආයෝජකයින් විශාල වශයෙන් ආයෝජනය කරමින් සිටිනවා කියන එකයි. මොකද, ඒගොල්ලන් තේරුම් අරගෙන තිබෙනවා, කලින් හිටපු ඇමතිවරු වාගේ දැන් ඉන්න ඇමතිවරු කොමිස් ඉල්ලන්නේ නැහැ කියලා. ඒ විතරක් නොවෙයි, අපි පුළුවන් තරම් ඒගොල්ලන්ට අවශ්‍ය පහසුකම් සලසා තිබෙනවා. ඒගොල්ලන්ගේ ආයෝජන අපේ රටේ කරන්න පහසු කරලා තිබෙනවා. ඒ වාගේම අපි අපේ රටේ ආයෝජකයිනුත් දිරිමත් කරනවා.

විශේෂයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතු ඉඩම් - අපි JEDB එක සමඟක් සාකච්ඡා කර තිබෙනවා. ඒගොල්ලන් සතුවත් ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා - මහවැලි සංවර්ධන අධිකාරිය වැනි ආයතනත් එක්ක ඒකාබද්ධ කරලා අපේ සංචාරක ක්ෂේත්‍රයට අදාළව ආයෝජන වැඩි කරන්න අපි පහසුකම් සලසා දී තිබෙනවා. ඉදිරියේදී වැඩි වන සංචාරකයන් ප්‍රමාණයත් සලකා බලා මේ ක්ෂේත්‍රයට අවශ්‍ය පහසුකම් දියුණු කරන්න අපි කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතැනදී සඳහන් කළා, සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර ලියාපදිංචි කිරීම් පිළිබඳව. ඇත්තටම මීට මාස හතරකට කලින් අපි මේ රජය භාර ගන්නකොට සංචාරක සංවර්ධන අධිකාරියේ 5,000කට වැඩිය පෝලිමක් තිබුණා, ව්‍යාපාර ලියාපදිංචි කරගන්න හා නැවත අලුත් කරගන්න. පසුගිය රජයන් කිසිම වග විභාගයක් නැතිව, ඒ කටයුතුවලට තාක්ෂණය පාවිච්චි කරන්නේ නැතිව, පරිගණකගත කරන්නේ නැතිව කටයුතු කරමින් සිටියා. හැබැයි, අපි ඇවිත් මාස තුනෙන් ඒ 5,000කට වැඩි පෝලිම අවසන් කරලා තිබෙනවා. මේ වෙනකොට කිසිම කෙනෙක් පෝලිමේ රැඳිලා ඉන්නේ නැහැ, සංචාරක ක්ෂේත්‍රයේ තමන්ගේ ව්‍යාපාරය ලියාපදිංචි කරවා ගන්න. මේ වෙනකොට අපි ඒවා සම්පූර්ණයෙන් අවසාන කරලා තිබෙනවා.

ඊළඟට අපි බලමු, සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය පුහුණු කිරීම් පිළිබඳව. අපි දන්නවා, අපට හෝටල් පාසල් කිහිපයයි තිබෙන්නේ කියලා. හැබැයි, ශීඝ්‍රයෙන් දියුණු වෙන මේ ක්ෂේත්‍රයට අදාළව පුහුණු කිරීම් කරන්න අවශ්‍යයි. ඒ නිසා මේ අවුරුද්දේ අන්තිම වෙනකොට පුහුණු කිරීම් දිස්ත්‍රික් මට්ටමට ගෙනියන්න, regional මට්ටමට ගෙනියන්න සහ දැනට සිදු කරගෙන යන පුහුණු කිරීම් double කරන්න අපි සැලසුම් කර තිබෙනවා.

ඒ වාගේම මේ ගරු සභාවේ කථා කළා, law enforcement ගැන. කලින් කිව්වා වාගේ සංචාරක ක්ෂේත්‍රයේ ලියාපදිංචි කාමර 53,000ක් තිබුණත්, ඒ වාගේ කිහිප ගුණයක කාමර අපේ රටේ තිබෙනවා ලියාපදිංචි නොවුණු. ඒවා අපිත් එක්ක ලියාපදිංචි වෙලා නැහැ. ඒක informal sector එකක් විධියට තමයි operate වෙන්නේ. විවිධ හේතු නිසා ඒ අය රජයත් එක්ක, එහෙම නැත්නම් සංචාරක සංවර්ධන අධිකාරියත් එක්ක ලියාපදිංචි නොවී තමන්ගේ ව්‍යාපාරය කරගෙන යනවා. හැබැයි, ඒ අය ලියාපදිංචි වෙලා ඉන්න online booking engines, එහෙම නැත්නම් online platforms තිබෙනවා. ඒගොල්ලන් එක්ක අපි සාකච්ඡා කරලා, එහෙම නැත්නම් අපිත් ඒවාට ගැළපෙන තාක්ෂණික වැඩසටහන් නිර්මාණය කරලා ඒ informal sector එක අපේ formal sector එකට ආකර්ෂණය කර ගන්න, ඒ අයත් regulate කරන්න, ඒ අයටත් නීතිය ක්‍රියාත්මක කරන තත්ත්වයට මේ ක්ෂේත්‍රය ගේන්න අපි මේ වෙනකොට කටයුතු කරමින් ඉන්නවා. වසර ගණනාවක් තිස්සේ නොවිසඳුණු ප්‍රශ්න, එහෙම නැත්නම් දශක ගණනාවක් තිස්සේ වර්ධනය වෙච්ච ප්‍රශ්න අපි ක්‍රමානුකූලව විසඳමින් තමයි මේ වැඩකටයුතු කරගෙන යන්නේ.

සංචාරක ක්ෂේත්‍රයේ city brandingවලට, එහෙම නැත්නම් නගර කේන්ද්‍ර කරගත් ප්‍රවර්ධනය සඳහා අපි මේ අය වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන් සීගිරිය, මහනුවර, අනුරාධපුර, ගාල්ල වැනි ස්ථානවලට. දැන් ලෝකය එහෙම තමයි destinations brand කරන්නේ; ඒ, ඒ නගර විධියට. එතකොට ඒ නගර අතරක් යම්කිසි තරගකාරීත්වයක් ඇති වෙනවා. මේ වැඩසටහන වෙනුවෙන් අපි රුපියල් මිලියන 500ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඊට අමතරව අපි රජයක් විධියට පියවර අරගෙන තිබෙනවා, සියලුම පළාත් ආවරණය වන පරිදි සංචාරක ආකර්ෂණීය ස්ථාන 100ක් තෝරාගෙන ඒ එක ආකර්ෂණීය ස්ථානයකට රුපියල් මිලියන 10 බැගින් රුපියල් මිලියන 1,000ක් යොදවලා ඒ සංචාරක ආකර්ෂණීය ස්ථානවල මූලික පහසුකම් දියුණු කරන්න. මේකත් අපි සංචාරක ක්ෂේත්‍රයට යොදවන ආයෝජනයක්.

ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයේ වැඩ කරන අය ලොකු අභියෝග මැද්දේ තමයි තමන්ගේ ව්‍යාපාර කරගෙන යන්නේ; ඒ රැකියාවේ නිරත වෙන්නේ. ඒ අය වෙනුවෙන් සහභාගිත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් සහ සමාජ ආරක්ෂණ අරමුදලක් මේ වසර තුළ අපි ඇති කරනවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය සඳහා ආර්ථික සවිබලගැන්වීම අවශ්‍යයි. අපේ රටේ මේ සංචාරක ක්ෂේත්‍රය, ඒ ව්‍යාපාරය ගත්තොත්, යම් යම් ස්ථාන, යම් ප්‍රදේශ කිහිපයකට තමයි කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ.

ඒ වාගේම ව්‍යාපාර විධියට ගත්තත් කිහිප දෙනෙකුට, විශාල ව්‍යාපාර කිහිපයකට තමයි කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ. හැබැයි අපේ රටේ සාමාන්‍ය ප්‍රජාවට සංචාරක ක්ෂේත්‍රයේ අවස්ථා නිර්මාණය කරන්න ඕනෑ. ඒ අනුව අපි සංචාරක කර්මාන්තය ඈත පස්සරට, බදුල්ලට, ලුණුගලට, අනෙක් පැත්තෙන් මන්නාරමට, කිලිනොච්චියට, දෙනියායට වාගේ මේ රටේ අනෙකුත් ප්‍රදේශවලට ගෙනියන්න අවශ්‍ය සැලසුමක් හදලා තිබෙනවා. විශේෂයෙන් මම ඉස්සෙල්ලාත් සඳහන් කළා JEDB වාගේ ආයතනත් එක්ක සාකච්ඡා කරලා ඒගොල්ලන්ගේ ඉඩම් ලබාගෙන, අපේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අවස්ථාව උදා කරලා සංචාරක ක්ෂේත්‍රය ඉදිරියට ගන්න අපි මේ වසර තුළ කටයුතු කරනවා කියන එක.

මේ සභාවේදී ව්‍යවසායකත්වය ගැන කෑ ගහන මහත්වරු COVID-19 වසංගතය වෙලාවේ කොහොමද කටයුතු කළේ කියලා අපට මතකයි. අද අපි විදේශ රැකියා ක්ෂේත්‍රය පිළිබඳවත් සාකච්ඡා කරනවා. ඈත එපිට කුරුණෑගල, ගල්ගමුවේ අම්මලා පිට රට ගිහිල්ලා COVID-19 වසංගතයෙන් තවත් අසරණ වෙලා කටුනායකට ආවාට පස්සේ තමන්ගේ හෝටලයට ගෙනිහිල්ලා ඒගොල්ලන්ගෙන් සල්ලි ගරා ගත්තු අය දැන් අපට ව්‍යවසායකත්වය ගැන කියනවා. අපි ඒගොල්ලන්ට කියන්නේ ව්‍යවසායකයෝ නොවෙයි, ජාවාරම්කාරයෝ කියලා. ඒ විතරක් නොවෙයි. තමන්ගේ පවුල්වලින් Ambassadorsලා විධියට පත් කළ සහෝදරවරු ඒ රටවලට ගිහිල්ලා travel agencies දැම්මා. එහෙම කරලා මේ රටට සංචාරකයෝ ගෙනාවා. ඒ වෙලාවේ අපේ රට lock down කරලා තිබුණේ. හැබැයි එයා ගිහිල්ලා Yala National Park එක open කරගෙන එයාගේ සංචාරකයෝ අරගෙන ගියා. ඒවා පවුල්වලට ලියාගෙන තිබුණේ. අපි දැන් අපේ රටේ national parks විවෘත කරලා තිබෙනවා. අපි දන්නවා Wilpattu National Park එක විශාලම national park එකක් බව. අපි ඒකට තව ප්‍රවේශ මාර්ග කිහිපයක් විවෘත කරලා සංචාරක ක්ෂේත්‍රයට යොදා ගන්න කටයුතු කරනවා. අනෙක් පැත්තෙන් මාදුරුඔය, වස්ගමුව, යාල කියන ජාතික වනෝද්‍යාන තවදුරටත් සංවර්ධනය කරලා සංචාරක ක්ෂේත්‍රයට යොදා ගන්න අපි කටයුතු කරනවා, මේ වසර තුළ. විශේෂයෙන්ම Yala National Park එක තුළ විශාල තදබදයක් තිබෙනවා. මේ ක්‍රියාපටිපාටිය තුළින් ඒක අවම කර ගන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි මේ අය වැයෙන් Dutch Fortsවලට මුදල් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන් කල්පිටිය, මන්නාරම සහ යාපනය Dutch Forts සංවර්ධනය කරන්න මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම Jaffna Dutch Fort එක සහ Mannar Dutch Fort එක අතර catamaran service එකක් open කරන්න අපි මේ වෙනකොට investor කෙනෙක් සොයාගෙන තිබෙනවා. මේ වාගේ කටයුතු හරහා සංචාරක ක්ෂේත්‍රය උතුරට සහ නැහෙනහිරට ගෙනියන්න අපි කටයුතු කරමින් ඉන්නවා. ඉතින් පොදුවේ මේ Budget එකෙන් සංචාරක ක්ෂේත්‍රයට රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබුණත්, මේ ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා අනෙකුත් ක්ෂේත්‍ර හරහා, - පරිසර වෙන්න පුළුවන්, මාර්ග සංවර්ධන වෙන්න පුළුවන්, සංචාරක ප්‍රවර්ධන වෙන්න පුළුවන් - අපි රුපියල් මිලියන 5,000ක්, 6,000ක් ආයෝජනය කරනවා.

විශේෂයෙන්ම අපේ ජාතික ප්‍රවර්ධන වැඩසටහන අපි මේ මාසය තුළ ආරම්භ කරනවා. අප්‍රේල් මාසයෙන් පසුව එන්නේ low season එකයි. අන්න ඒ කාලය ඇතුළත සංචාරකයන් විශාල පිරිසක් ආකර්ෂණය කර ගන්න, ඒත් එක්කම අප බලාපොරොත්තු වන මිලියන තුනේ සංචාරක ඉලක්කය ළඟා කර ගන්න අපි කටයුතු කරනවා. ඒ වෙනුවෙන් අවශ්‍ය පුහුණුව, සංවර්ධනය, law enforcement ආදි සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අපි මේ අය වැය තුළින් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය තුළින් ආර්ථිකයට ලබා දෙන්න පුළුවන් ඉහළම දායකත්වය ලබා දෙන්න රජය විධියට අපි කටයුතු කර තිබෙනවා. මා මුලින් සඳහන් කළ විධියට ඒ හරහා අපේ රටේ එක කණ්ඩායමකට, එක කල්ලියකට නම් පාඩුවක් සිදු වනවා. මෙතැනදී විපක්ෂයේ එක් මන්ත්‍රීවරයෙකු සඳහන් කරනවා මම දැක්කා, duty-free shopsවල rent එක අඩු කරන්න කියලා. ඉස්සර එහෙම කර ගන්න පුළුවන් වෙන්න ඇති. හැබැයි, අපේ ආණ්ඩුව ලවා ඒවා කර ගන්න හැකි වෙන්නේ නැහැ. අප විශේෂයෙන්ම එවැනි ආර්ථික වාසි උදා කරන්න බලාපොරොත්තු වන්නේ අපේ රටේ ප්‍රජාවට හෙවත් මහ ජනතාවටයි. එහෙම නැතුව කල්ලියකට ව්‍යාපාර කරන්න අවස්ථාව උදා කරන්න නොවෙයි අපේ රජය ඇවිත් තිබෙන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපේ රජයේ දැක්ම, සහභාගිත්ව සහ තිරසර සංචාරක ආර්ථිකයක් ඇති කිරීමයි. අපේ දැක්ම වන inclusive and sustainable tourism economy එක

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

ළඟා කර ගන්න අවශ්‍ය යෝජනා අපි මේ අය වැය මඟින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ඒ සියලු යෝජනාවල ප්‍රතිඵල මේ වසර තුළ ළඟා කර ගන්නත් අපි කටයුතු කරනවා. එ් කාරණයත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.52]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය කියන්නේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. ගරු විජිත හේරත් ඇමතිතුමා හොඳ අවබෝධයකින් මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරනවා කියා අපි විශ්වාස කරනවා. මොකද, එතුමාට අත්දැකීම් ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය තමයි අපේ රටේ අනාගතය සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් කළ යුතුව තිබෙන අමාත්‍යාංශය. ඒ හින්දා අපි මේ අමාත්‍යාංශය ලඝු කොට සලකා කථා කරන්න හොඳ නැහැ. ඒ පිළිබඳව කථා කරන කොට අපි පුළුල්ව කථා කරන්න ඕනෑ. එහිදී විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් නොසලකා හැරලා කටයුතු කරන්න හොඳ නැහැ. ගෝඨාභය රාජපක්ෂ නිටපු ජනාධිපතිතුමා කිව්වා නේ, "මම තමයි හොඳටම කළේ" කියලා. ඔබතුමා ඒ වාගේ නොවී කටයුතු කරන්න, ගරු ඇමතිතුමනි. ඔබතුමා එහෙම උඩඟු නැහැ කියා මම හිතනවා. මේ අදහසුත් ඉතාම වැදගත් අදහස්. මොකද, අවුරුදු ගණනාවක් පාලනය කළත්, මේ අංශ එදිනෙදා, නිරන්තරයෙන් වෙනස් වන දේවල්. මේක අලුත් වන ලෝකයක්. එම නිසා අපි මේ හැම ක්ෂේත්‍රයකටම අලුත් අලුත් අදහස්, අලුත් අලුත් වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්න ඕනෑ.

ගරු විජිත හේරත් අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ඇති විදේශ කටයුතු විෂයය අතිශය වැදගත්. ඉතිහාසයේ ඉඳලා දීර්ඝ කාලයක් තිස්සේ අපේ රට ලෝකයත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කළා. අපේ රටේ ඉතිහාසයේ අනුරාධපුර යුගය ගෙන බැලුවත්, අපි ලෝකයත් එක්ක වැඩ කරලා තිබෙනවා; පෙරදිග ආසියාවත් එක්ක වැඩ කරලා තිබෙනවා; ඉන්දියාවත් එක්ක වැඩ කරලා තිබෙනවා. පිහිටීම අනුව අපේ රට කොහොමටත් ලෝකයත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන දිවයිනක් හැටියට තමයි ඉතිහාසයට එකතු වෙලා තිබෙන්නේ. ඒ පිහිටීමත් එක්ක අපට වාසි වාගේම අවාසිත් ගොඩක් සිදු වනවා. විදේශ කටයුතු අමාත්‍යවරයා හැටියට අපේ රට ලෝකයට සම්බන්ධ කරන්න ඔබතුමාට විශාල කාර්යභාරයක් කරන්න තිබෙනවා, ගරු ඇමතිතුමනි.

අපේ රටේ ඉතිහාසය ගත්තාම අප දන්නවා, අපේ රට අවුරුදු 30ක යුද්ධයකටත් පැටලී තිබුණු බව. ඒවායේ නෂ්ටාවශේෂ තවමත් තිබෙනවා. ඒවාට උත්තර දෙන්නත් තිබෙනවා. ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් විසඳා ගෙන ඉස්සරහට යන්න අපට සිදුව තිබෙනවා.

පසුගිය කොවිඩ් වසංගතයත් එක්ක, ඒ වාගේම 2019දී සිදු වූ පාස්කු ඉරුදින ප්‍රහාරයත් එක්ක අපේ රට කාරණා ගණනාවකින් ආපස්සට ගිහින් තිබෙනවා. ඒවා අතරින් ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ ක්ෂේත්‍ර විශේෂයි. විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය, විදේශ රැකියා ක්ෂේත්‍රය බාහිර බලපෑම් ගණනාවකට මුහුණ දීපු ක්ෂේත්‍ර දෙකක්. ඒ ක්ෂේත්‍ර තුළින් අප බලාපොරොත්තු වන දේම නිසි ආකාරයෙන් ලැබෙනවාද කියන ගැටලුව ද ඇතුළුව ගැටලු ගණනාවක් මතුව තිබෙනවා. අපට පාලනය කරන්න බැරි සිද්ධි නිසා එම ක්ෂේත්‍රවල ආදායම අපේ රටට අහිමි වෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි කොවිඩ් උවදුර. කොවිඩ් වසංගතය පැවැති කාල සීමාව තුළ අපට විදේශ විනිමය ලැබුණු ප්‍රධාන පැති දෙකක් තිබුණා. එකක් තමයි, විදේශ රැකියා ක්ෂේත්‍රය.

කොවිඩ් වසංගතය එන්න ඉස්සර වෙලා 2018 වන කොට ඩොලර් මිලියන 7,000කට -ඩොලර් බිලියන 7කට- වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් විදේශගතව රැකියා කරන අපේ සහෝදර සහෝදරියන්ගෙන් අපේ රටට ආවා. නමුත්, කොවිඩ් වසංගතයත් එක්ක එම ආදායම ඉතාම ශීඝ්‍රයෙන් අඩු වෙලා ගියා. එතකොට අපි ලොකු අපහසුතාවකට පත් වුණා.

ඒ වාගේම තමයි සංචාරක ව්‍යාපාරයත්. සංචාරක ව්‍යාපාරයෙන් අපට වැඩිම ආදායමක් ලැබුණේ 2018 වර්ෂයේයි. ඩොලර් බිලියන 4කට වැඩි, ඒ කියන්නේ ඩොලර් මිලියන 4,300ක විතර මුදලක් ඒ වර්ෂයේදී අපට ලැබිලා තිබෙනවා. නමුත්, 2019දී සිදු වූ පාස්කු ඉරුදින ප්‍රහාරයත් එක්ක, ඒ වාගේම කොවිඩ් වසංගතයත් එක්ක සංචාරක ව්‍යාපාරයෙන් අපට සතයක්වත් නොලැබෙන තත්ත්වයක් ඇති වුණා. මොකද, මාස ගණනාවක් රට වහලා තිබුණා. ගරු ඇමතිතුමනි, එවැනි තත්ත්වයන්, එවැනි බාහිර බලපෑම් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ අපේ රටට මුදල් ලැබෙන විදේශ රැකියා ක්ෂේත්‍රයට, සංචාරක ක්ෂේත්‍රයට එල්ල වනවා. මේ තත්ත්වයන් තුළ, අපි බලාපොරොත්තු වන සියලු දේවල් ඒ ආකාරයෙන්ම අපට පාලනය කරන්න බැරි අවස්ථා තිබෙනවා. නමුත් මම සතුටු වෙනවා, විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයට අයත් විදේශ රැකියා සහ සංචාරක කියන අංශ දෙක සම්බන්ධයෙන් මේ වන කොට තිබෙන තත්ත්වය පිළිබඳව. සමහර කථාවලදී ඒ සම්බන්ධයෙන් විවිධ කාරණා කියැවුණා.

කොවිඩ්වලින් පස්සේ, සංචාරක ව්‍යාපාරයේ මේ වන කොට තත්ත්වය අපි ගනිමු. මම මේ වෙලාවේ සංඛ්‍යාලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි, 2018 සිට ගත්තොත්, සංචාරක ක්ෂේත්‍රයේ 2018දී අපට ලැබුණා ඇමෙරිකානු ඩොලර් මිලියන 4,380ක්. 2019දී පාස්කු ඉරුදින ප්‍රහාරයත් එක්ක අපි යම් කඩා වැටීමකට ලක් වුණත්, මේ ක්ෂේත්‍රයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 3,669ක් දක්වා ලබා ගන්න අපට පුළුවන් වුණා. නමුත්, 2020දී අපට ලැබුණේ බොහොම අඩු ප්‍රමාණයක්. මොකද, 2020, 2021 වසර දෙකේදීම මාස දෙකකදී විතරයි සංචාරකයන්ට එන්න පුළුවන් වුණේ. නමුත්, 2022දී එම ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන එක්දහස් ගණනකට ගිහිල්ලා, 2023දී ඇමෙරිකානු ඩොලර් මිලියන 2,067ට ගිහිල්ලා, 2024දී නැවත වතාවක් ඇමෙරිකානු ඩොලර් මිලියන 3,169 දක්වා සංචාරක ව්‍යාපාරය තුළින් අපේ රටට ඩොලර් ලැබිලා තිබෙනවා. මේක ඉතාම වැදගත්. මොකද, දැන් අපට ඉස්සරහට -2028 වන කොට- ණය වශයෙන් ගෙවන්න තිබෙන ඩොලර් ප්‍රමාණය තවත් ගොඩක් වැඩි වනවා. අපට මේ ක්ෂේත්‍රයෙන් තමයි වැඩි කොටසක් උපයන්න හැකියාව තිබෙන්නේ.

2024 වසරේදී මිලියන 2කට වඩා සංචාරකයින් මේ රටට ඇවිල්ලා තිබෙනවා. ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා

ඉදිරියේදී සංචාරකයින් මිලියන 3ක් -ඒ කියන්නේ ලක්ෂ 30ක්- ගෙන්වා ගන්න. එම සංඛ්‍යාව වසරින් වසර වැඩි කර ගන්නත් බලාපොරොත්තු වෙනවා. එහෙම නම්, සංචාරක ක්ෂේත්‍රයේ වෙනස්කම් ගණනාවක් ඇති කරන්න අපට සිදු වෙනවා. මොකද, මේ වන කොට මේ ක්ෂේත්‍රයේ පෞද්ගලික අංශයෙන් තමයි සියයට විශාල ප්‍රමාණයකින් දායකත්වය ලබා දීලා තිබෙන්නේ. රජය පැත්තෙන් යම් යම් සීමා දාලා තිබෙනවා, සමහර කාරණාවලට. ඒකට උදාහරණයක් තමයි අපේ ගරු රවි කරුණානායක මැතිතුමාත් කියපු, සීගිරිය නැරඹීම සම්බන්ධයෙන් පනවා තිබෙන සීමාව. සීගිරිය නරඹන්න එන අයට රාත්‍රි කාලයේ එයට ඉඩ දෙන්නේ නැහැ. ඊට බලපාන විවිධ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. නමුත්, ඒවා කොහොම හරි විසඳාගෙන මුදල් අය කර ගන්න තිබෙන ක්‍රම විවෘත කර ගත්තොත්, ලැබෙන මේ ඩොලර් ප්‍රමාණය තවත් වැඩි කර ගන්න අපට පුළුවන් වෙනවා. අපි බෙහෙවින් සතුටු වෙනවා, මේ වන විට ලෝකයේ සංචාරය සඳහා ඉතාම හොඳ ස්ථානයක් බවට සීගිරිය පත්ව තිබීම ගැන. ඒ කියන්නේ, සීගිරිය සංචාරක ව්‍යාපාරය අතින් ඉහළම ස්ථානයකට ඇවිත් තිබෙනවා. අපි ඒ ගැන බෙහෙවින් සතුටු වෙනවා. අපි ඒකේ ප්‍රයෝජනය ගන්න ඕනෑ. ඒකේ ප්‍රයෝජනය අරගෙන, අප උපයන ඩොලර් ප්‍රමාණය වැඩි කර ගන්න අවශ්‍ය පහසුකම් ටික අපි ලබා දෙන්න ඕනෑ. ඔබතුමන්ලා ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා නම් සංචාරක ක්ෂේත්‍රයෙන් තවත් වැඩි මුදල් ප්‍රමාණයක් සොයා ගන්න අපට පුළුවන්.

අපේ සංචාරක ක්ෂේත්‍රය ගත්තාම එයට තිබෙන බාධා ගැනත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. විවිධ රටවලින් එන බොහෝ සංචාරකයන් රාත්‍රි කාලයේදීත් විනෝද වීමට බලාපොරොත්තු වෙනවා. ඉතින් අපි ඒ අවස්ථා ඇති කළ යුතුයි. නමුත්, අපේ රටේ මේ වන කොට nightlife එක සම්බන්ධයෙන් යම් යම් ගැටලු තිබෙන බව අපි දන්නවා. ඉතින් යම් යම් ස්ථානවලට සීමා කරලා හෝ අවශ්‍ය වටා පිටාව සකස් කරලා දෙනවා නම්, ලංකාවට එන සංචාරකයන් ප්‍රමාණය විතරක් නොවෙයි, සංචාරක ව්‍යාපාරය තුළින් උපයන මුදල් ප්‍රමාණය වැඩි කර ගන්නත් අපට අවස්ථාව උදා වෙනවා.

සංචාරක ව්‍යාපාරය තුළ වෙනස්කම් ගණනාවක් කරලා, ඔබතුමන්ලා බලාපොරොත්තු වන ඩොලර් ප්‍රමාණය අපේ රටට ලබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නවා නම් ඒක වැදගත් වෙනවා. විශේෂයෙන්ම සංචාරක හෝටල් කාමර ප්‍රමාණය වැඩි කරන්න යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා මම දැක්කා. එහෙම නම්, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ඒ අංශවල අයට අවශ්‍ය සහයෝගය අපි ලබා දෙන්න ඕනෑ.

මොකද, ආයෝජකයෝ එන්න නම්, හෝටල් ඇති කරන්න නම්, ඒ ආයෝජකයන්ට අවශ්‍ය සහයෝගය රජය පැත්තෙන් ලබා දෙන්න ඕනෑ. එහෙම සහයෝගය ලබා දෙනවා නම් ගොඩක් දෙනෙක් මේවාට ආයෝජනය කරන්න බලාගෙන ඉන්නවා. මේ කාලසීමාව තුළ අපේ රටේ මේ තිබෙන තත්ත්වයත් එක්ක සංචාරක ව්‍යාපාරයට හොඳ අනාගතයක් හදා ගන්න අපට අවස්ථාව උදා වෙනවා. ඒ වටපිටාව ඉතාම වැදගත් වනවා.

විශේෂයෙන්ම ආරක්ෂාව සම්බන්ධයෙන් අද ඇති වෙලා තිබෙන භීෂණ තත්ත්වය සංචාරක ව්‍යාපාරයට එච්චර හොඳ වෙන්නේ නැහැ. මොකද, සංචාරකයෝ විදේශ රටකට එනකොට ඒ රටේ වෙඩි තැබීම්, මිනී මැරුම්, ඝාතනය කිරීම් වනවා නම්, ඒවා දිහා බලලා තමයි එන්නේ. ඒ තත්ත්වය වැඩි වෙන්න, වැඩි වෙන්න වියදම් කරන්න පුළුවන් සංචාරකයන්ගේ පැමිණීම අඩු වෙනවා. එම නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්න වෙනවා. මොකද, අපි සංචාරක ව්‍යාපාරයෙන් ලොකු ආදායමක් බලාපොරොත්තු වෙනවා නම්, ඉතා සාමකාමී වාතාවරණයක් රට තුළ ඇති කරගන්න ඕනෑ. එම නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ වනකොට රට තුළ ඇති වෙලා තිබෙන තත්ත්වය විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයට හිතකර තත්ත්වයක් නොවෙයි. මේ වන විට ලෝකය පුරාම අපේ රටේ ස්ථාන ගණනාවක් ජනප්‍රියම ස්ථාන බවට පත් වෙලා තිබෙනවා. ඒක වාසියක් කරගෙන ලංකාවට සංචාරකයන් ගෙන්වා ගන්න තිබෙන අවස්ථාව මේ ඇති වෙලා තිබෙන භීෂණ තත්ත්වය, එහෙම නැත්නම්, වෙඩි තැබීම් නිසා අපට අහිමි වෙන්න පුළුවන්. එම නිසා ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරලා වැඩ කටයුතු කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

විදේශ රැකියා ක්ෂේත්‍රය ගත්තාම, මේ වසරේ අපට විදේශ රැකියා ක්ෂේත්‍රයෙන් බිලියන 6ක් - මිලියන 6,000ක් - විතර ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. අපට මේ ප්‍රමාණය වැඩි කර ගන්න අවශ්‍යයි. ඒ ප්‍රමාණය වැඩි කර ගන්න නම් ඒ සඳහා දීර්ඝ කාලීනව කළ යුතු වැඩ කටයුතු තිබෙනවා. අපේ රටේ තරුණ තරුණියන් ගෘහ සේවයටම, එහෙම නැත්නම් වෙනත් සේවාවලටම යවන්න කවුරුවත් බලාපොරොත්තු වෙන්නේ නැහැ. හොඳ වැටුපක් තිබෙන, හොඳ skill එකක් තිබෙන කණ්ඩායමක් විදේශ රටවලට යවලා වැඩි ආදායමක් ගන්න තමයි අපි කවුරුත් බලාපොරොත්තු වන්නේ. පසුගිය වසර 10 ගත්තොත්, විදේශ රැකියාවලට ගිය අය අපේ රටට විශාල මුදලක් - රුපියල් බිලියන 50කට වඩා - එවලා තිබෙනවා. මේ අය එවපු මුදල්වලින් තමයි අපේ රටේ ගොඩක් කාරණා ක්‍රියාත්මක කර ගත්තේ. අපි තෙල් ගෙනෙන්නේ පිට රටින්. තවත් ගොඩක් භාණ්ඩ අපි පිට රටින් ගෙනෙනවා. ඒ හැම එකකට අවශ්‍ය විදේශ විනිමයෙන් වැඩි ප්‍රතිශතයක් අපි හොයා ගෙන තිබෙන්නේ විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියැළෙන සහෝදර සහෝදරියන් එවන මුදල්වලින්. ඒ නිසා අපේ යුතුකමක් තිබෙනවා, ඒ අය වෙනුවෙන් මීට වඩා අවධානයක් යොමු කරලා කටයුතු කරන්න. නමුත්, ඒගොල්ලන්ගේ ප්‍රශ්නවලට අපි අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. පසුගිය රජයන් ගණනාවකට අපි මේ කාරණය මතක් කළා. විශේෂයෙන්ම කොවිඩ් කාලසීමාව තුළ විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියුතු අපේ රටේ ගොඩක් දෙනෙකුට ප්‍රශ්න ගණනාවක් ඇති වුණා. නමුත්, රජයක් හැටියට අපි ඒ වෙලාවේ නිසි ප්‍රතිකර්මයක් ඒවාට ලබා දුන්නේ නැහැ. ඒ කාලසීමාව තුළ තමයි මේ ක්ෂේත්‍රය ගොඩක්ම කඩා වැටුණේ. ඒක විශාල වශයෙන් බලපෑවා, රට බංකොලොත්වීමටත්, ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව කඩා වැටීමටත්. ඒ නිසා මම ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අපට විශාල කාර්යභාරයක් ඉටු කරන ප්‍රජාවක් විදේශ රැකියා ක්ෂේත්‍රයට යොමු වෙලා ඉන්නේ. ඒ අයගේ පවුල්වල සුබසාධනය පැත්තෙන් බලනවා වාගේම, ඒ වාගේම ඒගොල්ලන් ලංකාවට ආවාම airport එකේ ඉඳලා ලබා දෙන්න පුළුවන් පහසුකම් ප්‍රමාණය වැඩි කරලා, එ්ගොල්ලන්ට ගෞරවාන්විතව ජීවත් වෙන්න පුළුවන් අවස්ථාවක් උදා කර දෙන්න ඕනෑ. ඒ පිළිබඳ අපි දිගින් දිගටම කථා කර තිබෙනවා. ඒ නිසා එ් සඳහා අවධානය යොමු කරන්න කියලාත් කියනවා.

ඒ වාගේම අද යම් යම් බාධා තිබෙනවා. පසුගිය COPA එකේදී අපි දැක්කා, විශේෂයෙන් සමහර කාරණා සම්බන්ධයෙන් අපට නිසි අවබෝධයක් නැතිව ප්‍රශ්න යොමු කිරීමේදී යම් යම් ක්ෂේත්‍රවල ඉන්න විශාල ප්‍රමාණයකට අසාධාරණයක් සිද්ධ වෙන්න පුළුවන් බව. Visit visa ප්‍රශ්නයේදී ඇත්තටම එතැන සිදු වුණු කාරණාව දිහා බැලුවාම, ඒක රජය මඟින් නිසියාකරව නීතියට යටත්ව කරන විදේශගතවීමක්.

විශේෂයෙන්ම කියන්න ඕනෑ, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරක වීසා මඟින් ගෘහ සේවිකාවන් ඇතුළු අනෙකුත් රැකියා

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

සඳහා යන අයට වීසා ලබා දීමේදී, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ register වෙලා, රුපියල් 23,000ක වාගේ මුදලක් ගෙවා තිබෙන බව. ඊට අමතරව ඒ ගිවිසුම සඳහා තවත් රුපියල් 15,000ක් ගෙවා තිබෙනවා. අපේ රටේ තානාපති කාර්යාලයට ඩොලර් 100ක් ගෙවා තිබෙනවා. ඉතාම ආරක්ෂිත ක්‍රමයකට අනුව තමයි ඒ ක්‍රියාවලිය සිදු වෙන්නේ. ඒ විධියට පිලිපීනයෙන්, ඉන්දියාවෙන්, වෙනත් ආසියානු රටවලින් ඩුබායිවලට, එක්සත් අරාබි එමීර් රාජ්‍යයට මිනිස්සු එනවා. ඒ එන හැම කෙනාම එන්නේ ඒ විධියට. නමුත්, දැන් මේ කම්ටුව හරහා ඇති වුණු සිද්ධිය නිසා මේක ලොකු වංචාවක් හොරකමක් හැටියට මතයක් හැදිලා, අද වෙනකොට මේ යන අයට ගුවන් තොටුපොළින් පවා හිරිහැර කරදර ආදියට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක අපට ලොකු අවාසියක්. අපේ රටට ඩොලර් විශාල ප්‍රමාණයක් ගේන්න යන අපේම සහෝදර සහෝදරියන්ට මේක විශාල හානියක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා මේ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේක කොයි ආකාරයෙන්ද සිදු වුණේ කියලා සොයා බලන්න. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් මේ පිළිබඳ නිවැරදි පැහැදිලි කිරීමක් ඒ කම්ටුවට යොමු කළා නම්, මෙවැනි මතයක් රට තුළ ඇති වෙන්නේ නැහැ. එහෙම නොවීම ගැන මම කනගාටු වෙනවා. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් දන්නවා, 2019 ඉඳලා තමයි මේ ක්‍රමය ක්‍රියාත්මක වුණේ කියලා. ඒ ක්‍රමය තමයි අනෙක් රටවලිනුත් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට යන හැම කෙනෙකුටම තිබෙන්නේ. ඒක තමයි ක්‍රමය. ගිවිසුමක් ඇතිව තමයි ඒක කෙරෙන්නේ. දැන් අපේ රටේ ඒ පිළිබඳ අනවබෝධයක් ඇතිවෙලා තිබෙනවා. අද ඒක විශාල වශයෙන් ප්‍රචාරය වෙලා තිබෙනවා. ඒ නිසා විදේශගත වන සහෝදර සහෝදරියන්ටත්, ඒ කටයුතුවල යෙදිලා ඉන්න සියලුදෙනාටත් අද විශාල අපහසුකම් ගණනාවක් ඇති වෙලා තිබෙනවා. මෙන්න මෙවැනි කටයුතු හරි අවබෝධයක් ඇතිව ක්‍රියාත්මක කරනවා නම් මෙවැනි දේවල් වන්නේ නැහැ. ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා, විදේශ රැකියා ක්ෂේත්‍රයෙන් දැනට අපට ලැබෙන ඩොලර් මිලියන 6,000ක පමණ මුදල් ප්‍රමාණය ඩොලර් මිලියන 10,000ක්, 15,000ක් දක්වා වැඩි කර ගන්න. ඒ තැනට යන්න නම් මෙන්න මෙවැනි ප්‍රශ්න ඇති නොකර, බිල්ලෝ මවලා ප්‍රශ්න ඇති කරන්නේ නැතිව නිසියාකාරයෙන්, නීත්‍යානුකූලව කටයුතු කළ යුතුයි. විදේශගත වන අපේ සහෝදර සහෝදරියන්ට අසාධාරණයක් නොවී, ඒ ක්ෂේත්‍රයේ රැකියා කරලා ආවාට පස්සේ ඔවුන්ට ලංකාවේත් හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන් සුබසාධනයක් ඇති කළ යුතුයි. ඒ වාගේම, මේ කටයුතු නිසි ක්‍රමයකට සකස් කරලා ඉදිරියේදී මේ තුළින් යම් ආදායමක් වැඩි කර ගැනීමකට අවශ්‍ය සහයෝගය ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ලබා දිය යුතුයි. හරියට තේරුම් ගන්නේ නැතිව කරන මෙවැනි කාර්යයන් තුළින් ඒ ක්ෂේත්‍රයේ ඉන්න අයටත්, විදේශගත වන අපේ සහෝදර සහෝදරියන්ටත් ලොකු හානියක්, අපහසුතාවක් ඇති වෙනවා. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මීට වඩා දිගට කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විදේශ රැකියා ක්ෂේත්‍රයත්, සංචාරක ක්ෂේත්‍රයත් තමයි අපේ රටට මුදල් ගේන්න තිබෙන පහසුම මාර්ග. මේ ක්ෂේත්‍ර දෙකෙන්ම විශාල මුදලක් අපේ රටට ගෙන එන්න ඉදිරි කාලසීමාව තුළ අවශ්‍ය ශක්තිය ඇමතිතුමාට ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ සඳහා කටයුතු කරන්න ඔබතුමාට අවස්ථාව ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක සභානායකතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.09]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථා විවාදයේදී එක නිශ්චිත කරුණක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. ඔබතුමිය දන්නවා, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සපයන සේවාව වෙනුවෙන් අපේ රටේ ජනතාව විශාල වියදමක් දරනවා, ඒ වාගේම රජයේ මුදල් විශාල ප්‍රමාණයකුත් යොමු කරනවා කියලා. මේ අමාත්‍යාංශය ලෝකය පුරා හැම රටකම තිබෙන අමාත්‍යාංශයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අමාත්‍යාංශය පිළිබඳව වෙනත් අමාත්‍යාංශයක වාගේ හොඳම පසු විපරමක් කර ගැනීම ප්‍රායෝගිකව දුෂ්කරයි. එම නිසා හැම අමාත්‍යාංශයකම තිබෙනවා වාගේ, යම් යම් දේවලට මුවාවෙලා කෙරෙන්නාවූ දූෂණ සහ නාස්තිකාර වියදම්වලින් විදේශ කටයුතු අමාත්‍යාංශයත් ගැලවිලා නැහැ.

මම අද ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. විශේෂයෙන්ම 2023 සැප්තැම්බර් 22 සහ 23 කියන දින දෙකේදී හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ විදේශ සංචාරයකට අදාළ තොරතුරු මෙතැන තිබෙනවා. මේ fax message එකේ title එක, "Private Visit of H.E. the President to Wolverhampton and London, U.K. 22-23 September, 2023" මේක හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ private visit එකක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එම fax message එක මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එම fax message එකේ මෙසේ සඳහන්ව තිබෙනවා:

> "H.E. the President and the First Lady are scheduled to visit Wolverhampton and London, U.K. from 22-23 September 2023 after attending the High Level Segment of 78th UNGA, New York."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනාධිපතිවරයාගේ වගකීම ඇතුළේ නිවියෝර්ක්වල පැවති සමුළුවට සහභාගිවීම රාජකාරී කටයුත්තක් බව අපි දන්නවා. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත්, Foreign Affairs Ministry එකේ මේ message එකේ පැහැදිලිව කරුණු තිබෙනවා. මේක address කරලා තිබෙන්නේ H.E. the High Commissioner/Londonට, යවන්නේ Chief of Protocol, for Secretary/Foreign Affairs, අගෝස්තු 16වැනි දා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"As requested by the presidential Secretariat, appreciate if you could kindly make the following arrangements:

- Reserve two rooms at the Hotel Hilton in Birmingham…
- Make reservation for Lunch on 22 September, 2023 at the hotel Hilton in Birmingham...
- Reserve suitable accommodation at Hotel Landmark in London..."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊට අමතරව රනිල් වික්‍රමසිංහ මහතාගේ, එම private visit of H.E. the President යටතේ, delegation එකක් තිබෙනවා, දහදෙනෙකුගෙන් සමන්විත. මම ඒගොල්ලන්ගේ නම් කියන්න යන්නේ නැහැ, වෙලාව යන නිසා. ඕනෑ නම් කිහිපයක් කියන්නම්. රනිල් වික්‍රමසිංහ, එතුමාගේ බිරිඳ, සෙනරත් දිසානායක, සැන්ඩ්‍රා පෙරේරා, doctor, security, advanced security team ආදී වශයෙන් ඔක්කෝම නම් තිබෙනවා. දහදෙනෙක් යනවා, එතුමාගේ private visit එකට. ඒ සියල්ල මෙතැන mark කරලා තිබෙනවා. ඒ private visit එකට සම්බන්ධ වුණු හැම කෙනාටම අදාළ වියදම්, වෙන් කරපු rooms පිළිබඳව විස්තර ඔක්කෝම සඳහන් කරලා තිබෙනවා. ඒ, අගෝස්තු 16වැනි දා.

ඊට පස්සේ ඒ සඳහා අවශ්‍ය මුදල්, 2023 අගෝස්තු 17වැනි දා, London High Commission එකෙන් ඉල්ලලා, "Most Urgent", "Strictly Confidential" කියලා සඳහන් කරලා fax message එකක් යවලා තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"It would be appreciated if urgent approval and allocation could be granted for the expenditure of £39,345 related to the visit."

නැවත මෙසේ සඳහන් වෙනවා:

"In addition to the above, the Mission would appreciate urgent approval and allocation from the Ministry for £1,680 (£840X2) as reservation of accommodation for Chie of Protocol and accompanying protocol officer in London."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතකොටත් තිබෙන්නේ "Private Visit of HE the President" කියලා.

ඊට පස්සේ සැප්තැම්බර් 4වැනි දා යවනවා email එකක්. ඒකේත් "Private Visit of H.E. the President" කියලා තිබෙනවා. ඒක යවන්නේ සෙනරත් දිසානායක මහතා, Chief of Protocol. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට අපේ ළඟ තිබෙනවා ඒකට අදාළ ticketsවල schedule එක: arrival - 21st of September, 2023; departure - 23rd යනාදී වශයෙන් තිබෙනවා.

ඊළඟට, මේකට අදාළ වියදම ගත්තොත්, - වෙලාව ඉතුරු කර ගන්න ඕනෑ නිසා මම මෙහෙම කියන්නම්. මේ සඳහා Foreign Affairs Ministry එකට ලිපියක් යවනවා, 07th September, 2023. එහි මෙසේ සඳහන් වෙනවා:

"Please find attached at Annex I revised budget estimate for the visit. The budget has been amended to add 20% VAT for reservation of the VIP Suite on arrival and departure. Accordingly, revised budget estimate is £40,445.

Attached at Annex II is the budget estimate for expenditure related to Chief of Protocol and the Protocol Officer, which amounts to £1,680."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතකොට මේ විධියට "පෞද්ගලික සංචාරයක් සඳහා" කියලා පැහැදිලිව පටන් අරගෙන වියදම් කරලා තිබෙනවා, ස්ටර්ලින් පවුම් 40,000ක්. මෙතැන තිබෙනවා, ඊට අදාළ ලංකාවේ මුදල. ලංකාවේ මුදලින් release කරලා තිබෙනවා, හරියටම ගත්තොත් රුපියල් ලක්ෂ 162ක්. 2023 සැප්තැම්බර් 12වැනි දා රුපියල් මිලියන 16කුත් රුපියල් 270,572.83ක් නිකුත් කර තිබෙනවා. දැන් මම නිතරම කිව්වා, මෙක "Private Visit of H.E. the President" කියලා තමයි පටන් ගත්තේ කියලා. හැබැයි දැන් අපට ලියුමක් හම්බ වෙනවා, Secretary's Bureau එකෙන්. මම හිතන විධියට මේක Presidential Secretariat එක වෙන්න ඕනෑ. එය Chief Accountant (Procurement)ට යවලා තිබෙන්නේ. ඒකේ "private visit" කියන එක ඉවත් කරලා "Official Programme" කියලා සඳහන් කරලා තිබෙනවා. මෙම Internal Memo එකේ මෙසේ සඳහන් වෙනවා:

"Official Programme, United Kingdom

This is to inform you that the following official of the Presidential Secretariat has travelled to the United Kingdom from 21-24 September 2023 as a member of HE the President's delegation

Ms. Sandra Perera Private Secretary to the president"

මම හොයා බැලුවා, මේ private visit එක, එක පාරටම official වුණේ මොකද කියලා. ඒ, මොනවා හරි දෙන claim එකක් ගන්න කියලා මම හිතනවා.

මොකද, private visit එකකට ඒ claim එක ගන්න බැහැ, Private Secretaryට. මෙතැන schedules ඔක්කෝම තිබෙනවා. අවසානයේ වෙලා තිබෙන දේ තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ සහ එතුමාගේ බිරිඳගේ පෞද්ගලික සංචාරයක් සඳහා Sterling Pounds 40,000ක්, ඒ කියන්නේ සාමාන්‍යයෙන් ගත්තොත් ලංකාවේ මුදලින් මිලියන 16ක් වියදම් කර තිබීම. ඒක ඉතා පැහැදිලිවම private visit කියලා පටන් අරගෙන අවසානය වෙනකොට official visit එකක් විධියට වෙනස් කරන්නත් උත්සාහ කර තිබෙනවා. දැන් "ෆෙරාරි" එක කොහොමත් හැප්පිලා තිබෙන්නේ. හෙට බටලන්ද ගැන statement එකක් දෙනවා කියලා ආරංචියක් තිබෙනවා. අපි මේ ගැනත් දැන ගන්න කැමැතියි. මොකද, මේක අපරාධමය වරදයක්. විශේෂයෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශය එවකට මේ මුදල් වියදම් කළේ කොහොමද කියලා අපි දැන ගන්න කැමැතියි. විදේශ කටයුතු අමාත්‍යාංශයේ මුදල් භාර ලේකම්වරියක් ඉන්නවා; අදාළ නිලධාරීන් ඉන්නවා. කොහොමද රාජ්‍ය නායකයාගේ පෞද්ගලික සංචාරවලට රජයේ මුදල් වියදම් කළේ? මේක තුළ අපරාධමය වරදකුත් තිබෙනවා කියලා අපි හිතනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා, මේ පිළිබඳ පරීක්ෂණයක් කරන්න කියලා ඇමතිතුමා ඇතුළු විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ලජ්ජා වෙනවා. මේ දුප්පත් රට, ඔහුම බංකොලොත් කරපු රට. ඔබතුමිය බලන්න, පෞද්ගලික සංචාරයකට butlerට ගෙවා තිබෙනවා, Sterling Pounds 2,000 for two days. ඒ bills තිබෙනවා. Butlerට ගෙවා තිබෙනවා, Sterling Pounds 2,000 for two days! ඒකයි අපි මේ දේවල් කියන්නේ. මේ රට විනාශ කිරීමට අමතරව මේ රටේ මහජන ධනය ඉතාම කැත ආකාරයට පෞද්ගලිකව පවා පාවිච්චි කරපු පුද්ගලයන් ගැන මේ රටේ ජනතාව දැනගත යුතුයි. අපි දිගටම මේවා හෙළිදරව් කරනවා. මෙය රාජ්‍ය මුදල් අවභාවිත කිරීමක්. ඇමතිතුමා අද හෝ ඉදිරියේදී හෝ මේ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනියි කියලා අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අපරාධමය වරදක් මෙතැන තිබෙනවා. ඒ නිසා ඊට අදාළ නිලධාරීන් සම්බන්ධ කරගෙන මේ පිළිබඳ යම් පරීක්ෂණයක් ආරම්භ කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. G.G. Ponnambalam. You have 20 minutes.

[3.18 p.m.]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Presiding Member, I am quite happy to speak today on the Votes of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism. I have been doing so since the first time I entered Parliament in 2001 and at every Budget, I have made it a point to make an intervention under this Ministry. That is because, Madam, the Ministry of Foreign Affairs, in the history of this country particularly since the ethnic conflict took on fairly large proportions, has been one of the key ministries that had been used by consecutive Governments against a counterinsurgency strategy. It has been, in the past, a Ministry of lies, a Ministry that has been chosen to cover up or deny major offences both in the International Human Rights Law and the International Humanitarian Law and till this Government came into power, that has been the reality. One of the key aspects of the Ministry has been to tackle the Tamil people's claim for their rights in this Island and it has been spearheading a campaign to portray the Tamil struggle for their rights as one of mere terrorism and carrying out a campaign against the Tamil people at large.

Now, the question, Madam, is whether this Government, since it came into power, has changed any of that. And, its approach towards the ethnic conflict and particularly the way in which it handles the Foreign Policy with regard to countries which have shown interest in voicing the concerns of the Tamil people in this country is another key aspect. What is the test, Hon. Presiding Member? I have here before me and will table in this House later the Statement by the UN High Commissioner for the Human Rights, Zeid Ra'ad Al Hussein, via videolink to the Human Rights Council. This statement was made on the 30th of September, 2015. I think it is a very important statement because it is after this statement that the then Government, in 2015, cosponsored a Resolution in the Human Rights Council. This is what the High Commissioner, who is a highly respected jurist and an activist, says about the situation in Sri Lanka. I quote:

> "I welcome the Government's commitments, made before this Council, to investigate these violations and ensure accountability, despite the opposition of some political parties and sections of the military and society. The unfortunate reality is, however, that Sri Lanka's criminal justice system is not currently equipped to conduct an independent and credible investigation into allegations of this breadth and magnitude, or to hold accountable those responsible for such violations, ..."

He goes on to say, I quote:

> "First, Sri Lanka lacks a reliable system for victim and witness protection,…"

And then, he mentions a few matters there and says, I quote:

> "Secondly, the domestic legal framework is inadequate to deal with international crimes of this magnitude."

Specifically, Madam, the UN High Commissioner for Human Rights refers to the fact that Sri Lanka does not have, in its laws, international humanitarian law violations and mass crimes as offences and therefore, states a very valid point that Sri Lanka is not "equipped" to deal with the nature of crimes that it is being accused of. Then, he goes on to state - this is the most important part that I wish to bring to the attention of the Hon. Minister, who is thankfully present here - I quote:

> "Thirdly, the State's security sector and justice system have been distorted and corrupted by decades of impunity. The independence and integrity of key institutions such as the Attorney -General's Office and the Human Rights Commission remain compromised. The security forces, police and intelligence services have enjoyed near total impunity and have not undergone any significant reform since the armed conflict."

That remains a fact even today, even whilst the Hon. Minister presents his case under the Votes of the Ministry of Foreign Affairs. He further goes on to say, I quote:

> "This is why I have recommended the establishment of an ad hoc hybrid special court, integrating international judges, prosecutors, lawyers and investigators, mandated to try notably war crimes and crimes against humanity, with its own independent investigative and prosecuting organ, defence office and witness and victims protections programme. In a highly polarized environment,..', which is what Sri Lanka is even today.
>
> "...such a mechanism is essential to give all Sri Lankans, especially victims, confidence in the independence and impartiality of this process."

Hon. Minister, as regards judicial accountability, he says, I quote:

> "Judicial accountability should be accompanied by broader transitional justice measures, including truth-seeking and reparations, to ensure that the right of victims to redress is realized."

Sir, I **table*** this entire Statement by the UN High Commissioner for Human Rights to the Human Rights Council before this House.

I spent some time marking this because it is after this Statement that the Good Governance Government - that is what they call themselves, but I do not agree with it - of 2015 agreed to cosponsor a Resolution. But, despite that, when Ranil Wickremesinghe became President, he went back on that; he went back on that Resolution he himself, as Prime Minister, was supposed to have cosponsored. He got his Foreign Minister, the Hon. Ali Sabry, to oppose it quite vehemently.

Then, on the 27th of July, 2023, when the then Foreign Minister, the Hon. Ali Sabry, met with the foreign correspondents in Sri Lanka, he very clearly justified going back on the Resolution and the mere creation of a Truth and Reconciliation Commission - a TRC - to ward off international intervention or inernational interference. That is the most important part. Madam, I have two articles here, which I would like to **table*.**

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

One is titled “Truth and Reconciliation Commission could help Sri Lanka stave off foreign intervention: FM” and the other is titled “Sri Lanka’s truth commission is to ‘ward off’ international interference and will have no prosecuting powers”. So, on the 27th of July, 2023, he assures the foreign correspondents of that and on the 04th of September, 2024, he comes and assures this House about recommending the Truth and Reconciliation Commission as that Commission would never have prosecuting powers.

That was the previous Government’s position. We all know that the Government before that with Gotabaya Rajapaksa and Mahinda Rajapaksa, who are suspected war criminals, was not going to prosecute themselves. Any fool would know that. So, we do not expect that from them. But, it was Ranil Wickremesinghe, who co-sponsored that Resolution High Commissioner Zeid had presented, who goes back on it and gets his Minister of Foreign Affairs Ali Sabry, who was Adviser to the then Defence Secretary Gotabaya Rajapaksa and President Mahinda Rajapaksa, to make that statement regarding more prosecutions.

Again, the current President, when he was campaigning for presidency, made repeated assurances that not a single person would be brought before court. So, there would be no judicial proceedings against any violators. He has said it repeatedly, not once, but several times; before he became President, after he became President and whilst he was campaigning for the Parliamentary Election, he has made those assurances. And it is in that context, Hon. Presiding Member, that my good Friend, the Hon. Minister of Foreign Affairs went to Geneva this time, and he, too, has opposed the Resolution and instead, what he calls for is a "domestic mechanism". If I am not mistaken, he calls for a truth and reconciliation mechanism to deal with all war-time atrocities. But, very clearly, not once has he given an assurance that there would be a criminal prosecutory process. If a criminal prosecutory process is to happen, Hon. Presiding Member, it is quite clear that it cannot be domestic; it is quite clear. If you really want to have reconciliation and if you really want to get to the bottom of this, then, that process must be credible vis-a-vis the victims and for it to be credible vis-a-vis the victims, it cannot possibly be domestic. At the very least, it must be an ad hoc hybrid mechanism, where the control of those investigative processes must be international in nature. That is the only minimum way in which you can have credibility or give credibility to victims in that process. Now, the question is, whether this Government has departed from past practices. That is the key question and it is my view that, very unfortunately, this Government has not and there are serious doubts with regard to this Government, not with regard to the NPP as such. We cannot forget and I say it with utmost sincerity that the JVP, when Mahinda Rajapaksa was President, was its most ardent supporter with regard to a military solution for the war. In fact, if I am not mistaken, the current President Anura Kumara Dissanayake, on several occasions, has taken credit for the fact that it is the JVP which managed to give a holistic argument justifying a military solution for the war, that while the Government at that time was merely talking racist-rhetoric, communal-rhetoric, it was the JVP which very technocratically created the justification to mobilize the public in favour of the war. "In favour of a total war” were the words he used. So, in that context, the question is whether, genuinely, this Government could spearhead an accountability process. You all supported that process so heavily, knowing that there were very grave offences taking place. Despite that, you all showed complete support to go ahead with the war, because in your own logic you felt that it was more important to destroy the LTTE, regardless of what the side effects would be. And, today, when we, as victims, say that we faced genocide and when the then High Commissioner for Human Rights, who is probably the most respected jurist when it comes to human rights and international humanitarian law, says that Sri Lanka is not "equipped" because of the nature of the conflict, the polarization that is within and that a domestic mechanism just would not do, then the question is, what is the answer that the Government has?

I repeatedly said and I say again that the last 77 years have been an utter disaster for the Tamil people; the last 77 years have been an utter disaster because it has been a racist regime that came in time and again. They may say something a bit soothing at a particular time, but in reality, their practice has been against the Tamil people, against accepting the rights of the Tamil people. The only time that a government has genuinely come into power - that is, a departure from those two parties which have governed from time to time over the last 77 years - is this Government. But, this Government also has a huge spot, a huge mark on its back because it is this Government or the JVP which supported the most heinous times faced by the Tamil people, which was the Mahinda Rajapaksa regime. Therefore, it is your Government that must come clean.

Now, I am asking the Minister of Foreign Affairs, why on earth are we frightened of an international mechanism? If we actually did not commit any offences - the Tamils are not running away from it - why are we running away? Then, you know for a fact that the nature of the conflict that took place is so polarizing that an internal mechanism just would not do. So, why do you not submit to an international mechanism and actually come to the truth? Should the Tamil people not deserve at least that? It does not mean that just because we go through a prosecutory process, there cannot be reconciliation. But, if you do not have criminal justice at the heart of this process, then everything else is a cover-up, which is exactly what the previous governments had been trying to do.

Madam, I also want to bring up something that has come up recently. Normally, I do not make these comments; I try to avoid making such comments, even though I repeatedly spoke on the Ministry of Foreign Affairs with regard to other Governments. When the NPP Government won the elections, the Ambassador to China visited Jaffna and made comments, which I thought were very unbecoming of an ambassador. I do not think the Chinese Government follows those processes, but certainly, that Ambassador, in my view, broke tradition and made completely unacceptable statements in support of the NPP. He interpreted those election results and

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

welcomed the support for the NPP in the North, particularly in Jaffna. The NPP got only 24 per cent of the votes in Jaffna. They might have got three seats out of six, but they only got 24 per cent of votes. On what calculation the Chinese Ambassador thought the Tamil people of Jaffna voted overwhelmingly for the NPP, I do not know. But, he should never have been allowed to make those comments. If the Government is so sincere with regard to changing the culture, then the Minister of Foreign Affairs must actually question the Ambassador because it is completely unfair for an ambassador to make such comments. I do not think any ambassador in any other country has made such comments. Why I am saying this, Madam, is from the 19th to the 23rd February, 2025, the Minister for National Ethnic Affairs Commission, Mr. Pan Yue, visited Sri Lanka with a delegation, met the Minister of Buddhasasana, Religious and Cultural Affairs and, I am told, had stated that China wants to open a Sri Lanka-China cultural affairs centre in Jaffna. This particular Ministry, the NEAC, Madam, is the Ministry in charge of ethnic minorities in China.

The Hon. Minister knows fully well that there are serious allegations against the policies of that Ministry: the Amnesty International has accused that Ministry of suppression of cultural and religious practices; there are allegations of genocide against the Uyghur Muslim minority practised by that Ministry; the Human Rights Watch has accused the Ministry of mass surveillance and data collection and there are also accusations of the Ministry being the epicentre of assimilatory policies and China's Head of ethnic affairs is keen to end the minority culture. That is the policy of China. The same sort of sentiments were expressed by Gotabaya Rajapaksa, that he did not like minorities and that we all must assimilate. The Chinese Ambassador goes to Jaffna soon after the elections and makes those comments and the Chinese Minister, whose Ministry is one of the most controversial Ministries in China, visits Sri Lanka and it was a secret visit. Why on earth would the Chinese Minister handling the subject of minorities come to Sri Lanka and not meet any of the minorities, but only the Minister of Buddhasasana Religious and Cultural Affairs and those especially of the Department of Archaeology, which is extremely controversial? We have been accusing the Department of Archaeology specifically of systematically carrying out cultural genocide in the North and the East, of changing the ethnicity and the cultural nature of the North and the East. So, I would urge the Hon. Minister to come clean. If a minister of India, America or of any other country had come and visited Jaffna, my God, it could have been all over the newspapers! People would have been criticizing every single word that that minister says. But, this Minister and his delegation had come and gone, but we do not know anything about it. We have to do research to find out what has happened. Therefore, especially in the backdrop of the way in which the Chinese Ambassador had made comments and this particular Ministry has been accused of in China, I think the Hon. Minister of Foreign Affairs must come clean.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.39]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අපි සතුටු වෙනවා විජිත හේරත් මැතිතුමා වාගේ කෙනෙකු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා වීම ගැන. ඇයි මම එහෙම කියන්නේ? දැන් මේ ආණ්ඩුවේ කොටස් දෙකක් ඉන්නවා, ජනතා විමුක්ති පෙරමුණ සහ මාලිමාව කියලා. ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න සමහර දුපත් මානසිකත්වයෙන් හිතන අය වාගේ නොවී සාපේක්ෂව මාලිමාවට බර පුද්ගලයෙකු මේ විෂය පථය පිළිබඳ ඇමතිවරයා වීම ගැන අපි සතුටු වෙනවා. මොකද, මේ අමාත්‍යාංශය රටට ප්‍රධාන ආදායමක් ගෙන දෙන අමාත්‍යාංශයක් වාගේම, ජාත්‍යන්තරය එක්ක ගනුදෙනු කරන්න පුළුවන් අමාත්‍යාංශයක්. ඒ නිසා බොරු කීම අයිතියක් කියලා පිළිගත්ත මන්ත්‍රීවරිය වාගේ වෙන්නේ නැතිව, බොරු කියන්නේ නැතිව විදේශ නායකයෝ එක්ක, විදේශ සමුළුවල, විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයෝ එක්ක කටයුතු කරන්න වෙනවා. ඒ නිසා එතුමා වැනි කෙනකු මෙම අමාත්‍යාංශයේ අමාත්‍ය ධුරයට පත්වීම ගැන අපි සතුටු වෙනවා. කනගාටුවට තිබෙන්නේ, පාර්ලිමේන්තුව පටන් ගත්ත මුල් දවස්වල හැම දාම උදේ ඉඳලා හවස් වනතුරු විනයගරුකව මෙතැන මන්ත්‍රීවරු 159දෙනාම ඉන්නවා කිව්වාට, අද ඉන්නේ කොහේද දන්නේ නැහැ. එතුමන්ලා රිළවුන් ගණින්න ගිහිල්ලාද, වඳුරන් ගණින්න ගිහිල්ලා ද මම දන්නේ නැහැ. නැත්නම් මාලිමාවේ නිසා JVP මන්ත්‍රීවරු එතුමා ගණුන් ගන්නේ නැද්ද කියලා මම දන්නේ නැහැ. මම හිතන්නේ නැහැ එහෙමයි කියලා. *[බාධා කිරීමක්]* එළියේ ඉඳලා වැඩක් නැහැ නේ. මෙතැන නේ ඉන්නවා කිව්වේ. අපිත් එළියේ ඉන්නකොට නේ ඒ කථා කිව්වේ.

ගරු ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය ගත්තාම, විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රය කියන්නේ මේ රටට ප්‍රධාන ආදායම් මාර්ගයක් තිබෙන ක්ෂේත්‍රයක්. රටේ භූගෝලීය පිහිටීම සහ අපට ලැබිලා තිබෙන දේවල් එක්ක ප්‍රධාන ආදායම් මාර්ගයක් තිබෙන තැනක්. ඔබතුමන්ලාගේ "ජාතික සංචාරක ප්‍රතිපත්තිය" කියලා එකක් තිබෙනවා. මම මේක සම්පූර්ණයෙන්ම දෙපාරක් කියෙව්වා. හැබැයි, මේකේ තිබෙන වචන හරඹය තුළ ආදායම් වැඩි කරන ක්‍රම මොනවාද කියලා හොයා ගන්න බැහැ. මම දන්නේ නැහැ, මේක ලියපු කෙනාටත් ඒක හොයා ගන්න පුළුවන්ද කියලා. නමුත්, මම විශ්වාස කරනවා ලංකාවට එන සංචාරකයන් සහ ඔවුන් වියදම් කරන ප්‍රමාණය වැඩි කරගෙන ආදායම් වැඩි කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබිය යුතුයි කියලා.

උදාහරණයක් වශයෙන් දැන් මේ සංචාරක කර්මාන්තයේ තිබෙන විශාලම ගැටලුවක් තමයි, සංචාරක කර්මාන්තය සඳහා එක තැනකින් නිර්මාණය වෙන proper communication system එකක් නැතිකම. දැන් ලංකාවේ හැම restaurant එකකින්ම, හැම හෝටලයකින්ම, හැම බිලකින්ම Tourism Development Levy කියලා සියයට එකක් අය කරගන්නවා. එතකොට විශාල මුදලක් ඒකට එකතු වෙනවා. මොකක්ද වෙන්නේ ඒකෙන්? දැන් WTM එකට, එහේ මෙහේ ප්‍රදර්ශනවලට යන එකට වඩා, මේක කේන්ද්‍රගතව තානාපති කාර්යාල තිබෙනවා, ඊළඟට, Tourism Promotion Bureau එක තිබෙනවා. නමුත් මොකක්ද, වැඩ පිළිවෙළ? දැන් ලබන සිකුරාදාට ජනාධිපතිතුමා පත් වෙලා මාස

6ක්. මාස හයක් කියන්නේ එතුමාගේ ධුර කාලයෙන් සියයට 10ක් ඉවරයි. එතකොට ඒ කාලය තුළ මේ සඳහා අරගෙන තිබෙන සාධනීය පියවර මොකක්ද කියන එක ඔබතුමා මේ සභාවට දැනුම් දෙනවා නම් අපි කැමැතියි කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, සංචාරක කර්මාන්තය තුළින් ආදායම් වැඩි වෙන්න නම් number of tourists වැඩි වෙන්න ඕනෑ. දැන් ලංකාවට තිබෙන ලොකුම බාධාව තමයි කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පුළුල් කරන තාක් විශාල ප්‍රමාණයේ ගුවන් යානා වැඩි ප්‍රමාණයක් ලංකාවට ගෙනෙන්න පුළුවන්කමක් නැතිකම. ඒ නිසා සංචාරකයන්ට විශාල බාධාවක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා රත්මලාන ගුවන් තොටුපොළට. රත්මලාන ගුවන් තොටුපොළේ runway එක London City Airport runway එකට වඩා ලොකුයි. London City Airport runway එකේ දවසකට ගුවන් යානා 100ක් විතර බානවා. එතකොට පැය තුනෙන්, හතරෙන් ලංකාවට එන සංචාරකයන් සඳහා මේ රත්මලාන ගුවන් තොටුපොළ පාවිච්චි කරන්න පුළුවන්. 2003 අවුරුද්දේ, මේ පාර්ලිමේන්තුව උඩින් planes යන්න වෙනවා, නමුත් ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා කියලා තමයි ඒක කරන්න බැහැ කිව්වේ. දැන් යුද්ධයත් ඉවරයි. අනික, පොඩි planes නොවෙයි, මගී ගුවන් යානා නේ යන්නේ. ඇමෙරිකාවේ පෙන්ටගනයට උඩින්, අඩි 30,000කට උඩින් ගුවන් යානා යනවා. ඉතින් ඇයි ලංකාවේ බැරි? ඇත්ත වශයෙන්ම දැන් යුද්ධයත් නැති නිසා මේ රත්මලාන ගුවන් තොටුපොළ commercial ගුවන් තොටුපොළක් බවට පත් කිරීමට හැකියාව තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

එහෙම කළොත්, budget touristsලා වෙනුවෙන් එය පාවිච්චි කරන්න පුළුවන්, එය ලංකාවට ආදායමක් ගෙනෙන තැනක් බවට පත් කරන්නත් පුළුවන්.

මූලාසනරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තවත් ඉල්ලීමක් කරනවා. ගරු විජිත හේරත් ඇමතිතුමනි, අපේ රටේ පිහිටීම දිහා බලන්න. ගරු ඇමතිතුමනි, අපේ රටේ සංචාරක කර්මාන්තය දියුණු වෙලා තිබෙන්නේ දකුණු මුහුදු තීරය ආශ්‍රිතව. නමුත් ඇයි අපට මීගමුවේ ඉඳලා කල්පිටිය දක්වා ඒක දියුණු කරන්න බැරි? මට මතකයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් සිටි කාලයේ කටාර් රාජ්‍යය කල්පිටියේ දූපත් සංචාරක කර්මාන්තය වෙනුවෙන් දියුණු කරන්න කැමැති වුණා. ඔවුන් ඉල්ලීමක් කළේ, කටුනායක ඉඳලා කල්පිටිය දක්වා පාර හදලා දෙන්න කියලා. එතකොට ඒක connect වෙනවා විල්පත්තුවට. අද වනවිට දක්ෂිණ අධිවේගී මාර්ගය තිබෙන නිසා බොහෝ සංචාරකයන්, wildlife touristsලා තුළ විල්පත්තුවට යනවාට වඩා යාලට යන්න ආකර්ෂණයක් තිබෙනවා. මොකද, පැය තුනෙන් යන්න පුළුවන්. විල්පත්තුවට යන්න පැය හයක් විතර ගත වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ කාරණය කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලනවා. ඔබතුමාගේ විෂයයට අදාළ නැති වුණත් මම සඳහන් කරන්න කැමැතියි, wildlife tourismත් දියුණු කිරීමට කටයුතු කළ යුතු බව. ඔබතුමා ආණ්ඩුවේ ප්‍රබලයෙක් නේ. ජනාධිපතිතුමාගේ දෙවැනියා නිසා ඔබතුමාට මේ කටයුතු කරන්න පුළුවන්. ඒ නිසා මේ සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වැඩසටහනක් ගෙනෙන්න. මොකද, වනජීවී -*[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඊළඟ, නායකයා බිමල් රත්නායක ඇමතිතුමා, ඔබතුමා ඊළඟ අගමැති.

ගරු ඇමතිතුමනි, ජාතික වනෝද්‍යානවල සංචාරක බංගලා තිබෙනවා. ඒවායේ taps කැඩිලා. හරිහමන් විධියට ඇඳන් නැහැ. මදුරු දැල් නැහැ. ඒවායේ ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් නැහැ. දැන් රුපියල් 25,000ක් ගන්නවා, two-night stay එකකට ඒ බංගලාවල. මම ඔබතුමාට යෝජනා කරනවා, ඒ bungalows ටික නවීකරණය කිරීමට කටයුතු කරන්න කියා. ඒවායෙන් යම් ප්‍රමාණයක් පළමු වටයේ trial එකක් විධියට තෝරා ගෙන නවීකරණය කරන්න. නවීකරණය කරලා, හොඳ chefsලා ටිකක් ඒවාට අනුයුක්ත කර, candlesවලින් ඒවා අලංකාර කළා නම්, නවාතැන් ගැනීම සඳහා සංචාරකයන්ට රුපියල් ලක්ෂයකට විතර දෙන්න පුළුවන්. එතකොට ඒවාට ලෝකයේ ඉන්න ඉහළ පෙළේ සංචාරකයන්ගේ, හොඳින් වියදම් කරන සංචාරකයන්ගේ ආකර්ෂණය ගන්නත් පුළුවන්. මොකද, රුපියල් 25,000කට කැලෑවක් ඇතුළේ රාත්‍රී 2ක් ඉන්න දෙනවා කියන එක ජාතික අපරාධයක්. ඒ නිසා එම සංචාරක බංගලා නවීකරණය කළොත් ඊට වඩා මුදලක් ඒවායෙන් හම්බ කරන්න පුළුවන්.

තව කාරණයක් කියන්න තිබෙනවා. සිංගප්පූරුව අරගෙන බලන්න, ඒගේ ඇති දෙයක් නැහැ. හැබැයි, හැම දේම සල්ලි බවට පත් කරලා තිබෙන්නේ. අපේ රටේ තිබෙන වනෝද්‍යාන පිළිබඳව, ඒවායේ ඉන්නා සතා සීපාවා පිළිබඳව, ඒවායේ තිබෙන ගහකොළ පිළිබඳව, භූමිය පිළිබඳව 3D demonstration එකක් නැහැ, proper souvenir shop එකක් නැහැ. මම මේ අවස්ථාවේ කනගාටුවෙන් වුණත් කිව යුතු ඇත්ත කාරණයක් තිබෙනවා. ගාමිණී ජයවික්‍රම මැතිතුමා දැන් නැහැ. එතුමා මිය ගියා. එතුමා වනජීවී ඇමති ධුරය දැරූ කාලයේ මම එතුමාට පිටු 107ක පොතක් හදා දුන්නා. නමුත් ශත පහක වැඩක් වුණේ නැහැ. අපේ ආණ්ඩුව තමයි ඒ කාලයේ තිබුණේ. එතුමා කළේ මොකක්ද? එක දෙයයි කළේ. අර උද්භිද උද්‍යානවලටයි, දෙහිවල සත්වෝද්‍යානයටයි buggies ටිකක් දැම්මා. එච්චරයි කළේ.

හරියට කළමනාකරණය කළොත් දිර්ඝ කාලීනව US Dollars 1 billion හොයන්න පුළුවන් තැනකට මේ සත්වෝද්‍යාන සහ අනෙක් භූගෝලීය ස්ථාන ටික ගෙනෙන්න පුළුවන්. සිංහල බෞද්ධයන් බහුතරයක් ජීවත් වෙන රටක් විධියට අපට prostitution promote කරන්න බැහැ; nightclubs promote කරන්න බැහැ. ගෝල් ෆේස් එක ළඟින් යනකොට මම දවසක් දැක්කා, කොට කලිසමක් ඇඳගෙන ඉණේ අත තබාගෙන අහස දිහා බලාගෙන සුද්දෙක් ඉන්නවා ගෝල් ෆේස් එකේ. ඇයි? ඒ කොහේ යන්නද? අඩුම තරමින් කොළඹ නගරයේ ඉඳලා කිලෝමීටර 7ක් දුරින් තිබෙන දෙහිවල සත්තු වත්ත ගැනවත් ඔහු දන්නේ නැහැ. ඒ ගැන document එකක් කිසිම හෝටලයක නැහැ. ඒ වාගේම මේවා පිළිබඳව දැනුම් තේරුම් තිබෙන පුහුණු කරපු කණ්ඩායම්වලින් යවන ටැක්සි ක්‍රමයක් නැහැ. ඔබතුමන්ලා බදු පිට බදු ගහලා මිනිස්සු මිරිකනවා වෙනුවට, නිර්මාණශීලි වැඩ කොටසක් කරලා මේ ක්ෂේත්‍රයෙන් ආදායම හොයා ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ සඳහා සැලසුම් සකස් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ සභානායකතුමා ඉතාම සංවේදීව - sensitive ලෙස - වචන පාවිච්චි කරලා බටලන්ද කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කළා. බටලන්ද වධකාගාරයේ වධකයන්ට දඬුවම් දිය යුතුයි. එහි කිසිම තර්කයක් නැහැ. හැබැයි අපි බලාගෙන ඉන්නවා චිත්‍රමසිංහ මහත්තයාත් එක්ක මේ ආණ්ඩුවේ තිබෙන ඩීල් එක කොහොමද කියලා. මොකද, බටලන්ද වධකාගාරය තිබුණේ ඊයේ පෙරේදා නොවෙයි, 1989දී. 1989දී බටලන්ද වධකාගාරය තිබුණාට පසුව 2004දී චන්ද්‍රිකාගේ ආණ්ඩුවේ කැබිනට් ඇමතිකම් 4කුයි, නියෝජ්‍ය ඇමතිකම් 4කුයි JVP එකට තිබුණා. විජිත හේරත් මැතිතුමාත් ඇමති වෙලා හිටියා නේ? එතකොට දැන් විජිත හේරත් ඇමතිතුමා කියනවා, අවුරුදු 25ක් ජනාධිපති ලේකම් කාර්යාලයේ අඳුරු ගබඩාවකයි ඒ වාර්තාව තිබුණේ කියලා. එතකොට 2004දී කැබිනට් රැස්වීම්වලට යද්දී ඒ අඳුරු ගබඩාවට ගියේ නැද්ද? ඒ අඳුරු ගබඩාවේ හංගලා

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

තිබුණු ඒ වාර්තාව ගන්න වුවමනාවක් තිබුණේ නැද්ද? අඩු ගණනේ කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් විධියට ඒ පිළිබඳව එක Cabinet meeting එකකදීවත් ප්‍රකාශයක් කර තිබෙනවාද? මේ රටේ සුනාමි අරමුදල් හොරකම් කළා කියලා චෝදනා එල්ල වෙච්ච මහින්ද රාජපක්ෂ ජනාධිපති කරන්න ඔබතුමන්ලා තමයි මෙන්න මේ පුටුවල ඉඳගෙන මහන්සි වුණේ. ඒක සර්ව සාධාරණීකරණය කළා වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා, ඒ වෙලාවේ තත්ත්වය අනුව රනිල් වික්‍රමසිංහ පරද්දන්න මහින්ද රාජපක්ෂ ගේන්න ඕනෑ කියලා. හැබැයි, ඔබතුමන්ලා ජනාධිපති කරපු මහින්ද රාජපක්ෂ ලවා ඒ අඳුරු කුටියේ තිබුණු වාර්තාව ගන්න වුවමනාවක් තිබුණේ නැද්ද?

ඊට පස්සේ යහ පාලන ආණ්ඩුව කාලයේවත්, - යහ පාලන ආණ්ඩුව ගෙනෙන්න JVP එක support කළා නේ - ඒ ගැන වුවමනාවක් තිබුණේ නැද්ද? යහ පාලන ආණ්ඩුවේ ලොකුම දෙදරීම ආවේ දින 52 සිද්ධියෙන්. එදා ඉස්සෙල්ලාම ප්‍රසිද්ධියේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පෞද්ගලික ජීවිතය විවේචනය කරපු කෙනා තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඔය ඊයේ කියපු විධියට ඒ මිය ගිය අය, ඒ මිය ගිය ඥාතීන් වෙනුවෙන් සාධාරණය ඉෂ්ට විය යුතු විධිය පිළිබඳව හිතේ තිබෙන කළු ගල අයින් කරන්න ඕනෑ නම් ඒ වෙලාවේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ලවා ඔය කොමිෂන් සභා වාර්තාව ගන්න තිබුණා නේ. ඒ වෙලාවේ ගෙනාවා නම් ඒ වාර්තාවට අවුරුදු 18යි. අවුරුදු 20ක් වෙලා නැහැ. අද වනකොට අවුරුදු 25යි. මම දන්න තරමට නම් විජයපාල මෙන්ඩිස් මැතිතුමා ඒක 2001දී සභාගත කළා. ඒක නීත්‍යානුකූලද නැද්ද කියලා මම දන්නේ නැහැ. හැබැයි, මේ කියන ඒවා අද කරන්න පුළුවන්ද? කමක් නැහැ, දැන් ඒ පිළිබඳව හොයන්න, දඬුවම් දෙන්න. ඒ ගැන අපේ තර්කයක් නැහැ. නමුත් මේ කාරණයත් මම කියන්න කැමැතියි. බටලන්ද කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කරනකොට කථානායකතුමා ඇඩුවා. හැබැයි, කථානායකතුමාට ඇඩුණේ නැද්ද කොටිකාවත්ත සද්ධාතිස්ස හාමුදුරුවෝ මරනකොට? මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මරනකොට? විජය කුමාරණතුංග මරනකොට? අපි කියනවා ඒවාත් හොයන්න කියලා. බෞද්ධ භික්ෂූන් වහන්සේලා කොච්චර මැරුවාද? කතෝලික පූජකවරු, පොලිස් නිලධාරීන් කොච්චර මැරුවාද? මම ඒ ගණන් කියන්නේ නැහැ. හමුදා නිලධාරීන්, රාජ්‍ය සේවකයන්, විදුහල්පතිවරු, නීතිඥවරු, ඉංජිනේරුවරු කීදෙනෙක් මැරුවාද? එතකොට ඒ අයගේ ආදරණීයන්ට, ඒ අයගේ ඥාතීන්ට, සහෝදර සහෝදරියන්ට, අම්මලාට, බිරිඳලාට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ නැද්ද? ඒ වාගේම මාධ්‍යවේදීන්, වෛද්‍යවරුන්, හමුදා නිලධාරීන්ගේ පවුල්වල සාමාජිකයන්, වතු අධිකාරීන්, ග්‍රාම ආරක්ෂකයන් මැරුවේ නැද්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් සමාජවාදී පක්ෂයේ හිතවතුන්, දේශපාලනඥයන්, ව්‍යාපාරිකයන්, ව්‍යාත්තීය සම්මති නායකයන් මැරුවේ නැද්ද? ඒ අය වෙනුවෙන් මොකක්ද වෙන්නේ?

ඒ නිසා ගෙනෙන කොට ඒ පැකේජ් එකම ගෙනෙන්න. ඒ ඔක්කෝම එකට එකතු කරලා ගෙනෙන්න. මා ළඟ ඡායාරූපයක් තිබෙනවා. එක හන්දියකදී නිර්වස්ත්‍ර පුද්ගලයෙකුට ජනතා විමුක්ති පෙරමුණේ ආධ්‍යාත්මික නායකයා පයින් ගහන හැටි මේ තිබෙන්නේ. පයින් ගහනවා. මේවා හරිද? බටලන්දේ වධකයාට දඬුවම් දෙන්න. බටලන්දේ වධකයාට දඬුවම් දෙන ගමන් මේ රටේ සිදු වුණු අනෙක් මිනී මැරුම් කරපු අයටත් දඬුවම් දෙන්න. මොකද, මට මතකයි මගේ තාත්තා මරන්න ආපු විධිය; මගේ තාත්තා දවස් 10ක් හැංගිලා හිටපු විධිය. එයා බේරුණේ කොහොමද කියලා මම දන්නවා. එදා මම පොඩි ළමයෙක්. ඉතින්, ඒවාටත් සාධාරණය ඉටු වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හැඟීම්බර වෙලා කඳුළු සලලා ඇත්ත වහන්න බැහැ. බටලන්ද වැනි වධකාගාර ගණනාවක් බිහි වෙන්න හේතු වෙච්ච කාරණා ටික හොයන්න ඕනෑ. ඒවාට දායක වුණු කට්ටිය ගැනත් හොයන්න ඕනෑ. ඔවුන්ට දඬුවම් දෙන්න කියලා, එවකට ඔබතුමන්ලාගේම පක්ෂයේ ජනාධිපති අපේක්ෂකවරයකු වූ නන්දන ගුණතිලක මහත්මයා කරපු ප්‍රකාශයක් ඊයේ පෙරේදා සමාජ මාධ්‍යවල පළ වී තිබෙනවා මම දැක්කා. ඒ ගැන මොකක්ද කියන්නේ කියලා අපි අහන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තත්පර 10ක් දෙන්න. මේ මන්ත්‍රීතුමා ඡායාරූපයක් පෙන්නුවා නේ. ඒ ඡායාරූපය මොකක්ද කියලා අපට දැනගන්න පුළුවන්ද? මොකද, වචනයෙන් කියපු එක නොවෙයිද දන්නේ නැහැ, ඒ තිබෙන්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමාට මගේ වෙලාව දෙන්න එපා. මම කිව්වේ, ආධ්‍යාත්මික නායකයා කියලා. කාගේවත් නමක් කිව්වේ නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ කාලයේ පොඩියි. ඔබතුමා දන්නේ නැහැ. ඔබතුමා ඒ කාලයේ ඉපදිලා ද දන්නේත් නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,- *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා phone එක පෙන්වලා යම් දෙයක් කිව්වා නේ. එතකොට, එතුමාගේ වගකීම තමයි ඒ ඡායාරූපය මේ ගරු සභාවට ඉදිරිපත් කරන එක.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම ඒක පෙන්නුවා විතරයි.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඒ ඡායාරූපය පෙන්වන්න කියලා තමයි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක මගේ වෙලාව. එතුමා පාර්ලිමේන්තු සම්ප්‍රදාය දන්නේ නැත්නම් නිකම් ඉන්න කියන්න. "මම එය සභාගත කරනවා" කිව්වොත් තමයි දෙන්න ඕනෑ. එහෙම නැත්නම් දෙන්න ඕනෑ නැහැ. එතුමා ඒක දන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ කාලයේ ඉපදිලාත් නැතුව ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාව අවසන් කරන්න කලින් මම තවත් කාරණයක් කියන්න ඕනෑ. අර්ව්චුනා මන්ත්‍රීතුමා ඊයේ පෙරේදා ඉස්ලාම් ආගම ගැනයි තවත් දේවල් ගැනයි දැඩි විවේචනයක් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තවත් මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම මේ කාරණය කියලා කථාව අවසන් කරනවා.

මේ ගරු සභාවේ අනාදිමත් කාලයක ඉඳලා අද වන කල් වැදගත් දැවිඩ මන්ත්‍රීවරු ගණනාවක් ඉඳලා තිබෙනවා; තවමත් ඉන්නවා. ඒ අය කවුරුවත් තමන්ගේ publicity එක උදෙසා ආගම් ඇදගෙන කථා කළේ නැහැ; ආගම් විවේචනය කළේ නැහැ. ඒ අය තමන්ගේ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන්, තමන්ට ඡන්දය දුන් ජනතාව වෙනුවෙන් කථා කළා. නමුත් මේ වතාවේ එක්කෙනෙක් ඇවිල්ලා YouTube එකෙන් monetization කරන්න උණු උණුවෙන් විකුණන්න පුළුවන් subjects දාගෙන ආගම් විවේචනය කරනවා. අපි එතුමාට කියනවා, අවුරුදු 10න්, අවුරුදු 12න් මුස්ලිම් ළමයි බන්දලා දීලා තිබෙන්නේ කොහේද කියා පුළුවන් නම් කරුණු ඉදිරිපත් කරන්න කියලා. කොහේද එහෙම බන්දලා දීලා තිබෙන්නේ? අපි එතුමාට කියනවා ඒවා සාක්ෂි සහිතව ඉදිරිපත් කරන්න කියලා. තේසවලමෙයි නීතිය ගැන අපි කථා කරන්නේ නැහැ. ආගම් සම්බන්ධ විවේචන කරන කොට නිවැරැදිව, කරුණු සහිතව ඔප්පු කරන්න කියලා අපි එතුමාට කියනවා.

අනෙක් එක, එතුමා කිව්වා මුස්ලිම් කාන්තාවන්ට හිරිහැර වෙනවා කියලා. ඇත්ත වශයෙන්ම එතුමා කරුණු දන්නේ නැත්නම් මම කියනවා, ඉස්ලාම් ආගමේ මොන තරම් වටිනාකමක්, ගෞරවයක් හා පිළිගැනීමක් මුස්ලිම් කාන්තාවන්ට ලබා දීලා තිබෙනවාද කියා ඉස්ලාම් ආගම අධ්‍යයනය කරලා දැනගන්න කියලා. එතුමාට monetization කරන්න, ඩොලර් හොයන්න නම් TikTok එකට හෝ YouTube එකට ගිහිල්ලා ඕනෑ තරම් දේවල් කරන්න පුළුවන්. එතුමාට ඕනෑ නම් සංචාරක ඇමතිතුමාගෙන් අවසර අරගෙන tourist destinationsවල ගිහිල්ලා YouTube live programmes ටිකක් කරන්න කියන්න, මෙතැන ඇවිල්ලා ආගම් විවේචනය කරන්නේ නැතුව. මෙහිදී අපට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ජනතා විමුක්ති පෙරමුණ සාමාන්‍යයෙන් කිසිදු ආගමක් විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ට ආගම් පිළිබඳ ලොකු වටිනාකමකුත් නැහැ. ඒ මන්ත්‍රීතුමා මේ කාගේ හයියෙන් ද කථා කරන්නේ කියලා මට සැකයක් තිබෙනවා. මොකද, ඇමතිතුමියලා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත - MMDA එක - වෙනස් කරන්න හදනවා. ජම්යතුල් උලමා සංවිධානය ඒවායේ කාලානුරූපීව කළ යුතු වෙනස්කම් ඒ අදාළ විශේෂඥයන් එක්ක කථා කරලා කරනවා. ඡන්දයෙන් ආපු කට්ටියට ඒවා කරන්න අයිතියක් නැහැ. බෞද්ධාගම වෙන්න පුළුවන්, කතෝලික ආගම වෙන්න පුළුවන්, හින්දු ආගම වෙන්න පුළුවන්, ඒ ඕනෑම ආගමක මූලික හරය වෙනස් කරන්න දේශපාලනඥයන්ට කිසිදු අයිතියක් නැහැ. ඒ නිසා අපි මූලාසනයෙනුත් ඉල්ලීමක් කරනවා, ඒ ආකාරයට අනවශ්‍ය විධියට දහලන අයට අවස්ථාව දෙන්න එපා, පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන්න දෙන්න එපා කියලා. එසේ ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අභා. 3.57]

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. ජාතික ජන බලවේගයේ 2025 වසරේ අය වැය යටතේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂය පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ ආණ්ඩුවේ attendance ගැන හොයන විපක්ෂයේ attendance අපට හොඳට බලා ගන්න පුළුවන්.

මොකද, අය වැය විවාදය කියන්නේ, විපක්ෂය විසින් counter -arguments ගෙන එන්න ඕනෑ දෙයක්. නමුත්, අපට පෙනෙනවා, ඒ අයගේ attendance කොහොමද කියන එක. අපි homework කරලා, හරියට අධ්‍යයනය කරලා, ඉතා වගකීම් සහගත මහජන නියෝජිතයන් විධියට, මේ අය වැය විවාදයට සම්බන්ධ වෙද්දී මට වෙලාවකට හිතෙනවා, අපි මේ සම්බන්ධ වෙලා ඉන්නේ අය වැය විවාදයකටද කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. විපක්ෂයේ මන්ත්‍රීවරුන් උදේට මෙහේට එනවා; කාගෙන් හරි මොනවා හරි ටිකක් සොයා ගන්නවා; Facebook එකේ උඩ පහළ යන මොනවා හරි ටිකක් සොයා ගන්නවා; කථාව කරනවා.

මට පෙර කථා කළා, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ඇතුළේ ජේවීපී ආධ්‍යාත්මික නායකයා ලෙස සඳහන් කරමින් යම් ඡායාරූපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඒ ඡායාරූපය සභාගත කරන්න කියලා මම ඔබතුමාට මුලින්ම කියනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආධුනික මන්ත්‍රීවරියක් වන එතුමියට මම කියන්න කැමැතියි, document එකක් සභාගත

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කරන්න ඕනෑ "සභාගත කරනවා" කියන වචන පාවිච්චි කළොත් පමණයි කියන එක. එහෙම නැතුව එවැන්නක් පෙන්නුවා කියලා, එය සභාගත කළ යුතු නැහැ. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියලා study කරලා නේ එනවා කියන්නේ. පොඩ්ඩක් ගිහිල්ලා මේ පාර්ලිමේන්තුවේ රීතිත් study කරලා එන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය කථාව කරගෙන යන්න.

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට එතුමා සමඟ වාදයකට යන්න අවශ්‍යතාවක් නැහැ. නමුත්, පැහැදිලි ලෙසම යම් ඡායාරූපයක් එතුමා පෙන්නුවා. ගරු මන්ත්‍රීතුමනි, ඒක ඇත්ත නම්, ඇත්ත කියලා ඔබතුමාට විශ්වාසයක් තිබෙනවා නම් ඒක සභාගත කරන්න කියලා තමයි මා ඉල්ලා සිටින්නේ.

මම දැන් මගේ කරුණු දැක්වීම කෙරෙහි අවධානය යොමු කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද විවාදයට ගන්නේ, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයයි. මා නියෝජනය කරන බලපිටිය, බෙන්තර ප්‍රදේශ අයත් වන ගාල්ල දිස්ත්‍රික්කය කියන්නේ, සංචාරක කර්මාන්තයේ මර්මස්ථානයක් හැටියට හඳුනා ගන්නා ප්‍රදේශයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා අද විවාදයේදී විශේෂයෙන් මගේ අවධානය යොමු කරන්න කැමැතියි, සංචාරක ක්ෂේත්‍රයට. ඕනෑම ක්ෂේත්‍රයක් ගැන කථා කරන කොට, අප අද සිටින්නේ කොතැනද කියන එක පිළිබඳව අපට තක්සේරුවක් තිබෙන්න ඕනෑ. ජාතික ජන බලවේගය මේ ආණ්ඩුව ලබා ගන්නා විට, අපට රටක් විධියට සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධව තිබුණු ප්‍රධාන ගැටලුව වුණේ, සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධව රටේ තිබෙන potential එක, එහෙම නැත්නම් විභවය නිවැරැදි ලෙස හඳුනා ගෙන නොතිබීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අනුව පෙනෙනවා, මේ රටට සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ නිවැරැදි ප්‍රතිපත්තියක්වත් තිබුණේ නැති බව. ඒ නිසාම අපේ රටට tourism sector එක සම්බන්ධයෙන් අඩුම තරමින් brand name එකක්වත් නැහැ. ඉන්දියාව ගත්තොත්, "Incredible India" කියලා slogan එකක් ඒගොල්ලන්ගේ tourism campaign එකේ තිබෙන බව අපි දන්නවා. මැලේසියාව ගත්තොත්, "Truly Asia" කියලා slogan එකක් තිබෙනවා. හැබැයි, එහෙමවත් brand name එකක් අපේ රටට තිබුණේ නැහැ. ඒ නිසා අපේ සංචාරක ක්ෂේත්‍රය කියන එකත් හුදු පුද්ගල ව්‍යාපාරයක් මත පදනම් වෙලා විතරයි තිබුණේ. ඒ නිසා දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා, අන්න එතැනින් නිවැරැදි තැනට, නිවැරැදි track එකට මේ සංචාරක ක්ෂේත්‍රය අරගෙන, එතැනින් මේ potential එක හඳුනා ගෙන, අපට ප්‍රතිලාභ ගන්න පුළුවන් ක්‍රමයක් නිර්මාණය කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද විශේෂ දවසක් කියලායි මා හිතන්නේ. මොකද, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නවතම දත්තවලට අනුව, සංචාරකයන් ලක්ෂ හයක් අපේ රටට මේ අවුරුද්දේ -2025 වර්ෂයේ- අද වන විට පැමිණ තිබෙනවා. මම හිතනවා, අපේ රට සංචාරක ක්ෂේත්‍රයෙන් කොයි තරම් දුරට, ඉහළට රැගෙන යන්න අපට පුළුවන්ද කියන එක මේ දේවලින් අපට තීරණය කරන්න පුළුවන් කියලා. ඒ වාගේම, විවිධ listingsවලින්, විවිධ rankingsවලින් අපේ රට ඉතා ඉහළ තැනක සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා අපේ අවධානය යොමු වෙන්න ඕනෑ, මෙන්න මේ දත්ත අනුව ලැබෙන ප්‍රතිලාභ අපේ රටට උපරිම වශයෙන් නෙළා ගන්නේ කොහොමද කියන කාරණයට. ඒ සඳහා ජාතික ජන බලවේගය විධියට අපට උපාය මාර්ගික සැලැස්මක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා තමයි, අපි මෙවර අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ආයතන ප්‍රතිසංවිධානය කරලා, ජාතික සංචාරක කොමිසමක් ස්ථාපනය කරලා ඒ හරහා සංචාරක ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට යොමු වෙලා ඉන්නේ.

අපි මේ අය වැය ලේඛනය හරහා 2025 වසරට අදාළව සංචාරක ක්ෂේත්‍රයේ තෝරාගත් ගමනාන්තවල සනීපාරක්ෂක පහසුකම්, යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 600ක් වෙන් කර තිබෙනවා. Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ සනීපාරක්ෂාව සඳහා මෙන්ම තොරතුරු මධ්‍යස්ථාන සහ විවේකාගාර පහසුකම් ලබා දෙන ස්ථාන නිර්මාණය කරන්න යෝජනා වෙලා තිබෙනවා. අප මේවා ගැන පළමු කොටම මාධ්‍යයට අදහස් දක්වන අවස්ථාවේ, සමහරු මේ දේවල් උපහාසයට ලක් කරලා කරන කථාත් අපි දැක්කා.

නමුත් අපේ උත්සාහය වෙලා තිබෙන්නේ මඩ වෙනුවට වැඩ කරලා, නිහඬව වැඩ කරලා, සන්දර්ශන නැතුව වැඩ කරලා ඒ ප්‍රතිලාභ ජනතාවට ලැබෙන විධියට කටයුතු කිරීමයි. බෙන්තර ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමේදී වාගේම, ගාල්ල දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයට බලපාන තවත් බොහෝ දේවල් තිබෙනවා. මේ සංචාරක ක්ෂේත්‍රය ඇතුළේ අපි අවධානය යොමු කරන්න ඕනෑ දෙයක් තමයි ඒ යටිතල පහසුකම් දියුණු කිරීම. සංචාරක කර්මාන්තය, එහෙම නැත්නම් සංචාරක ක්ෂේත්‍රය කියන එක අපි හඳුනාගන්නේ umbrella industry එකක් විධියට. එහෙම කියන්නේ තවත් බොහෝ අමාත්‍යාංශ හරහා මේ සංචාරක ක්ෂේත්‍රයට ආයෝජන එකතු කිරීමේ හැකියාවක් තිබෙන නිසායි. ඒ නිසා අපේ උත්සාහය තිබෙනවා ජනතාවට, ගමේ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන විධියට මේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න. ඒ වාගේම තමයි සාම්ප්‍රදායික සංචාරක කර්මාන්තවල සංකල්පවලට එහා ගිහිල්ලා, agro-tourism, ecotourism සහ integrated tourism වාගේ ගමටත් ඩොලර් අරගෙන යන ආර්ථිකයක් සංචාරක කර්මාන්තය හරහා උත්පාදනය කරන්න තමයි අපේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මම මේක අවස්ථාවක් කරගන්නවා මේ ගැනත් සඳහන් කරන්න. බලපිටිය, බෙන්තර කියන්නේ සංචාරක ක්ෂේත්‍රයේ ඉහළම විභවයක් තිබෙන ප්‍රදේශයක්. හැබැයි පසුගිය ආණ්ඩුවල කිසිම කෙනෙක් මේ ක්ෂේත්‍රය නහාසිටුවන්න කිසිම අවස්ථාවක අවධානය යොමු කරලා තිබුණේ නැහැ. බෙන්තොට ප්‍රදේශය ගත්තොත්, ඒ ප්‍රදේශයේ පානීය ජල ගැටලුවක් තිබෙනවා. ඒ පළාතේ පරම්පරාගත දේශපාලනය කරපු අය මේ සභාවේ මේ මොහොතේත් ඉන්නවා. හැබැයි ජනතාවගේ පානීය ගැටලුව විසඳීමට ඔවුන් වැඩ කළේ නැහැ. හැබැයි අපි බලයට පත් වෙලා මාස 4කින් පළමු සම්බන්ධීකරණ කමිටුව තුළින්ම බෙන්තොට ජල ප්‍රශ්නයට අපි හොඳ විසඳුමක් අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව ඒ ව්‍යාපෘතියේ අවසන් අදියරට දැන් අපි ඇවිත් තිබෙනවා. ලබන මැයි මාසය වාගේ වෙනකොට සංචාරක ක්ෂේත්‍රයට අදාළව යටිතල පහසුකම් දියුණු කිරීමට, පානීය ජල ප්‍රශ්නය විසඳීමට අපට හැකියාවක් තිබෙනවා.

ගොඩක් අය අපෙන් අහන දෙයක් තමයි, ජාතික ජන බලවේගයේ කට විතරද, වැඩ නැද්ද කියන එක. අපි වැඩ කරලා තිබෙනවා. ඒ වැඩ නිහඬව, සන්දර්ශන නැතුව තමයි අපි කරලා

තිබෙන්නේ. සංචාරක ක්ෂේත්‍රය තුළින් අපේ මේ පුංචි දිවයින, අපේ මේ පුංචි රට මේ ලෝකයේ හැමෝගෙම wish list එකේ එකක් බවට පත් වෙන, bucket list එකේ එකක් බවට පත් වෙන ගමනාන්තයක් බවට පත් කරන්නට ජාතික ජන බලවේගය විධියට අපි උපරිම කැප වෙනවා.

මට මේ කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[4.05 p.m.]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Hon. Presiding Member, today we are having a very important Committee Stage Discussion on the Votes of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism.

Madam, we have to work with the rest of the world; we cannot be isolated. As we continue with our economic recovery while strategically positioning ourselves in the changing landscape of world politics, it is essential to acknowledge the support we have received from the global community. When Sri Lanka faced with an unprecedented economic crisis, we declared bankruptcy. We witnessed demonstration of extraordinary international solidarity in our darkest hour. When our foreign exchange reserves depleted and our 22 million citizens were faced with shortages of essentials, several nations extended their support.

The Government of India, under the leadership of Prime Minister Narendra Modi, provided us with a crucial credit line of US Dollars 4 billion, enabling us to secure the vital medicines, food and other essentials. That timely intervention helped us stabilize our immediate humanitarian situation. For that, we are eternally grateful to Prime Minister Narendra Modi and the people of India and for being a great friend to Sri Lanka. Similarly, we acknowledge the Chinese Government, who significantly contributed through a currency swap, the Japanese Government as well as the Bangladesh Government.

Madam, we must recognize the geopolitical landscape that evolves continuously. After President Donald Trump returned to office in the United States, global political dynamics have shifted once again, which is good. As a responsible member of the international community, Sri Lanka must navigate through these changes thoughtfully. We observe the interests of President Donald Trump in his approach to complex global challenges including the efforts towards peace in Gaza and Ukraine.

Madam, as a country which exports garments and textiles worth US Dollars 2 billion to 2.5 billion annually to the US, we must continue to have a good relationship with them. The foreign exchange earned through those exports does not just add numbers to our country's balance sheet, but those exports also provide livelihood for hundreds of thousands of Sri Lankans. So, I think the Government of Sri Lanka must continue to have a dialogue with the United States to keep the current concessions on our exports because they bring an immense strength to our country's economy and the foreign exchange reserves.

ඒ විතරක් නොවෙයි, අපේ ගරු විජිත හේරත් ඇමතිතුමා විශේෂයෙන්ම දක්ෂ මන්ත්‍රීවරයෙක් බව අපට මතකයි. දැන් එතුමා මගේ දිස්ත්‍රික්කයේ කැබිනට් ඇමතිවරයෙක්. අපි ඔබතුමාට සුබ පතනවා. Hon. Minister, you have taken up a very challenging task because the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism is a crucial Ministry which has to be handled very carefully.

ගරු ඇමතිතුමනි, අපේ රටට ඩොලර් උපයන ප්‍රධානම ක්ෂේත්‍රයක් තමයි සංචාරක ක්ෂේත්‍රය කියන්නේ. මේ ක්ෂේත්‍රය ගැන කථා කරනකොට මටත් ලොකු කැක්කුමක් තිබෙනවා, වුවමනාවක් තිබෙනවා. මොකද, මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ආසනයේ වැඩිහරියක්ම අපේ අහිංසක මිනිස්සුන්ගේ ජීවනාලිය බවට පත් වෙලා තිබෙන්නේ සංචාරක ක්ෂේත්‍රයෙන් උපයන මුදල්. හැබැයි, මේ රටේ ඇති වෙච්ච පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයත් එක්ක, විශේෂයෙන්ම මේ රට බංකොලොත්භාවයට පත්වීමත් එක්ක, සංචාරක ක්ෂේත්‍රයට ඒවා බලපෑ ආකාරය පිළිබඳව අපි ආවර්ජනය කරන්න ඕනෑ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ නියැළුණ අපේ ව්‍යාපාරිකයන් දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ පෑවා. මොකද, ඒ අය ණය අරගෙන තිබුණා. ණය අරගෙන, ඒ ණය ගෙවා ගන්න බැරි වුණා. ඊට පස්සේ ඒ අයට moratorium දුන්නා. මේ තුළින් ඒ අය තවත් ණය උගුලක පැටළුණා. ඒ නිසා මේ අයට තවමත් ගොඩ එන්න බැරි තත්ත්වයක සිටිනවා, ගරු ඇමතිතුමා. අපි වර්තමාන රජයෙන් ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව අවධානය යොමු කරලා, විශේෂයෙන්ම මේ සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන ව්‍යාපාරිකයන් වෙනුවෙන් සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. උදාහරණයක් විධියට මගේ මීගමුව ආසනය ගන්න. මේ ව්‍යාපාරිකයන් වෙනුවෙන් යම්කිසි ණය සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රයෙන් ඩොලර් උපයන කණ්ඩායමක් වෙච්ච මේ මධ්‍යම පාන්තික ව්‍යාපාරිකයන් අරගෙන තිබෙන ණය වෙනුවෙන් මේ අය වැයෙන් යම්කිසි ආකාරයට රජය මැදිහත් වෙලා, ඒ බර ඒ අයගෙන් නිදහස් කර ගැනීම සඳහා කටයුතු කරාවි කියලා මම බලාපොරොත්තු වුණා. ඒ පිළිබඳව අය වැයේ කරුණු ඉදිරිපත් නොවුණත්, දැන්වත් මේ පිළිබඳව සලකා බලන්න කියලා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රය ගැන කථා කරනකොට මම ඔබතුමාට එදාත් අපේ Committee Room එකේ තිබුණු රැස්වීමේදීත් ප්‍රකාශ කළා, විශේෂයෙන්ම අපේ රටට සංචාරකයෝ එන්නේ, කාලා බීලා සතුටු වෙලා, මේ රටේ සතා සිවුපාවා, පරිසරය දැකලා enjoy කරලා යන්නයි කියන කාරණය. එවැනි තත්ත්වයක් තිබෙද්දී, අපේ රටේ මේ වන විට සංචාරක ක්ෂේත්‍රයේ යෙදී සිටින පිරිස්වල, ඒ අයගේ restaurantsවලට, resto-barsවලට දීලා තිබුණු මත්පැන් licences ඉවත් කරලා තිබෙනවා. මම හිතන විධියට ඒ යම්කිසි නඩු තීන්දුවක් මත. හැබැයි, යම් ආකාරයකට රජය මැදිහත් වෙලා මේ අයට licences ටික ලබා දීලා, නැවත වතාවක් සංචාරකයන්ට, ඒ අයගේ customersලාට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න අවශ්‍ය ඒ මැදිහත්වීම කරන්නය කියන ඉල්ලීම කරනවා.

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කාම්බෝජයට ගියා. කාම්බෝජයේ පාරවල ඇවිදගෙන යනකොට පොඩි කඩ, supermarkets, පොඩි පොඩි restaurants තිබෙනවා. මේ හැම එකකම වයින්, බියර් ඒගොල්ලෝ විකුණනවා. ගරු ඇමතිතුමනි, ඒ වාගේම තායිලන්තය ගත්තොත්, ඩොලර් බිලියන 15ක විතර ආදායමක් - revenue එකක් - ඒ රජය ලබනවා, විශේෂයෙන්ම මේ restaurantsවලින්. එහෙම නැත්නම් beveragesවලින්.

දැන් ලෝකයේ දියුණු වෙන රටවල් අතරින් විශේෂයෙන්ම තායිලන්තය අපට උදාහරණයකට ගන්න පුළුවන්. එය ආසියානු කලාපීය රටක්. ඒ නිසා එහි පරිසරය අපේ රටේ තිබෙන පරිසරයට සමානයි. තායිලන්තයේ health tourism ගත්තොත්, ඒ අය ඩොලර් බිලියන 2.9ක් health tourismවලින් 2023දී උපයලා තිබෙනවා. එතකොට අපටත් මේ health tourism ගැන අවධානය යොමු කරන්න පුළුවන්. අපේ රටේ ඉංග්‍රීසි වෙදකම වාගේම හෙළ වෙදකම තිබෙනවා. ඒ වාගේම, අපේ රටේ දක්ෂ වෛද්‍යවරු සහ නිලධාරින් ඉන්නවා. ඒ නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයටත්, රජයටත් මේකෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අවධානය යොමු කරන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා. Wellness tourism ගත්තොත්, තායිලන්තයේ මේ වෙනකොට එය සියයට 119.5කින් වර්ධනය වෙලා තිබෙනවා. මේකත් එක්ක සෞඛ්‍යසම්පන්න සමාජයක් ගොඩනඟනවා වාගේම, සෞඛ්‍යසම්පන්නව ජීවත් වෙන්න උත්සාහ ගන්න සංචාරකයන් මේ රටට ගෙන්වා ගැනීමේ අවකාශය, අවස්ථාව තිබෙනවා කියන එකත් අපි මතක් කර දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි. සංචාරක ක්ෂේත්‍රයේදී විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රය ඉතා වැදගත්. ප්‍රවාහන ක්ෂේත්‍රයේදී පොදු ප්‍රවාහන සේවය වාගේම පෞද්ගලික මගී ප්‍රවාහන සේවයත් ඉතා වැදගත්. අපේ පෞද්ගලික මගී ප්‍රවාහන සේවය ගත්තොත්, සමහර වෙලාවට නව තාක්ෂණය භාවිත කරලා, අලුත් app එකක් හදුන්වලා දීලා, මේ ප්‍රවාහන සේවය යාවත්කාලීන කරලා සංචාරකයන්ට ආරක්ෂිතව, අඩු මුදලකට සේවය ලබා දීලා රජයට සහ මේ රටට ආදායමක් උපයන ආකාරයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ආණ්ඩුවට පුළුවන්.

ඒ වාගේම පොදු ස්ථානවල වැසිකිළි කැසිකිළි පහසුකම් පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, මේ රටට එන හැම මනුස්සයෙක් වාගේම, අපි වුණත් ලෝකයේ රටකට ගියාම ලස්සනට ඇඳලා, කාලා බීලා ඉන්න කැමැතියි. සාමාන්‍ය ජීවිතයේදීත් එහෙමයි. ඒ නිසා මේ රටට එන සංචාරකයන්ට ඒ පහසුකම් ටික සැපයීම රජයේ වගකීමක් කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තමයි ආරක්ෂාව සැපයීමත්. අද අපේ රටේ ආරක්ෂාව පිළිබඳව පැහැදිලි ප්‍රශ්නයක් තිබෙනවා. අද තැන තැන පාතාලෙන් වෙඩි තියනවා; මිනී මරනවා. මෙවැනි තත්ත්වයක් තුළ සංචාරකයන් අපේ රටට එයිද? සංචාරකයන් මේ රටේ ප්‍රවෘත්ති බැලුවාම, ඒ අයට මැවිලා පේන්නේ කොලොම්බියාවේ මෙඩෙලින් නගරය. මෙඩෙලින්වල උසාවියට පබ්ලෝ එස්කොබාර් ගිනි තිබ්බා වාගේ තත්ත්වයක් තමයි අද අපේ රටේ තිබෙන්නේ. උසාවියට ඇවිත් මහ දවාලේ විත්තිකූඩුවේ ඉන්න මනුස්සයාට වෙඩි තියලා මරලා යන රටක සංචාරය කරන්න සංචාරකයෙක් එයිද කියන සාධාරණ සැකය ඕනෑම පුද්ගලයෙකුට ඇති වෙන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වාගේම අද ලෝකයේ සංචාරක ක්ෂේත්‍රයේ ඉහළින්ම තිබෙන රටක් තමයි Spain කියන්නේ. Spainවලට 2023 අවුරුද්දේ පමණක් මිලියන 85කට ආසන්න සංචාරකයන් ප්‍රමාණයක් ඇවිත් තිබෙනවා. ඒ වාගේම අපි Ibizaවලට ගියොත්, එහි මොන තරම් උත්සව තිබෙනවාද, parties තිබෙනවාද, EDM events තිබෙනවාද? මේවා තුළින් ඔවුන් මොන තරම් මුදලක් උපයනවාද කියලා අපි අධ්‍යයනය කරන්නට අවශ්‍යයි. අපි Brusselsවලට ගියොත්, Antwerpවලට ගියොත්, Tomorrowland ගියොත්, ඒත් එහෙමයි. මේ පාර්ලිමේන්තුවේ කී දෙනෙක් Tomorrowland ගිහින් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. මම ගිහිල්ලා තිබෙනවා. මම දැකලා තිබෙනවා, ඒ රටවල ජනතාව දවස් තුනක් ඇතුළත මොන තරම් ආදායමක් උපයනවාද කියලා. ඒ පිළිබඳව අපි අධ්‍යයනය කරන්න ඕනෑ. මේ රටවලට ගිහින් ඒවා දැකලා, ඒවා අධ්‍යයනය කරලා අපේ රටට උචිත ආකාරයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත් කියලා මා විශ්වාස කරනවා.

ඒ විතරක් නොවෙයි. අපි අපේ රටේ සම්පත් කොයි තරම් ආරක්ෂා කරනවාද කියන එක පිළිබඳවත් අපි කල්පනා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දැන් අපේ පරිසරය ගැන කථා කරනවා. අපේ පරිසරය බලන්න තමයි සංචාරකයන් එන්නේ. මම අද පත්තරේ තිබෙනවා දැක්කා, "138 elephants had been killed in train collisions in the past 17 years" යනුවෙන්. අපේ රටේ අලි ටික තමයි මේ මැරෙන්නේ. අපේ රටේ සම්පත් ටික තමයි මේ නැති වෙන්නේ. මහ පාරේ අලි දුවලා දළ කඩා ගන්න තත්ත්වයට අද මේ රට පත්වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපි මේ රටේ සම්පත් ටික විනාශ කර ගත්තොත්, අපි මේ රටට එන සංචාරකයන්ට පෙන්වන්නේ මොනවාද? අපේ රටේ රෑ දහය වෙනකොට parties ටික නතර කරනවා නම්, මේ රටේ සිටින අලි සම්පත මැරිලා යනවා නම්, මේ රටේ තිබෙන ගස් කොළන් ටික කපලා දමනවා නම් මේ රටට එන සංචාරකයන්ට අපි පෙන්වන්නේ මොනවාද? අපේ ඇමතිතුමෙක් කියනවා මම දැක්කා, මේ වඳුරෝ ටික අරගෙන ගිහින් දූපතකට දමන්න ඕනෑ කියලා. ඊට පස්සේ වත්තක් හදලා ගැහැනු වඳුරෝ ටික එක පැත්තකටයි, පිරිමි වඳුරෝ ටික අනෙක් පැත්තටයි දමන්න ඕනෑ කිව්වා. තව ඇමතිතුමෙක් කිව්වා, ලේන් ගැහැනු සතායි, ලේන් පිරිමි සතායි ටිං ටිං ගාලා ඇවිත් love කරනකොට කැටපෝලයෙන් විදිනවා කියලා. සතුන්ට love කරන්නවත් ඉඩ නැති රටක්. එතකොට මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්ද? රිළවාටයි, රිළවිටයි love කරන්න දෙන්නේ නැහැ, දෙපැත්තට දමනවා. ලේනායි, ලේනියි love කරන්න එනකොට කැටපෝලයෙන් විදිනවා. හැබැයි, මේ රටේ ජාතික ප්‍රතිපත්ති ගැන කථා කරනවා; සංචාරක ප්‍රතිපත්ති කථා කරනවා.

අපේ මන්ත්‍රීතුමියක් කථා කළා. මීට මාස කිහිපයකට කලින් තමයි "Visit Sri Lanka" තිබුණේ, hashtag එකත් එක්ක ගහලා. ඉතින්, මට තේරෙන්නේ නැහැ. ආණ්ඩුවේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එක පිළිබඳව අප දැනුවත් කරන්න. අපි කැමැතියි, මේ ආණ්ඩුවට උදව් කරන්න සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න. මොකද, අපේ දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙක් ඒකට ඉන්නේ. අපේ දිස්ත්‍රික්කයේ මිනිසුන්ගේ ආදායම තමයි මේ හරහා ශක්තිමත් වෙන්නේ. ඒ නිසා අපේ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. අපිත් අපේ අදහස් දෙන්නම්. මීට ඉස්සෙල්ලා ඇමතිතුමෙක්ද, මන්ත්‍රීතුමෙක්ද කිව්වා අපට ඔය ගොල්ලන්ගේ උපදෙස් ඕනෑ නැහැ කියලා.

එහෙම කියන්න එපා. පොඩ්ඩක් අපි කියන එකත් අහන්න. අපි කියන එක වැරදි නම් ඒක ප්‍රතික්ෂේප කළාට කමක් නැහැ. හැබැයි, එච්චර උද්ධච්ච වෙන්න එපා. මොකද, අපිත් නියෝජනය කරන්නේ ජනතාව. අපි ජනතාවගෙන් ඡන්දය අරගෙන තමයි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ කියන එක මතක් කර දෙමින්, මට මේ කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.

[4.21 p.m.]

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
Hon. Presiding Member, thanks a lot for the opportunity to speak. I was expecting this Discussion to be very constructive, but it is so disappointing since I do not see anything constructive as such in it. There are no arguments being built up and the Opposition is just wasting time.

Whatever it is, Sir, let me start my speech with this statement: "Those who squandered the nation's wealth yesterday, preach wisdom today. Credibility is not reclaimed through words, but with accountability". මේ වාගේ විවේචන ඉදිරිපත් කරන, කොහේද යන්නේ ඇහුවාම මල්ලෙ පොල් කියන මේ පිරිස ගත්තාම, එතුමන්ලා මීට කලින් දිගු කාලීනව ආණ්ඩු කළා කියන එක අමතක කරලා තමයි මේ විවාදයට සම්බන්ධ වෙලා තිබෙන්නේ. ඒකයි මේ සභාවේ constructive argument එකක් ගොඩනැහෙන්නේ නැත්තේ. ඇත්තටම මෙවර අය වැයෙන් විවිධ ක්ෂේත්‍රවලට මුදල් වෙන් කරලා තිබෙනවා. අපේ අමාත්‍යාංශය බොහෝ විෂය ක්ෂේත්‍ර සහිත අමාත්‍යාංශයක්. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කියන විෂයයන් ගැන එතුමන්ලාට බොහෝ දේවල් ගැන කථා කරන්න තිබුණා. නමුත් කමක් නැහැ, ඒ ගැන අපි පැහැදිලි කරන්නම්.

අපි දන්නවා, පසුගිය කාල වකවානුව තුළ අපේ අමාත්‍යාංශයට අදාළව විදේශ සම්බන්ධතා ගැන ලොකු අපැහැදිලිකමක් විපක්ෂයට තිබුණු බව. අපට විරුද්ධව මඩ ගැහුවා, අවලාද නැඟුවා, අපවාද නැඟුවා. ඒ සෑම දේම කළා. නමුත් අපි සතුටු වෙනවා, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ප්‍රමුඛ මේ අමාත්‍යාංශය ඉතාම සාර්ථකව ඒ සියලු කටයුතු, ඒ සියලු අභියෝග ජයගෙන රටක් විධියට ඉස්සරහට යන ගමනට දැවැන්ත දායකත්වයක් දැක්වීම ගැන.

පසුගිය මාස කිහිපය තුළ අපි දැවැන්ත ජයග්‍රහණ කිහිපයක් අත්පත් කර ගත්තා. විශේෂයෙන්ම ඉතාම කාර්යක්ෂම විධියට විදේශ තානාපති කාර්යාල ටික කරගෙන යෑමට අපි යම්කිසි මැදිහත්වීමක් කරලා තිබෙනවා. මේ අය වැයෙන් ලොකුම මුදල වෙන් කරලා තිබෙන්නේ විදේශ තානාපති කාර්යාල නඩත්තු කිරීම සඳහා සහ අලුතින් කාර්යාල පිහිටුවීම සඳහායි. පසුගිය කාලයේ මේ ක්ෂේත්‍රයට අදාළව ජනතාවගේ හිත් තුළ යම්කිසි අවිශ්වාසයක් ගොඩනැඟිලා තිබුණා. ඒකට බලපෑ කරුණු කාරණා තිබුණා. විශේෂයෙන් මේ රටේ රාජ්‍ය නායකයෝ පත් කරලා යවපු සමහර තානාපතිවරු පිළිබඳව ජනතාවට සෑහෙන ප්‍රශ්න තිබුණා. උදාහරණයකට, if we take the allegations against Jaliya Wickramasuriya, Sri Lanka's former Ambassador to the United States and a relative of former President Mahinda Rajapaksa, he was accused of financial misconduct. He was arrested in 2016 on charges of accepting a commission of US Dollars 322,000 during his tenure. In April, 2022, he pleaded guilty to diverting funds which were intended for purchasing a new embassy site. ඒ කියන්නේ, රජයේ මුදල් මේ රට තුළ විතරක් නොවෙයි, පිට රටවලත් අවභාවිත කරපු තානාපතිවරු තමයි කලින් සිටි රාජ්‍ය නායකයන් විසින් තානාපතිවරු විධියට පත් කරලා තිබුණේ. ඒ වාගේම තව කෙනෙක් ඉන්නවා, ඔහු ගැනත් සඳහන් කරන්න ඕනෑ. ඒ, උදයංග වීරතුංග. ඔහු ගැන මෙහෙම කියනවා, In December, 2024, the US State Department imposed sanctions on several individuals including Udayanga Weeratunga, Sri Lanka's former Ambassador to Russia. He was accused of benefitting from a corrupt procurement scheme of MiG aircraft for the Sri Lanka Air Force.

ජාතික මට්ටමින් විතරක් නොවෙයි, ජාත්‍යන්තර මට්ටමිනුත් දැවැන්ත වංචා, දූෂණවලට සම්බන්ධ වීමත් එක්ක අපේ ජනතාවට මේ තානාපති කාර්යාල පිළිබඳව අවිශ්වාසයක් ගොඩනැඟිලා තිබුණා.

නමුත්, ක්‍රමානුකූලව ජනතාවගේ හිත් තුළ දැන් මේ ක්ෂේත්‍රයට අදාළව දැවැන්ත විශ්වාසයක් ගොඩනැඟෙමින් තිබෙනවා. පසුගිය කාලයේ වාගේ ඥාති හිතුවතුන්, ගජ මිතුරන් පත් කරගෙන තමන්ට මොකක් හෝ වාසියක් ලබා ගැනීම සඳහා තානාපතිවරු පත් කළ විධියට අපි තානාපතිවරු පත් කරන්නේ නැහැ. රටට යහපතක් වන විධියට, රටට වාසියක් ගෙනෙන විධියට, රට ඉස්සරහට අරගෙන යන්න පුළුවන් විධියට තමයි අපි ඒ පත්වීම් ලබා දෙන්නේ. ඒ සහතිකය ජනතාවටත්, මේ සභාවටත් අපි දෙන්න කැමැතියි.

පසුගිය සති කිහිපය තුළ digitalization process එක හරහා විශාල සේවාවක් ලබා දෙන්න අපි සමත් වෙලා තිබෙනවා. විශේෂයෙන් eBMD Online Portal එක හරහා birth certificates, marriage certificates, death certificates වැනි දේවල් අපේ consular අංශය හරහා, අපේ සියලු තානාපති කාර්යාල හරහා නිකුත් කරන්න අපට යම්කිසි අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඇත්තටම කලින් තිබුණු ආකාරයට නම් ලංකාවේ තිබෙන DS office එකට හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට හෝ ගිහිල්ලා තමයි එම සහතික ගන්න ඕනෑ කියන තත්ත්වය මේ හරහා සම්පූර්ණයෙන් වෙනස් කරමින් අපි ඉතාම සැහැල්ලු, ඉතාම පහසු සේවයක් දැන් ලබා දීලා තිබෙනවා. විදේශගත වුණු ශ්‍රී ලාංකිකයන්ට මේ හරහා දැවැන්ත සේවයක් ලැබෙනවා වාගේම, ඉතාම කෙටි කාලයක් තුළ අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, රටට විදේශ විනිමය ගෙනෙන්න. විශේෂයෙන් මේ සේවය ලබා දීමත් එක්ක අපට ඇමෙරිකානු ඩොලර් 15,796ක් ලැබිලා තිබෙනවා. මේක අප ලද සුවිශේෂ ජයග්‍රහණයක් විධියට මා දකිනවා. ලෝකයේ සිදුවන වෙනස්කම් එක්ක පසුගිය කාලයේ ඒ වෙනස්කම් රට තුළ, එහෙම නැත්නම් අපේ රටට අනුබද්ධිත අනිකුත් ආයතනවල සිදු නොවුණත් අපි දැන් ඒ දේවල් ආරම්භ කර තිබෙනවා.

[ගරු අරුන් හේමවන්ද්‍ර මහතා]

සති කිහිපයකට පෙර passport backlog එකක් තිබුණා. මම check කරලා බලද්දී 26,000ක විතර passport backlog එකක් තිබුණා. මම ඉතාම සතුටු වෙනවා, මේ මොහොත වන විට අලුත් applications එක්ක 7,000ක් විතර තමයි passport printing සඳහා pending තිබෙන්නේ. ඒකත් අප ලද ලොකු ජයග්‍රහණයක්. ඒ වාගේම පරණ applications 2,000ක් විතර තමයි තිබෙන්නේ. මේ සතිය අවසන් වෙද්දි ඒවායේත් වැඩ අවසන් වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා. ඇත්තටම ඒක සුවිශේෂ දෙයක්. ඒ කාර්යභාරයට සම්බන්ධ වුණු සියලු නිලධාරීන්ට අපි ස්තුතිවන්ත වෙනවා. "පුනරුදය" කියන මේ වෙනසත් එක්ක, රටේ ජනතාව අපට ලබා දීපු මේ ජන වරමත් එක්ක ඇත්තටම මේ ක්‍රියාවලියට සම්බන්ධ වෙලා මේ සියලු කටයුතු ඉතාම කාර්යක්ෂම විධියට කරගෙන යෑමට උදව් කරපු සියලුදෙනාටම මේ වෙලාවේ මා ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විදේශ සම්බන්ධතා පිළිබඳව තැන් තැන්වල සමහර අය කථා කරලා තිබුණා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් රැස්වීම්වලත් කියලා තිබුණා, මේ ආණ්ඩුව ලෝකයේ සිදුවන භූගෝලීය වෙනස්කම් එක්ක, විශේෂයෙන් global trend එකත් එක්ක හරියට අධ්‍යයනයක් කරලා නැහැ කියලා. ඒක අසත්‍ය තොරතුරක්. අපේ ඇමතිතුමාත් එතුමාගේ කථාවේදී ඒ ගැන සඳහන් කරලා තිබුණා. ලෝකයේ සිදුවන සියලු දේවල් ගැන අපි නිවැරදි අධ්‍යයනයක් කරනවා. අපට Lakshman Kadirgamar Institute එක තිබෙනවා. ඒ ආයතනය හරහා අපි මේ සම්බන්ධ පළමුවැනි වටයේ කටයුතු ආරම්භ කළා. විශේෂයෙන් tariff policy ගැනත් කථා කරලා තිබුණා. අපි ඒකට අදාළ ඒ සාකච්ඡා දැන් ආරම්භ කරලා තිබෙන්නේ.

පළමුවැනි වටයේදී අපි "Sri Lanka's Preparedness to Meet the Emerging Global Economic Challenges" කියන නාමයෙන් අපේ round-table discussion එක පටන් ගත්තා. ඒක මෙතැනින් ඉවර වෙන්නේ නැහැ. අපි දැන් report එකක් හදලා තිබෙනවා. ඊළඟ පියවරට අපි තවත් පාර්ශ්ව එකතු කර ගන්නවා. විශේෂයෙන් මේ සාකච්ඡාවට BOI එක සම්බන්ධ වුණා, Sri Lanka Export Development Board එක සම්බන්ධ වුණා, Ceylon Chamber of Commerce සම්බන්ධ වුණා. ඒ වාගේම මේ ක්ෂේත්‍ර නියෝජනය කරන ආයෝජකයෝ, ඒ වාගේම ඉතාම සාර්ථකව ඒ ක්ෂේත්‍රයේ ඉන්න ඒ වාණිජ ප්‍රජාවගෙනුත් නියෝජිතයන් පිරිසක් අරගෙන තමයි අපි ඒ සාකච්ඡාව කළේ. අපි මේ ක්ෂේත්‍රය තවත් විවෘත කරන්න කැමැතියි. අපට යම්කිසි රාජ්‍ය නායකයෙකුට කියන්න බැහැ නේ, ඔබතුමන්ලාගේ රටේ මෙහෙම කරන්න කියලා. ඇත්තටම ඒ ඒ දේවල්වලට සරිලන විධියට අපේ ප්‍රතිපත්ති අපට සම්පාදනය කරන්න පුළුවන්. ඇත්තටම ඒකට අදාළව අපි කටයුතු කරගෙන යනවා. We are committed to the utmost to safeguard our nation and the people from whatever challenges we face in the world. So, we have to be really prepared and we are on that process. Definitely, the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism is dedicated to overcome all the struggles and challenges we have in front of us.

ඊට අමතරව, අපේ විපක්ෂය නියෝජනය කරන සමහර මන්ත්‍රීවරු සමහර තැන්වලදී ආණ්ඩුවට විවේචන ඉදිරිපත් කරනවා අපි දැක්කා. විවේචන ඉදිරිපත් කරන්න පුළුවන් ක්‍රම ගොඩක් තිබෙනවා. නමුත්, විවේචන ඉදිරිපත් කරන ක්‍රමය ඇත්තටම මොකක් හෝ පදනමක් සහිත එකක් වෙන්නට ඕනෑ. නමුත්, පදනම් විරහිත විවේචනවලට උත්තර දෙන්න අපි කැමැති නැහැ. විශේෂයෙන් එවැනි සංස්කෘතියක් නොවෙයි අපි බලාපොරොත්තු වුණේ. ඇත්තටම මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න තමයි අපි මැදිහත් වුණේ. අපි විශ්වාස කරනවා, මේ දේශපාලන සංස්කෘතියට යම්කිසි තිතක් තියලා නිවැරදි සහ ප්‍රගතිශීලි විධියට ඉස්සරහට යන්න පුළුවන් කියලා.

විශේෂයෙන් අපි foreign employment ගැන කථා කළොත්, විදේශ රැකියා - foreign employment - ක්ෂේත්‍රයත් දැවැන්ත ප්‍රශ්නවලට මුහුණ දුන් ක්ෂේත්‍රයක් බව අපි දන්නවා. එය පසුගිය කාලයේ දැවැන්ත දූෂණ, වංචා ගැන කථා කරපු ක්ෂේත්‍රයක්. විශේෂයෙන්ම E-8 වීසා කාණ්ඩය වෙන්න පුළුවන්, electric vehicle permit එක වෙන්න පුළුවන්, "ජයගමු ශ්‍රී ලංකා" වැඩසටහන වෙන්න පුළුවන්, විදේශ රැකියාවලට අදාළ recruitment process එක වෙන්න පුළුවන්, ඒ වාගේ බොහෝ දේවල් සම්බන්ධයෙන් සෑහෙන්න විවේචනවලට ලක් වුණු ක්ෂේත්‍රයක්. ඇත්තටම අපි භාර ගත්තේත් ඒ වාගේ ප්‍රශ්න සහිත ක්ෂේත්‍රයක් තිබෙන රටක්. හැබැයි අපි විශ්වාස කරනවා, ඒ සියලු දේ වෙනස් කරන්න පුළුවන් කියලා. විශේෂයෙන්ම දූෂණ, වංචාවලින් පිරුණු සමහර දේවල් අපි දැන් වෙනස් කරලා තිබෙනවා; සමහර දේවල් මුළුමනින්ම වෙනස් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපට අහිමි වුණු E-8 visa category එක අපි නැවත යම්කිසි පිළිවෙළකට පටන් අරගෙන තිබෙනවා. පසුගිය කාලයේ යම්කිසි ආකාරයක අපිළිවෙළට සහ සම්පූර්ණ පටහැනිව සිද්ධ වුණු දේවල් තිබුණා. නමුත්, එහෙම වෙන්නේ නැතුව ඉතාම හොඳ ආකාරයෙන් ඒකට අදාළ අනුමැතියත් අරගෙන විනිවිදභාවය සහිතව දැන් අපි මේ වැඩේ පටන් අරගෙන තිබෙනවා. හැබැයි, අපි එක දෙයක් කියන්න කැමැතියි. අපට ආරංචියි, මේ මොහොත වනකොටත් සමහර තැන්වල කලින් හිටපු ඇමතිවරුන්ගේ සමහර ගෝලයෝ, සමහර හෙංචියෝ මැදිහත් වෙලා, ඒකට එකතුවෙලා වෙන දා කරපු විධියටම ඒවා කරන්න උත්සාහ කරනවා වාගේ දෙයක්. සමහර මිනිසුන් නොමඟ යවන තත්ත්වයකුත් තිබෙනවා. ඒ අය සමහර තැන්වල සල්ලි එකතු කරනවා කියාත් ආරංචියක් තිබෙනවා. එම නිසා අපි ජනතාවටත් කියන්න කැමැතියි, කිසිසේත්ම ඒවාට සම්බන්ධ වෙන්න එපා කියලා. මේ කටයුත්ත සම්පූර්ණයෙන්ම භාරව සිටින ආයතනය තමයි Sri Lanka Foreign Employment Agency එක. මේ ආයතනයත් එක්කම සම්බන්ධතා පවත්වාගෙන යන්න. ඒ අය හරහා තමයි මින් ඉදිරියට E-8 visa category එක ක්‍රියාත්මක වෙන්නේ; සම්පූර්ණයෙන්ම ආණ්ඩුව මැදිහත් වුණු process එකක් විධියට තමයි ඒක ක්‍රියාත්මක වෙන්නේ.

ඒ වාගේම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙන්නත් පුළුවන්, සමහර foreign missionsවල හිටපු අය වෙන්නත් පුළුවන්, වෙනත් අයගේ වැරදි නිසා වෙන්නත් පුළුවන්, එවැනි අයගේ හෝ ආයතනවල අක්‍රමිකතා නිසා පසුගිය කාලයේ අපට අහිමි වුණු දේවල් ටිකක් තිබෙනවා. විශේෂයෙන්ම ඉතාලි රියදුරු බලපත්‍රයට අදාළව අපට තිබුණු වරප්‍රසාද ලබා ගන්න ආණ්ඩුවක් විධියට අපි දැන් යම්කිසි වැදගත් සන්ධිස්ථානයකට ඇවිල්ලා ඉන්නවා. අපේ ජනතාවට එම සේවය ඉතාම කෙටි කාලයක් තුළ යළි උදා වෙලා තිබෙනවා. මේක සුවිශේෂී ජයග්‍රහණයක්. ඒ වාගේම කාලයක් අත්හිටුවා තිබුණු - ඒ කියන්නේ ඉතාලි තානාපති කාර්යාලයෙන් ලංකාවේ ජනතාවට ලබා දුන් - ඒ work visa එක යළි ලබා දෙන්න සුදානම් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ process එක දැන් පටන් අරගෙන තිබෙනවා. ඒකත් ඉතාම සාර්ථකව අපට ලැබුණු ජයග්‍රහණයක් හැටියට තමයි අපි දකින්නේ.

විදේශ රැකියාවලට අදාළ process එක සම්පූර්ණයෙන්ම කඩා වැටුණු process එකක් හැටියට තමයි තිබෙන්නේ. අපි දන්නවා, විශේෂයෙන් මෙහි ඉහළ සිට පහළටම සම්බන්ධ යන්ත්‍රණයක් තිබෙන බව. නමුත් ඒ යන්ත්‍රණය හරියට ක්‍රියාත්මක

වෙන්නේ නැති ප්‍රශ්නයකුත් තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාලයේ විවිධ ආයතනවලින් මේකට අදාළව අපට විවිධ උදව්වු ලැබී තිබුණු බව. International Worker Migration Programme වාගේ විවිධ දේවල් අපට ලැබී තිබුණත්, පසුගිය ආණ්ඩු ඒ සම්බන්ධයෙන් හරියාකාරව කටයුතු කරපු නැති තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන් අපි ස්විට්සර්ලන්ත රජයටත් ස්තූතිවන්ත වෙනවා. ස්විට්සර්ලන්ත රජයේ අනුග්‍රහය සහිතව මෙවැනි programme එකක් මීට කලින් හරියට කරගෙන යන්න බැරිවෙලා තිබුණත්, අපි ආණ්ඩුව භාර ගත්තාට පස්සේ මේක ඉතාම වේගයෙන්, ඉතාම හොඳ ආකාරයෙන් කරගෙන යෑමට යම්කිසි අවස්ථාවක් ලැබී තිබෙනවා. එම නිසා දැන් සියලු දේම අලුත් වෙනවා.

අපි ජනතාවටත් කියන්නේ, අපේ වෙනස්කම් ටික අපේ භාවිතාව තුළින් දැන් අපි ඔප්පු කරලා ඔබතුමන්ලාට පෙන්නුම් කරලා තිබෙනවා කියන එකයි. ඉදිරියේදී තවතවත් සුබවාදී ආරංචි ගොඩක් අපි ලබා දෙන්න කැමැතියි. විශේෂයෙන් අපේ අය වැය විවාදයට අදාළව අපට තොරතුරු ලබා දීපු, ඒ වාගේම මේ සියලු කටයුතුවලට සම්බන්ධ වෙච්ච අපේ අමාත්‍යාංශය නියෝජනය කරන කාර්ය මණ්ඩලය, Sri Lanka Bureau of Foreign Employment, Lakshman Kadirgamar Institute, Sri Lanka Foreign Employment Agency කියන මේ සියලු ආයතන නියෝජනය කරන පාර්ශ්වවලට ස්තූතිය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[4.36 p.m.]

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
Hon. Presiding Member, first of all, I would like to thank you for giving me time to speak on this very important Ministry, the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism. I think a lot of views have been expressed regarding tourism and foreign employment. So, I would like to predominantly base my speech on foreign affairs.

Sir, the Ministry of Foreign Affairs is one of the most valuable and important ministries as it is the main institution which drives the foreign policy of a country. If you talk about the foreign policy of a state, that is also one of the most important policies of a country since it guides the country as to how it must interact with the other states, international organizations, non-governmental organizations and private parties in achieving and managing the country's political, economic, defense, social and cultural interests. We know of the Greek philosopher Aristotle. He described humans as political beings. Therefore, friendships and relations across the seas and the use of foreign policies have existed among the humans since the beginning of human interactions.

When we analyse the history of Sri Lanka's Foreign Policy since Independence, we could see the various foreign policy stances and directions the successive governments had taken during the Cold War era and post-Cold War era. It has been very difficult for Sri Lanka, as a country, to maintain a neutral and a friendly Foreign Policy. All the time with all the countries, we have maintained a friendly Foreign Policy, mainly due to the different internal political policies of subsequent governments.

If we briefly go down the memory lane of Sri Lanka's Foreign Policy, for example, from 1948 to 1956, Prime Minister D.S. Senanayake had a relationship with the Western Bloc. He thought that was the only solution for economic growth in Sri Lanka. Then, his successor, the Hon. Dudley Senanayake, signed the Rubber-Rice Pact with the communist China in 1952. That deal was done to settle the balance of payment crisis at that time. Then, we saw the US Economic Aid Agreement, which was brought in retaliation, never coming into operation. And if we take the subsequent governments, mainly, the Hon. S.W.R.D. Bandaranaike's Foreign Policy was based on non-alignment and friendship with all countries. The Hon. (Mrs.) Sirimavo Bandaranaike's Foreign Policy was anti-capitalist and therefore, anti-western.

Then, President J.R. Jayewardene continued to receive assistance from both capitalist and communist countries as well as from international organizations. So, we saw countries such as the UK, the United States, Norway and Japan becoming the biggest doners of grants to Sri Lanka. Also, we saw during President Premadasa's, President Chandrika Bandaranaike Kumaratunga's and also during President Mahinda Rajapaksa's times, based on their political ideologies, the Foreign Policy changed and that their decisions to align with different countries also changed every four to five years. So, if you look at the last 70 years, you would see, in summary, that based on the political leadership of subsequent governments, the Foreign Policy kept changing. They were either extreme leftist or right-wing and as a result, the country suffered because every four to five years, we saw certain governments align with certain countries, and then after another four years, the successive government aligning with some other countries. Developed countries like the United Kingdom, the United States and Australia can afford to change their foreign policies and align with different countries every four to five years because of their economic situations. Also, we have seen how countries such as China, Malaysia and Singapore have achieved their global development through long-term, well planned foreign policies. So, if you look at the examples I mentioned earlier, China, Malaysia and Singapore, they have had one long-standing foreign policy.

So, irrespective of which government came into power, 75 per cent of their foreign policy did not change; they left about 25 per cent of it for the subsequent government to be flexible on, taking forward the favoured party's policies. But, predominantly, they have had a long-term, fixed foreign policy. So, developing nations like Sri Lanka also, I think, would definitely benefit, if we have a long-term foreign policy. The Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism is in the Chamber today. Hon. Minister, I would

[ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය]

request you to make that change because, like I said before, for 70 years, we have seen subsequent governments changing their foreign policy based on their political ideology. But, now, you all have come to make a change in our country. So, I would humbly request you to consider having a long-term Foreign Policy, maybe, one which spans 10 to 15 years and which does not change based on the political ideologies of subsequent governments. If you look at the benefits of having such a long-term foreign policy, developing countries could avoid short-sighed policies which may not benefit them. Also, many of the challenges faced by developing countries such as climate change, poverty and inequality are complex and require long-term coordinated efforts. Therefore, again, I would request the Hon. Minister to consider having a long-term Foreign Policy.

Another topic I would like to touch upon is commercial diplomacy, which is an integral part of the foreign policy of a country. I know that in the Foreign Ministry, we have an Economic Affairs Division, but we need to be more proactive because if you look at a lot of the developed countries, we see that the Minister of Foreign Affairs is also the Minister of Trade. For example, in New Zealand, the Minister of Foreign Affairs also handles the Ministry of Trade Affairs mainly because there is a benefit when you branch them together. For instance, through commercial diplomacy, you could bring in a lot of investments to the country. So, I would request the Hon. Minister to relook at it and to introduce a system, maybe, of performance-based incentives to the staff in those divisions so that more investments could be brought into the country.

I would also like to briefly touch upon depoliticizing the Foreign Service.

We know that the NPP, throughout their campaign, mainly talked about not having any political appointments made to the Foreign Service. We expected that with the whole Clean Sri Lanka campaign, steps would be taken to clean the Foreign Service also. However, there are indications emerging that political appointments to the Foreign Service is continuing today as well. So, I would request the Hon. Minister, who is here today in the Chamber, to relook at it because that is not what was mandated.

Also if I refer very briefly to foreign employment, as we know, there is a large number of female domestic workers who bring in a lot of revenue to our country working in the Middle East and some of them have worked overseas for decades. But, when they come back, they find that most of the money they have sent has been either squandered by their husbands or used up by their families. So, when they come back even after working overseas for 20, 30 years, they have to start earning from scratch. Therefore, I would like to propose today to introduce a pension scheme for them. I think the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism could work together with the Sri Lanka Bureau of Foreign Employment and see if these women could be given a pension so that when they come back after a long service in the Middle East, they could have some pension. Therefore, introduce a system through which a deduction could be made from their monthly salary so that they could use it when they come back to Sri Lanka to retire. I hope the Hon. Minister would look at this suggestion favourably.

Sir, I would like to thank you again for giving me time. And, Hon. Minister, I wish you all the best in your functions at the Ministry and in all your future endeavours! Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.46]

ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අදහස් දක්වන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි හැම කෙනාම පිළිගන්නා දෙයක් තමයි, විදේශ රැකියා සහ සංචාරක ක්ෂේත්‍රය කියන්නේ අපේ රටට විදේශ ප්‍රේෂණ රැගෙන එන ප්‍රධානම ධාරා දෙකක් කියන එක. මේ ක්ෂේත්‍ර දෙකම රටක් ලෙස අත්‍යවශ්‍ය, ඒ වාගේම වැදගත් ක්ෂේත්‍ර දෙකක්. මේ ක්ෂේත්‍ර දෙකම මුල් කරගෙන තමයි බොහෝ දුරට රටක දියුණුව තීරණය වන්නේ. විදේශ රැකියා අංශය ගත්තාම, 2025 වර්ෂය තුළ විදේශ රැකියා සඳහා කුවේට් රාජ්‍යයට 84,000ක්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයට 55,500ක්, සෞදි අරාබියට 52,500ක්, කටාර් රාජ්‍යයට 51,100ක් වශයෙන් 243,100ක ශ්‍රමිකයන් පිරිසක් අපේ රටින් අලුතින් යැවීමට අපි සැලසුම් කර තිබෙනවා.

විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ, විදේශගතව රැකියාවේ නියුතු අපේ රටේ පුද්ගලයන් පිළිබඳව. ජාතික ජන බලවේගයේ ජයග්‍රහණය සඳහා ඔවුන් විශාල කාර්යභාරයක් ඉටු කළා. ඒ නිසා ආණ්ඩුවක් ලෙස -රජයක් ලෙස- අනිවාර්යයෙන්ම ඔවුන් පිළිබඳව, ඔවුන්ගේ සුබසාධන පැත්ත පිළිබඳව ජාතික ජන බලවේගය සලකා බලා තිබෙනවාය කියන කාරණාව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. විශේෂයෙන් ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වැනි විවිධ ක්ෂේත්‍ර පිළිබඳව මෙම අමාත්‍යාංශය සලකා බලා තිබෙනවා.

සංචාරක ක්ෂේත්‍රය පිළිබඳවත් කරුණු කාරණා කිහිපයක් සඳහන් කළ යුතුයි. සංචාරක ක්ෂේත්‍රය තුළ මතක් කළ යුතු කාරණාවක් තිබෙනවා. මෑද පෙරදිග සිට අපේ රටට සංචාරකයන්ගේ පැමිණීම ගත්තාම, 2018 වසරේදී සංචාරකයන් 71,636ක් අපේ රටට පැමිණ තිබෙනවා. හැබැයි, 2024 වන විට එහි වර්ධනයක් නොවෙයි සිදුව තිබෙන්නේ. එම ප්‍රමාණය 29,205ක් දක්වා ආපස්සට ගොස් තිබෙනවා. මම හිතන විධියට, 40,000ක පමණ සංචාරකයන් පිරිසක් මෑද පෙරදිග කලාපයෙන් අපේ රටට පැමිණ නැහැ. මම මෙතැනදී විශේෂයෙන් සඳහන් කළ යුතු කාරණාවක් තිබෙනවා. සාමාන්‍යයෙන් ප්‍රජාතන්ත්‍රවාදී

මූලධර්ම සහ මානව වටිනාකම් අගය කරන රටක් ලෙස, ඒ අගය කිරීම් මැද ලෝකයේ විවිධ රටවලින් සංචාරකයන් අපේ රටට පැමිණියා. සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව සලකා බලන විට රටක් ලෙස අපට වගකීමක් තිබෙනවා, ඇයි මැද පෙරදිග කලාපයෙන් අපේ රටට එන සංචාරකයන්ගේ ප්‍රමාණය විශාල ලෙස පහත වැටී තිබුණේ කියන කාරණය පිළිබඳව සොයා බැලීමට.

ඒකට ප්‍රධානම හේතුව මොකක්ද කියලා අපි හැම කෙනාම දන්නවා. විශේෂයෙන් 2019න් පස්සේ මේ රට කඩා වැටීමට ප්‍රධාන හේතුව තමයි, එදා පැවති රජය අනුගමනය කළ ජාතිවාදී පිළිවෙත, ඒ වාගේම ජාතිවාදී ලෙස හැසිරීම. රට තුළ පමණක් නොවෙයි, ඒ කරුණු කාරණා පිළිබඳව ජාත්‍යන්තරය තුළත් සාකච්ඡා වීම හරහා මැද පෙරදිග සිට අපේ රටට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව විශාල ලෙස පහත වැටී තිබෙනවා.

කොවිඩ් මරණ සිදු වුණු සමය පිළිබඳව අපි දන්නවා. කොවිඩ් මළ සිරුරු භූමදානය කළ හැකිය යන්න ලෝකයම පිළිගෙන ඒ සඳහා අනුමැතිය ලබා දෙන විටත් අපි ඒ මළ සිරුරු ආදාහනය කිරීම පළිගැනීමක්. ඒක ලෝකයේ අශිෂ්ටම පළිගැනීමක් ලෙස සඳහන් කරන්න පුළුවන්. ඕනෑම මනුෂ්‍යයෙකුට තමන්ගේ අවසන් කටයුතු කළ යුතු ආකාරය -ආදාහනය ද, භූමදානය ද කියලා- තීරණය කරන්න පුළුවන්. හැබැයි, ඒ වෙලාවේ පළිගැනීමක් ලෙස, දඬුවම් දීමක් ලෙස ඒ තීන්දු තීරණ ගැනීම නිසා සංචාරකයන් විශාල පිරිසක් අපේ රට මහ හැර ගොස් වෙනත් රටවලට යන්න පෙලඹුණා.

අප මෙහිදී විශේෂයෙන් මතක් කළ යුතු දෙයක් තිබෙනවා. අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය දියුණු කරනවා නම්, විශේෂයෙන් මැද පෙරදිග කලාපීය සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් අපට තිබිය යුතුයි. ඒ රටවලින් සාපේක්ෂව අවුරුද්දකට කෝටි නවයහමාරක් පමණ සංචාරකයන් ලෙස වෙනත් රටවලට පිටව යනවා. හැබැයි, ඒ සංචාරකයන්ගෙන් සියයට 0.04කටත් වඩා අඩු පිරිසක් තමයි අපේ රටට ආකර්ෂණය කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මැද පෙරදිග සංචාරකයන් පිළිබඳව සලකා බැලීමේදී, ඔවුන් පවුල් පිටින් රටකට ඇවිල්ලා මුදල් විශාල ලෙස වියදම් කරමින් සංචාරයේ යෙදෙන පිරිසක්. එම නිසා ඒ ක්ෂේත්‍රය වෙනුවෙන් ප්‍රමුඛතාව ලබා දිය යුතුයි කියලායි මා හිතන්නේ. ජාතික ජන බලවේගය රජය ලෙස අපි ඒ පිළිබඳව සලකා බලා තිබෙනවා.

අවුරුදු 10ක කාලයක් මැද පෙරදිග ජීවිතයක් ගත කරපු පුද්ගලයෙකු ලෙස මටත් අත් දැකීමක් තිබෙනවා. විශේෂයෙන් තානාපති සේවාවලට දේශපාලන පත්වීම් ලබා පැමිණෙන අය තමන්ගේ ගොඩ වැඩි කර ගන්නේ කොහොමද කියන අරමුණින් තමයි කටයුතු කළේ. ඒ මිස, අපේ රටේ අභිමානය ආරක්ෂා කිරීම වෙනුවෙන්, අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය නඟා සිටුවීම වෙනුවෙන් ඒ රටවල් තුළ වෙර දරනවාට වඩා වෙනත් කටයුතුවල නිරත වන පිරිස් තමයි අපි එහේ ජීවත් වෙච්ච කාල පරිච්ඡේදය තුළ තානාපති සේවාව තුළ දැක්කේ. විශේෂයෙන් පවුලේ ඥාතීන් - සමහර විට ඔවුන්ගේ ළඟම ඥාතීන්- පත්වීම් ලබපු අවස්ථා කුවේට් රාජ්‍යයේ ඉන්න කොට අපි දැසින් දැක්කා. අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරන්න පුළුවන් දක්ෂ තානාපතිවරුන් ඒ කලාපයට යොමු කිරීම හරහා ඉතා කෙටි කාලයක් තුළ අපේ රටට ඒ කලාපයේ සංචාරක පිරිස් රැගෙන එන්න පුළුවන්.

අපේ රටට සංචාරකයන් පැමිණීමේ ලේඛනය අරගෙන බැලුවාම මැයි, ජූනි, අගෝස්තු මාසවල සංචාරකයන් පැමිණීම යම් විධියකින් අඩු වෙනවා. හැබැයි, අපට තිබෙන වාසිය තමයි, විශේෂයෙන් මැද පෙරදිග සංචාරකයන් වෙනත් රටවලට සංචාරය සඳහා අප්‍රේල් මාසයේ සිට සැප්තැම්බර්, ඔක්තෝබර් දක්වා වූ මාසවලදී ඒ රටවලින් පිටත් වීම. අපි සමස්තය ඉලක්ක කරනවා වාගේම, අපේ රටට සංචාරකයන්ගේ පැමිණීම අඩු වන ඉහත කී කාල සීමාව තුළ එම මැද පෙරදිග සංචාරකයන් ගෙන්වා ගැනීම ඉලක්ක කරලා වැඩ කළාම සංචාරකයන් සංඛ්‍යාව වැඩි කර ගන්න අපට පුළුවන්.

අපේ සංචාරක ක්ෂේත්‍රයේ සංචාරකයන්ගේ පැමිණීම ගෙන බලමු. යුරෝපයෙන් සියයට 50.67ක පිරිසක් පැමිණෙනවා. Africa ගත්තාම, සියයට 0.70ක පිරිසක් පැමිණෙනවා. මැද පෙරදිග -Middle East- ගත්තාම, සියයට 1.42ක පිරිසක් තමයි පැමිණෙන්නේ. ඒ නිසා අපට විශාල වගකීමක් තිබෙනවා, මේ ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා වැඩ කරන්න.

මැද පෙරදිග සංචාරකයන් පැමිණෙන විට තිබෙන අඩුපාඩුවක් තමයි ඔවුන්ගේ භාෂාව හසුරුවන මාර්ගෝපදේශකයන් නොමැති වීමෙන් යම් තාක් දුරකට අහිතකර බලපෑමක් ඇති වීම. අපි රජය ලෙස ඒ පිළිබඳව කල්පනා කරලා ඒ පුහුණුව ලබා දීමට කටයුතු කරනවා. ඒ හරහා ඒ ක්ෂේත්‍රය දියුණු කරන්න අපට පුළුවන්.

ඒ වාගේම මැද පෙරදිග රටවලට, කොරියාව ආදි රටවලට රැකියා සඳහා යන අයට අපි මනා පුහුණුවක් ලබා දෙන්න ඕනෑ, ඒ භාෂාව පිළිබඳ දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. එහෙම යන කොට ඔවුන්ගෙන් අපේ රටට විශාල ප්‍රේෂණයක් ලැබෙනවා. හැබැයි, නිසි පුහුණුව නොමැතිව මැද පෙරදිග වැනි රටවල රැකියාවලට ගිය අයගෙන් පසුගිය කාලය පුරාවට විශාල ප්‍රේෂණයක් ලැබුණේ නැහැ. ඒ නිසා ඔවුන් පුහුණු කිරීම සඳහා වන වැඩ පිළිවෙළකුත් විශේෂයෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා.

ඒ වාගේම මෙතැනදී සඳහන් කළ යුතුයි, අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න විවිධ පාර්ශ්ව මේ මොහොත වන විටත් කොන්දේසි විරහිතව රජයට සහයෝගය පළ කරන්නට ඉදිරිපත් වෙලා සිටින බව. “Ruhunu Ring” කියන සංකල්පය පිළිබඳව දැන් සමාජය තුළ විශේෂයෙන්ම කතිකාවක් ඇති වෙලා තිබෙනවා. ඒ අනුව ගාල්ලේ සිට කතරගම දක්වා මුහුදු ප්‍රදේශය විශේෂයෙන් සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීමට කටයුතු කරනවා. ඒ යටතේ තංගල්ලේ සිට හම්බන්තොට දක්වා වූ කලාපය තුළ සංචාරක ක්ෂේත්‍රය තවත් ශක්තිමත්ව දියුණු කිරීම පිළිබඳ සාකච්ඡා සිදු වෙනවා. වැලිගම කියන්නේ තල්මසුන් නැරඹීමේ ප්‍රධාන ආකර්ෂණීය ස්ථානයක් බව අපි දන්නවා. පසුගිය කාලයේ එම කටයුතු කඩා වැටුණා. හැබැයි, රජයක් ලෙස අපි ගත්තු තීන්දු තීරණත් එක්ක එහි ප්‍රවණතාවක් නැවත ඇති වී තිබෙනවා.

ඒ වාගේම, මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ අලවල ප්‍රදේශයේ ග්‍රාමීය tourism සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට අපි කල්පනා කර තිබෙනවා. විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය වර්ධනය කිරීම තුළත්, විදේශ රැකියාවලට යොමු වන පිරිස් මනා පුහුණුවකින් යොමු කිරීම තුළත් අප බලාපොරොත්තු වන විදේශ ප්‍රේෂණ ලබා ගන්න අපට පුළුවන් වේවි කියා මම හිතනවා. හැබැයි, වැදගත්ම දේ තමයි පසුගිය රජය විවිධ පැතිවලින් කඩා වට්ටපු මේ රට යළි ගොඩ නැඟිය යුතු වීම. ඔවුන් මේ රට ආර්ථික වශයෙන් කඩා වැට්ටුවා විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් පාඩු සිදු කළා. මොකද, අප කරා පැමිණි ඒ ආකර්ෂණීය සංචාරකයන්ගේ විශ්වාසය පවා කඩා බිඳ වට්ටලා මේ රට පිළිබඳ අවිශ්වාසයක් ඇති කර තිබුණා. එම තත්ත්වයේ ඉඳලා නැවත අපේ රට කෙරෙහි විශ්වාසය ගොඩ නැඟෙන පරිදි කටයුතු කිරීමේ වගකීම අපට තිබෙනවා. අප එය අපේ කාලය තුළ අනිවාර්යයෙන්ම ඉටු කරමින්, මේ රට නිවැරදි දිශානතියකට විදේශ රැකියා සහ සංචාරක ක්ෂේත්‍රය තුළින් රැගෙන යන බව මම කියන්න කැමැතියි.

බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.57]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථා කරන මේ විෂය ලංකාවට වැදගත් විෂයයක්. පසුගිය කාලයේ විදේශ කටයුතු විෂය භාරව සිටි අලි සබ්‍රි ඇමතිතුමාත් මේ විෂය ඉතාම මැනවින්, හොඳට, රටට ගෞරවයක් හිමි වන විධියට කරගෙන ගියා. ඒක නැහැ කියන්න අපට බැහැ. ඒ වාගේම, අපේ ගරු විජිත හේරත් ඇමතිතුමාත් දැන් ඒ විධියටම වැඩ කරගෙන යනවා. හැබැයි, ගරු විජිත හේරත් ඇමතිතුමාට මම එකක් කියන්න ඕනෑ. එතුමාගේ පෞද්ගලික ලේකම් සුනිල් ද සිල්වා මහත්මයා කෙන්යාවේ තානාපති කාර්යාලයේ වැඩ කළා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කාලයේ තානාපති හැටියට. ඊට පස්සේ ඔහු ගුවන් තොටුපොළ අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩ කර තිබෙනවා, අපේ ප්‍රේමලාල් ජයසේකර මැතිතුමා යටතේ. දැන් ඇමති පෞද්ගලික ලේකම්. හැබැයි, කෙන්යාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ වැඩ කරපු විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරිනියක් සම්බන්ධව ඇති වෙච්ච ප්‍රශ්නයක් නිසා අන්ෂූල් ජාන් කියන ඒ නිලධාරිතුමිය කෙන්යාවෙන් ආවා මේ රටට. ඇවිල්ලා ඔහුට විරුද්ධව පැමිණිලි කළා. හැබැයි, ඒ පැමිණිල්ල ඒ කාලයේ ආණ්ඩුවත් වැහුවා. ඒකට action එකක් ගත්තේ නැහැ. හැබැයි මම හිතුවේ නැහැ, විජිත හේරත් වාගේ ඇමතිතුමෙකු ළඟ මේ වාගේ කෙනෙකු සේවය කරයි කියලා. මේ වාගේ රටේ හැම නායකයෙකු ළඟටම කොහෙන් හරි රිංගලා රට කන, රටේ නම කන, ඇමතිවරුන් කන මිනිස්සු එකතු වෙනවා. අපේ ගරු විජිත හේරත් ඇමතිතුමා ගාවටත් ඔහු කොහෙන් හරි රිංගලා තිබෙනවා. මම ඒ ගැන මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. මට ආරංචියක් ලැබුණා, මටත් කලින් එක්කෙනෙක් මේ කථාව කිව්වා කියලා. විජිත හේරත් ඇමතිතුමා මේ ගැනත් අවධානය යොමු කරන්න කියා මම මේ අවස්ථාවේදී කියනවා. මා හිතන්නේ, ගරු ඇමතිතුමා දැන් මෙතැන ඉඳලා ටිකකට එළියට ගියා.

ඊළඟට, මම තවත් කාරණයක් කියන්න ඕනෑ. රියැදුරු සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය කියලා course එකක් - 56 පාඨමාලාව - hotel school එකක කර තිබෙනවා. ඒ උදවිය රුපියල් ලක්ෂයක් ගෙවලායි එම පාඨමාලාව කරලා තිබෙන්නේ. හැබැයි, සංචාරක අමාත්‍යාංශයෙන් ඒ ගොල්ලන්ට licence එක දෙන්නේ නැහැ. එය සංචාරක අමාත්‍යාංශයෙන් පරක්කු කරනවා. රියැදුරු මාර්ගෝපදේශකයන් කියන්නේ සංචාරකයන් එහා මෙහා ගෙන යන අය. ඒ අයට මේ අවස්ථාව ලබා දෙන්න ඕනෑ. පුහුණුව අවසන් නම්, මුදල් අරගෙන තිබෙනවා නම්, පාඨමාලාව හරියට කරලා තිබෙනවා නම් ඒ licence එක දෙන්න ඕනෑ. හැබැයි, මුදල් අරගෙන, පාඨමාලාව කරවා licence එක නොදී ඉන්නවා. මේ වාගේ පොඩි පොඩි දේවල් සංචාරක මණ්ඩලය තුළත්, සංචාරක අමාත්‍යාංශය තුළත් සමහර අවස්ථාවලදී සිදු වෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමනි. මා හිතන විධියට, අදාළ නිලධාරීන් මේ මොහොතේ අර නිලධාරි කුටියේ ඉන්නවා. එතුමන්ලා මේවා අහගෙන ගිහින් මේවාට පුළුවන් විධියට පිළිතුරු සපයන්න ඕනෑ.

ඒත් එක්කම කොරියානු රැකියා පිළිබඳවත් මම කියන්න ඕනෑ. කොරියානු රැකියා සම්බන්ධයෙන් අද ලොකු ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. සමහර අයගෙන් චෝදනා තිබෙනවා, "අපි තවම ඉන්නවා. අපි ඒ රටට යවන්නේ නැහැ, අපි කපලා වෙන අය යවනවා" කියලා. මම හිතනවා එහෙම යවන්න බැහැ කියලා.

ඒ නිසා මම විශ්වාස කරනවා, ඒ කොරියානු රැකියා ලැයිස්තුවේ ඉන්න අයට මේ අමාත්‍යාංශය තුළින් නිසි ක්‍රමයට, කාටවත් අසාධාරණයක් නොවන විධියට අවස්ථාව ලබා දෙයි කියලා.

ඊළඟ කාරණය හැටියට, ඊයේ අපේ සභානායකතුමා බටලන්ද කොමිසමේ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කළා. මම හිතනවා, බටලන්ද කොමිසමේ වාර්තාවත් එක්ක තවත් කොමිෂන් සභා වාර්තා තුනක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න තිබෙනවා කියලා. එකක් තමයි විජය කුමාරණතුංග ඝාතනය පිළිබඳ ජනාධිපති කොමිෂන් වාර්තාව. ඒ වාගේ තවත් කොමිෂන් වාර්තා කිහිපයක් තිබෙනවා. ඊළඟ දවස්වල අපිත් ඒවා ගෙනැල්ලා සභාගත කරනවා, ගරු සභානායකතුමනි. මොකද, 1989දී අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරු 16දෙනෙක් මැරුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන් 6,300ක් මරලා තිබෙනවා; ඝාතනය වෙලා තිබෙනවා. අපි කියන්නේ ඒවා ගැනත් කොමිෂන් සභා පත්කරලා කථා කරන්න ඕනෑ කියලායි. ඊළඟට, 1989 ජනාධිපතිවරණය; මැතිනිය සහ ප්‍රේමදාස මහත්මයා ඉල්ලපු ජනාධිපතිවරණය. එදා මොනරාගල දිස්ත්‍රික්කයේ ඡන්ද පෙට්ටි 42කට එක ඡන්දයක්වත් වැටිලා තිබුණේ නැහැ. ඡන්ද පෙට්ටි 42ක එක ඡන්දයක්වත් දාලා තිබුණේ නැහැ. එදා ඒ ඡන්ද ටික පාවිච්චි වෙලා තිබුණා නම්, අනිවාර්යයෙන්ම දෙවැනි මනාපය ගණන් කරන්න වෙනවා, මැතිනිය සහ ප්‍රේමදාස මහත්මයාගේ ඡන්ද සංඛ්‍යාව බලන්න. එදා දෙවැනි මනාපය ගණන් කරන්න වුණේ නැත්තේ ඇයි? සියයට පනහයි දශම ගණනකින් තමයි ප්‍රේමදාස මහත්මයා ඒ වෙලාවේ ජයග්‍රහණය කළේ. ඔසී අබේගුණසේකර ඒ ජනාධිපතිවරණයේදී ඡන්ද 280,000ක් ගත්තා. ඔසී අබේගුණසේකර ලබා ගත්ත ඡන්ද 280,000න් වැඩි සංඛ්‍යාවක දෙවැනි මනාපය දීලා තිබුණේ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට. හැබැයි ඡන්ද පෙට්ටි 42ක ඡන්ද තිබුණේ නැති නිසා අපට අසාධාරණයක් වුණා, 1989 ජනාධිපතිවරණයේදී.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
තව මිනිත්තුවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි මේ දෙපැත්තටම සම්බන්ධ නැහැ. එදා ආණ්ඩුව පැත්තෙන් හොයාගෙන ආවේත් අපේ අය. අනෙක් පැත්තෙන් හොයාගෙන ආවේත් අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාක්ෂිකයෝ. ඒ නිසා ඔබතුමන්ලා බටලන්දට සාධාරණය ඉෂ්ට කරනවා වාගේම, අපේ සංවිධායකවරු, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෝ, අපේ හිටපු මැති ඇමතිවරු ඝාතනය වෙච්ච ඒවා ගැනත් අපි ඉදිරියේදී කථා කරනවා. මේ රටේ බිහි වෙච්ච කෘතහස්ත දේශපාලනඥයකු වූ විජය කුමාරණතුංග ඝාතනය පිළිබඳ ජනාධිපති කොමිසමේ වාර්තාවත් අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හිරුණි විජේසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පාර්ලිමේන්තුවේ කථා කළ එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා phone එක පෙන්වලා මොකක්ද photo එකක් පෙන්වුවා. මම එතුමාට කියන්න කැමැතියි, ඒක සත්‍ය ඡායාරූපයක් නම් අද බැරි නම් සඳුදාටවත් සභාගත කරන්න කියලා. අසත්‍ය ඡායාරූපයක් නම් සභාගත කරන්න ඕනෑ නැහැ. අපට ඒ ගැන දැන ගැනීමට අවශ්‍ය නැහැ. අපි ඒකට අමනාපයක් ඇති කර ගන්නේත් නැහැ.

අද විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම අතීතයේදී විදේශ කටයුතු අමාත්‍යාංශය වෙරළු අච්චාරුයි නෙල්ලි දෝසියි වාගේ තමයි තිබුණේ. වෙනත් අමාත්‍යාංශ එක්ක ගැට ගහලා, පටලලා තමයි තිබුණේ. නමුත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ "විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක" වශයෙන් ඒකීය අමාත්‍යාංශයක් පිහිටුවීමට අපට හැකියාව ලැබී තිබෙනවා. ඉතින් ඒක හරිම සතුටුදායකයි. අර කලින් ආණ්ඩුවල හිටපු කෙරුමෝ හිතුවා, ''අපට විතරයි පුළුවන්. අපි නැති වුණොත් විදේශ සම්බන්ධතා ඇති කර ගන්න බැහැ. ආයෝජකයෝ ගෙන්වා ගන්න බැහැ. රට වැටෙයි කියලා''. ඔවුන්ට කොකා පෙන්වලා විජිත හේරත් ඇමතිතුමා ඇතුළු නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනා ඔන්න විදේශ සම්බන්ධතා ගොඩ නගාගෙන, ආයෝජකයන් විශාල වශයෙන් රටට ගෙන්වනවා; විදේශ සමූළුවලට යනවා. ඉතා ගම්භීර ආකාරයෙන්, ගෞරවනීය ආකාරයෙන් රට නියෝජනය කරමින් ශ්‍රී ලාංකීය නාමය ඔන්න ජාත්‍යන්තරයට ගෙන ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම සංචාරකයෝ ලංකාවට එන්නේ නැහැ කියලා බිල්ලෝ මවලා තිබුණා. නමුත් ලංකාවේ සංචාරක කර්මාන්තය ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් යනවා. ඒ වෙනුවෙන් ඒ ක්ෂේත්‍රය භාර නියෝජ්‍ය ඇමතිවරුන්ට ස්තුතිවන්ත වෙනවා.

අද උදේ ඉඳලා විදේශ කටයුතු, විදේශ රැකියා සහ පරිසර අමාත්‍යාංශය පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරු යෝජනා හා අදහස් රාශියක් ඉදිරිපත් කළා. ඇත්තටම මම කියන්න කැමැතියි, සමහර මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු යෝජනා අර පරණ syllabus - old syllabus - එකේ ඒවා බව. අපට ඒවා වැඩක් නැහැ. දැන් අපි පරණ syllabus එක අත්හැරලා තිබෙන්නේ. ඒ නිසා අලුත් යෝජනා ඉදිරිපත් කරන්න. New syllabus එක ඉගෙන ගන්න. ඒ අතර තිබෙන සමහර යෝජනා අපි ඉදිරියේදී සාධනීය විධියට පාවිච්චි කිරීමට බලාපොරොත්තු වෙනවා.

අද මම විශේෂයෙන්ම සංචාරක අමාත්‍යාංශය යටතේ කරුණු දැක්වීමට බලාපොරොත්තු වෙනවා. මොකද, දැනට ලංකාවට වැඩිපුරම ඩොලර් උපයා දෙන ආදායම් මාර්ගයක් හැටියට සංචාරක කර්මාන්තය තුන්වැනි ස්ථානය ලබා ගනිමින්, වේගයෙන් දියුණු වෙමින් පවතිනවා.

ඒ අනුව 2025දී සංචාරකයෝ මිලියන 3කට අධික ප්‍රමාණයක් ලංකාවට ගෙන්වා ගැනීමට අපි අපේක්ෂා කරනවා. අපි එවැනි අරමුණකට ගමන් කරනවා නම්, ඔවුන් උදෙසා හෝටල් පහසුකම් ඇතුළු ඊට අදාළ යටිතල පහසුකම් විශාල වශයෙන් දියුණු කරන්න අවශ්‍යයි. දැනට ලංකාවේ ලියාපදිංචි හෝටල් කාමර තිබෙන්නේ 53,229ක් වාගේ ප්‍රමාණයක්. නමුත් අවධිමත් ආකාරයට පවත්වා ගෙන යන තවත් ප්‍රමාණයක් අපේ රටේ පවතිනවා. නමුත් ඒ පිළිබඳව වන සංඛ්‍යා දත්ත නිල වශයෙන් ඉදිරිපත් කිරීමට හැකියාවක් නැහැ. අපේ රටට එන සංචාරයකින් දෙගුණයකින්, තෙගුණයකින් වැඩිකර ගෙන්වා ගැනීමට කටයුතු කිරීමේදී විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය හරහා සංචාර කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රුපියල් මිලියන 600ක් වෙන් කර තිබෙනවා. එය ඉතාම සාධනීයයි. විශේෂයෙන්ම සංචාරකයන් විශාල වශයෙන් යන ඇල්ල සංචාරක කලාපයේ යටිතල පහසුකම් වැඩිදියුණු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මඩොල්සිම, ත්‍රිකුණාමලය, මිරිස්ස, කල්පිටිය ආදී ප්‍රදේශවල සංචාරක කර්මාන්තයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටත් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒවා ඉතාම සාධනීයයි. ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

2024 වර්ෂයේදී මේ සංචාරක කර්මාන්තය වෙනුවෙන් ඒ මුළු අවුරුද්දටම ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක් වාගේ ප්‍රමාණයක් තමයි ආයෝජකයන් ආයෝජනය කරලා තිබෙන්නේ. නමුත් අපි සතුටින් කියන්න කැමැතියි, 2025 වසරේ ගතවී තිබෙන මේ මාස දෙකහමාරට පමණක් ඇමෙරිකානු ඩොලර් මිලියන 20කට අධික ප්‍රමාණයක් ආයෝජනය කර තිබෙන බව. ඔවුන්ට අපි ගැනත්, රට ගැනත් විශ්වාසයි. මේ රට පිළිබඳ හොඳ අනාගතයක් ඔවුන්ට පෙනෙනවා. ඒ නිසා තමයි මෙතෙක් කල් ආවේ නැති ආයෝජකයෝ පවා දැන් එන්නේ. අර වසරක් පුරා ආයෝජනය කරපු මුදල් ප්‍රමාණය මාස දෙකක්, තුනක්, හතරක් ඇතුළත ආයෝජනය කරන්න විදේශික සහ ශ්‍රී ලාංකික ආයෝජකයෝ ඉදිරිපත් වෙලා තිබෙන්නේ අප පිළිබඳව තිබෙන විශ්වාසය නිසායි.

අපේ රටේ මන්නාරම, කල්පිටිය, මඩකලපුව ආදී ප්‍රදේශවල පැරණි බලකොටු තිබෙනවා. ඒ බලකොටු සංවර්ධනය කරලා ඒ ඔස්සේ ද සංචාරක කර්මාන්තය නවමු කේන්ද්‍රස්ථානයක් ලෙස දියුණු කිරීමට මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශයට මගේ ප්‍රශංසාව පුද කර සිටිනවා.

ඒ වාගේම ලෝ ප්‍රකට "Condé Nast Traveler" සඟරාව දක්වා තිබෙනවා, 2025 වසරේ පවුලේ අය සමඟ සංචාරය කරන්න හොඳම රට ශ්‍රී ලංකාව කියලා. ඒ වාගේම, පවුලේ අයත් එක්ක ගිහින් පදිංචි වෙන්න හොඳම රට ශ්‍රී ලංකාව බව එම ජාත්‍යන්තර සඟරාව තුළ දක්වා තිබෙනවා. ඒ ආකාරයට ඉතා ප්‍රශංසනීය විධියට නවමු පුවත් මවමින් අද වනවිට ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය ශීඝ්‍රයෙන් දියුණු වෙනවා.

මේ අවස්ථාවේදී මම යෝජනාවක් කරන්න කැමැතියි. 2025 මාර්තු 15වැනි දා ලංකාවට එන සංචාරකයෙක් 2026 මාර්තු 15වැනි දාටත්, 2027 මාර්තු 15 වැනි දාටත් වශයෙන් සෑම වසරකම අපේ රටට ගෙන්වා ගන්න. එක් වතාවක් පැමිණි සංචාරකයෙක් 10 වතාවක්, 20 වතාවක් පමණ ලංකාවට ගෙන්වා ගන්න අපි දැන ගන්න ඕනෑ. අන්න ඒ සඳහා නවමු සංචාරක කේන්ද්‍රස්ථාන බිහි කරන්න අවශ්‍යයි. එහිදී අපි දන්නා Kandy, Down South, Ella, Trincomalee වාගේ සංචාරක කේන්ද්‍රස්ථානවලට අමතරව අලුත් ස්ථාන හඳුනා ගැනීම අවශ්‍යයි. මොකද, අපේ රටට සංචාරකයන් දිනපතා එනවා නම්, කාර්තුවලට එනවා නම්, වාර්ෂිකව එනවා නම් ඒ අයට බලන්න අපේ රටේ ඒ වාගේ තැන් නිර්මාණය කරන්න ඕනෑ. දැනට ලංකාවේ සාම්ප්‍රදායික සංස්කෘතිය, පරිසරය, ඓතිහාසික තැන් පදනම් කරගෙන, ඒවා කේන්ද්‍රස්ථාන කරගෙන තමයි සංචාරක කර්මාන්තය දියුණු වෙලා තිබෙන්නේ. නමුත් අපි ඉන් ඔබ්බට ගිහිල්ලා ecotourism, geotourism, outbound tourism, medical tourism වාගේ නවමු කේන්ද්‍රස්ථානවලට අපේ සංචාරක කර්මාන්තය යොමු කරන්න ඕනෑ කියා මා යෝජනා කරනවා.

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

ඇත්තටම මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සම්බන්ධ වෙලා සංචාරක කර්මාන්තය දියුණු කරන්න කටයුතු කරන්න ඕනෑ. එහි මූලික පියවරක් වශයෙන් මා නියෝජනය කරන වයඹ පළාතේ කුරුණෑගල සහ පුත්තලම කේන්ද්‍ර කරගෙන සංචාරක කලාප රාශියක් බිහි කිරීමට වැඩසටහන් රාශියක් සකස් කර තිබෙනවා. ඒ ඔස්සේ කුරුණෑගල, දඹදෙණිය, යාපහුව, පඬුවස්නුවර, රිදී විහාරය ආදී ඓතිහාසික ස්ථාන කේන්ද්‍ර කරගෙන අපේ cultural tourism promote කරන්න අවස්ථාව, ඉඩකඩ සැලසී තිබෙනවා. ඒ වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. මම නියෝජනය කරන්නේ පුත්තලම දිස්ත්‍රික්කය. අපේ ප්‍රදේශයට අදාළ ඓතිහාසික ස්ථාන සහ කතන්දර -තම්මැන්නාව, කුවේණිය වාගේ- කේන්ද්‍ර කරගෙන සංචාරක කේන්ද්‍රස්ථානයක් නිර්මාණය කිරීමට දැන් වනවිට වැඩ කටයුතු සකසමින් තිබෙනවා. ඒ පිළිබඳව research කරලා සම්පත්දායකයන් සම්බන්ධ කරගෙන ඊට අදාළ වැඩ පිළිවෙළ දැනට ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

පිට රටකින් ලංකාවට එන researcher කෙනෙකුට ලංකාවේ research tourism කරන්න ලංකාවේ කිසිම තැනක් නැහැ. ඒ කියන්නේ පසේ තිබෙන සංඝටක පිළිබඳව, පරිසරය පිළිබඳව කාට හෝ research එකක් කරන්න අවශ්‍ය නම්, එහෙම කරලා ඒ research tourism කියන අත්දැකීම් ලබා ගන්න මම දන්නා හැටියට ලංකාවේ කිසිම ස්ථානයක් නැහැ.

ඉතින් ඒ දේවල් promote කිරීම සඳහා පුත්තලම, කල්පිටිය ඒ වාගේම තබ්බෝව, එළුවන්කුලම ප්‍රදේශය ආශ්‍රිතව ඒ ප්‍රාග් ඓතිහාසික පාෂාණවල චිත්‍රනාකම සහ ඒ ශාකමය චිත්‍රනාකම පදනම් කරගෙන ඒ ප්‍රදේශ සංවර්ධනය කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම විල්පත්තු වනෝද්‍යානයට අපට දුර බැහැරින් - අනුරාධපුර දිස්ත්‍රික්කය පැත්තේ - තමයි entrance එකක් තිබෙන්නේ. දැන් මෙවර සංචාරක ප්‍රවර්ධන වැඩසටහනේ ක්‍රියාමාර්ගයක් හැටියට විල්පත්තු වනෝද්‍යානයට එළුවන්කුලම හරහා නව ප්‍රවේශ මාර්ගයක් ලබා දීමට බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව නාත්තන්ඩිය, මාදම්පේ ප්‍රදේශය ආශ්‍රිතව ඇති ඇල - ඕලන්ද ඇල, හැමිල්ටන් ඇල - ආශ්‍රිත කරගෙන සංචාරක කලාපයක් කේන්ද්‍ර කරගෙන ප්‍රවර්ධනය කිරීමට සූදානම් වෙමින් පවතිනවා. මේ පිළිබඳව සතුටුදායක ප්‍රවේශයක් අපට දකින්න පුළුවන්.

ඇත්තටම මම කියන්න කැමැතියි, අපේ විදේශ ශ්‍රමික කාන්තාවන් ගත්තාම, ඔවුන් විශාල වශයෙන් විදෙස් රටවලට යන්නේ ඔවුන්ට රැකියා අවස්ථා, ව්‍යාපාරික අවස්ථා මේ රටේ නැති නිසා. මේ රටේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම හරහා මැද පෙරදිගට ගිහිල්ලා ගුටිකන දුප්පත් අසරණ කාන්තාවන් වෙනුවෙන් ලංකාවේ රැකියා අවස්ථා උදා කර දීමට අවස්ථාව ලැබෙනවා. ඒ ඔස්සේ තමන්ගේ දුවා දරුවන් රැක බලාගෙන, උගන්වා ගෙන, ඔවුන්ගේ ජීවනෝපාය කරගෙන හොඳින් ජීවත්වීමට මේ සංචාරක කර්මාන්තය හරහා අවස්ථාව ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන්ම මම යෝජනාවක් කරන්න කැමතියි. අපේ ලංකාවට වැඩියෙන්ම විදේශීය ජාතිකයන් එන්නේ යුරෝපයෙන්. ඒ අතරින් රුසියානු ජාතිකයන් තමයි බහුතරයක් එන්නේ. අපේ ලංකාවේ පාසල් ක්ෂේත්‍රය ගත්තාම අපොස සාමාන්‍ය පෙළට විෂයයක් හැටියට රුසියානු භාෂාව තිබෙනවා. නමුත්, ඇත්තටම සියයට 99ක් ලංකාවේ පාසල්වල රුසියානු භාෂාව විෂයයක් හැටියට උගන්වන්නේ නැහැ. මම ඇත්තටම හොයලා බලද්දී වයඹ පළාතේ කිසිම පාසලක රුසියානු භාෂාව විෂයයක් හැටියට උගන්වන්නේ නැහැ. ඒ නිසා, සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම මූලික කරගෙන අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙක් අමාත්‍යාංශත් එකතු වෙලා අපොස සාමාන්‍ය පෙළට රුසියානු භාෂාව, ප්‍රංශ භාෂාව, අරාබි භාෂාව එකතු කරන්න කියලා මම යෝජනා කරන්න කැමතියි. ඒ ඔස්සේත් අපට සංචාරක කර්මාන්තය දියුණු කරන්න හැකියාව ලැබෙන බව යෝජනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්ථාවර නියෝග 75 යටතේ මම කරුණක් මතු කරන්න කැමතියි. මීට කලින් කථා කළ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා, මේ ගරු සභාවේ අපේ ඇමතිතුමාට තනි රකින්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කෝ කියලා. අද ඉතා වැදගත් අමාත්‍යාංශයක් වන විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය ගැන තමයි කථා කරන්නේ. හැබැයි, මේ වෙලාවේ ගරු සභාවේ සිටින්නේ විපක්ෂයේ එකම එක මන්ත්‍රීතුමෙක් විතරයි කියන එක මම කියන්න කැමතියි. එතුමා ආවේත් එතුමාගේ කථාව කරන්නයි. එහෙම නැත්නම් විපක්ෂයේ කවුරුවත් නැහැ. අපේ මන්ත්‍රීවරුන්ගෙන් අවශ්‍ය අය මෙතැන ඉන්නවා. අපි ක්‍රියාකාරිව විවාදයට සහභාගි වෙනවා. ඒ නිසා කරුණාකරලා මාධ්‍ය ෂෝ දාන්නේ නැතිව, එතුමාගේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගැන අවධානය යොමු කරන්නය කියලා මම එතුමාට කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා.

[අ.භා. 5.14]

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාද කරනු ලබන්නේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි. ඇත්තටම මේ අමාත්‍යාංශය ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. රටක් විධියට ගත්තොත්, මේ රටේ ඉදිරිය වෙනුවෙන් ඉතා වැදගත් වැඩක් කළ හැකි අමාත්‍යාංශයක්. හැබැයි, අද අපට දකින්න තිබෙන විධියට මේ වෙනකොට විපක්ෂයෙන් එක් මන්ත්‍රීවරයෙක් පමණයි මෙම විවාදයට සම්බන්ධ වෙලා ඉන්නේ. පසුගිය කාලයේ විපක්ෂය අප ගැන

ජනතාවට කිව්වේ කොහොමද? එතුමන්ලා කිව්වා, ජාතික ජන බලවේගයට මේ ලෝකයත් එක්ක ගනුදෙනු කරන්න, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් පවත්වන්න හැකියාවක් නැහැ කියලා. හැකියාවක් නැහැ කියන එක තමයි ජනතාවට නිතරම කියා පෑවේ. අද උදේ සිට මේ විවාදය ආරම්භ කරලා ඉදිරියට යද්දී එතුමන්ලාගේ පැත්තෙන් කියවුණේ, අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමා මේ අමාත්‍යාංශය -විදේශ කටයුතු අමාත්‍යාංශය- සාර්ථකව කරගෙන යනවා, නිවැරදිව කරගෙන යනවා කියලායි. එතුමාට සුබ පතන්න ගත්තා. එහෙම නම්, අපි දකිනවා විපක්ෂයට වැරදිලා කියලා. විපක්ෂය එදා දැකපු හීනවලට අද මොකද වෙලා තිබෙන්නේ? අපේ කාර්යභාරය අපි හරියට කරනවා කියන එක එතුමන්ලා තේරුම් අරගෙන තිබෙනවා. ඒකට එතුමන්ලාගේ සහයෝගය දෙනවා කිව්වා. අපි ඒක බලාපොරොත්තු වෙනවා. ඇත්තටම රටක් විධියට ගත්තොත්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය කොච්චර වැදගත් අමාත්‍යාංශයක්ද?

අපේ රටේ ආර්ථිකයට මේ අමාත්‍යාංශය කොච්චර වැදගත් වෙනවාද? ආර්ථිකය සැලසුම් කර ගන්න, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් ඇතිකර ගන්නවා වාගේම, අපනයන ක්ෂේත්‍රය, ආයෝජන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න මේ අමාත්‍යාංශය කොච්චර වැදගත් වෙනවාද? රටක් විධියට අපි අසරණ වෙච්ච අවස්ථා බොහොමයි. පසුගිය කාලයේ අපේ රටේ තිබුණු ඩොලර් අර්බුදය අපි දැක්කා. මේ අර්බුදයට විසඳුම් හොයන්නේ කොහොමද? ඒ කාරණාවේදී විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය ඉතා වැදගත් වෙනවා. අපේ රටේ ආර්ථිකය බරපතළ කඩා වැටීමකට ලක් වෙලා තිබුණා. හැබැයි, අපේ රටේ ශ්‍රමිකයන් පිටරට ගිහිල්ලා විදේශ ප්‍රේෂණ එව්වා. ඔවුන් ඇමෙරිකානු ඩොලර් බිලියන 7.5ක් වාගේ ප්‍රමාණයක් අපට එවා තිබෙනවා. එහෙම නම් අපේ රටේ ආර්ථික අවපාතයට විසඳුම් සොයද්දී, විදේශ රටවල සිටින අපේ රටේ ශ්‍රමිකයන්ගේ විදේශ ප්‍රේෂණ ගෙන්වා ගන්න, ඩොලර් ගෙන්වා ගන්න කටයුතු කළ යුත්තේ කෙසේද කියන එක අපි සැලසුම් කරන්න ඕනෑ නැද්ද? අපි ඒ කාරණය දකිනවා. හැබැයි, ඒ කාරණය අද විපක්ෂයේ සිටින අය එදා දැකලා තිබුණේ නැහැ. නමුත් අද එතුමන්ලා අපට උපදෙස් දෙන්න එනවා, මෙන්න මෙහෙම කළ යුතුයි කියලා. වසර ගණනක් මේ රටේ දේශපාලනය කරලාත්, මේ අමාත්‍යාංශවල වැඩ කරලාත් මේවාට උත්තර ලබා දෙන්න එතුමන්ලාට බැරි වෙලා තිබෙනවා. අපට උපදෙස් දීම පමණක් එතුමන්ලා කරනවා.

ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයත් අපට ඉතාම වැදගත්. එම ක්ෂේත්‍රය ඩොලර් බිලියන 4ක වාගේ ආදායමක් ලබා ගන්න තැනකට ගෙනැල්ලා තිබුණා. හැබැයි, එතැනින් එහාට සංචාරක කර්මාන්තය රටට කොච්චර වැදගත්ද? එහි කොච්චර ප්‍රවණතාවක් තිබෙනවාද? සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම අපට වැදගත් වෙන්නේ නැද්ද? එහෙම නම්, ඒවා නොකළේ ඇයි? ඒකට මොකක්ද හේතුව කියන එකත් එතුමන්ලා කියන්න ඕනෑ. දැන් අපට උපදෙස් දෙන්න ආවාට වැඩක් නැහැ. දශක ගණනක් තිස්සේ මේ රටේ ආර්ථිකය බිඳ වැටී තිබුණා. එතුමන්ලා ඒවාට වගකිවයුත්තන් නොවෙයිද? වගකිව යුත්තන් තමයි. රටක් කඩා වැටෙද්දී, රටක් විනාශ වෙද්දී එතුමන්ලාගේ කාර්යභාරය අතහැරලා තිබෙනවා. අද විශේෂ වැදගත් අමාත්‍යාංශයක් පිළිබඳව සාකච්ඡාවට ගනිද්දී වෙනත් කාරණා තමයි එතුමන්ලා අවධාරණය කළේ. මේ අමාත්‍යාංශයේ වැදගත්කම දැකලා නැහැ. හරියට අවබෝධ කරගෙන නැහැ.

විදේශ කටයුතු ක්ෂේත්‍රය ගත්තොත්, ලෝකය වටේ තානාපතිවරු පත් කරද්දී එක එක විධියට, තමන්ගේ දේශපාලන ක්‍රියාවලිය තුළ තිබෙන හිතවත්කම් මත, යාළුකම් මත තානාපතිවරු පත් කරනවා. අමනාපකම් මත වෙනත් කෙනෙක් පත් කරනවා. ඥාති හිතවත්කම් මත තමයි තානාපතිවරු පත් කළේ. ඒ තුළින් අපේ රට පිළිබඳ විශ්වාසය බිඳ වටිටලා තිබෙනවා. අපේ රට සම්බන්ධව ලෝකයේ තිබෙන චිත්‍රය බිඳ වටිටලා, බොඳ කරලා තිබෙනවා. ඒ නිසා අපේ රට සම්බන්ධයෙන් විශ්වාසය ගොඩ නහන්න අවශ්‍ය වෙලා තිබෙනවා. මේ මොහොතේ අපි කළ යුත්තේ, අපි කරමින් සිටින්නේ, ඒ විශ්වාසය ගොඩ නැඟීමයි. ලෝකයෙන් අප අතහැරලා තිබුණත්, දැන් අපේ ගරු අමාත්‍යතුමාට පුළුවන් වෙලා තිබෙනවා මේ අමාත්‍යාංශය හරහා ඒ විශ්වාසය අංක එකට ගොඩ නහන්න. ඒක තමයි අපි ලබා තිබෙන ජයග්‍රහණය. දැන් අපේ රටට ආයෝජකයන් එනවා. වෙන දා ආයෝජකයන් ආවේ කොහොමද? ඒ අය ආපු ගමන් කොමිස් ඉල්ලනවා. ඊට පස්සේ ඔවුන් මේ රට දාලා යනවා. හැබැයි, අද ඔවුන්ට විශ්වාසය තහවුරු කරමින් තිබෙනවා. ආයෝජකයන් අපේ රටට එන්න කැමැතියි; ඩොලර් ගෙනෙන්න කැමැතියි. අන්න ඒ විශ්වාසය හදන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රය ඉතා වැදගත් වෙනවා. ඉදිරියේදී අපි රටක් විධියට ලෝකය එක්ක එකතු වෙන්න ඕනෑ. මේ ගෝලීයකරණය තුළ අපි යන්න ඕනෑ තැන ගැන අපි දන්නවා.

අපේ අපනයන, ආනයන පරතරය කොච්චරද? වෙළඳ ශේෂයේ ඩොලර් බිලියන 8ක වාගේ හිඟයක් තිබුණු බව අපි දැක්කා. මේවා ඇදගෙන, ඇදගෙන ආපු පාලකයෝ තමයි මේවා කියන්නේ. මේ ආර්ථිකය ගොඩ නහන්න සැලසුම් නැහැ. හැබැයි, ඔවුන් මොකක්ද කරලා තිබෙන්නේ? හිතවතුන් සතුටු කරමින්, ඥාතීන්ට සංග්‍රහ කරමින් ආපු ගමනකදී ආර්ථිකය කඩා වටිටලා තිබෙනවා. අද අපට -ගරු අමාත්‍යතුමාට- පුළුවන් වෙලා තිබෙනවා, මේ ක්ෂේත්‍රය ගොඩ නහන්න. ඒක වැදගත්. විශ්වාසය ගොඩ නහලා කෙටි කාලයක් තුළ සෑම අංශයකම දූෂණය, වංචාව වළක්වා නියමිත පරිදි මේ අමාත්‍යාංශය විධිමත් කර ගෙන යනවා.

ගරු ඇමතිතුමනි, රැකියා ක්ෂේත්‍රය ගත්තාම, අපි එහි යම් තැනකට ඇවිල්ලා තිබෙනවා. අද ඉතාලි රාජ්‍යය ගැනත් කථා කළා. පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව, නාත්තණ්ඩිය, හලාවත වාගේ ආසනවල මිනිස්සු ඉතාලි රාජ්‍යයේ සේවය කරනවා. ගොඩක් පිරිසක් ඉතාලි රාජ්‍යයේ සේවය කරනවා. ඔවුන්ට ප්‍රධාන ගැටලු කිහිපයක් තිබෙනවා. අන්න ඒ ගැටලුවලට විසඳුම් දෙන්න පසුගිය ආණ්ඩු උත්සාහ කළේ නැහැ. 2002දී ඔය driving licence එක renew කරන්න අවස්ථාව තිබුණත්, ඒවා කළේ නැහැ. හැබැයි, අපේ ගරු අමාත්‍යතුමා ඉතාම කෙටි කාලයක් තුළ ඒ අවස්ථාව අරගෙන විසඳුම් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම තමයි ඉතාලි employment visa සම්බන්ධ ප්‍රශ්නයත්. එය දිගටම තිබුණු ප්‍රශ්නයක්. දැන් අපි ඒක ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඉතා වේගයෙන් අපි මැදිහත් වෙලා ඒ සම්බන්ධව කටයුතු කරලා තිබෙනවා. ඉදිරියේදී කොරියාව, ජපානය, සහ ඊශ්‍රායලය වාගේ රටවල රැකියා අවස්ථා ලබා දෙන්න අපි අපේක්ෂා කරනවා. කොරියා රාජ්‍යයේ රැකියා 7,600ක් පමණ ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම ධීවර ක්ෂේත්‍රය, කෘෂිකර්ම ක්ෂේත්‍රය, ඉදිකිරීම් ක්ෂේත්‍රය වාගේ ක්ෂේත්‍රවලින් දකුණු කොරියාවේ රැකියා 7,600ක් පමණ ලබා දෙන්න අපි අපේක්ෂා කරනවා.

ඒ වාගේම ඊශ්‍රායලයේත් කෘෂිකර්ම, ඉදිකිරීම් හා සත්ව අභිජනන හා සේවා අංශයේ රැකියා 15,900ක් පමණ ලබා දෙන්න අපි අපේක්ෂා කරනවා. SSW වැඩසටහන යටතේ අපට ජපානයෙනුත් රැකියා 9,300ක් පමණ ලබා දීමට පුළුවන් වෙයි කියා අපේක්ෂා කරනවා. ඒ වාගේම අපි සැලසුම් කර තිබෙනවා, මේ ජනතාව දුප්පත්කමින් මුදා ගන්න. මනුෂලා කළා වාගේ අපි ජනතාවගේ විශ්වාසය පලුදු කරන්නේ නැහැ. මනුෂලා සල්ලි අරගෙන ඒ කටයුතු විනාශ කළා. එම නිසා විදේශ රැකියාවක් බලාපොරොත්තු වූ ජනතාවට ඒ රැකියාව ලැබුණේ නැහැ. වංචා, දූෂණවලට ගිහිල්ලා අපේ රටට තිබුණු ඒ පැහැදිලිකම නැති කරලා, ඒ අවස්ථා ත්‍රිත්වයම නැති කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LAKSHMAN NIPUNA ARACHCHI left he Chair, and HON. DEPUTY SPEAKER took the Chair.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු සභාපතිතුමනි, විදේශ රැකියා අවස්ථා සාධාරණව ලබා දෙන්න අපි ඉදිරියේදී සැලසුම් කරලා තිබෙනවා. ඒ රැකියා අවස්ථා කාගේවත් අතකට උඩින් යටින් යන්නේ නැතුව සාධාරණව ලබා දෙන්න අපි කටයුතු කරනවා. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ඇතුළේ දුප්පත්කම පිටුදකිමින් අපේ ආර්ථික ප්‍රතිපත්තිය මත මේ රට ගොඩනැඟීමට විදේශ රැකියා ක්ෂේත්‍රය පාවිච්චි කරන්න අපි සූදානම් වනවා. වංචාවට හා දූෂණයට නිත තබමින්, ඒවායේ තිබෙන අකාර්යක්ෂමතා පිටුදකිමින්, මේ රටට සේවය කරන විදේශ රටවල ඉන්න අපේ ශ්‍රමිකයන්ට සාධාරණ ලෙස සලකමින්, ඔවුන්ට තිබෙන අවස්ථා තවත් ඉදිරියට ගනිමින් විදේශ රැකියා ක්ෂේත්‍රයේ ඉදිරි පිම්මක් පනින්න අපි සූදානම් වනවා.

අපි මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න ඕනෑ; රැකියා අවස්ථා ලබා දෙන්න ඕනෑ; සංචාරක ක්ෂේත්‍රය පුළුල් කරන්න ඕනෑ. ඒ සඳහා ආයෝජකයෝ අවශ්‍යයි. මේ කරුණු-කාරණා සඳහා අපි ඉදිරි සැලසුම් සකස් කරලා තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය පුළුල් කිරීමේ අවස්ථාව අපේ රටට තිබෙනවා. ඒ සඳහා අවස්ථාව ලබා ගනිමින්, ඉතාම හොඳට අපේ අමාත්‍යාංශය ශක්තිමත් කරමින්, රටේ ආර්ථිකය ගොඩනඟන්න අපේ අමාත්‍යාංශයේ දායකත්වය ලබා දෙන්න අපි සූදානම් වනවා.

ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Vijitha Herath.

[අ.භා. 5.23]

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු සභාපතිතුමනි, අද දවස පුරා පැවතුණු විවාදයේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක්ම ප්‍රශ්න කළා, reconciliation process එක සම්බන්ධයෙන් රජයට තිබෙන ස්ථාවරය පිළිබඳව. අපි ඉතාම පැහැදිලිව ඒ ගැන කියන්න කැමැතියි. යුද්ධය අවසන් වුණේ 2009 මැයි 18වැනි දා. ඊට හරියටම සතියකට පසුව, ඒ කියන්නේ මැයි 26වැනි දා ජනතා විමුක්ති පෙරමුණේ අපි ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට Truth and Reconciliation Commission එකක් පිහිටුවන්න කියලා එවකට හිටපු ජනාධිපතිතුමාට යෝජනා මාලාවක් දුන්නා. යුද්ධයෙන් පසුව රට නැවත ගොඩගැනීම සඳහා පූර්ණ වැඩ පිළිවෙළක් තමයි ඒ තුළින් අපි ඇත්තටම භාර දුන්නේ. ජනාධිපතිතුමාට ඒක භාර දීලා, ඒක රටටත් ඉදිරිපත් කළා. නවනීදම් පිල්ලේ -ඒ කියන්නේ මානව හිමිකම් කවුන්සලයේ හිටපු මහ කොමසාරිස්වරිය- වසර ගණනාවකට පසු තමයි ලංකාවට ඒක යෝජනා කළේ. ඒ කවුරුවත් යෝජනා කරන්න කලින් තමයි අපි දේශපාලන ව්‍යාපාරයක් විධියට දුර දක්නා දැක්මෙන් යුක්තව යුද්ධය අවසන් වෙලා සතියක් යනකොට ඒ යෝජනාව ඉදිරිපත් කළේ.

ඒ වාගේම ජාතිකත්වය මත එන වෙනස්කම් වැළැක්වීම සඳහා කොමිසමක් පිහිටුවන්න කියලාත් අපි යෝජනා කළා. යුද්ධය නිසා විනාශයට පත් වුණු උතුරු සහ නැඟෙනහිර පළාත් නැවත ගොඩනැඟීමට වසර දෙකක කාලයක් සඳහා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂ ඒකාබද්ධව කාර්ය සාධක බලකායක් පිහිටුවන්න කියලාත් අපි යෝජනා කළා. ඒ එකක්වත් අවුරුදු ගණනක් ගත වෙලාත් සිදු වුණේ නැහැ. එදා අපි Truth and Reconciliation Commission එක පිහිටුවන්න කටයුතු කළා නම්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලය තුළ 51/1 යෝජනාව එන්නේ නැහැ. ඒක තමයි සත්‍යය. එම නිසා අපේ ස්ථාවරයේ කිසිදු වෙනසක් නැහැ. අපි විපක්ෂයේ ඉන්නකොට තමයි ඒ යෝජනාව කළේ, රටේ ජාතික සමගිය වෙනුවෙන්, සංහිඳියාව වෙනුවෙන්. අපි දැන් ආණ්ඩුව නියෝජනය කරනවා.

ඒ නිසා අපි අනිවාර්යයෙන්ම, අවංකවම මේ රටේ ජාතික සමගිය ගොඩ නැඟීමේ ක්‍රියාවලිය ශක්තිමත්ව ඉස්සරහට ගෙනියනවා. ඒක කරන්නේ මානව හිමිකම් කවුන්සලයේ වාර්තාවට ඉදිරිපත් කරන්න පමණක් නොවෙයි. අපට ඒ සඳහා අවංක වුවමනාවක් එදාත් තිබුණා, අදත් තිබෙනවා. ඒ නිසා මානව හිමිකම් කවුන්සලයට ගිහිල්ලා, අපි truth and reconciliation mechanism එක ක්‍රියාත්මක කරනවා කියලා කිව්වේ, ලෝකයට පෙන්වන්න හෝ ඒ Resolution එකෙන් ගැලවෙන්න නොවෙයි, මේ රටේ ඇත්ත ජාතික සමගිය ගොඩ නැඟීමේ වුවමනාවෙන්. ඒ නිසා අපි මේ රටේ දෙමළ හා මුස්ලිම් ජනතාවට සහතිකයක් දෙනවා, ඒ ජාතිකත්වයන් සහ සිංහල ජාතිකත්වය අතර ඉතිහාසය පුරා බිඳ වැටුණු ඒ ජාතික සමගිය, පාලකයන් විසින් ඇති කරපු ඒ අසමගිය, අනාගතයේ කිසිදාක නැවත ඇති නොවන්න අවශ්‍ය යන්ත්‍රණය අපි ක්‍රියාත්මක කරනවා, ඒ වෙනුවෙන් අපි මේ රටේ ජනතාවට වග වෙනවා කියලා.

ඒ නිසා තමයි, උතුරේ ජනතාව, නැඟෙනහිර ජනතාව, වතුකරයේ දෙමළ ජනතාව, මලයගම් දෙමළ ජනතාව අපට මහ මැතිවරණයේදී විශාල වශයෙන් ඡන්ද ලබා දුන්නේ. ඒ පළාත් නියෝජනය කරන මන්ත්‍රීවරුන් ජාතික ජන බලවේගයට දැන් එකතු වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සංහිඳියාව පිළිබඳ යන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේදී අපි කිසිවිටෙකත් පැකිළෙන්නේ නැහැ. ඒ කියපු වචනවලට අපි වග කියනවා. ඒ නිසා ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා, ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, accountability process එක ගැන ප්‍රශ්න කිරීම හොඳයි. හැබැයි කිසිදු ආකාරයක සැකයක්, අවිශ්වාසයක් තබා ගන්න ඕනෑ නැහැ, රජයක් විධියට අපි ඒ වෙනුවෙන් මේ රටේ ජනතාවට වග කියනවා, අපි ඒක ඉටු කරනවා. ඒ වෙනුවෙන් වූ OMP - Office on Missing Persons, ONUR, ඒ වාගේම OR එක දැනට තිබෙන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ නොවෙයි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ. හැබැයි, ඒ ආයතන ශක්තිමත්

කරලා, එදා අතුරුදහන් කරපු, ඒ වාගේම මරා දමපු, සියලුදෙනාගේ පවුල්වලට සාධාරණය ඉෂ්ට කරන්න අවශ්‍ය යන්ත්‍රණය අපි ශක්තිමත්ව ඉදිරියට ගෙනයනවා. ඒ වෙනුවෙන් රජය මේ අය වැයෙන් මුදල් වෙන් කරලාත් තිබෙනවා, ඒ වෙනුවෙන් විවිධ පියවර අරගෙනත් තිබෙනවා.

යාපනය පුස්තකාලය නැවත අලුත්ම තත්ත්වයට ගෙන එන්න අවශ්‍ය මුදල් වෙන් කිරීම මේ අය වැයෙන් කරලා තිබෙනවා. එලෙස භෞතිකව කරන සංවර්ධන කටයුතු පමණක් නොවෙයි, අධ්‍යාත්මිකව ජාතිකත්වයන් අතර සමගිය ගොඩනැඟීම සඳහා වෙච්ච විවිධ දේ අපි කරමින් තිබෙනවා වාගේම ඉදිරියට ඒවා තවත් ශක්තිමත් කරනවා. ඒක තමයි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයට අප පිළිබඳව ලබා දෙන විශ්වාසය. දේශීය යාන්ත්‍රණය කියන්නේ, මේ රට තුළ අපි අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරලා, මානව හිමිකම් ආරක්ෂා කරලා, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහ ශක්තිමත් කරලා, රට තුළ එවැනි තත්ත්වයක් නැවත ඇති නොවෙනවා කියන එකයි. ඒකට අදාළ වග වීම ප්‍රායෝගික භාවිතයෙන් ඔප්පු කිරීම අද අපි පටන් අරගෙන තිබෙනවා. ඒ දේ තමයි, දේශීය යාන්ත්‍රණය ඇතුළේ අපි සිදු කරමින් යන්නේ. ඒ නිසා කිසිදු ආකාරයක විදේශීය මැදිහත්වීමක අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ. එදා හිටපු පාලකයන්ට ඒ බල කිරීම කළේ, එදා අධිකරණයේ ස්වාධීනත්වය තිබුණේ නැති නිසායි. එදා අධිකරණයට ඇඟිලි ගැසුවා; කැලෑ නීතිය රජ කළා. ඒවා දැන් වෙනස් වෙලා තිබෙනවා. අද පොලීසියට, අධිකරණයට කිසිම දේශපාලන මැදිහත්වීමක් නැහැ. නීතියේ ආධිපත්‍යය ක්‍රියාවට නඟන්න අවශ්‍ය පූර්ණ නිදහස අද තිබෙනවා. ඒ ස්වාධීනත්වය, නිදහස නිසා ජාත්‍යන්තරයට ඒ විශ්වාසය ඇති වෙමින් තිබෙනවා. ඒ නිසා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ කොමසාරිස්වරයා ඒ සැසිවාරය අවසානයේදී කළ ප්‍රකාශය තුළින් ඒ පිළිබඳව සුබවාදීව කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ගැන මේ රටේ ජනතාවට විශ්වාසයක් තිබෙනවා. අද ලෝකය පුරා විසිරිලා ඉන්න දෙමළ ජනතාව, අපේ නව ආණ්ඩුවේ මේ ක්‍රියාවලිය පිළිබඳව පැහැදීමකින් ඉන්නවා. අද කැනඩාවේ අලුත් රජය පිහිටුවීමේදී අපේ රටේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ ආනන්ද සංගරී මහතාගේ පුතා, එහි අධිකරණ නීතිය පිළිබඳ අමාත්‍යවරයා බවට පත් වෙලා තිබෙනවා.

අපට සන්තෝෂයි, ශ්‍රී ලංකාවේ ජන්මය ලබා තිබෙන කෙනෙක් එවැනි රටක අමාත්‍යවරයකු බවට පත් වෙලා තිබෙන එක ගැන. ආනන්ද සංගරී මන්ත්‍රීවරයා අපි විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට ඉන්නකොට මේ රටේ ජාතික ප්‍රශ්නය ගැන විවිධ අවස්ථාවලදී අපිත් එක්ක ඉතාම කිට්ටුවෙන් කටයුතු කළා. ඒ නිසා ලෝකය පුරා විවිධ රටවල -කැනඩාවේ, එංගලන්තයේ, ඇමෙරිකාවේ, ඕස්ට්‍රේලියාවේ, ස්විට්සර්ලන්තයේ- විසිරිලා සිටින, විවිධ තත්ත්වයන් යටතේ විදේශගත වෙන්න සිද්ධ වෙච්ච අයගේ විශ්වාසය මේ වනකොට අපේ රට කෙරෙහි ගොඩනැඟෙමින් තිබෙනවා. ඒ වාගේම ඒ අයගේ සහයෝගය අපේ රටට ලැබෙමින් තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඒ සහයෝගය සහ විශ්වාසය මනින් මේ ක්‍රියාවලිය ශක්තිමත් කරගන්න වාගේම, සාර්ථක කරගන්න පුළුවන් කියලා.

ඒ වාගේම, මතු වෙච්ච තවත් කරුණු කිහිපයකට මම කෙටියෙන් පිළිතුරු ලබා දෙන්නම්. විවිධ රටවල රැකියා කරන ශ්‍රී ලාංකිකයන්ට සමාජ ආරක්ෂණ අරමුදල ලැබෙන්නේ නැහැ. උදාහරණයක් විධියට ගත්තොත්, සයිප්‍රසයේත් මේ ප්‍රශ්නය මතු වුණා. ඒ රටේ වැඩ කරපු අපේ ලාංකිකයන්ට ඒ සමාජ ආරක්ෂණ අරමුදල ලැබෙන්නේ නැති ප්‍රශ්නය කාලයක් තිස්සේ තිබෙනවා. ඒ සඳහා අපි සයිප්‍රස් ආණ්ඩුවත් එක්ක අවබෝධතා ගිවිසුමකට යා යුතුව තිබෙනවා. අපි ඉදිරියේදී ඒ කටයුත්ත සාර්ථක කරගන්න බලාපොරොත්තු වෙනවා. දැනටමත් අපි ඒ කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා. ඒ පිළිබඳව ඉන්දියාවත් එක්ක අපි එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. ඉන්දියාවේ විවිධ ආයතනවල වැඩ කරන ශ්‍රී ලාංකිකයන්ට වැඩ කරන කාලය තුළ හිමි වන ඒ සමාජ ආරක්ෂණ අරමුදල් ඔවුන් එම රැකියාවෙන් ඉවත් වෙලා ලංකාවට එනකොට ලබා ගන්න අවශ්‍ය ඒ MoU එක ඉදිරියේදී අපි අත්සන් කරලා අවසන් කරනවා. දැනට ඒකට එකඟතාව ලැබිලා තිබෙනවා. එතැනින් පටන් අරගෙන සයිප්‍රසය සහ අනෙකුත් රටවල වැඩ කරන ශ්‍රී ලාංකිකයන්ට දැනට නොලැබෙන ඒ සමාජ ආරක්ෂණ අරමුදල ලබා ගන්න පියවරෙන් පියවර කටයුතු කරන්න අපි සූදානම් කියන පණිවුඩය මේ ගරු සභාවට ලබා දෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපට සමහර රටවලින් ලැබෙන remittances බැංකු හරහාම ලැබෙන්නේ නැහැ. ඒකට බලපාන හේතු කිහිපයක් තිබෙනවා. විවිධ රටවල විවිධ තත්ත්ව තිබෙන්නේ. උදාහරණයක් විධියට අපි මාලදිවයින ගත්තොත්, මාලදිවයිනේ වැඩ කරන ලාංකිකයන්ට බැංකු හරහා එවන්න දෙන ඩොලර් ප්‍රමාණය සීමාසහිතයි. එතකොට අපේ ගොඩක් අය ඒ බැංකු හරහා ඩොලර් එවන්නේ නැහැ. වෙනත් ක්‍රම හරහා තමයි ඩොලර් එවන්නේ. මාලදිවයිනේ විදේශ ඇමතිවරයා ලංකාවට ආවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ මාලදිවයින් තානාපතිවරයාත් එක්ක අපි මේ ගැන සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. ඒ අනුව අපි උත්සාහ කරනවා, ඒ තත්ත්වය ඇති කර ගන්න. එතකොට අපට නිවැරදිව ඒ බැංකු යාන්ත්‍රණය හරහා මුදල් ගෙන්වා ගන්න පුළුවන්. ඒ වාගේම අනෙකුත් රටවලත් මේ තත්ත්වය තිබෙනවා. අපි කැමැතියි, අපේ ලංකාවේ බැංකු ඒ රටවල විවෘත කරන්න. නමුත් අපි කැමති වුණාටම ඒක කරන්න බැහැ. ඒ රටවල ආණ්ඩුත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන්න ඕනෑ. අපි පියවරෙන් පියවර එතැනට යන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයන් වැඩිපුර රැකියා කරන රටවල ඒවා විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, අපේ ගුවන් සේවා පුළුල් කිරීම පිළිබඳ යෝජනා ඉදිරිපත් වුණා. ඔව්, අපි ඒකට එකඟයි. දැනටමත් අපි ඒ ගැන පියවර ගනිමින් සිටිනවා. මට කියන්න සතුටුයි, පෞද්ගලික ආයතනයක් ලබන අප්‍රේල් මාසයේ මුල ඉඳලා කටුනායක සහ මලයාසියාවේ ක්වාලාලම්පූර් දක්වා ගුවන් සේවයක් ආරම්භ කරන බව. ඒ අනුව පෞද්ගලික අංශය හරහා හෝ මේ කටයුත්ත ඉෂ්ට කර ගැනීමේ වැඩ පිළිවෙළ පටන්ගෙන තිබෙනවා.

ඒ වාගේම හෝටල් කාමර book කිරීම online හරහා වන එක දැන් ඇත්තටම එක ආයතනයක අධිකාරියකට යටත් වෙලා තිබෙනවා. අපි දැන් ඒ ගැන ලංකාවේ දේශීය සමාගම් එක්ක සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. අපි ඔවුන්ට කියලා තිබෙනවා, වෙනත් ආයතන කිහිපයක් පටන් ගනිමු කියලා. දැනට ක්‍රියාත්මක වන එකත් ලියාපදිංචි කරන්න ඕනෑ. Booking.com එක ඇත්තටම අපට ලබා දිය යුතු බදු මුදල් දැනට ලබා දෙන්නේ නැහැ. ඒගොල්ලන් විශාල ලාභයක් රටින් අරගෙන යනවා. එම නිසා ඒක වෙනස් කළ යුතුයි. මම කියන්න සතුටුයි, දැනටමත් ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන්වල ඉන්න ශ්‍රී ලාංකික කණ්ඩායමක් මේ Booking.com එක වෙනුවට තව අලුත් portal එකක් ආරම්භ කරලා තිබෙන බව. අපි ඉදිරියේදී එවැනි ඒවා දියුණු කළාම ඒ promotions හරහා ඒ තිබෙන ඒකාධිකාරිය ටිකෙන් ටික වෙනස් කරගන්න පුළුවන් කියලා අප බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, දැනට අපි රටවල් 39කට මුදල් අය කරන්නේ නැතුව වීසා පහසුකම් -free-visa facility- ලබා දෙන්න තීන්දු කරලා තිබෙනවා.

කැබිනට් මණ්ඩලය ඒක අනුමත කරලා තිබෙනවා. තවත් රටවල් කිහිපයක් එයට ඇතුළත් කිරීමේ යෝජනාවක් තිබෙනවා.

[ගරු විජිත හේරත් මහතා]

ඒකත් එක්ක ඒ ගැසට් එක හැදුවාට පසු, මේ අය වැය විවාදය අවසන් වනකොට අපි මේ පාර්ලිමේන්තුවට එය ඉදිරිපත් කරනවා. එතකොට රටවල් 40කට වැඩි ප්‍රමාණයකට ඒ free-visa facility යටතේ අපේ ලංකාවට වැඩිපුර විදේශිකයන්, සංචාරකයන් ගෙන්වා ගැනීමේ අවස්ථා ඇති වෙනවාය කියන එක මම ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අපේ රටින් රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුපක් ලබා දෙන්න කියන ඉල්ලීම පසුගිය කාලය පුරාම තිබුණා. ඒ වාගේම අපේ සංචාරක ක්ෂේත්‍රයේ නියුතු රියදුරන්, මාර්ගෝපදේශකයන් වාගේම වක්‍රව සංචාරක ක්ෂේත්‍රයේ නියුතු වන බොහෝ පිරිස වයසට ගියාම ජීවත් වෙන්න ක්‍රමයක් නැති වෙනවා. ඒ නිසා ඔවුන්ටත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදුන්වා දෙන්න කියලා යෝජනාවක් තිබෙනවා. දැනටමත් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ තිබෙනවා, සමාජ ආරක්ෂණ අරමුදල. Social Security Fund එක. ඒ අරමුදලත් එක්ක අවබෝධතා ගිවිසුමක් අපේ Foreign Employment Bureau එක දැනටමත් අත්සන් කරලා තිබෙනවා. ඒ හරහා ඇත්තටම විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා දැනටමත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් තිබෙනවා. නමුත් ඒක ගොඩක් විදේශගත ශ්‍රී ලාංකිකයන් දන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, මේ අරමුදල හරහා ස්ථාපිත කරලා තිබෙන විශ්‍රාම වැටුප් ක්‍රමයට, ඒ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට මාසිකව ඔවුන් යම්කිසි මුදලක් බැර කළාට පස්සේ, ඒ එකතු වන අරමුදලින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ලබා දෙන ක්‍රමය විධිමත් විධියට, දැනුවත් කිරීම් හරහා ශක්තිමත්ව කරන්නට. ම සංචාරක ක්ෂේත්‍රයේ සහ විදේශ රැකියාවල ඉන්න අය වෙනුවෙන් දැනටමත් අපි ආරම්භ කරලා තිබෙන ඒ විශ්‍රාම වැටුප් ලබා දීමේ ක්‍රමය තව ශක්තිමත්ව දැනුවත් කිරීම් හරහා ඒ අයට හඳුන්වා දීමට අපි පියවර ගන්නවා, ඒක ක්‍රියාත්මක කරනවා කියන එකත් මේ ගරු සභාව දැනුවත් කරන්න මම කැමැතියි.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම තානාපතිවරු පත් කිරීම පිළිබඳව තවත් කරුණක් මම මතු කරන්න කැමැතියි. ඒ ගැන දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විවේචන ඉදිරිපත් කළා. සමහර කරුණු එතුමා දන්නේ නැහැ. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ, අපේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නඟන රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන් තමයි අපි ඒවාට පත් කරන්නේ. ඒ සඳහා විදේශ සේවයෙනුත් අපි පත් කරනවා. විදේශ සේවයේ නොවුණත්, සුදුසුකම් තිබෙන අය අපි පත් කරනවා. දැනට අපි හත්දෙනෙකුගේ නම් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ, හැකියාව සහ සුදුසුකම් තිබෙන අය. එහෙම නැතුව පවුල්වල ඥාතීන්, හිතවතුන් වැනි කවුරුවත් අපි ඒවාට පත් කරන්නේ නැහැ කියන එක ඉතා වගකීමෙන් කියනවා. රාජ්‍ය නායකයාගේ නියෝජිතයා තමයි තානාපතිවරයා හෝ මහ කොමසාරිස්වරයා කියන්නේ. ඔහු ජනාධිපතිතුමාගේ නියෝජිතයා. ඒ කියන්නේ ඔහු රජයට විශ්වාස, ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන පුද්ගලයා බවට පත් වෙන්න ඕනෑ. පසුගිය කාලයේ හිටපු අය එහෙම නොවෙයි. එතුමා පාකිස්තානයේ හිටපු මහ කොමසාරිස් ගැන කථා කළා; නාවික හමුදාවේ හිටපු නිලධාරියා. ඔහු එහේ ඉඳලා ආණ්ඩුවට බණිනවා, airport එකට ඇවිල්ලා, ආණ්ඩුව විවේචනය කරනවා. ඉතින් ආණ්ඩුව විවේචනය කරන කෙනෙක් ආණ්ඩුවේ නියෝජිතයා විධියට යවන්න පුළුවන්ද? බැහැ. ඊයේ පෙරේදාත් airport එකට ඇවිල්ලා, ඒ diplomatic passport එක පාවිච්චි කරලා යන්න හැදුවාම ආපසු හරවා එව්වා. එහෙම වැරදි විධියට ඒවා භාවිත කරන අයට රජයේ නියෝජිතයා, ජනාධිපතිවරයාගේ නියෝජිතයා විධියට තවදුරටත් ඉන්න දෙන්න බැහැ. එම නිසා අපි ඒ අය කැඳෙව්වා. අපි විදේශ සේවයේ නිලධාරීන් කිහිපදෙනෙකුත් නම් කරලා තිබෙනවා. ඒ වාගේම විදේශ සේවයෙන් පිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අයත් නම් කරලා තිබෙනවා. හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා වන ජයන්ත ජයසූරිය මහත්මයා අපි New Yorkවල ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයා විධියට නම් කරලා තිබෙන්නේ. එහෙම නැතුව පවුලේ ඥාතියෙක් හෝ ඇමතිවරයාගේ, මන්ත්‍රීවරයාගේ බිරින්දෑවරු හෝ අපි පත් කරලාත් නැහැ, පත් කරන්නේත් නැහැ. අපි කවුරුත් දන්නවා, එතුමාට තිබෙන සුදුසුකම් ගැන. ඒත් එක්කම මතු වුණා, එක්සත් රාජධානියට නම් කරලා තිබෙන අපේ සේනාධීර මැතිතුමා පිළිබඳවත්.

Facebookවල, WhatsApp groupsවල මේවාට විරුද්ධව එක එක අය කරුණු ඉදිරිපත් කරනවා, ඒ අයට අවස්ථා නැති වෙනකොට. ඒ ගැන මම කනගාටු වෙන්නේ නැහැ. ඒ අය ගැන මම අනුකම්පා කරනවා. සේනාධීර මහත්මයා කියන්නේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක්. අදත් ඔහු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අනුබද්ධව වැඩ කරනවා. ඔහු ජේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙක්. ඒ විතරක් නොවෙයි, ඔහුට MSc in Public Policy තිබෙනවා, එක්සත් රාජධානියේ විශ්වවිද්‍යාලයක. ඕස්ට්‍රේලියාවේ Flinders University එකේ Master of Public Administration තිබෙනවා. ඒ වාගේම අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ පරිපාලන අධ්‍යක්ෂවරයා - Director of Administration - විධියට අවුරුදු හතරක් වැඩ කරලා තිබෙනවා. ඒ වාගේම දකුණු අප්‍රිකාවේ Minister Counsellor and Minister, acting High Commissioner විධියට වැඩ කරලා තිබෙන කෙනෙක්. ඔහු පළපුරුද්ද තිබෙන කෙනෙක්. එහෙම කෙනෙක් ගැන තමයි අර විධියට උපහාසයට ලක් කළේ. අපි සුදුසුකම් තිබෙන අය තමයි නම් කරලා තිබෙන්නේ. ඒ වාගේම අපි රටවල් හතකට -වැඩිය නොවෙයි, හතකට- එහෙම නම් කරලා තිබෙනවා. ඒ සියලුදෙනා ඉතාම සුදුසු, රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනු කරගන්න පුළුවන්, නව රජයේ ප්‍රතිපත්ති ඒ රටවල් එක්ක ක්‍රියාවට නඟන්න පුළුවන්, රටේ ආර්ථික, දේශපාලන අභිවෘද්ධිය වෙනුවෙන් වැඩ කරන්න හැකියාව තිබෙන, දක්ෂතාව තිබෙන අය.

ඒ වාගේම මගේ පෞද්ගලික ලේකම්වරයා ගැනත් කරුණු ඉදිරිපත් කළා. ඇත්තටම ඔහුට විරුද්ධව කිසිදු චෝදනාවක් ඉදිරිපත් වෙලා නැහැ. නමුත් කුමන්ත්‍රණකාරී විධියට එක්කෙනෙක් දෙන්නෙක් මේ ප්‍රශ්නය මතු කරලා තිබෙනවා. ඒක මාධ්‍ය හරහා ප්‍රචාරය කරනවා. දකුණු අප්‍රිකාවේ සහ කෙන්යාවේ හිටපු මහ කොමසාරිස්වරයා තමයි මගේ පෞද්ගලික ලේකම්. වයස අවුරුදු 65යි, ඒක ඇත්ත. ඔහුට අත්දැකීම් තිබෙනවා. හැබැයි ඔය කියන ආකාරයේ කිසිදු චෝදනාවක් ඔහුට ඉදිරිපත් කරලා නැහැ. මාධ්‍යවලින් එහෙම ඒවා හඳනවා. ඇත්තටම ඒවා හදන්නේ කවුද කියලාත් මම දන්නවා. හැබැයි මම තවම ඒකට ක්‍රියාමාර්ග අරගෙන නැහැ. කුමන්ත්‍රණකාරී විධියට මේ රජය අපහසුතාවට පත් කරන්න එක්කෙනෙක් දෙන්නෙක් උත්සාහ කරනවා. ඒවාට මම සැලෙන්නේත් නැහැ, කේන්ති ගන්නේත් නැහැ. ඒකත් කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, සංචාරක කර්මාන්තය නඟා සිටුවීම ගැන කථා කරනකොට, දැනට අපට සංචාරක කලාප 26ක් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ඒක තව පුළුල් කරමින් තවත් සංචාරක කලාප 6ක් මේ වසර තුළ අලුතින් ඇති කරන්න. ඇත්තටම සමහර ප්‍රදේශ සංචාරක කලාප විධියට ගැසට් කළාට, නම් කළාට, ඊට අදාළ නිර්ණායක සහිත ගැසට් නිකුත් වෙලා නැහැ. කලාප විධියට නම් කළ පමණින් ඒ බලාපොරොත්තු වූ කාරණා ඉටු වෙන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා ඒ කටයුතු සම්පූර්ණ කරලා ඇත්තටම මහ පොළොවේ ක්‍රියාත්මක වෙන සංචාරක කලාප කිහිපයක්ම පිහිටුවන්න. ඉතා කෙටි

කාලයකින් අපි අලුතින් සංචාරක කලාප 6ක් පිහිටුවනවා. දැනට ඒ සඳහා ලංකාවේ අපි තෝරා ගත්ත ස්ථාන 100ක් විතර තිබෙනවා. ඇත්තටම ගත්තොත් 100ට වඩා වැඩියි, දහස් ගණනක් තිබෙනවා. නමුත් අපේ Budget එකේ තිබෙන මූල්‍ය ප්‍රතිපාදන අනුව ක්‍රමානුකූලව මුදල් වෙන් කරමින් තමයි ඒ කටයුත්ත ඉස්සරහට ගෙනියන්න වෙන්නේ. මේ විධියට සංචාරක කර්මාන්තය පුළුල් වෙනකොට ඒ සඳහා අවශ්‍ය සේවකයන් පුහුණු කිරීම සඳහා අපේ ඉලක්කයක් තිබෙනවා. මේ අවුරුද්ද තුළ අලුතින් 6,060දෙනෙක් පුහුණු කරන්නත්, පළාත් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් ආයතන පිහිටුවන්නත් අපි සැලසුම් කරලා තිබෙනවා. පළමුවෙනි පියවර විධියට මුලින් පළාත් කිහිපයක පටන් ගන්නවා. විශේෂයෙන් අපි උතුරු පළාතේ සහ යාපනයේ පටන් ගන්නවා. ඒ වාගේම නැඟෙනහිර පළාතේ මඩකලපුවේ දැනටමත් කොරියානු ආධාර යටතේ එවැනි වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. ඒක තවත් පුළුල් කරලා අපේ සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය හරහා ඒ කටයුතු තව ශක්තිමත් කරන්නත් අපි පියවර ගනිමින් සිටිනවා.

දිස්ත්‍රික්ක මට්ටමට ගියාම, සංචාරක ක්ෂේත්‍රයේ කටයුතු අපේ ඉලක්කවලට යන්න පුළුවන් ආකාරයට ශක්තිමත් වෙනවා. අපේ බලාපොරොත්තුව තිබෙන්නේ community-based tourism industry එකක්. ඒ කියන්නේ හෝටල් ආශ්‍රිත සංචාරක කර්මාන්තය කියන එකෙන් පිටට ඇවිල්ලා, ගමේ සාමාන්‍ය ජනතාව සංචාරක කර්මාන්තයත් එක්ක ඓන්ද්‍රියව බැඳිලා ඉන්න ක්‍රමයක් හදන්නයි. අපි එහි model experiment එකක් කරලා තිබුණා, කන්තලේ. ඒ, කොරියානු ආධාර යටතේ. ඒක ඉතාම සාර්ථකයි. ඒ එන විදේශිකයා, සංචාරකයා ගමේ සාමාන්‍ය අය අත්ට්‍රැක්ටරයේ - ලැන්ඩ්මාස්ටර් එකේ- තියාගෙන කුඹුරු මැදින් අරගෙන ගිහිල්ලා, ගොයම් පාගන හැටි, කුඹුරු හාන හැටි පෙන්වලා දෙන, ගමේ සංස්කෘතියත් එක්ක බද්ධ වෙන සංචාරක කර්මාන්තයක් අපි ඇති කළ යුතුයි. ඒ විධියට මුළු රටම සම්බන්ධ කර ගත්ත සංචාරක කර්මාන්තයක් විධියට ඉස්සරහට කටයුතු කරන්න තමයි අපි ඉලක්ක කරගෙන යන්නේ. එහි විවිධ ක්ෂේත්‍ර තිබෙනවා. ඒ විවිධ ක්ෂේත්‍ර ඉලක්ක කර ගත්ත තැනකට අපි යන්න ඕනෑ. මේ ආරම්භය පමණයි. මාස දෙකෙන් තුනෙන්, එක රැයින් මේවා ඔක්කෝම කරන්න බැහැ. අපි මේවා පටන් ගන්නේ යම්කිසි දැක්මක් ඇතිව.

විශේෂයෙන් සංචාරක කර්මාන්තය නහා සිටුවන්න අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, සම්බන්ධීකරණය. දැන් සීගිරිය ගැන කථා කළා. සීගිරිය අයිති සංස්කෘතික අරමුදලට. සංස්කෘතික අරමුදල සංචාරක අමාත්‍යාංශයෙන් බැහැරව තිබෙන්නේ. මේ දෙක කොහොමද ඒකාබද්ධ කරන්නේ? යාල වනෝද්‍යානයට සංචාරකයන් යනකොට එතැන ටිකට් දෙන්නේ Wildlife Conservation Department එකෙන්, සංචාරක අමාත්‍යාංශයෙන් නොවෙයි. හැබැයි එතැන පෝලිම් ගැහිලා ඉන්නකොට අපට විවේචන එනවා, ''අන්න පෝලිම් ගැහිලා, යන්න විධියක් නැහැ'' කියලා. එවැනි ප්‍රශ්නයක් තිබෙනවා, අපි ඒක හඳුනාගෙන තිබෙනවා.

ඒ නිසාම අපි යෝජනා කරන්නේ මෙයයි. අපි විවිධ අමාත්‍යාංශවලට අදාළ ආයතන 18ක් විතර මූලික වශයෙන් හඳුනාගෙන තිබෙනවා. සංචාරක පොලීසිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය ඒ වාගේම අදාළ පළාත්වල ඒ ඒ පළාත් පාලන ආයතන වාගේ ආයතන 18ක් ඒකාබද්ධ කරපු ජාතික සංචාරක කොමිසම අපි පිහිටුවනවා. ජාතික සංචාරක කොමිසම පිහිටුවලා ඒ සංචාරක කලාප, ඒ ප්‍රදේශ ඉලක්ක කරලා, ප්‍රාදේශීය සංචාරක සංවර්ධන කමිටු පිහිටුවන්න කටයුතු කරනවා. එතකොට ඒ සංචාරක කමිටු මඟින් ඒ කලාපය තුළ ඇතිවන ප්‍රශ්න විසඳන්නත්, සංවර්ධන කටයුතුවලට මැදිහත් වෙන්නත් පුළුවන්. ඒකට දැනට නීත්‍යානුකූල බලයක් නැහැ. දැනට තිබෙන්නේ 2005දී සම්මත වුණු සංචාරක පනත. අපි ඒක සංශෝධනය කරලා මේ කියන අලුත් නීතිමය තත්ත්වය ගෙනෙන්න දැනටමත් කැබිනට් මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඒ සඳහා කමිටුවක් පත් කරලා ඒ අදාළ පනත අලුතින් සම්මත කර ගන්නාට පස්සේ අපට පුළුවන්, සංචාරක කර්මාන්තයට සියලු අමාත්‍යාංශ ඒකාබද්ධ කරගත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. ඒ ඉලක්කය හරහා තමයි අපි බලාපොරොත්තු වෙන්නේ රටම සංචාරක කලාපයක් බවට පරිවර්තනය කරන්න.

ගරු සභාපතිතුමනි, මම වැඩිය වේලාව ගන්නේ නැහැ. අද මතු වෙච්ච කරුණු කිහිපයට තමයි පිළිතුරු ලබා දුන්නේ.

ගරු සභාපතිතුමනි, විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ මේ විවාදයට සම්බන්ධ වෙච්ච ආණ්ඩු පක්ෂයේ, විරුද්ධ පක්ෂයේ සියලු ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා. මම තනියෙන් මේ සියල්ල කරනවා නොවෙයි. මගේ නියෝජ්‍ය අමාත්‍යවරුන් දෙන්නා, අපේ ආණ්ඩුව, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය, අමාත්‍යාංශයේ නිලධාරි මහත්ම, මහත්මීන් ඒ සියලු දෙනාගේම ඇපවීම, කැපවීම, ඒ මැදිහත්වීම තුළින් තමයි මේ සාර්ථකත්වයට යන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ. ඒ නිසා අපි පටන් ගත් ආරම්භය, මේ යොදපු පදනම ඉතා ශක්තිමත් පදනමක්. ඒ පදනම අපි නිවැරැදිව දැන් යොදලා තිබෙනවා. ඒ foundation එක මත බිත්ති ටික හරියට බැඳලා, ඒ මත හරියට වහල ගැහුවාම මුළුපරස් ඇති වෙන්නේ නැහැ. එතකොට වහල ඇද වෙන්නේ නැහැ. අපට ඒ විශ්වාසය තිබෙනවා. අපේ අමාත්‍යාංශය ජාත්‍යන්තර වශයෙනුත්, ජාතික වශයෙනුත් රටේ අභිවෘද්ධිය වෙනුවෙන්, මුළු මහත් ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන්න උපරිමයෙන් කැප වෙනවා, සහතික වෙනවා කියමින් මේ විවාදයට සහභාගි වූ සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

"112 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන ව්‍යයදම් සඳහා රු. 1,190,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

112 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන ව්‍යයදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන ව්‍යයදම, රු. 61,000,000

"112 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන ව්‍යයදම් සඳහා රු. 61,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

112 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන ව්‍යයදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන ව්‍යයදම, රු. 18,217,000,000

"112 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන ව්‍යයදම් සඳහා රු. 18,217,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

112 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන ව්‍යයදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,995,000,000

"112 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 1,995,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

112 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලෙප්පු 112, නිකළ්ච්සිත්තිට්ටම් 01, මීන්ඩුවරුඤ් සෙලවුක්කාන රූපාය් 1,190,000,000 අට්ටවණෙයිට් චේර්ක්කප් පඩුමාක" එනුම් වීනා විඩුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 112, නිකළ්ච්සිත්තිට්ටම් 01, මීන්ඩුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

නිකළ්ච්සිත්තිට්ටම් 01.- සෙයල්මුරෙච් සෙයර්පාඩුකළ් - මූලතනච් සෙලවු, රූපාය් 61,000,000

"තලෙප්පු 112, නිකළ්ච්සිත්තිට්ටම් 01, මූලතනච් සෙලවුක්කාන රූපාය් 61,000,000 අට්ටවණෙයිට් චේර්ක්කප්පඩුමාක" එනුම් වීනා විඩුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 112, නිකළ්ච්සිත්තිට්ටම් 01, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

නිකළ්ච්සිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් සෙයර්පාඩුකළ් - මීන්ඩුවරුඤ් සෙලවු, රූපාය් 18,217,000,000

"තලෙප්පු 112, නිකළ්ච්සිත්තිට්ටම් 02, මීන්ඩුවරුඤ් සෙලවුක්කාන රූපාය් 18,217,000,000 අට්ටවණෙයිට් චේර්ක්කප් පඩුමාක" එනුම් වීනා විඩුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 112, නිකළ්ච්සිත්තිට්ටම් 02, මීන්ඩුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

නිකළ්ච්සිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් සෙයර්පාඩුකළ් - මූලතනච් සෙලවු, රූපාය් 1,995,000,000

"තලෙප්පු 112, නිකළ්ච්සිත්තිට්ටම් 02, මූලතනච් සෙලවුක්කාන රූපාය් 1,995,000,000 අට්ටවණෙයිට් චේර්ක්කප්පඩුමාක" එනුම් වීනා විඩුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 112, නිකළ්ච්සිත්තිට්ටම් 02, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 1,190,000,000, for Head 112, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 112, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 61,000,000

Question, "That the sum of Rs. 61,000,000, for Head 112, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 112, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 18,217,000,000

Question, "That the sum of Rs. 18,217,000,000, for Head 112, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 112, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,995,000,000

Question, "That the sum of Rs. 1,995,000,000, for Head 112, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 112, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු සභාපතිතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතු යයිද" මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අ. භා. 5.50ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.
කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 17 වන සඳුදා.
பி. ப. 5.50 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.
குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 மார்ச் 17, திங்கட்கிழமை.
At 5.50 p.m.,the Chairman left the Chair to report Progress.
Committee report Progress; to sit again on Monday, 17th March, 2025.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform the House that Head 112 has been considered and passed without Amendments in the Committee.

Item Nos. 2 to 6 of today's Order Paper to be moved by the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය: වාර්ෂික වාර්තාව (2021)
இலங்கை சுற்றுலா மற்றும் ஹோட்டல் முகாமைத்துவ நிறுவகம்: வருடாந்த அறிக்கை (2021)
SRI LANKA INSTITUTE OF TOURISM AND HOTEL MANAGEMENT: ANNUAL REPORT (2021)

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

Hon. Deputy Speaker, I move,

"That the Annual Report of the Sri Lanka Institute of Tourism and Hotel Management 2021 together with the observations of the Auditor-General for the year ended 31.12.2021 and presented on 08.09.2023 under Section 33 of the Tourism Act, No. 38 of 2005, be approved.

(Considered by the Sectoral Oversight Committee on National Economic and Physical Plans on 18.06.2024 and presented its report to Parliament on 08.08.2024)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය: වාර්ෂික වාර්තාව (2021)
இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபை: வருடாந்த அறிக்கை (2021)
SRI LANKA TOURISM DEVELOPMENT AUTHORITY: ANNUAL REPORT (2021)

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sir, I move,

"That the Annual Report of the Sri Lanka Tourism Development Authority 2021 together with the observations of the Auditor-General for the year ended 31.12.2021 and presented on 22.03.2024 under Section 20(2) of the Tourism Act, No. 38 of 2005, be approved.

(Considered by the Sectoral Oversight Committee on National Economic and Physical Plans on 18.06.2024 and presented its report to Parliament on 08.08.2024)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල: වාර්ෂික වාර්තාව (2021)
இலங்கை சுற்றுலா அபிவிருத்தி நிதியம்: வருடாந்த அறிக்கை (2021)
SRI LANKA TOURISM DEVELOPMENT FUND: ANNUAL REPORT (2021)

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sir, I move,

"That the Annual Report of the Sri Lanka Tourism Development Fund 2021 together with the observations of the Auditor-General for the year ended 31.12.2021 and presented on 22.03.2024 under Section 23(4) of the Tourism Act, No. 38 of 2005, be approved.

(Considered by the Sectoral Oversight Committee on National Economic and Physical Plans on 18.06.2024 and presented its report to Parliament on 08.08.2024)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය: වාර්ෂික වාර්තාව (2021)
இலங்கை சுற்றுலா ஊக்குவிப்புப் பணியகம்: வருடாந்த அறிக்கை (2021)
SRI LANKA TOURISM PROMOTION BUREAU: ANNUAL REPORT (2021)

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sir, I move,

"That the Annual Report of the Sri Lanka Tourism Promotion Bureau 2021 together with the observations of the Auditor-General for the year ended 31.12.2021 and presented on 09.02.2024 under Section 40(1) of the Tourism Act, No. 38 of 2005, be approved.

(Considered by the Sectoral Oversight Committee on National Economic and Physical Plans on 18.06.2024 and presented its report to Parliament on 08.08.2024)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය: වාර්ෂික වාර්තාව (2022)
இலங்கை சுற்றுலா ஊக்குவிப்புப் பணியகம்: வருடாந்த அறிக்கை (2022)
SRI LANKA TOURISM PROMOTION BUREAU: ANNUAL REPORT (2022)

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sri, I move,

"That the Annual Report of the Sri Lanka Tourism Promotion Bureau 2022 together with the observations of the Auditor-General for the year ended 31.12.2022 and presented on 07.05.2024 under Section 40(1) of the Tourism Act, No. 38 of 2005, be approved.

(Considered by the Sectoral Oversight Committee on National Economic and Physical Plans on 18.06.2024 and presented its report to Parliament on 08.08.2024)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.52ට, 2025 පෙබරවාරි 21වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 17වන සඳුදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி, பி.ப. 5.52 மணிக்கு பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 17, திங்கட்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 5.52 p.m. until 9.30 a.m. on Monday, 17th March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 15 වන කලාපය
தொகுதி 318 - இல. 15
Volume 318 - No. 15

2025 මාර්තු 17වන සඳුදා
2025 மார்ச் 17 , திங்கட்கிழமை
Monday, 17th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 17වන සඳුදා
2025 மார்ச் 17 , திங்கட்கிழமை
Monday, 17th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [පිටුව 2629]

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව [පිටුව 2629]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [පිටුව 2631]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 2632-2643]

ආංශික අධීක්ෂණ කාරක සභා [පිටුව 2643]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [විසිදෙවන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 101, 201-209 (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු); ශීර්ෂ 160, 283, 284, 291, 294, 322 (පරිසර)] - කාරක සභාවේදී සලකා බලන ලදී [පිටු 2645-2803]

ගාලු උරුමය පදනම:
වාර්ෂික වාර්තාව (2021) [පිටුව 2803]

කල්තැබීමේ යෝජනාව:
නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව [පිටු 2804-2816]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 2629]

பட்டலந்த வீடமைப்புத் திட்டத்தில் உள்ள சித்திரவதைக் கூடங்கள், சட்டரீதியற்ற தடுப்பு நிலையங்களை நிறுவுதல், பராமரித்தல் ஆகியவற்றை விசாரணை செய்த ஆணைக்குழுவின் அறிக்கை [ப: 2629]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 2631]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2632-2643]

துறைசார் மேற்பார்வைக் குழுக்கள் [ப: 2643]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட இருபத்திரண்டாம் நாள்]:
[தலைப்புக்கள் 101, 201- 209 (புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள்); தலைப்புக்கள் 160, 283, 284, 291, 294, 322 (சுற்றாடல்)] – குழுவில் ஆராயப்பட்டது [ப: 2645-2803]

காலி மரபுரிமை மன்றம்:
வருடாந்த அறிக்கை (2021) [ப: 2803]

ஒத்திவைப்புப் பிரேரணை:
புதிய அரசியலமைப்பு வரைவொன்றின் அவசியம் [ப: 2804-2816]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Value Added Tax (Amendment) Bill: Petition to the Supreme Court [Col. 2629]

Report of the Commission of Inquiry into the Establishment and Maintenance of Places of Unlawful Detention and Torture Chambers at the Batalanda Housing Scheme [Col. 2629]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 2631]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2632-2643]

SECTORAL OVERSIGHT COMMITTEES [Col. 2643]

APPROPRIATION BILL, 2025 - [Twenty-second Allotted Day]:
Considered in Committee - [Heads 101, 201-209 (Buddhasana, Religious and Cultural Affairs); Heads 160, 283, 284, 291, 294, 322 (Environment)] [Cols. 2645-2803]

GALLE HERITAGE FOUNDATION:
Annual Report (2021) [Col. 2803]

ADJOURNMENT MOTION:
Necessity of Drafting a New Constitution [Cols. 2804-2816]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 17වන සඳුදා
2025 மார்ச் 17, திங்கட்கிழமை
Monday, 17th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
VALUE ADDED TAX (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මාර්තු 14 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සමට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "එකතු කළ අගය මත බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් 2025 මාර්තු 15 දින මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

II

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව
பட்டலந்த வீடமைப்புத் திட்டத்தில் உள்ள சித்திரவதைக் கூடங்கள், சட்டரீதியற்ற தடுப்பு நிலையங்களை நிறுவுதல், பராமரித்தல் ஆகியவற்றை விசாரணை செய்த ஆணைக்குழுவின் அறிக்கை
REPORT OF THE COMMISSION OF INQUIRY INTO THE ESTABLISHMENT AND MAINTENANCE OF PLACES OF UNLAWFUL DETENTION AND TORTURE CHAMBERS AT THE BATALANDA HOUSING SCHEME

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, 2025 මාර්තු 14 දින ගරු ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් සිදු කරන ලද අමාත්‍යාංශ නිවේදනය අතරතුර සභාගත කරන ලද "බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව" මුද්‍රණය කරන ලදුව, ඔබගේ පරිශීලනය සඳහා සභා මේසය මත තබා ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සඳහන් කළ යුතු විශේෂ කාරණයක් නිබෙනවා. අද දවසේ අපොස (සාමාන්‍ය පෙළ) විභාගය ආරම්භ වෙනවා. එම විභාගයට මුහුණ දෙන සියලු දරුවන්ට මම මේ වෙලාවේ ආණ්ඩුව වෙනුවෙන් සුබ පතනවා.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක Point of Order එකක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේ වෙලාවේ මටත් අවස්ථාවක් දෙන්න. අද දවසේ අපොස (සාමාන්‍ය පෙළ) විභාගයට මුහුණ දෙන අප රටේ ජනතාවගේ ලක්ෂ සංඛ්‍යාත දූ දරුවන්ට සාර්ථක ලෙස එම විභාගයට මුහුණ දී, සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට හැකියාව ලැබේවා කියා මගේ ප්‍රාර්ථනාත් එකතු කරනවා.

ස්තුතියි.

අමාත්‍යාංශගීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශගීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමිය වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැහෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැහෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2023 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කොළඹ 14, මුස්තාපා ගොඩනැඟිල්ල, තුන්වැනි මහල, තානාපති ආරක්ෂක කොට්ඨාසය යන ලිපිනයෙහි පදිංචි එම්.කේ. දේවප්‍රිය මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දොඩන්දුව, කරාවෙගොඩ, 65 කණුව අසල යන ලිපිනයෙහි පදිංචි සුදත්ති මිරන්දා සමරනායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රාගම, තුඩුවේගෙදර, තල්ගස්වල පාර, අංක 600/3 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්. හෙට්ටිආරච්චි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගම්පහ, ඉඳිගොල්ල, අංක 74/7 ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.ආර්.ඒ. මොරායස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු කථානායකතුමනි, වත්තල, හුණුපිටිය, නන්දන මාවත, 'ශ්‍යාමලී', අංක 382/3 දරන ස්ථානයෙහි පදිංචි භික්කඛුවගේ ජීව ඉන්දික ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -483/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -493/2025- (1), ගරු පද්මසිරි බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

"තේ ශක්ති" අරමුදල: විස්තර
"தே சக்தி" நிதியம்: விபரம்
"TEA SHAKTHI" FUND: DETAILS

504/2025

3. ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'තේ ශක්ති' අරමුදල පිහිටුවන ලද වර්ෂය කවරේද;

(ii) එම අරමුදලේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අරමුදලේ මේ වන විට ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම අරමුදල් යොදා ගනිමින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) "தே சக்தி" நிதியம் தாபிக்கப்பட்ட வருடம் யாது;

(ii) மேற்படி நிதியத்தின் அங்கத்தவர்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி நிதியத்தில் தற்போது காணப்படும் நிதியின் அளவு யாது;

(iv) மேற்படி நிதியைப் பயன்படுத்தி எதிர்காலத்தில் நடைமுறைப்படுத்துவதற்குத் திட்டமிடப்பட்டுள்ள வேலைத்திட்டங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House of the -

(i) year in which the "Tea Shakthi" Fund was established;

(ii) total number of members in the said Fund;

(iii) current amount of funds available in the said Fund; and

(iv) programmes that have been planned to be implemented in the future using these funds?

(b) If not, why?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2000 වර්ෂයේදී තේ ශක්ති අරමුදල ස්ථාපනය කරන ලදී.

(2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත මඟින්)

(ii) තේ ශක්ති සාමාජිකයන් 140,000ක් පමණ වේ.

තේ ශක්ති කොටස් සාමාජිකයන් 94,425ක් වේ.

(iii) අරමුදලේ 2025.02.01 දින වනවිට ඇති අරමුදල් ප්‍රමාණය

ස්ථාවර තැන්පතු වටිනාකම -රු. 439,133,111.00

බැංකු ශේෂය -රු. 12,714,506.31

මුළු අරමුදල් ප්‍රමාණය -රු. 451,847,617.31

(iv)

- මිලියන 208ක් වූ තේ ශක්ති කොටස් හිමියන්ගේ කොටස් වගකීම් නිදහස් කිරීම.
- මිලියන 135ක් වූ තේ ශක්ති සුබ සාධන රක්ෂණ අරමුදල ගොඩනැඟීම තුළින් කුඩා තේ වතු හිමියන් වෙත මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන සුබ සාධන රක්ෂණ ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- මිලියන 33ක තේ ශක්ති බදු/කළමනාකරණ ගැනුම්කරුවන් විසින් රඳවා ඇති ආරම්භක තැන්පතු මුදල් අවශ්‍ය අවස්ථාවලදී නිදහස් කිරීම.
- ඉතිරි අරමුදල් කුඩා තේ වතු හිමියන් විසින් ඉදිරිපත් කර ඇති අදහස් හා යෝජනා අනුව තේ නැවත වගා කිරීම සඳහා සහනදායී පොලී අනුපානික යටතේ චක්‍රීය ණය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය.

(ආ) අදාළ නොවේ.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, තේ ශක්ති අරමුදල කිසිදු කළමනාකරණයකින් තොරව අවභාවිත වෙච්ච විධියක් තමයි අපට මේ විගණන වාර්තා අනුව පෙනෙන්නේ. තේ ශක්ති අරමුදල කියන්නේ කුඩා තේ වතු හිමියන්ගේ ලේ, දහඩිය, කඳුළු එකතු කරලා හදපු එකක්. කුඩා තේ වතු හිමියෝ ඒ ධනය එකතු කළේ අව්වට වේළිලා; වැස්සට තෙමිලා; කූඩැල්ලෝ කාලා. එවැනි අනේකවිධ දුක්ඛ දෝමනස්සවල එකතුවක් තමයි මේ තේ ශක්ති අරමුදල කියන්නේ. හැබැයි, මේ විගණන වාර්තා බැලුවාම අපට පෙනෙනවා, කිසිදු කළමනාකරණයකින් තොරව තමයි කටයුතු කරලා තිබෙන්නේ කියලා. ඒ නිසා අපි අහන්නේ තේ ශක්ති අරමුදල අවභාවිත වීම වළක්වන්න ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලායි, ගරු ඇමතිතුමනි.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මම මුලින් පැහැදිලි කළා වාගේ, තේ ශක්ති අරමුදල 2000 වසරේ තමයි ආරම්භ වුණේ. එය 2008 වසර වෙනකල් ලාභ ලබා තිබෙනවා. හැබැයි, මේ අරමුදල ආරම්භ කරන්න මූලික වශයෙන් භාණ්ඩාගාරය විසින් මහ ජනතාවගේ බදු මුදලින් රුපියල් මිලියන 437ක් යොදවා තිබෙනවා. ඊට පසුව කොටස් හිමියන්ගෙන් ප්‍රාග්ධනය ලෙස රුපියල් මිලියන 209ක් අරගෙන තිබෙනවා. ඊටත් පසුව තේ ශක්ති සාමාජිකයන්ගේ දායකත්වයෙන් රක්ෂණ අරමුදල නමින් තව රුපියල් මිලියන

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

135ක් අරගෙන තිබෙනවා. ඒ අනුව මූලිකව මේ වැඩේ පටන් ගන්න රුපියල් මිලියන 781ක් යොදවා තිබෙනවා. ඒ රුපියල් මිලියන 781 වියදම් කරමින් 2008 වසර දක්වා ඇවිල්ලා තිබෙනවා; එය ලාභ ලබන තත්ත්වයක තිබිලා තිබෙනවා.

හැබැයි, 2008 වසරෙන් පසුව මේ අරමුදල පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ අනුව තමයි අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් පරිදි ඒ ආකාරයට කටයුතු කර තිබෙන්නේ. ඔබතුමා කියපු කාරණා බොහොමයක් නිවැරදියි, ගරු මන්ත්‍රීතුමනි. මේ සම්බන්ධයෙන් නිසි කළමනාකරණයක් තිබිලා නැහැ. යම් යම් වංචා, දූෂණ සිදු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග අරගෙන නැති බව එවකට විගණන වාර්තා අනුව පෙනෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් යම් විමර්ශනයක් කරලා අදාළ ක්‍රියාමාර්ග ගන්න.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(මාණ්පුමිකු නිෂාන්ත පෙරේරා)
(The Hon. Nishantha Perera)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, තේ ශක්ති අරමුදල යටතේ කුඩා තේ වතු හිමියන්ගේ තේ කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් තිබුණා. නමුත් විගණන වාර්තා අනුව පෙනී යන පරිදි මේ වනවිට තේ ශක්ති අරමුදල යටතේ පාලනය වන කර්මාන්තශාලා ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. එම කර්මාන්තශාලාවලින් සමහර ඒවා බදු දීලා තිබෙනවා. එසේ බදු දුන් ඒවාට බදු මුදල් ලැබෙන්නේත් නැහැ. ගරු ඇමතිතුමනි, ඒ තුළත් විශාල අවභාවිතාවක් සිද්ධ වෙනවා. ඇත්තටම තේ ශක්ති අරමුදල යටතේ එසේ එම කර්මාන්තශාලා පාලනය වීම කුඩා තේ වතුහිමියන්ට තිබුණු හොඳ දෙයක්. හැබැයි, පසුගිය කාලයේ සිටි පාලකයන් විසින් ගත් තීන්දු තීරණ නිසා එම කර්මාන්තශාලාවලින් දැවැන්ත ප්‍රමාණයක් පාඩු ලබන තත්ත්වයට පත් වී තිබෙනවා. අපි දන්නවා, අපේ ගම් පළාත්වලත් තේ කර්මාන්තශාලා තිබෙන බව. විශේෂයෙන්ම ගිලීමලේ ප්‍රදේශයේ තිබෙන කර්මාන්තශාලාවත් පාඩු ලබනවා. හැබැයි, එම පුද්ගලයන් කර්මාන්තශාලාව පවත්වාගෙන යනවා. ඒ බදු මුදල් දෙන්නේත් නැහැ. ගරු ඇමතිතුමනි, මේ තේ කර්මාන්තශාලාවලට ඉදිරියේදී මොකක්ද වෙන්නේ? ඒවාට සිදු කර තිබෙන මේ විනාශය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(මාණ්පුමිකු කේ.වී. සමන්ත විත්‍යාරත්න)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු මන්ත්‍රීතුමනි, "තේ ශක්ති" අරමුදල සතුව තිබුණු තේ කර්මාන්තශාලා 12ක් අපි එන්නට පෙරාතුව අතුරු බදු දීම් සිදු කර තිබෙනවා. ඒ බදු දීපු කර්මාන්තශාලා 12න් පසුගිය පෙබරවාරි පළමුවෙනි දා වෙනකොට බදු මුදල් ලෙස රුපියල් මිලියන 451ක් අය කරගෙන තිබෙනවා. ඒ අනුව තමයි ඔබතුමාගේ මුල් ප්‍රශ්නයේ (අ) (iii) කොටසට පිළිතුර ලෙස මම කිව්වේ, රුපියල් මිලියන 451ක් දැනට අරමුදලේ තිබෙනවා කියලා. මේ මුදල, ඒ කර්මාන්තශාලා බදු දීලා දැනට එකතු කර ගත්ත මුදල. නැත්නම්, මේක බින්දුවට වැටුණු අරමුදලක් බවට තමයි පත් වෙලා තිබුණේ. දැන් මේ රුපියල් මිලියන 451ක මුදලක් හරි තිබෙන්නේ බදු දීලා බදුකරුවන්ගෙන් එකතු කර ගත්ත මුදල්. ඔබතුමා කිව්වා වාගේ සමහර කර්මාන්තශාලාවල බදු අඛණ්ඩව ගෙවීවේ නැති බව පෙනී යනවා. අපි ඔවුන් සමඟ සාකච්ඡා කරලා බදු ගෙවන්න අදාළ දැනුම් දීම් කරලා තිබෙනවා. මොකද, ව්‍යාපාරයක් කරගෙන යන නිසා. සමහරු බදු ගෙවන්න පටන් අරගෙන තිබෙනවා. නැත්නම් ඉදිරියේදී අනිවාර්යයෙන් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග අරගෙන ව්‍යාපාර කරගෙන යන්න පුළුවන් අයට ඒවා දෙන්න බලාපොරොත්තු වෙනවා. කොහොම නමුත්, අපි "තේ ශක්ති" අරමුදල සම්බන්ධයෙන් සමාලෝචනයක් කරලා ඉදිරි පියවරක් ගන්න බලාපොරොත්තු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

සණස සංවර්ධන බැංකුව: "උත්තමාචාර" ණය යෝජනා ක්‍රමය
சணச அபிவிருத்தி வங்கி: "உத்தமாசார" கடன் திட்டம்
SANASA DEVELOPMENT BANK: "UTHTHAMACHARA" LOAN SCHEME

510/2025

4. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) සණස සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් වන්නේද;

(ii) සණස සංවර්ධන බැංකුව මඟින් විශ්‍රාමික හමුදා නිලධාරීන්ට "උත්තමාචාර" නමින් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබේද;

(iii) ඒ යටතේ මේ වනවිට ණය නිකුත් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මුළු ණය මුදල කොපමණද;

(iv) වර්ෂ 2020 සිට 2024 දක්වා ණය නිකුත් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මුළු ණය මුදල කොපමණද;

(v) ණය ලබා දීමේදී සැලකිල්ලට ගනු ලබන විශ්‍රාම වැටුප් ප්‍රතිශතය කොපමණද;

(vi) ණය ආපසු ගෙවීමේ අවම හා උපරිම කාල සීමාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) කොවිඩ්-19 වසංගත කාලයේදී ණය අය කර ගැනීමේ කාල සීමාව දීර්ඝ කිරීමෙන් ණය මුදලට වඩා වැඩි මුදලක් පොලිය ලෙස ගෙවීමට සිදු වී ඇති බව දන්නේද;

(ii) එම දීර්ඝ කිරීම, බැංකුවේ අභිමතය පරිදි සිදු කර ඇති බව දන්නේද;

(iii) බැංකුවේ අභිමතය පරිදි එවැනි දීර්ඝ කිරීමක් සිදු කළ හැකිද;

(iv) ඒ මඟින් අගතියට පත් වී ඇති පුද්ගලයන්ට සාධාරණය ඉටු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) சணச அபிவிருத்தி வங்கி, இலங்கை மத்திய வங்கியின் ஒழுங்குறுத்தலுக்கு உட்பட்டதா;

(ii) சணச அபிவிருத்தி வங்கிமூலம் ஓய்வுபெற்ற இராணுவ உத்தியோகத்தர்களுக்கு "உத்தமாசார" என்ற பெயரில் கடன் திட்டமொன்று அறிமுகம் செய்யப்பட்டுள்ளதா;

(iii) அதன்கீழ் இதுவரை கடன் வழங்கப்பட்டுள்ள ஆட்களின் எண்ணிக்கை மற்றும் மொத்தக் கடன் தொகை யாது;

(iv) 2020ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரை கடன் வழங்கப்பட்டுள்ள ஆட்களின் எண்ணிக்கை மற்றும் மொத்தக் கடன் தொகை யாது;

(v) கடன் வழங்கும்போது கவனத்தில் கொள்ளப்படுகின்ற ஓய்வூதிய சம்பள வீதம் யாது;

(vi) கடனை மீளச் செலுத்துவதற்கான குறைந்தபட்ச மற்றும் உச்சளவான காலஎல்லை யாது;

என்பதை அவர் தெரிவிப்பாரா?

(ஆ) (i) 'கொவிட்-19' தொற்றுக் காலத்தில் கடனை அறவிட்டுக்கொள்ளும் காலஎல்லை நீடிக்கப்பட்டதன்மூலம் கடன் தொகையைவிடவும் கூடுதலான தொகையை வட்டியாகச் செலுத்தவேண்டிய நிலை ஏற்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா;

(ii) மேற்படி காலநீடிப்பு வங்கியின் தற்றுணிவின் பேரில் மேற்கொள்ளப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா;

(iii) வங்கியின் தற்றுணிவின் பேரில் அவ்வாறு நீடிப்புச் செய்யப்பட முடியுமா;

(iv) அதன்மூலம் பாதிக்கப்பட்டுள்ள ஆட்களுக்கு நியாயம் நிலைநாட்டப்படுமா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he state -

(i) whether the SANASA Development Bank is subject to regulation of the Central Bank of Sri Lanka;

(ii) whether the SANASA Development Bank has introduced a loan scheme called "Uththamachara" for retired military officers;

(iii) the number of persons to whom loans have been issued so far under the loan scheme concerned and the total amount issued as loans ;

(iv) the number of persons to whom loans have been issued from year 2020 to 2024 and the total amount of the loans so issued;

(v) the percentage of the pension taken into account in granting the loans; and

(vi) the minimum and the maximum repayment periods of the loans?

(b) Will he also state -

(i) whether he is aware that the recipients of loans have had to pay a greater amount of interest than the amount of loan as a result of extending the loan recovery period during the COVID-19 pandemic;

(ii) whether he is aware that the said extension has been given at the discretion of the Bank;

(iii) whether banks can give such an extension at its discretion; and

(iv) whether justice will be served to the persons who have been aggrieved by this measure?

(c) If not, why?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) සණස සංවර්ධන බැංකුව (පී.එල්.සී) යනු බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයන්ට යටත් වේ.

(ii) සණස සංවර්ධන බැංකුව විසින් ආබාධයන්ට ලක් වූ හමුදා නිලධාරීන්ට "උත්තමාචාර" නමින් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබේ.

(iii) පුද්ගලයන් සංඛ්‍යාව : 6,363යි.
මුළු ණය ප්‍රමාණය : රුපියල් බිලියන 41.1
(මෙම ණය යෝජනා ක්‍රමය 2014 දී ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත.)

(iv) පුද්ගලයන් සංඛ්‍යාව : 5,303යි.
මුළු ණය මුදල : රුපියල් බිලියන 28.2

(v) "උත්තමාචාර" ණය යෝජනා ක්‍රමය ලබා දෙනු ලබන්නේ වැටුප් මත පදනම්ව ආබාධයන්ට ලක් වූ හමුදා නිලධාරීන්ට වන අතර, එය විශ්‍රාමිකයන්හට ලබා නොදෙයි. එබැවින්, විශ්‍රාම වැටුප් ප්‍රතිශතය අදාළ නොවේ.

(vi) ණය ආපසු ගෙවීමේ අවම කාල සීමාව අවුරුදු 01ක් වන අතර, උපරිම කාල සීමාව අවුරුදු 10ක් වේ. කෙටි කාලයක් තුළ බැංකුව විසින් වසර 12ක් දක්වා ණය ප්‍රදාන සිදු කර ඇත. එසේ වුවද, ණය ප්‍රතිව්‍යුහගත කිරීමකදී ණය ආපසු ගෙවීමේ කාලය වෙනස් විය හැක.

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

(ආ) (i) ණය වාරිකයක වටිනාකම මුල් ණය මුදල, පොලී අනුපාතය සහ ණය මුදල අය කර ගැනීමේ කාලය යන විවිධ විචල්‍ය මත පදනම්ව තීරණය වෙයි.

තවද, විචල්‍ය ණය පොලී අනුපාත - variable interest rates - මත සමාන මාසික වාරික - equated monthly instalments - පදනම යටතේ ණය ලබා දී ඇත්නම්, ණය ප්‍රදාන පත්‍රය - offer letter - අනුව පොලී අනුපාතය වෙනස් වන අවස්ථාවලදී ණය වාරිකයේ අගය නොවෙනස්ව තබමින් ණය මුදල අයකර ගැනීමේ කාලය ගළපනු ලබයි.

එබැවින්, ණය මුදල අය කර ගැනීමේ කාලය විශාල ලෙස දීර්ඝ වුවහොත්, මුල් ණය මුදලට වඩා වැඩි මුදලක් පොලිය ලෙස ගෙවීමට සිදු වන සීමිත අවස්ථා තිබිය හැක.

(ii) ඉහත සඳහන් කර ඇති පරිදි, විචල්‍ය ණය පොලී අනුපාත මත සමාන මාසික වාරික පදනම යටතේ ණය ලබා දී ඇත්නම්, ණය ප්‍රදාන පත්‍රය - offer letter - අනුව ණය පොලී අනුපාත වෙනස්වීමේදී, ණය වාරිකයේ අගය නොවෙනස්ව තබමින් ණය මුදල අය කර ගැනීමේ කාලය ගළපනු ලබයි.

එසේ වුවද, ණය ගනුදෙනුකරුවෙකු ණය මුදල අය කර ගැනීමේ කාලය අඩු කර ගැනීම සඳහා වාරිකයේ වටිනාකම වැඩි කර ගැනීමට කැමැති අවස්ථාවලදී එම ණය ගනුදෙනුකරුගේ ඉල්ලීම මත වාරිකයේ වටිනාකම වෙනස් කිරීමට අවස්ථාව බැංකුව විසින් සලසා දී තිබුණි. මෙවැනි ණය ප්‍රතිව්‍යුහගත කිරීම් බැංකුව විසින් සිදු කර ඇත්තේ අතිරේක ගාස්තු අය කිරීමකින් තොරවය.

(iii) මේ බව ණය ප්‍රදාන පත්‍රයෙහි සඳහන් කර ඇත.

(iv)
- "උත්තමාචාර" ණය යොජනා ක්‍රමයේ පොලී අනුපාතය සියයට 13 දක්වා පසුකාලීනව පහත දමා ඇත. තවද, නොගෙවූ පොලී මුදල් මත පොලී අය කරනු නොලබයි.
- මීට අමතරව, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කරනු ලබන්නේ බැංකුව හා ගනුදෙනුකරු අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ණය නියමයන් හා කොන්දේසි - terms and conditions - මත පදනම්වය.
- එසේ වුවද, ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් හේතුවෙන් ණය ගනුදෙනුකරුවෙකු අපහසුතාවට පත්ව ඇත්තේ නම්, එවැනි ණය ගනුදෙනුකරුවෙකුට බැංකුව සමඟ සම්බන්ධ වී එකඟතාවකට එළඹීමට තවදුරටත් හැකියාව ඇති අතර, එලෙස එකඟතාවකට එළඹීමට නොහැකි වූයේ නම් හෝ එමඟින් සෑහීමකට පත් නොවන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික දෙපාර්තමේන්තුව වෙත දැනුම් දිය හැක.

(ඇ) පැන නොනඟී.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න අහන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත්, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. ඇත්තටම ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු ආකාරයට මේ ණය ලබා ගත් පිරිස අතර ආබාධිත තත්ත්වයට පත් වෙලා විශ්‍රාම ගිය, ත්‍රිවිධ හමුදාවේ සෙබළුන් ඉන්නවා; පොලීසියේ සහ සිවිල් ආරක්ෂක බළකායේ අයවලුන් ද ඉන්නවා. මට තවදුරටත් දැනගන්න ලැබුණු ආකාරයට රාජ්‍ය සේවයේ සහ අර්ධ රාජ්‍ය සේවයේ අයවලුන් ද ණය ලබා ගෙන අගතියට පත් වෙලා ඉන්නවා. ඒ, "උත්තමාචාර" ණය යෝජනා ක්‍රමය යටතේ නොවෙන්න පුළුවන්; වෙනත් ණය යෝජනා ක්‍රම යටතේ වෙන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් සාධාරණ විසඳුමක් බලාපොරොත්තුවෙන්, ගරු අධිකරණයේ නඩු කටයුත්තක් ද ගොනු කරලා තිබෙනවා. මට දැනගන්න ලැබුණා, පසු ගිය කාලයේ බැංකුව ඉදිරිපිට උද්ඝෝෂණයකුත් තිබුණු බව. නමුත්, ඔවුන්ට කිසිදු ආකාරයක සාකච්ඡාවක් හෝ බැංකුවෙන් ලැබිය යුතු සහනයක් ලබා දෙන්න එකඟ වෙලා නැහැ.

ඒ වාගේම, මට දැනගන්න ලැබුණු ආකාරයට, ආබාධිත තත්ත්වයට පත් වෙලා විශ්‍රාම ගිය අයවලුන්ගේ ණය වාරිකය වැඩි කර ගැනීමට ඔවුන්ගේ consent එක ගන්න, මුදල් රෙගුලාසි 238 කියන ආකෘති පත්‍රය ඔවුන් ලබා දෙන්න ඕනෑ. නමුත්, ඔවුන් කියනවා ඔවුන්ගේ ගනුදෙනුවක් නැහැ කියලා සහ ඔවුන් ඒක ලබා දුන්නේත් නැහැ කියලා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට යෝජනා කරනවා, ඒ ණයලාභීන්ගේ ප්‍රශ්නය විසඳීම සඳහා මුදල් අමාත්‍යාංශය පැත්තෙන් මැදිහත් වෙන්න කියලා.

මා හිතන විධියට අනෙක් බැංකුවල මෙවැනි ආකාරයේ ප්‍රශ්නයක් පැන නැඟිලා නැහැ. සණස සංවර්ධන බැංකුවේ පමණයි ණයලාභීන්ට මේ වාගේ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරලා සාධාරණයක් ඉටු කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු කථානායකතුමනි, තව පොඩි පිළිතුරකුත් ඒකට එකතු කරන්න ඕනෑ. අපි දන්නවා, මේ ආබාධිත රණවිරුවන් රට වෙනුවෙන් කැප වෙලා ඉදිරියට ආපු වෙලාවේදී කරපු සේවය, රට වෙනුවෙන් ලබා දීපු ඒ දායකත්වය ඉතා ඉහළ බව. එය මෙවැනි ණය පොලී අනුපාතයකට, ණය මුදලකට සීමා කරන්නට බැහැ. ඔවුන් රට වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් ඉදිරියට ඇවිල්ලායි ඒ සේවාව කළේ. ඒ නිසා රණවිරුවන් -විශේෂයෙන් ඒ ආබාධිත රණවිරුවන්- යම්කිසි විධියකින් අගතියකට පත් වෙලා තිබෙනවා නම්, මූල්‍ය ආයතනයක් ඒ අවශ්‍ය නිසි පහසුකම් ලබා දීමට හෝ ඒකට සංවේදීව ඇහුම්කන් දීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැත්නම් ඒ පිළිබඳව මැදිහත් වෙලා, සොයා බලා අවශ්‍ය සාධාරණත්වය ඉටු කර දීමට අපි වැඩ පිළිවෙළක් සූදානම් කරනවා කියලා මම දැනුම් දෙන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ලියාපදිංචි මුස්ලිම් පල්ලිවල ඉමාම් සහ මුඅද්දීන් තනතුරු: අවම වැටුප

பதிவுசெய்யப்பட்டுள்ள பள்ளிவாசல்களில் இமாம் மற்றும் முஅத்தின் பதவிகள்: குறைந்தபட்ச சம்பளம்

POSITIONS OF IMAM AND MUADHDHIN IN REGISTERED MOSQUES: MINIMUM WAGE

483/2025

1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති මුස්ලිම් දේවස්ථානවල ඉමාම් හා මුඅද්දීන් යන තනතුරු පවතින බව දන්නේද;

(ii) එම තනතුරුවල සේවය කරනු ලබන සේවකයන් සඳහා ගෙවිය යුතු අවම වැටුප සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු සටහනක් නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, ඉමාම් හා මුඅද්දීන් යන තනතුරුවල සේවය කරනු ලබන සේවකයන් සඳහා ගෙවිය යුතු අවම වැටුප සම්බන්ධයෙන් නිගමනයකට එළැඹ සෑම පල්ලියකම සමාන වැටුපක් ගෙවිය යුතු බවට තීරණයක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களத்தின்கீழ் பதிவுசெய்யப்பட்டுள்ள முஸ்லிம் பள்ளிவாசல்களில் இமாம் மற்றும் முஅத்தின் ஆகிய பதவிகள் உள்ளதென அறிவாரா என்பதையும்;

(ii) இதுவரையிலும் மேற்குறிப்பிட்ட பதவிகளில் சேவையாற்றும் பணியாளர்களுக்குச் செலுத்தவேண்டிய ஆகக் குறைந்த சம்பளம் தொடர்பான எவ்விதக் குறிப்பும் இல்லையென்பதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், இமாம் மற்றும் முஅத்தின் பதவிகளில் சேவையாற்றும் பணியாளர்களுக்குச் செலுத்தவேண்டிய ஆகக் குறைந்த சம்பளம் தொடர்பாக தீர்மானம் ஒன்றை மேற்கொண்டு, சகல பள்ளிவாசல்களிலும் சம அளவான சம்பளம் செலுத்தப்பட வேண்டுமென்ற தீர்மானம் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that positions of Imam and Muadhdhin exist at Muslim mosques which have been registered under the Department of Muslim Religious and Cultural Affairs;

(ii) whether he is aware that there has been no written record up to now pertaining to the minimum wages to be paid for the employees serving in those positions; and

(iii) if so, whether a conclusion will be reached in relation to the minimum wages to be paid to employees in Imam and Muadhdhin positions and a decision will be taken to pay an equal wage to those employed in those positions at every mosque?

(b) If not, why?

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ලියාපදිංචි කරන ලද බහුතර මුස්ලිම් පල්ලිවල ඉමාම් හා මුඅද්දීන් යන තනතුරු පවතින අතර ඇතැම් පල්ලිවල එම තනතුර පවතින්නේ නැත. පල්ලිවලට ලැබෙන ආදායම මත තනතුරු පිහිටුවනු ලැබේ.

(ii) අවම වැටුප සම්බන්ධයෙන් තවමත් තීරණයක් ගෙන නොමැත.

(iii) එසේ තීරණය කිරීමට නොහැකි ය. මුස්ලිම් පල්ලි යනු, ආදායම් උපයන ආයතනයක් නොවන අතර බහුතර පල්ලිවල ආදායම තීරණය වන්නේ එම පල්ලියට අයත් ප්‍රදේශවාසීන්ගෙන් ලැබෙන මාසික දායකත්ව ගාස්තුව (සන්දා ගාස්තුව) මත ය. තවද, ප්‍රදේශය අනුව හා එක් එක් පල්ලි යටතේ ලියාපදිංචි වී ඇති පවුල් සංඛ්‍යාව අනුව එම මාසික දායකත්ව ගාස්තුව ද වෙනස් වන බැවින් නිශ්චිත වැටුපක් තීරණය කිරීමට නොහැක.

ඔව්.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -493/2025- (1): ගරු පද්මසිරි බණ්ඩාර මහතා.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

ආංශික අධීක්ෂණ කාරක සභා
துறைசார் மேற்பார்வைக் குழுக்கள்
SECTORAL OVERSIGHT COMMITTEES

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම සඳහා මතු දැක්වෙන පරිදි ආංශික අධීක්ෂණ කාරක සභා හතක් (07) පත් කළ යුතු ය:-

(1) ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
(2) යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
(3) අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
(4) සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
(5) පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
(6) විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
(7) රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් (12) සමන්විත විය යුතු ය. එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් (03) සංයුක්ත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මෙහි ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ධුරය ආණ්ඩු පක්ෂය විසින් දරනු ලබනවා. යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ධුරය විපක්ෂය විසින් දරනු ලබනවා. අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ධුරයත් විපක්ෂය විසින් දරනු ලබනවා. සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ධුරය ආණ්ඩු පක්ෂය විසින් දරනු ලබනවා. ඒ වාගේම පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ධුරය විපක්ෂය විසින් දරනු ලබනවා. විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ධුරය ආණ්ඩු පක්ෂය විසින් දරනු ලබනවා. රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ධුරයත් ආණ්ඩු පක්ෂය විසින් දරනු ලබනවා.

ගරු කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ස්ථාවර නියෝග 91. (උ) කෙරෙහි. එහි මෙසේ සඳහන් වනවා:

"කථා කරමින් සිටින හෝ සභාවේ පැමිණ සිටින යම් මන්ත්‍රීවරයකු විසින්, අපහාසාත්මක හෝ අනිසි වචන පාවිච්චි කරනු ලැබුවහොත්, කථානායකවරයා විසින් ඒ මන්ත්‍රීවරයාට රීත්‍යානුකූල වන ලෙස නියෝග කරනු ලැබිය යුතු අතර, එම සඳහන් කිරීම පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස නියෝග කරනු ලැබිය යුත්තේ ය;"

ඒ Standing Order එක ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමියට ලබා දී තිබෙන පණිවුඩයක ඒ කරුණු තිබෙනවා. අප දන්නවා, එය පාර්ලිමේන්තුවේ සිද්ධ වූ බව. මම ඒ ගැන ඉතාම කෙටියෙන් කියන්නම්: "This is to bring to your attention that there is an extreme sexual violence being directed at Swasthika Arulingam, Attorney-at-Law by an MP here." මම ඒ සම්පූර්ණ text එක කියවන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එතුමියට විරුද්ධව 91. (උ) ස්ථාවර නියෝගය උල්ලංඝනය කරමින් මන්ත්‍රීවරයෙක් බරපතළ අපහාසාත්මක ප්‍රකාශයක් නිකුත් කළ බව එතුමියත් වාර්තා කරලා තිබෙනවා. අපත් එය දන්නවා. ඒ නිසා මේ පිළිබඳව සොයා බලා මේ ස්ථාවර නියෝගය හෝ සුදුසු ස්ථාවර නියෝගයක් මත පදනම් වෙලා කටයුතු කරන ලෙස අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා,

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, විසිදෙවන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: මාර්තු 15]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 15]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress:15th March]
[HON. SPEAKER in the Chair.]

101 වන ශීර්ෂය.- බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 640,000,000

தலைப்பு 101.- புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 640,000,000

HEAD 101.- MINISTER OF BUDDHASASANA, RELIGIOUS AND CULTURAL AFFAIRS
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 640,000,000

160 වන ශීර්ෂය.- පරිසර අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩ සටහන - පුනරාවර්තන වියදම, රු. 1,012,000,000

தலைப்பு160.- சுற்றாடல் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,012,000,000

HEAD 160.- MINISTER OF ENVIRONMENT
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,012,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය. බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 101, 201 සිට 209; පරිසර අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 160, 283, 284, 291, 294 සහ 322.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. Kins Nelson. You have 25 minutes.

[පූ.භා. 9.57]

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.17 සඳුදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 101, 201 සිට 209 සහ 160, 283, 284, 291, 294 සහ 322 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අද දින බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ පරිසර අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේ විවාදයට සම්බන්ධ වෙමින් අදහස් ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම පරිසර අමාත්‍යාංශය ගැන කථා කරනකොට අපේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි අලි-මිනිස් ගැටුම. ගරු සභාපතිතුමනි, වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමයි මේ අලි-මිනිස් ගැටුමට ප්‍රධාන වශයෙන්ම මුහුණ දෙන කණ්ඩායම වන්නේ.

සමහර අවස්ථාවලදී ඒ නිලධාරීන්ට ගම්වලට යන්න බැරි අවස්ථා පවා උදා වෙනවා. සමහර වෙලාවට අලින් විසින් ඒ අය යන වාහන පවා පෙරළන්න හදනවා; ගහන්න හදනවා. ගරු සභාපතිතුමනි, අවම පහසුකම් එක්ක තමයි වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කටයුතු කරන්නේ. විශේෂයෙන්ම අද තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි ප්‍රමාණවත් තරම් නිලධාරීන් නැතිකම. ගරු සභාපතිතුමනි, නිලධාරීන්ගේ පුරප්පාඩු තිබෙනවා. අලි වැට සම්බන්ධව සහ ජාතික වන උද්‍යාන, අමාත්‍යාංශය හා ඒ යටතේ තිබෙන අනෙකුත් ආයතන ගත්තාම පුරප්පාඩු 982ක් තිබෙනවා. අනුමත කාර්ය මණ්ඩලය 2,820ක් ඉන්න ඕනෑ තැන ඉන්නේ 1,892යි. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ කාර්ය මණ්ඩලය කියන එක ඉතා වැදගත්. උදාහරණයක් ගත්තොත්, යම් කිසි සිදුවීමක් වෙච්ච අවස්ථාවකදී එතැනට යන්න වාහනයක තෙල් නැත්නම්, ඒ වාහනයේ ටයර් ටික අබලන් වෙලා තිබෙනවා නම්, වාහනය ස්ටාර්ට් වෙන්නේ නැත්නම් නිසි වෙලාවට යන්න බැරි වෙනවා. වනජීවී දෙපාර්තමේන්තුව කියන්නේ ජාතික ආරක්ෂකයට විශාල ශක්තියක් ලබා දෙන ආයතනයක්. ගරු සභාපතිතුමනි, එදා ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා විධියට අය වැය ඉදිරිපත් කරපු වෙලාවේ කිව්වා, "අපේ රටේ අලි වැට ඉදිකරලා තිබෙනවා, කිලෝමීටර 5,611ක්. මෙවර අය වැයෙන් අපි වෙන් කරලා තිබෙනවා, මිලියන 200ක්. ඒ මිලියන 200න් කිලෝමීටර 1,456ක් අලුත්වැඩියා කරනවා" කියලා. "අලුත්වැඩියා කරනවා" කියන එක විතරයි කියන්නේ.

ගරු සභාපතිතුමනි, මේකට අලි වැට පමණක් ඉදිකරලා හරියන්නේ නැහැ. මේ වෙනකොට අලි වැට ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. අලි වැට තුළ නිසි විදුලිය ධාරිතාවක් නැහැ. බැටරි වැඩ කරන්නේ නැහැ. කම්බි කැඩිලා ගිහින් තිබෙනවා. වැටේ සිටුවා තිබෙන කණු දිරාපත්වෙලා තිබෙනවා. අලි මිනිස් ගැටුම අවම කර ගන්න නම්, එල්ලෙන වැට වෙන්න පුළුවන්, අගල් වෙන්න පුළුවන්, තිබෙන අලි වැට අලුත්වැඩියා කරන්න ඕනෑ.

මේ වෙනකොට ගොවීන්ට අලුතින් ඉඩම් දීලා තිබෙනවා. වන සතුන් සිටින භූමි ප්‍රමාණය තුළ තමයි ඒ විධියට ඉඩම් දෙන්නේ. වගා කිරීම සඳහා ඒ අයටත් ඉඩම් දෙන්න ඕනෑ තමයි. හැබැයි, ඉඩම් දෙනකොට අලි ගමන් කරන මාර්ග නවත්වන්න නම් අලුතින් අලි වැට ඉදිකරන්න වෙනවා. හැබැයි, මේ අය වැයේ කිසිම තැනක කියැවෙන්නේ නැහැ, අලුතින් කිලෝමීටරයක්වත් අලි වැට හදනවා කියලා. ගරු සභාපතිතුමනි, එම නිසා මම යෝජනාවක් කරන්න කැමැතියි. දැනට තිබෙන අලි වැටවලින් කිලෝමීටර 1,456ක් ප්‍රතිසංස්කරණය කරනවා කියලා විතරයි නේ අය වැයෙන් කියන්නේ. උදාහරණයක් ගත්තොත්, මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විතරක් තිබෙන අලි වැට කිලෝමීටර 1,100ක් දිගයි. මේ අය වැයෙන් ප්‍රතිසංස්කරණය කරන්න හදන්නේත් කිලෝමීටර 1,456යි. ගරු සභාපතිතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේත් මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයම තමයි. ඔබතුමා දන්නවා, දිඹුලාගල, වැලිකන්ද, මැදිරිගිරිය, පඹුරාන, පල්ලියගොඩැල්ල ප්‍රදේශවලට හැමදාම අලින්ගෙන් ප්‍රශ්න ඇති වෙන බව. අද උදේත් අලියෙක් ගහලා මැදිරිගිරියේ මනුස්සයෙක් මැරුණා. එක

[ගරු කිංස් නෙල්සන් මහතා]

පැත්තකින්, අලි වැට සඳහා අය වැයෙන් වෙන් කර තිබෙන මුදල ප්‍රමාණවත් මදි. අනෙක් පැත්තෙන්, අලුතින් අලි වැටක් ඉදි කෙරෙන්නේත් නැහැ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අලි-මිනිස් ගැටුම නිසා 2023 ඔක්තෝබර් මාසයේ සිට 2024.12.31 දක්වා කාලය තුළ අලි මරණ 876ක් සිදුවෙලා තිබෙනවා. මිනිස් මරණ 339ක් සිදුවෙලා තිබෙනවා. ඒ වාගේම 7,000කට ආසන්න දේපළ ප්‍රමාණයකට හානිවෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, 2025.01.01 සිට 2025.03.14 දක්වා කාලය තුළ අලි මරණ 93ක් සිදුවෙලා තිබෙනවා, මිනිස් මරණ 35ක් සිදුවෙලා තිබෙනවා, දේපළ හානි 756ක් සිදුවෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ වාගේම මේ අවුරුද්දේ මුල් මාස එකහමාර තුළ අලි 59දෙනෙක් මැරිලා තිබෙනවා. අපට ඒ තත්ත්වය අවම කර ගන්න බැරිවෙලා තිබෙනවා. මේක අද ඊයේ ඇති වුණු ප්‍රශ්නයක් නොවෙයි, ගරු සභාපතිතුමනි. පාර්ලිමේන්තුව තුළ මේ විෂය සම්බන්ධයෙන් කථා කළ සෑම අවස්ථාවකදීම අලි මරණ, මිනිස් ඝාතන පිළිබඳව අපි දිගින් දිගටම කථා කරලා තිබෙනවා. හැබැයි, කිසිම කෙනෙකුට මේ ප්‍රශ්නයට හරි උත්තරයක් දෙන්න බැරිවෙලා තිබෙනවා. එම නිසා මම පෞද්ගලිකව ගිහිල්ලා ඒ විෂය භාර ඇමතිතුමාව හමු වුණා, ගරු සභාපතිතුමනි. මම කිව්වා, මේක මම ඉතාම ආස කරන විෂයයක්, මේ විෂය තුළ අපට හුහක් වැඩ කරන්න පුළුවන් කියලා. විශේෂයෙන්ම මිනිස් මරණ වාගේම අලින්ගේ මරණත් සිද්ධ වෙනවා. මේ තත්ත්වය අවම කර ගන්න නම් අපට ක්‍රමවත් වැඩ පිළිවෙළක් දියත් කරන්න වෙනවා.

මෙහිදී අංක එකට වැදගත් වන්නේ කාර්ය මණ්ඩලයයි. අනිවාර්යයෙන්ම නිසි කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතුමයි. විශේෂයෙන් ගත්තොත්, මේ අලි වැට ආශ්‍රිතව මුර කුටි තිබෙනවා. උදාහරණයක් ලෙස ගත්තොත්, මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අලි වැට සම්බන්ධ මුර කුටි 136ක් තිබෙන්නට ඕනෑ, ගරු සභාපතිතුමනි. හැබැයි, මේ වනකොට ඉදිවෙලා තිබෙන්නේ මුර කුටි 64යි. ඒ මුර කුටි 64ටත් විදුලිය නැහැ, පානීය ජල පහසුකම් නැහැ. මුර කුටියකට අනිවාර්යයෙන් විදුලිය කියන එක අවශ්‍යයි නේ. වතුර බෝතලයක් නම් අරන් යන්න පුළුවන් කියමුකෝ. හැබැයි, මේ මුර කුටියකට අනිවාර්යයෙන්ම විදුලිය ඕනෑ. සාමාන්‍යයෙන් අලි වැට හැදුවාට පස්සේ අඩුම ගණනේ අලි වැටේ කිලෝමීටර 5න්, 5ට හෝ කිලෝමීටර 4න්, 4ට හෝ මුර කුටියක් තිබෙන්නට ඕනෑ. මුර කුටියක් තිබෙනකොට එතැන විදුලිය දැල්වෙනවා. අදාළ බලප්‍රදේශයේ මුර කුටියේ සිටින නිලධාරි මණ්ඩලය නිරීක්ෂණය කරනවා. එතකොට අලි ඇවිල්ලා අලි වැට කැඩුවොත් පහුවෙනිදා උදේට ගිහින් ඒක හදන්න පුළුවන්. නිලධාරි නිහය නිසාම තමයි මේ මිනිස් මරණ සහ අලි ගැටුම ඇති වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ රටේ තිබෙන ජාතික වනෝද්‍යාන ගත්තාම, මේක හැංගිච්ච රහසක් වාගෙයි. අපේ රටේ ජාතික ආර්ථිකයට විශාල ශක්තියක් දෙන ආයතන තමයි අපේ රටේ තිබෙන ජාතික වනෝද්‍යාන. ගරු සභාපතිතුමනි, යාල ජාතික වනෝද්‍යානය විතරක් 2024 වර්ෂයේ රුපියල් බිලියන 2.7ක ආදායමක් ලබා තිබෙනවා. මේ දවස්වල යාල ජාතික වනෝද්‍යානයේ දවසක ආදායම රුපියල් ලක්ෂ 100 පන්නනවා. ගරු සභාපතිතුමනි, ඒකයි මම කිව්වේ මේ වන ජීවී විෂය ගත්තාම මේ ආයතන තුළින් මහා විශාල සේවාවක් අපට කරන්න පුළුවන් කියලා. යාල ජාතික වනෝද්‍යානය ගත්තාම, මාසයකට petty cashවලට දෙන්නේ රුපියල් 100,000යි, ගරු සභාපතිතුමනි. එහි සියලු කටයුතු කරන්න රුපියල් 100,000න් පුළුවන්ද? කාර්යාලය නඩත්තු වෙන්න ඕනෑ. යාල ජාතික වනෝද්‍යානය ඇතුළේ බංගලා 9ක් තිබෙනවා, ඒ බංගලා 9ම නඩත්තු වෙන්න ඕනෑ; පාරවල් හැදෙන්න ඕනෑ; සේවකයින්ට අවශ්‍ය කරන දේවල් වෙන්න ඕනෑ. ඉතින්, මේ රුපියල් 100,000ක මුදල ඒ සඳහා ප්‍රමාණවත් නැහැ, ගරු සභාපතිතුමනි. ඒ වාගේම, යාල ජාතික වනෝද්‍යානයේ භූමි ප්‍රමාණය ගත්තාම හෙක්ටෙයාර 97,880ක් තිබෙනවා. Block 1 සිට Block 6 දක්වා කලාප 6කින් නිර්මාණය වෙච්ච වපසරියක් තිබෙන park එකක් තමයි යාල ජාතික වනෝද්‍යානය කියන්නේ. Block 1වල තිබෙන්නේ හෙක්ටෙයාර 14,000යි. මේ හෙක්ටෙයාර 14,000ට ජීප් රථ 550ක් ලියාපදිංචි වෙලා තිබෙනවා.

රියැදුරන් 951දෙනෙක් ලියාපදිංචි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් සංචාරකයෙකු උදේ 5ට ගියාම Park එක ඇතුළට ගන්නේ 6.30ට. එතකොට විශාල වශයෙන් එතැන තදබදයක් තිබෙනවා. මේ තදබදය අවම කරන්න මම යෝජනාවක් කරන්න කැමැතියි, ගරු සභාපතිතුමනි. Block 1 එකේ තිබෙන්නේ හෙක්ටෙයාර 14,000යි. එතකොට Block 1 සහ Block 6 එකතු කළාම හෙක්ටෙයාර 97,000ක් තිබෙනවා. මේකට Block 3 එකත් එකතු කළොත් අපට ජීප් රථවල තදබදය සම්පූර්ණයෙන්ම විසඳා ගන්න පුළුවන් වනවා. මොකද, මේ Park එකේ විශාල වපසරියක් තිබෙනවා. අද මේ හැම කෙනෙකුම සැරිසරන්නේ Block 1 එක ඇතුළේ විතරයි.

මෙතැනට පිවිසුම් දෙකක් තිබෙනවා. කටගමුව පිවිසුම තිබෙනවා. පලටුපාන පිවිසුම තිබෙනවා. අඩුම ගණනේ තව පිවිසුම් දෙකක් මේකට එකතු කළොත් මේ තදබදය අවම කර ගන්න අපට පුළුවන්. තැන් දෙකකින් විතරක් සංචාරකයින්ට ඇතුළු වෙන්න තිබෙන නිසා තමයි අද මෙතැන විශාල තදබදයක් ඇති වී තිබෙන්නේ. කිසිම කෙනෙකු කටගමුව පිවිසුමෙන් යාල ජාතික වනෝද්‍යානයට ඇතුළු වෙන්නේ නැහැ. කටගමුව පිවිසුමට කතරගම පැත්තෙන් ඉතාම ළඟයි. කොච්චිපතාන ගම්මානය මැදින් එනකොට කටගමුව පිවිසුම තිබෙනවා. නමුත්, හැමෝම එන්න උත්සාහ කරන්නේ පලටුපාන පිවිසුමෙන්. ඒ කියන්නේ, තිස්සමහාරාම පැත්තෙන් එන පිවිසුමෙන් තමයි හැමෝම එන්න හදන්නේ. ජීප් රථ 550ක් හැම දාම එකම තැනකින් ඇතුළු වනකොට හිතන්නකෝ Park එක ඇතුළට යන්නේ කොහොමද කියලා. මේ හැම ජීප් එකකටම අංකයක් දීලා තිබෙනවා.

දේශීය සංචාරකයෝත් මෙතැනට යනවා. ඒ අයට Park එකට ඇතුළු වෙන්න නම් පැය ගණනක් බලාගෙන ඉන්න වෙනවා. මොකද, අංක දීලා තිබෙන අය විතරයි ඇතුළට ගන්නේ. යාල ජාතික වනෝද්‍යානයට යන්න කැමැති දේශීය සංචාරකයෝ ඉන්නවා. හැබැයි, සමහර වෙලාවට ඇතුළට යන්න විධියක් නැතිව ඒගොල්ලන් නැවත එනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම යෝජනා කරනවා, අඩුම වශයෙන් තව පිවිසුම් දෙකක්වත් විවෘත කරන්න කියලා.

බුත්තල පාරේ ගල්ගමුව පැත්තෙන් එක පිවිසුමක් තිබෙනවා, Block 3 එකට යන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, කටගමුව පිවිසුමේ මාර්ගෝපදේශකවරුන් තුන්දෙනායි ඉන්නේ. මාර්ගෝපදේශකවරුන් තුන්දෙනෙකු විතරක් හිටියාම එතැනින් අපේ සංචාරකයින්ට හොඳ සේවාවක් ලබා දෙන්නේ කොහොමද? මේ හැම පිවිසුමකටම එක හා සමානව මාර්ගෝපදේශකවරුන් දැම්මොත් අපට මීට වඩා ආදායමක් ගන්න පුළුවන්. විශේෂයෙන්ම Block 2 එක ගත්තාම, අධි ආරක්ෂිත කලාපයක් වාගේයි. එතැනට යන්න උදේ 6ට ගිහිල්ලා permission ගන්න ඕනෑ. එම නිසා ජීප් දෙකක් ඕනෑය කියන එක සාධාරණයි. මොකද, එතැනට ගිහිල්ලා එක ජීප් රථයක් හිර වුණොත් අනෙක් ජීප් එකෙන් ඇදගෙන එන්න ඕනෑ නිසා. ගරු සභාපතිතුමනි, හැබැයි, Block 2 එක දැන් වනසතුන් දඩයම් කරන අයගේ පාරාදීසයක් කරගෙන තිබෙනවා.

දඩයක්කාරයෝ ගිහිල්ලා මේ රක්ෂිතයේ නැවතිලා වනසතුන් මරලා, ඒ සතුන්ගේ මස් වේළාගෙන අරගෙන යනවා. මොකද මේ කලාපවලට කවුරුවත් යන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. ඒ වාගේම අපට මීට වඩා ආදායමක් ලබා ගන්න පුළුවන් තව ක්‍රියාමාර්ග තිබෙනවා.

විශේෂයෙන්ම යාල ජාතික වනෝද්‍යානය ඇතුළේ බංගලා 9ක් තිබෙනවා. හිටපු ජනාධිපතිවරයෙකු වූ අපේ දිවංගත රණසිංහ ප්‍රේමදාස මහතා ඒ කාලයේ මේ හැම Park එකක්ම නිරීක්ෂණය කළා. එතුමා ඒ කාලයේ මේ හැම Park එකක් ඇතුළටම ගිහිල්ලා නිලධාරීන් එක්ක කථා කළා. ඇත්තටම ඒ කාලයේ මෙවැනි ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ගරු සභාපතිතුමනි, අපේ දිවංගත රණසිංහ ප්‍රේමදාස මහතා යාල වනෝද්‍යානය ඇතුළේ බංගලා කිහිපයක්ම හැදුවා. "බුතව" බංගලාව කියන්නේ රණසිංහ ප්‍රේමදාස මහතාගේ අදහසකට අනුව නිර්මාණය කරපු මුහුදු අයිනේ තිබෙන බොහොම ලස්සන බංගලාවක්. නමුත්, අද ඒකට යන්න බැහැ. අද වන විට ඒ බංගලාවේ වහලය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා; ටොයිලට් පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගිහිල්ලා. ගරු සභාපතිතුමනි, Yala Park එකෙන් එළියේ තිබෙන හෝටලයක එක කාමරයක් දවසකට රුපියල් ලක්ෂයකටත් වඩා වැඩි මුදලක් වෙනවා. හැබැයි, යාල ජාතික වනෝද්‍යානය ඇතුළට දේශීය සංචාරකයෙකුටවත් යන්න බැරි අවස්ථාවක් අද උදාවෙලා තිබෙනවා. මම මේ කියන කථාව ඇත්ත ද කියලා තහවුරු කර ගන්න අවශ්‍යයි නම්, යාල ජාතික වනෝද්‍යානයෙන් එළියේ තිබෙන සාමාන්‍ය හෝටලයක කාමරයක් කීයද කියලා අහලා බලන්න. දවසකට රුපියල් ලක්ෂයකටත් එහා ගිය මුදලක් ඒ හෝටල් කාමරයක් වෙනුවෙන් අය කරනවා. දේශීය සංචාරකයින්ට මේ Park එක ඇතුළේ ඉන්න අවශ්‍ය නවාතැන් ලබා දීලා මේ ආදායම රජයට ලබා ගන්න බැරි ඇයි? මම කියන්නේ නැහැ, park එක ඇතුළේ තිබෙන බංගලාවක් රුපියල් ලක්ෂයකට දෙන්න කියලා. හැබැයි, ඒ standardsවලට වනෝද්‍යානය ඇතුළේ තිබෙන බංගලාවක් අපට හදන්න පුළුවන්. එහෙම හැදුවොත් රුපියල් ලක්ෂයක් නොවෙයි, ලක්ෂ 5ක් හරි දීලා ඒවායේ මිනිස්සු ඉඳිවි. එහෙම යන්න වුවමනා අය අපේ රටෙත් ඉන්නවා. විශේෂයෙන්ම අප්‍රිකාව වාගේ රටකට ගියොත් එහේ දැන් luxury tents තිබෙනවා. රුපියල්වලින් බැලුවොත් මේ luxury tent එකක් දවසකට රුපියල් ලක්ෂ 3ක්, 4ක් වෙනවා. ඒ රටවලට යන සංචාරකයින් අපේ රටටත් ගෙන්වා ගන්න පුළුවන්. අපේ park එක ඇතුළේ luxury tents ගහන්න පුළුවන් campsites අපට තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම යෝජනා කරනවා, මේ සම්බන්ධව අපිත් එක්ක කථා කරන්න කියලා. අපි මේ දේවල් කියන්නේ සද්භාවයෙන්. ගරු සභාපතිතුමනි, අද වන විට අපේ රටේ ජාතික වනෝද්‍යාන ඇතුළේ තිබෙන බංගලා සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ මින්නේරිය ජාතික වනෝද්‍යානය ගැනත් මම කථා කරන්න ඕනෑ. දකුණු ආසියාවේ වැඩිම අලි සනත්වයක් තිබෙන්නේ මින්නේරිය ජාතික වනෝද්‍යානයේ. දැන් මේ මින්නේරිය ජාතික වනෝද්‍යානයේ මාර්ගෝපදේශකවරුන් පස්දෙනායි ඉන්නේ. මේ පස්දෙනා ජීප් රථ 400ක්, 500ක් පාලනය කරන්න ඕනෑ. සමහර ජීප් රථ මාර්ගෝපදේශකවරුන් නැතිව Park එකට ඇතුළු වෙනවා. මින්නේරිය ජාතික වනෝද්‍යානය 2024 වසරේදී රුපියල් මිලියන 300ක ආදායමක් උපයා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, මින්නේරිය ජාතික වනෝද්‍යානය ඇතුළේ කිසිම පහසුකමක් නැති බව. එන සංචාරකයින්ට වතුර ටිකක් බොන්න තැනක් නැහැ. වැසිකිළියකට යන්න විධියක් නැහැ; වැසිකිළි පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගිහිල්ලා. Park එක ඇතුළේ තිබෙන්නේ එක බංගලාවයි. ඒ බංගලාව මම හිතන විධියට අවුරුදු ගණනාවක් තිස්සේ පාවිච්චි වෙලා නැහැ. ගරු සභාපතිතුමනි, දකුණු ආසියාවේ වැඩිම අලි ඝනත්වයක් සහිත Park එක තමයි, මින්නේරිය ජාතික වනෝද්‍යානය. ඉතින් ඇයි, මේ වනෝද්‍යානයට එහෙම වෙලා තිබෙන්නේ? ඒ සම්බන්ධව අපි මේ පාර්ලිමේන්තුවේ දිගින් දිගටම කථා කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මින්නේරිය ජාතික වනෝද්‍යානය කියන්නේ විශාල ආදායමක් ලබා ගන්න පුළුවන් Park එකක්. ඒ නිසා මම යෝජනා කරනවා, ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා. එතැන ඉන්නේ මාර්ගෝපදේශකවරුන් පස්දෙනායි. අඩු ගණනේ මාර්ගෝපදේශකවරුන් තිස්දෙනෙක්වත් එහි ඉන්න ඕනෑ. එතකොට අපට ඒ Park එකෙන් දැනට ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි, කවුඩුල්ල ජාතික වනෝද්‍යානයත්. කවුඩුල්ල ජාතික වනෝද්‍යානය ඉතාම ලස්සන Park එකක්. ඒකෙත් ඒ හා සමාන අඩුපාඩු රාශියක් තිබෙනවා. ඒ නිසා අපි දිගින් දිගටම කියන්නේ, ඒ Parks ටික හැදුවා නම්, අපට හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන් කියලායි. ඉස්සරහට අපේ රටට සංචාරකයින් එන ප්‍රවණතාව වැඩියි. හැබැයි, ඔවුන් ඒ Parks ගැන දන්නේ නැහැ. ලංකාවට එන බහුතරයක් සංචාරකයින් කෙළින්ම යන්නේ උඩවලවට, නැත්නම් යාලට. ඇයි අපට බැරි, ලංකාවට එන සංචාරකයින් ඒ Parksවලටත් ගෙන්වා ගන්න? ඔවුන් ඒ Parksවලට නොයන්නේ ඒ සම්බන්ධව කිසිම දැනුවත් බවක් නැති නිසායි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පුළුවන්, ඒ සඳහා මැදිහත් වෙලා, මෙන්න මේවා තමයි අපේ රටේ තිබෙන ජාතික වනෝද්‍යාන කියලා පත්‍රිකාවක් හදලා ගුවන් තොටුපොළේදී ඔවුන්ව දැනුවත් කරන්න. ඒ වාගේම විදේශ රටවල ඉන්න අපේ තානාපතිවරුන් හරහාත් ඒ දැනුවත් කිරීම කරන්න පුළුවන්. අපේ රටේ මෙන්න මේ වාගේ Parks තිබෙනවා, අලි බලන්න ඕනෑ අයට අලි බලන්න පුළුවන්, දිවියන් බලන්න ඕනෑ අයට දිවියන් බලන්න පුළුවන්, කුරුල්ලන් බලන්න ඕනෑ අයට කුරුල්ලන් බලන්න පුළුවන් කියලා අපට කියන්න පුළුවන්. නමුත්, එහෙම කිසිම දෙයක් වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, පිට රටවල Park එකකට ගියාම අවසානයේදී ඒ Park එකෙන් එළියට එන්න තිබෙන්නේ souvenir shop එකක් ඇතුළෙන්. අපේ රටෙත් ඒ වාගේ ක්‍රමයක් හැදුවොත්, ඒ Park එකේ map එක, ඒ සතුන්ගේ photos වුණත් ප්‍රදර්ශනය කරලා අපට වෙනම ආදායමක් ලබා ගන්න පුළුවන්. එවැනි ක්‍රම තුළින් මේ දෙපාර්තමේන්තුවට අමතර ආදායමක් ලබා ගන්න පුළුවන්. නමුත් එහෙම කිසිම දෙයක් මේවායේ වෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි සියලුදෙනාම එකතු වෙලා අපේ රටේ තිබෙන ජාතික වනෝද්‍යාන ටික දියුණු කරලා හොඳ තත්ත්වයකට ගෙනාවොත්, අපට හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි, පොළොන්නරුවේ තිබෙන අංගම්මැඩිල්ල ජාතික වනෝද්‍යානය. ඔබතුමාත් දන්නවා ඇති, පරාක්‍රම සමුද්‍රයට වතුර එන්නේ අංගම්මැඩිල්ල ජාතික වනෝද්‍යානය ඇතුළෙන් බව.

අංගම්මැඩිල්ල කියන්නේ බොහොම ලස්සන ජාතික වනෝද්‍යානයක්. හැබැයි, ඒ ජාතික වනෝද්‍යානය ඇතුළේ යන්න පාරක් නැහැ; entrance එක විතරයි තිබෙන්නේ; office එක තිබෙනවා. නමුත්, යන්න පාරක් නැහැ. ගරු සභාපතිතුමනි, මේවා ඇතුළට යන්න අවශ්‍ය පාරවල් හැදුවොත් ඉතාම වටිනවා. විශේෂයෙන්ම මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තාම, සංචාරකයෝ ඒ ප්‍රදේශයේ කවදාවත් රැඳෙන්නේ නැහැ; රැයක් ඉන්නේ නැහැ. ඒ අය ඇවිල්ලා එක්කෝ

[ගරු කිංස් නෙල්සන් මහතා]

මින්නේරිය ජාතික වනෝද්‍යානය බලන්න යනවා, නැත්නම් නටබුන් බලන්න යනවා. ඊට පසුව ඒගොල්ලන් දඹුල්ලට හෝ හබරණට යනවා. මොකද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රැඳුණාට ඒගොල්ලන්ට කරන්න කිසිම දෙයක් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම යෝජනාවක් කරන්න කැමැතියි. මේ අංගම්මැඩිල්ල ජාතික වනෝද්‍යානයෙන් අපට පාරක් කපන්න පුළුවන්, වස්ගමුවට යන්න. එතකොට පොළොන්නරුවේ අංගම්මැඩිල්ලෙන් ඇතුළු වෙලා වස්ගමුවට ගියාම ඒගොල්ලන්ට කියන්න ඕනෑ, වස්ගමුවෙන් එළියට යන්න බැහැ, නැවත පොළොන්නරුවේ අංගම්මැඩිල්ල වනෝද්‍යානයෙන්ම තමයි එළියට එන්න ඕනෑ කියලා. එතකොට ඒ අයට මුළු දවසම ඒ වනෝද්‍යානය ඇතුළේ ගත කරන්න පුළුවන්. එහෙම වුණාම අනිවාර්යයෙන්ම එම සංචාරකයන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රැඳෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම නැවතත් යෝජනා කරනවා, අංගම්මැඩිල්ල ජාතික වනෝද්‍යානය හරහා වස්ගමුවට යන්න පාරක් හදන්න කියලා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මාදුරුඔය ජාතික වනෝද්‍යානය ගැනත් මම කිව යුතුයි. මාදුරුඔය ජාතික වනෝද්‍යානයට කොහෙන්ද මම දන්නේ නැහැ, පසුගිය කාලයේ හරක් වගයක් ගෙනැත් දමලා. දැන් ඒ වනෝද්‍යානය ඇතුළේ ඒ හරක් ඉන්නේ. ගරු සභාපතිතුමනි, හැබැයි අපි අසා තිබෙනවා, සාමාන්‍යයෙන් අපේ රටේ කිරි ගොවියෙකුට අයිති හරකෙක් වනජීවී කලාපයකට ගියොත් රුපියල් 50,000ක්, 60,000ක් අවම වශයෙන් එම ගොවියාට දඩ ගහනවා කියලා. හැබැයි, මේ වාගේ ජාතික වනෝද්‍යානයක් ඇතුළත කොහොමද, මේ කිරිහරක් ඉන්නේ? ඒකෙන් වෙන්නේ එම වනෝද්‍යානය තුළ සිටින සතුන්ට කන්න තිබෙන තණ බිම් ටික නැති වෙලා යන එකයි. මේ ගැන අපි දිගින් දිගටම පාර්ලිමේන්තුවේදී කථා කළා; කාගේද මේ හරක්, කොහෙන්ද මේ සතුන් ඇවිල්ලා ඉන්නේ කියා අපි ඒ ගැන කථා කළා. නමුත් අද වනතුරුත් ඒ හරක් ටික එම ස්ථානයෙන් ඉවත් කරන්න කාටවත් බැරි වෙලා තිබෙනවා. ඒ වනෝද්‍යානය ඇතුළේ හරක් ඉන්නවා. හරක් ඉන්නත් ඕනෑ තමයි. හැබැයි, හරකුන්ට ඉන්න වෙනම තණ බිම් හදන්න ඕනෑ. ඒක වෙනම කාරණාවක්. මම මේ කියන්නේ ජාතික වනෝද්‍යානයක් ගැනයි. අද වනවිට අලි -මිනිස් ගැටුම් වැඩි වෙලා තිබෙන්නේත් අලි ඉන්නා තැන්වලට හරක් ගෙනිහින් දමන නිසායි. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධවත් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා.

ඒ වාගේම අපේ රටේ තිබෙන ජාතික වනෝද්‍යානවල පවතින අඩුපාඩු ටික සකස් කර දෙන්න කියාත් මම ඉල්ලා සිටිනවා. මම මේ ඒවායේ පවතින අඩුපාඩු ගැන ඉතාම කෙටියෙන් කිව්වේ. මම කිව්වාට වඩා අඩුපාඩු විශාල ප්‍රමාණයක් ඒවායේ තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරලා, මේ ජාතික වනෝද්‍යාන ටික නැවත සකස් කර ගත්තොත්, අපට ඒවායින් විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්, ගරු සභාපතිතුමනි.

පසුගිය කාලයේ ගරු ජනාධිපතිතුමා කියනවා අපි අහගෙන හිටියා, දේශීය කිරි ගොවියා ශක්තිමත් කිරීම සඳහා රුපියල් මිලියන 2,500ක් වෙන් කර තිබෙනවා කියලා. ඒක හොඳයි. හැබැයි, ඒ අය ඒ කිරිහරකුන් තියා ගන්නේ කොහේද? ඒ සතුන් ජාතික වනෝද්‍යාන තුළට නොයවා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්කත් කථා කරලා, පරිසරයට හානියක් නොවන විධියට ඒ අයට තමන්ගේ හරක් ටික ගාල් කරගන්න අවශ්‍ය කරන කොටු ටික හදා ගන්න ස්ථානයක් ලබා දෙන්න වෙනවා.

දැන් වනජීවී කලාපයකට කිසිම කෙනෙකුට ඇතුළු වෙන්න බැහැ. ගරු සභාපතිතුමනි, මුළු ලංකාවම ගත්තොත්, මේ වනජීවී කලාපවල තිබෙන විල්වලට ගමේ ඉන්න කාටවත් ගිහිල්ලා බිලී පිත්තක් දාලා මාළුවෙක්වත් අල්ලා ගන්න බැහැ. හැබැයි, එහෙම වෙන්න බැහැ. ඒ සඳහා නිසි ක්‍රමවේදයක් හදන්න ඕනෑ. නිසි ක්‍රමවේදයක් හදලා ඒ අයට හැඳුනුම්පතක් හෝ නිකුත් කර දෙන්න ඕනෑ. ඒගොල්ලන් මහා පරිමාණයෙන් නොවෙයි, බිලී පිත්තෙන් තමයි මාළු අල්ලන්නේ. හැබැයි, බිලී පිත්තක් දාලා එහෙම මාළු අල්ලන කෙනෙක් අහු වුණොත් ඒ පුද්ගලයාට රුපියල් 25,000ක දඩයක් ගහනවා, ගරු සභාපතිතුමනි. එහෙම වෙන්න බැහැ. අදාළ වනජීවී නිලධාරීන් සමඟ කථා කරලා, මේ අයට විශේෂ හැඳුනුම්පතක් ලබා දීලා, ඒ කලාපයට ගිහිල්ලා ඒගොල්ලන්ට අවශ්‍ය කරන දේ කරගෙන නැවත එන්න අවස්ථාව උදා කර දෙන්න.

ගරු සභාපතිතුමනි, කුඩා හා මධ්‍යම පරිමාණයේ මැණික් ව්‍යාපාරිකයෝ රට පුරා ඉන්නවා. ඔබතුමා දන්නවා, පොළොන්නරුවේ ඇලහැර, බකමූණ, කලාගල වාගේම අපේ ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය නියෝජනය කරන ලග්ගල ප්‍රදේශයේත් එවැනි ව්‍යාපාරිකයින් සිටින බව. නමුත්, මේ කුඩා හා මධ්‍යම පරිමාණයේ කැණීම් කරන පුංචි මැණික් ව්‍යාපාරිකයින් අද ලොකු ගැටලුවකට මුහුණ දෙනවා. ඒගොල්ලන් ගිහිල්ලා බැකෝ දාලා මැණික් ගරන්නේ නැහැ. ඒගොල්ලන් කූඩයක් අරගෙන ගිහිල්ලා ගහට බැහැලා මැණික් හොයාගෙන බොහොම සාධාරණව ඒ ව්‍යාපාරය කරගෙන ගියා. ඔවුන් පාරම්පරික මැණික් ව්‍යාපාරිකයෝ. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම යෝජනා කරනවා, මේ අය හඳුනාගෙන ඒගොල්ලන් කොහොමද මේ කැණීම් කරන්නේ කියලා ඒ අයත් එක්ක සාකච්ඡා කරලා, ගංගා ඉවුරට සහ ගංගාවලට හානියක් නොවන විධියටත්, ඒ පරිසරයට හානියක් නොවන විධියටත් ඒ අයගේ වෘත්තීය කරගෙන යන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ තිබෙන ජාතික වනෝද්‍යානවල මාර්ගෝපදේශකවරු ඉන්නවා. මේ මාර්ගෝපදේශකවරු තමයි Park එකට සංචාරකයෙක් ගියාම ඒ අය අදාළ පාරවල්වල එක්කගෙන යන්නේ. සමහර සංචාරකයෝ විවිධාකාර සත්තු බලන්න කැමතියි. මේ මාර්ගෝපදේශකවරුන් අවුරුදු 12ක්, 15ක් කිස්සේ වැඩ කරන නිසා ඔවුන්ට මේ සම්බන්ධයෙන් මනා අවබෝධයක් තිබෙනවා. හැබැයි, තවමත් ඒ අය එම සේවාවේ ස්ථිර කරලා නැහැ. පසුගිය කාලයේ මේ මාර්ගෝපදේශකවරුන්ගේ දීමනාව හැටියට රුපියල් 600යි දුන්නේ. අපේ ගරු විපක්ෂ නායකතුමා මේ දීමනාව රුපියල් 1,000ක් කර දෙන්න කියලා ඉල්ලීමක් කළා. එවකට ඇමතිවරයා විධියට කටයුතු කරපු ගරු මහින්ද අමරවීර මැතිතුමාත්, අපිත් කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා රුපියල් 600ක මුදල රුපියල් 1,000ක් කළා. හැබැයි, තවම මේ අයගේ සේවය ස්ථිර කරලා නැහැ. මාර්ගෝපදේශකවරු 450කට වඩා හිටියා, අපේ රටේ තිබෙන ජාතික වනෝද්‍යානවල. දැන් ඉන්නේ 200කට වඩා අඩු සංඛ්‍යාවක්. දැන් මේ අයට හොඳ දැනුමක් තිබෙනවා. ඒ වාගේම Park එකට එන සංචාරකයින්ට මොන වාගේ දේවල් ද අවශ්‍ය කරන්නේ කියලා මේ අය දන්නවා. ඔවුන්ට ඒ park එක ගැන මනා අවබෝධයක් තිබෙනවා. ඒ නිසා මේ අයගේ සේවය ස්ථිර කර දෙන්න කියලා තමයි මම යෝජනා කරන්නේ.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බහුකාර්ය සංවර්ධන නිලධාරීන් 4,731ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ගත්තා. ඔවුන් කරන්නේ අලි වැට බලා ගැනීම පමණයි. දීමනාවක් විධියට මාසයකට රුපියල් 22,500ක් ඔවුන්ට ලැබෙනවා. හැබැයි, ඔවුන් පැය 24ම සේවය කළ යුතුයි. ඒගොල්ලන්ගේ ජීවිත පවා අවදානම්. ඒ නිසා ඔවුන්ගේ සේවය ස්ථිර කර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු සභාපතිතුමනි, මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමනි, GSMB කියන ආයතනයේ ඉංජිනේරුවරයෙක් ඉන්නවා, එච්.ඒ.සී.කේ.ඩබ්ලිව්. බණ්ඩාර කියලා. එතුමා පොළොන්නරුවේ සේවය කළ පුද්ගලයෙක්. එතුමාට විරුද්ධව චෝදනා රාශියක් තිබෙනවා. එලෙස චෝදනා රාශියක් තිබියදීත් එතුමා නැවතත් අම්පාර ප්‍රදේශයට, මේ තනතුරටම පත් කර තිබෙනවා. එතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා, 2020.07.10වැනි දින. මේ සම්බන්ධයෙන් කථා කරන්න මට වෙලාව මදි නිසා ඊට අදාළව මා ළඟ තිබෙන ලිපි සියල්ල සභාගත කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, එම පුද්ගලයා දීර්ඝ කාලයක් පොළොන්නරුවේ සේවය කර අම්පාරට ගියා. නැවත එතුමා මේ තනතුරටම පත් කර තිබෙනවා. එතුමා මේ තනතුරටම පත් කළාම ඒ ආයතනයේ නිලධාරීන් සහ ඒ ප්‍රදේශයේ ජනතාව සභාපතිවරයා හමු වෙන්න ගිහිල්ලා තිබෙනවා. ඊට පස්සේ සභාපතිවරයා කිව්වා ලු, "දැන් බලය තිබෙන්නේ අපට. අපට ඕනෑ විධියටයි මේවා කෙරෙන්නේ. ඒ නිසා දූෂණයට ලක් වුණු කෙනෙකු හෝ නොවුණු කෙනෙකු කියන එක අපට අදාළ නැහැ. ඒ නිසා මේ පුද්ගලයා තමයි මේකේ ඉංජිනේරුවරයා විධියට පත් කරන්නේ" කියලා. එයට අදාළ ලිපි කිහිපයක් මා ළඟ තිබෙනවා. මම ඒ ලිපි කිහිපය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Hiniduma Sunil Senevi. You have 16 minutes.

[පූ.භා. 10.24]

ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු සභාපතිතුමනි, නව රජය ඉදිරිපත් කළ 2025 පුරවැසි අය වැය යටතේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂය සම්බන්ධයෙන් වූ කාරක සභා අවස්ථාවේ විවාදය අද දවසේ පැවැත්වෙනවා. ඒ තමයි, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය. එම විෂය භාර අමාත්‍යවරයා ලෙස මා ඉතා සතුටින් මේ විශිෂ්ට, සන්ධිස්ථානමය වටිනාකමක්, වැදගත්කමක් උසුලන විවාදය අපේ පැත්තෙන් ආරම්භ කරන්න සූදානම්. කපා හැරීමේ යෝජනාව ඉදිරිපත් කරමින් විවාදයට ආරම්භයක් ලබා දුන්නු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා පරිසර විෂයය පැත්ත තමයි කථා කරන්න තෝරා ගත්තේ.

ඒක එතුමාගේ තෝරා ගැනීම වෙන්න ඇති. ඒත් මෙම කාරක සභා අවස්ථාවේ කපා හැරීමේ යෝජනාව ඉදිරිපත් කරමින් එතුමා විවාදය ආරම්භ කළ නිසා මා කල්පනා කළා, වනඅලි, හරකුන්, මීමින්නෝ ගැන කථා කරලා ඉවර වෙලා කලා, සංස්කෘතික ජීවිතය ගැන, ආගමික ජීවිතය ගැන එක වචනයක් හෝ එතුමා කථා කරාවි කියලා. නමුත් එහෙම වුණේ නැහැ. කමක් නැහැ. ඇත්තටම මේක තමයි අපේ රටට වුණේ. ඔබතුමන්ලා පොඩ්ඩක් බලන්න, විපක්ෂය දිහා. මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරන අද දවසේ මේ සභාවේ ආසන කොයි තරම් පාළුවට ගිහිල්ලාද බලන්න. අපරාධ උත්කර්ෂයට නංවන්න පුරුදු වෙච්ච ජනමාධ්‍යයක් අපට හැදුණේ මෙන්න මේ නොතකා හැරීම නිසායි. දූෂණයට ලක් වුණු කාන්තාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඒ වෘත්තිය අනුව විතරක් උද්ඝෝෂණ කරන වෘත්තියභාව ඇති වුණේ මේ නොතකා හැරීම නිසායි. අපේ සභානායකතුමාට ස්ථාවර නියෝග සිහිපත් කරවලා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ භාෂාව ගැන කථා කරන්න වෙන්නේ, අපහාස කරන්න එපා කියලා ඉල්ලන්න වෙන්නේ, මෙන්න මේ බලවත් නොතකා හැරීම නිසායි.

ස්ථාවර නියෝග හදන්නේ කවුද? ස්ථාවර නියෝග හදන්නේ ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය, කලාව, සංස්කෘතිය හා ආගමික ජීවිතය. අන්න ඒ සඳහා තමයි අපේ අමාත්‍යාංශය තිබෙන්නේ. ස්ථාවර නියෝග හදවතේ ස්ථාවර ලෙස සටහන් වූ ප්‍රජාවක් හදන්න තමයි මේ පුරවැසි අය වැය මේ සැරේ බරපතළ වැය ශීර්ෂයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම කැමැතියි, රජය වෙනුවෙන් කෙරෙන ආරම්භක කථාවේදී මූලික, වැදගත් කරුණු රැසක් වේගයෙන් ඔබ හමුවේ තබන්න.

ගරු සභාපතිතුමනි, කලා සහ සංස්කෘතික අඩවිය කියන්නේ, මා පර්යේෂණ කළ, මා පුහුණුව ලද ක්ෂේත්‍රය. ලංකාව අඩුවෙන්ම බර තබා තිබූ ක්ෂේත්‍රය. ඒ වාගේම තමයි සැහවුණු විපාක, නිහඬ විපාක බහුල ක්ෂේත්‍රය. මේ ක්ෂේත්‍රයට කර තිබෙන මේ නොතකා හැරීම නිසා තමයි අද අපට ඇසින් දකින්න බැරි, කනින් අහන්න බැරි වර්ගයේ අපරාධ ප්‍රචණ්ඩත්වය හැටියට මහ පාරේ දකින්න ලැබෙන්නේ. එම නිසාම ජාතික ජන බලවේගය රජය ආගමික හා සංස්කෘතික ක්ෂේත්‍රයට විශාල පිරිනැමීමක්, පිරිවැයක් මේක අඩවියක් හැටියට වටහාගෙන වෙන් කරලා තිබෙනවා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" අපට හදන්න පුළුවන් වෙන්නේ මේ බර තැබීම මතයි.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශය ප්‍රධාන වශයෙන්ම තේමා දෙකක් යටතේ පිරිවැය බර තබා තිබෙනවා. එකක් තමයි, ආගමික කටයුතු. දෙවැනි එක තමයි, සංස්කෘතික හා ජාතික උරුමයන්. ආගමික කටයුතු අපේ රටේ ප්‍රධාන ආගම් 4ටම - බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කිතුනු කියන ක්ෂේත්‍ර හතරටම- බෙදී යන බව ගරු සභාව දන්නවා. මෙම අමාත්‍යාංශයේ ප්‍රගතිය සඳහා මෙවර අය වැයෙන් වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 13,725ක්.

එය වෙන විධියකට කිව්වොත්, රුපියල් බිලියන 13.7ක්. එය පසු ගිය වර්ෂයට සාපේක්ෂව රුපියල් බිලියන 3.5ක මුදලක් වැඩියෙන් වෙන් කිරීමක් කියන එක මා අවධාරණය කරන්න ඕනෑ. මේ පුරවැසි අය වැයෙන් අපේ රජය බලාපොරොත්තු වන විශිෂ්ට කර්තව්‍යයන් වන කලා, සංස්කෘතික, ආගමික දේහයේ ප්‍රගතිය නංවන එක තිබෙන්නේ මේ රුපියල් බිලියන 3.5 තුළයි. ඒ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

සඳහා අරමුදල් රැස් කර ගන්නට අපි අපේක්ෂා කරන්නේ මෙන්න මේ විධියටයි. ඒ, දේශීය අරමුදල් පැත්තෙන් රුපියල් මිලියන 12,684ක්, විදේශීය අරමුදල් පැත්තෙන් රුපියල් මිලියන 1,041ක්.

මම දැන් කැමැතියි, ආයතන 26ක් උදෙසා වෙන් වී ඇති මේ මහා මුදල් ප්‍රමාණය වැය ශීර්ෂ ලෙස සාරාංශකරණය කරලා ඉදිරිපත් කරන්න. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 4,175ක්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 1,970ක්, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 210ක්, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 270ක්, ඒ වාගේම, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 300ක්, මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 135ක්, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 1,600ක් වෙන් කරලා තිබෙනවා. අපි ඒ දෙපාර්තමේන්තුවට විශාල මුදලක් වෙන් කරලා තිබෙන්නේ, එතැන තමයි මේ පුරවැසි ජීවිතය නංවන්න ඕනෑ කරන වැඩ බිම තිබෙන්නේ.

ඒ වාගේම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 2,520ක් වෙන් කරලා තිබෙනවා. යම් කෙනෙකු හිතන්න පුළුවන්, මේ මිය ගිය ජීවිත ගැන, මේ ගල් කණු ගැන, මේවා ගැන සොයන්නද මේ තරම් මුදලක් වෙන්කරන්නේ කියලා. එහි හරය මා පසුව පැහැදිලි කරන්නම්. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 780ක්, එසේම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 1,765ක් වෙන් කරලා තිබෙනවා. මෙන්න මේ ආකාරයට තමයි, මේ මුදල් බෙදිලා යන්නේ.

ගරු සභාපතිතුමනි, ආගමික කටයුතු කියන ක්ෂේත්‍රයේ අපේ රටේ ප්‍රධාන ආගම් හතරටම අදාළ ව්‍යාපෘති රැසක් අඛණ්ඩව ක්‍රියාත්මක වෙනවා. දිවයින පුරා විවිධ ආගම්වලට අයත් දහම් පාසල්වල තරග විභාග, දහම් ග්‍රන්ථ මුද්‍රණය, ඒ වාගේම ගුරුවරුන්ගේ නිල ඇඳුම් ඇතුළු පහසුකම් විශාල ප්‍රමාණයක් වෙනුවෙන් මෙවර සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන් දහම් පාසල් ගුරුවරුන්ගේ නිල ඇඳුම් වැනි කාරණාවලට වැඩි බර තැබීමක් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි මේ ගත කරමින් සිටින්නේ අපේ මුස්ලිම් බැතිමතුන්ගේ රාමසාන් කාලය; රාමසාන් සමය. අපි ඒ අයට සුබ පතමින්, අපේ ආශීර්වාදයත් එකතු කරමින් මතක් කරන්නට ඕනෑ, ඒ වෙනුවෙන් අපේ තිබෙන මැදිහත්වීම ගැන. උදාහරණ කීපයක් මතක් කළොත්, අපි ජාතික තෙපොංගල් උළෙල යාපනයට වෙන් කළා. ඒ වාගේම, මහා ශිවරාත්‍රිය වෙනුවෙන් පැවැත්වෙන ජාතික උළෙල අපි රත්නපුරයට වෙන් කළා. අපි දන්නවා, පසුගිය දවස්වල කව්වනිව් දූපතේ කිතුනු බැතිමතුන්ගේ මහා සැමරුමක් තිබුණු බව. ඉන්දියාවෙන් පවා විශාල පිරිසක් මේකට සහභාගි වෙනවා. මේ පූජා භූමි සංවර්ධනය, මුස්ලිම්, හින්දු, කතෝලික සිද්ධස්ථාන සංවර්ධනය, ආගමික ස්ථාන සඳහා සූර්ය පැනල, නැත්නම් සූර්යබල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වාගේ කාරණා රාශියකට මෙතැනදී අවධානය යොමු වෙනවා. ගරු සභාපතිතුමනි, වසර 16කට පසු සිරි දළදා දැක්මත් අපේ රජය සුදානම් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් විශාල පිරිවැයක් සහ මැදිහත්වීමක් අපේ රජය දරන්න බලාපොරොත්තු වෙනවා. මේක අනුස්මරණීය අත්දැකීමක් වෙනවා නොඅනුමානයි. ඒක මෙහෙයවන, ඒකට නායකත්වය දෙන අමාත්‍යාංශයක වගකීම දරන්නට ලැබීම මා සලකන්නේ භාග්‍යයක් ලෙසයි.

ගරු සභාපතිතුමනි, කලා සංස්කෘතික අඩවිය හා ජාතික උරුම සංරක්ෂණය තමයි අපේ ඊළඟ අඩවිය. මේක මීල කළ නොහැකි කලාපයක්. ඉතා වටිනා ආයතන රැසක් ලෙස අප ඉදිරියේ තිබෙනවා මේ කොටසට අයිති ආයතන ලෙස. නිදර්ශන විධියට ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, - මේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඉරණම ගැන; අපට භාර දුන්න අරමුදලේ තත්ත්වය මම හිතන විධියට මේ සභාවේ අපි ඕනෑතරම් කථා කරලා තිබෙනවා- ජාතික කෞතුකාගාරය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, ජාතික පුස්තකාලය, ටවර් හෝල් රහඟල ආදී ආයතන රාශියක් මෙතැන තිබෙනවා. ගරු සභාපතිතුමනි, මා කලින් සඳහන් කළා, මේ අඩවියට වෙන් කරන ප්‍රතිපාදනවල විපාක දකින්න ලැබෙන්නේ කල් ගිහිල්ලා කියලා. මේ අඩවියේ ප්‍රතිපාදන කියලා කියන්නේ ශිෂ්ටාචාරමය ආයෝජන. මේක තමයි අපට පෙනෙන්නේ නැති කාරණය. මේ ඔබට අපට හුරුපුරුදු, ලාභ පාඩු සූත්‍ර එක්ක සාමාන්‍යයෙන් වැඩ කරන අඩවියක් නොවෙයි. උදාහරණයක් හැටියට ගත්තොත්, මීට වසර ගණනාවකට කලින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ තදනුබද්ධ පර්යේෂණ කණ්ඩායම් පාණියංගල මානවයා ලෙස නම් කරපු ඇටසැකිලි සොයාගත්තා. එය වසර 10,600කට වඩා පැරණි අස්ථි පද්ධතියක්. අප සතු පැරණිතම මානව අස්ථි අවශේෂ තිබෙන්නේ මෙතැන. මේක නිධානයක් වාගෙයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය, කාය විච්ඡේද අධ්‍යයන අංශය සහ ජාතික කෞතුකාගාරය මේකට මැදිහත් වුණා. මහාචාර්යවරු එදා කිව්වා, මීල කළ නොහැකි මේ අස්ථි පද්ධතියේ විනාශ නොවුණු DNA ආරක්ෂා වෙලා තිබෙන්න පුළුවන් බව, ආචාර්ය උපාධි 7, 8කට අවශ්‍ය දේවල් මෙතැන තිබෙන බව සහ පර්යේෂණ පත්‍රිකා සිය ගණනක් මෙතැන තිබෙන බව.

ඒ නිසා තමයි ගරු සභාපතිතුමනි, අපි research and development, එහෙම නැත්නම් පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලට විශාල මුදලක් වෙන් කරන්නේ. මේවායින් තමයි මුළු ශ්‍රී ලංකාවම අපට නැගිටිටවන්න පුළුවන් වන්නේ. ආර්ථිකය හා කලා සංස්කෘතික දේහය කියන්නේ එකම සිරුරක හදවත සහ මනස වාගේ වෙන් කළ නොහැකි අර්ධ දෙකක්; භාග දෙකක්. අපේ රජය මේ අර්ධ දෙකටම එක සේ ප්‍රතිපාදන වෙන් කරලායි තිබෙන්නේ.

ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහත්මයා ඊයේ මා සමඟ සහභාගි වුණා, චිත්‍රපටයක මංගල දර්ශනය නරඹන්න. මුදල් අමාත්‍යාංශය කියන්නේ ආර්ථිකය. මගේ අමාත්‍යාංශය කියන්නේ කලා, සංස්කෘතික දේහය. ඒ අර කියපු අර්ධ දෙක. පරාක්‍රම නිරිඇල්ල මහත්මයාගේ "සිහිනයකි දෙපා නැති" කියන විශිෂ්ට චිත්‍රපටය තමයි අපි බැලුවේ. එහි තේමාව තමයි "කොරා සහ අන්ධයා" කියන එක. ඒක ප්‍රසිද්ධ තේමාවක්. පරිපූර්ණත්වය පතා අන්ධයාගේ පිටේ නැඟපු කොරා මේ ගමන යනවා. එය දුෂ්කර ගමනක්; දැඩි අසීරු ගමනක්. හරියට අපේ රජය ඉලක්කයකට මේ ගමන යන්නේ, මෙන්න මේ වාගේ කලාව සහ සංස්කෘතිය වාගේම ආර්ථිකය කියන අර්ධ දෙකම එකතු කරගෙන. මොකද, මේ අර්ධ දෙක අතහරින්න බැහැ. එකිනෙකාට අවශ්‍යයි. හරියට එක්කෙනෙක් නැතුව අනික් එක්කෙනාට අඩියක්වත් තියන්න බැහැ වාගෙයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, පොහොසත් රට සහ ලස්සන ජීවිතය හැදෙන්නේ මෙන්න මේ අර්ධ දෙකම එකතු වෙලා.

චිත්‍රපටයේ අපි දැක්ක ඒ අන්ධ තරුණයා, ජාත්‍යන්ධයෙක්. ජාත්‍යන්ධයෙක් කියන්නේ ගරු සභාපතිතුමනි, උපතින්ම අන්ධ අයට. අපේ ජන ජීවිතය, අපේ කලා සංස්කෘතික ජීවිතය, අපේ ආර්ථික ජීවිතය අන්ධ කළේ, කොර කළේ, බිහිරි කළේ පසුගිය රජයන් සියල්ල එකතු වෙලා. එය, ඒගොල්ලන්ගේ මැදිහත්වීමෙන් කළ දෙයක් මිසක් ඉපදෙනකොට තිබිච්ච

ලක්ෂණයක් නොවෙයි, කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසා අපට මෙන්න මේ අංගවිකලභාවයෙන් යුක්ත යථාර්ථයක් තමයි භාර ගන්න වුණේ නැඟිටිටවන්න, ගරු සභාපතිතුමනි.

මගේ ක්ෂේත්‍රය කලා, සංස්කෘතික ක්ෂේත්‍රය නිසා වැඩිපුර මම කැමැතියි, ඒ ගැන කථා කරන්න. මේ අවස්ථාවේ මම කැමැතියි, කවියක් මතක් කරන්න.

පියන්කාරගේ බන්දුල ජයවීර කවියා මෙහෙම ලිව්වා:

"තාත්තේ ඇයි අපට කාර් එකක් නැත්තේ?
පුතේ ඒ අපට පුස්තකාලයක් තියෙන නිසා"

ඒක ලස්සන වාගේ පෙනුණාට වේදනාබර කවියක්. ලංකාවේ හැම පවුලකටම අයිති වෙන්න තිබ්බ කාර් එකයි, පුස්තකාලයයි දෙකම විනාශ කරපු ආණ්ඩු තිබුණේ. ඒ නිසා අප ඉදිරියේ හදන්නට තිබෙන්නේ කොයි වාගේ පවුලක්ද? කාර් එකකුයි, පුස්තකාලයකුයි දෙකම තියාගන්න පුළුවන් ලස්සන පවුලක් ජාතික ජන බලවේගය යටතේ අපි හදනවා. ඒක හදන පුරවැසි අය වැයේ අපේ අමාත්‍යාංශයේ කොටස තමයි මම ඔබත් එක්ක බෙදා ගනිමින් ඉන්නේ.

ඒ වාගේම, ඊයේ නිරිඇල්ල මහත්මයා කිව්වා වාගේ ඒ චිත්‍රපටයේ තිබුණේ දෙපා නැති සිහිනයක් ගැනයි. අපි ඒ සිහිනය නිසැකවම නැඟිටුවනවා අපේ දෙපා මත, අපේ ජීවිත කාලය තුළ.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලාංකික දිනය - Sri Lanka Day - මේ අය වැයේ දකින්න තිබෙන තවත් විශේෂ කොටසක්. අන්න එය වෙනුවෙන් අය වැය යෝජනා අංක 33 යටතේ රුපියල් මිලියන 300ක් වෙන් වෙනවා. ජාතිය, ජන වර්ගය නොතකන, කුලය, ප්‍රාදේශීය වාද නොතකන, අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ වාද විවාද නොතකන -ඒවා ගැන තැකීමක් කරන්නේ නැති- තනි යායක් වාගේ වෙව්ව ලංකාවක් හදන්න නම් මෙන්න මේ ශ්‍රී ලාංකික දිනය දැන්වත් අපට ඕනෑ වෙනවා. ඒකට විශාල මුදලක් -රුපියල් මිලියන 300ක් වාගේ මුදලක්- වෙන් වන්නේ ඒ නිසායි. බෙදීම් නැති මහා ආත්මයක් සහිත පුරවැසියෙකු හදන්න අපේ අමාත්‍යාංශය ලොකු වගකීමක් දරනවා.

මට මේ කාරණයත් මතක් කරන්න තිබෙනවා. ඉදිරියේදී ජාතික වෙසක් උත්සවය එළඹෙනවා. ඒ වෙසක් උත්සවය වෙනුවෙන් රුපියල් මිලියන 12ක් වෙන් වෙනවා. කලින් වතාවේ රුපියල් මිලියන 10ක් වාගේ තමයි ඒ වෙනුවෙන් වෙන් වුණේ. නුවරඑළියේ තමයි මෙදා ජාතික වෙසක් උළෙල තිබෙන්නේ. මම කියන්න සතුටුයි, ජාතික වෙසක් උළෙලේ තේමා පාඨය. ඒ තමයි, "හජේථ මිත්තේ කල්‍යාණේ" කියන තේමාව. ඒ කියන්නේ, "කලණ මිතුරන් ඇසුරු කරන්න" කියන එකයි. ගරු සභාපතිතුමනි, නුවරඑළියේ පන්සල් 350ක් සහ පිරිවෙන් 11ක් තිබෙනවා. අපි නුවරඑළියේ පන්සල් ඇසුරු කරගෙන ජාතික වෙසක් උත්සවය සමරන්න බලාපොරොත්තු වන්නේ, මලයගම් ජනතාවත් එක්කයි. ඒ මලයගම් ජනතාවගේ දරුවන් එක්ක වෙසක් කූඩු හදන තැනකට අපි ජාතික වෙසක් උත්සවය ගෙන යන්න ඕනෑ. මේක තමයි මම කියපු අර විශිෂ්ට පුරවැසි ජීවිතය.

කතෝලික ප්‍රජාව වෙනුවෙන් ද අපි ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. වැඩසටහන් රැසක් තිබෙනවා. යූටියුබ් නාළිකා හා නාට්‍ය, පසන් ගීතිකා වෙනුවෙන් විශාල මුදලක් වෙන් වෙනවා. ගරු සභාපතිතුමනි, අප්‍රේල් 21වන දාත් ළඟ එනවා. එදාට අපි මොකද කරන්න ඕනෑ? එදා ජීවිත බිලිගන්න අභිමුඛ වෙච්ච කතෝලික, මුස්ලිම් ජනතාව ආදරයෙන් වැලඳගන්නා තැනට ඒ ජාතීන් අතර ආදරය බෙදන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, සුවපත් කිරීමේ සහ සමාව දීමේ ඇත්ත කොමිසමක් - Truth and Reconciliation Commission - අපි දැන්වත් හදන්න ඕනෑ. මෙහි වගකීම විශාල වශයෙන් බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට පැවරෙනවා.

දකුණු අප්‍රිකාවේ නෙල්සන් මැන්ඩෙලා හැදූ "දේදුනු ජාතියක්" හෙවත් "Rainbow nation" එකක් දැන්වත් අපට ඇත්තටම අවශ්‍යයි. "ඇත්තටම අවශ්‍යයි" කියලා මා කියන්නේ ඒ වෙනුවෙන් ගත්තු උත්සාහයන්හි තැවරී තිබුණු ව්‍යාජ දේශපාලන අලංකරණ නිසා. අපි Sri Lanka Day වෙනුවෙන් රුපියල් මිලියන 300ක් වෙන් කරන්නේ අන්න ඒ ඇත්ත උත්සාහය සඳහායි.

මට මතක් වෙනවා "Invictus" කියන චිත්‍රපටය. රොබින් දූපතේ අවුරුදු 26ක්, 27ක් හිර කරලා හිටපු නෙල්සන් මැන්ඩෙලා නිදහස් වෙලා ආවාට පසුව ඔහුට පුළුවන් වෙනවා ඔහුගේ සාතකයන්ට, ඔහුගේ පීඩකයන්ට ඇත්තටම සමාව දෙන්න. ඒ සමාව දෙන්න ගිය මොහොතේ ඔහුගේ කළු ජාතික මිතුරන් අහනවා, "ඔබට පුළුවන්ද සුදු ජාතියට මේ වාගේ සමාව දෙන්න?" කියලා. මැන්ඩෙලා කියන්නේ "Reconciliation starts here" කියලායි; "දැන් ආරම්භ කරන්න ඕනෑ සංහිඳියාව" කියලායි. මැන්ඩෙලාගෙන් අවසාන වශයෙන් අහනවා, "ඔබ එයාලාට සමාව දෙනවාද?" කියලා. ඔහු කියනවා, "Yes, forgiveness starts here, too" කියලා; "සමාව දීමත් ඇරඹෙන්නේ මෙතැනින්" කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is over.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු කියන මේ විශිෂ්ට වටිනාකම්, පරාමිතීන් දරන අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මේ තරම් මුදලක් මේ සැරේ වෙන් කර තිබෙන්නේ මේ බිඳ වැටුණු ශ්‍රී ලංකාව ගොඩ නඟන්නයි. ආරම්භක අදහස් දැක්වීමේදී මම ක්ෂේත්‍ර සියල්ල ආවරණය කළාට අපේ සහෝදර මන්ත්‍රීවරු, අමාත්‍යවරු ඉදිරියේදී මෙහි විශේෂිත ක්ෂේත්‍ර පිළිබඳව දීර්ඝව කථා කරනවා ඇති.

ගරු සභාපතිතුමනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Leader of the Opposition. You have 18 minutes.

[පූ.භා. 10.41]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු සභාපතිතුමනි, අද දවසේ අය වැය කාරක සභා අවස්ථාවේ වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ කිහිපයක් පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ මම කැමැතියි මේ හැම මාතෘකාවක් පිළිබඳවම කථා කරන්න. නමුත්, තවත් කථිකයින් විශාල පිරිසක් සිටින නිසා, විශේෂයෙන් පරිසර ක්ෂේත්‍රය කේන්ද්‍ර කරගෙන අදහස් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඇත්ත වශයෙන්ම මේ කථාවෙනුත් අපි රජයට ඉදිරිපත් කරන්නේ ප්‍රායෝගික යෝජනායි. ඒ යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් අපේ රටට අගයක්, වටිනාකමක් එකතු වෙනවා.

පළමුවෙන්ම අපේ රටේ ජාතික පරිසර පද්ධතිය අගැයීමක් - national ecosystem assessment එකක් - හරහා valuation එකක් ලබා ගැනීම අනිවාර්යයෙන්ම අවශ්‍යයි. මොකද, අපේ රටේ පරිසර පද්ධතිය හරහා ජෛව විවිධත්ව වටිනාකම, ඒ වාගේම පරිසර පද්ධතිය ලබා දෙන සේවා, ඒ සේවාවලින් මානව සංහතියේ පැවැත්ම තහවුරු වන ආකාරය කියන කරුණු කාරණා පිළිබඳව පුරවැසි සියලුදෙනා හොඳ අවබෝධයකින් කටයුතු කරන්න ඕනෑ.

මේ පරිසර ක්ෂේත්‍රයට අදාළව බොහෝ අවස්ථාවල අප දකින්නේ පැලැස්තර විසඳුම්. නමුත් අපේ රටේ භූගෝලීය පිහිටීම අනුව අපි සංරක්ෂණ ඉලක්ක නිර්මාණය කර ඉදිරියට යන්නට ඕනෑ. දේශපාලන පක්ෂයක් හැටියට සමගි ජන බලවේගය, සමගි ජන සන්ධානය ප්‍රධාන ධාරාවේ හරිත දේශපාලන පක්ෂයක්. ශ්‍රී ලංකාව; අපේ රට; අපේ මාතෘ භූමිය විශේෂයෙන්ම ජෛව විවිධත්ව උණුසුම් කලාප 36න් එකක් හැටියට සැලකෙන, ජෛව විවිධත්ව ඝනත්වය ඉහළ ස්ථානයක තිබෙන, ස්වාභාවික තිරසර පද්ධතියක අවශ්‍යතාව තිබෙන, තිරසර සංරක්ෂණය සහ තිරසර සංවර්ධනය ක්‍රියාත්මක විය යුතු රටක්.

පසුගිය ජනාධිපතිවරණයේදීත්, 2019 ජනාධිපතිවරණයේදීත් අප ඉදිරිපත් කරපු පරිසර සැලැස්ම -පාරිසරික ප්‍රඥප්තිය- මම මේ මොහොතේත් ඉදිරිපත් කරනවා. ඒ වාගේම, පරිසර විෂය කේන්ද්‍ර කරගෙන අපි "Project Elephant", "Project Leopard" and "Project Blue" යනාදි වශයෙන් වනඅලින්, වනයේ සිටින කොටින්, ඒ වාගේම තල්මස් සම්පත කේන්ද්‍ර කරගෙන විශේෂිත වූ ජාතික ව්‍යාපෘති තුනක් පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. සියලු දෙනාගේ පරිශීලනය සඳහා එකී ලේඛන මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

කෙසේ වෙතත්, අපේ රටේ පරිසරය ශක්තිමත් කිරීමට නම් පරිසර පද්ධතිය ආරක්ෂා කිරීමට නම් අපි විශ්වාස කරනවා පළමුවෙන්ම ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් අවශ්‍යයි කියලා. ඒ වාගේම ජාතික භෞතික සැලැස්මකුත් අවශ්‍යයි. මේ පිළිබඳව පුළුල් එකඟතාවක් පක්ෂ දේශපාලන භේදයෙන් තොරව රට තුළ ක්‍රියාත්මක වන්නට ඕනෑ.

ජෛව විවිධත්ව සංරක්ෂණය උදෙසා, ජෛව විවිධත්ව සම්පත් අපි value කරන්න ඕනෑ; එහි වටිනාකම අවබෝධ කරගන්න ඕනෑ.

යහපත් පරිසර කළමනාකරණ වැඩසටහන්, පරිසර දූෂණය අවම කිරීමේ වැඩසටහන්, ප්ලාස්ටික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩසටහන්, පාංශු බාදනය පාලනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වාගේම, අනවසර ආකාරයට වන විනාශය සිදු වන ව්‍යාපෘති තහනම් කිරීම කරන්නට ඕනෑ. මේ ආදී වශයෙන් පරිසර සංරක්ෂණයට අපි සර්වාංගික ප්‍රවේශයක් - integrated approach එකක් - ලබා ගන්නට ඕනෑ. ඒ වාගේම, අපි විශ්වාස කරනවා වක්‍රීය ආර්ථිකයක් කරා යොමු වෙන්නට ඕනෑය කියලා. වක්‍රීය ආර්ථිකය තුළ තිරසර සංවර්ධනය සහ සංරක්ෂණය අපේ ප්‍රධාන ඉලක්ක කර ගන්නට ඕනෑ. ප්‍රජා කේන්ද්‍රීය, ජනතා කේන්ද්‍රීය පරිසර සංරක්ෂණය අතිශයින්ම වැදගත්. පරිසර සංරක්ෂණය, වන ජීවී සංරක්ෂණය ප්‍රජා කේන්ද්‍රීය සහ පුද්ගල කේන්ද්‍රීය ආකාරයෙන් සැලසුම්ගත කරන්න අපට පුළුවන් නම්, ඒ සංරක්ෂණ රටාව නියත වශයෙන්ම සාර්ථක වෙනවා. We need to create an economic stake for the communities, for the stakeholders and for the people of our country in promoting wildlife conservation and forest conservation. එම නිසා ප්‍රජා කේන්ද්‍රීය, පුද්ගල කේන්ද්‍රීය සංරක්ෂණ වැඩසටහන් තුළ අපේ සංරක්ෂණ රටාව විශාල වශයෙන් ශක්තිමත් කර ගන්නට පුළුවන්. ඒ වාගේම, දේශගුණික විපර්යාස - climate change - ඇති වෙනවා. අද කවුරු මොන දේ කිව්වත් ඒක ලෝක සත්‍යයක්; ලෝකයේ යථාර්ථයක්.

අපි ප්‍රඥප්ති ගණනාවකට එකඟවෙලා තිබෙනවා. United Nations Framework Convention on Climate Change, 1992, Kyoto Protocol, 1997, පැරිස් සම්මුතිය, 2015, Montreal Protocol, 1987, Convention on Biological Diversity, 1992, Ramsar Convention on Wetlands, 1971, Stockholm Convention on Persistent Organic Pollutants, 2001, Sendai Framework for Disaster Risk Reduction, 2015 යනාදී වශයෙන් අපි කාලයෙන් කාලයට විවිධ ප්‍රඥප්තිවලට අපේ එකඟතාව ලබා දී තිබෙනවා. නමුත්, රටක් හැටියට කොතෙක් දුරට අපි ඒ ඉලක්ක සම්පූර්ණ කරලා තිබෙනවාද? අද "හරිත සංරක්ෂණය" කියන විෂයය කේන්ද්‍ර කරගෙන බංකොලොත් වූ අපේ රටට ජාත්‍යන්තර වශයෙන් අවස්ථා රැසක් නිර්මාණය වෙලා තිබෙනවා. අපේ රටේ පරිසර සංරක්ෂණය කේන්ද්‍ර කිරීම සඳහා Carbon Fund, විවිධ පරිසර සංරක්ෂණ මූල්‍ය ශක්ති වාගේ විවිධ අරමුදල් ලබාගෙන, පරිසර හිතෛෂී කර්මාන්ත ඇති කරන්න පුළුවන්. විශේෂයෙන් සංචාරක කර්මාන්තය සඳහා.

අද දවසේ සංස්කෘතික විෂයය ගැනත් කථා කළා. ගරු ඇමතිතුමාගේ අදහස්වලට මම එකඟ වෙනවා. මම ප්‍රාර්ථනා කරනවා, ඒ අදහස් මහ පොළොවේ සත්‍යයක්, යථාර්ථයක් බවට පත් කරන්නට අවස්ථාව ලැබේවා කියලා. මොකද, අපි බොහෝ දුරට දකින දේ තමයි, ප්‍රකාශන සහ ක්‍රියාත්මක වීම අතර සාමාන්‍යයෙන් ලොකු පරතරයක් තිබෙන එන. විශේෂයෙන්ම ඇයි අපට බැරි, ecotourism සංකල්පය යටතේ පැහැදිලිවම අපේ රටට විදේශ විනිමය - ඩොලර් - ගලාගෙන එන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න? මම සඳහන් කළා, "Project Elephant", "Project Leopard" and "Project Blue" ගැන. විශේෂයෙන්ම මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. 1971 හෝ 1972 ඉන්දියාවේ ඉන්දිරා ගාන්ධි මැතිනිය, වඳවීගෙන යන ව්‍යාඝ්‍රයින් - tigers - කේන්ද්‍ර කරගෙන conservation වැඩසටහනක් ක්‍රියාත්මක කළා. ඒ conservation වැඩසටහන පමණක් නොවෙයි, tiger tourism, ඒ කියන්නේ ව්‍යාඝ්‍රයා කේන්ද්‍ර කරගත් සංචාරක කර්මාන්තයක් නිර්මාණය කළා.

අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අද ව්‍යාඝ්‍රයාත් සුරක්ෂිතයි. ඉන්දියාවේ වනාන්තරවල tiger population එක ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම, ඒ ව්‍යාඝ්‍රයා කේන්ද්‍රීය දැවැන්ත ecotourism ප්‍රවර්ධනයක් සිදු වෙලා විශාල වශයෙන් මානව සම්පතට ඉහළ දායකත්වයක්, ඉහළ ශක්තියක් ලැබිලා තිබෙනවා. ඒ විධියටම,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR) RIZVIE SALIH] took the Chair.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ඉන්දියාව වාගේ රටකට ඒ "Project Tiger" ඔස්සේ සංචාරක ක්ෂේත්‍රයෙන් විශාල ආදායම් ලබන තත්ත්වයකට යන්න පුළුවන්කම ලැබුණා නම්, ඒ වාගේම ඒ ව්‍යාඝ්‍රයා කියන සතා සුරක්ෂිත කරන්නට ජාතික වැඩසටහනකුත් සාර්ථකව ක්‍රියාත්මක වුණා නම්, අපටත් පුළුවන් නේද, අපේ රටේ ඉන්න වනඅලි සම්පත, කොටි සම්පත, මුහුදු සම්පතේ ඉන්න whales, dolphins සඳහාත් ඒ විධියට කටයුතු කරන්න. මම දන්නවා, දැනටමත් ඒ සංරක්ෂණ කේන්ද්‍රීය වැඩසටහන් යම් මට්ටමකට ක්‍රියාත්මක වෙන බව. නමුත්, ඒක බොහොම අවිධිමත්ව ක්‍රියාත්මක වෙන්නේ. Specialized ecotourism plan එකක් නැහැ. විශේෂිත වූ පරිසර කේන්ද්‍රීය සංචාරක කර්මාන්තයක් නැහැ. බොහොම අවිධිමත් විධියට ඒක ක්‍රියාත්මක වෙන්නේ; බොහොම *ad hoc* විධියට ක්‍රියාත්මක වෙන්නේ. අපේ විදේශ විනිමය ඉතාම අවම මට්ටමක තිබෙන මොහොතක ඉන්දියාවේ "Project Tiger" නැමැති ව්‍යාපෘතියෙන් ඉගෙනගෙන, මේ සංරක්ෂණ කේන්ද්‍රීය සංචාරක කර්මාන්තය පැත්තට යොමු වීම තුළින් අපටත් පුළුවන්කම ලැබෙනවා එක පැත්තකින් සතා සිවිපාවා රකින්නටත්, අනික් පැත්තෙන් සතා සිවිපාවා කේන්ද්‍ර කරගෙන ජනතාවගේ ජීවිත ශක්තිමත් කරන්නටත්.

ඒ වාගේම විශේෂයෙන් මම කියන්නට ඕනෑ වනඅලි-මිනිස් ගැටුම, වනසතුන්-මිනිස් ගැටුම බරපතළ ගැටලුවක් බව. ඒවාට විසඳුම් ලබා දෙන්නට බොහෝදෙනා උත්සාහ දරා තිබෙනවා. නමුත්, ඒ වැඩ පිළිවෙළවල කිසිම ක්‍රමවත්භාවයක් නැහැ. වනසතුන් සහ මිනිසුන් අතර, වනඅලින් සහ මිනිසුන් අතර තිබෙන ගැටුම් අවම කරගන්නට ලෝකයේ ඉතාම සාර්ථක වැඩසටහන් ඕනෑ තරම් තිබෙනවා. නව තාක්ෂණය උපයෝගි කර ගත්, AI තාක්ෂණය උපයෝගි කර ගත්, අලුත් ක්‍රම උපයෝගි කර ගත්, විවිධ වගාවන් උපයෝගි කර ගත් ඒ ගැටුම් අවම කිරීමේ වැඩ පිළිවෙළ රාශියක් තිබෙනවා. නමුත්, අද අපේ රට තුළ වනජීවී සංරක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම ඉතාම අපහසු කාර්යයක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා වන යන්ත්‍රණය ප්‍රමාණවත් නැහැ. වනජීවී සංරක්ෂණ යාන්ත්‍රණය සවිමත් කරන්නට අවශ්‍ය මානව සම්පත් නැහැ, අවශ්‍ය භෞතික සම්පත් නැහැ. විශේෂයෙන්ම ජීවිත හානිවලට, දේපළ හානිවලට, වගා හානිවලට විධිමත් රක්ෂණ වැඩසටහනක් නැහැ. ඒ නිසා මේ human-animal conflict එක, human-elephant conflict එක වළක්වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අපේ රටේ පැහැදිලි වැඩ පිළිවෙළක් නැහැ. ඒවාට කියනවා mitigation plans කියලා. ඒවා කාලයෙන් කාලයට වෙනස් වෙනවා, රජයෙන් රජයට වෙනස් වෙනවා, ඇමතිවරයාගෙන් ඇමතිවරයාට වෙනස් වෙනවා. මේ අවිධිමත්භාවය නිසා, විධිමත් සැලැස්මක් නොමැතිකම නිසා ඒ හිස්තැන පුරවන්නට වර්තමාන ඇමතිවරයා ප්‍රමුඛ රජයට අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා.

ඒ වාගේම, සත්ව සුබසාධනයට අපි ප්‍රමුඛස්ථානයක් ලබා දෙන්නට ඕනෑ. බොහොම සංවේදී, සතා සිවිපාවුන් සුරක්ෂා කරන, ඒ මානව හිතවාදී, මිනිස්කම ඉහළටම ප්‍රවර්ධනය කර ගත්ත ගුණාත්මකභාවයෙන් ඉහළ සංස්කෘතික පුරවැසියා බවට පත් වන්නට අපි කටයුතු කරන්නට ඕනෑ.

අද ජාත්‍යන්තර සමුළු පැවැත්වෙනවා. ඒ සමුළුවලට සහභාගි වෙනවා. COP සමුළුව කියලා කියයි, මේ හැම සමුළුවකින්ම අපේ රටේ තිරසර සංවර්ධනයට, පරිසර සංරක්ෂණයට ගතහැකි දේ අපි උපරිමයෙන්ම ලබා ගන්නට ඕනෑ. නව හරිත විෂය ප්‍රවණතා තුළ අපේ රටට ලැබෙන අවස්ථා ටික අපි ප්‍රවර්ධනය කර ගන්නට ඕනෑ. ඒ වාගේම පරිසර කේන්ද්‍රීය සංරක්ෂණය තවදුරටත් ප්‍රගුණ කිරීම උදෙසා international environmental university එකක් ස්ථාපනය කළ යුතු යයි කියා අපි විශ්වාස කරනවා. මම හිතන විධියට මේ සංකල්පය පසුගිය රජය ඉදිරිපත් කළා. ඒක හොඳ සංකල්පයක්. රාජ්‍ය-පෞද්ගලික partnership එකක් හරහා international environmental university එකක් මේ රටේ ස්ථාපනය කරලා, අපේ රට පරිසර අධ්‍යයනයේ - environmental studies සඳහා වූ - ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානයක් බවට පත් කරලා, ජාතික වනෝද්‍යාන කේන්ද්‍ර කරගෙන ඒ පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළම අවස්ථාවක් තිබෙන රටක් බවට පත් කරමින් එය අපේ රටේ උන්නතිය උදෙසාත්, ජනතාවගේ උන්නතිය උදෙසාත්, පරිසර ක්ෂේත්‍රයේ ආරක්ෂණය උදෙසාත් පාවිච්චි කරන්නට හැකියාව අපි ඇති කරගන්න ඕනෑ.

විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාට මම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. ගරු කිංස් නෙල්සන් මැතිතුමා සඳහන් කළා, ස්වේච්ඡා සේවයේ නියැළී සිටින පරිසර ක්ෂේත්‍රය පිළිබඳව වසර ගණනාවක හොඳ අත්දැකීම් තිබෙන, එනමුත් ඉතාම සොච්චම් දෛනික දීමනාවකට ස්වේච්ඡා සේවාව කරන වනජීවී ක්ෂේත්‍රයේ නිලධාරීන් සිටින බව. ඒ අය ස්ථිර කරන්නට ඉක්මන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම යෝග්‍යයි. ඒ වාගේම බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව යටතේ රුපියල් 22,500ක මාසික දීමනාවක් ලබන, අපේ රටේ වනජීවී ක්ෂේත්‍රය ආරක්ෂා කරන්නට කටයුතු කරන දහස් ගණනක් සිටිනවා. විශේෂයෙන්ම වනජීවී නිලධාරීන්ගේ හිඟකම පියවන්නට මේ කණ්ඩායමත් ලොකු ශක්තියක් ලබා දෙනවා. ඒ අයගේ රැකියා ස්ථිර කිරීමත් ඉතාම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්නට කැමැතියි.

ගරු සභාපතිතුමනි, වනසතුන් පිළිබඳ සංගණන ගැන අද බොහෝ දුරට කථා වෙනවා. මේක ඉතාම වැදගත් මාතෘකාවක්. එම සංගණන සිදුකිරීම විධිමත්ව ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. මේවායේ විධිමත්භාවයක් අපි දකින්නෙ නැහැ. මේක multidisciplinary වැඩසටහනක්, බහුවිධ රාජ්‍ය ආයතන ඒකාබද්ධ වෙලා කරන්නට ඕනෑ වැඩසටහනක්. මේ සංගණන තුළ අඩුම ගණනේ අපේ රටේ වනසතුන් සහ මිනිසුන් අතර, ඒ වාගේම වනඅලින් සහ මිනිසුන් අතර තිබෙන ඝට්ටනය පිළිබඳව, එම ඝට්ටනයට තුඩු දෙන සතා සිවුපාවන්ගේ ප්‍රමාණය පිළිබඳව දළ වශයෙන් හෝ සංඛ්‍යාත්මක අවබෝධයක් ලබා ගැනීමේ හැකියාවක් ලැබෙනවා කියලා අපි විශ්වාස කරනවා. අනිවාර්යයෙන්ම ඒ සංගණන කවදාවත් අංග සම්පූර්ණ වෙන්නේ නැහැ. ඒ නිසා මම හිතන විධියට මේ සංගණන විහිළුවට ලක් කිරීම ඒ තරම් යෝග්‍ය නැහැ. මේවා විහිළුවට ලක් වෙන්නේ මේ සංගණන ක්‍රියාත්මක කිරීමේ නිසි ක්‍රමවේද, නිසි වැඩ පිළිවෙළ ඉතා අවිධිමත් ලෙසට ජනතාවට ඉදිරිපත් කරනකොට, විවිධ අය තම තමන්ගේ පෞද්ගලික චින්දනයන් සඳහා මේවා උපයෝගි කර ගන්නට කටයුතු කරන නිසායි. නමුත් ඇත්ත කථාව තමයි, රටක් හැටියට ඉදිරියට යන්නට නම් අපි දත්ත කේන්ද්‍රීයව, විද්‍යාත්මක තොරතුරු මත පදනම් වුණු ප්‍රතිපත්ති සම්පාදනයකට යන්න ඕනෑ. ඒක තමයි සත්‍ය කථාව. ඒක විහිළුවක් නොවෙයි. හැබැයි, විහිළුවට ලක් වන ආකාරයට මේ සංගණන රටාවන් නිර්මාණය කිරීම ඒ තරම් සුදුසු නැහැ.

පරිසර ක්ෂේත්‍රය පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන මැති ඇමතිවරුනුත් ඉන්නවා කියලා මම විශ්වාස කරනවා. මේ විෂය ගැන හොඳ අවබෝධයක් තිබෙන අය මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්න. ඒ වාගේම, මේකට අවශ්‍ය විද්‍යාඥවරුන්ගේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දැනුම, විශේෂඥයන්ගේ දැනුම, සිවිල් පාර්ශ්වවල දැනුම අපි ලබාගන්න ඕනෑ. විශේෂයෙන්ම අපි කොටි සංගණන දිහා බැලුවාම ඇත්ත වශයෙන්ම රාජ්‍ය අංශයට වඩා ඒක පෞද්ගලික අංශයෙන් සිද්ධ වෙන්නේ. "Leopard Diaries" කියලා අපි අහලා තිබෙනවා. ඒ වාගේම, කුමන ජාතික වනෝද්‍යානය, විල්පත්තුව ජාතික වනෝද්‍යානය, යාල ජාතික වනෝද්‍යානය මුල් කරගෙන ඉතාම හොඳ සංගණන ක්‍රියාත්මක වෙනවා. ඒක සතුන්ට ආදරය කරන, ඒ සතුන්ව ඡායාරූපගත කරන පරිසරලෝලීන් කරන පෞද්ගලික වැඩසටහනක්. මේකට රජයේ සහයෝගයත් ලබා දීලා, පෞද්ගලික අංශයේත් සහයෝගය අරගෙන, ඒ දෙකම එකතු කරගෙන මේ හැම සංගණනයක්ම වඩාත් විධිමත්ව, වඩාත් විද්‍යාත්මකව රටට ප්‍රයෝජනයක් ඇති වන ආකාරයට ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්. විශේෂයෙන්ම මේ සත්ව සංගණන හරහා මේ රටේ සිටින දුර්ලභ සතුන් උපයෝගී කරගෙන පාරිසරික සංචාරක කර්මාන්තය විශාල ලෙස පුළුල් කරලා අපේ රටට අත්‍යවශ්‍යව තිබෙන විදේශ විනිමය ලබා ගන්නට අපට හැකියාව ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, මම බොහොම උනන්දුවෙන් හිටියා බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ක්ෂේත්‍රය ගැන කථා කරන්න. නමුත්, තවත් කථික මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් සිටින නිසා ඒ අයටත් අවස්ථාව ලබා දීමට අවශ්‍යයි. මට පරිසර ක්ෂේත්‍රය ගැන අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. අවසාන වශයෙන් මා නැවත නැවතත් කියන්නට ඕනෑ, 2019 ජනාධිපතිවරණයේදීත්, 2024 ජනාධිපතිවරණයේදීත් අපි ඉදිරිපත් කරපු පරිසර ප්‍රඥප්තියත්, ඒ වාගේම, "Project Elephant", "Project Leopard", "Project Blue" කියන ව්‍යාපෘතිනුත් මම සභාගත කළ බව. විශේෂයෙන්ම මේ අදහස් ප්‍රයෝජනයට අරගෙන විපක්ෂයේ අපිත්, ආණ්ඩු පාර්ශ්වයේ සියලු දෙනාත් අත්වැල් බැඳගෙන තිරසර සංවර්ධනයක් උදෙසා ශක්තිමත් මාතෘ භූමියක් ගොඩ නහන්නට කැප වෙමු.

ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Dammika Patabendi. You have 15 minutes.

[පූ.භා. 11.03]

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු සභාපතිතුමනි, ජාතික ජන බලවේග රජයේ පළමු අය වැය මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එහි කාරක සභා අවස්ථාවේ විවාදයේදී අද දින පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට එකතු වෙන්නට ලැබීම ගැන පරිසර අමාත්‍යවරයා විධියට මම ඉතාම සතුටු වෙනවා. නව රජයේ සංවර්ධන වැඩ පිළිවෙළ වන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්තිය මඟින් ශ්‍රී ලංකාව තුළ සමාජ, ආර්ථික, දේශපාලනික පරිවර්තනයක් සිදු කිරීම තමයි අපේ අපේක්ෂාව. එම වැඩ පිළිවෙළ තුළ තිරසර ජෛව ලෝකයක්, සදාහරිත ජීවිතයක් ලෙස අපේ පාරිසරික ප්‍රතිපත්තිය හඳුන්වා දී තිබෙනවා. පසුගිය පාලනයන් අප රට තුළ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට අපොහොසත් වූවා පමණක් නොවෙයි, පරිසර හිතකාමී මානව සමාජයක් නිර්මාණය කිරීමටත් අසමත් වී තිබෙනවා. ජාත්‍යන්තර පාරිසරික සම්මුතීන් ගණනාවකටම අප රට අත්සන් තබා තිබුණත්, රට තුළ පාරිසරික නීති සියයකට වැඩි ප්‍රමාණයක් නීතිගත කර තිබුණත්, පරිසර හිතකාමී ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීමට අපි අසමත් වී තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ දක්වා පරිසර අමාත්‍යාංශයේ කාර්යභාරය කෙරෙහි විශාල විවේචනයක් සමාජය තුළින් මතුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම පරිසරවේදීන් පසුගිය කාලය මුළුල්ලේම පරිසර අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳ විශාල විවේචන ඉදිරිපත් කර තිබෙනවා. අපි එම විවේචනවල හරය තේරුම් ගනිමින්, එසේම පරිසර අමාත්‍යාංශය ලෙස අපගේ කාර්යභාරය නිවැරදිව හඳුනා ගනිමින් හා එය නිසි පරිදි ක්‍රියාවට නඟමින් කටයුතු කිරීමට සූදානම්. ඒ වගකීම අප වෙත පැවරී තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. ඒ අනුව සමාජ, ආර්ථික සංවර්ධනය සහ පරිසරය අතර සමතුලිතතාව රැකෙන පරිදි ස්වභාවික සම්පත් භාවිතය, තිරසර කළමනාකරණයේදී සහභාගීත්ව ප්‍රවේශය, දේශගුණික විපර්යාසවලින් ඇතිවන පීඩාව අවම කිරීම, දැනුම, කුසලතා, ආකල්ප සහ මනෝභාවයන් වර්ධනය වන පරිදි කටයුතු කිරීම අපේ වගකීම බව අපි තේරුම් අරගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, වත්මන් ජාතික ජන බලවේග ආණ්ඩුව ඒ සඳහා අවශ්‍ය කරන ඉතාම වැදගත් පියවර ගණනාවක් මේ වන විට අරගෙන තිබෙනවා.

ඒ අතරින් ඉතාම වැදගත්ම පියවර හැටියට, පරිසර අමාත්‍යාංශය යටතේ තිබිය යුතු සියලු ආයතන ඒ යටතට පත් කරන්න ජාතික ජන බලවේග ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා. මීට පෙර විවිධ වුවමනා සඳහා විවිධ අමාත්‍යාංශ යටතට පත්කර තිබුණු එම ආයතන සියල්ල ඉතිහාසයේ පළමුවැනි වතාවට පරිසර අමාත්‍යාංශය යටතට පත් කරන්න ජාතික ජන බලවේග ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. එම ක්‍රියාමාර්ගය පරිසර හිතකාමී සියලුදෙනා අගය කරන ක්‍රියාමාර්ගයක්. ඒ විතරක් නොවෙයි, පරිසරයට ආදරය කරන, පරිසර හිතකාමී සියලුදෙනාගේ බලාපොරොත්තු ඉහළ නංවන ක්‍රියාමාර්ගයක් බවටත් එය පත්වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ අනුව අපේ අමාත්‍යාංශය යටතට ආයතන 12ක් අයත් වෙලා තිබෙනවා. මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, GSMB Technical Services (Pvt.) Limited, Sri Lanka Climate Fund (Pvt.) Limited, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, රාජ්‍ය දැව සංස්ථාව, ජල සම්පත් මණ්ඩලය සහ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යන ආයතන 12 ඉතිහාසයේ පළමුවැනි වතාවට පරිසර අමාත්‍යාංශය යටතට පත් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ සෑම ආයතනයකටම ඊට අනන්‍ය වූ කාර්යභාරයක් පැවරී තිබෙනවා; වගකීමක් පැවරී තිබෙනවා. එම ආයතන 12 පනත් 11ක් මඟින් මහ පෙන්වීම ලබමින් අපේ රටේ පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා මැදිහත් වෙනවා.

අපි දන්නවා, ගත වූ කාලය මුළුල්ලේම පරිසර අමාත්‍යාංශයත්, පරිසරවේදීනුත් අතර ගොඩනැඟිලා තිබුණේ හොඳ සබඳතාවක් නොවෙයි කියලා. එකිනෙකාට ප්‍රතිවිරෝධී සබඳතාවක් තමයි ඔවුන් අතර ගොඩනැඟිලා තිබුණේ. ඊට ප්‍රධානම හේතුව බවට පත්වෙලා තිබුණේ, පැරණි දේශපාලන සංස්කෘතීන් විසින් සිය පටු සහ පෞද්ගලික වුවමනා සඳහා පරිසර අමාත්‍යාංශය යොදා ගැනීමයි. ඒ නිසා පරිසර අමාත්‍යාංශයට ඊට අනන්‍ය කාර්යභාරය ඉටු කිරීමට බාධා පැමිණුණා. ඒ නිසාම තමයි පරිසරවේදීන්, පරිසර හිතකාමීන් සහ පරිසර අමාත්‍යාංශය අතර ගැටුමක්, ප්‍රතිවිරෝධයක් නිර්මාණය වුණේ කියලා අපි විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, නමුත් අපි විශ්වාස කරන ආකාරයට, පරිසර අමාත්‍යාංශයටත්, පරිසරවේදීන්ටත් තිබෙන්නේ එකම අරමුණක්. ඒ නිසා පරිසර හිතකාමී සියලුදෙනාගේ සහයෝගය, මැදිහත්වීම සහ හොඳ හිත දිනා ගැනීමට පරිසර අමාත්‍යාංශය සමත් විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඉතින් අපි පසුගිය කාලයේ ඒ සඳහා විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නිපුණතාව සහිත, ප්‍රවීණත්වය සහිත පරිසරවේදීන් සමඟ සාකච්ඡා කරලා, ඔවුන් සමඟ කටයුතු කරන්න අවශ්‍ය කරන මූලික පියවර අරගෙන තිබෙනවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට පරිසර අමාත්‍යාංශය ලෙස අපි පරිසරවේදීන් සමඟ ඉතාම සාධනීය සාකච්ඡාවක් ආරම්භ කරලා තිබෙනවා. පරිසර අමාත්‍යාංශයේ කටයුතු සඳහා ඔවුන් සම්බන්ධ කර ගැනීම සඳහා අපි ඒ පරිසරවේදීන් ප්‍රධාන කමිටු 10කට ගොනු කරගෙන තිබෙනවා.

ඒ අනුව පසුගිය කාලයේ අපි පරිසරවේදීන් ප්‍රධාන ක්ෂේත්‍ර 10ක් යටතේ වර්ග කරනු ලැබුවා. Biodiversity and Ecosystem Service Conservation, Climate Change and Resilience Committee, Environmental Pollution Control and Mitigation, Natural Resource Management and Sustainable Development, Urban Environment and Infrastructure, Disaster Risk Reduction and Environmental Emergency Response, Education, Awareness and Community Engagement, Policy, Legislation and International Conventions, Technology and Innovation for Environment and Natural Resources, Current Environmental Related Issues and Trends Addressing Committee හැටියට ක්ෂේත්‍ර 10ක් යටතේ ඔවුන් ගොනු කරලා, ඔවුන් සමඟ ඒ අවශ්‍ය ගනුදෙනු කිරීම අපි ආරම්භ කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් සිදු වන්නේ, හුදෙක් පරිසරය ආරක්ෂා කිරීම, පරිසරය සුරැකීම පමණක් නොවෙයි. පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන ඒ ආයතන අපේ රටේ ආර්ථිකයටත් සුවිශේෂී දායකත්වයක් සපයනවා.

විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන් කරුණු දැක්වූවා වාගේම අපේ රටේ සංචාරක කර්මාන්තයටත් පරිසර අමාත්‍යාංශය යටතේ පවතින වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව හා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනවා. ජාතික වනෝද්‍යාන තුළින් ලබා ගත් ආදායම් පිළිබඳවත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් කරුණු දැක්වූවා. ඒ විතරක් නොවෙයි. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව පසුගිය අවුරුද්දේ රුපියල් මිලියන 1,512කුත්, ඒ වාගේම ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 1,366කුත් වශයෙන් ආදායම් ලබමින් මේ ආර්ථිකයට දායකත්වය දක්වා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පරිසර අමාත්‍යාංශය හඳුනා ගත යුත්තේ රටේ ආර්ථිකයට සෘජු දායකත්වයක් ලබා දෙන අමාත්‍යාංශයක් ලෙසිනුයි. එසේ රටේ ආර්ථිකයට සෘජු ලෙස දායකත්වය ලබා දෙන නිසාම ඉදිරියේදී පරිසර අමාත්‍යාංශය විසින් සිදු කළ යුතු කාර්යභාරය තව තවත් වැඩි වෙයි කියා අපි විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ වෙනකොට පරිසරය සම්බන්ධව ලෝකයේ තිබෙන ප්‍රවණතා මොනවාද කියා අපි දන්නවා. තිරසර කාර්මික පිළිවෙත්, පරිසර හිතකාමී කාර්මික පිළිවෙත් උදෙසා ලෝකයේ තිබෙන ජාත්‍යන්තර සංවිධාන නව ප්‍රතිපත්ති හා රෙගුලාසි හඳුන්වා දෙමින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පාරිභෝගිකයන්ද තිරසර නිෂ්පාදන, පරිසර හිතකාමී නිෂ්පාදන සහ සේවා පිළිබඳව වඩ වඩාත් දැනුවත් වී තිබෙනවා. ඒ නිසාම තිරසර නිෂ්පාදන හා සේවා සඳහා පවතින ඉල්ලුම ඉහළ යන ප්‍රවණතාවක් දැන් මතුව තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඉදිරියේදී ජාත්‍යන්තර වෙළෙඳ පොළට පිවිසීමේදී පාරිසරික තත්ත්ව සහතිකවල වැදගත්කම වඩ වඩාත් ඉහළ යනු ඇතැයි කියලා. ගරු සභාපතිතුමනි, එවන් වටපිටාවක් තුළ විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකයට විදේශ වෙළෙඳාම සම්බන්ධ කර ගැනීමේදී පරිසර අමාත්‍යාංශයේ කාර්යභාරය තව තවත් වැඩි වෙනු ඇතැයි කියාත් අප විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ඉහත නම් සඳහන් කළ ආයතන තුළ විශිෂ්ට කාර්ය මණ්ඩලයක් නියෝජනය වන බව. පසුගිය පාලන කාලවල පැවැති වැරදි, අඩුපාඩු නිසා, වැරදි දේශපාලන සංස්කෘතිය නිසා ඔවුන් සතු හැකියාවන්ගෙන්, ඔවුන්ගේ අවංකභාවයෙන් මේ රටට, මේ ක්ෂේත්‍රයට අවශ්‍ය හොඳම ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඒ කාර්ය මණ්ඩල සමඟ දුර ගමනක් යන්න අපට පුළුවන් වෙයි කියලා. මොකද, වංචා, දූෂණවලින් තොරව, අවංකව හා කාර්යක්ෂමව ඔවුන්ගේ සේවාව ලබා දීමට ඔවුන් සූදානම් වෙලා ඉන්නවා.

ගරු සභාපතිතුමනි, පසුගිය දවසක පින්නවල අලි අනාථාගාරයේ 50වන සංවත්සරය පැවැත්වුණා. පරිසර අමාත්‍යවරයා වශයෙන් විශේෂ ආරාධිතයෙකු ලෙස මටද ඒ සංවත්සර උත්සවයට සහභාගි වෙන්න ඉඩකඩ ලැබුණා. පින්නවල අලි අනාථාගාරය තුළ සංචාරය කරද්දී මම දැක්කා, කෘශ වෙලා, වැහැරිලා හිටපු අලියෙක්. මම එතැන හිටපු පශු වෛද්‍යවරයාගෙන් ඒ අලියා ගැන ඇහුවාම ඔහු කිව්වා, ඒ අලියා විශේෂ රෝගී තත්ත්වයකින් පෙළෙනවා, ඒ නිසා තමයි ඔහොම වෙලා තිබෙන්නේ කියලා. ඒ අලියාට වැලඳිලා තිබුණා, thyrotoxicosis කියන රෝගය. අපි එම රෝගය ගැන දන්නවා. එය සාමාන්‍යයෙන් මනුෂ්‍යයන්ටත් වැලඳෙන රෝගයක්. ඒ රෝගය ඒ අලියාටත් වැලඳී තිබුණා. ඒ වන විටත් ඒ පශු වෛද්‍යවරුන් ඒ රෝගය හඳුනා ගෙන ඒ අලියාට ප්‍රතිකාර කරමින් තිබුණා. ගරු සභාපතිතුමනි, නමුත් කනගාටුදායක ලෙස පසුගිය දවසක ඒ අලියා මිය ගියා. එදා ඒ ආසන්නයේම හිටපු තවත් අලියෙක් පෙන්වා ඒ පශු වෛද්‍යවරයා මට කිව්වා, "ඇමතිතුමනි, මේ අලියාටත් තයිරොයිඩ් හෝර්මෝනය අධික ලෙස ශ්‍රාවය වීම නිසා ඇති වන thyrotoxicosis කියන රෝගී තත්ත්වය වැලඳී තිබුණා, නමුත් අපි මේ අලියාව දැනට සනීප කර තිබෙන්නේ" කියලා. අපි දන්නවා, පරිසර අමාත්‍යාංශයට අදාළ ආයතනවල සිටින කාර්ය මණ්ඩල, ඒ ආකාරයේ ඉතා සුවිශේෂී කාර්ය මණ්ඩල බව. ඒ නිසා ඔවුන්ගේ හැකියාවන් තව තවත් ඉහළ නංවා, ඔජ්ජ නංවා ගැනීමේ වගකීම අපට තිබෙනවා.

අපි දන්නවා, මේ වනකොට පරිසර අමාත්‍යාංශයට අදාළ ආයතනවල - විවිධ ක්ෂේත්‍රවල - සේවක හිඟයක් තිබෙන බව. අපි ඒ ප්‍රශ්නය හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න මේ වනකොට මැදිහත් වෙලා තිබෙනවා. ඒ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා වන අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා තිබෙන කමිටුවට අපි මේ තොරතුරු ටික වාර්තා කරලා ඒ අවශ්‍ය බඳවා ගැනීම් කරන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ අනුව, අපි මේ වනවිට නව බඳවා ගැනීම් ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය දා මධ්‍යම පරිසර අධිකාරියට අවශ්‍ය කරන බඳවා ගැනීම් 144ක් සඳහා කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඒ බඳවා ගැනීම් කරන්න අපි දැනටමත් කටයුතු කරමින් ඉන්නවා.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

ගරු සභාපතිතුමනි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින බහුකාර්ය සංවර්ධන නිලධාරින් මුහුණ දී තිබෙන ප්‍රශ්නය ගැනත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කළා. එම බහුකාර්ය සංවර්ධන නිලධාරින් පරිසර අමාත්‍යවරයා ලෙස මාවත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාවත් හමු වෙලා මේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කළා. අපි පසුගිය කාලයේ ඔවුන්ගේ ප්‍රශ්නය වෙනුවෙන් විශේෂ මැදිහත්වීමක් කළා. ඒ මැදිහත්වීම කරද්දී අපිට ගැටලුවකට මුහුණ දෙන්න සිදු වුණා, ඒ බහුකාර්ය සංවර්ධන නිලධාරින්ට අදාළව අධිකරණ ක්‍රියාමාර්ගයක් අරගෙන තිබීම නිසා. ඒ අධිකරණ ක්‍රියාමාර්ගය නිසා අපිට ඒ බහුකාර්ය සංවර්ධන නිලධාරින් ස්ථිර කිරීමට යම් කාලයක් ගැනීමට සිදු වුණා. නමුත්, ඒ අධිකරණ ක්‍රියාවලිය අවසන් වූ වහාම අපි ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා. පරිසර අමාත්‍යාංශය පැත්තෙන් තිබෙන සියලු ගැටලු නිරාකරණය කරලා, ඒ ප්‍රශ්නය මේ වනවිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉතා ඉක්මනින් ලැබේවි කියලා. ඒ අනුමැතිය ලැබුණු වහාම 3,530ක් වන ඒ බහුකාර්ය සංවර්ධන නිලධාරින්ට පත්වීම් ලබා දීම සඳහා මේ වනවිටත් පරිසර අමාත්‍යාංශය ලෙස අපි සියලු කටයුතු සූදානම් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, 2025 වර්ෂය සඳහා වන අය වැයෙන් පරිසර අමාත්‍යාංශයට රුපියල් මිලියන 16,040ක් වෙන් කරලා තිබෙනවා. මේ රටේ ඉතිහාසයේ පරිසර අමාත්‍යාංශයට වෙන් වෙච්ච වැඩිම මුදල තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මෙවර අය වැයෙන් අපිට වෙන් කරලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, පරිසර අමාත්‍යාංශය හැටියට අපිට විශාල කාර්යභාරයක් පැවරී තිබෙනවා, ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන නව වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී අපේ කාර්ය කොටස ඉටු කිරීම සඳහා.

ඒ වාගේම වසර 24ක් තිස්සේ අලුත් නොවී තිබෙන පරිසර පනත ඉතා ඉක්මනින් සංශෝධනයට ලක් කිරීමට අපි කටයුතු කරමින් සිටිනවා. ශ්‍රී ලංකාවේ පරිසර කළමනාකරණ ක්‍රමෝපායයන් දේශීය සහ ගෝලීය පරිසර අභියෝග සහ තිරසර සංවර්ධන ඉලක්කවලට අනුකූල වන පරිදි සංශෝධනය කරන්නත්, ඊට අනුකූල වන පරිදි රෙගුලාසි සංශෝධනය කරන්නත් අපි කටයුතු කරමින් සිටිනවා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම වර්ධනය වෙමින් පවතින වායු දූෂණය ආශ්‍රිත ගැටලුවලට සාර්ථකව මුහුණ දීම පිණිස ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි වායුගෝලීය තත්ත්වය මැන සටහන් කිරීමට සහ ඊට අනුරූපව මහ ජනතාව දැනුවත් කිරීමට මෘදුකාංග පද්ධතියක් මේ වසර තුළ දී හඳුන්වා දීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම පරිසර වායු දූෂණ මට්ටම් මහජන සෞඛ්‍යයට සහ දෛනික ජීවිතයට අනතුරක් විය හැකි මට්ටම් කරා ළඟා වීම අවම කිරීමටත්, එවන් අවස්ථාවලදී මහ ජනතාව අනුගමනය කළ යුතු සෞඛ්‍ය ආරක්ෂණ පිළිවෙත් පිළිබඳ තොරතුරු ලබා දීමටත්, දැනට සකස් කර ඇති හදිසි ප්‍රතිචාර ක්‍රියාකාරී සැලැස්මේ - Contingency Response Action Plan එකේ - කටයුතු අවසන් කර මේ වසර තුළදී එය ජනගත කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, කර්මාන්තකරුවන්ට පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම් කිරීම සඳහා online system එකක් ඉතා ඉක්මනින් මේ වසර තුළ හඳුන්වා දීමටත්, මධ්‍යම පරිසර අධිකාරිය මඟින් සිදු කරනු ලබන අනෙකුත් නියාමන කටයුතු ද online ක්‍රමවේදය ඔස්සේ සිදු කිරීමට අවශ්‍ය කරන ඉක්මන් පියවර ගන්නත් අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම වර්ධනය වෙමින් පවතින ප්ලාස්ටික් සම්බන්ධ පාරිසරික ගැටලු විසඳීම සඳහා ප්ලාස්ටික් කළමනාකරණ ඒකකයක් පිහිටුවීමටත්, ප්ලාස්ටික් ආනයනයේ සිට අවසන් බැහැර කිරීම දක්වා ක්‍රියාවලියට අදාළ දත්ත පද්ධතියක් සකස් කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය කරන නීතිමය ප්‍රතිපාදන සහ විකල්ප ඇතුළත් කළමනාකරණ ක්‍රමවේදයක් මේ වසර තුළ දී හඳුන්වා දීමටත් අපි කටයුතු කරනවා. ඒ සඳහා සියලු පාර්ශ්වකරුවන්ගේ සහාය ලබා ගැනීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is up.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු සභාපතිතුමනි, මේ කාරණයත් කියා මගේ කථාව ඉක්මනින් අවසන් කරනවා.

පරිසර සංවර්ධනය සහ ප්‍රවර්ධනය උදෙසා කර්මාන්ත, රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, මාධ්‍ය ආදිය අගයමින් මධ්‍යම පරිසර අධිකාරිය හැටියට අපි ජනාධිපති පරිසර සම්මාන උළෙල මේ වසරේදීත් පවත්වන්න කටයුතු කරමින් සිටිනවා. මේ රටේ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ආයතනය වෙන්නේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියයි. අපේ රටේ භූමි ප්‍රමාණය වාගේ අට ගුණයක්, ඒ කියන්නේ වර්ග කිලෝමීටර 512,000කට ආසන්න සමුද්‍රීය බල ප්‍රදේශයක් අප සතුව තිබෙනවා. ජාතික ජන බලවේගයේ වැඩ පිළිවෙළ අනුව ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධාන නාවික මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට කටයුතු කරමින් සිටිනවා. ඒ නිසාම පරිසර අමාත්‍යාංශය යටතේ පවතින සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්යභාරය සුවිශේෂී වැදගත්කමක් ගෙන දෙනවා. මේ වනවිට පවතින සමුද්‍ර දූෂණය වැළැක්වීම පනතේ ප්‍රතිපාදන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ නිසා ලංකාවද පාර්ශ්වකරුවෙක් වී ඇති අන්තර්ජාතික සම්මුතීන් හා ප්‍රඥප්තිවලට අනුකූලව 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. නැව් මඟින් සිදු වන දූෂණ වැළැක්වීම හා නැව් මඟින් සිදු වන දූෂණයකදී වන්දි ගැනීම සඳහා වන අන්තර්ජාතික සම්මුතිවල ශ්‍රී ලංකාව තවමත් පාර්ශ්වකරුවෙක් නොවෙයි, ගරු සභාපතිතුමනි. ඒ වාගේම ඒ අන්තර්ජාතික සම්මුති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන නීතිමය ප්‍රතිපාදන තවමත් අපේ රට තුළ සකස් කරලා නැහැ. ඒ නිසා අපි ඉක්මනින්ම මෙන්න මේ තත්ත්වය විමර්ශනය කරලා අදාළ අන්තර්ජාතික සම්මුතිවලට දායක වීමටත්, ඊට අනුකූලව පනතේ සංශෝධන සිදු කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීමකදී එවැන්නක් වළක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ද්‍රව්‍යමය හා මානව සම්පත් නොමැතිකම සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමේදී අප මුහුණ දී සිටින තවත් ප්‍රශ්නයක්. ඒ සඳහා අවශ්‍ය කරන මානව සහ ද්‍රව්‍යමය සම්පත් ඉක්මනින් වැඩිදියුණු කරලා ඒ ප්‍රශ්නය විසඳා ගැනීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, could you please wind up?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු සභාපතිතුමනි, ඉක්මනින්ම මම අවසන් කරනවා.

අපි සූදානම්, මෙතෙක් මේ පරිසර අමාත්‍යාංශය අරගෙන ගිය ඒ අඩුපාඩු සහිත ගමන් මඟ වෙනස් කරලා මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න, මේ රටේ ජනතාවට ලස්සන ජීවිතයක් උරුම කර දෙන්න. ඒ පුනර්ජීවන වැඩසටහනේ වැදගත් කොටස්කරුවෙකු ලෙස පරිසර අමාත්‍යාංශය මේ රටේ සංවර්ධනයටත්, තිරසර පරිසරයක් ඇති කිරීමටත් උපරිම මැදිහත්වීමක් කරන්න සූදානම් කියන පණිවුඩය ලබා දෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Thurairasa Ravikaran. You have 15 minutes.

[மு.ப. 11.24]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தவிசாளர் அவர்களே, புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் அவர்களே, பிரதி அமைச்சர் அவர்களே, சுற்றாடல் அமைச்சர் அவர்களே, பிரதி அமைச்சர் அவர்களே, உங்களுடைய 159 பாராளுமன்ற உறுப்பினர்களும் இனவாதக் கருத்துகளை வீசாமல், எல்லோரையும் அரவணைத்துக்கொண்டு செல்ல வேண்டுமென்ற எண்ணத்தோடு செயற்படுகின்ற நிலையில் இருப்பதை நாங்கள் முழுமையாக அவதானிக்கின்றோம். கூடுதலான சிங்கள மக்கள்கூட இனவாதக் கருத்துகளை ஏற்றுக்கொள்ளவில்லை என்பதற்குச் சான்று, கடந்த பாராளுமன்றத்தில் 3 அங்கத்தவர்களைக் கொண்டிருந்த நீங்கள் இன்றைக்கு 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டிருப்பதாகும். அந்த அடிப்படையில், ஏற்கனவே இருந்த சில இனவாதிகளை மக்கள் நீக்கியிருக்கிறார்கள். நாங்களும் உங்களுடன் இணைந்து இந்த நாட்டைக் கட்டியெழுப்ப வேண்டுமென்ற நோக்கத்தோடுதான் இருக்கின்றோம். அந்த வகையில், உங்களுடைய ஒத்துழைப்பை நாடுகின்றோம். நீதியான, நேர்மையான, நல்ல ஓர் ஆட்சி அமைந்து, நாடு செழிப்புற வேண்டும் என்பதில் எங்களுக்கு மாற்றுக் கருத்து இல்லை. நாங்கள் நிச்சயமாக அதற்காக உங்களோடு ஒத்துழைப்போம்.

இந்துத் தம்பதிகளான சுத்தோதனருக்கும் மாயாதேவிக்கும் பிறந்து, யசோதரையைத் திருமணம் செய்த சித்தார்த்தரே புத்தபிரான் ஆவார். அவரது போதனைகளைப் பின்பற்றி, பஞ்சசீலக் கொள்கைகளின் அடிப்படையில் ஒழுகுவோரே பௌத்தர்கள் எனப்பட்டனர். இந்து மதமும் பௌத்த மதமும் ஒன்றோடொன்று பின்னிப் பிணைந்தவை. தென்னாசியாவின் பிரதான மதங்களான இவை தென்னாசியா எங்கும் இணை மதங்களாகவே அனுஷ்டிக்கப்படுகின்றன; ஒத்திசைவுடன் ஓம்பப்படுகின்றன. ஆனால், இலங்கையில் மட்டும் அவ்வாறு இல்லை. இங்கு புத்தபிரானின் போதனைகளையும் அவரது பஞ்சசீலக் கொள்கைகளையும் கைவிட்ட சில பௌத்த துறவிகள், அவர்களின் பின்னின்று இயக்கும் சில அரசியல்வாதிகளின் தயவுடன் இந்த நாட்டில் அமைதியின்மையையும் இன முறுகலையும் தொடர வேண்டும் என எண்ணும் சில ஏகாதிபத்தியவாதிகளின் தயவால் எதேச்சாதிகாரம் பெற்று, சட்டத்தையும் ஒழுங்கையும் கையிலெடுத்து, தமிழர் பகுதிகளில் பல்வேறு எதேச்சாதிகாரச் செயல்களைப் புரிந்து, இலங்கையில் மத நல்லிணக்கம் என்பதை இல்லாதொழித்துள்ளார்கள். வடக்கு, கிழக்கு மாகாணங்களின் இனப்பரம்பல் வீதத்தை மாற்றியமைக்க முயலும் பேரினவாதச் சக்திகளின் ஊதுகுழல்களாகச் செயற்பட்டுவரும், பௌத்தப் போக்கின்மையைக் கடைப்பிடித்துவரும் சில பிக்குகள் இலங்கையின் அரச திணைக்களங்களான மகாவலி அபிவிருத்தி அதிகாரசபை, இலங்கைத் தொல்பொருள் திணைக்களம், பொலிஸ் திணைக்களம் என்பவற்றையும் பாதுகாப்புப் படையினரையும் சில இடங்களில் வெளிப்படையாகவே வழிநடத்தி வருவது கடந்த காலத்தில் அவதானிக்கப்பட்டது. இந்த விடயங்களை எம்மால் புள்ளிவிபரங்களுடன் சமர்ப்பிக்க முடியும்.

நான் வன்னி தேர்தல் மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்துபவன். என்னுடைய சொந்த மாவட்டம் முல்லைத்தீவு என்ற வகையில் அங்கே நடைபெறுகின்ற பிரச்சினைகள் மற்றும் நடந்த பிரச்சினைகள் பற்றிய சில விபரங்களை இச்சந்தர்ப்பத்தில் நான் தெளிவாகச் சொல்ல விரும்புகின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுறைப்பற்று பிரதேச செயலாளர் பிரிவில் நாயாற்றுக்கு அண்மையிலுள்ள பழைய செம்மலைப் பிள்ளையார் ஆலய வளாகத்திற்குள் குருகந்த ரஜமகா விகாரை எனக் கூறி, கொலம்பகே மேதானந்த கீர்த்திசிறி தேரர் என்ற பௌத்த துறவி கட்டிடமொன்றை அமைக்கத் தொடங்கினார். இக்கட்டிட வேலைகளை இவ்வாலயத்தின் எதிர்த் திசையில் இராணுவ முகாமிலிருந்த இராணுவத்தினரே மேற்கொண்டனர். இது தொடர்பாக 31823ஆம் இலக்கத்தில் வழக்கொன்று முல்லைத்தீவு நீதிமன்றத்தில் நடைபெற்று, 2019.05.06இல் குறித்த இடத்தில் ஏதேனும் செயற்பாடுகள் செய்வதானால் சமாதானத்தைப் பேணி, நாட்டிலுள்ள சட்டதிட்டங்களுக்கமைய அது மேற்கொள்ளப்பட வேண்டுமென நீதிமன்றத்தால் கட்டளையிடப்பட்டது. இருந்தபோதும், பிரதேச சபையின் தடையுத்தரவையும் மீறி, இவ்வாலயத்தில் கொலம்பகே மேதானந்த கீர்த்திசிறி தேரரால் பிரமாண்டமான புத்தர் சிலையொன்று வைக்கப்பட்டது. நீதிமன்றக் கட்டளையை மீறிய இந்த நடவடிக்கையை இந்த நாட்டின் சட்டம், ஒழுங்கு வேடிக்கைதான் பார்த்திருந்தது.

சில நாட்களின் பின்னர் கொலம்பகே மேதானந்த கீர்த்திசிறி தேரர் மரணமடைந்தார். இவரது உடலைக் கடற்கரையில் அடக்கம் செய்யுமாறு முல்லைத்தீவு நீதிமன்றம் கட்டளையிட்டது. அந்தக் கட்டளையை மீறி, ஞானசார தேரர் தலைமையிலான பௌத்த துறவிகள் குழு அவ்வுடலைப் பழைய செம்மலைப் பிள்ளையார் ஆலயத் தீர்த்தக் குளத்தில் அடக்கம் செய்தனர். எதிர்த்துநின்ற தமிழ் மக்களையும், சட்டத்தரணிகளையும் இலங்கைப் பொலிசார் துரத்தித் துரத்தி அடித்தனர். பொலிசாரால் தாக்கப்பட்டு ஆலயப் பூசகர் வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டார். இலங்கையில் மத நல்லிணக்கத்திற்குப் பகிரங்கமாக வேட்டு வைக்கப்பட்ட பல்வேறு சந்தர்ப்பங்களில் இதுவுமொன்று. சிலவற்றைத்தான் நான் சொல்லலாம், ஏனென்றால் நேரம் போதாது.

கொக்கிளாய் கிராமத்திலிருந்து 1983ஆம் ஆண்டு இடம்பெயர்ந்த மக்கள் 2011இல் அங்கு மீளக் குடியமர அனுமதிக்கப்பட்டார்கள். மணிவண்ணதாஸ் என்பவரின்

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

குடும்பமும் அங்கு மீளக்குடியமர்வதற்குச் சென்றது. அவரின் தந்தையாரான திருஞானசம்பந்தர் என்பவரிடம் காணி அபிவிருத்திக் கட்டளைச் சட்டத்தின் கீழ் வழங்கப்பட்ட காணியின் அனுமதிப்பத்திரம் உண்டு. ஆனால், மணிவண்ணதாஸ் குடும்பம் இங்கு மீளக்குடியமர அனுமதிக்கப்படவில்லை. அவரது குடும்பம் இராணுவத்தினரால் துரத்தியடிக்கப்பட்டது. அந்தக் காணியில் கட்ட ஆரம்பிக்கப்பட்ட விகாரையொன்று பல்வேறு தடையுத்தரவுகளையும் மீறி இன்றுவரை கட்டப்பட்டுக் கொண்டிருக்கிறது. மணிவண்ணதாஸ் குடும்பம் இன்றுவரை தமது சொந்தக் காணியில் மீளக் குடியமர்வதற்கு முடியவில்லை; தாம் பிறந்த மண்ணில் ஏதிலிகளாக அவர்கள் வாழ்ந்து வருகின்றார்கள். தாய் தந்தையரை, அன்பு மனையாள் யசோதரையை, அருமைப் பாலகன் இராகுலனைத் துறந்து போதிமர நிழலில் பரிநிர்வாணம் அடைந்த போதிமாதவன் புத்தபிரான் சிலையாய் அமர்வதற்காக, மணிவண்ணதாஸ், அவரது மனைவி, குழந்தைகள் துரத்தியடிக்கப்பட்டு அவர்களது பரம்பரை வாழ்ந்த பூர்வீக நிலம் பறிக்கப்பட்டு, ஏதிலிகளாகத் துரத்தப்பட்டிருக்கின்றார்கள். இதுதான் அங்குள்ள நிலைமை! இந்த நிலைமை உங்களில் பலருக்குத் தெரியாது, அதனால்தான் நான் சொல்கின்றேன். இப்படியா புத்தர் போதித்த பஞ்ச சீலக் கொள்கை வழி நடப்பவர்கள் செய்வார்கள்? புத்தருடைய ஆன்மா இச்செயலால் வெட்கித் தலைகுனிந்து நிற்கும் என்று அங்கு மக்கள் கதைக்கின்றார்கள்; நானும் அதையே சொல்கின்றேன்.

வடக்கிலும் கிழக்கிலும் ஞானசார தேரரின் வழிநிற்கும், காவி உடை உடுக்கவே பொருத்தமில்லாத சிலரால் புத்த பெருமானின் திருவுருவச் சிலைகள் நில ஆக்கிரமிப்பின் எல்லைக் கற்களாக அந்தப் பகுதிகளில் பயன்படுத்தப்படுகின்றன. அதாவது, புத்த பெருமானின் சிலைகள் மற்றும் சிறிய விகாரை அடையாளங்கள் அங்கு கடவுளாக அடையாளப்படுத்தப்படாது, பறிக்கப்பட்ட நிலங்களின் எல்லைக் கற்களாக மாறியிருக்கின்றன. நீங்கள் எல்லோரும் வாருங்கள், நான் அந்த இடங்களை உங்களுக்குக் காண்பிக்கின்றேன்.

குருந்தூர் மலை ஒரு தொல்லியல் பிரதேசம் என்பதனை நாம் அனைவரும் அறிவோம். விடுதலைப் புலிகளின் காலத்தில் அங்கிருந்த தொல்பொருட் சின்னங்களுக்கு இம்மியளவுகூட பங்கமேற்படவில்லை. எங்காவது ஓரிடத்திலேனும் ஏதாவது பாதிப்பு ஏற்பட்டிருந்தால் நீங்கள் காண்பியுங்கள்! ஆனால், அவ்வாறு ஏற்படவில்லை. குருந்தூர் மலையில் தொல்பொருள் சின்னங்களுள் ஒன்றாய் பல நூற்றாண்டுகள் பழைமை வாய்ந்த திரிசூலம் ஒன்று காணப்பட்டது. அது பல நூற்றாண்டுகளாகவே சுற்றயல் கிராம மக்களால் கிராமிய முறையில் பொங்கல் செய்து, படையலிட்டுப் பயபக்தியுடன் வழிபடப்பட்டு வந்தது. ஆனால், அது இன்று பிடுங்கி எறியப்பட்டு, இந்து மத வழிபாடுகள் தடைசெய்யப்பட்டுள்ளன. இதுவா மத நல்லிணக்கம்? உண்மையிலேயே இனவாதிகள் செய்த இவ்வாறான அநியாயங்களுக்கு உங்களிடமிருந்து நியாயம் கிடைக்குமென்றுதான் நாங்கள் எதிர்பார்க்கின்றோம்.

அங்கு புத்தர் சிலை ஒன்றை வைப்பதற்காக கல்கமுவ சந்தபோதி தேரர் தலைமையிலான குழுவினர் புத்தர் சிலையொன்றுடன் வாகனங்களில் வந்தபோது, அப்பிரதேச மக்களால் தடுத்து நிறுத்தப்பட்டனர். இதனால் அப்பிரதேசத்தில் அமைதிக் குலைவு ஒன்று ஏற்பட்டது என்று பொலிஸாரால் முல்லைத்தீவு நீதிமன்றத்தில் வழக்கொன்று தாக்கல் செய்யப்பட்டது. AR/673/18 என்ற இலக்கம்கொண்ட இவ்வழக்கின் மீதான 2018.09.27ஆம் திகதிய கட்டளையின் பிரகாரம், அப்பிரதேசத்தில் வாழ்கின்ற மக்களின் சார்பில் விடுக்கப்பட்ட விடயம் கவனத்தில் கொள்ளப்பட்டு, இப்பிரதேசம் தொல்லியல் இடமாகக் காணப்படுகின்றது எனவும், யாழ்ப்பாணப் பல்கலைக்கழகத் தொல்லியல் விரிவுரையாளர்கள், தொல்பொருள் ஆராய்ச்சி மாணவர்கள் ஆகியோரின் தொல்லியல் ஆய்வுகளை இணைக்குமாறும் தொல்லியல் திணைக்களத்துக்கு நீதிமன்றம் கட்டளை பிறப்பித்திருந்தது. இன்று இப்பிரதேசத்தில் தொல்லியல் ஆய்வுகள் தொடர்கின்றன. ஆனால், யாழ். பல்கலைக்கழகத்தினரின் சமுகமின்மையுடன்தான் நடைபெறுகின்றது. வெளிப்படைத் தன்மையையும் நடுநிலைமையையும் கோஷமாகக் கொண்டு ஆட்சிக்கு வந்த இந்த அரசாங்கத்தின் காலத்திலும் குருந்தூர் மலையில் நீதிமன்றக் கட்டளைக்கு முரணாக, வெளிப்படையற்ற செயற்பாடுகள் தொல்லியல் ஆய்வுகள் என்ற போர்வையில் நடைபெறுகின்றன. நீங்கள் ஆட்சிக்கு வந்து இப்போது குறுகிய காலம்தான்! உங்களுக்கு இன்னும் நீண்டகாலம் இருக்கின்றது; நிச்சயமாக நியாயத்திற்கு நாங்கள் உங்களுக்கு ஒத்துழைப்புத் தருகின்றோம். நான் சொல்கின்ற இந்தக் குறைகளை நேரடியாக உங்களைக் கூட்டிக் கொண்டுபோய்க் காட்டவும் முடியும்.

குருந்தூர் மலையில் தொல்பொருள் திணைக்களத்தினரால் இலங்கைப் பொலிஸாரினதும் இராணுவத்தினரினதும் உதவியுடன் மேற்கொள்ளப்பட்ட அராஜகங்கள் பௌத்த தர்மத்துக்கு மட்டுமல்ல, இலங்கையின் தொல்பொருள் சட்டத்துக்கும் முற்றிலும் முரணானவை. இதுபற்றி இன்னும் விலாவாரியாக விபரிப்பதற்கு எனக்குத் தரப்பட்ட நேரம் போதாது. தொல்பொருள் இடமாகக் காணப்பட்ட அந்தப் பிரதேசம், நீதிமன்றங்களின் பல்வேறு கட்டளைகளையும் இலங்கையில் நடைமுறையில் இருந்துவருகின்ற தொல்பொருள் சட்டங்களையும் மீறி, தொல்பொருள் திணைக்களத்தால் ஒரு விகாரையாக மாற்றியமைக்கப் பட்டுள்ளது. இது தொடர்பில் பல்வேறு தீர்ப்புகளை வழங்கிய முல்லைத்தீவு நீதிபதி சரவணராஜா உயிர் அச்சுறுத்தல் காரணமாகத் தனது பதவியைத் துறந்து நாட்டைவிட்டு வெளியேறியுள்ளார். இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசால் தொல்பொருள் இடமாக வர்த்தமானியில் வெளிப்படுத்தப்பட்ட குருந்தூர் மலையில் தென்பகுதியில் இருந்து கொண்டுவரப்பட்ட 'கபொக்' கற்களினாலும் சீமெந்தாலும் கட்டியெழுப்பப்பட்ட விகாரை ஒரு பௌத்த சின்னமல்ல, ஊழலின் சின்னம்! நீங்கள் அதைப் பாருங்கள்! அதைப் பார்த்து அது தொடர்பில் முடிவு செய்யுங்கள்! ஊழலுக்கு எதிரான கோஷத்துடன் ஆட்சிக்கு வந்த இந்த அரசு இது தொடர்பில் என்ன பொறுப்புக் கூறப்போகின்றது என அங்குள்ள மக்கள் கேட்கின்றார்கள். குருந்தூர் மலைப் பிரதேசத்தில் இருந்து பிடுங்கிச் செல்லப்பட்ட ஆதிசிவனின் சூலத்தை மீளவும் அப்பிரதேச இந்துக்களிடம் ஒப்படைக்குமாறும், அங்கு தங்குதடையின்றி வழிபாடுகள் தொடர இந்துக்கள் அனுமதிக்கப்படுவார்களா? எனவும் அந்த மக்கள் கேட்கின்றார்கள்.

வவுனியா மாவட்டத்தின் வவுனியா வடக்கு பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள வெடுக்குநாறி மலை என்பது வன்னியில் வாழும் இந்துக்களின் ஆதி வழிபாட்டுத் தலம். கடந்த வருடம் இங்கு சிவராத்திரி வழிபாட்டுக்காகச் சென்றிருந்த மக்கள் இலங்கைப் பொலிஸாரால் துரத்தியடிக்கப்பட்டனர்.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Thurairasa Ravikaran, your time is up.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෛරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)
Give me one more minute, Sir.

இங்கு பூஜைகளை மேற்கொண்ட பரம்பரைப் பூசாரியும் இன்னும் 14 பேரும் சிவராத்திரியை வெடுக்குநாறிமலையில் அனுஷ்டித்ததற்காக இரண்டு வாரங்கள் சிறையில் அடைக்கப்பட்டார்கள். இம்முறையும் சிவராத்திரி பூஜைகள் நடத்த மாலை ஆறு மணிக்குப் பிறகு அனுமதிக்கப்படவில்லை. சிவராத்திரி என்றாலே இரவில் நித்திரை விழித்துச் செய்யும் பூஜைதான். ஆனால், மாலை 6 மணிக்குப் பின் மக்கள் அங்கு அனுமதிக்கப்படவில்லை. இவ்வாறான செயல்களால் தாங்கள் புறக்கணிக்கப்படுவதாக அந்த மக்கள் நினைக்கிறார்கள். நீங்கள் அவர்களை அரவணைத்துக்கொண்டு செல்ல வேண்டும். இந்த நாட்டில் நான்கு சமயங்கள் இருக்கின்றதென நீங்களே சொல்கின்றீர்கள். நீங்கள் பௌத்தம், இந்து, கிறிஸ்தவம், இஸ்லாம் ஆகிய இந்த நான்கு மதத்தவரையும் அரவணைத்துக்கொண்டு செல்ல வேண்டும். நான் மீண்டும் சொல்கிறேன். உங்களுடைய உண்மைத் தன்மையான, வெளிப்படையான நல்ல வேலைகள் அனைத்துக்கும் நாங்கள் ஒத்துழைப்புத் தருவோம். இந்த வகையில், நீங்கள் நிச்சயமாகத் தமிழ் மக்களையும் அரவணைத்துக்கொண்டு செல்ல வேண்டும்.

யாழ்ப்பாண மாவட்டத்திலும் வன்னி தேர்தல் மாவட்டத்திலும் உங்களுக்குத்தான் அதிகமான வாக்குகள் வழங்கப்பட்டிருக்கின்றன. அந்த மக்கள் பிரிவினை பார்த்திருந்தால், சிங்கள மக்களை வெறுக்கின்றவர்கள் என்றால், சிங்களக் கட்சிகளை வெறுக்கின்றவர்கள் என்றால், உங்களை ஆட்சிக்குக் கொண்டுவந்திருப்பார்களா? ஆகவே, நீங்கள் எங்களுடைய மக்களைப் புறக்கணிக்காதீர்கள்! அவர்கள் தங்களுடைய மத வழிபாட்டுத் தலங்களில் வழிபடுவதற்கான உரிமையைத் தடுக்காதீர்கள்! பௌத்தர்கள் இல்லாத இடத்தில் இப்பொழுது எதற்கு பௌத்த விகாரை? இராணுவ முகாம்களில் பெரிய பெரிய விகாரைகளைக் கட்டியிருக்கிறார்கள். அது ஏன்? ஒரு சிறிய விகாரையை அமைத்து, சிறிய புத்தர் சிலையொன்றையும் வைத்து அவர்கள் வழிபாடுகளை மேற்கொள்ளலாம். பௌத்தர்கள் இருந்தால், அந்த இடத்தில் பொிய பௌத்த விகாரையை அமைத்து வழிபடலாம். அராஜகப் போக்குடன், இனவாதப் போக்குடன் செயற்படக் கூடாது. முன்னைய ஆட்சியாளர்கள் இப்படியான ஒரு வெறுப்புத் தன்மையை மக்களிடத்தில் உருவாக்கியிருப்பதை நீங்கள் நீக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் எனது உரையைக் கேட்டுக்கொண்டு இருக்கின்றார். உங்களுடைய மனநிலை பற்றி எங்களுக்குத் தெரியும். நானும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுவில் உறுப்பினராக இருக்கின்றேன். நீங்கள் சரியான முறையில் செயற்படுங்கள்! அந்த வகையில், உங்களுக்கு நாங்கள் முழுமையான ஆதரவை வழங்குவோம். நீங்கள் எமது பிரதேசத்துக்கு வந்தால், அங்கு நடந்த அட்டூழியங்களையும் அவை எப்படி நடந்ததென்பதையும் அந்தந்த இடங்களுக்கு நேரடியாக அழைத்துச் சென்று காட்டுவேன். நன்றி!

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Ruwan Mapalagama. You have ten minutes.

[පූ.භා. 11.41]

ගරු රුවන් මාපලගම මහතා
(මාණ්පුමිකු රුවන් මාපලකම)
(The Hon. Ruwan Mapalagama)
ගරු සභාපතිතුමනි, 2025 අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය ආරම්භ වී මේ ගෙවුණු කාලය පුරා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා අහගෙන හිටියාම මට මතක් වන්නේ, මහතොට යන එන කොට ත්‍රිරෝද රථවල ලියා තිබෙන වැකියක්. ඒ තමයි, "මුහුණේ ලස්සන හදවතේ තිබුණා නම්" කියන එක. මේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ කථා ඇහුවාම කියන්න තිබෙන දේ තමයි, ඔය අදහස්වල ලස්සන, ඔය කථා කරන සංකල්පවල තිබෙන දේ ඔබ එදා ආණ්ඩු බලය දරන කොට කළා නම් අද ඔබට මේ විපැත්තිය වෙන්නේ නැහැ කියන එක. හවස රූපවාහිනියේ ප්‍රවෘත්ති විකාශනයෙන් - newscast එකෙන් - මේ පාර්ලිමේන්තුව දකින කොට, "විපක්ෂය පාර්ලිමේන්තුව දෙදරවයි. විපක්ෂය ආණ්ඩුවේ රෙදි ගලවයි" කියන news එක යන කොට, ලංකාවේ සුවහසක් ප්‍රේක්ෂකයෝ හිතනවා විපක්ෂය මහා විශාල කාර්යභාරයක් මේ පාර්ලිමේන්තුව තුළ කරනවා කියලා.

ගරු සභාපතිතුමනි, අද මාර්තු මාසයේ 17වැනි දා. දැන් වෙලාව පෙර වරු 11.40යි. මේ වෙලාවේ මේ සභා ගර්භයේ විපක්ෂය නියෝජනය කරමින් ඉන්නේ මගේ අතේ ඇඟිලි ගණනටත් වඩා අඩු මන්ත්‍රීවරු සංඛ්‍යාවක්. ගරු සභාපතිතුමනි, මම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු වෙලත් මට මේ ගරු සභාවේ ආසනය ලැබෙන්නේ විපක්ෂය පැත්තේ. මේ පාර්ලිමේන්තුව නිර්මාණය කරපු ඒ ගෘහ නිර්මාණ ශිල්පියා හිතුවාට වඩා ජන වරමක් 2024දී ලංකාවේ ජනතාව අපට ලබා දුන්නා. විපක්ෂය පැත්තේ මේ පිටුපස ආසනවල ඉන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු නොවෙයි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුයි. ඔය විධියටම ඉදිරියටත් හැසිරෙන්න; එතකොට මේ විධියටම විපක්ෂයේ ඉදිරි පේළියට ඔබ කේන්ද්‍රගත වේවි. ඒ වෙනුවෙන් අපි සුබ පැතුම් එක් කරනවා.

ගරු සභාපතිතුමනි, අද විශේෂ දවසක්. 2024 වර්ෂයේ අපොස (සාමාන්‍ය පෙළ) විභාගය අද ආරම්භ වෙනවා. ලක්ෂ ගණනක් දරුවන් සාමාන්‍ය පෙළ විභාගයේදී බුද්ධ ධර්මය, එහෙම නැතිනම් තමන්ගේ ආගමික විෂයය පිළිබඳ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියන දවස, අද. ඒ වාගේම බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා දවසත්, අද. එවැනි දවසක මගේ කථාව කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම බෙහෙවින් සතුටට පත් වෙනවා.

ගරු සභාපතිතුමනි, ලංකාවේ ආසන්න ඉතිහාසයේ සියලු අමාත්‍යාංශ අතරින් අඩුම සැලකිල්ලක් දැක්වූ, කුඩම්මාගේ සැලකිලි දැක් වූ අමාත්‍යාංශයක් තමයි බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය. නමුත්, අපේ රජය මැතිවරණයට ඉදිරිපත් කළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය ඇතුළේ ලොකු බර තැබීමක් තැබූ පරිවිඡේදයක් තමයි, "උදාර සංස්කෘතික ජීවිතයක් - සහකම්පනීය ජනතාවක්" කියන එක. "උදාර සංස්කෘතික ජීවිතයක් - සහකම්පනීය ජනතාවක්" පිළිබඳව මැතිවරණයට පෙරත් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අපි සාකච්ඡා කළා.

අද අප සමාජයක් විධියට මුහුණ දෙන බරපතළ සමාජ බෙදවාචක රැසකට හේතුව, සහකම්පනීය ජීවිතයක් නොමැතිකමයි. සහකම්පනීය ජීවිතයක් කියන්නේ, තමාට දැනෙන වේදනාවම, තමාට දැනෙන හැඟීමම තමාට මෙන්ම තමා ඉදිරියේ ඉන්න අනෙකාටත් දැනෙන බව දැනීමයි. සහකම්පනීය ජීවිතයක්, සහකම්පනීය මානව සම්පතක් නොමැති වීමේ බෙදවාචකය තමයි

[ගරු රුවන් මාපලගම මහතා]

මේ ආසන්න දින කිහිපයකට පෙර මැදිරිගිරිය සංගීත සංදර්ශනයක සිදු වූ බේදවාචකයෙනුත් අප දැක්කේ. අද වන කොට සමාජය මුහුණ දෙන අතෘප්තිය සහ ප්‍රචණ්ඩත්වය, දිවි නසා ගැනීම්, මානව ගරුත්වය නොමැති වීම වාගේ සමාජ ප්‍රශ්න රැසකට සහකම්පනීය ජීවිතයක් නොමැතිකම බලපා තිබෙනවා. ඉතින්, ඉක්මනින් මේ සමාජය සුවපත් කරන්නට සමාජය ඉල්ලා සිටිනවා සහකම්පනයක් සහිත නවීන පුරවැසියෙක්. එම පුරවැසියා තැනීම සිදු කළ හැක්කේ ජාතික පුනරුදයක් ඉලක්ක කරගත් කලා, සංස්කෘතික ක්ෂේත්‍රයේ සිදු කරන ප්‍රබල පරිවර්තනයකින් බව රජය ලෙස අපි විශ්වාස කරනවා.

බහුවිධ සංස්කෘතිය පිළිගන්නා නිවහල්, විචාරශීලී, මානව ගරුත්වයෙන් පිරි නව සංස්කෘතික මිනිසෙකු නිර්මාණය කර ගැනීම ජාතික ජන බලවේගයේ අපේක්ෂාවක්. ඒ වෙනුවෙන් රජය කැපවෙනවා. ඒ විතරක් නොවෙයි, මැතිවරණයට පෙර ඒ සංස්කෘතික ජීවිතය පිළිබඳව අපි පැවසූ දෙයට එලෙසම බරක් තබමින් සංස්කෘතිය, ආගම, කලාව පිළිබඳව ශාස්ත්‍රාලය තුළත් ඉන් එපිට මහ පොළොවේත් විශාල වැඩ කොටසක් කළ සහ කරමින් සිටින මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි සහෝදරයාට මේ අමාත්‍යාංශය භාර දීලා රජය පෙන්නුම් කළා, සංස්කෘතිය, කලාව පිළිබඳව මේ රජය තබපු බර තැබීම.

ගරු සභාපතිතුමනි, මගේ මේ කථාව කේන්ද්‍රගත කරගන්නවා, සංස්කෘතිය පිළිබඳව අදහස් දක්වන්න. අපේ සංස්කෘතිය පිළිබඳව මේ අය වැයෙන් තබපු බර තැබීම කොපමණද, සාහිත්‍ය කලාව පිළිබඳව තබපු බර තැබීම කොපමණද කිව්වොත්, මේ අය වැයෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලෝක කවි දින තරගාවලියක් පැවැත්වීමට, ශාස්ත්‍රීය සම්භාෂණ මාලාවක් පැවැත්වීමට, යාපනයේ පාසල් පුස්තකාලවලට පොත් බෙදා දීමට කටයුතු කර තිබෙනවා. එපමණක් නොවෙයි, ජාතික කලා මණ්ඩලය යටතේ නිවැරදි භාෂා භාවිතය හා නිර්මාණාත්මක ලේඛන කලාව දියුණු කිරීමට, පාසල් ගුරුවරුන්ට සාහිත්‍ය, කලා, සෞන්දර්ය විෂයයන් අභිවර්ධනයට ජාතික වැඩසටහන් සකස් කිරීමට, සංස්කෘතික මධ්‍යස්ථාන හරහා රස වින්දන වැඩසටහන් දියුණු කිරීමට, ප්‍රාදේශීය සාහිත්‍ය උත්සව පැවැත්වීමට, ප්‍රාදේශීය බලමණ්ඩල හරහා ග්‍රාමීය සංස්කෘතික කලා ප්‍රවර්ධනයට, ලෝක සාහිත්‍යය තුළ ලේඛක ලේඛිකාවන්ගේ දෘෂ්ටිවාද පිළිබඳ විශ්වවිද්‍යාල වැටසටහන් සංවිධානය කිරීමට ආදී ලෙස මේ වැය ශීර්ෂයට රුපියල් මිලියන 18.7ක් වෙන් කර තිබෙනවා.

එපමණක් නොවෙයි, මේ වැය ශීර්ෂයෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ළමා සාහිත්‍ය ප්‍රවර්ධනයට රුපියල් මිලියන 9ක්, සංස්කෘතික මධ්‍යස්ථාන අතර ප්‍රතිභා නර්තන චිත්‍ර තරගාවලියට රුපියල් මිලියන 9.5ක්, කඳුකර වතු ජනතාවගේ සංස්කෘතික ප්‍රවර්ධනයට, කාව්‍ය සාහිත්‍ය ප්‍රවර්ධනයට වාගේම, ළමුන් තුළ ආබාධ සහිත ප්‍රජාව පිළිබඳ සමානාත්මතා ආකල්ප වර්ධනය කරන ළමා කතන්දර, සංඥා භාෂා චිත්‍රපට නිර්මාණයට මුදල් වෙන් කර තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඉතිහාසයේ පළමුවැනි වතාවට ආබාධ සහිත වූවන්ගේ සාහිත්‍ය නිර්මාණ තරගාවලියක් 2025 වර්ෂයේ පැවැත්වීමට අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, සාහිත්‍ය නිර්මාණයේ යෙදෙන ආබාධ සහිත වූවන්ගේ නිර්මාණ එළි දැක්වීමට, ආබාධ සහිත පුද්ගලයන්ගේ දැනුම භාවිත කර අන් අය පෝෂණය කිරීම සඳහා මානව පුස්තකාල - human libraries - හඳුන්න අය වැයෙන් යෝජනා කර තිබෙනවා. ඒ අනුව, මානව සංස්කෘතික විෂයයන්, මානව ශාස්ත්‍රීය විෂයයන් පිළිබඳව ලංකාවේ ඉතිහාසයේ රජයක් දැක්වූ වැඩිම අවධානය තමයි, ජාතික ජන බලවේග රජය දක්වා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල තිබෙන සංස්කෘතික මධ්‍යස්ථාන අද වන විට කේක් පන්ති පවත්වන, රූපලාවණ්‍ය පන්ති පවත්වන, කරාටේ පන්ති පවත්වන මධ්‍යස්ථාන බවට පත් වෙමින් තිබෙනවා. රජයක් ලෙස අපි ඒවා නැවත සංස්කෘතික මධ්‍යස්ථාන බවට පත් කළ යුතුයි. ඒ වාගේම, සංස්කෘතික ජීවිතයක් ගොඩ නඟා ගන්නා ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මේ වැඩ පිළිවෙළේදී අපට පාසල් විෂය නිර්දේශය, පාසල් විෂය මාලාව අමතක කරන්නට බැහැ. අතීතයේ කියූ සේම, "පෙදෙහි රසඟව් විඳුනා - දෙනෙතා ඉතා දුලබෝ" ලෙසම මේ සාහිත්‍ය කලා රසවින්දනය ඉබේ පුහුණු වෙන්නේ නැහැ. ඒ පුහුණුව ලබා දිය යුතුයි. සාමාන්‍ය පෙළ සමත් වෙලා, උසස් පෙළ කලා විෂය ධාරාව හදාරන්න ඇවිත්, එතැනිනුත් භාෂාව සහ සාහිත්‍ය විෂය තෝරා ගත්තොත් පමණයි, රස වින්දනය හුරු කිරීමක් වෙන්නේ. නමුත්, අනෙක් විෂය ධාරා හදාරන දරුවන්ට එය ලැබෙන්නේ නැහැ. ඒ නිසා පාසල් විෂය මාලා තුළට, උසස් පෙළ සිංහල භාෂාව හදාරන දරුවන්ට තිබෙන නව කථාව, නාට්‍ය ආදිය මේ ජාතික මිනිසා, මේ සංස්කෘතික මිනිසා ගොඩ නඟන්න උදවු වෙන තත්ත්වයට පත් කර ගත යුතු යැයි අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් රජයක් ලෙස අපි කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ රජය පත් වෙලා දැන් මාස හතරකට ආසන්නයි. දැන් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු තැනින් තැන කියනවා, සමාජ මාධ්‍යවල දමනවා අපට පෙනෙනවා, මේ රජයත් වැටෙන්න ලු යන්නේ, ආයු කාලය ඉවරයි ලු. ඔන්න දැන් වැටෙනවා, අද වැටෙනවා, හෙට වැටෙනවා ලු ආදී වශයෙන්. ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරුන් 159දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මම කියන්න කැමැතියි, මේ රජය බිහි කර ගන්න කටයුතු කරපු අපි 159දෙනා කියන්නේ එක්තරා ප්‍රකාශනයක් විතරයි. විශාල ජන සන්නිපාතයක, මහා ජන සමූහයක ප්‍රකාශනයක් පමණයි. විපක්ෂයේ මන්ත්‍රීවරු මැතිවරණයේදී කියපු කිසිවක් අද වෙනකොට ඉෂ්ට වෙලා නැහැ. තෙල් පෝලිම් එනවා කියලා එතුමන්ලා කිව්වා. නමුත් තෙල් පෝලිම් නැහැ. ගෑස් පෝලිම් එනවා කිව්වා. නමුත් ගෑස් පෝලිම් නැහැ. IMF එක යනවා කිව්වා. නමුත් ඒ වැඩසටහන එහෙම ම කරගෙන යනවා. ආගම සම්බන්ධයෙන් ව්‍යාජ තොරතුරු පැතිරවුවා. බොරු තොරතුරු පතුරුවලා, ආගම්වාදය ඇති කරන්න උත්සාහ ගත්තා. ඒ කිසිවක් නොවුණු තැන තමයි, විපක්ෂය දැන් කලබල වෙලා ඉන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ruwan Mapalagama, your time is up.

ගරු රුවන් මාපලගම මහතා
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම අපි දන්නවා, දේවාලවල කපුවෝ කියලා ජාතියක් ඉන්න බව. දේවාලයට එන බැතිමතුන් පූජා වට්ටිය දෙවියන්ට පූජා කරන්න ගියාම, පඬුරු තියලා ඒක ලබා දෙන්නේ කපුවා අතට තමයි. කපුවා තමයි, අපේ පූජා වට්ටිය අරගෙන තිරයෙන් පිටුපස ඉන්න දෙවියන්ට දෙන්නේ. තිරය මැත් කරලා පූජා වට්ටිය අපට නැවත දෙනකොට, ඒ පූජා වට්ටියට සැදැහැ සිතින්, බැති සිතින් තැබූ නෝට්ටුව අතුරුදන්. ගරු සභාපතිතුමනි, අපට මතකයි, පසු ගිය කොරෝනා කාලයේ රට lock down වුණාම, දේවාලවලට යන බැතිමතුන් අඩු වුණාම වැඩිපුරම පාඩු වුණේ ඒ කපුවන්ට බව. ඒ වාගේම අපේ සමාජයේ ඉන්නවා දේශපාලනික කපුවෝ. රක්ෂාවක් දෙන්න සල්ලි ගත්ත, පිටරට යවන්න සල්ලි ගත්ත, මාරුවීමක් ගන්න සල්ලි ගත්ත, දරුවා ඉස්කෝලයට දමන්න සල්ලි ගත්ත ඒ සියලුදෙනාගේ ආදායම් මාර්ග අද නැති වෙලා තිබෙනවා.

ඉතින් කපුවෝ කලබල වෙලා. ඒ කපුවන්ට අපි කියන්න කැමැතියි, මොන චෝදනා කළත් අපේ මන්ත්‍රීවරු 159දෙනා එක හඬින් එක මිටට ඉන්නවා කියලා. ඔය මොන චෝදනා කළත්, අදටත් මේ 159දෙනාගෙන් එක්කෙනෙකුගේවත් වංචාවක්, දූෂණයක් හොයාගන්න කිසිම මාධ්‍යයකට බැරි වෙලා තිබෙනවා. සියල්ලට ඉහළින් සියල්ල දකින අයටත්, පැත්ත ගියත් ඇත්ත කියන අයටත් ඒක බැරි වෙලා තිබෙනවා. අපේ එක මන්ත්‍රීවරයෙක්වත් රහසින් හරි එක මූල්‍ය වංචාවක් හරි කරලා තිබුණා නම් බලන්න තිබුණා, පැයෙන් පැයට breaking news එන විධිය. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි විපක්ෂයට කියන්න කැමැතියි, මේ රජය බිහි කරගන්න මහන්සි වුණාට වඩා වැඩියෙන් මේ රජය ආරක්ෂා කරගන්න අපිත් කැප වෙනවා, ජනතාවත් කැපවෙනවා කියලා. ගරු ජනාධිපති අනුර දිසානායක සහෝදරයා පාර්ලිමේන්තුවේ කියපු කථාවක් කියලා මගේ කථාව අවසන් කරන්නම්: "විපක්ෂයට අවශ්‍ය නම් අනාගතයේ හෝ ආණ්ඩු බලය ගන්න, ගරු විපක්ෂයේ මන්ත්‍රීවරුනි, අපට වඩා හොඳ වෙලා පෙන්වන්න. අලුත් පාරකින් එන්න. ඔය පරණ පාර ජනතාව ප්‍රතික්ෂේප කර අවසන්."

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Dilith Jayaweera. You have a total of 21 minutes, including the additional time allotted to you.

[පූ.භා. 11.54]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු සභාපතිතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මේ ගෞරවනීය පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කිරීමට ලැබීම සතුටට කරුණක්.

ගරු සභාපතිතුමනි, මේ රටේ සිංහල බෞද්ධ සභ්‍යත්වය හා බැඳුණු අපේ සංස්කෘතිය පිළිබඳ නිවැරදි නිර්වචනයක් මේ සභාවේ සඳහන් කිරීම ඓතිහාසික වගකීමක් කියලා මම හිතනවා. ගරු සභාපතිතුමනි, විටින් විට දූෂණයට ලක් වුණු අපේ මේ සභ්‍යත්වය යන වචනය හැම දාම දේශපාලනයේදී භාවිත වුණේ ඉතා පහත් අවර අර්ථයකින් මිස, එයට ලැබිය යුතු ඒ විදග්ධ අවස්ථාව කිසි දිනෙක නොලැබුණු බව මගේ නිරීක්ෂණයයි.

ගරු සභාපතිතුමනි, මීට කලින් කථා කරපු රුවන් මාපලගම මන්ත්‍රීතුමා කිව්වා, "මේ වෙලාවේ සභා ගර්භයේ විපක්ෂය නියෝජනය කරමින් ඉන්නේ මගේ අතේ ඇඟිලි ගණනට වඩා අඩු මන්ත්‍රීවරු ප්‍රමාණයක්" කියලා. මම බොහොම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, එතුමාට. මොකද, ලාල් කාන්ත ඇමතිතුමා පමණක් මේ සභාවේ දැන් ඉන්න නිසා. මම ගණන් කරනකොට ආණ්ඩු පක්ෂයෙන් තව 14දෙනෙක් හිටියා. *[බාධා කිරීමක්]* ඒකත් සඳහන් කළා. තව 5ක් විතර ඉන්නවා. ඇමතිතුමන්ලා දෙන්නෙක් ඉන්නවා, මගේ කථාව අහන්න. ඒක සටහන් වෙන්න ඕනෑ නිසායි මම කිව්වේ. කොහොම වුණත්, ගරු සභාපතිතුමනි, වඩා වැදගත් වන්නේ මෙතැන කී දෙනෙක් ඉන්නවාද කියන එකට වඩා මේ කරුණ මට මේ පාර්ලිමේන්තුවේ සඳහන් කිරීමට අවස්ථාව ලැබීමයි.

ගරු සභාපතිතුමනි, අපි දිගින් දිගටම කියනවා, අපේ මේ ශ්‍රී ලාංකීය ජාතිකත්වය රැක ගත යුතුයි, අපි මේ රට ගොඩනැඟිය යුත්තේ ශ්‍රී ලාංකික ජාතිකත්වය මත පදනම්ව කියලා. ශ්‍රී ලාංකික ජාතිකත්වය යනු කුමක්ද? ශ්‍රී ලාංකික ජාතිකත්වය යනු, සිංහල බෞද්ධයා ගැන ප්‍රකාශනයක්ද, එසේ නැත්නම් අපේ මහා සභ්‍යත්වයේ ප්‍රකාශනයක්ද? අපේ ජාතිකත්වයට ආගමික බලපෑම් ඇති කරන, ප්‍රධාන, මුඛ්‍ය සංස්කෘතික බලපෑම ඇති කරන බුදු දහමේ දාර්ශනික හා ආගමිකත්වයෙන් ගත්තත් සටහන් කළේ, "න ජච්චා වසලෝ හෝති, න ජච්චා හෝති බ්‍රාහ්මණෝ, කම්මනා වසලෝ හෝති, කම්මනා හෝති බ්‍රාහ්මණෝ" යනුවෙන්. කිසි කෙනෙකුට උපතින් කිසි දෙයක් අයිති වෙන්නේ නැහැ. ඔබ වසලයෙක් වෙන්නේත් නැහැ, ඔබ බ්‍රාහ්මණයෙක් වෙන්නේත් නැහැ, ඔබ සිංහලයෙක් වෙන්නේත් නැහැ, ඔබ ද්‍රවිඩයෙක් වෙන්නේත් නැහැ, ඔබ මුස්ලිම්වරයෙක් වෙන්නේත් නැහැ, උපතින් පමණක්. එය ක්‍රියාවෙන් වෙන බවයි අපේ සභ්‍යත්වයේ විශ්වාසය. එසේ නම්, කෙතරම් ශ්‍රේෂ්ඨ දර්ශනයකින්ද අපේ සභ්‍යත්වයට මේ පහස ලැබිලා තිබෙන්නේ?

ගරු සභාපතිතුමනි, හැබැයි මම කලින් සඳහන් කළ පරිදි මෙය නිවැරදිව වටහා නොගැනීම නිසා සමාජයේ විවිධ අදහස් පළ වෙමින්, ඒ පළ වන අදහස් ඔස්සේ මේ රටේ ඒ සංහිඳියාව, - ඔබතුමන්ලාගේ අර NGO සංහිඳියාව නොවෙයි - අපේ සභ්‍යත්වයට අයිති අපේම සංහිඳියාව නැති වෙලා තිබෙන බව අපි පිළිගන්නට ඕනෑ. අපේ ඒ අනන්‍ය වූ අවබෝධයට හානි සිදු වෙලා තිබෙනවා. එය නිවැරදි කරගත යුතුයි, ගරු සභාපතිතුමනි. මම මීට කලින් ඇසුවා, අපේ ද්‍රවිඩ මන්ත්‍රීවරයෙකුගේ කථාවක්. එතුමා පවසන ආකාරයට ඔවුන්ගේ ආගමික නිදහස හා සංස්කෘතික නිදහසට බාධා වන ආකාරයෙන් අපේ ස්වාමීන් වහන්සේලා සමහර තැන්වල කටයුතු කරලා තිබෙනවා. එය එසේ සිදුවී තිබෙනවා නම්, එය නිවැරදි විය යුතුයි.

ගරු සභාපතිතුමනි, I must mention that, yesterday, I attended an *Iftar* ceremony, where I heard a sermon by Sheikh M.F.M. Farood. I was listening to his sermon, which he delivered in Sinhala, and it was like a Buddhist sermon; almost all the words he used were similar to those used by a Buddhist monk. අපේ හාමුදුරුනමක් කථා කරනවා වාගේ කථා කළේ, ගරු සභාපතිතුමනි. ඒ, අපේ මහා සංස්කෘතියේ බලපෑම ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ට බලපා ඇති ආකාරය. අපේ කතෝලිකයාට ඒ බලපෑම ඇති වෙලා තිබෙනවා. මේ රටේ ඉන්නේ රෝමානු කතෝලිකයෙක් නොවෙයි, ශ්‍රී ලාංකික කතෝලිකයෙක්. ගරු සභාපතිතුමනි, මේ රටේ ඉන්නේ ඔබ වැනි ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්. ඒක තමයි මහා සංස්කෘතියේ බලපෑම. අපේ සභ්‍යත්වය ගැන එඩිතරව කථා කරන්නට අපි ලජ්ජා වෙන්න නරකයි, පසු බහින්න නරකයි. මේ රටේ සියලු අන්‍ය ආගමිකයින්, අන්‍ය ජාතිකයින් මේ සභ්‍යත්වයට ගරු කරනවා. දේශපාලනය නිසා මේක පටලවා ගත්ත අය තමයි මේකට ගරහන්නේ.

ගරු සභාපතිතුමනි, මම ඊයේ ඇහුවා අර, Lex Fridmanගේ interview එක with Prime Minister Narendra Modi. That brings so much energy to that nation. So, why are we talking about මේ සංස්කෘතික මිනිසා සහ රේන්බෝ මිනිසා? රේන්බෝ මිනිස්සු නැහැ. සංස්කෘතික ජීවියා කියන්නේ ආගම්, ජාතිවාදී භේදයෙන් තොරව තමන්ගේ රටට අනන්‍ය සංස්කෘතියෙන් බිහි වන ඒ රටේ මිනිස්සු. ඒ තමයි සංස්කෘතික මිනිහා. මේ, සංස්කෘතියේ මිනිස්සු. ගරු සභාපතිතුමනි, මේක පටලවා ගන්න එපා, අපේ මාක්ස්වාදයේ එන දයලෙක්තික භෞතිකවාදයත් එක්ක. ඒ භෞතිකවාදය දැන් පටලැවිලා ඔබතුමන්ලාත් දැන් මාක්ස්ව අයින් කරලා ඉන්නේ. අපේ ලාල්

[ගරු දිලිත් ජයවීර මහතා]

කාන්ත ඇමතිතුමනි, දැන් පෙළපාළියේ එන්නේ නැහැ, මාක්ස්. දැන් පෙළපාළියේ එන්නේ නැහැ, එංගල්ස්. ඇයි? ඒවා failed projects.

අපේ මෝදි අගමැතිතුමාත් ඊයේ කිව්වා, ගෞතම බුදුරජාණන් වහන්සේගේ පහස ලබලා තිබෙන නිසා තමයි ඉන්දියාවට ඒ සංස්කෘතික අගය ලැබුණේ කියලා. ඉතින්, අපි ඒක අගය කරන්නට ඕනෑ. ඔන්න ඕක පටලවා ගත්තාම, අර කැලණියේ නයා, - *[බාධා කිරීම්]* කැලණියේ නයා පැටළුණේ එහෙමයි. ගරු සභාපතිතුමනි, අපේ නලින් හේවගේ මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. එතුමා අපේ ගමේ. එතුමා කිව්වා, කොස් ගස යට බුදු හාමුදුරුවෝ හිටියා නම්, මිනිස්සු කොස් ගසටත් වඳින්න යයි කියලා. තවත් අපේ අමාත්‍යවරයෙක් කිව්වා, ශ්‍රී මහා බෝධියට වඳින එක හරිම ගෝත්‍රික වැඩක් කියලා. අපේ ජනාධිපතිතුමාත් කිව්වා, "මම නම් කවදාවත් යන්නේ නැහැ, කැමරා අරගෙන" කියලා. හැබැයි, අපේ විජිත හේරත් මැතිතුමා අර උසේන් බෝල්ට්ටත් වැඩිය වේගයෙන්; එදා රනිල් වික්‍රමසිංහව බේරා ගන්න කථානායකතුමා ළඟට දිව්වාටත් වැඩිය වේගයකින්, අපේ ජනාධිපතිතුමා දළදා මාලිගාවට දිව්වා, අපේ මහානායක හාමුදුරුවෝ හම්බ වෙන්නට. අපි ඒක අගය කරනවා. බුදු හාමුදුරුවොත් කිව්වා, "අප්පමාදෝ අමතපදං" කියලා. අප්‍රමාදීව කටයුතු කරන්නට ඕනෑ. ඒක හොඳයි. අපේ රනිල් වික්‍රමසිංහ මහත්තයා අර වැල් පාලමේ ගෙනාපු බබා; IMF බබා භාර දුන්නා, අපේ ජනාධිපතිතුමාට. එතුමා සෙනෙහසින් ලු, ජනාධිපතිතුමාට භාර දුන්නේ. දැන් බබා බදාගෙන ඉන්නවා. ඊට අමතරව ඔය දළදා ප්‍රදර්ශනය, ඒ හිටපු ජනාධිපතිතුමාගේ, මෙතුමන්ලාගේ න්‍යායාචාර්යතුමාගේ අදහසක්. දැන් දළදා ප්‍රදර්ශනය සිද්ධ වෙනවා.

අපි ඒ ගැන ආඩම්බර වෙනවා. අපි සතුටු වෙනවා, මේ රජය මේ සංස්කෘතික යථාර්ථය තේරුම් ගත්ත එක ගැන. මේ සංස්කෘතික යථාර්ථය තේරුම් අරගෙන ඒ අනුව කටයුතු කරමින් මේ නිවැරදි කිරීම ගැන මම ගෞරව කරනවා, අපේ ලාල් කාන්ත ඇමතිතුමනි. අපේ රටට අවශ්‍ය ඒකයි. අපි වැරැදි නිවැරදි කරගෙන ඉදිරියට යන්න ඕනෑ. අපි හැම දාම "හැත්තෑහය වසරක සාපය" වැනි වචන පාවිච්චි කළා. ඔබතුමන්ලාත්, අපිත් විටෙක විශ්වාස කළා, ආගම "අබිං" කියලා. එහෙම නේ, අපි කියෙව්වේ අපේ රතු පාට පොතේ. එහෙම නොවෙයි කියලා අපි දැන් පිළිගෙන තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා ඔය මනස්ගාතවලින් අයින්වීම ගැන මට සතුටුයි. දළදා ප්‍රදර්ශනය පැවැත්වීමට කටයුතු කිරීම ගැන මට සතුටුයි.

මම ඔබතුමන්ලාට යෝජනාවක් කරන්න කැමැතියි. අපි වරක් වැන්දොත් නිවන් දකින්න පුළුවන් කියලා විශ්වාස කරන කැලණිය රජ මහා විහාරයේ අපේ හාමුදුරුවොත් එක්ක කථා කරලා එතැනත් නාග ධාතු ප්‍රදර්ශනයක්,- *[බාධා කිරීමක්]* එහෙම කිව්වාම අපට ශ්‍රද්ධාව ඇති වෙනවා නේ. හැම ආගමකම තිබෙන්නේ ඒ දර්ශනයෙන් ඔබ්බට ගිය, ඒ අදහසින් ඔබ්බට ගිය ශ්‍රද්ධාවක්. අපි දැකලා නැහැ, හේමමාලා කුමරිය දන්ත ධාතු අරගෙන එනවා. හැබැයි, අපි එහෙම විශ්වාස කරනවා. ඒක අපේ විශ්වාසයක්. මණිඅක්ඛිත නා රජු දමනයට බුදුරජාණන් වහන්සේ කැලණියට වඩිනවා අපි දැක්කේ නැහැ. හැබැයි, අපි එහෙම විශ්වාස කරනවා. ආගමික විශ්වාසවලට ඒ විධියට පහර ගහන්න ඔබතුමන්ලා කටයුතු කරනකොට, -*[බාධා කිරීමක්]* "නයා, නයා" කියලා ඔබතුමන්ලාගේ fake accountsවලින් ගැහුවේ මේ රටේ ශ්‍රී ලාංකික සභ්‍යත්වයට මිස මට නොවෙයි. ඔය news එක දමනවා කියලා මම දන්නෙත් නැහැ. දැන ගත්තත් මම නවත්වන්නෙත් නැහැ. ඒක මේ රටේ ජනතාව දැනගන්න ඕනෑ news එකක්. හැබැයි, ඔය news එක හැම channel එකකම යැව්වා. හැම channel එකකම යැව්වා. දැන් ඔබතුමන්ලාගේ official channel එක වන "සිරස" නාළිකාවෙත් පැයක වැඩසටහනක් live ගියා.

ඉතින්, මම කියන්නේ ඒක හොඳයි කියලායි. ඒ වාගේ වැඩ සිදු වුණු එක හොඳයි. මම ඒක අගය කරනවා. නමුත් මම සියල්ලටම වැඩිය අගය කරනවා ඔබතුමන්ලාගේ මේ වෙනස්වීම; ඔබතුමන්ලා සංස්කෘතික ජීවීන් බවට පත් වීම. අසංස්කෘතික ඔබගේ කුහකත්වය, ඊර්ෂ්‍යාව නැති වීම. බුදුරජාණන් වහන්සේ පමණක් නොවෙයි ගරු සභාපතිතුමනි, අල්ලාහ් දෙවියන් වහන්සේත්, අනෙක් සියලු ආගමික නායකයිනුත් සඳහන් කළේ ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වෙනුවට ප්‍රේමයයි. අපට ප්‍රේමය අවශ්‍යයි; සෙනෙහස අවශ්‍යයි. පිටරටින් මොනවා හෝ අතට දුන්නා කියලා NGOsවලින් වචන අල්ලාගෙන අපේ සංස්කෘතියට පහර දෙන්නේ ඇයි? මේ මොන ගොබ්බ වැඩක්ද?

ගරු සභාපතිතුමනි, අපේ අගමැතිතුමිය 2016දී ලාල් විජේනායක කොමිසමට ගිහිල්ලා කිව්වා, මේ රට නිරාගමික රාජ්‍යයක් වෙන්නට ඕනෑ කියලා. නමුත් අද අපේ ජනාධිපතිතුමා සංස්කෘතික මනුස්සයෙක් වෙලා තිබෙනවා. එතුමා අපේ සංස්කෘතියට ගරු කරමින් සංස්කෘතික මනුස්සයෙක් වෙලා තිබෙනවා. ඉතින්, අපි සතුටු විය යුතු නැද්ද? අපි සතුටු විය යුතුයි. අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමනි, අපට ගොඩක් සතුටුයි. අපට ඕනෑ ඒක තමයි. අපට ඕනෑ අන්න ඒ සංස්කෘතික ශ්‍රී ලංකාවේ, ඒ සභ්‍යත්වයේ පහස පිරි ශ්‍රී ලංකාවේ වැසියෙක් වෙන්නට මීස අන් දෙයක් නොවෙයි.

ගරු සභාපතිතුමනි, ඒ අතරතුර මම මේ කාරණයත් පවසන්නට ඕනෑ. අපි හැමදාම හිතුවා, මේ රට සහෝදරත්වයෙන් පුරවන්නට නම් ජාති, ආගම් භේදයකින් තොරව එකතු වෙන්නට ඕනෑ කියලා, ගරු සභාපතිතුමනි. අන්න ඒකට දාර්ශනික පසුබිම සකසා දෙන්නේ යල් පැන ගිය මාක්ස්වාදය නොවෙයි. අද මුළු රටම ඔබගේ රජයෙන් බලාපොරොත්තු සහගතව ඉන්නවා, මේ ශ්‍රේෂ්ඨ දර්ශනය ගැන; අපේ සභ්‍යත්වය ගැන.

අය වැය ගැනත් යමක් කථා කරන්න කියා ඉල්ලනවා නේ. මම ගොඩක් කැමැතියි, අය වැය ගැන කථා කරන්නට. නමුත් මම ඔබතුමන්ලාව අපහසුතාවට පත් කරන්න කැමති නැහැ. මේ අමාත්‍යාංශය හැදුවේ ජේ.ආර්. ජයවර්ධන මහත්මයා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මේක හැදුවාම වල්පොල හාමුදුරුවෝ ඇහුවා, බෞද්ධාගම බේරා ගන්නේ,- බෞද්ධාගමේ තිබෙන්නේ නිවන් යන මාර්ගය නේ. අවසානයේදී නිවන. දැන් නිවන් යවන්නේ මේ අමාත්‍යාංශයේ අපේ සෙනෙවි ඇමතිතුමාද කියලා මට අහන්න සිද්ධ වෙනවා. අපි ඉතින් මිත්‍රයෝ. හැබැයි, මගේ ප්‍රශ්නය ඒක නොවෙයි. මේ අමාත්‍යාංශය තිබෙන්නේ ඔය වැඩේට නොවෙයි, ඇමතිතුමා. මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දිහා බැලුවාම ඇත්තටම ගොඩක් දේවල් කරන්න පුළුවන්. අර මාපලගම මන්ත්‍රීතුමා කියවාගෙන ගියා පොත් ගහන්න, librariesවලට කීයක් හරි දෙන්න, තව තැනකට කීයක් හරි දෙන්න වාගේ දේවල්. මේ අමාත්‍යාංශය තිබෙන්නේ ඒවාට නොවෙයි. මෙන්න මේ මම කථා කරන, අපි යෝජනා කරන, මේ රට ඉල්ලා සිටින, මේ රටේ මානව ප්‍රාග්ධනය අභිප්‍රේරණය කිරීමට අවශ්‍ය වූ ඒ සංස්කෘතික පසුබිම හදන්නයි මේ අමාත්‍යාංශය තිබෙන්නේ.

මෝදි අගමැතිතුමා ඊයේ දීපු ඒ interview එක අහන්න. Sir, in fact, I must mention about the concept of differentiation of nations, how they are using their cultural and civilizational values to differentiate their nations. So, if we are to go “rainbow”, we can go to America and be “rainbow”. However, not even America

is “rainbow”. I must say that they are more culturally sensitive to their beliefs than most of you all are. The Americans believe that theirs is a civilization of white Christians. That is why, Sir, when you go to that country, you have to take an oath. You have to take that oath which states, “In God, we trust”. So, that is the "*sanskruthiya"*, that is the "*sabhyathwaya*" they are trying to protect. අපට කොහෙන් ආපු පිස්සුවක් නිසාද, මේ සංස්කෘතියට පහර දෙමින් කථා කරන්නේ? මේක හරියන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, අපේ ජනාධිපතිතුමා දැන් මේ ගරු සභාවේ නැති නිසා අපේ මේ විශේෂ ගෞරවය එතුමාට ලබා දෙන්න විධියක් නැති වුණා. එතුමා සභාවේ හිටියා නම් කොච්චර හොඳද? අද එහෙම නම් මා තරම් සතුටු වෙන වෙනත් කවුරුවත් නැහැ, එතුමා කරන දේවලට ඒ ගෞරවය ලබා දීලා. "පුනරුදය" කියන වචනයේ ඇත්තම තේරුම දැන් තිබෙන්නේ අන්න එතැන. නිරාගමික රාජ්‍යයක් ඉල්ලා සාක්ෂි දුන් අපේ අගමැතිතුමිය, බලන්නකෝ සුදු සාරිය ඇඳගෙන, අටපිරිකර අරගෙන එකත්පසෙකව නැවෙනකොට, මේ රටේ සභ්‍යත්වය ගැන අපට ආඩම්බර නැද්ද? *[බාධා කිරීම්]* අපට ආඩම්බර නැද්ද? *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
අය වැය, අය වැය?

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු සභාපතිතුමනි, අය වැය ගැන කථා කරන්න ඕනෑ නම්, අය වැය ඉදිරිපත් කරනකොට මේ සංකල්පය තේරුම් ගන්න ඕනෑ. අවුරුදු 2500ක් පරණ මේ රටේ තිබෙන මේ සංකල්පය තේරුම් ගන්න. ඔළමොට්ටළ දේවල් ඔළුවෙන් අයින් කළ පමණින්ම, ඒක නිවැරදි වෙලා නැති බවයි මේ කෑ ගැහිල්ලෙන් පේන්නේ. ඔබතුමන්ලා මැයි දින පෙළපාළියේ ඉස්සර ගෙනිව්ව ඒවා දැන් ගෙනියන්නේ නැහැ නේ. දැන් ඒ පෙළපාළිවල මාක්ස් යන්නේ නැහැ නේ, එංගල්ස් යන්නේ නැහැ නේ. පන්ති පහට ගිය මටයි, අර ගමේ අයටයි ඒවා කියන්න. *[බාධා කිරීම්]* පොඩ්ඩක් අහගෙන ඉන්න. *[බාධා කිරීම්]* අපේ ගරු ජනාධිපතිතුමා කිව්වා, ශිෂ්ට වෙන්න කියලා. *[බාධා කිරීම්]* අහගෙන ඉන්න. *[බාධා කිරීම්]* මම කියන්නේ සභ්‍යත්වයට ගරු කරලා ඔබතුමන්ලාට ශිෂ්ට වෙන්න කියලායි. ඔබතුමන්ලා ශිෂ්ටසම්පන්න වෙන්න, කථාවක් අහගෙන ඉන්න පුරුදු වෙන්න. ගරු ජනාධිපතිතුමා, මෙතැනට ඇවිල්ලා ඇඬුවා, මිනිස්සුන්ට ශිෂ්ට වෙන්න කියලා. ශිෂ්ට වෙන්න, පරණ කතන්දර අමතක කරලා දමන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. පාර්ලිමේන්තුවට බෝම්බ ගහන්නත් ආවා, පාර්ලිමේන්තුව අල්ලා ගන්නත් ආවා, දළදා මාළිගාවට බෝම්බ ගහන්නත් ගියා. ඒවා නැවැත්වුවා, නිවැරදි වුණා. ඉතින් අපි ගරු කරනවා. අපි තවත් ශිෂ්ට වෙන්න හදනකොට ඔබතුමන්ලා මට බාධා කරන්න එපා.

ගරු සභාපතිතුමනි, this is the Ramazan season and it is important that we discuss an issue here. I saw the Cardinal on media once again. When you clearly observe the Easter attack, you understand that there is some fundamental misunderstanding, an error of judgement. That is why, from time to time, he comes and gives statements.

ගරු සභාපතිතුමනි, මම කලින් පැවසූ පරිදි ඇත්තටම අපේ සංස්කෘතියට වැඩි ආගමික ආභාසයක් ලැබෙන්නේ බෞද්ධ ආගමෙන්.

ගරු සභාපතිතුමනි, බෞද්ධ ආගම - Buddhism - as you know, does not compete with any other religion. If you take Islam, Christianity or Judaism, they are competitive religions in the world, unfortunately, as much as you and I would love to see religions not competing with each other. The Bible, The Quran and the Torah believe in the same God, but the Messengers in them are different. In our case, Buddhism does not compete with any other religion. Therefore, we should use the full potential of that opportunity to build an inclusive nation so that we could give an example to the rest of the world. If we had done mistakes for various reasons, we have got to correct them, for sure, I agree. So many politicians are responsible for that, I agree; political parties are responsible for that, I agree. But, that does not mean that we must continue to make the same mistakes.

In that context, Sir, I must say this.

අපි මහ මොළකරුවෙකු පසුපස දුවමින් ඉන්නවා. මමත් කතෝලික පාසලකින් අධ්‍යාපනය ලබපු කෙනෙක්. නමුත්, මගේ පන්තියෙන් භාගයක්ම හිටියේ මුස්ලිම් සහෝදරවරුන්. මම ඒ බහු සංස්කෘතියෙන් එන පුද්ගලයෙක්. මම හොඳටම දන්නවා, ඒ සියුම් සංස්කෘතික කොටස්. හැබැයි, අපි ඔක්කෝම එකතු වෙලා මේ මහ මොළකරු හොයනවා වෙනුවට අපි බලාපොරොත්තු වන ශ්‍රී ලංකාව නිර්මාණය කර ගැනීමට ඇති බාධාව ඉවත් කරන්න ඕනෑ. පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වුණු පසුබිම පිළිබඳව මේ රටේ මුස්ලිම් ජනතාව තුළ නිවැරදි කියවා ගැනීමක් තිබෙනවා. Sir, I associate with them very closely; I am a friend of your community. That is why I say that we would not move forward, not even one inch, if we are not going to agree on this. In that context, Sir, I take this opportunity to bring up that point for discussion. අපි හැම දාම දේශපාලන අර්ථයෙන් මහ මොළකරුවෙකු අල්ලා ගන්න ගියොත් වෙන්නේ, ආගම් හා ජාතීන් අතර අපේ රටේ පවතින බැඳීම නැති වෙලා, ආගමික සංවේදී සත්‍යය තේරුම් නොගෙන අපි වළක වැටෙන එක විතරයි.

ගරු සභාපතිතුමනි, කොහොම වුණත් මම මේ අවස්ථාවේදී මේ කාරණයත් ප්‍රකාශ කරන්න ඕනෑ. මේ නව ආණ්ඩුව උත්සාහ කරනවා, අනෙකුත් කරුණු අතර සංස්කෘතික හා ආගමික ප්‍රබෝධයක් ඇති කරන්න. දළදා ප්‍රදර්ශනය වාගේම සර්වඥ ධාතු ප්‍රදර්ශනය වැනි එකක් රාජ්‍ය අනුග්‍රහයෙන් කැලණියේත් පවත්වන්න. මොකද, අනෙකුත් ජාතීන්ට හා ආගම්වලට ගරු කරමින් ඒ ඒ සංස්කෘතික කටයුතුවලටත් රාජ්‍ය අනුග්‍රහය ලබා දෙමින් අපි කටයුතු කරන්න ඕනෑ. Sir, the Ramazan festival is just around the corner. I think they can sponsor a big *Iftar* function for all of us so that that would be appreciated. ඒ දේ කරමින් ඔබතුමන්ලා ඉදිරියට යන්න.

ගරු සභාපතිතුමනි, මේ සභාවේ කථාවක් කළාට පස්සේ දිගටම මේ සභාවේ රැඳී ඉන්න මට වෙලාවක් නැහැ. අපට අපේ පක්ෂයේ ගොඩක් වැඩ තිබෙනවා. නමුත්, මම නැඟිටලා ගියාට පස්සේ එහෙන් මෙහෙන් මට පහර දෙනවා. මම කියනවා, ඔබට පහර දෙන්නම ඕනෑ නම් ගෞරවනීය විධියට ඒ පහර දීම කරන්න කියලා. ගරු සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ නළුවන් විධියට හිටියේ, ජාතියේ මහා නළු ගාමිණී ෆොන්සේකා මහතා, අපි ඔක්කෝම ආදරය කරපු බොහොම ජවසම්පන්න සම්භාව්‍ය

[ගරු දිලිත් ජයවීර මහතා]

ගණයේ නළුවෙක් වුණු රවීන්ද්‍ර රන්දෙනිය මහතා, මහා නිළිය මාලනී ෆොන්සේකා මැතිනිය වැනි අය. නළුවෝ දාලා හරි මට පහර ගහනවා නම් හොඳ නළුවෙක් ගෙනැල්ලා මට පහර ගහන්න කියමින්, කාලය ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Upul Kithsiri. You have ten minutes.

[අ.භා. 12.17]

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු සභාපතිතුමනි, මම මේ පාර්ලිමේන්තුවට ආ පසු හිනා වෙලා කථාවක් අහපු, දැකපු පළමුවැනි අවස්ථාව තමයි දැන් මේ මම අත්වින්දේ. අපේ විපක්ෂයේ "නයි මන්ත්‍රීතුමා" නයා පෙන්නුවේ ඉස්සෙල්ලා. අපේ රටේ සංස්කෘතිය පිළිබඳව, සභ්‍යත්වය පිළිබඳව, ආගම පිළිබඳව එතුමා කථා කළා. මේ රටේ ජනතාවට එදා නයි පෙන්නලා මේ රටේ මහා විනාශයකට දායක වුණා කියන එක අමතක වෙලා තමයි එතුමා අද කථා කළේ.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Dilith Jayaweera? *-[Interruption.]*

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීමක්]* ගරු සභාපතිතුමනි, he made a direct reference to me. So, let me clarify it. මම මීට කලිනුත් මේ ගැන කිව්වා. මේ නාළිකාව මට අයිතිව තිබුණු බව ඇත්ත. "දෙරණ" නාළිකාවේ විනාඩි දෙකයි, තත්පර තිස් ගණනක clip එකක් විකාශනය වුණා. ඒක ඇත්ත. අනෙක් නාළිකාවල ඊට වැඩිය කාලයක් විකාශනය වුණා. මම කිව්වා, තවත් නාළිකාවක පැයක වැඩසටහනක් විකාශනය වුණා කියලා. ඒවායේත් මේ ඔක්කොම විකාශනය වුණා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා හොඳ ඉස්ලාම් භක්තිකයෙක් නිසායි මම මේ කාරණය කියන්නේ. මෙතුමන්ලා මේ පහර ගහන්නේ මට නොවෙයි. මේ පහර ගහන්නේ වරක් වැන්දොත් නිවන් දකින්න පුළුවන් කියන කැලණිය පන්සලට මිසක් දිලිත් ජයවීරටවත්, වෙන කොහේටවත් නොවෙයි. මෙන්න මේ සංස්කෘතික ප්‍රහාරය නවත්වන්න කියායි මම යෝජනා කරන්නේ. ඒ නයා ගැන කථා කරනවා නම්, මුවලින්ද නාගරාජයා ගැනත් කථා කරන්න. අපේ බුදු රජාණන් වහන්සේ වැස්සෙන් ආරක්ෂා කළ මුවලින්ද නාගරාජයා ගැන සහ බුදු රජාණන් වහන්සේ වැඩම කළ,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dilith Jayaweera, you have made your point clear. Hon. Upul Kithsiri, you may please continue.

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු සභාපතිතුමනි, එතුමා විපක්ෂයේ හිටපු හොඳ නළු නිළියෝ ගැන කථා කළා. නළුවෙක් වෙන්න හැදුවාට එහෙම වෙන්න බැහැ. මේ රටේ මිනිස්සු අපේ රටේ ඉතිහාසය හොඳට දන්නවා.

ගරු සභාපතිතුමනි, මෙම අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත්, පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත් ගැන කථා කරන්න තමයි අද අපට තිබෙන්නේ. මේ අය වැය අපේ රජයේ ප්‍රථම අය වැය. මේ අය වැය තුළින් වනජීවී ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න අපි සමත් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අලි-මිනිස් ගැටුම කියන්නේ අපේ රටේ නිරන්තරයෙන්ම කථා වන මාතෘකාවක්. මේ අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා තිරසාර උත්තරයක් සොයන්න වාගේම, මේ රටේ අලින්ගේ ජීවිත මෙන්ම මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න ඕනෑ වැඩ පිළිවෙළ සකස් කිරීම සඳහාත් මෙවර අය වැයෙන් පියවර තබා තිබෙනවා. අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා අපි මේ අය වැයෙන් රුපියල් මිලියන 400ක මුදලක් වෙන් කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, විදුලි වැට ඉදිකිරීම සඳහා තවත් රුපියල් මිලියන 274ක වාගේ මුදලක් වෙන් කරන්නත්, වනජීවීන් සඳහා ආහාර සුපෝෂිත කලාප බිහි කිරීමට තවත් රුපියල් මිලියන 160ක් වෙන් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අලි-මිනිස් ගැටුම ගැන කථා කරද්දී අලි වැට ගැන විපක්ෂය කොච්චර කිව්වත්, අලි වැටක් යෙදීමෙන් විතරක් අලින් පනින එක නවත්වන්න බැහැ. සමහර තැන්වල අපට අලි වැටක් ඉදි කරන්න වෙයි; සමහර තැන්වල අලින් සඳහා අගල් ඉදිකරන්න වෙයි; තවත් සමහර තැන්වලදී දියුණු ජෛව විවිධත්ව ක්‍රම භාවිත කරන්න වෙයි. ඒ වාගේම තමයි, විශේෂයෙන්ම මේ සඳහා පලිහක් හැටියට, ආධාරක හැටියට මිනිසුන්ගෙන් අපට උදව් ලබා ගන්නට සිදු වෙයි. මේ අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා කටයුතු කරද්දී අපට විවිධ ගැටලු පැනනැඟිය හැකියි. එම නිසා අපේ අය වැය ඇතුළේ ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුවෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අලි-මිනිස් ගැටුම නිසා ජීවිත විශාල සංඛ්‍යාවක් විනාශ වන බව අපි දන්නවා. අපේ රටේ අලි ගහනය ගත්තොත්, 2024දී කරපු සමීක්ෂණයේ ප්‍රතිඵල තවම ආවේ නැතත්, ඊට අවුරුදු 12කට, 13කට කලින් කරපු සමීක්ෂණයට අනුව ලංකාවේ අලින් 6,000කට ආසන්න ප්‍රමාණයක් වාර්තා වෙනවා. ලංකාව කියන්නේ කුඩා භූමියක්. ඒ භූමියේ සිටින අලි ගහනය ගත්තොත්, අලින් ජීවත් වන භූමියෙන් සියයට 30ක වාගේ ප්‍රමාණයක තමයි අලි පමණක් ජීවත් වෙන්නේ කියන එක අපි දන්නවා. අලි ගැවසෙන අනෙක් සියයට 70ක ප්‍රදේශය මිනිසුන් සහ අලින් අතර මාරුවෙන් මාරුවට වාස භූමි වශයෙන් භාවිත වන ආකාරය තමයි අපි දකින්නේ. ඒ ඇතුළේ තමයි අලි-මිනිස් ගැටුම නිර්මාණය වෙන්නේ.

එම නිසාම ඒ අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහාත්, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ඇතුළු විවිධ ක්ෂේත්‍ර සඳහාත් මෙවර අය වැය තුළින් අපි විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ මේ වනකොට විශාල සේවක හිඟයක් තිබෙනවා. එම නිසා ඒ සේවක හිඟය නැති කිරීම සඳහා ඒ අවශ්‍ය cadre එක සම්පූර්ණ කිරීමට මේ වනකොට අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා විශාල ප්‍රමාණයක් කරගෙන යනවා. අලි වැටවල් සකස් කිරීමට වාගේම වනජීවී කලාප තුළ තිබෙන අඩවි වන කාර්යාල සහ අනෙකුත් සේවාවන් සඳහා විශාල සේවක සංඛ්‍යාවක් ඕනෑ කර තිබෙනවා.

ඒ වාගේම, අපේ වන සම්පත ආරක්ෂා කරගන්නත් ඕනෑ. අපි දන්නවා, අපේ රටේ දළ ජාතික ආදායමට විශාල පංගුවක් එකතු කරන ඒකකයක් තමයි වනජීවී ක්ෂේත්‍රය කියන්නේ. උදාහරණයක් හැටියට ගත්තොත්, මේ වනකොට උඩවලව ජාතික වනෝද්‍යානයේ දෛනික ආදායම රුපියල් ලක්ෂ 100 දක්වා පැමිණ තිබෙනවා. ඒ වාගේම, මේ වනකොට උඩවලව ඇත් අතුරු සෙවණේ දෛනික ආදායම රුපියල් ලක්ෂ 4ක්, 5ක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඒ අනුව, වනජීවී ක්ෂේත්‍රය මේ රටේ ආර්ථිකයට දක්වන දායකත්වය ඉතාම ඉහළ අගයකයි තිබෙන්නේ. එම නිසා තමයි ඒ නිලධාරීන්ගේ සුබ සාධනය සහ අනෙකුත් අවශ්‍යතා ඉටු කරන්න මේ වනකොට අපි කටයුතු කරමින් ඉන්නේ. ඒ වාගේම තමයි ගල්ඔය ජාතික වනෝද්‍යානයත්. අපි මේ වනකොට තවත් ජාතික වනෝද්‍යාන කලාප ගණනාවක මැනුම් කටයුතු අවසන් කර ඒවා ජාතියට දායාද කිරීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, වනජීවී නිලධාරීන් පුහුණු කරපු ආයතනය තමයි ගිරිතලේ වනජීවී පර්යේෂණ පුහුණු මධ්‍යස්ථානය. එම පුහුණු මධ්‍යස්ථානය ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කරන්න ඕනෑ කරන සාධක, කටයුතු මේ වනකොට අපි අවසන් කරමින් ඉන්නවා. නව රජයක් හැටියට මේ පරිසර පද්ධතිය, මේ ජෛව විවිධත්වය ආරක්ෂා කළ යුතුයි කියන තැන අපි සිටිනවා.

අපේ මේ කුඩා රට ඇතුළේ ජෛව විවිධත්වය අතින් විශාල පරිසර පද්ධතියක් අපට තිබෙනවා. මේ පරිසර පද්ධතිය අපි ආරක්ෂා කරන්න ඕනෑ. ඒකට හේතුව තමයි මේ කුඩා ඉඩ ඇතුළේ ලෝකයේ තිබෙන විවිධ පරිසර පද්ධති තිබීම. ඒ තුළ විවිධ ශාක, අපට ආවේණික පක්ෂීන්, අපට ආවේණික ජලජ ජීවීන්, උරගයින් ඇතුළු විශේෂ සතුන් ජෛව විවිධත්වයට එක් කර තිබෙනවා. ඒ නිසා පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම අපේ ආණ්ඩුවේ ප්‍රධාන කොටසක් හැටියට තමයි අපි දකින්නේ. ගරු සභාපතිතුමනි, අපේ ජාතික ජන බලවේග ආණ්ඩුව එහි ප්‍රධානම කාර්යයක් හැටියට මේ වනජීවී ක්ෂේත්‍රය සඳහා දැවැන්ත මුදල් ප්‍රමාණයක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, අපට ජාත්‍යන්තර අරමුදල්වලින් වෙන් කරන ලද තවත් විශාල මුදලක් තිබෙනවා. ඒ වාගේම ඉදිරි කාලය තුළ අලුතින් අලි වැට කිලෝමීටර 834ක් ඉදි කරන්නත් මේ වනකොටත් මුදල් වෙන් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ රට කුඩා රටක්. මේ දිවයින ඉතා සුන්දර දිවයිනක් හැටියට තමයි අපි දකින්නේ. ඒ වෙන මොනවත් නිසා නොවෙයි, මේ පරිසර පද්ධතිය නිසා බව අපේ රටේ පුරවැසියන් මෙන්ම විදේශීය සංචාරකයන් අද හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා අනාගතයේ දරුවන් සඳහා අපි මේ පරිසර පද්ධතිය ආරක්ෂා කළ යුතුයි. ගරු සභාපතිතුමනි, අපට මතකයි, මේ පරිසර පද්ධතිය විනාශ වෙන්නේ කොහොමද කියලා. මීට වසර කිහිපයකට කලින් මාධ්‍ය තුළින් අපි දැක්කා, අපේ රටේ පරිසර පද්ධතිය - වනාන්තර, ගංගා, ඇළ, දොළ - විනාශ වන ආකාරය. මේ කටයුතු සඳහා විවිධ ඉදිකිරීම්, දේශපාලන මැදිහත්වීම් බලපා තිබෙන ආකාරය අපි විශාල වශයෙන් දැකලා තිබෙනවා. ඒ නිසා අපේ රජයට වගකීමක් තිබෙනවා, එවැනි තත්ත්වයන්ගෙන් වැළකිලා මේ මහඟු සම්පත ආරක්ෂා කර ගන්න. ඒ වෙනුවෙන් තමයි මෙවර අය වැයෙන් විශාල මුදල් කොටසක් වෙන් කරලා තිබෙන්නේ.

මීට වසර කිහිපයකට කලින් අපේ රටේ සිදු වුණු නාය යෑමක් පිළිබඳව අපි කථා කළා. අපි කවුරුත් දැක්කා, මේ සමාජයට මහා බෙදවාචකයක් එක් කළ මීරියබැද්ද ප්‍රදේශයේ සිදු වුණු ඒ නාය යෑම. ඒ තුළ ජීවිත විශාල සංඛ්‍යාවක් විනාශ වුණු ආකාරය අපි දැක්කා. එදා විශාල කම්පනයක් මේ රට තුළ ඇති වුණා. ඒ අවස්ථාවේදී මේ රටේ මාධ්‍ය ඒ සම්බන්ධයෙන් විශාල කතිකාවක් මතු කළා. ඒ අවස්ථාවේ මාධ්‍යයේ පළ වෙලා තිබුණු විශේෂ ප්‍රකාශයක් අපි දැක්කා. මීට වසර කිහිපයකට පෙර මීරියබැද්ද ප්‍රදේශයේ ඒ නාය යෑම සිදු වූ අවස්ථාවේ, මිනිසුන් ඒ පස් කඳුවලට යට වෙලා මිය ගිය අවස්ථාවේ මාධ්‍යයේ පළ වූ සටහනක් මේ සභාව හමුවේ තබන්න මම කැමැතියි. ඒ සටහනෙහි මේ ආකාරයට සඳහන් වෙනවා.

"දිනය, 1970 මාර්තු මස 12වැනි දා. ස්ථානය, කොළඹ හයිඩ් පිටිය. වෙලාව, පස්වරු 4.00යි. ජනතා විමුක්ති පෙරමුණේ මංගල රැස්වීම. කථිකයා, රෝහණ විජේවීර.

ආදරණීය මව්වරුනි, පියවරුනි, සහෝදර සහෝදරියනි, මා අද මේ මංගල රැස්වීම අමතා කථා කරන්නේ මරණ වරෙන්තුව අතේ තබාගෙනයි. සුදු අධිරාජ්‍යවාදීන් අපේ මාතෘ භූමිය බලහත්කාරයෙන් අල්ලා ගැනීමෙන් පසුව කන්ද උඩරට අඩි 5,000ට වඩා උස සියලු වනාන්තර භූමිය කපා විනාශකොට තේ වගා කළා. ඉන්පසුව කළු සුද්දෝ ඉතිරි වනාන්තර ටික කපා මහා විනාශයක් සිදු කරමින් ඉන්නවා.

මේ මහා වන විනාශය නැවැත්තුවේ නැත්නම් දශක තුනක් හතරක් ඉදිරියට යද්දී නායයෑම්, සෝදා පාළුව, ජල ගැලීම්, නියඟය ඇති වී ජන සංහාරයක් සිදු වෙනවා. මේ මාතෘ භූමියේ ගෝලීය තත්ත්වය අනුව ස්වාභාවික පරිසරයේ සමතුලිතතාව රැකීමට නම් අනිවාර්යයෙන්ම අඩි 5,000ට වඩා උස සියලු භූමිය වනගත කළ යුතුයි. කළු සුද්දනි, මේ වන විනාශය දැන්වත් නවත්තපල්ලා. නොප එසේ නොකළහොත්, එදාට මා ජීවතුන් අතර සිටින්නත්, නොසිටින්නත් පුළුවන්. නමුත්, නායයෑම්වලින්, කඳු කඩා වැටීම්වලින් සිය දහස් ගණන් ජනයා මිය යෑම වළක්වා ගන්නට බැරි වෙනවා."

එදා මීරියබැද්දේ වුණු සිදුවීම පදනම් කරගෙන මාධ්‍යයේ මේ ප්‍රකාශය පළ වුණා. එදා ඒ දැකපු විධියටම අපි පරිසරයට ආදරය කරන්න ඕනෑ. ඒ අදහස ඇතිව අපි අදත් ඒ වෙනුවෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி. ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Chanaka Madugoda. You have 12 minutes.

[අ.භා. 1.00]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

අද දින අය වැය කාරක සභා අවස්ථාවේ බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට සහ පරිසර අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳව විවාද කරනවා. මම විශ්වාස කරනවා සමාජයක් විධියට මේ අමාත්‍යාංශ විෂයයන් පිළිබඳව මේ මොහොතේ කථා කිරීම වෙනදාට වඩා කාලෝචිතයි කියලා. එවැනි කාලෝචිත අවස්ථාවක තමයි අපි මේ වැය ශීර්ෂ පිළිබඳව අද දවසේ මේ කථා කරන්නේ. ගරු සභාපතිතුමනි, මම එහෙම කියන්න හේතුව තමයි, අද තැන තැන වෙඩි වරුසා දකින, තැන තැන මිනිසුන් ඝාතනය වන, මිනිසුන්ට ජීවිතය සහ මරණය පිළිබඳව බිය, තැති ගැනීම ඇති වන සමාජයක් පැවතීම. අද සමාජය දයාව, කරුණාව වෙනුවට ක්‍රෝධය, වෛරය වැපිරෙන සමාජයක් බවට පත් වෙච්ච මොහොතක තමයි, ඒවා පිළිබඳව වැඩි වැඩියෙන් අහන්න දකින්න ලැබෙන අවස්ථාවක තමයි මේ වැය ශීර්ෂ පිළිබඳව අප කථා කරන්නේ.

අද දේශපාලන චුවමනා වෙනුවෙන්, එහෙම නැත්නම් බලය ලබා ගැනීම වෙනුවෙන් සමාජය තුළ වෛරය හා ක්‍රෝධය වපුරමින් තිබෙනවා. මේ මොහොත මිනිස් සමාජය තුළ වෛරය ඇති කරමින් දේශපාලනය කරන මොහොතක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මා විශ්වාස කරනවා, නිර්මල ආගමික ඉගැන්වීම්වලට සමාජය නතු කිරීම, හසු කිරීම, ඒ පිළිබඳව හිතන තැනට පත් කිරීම මීට හොඳම විසඳුමයි; හොඳම පිළියමයි කියලා. මම මේ මොහොතේ ඒ කාරණය විශේෂයෙන් අවධාරණය කරන්න කැමැතියි. ඒ වාගේම සමාජයට සහ ආගමික සංස්කෘතියට රජය ඍජුව සම්බන්ධ විය යුතුයි.

අපේ විහාරස්ථාන වෙන්න පුළුවන්, කිතුනු පල්ලි වෙන්න පුළුවන්, ඉස්ලාම් පල්ලි වෙන්න පුළුවන්, හින්දු කෝවිල් වෙන්න පුළුවන්, මේ සමස්ත ආගමික ස්ථානවල අද තිබෙන අඩුපාඩුකම් සැපිරීමට, ඒවායේ තිබෙන භෞතික ගැටලු විසඳීමට මේ අය වැය ලේඛනයෙන් යම් මුදලක් වෙන් වුණා ද කියන කාරණය පිළිබඳව අප විමසිය යුතුයි. ගරු සභාපතිතුමනි, දහම් පාසලේ අධ්‍යාපනය ලබන දහම් පාසල් දරුවාට අවශ්‍ය පහසුකම් සපයන්න, පහසුකම් සැපයීම වෙනුවෙන් යම් ප්‍රතිපාදනයක් කරන්න යම් ඉඩක් මේ අය වැය තුළ තිබෙනවා ද කියන කාරණය පිළිබඳවත් අප විමසිය යුතුයි. ඒ වෙනුවෙන් වන රජයේ අනුග්‍රහය මේ අය වැය ලේඛනය තුළ අපට දකින්න ලැබුණේ නැහැ කියන කාරණයත් මේ මොහොතේ සඳහන් කරන්න ඕනෑ.

අපි ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවට ඇහුම්කන් දුන්නා. ඒ අය වැය කථාව තුළ අපට දකින්න ලැබුණේ නැහැ, ආගමික සහ සංස්කෘතිමය කාරණා පිළිබඳව අය වැය ලේඛනයෙන් යම් උනන්දුවක්, යම් සාධනීය ප්‍රතිචාරයක් දක්වන බවක්. නමුත්, අප ආණ්ඩු කරපු කාලයේත්, විපක්ෂයේ සිටින විටත් සමාජයේ ආධ්‍යාත්මික හා අභෞතික වටිනාකම් පිළිබඳව තදින් විශ්වාස කරමින් කටයුතු කළා; කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, රටේ ප්‍රධාන නීතිය වන අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදයේ බුද්ධාගම ප්‍රධාන අනෙකුත් ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ගැන සඳහන් වෙනවා. ඒ අයිතිවාසිකම් ගැන සඳහන් කරද්දී අද මේ සමාජය තුළ මතු වෙමින් පවතින යම් ගැටලුකාරී කාරණා කිහිපයක් මතු කර පෙන්වීමට මෙය අවස්ථාවක් කර ගත යුතුයි කියලා මම හිතුවා.

අද යාපනයේ තිස්ස විහාරය සම්බන්ධව තිබෙන ගැටලුව ඒවායෙන් එකක්. ඉතාම පෞරාණික උරුමයක් සහිත යාපනයේ තිස්ස විහාරයේ ඉඩම් ගැටලුවට තවමත් නිසි විසඳුමක් ලැබී නැහැ, ගරු සභාපතිතුමනි. 1956 නගර සැලසුම් සිතියමේ යාපනයේ තිස්ස විහාරය තිබෙනවා. ඒ බෞද්ධ උරුමය මේ රටේ සැදැහැවතුන්ට ආරක්ෂා කර දෙන්න විශේෂයෙන්ම රජය විධියට කටයුතු කළ යුතුයි කියන කාරණය මා සඳහන් කරනවා. එම විහාරය ආශ්‍රිතව අනවසර පදිංචිකරුවන් ඉන්නවා. ඒ අනවසර පදිංචිකරුවන් ඔවුන්ගේ පදිංචිය සනාථ කරන්න විවිධ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කරමින් කටයුතු කර තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා රජය මැදිහත් වෙලා විශේෂ කමිටුවක් මඟින් පරීක්ෂා කරලා ඒ අනවසර පදිංචිකරුවන්ට වෙනත් ස්ථානයකින් ඉඩම් ලබා දීලා, යාපනයේ තිස්ස විහාරය හා සම්බන්ධ ගැටලුව විසඳා දෙන්න කියලා. එම ගැටලුව විසඳා දෙන්න පුළුවන් නම් එය ඉතාම වටිනවා.

ඒ වාගේම, මුලතිව්වල පිහිටා තිබෙන අපේ කුරුන්දි විහාරය ගැනත් මම කියන්න ඕනෑ. අද උදේ අපේ දම්ළ මන්ත්‍රීතුමෙක් ඒ පිළිබඳව සඳහන් කළා. මම එයට සවන් දුන්නා. අප මේ සඳහන් කරන කාරණා බෞද්ධ විහාරස්ථාන පිළිබඳ, හින්දු කෝවිල් පිළිබඳ, ඉස්ලාම් පල්ලි පිළිබඳ, එහෙම නැත්නම් වෙනත් ආගමික ස්ථාන පිළිබඳ කාරණා ද කියන එක නොවෙයි වැදගත් වන්නේ. මේ සමාජය තුළ තිබෙන ගැටලු විසඳීම රජයේ වගකීමක් වනවා.

මුලතිව් කුරුන්දි විහාරයේ පිළිම ගෙයි කැණීම් කටයුතු පසුගිය දවස්වල සිදු කළා. අද ඒ කැණීම් කටයුතු උසාවි නියෝගයක් මත නතර වෙලා තිබෙනවා. හැබැයි, අද ඒ කැණීම් කටයුතු අතරමඟ නතර වී තිබෙන්නේ බෞද්ධ උරුමය පවතින ස්ථානයකයි. අද මේ සමාජය තුළ දිනෙන් දින අපේ උරුමය අභාවයට යමින් තිබෙනවා; විශේෂයෙන්ම පෞරාණික වටිනාකම් සහිත පිළිම ගෙවල් වේගයෙන් විනාශයට පත් වෙමින් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපේ අනාගත දරු පරම්පරාවට ඒවා උරුම කර දීම, එම උරුමය දකින්න ඒ අයට ඉඩ කඩ ලබා දීම, ඒවාට අදාළව තිබෙන ගැටලු විසඳීම රජයෙහි වගකීමක් වනවා. කුරුන්දි විහාරයේ තිබෙන සියලු නීත්‍යානුකූල මායිම්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ලකුණු කර තිබියදීත් ඒ කටයුතු අතරමඟ නතර කර තිබෙනවා. උතුරේ සමහර දේශපාලඥයන් තමන්ගේ දේශපාලනය ඉදිරියට ගෙන යන්න ඒ බෞද්ධ විහාරස්ථාන තුළ තිබෙන යම් යම් කාරණා ඉස්මතු කරමින් කටයුතු කරනවා. එම නිසා රජය විධියට මේ ප්‍රශ්න දුර දිග යන්න නොදී මේ ප්‍රශ්න විසඳීම වැදගත් කියන කාරණය මා විශේෂයෙන් සඳහන් කරනවා.

අපේ උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන 600ක් පමණ හඳුනාගෙන තිබෙනවා. එසේ හඳුනාගෙන තිබෙන ස්ථාන පුරාවිද්‍යා රක්ෂිත ලෙස ගැසට් කරලා, ඒවාට නීත්‍යානුකූලභාවයක් ඇති කරලා, මේ රටේ අනාගත දුවා දරුවන්ගේ උරුමයන් විධියට, මේ රටේ සංස්කෘතියේ අංග විධියට, මේ රටේ ඓතිහාසික ස්ථාන විධියට ඒවායේ තිබෙන වටිනාකම් තහවුරු කිරීම රජයෙහි වගකීමක් කියන කාරණයත් මම මේ මොහොතේ සඳහන් කරනවා.

ගරු සභාපතිතුමනි, වවුනියාවේ අපේ සපුමල්ගස්කඩ විහාරස්ථානය ගැනත් කියන්න ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ එම විහාරස්ථානයට අදාළ මාර්ගය සංවර්ධනය කිරීම ආරම්භ කළා. හැබැයි, අද ඒක අතරමඟ නතර වෙලා තිබෙනවා. වව්නියාව සපුමල්ගස්කඩ විහාරයේ අතරමඟ නතර වෙච්ච ඒ ඉතිරි කටයුතු කරන ලෙසත්, ඒ වෙනුවෙන් යම් අවධානයක් යොමු කරන ලෙසත් මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

මා දැන් ඒ කාරණාවෙන් බැහැරව, දහම් පාසල් ගැන කියන්න ඕනෑ. අද දහම් පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට ස්වේච්ඡාවෙන් දහම් අධ්‍යාපනය ලබා දෙන දහම් පාසල් ගුරු මහත්ම මහත්මීන්, ගුරු මෙනෙවියන් වෙනුවෙන් ආණ්ඩුව මේ මොහොතේ තබා තිබෙන බර, ඒ අය කරන ඒ ස්වේච්ඡා සේවයට ලබා දීපු ගරුත්වය ප්‍රමාණවත් නැහැ කියලා අපි හිතනවා. ඒ අයට වසරකට රුපියල් 5,000ක මුදලක් පමණයි ලැබෙන්නේ, ගරු සභාපතිතුමනි. ඒ නිසා රජය විධියට ඒ අය අගයන්න, තවත් ධෛර්යවත් කරන්න, වාර්ෂිකව ලබා දෙන මුදල රුපියල් 20,000ක් කරලා ඔවුන් තවත් දිරිමත් කරන්න හැකියාවක් තිබෙනවා නම් වටිනවා කියන කාරණයත් මම මේ මොහොතේ සඳහන් කරනවා.

ඒ කාරණා වාගේම පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් කථා කරන මේ මොහොතේ, අපේ රට තුළ තිබෙන පාරිසරික ගැටලු අමතක කරලා කථා කරන්න බැහැ. මෙම අය වැය ලේඛනයෙන් පරිසරය වෙනුවෙන්, කසළ කළමනාකරණය වෙනුවෙන් වෙන් කරපු මුදල ප්‍රමාණවත් නැහැ. නමුත්, අනුරාධපුරයේ කසළ කළමනාකරණය වෙනුවෙන් මුදලක් වෙන් කර තිබෙනවා අපි දැක්කා. වෙනත් ප්‍රදේශවල කසළ කළමනාකරණය වෙනුවෙන් වෙන් කළ මුදල් ප්‍රමාණ පිළිබඳව ගැටලුවක් තිබෙනවා. අද ගාල්ල, හම්බන්තොට, කොළඹ ආදි හැම ප්‍රදේශයකම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් යම් යම් ගැටලු පවතිනවා.

ගරු සභාපතිතුමනි, අපට මතකයි, අපේ ආණ්ඩුව කාලයේ ගාල්ල ප්‍රදේශයේ මොන්රොවියාවත්ත කේන්ද්‍ර කරගෙන විශාල කසළ අංගණයක් -කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක්- හැදුවා. අද ඒ කසළ අංගණයේ කටයුතු ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනවා. හැබැයි අද එහි ගැටලු ද පවතිනවා. එහි දෙවැනි අදියර ක්‍රියාත්මක කරන්න යම් ප්‍රතිපාදනයක් වෙන් වුණා නම් හොඳයි. අද ඒ කසළ අංගණය තුළ සිදු වන්නේ දිරන කසළ කොම්පෝස්ට් බවට පත් කිරීමයි. ඒවා කොම්පෝස්ට් බවට පත් කරලා අද ආදායමක් ලබනවා. හැබැයි නොදිරන කසළ හා සම්බන්ධ ගැටලුව විසඳිලා නැහැ. ඒ නිසා විද්‍යාත්මක ක්‍රමවේද හඳුන්වා දෙමින් ඒ පිළිබඳව කටයුතු කරන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මම මේ මොහොතේ සඳහන් කරනවා. මොකද, කසළ පිළිබඳව තිබෙන ගැටලුව අපට සුළුවෙන් තකන්න බැහැ. කසළ පිළිබඳව මේ සමාජය තුළ තිබෙන මතය වෙනස් කරන්න ඕනෑ. කසළ කළමනාකරණය පිළිබඳව පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා ඊට අදාළ විෂය කරුණු පාසල් අධ්‍යාපනයට ඇතුළත් කරලා කසළ කළමනාකරණ වැඩසටහන සමාජමය වගකීමක් විධියට ඉදිරියට ගෙන යන්න පුළුවන් නම්, අනාගතයේදී අපට ඉතා හොඳ පරිසරයක් නිර්මාණය කරගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

අපේ ආණ්ඩු කාලවල ඉතා හොඳ, දැකුම්කලු නගර නිර්මාණය කළා; පරිසර උද්‍යාන හැදුවා; ව්‍යායාම කිරීම සඳහා jogging paths හැදුවා. එවැනි විශාල කාර්යභාරයක් අපි අපේ ආණ්ඩු කාලවල සිදු කළා. ආදරණීය ජනතාවට මානසික සුවයෙන්, ඉතා හොඳ පරිසරයක තමන්ගේ ජීවිත ගත කරන්න පුළුවන් වටාපිටාවක් අපි ඒ තුළින් ගොඩ නැඟුවා. පරිසරය සංරක්ෂණය කරනවා වාගේම අපේ දරුවෙකුට, අම්මා කෙනෙකුට, තාත්තා කෙනෙකුට ස්වභාව ධර්මයත් එක්ක නිදහසේ තමන්ගේ ජීවිතය ගත කරන්න හැකියාව තිබෙන පරිසරයක් ගොඩ නඟන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මම මේ මොහොතේ සඳහන් කරනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, ගාල්ල දිස්ත්‍රික්කයේ කැළි කසළ හා සම්බන්ධ තවත් ගැටලුවක් පිළිබඳව. මහමෝදර, නගර සභාව සතු කසළ එකතු කරන ඉඩම තුළ ඉතා අවිධිමත් කසළ බැහැර කිරීමක් සිදු වෙමින් තිබෙනවා. හැබැයි මම දැක්කා, ඒ සඳහා ඔබතුමන්ලාගේ අය වැය ලේඛනයෙන් යම් මුදලක් වෙන් කර තිබෙනවා. ඒ මුදල වෙන් කළා වාගේම ඒ කටයුතු විද්‍යාත්මකව සිදු කරනවා නම් හොඳයි. මොකද, ඒ ප්‍රදේශයේ ඉතා හොඳ පරිසරයක පිහිටි ස්ථානයකට තමයි ඒ කැළි කසළ එකතු කරමින් තිබෙන්නේ. ඒ නිසා විද්‍යාත්මකව ඒ කටයුතු කරන්න පුළුවන් නම් ඉතාම වටිනවා කියන කාරණයත් මම මේ මොහොතේ මතක් කරනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මතු කරමින්, මම මගේ කථාව අවසන් කරනවා. මේ සමාජය තුළ පසුගිය කාලයේ කථා බහට ලක් වුණා, දැහැමි සමාජයක් තුළ දැහැමි රජෙකු පහළ වුණාම රටට ලැබෙන්නේ මොනවාද කියලා. රජය, සමාජය දැහැමි වන තරමට නිසි කලට නිසි වැසි ලැබෙන බවත්, කෙත් වතු සරු වී සෞභාග්‍යය උදා වන බවත්, සියලු සත්ත්වයන්ගේ සිත් සතුටින් පිරී යන බවත් අපි ඉගෙන ගෙන තිබෙනවා. ඒ නිසා රටකට දැහැමි පාලකයෙකු පත් වුණාම අපි විශ්වාස කරනවා ඉහත කී දේවල් අපට ලැබෙනවා කියලා. ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳ ප්‍රාර්ථනා ඇතුළත් ගාථාවකින් මගේ කථාව අවසන් කරනවා.

"දේවෝ වස්සතු කාලේන
සස්ස සම්පත්ති හෝතු ච
ඵීතෝ භවතු ලෝකෝ ච
රාජා භවතු ධම්මිකෝ..."

"කල් වැසි වසීවා - කෙත් වතු සාර වේවා
සත් සිත් නිවේවා - රජය දැහැමිව ලොවැඩ වේවා"

ගරු සභාපතිතුමනි, අපේ රට බහු ආගමික, බහු වාර්ගික රටක්; ඒ සියලු දෙනා එකට ජීවත් වන රටක්. මම විශ්වාස කරනවා, වත්මන් ආණ්ඩුව ආගමික සහජීවනය, ආගමික පරිසරය ආරක්ෂා කර දේවි කියලා.

විශේෂයෙන්ම ගාල්ල ප්‍රදේශය ගත්තාම, මුස්ලිම්, සිංහල, කිතුනු, හින්දු කියන සියලුදෙනා එකට ජීවත් වෙන්නේ. අපි අතර ආගමික භේද නැහැ. අපි සංස්කෘතිකමය වශයෙන් බැඳිලා ඉන්නේ. අපි අතර තිබෙන සංස්කෘතික බැඳියාව, ඒ සහෝදරත්වය, ඒ ආදරණීය බව අපේ ජීවිතවලින් කවදාවත් බිඳිලා, කැඩිලා ගිහින් නැහැ. ඒ නිසා මම විශ්වාස කරනවා, මේ රටේ යම් කෙනෙක් කථා කරනවා නම් ජාතිවාදය ගැන, ආගම්වාදය ගැන, යම් කෙනෙක් මේ රටේ ජීවත් වන ජාතීන් උස් පහත් කරමින් කථා කරනවා නම් ඒ කථා කරන සෑම කෙනෙක්ම එසේ කථා කරන්නේ තමන්ගේ දේශපාලන ගමන සඳහා බව. ඔවුන් ඒ දේට උත්සාහ ගන්නවා මිසක්, සමාජමය කාරණයක් සඳහා නොවෙයි ගරු සභාපතිතුමනි එවැනි කටයුතු කරන්නේ. ඒ නිසා හැමදෙනාම ජාතිවාදය කරගහ ගෙන යන්නේ, හැමදෙනාම ආගම්වාදය කරගහ ගෙන යන්නේ තමන්ගේ දේශපාලන පටු අරමුණින්. නමුත් මේ රටේ එහෙම ප්‍රශ්නයක් නැහැ. ගාලු දිස්ත්‍රික්කයේ අපි හැමදෙනාම එකට ඉන්නවා නම්, අපට හින්දු කෝවිලට ගිහිල්ලා හොඳින් වන්දනාමාන කරන්න පුළුවන් නම්, අපට මුස්ලිම් පල්ලිය ඇතුළට ගිහිල්ලා ඔවුන්ගේ ආගම අදහන ස්ථානයේ ඉන්න පුළුවන් නම්, අපට කිතුනු පල්ලියට ගිහිල්ලා ඔවුන් සමඟ යාඥා කරන්න පුළුවන් නම් අප සහ ඔවුන් අතර කිසිම පරතරයක් නැතුව ආගමික, සංස්කෘතික සහජීවනයෙන් යුතුව අපට කටයුතු කරන්න පුළුවන්. මොකක්ද ඒකට තිබෙන ප්‍රශ්නය?

අද විවිධ පක්ෂ තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් ආගම ඉස්සරහට දමලා, ජාතිය ඉස්සරහට දමලා, ජාතියේ අනන්‍යතාව පෙන්වමින් මේ රට තුළ දේශපාලන කටයුතු කරනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, අපට ඒ සියලු ජාතීන්වල අනන්‍යතාව, සියලු ජාතීන්ගේ ගරුත්වය, සියලු ජාතීන්ට තිබෙන වටිනාකම -එකිනෙකාට තිබෙන ඒ වටිනාකම- ලබා දෙමින් කටයුතු කරන්න පුළුවන් නම් එය වටිනා බව.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chanaka Madugoda, your time is up now.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
එවිට මේ සමාජය තුළ පවතින ජාතිවාදය, ආගම්වාදය මෙන්ම අප අතර තිබෙන වෙනත් පටු අරමුණු නැති වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විධියට අපට මේ පාර්ලිමේන්තුව තුළින් ඒ ගෞරවනීය බව ලබා දෙන්න පුළුවන් නම්, මේ රට අපට හොඳ රටක්, ජීවත් වෙන්න පුළුවන් ඉතා හොඳ පරිසරයක් තිබෙන රටක් බවට පත් කරන්න පුළුවන් කියා මම විශ්වාස කරනවා. ඒ කටයුතු කිරීමට අවශ්‍ය ශක්තිය ඔබේ ආණ්ඩුවට ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. K.V. Samantha Viddyarathna. You have 11 minutes.

[අ.භා. 1.14]

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු සභාපතිතුමනි, අද අපි අමාත්‍යාංශ දෙකකට අදාළ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරනවා. විශේෂයෙන්ම මම කැමැතියි, මේ මොහොතේ පරිසර අමාත්‍යාංශයට අදාළව කරුණු කිහිපයක් දක්වන්න.

අද වනවිට සමස්ත ලෝකයම විශාල පාරිසරික අර්බුදවලට මුහුණ දී තිබෙනවා. අද ලෝකයේ රටවල් පවත්වන සමුළුවලින් වැඩි ප්‍රමාණයක් පවත්වන්නේත්, රාජ්‍ය නායකයන් වැඩි වශයෙන් එකතු වන්නේත්, අත්සන් කරනු ලබන ගිවිසුම්වලින් වැඩි ප්‍රමාණයක් අත්සන් කරන්නේත් පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන්. ලෝකයේ අනෙක් රටවලට උරුම වී තිබෙනවා වාගේම, අද වනවිට අපේ මාතෘ භූමියටත් ඉමක් කොනක් නැති පාරිසරික ගැටලු රාශියක් ඇති වී තිබෙන බව අපට පෙනෙනවා. ඒ පාරිසරික ප්‍රශ්නවලින් ලැබී තිබෙන ප්‍රතිඵලවලටත් අපි දැන් මුහුණ දෙමින් ඉන්නවා. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම, දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වය වාගේ වචන යොදමින් අපි කථා කළාට, නාය යෑම්, ගංවතුර උවදුර, කැලෑ ගිනි ගැනීම් ආදී ප්‍රශ්න අපට පෙනෙන්න තිබෙනවා. මේ ප්‍රශ්නවල උපත තිබෙන්නේ කොතැනද කියා බැලුවොත්, කවුරු කොහොම කිව්වත් අපි දකින්නේ ඒකට දේශපාලනයත් ප්‍රධාන වශයෙන් සම්බන්ධයි කියන එක.

අපි පසුගිය අවුරුදු කිහිපයේම මහා ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නා. මහා බිඳ වැටීමකට අපි ලක් වුණා. අපි අගාධයකට වැටුණේ. දැන් ඒ අගාධයෙන් අපි ටිකෙන් ටික ඔළුව ඔසවා ගෙන එන්න හදනකොට, අර පරණ කණ්ඩායම් නැවත ඒ වළටම වටිටන්න හැදුවත් අපි හිතනවා, ජනතාව ඒක තේරුම් අරගෙන ඉන්නේ කියලා. ආර්ථික වශයෙන් විතරක් නොවෙයි මේ රට බිඳ වැටිලා තිබෙන්නේ. මේවා ඔක්කෝම එකට ගැට ගැසී තිබෙන්නේ. ඒවා එකකින් එකක් වෙන් කරන්න බැහැ. පාරිසරික වශයෙනුත්, සංස්කෘතිකමය වශයෙනුත්, ආගමික පැත්තෙනුත් අප යම් යම් ප්‍රශ්නවලට, ගැටලුවලට දේශපාලනය විසින් ලක් කර තිබෙනවා. දැන් මේවා එකින් එක ලිහන්න ඕනෑකමක් තිබෙනවා. පසුගිය කාලයේ පැවතුණු පාලනය ගත්තාම, සොබාදහමේ සම්පත් කොල්ලකෑමක නිරත වුණු ස්වභාවයක් තමයි අපට පෙනුණේ. ස්වාභාවික සම්පත් කොල්ලකමින්, සම්පත් විනාශය උත්කර්ෂයට ගිය යුගයක් තමයි ඇත්තටම ඉතිහාසයේ තිබුණේ. එවන් තත්ත්වයක ඉඳිමින් තමයි අද අපට මේ සාකච්ඡාව කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඉතිහාසය තුළ පරිසරය ආරක්ෂා කර ගන්න වුණේ කාගෙන්ද? ගම්, නගරවල වැසියන්ගෙන්ද? නිලධාරීන්ට, සාමාන්‍ය සමාජයට මේ පරිසරය ආරක්ෂා කර ගන්න වුණේ කාගෙන්ද? පරිසරය ආරක්ෂා කර ගන්න වුණේ පාලකයන්ගෙන්. පරිසරයට හානි කරපු ප්‍රධානම කණ්ඩායම ආණ්ඩු කියලා කිව්වොත්, නිවැරදියි. අපි ඇතුළු පරිසරවේදීන්, මේ රටේ ගම්බිම්වල වැසියෝ අරගළ කළේ ආණ්ඩුවත් එක්කයි. ආණ්ඩුවත් එක්කයි අපි සටන් කළේ. ඒ ආණ්ඩුවලට වුවමනා විධියට කටයුතු කරපු සුළු නිලධාරි පිරිසකුත් ඉන්න ඇති. හැබැයි, බහුතරයක් නිලධාරීන් පසුගිය යුගවල පැවති ආණ්ඩුත් එක්ක හැප්පුණු බවක් අපි දැක්කා. එවැනි අවස්ථාවල නිලධාරීන් වුණත් අධෛර්යවත් වුණු තැන් අපි දැක්කා.

දැන් හොඳ යුගයක් එළැඹිලා තිබෙනවා. සියලු ජනතාව එකතු වෙලා ජාතික ජන බලවේගයේ පාලනයක් ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ මූලිකත්වයෙන් ගොඩ නැඟුවේ සුවිශාල බලාපොරොත්තු සහිතව. ඒ නිසා දැන් ආණ්ඩුවත්, අපිත් පොර බඳනවා පරිසරයත්, සංස්කෘතියත්, දහමත් ආරක්ෂා කර දෙමින් මේ රට ගොඩනඟන්න. ආර්ථිකය වෙනමයි, පරිසරය වෙනමයි ගොඩනඟනවා කියලා දෙකක් නැහැ. මේවා ඒකාබද්ධ වෙච්ච දේවල්. පසුගිය ඉතිහාසයේ පාරිසරික සතුරු සංවර්ධනයක් කරන්න තමයි උත්සාහ ගත්තේ. පරිසරයත් එක්ක ගැටෙන සංවර්ධනයක් කරන්න තමයි උත්සාහ ගත්තේ. අපේ අදහස වෙලා තිබෙන්නේ පාරිසරික මිතුරු සංවර්ධනයකට රට ගෙන යා යුතුයි කියලායි. ඒ නිසා කර්මාන්ත වෙන්න පුළුවන්, කෘෂිකර්මාන්ත වෙන්න පුළුවන්, අනෙකුත් සියලු ප්‍රතිපත්ති වෙන්න පුළුවන්, ඒ සියලු දේ පරිසරයත් එක්ක එකතු වෙලායි අපි කරන්න සූදානම් වෙන්නේ. අපි දන්නවා, ඉතිහාසයේ එක් එක් අමාත්‍යාංශ මේවා සමඟ කටයුතු කළේ වියුක්තව; වෙන් වෙන්ව බව. අපේ රජයේ තිබෙන විශේෂ ලක්ෂණයක් ලෙස අපි මේ ඔක්කෝම සංයුක්තව කල්පනා කරනවා. ඒකාබද්ධව කල්පනා කරමින් තමයි අපි මේ සියලු සැලසුම් හදන්නේ. ඒ නිසා මෙතැන් සිට රටේ දියත් කරන්න අපි මහන්සි ගන්නේ පාරිසරික මිතුරු සංවර්ධනයක් බව ඔබතුමන්ලාට මතක් කළ යුතුව තිබෙනවා. පරිසර හිතකාමී මානව සමාජයක් ගොඩනඟා ගැනීම අපේ කාර්යභාරයක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ මොහොතේ මම විශේෂ ගැටලු කිහිපයක් මතක් කරන්න ඕනෑකම තිබෙනවා. පරිසරය පිළිබඳ සංවේදීභාවයක්, දක්ෂතාවක් තිබෙන, හැකියාවක් තිබෙන නිලධාරීන් හා ජනතාව එකතු කරගෙන වැඩ කරන්න පුළුවන් හොඳ අමාත්‍යවරයෙක් මේ අමාත්‍යාංශයට ලැබිලා තිබෙනවා. ඒ, ගරු වෛද්‍ය දම්මික පටබැඳි ඇමතිතුමා. ඒ වාගේම නියෝජ්‍ය අමාත්‍ය ගරු ඇන්ටන් ජයකොඩි මැතිතුමා අපිත් එක්ක පරිසරය වෙනුවෙන් කරපු සටන්වල නියැළුණු කෙනෙක්, පරිසර ක්ෂේත්‍රයේ හිටපු කෙනෙක්; භූ විද්‍යාඥයෙක්. ඒ නිසා අපි හිතනවා මේ අමාත්‍යාංශය වෙනුවෙන් හොඳ සාධාරණයක් ඉෂ්ට කරන්න එතුමන්ලාට ශක්තිය තිබෙනවා කියලා.

ගරු සභාපතිතුමනි, ජාතික ජන බලවේගයේ පරිසර ප්‍රතිපත්තිය හදනකොට ප්‍රධාන මූලධර්ම 13ක් මත තමයි අපේ පරිසර ප්‍රතිපත්තිය සැකසුවේ. ඒ මූලධර්ම 13ට අපි ක්‍රියාමාර්ග 80ක් දැම්මා. අපේ ඒ මූලධර්ම 13ම මෙතැන කියන්න වෙලාව නොවෙයි, මේ. අපේ පළමු මූලධර්මය හැටියට අපි දැම්මේ, "පාරිසරික යුක්තිය තිබෙන්න ඕනෑ" කියලා. අපි දන්නවා, පසුගිය කාලයේ පාරිසරික යුක්තියක් තිබුණේ නැහැ. පරිසරයට සාධාරණය ඉෂ්ට වුණේ නැහැ. පරිසරයට යුක්තිය ඉෂ්ට වුණේ නැහැ. පරිසරය කිව්වාම, ගහ-කොළ, ඇළ-දොළ, ගංගා, සත්ත-සිව්පා, මානව අපි කියන මේ ඔක්කෝම ඇතුළත්. ඒකට යුක්තිය ඉෂ්ට වුණේ නැහැ.

අපි දෙවැනි කාරණය හැටියට දැම්මා, "පරිසරය සහ සංවර්ධනය අතර සමබරතාව රැකගෙන කටයුතු කරන්න ඕනෑ" කියලා. වර්තමාන අපේ අමාත්‍යාංශය ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තියත් පරිශීලනය කරලා ඒ අදාළ වැඩ පිළිවෙළ සංවිධානය කරලා ඇති කියලා මම හිතනවා. තිරසර සම්පත් භාවිතාවක් සම්බන්ධයෙන් අපි සාකච්ඡා කළා. අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඒ සඳහා ක්‍රියාමාර්ග 80ක් පෙන්වා දුන්නා. මම හිතනවා, හුඟක් නිලධාරි මහතුරු දැන් ඒවා අධ්‍යයනය කරලා ඇති, අලුත් වැඩ පිළිවෙළට යොදා ගෙන ඇති කියලා. ඒවා සම්බන්ධයෙන් අපේ අවධානය යොමු කරනවා.

එහි සඳහන් කාරණා දෙකක් මම මේ මොහොතේ මතක් කරන්න කැමතියි. ඒ ක්‍රියාමාර්ග 80හි අංක 6 යටතේ තිබෙනවා, පාංශු සංරක්ෂණය සහ සාරවත් පසක් නිර්මාණය කර ගැනීමට කටයුතු කරනවා කියලා. එතැන බරපතළ කාරණයක් තිබෙනවා. මම ජීවත් වෙන්නේ මධ්‍යම කඳුකරයේ. මධ්‍යම කඳුකරය අයිති අපට විතරක් නොවෙයි. මේ රටේ හදවත කියන්නේ, මධ්‍යම කඳුකරය. අද මධ්‍යම කඳුකරය ඉතා මහලු යුගයකට පත් වෙමින් තිබෙනවා. පසුගිය කාලයේ විශාල විනාශයක් මධ්‍යම කඳුකරයට සිද්ධ වුණා. ඒ මධ්‍යම කඳුකරයට ඒවා උහුලා ගන්න පුළුවන් මට්ටමක තිබුණේ නැහැ. ඒ නිසා ඒවායේ ප්‍රතිඵල අපි නාය යෑම් හැටියට භුක්ති විඳිනවා; පස සෝදා යෑම් හැටියට භුක්ති විඳිනවා. ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල ගංගා, ඇළ-දොළ ගලාගෙන යන්නේ වොකලටි පාටට. ඒ සෝදා ගෙන යන්නේ අපේ සාරවත් පස් තට්ටුව. ඒවා ගලා ගෙන ගිහිල්ලා පහළින් තිබෙන රන්ටැබේ, රන්දෙනිගල වාරි පද්ධතිවල තැන්පත් වෙනවා. එතකොට රජයේ මුදල් යොදවලා ඒවා ගොඩ දාන්න වෙනවා. ඒක අපේ කෘෂිකර්මාන්තයට, ආර්ථිකයට බලපා තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා, පාංශු සංරක්ෂණය වෙනුවෙන් විශේෂ ව්‍යාපෘතියක් මේ අමාත්‍යාංශයට නොපමාව අවශ්‍යයි කියලා. මේ පස සෝදා ගෙන යන එක වළක්වන්න ඕනෑ. රන්ටැඹේ ජලාශය සියයට 65ක් රොන් මඩෙන් පිරිලා. මම නොවෙයි ඒක කියන්නේ ඒ අමාත්‍යාංශමයි ඒක කියන්නේ. ඒ කියන්නේ වැවේ ගැබෙන් - ගර්භෂයෙන්- සියයට 65ක වතුර දරන්නේ නැහැ, 35ක පමණයි වතුර දරන්නේ. ඉතිරි ඒවා පිරිලා. ඒ වාගේම, රන්දෙනිගල ජලාශයත් සැලකිය යුතු ප්‍රමාණයකින් මඩෙන් පිරිලා. පසුගිය ආණ්ඩුව හැදුවා උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය කියලා එකක්. දැන් පුහුල්පොළ ජලාශයත් සැලකිය යුතු ප්‍රමාණයක් මඩෙන් පිරිලා. මේවා අපට මෙහෙම කිය කියා ඉන්න බැහැ. මේවාට උත්තරයක් අවශ්‍යයි. අන්න ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරන්න කැමතියි. මේ පාංශු බාදනයත් එක්ක අපි සැලකිය යුතු ප්‍රශ්නවලට මුහුණ දෙනවා. නාය යෑම් ප්‍රශ්නවලට මුහුණ දෙනවා. අපේ මධ්‍යම කඳුකරය විශාල නාය යෑම්වලට ගොදුරු වෙලා තිබෙනවා. මම අහගෙන හිටියා, අපේ ගරු මන්ත්‍රීතුමෙකුත් මේ ගැන පැහැදිලි කළා. බොහෝ කාලයකට පෙර, පරිසර අධිකාරියක්වත් පිහිටුවන්න පෙර අපේ පක්ෂයේ නායක ආදරණීය රෝහණ විජේවීර සහෝදරයා මේවා පෙන්වා දුන්නා.

දැන් අපි ඒ විපාක භුක්ති විඳිනවා. පසුගිය 7වැනි දා බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව රැස්වුණා. අපේ අමාත්‍යාංශයෙන් විශේෂ නිවාස ව්‍යාපෘතියක් මෙවර දියත් කර තිබෙනවා. ඇත්තටම, පසුගිය කාලයේ නිවාස හැදුවේ දේශපාලන හිතවතුන්ට. හැබැයි අපේ ආණ්ඩුව තීන්දු කළා, මෙවර නිවාස හදනකොට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය - NBRO එක - කියනවා නම්, "අධි නායයෑම් ප්‍රදේශයකයි මේ වැසියෝ ඉන්නේ, ඒ කට්ටිය වහා ඉවත් කරන්න, නැත්නම් නාය ගිහිල්ලා මැරෙන්න පුළුවන්" කියලා, අන්න ඒ කට්ටියගේ නිවාස හදන්න.

අපේ අමාත්‍යාංශයට අයිතියි වතු ප්‍රජාවත්. ඒ, ලැයිම්වල ඉන්න කට්ටිය. ලැයිම්වල ඉන්න අපේ දිස්ත්‍රික්කයේ අධි නාය යෑම් අවදානමේ සිටින පවුල් සංඛ්‍යාව 2,219ක්, ගරු සභාපතිතුමනි, ගරු පරිසර ඇමතිතුමනි. ඒ අයට මේ අවුරුද්දේ ගෙවල් ටික හදලා දෙන්න අපි තීන්දු කළා. හැබැයි, වතු ප්‍රජාවට අයිති නැති බදුල්ල දිස්ත්‍රික්කයේ අධි නාය යෑම් නිවාසවල වාසය කරන තවත් පවුල් සංඛ්‍යාවක් ඉන්නවා. ඒ සංඛ්‍යාව පවුල් 1,815ක්. මේ සම්බන්ධයෙන් අපි පියවරක් ගන්න ඕනෑ. මීරියබැද්දේ නාය යෑමෙන් මිනිස්සු වැළලුණා වාගේ මේ මිනිස්සු වැළලෙන්න දෙන්න බැහැ.

පසුගිය කාලයේ තිබුණු දේශපාලන සංස්කෘතිය අනුව අපේ ස්වාභාවික කඳු චිතරක් නොවෙයි කඩාගෙන වැටුණේ. ගරු පරිසර ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ අමාත්‍යාංශයටම අයිති කසළ ප්‍රශ්නය ගත්තොත්, මීතොටමුල්ල කුණු කන්දත් කඩා වැටිලා නාය ගිහිල්ලා මිනිස්සු මියැදුණු රටක්, මෙක. මේ රටේ පරිසරය සම්බන්ධයෙන් අවධානයක් තිබුණේ නැහැ. ඒ සම්බන්ධයෙන් ඉක්මන් අවධානයක් අමාත්‍යාංශය පැත්තෙන් යොමු කරන්න අවශ්‍යයි. අපේ පැතිවල විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ලැව් ගිනි ඇවිළීමත් එහෙමයි. සංචාරක පුරවරයක් වන ඇල්ල ප්‍රදේශයේ ඇවිළෙන ගින්න නිවන්න හැම වර්ෂයකම විශාල වියදමක් දරනවා. ඒක සංචාරක ව්‍යාපාරයට බලපානවා. මෙවර Ella Rock එකේ විශාල භූමි ප්‍රමාණයක් ගින්නෙන් විනාශ වුණා. ඒ විනාශ වීමත් එක්ක ඇල්ල-වැල්ලවාය ප්‍රධාන පාර සම්පූර්ණයෙන් වහලා තිබුණා. මීට දවස් කිහිපයකට ඉහතදී එහි එක මංතීරුවක් විවෘත කළා. රටේ ජනතාව මේ වාගේ ප්‍රශ්නවලට මුහුණ දෙනවා.

මම ඔබතුමන්ලාට කරුණු 2ක් ගැන කියන්නම් කිව්වා. දෙවැනි එක තමයි, අපේ ක්‍රියාකාරකම් සැලැස්මේ අංක 9 හැටියට අපි ඉදිරිපත් කර තිබෙනවා, සියලු ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීමේ යෝජනාවක්. අද විශාල අතවරයකට ලක් වෙන තැනක් තමයි අපේ ජල මූලාශ්‍ර. ජල මූලාශ්‍ර විශාල වශයෙන් විනාශ වෙමින් තිබෙනවා. ගරු පරිසර ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, අදාළ නිලධාරිනුත් එක්ක අපි සාකච්ඡා කරලා කිව්වා, අපේ ජල මූලාශ්‍ර ටිකේ මිනුම් කටයුතු කරලා, සංරක්ෂණය කරලා මේ කටයුත්ත ගෙනියන්න අපට අවස්ථාව දෙන්න කියලා. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, ඒක රටේ ප්‍රමුඛ අවශ්‍යතාවක් හැටියට සලකා, ඒ සම්බන්ධයෙන් මේ රටේ ජනතාව දැනුවත් කරලා, රටේම තිබෙන ජල මූලාශ්‍ර ටික මිනුම් කටයුතු කරලා සංරක්ෂණය කරන වැඩ පිළිවෙළකට යන්න අවස්ථාව දෙන්න කියලා. මිනිස්සු මැරුණොත් නැවත උපදිනවා. හැබැයි, උල්පතක් මැරුණොත් ආපසු උපද්දවන්න ලේසි නැහැ, ගරු සභාපතිතුමනි. අන්න ඒ නිසා මෙවැනි සංවේදී ප්‍රශ්නවලට අවධානය යොමු කරමින් මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සාර්ථකව කරගෙන යන්න අපේ ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, ඒ නිලධාරි මණ්ඩලයටත් ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බෙහෙවින්ම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. (Dr.) Elayathamby Srinath. You have 13 minutes.

[பி.ப. 1.25]

ගරු (වෛද්‍ය) ඉලෙයතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தவிசாளர் அவர்களே, வரவு செலவுத்திட்டத்தின் இன்றைய குழுநிலை விவாதத்துக்குரிய அமைச்சுகளின் கௌரவ அமைச்சர்களுக்கும் பிரதி அமைச்சர்களுக்கும் வணக்கத்தைத் தெரிவித்துக்கொண்டு, மிக முக்கியமான சில விடயங்களை இங்கு குறிப்பிட விரும்புகின்றேன். மத சமத்துவமும் இன சமத்துவமும் நிலவுகின்ற ஒரு நாட்டிலேதான் அபிவிருத்தியைப் பற்றியும் நிலையான பொருளாதாரத்தைப் பற்றியும் சிந்தித்து, அவற்றை வெற்றிகரமாகக்கொண்டு செல்லக்கூடிய நடைமுறை இருக்கும். இன்று நாம் நாட்டில் ஸ்திரமான பொருளாதாரத் தன்மையை ஏற்படுத்துவது பற்றி பலவாறாக ஆராய்ந்து கொண்டிருக்கின்றோம். உண்மையில் இங்கு வாழுகின்ற மக்கள் எல்லோரும் சமமாக, சமத்துவமாக, மத சுதந்திரத்துடன் வாழவேண்டுமென்ற கொள்கையின் அடிப்படையில், மாண்புமிகு ஜனாதிபதி அவர்களின் வழிகாட்டலின்கீழ் நீங்கள் பயணித்துக்கொண்டு இருக்கிறீர்கள். ஆனால், நாட்டிலே நடைபெறுகின்ற சம்பவங்கள் அவ்வாறான நிலைமைகளை எடுத்துக் காட்டுவதாயில்லை.

உண்மையாகவே பல விடயங்கள் சிறுபான்மை மக்களுக்கு மன வருத்தத்தையும் மனக்கிலேசத்தையும் உண்டாக்குகின்ற வகையிலே நடந்துகொண்டிருக்கின்றன. வரவு செலவுத்திட்டத்தில் புத்த சாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சுக்கு 13,000 மில்லியன் ரூபாய்க்கும் அதிகமான தொகை ஒதுக்கப்பட்டிருக்கின்றது. இந்த நாட்டில் எவ்வாறு பௌத்த மதம் நடத்தப்படுகின்றதோ அதுபோன்று இந்து, இஸ்லாம், கிறிஸ்தவ மதங்களும் சமமாக நடத்தப்பட வேண்டும். ஏனென்றால், அந்த மதங்களும் பாரம்பரிய வரலாறுகளைக் கொண்டிருக்கின்றன. அந்த அடிப்படையில், பௌத்த மதத்துக்குக் கொடுக்கப்படுகின்ற அதே சமத்துவமும் உரிமையும் இந்து மதத்துக்கும் ஏனைய மதங்களுக்கும் கொடுக்கப்பட வேண்டுமென்பதே எங்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது.

வடக்கு, கிழக்குப் பகுதியிலே பன்னெடுங்காலப் பண்டைய வரலாறுகளைக் கொண்ட பல ஆலயங்கள் இருக்கின்றன. அவற்றின் தொன்மையைப் பாதுக்க வேண்டிய பொறுப்பும் அவற்றைப் புனர்நிர்மாணம் செய்ய வேண்டிய பொறுப்பும் இந்தப் புத்த சாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சுக்கு இருக்கின்றது. உதாரணமாக, மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு இவ்வாறான பல ஆலயங்கள் இருக்கின்றன. அங்குள்ள தாந்தாமலை ஸ்ரீ முருகன் ஆலயம் பல வரலாறுகளைக் கொண்டது. அந்த ஆலயம் பன்னெடுங்கால அரசர்கள் மற்றும் தமிழர்களின் வரலாற்றைப் பறைசாற்றி நிற்கின்ற ஓரிடம். அந்த ஆலயத்தைக்கூட அபிவிருத்தி செய்ய முடியாதவாறு தொல்பொருள் திணைக்களமும் அரச நிருவாகத்தின்கீழ் இருக்கின்ற ஏனைய திணைக்களங்களும் இடையூறுகளை ஏற்படுத்தியிருக்கின்றன. அதுபோல், அங்குள்ள கொக்கட்டிச்சோலை சிவன் கோவில், சித்தாண்டி முருகன் கோவில், திருக்கோவில், தம்பிலுவில் முருகன் கோவில், மண்டூர் முருகன் கோவில், வெருகல் முருகன் கோவில் போன்ற பல ஆலயங்கள் பண்டைய-தொன்மை வரலாறுகளைக் கொண்டிருக்கின்றன. அவற்றுக்கான நிதியொதுக்கீடுகளோ, அவற்றைப் புனர்நிர்மாணம் செய்கின்ற எந்தவிதமான விடயங்களுமோ கடந்த காலங்களிலே பாரியளவிலே முன்னெடுக்கப்படவில்லை.

மட்டக்களப்பு மாவட்டத்திலே 400 - 500 வருடங்களுக்கும் மேற்பட்ட கிறிஸ்தவ தேவாலயங்கள் இருக்கின்றன; அவற்றுக்கான நிதியொதுக்கீடுகள்கூட செய்யப்படவில்லை. அண்மையிலே Clean Sri Lanka வேலைத்திட்டத்தின் அடிப்படையிலோ அல்லது வேறு ஏதோவொரு திட்டத்தின் கீழாகவோ ஹபரணையிலே இருக்கின்ற ஓர் இந்து ஆலயத்தின் முகப்பு மறைக்கப்படக்கூடிய வகையில் ஒரு பேருந்துத் தரிப்பிடம் அமைக்கப்பட்டு, இந்து மக்களின் மனதில் துன்பத்தை ஏற்படுத்துகின்ற நிகழ்வு நடந்திருக்கின்றது. இவ்வாறான நிகழ்வுகள் எவ்வாறு அரசாங்கத்தின் சமதர்மமான சமத்துவக் கொள்கையிலே நம்பிக்கையை ஏற்படுத்தும்? என்ற விடயத்தை நீங்கள் நோக்க வேண்டும். இந்து மக்களின் அல்லது கிறிஸ்தவ மக்களின் அல்லது இஸ்லாமிய மக்களின் மனங்களில் பயத்தையும் நம்பிக்கையீனத்தையும் ஏற்படுத்துகின்ற எந்தவிதமான செயற்பாடுகளையும் உங்கள் அரசு செய்யாது என்று நாங்கள் நினைக்கின்றோம். ஆகவே, இந்த வேலைத் திட்டங்களைச் செய்தவர்கள் யார்? இதற்கான அதிகாரங்களை வழங்கியவர்கள் யார்? இதற்கான நடவடிக்கைகள் எந்த வகையில் முன்னெடுக்கப்பட்டன? என்பதை நாம் அமைச்சர் அவர்களிடம் இந்த இடத்திலே வினவுகின்றோம். ஆகவே, பல்வேறு வகையான பண்டைய-தொன்மை வரலாறுகளைக் கொண்ட இந்து சமயமும் அதற்கான செயற்பாடுகளுக்கான முன்னுதாரணங்கள்மூலம் கட்டியெழுப்பப்பட வேண்டும்.

எமது வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே பல ஆலயங்கள் இருக்கின்றன. தமிழ்ப் பாரம்பரியத்தையும் இந்துப் பாரம்பரியத்தையும் பாதுகாப்பதற்கான எந்த நிகழ்ச்சித்திட்டங்களை இந்த வரவு செலவுத்திட்டத்தில் நீங்கள் முன்னெடுத்திருக்கின்றீர்கள்? இதில் பல வகையான திட்டங்கள், பல்வேறு வகையான நிதியொதுக்கீடுகள் இருந்தும், எமது பண்டைய மன்னர்களான பண்டார வன்னியன், சங்கிலியன், மட்டக்களப்புப் பகுதியிலே உலகநாச்சியார் ஆகியோர் பிரதானமாகப் போற்றிப் பாதுகாத்த அந்தக் கலாசாரப் பொக்கிஷங்களைப் பாதுகாப்பதற்கான என்ன நடவடிக்கைகள் எடுக்கப்பட்டன? என்பதை நாம் இந்த இடத்திலே கேள்வியாக எழுப்ப விரும்புகின்றோம். ஆகவே, எமது பிரதேசங்களிலும் அங்கிருக்கின்ற அறிஞர்கள் மற்றும் அரசியல் கட்சிகளின் பிரதிநிதிகளின் ஆலோசனைகளைக் கேட்டு, அவ்வாறான திட்டங்களை முன்னெடுக்க வேண்டும். உதாரணமாக, தொல்பொருள் விடயத்தில் கடந்த காலங்களிலிருந்து மிகப் பாரிய அநீதியைத் தமிழ் மக்கள் எதிர்கொண்டு வருகின்றார்கள். எமது சக பாராளுமன்ற உறுப்பினர்கூட வடக்குப் பகுதியில் ஏற்பட்ட அவலங்களை மிகத் தெளிவாக எடுத்துக் கூறினார். அவ்வாறான விடயங்களில் தமிழ்ப் பிரதேசப் பல்கலைக்கழகங்களில் இருக்கின்ற உயர் தொழில்நுட்ப வல்லுனர்கள் மற்றும் கல்வியாளர்களைத் தொல்பொருள் திணைக்களத்துடன் இணைத்துக்கொண்டு தமிழ்ப் பாரம்பரியத்தைப் பாதுகாக்குமளவில் உங்களுடைய செயற்பாடுகள் அமைந்திருக்கவேண்டுமென்பது எமது எதிர்பார்ப்பாக இருக்கிறது.

சுற்றாடல் அமைச்சு தொடர்பாக எடுத்துக் கொண்டால், மிக முக்கியமாக பல்வேறு வகையான நிலங்கள் இன்று வன இலாகாவின் கட்டுப்பாட்டில் இருக்கின்றன. மட்டக்களப்பு மாவட்டத்தில் நீர்ப்பாசனத்திற்காக இருந்த பல சிறிய குளங்கள் இன்று வன இலாகாவின் கீழ்க் கொண்டுவரப்பட்டுள்ளன. இதனால் சிறிய பயிர்ச்செய்கை நிலங்களுக்கு நீர் பாய்ச்சுதல், மீன் வளர்ப்பு போன்வற்றைச் செய்ய முடியாத ஓர் இக்கட்டான நிலை ஏற்பட்டுள்ளது. இந்தப் பிரச்சினைகளை நீங்கள் எவ்வாறு தீர்க்கப் போகின்றீர்கள்? எமது நாட்டின் பொருளாதாரத்தை முன்னேற்ற வேண்டும், உற்பத்தியைப் பெருக்க வேண்டுமென்று மாண்புமிகு சனாதிபதி அவர்கள் உரையாற்றுகிறார். அந்தச் செயற்றிட்டங்களை நீங்கள் எவ்வாறு இந்த அமைச்சினூடாகக் கொண்டுசெல்ல இருக்கிறீர்கள்?

மட்டக்களப்பு மாவட்டத்தில் பல நூற்றுக்கணக்கான குளங்கள் இன்று வன இலாகாவின் கீழ்க் கொண்டுவரப் பட்டுள்ளது. அதன் காரணமாக எமது மக்கள் விவசாயத்தைச் செய்ய முடியாத நிலை இருக்கின்றது. மீன் உற்பத்தித் துறையைத் தனியே கடல் வளத்தைக் கொண்டுமட்டும் அபிவிருத்தி செய்ய முடியாது. உள்ளூர் மீன் உற்பத்தியை மேம்படுத்த வேண்டுமாயின், சிறிய குளங்களில் மீன்பிடியை மேம்படுத்த வேண்டிய தேவையிருக்கின்றது. அதற்கு வன இலாகா மறுக்கின்றது. அவ்வாறான செயற்றிட்டங்களை உடனடியாக உங்களது அமைச்சின் ஊடாக ஆராய்ந்து, அதற்குரிய ஏற்பாடுகளைச் செய்யுங்கள்! நாங்களும் உங்களுடன் பங்குபற்றுவோம். மக்கள் பிரதிநிதிகள் மட்டுமல்லாமல் துறைசார் நிபுணர்களையும் அழைத்துக் கொள்ளுங்கள்! இதன்மூலம் நாட்டின் உற்பத்தியைப் பெருக்கிக் கொள்ள முடியும்.

மேலும், மக்களின் மனங்களைக்கூட நீங்கள் உணர்ந்து கொள்ள வேண்டும். கடந்த சனாதிபதித் தேர்தலிலும், பொதுத் தேர்தலிலும் மக்கள் உங்களுக்காகப் பாரிய வாக்களிப்பைச் செய்திருந்தார்கள். ஆனால், வருகின்ற உள்ளூராட்சிச் சபைத் தேர்தல் தொடர்பாகப் பல நம்பிக்கையீனங்களையும், அசௌகரியங்களையும் மக்கள் எதிர்கொண்டுள்ளார்கள். இவற்றை நிவர்த்தி செய்வதற்கு நீங்கள் முயலாவிட்டால், மக்களின் மனதில் நம்பிக்கையை ஏற்படுத்தாவிட்டால், அதன் விளைவுகளை நீங்கள் இத்தேர்தலில் எதிர்கொள்ளவேண்டி வரும் என்ற செய்தியை உங்களுக்குச் சொல்லிவைக்க விரும்புகின்றேன்.

அதுமட்டுமல்ல, வனஜீவராசிகள் சம்பந்தமாகப் பல்வேறு வகையான செயற்றிட்டங்களை நாங்கள் அமைச்சுடன் கலந்தாலோசித்திருக்கின்றோம்; பல வேண்டுகோள்களை விடுத்திருக்கின்றோம். மிக முக்கியமாக யானை-மனித மோதல் என்பது பாரிய பிரச்சினையாக மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்றது. இப்பிரச்சினை நாட்டின் பல இடங்களிலும் இருப்பதை நாம் ஏற்றுக் கொள்கின்றோம். ஆனால், அங்கு அதற்கான ஆளணிப் பற்றாக்குறை பாரியளவானதாக இருக்கின்றது. அமைச்சர் அவர்கள் பேசும்போதுகூட அதனை நிவர்த்தி செய்வதற்குரிய திட்டங்கள் உள்ளனதெனக் குறிப்பிட்டிருந்தார். ஆனால், எவ்வாறான செயற்பாடுகள் மட்டக்களப்பு மாவட்டத்தில் முன்னெடுக்கப்படவிருக்கின்றன? யானைத் தாக்கத்தினால் நாளாந்தம் சொத்துகளையும் வீடுகளையும் மனித உயிர்களையும் இழக்கின்ற நிலை ஏற்பட்டுள்ளது. இதனைத் தடுப்பதற்கான அரசாங்கத்தின் செயற்திட்டம் என்ன?

மக்கள் பிரதிநிதிகள் என்ற அடிப்படையில் இந்தக் கேள்விகளை மக்கள் எங்களிடம் முன்வைக்கின்றார்கள். நாங்கள் தொடர்புடைய அதிகாரிகளிடம் கேட்கின்றபோது அவர்கள் ஆளணி மற்றும் வளப் பற்றாக்குறையை மிகப் பிரதான காரணமாகச் சுட்டிக் காட்டுகின்றார்கள். நீங்கள் ஆட்சிப் பொறுப்பேற்று 100 நாட்களைக் கடந்து செல்கின்ற நிலையில் இவற்றுக்கான செயற்றிட்டங்கள் ஏன் இன்னும் தாமதமான நிலையில் இருக்கின்றன? கடந்த வாரத்தில் கிரான் பகுதியில் யானைத் தாக்கத்தினால் வீடொன்று சேதப்படுத்தப் பட்டது. இதனைத் தடுக்காமை பற்றி அதிகாரிகளைக் கேட்டபோது, அவர்களுக்கு உள்ள வாகனப் பற்றாக்குறை அதற்குக் காரணமாகத் தெரிவிக்கப்பட்டது. எனவே, இதனை நிவர்த்தி செய்வதற்கான உங்களுடைய பொறிமுறையை மிகத் துரிதமாகச் செயற்படுத்த வேண்டும். 100 நாட்கள் என்பது மிக அதிகமாக மக்களின் சேவைகளைச் செய்வதற்காகப் பயன்படுத்தப்பட்டிருக்க வேண்டிய காலம். இந்தக் காலப்பகுதியில்கூட முடிவெடுக்க முடியாத நிலை அல்லது செயற்றிட்டத்தைக் கொண்டுசெல்ல முடியாத நிலை ஏற்படுகின்றபோது எவ்வாறான நம்பிக்கையை நீங்கள் மக்களுக்குக் கொடுக்கவிருக்கின்றீர்கள்?

தர்ம போதனைகளைப் போதித்த புத்தபிரானின் கொள்கைகளைப் பின்பற்றுகின்ற நீங்கள், எல்லா மதங்களையும் சமத்துவமாகப் பார்க்கின்ற நிலைமையை, அந்தந்த மதங்களைப் பின்பற்றுகின்ற மக்களைப் பாதுகாக்கின்ற நிலைமையை உறுதிப்படுத்துவதற்காக என்ன நடவடிக் கைகளை எடுத்துள்ளீர்கள்? எமது பிரதேசத்தில் நாளாந்தம் இவ்வாறான கேள்விகள், கோரிக்கைகள் முன்வைக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. எமது பிரதேசத்திலே பல்வேறுபட்ட ஆலயங்கள் சம வாய்ப்புகள் அற்ற நிலைமையில் காணப்படுகின்றன. ஆகவே, மட்டக்களப்புப் பிரதேசத்திலே உள்ள பன்னெடுங்கால வரலாறுகளைக் கொண்ட ஆலயங்களைப் புனரமைப்பதற்கான ஓர் உதவித் திட்டத்தை ஆரம்பியுங்கள்! அவர்களுக்கு நம்பிக்கையைத் தருகின்ற வகையில், எல்லா ஆலயங்களின் விடயத்திலும் இந்த அரசு சமத்துவமாக நடந்துகொள்ளும் என்ற நம்பிக்கையை உருவாக்குங்கள்!

எங்களுடைய பிரதேசத்திலே இயற்கை வளம் சம்பந்தப்பட்ட பல பிரச்சினைகள் பற்றி நாங்கள் கௌரவ அமைச்சருடன் ஆலோசித்திருந்தோம். உதாரணமாக, மட்டக்களப்பு மாவட்டத்தில் மிக முக்கியமான நெருக்கடியாக நாங்கள் காண்பது, சுற்றாடல் அல்லது மற்றைய அமைச் சுகளினூடாக நியமிக்கப்படுகின்ற பல அதிகாரிகளுக்கு இருக்கின்ற மொழி சம்பந்தமான பிரச்சினையாகும். இதனால் அவர்கள் மக்கள் தொடர்பு அற்றவர்களாக இருக்கின்றார்கள். மக்கள் தங்களுடைய குறைகளை அவர்களிடம் கொண்டுசெல்ல முடியாத நிலை இருக்கின்றது. மொழி புரிந்தால்தான் அந்த மக்களுடைய பிரச்சினைகளை அவர்களால் விளங்கிக்கொள்ளக் கூடியதாக இருக்கும். நாங்கள் இங்கு வந்து இனவாதம் சம்பந்தப்பட்ட விடயங்களைக் கதைக்கவில்லை; அந்தப் பிரதேசத்தினுடைய மக்களின் நிலைமைகளைப் பற்றியே தெளிவாக எடுத்துக் கூறுகின்றோம். ஆகவே, எதிர்வரும் காலங்களிலே இவற்றை நிவர்த்தி செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த அமைச்சின் இன்றைய விவாதத்திலே இன்னுமொரு விடயத்தையும் நான் மிகத் தெளிவாகச் சொல்ல வேண்டியிருக் கின்றது. அண்மைக் காலத்தில் கிழக்குப் பல்கலைக்கழகத்திலே நியமிக்கப்பட்ட பேரவை உறுப்பினர்களின் எண்ணிக்கை ஒரு பெரிய பிரச்சினையாக மாறியிருக்கின்றது. காலங்காலமாகப்

[ගරු (වෛද්‍ය) ඉලෙයතම්බි සිරිනාත් මහතා]

පේණප්පට්ටු වන්ත ඉන විකිතාසාර මුරෙ මාට්රියමෙක් කප්පට්ටු, අංකු මික අතිකළවාකච් සිංකළ මොළි පේසුපවර්කළ් නියමික්කප්පට්ටිරුක්කින්රාර්කළ්. නාංකළ් ඉතෙ ඉනවාත ෑතියාකප් පාර්ක්කවිල්ලෙ. ආනාල්, අන්තප් පිරතේසත්තිලිරුක්කින්ර පල්කලෙක්කළකත්තින් වළර්ච්චික්කු අවර්කළ් එව්වාරු පංකළිප්පුච් චෙය්ය මුටියුම්? ඉන්ත අරසාංකම් පල්වේරුපට්ට නටවටික්කෙකළින්මූලම් අරස චෙලවිනංකළෙක් කුරෙත්තුක් කොළ්වතාක අරිවිත්තිරුක් කින්රතු. ආනාල්, මාවට්ටත්තිර්කු වෙළියේයිරුක්කින්ර උත්තියෝකත්තර්කළෙ අංකු නියමික්කින්රපොළුතු, චරාචරියාක 30,000 ඉලිරුන්තු 50,000 රූපාය්වරෙ මේලතික චෙලවු ඒර්පටුකින්රතු. අව්වාරු, වෙළි මාවට්ටත්තිලිරුන්තු 10 පේරවෙ උරුප්පිනර්කළෙ නියමික්කින්රපෝතු, මාතත්තිර්කු 500,000 රූපාය් - වරුටත්තිර්කු 6,000,000 රූපාය් - එන්ර වකෙයිල් මේලතිකමාක ඉන්ත අරසාංකත්තිර්කු ඉළප්පු ඒර්පටුකින්රතු. කටන්ත අරසාංකත්තිලේ පල විටයංකළිල් තේවෙයර්ර චෙලවුකළ් චෙය්යප්පට්ටිරුක්කින්රතෙන්රුම්, වීණ් විරයම් චෙය්යප්පට්ටිරුක්කින්රතෙන්රුම් නීංකළ් චුට්ටික් කාට්ටියිරුන්තීර්කළ්.

උංකළතු ඉව්වාරාන චෙයර්පාටුකළ්කූට තේවෙයර්ර, වීණ් විරයමාන චෙලවුකළෙයේ වෙළික්කාට්ටුකින්රතු. ඒන්, මට්ටක්කළප්පු මාවට්ටත්තිලේ පේරවෙ උරුප්පිනර්කළාක නියමිප්පතර්කුත් තකුතියානවර්කළ්, ඌළලර්ර්රවර්කළ්, පිත්තවර්කළ් ඉල්ලෙයා? ඉතන් පින්නණියිල් ඉරුන්තවර්කළ් යාර්? ඉව්වාරාන චමත්තුවමර්ර කොළ්කෙයිනාලුම්, අන්තප් පිරතේසත්තිලේ ඉරුක්කින්ර නිලෙමෙකළෙප් පුරින්තුකොළ් ළාමල් නියමනංකළෙ වළංකුවතනාලුම් මක්කළින් මත්තියිලේ කචප්පාන උණර්වුකළ් ඒර්පටුවතුටන්, අවර්කළතු වෙරුප්පෙයුම් නීංකළ් චම්පාතික්ක වේණ්ටිය නිලෙමෙ ඒර්පටුම්. එනවේ, ඉව්වාරාන පිරච්චිනෙකළෙ ඉනංකණ්ටු, නීංකළ් එතිර්කාලත්තිලේ මිකච් චරියාන මුරෙයිලේ උංකළතු චෙයර්පාටුකළෙ මේර්කොළ්ළාවිට්ටාල්, පාරිය වෙරුප්පුණර්වෙ තමිල් මක්කළ් චාර්පාකවුම්, මුස්ලිම් මක්කළ් චාර්පාකවුම් නීංකළ් එතිර්කොළ්ළ වේණ්ටියිරුක්කුම්.

මට්ටක්කළප්පු පාරිය වළප් පිරතේචංකළෙක් කොණ්ට පිරතේචම්; පණ්ටෙය වරලාරුකළෙක් කොණ්ට මාවට්ටම්; චුතන්තිරත්තිර්කු මුන්නතාක අල්ලතු ඉරෝප්පියර් ආට්චික්කු මුන්නතාකප් පල තමිල් මන්නර්කළින් ආට්චිකළ් නිලවිය ඉටම්; උලක නාච්චියාර් ආණ්ට ඉටම්. අත්තකෙය ඔරු පිරතේසත්තිල් තමිල්ත් තොල්ලියලාළර්කළෙයුම් ඉණෙත්තු, උංකළ් චනාතිපතියින් ආලෝචනෙයින්කීළ් ඔරු තිට්ටමිටුතල්මූලම් චමත්තුවමාන මුරෙයිලේ එමතු චමයත්තෙයුම් වරලාරුකළෙයුම් පාතුකාක්කුම් වකෙයිල් තොල්ලියල් නටවටික්කෙකළෙ මුන්නෙටුක්ක වේණ්ටුම්. උංකළ් අරසාංකත්තින් කොළ්කෙකළ් මික නන්රාක ඉරුක්කින්රන; නාම් උණ්මෙයාක අතනෙ වරවේර්කින්රෝම්. ආනාල්, අවර්රෙ නටෙමුරෙප්පටුත්තුවතිලේ පල ඉටර්පාටුකළුම් කුරිප්පාක, තමිල් මක්කළ් තුන්පප්පටුකින්ර නිලෙමෙකළුම්, මුස්ලිම් මක්කළාල් චිලවර්රෙ ඒර්රුක්කොළ්ළ මුටියාත නිලෙමෙකළුම් කාණප්පටුකින්රන. එනවේ, ඉව්වාරාන චෙයර්රිට්ටංකළෙ නීංකළ් මුන්නෙටුක්කින්රපොළුතු අන්තප් පිරතේසත්තිලිරුක්කින්ර, අන්ත මක්කළාල් තෙරිවුචෙය්යප්පට්ට අරචියල් කට්චිකළින් පිරතිනිතිකළෙයුම් අරවණෙත්තුක් කොණ්ටු චෙය්ය වේණ්ටුම්.

ඉව්වාරාන වරවු චෙලවුත්තිට්ටංකළින්පෝතු, පිරතේච අපිවිරුත්තිත් තිට්ටංකළ් මර්රුම් පිරතේච වළර්ච්චිත් තිට්ටංකළිල් අවර්කළින් ඉණක්කප්පාට්ටෙයුම් පෙර්රුක් කොළ්ළ වේණ්ටුම්. එතිර්වරුම් කාලංකළිලේ ඉන චමත්තුවත්තෙයුම් මත චමත්තුවත්තෙයුම් පේණුකින්ර වකෙයිලේ උංකළුටෙය චෙයර්පාටුකළ් ඉරුක්ක වේණ්ටුම්. අව්වාරාන චන්තර්ප්පංකළිලේ නාංකළ් එංකළුටෙය මුළුමෙයාන ඔත්තුළෙප්පෙත් තරත් තයාරාක ඉරුක්කින්රෝම්. ආනාල්, අතර්කු එතිර්මාරාක මත චුතන්තිරත්තෙයුම් පාතික්කින්ර වකෙයිලාන, ඉන චමත්තුවත්තෙයුම් පාතික්කින්ර වකෙයිලාන චෙයර්පාටුකළ් ඉරුන්තාල් මුළුමෙයාක එංකළුටෙය එතිර්ප්පුකළෙ නාංකළ් වෙළුවෙන් කාට්ටුවෙන්!

අතුමට්ටුමල්ලාතු, මික මුක්කියමාක, මක්කළ් පල විටයංකළිලේ අරසාංකත්තින්මීතු නම්පික්කෙ වෛත්තුත්තාන් උණ්මෙයාක උංකළුටෙය උරුප්පිනර්කළ් ඉත්තනෙපේරෙ වට, කිළක්කුප් පකුතිකළිලුම් තෙරිවු චෙය්තාර්කළ්. අන්ත නම්පික්කෙයෙක් කාප්පාර්රුම් විතමාක උංකළුටෙය චෙයර්පාටුකළ් එතිර්කාලත්තිල් අමෙය වේණ්ටුම් එන්රු කේට්ටුක්කොණ්ටු, නීංකළ් නිච්චයමාක අව්වාරු නටන්තු කොළ්වීර්කළ් එන්ර නම්පික්කෙයෝටු, ඈපරණෙප් පකුතියිලේ ඉන්තු ආලයත්තින් මුකප්පු මරෙක්කප් පට්ටිරුක්කින්ර නිලෙමෙයිල් ඉන්තු මක්කළින් මනවේතනෙයෙයෙ ඉන්ත ඉටත්තිලේ පිරතිපලිත්තු, අන්තච් චම්පවත්තිර්කු එව්වාරාන තීර්වෙ නීංකළ් වළංකප් පෝකින්රීර්කළ් එන්ර වින්නාවෙ අමෙච්චරිටම් තොටුත්තු, එතිර්කාලත්තිලේ උංකළුටෙය චමත්තුවමාන කොළ්කෙකළෙය නීංකළ් මිකත් තිරමෙයාකප් පයන්පටුත්තිත් තමිල් මක්කළ් මර්රුම් මුස්ලිම් මක්කළින් මනංකළෙ වෙල්වීර්කළ් එන්ර එතිර්පාර්ප්පුටන්, එනතු උරෙයෙ මුටික්කින්රේන්. නන්රි!

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිචාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. (Mrs.) Sagarika Athauda. You have 10 minutes.

[අ.භා. 1.41]

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
(මාණ්පුමිකු චට්ටත්තරණි (තිරුමති) චාකරිකා අතාවුත)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, ආසියානු වනජීවී නිලධරයන්ගේ බලමණ්ඩලය විසින් ද්විමාසිකව ප්‍රකාශයට පත් කරන, "ආසියානු වනජීවී නිලධර හඬ" නැමැති සඟරාව මඟින් ආසියාවේ කැපී පෙනෙන වනජීවී නිලධාරිනියන් ඇගැයීමකට ලක් කළා. විශේෂයෙන්ම පසුගිය දා සමරන ලද කාන්තා දිනය ඉලක්ක කර ගනිමින් තමයි ඒ ඇගැයීම සිදු කළේ. ගෝලීය වනජීවී නිලධාරිනියන්ගේ නියෝජනය සියයට 3ත්, 11ත් අතර පවතින තත්ත්වයක් තුළ, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ලක්මිණී ජයසුන්දර සහ චතුරි සංජීවනි යන නිලධාරිනියන් දෙදෙනා එම්දී ඇගැයීමට ලක් වෙනවා. කාන්තා දිනය තේමා කරගෙන වනජීවී නිලධාරිනියන් එවැනි ඇගැයීමකට ලක් කිරීම වාගේම ශ්‍රී ලංකාවේ වනජීවීන් රැක ගැනීම වෙනුවෙන් නිලධාරිනියන් වශයෙන් එතුමියන්ලා කරන ලද කැප කිරීමත් සිහිපත් කරමින් මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, 1854දී රතු ඉන්දියානු නායක සියැටල් තම මාතෘ භූමිය සම්බන්ධයෙන් තීරණාත්මක අවස්ථාවක "මිහිමඬලේ ගීතය" නැමැති ඓතිහාසික කථාව පවත්වනවා. එහිදී ඔහු මෙවැනි අදහසක් පළ කර තිබෙනවා.

"මේ මිහිතලයේ සෑම බිම් අහලක්ම මගේ පරපුරට ශුද්ධ වූ වස්තුවක්. දිලිසෙන දේවදාර ගසක හැම කිනිත්තක්ම, වැලි තලාවෙන් පිරී ගිය සෑම වෙරළක්ම, අඳුරු වනාන්තරවල තිබෙන සෑම මිහිදුම් වලාවක්ම, සිහින් හඬින් ගී ගයන සෑම කුඩා ප්‍රාණියෙක්ම මගේ මිනිසුන්ගේ මතකයන් අතර අත්දැකීම් සමුදායන් අතර පූජනීය වස්තූන් වන්නේය."

වර්ග කිලෝමීටර 65,610ක භූමි ප්‍රදේශයක් තුළ ජීවත් වන අපටත් මේ "මිහිමඬලේ ගීතය" ඇතුළේ විස්තර වන භූමිය ගැන අත්දැකීමේ වෙනසක් නැහැ. විශේෂයෙන් පරිසරයේ කොටසක්ම බවට පත් වූ මිනිසාට අද වනකොට පරිසරය පාලනය කරන්න යෑම තුළ ගන්නා ලද අවිධිමත් තීන්දු තීරණ නිසා දැවැන්ත පාරිසරික අර්බුදයන්ට මුහුණපාන්නට සිද්ධ වෙලා තිබෙනවා. දශක ගණනාවක් තිස්සේ අවිධිමත් ලෙස සිදු කරන ලද ඇතැම් ඉදිකිරීම්, මෑත ඉතිහාසයේ දිගින් දිගටම කථා බහට ලක් වුණු වන සංහාර වාගේම රක්ෂිත ප්‍රදේශවල ඇතැම් ඉදිකිරීම් සිදු කිරීම වැනි ක්‍රියාකාරකම් නිසා අපේ රටේ සමස්ත පාරිසරික සමතුලිතතාව බිඳ වැටිලා තිබෙනවා. එම නිසා වර්තමානයේ පරිසර පද්ධතිය පවතින්නේ දැඩි අර්බුදකාරී තත්ත්වයකයි.

ගරු සභාපතිතුමනි, එහි අතුරු ප්‍රතිඵලයක් විධියට අපට දිනපතා අහන්න ලැබෙනවා, අලින් මරණයට පත්වීම් සම්බන්ධව. ඒ වාගේම, මම නියෝජනය කරන කෑගල්ල වැනි ප්‍රදේශවල විශාල වශයෙන් වගාවන්ට හානි කරන සතුන්ගේ - රිළවුන්, මොනරුන්, වඳුරන් - ව්‍යාප්තිය ජන ජීවිතයට බාධාවක් එල්ල කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ සියලු ක්‍රියාකාරකම්වලට හේතුව වන්නේ නිසි ආකාරයෙන් පරිසරය කළමනාකරණය කරලා, ඒ සම්පත් භාවිත කරලා, අපි අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමයි. ගරු සභාපතිතුමනි, මේ රටේ දශක ගණනාවක් තිස්සේ සිදු කරන ලද අවිධිමත් ක්‍රියාවලියක් යථාවත් කිරීමේ වගකීමයි, දැන් ජාතික ජන බලවේගයේ රජය සතුව තිබෙන්නේ. හැබැයි, දශක ගණනාවක් තිස්සේ සිදු වුණු වැරැද්දක් දවසින් දෙකෙන් නිවැරැදි කරන්න අපට හැකියාවක් නැහැ. දැන් අපිට අවශ්‍යයි, වඩාත් විධිමත්ව, නිශ්චිත ක්‍රමවේදයක් ඔස්සේ, පරිසරය සම්බන්ධයෙන් පවතින මේ ගැටලු නිරාකරණය කරමින් රටක් විධියට ඉදිරියට යන්න.

ගරු සභාපතිතුමනි, පසුගිය වසරේ රාජ්‍ය දැව සංස්ථාවේ ලාභ සම්බන්ධයෙන් වාර්තාවක් අපට ලැබිලා තිබෙනවා. ඒ වාර්තාවට අනුව 2024 වර්ෂයේ, පෙර වර්ෂයට වඩා ලාභ ඉපැයීමක් කරලා තිබෙනවා. එහි සමස්ත ආදායම රුපියල් මිලියන 1,915ක්. ඊළඟට, අලින් සම්බන්ධයෙන් දිගින් දිගටම කථා වුණු නිසා මම මේ කාරණයත් සඳහන් කරන්නම්. රාජ්‍ය දැව සංස්ථාවේ සමස්ත ආදායම හැටියට රුපියල් මිලියන 1,915ක් ලබනකොට, පසුගිය වර්ෂයේ අලින් සම්බන්ධයෙන් වන ගැටලුව විසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අලි වැට කණු 8,122ක් නිෂ්පාදනය කරලා තිබෙනවා. මෙවැනි කටයුතු රජය මැදිහත් වෙමින් සිදු කර තිබෙනවා.

රජයක් විධියට අපි ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළා. පරිසරය සම්බන්ධයෙන් වන මූලධර්ම එහි පැහැදිලිව විස්තර කර තිබෙනවා, ගරු සභාපතිතුමනි. එම මූලධර්ම තමයි, පාරිසරික යුක්තිය සහ සාධාරණත්වය, පරිසරය සහ සංවර්ධනය අතර සමබරතාව, තිරසර සම්පත් භාවිතය සහ පූර්වාරක්ෂක ක්‍රමවේදය, පරිසර පද්ධතික ප්‍රවේශය, ආයතනික සම්බන්ධීකරණය සහ මහජන සහභාගිත්වය, දූෂකයා ප්‍රතිපූර්ණය, පාරිසරික යහ පාලනය, ප්‍රජාව සවිබලගැන්වීම, පාරිසරික ආරක්ෂාව සහ පිවිතුරු නිෂ්පාදන කියන කාරණා. අපි මේ වැඩ පිළිවෙළ විද්‍යාත්මකව ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය ආරම්භ කර අවසන්. ගරු සභාපතිතුමනි, මෙවර අය වැය තුළින් පරිසර අමාත්‍යාංශය වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහායි. ආයතන ගණනාවක්, දශක ගණනාවක් තිස්සේ විවිධ අමාත්‍යාංශ යටතේ අවිධිමත්ව කළමනාකරණය වෙද්දී ජාතික ජන බලවේගයේ රජය පළමුවරට මේ පරිසර විෂයය හා බැඳුණු සියලු ආයතන එක අමාත්‍යාංශයක් යටතට අරගෙන ඒ ආයතන අතර අන්තර් සම්බන්ධතාව සහිතව සැලසුම් සකස් කරලා, ඒවා ක්‍රියාත්මක කිරීමට පටන්ගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මෙවර අය වැය තුළින් වැඩි අවධානයක් ලක් කරන ලද දෙපාර්තමේන්තුවක් වන ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ගැන පැහැදිලි කරන්නට මා දැන් සූදානම්. එහි කාර්යභාරය වශයෙන් දක්වා තිබෙන්නේ ශ්‍රී ලංකාව තුළ ඇති ශාක විවිධත්ව විතැන් සංරක්ෂණය කිරීම. එය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ විධියට දක්වා තිබෙනවා. ඒ වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,112ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම උද්භිද උද්‍යාන භාර අරමුදලෙන් ඒ සඳහා මුදල් වෙන් කිරීමට සූදානම්. එහි ප්‍රධාන කාර්යභාරය - අරමුණ- විධියට දක්වා තිබෙන්නේ උද්‍යාන අලංකරණය හා මල් වගාව ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා පර්යේෂණ වැඩකටයුතු කිරීම සහ වෘත්තීය සඳහා උද්‍යෝගයක් දක්වන තැනැත්තන්ගේ නිර්මාණ ආශ්‍රිත ක්‍රියාකාරකම් හරහා ඔවුන්ව දැනුවත් කිරීමයි. මෙම අරමුණු ක්‍රියාත්මක කිරීම උදෙසා ගරු සභාපතිතුමනි, මෙවර අය වැයෙන් වැඩි ප්‍රතිශතයක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත වෙන් කර තිබෙනවා. අපි විවේකයක් ගත කරන්නට, විනෝද ක්‍රීඩාවක් කරන්නට, විනෝදාස්වාදයක් ලබන්නට, එහෙමත් නැත්නම් උද්භිද විද්‍යාව ආශ්‍රිත අධ්‍යයනයක් කරන්නට බොහෝ විට උද්භිද උද්‍යාන භාවිත කරනවා. පසුගිය වර්ෂයේ වාර්තා අනුව සංචාරකයන්ගේ පැමිණීම්වලින් රුපියල් මිලියන 2.5ක ආදායමක් ලැබී තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, පෙර වර්ෂයට වඩා මෙම වර්ෂයේ සියයට 52කින් ආදායම වැඩි වෙලා, රුපියල් මිලියන 1,366ක ආදායමක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලබාගෙන තිබෙනවා.

2025 අය වැයේ ප්‍රධාන ඉලක්කයක් වනවා, ශාක සංරක්ෂණ වැඩසටහන. ඒ අනුව ඇම්බැක්ක සහ දුනුමඩලාව රක්ෂිත වනාන්තරවල තර්ජනයට ලක් වෙලා තිබෙන ශාක හඳුනාගෙන ඒවා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව හරහා ගවේෂණය කිරීම ප්‍රධාන අරමුණයි. මේ හරහා විතැන් සංරක්ෂණය ක්‍රියාවට නැංවීමත්, විවිධ කර්මාන්තයන්ට තිරසාර වශයෙන් ඒ ශාක වර්ග හඳුනා ගැනීමත් අපේක්ෂා කරනවා. ඒ වාගේම විකුණුම් සහ ගෙවතු භාවිතය සඳහා සියලු උද්‍යානවල පැළ ලක්ෂ 5ක් නිෂ්පාදනය කිරීමේ අරමුණත් මෙවර අය වැයේ සැලැසුම් අතර පවතිනවා. ඒ වාගේම 2025 වර්ෂය තුළ පර්යේෂණ හා මල් වගා පර්යේෂණ ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින් ශාක ප්‍රචාරණ ක්‍රම, පළිබෝධ රෝග කළමනාකරණය, පසු අස්වනු තාක්ෂණය වැනි ඒකාබද්ධ අංශ සඳහා පර්යේෂණ 30ක් ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ශාක වගාව හා ශාක ආශ්‍රිත ක්ෂේත්‍ර පිළිබඳව පුද්ගලයන් 25,000ක් පමණ පුහුණුවට ලක් කර, තෝරා ගත් පාඨමාලා සඳහා ඔවුන්ගෙන් පුද්ගලයන් 60ක් පුහුණු කිරීම මෙවර අය වැයේ ඉලක්කයක් විධියට අපි දක්වා තිබෙනවා.

ඊළඟ එක තමයි, මල් වගා සංවර්ධන ව්‍යාපෘතිය. කාන්තාවන් විධියට අපි මල් වගා කරන්න කැමතියි. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධ වෙලා විධිමත් ව්‍යාපෘතියක් යටතේ ඔවුන්ගේ ආර්ථිකයට දායකත්වයක් ලබා දීමේ වැඩසටහනක් සකස් කර තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

දැනටමත් ක්ෂේත්‍රයේ නියැළී සිටින පහළ සහ මධ්‍යම මට්ටමේ මල් වගාකරුවන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් සකස් කර තිබෙනවා. ඒ වාගේම සංචාරක කර්මාන්තය වඩාත් වර්ධනය කිරීම සඳහා ඉලක්කසහගතව මෙවර ප්‍රතිපාදන සියයට 10ක ප්‍රමාණයක් වැඩි කිරීමේ අරමුණින් විශේෂයෙන් පේරාදෙණිය, හක්ගල, සීතාවක, මිරිජ්ජවිල හා හෙනරත්ගොඩ වැනි තෝරා ගත් උද්භිද උද්‍යාන සඳහා සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමත්, අක්මීමන කඩොලාන උද්භිද උද්‍යානය සකස් කිරීමත් අපේක්ෂා කරනවා. මේ සියලු කාර්යයන් 2025 අය වැයෙන් ඉලක්කගත කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මිනිසා යනු පරිසරයේ කොටසක් මිස පරිසරය යනු මිනිසාගේ කොටසක් නොවන බව තේරුම් ගනිමින් මෙවර අය වැයෙන් වැඩි මුදල් ප්‍රතිශතයක් පරිසරය වෙනුවෙන් වෙන් කරමින් පරිසරය නැවත ගොඩනැඟීමේ භාරදූර කාර්යය ජාතික ජන බලවේගයේ රජය භාරගෙන තිබෙනවාය කියන කාරණයත් සිහිපත් කරමින්, වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Mujibur Rahman. You have 12 minutes.

[අ.භා. 1.52]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු සභාපතිතුමනි, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ අදහස් කිහිපයක් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

කෞරව තවිසාළර් අවර්කළේ, ඉන්‍රෙය තිනම් නටෙපෙරුකින්‍ර විවාතත්තිල් කලන්තුකොන්ටු මුක්කියමාන සිල විටයන්කළෙ මුන්වෙක්ක විරුම්පුකින්‍රේන්. කටන්ත කාලන්කළිල් ඉන්ත නාට්ටිලුම් ඉන්තප් පාරාළුමන්‍රත්තිලුම් සිරු පිල්ළෙකළින් විවාකම් පට්‍රි පල්වේරු කරුත්තුකළ් මුන්වෙක්කප්පට්ටන. ඉප්පෝතු අමෙච්චරාක ඉරුක්කින්‍ර ඔරුවර් අණ්මෙයිලුම් පාරාළුමන්‍රත්තුක්කු වරමුන්නරුම් ඉව්විටයම් තොටර්පිල් කරුත්තුත් තෙරිවිත්තිරුන්තාර්. අතේපෝල්, ඉරණ්ටු වාරංකළුක්කු මුන්නර්, ඉන්තප් පාරාළුමන්‍රත්තිල් කෞරව ඉරාමනාතන් අර්ච්සුනා අවර්කළුම් සිරු පිල්ළෙකළින් විවාකම් පට්‍රික් කුර්ප්පිට්ටිරුන්තාර්. කුර්ප්පාක, මුස්ලිම් සමූකත්තින්මීතු කුට්‍රච්චාට්ටුකළෙ මුන්වෙත්තාර්. අතාවතු, මුස්ලිම් සමූකත්තිල්තාන් කූටුතලාක සිරු පිල්ළෙකළින් විවාකම් නටෙපෙරුවතාකක් කූර්නිනාර්. මේලුම්, ඉන්ත නාට්ටිල් එල්ලෝරුක්කුම් ඔරේ චට්ටම් ඉරුක්ක වේණ්ටුමෙනවුම් චොන්නාර්.

2012இல் Census and Statistics Department ஆல் வெளியிடப்பட்ட புள்ளிவிவரம் இப்போது என்னுடைய கையில் இருக்கின்றது. கடைசியாக 2012இல்தான் இது பற்றிய கணக்கெடுப்பு Census and Statistics Department ஆல் மேற்கொள்ளப்பட்டது. அதன் பின்னர், இதுவரை அது தொடர்பான கணக்கெடுப்பு மேற்கொள்ளப்படவில்லை. அந்த புள்ளிவிவரத்தின்படி, இந்த நாட்டில் 17 வயதுக்குக் குறைந்த பிள்ளைகளின் விவாகம் பெரும்பான்மையின சிங்கள சமூகத்தில் 21,510 நடைபெற்றிருக்கின்றன. இது நூற்றுக்கு 69 சதவீதமாகும். இலங்கைத் தமிழ் சமூகத்தில் அத்தகைய 3,925 விவாகங்கள் நடைபெற்றிருக்கின்றன. இது நூற்றுக்கு 13 சதவீதமாகும். மலையகத் தமிழ் சமூகத்தில் அத்தகைய 1,312 விவாகங்கள் நடைபெற்றிருக்கின்றன. இது நூற்றுக்கு 8 சதவீதமாகும். முஸ்லிம் சமூகத்தில் அத்தகைய 4,329 விவாகங்கள் நடைபெற்றிருக்கின்றன. இது நூற்றுக்கு 14 சதவீதமாகும். இவ்வாறு அத்தகைய விவாகம் எல்லா சமூகத்திலும் நடந்திருக்கிறது. அதாவது, பெரும்பான்மையின சிங்கள சமூகத்திலும் நடந்திருக்கிறது; இலங்கைத் தமிழ் சமூகத்திலும் நடந்திருக்கிறது; மலையகத் தமிழ் சமூகத்திலும் நடந்திருக்கிறது; முஸ்லிம் சமூகத்திலும் நடந்திருக்கிறது. ஆகவே, இது பொதுவானதொரு பிரச்சினை! இந்தப் பிரச்சினையைப் பொதுவாகப் பார்க்காது, ஒரு சமூகத்தின்மீது மட்டும் குற்றச்சாட்டை முன்வைத்துப் பேசுவதென்றால், அதற்குப் பின்னால் வேறு திட்டங்கள் இருக்கக் கூடும். அதாவது, எங்களுடைய நாட்டில் 17 வயதுக்குக் குறைந்த பிள்ளைகளின் விவாகம் எல்லா சமூகத்திலும் நடந்திருக்கையில், ஒரு சமூகத்தின்மீது மாத்திரம் குற்றச்சாட்டு முன்வைக்கப்படுகின்றது என்றால், அதற்குப் பின்னால் வேறு அரசியல் காரணங்கள் இருக்கக் கூடும் என்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது.

கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்கள் பேசும்போது, இந்த நாட்டில் எல்லோருக்கும் ஒரே சட்டம் இருக்க வேண்டுமெனச் சொன்னார். இலங்கையானது பல இனங்கள் வாழ்கின்ற ஒரு நாடு என்பது எங்களுக்குத் தெரியும்! இந்த நாட்டில் பல்வேறு வகையான சட்டங்கள் இருக்கின்றன. முஸ்லிம் மக்களுக்கென தனியாக முஸ்லிம் தனியார் சட்டம் இருக்கின்றது. அதேபோல, கண்டியில் வாழக்கூடிய மக்களுக்கென தனியாக உඩරට විවාහ නීතිය என ஒரு சட்டம் இருக்கின்றது. அதேபோல, யாழ்ப்பாண மக்களுக்கென தனியாக தேசவழமைச் சட்டம் இருக்கின்றது. இவ்வாறான சட்டங்கள் தேவையும்கூட. ஏனென்றால், இந்த நாட்டில் பல இன மக்கள் வாழ்கின்றார்கள். அவர்களுக்கென தனித்துவமான விடயங்கள் இருக்கின்றன. குறிப்பாக, மதம் சார்ந்த உரிமைகள் இருக்கின்றன. அவற்றை அடையாளப்படுத்த வேண்டிய தேவை இருக்கிறது. இவ்வளவு காலமாக அந்தச் சட்டங்களை எல்லோரும் ஏற்றுக்கொண்டார்களே ஒழிய, யாரும் நிராகரித்ததில்லை. ஆனால், அண்மையில் கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்கள் முஸ்லிம் விவாக, விவாகரத்துச் சட்டத்தை எதிர்த்துப் பேசி வருகின்றார். அப்படியென்றால், இந்த நாட்டில் தேசவழமைச் சட்டமும் தேவையில்லையா? நீங்கள் தேசவழமைச் சட்டத்துக்கும் எதிராகவா இருக்கின்றீர்கள்? தேசவழமைச் சட்டத்தையும் நீக்க வேண்டுமென நீங்கள் சொல்கின்றீர்களா? என நாங்கள் அவரிடம் கேட்கின்றோம். இதற்கு அவர் பதில் கூற வேண்டும். அவர் ஒரு சிறுபான்மை சமூகத்தைச் சேர்ந்த ஓர் உறுப்பினராக இருந்துகொண்டு, இன்னுமொரு சிறுபான்மைச் சமூகத்துக்கு எதிராகப் பேசுவது என்பது மிகவும் கவலைக்குரிய விஷயமாகும்.

கடந்த காலங்களில் இந்தப் பாராளுமன்றத்தில் பல தமிழ் உறுப்பினர்கள் இருந்திருக்கிறார்கள்; இப்போதும் இருக்கிறார்கள். குறிப்பாக, வடக்கு மாகாணத்தையும் கிழக்கு மாகாணத்தையும் பிரதிநிதித்துவம் செய்யும் உறுப்பினர்கள் இருக்கிறார்கள். அவர்கள் அனைவரும் தங்களுடைய பிரதேசங்களிலுள்ள பிரச்சினைகளையே இங்கு முன்வைக்கிறார்கள். அவர்கள் எவரும் இன்னோர் இனத்தின் உரிமைகளுக்குப் பாதிப்பு ஏற்படும் வகையிலான கருத்துகளையோ, அந்த இனத்துக்கு எதிரான கருத்துகளையே முன்வைப்பதில்லை. எனினும், கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்கள் ஒரு சிறுபான்மை இனத்தின் பிரதிநிதியாக இருந்து கொண்டு, இன்னொரு சிறுபான்மை இனத்துக்கு எதிராக கருத்துத் தெரிவிப்பது என்பது, அவர் தனக்கு வாக்களித்த மக்களுக்கு ஏற்படுத்தும் அவமானமென்றே நான் நினைக்கிறேன்.

இந்த நாட்டில் வாழுகின்ற தமிழ் பேசும் மக்களுக்குப் பல்வேறு பிரச்சினைகள் இருக்கின்றன. சுதந்திரம் கிடைத்ததிலிருந்து இன்றுவரை இந்த நாட்டில் எத்தனையோ அரசாங்கங்கள் இருந்திருக்கின்றன. எனினும், அவை பிரச்சினைகளுக்குச் சரியான முறையில் தீர்வுகளை வழங்கவில்லை. அதனால்தான் இந்த நாட்டில் ஒரு யுத்தமும் உருவாகியது. இந்த நாட்டில் 30 வருடங்களாக இடம்பெற்ற யுத்தம் இப்போது முடிவுக்குக் கொண்டுவரப்பட்டு இருக்கின்றது. ஆனாலும், அந்த யுத்தம் உருவாகுவதற்குக் காரணமாக இருந்த பிரச்சினைகளுக்கு இன்றுவரை தீர்வு வழங்கப்படாத நிலைமையே காணப்படுகின்றது. இந்த நாட்டில் யுத்தம் முடிவடைந்து இப்போது 15 வருடங்கள் ஆகிவிட்டன. எனினும், அது உருவாகுவதற்குக் காரணமாக இருந்த பிரச்சினைகளைத் தீர்ப்பதற்கு இன்றைய அரசாங்கமும் முன்வருவதாகத் தெரியவில்லை.

இந்த நாட்டில் வாழுகின்ற எல்லா இனங்களுக்கும் தனித்துவமான மத உரிமைகள் இருக்கின்றன; கலாசாரம் இருக்கின்றது; சட்டங்கள் இருக்கின்றன. நாங்கள் அவற்றுக்கு மதிப்பளிக்க வேண்டும்; அவற்றைப் பாதுகாக்க வேண்டும். சிறு பிள்ளைகளின் விவாகம் என்பது முஸ்லிம் சமூகத்தில் மட்டும் இருக்கும் பிரச்சினையல்ல. இந்த நாட்டிலுள்ள எல்லா சமூகங்களும் இந்தப் பிரச்சினைக்கு முகங்கொடுத்துக் கொண்டுதான் இருக்கின்றன. அதனால் இது இந்த நாட்டில் இருக்கக்கூடிய ஒரு பொதுவான பிரச்சினையாகும். அதைவிடுத்து, அவர் ஒரு சமூகத்தை மட்டும் குற்றஞ் சாட்டுகின்றார் என்றால், அவருக்குப் பின்னால் யாரோ ஒருவர் இருந்து கொண்டு அவரைத் தூண்டுகிறார். அந்த நபருடைய agendaவுக்கு அமைய இவர் வேலை செய்கிறாரோ? என்ற சந்தேகம் எங்களுக்கு எழுகின்றது.

ගරු සභාපතිතුමනි, මම ඒ පිළිබඳව විශේෂයෙන් අදහස් දැක්වීමට හේතුව මෙකයි. අපේ රට බහු වාර්ගික ජන කොටස් ජීවත් වන රටක්. මේ රට තුළ ඒ එක එක ආගම් අනුව, එක එක ජාතීන් අනුව යම් යම් පෞද්ගලික නීති, ආගමික නීති තිබෙනවා. ඒ නීති කාලයක් තිස්සේ ඉස්සරහට ඇවිත් තිබෙනවා. ඒ නීති රීතිවල අඩු පාඩු තිබෙනවා නම් අපට පුළුවන් කථා කරලා ඒවා නිවැරැදි කර ගන්න. ඒ ගැන වාදයක්, විවාදයක් නැහැ.

මේ රටේ බාල වයස්කාර විවාහ බහුලව සිදු වන්නේ මුස්ලිම් ජන කොටස තුළයි කියලා එක ජන කොටසකට ඒ චෝදනාව එල්ල කිරීම පිටුපස යම් දේශපාලන න්‍යාය පත්‍රයක් තිබෙනවා කියා මම හිතනවා. මා ළඟ තිබෙනවා, 2012 වර්ෂයේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් අවසන් වරට නිකුත් කරපු ලියවිල්ල. ඒ ලියවිල්ල අනුව බලනකොට මේ රටේ ප්‍රධාන ජන කොටස තුළ ළමා විවාහ සියයට 69ක් සිද්ධ වෙලා තිබෙනවා; ලාංකික දෙමළ ජනතාව තුළ ළමා විවාහ සියයට 13ක් සිදු වෙලා තිබෙනවා; කන්ද උඩරට ද්‍රවිඩ ජනතාව තුළ ළමා විවාහ සියයට 8ක් සිද්ධ වෙලා තිබෙනවා; මුස්ලිම් ජනතාව තුළ ළමා විවාහ සියයට 14ක් සිද්ධ වෙලා තිබෙනවා. මේ සංඛ්‍යාලේඛන දිහා බැලුවාම පෙනෙනවා, හැම ජන කොටසක් තුළම ළමා විවාහ සිද්ධ වෙලා තිබෙන බව. ඒ හින්දා මේක පොදු ප්‍රශ්නයක්. මේ පොදු ප්‍රශ්නය විසඳනවා වෙනුවට එක ජන කොටසක් ඉලක්ක කරගෙන ජාතිවාදී ස්වරූපයකින් අදහස් දැක්වීම තුළ පෙනෙනවා, ඒ තුළ යම් දේශපාලන න්‍යාය පත්‍රයක් තිබෙන්න පුළුවන් කියලා. ඒ හින්දා ඒ මන්ත්‍රීතුමාගෙන් අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මීට වඩා වගකීමකින් කථා කරන්න කියලා. මොකද, පාර්ලිමේන්තුවේ කථා කරන දේවල් හැන්සාඩ්ගත වෙනවා. ඒ නිසා අපි ඒ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, කථා කරන කොට සංඛ්‍යාලේඛනත් එක්කම කථා කරන්න, එහෙම නැතුව නිකම් කවුරු හරි එක එක්කෙනා කියන දේවල් අහගෙන ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කථා කරන්න එපා කියලා.

ගරු බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මම විශේෂ කාරණයක් එතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මහර බන්ධනාගාරයේ තිබෙනවා අවුරුදු 122ක් පැරණි මුස්ලිම් දේවස්ථානයක්. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් මහර බන්ධනාගාරය ඉදි කරන කොට ඒ බන්ධනාගාර පරිශ්‍රය තුළ තමයි ඒක ඉදි වෙලා තිබුණේ. ඒ ප්‍රදේශයේ ඉන්න සියලු ජනතාව තමන්ගේ යාඥා සිදු කරන්න; ආගමික කටයුතු කරන්න එය පරිහරණය කළා. 2019දී සිදු වුණු පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් මත ඒ දේවස්ථානයට පැමිණෙන එක තහනම් කරලා දැනට අවුරුදු ගණනාවක් වෙනවා. පසුගිය ආණ්ඩු කාලවලදීත් -ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේත්, රට පසුව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ ආණ්ඩු තුළත්- අප මේ වාගේ අය වැය විවාදවලදී එය මතු කළාම එතුමන්ලා කිව්වා, "ඒ සඳහා වෙනම ප්‍රදේශයක් ලබා දෙන්නම්. ආරක්ෂක තත්ත්වයක් හින්දා ඒක නැවත ලබා දෙන්න අපහසුයි. ඒකට හරියන්න ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට තමන්ගේ ආගමික කටයුතු කරන්න වෙනත් ඉඩමක් ලබා දෙන්නම්" කියලා. නමුත් ගරු ඇමතිතුමනි, ඒක තවම ඉෂ්ට වෙලා නැහැ. මම හිතන විධියට, එවකට අධිකරණ ඇමතිවරයා හැටියට විජයදාස රාජපක්ෂ මැතිතුමා තමයි මේ පාර්ලිමේන්තුවේදී ඒ පොරොන්දුව ලබා දුන්නේ. නමුත්, තව වනකල් ඒ පොරොන්දුව ඉෂ්ට වෙලා නැහැ. ඒ හින්දා දැන් ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට විශාල ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. තමන් අවුරුදු ගණනාවක් පරිහරණය කරපු -අවුරුදු 100කට වඩා වැඩියෙන් පරිහරණය කරපු- ඒ දේවස්ථානය වසා දැමීම නිසා අද ඒ ජනතාවට ආගමික කටයුතු කරන්න බැරි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ හින්දා මම ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා, එක්කෝ ඒ දේවස්ථානය ජනතාවට නැවත වතාවක් පරිහරණය කරන්න අවස්ථාව ලබා දෙන්න, එහෙම නැත්නම් එතැන වෙනත් ඉඩම් ප්‍රමාණයක් හරි ලබා දීලා ඒ ගැටලුවට විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
I will finish my speech, Sir.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු සභාපතිතුමනි, මට පොඩි නිවැරදි කිරීමක් ද කරන්න ඕනෑ. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරද්දී මම අදහසක් පළ කළා, contrast media කියන බෙහෙත් වර්ගය ගැන. ඒක නිවැරදි වෙන්න ඕනෑ. විශේෂයෙන්ම GE Healthcare කියන සමාගම රුපියල් 2,025කට ඒ unit එකක් ගෙනාවා. මම පැවසුවා, Sunshine Healthcare Lanka Limited එක ඒක ලබා දුන්නේ, රුපියල් 75,000කට කියලා. නමුත් එය නිවැරදි වෙන්න ඕනෑ, එක unit එකක් රුපියල් 7,500ක් වශයෙන්. රුපියල් 7,500 වුණත්, රුපියල් 2,025 එක්ක සංසන්දනය කරන කොට තුන්ගුණයක් වැඩි කරලා තමයි එය ලබා දීලා තිබෙන්නේ. MSD එකේ official digital platform එක වන "Swastha" system එක හරහා ලබා දුන්නු දත්තවලයි එම මුදල රුපියල් 75,000යි කියලා කියන්නේ. එහෙම නම්, "Swastha" system එකෙන් දීපු දත්තවල ප්‍රශ්නයක් තිබෙනවා. අපට පෙනෙනවා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඒ system එක ගැන, ඒගොල්ලන්ගේ දත්ත ගැන ලොකු ගැටලුවක් තිබෙන බව. මම ඒක නිවැරදි කර යළිත් කියනවා. රුපියල් 2,025කටයි, GE Healthcare එකේ unit එක ලබා දුන්නේ. නමුත් Sunshine Healthcare Lanka Limited එක, ඒ unit එකක් රුපියල් 75,000කට ලබා දීලා තිබෙනවා කියපු එක රුපියල් 7,500ක් ලෙස නිවැරදි වෙන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Gamagedara Dissanayake. You have 11 minutes.

[අ.භා. 2.05]

ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු සභාපතිතුමනි, අද උදෑසන සිට බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව මේ සභා ගර්භය තුළ යම් යම් කරුණු කාරණා සාකච්ඡාවට ගැනුණා. ඒ සමහර කාරණා යම් සද්භාවයක් සහිතවත්, සමහර කාරණා සද්භාවය තුළ සහවපු අසද්භාවයක් සහිතවත් ප්‍රකාශයට පත් වුණා කියන කාරණය මම මේ වෙලාවේ කියන්න ඕනෑ.

අද මේ සභා ගර්භයේ සාකච්ඡා කරන මේ අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය මා හිතන විධියට අනෙකුත් අමාත්‍යාංශවලට වඩා විශේෂයි. අපේ ගරු අමාත්‍යතුමා උදය වරුවේ මූලික ප්‍රවේශයේදී කිව්වා වාගේම අපේ රටේ බොහෝ අමාත්‍යාංශ භෞතිකමය කාරණා පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන කොට විශේෂයෙන් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මානවවාදී බැඳීම මතු කරන අමාත්‍යාංශයක් හැටියට හඳුනා ගන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මෙවර විශේෂත්වයක් තිබෙනවා. මොකද, මෙවර අපේ අය වැය මහින් මුදල් වෙන් කිරීම ඇතුළේ ඉතාම විශේෂත්වයක් මේ අමාත්‍යාංශය වෙත දක්වා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ වර්ෂය තුළ මෙතෙක් සාම්ප්‍රදායිකව මේ අමාත්‍යාංශය තුළ දුටුවාට වඩා යම් වෙනස් ක්‍රියාකාරිත්වයක් රට හමුවට ගෙන එන්න අපට පුළුවන්කම ලැබෙයි කියලා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මේ වෙලාවේ මගේ අවධානය යොමු වන්නේ, මේ අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයක් කරන බුද්ධශාසන හා ආගමික ක්ෂේත්‍රය සම්බන්ධයි. අපි අමාත්‍යාංශයක් හැටියට මැදිහත් වෙලා මේ වන විටත් කාර්යයන් ගණනාවක් සිදු කරගෙන යනවා. විශේෂයෙන් අපේ අමාත්‍යාංශය තුළ ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය සඳහා විශාල අවධානයක් යොමු කර තිබෙනවා. මේ ගරු සභාව නියෝජනය කරන විවිධ ජාතීන්ට, විවිධ ආගම්වලට අයත් ගරු මන්ත්‍රීවරු දන්නවා මේ වෙලාවේ අපේ රටේ විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා තිබෙන වෙහෙර විහාරස්ථාන, ඒ වාගේම පල්ලි, දේවස්ථාන සංවර්ධනය කිරීම අත්‍යවශ්‍යයි කියන කාරණය. පසුගිය කාලයේ මේ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් කර තිබුණේ නැහැ. නමුත් අපි 2025 වර්ෂයට අදාළව වෙන් කරන ලද ප්‍රතිපාදන පාවිච්චි කරලා, ග්‍රාමීය මට්ටමේ තිබෙන පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

පූජා භූමි සංවර්ධන වැඩසටහන මෑත කාලයේ ඉතාම විශේෂිත වූ වැඩසටහනක් ලෙස අපට හඳුන්වන්නට පුළුවන්. පූජනීය ස්ථාන කිව්වාම, බෞද්ධ පූජනීය ස්ථාන වෙන්න පුළුවන්, හින්දු පූජනීය ස්ථාන වෙන්න පුළුවන්, ඉස්ලාමීය පූජනීය ස්ථාන වෙන්න පුළුවන්, කතෝලික පූජනීය ස්ථාන වෙන්නත් පුළුවන්.

ඒ ඕනෑම එකක්, ඕනෑම තත්ත්වයක් සැලකිල්ලට අරගෙන පූජා භූමි සංවර්ධන සැලැස්මට අපි ඇතුළත් කරමින් යනවා. ඉදිරියේදීත් අපි ඒ කටයුත්ත සිදු කිරීම සඳහා සැලසුම් සකස් කරලා තිබෙනවා. අපි බුද්ධ ශාසනයට අදාළව ගත්තොත්, භික්ෂු භික්ෂුණීන්ගේ අවශ්‍යතා වෙනුවෙන් මැදිහත්වීම වෙනත් කාලවකවානුවලට වඩා වැඩි කරලා තිබෙනවා. ඒ සඳහා සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් අපි වෙන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි අපේ අමාත්‍යාංශය හරහා විශේෂම අවධානයක් යොමු කරපු ක්ෂේත්‍රයක් තමයි දහම් පාසල් අධ්‍යාපනය. අපි බොහෝ සාකච්ඡාවලට යනකොට, බොහෝ විහාරස්ථානවල යම් යම් උත්සවවලට සහභාගි වෙනකොට, ශාසනාරක්ෂණ මණ්ඩලවල සාකච්ඡාවලට සම්බන්ධ වෙනකොට නිතර පැන නඟින ප්‍රශ්නයක් තමයි දහම් අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නය. මම හිතන විධියට මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාත්, අපේ රටේ ජනතාවත් දන්නවා මේ රටේ විධිමත් ආකාරයට සකස් වෙච්ච පාසල් පද්ධතියේ තිබෙන්නේ පාසල් 10,126යි කියලා. අපේ රටේ අධ්‍යාපනය හා සම්බන්ධ වෙච්ච, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙහෙයවන පාසල් 10,126යි තිබෙන්නේ. නමුත් ගරු සභාපතිතුමනි, අපේ රටේ දහම් පාසල් 10,646ක් තිබෙනවා. මෙහි විශේෂ තත්ත්වයක් තිබෙනවා. අර 10,126ක් වෙච්ච පාසල් තුළ අපේ රටේ දරු දැරියන් අඩුම තරමින් ලක්ෂ 40කට වැඩි සංඛ්‍යාවක් අධ්‍යාපනය හදාරනවා. නමුත් ඊට වඩා යම් ප්‍රමාණයකින් වැඩි 10,646ක් වෙච්ච දහම් පාසල් තුළ අධ්‍යාපනය හදාරන්නේ ලක්ෂ 18කට වඩා තරමක් වැඩි දරුවන් සංඛ්‍යාවක්. සමස්ත පාසල් පද්ධතිය ඇතුළේ දරුවන් ලක්ෂ 40ක් ඉන්නවා. හැබැයි, 10,646ක් වූ දහම් පාසල් පද්ධතිය ඇතුළේ ඉන්නේ දරුවන් ලක්ෂ 18යි. ඒකෙන් පේනවා, මේ දහම් පාසල් අධ්‍යාපනය අද විශාල අභියෝගයකට මුහුණ දීලා තිබෙන බව. ඒ සඳහා විවිධ හේතු කාරක බලපා තිබෙනවා. ඒ නිසා අපි අමාත්‍යාංශයක් හැටියට මේ ඉදිරි කාලය තුළ ඒ සඳහා මෙතෙක් නිබුණු සාකච්ඡාවලින් ඔබ්බට ගිය ප්‍රායෝගික වැඩ පිළිවෙළකට යා යුතුයි කියන අදහසින් ඉන්නවා.

ඒ වාගේම තමයි අපේ රටේ ක්‍රියාත්මක වන ශාසනාරක්ෂණ මණ්ඩල. අපේ රටේ තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ල ආවරණය වන ශාසනාරක්ෂණ බල මණ්ඩල හරහා තමයි බොහෝ

සංවිධානාත්මක කාර්යයන් සිද්ධ වෙන්නේ. අපි අමාත්‍යාංශයක් හැටියට ඒ ශාසනාරක්ෂණ මණ්ඩලවල ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ ඉල්ලීම්වලට මූලිකත්වය දෙන්න අවධානය යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම බුද්ධ ශාසන අමාත්‍යාංශය මැදිහත් වෙමින් පුණ්‍ය ග්‍රාම වැඩසටහන් වැනි ඉතාම යහපත් වැඩසටහන් හඳුන්වා දෙනවා. අපි දන්නවා, මේ සංකීර්ණ සමාජය ඇතුළේ ග්‍රාමීය මට්ටමින් ජන ජීවිතය මහා විපරියාසවලට ලක් වෙලා තිබෙන බව. ඒ නිසා අපි අවධානය යොමු කරලා තිබෙනවා, පුණ්‍ය ග්‍රාම වැඩසටහන් හරහා ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ යම් සංහිඳියාවක් ගොඩ නඟන්න.

ගරු සභාපතිතුමනි, හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හරහාත් අපි විශාල වැඩ කොටසක් සැලසුම් කරලා තිබෙනවා. විශේෂයෙන් හින්දු දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන දහම් පාසල් ප්‍රවර්ධනය කරන්න, සංවර්ධනය කරන්න, ඒ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අපේ හින්දු කටයුතු දෙපාර්තමේන්තුව වැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා. අපි මුලින් කිව්වා වාගේ අපේ රටේ පැතිරිලා තිබෙන විහාරස්ථාන සංවර්ධනය කරනවා වාගේම අපේ රටේ හින්දු ජනතාව භක්තිමත්ව ආගමික වතාවක් සිදු කරන කෝවිල් සංවර්ධනය කිරීම සඳහාත් විශේෂ ප්‍රතිපාදනයක් අපි වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම හින්දු සංස්කෘතික කටයුතු වෙනුවෙන් අපේ මැදහත් වීම වැඩි කරලා තිබෙනවා. තමුන්නාන්සේලා කවුරුත් වාගේ දන්නවා, අපි පසුගිය ජනවාරි මාසයේ අපේ රටේ හින්දු ජනතාවත් එක රාශි කරගෙන යාපනය නගරය කේන්ද්‍ර කරගෙන තෛපොංගල් උත්සවය ඉතා ඉහළින් පැවැත්වූ බව.

ඒ වාගේම ඉස්ලාම් ජනතාව වෙනුවෙනුත් අපේ වැඩි අවධානයක් යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මුස්ලිම් සංස්කෘතිය ප්‍රවර්ධනය කරන්නත්, වැඩි දියුණු කරන්නත්, මුස්ලිම් භක්තිකයන්ගේ ආගමික සිද්ධස්ථාන වැඩි දියුණු කරන්නත් විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ක්‍රිස්තියානි ආගමික කටයුතු වෙනුවෙනුත් අපි විශාල මැදිහත්වීමක් කරන්න සැලසුම් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශයේ සුවිශාල කාර්යභාරයක් ඉටු කරන ආයතනයක් හැටියට මධ්‍යම සංස්කෘතික අරමුදල හඳුන්වන්න පුළුවන්. ඒ හරහා අපේ රටේ ව්‍යාප්ති 24ක් හඳුනාගෙන, ඒවා සඳහා මේ වෙනකොට ඉතාම වැදගත් කාර්යයන් ගණනාවක් සිද්ධ කරමින් සිටිනවා. ඒක අපේ රටේ අන්‍යාන්‍යතාව පෙන්වන ආයතනයක්. ඒ නිසා අපි ඒ ආයතනය වෙනුවෙන් සුවිශාල දායකත්වයක් ලබා දීලා තිබෙනවා.

අමාත්‍යාංශය හැටියට අපි මේ වසරේ අපේ උරුමයන්, අපේ අනන්‍යතාව පෙන්නුම් කරන පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කර ගැනීම, සංරක්ෂණය කර ගැනීම වෙනුවෙන් වැඩි අවධානයක් සහිතව සැලසුම් සකස් කරලා තිබෙනවා, ක්‍රියාත්මක කිරීම සඳහා. බෞද්ධ කටයුතු, හින්දු කටයුතු, ඉස්ලාම් කටයුතු, ක්‍රිස්තියානි කටයුතු සඳහා වෙන් වුණු දෙපාර්තමේන්තු ඇතුළු මේ අමාත්‍යාංශයට අයත් ආයතන 26ක් යටතේ ගරු අමාත්‍යතුමාගේත්, අපේත් මැදිහත්වීම සහිතව එම කටයුතු සිදු කරමින් සිටිනවා. අපි විශ්වාස කරනවා මේ රටේ ජනතාව තුළ හැදෙන සංහිඳියාව හා ආගමික පුනර්ජීවනය ගොඩ නඟන්න පුළුවන්කම තිබෙන්නේ ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ඒ තුළට ගෙනියන්න සමත් වුණොත් විතරයි කියලා. අපට ඒ ගැන ඕනෑ තරම් දේශන කරන්න පුළුවන්, සාකච්ඡා කරන්න පුළුවන්. හැබැයි ඒ දේශන, සාකච්ඡාවලින් ඔබ්බට ගිය ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ඇතුළේ තමයි ඒ ආගමික සංහිඳියාව ගොඩ නැඟෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ වෙලාවේදී අපි සමාජයට කියන්න ඕනෑ බොහෝදෙනා කථාබහෙන් හඳන චිත්‍රවලට වඩා ප්‍රායෝගික තත්ත්වය වෙනස් බව. බුදු දහමේ උගන්වන ධම්මපදයේ අදහසත්, හින්දු ආගමේ භගවත් ගීතාවේ අදහසත්, ඉස්ලාම් ආගමේ අල්-කුරානයේ අදහසත්, ක්‍රිස්තියානි ආගමේ බයිබලයේ අදහසත් කියන සියල්ල කැටි කරලා ගත්තොත්, යහපත් සමාජයක් ගොඩ නැඟීම තමයි ඒවායේ අරමුණ වෙලා තිබෙන්නේ. ඒ වෙනුවෙන්, ඒ මූලික සංකල්පය වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න, ඒ වෙනුවෙන් මැදිහත්වීම් කරන්න අමාත්‍යාංශයක් හැටියට අපි සූදානම් කියන පණිවුඩය ලබා දෙමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි සභාපතිතුමනි.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු සභාපතිතුමනි, මගේ පිළිතුරු කථාවට කලින්, ඉදිරිපත් වෙලා තිබෙන ප්‍රශ්න කිහිපයකට ඉතාම කෙටියෙන් පිළිතුරු දෙන්නම්, ප්‍රශ්න එකතු වෙනවා වැඩියි වාගේ පෙනෙන නිසා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙකුම මතු කළා උතුරේ ආගමික ස්ථානවල කෙරෙන මැදිහත්වීම් ගැන. මුලතිව් වාගේ ප්‍රදේශවල බුදුපිළිම තැනීම, ප්‍රාදේශීය සභාවල නියෝග නොතකා හැරීම වාගේ දේවල් සහ නැවත පදිංචි කිරීම සම්බන්ධ ගැටලු කිහිපයක් ඉදිරිපත් වුණා. ඇත්තටම මේ මතු කරලා පෙන්වපු හුඟක් දේවල් මීට අවුරුදු ගණනාවකට කලින් සිද්ධ වෙච්ච ඒවා. නමුත් අපි රජය භාර ගත්තාට පස්සේ එවැනි කිසිදු මැදිහත්වීමක්, එබඳු දෙයක් කළේ නැති බව මම කියන්න ඕනෑ.

විශේෂයෙන් යාපනයේ තිස්ස විහාරය ගැන ප්‍රශ්න කිහිපයක් මතු කළා. තිස්ස විහාර 3ක් අපට දකින්න පුළුවන් වලිකාමම් උතුර ප්‍රදේශයේ. තයිඩ්ඩි ප්‍රදේශයේ තිබෙන තිස්ස විහාරය ගැන විශේෂයෙන් කියැවුණා. ගරු මන්ත්‍රීතුමනි, එතැන තිබෙන ගැටලුවලින් කිහිපයක්ම ඉඩම් නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් තමයි ඉලක්ක වෙන්නේ. බුද්ධ ශාසන අමාත්‍යාංශයට ඉඩම් පවරා ගැනීමක් කරන්න බලතල නැහැ. නමුත් අපි පිළිගන්නවා, මේ ප්‍රදේශවල තිබෙන ගැටලු ඉතාම සංහිඳියාවෙන්, ඉවසීමෙන් පරීක්ෂා කරලා විසඳන්නට ඕනෑ බව.

අපේ ගරු මන්ත්‍රීවරයකුගෙන් කියැවුණා සුළුතර ජනතාවගේ වෛරය ඇති කෙරෙන කටයුතු සිදු වෙන බව, තවමත්. අපි ඒ කාරණය නම් ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. මොකද, මෙවර අය වැයෙන් අපි විශාල බර තැබීමක් කරලා තිබෙනවා උතුරුකරය සංවර්ධනයට, ඒ වාගේම මේ ජාතීන් අතර සංහිඳියාවට.

පුරාවිද්‍යා මැදිහත්වීම්වලදී අයුක්තියක් සිදුවන බවත් සඳහන් කෙරුණා. අද දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී ජාතික

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

ආරක්ෂක කවුන්සලය රැස් වුණා. එතැනදී විශේෂයෙන්ම දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උතුරු, නැඟෙනහිර පළාත්වල දෙමළ භාෂාව කථා කරන නිලධාරීන් 81දෙනෙක් සේවය කරන බවත්, එබඳු නිලධාරීන්ගේ අඩුවක් තිබෙන බවත් සඳහන් වුණු නිසායි මා මේ කාරණය සඳහන් කරන්නේ. ඉතිරි පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව, දෙමළ භාෂාවෙන් සේවය කළ හැකි නිලධාරීන් බඳවා ගන්නට උත්සුක වන බව ජනාධිපතිතුමා විශේෂයෙන් එහිදී සඳහන් කළා. උතුරු, නැඟෙනහිර පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන බවත්, ඒ වාගේම, ඒ ජනතාවගේ එදිනෙදා කටයුතුවලට බාධාවක් නොවන ආකාරයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බවත් ජාතික ආරක්ෂක කවුන්සලයේදී අද උදේ නැවතත් අවධාරණය කළා.

ගරු සභාපතිතුමනි, කුරුන්දි විහාරය ගැන මතු කරපු කරුණ ගැන කියන්න ඕනෑ. මේ පිළිබඳව ඇති වුණු ගැටලුවට ගැඹුරු අවධානයක් අපි යොමු කරලා තිබෙනවා. ඒ පිළිබඳව සොයන්න විද්වත් කමිටුවක් පත් කරලා තිබෙනවා. මේ තත්ත්වය සමථයකට පත්වන තුරු කුරුන්දි ප්‍රදේශයේ ගවේෂණය කරන්න පුරාවිද්‍යා නිලධාරීන් යොදවා නැති බව කියන්න ඕනෑ. ඒ වාගේම, වඩුනාගල ප්‍රදේශයේ තිබෙන ගැටලුව ගත්තොත්, දෙපාර්තමේන්තුව අනුමත කර තිබෙන නිර්දේශ ඉක්මවා පුද්ගලයන් ක්‍රියාත්මක වීම තමයි ඒ කාරණයටත් හේතු වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, 2025 අය වැය කාරක සභා අවස්ථාවේදී බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් තමයි අද දවසේ කථා කරන්නේ. මෙම විවාදයට සම්බන්ධ වෙමින් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න ලැබීම මට සතුටක්. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ගැන කථා කළොත්, අපි විශ්වාස කරනවා, මෙම අමාත්‍යාංශයට විශේෂයෙන්ම විෂයය පිළිබඳ විශාල දැනුමක් තිබෙන ඇමතිවරයෙකු පත්වී තිබෙනවා කියලා. මොකද, මුළු ජීවිත කාලය තුළම එම විෂයය වෙනුවෙන් කටයුතු කරපු සුනිල් සෙනෙවි සහෝදරයා තමයි මේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන්නේ. ඒ වාගේම අපේ ගම්මෙදර දිසානායක සහෝදරයා නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් එම අමාත්‍යාංශය තුළ කටයුතු කරනවා. මම එම අමාත්‍යාංශය ගැන තමයි අද කථා කරන්න බලාපොරොත්තු වන්නේ, පරිසර අමාත්‍යාංශය ගැන නොවෙයි.

ගරු සභාපතිතුමනි, මම මුලින්ම එක් කාරණයක් කියන්න කැමැතියි. විශේෂයෙන්ම මේ රටේ ජනතාව පසුගිය සැප්තැම්බර් 21වැනි දා පැවැති ජනාධිපතිවරණයේදීත්, ඉන්පසු පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේදීත් ඔප්පු කර පෙන්වූ දෙයක් තිබෙනවා. ඒ තමයි, අපි ඔක්කෝටම එකට ඉන්න පුළුවන් තරමට මේ රට ලොකුයි කියන එක. භූමියෙන් ගත්තත් අපට මේ රට ලොකුයි, සංස්කෘතිකමය වශයෙන් ගත්තත් අපට මේ රට ලොකුයි, අපි ඔක්කෝටම බෙදා හදා ගෙන මේ රට තුළ ඉන්න පුළුවන් කියන එක තමයි මම හිතන විධියට ජාතික ජන බලවේගයට ලබා දුන් ජනවරම තුළින් පෙන්නුම් කළේ. පරුත්තිත්තුරෛ ඉඳලා දෙවුන්දර තුඩුව දක්වා ජීවත් වන ජනතාව ඒ තීන්දුව දීලා තිබෙනවා, කිසිම අඩුවක් නැතුව. ඒ නිසා මම හිතනවා, ඒ ජනවරම තේරුම් ගෙන වැඩ කිරීම ආණ්ඩු පක්ෂයේ පමණක් කාර්යභාරයක් නොවෙයි කියලා. අනාගතයේදී ලංකාව යහපත් රටක් කරන්න හිතනවා නම් අපි මොන ජාතියකට, ආගමකට අයිති වුණත් අපි කාටත් ඒකට වගකීමක් තිබෙනවා. අපි මේ කථා කරන්නේ රාමසාන් මාසයේ. ඒ නිසා අද මේ විවාදය තුළත් ආගමික වැදගත්කමක් තිබෙනවා, සංස්කෘතික වැදගත්කමක් තිබෙනවා.

මම මුලින්ම කියන්න කැමැතියි, විශේෂයෙන්ම අපේ ආණ්ඩුවේ කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමිය වන සරෝජා පෝල්රාජ් මැතිනිය ඉලක්ක කර ගනිමින් දිගු කාලයක් තිස්සේ ඉතාම නරක, වැරදි, සදාචාර විරෝධී දේශපාලන ප්‍රහාරයක් දියත් වෙන බව. ඒ නිසා සාධාරණ මුස්ලිම් උගතුන්ගෙන්, සාධාරණ මුස්ලිම් විද්වතුන්ගෙන්, සාධාරණ මුස්ලිම් ආගමික නායකයන්ගෙන් මම අවංකව ඉල්ලා සිටිනවා, එම කටයුත්ත නතර කිරීම සඳහා මැදිහත් වෙන්න කියලා. ඔබතුමන්ලා දන්නවා, අපි දේශපාලන ව්‍යාපාරයක් විධියට කිසිම ජාතිවාදයක්, ආගම්වාදයක් ඔසවා ගෙන යන ව්‍යාපාරයක් නොවන බව. විපක්ෂය පැත්තේ අද ඉන්න සහ මෙවර පාර්ලිමේන්තුවට එන්න බැරි වුණු "මුස්ලිම්" යැයි කියා ගන්නා සහ කියා ගත් බොහෝ අය, මුස්ලිම් ජනතාවට වැඩියෙන්ම පහර ගහපු හැම ආණ්ඩුවකම කැබිනට් ඇමතිකම් දරා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේත් ඒ අය ඉන්නවා. නමුත් අපි කවදාවත් ඡන්ද බලාගෙන ජාතිවාදය, ආගම්වාදය ඇති කළ පක්ෂයක් නොවෙයි.

අපේ පක්ෂයේ ඉන්න ඉතාම වටිනා, අපි ඉතා අගය කරන නායිකාවක් තමයි සරෝජා පෝල්රාජ් මැතිනිය. 1983 කළු ජූලිය පැවැති කාලයේ එතුමියට අවුරුදු 6යි. ඒ කාලයේ එතුමියගේ පවුලේ අයත් අනාථ කඳවුරක ඉඳලා තිබෙනවා, මාස කිහිපයක්. එතුමියගේ පියා ඇතුළු ඥාතීන් ඒ ප්‍රදේශයේ හිටපු ප්‍රභූවරු, වැදගත් අය. ඒ අයගේ දේපළ විනාශ කළාට පසුවත් මාතර දමලා යන්නේ නැතුව මාතරම ඉඳිමින් සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව සමඟ එකට වැඩ කරලා තමයි අද වනවිට එතුමිය මේ රටේ නායිකාවක් වෙලා තිබෙන්නේ. අඩු ගණනේ ඒකටවත් respect කරන්නේ නැහැ. මාතර දිස්ත්‍රික්කයේ කොච්චර මුස්ලිම් ජනතාව සිටියත් ඉස්සෙල්ලාම මුස්ලිම් මන්ත්‍රීවරයෙක් ආවේ අපේ පක්ෂයෙන්. හිස්බුල්ලාහ් මැතිතුමනි, ඔබතුමන්ලාගේ පක්ෂයෙන් ආවේ නැහැ. ඒකටවත් respect කරන්නේ නැහැ.

ගරු ජනාධිපතිතුමා ගිහිල්ලා ජම්ඉයියතුල් උලමා සභාවේ සභාපතිතුමා මුණ ගැසුණේ එතුමා ජනාධිපති වෙන්න කලින්. ගරු සභාපතිතුමනි, මුස්ලිම් ජනතාවට අදාළ පෞද්ගලික නීති ප්‍රමාණයක් අපේ රටේ තිබෙනවා. හින්දු ජනතාවටත් ඒ වාගේම තිබෙනවා. උඩරට ජනතාවටත් ඒ විධියට තිබෙනවා. විශේෂයෙන්ම ඉස්ලාමීය නීති වෙනස් කරනවා නම් ඒවා වෙනස් කරන්නේ හැම කෙනා සමඟම සාකච්ඡා කරලා තමයි කියන එක එතුමා ජනාධිපති අපේක්ෂකයෙක් වශයෙන් සිටියදීත් කිව්වා. එතුමා දැන් ජනාධිපති. එසේ කියා තිබියදීත්, ඒක දැන දැන නැවත නැවතත්, නැවත නැවතත් සරෝජා පෝල්රාජ් ඇමතිතුමියට ඉතාම නින්දිත විධියට එක එක දේවල් කියනවා. අපි දැකලා තිබෙනවා, social mediaවලින් එක එක ප්‍රකාශ නිකුත් කරනවා. පාර්ලිමේන්තුවේදීත් එක එක දේවල් කියනවා.

ගරු සභාපතිතුමනි, රටේ ජනාධිපතිතුමා ඒක කියලා තිබෙනවා. අපේ භාවිතාවෙන්ම ඒක පෙන්වලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමා දන්නවා, මේ රටේ අවුරුදු ගණනක් තිස්සේ - අවුරුදු 11ක් තිස්සේ- ඉස්ලාමීය නීති වෙනස් කිරීම සම්බන්ධව ඉස්ලාමීය උගතුන්ගේ කමිටුවක්; මේ රටේ සිටින ප්‍රබුද්ධම ඉස්ලාමීය උගතුන් සම්බන්ධ වෙච්ච කමිටුවක් තිබුණු බව. ඒ කමිටුවේ මේ ගැන වෙච්ච සාකච්ඡා තිබෙනවා. එසේ තිබියදී, ජනාධිපතිවරයා කියලා තිබියදී, අපේ භාවිතාවෙනුත් කිසිම දෙයක් නැතිව අතම්බාවා මන්ත්‍රීතුමාව විවේචනය කළා. අපි මැරිලා ඉපදුණේ නැහැ. මේ මුස්ලිම්, දෙමළ කියාගෙන, සිංහල කියාගෙන ආපු ඇමතිවරු පල්ලි ඇතුළේ දේශපාලනය කරපු විධිය අපි දන්නේ නැද්ද? අපි බබාලා! අපි දන්නවා. සියලු මුස්ලිම් මන්ත්‍රීතුමන්ලාට නිසි ගෞරවය ඇතිව මම කියන්නම්, ගරු සභාපතිතුමනි. එතුමන්ලාගෙන් ගෞරවනීය පුද්ගලයන් ඉන්න පුළුවන්. මේ රටේ මුස්ලිම් ජනතාව "තේසිය මක්කල් ශක්ති" පක්ෂය ලංකාවේ ලොකුම මුස්ලිම් පක්ෂය බවට පත්කළේ ඇයි කියලා මම අහන්න කැමැතියි. දේශපාලනය කරන බොහෝ මුස්ලිම් අයගේ දේශපාලනය හරාම්. ඒ දේශපාලන නායකයන්ගේ පෞද්ගලික ජීවිත හරාම්. එතුමන්ලාගේ බිස්නස් ඔක්කෝම හරාම්. ඒගොල්ලෝ ආගමේ නාමයෙන් කරන්නෙත් හරාම්. අද මේ කරන්න හදන්නේ මොකක්ද? දැන් පළාත් පාලන ඡන්දය එනවා නේ. මේ අය වැලේ වැල් නැතිව නේ ඉන්නේ. ඒ නිසා දැන් මේක ඇදලා ගන්න හදනවා.

ගරු සභාපතිතුමනි, මම මේ කාරණාවත් අහන්න කැමතියි. ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය ස්විට්සර්ලන්තයට ගියා. මම එතුමියගේ ඒ කථාව තව පොඩ්ඩකින් හැන්සාඩගත කරනවා. මම අභියෝග කරනවා, ඒ කථාවේ එහෙම තිබෙන්නේ

කොහේද කියලා පෙන්වන්න කියලා. එතුමිය එහෙම එකක් කියලා නැහැ. එතුමිය මඟින් මහට මේ ගරු සභාවේදීත් කරුණු ඉදිරිපත් කළා. මම හිතන විධියට, මීට සතියකට කලිනුත් කිව්වා. ගරු සභාපතිතුමනි, මේ නීති කියන්නේ මිනිස්සු ලියපුවා නේ. නීති වෙනස් කරන්න අවශ්‍ය නම්, සියලු කණ්ඩායම් සමඟ සාකච්ඡා කරලා තමයි වෙනස් කරන්නේ කියන කාරණය එතුමිය මේ ගරු සභාවේ දී ඕනෑ තරම් කියලා තිබෙනවා. හැබැයි, ඇහෙන්නේ නැහැ. ඇයි ඒ? මැතිවරණයට කලින් මොනවා හෝ පත්තු කර ගන්න ඕනෑ. රාජපක්ෂලා එහෙම හිටියා නම් හරි ලෙහෙසියි. අපි මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකයන්; කතෝලික, ක්‍රිස්තියානි, ඉස්ලාම් භක්තිකයන් හැම කෙනාටම සම්පූර්ණ ගරුත්වය සහිත ආණ්ඩුවක් හදලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමන්ලාට ඉතා කරුණාවෙන් කියා සිටිනවා අපි කිසිසේත්ම එහෙම කටයුතු කරන්නේ නැහැ කියන එක. වෙනස්කම් කරන්න ඕනෑ නම් වෙනස්කම් කළ යුතුයි. එහෙම තමයි ලෝකයේ රටවල් ඉස්සරහට ගිහිල්ලා තිබෙන්නේ. තුර්කිය වෙන්න පුළුවන්, සෞදි අරාබිය වෙන්න පුළුවන්, ඉන්දුනීසියාව වෙන්න පුළුවන්, මලයාසියාව වෙන්න පුළුවන්. අපි කොයි තරම් ඉහළින් සෞදි අරාබි තානාපතිතුමා එක්ක කථා කරනවාද? පලස්තීන තානාපතිතුමා එක්ක කථා කරනවාද? අපි මේ රටේ හැම තානාපති කාර්යාලයක් එක්කම කටයුතු කරනවා. අපි ඉස්ලාමීය සංස්කෘතියේ තිබෙන ඒ වැදගත්කම පිළිගන්නවා. ගරු සභාපතිතුමනි, මම දුක් වෙනවා, "ස්වර්ගය ඇත්තේ මවගේ දෙපතුළට පහළිනි" කියලා කියන එවැනි වැදගත් ආගමික ග්‍රන්ථයක් වන කුරානයේ එසේ තිබියදී, -

ගරු මුනීර් මුලාෆර් මහතා
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
හදීස් එකේ තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හදීස් නැමැති ග්‍රන්ථයේ එහෙම තිබියදී, අම්මා කෙනෙක් වෙච්ච කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමියට දිගින් දිගටම එහෙම චෝදනා කරනවා. අපි පක්ෂයක් වශයෙනුත්, ප්‍රතිපත්තිමය වශයෙනුත්, ජනාධිපතිතුමා එතුමාගේ මට්ටමෙනුත් මේ සම්බන්ධව කියලා තිබෙනවා. ඒ වාගේම ඔප්පු කරලාත් තිබෙනවා, "අපි ජාතිවාදය කරන්නේ නැහැ, අපි සියලු සංස්කෘතීන්වලට respect කරනවා" කියලා. ඒ නිසා මම මේ රටේ සිටින වැදගත් මුස්ලිම් උගතුන්ගෙන් වාගේම, නායකයන්ගෙන් ඉල්ලා සිටිනවා කරුණාකරලා මේක නතර කරන්න කියලා. මේක ඇති. ඔබතුමන්ලාට යම් කිසි විවේචනයක් තිබෙනවා නම් ඒක ආණ්ඩුවට කරන්න.

ගරු සභාපතිතුමනි, මම කියන්න කැමතියි ඕනෑම නීතියක් වෙනස් කරනවා නම් - ඉස්ලාමීය නීතිය විතරක් නොවෙයි, බෞද්ධ නීතිය විතරක් නොවෙයි - අපි සාකච්ඡා කරලා තමයි එය කරන්නේ කියන එක. අපි සියල්ල දන්නා පණ්ඩිතයෝ නොවෙයි. අපි අහලා තමයි කරන්නේ. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. හැම දෙයක්ම "හරාම්" කරන දේශපාලනඥයන් ප්‍රමාණයක් ඉන්නවා. ඒ හැම දෙයක්ම "හරාම්" කර කර මෙතැනට ඇවිල්ලා බොරුවට මුස්ලිම් ජනතාවට බොරු කියලා දැලේ දා ගන්න හදනවා. මුස්ලිම් ජනතාව පසුගිය මැතිවරණයේ දී ඔබතුමන්ලාව ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. මම මේ රටේ මුස්ලිම් ජනතාවගෙන් ගෞරවනීය වශයෙන් ඉල්ලා සිටිනවා ඉතිරි ටිකත් ප්‍රතික්ෂේප කරලා, - තේසිය මක්කල් ශක්ති පක්ෂයම වෙන්න ඕනෑ නැහැ - වැදගත්, උගත්, පිළිගත්, තමන්ගේ ජීවන භාවිතාව ඉස්ලාමීය දහමට අනුව ගෙවන, සැබෑ ලෙස ජීවත් වෙන ඉස්ලාමීය උගත් තරුණ තරුණියන් මේ ගරු සභාවට එවන්න කියලා.

ගරු සභාපතිතුමනි, අපි හැම කෙනාම ආරක්ෂා වුණොත් තමයි අපි තනි තනිවම ආරක්ෂා වෙන්නේ. ඉතින් ඒ නිසා එක්කෙනෙකුගේ සංස්කෘතිය බිඳ දැමීමොත් අනෙක් අයගේ සංස්කෘතියත් බිඳ වැටෙනවා. ඒ නිසා ඉස්ලාම් වේවා, බෞද්ධ වේවා, ඒ හැම කෙනාවම අපි ආරක්ෂා කරනවා කියන එක අපි ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි. මොකද දන්නවාද? දැන් ඒ තත්ත්වය සෑහෙන ප්‍රමාණයකින් අපේ රටේ ජනතාව පරාජයට පත් කරගෙන තිබෙනවා.

අපි ඇත්තම කථා කරනවා නම්, අපි දන්නා දෙයක් තමයි අපේ රටේ එක ජාතික කණ්ඩායමක බහුතරයක් සිටින තැනක, අනෙක් ජාතික කණ්ඩායම් දෙකතුනේ අයිතිවාසිකම්වල තත්ත්වය මොකක්ද කියන එක. ඒක තමයි බලන්න තිබෙන litmus test එක. සිංහල ජනතාව බහුතරයක් සිටින ප්‍රදේශයක දෙමළ, මුස්ලිම් ජනතාවගේ සංස්කෘතික ආරක්ෂාව කොහොමද? දෙමළ ජනතාව බහුතරයක් සිටින ප්‍රදේශයක සිංහල සහ මුස්ලිම් ජනතාවගේ සංස්කෘතිය භුක්ති විඳීම සඳහා තිබෙන ඉඩකඩ කොහොමද? මුස්ලිම් ජනතාව බහුතරයක් සිටින තැන්වලදී දෙමළ සහ සිංහල ජනතාවගේ සංස්කෘතිය භුක්ති විඳීමේ ඉඩකඩ කොහොමද? ඔක තමයි test එක. මේවායේ තවම පොඩි පොඩි ප්‍රශ්න තිබෙනවා කියලා අපි දන්නවා. ඒවා වෙනස් කර ගැනීම අපේ රටේ අලුත් තරුණ පරම්පරාව බාර ගන්න ඕනෑ කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, සංස්කෘතික ඇමතිතුමාට මම මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබතුමා ආවාට පස්සේ මේ පාර්ලිමේන්තුවේ පළමුවැනි වතාවට පොංගල් උත්සවය පැවැත්වුවා. ගරු සභාපතිතුමනි, අපි කොතැනකදීවත් ethnic balance එක ගැන, වාර්ගික අනුපාතයක් ගැන හිතන්නේ නැහැ. නමුත්, මම හිතන විධියට මේ පාර්ලිමේන්තුවේ සේවක සේවිකාවන් 900ක් පමණ වැඩ කරනවා. මම පොංගල් දවසේ තමයි දැන ගත්තේ, පාර්ලිමේන්තුවේ රාජකාරි කරන දෙමළ කාර්ය මණ්ඩලය 30කටත් අඩුයි කියලා. ඉස්ලාමීය - මුස්ලිම් - අයත් අඩු ඇති. මම කියන්නේ නැහැ, ඒක වෙනම වැඩි කරන්න කියලා. නමුත්, ඒ balance එක තිබුණා නම් මේක තවත් ලස්සන වෙයි කියලා මම හිතනවා. මොකද, පොංගල් උත්සවය මේ පාර්ලිමේන්තුවේ පැවැත්වුවාම ඒ ජනතාවට ඒක කොච්චර දැනුනා ද කියලා මම දැක්කා. අපි ඒවා photosවලට කරන වැඩ නොවෙයි. රාමසාන් උත්සවය ගත්තත් අපි ඒක truly විශ්වාස කරනවා. මිනිස්සු ඒවාත් එක්ක ගොඩ නැඟෙනවා. ඒ නිසා අපි ගරු සභාපතිතුමාගෙනුත්, මේ පාර්ලිමේන්තුවෙනුත් ඉල්ලා සිටිනවා, fully represent වන විධියට, - දැන් මන්ත්‍රීතුමියන් ගොඩක් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා - අනෙක් දේවලුත් ඒ පැත්තට යනවා නම් හොඳයි.

ඒ වාගේම ගරු සංස්කෘතික කටයුතු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. ආගමික සහජීවනයේදී, නැත්නම් ජනතාව අතර විශ්වාසය තහවුරු කිරීමේදී පුරාවිද්‍යාව කියන්නේ natural science එකක් වුණාට දැන් ඒක පොඩ්ඩක් politicize වෙලා තිබෙනවා. පුරාවිද්‍යාව කියන්නේ ඉතිහාසයේම කරුණක්. නමුත් විවිධ රටවල, විවිධ යුගවල දේශපාලන අරමුණු වෙනුවෙන් පුරාවිද්‍යාව භාවිත කරගෙන තිබෙන බව කවුරුත් දන්නවා. ඒ නිසා මේ සම්බන්ධව කටයුතු කරන්න විශ්වවිද්‍යාලයීය වශයෙන්, නැත්නම් විශ්වවිද්‍යාලවලින් පරිබාහිරව හරි උගතුන් ප්‍රමාණයක් පත්කර ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. පුරාවිද්‍යා ගවේෂණයට විතරක්ම නොවෙයි; science පැත්තටම නොවෙයි. ඒ සම්බන්ධව කෙරෙන්නා වූ යම් ආකාරයක බලපෑම් තිබෙනවා. ඒවා ජාතිවාදී, ආගම්වාදී dose එකෙන් බේරාගෙන, ඒ flavour එකෙන් බේරාගෙන ඉස්සරහට අරගෙන යන්න පුළුවන් යම් ආකාරයේ ව්‍යුහයක් සකස් කරන්න කියලා මම ඔබතුමාට කියන්න කැමැතියි.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු අගමැතිතුමියගෙනුත් මම ඉල්ලීමක් කරන්න කැමැතියි, ඉදිරියේදී එතුමිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න යන නිසා. අපි දන්නවා, අපේ රටේ ඉතිහාසය ගැන ලියැවුණු අළුවු පොත් තිබෙන බව. අපේ රටේ සාතිශය බහුතරය සිංහල, බෞද්ධ ජනතාව බව අපි පිළිගන්නවා. ඔවුන්ගේ සංස්කෘතික කටයුතු තමයි ගොඩක්ම තිබෙන්නේ. ඒක බොරුවක් නොවෙයි, සත්‍යයක්. නමුත් ඒ අතරම දෙමළ, මුස්ලිම්, ක්‍රිස්තියානි සහ එසේත් නොවන ජනතාවකුත් ඉන්නවා. වවුනියාවේ පුංචි ගමක් තිබෙනවා,නොවිකුලම කියලා. ඒ ගමේ ඉන්නේ වඩිග කියන ජනතාව. මම ඒ ගමට ගිහිල්ලා තිබෙනවා. එවැනි ගම්මාන හතරක් තිබෙනවා, ගරු සංස්කෘතික කටයුතු ඇමතිතුමනි. ඔවුන්ගේ ජාතිකත්වය වඩිග.

අද පාසල් පෙළ පොතක් කියෙව්වාම මුස්ලිම් දරුවෙකුට හිතෙන්න ඕනෑ, මම ලංකාවට අයිතියි කියලා. ඒ වාගේම දෙමළ දරුවෙකුටත් හිතෙන්න ඕනෑ, මම ලංකාවට අයිතියි කියලා. මගේ ආත්තම්මලා, සීයලා ලංකාව වෙනුවෙන් දෙයක් කර තිබෙනවා කියලා ඔවුන්ට හිතෙන්න ඕනෑ. ඒ නිසා මම කියනවා, විෂය නිර්දේශය සකස් කරද්දී මෙහි තිබෙන සැබෑ යථාර්ථය විකෘති නොකර හැමකෙනාම include වෙන විධියට ඒවා සකස් කරනවා නම් හොඳයි කියලා.

ගරු සභාපතිතුමනි, පුරාවිද්‍යා වැදගත්කමක් තිබෙන ඉස්ලාමීය ස්ථාන මෙන්ම කතෝලික ස්ථානත් මන්නාරමේ තිබෙනවා. ඉතින් මම කියනවා, අපේ රටේ බෞද්ධ සංස්කෘතික ස්ථාන වාගේම පුරාවිද්‍යා වැදගත්කමක් තිබෙන ඉස්ලාමීය ස්ථානත්, කතෝලික ස්ථානත් හඳුන්වා දෙන්න කියලා. අපි ඉතාලියට ගියොත්, ඉන්දියාවට ගියොත් බලන්නේ ඒ රටේ සංස්කෘතිය. ඒ නිසා ලංකාවේ සිංහල ජනතාව උතුරට ගියාමත් උතුරේ තිබෙන හින්දු සංස්කෘතිය -නාගදීපයේත් යන ගමන්- තමයි වැඩිපුරම බලන්න ඕනෑකම තිබෙන්නේ. එහෙම වුණාම තමයි අපි මේ රටේ හැම සංස්කෘතියක්ම හුක්ති විඳින්නත් බවට පත් වෙන්නේ.

අපේ රටේ සංහිඳියාව ගොඩනහන්න බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට සුවිශාල වගකීමක් තිබෙනවා. පාසල් අධ්‍යාපනය තුළින් වාගේම පාසල් අධ්‍යාපනයට පිටතුත් හැම ආගමකම තිබෙන වෙනස්කම් අපට ඉගැන්විය යුතුයි. නමුත්, බොහෝ විට අපට උගන්වන්නේ සමානකම් විතරයි. වෙනස්කම් උගන්වන්නත් ඕනෑ. මොකද, වෙනස්කම් ඉගෙන ගත්තාට පසුව තමයි ඒවාත් එක්ක ජීවත් වෙන විධිය ඉගෙන ගන්න පුළුවන් වෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ, රාමසාන් මාසය. ඉස්ලාම් ජනතාවට මේ කාලය කොච්චර අමාරුද? අපේ මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා ගත්තත්, මේ කාලය එතුමාටත් කොච්චර අමාරුද? ඒක අපටත් දැනෙන්න ඕනෑ. වෙසක් කූඩු හදන එක බෞද්ධ දරුවෙකුට දැනෙන ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, ඒක ඉස්ලාමීය දරුවෙකුට නොදැනෙන්න පුළුවන්. ඒ නිසා සමානකම් වාගේම වෙනස්කම් උගන්වන්නත් ඕනෑ. වෙනස්කම් ඉගෙන ගන්න ඕනෑකම තිබෙන්නේ, අනෙකාව තේරුම් ගන්නයි. ඉතින්, ඒවාත් එකතු කරගන්න අවශ්‍යයි. අධ්‍යාපනය තුළ පමණක් නොවෙයි, ඉන් පිටතදීත් මේ කටයුත්ත කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් තරුණ පරම්පරාවට මම මේ කාරණය කියනවා. මේ රට අපි ඔක්කෝටම එකතු වෙලා ඉන්න පුළුවන් තරම් ලොකුයි. අපේ ආගම දහම, සංස්කෘතිය හුක්ති විඳින්න තරම් මේ රට ලොකුයි. ඒ නිසා පරාජය වෙච්ච දේශපාලන චරිතවලින් අපේ ලස්සන භූමිය තවත් අවලස්සන කරන්න දෙන්න එපා. ඔබේ ලස්සන අනාගතය දේශපාලනඥයන්ගේ ඡන්ද වෙනුවෙන් ගසාකන්න දෙන්න එපා. එය තේරුම් ගෙන කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Rohitha Abeygunawardhana. You have 17 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය]මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

[අ.භා. 3.31]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියට ස්තුතිවන්ත වෙනවා, අද දින විවාදයට ගැනෙන බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේත්, පරිසර අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ අදහස් දැක්වීමට මට කාලය ලබා දීම සම්බන්ධයෙන්. විශේෂයෙන්ම මේ අමාත්‍යාංශ ගැන කථා කරන්න ඉස්සෙල්ලා යම් කාරණයක් ගැන කථා කරන්න මම කැමැතියි. ගරු සභානායකතුමා කථා කළා, ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය සම්බන්ධයෙන් විවේචනාත්මක විධියට මාධ්‍ය තුළ වාගේම අනෙකුත් සමාජ මාධ්‍ය තුළ පළ වෙලා තිබෙන දේවල් ගැන. ගරු ඇමතිතුමියනි, ඔබතුමිය හොඳ උගත්, බුද්ධිමත් කෙනෙක් බව මම පිළිගන්නවා. ගරු සභානායකතුමනි, ඔබතුමා මේ පාර්ලිමේන්තුවට අලුත් කෙනෙක් නොවෙයි, පරණයි. මේ පාර්ලිමේන්තුවේ අපි එකට හිටියා. ගරු ඇමතිතුමියනි, අපි කරන හොඳ දේ හොඳයි. අපි නරක දේ කෙරුවොත්, අපි වපුරපු විධියට තමයි අස්වැන්න ලැබෙන්නේ. ඔබතුමියගේ පැහැදිලි කිරීම මම අහගෙන හිටියා. මේකට කියනවා, උත්තරිතර පාර්ලිමේන්තුව කියලා. මුළු රටේම ජනතාව වෙනුවෙන් තෝරා එවපු මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් තමයි අපි. ගරු ඇමතිතුමියනි, පාර්ලිමේන්තුවට ආ පසු අපට මේවාට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. පාර්ලිමේන්තුව උත්තරිතරයි කියලා අපි කියනවා. හැබැයි කියන තරම්ම රස නැහැ, මේකේ උත්තරිතරකම. මේ ගරු සභාව තුළ මේ වෙලාවේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ඇමතිතුමාත් ඉන්නවා.

පාර්ලිමේන්තුව නියෝජනය කරන්න වෙනදා ආවේ, මේ රටේ සිවිල් පුරවැසියෝ. ඒ කියන්නේ, සාමාන්‍ය මිනිස්සු. පසුගිය කාලයේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආවා, හාමුදුරුවන් වහන්සේලාත්. ඒ කියන්නේ මහා සංඝරත්නයත් වැඩියා. වැඩියා නොවෙයි, ජනතාව වැඩමෙව්වා. ජනතාව මහා සංඝ රත්නයටත් ඡන්දය දීලා පාර්ලිමේන්තුවට පත් කර එව්වා. මහා සංඝ රත්නයත් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වැඩසිටියා. මම අවුරුදු 25ක්

තිස්සේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ගරු ඇමතිතුමියනි, පාර්ලිමේන්තුවේදී මහා සංඝ රත්නය සෙංකෝලය උදුරන්න, අරවාට මේවාට ගිහිල්ලා මොකක්ද වුණේ? කිව්වාට තරහා වෙන්න එපා, අපේ හාමුදුරුවන්ගේ රහස් තැනින් පවා ඇල්ලුවා. ගරු ඇමතිතුමනි, මේ සභා ගර්භයේ, මේ රතු පලස උඩදි තමයි එවැනි දේවලුත් වුණේ. ගරු ඇමතිතුමියනි, එම නිසා මෙම පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨයෙකු හැටියට මම ඔබතුමියට කියනවා, පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආවා නම් මේවාට පුරුදු වෙන්න වනවා කියලා. මේ පුටු තිබෙනවා නේද, ඒවායේ වාඩි වුණු අපි හැමෝටම කොච්චර හොඳට හිටියත් මඩ කන්න වනවාම තමයි. ඒ, මේකේ හැටි. එම නිසා ඔබතුමිය කරගෙන යන වැඩ පිළිවෙළ බොහොම විනිවිදභාවයෙන් යුතුව, කිසිම ජාතිකයෙකුට, කිසිම ආගමිකයෙකුට යම් අසතුටක් ඇති නොවන විධියට කරගෙන යන්න කියලා මම මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, මේ රටේ බෞද්ධ, ඉස්ලාම්, කතෝලික හා හින්දු කියන ආගම් අදහන මිනිසුන් ජීවත් වනවා. ඒ වාගේම සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ ආදී වශයෙන් ජාතීන් ගණනාවක් ජීවත් වනවා. අද විවාදයේදී කථා වුණා, අය වැය යෝජනාවලිය අනුව අහවල් අහවල් විෂයයන්ට මේ තරම් මුදලක් වෙන් වනවා කියලා. ඔව්, භෞතික සංවර්ධනය සිදු වෙන්න ඕනෑ. පන්සල් හැදෙන්න ඕනෑ, පල්ලි හැදෙන්න ඕනෑ. ඒවාත් සිදු කරන ගමන් තමුන්නාන්සේලා මොකක්ද කරන්න ඕනෑ? තමුන්නාන්සේලා අලුත් රජයක්. නව මාවතක ගමන් කරන්නේ. එහිදී තමුන්නාන්සේලාට උත්සාහ කරන්න වනවා, මේ රට තුළ ශ්‍රී ලාංකීය ජාතිය හැටියට ඕනෑම කෙනෙකුට මේ කියන ආගම් නිදහසේ ඇදහීමේ අයිති ලබා දීම සම්බන්ධව. මම සිංහල බෞද්ධයෙක්. ගරු ඇමතිතුමනි, මම අදහන බෞද්ධ දර්ශනය වාගේම, කතෝලික ආගම අදහන කිතුනුවෙකුටත්, හින්දු සහ ඉස්ලාම් කියන ආගම් අදහන අයටත් නිදහසේ තමන්ගේ ආගම ඇදහීමේ අයිතිය සහ තවත් කෙනෙකුට තවත් කෙනෙකුගේ ආගමට ගෞරව කිරීමේ වැඩ පිළිවෙළක් හදන්න පුළුවන් නම් ඒක ශුභවාදියි කියන එකයි මම විශ්වාස කරන්නේ. අපි අපේ ආගමට ආදරය කරන තරමටම අනෙක් ආගම්වලටත් ගරු කරන්න පුරුදු වෙන්න ඕනෑ. හැබැයි, ඒ ආගම්වල ඇදහීම් ක්‍රම සහ අපේ බෞද්ධ දර්ශනය අතර වෙනසක් ඇති. එලෙස වෙනසක් තිබුණත්, අවසානයේදී සියලු ආගමික ශාස්තෘවරයන් කියලා තිබෙන්නේ, තමන් අනික් හැම කෙනෙකුටම ආදර්ශයක් වෙමින් රටේ ජීවත් වෙන්න කියලායි. අන්න ඒ තත්ත්වය උදා කරන්න කියලා මම ඔබතුමාට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, අප සියලුදෙනා නිදහසේ තමන්ගේ ආගමික ඇදහීම් කරගෙන ගිය බව. නමුත්, මීට වසර හයකට ඉස්සෙල්ලා පාස්කු ප්‍රහාරය සිදු වුණා. ගරු ඇමතිතුමනි, එම ප්‍රහාරය නිසා දේවස්ථාන තුළ සිටි 269දෙනෙක් පමණ මිය ගියා. 500දෙනෙකුට ආසන්න පිරිසක් ආබාධිත තත්ත්වයට පත් වුණා. ඇස් දෙක පෙනෙන්නේ නැතුව, කන් දෙක ඇහෙන්නේ නැතුව, අතපය නැතුව අදටත් ඔවුන් දුක්ඛිත ජීවිත ගත කරනවා. අපේ රට පමණක් නොවෙයි, මුළු ලෝකයම එය ඉතා මිලේච්ඡ ක්‍රියාවක් හැටියට දකිනවා. එදා ඒ දේව මෙහෙයන්වලට ගිහිල්ලා තමන්ගේ ආගම සිහි කරමින් ඉන්න වෙලාවේදී සිදු වූ ප්‍රහාරය මේ පාර්ලිමේන්තුවේ සිටින හැම කෙනාම හෙළා දැක්කා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, යහ පාලන ආණ්ඩුව කාලයේදී තමයි එම ප්‍රහාරය සිදු වුණේ.

යහ පාලන ආණ්ඩුව මේ රට පාලනය කරනකොට තමයි පාස්කු ප්‍රහාරය සිද්ධ වුණේ. ඊට පස්සේ බලයට ආවේ කවුද? ඊට පස්සේ බලයට ආවේ අපි නියෝජනය කරපු ආණ්ඩුව. ඒ කියන්නේ, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා නියෝජනය කරපු ආණ්ඩුව බලයට ආවා. ඒ ආණ්ඩුව බලයට ආවාට පස්සේ, අතිඋතුම් අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් කිව්වා, පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් සොයා දෙන්න, මහ මොළකරුවන්ව අල්ලලා දෙන්න කියලා. නමුත්, කාදිනල් හිමිපාණන් බලාපොරොත්තු වුණු විධියට අපිටත් තවම මේ පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු කවුද කියන එක ප්‍රශ්නයක්; තවමත් ඒක ප්‍රශ්නයක්. පසුගිය මැතිවරණයේදී කතෝලික ජනතාවගේ ඡන්දවලින් සියයට 99ක් ලබා දුන්නේ කාටද? මාලිමාවේ රජයක් පිහිටුවා ගන්න; මාලිමාවේ ආණ්ඩුවක් ගේන්න. ඔවුන් මොකටද ඒ ඡන්දය දුන්නේ? ඔවුන් ඡන්දය දුන්නේ, "මේ පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් හරියාකාරව අපිට පෙන්වා දෙන්න, ඔවුන්ව නීතිය ඉදිරියට ගේන්න, ඔවුන්ට දඬුවම් දෙන්න" කියායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි විශ්වාස කරනවා, මේ රජය ඒ යුතුකම ඉටු කරයි කියලා. කාදිනල් හිමිපාණන් කියනවා අපි දැක්කා, "අපි මේ අප්‍රේල් මාසයේ 21වැනි දා වෙනකම් බලනවා, ඒකට මේ රජය ගන්න තීන්දුව මොකක්ද කියලා, හැබැයි, මේ රජය ඒ තීන්දුව ගන්නේ නැත්නම් අපි මේ රජයටත් රතු එළියක් ලබා දෙනවා, අපි පාරට බහිනවා" කියලා. එම නිසා මේ කරපු දේ වෙනුවෙන් ඒ අහිංසක මිනිසුන්ට විසඳුමක් ලබා දෙන්න වෙනවා. අනිවාර්යයෙන්ම මේ මහ මොළකරුවා කවුද කියන එක සොයා ගැනීමේ වගකීම ඔබතුමන්ලාට ඉටු කරන්න සිද්ධ වෙනවා. ඒක කරන එක හොඳයි. මේ ප්‍රහාරයෙන් කතෝලික ජනතාව මිය ගියා. කතෝලික ජනතාවට ඒ වෙච්ච අසාධාරණය වාගේම මේ රටේ මුස්ලිම් ජනතාවටත් පාස්කු ප්‍රහාරය නිසා ලොකු අසාධාරණයක් සිද්ධ වුණා. මොකද, පාස්කු ප්‍රහාරය සිද්ධ වුණාට පස්සේ කිසිම මුස්ලිම් පුද්ගලයෙකුට පාරේ යන්න බැරි වුණා. මුස්ලිම් අය දිහා බැලුවේ මහ බෝම්බකරුවෙක් විධියට. ඔවුන්ගේ National Identity Card එක දුන්නාම නමේ "මොහොමඩ්" කියලා කොටසක් තිබෙනවා නම් ඔහු දිහා බැලුවෙත් අර පාස්කු ප්‍රහාරයට සම්බන්ධ කෙනෙක්ද කියන අදහසින්. ඒ නිසා අද බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී අපි ගරු ඇමතිතුමාට මේ කාරණය කියනවා. අද ඔබතුමාත්, පොලීසිය හාර ඇමතිතුමාත් එක ළඟ අසුන්වල වාඩි වෙලා ඉන්නවා. මේ වගකීම ඔබතුමන්ලා දෙදෙනාටම පැවරිලා තිබෙනවා. පොලීසිය හාර ඇමතිතුමාත්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා ඇමතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. බලන්න, අද ගැළපෙනම තුන්දෙනා එක ළඟට ඇවිල්ලා ඉන්නවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ විශේෂ අවධානය යොමු කරන්න. මේ මහ මොළකරුවා සොයා දෙන්න; මේ ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච අය සොයා දෙන්න. ඒ අය සොයා දෙන්නේ නැතුව වෙන ආණ්ඩුවකට මේ සිද්ධිය ආපහු සොයන්න ඉඩ තියන්න එපා, ගරු ඇමතිතුමනි. මේ සිද්ධිය වෙන කාටවත් සොයන්න තියන්න එපා. මේක ඉවරයක් කරන්න. මොකද, කාදිනල් හිමිපාණන් බලාගෙන ඉන්නවා, මේ කටයුතු අවසන් වෙනතුරු. කතෝලික ජනතාව බලාගෙන ඉන්නවා, මේ පාස්කු ප්‍රහාරය වෙනුවෙන් තමුන්නාන්සේලාගේ වගකීම ඉටු කරන තුරු.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද ලබන මාසයට යෙදී තිබෙනවා. මේ මාසය ඉතා වැදගත්. ඒ වාගේම තමයි, මේ මුස්ලිම් ජාතිකයන්ගේ, ඉස්ලාම් ආගම අදහන ජනතාවගේ රාමසාන් කාල සීමාව. මේ රටේ ඉන්න සියලු මුස්ලිම් ජනතාව මේ දවස්වල උපවාසයේ යෙදිලා ඉන්නවා. අනෙක් පැත්තෙන්, අපේ ජනතාව සිංහල සහ හින්දු අලුත් අවුරුද්දට ලැහැස්ති වෙනවා. මේ එළඹෙන මාසයත් එක්ක අපිට තවත් හොඳ පණිවුඩයක් ලැබෙන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ පණිවුඩය තමයි, මේ රටේ ඉන්න සුවහසක් බෞද්ධ ජනතාවට දළදා වහන්සේ වැඳ පුදාගෙන ආශීර්වාද ලබා ගන්න අවස්ථාවක් උදාවෙන එක. ඒකට මේ වනවිට මුළු රටේම බෞද්ධ ජනතාව විතරක් නොවෙයි, වෙනත් ආගම් අදහන අයත් බලාගෙන ඉන්නවා. හුහක් වෙලාවට අපෙන් ඒ අය අහනවා, "අනේ, අපිටත් ගිහිල්ලා දළදා වහන්සේ වැඳ පුදාගෙන එන්න බැරිද?" කියලා.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

මේක ඉතා හොඳ වැඩක්. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට පැහැදිලිව කියනවා, මේකෙදි ආරක්ෂාව ගැන වැඩි අවධානයක් යොමු කරන්න කියලා. පොලීසිය භාර ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අපි දන්නේ නැහැ, අද රටවල - ජාත්‍යන්තරයේ- තිබෙන තත්ත්වය පිළිබඳව. ඒ නිසා ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් ඉතිහාසයේ වෙච්ච දේවල් නිසා තමයි සැකයක් ඇති වෙන්නේ. සමහර ඒවා සැකයට භාජන වෙනවා නේ. සමාජ මාධ්‍ය තුළ දැන් කතිකාවක් ඇති වෙලා තිබෙනවා, ඊළඟ මැතිවරණය ඉලක්ක කරගෙන ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනය කරන්න කටයුතු කළාද කියන එක ගැන. ගරු ඇමතිතුමනි, මම මේ කාරණය ඔබතුමාට කියන්නේ බොහොම සද්භාවයෙන්. මේක බොහොම හොඳ වැඩක්. මේකට හේතුව ඒක නොවෙන්න පුළුවන්. නමුත්, මේක මැතිවරණ කාල සීමාවක්. මේ මැතිවරණ කාල සීමාවේ කවුරුන් හෝ යම් විධියකින් මොනවා හෝ දෙන්න උත්සාහ කරනවාය කියලා අපි හිතමු. අපි දැක්කා නේ, පසුගිය රජයන් නොයෙක් අවස්ථාවලදී - මැතිවරණ කාලයේදී- දන්සල් දුන් ආකාරය. ඒක වැරදියි නේ. ඒක දේශපාලන අල්ලසක්. හරි නේද, ගරු සභානායකතුමනි? *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පාස්කු ප්‍රහාරය සම්බන්ධ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දුන්නොත්, තමුන්නාන්සේලා මේ රටේ කළ යුතු දේ හරියට කළාය කියලා මම නිර්ලෝභීව කියනවා. ඒ පිටුපස රාජපක්ෂද, වික්‍රමසිංහද, සොයිසාද, සිල්වාද, නඩරාජාද, අබිදුල්ලාද කියන මේ කවුරු හිටියත් කමක් නැහැ. මේ පාප කර්මය කරපු කවුරු වුණත් නීතිය ඉදිරියට ගේන්න. ඒ වෙනුවෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා. හැබැයි, මේක ඉවර කරන්න. එහෙම නැතුව මේක තවත් තැනක දේශපාලන මාතෘකාවක් කරගන්න ඉඩ තියන්න එපා කියන එක මම මේ වෙලාවේදී මතක් කරනවා.

තව කාරණා කිහිපයක් ගැන කියන්න තිබුණත්, මම පරිසරය ගැන යමක් කිව යුතුයි. ගරු ඇමතිතුමනි, පරිසරය ආරක්ෂා කරන එක අපේ වගකීමක්. ගහ කොළ, සතා සිව්පාවා ඇතුළු මේ සියල්ල අපිට ඕනෑ. හැබැයි, පරිසරය මුවාවෙන් මේ රටේ ආර්ථිකයට, මේ රටේ ගෙන යන වැඩ පිළිවෙළට යම් හානියක් සිද්ධ වෙන්න දෙන්න එපා. ගරු ඇමතිතුමනි, පරිසරය ගැන කියනකොට මට මතක් වෙනවා, මධ්‍යම අධිවේගී මාර්ගය සහ පඬුකරද ගහ ගැන. අපි එහෙම ජාතියක්. අපි පඬුකරද ගහක් හරි දේශපාලන මාතෘකාවක් කර ගත්තාම ඒක රටේ ආර්ථිකයට බලපානවා; ඒක ආර්ථිකයට බලපෑවා. චීන සමාගම මහාමාර්ග අමාත්‍යාංශයෙන් ප්‍රමාද ගාස්තුව විධියට රුපියල් බිලියන 5ක් ගත්තා, පඬුකරද ගහක් හින්දා. මේවා දේශපාලන මාතෘකා. මෙවැනි දේවල් වෙන්න දෙන්න හොඳ නැහැ. මෙහෙම දේවල් වෙනවා. නමුත් මෙහෙම දේවල් වෙන්න දෙන්න හොඳ නැහැ කියන එකයි මම කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ කළු ගහ ආශ්‍රිතව සිටින පවුල් දහ පහළොස්දහසක පමණ අහිංසක මිනිස්සු වැලි ටිකක් ගොඩ දාගෙන ඒකෙන් ජීවත් වෙනවා. ඔවුන් අහිංසක මිනිස්සු. ඔවුන්ගේ කන් ඇහෙන්නේ නැහැ. පනිවිටුව අරගෙන අඩි ගණනක් ගහ පතුලට ඔවුන් යනවා. හැබැයි, මෙලෙස වැලි ගොඩ දැමීම තුළින් පරිසර හානියක් වෙනවා නම් ඒක නවත්වන්න ඕනෑ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කියනවා, මේ ගහ පතුලේ වැලි කියුබ් ලක්ෂ 5ක් තිබෙනවා, ඒකෙන් ලක්ෂ 3 ½ක් ගන්න පුළුවන් කියලා. හැබැයි, සමහර අය කියනවා, නැහැ, ඒක ගත යුතු නැහැ කියලා. ඒ නිසා කළුතර දිස්ත්‍රික්කයේ කළු ගහ ආශ්‍රිතව ඉන්න අහිංසක මිනිස්සු අද දරුවෝත් එක්ක බඩගින්නේ ඉන්නවා. මේ අය විපක්ෂයට ඡන්දය දීපු අය නොවෙයි. විපක්ෂයටත් ඡන්දය දෙන්න ඇති. ඒ හින්දා නේ, මම පාර්ලිමේන්තුවට ආවේ. වැඩි බහුතරයක් ඡන්දය ලබා දුන්නේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට. එම නිසා ඒකට හේතු වුණු තාක්ෂණික කාරණා හොයා බලලා ඒ මිනිසුන්ගේ බඩගින්න නිවන්න. මම මේ කියන්නේ පරිසරය ගැන. පරිසරය වෙනුවෙන් ඒ දේවල් ආරක්ෂා කරගත යුතුයි. හැබැයි, මිනිස්සු ජීවත් කරවන්න, ඔවුන්ට මැරෙන්න දෙන්න එපා කියලා මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු සහ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් පැවැත්වෙන විවාදයට එකතු වෙලා අදහස් දැක්වීමට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මේ අමාත්‍යාංශ යටතට එන විෂයන්වල කරුණු කාරණා ගත්තම, මේ අමාත්‍යාංශ අපේ ජීවිතය එක්ක බද්ධ වුණු සංවේදීම අමාත්‍යාංශ ලෙස අපට හඳුන්වන්න පුළුවන්. මේ අමාත්‍යාංශ නිසියාකාරයෙන් කළමනාකරණය නොවීම හරහා රටක මානවයාගේ විනාශය පවා සිදු වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ආගම ධර්මය පිළිබඳව මෙම සභාව තුළ විවිධ අදහස් දැක්වුවා. මා විශ්වාස කරන විධියට, ලෝකයේ පවතින සියලු ධර්මයන් තුළින් බලාපොරොත්තු වන්නේ, ඒ වාගේම සංස්කෘතීන් තුළින් බලාපොරොත්තු වන්නේ, තමන් තුළින් වටිනා මිනිසෙක් හදා ඒ වටිනා මිනිසා තමන් වටා ඉන්න අනික් මිනිසුන්ටත් වටිනාකමක් දීලා, තමන්ව පෝෂණය කරන පරිසරයටත් වටිනාකමක් දීලා, ඒ අනුව කටයුතු කරයි කියන එකයි. එවැනි බලාපොරොත්තු එක්ක තමයි ඒ ඒ ධර්මයන් ලෝකයට තමන්ගේ පණිවුඩය ලබා දී තිබෙන්නේ.

මෙතැනදී විවිධ කරුණු කාරණා පිළිබඳව විවිධ වෝදනා, අභියෝග එල්ල වුණා. ඒ සම්බන්ධව මට මෙන්න මේ කාරණාව කියන්න පුළුවන්. තුවාල කිරීම කාටත් කළ හැකියි. හැබැයි, සුවපත් කළ හැක්කේ ශිෂ්ට සම්පන්න, ඒ වාගේම පුළුල් මනසක් තිබෙන, අනිකාට සහ සමාජයට වටිනාකමක් දෙන උසස් මිනිසුන්ට පමණයි.

ඔබ දන්නවා, පසුගිය දවස්වල සමහරු මෙතැනට ඇවිල්ලා කථා කරපු දේවල් ගැන. විපක්ෂයේ එක්තරා මන්ත්‍රීවරයෙක් මුස්ලිම් නීතිය පිළිබඳව අදහස් දැක්වුවාම, විපක්ෂයේ ඉන්න තව සමහර පිරිස් ඒ මන්ත්‍රීවරයාගේ ඒ වචනය උඩ එල්ලාගෙන දැඩි ලෙස විවේචන එල්ල කළා. සමහරු සමාජ මාධ්‍ය තුළ අපේ පින්තූර දාලා, මේ මිනිස්සු ඇයි නිහඬ, මේ මිනිස්සු ඇයි කථා

කරන්නේ නැත්තේ කියන ප්‍රශ්නය අපෙන් නැඟුවා. මම කියන්න කැමැතියි, මෙන්න මේ අල්-කුරාන් පාඨය. අල්-කුරානය අපට මහ පෙන්වා දී තිබෙන්නේ, "*Wa 'ibaadur Rahmaanil lazeena yamshoona 'alal ardi hawnanw wa izaa khaata bahumul jaahiloona qaaloo salaamaa*" යනුවෙන්.

ශිෂ්ට මිනිස්සු, වැදගත් මිනිස්සු තමන්ගේ ගමන තුළ හැම විටම ඒ ශිෂ්ට සම්පන්නභාවය රැගෙන යනවා වාගේම මෝඩයන්, අඥානයන්, මානසික ලෙඩ්ඩු අපට විවේචන එල්ල කරනකොට ඔවුන්ට උත්තර දෙන්නේ, "ඔබට ශාන්තිය, ඔබට සාමය" යනුවෙන් මිසක්, ඔහු මත්තේ එල්ලෙන සමාජයක් තුළ නොවෙයි කියන පණිවුඩය මම කියන්න කැමැතියි. විශේෂයෙන් ඒ විවේචනය එල්ල කළ පුද්ගලයා පිළිබඳව අපි රටක් වශයෙන් කල්පනා කළ යුතුයි. ඔහු එදා කුඩා ළමයින්ගේ විවාහය පිළිබඳව කථා කරනවා. නමුත් බුද්ධියක් තිබෙන, අධ්‍යාපනයක් තිබෙන තාත්තා කෙනෙකු ලෙස, පියෙකු ලෙස මම මේ කාරණය කියන්න කැමැතියි. තමන්ගේ දියණිය කුඩා වියේ විවාහ කරදෙනවාට වඩා, විවාහයට සුදුසු, ඒ සඳහා මානසිකව, ශාරීරිකව සූදානම් වෙච්ච මොහොතේ ඔබේ දියණිය විවාහ කර දෙන්න කියන පණිවුඩය තමයි ඉස්ලාමය ලබා දී තිබෙන්නේ. ඒ මිසක්, වෙනත් කිසිම වයස් සීමාවක් පිළිබඳව අදහසක් එහි සඳහන් කරලා නැහැ.

කාන්තා අයිතිය පිළිබඳව කථා කරන ඒ මනුෂ්‍යයාගෙන් මා ඉල්ලා සිටිනවා, කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා තමන් මොන තරම් දුරට කාන්තාවන්ට අපහාස කර තිබෙනවාද කියන එක ගැන ප්‍රශ්න කරන්න කියලා.

ඒ විතරක් නොවෙයි. ඔහු විටෙක අපේ රාමී සහෝදරයාට වැරදි වචන පාවිච්චි කරලා විවේචනය කරනවා. ඒ වාගේම උතුරෙන් ආපු අපේ පැත්තේ මන්ත්‍රීවරුන්ට ඉතා පහත් වචන පාවිච්චි කරනවා. ඔහු නියෝජනය කරන සංස්කෘතිය, ඔහු ඉගෙන ගත්ත සංස්කෘතිය තුළ වෙන්න ඇති, ඔහු එලෙස කටයුතු කරන්නේ කියන අදහස මට සමහර විට ඇති වෙනවා.

විශේෂයෙන් අපේ සභානායකතුමා සඳහන් කළා වාගේම අපි හැම කෙනාම දන්නවා, අපි ඇති තරම් කුළල් කා ගත්ත, අවුරුදු 30ක් යුද්ධයකට මැදි වෙච්ච රටක මිනිස්සු බව. අපි හැම කෙනාගේම ජීවිත තුළ ඇති තරම් තුවාල ඇති වෙලා තිබෙනවා. තවදුරටත් ඒ තුවාල පාරාගෙන, අවුස්සාගෙන, ඒ මත්තේම ගමන් කරනවාට වඩා සුවපත් සමාජයක් වෙනුවෙන් ගමන් කිරීම අප හැම කෙනාගේම වගකීමක් කියන එකයි මම විශ්වාස කරන්නේ. ඒ වාගේම අපි හැම කෙනාම දන්නවා, අපි උත්තර දෙනකොට ඒ උත්තර දෙන මනුෂ්‍යයාට වටිනාකමක් තිබෙන්න ඕනෑය කියන එක. මහ පාරේ නීතිය රකින පොලිස් නිලධාරින් එක්ක හැසිරෙන්න දන්නේ නැති, අවන්හලකට ගිහිල්ලා කෑම වේලක් හරියට ගන්න බැරි, අවන්හලේ මිනිස්සු එක්ක රණ්ඩු කරන මනුෂ්‍යයාට අපි උත්තර දෙනවා නම්, අපි ඔහු පිළිබඳව කථා කරනවා නම්, ඔහු පිළිබඳව අපි සමාජ මාධ්‍ය තුළ කථා කරනවා නම්, අපි ඊටත් වඩා පහත් කියන එක තමයි මගේ විශ්වාසය.

ඒ නිසා ධර්මය අනුව අපි හැම දෙනාටම වැදගත් වන හොඳ උදාහරණයක් මම කියන්නම්. අසල්වැසි කාන්තාවක් දිනපතාම නබිතුමාට කුණු වීසි කළා. නබිතුමා ඒ කුණු පැත්තකට දමලා තමන්ගේ ගමන ගියා. දවසක් නබිතුමාගේ පිටට කුණු නොවැටුණාම නබිතුමා සොයා බලනවා, අද දවසේ මට කුණු වැටුණේ නැත්තේ ඇයි කියලා. ඒ අසල්වැසි කාන්තාව ගැන සොයා බැලුවාම දැන ගන්නවා ඇය ලෙඩ වෙලා ලෙඩ ඇදේ ඉන්නේ කියලා. නබිතුමා ගිහින් ඇයගේ සුව දුක් විමසනවා. ඒක ඇයට දරාගන්න බැරි වෙනවා. මම මෙතෙක් කල් මඩ ගැහුවේ, කුණු වීසි කළේ මෙවැනි චරිතයකටද කියලා ඇය හිතනවා.

අපේ රට පෝෂණය කරන බුදු දහම තුළත් අපට කියා දී තිබෙන්නේ "වෛරයෙන් වෛරය නොසන්සිඳේ. අවෛරයෙන් වෛරය සන්සිඳේ" කියලායි. අපි වෛරයෙන් කටයුතු කරනවාද, එහෙම නැත්නම් වෛරය වෙනුවට ආදරයෙන් සමාජය වෙනස් කරනවාද කියන කාරණය අපි හැම කෙනාම කල්පනා කළ යුතුයි.

අනෙක් කාරණාව මේකයි. විශේෂයෙන් නැහෙනහිරින් ආපු මන්ත්‍රීවරු කිව්වා, අපි දේශපාලන පත්කිරීම් කරනවා කියලා. පල්ලිවල වකුප් සභාවලට දේශපාලන මැදිහත්වීම් කරනවාය කිව්වා. ඔබතුමන්ලා හාරා අවුස්සලා සොයා බලන්න. මම ඔබතුමන්ලාට අභියෝග කරනවා. ඉතිහාසයේ හැම දාම හජ් කමිටුවට පත් කරනකොට ඒ ඇමතිවරයාගේ හෙන්චයියෙකුව, ඔහුට මුදල් දීපු කෙනෙකුව හජ් කමිටුවට පත් කළා. හැබැයි, පළමු වතාවට මෙවර හජ් කමිටුවට අපිත් එක්ක දේශපාලනය නොකරපු, සමහරවිට අපට කිසිම විධියකට උදව් නොකරපු අය, සුදුසු අය පත් කරලා ඒ හජ් ක්‍රියාවලිය හරියාකාරව ක්‍රියාත්මක කිරීමට අපි හැම කෙනාම මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම අපි අදත් වැඩ කරන්නේ පසුගිය ආණ්ඩුවෙන් පත් කරපු වකුප් සභාවත් එක්කයි. හේතුව මොකක්ද? වෙන ආණ්ඩු වාගේ අපි බලයට ආපු ගමන් අපේ කිහිප දෙනෙකුව දමලා දේශපාලන පත්කිරීම් කරන්න අපි කටයුතු කළේ නැහැ. එහෙම කරන්න අපි දේශපාලනයට ආවේ නැහැ. අපට ඕනෑ මේ රටට යහපතක් කරන්නයි. මේ රටේ සියලු ක්ෂේත්‍රවලට යහපතක් කරන්නයි අපට අවශ්‍ය වෙන්නේ. ඒ නිසා අර කථා කරපු මන්ත්‍රීවරු කණ්ණාඩියක් ඉදිරියට ගිහින් බලන්න. අක්කරෙයිපත්තුව ටවුන් එකේ තිබෙන පල්ලියට කාවද පත් කරලා තිබෙන්නේ? නැටපිඩ්ඩිමුනේ පල්ලියට කාවද පත් කරලා තිබෙන්නේ? මහ ලොකුවට කථා කළාට කාත්තන්කුඩි පල්ලියේ පවා දේශපාලනය කරන මිනිස්සු. ඒගොල්ලන් දැන් ඒ විධියට කථා කරනවා. අපි ජාතික සමගිය වෙනුවෙන් මේ රට තුළ, "Welcome to my Masjid; එන්න අපේ පල්ලියට. අපි සංස්කෘතිය බෙදා ගනිමු" කියලා වැඩසටහන් මාලාවක් - 50කට වැඩිය - මේ රටේ රැගෙන ගියා. හැබැයි, එකම එක පල්ලියක් තුළ තමයි දේශපාලන මැදිහත්වීමක් තිබුණේ. ඒක තිබුණෙත් අදාළ මන්ත්‍රීවරයාගේ පල්ලියේ කියන එක විශේෂයෙන් මම මෙතැනදී මතක් කරන්න කැමැතියි.

ගරු සභානායකතුමා සඳහන් කළා වාගේ ඉදිරියේදී පළාත් පාලන මැතිවරණය එනවා. ඒ නිසා සමාජය අවුස්සන්න, ඒ ඇවිස්සීම මත්තෙන් තමන්ට ඡන්ද එකතු කරන්න අවශ්‍ය නිසා තමයි සමහරු දැන් මේ නොයෙක් ප්‍රකාශ කරන්නේ. විශේෂයෙන් කාන්තා හා ළමා කටයුතු ඇමතිවරිය එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට එකතු වෙලා කරුණු කාරණා පැහැදිලිව කියද්දීත්; මේ රටේ නීතියේ වෙනසක් ඇති කරනවා නම්, සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කරලා, අදහස් අරගෙන මේවා වෙනස් කරනවා කියලා ගෞරවයෙන් ප්‍රකාශ කරද්දීත්, නැවත නැවතත් තුච්ඡ විධියට මාධ්‍ය පාවිච්චි කරලා මේ රටේ ජනතාව නොමඟ යවන්න සමහරු උත්සාහ කරනවා.

ඔබතුමන්ලා දන්නවා, අද වෙනකොට සමහරු මාධ්‍යයට ඇවිල්ලා කියනවා මහ මොළකරු තමන් දන්නවාය කියලා. හැබැයි, අද අපේ ආදරණීය මිනිස්සු ඒවාට වටිනාකමක් දෙන්නේ නැහැ. මේ රටේ වුණු ඒ සිදුවීම පිළිබඳව ජාතික ජන බලවේගය නිසි පරීක්ෂණයක් පවත්වලා ඒ උදව්යට අනිවාර්යයෙන් දඬුවම් ලබා දෙන බව මම කියන්න කැමැතියි. අපි හැම කෙනාම ආගම, සංස්කෘතිය, පරිසරය පිළිබඳ සංවේදී වෙන්න ඕනෑ. ආගම, සංස්කෘතිය, පරිසරය පිළිබඳ සංවේදිතාවක් තිබෙන පිරිසක් නිසා තමයි මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට උතුරෙත්, නැහෙනහිරත්, කඳුකරයේත්, දකුණෙත්, බටහිරත් හැම කෙනාම එකතු වෙලා මේ ආණ්ඩුව පත් කර ගත්තේ. ඒ විශ්වාසය අපි අනිවාර්යයෙන්ම රකිනවා කියන එක මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.58]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2025 අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයට සම්බන්ධ වෙමින් අපි දින ගණනාවක් තිස්සේ ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය, කෘෂි කර්මාන්තය, නීති ප්‍රතිසංස්කරණය වැනි විවිධ විෂයයන් ගැන වාද විවාද කරමින් අදහස් ප්‍රකාශ කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම විශ්වාස කරනවා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කරන අද දවස ජාතියේ ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳව අවධානයට ලක් කරන දිනයක් කියලා. ඕනෑම පුද්ගලයෙකු ආර්ථික වශයෙන් ධනවත් වෙන්නත්, ඒ වාගේම ආර්ථික වශයෙන් දුප්පත් වෙන්නත් පුළුවන්. හැබැයි යම් පුද්ගලයෙකුගේ ආධ්‍යාත්මික ධනය අහිමි වුණොත්, සංස්කෘතික පවුරු පදනම් බිඳ වැටුණොත් ආර්ථික දුප්පත්කමෙන් ගොඩ යනවා වාගේ ඉක්මනට ගොඩ යන්න බැරි වන බවත් අපි මතක තබා ගත යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ අමාත්‍යාංශය ගැන කථා කරද්දී අපේ රටේ ප්‍රෞඪ ඉතිහාසය අමතක කරලා අපට කථා කරන්න බැහැ. විජය රජ්ජුරුවෝ අපේ රටට ගොඩ බැහැපු දවසේ පටන් සිංහල ජනාවාස ආරම්භ වුණා වාගේම මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකාගමනයත් එක්කම අපේ රට ධර්මද්වීපයක් බවට පත් වුණු බව අපේ ඉතිහාසය අපට කියා දෙනවා. ඒ සමඟම අපේ රටේ ආගමික හා සංස්කෘතික පදනමට ද ආරම්භයක් ලැබුණා.

අප කිසි ලෙසකින්වත් අමතක නොකළ යුතු කාරණයක් තමයි, අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් කරලා, නිදහස දිනා ගන්න කොට අපේ රටේ සියලු ජාතීන්, සියලු ආගමිකයන් එකට එකතු වුණු බව. එතැනදී අපට මතක් වෙනවා ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා අමද්‍යප ව්‍යාපාරයට නායකත්වය සපයමින් රට පුරා විශාල බෞද්ධ ප්‍රබෝධයක් ඇති කරන්න ක්‍රියා කරපු හැටි. ඒ වාගේම අපට අමතක කරන්න බැහැ, ශ්‍රී සරණංකර සංඝරාජ නාහිමිපාණන් වහන්සේ, හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමිපාණන් වහන්සේ වැනි ස්වාමීන්ද්‍රයන් වහන්සේලා බෞද්ධ පුනරුදය වෙනුවෙන් ඉටු කළ මහඟු සේවය. මාළිගාකන්ද විද්‍යෝදය පිරිවෙන, පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආදි අධ්‍යාපනික ආයතන ඇති කිරීම, ඒ වාගේම මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පානදුරාවාදය සිදු කිරීම ආදිය බෞද්ධ පුනරුදයේ සුවිශේෂ සන්ධිස්ථාන ලෙස අපට මතක් වෙනවා.

ඕල්කට්තුමා අපේ ගාලු වරායෙන් ලංකාවට ගොඩ බැහැලා ලංකාවේ ප්‍රථම දහම් පාසල ගාල්ලේ -ගරු ඇමතිතුමනි, ඔබතුමාගේත්, අපේත් පළාතේ- විජයානන්ද පිරිවෙන කේන්ද්‍ර කරගෙන ආරම්භ කළ හැටිත්, අදටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන බෞද්ධ පාසල් වන කොළඹ ආනන්ද විද්‍යාලය, මහනුවර ධර්මරාජ විද්‍යාලය, ගාල්ල මහින්ද විද්‍යාලය වාගේ බෞද්ධ පාසල් ආරම්භ කළ හැටිත් අපට මතක් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එවැනි ඉතිහාසයකට උරුමකම් කියන අපට අද රටක් ලෙස අහන්න, දකින්න ලැබෙන දේවල් ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුවම තිබෙනවා. මේ ඇති වී තිබෙන තත්ත්වය සැලකිල්ලට ගන්නා විට ඔබතුමාගේ අමාත්‍යාංශයට පැවරී තිබෙන්නේ ලොකු කාර්යභාරයක් වාගේම, ඔබතුමාට ඉටු කරන්න තිබෙන්නේ ලොකු වගකීමක් කියලා අපට පෙනෙන්නට තිබෙනවා.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බෞද්ධාගම ආරක්ෂා කොට පෝෂණය කිරීමට අපි සියලුදෙනා බැඳී සිටිනවා. ඒ වාගේම අනෙකුත් ආගම් ඇදහීමට ඇති අයිතියටත් අපි සියලුදෙනා ගරු කරනවා. රටේ සාරධර්ම, විනය, සදාචාරය ශිෂ්‍ය ලෙස පිරිහී තිබෙන ප්‍රවෘත්ති තමයි අපට දිනපතා කන වැටෙන්නේ. එවැනි වකවානුවක ආගම දහමට අපේ සමාජය වඩ වඩාත් සමීප කරවීමට මේ අමාත්‍යාංශයෙන් මීටත් වඩා අවධානය යොමු කරන්න දැන් කාලය ඇවිත් තිබෙනවා කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රට පුරා බෞද්ධ විහාරස්ථාන 12,920ක් තිබෙනවා. ඒවා අතරින් ලියාපදිංචි විහාරස්ථාන තිබෙනවා 10,415ක් විතර. රට පුරා බෞද්ධ භික්ෂූන් වහන්සේලා 43,000ක් පමණ වැඩ සිටිනවා. සමහර විට ඊට වඩා අඩු වෙන්න පුළුවන්; එහෙම නැත්නම් ඒ ගණනම වෙන්නත් පුළුවන්. නමුත් ඊට වඩා වැඩි වෙන්න නම් විධියක් නැහැ කියලායි මට හිතෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද අප දකින බරපතළ ගැටලුවක් තමයි, අපේ ශාසනයේ ඉදිරි පැවැත්මට අවශ්‍ය තරම් භික්ෂූන් වහන්සේලා නොමැති වීම.

සමහර පන්සල්වල වැඩ ඉන්නේ එක හාමුදුරුවන් වහන්සේ නමක් පමණයි. සමහර පන්සල්වල වැඩ සිටින්නට එක නමක්වත් නොමැති නිසා එම පන්සල් වැහිලා ගිහින් තිබෙනවා. දායක පිරිස දෙස බලන විට, අද එක හාමුදුරුවන් වහන්සේ නමකට දායකයන් විශාල පිරිසකගේ ඕනෑ එපාකම්, අවශ්‍යතා ඉටු කරන්නට සිදු වෙලා තිබෙනවා. තවත් ප්‍රශ්නයක් තමයි දැන් ශාසනයට අලුතින් පිරිස් එකතු නොවීම. වැඩ සිටි ස්වාමීන් වහන්සේලාගෙන් යම් පිරිසක් උපැවිදි වීමත් මේ තත්ත්වයට මූලික හේතුවක් වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ජනතාවගේ පැත්තෙන් බැලුවොත්, දායකයන් හැටියට ඒ අය මුහුණ දෙන ප්‍රශ්නයක් තිබෙනවා. එය තමයි, සිවුපසයෙන් උපස්ථාන කිරීමේදී ඒ අයට මුහුණ දීමට සිදුව තිබෙන ආර්ථික ගැටලු; අධික ජීවන බර. ඒ ප්‍රශ්නයත් අද ඒ අයට බලපා තිබෙනවා, දානයක් දෙන්න යද්දී පවා. මිනිස්සු අද එවැනි අමාරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ තත්ත්වය හමුවේ විහාරස්ථානවල පවතින අඩු පාඩු ගැනත්, විශේෂයෙන්ම පිරිවෙන් අධ්‍යාපනය සුරකින්න අවශ්‍ය කටයුතු කිරීම ගැනත් ඔබතුමාගේ අමාත්‍යාංශයෙනුත් අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

අද අපේ රටේ වැඩ සිටින බහුතරයක් තරුණ ස්වාමීන් වහන්සේලා දෙස බලන කොට පෙනෙනවා, උන් වහන්සේලා අධ්‍යාපනික වශයෙන් සුවිශේෂ දක්ෂතා පෙන්වන බව. උසස් අධ්‍යාපනය ලබන්න ලොකු උනන්දුවක් දක්වනවා වාගේම, ඒ සඳහා වන දක්ෂතා ද අපේ තරුණ ස්වාමීන් වහන්සේලාට තිබෙන බව හැම පැත්තෙන්ම පෙනෙන්නට තිබෙනවා. ඒ නිසා අපේ තරුණ ස්වාමීන් වහන්සේලාට සිංහල සහ පාලි භාෂාව පමණක් නොව, ඉංග්‍රීසි භාෂාව සහ අනෙකුත් ජාත්‍යන්තර භාෂා ද වැඩිපුර ඉගෙන ගැනීම සඳහා තවතවත් අවස්ථා ලබා දෙන්න කටයුතු කරනවා නම් බොහොම වටිනවා. උන්වහන්සේලාට ලෝකය පුරා වැඩම කරලා ධර්ම ප්‍රචාරයේ යෙදෙන්නටත් අවස්ථා වැඩි වශයෙන් ලැබෙන්න එය ඉවහල් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ බෞද්ධ දහම් පාසල් ගැන කථා කළොත්, දිස්ත්‍රික්ක 22ක ශාසනාරක්ෂක බල මණ්ඩල 328ක බෞද්ධ දහම් පාසල් 10,646ක් පවත්වාගෙන යනවා. බෞද්ධ දහම් පාසල්වල දහම් පාසල් ගුරුවරු ඉන්නවා 123,900ක් විතර. බෞද්ධ දහම් පාසල්වල ඉගෙන ගන්නා අපේ දරුවෝ දහඅටලක්ෂයක් විතර හැම ඉරිදාම දහම් පාසල් අධ්‍යාපනය ලබන්න පන්සල්වලට යනවා. අපේ හාමුදුරුවන් වහන්සේලා මේ දහම් පාසල් නඩත්තු කරන්නේත් හරි අමාරුවෙන්. ඒවා වැඩි දියුණු කරන්න අමාත්‍යාංශයේ මැදිහත් වීම පුළුවන් තරම් ලබා දීම ගැන අවධානය යොමු කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් හුඟක් දහම් පාසල්වල ඩෙස්ක්, බංකු හිඟයක් තිබෙනවා; අනෙකුත් පහසුකම්වලත් හිඟයක් තිබෙනවා. ගොඩනැඟිලි පහසුකම් නැතුව පන්සලේ තැනින් තැන, ඒ වාගේම ගස් යට පවා දරුවන් දහම් පාසල් අධ්‍යාපනය ලබන හැටි අපි ගම්වල ඇවිදින කොට හුඟක් තැන්වලදී දකිනවා. ඒවා ගැන සොයන්න වැඩ පිළිවෙළක් ඇති කරන්න.

මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, වෙනමම දහම් පාසල් අරමුදලක් ඇති කරන්න පුළුවන් නම්, ඔබතුමාගේ කාලය තුළ දහම් පාසල්වලට අත දෙන්න හුඟක් දුරට පුළුවන්කම ලැබෙයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම වැඩි වෙලාවක් ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. තවත් කථිකයෝ කිහිප දෙනෙක් බලාගෙන ඉන්නවා, කථා කරන්න. බෞද්ධ දහම් පාසල් වාගේම අනෙකුත් ආගමික දහම් පාසල් දියුණු කිරීම ගැනත් රජයේ අවධානය යොමු කළ යුතුයි, මේ අමාත්‍යාංශය බෞද්ධ විතරක් නොව සියලු ආගම් වෙනුවෙන් පිහිටුවපු අමාත්‍යාංශය වන නිසා. ගරු ඇමතිතුමනි, හින්දු ආගමික දහම් පාසල් 2,000ක්, 2,500ක් පමණ පවතින බවත්, කතෝලික දහම් පාසල් 1,600ක් පමණ පවතින බවත් ඉස්ලාම් ඇතුළු සියලු ආගම්වලට සම්බන්ධ දහම් පාසල් 17,000ක්, 20,000ක් විතර අපේ රටේ තිබෙන බවත් අපට තොරතුරුවලින් දැනගන්න ලැබී තිබෙනවා.

මේ පවතින සංස්කෘතික පිරිහීම හමුවේ ආගමික කටයුතුවලට මීට වඩා ප්‍රතිපාදන ඔබතුමාගේ අමාත්‍යාංශයට මේ අය වැයෙන් වෙන් කළා නම් ඇත්ත වශයෙන් වටිනාකමක් තිබෙනවා. මේ වෙන් කරපු මුදල දහම් පාසල් ඔක්කෝටම බෙදිලා යන කොට සොච්චම් මුදලක් තමයි එක දහම් පාසලකට වෙන් කරන්න පුළුවන්කම ලැබෙන්නේ. අද රටේ තිබෙන වාතාවරණයත් එක්ක, ජනතාව වඩ වඩාත් දහමට ළං කරගත යුතු කාලයක, දහම් අධ්‍යාපනයේ වටිනාකම පෙනෙන කාලයක සංස්කෘතික හා ආගමික කටයුතු සඳහා මීට වඩා රජය පැත්තෙන් අවධානය යොමු වුණා නම් සුදුසුයි කියලා මම විශේෂයෙන් කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දිනපතා රට පුරා වෙඩි තැබීම්වලින් ජීවිත අහිමි වන හැටි අපට අහන්න සිදු වෙනවා. එවැනි සිදුවීම් පිළිබඳව උදේට එකක් ඇහෙනවා; ආපහු රෑටත් ඇහෙනවා; ඊළඟ දවසේත් ඇහෙනවා. අද ඒවා තමයි සීමාවක් නැති විධියට අහන්න ලැබෙන්නේ. ඒ වාගේම සියදිවි නසා ගැනීම් ද වාර්තා වෙනවා. ගම්වල මිය ගිය අයගේ අවසන් කටයුතු සිදු වන අවස්ථාවන්ට ගියාම අපි දකිනවා විශාල පිරිසක් ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන බව. වෛරී සිතුවිලිවලින් පිරුණු සමාජයක් බවට මේ සමාජය දැන් පත් වෙලා තිබෙනවා. මේ සියල්ල ගැන බලද්දී මානසිකව ගිනිගත් සමාජයක් බවට මේ සමාජය පත් වෙලා තිබෙන නිසා මේ අමාත්‍යාංශයට ලොකු කාර්යභාරයක් ඉෂ්ට කරන්න තිබෙනවා කියන එක තමයි අපට නැවත නැවතත් කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි ශත වර්ෂ ගණනාවකට පෙර අතීතය ගැන කල්පනා කර බලමු. ඒ අතීතයේ නීතියත්, උසාවියත්, පොලීසියත් නොතිබුණු සමාජය පාලනය කළේ ආගමික ශික්ෂණයෙන් සහ සංස්කෘතික රාමුවෙන් බව අපි හොඳින්ම දන්නවා.

ඔක්කෝම දේවල් නීතියට භාර දීලා විතරක් මේක කරන්න පුළුවන්කමක් නම් නැහැ. මාංචු දාලා දිනපතා රට පුරා අධිකරණවලට අරගෙන එන දහස් ගණන් පිරිස හිරේ දාලාවත්, කන්දකාඩු යවලාවත් මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා ආගමික සංස්ථාවේ සහාය ලබාගෙන ආධ්‍යාත්මික ගුණ වගාව රට තුළ පෝෂණය කිරීමට දැන් කාලය එළැඹිලා කියන එක තමයි පුන පුනාම අපට කියන්න තිබෙන්නේ. ඒ නිසා මේ අමාත්‍යාංශය සුළු පටු අමාත්‍යාංශයක් හැටියට මම දකින්නේ නැහැ. ඉස්සර සමහරු හිතුවා, බුද්ධ ශාසන, අරක මේක කියලා කිව්වාම මොකක්ද මේකෙන් කරන්න පුළුවන් කියලා. අද දවස දිහා බලනකොට, ඒ වාගේම අද රට පත්වෙලා තිබෙන තත්ත්වය ගැන හිතනකොට මේ අමාත්‍යාංශය ප්‍රධානම අමාත්‍යාංශයක් හැටියටයි මම දකින්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමියගෙන් වෙන දා වාගේ වේලාව ඉල්ලන්නේ නැතුව මම අද වෙලාවට ඉස්සෙල්ලා කථාව අවසන් කරන්නම්.

මට වෙන් වූ කාලය අවසන් කියලා කියන නිසා අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ගැන මම සතුටු වෙනවා. ඔබතුමාත් අපේ හිනිදුම් පත්තුවේ කෙනෙක්. ඒ වාගේම ගමේ නම නමේ මුලට යොදා ගත්ත දුර්ලභ ගණයේ පුද්ගලයෙක්. ඉතින්, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ඇමතිවරයා හැටියට හිනිදුම් පත්තුවෙන් බිහි වුණු ඔබතුමාට, අපේ රට අගාධයට පත්වෙලා සාරධර්ම පිරිහී තිබෙන මේ වෙලාවේ රට තුළ ආගමික පුනරුදයක් ඇති කරන්න ශක්තිය, ධෛර්යය ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියට කීකරුව නියමිත වෙලාවට මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ස්තුතියි.

ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.11]

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරද්දී, පරිසර අමාත්‍යාංශයේ තිබෙන වගකීම් අනුව අනෙක් අමාත්‍යාංශවලට වඩා එහි වෙනසක් තිබෙන බව කියන්න ඕනෑ. අනෙක් අමාත්‍යාංශ, අමාත්‍යාංශය තුළ

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

සංවර්ධනය වෙමින්, ගොඩනඟමින් ඉදිරියට යන්න ඕනෑ. හැබැයි, පරිසර අමාත්‍යාංශය ඊට වඩා වෙනස්කමක් දරනවා. ස්වභාවධර්මය තුළින් ලැබුණු දැවැන්ත සම්පත් සමුදායක් රැකගෙන, අපේ සමාජයේ මානව වුවමනා වෙනුවෙන් ඒවා සුරක්ෂිතව කළමනාකරණය කරගෙන මතු පරම්පරාවට දායාද කිරීමේ මහඟු වගකීම තමයි මේ අමාත්‍යාංශයට පැවරිලා තිබෙන්නේ. මේ වගකීම පැවරුණාම, මේ අමාත්‍යාංශයේ කාර්යභාරය ඉෂ්ට කරන්න අමාත්‍යාංශයට තිබෙන ආයතන මොනවාද කියලා ඉතාම හොඳින් හඳුනාගත යුතුයි. මීට කාලයකට පෙර සිටම තිබුණු දෙයක් තමයි මේ විෂය පථය ඇතුළත් කරන්නේ මොන අමාත්‍යාංශයටද කියලා බලන්නේ නැතුව විවිධ අමාත්‍යාංශ ගොඩනඟමින්, ඒ විවිධ ආයතන අමාත්‍යාංශවලට ඇතුළත් කරමින් පරිසරය සම්බන්ධ හිතුවක්කාරී ගමනක් යෑම. හැබැයි, කැබිනට් මණ්ඩලයේ සාමූහික එකඟතාව මත පරිසරයට අදාළ විෂය පථය වෙන් කරගෙන, ඒ වාගේම ගරු ජනාධිපතිතුමාගේ දැක්මට සරිලන ආකාරයෙන් පරිසර අමාත්‍යාංශයට අදාළ ආයතන 12ම එක සෙවණක් යටතට ගේන්න අපට පුළුවන්කම ලැබුණා. මේ රටේ පරිසරවේදීන්ට එය දැවැන්ත ශක්තියක්, ධෛර්යයක් වුණා. තැන් තැන්වල වෙන වෙනම සටන් කරන්න තිබුණු සීමාව ඉවත් කොට, එක තැනකට ඇවිල්ලා ඉලක්ක සහගතව පරිසරය රකින්න, පරිසරයට අදාළ කළමනාකරණ කටයුතු කරන්න, අනාගත පරම්පරාවට පරිසරය උරුම කර දෙන ක්‍රියාවලියට මැදිහත් වෙන්න ඒ හරහා පුළුවන්කම ලැබුණා.

ගෝලීය වශයෙන්, විශ්වීය වශයෙන් ගත්තාම, විවිධ පරිසර පද්ධති අතර එකින් එකට දැවැන්ත බැඳීමක් තිබෙනවා. ඒ බැඳීම නිසාම පරිසර පද්ධතියක් තව දෙයකින් ගලවන්න බැහැ. හැබැයි, කළමනාකරණයටත්, අධ්‍යයනයටත් ඇති පහසුව තකා අපි ලාංකීය පරිසර පද්ධතිය වෙන් කරලා හඳුනාගන්නට ඕනෑ. ඒක අමාරු වැඩක්. හැබැයි, ඒ පරිසර පද්ධතිය හඳුනා ගැනීමේදී ඉතාම වැදගත් වන සුවිශේෂී කාරණා 8ක් තිබෙනවා. මේ කාරණා 8 සම්බන්ධයෙන් අපේ රටේ ජනතාව, මහජන නියෝජිතයන්, උගතුන්, බුද්ධිමතුන්, ඒ විශේෂඥ දැනුම තිබෙන අය දැඩි අවධානයකින් සිටින බව අපි දන්නවා. ඒ කාරණා 8කට වැඩි බොහෝ ප්‍රමාණයක් තිබෙන්නට පුළුවන්. නමුත් අවම වශයෙන් මේ කාරණා 8 සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරන්නට අවශ්‍යයි.

ඒ කාරණා 8 ගත්තොත්, අපි මොන පදනමින් ජීවත් වුණත්, අපේ රට මධ්‍ය කඳුකරයක් සහිත රටක්. මේ මධ්‍ය කඳුකරය තුළ අපි ජීවත් වෙන්නේ කොහේ වුණත් අපට උඩින් මහා දැවැන්ත කඳු වැටියක් තිබෙනවාය කියන හැඟීම අප තුළ තිබිය යුතුයි.

ඊළඟ කාරණය මේකයි. අපේ රටට ආකාර තුනකට වර්ෂාපතනය ලැබෙනවා. ඊසානදිග මෝසම් වැසි කන්දේ එක පැත්තකට වැටෙනවා. නිරිතදිග මෝසම් වැසි තව මාස 4ක් කන්දේ අනෙක් පැත්තට ලැබෙනවා. ඒ වාගේම පිළිවෙළක් නැති සුළි කුණාටු, අවපාත විධියට තව මාස 2 බැගින් කන්දේ දෙපැත්තට වැසි ලැබෙනවා. මෙන්න මේ විධියට මෝසම් වැසිවලින් ඉතාම පොහොසත් රටක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා. මේ විධියට අපේ රටේ මධ්‍ය කඳුකරයට වැටෙන වර්ෂාව, ගංගා 103කින්, අතු ගංගා 40කින් කඳුකරයේ සිට රට පුරාම ගලාගෙන යනවා; මතුපිටින් ගලාගෙන යනවා. ඒ වැටෙන වැහි බින්දුව, බින්දුව පොළොවට උරාගෙන, පොළොව අභ්‍යන්තරයේ ජල තටාකයක් නිර්මාණය කරගෙන මුහුදුබඩ ප්‍රදේශවලට ඇවිත් sponge එකකට වාගේ උරාගෙන ක්‍රමානුකූලව දිය සීරාව මුහුදට ගලා බසිනවා. අපේ රටේ මතුපිටින් සහ පොළොව අභ්‍යන්තරයෙන් මේ විධියට දැවැන්ත ජල ධාරාවක් ගමන් කරන්න පටන් ගත්තොත්, මේ පස් කන්ද දැවැන්ත අවදානමකට ලක් වෙනවා. අන්න ඒක බේරා ගැනීම වෙනුවෙන් අපේ රට වටේ වැටක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ තමයි කොරල් පරය. මේ කොරල් පරය සජීවී කොරල් පරයක්. වැවෙමින් පවතින, මැරෙමින් පවතින මේ සජීවී ශීඝ්‍ර උෂ්ණත්ව වෙනස්වීමක් තිබෙනවා. වැල්ලවායේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 32යි. එතැන් සිට කිලෝමීටර 30ක් යනකොට බෙරගලදී සෙන්ටිග්‍රේඩ් අංශක 12 දක්වා උෂ්ණත්වය අඩු වෙනවා. බෙරගල සිට කඳු නැඟගෙන හපුතලේට කිලෝමීටර 8ක් යනකොට උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 8ට අඩු වෙනවා. සියල්ල කිලෝමීටර 38යි. ඒ දුර ප්‍රමාණය තුළ සෙන්ටිග්‍රේඩ් අංශක 32 සිට සෙන්ටිග්‍රේඩ් අංශක 8 දක්වා උෂ්ණත්වය අඩු වෙනවා. කෙටි දුරක් ඇතුළත මෙවැනි දැවැන්ත ආකාරයට උෂ්ණත්වය අඩුවීම ගත්තාම, ඒ ඒ කිලෝමීටරයෙන් කිලෝමීටරයට, මීටරයෙන් මීටරයට, සෙන්ටිමීටරයෙන් සෙන්ටිමීටරයට අතිදැවැන්ත ලෙස සත්ව වෙනස්වීමක් දකින්න ලැබෙනවා. පොළොව මත බඩගාන සත්තු, ඉගිලෙන සත්තු, කෘමි සත්තු, මාළු වර්ග, කටුසු වර්ග, බත් කූරන් වර්ග වැනි වෙනස් වෙනස් දේවල් හඳුනාගන්න පුළුවන්කම ලැබෙනවා. පොළොව අභ්‍යන්තරයේ සෙන්ටිමීටරයෙන් සෙන්ටිමීටරයට විවිධ ශාක සතත්ව දකින්නට ලැබෙනවා. මෙන්න මේ විධියේ රටක් අපට තිබෙනවා. අපි ඒකට කියනවා, මහා දැවැන්ත ජෛව විවිධත්වයක් තිබෙන රටක් කියලා.

ඒ වාගේම අපේ රට ආලෝකය අනුව දෙකට බෙදිලා තිබෙනවා. හරියට පැය 12ක් ආලෝකය තිබෙන, පැය 12ක් අඳුර තිබෙන රටක්, මේ රට. මේ කාරණා සියල්ලම ගත්තාම, අපේ රටේ පරිසර පද්ධතිය අපට ඇස් පනාපිටම දකින්නට ලැබෙන සජීවී පරිසර පද්ධතියක්. මෙන්න මෙවැනි පරිසර පද්ධතියක් තුළ අර මම කථා කරපු කාරණා 8ට අදාළව ලංකාව තුළ වෙන වෙනම ඒවාට අදාළ පරිසරවේදීන් නිර්මාණය වෙලා තිබෙනවා. ඒවා රකින්නට පරිසරවේදීන් තමන්ගේ දැනුමෙන් ඒවාට අදාළ නිර්ණායක සකස් කරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් පරිසර සමිති හැදිලා තිබෙනවා. තනි තනිවම තමන්ගේ ක්ෂේත්‍රය තුළ අරගළ කරපු ඒ පරිසරවේදීන් එක තැනකට ගෙනැල්ලා පරිසර අමාත්‍යාංශය තුළ වෛද්‍ය දම්මික පටබැඳි ඇමතිතුමාගේ මූලිකත්වය යටතේ, ආචාර්ය ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමාගේත් මූලිකත්වය යටතේ පරිසරය නියාමනය කිරීම සඳහා මේ පරිසරවේදීන් එකතු කරලා තිබෙනවා. ඒක නිසා පරිසර පද්ධතියක් හැටියට ඉතාම යහපත් තත්ත්වයක්, පරිසරවේදීන්ට යම් සැහැල්ලුවක්, පරිසරය වෙනුවෙන් කරන අරගළය වෙනුවට පරිසරය රකින්න අමාත්‍යාංශය සමඟ බද්ධ වෙන්න අවස්ථාවක් නිර්මාණය කරලා තිබෙනවා. මේක අවුරුදු ගණනක් අපේ රට තුළ සිද්ධ නොවුණු දෙයක්. ඒ නිසා පරිසරවේදීන් විධියට අපි බලාපොරොත්තු වෙනවා, මේ ලැබුණු අවස්ථාව තුළින් අපේ රටේ ශිෂ්‍යයන්ට, අපේ රටේ පරිසරවේදීන්ට, පරිසරය සම්බන්ධව අධ්‍යයනය කරන අයට ඉතාම වැදගත් කාර්යාවලියක් ඉෂ්ට කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි. කථාව අවසන් කරන්න.

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මෙන්න මේ සියලු අවශ්‍යතා පිළිබඳව අපි කථාබහ කරද්දී, ඒ වෙනුවෙන් දේශපාලන නායකත්වය ඉතාම වැදගත් වෙනවා. ඒ දේශපාලන නායකත්වය යටතේ පරිසරයට අදාළව මුදල් වෙන් කරනකොට, ඒ ඒ පරිසර පද්ධති වෙන වෙනම හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබීම සතුටට කරුණක්. මේ සියලු කරුණු ඒක රාශි කරගත්තාට පසු, මේ රටේ නිර්මාණය වන පුනරුදය යථාර්ථයක් බවට පත් කරගන්න පුළුවන් කියා අපි විශ්වාස කරනවා.

සියලුදෙනාටම ස්තුතියි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Hon. Deputy Chairperson, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රන්වල මැතිතුමා ඉතාම හොඳ කථාවක් කළේ.

ඔබතුමාට ආචාර්ය උපාධිය තිබෙන්නේ ඒ ක්ෂේත්‍රයෙන්ද? ඒ ආචාර්ය උපාධිය තවම අරගෙන නැහැ නේ. ඔබතුමා මොකක්ද ඒ සම්බන්ධව කියන්නේ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඒක point of Order එකක් නොවෙයි නේ. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
උපාධිය මොකක්ද කියලා කියන්න, කියන්න. කෝ, ආචාර්ය උපාධිය?

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මොකක්ද point එක? පාර්ලිමේන්තුවේ කාලය කන්න එපා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.19]

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වසර මිලියන ගණනකට ප්‍රථම පෘථිවිය බිහි වුණාට පසුව තමයි මේ මිහිමත මිනිසා බිහි වුණේ. මිනිසා බිහි වෙලා වසර 250ක වාගේ කාලසීමාවක් තුළ මිහිමත තිබුණු දැවැන්ත සම්පත්වලින් සියයට 50කට වඩා භාවිත කර අවසන්ව තිබෙනවා. මුළුමහත් ලෝකය තුළ ජීවත් වන සකලවිධ ජනතාව, සියලු ආණ්ඩු පෘථිවියේ අනාගත පැවැත්ම පිළිබඳව ප්‍රශ්නාර්ථයක් තමන් ඉදිරිපිට තබාගෙන ඉන්නවා. විවිධ දේශගුණික විපර්යාස, මුහුදු මට්ටම ඉහළ යෑම්, කෙටි කාලයක් තුළ සිදු වන ස්වාභාවික විපත්, පෘථිවිය දැවැන්ත විධියට උණුසුම් කරන කාබන් විමෝචනය, සමස්ත ජීව පද්ධතිය අභියෝගයට ලක් කරමින් සිදු වන වායු දූෂණය, කිසිදු ආකාරයකින් සාධාරණීකරණය කළ නොහැකි මට්ටමට සාගරයට මුදා හරින ප්ලාස්ටික්, පොලිතින් ප්‍රමාණයන් ආදී මේ සියලු දේවල්වලින් ලෝකයේ පරිසර පද්ධතිය විනාශ වෙමින් පවතිනවා. ඒ සියලු ව්‍යසන සිදු වන කුඩා දූපත් රාජ්‍යයක තමයි ඔබ අපි ජීවත් වන්නේ.

රටක් විධියටත්, මේ රටේ බලයට පත් වූ ආණ්ඩුවක් විධියටත් අපට සකලවිධ පරිසර පද්ධතියට සිදු වන විනාශයෙන් මේ රට ගලවා ගැනීම පිළිබඳව දැවැන්ත වගකීමක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අන් කිසිදු විෂයකට වඩා ඉතා බරපතළ සමාජ වගකීමක් දරාගෙන තිබෙන, අන් කිසිදු අමාත්‍යාංශයකට වඩා මුළුමහත් මිනිස් සංහතියේ අනාගතය පිළිබඳව වගකීමක් තිබෙන අමාත්‍යාංශයක් තමයි පරිසර අමාත්‍යාංශය කියන්නේ. ඒ නිසා මේ අමාත්‍යාංශයට පැවරෙන ඓතිහාසික වගකීම ලොකු එකක්. පසුගිය කාලපරිච්ඡේදය තුළ කිසිදු සංයුක්ත සැලැස්මකින් තොරව, ඉතාම අවිද්‍යාත්මකව, ඒ විෂය පිළිබඳව අවබෝධයක් රහිත මිනිස්සු මේ පරිසර අමාත්‍යාංශයට නායකත්වය දුන් බව අපි දන්නවා. ඒ වැරදි ඉතිහාසය වෙනස් කරලා ලංකා ඉතිහාසයේ පළමු වතාවට අද පරිසර ක්ෂේත්‍රයට අදාළ කරන ආයතන පද්ධති සියල්ල එක අමාත්‍යාංශයක් යටතට ගෙනැල්ලා තිබෙනවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව කියන දෙපාර්තමේන්තු පහම එක වහලක් යටට ගෙනැල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඊට අමතරව, ව්‍යවස්ථාපිත මණ්ඩල විධියට තිබෙන මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, ජල සම්පත් මණ්ඩලය කියන මණ්ඩල තුනම එක වහලක් යටට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම, රාජ්‍ය දැව සංස්ථාව කියන ස්වයං අරමුදල් මඟින් පාලනය වන සියලු ආයතන එක පද්ධතියක් යටතට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම මහජන මුදලින් පාලනය කරන තවත් ආයතන 5ක් මේක ඇතුළට ගෙනැල්ලා තිබෙනවා. පරිසරවේදීන් පරිසරය සම්බන්ධයෙන් මැදිහත් වෙද්දී ඔවුන්ට බලපෑ ප්‍රබලම කාරණය, ඔවුන්ට තිබුණු ලොකුම දුක්ගැනවිල්ල, ලොකුම චෝදනාව තමයි, එක ආයතනයක් ඇතුළේ තීන්දු තීරණ නොගැනීම. පරිසරය අනාරක්ෂිත වෙන්න, සතුන්ගේ ජීවිත අනාරක්ෂිත වෙන්න, පරිසර පද්ධතිය පිළිබඳ වැදගත් තීන්දු තීරණයක් ගන්න බැරි වෙන විධියට මේ අවිද්‍යාත්මක කාරණය බලපා තිබුණා. ඒ නිසා අපි ලංකා ඉතිහාසයේ පළමු වතාවට ඒ වැදගත් තීන්දුව අරගෙන තිබෙනවා.

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. පරිසර පද්ධතිය රැක ගැනීම වෙනුවෙන් ගොඩ නහා තිබෙන පරිසර අමාත්‍යාංශය පසුගිය කාල පරිච්ඡේදයේ මැදිහත් වුණේ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීමේ අරමුණින් නොවෙයි.

ඔවුන්ට පැවරුණු වගකීමට අනුව නොවෙයි ඔවුන් හැසිරුණේ; තමන්ට පැවරිච්ච වගකීමට ප්‍රතිවිරුද්ධ වගකීමක් තමයි ඔවුන් ඉෂ්ට කළේ. ඒ නිසා පරිසරය ආරක්ෂා කරන්න මැදිහත් වෙන ක්ෂේත්‍රයේ සිටින බුද්ධිමතුන්ට, විශේෂඥයන්ට, පරිසරවේදීන්ට, ප්‍රාදේශීය මට්ටමේ සිටින පරිසර ක්‍රියාකාරිකයන්ට හැමවිටම ආණ්ඩුවේ ක්‍රියාමාර්ගත් එක්ක හැප්පෙන්න සිද්ධ වුණා. එම නිසා ඒ ඓතිහාසික ප්‍රතිවිරෝධය වෙනස් කරලා මෙවර ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් ගොඩ නහා තිබෙන පරිසර අමාත්‍යාංශය ඉතිහාසයේ ප්‍රථම වතාවට ඒ පරිසරවේදීන්, පරිසර ක්‍රියාකාරිකයන්, ක්ෂේත්‍රයේ සිටින විශේෂඥයන් එකතු කර ගනිමින් කමිටු 10ක් ගොඩ නහා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එයින් අදහස් වන්නේ මොකක්ද? ආණ්ඩුවේ අපේක්ෂාවත්, පරිසර අමාත්‍යාංශයේ අපේක්ෂාවත්, ඇමතිතුමාගේත්, නියෝජ්‍ය ඇමති සහෝදරයාගේ අපේක්ෂාවත්, පරිසරවේදීන්ගේ අපේක්ෂාවත් කියන මේ හැම අපේක්ෂාවකම තිබෙන්නේ එකම අරමුණයි. ඒ තමයි, ලංකාවේ මේ පරිසර පද්ධතිය රැකගෙන අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කරදීම. ඒ වෙනුවෙන් අපි කමිටු 10ක් ගොඩ නහා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි ඉදිරියේදී මෙන්න මෙවැනි ආකාරයට කටයුතු කරන්න සූදානම් වෙනවා. පරිසර අමාත්‍යාංශය මැදිහත් වෙලා සිදු කරන සියලුම සංවර්ධන ව්‍යාපෘතිවලදී, පරිසර තක්සේරු ඇගයීම් වාර්තා කියන මූලික බලපත්‍ර ලබාදෙන ලියවිල්ල; EIA report එක සකස් කරලා අවසන් වෙලා ඒ ක්‍රියාවලිය ආරම්භ වුණාට පස්සේ තමයි පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් ස්ථානීය පරීක්ෂාවට යන්නේ. පරිසර ආරක්ෂණ ඇගයීම වාර්තාව අමාත්‍යාංශයට ලැබෙන්න කලින් එම ස්ථාන නිරීක්ෂණය කරමින්, එය අදාළ කරන සංවර්ධන ව්‍යාපෘතියට සුදුසු බිමක් ද, ආරක්ෂා කළ යුතු බිමක් ද, නැත්නම් වෙනත් කටයුත්තක් සඳහා පාවිච්චි කළ යුතු බිමක් ද කියන එක පිළිබඳව පරිසර අමාත්‍යාංශය මැදිහත් වෙලා, මධ්‍යම පරිසර අධිකාරිය මැදිහත් වෙලා, කලින් ඔවුන්ට උපදෙස් ලබාදෙන තීන්දු තීරණ අපි අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි, දෛනිකව මතුවන ගැටලුවලට මැදිහත් වන පරිසර අමාත්‍යාංශයක් වෙනුවට, සැලසුම් සහගතව පරිසරය පිළිබඳව මැදිහත් වන සැලැස්මක් අපි ගොඩ නහා තිබෙනවා. ඒ නිසා ඉදිරි කාලය තුළ පරිසර අමාත්‍යාංශය විසින් ගන්නා වැදගත් ප්‍රතිපත්තිමය තීන්දු තීරණ හරහා අපට මේ පරිසර ක්ෂේත්‍රයට මැදිහත්වීමේ හැකියාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ තිබෙන වැදගත්ම පරිසර පද්ධතියක් තමයි වනාන්තර. දැනට පරිසරවේදීන්ගේ වාර්තාවලට අනුව අපේ රටේ සමස්ත බිම් ප්‍රමාණයෙන් වනාන්තර පද්ධතිය ලෙස ඉතිරිවෙලා තිබෙන්නේ සියයට 16ක් පමණයි. නමුත්, අමාත්‍යාංශයේ දත්ත අනුව ඒක සියයට 29ක් තිබෙනවා. ඒ නිසා අපේ රටේ සත්‍ය ලෙසම පවතින්නේ කවරාකාර වනාන්තර ප්‍රමාණයක්ද කියන එක පිළිබඳව අපි අලුතින් සමීක්ෂණයක් කළ යුතුයි. ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් මෙවර අය වැයේදී මුදල් වෙන් කර තිබෙනවා. එවිට අපට පුළුවන්, අපේ රටට හිමි ඇත්ත වනාන්තර පද්ධතිය පිළිබඳව හඳුනා ගන්න. සාමාන්‍යයෙන් අපේ ගම්වල පොදු පිළිගැනීම තමයි, අපේ රටේ වනාන්තර පද්ධතිය සියයට 30ක් වත් අඩුම තරමේ පැවතිය යුතුයි කියන එක. ඒ නිසා වේගයෙන් හායනයට ලක් වන මේ වනාන්තර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා අමාත්‍යාංශයක් විධියට මැදිහත් වෙලා ඒ සඳහා පළමු සමීක්ෂණය කරන්න අපි තීන්දු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියත්, අපත් ජීවත් වන ගම්පහ දිස්ත්‍රික්කය තුළ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 1.6යි වනාන්තර තිබෙන්නේ. කොළඹ දිස්ත්‍රික්කයේ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 3යි වනාන්තර තිබෙන්නේ. ඒ නිසා අපට හුස්ම ගන්න අවශ්‍ය කරන වාතය අද වන විට අහිමි කරමින් තිබෙනවා. එම නිසා ඉතා ඉක්මනින් මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා අපි මැදිහත් විය යුතුයි. ඒ නිසා පරිසර අමාත්‍යාංශය හරහා ඉතිහාසයේ අන් කවරදාටත් වඩා වැඩි වගකීමක් අපට පැවරී තිබෙනවා. ඒ සඳහා ගත් ප්‍රතිපත්තිමය තීන්දු මත පදනම් වෙලා ඉදිරියේදී පරිසර අමාත්‍යාංශයත්, එහි උපදේශක කාරක සභාවේ සාමාජිකයන් විධියට අපිත් වැඩ කටයුතු කරන්න සූදානම් කියන පණිවුඩය ලබා දෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.28]

ගරු ජගත් මනුවර්ණ මහතා
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කථා කරන මේ වැදගත් විවාදයේදී අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ විරුද්ධ පක්ෂය දිහාවටයි. ඇත්තටම අමාත්‍යාංශ දෙකක් යටතේ වුණත් වැය ශීර්ෂ කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයේ තරුණ මන්ත්‍රීවරු විශාල පිරිසක් මෙම පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. නමුත් කනගාටුවට කරුණ මෙයයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ අයට අපේ සංස්කෘතිය, ආගම, පරිසරය කොතරම් වැදගත්ද කියන එක විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආසන දෙස බැලුවාම අපට තේරෙනවා. මේ සභාවේ wide shot එකක් අරගෙන දෙන්න අපට විධියක් නැහැ. එවැනි wide shot එකක් අරගෙන දුන්නා නම් මේ රටේ මිනිසුන්ට බලාගන්න පුළුවන්, අද මේ කෑ මොර දෙන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ රටේ ආගම ගැන, සංස්කෘතිය ගැන, පරිසරය ගැන කොයිතරම් කැක්කුමක් ද තිබෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දැනට දින කිහිපයකට කලින් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් අපට විශාල චෝදනාවක් කළා, මා ළඟ තිබෙන මෙන්න මේ පින්තූරය තමන්ගේ දුරකථනයෙන් පෙන්වලා. මේ ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ආධ්‍යාත්මික නායකයාය කියලා එතුමා කියා සිටියා. 1983 ජූලි කලබල දවස්වල මේ පහරදීම සිදු කරන්නේ ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ කෙනෙක් කියලා විශාල චෝදනාවකුත් කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කියන්න කනගාටුයි, කලකට පෙර -දේශපාලනයට ප්‍රවිෂ්ට වෙන්න කලින්- එතුමා මාධ්‍යවේදියෙක් සහ මේ රටේ වගකිවයුතු මාධ්‍ය නාළිකාවක වැඩ කළ කෙනෙක්. එතුමා මේ පින්තූරය පෙන්වලා එහෙම කිව්වේ, එක්කෝ හිතා මතා වරද්දලා වෙන්න පුළුවන්. එහෙම නොවෙයි නම් ඒකෙන් අපට පැහැදිලි වෙනවා, දේශපාලන ඉතිහාසය සම්බන්ධයෙන් එතුමාගේ තිබෙන දැනුම පිළිබඳව. හිතා මතා වරද්දලා ඒක කිව්වා නම්, ඒක දේශපාලන තක්කඩිකම. මේ පින්තූරය ලබාගෙන තිබෙන්නේ, චන්ද්‍රගුප්ත අමරසිංහ කියන

ඡායාරූප ශිල්පියා. මා ඔහු මුණගැහිලා තිබෙනවා. මීට අවුරුදු ගණනාවකට කලින් මේ රටේ එක්තරා වාර්තා චිත්‍රපටයක් කෙරුණා, ජූඩ් රත්නම් තමයි එම චිත්‍රපටය කළේ. එය, 1983දී ඇති වූ ජූලි කලබල සම්බන්ධයෙන් කරපු වාර්තා චිත්‍රපටයක්. එම චිත්‍රපටයේදී මේ පින්තූරය සම්බන්ධයෙන් ඔහු ප්‍රකාශයක් ලබා දෙනවා, ඒ සිදුවීම වුණු ස්ථානයට ගිහිල්ලා. ඒ නිසා මේක අතිශය වැරදි තොරතුරක්. මේ වැරදි තොරතුරු සමාජගත කරලා අප ලබාගෙන තිබෙන මේ ජයග්‍රහණය ආපස්සට හරවන්න උත්සාහ දරන මන්ත්‍රීවරුන්ට මම යමක් කියන්න කැමැතියි. එතුමා මාධ්‍යවේදියෙක්. එතුමාට තිබුණා, එතුමා කලින් නිරත වුණු මාධ්‍ය වෘත්තියේ ගෞරවය ආරක්ෂා කරන්න. ඒ වාගේම අදටත් ප්‍රශස්ත ලෙස සිය මාධ්‍යකරණයේ නියැළෙන ඒ ආයතනයේ ගෞරවය ගැන එතුමාට හිතන්න තිබුණා. ඒ නිසා මේ තක්කඩි දේශපාලනයට අපි කිසිසේත්ම එකඟ වෙන්නේ නැහැ; එය අනුමත කරන්නේත් නැහැ. ඒ එක්කම අපි මතක් කරන්න ඕනෑ, 1983දී සිදු වුණේ ඒ සිදුවීම විතරක් නොවෙයි කියන එක.

ඔබතුමන්ලාට මතක නම් 70 දශකය අපි හඳුන්වන්නේ, ලංකා සිනමාවේ ස්වර්ණමය යුගය කියලායි. හැබැයි, මේ රටේ සිනමාව අද යන එන මං නැතුව කඩා වැටිලා තිබෙනවා. ඒ කියන්නේ මේ රටේ සිනමාව වළ පල්ලට යන අදියරකට ඇද දමලා තමයි අපට මේ ආණ්ඩුව භාර දුන්නේ. ඒ කඩා වැටීමට බලපාන සිදුවීම් පවා 1983දී වුණා. එදා මේ රටේ සිනමාශාලා විශාල ප්‍රමාණයක් ගිනිබත් කළා. අදටත් ගියොත් බලන්න පුළුවන්, එදා ගිනි තියපු කොළඹ රියෝ සිනමාශාලාව අහුරුත් එක්ක තවමත් තිබෙනවා. ඒ වාගේම ඔබතුමන්ලා සියලුදෙනා දන්නවා, "ශ්‍රී පතුල" චිත්‍රපටය හදපු කේ. වෙන්කට් කියන සිනමාකරුවා මරලා ඔහුගේ වාහනයටම දමා ගිනි තැබූ බව. එදා මට මතකයි, මනෝ ගනේසන් මන්ත්‍රීවරයා අපේ අධිකරණ අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමාට ස්තුති කළා, එදා ඒ පවුල බේරා ගත්තේ එතුමාගේ තාත්තා වන යසපාලිත නානායක්කාර මහත්මයා කියලා. කේ. වෙන්කට් මහතා එදා යසපාලිත නානායක්කාර මහත්මයාගේ නිවසෙන් පිටව ගියාට පසුව තමයි කළුබෝවිලදී ඒ සිදුවීම වෙලා තිබෙන්නේ. ඒ අඳුරු දේශපාලන ඉතිහාසය නිර්මාණය කළේ, ඔවුන් නියෝජනය කළ දේශපාලන පක්ෂ විසින්ම තමයි. ඒ අපකීර්තිය අප මත පටවන්න දරන උත්සාහය අපි හෙළා දකිනවා.

මට ලැබී තිබෙන කාලය කෙටි නිසා විශේෂයෙන්ම සිනමාව, නාට්‍ය කලාව සහ අනෙකුත් කලා විෂයයන් සම්බන්ධයෙන් විතරක් මගේ අවධානය යොමු කරන්නම්. මම හැදුණේ වැඩුණේ මහනුවර දිස්ත්‍රික්කයේ. මම ජීවත් වුණු ගලහ ප්‍රදේශයේ තිබුණා, "ජෝති ගලහ" කියලා සිනමාශාලාවක්. එය වැහිලා දැන් අවුරුදු 25කට වැඩියි. ඒ වාගේම නුවර ප්‍රදේශය ආශ්‍රිතව සිනමාශාලා රාශියක් තිබුණා. රීගල්, වේයස්, වෙම්බ්ලි, තුසිත - පේරාදෙණිය, ඕඩියන් - ගල්කිස්සේ වාගේම නුවරත් ඕඩියන් එකක් තිබුණා - ඒ වාගේම සීගිරි - කටුගස්තොට සහ එරීනා - කටුගස්තොට යන සිනමාශාලා සියල්ල මේ වන විට වැහිලා ගිහිල්ලා තිබෙනවා. අද මහනුවර Kandy City Centre එකේ තිබෙන KCC Multiplex එක විතරයි ඉතුරු වෙලා තිබෙන්නේ. මේ කඩා වැටුණු සිනමාව නැවත නඟාසිටුවන වගකීම අපට පැවරිලා තිබෙනවා. අපි ඒ සඳහා ගන්න පුළුවන් සියලු ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ වාගේම පසුගිය දවසක අපි සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යතුමා එක්කත් කථා කළා, මේ රටට විශාල අඩුපාඩුවක්ව තිබෙන සිනමා පාසලක් - cinema academy එකක් - පටන් ගැනීම සම්බන්ධයෙන්. ඒක විශාල පිරිසකගේ, ඒ විෂයයට ආශා කරන -ඇලුම් කරන- මිනිසුන්ගේ ඉල්ලීමක්, කැමැත්තක්. මේ රටේ සිනමා ක්ෂේත්‍රය වැඩිදියුණු කරන්න නම්, කර්මාන්තයක් විධියට නඟාසිටුවන්න නම්, ඒකට අවශ්‍ය දැනුම සම්පාදනය කරන ආයතනයක් අවශ්‍යයි. සතුටුයි කියන්න, ඒ සඳහා වූ මූලික සාකච්ඡා අපි පටන් අරගෙන තිබෙනවා. ඉන්දියානු ආධාර යටතේ අපි ජාත්‍යන්තර කීර්තියට පත් සිනමාශාලාවක් අනාගතයේදී මේ රටේ බිහි කරන්න සැලසුම් සකස් කරමින් ඉන්නවා.

ඒ වාගේම තමයි, අපේ රටේ නාට්‍ය කලාවත්. මේ වන විට අපේ නාට්‍ය කලාව සීමා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ රටේ අලුතෙන් නිෂ්පාදනය වන නාට්‍ය, ආධුනික නිර්මාණකරුවන්ගේ නාට්‍ය කොළඹ ඉන්න ඉතා සීමිත ප්‍රේක්ෂකාගාරයක් පමණයි නරඹන්නේ. ඒක බෙදවාචකයක්. මේ රටේ ගම්වල ජීවත් වන අහිංසක තරුණ තරුණියන්ට, පාසල් දරුවන්ට නාට්‍යයක් බලන්න, සංගීතයක් රස විඳින්න තැනක් ඕනෑ. නමුත් කනගාටුවට කාරණය නම්, කිසිම විධියකින් ඒවාට අවශ්‍ය පහසුකම් ගම්වල නොමැති වීමයි. මම ජීවත් වන හේවාහැට ආසනයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් තිබෙනවා; එක නාට්‍ය ශාලාවක්වත් නැහැ; එක සිනමාශාලාවක්වත් නැහැ. එතකොට ඒ ජනතාවගේ කලා සංස්කෘතික ජීවිතයට ඇති අයිතියට මොකද වෙන්නේ? ඒවා නැවත වතාවක් යථාවත් කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සඳහා අපි යම් උත්සාහයක් ගන්නවා. මේ වෙනකොට නාට්‍ය උළෙල දෙකක් ලංකාවේ පැවැත්වෙනවා. ඒ තමයි, යෙහෙන සම්මාන නාට්‍ය උළෙල සහ රාජ්‍ය සම්මාන නාට්‍ය උළෙල.

එම නාට්‍ය උළෙලවලට තරුණ තරුණියන් ඉතාම ප්‍රශස්ත මට්ටමේ නිර්මාණ අරගෙන එනවා. හැබැයි, මේ නාට්‍ය උළෙලවලින් පසුව ඒවා පෙන්වා ගන්න තැනක් නැහැ; ඔවුන්ට ඒ සඳහා සහායක් නැහැ. අපි උත්සාහ කරනවා, එම නාට්‍ය දිවයින පුරා පෙන්වන වැඩ පිළිවෙළක් හදන්න. මොකද, ඒවා කොළඹ ප්‍රේක්ෂකාගාරවලට පමණක් සීමා විය යුතු නැහැ. දිවයින පුරා සිටින සියලුදෙනාට එම නාට්‍ය බලන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිසා රාජ්‍ය නාට්‍ය උළෙල සහ යෙහෙන සම්මාන නාට්‍ය උළෙල නියෝජනය කරන නාට්‍ය සියල්ල දිවයින පුරා පෙන්වන වැඩ පිළිවෙළක් අපි ඉදිරියේදී සකස් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ අවස්ථාවේදී කනගාටුවෙන් වුවත් කිව යුතු කාරණයක් තිබෙනවා. නාට්‍ය හා රංග කලාව හදාරන, කලාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ඕනෑ තරම් දිවයින පුරාම ඉන්නවා. නමුත් බෙදවාචකය නම්, සිනමාශාලාවකට ගිහිල්ලා චිත්‍රපටයක් නරඹා නැති, නැරඹීමට බැරි වුණු දරුවෝ පාසල්වල සිටින එක. නාට්‍යශාලාවකට ගිහිල්ලා තමන්ගේ විෂයයට අදාළ නාට්‍යයක් නරඹා නැති ශිෂ්‍ය ශිෂ්‍යාවන් -දරු දැරියන්- මේ රටේ ඉන්නවා. මේක බෙදවාචකයක්. එහෙම හදන පරපුරකින් musical show එකකට ගියාම ඒවාට ගල් ගහන, පුටු පෙරළන, බෑල් පෙරළන වාගේ දේවල් නැතුව වෙන මොනවාද අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්? කලාවට, සංස්කෘතියට ආදරය කරන පරපුරක් මේ රටේ හදන්න නම්, ඔවුන්ට ඒ අවස්ථා හදා දෙන්න ඕනෑ. රස විඳීනයක් සහිත ජාතියක් නිර්මාණය කරන්න ඕනෑ. නාට්‍යශාලාවකට ගිහිල්ලා නාට්‍යයක් නැරඹීමේ අවස්ථාව, සිනමාශාලාවකට ගිහිල්ලා චිත්‍රපටයක් නැරඹීමේ අවස්ථාව අපි ගම්වල ජනතාවට හදා දෙන්න ඕනෑ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, අනාගතයේදී ඒ කලා, සංස්කෘතික අවකාශය ගම් තුළ නිර්මාණය කර දෙන්න. ඒ සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන හරහා ඒ වාගේ සංස්කෘතික අවකාශ සලසා දීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න පුළුවන් නැන් අපි නිර්මාණය කර දෙන්න ඕනෑ.

අපි කලාව; සංස්කෘතිය මිනිස්සුන්ගේ ජීවිතයේ අයිතියක් විධියට පිළිගන්නා දේශපාලන ව්‍යාපාරයක් සහ පක්ෂයක්. එම නිසා අපි මේ රටේ ජනතාවට කියනවා, අපි නියෝජනය කරන්නේ ඔබේ ඒ අයිතිය දිනා දෙන්න ආපු පක්ෂයක් බව. එම නිසා ඔබ බලාපොරොත්තු වුණු ඒ රට අපි ඔබට ලබා දෙනවා. "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති

[ගරු ජගත් මනුවර්ණ මහතා]

ප්‍රකාශනය ඇතුළේ අපි සඳහන් කර තිබෙනවා, ඒ කලා, සංස්කෘතික අයිතිය මේ රටේ මිනිස්සුන්ට දිනා දෙන බව. ඒ සම්බන්ධයෙන් වූ පොරොන්දුව ලබා දෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ඉක්මනින්, කෙටියෙන් යම් කාරණයක් සඳහන් කරනවා. මීට කලින් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා point of Order කියලා නැඟිටලා ඉතාම වැරදි කථාවක් කිව්වා. එතුමා දැන් සභාවේ නැහැ. එතුමා 91 (උ) සහ (එ) කියන ස්ථාවර නියෝග කඩකරමින්, එතුමාට ඇති බලතල මේ සභාව තුළ අනිසි ලෙස පාවිච්චි කරන්න උත්සාහ කළා. හැබැයි, මම පැහැදිලිව කියන්න කැමැතියි, අපි අලුත් කියලා, ආධුනිකයි කියලා අපට පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් උගන්වන්න එන විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් මේ සම්ප්‍රදායයන් විහිළුවට ලක් කරමින් පාර්ලිමේන්තුවේත්, මේ හැමෝගේමත් කාලය නාස්ති කරමින් කටයුතු කරන බව. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ ගෞරවය කෙලෙසන්න උත්සාහ කරනවා. මම ඒ ගැන විරෝධය ප්‍රකාශ කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.37]

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මට ලබා දුන් මේ කාලය මේ අය වැය විවාදය වෙනුවෙන් වැය කළ යුතුද කියලාත් මට හිතෙනවා. මොකද, අපි අය වැය සම්බන්ධයෙන් සාකච්ඡාවක් කළ යුත්තේ විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ තර්ක විතර්ක මත; එම තර්ක විතර්ක යොදා ගනිමින් අය වැයට සංශෝධන එක්කාසු කිරීම වෙනුවෙන්. නමුත්, මේ අවස්ථාව වෙනකොට විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙක් මේ සභා ගර්භය තුළ නැහැ. ඒ පිළිබඳව බොහොම කනගාටුයි. ඒත් මගේ කථාව මම කරගෙන යන්නම්.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
"අපි වෙනුවෙන් අපි".

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, "අපි වෙනුවෙන් අපි" කියන තේමා පාඨය යටතේම මා මගේ කථාව ආරම්භ කරන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පරිසරය කියන්නේ මොකක්ද කියලා ඇහුවොත් අපි දන්නවා, ඕනෑම කෙනෙකුගේ මුවින් ප්‍රකාශ වෙන දේ තමයි මහ පොළොව, ජලගෝලය, වායුගෝලය, සතා සීපාවා සහ ගස් කොළන් අඩංගු ජෛව ගෝලය කියන එක. විවිධ ආණ්ඩු මෙන්න මේවා නියාමනය කිරීම සඳහා විවිධ ආයතනවලට බලතල ලබා දීලා තිබෙනවා, ඒ ඒ පනත්වලින්. එසේ නියාමනය සඳහා බලතල ලබා දී තිබෙන ආයතන ඔක්කෝම එක්කාසු කර එක තැනකට ගත් ඉතිහාසයේ පළමු අවස්ථාව ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ තිබෙන මේ පරිසර අමාත්‍යාංශයයි කියා මා හිතනවා.

ජාතික ජන බලවේග ආණ්ඩුවේ පරිසර අමාත්‍යාංශයේ ඇමතිවරයාවත්, මමවත්, අනෙක් කිසිම ඇමතිවරයෙක්වත්, මන්ත්‍රීවරයෙක්වත් කිසිවිටෙක හිතන්නේ නැහැ, මේ පරිසරය තමන්ගේ පෞද්ගලික බූදලයක්, මේකේ අයිතිකාරයෝ අපි කියලා.

නිසි කාලයට නිසි ලෙස කළමනාකරණය කරලා, අනාගත පරපුරට පරිසරය භාර දෙන්න අපට ලබා දීපු අවස්ථාවක් කියායි අපි මෙය සලකන්නේ. අපි පරිසරයේ අයිතිකාරයෝ නොවෙයි. හැබැයි, මීට පෙර මේගොල්ලන් මේවා සිද්ධ කළේ කොහොමද කියලා අපි දන්නවා. එම නිසා අපි ඒ ගැන ආපහු කියන්න ඕනෑ නැහැ. අපි, අපේ පරිසර ප්‍රතිපත්තිය හදලා තිබෙන්නේ ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන්ට හා පිළිගත්ත මූලධර්මවලට - principlesවලට - අනුවයි කියා මම හිතනවා. එලෙස ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන්ට හා පිළිගත්ත මූලධර්මවලට අදාළව අපි පරිසරය ගොඩනඟමු. Sustainable Development Goals අනුව තමයි අපි මේ පරිසර ප්‍රතිපත්තිය නිර්මාණය කළේ. මෙන්න මේ පරිසර ප්‍රතිපත්තිය නිර්මාණය කරලා, හොඳ පරිසරයක් ගොඩනැඟීම තමයි ඇත්තටම අපේ ප්‍රධානම කාර්යයප වන්නේ. භූ විෂමතාව අනුව, වර්ෂාපතනය, උෂ්ණත්වය අනුව දැවැන්ත පරිසර පද්ධතීන් ප්‍රමාණයක් අපේ රට තුළ නිර්මාණය වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම ලෝකය ගත්තොත්, අපේ රට ජෛව විවිධත්වය පැත්තෙන් ඉදිරියෙන්ම සිටින රටක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ මේ පරිසර පද්ධතීන් අපේ ජාතික ආර්ථිකයට අපි එක්කාසු කර ගත්තාද, නැද්ද කියන එක පිළිබඳව දැන් අපිට සලකා බලන්න වෙනවා. මෙතෙක් පැවති ආණ්ඩු පරිසරය සැලකුවේ ජාතික ආර්ථිකයට හතුරෙක් ලෙසයි. ඒ නිසා තමයි විවිධ තීන්දු තීරණ ගත්තේ. ඒ හේතුව නිසාම පාරිසරික පද්ධති අතර තිබිය යුතු අන්තර් සම්බන්ධතාව කඩා බිඳ දාලා තිබෙනවා. මේ තුළින් ගොඩනැඟුණු පාරිසරික ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවාට පිළිතුරු සෙවීම තමයි අපේ ප්‍රමුඛතම කාර්යභාරය වෙන්නේ. අපේ මේ පරිසර පද්ධතිය සංරක්ෂණය කර ගැනීමෙන් එය ආර්ථිකයට බද්ධ කර ගන්නේ කොහොමද කියලා අපි මේ වෙනකොටත් සාකච්ඡා කරමින් සිටිනවා. ඒත් එක්කම මේ පරිසර පද්ධතීන් සංචාරක කර්මාන්තය වේවා, වෙනත් නිෂ්පාදන ක්‍රියාවලි සඳහා අපි උපයෝගී කර ගන්නේ කොහොමද? ඒ පිළිබඳව වැඩකටයුතු සකස් කරලා ඉදිරියේදී ඒවා ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සම්බන්ධයෙන් උදේ වරුවේ අවස්ථා දෙක තුනකදී කරුණු මතු වුණා. පොදුවේ මතයක් තිබෙනවා, මේ ආයතනය දූෂිත ආයතනයක් කියලා. හැබැයි, මේ ආයතනය තුළ අවංකව වැඩ කරන හොඳ නිලධාරීන් බොහෝදෙනෙක් ඉන්නවා. නමුත්, දූෂිත ආකාරයෙන් කටයුතු කරන කීප දෙනෙකුත් ඒ අතර

සිටිනවා. මෙම භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විසින් සිදු කරන ක්‍රියාවලිය හොඳ තැනකට පත් කර ගන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් කතිකාවක් ඇති කර ගන්න කලින් මේ තුළින් සිද්ධ වෙන ක්‍රියාවලිය මොකක්ද කියලා අපි ඇත්තටම හඳුනා ගත යුතුයි. 1993 අවුරුද්දට කලින් මේ ආයතනය තිබුණේ භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව ලෙසයි. මෙන්න මේ දෙපාර්තමේන්තුව රටේ විශාල කාර්යභාරයක් කරපු ආයතනයක්. ඔවුන් බනිජ සම්පත් සම්බන්ධයෙන් ගවේෂණය කළා. ඒ ගවේෂණවල ප්‍රතිඵල මත දැවැන්ත කර්මාන්ත ප්‍රමාණයක් අපේ රට තුළ ස්ථාපිත වුණා. උදාහරණයක් හැටියට ගත්තොත්, ලංකා බනිජ වැලි සංස්ථාව, බනිජ වැලි නිස්සාරණය කිරීමේ කර්මාන්තශාලාව වාගේම සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලා දෙකක් ස්ථාපිත වුණා. ඒ වාගේම ලංකා පිහන් සංස්ථාව, වීදුරු කර්මාන්තශාලාව, එප්පාවල ලංකා පොස්පේට් ආයතනය ආදී වශයෙන් කර්මාන්ත විශාල ප්‍රමාණයක් උත්පාදනය කරන්න අවශ්‍ය මූලික ක්‍රියාවලිය භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කළා. ඒ නිසා ඇත්තටම මම හිතනවා, එය රටේ ආර්ථිකයට දැවැන්ත කාර්යභාරයක් කරපු ආයතනයක් කියලා. පසු කාලීනව ඒ දෙපාර්තමේන්තුවට සිද්ධ වුණේ මොකක්ද? ඒ දෙපාර්තමේන්තුව පසු කාලීනව 1992 අංක 33 දරන පතල් හා බනිජ ද්‍රව්‍ය පනත ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය බවට පරිවර්තනය කළා. ඊට පස්සේ මොකක්ද වුණේ? පත් වෙච්ච ඇමතිවරු, මන්ත්‍රීවරු මේ රටේ තිබෙන සම්පත් ටික තමන්ගේ තනි අයිතියක් බවට පරිවර්තනය කර ගන්න පටන් ගත්තා. මෙන්න මේ හේතුවෙන්ම ඔවුන්ගේ පවුල්වල ඥාතීන්ට, තමන්ගේ දුවා දරුවන්ට, තමන්ගේ බිරිඳට, තමන්ගේ පාක්ෂිකයන්ට ලයිසන් දීමේ එක් කාර්යාලයක් බවට එය පරිවර්තනය කර ගන්න පටන් ගත්තා. මෙන්න මෙතැන තමයි දූෂණය පටන් ගත්ත පළමුවන තැන. දේශපාලනය විසින් ඒ ආයතනය තුළ අමු අමුවේ දූෂණ කටයුතු කරන්න පටන් ගත්තා. එහි ප්‍රතිඵල තවමත් අපට දක්නට තිබෙනවා.

අන්න ඒ නිසා තමයි සමාජයේ මතයක් ගොඩනැඟිලා තිබෙන්නේ මේ ආයතනය දූෂිතයි කියලා. ජාතික ජන බලවේගය හැටියට අපි කිසිදු ඇමතිවරයෙකුට, මන්ත්‍රීවරයෙකුට, ඔවුන්ගේ පවුලේ කෙනෙකුට හෝ ඥාතියෙකුට බලපත්‍ර ලබා දෙන්නේ නැහැ. ඒ ක්‍රියාවලිය අපි නතර කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කිසිදු ඇමතිවරයෙක් හෝ මන්ත්‍රීවරයෙක් මේ වෙනකල්ම කිසිදු බලපෑමක් සිද්ධ කරලා නැහැ. අපි ඒ ප්‍රතිපත්තිය දිගටම රකිනවා. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් වැඩිපුරම කෙරෙන්නේ බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය. ඒ බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය අපි වෙනස් වූ ක්‍රමයකට -අල්ලසක්, පගාවක් නැති වන විධියට- හදනවා. කැණීම් බලපත්‍ර වෙන්න පුළුවන්, ගවේෂණ බලපත්‍ර වෙන්න පුළුවන්, ඒවා නිර්දෝෂී, නියමාකාරයට ලබා දෙන තැනක් බවට ඒ ආයතනය පරිවර්තනය කරනවා. ඒ වාගේම කැණීම් අධීක්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය කරන වටපිටාව මේ වනකොටත් අපි සකස් කරමින් ඉන්නවා. අනවසර කැණීම් වළක්වා ගැනීම සඳහා මේ වනකොටත් අපි පිළියම් සකසමින් තිබෙනවා.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට මේ වනකොටත් අපි කියලා තිබෙනවා, නීත්‍යානුකූලව ලබා දුන් බලපත්‍ර සිතියම්ගත කරලා, පොදු මහ ජනතාවට phone එකක app එකකින් බලන්න - නිරීක්ෂණය කරන්න - පුළුවන් වන ආකාරයේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. මම හිතන විධියට, මේ වනකොටත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් සිටිනවා. මෙහි රාජ්‍ය භාගය අය කිරීමේදී විශාල ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. ඉදිරියේදී බනිජවලට මොන ආකාරයේ මිලක් නියම වෙයිද කියන එක සම්බන්ධයෙන් ප්‍රවීණයින් එක්කාසු කරගෙන, ඔවුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් එක්ක කටයුතු කරමින් වෙනස් වූ ක්‍රමවේදයකට අනුව මේ බලපත්‍ර ලබා දීම වාගේම, රාජ්‍ය භාගය අය කිරීමේ ක්‍රමවේදයට අපි වැඩ පිළිවෙළක් සකස් කරමින් සිටිනවා.

තවත් ප්‍රධානතම ආයතනයක් ගැන අපට කථා කරන්න තිබෙනවා. ඒ තමයි, ජල සම්පත් මණ්ඩලය. මට මතක විධියට 1964 අවුරුද්දේ පනතකින් තමයි මේ ජල සම්පත් මණ්ඩලය ආරම්භ කළේ. ඔවුන්ගේ ප්‍රධානතම රාජකාරිය තමයි භූගත ජලය ආරක්ෂා කර ගැනීම හා නියාමනය කිරීම. භූගත ජලධරයන් - aquifers - සුරක්ෂිත කිරීමේ වැඩ පිළිවෙළ අපි මේ අවුරුද්දේම ආරම්භ කරනවා. ඒ වාගේම භූගත ජලධරයන්ගෙන් එළියට මතු වන ජල උල්පත් ප්‍රමාණය සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් මේ අවුරුද්දේ අපි බදුල්ල දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරනවා. මේ රටේම තිබෙන ජල උල්පත් ටික සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් අපි ඉදිරියේදි ක්‍රියාත්මක කරනවා. ජල සම්පත් මණ්ඩලය ආරම්භ කර මේ වනකොට වසර 50ක්, 60ක් විතර ගත වෙලා තිබෙනවා. මේ කාලය තුළ දැවැන්ත වාෂ්පීකරණයක් සිද්ධ වෙලා තිබෙනවා; භූගත ජලයේ තිබෙන ජල වාෂ්පීකරණය දෙගුණ වෙලා තිබෙනවා. ඒ නිසා භූගත ජලය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් අපි සකස් කර එය මේ අවුරුද්දේ සිටම ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்டன் ஜயகொடி)
(The Hon. Anton Jayakody)
තව විනාඩියක් මට දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපි ආර්ථිකය බද්ධ කරගන්න ඕනෑ අපේ පරිසරයත් එක්ක. දකුණු ආසියාව කියන්නේ විශාල ක්‍රිකට් උන්මාදයකින් පෙළෙන කලාපයක් බව අපි දන්නවා. ඒ සඳහා අවශ්‍ය cricket bats හදන්න මේ රටේ තිබෙන ඇල්බීසියා ලීයට දැවැන්ත ඉල්ලුමක් තිබෙනවා. වන ආවරණ ඇති කිරීම සඳහා මෙවර අය වැයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වෙන් කරලා තිබෙනවා, රුපියල් මිලියන 1,000ක්. ඒකෙන් රුපියල් මිලියන 404ක් අපි වෙන් කරනවා, වන වගාවට. මේ මුදලින් කොටසක් යොදවා වතු ආශ්‍රිතව ඇල්බීසියා වගාවක් ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, තව අවුරුදු 5කින් වාගේ ඒ ලීය සම්පූර්ණයෙන්ම තුරන් වෙනවා. ඒ නිසා දිගටම ඒ වෙළෙඳාම, market එක තබා ගැනීම අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்டன் ஜயகொடி)
(The Hon. Anton Jayakody)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මේ අය වැයෙන් අපේ ප්‍රතිපත්තිය reflect වෙනවා. එහි කැඩපතක් හැටියට සලකන්න පුළුවන්, මේ අය වැය. මම හිතනවා, විපක්ෂය ඇතුළු අපි ඔක්කොම එක්කාසු වෙලා මේ කටයුතු කරන්න ඕනෑ කියලා. ඇත්තටම, විපක්ෂයෙන් මීට වඩා ගුණාත්මක තර්ක, ගුණාත්මක අදහස්, ගුණාත්මක විවේචන ඉදිරිපත් කරන්න තිබුණා. පරිසරය කියන එක අපට පොදු දෙයක්.

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

විපක්ෂය වෙන්න පුළුවන්, ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන්, පොදු සමාජයටම තිබෙන පරිසරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් මීටත් වඩා හොඳ තර්ක විතර්ක හා අදහස් ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 4.50]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින කාරක සභා අවස්ථාවේ සාකච්ඡා කරන්නේ බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවයි. මා සතියකට පමණ පසුවයි අද පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ. මට පෙර කථා කරපු ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් චෝදනා කළා, ආගමික සහ සංස්කෘතික කටයුතු විෂයය පිළිබඳව කථා කරන දවසේ විපක්ෂය නියෝජනය කරන්න මන්ත්‍රීවරු සභාවේ නැහැ, ආගම දහමට තිබෙන ළැදියාව ඒකෙන් හඳුනා ගන්න පුළුවන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා ඉතිහාසයේ පළමු වතාවට පාර්ලිමේන්තුවේ අය වැය විවාදය යන අතරේ පළාත් පාලන මැතිවරණයක් කැඳවා තිබෙනවා. පාර්ලිමේන්තුව නියෝජනය කරන සෑම මන්ත්‍රීවරයෙක්ම වාගේ ආසන සංවිධායකවරයෙක්. සෑම කෙනෙකුටම ප්‍රාදේශීය සභාවල අපේක්ෂක ලැයිස්තු හදන්න තිබෙනවා. මට කලින් කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මේ විවාදයේදී ගුණාත්මක විවේචන, ගුණාත්මක අදහස් බලාපොරොත්තු වෙනවා කියලා. හැබැයි, එහෙම ගුණාත්මක විවේචන හා අදහස් ලබා දෙන්නේ කොහොමද, ඔබතුමන්ලා තැටිය රත් වෙච්ච වෙලාවේ රොටිය පුච්ච ගන්න හදනකොට? ඔබතුමන්ලාගේ ජනප්‍රියත්වය දැන් දවස ගාණේ ශීඝ්‍රයෙන් හීන වෙමින් යනවා. එම නිසා ඉක්මනින් මැතිවරණ පවත්වා ගැනීමේ වුවමනාව නිසා හදිසියේ, කඩිමුඩියේ අවුරුද්දකට වැඩි කාලයක් සඟවලා තිබුණු මැතිවරණය පාර්ලිමේන්තුවේ අය වැය විවාදය අස්සේම පවත්වන්න හදලා, ඊට පස්සේ කියනවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු නැහැ ලු. ඒ නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තර්ක ගෙනෙනකොට -ඔබතුමාගේම වචනවලින් මම කියන්නේ- ගුණාත්මක තර්ක ගෙනෙන්න, ප්‍රායෝගික තර්ක ගෙනෙන්න, පිළිගත හැකි තර්ක ගෙනෙන්න. ගෙනැල්ලා පිළිගත හැකි විධියට කථා කරන්න. පාර්ලිමේන්තුවේ විපක්ෂය පැත්තේ සංයුතිය ගැන කථා කරන ඔබතුමන්ලාගේ පැත්තේ සංයුතිය කීයද? 159ට සාපේක්ෂව ඔබතුමන්ලාගේ සංයුතිය කීයද තිබෙන්නේ? එම නිසා රටට පෙනෙන්න දේවල් කථා කරනවාට වැඩිය තමන්ම අනලා, ජරා කරලා, ඒ වාගේ දේවල් ගැන විපක්ෂය පැත්තට චෝදනා එල්ල කරන්න එපා. විපක්ෂයේ අවශ්‍යතා අනුව යොමු වෙමින්, කථික ලැයිස්තුවේ නියෝජනයත් අපි නිසි විධියට කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආගමික කටයුතු ගැන කථා කරනකොට, අපි දන්නවා මේ රටේ අද බලය හොබවන්නේ, ආගමික කටයුතු නිල් කරපු බලවේගයක් බව. හැබැයි, මීට කලින් මේ රට පාලනය කරපු සෑම රජයක්ම ප්‍රධාන වශයෙන් බුද්ධාගම මුල් කරගෙන වාගේම අනෙකුත් සියලු ආගම් මුල් කරගෙන තමයි ක්‍රියාත්මක වුණේ. ඒ හරහා අපේ ආගම ආරක්ෂා කරමින්, සියලු ආගම්වලට තමන්ගේ ස්වයං තීරණ මත ක්‍රියාත්මක වෙන්න ඒ අවශ්‍ය කරන සහයෝගය සහ ශක්තිය ලබා දුන්නා. එම නිසා අපි මේ ආණ්ඩුවට කියන්නේ, එහෙට දික් කර කර, මෙහෙට දික් කර කර තමන්ගේ තිබුණු පරණ මතවාදත් එක්ක ගමන් කරන්නේ නැතුව ආගමික සබැඳියාව ඇතිව කටයුතු කරනවා නම් බොහොම හොඳයි කියලා. ඒක තමයි විය යුත්තේ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ආගමික ස්ථාන ගත්තාම ඔබතුමන්ලා දන්නවා ජනප්‍රිය විහාරස්ථානවලට ඕනෑ තරම් සම්පත් ගලාගෙන එන බව. හැබැයි, ග්‍රාමීය විහාරස්ථාන ගත්තාම හැම දාම ගමේ දායක සභාවට ඒ සම්බන්ධව විශාල බරක් තිබෙනවා. ගමේ දායක සභාව ඇතුළු ගමේ භක්තිකයන් සියලුදෙනාට වාගේම, ස්වාමීන් වහන්සේලාට ලොකු වුවමනාවක් තිබෙනවා තමන්ගේ විහාරස්ථානය අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත් කර ගන්න. අර හිඟන්නාගේ තුවාලය වාගේ තමයි, හැම දාම අපි පන්සලකට ගොඩ වුණොත් එම පන්සලේ මොකක් හෝ ඉදිකිරීමක් කරගෙන යනවා. පන්සල් අංග සම්පූර්ණ කර ගැනීමට හැකියාවක් නැත්තේ ඇයි? ඒවාට අවශ්‍ය කරන ශක්තීන් ටික නැහැ. දුප්පත් දායක සභාවක් ඉන්නේ. ඉතින්, ඒ හරහා එම පන්සල අංග සම්පූර්ණ කර ගන්න බැහැ. එම නිසා එක පැත්තකට සම්පත් ගලා ගිහින් අතිරික්තයක් තිබෙනවා වාගේම, තව පැත්තකින් දුප්පත් පන්සල් ප්‍රමාණයක් තිබෙනවා. ඒ පන්සල් ගැනත් අවධානය යොමු කරන්න. විහාරස්ථානය ගොඩනඟා ගන්න එක කෙසේ වෙතත් සමඟර ස්වාමීන් වහන්සේලාට ලැගුම් අවශ්‍යතා සපුරා ගන්න, දාන මාන අවශ්‍යතා ටික සපුරා ගන්නත් අපහසුතා තිබෙනවා. එවැනි විහාරස්ථාන ලංකාවේ ඕනෑ තරම් තිබෙනවා. මේක බෞද්ධ රටක්. විශේෂයෙන් බෞද්ධයෝ ආගම මුල් කරගෙන කටයුතු කරන පිරිසක්. ඒ නිසා ආගම නඟා සිටුවන්නට ඔබතුමන්ලා මීට වඩා අවධානය යොමු කරන්න. ඔබතුමන්ලා අලුත් වෙනසක් ඇති කරන්න ආපු කට්ටියක්. පසුගිය කාලයට ශාප කරමින් සිටීම අවසන් කරලා, විහාරස්ථාන ගොඩනඟන්නට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න. එය ක්‍රියාත්මක වන විධියක් තිබිය යුතුයි. විහාරස්ථානයක සැලැස්ම මොකක්ද, ඒ සැලැස්ම අවසන් කරන්නේ අදියර කීයකින්ද, රජයේ අධීක්ෂණය යටතේ ඒ කටයුතු කළොත් හොඳයි. එහෙම නැති වුණොත් හැම දාම එම විහාරස්ථානවලට අඩු පාඩු එක්ක තමයි කටයුතු කරගෙන යන්න වෙන්නේ.

ඒ වාගේම අනෙකුත් ආගම් ගත්තාම, ඒ සෑම ආගමක්ම අදහන ජනතාවට ගෞරවාන්විතව ඒ කටයුතු කරගෙන යෑමේ අවස්ථාව අපි ගොඩනැඟිය යුතුයි. ඒවා ගැන මම දීර්ඝව කථා කරන්නේ නැහැ. මම දැක්කා, හැම කෙනෙක්ම ඒවා ගැන කථා කළා. ඒ සියලු ගැටලු ඔබතුමන්ලා සහ අපි ඔක්කොම දන්නවා. ඒ නිසා මේ රටේ හැම ආගමක්ම වෙනුවෙන් මුදල් වෙන් කිරීමට රජය හැටියට මැදිහත් වෙන්න.

අපි දැක්කා, ශ්‍රී ලාංකික දිනයක් ගැන කථා කරනවා. ඒ ශ්‍රී ලාංකික දිනය නිර්මාණය කරන්න. හැබැයි, මගේ පෞද්ගලික මතවාදය නම්, අපිට නිදහස් දිනය හැරුණාම, වෙනත් ශ්‍රී ලාංකික දිනයක අවශ්‍යතාවක් නැහැ. ඒ ආගමික බැඳියාව, සියල්ල එකතු කරන්නට පුළුවන් හොඳම දවස තමයි පෙබරවාරි මාසයේ 04වැනි දා. ඒ, අපි ශ්‍රී ලාංකිකයෝ විධියට නිදහස ලබපු දිනය. අපි සියලු ජාතීන් එකතු වෙලා නිදහස ලබපු දිනය. ඔබතුමන්ලා තමන්ගේ දේශපාලන ක්‍රියාවලියක් සඳහා හෝ "අපි දෙයක් කළා" කියලා කියන්න හෝ තවත් සන්දර්ශන මාලාවක් පවත්වන්නට කටයුතු කරනවා වෙනුවට, ප්‍රායෝගිකව නිදහස් දිනය කියන එකට දැඩි අවධානය යොමු කරලා, ශ්‍රී ලාංකිකයින්ගේ ඇහට දැනෙන විධියට, අපිට හැඟීමක් දැනෙන විධියට, තව ඒක උද්දීපනය කරලා ගන්නවා නම් හොඳයි. ඒකට වෙන වෙන සන්දර්ශන දාලා, ඒකේ අවධානය වෙන පැතිවලට යොමු කරන්න කටයුතු කරන්න එපා. "අපි ආවේ රේන්ජ් රෝවර් එකෙන් නොවෙයි, අපි ආවේ, කැබ් එකෙන්. අපි පාවිච්චි කරන්නේ කැබ්" කියලා පෙන්නුවාම, ඒක තමයි එදා දවසේ ප්‍රවෘත්තිය බවට පත් වෙන්නේ. තමන්ගේ කුණු වසා ගන්න එහෙම කරනවා. තමනුත් රේන්ජ් රෝවර් එකේ යන්න ආසයි. වෙදිකාවල කියපු මුසාවාද නිසා අනේ! ඒ ආසාව යටපත් කරගෙන කථා කරනවා. අවසානයේ අපේ රටේ වැදගත්ම දිනය දවසේ ඒක අපේ රටේ ජනතාවට ඇහට දැනෙන්න කටයුතු කරනවා වෙනුවට, තමන්ගේ විළි වසා ගන්නට, තමන් කරපු දේ වසා ගන්නට, කැබ් එකක ඇවිල්ලා පෙන්වනවා, "මෙන්න අපි කැබ්වල දැන් එන්නේ. අපි රේන්ජ් රෝවර් පාවිච්චි කරන්නේ නැහැ" කියලා. හැබැයි, ගමේ කට්ටිය දන්නවා, රේන්ජ් රෝවර් එකෙන් එන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ආණ්ඩුකාරවරු ඉන්නවා, වාහන තුනක් පාවිච්චි කරන. රාජකාරියට එන්නේ කැබ් එකෙන්. හැබැයි, එතුමා එතැන ඉඳලා කොළඹ එන්නේ BMW එකෙන්. තවත් ගමනක් යන්නේ රේන්ජ් රෝවර් එකෙන්. මේ කාවද රවට්ටන්නේ? ඒ නිසා මෙවැනි සන්දර්ශන දාලා රවට්ටලා, රටේ ජනතාව ගොනාට අන්දලා කටයුතු කරනවා වෙනුවට, ඔබතුමන්ලාගේ ශ්‍රී ලාංකික දිනය පෙබරවාරි මාසයේ 4වැනි දාට අරගෙන කටයුතු කරන්න. සෑම ගෙදරකම අය පුළුවන් තරම් උත්සාහ කරනවා, එදාට සිංහ කොඩිය ඔසවලා අපේ ජාතිකත්වය පිළිබිඹු කරන්න. ඒකට තව පොඩ්ඩක් ගුණාත්මකභාවයක් එක්කාසු කරලා කටයුතු කරනවා නම් ඒක ඉතාම වැදගත්. ඒ නිසා මේ ජාතීන් සියලුදෙනා ඒක රාශි කරන්න පුළුවන් ශ්‍රී ලාංකීය දිනය විධියට පෙබරවාරි මාසයේ 04වැනි දා අපිට තිබෙනවා. ඒක ඔබතුමන්ලා තවත් දිනයක් බවට පත් කරලා, තවත් සන්දර්ශන කරන්න එපා. ඒක ගැන අපිට තවත් කථා කරන්න ගියොත්, මේ එන කතන්දර එක්ක අර ඉල්මහ විරු සමරුව තිබෙන දිනයද ඔබතුමන්ලා තෝරා ගන්න යන්නේ කියලා ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒ නිසා එහෙම තැන්වලට යොමු වෙන්නේ නැතුව, බොහොම පැහැදිලිව රටේ ජනතාවට විධියට මේ සියලු ආගම්වලට එකට යන්න පුළුවන් විධියට, රටේ බලවේගය, ශක්තිය ඔබතුමන්ලා ළඟ තිබෙනවා. ඒ නිසා එය ගොඩ නහන්න කියන කාරණය මම කියන්න කැමැතියි.

අනෙක් පැත්තෙන්, පරිසරය කියන්නේ වැදගත්ම කාරණයක් බව අපි දන්නවා. අපේ සෞඛ්‍ය සම්පන්නභාවය ඇතුළු සියලු කාරණාවලට පරිසරය පිරිසිදුව පවත්වා ගෙන යෑම ඉතා වැදගත්. ඒ නිසා පරිසරය සම්බන්ධව තීන්දු තීරණ ගන්නා විට ඒවා වගකීමක් ඇතිව ගත යුතු වෙනවා. දැන් අපිට විශාල වශයෙන් චෝදනා එල්ල වන කාරණයක් තමයි, ඛනිජ සම්පත් සම්බන්ධව පත් කරලා ඉන්න නිලධාරීන් මහත්වරුන් ගැන තිබෙන චෝදනාව. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා, පසු ගිය කාලයේ විපක්ෂය නියෝජනය කරනකොට, විනාඩි 19ක් කථා කරපු, චෝදනා කරපු, ඒ උත්තමයාම අද ඒකේ ප්‍රධානියා බවට පත් කරගෙන කටයුතු කරනවා. එතකොට ඒ හරහා අනෙකුත් පත්වීම් ලබා දෙනවා. එතකොට "ඇමතිවරු මේවාට අතගහන්නේ නැහැ, අපි කිසි දෙයකට call කරන්නේ නැහැ, අපි මේවාට චෝදනා කරන්නේ නැහැ, අපි කවුරුවත් බලපත්‍ර ඉල්ලා ගෙන ඇවිල්ලා නැහැ" කියලා කියනවා. හැබැයි, ඇමතිවරුන්ගේ ඉල්ලීමට අම්පාරට පත් කර ගන්නේ කවුද? දූෂණ චෝදනා එල්ල වෙලා, අයින් කරලා තිබුණු අය ගෙනැල්ලා තියාගෙන ඉන්නවා. එහෙම නම් ඒක වෙන්නේ නැද්ද? එතකොට කාගේ ඉල්ලීමටද මේවා වෙන්නේ? ඒ කෙනා පත් කර ගන්නේ ඇයි? මේ හරහා තමයි, රජයට ලැබිය යුතුව තිබෙන මුදල් විශාල ප්‍රමාණයක් අවභාවිත වෙන්නේ. මේ දූෂණ චෝදනා එල්ල වෙච්ච අය ඔබතුමන්ලා තවත් රකින්නේ, ඒකේ යටි අරමුණක් තිබෙන්න පුළුවන්.

ඊළඟට ඔබතුමන්ලා පෙන්වනවා, "අපි වියදම් කරන්නේ නැහැ, රාජ්‍ය මුදල් අපි ඉතුරු කරනවා" කියලා. රාජ්‍ය මුදල් ඉතුරු කරන කොට, ඔබතුමන්ලාගේ යැපීමටද මෙවැනි දූෂිත නිලධාරින් තියා ගන්න ඔබතුමන්ලා උත්සාහ කරන්නේ? ඒ නිසා දූෂිත නිලධාරීන්ට විරුද්ධව ඔබතුමන්ලා කථා කළා නම්, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා, විපක්ෂයේ ඉන්න කොට විනාඩි 19ක් ඒ පුද්ගලයා පිළිබඳව විවේචනය කළා නම්, අද ජනාධිපතිවරයා විධියට එතුමා තවත් ඒ අයට රාජකාරි පවරලා පවත්වා ගෙන යෑමේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා නේ. එතකොට එතුමා හරහා ඊළඟට උඩම පුටුවේ ඉඳලා යටම පුටුව දක්වා තමන්ට හිතෙෂීන් නේ පත් කර ගන්නේ. ඒ හරහා විශාල මුදල් අවභාවිත වීමක්, දූෂණයක්, වංචාවක් සිද්ධ වෙනවා. ලැබෙන්න තිබෙන රාජ්‍ය භාගය රාජ්‍යයට නොලැබී ඒවා වක්‍රාකාරයෙන් මේ අයගේ ගිණුම්වලට - accountsවලට - වැටෙනවා; අතට ලැබෙනවා. ඒක ලැබෙනකොට දේශපාලනඥයා ඔවුන්ව ආරක්ෂා කරන්නේ, ඒකෙන් ගතමනාවක් තමනුත් අරගෙන, අනේ, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විදේශ සංචාර යනකොට ඩොලර් මිලියන 1.8කින් ගිහිල්ලා ආවා වාගේ ඉතිරි වියදම් ටික පියවා ගන්නද අනෙක් අයත්? ඒ නිසා ඒ බොරු දේවල් අවශ්‍ය නැහැ, සැබැවින්ම රජයෙන් විය යුතු වියදම් ටික දරන්න. ඒකෙන් මේ රටේ ජනතාවට කිසිම බරක් නැහැ. ඒ වියදම් සඳහා දශම ගණන් යන්නේ.

හැබැයි ඒවා අනෙක් පැත්තෙන්, වක්‍රාකාරයෙන් අර කියපු අය හරහා එනකොට තවත් තැන් තැන්වල නතර වෙලා එන්නේ. තමන්ට එන්න සොච්චම් මුදලක් වැය කරන කොට දූෂණයෙන් උපයපු දේවල් අර කියපු අය හරහා තවත් කිහිපදෙනෙකු ළඟ නතර වෙලා එන්නේ.

මේ රටේ හොඳ, පිරිසිදු රාජ්‍ය සේවකයන් ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන කොටත් ඒ ගැන කිව්වා. මම මේ ඒ අයට චෝදනා කරනවා නොවෙයි. හොඳ රාජ්‍ය සේවකයන් ඉන්නවා වාගේම, අර කියපු විධියේ දූෂිත නායකයෙකු හිටියාම ඒ දූෂිත නායකයා ඉස්මතු කරගෙන ඔබතුමන්ලා ගමන යන කොට එතුමා හරහා එතුමාගේ හිතෙෂීන් ටික ඉතිරි තනතුරුවලට පත් කරන කොට, ඒ සඳහා ඇමතිවරුන්ගේ ආරක්ෂාව, අනුදැනුම ලැබෙන කොට, ඒ අයගේ අවශ්‍යතාව ඉෂ්ට වෙමින් යන කොට ඒක රටේ ජනතාවට හංගන්න පුළුවන් දෙයක් වන්නේ නැහැ. ඒ නිසා රටේ හැම කෙනෙකුම දන්නා කාරණයක් තමයි, මේ පිටුපස යටි අරමුණක් තිබෙනවා කියන එක. අනුර කුමාර ජනාධිපතිතුමා එදා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට මේ පාර්ලිමේන්තුවේදී විනාඩි 19ක් නිස්සේ චෝදනාවට ලක් කරපු කෙනා තියාගෙන කටයුතු කරන එකෙන් අපට තේරෙනවා, අර කියපු ඩොලර් මිලියන 1.8හි ඉතිරි අඩුව මෙවැනි පුද්ගලයන් හරහා පියවා ගන්නට සිදු වෙනවා කියලා.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

රජයේ අනෙකුත් සියලු වියදම් ගැන අපට කිසි ගැටලුවක් නැහැ. ඔබතුමන්ලා ඒවා දරන්න; ඒවා ගන්න. ඒවා ගැන අපේ කිසි විවේචනයක් නැහැ. ඔබතුමන්ලා Range Rover එකේ යන එක ඔබතුමන්ලාගේ ආරක්ෂාවට හොඳයි. සාමාන්‍ය වාහනයක යන කොට ඔබතුමන්ලාගේ කොඳු ගෙවෙනවා. ඒවාටත් ඔරොත්තු දෙන විධියට යන්න තමයි ඒ වාගේ පහසුකම් සැලසී තිබෙන්නේ. ඒ වාගේම, ඔබතුමන්ලා අවශ්‍ය වේගයෙන් යන්න ඕනෑ. ඔබතුමන්ලාගේ විනාඩියකුයි, අපේ විනාඩියකුයි, ගමේ ඉන්න ගොවි මහත්තයෙකුගේ විනාඩියකුයි අතර ලොකු වෙනසක් තිබෙනවා; වටිනාකම්වල වෙනසක් තිබෙනවා. "අපි කැබ් එකේ යන හින්දා මෙච්චරක් ඉතුරු කරලා තිබෙනවා" කිව්වාට, අර දූෂිත නිලධාරින් ආරක්ෂා කරලා, දූෂිත ක්‍රියාවලියට යන්න ඉඩ හැරලා තිබුණාම මේ රජයට ලැබිය යුතු විශාල ප්‍රමාණයක බදු මුදල් ඒ හරහා අපතේ යනවා කියන එක ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ. ඒ නිසා එවැනි බොරු, සරල දේවල් කියලා මේ රටේ ජනතාව රවටන්න කටයුතු නොකරන්න කියා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

පරිසරය සම්බන්ධවත් මම කිව යුතුයි. ඔබතුමන්ලා දන්නවා ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය පිළිබඳව. ප්ලාස්ටික් නිෂ්පාදනය කරන, ඒවා භාවිත කරන ආයතනවලටම ඒවායෙන් සියයට ප්‍රමාණයක් -සියයට 20ක් විතර- නැවත ලබා ගැනීමේ ක්‍රමයක් සකස් කිරීම වෙනුවෙන් අපි පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සම්මත කරලා තිබෙනවා. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා දැන් මාස 5කට ආසන්න කාලයක් වෙනවා. ඔබතුමන්ලා තවම ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවාද? ඔබතුමන්ලා පරිසරය ආරක්ෂා කරන්න කටයුතු කරනවා නම් ඒවා ක්‍රියාත්මක කරන්න ඕනෑ. ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය වෙන්නේ නැහැ. ඒවා පරිසරයට විශාල බරක් බවට පත් වෙලා තිබෙනවා. ලියනාඩෝ ඩිකැප්‍රියෝ කියන නළුවාගේ Facebook account එක හරහා අලි, පොලිතීන් කන දර්ශන පවා දාලා තිබෙනවා අපි දැක්කා. අපේ රට විශාල අපකීර්තියකට පත් වන විධියට එය viral වෙලා ගියා. ඔබතුමන්ලා පරිසර පද්ධතිය ගොඩ නහන්න ආරක්ෂිත වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙන්නේ කොහේද? ඒ ගෙන ආ පනත ඉක්මනින් ක්‍රියාත්මක කරලා ඒ ආයතනවලටම ඒ වගකීමත් දුන්නොත්, අපට ඒ අර්බුදයෙන් යම්කිසි ප්‍රමාණයකින් ගැලවෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කර ගන්න හැකියාව ලැබෙනවා. ඒ නිසා ඒ ආකාරයෙන් පරිසරය පිළිබඳව කටයුතු කරන්න ඕනෑ.

පසුගිය කාලයේ, විදේශ රටවල රෝහල්වලින් අයින් කරපු අපද්‍රව්‍ය පවා අපේ රටට ආවා. ඔබතුමන්ලා හිතුමතයට කන්ටේනර් නිදහස් කර යවනවා. හැබැයි, ඒවායේ මොනවා ආවාද කියලා දන්නේ නැහැ. ඒවා ඔය වාගේ කැළි කසළ ආපු ඒවාද දන්නේත් නැහැ. පසුගිය කාලයේත් ඒවා එළියට ආවා නේ. ඔබතුමන්ලා කන්ටේනර් තුන්සිය ගණනක් නිදහස් කරලා යැව්වා. ඒවා තුළ ඒ වාගේ කැළි කසළත් එන්න ඇති. ඒවාත් අපේ පරිසරයේ කොහේට හරි මුදා හරින්න ඇති. එහෙම නැත්නම් අපේ ගඟකට මුදා හරින්න ඇති. එහෙමත් නැත්නම් අපේ මුහුදු කලාපයේ මුහුදුබත් කරන්න ඇති. ඒ නිසා වගකීමක් ඇතිව මේ රටේ මේ පරිසර පද්ධතිය ආරක්ෂා කර ගන්නට අප සියලුදෙනා කටයුතු කළ යුතුයි. කෑගල්ල පැත්තේත් විවිධ ඉදිකිරීම් නිසා අපටම ආවේණික වෙච්ච මත්ස්‍ය විශේෂ පවා අභිජනනය වීම, බෝ වීම නතර වන තැනට කටයුතු සිද්ධ වනවා. ඒවා පිටුපස ඒ ප්‍රදේශයේ ඉන්න ඔබතුමන්ලාගේ බලවත් මන්ත්‍රීවරු ඉන්නවා කියලා තමයි අපට දැනගන්න ලැබිලා තිබෙන්නේ. කථාවට විතරක් කිව්වාට වැඩක් නැහැ, ක්‍රියාවෙනුත් මේ පරිසර පද්ධතිය ආරක්ෂා කරන්න කටයුතු කරන්න. ඒ නිසා පරිසර පද්ධතිය ගැන අපි මීට වඩා අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ජනගහනය එන්න එන්න වැඩි වන කොට, අපේ පරිභෝජනය ශීඝ්‍රයෙන් වැඩි වන කොට, පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය ප්‍රමාණය වැඩි වන කොට අප ඒවා සම්බන්ධයෙන් ක්‍රමවත් සැලැස්මක් ඇතුව කටයුතු නොකළොත් සිදු වන්නේ විනාශයක්. අපේ රටේ කුණු කඳු නාය ගිහිල්ලා ජීවිත අහිමි වීම වාගේ දේවල් විතරක් නොවෙයි, බෝ වන රෝගවලට ද අපේ රටේ අහිංසක දරුවන් ඇතුළු සියලුදෙනාට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ නිසා පරිසර කළමනාකරණය, කැළි කසළ කළමනාකරණය, ප්‍රතිචක්‍රීකරණය ඇතුළු සියලු කාරණා පිළිබඳව ඔබතුමන්ලා මීට වඩා අවධානය යොමු කරන්න. ඔබතුමන්ලා කොහොම හරි පළාත් පාලන මැතිවරණය පැවැත්වුවාම ප්‍රාදේශීය සභා ද ඇතුළුව අපේ පළාත් පාලන ආයතන බල ගැන්වුණාට පසුව ඒ ආයතන ටික මුල් කරගෙන අපේ රටේ කැළි කසළ ප්‍රතිචක්‍රීකරණය වෙනුවෙන් ඉක්මනින් වැඩි අවධානයක් යොමු කරන්න කියන ඉල්ලීමත් ඔබතුමන්ලාගෙන් කරනවා.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් අද වන කොට බරපතළ ගැටලු ගණනාවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අද අහන්න ලැබිච්ච ශෝකජනක පුවත තමයි, පසු ගිය දා වෙඩික්කරුවෙකුගේ වෙඩි ප්‍රහාරයකට ලක් වෙච්ච 'යුනිකෝන්' කියන ඇතා අද මේ වන කොට මිය ගිහින් තිබෙනවා කියන එක. පසුගිය දවසක දළයක් අහිමි වෙලා පලා ගිය 'සුමේධ' ඇතා දවස් ගණනක් තිස්සේ සොයමින් හිටියා. තමුන්නාන්සේලා රිළවුන්, වඳුරන් ගණන් කරන්න තමයි උත්සාහ කළේ. හැබැයි ඒ ඇතා සොයා ගන්න දවස් ගණනාවක් ගත වුණා.

එහෙම තත්ත්වයක් අද තිබෙන්නේ. එහෙම නම් අපට හිතාගන්න පුළුවන් කැලේ ඉන්න වඳුරන්, රිළවුන්, මොනරුන්, දඩු ලේනුන් ගණන් කිරීම ගැන. දළයක් අහිමි වෙච්ච සුමේධ ඇතා ඒ දළයත් දාලා එතැනින් පලා ගියාම, ඒ මාර්ගය ඔස්සේ ගිහිල්ලා ඒ ඇතා සොයා ගන්න දවස් කොච්චරක් නම් ගත වුණා ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට විදේශ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට විශාල ශක්තියක් ලබා දෙන පිරිසක් තමයි අලි ඇතුන් කියන්නේ. ඉතින් ඒ පිරිස ආරක්ෂා කර ගන්නවා වාගේම අනෙක් පැත්තෙන් ඒ සතුන් හරහා මේ රටේ මිනිසුන්ට -ජනතාවට- වන හානියත් වළක්වා ගන්න කටයුතු කළ යුතුව තිබෙනවා.

ඊයේ පෙරේදා 'මීනගයා' දුම්රියේ අලි රංචුවක් හැපුණාම, දුම්රිය ගමන් වෙලාව වෙනස් කළා. ඒ වාගේම අපේ ඇමතිතුමා අලි එක්ක WhatsApp ගනුදෙනුවකුත් කරන්න යෝජනා කරලා තිබුණා. ඒ විධියට අලුත් තාක්ෂණය යොදාගෙන ග්‍රාමීය කමිටු එක්ක එකතු වෙලා WhatsApp එක හරහා කටයුතු කරන්න යනවා. ඒ වාගේම අලින්ටත් WhatsApp number එකක් දීලා තියන්න. එතකොට අලියා එන්න හදන කොට ග්‍රාමීය කමිටුවේ කට්ටිය දැනුවත් කරාවි, "මම මේ වෙලාවේ රේල් පාර cross කරනවා. කෝච්චියක් එනවා නම් ඔබතුමන්ලා ඒක පොඩ්ඩක් ප්‍රමාද කර ගන්න" කියලා. එවැනි අලුත් කතන්දරවලට යනවාට වඩා හොඳයි ප්‍රායෝගික විසඳුමක් සෙවීම.

ඉන්දියාව බොහොම පැහැදිලිව මේ ගැටලුවට අවශ්‍ය විසඳුම් සොයාගෙන තිබෙනවා. අලියා එනවා නම්, ඒ පිළිබඳව detect කර ගන්න පුළුවන් විධියට කැමරා පද්ධති සවි කරලා, GPS තාක්ෂණය හරහා ඒ පණිවිඩය දුම්රියට ලැබෙන විධියේ ක්‍රමයක් ඒ රටේ සකස් කරලා තිබෙනවා. නමුත් අපේ රටේ අදටත් බැරි වෙලා තිබෙනවා, GPS තාක්ෂණය අපේ දුම්රිය සේවාවට එකතු කර ගන්නට. ඒ නිසා කෝච්චිය කොතැනද එන්නේ කියලා දන්නේ නැහැ. ප්‍රායෝගික නොවන විසඳුම්වලට නොව ප්‍රායෝගික විසඳුම්වලට යන්න ඕනෑ. එදා දවසේ ප්‍රශ්නයට නිකම් කථාවකින් උත්තරයක් දීලා ඒකෙන් මාරු වෙලා යනවාට වඩා හොඳයි, ඒ ගැටලුවලට ප්‍රායෝගික විසඳුම් දෙනවා නම්.

මේ ප්‍රශ්නයට විසඳුමක් විධියට දැන් දුම්රිය ප්‍රමාද කරලා තිබෙනවා. අපේ පුලතිසි දුම්රිය දැන් වෙනදාට වඩා පැයක් ප්‍රමාදයි. ජනතාව ඒ දුම්රියෙන් කොළඹට ආවේ උදෑසන ඇවිල්ලා වැඩක් කරගෙන සවස ආපහු ගමට යන්න බලාගෙනයි. නමුත් දැන් අලින් බෙරන්න කියලා හිතාගෙන දුම්රිය පැයකින් ප්‍රමාද කරලා තිබෙනවා. ඒ දුම්රිය ප්‍රමාද කළාට අනෙක් දුම්රිය වේලාව ඒකට අනුව ගළපා නැහැ. ඒ නිසා ඒ දුම්රිය එනකොට අනෙක් දුම්රිය හරස් වීම හේතුවෙන් ඒ සියල්ල ප්‍රමාද වෙලා එනවා. වෙන දා උදේ 9.00ට කොළඹින් බැහැපු කෙනා දැන් බහින කොට උදේ 10.30 හෝ 11.00 විතර වෙනවා. එතකොට ඒ මනිින්ගේ වැඩ කර ගන්න තිබිච්ච හොඳම පැය දෙකක් අහිමි වෙනවා. එමඟින් අලින් අනාරක්ෂිත වීම කියන ප්‍රශ්නයට විසඳුම් ලැබිලා නැහැ. මොකද, හරියටම කවුරු හරි දන්නවාද අලියා රේල් පාර මාරු වන වෙලාව? ඒ නිසා "මේ වෙලාවට තමයි අලියා රේල් පාර මාරු වෙන්න හිටියේ, ඒ හින්දා අපි කෝච්චිය පොඩ්ඩක් ප්‍රමාද කරගෙන ගියාම අලියා බේරෙනවා" කියන එක උත්තරයක් කියලා මම නම් හිතන්නේ නැහැ. තාක්ෂණය පිළිබඳව ලොකුවට කථා කරලා ආපු, මේ රටේ ඩිජිටල් ආර්ථිකයක් ගොඩ නහන්න ආපු ඔබතුමන්ලා මේ වාගේ සරල, බොරු කාරණාවලට කාලය වෙන් කිරීම වැදගත් නොවන දෙයක් කියලායි මා හිතන්නේ.

ඒ වාගේම අපි දැක්කා, ආණ්ඩුව ආපු ගමන් කලබලයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ අලි එක්කාසු කරගෙන ගියා, විල්පත්තුව border එකට. පොලීසිය, හමුදාව ඔක්කෝම දාගෙන ඒ අලි ටික කොහොම හරි තල්ලු කරගෙන, තල්ලු කරගෙන ගියා. දවස් ගණක්ම තිබිච්ච එකම රාජකාරිය වුණේ ඒක. කොහොම හරි ඒ අලි ටික අරගෙන ගිහින් විල්පත්තු border එක පෙනී පෙනී ඇලයාපත්තුවේ, ඔයාමඩුවේ අත්හැරලා දාලා ආවා. ඊට පස්සේ ඒ අලි ඒ පැත්තේ වටේ පිටේ තිබුණු සියලු හේන් ටිකට දවස ගානේ කඩා වැදුණා. ඒ අලින්ට ආයේ කැලේ ඇවිදින්න අවශ්‍යතාවක් නැහැ. මොකද, හේන් වගා කරලා තිබෙනවා. ඉතින් ඒ අලි රංචුව පිටින් දවස ගානේ ගිහිල්ලා එක එක හේනට වැඩේ දීලා එනවා. දැන් ඒ තත්ත්වයට පත් කරලායි තිබෙන්නේ. ඉතින් මේවා ප්‍රායෝගික නොවන විසඳුම්. හරක් ගාලක් දක්කාගෙන ගියා වාගේ අලි ටිකත් අරගෙන ගිහිල්ලා අත් හැරලා දැම්මාම මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා හිතාගෙන කටයුතු කරන තත්ත්වයක් තමයි අපි දැක්කේ. එහෙම නොවන ප්‍රායෝගික විසඳුම් ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරන්න ඕනෑ.

අනෙක් පැත්තෙන් වනජීවී එක කටයුතු කරන ආකාරය බලන්න. ඉඩම් ටික අත්පත් කර ගැනීමේදී බලය ඇත්තන්ට ලොකු හැන්දෙන් බෙදලා තිබෙනවා. එයාලා ගිහිල්ලා තමන්ට ඕනෑ ඕනෑ විධියට ඉඩම් අත් පත් කරගෙන කටයුතු කරනවා; එක එක ව්‍යාපෘතිවලට ඉඩම් ටික ලබා දෙනවා. හැබැයි සාම්ප්‍රදායිකව, පාරම්පරිකව තමන්ගේ පියාගෙන් උරුම වෙලා, සීයාගෙන් උරුම වෙලා ආපු හේනට එක කන්නයකදී යන්න බැරි වෙලා තිබුණා නම්, ඒ හේතුවෙන් ඒක ලඳු කැලෑවක් බවට පත් වුණා නම් ඊළඟ සැරේ ගිහිල්ලා ඒ හේන සුද්ද කරන්න හදන කොට පෙනෙනවා, වනජීවී එකෙන් ඇවිත් මායිම් ගල් දාලා ගිහින් කියලා; එහෙම නැත්නම් වන සංරක්ෂණ එකෙන් ඇවිත් මායිම් ගල් දාලා ගිහින් කියලා. ඉතින් අම්මා මුත්තා කිව්වත් ඒ ඉඩම් ආයේ ඒ නිලධාරින්ගෙන් ගලවා ගන්න එක නම් කරන්න බැහැ. ඒවා සදාකාලිකව කැලේට අරින්න වෙනවා. හැබැයි බලය ඇත්තෝ අනෙක් පැත්තෙන් අක්කර සියගණන් අත් පත් කර ගන්නවා. නමුත් තමන්ගේ ජීවන වෘත්තිය පවත්වාගෙන යන එකට, තමන්ගේ දරුවාගේ කෑම වේලට අවශ්‍ය කරන පෝෂ්‍යදායී ආහාර වේල ලබා දෙන එකට, විකුණන්න නොව යැපුම සඳහා හේන් කැල්ලක් කරගෙන යන එකට තමයි වැට බැඳලා තිබෙන්නේ. ගම අවට පිහිටි ඒ හේන් ටිකේ වැඩ කළා නම් සවසට ඒ කටවිය ඒ හේන්වලට යනවා, පැල් රකින්න. එතකොට අලියා ගම් වදින එකත් නතර වෙනවා. නමුත් දැන් හේන් ටික කැලේට ඇරලා, ගෙදර ටොයිලට් එක ළඟට එනකල්ම රක්ෂිත කැලය කියලා මායිම් ගල් දාලා, අලියා ගම් වදින එක වළක්වන්න වෙන වෙන දේවල් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් ලොකු ඉල්ලීමක් තිබෙනවා. පසුගිය කාලයේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇවිල්ලා මොකද කළේ? ඒ කට්ටියට තිබුණේ ලක්ෂයේ කථා. මාර්ග කිලෝමීටර් ලක්ෂයක්, රැකියා ලක්ෂයක් වාගේ කථා. පොඩි පොඩි ඒවා නොවෙයි. පොඩි පොඩි ඒවා තිබුණේ නැහැ නේ. රැකියා ලක්ෂයේ වැඩසටහන කියලා එකක් පටන් අරගෙන අභිංසක පිරිසක් රුපියල් 22,500ක ගෙවීමකට බඳවා ගෙන මඩව මඩවා හිටියා. හොඳ හොඳ රැකියා කරමින් හිටපු තරුණයෝ ඇවිල්ලා "අනේ රජයෙන් දෙන රස්සාවක් නේ. ඒක ටොප් නේ" කියලා ඒවා භාර ගත්තා.

අවසානයේ ඒකෙත් බර ආණ්ඩුවට වැටුණා. පසුගිය කාලයේ බංකොලොත් වෙච්ච ආර්ථිකය නිසා රනිල් වික්‍රමසිංහ රජය තුළින් මේ අයගෙන් කොටසක් ස්ථිර කරලා ස්ථිර පත්වීම් ලබා දුන්නා. හැබැයි, අවාසනාවට සමහර අය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගියා. අපේ ගම්වල තිබුණු ප්‍රශ්න නිසා ගම ආරක්ෂා කරන්න, ගමේ ජනතාවගේ ගොවිතැන ආරක්ෂා කරන්න අවශ්‍යතාවක් විධියට දකින අලි වැට ආරක්ෂා කරන්න රැකියා ලක්ෂයේ ව්‍යාපෘතියට ඇතුළත් වුණු මේ අයගෙන් කොටසක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඇතුළත් වුණා. අනෙක් සියලුදෙනා ස්ථිර කළා. නමුත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කොහේද තිබුණු කතන්දර කන්දක් ඇදගෙන ඇවිත් ඒ අයගේ ස්ථිර කිරීම නතර කළා. ඒක වෙන්න දුන්නේ නැහැ. ඊට පසුව මේ අය අධිකරණයට ගියා. දැන් අධිකරණයෙන් ඒ සහනය ලැබිලා තිබෙනවා. නමුත් තවමත් ඒ අය ස්ථිර කරන්න කටයුතු කරලා නැහැ. ඒ නිසා දැන් ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා. දැන් වසර ගණනාවක් තිස්සේ ඒ පිරිස රාජ්‍ය සේවයට අනුයුක්ත වෙලා ඉන්නේ. ඒ අය අලි වැට රැකීමේ කටයුතුවල නිරතවෙලා ඉන්නේ. ඒ නිසා දැන් ඒ අය රාජ්‍ය සේවයෙන් එළවන්න නොවෙයි තිබෙන්නේ. ඒ අයගේ තරාතිරම, විවිධ පෞද්ගලික කාරණා තිබෙන්න පුළුවන්. ඒ අය අතර වයස අවුරුදු 36 ඉක්මවූ අය ඉන්න පුළුවන්, අට පාස් නැති අය ඉන්න පුළුවන්. එවැනි විවිධ දේවල් තිබෙන්න පුළුවන්. හැබැයි, දැන් ඒ අය රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරලා ඔබතුමන්ලා ඒ අයගෙන් වැඩත් අරගෙන තිබෙනවා. ඒ නිසා ඒ අය ස්ථිර කරලා ඒ අයගේ අභිමානය රැක ගන්න, වෘත්තියේ ගරුත්වය ආරක්ෂා කරන්න අවශ්‍ය ශක්තිය ලබා දෙන්න කියන කාරණය මම කියා සිටින්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට මට සහභාගි වෙන්න බැරි වුණා. මට හාල් ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න තිබෙනවා. ඔබතුමන්ලා බලයට ආපු ගමන් හාල් ප්‍රශ්නය, පොල් ප්‍රශ්නය, රිළා ප්‍රශ්නය ආවා. හාල් ප්‍රශ්නය එනකොට ඔබතුමන්ලා කිව්වා, "පසුගිය රජයන්ට හාල් සංචිතයක් තිබුණේ නැහැ. ඒ නිසා හාල් ප්‍රශ්නය ඇති වෙන අන්තිම අවස්ථාව මේක. මෙතැනින් පස්සේ මේ රටේ හාල් පිළිබඳ ප්‍රශ්නයක් එන්න දෙන්නේ නැහැ. රජය සතුව සංචිතයක් තියා ගන්නවා. එක එක ව්‍යාපාරිකයන්ට ඕනෑ විධියට මේ රටේ හාල් මිල නියාමනය කරන්න දෙන්නේ නැහැ" කියලා. ඒ කියිවාරු ගහලා "අපි වී මෙච්චර මිලදී ගන්නවා" කිව්වා. දැන් කියන්න බලන්න, ඔබතුමන්ලා ගත්ත වී ප්‍රමාණය කොච්චරද කියලා? වී මෙට්‍රික්ටොන් කීයක් අරගෙන තිබෙනවාද කියන්න. ඔබතුමන්ලා හාල් වෙළෙඳ පොළට බලපෑම් කරන්න පුළුවන් තරම් හාල් මෙට්‍රික්ටොන් ප්‍රමාණයක් ගත්තාද? වීවලට සාධාරණ මිලක්

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

ගොවියාට දුන්නාද? ඒ කිසිම දෙයක් නැහැ. ලබන කන්නය වෙනකොට ඉතා විශාල මිලකට මේ රටේ පාරිභෝගිකයාට හාල් ටික ගන්න සිද්ධ වෙනවා. ඔබතුමන්ලාට එදාට තිබෙන එකම විකල්පය තමයි පසුගිය වතාවේ කළා වාගේ හාල් ටික ආනයනය කරලා පාරිභෝගිකයාට ලබා දෙන එක. මේ රටේ ව්‍යාපාරිකයා ලාභයක් ලබන එකට,- වී වේලලා, තම්බලා, කොටලා ලාභයක් ලබන එකට- ඔබතුමන්ලා සාප කරනවා; වෛර කරනවා. ඒකට මාෆියාව කියලා කියනවා. එහෙම කියන රජය රුපියල් 65ක බද්දක් ගහලා, "අපි කෝටි 1,000ක බදු ආදායමක් ලැබුවා" කියලා පම්පෝරි ගහනවා. ඉතින්, අර ඩඩ්ලි මුදලාලි හොඳයි නේ. එයා ගන්නේ රුපියල් 10යි නේ. වී ගබඩා කරලා, වී තම්බලා, වේලලා, කොටලා, බැංකුවලට පොලී ගෙවලා රුපියල් 10ක් ලාභ ලබන කොට, ජනතාවාදී ආණ්ඩුව රුපියල් 65ක් ගත්තා නේ. එහෙම නම් හරි කළු කඩේ කවුද? මේ වතාවේත් ඔබතුමන්ලාට හාල් ප්‍රශ්නයට විසඳුමක් නැහැ. ඔබතුමන්ලා ගොවියාට සාධාරණ මිලක් ලබා දුන්නේත් නැහැ. ඒ නිසා හෙට දවසේත් නැවත මේ රටේ හාල් පාරිභෝගිකයා අසරණ වෙනවා. ඔබතුමන්ලා හාල් ආනයනය කරලා මේ රටේ විදේශ විනිමය ටික - අපි සතුව තිබෙන ඩොලර් ටික - විදේශ රටකට පූජා කරලා ඒකත් මාෆියාවක් කරගෙන පම්පෝරි ගහයි. අපි හාල් ආනයනය කළාට අපි ඒකෙන් මෙච්චර බදු ආදායමක් ගත්තා, ඒකෙන් මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳනවා කියලා එදාටත් කයිවාරු ගහයි. මේ ප්‍රශ්නවලට ප්‍රායෝගික විසඳුම් දෙන්න ඔබතුමන්ලා අපොහොසත් වෙලා තිබෙනවා.

පසුගිය ආණ්ඩුවලට බැණ බැණ ඉන්න තිබුණු කාලය දැන් ක්‍රම ක්‍රමයෙන් ඔබතුමන්ලාගෙන් ගිලිහී යනවා. දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට බණින කාලය ඇවිත් තිබෙනවා. දැන් ගම්වල ජනතාව එක්කෙනා, දෙදෙනා, තුන්දෙනා එහෙම කථා කරනවා. ෆේස්බුක් එකේ ඔබතුමන්ලා වෙනුවෙන් පෙනී හිටපු අය දැන් ඔබතුමන්ලාට විරුද්ධව හඬ නඟනවා. පසුගිය කාලය කියන තැටිය ගහගෙන හිටපු කාලය දැන් අවසන් වෙමින් යන්නේ. මේ අප්‍රේල් මාසය පැන්නාට පස්සේ ඔබතුමන්ලාට පසුගිය ආණ්ඩුවලට සාප කර කර ඉන්න අවස්ථාව දෙන්නේ නැහැ, මේ රටේ ජනතාව. ඒ නිසා ප්‍රායෝගික විසඳුම්වලට යන්න.

අනෙක් පැත්තෙන් පාස්කු ප්‍රහාරය නිසා මේ රටේ ක්‍රිස්තු බැතිමතුන් ඔබතුමන්ලාට විශාල සහයෝගයක් ලබා දුන්නා. මොකද, තමන්ගේ භක්තිකයන්, ඔවුන්ට ඉතාම වැදගත් දිනයක පල්ලි තුළ ඝාතනයට ලක් වුණු එක ගැන ඇති වුණු කැක්කුමට. ගිය වතාවේ ගෝඨාභය රාජපක්ෂ විශ්වාස කරලා ගෝඨාභය රාජපක්ෂ දිනෙව්වා. ඒ අය පසු කාලීනව ගෝඨාභය රාජපක්ෂටම චෝදනා කළා. ඊට පසු මෙවරත් ඇත්ත කියන කෙනා පෙනී පෙනී ආයෙත් ක්‍රිස්තියානු ජනතාව ඔබතුමන්ලාගේ රැවටීමට අහුවෙලා ඉන්නවා. අපි බලයට ආවාම දවසින්, සතියෙන්, ඉස්සෙල්ලාම මේ මහ මොළකරු පෙන්වා දෙනවා කිව්වා. නමුත් තවම ඒක කරන්න බැරි වෙලා තිබෙනවා. මහ මොළකරු සොයන්නේ කොහේද? තවම බැරි වුණා නේ, මේ රටේ පොලිස්පතිතුමා හොයාගන්න. හිටපු පොලිස්පති නම් තව කමක් නැහැ. දැන් ඉන්න පොලිස්පති සොයා ගන්නත් බැහැ. සෙව්වන්දි සොයාගන්නත් බැරි වුණා. අධිකරණය ඇතුළට ඇවිල්ලා කෙනෙක් මරලා ගියා. ඒත් තවම සොයාගන්න බැරි වුණා. මිරිස් කුඩු ගැහුවා කියලා ඔබතුමන්ලා මිරිස් කුඩුකාරයා කියලා එයාට කියන්නේ. පාර්ලිමේන්තුවේ හිටපු ඒ මන්ත්‍රී සොයාගන්නත් බැහැ. ඉතින්, පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු හොයලා දෙයි කියලා කවුරු හරි කෙනෙක් හිතාගෙන ඉන්නවා නම්, අනේ පව්! දැන් කියනවා ඔබතුමන්ලාගෙන් ටියුෂන් ගන්නලු. ගේමක් ගහලා හැංගිලා ඉන්නේ කොහොමද කියලා නම් ඔබතුමන්ලාගෙන් ෂෝක් එකට ටියුෂන් ගන්න පුළුවන්. හොරා අල්ලන ටියුෂන් නම් බංකුවල නොවෙයි, ඩෙස් උඩ නැඟලාවත් අපට මේ කට්ටියගෙන් ගන්න වෙන්නේ නැහැ.

හැබැයි, ආරංචියක් තිබෙනවා ඔබතුමන්ලාගේ සුවිශේෂී ආරක්ෂාව යටතේ, ඔබතුමන්ලාගේ මූල්‍ය සහකරුවකු විධියට පෙනී සිටින හිටපු අමාත්‍යවරයෙකුගේ ගෙදර මේ කට්ටිය ඉන්නවා කියලා. හැබැයි ඒ ගේ වටේ කැරකී කැරකී ඉන්නවා මිසක් ඒ ගේ search කරන්න යන්නේ නැහැ. ඒ වෙනුවට ගිහිල්ලා කපු මහත්වරුන්ගේ ගෙවල් search කරනවා. හැබැයි, මේ රටේ පොඩි දරුවාගේ ඉඳන් කියනවා අහවලාගේ ගෙදර තමයි ඉන්නේ කියලා. ඒ නිසා මම කියන්නේ මාධ්‍යත් අරගෙන ගිහිල්ලා නිකමට check කරපල්ලාකෝ. ඒක check කරන්න යන්න කැක්කුමක් නැහැ. මේ කට්ටිය කියනවා ඔබලාගේ මූල්‍ය සහකරු එයා කියලා. පසුගිය කාලයේ VFS ගනුදෙනුවක් ගැන චෝදනා කළා. දැන් කෝ අද කථා කරනවාද ඒ හොරා ගැන?

මම ඊයේ පෙරේදා අපේ පුතාට පාස්පෝට් එක ගන්න ගියා. නිකම් කඩදාසි කොළ හොඳයි ඒකේ තිබෙන කොළයට වඩා. දෙපාරක් මොකක් හරි එකක දැම්මොත් ඉරිලා යනවා. ඒක බාල කොළ තිබෙන පාස්පෝට් එකක්. ඔබතුමන්ලා කිව්වා පාස්පෝට් පෝලිම් ඉවර කළා කියලා. මාස දෙකක් පෝලිමේ ඉඳලා තමයි එක් දින සේවාව ලබා ගන්න ඕනෑ. ඒ වාගේ තැනකට තමයි ඔබතුමන්ලාගේ කෙරුවාවල් ගමන් කරලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මට තව වේලාව ගන්න පුළුවන්ද දන්නේ නැහැ. අපේ ප්‍රධාන සංවිධායකතුමා සභාවේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අමතර වේලාවකුත් එක්ක දීලා තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
කථා කළ යුතුව තිබුණු තව ප්‍රධාන කාරණා කිහිපයක්ම තිබෙනවා.

කලින් දැනගෙන අපි කථා නොකර හිටපු කාරණයක් මේක. මේවා දැනගත්තාම පාතාලය තවත් ක්‍රියාත්මක වෙනවා. අනුරාධපුරයේ CCTV කැමරා එකක්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවා අපි කියන්නේ නැතිව හිටියේ ඒවා දැනගත්තාම තවත් වැඩිපුර පාතාලය ක්‍රියාතමක වෙන හින්දා. ඔබතුමන්ලා ඇවිල්ලා පම්පෝරි ගැහුවා police barriers ඔක්කෝම අයින් කරලා පාර clear කළා කියලා. ඒ නිසා අද භය නැතිව පාතාලය ක්‍රියාත්මක වෙනවා. ඉස්සෙල්ලා ආරක්ෂාව තහවුරු කරලා police barriers අයින් කළා නම් සාධාරණයි කියන්න පුළුවන්. Police barriers ටික අයින් කරපු නිසා පාතාලය ක්‍රියාත්මක වෙනවා. අද දවස ගානේ පළමුවෙනි ප්‍රවෘත්තිය වෙන්නේ අහවල් තැන අහවල් ප්‍රමාණයක් ඝාතනය කරලා තිබෙනවා කියන එක. ඒ නිසා ඔබතුමන්ලාගේ කයිවාරු පැත්තකින් තියලා මේ කියන කාරණා පිළිබඳව ක්‍රියාත්මක වෙලා විසඳුම් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

පළාත් පාලන මැතිවරණයත් එනවා. අද බුද්ධ ශාසනය ගැන කථා කළ අය, දළදා මාළිගාවට බෝම්බ ගහපු අය, දළදා වහන්සේ පෙන්වලා දළදා වහන්සේගේ ආශිර්වාදයෙන්, ඒ රැල්ලෙන්ම මේ පළාත් පාලන මැතිවරණයත් ජයග්‍රහණය කරන්න උත්සාහ කරනවා. එය පිළිකුලෙන් යුතුව හෙළා දකිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ඒ නිලධාරියා වැඩ තහනමට ලක් වෙලා ඉන්නකොට එතුමන්ලාගේ නායකයෙක් වූ රනිල් වික්‍රමසිංහ තමයි නැවත ගෙනැල්ලා දාලා තිබෙන්නේ, ඡන්දයට දින කිහිපයකට කලින්. ඒ පිළිබඳ විමර්ශනයක් මේ වෙනකොට අමාත්‍යාංශයේ ලේකම්තුමා මැදිහත් වෙලා සිදු කරගෙන යනවා. ඉදිරියේදී ඒ පිළිබඳව අදාළ ක්‍රියාමාර්ග ගැනේවි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.17]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු සහ පරිසර අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ විවාදයේ අවසාන භාගයේ කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා.

පරිසර අමාත්‍යාංශය රටේ පරිසරය සුරකිනවා. Clean Sri Lanka වැඩසටහනයි, පරිසරයයි සමගාමීව යන්නේ. පරිසර ඇමතිතුමනි, මට පෙනෙන විධියට නම් දැන් Clean Sri Lanka ටිකක් නැවතිලා වාගේ. Clean Sri Lanka වැඩසටහන යනකොට පසුගිය කාලයේ ඔබතුමන්ලාගේ සමහර ඇමතිලා වැව්වල බැස්සා, සමහරු පාරවල් ශුද්ධ කළා, මුහුදු ශුද්ධ කළා. ඒ විධියට නොයෙකුත් දේවල් කළාට ඒක දැන් නැවතිලා වාගේ කියලා මට පෙනෙනවා. Clean Sri Lanka එකට හමුදාව, බන්ධනාගාරවල ඉන්න අය සම්බන්ධ කර ගන්න එපා. ගෝඨාභයගේ කාලයේ විපක්ෂයේ හිටපු ඔබතුමන්ලා කිව්වෙත් ඒ අය සම්බන්ධ කර ගන්න එපා කියලානේ. රාජ්‍ය සේවකයෝ, රාජ්‍ය යාන්ත්‍රණය සම්බන්ධ කරගෙන Clean Sri Lanka කරන්න බැහැ. Clean Sri Lanka කරන්න තමයි රැකියා ලක්ෂයකට බඳවා ගත්තේ. Clean Sri Lanka කරන්න තමයි නගර සභාවල, ප්‍රාදේශීය සභාවල මාර්ග කම්කරුවන් සහ කසළ කම්කරුවන් ඉන්නේ. ඒ වාගේ තනතුරු තිබෙනවා. හැම ප්‍රාදේශීය සභාවකම, නගර සභාවකම ඒ වෙනුවෙන් වැඩ කරන්න කම්කරුවෝ ඉන්නවා. ඒකට ඒ ප්‍රාදේශීය සභා, නගර සභා ශක්තිමත් කරන්න. පළාත් පාලන ආයතන ඡන්දය තියනවා වාගේම, ඒ ප්‍රාදේශීය සභා නගර සභාවලට සේවකයෝ බඳවා ගන්න, අඩු පාඩු පුරවා ගන්න. එතකොට ඒ අයගේ රාජකාරිය Clean Sri Lanka තමයි. අද ප්‍රාදේශීය සභාවල කසළ කම්කරුවෝ ඉන්නවා, මාර්ග කම්කරුවෝ ඉන්නවා. මාර්ග කම්කරුවෝ ගම්මාන ගානේ යවන්න පාරවල් ටික ශුද්ධ කරන්න, බෝක්කු ටික ශුද්ධ කරන්න.

ඒවා කරන්න ඕනෑ ආයතන තිබෙද්දී, Clean Sri Lanka කියලා දිනයක් දාගෙන ඔෆිස්වල ඉන්න රාජ්‍ය සේවකයෝ දවසකට පැය දෙකකට විතර පාරට ගිහිල්ලා, පැය අටෙන් ඉතුරු වේලාව නිකම් ඉඳලා පොඩි සොමියකුත් දාලා ගෙවල්වලට යනවා. Clean Sri Lanka කියලා වැඩේ පෙන්වනවා. මේ රටේ ඒ විධියට Clean Sri Lanka වැඩසටහන කරන්න බැහැ.

මම මේ වෙලාවේ මේ කාරණයත් කියන්න ඕනෑ. අද මම එනකොට දවල් ප්‍රවෘත්තිවල දැක්කා, සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා කියනවා, "චන්ද්‍රිකා බණ්ඩාරනායකයි, රනිල් වික්‍රමසිංහයි එක ඉස්කෝලයට ලු ගියේ" කියලා. විහිළුවක් නේ. රනිල් වික්‍රමසිංහ මහත්තයා ගියේ රාජකීය විද්‍යාලයට. ඒක පිරිමි ඉස්කෝලයක්. චන්ද්‍රිකා නෝනයි, රනිල් වික්‍රමසිංහ මහත්තයායි කවදාවත් එක ඉස්කෝලේ එක පන්තියේ හිටියේ නැහැ. "චන්ද්‍රිකා බණ්ඩාරනායකයි, රනිල් වික්‍රමසිංහයි එක ඉස්කෝලේ ගියා ලු. යාළුවෝ ලු. ඒක නිසා ලු බටලන්ද වාර්තාව එළියට දැමීමේ නැත්තේ" කියනවා. රාජකීය විද්‍යාලය පිරිමි පාසලක් කියලා සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා දන්නේ නැහැ. ඒ කථාව අද දවල් "දෙරණ" ප්‍රවෘත්තිවල විකාශනය වුණා. ඒ නිසා බොරු බේගල් අදින්නේ නැතුව හරියට හොයලා බලලා වචන පාවිච්චි කරන්න කියන එක මම මේ සභාවේදී කියන්න ඕනෑ.

මේ වෙලාවේ බටලන්දක් ඇදගෙන ඉඳලා වැඩක් නැහැ. මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ මහින්ද රාජපක්ෂගේ ගෙදර ඇදාගෙන කථා කර කර හිටියා. මාස තුනක් විතර මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ගෙදර ගැන කථා කර කර ඒක පිටිපස්සේ ගියා. අදත් මහින්ද රාජපක්ෂ ඒ ගෙදර ඉන්නවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවට තවමත් මහින්ද රාජපක්ෂ ගෙදරින් එළියට දාගන්න බැරි වුණා. මහින්ද රාජපක්ෂ මහත්තයා ගෙදරින් යවනවා කිව්වා. අද යන්න කිව්වා, හෙට යන්න කිව්වා. ගියේ නැහැ නේ. උසාවි යනවා කිව්වා, ගියේ නැහැ නේ. උසාවි ගියේත් නැහැ, එතුමා ගෙදරින් යවා ගන්නත් බැරි වුණා. ඒ මානෘකාව පරණ වෙන කොට, ඔබතුමන්ලාට ඒ මානෘකාව වැඩක් නැති වෙන කොට තමයි දැන් මේ බටලන්දක් බදාගෙන ඉන්නේ. මම මේ රටේ මිනිසුන්ට කියන්නේ, තව මාස දෙකකට බටලන්ද මේ රටේ තියේවි. ඒවා එනවා; යනවා. ඒ වාගේ ආවා ගිය ඒවා ඕනෑ තරම් තිබෙනවා.

පරිසර අමාත්‍යාංශය කියන්නේ රටේ හොඳ ආයතන කිහිපයක් තිබෙන තැනක්. හැබැයි, පරිසර අමාත්‍යාංශයට එකතු වෙන්න ඕනෑ ආයතන ඔබතුමාට එකතු කරලා දීලා නැහැ. පරිසර අමාත්‍යාංශය යටතේ තිබුණු සමහර ආයතන මේ සැරේ වෙනත් අමාත්‍යාංශ යටතට ගිහිල්ලා තිබෙනවා. නමුත් මේ රටේ පරිසර බලපත්‍රයක් හෝ මොනවා හරි දෙනකොට පරිසර වාර්තාව නැතුව මේ රටේ මොනවාත් කරන්න බැහැ. පරිසර ඇමතිතුමනි, පරිසර වාර්තාවක් ගන්න ගියාම ප්‍රශ්න තිබෙනවා. මිනිසුන්ට නිදහසේ වැඩක් කරන්න ඉඩ නැත්තේ පරිසර වාර්තාව ගන්න කියන එකත් එක්ක. ඒක නිසා පරිසර අමාත්‍යාංශය මීට වඩා ඉක්මන් කරලා වැඩ කරන්න වෙනවා. හොයලා බලලා, ජනතාවට දැනෙන්න වැඩ කරන්න වෙනවා.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයත් එහෙම තමයි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට කොච්චර සල්ලි හොයලා දෙන්න ගියත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට සල්ලි ගන්න වුවමනාවක් නැහැ. වැලි ටිකක් බාන්න ගියාම, වැලි ටිකක් අදින්න ගියාම වැලි ලොරිකාරයාට, වැලිවලින් ජීවත් වෙන

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

මිනිසුන්ට ප්‍රශ්න ගොඩක් තිබෙනවා. අද මට කථා කරලා ඒ වාගේ සිද්ධියක් කිව්වා. අම්පාර පැත්තේ ගල්කොරි කරන මිනිසුන්ට බලපත්‍ර දෙන්නේ නැහැ. ඒක නවත්වලා තිබෙනවා. ඒ වාගේ නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළේත් විශාල ප්‍රශ්න තිබෙනවා. වැඩක් කර ගන්න භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට ගියාම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වැඩ වෙන්න ටිකක් ප්‍රමාද වෙනවා. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කියන්නේ මේ රටට සල්ලි හොයන්න පුළුවන් සම්පතක්. රටට සල්ලි හොයන්න තිබෙන ආයතනයක්. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය 1994න් පස්සේ තමයි තැනින් තැන කාර්යාල දැම්මේ. බදුල්ල දිස්ත්‍රික්කයේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විවෘත කළේ 1997 හෝ 1998දී ෆවුසි ඇමතිතුමාගේ කාලයේ. බලය විමධ්‍යගත කරලා පළාත් මට්ටමින් ගිහිල්ලා දැන් කාර්යාල පිහිටුවා තිබෙනවා. දැන් පරිසර කාර්යාලය තිබෙනවා, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කාර්යාලය තිබෙනවා. මිනිස්සු ඉස්සර දෙහිවලට එන්න ඕනෑ, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබා දෙන බලපත්‍රය ගන්න. දැන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් දෙන ඒ බලපත්‍රය බදුල්ලෙන් ගන්න පුළුවන්. ඉස්සර ඒ කාර්යාල අම්පාරට තිබුණේ නැහැ; මොනරාගලට තිබුණේ නැහැ. හැබැයි, ඒක විමධ්‍යගත වෙලා තිබෙනවා. විමධ්‍යගත වෙලා තිබුණා කියලා රටේ ජීවත් වෙන ඒ කර්මාන්තවල යෙදෙන අයට ඉක්මනට ඒ සහන ලබා දෙන්න පුළුවන්ද කියන එක මම නම් දන්නේ නැහැ. ඇමතිතුමාට ඒ ගැනත් ගොඩක් හොයලා බලන්න වෙයි. පරිසර බලපත්‍රයක් නැතුව මේ රටේ කිසි දෙයක් කරන්න බැහැ. පරිසර බලපත්‍රය දෙන්නේ නැත්නම් අපට මේ රටේ කිසිම දෙයක් කරන්න බැහැ. කර්මාන්ත කරන අයටත් එහෙමයි. මොනවා කරන්න ගියත් පරිසර බලපත්‍රය අවශ්‍යයි. ඒක නිසා පරිසර බලපත්‍ර දෙන එක පොඩ්ඩක් ඉක්මන් කරන්න කියන්න. ඒකට මොනවාද ඉල්ලන ලියකියවිලි? ඒවා අවශ්‍ය නැති ලියකියවිලි නේ. පළාත් පාලන ඡන්දයට නාම යෝජනා පත්‍රයක් භාරදෙන්න ගියාම මැතිවරණ කාර්යාලයෙන් ඉල්ලන්නේ නැති ලියවිල්ලක් නැහැ නේ.

නාම යෝජනා භාරදෙන කොට තරුණ අපේක්ෂකයෝ දාලා, තරුණ list එකක්, කාන්තා list එකක් විධියට වෙනම lists දාලා අතිවිශාල ලියකියවිලි මිටියක් කච්චේරියට භාර දෙන්න ඕනෑ. මේ කොළ කැලි ප්‍රමාණය පොඩ්ඩක් අඩු කරන්න ඕනෑ. ඒ ගතවන කාලය අඩු කරන්න ඕනෑ. ඒ කොළ කැලි අඩු කරලා ටිකක් ඉක්මනට වැඩක් කරන්න පුළුවන් ක්‍රමයක් හදන්න. පසුගිය අවුරුදු 76ක් ගැන කියමින් අපට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ. රනිල් වික්‍රමසිංහට බැණලා වැඩකුත් නැහැ. අභවලා දැම්මේ රනිල් වික්‍රමසිංහ කිය-කියා ඉඳලා වැඩක් නැහැ. මේ ආණ්ඩුවට දින 150ක් පහුවෙලා දැන් දින 180ක් වෙලා තිබෙනවා. ඊළඟ මාසය වෙනකොට දින 210යි. මෙහෙම ගිහිල්ලා ආණ්ඩුවට අවුරුද්දකුත් සම්පූර්ණ වෙයි. අන්තිමේදී ගහපු බෙරයකුත් නැතිවෙයි, බෙරේ පළුවකුත් නැතිවෙයි. එම නිසා ආණ්ඩුව ටිකක් උණු උණුවේ වැඩ කළොත්, උණු උණුවේ වැඩ පෙන්නුවොත්, ආණ්ඩුව ගැන ජනප්‍රිය භාවයක් ඇති වෙයි. 2015දීත් ඔහොම තත්ත්වයක් තිබුණා. දින 100යි කිව්වා. දින 100 ආණ්ඩුව ආවාම මිනිස්සු හිතුවා "දින 100යි - වැඩ කෝටියයි" කියලා. වැඩ පෙන්නුවේත් නැහැ, දින 100ත් නැහැ, වැඩත් නැහැ. අන්තිමේදී 2018 පළාත් පාලන ආයතන ඡන්දය පැවැත්වුණා. දින 100ට වැඩ පෙන්නුවේ නැති නිසා පළාත් පාලන ආයතන ඔක්කෝම අලුතින් දාපු පොහොට්ටුවට ගලවාගෙන ගියා. ඒක නේ වුණේ. දින 100 ආණ්ඩුව වැඩ පෙන්නුවේ නැති නිසා පළාත් පාලන ඡන්දයේදී එම ආයතන ඔක්කෝම ටික කඩාගෙන බිඳගෙන අලුතින් දාපු පොහොට්ටුවට ගියා. ඒක තමයි වුණේ.

දැන් සමහර අය හිතාගෙන ඉන්න පුළුවන්, පළාත් පාලන ආයතන ටික සියයට 100ක්ම දිනයි කියලා. ඔබතුමන්ලා පළාත් පාලන ආයතන සියයට 100ක්ම දිනන්නේ කොහොමද? ඔබතුමන්ලා පිළිගන්න, ඔබතුමන්ලාගේ ජනාධිපති පත්වෙලා දවස් 32කින් ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය පැවැත්වුණා. අනුර කුමාර මැතිතුමා ජනාධිපති වෙලා දවස් 32න් ඇල්පිටිය ඡන්දය පැවැත්වුණා. දවස් 32කට පස්සේ පැවැති ඡන්දයේදී මොකක්ද වුණේ? විපක්ෂයට මන්ත්‍රීධුර 15යි, මාලිමාවට මන්ත්‍රීධුර 15යි. ජනාධිපතිවෙලා දවස් 32කට පස්සේ පැවැති ඡන්දයෙන් මාලිමාවට මන්ත්‍රීධුර 15යි, විපක්ෂයට මන්ත්‍රීධුර 15යි. එතකොට කොහොමද සභාව පිහිටුවන්නේ? මේ පළාත් පාලන ඡන්දයේදී සාමාන්‍යයෙන් ලැයිස්තු 10ක් විතර වැටෙනවා. ස්වාධීන කණ්ඩායම්, අර පක්ෂ, මේ පක්ෂ එකතුවෙලා ලැයිස්තු 10ක් විතර දැම්මාම මොකද වෙන්නේ කියලා ආණ්ඩුවට හොඳට බලාගන්න පුළුවන්. ආණ්ඩුව එක පැත්තකට යයි, අනෙකුත් පක්ෂ සහ කණ්ඩායම් ඔක්කෝම එකතු වුණාම පළාත් පාලන ආයතනයේ බලය විපක්ෂයට යයි. එතකොට, අවුරුද්දකින් පස්සේ පළාත් පාලන ආයතනයේ සභාපති විපක්ෂයෙන් පත් වෙනවා. මොකද, අදාළ පනතේ තිබෙන්නේ අවුරුද්දක්, දෙකක් යනකොට පළාත් පාලන ආයතනයට නැවත සභාපතිවරයෙක් පත් කරන්න පුළුවන් කියලා නේ. සභාව තුළින් අලුත් කෙනෙක් පත් කරන්න පුළුවන්. ඉතින්, මේක විහිළුවක්. එතකොට මේ පළාත් පාලන ඡන්දයත් විහිළුවක් වෙනවා. මම පළාත් පාලන ආයතනයක හිටපු මන්ත්‍රීවරයෙක්, විපක්ෂ නායකවරයෙක්, ඒ වාගේම සභාපතිවරයෙක්.

ඒ තනතුරු තුනේම හිටපු කෙනෙකු විධියට පළාත් පාලන ආයතන ගැන මට අත්දැකීම් තිබෙනවා. මේ ආණ්ඩුවට මන්ත්‍රීධුර 159ක් තිබෙන නිසා පළාත් පාලන පනත සංශෝධනය කරයි කියලා අපි හිතුවා. පළාත් පාලන පනත සංශෝධනය කරලා පරණ ක්‍රමයට සමාන ක්‍රමයක් හැදෙයි කියලා අපි හිතුවා. හැබැයි, ආණ්ඩුවට ඒක හදාගන්න බැරි වුණා. අලුත් පනතක් ගෙනැල්ලා පළාත් පාලන ආයතන අලුත් විධියට හිතලා වැඩ කරන තැනට පත් කරන්න ආණ්ඩුවට බැරි වුණා. 159ක බලයක් තිබුණාට වැඩක් නැහැනේ. දැන් මොකක්ද කියන්නේ? දැන් කියනවා, පළාත් පාලන ඡන්දය පවත්වනවා, වැඩ කරන ආණ්ඩුවට තවත් හොඳින් වැඩ කරන්න පළාත් පාලන මැතිවරණයේදී ඡන්දය ලබා දෙන්න ලු. වැඩ කරන්න තමයි ජනාධිපතිවරයෙක් පත් කළේ, වැඩ කරන්න තමයි ආණ්ඩුවක් පත් කළේ, ඒ වාගේම මන්ත්‍රීධුර 159ක් දුන්නේ. දැන් වැඩ කරලා පෙන්වන්න. දැන් පළාත් පාලන ආයතනවල බලයත් ඉල්ලනවා. ඔය විධියට පසුගිය කාලයේ තිබුණු හැම ආණ්ඩුවක්ම බලය ඉල්ලමින් සිටියා. පළමු මැතිවරණයෙන් ජනාධිපති වෙන්න බලය ඉල්ලනවා, ඊළඟට පාර්ලිමේන්තුවේ බලය ඉල්ලනවා, ඊට පස්සේ පළාත් සභාවේ බලය ඉල්ලනවා, ඊටත් පස්සේ ප්‍රාදේශීය සභාවේ බලයත් ඉල්ලනවා. ඒක තමයි ගිය ආණ්ඩුත් කළේ. ගිය ආණ්ඩුත් ඒවායේ බලය ඉල්ලමින් සිටියා. ඊට පස්සේ අවුරුදු 5 යනවා, නැවත ජනාධිපතිවරණයක් එනවා. ඒ ජනාධිපතිවරණයේදී ජනාධිපතිවරයා නැවත මාරු වෙනවා. ඒක තමයි අපේ රටේ දේශපාලනයේ සිද්ධ වුණේ.

මේ බලන්න, මේ අය වැයෙන් අපේ ආගමික කටයුතු වෙනුවෙන් වෙන් වුණේ මොනවාද කියලා. බුද්ධ ශාසනය ගත්තොත්, අද කොච්චර පන්සල් තිබෙනවාද? අද සමහර පන්සල් තිබෙනවා, ඒවා තෙමෙනවා. සමහර පන්සල්වල වැසිකිළි පද්ධතිය නැහැ. සමහර පන්සල් තිබෙනවා, ඉතාම දියුණුයි. මම අද එනකොට පාර block. ඒ කොහේද? කුඹල්වෙල ආරණ්‍ය සේනාසනය ළඟ. මම අද බදුල්ලේ ඉඳලා එනකොටත් කුඹල්වෙල ආරණ්‍ය සේනාසනය ළඟ පාර blocked. විශාල සෙනඟක් බස් අරගෙන කුඹල්වෙල ආරණ්‍ය සේනාසනය බලන්න යනවා. කුඹල්වෙල ආරණ්‍ය සේනාසනය බලන්න ඕනෑ තරම් මිනිස්සු එනවා.

හැබැයි, මහියංගනය, රිදීමාලියද්ද වාගේ ඈත, අතිදුෂ්කර ප්‍රදේශවල තිබෙන පන්සල්වලට කිසිම සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ, මේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් හෝ කොයි ආණ්ඩුවෙන් වුණත්. අපි සමහර වෙලාවට විමධ්‍යගත ප්‍රතිපාදනවලින් රුපියල් ලක්ෂ 2ක්, 3ක්, 5ක්, 10ක් ලබා දෙනවා. එම ප්‍රතිපාදන සම්බන්ධවත් වක්‍රලේඛයක් ගහනවා, පන්සල්වලට මීට වඩා දෙන්න එපා, කෝවිල්වලට මීට වඩා දෙන්න එපා, පල්ලිවලට මීට වඩා දෙන්න එපා කියලා. දැන් රුපියල් ලක්ෂ 2ක් දීලා මොනවා කරන්නද? ඒ කාලයේ නම් රුපියල් ලක්ෂ 2ක් දුන්නාම පන්සලක මොනවා හෝ කරන්න පුළුවන්, කෝවිලක මොනවා හෝ කරන්න පුළුවන්. බදුල්ල දිස්ත්‍රික්කයේ තිබෙන බොහෝ කෝවිල් කඩලා තිබෙනවා. මම දන්නා විධියට, වතුවල තිබෙන කෝවිල් 100කට වඩා කඩලා දැන් හදාගන්න බැරිව ඉන්නවා. ඇයි ඒ? ඒගොල්ලන් හිතන්නේ නැතිව මේවා කඩා දමනවා. කඩා දැමුවාට පසු හිතනවා, හදන්න. නමුත් හදන්න රුපියල් කෝටි ගණනක් යනවා. ඒවායේ උත්සව පවත්වන්න ඊටත් වඩා වියදමක් යනවා. "කුම්භාභිෂේක" කියලා උත්සවයක් තිබෙනවා. දින 45ක් දෙවියන් නාවලා ඒ උත්සවය කරන්න පුදුම වියදමක් යනවා. පල්ලිවලත් එහෙම තමයි. සමහර පල්ලි අලුතින් හදනවා. දුප්පත් පල්ලිත් තිබෙනවා, සල්ලි තිබෙන පල්ලිත් තිබෙනවා. සල්ලි තිබෙන ඒවාට නම් ඕනෑ තරම් ආධාර ලැබෙනවා. හැබැයි, දුප්පත් පල්ලිවලට ආධාර ලැබෙන්නේ නැහැ. සමහර පන්සල්, පල්ලි, දේවාල, කෝවිල් තිබෙනවා, ඒවාට කවුරුවත් උදවු කරන්නේ නැහැ. උදවු කරන තැන්වලට හැමෝම උදවු කරනවා, හැමෝම සහයෝගය දෙනවා. නැති තැනට ඒ මොනවාවත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මේ දේවල් ගැන බලන්න ඕනෑ.

මම අහගෙන හිටියා, කාදිනල්තුමා ඊයේද-පෙරේදාද මන්දා voice-cut එකක් දෙනවා, "ආණ්ඩුව ගැන අපි විශ්වාසය තැබුවා ඇති, අපිත් එළියට බහිනවා" කියලා. කාදිනල්තුමා ආයෙත් දැන් එළියට බහින්න ලෑස්තියි. ඇයි, මෙහෙන් ආණ්ඩුව බටලන්ද ගැන හොයන්න පටන් ගත්තා කිව්වාම, සභානායකතුමා බටලන්ද කොමිෂන් සභා වාර්තාව සභාගත කළාම,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

වුණා. කාදිනල්තුමා දැන් කියනවා, අපටත් පාරට බහින්න කාලය ඇවිල්ලා කියලා. අපේ මහනායක හාමුදුරුවරුන් කවදාවත් රටේ මොන ප්‍රශ්න ඇති වුණත්, මොන ගැටලුව ඇති වුණත් පාරට බැස්සේ නැහැ. උතුරු-නැඟෙනහිර ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාර සිදු වුණු කාලයේවත් අපේ නායක හාමුදුරුවරුන් පාරට බැස්සේ නැහැ. ඒකත් අපි කියන්න ඕනෑ. කොළඹ බෝම්බ පිපිරුවත්, රට මැද බෝම්බ පිපිරුවත් අපේ හාමුදුරුවරුන් එහෙම හැසිරුණේ නැහැ. ඒකත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ. කාදිනල්තුමා දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට විරුද්ධව පාරට බහින්න සූදානම් වෙලා ඉන්නවා. මොකද, පාස්කු ප්‍රහාරයට ඔබතුමන්ලාගෙන් තවම කිසිම සාධාරණයක් ඉෂ්ට වුණේ නැහැ කියලා කාදිනල්තුමා කියනවා. මේ ඊයේ-පෙරේදා තමයි එතුමා එහෙම කිව්වේ.

ජනාධිපතිතුමා ඇවිල්ලා අය වැය දෙවැනි වර කියවීම ඉදිරිපත් කරලා ගියාට පස්සේ දෙවැනි දවසේ මම කිව්වා, මේ වැටුප් ප්‍රශ්නයට සෞඛ්‍ය සේවකයන් අනිවාර්යයෙන් පාරට බහිනවා කියලා. අපි එහෙම කිව්වාම මෙතැන හිටපු සමහර අය හිනා වුණා. එහෙම වෙන්නේ නැහැ කිව්වා. සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා, එහෙම වෙන්නේ නැහැ කියලා. අද nursesලා strike; වෛද්‍ය සේවය, අතුරු වෛද්‍ය සේවය හෙට පැය 24ක් strike. ඔවුන් දැන් strike එකට බැහැලා. එදා මම මේ පාර්ලිමේන්තුවේදී ඒ ගැන කිව්වාම, එහා පැත්තේ ඉඳගෙන සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා, එහෙම වෙන්නේ නැහැ කියලා. ගිය මාසයේ 21වැනි දා වෙන්න ඕනෑ, ජනාධිපතිතුමා Budget එක ඉදිරිපත් කරලා ගිහින් දින කිහිපයකට පසුව මම කිව්වා, මෙන්න මෙහෙමයි, බදුල්ල ඉස්පිරිතාලයේ හාහූවක් තිබෙනවා, සෞඛ්‍ය අංශයේ සේවකයන් එළියට බහින්න හදනවා කියලා. අපිත් මේවා කිව්වා. අපි කියන ඒවාටත් පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න.

Nursesලා, වෛද්‍ය සේවයේ, අතුරු වෛද්‍ය සේවයේ ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හිටපු සියලුදෙනා මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තැබුවා. මොකද, මේ ආණ්ඩුවට රාජ්‍ය සේවයේ සියයට 85ක් විතර ඡන්දය දුන්නා. සමහර ඡන්ද ප්‍රතිඵල දිහා බැලුවාම ඒක පැහැදිලියි. බදුල්ල දිස්ත්‍රික්කයේ තැපැල් ඡන්ද ප්‍රතිඵලය මාලිමාවට ඡන්ද 25,000යි, ටෙලිෆෝන් එකට ඡන්ද 3,000යි, ගෑස් සිලින්ඩරයට ඡන්ද 2,000යි. එතකොට කොච්චර පරතරයකින් මේ ආණ්ඩුව කෙරෙහි රාජ්‍ය සේවකයෙන් විශ්වාසය තබා තිබෙනවාද? ඉතිහාසයේ කිසිම දවසක රාජ්‍ය සේවකයෝ මේ විධියට ආණ්ඩුවක් කෙරෙහි විශ්වාසය තබා නැහැ. ජේ.ආර්. ජයවර්ධනගේ භයෙන් පහක බලය තුළවත් රාජ්‍ය සේවකයෝ මෙහෙම විශ්වාසයක් තැබුවේ නැහැ. මේ ආණ්ඩුව කෙරෙහි තරම් කිසිම ආණ්ඩුවක් කෙරෙහි ඔවුන් විශ්වාසය තැබුවේ නැහැ. හැබැයි, මේ ආණ්ඩුව කෙරෙහි තබපු විශ්වාසය දැන් ටික ටික පලුදු වෙමින් යනවා. ඒකට හේතුව තමයි, කියපු දේවල් එකක්වත් කරගන්න මේ ආණ්ඩුවට නොහැකිවීම. හෙට-අනිද්දා මේ අය වැය සම්මත වෙනවා. අය වැය සම්මත වුණාට පස්සේ අප්‍රේල් 10වැනි දා වැටුප ලැබෙනකල් තමයි සමහර අය බලාගෙන ඉන්නේ.

වැටුප ලැබුණාම තේරුම් ගන්න පුළුවන්, රාජ්‍ය යාන්ත්‍රණය කොහේද තිබෙන්නේ, රාජ්‍ය සේවකයාට මොකද වුණේ කියලා. ඒ නිසා මේ වෙලාවේ ඒ කාරණයත් රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට මතක තබාගන්න. අපි ආණ්ඩුව කෙරෙහි වෛරයෙන් කථා කරන්නේ නැහැ. අපි කථා කරන්නේ නිවැරදි දේවල්. අපි ඇත්ත කියනවා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා. අපි සමහර දේවල් කිව්වාම කියනවා, උදේ පාන්දර ඇවිල්ලා බොරු අතඅරිනවා කියලා. අපි බොරු අතඅරින්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඇත්ත කියනවා. අපි කොතැන හිටියත්, කොයි පුටුවේ හිටියත්, කොයි පැත්තේ හිටියත් ඇත්ත කියනවා.

අද රාජ්‍ය සේවයේ විශාල වශයෙන් ප්‍රශ්න තිබෙනවා. අපේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාම කියලා තිබෙනවා, උපාධිධාරීන් 35,000ටම එතුමන්ලාගේ ආණ්ඩුවක් යටතේ රැකියා දෙනවා කියලා. ඒ උපාධිධාරීන් අද පාරට බහිනවා. ඒ අය රැකියා ඉල්ලනවා. ඔබතුමන්ලා කියපු දේවල් ඉෂ්ට වෙලා නැහැ. මේ ආණ්ඩුව තවත් ගොඩක් දේවල් කිව්වා. අපි කියපු දේවල් දැන් නැහැ; ඉවරයි. දැන් ජනතාව අපට කථා කර කර කියනවා, පාර්ලිමේන්තුවේ දී මේවා කියන්න කියලා. රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බඳවා ගත් සමහර අය අද ස්ථිර වෙලා නැහැ. අපට කියනවා, ඒ ගැන පාර්ලිමේන්තුවේදී කියන්න කියලා. උපාධිධාරීන් කියනවා, ඔවුන්ට රැකියා දෙනවා කිව්වාට, දැන් රැකියා දෙන්නේ නැහැ කියලා. පරිසර අමාත්‍යාංශයේ එහෙම වැඩ පිළිවෙළක් හදලා ඒ උපාධිධාරීන්ට රැකියා දෙන්න. පුරප්පාඩු හොයලා ඒ අයට රැකියා දෙන්න. ඒවා මුදල් උත්පාදනය කරන්න පුළුවන් තැන්. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළු පරිසර අමාත්‍යාංශය කියන්නේ කොච්චර මුදල් හොයන්න පුළුවන් තැන් ද? හැබැයි, ඒවාට ගියාම පෝලිම්වල ඉඳලා, රස්තියාදු වෙන්න මිනිස්සුන්ට සිද්ධ වෙනවා. එතකොට මිනිස්සුන්ට එපා වෙනවා; එපා කරවනවා; එපා කරවන තැනට වැඩ කරනවා. පරිසර ඇමතිතුමා හිටියා කියලා එතුමා ගිහිල්ලා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ හිටගෙන ඉන්නද? පරිසර අමාත්‍යාංශයේ හිටගෙන ඉන්නද? බලපත්‍ර දෙන තැන මේ

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඇමතිතුමා හිටගෙන ඉන්නද? නැහැ. නමුත්, සමහර තැන්වල එපා කරවන තැනට වැඩ කරනවා. ඒ නිසා මම මේ වෙලාවේ කියන්නේ පරිසර ඇමතිකම කරනවා නම් හොඳට හොයා බලා බොහොම වගකීමෙන් කරන්න ඕනෑ බවයි. පරිසර අමාත්‍යාංශයෙන් මේ රටට ගොඩක් වැඩ කටයුතු වෙනවා. කර්මාන්තශාලා සියල්ලටම, සෑම ව්‍යාපෘතියකටම පරිසර බලපත්‍රයක් ඉල්ලනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පොඩි කර්මාන්තයක් පටන් ගත්තත්, මහා පරිමාණ කර්මාන්තයක් පටන් ගත්තත්, ඒ ඕනෑම දෙයකට වුණත් පරිසර බලපත්‍රය නැතිව කිසි දෙයක් කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා පරිසර අමාත්‍යාංශය රටේ හදවත වාගේයි. කර්මාන්තවලට හදවත වාගේ තමයි පාරිසරික බලපත්‍රය. ඇල්ල ප්‍රදේශයේ සංචාරක හෝටලයක් කළත්, පරිසර බලපත්‍රය නැතිව ඒ හෝටලය කරන්න බැහැ. අවුරුදු 3කට වලංගු වන විධියටයි පරිසර බලපත්‍රය දෙන්නේ. ඒ නිසා පරිසර අමාත්‍යාංශය භාර ගරු ඇමතිතුමාට මම කියනවා, පරිසර අමාත්‍යාංශය නහාසිටුවලා මේ රටේ ආදර්ශවත් අමාත්‍යාංශයක් බවට පත් කරන්න නම් මීට වඩා මහන්සි වෙලා වැඩ කරන්න සිද්ධ වන බව. මම හිතනවා, ඒ ඇමතිතුමා දක්ෂ ඇමතිවරයෙක් කියලා. මට දැනගන්න ලැබුණා, නිලධාරීන් එක්ක බොහොම සහයෝගයෙන් යුතුව එතුමා වැඩ කරනවා කියලා. නිලධාරීන් එක්ක සහයෝගයෙන් වැඩ කරනවා වාගේම හොයා බලාත් වැඩ කරන්න. ඔබතුමාට දක්ෂ ලෙස මේ අමාත්‍යාංශය කරගෙන යන්න ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.හා. 5.38]

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ වැදගත් විවාදයේ පිළිතුරු කථාව කෙටියෙන් හෝ කරන්නට අවස්ථාව සකස් කර දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ අමාත්‍යාංශය බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයයි. අපි කලිනුත් සඳහන් කළා, මේ අමාත්‍යාංශය තුළ විශාල වශයෙන් පැතිරුණු විෂය ක්ෂේත්‍රයක් දකින්න තිබෙන බව. දෙපාර්තමේන්තු 9ක්, ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය ආයතන 7ක්, ස්වයං මූල්‍යයන ආයතන 4ක්, රාජ්‍ය අරමුදල් 3ක් වාගේ විශාල ක්ෂේත්‍රයක් කෙරෙහි මේ අමාත්‍යාංශය පැතිර යනවා.

අද ඉදිරිපත් වුණු ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට විශාල කාලයක් ගත වනවා. ඒ අතරම මටත් කරුණක් දෙකක් මතු කරන්නට වුවමනාවකුත් තිබෙනවා. ගරු මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ අය වැය කථාවේ අංක 36 යටතේ, කලාකරුවන් සහ මාධ්‍යවේදීන් වෙනුවෙන් ඉදිකෙරෙන නිවාස ව්‍යාපෘතියකට ඉතා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළ බව ඔබතුමන්ලාට මතක ඇති. ෂෙන්හේජ් කියන චීන සහයෝගිතා වැඩසටහන සමඟ කොට්ටාව පලතුරුවත්ත ප්‍රදේශයේ නිවාස ඒකක 1,996ක් ඉදිකෙරෙනවා. ඉන් නිවාස ඒකක 108ක් කලාකරුවන්ට සහ මාධ්‍යවේදීන්ට තමයි වෙන් කෙරෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි උදේ ඉඳලා පෙන්වා දුන්නා, මේ කලා සංස්කෘතික ක්ෂේත්‍රය සහ ආගමික ක්ෂේත්‍රය මොන තරම් අපේ පුරවැසි ජීවිතය නංවන්න ඉවහල් වෙනවා ද කියලා. මේ රාමසාන් කාලය. අපට සවුදි අරාබියෙන් රටඉඳි කිලෝග්‍රෑම් මෙට්‍රික්ටොන් 50ක් ත්‍යාගයක් හැටියට ලැබුණා. අපි ඒවා අපේ රටේ පල්ලි 2,700 ගණනකට සාධාරණව බෙදා දුන්නා. ඒ රටඉඳි ප්‍රමාණය බෙදා දුන්නු බව මම මුහුණු පොතෙන් ප්‍රකට කළාට පස්සේ කවුදෝ ලියා තිබුණා, මීට කලින් ලැබුණු මේ වර්ගයේ රටඉඳි තැග්ගෙනුත් ගසා කාලා තිබෙනවා කියලා. මෙන්න මේ විධියට තමයි මේ උදවිය අපේ රටේ ආගමික සංහිඳියාව හැදුවේ.

මම පසුගිය දවසක රත්නපුර රත්නේශ්වරම් කෝවිලට ගියා. මහා ශිව රාත්‍රිය වෙනුවෙන් පවත්වපු ජාතික උත්සවය අපි ඒ ප්‍රදේශයේ පවත්වන්නයි අවසර දීලා තිබුණේ. අපේ සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය අමාත්‍යතුමා, මම ඇතුළු පිරිසක් ඒ ප්‍රදේශයට ගියා. ඔබතුමන්ලා දන්නවාද, ගරු මන්ත්‍රීවරුනි, ගරු අමාත්‍යවරුනි, ඒ කෝවිලේ බිත්තියෙන් වෙන් වන්නේ එහා පැත්තේ තිබෙන බෝධිරාජ පන්සලයි කියන එක. එකම තුනී තාප්පයකින් තමයි මේ හින්දු කෝවිලත්, බෞද්ධ පන්සලත් වෙන් වෙන්නේ. මීටර් 100ක් විතර එහා පැත්තෙන් තිබෙන්නේ අල්මකියා මුස්ලිම් පාසල. අපේ රටේ මෙන්න මේ විධියට තමයි ආගමික සංහිඳියාව, ජාතීන් අතර සංහිඳියාව තිබෙන්නේ. ඒ නිසා අප අතරේ තිබෙන්නේ බොහොම තුනී බිත්තියක්. අපි හරිම සමීපයි. එකම දේ තිබෙන්නේ අපේ මේ ජාතීන් අතර තිබෙන සමීපකම පසුගිය දශක ගණනාවක් තිස්සේ පාවිච්චි කළේ එකිනෙකා බෙදලා දේශපාලන වාසි ගන්නයි. මින් පස්සේ මේ රටේ ජාතිය, ආගම, කුලය, ප්‍රාදේශීය වාදවලින් මිනිසුන් බෙදන්න හම්බ වෙන්නේ නැති බව අපි තරයේ පැහැදිලි කරන්නට ඕනෑ. ජාතික සංහිඳියාව ඇත්තටම ඕනෑ නම්, ආගමික සංහිඳියාව ඇත්තටම ඕනෑ නම්, ඒකට කරන්න තිබෙන්නේ එක දෙයයි. මේ කාරණයේදී අපි කවුරුත් අවංක වෙන්න ඕනෑ. ඒ නිසා තමයි පසුගිය 14වැනි දා මම ඇතුළු අනෙකුත් සියලුදෙනා මහනුවරට ගිහිල්ලා ඒ කටයුතුවලට සම්බන්ධ වුණේ. ඒ අවස්ථාවට අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට සම්බන්ධ වෙන්න හැකියාවක් තිබුණේ නැහැ. අපි සියලුදෙනා මහනුවරට ගිහිල්ලා දළඳා ප්‍රදර්ශනය වෙනුවෙන් එහි සංවිධාන කටයුතුවලට මහන්සි වෙලා, එදාම සවස පුළුවන් තරම් ඉක්මනින් කොළඹට ආවේ අපේ ආදරණීය මුස්ලිම් ප්‍රජාවත් එක්ක ඉෆ්තාර් උත්සවය සමරන්නයි. අපි අවංකව මහන්සි වෙනවා නම්, අපි අවංකව කැපවීම් කරනවා නම් අපට පුළුවන් මේ වැඩේ කරන්න. දැන් විපක්ෂයේ එක් මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේ අශිෂ්ට භාෂාව පිළිබඳව වාගේම නින්දා, අපහාස ගැන පැහැදිලි කරමින් කිව්වා, මෙවාට පුරුදු වෙන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේවාට පුරුදු වෙන්න ඕනෑද? අශිෂ්ටත්වය කියන්නේ පුරුදු වෙන්න ඕනෑ දෙයක් නොවෙයි. අපි අශිෂ්ටත්වය අවසන් කරන්න ඕනෑ. අපි ශිෂ්ටත්වයයි පුරුදු කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු අමාත්‍යතුමනි.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි පුරුදු වෙන්න ඕනෑ ශිෂ්ටත්වයයි. ඒකට තමයි මේ අමාත්‍යාංශය තිබෙන්නේ. ඒකට තමයි මේ අමාත්‍යාංශයට මෙපමණ ජනතා බදු මුදලක් වෙන් කර තිබෙන්නේ. සමහර වෙලාවට විපක්ෂයෙන් අද මතු වෙච්ච ඒවා තර්ක නොවෙයි. ඒවා

හුදු ප්‍රලාප. ඒවාට උත්තර දෙන්න මහන්සි වෙන එකත් අපරාදේ. එක් මන්ත්‍රීවරයෙක් මතු කරලා ගියා, ධාතු වන්දනාවක් ගැන. ඒ අය ජ්ලාස්ටික් බෝතල්වල මතු වෙච්ච නයි සහ මහනුවර තිබෙන සිරි දළදා දැක්ම වෙන් කර ගන්න බැරි උදවිය. ඒ නිසා මේවාට පිළිතුරු දෙන්න කාලය ගත කරන එක අපරාධයක් කියායි මට හිතෙන්නේ.

හජ් වන්දනාව ගැන කරුණක් මතු වුණා. මේ සම්බන්ධයෙන් අපේ මැදිහත්වීම ගැන මට මතක් වෙනවා. හජ් වන්දනාව සඳහා අපේ රටින් බැතිමතුන් 3,500ක් මෙවර මක්කම නගරයට යනවා. නමුත් ඔබ සියලුදෙනා දන්නවා, මේක වෙළෙඳ කටයුතු සමඟ සම්බන්ධ කටයුත්තක් බව. අවසානයේ recommend කළ, නැත්නම් නියම කරපු මුදල වුණේ රුපියල් ලක්ෂ 21ක්. ඒ මුදල තමයි හජ් කමිටුව මඟින් තීරණය කළේ. නමුත් අපි සියලුදෙනා කැමැතියි, මේ ගණන අඩුවෙලා අපේ රටේ අහිංසක මුස්ලිම් බැතිමතුන් ප්‍රිය කරන ශුද්ධ වූ මක්කම නගරයට යන්න පුළුවන් නම්. මම සවුදි අරාබියේ ශුද්ධ වූ මක්කම නගරයට ගිහිල්ලා, මේ ගිවිසුම අත්සන් කරලා ශුද්ධ වූ අල් මදීනාවට ගියා. අල් මදීනාවට ගිය මුස්ලිම් නොවන එකම ලාංකික අමාත්‍යවරයා මම කියලා ඒ මිනිස්සු කිව්වා. මේ ගිවිසුම අත්සන් කරන්න කොයි තරම් ඇමතිවරු මේ රටින් ගිහිල්ලා තිබෙනවාද? සමහර ඇමතිවරු පැය දෙකයි සවුදි අරාබියේ ඉඳලා තිබෙන්නේ. මම සවුදි අරාබියේ දවස් 4ක් ඉඳලා, උදේ 8.00 සිට රාත්‍රී 10.00 වෙනකම් වැඩ කරලා, සෑහෙන්න මිනිසුන් ප්‍රමාණයක්, සංවිධාන වාගේම service providersලා මුණ ගැහිලා අපේ රටින් යන මිනිසුන්ට කොහොමද පහසුකම් ලබා දෙන්නේ කියලා කථා කළා. ඒක තමයි මම ඔබතුමන්ලාට කිව්වේ. මේක කරන්න ඕනෑ නම් එක දෙයයි කරන්න තිබෙන්නේ. ඒ, අවංකව මහන්සි වෙන එක විතරයි.

කියන්න තවත් ගොඩක් කරුණු තිබුණත් මේ කාරණය කියා මම කථාව අවසන් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2025 වසරට අදාළව මේ වැය ශීර්ෂවලට අමතරව අපි තවත් ව්‍යාපෘති රාශියක් හඳුනා ගනිමින්, තත්ත්ව පරීක්ෂණය කරමින්, ශක්‍යතා අධ්‍යයනය කරමින් ඉන්නවා. ජාත්‍යන්තර පරිවර්තන මධ්‍යස්ථානයක්, කලාකරු නිකේතනයක්, නව පුනරුද බහු සංස්කෘතික කේන්ද්‍ර පද්ධතියක් ඇති කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික ආගමික දර්ශනවල සාරය, හරය නිරවුල්ව සමාජයට ගෙන යන්න අධ්‍යාත්මික දර්ශන අධ්‍යයන කේන්ද්‍රයක් සම්බන්ධයෙන් අපේ බලාපොරොත්තුවක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(මාණ්පුමිකු (කලානිදි) හිණිදුම සුනිල් සෙනෙවි)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජාතික චිත්‍රපට සංරක්ෂණාගාරය, සිනමා පාසල, ජාත්‍යන්තර නාට්‍ය පාසල, ජාත්‍යන්තර දෘශ්‍ය කලා මධ්‍යස්ථානය ආදී විෂයයන් රාශියක් අපේ සිහිනය ඇතුළේ තිබෙන බව මා කියන්නට ඕනෑ.

අවසාන වශයෙන් මේ කාරණය කියා මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අය වැය කාරක සභා අවස්ථාවේදී අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පුළුල්ව විවාදයට ගන්න සම්බන්ධ වෙච්ච සියලුදෙනාට වාගේම, ඒ අදහස් පළ කළ සියලුදෙනාට මා ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම අපට අවශ්‍ය කරුණු-කාරණා, තර්ක, තොරතුරු ඒකරාශි කරලා දුන් අපේ අමාත්‍යාංශයේ ලේකම් ප්‍රින්ස් සේනාධීර මහත්මයා ඇතුළු සමස්ත නිලධාරි මණ්ඩලයට, ලේකම්වරුන්ට, අධ්‍යක්ෂවරුන්ට, කොමසාරිස්වරුන්ට මගේ ස්තුතිය පළ කරනවා. ඒ වාගේම ගරු කථානායකතුමා ඇතුළු මූලාසනයේ කටයුතු කළ සියලු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ටත්, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයටත් මා ස්තුතිවන්ත වෙනවා. පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් තමයි අපේ බලාපොරොත්තුව. ඊට මගේ අමාත්‍යාංශයෙන් දක්වන්න පුළුවන් සකලවිධ කැපවීම දක්වන බවට පොරොන්දු වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සභාවේ නොසිටි වෙලාවේ මගේ නම සඳහන් කරලා කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය කථාවක් කරලා තිබුණා. මම ඇහුවේ එක කාරණයයි. එතුමිය කියා තිබුණා, මම මේ පාර්ලිමේන්තුවේ ගෞරවය කෙලෙසුවා කියලා. පාර්ලිමේන්තුවේ ගෞරවය කෙලෙසලා තිබෙන්නේ මම නොවෙයි. මේ වනතුරු හොයා ගන්න බැරි වෙච්ච බොරු ආචාර්ය උපාධියක් තිබෙනවාය කියමින් කථානායක පුටුවේ වාඩි වුණු රන්වල මැතිතුමාගෙන් තමයි මම ප්‍රශ්නය ඇහුවේ. එහෙම නැතුව කිසිම වෙලාවක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- අපිත් මේ සභාවේ අවුරුදු ගණනක් තිස්සේ ඉඳලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨයෝ කියලා වැරදි විධියට අපි මේ සභාව පාවිච්චි කරලා නැහැ. ඒ නිසා එතුමිය කළ ප්‍රකාශය සම්පූර්ණ වැරදි ප්‍රකාශයක්. එතුමිය කියපු ස්ථාවර නියෝග ගැන මම කථා කළේත් නැහැ. ඒක මම එතුමාගෙන් අහපු කාරණයක්. 103,000ක් එතුමා ඡන්ද අරගෙන තිබෙනවා, ගම්පහ දිස්ත්‍රික්කයෙන්. ඒ වාගේම ජාතික ජන බලවේගය ඡන්ද ලක්ෂ 8ක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් අරගෙන තිබෙනවා, පසුගිය මැතිවරණයේදී.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපට කාරණය පැහැදිලියි. අපි විවාදයට අදාළව කථා කරමු.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි. ඒ කෙලෙසා තිබෙන්නේ, අපේ රටේ ගෞරවය; ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ගෞරවය. ඒ නිසා ආචාර්ය උපාධියක් තිබෙනවා කියලා පාර්ලිමේන්තුවට ආපු ඒ කාරණය පිළිබඳව තමයි මම ඇහුවේ. ඒ නිසා කරුණාකරලා ඒක වැරදි විධියට තේරුම් ගන්න එපා කියන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඒ වෙලාවේ දයාසිරි ජයසේකර මැතිතුමා මතු කළේ point of Order එකක් නොවෙයි කියලා තමයි කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය කිව්වේ. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු විධියට ඒ කාරණය point of Order එකක් විධියට උපුටා දක්වමින් කැත දේශපාලන අවස්ථාවක් තමයි ඒ ලබා ගත්තේ. ඒ නිසා point of Order එකක් හැටියට ඒ අවස්ථාව ගන්න එපා කියලා තමයි එතුමිය කිව්වේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් එතුමා නැඟිටපු මොන point of Order එක මතු කරන්නද කියලා මට කියන්න? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා point of Order මතු කරන්න නැඟිටපු Standing Order එක මොකක්ද? *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි මේ විවාදයට අදාළව කථා කරමු.

පිළිතුරු කථාව, ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.48]

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසර අමාත්‍යාංශයේ සහ බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාද කරන මේ අවස්ථාවේ පිළිතුරු කථාව කිරීමට මට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ සභාව ගරු කටයුතු තැනක්. ඒ වාගේම මහජන මුදල් වැය කරමින් ක්‍රියාත්මක වන තැනක්. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ සභාව ඇතුළේ වගකීම්සම්පන්න හැසිරීමක්.

අපි දැක්කා, ඇතැම් මන්ත්‍රීවරුන් උදේ වරුවේ කොහේ හරි ගිහිල්ලා, අවසාන මොහොතේ කථාව කරන්න මෙතැනට ඇවිල්ලා වගකීම් විරහිතව මොනවා හෝ දේවල් ටිකක් කියලා අපෙන් පිළිතුරු බලාපොරොත්තු වන බවක්. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ නිශ්චිත නැතිව ඔහේ වනලා ගහන දේවල්වලට පිළිතුරු දෙන්න මේ සභාවේ කාලය නාස්ති කරන්න අවශ්‍ය නැහැ කියලා මම විශ්වාස කරනවා.

මීට කලින් මේ සභාව ඇමතූ මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වෛද්‍ය ඉලෙයියතම්බි සිරිනාත් මැතිතුමා ගැටලුවක් මතු කළා, එතුමාගේ ප්‍රදේශයේ පවතින වැව් සහ කුඹුරු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවරා ගැනීමක් සම්බන්ධයෙන්. ඒවාට අදාළ භූමි හඳුනාගෙන, අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා කරලා ඒ ගැටලු විසඳා දීමට දැනටමත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හැටියට අපි කටයුතු ආරම්භ කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වසරේදී එම කටයුතු අවසන් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම එම කටයුතු දිවයින පුරා ක්‍රියාත්මක කිරීමටත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හැටියට අපි කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ ඉතාම කනගාටුදායක පුවතක් මේ සභාවට දැනුම් දෙන්නට තිබෙනවා. ඒ තමයි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය ජාතික වනෝද්‍යානයේ වාසය කරපු යුනිකෝන් කියන ඇතා වෙඩි වැදීමකින් මිය ගිය පුවත. 15 වැනි දා තමයි මේ සිද්ධිය වෙලා තිබෙන්නේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් 17 වැනි දා, එනම් අද දින ඒ ඇතා මැරී සිටි තැන නිරීක්ෂණය කරලා හඳුනාගෙන තිබෙනවා. විශ්වාස කරනවා, වෙඩි තැබීමක් නිසා එම සතාගේ මරණය සිදු වුණා කියා. ඒ නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් පුළුල් පරීක්ෂණයක් සිදු කර ඊට වගකිව යුතු අයට අවශ්‍ය නීතිමය කටයුතු කිරීමට දැනටමත් මැදිහත් වී සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා අපේ රටේ වනඅලි-මිනිස් ගැටුම කියන්නේ ඉතාම තීව්‍ර, උච්චතම අවස්ථාවකට ළඟා වුණු ප්‍රශ්නයක් බව. මේ ප්‍රශ්නය විසඳීම සඳහා අපි මේ අමාත්‍යාංශය භාරගත් දවසේ ඉඳලා විශාල වශයෙන් මැදිහත් වෙනවා. පරිසර අමාත්‍යාංශය පැත්තෙන් මැදිහත් කරගන්න පුළුවන් සියලු අංශ මැදිහත් කර ගනිමින්, මේ ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීණ විද්වතුන්, පරිසරවේදීන් සම්බන්ධ කර ගනිමින්, මේ සම්බන්ධව ලොව පුරා තිබෙන අත්දැකීම් සමාලෝචනය කරමින්, වනඅලි සංරක්ෂණය සහ අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා මැදිහත් වන ලෝකයේ තිබෙන ආයතන සමඟ සාකච්ඡා කරමින් අපි එම කටයුත්තට මැදිහත් වෙමින් ඉන්නවා. අපට තවම අවශ්‍ය පමණට එම ගැටලුව විසඳා ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අලි-මිනිස් ගැටුමට පිළිතුරු සෙවීම සඳහා අපි මේ වසර තුළත් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා මෙවර අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයට විශාල මුදලක් වෙන් කර තිබෙන්නේ ඒ නිසායි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයට මෙවර අය වැයෙන් රුපියල් මිලියන 5,730ක් ලබා දෙනකොට, වනසත්ව සංරක්ෂණය හරහාත් මේ වසරේදී අපි රුපියල් මිලියන 1,405ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව අපි විදුලි වැට ක්‍රියාත්මක කිරීමේ කටයුත්තෙන් එහාට ගොස්, අලින්ට අවශ්‍ය -වනජීවී සුපෝෂණය සඳහා- වැව් පද්ධති සෑදීම, තෘණ භූමි වගා කිරීම, ඒ වාගේම අනෙකුත් පර්යේෂණ කටයුතු යනාදිය සඳහා විශාල බරක් තබා විශාල මැදිහත්වීමක් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්ලාස්ටික් කළමනාකරණය ගැනත් මේ සභාවේදී ප්‍රශ්නක් මතු කළා. ඒ නිසා ඒ පිළිබඳවත් පැහැදිලි කිරීමක් කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. අපේ රටේ ප්ලාස්ටික් කළමනාකරණය සඳහා වෙනම පනතක් නැහැ. සමහර මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධ කාරණා සඳහන් කරමින් මේ සභාව නොමඟ යවන්න හදනවා. නමුත් එහෙම වෙනම පනතක් නැහැ. අපි ප්ලාස්ටික් භාවිතයට අදාළව තීන්දු තීරණ ගන්නේ, කටයුතු කරන්නේ ජාතික පාරිසරික පනතේ තිබෙන රෙගුලාසි යටතේ.

ඒ අනුව එක් වරක් භාවිත කරනු ලබන ප්ලාස්ටික් - single-use plastic - දැනටමත් තහනම් කර තිබෙනවා. ඒ වාගේම මෑතකදී දුන් අධිකරණ තීන්දුවක් මඟින් ෂොපින් බෑග් සඳහා මුදල් අය කිරීමට තිබූ බාධා ඉවත් වෙලා තිබෙනවා. 2024 මාර්තු මාසයේ 28 වෙනි දා මීට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම Extended Producer Responsibility කියන සංකල්පය යටතේ, පාරිසරික පනතට අවශ්‍ය සංශෝධන කිරීම සඳහා දැනටමත් අපි කටයුතු කරමින් ඉන්නවා. අපි පරිසර අමාත්‍යාංශය හැටියට ඒ සඳහා මැදිහත් වෙමින් ඉන්නවා. මධ්‍යම පරිසර අධිකාරිය හරහාත් මේ සඳහා ගනු ලබන පියවර ගැන මම අද උදෑසන කළ කථාවේදී පැහැදිලි කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකායේ සේවකයන් පිළිබඳවත් මේ ගරු සභාවේ ප්‍රශ්නයක් මතු කළා. ඒ ගැනත් මම උදෑසන කළ කථාවේදී පැහැදිලි කළා. ඒ බහුකාර්ය සේවකයන් 3,530 දෙනාගේ සේවය ස්ථිර කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය මඟින් ඒ අවශ්‍ය සියලු කටයුතු සිදු කර දැන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අපි විශ්වාස කරනවා ඉතා ඉක්මනින් එයට අනුමැතිය ලැබේවි කියලා. ඒ අනුමැතිය ලැබුණු වහාම ඔවුන්ට පත්වීම් ලබාදීම සඳහා දැනටමත් පරිසර අමාත්‍යාංශය කටයුතු සූදානම් කර තිබෙනවා කියන කාරණය පැහැදිලි කරමින් මම කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு

MINISTRY OF BUDDHASASANA, RELIGIOUS AND CULTURAL AFFAIRS

පුනරාවර්තන	රු. 8,300,000,000
මූලධන	රු. 5,425,000,000

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'පුනරාවර්තන රු. 8,600,000,000' "

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 8,600,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මීණ්ඩුවරුඤ් සෙලවුක්කාන අතිකරිික්කප්පට්ට රූපාය් 8,600,000,000 අට්ටවණෙයිට් සේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්ට්‍රුක්කොළ්ළප්පට්ටදු.

මීණ්ඩුවරුඤ් සෙලවු තිරුත්තප්පට්ටවාරු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, "That the increased sum of Rs. 8,600,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

"101 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 640,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

101 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 109,000,000

"101 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 109,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

101 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලෙප්පු 101, නිකළ්ච්චිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඤ් සෙලවුක්කාන රූපාය් 640,000,000 අට්ටවණෙයිට් සේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්ට්‍රුක්කොළ්ළප් පට්ටදු.

තලෙප්පු 101, නිකළ්ච්චිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

නිකළ්ච්චිත්තිට්ටම් 01.- සෙයල්මුරෙච් සෙයර්පාටුකළ් - මූලතනච් සෙලවු, රූපාය් 109,000,000

"තලෙප්පු 101, නිකළ්ච්චිත්තිට්ටම් 01, මූලතනච් සෙලවුක්කාන රූපාය් 109,000,000 අට්ටවණෙයිට් සේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්ට්‍රුක්කොළ්ළප්පට්ටදු.

තලෙප්පු 101, නිකළ්ච්චිත්තිට්ටම් 01, මූලතනච් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 640,000,000, for Head 101, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 101, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 109,000,000

Question, "That the sum of Rs. 109,000,000, for Head 101, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 101, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,350,000,000; මූලධන වියදම, රු. 2,076,000,000

නිකුත්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් චෙයර්පාටුකළ් - මීණ්ටුවරුඤ් චෙලවු, රූපාය් 1,350,000,000; මූලතනච් චෙලවු, රූපාය් 2,076,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 1,350,000,000; Capital Expenditure, Rs. 2,076,000,000

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, 101 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"9 වන පිටුවේ, 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 1,650,000,000 රු. 2,076,000,000' "

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ, වැය ශීර්ෂ අංක 101 සඳහා අය වැය යෝජනා අංක 37 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු. 300,000,000කින් පුනරාවර්තන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

" 101වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.1,650,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

101 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"101 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 2,076,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

101 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 101, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 1,650,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 101, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 101, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 2,076,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 101, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 1,650,000,000, for Head 101, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 101, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the sum of Rs. 2, 076,000,000, for Head 101, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 101, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

201 වන ශීර්ෂය.- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 129,000,000

"201 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 129,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

201 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 8,000,000

"201 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 8,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

201 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,708,000,000

"201 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,708,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

201 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 125,000,000

"201 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 125,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

201 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

202 වන ශීර්ෂය.- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 179,000,000

"202 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 179,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

202 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 31,000,000

"202 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 31,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

202 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

203 වන ශීර්ෂය.- ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 208,000,000

"203 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 208,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

203 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 62,000,000

"203 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 62,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

203 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

204 වන ශීර්ෂය.- හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 253,000,000

"204 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 253,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

204 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 47,000,000

"204 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 47,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

204 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

205 වන ශීර්ෂය.- මහා භාරකාර දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 114,000,000

"205 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 114,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

205 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 21,000,000

"205 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 21,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

205 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

206 වන ශීර්ෂය.- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 160,000,000

''206 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 160,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

206 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 12,000,000

''206 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 12,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

206 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 797,000,000

''206 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 797,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

206 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 631,000,000

''206 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 631,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

206 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

207 වන ශීර්ෂය.- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 341,000,000

''207 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 341,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

207 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 25,000,000

''207 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 25,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

207 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 1,706,000,000

''207 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 1,706,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

207 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 448,000,000

''207 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 448,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

207 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

208 වන ශීර්ෂය.- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 98,000,000

''208 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 98,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

208 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 30,000,000

''208 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 30,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

208 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 333,000,000

''208 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 333,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

208 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 319,000,000

''208 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 319,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

208 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

209 වන ශීර්ෂය.- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 168,000,000

''209 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 168,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

209 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම්, රු. 10,000,000

''209 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 10,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

209 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 116,000,000

''209 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 116,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

209 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 1,471,000,000

''209 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 1,471,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

209 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

තලෙප්පු 201.- பௌத்த அலுவல்கள் திணைக்களம்

නිකුළුම්චිත්තිට්ටම 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 129,000,000

"තලෙප්පු 201, නිකුළුම්චිත්තිට්ටම 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 129,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 201, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 8,000,000

"தலைப்பு 201, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 8,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 201, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,708,000,000

"தலைப்பு 201, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,708,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 201, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 125,000,000

"தலைப்பு 201, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 125,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 201, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

தலைப்பு 202.- முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களம்

ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.17]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ විවාදයේදී මතු කර තිබෙන්නේ අපේ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා මීට දශක තුනකට එහා පැත්තේ අපිත් එක්කත් එකඟ වෙච්ච කාරණාවක්. මාස තුනක ආණ්ඩුවක් මේ යන්නේ. ඒ කාලය තුළම සභාව කල් තබන අවස්ථාවේ මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා මේ ගැන කියන්න තරම් මෙතුමන්ලා උනන්දු වෙලා තිබෙනවා. ඒම ගැන එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දශක තුනකට වැඩියි අපි මේ ගමන් මාර්ගයේ ඇවිල්ලා. මේ විධායක ජනාධිපති ධුරයේ හරය තමයි, ව්‍යවස්ථාදායකයත්, අධිකරණයත් කියන ආයතන දෙකම තමන්ගේ සාක්කුවට දාගෙන පාලනය කිරීම. අපි දන්නවා, ජේ.ආර්. ජයවර්ධන එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස්වීමේ ලිපි සාක්කුවේ දාගත්තා කියලා. ඊට පස්සේ ආපු සෑම ජනාධිපතිවරයෙක්ම ශ්‍රේෂ්ඨාධිකරණයට අත ගැහුවා. තමන්ට පක්ෂපාති තීන්දු දෙන්නේ නැහැ කියලා අග්‍ර විනිශ්චයකාරතුමිය එළවා දමපු ඉතිහාසයක් ඇතුළේ 1 සිට 8 දක්වා හිටපු ජනාධිපතිවරු මේ රට පාලනය කළේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැබිනට් මණ්ඩලයකින් නොවෙයි, පාර්ලිමේන්තුවකින් නොවෙයි, තමන් හදාගත්ත කල්ලියකින්. ජේ.ආර්.ජයවර්ධන මහත්මයාට කල්ලියක් හිටියා, ප්‍රේමදාස මහත්මයාට කල්ලියක් හිටියා, චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියට කල්ලියක් හිටියා, මහින්ද රාජපක්ෂ මහත්මයාට කල්ලියක් හිටියා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට කල්ලියක් හිටියා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට කල්ලියක් හිටියා. ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි අපි දැන් කැබිනට් මණ්ඩලයක් එක්ක රටක් පාලනය කරන්නේ. පාර්ලිමේන්තුවට වගකියන ජනාධිපතිවරයෙක් හිටියා නම් ඉන්නේ මේ දැන් ඉන්න නවවැනි ජනාධිපතිවරයා. එදා විධායක ජනාධිපති ක්‍රමයේ තිබිච්ච

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

භයංකාරකම පාතාලය දක්වා සංක්‍රමණය වෙලා තිබුණා. විධායක ජනාධිපති ධුරය පාතාලයත් ආක්‍රමණය කරලා තිබුණා. ඒ මට්ටමටයි තිබුණේ. අද තමයි ජනාධිපතිවරයෙක් ඉන්නේ, ජනතාවට වගකියන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ව්‍යවස්ථාදායකයකට බලපෑමක් නැහැ, අධිකරණයට බලපෑමක් නැහැ. අද අපි දැක්කා, අභියාචනාධිකරණය හරි අපූරු තීන්දුවක් දීලා තිබෙනවා.

මේ රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට පොලිස්පතිවරයෙකුට එරෙහිව කටයුතු කරලා ඒ පොලිස්පතිවරයා අත් අඩංගුවට අරගෙන වහාම ඉදිරිපත් කරන්න කියන නියෝගය ගරු අධිකරණයෙන් දීලා තිබෙනවා. ඒ දේශබන්දු තෙන්නකෝන්ට එරෙහිව. නමුත් පසුගිය වකවානුවල මොනවාද වුණේ? විධායකය තනිකරම තමන්ගේ යකඩ සපත්තුවට ගරු අධිකරණය පාගා ගෙන හිටියා. මාතර මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඒ දීපු තීන්දුව තහවුරු කරමින් ගරු අභියාචනාධිකරණය පොලිස්වතිවරයා ඉදිරිපත් කළ පෙත්සම නිශ්ප්‍රභ කරමින්, ඔහු වහාම අත් අඩංගුවට ගන්න කියලා නියෝගයක් කරලා තිබෙනවා. අන්න එහෙම ස්වාධීනත්වයක් අද ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කාල වකවානු වාගේ නොවෙයි. අපි අනිවාර්යයෙන් පොරොන්දුවක් දීලා තිබෙනවා. ඒ පොරොන්දුව මත පිහිටමින් අපි කටයුතු කරනවා. අපි දශක තුනක් බලාගෙන හිටියා. දශක තුනක් තිස්සේ ඒ ගොල්ලෝ මේවා හුක්ති වින්දා. දශක තුනක් තිස්සේ ඒ වළදේම වළඳ වළඳ හිටියා. දැන් ටිකක් හදිසි වෙලා තිබෙනවා. කමක් නැහැ. බොහොම ස්තුතියි, විපක්ෂයට. නමුත් ඒ ගොල්ලන්ගේ දින වකවානු අනුව නොවෙයි, කාල රාමු නොවෙයි, අපි අපේ කාල රාමුවකට යටත්ව ජනතාවට පැහැදිලි වන අයුරින් මේ කියන යෝජනාව අපි ස්ථාපිත කරනවා. අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන සෑම කාරණයක්ම ඉෂ්ට කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන ආයතන දෙකට, විශේෂයෙන්ම ව්‍යවස්ථාදායකයටත්, අධිකරණයටත් බලපෑම් නොකරන ජනාධිපතිවරයෙක් ඉතිහාසයේ ප්‍රථම වතාවට පත් වෙලා තිබෙනවා කියලා යළිත් මා කියා සිටිනවා. ඒ ජාතික ජන බලවේගයේ ජනාධිපතිවරයා කියන එක මේ අවස්ථාවේ මතක් කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.21]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ 1978 සම්මත කරන ලද, අපි දැනට පාලනය වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ඇති තරම් විවේචන, මේ ව්‍යවස්ථාව සම්මත කරපු ආකාරය පිළිබඳව ඇති තරම් විවේචන අපි අසා තිබෙනවා. ඒ වාගේම, විධායක ජනාධිපති ධුරය හරහා කටයුතු කරපු ආකාරය මීට දවස් කිහිපයකට ඉස්සෙල්ලා ගරු සභානායක බිමල් රත්නායක ඇමතිතුමා බොහොම පැහැදිලිව විස්තර කළා. 80 දශකයේ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය සහමුලින්ම විනාශ කර දමන ලද්දේ කොහොමද කියන එක එතුමා සඳහන් කළා. එවකට පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් සම්මත කරපු ලංකාවේ දැනට පවතින ව්‍යවස්ථාව, දශක ගණනාවක් තිස්සේ ප්‍රශ්නගත ව්‍යවස්ථාවක්. ඒකට මූලිකම හේතුව තමයි විධායක ජනාධිපති ධුරය විසින් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන මත අනවශ්‍ය බලපෑමක් ඇති කරනවා කියන කාරණය. අනවශ්‍ය ලෙස ඒවා පාගා දමනවාය කියන කාරණය. අපි හැමෝම ඒක දන්නවා. ඒක නිසා තමයි 1994දී, ඒ වාගේම 2015වැනි මෑත කාලයේදී වරින් වර, විවිධ විවිධ දේශපාලන පක්ෂ විසින් -එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙන්න පුළුවන්- වරින් වර මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා කියන පොරොන්දුව ලබා දීලා තිබෙන්නේ. ඒ ගැන ඔවුන්ගේ මැතිවරණ campaignsවල කථා කරලා තිබෙනවා. එහෙම කථා කරලා, බලය ගත්තත් මේ සම්බන්ධව කිසිම දෙයක් කරන්නේ නැතුව ඉඳලා, දැන් ජාතික ජන බලවේගය බලය ලබා ගත්තාට පස්සේ අපේ ආණ්ඩුව යටතේ අලුත් ව්‍යවස්ථාවක් බොහොම හදිසියේ ගෙන ඒමේ යෝජනාවක් ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. මේවා ගැන ඇත්තටම මෙච්චර කඩිනමින් හිතුවා නම්, යහ පාලන රජය පැවැති කාලයේ මෙච්චර කඩිනමින් මේවා ගැන හිතුවා නම්, එහෙම නැත්නම් 1994දී මෙච්චර කඩිනමින් මේවා ගැන හිතුවා නම්, ඇත්තටම අපේ රටේ දැනට තිබෙන ප්‍රශ්නවලට යම් තීරණයක් ගන්න තිබුණා කියලා මම හිතනවා. මොකද, ප්‍රශ්න විශාල ප්‍රමාණයක් මේ විධායක ජනාධිපති ධුරය විසින් ඇති කරලා තිබෙනවා. ඒ ප්‍රශ්න වෙනුවෙන් ඒ කාලයේ යම් තීරණයක් ගන්න තිබුණා. හැබැයි, එහෙම කරන්නේ නැතුව මේ ව්‍යවස්ථාව පුළුවන් තරම් අපයෝජනය කළා. සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්වා වාගේ ඒක පුළුවන් තරම් අපයෝජනය කරලා, පුළුවන් තරම් ඒ බලය අයුතු ලෙස පාවිච්චි කරලා, ප්‍රශ්න තවත් වැඩි කරලා, දැන් ඇවිල්ලා කියනවා අලුත් ව්‍යවස්ථාවක් ඕනෑ කියලා. ජාතික ජන බලවේගය දැන් තමයි ජනප්‍රිය, ඒ ජනප්‍රියකම පසුව නැති වෙන්න පුළුවන්, ඒ නිසා මේ වෙලාවේ ව්‍යවස්ථාව අලුතින් ගෙනෙන්න ඕනෑ කියලා කියනවා. මම හිතන විධියට අපි පැහැදිලිව කියන්න ඕනෑ වැදගත්ම දේ තමයි අපේ රජයේ ජනප්‍රිය බව වැඩි වෙනවා මිසක් අඩු වෙන්නේ නැහැ කියන එක. මොකද, අපි ජනතාවට එරෙහිව, ජනතාව පාගා දමන විධියට, ජනතාවට විරුද්ධ ක්‍රියාමාර්ග ගන්නේ නැහැ. මම හිතන විධියට ජනතා විරෝධී දේශපාලනය කරන අයට තිබෙන බයක් තමයි ඒ අය ආණ්ඩුව ගත්තාට පස්සේ ජනතාවට විරුද්ධ වෙන නිසා ඒ අයගේ ජනප්‍රිය බව අඩු වෙයි කියන එක.

අපේ රජයට ඒ ප්‍රශ්නය තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. ඒ වාගේම අපි අපේ timeline එකකට අනුව, අපට අවශ්‍ය ආකාරයට කටයුතු කරනවා. දැන් තිබෙන්නේ ජාතික ජන බලවේගය ආණ්ඩුව. එතකොට විපක්ෂය ගෙනෙන agenda එකකට අනුව අපි රට පාලනය කරන්න අවශ්‍ය නැහැ. අලුත් ව්‍යවස්ථාවක් ඕනෑ කියන එක අපි පිළිගන්නවා. අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න අපි බැඳී සිටිනවා. ඒක අපි අපේ මැතිවරණය තුළදී ප්‍රකාශ කරලා තිබෙනවා. අපි කිව්වා වාගේම, 2015-2019 කාලයේ සිදුවූ ව්‍යවස්ථාව නැවතත් සකස් කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙනයමින්, ඒකට අලුතින් යම් යම් දේ එකතු කරමින්, අපි අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්නේ කොහොමද කියන එක ගැන කථා කරන්නට ඕනෑ. ඒ සඳහා මේ රටේ දැනට,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමිය.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන කරන්නම්.

දැනට අපි මේ රටේ මැතිවරණ ක්‍රියාවලියක් ගෙන යමින් තිබෙනවා. ඊළඟට, පළාත් සභා මැතිවරණය පවත්වන්නට අවශ්‍යයි. මේ කියන විධියට මේ ගොල්ලන්ට අලුතින් ව්‍යවස්ථාවක් ගෙනෙන්න තිබෙන ප්‍රශ්නයට වඩා, මම හිතන විධියට මේක partisan කරන්න අවශ්‍ය නැහැ.

අපට තුනෙන් දෙකේ බලයක් තිබෙනවා; අලුත් ව්‍යවස්ථාවක් ගෙන ඒමේ බලය තිබෙනවා. මේක දේශපාලන පක්ෂ අතර තරගයක් කර ගැනීමට කිසිම අවශ්‍යතාවක් නැහැ. අපි නිශ්චිත වශයෙන්ම අලුත් ව්‍යවස්ථාවක් අරගෙන එනවා. විධායක ජනාධිපති ධුරය සම්බන්ධයෙන් ලබා දී තිබෙන පොරොන්දුවලට අනුව අපි කටයුතු කරනවා. ඒ නිසා මේ අවස්ථාවේදී මේ ආකාරයේ කමිටු පත් කිරීමට හෝ මේ යෝජනාවට අනුව කටයුතු කිරීමට අවශ්‍යතාවක් නැහැ කියන එක අවධාරණය කරමින්, මම නවතිනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මැතිතුමා, ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.25]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉස්සෙල්ලාම කල්පනා කරන්නට ඕනෑ දෙයක් තිබෙනවා. මම මීට කලින් කාරක සභා අවස්ථාවේ කියපු දේ සමහර මන්ත්‍රීවරුන්ට ඇහිලා නැහැ. ඒ නිසා නැවත වතාවක් ඒ දේම කියන්න මට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අපි "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය ලිව්වේ විපක්ෂයෙන් අහලා නොවෙයි; ජනතාවට බය වෙලා නොවෙයි. අපි මාස ගණනක් අධ්‍යයනය කරලා, දශක ගණනක් කල්පනා කරලා ලියපු දෙයක් තමයි විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සහ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම. අපි පොරොන්දු වෙලා තිබෙන්නේ වෙන කාටවත් නොවෙයි, මහජනතාවට. ජනතාවට දීපු පොරොන්දු අපි කඩ කරන්නේ නැහැ. නමුත් සමහර වෙලාවට විපක්ෂයේ මන්ත්‍රීවරු කලබල වෙන එක හරි. මොකද, ඒ ගොල්ලන්ගේ පොරොන්දු ඉෂ්ට කරන ඒවා නොවෙයි. ඒවා stage එකට විතරයි. අපි ලස්සන රටක් පොහොසත් ජීවිතයක් කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පොරොන්දු ඉෂ්ට කරන්නේ කාගේවත් කාලසටහනකට හෝ කම්පනයකට අනුව නොවෙයි, අපි ජනතාවට ලබා දුන් පොරොන්දුවක් අනුවයි.

විපක්ෂයේ මන්ත්‍රීවරු අඩු ගණනේ දැන්වත් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ කොටසින් කොටස හෝ කියවන එක ගැන මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඒ ගොල්ලන්ට ඒකෙන් ගොඩක් දේවල් ඉගෙන ගන්න පුළුවන්. එහි තිබෙන්නේ අපි අවුරුදු පහකදී කරන දේවල් මිස පළමුවැනි මාස පහේදී කරන දේවල් නොවෙයි. ඉස්සෙල්ලාම ඒක තේරුම් ගන්නට ඕනෑ. අපි බලයට ආපු ගමන් අපට priorities තිබුණා. අපි මේ පොරොන්දු ඔක්කොම ඉෂ්ට කරන්න ඕනෑ. මේක තමයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය. ඒ දේ සිද්ධ වෙනවා. නමුත් priority එක මොකක්ද? රටේ තිබුණු ආර්ථික අස්ථාවරත්වය නැවත නිවැරදි තැනට ගෙනෙන්න අපට අවශ්‍ය වුණා. මොකද, ඒක අපට දීපු ප්‍රධානම වගකීමක්. මේ වෙනකොට මුල් අය වැය ඇවිත් තිබෙනවා. IMF එකේ දැඩි කොන්දේසි යටතේ වුවත් ජනතාවට සහන රාශියක් ලබා දෙන්නට අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම පඩිත් දැනෙන මට්ටමින් වැඩි කරන්නට අපට හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම අපි දැන් ආයතනවල, රජයේ දෙපාර්තමේන්තුවල වංචා දූෂණ බින්දුවට ගෙනැවිත් තිබෙනවා. ඒවා නවත්වා තිබෙනවා. දැන් ඔබලාට ඇහෙන්නේ නැහැ නේ, මන්ත්‍රීවරු commission ගන්නවා කියලා. දැන් ඔබලාට ඇහෙන්නේ නැහැ නේ, ඇමතිවරු රජයේ මුදල් නාස්ති කරනවා කියලා. ඒ විතරක් නොවෙයි. ජනාධිපතිවරයා, අගමැතිවරිය සහ අපි සියලුදෙනා රජයේ වියදම් කොච්චර අඩු කරලා තිබෙනවාද? නාස්තිය කොච්චර අඩු කරලා තිබෙනවාද? මේක තමයි මූලික දේ. අපි ඒ දේ ඉස්සෙල්ලා කළා.

දෙවනුව, මිනිස්සු අපෙන් බලාපොරොත්තු වුණේ මොකක්ද? වංචනිකයන්, දූෂිතයන් අධිකරණය ඉදිරියට පැමිණවීම. අන්න ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරලා, දැන් ඒ ගමන යමින් තිබෙනවා. අපේ වටගල සහෝදර මන්ත්‍රීතුමා කිව්වේත් ඒකයි. කොයි රටේද IGP කෙනෙක් පොලීසියෙන් හැංගුණේ? සමහර වෙලාවට වෙන ආණ්ඩුවක් තිබුණා නම්, ඔය IGP හැංගෙන්නේ නැහැ. ඇයි? භාර වෙලා සති දෙකකට පසුව කිසි කරදරයක් නැතිව නැවත ගෙදර යන්න පුළුවන් කියලා දන්න නිසා. නමුත් අපේ ආණ්ඩුව යටතේ භාර වෙන්න ඔහුට කැමත්තක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි Court of Appeal එකට ගිහින් Writ application එකක් දාලා කිව්වේ, "මා අත් අඩංගුවට ගන්න එපා කියන්න" කියලා. මොකද, අපේ ආණ්ඩුව යටතේ හොරුන්ට, වංචනිකයන්ට ඉඩ නැහැ, අපේ රටේ නීතිය හැමටම සමානව ක්‍රියාත්මක කරන බව ඔහු දන්නවා. ඒ නිසා මේ නිශ්චිත මොහොතේ ඔහු අත් අඩංගුවට ගන්න අවශ්‍ය කටයුතු වටගල නියෝජ්‍ය ඇමතිවරයා නියෝජනය කරන අමාත්‍යාංශයෙන් සිද්ධ වෙනවා. ඉතින් බලන්න, අපි මොකක්ද කරලා තිබෙන්නේ? අපි මිනිසුන්ගේ අවශ්‍යතාව අනුව timeline එකකට වැඩ කරගෙන යනවා.

ඊළඟට, පැහැදිලිවම අපි පළාත් පාලන මැතිවරණය පවත්වන්නට ඕනෑ. ඒක ගිය අවුරුද්දේ ඉඳන් කල් යන එකක්. ඒ නිසා ඒක සිද්ධ වෙනවා. දැන් ඒකට දින නියම වෙලා තිබෙන්නේ. අපේ සැලැස්ම අනුව ඉන් පසුව පළාත් සභා මැතිවරණය පවත්වන්න ඕනෑ. ඒවා කරන්නට ඕනෑ. මොකද, මේ ආයතන අකර්මණ්‍ය වෙලා තිබෙන්නේ. විශේෂයෙන් පළාත් පාලන ආයතන අකර්මණ්‍ය වෙලා තිබෙන්නේ. ඉතින් මේවායින් පෙන්නුම් කරන්නේ මොකක්ද? අපි දීපු පොරොන්දු ඉෂ්ට කරන්නේ නැහැයි කියන එක නොවෙයි. අපේ රජය හදපු timeline එකක් සහ සැලැස්මක් අනුව අපි ඒ කටයුතු කරගෙන යනවා. අනිවාර්යයෙන්ම අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන වැඩේත් ඒ සමඟම අපි කරනවා.

මේ අවස්ථාවේ මම පැහැදිලිවම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ ජනප්‍රිය බව අඩු වෙනවා කිව්වා. ඒක වෙනත් පක්ෂවලට අයිති රෝගයක් මිසක් ජාතික ජන බලවේගයේ රෝගයක් නොවෙයි. අපේ ජනප්‍රිය බව එන්න එන්න වැඩි වෙනවා. මොකද, අපි ජනතාව තළා පෙළා විනාශ කරන්නේ නැහැ. ඒ හින්දා මේ අවුරුදු 5 අවසානයේ නැවත වතාවක් රටේ ජනතාව අපට බලය දෙන්න කල්පනා කරනවා. මොකක්ද හේතුව? අපේ ජනප්‍රිය බව වැඩි වෙනවා. ඒ හින්දා ඒ ප්‍රශ්නය අපට

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

බලපාන්නේ නැහැ. නමුත් යම් හෙයකින් අපේ ජනප්‍රිය බව අඩු වෙයි කියලා කවුරු හරි හීන දකිමින් ඉන්නවා නම්, ඒ අය අවදි කරන්නත් මම සූදානම් නැහැ. මොකද, ඒ අයගේ හීන ඒ අයට දකින්න අවසර තිබෙනවා.

මම අවසාන වශයෙන් කියන්නේ අපි දුන් පොරොන්දු ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරන බවයි. අපි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන එක කරනවා. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේම, අපේ ගරු අනුර දිසානායක ජනාධිපතිතුමාත්, ගරු බිමල් රත්නායක ඇමතිතුමාත් කලින් Constitution drafting process එකේ හිටපු අය. ඒ නිසා ආයේ මුල ඉඳන් පටන් ගන්න දෙයක් නැහැ. අපි එහෙම කල් මරන්නේ නැහැ. අපි දන්නවා, වැඩේ නවත්වපු තැන ඉඳන් පටන් අරගෙන ඒක ඉක්මනට ගේන්න පුළුවන් බව. ඒකට අවශ්‍ය සියලු කරුණු අපේ කාලසටහනකට අනුව කරනවා. ඒක කිසිම ආකාරයකින් පොරොන්දු මහ හැර යෑමක් නොවෙයි. එහෙම නොවුණොත් අවුරුදු 5ක් අවසානයේ ඔබතුමන්ලා සන්තෝෂ වෙන්න පුළුවන්. මොකද එතකොට විපක්ෂයට කියන්න පුළුවන්, මෙන්න ජාතික ජන බලවේගය දීපු පොරොන්දු ඉෂ්ට කළේ නැහැ කියලා. නමුත් එහෙම කියන්න අපි ඔබතුමන්ලාට ඉඩක් තියන්නේ නැහැ. ඒ නිසා ඒ වැඩේ කෙරෙනවා.

මම අවසාන වශයෙන් මෙච්චරයි කියන්නේ. බල්ලා තමයි නැවිට වනන්නේ. නැවිටට ඕනෑ විධියට බල්ලා වැනෙන්නේ නැහැ. ඒ හින්දා නැවිට දැනගන්න ඕනෑ නැවිටේ විධියට ඉන්න. ආණ්ඩුව අපේ. අපේ කාලසටහන අනුව අපි ඒ පොරොන්දු ටික ඉෂ්ට කරනවා. විපක්ෂයට පුළුවන් අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]* හරි, ජය වේවා. *[බාධා කිරීම්]*

එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 පෙබරවාරි 21වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 18වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 21ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 18, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly until 9.30 a.m., on Tuesday 18th March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 16 වන කලාපය
தொகுதி 318 - இல. 16
Volume 318 - No. 16

2025 මාර්තු 18වන අඟහරුවාදා
2025 மார்ச் 18, செவ்வாய்க்கிழமை
Tuesday, 18th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 18වන අඟහරුවාදා
2025 மார்ச் 18, செவ்வாய்க்கிழமை
Tuesday, 18th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
පාර්ලිමේන්තුවේ කාරක සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ නීතිමය පදනම පිළිබඳව සොයාබලා එකී නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව තුළ ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ මහ පෙන්වීම පිණිස පත් කළ කමිටුව [තිරුව 2817]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තිරු 2819-2838]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :
එක්සත් ජනපද නව තිරුබදු ප්‍රතිපත්තිය මත ශ්‍රී ලංකා අපනයනවලට ඇති වන බලපෑම අවම කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග [තිරුව 2839]

උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය සඳහා විසඳුම්:
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තිරුව 2843]

පරිපූරක සහ අතුරු වෛද්‍ය වෘත්තිකයන්ගේ වැටුප් ගැටලුව:
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තිරුව 2848]

වරප්‍රසාද:
2025.03.06 දින කෝප් කමිටුවේදී කරන ලද ප්‍රකාශය [තිරුව 2851]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [විසිතුන්වන වෙන් කළ දිනය]:
[ශීර්ෂ149, 303 (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන); ශීර්ෂ 194, 219 (තරුණ කටයුතු සහ ක්‍රීඩා)] කාරක සභාවේදී සලකා බලන ලදී. [තිරු 2853-2984]

ජාතික තරුණ සේවා සභාව:
වාර්ෂික වාර්තාව (2021) [තිරුව 2985]

කල්තැබීමේ යෝජනාව:
විදෙස්ගත වන ශ්‍රමිකයන් නියාමනය සඳහා නිසි වැඩ පිළිවෙළක් [තිරු 2986-2994]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
பாராளுமன்றக் குழுக்களின் பரிந்துரைகளைச் செயற்படுத்துதல் தொடர்பான சட்ட அடிப்படை பற்றி ஆராய்ந்து, அப்பரிந்துரைகளைச் செயற்படுத்தாமை தொடர்பில் அரசியலமைப்புச் சட்டகத்துக்குள் எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் பற்றிய வழிகாட்டலுக்காக நியமிக்கப்பட்ட குழு [ப: 2817]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2819-2838]

தனி அறிவித்தல் மூல வினா:
ஐக்கிய அமெரிக்காவின் புதிய சுங்கவரிக் கொள்கைகள் இலங்கையின் ஏற்றுமதிகள்மீது செலுத்தும் தாக்கத்தைக் குறைப்பதற்குத் தேவையான நடவடிக்கை [ப: 2839]

பட்டதாரிகளின் வேலையின்மைக்கான தீர்வுகள்:
பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 2843]

துணை மருத்துவ மற்றும் அதனுடன் இணைந்த மருத்துவ நிபுணர்களின் சம்பளப் பிரச்சினை:
சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று [ப: 2848]

சிறப்புரிமை:
'கோப்' குழுவில் 06.03.2025 அன்று தெரிவிக்கப்பட்ட கருத்து [ப: 2851]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட இருபத்துமூன்றாம் நாள்]:
[தலைப்புக்கள் 149, 303 (கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி); தலைப்புக்கள் 194, 219 (இளைஞர் அலுவல்கள் மற்றும் விளையாட்டுத்துறை)] – குழுவில் ஆராயப்பட்டது [ப: 2853-2984]

தேசிய இளைஞர் சேவைகள் மன்றம்:
வருடாந்த அறிக்கை (2021) [ப: 2985]

ஒத்திவைப்புப் பிரேரணை:
வெளிநாடு செல்லும் தொழிலாளர்களை ஒழுங்குறுத்துவதற்கான முறையான செயற்றிட்டம் [ப: 2986-2994]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
- Committee to Look into the Legal Basis for Implementing the Recommendations of Parliamentary Committees and to Provide Guidance on Actions that Can be Taken within the Constitutional Framework Regarding the Non-implementation of Such Recommendations [Col. 2817]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2819-2838]

QUESTION BY PRIVATE NOTICE:
- Necessary Measures to Mitigate Impact on Sri Lankan Exports Due to New Tariff Policy of the United States [Col. 2839]

SOLUTIONS FOR UNEMPLOYMENT OF GRADUATES:
- Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 2843]

ISSUE OF SALARIES OF PARAMEDICAL AND ALLIED HEALTH PROFESSIONALS:
- Statement by Minister of Health and Mass Media [Col. 2848]

PRIVILEGE:
- Remark Made at the COPE on 06.03.2025 [Col. 2851]

APPROPRIATION BILL, 2025 - [Twenty-third Allotted Day]:
- Considered in Committee - [Heads 149, 303 (Industry and Entrepreneurship Development); Heads 194, 219 (Youth Affairs and Sports)] [Cols. 2853-2984]

NATIONAL YOUTH SERVICES COUNCIL:
- Annual Report (2021) [Col. 2985]

ADJOURNMENT MOTION:
- Proper Programme to Regulate Migrant Workers [Cols. 2986-2994]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 18වන අඟහරුවාදා
2025 மார்ச் 18, செவ்வாய்க்கிழமை
Tuesday, 18th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තුවේ කාරක සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ නීතිමය පදනම පිළිබඳව සොයාබලා එකී නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව තුළ ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ මහ පෙන්වීම් පිණිස පත් කළ කමිටුව
பாராளுமன்றக் குழுக்களின் பரிந்துரைகளைச் செயற்படுத்துதல் தொடர்பான சட்ட அடிப்படை பற்றி ஆராய்ந்து, அப்பரிந்துரைகளைச் செயற்படுத்தாமை தொடர்பில் அரசியலமைப்புச் சட்டகத்துக்குள் எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் பற்றிய வழிகாட்டலுக்காக நியமிக்கப்பட்ட குழு
COMMITTEE TO LOOK INTO THE LEGAL BASIS FOR IMPLEMENTING THE RECOMMENDATIONS OF PARLIAMENTARY COMMITTEES AND TO PROVIDE GUIDANCE ON ACTIONS THAT CAN BE TAKEN WITHIN THE CONSTITUTIONAL FRAMEWORK REGARDING THE NON-IMPLEMENTATION OF SUCH RECOMMENDATIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 ජනවාරි 23වැනි දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹී තීරණය පරිදි "පාර්ලිමේන්තුවේ කාරක සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ නීතිමය පදනම පිළිබඳව සොයාබලා එකී නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව තුළ ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ මහ පෙන්වීම් පිණිස" ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අමාත්‍ය නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාගේ සභාපතිත්වයෙන් යුත් සිව් පුද්ගල කමිටුවක් පත් කරන ලදී.

2025.03.15 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹී තීරණය පරිදි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී ඔෂානි උමංගා මහත්මිය ද එකී කමිටුවේ සාමාජිකයෙකු ලෙස නම් කරන ලදී.

ඒ අනුව, එම පංච පුද්ගල කමිටුවේ සාමාජිකත්වය පහත පරිදි වන බව මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අමාත්‍ය නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා - සභාපති
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නියෝජ්‍ය අමාත්‍ය නීතිඥ සුනිල් වටගල මහතා - සාමාජික
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණානායක මහතා - සාමාජික
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් පී. පෙරේරා මහතා - සාමාජික
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී ඔෂානි උමංගා මහත්මිය - සාමාජික

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, හෝමාගම, ගලවිලවත්ත, සමන් මාවත, 3වැනි පටුමග, අංක 9/2 දරන ස්ථානයෙහි පදිංචි ජයනාත් කුරුප්පු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) තිහගොඩ, පැලවත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ.කේ.ඒ. ඉරෝෂන් මංජුල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හක්මණ, බෙරුවෙවෙල, අංක 139/2 දරන ස්ථානයෙහි පදිංචි එම්. හරිප්‍රිය රෝහණ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)

ගරු කථානායකතුමනි, නිල්ලඹ, නව වාරියගල වත්ත, අංක 16/1 දරන ස්ථානයෙහි පදිංචි බී.ඩී. ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මරදන්කඩවල, වළගම්බාහුව, දයාගම, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි කේ. අබේවික්‍රම මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

මිහින්තලේ ගොවිජන සේවා බැංකුව: සී/ස ජනතා ලංකා මිරිස් අළෙවි සමාගමට ලබා දුන් ණය
மிகிந்தலை கமநல சேவைகள் வங்கி: வ/ப ஜனதா லங்கா மிளகாய் சந்தைப்படுத்தல் கம்பனிக்கு வழங்கப்பட்ட கடன் தொகை
GOVI JANA SEVA BANK, MIHINTALE: LOAN GRANTED TO JANATHA LANKA CHILLIE MARKETING LTD.

495/2025

1. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මිහින්තලේ, ගොවිජන සේවා බලප්‍රදේශයේ, සීමාසහිත ජනතා ලංකා මිරිස් අළෙවි සමාගම පිහිටුවා තිබෙන බව දන්නේද;

(ii) 2001 වර්ෂයේදී මිහින්තලේ ගොවිජන සේවා බැංකුව මඟින් එම සමාගමට රුපියල් 1,275,000ක ණය මුදලක් ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම ණය මුදල ලබා දීමේ පදනම කවරේද;

(iv) එම ණය මුදල නැවත අයකර ගන්නේද;

(v) එසේ නම්, අයකර ගැනීමේ පදනම කවරේද;

(vi) එම ණය මුදල සඳහා අයකර ගතයුතු රුපියල් 1,975,233ක පොලී මුදල අයකර නොගැනීමට තීරණය කර තිබේද;

(vii) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மிகிந்தலை கமநல சேவைகள் ஆளுகைப் பிரதேசத்தில், வரையறுக்கப்பட்ட ஜனதா லங்கா மிளகாய் சந்தைப்படுத்தல் கம்பனி நிறுவப் பட்டுள்ளமையை அறிவாரா என்பதையும்;

(ii) 2001ஆம் ஆண்டில் மிகிந்தலை கமநல சேவைகள் வங்கியால் மேற்படி கம்பனிக்கு ரூ.1,275,000 கடன் தொகை வழங்கப் பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அக்கடன் தொகை வழங்கப்பட்ட அடிப்படை யாதென்பதையும்;

(iv) மேற்படி கடன் தொகை மீள அறவிடப்படுமா என்பதையும்;

(v) ஆமெனில், அறவிடப்படும் அடிப்படை யாதென்பதையும்;

(vi) மேற்படி கடன் தொகைக்காக அறவிடப்பட வேண்டிய ரூ. 1,975,233 வட்டித் தொகையை அறவிடாதிருப்பதற்குத் தீர்மானிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(vii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that the Janatha Lanka Chillie Marketing Limited is situated in the Mihintale Agrarian Service area;

(ii) whether a loan of Rs. 1,275,000 has been granted to that company by the Mihintale Govijana Seva Bank in 2001;

(iii) if so, the basis on which that loan was granted;

(iv) whether that loan will be recovered;

(v) if so, the basis on which the said loan will be recovered;

(vi) whether a decision has been taken not to collect the interest of Rs. 1,975,233 of the loan; and

(vii) if so, the reasons for that?

(b) If not, why?

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

සීමාසහිත ජනතා ලංකා මිරිස් නිෂ්පාදන හා අළෙවි ගොවි සමාගම, N(EPV) (P) 122 යන ලියාපදිංචි අංකය යටතේ 2001 මාර්තු 21 දින සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කර ඇත.

(ii) ඔව්.

(iii) 2001.04.19 වන දින සීමාසහිත ජනතා ලංකා මිරිස් නිෂ්පාදන හා අළෙවි ගොවි සමාගමේ සභාපති එස්.එම්. චන්ද්‍රසේන මහතා - එස්.එම්. චන්ද්‍රසේන කියන්නේ හිටපු ඇමතිතුමා - විසින් රුපියල් ලක්ෂ සියයක ණය මුදලක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බල ප්‍රදේශ 12ක මිරිස් මිලදී ගැනීම සඳහා මිහින්තලේ ගොවිජන බැංකුවෙන් ඉල්ලා ඇත.

එම ඉල්ලීම මිහින්තලේ ගොවිජන සේවා කාරක සභාව විසින් 2001.04.19 දින නිර්දේශ කර අනුරාධපුර දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව වෙත යොමු කර ඇති අතර, එම නිර්දේශ පදනම් කර ගනිමින් 2001.04.23 දින දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව විසින් රුපියල් ලක්ෂ 100ක ණය මුදල කොටස් වශයෙන් නිකුත් කිරීමටත්, ණය කොටස් ලබා දීමට පෙර ජාතික මෙහෙයුම් කමිටුව ණය නිකුත් කිරීමේදී හා භාවිතයේදී පනවන කොන්දේසි හා උපදෙස් අනුව කටයුතු කිරීමටත් ගොවිජන බැංකු (නියමු) යෝජනා ක්‍රමයේ අනුරාධපුර දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව තීරණය කර ඇත.

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ලිපි අංක 7/11/8/2/1/12 හා 2001.04.23 දිනැති කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් අමතන ලිපිය මඟින් රුපියල් ලක්ෂ සියයක් (රුපියල් මිලියන 10ක්) ආයෝජනය අවශ්‍ය නොවන බවත්, ඒ සඳහා රුපියල් මිලියන 1.2ක ණය මුදලක් නිකුත් කිරීම සුදුසු බවටත් නිර්දේශයක් එමඟින් දන්වා ඇත.

ඒ අනුව අධ්‍යක්ෂක මුදල් සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතනික සංවර්ධන) පිටපත් සහිතව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපි අංක ආසං/ගො.බැං. හා 2001.05.02 දිනැති ලිපිය මඟින් මෙම ණය මුදල අනුමත කරන ලද බව දන්වා ඇත.

එකී අනුමැතිය නියෝජ්‍ය කොමසාරිස් (එලදා හා අළෙවි) විසින් සහකාර කොමසාරිස්, අනුරාධපුර අමතන ලද ලිපි අංක 7/11/8/2/1/12 හා 2001.05.03 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇති බව දන්වා ඇත.

(iv) ඔව්.

අනුරාධපුර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, ලිපි අංක 20/05/01/01/02 හා 2025.02.28 දිනැති ලිපිය මඟින් ණය මුදල හා අයවීමට ඇති ශේෂයන් පිළිබඳව පහත පරිදි දක්වා ඇත.

දිනය	ණය හා පොලී අයවීම (රුපියල්)		මුළු එකතුව	අයවීමට ඇති ණය හා පොලී අයවීම (රුපියල්)	
	ණය මුදල	පොලිය		ණය මුදල	පොලිය
2001.09.07	389,500.00	10,500.00	400,000.00	885,500.00	-
2024.11.06	885,500.00	-	885,000.00	-	1,975,233.00
එකතුව	1,275,000.00	10,500.00	1,285,500.00		1,975,233.00

2001.09.07 දින සිට 2024 දක්වා මේ මුදල ගෙවීමට තිබෙනවා. නමුත්, ඒ වනකල්ම මේ මුදල ගෙවා තිබුණේ නැහැ.

(v) වාර්ෂිකව, කොමසාරිස් ජනරාල්ගේ 7/11/8/2/1/12 හා 2001.05.17 දිනැති ලිපිය මඟින් සියයට 10.5ක පොලී අනුපාතයක් සහිතව සාමාන්‍ය ණය අය කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් ණය මුදල සහ පොලිය අය කිරීමට කටයුතු සිදු කරන ලෙස උපදෙස් දී ඇත.

(vi) නැත.

(vii) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන ගණකාධිකාරි විසින්, 2015.11.18 දිනැතිව 7/12/15/ජනතා මිරිස්/ගො/සං යටතේ අනුරාධපුර සහකාර කොමසාරිස් අමතන ලද ලිපියක් මඟින් උක්ත සමාගමේ අයවීමට පවතින ණය මුදල පමණක් අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. චන්ද්‍රසේන මහතා විසින් ගෙවීමට එකඟ වී ඇති බව සහකාර කොමසාරිස් විසින් සඳහන් කර ඇති බැවින් එකී ණය මුදල වන රුපියල් 885,500 පමණක් වාරික 12කින් අය කර එවන ලෙස දන්වා ඇත.

එකී ලිපියට අනුව නැවත ගොවිජන සංවර්ධන කොමසාරිස් (සේවා) ලිපි අංක 7/12/1/15-2 හා 2025.01.02 දිනැති ලිපිය මඟින් සී/ස (ජනතා) ලංකා මිරිස් නිෂ්පාදන හා අළෙවි ගොවි සමාගම වෙත නිකුත් කරන ලද ණය මුදල වන රුපියල් 885,500ක් පමණක් අය කිරීම ප්‍රමාණවත් බවත්, පොලී මුදල වන රුපියල් 1,975,233ක් අය කිරීම අවශ්‍ය නොවන බවත් දන්වා ඇත.

එහෙත් ඉහත සඳහන් ලිපිය නැවත සංශෝධනය කර 2025.01.29 දිනැති ලිපිය මඟින් සී/ස (ජනතා) ලංකා මිරිස් නිෂ්පාදන හා අළෙවි ගොවි සමාගම වෙත නිකුත් කරන ලද ණය මුදල වන රුපියල් 885,500ක් සහ මුළු පොලී මුදල වන රුපියල් 1,975,233ක් අය කිරීම අවශ්‍ය වන බව අනුරාධපුර නියෝජ්‍ය ගොවිජන සංවර්ධන කොමසාරිස් වෙත දන්වා ඇත. ඒ අනුව ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි විසින් අංක 19/26/ගො.බැ. හා 2025.02.18 දිනැතිව එස්.එම්. චන්ද්‍රසේන මහතා අමතන ලද ලිපිය මඟින් උක්ත පොලී මුදල ද දින 14ක් තුළ ගෙවන ලෙස දැනුම් දී ඇත.

කලින් එහෙම තීන්දුවක් අරගෙන තිබුණා. ඒ තීන්දුව මේ වනකොට අපි වෙනස් කර තිබෙනවා. ඒ අනුව, රුපියල් 1,975,233ක මුදලක් අයවීමට නියමිතයි.

(ආ) අදාළ නොවේ.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)

(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපි දන්නවා, ගොවිජන සේවා බලප්‍රදේශයේ පිහිටුවා තිබෙන ගොවිජන සේවා කාරක සභාව මඟින් ගොවි ජනතාවත් ණය ලබා ගන්නා බව.

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

කන්න වගාව සඳහා රුපියල් 50,000, රුපියල් 100,000 ආදී වශයෙන් එමනින් ණය ලබා ගන්නවා. හැබැයි, ප්‍රශ්නය මේකයි. 2001 වර්ෂයේදී ලබා ගත් මේ රුපියල් 1,275,000ක ණය මුදල වාරික දෙකකින් ගෙවා තිබෙනවා, මේ ජනතා ලංකා මිරිස් අලෙවි සමාගමේ සභාපති චන්ද්‍රසේන හිටපු කෘෂිකර්ම ඇමතිවරයා. ඔහු ඒ මුදල ගෙවා තිබෙන්නේ 2024 වර්ෂයේ අවසාන භාගයේදී. හැබැයි, තිබෙන ප්‍රශ්නය තමයි 2001 වර්ෂයේදී ලබා ගත් ඒ ණය මුදලට තවම පොලිය අය කරගෙන නොමැති වීම. සාමාන්‍ය ගොවියෙකුට ණයක් දුන්නොත් ඉතාම කෙටි කාලයක් ඇතුළත ඒ ණය සහ පොලිය අය කර ගැනීම සඳහා යුහුසුලුව මැදිහත් වෙනවා. හැබැයි, 2001 වර්ෂයේ සිට මේ දක්වා වසර 24කට ආසන්න කාලයක් තිස්සේ මේ ණය මුදලට පොලිය අය කරගෙන නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රුපියල් 1,975,233ක මේ පොලී මුදල කොපමණ කාලයක් ඇතුළත අය කර ගන්නවාද?

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය මට පැහැදිලියි. මාවිල්ආරු සොරොව්ව ඇරියාම වතුරට ගහගෙන ගියා වාගේ අවුරුදු 24ක් තිස්සේ මේ මුදලත් අතුරුදන් වෙලා තිබුණේ. ඔබතුමා කියන කාරණය නිවැරදියි. මීට පෙර ඒ මුදල අය කර ගැනීමට කටයුතු කර නැහැ. ඒ විතරක් නොවෙයි. එම පොලී මුදල නැතිව මේ මුදල ගෙවීමට අදාළවත් පසුගිය දවස්වල ලිපි ලේඛන හුවමාරු වෙලා තිබෙනවා. කොහොම නමුත්, ඒ සමස්ත මුදල ගෙවන ලෙස එම සමාගමේ සභාපති චන්ද්‍රසේන මහතාට මේ වනකොට ලිඛිතව දැනුම් දීම් කර තිබෙනවා. ඒ අනුව එම මුදල අනිවාර්යයෙන්ම අය කර ගන්නවා.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. වර්තමාන රජය විධියට අපි පසුගිය කාලයේ පොහොර සහනාධාරය ලබා දුන්නා. පසුගිය ආණ්ඩුව කාලයේ පොහොර සහනාධාරය ලබා දීමේදී අක්‍රමිකතා විශාල ප්‍රමාණයක් සිද්ධ වුණා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත්, අපිත් පසුගිය කාලයේ මේ වෙනුවෙන් සටන් කළා වාගේම ඒ වෙනුවෙන් මැදිහත් වුණා.

වර්තමාන රජය විසින් හෙක්ටෙයාරයකට රුපියල් 25,000ක මුදලක් ලබා දෙන්න තීරණය කළා. අපි ඒ මුදල ලබා දුන්නා. හැබැයි, තමන්ගේ ගිණුමට ඒ මුදල ලැබී නැති සැලකිය යුතු ගොවීන් පිරිසක් මේ වෙනකොට රට පුරා ඉන්නවා. වෙබ් අඩවියේ පෙන්වනවා, මුදල් ලැබී තිබෙනවා කියලා. නමුත් බැංකු පොත යාවත්කාලීන කර බැලුවාම පෙනී ගිහින් තිබෙනවා, ඒ අයගේ බැංකු ගිණුම්වලට පොහොර සහනාධාරය වෙනුවෙන් ලබා දීපු මුදල් ලැබී නැති බව. ඒ නිසා මේ සම්බන්ධයෙන් මොකක්ද ගනු ලබන පියවර? දැන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. අපිට ආරංචියකුත් ලැබී තිබෙනවා, මේ වෙනකොට මේ සම්බන්ධයෙන් CID එකේ පැමිණිල්ලක් දමා තිබෙන බවට. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් කරන පැහැදිලි කිරීම මොකක්ද?

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් යොමු කළේ. ඔබතුමාත්, අපිත් පසුගිය කාලය පුරාවටම මේ පිළිබඳව උනන්දු වුණා. හැම කන්නයක් අවසානයේම ගොවි ජනතාවගේ පැත්තෙන් අපට, ගොවිජන සම්මේලනයට පැමිණිලි ගොඩක් එනවා. "යායේ ඔක්කෝටම සල්ලි හම්බ වුණා. අපට සල්ලි හම්බ වුණේ නැහැ. අහවල් යායේ හැමෝටම සල්ලි හම්බ වුණා. ගොවීන් 10දෙනෙකුට හම්බ වුණේ නැහැ, 20දෙනෙකුට හම්බ වුණේ නැහැ" යනාදී වශයෙන් ගොවි ජනතාවගේ පැත්තෙන් පැමිණිලි ගොඩක් එනවා. ඇත්තටම මේ පිළිබඳව අපිත්, ඔබතුමන්ලාත් ඒ කාලයේ සොයා බැලුවා. එතකොට අපට ඒ සම්බන්ධව විවිධ උත්තර ලැබුණා. හැබැයි, අපි මේ අමාත්‍යාංශවල වගකීම භාර ගත්තාට පසුව අපි මේවායේ පතුලටම ගිහින් මේ පිළිබඳව විපරම් කළා. එසේ විපරම් කළාට පසුව යම් තොරතුරු ප්‍රමාණයක් අපට සොයා ගන්න පුළුවන් වුණා, ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව මේ වනකොට ඊට අදාළ පරීක්ෂණයක් සිදු කරනවා. ඒ වාගේම පොලිස්පතිතුමා එක්කත් අපි ඒ පිළිබඳව සාකච්ඡා කළා. CID එකේ පැමිණිල්ලකුත් දමා තිබෙනවා, මේ ගැන. ඊට අදාළ විමර්ශන සිදු වෙනවා. මේ වෙනකොට විශේෂයෙන්ම ලංකා බැංකු මූලස්ථානය පැත්තෙනුත් මේකට අදාළ තොරතුරු අපි අරගෙන තිබෙනවා.

මා වෙත ලැබී තිබෙන තොරතුරු අනුව ඔබතුමාගේ දිස්ත්‍රික්කය වන අනුරාධපුරයේ පමණක් ගොවීන් 155දෙනෙකුට ලබා දිය යුතු රුපියල් 2,934,310ක් හොරකම් කර තිබෙනවා.

මීට අදාළ සාක්ෂි තිබෙනවා. මීට සම්බන්ධ එක නිලධාරිනියක් මේ වෙනකොට අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. කොහොම නමුත්, අහිංසක ගොවි ජනතාවට ලැබෙන්න තිබෙන මුදල් ඔවුන්ගේ ගිණුමට ගියේ නැහැ. හැබැයි, වෙන වෙන අයගේ ගිණුම්වලට මේ මුදල් ගිහිල්ලා තිබෙනවා. අහිංසක මිනිස්සුන්ගේ, ගොවීන්ගේ සල්ලි තමයි මේ විධියට හොරකම් කරලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මීට අදාළව දිගටම පරීක්ෂණ සිදු කෙරෙනවා. කිසිම කෙනෙකුට කිසිම සමාවක් නැති බව අපි පැහැදිලිව ප්‍රකාශ කරනවා. මීට අදාළව නීත්‍යානුකූලව ගතහැකි උපරිම ක්‍රියාමාර්ග අපි ගන්නවා කියන එකත් මේ අවස්ථාවේ දී මම මතක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -496/2025- (1), ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -498/2025- (1), ගරු අනුරාධ ජයරත්න මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ගුරු සේවය සහ විදුහල්පති සේවය: වැටුප් විෂමතා
ஆசிரியர் சேவை மற்றும் அதிபர் சேவை: சம்பள முரண்பாடு
TEACHERS' SERVICE AND PRINCIPALS' SERVICE: SALARY ANOMALIES

502/2025

4. ගරු නන්ද බණ්ඩාර මහතා
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගුරු හා විදුහල්පති සේවාවල වැටුප් විෂමතාවක් පවතින බව පිළිගන්නේද;

(ii) එය විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද;

(iii) ගුරු සේවා ව්‍යවස්ථාව අනුව උසස්වීම් සඳහා මොඩියුල අවශ්‍යතා සපුරාගත යුතු බව දන්නේද;

(iv) මොඩියුල අවශ්‍යතා සම්පූර්ණ කරගත නොහැකි වීම හේතුවෙන් උසස්වීම් අහිමි වීම, වැටුප් වර්ධක නොලැබීම හා සේවය ස්ථිර කිරීම ප්‍රමාද වීම ආදී ගැටලු පැන නැඟී ඇති බව දන්නේද;

(v) එම ගැටලු විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද;

(vi) ඒවා විසඳන දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සේවා ව්‍යවස්ථානුකූලව සීමිත හා විවෘත බඳවා ගැනීම් කාල රාමු දෙකකදී සිදු කිරීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨත්වය සම්බන්ධයෙන් ගැටලු පැන නැඟී ඇති බව දන්නේද;

(ii) එම ගැටලු විසඳීමට බාධාවන් තිබේද;

(iii) එම ගැටලු විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් ස්ථානගත කිරීම විධිමත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

පිරිතම අමාත්‍යාංශ ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

(අ) (i) ආසිරියර් මට්ටමේ සහ අදිපර් සේවාවල් වල සම්බන්ධතා ගැටලුවක් පවතින බව දන්නේද;

(ii) එම ගැටලුව විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද;

(iii) එම ගැටලුව විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය කොපමණද;

(iv) එම ගැටලුව විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට බාධාවන් තිබේද;

(v) එම ගැටලුව විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද;

(vi) ඒවා විසඳන දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් ස්ථානගත කිරීම විධිමත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පිරිතම අමාත්‍යාංශ ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

(අ) (i) ආසිරියර් මට්ටමේ සහ අදිපර් සේවාවල් වල සම්බන්ධතා ගැටලුවක් පවතින බව දන්නේද;

(ii) එම ගැටලුව විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද;

(iii) එම ගැටලුව විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය කොපමණද;

(iv) එම ගැටලුව විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට බාධාවන් තිබේද;

(v) එම ගැටලුව විසඳීම සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද;

(vi) ඒවා විසඳන දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් ස්ථානගත කිරීම විධිමත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஆசிரியர் மற்றும் அதிபர் சேவைகளில் சம்பள முரண்பாடு காணப்படுவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) அதனைத் தீர்ப்பதற்குள்ள வேலைத்திட்டம் யாதென்பதையும்;

(iii) ஆசிரியர் சேவை பிரமாணக்குறிப்பின் பிரகாரம், பதவி உயர்வுகளுக்கு மொடியுல் தேவைகள் பூர்த்திசெய்யப்பட வேண்டுமென்பதை அறிவாரா என்பதையும்;

(iv) மொடியுல் தேவைகளைப் பூர்த்திசெய்ய முடியாததால், பதவி உயர்வுகள் இழக்கப்படுதல், சம்பள ஏற்றங்கள் கிடைக்காமை மற்றும் சேவையை நிரந்தரமாக்குவதில் தாமதம் போன்ற பிரச்சினைகள் எழுந்துள்ளமையை அறிவாரா என்பதையும்;

(v) மேற்படி பிரச்சினைகளுக்குத் தீர்வு காண்பதற்குள்ள வேலைத்திட்டம் யாதென்பதையும்;

(vi) அவற்றைத் தீர்ப்பதற்கான கால வரையறை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சேவை பிரமாணக் குறிப்பின் பிரகாரம், மட்டுப்படுத்தப்பட்ட மற்றும் திறந்த ஆட்சேர்ப்பு நடவடிக்கைகள் இரண்டு கால வரையறைக்குள் மேற்கொள்ளப்பட்டதன் காரணமாக மூப்புரிமை தொடர்பான பிரச்சினைகள் எழுந்துள்ளமையை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி பிரச்சினைகளைத் தீர்ப்பதில் தடைகள் உள்ளதா என்பதையும்;

(iii) அந்தப் பிரச்சினைகளைத் தீர்ப்பதற்குள்ள வேலைத்திட்டம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இலங்கை கல்வி நிர்வாகச் சேவை அலுவலர்களைப் பணியில் அமர்த்தும் நடவடிக்கை முறைப்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இன்றேல், அது தொடர்பாகக் காணப்படும் வேலைத்திட்டம் யாதென்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she admits that there is a salary anomaly in the Teachers' and the Principals' Services;

(ii) the plan in place to resolve it;

(iii) whether she is aware that the module requirements must be met for promotions as per the Teachers' Service Minute;

(iv) whether she is aware that problems such as missing out on promotions, non-receipt of salary increments and delays in service confirmation have arisen due to failure to complete module requirements;

(v) the planned course of action in place to resolve the problems referred to above; and

(vi) the dates on which the above problems will be resolved?

(b) Will she also inform this House -

(i) whether she is aware that problems have arisen regarding seniority due to limited and open recruitments being conducted in two time frames, as per the Service Minute;

(ii) whether there are obstacles in resolving the said problems that so arise; and

(iii) the course of action in place to resolve the above problems?

(c) Will she further inform this House -

(i) whether the placement of officers in the Sri Lanka Education Administrative Service has been regularized; and

(ii) if not, the course of action in place in that regard?

(d) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගුරු සේවයේ සහ විදුහල්පති සේවයේ වැටුප් සංශෝධනය කිරීමේදී ගුරු සේවයේ වැටුප් වැඩි වීමේ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකින් විදුහල්පති සේවයේ වැටුප් සංශෝධනය කිරීම හේතුවෙන් අදාළ සේවාවන් දෙක අතර වැටුප් විෂමතාවක් පැන නැඟී ඇති බව වාර්තා වී තිබේ.

(ii) මෙවර අය වැයේදී සමස්ත රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීමට කටයුතු කළ අතර එක් එක් සේවාවල වැටුප් විෂමතා විසඳීම සම්බන්ධව වෙන් වෙන් වශයෙන් කටයුතු කළ යුතුව ඇති බැවින් ඉහත මතු වී ඇති වැටුප් විෂමතා ගැටලුව විසඳීම සඳහා දැනටමත් අදාළ ආයතන සමඟ සාකච්ඡා කරමින් පවතී.

(iii) ඔව්.

අංක 1885/38 හා 2014.10.23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත නව ගුරු සේවා ව්‍යවස්ථාවේ 8 වන වගන්තිය හා උපලේඛන 1 මඟින් කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධයෙන් විධිවිධාන පනවා ඇති අතර, ඒ අනුව එය කලාප මට්ටමින් පවතින ගුරු සංවර්ධන මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක වන මොඩියුල පුහුණු ලෙස සකස් කර ඇත.

(iv) ඔව්.

2019න් පසු රටේ පැවති කොවිඩ් වසංගතය, පාස්කු ප්‍රහාරය, ආර්ථික අර්බුද හේතුවෙන් කලාප මට්ටමින් පවතින ගුරු සංවර්ධන මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක වන මොඩියුල පුහුණු කිරීමේ ක්‍රමවේදයෙහි ප්‍රායෝගිකව ගැටලු මතු වීම මත නිසි පරිදි එම මොඩියුල පුහුණු පැවැත්වීමට බාධා වී ඇත.

(v) ගුරුවරුන්ගේ පාලනයෙන් බැහැර හේතූන් මත එසේ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සම්පූර්ණ කිරීමට නොහැකි වීමෙන් සිදුවන අගතියට පත්වීම වැළැක්වීම සඳහා වරින් වර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් කාර්යක්ෂමතා කඩඉම් සඳහා වන එම මොඩියුල සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් සහන ලබා ගැනීමට කටයුතු කර ඇත. ඉන්පසු දිගින් දිගටම මෙම මොඩියුල ක්‍රමවේදය හේතුවෙන් ගුරුවරුන්ගේ උසස්වීම් ප්‍රමාදවීම හේතුවෙන් ඒ සඳහා සුදුසු විකල්ප ක්‍රමවේදයක් සඳහා නිර්දේශ ලබා ගැනීමට 2024 වර්ෂයේදී නිලධාරීන්ගෙන් හා වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර එම කමිටු නිර්දේශ අනුව දැනට පවතින මොඩියුල 20 වෙනුවට මොඩියුල 10 දක්වා අඩු කර එම මොඩියුල ආශ්‍රයෙන් විභාග ක්‍රමවේදයක් අනුගමනය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ යොමු කරන ලද අතර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, සේවා ව්‍යවස්ථාවට සිදු කළ සංශෝධන හා එහි සංශෝධන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අවශ්‍ය ගැසට් පත්‍රය ද සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී එම ගැසට් පත්‍රය නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, විභාග සංවිධානය කිරීමට අදාළ මූලික කටයුතු ආරම්භ කර ඇත.

(vi) එම කාර්යක්ෂමතා කඩඉම් සඳහා වන විභාග ක්‍රමය 2025.07.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

(ආ) (i), (ii) සහ (iii)

සේවා ව්‍යවස්ථානුකූලව සීමිත හා විවෘත බඳවා ගැනීම් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය හා ගුරු අධ්‍යාපනඥ සේවය සිදු කරනු ලබයි.

<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය</u>

- සීමිත පදනම මත පුරප්පාඩු 442ක් සඳහා සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ 20% (45)ක් බඳවා ගැනීමට අමප/23/0822/605/012-III හා 2023.05.08 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් සහ විශේෂ සේවක සංඛ්‍යාව යටතේ 100% ක් (397)ක් -ඉතිරි ප්‍රමාණය- බඳවා ගැනීමට අංක: DMS/CM/08/SLEAS හා 2024.04.19 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත.
- විවෘත පදනම මත පුරප්පාඩු 113ක් බඳවා ගැනීමට අංක: DMS/CM/08/SLEAS හා 2024.04.19 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, ඉහත අනුමැතීන් පරිදි තරග විභාග හා සම්මුඛ පරීක්ෂණ පවත්වා අදාළ සම්මුඛ පරීක්ෂණ උපලේඛන මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත යොමු කර ඇත. කෙසේ වෙතත්, බඳවා ගැනීම් කාල රාමු දෙකකදී සිදු කර නොමැති අතර, තරග විභාග පැවැත්වීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම පමණක් කාල රාමු දෙකකදී සිදු කර ඇත.

මෙම බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් වන බැවින් බඳවා ගැනීම් සිදු කරනු ලබන දින වකවානු පිළිබඳව මෙම අවස්ථාවේ ප්‍රකාශ කළ නොහැක.

<u>ගුරු අධ්‍යාපනඥ සේවය</u>

ගුරු අධ්‍යාපනඥ සේවයට අදාළව නම්, කාල රාමු දෙකකදී මෙම බඳවා ගැනීම්වලට අදාළ කටයුතු සිදු කිරීම සඳහා හේතු වී ඇත්තේ අවස්ථා දෙකකදී මේ සඳහා අනුමැතිය ලැබීමය.

- සීමිත පදනම මත පුරප්පාඩු 706ක් බඳවා ගැනීමට අදාළව අංක අමප/23/0822/605/012-III හා 2023.05.08 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත.
- විවෘත පදනම මත පුරප්පාඩු 384ක් බඳවා ගැනීමට අදාළව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා අමප/24/0153/607/009 හා 2024.02.12 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව ඉහත අනුමැතීන් පරිදි සීමිත හා විවෘත තරග විභාග (ලිඛිත විභාග) පවත්වා අවසන් කර ඇත. සීමිත පදනම මත බඳවා ගැනීම්වලට අදාළව මූලික හා යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණ, ප්‍රායෝගික පරීක්ෂණය පවත්වා සම්මුඛ පරීක්ෂණයන්හි ලකුණු සහිත උපලේඛන 2025.01.29 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත යොමු කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව අංක ESC/APP/SLTES/01/87/2019 හා 2024.08.22 දිනැතිව ලිපියේ නියමය පරිදි විවෘත පදනම මත බඳවා ගැනීමට අදාළව මූලික සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත. කෙසේ වෙතත්, බඳවා ගැනීම් කාල රාමු දෙකකදී සිදු කර නොමැති අතර, තරග විභාග පැවැත්වීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම පමණක් කාල රාමු දෙකකදී සිදු කර ඇත.

(ඇ) (i) ඉදිරියේදී බඳවා ගැනීමට නියමිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ (සීමිත/විවෘත) නිලධාරීන් ස්ථානගත කිරීම සඳහා සියලුම පළාත් සභා වෙතින් පුරප්පාඩු කැඳවීමක් මේ වන විට සිදු කරමින් පවතින අතර, පළාත් රාජ්‍ය සේවයෙන් මධ්‍යම රාජ්‍ය සේවය වෙත ස්ථාන මාරු ලබා ගැනීමට අපේක්ෂිත නිලධරයන් සම්බන්ධයෙන් ද පහත ආයතන වෙතින් තොරතුරු කැඳවා ඇත.

1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
2. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
4. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
5. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු
6. සියලුම කලාප අධ්‍යාපන කාර්යාල
7. ජාතික පාසල්

ඒ අනුව මේ වන විට දුෂ්කර සේවයේ යෙදී සිටින, මීට පෙර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්වලට ප්‍රමුඛස්ථානය ලබා දී පසුව ඉහත පරිදි බඳවා ගනු ලබන නවක නිලධාරීන් සේවා අවශ්‍යතාව පවතින පළාත්, ජාතික පාසල් හා දෙපාර්තමේන්තු වෙත ස්ථානගත කරනු ලැබේ.

(ii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

ගරු නන්ද බණ්ඩාර මහතා
(මාණ්පුමිකු නන්ත පණ්ටාර)
(The Hon. Nanda Bandara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය රජයන් යටතේ ග්‍රාමීය පාසල්වල, විශේෂයෙන් මහා විද්‍යාලවල තිබුණු ප්‍රාථමික පන්ති ඉවත් කරලා, ගුරුවරුන් සහ දරුවන් සමඟ එම ප්‍රාථමික ශ්‍රේණි එක් පාසලකට අනුයුක්ත කළා.

එසේ අනුයුක්ත කළ ප්‍රධාන පාසලේ ඉඳලා කිලෝමීටර එකක්, දෙකක්, තුනක් වාගේ දුර තිබෙන තවත් ප්‍රාථමික පාසල් ගොඩක් ග්‍රාමීයව තිබෙනවා. ඒ පාසල් දැන් වැසී යෑමේ තර්ජනයකට ලක් වෙලා තිබෙනවා, අර ජනප්‍රිය පාසලට දරුවන් ඇතුළත් කිරීම නිසා. ග්‍රාමීයව පිහිටා තිබෙන දුෂ්කර ප්‍රාථමික පාසල් ආරක්ෂා කර ගැනීම සඳහා නව රජයේ අධ්‍යාපන ඇමතිතුමිය විධියට අනුගමනය කරන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) මදුර සෙනෙවිරත්න)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ප්‍රාථමික පාසල් ආසන්න වශයෙන් 4,000ක් පමණ තිබෙනවා. ඒවායේ ලක්ෂ 6කට වැඩි ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් ඉගෙනුම ලබනවා. ප්‍රතිපත්තියට අනුකූලව අපි අරය සංකේතය වශයෙන් ගන්නවා. ඒ අනුව, කිලෝමීටර 3ක අරයක් ඇතුළත ප්‍රාථමික පාසල් තිබිය යුතුයි කියන ප්‍රතිපත්තිමය තීන්දුව මත අපි ඉන්නවා. ඒ අනුව මේ මොහොතේ කරන කාර්යයන් දෙකක් තිබෙනවා. එකක් තමයි, දැනට පාසල් ස්ථානගත කිරීම සම්බන්ධයෙන් දත්ත විශ්ලේෂණය කරමින් පැවතීම. ඉතාම ඉක්මනින් අපට තොරතුරු ලබාගත හැකිව තිබෙනවා, අප ප්‍රාථමික පාසල් ස්ථානගත කළ යුත්තේ කොයි කොයි තැන්වල ද කියන කාරණාව සම්බන්ධයෙන්. දෙවැන්න තමයි, තෝරා ගත්තු පාසල නවීකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක සිටීම. සම්මත ලෙස ලංකාව පුරා කිලෝමීටර 3ක අරයක් ඇතුළත තෝරා ගත්තු පාසල් නවීකරණය කිරීම සම්බන්ධයෙන් මූලික වැඩ පිළිවෙළ සකස් කරමිනුයි තිබෙන්නේ.

ප්‍රාථමික අධ්‍යාපන අවශ්‍යතා සහිත, ප්‍රාථමික පාසලට ඇතුළු විය යුතු ශිෂ්‍යයන්ට අසාධාරණයක් නොවන පරිදි තමයි මේ කාර්යය සිද්ධ වන්නේ. එතකොට ප්‍රාථමික පාසල් වැසීමක් සිද්ධ වෙන්නේ නැහැ. අවස්ථා විවරවීමක් තමයි සිද්ධ වෙන්නේ.

ගරු නන්ද බණ්ඩාර මහතා
(මාණ්පුමිකු නන්ත පණ්ටාර)
(The Hon. Nanda Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධවයි. පාසල් අධ්‍යාපනයට බඳවා ගන්නා ගුරුවරුන් හා සමාන සුදුසුකම් සහිතව තමයි පිරිවෙන් ගුරුවරුත් බඳවා ගන්නේ. පිරිවෙන් විද්‍යායතන ගත්තොත්, ගොඩක් වෙලාවට ඒවායේ ගිහි ගුරුවරු තමයි ඉගැන්වීමේ කටයුතු කරන්නේ. පිරිවෙන් විද්‍යායතනවලට පාසල් විෂය නිර්දේශයම අදාළයි. පිරිවෙන්වල තිබෙන ප්‍රශ්න මේවායි. පිරිවෙන්වල සෞන්දර්ය විෂය උගන්වන්න ඕනෑ. ක්‍රීඩා විෂයත් පිරිවෙන්වලට අනුයුක්ත කරලා තිබෙනවා. විද්‍යාව වාගේ විෂයනුත් පිරිවෙන්වල තිබෙනවා. නමුත් මේවාට අවශ්‍ය මූලික පහසුකම් ටික පිරිවෙන්වලට ලැබිලා නැහැ.

මගේ ප්‍රශ්නය මෙයයි. ක්‍රීඩා විෂය ගත්තාම, පිරිවෙන් විද්‍යායතනවල දරුවන්ට ක්‍රීඩා කිරීමට අදාළ උපකරණ හෝ අදාළ පිටිටනියක් නැහැ. ඒ නිසා ඉල්ලීම තිබෙන්නේ ළඟම තිබෙන පාසලකට සම්බන්ධ කරලා හෝ ක්‍රීඩා පිටියක් ලබා දීමට කටයුතු කරන්න කියන එකත්, අදාළ ක්‍රීඩා උපකරණ ලබා දෙන්න කියන එකත්.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) මදුර සෙනෙවිරත්න)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, පිරිවෙන් අධ්‍යාපනයේදී විෂය නිර්දේශයට අදාළව පවතින අඩුපාඩු කෙරෙහි මේ අවුරුද්දේ අය වැයෙන් පිරිවෙන් අධ්‍යාපනයට වෙන් කර ඇති මුදලත් එක්ක අවධානය යොමු කරන්න පුළුවන්.

එතැනදී කාරණා දෙකක් මතු වෙනවා. එකක් තමයි ක්‍රීඩා පිටි. දැනට අපේ ප්‍රතිපත්තිමය කාරණාව තමයි ප්‍රදේශයට අදාළව එක ක්‍රීඩා විද්‍යාලයක් දියුණු කරනවා කියන එක. නමුත් ළඟම තිබෙන පාසල අපට පිරිවෙන් විද්‍යායතනවල ක්‍රීඩාව සඳහා යොදා ගන්න පුළුවන්.

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

දෙවැනි කාරණාව, සෞන්දර්යයට අදාළ අවශ්‍යතා තිබෙන පිරිවෙන්වලට මේ අවස්ථාවේ අය වැයෙන් වෙන් වී තිබෙන මුදල්වලින් උපකරණ ලබා දීමේ හැකියාවක් තිබෙනවා. මේ කියන ප්‍රශ්නය ඇත්ත. සමහර පිරිවෙන්වලින් අපට ඒ ප්‍රශ්නය ලැබිලා තිබෙනවා. ඒ සඳහා අපි අවධානය යොමු කරනවා.

බදුල්ල දිස්ත්‍රික්කයේ වතු: පානීය ජල ව්‍යාපෘති
பதுளை மாவட்டத்திலுள்ள தோட்டங்கள்: குடிநீர் திட்டங்கள்
ESTATES IN BADULLA DISTRICT: DRINKING WATER PROJECTS

505/2025

5. ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்னன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වතුකරයේ ජනතාවට පිරිසිදු පානීය ජලය නොලැබෙන බව දන්නේද;

(ii) 1992 වර්ෂයෙන් පසුව රජය සහ වැවිලි මානව සංවර්ධන භාරය (Trust) විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතුයාය තුළ ක්‍රියාත්මක කරන ලද පානීය ජල ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල සහ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, පූනාගල LLG, කෙප්කඩේ නව නිවාස සංකීර්ණයේ ක්‍රියාත්මක කරන ලද ජල ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර නොමැති බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මේ වනවිට එම මුදල සම්පූර්ණයෙන්ම නිදහස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பெருந்தோட்ட மக்களுக்குச் சுத்தமான குடிநீர் கிடைப்பதில்லை என்பதை அறிவாரா;

(ii) 1992ஆம் ஆண்டின் பின்னர் அரச மற்றும் பெருந்தோட்ட மனிதவள அபிவிருத்தி நிதியத்தால் (TRUST) பதுளை மாவட்டத் திலுள்ள தோட்டங்களில் நடைமுறைப்படுத்தப் பட்ட குடிநீர் கருத்திட்டங்களின் எண்ணிக்கை எத்தனை;

(iii) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்துக்கும் செலவிடப்பட்ட பணத்தொகை மற்றும் தற்போதைய நிலைமை வெவ்வேறாக யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பதுளை மாவட்டத்தின், பூனாகல LLG, கெப்கடை புதிய குடியிருப்புத் திட்டத்தில் நடைமுறைப்படுத்தப்பட்ட நீர் கருத்திட்டம் முழுமையாகப் பூர்த்தி செய்யப்படவில்லை என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்துக்கு ஒதுக்கப்பட்ட நிதி எவ்வளவு;

(iii) இன்றளவில் இந்நிதி முழுமையாக விடுவிக்கப் பட்டுள்ளதா;

என்பதையும் அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether he is aware that the people in the Estates do not get clean drinking water;

(ii) the number of drinking water projects implemented in the estates in the Badulla District by the Government and the Plantation Human Development Trust after 1992; and

(iii) the amount of money spent on each such project and their current state, separately?

(b) Will he also inform this House -

(i) whether he is aware that the water project carried out at the new housing scheme at Punagala LLG, Kepkade in the Badulla District has not been completed;

(ii) the amount of money allocated for that project; and

(iii) whether the said amount has been released in full at present?

(c) If not, why?

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ சபாநாயகர் அவர்களே, பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர் சார்பாக நான் இந்த வினாவுக்கு விடையளிக்கின்றேன்.

(அ) (i) ஆம்.

இந்த வரிசையிலுள்ள பெரும்பாலான தோட்டங்கள் மற்றும் பிற வீடுகள் இயற்கை நீர் ஆதாரங்களால் சூழப்பட்டிருந்தாலும், பொது நீர்த் திட்டத்திலிருந்தோ அல்லது தனித்தனியாகவோ நீர் வசதிகளைப் பெற்றிருந்தாலும், தோராயமாக 10 சதவீதத்துக்கும் குறைவானவர்களே பாதுகாப்பான மற்றும் சுத்தமான குடிநீரைப் பெறுகின்றார்கள்.

(ii) எங்கள் தரவுகளின்படி, 2004 முதல் 2024 வரை பதுளை மாவட்டத்திலுள்ள பெருந்தோட்டங்களில் செயற்படுத்தப்பட்ட குடிநீர்த் திட்டங்களின் எண்ணிக்கை பின்வருமாறு:

அரசு நிதியுடனும் பெருந்தோட்ட மனித மேம்பாட்டு அறக்கட்டளையாலும் மேற்கொள்ளப்படும் திட்டங்களுக்கான குடிநீர்த் திட்டங்களின் எண்ணிக்கை	91
தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை மற்றும் நீர் வழங்கல் மற்றும் சுகாதார மேம்பாட்டுத் திட்டத்தால் மேற்கொள்ளப்படும் குடிநீர்த் திட்டங்களின் எண்ணிக்கை	12
மொத்த எண்ணிக்கை	**103**

(iii) திட்டச் செலவுகள் தனித்தனியாக இணைக்கப்பட்டுள்ளன. மேலும், அரச நிதியைப் பயன்படுத்தி செயற்படுத்தப்படும் குடிநீர்த் திட்டங்களுக்கான தோராயமான செலவு ரூ. 209,125,085.32 ஆகும்.

கணிசமான எண்ணிக்கையிலான திட்டங்களை முடிவுக்குக் கொண்டுவர நீண்டகாலம் தேவைப்பட்டதனால், தனித்தனியாக ஆய்வை நடத்தாமல் அந்தத் திட்டங்களின் தற்போதைய நிலையைக் கூறுவது கடினம்.

பதுளை மாவட்டத்தில் அமைச்சின் ஏற்பாடுகளின்கீழ் 2004 - 2022 காலகட்டத்தில் செயற்படுத்தப்பட்ட நீர் வழங்கல் திட்டங்களின் எண்ணிக்கை

ஆண்டு	திட்ட அளவு	செலவிடப்பட்ட தொகை (ரூ.)
2004	26	5,202,088.31
2006	5	1,331,644.25
2010	5	1,474,362.14
2014	2	597,739.85
2015	3	2,489,985.09
2016	13	3,832,570.05
2016	4	3,388,483.50
2017	6	2,906,370.48
2017	11	21,913,747.66
2018	1	704,250.14
2021	14	29,083,416.54
2024	1	3,218,547.42
மொத்தம்	**91**	**76,143,205.43**

2004 - 2022 காலகட்டத்தில் பதுளை மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை மற்றும் நீர் வழங்கல் மற்றும் சுகாதார மேம்பாட்டுத் திட்டத்தால் மேற்கொள்ளப்பட்ட திட்டங்களின் எண்ணிக்கை

ஆண்டு	திட்ட அளவு	செலவிடப்பட்ட தொகை (ரூ.)
2021	10	11,834,740.48
2024	2	121,147,139.41
மொத்தம்	**12**	**132,981,879.89**

மொத்த நீர் வழங்கல் திட்டங்களின் எண்ணிக்கை	செலவழித்த மொத்தத் தொகை
103	209,125,085.32

(ஆ) (i) இது அரசாங்கத்தால் நிதியளிக்கப்பட்டு பயனாளிகளின் உழைப்பைப் பயன்படுத்திச் செயற்படுத்தப்படும் ஒரு வீட்டு வசதித் திட்டமாகும். இந்த நோக்கத்துக்காகச் செயற்படுத்தப்பட்ட இந்த நீர்த் திட்டம், மதிப்பீடுகளின்படி, செப்ரெம்பர் 20, 2020 அன்று நிறைவடைந்தது.

(ii) எங்களுடைய அறிக்கைகளின்படி, இந்தத் திட்டத்துக்காகச் செலவிடப்பட்ட தொகை ரூ. 1,017,677.60 ஆகும்.

திட்டத்துக்காகச் செலவிடப்பட்ட தொகை - ரூ. 978,536.15
மேலாண்மைச் செலவுகளுக்காகச் செலவிடப்பட்ட தொகை - ரூ. 39,141.45

மொத்தத் தொகை - ரூ. 1,017,677.60
==========

(iii) முழுத் தொகையும் செலுத்தப்பட்டுவிட்டது.

(இ) ஏற்புடையதன்று.

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

1987ஆம் ஆண்டு தோட்டப்புறங்களுக்கான குடிநீர் விநியோகத் திட்டமானது ஒழுங்காக வடிவமைக்கப்பட்டு, UNICEF நிறுவனத்தால் அறிமுகப்படுத்தப்பட்டது. அதற்கு முன்னர், தோட்டப்புறங்களுக்கு வடிவமைக்கப்பட்ட, ஒழுங்கானதொரு நீர் விநியோகத்திட்டம் இருக்கவில்லை. இதனால் தோட்டத் தொழிலாளர்கள் மட்டுமல்ல, கீழ்மட்டத்திலுள்ள கிராம மக்களும் பாரியளவில் பாதிக்கப்பட்டனர். குறிப்பாக, அவர்கள் நீரிழிவு, சிறுநீரக நோய் போன்றவற்றால் பாதிக்கப்பட்டனர். மலையகத்திலுள்ள தேயிலைத் தோட்டங்களுக்கு இரசாயன உரம் பயன்படுத்துவதே இதற்கு முக்கிய காரணமாகும். 1987ஆம் ஆண்டு UNICEF நிறுவனத்தால் நடைமுறைப்படுத்தப்பட்ட திட்டமானது, இன்று தூர்ந்துபோன நிலையில் இருக்கின்றது. எனவே, இது தொடர்பில் உங்களால் ஆய்வொன்றைச் செய்ய முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)

1987ஆம் ஆண்டுக்கு முன்னர், மலையகப் பகுதியில் ஒழுங்காக வடிவமைக்கப்படாத குடிநீர் விநியோக முறைதான் காணப்பட்டது. 1987ஆம் ஆண்டு UNICEF நிறுவனத்தால் மேற்கொள்ளப்பட்ட குடிநீர் விநியோகத் திட்டமானது, மலையகம் முழுவதிலும் அல்லாமல் அதன் சில பகுதிகளிலேயே நடைமுறைப்படுத்தப்பட்டது. இந்தத் திட்டம் மேற்கொள்ளப்பட்டு மிக நீண்டகாலம் என்பதனால், இத்திட்டத்துக்குப் பயன்படுத்தப்பட்ட நீர்க் குழாய்கள் இப்பொழுது பழுதடைந்திருக்கின்றன. எதிர்வரும் காலங்களில்

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

පෙරුන්තෝට්ට මෙන්ම සමූහ උට්කට්ටමෙප්පු වතුකරයේ අමෙච්චිනූටාහ පතුළෙ, කණ්ඩි, නුවරෙලියා, ඉරත්තිනපුරි, කේකාලෙ, මොනරාකලෙ, කාලි, මාත්තරෙ පෝන්ර මාවට්ටංකලිලුළ්ළ පෙරුන්තෝට්ටප් පකුතිකලිල් කුටිනීර් වළංකල් තිට්ටංකළෙ මුන්නෙටුප්පතර්කු නාංකළ් තීර්මානිත්තු ඉරුක්කින්රෝම්.

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(මාණ්පුමිකු කිට්ණන් සෙල්වරාජ්)
(The Hon. Kitnan Selvaraj)
කෞරව ප්‍රතිය අමෙච්චර් අවර්කළේ, එන්නුටෙය ඉරණ්ටාවතු මේලතික විනාවෛක් කේට්කින්රේන්.

එනතු ප්‍රතාන විනාවිල් කුරිප්පිටප්පට්ටුළ්ළ පූනාකලෙ LLG ප්‍රිරිවිලුළ්ළ කුටියිරුප්පුත් තිට්ටත්තිල් නටෙමුරෛප් පටුත්තප්පට්ට නීර් විනියෝකත් තිට්ටත්තුක්කු පත්තු ඉලට්චම් රූපාය්ක්කුම් මේර්පට්ට නිති චෙලවිටප්පට්ටුම්, ඉතුවරෙ ඔළුංකාන මුරෛයිල් නීරෛප් පෙර්රුක්කොටුක්ක මුටියාත නිලෙයේ කාණප්පටුකින්රතු. ඉතනාල් අංකුළ්ළ මක්කළ් කෂ්ටප්පටුකින්රාර්කළ්. එනවේ, ඉතු චම්පන්තමාන කණක්කාය්වෛච් චෙය්තු, අතෛ ඉන්තච් චපෛක්කුච් චමර්ප්පික්ක මුටියුමා? එනක් කේට්කින්රේන්.

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා
(මාණ්පුමිකු සුන්දරලිංකම් ප්‍රිරතීප්)
(The Hon. Sundaralingam Pradeep)
ඉතු චම්පන්තමාන කණක්කාය්වු අරික්කෛයෛ නාංකළ් එතිර්වරුම් කාලංකළිල් චමර්ප්පිප්පතර්කුත් තීර්මානිත්තුළ්ළෝම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු චපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 2 -496/2025- (1), ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) නිෂාන්ත චමරවීර)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(මාණ්පුමිකු (වෛත්තියර්) නළින්ත ජයතිස්ස - චුකාතාරම් මර්රුම් වෙකුචන ඌටක අමෙච්චරුම් අරචාංක්කක් කට්චියින් මුතර්කෝලාචානුම්)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෛ මර්රොරු තිනත්තිර් චමර්ප්පික්ක් කට්ටළෛයිටප්පට්ටතු.
Question ordered to stand down.

වන සතුන්ගෙන් සිදුවන වගා හානිය: අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග

வன விலங்குகளால் ஏற்படுத்தப்பட்ட பயிர்ச்சேதம்: குறைப்பதற்கான நடவடிக்கை

DAMAGE TO CULTIVATIONS BY WILD ANIMALS: MEASURES FOR MITIGATION

498/2025

3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු අනුරාධ ජයරත්න මහතා වෙනුවට)
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක - මාණ්පුමිකු අනුරාත ජෙයරත්න චාර්පාක)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Anuradha Jayaratne)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 වර්ෂයේදී, වන සතුන්ගෙන් වගාවන්ට සිදු වූ හානි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ හේතුවෙන් සිදු වූ ආර්ථික අලාභය කොපමණද;

(iii) වන සතුන්ගෙන් සිදු වන වගා හානිය අවම කර ගැනීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ගොවීන් වෙත නිකුත් කර ඇති ගිනි අවි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගිනි අවි සඳහා භාවිත කරනු ලබන පතරොමක මිල රු. 450ක් වන බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් ගොවීන් දැඩි අපහසුතාවට පත් වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොළිල්, කාල්නටෙ වළංකළ්, කාණි මර්රුම් නීර්ප්පාසන අමෙච්චරෛක් කේට්ට විනා:

(අ) (i) 2024ආම් ආණ්ටිල් වන විලංකුකළාල් ඒර්පටුත්තප්පට්ට පයිර්ච්චේතංකළින් අළවු යාතෙන්පතෛයුම්;

(ii) අතන් කාරණමාක ඒර්පට්ට පොරුළාතාර නට්ටම් යාතෙන්පතෛයුම්;

(iii) වන විලංකුකළාල් ඒර්පටුත්තප්පටුම් පයිර්ච්චේතංකළෛක් කුරෛප්පතර්කු ඉන්රළවිල් මේර්කොළ්ළප්පට්ටුළ්ළ නටවටික්කෛකළ් යාවෛයෙන්පතෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) (i) පයිර්ච්චෙය්කෛකළෛප් පාතුකාප්පතර්කු විවචායිකළුක්කු වළංකප්පට්ටුළ්ළ තුප්පාක්කිකළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(ii) මේර්පටි තුප්පාක්කිකළුක්කුප් පයන්පටුත්තප්පටුම් තෝට්ටා ඔන්රින් විලෛ රූ. 450ආක කාණප්පටුවතෛ අරිවාරා එන්පතෛයුම්;

(iii) අතන් කාරණමාක විවචායිකළ් කටුම් චිරමංකළෛ එතිර්කොණ්ටුළ්ළමෛයෛ අරිවාරා එන්පතෛයුම්;

(iv) ஆமெனில், அது தொடர்பாக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House of the -

(i) magnitude of damage that was caused to cultivations by wild animals in 2024;

(ii) resultant economic loss incurred; and

(iii) measures that have been taken so far to mitigate the damage caused to cultivations by wild animals?

(b) Will he also inform this House -

(i) the number of firearms issued to farmers in order to protect cultivations;

(ii) whether he is aware that a bullet used in such firearms costs Rs. 450;

(iii) whether he is aware that farmers are severely inconvenienced as a result; and

(iv) if so, the measures that would be adopted in this regard?

(c) If not, why?

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නිශ්චිත වශයෙන්ම 2024 වසර තුළ වන සතුන්ගෙන් සිදු වූ වගා හානි ප්‍රමාණය සම්බන්ධයෙන් විධිමත් තක්සේරු කිරීමක් කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත්ව සිදුකර නොමැත.

නමුත්, කෘෂි කර්මාන්තයේ වන සත්ව හානි සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී හෙක්ටර් කොඹබැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මඟින් අර්ධ වාර්ෂික දළ තක්සේරුවක් සිදුකර ඇත.

සවිස්තර තොරතුරු පසුබිම් වාර්තාවට** ඇතුළත් කර ඇත.

(ii) එවැනි අලාභ ගණනය කිරීමක් 2024 වර්ෂයේදී සිදුකර නොමැත.

සාමාන්‍යයෙන් නියඟය, ගංවතුර වැනි ස්වාභාවික විපත් හා වනඅලින්ගෙන් සිදුවන වගා හානිවල අලාභ ගණනය කිරීමක් සිදු කළ ද නිරන්තරයෙන් සිදුවන රිළවා, වඳුරා, දඩු ලේනා, වල් ඌරා හා ඉත්තෑවා වැනි වනසතුන්ගෙන් වන වගා හානි පිළිබඳව ජාතික මට්ටමින් අලාභ ගණනය කිරීමක් සිදු කර නොමැත.

(iii) v දැනට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය මෙහෙයවීමෙන් ප්‍රමුඛ සහ සුලබ වන සත්ව හානි කළමනාකරණය සඳහා කමිටුවක් පත් කර ඇත.

එම කමිටු තීරණ වශයෙන් පහත ක්‍රියාමාර්ග ගනිමින් ඇත.

පහත වන සතුන් පිළිබඳ සංගණනයක් පැවැත්වීම.

රිළවා, මොනරා, දඩු ලේනා, වඳුරා

තිරසාර වන සත්ව හානි කළමනාකරණ විධික්‍රම හඳුනාගැනීම සඳහා සුදුසු විද්වත් මණ්ඩලයක යෝජනා තෝරාගෙන ඉදිරි කටයුතු සිදු කිරීම.

v ඉහත කමිටුව යටතේ ගනු ලබන ක්‍රියාමාර්ගවලට අමතරව වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා වායු රයිෆල් බෙදා දීම, විදුලි වැට හා විදුලි පඹයා ලබා දීම වැනි ව්‍යාපෘතීන් දිස්ත්‍රික් මට්ටමින් සියයට 50ක දායකත්වය යටතේ සිදු කිරීම.

v එසේම, හෙක්ටර් කොඹබැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් "කෘෂි කාර්මික ප්‍රදේශවල වගාවන්ට වනසතුන්ගෙන් මතුවන ගැටලු අවම කිරීම සම්බන්ධයෙන් තිරසාර වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා" යන මාතෘකාව යටතේ දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් යෝජනා ගෙන්වාගෙන වැඩමුළුවක් පවත්වා ඇත. එය පදනම් කරගෙන "මානව වනජීවී සහජීවනයට ප්‍රවේශයක්" මැයෙන් ඉදිරියේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව මහජනතාවට කෘතියක් සම්පාදනය කර බෙදාහැරීමට කටයුතු කර ඇත.

(ආ) (i) 2024.12.31 දිනට වගා ගිනිඅවි සංඛ්‍යාව 13,207කි.

(ii) 2024.12.01 දින සිට බෝර 12 එස් ජී පතරොමක මිල රුපියල් 500.76ක් වේ.

(iii) දිස්ත්‍රික් අළෙවි නියෝජිතයන් විසින් සියයට 30ක ලාභ ප්‍රතිශතයක් යටතේ බෝර 12 එස් ජී පතරොමක් අළෙවි කළ අතර, ආරක්ෂක අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ගොවීන්ට සහනයක් ලබා දීමේ අරමුණින් සියයට 30ක ලාභ ප්‍රතිශතය 2024.12.01 දින සිට බල පැවැත්වෙන පරිදි සියයට 20 දක්වා අඩු කරන ලදී.

(iv) පසුගිය වසර 3ක කාලය තුළ ඇති වූ විදේශ විනිමය අර්බුදය -ඩොලර් හිඟතාව- හේතුවෙන් රටේ ඩොලර් සංචිතය හිඟවීම හා වැටී එක අයකිරීමේ ප්‍රතිශතය වැඩිවීම තුළින් පතරොම් සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී වැඩි පිරිවැයක් දැරීමට සිදු වූ අතර සෑම පුපුරණ ද්‍රව්‍යයක්ම පෙර තිබූ මුදලට වඩා තුන් ගුණයකින් මිල ඉහළ ගොස් ඇත.

ඒ අනුව, ප්‍රතිපත්තිමය තීරණයක් වශයෙන් දිස්ත්‍රික් අළෙවි නියෝජිතයන් විසින් පතරොම් අළෙවි කිරීමේදී තබාගත් සියයට 30ක ලාභ ප්‍රතිශතය ආරක්ෂක අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ගොවීන්ට සහනයක් ලබාදීමේ අරමුණින් 2024.12.01 දින සිට බල පැවැත්වෙන පරිදි සියයට 20 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, බෝර 12 එස් ජී පතරොමක නව මිල රුපියල් 500.76ක් ලෙස අඩු වී ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

එක්සත් ජනපද නව තීරුබදු ප්‍රතිපත්තිය මත ශ්‍රී ලංකා අපනයනවලට ඇති වන බලපෑම අවම කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග
ஐக்கிய அமெரிக்காவின் புதிய சுங்கவரிக் கொள்கைகள் இலங்கையின் ஏற்றுமதிகள்மீது செலுத்தும் தாக்கத்தைக் குறைப்பதற்குத் தேவையான நடவடிக்கை
NECESSARY MEASURES TO MITIGATE IMPACT ON SRI LANKAN EXPORTS DUE TO NEW TARIFF POLCY OF THE UNITED STATES

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I would like to ask the following Question from the Minister of Finance, Planning and Economic Development under Standing Order No. 27(2).

The export of Sri Lanka's textiles, apparels and other general items is a key driver of economic growth with a projected target of US Dollars 8 to10 billion by 2030. A significant portion of these exports is directed towards the United States, a major trading partner. However, US President Donald Trump is pursuing a policy of deglobalization, using tariffs as a strategic tool to regulate trade, particularly targeting countries with which the US has a trade deficit. While the previous US administrations adopted a different approach for developing countries, the possibility of a return to protectionist policies in the future remains a concern under the new Trump administration.

In this context, could the Hon. Minister inform this House,

1. whether the Government has conducted an assessment on how the deglobalization policies and potential tariff hikes by the US could impact on Sri Lanka's general, textile and apparel exports;
2. whether we cannot step up our negotiating skills, especially as a country that is very precariously coming out of bankruptcy, and negotiate for a special accommodation from President Trump and his Government;
3. as to what steps the Government has taken to retain and expand market access for Sri Lankan exports in the US under the existing Generalized System of Preferences - GSP- or alternative trade arrangements; and
4. whether Sri Lanka has engaged in any bilateral negotiations with the US Trade Representative or other US authorities to mitigate tariff risks and ensure that Sri Lanka remains competitive in the US market?
5. එක්සත් ජනපද වෙළඳ ප්‍රතිපත්ති ආශ්‍රිතව පවත්නා අවිනිශ්චිතතාව සැලකිල්ලට ගනිමින්, අපනයන වෙළෙඳ පොළ විවිධාංගීකරණය කර ගනිමින් ශ්‍රී ලංකාවේ රෙදිපිළි ප්‍රධාන ගැනුම්කරුවෙකු ලෙස එක්සත් ජනපදය මත පවත්නා රඳා පැවැත්ම අඩු කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරමින් පවත්නා ක්‍රියාමාර්ග කවරේද?
6. ගෝලීය ආරක්ෂණවාදී ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා රජය වෙනත් රටවල් සමඟ සෘජු විදේශ ආයෝජන - FDIS - අවස්ථා හෝ වෙළෙඳ ගිවිසුම් පිළිබඳව විමසා බලා තිබේද?

   Hon. Speaker, 1.2 million people are directly employed in that industry.
7. රජය විසින් සිය වෙළෙඳ උපාය මාර්ග ගෙන හැර දක්වමින් ඉස්මතු විය හැකි කවර හෝ අවදානමක් සහ එහිලා අනුගමනය කිරීමට අදහස් කරන ප්‍රති-පියවර පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරනු ලබන බවට සහතික වන්නේද?
8. ශ්‍රී ලංකාවට අඩු නිෂ්පාදන පිරිවැය තත්ත්වයන් පවත්වා ගත හැකි නම්, තීරු බදු පැවතියදී වුවද අපගේ රෙදිපිළි අපනයන එක්සත් ජනපද වෙළෙඳ පොළේ වඩාත් තරගකාරී මට්ටමක පවත්වා ගත හැකිය. රජය මෙම වෙළෙඳ අංශය සමඟ අදාළ සංවාද පවත්වමින් සිටින්නේද?
9. Deglobalization ප්‍රතිපත්තිය සහ තීරුබදු මඟින් අභියෝග ඉදිරිපත් කරන අතරම, ඒවා විසින් උපාය මාර්ගික ගැළපීම් සඳහා අවස්ථා ද ලබා දෙනු ලබයි. යම් හවාය ප්‍රතිලාභ පවත්නේ නම් ඒවාද ප්‍රයෝජනයට ගනිමින් ඍණාත්මක බලපෑම් අවම කිරීමට අදාළ මාර්ග පිළිබඳව සොයා බැලීම ශ්‍රී ලංකාව විෂයයෙහි තීරණාත්මක වේ. මේ සම්බන්ධයෙන් යම් පියවර ගෙන ඇත්තේ නම්, ඒ කවරේද?
10. ප්‍රතිපත්ති මැදිහත්වීම් සහ සහාය වැඩසටහන් හරහා රජයට මෙම උපායමාර්ගික ගැළපීම් සඳහා පහසුකම්කරණය සැලසිය හැක්කේ කෙසේද?
11. මෙම අපේක්ෂිත තීරුබදු ඉහළ නැංවීම සැලකිල්ලට ගත් කල කර්මාන්තයට සහ එහි නියුක්ත ශ්‍රම බලකායට සහාය වීම සඳහා රජයට ගතහැකි පියවර කවරේද?
12. රජය විසින් ශ්‍රී ලංකාවේ පවත්නා භූගෝලීය පිහිටීම ප්‍රයෝජනයට ගනිමින් අප රට ඍජු විදේශ ආයෝජන - FDI - සඳහා ඉතා යහපත් ස්ථානයක් බවට හඳුනාගනු පිණිස එක්සත් ජනපද ආයෝජකයින් ආකර්ෂණය කරගත යුතුය. මේ ආශ්‍රිතව යම් පියවර ගත හැක්කේද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ඉදිරිපත් කරන ලද සාධාරණ වෙළෙඳාම පිළිබඳව මතු කර ගත් විභව තීරු බදු කාරණය, ඒ කියන්නේ reciprocal tariff ප්‍රශ්නය අපේ අපනයන සමඟ ගැට ගැහිලා තිබෙනවා. එහිදී අදාළ ප්‍රතිපත්ති ඉදිරිපත් කරන්න නියමිත වෙන්නේ අප්‍රේල් මාසයේදී කියලා වාර්තා වෙනවා. කෙසේ වෙතත්, අපි දැනට පැනනැඟී තිබෙන තත්ත්වයට අදාළ නිශ්චිත කරුණුත්, භූ දේශපාලනික හා අනෙකුත් කරුණු පිළිබඳවත් විශේෂ සැලකිල්ලක් දක්වමින් ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයට ඇති විය

හැකි බලපෑම් පිළිබඳව අධ්‍යයනය කරමින් සිටිනවා. මෙය 2025 අප්‍රේල් මාසයේදී ප්‍රකාශ කරන බව තමයි මාධ්‍ය මඟින් දැන ගන්නට ලැබී තිබෙන්නේ.

විභව තීරු බදු සහ සාධාරණ වෙළෙඳාම පිළිබඳ ප්‍රතිපත්තියේදී සැලකිල්ලට ගැනීමට ඉඩ කඩ තිබෙන කරුණු වන්නේ, ඒ ඒ රටවල් අතර තිබෙන වෙළෙඳ පරතරය, විනිමය අනුපාතය, එහි ප්‍රබලතාව හා දුබලතාව, තීරුබදු අනුපාත සහ VAT ඇතුළු වෙනත් බදු වර්ගයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව පිළිබඳව සැලකීමේදී ඇමෙරිකාව එක්ක තිබෙන වෙළෙඳ පරතරය අපට වාසිදායක බව සැබෑවක්. කෙසේ නමුත්, ඩොලරයට සාපේක්ෂව අපේ රුපියල දුර්වල මට්ටමකයි තිබෙන්නේ. අපේ රුපියල strong currency එකක් නොවන නිසා අපට එතැනින් ඇති විය හැකි බලපෑමත් අඩු මට්ටමකයි තිබෙන්නේ.

අනෙක් පැත්තෙන්, රාජ්‍ය තාන්ත්‍රිකව අපි ඉතාම හොඳ සම්බන්ධතාවක් පවත්වාගෙන යනවා. ඒ තත්ත්වය නිසා ඇති විය හැකි negative බලපෑම අඩුයි. කෙසේ වෙතත්, සාධාරණ වෙළෙඳාමේදී විභව තීරු බදු සම්බන්ධ කරුණු අපි අධ්‍යයනය කරමින් ඉන්නවා. එහිදී මුදල් අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය, ඒ වාගේම අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන සහ වෙනත් කණ්ඩායම් මේ සම්බන්ධව අධ්‍යයන කටයුතු කරලා තිබෙනවා. 2024 වසරේ විශේෂයෙන් ඇමෙරිකාවත් එක්ක සිදු කරනු ලබන විදේශ වෙළෙඳාමේදී මේ වනකොට වැඩිම බලපෑමකට ලක් විය හැකි ක්ෂේත්‍ර විධියට හඳුනාගෙන අපි සාරාංශගත කරලා තිබෙන්නේ, apparels and textiles, rubber and rubber products, coconut and coconut-based products and plastic products ආදියයි.

සමස්තයක් වශයෙන් ගත්තාම, ඒවා අපේ අපනයන ආදායමින් සියයට 86කට පමණ සම්බන්ධ වෙනවා. මේ වෙනුවෙන් අපි ගන්නා යම් ක්‍රියාමාර්ග ප්‍රමාණයක් තිබෙනවා. ඊට අමතරව ඇමෙරිකාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා තානාපතිතුමා දැනටමත් මේ පිළිබඳ මූලික සාකච්ඡා සහ අවබෝධතා හඳමින් තිබෙනවා. විශේෂයෙන්ම මේ ප්‍රතිපත්තිවලට සම්බන්ධ වෙන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ Office of the United States Trade Representative. ඒ කාර්යාලය එක්ක සම්බන්ධතාව ඇමෙරිකාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා සිදු වෙමින් තිබෙනවා. ඊට අමතරව අපි ලංකාව තුළත් මෙයට සම්බන්ධ වෙන්න ඕනෑ කණ්ඩායම් පිළිබඳව ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේදී සාකච්ඡාවක් පැවැත්වුවා. අපේ විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය ඇමති ගරු අරුන් හේමවන්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ ඒ ක්ෂේත්‍රවල ඉන්න කණ්ඩායම් කැඳෙව්වා. එයට මමත් සම්බන්ධ වුණා. ඊට අමතරව අපේ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමති ගරු හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමාත්, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීනි ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවියත් සම්බන්ධ වෙලා සාකච්ඡා පැවැත්වුවා. එහි දෙවැනි සාකච්ඡාවත් අද පැවැත්වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පිළිබඳව අධ්‍යයනයක් සිදු කරනවා, ඉදිරියේදී එන තත්ත්වයන්ට උචිත පරිදි තීන්දු තීරණ ගැනීම සඳහා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීම් දෙකතුනක් කරගන්න අවශ්‍යයි. අද එනකොට CNN එකේ දාලා තිබෙනවා මම දැක්කා, ඒගොල්ලන් මේ කාන්තා ඇඳුම් ඔක්කොම නැවත ඇමෙරිකාවට ගෙනයන්න හදනවා කියලා. අප්‍රේල් මාසයේ අපනයනය සම්බන්ධ statistics ගත්තොත්, ලංකාවෙන් ඇමෙරිකාවට සිදු කළ අපනයන ප්‍රමාණය පසුගිය අවුරුද්දට වඩා සියයට 18.1කින් වැඩිවෙලා තිබෙනවා. ඔබතුමා කිව්වා මේ tariff එක අප්‍රේල් මාසයේ සිට වැඩි කරන්න යනවා කියලා. මේක සමස්තයක් වශයෙන් ලෝකයේම වැඩි වුණාට ප්‍රශ්නයක් නැහැ. නමුත්, ලංකාව වාගේ trade deficit එකක් තිබෙන රටවලට විතරක් මේක වැඩි කළොත් අන්න ඒක තමයි අපට බලපාන්නේ. මා හිතන විධියට, පැවැති සියලුම ආණ්ඩු මෙතෙක් සිදු කළේ, සිදු වුණු දේ දෙස බලාගෙන කථා කිරීමයි. ඉදිරි දැක්මක් සහිතව මේ දේවල් negotiate කරලා නැති එක තමයි තිබෙන ලොකුම දුර්වලතාව. අපි ඉතාම ඕනෑකමින් කටයුතු කරලා, රට මේ බංකොලොත්භාවයෙන් එළියට එන මේ අවස්ථාවේදී ඇමෙරිකාවත් සමඟ කථා කරලා, අවුරුදු 10ක, 15ක special tariff agreement එකක් ලබා ගන්න බැරි ඇයි? බංග්ලාදේශය දැන් ඒක සාර්ථක කරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දන්නා හැම කරුණක්ම පාවිච්චි කරලා කරුණාකර මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මොකද, මේ වන විට ලක්ෂ දොළහමාරක ඍජු රැකී රක්ෂා ප්‍රමාණයක් මේ ඇඟලුම් කර්මාන්තය තුළයි රැඳී තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ඒ නිසා ඉතා ඕනෑකමින් මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මෙතැන කාරණා දෙකක් තිබෙන්නේ. විස්තීර්ණ තීරු බදු සම්බන්ධ කාරණය සම්බන්ධයෙන් දැනටමත් සාකච්ඡා පවත්වමින් යනවා. ඒක ගැටලුවක් වෙලා නැහැ. ඇත්තටම විශේෂයෙන් මතු වෙච්ච කාරණය තමයි, reciprocal tariff කියන කාරණය. ඒ කියන්නේ, සාධාරණ වෙළෙඳ ප්‍රතිපත්තිය කියන එක. එතැනදී අපට සාකච්ඡාවට යන්න සිද්ධ වුණේ මේකයි. ඇත්තටම මේක ලංකාව සම්බන්ධයෙන් කරපු එකක් නොවෙයි. සමස්ත ගෝලීය තත්ත්වයකදී ඇමෙරිකාවේ ප්‍රතිපත්තිය තමයි සංශෝධනය කරන්නේ. එතැනදී ඒගොල්ලන් ඉදිරිපත් කරන කාරණයත් එක්ක තමයි අපට ප්‍රවිෂ්ට වෙන්න සිද්ධ වෙන්නේ. ඒකට පෙර සූදානමක් විධියට දැනටමත් අවශ්‍ය කරුණු කාරණා අපි සිද්ධ කරමින් තිබෙනවා, ඒ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව හරහා. එමෙන්ම අපි ණය ප්‍රතිව්‍යුහගතකරණය කියන කාරණයේදී, ඒ කියන්නේ IMF එක සම්බන්ධ වෙලා, බිඳ වටිටලා තිබුණු තත්ත්වයකින් අපි ගොඩ එන තත්ත්වයකදී ඒවාටත් උදව් උපකාර කරන්න ඇමෙරිකාව සම්බන්ධ වූ නිසා හුදෙක් reciprocal tariff සම්බන්ධයෙන් විතරක් නොවෙයි, ඒගොල්ලන් ඒ ඒ රට සම්බන්ධයෙන් තමයි මේ කරුණු අනුගමනය කරන්නේ. කරුණු දන්නේ නැතුව අපට එකවර මෙතැනදී ඒ ගැන කියන්න බැහැ. ඒ නිසා අපෙන් විය යුතු උපාය මාර්ගික සහ රාජ්‍ය තාන්ත්‍රිකභාවය වන්නේ අදාළ තොරතුරු ලැබුණු විගස ඒ කටයුතු කිරීමයි. ඊට අමතරව රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව නිසි පරිදි අපි පවත්වාගෙන යනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, පැහැදිලි කරගැනීමක්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පැහැදිලි කරගැනීම් ඇති, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]* ඔබතුමා දැන් කරුණාකර ඉඳගන්න. ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කළා. ගරු අමාත්‍යතුමා

[ගරු කථානායකතුමා]

ඒකට පිළිතුරු ලබා දුන්නා. තව එක පැහැදිලි කර ගැනීමකටත් අවස්ථාව ලබා දුන්නා. ස්ථාවර නියෝග 27(2) යටතේ එහෙම එකක් නැහැ. කරුණාකරලා ඔබතුමා ඒ ස්ථාවර නියෝගය කියවන්න.

අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය.

උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය සඳහා විසඳුම්: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

பட்டதாரிகளின் வேலையின்மைக்கான தீர்வுகள்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

SOLUTIONS FOR UNEMPLOYMENT OF GRADUATES : STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් 2025.03.11වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. 1. **ප්‍රාථමික හා ද්විතීයික මට්ටම**

* සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රාථමික හා ද්විතීයික අංශවල වියදම් සම්බන්ධ වෙන් කළ දත්ත නොමැති අතර සමස්ත ලෙස එම අවධි දෙකටම පොදුවේ එක් එක් වර්ෂයේ එක් ශිෂ්‍යයෙකු සඳහා වන වියදම පහත පරිදි වේ. (අධ්‍යාපනය සඳහා වෙන් කළ සමස්ත ප්‍රතිපාදනය හා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ගණනය කර ඇත.)

අවුරුදු ගණනාවක තොරතුරු ඉල්ලා තිබෙනවා. 2020 සිට 2025 දක්වා තොරතුරු විතරක් මම ඉදිරිපත් කරන්නම්.

වර්ෂය	එක් ශිෂ්‍යයෙකු සඳහා වන වියදම (රුපියල්)
2020	62,136.00
2021	63,498.00
2022	75,096.00
2023	87,594.00
2024	97,784.00
2025 (ඇස්තමේන්තුගත)	115,715.00

තෘතීයික මට්ටම

පීඨය / අධ්‍යයන පාඨමාලාව	ඒකක පුනරාවර්තන වියදම 2022 වර්ෂය සඳහා (රුපියල්)
කලා	341,665.00
අධ්‍යාපන	492,344.00
නීතිය	273,037.00
සෞන්දර්ය	413,482.00
කළමනාකරණ හා වාණිජ්‍යය	260,967.00
ඉංජිනේරු විද්‍යාව	526,305.00
වාස්තු විද්‍යාව	371,669.00
තොරතුරු තාක්ෂණය	345,449.00
වෛද්‍ය විද්‍යාව	818,583.00
දන්ත ශල්‍ය විද්‍යාව	1,352,947.00
පශු වෛද්‍ය විද්‍යාව	1,372,710.00
කෘෂිකර්මය	579,495.00
විද්‍යාව	428,582.00
සම සෞඛ්‍ය	438,114.00
තාක්ෂණවේදය	267,054.00
දේශීය වෛද්‍ය විද්‍යාව	544,994.00
සාමාන්‍යය	405,313.00

ගරු කථානායකතුමනි, තෘතීයික මට්ටම එක් එක් විෂය ධාරාව අනුව වෙනස් වෙනවා. තෘතීයික මට්ටමේදී සාමාන්‍යයෙන් දරන වියදම, average එක රුපියල් 405,313යි. ඒක තමයි average එක. නමුත්, විෂයෙන් විෂයට, discipline එකෙන් discipline එකට ඒක වෙනස් වෙනවා. එක් එක් විෂය අනුව විශ්වවිද්‍යාලයක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු සඳහා 2022 වසරේදී වැය කරන පුනරාවර්තන වියදම පිළිබඳ තොරතුරු තමයි මම ඒ ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමනි, නිදහස් අධ්‍යාපනය යටතේ ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික යන එක් එක් මට්ටමේ අධ්‍යාපන කඩඉම් වෙනුවෙන් රජය විසින් වාර්ෂිකව එක් ශිෂ්‍යයෙකු සඳහා කොපමණ මුදලක් වැය කරන්නේ ද යන්න පිළිබඳව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යයනයක් මේ වනකොට සිදු කර නැහැ.

2. ගරු කථානායකතුමනි, විවිධ විෂය ක්ෂේත්‍රවලින් අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයන් උපාධිය අවසන් කර ඔවුන්ට රැකියාව සොයා ගැනීමට ගත වන කාලය පිළිබඳව යම් යම් කාල තුළ විවිධ විශ්වවිද්‍යාලවලින් අධ්‍යයනයන් සිදු කර තිබෙනවා. නමුත්, ඒ තොරතුරු අසම්පූර්ණයි. මොකද, ඒවා අවුරුද්දෙන් අවුරුද්දට නිසි පරිදි කරන අධ්‍යයන නොවෙයි. මෙතැන ඉල්ලා තිබෙන්නේ අභ්‍යන්තර ශිෂ්‍යයන්ගේ තොරතුරු, බාහිර ශිෂ්‍යයන්ගේ තොරතුරු සහ දූරස්ථ කියන අංශ තුනෙන්ම වෙන් වෙන් වශයෙනුයි. ඇත්ත වශයෙන්ම එම තොරතුරු ඒ විධියට විධිමත් ලෙස ලබා ගැනීමේ හැකියාවක් නැහැ. යම් යම් විශ්වවිද්‍යාලවලින් සිදු කර තිබෙන tracer studies තිබෙනවා. නමුත්, විශාල අධ්‍යයනයකින් පසුව තමයි අපට ඒවා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් වන්නේ.

3. ගරු කථානායකතුමනි, උපාධිධාරින්ට රැකියා ලබා ගැනීමේදී තිබෙන ප්‍රශ්නත්, එවැනි ප්‍රශ්න තිබෙන්නේ ඇයි කියන එක ගැනත් විවිධ අධ්‍යයන සිදු කර තිබෙනවා. එවැනි අධ්‍යයන විශ්වවිද්‍යාල ආචාර්යවරු සිදු කර තිබෙනවා; විවිධ ආයතනවලින් සිදු කර තිබෙනවා. Qualitative studies තිබෙනවා; quantitative studies තිබෙනවා. ඒවා විවිධ පර්යේෂණ නිබන්ධන හැටියටත් තිබෙනවා; පත්‍රිකා හැටියටත් තිබෙනවා. ඒ පිළිබඳව විශාල සංවාදයක්, සාකච්ඡාවක් තිබෙනවා.

නමුත් සරලව ගත්තොත්, ඒ qualitative studiesවලින් කියන්නේ, මේ සඳහා එක් හේතුවක් නැහැ කියන එකයි. මේ සඳහා විවිධ හේතු තිබෙන්න පුළුවන්. විශේෂයෙන් සාමාන්‍ය අධ්‍යාපනය තුළ තිබෙන අවස්ථා මේ සඳහා ගොඩක් දුරට බලපානවා. ඒ වාගේම social capital කියන එක, ඒ කියන්නේ තමන්ට තිබෙන සමාජ සම්බන්ධතා, සමාජ ගනු දෙනු, networking අනුවත් රැකියා ලබා ගැනීමේ අවස්ථාව තීරණය වෙනවා, විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ. ඉතින් මේක සංකීර්ණ විෂයක්, සංකීර්ණ හේතු ගණනාවක් තිබෙන එකක්. ඒ නිසා කෙටි පිළිතුරක් දෙන්න පුළුවන් කාරණයක් නොවෙයි. ඒ වාගේම මේ පිළිබඳව අධ්‍යයන විශාල ප්‍රමාණයක් කරලා තිබෙනවා. නමුත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින්ම මේ පිළිබඳ විශේෂ අධ්‍යයනයක් කරලා නැහැ. 2022 වර්ෂයේ විශ්වවිද්‍යාල උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිධාරින්ගෙන් ලබා ගත්ත තොරතුරු අනුව පහත පරිදි යම් උත්තරයක් දෙන්න පුළුවන්.

පීඨය / විෂය ධාරාව	රැකියා නියුක්ති ප්‍රතිශතය
කෘෂිකර්මය	60.3
සමසෞඛ්‍ය	54.8
වාස්තු විද්‍යාව	84.8
කලා	30.6
පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය	94.2
ඉංජිනේරු විද්‍යාව	73.5
කළමනාකරණය හා වාණිජ්‍යය	71.0
විද්‍යාව	65.4
තාක්ෂණය	51.3

ඒ ආදී වශයෙන් 2022 වසරේ tracer study එක අනුව එක් එක් ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිය විවිධ ප්‍රතිශතවලින් දක්වා තිබෙනවා.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නවක උපාධි අපේක්ෂකයන් සඳහා වෘත්තීය වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ස්ථාවර කම්ටුවක් පවත්වාගෙන යනු ඇත. මෙම කම්ටුවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන ඒකකවල අධ්‍යක්ෂවරු ඇතුළත් වේ. ප්‍රධාන රැකියා වෙළෙඳ පොළ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් සියලු විශ්වවිද්‍යාල පුරා වෘත්තීමය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. උපාධි අපේක්ෂකයන් සහ කර්මාන්ත ඉල්ලීම් අතර පරතරය පියවීම සඳහා රැකියා වෙළෙඳපොළවල් සංවිධානය කරනු ලබන අතර, නවක උපාධිධාරින් සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර අතර සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා ව්‍යාපාරික සම්බන්ධතා - business linkages - ස්ථාපිත කර ඇත. මෙම මූලපිරීම් උපාධිධාරින්ගේ නවෝත්පාදන දිරිමත් කරන අතර, කර්මාන්ත වෘත්තිකයන් සමඟ සම්බන්ධ වීමට ඔවුන්ට අවස්ථා නිර්මාණය කරයි.

විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය හරහා සිසුන්ට නායකත්වය, මෘදු කුසලතා සහ අනෙකුත් අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ පුහුණුව ලැබේ. මීට අමතරව කර්මාන්ත විශේෂඥයන් සහභාගි වන වැඩමුළු සිසුන්ට සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම් වීමට, විශ්වාසය ගොඩනැඟීමට සහ සිහි කල්පනාව වැඩි දියුණු කිරීමට උපකාරී වෙයි.

තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සෑම විශ්වවිද්‍යාලයකම වෘත්තීය මාර්ගෝපදේශන ඒකක සඳහා ව්‍යුහගත රාමුවක් සහ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සඳහා චක්‍රලේඛයක්ද නිකුත් කර ඇත. මෙම මූලපිරීමෙන් අරමුණු කරන්නේ නවක උපාධිධාරින්ට සහාය වීම, ක්‍රමයෙන් විරැකියාව අඩු කිරීම සහ ලංකාවේ තිරසර මට්ටමකින් උපාධිධාරී රැකියා පවත්වා ගැනීමයි.

ගරු කථානායකතුමනි, මෙතැනදී මම එක කරුණක් එකතු කරන්න ඕනෑ. මේක විශ්වවිද්‍යාලවලට විතරක් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. රැකියා උත්පාදනය වීමත් අවශ්‍යයි. ඒ වාගේම සාමාන්‍ය අධ්‍යාපනය තුළත් විශාල වෙනස්කම් අවශ්‍යයි, රැකියා විරහිතභාවයට තිරසර උත්තරයක් හොයන්න නම්.

4. දැනට රජයේ පවතින පුරප්පාඩු මත උපාධිය සුදුසුකම් වන තනතුරු / ක්ෂේත්‍ර සඳහා උපාධිධාරින් 35,000ක් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, ඒ සඳහා එක් එක් අමාත්‍යාංශ හෝ ආයතන සඳහා වෙන් වූ ප්‍රතිපාදනවලට අමතරව රුපියල් මිලියන 10,000ක අතිරේක ප්‍රතිපාදනද වෙන් කර ඇත. මේ බඳවා ගැනීම් අතරින් වැඩි පිරිසක් ගුරු වෘත්තිය සඳහා බඳවා ගැනීමට නියමිත අතර, දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින නඩුව අවසන් වූ පසු එහි තීරණය ප්‍රකාරව ඒ සඳහා ඉදිරි කටයුතු සිදු කරන අතර, ඉතිරි අනෙකුත් තනතුරු සඳහා ඒ ඒ තනතුරු සඳහා වූ බඳවා ගැනීම් පටිපාටිය ප්‍රකාරව කුසලතා පදනම් මත හෝ විවෘත තරග විභාග මත බඳවා ගැනීමේදී කටයුතු කෙරෙනු ඇත.

5. මේ යටතේ අසා තිබෙන්නේ ටිකක් පුළුල් ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි. ඒ නිසා මම කෙටියෙන් උත්තර දෙන්නම්. මේ තිබෙන අර්බුදයට, විරැකියාවට, උපාධිධාරින්ගේ රැකියා ප්‍රශ්නයට අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් යෝජනා කරන්නේ මොනවාද කියලා තමයි අහලා තිබෙන්නේ. අර මම කලින් කියපු විධියට එතැන මූලික ප්‍රශ්නය තිබෙන්නේ පාසල් අධ්‍යාපනය -සාමාන්‍ය අධ්‍යාපනය- තුළයි.

අපේ ප්‍රතිසංස්කරණවල විශේෂ අවධානය අපි යොදවන්නේ එතැනට. වෘත්තීය හා තාක්ෂණ අධ්‍යාපනයට තිබෙන ප්‍රවේශය පුළුල් කරන්න තමයි අපි ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ. ඒ වාගේම labour forecasting සඳහා වෙනම කම්ටුවක් පත් කරලා, ඒ හරහා labour market එකේ අවශ්‍යතාව අනුව වෘත්තීය හා තාක්ෂණ අධ්‍යාපනය හැඩගස්වමින් දියුණු කරන්න තමයි අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරන්න බලාපොරොත්තු වෙන්නේ.

පාසල් අධ්‍යාපනය තුළ කරන වෙනස්කම් වාගේම උසස් අධ්‍යාපනයේත් වෙනස්කම් සිදු කළ යුතුයි. එහිදී අපි හිතනවා, පාසල්වලින් එළියට එන ශිෂ්‍යයන් බහුතරයක් යොමු විය යුත්තේ තාක්ෂණ හා වෘත්තීය - vocational - අධ්‍යාපනයට බව. ඒ සඳහා උසස් අධ්‍යාපන මාවත තව පුළුල් කරන්න තමයි අපි යෝජනා කර තිබෙන්නේ.

බොහොම ස්තූතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් ලබා දෙන්න, පැහැදිලි කිරීමක් කරගන්න.

ගරු අගමැතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, පිළිතුරු ලබා දීම ගැන. මම මේ ප්‍රශ්නයේ 4වන කොටස යටතේ ඔබතුමියගෙන් ඇහුවේ, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතාම පැහැදිලිව සඳහන් කර තිබෙන කාරණයක් ගැන. ඔබතුමියලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 72වැනි පිටුවේ සඳහන් වෙනවා, "උපාධිධාරීන් 20,000ක් ගුරු වෘත්තියට; විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත උපාධිධාරීන් 3,000ක් සහ STEM නොවන උපාධිධාරීන් 9,000ක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට සහ තවත් 3,000ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගු දෙපාර්තමේන්තුවට, විදේශ සේවාවට, සංචාරක කර්මාන්තයට..." යනාදී වශයෙන්.

ඔබතුමිය හොඳින් දන්නවා, ඊයේ දවසේ ඉඳලා උපාධිධාරීන් පොල්දූව මංසන්ධියේ උද්ඝෝෂණයක නියැළී සිටින බව. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වුණු කරුණු කාරණා ගැන මම හිතන විධියට ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාත් බොහොම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා, බොහොම පැහැදිලිව පොරොන්දු දී තිබෙනවා. එම පොරොන්දු ඉෂ්ට වෙන නිශ්චිත වැඩ පිළිවෙළක්, නිශ්චිත මාර්ග සිතියමක්, නිශ්චිත කාල රාමුවක් ඔබතුමියට ලබා දෙන්න පුළුවන් නම්, පොල්දූවේ උද්ඝෝෂණය කරන රැකියා විරහිත උපාධිධාරීන්ට නිශ්චිත වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරනවා නම්, ඒ අය උද්ඝෝෂණයේ නියැළෙන්නේ නැහැ. විශේෂයෙන්ම 2025 වසර තුළ රැකියා විරහිත උපාධිධාරීන්ගේ ස්වර්ණමය යුගය නිර්මාණය වෙනවාය කියන එක තමයි ඇත්තටම ජාතික ජන බලවේගය -ජනතා විමුක්ති පෙරමුණ- ප්‍රකාශ කළේ. මම අහන්න කැමැතියි, එසේ රැකියා ලබා දීම ක්‍රියාවට නංවන නිශ්චිත කාල රාමුව සහ මාර්ග සිතියම, ඒ වැඩ පිළිවෙළ ඔබතුමිය හෙළිදරව් කරනවාද කියලා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට මම දැනටමත් උත්තර දීලායි තිබෙන්නේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියපු පරිදි තමයි අපි බඳවා ගැනීම් කරන්නේ. පෙර ආණ්ඩු වාගේ කිසිම නිර්ණායකයක් නැතිව හිතෙන හිතෙන විධියට, උස ද, මිටි ද කියන එක බලලා නොවෙයි අපි මේ රැකියා ලබා දෙන්නේ. මෙහි යම්කිසි ක්‍රමවේදයක් තිබෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේත් තීන්දු තීරණ, ප්‍රතිපත්ති අනුවයි අපි ඒ කටයුතු කරන්නේ. ඒ ඒ ක්ෂේත්‍රවල පුරප්පාඩු හඳුනාගෙන, විවෘත තරග විභාග පවත්වා, සම්මුඛ පරීක්ෂණ හරහා, ක්‍රමවේදයක් අනුව අපි ඒ පුරප්පාඩු පුරවමින් යනවා. අපි ඒ කටයුතු දැනටමත් ආරම්භ කර තිබෙනවා. අපි මේ වෙනකොටත් රැකියා ගණනාවක් -රැකියා 10,000කට ආසන්න- දීලා තිබෙනවා. ඒ ක්‍රියාපටිපාටිය අපි ආරම්භ කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් තිබෙනවා. ඒ හරහා පුරප්පාඩු හඳුනාගෙන ඒවා පුරවන්න කටයුතු කරමින් සිටිනවා.

ගරු කථානායකතුමනි, මම නැවත වතාවක් අවධාරණය කරන්න කැමැතියි, විපක්ෂයේ මන්ත්‍රීවරු වුවත්, වගකීමක් සහිතව නිවැරදි තොරතුරු එළියට දෙන්න ඕනෑය කියන එක. විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ, ගුරු වෘත්තියට ඒ අයව බඳවා ගැනීමට බාධාවක් වෙලා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබෙන නිසායි. ඒ නඩුව නිසා අදාළ පුරප්පාඩු අපිට දැනට පුරවන්න බැහැ. ඇත්තටම මෙතැන පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙන්නේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ. පුරප්පාඩු 20,000ක්, 25,000ක් තිබෙනවා. ඒ නඩුවෙන් ලැබෙන තීරණය අනුව තමයි අපිට බඳවා ගැනීම් කරන්න පුළුවන් වෙන්නේ.

මේ පුරප්පාඩු පිරවීම පිළිබඳව කැබිනට් මණ්ඩලය ගත්ත තීරණය අපි මේ වෙනකොට නීතිපති හරහා උසාවියට දැනුම් දීලා තිබෙනවා. ඊළඟ නඩු වාරය එන්නේ අප්‍රේල් මාසයේ මුල විතර. එහිදී නීතිපති එය ඉදිරිපත් කළාම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබෙන තීන්දුව අනුව මේ පුරප්පාඩු පුරවන්න අපිව නිදහස් වුණොත් ඒ සඳහා අපි වහාම ක්‍රියාත්මක වෙනවා. ඒ කටයුතු ක්‍රියාත්මක වෙන්නෙත් හරි ක්‍රමවේදයක් යටතේ. අපි නිකම් ඔහේ අතැනට, මෙතැනට බඳවා ගන්නේ නැහැ. එහෙම වුණොත් ඒක ඒ උපාධිධාරීන්ටත් කරන අසාධාරණයක්. තිබෙන පුරප්පාඩු ගැන අපි මේ වෙලාවේ අධ්‍යයනයක් කර තිබෙනවා. මොන විෂයන්වලටද, මොන පාසැල්වලටද, කොතැනද පුරප්පාඩු තිබෙන්නේ කියන එක ගැන අපි දැන් තොරතුරු හොයනවා. අපි ඒ තොරතුරු අනුව ක්‍රමවේදයක් අනුව ඒ අය බඳවා ගන්නවා. ඒ නිසා අපේ ප්‍රතිපත්තිවල තිබෙන කිසිම දෙයක් අපි නොකර ඉන්නේ නැහැ. එහෙම නොකර ඉන්නවාය කියන මතය හඳන එක සම්පූර්ණයෙන් වැරදියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා.

පරිපූරක සහ අතුරු වෛද්‍ය වෘත්තිකයන්ගේ වැටුප් ගැටලුව: සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

துணை மருத்துவ மற்றும் அதனுடன் இணைந்த மருத்துவ நிபுணர்களின் சம்பளப் பிரச்சினை: சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று

ISSUE OF SALARIES OF PARAMEDICAL AND ALLIED HEALTH PROFESSIONALS: STATEMENT BY MINISTER OF HEALTH AND MASS MEDIA

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, පරිපූරක සහ අතුරු වෛද්‍ය සේවා සපයන වෘත්තිකයන් කණ්ඩායමක් පැය 24ක සංකේත වර්ජනයක් කැඳවා තිබෙන බව මේ වන විට ඔබතුමාත්, මේ පාර්ලිමේන්තුවත්, රටත් දන්නවා. ඔවුන් කියන්නේ, තමන්ගේ දීමනා මේ අය වැයෙන් කප්පාදු කර තිබෙනවා කියායි. මේ ගැටලුව ඔවුන් ඉදිරිපත් කළාට පසුව අමාත්‍යවරයා හැටියට මම සාකච්ඡාවක් කළා. පසුගිය 06වැනි දා ඔවුන් වැඩ වර්ජනයක් කැඳවා තිබුණා. 06වැනි දා විවාදයට ගැනුණේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයයි. මම ඒ වෙලාවේ ඔවුන්ට පෙන්වා දුන්නා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දවසේ ඒ වැඩ වර්ජනය කරන එකේ

තේරුමක් නැති බව. ඔවුන් මගෙන් ඉල්ලා සිටියා මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡාවක් ලබා දෙන්න කියලා. අමාත්‍යාංශය මැදිහත් වෙලා ඔවුන්ට මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡාවක් ඊයේ පෙර වරු 10.00ට ලබා දුන්නා. ගරු කථානායකතුමනි, අපට පෙනුණා, ඒ කණ්ඩායම ඒ සාකච්ඡාවට ගියේ වැඩ වර්ජනය ඉදිරියට ගෙන යනවාද, නැද්ද කියන එක මුදල් අමාත්‍යාංශයේ විසඳුම් මත තීරණය කරනවා කියන තීන්දුව අරගෙන නොවෙයි කියලා. කොහොමත් වැඩ වර්ජනය කරනවා කියන පදනමෙන් තමයි ඔවුන් ඒ සාකච්ඡාවට ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා මුදල් අමාත්‍යාංශය සමඟ කළ ඒ සාකච්ඡාව අවසන් වෙලා එළියට ආ වහාම ඒ අය ප්‍රකාශයට පත් කළා, වැඩ වර්ජනය දිගටම කරනවා කියන එක.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කවර වෘත්තිකයන් කණ්ඩායමක්, කවර ප්‍රමාණයක වැඩවලින් ඉවත් වුණත් ඒක සෞඛ්‍ය ක්ෂේත්‍රයට බලපෑමක් වන බව. මොවුන් මේ කියන කප්පාදුව, එහෙම නැත්නම් අසාධාරණය මොකක්ද? ආණ්ඩුවක් හැටියට අපි මේ සෞඛ්‍ය වෘත්තිකයන් -විශේෂයෙන් පරිපූරක සහ අතුරු වෛද්‍ය වෘත්තිකයන්- වෙනුවෙන් දැනෙන මූලික වැටුප් වැඩි වීමක් කරලා තිබෙනවා. ඒ ගැන මම කලිනුත් කියා තිබෙනවා. ඩී.එස්. සේනානායක අගමැතිවරයාගේ ඉඳලා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා දක්වාම පැවැති හැම ආණ්ඩුවක්ම මූලික වැටුපට යම් යම් දේවල් එකතු කරලා, වැඩි කරලා අවසානයේදී රාජ්‍ය සේවක වැටුප ගෙනැල්ලා තිබුණේ කොතැනටද? අවසානයේ Grade IIIවල නිලධාරියෙකු ලැබුවේ, රුපියල් 32,080ක් පමණයි. ඒක මෙවර අය වැයෙන් රුපියල් 54,120 දක්වා වැඩි කරනවා. ඒ කියන්නේ, රුපියල් 22,040කින් වැඩි කරනවා. ගරු කථානායකතුමනි, රුපියල් 32,000ක මූලික වැටුපක් තිබෙන කෙනෙකුගේ වැටුපට අපි රුපියල් 22,000ක් එකතු කරනවා. රුපියල් 37,190ක මූලික වැටුපක් තිබෙන කෙනෙකුට රුපියල් 26,120ක් අමතරව එකතු කරනවා. රුපියල් 44,520ක මූලික වැටුපක් තිබෙන කෙනෙකුට තවත් රුපියල් 32,010ක් එකතු කරනවා. රුපියල් 58,590ක මූලික වැටුපක් තිබෙන කෙනෙකුට තවත් රුපියල් 43,320ක් එකතු කරනවා. ගරු කථානායකතුමනි, මේ මූලික වැටුප් වැඩි වුණාට පසුව ඒ මත සියලු අතිකාල, OT, නිවාඩු දින දීමනා වැඩි වන බව ඔබතුමා දන්නවා. ඒ වාගේම, බැංකු ණයක් ගන්න ගියත් මූලික වැටුප තමයි සලකා බලන්නේ. ඒ නිසා මේ මූලික වැටුප් වැඩි වීම කියන්නේ, ඒ අයට දැනෙන වැටුප් වැඩි වීමක්. එසේ තිබියදී තමයි මේ වැඩ වර්ජනය සිදු කරන්නේ.

එම වැඩ වර්ජනයට සමස්ත පරිපූරක සහ අතුරු වෛද්‍ය සේවා වෘත්තිකයන් සම්බන්ධ වෙන්නේ නැති බව මා කියන්න කැමැතියි. මේ කණ්ඩායම නියෝජනය කරන වෘත්තීය සමිතිවල අයත් අද රෝහල්වල සේවා සපයනවා. ඒ වාගේම තවත් වෘත්තීය සමිති ගණනාවක් තමන්ගේ සේවා සපයමින් ඉන්නවා. ගරු කථානායකතුමනි, මේ වෘත්තිකයන්ට තමන් අතට ලැබෙන මූලික වැටුප, OT payment එක, PH allowance එක ආදි සියලු දේවල් සම්බන්ධයෙන් අන්තිම රුපියල වනකල් ගණන් හදා ගන්න පුළුවන්කම ලැබුණාට ඒ අයට මේ වැටුප් ගෙවන්න බදු ගෙවන මිනිසුන් දන්නේ නැහැ තමන් ගෙවන බදු ප්‍රමාණය කොච්චරද කියලාවත්. ඒ ජනතාවගෙන් අය කරන බදු මුදල්වලින් තමයි රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවන්නේ.

අද බාහිර රෝගී අංශවලට, clinicsවලට ඇවිල්ලා වෛද්‍යවරයෙකු රෝගය බලලා ප්‍රතිකාරයක් ලිව්වාට පසුව ෆාමසි එකෙන් බෙහෙත ගන්න බැරි නම්, ඒ ජ්‍යෙෂ්ඨ පුරවැසියාට බෙහෙත් නැතුව හිස් අතින් ගෙදර යන්න සිදු වනවා නම් ඒක බදු ගෙවන පුරවැසියාට කරන බලවත් අසාධාරණයක්. මෙහෙම වැඩ වර්ජනයක් දියත් කළාට කමක් නැහැ ගරු කථානායකතුමනි, ආණ්ඩුවෙන් ඒ අයට සාධාරණයක් කරලා නැත්නම්. දැනෙන, සාධාරණ මූලික වැටුප් වැඩිවීමක් ලබා දීලා තිබියදීත් ආණ්ඩුවට මාස හතරක් ගත වන කොට සෞඛ්‍ය සේවාවේ යම් කොටසක් හෝ අඩපණ කරන්න කවුරුන් හෝ වැඩ වර්ජනයක් දියත් කරනවා නම් එය කිසිසේත් සාධාරණ නැහැ; කිසිසේත් සාධාරණ නැහැ. ඔවුන්ගේ ගැටලුව සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා මාර්ගයෙන් අවධානය යොමු කළ හැකිව තිබුණා. අනෙක් අතට, අපි දීලා තිබෙන්නේ මේ මොහොතේ ආර්ථිකයට දරා ගන්න පුළුවන්, දෙන්න පුළුවන් දේවල් පමණයි. කවුරුන් හෝ ඉල්ලා සිටිනවා නම් "අපට ඕස්ට්‍රේලියාවේ ගෙවන වැටුපක් ඕනෑ, එංගලන්තයේ ගෙවන වැටුපක් ඕනෑ" කියලා, එහෙම දෙන්න තරම් ආර්ථිකයක් මේ රටේ නැහැ. මේ සියල්ල සලකා බලමින්, සමස්ත රාජ්‍ය සේවකයන්ට රුපියල් බිලියන 110ක වැටුප් වැඩි වීමක් ලබා දීලා තිබෙනවා, එම මුදල රුපියල් බිලියන 330ක් දක්වා තවත් මාස 18කින් වැඩි කරන්න බලාගෙන. එහෙම තිබියදීත් මේ විධියට රෝගීන් ප්‍රාණ ඇපයට තබාගෙන සෞඛ්‍ය සේවාවේ ඇතැම් අය මේ කරන සංකේත වැඩ වර්ජනය වුණත් සාධාරණ නැහැ කියලායි මා කියන්නේ.

මේ වැඩ වර්ජනය කරන කණ්ඩායමේ යම් කෙනෙක් කියලා තිබුණා, මම ඇමතිවරයා හැටියට වෘත්තීය සමිති යොදාගෙන එම වැඩ වර්ජනය කඩාකප්පල් කරන්න හදනවා කියලා. ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාවට සාධාරණව සේවයක් සපයන්න මේ වෘත්තියේම යෙදෙන අය සේවාව කරද්දී, ඒ වාගේ එම වෘත්තීය සමිතිවල අයත්, සාමාජිකයෝත් සේවාව කරද්දී ඒ අයගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී ඉන්න එක රජයේ වගකීමක්. එම නිසා මම සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් සියලු ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලනවා මේ වෙලාවේ මේ වැඩ වර්ජනයට සම්බන්ධ නොවී සේවා සපයන සියලු වෘත්තිකයන් ආරක්ෂා කරන්න කියලා. ඒ අය අද මේ පැය 24 ඇතුළත වැඩි workload එකක් දරාගෙන සේවය කරනවා ජනතාවට සෞඛ්‍ය සේවාව සැපයීම වෙනුවෙන්. එම නිසා ආයතන ප්‍රධානීන්ට අපි උපදෙස් දීලා තිබෙන්නේ, ඒ අය ආරක්ෂා කරන්න කියලායි. මේ විධියට හිතා මතා, දේශපාලන අරමුණුවලින් යුතුව ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න කියලා හිතාගෙන වැඩ වර්ජන කරනවා නම් මා හිතන විධියට එය සාධාරණ නැහැ.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මෙවැනි වැඩ වර්ජනවලට ගිහිල්ලා රෝගීන් ප්‍රාණ ඇපයට තබාගෙන අසාධාරණ වැඩ කරනවා වෙනුවට, තමන්ගේ වෘත්තියේ තිබෙන ඇත්ත ප්‍රශ්න සාකච්ඡා කරන්න එන්න කියලා. ඒ සඳහා ජනාධිපතිවරයා මේ ඕනෑම කණ්ඩායමකට වෙලාවක් ලබා දෙනවා.

හෙටත් අපි මේ අයට වෙලාවක් ලබා දීලා තිබෙනවා. අපි ඒ වෘත්තියේ තිබෙන ඇත්ත ප්‍රශ්න ගැන සාකච්ඡා කරන්න සූදානම්. නමුත්, කවුරු හරි කියනවා නම්, "මූලික වැටුප් වැඩි වීම නොවෙයි අපිට වැදගත් වෙන්නේ, rate එකයි" කියලා, අපි කියනවා rate එකත් වැඩි වෙලා තිබෙන බව. Rate එකත් වැඩි වෙලා තිබියදී, OT එකත් වැඩි වෙලා තිබියදී, "අපිට මූලික වැටුප වැඩි නොවුණත් කමක් නැහැ, අර rate එක තිබුණා නම් ඇති" කියලා කියන මට්ටමට ගිහිල්ලා තිබෙනවා නම්, ඒක ඒ වෘත්තියේ ඉන්න අයටත් කරන බලවත් අසාධාරණයක්, ජනතාවටත් කරන බලවත් අසාධාරණයක්. ඒ නිසා මම මේ පාර්ලිමේන්තුවේ අවධානය - විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අවධානය - යොමු කරවමින් කියනවා, මේ දීලා තිබෙන මූලික වැටුප් වැඩි වීම ගැන අවධානයෙන් යුතුව බලන්න, ඒකේ rate එක වැඩි වෙන හැටි බලන්න, ආණ්ඩුවට රටක් හැටියට, රජයක් හැටියට දෙන්න පුළුවන් සහනය ලබා දීම පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. ඒ නිසා මේ විධියට අසාධාරණ ලෙස රෝගීන්, පුරවැසියා ප්‍රාණ ඇපයට තබාගෙන, බිල්ලට තියාගෙන කරන වැඩ වර්ජනවලට උදව් කරන්න එපා කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු චාමර සම්පත් දසනායක මහතා.

වරප්‍රසාද: 2025.03.06 දින කෝප් කමිටුවේදී කරන ලද ප්‍රකාශය
சிறப்புரிமை: \கோப்' குழுவில் 06.03.2025 அன்று தெரிவிக்கப்பட்ட கருத்து
PRIVILEGE: REMARK MADE AT THE COPE ON 06.03.2025

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, 2025.03.06 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී - COPE එකේදී - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අදාළව මැණික් මල්ලක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වූ අවස්ථාවේදී, "බදුල්ලේ ඉන්න බඩා හීනෙන්වත් කිව්වේ නැද්ද?" යනුවෙන් එම වැදගත් කමිටුව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු නියෝජිතයින් ප්‍රශ්න කර ඇත. මෙය ඉතාම අශෝභන හා ශිෂ්ට සම්පන්න නොවන තත්ත්වයක් බව මම කනගාටුවෙන් ප්‍රකාශ කර සිටිමි.

ඇඟ, කඳ, බඩ නිබෙන කෙනෙකු මෙවර පාර්ලිමේන්තුවට එවීම පිළිබඳව මාගේ දිස්ත්‍රික්කයේ ජනතාවට මා ස්තුතිවන්ත වන අතර, සමහර අයට නොමැති වුව ද මාහට හිමි මෙම උදරය මට ආඩම්බරයක් බව මම සඳහන් කරමි.

එහිදී උක්ත කමිටුව නියෝජනය කරන පාර්ලිමේන්තු නියෝජිතයින් මාහට හා එවකට මා විසින් පත් කළ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය ඉලක්ක කර චෝදනා නැඟුව ද, එය අප පත්වීමට ප්‍රථම ඇති වූ සිදුවීමක් බවත්, මෙම මැණික් මල්ල බලෙන් තබාගෙන සිටින බවට එයට හිමිකම් කියන පාර්ශ්වය සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අධිකාරියට එරෙහිව නඩු දෙකක් ගොනු කර එම නඩුවලින් පැමිණිලිකාර පාර්ශ්වයට වාසිදායක ලෙස තීන්දුව ප්‍රකාශයට පත් වී ඇති පසුබිමක, ආයතනයේ නීති රාමුවට යටත්ව පැනවිය හැකි උපරිම දඩ මුදලක් මත මෙය නිදහස් කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි එහි ඉදිරි කටයුතු සිදු වී ඇත.

මෙවැනි වැදගත් කමිටුවක සාමාජිකයින් යම් යම් පුද්ගලයින් වෙත පෞද්ගලිකව අපහාස කිරීමෙන් බැහැරව කමිටුවේ ගෞරවය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම අප සැමට මෙන්ම සමස්ත ජනතාවටම ආදර්ශයක් බව මම ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, බදුල්ලේ වෙන බඩාලා නැහැ නේ. බදුල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමාට මට තරම් බඩක් නැහැ.

බදුල්ලේ අනෙක් මන්ත්‍රීවරුන් සියලුදෙනාටම මට තරම් බඩක් නැහැ. එහෙම නම්, ඒ මම නේ. මම නේ හිටපු ඇමති. COPE එක වාගේ තැනක, විගණකාධිපතිවරයාත් ළඟ තියාගෙන,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා භාර දුන් ලිපියේ තිබෙන ටික කියවන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම දැන් ඒක කියවලා ඉවරයි. මට තව වචනයක් කියන්න අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් වරප්‍රසාද ප්‍රශ්නය නැඟුවා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔව්. මට තව වචනයක් කථා කරන්න ඉඩ දෙන්න, ගරු කථානායකතුමනි.

COPE එක කියන්නේ විගණකාධිපතිතුමාත් සිටින, වැදගත් විධියට කටයුතු කරන තැනක්. එහිදී කරන ප්‍රකාශ මාධ්‍යයේත් පළ වෙනවා. ගරු සභානායකතුමා කිව්වා, මේ පාර්ලිමේන්තුව මහුල් මඩුවක් කරගන්න එපා, හොඳින් හැසිරෙන්න පුරුදු වෙන්න කියලා. හැබැයි, දැන් COPE එකේ අපේ සාමාජිකයෝ කවුරුත් නැහැ. COPE එකේ සාමාජිකයන් හැටියට දැනට ඉන්නේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අය. ගරු කථානායකතුමනි, මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, මම දැන් ඔබතුමාට එවන්නම්, නීතිපතිවරයා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිතුමාට යවපු ලියුම. මේ ලිපිය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා. නීතිපතිවරයා නේ, අපි වෙනුවෙන් ඉදිරිපත් වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය යොමු කළා නේ. අපි ඒ ගැන,-

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ ගැන COPE එකේ සාමාජිකයන්ව දැනුවත් කරන්න. විගණකාධිපති ඇතුළු වැදගත් සාමාජිකයෝ නියෝජනය කරන කමිටුවක හැසිරෙන විධිය ගැන ඒ මන්ත්‍රීවරු ගෙන්වලා උපදෙස් දෙන්න. මගේ බඩ කපලා අයින් කරන්න බැහැ නේ, ගරු කථානායකතුමනි. ඒක අඩු කරන්නත් මම මහන්සි වෙනවා. නමුත් අඩු වෙන්නේ නැහැ. ඒකට මම මොනවා කරන්නද? උදේ ඉඳන් ඇවිද්දත් බඩ අඩු වෙන්නේ නැතුවාට මම මොනවා කරන්නද? ඒක දෙයියෝ දීපු එක. ඒක මෙතැන අයට අදාළ වුණාට මට ප්‍රශ්නයක් නැහැ. හැබැයි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඒක ගැන-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, විසිතුන්වන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-

[ප්‍රගතිය: මාර්තු 17]

[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 17]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 17th March]
[HON. SPEAKER in the Chair.]

149 වන ශීර්ෂය.- කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,392,700,000

தலைப்பு 149.- கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,392,700,000

HEAD 149.- MINISTER OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,392,700,000

194 වන ශීර්ෂය.- තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,325,000,000

தலைப்பு 194.- இளைஞர் அலுவல்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,325,000,000

HEAD 194.- MINISTER OF YOUTH AFFAIRS AND SPORTS
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,325,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 149 සහ 303; තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 194 සහ 219.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. Hesha Withanage Ankumbura Arachchi. You have 29 minutes.

[පූ.භා. 10.46]

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.18වන අහඹරුවාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 149, 303, 194 සහ 219 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අද ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ විවාදයට ගැනෙන වෙලාවේ විශේෂයෙන්ම මම කැමැතියි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳව වත්මන් අමාත්‍යවරයාගේ සහ වත්මන් ආණ්ඩුවේ ජනාධිපතිවරයා ඇතුළු කණ්ඩායමේ අවධානය යොමු කරවන්න. පසුගිය වකවානුවල පාර්ලිමේන්තුවේ මේ වාගේම අය වැය විවාද ගණනාවකදී අපි කරුණු කාරණා මතු කළා, මේ අමාත්‍යාංශය හරහා මේ රටේ තාරුණ්‍යයට, පාසල් දරුවන්ට, ක්‍රීඩකයන්ට ඉටු විය යුතු සේවාව ඉටු වෙනවාද කියන කාරණාව ගැන. නමුත් මේ මොහොත වන විටත් මේ රටේ ජනතාවට ඒ පිළිබඳ විශ්වාසය තබා ගන්න පුළුවන් ආකාරයක ප්‍රවේශයක් දකින්න නැහැ. මේ ආණ්ඩුවට මහ ලොකු කාලයක් නැහැ. පසුගිය අවුරුදු ගණනාවක් තුළ පැවැති එක් එක් ආණ්ඩු කරපු වැරදි නිවැරදි කරන්න කාලයක් මේ ආණ්ඩුවට නැහැ කියන කාරණාව මම විශ්වාස කරනවා. හැබැයි, මේ කරුණු නිවැරදි දිශාවට ගෙනයයි කියන ප්‍රවේශයවත් ගන්න වත්මන් ආණ්ඩුවත්, වත්මන් අමාත්‍යවරයාත් සූදානම් නැහැ කියන ඒ සංඥාව අපට, ජනතාවට දැන් දකින්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ නිසා නිකම් පාර්ලිමේන්තුවේ කාලය කා දමනවාට වඩා, වටිනා හරවත් තොරතුරු එක්ක මේ අමාත්‍යාංශය පිළිබඳ යම්කිසි විවාදයකට එක්වීම වෙනුවෙන්, අපි මේ මාසයේ 10වෙනි දා ලංකාවේ සියලු ක්‍රීඩා සංගම්වලට ආරාධනා කරලා, කොළඹ පදනම් ආයතනයේදී සාකච්ඡාවක් කළා. එහිදී මතු වෙච්ච සුවිශේෂී කරුණු ටිකක් තිබෙනවා. මම හිතනවා, ඒවා අමාත්‍යවරයාටත් වැදගත් වෙයි. අපටත් වැදගත් වෙනවා. ඒ වාගේම මේ පිළිබඳව උනන්දුවක් දක්වන මේ රටේ පුරවැසියාටත් වැදගත් වෙයි කියලා.

ගරු සභාපතිතුමනි, ක්‍රීඩා අමාත්‍යාංශය කියන්නේ, තරුණ කටයුතු අමාත්‍යාංශය කියන්නේ රටක ඉතාම වැදගත් අමාත්‍යාංශ. තරුණ කටයුතු අමාත්‍යාංශය ගත්තොත් ගරු සභාපතිතුමනි, පසුගිය කාලසීමාව පුරාම හැමදාම සිද්ධ වුණේ පත් වෙන පාලකයාගේ කවුරු හරි හිතවතෙක්, නැත්නම් පාලකයාගේ දේශපාලන ව්‍යාපාරයට අත හිත දෙන කෙනෙක් තරුණ සේවා සභාවේ සභාපති කරන එක. එතුමාගේ වගකීම එතකොට මේ රටේ තාරුණ්‍යය වෙනුවෙන්, තාරුණ්‍යයේ අනාගතය වෙනුවෙන් කටයුතු කරන එක නොවෙයි, එයාට පත්වීම ලබා දීපු, එයාට දේශපාලන පත්වීම ලබා දීපු පාලකයා වෙනුවෙන් ඒ දේශපාලනික කටයුතුවලට හයිය දෙන එක.

කෝප් එකේදී ජාතික තරුණ සේවා සභාව පිළිබඳ කරපු විවරණය ගැන, ඒ එළිදැක්වීම ගැන මාධ්‍ය තුළින් මමත් දැක්කා. විපක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට මම ඒ ගැන ඉතාම ස්තුතිවන්ත වෙනවා; සතුටු වෙනවා. මොකද, ඒක වෙන්න ඕනෑ. මේ රටේ දේශපාලන නායකයන්ට ඕනෑ විධියට තරුණ කටයුතු අමාත්‍යාංශයේ හෝ ජාතික තරුණ සේවා සභාවේ කටයුතු වෙනවා නම්, අද පත් වෙලා තිබෙන තත්ත්වයටත් එහා ගිය නරක තැනකට අනාගතයේ මේක තල්ලු වෙයි කියලා අපි විශ්වාස කරනවා.

වත්මන් ආණ්ඩුවේ ගරු අග්‍රාමාත්‍යතුමිය උපාධිධාරීන්ගේ ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර මම අහගෙන හිටියා. ඒ කාරණාවට මමත් එකඟයි. මොකද, මේ රටේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී නියම ක්‍රමයක් තිබෙන්න ඕනෑ. පසුගිය කාලයේ බැසිල් රාජපක්ෂ මහත්මයා උපාධිධාරීන්ට රැකියා දුන්නා. ඔවුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රැකියාවට ගියා. ඒ අයට වාඩි වෙන්න

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

පුටුවක් නැහැ. ඒ අයට වාඩි වෙන්න පුටු නැති වුණාම ඇට පැකට් ටිකක් දීලා ගෙවල් ගණනේ ගිහිල්ලා ඒවා හිටවන්න කියලා දෙන්න කියලා යැව්වා. පසුගිය කාලයේ උපාධිය අරගෙන ගෙදර ආවාම ඒක තමයි වුණේ. වත්මන් ආණ්ඩුවත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කරපු දේම උපාධිධාරින්ට කරනවා කියන එක තමයි උපාධිධාරින් කියන්නේ. ගරු ඇමතිතුමියනි, ඔබතුමියගේ ප්‍රතිත්තිමය කාරණාවත් එක්ක අපි එකඟයි. ඒක වෙන්න ඕනෑ. හැබැයි, වත්මන් ආණ්ඩුව නියෝජනය කරන අමාත්‍යවරු මැතිවරණ කාලයේ, "මැතිවරණයේදී අපට සහයෝගය දක්වන්න. අපි ආවාම මෙහෙමයි කරන්නේ" කියලා තරුණ උපාධිධාරින්ට කියපු කථා මගේ දුරකථනයේ තිබෙනවා. මේක අගමැතිතුමිය දන්නේ නැතිව ඇති. අපි මෙහෙමයි කරන්නේ කියලා ඒ අභිංසක තරුණ උපාධිධාරින් රවටිටපු විධිය අපි දන්නවා. එහෙම නම් රාජපක්ෂ මහත්මයා කරපු දේම තමයි වත්මන් ආණ්ඩුවත් කරලා තිබෙන්නේ. ඡන්ද ලබා ගන්න, මැතිවරණ ජයග්‍රහණය කරන්න උපාධිධාරින්ට ඒ පොරොන්දුව දුන්නා. පළාත් හතේම ඉන්න උපාධිධාරින් එකතු වෙලා අපිත් එක්ක මේවා කථා කළා. ඒ කියන කාරණාත් එක්ක ඉතා පැහැදිලියි, අද ඔවුන් ඉතා අසරණභාවයට පත් වෙලා තිබෙන්නේ කියලා. ඔවුන් සියලුදෙනා දේශපාලන වශයෙන් ඔබතුමන්ලාට සහයෝගය දුන්නා, වත්මන් ආණ්ඩුව පිහිටුවන්න. ඒ ප්‍රතිපත්තිමය කාරණා ක්‍රියාත්මක කරන බව ගරු අග්‍රාමාත්‍යතුමිය කිව්ව එක හොඳයි. හැබැයි, ඒක එදා මැතිවරණ වේදිකාව තුළ, ඒ වෙනුවෙන් පවත්වපු සාකච්ඡා තුළ කොහේවත් කියැවෙන්නේ නැහැ. අපි ඔබට සාධාරණය ඉටු කරනවා කියන කාරණාව තමයි කිව්වේ. අද පාරට බැහැලා කෑගහන්නේ ඒ බලාපොරොත්තුව ඉටු නොවෙච්ච අපේ රටේ තරුණ අය තමයි.

ඊළඟට මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා, ජාතික යොවුන් සේනාංකය ගැන. 2002 පාර්ලිමේන්තු පනතක් මඟින් තමයි මේ ආයතනය පිහිටෙව්වේ. යෞවනයේ විනය, නායකත්වය, පෞරුෂ සංවර්ධනය ඇතිකරලීමත් ඒ තුළින් ඔවුන් ව්‍යක්තීය පුහුණුවට යොමු කිරීමත්, රැකියාගත කිරීමත් අරමුණුකොට ගෙන තමයි මේ ආයතනය පිහිටෙව්වේ.

අපට තොරතුරු වාර්තා වෙනවා ඒ ආයතනය තුළ ප්‍රමිතිය, නියාමනය පිළිබඳ යම් කිසි ප්‍රශ්න තිබෙනවා කියලා. ඒ ආයතනය වසා දැමීමට කටයුතු කරනවා කියලා ඒ ආයතනයේම අය අපට ඒ ප්‍රශ්නය මතු කරන්න කියනවා. අපි ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, එහෙම අදහසක් තිබෙනවා නම් එවැනි තත්ත්වයකට පත් වෙන්න හේතුව කුමක්ද කියලා.

ගරු සභාපතිතුමනි, මීට පෙර දිනක පාර්ලිමේන්තුවේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනැල්ලා අපි ක්‍රීඩා අමාත්‍යාංශය ගැන යම් කරුණු කාරණා ටිකක් සාකච්ඡා කළා. ඇමතිතුමා එදා වුණු පොරොන්දු සහ කළ ප්‍රකාශ එක්ක මම දැන ගන්න කැමැතියි, හිටපු අමාත්‍යවරු හරහා ක්‍රීඩා අමාත්‍යාංශයේ වගකීම ඉටු වෙලා තිබෙනවාද, වර්තමානය වෙනකොට එය කොතැනටද ඇවිල්ලා තිබෙන්නේ කියලා.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ජනරජයේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතට අනුව තමයි ක්‍රීඩා සංගම් ලියාපදිංචි කරන්නේ. ඒ පනතට අනුව අපේ රටේ ලියාපදිංචි ක්‍රීඩා සංගම් 73ක් තිබෙනවා. ක්‍රීඩා සංගම් 73ක් අපේ රටේ ලියාපදිංචි වෙලා තිබුණාට, ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ නායකත්වයෙන් පවත්වන ජාතික ක්‍රීඩා උළෙලට එන්නේ ක්‍රීඩා සමාජ 28යි. ක්‍රීඩා සංගම් 73ක් තිබෙනවා. ක්‍රීඩා සංගම් 28යි ජාතික ක්‍රීඩා උළෙලට සම්බන්ධ වෙන්නේ. එහෙම නම් මොකක්ද එතැන තිබෙන වෙනස කියලා පසුගිය රජයන්වල හිටපු ක්‍රීඩා අමාත්‍යවරුන්ට අවබෝධයක් ලැබිලාත් නැහැ, ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙලාත් නැහැ. ඒ ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරක් ලැබිලාත් නැහැ. අපි වත්මන් අමාත්‍යතුමාගෙනුත් අහනවා, ඔබතුමාත් ඒ ක්‍රමයම ඉදිරියට අරගෙන යනවාද කියලා.

පසුගිය දවස්වල අප පැවැත්වූ සාකච්ඡාවේදී අපේ රටේ ක්‍රීඩා සංගම් මතු කරපු කාරණා එකින් එක මම මේ සභාව හමුවේ කියන්න කැමැතියි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ගැන මම දිගින් දිගටම කථා කළා. අද මම මේ හෙළිකරන දේවල් වෙනුවෙන් ආණ්ඩුව දෙන පිළිතුරත් එක්ක මේ රටේ ක්‍රිකට් ලෝලීන්ට, මේ රටේ ක්‍රිකට් වෙනුවෙන් කථා කරන අයට, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ගැන උනන්දුවක් තිබෙන අයට අපි කියනවා, මෙතැනින් එහාට ක්‍රිකට් ගැන කථා කරලා වැඩක් නැහැ, මේ වෙනකොට ආණ්ඩුවේ හැසිරීම මොකක්ද කියලා අපට අවබෝධයක් තිබෙනවා කියලා. අපි ගරු අමාත්‍යතුමාගෙන් කරුණු පැහැදිලි කර ගන්න සෘජුවම ප්‍රශ්න කිහිපයක් යොමු කරන්න කැමතියි. එතුමා ලබා දෙන පිළිතුරු එක්ක අපට පැහැදිලි වෙන්න පුළුවන්, මේ රටේ ක්‍රිකට් යන්නේ කොතැනටද, පසුගිය කාලයේ ඇමතිවරු හැසිරුණු විධියටම මෙතුමාටත් හැසිරෙන්න සිදු වෙලා තිබෙනවාද කියන කාරණාව.

ගරු සභාපතිතුමනි, මේ මොහොත වෙන කොට අපේ රටේ ක්‍රිකට් පිළිබඳ ලොකු ආන්දෝලනාත්මක තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. මේ මාසයේ 31වැනි දා ක්‍රිකට් නිලවරණය කැඳවලා තිබෙනවා. අපි පසුගිය දිනක මේ නිලවරණය ගැන ඇහුවාම, ගරු ඇමතිතුමා ඉතා පැහැදිලි පිළිතුරක් ලබා දුන්නා. එදා එතුමා ලබා දීපු පිළිතුර හැන්සාඩ් වාර්තාවෙන් අරගෙන මම උපුටා දක්වන්න කැමැතියි. එතුමා මෙහෙම කියනවා:

"අපි කාටවත් බය නැහැ, කාටවත් නැමෙන්නේත් නැහැ, කාගෙවත් සාක්කුවලට වැටෙන්නේත් නැහැ. අපට බලය තිබෙනවා. අපි ඒ බලය අවශ්‍ය අවස්ථාවේදී පාවිච්චි කරනවා. සතියක් දෙකක් ඇතුළත බලාගන්න පුළුවන් අපි මොනවාද කරන්නේ කියලා."

ගරු ඇමතිතුමා එහෙම ප්‍රකාශ කරනවා. හැබැයි, එතුමා ප්‍රකාශ කළ ඒ සතිය, දෙක නම් දැන් ඉවරයි. මා දන්නා තරමින් එතුමා කරපු දෙයක් තවම නැහැ. ඒවා එතුමාගේ හිතේ තිබෙනවාද, එතුමා යමක් කරලා තිබෙනවාද කියලා අපි අද බලාගනිමු.

ගරු සභාපතිතුමනි, මේ වාගේ අවස්ථාවලදී සිදුවන්නේ මොකක්ද කියලා අපි දන්නවා. පසුගිය අය වැය විවාදය වෙලාවේ රොෂාන් රණසිංහ හිටපු ක්‍රීඩා ආමාත්‍යතුමාට අමාත්‍යාංශය දීලා ගෙදර යන්න වුණා. ඇයි, එතුමාට අමාත්‍ය ධුරය දීලා ගෙදර යන්න වුණේ? ගරු සභාපතිතුමනි, එදා හිටපු පාලකයා, එදා හිටපු පාලකයාගේ ලේකම්වරු, එදා හිටපු පාලකයාගේ උපදේශකවරු ක්‍රිකට් පාලනය එක්ක තිබුණු සම්බන්ධතා එක්ක, ඇමතිවරයෙක් ගෙදර යවන තත්ත්වයකට තල්ලු කරගෙන ආවා. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යාවස්ථාව කඩිනමින් බලාත්මක කරන්න දීපු පොරොන්දුව තිබෙනවා, 34වන පිටුවේ. චිත්‍රසිරි වාර්තාව පිළිබඳව අපි ඉදිරියේදී කථා කරමු. එහෙම තත්ත්වයක් තිබෙන්නේ. මේ රටේ ක්‍රිකට්වලට ආදරයක් තිබෙන ඕනෑම කෙනෙකුගෙන් ඇහුවොත්, පාලකයෝ මේ රටේ ක්‍රිකට් විනාශ කරලා තිබෙන්නේ, මේ රටේ ක්‍රිකට් නැත්තටම නැති කරලා තිබෙන්නේ, ඒක ජාවාරමක් බවට පත් කරගෙන ආදායම් මාර්ගයක් බවට පත් කරගෙන තිබෙන්නේ කියන එක ඕනෑම කෙනෙක් පිළිගන්නවා. එවැනි වටපිටාවක් තුළ ජනාධිපතිවරයා කිව්වා වාගේ එක පැන් පහරෙන් මේ දූෂිත කණ්ඩායම ගෙදර යවන්න අවස්ථාව තිබෙද්දී නිශ්ශබ්දව ඉන්න එක ගැන අපි අමාත්‍යතුමාට චෝදනා කරන්න කැමැති නැහැ.

හැබැයි, ඇස් පෙනෙන, කන් ඇහෙන ඕනෑම මිනිහෙකුට දැනෙනවා මේ ඇමතිතුමාටත් තිබෙන්නේ පසුගිය ඇමතිවරුන්ට තිබුණු ලෙඩේමයි කියලා. එක්කෝ, මේ ඇමතිතුමාව බලෙන් හරි සාක්කුවට දාගෙන. එහෙම නැත්නම්, ඇමතිතුමාව සාක්කුවට දා ගන්න බැරිව ඊට උඩ ඉන්න කෙනෙක් සාක්කුවට වැටිලා ඇමතිතුමාට බලපෑම් කරනවා කියලා අපි අකමැත්තෙන් හෝ කියනවා. නැත්නම් මේක දැන් විසඳිලා තිබෙන්න ඕනෑ වෙලාවක් නේ. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවක් තිබුණා නම් පොඩි ප්‍රශ්න තිබුණා, බැදියාවන් තිබුණා. රාජපක්ෂ ආණ්ඩුවට ඔය කණ්ඩායම් එක්ක බැදියාවන් තිබුණා. ජාතික ජන බලවේගයට එහෙම බැදියාවන් තිබෙන්න විධියක් නැහැ කියලා අපි හිතනවා. ගරු සභාපතිතුමනි, හැබැයි යම් බැදියාවන් එක්ක තමයි එතුමන්ලා හිරවෙලා තිබෙන්නේ කියලා දැන් පේනවා. මේ කට්ටියගේ හිතේ තිබෙනවා ඇති, රැවුලයි කැඳයි දෙකම බේරා ගන්නා වැඩක් කරන්න. ශම්මි සිල්වා මහත්මයාට මේ 31වෙනි දා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති වෙන්න, නිලතල ටික ගන්න අවස්ථාව දීලා, ඊට පස්සේ චිත්‍රසිරි කමිටු වාර්තාව ගෙනෙනවා කියලා හිතාගෙන ඇති. අපේ රටේ ක්‍රීඩාව පිළිබඳව උනන්දු මිනිස්සු ඒ තරම් මෝඩ නැහැ. එතැනට ඒක ගෙනැල්ලා, අපි මේ ප්‍රශ්නයට උත්තර හෙව්වා කියලා කියන්න හිතාගෙන ඉන්නවා නම්, එහෙම හිතන අයට ලොකු වැරදීමක් තමයි වෙලා තිබෙන්නේ කියන එක මම මතක් කර දෙන්න කැමැතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ වීය.

අතඅන්පිරකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු සභාපතිතුමනි, ක්‍රිකට් ආයතනයේ තිබෙන ගැටලු සම්බන්ධයෙන් 2023දී මේ පාර්ලිමේන්තුවේ දවස් දෙකක විවාදයක් තිබුණා; මේ රටේ ක්‍රිකට් විනාශ වෙනවා කියන ඒ කාරණාවට උත්තර සොයන්න දින දෙකක විවාදයක් තිබුණා. ඒ දින දෙකේ විවාදයෙන් ආපු අවසන් නිගමනය ගැන මම සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, සියලුදෙනා අකමැත්තෙන් වුණත් අත උස්සලා ඒකමතික තීන්දුවක් දුන්නා, අපේ රටේ ක්‍රීඩා පනත සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාව යථාරූපී කරලා නිවැරදි තැනකට අරගන්න ඕනෑ කියලා. සමහරු අකමැත්තෙනුත් ඉන්න ඇති. මොකද, පසුගිය කාල සීමාවේ දිස්ත්‍රික් ක්‍රිකට් සංගම්වල සභාපතිවරු ලෙස සියයට 95ක්ම හිටියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. හැබැයි පසුගිය ආණ්ඩුව පරාජයට පත් වෙලා ගෙදර ගියා. එත්මන් ආණ්ඩුවට ඒක ඉදිරියට අරගෙන යන්න ඕනෑ තරම් අවස්ථාව තිබුණා. නමුත් මේ කාල සීමාව තුළ අපි ඒ බවක් දැක්කේ නැහැ.

මේ සම්බන්ධව පසුගිය ආණ්ඩුව කැබිනට් අනුකමිටුවක් පත් කළා. ඒකේ සභාපතිවරයා වුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී, එවකට අමාත්‍ය අලි සබ්රි මැතිතුමා. මේ වෙනකොට එතුමා පාර්ලිමේන්තුවේ නැති වුණත් මගේ ගෞරවය හිටපු අමාත්‍ය අලි සබ්රි මැතිතුමාට පිරිනමනවා. එතුමා අවංකව, සද්භාවයෙන් කටයුතු කළා. ඒ ක්‍රිකට් කල්ලියේ සාක්කුවට වැටෙන්නේ නැතිව, ඒ කණ්ඩායමත් එක්ක එකට සමාජශාලාවල, වෙන වෙන තැන්වල පාටි දාන වැඩවලට නොගිහින්, කොන්ද කෙළින් තියාගෙන ආණ්ඩුවේ අමාත්‍යවරයකු විධියට මේ රටේ ක්‍රිකට් හරි තැනට ගන්න එතුමා කටයුතු කළා. එතුමා ඒ හයිය දුන්නා. අවාසනාවකට ඒක එතැනින් එහාට ගියේ නැහැ. ඒ තත්ත්වයට අද මොකද වෙලා තිබෙන්නේ කියලා අපි දැනගන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු ගරු විනිශ්චයකාර චිත්‍රසිරි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ සම්බන්ධව කමිටුවක් පත් කළා. එම කමිටුව මඟින් ඉදිරිපත් කළ වාර්තාව අධීක්ෂණය කිරීමෙන් අනතුරුව අලි සබ්රි මැතිතුමා එවකට තිබුණු කැබිනට් මණ්ඩලයට එය ඉදිරිපත් කළා. එම වාර්තාව 2024 ජනවාරි මාසයේදී හිටපු ජනාධිපතිතුමාට භාර දුන්නා. හැබැයි, මේ වනතෙක් එය පාර්ලිමේන්තුවට ආවේ නැහැ. එත්මන් ඇමතිතුමාගෙන් අපි අහනවා, කෝ චිත්‍රසිරි වාර්තාව? එය කැබිනට් එකට ගියාද? ඇයි ඒක යන්නේ නැත්තේ? චිත්‍රසිරි වාර්තාව පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ කවදාද? ඒක ගෙනෙන්න ප්‍රමාද ඇයි? රටම බලාගෙන සිටින වෙලාවක ඒක හමස්පෙට්ටියට දාලා, කල්ලියකට අවශ්‍ය විධියට කටයුතු කරන්න ඉඩ දෙන්නේ ඇයි?

එත්මන් තත්ත්වය ගන්නකෝ. මම අනෙක් ක්‍රීඩාවලටත් එන්නම්. හැබැයි, මම පළමුවෙන්ම මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කරන්නම්. මේ රටේ මිනිස්සු ඉතාම ආදරය කරන, ඉතාම උනන්දුවක් දක්වන ක්‍රීඩාව තමයි ක්‍රිකට්. මම ඉස්සෙල්ලාම මේ තොරතුරු ටික කියන්න කැමැතියි.

ශ්‍රී ලංකාව අද වන විට ටෙස්ට් ක්‍රිකට් ශ්‍රේණිගත කිරීමවල ඉන්නේ කී වැනි තැනද? 6වැනි ස්ථානයේ ඉන්නේ, ගරු සභාපතිතුමනි. එක්දින ක්‍රිකට් ශ්‍රේණිගත කිරීමවල ශ්‍රී ලංකා කණ්ඩායම ඉන්නේත් 6වැනි ස්ථානයේ. T20 ශ්‍රේණිගත කිරීමවල ඉන්නේ 8වැනි ස්ථානයේ. එතකොට ශ්‍රී ලංකා ක්‍රිකට් බලධාරින් කරලා තිබෙන්නේ මොකක්ද? ඒ අය කළේ එක දෙයයි. ඔවුන් කළේ, මේ රටේ පත්වන හැම දේශපාලන නායකයෙක්ම ඔවුන්ගේ දැලට දමාගැනීම. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාව දැලට දමාගත්තා. පොළොන්නරුවේ ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හදනවා කියලා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට පොරොන්දු දුන්නා. එතකොට එතුමා මේ රටේ ජනාධිපති. ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හදනවා කියලා එතුමාත් රවට්ටලා අද එතැන වල් වැදිලා තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා COPE එකේ හිටපු සභාපතිවරයෙක්. අපට එතුමා කෙරෙහි ගෞරවයක් තිබෙනවා. අපි හිතනවා, එතුමාව අන්දන්න පුළුවන් වන එකක් නැහැ කියලා. හැබැයි, මේ මොහොතේ මේ රටේ ක්‍රිකට් නිලවරණය දිනාගන්න ආණ්ඩුවෙන් අනියම් සහයෝගයක් ලබා ගැනීමේ අරමුණින් සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාවත් බිල්ලට තියලාද පඹුරණ ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හදන්න උත්සාහ කරන්නේ කියලා මට පෞද්ගලික සැකයක් තිබෙනවා.

මාතර ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හදන එකට පෞද්ගලිකව මමත් කැමැතියි. මාතර විතරක් නොවෙයි, රත්නපුරය ආදී හැම තැනකම එවැනි ක්‍රිකට් ක්‍රීඩාංගණ හැදෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සිටින දූෂිත කණ්ඩායමත් එක්ක ඔබතුමා අත තබන ක්‍රියාදාමය නිවැරදිද කියන එක ගැන ඔබතුමා තවදුරටත් හිතන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද මම මේ ගැන කථා කළ පසු, මාතර මිනිස්සු කිහිපදෙනෙකුත් මේ ගැන මා සමඟ කථා කළා. මාතර ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හැදෙන එකට අපි විරුද්ධ නැහැ. හැබැයි, මේ වෙලාවේ අපේ ප්‍රමුඛතාව ක්‍රිකට්

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

ක්‍රීඩාංගණයක් හැදීමද? ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාට පුළුවන් නම්, Narandeniya Central College එකේ, මුලටියන, අකුරැස්ස, වැලිගම වැනි ප්‍රදේශවල සිටින පාසල් ක්‍රීඩකයන්ට ක්‍රීඩා කරන්න පුළුවන් ආකාරයේ පහසුකම් ටික දෙන්න. එතකොට ඔබතුමාට ඊට වැඩිය ලොකු ගෞරවයක් ලැබෙයි කියලා මම හිතනවා. හිටපු ක්‍රීඩකයෝ අතළොස්සක් සහ එහි පරිපාලනයේ හිටපු බොහෝදෙනෙක් "ශ්‍රී ලංකා ක්‍රිකට්" නාමයෙන් ජාවාරමක නිරතවෙලා ඉන්නවා, ඔවුන්ට ඕනෑ බලය තියාගන්න විතරයි. ඔවුන් බලය ගත්තාට පස්සේ හඳුන්නෙත්ති ඇමතිතුමාට එහෙම නොවේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා. එම ක්‍රීඩාංගණය ඉදි කළොත්, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට වෙච්ච දේම තමයි එතුමාටත් වෙන්නේ.

ඒ නිලධාරි කණ්ඩායම හැම වෙලාවේම උත්සාහ කරන්නේ නියම, නිවැරදි ක්‍රමය හරහා මේ වැඩේ අරගෙන යන්න නොවෙයි. ගරු හඳුන්නෙත්ති ඇමතිතුමනි, රත්නපුර නගරය අරගෙන බලන්නකෝ. වසරේ එක් කාල සීමාවක් තිබෙනවා, රත්නපුර නගරය සම්පූර්ණයෙන්ම ගංවතුරෙන් යට වෙන. අද වෙනකල් ඒකට උත්තරයක් නැහැ. අන්න, ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හදලා තිබෙනවා. ඒ, මොණරවිල ක්‍රීඩාංගණය. රත්නපුරයේ ක්‍රීඩාංගණයක් හදපු එක ගැන අපි සතුටු වෙනවා. රත්නපුරයට වැහැලා රත්නපුරය යට වෙන්න ඕනෑ නැහැ, දවස් දෙකක් වැස්සොත් එම ක්‍රීඩාංගණය යට වෙනවා. ක්‍රීඩාංගණය හදලා විවෘත කළාට පස්සේ මැච් එකක්වත් ගහන්න වුණේ නැහැ, ගංවතුරට යට වීම නිසා ඒ ක්‍රීඩාංගණය සම්පූර්ණයෙන්ම විනාශ වුණා. මේ නිලධාරින්ට වුවමනා වෙලා තිබෙන්නේ නිවැරදි දේ කරන්න නොවෙයි, නිවැරදි විධියට මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව නංවන්න නොවෙයි, ඔවුන්ට තිබෙන එකම වුවමනාව වෙන්නේ තමන්ට හිතවත් කල්ලියක් හදාගෙන නිලවරණය දිනලා තනතුරුවල රැඳී සිටීමයි. ඒ වාගේම ඒ තුළ සිදු කරන ව්‍යාපෘති හරහා තමන්ගේ සාක්කුවට විශාල වශයෙන් කොමිස් මුදල් දමා ගැනීමයි. මම අභියෝග කරනවා, රත්නපුරය නියෝජනය කරන කොන්ද කෙළින් තිබෙන, ඔළුව තිබෙන එක දේශපාලනඥයෙකුට ලජ්ජා නැතුව කියන්න කියලා ඒ ව්‍යාපෘතිය සාර්ථක ව්‍යාපෘතියක් කියලා. කාටවත් එහෙම කියන්න බැහැ. ඒක සාර්ථක ව්‍යාපෘතියක් නොවෙයි. ගහට පහළිනුයි ක්‍රීඩාංගණය හදලා තිබෙන්නේ. ගඟේ වතුර හැමදාම වැඩි වෙනවා කියලා දැන දැනම ඒක හැදුවේ ඇයි? එහෙම කළේ තමන්ට හිතෙන හිතෙන වෙලාවට, ඕනෑ ඕනෑ දේවල් කරන්න පුළුවන් නිසායි.

මේ අවස්ථාවේදී පාසල් ක්‍රිකට් ගැනත් මම කාරණා කිහිපයක් කියන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමියත් මේ වෙලාවේ සභාව තුළ ඉන්නවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, අපේ රටේ ක්‍රිකට් කඩා වැටීමේ ප්‍රධානම මර්මස්ථානය තමයි, පාසල් ක්‍රිකට්. පාසල් ක්‍රිකට් ක්‍රීඩාව අද නන්නත්තාර වන තැනට ඇවිල්ලා තිබෙනවා. මම ඊයේ-පෙරේදා දැකපු දෙයක් පළමුවැනිම කාරණාව විධියට ගන්න කැමැතියි.

මෙවර කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලය සහ අම්බලන්ගොඩ දේවපතිරාජ විද්‍යාලය අතර අන්තර් පාසල් අවුරුදු 13න් පහළ ක්‍රිකට් අවසන් මහා තරගය පැවැත්වුණා. ඒ අවසන් තරගය රාජකීය විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පවත්වන්න තමයි යොදාගෙන තිබුණේ. හැබැයි පෙර දින රාත්‍රියේ වහිනවා, ක්‍රීඩාංගණය ආවරණය කරලා තිබුණේ නැහැ. උදේ දරුවෝ ටික එනවා, ක්‍රීඩා කරන්න. නමුත්, පෙර දින රාත්‍රියේ වැස්ස නිසා එහි ක්‍රීඩා කරන්න බැහැ. ඒ නිසා දරුවෝ ටික පටවාගෙන යනවා, පානදුරට. පානදුරට අරගෙන ගිහිල්ලා දවල් 1ට විතර මැච් එක ගහන්න පටන් ගන්නවා. ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාසලකට - ගමකින් ආපු කණ්ඩායමකට- ඉදිරියට එන්න තිබුණු අවස්ථාව වැහිලා යන්නේ මේ රටේ ක්‍රීඩා පරිපාලනයේ තිබෙන දුර්වලකම් නිසායි. ඒ වාගේම පසුගිය වසරේ මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලයේ දරුවෝ, ගාල්ල දිස්ත්‍රික්කයේ පාසලක් -මම නම කියන්නේ නැහැ- සමඟ අවසන් පූර්ව තරගයක් සඳහා ඇඹිලිපිටියේ ක්‍රීඩාංගණයක් යොදා ගත්තා.

ඒ විනිසුරුවරුන්ගේ තිබුණු දුර්වලතා නිසා, විනිසුරුවරුන් නියමානුකූලව කටයුතු නොකරපු නිසා එදා ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලයේ - මේ ග්‍රාමීය ප්‍රදේශයක තිබෙන පාසලක් - දරුවන්ට ඉදිරියට යන්න තිබුණු අවස්ථාව අහිමි වෙලා ගියා. පාසල් ක්‍රිකට් ක්‍රීඩාව හදන්නේ නැතිව, පාසල් ක්‍රිකට් සඳහා බෝලයක්, බැට් එකක් දෙන්නේ නැතිව, පාසල් ක්‍රිකට් සඳහා මොකක්ද කරන්නේ කියලා අවබෝධයක් නැතිව, පාසල් ක්‍රිකට් ක්‍රීඩාව භාර දීලා තිබෙනවා, තමන්ගේ හෙංචයියෙකුට. මම ඒක කියන්නේ වගකීමෙන්. මොකද, ඔහු වැඩ කරන්නේ එහෙමයි. ඔහු සම්පූර්ණයෙන්ම ක්‍රිකට් පාලනය කරන්න ඉන්න අයට උදව් කරනවා හැර පාසල් ක්‍රිකට් හදන්න වැඩ කරන්නේ නැහැ. ඒ කවුද කියලා කියන්නත් මම කැමැති නැහැ. ඒත් කමක් නැහැ, මම ඒ කවුද කියලා කියනවා. ඔහු පසුගිය කාලයේ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් සිටින ගමන් පාසල් ක්‍රිකට් සංගමයේ සභාපති වශයෙනුත්, ශ්‍රී ලංකා ක්‍රිකට් විධායක කමිටුවේ සභාපති වශයෙනුත් කටයුතු කළා. මේ සේරම ටික තිබුණේ ඔහුගේ අතේ. ඊට පසු එම විද්‍යාලයේ විදුහල්පතිකම දාලා විභාග දෙපාර්තමේන්තුවට ගියා. මම දන්නේ නැහැ, එහෙම ඉන්න පුළුවන්ද, ඒක නිවැරදිද කියලා. ගරු ඇමතිතුමනි, ඔහු විභාග දෙපාර්තමේන්තුවේ ඉන්න ගමනුත් පාසල් ක්‍රිකට් භාරව ඉන්නවා. කල්ලියක් වටේ ශ්‍රී ලංකා ක්‍රිකට් එක කරකැවෙන එකට උත්තරයක් සොයාගන්න ඔබතුමන්ලාටත් ඇයි බැරි? අපි ජාතික ජන බලවේගයේ ආණ්ඩුවකින් මේ සඳහා විසඳුමක් බලාපොරොත්තු වෙනවා. මේ ජාවාරම්කාරයෝ ටික, ක්‍රිකට් ක්‍රීඩාව විනාශ කරන ෂම්මි සිල්වාගේ කල්ලිය, අනෙකුත් ක්‍රීඩාවලට සම්බන්ධව සිටින මෙවැනි අය සම්බන්ධව මේ රටේ ක්‍රීඩාවේ නාමයෙන් යම් පියවරක් ගත යුතුයි.

අද වෙනකොට football ක්‍රීඩාවට FIFA එකෙන් මුදල් ලබා දීම නතර කරලා තිබෙනවා. ඒ, ඇයි? හේතුව තමයි, අර ජස්වර් උමාර්ලා එකතු වෙලා අවුරුදු 3ක් තිස්සේ විගණන වාර්තා ටික නොදී සිටීම. ඔවුන් කරපු දේවල් සම්බන්ධයෙන් වාර්තා ලබා දෙන්න ඔවුන්ට බැරිවෙලා තිබෙනවා. හිටපු ඇමතිතුමෙකුගේ මාමණ්ඩියෙකු සම්බන්ධවත් වාර්තාවක් තිබෙනවා අපි දැක්කා. අනුර කුමාර දිසානායක මැතිතුමා එදා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් සිටියදී මේ ගැන කථා කළා. අද එතුමා මේ රටේ ජනාධිපති. නමුත් අද එතුමා මේ ගැන කථා කරන්නේ නැහැ. එතුමාට තීන්දු තීරණ ගැනීමේ අවස්ථාව දැන් ඇවිල්ලා තිබෙනවා. අද එතුමා යටතේ සිටින අමාත්‍යතුමා කථා කරන්නේත් නැහැ. අපි අහන්නේ එහෙම වෙන්නේ ඇයි කියලායි. ඔබතුමන්ලාගේ කට වැහුණා, පරණ හිටපු ඇමතිතුමන්ලාටත් වඩා ඉක්මනින්. අද football ක්‍රීඩාව විනාශ වෙලා යනවා. Football ක්‍රීඩාව එහෙම විනාශ වෙන්නේ මේ රටේ football ක්‍රීඩාව ඉස්සරහට ගෙනයන්න අවශ්‍ය නිසි මහපෙන්වීම් නොකරන නිසායි. අද ලෝකයේ football ක්‍රීඩාව කරන රටවල් 200න් මම හිතන විධියට 196වෙනි තැනටද කොහෙදෝ තමයි අපි ඉන්නේ. සෝමාලියාව වාගේ රටවල් දෙකක් තමයි අපට පිටුපසින් ඉන්නේ.

මම දැක්කා, අන්තර්ජාල සූදු ඔට්ටුකරුවන් මට්ටු කරන්න ආධාර දෙන්න කියලා ජනාධිපතිතුමා චීනයෙන් ඉල්ලීමක් කරනවා. මම කියනවා, ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ඕකට චීනයට යන්න ඕනෑ නැහැ කියලා. ශ්‍රී ලංකා ක්‍රිකට් නියාමනය කරන්න. ඔය එක එක ජාතියේ බෙට්කාරයෝ ටික ඔක්කෝම

එතකොට ගෙදර යාවි, මේ ජාවාරම අවසන් වේවි. හැබැයි, ඒක කරන්නේ නැත්නම් ඒ වෙන භානිය අද ගොඩක් දුරදිග ගිහිල්ලා, මේ රටේ පාසල් දරුවන්, මේ රටේ තරුණ තරුණියන් විශාල පිරිසක් මේ සූදු දැලට අහුවෙලා තිබෙනවා. එහෙම නම්, මේ තත්ත්වය වළක්වන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. පසුගිය කාලයේ තමන්ට ඕනෑ ඕනෑ විධියට නටන්න හදපු ඒ කණ්ඩායමට අවශ්‍ය විධියටම නටන්න ඉඩ දෙන්න එපා කියලා මේ අවස්ථාවේදී මම කියනවා.

ශ්‍රී ලංකා ක්‍රිකට් මෑතකදී සිදු කළ ව්‍යවස්ථා සංශෝධනය ගැනත් මම ගරු ඇමතිතුමාට කියනවා. මේ ගැන ඇමතිතුමාත් දන්නවා ඇති. හැබැයි, මේක මාධ්‍ය තුළ ප්‍රචාරය වුණේ නැහැ. ඒ ගැන මේ රටේ මිනිස්සු දන්නේ නැහැ. ශ්‍රී ලංකා ක්‍රිකට් බලධාරින් මේ සඳහා ආකර්ෂණීය යෝජනාවක් ගෙනාවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය සඳහා පසුගිය කාලයේ ඡන්ද 147ක් තිබුණා. ඒ 147ක ඡන්ද ප්‍රමාණය 60කට අඩු කරනවා කියලා ඔවුන් ප්‍රකාශයක් කළා. ඒක හොඳයි. මේ රටේ සිටින හැම කෙනෙකුම වාගේ කැමැතියි, මේ කණ්ඩායම, මේ ජාවාරම්කාරයෝ ටික එළවන්න පුළුවන් නම්. නමුත්, ඒක එහෙම ලෙහෙසියෙන් කරන්න බැහැ. මේක ඊට වඩා ලස්සනට plan කරලා ගහපු ගේම් එකක්. 147ක්ව තිබුණු ඡන්ද ටික 60ට අඩු කරලා බලන්න. මම නිකමට කියනවා, මේ පිළිබඳව අවබෝධයක් තිබෙන අයට මේ ගැන කල්පනා කරන්න කියලා. උදාහරණයක් ගත්තොත්, දිස්ත්‍රික් සංගම් 22ක් තිබෙනවා. ඒ සංගම් 22හි ඡන්ද 22ක් තිබෙනවා. මේ දිස්ත්‍රික් සංගම්වලින් බොහොමයක -සියල්ල කියලා කියන්න බැහැ - මේ මොහොතේ සභාපතිවරුන් විධියට ඉන්නේ දේශපාලනඥයින්, ගරු ඇමතිතුමනි. මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන්, හිටපු ඇමතිවරුන් තමයි ඒ තනතුරුවල ඉන්නේ. සමහර සංගම්වල ඉන්න සභාපතිවරයාට -හිටපු ඇමතිතුමාට- ඇවිදින්නත් බැහැ, ඒත් සභාපති. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සවිය දෙන්න, එහි සභාපතිතුමාට සවිය දෙන්න හදන්නේ එහෙම අය තමයි. මේ සංගම්වල ඉන්න නිලධාරින් ගැන විස්තර මම පසුගිය දිනක මේ වාගේම විවාදයක් පැවති අවස්ථාවකදී සභාගත කළා. ක්‍රිකට් ආයතනයෙන් වැටුප් ගන්න මෙවැනි පුද්ගලයන් 147ක් ඉන්නවා.

ක්‍රිකට් ආයතනයෙන් වැටුප් ගන්න පුද්ගලයා අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට උදවු කරනවා. රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, රත්නපුර දිස්ත්‍රික් නිලවරණය තියා ගන්න බැහැ. අපි රත්නපුර දිස්ත්‍රික්කයේ නිසා රත්නපුර ක්‍රිකට් ක්‍රීඩා කරන කණ්ඩායම එක්ක කථා කළා. රත්නපුර දිස්ත්‍රික් නිලවරණය දිනා ගන්න බැරි නිසා එම නිලවරණය රත්නපුරයේ තියන්නේ නැතිව කොළඹට ගෙනෙනවා. සංගම් නිලධාරි කොළඹට එන්න කියනවා, නිලවරණය කොළඹ තියන්න. ඇයි, ඒ? ගේමක් ගහන්න පුළුවන්ද කියලා බලන්න. අපි බලමු, ගේමක් ගහන්න පුළුවන් වෙයිද කියලා. මේක, තමන්ගේ යෝජනා ක්‍රියාත්මක කර ගන්න මේ ගෙනැත් තිබෙන ව්‍යවස්ථා සංශෝධනය තුළින් මේ රටේ මිනිස්සු අන්දලා, දේශපාලන අධිකාරියත් එක්ක එකතු වෙලා තවදුරටත් බලය ලබා ගන්න කරන ක්‍රියාවක් කියන එක මම මේ වෙලාවේ විශේෂයෙන් මතක් කර දෙන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, මේ කාරණාව මම අපේ ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි. පසුගිය කාලයේ මුදල් කමිටු, විගණන කමිටු පත් කළා. විගණකාධිපතිතුමාගේ වාර්තාවලින් විශාල අක්‍රමිකතා පිළිබඳව හෙළිදරව් කළා. නමුත්, ඒ ගැන කිසිම පිළිතුරක් නැහැ. ඒකට ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ. එම නිසා ඒ සම්බන්ධයෙන් මම ඉල්ලීමක් කරනවා. පාරිශුද්ධතාවක් තිබෙනවා නම්, 2016 අවුරුද්දේ ඉඳලා 2024 වනකල් ශ්‍රී ලංකා ක්‍රිකට් සම්බන්ධව වෝහාරික විගණනයක් කරන්න පුළුවන් නම් සියලු තොරතුරු ටික හෙළිදරව් කර ගන්න හැකියාව ලැබෙයි.

දැන් නිලවරණයක් කැඳවලා තිබෙනවා. නිලවරණය මේ මාසයේ 31වැනි දා තිබෙනවාය කියනවා. මේ සඳහා 2024.12.20 දින සම්මත කර ගත් යෝජනා අතර මාධ්‍යයට නොගිය තව කාරණා කිහිපයක් තිබෙනවා. ඒ තමයි, සංශෝධන අංක 7(h).හි තිබෙනවා, "මෙම සංශෝධනයට අනුව -මේක ඉතාම වැදගත්- පසුගිය වසර 15ක කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුවේ හෝ විශේෂ කමිටුවක වසර දෙකක නියෝජනයක් නොමැති කිසිවෙකුට නිලතල සඳහා ඉදිරිපත් වීමට නොහැක" කියලා. මේක කොහේවත් කිව්වි නැහැ. ඒ කියන්නේ, ක්‍රිකට් නිලවරණයට ඉදිරිපත් වෙන්න පුළුවන් මේකේ හිටපු සෙට් එකට විතරයි, මේකේ රහ දන්න කට්ටියට විතරයි. ක්‍රිකට්වලට ආදරය කරන කිසි කෙනෙකුට අලුතින් එන්න බැහැ. මේක දන්න නිසා තමයි රොෂාන් මහානාම මැතිතුමා මාතර ක්‍රීඩාංගණය ගැන ප්‍රකාශයක් කරන්නේ. එතුමාට කොන්දක් තිබෙනවා. එතුමා මේ රටේ ක්‍රිකට්වලට ආදරය කරන මනුස්සයෙක්. එතුමා තමන්ට පුළුවන් විධියට ජාත්‍යන්තර සහයෝගය අරගෙන මේ රටේ ක්‍රීඩාවට සහයෝගයක් ලබා දෙන කෙනෙක්. ඒ හින්දා මම කියනවා, ගරු ඇමතිතුමාට මේක පැත්තකට කරලා බලාගෙන ඉන්න බැහැ කියන එක, ගරු සභාපතිතුමනි. ඇයි, ඒ? අවුරුදු 15ක් මේකේ විධායක සභාව නියෝජනය කළ කෙනෙකුට හැර අලුතින් වෙන කෙනෙකුට එන්න බැහැ කියනකොට මොකක්ද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය? මේක මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්. ඉතින් මෙහෙම වුණාම, මේ ආණ්ඩුවේ උගත්, බුද්ධිමත් බහුතර පිරිසක් සිටියත් මේවාට හයිය දෙන්න ඇමතිතුමාට හැකියාවක් ලැබෙන්නේ නැහැ කියා මම හිතනවා.

අපි සතුටු වනවා, පසුගිය දිනක ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධයෙන් පැවැත් වූ සභාව කල් තැබීමේ විවාදයේදී ජාතික ජන බලවේගය නියෝජනය කරන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිප දෙනෙකු ඒ පිළිබඳව කථා කිරීම ගැන. ඒ මන්ත්‍රීවරු අවංකව, සද්භාවයෙන් මේ රටේ ක්‍රිකට් ආයතනය දූෂිතයි කියන කාරණාව, මේ කරන දූෂණය ගැන හෙළිදරව් කළා. දේශපාලන, පක්ෂ, පාට භේදයකින් තොරව මේ රටේ ක්‍රීඩාවට ආදරය කරන මිනිස්සු වශයෙන් ඒ මැදිහත්වීම පිළිබඳව අපි සතුටු වනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ සංශෝධන ඉතා උපක්‍රමශීලීව සම්මත කරගෙන තිබෙනවා. මේක ඉතාම අසාධාරණ ක්‍රියාවක්, ඒ වාගේම මානුෂික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් කියන එක මම ඔබතුමාට නැවත නැවතත් මතක් කරනවා, ගරු ඇමතිතුමනි. මේ ගැන ඉතාම වගකීමසහගත පිළිතුරක් අද දින අපි ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, මෙන්න මේ කාරණාව සම්බන්ධයෙන් මම ඔබතුමාගෙන් ඍජුව පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. ක්‍රීඩා පනතේ 51(අ) වගන්තිය අනුව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය "A" ශ්‍රේණියට යටත් වන සංගමයක්. එහිදී එම සංගමයේ භාණ්ඩාගාරිකවරයාට තිබිය යුතු සුදුසුකමක් තමයි, Chartered Accountant කෙනෙකු වීම. මම නිවැරදියි කියලා හිතනවා. මම වැරදියි නම් ඔබතුමා කියන්න. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය 2023.12.20වන දින පැවති විශේෂ මහා සභා රැස්වීමේදී එම තනතුර සඳහා වරලත් ගණකාධිකාරිවරයෙකු -Chartered Accountant කෙනෙකු- වෙනුවට ජාත්‍යන්තර සම්මේලනයට සහභාගි වූ අයෙකුට භාණ්ඩාගාරික තනතුර දැරීමට හැකි වන සේ ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාව සංශෝධනය කර තිබෙනවා.

ඒ ජාත්‍යන්තර සම්මේලනයට සහභාගිවීම හේතුකොටගෙන ඒ අදාළ අධ්‍යාපන සුදුසුකම අහෝසි කරන්න කියලා ක්‍රිකට් ව්‍යවස්ථාව සංශෝධනය කරනවා. හරියට මට මේක දැනෙන්නේ, ඇමෙරිකානු පුරවැසිභාවය අහිමි කර ගන්න අකැමති වුණු බැසිල් රාජපක්ෂට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට එන්න බැරි වුණාම එතුමාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට ගෙන එන්න

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළා වාගේයි. විමල් වීරවංශ මහත්මයා ඇතුළු කණ්ඩායම කෑ ගහලා, මේ පාර්ලිමේන්තුවේ ඒ වෙනුවෙන් අත ඔසවලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා තමයි බැසිල් රාජපක්ෂ මහත්මයා මන්ත්‍රීවරයෙකු විධියට පාර්ලිමේන්තුවට ගෙනාවේ. ඒ වාගේම, සුජීව ගොඩලියද්ද මේකේ සදාකාලික භාණ්ඩාගාරික කරන්න ඕනෑ නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාව සංශෝධනය කර තිබෙනවා. ඒක ඔබතුමන්ලා කරපු දෙයක් නොවෙයි. හැබැයි, ඔබතුමන්ලාට පුළුවන් දැන් මේක වහලා දමන්න. ඔබතුමන්ලාට පුළුවන්, පසුගිය කාලයේ මේ ජාවාරමට සහභාගි වෙච්ච, ඒවාට භයිය දීපු උදවිය මේ කරන ක්‍රියාදාමය වෙනුවෙන් උත්තරයක් හොයන්න.

ගරු සභාපතිතුමනි, 2024 මැයි මස 03වැනි සිකුරාදා නිකුත් කළ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් විගණනය කරන ලද මූල්‍ය වාර්තා නියමිත දිනට ඉදිරිපත් කළ යුතු අතර, අද දින වනවිටත් සාමාජිකයන් වෙත හෝ අමාත්‍යාංශය වෙත ඒවා යොමු කර නැහැ. අති විශේෂ ගැසට් පත්‍රයේ II වන කොටසේ, 5. (4) (ද) (iii) අනුව විධායක සභාවේ ඉන්න කිසිකෙනෙකුට ඉදිරි මැතිවරණ වර්ෂයේ තනතුරු සඳහා ව්‍යවස්ථානුකූලව ඉදිරිපත් වෙන්න අයිතියක් නැහැ; නිල බලයක් නැහැ. අපි ඒ වෙනුවෙන් අධිකරණයට යනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරක් දෙයි කියලා අපි බලාගෙන හිටියා. ඔබතුමා සති දෙකකින් පිළිතුරු දෙනවා කිව්වා. ඔබතුමාගේ පිළිතුර තවම ලැබුණේ නැහැ. අපි මේ වෙනුවෙන් අධිකරණයට යනවා. මොකද, මේ කණ්ඩායමට මොනම හේතුවකටවත් ඉන්න හැකියාවක් නැහැ; නාම යෝජනා භාර දෙන්න අවසරයක් නැහැ. ඉහත ගැසට් පත්‍රයේ III වන කොටසේ, 6. (xiii) වන වගන්තිය අනුව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විගණන වාර්තා අදාළ කාල සීමාව තුළ විගණකාධිපතිවරයා වෙත යොමු කර නැහැ. එබැවින්, 2025.03.31 දිනට යොදා ඇති 2025-2027 නිලවරණය තුළින් වර්තමාන විධායක කමිටු නිලධාරීන්ට ඉදිරි වසර දෙක සඳහා පත්වීමට අවසර නැහැ. ගරු සභාපතිතුමනි, ඊට අදාළ කරුණු කාරණා ඇතුළත් 2024 මැයි මස 03වැනි සිකුරාදා අති විශේෂ ගැසට් පත්‍රය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමා ඇතුළු වත්මන් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ සම්බන්ධයෙන් ඍජු පිළිතුරක් ලබා දීලා මේ දූෂිත කණ්ඩායම මෙතැනින් ඉවත් කරන්න කටයුතු කරන්න ඕනෑ. ජාතික ජන බලවේගයේ ඔබතුමන්ලාගේ හිතවතුන් පිරිසක් වෙන්න පුළුවන්, පිරිසිදු මිනිසුන් ටිකකට මේක භාර දෙන්න. මේ අහුරලා තිබෙන ඒ වැට නිරාවරණය කරන්න. එහෙම නැත්නම් අපි මේ රටේ ජනතාවගේ විශ්වාසය තිබෙන එකම තැන විධියට අධිකරණයට යන්න සූදානම්.

ගරු සභාපතිතුමනි, හිටපු පොලිස්පතිතුමා තවමත් සොයා ගන්න නැහැ නේ. හිටපු පොලිස්පතිතුමාත් මේ Sri Lanka Cricket එකේ pay list එකේ ඉඳලා තිබෙනවා. මේ වාර්තාව එළිදැක්වුණේ ඊයේ පෙරේදා. මේකත් හැංගිලා තිබුණේ. ඒකේ එතුමා ගැන මෙසේ සඳහන්ව තිබෙනවා. Sri Lanka Cricket වෙතින් මසකට රුපියල් ලක්ෂ එකහමාරක් ලබාගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පෙට්‍රල් ලීටර් 200ක්, ලැප්ටොප් එකක්, mobile phone එකක් ලබා දීම සඳහා විධායක කමිටුවේ අනුමැතිය අරගෙන තිබෙනවා. මේ වාගේ අයටද 2025 මාර්තු 31වැනිදා යින් පස්සේ නැවත එන්න දෙන්න හදන්නේ? මේ කරන ජඩ වැඩ ටික වහගන්න හිටපු පොලිස්පතිතුමාට දීපු අල්ලස් මේවා. හිටපු පොලිස්පතිතුමාට මේ දීලා තිබෙන දේවල් අල්ලස් නොවෙයිද, ගරු සභාපතිතුමනි? මේ සම්බන්ධයෙන් අපරාධ නීතිය අනුව ක්‍රියාත්මක වෙන්න ඕනෑ නැද්ද? හිටපු පොලිස්පතිතුමා අල්ලනවා වාගේම, හිටපු පොලිස්පතිතුමා හොයනවා වාගේම මේ කණ්ඩායමට විරුද්ධවත් අල්ලස් දීමේ වරදට අනිවාර්යයෙන්ම අපරාධ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. රටේ හිටපු පොලිස්පතිට වැටුප් ගෙවලා, ඉන්ධන, ලැප්ටොප් එකක්, දුරකථනයක් දීලා තමන්ගේ ජඩ වැඩ ටික වහ ගන්න කටයුතු කර තිබෙනවා. මේ අයට නැවත මැතිවරණයකට යන්න ඉඩදීලා මේ කැබිනට් මණ්ඩලයට බලාගෙන ඉන්න ශුද්ධවත් අයිතියක් නැහැ කියලා මම මේ වෙලාවේදී විශේෂයෙන්ම මතක් කර දෙනවා. ක්‍රිකට් ගැන මම මීට වඩා කථා කරන්න කාලය ගන්නේ නැහැ. මොකද, මට ඉතිරි වෙලා තිබෙන්නේ තව ටික වෙලාවයි.

ගරු සභාපතිතුමනි, ක්‍රීඩා සංගමයකට යම්කිසි අසාධාරණයක් වුණාම ගිහිල්ලා appeal කරන්න තැනක් ක්‍රීඩා අමාත්‍යාංශයේ තිබෙනවා. ඒ අභියාචනා කමිටුව අද නිශ්ශබ්ද වෙලා තිබෙනවා.

පසුගිය අවුරුද්දේ කළුතර ක්‍රීඩා සමාජය යම් අසාධාරණකමක් හේතු කොටගෙන අභියාචනයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අභියාචනා කමිටුව සති දෙකකින් ඒකට පිළිතුරු ලබා දෙනවා. මම එයට අදාළ සියලු ලිපිලේඛන **සභාගත*** කරනවා.

පිළිතුරු ලබා දුන්නාට ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පසුව ඒ කරුණු කාරණා එක්කම නැවත වතාවක් අභියාචනයක් ඉදිරිපත් කරනවා. හැබැයි අර දීපු තීන්දුව, විශ්‍රාමලත් අධිකරණ විනිසුරුවරුන් ලබා දීපු තීන්දුව අභියෝගයට ලක් කරන්න බැරි නිසා, දැන් මාස හතක් ගත වෙලාත් ඒ අභියාචනයට පිළිතුරක් දෙන්නේ නැහැ. ඉස්සෙල්ලා ඉදිරිපත් කළ අභියාචනයට සති දෙකෙන් පිළිතුරු දෙනවා. ඒ සති දෙකෙන් දීපු පිළිතුරම තමයි මේකටත් දෙන්න තිබෙන්නේ. හැබැයි, අභියාචනා කමිටුව ඒකට-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු සභාපතිතුමනි, මට තව සුළු වේලාවක් ලබා දෙන්න.

අපේ රටේ මෝටර්ස්පෝර්ට්ස්, නෙට්බෝල්, දුනු විදීම, බර ඉසිලීම වැනි ක්‍රීඩා ගත්තොත්, විශේෂයෙන් බර ඉසිලීමේ ඉසව්වලින් අපේ රටට medals 13ක් අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ කණ්ඩායමත් එක්ක හිටපු ඇමතිවරයෙක්වත්, වත්මන් ඇමතිවරයෙක්වත් වචනයක් මේ ක්‍රීඩා ගැන කථා කරලා නැහැ. ගරු සභාපතිතුමනි, කරාටේ ක්‍රීඩාව, මල්ලවපොර සංගමය, විශේෂයෙන් පාපන්දු සංගමය සම්බන්ධ ලිපි ලේඛනත්, මගේ කථාවට අදාළ අනෙකුත් සියලු ලිපි ලේඛනත් ඉදිරි ප්‍රයෝජනය සඳහා මම **සභාගත*** කරනවා, කාලය නැති නිසා.

කථාව අවසන් කරන්න කලින් මම තව කාරණයක් ගැන කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම මෙයට ඍජු පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. මෙවැනි තත්ත්වයක් උඩ, මේ නුසුදුසුකම් තිබෙන කණ්ඩායමට නිලවරණයට ඉදිරිපත් වෙන්න

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඔබතුමා අමාත්‍යවරයා විධියට ඉඩ ලබා දෙනවාද? දෙවැනි කාරණය, ඔබතුමාගේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැම සංගමයකින්ම විශාල චෝදනාවක් තිබෙනවා. එතුමාට හිතවත්කම් පාන, එතුමාට අවශ්‍ය සන්තෝසම් දෙන කණ්ඩායමට විතරයි සලකන්නේ. ගරු සභාපතිතුමනි, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්තුමා මේ වනකොටත් අර ගොඩලියද්ද මහත්මයාට ක්‍රිකට් ආයතනයේ භාණ්ඩාගාරික විධියට ඉන්න අවශ්‍ය ලිපියට අත්සන් කර තිබෙනවා; නිලභාවය ලබා දීලා තිබෙනවා. එහෙම නම්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවකිනුත් මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච පාරිශුද්ධභාවයට මේ වෙනකොටත් කැළැලක් ඇතිවෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, would you please wind up?

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු සභාපතිතුමනි, තව තත්පර 30ක් දෙන්න. මම අවසන් කරනවා.

ඒ නිසා මම කියනවා, අපේ රටේ ක්‍රීඩාව නහා සිටුවන්න, අපේ රටේ තාරුණ්‍යයට වග කියන්න ඔබ දීපු පොරොන්දු ටික මේ රටේ ජනතාව ඉදිරියේ ක්‍රියාත්මක කරන්න කියලා. ජඩ වැඩ කරන, මංකොල්ල කන කණ්ඩායම්වලට නැවතත් හිස ඔසවන්න දෙන්න එපා කියන ඉල්ලීම කරමින්, මේ රටේ ක්‍රීඩාවට ආදරය කරන, මේ රටේ තාරුණ්‍යයට ආදරය කරන අමාත්‍යවරයෙකු විධියට ගරු ඇමතිතුමා අද දිනයේ මේ සඳහා සාධනීය පිළිතුරක් ලබා දෙයි කියලා විශ්වාස කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Sunil Handunnetti. You have 14 minutes.

[පූ.භා. 11.27]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ අද දින විවාදයට ගැනෙනවා. ඒ අතරින් කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා හැටියට මම අද දවසේ මට ලැබී තිබෙන සම්පූර්ණ වෙලාවෙන් කොටසක් අරගෙන මගේ කථාව කරනවා.

අපේ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව, අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව අපේ අමාත්‍යාංශයේ මූලික අරමුණ තමයි ලංකාවේ නිෂ්පාදන ආර්ථිකය පණ ගැන්වීම; ඒ නිෂ්පාදන ආර්ථිකයට ජනතාව සහභාගි කර ගැනීම සහ ජනතාවට සාධාරණ ලෙස ප්‍රතිලාභ බෙදී යාම සහතික කිරීම. එහිදී අපේ අමාත්‍යාංශයේ මූලික ඉලක්කය තමයි අපේ නිෂ්පාදනය වර්ධනය කිරීම. මොකද, අපි මොනවා කථා කළත් පසුගිය අවුරුදු 76ක කාලයේ සිද්ධ වුණු අසමතුලිත සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵලය විධියට අපේ රටේ ආර්ථිකය ඍණ අගයකට පහළ වැටුණා; ණය බර වැඩි වුණා. රට ණය වෙච්ච තරම කොච්චරද කිව්වොත්, ණය ගෙවා ගන්න බැරි වුණා. ඒ නිසා ගරු සභාපතිතුමනි, දැන් අපේ මූලික ඉලක්කය වන්නේ නිෂ්පාදන ආර්ථිකය පණ ගැන්වීමත්, ඒ සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයෙන් වැඩි දායකත්වයක් සැපයීමත්, ඒ හරහා හඳුනා ගත්ත කර්මාන්ත ඔස්සේ අපනයන ආර්ථිකය දියුණු කිරීම තුළ අපනයන වෙළෙඳ පොළ ශක්තිමත් කරලා අපේ රටේ තිබෙන ඩොලර් අර්බුදයට උත්තර සොයා ගැනීමත් කියන කාරණා ඉටු කර ගැනීමයි. මේ වනකොට අපි ඩොලර් බිලියන 16ක අපනයන ආර්ථිකයක ඉන්නේ, ගරු සභාපතිතුමනි. මේ අවුරුද්ද තුළ ඩොලර් බිලියන 19ක අපනයන ආර්ථිකයකට යන්නත්, 2030 වෙනකොට කර්මාන්ත ක්ෂේත්‍රයෙන් අපනයන ආර්ථිකයට ඩොලර් බිලියන 28ක දායකත්වයක් ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

හැබැයි, එතැනදී අපි මුහුණ දෙන ගැටලු කිහිපයක් තිබෙනවා. මොකද, අද අපේ රටේ කර්මාන්තකරුවන් වෙනුවෙන්, කර්මාන්ත හා ව්‍යවසායකත්වය වෙනුවෙන් වෙන් වෙලා තිබෙන භූමිය; ඉඩම් ප්‍රමාණය සීමිතයි. අපි විශාල අර්බුදයක ඉන්නේ. විශේෂයෙන් බස්නාහිර, වයඹ වාගේ පළාත්වල කර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වයට තිබෙන භූමිය ඉතා සීමිතයි. ව්‍යවසායකත්වය වෙනුවෙන්, කර්මාන්ත වෙනුවෙන් අපට තිබෙන්නේ 0.01ක වාගේ ඉඩම් දායකත්වයක්. අපේ ඉලක්කය මේ ප්‍රමාණය 2030 වෙනකොට අඩු තරමේ සියයට 1ක් දක්වාවත් ඉහළට ගෙන යන්නයි. ජාත්‍යන්තර ප්‍රමිති අනුව ගත්තත් රටක තිබෙන ඉඩම්වලින් කර්මාන්තවලට අඩුම තරමේ සියයට 3කවත් භූමි දායකත්වයක් තිබෙන්න ඕනෑ. අපි මේ ගැන ජනාධිපතිතුමා එක්කත් සාකච්ඡා කළා. අපි බලාපොරොත්තු වෙනවා, කෘෂිකර්මාන්තයට යොදවා ඉතුරු වන ඉඩම් ප්‍රමාණයෙන් හඳුනා ගත් ඉඩම් ව්‍යවසායකයින්ට ලබා දෙන්න.

ගරු සභාපතිතුමනි, අපි ඉලක්කයක් විධියට හඳුනා ගෙන තිබෙනවා, ඇත්තටම අපේ රටේ ව්‍යවසායකත්ව උන්මාදයක් ඇති කරන්න ඕනෑ කියන කාරණය. ගරු අධ්‍යාපන ඇමතිතුමියගෙනුත් අපි ඉල්ලීමක් කළා, ලබන අවුරුද්දේ ඉඳලා විෂයය නිර්දේශයට ව්‍යවසායකත්වය විෂයය -9 වසරෙන් පසුව හෝ උගන්වන්න- එකතු කරන්න කියලා. මොකද, හැම තරුණයෙකුටම රජයේ රැකියාවක් නැති වෙන්න පුළුවන්. අපේ රටේ තරුණයා අධ්‍යාපනය නතර කරන්නේ කොතැනින්ද කියා බලා ඔහු ව්‍යවසායකයෙක් හැටියට, කර්මාන්තකරුවෙක් හැටියට ආර්ථිකයට උකහා ගන්නා, බද්ධ කර ගන්නා සැලැස්මකට තමයි අපි යන්නේ. අපි ඒ වෙනුවෙන් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර තිබෙනවා, අපේ අමාත්‍යාංශය යටතේ. විශේෂයෙන්ම අපි අලුතින් හඳුනා ගත් කර්මාන්ත ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. පසුගිය කාලයේ වාහන ආනයනය සීමා වීමත් එක්ක වාහන උපාංග නිෂ්පාදනය කියන කර්මාන්තය 2019 ඉඳලා අපේ රටේ අලුත් කර්මාන්තයක් බවට පත් වුණා. මේක සමහර අය වැරදි විධියට අර්ථ කථනය කර ගන්නවා, වාහන කොටස් කර ගෙනැල්ලා මෙහේදී එකලස් කරන එක කියලා. එසේ කටයුතු කිරීම නොවෙයි. වාහන උපාංග නිෂ්පාදනය කරන කර්මාන්තය අද වනවිට අපේ රටේ නව කර්මාන්තයක් වෙලා තිබෙනවා. එහෙම කර්මාන්ත 17ක් විතර අපේ රටේ ඇති වෙලා තිබෙනවා.

ඊළඟට, iron and steel කර්මාන්තයත් අපේ රටේ පවතින ලොකු කර්මාන්තයක්. ඒ වාගේ විශාල කර්මාන්ත අපේ රට තුළ බිහි වෙලා තිබෙනවා. අපේ leather products, අපේ සම්භාණ්ඩ නිෂ්පාදන, සපත්තු නිෂ්පාදන ගත්තාම, ජාත්‍යන්තර මට්ටමට ගිය සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයක් අපේ රට තුළ තිබෙනවා. අපේ අපනයන ආදායමින් විශාල පංගුවක් අද apparel industry එක, ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රය නියෝජනය කරනවා. ඒ ගැන කාටවත් විවාදයක් නැහැ. ලෝකයේ විශාල ජනගහනයක් ඉන්නා ඉන්දියාවේ පවා apparel industry එක තුළ අපට තිබෙන ඉඩකඩ ඒගොල්ලන්ට නැහැ. ඒ potential එක අපට තිබෙනවා, ගරු සභාපතිතුමනි.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඒ වාගේම අපි කවුරුත් දන්නවා, gem and jewellery කියන්නේ අපේ අපනයන ආදායම විශාල වශයෙන් වැඩි කරන, අපේ රටේ ආර්ථිකය හදන ක්ෂේත්‍රයක් බව. Ceylon blue sapphire කියන්නේ ලොව වැඩිම ඉල්ලුමක් තිබෙන දෙයක්. නමුත් අපිට ඒකට අවශ්‍ය කරන වගවීම, සහතිකවීම හරියාකාරව දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම මේ වාගේ හඳුනා ගත් ක්ෂේත්‍රවල දැනට පවතින කර්මාන්ත ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගෙනියන්න. ඒ වෙනුවෙන් වන ව්‍යුහය අපට තිබෙනවා.

ලංකාවේ පළමු වතාවට විද්‍යාත්මක පදනමක් යටතේ අපේ අමාත්‍යාංශය සකස් කර තිබෙන බව මම සතුටින් කියන්න කැමැතියි, ගරු සභාපතිතුමනි. ඒ නිසා ගමේ රැකියාවක් නැතුව ඉන්නා; රැකියා විරහිත තරුණයෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ඇවිල්ලා "මට රැකියාවක් නැහැ. මම ව්‍යවසායකයෙක් වෙන්න කැමැතියි" කිව්වොත්, ඔහුව ව්‍යවසායකයෙක් කරලා අපනයන වෙළෙඳ පොළට ගෙනියන්න තරම් ශක්‍යතාවක්; හැකියාවක් අද වනවිට අපේ අමාත්‍යාංශයට තිබෙනවා. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ඒ වාගේම අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය, ජාතික ශිල්ප සභාව, ලක්සල වාගේ ආයතන හැම එකකම නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දක්වා විහිදී ඉන්නවා. මීට කලින් ඔවුන් වැඩ කළේ වෙන වෙනම. නමුත් අපි දැන් ඔවුන් එකට ඒකාබද්ධ කර තිබෙනවා. ඒ අනුව ඔවුන් එකට එකතු වෙලා ව්‍යවසායකයින් නිර්මාණය කිරීමේ සංකල්පය ගමට ගෙන ගොස් තිබෙනවා. අපි ඒ වෙනුවෙන් ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් හදා තිබෙනවා, අපනයන සඳහා වන අමාත්‍ය සභාව. අවුරුදු 28කට පසුව අපි එය පිහිටෙව්වා මේ මාස 4 ඇතුළත. අපනයන ක්ෂේත්‍රයට අදාළ සියලු අමාත්‍යාංශවල අමාත්‍යවරුන් ඒකාබද්ධ කරලා; වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශය - යටිතල පහසුකම් ලබා දෙන්න - ඒ වාගේම මුදල් අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් සියලු අමාත්‍යාංශවල ප්‍රධානීන් මූලික වුණු කමිටුවක් අපි හදා තිබෙනවා; අමාත්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවක් හදා තිබෙනවා. ඒ නිසා අපනයන ක්ෂේත්‍රයට අදාළ සියලු ප්‍රශ්න අපට එතැනින් විසඳා ගන්න පුළුවන්.

ඊළඟට, හැම දිස්ත්‍රික්කයකටම අදාළව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තිබෙනවා, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව තිබෙනවා. ඒක හරිම වැදගත්. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව හුඟාක් වෙලාවට කැඳවනවා, දිස්ත්‍රික් ලේකම්තුමා විසින්.

හැබැයි, දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රවර්ධන සභාවක් පිහිටුවන්න පුළුවන්. දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රවර්ධන සභාව අපි දැන් දිස්ත්‍රික්කවල පිහිටුවමින් යනවා. මේ වන කොට රත්නපුරය, හම්බන්තොට, මාතර, ගාල්ල ආදි දිස්ත්‍රික්කවල එය සක්‍රිය කර තිබෙනවා. දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රවර්ධන සභාවට වාණිජ මණ්ඩල කැඳවන්න පුළුවන්, බැංකු ටික කැඳවන්න පුළුවන්, අපේ අමාත්‍යාංශයට අදාළ සියලු ආයතන කැඳවන්න පුළුවන්, ඉඩම් අමාත්‍යාංශය කැඳවන්න පුළුවන්, LRC එක කැඳවන්න පුළුවන්, අදාළ සියලු අමාත්‍යාංශ කැඳවලා ඒ දිස්ත්‍රික්කයේ කර්මාන්ත ප්‍රවර්ධනයට අවශ්‍ය තීන්දු තීරණ ගන්න පුළුවන්.

ඒ වාගේම, ප්‍රාදේශීය මට්ටමින්, ප්‍රාදේශීය කර්මාන්ත කමිටුව පිහිටුවන්න පුළුවන්. මෙන්න මේ ව්‍යුහය අපි දැනට හදලා තිබෙනවා. අපි මේ ව්‍යුහය හදන්නේ මොකටද? අපේ රටේ බිඳ වැටිච්ච කර්මාන්ත යළි නඟා සිටුවීම වෙනුවෙන්. අලුත් කර්මාන්ත ආරම්භ කිරීම වෙනුවෙන්. ගරු සභාපතිතුමාත් දන්නවා, මේ වන කොට අප අලුතින් හඳුනා ගත්තු ක්ෂේත්‍ර තිබෙන බව. Event management කියන්නේ එවැනි ක්ෂේත්‍රයක්. අද ඕනෑම තැනක උත්සවයක් සංවිධානය කරන්න - වෙඩින් එකක් ගන්න පවා - event management එකක් කරනවා. අපේ රටේ event management තිබුණාට එය කර්මාන්තයක් විධියට හඳුනාගෙන තිබුණේ නැහැ. හැබැයි, අද අපි event management කියන එක කර්මාන්ත ක්ෂේත්‍රයක් හැටියට හඳුනාගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ film industry එක තිබෙනවා. මොකද, අපේ රට ස්වභාව සෞන්දර්යෙන් ඉතා වටිනා රටක්. ස්වභාව සෞන්දර්යය සහ ස්වභාව සෞන්දර්යයේ විවිධත්වය නිසා අනිවාර්යයෙන්ම විශාල මූල්‍ය හැකියාවක් උපදවන්න අපට පුළුවන්, film industry එක හරහා. නමුත්, film industry එක තිබෙන්නේ වෙනම, චිත්‍රපට සංස්ථාව තිබෙන්නේ වෙනම. Industry එකක් හැටියට එය හඳුනාගෙන තිබුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේමයි beauticiansලා ගත්තත්, cosmetics ගත්තත්. එයත් අලුත් කර්මාන්ත ක්ෂේත්‍රයක්. අද තරුණ තරුණියන් විශාල වශයෙන් beauticiansලා ළඟට යන්න, cosmeticsවලට කැමතියි. අපි අද ඒ ක්ෂේත්‍රයත් කර්මාන්තයක් විධියට හඳුනාගෙන තිබෙනවා. මෙන්න මේ වාගේ අලුතින් අගය එකතු කරන්න පුළුවන් -value addition කරන්න පුළුවන්- කර්මාන්ත ක්ෂේත්‍ර ගණනාවක් අපි හඳුනාගෙන තිබෙනවා. ඒ සමහර ඒවා සේවා සපයන ක්ෂේත්‍ර, සමහර ඒවා අලුතින් කර්මාන්ත විධියට පවත්වාගෙන යන්න පුළුවන් ක්ෂේත්‍ර. ඒ වෙනුවෙන් වන වැඩ පිළිවෙළක් මෙතෙක් තිබුණේ නැහැ. මා කියන්නේ මීට කලින් හිටපු කර්මාන්ත අමාත්‍යවරු, ඒ අමාත්‍යාංශ වැඩ නොකළා කියා නොවෙයි. ඒවා දියුණු කිරීම ඉලක්ක කරගෙන, ඒ වෙනුවෙන් වන නිශ්චිත KPIs හඳුනාගෙන නිශ්චිත ඉල්ලක්කවලට ගියේ නැති නිසා කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ජාතික ආර්ථිකයට අපට ලැබිය යුතුව තිබුණු දායකත්වය හරියාකාරව ලැබුණේ නැහැ. ඒ වෙනුවට අපේ රටේ ප්‍රතිපත්තිය තිබුණේ අනෙක් පැත්තට. විවෘත ආර්ථිකය තිබුණා කිව්වාට ඇත්තටම ගත්තොත් විවෘත ආර්ථිකයවත් හරියාකාරව ක්‍රියාත්මක වෙලා තිබුණේ නැහැ. විවෘත ආර්ථිකය හරියාකාරව ක්‍රියාත්මක වෙලා තිබුණා නම් යම් කර්මාන්තයක්, ව්‍යාපාරයක් ආරම්භ කරන්න එන ආයෝජකයෝ මෙච්චර රස්තියාදු වෙන්න ඕනෑ නැහැ. යම් කර්මාන්තයක්, ව්‍යාපාරයක් ආරම්භ කරන්න විදේශීය ආයෝජකයෙකු ආවොත්, දේශීය වශයෙන් කර්මාන්තයක්, ව්‍යාපාරයක් ආරම්භ කරන්න ආයෝජකයෙකු හිතුවොත් අඩුම තරමින් අවුරුදු එකහමාරක්වත් යනවා, ඊට අදාළ අනුමත කර ගැනීමේ ක්‍රියාවලිය කර ගන්න. අනුමත කර ගැනීමේ ක්‍රියාවලියට අවුරුදු එකහමාරක් විතර ගත වෙනවා; රස්තියාදු වෙන්න සිදු වනවා. ඒ වාගේම අවශ්‍ය පහසුකම් නැහැ; සේවා පහසුකම් නැහැ. ඒ නිසා අපේ කාර්මික සංවර්ධන මණ්ඩලය මූලික වෙලා හැම පළාතකටම incubator මධ්‍යස්ථානයක්, සත්කාර සපයන මධ්‍යස්ථානයක් - centre එකක් - ආරම්භ කරන්න අපි තීරණය කරලා තිබෙනවා.

ඒ වාගේම, තරුණයින්ට, ව්‍යාවසායකයන්ට අලුත් ව්‍යාපාර - start-ups - ආරම්භ කිරීම වෙනුවෙන් start-up clusters හදන්න, හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම අඩුම තරමින් cluster එක බැගින් හදන්න අපි තීරණය කරලා තිබෙනවා. ජනතාව 15,000කට විතර අලුතින් රැකියා උත්පාදනය කරන clusters 331ක් අපි හඳුනා ගෙන තිබෙනවා. එය අද ඉන්දියාව, චීනය, වියට්නාමය, දකුණු කොරියාව ආදි රටවල නව ව්‍යවසායකයෝ බොහෝ සෙයින් ආර්ථිකයට කැඳවන ක්‍රියාවලියක් බවට පත් වෙලා තිබෙනවා. අපි ඒ දේවල් හදන්න ඕනෑ. හැබැයි, එහෙම දේවල් හදන්න ගියාට පසුව මතු වන ප්‍රශ්නයක් තිබෙනවා. මීට කලින් ප්‍රමුඛතාව දීලා තිබුණේ අනෙක් පැත්තට. මීට කලින් ප්‍රමුඛතාව දීලා තිබුණේ දූෂණයට, නාස්තියට, හොරකමට,

වංචාවට, පගාවට. ඒවාට තමයි මේ හැම දෙයක්ම යට වෙලා තිබුණේ. අද කිසිම ආයෝජකයෙකු ඇවිල්ලා දේශපාලන වශයෙන් අපේ මේ මන්ත්‍රීවරයෙකුට හෝ ඇමතිවරයෙකුට පගාව දෙන්න අවශ්‍ය නැහැ, තමන්ගේ ව්‍යාපෘතියක් අනුමත කරවා ගන්න. ඒ වෙනුවෙන් අපි ඊට වඩා විවෘත, විනිවිදභාවයක් හදලා තිබෙනවා. ජාතික තීරුබදු ප්‍රතිපත්ති කමිටුව පත් කිරීම කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා. ඒ ජාතික තීරු බදු ප්‍රතිපත්තිය ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවට ගෙන එන්න අපි තීරණය කරලා තිබෙනවා. පසුගිය අය වැය කථාවේදීත් ගරු ජනාධිපතිතුමා ඒ ගැන කිව්වා.

ගරු සභාපතිතුමනි, අපි අපනයන සංවර්ධන අමාත්‍ය සභාව - EDCM - පිහිටෙව්වා වාගේම, ආයෝජන පහසුකම් සැලසීමේ කමිටුව - Investment Facilitation Committee - ස්ථාපිත කරලා තිබෙනවා. ආයෝජන පහසුකම් සැලසීමේ කමිටුව මඟින් ආයෝජකයන්ට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙනවා. අපි කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාවට අදාළව ඉඩම් අක්කර 332ක් හඳුනා ගත්තා. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අපේ අමාත්‍යාංශය ඒකාබද්ධව නව ආයෝජන කලාපයක් අපි කන්කසන්තුරේ ආරම්භ කරනවා. කන්කසන්තුරේ වරාය ආශ්‍රිතව සහ යාපනයේ පලාලි ගුවන් තොටුපොළ ආශ්‍රිතව නව ආයෝජන කලාපයක් අපි ආරම්භ කරනවා.

අපි මාන්කුලම්වල අක්කර 200ක් හඳුනා ගත්තා. අපනයන ඉලක්ක කරගත්, ඒ වාගේම දේශීය නිෂ්පාදනවලට වැදගත් වන chemical industrial zone එකක් අපි පරන්තන්වල ආරම්භ කරනවා. මෙන්න මේ ආකාරයෙන් හඳුනාගත්, හැම පළාතකම කර්මාන්ත ප්‍රවර්ධනය කරන, ඒ වාගේම branding කරන, ඒකට අවශ්‍ය යටිතල පහසුකම් සලසන විශාල ව්‍යුහයන් ගණනාවක් එක අමාත්‍යාංශයක් යටතේ එක වර ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනක් අපි ආරම්භ කර තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ තමයි මේ අමාත්‍යාංශය හරහා ජාතික ආර්ථිකයට අපට දෙන්න පුළුවන් විශේෂ දායකත්වය. අප හුදෙකලාව වැඩ කරනවා වෙනුවට අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන සමඟ එකට වැඩ කරන ගමන් අනෙකුත් අමාත්‍යාංශ සියල්ල සමඟත් අපි එකට වැඩ කරනවා. මම පසුගිය දවසක වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා හමු වුණා. අපි වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හමු වුණා. අපි වෙළෙඳ අමාත්‍යාංශය සමඟත් එකට වැඩ කරනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය, වැවිලි අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය ආදී වශයෙන් ඒකාබද්ධ වෙච්ච වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරගෙන යනවා. අපේ අමාත්‍යාංශය පිළිබඳව ඔබතුමන්ලාට තිබෙන සාධනීය විවේචන ඉදිරිපත් කරන්න. ඒ සියලු විවේචන භාරගන්න ලෑස්තියි වාගේම අඩු පාඩු නිවැරදි කර ගන්නත් අපි ලෑස්තියි.

ගරු ඡේෂා විතානගේ මන්ත්‍රීතුමා ක්‍රීඩාව ගැන කියපු නිසාත්, මගේ නම සඳහන් කරපු නිසාත්, මාතර ඉදි කරන්නට යන ක්‍රීඩාංගණයක් ගැන කියපු නිසාත් මම අවසාන වශයෙන් ඒ පිළිබඳව කියන්න ඕනෑ. ගරු ඡේෂා විතානගේ මන්ත්‍රීතුමා දන්නවා, මේ පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය කථානායකවරයෙකු එම ධුරයේ කටයුතු කරද්දීම ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයා හැටියටත් සිටි බව. ඒ, තිලංග සුමතිපාල මහත්මයා. එතුමා මේ මූලාසනයේ අසුන් ගෙන හිටපු නිසා සමහරු හිතුවේ නැහැ එතුමාව Sri Lanka Cricket එකේ සභාපතිවරයා හැටියට COPE එකට කැඳවන්න පුළුවන් වෙයි කියලා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට මතක ඇති, එතුමා නියෝජ්‍ය කථානායකවරයා හැටියට සිටියදී COPE එකට කැඳෙව්වේ එම කාරක සභාවේ සභාපතිවරයා හැටියට මා බව. එතකොටත් ඔය කියන ෂම්මිලා, සුජීව ගොඩලියැද්දලා ආදි ඔක්කොම හිටියා. ඒගොල්ලන් කරපු කෙරුවාව මේ රට මුලින්ම සජීවීව දැනගත්තේ COPE එකේ අපි නිසා. එදා ඒගොල්ලන්ගේ සල්ලිවලට යට වුණේ නැති අපි, අද යට වෙන්නේත් නැහැ. ගරු මන්ත්‍රීතුමා; හෙට යට වෙන්නේත් නැහැ. ඒක බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. ඒගොල්ලන්ට නිලවරණ ප්‍රචාරක වාසියක් ගන්න පුළුවන්කම තිබෙනවා ඇති, එවැනි ඕනෑම දෙයක් කියමින්. හැබැයි, අපේ න්‍යාය පත්‍රය ඊට වඩා වෙනස්. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අන්දලා Cricket Aid කියලා life membership එක හදා ගත්තු වෙනම කොම්පැනියක් ඒගොල්ලන් පිහිටුවා ගත් බව ඔබතුමන්ලා දන්නවා. ඒ කාරණය පාර්ලිමේන්තුවට ගෙන ආවේ අපි. අපි ඒවා හෙළිදරව් කළා; ඒ Cricket Aid ආයතනය අහෝසි කළා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒක මතක ඇති. අපි එහෙමයි වැඩ කළේ. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. 2007දී තමයි පොල්ෙහේනට ක්‍රීඩා පුහුණු පාසලක් යෝජනා වුණේ. ඒක, ක්‍රිකට් පුහුණු පාසලක්. ඒක ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හැටියට හඳුන්වමින් එය නිලවරණයට ප්‍රචාරක වාසි ගන්න ඒගොල්ලන් යොදා ගත්තාට මට කරන්න දෙයක් නැහැ. අපි ඉල්ලන්නේ, දකුණු පළාතේ පාසල්වල, ක්‍රීඩා සමාජවල ක්‍රීඩකයන්ට ක්‍රිකට් පුහුණු වෙන්න පුහුණු ආයතනයක්. ඒකට ඉඩම වෙන් කරලා තිබුණේ 2007 ඉඳලායි. ගරු ඡේෂා විතානගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන හොයලා බලන්න.

ගාල්ලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය හදන්න යන කොට UNESCO එක එපා කිව්වා. ඒ, එය UNESCO සංරක්ෂිත ප්‍රදේශයක් හින්දා. UNESCO එක එපා කිව්වත්, ඒගොල්ලන් එක රැයින් තාප්ප ගහලා Galle International Cricket Stadium එක හදා ගත්තා. මට මතක හැටියට ඒ, 2011දී. ඒ ක්‍රීඩාංගණයට මහින්ද රාජපක්ෂ මහත්මයාගේ නම දමා ගත්තු හින්දා ඒගොල්ලෝ බය වුණා. අද්ත් හරියාකාරව match එකක් ගහන්න බැහැ ගාල්ලේ පිහිටි ඒ ක්‍රීඩාංගණයේ. සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය හැදුවා, හම්බන්තොට වරාය හදපු එකට තෑග්ගක් හැටියට; එහෙම නැත්නම්, අතුරු තෑග්ගක් හැටියට. එතැනත් හරියාකාරව match එකක් ගහන්න බැහැ. ඒක ගැනත් අපි COPE එකේදි කථා කළා. අන්තිමට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් තමයි ඒකේ වන්දිය ගෙව්වේ. මා හිතන විධියට, තවමත් ගෙවන්නේ එහෙමයි. සූරියවැව ක්‍රීඩාංගණයට අලියෙක්වත් එන්නේ නැහැ match ගහන්න. කල්පනා කරලා බලන්න. මම කෝප් කමිටුවට Sri Lanka Cricket එක කැඳවපු වෙලාවේ කිව්වා, "මේ ගොල්ලන් ගහලා නැත්තේ ක්‍රිකට් විතරයි" කියලා. ඒක ඔබතුමාට මතක ඇති. එදා එහෙම කියපු අපිම තමයි අදත් ඉන්නේ. ඔබතුමා දන්නවා, පසුගිය කාලයේ ආණ්ඩුවල හිටපු ඇමතිවරු ඔය ක්‍රීඩා සංගම්වල සභාපතිකම් ගන්න කොච්චර සල්ලි වියදම් කළා ද කියලා. අද අපේ ආණ්ඩුවේ කිසිම මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් කිසිම ක්‍රීඩා සංගමයක නැහැ. අපි ඒවායේ අද ඉන්නේත් නැහැ; හෙට ඉන්නේත් නැහැ. මේක තමයි ඇත්ත. ඒගොල්ලන් කෝටි ගණන් සල්ලි හොයපු ආයතන ඒවා.

ඒ කාලයේ පාර්ලිමේන්තුවේ ඇමතිවරුන් දෙන්නෙකු අතර - අර්ජුන රණතුංග මහත්මයායි, තිලංග සුමතිපාල මහත්මයායි අතර - තරගයක්, සටනක් තිබුණා. මතකයි නේද? දෙන්නා දෙපැත්තට පිල් මාරු වුණේ, පක්ෂ මාරු කළේ මොකටද? ඒගොල්ලන්ට ඇමතිකමට වඩා ලොකුයි Sri Lanka Cricket එකේ සභාපතිකම. ඒක තමන්ගේ බූදලයක් කරගෙනයි තිබුණේ. අපි එදාත් සල්ලිවලට විකිණිච්ච නැති මිනිස්සු, අදත් විකිණෙන්නේ නැති මිනිස්සු, හෙටත් විකිණෙන්නේ නැති මිනිස්සු. අපි ඒක සහතික කරනවා. අපි හැමදාම වගකීමෙන් ඒ වටිනාකම ආරක්ෂා කරනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is the Hon. Sajith Premadasa. You have ten minutes.

[පූ.භා. 11.43]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු සභාපතිතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැනත් විවාද වන මේ අවස්ථාවේ මම විශේෂයෙන් කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි, මේ රජය අපනයන සේවා කර්මාන්ත ක්ෂේත්‍රයට පනවා තිබෙන සියයට 15ක බද්ද ගැන.

මම පැහැදිලිව කියන්න කැමැතියි, අපනයන ප්‍රවර්ධනය කරනවාය කියන ප්‍රතිපත්තියට මේ බද්ද ඉතාම හානිදායක බව. විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ අපනයන ක්ෂේත්‍රයට ඒක ඍණාත්මකව බලපානවා. ඒත් අපට පෙනෙනවා අරුම පුදුම තත්ත්වයක්. රජය කියනවා, සියයට 15ක බද්දක් පනවනවා කියලා. ඇමතිතුමා කියනවා, ඒකට විරුද්ධයි කියලා. මම කියන්නේ එක ප්‍රතිපත්තියක ඉන්නට ඕනෑ කියලා. මොකක්ද ප්‍රතිපත්තිය? අපනයන සේවාවලට සියයට 15ක බද්දක් පැනවීමද ප්‍රතිපත්තිය? ඇමතිතුමා ඒකට පක්ෂපාතීද? රජයක් ඇතුළේ ඉඳගෙන ඉන් පිටත සම්මුඛ සාකච්ඡාවකට ගිහිල්ලා, "මම මේකට විරුද්ධයි, මේ බද්දෙන් ඍණාත්මක බලපෑමක් සිදු වන බව මම පිළිගන්නවා, මේක තාක්ෂණික ප්‍රවර්ධනයට අහිතකරයි" කිව්වාට හරියන්නේ නැහැ. ඒ වාගේම අපි තවත් අවස්ථාවක දැක්කා, ඒ සියයට 15ක බද්ද හරියට ජයග්‍රහණයක් ලැබූ දෙයක් හැටියට සැලකුවා. කොහොමද එය ජයග්‍රහණයක් හැටියට කිව්වේ? "අපට IMF එක කිව්වා, සියයට 30ක් පනවන්න කියලා. අපි කොහොම හරි කථා කරලා එය සියයට 15ට අඩු කර ගත්තා" කිව්වා. ගරු ඇමතිතුමනි, අපි පිළිගන්නවා IMF එකේ රාමුව තුළ වැඩ කළ යුතුයි කියලා. නමුත්, ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකට පුළුවන්ද විශේෂයෙන්ම අපේ අපනයන ක්ෂේත්‍රයේ බදු ප්‍රත්පත්තිය තීන්දු කරන්න? සියයට 30 ඉඳලා සියයට 15 දක්වා අඩු කර ගත්ත එක මහා සමත්කමක් ලු! ඒක මහා ඉහළ සාමර්ථයක් හැටියට තමයි මේ සාකච්ඡාවේදී රජය කරුණු ඉස්මතු කළේ. ගරු ඇමතිතුමනි, අපිත් විශ්වාස කරනවා මේ සියයට 15ක බද්දක් පැනවීම නිසා තොරතුරු තාක්ෂණ සේවා අපනයනය, ඩිජිටල් **සේවා** අපනයනය තුළින් හොඳ ආදායමක් ලබපු ව්‍යවසායකයන් විශාල ප්‍රමාණයක් අගතියට පත් වන බව. ඒ නිසා මේ සියයට 15 බද්ද පිළිබඳව අපේ දැඩි විරෝධය පළ කරනවා. එය වහා වෙනස් කර ගන්නට කටයුතු කරන්න කියලා ගරු අමාත්‍යතුමාට මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි ඇමෙරිකා එක්සත් ජනපදය ක්‍රියාත්මක කරන වෙළෙඳ බදු ප්‍රතිපත්තිය ගැන. මේ ප්‍රශ්නය මම විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සාකච්ඡාවට භාජන වනකොටත් කිව්වා. ඇත්තටම අපේ රටේ අපනයනවලට, ඒ වාගේම පොදුවේ ගත් කළ වෙළෙඳ ප්‍රතිපත්තියට බරපතළ අගතිගාමී තත්ත්වයක් නිර්මාණය වෙමින් පවතිනවා, ඇමෙරිකා එක්සත් ජනපදය ක්‍රියාත්මක කරන වෙළෙඳ බදු ප්‍රතිපත්තිය තුළ, tariff ප්‍රශ්නය තුළ. මේ tariff ප්‍රශ්නයට, විශේෂයෙන්ම ගෝලීය තීරු බදු -global tariffs- වැඩි වීමේ ප්‍රශ්නයට මේ රජය ඒකාබද්ධව කටයුතු කරන්නට ඕනෑ. විදේශ කටයුතු අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, ඒ වාගේම, මේ රටේ ආර්ථිකයට බලපාන සෑම අමාත්‍යාංශයක්ම මේ ගෝලීය අභියෝගයට මුහුණ දෙන්නට, ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ප්‍රතිපත්තියට මුහුණ දෙන්නට හොඳ සැලැස්මක් තිබෙන්නට ඕනෑ. ඔබතුමා බලාපොරොත්තු වන නිෂ්පාදන ආර්ථිකය, නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය, නිෂ්පාදන කර්මාන්ත හරහා අපේ රටට ධනය උත්පාදනය කිරීම, අපනයන කේන්ද්‍රීය කර්මාන්ත දියුණු කිරීම කියන ඉලක්ක කරා යන්නට පුළුවන්කමක් තිබෙනවාද ගෝලීය වෙළෙඳ යුද්ධයක් - global trade war එකක් - ක්‍රියාත්මක වනකොට? ඇත්ත වශයෙන්ම මේ තිබෙන්නේ global trade war එකක් විතරක් නොවෙයි, global tariff war එකක්. ඇමෙරිකාව tariff එකක් දමනකොට තවත් රටවල් දානවා; ඒකට ප්‍රතිචාරයක් හැටියට තවත් tariffs වැඩි වනවා. මේ මේ ආකාරයට සිදු වන ගෝලීය වෙළෙඳ බදු යුද්ධයට කොහොමද කර්මාන්ත අමාත්‍යාංශය හැටියට ඔබතුමන්ලා මුහුණ දෙන්නේ කියලා මේ අවස්ථාවේ පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

ඒ වාගේම, කනගාටුයි කියන්න, අපට පොදු මාතෘකා පිළිබඳව කථා කරන්න වෙන දා ලැබුණු, විශේෂයෙන්ම විවාදයක් ආරම්භ කරන්නට පෙර ලැබුණු නිදහස අද අහිමි වෙලා තිබෙනවා. අද භාෂණයේ නිදහස අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා මේ විෂයට ඍජුව සම්බන්ධ නොවුණත්, මේ කාරණාව මම මතු කරන්නට ඕනෑ. මොකද, ඊයේ පරිසර ක්ෂේත්‍රය පිළිබඳව අපි කථා කරනකොට, මේ සිද්ධිය අපට වාර්තා වෙලා තිබුණේ නැහැ. නමුත්, මේ සිද්ධිය අපේ සංචාරක කර්මාන්තයට, පරිසර ක්ෂේත්‍රයට ඍජුවම බලපානවා.

මේ රටේ වන අලි අතුරින්, විශේෂයෙන්ම ඇතුන් ඉතා ශීඝ්‍රයෙන් මරුමුවට පත් වෙනවා. ඒක මේ ආණ්ඩුවේ වරදක් නොවෙයි. පසු ගිය කාලය පුරාවටම ඒක සිද්ධ වෙලා තිබෙනවා. දැන් අපට ආරංචි වුණා, ඊයේ මීන්නේරිය කවුඩුල්ල ප්‍රදේශයේ "යුනිකෝන්" කියලා නම් කරලා තිබෙන ඇතා ඝාතනය කරලා තිබුණා, මරලා දමලා තිබුණා කියලා. අපේ රටේ ආසියාතික අලියාගේ, පිරිමි අලියාගේ තමයි දළ එන්නේ. දැරණියගල මැතිතුමා කරලා තිබෙන සමීක්ෂණවලට අනුව අපි අහලා තිබෙන්නේ, පිරිමි අලි ගහනයෙන් සියයට 11ක් දළ ඇතුන් ඉන්නවා කියලා තමයි. නමුත්, අද බොහෝ විශේෂඥයන් කියනවා, ඒක සියයට 7ට අඩු වෙලා තිබෙනවා කියලා. මම පෙන්වන්න කැමැතියි, ඒ තනි දළ ඇතා ඝාතනය කළ පසු ගත් ඡායාරූප හා මීන්නේරිය කවුඩුල්ල ප්‍රදේශයේ ඒ දළ ඇතා ජීවතුන් අතර සිටින කාලයේ ගත් ඡායාරූප. මම ඒ ඡායාරූප **සභාගත*** කරනවා.

විශේෂයෙන්ම අපේ රටේ ඇත් සම්පත ආරක්ෂා කර ගන්නට, අපි මීට වැඩිය විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. මේ ඇත් පරපුර සිටින වනජීවී බලප්‍රදේශ, ප්‍රේරණ කලාපීය බලප්‍රදේශ සහ ඒ ඇතුන් හඳුනා ගැනීමේ වැඩ පිළිවෙළ පරිසරවේදීන්, පරිසර විශේෂඥයන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. කලා වැව ආශ්‍රිතව, කහල්ල පල්ලේකැලේ, යාල, කුමන, විල්පත්තු, උඩවලව, වස්ගමුව, සෝමාවතිය යනාදී වනජීවී බලප්‍රදේශවල සිටින ඇත් සම්පත ආරක්ෂා කර ගැනීම සඳහා අපට වෙන විකල්පයක් නැහැ. ඒ සඳහා අපි GPS collars, එහෙමත් නැත්නම් GPS කරපටි පාවිච්චි කිරීමේ වැඩසටහනකට අනිවාර්යයෙන්ම යා යුතුයි. ඒ නිසා ඒ පිළිබඳව රජයේ අවධානය යොමු කරලා, GPS tracking system එක හරහා මේ රටේ ඇත් පරපුර ආරක්ෂා කර ගන්න වැඩසටහනට ප්‍රවේශ වන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාට ඍජුවම බලපාන කාරණාවක් මම දැන් ඉදිරිපත් කරන්නට යනවා. මම උදේ වරුවේත් මේ කාරණාව මතු කළා. මම කනගාටුවට පත්

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

වෙනවා. අපේ උගත්, බුද්ධිමත්, ආචාර්යවරියක වන අග්‍රාමාත්‍යවරියත් මේ උපාධිධාරීන් 35,000කගේ රැකියා ගැටලුව, ශරීර ලක්ෂණවලට සීමා කිරීම ගැන මම ඇත්තවශයෙන්ම කනගාටු වෙනවා. ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා දන්නවා, ඔබතුමා තමයි පුරෝගාමීව කටයුතු කළේ, රට වටේම ගිහිල්ලා උපාධිධාරීන්ට රැකී රක්ෂා ලබා දෙනවා කියන වැඩසටහන ගැන. මම පිළිගන්නවා, ඒක විධිමත්ව සිදු විය යුතු බව. නමුත්, ගරු ඇමතිතුමනි, ඔබතුමා බලන්න, පොල්දූව හන්දියේ ඒ දූ දරුවන්, ඒ සහෝදර සහෝදරියන් උද්ඝෝෂණයක යෙදී සිටිනවා. ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ බලාපොරොත්තු කඩ වෙලා තිබෙනවා; දැඩි කනගාටුවට පත් වෙලා තිබෙනවා. ඔබතුමා තමයි, රටේ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකී රක්ෂා ලබා දීමේ වැඩසටහන, අනිවාර්යයෙන්ම, අවස්ථාව ලැබුණු පළමුවන මොහොතේම ක්‍රියාත්මක කරනවා කියලා කිව්වේ. ඒක ඔබතුමාගේ වචනයෙන්ම කියලා තිබෙනවා. ඒක ගැන තර්ක කරන්න දෙයක් නැහැ. ඒ ගැන වීඩියෝපට ඔක්කොම තිබෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. මම ඔබතුමාට කියන්නේ, කරුණාකරලා ඒ ප්‍රශ්නයට විහිළු සපයන්නේ නැතුව, විධිමත් විසඳුමක් ලබා දෙන්නට කටයුතු කරන්න කියලායි.

අපිට හේතුවක් හැටියට කියලා තිබෙනවා, "නඩුවක් තිබෙනවා, ඒ නඩුව නිසා රැකී රක්ෂා ලබා දීමේ විධිමත් වැඩසටහන ක්‍රියාත්මක කරන්නට අපහසුතාවක් තිබෙනවා" කියලා. මේ උත්තරයම තමයි පසුගිය රජයත් කිව්වේ. හැබැයි මැතිවරණ වේදිකාවේදී එහෙම කිව්වේ නැහැ නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරනකොට එහෙම කිව්වේ නැහැ නේ. ඔබතුමා පැහැදිලිව කිව්වා, ඒ අය වෙනුවෙන් විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරනවාය කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරනවා. උපාධිධාරීන් 35,000කට රැකී රක්ෂා ලබා දීමේ පළමු පියවරක් කියලා එකක් සුපුරුදු පරිදි තිබුණා. ඒක ඔබතුමා දන්නවා. යම් චේතනයක් සහිතව ඒ අයව බඳවා ගැනීමේ මූලික ක්‍රියාදාමය ඉෂ්ට සිද්ධ කරන්න. ඒ දේ ඉෂ්ට සිද්ධ කරන්නට ඔබතුමන්ලා කටයුතු කරන්න. අඩුම තරමින් ඒ පියවරවත් තබන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sajith Premadasa, you have exhausted the time allotted to you.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, please give me one more minute.

අඩුම ගණනේ ඒ පියවරවත් තබලා මේ ක්‍රියාවලිය ආරම්භ කරන්න. මොකද, උපාධිධාරීන් 35,000ක් මහ පාරට දාලා ඒ තුළින් දේශපාලන ජයග්‍රහණ ලබාගන්න කටයුතු කිරීමෙන් අපි සතුටක් ලබන්නේ නැහැ. අපට අවශ්‍ය වන්නේ, ඔබතුමන්ලා පොරොන්දු වුණු ආකාරයට ඒ ප්‍රතිපත්තිමය යෝජනාව ක්‍රියාවට නැංවීමයි. කරුණාකරලා ඒ දේ සිද්ධ කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sunil Kumara Gamage. You have seven minutes.

[ප.භා. 11.55]

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු සභාපතිතුමනි, අද දින තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙනුත් කථා කරන මේ විවාදයේ මට ලැබුණු කෙටි වෙලාව තුළදී මූලික කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය, ජාතික තරුණ සේවා සභාව වාගේ ආයතනත් එක්ක අපේ අමාත්‍යාංශයට ආයතන 9ක් ඇතුළත් වෙනවා. මේ ආයතන සියල්ල ගත්තාම, මේවා ඇතුළේ අපේ අරමුණ වෙලා තිබෙන්නේ පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගොඩනඟන්න මේ ආයතන ටික දායක කරගන්නේ කොහොමද කියන එකයි. "ලස්සන ජීවිතයක්" කියන කාරණයේදී මෙන්න මේ ක්‍රීඩාව සහ තාරුණ්‍යය කියන කාරණා දෙක අපිට අතිශය වැදගත් බව අපි දන්නවා. අපේ අමාත්‍යාංශය ඇතුළේ අපි බලාපොරොත්තු වෙන්නේ, ක්‍රීඩාව සහ තාරුණ්‍යය හරහා අපේ රජය; අපි බලාපොරොත්තු වෙන ලස්සන ජීවිතය ගොඩනැඟීමේ වැඩ පිළිවෙළ මෙහෙයවන්නයි. ක්‍රීඩාව තුළින් ජවසම්පන්න පුරවැසියෙක් සහ ජයග්‍රාහී ජනතාවක් ගොඩනඟන්නේ කොහොමද කියන කාරණය තමයි අරමුණක් විධියට අපි පැහැදිලි කරගෙන තිබෙන්නේ.

දශක ගණනක් පැරදිච්ච ජනතාවක් ජයග්‍රාහී ජනතාවක් බවට පත් කිරීමේ වගකීම අපේ දෙවුර මත පැටවී තිබෙන බව අපි දන්නවා. ඒ වගකීම අපේ අමාත්‍යාංශය හරහා ඉෂ්ට කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, දියුණු සංස්කෘතියක් සහිත නිවහල් චින්තනයකින් හෙබි තෘප්තිමත් තාරුණ්‍යයක් නිර්මාණය කිරීමත් අපේ අමාත්‍යාංශයේ වගකීමක්. මොකද, අපේ තරුණයන්ට දියුණු සංස්කෘතියක් වාගේම නිවහල් චින්තනයකුත් අවශ්‍යයි. ඒක ගොඩනැඟීමේ වගකීම අපේ අමාත්‍යාංශය සතුව තිබෙනවා. මෙන්න මේ අරමුණ ඉෂ්ට කරගන්න අපිට මේ අය වැය පාවිච්චි කිරීම -භාවිත කිරීම- සඳහා මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව මේ අය වැයෙන් අපේ අමාත්‍යාංශයට පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 7,100කුත්, ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 5,500කුත් වෙන් කරලා තිබෙනවා. ඒක වෙනත් විධියකින් කිව්වොත්, අපේ රටේ ක්‍රීඩා සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 8,486කුත්, තරුණ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 4,114කුත් අපි අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. පසුගිය වසරවල අය වැයවලින් වෙන් කළ මුදල ඇත්තටම වියදම් කරලා නැහැ. ගොඩක් ආයතනවලට එහෙම වියදම් කරගන්න බැරි වෙනවා. මොකද, මහා භාණ්ඩාගාරයට ගියාම අය වැය කථාවේ කියන කථාව ප්‍රායෝගිකව ඉෂ්ට කරන්න හම්බ වෙන්නේ නැහැ. ගොඩක් වෙලාවට පසුගිය ආණ්ඩුවල නිබ්බිච්ච අය වැය කථා, කථාම විතරයි. හැබැයි අපේ අය වැය තුළ අපි වෙන් කරන මුදල් හරියටම වියදම් කරලා ඒ වැඩ ටික කරන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.

ඉතින්, මේ අය වැයෙන් වෙන් කරන මුදල අපි යථාර්ථයක් බවට පත් කරනවා. මොකද, ගිය අවුරුද්දේ අපේ අමාත්‍යාංශයට ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරන ලද මුදලින් සියයට 50ක් විතර තමයි ඇත්තටම වියදම් කරලා තිබෙන්නේ.

මේ අය වැය ක්‍රියාත්මක කිරීමේදී අපි බලාපොරොත්තු වෙන වැඩසටහන් ගණනාවක් තිබෙනවා. ඒ වැඩසටහන් ගැන කියන

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

කොට, අපි පසුගිය මාස කිහිපයේ මොනවාද කළේ කියන සාකච්ඡාවත් මේ වෙලාවේදී මතු කරන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. මේ මාස තුන තුළ අපි විශාල පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. මොකද අපි හැමෝම දන්නවා, අපේ රටේ හැම ක්ෂේත්‍රයක්ම විශාල බාදනයකට, විශාල අර්බුද ගණනාවකට ලක් වෙච්ච system එකක් ඇතුළේ තිබෙන බව. මේවා පසුගිය පාලනයන් සහ ඒ ක්‍රමවේද ඇතුළේ නිර්මාණය වෙච්ච දේවල්. ඒවා වෙනස් කරන්න; ඒවා ජනතාවට අවශ්‍ය විධියට වෙනස් කරන්න තමයි අපි අපේ පාලනය නිර්මාණය කර ගත්තේ. අපි ඒ වගකීම මේ මොහොතේ ඉෂ්ට කරමින් ඉන්නවා.

ක්‍රීඩාව සම්බන්ධයෙන් ගත්තොත්, බොහෝ අය මතු කරන කාරණයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙත් පැහැදිලිව සඳහන් කළා, ජාතික ක්‍රීඩා පනත වෙනස් කරනවා කියලා. ජාතික ක්‍රීඩා පනත වෙනස් කිරීමේ කාර්යය මේ වෙනකොට බොහෝදුරට අවසන් කරමින් තිබෙනවා. මොකද, ඒක සරල කාරණයක් නොවෙයි. මන්ත්‍රීවරු මතු කරනවා වාගේ අපට දවසකින් දෙකකින් කරන්න පුළුවන් කටයුත්තක් නොවෙයි, ඒක. අපි ක්‍රීඩා 73ක් ඉලක්ක කරගෙන තමයි මේ ක්‍රීඩා පනත හදන්නේ. පුද්ගලයෙක්, එහෙම නැත්නම් කණ්ඩායමක් ඉලක්ක කරගෙන රටක ප්‍රතිපත්තියක්, පනතක් හදන්න බැහැ. නමුත් ඒ සියල්ල ආවරණය වෙන ආකාරයට අපි අපේ ක්‍රීඩා පනත නිර්මාණය කර ගන්නවා. විශේෂයෙන්ම ජේෂ්ඨ විතානගේ මන්ත්‍රීතුමා මතු කරපු කාරණා සියල්ල, කාරණාවෙන් කාරණාව - එකින් එක- පැහැදිලි කරනවාට වඩා ඒ සියල්ලම අපි එක පනතකින් වෙනස් කරන්න බලාපොරොත්තු වෙන බව සඳහන් කරනවා. මොකද, අපට පුද්ගල ප්‍රශ්නයක් නැහැ. අපට කණ්ඩායම් ප්‍රශ්නයක් නැහැ. අපට තිබෙන්නේ ක්‍රීඩාවේ ප්‍රශ්නය. අපි දියුණු කරන්නේ ක්‍රීඩාව. එතැන ඉන්නේ කවුද, නැත්තේ කවුද කියන එක අපට අදාළ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ක්‍රීඩා රෙගුලාසි ඇතුළත් ගැසට් පත්‍රයක් නිකුත් කරනවා කියලා ඔබතුමාට කියන්න කැමැතියි. මම කලිනුත් කිව්වා, අපට ඒකේ නීතිමය කාරණා කිහිපයක් බේරා ගන්න, සාකච්ඡා කරන්න තිබුණු බව. මොකද, අපි මේක ඉදිරිපත් කරන්නේ ක්‍රීඩා සංගම් 73කට අදාළව. එක සංගමයකට අදාළව නොවෙයි. ඉතින් අපි දැන් ඒ කටයුත්ත අවසන් කරලා තිබෙනවා. අපි ඒක ඉදිරිපත් කරනවා.

ඊළඟට, ඔබතුමාගෙන් නොකියැවුණු කාරණා කිහිපයකුත් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. අපි මේ වෙනකොටත් ජාතික ඔලිම්පික් කමිටුවේ ගැටලුව සම්බන්ධයෙන් මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම කිසිදු ඇමතිවරයෙක් මැදිහත් නොවුණු ගැටලුවලට පවා මම මැදිහත් වෙලා, මේ වෙනකොට ඒවා සම්බන්ධයෙන් තීරණ අරගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒවා අමතක වීම ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේම මේ වැඩ කිරීම ඇතුළේ දැනටමත් මට නඩු කිහිපයක් ඇවිත් තිබෙනවා. මම ආසයි, ඒවාට. අපි වැඩ කරනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ තිබෙන අර්බුද, මේ තිබෙන ප්‍රශ්න නීත්‍යානුකූලව ඒ අවශ්‍ය පනත් සහ ඒ රෙගුලාසි හරහා වෙනස් කර ගන්න. ඒක අපි අනිවාර්යයෙන්ම කරනවා. අපි ඒ සඳහා වැඩකටයුතු කරලා තිබෙනවා. ඒ ගැනත් මතක් කරමින්, මම කථා කරන ඊළඟ අවස්ථාවේදී අපේ වැඩකටයුතු ගැන සාකච්ඡා කරන්න මම බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)

Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have nine minutes.

[பி.ப. 12.03]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

மாண்புமிகு தவிசாளர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான பாதீட்டின்மீதான விவாதத்தில் கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு தொடர்பாக எனது கருத்துக்களை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன்.

இன்று உலக பொருளாதாரத்தை விவசாயத் துறை, கைத்தொழில் துறை, சேவைகள் துறை எனப் பிரித்துப் பார்க்கலாம். பொருளியல் அறிஞரான டேவிட் ரிக்காடோ தனது ஒப்பீட்டு நன்மைக் கோட்பாட்டின்படி, உலகிலுள்ள நாடுகள் குறைந்த உற்பத்திச் செலவுடன் சிறப்பாக உற்பத்தி செய்யக்கூடிய துறைகளில் தத்தமது வளங்களை ஒதுக்கீடு செய்வதன்மூலம் குறித்த உற்பத்தியில் சிறப்புத் தேர்ச்சியடைவதோடு, அதனைக் கட்டற்ற சந்தையில் பிற நாடுகளுடன் பரிமாற்றம் செய்வதன்மூலம் இரு பகுதியினரும் நன்மையடைய முடியுமெனக் கூறினார். இந்த அடிப்படையில், சில நாடுகள் விவசாய உற்பத்திகளை மேற்கொள்ளும் நாடுகளாகவும் இன்னும் சில நாடுகள் கைத்தொழில் உற்பத்திகளை மேற்கொள்ளுகின்ற நாடுகளாகவும் மாறிவிட்டன. விவசாய உற்பத்திகளுக்கான விலைசார் கேள்வி நெகிழ்ச்சி குறைவாகவும், கைத்தொழில் உற்பத்திகளுக்கான விலைசார் கேள்வி நெகிழ்ச்சி அதிகமாகவும் உள்ளது. இதனால் ஒப்பீட்டு நன்மைக் கோட்பாட்டின் அடிப்படையில் கைத்தொழில் உற்பத்திகளை மேற்கொண்ட நாடுகள் அபிவிருத்தியடைந்த நாடுகளாக மாறிவிட்டன. விவசாய உற்பத்திகளை முதன்மையாகக் கொண்ட நாடுகள் குறை அபிவிருத்தி கொண்ட நாடுகளாக மாறிவிட்டன. எனவே, நாமும் கைத்தொழிற்றுறையை முதன்மையாகக் கொண்ட நாடாக மாறவேண்டிய கட்டாயத்தில் இருக்கின்றோம்.

இந்தச் சூழலில், இந்த அரசால் முன்வைக்கப்பட்டுள்ள பாதீட்டில் கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சுக்கு மீண்டெழும் செலவுக்காக கிட்டத்தட்ட 4.8 பில்லியன் ரூபாயும், மூலதனச் செலவுக்காக 8.6 பில்லியன் ரூபாவுமாக மொத்தமாக 13.4 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இது கடந்த ஆண்டைவிட 3.9 பில்லியன் ரூபாய் அதிகமானதாகும்; இது வரவேற்கத்தக்கது. எனினும், இந்த ஒதுக்கம் கைத்தொழிற்றுறையை மேம்படுத்த வேண்டுமென்று நினைக்கின்ற நாட்டுக்குப் போதுமானதல்ல. எடுத்துக்காட்டாக, அழிவடைந்து செயற்பட முடியாத நிலையில் காணப்படும் திருகோணமலை மாவட்டத்தில் அமைந்துள்ள கந்தளாய் சீனி ஆலையை மறுசீரமைப்பதற்கு இந்தப் பாதீட்டில் 26 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இந்த ஒதுக்கீட்டைப் பத்து மடங்காக அதிகரித்தால்கூட இந்த சீனி ஆலையை மீளச் செயற்படுத்த முடியாத நிலை காணப்படுகின்றது என்பதை இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன். எனவே, ஒதுக்கீடுகள் அதிகரிக்கப்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். பொருளாதாரத்தில் கைத்தொழிற்றுறையின் பங்கை அதிகரிக்கவேண்டுமானால் அதிலுள்ள சவால்கள், வாய்ப்புக்கள் பற்றி நாங்கள் விவாதிப்பது அவசியம். மேலும், உலகின் பிறநாடுகளின் வெற்றிகரமான நடைமுறைகளிலிருந்து பாடங்களைக் கற்றுக் கொண்டு, இலங்கைக்கான நடைமுறைத் தீர்வினை முன்வைக்க வேண்டும்.

கைத்தொழில் மற்றும் தொழில்முனைவோரது அபிவிருத்திக்காக தென்கொரியா, ஜேர்மனி முதலிய நாடுகள் தங்கள் பாதீட்டில் 5 முதல் 7 சதவீதமான தொகையை ஒதுக்குகின்றன. இந்த நாடுகள் ஆராய்ச்சி மற்றும் மேம்பாடு, தொழில்நுட்ப ஏற்பு, சிறிய மற்றும் நடுத்தர தொழில்களுக்கான ஆதரவை வழங்குதல் என்பவற்றை முன்னுரிமையாகக் கொண்டுள்ளன. இதன்மூலம் அவை உலகளவில் போட்டித்திறன்மிக்க நாடுகளாக உயர்ந்துள்ளன. இதற்கு மாறாக, இலங்கையில் இத்துறைக்கான ஒதுக்கீடு பாதீட்டில் 0.3 சதவீதமாக உள்ளது. இந்தக் குறைந்த ஒதுக்கீடானது, உலகளவில் போட்டியிடும் நமது திறனைக் குறைத்து, உள்நாட்டுத் தொழில்களின் வளர்ச்சியைத் தடுக்கிறது.

மேலும், இந்தியா மற்றும் வியட்நாம் முதலிய நாடுகள் எண்ம மயமாக்கல், பசுமை ஆற்றல் மற்றும் ஏற்றுமதி சார்ந்த உற்பத்தித் துறையில் புரட்சிகளைத் தொடங்கியுள்ளன. இந்தப் புரட்சிகள் அவர்களது பொருளாதாரத்தை மாற்றியமைத்துப் பெருமளவான வேலைவாய்ப்புகளை உருவாக்கியுள்ளதோடு, வெளிநாட்டு முதலீடுகளையும் ஈர்த்துள்ளன.

இலங்கையில், கைத்தொழில் மற்றும் தொழில்முனைவோர் துறை பின்வரும் சவால்களை எதிர்கொள்கிறது:

1. நிதி அணுகல் இன்மை: குறிப்பாக, தொழில் முனைவோர் கிராமப்புறங்களில் தொழில் தொடங்க அல்லது விரிவாக்க கடன் அல்லது நிதியுதவி பெறுவதில் சிரமப்படுகின்றனர்.

2. பழைய தொழில்நுட்பம்: நமது தொழில்கள் பழைய இயந்திரங்கள் மற்றும் செயல்முறைகளை நம்பியுள்ளன. இது உற்பத்தித் திறனைக் குறைக்கிறது.

3. ஏற்றுமதி மாறுபாடு இன்மை: தேயிலை மற்றும் ஆடை போன்ற பாரம்பரிய ஏற்றுமதிகளை நாம் மட்டுமே நம்பியிருப்பது, உலகச் சந்தையின் ஏற்ற, இறக்கங்களுக்கு நம்மைப் பாதிப்படைய வைக்கிறது.

4. வினைத்திறன்மிக்க தொழிலாளர் பற்றாக்குறை: கல்வி நிறுவனங்களில் கற்பிக்கப்படும் திறன்களுக்கும் நவீன தொழில்களின் தேவைகளுக்கும் இடையே பாரியதோர் இடைவெளி உள்ளது.

இந்தச் சவால்களைச் சமாளிக்கப் பின்வரும் நடவடிக்கைகளை மேற்கொள்ளலாம்:

கைத்தொழில் மற்றும் தொழில்முனைவோர் அபிவிருத்திக்காகப் பாதீட்டில் குறைந்தது ஐந்து சதவீதமான நிதி ஒதுக்கப்பட வேண்டும். இந்த நிதியானது ஆராய்ச்சி மற்றும் மேம்பாடு, தொழில்நுட்ப மேம்பாடு, சிறிய மற்றும் நடுத்தர தொழில்களின் ஆதரவுக்காகப் பயன்படுத்தப்பட வேண்டும். எடுத்துக்காட்டாகப் பின்வரும் விடயங்களைக் குறிப்பிடலாம்:

1. எண்ம மயமாக்கல்: இந்தியாவின் 'டிஜிட்டல் இந்தியா' திட்டத்தைப்போல தொழில்களை நவீனமயமாக்கி, திறனை மேம்படுத்த வேண்டும்.

2. பசுமை ஆற்றல்: புதுப்பிக்கத்தக்க ஆற்றல் தொழில் நுட்பங்களில் முதலீடு செய்வதன்மூலம் உற்பத்திச் செலவைக் குறைத்து, உலகளாவிய நிலைத்தன்மைப் போக்குகளுடன் இணைய வேண்டும்.

3. ஏற்றுமதி மாறுபாடு: தகவல் தொழில்நுட்ப சேவைகள், மருந்து உற்பத்தி மற்றும் வேளாண்மை சார்ந்த உற்பத்திகள் முதலிய உயர் மதிப்புள்ள தொழில்களை ஊக்குவிக்க வேண்டும்.

4. நிதி அணுகலை மேம்படுத்தல்: இதற்காக தொடக்க நிறுவனங்கள், சிறிய மற்றும் நடுத்தர தொழில்களுக்கு ஒரு தனி நிதியை உருவாக்க வேண்டும்; குறைந்த வட்டிக் கடன்கள் மற்றும் நிதியுதவிகளை வழங்க வேண்டும்; பன்னாட்டு நிதி நிறுவனங்களுடன் கூட்டுச் சேர்ந்து தொழில்நுட்ப மற்றும் நிதியுதவிகளை வழங்க வேண்டும்.

5. திறன் மேம்பாடு: இதன்பொருட்டுப் பல்கலைக்கழகங்கள் மற்றும் தொழிற்கல்வி நடுவங்களோடு இணைந்து தொழில் சார்ந்த பாடத்திட்டங்களை வடிவமைக்க வேண்டும்; கல்வி மற்றும் வேலைவாய்ப்புக்கு இடையேயான இடைவெளியைக் குறைப்பதற்கான பயிற்சித் திட்டங்களைத் தொடங்க வேண்டும்.

6. பொது - தனியார் கூட்டு முயற்சிகள்: அரசாங்கம் மற்றும் தனியார் துறையிடையே கூட்டுமுயற்சிகளை ஊக்குவிக்க வேண்டும். இது முதன்மையான தொழில்களில் புதுமையை ஊக்குவிக்கும்.

அடுத்து, அரச தொழில் முயற்சிகளை எடுத்துக் கொள்வோமானால், இவை நாட்டின் சமூக, பொருளாதார முன்னேற்றத்தில் முதன்மையான பங்கு வகிக்கின்றன. எடுத்துக்காட்டாக, வளரும் நாடுகளில் அரசின் கட்டுப்பாட்டிலுள்ள நிறுவனங்கள் வேலைவாய்ப்புகளை உருவாக்கல், வறுமை ஒழிப்பு மற்றும் நிதி உறுதித்தன்மை ஆகியவற்றில் முக்கிய பங்காற்றுகின்றன. இலங்கையில் அரச நிறுவனங்கள், இரண்டாம் உலகப் போர் காலத்தில் இன்றியமையாத பொருட்களை வழங்கும் நோக்குடன் உருவாக்கப்பட்டன. நம் நாட்டில் அரசுக்குச் சொந்தமான 527 பொதுத்துறை நிறுவனங்கள் உள்ளன. முறையற்ற அரசியல் நியமனங்கள், அதன் விளைவான வினைத்திறனற்ற மேலாண்மை, அளவுக்கு அதிகமான ஊழியர் நியமனங்கள், தேவையற்ற செலவுகள், ஊழல், நடைமுறைக்கு ஏற்ற மறுசீரமைப்பு இன்மை முதலிய காரணங்களால் இப்பொதுத்துறை முயற்சிகள் நட்டத்தில் இயங்குகின்றன. அரசு மற்றும் தனியார் பங்குடைமை முயற்சிகளை உருவாக்குதல், சரியான அளவில் மறுசீரமைப்புச் செய்தல், கூட்டுறவு மேலாண்மையை ஊக்குவித்தல், எண்ம மயமாக்கல், தேவையற்ற செலவுகளைக் குறைத்தல், தொடர்ச்சியான கணக்காய்வு மற்றும் கண்காணிப்புகள் முதலியவற்றின்மூலம் இச்சிக்கல்களுக்குத் தீர்வு காணலாம்.

தெற்காசியாவில், புத்தாக்கம் மற்றும் தொழில்முயற்சி களுக்கான அமைவிட நிலையமாக மாறுவதற்கு இலங்கைக்குச் சிறப்பான ஆற்றல் உள்ளது. பிற நாடுகளின் வெற்றிகளிலிருந்து பாடங்களைக் கற்றுக்கொண்டு, நமது குறைபாடுகளைச் சரிசெய்வதன்மூலம் வேலைவாய்ப்பை உருவாக்கும், ஏற்றுமதியை அதிகரிக்கும் மற்றும் பொருளாதார வளர்ச்சியை ஊக்குவிக்கும் ஒரு துடிப்பான தொழிற்றுறையை உருவாக்க முடியும். கைத்தொழில் மற்றும் தொழில்முனைவோர் வளர்ச்சி என்பது பொருளாதார வளர்ச்சி மட்டுமல்ல, இது நமது நாட்டு மக்களுக்கு, குறிப்பாக நமது இளைஞர்களுக்கு பெரிய கனவுகளைக் காணவும் அவர்களின் வேட்கைகளை அடையவும் வாய்ப்பளிக்கும்.

இறுதியாக, இந்த முன்மொழிவுகளைச் செயல்படுத்துவதில் துணிச்சலான நடவடிக்கைகளை எடுக்குமாறு கௌரவ கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்டுக் கொள்கிறேன். செழிப்பானதும் புதுமையானதும் உலகளாவிய போட்டித்தன்மை

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

கொண்டதுமான இலங்கையைக் கட்டியெழுப்ப நாம் அனைவரும் ஒன்றிணைந்து செயற்படுவோம் எனக் கூறிக்கொண்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Roshan Akmeemana. You have eight minutes.

[අ.භා. 12.11]

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි.

අද දිනයේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් කථා කරන නිසා මට ලැබී තිබෙන කාලය තුළ මගේ විශේෂ අවධානය යොමු වන්නේ අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් යම් අදහසක් පළ කරන්නයි. වර්තමානයේ අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර තලයේදී අත් කරගෙන තිබෙන යම් පසුබෑම් සහගත ස්වභාවය සම්බන්ධයෙන් සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳව ඉදිරිපත් වෙලා තිබෙන විවේචනාත්මක කරුණු කාරණා සම්බන්ධයෙන් අදහස් දැක්වීම වෙනුවට මම කැමැතියි, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් යම් වෙනස් මානයක අදහස් දැක්වීමක් කරන්න. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වයස අවුරුදු 15න් පහළ, 17න් පහළ සහ 19න් පහළ දිස්ත්‍රික් ක්‍රිකට් කණ්ඩායම්වල හිටපු නායකයෙකු විධියටත්, වර්තමානයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රධාන පෙළේ ක්‍රීඩා සමාජයකට ක්‍රීඩා කරන ක්‍රිකට් ක්‍රීඩකයෙකු විධියටත් මට තිබෙන අත්දැකීම් අනුව ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් මෙවැනි අදහසක් පළ කිරීම සුදුසු යැයි මා හිතුවා.

ගරු සභාපතිතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව අපේ රටට දායාද වුණේ යටත් විජිත උරුමයක් විධියටයි. ඒ අර්ථයෙන් එය ස්වභාවයෙන්ම ප්‍රභූ පෙළැන්තියට අයත්, ප්‍රභූ පෙළැන්තිය විසින් කරපු ක්‍රීඩාවක්. නමුත් ඉතිහාසය කවදාවත් ඍජු රේඛාවක් ලෙස ගමන් කරලා නැහැ. අරවින්ද ද සිල්වා මහතාට salute එකක් ගහන ගමන්, මම 1996 වසර මතක් කරන්න කැමැතියි. 1996දී අපි ලබා ගත්තේ නිකම්ම නිකම් ක්‍රීඩා ජයග්‍රහණයක් නොවෙයි. එය, පරිධියේ සිටි රටක් මධ්‍ය ලක්ෂ්‍යය දක්වා පැමිණීමක්. එය අතික්‍රමණයක් ලෙස හඳුන්වන්න පුළුවන්.

ඒත් එක්කම මට තවත් කාරණයක් මතක් වෙනවා. මේ වෙලාවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව යම් අරගළයක්, කැරැල්ලක් ලෙසින් ඉදිරිපත් වෙලා තිබෙනවා. ක්‍රිකට් කියන්නේ අපට එක්තරා ආකාරයකින් කැරැල්ලක්, අරගළයක් වාගේම ජාතික අනන්‍යතාවේ ප්‍රකාශනයක්. විමෝක්ෂා බාලසූරිය කියන ක්‍රීඩිකාව මේ වන විට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ 19න් පහළ කාන්තා ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරමින් ඉන්නවා. ඇය වයස අවුරුදු 17ක තරුණියක්. ඒ වාගේම කන්තලේ ප්‍රදේශයේ මිතලි අයෝධ්‍යා ක්‍රීඩිකාව ජාතික කණ්ඩායමේ දොරට තට්ටු කරමින් ඉන්නවා. ඇය 19න් පහළ ක්‍රීඩිකාවක්. ක්‍රිකට් ක්‍රීඩාව අපේ රටේ යටත් විජිත උරුමයක් වුණාට, මේ වන විට කොළඹ දිස්ත්‍රික්කයේ දුවිලි පිරුණු මාර්ගවල සිට, ඒවායේ සිටින දරුවන් ග්‍රාමීය වෙල් ඉපනැල්ලේ රබර් සෙරෙප්පු දෙකක් දමාගෙන, ගෙවී ගිය පිත්තකින් ක්‍රීඩා කරන තරුණ තරුණියන් එක්ක ගත්තාම, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ අරගළයක්, එහෙම නැත්නම් කැරැල්ලක්. ඒ, ඇයි? බෙදී වෙන් වූ අපේ සමාජය එකට එකතු කරන උපකරණයක් ලෙසත්, වර්තමානයේ අපේ රටේ තිබෙන අසමානතාව, විෂමතාව පිළිබිඹු කරන කැඩපතක් ආකාරයෙනුත් ක්‍රිකට් ක්‍රීඩාව ක්‍රියාත්මක වෙනවා. මොකද, ක්‍රිකට් ක්‍රීඩාව ඇතුළේ ධීවරයෙකුගේ හෝ කම්කරුවෙකුගේ දරුවෙකුටත්, මහා පරිමාණ ව්‍යාපාරිකයෙකුගේ දරුවෙකුටත් එකම ධජයක් යටතේ ක්‍රීඩා කිරීමට හැකියාව තිබෙනවා. හැබැයි, අපි විචාරාත්මක වුණොත්, ප්‍රවේශය සඳහා තිබෙන හැකියාව සහ පහසුකම් අනුව තමයි ක්‍රිකට් ක්‍රීඩාවේ අවස්ථාව තීරණය වෙන්නේ.

මේ අවස්ථාවේ මට යම් සිදුවීමක් මතක් වෙනවා. මම වයස අවුරුදු 15න් පහළ කණ්ඩායමේ ක්‍රීඩා කළ කාලයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ක්‍රිකට් කණ්ඩායම විධියට අපි මූලික වටයේ තරග කිහිපයක් ජයග්‍රහණය කරලා කොළඹ දිස්ත්‍රික් ක්‍රිකට් කණ්ඩායමත් එක්ක තරගයට අවතීර්ණ වුණා. ඒ අවස්ථාවේ තමයි අපට ජීවිතයේ ප්‍රථම වතාවට turf cricket ground එකක සෙල්ලම් කරන්න අවස්ථාව ලැබුණේ. ඒ නිසා ක්‍රිකට් තරගයට තිබෙන උද්‌යෝගය වෙනුවට turf cricket ground එක දැක්කාම අපට ඇති වුණු ආශාව එක්ක අපේ කණ්ඩායමේ ක්‍රීඩකයින් තණකොළ පවා ගලවාගෙන ගෙදර ගෙනියන්න උත්සාහ කළ ආකාරය මට මතකයි. එහෙම තමයි අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ අසමානතා තිබෙන්නේ. හැබැයි, කොළඹ දිස්ත්‍රික් ක්‍රිකට් කණ්ඩායම ඉදිරියේ ලබපු අමිහිරි පරාජයෙන් අවුරුද්දකට පසුව ත්‍රිකුණාමලය සිංහල මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමට පන්දු වාර 50කදී ලකුණු 665ක් ලබාගෙන වාර්තාවක් තියන්න පුළුවන් වුණා.

ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ ව්‍යුහයේ තිබෙන අක්‍රමිකතා, දූෂණ, වංචා පිළිබඳව විතරක් අවධානය යොමු කරනවා වෙනුවට අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් අපි වැඩි අවධානයක් යොමු කළ යුතුයි. ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ බල ව්‍යුහයට අභියෝග කරන්න පුළුවන් වන්නේ ඒ පාලක මණ්ඩලයේ වර්තමාන නිලධාරීන් මාරු කිරීමෙන් විතරක් නොවෙයි. මොකද, ඉන්න සභාපති මාරු කරලා වෙනත් සභාපති කෙනෙක් ගෙනෙන එකෙන් විතරක් ක්‍රිකට්වල පවතින බල ව්‍යුහය වෙනස් වෙන්නේ නැහැ. ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය දිස්ත්‍රික්ක මට්ටමට ගලාගෙන යනවා. ක්‍රීඩා සමාජ සීමාසහිත ප්‍රමාණයක් ලියාපදිංචි කරලා ඒවා පවත්වාගෙන යන බල ව්‍යුහය හරහා ජාතික කණ්ඩායම පමණක් ඉලක්ක කරගත් ක්‍රිකට් ක්‍රීඩාවක් තමයි අපේ රටේ තවම තිබෙන්නේ. එහෙම ක්‍රිකට් ක්‍රීඩාවකින් අපට ක්‍රීඩාවේ සංවර්ධනයක්වත්, ක්‍රීඩාවෙන් අපේ තරුණයන් අපේක්ෂා කරන සංවර්ධනයක්වත් ලබා දෙන්න බැහැ.

වර්තමානයේ අපේ ජාතික ක්‍රිකට් කණ්ඩායම ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉන්න ස්ථානය සම්බන්ධයෙන් අද මේ සභාවේ කථා බහක් ඇති වුණා, අපි පසුබෑමක ඉන්නවා කියලා. හැබැයි, ජාතික කණ්ඩායමේ තිබෙන ශ්‍රේණිගත කිරීම්වලින් විතරක් රටක ක්‍රිකට් ක්‍රීඩාව මනින්න බැහැ. ජාතික කණ්ඩායමේ ශ්‍රේණිගත කිරීම් කියන්නේ රටේ පවතින ක්‍රිකට් ව්‍යුහයේ ප්‍රතිඵලය පමණයි. රටේ පවතින ක්‍රිකට් ව්‍යුහයේ ප්‍රතිඵලය පෙනෙන්නේ ශ්‍රේණිගත කිරීම්වලින්. කණ්ඩායමේ නායකයා මාරු කරලා හෝ පාලක මණ්ඩලයේ ප්‍රධානින් මාරු කරලා හෝ අතුරු කමිටුවක් දාලා හෝ තාවකාලික ශ්‍රේණිගත කිරීම්වලින් ඉහළට යන එක උත්තරයක් නොවෙයි. ඒක නිසා අපි යෝජනා කරන්නේ ප්‍රාදේශීය මට්ටමින්, බිම් මට්ටමින් අපේ රටේ තරුණයන්ට ක්‍රීඩාවට ප්‍රවේශවීමට ඇති හැකියාව වැඩි කරන්න ඕනෑ කියන එකයි.

ක්‍රිකට් ක්‍රීඩාවේ ලෙදර් පන්දු ක්‍රීඩාවට අමතරව සැහැල්ලු පන්දු ක්‍රීඩාව දියුණු කරන එක තමයි මේකට තිබෙන ප්‍රධානම පිළිතුරක් වෙන්නේ. අඩු ආදායම්ලාභී තරුණයන්ට, රැකියා ජීවිතයත් එක්ක කාර්ය බහුල මැදි වයසේ අයට සති අන්තයේ වෙන්න පුළුවන්, රාජකාරි දිනවල හවස් වරුවේ වෙන්න පුළුවන්, නිවාඩු දිනවල වෙන්න පුළුවන් ක්‍රීඩාවට ප්‍රවේශ වෙන්න පුළුවන් ආකෘතිය තිබෙන්නේ මේ සැහැල්ලු පන්දු ක්‍රිකට් ක්‍රීඩාවේයි. ඒ පිළිබඳව උනන්දුවක් දක්වන, ක්‍රිකට් ක්‍රීඩාවට ආදරයක් තිබෙන, ක්‍රිකට් ක්‍රීඩාව ගැන ඇම්මක් තිබෙන කොල්ලෝ මේ වනවිටත් සති අන්තයේ එකතු වෙලා ස්වේච්ඡාවෙන් ක්‍රිකට් තරගාවලි ලැහැස්ති කරමින් මේ ක්‍රීඩාව ආදරයෙන් පරිස්සම් කරගෙන යනවා. රජයක් විධියට - ආණ්ඩුවක් විධියට - අපි ගම් පුරා විහිදිලා ඉන්න, ස්වේච්ඡාවෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදිලා ඉන්න අපේ ග්‍රාමීය මට්ටමේ අය වෙනුවෙන් සැහැල්ලු පන්දු ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රචලිත කරන්න ඕනෑ. අපි ග්‍රාමීය මට්ටමේ තිබෙන ක්‍රීඩා සමාජ හඳුනාගෙන, ඒ ක්‍රීඩා සමාජවලට අවශ්‍ය පහසුකම් සපයලා, ග්‍රාමීය මට්ටමින් සති අන්තවල මාසයකට, මාස තුනකට වතාවක් ක්‍රිකට් තරගාවලි සංවිධානය කිරීම හරහා අපේ තරුණ පරම්පරාව මත් ද්‍රව්‍ය වාගේ ඍණාත්මක පැතිවලට - negative influencesවලට - යොමු වන එක නවත්වන්න පුළුවන්. ක්‍රීඩකයෙක් විධියට මම ඒක ප්‍රායෝගිකව අත්දැක තිබෙනවා.

ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කරද්දී ජාතික ක්‍රිකට් කණ්ඩායම පිළිබඳව පමණක්, ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය ගැන පමණක් අවධානය යොමු කරන්න එපා. අපි අවධානය යොමු කළ යුත්තේ ජාතික කණ්ඩායමට හොඳ ක්‍රීඩකයන් 11දෙනෙක් තෝරා ගන්න එක ගැන විතරක් නොවෙයි. අපි අවධානය යොමු කළ යුත්තේ ග්‍රාමීය මට්ටමේ සෑම පුද්ගලයෙකුටම ක්‍රීඩාවට වෙලාවක් වෙන් කරන එක ගැන; තරුණ පරම්පරාවට ක්‍රීඩාව තමන්ගේ ජීවිතයේ ආශාවක් බවට පත් කරන එක ගැන; ක්‍රීඩාව තමන්ගේ ජීවිතයේ කොටසක් කරන එක ගැන; වැඩ අවසන් වෙලා ගිහිල්ලා හැම දාම හවසට පොඩ්ඩක් සෙල්ලම් කරන එක ගැන. සති අන්තයේ නිවාඩු වෙලාවට ගමේ ඉන්න තරුණ පරම්පරාව එකට එකතු වෙලා ක්‍රීඩා කරන තැනට යොමු කරන ලංකාවේ ප්‍රධානම ක්‍රීඩාව තමයි, ක්‍රිකට් ක්‍රීඩාව. ඒ සම්බන්ධයෙන් අවධානයක් මුළු සමාජයේම තිබෙන නිසා ඒක අමාරු වෙන්නේ නැහැ. අපි ඉදිරියේදී සැහැල්ලු පන්දු ක්‍රිකට් ක්‍රීඩා කරන තරුණ තරුණියන් ගැන වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ.

කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව ගත්තාම අද අපේ රටේ කෙල්ලෝ කැරැල්ලක් ගහගෙන ඉන්නවා. අපි වැඩි-වැඩියෙන් කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. අපේ ජනාධිපතිතුමාටත්, ක්‍රීඩා ඇමතිතුමාටත්, ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිය පළ කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. දශක කිහිපයක් තිස්සේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට විශේෂ අවශ්‍යතාවක්ව තිබුණු ජාතික මට්ටමේ පළාත් ක්‍රීඩා පිටිය සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 380ක මුදලක් වෙන් කර තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Mayilvaganam Jegatheeswaran. You have 10 minutes.

[பி.ப. 12.20]

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தவிசாளர் அவர்களே!
"கைத்தொழில் ஒன்றைக் கற்றுக்கொள்!
கவலை உனக்கில்லை ஒத்துக்கொள்!"

இது நாமக்கல் கவிஞர் செ. இராமலிங்கம் பிள்ளை அவர்களுடைய வாக்கு. ஒரு நாட்டின் மொத்தத் தேசிய வருமானத்தில் கைத்தொழிலானது பாரிய பங்கை வகிக்கின்றது. அந்த வகையில், கைத்தொழிற் புரட்சியின் மூலமாக, கைத்தொழிலின் மூலமாக அபிவிருத்தியடைந்த பல்வேறு நாடுகளை நாங்கள் காண்கின்றோம். இலங்கை நாட்டைப் பொறுத்தவரையில், கடந்த காலங்களில் கைத்தொழிற்றுறை எவ்வாறு காணப்பட்டதென்பதை நாங்கள் நோக்குவோமானால், அது கேள்விக்குரிய ஒரு விடயமாகத்தான் இருந்தது. அதாவது, எங்கள் நாட்டில் காணப்படுகின்ற வளங்களான மூலப்பொருட்களை முடிவுப் பொருட்களாக மாற்றுகின்ற செயற்பாடுகள், எவ்வளவுதூரம் காத்திரமிக்கதாகக் கடந்த காலங்களில் இருந்ததென்பது கேள்விக்குரிய விடயமாகும். நான் கல்வி கற்ற காலப்பகுதியில் கைத்தொழிற்றுதுறை பற்றி குறிப்பிடும்போது, காங்கேசன்துறையில் சீமெந்து தொழிற்சாலை, பரந்தனில் இரசாயனத் தொழிற்சாலை, ஆனையிறவில் உப்பளம், வாழைச்சேனையில் காகித ஆலை, கந்தளாயில் சீனித் தொழிற்சாலை என்று கற்ற ஞாபகமிருக்கின்றது. ஆனால், தற்பொழுது இந்தத் தொழிற்சாலைகளின் நிலை எவ்வாறு இருக்கின்றதென்று எடுத்து நோக்கினால், அது மிகவும் மனவேதனைக்குரிய விடயமாகக் காணப்படுகின்றது.

எமது அரசாங்கம் பதவியேற்றதன் பிற்பாடு, கடந்த வாரத்திற்கு முன்னைய வாரம் கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர், பிரதி அமைச்சர் உட்பட, வட மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்களான நாங்கள் எல்லோரும் காங்கேசன்துறைச் சீமெந்துத் தொழிற்சாலை, பரந்தன் இரசாயனத் தொழிற்சாலை, ஆனையிறவு உப்பளம், அதேபோன்று மாங்குளத்தில் கைத்தொழில் பேட்டைக்காக ஒதுக்கப்பட்டுள்ள இடம், ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலை போன்ற இடங்களைச் சென்று பார்வையிட்டோம். காங்கேசன்துறைச் சீமெந்துத் தொழிற்சாலையைப் பார்வையிட்டபோது, அந்த இடமானது காடுகள் சூழ்ந்த நிலையில் மிகவும் வேதனைக்குரியதாகக் காணப்பட்டது. மேலும், கடந்த காலங்களில் சீமெந்து உற்பத்திக்காகச் சுண்ணக்கல் அகழப்பட்டதனால், அந்த இடத்தில் ஏற்பட்ட 15 - 20 அடிக்கு மேற்பட்ட பாரிய குழிகள் நிரப்பப்படாமல் காணப்படுகின்றது. அந்தக் குழிகள் நிரப்பப்பட வேண்டிய தேவை இருக்கின்றது. அது மட்டுமல்லாமல், தொடர்ந்து சீமெந்துத் தொழிற்சாலைக்காக அங்கு நாங்கள் சுண்ணக்கற்களைத் தோண்டுவோமானால், நிச்சயமாக அது இயற்கைக்கும் சூழலுக்கும் பாரிய பாதிப்பை ஏற்படுத்துவது மட்டுமல்லாமல், காங்கேசன்துறைப் பிரதேசம் நீரில் மூழ்கக்கூடிய அபாயமும் காணப்படுகின்றது. அது தொடர்பாகவும் நாம் கலந்துரையாடி, அந்த விடயத்தையும் கவனத்திற் கொண்டுள்ளோம். அந்தப் பிரதேசத்தில் 300 ஹெக்டயருக்கும் மேற்பட்ட இடம் பாவனையில்லாமல் காணப்படுகின்றது. அதனைக் கைத்தொழிற்சாலைகள் அல்லது ஏனைய பொருத்தமான விடயங்களுக்குப் பயன்படுத்தும் நோக்கில் உயர்மட்ட ஆலோசனைகள் தற்பொழுது இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. நிச்சயமாக, எமது அரசாங்கத்திலே இந்த விடயம் குறிப்பாகக் கவனத்திற் கொள்ளப்படும்.

அடுத்ததாக, ஆனையிறவு உப்பளத்திற்குச் சென்றிருந்தோம். உண்மையிலே, கடந்த காலங்களிலே உப்பை இறக்குமதி செய்யவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலை காணப்பட்டது. நாங்கள் அங்கு சென்று பார்த்தபோதுதான்

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

எமது நாட்டின் தேவைக்கு மட்டுமல்ல, வெளிநாடுகளுக்கும் ஏற்றுமதி செய்யக்கூடிய வகையிலே அங்கு உப்பு உற்பத்தி செய்யக்கூடிய நிலைப்பாடுகள் காணப்படுவதை அவதானித்தோம். இதுவரை காலமும் அங்கு உற்பத்தி செய்யப்பட்ட உப்பானது raw materialsஆக மட்டுமே தனியாருக்கு விற்பனை செய்யப்பட்டது. தனியார் அதை அயடீன் கலந்து தூள் உப்பாகச் சந்தைப்படுத்தி யிருந்தார்கள். அந்த விடயத்தைக் கருத்திற்கொண்டு எமது அரசாங்கத்தினால் புதிய இயந்திரங்கள் கொள்வனவு செய்யப்பட்டு, எதிர்வரும் வாரத்திலே அயடீன் கலந்த தூள் உப்பை அங்கு உற்பத்தி செய்வதற்குரிய ஒழுங்குகள் மேற்கொள்ளப்பட்டுள்ளது என்ற ஒரு மகிழ்ச்சியான செய்தியைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். அதுமட்டுமல்லாமல், அதற்கு அருகிலே இருக்கின்ற குறிஞ்சாத்தீவினை நாங்கள் சென்று பார்வையிட்டோம். எமது நாட்டின் மொத்த உப்பு உற்பத்தியிலே குறிஞ்சாத்தீவில் காணப்படுகின்ற உப்பு உற்பத்திக்கான வளத்தினை இணைக்கும்பொழுது, நிச்சயமாக வெளிநாடுகளுக்கு உப்பினை ஏற்றுமதி செய்து வருமானத்தினைப் பெறக்கூடிய ஒரு வாய்ப்பு இருக்கின்றது. அது தொடர்பாகவும் நாங்கள் அலசி ஆராய்ந்துள்ளோம்.

அந்த உப்பளத்திலே பணிபுரிகின்ற ஊழியர்களின் நலன்புரி நடவடிக்கைகள் தொடர்பாகக் கடந்த காலங்களிலே சரியான முறையில் கவனஞ்செலுத்தப்படாத ஒரு நிலைமை காணப்பட்டது. அவர்கள் சரியான முறையிலே தொடர்ச்சியான தொழில் வாய்ப்பைப் பெறுவதில் அல்லது தொழிலைத் தொடர்ச்சியாக மேற்கொள்வதில் இடையூறுகளை எதிர்நோக்கியிருந்தார்கள். அவர்கள் தங்களுடைய வேதனையை அங்கு சென்றிருந்த எமது குழுவினரிடம் பகிர்ந்திருந்தார்கள். நாங்கள் அவர்களுக்கு எதிர்காலத்திலே நலன்புரி நடவடிக்கையாக ஒரு காப்புறுதித் திட்டத்தினை ஆரம்பிப்பதாக வாக்குறுதியளித்திருக்கின்றோம்; அதை நாங்கள் நிறைவேற்றுவோம். அதுமட்டுமல்லாமல், அந்த உப்பு உற்பத்தியின்மூலம் கிடைக்கின்ற வருமானத்திலிருந்து அவர்களுக்கும் பங்கு கொடுப்பதற்கான வழிவகைகளை எதிர்காலத்திலே நாங்கள் மேற்கொள்ள இருக்கின்றோம்.

மேலும், மாங்குளம் பகுதியிலே ஒரு கைத்தொழில் பேட்டையை அமைக்கக்கூடிய 200 ஏக்கருக்கும் மேற்பட்ட நிலப்பரப்பை நாங்கள் அடையாளங் கண்டுள்ளோம். அந்த வகையில், அங்கு முதலீட்டாளர்களை வரவழைத்து, ஒரு கைத்தொழிற்பேட்டையை அமைப்பதற்கு எங்களுடைய அரசாங்கம் தீர்மானித்திருக்கின்றது என்பதையும் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

பரந்தன் பிரதேசத்திலே இரசாயனத் தொழிற்சாலை அமைந்திருந்த இடம் காடுகள் சூழ்ந்து காணப்படுகின்றது. அதனை மீளவும் ஆரம்பிப்பதற்கான நடவடிக்கைகளை எடுப்பதற்கான ஆயத்தங்களை நாங்கள் மேற்கொள்ளவிருக் கின்றோம். அத்தோடு, ஒட்டுசுட்டானிலே இருக்கின்ற ஓட்டுத் தொழிற்சாலை கடந்த 30 வருடங்களுக்கும் மேலாகப் பூட்டப்பட்ட நிலையிலே காணப்பட்டது உங்களுக்குத் தெரியும். நாங்கள் அங்கு சென்று பார்வையிட்டபோது, அந்த ஓட்டுத் தொழிற்சாலையை மீண்டும் இயங்க வைப்பதற்குரிய அத்தனை நடவடிக்கைகளையும் மேற்கொள்ளக்கூடியதாக இருந்தது. கடந்தகால அரசாங்கத்தினால் அந்த ஓட்டுத் தொழிற்சாலையைத் தனியாருக்கு விற்பனை செய்வதற்கான ஆயத்தங்கள் செய்யப்பட்டிருந்தது. அதை உடனடியாக நிறுத்தி, கடந்த வாரத்திலே நாங்கள் அங்கு ஓடு உற்பத்தியை மீண்டும் ஆரம்பித்திருக்கின்றோம். வட மாகாணத்திலே 30 ஆண்டுகளுக்குப் பிறகு முதலாவதாக ஒரு கைத்தொழிற்சாலை மீளவும் எங்களுடைய அரசாங்கத்தினால் ஆரம்பிக்கப்பட்டிருக் கின்றதென்ற விடயத்தை இங்கு கூறிவைக்க விரும்புகின்றேன். இதன்மூலமாகக் கணிசமானவர்களுக்கு வேலைவாய்ப்பு வழங்கப்படவிருக்கின்றது. இவ்வாறு வட மாகாணத்திலே காணப்படுகின்ற ஏனைய தொழிற்சாலை களையும் மீள ஆரம்பிப்பதன் மூலமாக, அந்தப் பகுதியிலே வேலையற்றிருக்கின்ற இளைஞர், யுவதிகளுக்குத் தொழில்வாய்ப்பைப் பெற்றுக்கொடுப்பதற்கான வாய்ப்புகள் காணப்படுகின்றது.

மேலும், அங்குள்ள வளங்களான பனை, தென்னை போன்றவற்றைப் பயன்படுத்தி, வட பகுதியிலே பாரிய கைத்தொழில் புரட்சியொன்றை ஏற்படுத்தக்கூடிய வாய்ப்பு இருக்கின்றது. அதற்கான செயற்றிட்டங்கள் அரசாங்கத்தால் ஆரம்பிக்கப்பட்டுள்ளன. அதன் முதற் கட்டமாக இந்த வருடத்திலே 16,000 ஹெக்டயரில் தென்னைப் பயிர்ச்செய்கை மேற்கொள்ளப்படவுள்ளது. அதன்மூலமாகத் தெங்குக் கைத்தொழில் உற்பத்திகளைக் கூடுதலாக மேற்கொண்டு, அவற்றை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்வதன்மூலமாக நாங்கள் வருமானத்தை ஈட்டிக்கொள்ள முடிவதுடன், எமது நாட்டின் தேவையையும் பூரணமாகப் பூர்த்தி செய்யக் கூடியதாக இருக்கும்.

அதேபோல், பனைசார் உற்பத்திகளுக்கு இவ்வளவு காலமும் சந்தை வாய்ப்புகளையோ அல்லது ஏனைய தொழில்நுட்ப ஆலோசனைகளையோ கடந்த காலங்களிலே பெற்றுக் கொடுக்காத காரணத்தினால் அந்தக் கைத்தொழில் மிகவும் நலிவடைந்த நிலையிலே காணப்படுகின்றது. அவர்கள் உற்பத்தி செய்யும் அலங்காரப் பொருட்களையும் ஏனைய பொருட்களையும் உல்லாசப் பிரயாணிகளுக்கு விற்பனை செய்வதற்கான ஒழுங்குகளைச் செய்து கொடுக்குமுகமாக 'லக்சல' நிறுவனத்துடன் நாங்கள் பேச்சுவார்த்தைகளில் ஈடுபட்டிருக்கின்றோம். ஏனென்றால், வெளிநாட்டவர்கள் மத்தியில் அதற்கான கிராக்கி அதிகளவிலே காணப்படுகின்றது. வெளிநாட்டு உல்லாசப் பிரயாணிகள் அவற்றைக் கொள்வனவு செய்வதன்மூலம் நாங்கள் வெளிநாட்டுச் செலாவணியைப் பெற்றுக்கொள்வதோடு மட்டுமல்லாமல், அந்த உற்பத்திகளை மேற்கொள்கின்ற தொழிலாளர்களும் போதிய வருமானத்தைப் பெற்றுக் கொள்ளக்கூடியதாக இருக்கும். குடிசைக் கைத்தொழில்கள் நலிவடைந்தமைக்கு முக்கிய காரணம் அவற்றுக்கான சந்தைப்படுத்தல் வாய்ப்புகள் சரியான முறையில் பெற்றுக்கொடுக்கப்படாமையாகும். எனவே, எதிர்வரும் காலங்களிலே எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் நிச்சயமாக நாட்டின் மொத்தத் தேசிய வருமானத்துக்குக் கைத்தொழில் துறையின்மூலமாகச் சிறந்த ஒரு பங்களிப்பை வழங்கும் வகையில், கைத்தொழில் துறையிலே ஒரு புரட்சியை எற்படுத்தக்கூடிய திட்டங்களை நடைமுறைப்படுத்தும் என்று இவ்விடத்தில் கூறி, வாய்ப்பளித்தமைக்காக நன்றி தெரிவித்து, விடை பெறுகின்றேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පඩි, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දින අය වැය කාරක සභා අවස්ථාවේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේත්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශය මේ රටට අවශ්‍යම අමාත්‍යාංශයක්. ඒ වාගේම කර්මාන්ත අමාත්‍යාංශයත් මේ රටට විශාල ධනයක් උපයා දෙන, ආර්ථිකයට ශක්තිය දෙන අමාත්‍යාංශයක්.

ගරු ක්‍රීඩා අමාත්‍යතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු අමාත්‍යතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව තමයි අපේ රටේ ජනප්‍රියම ක්‍රීඩාව. ඒ වාගේම, අපේ රටට ජයග්‍රහණ ලබා දෙන, රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න දායක වන, සංචාරකයන්ගේ පැමිණීමට හේතු වන ක්‍රිකට් ක්‍රීඩාව නහා සිටුවීම කළ යුතුයි.

පසු ගිය පාර්ලිමේන්තුවේදීත් ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කළා. 2023දී එවකට හිටපු ක්‍රීඩා ඇමතිවරයා ක්‍රිකට් අතුරු පාලක කමිටුවක් පත් කළා. අන්තිමේදී ICC එක ශ්‍රී ලංකා ක්‍රිකට් තහනමකට ලක් කළා. ඒ වාගේම, 2024දී ලංකාවේ පැවැත්වීමට නියමිතව තිබුණු වයස අවුරුදු 19න් පහළ ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියත් අපේ රටට අහිමි වුණා. ඒ හිටපු ක්‍රීඩා ඇමතිවරයාත් ධුරයෙන් ඉවත් කළා. ඊට පසුව එතුමා පසුගිය ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා. එතුමා එක එක්කෙනාගේ ලණු කාලා හිතුවා, ක්‍රිකට් ක්‍රීඩාවට ඇඟිලි ගැහුවාම ඔක්කෝම හරි, තමන්ට ලොකු ගමනක් තියේවි කියලා. සමහර අය ලණු දෙනවා නේ. එහෙම දීපු ලණුවක් කාලා හිටපු ක්‍රීඩා ඇමතිතුමා ගියා අනෙක් පැත්තට. අන්තිමට එතුමාට ඇමතිකමත් නැති වුණා. මට මතක විධියට එතුමාට ජනාධිපතිවරණයෙනුත් ලබා ගන්න පුළුවන් වුණේ ඡන්ද 4,000ක් වාගේ ප්‍රමාණයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම මේ අවස්ථාවේදී වත්මන් ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ආයතනයට ඇඟිලි ගහන්න යන්න එපා. ජාත්‍යන්තර මට්ටමින් ICC එක එය පාලනය කරනවා. ඒ වැඩේ ඒ අයට කරන්න දෙන්න. මොකද, එහෙම ඇඟිලි ගහන්න ගිහිල්ලා 2024දී වයස අවුරුදු 19න් පහළ ක්‍රිකට් World Cup තරගාවලියත් අපට අහිමි වුණා. 2026දී පැවැත්වෙන පන්දු වාර 20 - 20 World Cup තරගාවලියේ සත්කාරක රටක් හැටියට ඉන්දියාවත් එක්ක ශ්‍රී ලංකාවත් පත් කරලා තිබෙනවා. 2026 වර්ෂයේ පැවැත්වෙන 20 - 20 ක්‍රිකට් World Cup තරගාවලියේ තරග 22ක් අපේ රටේ පැවැත්වෙනවා. ඉන්දියාවයි, පාකිස්තානයයි තරග කරන්නේත් ලංකාවේ. එතකොට සංචාරකයෝ විශාල පිරිසක් එනවා. අපේ රටට ඩොලර් මිලියන 100ක විතර විශාල ආර්ථික වාසියකුත් ලැබෙන්න නියමිතව තිබෙනවා. අපි කවුරුවත් මේවා නැති කරගන්න ඕනෑ නැහැ.

පසුගිය කාලයේ මොකක්ද වුණේ? හිටපු ක්‍රීඩා ඇමතිතුමාට එක එක්කෙනා එක එක විධියට ලණු දුන්නා. හිටපු ක්‍රීඩා ඇමතිතුමා ඒ ලණු කෑමේ ප්‍රතිඵලයක් විධියට අන්තිමේදී ICC එක අපේ ක්‍රිකට් ක්‍රීඩාවට තරග තහනමකුත් දැම්මා. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව නැවත මේ තත්ත්වයට ගන්න සෑහෙන්න අමාරු වුණා. අන්න ඒ නිසා මම මෙහිදී ගරු ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පාලක මණ්ඩලයට පත් කිරීම ආදියට අදාළ ප්‍රශ්න ක්‍රීඩා සංගම්වලින් ගිහිල්ලා විසඳාගෙන ඒවි; ඒගොල්ලෝ ඒ විධියට ඒවා විසඳා ගනීවි. ඒවාට ඇඟිලි ගහන්න ගිහිල්ලා මේ රටට ලැබෙන්න තිබෙන වරප්‍රසාද නැති කර ගන්න එපා. ගරු ක්‍රීඩා ඇමතිතුමනි, 2026දී පන්දු වාර 20 - 20 ක්‍රිකට් World Cup තරගාවලිය පැවැත්වෙනවා. එහි තරග 22ක් ලංකාවේ පැවැත්වෙනවා. අපි අන්න ඒවායෙන් ප්‍රයෝජන ගන්න ඕනෑ. මම මේ වෙලාවේ ඒ කාරණය ගැනත් ඔබතුමාව දැනුවත් කරනවා.

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, සමහර අය මේ ගරු සභාවට ඇවිල්ලා එක එක ඒවා කියාවි; ක්‍රිකට් ක්‍රීඩාව මෙහෙමයි, අරෙහෙමයි කියලා පැය ගණන් කියාවි; පෞද්ගලික තරහ පිරිමහගන්න බලාවි. නමුත් මේක පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. අපි ක්‍රීඩාවට පෞද්ගලිකව ඇඟිලි ගහලා වැඩක් නැහැ. මම ඒකත් මේ වෙලාවේදී කියන්න ඕනෑ. මම ඒ ගැන මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

මම ගරු කර්මාන්ත ඇමතිතුමාටත් කාරණයක් කියන්න ඕනෑ. ගරු කර්මාන්ත ඇමතිතුමනි, ඔබතුමා අද දරන අමාත්‍යාංශයේ විෂය කොටසක් භාර රාජ්‍ය ඇමතිවරයකු හැටියට මම පසුගිය කාලයේ කටයුතු කළා. මට භාර දීලා තිබුණු වැඩ කොටස මම හරියාකාරව කළා. මම සමහර ආයතන කරපු විධිය ගැන හොඳ නරක දෙකම ගැන විස්තර දැන් ඔබතුමාට ඇවිල්ලා ඇති. මම මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය භාර රාජ්‍ය ඇමතිවරයා හැටියට අවුරුදු 2ක් කටයුතු කළා. මම අද ගරු කථානායකතුමාට වරප්‍රසාද ප්‍රශ්නයකුත් ඉදිරිපත් කළා, පසුගිය දවසක මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය COPE එකට කැඳවපු වෙලාවේ වෙච්ච සිද්ධියක් ගැන.

2023 වර්ෂයේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ඇමෙරිකානු ඩොලර් මිලියන 470ක අපනයන ආදායමක් ගෙන ආවා. හැබැයි, 2025 වර්ෂයේ මේ වන කොට එහි අපනයන ආදායම සියයට 30කින් අඩු වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ඇයි කියලා ඔබතුමා හොයලා බලන්න. ඒ ගැන මම දන්නේ නැහැ. එහි අපනයන ආදායම සියයට 30කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට එන ආදායම සියයට 50කින් අඩු වෙලා තිබෙනවා. ඔබතුමා දැන් එම අධිකාරියට සභාපතිවරයෙකු පත් කරලා තිබෙනවා. අසනීප කාටත් තිබෙනවා. හැබැයි, ඒ සභාපතිතුමාට අමතක වීම් නම් තිබෙනවා. ඒ ගැනත් මම මේ වෙලාවේ කියන්න ඕනෑ. ගොඩක් අමතක වීම් වන සභාපතිවරයෙකු තමයි ඔබතුමා පත් කරලා තිබෙන්නේ. ටිකක් මතක තබාගෙන වැඩ කරන්න වෙයි. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට මම ගිය කාලයේත් සමහර අය බෙර ගහලා මාව පිළිගත්තා. ඒ කාලයේ මාවත් උස්සලා තියලා තමයි කථා කළේ. ඔබතුමා ගියාමත් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අය එහෙම තමයි කරන්නේ. ඒක තමයි හැටි. ඒ තමයි රජයේ ආයතනවල, අධිකාරිවල හැටි.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

මම තව කාරණයක් කියන්න ඕනෑ. මැණික් පතල්වලට ලයිසන් දෙන එක සම්බන්ධයෙන් දැන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම කියන්න ඕනෑ, රත්නපුරේ සිටින නීති නිලධාරිනියක් ගැන. ෆයිල් ටික ඔක්කෝම ඒ නීති නිලධාරිනිය ළඟ තබාගෙන තමයි ලයිසන් දෙන්නේ. හැබැයි ගරු ඇමතිතුමනි, එම නිලධාරිනියගේ ස්වාමි පුරුෂයා එතැන කැෂියර්. හොඳට හොයලා බලන්න, එතුමියගේ මහත්තයා තමයි කැෂියර්. ඒ මහත්තයායි, නෝනායි අතරත් තිබෙනවා පොඩි ගේම් එකක්. ඒකත් මම මෙතැනදී කියන්න ඕනෑ. ඇත්ත කථාව කියන්න ඕනෑ. මොකද, අපි හිටපු කාලයේ අපිත් ඔය ප්‍රශ්නය දැක්කා. මැණික් පතල් සඳහා ලයිසන් ගන්න එන කට්ටිය අපට කිව්වා, මෙන්න මේ නීති නිලධාරිනියයි, ඇයගේ මහත්තයායි සම්බන්ධයෙන් මෙන්න මෙවැනි ප්‍රශ්නයක් තිබෙනවා කියලා. නෝනා ෆයිල් එක එළියට දැම්මාට පසුව මහත්තයා ගිහිල්ලා කථා කළාම තමයි ඒ බිස්නස් එක එතැන වෙන්නේ. මා ඒකත් කියන්න ඕනෑ. මේ වෙලාවේත් එතුමිය ඒ ෆයිල් ටික අරගෙන ඒ වැඩේ කරනවා කියලා තමයි කියන්නේ. මට ආරංචි වෙලා තිබෙන විධියට එහෙමයි වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම ඒක කියන්න ඕනෑ. පතල් සඳහා ලයිසන් දෙන එක ප්‍රමාදයි. එහි ගොඩක් ප්‍රමාද වීම් තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. මැණික් ව්‍යාපාරය ගත්තාම, ඒ මඟින් අපට සොයා ගන්න පුළුවන් ආදායමක් තිබෙනවා නම්, ඒ වෙනුවෙන් මහන්සි වෙලා අවශ්‍ය කටයුතු කරලා ඒ ආදායම සොයන්න ඕනෑ. එහෙම නැතිව ආවාට ගියාට, ඕනෑවට එපාවට කටයුතු කිරීම තුළින් කවදාවත් ජයග්‍රහණයක් ලබා ගන්න බැහැ. මම ඒක හොඳින්ම දන්නවා.

සාමාන්‍යයෙන් වැහෙන්න ගිය ආයතන තමයි මගේ අමාත්‍යාංශය යටතේ ගොඩක් තිබුණේ. එවැනි තවත් ආයතනයක් තමයි ඔඩ්ඩුසුඩාන් උළු කර්මාන්තශාලාව. එහි වැඩ කටයුතු වෙනුවෙන් මම ඒ කාලයේ රුපියල් මිලියන 20ක් ලබා ගත්තා. දැන් ඒකේ වැඩ අවසන් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබන මාසයේ හෝ මේ මාසයේ ද කොහේද ඒක විවෘත කරනවා කිව්වා. මම ඒ ගැන බෙහෙවින් සතුටු වෙනවා. ඔඩ්ඩුසුඩාන් උළු කර්මාන්තශාලාව එල්ටීටීඊ ත්‍රස්තවාදීන් යටතේ තිබිලා අපට හමු වුණා. පසුව එහි හමුදා කඳවුරක් ද තිබුණා. අපි එය අමාත්‍යාංශය යටතට අරගත්තා. ගරු ඇමතිතුමනි, දැන් ඒක ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ. මා හිතන විධියට ඒක තවත් මාසයකින් විතර විවෘත කරන්න පුළුවන්. එවිට ඔඩ්ඩුසුඩාන් උළු කර්මාන්තශාලාවේ උළු නිෂ්පාදනය කරන්න පුළුවන්. දැන් අපේ රටේ මධ්‍යම පළාතේ උළු සෙවිලි කරන්නේ නැහැ. අම්පාරේ එරගම උළු කර්මාන්තශාලාවෙන් තමයි රටේම තිබෙන උළු කර්මාන්තශාලා ටික දුවන්නේ. හැබැයි, යාපනය ඇතුළුව උතුරු නැහෙනහිරට උළු විකුණන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. මොකද, ඒ ප්‍රදේශවල මිනිස්සු තවමත් උළු සෙවිලි කරනවා. එම නිසා ඔඩ්ඩුසුඩාන් උළු කර්මාන්තශාලාව පටන් ගත්තාම විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්.

ඊළඟට, මම කැමැතියි, අලිමංකඩ ලුණු ලේවාය ගැන කථා කරන්න. අලිමංකඩ ලුණු ලේවාය තිබෙන්නේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ. හැබැයි, හම්බන්තොට ලුණ ලේවාය එම අමාත්‍යාංශය යටතේ නැහැ. ඒක Employees' Trust Fund Board එක යටතේ තිබෙන්නේ. දැන් අලිමංකඩ ලුණු ලේවාය කරගෙන යනවා, මන්නාරම ලුණු ලේවායත් කරගෙන යනවා. මා හිතන විධියට අලිමංකඩ ලුණු ලේවාය තවත් පුළුල් කරන්න පුළුවන්. කොම්පැනි කිහිපයක්, පෞද්ගලික ආයතන කිහිපයක් ද ඉල්ලීම් කරලා තිබෙනවා; මැලිබන් ආයතනය සහ තවත් ආයතන කිහිපයක් ඉල්ලීම් කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඔබතුමාට පුළුවන් නම් අලිමංකඩ ලුණු ලේවාය තවත් පුළුල් කරලා, නියැදි හදලා ඉදිරියට අරගෙන යන්න. එහෙම කරන්න පුළුවන් නම් හොඳයි. දැන් salt machine එකක් ගෙනැල්ලා තිබෙනවා. ඔබතුමා ලබන මාසයේ ඒ කටයුතු පටන් ගන්නවා. මා රාජ්‍ය අමාත්‍යවරයාව හිටපු කාලයේ තමයි ඒක ගත්තේ. ඒ සඳහා රුපියල් මිලියන එකසිය ගණනක් ගියා. ලංකාව table salt ලොකුම plant එක දැන් අලිමංකඩ ලුණු ලේවායේ සවි කරලායි තිබෙන්නේ. ඒක විවෘත කරන්න ඔබතුමා ලබන මාසයේද කොහේද දින දාගෙන තිබෙන බවක් කියනවා. මම විශ්වාස කරනවා, අලිමංකඩ ලුණු ලේවාය හරහා මේ රටේ ලුණු නිෂ්පාදනය වැඩි කරලා මේ රටේ ආර්ථිකයට ලොකු දායකත්වයක් දෙන්න පුළුවන් වෙයි කියලා.

පසුගිය කාලයේ අපි ආර්ථිකය අර්බුදයට වැටිච්ච වෙලාවේ, අපි පුළුවන් පුළුවන් අමාත්‍යාංශවලින් ඩොලර් බිලියනයක් මහා භාණ්ඩාගාරයට දුන්නා. ලංකා පොස්පේට් සමාගමෙන් ඩොලර් මිලියන 300ක්, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙන් ඩොලර් මිලියන 400ක් ඇතුළුව මහා භාණ්ඩාගාරයට ඩොලර් බිලියනයක් - ඩොලර් මිලියන 1,000ක් - පුළුවන් විධියට අපි ලබා දුන්නා ඒ ආර්ථික අර්බුදය තිබුණු වෙලාවේ. ඒ නිසා මේ ආයතන ගොඩගන්න බැහැ කියලා දෙයක් නැහැ, ගොඩගන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් අපි BCC Lanka Limited ගත්තොත්, මම හිතන විධියට කොළඹ ප්‍රදේශයේ හැම තැනම BCC පොල්තෙල් තමයි මිනිස්සු පාවිච්චි කරන්නේ. ෆුඩ් සිටිවල, හැම තැනම BCC පොල්තෙල්වලට පුදුම ඉල්ලුමක් තිබෙනවා. හැබැයි, ගරු ඇමතිතුමනි, පොල්තෙල් මිල හිටපු ගමන් උඩ පහළ යනවා. මිල අඩු වෙලාවට පොල්තෙල් අරගෙන, මිල වැඩිවෙනකොට ඒ මිලට දෙන්න පුළුවන් විධියට කළා නම් ලොකු ලාභයක් ගන්න පුළුවන්. මොකද, සමහර වෙලාවට එතැනට ටොන් 25ක් ගන්නවා. ටොන් 50ක්, 100ක්, 200ක්, 300ක් තබාගන්න පුළුවන් තත්ත්වයේ තැනක් තමයි BCC ආයතනය. මේවා ලොකු වැඩක් කරන්න පුළුවන් ආයතන. අද වෙනකොට ඒ ආයතනයට අයත් ඉඩම් අක්කර ගණනක් තිබෙනවා. ඒවා විනාශ වෙලා තිබෙන්නේ. ඒ ගැනත් ඔබතුමා හොඳට හොයලා බලන්න. මම දන්නවා, පසුගිය කාලයේ ඔබතුමා ගිහිල්ලාත් තිබෙනවා, හොයලා බලලා වැඩ කරලාත් තිබෙනවා.

දැන් අපි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන වාලච්චේන කඩදාසි කම්හල දෙස බැලුවොත්, ඒ මැෂින් පරණයි, කැඩෙනවා. මැෂින් කැඩුණාම කොළ සවුත්තු වෙනවා, විකුණන්න බැහැ. හැබැයි, ඒකට හොඳ ආයෝජකයෙක් ගෙනැල්ලා වැඩේ පටන් ගන්නවා නම් ලංකාවේ කඩදාසි ඉල්ලුම සියයට 50කින් විතර සපුරාගන්න අපට පුළුවන්. පසුගිය කාලයේ අපට ඒ මැෂින් ගෙනෙන්න සල්ලි තිබුණේ නැහැ. අලුතින් මැෂින් හයි කරන්න වුවමනාව තිබුණා. නමුත් කැඩුණු මැෂින් ටික නියාගෙන තමයි වැඩ කරගෙන ගියේ. මම හිතන විධියට, කඩදාසි කර්මාන්තශාලාවත් ගොඩදමන්න පුළුවන්. හැබැයි, අමාරුයි. රජයකට ගොඩදමන්න අමාරු තැන් පෞද්ගලික ආයෝජකයෝ හරි ගෙනැල්ලා පුළුවන් නම් ගොඩදමන්න. කහටගහ ග්‍රැෆයිට් සමාගමත් එහෙමයි. පසුගිය කාලයේ කහටගහ ග්‍රැෆයිට් විකුණාගන්න බැරිව විශාල ප්‍රශ්න ගොඩකට මැදිහත් වෙලා තිබුණා. දැන් විකිණෙනවාද දන්නේ නැහැ. පසුගිය කාලයේ පඩිනඩි පවා ගෙවාගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබුණා. ඔබතුමා ඒ ගැනත් අවධානය යොමු කර වැඩ කරයි කියලා මම දන්නවා. මේ අමාත්‍යාංශය රටට ඵලදායී විධියට වැඩ කරන්න පුළුවන් තැනක්.

ගරු ඇමතිතුමනි, පැල්වත්ත සීනි සමාගම සහ සෙවනගල සීනි සමාගමත් ඔබතුමා යටතේ තිබෙනවා. සෙවනගල සහ පැල්වත්ත සමාගම්වල ලොකු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. උක් හිටවන අයට බිම් සැකසීමට ලබාදී තිබූ සහනාධාර දැන් නවත්වා තිබෙනවා. ඒ වාගේම, වසරකට දෙවතාවක් දුන් දිරි දීමනා නවත්වා තිබෙනවා. වෛද්‍ය දීමනා නවත්වා තිබෙනවා. වසර අග ලබාදෙන දිරි දීමනා ඉවත් කිරීම වැනි ගොඩක් දේවල් ගැන ලිපියක් මඟින් මට එවා තිබෙනවා, පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ වැඩ කරන අය සහ උක් ගොවියෝ. මේ ලිපිය මම එවනවා ඔබතුමාට. මේකට අවධානය යොමු කර වැඩ කරන්න කියා මම ඉල්ලා සිටිනවා. කර්මාන්ත අමාත්‍යාංශය කියන්නේ ලොකු ගමනක් යන්න පුළුවන්, ලොකු ගමනක් පටන්ගන්න පුළුවන් තැනක්. මේ අමාත්‍යාංශයේ හිටපු ඇමතිවරයා හැටියට රමේෂ් පතිරණ මැතිතුමා වැඩ කළා. එතුමාත් දැවැන්ත වැඩ කොටසක් කළා. මේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය වශයෙන් පළපුරුදු ලේකම්තුමියක් ඉන්නේ. එතුමිය කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමිය හැටියට අවුරුදු ගණනක් වැඩ කරපු නිසා එතුමියටත් ලොකු අත්දැකීම් තිබෙනවා. අත්දැකීම් තිබෙන ලේකම්වරියක් නිසා එතුමියට මේ අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යන්න අපහසුවක් නැහැ. මොකද, එතුමියට දීර්ඝ කාලයක් වැඩ කරලා පළපුරුද්ද තිබෙනවා. ඔබතුමාට හොඳ නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නවා. එතුමාත් මහන්සි වෙනවා. ඔබතුමාත් මහන්සි වෙන්න පුළුවන් ඇමතිවරයෙක්. ඒ නිසා මේ කර්මාන්ත නහා සිටුවනකොට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවල ඉන්න ඒ අයගේ දිරි දීමනා - incentives, අරවා මේවා, ඉල්ලන දේවල් දෙන්න ඕනෑ. ඒවා දෙන ගමන් තමයි ඒ අයගෙන් අපට අපේ ලාභ ටික, නැත්නම් ආයතනයේ දියුණුව සලසාගන්න පුළුවන් වෙන්නේ. මේ ආයතන ගොඩනඟාගන්න අපි පුළුවන් තරම් කැපවෙන්න ඕනෑ.

මා ළඟ වාඩි වෙලා ඉන්න මේ බී. ආරියවංශ මන්ත්‍රීතුමා ඇඹිලිපිටිය ප්‍රදේශයේ. අපට විශාල සම්පතක් ඇඹිලිපිටියේ තිබෙනවා. උළු ෆැක්ටරිය තිබෙනවා. උළු ෆැක්ටරිය විශාලයි. කඩදාසි කම්හල වෙනම තිබෙනවා. හැබැයි, කඩදාසි කම්හල දැන් පෞද්ගලික ආයතනයකට දීලා තිබෙන නිසා කරගෙන යනවා. උළු ෆැක්ටරිය තිබෙන ඉඩම විශාල ඉඩමක්. ඒවායේ උළු හදන්න බැරි නම්, ආයෝජකයෙක් ගෙනැල්ලා වෙන මොනවා හරි ෆැක්ටරි ටිකක් දමන්න ඕනෑ. මම හිතන විධියට, කර්මාන්ත අමාත්‍යාංශය යටතේ විශාල දේපළ ප්‍රමාණයක් තිබෙනවා. අනුරාධපුරයේ ගියාම, විලච්චිය පාරේ ලොකු ඉඩමක හමුදා කඳවුරු දාලා. දැන් නම් ඒවා ඉවත් කරගෙන ගිහිල්ලා. එතැනත් ලොකු ඉඩමක් තිබෙනවා, උළු ෆැක්ටරියත් එක්ක. ඒ වාගේම තමයි මාවතගම. එතැනත් ලොකු ඉඩමක් තිබෙනවා, උළු ෆැක්ටරියත් එක්ක. ඒ වාගේ මහියංගනයේත් ලොකු ඉඩමක් තිබෙනවා; උළු ෆැක්ටරියක් තිබෙනවා. මේ කර්මාන්තවල උළු හදන්න බැරි නම් වෙන මොනවා හරි හදන්න. ආයෝජකයෝ එනවා නම් ඒවායේ මොනවා හරි පටන් ගන්න. ඇඹිලිපිටියේ අඩුම වශයෙන් වෙන කර්මාන්තශාලාවක් හරි පටන් ගන්න පුළුවන්. ඇඹිලිපිටිය කඩදාසි කම්හල පෞද්ගලික ආයතනයකට දීපු එකෙන් විශාල රැකියා ප්‍රමාණයක් වාගේම ඒ ප්‍රදේශයට ලොකු ශක්තියක් ඇති වෙලා තිබෙනවා. ඉතින්, මේවා වහගෙන ඉදීමේ තේරුමක් නැහැ. මේවාගෙන් කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැතිව වහගෙන ඉන්න එකයි අපි කරන්නේ.

ඔබතුමා කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පටන් ගන්නවා කියලා මට ආරංචියක් ලැබුණා. ඒක බොහොම හොඳ වැඩක්. පටන් අරගෙන, අඩුම වශයෙන් මේ පැත්තට කෙසේ වෙතත් උතුරු පැත්තේ -මුලතිව්, කිලිනොච්චියෙන් එහාට- සිමෙන්ති ප්‍රශ්නය විසඳන්න පුළුවන් නම් හොඳයි. අපට ලාංඡනයක් තිබෙනවා. කර්මාන්ත අමාත්‍යාංශයට අයිති ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව තිබෙනවා. ඒ නිසා මේක කරගෙන යන්න පුළුවන්, බැරි නැහැ. වැඩ කරනකොට මෙහෙම තමයි. සමහර වැඩ කරන්න දෙන්නේ නැහැ, ගරු ඇමතිතුමා. ඒක ඔබතුමා දන්නවා. එක එක ආයතන එනවා. ඇවිල්ලා කියනවා, නඩු දානවා කියලා. වැඩි ප්‍රමාණයක් නඩු දාගෙන ආයෝජකයන්ට වැඩක් කරන්න දෙන්නේ නැති තැනක් මේක. ගොඩක් තැන්වල අවශ්‍යතාව අනුව වැඩ කටයුතු කරගෙන යනකොට ඒ වාගේ ප්‍රශ්න ඇති වෙනවා. කර්මාන්ත අමාත්‍යාංශය වැදගත් ක්ෂේත්‍රයක්. බොහොම ආසාවෙන්, උනන්දුවෙන් වැඩ කටයුතු කරන්න පුළුවන් තැනක්. ඔබතුමා ඒ වෙනුවෙන් මහන්සි වෙලා වැඩ කළොත් මේ රටේ දියුණුව වෙනුවෙන්, ජයග්‍රහණය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. එවැනි ආයතනයක් ඔබතුමාට ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ ආයතනයේ දායකත්වය ඇතිව මේ රට දියුණු කරන්න, ගොඩ නහන්න ඔබතුමන්ලා දෙපළට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.18]

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සහ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී විශේෂයෙන්ම මම තරුණ කටයුතු පිළිබඳව අවධානය යොමු කරන්න කැමැතියි. මොකද, අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් පෙර කථාවලදී විශේෂ අවධානයක් යොමු වුණ නිසා.

අපි දන්නවා, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ඇතුළේ ආයතන ප්‍රමාණයක් තිබෙන බව. දීර්ඝ කාලයක් තිස්සේ මේවා ක්‍රියාත්මක වෙලා තිබෙනවා, රටේ තරුණ ප්‍රජාව වෙනුවෙන්. අපි මෙවර අය වැයෙන් ජාතික තරුණ සේවා සභාවට රුපියල් මිලියන 600ක් විවිධ ව්‍යාපෘති සඳහා වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම ජාතික යොවුන් සේනාංකයට රුපියල් මිලියන 500ක් සහ නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට රුපියල් මිලියන 70ක් මුදල් වෙන් කර තිබෙනවා. මේවායින් විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් කරන්න නියමිතයි.

ඒ කාරණාත් එක්කම මම වැඩි වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ, අපේ රටේ තාරුණ්‍යයට තිබෙන ප්‍රශ්නය කුමක්ද කියන එක පිළිබඳව. දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටේ තරුණ ප්‍රජාවත් එක්ක අපි කටයුතු කරනවා. අතිවිශාල තරුණ ප්‍රජාවක් ශ්‍රී ලංකාවේ ජීවත් වනවා. පසුගිය කාල සීමාව තුළත්, මේ මාස කිහිපය තුළ ආණ්ඩුකරණයේ නියැළෙද්දීත් අපි ඔවුන් මුණ ගැහිලා තිබෙනවා. නමුත්, මූලික ප්‍රශ්නය තිබෙන්නේ, තරුණ ගැටලු සහ ප්‍රශ්න ගැන කථා කළාට, අර්බුද සහ බේදවාචක කියන තැනට ඒ ප්‍රශ්න ගිහිල්ලා තිබෙන එක. පසුගිය දිනවල සහ අදත් විශාල වශයෙන් උපාධිධාරීන්ගේ රැකියා ගැටලු, ඒ වාගේම තරුණ රැකියා වියුක්තිය පිළිබඳ කථා බහක් ඇති වුණා. මේ විධියට නිරන්තරයෙන් කථා බහට ලක් වන ක්ෂේත්‍රයක් බවට මේ ක්ෂේත්‍රය පත් වෙලා තිබෙනවා.

හැබැයි, ප්‍රශ්නය කේන්ද්‍රගත වන්නේ අපේ රටේ තාරුණ්‍යය එක් අදියරකින් එහාට ඔසවා තබන්න අපි කොයි තරම් දුරකට

[ගරු තනුර දිසානායක මහතා]

සංයුක්ත වැඩ පිළිවෙළකට අපේ මේ ක්‍රියාමාර්ග යොමු කර තිබෙනවාද කියන කාරණය මතයි. මොකද, විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් ගියාට වැඩක් නැහැ, තාරුණ්‍යය අවුරුද්දෙන් අවුරුද්ද, මාසයෙන් මාසය කොයි දිශාවට ද ගෙනියන්නේ කියන එක සම්බන්ධයෙන් හොඳ ලයින් එකක් අපට තිබෙන්නට ඕනෑ. විශේෂයෙන්ම ආණ්ඩුවක් විධියට අපි ඒක විශේෂයෙන්ම සලකා බලපු කාරණයක්. අපේ රටේ තරුණයාට ප්‍රශ්න තිබෙනවා. එකක් තමයි, කොයි තරම් වැඩසටහන් තිබුණත් ඒ අයට ඕනෑ කරන දේවල් නිවැරදිව සන්නිවේදනය කර ගැනීමේ ප්‍රශ්න තිබෙනවා. අද වෙනකොට හැමෝම නවීන තාක්ෂණය පාවිච්චි කරනවා. සමාජ මාධ්‍ය දිහා බැලුවොත් රටේ වෙන්න ඕනෑ වෙනස්කම්, තරුණයන් වෙනුවෙන් වෙන්න ඕනෑ වෙනස්කම් සම්බන්ධයෙන් විශාල සංවාද ප්‍රමාණයක් සමාජ මාධ්‍යවල යනවා. ඒ වාගේම, discussion forums තිබෙනවා. ඒ ඩිජිටල් අවකාශය තුළ platformsවල, discussion forumsවල විශාල වශයෙන් ඒ උදවිය එකතුවෙලා කථාබස් කරමින් යනවා. ලෝකය තවදුරටත් ඉස්සරහට යන්නේ ඔය විධියට තමයි. ඒ නිසා අපට නිවැරදිව මේ තරුණ ප්‍රජාව වෙනුවෙන්, විශේෂයෙන්ම රටේ අනාගතය වෙනුවෙන් යහපත් ක්‍රියාවලියකට අපේ ආණ්ඩුවේ සහ රජයේ ක්‍රියාවලිය යොමු කරන්න ඕනෑ නම්, අපට ඒ අයත් එක්ක හොඳ සන්නිවේදනයක් තිබෙන්න ඕනෑ. ඒ අයගේ අදහස් මේ ව්‍යාපෘතිවලට, වැඩසටහන්වලට යොදා ගන්න ඕනෑ. ඒ නිසා අපි විශේෂයෙන්ම ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය එක්කත් සම්බන්ධ වෙලා youth app එකක් සංවර්ධනය කරමින් ඉන්නවා.

අපි හඳුනා ගත්ත ප්‍රශ්න ටිකක් තිබෙනවා. එකක්, අපේ රටේ තරුණ අය විවිධ ක්ෂේත්‍රවලින් ඉගෙන ගන්නවා. ඒක හරි. පසුගිය කාලසීමාව තුළ මගේ ප්‍රදේශයේ තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් මාව හමුවෙලා තිබෙනවා. ඒ උදවියගෙන් ඇතැම් අය ඇවිල්ලා අපෙන් අහන්නේ, මොකක් හරි රැකියාවක් කොහොමද ගන්නේ කියන එක ගැනයි. ප්‍රශ්නය වන්නේ, ඒ අයට කිසිම guidance එකක් ලැබිලා නැහැ. ඒ අය විවිධ ක්ෂේත්‍රවලින් ඉගෙනගෙන තිබෙනවා. රටේ ආර්ථිකය හැසිරවෙන්නේ කොහාටද කියලා අපි බලන්න ඕනෑ. මොකද, අපි අද තමයි, මේ ආණ්ඩුවේදී තමයි අපි හඳපු අමාත්‍යාංශවල එක අරමුණකින් වැඩ කරන්නේ. මොකද, රැකියා ප්‍රශ්නයට උත්තර හොයන්න නම් එකක්, කර්මාන්ත අමාත්‍යාංශයටත් විශාල වගකීමක් තිබෙනවා. ඒ වාගේම තමයි, සංචාරක අමාත්‍යාංශයටත්, අධ්‍යාපන අමාත්‍යාංශයටත් ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා.

අපි අමාත්‍යාංශ 24ක් හදලා තිබෙනවා නේ. මේ හැම එකක් වෙනුවෙන්ම තමන්ගේ වැඩසටහනේ යම් කොටසක් වෙන් වෙන්න ඕනෑ. එක අරමුණකින්, ඉලක්කයකින් වැඩ කළොත් තමයි සමස්ත ප්‍රශ්නය විසඳෙන්නේ. එහෙම නැතිව අපි කොටස කොටස, මොනවා හරි නිශ්චිත ගැටලු සම්බන්ධයෙන් විතරක් කථා කළාට තාරුණ්‍යය මුහුණ දෙන ප්‍රශ්න විසඳන්න හම්බ වෙන්නේ නැහැ. විශේෂයෙන්ම එයාලාට අධ්‍යාපනය ලබා ගන්නකොට හොඳ guidance එකක් දෙන්න ඕනෑ; හොඳ මහ පෙන්වීමක් දෙන්න ඕනෑ, "ඔය ගොල්ලන්ගේ දක්ෂතා අනුව මෙන්න මේ දේවල් ඉගෙන ගන්න, අපි ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිය විධියට මෙන්න මේ ක්ෂේත්‍රය දියුණු කරනවා" කියලා. උදාහරණයක් විධියට අපි සංචාරක ක්ෂේත්‍රය දියුණු කරනවා නම්, ඒකට අදාළව අපි තාරුණ්‍යය පුහුණු කරන්න ඕනෑ. කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කරනවා නම්, අලුත් තරුණ ව්‍යවසායකයන් හදන්න අපි සැලසුම් කරනවා නම්, ඒකට අදාළ වැඩ පිළිවෙළ කේන්ද්‍රගත වෙන්න ඕනෑ. විශේෂයෙන්ම ඒ අයටත් වුවමනාව තිබෙනවා. ඒ තරුණ අයත් කැමති දේවල් තිබෙනවා. එම නිසා ඒ අයත්, ආණ්ඩුවත්, මේ රාජ්‍ය ක්‍රියාවලියත් ඒකාබද්ධ කරන්න නම් හොඳ සංවාදයක් හදාගන්න ඕනෑ, ඒ අයගේ ප්‍රශ්න හොඳට අවබෝධ කර ගන්න ඕනෑ. Counselling කරන්න ඕනෑ වෙලාවල් තිබෙනවා; හොඳ guidance එකක් දෙන්න ඕනෑ. මේ සඳහා හොඳ social media type එකේ platform එකක් අද රටට අවශ්‍ය වෙලා තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. මොකද, අපට ඕනෑ තරම් හෝට්ල් සම්බන්ධයෙන් හරි, කොතැන හෝ තැනක ඒගොල්ලන්ට එක්ක සාකච්ඡා කරන්න පුළුවන්; අදහස් ගන්න පුළුවන්. අපි ඕනෑ තරම් එහෙම ඒවා කරනවා, ඒ අයව හම්බ වෙනවා. WhatsAppවලින් message කරනවා; Messengerවලින් කටයුතු කරනවා. නමුත්, මේකට හොඳ platform එකක් ඕනෑ. අද ඉන්දියාව ගත්තොත් ඒ අය විශේෂයෙන්ම volunteer programmes ගොඩක් කරනවා. MY Bharat Programme එක කරගෙන යනවා. ඒකේ volunteersලා විධියට තරුණ ප්‍රජාව සම්බන්ධ වෙනවා. ඒවාට register වෙනවා. හැබැයි, විශේෂයෙන්ම අපේ රටේ තරුණයන්ට තිබෙන උනන්දුව නිසාම පරිසරය ආරක්ෂා කරන්න හරි මොනවා හෝ ක්‍රියාවලියකට volunteersලා විධියට වැඩ කරනවා. හැබැයි, මේක හරියට ඒකාබද්ධ වෙලා කියලා පේන්නේ නැහැ. එම නිසා ඒ අයගේ social skills වැඩි වෙන්න නම්, සමාජශීලීත්වය වැඩි වෙන්න නම්, ලෝකය යන්නේ කොයි පැත්තටද කියන එක සහ ඒගොල්ලන්ට තව වැඩි වැඩියෙන් අවස්ථා ලැබෙන්න නම් අපි ඒ අය ස්වේච්ඡා සේවාවන්වලටත් සම්බන්ධ කර ගන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන ඉතාම පුළුල් වැඩසටහනක් විධියට කරගෙන යනවා. අපට පුළුවන් මේ ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනට අපේ තරුණ ප්‍රජාව විශාල වශයෙන් සම්බන්ධ කර ගන්න. මේ වැඩසටහන්වල ඵලදායීතාව, මේ අමාත්‍යාංශය හරහා, ආයතන හරහා වියදම් කරන මුදල්වල ඵලදායීතාව ගෙනෙන්න අපට පුළුවන් වන්නේ ප්‍රායෝගික හැකියාවන්, කුසලතා සහිත තරුණ ප්‍රජාවක් අපි නිර්මාණය කළොත් පමණයි. ඒ නිසා අපි විශේෂ අවධානයක් මේ සම්බන්ධයෙන් යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මිහිකත සුරැකීමේ බලකායට "ක්ලීන් ශ්‍රී ලංකා" වෙනුවෙන් අපි යම් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම තමයි, "භවසට IT" වැඩසටහන. ඒ විධියට අපි මේ වසර තුළ ප්‍රවේශය අරගෙනයි තිබෙන්නේ. විශේෂයෙන්ම තරුණයන් එක්ක හොඳ සංවාදයක් සහිතව, ඒගොල්ලන්ට ඕනෑ කරන විධියට, එක තලයකින් ඒගොල්ලන්ගේ ජීවිතය උස්සලා ගන්න පුළුවන් විධියට social media platform එකක් වාගේ platform එකක් හදන එක සහ තවත් විශාල බලාපොරොත්තු ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම අපි V4R වැඩසටහනත්, ඩිජිටල්කරණයත් එක්ක -

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපි V4R App කියලා platform එකක් හදුන්වා දෙන්න සූදානම් වෙලා තිබෙනවා. ඒකට හේතුව මේකයි. විශාල අදහස් ප්‍රමාණයක් සහිත, නව නිෂ්පාදන කරන, නවෝත්පාදන කරන සහ සැලසුම් සහිත තරුණ ප්‍රජාවක් ඉන්නවා. ඒ නිසා ආණ්ඩුවේත්, රජයේත් ක්‍රියාවලියට සහ ඉලක්කවලට යන්න, මේ සියලු

අමාත්‍යාංශ හරහා යෙදවෙන රටේ ඉදිරි දිශානතියට තරුණයන් බද්ධ කර ගැනීම සඳහා අපට digital platform එකකට ඒගොල්ලන් එක්ක සම්බන්ධ වෙන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒ සඳහා ආණ්ඩුවල ප්‍රතිපත්ති, රජයේ ප්‍රතිපත්ති වෙනස් කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් ඔවුන් හුදකලා වෙනවා. අපි වෙන වැඩසටහනක යනවා. ඒ නිසා ඒක නවත්වන්න ඕනෑ. අපි දීර්ඝ කාලයක් තිස්සේ මුදල් වියදම් කරලා තිබෙනවා. හැබැයි හරි ලයින් එකකට, අපේ තාරුණ්‍යයේ ජීවිත ඊළඟ මට්ටමට, තෘප්තිමත් තාරුණ්‍යයකට, නිවහල් චින්තනයකින් යුතු තාරුණ්‍යයකට ගෙන යන්න නම් අපි තාක්ෂණයත් එක්ක බද්ධ වෙච්ච ක්‍රියාවලියක යන්න ඕනෑ කියලා අපි හිතනවා. ඒක තමයි අපේ අරමුණ. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.26]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේත්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ තමයි අද දින විවාදයට ගැනෙන්නේ. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ගැන දීර්ඝ වශයෙන් කථා කිරීමට අවශ්‍ය නැහැ. මොකද, ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක් නොවුණත්, කර්මාන්ත ප්‍රවර්ධනය කරන්නේ කොහොමද කියන කාරණයේදී ඔබතුමන්ලාගේ බදු ප්‍රතිපත්තියත් එක්ක ඔබතුමන්ලාට විශාල අභියෝගයකට මුහුණ දෙන්න සිදු වෙනවා, ගරු අමාත්‍යතුමනි. ලෝකයේ බොහෝ රටවල competitive tax model එකක් තමයි තිබෙන්නේ කියලා අපි දන්නවා. යම් රටක කර්මාන්තවලට ආයෝජනය කරනවා නම්, ඒ ආයෝජනය කරන රට ඇතුළේ තමන්ට උපරිම ලාභයක් උපයන්න පුළුවන් ආකාරයට තමයි කර්මාන්තවලට ආයෝජනය වෙන්නේ. තවත් පැත්තකින්, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට financial issue එකක් තිබෙනවා; cash flow ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම market accessibility පිළිබඳව විශාල ගැටලුවක් තිබෙනවා. ඉතින් මේ කාරණා එක්ක වර්තමානයේ පොලී අනුපාතයේ යම් අඩුවීමක් තිබුණත්, අපේ රටේ බැංකු පද්ධතියේ ක්‍රමවේදය සකස් වෙලා තිබෙන විධිය අනුව collateral එකක් නැතුව, අඩුම ගණනේ ගෙදර ඔප්පුව හෝ නැතුව business proposal එකකට ණයක් දෙන්නේ නැහැ කියලා අපි දන්නවා. ඔබතුමන්ලා මැතිවරණ කාලයේ යම් formula එකක් හැදුවා. මම හිතන විධියට, මුදල් පනත සහ මහ බැංකුවේ අණ පනත් වෙනස් කරනකල් ඔය කියන කිසිම formula එකක් ක්‍රියාත්මක කරන්න වෙන්නේ නැහැ. ඒ වාගේම තමයි දේශීය කර්මාන්තවලට, නැත්නම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට රටේ හැම රජයක්ම යම් සහන දෙනවා. හැබැයි ඒ සහන දීම තුළ අපි අපේක්ෂා කරන ඉලක්කවලට යනවාද නැද්ද කියන කාරණය පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ. අද ඉන්දියාවේ සෙල්ලම් බඩු නිෂ්පාදනය බලන්න. අසල්වාසී රට නිසායි මම ඉන්දියාව උදාහරණයට ගන්නේ. මෙතෙක් කල් ලෝකයේ වැඩියෙන්ම සෙල්ලම් බඩු import කළේ ඉන්දියාව. හැබැයි, අද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාගේ ඉඳලා ඒ සඳහා සම්බන්ධ කර ගැනීම තුළ, domestic market එකට අමතරව සෙල්ලම් බඩු - පොඩි ළමයින්ගේ toys - සඳහා ලෝකයේ පළමු පෙළ export market එකක් සහිත රටක් බවට එය පරිවර්තනය වෙලා තිබෙනවා.

ඊළඟට, දේශීය නිෂ්පාදන සහ දේශීය සොයාගැනීම්වලටත්, නැත්නම් IP Registration එක ලංකාවට තිබෙන ආයතනවලටත් ඔබතුමන්ලාගේ tax policy එකත් එක්ක තවත් පැත්තකින් IMF රෙගුලාසි නිසා විශාල අභියෝගයක් එල්ල වෙලා තිබෙන බවත් කියන්න ඕනෑ. උදාහරණයක් හැටියට කිව්වොත්, වේගා එකේ ත්‍රි රෝද රථය. ඒකේ Intellectual Property -IP- Right එක තිබෙන්නේ ලංකාවට; අනෙක් පැත්තෙන්, නිෂ්පාදනය කරන්නේ ලංකාවේ. ඒක assembling නොවෙයි, semi knocked-down නොවෙයි. ලංකාවේ නිෂ්පාදිත, ලංකාවේ ලියාපදිංචි, ලංකාවට Intellectual Property Right එක තිබෙන වාහනයක්. හැබැයි ඒකටත් import tax එක වදිනවා, componentsවලට නොවෙයි, සම්පූර්ණ වාහනයටම. හැබැයි ලංකාවේ Intellectual Property Right එකක් හොයාගෙන, ඒක තවත් රටකට විකුණන්නේ නැතුව ලංකාවේ නිෂ්පාදනය -manufacture - කරනකොට ඒ වාහනයටත් - ඒ ත්‍රි රෝද රථයටත් -import tax එකක් අය කරනවා නම් එතැනින් එහාට අපේ රටේ Intellectual Property market එකක් නිර්මාණය වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඉතින් හොඳම උදාහරණය තමයි ඇමෙරිකාව. ඇමෙරිකාවේ Intellectual Property market එක අද ඩොලර් බිලියන 6ක්; එය ඩොලර් බිලියන 6කට වැඩි ආර්ථිකයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා අපි රටක් විධියට මේ සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් කළ යුතුයි කියලා මම හිතනවා. ආණ්ඩුව විධියට ඔබතුමන්ලා ඒ සඳහා යම් ඍජු මැදිහත්වීමක් සිදු කළ යුතුයි.

මොකද, ඇමෙරිකාව වාගේ රටක වුණත්, වෙනත් රටක වුණත් වාහන නිෂ්පාදනය නොකළත්, Intellectual Property එක නිසා ලැබෙන ආදායම ඩොලර් බිලියන 6 ඉක්මවනවා. තමුන්නාන්සේලාගේ බදු ප්‍රතිපත්තියත්, තමුන්නාන්සේලා මෙතෙක් කල් ආයෝජකයන් කෙරෙහි සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් කෙරෙහි දැක්වූ දේශපාලන ආකල්පය නිසාත් තමුන්නාන්සේලාට ඒ අභියෝගයට මුහුණ දීමට සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ගැනත් කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා. මමත් කාලයක් එම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විධියට කටයුතු කළා. මම ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ හිටපු අමාත්‍යාංශ ලේකම් අනුරාධ විජේකෝන් මැතිතුමාටත්, එදා හිටපු DG (Sports) අමල් එදිරිසූරිය මැතිතුමාටත්, ඒ වාගේම ක්‍රීඩා කවුන්සලයේ සභාපතිවරයා විධියට කටයුතු කළ මහේල ජයවර්ධන මැතිතුමා ඇතුළු ඒ සමස්ත කණ්ඩායමටම මා මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා ඇතුළු ඒ Selection Committee එකේ කටයුතු කළ සියලුදෙනාටත් මා ස්තුතිවන්ත වෙනවා, එදා ඒ කළ කැපවීමට. මොකද, ඒ වෙනකොට පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වයත් එක්ක තමයි අපට තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ කටයුතු කරන්න සිද්ධ වුණේ. එදා ලෝකයේ අනික් රටවලත් ක්‍රීඩාව සම්පූර්ණයෙන්ම අඩපණ වෙලා තිබුණේ. හැබැයි අපට හැකියාවක් ලැබුණා, bio-bubble එක ඇතුළේ LPL තරගාවලිය පටන් ගන්න. ඉන්දියාවත් තමන්ගේ තරග ඩුබායිවලට shift කරනකොට, දකුණු ආසියාවේ පළමු වතාවට අපට LPL තරගාවලිය පවත්වන්න හැකියාව ලැබුණා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ කැපවීමත් සමඟ. මම විශ්වාස කරනවා, LPL එක අද වෙනකොට ඩොලර් මිලියන 150 ඉක්ම වූ brand එකක් බවට පරිවර්තනය වෙලා තිබෙන බව.

ක්‍රීඩාව කිව්වාම, එය හුදෙක් ක්‍රීඩා භාණ්ඩ බෙදීමක් හෝ තනි - හුදෙකලා - ව්‍යාපෘතියක් හෝ අමාත්‍යාංශයක් විධියට දකින්න එපා. මොකද, ලෝකය තුළ තිබෙන්නේ ඩොලර් ට්‍රිලියන 2.3කටත් එහා ගිය ක්‍රීඩා ආර්ථිකයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඉන්දියාවේ

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ක්‍රීඩා ආර්ථිකය 2030 වර්ෂය වෙනකොට ඔවුන්ගේ රට ඇතුළේ ඩොලර් බිලියන 130 ඉක්ම වූ ආර්ථිකයක් බවට පත් කරනවා. ඒ වාගේම මිලියන 10.5කට එහා රැකියා උත්පාදනය කරන රටක් බවටත් ඒ රට පත් වෙනවා. ඒ වාගේම ඔවුන්ගේ ක්‍රීඩා ආර්ථිකය තුළින් ඔවුන්ගේ රටට ඩොලර් බිලියන 21කට වැඩි බදු ආදායමක් ලබා දීමට සැලසුම් හදා තිබෙනවා. අනෙක් පැත්තෙන්, ඇමෙරිකාව වාගේ රටවල ක්‍රීඩා ආර්ථිකය ඩොලර් බිලියන 500 ඉක්මවා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම ලෝකයේ අලුතින් e-games කියන concept එක ව්‍යාප්ත වෙනවා. මම හිතන විධියට 2030-2032 වර්ෂ වෙනකොට ඩොලර් බිලියන 6 ඉක්ම වූ ආර්ථිකයක් බවට e-games ආර්ථිකය පරිවර්තනය වෙනවා. කොරියාව වාගේ රටවල සමස්ත ආර්ථිකයට sports economy එකෙන් සියයට 13ක් වාගේ ප්‍රමාණයකුත්, global esports market එකෙන් සියයට 13ක්, 14ක් වාගේ ප්‍රමාණයකුත් ලැබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා ක්‍රීඩාව කියන කාරණය හුදෙක් ක්‍රීඩාවලට පමණක්, නැත්නම් ක්‍රීඩා භාණ්ඩ බෙදීම කියන කාරණයට පමණක්, එහෙමත් නැත්නම් අපි සාම්ප්‍රදායිකව විශ්වාස කරන ක්‍රීඩාවට පමණක් ලඝු කරන්න එපා කියාත් මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

එක පැත්තකින්, leisure sports ගැන කථා කරනවා. තමුන්නාන්සේලා, අපි වාගේ අය උදේ හවස දුවමින්, ව්‍යායාම කරමින්, walking pathsවල ඇවිදිනවා, jogging pathsවල ඇවිදිනවා. එහෙම කරන අයගේත් යම් කිසි ක්‍රීඩා ආර්ථික මට්ටමක් තිබෙනවා. කොරියාව වාගේ රටවල walking, jogging කියන එක දැවැන්ත ක්‍රීඩා ආර්ථිකයක් බවට අද පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි, competitive sports කියන එකත්. පදක්කම් දිනා ගන්න, ලෝක කුසලාන දිනා ගන්න, ආසියානු තරග ජයග්‍රහණය කරන්න අවශ්‍ය competitionවලට යන්න පුළුවන් විධියට competitive sportsවලින් ක්‍රීඩකයා හැදෙනවා. එහෙම ක්‍රීඩකයෙක් හදන්න නම් leisure sports industry එක develop වෙන්න ඕනෑ. මොකද, ක්‍රීඩක ක්‍රීඩිකාවන් competition එකකට එන්න කලින් ඒ අයගේ තරුණ කාලයේ leisure sportsවලට active nation එකක් බවට මේ රට පරිවර්තනය කරන්න ඕනෑ.

ඊළඟට, ක්‍රීඩා ආර්ථිකය - sports economy එක - බලන්න. Apparel sector එකෙන් පටන් ගත්තාම, manufacturing දක්වා Intellectual Properties වාගේම asset, brand values develop කරන්න, franchise tournamentsවලට මේක පරිවර්තනය කරන්න ඕනෑ. ක්‍රීඩා ආර්ථිකයත් එක්ක බැඳුණු තවත් දෙයක් තමයි, sports tourism කියන එක. වාමර සම්පත් මන්ත්‍රීතුමාත් මේ ගැන සඳහන් කළා. 2026දී 20යි, 20 ලෝක කුසලාන තරගාවලිය ලංකාවේ පවත්වනවා. එහි Matches 22ක් තිබෙනවා. අපට ඒ සඳහා අවශ්‍ය 5වැනි ක්‍රීඩා පිට්ටනියත් ලංකාවේ තිබුණා නම්, BCCI එක නැතුව තනිව ලෝක කුසලාන තරගාවලියක් අපේ රටේ පැවැත්වීමේ හැකියාව අපට ලැබෙනවා. හැබැයි, අවාසනාවකට අපට ඊට ගැළපෙන පිට්ටනි 4යි තිබෙන්නේ. තනියෙන් World Cup tournament එකකට host කරන්න නම්, ඊට සරිලන පිට්ටනි 5ක් තිබෙන්න ඕනෑ.

කෙසේ වෙතත්, අද ලෝකය sports industry එකක් බවට පරිවර්තනය වෙමින් පවතිනවා. ඒ නිසා කර්මාන්ත අමාත්‍යාංශයටත්, සංචාරක අමාත්‍යාංශයටත් මේ විෂයය වැදගත් කියා මම විශ්වාස කරනවා. හැබැයි, competitive sportsවලදී අපි High Performance Pool එක කොච්චර කාලයකට maintain කරනවාද? බොහෝ වෙලාවට අපි දකින්නේ හැම අවුරුද්දේම මාස 6කට කලින් performance සම්බන්ධව selection එකක් තියලා, pool එක කැඳවන එකයි. එදා අපි සැලැස්මක් හැදුවා, 2032 වර්ෂය දක්වා ක්‍රීඩා පාසලෙන් එන දරුවන් ඉස්සරහට ගෙනෙන්න. මම දැක්කා, හඳුන්නෙත්ති ඇමනිතුමා ගිහිල්ලා මාතර ජාත්‍යන්තර ක්‍රිකට් පුහුණු පාසලක් ආරම්භ කිරීමේ කටයුතු සැලසුම් කර තිබුණු බව. ඒ සම්බන්ධව යම් ආන්දෝලනයකුත් ඇති වුණා. ඒවා එහෙම තමයි. මෙවැනි දේවල් සම්බන්ධව එක එක අයගේ එක එක මත තිබෙනවා. ක්‍රීඩා පුහුණු පාසලක් ඉදිකිරීමේ වැරැද්දක් නැහැ. හැබැයි, ඒක business model එකකට ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මම හිතන විධියට ඒකට සූරියවැව ක්‍රීඩාංගණය base කරගන්න පුළුවන්, ඒ වාගේම පල්ලෙකැලේ ක්‍රීඩාංගණය base කරගන්න පුළුවන්, දඹුල්ල ක්‍රීඩාංගණය base කරගන්න පුළුවන්, බෙත්තාරාම ක්‍රීඩාංගණය base කරගන්න පුළුවන්.

ඒ වාගේම යාපනයත් කේන්ද්‍ර කරගෙන Sri Lanka Cricket එකත්, Football Federation එකත් එකතු කරගෙන මේ කටයුතු කරන්න. Football Federation එක විතරක් නොවෙයි, Sri Lanka Athletics එකත් මේ සඳහා එකතු කර ගන්න. සල්ලි උත්පාදනය කර ගන්න පුළුවන් ක්‍රීඩා සංගම් කිහිපයක් අපේ රටේ තිබෙනවා. විශේෂයෙන්ම තිබෙනවා Sri Lanka Cricket සහ Football Federation එක. එම නිසා මේ සංගම් දෙක එකට බද්ධ කර ගන්න. මොකද අපේ රටේ capacity එක නැහැ, තනි academy එකකින් ක්‍රියාත්මක වන්න. මොකද, අපේ ජනගහනය - population එක - මිලියන 22යි. එක පිට්ටනියක matches 5ක් ගහලා බලන්න, සෙනඟ එන්නේ නැහැ. ඒක තමයි යථාර්ථය. Travel කරලා, පිට්ටනිවලින් මාරු කර කර තරග දෙන්න ඕනෑ. ක්‍රීඩාවකට තනියෙන් survive වෙන්න බැහැ. තමුන්නාන්සේලා වෙන්න පුළුවන්, වෙනත් ඕනෑම ආණ්ඩුවක් වෙන්න පුළුවන්, මේ කාරණා ඇතුළේ holistic approach එකක් අරගෙන සමස්ත සංගම් එකතු කරගෙන යන ගමනකට ඒ කවුරු හෝ සූදානම් වෙන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම National High Performance Pool එක ගැනත් කථා කළ යුතුයි. අපි ඒ කාලයේ National High Performance Pool එකට මාසිකව රුපියල් 100,000ක් දුන්නා, ඒ වාගේම ආහාරවලටත් යම් දීමනාවක් දුන්නා, පුහුණුකරුවාටත් රුපියල් 50,000ක් දුන්නා. හැබැයි, මෑත කාලයේ ඒ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් අතරමඟ නවතා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, හැබැයි මේකට excuse එකක් විධියට කියන්නේ, අවශ්‍ය මුදල් නැහැ කියලා, එහෙම නැත්නම් sponsorsලා නැහැ කියලා. හැබැයි, තමුන්නාන්සේලා මේ Budget එක හදන ක්‍රමවේදය පිළිබඳව රට තුළ ල ාකු ප්‍රශ්නයක් තිබෙනවා.

අපි හැම අවුරුද්දකම Budget එක හදන්නේ කොහොමද? පසුගිය අය වැය ගන්නවා, ඒකට සියයට 10ක් එකතු කරලා දෙනවා. හැබැයි, තමුන්නාන්සේලා දෙපළටම මේක වැදගත් නිසා මතක තියා ගන්න. තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ඇතුළේ තරුණයාට සහ ක්‍රීඩකයාට වෙන් වෙන්නේ සියයට 6යි කියන එක. එහෙම නැත්නම්, මානව සම්පත් සංවර්ධනය - human resources development - සඳහා වෙන් වෙන්නේ සියයට 6යි. අපි ඒක ක්‍රීඩා කවුන්සලයේ සහයෝගයත් එක්ක සියයට 21කට වැඩි කළා. අවුරුදු 4ක් ඇතුළත මේක සියයට 40ක් දක්වා වැඩි කිරීම අපේ ඉලක්කයක්ව තිබුණා. හැබැයි දියුණු රටවල, මම සඳහන් කරපු දැවැන්ත ක්‍රීඩා ආර්ථිකයක් තිබෙන රටවල තරුණයාට සහ ක්‍රීඩකයාට සමස්ත අය වැයෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයක් වෙන් වෙනවා. අපට එතැනට යන්න කාලයක් ගතවේවි. අඩුම ගණනේ අවුරුදු 10ක transition period එකක්වත් යාවි.

තමුන්නාන්සේලා මේ අවුරුද්දේ Budget එක හදලා ඉවරයි. ඒ නිසා ඒකට තමුන්නාන්සේලාට මැදිහත් වෙන්න බැහැ. හැබැයි, ලබන අවුරුද්දේ Budget එක හදනකොටවත් තමුන්නාන්සේලා ඒ සියයට 6 අඩුම ගණනේ සියයට 21ක් බවට පත් කළොත් මේ දීමනා ටික ඒ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දෙන්න පුළුවන් වනවා. පසුගිය දවස්වල පැවති Paralympics තරග ාවලියේදී ජයග්‍රහණ ලබපු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඒ දීමනා දීලා නැහැ. ඉතින් ඒ පිළිබඳව ඔවුන්ගේ ලොකු කනස්සල්ලක් තිබෙනවා. ඒක සාධාරණයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 5ක් වෙන් කරනවා.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

තමුන්නාන්සේලා සමහර විට හිතනවා ඇති, Paralympiansලා වැඩක් නැහැ, normal athletesලාට තමයි ප්‍රධාන දීමනාව දෙන්න ඕනෑ කියලා. මේක දෙකක් විධියට දකින්න එපා. මොකද, අපට international platformsවල ලෙහෙසියෙන්ම medals දිනන්න පුළුවන් segment එක තමයි, Paralympic segment එක. මේ වෙනකොට අපි Paralympicsවල gold medals දිනලා තිබෙනවා. ඒ අයට අපේ ආණ්ඩුව කාලයේ අපි අවශ්‍ය සහයෝගය ලබා දුන්නා. ඉතින් මම විශ්වාස කරනවා, තමුන්නාන්සේලා ඒ අයව discriminate කරන්නේ නැතිව ඒ සම්බන්ධයෙන් කටයුතු කරයි කියලා. මොකද, පැවති හැම ආණ්ඩුවක්ම වාගේ - බොහෝ ආණ්ඩු - Paralympic කිව්වාම පැත්තකට දාලා තිබුණු ආකාරය අපි දකිනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගැන දන්නවා. මේ දෙගොල්ලන්ට වෙන වෙනම සලකන්න එපා. මේ දෙගොල්ලන්ම එක platform එකකට ගන්න. අපි ඒකට උත්සාහ කළා සහ ඒක සාර්ථක වුණා.

1973දී - විවෘත ආර්ථිකයටත් කලින් - හඳපු ක්‍රීඩා පනතක් තමයි අපට තිබෙන්නේ. විවෘත ආර්ථිකයටත් කලින් හදපු ක්‍රීඩා පනත ඇතුළේ ක්‍රීඩාව තිබෙන්නේ යැපෙන්නන්ගේ සංගමයක් විධියටයි. ආණ්ඩුවෙන් යැපෙන්න ඕනෑ. දැන් ලෝකයේ ක්‍රීඩා ආර්ථිකය ඩොලර් ට්‍රිලියන 2.3ක්. සංවර්ධනය වන රටක GDP එකෙන් සියයට 2ත්, 3ත් අතර ආදායමක් උත්පාදනය කරන brand විධියට, brand valuesවලින් ඩොලර් බිලියනය ඉක්මවා ගිහිපු brands අපි වාගේ රටකත් හදන්න පුළුවන් ක්ෂේත්‍රයක් - sector එකක් - තමයි ක්‍රීඩාව. එහෙමනම් මේ ක්‍රීඩා පනත සංශෝධනය විය යුතුයි. මම හිතනවා, ක්‍රීඩා අමාත්‍යතුමා මා එක්ක අමනාප වෙන එකක් නැහැ කියලා. මම නම් විශ්වාස කරන්නේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ඇමතිවරයා වෙනුවට ක්‍රීඩා අමාත්‍යාංශයේ Director Generalට - DGට - power එක දෙන්න ඕනෑය කියලායි. ඉන් පසු ක්‍රීඩා සංගම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන්නත්, ජාතික කණ්ඩායම තේරීමෙන් පසු ඒ සඳහා අත්සන් කිරීමේ බලය ඔහුට ලබා දෙන්නත් කටයුතු කරන්න ඕනෑ. ක්‍රීඩා අමාත්‍යාංශය සම්පූර්ණයෙන් ලේකම්වරයා යටතේ ක්‍රියාත්මක වෙන ආයතනයක් බවට පත් කළෝතින්, National Olympic Committee එකත්, Sri Lanka Cricket එකත්, Football Federation එකත් එක්ක තිබෙන ප්‍රශ්න ටිකත් විසඳිලා යනවා. මොකද අපි කැමැති වුවත්, අකැමැති වුවත් ලෝකය වටේම එය reform වෙලා තිබෙනවා. ලෝකයේම මේ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. අද වෙනත් රටවල ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රියාත්මක වන්නේ හුදෙකලා ක්ෂේත්‍රයක් විධියට නොවෙයි. හැබැයි, ස්වාධීන ආයතන විධියට ඒවා ක්‍රියාත්මක වනවා, දේශපාලන මැදිහත්වීමෙන් තොරව. මේ දේශපාලන මැදිහත්වීමට විරුද්ධව කථා කරන තමුන්නාන්සේලාටත් පුළුවන්, ක්‍රීඩා අමාත්‍යාංශය තුළින් මේක පටන් ගන්න. ක්‍රීඩා පනත සංශෝධනය කරන්න, අමාත්‍යවරයා අයින් කරන්න, Director Generalට - DGට - බලය දෙන්න, ක්‍රීඩා කවුන්සලය බල ගන්වන්න, ක්‍රීඩා කවුන්සලයට පූර්ණ කාලීන සාමාජිකයෝ බඳවා ගන්න.

ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්වරයා - Secretary - යටතේ Department එක පාලනය කරන්න. ඒ Department එක එක්කෝ අග්‍රාමාත්‍ය කාර්යාලයට හෝ ජනාධිපති ලේකම් කාර්යාලයට හෝ තමුන්නාන්සේලා කැමැති අමාත්‍යාංශයකට පවරන්න. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, දේශපාලනීකරණයෙන් ක්‍රීඩාව ඈත් වෙන්න ඕනෑ. අපි ක්‍රීඩා සංගම් එක්ක හැප්පෙනවා. හැබැයි, කිසිම කාලයක ක්‍රීඩා සංගම්වලට අවශ්‍ය සහනය දෙන්නේ නැහැ. ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිතුමාත් මලල ක්‍රීඩා සංගමයේ සභාපතිවරයා විධියට හිටියා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් ඒ කාලයේ ආණ්ඩුව එක්ක හැප්පුණා. මොකද, ක්‍රීඩාවට ආණ්ඩු මැදිහත් වෙනවා. ඒක තමයි ක්‍රමවේදය. ඒ නිසා මේකෙන් ආණ්ඩුව ඈත් වෙන්න ඕනෑ. මම විශ්වාස කරනවා, හුදෙක් මේ ක්‍රීඩා සංගම් ක්‍රියාත්මක වීමේ යම් වැරැද්දක් තිබෙනවා නම්, ඒ පිළිබඳව ස්වාධීනව කටයුතු කරන්න ඕනෑ කියලා. ඒක ඒ අයට මඩ ගහන්නවත්, ඒ අයගේ චරිත ඝාතනය කරන්නවත්, ඒ අයගේ පෞද්ගලිකත්වය කෙලෙසන්නවත් කරන දෙයක් නොවෙයි. පවත්නා නීතියට අනුකූලව අපි කටයුතු කරමු. හැබැයි, අවසානයේ ක්‍රීඩා සංගම් සහ ආණ්ඩුව හැප්පෙන්න පටන් ගත්තාම, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒකෙන් තැළෙන්නේ ක්‍රීඩකයා මිසක් දේශපාලනඥයාවත්, ක්‍රීඩා සංගමයවත් නොවෙයි. අපි ඉතිහාසයේදී ඒක දැකලා තිබෙනවා. Under-19 Cricket World Cup එක ලංකාවේ තිබුණා නම් මම හිතනවා, අපට ඊට වඩා හොඳට perform කරන්න තිබුණා කියලා. මුළු Cricket World Cup එකම අපට ලංකාවේ host කරන්න පුළුවන්කම තිබුණා නම්, Football Federation එක අවුරුදු කිහිපයක් තහනම් වෙලා තිබුණේ නැත්නම්, Rugby Sevens තහනම් වෙලා තිබුණේ නැත්නම් ක්‍රීඩා සංගම්වලට හොඳ මිනිස්සු එනවා. එදා Carlton Sevens පටන්ගෙන ඒක දේශපාලනීකරණය වෙලා අන්තිමට නඩුත් දාලා මම හිරේටත් ගියා. ඒ නිසා ක්‍රීඩාවට දේශපාලනය මැදිහත් කර ගත්තේ නැත්නම් අද ඒ සංගම්වලට හොඳ මිනිස්සු එනවා. හැබැයි, ක්‍රීඩා සංගම් හුදෙක් දේශපාලනීකරණයෙන් මෙහෙයවන්න පටන් ගත්තාට පසුව ඒ සංගම්වලට ඒ quality එකේ අය කවදාවත් සම්බන්ධ වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. කවුරු කැමැති වුණත්, අකැමැති වුණත් ඒක තමයි ඇත්ත කථාව. රටේ හැම ආණ්ඩුවක්ම උත්සාහ කරන්නේ ක්‍රීඩා අමාත්‍යාංශය රැක ගන්න මිසක්, ක්‍රීඩකයා රැක ගන්න නොවෙයි. ඒ හින්දා තමයි මම කියන්නේ ක්‍රීඩා අමාත්‍යාංශය රැක ගැනීම ආණ්ඩුවේ වගකීමක් නොවෙයි, ඒක දෙපාර්තමේන්තුවේ සහ ක්‍රීඩකයාගේ වගකීමක් කියලා. එහෙම නම් ක්‍රීඩකයා සහ පුහුණුකරුවා අපි ගොඩනඟමු. ක්‍රීඩා අමාත්‍යාංශයට අපි සහයෝගය ලබා දෙමු. ක්‍රීඩාව දේශපාලනීකරණයෙන් අපි ඈත් කරමු. ඒ වාගේම Paralympic ක්‍රීඩකයන්ට - සමීප දුලාන්ටත්, පාලිත බණ්ඩාරටත් - අවශ්‍ය සහයෝගය තමුන්නාන්සේලා ලබා දෙන්න.

ගරු ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ඒ සඳහා මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කොළඹ හතේ supermarket එකකට ගිහිල්ලා බඩු ගන්නවා මම දැක්කා. බොහොම හොඳයි. මම දන්නවා, ඔබතුමාට වැඩ ගොඩක් තිබෙන බව. අමාත්‍යාංශයේ වැඩ තිබෙනවා, ගෙදර වැඩ තිබෙනවා, supermarketsවලට යන්න තිබෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත්, ඇමතිතුමාත්

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

දෙපළම ක්‍රීඩා අමාත්‍යාංශයේ hostel එකටත් පොඩ්ඩක් ගිහිල්ලා, ඒකේ canteen එකේ සහ dormitory එකේ තිබෙන තත්ත්වය පිළිබඳව අවධානය යොමු කරන්න. ගරු සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, ඒකේ තිබෙන කෑම වේල ගැන හොයලා බැලුවොත් හොඳයි කියලා මම හිතනවා. මොකද, ඒ ක්‍රීඩකයන්ට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාරය ලැබෙනවාද කියන එක පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මම ඒක පෞද්ගලිකව දන්න හින්දායි තමුන්නාන්සේලාට කියන්නේ. තමුන්නාන්සේලා ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු. ඒ නිසා තමුන්නාන්සේලාට ගොඩක් වැඩ තිබෙන බව මම දන්නවා. ඒ අතරතුර ගෙදර දොරේ වැඩවලට supermarketsවලටත් යන්න වුණාම අමාරුයි. හැබැයි, අමාත්‍යාංශයේ ඉඳලා මීටර් 100ක වාගේ දුරක් තමයි ඒ hostel එකට තිබෙන්නේ. ඒ නිසා පොඩ්ඩක් එතැනට ගිහිල්ලා බලන්න. මේවා කියනකොට සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමාට හිනා යනවා. මොකද, එතුමා ඒ ළමයි කන බොන විධිය සහ ඉන්න විධිය ගැන දන්නවා. හැබැයි, ඉතින් එතුමාටත් කර ගන්න දෙයක් නැද්ද කියන්න මම දන්නේ නැහැ, අසරණ වෙලා වාගේ ඉන්නවා. ඒ නිසා ඔබතුමා ගෙදර යන ගමන් එතැනටත් පොඩ්ඩක් ගිහිල්ලා අවශ්‍ය කටයුතු සොයා බලා ඒ ළමයින්ගේ ආහාරපානවලට අවශ්‍ය පහසුකම් ටික සපයා දුන්නොත් හොඳයි කියලා මම හිතනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමා.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා සඳහන් කරපු විධියට මම කොළඹ හතේ supermarket එකකට ගිහිල්ලා බඩු ගත්තේ නැහැ. සාමාන්‍යයෙන් හැම සතියකම කොට්ටාවේ "Food City" එකෙන් මම බඩු ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි. ඒක මගේ දින චර්යාවේ කොටසක්.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා රගර් ගැන කථා කළේ නැති හින්දා මේ කාරණයත් මම කියන්න ඕනෑ. ඒ සඳහා මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. 2014 මැයි මාසයේ ඔය බෙබිලා රගර් ගහපු කාලයේ match එකක් දිනන්න ඕනෑ හින්දා ෆිජිවලින් ක්‍රීඩකයින් තුන්දෙනෙක් ගෙනාවා, අපේ රටේ රගර් ගහන්න. ඔවුන් ගෙනාවේ කොළඹ තිබෙන tournament එකක match එකක් දිනන්න. ඒක World Rugby එකට පසු කාලයකදී ප්‍රශ්නයක් වෙලා දැනගන්න ලැබෙනවා. ඊටපසුව World Rugby එක අපට දඩයක් නියම කරනවා, පවුම් 50,000ක. 2014 අවුරුද්දේදී හිතුමතේ, වංචනික ලෙස ෆිජිවල ක්‍රීඩකයෝ ගෙනැල්ලා රගර් ගහපු එකට අවුරුද්දකට පවුම් 5,000 ගණනේ ලංකාව අදටත් ගෙවනවාය කියන කාරණයත් මට මේ අවස්ථාවේදී මතක් කරන්න සිදු වෙලා තිබෙනවා. මොකද, අපට දැනුත් ඒ මුදල ගෙවන්න කියලා දන්වා තිබෙනවා.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
බොහොම හොඳයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා කොට්ටාවේ හෝ කමක් නැහැ, supermarket එකට යන ගමන් අර ක්‍රීඩකයෝ ගැනත් බලන්න කියායි මම කිව්වේ. Supermarket එක කොළඹ හතේද, කොට්ටාවේද කියන එක නොවෙයි, මට තිබෙන ප්‍රශ්නය. මට තිබෙන ප්‍රශ්නය, hostel එකේ ළමයින්ට හම්බ වන කෑම පිළිබඳවයි.

ෆිජිවල රගර් ක්‍රීඩකයෝ විතරක් නොවෙයි, මේ වනකොට dual citizenship එක තියාගෙන සෙල්ලම් කරන 11දෙනෙක් Football Federation එකේ ඉන්නවා. ඔබතුමන්ලා ඒ ගැන හොයා බලන්න. ඒක අපේ sports economy එක expand කරන්න සහ competitive sportsවල තුන්වන පරම්පරාවේ ශ්‍රී ලාංකිකයෝ සම්බන්ධ කර ගැනීමට යන වැඩ පිළිවෙළේ කොටසක්. හැබැයි, එදා ලංකාවේ සම්භවයක් තිබෙන ෆිජිවල ක්‍රීඩකයින් කිහිපදෙනෙක් අපේ රටට ආවා. හැබැයි, ආණ්ඩු මාරු වුණාට පසුව ඒක දේශපාලනීකරණය වෙලා තිබෙනවා. පසුව ඔබතුමන්ලාගේම පක්ෂයේ ඇමතිවරයෙක් -දැන් ඉන්න ඇමතිවරයෙක්; එදා හිටපු මන්ත්‍රීවරයෙක්, මම හිතන විධියට මන්ත්‍රීවරයෙකුත් නොවෙයි, එදා හිටපු වෘත්තීය සමිති නායකයෙක් - තමයි IRD එකට ඒ ගැන ලිව්වේ. ඔය පරීක්ෂණය ඉල්ලාගෙන කාපු එකක්. ඔබතුමාට වැරදි කාරණයක් ලියලා දීලා තිබෙන්නේ. ඔය කාරණය පිළිබඳව හරියට හොයා බලන්න.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙනුත් ඉල්ලනවා, තුන්වන පරම්පරාවේ ශ්‍රී ලාංකිකයන්ට ජාතික කණ්ඩායම් නියෝජනය කරන්න අවස්ථාව දෙන්න කියලා. ඒක නරක දෙයක් නොවෙයි. මොකද, විශේෂයෙන් රගර්, football වාගේ ක්‍රීඩාවලට ක්‍රීඩකයින් අඩුයි. වොලිබෝල් ක්‍රීඩකයෝ නම් ගොඩක් අපේ රටේ ඉන්නවා. Football, රගර් වාගේ high performance එකක් තිබෙන competitive sportsවලට ඒක හොඳ දෙයක්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.46]

ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ශ්‍රී ලංකාවේ කල් පවත්නා සමාජ, ආර්ථික අර්බුද ගණනාවකට තිරසාර, නිවැරදි විසඳුම් ලබා දෙන්න පුළුවන් ක්ෂේත්‍රයක් පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමියට පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා.

අපි දන්නවා, ලංකාව අතීතයේ විවිධ නම්වලින් හඳුන්වපු බව. අපේ රටට "වැව් බැඳි රට" කිව්වා. හුහක් වගා කරපු නිසා "පෙරදිග ධාන්‍යාගාරය" කිව්වා. ලෝකයේ හොඳම මැණික් හම්බ වන රට නිසා "රත්නදීපය" කිව්වා. හැබැයි, නිදහසින් පසුව අවුරුදු 75ක්, 80ක් ගත වනකොට අපට අලුත් නමක් පටබැඳිලා තිබෙනවා. ඒ තමයි, "නිධානයක් උඩ නිදාගෙන ඉන්න ජාතියක්" කියන එක. ලංකාවේ ඇති තරම් ඩොලර් බවට පත් කරන්න පුළුවන්, රුපියල් බවට පත් කරන්න පුළුවන් සම්පත් තිබියදී ඒවායින් ප්‍රයෝජනයක් අරගෙන ලංකාවේ තිබෙන සමාජ, ආර්ථික අර්බුදවලට විසඳුම් හොයන්න නිසි වැඩ පිළිවෙළක් තිබුණා නම් මම ඔය අන්තිමට කියපු "නිධානයක් උඩ නිදාගෙන ඉන්න ජාතියක්" කියන නම පටබැඳෙන්නේ නැති බව අපි දන්නවා.

මේ වනකොට අපි දැඩි විනිමය අර්බුදයකින් පෙළෙනවා. අපේ රටේ තරුණ තරුණියන් රැකියා අර්බුදයකින් පෙළෙනවා. සංවර්ධනය බස්නාහිර පළාතට කේන්ද්‍ර වෙලා තිබෙනකොට රටේ අනෙක් ප්‍රදේශ ජාතික නිෂ්පාදනයට දායක වෙන්නේ ඉතාම සුළු ප්‍රතිශතවලින්. ඒ නිසා තමයි සමහර අය කියන්නේ, "කොළඹට කිරි - ගමට කැකිරි" කියලා. ඒ වාගේම රටේ ජනතාවගෙන් සැලකිය යුතු -විශාල- ප්‍රතිශතයක් දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්නේ. ඇත්තෙන්ම මේ සියලු අර්බුදවලට විසඳුම් හොයන්න අපිත්, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කළා, මේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා අරගෙන යන්න ඕනෑ කියලා. අන්න ඒ සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයට, ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයට ලොකු වගකීමක් වාගේම ලොකු කාර්යභාරයක් පැවරී තිබෙනවා. අපි මේ ක්ෂේත්‍රයේ පසුබැසීම් එක්ක යන්නේ. අපට මේ සම්බන්ධව තිරසාර ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ලංකාවේ තිබෙන සම්පත් මොනවාද, ඒවායෙන් අපට වාසිදායක විධියට කරන්න පුළුවන් නිෂ්පාදන මොනවාද, ඒ ඒ කර්මාන්ත ස්ථානගත කරන්නේ කොතැනද, ඒවා ආරක්ෂා කරන්නේ කොහොමද කියලා අපි හදුනාගෙන තිබුණා නම් එය ඉතා ප්‍රයෝජනවත්. එවැනි නිෂ්පාදන ප්‍රතිපත්තියක්, කර්මාන්ත ප්‍රතිපත්තියක් අවශ්‍යයි. එවැනි නිෂ්පාදනවලට ව්‍යවසායකයන් පෙලඹවීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ප්‍රතිපත්තියක් අපට තිබෙනවා නම් ඒ තුළින් අපට මේ රටේ සම්පත් ප්‍රයෝජනයට ගන්න, එම කර්මාන්ත දියුණු කරන්න උත්සාහයක් ගන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. අපිට කර්මාන්ත හා ව්‍යවසායකත්වය තනියෙන් - හුදෙකලාව - දියුණු කරන්න බැහැ. කර්මාන්ත ප්‍රතිපත්තිය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ප්‍රතිපත්තිය, සමුපකාර ප්‍රතිපත්තිය, ඒ වාගේම, ඒවාට ගැළපෙන තීරු බදු ප්‍රතිපත්තිය, ඒ වාගේම, anti-dumping policy එක දියුණු කළ යුතුයි. අපි දන්නවා, මේ රටේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය තුළ වෙනත් රටවල නිෂ්පාදන, ඒවායේ නිෂ්පාදන වියදමටත් වඩා අඩුවෙන් ගෙනැල්ලා, කසළ මට්ටමේ නිෂ්පාදන මේ රටේ වෙළෙඳ පොළට දමන බව. අපේ රටේ නිෂ්පාදකයාට ඒවා එක්ක තරග කරන්න බැහැ. ඒ නිසා ඒවා අපේ වෙළෙඳ පොළට ඒම වළක්වන්න අපි ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මේ ගමන යන්නේ, ඒ ආකාරයට ලංකාවේ කර්මාන්තවලට ගැළපෙන ප්‍රතිපත්ති රාමුවකුත් නිර්මාණය කරගෙන බව මේ ගරු සභාවට කියන්න ඕනෑ.

ඒ වාගේම, අපේ අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරනකොට, 6 ශ්‍රේණියේ ඉඳලා "ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව" කියන විෂයය හඳුන්වා දීලා, අනාගත අංකුර ව්‍යවසායකයන්, කර්මාන්තකරුවන් බිහි කරන්න අවශ්‍ය පදනම අපි ඉදිරියේදී සකස් කරනවා. ඒ විතරක් නොවෙයි. ප්‍රාදේශීයව පවත්නා විවිධ කර්මාන්තවලට ගැළපෙන පරිදි, තෝරා ගන්න පුළුවන් විෂයන්, ඒ විෂය මාලා සඳහා එකතු කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. උදාහරණයක් විධියට මම නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, අපේ දිස්ත්‍රික්කය මැණික් කර්මාන්තයට මුළු ලෝකයේම ප්‍රසිද්ධයි. නමුත්, අපේ ප්‍රදේශයේ දරුවෙක් මැණික් කර්මාන්තයට එන්නේ, එක්කෝ සාම්ප්‍රදායිකව උපයා ගන්නා දැනුමෙන්, එහෙම නැත්නම් එදිනෙදා පරම්පරාවෙන් ලැබෙන දැනුමෙන්. නමුත්, ඒ අය විද්‍යාත්මක දැනුමත් එක්ක මේ කර්මාන්තයට එන්නේ නැහැ. ඒ නිසා අපි යෝජනා කරනවා, "රත්න විද්‍යාව" වැනි විෂයක් අපේ ප්‍රදේශයේ ළමයින්ට ඉගෙන ගෙන ඒ කර්මාන්තයට එන්න පුළුවන් ක්‍රමයක් හදන්න ඕනෑ කියලා. දැනටමත් අපි ඒ සඳහා විෂය මාලා සකස් කර තිබෙන බව මේ ගරු සභාවට දැනුම් දෙනවා.

මෙවර අය වැය ලේඛනයෙන් ලංකාවේ ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය වෙනුවෙන් රුපියල් බිලියන 99ක් වෙන් කර තිබෙන බව අපි දන්නවා. ඒ අතරතුර මේ රට තුළ ව්‍යවසායකත්ව උන්මාදයක් ඇති කරන්න, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයාට දිරිදීම සඳහා රුපියල් බිලියන 38.6ක් පමණ වෙන් කර තිබෙනවා. මේ තුළින් අපි මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයාට තිබෙන්නේ මූල්‍ය ගැටලුව නම්, ඒ මූල්‍ය පහසුකම් ලබා දෙන්න, ඔවුන්ට තිබෙන්නේ ඉඩම් ගැටලුව නම්, ඒ ඉඩම් ගැටලුව විසඳා දෙන්න කටයුතු කරනවා. ඒ වාගේම, අපි ඒ කර්මාන්ත සඳහා සියලු පහසුකම් තිබෙන කාර්මික ජනපද, කාර්මික ගම්මාන ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. ඒකත් එකම ගම්මානය තුළ විවිධ නිෂ්පාදන තිබෙන්න නොවෙයි, මැණික් නම්, ඒ කර්මාන්තපුරයේ මැණික් ආශ්‍රිත නිෂ්පාදන, සම් භාණ්ඩ නම්, ඒ වර්ගයේ නිෂ්පාදන තමයි ඒ කර්මාන්තපුරයේ තිබෙන්න ඕනෑ. ඒ විධියට ඒ ඒ කර්මාන්තයට සුවිශේෂී වූ කර්මාන්තපුර අපි ඉදිරියේදී ආරම්භ කිරීම සඳහා කටයුතු සැලසුම් කරනවා.

ඒ වාගේම, මේ අයට උදව් දීම සඳහා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයත් එක්ක එකතු වෙලා, කර්මාන්ත පෝෂක මධ්‍යස්ථාන අපි සූදානම් කර තිබෙනවා. ඒ ආරම්භක කර්මාන්තකරුවන් වෙනුවෙන්, ඒ අයට අවශ්‍ය සියලු යටිතල පහසුකම් අපි ලබා දෙනවා. ඒක දැනුම වෙන්න පුළුවන්, තොරතුරු වෙන්න පුළුවන්, වෙළෙඳ පොළ වෙන්න පුළුවන්, ඇසුරුම්කරණය වාගේ කටයුතු වෙන්න පුළුවන්, අළෙවිකරණය වෙන්න පුළුවන්. ඒ වාගේ සියලු පහසුකම් ඒ අයට ලබා දීලා, අනාගතයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දියුණු කරගෙන, එයින් මහා පරිමාණ නිෂ්පාදනයන්ට එළැඹෙන්න අවශ්‍ය පිරිස පහළ මට්ටමින් සකසා ඉහළට ගෙන ඒමට අවශ්‍ය පියවර ගන්නවා. ඒ විතරක් නොවෙයි, ඒ පියවර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්ම පටන් අරගෙන, මේ කර්මාන්ත හා ව්‍යවසායකත්ව ආශ්‍රිත සංවර්ධනය සමස්ත දිවයින පුරා විසුරුවා හරින්නට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, ප්‍රාදේශීය වශයෙන් තිබෙන විෂමතා ඉවත් කරන්නත්, ප්‍රාදේශීය වශයෙන් තිබෙන රැකියා වියුක්තිය ඉවත් කරන්නත්, අපට ප්‍රාදේශීය වශයෙන් වටිනාකමක් ඇති කරගන්න පුළුවන් සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගන්නත් අපි කටයුතු කරනවා. ඒ තුළින් තමයි අනාගතයේදී නිෂ්පාදන ආර්ථිකයක් කරා අපිට යන්න පුළුවන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ ප්‍රදේශයේ මැණික් කර්මාන්තය ගැන කාරණා දෙකක් කියලා මම කථාව අවසන් කරන්නම්. අපි දන්නවා, ලංකාවේ තිබෙන මැණික් සම්පතෙන් අපි තවම සියයට 80ක් විතර ගවේෂණය කරලාත් නැහැ කියලා. අපේ රට තමයි ලෝකයේ හොඳම මැණික් ලැබෙන රට. අපේ ගරු ඇමතිතුමා කිව්වා වාගේ නිල් මැණික්වලට - blue sapphireවලට - අපේ රට හරි ප්‍රසිද්ධයි. නමුත් අපේ රට ලෝකයේ මැණික්වලට ප්‍රසිද්ධ වුණාට ලෝක මැණික් වෙළඳාමේ ප්‍රමුඛයා බවට අපි තවම පත් වෙලා නැහැ. ඒ නිසා අපි ඉදිරියේදී රත්නපුරයත් සම්බන්ධ කරගෙන, ලෝක මැණික් වෙළඳාමේ ප්‍රමුඛයෙකු වීම සඳහා ඒ අවශ්‍ය මැණික් කේන්ද්‍රස්ථානය හදාගන්න කටයුතු කරනවා. ඒකට අවශ්‍ය වෙළෙඳපොළ අලුතෙන් හොයාගෙන, ප්‍රදර්ශන ආදී මහපෙන්වීම් තුළින් ලොකු වෙළෙඳ පොළක් අත්පත් කරගන්න සහ ලංකාව මැණික් වෙළෙඳාමේ කේන්ද්‍රස්ථානය බවට පත් කර ගන්න අපි කටයුතු සූදානම් කර තිබෙනවා. එහිදී මැණික් ව්‍යාපාරය නියාමනය කිරීම සඳහා නව නීති-රීති, නව වැඩ පිළිවෙළවල් අපි සකස් කර තිබෙනවා. ඒ තුළින් සමස්ත කර්මාන්තය දියුණු කරනවා වාගේම, මැණික් කර්මාන්තයෙන් රටේ සංවර්ධනයට ලොකු දායකත්වයක් ලබා ගන්නත් අපි බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමියට බෙහෙවින් ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු වරුණ ප්‍රියන්ත ලියනගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.57]

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. ඒ වාගේම, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේත්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

මම අද විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වුණත්, අපේ ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිතුමා ගැන ඉතා ආඩම්බරයෙන් කථා කරන්නේ. මොකද, රටට විශාල කීර්තියක් ගෙනාපු නායකයෙක් විධියට අපි එතුමාව දකිනවා. මට මතකයි, එතුමා නුවරඑළිය දිස්ත්‍රික්කයේ විදුලිපුර මහා විද්‍යාලයෙන් ඉගෙන ගෙන 1996 වසරේදී 400-metre event එකෙන් - සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, සිඩ්නිවලදී දන්නේ නැහැ - මයිකල් ජොන්සන්ව පරද්දපු ආකාරය. ඔබතුමා එදා ඒ දක්වපු දක්ෂතාව අපේ රටට කීර්තියක් ගෙනාවා කියලා මම විශ්වාස කරනවා. ඒ වෙලාවේ ටීවී එක බලාගෙන ඉන්දෙද්දි ඇස් දෙකට කඳුළු ආපු ක්‍රීඩකයෙක්, මමත්. මොකද, අපිට ඒ වාගේ අවස්ථාවක් කවදාවත් ලැබිලා තිබුණේ නැහැ. මයිකල් ජොන්සන් කියන්නේ ඒ record එක තැබූ කෙනා. ඔබතුමාට එතුමාව පරද්දන්න ලැබීම ගැන මම ඉතා සන්තෝෂ වෙනවා. මොකද, මමත් රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයෙකු විධියට basketball, badminton, Cricket, TT කියන මේ සියල්ලේම පළාත් නායකයා විධියටයි කටයුතු කළේ. මට ගොඩක් කථා කරන්න වෙලාව නැහැ. අපි එතුමා ගැන සන්තෝෂ වෙනවා, අපිට මෙහෙම ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිවරයෙකු බිහි වීම සම්බන්ධයෙන්. ඒ නිසා ඉදිරි කාලයේදී අපේ ක්‍රීඩාව සම්බන්ධයෙන් අපිට සන්තෝෂයෙන් කථා කරන්න පුළුවන් වෙයි. තවම එතුමා අමාත්‍යාංශය භාර ගත්තා විතරයි නේ. ඒ නිසා එතුමාටත් තව කාලයක් දෙන්න සිද්ධ වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි බලාගෙන ඉන්නවා, තව අවුරුදු තුනකින් පස්සේවත් මේ රටේ අනාගතයේ ඔබතුමා වාගේ ක්‍රීඩකයෝ බිහිවෙයි කියලා. අපි ඔබතුමාට සුබ පතනවා, ඉදිරි කාලයේ වැඩ ටික කරගෙන යන්න ධෛර්යය, ශක්තිය ලැබෙන්න ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, track and field event එක ඔබතුමාගේ ක්ෂේත්‍රය නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රත්නපුර දිස්ත්‍රික්කය ගත්තාම, අපේ දිස්ත්‍රික්කයේ පළාත් ක්‍රීඩාංගණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. ඒ පළාත් ක්‍රීඩාංගණය අපි රුපියල් මිලියන 400ක් වියදම් කරලා අවුරුදු ගණනාවක් තිස්සේ අලුත්වැඩියා කරමින් පවතිනවා.

ඒ අලුත්වැඩියා කටයුතු අවසන් කර ගන්න අපට තවම බැරි වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ අලුත්වැඩියා කටයුතු ඉක්මනින් අවසන් කරලා එක්කෝ මධ්‍යම ආණ්ඩුව යටතේ තියාගෙන, කාර්ය මණ්ඩලය ලබා දීලා ඒ ක්‍රීඩාංගණය ඉක්මනින් ක්‍රීඩකයන්ට ලබා දෙන්න කටයුතු කරයි කියලා. ඒ ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කරන්න ක්‍රීඩකයන් බලාපොරොත්තුවෙන් සිටියත්, දැන් අවුරුදු ගණනාවක් තිස්සේ ක්‍රීඩකයන්ට ඒ අවස්ථාව අහිමි වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, ක්‍රීඩකයෙකුට ඒ අවස්ථාව තිබෙන්නේ ඉතාම සීමිත කාලයක් විතරයි කියලා. එහෙම නැත්නම් ඊළඟ අවුරුද්දට යනවා. එහෙම වුණාම නියමිත කාලයට performances පෙන්වා ගන්න බැරි වෙනවා. මේ විධියේ ගැටලුවක් අපේ දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ට තිබෙනවා. රුපියල් මිලියන 400ක් වියදම් කරලා අලුත්වැඩියා කරන ඒ පළාත් ක්‍රීඩාංගණයටම යාබදව හදලා තිබුණා, jogging track එකක්. ගරු ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිතුමනි, ක්‍රීඩකයකු වශයෙන් ඔබතුමා දන්නවා, එහි අවශ්‍යතාව. මොකද, ක්‍රීඩකයන් event එකට එන්න ඉස්සෙල්ලා ඒ jogging track එකේ අනිවාර්යයෙන්ම training කරනවා. එහි training කරලා තමයි event එකට එන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, රුපියල් මිලියන 20ක් වියදම් කරලා ඒ jogging track එක හදලා තිබෙනවා. හැබැයි, පසුගිය ආණ්ඩුව ඒකේ වෙළෙඳ සංකීර්ණයක් හදලා තිබෙනවා. මම හිතන්නේ නැහැ, ඒක සුදුසු කාරණයක් කියලා. මම දන්නේ නැහැ, ඒකට කවුරු අවසරය දුන්නා ද, ඒවා කවුරු කළා ද කියලා. ක්‍රීඩකයන් විධියට ඒ indoor stadium එකට යන කොට අපි දකිනවා ඊට එහා පැත්තේ ක්‍රීඩාවට සම්බන්ධ නැති වෙළෙඳ සංකීර්ණයක්. හැබැයි, අප බලයට පත් වුණා නම්, මම පහුවෙනිදාම ඒක නවත්වනවා. ඒක තමයි ඇත්ත. නමුත්, අපට ඒක කර ගන්න බැරි වුණා. කොහොම නමුත්, ඔබතුමන්ලා බලයට පත් වුණා. ගරු අමාත්‍යතුමා ඒ කාරණය ගැන දන්නවාද නැද්ද කියන්න මම දන්නේ නැහැ. ඔබතුමා ඒ ගැන සොයා බලා, එක්කෝ අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු හරි කියලා ඒ කටයුත්ත නතර කරලා ඒක jogging track එකටම දෙන්න පුළුවන් වුණා නම්, එය ක්‍රීඩකයන්ට විශාල ශක්තියක්. මොකද, එය පළාත් ක්‍රීඩාංගණය. එය දිස්ත්‍රික් ක්‍රීඩාංගණයක් නොවෙයි. අපි පළාත් 9ට අලුතින් ක්‍රීඩාංගණ 9ක් හදලා තිබෙනවා. ඒ වාගේම දිස්ත්‍රික්ක මට්ටමින් තවත් ක්‍රීඩාංගණ 18ක් සංවර්ධනය වෙමින් පවතිනවා. ගරු ඇමතිතුමනි, කාර්ය මණ්ඩල නොමැති වීම නිසා ඒවා නඩත්තු කරගෙන යෑමේ විශාල අර්බුදයකයි තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා මේ ගැන අවධානය යොමු කරලා කටයුතු කරයි කියා මම විශ්වාස කරනවා.

ගරු අමාත්‍යතුමනි, අපේ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, මේ රටේම ක්‍රීඩා පුහුණුකරුවන් විශාල සංඛ්‍යාවකගේ පුරප්පාඩු තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ කොට්ඨාස 18ක් තිබෙනවා; අමාත්‍යාංශයේ ලියාපදිංචි වෙච්ච ක්‍රීඩා සංගම් පමණක් 40කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. හැබැයි, අපේ දිස්ත්‍රික්කය ගත්තොත්, බොහෝ ක්‍රීඩාවලට අදාළව පුහුණුකරුවන් නැහැ. Indoor stadium එකක් තිබෙනවා, basketball court එකකුත් තිබෙනවා. නමුත්, පුහුණුකරුවෙක් නැහැ. ඒ නිසා එය ලබා දෙන්න විධියක් නැහැ, අපේ දිස්ත්‍රික් team එකට හෝ පළාත් team එකට. වොලිබෝල් කණ්ඩායම ඉන්නවා, නමුත් පුහුණුකරුවෙක් නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, සංචිත හදන්න කියලා. වයස අවුරුදු 15න් පහළ, 17න් පහළ, 19න් පහළ සංචිත හදලා ඒවායේ තිබෙන ප්‍රශ්න දිහා බලලා ඒ අවශ්‍යතා සපුරා දෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමනි, කර්මාන්ත අමාත්‍යාංශය ගැනත් කථා කරන්න ඕනෑ. ඒ නිසා මම ක්‍රීඩාව ගැන කථා කිරීම මෙතැනින් නවත්වනවා.

ගරු ඇමතිතුමා, අපේ අය වැය හිඟය රුපියල් බිලියන 2,200ක් වනවා. ඒ ගැටලුවට හොඳම විසඳුම තිබෙන්නේ ඔබතුමා අතේ. ඒ නිසා වෙන කාටවත් මේක ගැන කථා කරලා වැඩක් නැහැ. අපි රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු; මැණික් ක්ෂේත්‍රයේ ඉන්න අය. ඔබතුමා කිහිප විටක්ම ගිහිල්ලා එම ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම ගැන මම සන්තෝෂ වෙනවා.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා මම දැක්කා, බැකෝ යන්ත්‍ර යොදාගෙන පතල් කැණීමට අදාළව. එම වක්‍රලේඛය ඔබතුමා කියවන්න ඇති කියා මා හිතනවා. එහි සඳහන් කර තිබෙනවා, බැකෝ යන්ත්‍ර යොදාගෙන පතල් කැණීමට අදාළ බලපත්‍රයක් අලුත් කිරීමේදී රුපියල් කෝටි 2ක් අනිවාර්යයෙන්ම පෙන්වන්න කියලා. නමුත් සමහර බලපත්‍රවලට අදාළව ගෙවන කෝටි දෙකත් පාඩුයි. ඒ වැඩෙවත් කරගෙන යන්න විධියක් නැහැ, අවුරුද්දක් ඇතුළත.

ඉතින් අවුරුද්දක් ඇතුළත බලපත්‍රය අලුත් කිරීමේදී කෝටි දෙකක් පෙන්විය යුතුයි කියලා සඳහන් කළාට ඒ කටයුත්ත කරන්න බැහැ. බැංකුවලට ණය වෙලා, සමහර විට ඉඩම් උකස් තියලා තමයි පතල් කර්මාන්තයේ නියැළෙන්නේ. බැංකෝ යන්ත්‍රවලටම පැය ගණන්වලට මුදල් ගෙවන කොට ඇත්තටම ඒ කෝටි 2 පෙන්වන්න බැහැ. දැන් රුපියල් කෝටි 2යි කියලා දාලා තිබෙන ප්‍රමාණය පසුගිය ආණ්ඩුවෙන් නියම කරලා තිබුණේ හැම licence එකක්ම අලුත් කරන්න අවුරුද්දකට රුපියල් කෝටියක් කියලායි. නමුත් දැන් ඔබතුමන්ලා රුපියල් කෝටි 2ක් කියලා දාලා තිබෙනවා. එතකොට ඒක කරන්නේ කොහොමද? ඔබතුමාම කල්පනා කර බලන්න, ගරු ඇමතිතුමා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පුළුවන් නම් මට තවත් විනාඩියක කාලයක් දෙන්න. මොකද, බරපතළ කාරණා රැසක් තිබෙනවා, මැණික් ක්ෂේත්‍රය ගැන සඳහන් කරන්න.

අපි පසුගිය කාලයේ ඉල්ලීමක් කළා සියයට 18 tax එක අයින් කරලා දෙන්න කියලා. අපි විශ්වාස කළා, ඔබතුමන්ලා ඇවිත් ඒක කරයි කියලා. අද ඒ tax එක නිසා බරපතළ ප්‍රතිඵල රැසක් අත් විඳින්න සිද්ධ වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, දැන් ඒ ක්ෂේත්‍රයට අදාළව import කරද්දී තක්සේරු කරලා - value කරලා - තමයි tax එක ගහන්නේ. ඒ ක්ෂේත්‍රයට අදාළව import කරන එක ගැනයි මම මේ කියන්නේ. අද වන විට අප්‍රිකානු කලාපයේ රටවලට import කරන එකත් නැවතිලා තිබෙනවා. අපේ රටේ ව්‍යවසායකයින් 3,000කට ආසන්න පිරිසක් cut and polish ක්ෂේත්‍රයේ නියැළී ඉන්නවා. අද ඒගොල්ලන්ටත් අවස්ථාව නැති වෙලා තිබෙනවා. ඇත්තටම මේවා ගැන කථා කරන්න මට වෙලාව මදි, ගරු ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මට කියන්න කාරණා රැසක් තිබෙනවා, විනාඩි 7න් ඒවා ගැන කියන්න අමාරුයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය කළමනාකරණය කර ගන්න සිදු වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
කෙසේ වෙතත්, මට මේ අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඔබතුමා මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනුවත් වෙලා කටයුතු කරන්න කියලායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට තවත් විනාඩි දෙකක් ලබා දෙන්න කියලා ඔබතුමාගේ නායකතුමා කියනවා.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
බෙහෙවින් ස්තුතියි.

ඊළඟට, ගඟේ මැණික් ගැරීමේ කටයුතු කරන, එහෙම නැත්නම් අනවසර පතල් කරන කට්ටිය සම්බන්ධයෙන් ඔබතුමන්ලාත් කථා කළා. අපට ආණ්ඩුවක් තිබුණේ නැහැ. හැබැයි, පසුගිය සෑම ආණ්ඩුවකින්ම ඒ ගොල්ලන්ට යම් සහනයක් ලබා දුන්නා. ඒ වැඩ කරගෙන යද්දී ඒගොල්ලන් නීතියට හසු කර ගන්න එපා කිව්වා. නමුත්, අද වන කොට ඒගොල්ලන් නීතියෙන් අල්ලලා ඇඟ බඳිනවා. ගරු ඇමතිතුමනි, මා හිතන විධියට ඔබතුමාත් ඒ ගැන දැනුවත් වෙලා ඇති. පනතේ 81 වගන්තිය යටතේ තමයි මීට අදාළව නඩු දමන්නේ. 81 වගන්තිය යටතේ නඩුව දැම්මාට පස්සේ ඔබතුමා දන්නවා මාසයකට සැරයක් පොලීසියේ පෙනී ඉන්න ඕනෑ කියලා. මාස හයක් ගියේ නැත්නම් වරෙන්තු වෙනවා. දැනට 100කට ආසන්න සංඛ්‍යාවක් ඇඟ බැඳීමට යටත් කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන කල්පනා කරලා මින් ඉදිරියට එහෙම ඇඟ බැඳීමට යටත් කරන්නේ නැතිව, මැණික් බලපත්‍රයක් නැතිව වැඩ කිරීමේ අවස්ථාව ඒ අයට ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. දඩ ගැහුවාට අපට ප්‍රශ්නයක් නැහැ. ඇඟ බැඳීමට යටත් කරන එක නවත්වා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, අනෙක් කාරණය මේකයි. මේ ක්ෂේත්‍රයට අදාළව export කරද්දී සියයට 23ක විතර tax එකක් වදිනවා. ඒ නිසා අද වන විට export කිරීම නැවතිලා තිබෙනවා. අපි දැක්කා, 2023දී ඩොලර් මිලියන 470ක විතර ආදායමක් අපේ රටට ඇවිත් තිබෙනවා. දැන් එය සියයට 30ක් විතර අඩු වෙලා තිබෙනවා. නමුත්, මෙය ආදායම වර්ධනය කර ගන්න පුළුවන් කර්මාන්තයක්. ඒ නිසා ඔබතුමා ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අලුත් සභාපතිවරයෙක් දැන් ඉන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මැදිහත් වෙලා මේ කාරණය සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරලා ඒ ක්ෂේත්‍රයට ශක්තියක් ලබා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. කාලය නොමැති නිසා මම කථාව අවසන් කරනවා. මට අමතර විනාඩි දෙකක් ලබා දීම ගැන බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 2.08]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு, இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சு ஆகியவற்றின் விவாதத்தில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றி! மிக முக்கியமாக, இந்த நாட்டின் பொருளாதாரத்துக்கு

[ගරු සිවඥානම් ශ්‍රීධරන් මහතා]

முதுகெலும்பாக இருந்த விவசாயத்துறை இன்று வீழ்ச்சி கண்டிருக்கின்றது. உலகத்திலே விவசாயத்துறையின் வளர்ச்சி என்பது வித்தியாசமான தொழில்நுட்பங்களோடு வளர்ந்து வருகின்றபொழுது, இலங்கையிலே விவசாயத்துறை என்பது படிப்படியாக வீழ்ச்சி கண்டிருக்கின்றது. இலங்கையினுடைய கைத்தொழில்துறை என்பதுகூட, ஒரு காலத்திலே எரிபொருட்களுக்கான மசகு எண்ணெயை இறக்குமதி செய்து, சுத்திகரித்து, ஏற்றுமதி செய்து, அதன்மூலம் வருமானத்தைப் பெற்றுக் கொண்டது. அதுபோல், ஆடைகளுக்கான துணிகளை இறக்குமதி செய்து, தைத்த ஆடைகளை ஏற்றுமதி செய்து, அதன் மூலமாகவும் பொருளாதாரத்தை ஈட்டிக் கொண்டது. ஆனால், இந்தத் துறைகளெல்லாம் இன்று இலங்கையிலே மெல்லமெல்ல வீழ்ச்சிப் போக்கிலேயே காணப்படுகின்றன. இலங்கையின் கைத்தொழில்துறை பாரிய வளர்ச்சியைக் காணவில்லை என்கின்ற எண்ணமும் சிந்தனையும் இன்று உலக நாடுகளிலும் உண்டு; இலங்கையிலும் உண்டு. குறிப்பாக வடக்கு, கிழக்கில் இருந்த பல தொழிற்சாலைகள் இயங்காமல் திட்டமிட்டு முடக்கப்பட்டிருக்கின்றன.

இந்த நாட்டிலே ஜனாதிபதியாக இருந்த மஹிந்த ராஜபக்ஷ அவர்கள், யுத்தம் முடிந்த பிற்பாடு இந்த நாட்டின் இனப் பிரச்சினைக்கு 13ஆம் திருத்தத்துக்கு அப்பால் Thirteen plus தீர்வைத் தான் கொடுக்கப்போவதாகச் சொன்னார்; அவர் எந்தத் தீர்வையும் கொடுக்கவில்லை. அவருடைய காலத்தில் அழிந்துபோன கைத்தொழில் துறைகளை விருத்தி செய்வதற்கோ, வடக்கு, கிழக்கில் பொருளாதார முன்னேற்றங்களை ஏற்படுத்தவோ முனையவில்லை. உதாரணமாக, இன்றைக்கும் மூடப்பட்ட நிலையில் யாழ்ப்பாண மாவட்டத்தில் இருக்கும் காங்கேசன்துறைச் சீமெந்துத் தொழிற்சாலையில் இருந்த இரும்புகள்கூட களவாடப்பட்டு, வெறும் சீமெந்து அடி அத்திவாரங்கள் மட்டும் காணப்படுகின்றது. அந்த இடத்திலே சீமெந்துத் தொழிற்சாலையை உருவாக்கக்கூடிய வசதிகள் எதுவும் இன்றுவரை ஏற்படுத்தப்படவில்லை.

அதுபோல், இன்று அங்கு மூடப்பட்டுள்ள 'பரந்தன் இரசாயனத் தொழிற்சாலை' என்பது ஒரு காலத்திலே ஆசியாவிலே பெயர் பெற்றிருந்த ஒரு தொழிற்சாலையாகும். இன்று அந்த இடத்திலே ஒரு தொழிற்பேட்டையை உருவாக்குவதாக அரசாங்கம் குறிப்பிட்டிருப்பது வரவேற்கத்தக்கது. 2015ஆம் ஆண்டிலே அன்றைய அரசோடு சில நடவடிக்கைகளில் இணைந்து செயற்பட்ட காலத்தில் இந்தப் பிரேரணையை நாங்கள் முன்வைத்திருந்தோம். அதாவது, கிளிநொச்சி மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில், அச்சுவேலியில் உருவாக்கப்பட்டதைப்போன்ற ஒரு கைத்தொழிற்பேட்டை பரந்தனிலே உருவாக்கப்பட வேண்டுமென்ற பிரேரணையையும் அதற்கான காரணங்களையும் நான் முன்வைத்திருந்தேன். மன்னார், வவுனியா, முல்லைத்தீவு, கிளிநொச்சி, யாழ்ப்பாணம் போன்ற இடங்களிலிருந்து புகையிரதமூலமும் பேருந்துகள் மூலமும் போக்குவரத்தை மேற்கொள்ளக்கூடிய இடம் அது. ஆகவே, குறைந்தது 20 நிறுவனங்களையாவது உள்வாங்கி, 1,000 பேருக்குக் குறையாதவர்களுக்கு வேலைவாய்ப்பை வழங்கக்கூடிய ஒரு தொழிற்பேட்டைக்கான கருத்திட்டத்தை கிளிநொச்சி மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்கூட்டத்திலே நான் சமர்ப்பித்திருந்தேன். ஆனால், இதுவரை எந்த முன்னேற்றமும் இல்லை. அதற்குப் பிற்பாடு அண்மையில் நடந்த கூட்டங்களிலும்கூட இதுபற்றி நாங்கள் குறிப்பிட்டிருந்தோம்.

இங்கே கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர் கௌரவ சுனில் ஹந்துன்னெத்தி அவர்கள் இருப்பதால் நான் அவரிடம் இந்த விடயத்தைக் குறிப்பிடுகின்றேன். நீங்கள் முதலிலே வடக்கு, கிழக்கில் அழிந்துபோயிருக்கின்ற கைத்தொழிற்சாலைகளை மீட்பதற்குரிய ஒரு கருத்திட்டத்தைக் கையில் எடுங்கள்! அந்தந்த மாவட்ட அரசாங்க அதிபர்களூடாக அத்தொழிற்சாலைகளை மீண்டும் இயக்குவதற்குத் தேவையான விபரங்களைப் பெற்றுக் கொள்ளுங்கள்! ஒரு சீமெந்து தொழிற்சாலை என்றால், அதனை இயங்க வைப்பதற்கான திட்டங்கள் என்ன, எத்தனை ஏக்கர் காணி தேவை, எவ்வளவு பணம் தேவை, அதற்கான மூலப்பொருட்களை எங்கிருந்து பெற்றுக் கொள்வது என்பது போன்ற தகவல்கள் உங்களுடைய கைக்கு வர வேண்டும். அதுபோல, பரந்தன் இரசாயனத் தொழிற்சாலையை இயங்க வைப்பதற்கான திட்டங்கள் பற்றி ஆராய வேண்டும்.

இலங்கையில் தரமான உப்பை உற்பத்தி செய்த இரண்டு நிறுவனங்களில் ஒன்று, ஆனையிறவு உப்பளம்; இரண்டாவது, குறிஞ்சாத்தீவு உப்பளம். அவை இரண்டும் எனது மாவட்டத்தைச் சேர்ந்தவை. ஆனையிறவில் உற்பத்தி செய்யப்படுகின்ற உப்பை மன்னாருக்கு எடுத்துச் சென்று, அங்கு அதைக் கழுவி அது மாந்தை உப்பு என்ற பெயரில் விற்பனை செய்யப்படுகிறது. உண்மையில், அது கிளிநொச்சி மாவட்டத்தில்தான் உற்பத்தி செய்யப்படுகிறது. குறிஞ்சாத்தீவு என்பது ஆசியாவிலே வெள்ளை உப்புக்கு - white saltக்குப் பெயர்பெற்ற ஒரேயோர் இடம். கிட்டத்தட்ட 72 வீடுகளோடு, 3,000 ஏக்கருக்கு குறையாத காணியிலே, ஆசியாவிலே மிகவும் தரம் வாய்ந்த உப்பை உற்பத்தி செய்யும் குறிஞ்சாத்தீவு உப்பளம் இன்றைக்கும் இயங்க முடியாமல் இருக்கின்றது.

இவ்வளவு காலமும் கண்ணிவெடியைக் காரணம் காட்டினார்கள். கடந்த காலத்தில் நான் அந்த உப்பளத்தை நேரடியாகச் சென்று பார்வையிட்டு, ஒரு கம்பனிக்கூடாக அதனை மீள ஆரம்பிப்பதற்கான முயற்சிகளை மேற்கொண்டிருந்தேன். அதுபற்றி இந்திய தூதரகத்துடன் பேசியதற்கிணங்க அத்தூதரகமும் அதற்கான சார்பு நிலைகளைக் கொண்டிருந்தது. இப்பொழுதும் இந்திய தூதரகமும் யாழ்ப்பாணத் துணைத் தூதரகமும் குறிஞ்சாத்தீவு உப்பளத்தை இயங்கச் செய்வதற்கான சாதகமாக செய்திகளைச் சொல்கின்றன. நீங்கள் அந்த அணுகுமுறையைக் கையாளுங்கள்! இந்தியாவின் தொழில் நுட்பத்தைப் பயன்படுத்தி குறிஞ்சாத்தீவு உப்பளத்தை இயக்கச் செய்தால், அது ஆகக்குறைந்தது 2,000 தமிழ் இளைஞர், யுவதிகளுக்கு உடனடி வேலைவாய்ப்பை வழங்கக்கூடிய மிகப்பொிய ஒரு களமாக அமையும். 2015 முதல் இதுவரையும் நான் பல முயற்சிகளைத் தனிப்பட்ட ரீதியாகவும் கட்சி ரீதியாகவும் மேற்கொண்டிருந்தேன். ஆனால், அவை எதுவும் வெற்றிபெறவில்லை.

அதுபோல, ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலையை எடுத்துக்கொண்டால், கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்கள் அதை ஆரம்பிப்பதற்கான முயற்சிகள் மேற்கொள்ளப்பட்டு வருவதாக இங்கே சொல்லியிருந்தார். விடுதலைப் புலிகளுடைய ஆட்சிக் காலத்தில் அந்த ஓட்டுத் தொழிற்சாலை மிகச் சிறப்பாக இயங்கியது. 'தமிழீழம்' எனப் பொறிக்கப்பட்டு உற்பத்தி செய்யப்பட்ட அந்த ஓட்டின் தரம் எவ்வாறானது என்பதை இப்போதும் பல இடங்களிலும் பரவலாகப் பார்க்க முடியும். அதற்கு விடுதலைப் புலிகளுடைய தொழில்நுட்பம், அவர்களிடம் இருந்த பொருண்மிய அறிவு மிகப் பாரியளவிலே பயன்படுத்தப்பட்டது. அந்த ஓட்டுத் தொழிற்சாலை இயங்காமற் போயிருக்கிறது.

அடுத்து, மட்டக்களப்பு மாவட்டத்தின் வாழைச்சேனை காகிதத் தொழிற்சாலை! மேனாள் நாடாளுமன்ற உறுப்பினர் சீனித்தம்பி யோகேஸ்வரன் அவர்கள் அதை மீண்டும் இயக்குவதற்குப் பெரும் முயற்சி எடுத்தார். 2015 - 2019 காலப்பகுதியில் நெதர்லாந்திலிருந்து வரவழைக்கப்பட்ட தொழில்முயற்சியாளர் குழுவொன்று அந்தக் காகிதத் தொழிற்சாலையை இயக்குவதற்கு 3,000 மில்லியன் ரூபாயை உடனடியாக முதலீடு செய்ய முன்வந்திருந்தது. ஆனால், அப்போதைய அரசாங்கமும் அதிலிருந்த சிலரும் அதைத் தடுத்துவிட்டார்கள். அதனால், மேனாள் நாடாளுமன்ற உறுப்பினர் கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன், கௌரவ ஸ்ரீநேசன் ஆகியோரது முயற்சி கைவிடப்பட்டது. நான் உங்களிடம் இந்தப் பொறுப்பை ஒப்படைக்கிறேன். காரணம், இவ்வாறான ஒரு காகிதத் தொழிற்சாலையை இயங்க வைக்க இதுவரை ஒரு மாற்றுத் திட்டம் இல்லை. ஓட்டுத் தொழிற்சாலை இயங்கவில்லை, உப்பளங்கள் இயங்கவில்லை, பரந்தன் இரசாயனத் தொழிற்சாலை இயங்காமல் அப்படியே கைவிடப்பட்டிருக்கிறது. காங்கேசன்துறைச் சீமெந்துத் தொழிற்சாலை இயங்கவில்லை. இவ்வாறு இருக்கும்போது எவ்வாறு இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்பை வழங்க முடியும்? இளைஞர்கள் எவ்வாறு இந்த நாட்டிலே விருப்பத்தோடு இருப்பார்கள்? வேலைவாய்ப்பை வழங்கும் தொழில் துறைகள் என்ன?

இப்போது கிளிநொச்சியிலே 'விடியல்', 'வானவில்' என்ற இரண்டு ஆடை உற்பத்தித் தொழிற்சாலைகள் இயங்குவதால் அங்கு கொஞ்சப்பேர் வேலைக்குச் சென்று வருகிறார்கள். அங்கும் மெல்ல மெல்ல ஆட்குறைப்பு நடைபெறுவதாக அறிகிறேன். காரணம், அவர்களுக்கான orders அல்லது விருப்பத் தேர்வுகள் குறைந்திருப்பதாகும். அதனால் உற்பத்தி குறைவதனால், அவர்களுக்கான வேலை நேரங்களும் குறைந்துகொண்டு செல்கின்றது. இது அந்தத் தொழில் துறைகளைப் பின்னுக்குத் தள்ளுகிறது. நாடு முதலில் உற்பத்தித் துறையிலே வளர வேண்டும்; உற்பத்தி ரீதியாக அடையாளப்படுத்தப்பட வேண்டும். அதற்கு இந்த நாட்டினுடைய கைத்தொழில் மேலோங்கி வர வேண்டும்.

இப்போது நாட்டில் குறிப்பாக யாழ்ப்பாணத்தில் சுற்றுலாப் பணிகளை நோக்காகக்கொண்டு பிரியாணி கடைகளும் சாப்பாட்டுக் கடைகளும் திறக்கப்படுகின்றன.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒரு நிமிடம் தாருங்கள்!

சுற்றுலாப் பயணிகளுக்குச் சாப்பாடு கொடுப்பதற்காகப் பிரியாணி கடைகள் திறக்கப்படுகின்றதே தவிர, இளைஞர்களுக்கான வேலைக்கான களம் திறக்கப்படவில்லை. அந்த யாழ்ப்பாண மண்ணிலே, மட்டக்களப்பு மண்ணிலே, திருகோணமலை மண்ணிலே, கிளிநொச்சி, வவுனியா, மன்னார், முல்லைத்தீவு மண்ணிலே இருக்கின்ற இளைஞர்களுக்கான வேலைக்கான களம் எங்கே திறக்கப்பட்டிருக்கின்றது? சாப்பாட்டுக் கடைகளைத் திறப்பதால் வேலை கிடைக்குமா?

இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையிலான பாலம் அமைக்கப்படுமா? அவ்வாறு அமைக்கப்பட்டால் கிடைக்கும் இலாபம் என்ன? அதற்கான வேலைத்திட்டங்கள் எந்தளவில் இருக்கின்றன? தலைமன்னாருக்கும் இராமேஸ்வரத்துக்கும் இடையில் இராமாயணக் காலத்தில் இருந்த பாலத்தின் செயற்பாட்டை முன்னெடுப்பதாகப் பேசப்பட்டதே தவிர, இன்றுவரை அது கிடப்பில் இருக்கின்றது. அதானி குழுமம் மேற்கொள்ளவிருந்த காற்றாலை மின் உற்பத்தி நிலையச் செயற்பாடுகள் தடுக்கப்பட்டிருக்கின்றது அல்லது அவர்கள் பின் வாங்கியிருக்கின்றார்கள். தாங்கள் கௌரவமாகப் பின்வாங்குகிறோம் என்று அவர்கள் சொல்கின்றார்கள். அப்படியென்றால், உற்பத்தித் தொழில் துறைகள், மக்களுக்கான வேலைவாய்ப்புக் களங்கள், வேலை வாய்ப்புக்கான தளங்கள் போன்றவை ஆரம்பிக்கப்படுவது தள்ளித் தள்ளிச் செல்கின்றது.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
நான் முடிக்கிறேன்.

இந்த அரசாங்கத்தின்மீதோ அல்லது அமைச்சர்கள்மீதோ குற்றம் கூறுவது எனது நோக்கமல்ல. கடந்த காலங்களில் இவை சரியாகக் கையாளப்படவில்லை என்பது உங்களுக்குத் தெரியும். நான் ஓர் அதிபராக, ஆசிரியராக சொல்கிறேன், நீங்கள் ஐந்தாண்டு செய்கின்ற ஆட்சிதான் அடுத்துவரும் ஆண்டுகளில் நாட்டினுடைய வளர்ச்சியைப் படம்போட்டுக் காட்டும்! ஒரு பாடசாலையிலே ஓர் அதிபருடைய ஐந்தாண்டுத் திட்டம் அந்தப் பாடசாலையின் வளர்ச்சியைக் காட்டுவதுபோல, அரசாங்கத்தின் ஐந்தாண்டு ஆட்சிதான் நாட்டை அடுத்த கட்டத்துக்குக் கொண்டு செல்லும். உங்களுடைய ஐந்தாண்டு ஆட்சிக் காலம் எவ்வாறான முன்னேற்றத்தைத் தரப்போகின்றது? அதற்கான உங்களுடைய சிறந்த முயற்சிகளுக்கு எங்களது ஒத்துழைப்பை நாங்கள் வழங்கத் தயாராக இருக்கிறோம். எனவே, தயவுசெய்து, இந்தத் தொழிற்சாலைகள் தொடர்பிலே அதிகமான கவனம் செலுத்துங்கள் என்பதை மீண்டும் நான் பதிவுசெய்கிறேன். நன்றி!

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කියපු කාරණයක් ගැන පොඩි නිවැරැදි කිරීමක් කරන්න ඕනෑ. අපි ඔඩිඩුසුඩාන් උළු කර්මාන්තශාලාවේ වැඩ දැනටමත් පටන් ගත්තා. ඔබතුමන්ලා කවුරුත් දන්නා පන්ඩාර වන්නි කියන දෙවියන්ගේ නමින් PV tiles හැටියට තමයි ඒ උළු තිබෙන්නේ. අපි දැන් PV tiles හදන්න පටන් ගත්තා; ගඩොල් හදන්න පටන් ගත්තා. ඒ ප්‍රදේශයට ගැළපෙන විධියට, heat එක අඩු කරන සිදුරු හතරක් තිබෙන ගඩොල් හදනවා. දැනට ඒක වෙළඳ පොළට නිකුත් කරන්න බලාපොරොත්තු වෙනවා. අපි දැන් ඒ වැඩ පටන් අරගෙන තිබෙන්නේ. පරන්තන්වල chemical manufacturing industrial zone එකට මුදල් වෙන් කරලා තිබෙනවා. යුද්ධය නිසා එතැන බිල්ඩින් සියල්ල විනාශ වෙලා තිබෙන්නේ. ඒවා මොකුත් එතැන නැහැ. අලුතින් බිල්ඩින් හදලා වැඩ පටන් ගන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් අක්කර 50ක් වෙන් කරගෙන තිබෙනවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මේස ලුණු - table salt - කියලා දැනට භාවිතයට ගන්නා ලුණු කලින් ඒ කර්මාන්තශාලාවේ හදලා තිබුණේ නැහැ. අපි ලබන 29වැනි දා ඉඳලා රජයේ ලුණු හැටියට අලිමංකඩ ලුණු වෙළඳ පොළටත් නිකුත් කරනවා. ඔබතුමා කියපු කුරුංජාතීවු ප්‍රදේශය අපි නිරීක්ෂණය කළා. අපට ඒකේ අලුතින් ලුණු කර්මාන්ත පටන් ගන්න පුළුවන්. ඒක private companiesවලින් ඉල්ලලා තිබුණා. ඒක අපේ National Salt Limited එකෙන් කරන්න පුළුවන්, කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ හැම රැකියාවක්ම දෙන්නේ ඔබතුමන්ලාගේ ප්‍රදේශයේ උතුරු පළාතේම ජනතාවට තමයි. වෙන කොහෙන්වත් කවුරුවත් ගෙනැල්ලා ඒ jobsවලට දාන්නේ නැහැ. අපේ ලැයිස්තුවලින් කවුරුවත් දාන්නේ නැහැ. අනිවාර්යෙන්ම ඔබතුමන්ලාගේ ප්‍රදේශවල සුදුසු අයට තමයි අපි ඒ රැකියා ලබා දෙන්නේ.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, மீண்டும் எனது நன்றியை நான் உங்களுக்குத் தெரிவித்துக் கொள்கின்றேன். மிக முக்கியமாக, ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலையின் ஓட்டு உற்பத்தியை நீங்கள் மாவீரன் பண்டாரவன்னியனுடைய பெயரிலே செய்வதுபோல, 'ஆனையிறவு உப்பு' என்பது அதன் பெயரிலேயே விற்பனைக்கு வரவேண்டும். அது ஆனையிறவு மண்ணுக்குச் சொந்தமானது. 'ஆனையிறவு உப்பு' என்ற பெயர்தான் கடந்த காலங்களிலும் இருந்தது. அதேபோல, குறிஞ்சாத்தீவில் உற்பத்தியாகின்ற உப்பின் பெயரும் 'குறிஞ்சாத்தீவு உப்பு' என்று குறிக்கப்பட வேண்டும். தயவுசெய்து அந்த உண்மையான வரலாற்றுப் பெயர்களோடு மீண்டும் அவற்றின் உற்பத்திகளைக் கொண்டுசெல்ல நீங்கள் எடுக்கின்ற முயற்சிகளுக்கு எங்களாலான முழு ஒத்துழைப்பும் இருக்கும். விரைவாக இவற்றை மேற்கொள்ளவும், கைத்தொழில் பேட்டையை நீங்கள் விரைவாகப் பரந்தனிலே ஆரம்பிக்கவும் என்ன வழியில் உதவ முடியுமோ அதற்கு நாங்கள் காத்திருக்கின்றோம்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.19]

ගරු සුගත් තිලකරත්න මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுகத் திலகரத்ன - விளையாட்டுத்துறைப் பிரதி அமைச்சர்)
(The Hon. Sugath Thilakaratne - Deputy Minister of Sports)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2025 වර්ෂයේ අය වැය විවාදයේදී තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද දිනය ශ්‍රී ලාංකීය ක්‍රීඩා ඉතිහාසයේත් ඒ වාගේම මේ පාර්ලිමේන්තු සභාවේත් සුවිශේෂ දිනයක් කියලා මා විශ්වාස කරනවා. මා දන්නා විධියට Olympian කෙනෙක් මේ පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කරන ප්‍රථම අවස්ථාව මෙයයි. ඇත්තටම එය මගේ ජීවිතයේ ලද භාග්‍යයක් සේ සලකනවා. ඒ වාගේම නුවරඑළිය දිස්ත්‍රික්කයේ නෝටන්බ්‍රිජ් විදුලිපුර මහා විද්‍යාලයේ පාසල් ක්‍රීඩා පිටියෙන් ආරම්භ කරපු මගේ ගමනේදී ජාතික ජයග්‍රහණ, ඒ වාගේම ජාත්‍යන්තර ජයග්‍රහණ දක්වා ආ මාවත ඔබ සැමට මතක ඇතැයි මා විශ්වාස කරනවා. ඒ ආ දුෂ්කර ගමනේදී 1993 සිට 2006 දක්වා මා ලැබූ ජයග්‍රහණවලින් බිඳක් ඔබ හමුවේ තබන්නම්.

මම දකුණු ආසියානික තරඟාවලියේදී වාර්තා තුනක් සමඟින් රන් පදක්කම් පහක්ද, ඒ වාගේම තවමත් නොබිඳී පවතින ආසියානු ශූරතා තරඟාවලි වාර්තාවත් සමඟින් රන් පදක්කම් තුනක්ද, ආසියානු ක්‍රීඩා උළෙලේ පදක්කම් තුනක්ද, පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලේ ලෝකඩ පදක්කම සහ ලෝක ශූරතා තරඟාවලියේ ලෝකඩ පදක්කමක්ද සමඟ 1996 සහ 2000 වර්ෂවලදී ඔලිම්පික් ක්‍රීඩා උළෙල නියෝජනය කළ ක්‍රීඩකයෙක්. ඒ වාගේම ඉතිහාසයේ මා ලැබූ ජයග්‍රහණ, පරාජ වාගේම, මලල ක්‍රීඩා සංගමයේ සභාපති ලෙස ලද අත්දැකීම් ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් යොදා ගැනීමට මා අදහස් කරනවා.

ඒ වාගේම ක්‍රීඩාවේදී ලද පරාජයන් තුළින් ජයග්‍රහණයට යන මාවත තව තවත් ශක්තිමත් කර ගැනීමට හැකි වුණා වාගේම දේශපාලනිකවද අප කණ්ඩායමක් ලෙස විවිධ දුක් ගැහැට, දහඩිය, කදුළු තුළින් ලැබූ පන්නරය මෙන්ම මේ රට වෙනස් කිරීමට තිබූ අරමුණ අද ජයග්‍රහණය කර ඇති බවද මම වැඩදුරටත් සඳහන් කරන්න කැමතියි. ඒ වාගේම 76 වසරක ඉතිහාසය තුළ ක්‍රීඩාව වෙනුවෙන් අප වෙන් කළ කාලයට, ඒ වාගේම වෙන් කළ මුදලට සාපේක්ෂව නිරෝගී ජනතාවක් බිහි කරන්නට හැකි වුණාද කියන එක ගැන අපට සැකයක් තිබෙනවා. ඒ පිළිබඳව අපි නැවත සිතා බැලිය යුතු යැයි මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ක්‍රීඩාවේ යෙදෙන අපට මේ විශ්වයේ තිබෙන මහා මංගල්‍යය තමයි ඔලිම්පික් ක්‍රීඩා තරඟාවලිය. 1948 සිට මේ දක්වා ඔලිම්පික් ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාව වෙනුවෙන් නියෝජනය කරලා තිබෙන්නේ 107දෙනෙකු පමණයි. ලෝකය විධියට ගත්තොත්, ඇත්තටම ඒ ඉතාම සුළු පිරිසක්. ඒ වාගේම අපට ලැබී තිබෙන්නේ ඔලිම්පික් පදක්කම් දෙකයි. 1948දී ඩන්කන් වයිට් ක්‍රීඩකයා සහ 2000 වසරේදී සුසන්තිකා ජයසිංහ ක්‍රීඩිකාව ඒ පදක්කම් දෙක ලබා ගත්තා. ඉතින්, අද අපේ ක්‍රීඩාවේ තිබෙන තත්ත්වයක් එක්ක, ඔවුන් දෙදෙනා ලද ඒ රිදී පදක්කම් දෙක මම අද සිහිපත් කරනවා.

පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟවලදී අපි මේ වනවිට සියලු ක්‍රීඩාවලින් පදක්කම් 24ක් ලබාගෙන තිබෙනවා. ඒ වාගේම ආසියානු ක්‍රීඩා උළෙලේදී විවිධ ක්‍රීඩා නියෝජනය කරමින් මේ වනවිට අපි දිනා ඇත්තේ පදක්කම් 51ක් පමණයි. ඒ හා සමානව ක්‍රිකට් ක්‍රීඩාව ගත්තොත් අපි ලෝක කුසලාසනය, T20 කුසලාන දිනාගෙන තිබෙනවා. අපේ ශ්‍රී ලංකා ක්‍රීඩා ඉතිහාසය තුළ අපි ශූරතා වාගේම අනුශූරතා දිනාගෙන තිබෙනවා.

තරග කිහිපයක් හැරුණුකොට, අපේ රට පිළිබඳව වෙනත් සුවිශේෂී ජයග්‍රහණ ගැන අපට සඳහන් කරන්න බැහැ. හැබැයි, අමාත්‍යාංශයක් හැටියට ඉදිරියේදී එවැනි ජයග්‍රහණ වෙනුවෙන් කටයුතු කරන්න අපි සූදානම් වෙලා ඉන්නවා. අපි ඒ කටයුතු සූදානම් කරමින් සිටිනවා. ඉදිරියේදී මේ රටේ ක්‍රීඩාව ඉස්සරහට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන මේ වෙනකොට සියලු සංගම් සමඟ සාකච්ඡා කරලා එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. අපි ඔවුන්ගේ ගැටලු, ප්‍රශ්න නිරාකරණය කරලා දීලා ඔවුන් සමඟ එක්ව වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවා. තවදුරටත් ඔලිම්පික් පදක්කම් දෙකකින් පමණක් සෑහීමකට පත් නොවී ඒක එතැනින් එහාට ගෙන යන්න අපට වගකීමක් තිබෙනවා. ඒක තමයි ජාතික ජන බලවේගය රජය අපට දීලා තිබෙන වගකීම.

ඔලිම්පික් සහ ජාත්‍යන්තර මට්ටමේ තරග ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වන පරිදි අපි ක්‍රීඩාව මෙහෙයවනවා. ඒ වෙනුවෙන් අය වැයෙන් අපට මුදල් වෙන් කරලා දීලා තිබෙනවා. නිවැරදි කළමනාකරණයක් යටතේ මුදල් වියදම් කරමින් අපි ඒ කටයුතු සිද්ධ කරන්න බලාපොරොත්තු වෙනවා.

විපක්ෂයේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, ක්‍රීඩා භාණ්ඩ බෙදන එක නොවෙයි ක්‍රීඩා අමාත්‍යාංශයේ කාර්යභාරය කියලා. ඇත්තටම මම කියන්න කැමැතියි, අපි ක්‍රීඩා භාණ්ඩ බෙදන එක කරන්නේ නැහැ. අපට ක්‍රීඩා සංවර්ධනය වෙනුවෙන් ඊට වඩා දෙයක් කරන්න තිබෙනවා. ක්‍රීඩා සංවර්ධන කටයුතු සඳහා තමයි අපි විශේෂයෙන්ම වැඩි අවධානය යොමු කරලා තිබෙන්නේ. ඒ වාගේම මම මතක් කරන්න කැමැතියි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ක්‍රීඩා අමාත්‍යවරයාව සිටි කාලයේ කන්ටේනර් පෙට්ටිවල gyms හදලා පාරක් පාරක් ගානේ දාලා තිබුණු බව. මම හරියටම දන්නේ නැහැ කීයක් දාලා තිබුණාද කියලා. හැබැයි අද ඒවා ඒ තැන්වල නැහැ. ඒවාට වියදම් කළ මුදල් නිරපරාදේ, නිස්කාරණේ නාස්ති වුණා කියලා මම හිතනවා. ඉස්සරහට ඒවා ගැන සොයලා බලන්න වෙයි කියලාත් මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් කිව්වා අපි මේ වෙද්දී high performance schools පවත්වාගෙන යන්නේ නැහැයි කියලා. හැබැයි, අපි මේ වෙනකොටත් high performance schoolsවලට අදාළ ක්‍රීඩකයින්ගේ තොරතුරු එවන්නය කියලා ක්‍රීඩා සංගම් දැනුවත් කරලා තිබෙනවා, ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා. මේ වන විට සංගම් කිහිපයකින් හැරෙන්න ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තොරතුරු ලැබිලා නැහැ. හැබැයි, ලැබිලා තිබෙන තොරතුරු අනුව ඒ ක්‍රීඩකයින්ගෙන් මේ මාසයේදී එම සංචිත ආරම්භ කරන්න අපි පටන් ගන්නවා. මේ ගැන විශේෂ කාරණයක් කියන්න තිබෙනවා. 2021දී ක්‍රීඩකයින් 70දෙනෙකුගෙන් පමණ මේ පුහුණු සංචිත ආරම්භ කරලා, අදියර 4ක් යටතේ මුදල් ගෙවීම සිදු කරලා තිබෙනවා. පසුගිය 2024 වර්ෂයේ ක්‍රීඩකයින් 58දෙනෙක් සම්බන්ධ කරගෙන තිබෙනවා මේ high performance school එකට. මේ වෙනකොට ඔවුන් ගැන කිසිම පසුවිපරමක් කරලා නැහැ. අපි ආවාට පසුව සොයා බැලුවාම ඔවුන්ගෙන් ක්‍රීඩකයින් 10දෙනෙක් පමණ තමයි නියමිත දක්ෂතා අතරට ඇවිල්ලා තිබෙන්නේ. අපි ක්‍රීඩකයින් 100ක්, 200ක් අරගෙන සංචිත හැදුවාට වැඩක් නැහැ ඔවුන්ට දක්ෂතා නැත්නම්. මොකද, අපි ක්‍රීඩකයින්ගෙන් රටට දෙයක් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ක්‍රීඩකයින් තෝරා ගැනීමේ නිර්ණායක ඉතා වැරදි විධියට කරලා තිබෙනවා. ඒ නිසා තමයි එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. ඉදිරියේදී අපි මේ සංචිත ආරම්භ කරනවා. මීන් පසුව නිවැරදි නිරීක්ෂණ ක්‍රමයක් යටතේ ඔවුන් තෝරාගෙන, ඔවුන්ගේ දත්ත ගබඩාවකුත් එක්ක ක්‍රීඩකයින් ආරක්ෂා කරගෙන ඉදිරියට ගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා. තෝරාගත් ක්‍රීඩකයින්ට මුදල් ගෙවීම පමණක් නොවෙයි අපි සිද්ධ කරන්නේ. කලින් මුදල් ගෙවීම පමණක් සිද්ධ කරලා තිබෙනවා. ඒ තුළින් නේවාසික පුහුණුව, ඔවුන්ගේ පුහුණුව නිරන්තර අධීක්ෂණය, දක්ෂතා විශ්ලේෂණය කිරීම සහ පෙර සිදු වූ දුර්වලතා මඟ හරවා ගැනීමට අපි අදහස් කරනවා.

අපි high performance පුහුණු සංචිතවලින් බලාපොරොත්තු වෙන්නේ ආසියාවේ පොදු රාජ්‍ය මණ්ඩලීය තරග, ඔලිම්පික් ක්‍රීඩා උළෙල සහ ලෝක ශූරතා තරගවලට මුහුණ දීලා ඒවායින් අපේ රටේ කීර්තිය, අභිමානය මේ ලෝකයට ගෙන යන්නයි. මේ සඳහා අපි විශේෂ වැඩ පිළවෙළ රාශියක් ඇති කරලා තිබෙනවා. විශේෂයෙන් අපට මලල ක්‍රීඩාවේ හෙල්ල විසි කිරීමේ ක්‍රීඩකයින් දෙදෙනෙක් ඉන්නවා. ඔවුන් දෙදෙනා මේ වන විට ලෝකයේ අංක එක සහ අංක දෙක කියන තැන්වල ඉන්නවා. ඒ, සුමේධ රණසිංහ සහ රොමේෂ් තරංග කියන ක්‍රීඩකයින් දෙදෙනා. දකුණු ආසියාවේ තමයි මේ වෙනකොට හෙල්ල විසි කිරීමේ හොඳම ක්‍රීඩකයින් ඉන්නේ. පසුගිය ඔලිම්පික් ක්‍රීඩා උළෙලේදී රන් පදක්කම සහ රිදී පදක්කම දිනා ගත්තේ පාකිස්තානයේ ක්‍රීඩකයා සහ ඉන්දියාවේ ක්‍රීඩකයා. අපිත් දකුණු ආසියාවේ; ලෝකයේ හොඳම ක්‍රීඩකයින් ඉන්නේ දකුණු ආසියාවේ. ඉතින් අපිත් දකුණු ආසියානික රටක් නිසා 2028දී හෙල්ල විසි කිරීමේ ඉසව්වෙන් අපට ඔලිම්පික් පදක්කමක් බලාපොරොත්තු වෙන්න පුළුවන් කියලා විශ්වාස කරනවා. අපි හෙල්ල විසි කිරීමේ ඉසව්ව සඳහා විශේෂ වැඩසටහනක් ඉදිරියේදී ක්‍රියාත්මක කරනවා. හෙල්ල විසි කිරීමේ ක්‍රීඩාව ගමට ගෙන ගිහිල්ලා, ගමේ සිටින ක්‍රීඩකයින් තෝරාගෙන මේ ඉසව්ව සඳහා පමණක්ම විශේෂිත වූ ක්‍රීඩා වැඩසටහනක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න මේ වෙද්දී අපි සැලසුම් සකස් කරමින් සිටිනවා.

ඒ සඳහා අපි ක්‍රියාත්මක වෙනවා. මොකද, අපට ඕනෑ කරන්නේ අපේ රටේ ක්‍රීඩාව ඉදිරියට අරගෙන යන්න. විශේෂයෙන් ජාතික සහ ජාත්‍යන්තර ජයග්‍රහණ ගෙනෙන පැත්තට අරගෙන යන්න.

ඒ වාගේම මේ වෙනකොට අපි ජාතික පුහුණු සංචිත පවත්වාගෙන යනවා. අපි පුහුණු සංචිත 3ක් පවත්වාගෙන යනවා. එකක්, High Performance Pool, ඊට පස්සේ National Pool, ඊටත් පස්සේ කනිෂ්ඨ සංචිතය. අපි ඒ වාගේ සංචිත 3ක් පවත්වාගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජ්‍යෙෂ්ඨ සංචිතය ගැන කියනවා නම්, පසුගිය වසරේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 273දෙනෙක් පමණයි තෝරාගෙන තිබුණේ. නමුත්, අපි 2025 වර්ෂය සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 500ක පමණ පිරිසක් සංචිතගත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒකට විශේෂ හේතුව තමයි, 2026 ජනවාරි මාසයේ දකුණු ආසියානු ක්‍රීඩා උළෙල පැවැත්වීම. ඒ වෙනුවෙන් අපි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සූදානම් කරන්න ඕනෑ. අපේ රටේ ජයග්‍රහණය වෙනුවෙන් අපට විශේෂ කැප කිරීමක් කරන්න වෙනවා. ඒ වාගේ සැලසුම් එක්ක තමයි අපි ලෝක මට්ටමේ තරගාවලි සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සූදානම් කරන්න ලැහැස්ති වෙලා ඉන්නේ.

ඒ වාගේම මම සඳහන් කරන්න ඕනෑ, සංචිතගත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ආහාර පාන ලබා දෙනවා, ඇඳුම් වියදම් ලබා දෙනවා වාගේම, ඔවුන්ගේ භාවිතය සඳහා අපේ අමාත්‍යාංශය සතු යටිතල පහසුකම් ලබා ගන්න අවශ්‍ය පහසුකම් ද අපි සලසනවා. විශේෂයෙන්ම ඉදිරියේදී අපි කනිෂ්ඨ සංචිත පවත්වාගෙන යන්නත් කටයුතු කරනවා. "ක්‍රීඩා ශක්ති" වැඩසටහන යටතේ අපි ඒ දේවල් ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා අපි ක්‍රීඩා 19ක් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගෙන, ක්‍රීඩක ක්‍රීඩිකාවන් 900දෙනෙකුගේ සංචිතයක් පවත්වාගෙන යන්න ඉදිරියේදී කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තිබෙන කාල වේලාව මදි නිසා මගේ කථාවත් කෙටි කරන්න වෙනවා. විශේෂයෙන් ගත්තොත්, අපට දැන් තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක භාවිතය. අද වන විට ක්‍රීඩක ක්‍රීඩිකාවන් බොහෝ වෙලාවට තහනම් උත්තේජක භාවිතයෙන් ක්‍රීඩාවේ ජයග්‍රහණ කරා යන්න පුරුදු වෙලා තිබෙනවා. ලෝකයේ අනෙක් රටවලට වාගේම අපේ රටටත් ඒක විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා; ප්‍රබල තර්ජනයක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය හරහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, ඒ වාගේම ගුරුවරුන් මේ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් දිගින් දිගටම සිදු කරන්නත් අපි කටයුතු කරනවා. විශේෂයෙන් පාසල් ක්‍රීඩා මට්ටම

[ගරු සුගත් තිලකරත්න මහතා]

තුළත් අද තහනම් උත්තේජක භාවිතය ශීඝ්‍ර ලෙස වර්ධනය වෙලා තිබෙනවා කියලා අපට දැනගන්න ලැබී තිබෙනවා. ඒ සඳහාත් අපි මැදිහත් වෙලා කටයුතු කරනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය හරහා ඉදිරියේදී ක්‍රීඩක ක්‍රීඩිකාවන් අනිවාර්යයෙන්ම අදාළ පරීක්ෂණ සඳහා යොමු කරන්නත් අපි කටයුතු කරනවා. දැනට ඒ පරීක්ෂණ සඳහා භාවිත කරන්නේ මුත්‍රා සාම්පල පමණයි. හැබැයි, මේ වෙද්දි ලෝකයේ වෙනත් රටවල් ලේවලිනුත් තහනම් උත්තේජක පරීක්ෂණ කරනවා. ඉදිරියේදී කෙසේ හෝ එම සාම්පල දෙක යටතේම මේ සම්බන්ධ පරීක්ෂණ කටයුතු කරන්න අපට අනිවාර්යයෙන්ම සිදු වෙනවා. අපි කොහොම හරි ඒ සඳහා පෙලඹෙනවා. එහෙම නොවුණොත්, අපේ රටේ ක්‍රීඩාවේ අභිමානය නැති වෙනවා. ඒ වාගේම ගොඩක්දුරට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අනාගතයත් නැති වෙයි. ක්‍රීඩකයින්ගේ අසාමාන්‍ය දක්ෂතාත් එක්ක තහනම් උත්තේජක පිළිබඳව අපට අනිවාර්යයෙන් දැඩි තීරණයක් ගන්න සිදුවෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය නම් දැන් අවසන් වෙලා තිබෙන්නේ.

ගරු සුගත් තිලකරත්න මහතා
(*மாண்புமிகு சுகத் திலகரத்ன*)
(The Hon. Sugath Thilakaratne)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපේ පුහුණුකරුවන් ගැනත් මම සඳහන් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම අද සිටින පුහුණුකරුවන්ගේ දැනුම ප්‍රමාණවත් නැහැ කියලා අපි විශ්වාස කරනවා. අපේ පුහුණුකරුවන්ටත් විදේශීය පුහුණුකරුවන්ගේ දැනුම ලබා දීමට අවශ්‍ය යම්කිසි වැඩසටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. අද ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගත්තොත්, පාසල් මට්ටමේ සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා ඉතා ඉහළ මට්ටමක පවතිනවා. හැබැයි, ජාතික මට්ටමට එද්දි ඔවුන්ගේ එම ක්‍රීඩා දක්ෂතා නැතිවෙලා යනවා. ඒකට හේතුව තමයි, ඔවුන් අධික ලෙස පුහුණු කටයුතුවල යෙදවීම. ඒ වාගේම නිවැරදි ක්‍රමවේදවලින් තොරව පුහුණුවීම්වල නිරතවීම. ඒකෙන් වෙන්නේ අපේ රටේ සිටින සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අගතියක් සිදු වන එකයි. මොකද, අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් national level එකට එද්දීම ඔවුන්ගේ දක්ෂතා නැතිවෙලා අයාලෙ ගිහින් ක්‍රීඩාවෙන් ඈත් වෙනවා. මේ සියලුම කරුණු කාරණා ගත්තොත්, පුහුණුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආදී ගොඩක් දේවල් අපට කරන්න තිබෙනවා.

මට ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්න දෙකකට උත්තර දෙන්නත් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එතුමා කිව්වා, පුහුණු සංචිතයේ hostels ගැන බලන්න, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කෑම ගැන බලන්න කියලා. මමත් අවුරුදු 13ක් ඒ pool එකේ hostel එකේ සිටියා. අපි ක්‍රීඩා අමාත්‍යාංශය භාර අරගෙන සතියකට පස්සේ එම ස්ථානය බලන්න ගියා. එතැනට ගියාට පස්සේ එහි තිබෙන අඩු පාඩු සියල්ල ගැන අපව දැනුවත් කළා.

ක්‍රීඩා වෛද්‍ය ඒකකයේ පෝෂණවේදීන්ට අපි දැනුම් දුන්නා, menu එක වෙනස් කරලා, අවශ්‍ය විධියට කෑම ලබා දෙන්න කියලා. ඒවායේ A/C කැඩිලා තිබුණා. ඒ හැමදේම නැවත හදන්න කියලා අපි කිව්වා. ඊට පසු අපට එම ස්ථානය බලන්න යන්න බැරි වුණා. අපට නිතරම ඒ පැත්තට යන්න එන්න බැහැ. ඒ වගකීම භාර ගත් අය ඒ වගකීම ඉෂ්ට කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම මගේ කථාව මෙහෙම අවසන් කරන්නම්. ජයග්‍රහණය විසින් රටට කීර්තිය සහ අභිමානය ගෙන ඒමත්, සහභාගිත්වය තුළින් නිරෝගි ජාතියක් බිහි කිරීමත්, විනයගරුක, ශක්තිමත්, පෞරුෂයක් සහිත, උසස් මනෝභාවයක් ඇති ජන සමාජයක් බිහි කිරීමත් අපගේ එකම අරමුණයි. කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.33]

ගරු දිලිත් ජයවීර මහතා
(*மாண்புமிகு திலித் ஜயவீர*)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජාතික ජන බලවේගය රජයේ මංගල අය වැය පිළිබඳව පැවැත්වෙන මෙම විවාදයේ මම හිතන විධියට මට කථා කරන්න ලැබෙන අවසාන අවස්ථාව මෙයයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා මිත්‍ර හඳුන්නෙත්ති ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා ඉස්සරවෙලාම මම මේ කාරණය මතක් කර දෙන්න කැමැතියි. 2006 වසරේ අග භාගයේදී එතුමන්ලාත්, අපිත් එක්ව යම් විධියකට ආශීර්වාද කරමින්, එතුමන්ලා ඒ රජයේ කොටස්කරුවන් වෙමින්, ඒ මහින්ද රාජපක්ෂ රජය ගෙන යන ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව, විශේෂයෙන්ම ආචාර්ය පී.බී. ජයසුන්දර මහතාගේ ලේකම් ධුරය යටතේ පැවැති තත්ත්වය පිළිබඳව අපේ නිරීක්ෂණයට භාජන කළා. ඒ දවස්වල පාගොඩ පාරේ තිබෙන ඔබතුමන්ලාගේ මූලස්ථානයට මම නිතර එනවා. ඔබතුමාටත් මතක ඇති, ඒ කාලයේ අපි නොයෙක් දේවල් සාකච්ඡා කළ බව. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි විශාල විවේචනයක් ඉදිරිපත් කළා, මේ විධියට ගිහිල්ලා අපි විශාල අමාරුවක වැටෙයි, අපට අපේම වූ ස්වදේශික ආර්ථික උපාය මාර්ගයක් නොතිබුණොත් කියලා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට අපි ඒ විරෝධතා ව්‍යාපාරය දිගටම ගෙනයන්නට ජෝන් පර්කින්ස්ගේ ඒ "Confessions of an Economic Hit Man" කියන පොත "ආර්ථික කුලී ඝාතකයෙකුගේ පාපොච්චාරණය" නමින් පරිවර්තනය කරලා, එවැනි ආර්ථික ඝාතකයෙකු විසින් කරන ලද පාපොච්චාරණයක් කොළඹ ගාලු මුවදොර හෝටලයේදී එළිදැක්වුවා. එහිදී මමත්, ඔබ පක්ෂය නියෝජනය කරමින් විමල් වීරවංශ මැතිතුමාත්, මට මතක හැටියට ව්‍යවසායකයෙකු හැටියට ඩබ්ලිව්.කේ.එච්. වෑගපිටිය මැතිතුමාත් දේශන 3ක් පැවැත්වුවා. ඒ දේශනයේදී මම අද මේ රටට - අපේ මව් බිමට - අත්විය හැකි ඉරණම පිළිබඳව පුරෝකථනයක් කළා. ඒ පුරෝකථනය අද අන්තිම දශමයට නිවැරදිව, ඒ විධියටම සිද්ධ වෙලා තිබෙනවා.

මේ ඇති වී තිබෙන තත්ත්වයට මෙම NPP රජය වගකිව යුතුයි කියලා මම කිසිසේත්ම මොහොතකටවත් කියන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, අපි දන්නා විධියට විටින් විට, ඒ ඒ වෙලාවලදී ඒ ඒ රජයන්ට අපි ආශීර්වාද කළා. අපි පුළුවන් හොඳම දේ කරගන්නට උත්සාහ කළා. නමුත්, ඒ හැම අවස්ථාවකම අපට අපේම ස්වදේශික ආර්ථිකයක් බිහි කරගැනීමට තිබුණු අවස්ථා මහ හැරී ගියා. ඒකට හොඳම උදාහරණය මෙයයි. මම අවසාන වශයෙන් මගේ ආශීර්වාදය ලබා දෙමින් උදව් කළේ ගෝඨාභය රාජපක්ෂ

ජනාධිපතිවරයා පත් කරගන්නටයි. ඒ ජනාධිපතිවරයා පත් කරගෙන දින කිහිපයකින් ආර්ථික ඝාතකයා ලෙස මම දිගින් දිගටම හඳුන්වා දුන් පී.බී. ජයසුන්දරව ඔහුගේ ලේකම් වශයෙන් පත් කළා, ඒ සියලු බලතල සහිතව. පී.බී. ජයසුන්දර තමයි ඊට පසු බැසිල් රාජපක්ෂ මහත්මයා එක්ක එකතු වෙලා මේ ආර්ථික ඝාතනය දිගින් දිගටම කරගෙන ගියේ. මම හිතනවා, ඒ නිසා තමයි ජනතාව තීන්දුවක් ගත්තේ, මේ වැඩේ හරියන්නේ නැහැ, NPP එකට බලය දීලා බලනවා කියලා. ඒ නිසා මම ඔබ ගැන අනුකම්පා කරනවා, ගරු ඇමතිතුමනි. ඔබතුමා කිව්වා වාගේම මේ හම්බ වෙලා තිබෙන්නේ අර රනිල් වික්‍රමසිංහ මහත්මයා වැල් පාලමේ ගෙන ගිය බබා. මම දන්නේ නැහැ, ඔව්වර ලණු දීලාත් ඔබතුමන්ලා එතුමාව ඔව්වර ළඟින් ආශ්‍රය කරන්නේ ඇයි කියලා. දැන් බලන්න, ඒ බබාගේ තත්ත්වය මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම නිරීක්ෂණය කරපු සියලු කරුණු අනුව, මම ඉතාම කෙටියෙන් සාරාංශගතව වාක්‍යයකින් මේ අය වැය ගැන කිව්වොත්, මේ අය වැය කිසිසේත්ම ප්‍රායෝගික අය වැයක් නොවෙයි. මේ අය වැයෙන් එන අය ද, වැය ද -දෙකම- ප්‍රායෝගික නැහැ.

විශේෂයෙන්ම අපි මේ අය වැයෙන් අපේක්ෂා කරනවා, සියයට 24ක බදු ආදායම් වැඩිවීමක්. රුපියල් ට්‍රිලියන 4.6ක්. මේක කොහෙන්ද ලබා ගන්නේ? අපි චක්‍ර බදුවලින් සියයට 40ක වැඩිවීමක් බලාපොරොත්තු වනවා. ඊට අමතරව බාහිර - external - ආකාරයෙන් සියයට 60ක ආදායමක් ලබා ගන්න බලාපොරොත්තු වනවා. ඒ වාගේම අපේ, tax revenue targets also include Rs. 340 billion from Import Duty and from VAT on vehicle imports. These are not practical.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ ආණ්ඩුවේ ආදායමින් සියයට 60ක් ණය පොලී ගෙවන්න වැය වෙනවා. අපට ඉතුරු වෙලා තිබෙන සියයට 40න් තමයි මේ ඔක්කොම කරන්න වෙන්නේ. මම ඒකයි ඔබ ගැන මේ විධියට අවංකව කථා කරන්න කැමැති. මෙය, ඉතාම දුෂ්කර තත්ත්වයක් තුළ ඔබ රජය විසින් ඉදිරිපත් කරන ලද අය වැයක්. ඒ නිසා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ, මේ යථාර්ථය පිළිබඳව ජනතාවට මැනවින් දැනුම ලබා දීලා, ඔවුන් දැනුවත් කරලා ඒ යථාර්ථයට මුහුණ දෙන්නට අපේ ජනතාව සූදානම් කළ යුතුය කියන එකයි. අපි ඉතා විශාල අර්බුදයකටයි වැටෙන්න යන්නේ. මේ අර්බුදයේ හෙල; මේ හෙලේ ගැඹුර ගැන මට හිතා ගන්නටවත් බැහැ. මේ රටේ මිනිස්සු මුහුණ දීමට නියමිත ඒ දුෂ්කර කාල පරිච්ඡේදය ගැන මට හිතා ගන්නටවත් බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විපක්ෂයක් හැටියට අපේ යුතුකම හුදු විවේචනයෙන් ඔබ්බට ගිහිල්ලා සාධනීය සංවාදයක කොටස්කරුවන් වීමයි. අපේ ගරු ඇමතිතුමාත් මේ ගැන දන්නවා. මම එදාත් යෝජනා කළා, මේකට ස්වදේශීය විසඳුමක් වාගේම නිර්මාණශීලී විසඳුමක් අවශ්‍යයි කියලා. ඒ නිසාම තමයි ඔබතුමන්ලාගේ පක්ෂයේත් ආශීර්වාදය ඇතුව සූර්ය සිංහ ලාංඡනය ඇතුළත් "ගන්න අපේ දේ" කියන සංකල්පය ඔස්සේ වූ 'මව්බිම ලංකා පදනම' මා විසින් නිර්මාණය කළේ. ඔබතුමාට මතක ඇති, ඒ පදනම නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය නිර්මාණශීලී අදහස් ඔබතුමන්ලා අතරටත් ගෙනා බව. ඒ නිර්මාණශීලී අදහස් ගෙනැල්ලා අපි කිව්වා, ස්වදේශික ආර්ථිකයක් ගොඩනහන්න කියලා. මම ඔබතුමන්ලාට ගෞරව කරනවා. මොකද, ඔබතුමන්ලාගේ සම්පූර්ණ ආශීර්වාදය ඒ අවස්ථාවේ ලැබුණා. නමුත්, දැන් ඒක අපි ඔක්කොගේම අතින් ගිලිහී ගියත්, මව්බිම ලංකා පදනමේ අදහස වුණේ, අපේ දේ ගන්න, අපේ දේ නිෂ්පාදනය කරන්න, අපි අන් රටවල් මත යැපීම අවම කරන්න කියන පණිවුඩය. නමුත්, අපට ඒ ගිලිහී ගිය සියලු අවස්ථා නැවත නිර්මාණය කර ගැනීමට අවශ්‍ය නම් අපි නිර්මාණශීලීව සිටිය යුතුව තිබෙනවා. මට ඔබගේ අය වැය ගැන තිබෙන හා තිබුණු කනගාටුව තමයි, අපි මේ යථාර්ථය දැන දැනම, IMF එක කියන කියන දේ කරමින් සිටිනවා මිස අපේම වූ ස්වදේශික නිර්මාණශීලිත්වයක් තුළින් මෙයට විසඳුම් හොයන්නේ නැත්තේ ඇයි කියන එක.

ඔබතුමන්ලාගේ අය වැයේ සාරාංශයේ තිබෙනවා, ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා රුපියල් බිලියන 35ක පමණ මුදලක් වෙන් කර තිබෙනවා කියලා. හැබැයි, අපි ඔක්කොම දන්නවා, මැතිවරණයක් ඉදිරියේ ඉදිරිපත් කරන අය වැයක් නිසා ඔබත් ජනප්‍රිය තීන්දු ගොඩක් අරගෙන මුදල් වෙන් කර තිබෙනවා කියන එක. හැබැයි, අපි ඔක්කොම දන්නවා, වැටෙන්න යන්නේ වළේ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපට අවශ්‍ය වන්නේ කිසිම පක්ෂ භේදයකින් තොරව, කිසිම වර්ණ භේදයකින් තොරව, මේ රටට නිර්මාණශීලී විසඳුම තිබෙන්නේ කොහේද කියලා සොයා ගැනීමයි. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ, ව්‍යවසායකත්ව රාජ්‍යය කියන එක. මේක ඉතා සියුම්ව වටහා ගත යුතු සංකල්පයක්. ව්‍යවසායකත්ව රාජ්‍යය යනු හුදු ව්‍යවසායකයන් බිහි කිරීම නොවෙයි. රාජ්‍යයේ මනස, ව්‍යවසායකත්ව මනසක් විය යුතුයි. මොකක්ද, මේ ව්‍යවසායකත්ව මනසක් කියන්නේ?

නිර්මාණශීලීව හිතන්නට ඕනෑ. සම්ප්‍රදායයෙන්, පරණ පුරුදු විසඳුම්වලින් ඔබ්බට ගිහිල්ලා විසඳුමක් සොයන්නට ඕනෑ. ඒ සඳහා අවදානම් ගැනීමට අපට ශක්තිය, ශක්‍යතාව තිබෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ ගරු ඇමතිතුමාට මම තවදුරටත් යෝජනා කරනවා, නැවතත් මේ අය වැය - Budget එක - ගැන හිතන්න කියලා. මේ අය වැයට අපි විශාල නිර්මාණශීලිත්වයක් එක් කළ යුතුව තිබෙනවා. ඒ සඳහා ව්‍යවසායකත්ව මනසකින් බලා ශ්‍රී ලාංකික ව්‍යවසායකත්වයටත් පණ දෙන්නට ඕනෑ. ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය කිව්වාම ඒ හැකියාව ඇති, මේ රටේ මහ පොළොවේ ඉන්න මිනිස්සුන් එක්ක ගමනක් යන්නට ඕනෑ. ඔවුන්ව අභිප්‍රේරණය කරලා, ඔවුන්ට ප්‍රාග්ධනය, ශක්තිය ලබා දීලා ඔවුන් ගොඩ ගන්නට ඕනෑ. ඔබතුමන්ලාගේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන මේ පොතේ සඳහන් වෙනවා, ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය හා මහා පරිමාණයේ ව්‍යවසායකයන්ට සහයෝගය ලබා දෙන්නේ කොහොමද කියලා. මම දන්නා තරමින් මේ මාර්තු 31වැනි දා වෙනකොට ව්‍යවසායකයන් ලක්ෂ 3ක් අතරින්, පරාටෙ නීතියට මුහුණ දෙමින් ඉන්න අයගෙන් 280,000ක්ම අන්තිම අමාරුවට වැටෙනවා, වැටෙනවාමයි. ඒ සඳහා ඔබ යමක් කළේ නැත්නම් මේ බලාපොරොත්තු වුණු බදු ආදායමෙන් විශාල ප්‍රමාණයක් ඔබට අහිමි වී යනවා. ඔවුන් තමයි මේ රටට පණ දෙන්නේ. ඔවුන් තමයි මේ රටේ මිලියන 2.5කට වැඩි ප්‍රමාණයකට රැකියා ලබා දෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔවුන් සුරකින්නේ නැතුව, ඔවුන්ට පණ දෙන්නේ නැතුව අපි මේ ගමන යන්නේ කොහොමද? එහෙම අපට මේ ගමන යන්න විධියක් නැහැ.

අපට අද ගමට යන්න වෙලා තිබෙනවා. ඔබ දන්නවාද, අද වනකොට ගමේ තත්ත්වය? මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා කාන්තාවන් 20,000කට වැඩිය අන්ත දුගී තත්ත්වයට පත්වෙලා තිබෙනවා. රුපියල් බිලියන 100කට වැඩිය බැංකු නොවන මූල්‍ය ආයතන හරහා ණය අරගෙන තිබෙනවා. ඇත්තටම මූල්‍ය ආයතන දෙකක් සියයට 60කට වැඩිය ණය දීලා තිබෙනවා. කොහොම වුණත් ඒ කාන්තාවන් අන්ත අසරණ තත්ත්වයකට පත්ව තිබෙනවා. ඔවුන් ණය ගත්ත මහත්මයා ගෙදරට එනකොට, ගෙදර ඉන්න මනුස්සයාට ගෙදරින් පිටවෙලා යන්න සිද්ධ වෙලා

[ගරු දිලිත් ජයවීර මහතා]

තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ නිසා සියදිවි නසා ගැනීම් 190කට වැඩිය කරගෙන තිබෙනවා. එම නිසා අඩුම ගාණේ අපේ පැත්තෙන් යමක් කරලා, ඔබගේ රජයටත් උදව් කරන්නට නම් පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයේදී අපි පළාත් පාලන ආයතන කිහිපයක් දිනා ගන්නට ඕනෑ. අපි පළාත් පාලන ආයතන කිහිපයක් දිනාගෙන ගම් ටික දියුණු කරලා, අපි ඒ ගම් ස්වයංපෝෂිත කරන්නට ඕනෑ. ගමට ව්‍යවසායකත්වය ගෙනිහිල්ලා, අපි යෝජනා කරන සර්වජන සභාව පිහිටුවලා, ඔවුන්ට හැකි පමණින් ප්‍රාග්ධනය නිර්මාණය කරන්නට අවස්ථාව ලබා දීලා, විශේෂයෙන්ම ව්‍යවසායකත්වයෙන් පිරුණු, ධෛර්යවත් ශ්‍රී ලාංකික කාන්තාවට පණ දීලා, ගම දියුණු කරන්න ඕනෑ. අඩුම ගාණේ නුදුරේදී අපට මුහුණ දීමට නියමිත ඒ බරපතළ ආර්ථික බෙදවාචකයට මුහුණ දෙන්නට නම් අපි ගම සූදානම් කිරීමට කටයුතු කරන්න ඕනෑ. ඔබතුමන්ලාට උදව් කරන්න අපටත් පුළුවන්. අපි පළාත් පාලන ආයතන ටිකක් දිනා ගත්තාම ඔබතුමන්ලාගේ බරත් ගොඩක් අඩු වෙනවා. එතකොට ඔබතුමන්ලාට මහන්සි වෙන්න තිබෙන ප්‍රමාණය අඩුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි අවංකවම කියන්නට ඕනෑ, අද ගමේ ජනතාවට ලබා දෙන "අස්වැසුම" කියන ඔය ඇස්වැසුමෙන් කිසිසේත්ම එලක් වෙලා නැහැ කියන එක. ඒ වාගේම, ඔය දෙන දීමනාවලින් කිසිසේත්ම එලක් වෙලා නැහැ. ඔවුන්ට ජීවිතයේ කිසිම සතුටක් එයින් ලබා දෙන්නේ නැහැ. අපි ඇත්තටම ජනතාවට සහනාධාර ලබා දිය යුතුයි. නමුත්, ඒ රුපියල් 1,000ක්, 2,000ක්, 3,000ක් නොවෙයි. සහනාධාර ලබා දෙනවා නම් ඒ නියමිත කුටුම්බයන්ට උපරිම සහනාධාරය ලබා දීමට අපි කටයුතු කරන්නට ඕනෑ. හැබැයි, ඒ සඳහා අපි ධනය උත්පාදනය කරන්න ඕනෑ; ධනය නිර්මාණය කරන්නට ඕනෑ. ධනය නිර්මාණය කරන්න නම් ශ්‍රී ලාංකික ව්‍යවසායකත්වය උපරිම තලයකට ගෙනියන්නට ඕනෑ. ඒ සඳහා රජයකට නිර්මාණශීලී චින්තනයක් අවශ්‍යයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ චින්තනය මේ රජයට එන්නේ කොහෙන්ද කියලා මම එදාත් ඇහුවා. From where would we get that creativity infused? In that, I would like to again help, support you wholeheartedly. We have to infuse creativity into the State. Then only, you could take decisions so that we can move our economy forward.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රජය අපේක්ෂා කරනවා, ඩොලර් බිලියන 18ක්, 19ක් දක්වා විතර අපනයන ආදායම වර්ධනය කරගන්න. එතකොට, ඒක වර්ධනය වෙන්නේ කොතැනින්ද? මොනවා කරලාද? ගරු ඇමතිතුමනි, හැම ක්ෂේත්‍රයක්ම වේගයෙන් වැටෙනවා. දැන් අද ගොඩනැඟිලි කර්මාන්තය - construction industry එක - වැටිලා සුන්නද්දුලි වෙලා ඉවරයි. සුළු ආයතන දෙක තුනක් විතරයි පවත්වාගෙන යන්නේ. රැකියා සියල්ල අහිමි වෙලා තිබෙනවා. විශාල පරිමාණයේ දෙකක් තුනක් තිබුණා. පිට රටින් ඇවිල්ලා ඒගොල්ලන්ම project එක අරගෙන, ඒගොල්ලන්ම සල්ලි දමලා ඒ ගොල්ලන්ම සල්ලි අරගෙන යනවා. ඒකෙන් අපේ ආර්ථිකයට කිසි වැඩක් නැහැ.

උදාහරණයක් හැටියට පොල් තෙල් කර්මාන්තය ගත්තොත්, ඒ ඔක්කෝම factories දැන් විකුණන්නේ යකඩවලට. ඒකට අපට කිසි දෙයක් කරන්න ලැබිලා නැහැ. ඒ නිසා අපි යෝජනා කරන්නේ, මේ ආණ්ඩුව නැවතත් වාඩි වෙලා මේ අය වැය ගැන හිතන්න කියලායි. මේ අය වැය සාම්ප්‍රදායික අය වැයක්. ගරු ඇමතිතුමනි, අපි එදා කථා කරපු දවසේ ඉඳලා, පී.බී. ජයසුන්දර මහත්මයාට බැණ බැණ ඔබතුමාගේ කාර්යාලයේ ඉඳගෙන කහට බීපු වෙලාවේ ඉඳලා අද වෙනකල් කිසි වෙනසක් වෙලා නැහැ. මේ තිරස් සහ සිරස් සියලු අයිතමයන් එහෙමමයි. මේ ලොකු විනාශයක අපි වැටිලා තිබෙන්නේ. මේ අයිතමයන්ගෙන් පිට ගිහිල්ලා අපි හිතන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ, අපේ මව් බිම. මේ මව් බිමේ මිනිස්සු අපේක්ෂා කරනවා, ඔවුන්ට කවදා හරි දවසක සහනයක් ලැබෙයි කියලා; සතුටක් ලැබෙයි කියලා; ඔවුන්ගේ කුටුම්බය සතුටෙන් පවත්වාගෙන යන්න හැකියාව ලැබෙයි කියලා. ශ්‍රී ලාංකික කාන්තාවට අපි කවදාද ඒ අවස්ථාව උදා කර දෙන්නේ?

ඔබතුමන්ලාගේ මේ අය වැයේ සඳහන් වන විධියටම දුගී සහ අන්ත දුගී මිනිස්සු මේ රටේ මෙච්චර ඉන්නවා නම්, අපි කවදාද ඒගොල්ලන් ගොඩ ගන්නේ? ගොඩ ගන්න අපට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා අපි සාකච්ඡා කළ යුතුයි. එහෙම නැත්නම් මේ පුණ්‍ය භූමියේ ඉපදුණු මිනිසුන් පවුකාරයන් බවට පත් වෙනවා. මේ ශ්‍රී ලාංකිකයන්ට මේ පව ගෙවන්න සිද්ධ වන්නේ ඇත්ත වශයෙන්ම විටින් විට ඒ ඒ රජයන් ගත් වැරදි තීරණ නිසා බව මම පිළිගන්නවා. හැබැයි එහෙම වෙලා තිබෙන්නේ අපට අවේණික වූ චින්තනයෙන්, අපට ඓතිහාසිකව උරුම වූ චින්තනයෙන් වැඩක් ගන්නේ නැති නිසා; අපි බටහිරට කත් අදින නිසා; පිටින් එන හැමදේම හොඳයි කියන නිසා.

අද බලන්න, ඉන්දියාව දිහා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ ඇමතිවරුන්ගේ කථා, විශේෂයෙන් මුදල් ඇමතිතුමියගේ කථාව අහගෙන ඉන්නකොට, ඒ රටේ අගමැතිතුමා කථා කරනවා අහගෙන ඉන්නකොට මට ඇත්තටම ගොඩක් දුක හිතෙනවා. ඔවුන් ස්වදේශිකත්වය මත කොතරම් විශ්වාසය තබා තිබෙනවාද, ස්වදේශික ව්‍යවසායකත්වය ගැන කොතරම් විශ්වාසය තබා තිබෙනවාද? ඇයි, අපට එහෙම හිතන්න බැරි? අපේ කිසි විරසකයක් නැහැ, මේ නව NPP රජයත් එක්ක. කිසිම විරසකයක් නැහැ. ඒ නිර්මාණශීලී මාවත ඔස්සේ අපේ මව් බිම ඉදිරියට ගෙන ගොස් මේ රටේ දුක් විඳින ජනතාවට, සැබැවින්ම දුක් විඳින ජනතාවට සිතට සැනසිල්ලක් ගෙන දෙන්නට පුළුවන් නම්, මුවගට සිනහවක් ගෙන දෙන්නට පුළුවන් නම්, අපට ඕනෑ එයයි. ඒ සඳහා කැප වෙන්න.

අවසාන වශයෙන් මම රජයෙන් ආයාචනයක් කරනවා. ශ්‍රී ලාංකික ව්‍යවසායකයන් කියන්නේ බොහොම අමාරුවෙන් ගොඩ ආපු ව්‍යවසායකයන්, මම ද ඇතුළුව. ඔබතුමන්ලා දේශපාලන වේදිකාවේදී, "ඇන්ටිජන් හොරා" අර හොරා, මේ හොරා කිව්වාට කමක් නැහැ. නමුත් මේ රටේ ව්‍යවසායකයන් හොරු නොවෙයි. මේ රටේ ව්‍යවසායකයන් යම් අවස්ථාවකදී දුෂ්කරතාවට පත්වෙලා තිබෙනවා නම්, ඒ මේ ක්‍රමවේදය නිසායි. ගරු ඇමතිතුමනි, මම ඇත්තටම අභියෝගයක් කරනවා. මම හිතාගෙන හිටියේ වරප්‍රසාද ප්‍රශ්නයක් නඟන්නයි, මම නැති වෙලාවට මේ ඇන්ටිජන් කථාව කියන නිසා. ඔබතුමන්ලාගේ සෞඛ්‍ය ඇමතිතුමා බොහොම පැහැදිලිව කිව්වා, එතැන වංචාවක් සිද්ධ වෙලා නැහැ කියලා. නමුත් මම ඒක ගන්නේ උදාහරණයක් හැටියට පමණයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, යහ පාලන ආණ්ඩුව පැවැති කාලයේ ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් 714දෙනකු ප්‍රශ්න කිරීම සඳහා FCID එකට ගෙන ගියා, අර අපේ ආනන්ද විජේපාල මැතිතුමාගේ ලේකම් ධුරය යටතේ අපේ වත්මන් ජනාධිපතිතුමා එවකට මෙහෙය වූ, -

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව විනාඩියක් ලබා දෙන්න. මම කියන්නේ මේ ව්‍යවසායකයින් දෙස එහෙම බලන්න එපා කියලායි. අපි කොහොමද ඔවුන්ට උදවු කරන්නේ කියලා මේ ව්‍යවසායකයින් දෙස බලන්න. ඒ ව්‍යවසායකයින්ට උදවු කරන්නේ කොහොමද කියා බලන්න. මේ ව්‍යවසායකයින් FCID එකට ගෙනියන ක්‍රමය නොවෙයි, බැලිය යුත්තේ. ඔවුන් වරදක් කර තිබෙනවා නම්, නීති රාමුව තුළ කටයුතු කිරීමේ වරදක් නැහැ. නමුත් අපි කොහොමද ශ්‍රී ලාංකික ව්‍යවසායකත්වය සමරන්නේ? How to celebrate Sri Lankan entrepreneurship is what we have to discuss.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් කථා කරන මේ මොහොතේ කර්මාන්ත ක්ෂේත්‍රය නියෝජනය කරන ව්‍යවසායිකාවක් විධියට මේ පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කරන්න ලැබීම ඉතා භාග්‍යයක් කොට මා සලකනවා.

ලංකාව කියන්නේ කාර්මික රටක් නොවෙයි. නමුත් ලංකාව තුළ යම් නිෂ්පාදන ප්‍රමාණයක් තිබෙනවා. ඒක ජාතික අවශ්‍යතාව සපුරන්න තරම් ප්‍රමාණවත් නැහැ. ඒකට ප්‍රධානම හේතුව වුණේ ලංකාවේ නිෂ්පාදන සංස්කෘතියක් නොමැතිකමයි. 1977 ඉඳලා මේ දක්වා තිබෙන්නේ පරිභෝජනවාදී සංස්කෘතියක්. ඒ අනුව ඉදිකටුවේ ඉඳලා, නූල් බෝලයේ ඉඳලා ඉන්දියාවෙන්, චීනයෙන් මෙරටට ගෙන්වන්න පටන් ගත්තාට පසුව කම්මැලිකාර, අලස පරිභෝජනවාදයකට රට තල්ලු වුණා. එහි අභාග්‍ය සම්පන්න තත්ත්වය වුණේ දුටු දුටු දේ සූරා කමින් විකිණීමට පටන් ගැනීමයි. ඉඩම් ටික විකිණුවා; පස් ටික විකිණුවා; වැලි ටික විකිණුවා; ගල් ටික විකිණුවා. ඒවා විකිණුවා විතරක් නොවෙයි, සූරා කන සංස්කෘතියකුත් බිහි වුණා.

මීට ඉස්සෙල්ලා පාර්ලිමේන්තුව නියෝජනය කරපු සමහර මන්ත්‍රීවරුන්ගේ නම් ඉස්සරහින් ගල් නම්, අහවල්; වැලි නම් අහවල්; පස් නම් අහවල් කෙනා; ඉඩම් කොල්ල කෑවා නම් මේ මේ කට්ටිය වශයෙන් නම් පටබැඳී තිබුණා. හන්තානයේ ඉඩම් කොල්ල කෑවා. පොළොන්නරුවෙන්, අනුරාධපුරයෙන්, හම්බන්තොට්න්, උතුරෙන්ද, නැඟෙනහිරින්ද, බස්නාහිරින්ද, දකුණෙන්ද ඒ හැම පැත්තෙන්ම එසේ කොල්ලකෑම්වලට ඉඩ තිබුණා. මෙහෙම යනකොට මේ රටේ මිනිසුන්ට වෙනසක්; system change එකක් ඕනෑ වුණා. ඒ වෙනසේ ප්‍රවේශය නිෂ්පාදන චින්තනයයි.

පසුගිය කාලය පුරාවටම රටක් විධියට අපි දැනුම නිෂ්පාදනය කළේ නැහැ, concepts නිෂ්පාදනය කළේ නැහැ, brands නිෂ්පාදනය කළේ නැහැ. නවෝත්පාදන ශීඝ්‍රයෙන් අඩු වුණා. මේ සියල්ලම ආනයනය කරන්න සිද්ධ වුණා. එසේ ආනයනය කිරීමේදී, හිටපු පාලකයෝ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟනවා වෙනුවට ඒ දේවල් ආනයනය කිරීම හරහා ඔවුන්ට කොමිස් කුට්ටි ගොඩ ගසාගන්න පටන් ගත්තා. ආණ්ඩු මාරු වුණත්, මොන දේශපාලන ව්‍යාපාර බලයට ආවත් කර්මාන්ත අමාත්‍යාංශය නියෝජනය කරපු සමහර ඇමතිවරුන් එම අමාත්‍යාංශය බහිරවයෝ වාගේ අල්ලා ගෙන හිටියා. ඒවා අත හැරියේ නැහැ. නමුත් මිනිස්සු ඒක වෙනස් කළා. Racket ආර්ථිකයකට අපි හසු වෙලා තිබෙන්නේ, buying and selling concept එක යටතේ තමයි අපි හිතන්න පටන් ගෙන තිබුණේ. ඉතින් ඒ අඳුරු යුගය නිමා කර "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" වෙනුවෙන් මේ රටේ පුරවැසියන් මාලිමාවට ඡන්දය දුන්නා.

හෙලේ ගැඹුර හොඳින්ම තේරුම් ගෙන හදපු අය වැයක්, මේක. මම බලාපොරොත්තු වුණා, ව්‍යවසායකයෝ මේ අය වැය පිළිබඳව කථා කරද්දී මීට වඩා සාධාරණ විවේචන සහ අදහස් ඉදිරිපත් කරයි කියලා. හැබැයි, කෙඳිරිලි චිතරයි අපට හැම දාම ඇසුණේ. කොහොම වුණත් මේ කුඩා රට තුළ system change එකක් කරන්න මූලික හැකියාවක් තිබෙන කණ්ඩායම් ඉන්නවා. නිෂ්පාදකයෝ, ව්‍යවසායකයෝ ඉන්නවා. විශේෂයෙන්ම ව්‍යවසායිකාවන් ඉන්නවා. කාන්තාව කියන්නේ උත්පත්තියෙන්ම නිෂ්පාදනයට හිමිකමක් තිබෙන තැනැත්තියක්. ඇයගේ ශක්තිය මේ රටට දායක කරගන්න ඕනෑ.

ඒ වාගේමයි නව නිපැයුම්කරුවන් සහ පර්යේෂකයන්. අපි ඔවුන් සමඟ එක්ව නිෂ්පාදන සංස්කෘතිය ගොඩ නඟන්න කටයුතු කරන්න ඕනෑ. මේ රටේ ව්‍යවසායක ක්‍රියාවලියට ව්‍යවසායකයන් ගෙනෙන එකේ challenge එක ආණ්ඩුව විධියට අපි භාර ගත්තා. ලෝකයේ තිබෙන හැම කර්මාන්තයක්ම කරන්න අපට බැහැ. හැබැයි, අපේ රටට ආවේණික වෙච්ච කර්මාන්ත තිබෙනවා; අපේ රටට අනන්‍යතාවක් පෙන්වන්න පුළුවන් නිෂ්පාදන තිබෙනවා. උදාහරණයක් විධියට ගන්න පුළුවන්, ලංකාවේ බනිජ සම්පත. එය අපේ රටට තිබෙන රන් ආකරයක් වාගෙයි. Quartzවල purity එක සියයට 99.99ක් දක්වා වන නිධි ද අපේ රටේ තිබෙනවා. ඒ වාගේම calcite, dolomite, feldspar, phosphate, ilmenite, monazite විතරක් නොවෙයි, ලංකාවේ මැණික් කර්මාන්තය ගත්තත්, එය ලෝකයේ ලොකු ඉල්ලුමක් තිබෙන ක්ෂේත්‍රයක්. මැණික් පිහිටි රටවල් තිබෙන්නේ ලෝකයේ රටවලින් 20කටත් අඩු ප්‍රමාණයක විතරයි. ලංකාවේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකටත් වැඩි ප්‍රමාණයක -සියයට 70ක පමණ- මැණික් තිබෙන බවට ඇස්තමේන්තුගත කරලා තිබුණත් සියයට 20ක් වාගේ තමයි ගවේෂණය කරලා තිබෙන්නේ. නව මැණික් නිධි ගවේෂණය ප්‍රමුඛ කාර්යයක් බව හඳුනාගෙන තිබෙන අතර, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් නව තාක්ෂණය යොදා ගනිමින් මැණික් නිධි ගවේෂණයට කටයුතු සලසා තිබෙනවා. ඒ වාගේම, හොරණ ප්‍රදේශය ආශ්‍රිතව ඉංගිරිය, දෙහිඕවිට, අයගම, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මූලික කර ගනිමින්, මැණික් විභව හඳුනා ගනිමින් ඒවා සිතියම්ගත කිරීමේ වැඩ පිළිවෙළක් ද මේ වන කොට ආරම්භ කර තිබෙනවා. අපි මැණික් පිට රට යවන්නේ raw material එකක් විධියටයි. අපි එය අගයදාම නිෂ්පාදනයක් -value-added product එකක්- විධියට ලෝකයා හමුවේ අපේ අනන්‍යතාව සහිතව sell කරන්න කටයුතු කරමින් ඉන්නවා. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු කිරීම් සඳහා මෙවර අය වැයෙන් රුපියල් බිලියන 0.12ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ආර්ථික සේවා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය වෙනුවෙන් 2025 වසරට රුපියල් බිලියන 99ක් වෙන් කර තිබෙනවා. එහිදී නව කර්මාන්තපුර පිහිටුවීමට හා දැනට ස්ථාපිත කර තිබෙන කර්මාන්තපුර 32ක යටිතල පහසුකම් දියුණු කිරීමට රුපියල් බිලියන 1.5ක් වෙන් කර තිබෙනවා. එහිදී "one product, one zone" කියන concept එක අපි භාවිත කරනවා. ඒ,

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

gem and jewellery sector එකට එක zone එකක්, leather products වලට එක zone එකක්, සුරතල් මත්ස්‍ය කර්මාන්තය සඳහා එක zone එකක්, ආහාර නිෂ්පාදනය සඳහා එක zone එකක් ආදි වශයෙනුයි. නමුත්, කර්මාන්තපුර තිබෙන zonesවලට දැන් ගිහිල්ලා බැලුවොත් අපට දකින්න ලැබෙන්නේ මොකක්ද? එහි එක පැත්තක ආහාර නිෂ්පාදනය කරනවා, අනෙක් පැත්තේ chemical factory එකක් තිබෙනවා. මේවා විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ සකස් කළ ඒවා නොවෙයි.

කාර්මික අංශයෙන් උපරිම ඵලදායීතාව ලබා ගැනීමට 2025 වසරේ අවම වශයෙන් ආයෝජකයින් 50දෙනෙකුට ඉඩම් ලබා දීමට අපි කටයුතු කරනවා. ඉස්සර කර්මාන්තපුරවල ඉඩම් ලබා දෙන විට බෝතලයට, බයිට් එකට පවා ඉඩම් ලබා දුන්නා. එවැනි කර්මාන්තපුර අපි දැකලා තිබෙනවා. සමහර ඇමතිලා කන බොන වෙලාවට දීපු පොරොන්දුවලට අනුවත් කර්මාන්තපුරවල ඉඩම් දුන්නා. ඒවායේ හරියාකාරව ව්‍යාපෘති සිදු වුණේ නැහැ. අත්තනෝමනික විධියට ඒ ඉඩම් පරිහරණය කළා. අපි මේ ක්‍රමවේදයෙන් එහාට ගිහින් සැබෑ ව්‍යවසායකයන්ගට අවශ්‍ය කරන ඉඩම් සාධාරණව ලබා දීමට කටයුතු කරනවා.

Risk Committee එකට දාලා ව්‍යාපෘතියක් approve කර ගත්තාට පස්සේ එතැන් සිට යන procedure එක ඉතාම දීර්ඝයි. අපේ ගරු ඇමතිතුමා නිතරම මේ පිළිබඳව කථා කළා; මේ ගරු සභාවත් දැනුවත් කළා; ඉදිරියේදී ව්‍යවසායකයන් එවැනි අපහසුතාවන්ට පත් නොවන අයුරින් ඒ සියලු දේ සකස් කරගෙන යන බව ද ප්‍රකාශ කළා.

ආයෝජකයන් ආකර්ෂණයට රුපියල් බිලියන 2.4ක් අපි වෙන් කරලා තිබෙනවා. ඉතින් අපේ අමාත්‍යාංශවලවත්, අපේ ආණ්ඩුවේවත් "Mr. Ten Percent"ලා නැහැ; "Mr. Twenty Percent"ලා නැහැ; විදේශීය සහ දේශීය ආයෝජකයන් ගෙනෙන මිල මුදල් ඩැහැ ගන්නා කපුටෝ නැහැ. අපි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සංවර්ධනයටත් රුපියල් බිලියන 38.64ක් වෙන් කර තිබෙනවා. මේ අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය යළි පුනර්ජීවනය කිරීම සඳහා සහ දිරිමත් කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමයට රුපියල් බිලියන 20ක් වෙන් කර තිබෙනවා.

එහිදී SMILE III loan එකට රුපියල් බිලියන 4ක්, අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ගෙන්වා ගැනීම සඳහා, තිරසාර ආයෝජනය සඳහා රුපියල් බිලියන 1.5ක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන්.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) ඔෂානී උමංකා)
(The Hon. (Mrs.) Oshani Umanga)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තවත් විනාඩියක් ලබා දෙන්න.

ඉස්සර නම් මේ වාගේ ණය යෝජනා ක්‍රම එනකොට ඒවා බෙදා ගන්න කට්ටිය හිටියා. ඒ නිසා ඒවා ඇත්ත ව්‍යවසායකයන් අතට පත් වුණේ නැහැ. අපි එතැනින් එහාට ගිහිල්ලා, එම ප්‍රතිලාභ ජනතාවට සාධාරණව ලැබෙන අයුරින් කටයුතු සලස්වනවා. ඒ වාගේම, අද අපේ රටේ කර්මාන්ත උන්මාදයක්, කර්මාන්ත පුනරුදයක් බිහි කරන්න ආණ්ඩුව විධියට අපි කටයුතු කරනවා. කර්මාන්ත පුනරුද අය වැයෙන් සංචාරක කර්මාන්තය සඳහා රුපියල් බිලියන 14.4ක් වෙන් කර තිබෙනවා. පසුගිය මාස දෙක ඇතුළත, එනම් ජනවාරි සහ පෙබරවාරි මාස දෙක ඇතුළත සංචාරක කර්මාන්තයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 764.2ක ආදායමක් උපයාගෙන තිබෙනවා. 2020 ඉදලා බැලුවාම මාස දෙකක් ඇතුළත වැඩිම ආදායම උත්පාදනය කරන්න අපි සමත් වෙලා තිබෙනවා. 2025දී සංචාරකයන් මිලියන 3ක් ලංකාවට ගෙන්වා ගැනීමටත්, එමඟින් ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් ඉක්ම වූ ආදායමක් ලබා ගැනීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් සංචාරක හෝටල් හිමියන්ගේ සිට තැඹිලි ගෙඩිය විකුණන තරුණයා දක්වා වන පිරිසට තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට අවස්ථාව ලැබෙනවා. මගේ කථාව ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මෙය, ජනතාවගේ අය වැයක්, ආර්ථික පුනරුදයක් කරා ගෙන යන අය වැයක්, කර්මාන්ත උන්මාදයක් ඇති කරන්න ඉදිරිපත් කරපු අය වැයක්. ව්‍යවසායකත්ව මනසක් හදා ගන්න පුළුවන් නම්, ඒ risk එක ගන්න පුළුවන් නම්, මෙය හොඳම අවස්ථාවක්. රැකියාවක් කරන්නකු වෙනුවට රැකියාවක් බිහි කරන තරුණ පරපුරක් වන්නට අපි ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 3.05]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
නන්දි, කෞරව පිරතිත් තවිසාළර් අවර්කළේ! ඉන්නෙය තිනම් නටෙපෙරුකින්ර ඉළෛඥර් අලුවල්කළ් මර්රුම් විළෙයාට්ටුත්තුරෙ අමෛච්චින් නිති ඔදුක්කීටු මීතාන කුළුනිලෙ විවාතත්තිල් කලන්තුකොණ්ටු චිල විටයංකළෛක් කූරලාමෙන නිනෛක්කින්රේන්.

ඉළෛඥර්කළ් එන්පතු එමතු නාට්ටින් පෙරුමතිමික්ක ඔරු වළමාකුම්. අවර්කළෛ වළර්පටුත්තවේණ්ටිය පොරුප්පු අරසාංකත්තුක්කු ඉරුක්කින්රතු. කටන්ත තේර්තලිල් අතිකර්පටියාන ඉළෛඥර්කළ් ඉන්ත අරසාංකත්තුක්කු වාක්කළිත්තු ඉරුක්කිරාර්කළ්. අවර්කළුටෙය තේවෛප්පාටු කළෛයුම් එතිර්පාර්ප්පුකළෛයුම් පූර්ත්ති චෙය්යවේණ්ටිය නිලෛයිල් අරසාංකම් ඉරුන්තුකොණ්ටු ඉරුක්කින්රතු. ඉන්රු එංකළුටෙය ඉළෛඥර්කළ් පල්වේරු පිරච්චිනෛකළෛ එතිර්නෝක්කික්කොණ්ටු ඉරුක්කින්රාර්කළ්. අවර්රුක්කුත් තීර්වු කාණවේණ්ටිය නිලෛයිල් නාංකළ් ඉරුන්තුකොණ්ටු ඉරුක්කින්රෝම්. අවර්කළුටෙය පිරච්චිනෛකළුක්කුත් තීර්වුකළෛ වළංකක්කූටිය වකෛයිලුම්, අවර්කළුටෙය එතිර්කාලත්තෛ උරුතිප්පටුත්තක්කූටිය වකෛයිලුම් චරියානතොරු තිට්ටත්තෛ වකුත්තු, අතෛ අමුල්පටුත්ත වේණ්ටිය තේවෛ ඉරුක්කින්රතු. එනවේ, අරසාංකමානතු ඉළෛඥර්කළ්මීතු කූටුතලාන කවනත්තෛච් චෙලුත්ති, අවර්කළුක්කුච් චිරන්තතෝර් එතිර්කාලත්තෛ උරුවාක්කික් කොටුක්ක වේණ්ටුමෙන නාන් ඉන්තච් චපෛයිල් කේට්ටුක් කොළ්කින්රේන්.

ඉළෛඥර්කළ් එන්පතු කෛවිටප්පටක්කූටාත ඔරු චමූකප් පිරිවිනර් ආකුම්. ඉන්රු පල්කලෛක්කළකංකළිල්

பட்டங்களைப் பெற்றுள்ள பலர், தொழில்வாய்ப்பின்றி மிகுந்த சிரமத்துக்கு உள்ளாகி இருக்கின்றார்கள். அவர்களுக்கு வயது கூடிக்கொண்டே போகின்றது. எனினும், அவர்கள் திருமணம் செய்ய முடியாத நிலையில் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். மேலும், இன்று பல்கலைக்கழகத்துக்கு அனுமதி பெறுவோரின் எண்ணிக்கை 40 சதவீதத்துக்கும் குறைவாக இருக்கின்ற காரணத்தால், நாங்கள் இளைஞர்கள் தொடர்பில் அதிக கவனம் செலுத்தவேண்டியவர்களாக இருந்துகொண்டு இருக்கின்றோம்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, பல்கலைக் கழகத்துக்குத் தெரிவுசெய்யப்படுகின்ற மாணவர்களுக்கான விடுதி வசதிகள் முறையாக செய்து கொடுக்கப்படுவதில்லை என்ற குற்றச்சாட்டு எங்களிடம் முன்வைக்கப்படுகின்றது. சுமார் 30 சதவீதத்தினருக்கு மாத்திரமே விடுதி வசதி கிடைக்கின்ற காரணத்தால், ஏனையவர்கள் பல கஷ்டங்களுக்கு மத்தியிலேயே தங்குமிட வசதியைப் பெறுகின்றார்கள். எனவே, இதற்கென ஒரு தீர்வை இந்த அரசாங்கம் முன்வைக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இன்று எங்களுடைய நாட்டில் இளைஞர்கள் தவறான வழியில் செல்லக்கூடிய நிலைமை ஏற்பட்டிருக்கிறது. குறிப்பாக, போதைப்பொருள் விநியோகம் இன்று இளைஞர்களை குறிவைத்தே முன்னெடுக்கப்படுகின்றது. போதைப்பொருள் பாவனை நாட்டின் எல்லா இடங்களிலும் பரவலாகக் காணப்படுகின்றது. இதற்கு அடிமையாகின்ற ஒரு சமூகமாக இன்று எங்களுடைய இளைஞர் சமூகம் மாறிக்கொண்டு இருக்கின்றது. குறிப்பாக, பாடசாலை மாணவர்கள், விளையாட்டு வீரர்கள் எனப் பலர் போதைப்பொருள் பாவனையால் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள்.

எனவே, நாங்கள் இந்த விடயத்தில் கவனம்செலுத்த வேண்டிய நிலையில் இருந்துகொண்டு இருக்கின்றோம். எதிர்காலத் தலைவர்களான இன்றைய இளைஞர்கள் போதைப்பொருளுக்கு அடிமையாவதால், பல விடயங்களில் அவர்களின் பங்களிப்புக் குறைந்துகொண்டே செல்கின்றது. இந்த அரசாங்கத்துக்குக் கூடுதலான இளைஞர்கள் ஆதரவு வழங்கி இருக்கிறார்கள் என்ற அடிப்படையில், அவர்களைப் போதைப்பொருள் பாவனையிலிருந்து எவ்வாறு பாதுகாப்பது என்ற விடயத்தில் அரசாங்கம் கூடுதலான கவனத்தைச் செலுத்தி, அதற்கென ஒரு விசேட வேலைத்திட்டத்தை முன்னெடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, திருகோணமலை மாவட்டம் மிகவும் பிரசித்திபெற்ற ஒரு மாவட்டமாகும். திருகோணமலையில் காணப்படுகின்ற மெக்கேசர் விளையாட்டு மைதானமானது கிரிக்கெட் விளையாடுவதற்கு உகந்த ஒரு மைதானமாகும். அதனைச் சூழவுள்ள வளங்களும் பிரதேச அமைப்பும் அதற்கு உகந்ததாகக் காணப்படுகின்றது. சென்ற காலங்களில் அந்த மைதானத்துக்கு நிதி ஒதுக்கீடுகள் வழங்கப்பட்டாலும், அந்த மைதானத்தின் புனரமைப்பு வேலைகளை மேற்கொள்ளும்பொழுது, ஏதோ ஒரு விதத்தில் அதற்குத் தடை ஏற்பட்டு விடுகின்றது. இதனால், இன்றும் அந்த மைதானம் அதே நிலையில்தான் காணப்படுகின்றது. சென்ற காலங்களில் மேற்கொள்ளப்பட்ட நிதி ஒதுக்கீடுகள் மூலம் அந்த மைதானத்தின் புனரமைப்புப் பணிகள் முன்னெடுக்கப்படவில்லை. அந்த மைதானத்தை இலகுவாக சர்வதேச கிரிக்கெட் விளையாட்டு மைதனமாக மாற்றுவதற்கான வாய்ப்பு இருக்கின்ற காரணத்தால் இந்த விடயத்தில் அரசாங்கம் கவனம் செலுத்த வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் சிறந்த விளையாட்டு வீரர்கள் பலர் இருக்கிறார்கள். குறிப்பாக, பெண்கள் கிரிக்கெட் அணியில் எமது மாவட்டத்தைச் சேர்ந்த ஒரு வீராங்கனை இருக்கிறார். எனினும், எங்களுடைய மாவட்டத்தில் விளையாட்டுத்துறையை அபிவிருத்தி செய்வதற்கென சரியானதொரு திட்டம் இல்லை என்ற குறை இருக்கின்றது. எனவே, அதை நிவர்த்திப்பதற்கான நடவடிக்கைகளை அரசாங்கம் முன்னெடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

பாடசாலை மட்டத்தில் விளையாட்டுகளை ஊக்குவிப்பதற்கென ஒரு வேலைத்திட்டம் உருவாக்கப்பட வேண்டும். குறிப்பாக, cricket, football, tennis, swimming போன்ற விளையாட்டுகளை ஊக்குவிக்க வேண்டும். எங்களுடைய கிழக்கு மாகாணத்தில் கடற்றொழிலில் ஈடுபடுகின்றவர்கள் கூடுதலாக இருக்கின்றார்கள். அங்கு கடலில் நீச்சல் அடிக்கக்கூடிய திறமைமிக்க பலர் இருந்தும், அவர்கள் swimming போட்டியில் கலந்துகொள்வதற்கான வாய்ப்பைக்கூட பெறாத ஒரு நிலை காணப்படுகின்றது. மிகவும் வேகமாக நீச்சல் அடிக்கக்கூடியவர்கள் எங்களுடைய பிரதேசத்தில் இருக்கின்றார்கள். அவர்களுக்குத் தேசிய மட்டப் போட்டிகளில் கலந்துகொள்தற்கான சூழல் உருவாக்கப்பட்டு இருக்கின்றதா? என்பதை நாங்கள் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம். எங்களுடைய பிரதேசங்களில் சிறந்த விளையாட்டு வீரர்கள் இருந்தும், அவர்களை நாங்கள் சிறந்த முறையில் பயன்படுத்த முடியாத நிலையில் இருந்துகொண்டு இருக்கின்றோம்.

இன்று ஸ்ரீ லங்கா கிரிக்கெட்டில் வேகப்பந்து வீச்சாளருக்கான பற்றாக்குறை காணப்படுகின்றது. அதாவது, இலங்கையில் கிரிக்கெட் விளையாட்டுத்துறையில் வேகப்பந்து வீச்சாளருக்குத் தட்டுப்பாடு காணப்படுகின்றது. இந்நிலையில், எங்களுடைய பிரதேசங்களில் இருக்கின்ற எத்தனையோ வேகப்பந்து வீச்சாளர்கள் வீதிகளில் விளையாடிக்கொண்டு இருக்கின்றார்கள். அவர்களுக்குச் சரியான பயிற்சிகளை வழங்கி, அவர்களை வளர்த்தெடுத்தால், அவர்கள் இந்த நாட்டுக்காக விளையாடக்கூடிய வேகப்பந்து வீச்சாளர்களாக வருவதற்கான வாய்ப்பு இருக்கின்றது. அதற்கான வழியை ஏற்படுத்தக்கூடிய வகையில், நாங்கள் ஒரு திட்டத்தை வகுக்க வேண்டியவர்களாக இருக்கின்றோம். இன்று எங்களுடைய பிரதேசங்களில் சிறந்த உதைப்பந்தாட்ட - football - வீரர்கள் பலர் இருக்கின்றார்கள். அண்மையில் நடைபெற்ற போட்டித்தொடரின்போது கொழும்பில் இருக்கின்ற சிறந்த பாடசாலை அணிகளை அவர்கள் தோற்கடித்து இருக்கின்றார்கள். இன்று அந்த வீரர்கள் எவ்வாறான விளையாட்டு மைதானங்களில், எவ்வாறான நிலையில் விளையாடுகின்றார்கள் என்பதை நாங்கள் பார்க்க வேண்டும். எனவே, அவர்களுக்குத் தேவையான வசதி வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுப்பதற்கென ஒரு திட்டத்தை வகுக்க வேண்டுமென நாங்கள் கேட்டுக் கொள்கின்றோம்.

எங்களுடைய பிரதேசங்களில் cricket, football போன்ற விளையாட்டுகளை விளையாடுவதற்கென போதிய மைதானங்கள் இல்லை. தோப்பூர் பிரதேசத்தை எடுத்துக்கொண்டால், கடினப்பந்து விளையாடக்கூடிய பல கழகங்கள் அங்கு காணப்படுகின்றன. எனினும், அந்தக் கழகங்களால் கடினப்பந்து சார்ந்த செயற்பாடுகளை

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

முன்னெடுப்பதற்குக் கஷ்டமான நிலையே காணப்படுகின்றது. ஏதோ அடிப்படையில் ஒரு மைதானத்தை உருவாக்கி, இன்று அவர்கள் விளையாடிக்கொண்டு இருந்தாலும், அவர்களுக்கென ஒரு சிறந்த மைதானத்தை வழங்கவேண்டிய பொறுப்பு இருக்கின்றது. அதேநிலைதான் கிண்ணியா, திருகோணமலை, மூதூர், தம்பலகாமம் போன்ற பிரதேசங்களிலும் காணப்படுகின்றது. எனவே, அவர்கள் தங்களது விளையாட்டுச் செயற்பாடுகளைச் சிறந்த முறையில் முன்னெடுக்கக்கூடிய வகையில், ஒரு திட்டத்தை வகுத்து, அதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென நாங்கள் அரசாங்கத்தைக் கேட்டுக் கொள்கின்றோம்.

சென்ற 'நல்லாட்சி' அரசாங்க காலத்தில் sports coach - விளையாட்டுப் பயிற்றுவிப்பாளர் - நியமனங்கள் வழங்கப்பட்டன. அதன் பின்னர், பாடசாலை மாணவர்களின் விளையாட்டுத் திறமைகளை வெளிக்கொண்டு வருகின்ற விடயத்தில் பல படிகள் முன்னேற்றம் ஏற்பட்டு இருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. எனவே, sports coach - விளையாட்டுப் பயிற்றுவிப்பாளர் - நியமனங்களைத் தொடர்ச்சியாக வழங்குவதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் முன்னெடுக்க வேண்டுமென நாங்கள் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றோம்.

இன்று எங்களுடைய பிரதேசத்தில் பல விளையாட்டுக் கழகங்கள் காணப்படுகின்றன; பல விளையாட்டு வீரர்கள் இருக்கின்றார்கள். அவர்களை நாங்கள் எவ்வாறு சரியாகப் பயன்படுத்துவது என்பதுதான் இன்றிருக்கின்ற பிரச்சினையாகும். இன்று பாடசாலை மட்டத்தில் திறமையான விளையாட்டு வீரர்களை இனங்காண்பதற்கு அல்லது மாணவர்களின் விளையாட்டுத் திறமைகளை வெளிக்கொண்டு வருவதற்கு ஏற்றதொரு சூழல் இருக்கின்றதா? என நாங்கள் சிந்திக்க வேண்டும். ஏனெனில், போதைப்பொருள் பாவனைக்கு கூடுதலான இளைஞர்கள் அடிமையாக்கப் படுகின்றார்கள். அவ்வாறு ஏற்றதொரு சூழல் இல்லாத காரணத்தால்தான் இன்று இளைஞர்கள் திசை மாறிச் செல்கின்ற ஒரு சூழல் காணப்படுகின்றது. நான் ஆரம்பத்தில் குறிப்பிட்டதுபோன்று, இளைஞர்கள் போதைப்பொருள் பாவனைக்கு அடிமையாவதற்கும், பிழையான திசையில் செல்வதற்கும் பிரதான காரணம் என்னவென்றால், நாங்கள் அவர்களுடைய விளையாட்டு விடயத்தில் கவனம் செலுத்தி, அதற்கான வசதி வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுக்காமைதான். நாங்கள் இதனை விசேடமாகக் கவனத்திற்கொள்ள வேண்டும். எனவே, இளைஞர்களைக் குறிவைத்து மேற்கொள்ளப்படுகின்ற இவ்வாறான செயற்பாடுகள் எதிர்காலத்தில் எவ்வாறானதொரு தாக்கத்தை ஏற்படுத்தும்? எதிர்காலத்தில் எங்களுடைய இளைஞர்களின் நிலை என்னவாகும்? என்பன பற்றி நாங்கள் சிந்திக்க வேண்டும்.

இன்று எங்களுடைய இளைஞர்கள் பல்வேறு தேவை உடையவர்களாக இருக்கின்றார்கள். அவர்கள் universityக்குச் சென்றாலும், collegeக்குச் சென்றாலும், படித்தவர்களாக இருந்தாலும் அவர்களுக்கும் தேவைப்பாடுகள் இருக்கின்றன. வேலைவாய்ப்புப் பெறுவதுகூட, இன்று அவர்களுக்கு ஒரு கனவாக மாறியிருக்கின்றது. பட்டதாரி நியமனம் சம்பந்தமாக அரசாங்கத்தால் முன்னெடுக்கப் படுகின்ற சில முன்னெடுப்புகள் காரணமாக அவர்களில் பலர் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். அவர்களுக்கான ஒரு தீர்வை நாங்கள் வழங்காவிடின், அவர்கள் பிழையான திசையில் செல்வதற்கு வாய்ப்பு இருக்கின்றது. அவர்கள் தொடர்பில் கூடுதல் கவனம் செலுத்தவேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கும் எங்களுக்கும் இருக்கின்றது. எனவே, இதற்கொரு சரியான தீர்வை வழங்குவதற்கு அரசாங்கம் முன்வர வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். எனவே, மாணவர்களின் பாடசாலை மட்ட விளையாட்டுச் செயற்பாடுகளில் நாங்கள் உரிய கவனம் செலுத்த வேண்டும். அந்த வகையில், பாடசாலை மட்டத்தில் விளையாட்டுத்துறையை ஊக்குவிக்க வேண்டும். இன்று திறமையான வீரர்கள் பலர் இருந்தும், அவர்களுடைய திறமைகளைச் சரியாகப் பயன்படுத்துகின்றோமா என்று நாங்கள் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம். எங்களுடைய இளைஞர் சமுதாயத்தின் எதிர்காலம் கேள்விக்குறியாகி உள்ளது.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நான் ஆரம்பத்தில் சொன்னதுபோன்று, கடந்த தேர்தலில் அதிகமான இளைஞர்கள் ஏன் உங்களுக்கு ஆதரவாக வாக்குகளை அளித்தார்கள் என்றால், இந்த நாட்டில் ஒரு மாற்றத்தை ஏற்படுத்த வேண்டும் என்பதற்காகத்தான். அவர்கள் வித்தியாசமானதொரு கலாசாரத்தை, அரசியல் பயணத்தை விரும்புகின்றார்கள். அதனுடைய பிரதிபலிப்பாகத்தான் அவர்கள் இந்த அரசாங்கத்துக்கு கூடுதலான வாக்குகளை வழங்கியிருக்கிறார்கள் என நான் நினைக்கின்றேன். இளைஞர்கள் விடயத்தில் இந்த அரசாங்கம் என்ன செய்யப்போகின்றது என்பதை எல்லோரும் பார்த்துக் கொண்டிருக்கின்றார்கள். இந்த நிலையில், எவ்வாறான முன்னெடுப்புகளை மேற்கொள்ளப் போகின்றதென்பதை அரசாங்கம் தெளிவுபடுத்த வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய திருகோணமலை மாவட்டமானது, பல்வேறு குறைபாடுகளுடன்கூடிய ஒரு மாவட்டமாகக் காணப்படு கின்றது. அங்கு திறமையான விளையாட்டு வீரர்கள் பலர் இருந்தும், அவர்கள் புறக்கணிக்கப்படுகின்றார்கள். சமூக ரீதியாகவும் நாங்கள் புறக்கணிக்கப்படுகின்றோம். அது மாத்திரமல்ல, சில விளையாட்டு அமைப்புகள்கூட எங்களுடைய கிழக்கு மாகாணத்தைப் புறக்கணிக்கின்றன. இவ்வாறு பல புறக்கணிப்புகளை எதிர்நோக்குகின்றவர்களாக நாங்கள் இருக்கின்றோம். எனவே, இவற்றுக்குரிய தீர்வுகளை எந்தவொரு வேறுபாடும் இல்லாமல் சரியான முறையில் அரசாங்கம் வழங்க வேண்டுமென இந்த இடத்தில் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු නිතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.

[අ.භා. 3.21]

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අය වැය කාරක සභා අවස්ථාවේ වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී මගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ තරුණ ප්‍රජාව දළ වශයෙන් සියයට 23.5ක් වෙනවා. අපේ රටේ අනාගතය භාර ගන්න ඉන්න ඒ වයස් කාණ්ඩයේ තරුණ තරුණියන්ගෙන් සියයට 25ක් පමණ අද වෙනකොට විරැකියාවෙන් පෙළෙනවා කියලා අපිට සඳහන් කරන්නට පුළුවන්. ඇත්තටම වැඩිහිටියන් වශයෙන්, ඒ වාගේම ආණ්ඩුවක් වශයෙන් අපේ මූලික පරමාර්ථය විය යුත්තේ, විරැකියාව කියන ප්‍රශ්නය විසඳන එකයි. අද අපේ ගරු විපක්ෂ නායකතුමාත්, ගරු අගමැතිතුමියත් ඒ සම්බන්ධයෙන් කථා කළා. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කරලා තිබුණා, විරැකියාවෙන් පෙළෙන උපාධිධාරීන් 35,000කට රැකියා ලබා දෙනවා කියලා. මම නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේත් 2,000කට ආසන්න උපාධිධාරීන් ප්‍රමාණයක් අද රැකියා නොමැතිව ඉන්නවා. ඒ වාගේම, ඒ අයගේ වයස් සීමාව ඉක්මවා යනවා. මොකද, ඒ අය අවුරුදු පහක්, හයක් රැකියාවක් නැතුව ගෙවල්වලට වෙලා ඉන්නවා. මම හිතන විධියට ඊයේ ඉඳලා ඔවුන් දියත උයනේ උපවාසයක නිරත වෙලා සිටිනවා. ඒ අය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම මේ අවස්ථාවේදී ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු අගමැතිතුමිය අද එතුමියගේ උත්තරයෙන් සඳහන් කළා, අද වෙනකොට 10,000ක් විතර බඳවා ගෙන තිබෙනවා කියලා. 2025 මාර්තු 10වැනි දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹුණු තීරණයක් තමයි 5,882දෙනෙකු බඳවා ගැනීම. මා ළඟ ඒ අමාත්‍ය මණ්ඩල තීරණය තිබෙනවා. නමුත්, මෙහි කිසිදු සඳහනක් නැහැ, මේ උපාධිධාරීන්ද, එහෙම නැත්නම් මොන ශ්‍රේණියේ බඳවා ගැනීම්ද කියලා. මේ සංඛ්‍යාලේඛන අපිට ඉදිරිපත් කළත්, මේ කොටසින් උපාධිධාරීන් කීදෙනෙකු බඳවා ගන්නවාද, එහෙම නැත්නම් අනෙකුත් ශ්‍රේණිවල බඳවා ගැනීම් කීයද කියලා පැහැදිලිව සඳහන් කරලා නැහැ. එම නිසා මා නැවතත් ඉල්ලීමක් කරනවා. ජනාධිපතිවරණයේදී අපිත් එක්ක උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් මැතිවරණ ක්‍රියාවලියේ යෙදුණා. නමුත්, ජනාධිපතිවරණය පරාජය වීමත් සමඟම, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණු පොරොන්දුවීම් නිසා, උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් අපේ මැතිවරණ ක්‍රියාවලියට සහභාගී වුණේ නැහැ. මොකද, රැකියාවක් ලැබෙන්නේ නැති වෙයි කියන සැකය ඔවුන්ට තිබුණු නිසා. ඒ නිසා, පොරොන්දු වුණු ආකාරයට උපාධිධාරීන්ට සාධාරණයක් ඉටු කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා.

අපි දන්නවා, මම කලින් කියපු විධියට ඕනෑම රජයක මූලික වගකීම තමයි අපේ රටේ තරුණ තරුණියන්ට අවශ්‍ය රැකියා ලබා දීම බව. නමුත්, අද ආණ්ඩුව ඒක කරන්න අසමත් වෙලා තිබෙනවා. හැමෝටම රජයේ රැකියා ලබා දෙන්න අපිට බැහැ. අපි ඒක පිළිගන්නවා. නමුත්, ආයෝජකයන් ලංකාවට ගෙනැල්ලා, කර්මාන්තශාලා විවෘත කරලා, රැකියා උත්පාදනය කිරීම තමයි බලාපොරොත්තු වෙන්නේ. මේ රජය බලයට පත් වෙලා දැන් මාස හයක් විතර ගත වෙලා තිබෙනවා. නමුත්, කිසිම ආයෝජකයෙක් අද වෙනකොට ලංකාවට ඇවිල්ලා නැහැ. ආයෝජනය කරලා තිබුණු ආයෝජකයින් "ටාටා බායි" කියලා ලංකාව හැර ගිහිල්ලා තිබෙනවා.

අවුරුදු 30කට කලින් සිදු වුණු මිලේච්ඡ සිදුවීම් සම්බන්ධයෙන් දින කිහිපයකට ඉහත සිට නැවත කථා කරනවා අපි දැක්කා. ඉතින්, ඒවා ගැන නිතර නිතර මතක් කරනකොට, විදේශ ආයෝජකයන් අපේ ලංකාවට එයිද කියලා මම අහන්න කැමැතියි. මොකද, මේ වාගේ සිදුවීම් අපි උලුප්පා දක්වනකොට විදේශ ආයෝජකයන් වුණත් අපේ රටට එන්න දෙවරක් හිතනවා, කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි සමහර රජයේ රැකියා අවස්ථා තිබුණත්, අද වෙනකොට ඒ බඳවා ගැනීම් කඩිනමින් සිදු වෙන්නේ නැති බව අපි දකිනවා. විදේශ කටයුතු අමාත්‍යාංශය ගත්තොත්, අද වෙනකොට එහි පුරප්පාඩු 100ක් විතර තිබෙනවා. නමුත්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ විභාගය තිබෙන්නේ අවුරුදු තුන හතරකට සැරයක්. විදේශ කටයුතු අමාත්‍යාංශයේ රැකියාවක් බලාපොරොත්තු වෙන තරුණ තරුණියන්ට නිශ්චිතව විභාගය පැවැත්වෙන්නේ කවදාද කියලා දැනගන්න ක්‍රමවේදයක් නැහැ. 2013දී තිබුණා, ඊට පස්සේ 2017දී තිබුණා. නැවත 2022දී තිබුණා. විභාගය පැවැත්වෙන්නේ කවදාද කියලා දැනගන්න කිසිම ක්‍රියා පටිපාටියක් නැහැ.

ඒ වාගේම තමයි සිසු හෙද පුහුණුවට 3,000ක් බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබෙනවා. නමුත්, 2,183ක් තමයි බඳවා ගෙන තිබෙන්නේ. 817ක පුරප්පාඩු තිබෙනවා. අද වෙනකොට ඒ පුරප්පාඩුවලට අවුරුදු 25, 26, 27 වයස්වල තරුණ තරුණියන් බඳවා ගන්න හැකියාව තිබුණත්, ඒක කරලා නැහැ. අපි දන්නවා, හෙද සිසු පුහුණුවට සියයට 5ක් පිරිමි -තරුණයන්- බඳවා ගන්න පුළුවන් බව. මම හිතන විධියට සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් විශේෂ අනුමැතියක් ලබා ගෙන තිබෙනවා. පිරිමි හෙද සිසු පුහුණුවට සියලුම අවශ්‍යතා සපුරපු තරුණයන් 2,016ක් දැන් ඉන්නවා. අද වෙනකොට සෞඛ්‍ය අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබෙනවා වුණත්, ඒ බඳවා ගැනීම් සිදු කර නැහැ. ඉතින්, රජයේ තිබෙන පුරප්පාඩුවලටවත් අවශ්‍යතා අනුව තරුණ තරුණියන් බඳවා ගැනීමට නොහැකි වෙලා තිබෙනවා.

අද තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැනත් කථා කරනවා. ගරු ඇමතිතුමනි, මම නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ මීටර් 200ක ධාවන පථ සහිත ක්‍රීඩා පිටි 4ක් තිබෙනවා. බෝගම්බර, දිගන, නාවලපිටිය ජයතිලක ක්‍රීඩා පිටිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය තිබෙනවා. මේ ක්‍රීඩා පිටිවල පුහුණුවීම් සඳහා එක් දරුවෙකු රුපියල් 60 බැගින් අදාළ නගර සභාවට හෝ එම අධිකාරියට ගෙවන්න ඕනෑ. යම්කිසි දරුවෙකුට සතියකට දින 4ක්, 5ක් පුහුණු වෙන්න අවශ්‍ය නම් සතියකට රුපියල් 500ක් විතර වියදම් කරන්න වෙනවා, එම ක්‍රීඩා පිටියක පුහුණුව ලබා ගන්න. මම මේ අවස්ථාවේ මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. මහනුවර තරුෂි කරුණාරත්න තමයි Asian Games වල 400m රන් පදක්කමක් ලබා ගත්තේ. Walala A. Rathnayake Central College එකේ තමයි ඇය ඉගෙන ගත්තේ.

එම ක්‍රීඩිකාවත් පුහුණුවීම් කටයුතු සිදු කළේ හරියාකාරව ක්‍රීඩා පිටියක් නොමැතිවයි. මා කලින් සඳහන් කළ එක ක්‍රීඩා පිටියකවත් synthetic track එකක් නැහැ. තිබෙන්නේ තණකොළ සහිත ධාවන පථයක්. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් හොයා බලා අපේ මහනුවර දිස්ත්‍රික්කයට synthetic track එකක් සහිත එක් ක්‍රීඩාංගණයක් හෝ අඩුම තරමින් හදලා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Chitrasiri Committee Report එකට අනුව යෝජිත ක්‍රිකට් ව්‍යවස්ථාව ගරු ජනාධිපතිතුමාට මීට මාස දෙකකට විතර කලින් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 34වන පිටුවේත් තිබෙනවා, "යෝජිත ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාව

[ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය]

කඩිනමින් බලාත්මක කරනවා" කියලා. අපේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධව කථා කළා. අපි ඉල්ලා සිටින්නේ, මැතිවරණ සමයේදී පොරොන්දු වූ පරිදි, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වන පරිදි චිත්‍රසිරි කමිටුව නිර්දේශ කළ යෝජිත ක්‍රිකට් ව්‍යවස්ථාව හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පියවර ගන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.31]

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்காணி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත් විවාද කෙරෙන අද දවසේ මම කැමැතියි, කාන්තාව හා ක්‍රීඩා ජයග්‍රහණ පිළිබඳව කථා කරන්න. මෙම අමාත්‍යාංශයට රුපියල් මිලියන 12,600ක වාගේ මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ මුදලෙනුත් රුපියල් මිලියන 8,486ක් ක්‍රීඩාව සඳහා වෙන් කරලා තිබෙනවා. අපි එම මුදල වෙන් කිරීමේ ප්‍රධාන පරමාර්ථය තමයි, ගම් නියම් ගම්වල ඉන්න ක්‍රීඩාවට ලොබ බඳින ආදරණීය තරුණ තරුණියන්ට, පාසල් දරුවන්ට ඔවුන්ගේ මංපෙත් විවර කරගෙන ක්‍රීඩා ලොවේ ජයග්‍රහණ අත්පත් කර ගන්න අවස්ථාව සැලසීම. අපි දන්නවා, කාන්තාව හා ක්‍රීඩාව ගැන කථා කිරීමේදී "ආසියාවේ කළු වෙළඹ" ලෙස විරුදාවලිය ලැබුවේ, සුසන්තිකා ජයසිංහ ක්‍රීඩිකාව බව. අද වනකොට ඔලිම්පික් පදක්කම් දෙකක් පමණයි අපට ලබා ගන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ. ඒ පදක්කම් දෙකෙන් එකක් තමයි, 2000 වර්ෂයේදී සිඩ්නි නුවර පැවැති කාන්තා මීටර් 200 ධාවන තරගයේදී අපේ සුසන්තිකා ජයසිංහ මහත්මිය දිනා ගත් රිදී පදක්කම. දමයන්ති දර්ශා, තරුෂි කරුණාරත්න කියන ක්‍රීඩිකාවනුත් විශේෂයෙන්ම ධාවන ශූරියන් ලෙස අපේ රටේ නම් ගත්, නම් දරපු ක්‍රීඩිකාවන්.

විශේෂයෙන්ම කාන්තාවන් පමණක් නියැළෙන ක්‍රීඩා අතරින් ඔවුන් වැඩිපුරම ලොබ බඳින ක්‍රීඩාව තමයි, නෙට්බෝල් ක්‍රීඩාව. 2015 වර්ෂයේදී ආසියානු ශූරතාව දිනා ගන්න අපේ නෙට්බෝල් කණ්ඩායමට හැකියාව ලැබෙනවා. ඒ වාගේම 2004, 2006, 2008, 2010, 2013 සහ 2024 වර්ෂවලදී ආසියානු කුසලානයේ අනුශූරතාව අපේ නෙට්බෝල් කණ්ඩායම දිනා ගන්නවා. ඒ නිසා තමයි තර්ජිනී සිවලිංගම්, ගයාන්ජලී අමරවංස වාගේ ක්‍රීඩිකාවන් ගැන අදත් කථාබහට ලක් වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නඩු කටයුත්තක් නිසා අද වනකොට නෙට්බෝල් සංගමයේ නිලවරණය පැවැත්වීමේ නොහැකියාවක් අපට මතු වෙලා තිබෙනවා. හැබැයි, මේ අර්බුදකාරී තත්ත්වයේ වුණත් ජූනි 27වැනි දා දකුණු කොරියාවේ පැවැත්වෙන ආසියානු කනිෂ්ඨ නෙට්බෝල් ශූරතාව වෙනුවෙන් අපි ක්‍රීඩිකාවන් 25දෙනෙකුගෙන් සමන්විත සංචිතයක් නම් කරලා ආණ්ඩුවේ වගකීම ක්‍රීඩාව වෙනුවෙන් ඉටු කරමින් ඉන්නවා.

ඒ වාගේම ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලි සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කිරීමේ එක් බලාපොරොත්තුවක් තමයි, ආසියානු කනිෂ්ඨ සහ ලෝක ශූරතා කනිෂ්ඨ කියන නෙට්බෝල් තරගාවලි දෙකෙහිම ශූරතා අත්පත් කර ගැනීම. කාන්තා ක්‍රීඩා ජයග්‍රහණ ගැන කථා කිරීමේදී අපි හිතනවා, නෙට්බෝල් හා ධාවන තරග විතරයිද කාන්තාවන්ට හිමි ක්‍රීඩා කියලා. එහෙම නැහැ. ලෝකය අත්පත් කර ගත්, ජාත්‍යන්තර ජයග්‍රහණවල මංපෙත් විවර කරපු එක් ක්‍රීඩිකාවක් තමයි, නෙත්මි අහිංසා. 2022දී පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරගාවලියේදී කිලෝග්‍රෑම් 57 බර පන්තියේ කාන්තා මල්ලවපොර ලෝකඩ පදක්කම ඇය හිමි කර ගත්තා. නමුත් අපට මේ වනකොටත් බැරි වෙලා තිබෙනවා, ඇයට හිමි ත්‍යාග මුදල ප්‍රදානය කරලා, ඇයට සාධාරණයක් ඉෂ්ට කරන්න.

ඒ වාගේම කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව ගැනත් මේ මොහොතේ කථා කළ යුතුමයි කියලා මා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව ඇතුළේ අපි චමරි අතපත්තු වාගේ දැවැන්ත චරිත ගැන කථා කරන්නේ කාන්තාව ක්‍රීඩාවට එක් වෙලා මේ පුංචි රටේ නාමය ලෝකයේ බබළවන්නට කටයුතු කරපු නිසායි. මා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කය කියන්නේ දැවැන්ත ලෙස දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවක් සිටින දිස්ත්‍රික්කයක්. මෙවර නවසීලන්ත T20 තරගය නියෝජනය කරන්න මගේ දිස්ත්‍රික්කයේ ආදරණීය ක්‍රීඩිකාවන් දෙදෙනෙකුට හැකියාව ලැබෙනවා. ඒ තමයි, චේතනා විමුක්ති සහ වමෝදි ප්‍රබෝධා මුණසිංහ කියන දැරියන්. අපි දන්නවා, මේ හැම ජයග්‍රහණයක් පිටුපසම ඔවුන්ට බෙදනීය කථාවක් තිබෙන බව. මොනතරම් බෙදවාවක අතරින්ද ඔවුන් මේ ජයග්‍රහණ අත්පත් කරගෙන තිබෙන්නේ කියන එක සම්බන්ධයෙන් කියන්න අපට කථාවක් තිබෙනවා. මම කියන්න කැමැතියි, මේ හැම රිදී රේඛාවක්ම ජයග්‍රහණය කරලා තිබෙන්නේ ඔවුන්ට අඳුරු වලාවක් වුණු ජීවිත කථාවක් ඇතුළේ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට අපි පදක්කම්ලාභී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට හිමි ත්‍යාග මුදල් ගෙවලා නැහැ කියන කාරණය විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු මතු කළා. මම කියන්න කැමැතියි, මේ හැම මුදලක්ම ගෙවන්න ඕනෑ ජාතික ක්‍රීඩා අරමුදලෙන් වුණත්, පසුගිය කාලයේ ජාතික ක්‍රීඩා අරමුදලේ ශේෂය බින්දුවක් බවට පත් වෙලා තිබුණු බව. ජයග්‍රහණ අත්පත් කරගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම් කටයුතු කරන්න මේ වෙනකොට ජාතික ක්‍රීඩා අරමුදලේ රුපියල් මිලියන 86.45ක් ඉතිරිව තිබෙනවා. 2024 අවුරුද්දේ පැවති Paralympics තරගාවලියේදී ජයග්‍රහණ ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට රුපියල් මිලියන 48.7ක් ගෙවන්න තිබෙනවා. ඒ වාගේම ලෝක මල්ලවපොර ක්‍රීඩිකා නෙත්මි අහිංසා සහ ඇයගේ පුහුණුකරු වෙනුවෙන් රුපියල් මිලියන 3.75ක් ගෙවන්න තිබෙනවා. ලෝක පැරා මලල ක්‍රීඩා ජයග්‍රහණ වෙනුවෙන් රුපියල් මිලියන 34ක වාගේ මුදලක් ගෙවන්න තිබෙනවා. 2024දී නොගෙවපු මේ හැම මුදලක්ම අපට ගෙවන්න වෙන්නේ කැබිනට් මණ්ඩල අනුමැතියකින් අනතුරුවයි. අපි ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා කියන එකත් මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි.

ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙල වෙනුවෙනුත් රුපියල් මිලියන 50ක වාගේ මුදලක් මේ අය වැයෙන් වෙන් කිරීමේ අපේ බලාපොරොත්තුව තමයි, ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිරිගැන්වීම තුළින් ඔවුන්ව ජාත්‍යන්තර ජයග්‍රහණවලට යොමු කිරීම. ඒ වාගේම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර තරග සඳහා යැමේදී අවශ්‍ය ආහාර පාන වෙනුවෙන්, ගුවන් ටිකට්පත් හා අනෙකුත් පහසුකම් වෙනුවෙන් මේ අය වැය තුළ අපි රුපියල් මිලියන 150ක වාගේ මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, "ක්‍රීඩා ශක්ති" වැඩසටහන මඟින් තෝරා ගත් ක්‍රීඩකයන්ට රුපියල් 10,000ක මාසික පෝෂණ දීමනාවක් හා අඛණ්ඩ පුහුණුවක් ලබා දීම වෙනුවෙන් අපි රුපියල් මිලියන 200ක මුදලක් වෙන් කරලා

තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ජාතික ක්‍රීඩා තරඟාවලියේ ජයග්‍රහණ වෙනුවෙන් ලබා දෙන සහතිකයට විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී ප්‍රසාද ලකුණු හිමි කර දීම තුළින් අපි බලාපොරොත්තු වෙනවා, පාසල් දරුවන් ක්‍රීඩාවට තව තවත් ඇද ගැනීමට.

ඒ වාගේම මේ මොහොතේ මා කියන්න කැමැතියි, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් බොහොම බේදනීය විධියට ක්‍රීඩකයන්ගේ පෝෂණය ගැන, බඩගින්න ගැන කථා කළ බව. හැබැයි, මේ කථා කරන්නේ ක්‍රීඩකයන්ගේ ජීවත් වීමේ අයිතියත් උදුරාගත් මිනිස්සු. ඒ වාගේම ඒ මන්ත්‍රීතුමා ක්‍රීඩා ආර්ථිකයක් ගැනත් කථා කළා. සූරියවැය ක්‍රීඩාංගණය හදලා ඒකෙන් ආදායම් උපයපු හැටිත් පැහැදිලි කරලා ඒ මන්ත්‍රීතුමා ඒ කථාව කිව්වා නම් සදාචාරයක් තිබෙනවා කියලා මම කියන්න කැමැතියි. ඒ වාගේම මේ අය වැය ඇතුළේ අපි බලාපොරොත්තු වෙන්නේ, තරුණ පරපුර සිරගෙවල්වලට ලඝු කරනවා වෙනුවට ක්‍රීඩාව තුළින් ඔවුන්ගේ ජීවිත ශක්තිමත් කරලා, පොහොසත් රටක් නිර්මාණය කරලා, ඔවුන්ගේ ජීවිත නහාසිටුවීමයි. එය මෙවර අය වැයේ අපගේ ප්‍රධාන බලාපොරොත්තුවක් වනවා. මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ගැන කියනකොට, ඒක ගමේ කහ පාත්තියක් දමන මනුස්සයාගේ ඉඳලා මෝටර් රථ හදන මනුස්සයා දක්වා විහිදිච්ච දැවැන්ත ජන ප්‍රජාවකට බලපාන අමාත්‍යාංශයක් බව කිය යුතුයි. එවැනි අමාත්‍යාංශයක් ගැන විනාඩි කිහිපයක් තුළ වචන කිහිපයක් හරි කථා කරන්න ලැබීම ගැන මා ඉතා සතුටු වෙනවා.

මේ කථාව කරද්දි මම මතක් කරන්නම ඕනෑ, අපේ රටේ හිටපු පඬිවරයෙක් ගැන. ඒ තමයි, කුමාරතුංග මුනිදාස පඬිවරයා. එතුමා 1920 ගණන්වල වාගේ රචිත කවි පන්තියක් තිබෙනවා. ඒ කවි පන්තියේ සඳහන් වෙනවා, "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනඟී - හිහා කෑම බැරි වුණ තැන ලඟී ගයා මර ගී" කියලා. මේ කවි පන්තිය මේ අමාත්‍යාංශයත් එක්ක හිතලා බලනකොට මට හිතුණා, කුමාරතුංග මුනිදාස පඬිවරයා අපේ රට ගැන අවුරුදු සිය ගණනකට කලින් දැකලා තිබෙනවා නේද කියලා. ඒ නිසා මට හිතුණා, මගේ කථාවේදී අද විශේෂයෙන්ම ඒ ගැන මතක් කරන්නට. මොකද, අද දවසේ එතුමාගේ කවි පන්තිය විශේෂයෙන්ම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ භාණ්ඩ හා සේවා ගත්තොත්, 1977 අවුරුද්දේදී ලෝකයේ භාණ්ඩ හා සේවාවලින් දෙසීයෙන් එකක් අපි නිෂ්පාදනය කරලා තිබුණා. හැබැයි, 2023 අවුරුද්ද වෙද්දී, එය දෙදාහෙන් එකක් බවට අඩු වෙලා තිබුණා. අපේ රට මේ තත්ත්වයට පත් වෙන්න හේතුව මොකක්ද? අපට කුඩා කාලයේදී ඉගැන්නුවා, නිෂ්පාදන සාධක ගැන. නිෂ්පාදනයක් බිහි කරන්න අවශ්‍ය සාධක තමයි භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය. නමුත් අපි ටිකක් ලොකු වෙනකොට දැක්කා, අපේ රටේ දේශපාලනඥයෝ මේ සාධක ටික එක එක විධියට වර්ග කරනවා. ශ්‍රමය කියන එක සම්පූර්ණයෙන්ම හැල්ලු කරලා දැම්මා. අපේ රටේ ශ්‍රමිකයන් 1980 ජූලි වැඩ වර්ජනයේදී එළියට දාලා, ශ්‍රමිකයාගේ අගය හැල්ලු කළා. ශ්‍රමය කියන්නේ නිකම් සූරාගෙන කන දෙයක් හැටියට තමයි සැලකුවේ. හැබැයි, ශ්‍රමය කියන්නේ ඊට එහා ගිය මානව සම්පත. ඒ මානව සම්පතට තිබෙන ගෞරවය අපේ රටේ බිහි කළේ නැහැ. ඒ වාගේම දේශපාලන නායකත්වයට ඕනෑ විධියට, තම තමන්ට වාසි විධියට මේ භූමිය කියන සාධකය පාවිච්චි කළා. කිසිම විධිමත් බවක් නැතුව අපේ රටේ භූමිය පාවිච්චි කිරීම තුළ කර්මාන්ත පද්ධතියට එය දැවැන්ත ලෙස බලපා තිබෙනවා. එදා දේශපාලනීකරණය තුළින් තමයි මේ භූමිය පාවිච්චි කළේ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒගොල්ලන් තව වැඩක් කළා. ප්‍රාග්ධනය සහ ව්‍යවසාය අපේ රටේ නැහැ කියන තර්කය ඒගොල්ලන් ගෙනාවා. ප්‍රාග්ධනය සහ ව්‍යවසාය ගේන්නේ පිට රටින් කියන තර්කයක් ගෙනාවා. විදේශීය ප්‍රාග්ධනය නැත්නම් මේ රට හදන්න බැහැ, පිට රට ව්‍යවසාය නැත්නම් මේ රට හදන්න බැහැ කියන මූලික පදනම ඒගොල්ලන් බිහි කළා. හැබැයි, 1977 අවුරුද්දෙන් පස්සේ ඒ ආපු ආර්ථික ක්‍රමය තුළ ඒගොල්ලන් ඒ ගෙනාපු තර්කය, ඒගොල්ලන්ටම විනාශයක් වුණා. ඒගොල්ලන්ටම ඒක ඔප්පු කර ගන්න බැරි වුණා. ලෝකයේ තිබෙන කර්මාන්ත, ව්‍යාපාර ගත්තොත්, "Fortune 500" කියන ඒ ව්‍යාපාර 500න් එකක්වත් මේගොල්ලන්ට ගෙන්වන්න බැරි වුණා. ඒ නිසා එදායින් පස්සේ අපේ රටේ ආර්ථිකයේ සමස්ත ක්‍රියාවලිය මානව සම්පත ඉලක්ක කර ගත්ත, මේ රටේ භූමිය ඉලක්ක කර ගත්ත එකක් නොවෙයි. එය දැවැන්ත සෝදා පාළුවක් සහිත ආර්ථිකයක් බවට ඒගොල්ලන් පත් කළා. ඒ නිසා මොකද, වුණේ? එහි ප්‍රතිඵලයක් වශයෙන් අපේ රටේ හිඟා කෑම ස්ථාවර තත්ත්වයට පත් වුණා. හිඟා කෑම දේශපාලන දර්ශනය බවට පත් වුණා. ඒ නිසා අපේ රටේ කර්මාන්තකරුවා විනාශ වුණා. තනි තනි කර්මාන්තකරුවා විතරක් නොවෙයි, ජාතියක් විධියට අපේ ව්‍යවසායක භීනය බිඳ වැටිටුවා. ජාතියක් විධියට තිබෙන්න ඕනෑ භීනයක් තමයි, නව ව්‍යවසායන් පිළිබඳ භීනය. ඒක යථාර්ථයක් කර ගන්න මහ ජාතියක් විධියට අපි මහන්සි වෙන්න ඕනෑ. ඒ සම්පූර්ණ භීනය බිඳ වැටිටුවා. ඊළඟට, ජාතියක බිහි වෙන්න ඕනෑ, නවෝත්පාදන. නවෝත්පාදන සංකල්පය, නිර්මාණශීලීත්වය කියන ඒ සියල්ල බිඳ වැටිටුවා. අපේ රටේ යම් දරුවෙක් සරුංගලයක් හැදුවා නම්, ඒ සරුංගලය හදන ඒ නිර්මාණශීලීත්වය නැති කළා. අපි පුංචි කාලයේ නූල් රෝදයෙන් කරත්ත හැදුවා. ඒ සියල්ල විනාශ කළා; ඒ සියල්ල නැති කළා. කුඩා කාලයේ ඉඳලාම ඒ නවෝත්පාදන චින්තනය බිඳ වැටිටුවා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, ව්‍යාපාර වාගේම කර්මාන්ත අමු ද්‍රව්‍ය නැත්නම් පවත්වාගෙන යන්න බැරි බව. අපේ රටේ අමු ද්‍රව්‍ය නිෂ්පාදනයත් සම්පූර්ණයෙන්ම විනාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන්නේ ගාල්ල දිස්ත්‍රික්කය. රත්නපුර, කළුතර, කෑගල්ල වාගේම ලංකාව පුරාම තවත් දිස්ත්‍රික්ක ගණනාවක තේ වගා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයත් තේ නිෂ්පාදනය අතින් ගත්තාම ප්‍රධාන දිස්ත්‍රික්කයක්. නමුත් අපේ රටේ තේ කර්මාන්තයට මොකක්ද කළේ? අපේ රටේ තේ කර්මාන්තය වසර 10ක් ඇතුළත වේගයෙන් බිඳ වැටිටුවා. අපි දන්නවා, 2012 වාගේ කාලයේ කිලෝ මිලියන 310ක් අපි තේ අපනයනය කළ බව. හැබැයි, ඒක 2020, 2021, 2022 විතර වනකොට කිලෝ මිලියන 210ට බැස්සුවා. තේ සඳහා ලෝකයේ තිබිච්ච හොඳම නම අපේ රට සතුවයි තිබුණේ. "ලිප්ටන්ගේ තේ වත්ත" කියලා අපේ රට හැඳින්වුවා. හොඳම තේ තිබුණේ ලංකාවේ. ඒ සියලු කීර්ති නාම ටික බිඳ වටිටවමින් මේගොල්ලන් අපේ රටේ තේ කර්මාන්තයත් බිඳ වැටිටුවා.

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

ඒ විතරක් නොවෙයි. අපි හදන තේ ටිකටත් අගය එකතු කළේ නැහැ. අගය එකතු කරන්නේ නැතුව තේ කොළ විතරක් පිට රටවලට පැටෙව්වා. නමුත් වෙන රටවල් ඒකට අගය එකතු කළා. ඇත්තටම අපේ රටේ ව්‍යාපාරිකයාටවත්, කර්මාන්තශාලා හිමියාටවත්, කුඩා තේ වතු හිමියාටවත් මේකෙන් ලාභය ආවේ නැහැ. ඒ ලාභය ආවේ පිට රටවලට. අපේ රටේ පාලකයන් මෙන්න මේ වාගේ දේවල් වෙනුවෙන් කටයුතු කළේ නැහැ. ඒ විතරක් නොවෙයි. තේ කර්මාන්තශාලා පද්ධතිය ආශ්‍රිතව, නැත්නම් තේ කර්මාන්තය ආශ්‍රිතව නීති රීති පද්ධතියක් සකස් කළේ නැහැ. ඒ නිසා අද එහි ප්‍රතිඵලය වෙලා තිබෙන්නේ මොකක්ද? තේ කොළවලට විවිධ ද්‍රව්‍ය - සීනි, විවිධ පාට - කලවම් කරලා, අපේ රටින් ඒවා අපනයනය කරලා, අපේ රටට තේ පිළිබඳ තිබුණු අභිමානය සම්පූර්ණයෙන් බිඳ වැටිලා තිබෙනවා. මේවා මේ පාලකයින් දැනුවත්වයි සිදු කළේ. මේ පාර්ලිමේන්තුවේත් තේ කර්මාන්තශාලා හිමියන් ඕනෑ තරම් ඉඳලා තිබෙනවා; වතු හිමියන් ඉඳලා තිබෙනවා. හැබැයි, මේ රටේ තේ කර්මාන්තය රැක ගැනීම වෙනුවෙන්, තේ අභිමානය රැක ගැනීම වෙනුවෙන් වැඩ කරන්න ඒ කවුරුවත් සමත් වෙලා තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ විතරක් නොවෙයි. තේ කර්මාන්තය පවත්වාගෙන යනකොට ඒ තුළ කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදනත් තිබෙනවා. එම නිෂ්පාදනයත් බිඳ වැටිටුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුමාරතුංග මුනිදාස මහතා රචනා කර තිබෙනවා, "හිහා කෑම බැරි වුණු තැන ලගී ගයා මර ගී" කියලා. අපට ලැබුණේ හිහා කන්නත් බැරි වෙච්ච රටක්; එක තැන ලැගපු රටක්. දේශපාලකයන් විසින් තවදුරටත් ලැග්ගවීමට උත්සාහ කරන රටක් තමයි අපට ලැබුණේ. මේ කෙටි කාලය ඇතුළත අපි මොකක්ද කළේ? ලෝකය තුළ ජාතිවාදී නොවන, ජනතාවට වෙනස් ලෙස නොසලකන ජාතියක් අපට බිහි කර ගන්න පුළුවන් වුණා. ඒ විතරක් නොවෙයි. දූෂණයෙන් තොර රටක් බිහි වුණා. නීතිය රකින රටක් බවට අපි මේ රට පත් කර ගත්තා. දැන් අපි මොකක්ද කරන්න ඕනෑ? අපි මෙතැනින් එහාට මේ ලෝකය තුළත්, අපේ රටේ ජනතාවගේ හදවත් තුළත් "Made in Sri Lanka" කියන ඒ අතීත නාමය, ඒ විශිෂ්ට නාමය ස්ථානගත කරන්න ඕනෑකම තිබෙනවා. මේක "Made in Sri Lanka" කියන නමින් පත්තරේක විතරක් දාලා බැහැ. ජනතාවගේ හදවත තුළ "Made in Sri Lanka" කියන ඒ වටිනා නාමය ස්ථාපිත කර ගත යුතුව තිබෙනවා. ඒ සඳහා අපි අරගළ කරනවා. ඒ විතරක් නොවෙයි. ව්‍යවසායකත්ව සිහිනයක් මේ ජාතියට ගොඩනඟන්න ඕනෑ. ඒ කාර්යභාරය මේ මොහොතේ අතිවැදගත් දෙයක් වෙනවා. හැබැයි, අපට ඒ සඳහා බාධා තිබෙනවා. ඒ බාධා මොනවාද? පළමුවැනි එක තමයි, ඍණාත්මක - negative - චින්තය, එහෙම නැත්නම් රට ලග්ගවන චින්තනය. රට ලග්ගවන චින්තනයක් ගේනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු මේ ගරු සභාවේ උදේ ඉඳලා කියන්නේ ඍණාත්මක කථා. සමහර වෙලාවට රූපවාහිනී නාළිකාවල විකාශනය වන දේවල් බලනකොට අපට ඒ බව පෙනෙනවා. හැම දෙයටම "බැහැ" කියන අර්ථය තමයි ගේන්නේ. අද ඒක ජාතියට බිහි කරන්න හදනවා. මොකද, ඒගොල්ලන්ගේ ලග්ගපු දේශපාලනය ඒගොල්ලන්ට අවශ්‍ය වෙලා තිබෙනවා. රට නග්ගන දේශපාලනය වෙනුවට ඒගොල්ලන් නිතරම කරන්නේ මොකක්ද? හැම වෙලාවේම "නැහැ", "බැහැ", "හරියන්නේ නැහැ" කියන දේශපාලනය ජනතාව තුළට ගේන්න හදනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසන් වෙනවා.

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
මේ කාරණයත් කෙටියෙන් කියා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අය වැය ලේඛනය තුළ අපට ගොඩක් දේවල් කථා කරන්න තිබුණා. මේ අමාත්‍යාංශය යටතේ අපට තිබෙන ප්‍රධාන වගකීම් තමයි, ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම, යටිතල පහසුකම් සැපයීම, අපනයන දාම ඇති කිරීම, ව්‍යවසායකත්ව සහාය ලබා දීම, රාජ්‍ය ව්‍යවසාය ගොඩනැඟීම, ශිල්ප සහ සාම්ප්‍රදායික කර්මාන්ත ගොඩනැඟීම. ඒ කාරණා ටික ඉටු කරන්න අපි උත්සාහ කරනවා.

ඒ විතරක් නොවෙයි. අපේ රටේ තිබෙන හොඳම දේ තමයි කුළු බඩු. කුරුඳු, කහ, ගම්මිරිස්, ඉඟුරු, සාදික්කා, කරාබු නැටි, පැඟිරි, සේර, ගොරකා, කොකෝවා, වැනිලා වැනි මේ ලෝකයේ කිසිම රටක නැති අගයක් සහිත කුළු බඩු ගම්මාන අපේ රටේ නිර්මාණය කරනවා. ගොවියාත්, කර්මාන්තකරුවාත් සම්බන්ධ කරලා ලෝකයේ අතිවිශිෂ්ට නාමයක් ගොඩනඟන්න අවශ්‍ය පසුබිම අපි සකස් කරනවා. ඒ සඳහා යන ගමන අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. සංචාරක කර්මාන්තය ගොඩනැඟීමේදී මෙන්න මේ ගම්මානත් සම්බන්ධ කර ගනිමින් සංචාරකයාගේ හොඳම ගමනාන්තය සහ ඔවුන්ට වටිනාම දේ දෙන රටක් බවට අපි මේ රට පත් කරනවා. "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනඟී - හිහා කෑම බැරි වුණ තැන ලගී ගයා මර ගී" කියන කුමාරතුංග මුනිදාස මහතා විසින් රචිත කවිය නැවතත් මතක් කරමින්, මේ ජාතිය ගොඩනඟන, රට ගොඩනඟන අපේ වැඩ පිළිවෙළට එකතු වෙන්න කියා මේ රටේ ජනතාවටත් ආරාධනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මුලින්ම තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්නම්. මම ක්‍රීඩා අමාත්‍යවරයා විධියට සිටි කාල වකවානුව තුළ ඇත්තටම අපට විශාල වැඩ කොටසක් කරන්න හැකියාව ලැබුණා.

2015 වර්ෂයේදී අපේ රවි කරුණානායක මැතිතුමාත්, මිය ගිය මංගල සමරවීර මැතිතුමාත් අපට දුන් සහයෝගය මා ඉතා ගෞරවයෙන් මේ අවස්ථාවේ සිහිපත් කරනවා. මම හැම අවුරුද්දකම දෙසැම්බර් මාසයට කලින් අගෝස්තු මාසය විතර වනකොට programmes හදාගෙන ගිහිල්ලා එතුමන්ලාගෙන් සල්ලි ඉල්ලුවා. ඒ සල්ලි අරගෙන වැඩ කෙරුවා. පළාත් ක්‍රීඩාංගණ ගණනාවක් හැදුවා. විශේෂයෙන් දිගන පළාත් ක්‍රීඩාංගණය, උතුරු පළාත් ක්‍රීඩා සංකීර්ණය, සබරගමුව, රත්නපුර ක්‍රීඩා සංකීර්ණය හැදුවා. බිංගිරිය ක්‍රීඩා සංකීර්ණයේ වැඩ තව

ටිකක් තිබෙනවා. යාපනය දොරේ අප්පා ක්‍රීඩාංගණය, මාතර කොටවිල ක්‍රීඩාංගණය, මඩකලපුව වෙබර් දිස්ත්‍රික් ක්‍රීඩාංගණය, පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩාංගණය, කළුතර දිස්ත්‍රික් ක්‍රීඩාංගණය, කෑගල්ල දිස්ත්‍රික් ක්‍රීඩාංගණය, පුත්තලම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය, අම්පාර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය, මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය, ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය, ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය වැනි ක්‍රීඩා සංකීර්ණ 10කට වැඩි ප්‍රමාණයක වැඩ පටන් අරගෙන සෑහෙන වැඩ ප්‍රමාණයක් අපි අවසන් කෙරුවා. මේ වන විට ක්‍රීඩා සංකීර්ණ කිහිපයක වැඩ පමණයි තිබෙන්නේ.

මේ වෙලාවේ ගරු සභාවේ නියෝජ්‍ය ඇමතිතුමාත් නැහැ. ඇමතිතුමාත් නැහැ. අපි කනගාටු වෙනවා. අපි කථා කරන කොට ඒ දෙදෙනාගෙන් එක්කෙනෙක් හිටියා නම් හොඳයි. අපේ තිබෙන දෙයක් කියන්නවත්, තොරතුරක් දැන ගන්නවත් ක්‍රමයක් නැහැ. තමුන්නාන්සේලා අපි කථා කරන දේවල් දන්නේ නැහැ, උත්තරයක්වත් දෙන්න. කාටද අපි කථා කරන්නේ? දෙයියන්ට කියන්නද, අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒ නිසා දෙන්නාගෙන් එක්කෙනෙක් සභාවේ ඉන්න ඕනෑ. කියන කාරණා ලියා ගන්න, කථා කරන්න, ඒවා හදාගන්න එතුමන්ලා කවුරු හරි මේ සභාවේ ඉන්න ඕනෑ.

මගේ මූලිකම කාරණය මෙයයි. ඒ ක්‍රීඩා සංකීර්ණ හැදුවාට පසුව ඒ ක්‍රීඩා සංකීර්ණ පවත්වාගෙන යාම තමයි ප්‍රධාන අර්බුදය වුණේ. මගේ යෝජනාව තිබුණේ, සුගතදාස ක්‍රීඩා සංකීර්ණයත් එක්ක මේ සියලු සංකීර්ණ බද්ධ කරලා එක වැඩ පිළිවෙළක් යටතට මේක ගෙනෙන්න ඕනෑ කියන එකයි. නමුත් තවමත් ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. මේ කාරණය කරන්න කියලා මම ඇමතිතුමාගෙන් ඉල්ලනවා. නැත්නම් මේවා පාලනය කරන්න කිසිම මුදලක්, මේවා භාර ගත්තු ප්‍රාදේශීය සභාවලට හෝ පළාත් සභාවලට නැහැ. ඒ නිසා කරුණාකරලා කැබිනට් පත්‍රිකාවක් ගෙනැල්ලා මේ සියල්ලම එකට අරගන්න. Sugathadasa Stadium එකේ පාලක මණ්ඩලයක් තිබෙනවා. ඒකට ගෙනැල්ලා මේ සියල්ල එකට පාලනය කරන්න ගන්න. නැත්නම් මේවායේ සත පහක වැඩක් වෙන්නේ නැහැ. මේවා සම්පූර්ණයෙන් කඩා වැටෙනවා.

මම තමයි පටන් ගත්තේ ජනාධිපති සම්මාන ක්‍රීඩා උළෙල. අවුරුදු කිහිපයක් එය තියන්න හම්බ වුණේ නැහැ. මේ අවුරුද්දේ මුදල් දාලා කියලා මම දැක්කා අපේ මන්ත්‍රීතුමියක් කියනවා. බොහොම ස්තුතිවන්ත වෙනවා, ඒකට. ඒ වැඩ පිළිවෙළ මම ඉන්න කාලයේ දිගටම කරගෙන ගියා. 2016, 2017, 2018 අවුරුදු තුන තුළ එක දිගට එය කරගෙන ගියා. ක්‍රීඩා සම්මාන උළෙල දක්ෂතා තිබෙන මේ රටේ ක්‍රීඩකයන්ට විශාල පිටුවහලක් වුණා. මම විශේෂයෙන් පටන් ගත්තු වැඩසටහනක් තිබුණා, "Talent Identification" කියලා. අධ්‍යාපන අමාත්‍යාංශයත්, ක්‍රීඩා අමාත්‍යාංශයත් දෙගොල්ලන් එකතු වෙලා අවුරුදු 7ත්, 13ත් අතර දරුවන් සඳහා දිස්ත්‍රික්ක හැම එකකින්ම වාගේ කොටියාස 316ක අපි වැඩ පිළිවෙළක් පටන් ගත්තා, ඒ අයව සංවර්ධනය කරන්න. ඒකත් නතර වෙලා තිබෙනවා.

ක්‍රීඩා අරමුදල ගැන කථා කෙරුවා. ක්‍රීඩා අරමුදලට විශේෂයෙන් සල්ලි දාන්න ඕනෑ නැහැ. අපි ඒ කාලයේ ජාතික ලොතරැයි මණ්ඩලයෙන්, සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් - DLB එක- මාසයෙන් මාසයට අපට දෙන්න තිබෙන සල්ලි ගෙන්වා ගත්තා. හේතුව, මේ අය සල්ලි දෙන්නේ නැහැ. සමහර වෙලාවට මේ ගොල්ලන් සෑහෙන කාලයක් සල්ලි නොදී ඉන්නවා. ඒ නිසා සාමාන්‍යයෙන් අපි කරන්නේ, ගෙන්වලා කථා කරලා ඒ සල්ලි ගන්නවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? අද පැරා ඔලිම්පික් ක්‍රීඩකයන්ට ඒ මුදල් ටික ගෙවලා නැහැ.

ඒ ක්‍රීඩකයන්ට ලැබෙන්න තිබෙන මුදල් ටික නොලැබීම නිසා විශාල වශයෙන් ඒ අය කඩා වැටිලා තිබෙනවා. ඒ නිසා මුදල් අමාත්‍යාංශයත් එක්ක හෝ සාකච්ඡා කරලා යම් මුදලක් අරගෙන කරුණාකර ඒවා ගෙවලා ඉවර කරන්න කියා ඉල්ලනවා, ඒ ක්‍රීඩකයන්ගේ අනාගතය වෙනුවෙන්.

මම ඒ කාලයේ පටන් ගත්තා Sports Re-engineering Project එක. ඒකට මිලියන 100 ගානේ අපි හැම අවුරුද්දේම ගත්තා, මේ රටේ ඉන්න සියලු පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා. හැබැයි, මේ අවුරුද්දේ Sports Re-engineering Project එකට සල්ලි ලබාගෙනද කියලා මම දන්නේ නැහැ. ඒකට අදාළ මුදල් ටික ලබා ගැනීම අත්‍යවශ්‍ය කාරණයක්.

ඒ වාගේම මම ඉන්න කාලයේ තමයි පටන් ගත්තේ Human Performance Laboratory එක. ලංකාවේ ක්‍රීඩාවට අවශ්‍ය කරන විද්‍යාව අපි ගෙනාවා. එච්චර කාලයක් ඒක තිබුණේ නැහැ, ඒක හැංගිලා තිබුණේ. මම ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා ඒ ආයතන එක්ක සාකච්ඡා කරලා, එතැනින් කැන්බරාවලට ගිහිල්ලා එහි විශ්වවිද්‍යාල එක්ක සාකච්ඡා කරලා ඒ අයව train කරන්න අවශ්‍ය කටයුතු ටික කළා. නමුත් අද මොකද වෙලා තිබෙන්නේ? අද බලන්න, මේ ක්‍රීඩා වෛද්‍ය ආයතනය ගැන. මේ වෙලාවේ ගරු සභාවේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා, එතුමා ඒ ගැන දන්න කෙනෙක්. අපට අවශ්‍ය වෙලා තිබුණා sports biomechanist කෙනෙක්. ඔබතුමාත් ගිහිල්ලා බලන්න, ක්‍රීඩා වෛද්‍ය ආයතනයට. ඔබතුමාටත් යන්න පුළුවන් කිසි ගැටලුවක් නැහැ, Sri Lanka Cricket එක ඉස්සරහා තිබෙන ගොඩනැඟිල්ලේ third floor එකට ගිහිල්ලා බලන්න. Human Performance Laboratory එක හදලා තිබෙන්නේ. ඒකට බඩු ගෙනැල්ලා ඔක්කෝම කරලා ඉවරයි. නමුත් අවුරුදු ගාණක් වෙනවා තවමත් sports biomechanist කෙනෙක් සහ sport and exercise physiologist කෙනෙකුයි ගන්න බැරිව 2024 ඉඳලා එහාට මෙහාට ලියුම් යවමින් ඉන්නවා.

ගරු ඇමතිතුමා මේ සභාවේ හිටියා නම් මම කියන්න කැමැතියි, අපි සාමාන්‍යයෙන් මුදල් අමාත්‍යාංශයේ DG ගෙන්වලා කථා කරලා තමයි මේවාට අවශ්‍ය අනුමැතිය ගත්තේ, බලහත්කාරයෙන් රණ්ඩු කරලා ගත්තේ. දැන් මේක සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබෙන්නේ. මම අමාත්‍යවරයා විධියට ඉන්න කාලයේ මම කියලා තිබුණා අපේ සංගම් 76ටම, හැම pool එකක්ම ලියාපදිංචි කරන්න ඕනෑ කියලා මේ ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ. ඒ සියලු ක්‍රීඩකයන් ගැන බලන්න ඕනෑ. මොකද, ඒ අයට තිබෙන injuries ගැන කිසිම දැනුමක් මේ පුහුණුකරුවන්ට නැහැ. ඒ අයව දැනුවත් කරන්න හොඳම වැඩේ තමයි physiotherapistsලා ටික ගන්න වැඩ පිළිවෙළ. 2024 ඉඳන් මේ ගැන ලියුම් එහාට මෙහාට යනවා. DG ඉන්නවා Management Services Department එකේ, සාමාන්‍යයෙන් අපි ගෙන්වාගෙන කථා කරනවා. කරුණාකරලා sports biomechanist කෙනෙක් සහ sport and exercise physiologist කෙනක් අරගෙන දෙන්න. ඒ අය නැතිව ක්‍රීඩා වෛද්‍ය ආයතනය ක්‍රියාත්මක කරන්න බැහැ.

ඒ විතරක් නොවෙයි, මේ ආයතනයටම doctorsලා හතරදෙනෙක් අවශ්‍යයි, හෞත චිකිත්සකයෝ හත්දෙනෙක් ඕනෑ. ඒ අය නැතිව ඒ කටයුත්ත කරන්න බැහැ. මොකද, මම හිටපු ගමන් ක්‍රීඩා වෛද්‍ය ආයතනයට යනවා අතකට පයකට මොනවා හරි වුණාම. හෞත චිකිත්සකයෝ ඉන්නේ දෙදෙනායි. හත්දෙනෙකු ඉන්න ඕනෑ. හැබැයි ඉන්නේ දෙදෙනායි. මේ දෙදෙනාට ලංකාවේ ඉන්න සියලු ක්‍රීඩකයෝ ගැන බලන්න බැහැ. උදේ ඉඳන් රෑ වෙනකම් ඒ මිනිස්සු වැඩ. ඒ විධියට ඒ මිනිස්සුන්ට වැඩ කරන්න බැහැ. ඒ අය trainersලා ගෙන්වලා තමයි දැන් වැඩ

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

කරගෙන යන්නේ. කරුණාකරලා DG, Management Services Department ගෙන්වා ඔබතුමන්ලා කථා කරන්න, කථා කරලා ඒ පත්වීම් ටික වහාම කරන්න.

එක පෝෂණවේදියෙක් හිටියා. තවත් එක්කෙනෙක් ගන්න ඕනෑ. මම අද ඔබතුමාට කියන්නම්. කරුණාකරලා ගිහිල්ලා බලන්න. 2025, මේ අවුරුද්දේ, Asian Youth Games තිබෙනවා, World Athletics Championship එක තිබෙනවා, Asian Youth Netball Championship එක තිබෙනවා, World Youth Netball Championship එක තිබෙනවා, Asian U20 Athletics Championship එක තිබෙනවා, Asian Athletics Championship එක තිබෙනවා, South Asian Senior Athletics Championship එක තිබෙනවා. ඒ කියන්නේ, මේ අවුරුද්දේ පමණක්. ඒ වාගේම 2026 South Asian Games තිබෙනවා, Commonwealth Games සහ Asian Games තිබෙනවා. සාමාන්‍යයෙන් වෙනදා කරන්නේ අවුරුදු දෙකකට කලින් මේ අයව pool කරලා ඒ pools වෙනම වැඩ කරවනවා, වෙනම coachesලා දානවා, ක්‍රීඩකයෝ ටික වෙනම ගන්නවා, ඒ athleticsවලට වෙන්න පුළුවන්, බැඩ්මින්ටන්වලට වෙන්න පුළුවන්, ඒ හැම දෙයකටම. ඒ කිසිම වැඩ පිළිවෙළක් අද නැහැ. ඒ අයව pool කරලා නැහැ. 2025 අවුරුද්දේ weightlifting කරන අයට තරගවලට යන්න තිබෙනවා. සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා, ඒ අයට රෑට කන්න දෙන්නේ මොනවාද? රෑට කන්න දෙන්නේ සම්බෝලයි, කරවලයි, බත් ටිකකුයි. මේ, weightlifting කරන අයට කන්න දෙන විධිය. ඔබතුමා ගිහිල්ලා බලන්න, athletesලා ඉන්න hostel එකට. ඒ hostel එකේ මදුරුවෝ, මකුණෝ පිරිලා.

ගිහිල්ලා ඒවා ගැන බලන්න. වෙනදා අපි කරන්නේ මොකක්ද? පෝෂණවේදියෙකු ගෙනැල්ලා ඒ පෝෂණවේදියාට කියනවා, ඒ ක්‍රීඩකයන්ට අවශ්‍ය කරන කෑම ටික ලැහැස්ති කරන්න කියලා. මොකද, ඒ ක්‍රීඩකයන්ට අවශ්‍ය කරන කෑම ටික දෙන්නේ නැතුව කොයි තරම් weightlifting කරන්න කිව්වත් හරි යන්නේ නැහැ. උදේට මොනවාද දෙන්නේ? බිත්තරයක් දෙන්නේ. දවල්ට චිකන් කැල්ලක් දෙනවා; එහෙම නැත්නම් මාළු කැල්ලක් දෙනවා. එහෙම කාලා හරියන්නේ නැහැ. මොකද, diet plan එකක් හදලා, ඒ diet plan එක අනුව තමයි ඒ අයට කෑම බීම ලබා දෙන්න ඕනෑ. ඔක්කෝම coachesලා ගෙන්වලා මම ඇහුවා, ඔබලාට අවශ්‍ය කෑම බීම ටික මොනවාද කියලා. අපි ගිහිල්ලා ඒවා බැලුවා. හැබැයි, අද ඒ ක්‍රමය සම්පූර්ණයෙන් ඇත් වෙලා තිබෙනවා, ක්‍රීඩකයෝ තැන් තැන්වල. ඒ අය තමන්ම එකතු කර ගන්නා සල්ලි ටිකෙන් තමයි අද යන්තම් කන්නේ බොන්නේ. මේවාට සල්ලි ඉල්ලා ගන්න පුළුවන්; බැරිකමක් නැහැ. රටේ ක්‍රීඩාවට අවශ්‍ය කරන මුදල් අපට ගන්න පුළුවන්; බැරි කමක් නැහැ. වුවමනාව තිබෙනවා නම් ඒ සඳහා අවශ්‍ය කටයුතු ටික කරන්න පුළුවන්. එම නිසා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා, ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ නිලධාරින්ගේ හිඟය, පෝෂණවේදියෙකු නොමැති වීම කියන ප්‍රශ්න විසඳන්න අවශ්‍ය කටයුතු ටික කරුණාකර කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ DG යටතේ තිබෙන තනතුරු ටික අරගෙන බලන්න. අපට Sports Coachesලා 103දෙනෙක් ඉන්න ඕනෑ. නමුත් ඉන්නේ 86දෙනෙකු විතරයි. තවත් 17දෙනෙක් මදි. හිටපු අයගෙන් සෑහෙන්න පිරිසක් ලංකාවෙන් ගිහිල්ලා. Sport Officersලා ටික හිටියේ නැත්නම් ක්‍රීඩාව හදන්න බැහැ. අපි ඒ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු ටික කරන්න ඕනෑ. එහි විසිදෙදෙනෙකුගේ අඩුපාඩුවක් තිබෙනවා. තවත් vacancies 18ක් තිබෙනවා. ඒ වාගේම Headquarters' Sports Officer තනතුර සඳහා 12 දෙනෙකු සිටිය යුතු වුවත්, දැන් ඉන්නේ 8දෙනෙකු පමණයි. කරුණාකර මේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න. ඒ වාගේම Assistant Directors (Sports) 4 දෙනෙකුට vacancies තිබෙනවා. කරුණාකර ඒ පුරප්පාඩුත් පුරවන්න. මොකද, DGට පමණක් කටයුතු කරන්න බැහැ. ඒ 4 දෙනා බඳවා ගත්තොත් මේ ක්‍රියාදාමය ඉස්සරහට ගෙන යන්න පුළුවන්.

ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කරන කොට මා විශේෂ කාරණයක් කියන්න කැමැතියි. ක්‍රීඩා අමාත්‍යාංශයට පත් වෙලා එන ඇමති හැමදාම හිර වෙන්නේ ක්‍රිකට්වලයි. අනෙක් ක්‍රීඩා සම්බන්ධයෙන් මා කරපු වැඩ එකක්වත් එළියට දාගන්න ලැබුණේ නැහැ. හේතුව, ක්‍රිකට්වලට හිර වුණු එකයි. අවසානයේ ක්‍රිකට්වලින් තමයි කන්න වුණේ. මොකද, ඒකෙන් කෑවාම කරපු හොඳ ඔක්කෝම ඉවරයි. ගරු හඳුන්නෙත්ති ඇමතිතුමනි, කරපු හොඳ ඔක්කොම ඉවර වුණා. පසුගිය වතාවේ රොෂාන් රණසිංහ මහත්මයාත් ඒ වැඩේම කළා. මේ පැත්තේ හිටපු කට්ටිය එතුමාව චූන් කළා. අවසානයේ රොෂාන් රණසිංහ ගෙදර ගියා. එතුමා හිතුවා, ක්‍රිකට්වලට අත ගැහුවාම ජනාධිපති වෙන්න පුළුවන් වෙයි කියලා. මතක තියාගන්න, එතැන ඉන්නවා කොටස් දෙකක්. ඒ තමයි, ෂම්මි සිල්වා පිල සහ උපාලි ධර්මදාස පිල. ඉස්සර නම් සිටියා තිලංග සුමතිපාල පිල සහ තවත් කණ්ඩායම්. උපාලි ධර්මදාස පිලෙන් ගෙව්වාම ඒ කට්ටිය ඇවිල්ලා මෙතැන කථා කරනවා. මම නම් ෂම්මි සිල්වාගෙන් සල්ලි අරගෙනත් නැහැ, උපාලි ධර්මදාසගෙන් සල්ලි අරගෙනත් නැහැ. හැබැයි මම කියන්නේ, මේවාට හසු වෙන්න එපා කියලායි. මොකද, ගිය වතාවේත් මේකට හසු වුණු නිසා Under-19 Asia Cup Tournament එක ලංකාවට නැතිව ගියා. දැන් මොකක්ද කරන්න හදන්නේ? ඊළඟට Asia Cup Tournament එක එනවා. එක එක්කෙනා මේකට අත ගහනවා. ක්‍රිකට් කියන්නේ තනිකරම politics. ඒකට අත ගහන්න මට නම් වුවමනාවක් තිබුණේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති, නිලවරණය තියන්නේ නැතුව අවුරුදු 8කට වැඩි කාලයක් ඒ අය තමන්ට කැමති විධියට කටයුතු කරගෙන ගියා. මම ඒකට විරුද්ධ වුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයා personally මට call කරලා කිව්වා, "කරුණාකර නිලවරණය තියන්න එපා. අපි committee එකක් දානවා" කියලා. මම කිව්වා, "එහෙම බැහැ සර්, මම ක්‍රීඩා ඇමති, ඒ නිසා මම නිලවරණය පවත්වනවා" කියලා. එහෙම තමයි ඒ ඡන්දය පැවැත්වුවේ. ඒකට ඒ තරම් බලපෑම් ආවා. නමුත් අපි ඒක කළා. ඒ ඡන්දය පැවැත්වීමේ ප්‍රතිඵලය වුණේ මොකක්ද? ලංකාවේ ඉන්න ක්‍රීඩා ඇමතිට හෝ ලංකාවේ ජනාධිපතිට "ශ්‍රී ලංකා ක්‍රිකට්" එකට අත ගහන්න බැහැ. ඒක එහෙම තමයි සිද්ධ වෙලා තිබෙන්නේ.

ඔලිම්පික් කමිටුවත් ඒ වාගේම තමයි. ලංකාවේ ඔලිම්පික් කමිටුවේ තිබෙන දූෂණ, වංචා විස්තර අරගෙන ඇවිල්ලා දැන් දෙගොල්ලන්ම ගහගන්නවා. මොකද, ඒ දෙගොල්ලන්ම හොරකම් කරලායි තිබෙන්නේ. හැබැයි, ඒගොල්ලන්ට ගිහින් කථා කරන්න බැහැ. මොකද, අපි මෙහෙන් කථා කරපු ගමන් ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව ලංකාවේ ඔලිම්පික් කමිටුව තහනම් කරනවා. එසේ තහනම් කළාම මොකක්ද වෙන්නේ? ලංකාවේ කාටවත් ක්‍රීඩා කරන්න බැරි වෙනවා. එතකොට අපි යන්න ඕනෑ ස්වාධීන කොඩියක් ඔසවාගෙන. එහෙම තමයි සිද්ධ වෙන්නේ. ඒ නිසා කරුණාකර ශ්‍රී ලංකා ක්‍රිකට්වලට අත ගහලා අපේ ක්‍රිකට් ක්‍රීඩාව නැවත විනාශ කරන්න එපා කියා මම කියනවා. නිවැරදි විධියට ICC එකත් එක්ක කථා කරලා ඒකට අත ගහන්න. එහෙම නොකර, දේශපාලනඥයන් කියන කාරණාවලට අත ගහන්න ගිහිල්ලා ශ්‍රී ලංකා ක්‍රිකට් විනාශ කරන්න එපා. ලබන අවුරුද්දේ 30,000කට අධික විදේශිකයන් පිරිසක් ලංකාවට එනවා. ඒ වැඩ පිළිවෙළත් එක්ක හෝටල් කාමර **බුක්** වෙනවා. 2026දී මේ රටට විදේශීය සංචාරකයින් විශාල පිරිසක් එන්න නියමිතව තිබෙනවා. ඒක වෙන්න ඉඩ දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න, ජාතික තරුණ සේවා සභාව ගැනත් කථා කරන්න. මේ වන කොට ජාතික තරුණ සේවා සභාව තුළ අර්බුද විශාල ගණනක් මතු වෙලා තිබෙනවා. අවුරුදු 3ක් තිස්සේ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය පවත්වා නැහැ. ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් යෞවන සමාජ ගොඩ නඟලා නැහැ. ප්‍රාදේශීය මණ්ඩල, දිස්ත්‍රික් මණ්ඩල හදලා නැහැ. ඒවා ගොඩ නැඟීමට අවශ්‍ය වැඩ පිළිවෙළ දැන් සකස් කරන්න ඕනෑ. නමුත් ඒ කටයුත්ත දැන් නතර කරලායි තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මම කියනවා කරුණාකර මේ පිළිබඳව සොයන්න කියලා. මොකද, අද වන කොට සබරගමුව පළාත් තරුණ සේවා අධ්‍යක්ෂවරයාත් මාරු කරලා. මේක ඡන්දයක් කැඳවා තිබෙන වෙලාවක්. තමුන්නාන්සේලා දේශපාලනිකව ඒ පුද්ගලයන් ගැන කල්පනා කරන්න එපා. එහි නිලධාරින් COPE එකට ගෙනැල්ලා පහර ගහනවා මම දැක්කා. මේකට ජාතික තරුණ සේවා සභාවේ නිලධාරින් පළි නැහැ.

මොකද, ඒ ආයතනයට පත් වන සභාපතිවරයා කරන පිස්සුවලට නිලධාරින් පළි නැහැ. හිටපු සභාපතිවරයා තමයි ඔය කියන සංගීත සංදර්ශනය පැවැත්වූවේ. අවසානයේදී ඒකට එකඟ වුණේ නැහැ කියලා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජගත් ලියනගේ මහත්මයාට ගෙදර යන්න වුණා; ඔහුව ඉවත් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජාතික තරුණ සේවා සභාව තමයි මේ රටේ තරුණයන් පුරුදු කරපු තැන, තරුණයින් නායකත්වයට ගෙනාපු තැන. අපිත් තරුණ සේවා සභාවෙන් ගොඩනැඟුණු මිනිස්සු. ඒ නිසා තරුණ සේවා සභාව දේශපාලනීකරණය කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න එපා. කරුණාකර මේ සිටින තරුණ සේවා නිලධාරින් එක්ක එකතු වෙලා ඒ ආයතනය ගොඩ නඟන්න. එය එක දේශපාලන පක්ෂයක තරුණයන් ගොඩනඟන්න පාවිච්චි කරන්න එපා කියන ඉල්ලීමත් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට වෙලාව ලබා දීම සම්බන්ධව.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කාරණා කිහිපයක් සඳහන් කළා. ක්‍රිකට් සම්බන්ධයෙන් එක එක්කෙනාට හසු වෙන්න එපා කියන එක පිළිබඳව විපක්ෂයේම මන්ත්‍රීවරුන් අතර පරස්පර සාකච්ඡා තමයි තිබෙන්නේ. කොහොම වුණත්, අපට කියන්න තිබෙන්නේ අපි ක්‍රිකට්වලට විතරක් නොවෙයි, කිසිම කෙනෙකුට හසු වෙන්නේ නැහැ කියලායි, ගරු මන්ත්‍රීතුමා. අපි කිසිම කෙනෙකුට හසු වෙන්නේ නැහැ. ඒ නිසා ක්‍රිකට්වලට කියලා විශේෂත්වයකුත් නැහැ. හැබැයි, අපි ඒ හැම ක්‍රීඩාවකටම රජයක් විධියට වග කියනවා. ඒ වගකීම ඇතුළේ කරන්න ඕනෑ කටයුතු ටික අපි කරනවා. නමුත්, අපි කාටවත් හසුවෙන්නේ නැහැ. ඒ වාගේම, ඔබතුමා සඳහන් කරපු vacancies ගැන අපි දැන් හදාරා තිබෙනවා. ඒ vacancies පුරවන්න අපි මේ වෙලාවේ සාකච්ඡා කරගෙන යනවා, අවශ්‍ය තැන්වලට ඒ අය ගන්නේ කොහොමද කියලා. අපි මේ සභාවේ රැඳී සිටින්නේ නැති බවක් ඔබතුමා කිව්වා. නමුත් මම phone එකෙන් ඔබතුමාගේ කථාව අහගෙන හිටියා. මොකද, තාක්ෂණය තිබෙන නිසා අපට එළියේදීත් ඔබතුමාගේ කථාවට ඇහුම්කන් දෙන්න පුළුවන්. පොඩි වැඩකටයි මම එළියේ හිටියේ. මම ඒ කාරණයත් මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි, මට විනාඩියක කාලයක් ලබා දුන්නාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

ගරු කංචන වැලිපිටිය මහතා
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් සාකච්ඡා කරන මේ මොහොතේ, විශේෂයෙන්ම අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කථා කරද්දී පොඩි බයකුත් හිතෙනවා, අපේ ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාත් එකතු වෙලා ක්‍රීඩා අමාත්‍යාංශය සම්පූර්ණයෙන් විනාශ කළා ද කියලා. මොකද, විපක්ෂයෙන් කථා කරන හැම කෙනාම වාගේ මාස 4කට පෙර පත් වෙච්ච ආණ්ඩුවක ක්‍රීඩා ඇමතිවරයාට, ඒ වාගේම නියෝජ්‍ය ඇමතිවරුන් දෙදෙනාට දොස් පවරනවා වාගේ තමයි කථා බහ කරන්නේ. හැබැයි, ඉතිහාසයේ ඒ කථා කරපු කවුරුත් නියෝජනය කරපු ආණ්ඩු විසින් කරපු දේවල ප්‍රතිඵල හැටියට තමයි මේ හැම විනාශයක්ම සිදු වෙලා තිබෙන්නේ. ඒවා නිවැරදි කරන්න තමයි අපේ මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව පත් වුණේ. අපේ ක්‍රීඩා ඇමතිවරයා සහ නියෝජ්‍ය ඇමතිවරුන් දෙදෙනා ඒ වෙනුවෙන් දිවා රෑ වෙහෙස මහන්සි වෙලා කටයුතු කරමින් ඉන්නවා. එහි ප්‍රතිඵල මාස 4ක් ඇතුළත බලාගන්න අමාරුයි තමයි. හැබැයි, ඒ සඳහා කෙටි කාලයක් යනවා. අපි විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා ඒ කාලයට ඉඩ දීලා ඉවසාගෙන ඉන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම වාගේ කථා කළේ ක්‍රීඩාව පැත්ත ගැන විතරයි. හැබැයි, මේ අමාත්‍යාංශය යටතේ තරුණ කටයුතු පැත්තත් තිබෙනවා. ඒක ඒ සියලු දෙනාට අමතක වෙලා තිබුණා. ඒ නිසා මම හිතුවා මගේ මේ විනාඩි 8ක කාලය ඇතුළත මේ අය වැයෙන් තරුණ කටයුතු සම්බන්ධයෙන්, තරුණයන් වෙනුවෙන් වෙන් කර තිබෙන දේවල් සම්බන්ධයෙන් පොඩි කථා බහක් සිදු කළොත් හොඳයි කියලා.

විශේෂයෙන්ම මේ අය වැයෙන් දිස්ත්‍රික්ක මට්ටමින් සිටින කලාකරුවන්, නාට්‍යවේදීන් -ඒ අංකුර කලාකරුවන්- හඳුනා ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 7ක් වෙන් කර තිබෙනවා. ගම්වල ජීවත් වන කොට අපි දකිනවා, අපේ ගම්වල සිටින, තමන්ගේ කලා හැකියාවන් දියුණු කර ගන්නට බැරිව දුක් විඳින දරුවන්. ඒ නිසා අපේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ඒ

[ගරු කංචන වැලිපිටිය මහතා]

අය වෙනුවෙන් කටයුතු කරන්න රුපියල් මිලියන 7ක් වෙන් කර තිබෙනවා, ඒ අංකුර කලාකරුවන් හඳුනා ගැනීම වෙනුවෙන්. ඒ වාගේම, අපේ අමාත්‍යාංශය, හඳුනාගන්නා ඒ අංකුර කලාකරුවන් එකතු කරලා 2026 අවුරුද්දේ නාට්‍ය පාසල නැවත ව්‍යාවක් ආරම්භ කරන වැඩ පිළිවෙළ ඒගොල්ලෝ යෝජනා කර තිබෙනවා. ඉතින් අපි හිතනවා, ගම්වල ජීවත් වන තරුණ දුවා දරුවන්ට ඒකෙන් යහපතක් වෙයි කියලා.

ඒ වාගේම මේ අය වැයෙන් දේශීය තරුණ හුවමාරු වැඩසටහන් වෙනුවෙන් රුපියල් මිලියන 12ක් වෙන් කර තිබෙනවා. අපි දන්නවා, ඉතිහාසයේ හැම දාමත් විවිධ දේශපාලන ව්‍යාපාර, විවිධ කණ්ඩායම් ජාතිවාදය වපුරමින් කටයුතු කළ බව. ඉතිහාසයේ එවැනි නරක අත්දැකීම් තිබෙනවා. 1983 කළු ජූලිය නිර්මාණය වුණේ දේශපාලන වුවමනාව වෙනුවෙන්. එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් උතුරේ දමිළ ජනතාව ඝාතනය කරමින්, ඔවුන්ගේ දේපළ විනාශ කරමින්, ඔවුන්ගේ ජීවිත හානි කරමින් දැවැන්ත ජන සංහාරයක් කළා. ඒකට එවකට හිටපු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වග කියන්න ඕනෑ. හැබැයි, ඒක ඒගොල්ලන් පාවිච්චි කර ගත්තේ තමන්ගේ දේශපාලන වුවමනා වෙනුවෙන්. එක පැත්තකින් උතුරේ දෙමළ දේශපාලනඥයෝ දෙමළ ජාතිවාදය වපුරනවා, උතුරේ. දකුණේ සිංහල දේශපාලනඥයෝ සිංහල ජාතිවාදය දකුණේ වපුරනවා. අනෙක් පැත්තෙන්, මුස්ලිම් ජාතිවාදය වපුරමින් ඒගොල්ලන්ගේ අවශ්‍යතා වෙනුවෙන්, ඒගොල්ලන්ගේ දේශපාලන වුවමනා ඉෂ්ට කර ගැනීම වෙනුවෙන් කටයුතු කළා. ඒක නිසා අපේ සමාජවාදී තරුණ සංගමය මඟින් 1983 කළු ජූලියත් එක්ක අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු ජනතාව එකට ජීවත් වන රටක් නිර්මාණය කර ගැනීම වෙනුවෙන් සහෝදරත්වයේ දිනය නිර්මාණය කර තිබුණා. අපේ සමාජවාදී තරුණ සංගමය දිගටම ඒ කටයුතු ඉෂ්ට කරමින් ආවා. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ගොඩ නැඟුණාම අපි තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් බවට ඒක පත් කරගෙන තිබෙනවා. උතුර, නැඟෙනහිර, දකුණ, බටහිර සියලු ජනතාව සහෝදරත්වයෙන් එකතු කරගෙන, ඒ සියලුදෙනා ශ්‍රී ලාංකිකයන් හැටියට හිතන පතන රටක් ගොඩ නැඟීම අපේ බලාපොරොත්තුවයි. ඒ වෙනුවෙන් මේ අය වැයෙන් රුපියල් මිලියන 12ක් වෙන් කිරීම සුබවාදී ලෙස අපි දකින්න ඕනෑ. අපේ සමාජවාදී තරුණ සංගමය ඉතිහාසය පුරා කරපු අරගළයේ ප්‍රතිඵලයක් හැටියට පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී අපේ රටේ සියලු ජනතාව එකට එකතු කරපු ඡන්ද ප්‍රතිඵලයක් ලබා ගන්න අපට පුළුවන් වුණා. උතුරත්, දකුණත්, නැඟෙනහිරත්, බටහිරත් සියලුදෙනා එකට එකතු කරපු, යා කරපු ඡන්ද ප්‍රතිඵලයක් අපට ගන්න පුළුවන් වුණේ, තරුණ සංගමය සහෝදරත්වයේ දිනය නිර්මාණය කරලා, අපේ රටේ ජාතික සමගිය ගොඩ නඟන තැනට කටයුතු කරපු නිසායි. අපි ජාතික සමගිය ගොඩ නඟා ගැනීම වෙනුවෙන් මේ අය වැයෙන් රුපියල් මිලියන 12ක් වෙන් කර තිබෙනවා. ඒක අපි ලබපු ජයග්‍රහණයක් කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගොඩක් අය තරුණ සේවා සභාව ගැන කථා කළා. තරුණ සේවා සභාවට අයිති බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය මහනුවර තිබෙනවා. හැබැයි, දැන් එක විනාශ වෙලා තිබෙන්නේ. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මැදිහත් වෙලා ගම්වල ජීවත් වන දරුවන්ගේ දක්ෂතා ඉදිරිපත් කර ගන්න, ඒ හැකියාව ඉදිරියට අරගෙන යන්න, ඒ තුළින් හොඳ කලාකරුවන් රටට බිහි කර ගන්න නැවත ව්‍යාවක් බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය ගොඩ නැඟීම වෙනුවෙන් මුදල් වෙන් කරලා ඒ කටයුතු ආරම්භ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යොවුන් සිනමා උළෙල වෙනුවෙන් රුපියල් මිලියන 10ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ජාතික යෞවන සම්මාන උළෙල වෙනුවෙන් රුපියල් මිලියන 40ක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ නාට්‍යවේදීන් ඇතුළු යෞවනයන්ගේ හැකියාව, දක්ෂතා එළි දක්වලා ඔවුන්ගේ හැකියාව ලෝකයට අරගෙන යන්න, නව තවත් ඒවා වර්ධනය කර ගන්න දායකත්වයක්, ශක්තියක්, ධෛර්යයක් සැපයීම වෙනුවෙන් තමයි එවැනි මුදලක් වෙන් කර තිබෙන්නේ. ඒ වාගේම යෞවන නාට්‍ය උළෙල වෙනුවෙන් රුපියල් මිලියන 10ක් වෙන් කර තිබෙනවා.

අද උදේ ඉඳලා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ ක්‍රීඩාව ගැන කථා කළා. ඒ වාගේම තරුණයා වෙනුවෙනුත් මේ අය වැයෙන් අතිවිශාල මුදලක් වෙන් කරලා ඉතා හොඳ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. මේ වසර අවසන් වනකොට මේ රටට ආදරය කරන හොඳ තරුණයෙක්, ශ්‍රී ලාංකික පුරවැසියෙක් ගොඩ නැඟීම වෙනුවෙන් කටයුතු සූදානම් කර තිබෙනවාය කියන එක මතක් කරමින්, මට කථා කරන්න මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මාණ්පුමිකු (වෛත්තියර්) ඉළෛයතම්පි සිරිනාත් අවර්කළුක්කු 8 නිමිඩංකළ්!

[ප.ව. 4.13]

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉළෛයතම්පි සිරිනාත්)
(The Hon. (Dr.) Elayathamby Srinath)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ! කෞරව උරුප්පිනර්කළේ! ඉළෛඤර් විවකාරංකළ් මර්‍රුම් විළෛයාට්ටුත්තුරෛ අමෛච්චු, කෛත්තොළිල් මර්‍රුම් තොළිල් මුයර්චියාණ්මෛ අපිවිරුත්ති අමෛච්චු ආකියවර්‍රින් මීතාන ඉන්‍රෛය කුළුනිලෛ විවාතත්තිලේ උරෛයාර්‍රර්‍රච් චන්තර්ප්පම් කිටෛත්තතෛයිට්ටු මකිළ්ච්චියටෛකින්‍රේන්. එමතු නාට්ටින් වටක්කු, කිළක්කුප් පකුතිකළිල් කටන්ත කාලත්තිලේ ඔරු යුත්තම් ඉටම්පෙර්‍රිරුන්තතු; ඉළෛඤර්කළ් පල්වේරු තිසෛකළිල් සෙන්‍රිරුන්තාර්කළ්. යුත්තත්තින් පින්පු 10 - 15 වරුටංකළාකියුම් අවර්කළුක්කාන ඔරු වළිකාට්ටල් ඉල්ලාමෛයාල් වේලෛවාය්ප්පුකළුක්කාක වෙළිනාටු කළුක්කුච් චෙල්ල වේණ්ටිය නිලෛමෛ කාණප්පටුකිර්‍රතු. ඉන්ත නිලෛමෛයෛය මාර්‍රියමෛක්ක වේණ්ටිය මිකප් පෙරිය තාර්මීකප් පොර්‍රුප්පු, මක්කළ් ආතරවුටන් ආට්චික්කු වන්තිරුක්කින්‍ර, 159 පාරාළුමන්‍ර උරුප්පිනර්කළෛක් කොණ්ටිරුක්කින්‍ර උංකළ් අරචාංකත්තිර්කු ඉරුක්කින්‍රතු.

වටක්කු, කිළක්කෛප් පොරුත්තළවිලේ විළෛයාට්ටුත් තුර‍ෛ මර්‍රුම් ඉළෛඤර්කළුක්කාන වේලෛවාය්ප්පුත් තුර‍ෛකළ් පාරියළවිලේ සීරළිවෛච් චන්තිත්තිරුක්කින්‍රන. අවර්කළුටෛය එතිර්කාලම් පර්‍රිය නිච්චයමර්‍ර නිලෛමෛ කාණප්පටුකින්‍රතු. විළෛයාට්ටුත්තුර‍ෛයෛප් පොරුත්ත වරෛයිල් කටන්ත කාලත්තිල් වටක්කු, කිළක්කිලේ, කුර්‍රිප්පාක මට්ටක්කළප්පු මාවට්ටත්තිලේ පල්වේරු වකෛයාන විළෛයාට්ටු වීරර්කළ් උරුවාකියිරුක්කින්‍රාර්කළ්. අංකුළ්ළ පුනිත මික්කේල් කල්ලූරි කූටෛප් පන්තාට්ටත්තිලේ අකිල ඉලංකෛ ෆීතියිලේ පුකළ් පෙර්‍රිරුන්තතු. ආනාල්, පටිප් පටියාක අතර්කුරිය වාය්ප්පුකළ් කිටෛක්කාමෛයාල් ඉප්පෝතු නාටළාවිය ෆීතියිලේ පෙරුමළවිලේ අතන් උර්වේකත්තෛක් කාට්ට මුටියාතිරුක්කින්‍රතු. ආකවේ, විළෛයාට්ටුත්තුර‍ෛ

அமைச்சின் ஊடாக மட்டக்களப்பு மாவட்டத்திலே விளையாட்டுத்துறை சம்பந்தமான செயற்றிட்டங்களை முன்னெடுக்க வேண்டிய பாரிய பொறுப்பு இந்த அமைச்சுக்கு இருக்கின்றது.

மேலும், மட்டக்களப்பு மாவட்டத்திலே மிகப் பிரதானமாக இருக்கின்ற Weber Stadiumஇல் இன்னும் பாரிய அபிவிருத்திப் பணிகளைச் செய்யவேண்டிய பொறுப்பு இருக்கின்றது. ஏனென்றால், அது நீதிமன்றக் கட்டடத்திற்கு அண்மையில் இருப்பதனால் விளையாட்டு நிகழ்வுகளைச் சீராக நடத்த முடியாமல், வேறு பல இடங்களில் அவற்றை நடத்தவேண்டிய நிலை இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டமானது, மட்டக்களப்பு வடக்கு வாகரைப் பிரதேசம், செங்கலடி, வாழைச்சேனைப் பிரதேசங்கள், படுவான்கரையைச் சேர்ந்த பட்டிப்பளைப் பிரதேசம் மற்றும் மட்டக்களப்பு தெற்கு களுவாஞ்சிக்குடிப் பிரதேசம் ஆகியவற்றை உள்ளடக்கிய மிகப் பெரிய பிரதேசமாக இருக்கின்றது. இவ்விடங்களில் சீரிய விளையாட்டு மைதானங்கள் இல்லாமையால் விளையாட்டு வீரர்கள் தரமற்ற, சிறிய சிறிய மைதானங்களிலே தங்களுடைய திறமைகளைக் காட்டவேண்டிய நிலை இருக்கின்றது. அண்மையில்கூட மட்டக்களப்பு மாவட்ட கபடி அணியானது இந்தியா சென்று கேரளாவிலே பாரிய வெற்றியைப் பெற்றிருக்கின்றது. இவ்வாறானவர்களை ஊக்குவிக்கும் வகையில் அந்த மாவட்டத்திலே விளையாட்டுத் துறையைப் பாரியளவு சீர்செய்ய வேண்டிய தேவையிருக்கின்றது.

அந்த மாவட்டத்திலே District Sports Officer ஒருவர் நிரந்தரமாக இல்லை; விளையாட்டுகளைப் பயிற்றுவிக்கின்ற coaches ஐவருக்கான வெற்றிடம் நிலவுகின்றது; பிரதேசங்களுக்கான 14 Sports Officersஇலே 7 பேர்தான் இருக்கின்றார்கள். இவ்வாறான ஆளணி, வளப் பற்றாக்குறையுடனும் விளையாட்டு மைதானங்கள் இல்லாமலும்கூட மட்டக்களப்பு மாவட்டத்திலே karate மற்றும் wrestling போன்ற விளையாட்டுகளில் தேசிய அளவில் சாதிக்கின்ற நிகழ்வுகள் நடந்து கொண்டிருக்கின்றன. கபடி மற்றும் கூடைப் பந்தாட்டத்தில் திறமை வாய்ந்த விளையாட்டு வீரர்கள் இருக்கின்றபோதும் அவர்களுக்கான வாய்ப்புகள் கடந்த காலங்களில் புறக்கணிக்கப்பட்டிருக்கின்றது. உங்களுடைய அரசாங்கம் சமத்துவத்தைப் பேணுகின்ற அடிப்படையில் எல்லா இடங்களுக்கும் சம அளவில் வசதிகளை வழங்குமென்றும், எதிர்வரும் காலங்களில் விளையாட்டுத் துறை அபிவிருத்திக்காக மிகப் பாரிய ஒதுக்கீடுகளைச் செய்யுமென்றும் மக்கள் நம்புகின்றனர். இந்த முதலாவது வரவு செலவுத்திட்டத்தில் மட்டக்களப்பு மாவட்டத்திற்கெனப் பாரியளவான நிதி ஒதுக்கீடுகள் இல்லாவிடினும் எதிர்வரும் காலங்களில் நாடளாவிய ரீதியில் செயற்படுத்தப்படவுள்ள திட்டங்களினூடாக மட்டக்களப்பு மாவட்டத்திலும் பாரியளவு அபிவிருத்திகளைச் செய்யவேண்டிய தேவையிருக்கின்றது.

மேலும், எமது மாவட்டத்தில் வேலை வாய்ப்பற்ற ஆயிரக் கணக்கான பட்டதாரிகள், இளைஞர்கள் இருக்கின்றனர். இவர்களுக்கான ஒரு தேசிய செயற்றிட்டம் உருவாக்கப்பட வேண்டும். வேலை வாய்ப்பின்மையால்தான் அவர்கள் வேறு பலவிதமான சமூகச் சீரழிவு நடவடிக்கைகளிலும் போதை வஸ்துப் பாவனையிலும் ஈடுபடுகின்றார்கள். அத்தோடு, சமூக ஊடகங்களில் வீணாக நேரத்தைச் செலவிடுகின்றார்கள். எனவே, வேலைவாய்ப்புகளை உருவாக்குகின்ற செயற் றிட்டங்கள் மட்டக்களப்பில் பாரியளவில் முன்னெடுக்கப்பட வேண்டும்.

எமது சக பாராளுமன்ற உறுப்பினர்கள் ஏற்கனவே கூறியதுபோன்று, மட்டக்களப்பு மாவட்டம் மிகப் பிரதானமாக விவசாயத்தையும் கடல் வளம் மற்றும் கால்நடை வளம் போன்றவற்றையும் நம்பியிருக்கின்றது. இவை தொடர்பான செயற்றிட்டங்களுக்கான முதலீடுகள் முன்மொழியப்பட வேண்டும். விவசாயிகள் தங்கள் நெல்லினை அறுவடை செய்ததன் பின்னர் அதனை உலர்த்துவதற்கான கருவி வசதிகளோ, செயற்றிட்டங்களோ இல்லை. மட்டக்களப்பு மாவட்டம் நெல் உற்பத்தியில் ஐந்தாவது இடத்தில் காணப்படுகின்றபோதும் அந்த விவசாய உற்பத்திகளைப் பாதுகாக்கக்கூடிய வகையில் கைத்தொழில் துறையை விரிவுபடுத்த வேண்டிய பிரதான தேவை இருக்கின்றது. அதுபோல், மீன்பிடித் துறையை வளப்படுத்தி மேம்படுத்தக் கூடிய வசதிகள் இல்லை. இதன் காரணமாக எமது நாடு மீனுணவுத் தேவைக்காகவும், அரிசித் தேவைக்காகவும் இறக்குமதிகளைச் செய்ய வேண்டிய நிலையில் இருக்கின்றது.

பால் உற்பத்தியைப் பெருக்குவதற்கான எந்தவிதமான ஊக்குவிப்பு நிகழ்வுகளும் அங்கு செயற்படுத்தப்படவில்லை. ஆறு இலட்சத்திற்கும் அதிகமான மாடுகள் இருக்கின்றபோதும் அவற்றுக்குத் தேவையான மேய்ச்சல் தரைகள் இல்லை. இந்தப் பிரச்சினையானது, மட்டக்களப்பு மாவட்டத்தில் பல பிரதேசங்களில் காணப்படுகின்றது. காலங்காலமாக நீடித்து வரும் மயிலத்தமடு, மாதவனை மேய்ச்சல் தரைப் பிரச்சினை இன்னும் தீர்க்கப்படவில்லை. ஆகவே, இப்புதிய அரசாங்கம் சமத்துவக் கொள்கையின் அடிப்படையில் எல்லா மாவட்டங்களையும் முன்னேற்ற வேண்டுமென்ற எண்ணத் துடன் இந்த விடயங்களைச் சீர்தூக்கிப் பார்த்து மிக விரைவான செயற்பாடுகளை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதற்கப்பால், எமது மட்டக்களப்பு மாவட்டத்தில் யுத்தத்திற்கு முன்னர் பல தொழிற்சாலைகள் காணப் பட்டதுடன், புதிய தொழிற்சாலைகளை உருவாக்கும் செயற்றிட்டங்களும் இருந்தன. அவற்றில் அங்குள்ள காகித ஆலை பெருமளவு வேலைவாய்ப்புகளை வழங்கிய இடமாக இருந்திருக்கின்றது. அச்சகக் கூட்டுத்தாபனம் மற்றும் ஐஸ் தொழிற்சாலைகள் போன்றவையும் அங்கே காணப்பட்டன. ஆனால், யுத்தத்தின் காரணமாகச் சேதமடைந்த அந்தத் தொழிற்சாலைகளை யுத்தத்தின் பின்னராவது அபிவிருத்தி செய்வதற்கான எந்தச் செயற்றிட்டங்களும் முன்னெடுக்கப் படவில்லை. யுத்தத்திற்குப் பின்னரான 15 வருட காலப்பகுதியில், எமது சக பாராளுமன்ற உறுப்பினர்கள் கூறியதுபோன்று, பல்வேறு முதலீட்டுத் திட்டங்களை வெளிநாட்டவர்கள்மூலம் கொண்டுசெல்வதற்குக்கூட தடை யாகக் கடந்தகால அரசாங்கங்கள் இருந்திருக்கின்றன. ஆகவே, இந்த விடயங்களை நிவர்த்தி செய்யவேண்டிய பாரிய பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. ஏனெனில், தமிழ் மக்கள் நிறைய நம்பிக்கைகளுடன் உங்களுக்கு வாக்களித் திருக்கிறார்கள்.

இந்த வரவு செலவுத்திட்டத்தில் உண்மையில் மட்டக் களப்பு மாவட்டத்துக்கான பாரிய முதலீட்டுத் திட்டங்களை நீங்கள் முன்வைத்திருக்கவில்லை. ஆனால், இந்திய நிதியுதவி யினூடான செயற்திட்டங்கள் முன்னெடுக்கப்படுமென்ற ஓர் உறுதிமொழியைத் தந்திருக்கிறீர்கள். இந்தத் திட்டங்கள் தொடர்பாக மிகச் சீர்தூக்கி ஆராய்ந்து பார்த்து, சிறப்பாக அவை முன்னெடுக்கப்பட வேண்டும். இவை சம்பந்தமான எந்த விடயங்களும் மக்கள் பிரதிநிதிகளாகிய எங்களுடன் கலந்தாலோசிக்கப்படுவதில்லை. ஆகவே, மாவட்டத்திலுள்ள அமைச்சர்கள், புத்திஜீவிகள், அங்குள்ள வளங்களைப் பாதுகாக்க விரும்புபவர்கள் மற்றும் மக்கள் பிரதிநிதிகளை ஒன்றிணைத்து இந்தச் செயற்திட்டங்கள் முன்னெடுக்கப்பட வேண்டிய தேவையிருக்கின்றது.

[ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා]

මට්ටක්කළප්පු මාවට්ටත්තිලේ කටන්ත කාලංකළිලේ මුන්නෙටුක්කප්පට්ට පල තිට්ටංකළ් ඉයර්කෙයෙච් සීරළිප් පතාකවුම් ඉයර්කෙක්කු මුරණාකවුම් ඉරුන්තිරුක්කින්රතු. උතාරණමාක, ඉල්මනෙට් අකළ්වු මර්රුම් ඉරාල් පණ්ණෙකළ් පෝන්ර පල්වේරු වකෙයාන සෙයර්පිට්ටංකළ් නාට්ටින් වළංකළෙච් සූරෙයාටුකින්ර වකෙයිලුම් ඉයර්කෙක්කු එතිරානවෙයාකවුමේ ඉරුන්තිරුක්කින්රතු. එමතු පකුතියිලේ පාරියළවිලාන විවසායච් සෙය්කෙයෙ මිකච් සිරප්පාන මුරෙයිල් සෙය්යක්කූටිය වසති ඉරුක්කින්රතු. අන්ත වකෙයිල්, විවසාය උර්පත්තියෙ මේම්පටුත්තුවතර්කාන පාරිය මුතලීට්ටුත් තිට්ටංකළ්, කුරිප්පාක තෙන්නෙ මර්රුම් මුන්තිරිකෙ පෝන්රවර්රින් උර්පත්තියෙප් පෙරුක්කි, අවර්රෙ එර්රුමති සෙය්වතර්කාන මුතලීට්ටුත් තිට්ටංකළ් පෝන්රවර්රෙ නීංකළ් කොන්ටුවර වේන්ටුම්. ඒලවේ, මට්ටක්කළප්පු මාවට්ටත්තිල් ඉව්වාරාන උර්පත්තිච් සෙය්කෙයිල් මක්කළ් ඊටුපට්ටාලුම්, අවර්කළ් කුරෙන්ත විලෙයිලේයේ අවර්රෙ විර්කවේන්ටිය නිලෙ ඉරුක්කින්රතු. ආකවේ, ඉන්ත විටයංකළිලේ නීංකළ් මුන්මාතිරියාකච් සෙයර්පට වේන්ටුම්. නීංකළ් සමත්තුවත්තෙප් පේණුකින්රවර්කළ් එන්ර නම්පික්කෙ එංකළුක්කු ඉරුක්කින්රතු. ඉතුපෝන්ර තිට්ටංකළුක්කාක ඉන්ත මුරෙ වරවු සෙලවුත්තිට්ටත්තිල් නිති ඔතුක්කප්පටාතිරුන්තාලුම්කූට, අතර්කාන සාත්තිය වළ ආය්වුකළෙ මාවට්ට මට්ටත්තිලේ මුන්නකර්ත්ති, ඔරු නම්පික්කෙයෙ නීංකළ් එමක්කුත් තරවේන්ටිය තේවෙයිරුක්කින්රතු.

තමිල් මක්කළ් කටන්ත කාලංකළිලේ පාතික්කප්පට්ටවර්කළ් එන්ර අටිප්පටෙයිල්, නීංකළ් සරියාන මුරෙයිලේ උංකළුටෙය නටවටික්කෙකළෙ මේර්කොළ්ළුකින්රපෝතු, එංකළුටෙය පාරිය ඔත්තුළෙප්පුකළෙත් තරක්කූටියතාක ඉරුක්කුම්. ආකවේ, නාන් ඉංකු කූරියපටි ඉන්ත අරසාංකත්තිනාල් ඉළෙඤර්කළුක්කු වේලෙවාය්ප්පිනෙප් පෙර්රුක් කොටුප්පතර්කු ඒර්ර වකෙයිල්, අංකු මුතලීට්ටුත් තිට්ටංකළ් උරුවාක්කප්පට වේන්ටුම්. මට්ටක්කළප්පු මාවට්ටත්තිලේ විළෙයාට්ටුත් තුරෙයෙ මේම්පටුත්ත වේන්ටුම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කෞරව උරුප්පිනර් අවර්කළේ, උංකළුටෙය නේරම් නිර්රවටෙන්තු විට්ටතු.

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉළෙයතම්පි සිරිනාත්)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Sir, please give me one more minute.
අතනෝටු ඉණෙන්තතාක, කෛවිටප්පට්ට උර්පත්තිච් සාලෙකළෙ මීණ්ටුම් සෙයර්පටුත්ත මුයර්සිකළෙ මේර්කොළ්ළ වේන්ටුම්. පිරතානමාක, කාකිත ආලෙයින් සෙයර්පාටුකළෙප් පාරියළවිල් කොන්ටුසෙල්වතර්කාන මුතලීට්ටුත් තිට්ටත්තෙච් සෙයර්පටුත්තුවීර්කළෙන්රු නම්පුකින්රේන්. කටන්ත අමෙච්සු සාර් ආලෝසනෙක් කූට්ටත්තිලුම් ඉතුපර්රිච් සොන්නපෝතු, අතු සම්පන්තමාක මේර්කොන්ටු නටවටික්කෙ එටුප්පතාක අමෙච්සර් අවර්කළ් උරුතියළිත්තිරුන්තාර්. ආකවේ, අවරතු උරුතියළිප්පෙ එර්රුක්කොන්ටු, එතිර්කාලත්තිලේ ඔරු සිරන්ත තිට්ටම් මුන්නෙටුක්කප්පටුම් එන්ර නම්පික්කෙයුටන් විටෙපෙරුකින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.22]

ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන කාලය අනුව විශේෂයෙන්ම තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් දක්වන්න මම බලාපොරොත්තු වෙනවා. අද දවසේදී මතු වුණු කරුණුවලට යම් උත්තර ප්‍රමාණයක් දෙමින්, අපි කරන්න යන කටයුතු පිළිබඳව යම් අදහසක් ඉදිරිපත් කරන්න අපි උත්සාහ දරනවා. හිටපු ඇමතිවරු, දැන් විපක්ෂයේ සිටින සමහර මන්ත්‍රීවරු මේ සභාවට ඇවිල්ලා, "මම කළා, මම කළා, මම කළා" කියා කියනවා ඇරෙන්න, වෙන මොකක්වත් කිසිම සාකච්ඡාවක් නැහැ. හැබැයි, අපේ රටේ තිබෙන රජයේ ආයතනවලට ගිහිල්ලා බැලුවාට පස්සේ ඒ උදවිය කරපු තරම බලාගන්න පුළුවන්කම තිබෙනවා. මේ ආයතන පිළිබඳව නැවත විමර්ශනය කරන්න ගත්තාට පස්සේ අපට බලන්න පුළුවන්කම තිබෙනවා, "මම කළා, මම කළා, මම කළා" කියලා කිව්වාට කරලා තිබෙන්නේ මොනවාද කියලා.

අපි මේ සාකච්ඡාවෙන් ගන්නේ මොකක්ද? 2025 අවුරුද්දේ අය වැය ගැන කියන්නේ මොකක්ද? අපි කියන්නේ, මේක පුරවැසි අය වැයක් කියලා. මේක මහ ජනතාවගේ අය වැයක්. තාරුණ්‍යයේ අය වැයක්. අපි එහෙම කියන්නේ ඇයි? ඒකට හේතුවක් තිබෙනවා. මීට පෙර, පසුගිය අවුරුදුවල අපේ මේ සභාව දෙදරන්න අය වැය සාකච්ඡා සම්බන්ධයෙන් විවාද කර තිබෙන බව අපි දන්නවා. තරුණයන්ට අර මහ පෙන්වීම කරනවා කියනවා; සවිබලගන්වනවා කියනවා. හැබැයි, අවසානයේදී සවිබලගැන්වූයේ අපේ රටේ තරුණ පරම්පරාව නොවෙයි, ඒ නායකයන්ගේ පුත්තු; ඒ නායකයන්ගේ දුව, පුතා තමයි සවිබලගැන්වූයේ. ඒවා තමයි මේ ආයතන ටික ඇතුළේ කරලා තිබුණේ. ඒ විතරක් නෙවෙයි. අවසාන වෙලාවේ සමහර අයගේ දේශපාලන projects තමයි, ජනාධිපතිවරණය සමයේ සමහර අයගේ projects තමයි මේ රටේ හැමදාම ව්‍යාපෘති ඇතුළේ කරමින් තිබුණේ. හැබැයි, ඒවා කරද්දී සද්දයක් නැතිව ඉඳලා, ඒ දේවල් කරපු උදවියට ආවඩලා, ඒ වෙනුවෙන් ගුණ ගායනා කරලා, ඒ වෙනුවෙන් ප්‍රශස්ති කියලා දැන් ඇවිල්ලා කියනවා, "මම කළා, මම කළා, මම කළා" කියලා. අපේ දේශපාලනය ඊට වඩා වෙනස්. ඒ නිසා, "මම කළා" කියන එක නොවෙයි, අපි සියලුදෙනා එකතු වෙලා මේ නව තරුණ පරම්පරාව නහා සිටුවීමේ මහා පුරවැසි අය වැයක ශක්තිමත් පියවරක් තමයි අපි මේ අය වැය ඇතුළේ සටහන් කර තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආසන්නම උදාහරණයක් විධියට මීට පෙර සිදු වුණු දෙයක් ගැන මම කියන්නම්. 2024 අවුරුද්ද වෙනුවෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා අය වැයක් ඉදිරිපත් කළා. ඒ අය වැය ඇතුළේ විශේෂයෙන්ම ජාතික තරුණ සේවා සභාවට රුපියල් මිලියන 1,450ක් වෙන් කළා. හැබැයි, ජනාධිපතිවරණය කිට්ටු වෙද්දී එතුමා පෞද්ගලිකව ජනාධිපතිවරණයේ campaign එක වෙනුවෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කර ගත්තා. ඒ රුපියල් මිලියන 1,000න් පසුගිය අවුරුද්දේ ජාතික තරුණ සේවා සභාවට shows පවත්වන්න අදාළ කරන වැඩකටයුත්ත හැදුවා. අද මම ඒවා ගැන කථා කරන්න යන්නේ නැහැ. ඒ නිසා තමයි අද වන විට ඒ ආයතනයේ නිලධාරින්ට COPE කමිටුව ඉදිරියට ඇවිල්ලා මේ දේවල් ගැන කියමින් විලාප නියන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ සභාවේ අපි ඉස්සරහා සිටින විපක්ෂයේ මන්ත්‍රීවරු, පසුගිය ආණ්ඩුවල ඇමතිවරු වෙලා, අගමැතිවරු

වෙලා, ජනාධිපතිවරු වෙලා දාපු සෙල්ලම්වල බේදවාචක තමයි අද ජාතික තරුණ සේවා සභාව හරහා, මේ ක්‍රීඩා ආයතන හරහා දෙදරුම් කමින් තිබෙන්නේ. දැන් අපට ඒ පිළිබඳව සොයන්න අවශ්‍ය වටපිටාව තිබෙනවා. තාරුණ්‍යයේ මහ ගෙදර බවට මේ ආයතනය පත් කර ගැනීමේ ව්‍යායාමයට තමයි අද අපි මැදිහත් වෙමින් තිබෙන්නේ. ඒ වෙනුවෙන් තමයි මේ අය වැයෙන් අපි මෙවර මුදල් වෙන් කර තිබෙන්නේ.

මේ අය වැය ඇතුළේ අපේ දිශානතිය මොකක්ද? මොකද, හැමදාම ඕනෑ තරම් මුදල් වෙන් කළාට අපේ රටේ තරුණ තරුණියන් නහා සිටුවීම, ඔවුන් සවිබලගැන්වීම සිදු වුණේ නැහැ. ඒ නිසා මේ පුරවැසි අය වැය ඇතුළේ අපේ දැක්ම මොකක්ද? එක පැත්තකින්, නිවහල් චින්තනයක් හරහා තෘප්තිමත් තාරුණ්‍යයක් ගොඩනැඟීමේ අරමුණින් තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරමින් තිබෙන්නේ. ඒ වාගේම, මෙහි අපේ ඉලක්කය බවට පත් වෙන්නේ කවුද? ඒ ඉලක්කය තමයි, එක පැත්තකින් Generation C, නැත්නම් Generation Alpha. ඒ නිසා ඔවුන් වෙනුවෙන් තමයි අපි මේ හැමදේම කරන්නේ. මේක අවුරුදු 5කට හදපු එකක් නොවෙයි. අඩුම තරමේ තව අවුරුදු 20කට, 30කට plan කරලා තමයි අපි මේ තරුණ පරම්පරාවත් එක්ක ගනුදෙනු කරන්න ඕනෑකම තිබෙන්නේ. තරුණ පරම්පරාව කියන්නේ ලබන අවුරුද්දේ මැතිවරණයෙන්, නැත්නම් ඊළඟට තිබෙන මැතිවරණයෙන් තීරණය වන කෙටිකාලීන දෙයක් නොවෙයි. තව generations කිහිපයක් මත පදනම් කර ගත්ත අය වැයක් ඉදිරිපත් කරන්න අපි මැදිහත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, අද ලෝකයේ Generation C ගැන, Generation Alpha ගැන සාකච්ඡා කරන බව. ඒ වාගේම අප තේරුම් ගන්න ඕනෑ, ශ්‍රී ලාංකීය තරුණ පරම්පරාව කියන්නේත් වෙනස්ම තාරුණ්‍යයක් සහිත තරුණ පරම්පරාවක් බව. අපේ රටේ තරුණ පරම්පරාව කියන්නේ අපි දැන් මේ කියන සමාජ සන්දර්භය ඇතුළේ ප්‍රශ්න කරනවා වාගේම, ඒවාට විසඳුම් හොයන තරුණ පරම්පරාවක්. ඒ නිසා තමයි අද මේ පාර්ලිමේන්තුවේ මම සිටින මේ පැත්තත් ඔය පැත්තත් මහජන බලයෙන් පුරවන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ. ඔවුන් වෙනුවෙන් තමයි අපි මේ අය වැය ඉදිරිපත් කිරීමට මැදිහත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි සූදානම් වෙන්නේ සුපුරුදු පරිදි තරුණයාට හෙටක් හැදීමට නොවෙයි. අනාගතය වෙනුවෙන් අපේ රටේ තරුණ පරම්පරාව නිර්මාණය කිරීමේ පදනම තමයි අපි මේ අය වැය තුළට ඇතුළත් කරන්න සූදානම් වෙමින් තිබෙන්නේ. ඒ වෙනුවෙන් අප ගත් යෝධ පියවරේ පළමු අඩිය තැබීමට තමයි මේ අය වැය තුළින් අපි මැදිහත් වෙලා තිබෙන්නේ.

ඊළඟට, හිටපු ඇමතිවරයෙක් තරුණ සේවා සභාවේ යෞවන සමාජ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. මම ඒ ගැන කියන්න කැමැතියි. මොකද, මීට පෙර හිටපු එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරුන්ට යෞවන සමාජ පිහිටුවන්න ඕනෑකමක් තිබුණේ නැහැ; යෞවන සමාජ සම්මේලන පවත්වන්න ඕනෑ වුණේ නැහැ. ඒ වෙනුවෙන් shows තිය තියා හිටියා. හැබැයි අපි මේ යෞවන සමාජ නව "ස්මාර්ට්" යෞවන සමාජ බවට පත් කිරීම සඳහා මේ වසර තුළ නිශ්චිත වැඩ පිළිවෙළක් සකස් කරන්න රුපියල් මිලියන 15කට වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් තරුණ සේවා සභාව හරහා ග්‍රාමීය, දිස්ත්‍රික්ක, ජාතික මට්ටමෙන් යෞවන සමාජ අඛණ්ඩව ගොඩ නැඟීමේ ක්‍රියාවලියක් කරගෙන යන්න අප සූදානම්. ඒ වෙනුවෙන් අපි මේ යෞවන සමාජ සියල්ල "ස්මාර්ට්" සමාජ බවට පත් කරනවා. ඒ විතරක් නොවෙයි. අපේ රටේ තරුණ තරුණියන්ගේ සිහිනය මහජන ආණ්ඩුවත්, යෞවන සමාජත් අතර සම්බන්ධය තුළින් යථාර්ථයක් බවට පත් කරන්න අපි සූදානම් වෙනවා. ඒ වාගේම අපේ ප්‍රධාන තේමා පාඨය වන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යථාර්ථයක් බවට පත් කිරීමේ කොටස්කරුවන් බවටත් යෞවන සමාජ පත්කර ගන්න අපි සූදානම් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැඩ පිළිවෙළ ඇතුළේ අපි තවත් සංකල්පයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ තමයි, බහුවිධ මධ්‍යස්ථාන - multimodal centres, MMCs - සංකල්පය. අප ඒ වෙනුවෙන් රුපියල් මිලියන 50කට වැඩි ප්‍රමාණයක් වෙන් කරන්න යෝජනා කරලා තිබෙනවා. මෙහි අදහස මොකක්ද? අපි දන්නවා, අපේ රටේ තරුණ පරම්පරාව -අද දවසේ නොවෙයි, හෙට දවසේ තරුණ පරම්පරාව- තෝරා ගැනීම, ඔවුන් පිළිබඳව සාකච්ඡා කිරීම, ඔවුන් පිළිබඳව තිබෙන අභියෝගය අප භාර ගත යුතුයි; අධ්‍යයනය කළ යුතුයි. ඒ වෙනුවෙන් තමයි අපි තරුණ පරම්පරාවත් එක්ක ගනුදෙනු කරන්න ඕනෑකම තිබෙන්නේ. ඒ නිසා, මේ බහුවිධ මධ්‍යස්ථාන නව සංකල්පයක් අනුව පවත්වාගෙන යමින්, යොවුන් සේනාංකයත් ඒකාබද්ධ කරගෙන අපේ රටේ තරුණ පරම්පරාව එතැනට සම්බන්ධ කරන්න අප සූදානම්.

මොකක්ද මේ MMC කියන්නේ? MMC කියන්නේ ජීවිතය විඳින අපේ රටේ තරුණ පරම්පරාව එකතු කරන තැනක්; සින්දු කියන, සින්දු පිළිබඳ විචාර තිබෙන, සිනමාපට රස විඳින්දනය කරන තැනක්. ඒ වාගේම ඒ මධ්‍යස්ථාන තාක්ෂණයේ තෝතැන්නක් බවට පත් කරන්නත් අපි සූදානම් වෙනවා. ඒ විතරක් නොවෙයි. විද්‍යාව, මිථ්‍යාව, ඒ වාගේම ආදරය, ඒ වාගේම දේශපාලනය, ඒ වාගේම ආර්ථිකය පිළිබඳව සංවාද කරන, තර්ක කරන තැනක් බවට MMCs පත් කරන්න අපි සූදානම් වෙනවා. ඒ වෙනුවෙන් තමයි අපි මේ MMCs කියන බහුවිධ මධ්‍යස්ථාන නිර්මාණය කරන්න යන්නේ. ඒ නිසා නවීන තාරුණ්‍යයේ, සාමූහිකත්වයේ, ඒ වාගේම ආදරයේ තෝතැන්නක් වශයෙන් රට පුරාම MMC මධ්‍යස්ථාන නිර්මාණය කිරීමට අපි මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා; ඒ වෙනුවෙන් අප මැදිහත් වෙනවා.

ඒ විතරක් නොවෙයි. අපේ රටේ තරුණ පරම්පරාවට අපි යම් දිශානතියක් පෙන්වා දිය යුතුයි. හැබැයි අප ඒ වෙනුවෙන් ආරම්භක පියවරක් ගත යුතුයි. ඒ වෙනුවෙන් අපි "හවසට IT" කියන වැඩසටහන මේ අය වැය තුළ හඳුන්වා දීලා තිබෙනවා. එහි බලාපොරොත්තුව මොකක්ද? එහි බලාපොරොත්තුව මේකයි. අපේ රටේ තරුණ පරම්පරාව ඉන්නවා. අපි දන්නවා, පසුගිය කාලයේ මේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ එක පැත්තකින් භාෂාව, අනෙක් පැත්තෙන් IT දැනුම ඔවුන්ට අත්පත් කර ගන්න බැරිවීමේ ගැටලුවක් තිබෙන බව.

ඔවුන්ගේ තරුණ කාලයත් ක්‍රමයෙන් ගෙවෙමින් තිබෙනවා. නමුත් අපි ඒ තරුණ පිරිස වෙනුවෙන් ජාත්‍යන්තර මානව වෙළෙඳ පොළෙන් යම් පංගුවක් අත්පත් කරගන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අපි "හවසට IT" කියන වැඩසටහන හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ වෙනුවෙන් අපි දිස්ත්‍රික්ක 25 පුරාම පැය 100ක මූලික පාඨමාලාවක් විශේෂයෙන්ම IT දැනුමත්, ඉංග්‍රීසි දැනුමත් පදනම් කරගෙන ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. අපේ රටේ සිටින තරුණ පරම්පරාව ඒකට එකතු කරගන්න අපි බලාපොරොත්තු වෙනවා. එතැනින් පසුව ප්‍රධාන පාඨමාලා 6ක් තරුණ තරුණියන්ට ලබා දීමට අපි සූදානම් කර තිබෙනවා, විශේෂයෙන්ම ජාත්‍යන්තර මානව වෙළෙඳ පොළේ පංගුවක් අත්පත් කර ගැනීම වෙනුවෙන් මැදිහත් වෙන්න. එම පාඨමාලා 6 තුළින් විශේෂයෙන්ම online marketing, game development, digital marketing ඇතුළු IT ක්ෂේත්‍රය පදනම් කර ගත් ජාත්‍යන්තර මානව වෙළෙඳ පොළ අත්පත් කර ගත හැකි ක්‍රියාවලියකට මැදිහත් වෙන්න අප සූදානම් වෙනවා.

[ගරු එරංග ගුණසේකර මහතා]

ඒ විතරක් නොවෙයි. මේ ක්‍රියාවලිය ඇතුළේ අපි තවත් සංකල්පයක්, එනම් V4R කියා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරනවා. එම වැඩ පිළිවෙළ තුළින් අපි බලාපොරොත්තු වන්නේ මේකයි. අපි දන්නවා, අපේ රටේ සිටින තරුණ පරම්පරාව තුළ නවෝත්පාදකයන්, නව ව්‍යවසායකයන් ඉන්න බව. නමුත් ඔවුන්ට නිසි මඟ පෙන්වීමක් නැහැ, ඔවුන්ට අවශ්‍ය කරන මැදිහත්වීම ලැබෙන්නේත් නැහැ. නමුත් අපි සූදානම්, V4R digital platform එක හරහා අපේ රටේ සිටින තරුණ පරම්පරාවට, නව ව්‍යවසායකයන්ට, නව නිපැයුම්කරුවන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ සඳහා මේ digital platform එකට සම්බන්ධ වෙන්න ඔවුන්ට පුළුවන්. V4R එක සඳහා අපි විශේෂඥ කමිටුවක් පත් කරනවා. ඒ කමිටුව විසින් ඔවුන්ට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙනවා. මේ රටේ තරුණ ව්‍යවසායකයන් බිහි කර, ඒ අය ඉදිරිපත් කරන ව්‍යාපෘති සාර්ථකද යන්න සොයා බලා ඒ වෙනුවෙන් අවශ්‍ය මැදිහත්වීම් කිරීම වෙනුවෙන්, ඔවුන්ට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම වෙනුවෙන් නව V4R කියන digital platform එක ආරම්භ කරන්න අපි මැදිහත් වෙනවා.

දැන් මේ සභා ගර්භය තුළ නැති වුණත්, චන්මන් විපක්ෂයේ සිටින හිටපු ඇමතිවරයෙක් ලොකු සද්දෙකින් ගොඩක් දේවල් කියාගෙන, කියාගෙන ගිය ආකාරය අපි දැක්කා. එතුමා කිව්වා, ජාතික තරුණ සේවා සභාවේ සබරගමුව පළාතේ හිටපු අධ්‍යක්ෂවරයෙකු ඉවත් කර තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. එම නිලධාරියා ඉවත් කර තිබෙන්නේ එතුමා කර තිබෙන මූල්‍ය වංචාවක් නිසා සහ අසත්‍ය ලේඛන සකස් කිරීමක් නිසා. ඒවා හොයා ගත්තේ අපි නොවෙයි. විගණකාධිපතිවරයාගේ වාර්තා පදනම් කරගෙන තමයි එම නිලධාරියාව එසේ ඉවත් කර තිබෙන්නේ. නමුත්, ඒ කිසි දෙයක් ගැන හොයන්නේ නැතුව කොහේ හරි කියපු දෙයක් අල්ලාගෙන මෙතැන ඒ දේවල් කියවා එළියට යනවා. එම නිසා අපි ඒ ඉදිරිපත් කිරීම පිළිබඳව බරපතළ අප්‍රසාදයක් පළ කරන අතර, මේ රටේ තරුණ පරම්පරාව ශක්තිමත්ව නඟාසිටුවීමේ පුරවැසි අය වැයේ පංගුකරුවන් බවට පත් වෙන්න කියා ඔබ සැමට ආරාධනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ඔබතුමාට බොහොම ස්තුතියි, මට මේ කාල වේලාව ලබා දුන්නාට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.34]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ඇමති ධුරය දරන, අපේ ගරු චතුරංග අබේසිංහ මැතිතුමා නියෝජ්‍ය ඇමති ධුරය දරන අමාත්‍යාංශය පිළිබඳව තමයි මා මුලින්ම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඔවුන් දෙදෙනාම මගේ මිත්‍රයන්. මම ඔවුන් දෙදෙනාටම සුබ පතනවා. ඒ වාගේම ඔබතුමන්ලාට මේ කර්තව්‍යය කරගෙන යන්න හැකි වෙයි කියා මම බලාපොරොත්තු වෙනවා.

මේ අවස්ථාවේදී මම කාරණා කිහිපයක් පිළිබඳව විවේචන ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ හදන්න යන්නේ නිෂ්පාදන ආර්ථිකයක්, ඒකට ජනතාව සහභාගි කරගන්න ඕනෑ, ඔවුන්ට සාධාරණ ලෙස ඒ ප්‍රතිලාභ බෙදී යන්න ඕනෑ කියලා. ඕක තමයි කවුරුත් කරන්න බලාපොරොත්තු වුණේ සහ වෙන්නේ. ඒක තමයි අපේ "Economic Blueprint" එකේත් තිබෙන්නේ. ඒ කියන්නේ, උසස් සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් අපි හදන්නේ කොහොමද කියන එකයි. නමුත්, ගැටලුව වන්නේ අපි කොහොමද ඒක කරන්නේ කියන එකයි.

එදා ඔබතුමන්ලා ඔය ප්‍රතිපත්ති ප්‍රකාශනය නිකුත් කරනවාට වඩා, අපි ප්‍රතිපත්ති ප්‍රකාශනය නිකුත් කරනවාට වඩා වෙන තැනකයි අද ලෝකය තිබෙන්නේ. ට්‍රම්ප් ජනාධිපතිතුමා බලයට ආ පසු සම්පූර්ණයෙන්ම මේ dynamics වෙනස් වෙලා තිබෙනවා. ඒ සඳහා අපේ strategies වෙනස් කරගන්නේ කොහොමද කියන එකත් මේ පාර්ලිමේන්තුවේදී අද සාකච්ඡා වුණා. එතැනදී ඔබතුමා කිව්වේ, "අපි අපනයන ආර්ථිකයක් කරා තමයි ගමන් කරන්නේ. අපනයන ආර්ථිකයක් හදන්න තමයි අපේ දැඩි අවශ්‍යතාව තිබෙන්නේ" කියලායි. එහෙම නම් ප්‍රතිපත්තිමය වශයෙන් අපි කළ යුත්තේ කුමක්ද? අපනයනය කරන්න ඕනෑය කියලා කියන්න ලෙහෙසියි. ඔබතුමා කිව්වා, 2030 වර්ෂය වෙනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 28කද කොහේදෝ අපනයන ආදායමක් කර්මාන්ත හරහා ලබා ගන්න බලාපොරොත්තු වෙනවා කියලා. ඒ වාගේ කථාවක් තමයි මට ඇහුණේ. දැන් මොනවාද අපි අපනයනය කරන්නේ? ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් ගන්නා තීරණ මොනවාද?

ගරු ඇමතිතුමනි, ආර්ථික පරිවර්තන පනත - Economic Transformation Bill එක - දැන් මා ළඟ තිබෙනවා. ඔබතුමන්ලා මේ පනතට විරුද්ධව නඩු දැම්මා. ගරු නියෝජ්‍ය අමාත්‍ය සුනිල් වටගල මැතිතුමනි, ඔබතුමා එදා නීතිඥවරයා වශයෙනුත්, ගරු හර්ෂණ නානායක්කාර ද මැතිතුමාද, ගරු සූරියප්පෙරුම මැතිතුමා ද කියලා මම දන්නේ නැහැ, ඒ දෙදෙනාගෙන් එක්කෙනෙකුත් මේ ආර්ථික පරිවර්තන පනතට විරුද්ධව නඩුවක් දැම්මා. ඔබතුමන්ලාගේ තර්කය වුණේ, ආර්ථික කොමිසම අතිමහත් ලෙස අපනයන සහ ආයෝජන ආර්ථිකයක් නිර්මාණය කිරීමට අනුග්‍රහය දෙනවා, ඒක විදේශ විනිමය ඉතිරි කරන ආනයන ආදේශන කර්මාන්තය නොසලකා හැරීමක්ය කියන එකයි. එම කාරණයටයි ඔබතුමන්ලා විරුද්ධ වුණේ. ඒක ඔබතුමන්ලා විරුද්ධ වූ පළමු කාරණයයි.

ඔබතුමන්ලා විරුද්ධ වුණු දෙවැනි කාරණය තමයි, දේශීය ආයෝජකයන්ට ලැබෙන සැලකිල්ලට නොඅඩු සැලකිල්ලක් විදේශ ආයෝජකයන්ට ලැබෙනවා කියන එක. ඒකටත් ඔබතුමන්ලා විරුද්ධ වුණා. දැන් අපි කල්පනා කරන්න ඕනෑ, ඔබතුමන්ලා එදා කළේ හරි දෙයක්ද, නැද්ද කියලා. ඔබතුමන්ලා ඒ තර්කය හේතුවෙන් ජූනි මාසයේ 4වෙනි දා තමයි සුප්‍රීම් උසාවියට ගියේ. මා මිත්‍ර ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමන්ලාගේ තර්කය අදටත් ඒකමද, නැත්නම් වෙනස් ද කියලා. දැන් මේ ගරු සභාවේ ඇමතිවරුන් ඉන්නවා, ඒ කවුරුවත් ඒකට පිළිතුරු දෙන්නේ නැහැ. කමක් නැහැ. මොකද, ඒ තර්කය වෙනස් විය යුතුයි. ඔය තර්කය වෙනස් නොකර ඔබතුමන්ලාට ඔය බලාපොරොත්තු වෙන අපනයන ආර්ථිකය හදාගන්න බැහැ.

අය වැය කථාවේදී ගරු ජනාධිපතිතුමා කිව්වා, කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වය - Regional Comprehensive Economic Plan, RCEP - සහ අනෙකුත් ගිවිසුම් හරහා ආසියානු සංවිධානයේ රටවල් සමඟ ආර්ථික සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ නිදහස් වෙළෙඳ ගිවිසුම් - FTA - ජාලය පුළුල් කරන්න ඕනෑය කියලා. ඒක හරි. අපි ඇමෙරිකාවට විශාල ලෙස අපනයනය කරනවා, ප්‍රධාන අපනයනකරුවෙකු විධියට. නමුත්, ට්‍රම්ප් කොයි

විධියට හැසිරෙයි ද කියලා අපි දන්නේ නැහැ. එතුමා හිතන්නේ නැහැ, ප්‍රමුඛතාව දෙන්න ඕනෑද, නැද්ද කියලා. කෙළින්ම එක අත්සනක් ගහනවා, ඔක්කෝම අයින් කරලා දානවා. මම හිතන විධියට, ලංකාව තිබෙන්නේ සියවෙනි ස්ථානයේ. ඇමෙරිකාව කියන්නේ, වෙළෙඳ ශේෂයක්, අතිරික්තයක් තිබෙන රටක්. අපට අපනයන ආදායම තිබෙන්නේ ඩොලර් බිලියන දෙකහමාරක් වාගේ ප්‍රමාණයක්. නමුත් කාටවත් කියන්න බැහැ, මේක පොඩි රටක්, මොවුන්ට අපි සම්බාධක දැම්මොත් ප්‍රශ්නයක් වෙයි කියලා. ලොකු රටද, පොඩි රටද කියන්නේ නැතිව සමහර විට ඔක්කෝටම මේක කරන්න ඉඩ තිබෙනවා. ඒ නිසා මම අහගෙනයි, Foreign Affairs Ministry Vote එකේදී විජිත හේරත් ඇමතිතුමා කියලා තිබුණා ලු, ඔවුන් ඇමෙරිකාවට යන්න බලාපොරොත්තු වෙනවා, ගිහිල්ලා මේ ගැන සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. ඒක කරන්න පුළුවන් නම් හොඳයි. මොකද, එදා මම ගරු මංගල සමරවීර හිටපු ඇමතිතුමා සමඟ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමති හැටියට වැඩ කරනකොට GSP Plus සහනය නැවත ලබා ගැනීම සඳහා මම තමයි point man හැටියට යැව්වේ. මම දන්නවා, ඒක කොච්චර අමාරු කර්තව්‍යයක් වුණාද කියලා. අපි European Parliament එකට ගිහිල්ලා දවස් ගණන් සාකච්ඡා කළා. ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා එදා මන්ත්‍රීවරයෙකු විධියට අපිත් එක්ක හිටියා, වෙනත් වැඩකට ගිහිල්ලාත්. ඒක ලෙහෙසි කාරණාවක් නොවෙයි. ඉතින් ඒක කරලා සහයෝගය දෙන්න පුළුවන් නම් අපි උපරිමයෙන් දෙනවා. නමුත්, ඊට එහා ගිහිල්ලා අපි කල්පනා කරන්න ඕනෑ අනෙක් marketsවලට අපි enter වෙන්නේ කොහොමද කියලා, ඒ වාගේම අනෙක් රටවල් සමඟ අපි අපේ අපනයන දියුණු කරන්නේ කොහොමද කියලා. ඇමෙරිකාවේ ඒ තිබෙන තත්ත්වය රඳවා ගන්න ඕනෑ. අපට පුළුවන් නම් specialized trade agreement එකකට යන්න ඕනෑ. සමහර රටවල් specialized trade agreementsවලට ගිහිල්ලා තිබෙනවා. බලන්න, නරේන්ද්‍ර මෝදි අගමැතිතුමා ගිහිල්ලා මොකක්ද කළේ? එතුමා ඩොනල්ඩ් ට්‍රම්ප් හමුවෙලා කිව්වා, හරි, ඔයගොල්ලන්ගේ Harley-Davidson motorcyclesවලටයි, Kentucky Bourbonවලටයි පනවා තිබෙන බදු අපි අඩු කරන්නම් කියලා. ඊට පස්සේ ඔවුන් කිව්වා, ඔයගොල්ලන්ගේ F-35 Aircraft අපි ගන්නම්, ඔයගොල්ලන්ගේ තෙල් අනෙක් රටවලට වඩා මිල වැඩි වුණාට අපි ඔයගොල්ලන්ගෙන් ගන්නම් කියලා. නමුත්, අපට එහෙම ශක්තියක් නැහැ. ඒ නිසා මේ transaction එක, මේ negotiation එක අපට ඉතාම බුද්ධිමත්ව කරන්න සිද්ධ වෙනවා.

අපි RCEP එකට බැඳෙන්නේ කොහොමද? RCEP එක කියන්නේ, ලෝකයේ දැනට තිබෙන ලොකුම trade agreement එක. මම හිතන විධියට, ලෝකයේ තිබෙන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 30ක් විතර RCEP එක ඇතුළේ තිබෙනවා. දැන් මේ RCEP එකට join වෙන්න නම් අතිශයින්ම අර ඔබතුමන්ලාගේ කලින් තිබුණු අදහස සුප්‍රීම් උසාවියට ගිය position එක අංශක 180කින් වෙනස් කරන්න වෙනවා; ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය අංශක 180කින් වෙනස් කරන්න වෙනවා.

උදාහරණයක් හැටියට ගත්තොත් අපට servicesවලටත් ඒක විවෘත කරන්න වෙනවා. මෙච්චර කල් භාණ්ඩ -goods- අපනයනය සම්බන්ධ වෙළෙඳ ගිවිසුම්වලදීත් නොයෙකුත් සම්බාධක දමාගෙන හිටියා. අපි සිංගප්පූරුව සමඟ තිබෙන වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක කරන්න යනකොට සමහර මන්ත්‍රීවරු කිව්වා, "අපේ ප්‍රතිපත්තිය ඒක නොවෙයි. අපට para-tariff අයින් කරන්න අවශ්‍ය නැහැ" කියලා. නමුත්, පසුව ඒ තීරණය වෙනස් කරගෙන අවුරුද්දට පහෙන් එක ගණනේ ඒ para-tariff අයින් වෙනවා. Servicesවලට එන්න කලින්, අපි උදාහරණයක් හැටියට goods ගනිමු. මම හොයලා බැලුවා, agreement එකේ HS Code 6910.10 කියන එක. ඒක ceramic sanitaryware එකක්. ඕනෑ එකක් ගන්න පුළුවන්. ඒකට සියයට 20ක Customs Duty එකක් අපි ගහනවා. VAT එකක් ගහනවා, සියයට 18ක. PAL එකක් ගහනවා, සියයට 10ක. Cess එකක් ගහනවා, කිලෝවකට රුපියල් 50ක. SSCL එකක් ගහනවා, සියයට 2.5ක. ඔය ඔක්කොම එකතු වුණාම සියයට 60ක විතර tariffs and para-tariffs වදිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම බැලුවා, RCEP එක ඇතුළේ රටවල මේ duty structure එක තිබෙන්නේ කොහොමද කියලා. දැන් අපේ සියයට 60 නේ. පළමුවැනි අවුරුද්දේ තායිලන්තයේ තිබෙනවා, සියයට 30ක්; හැබැයි, ඊළඟ අවුරුද්දේ ඉඳලා ඒක සියයට බින්දුවයි. ඉන්දුනීසියාව ගත්තොත්, චීනයෙන් ඉන්දුනීසියාවට import කරනවා, දැනට සියයට 20ක්; ඊළඟ අවුරුද්දේ සියයට බින්දුවයි. මලයාසියාව දැනට සියයට 25යි; අවුරුදු 5ක් යනකොට සියයට 22.7යි; අවුරුදු 10කින් සියයට 11.4යි; අවුරුදු 15කින් සියයට බින්දුවයි. මියන්මාරයේ දැනට සියයට 10යි; ඊළඟ අවුරුද්දේ සියයට බින්දුවයි. පිලිපීනයේ දැනට සියයට 15යි; ඊළඟ අවුරුද්දේ සියයට බින්දුවයි. වියට්නාමයේ දැනට සියයට 35යි; අවුරුදු 20කින් සියයට 17.5යි. චීනයේ දැනට සියයට 10යි; ඊළඟ අවුරුද්දේ සියයට බින්දුවයි. දැන් අපි සියයට 60යි. අපි ඒක තවත් වැඩි කරනවා. මේක පරස්පරයක්, conflict එකක්. RCEP එකට join වෙන්න නම් අපට අර මතයේ ඉන්න බැහැ. ආනයන ආදේශනවලට ප්‍රමුඛතාව නොදී අපට අපනයනය වර්ධනය කරන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 4ක් දෙනවාය කිව්වා.

අපනයනය ප්‍රමුඛ ආර්ථිකයක් හදන්න නම් ඒ ideology එකෙන් අපි අයින් වෙන්න ඕනෑ. අනෙක් කාරණය මෙයයි. ආයෝජකයින්ට දේශීය ආයෝජකයෙකුට වාගේ සලකන පරිසරයක් නිර්මාණය වෙන්නත් ඕනෑ. මම මේ කිව්වේ goods සම්බන්ධයෙන්.

ඊළඟට, අපි services ගනිමු. Services කියන්නේ, පුද්ගලයන් විසින් වෙන රටවලට ගිහිල්ලා තමන්ගේ දැනුම ලබා දෙන එක. Services modes 4ක් තිබෙනවා. ඒ ගැන දීර්ඝව කථා කරන්න වෙලාවක් නැහැ. අපි බලමු, Mode 4 services ගැන. ඒ කියන්නේ, professional කෙනෙක් ඉන්නවාය කියලා අපි හිතමු. ඒ professional තව රටකට ගිහිල්ලා professional service එකක් කරනවා. ඒ කියන්නේ, ඉන්දියාවේ හෝ සිංගප්පූරුවේ හෝ ඕස්ට්‍රේලියාවේ හෝ qualifications තිබෙන accountant කෙනෙක් ලංකාවට ඇවිල්ලා accounting firm එකක් කරනවා. එහෙම නැත්නම් doctor කෙනෙක් වෙන්න පුළුවන්; engineer කෙනෙක් පුළුවන්; architect කෙනෙක් වෙන්න පුළුවන්. RCEP එක ඇතුළේ මේවා බොහෝදුරට විවෘත කරලා තිබෙන්නේ. මට මතකයි, සිංගප්පූරුවත් එක්ක agreement එක අත්සන් කරනකොට මේ ගරු සභාවේ විශාල කෑ ගැහිල්ලක් තිබුණා, "එහෙම කරන්න බැහැ, professionalsලාට ලංකාවට ඇවිල්ලා වැඩ කරන්න දෙන්න බැහැ" කියලා. ඉතින් Singapore Free Trade Agreement එක ඇතුළේ මේ Mode 4 services සම්පූර්ණයෙන් වහලායි තිබෙන්නේ. එදා වුණත් කිසිම විධියකට services liberalize කරන්න බලාපොරොත්තු වුණේ නැහැ.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

හැබැයි, RCEP එකට යනවා නම් ඒ මතයත් වෙනස් කරගන්න සිද්ධ වෙනවාය කියන එකයි මම කියන්නේ. Market access තිබෙන්න ඕනෑ; fair and equitable treatment තිබෙන්න ඕනෑ; mutual recognition තිබෙන්න ඕනෑ. මම බැලුවා, මේ රටවල් ඇතුළේ තිබෙන professional services ගැන. Legal services තිබෙනවා, lawyersලාට වැඩ කරන්න පුළුවන්; accountantsලාට වැඩ කරන්න පුළුවන්; architectsලාට වැඩ කරන්න පුළුවන්; engineersලාට වැඩ කරන්න පුළුවන්. Telco services ගත්තාම, වෙන රටක වෙන company එකක voice and data services මේ රටේ පාවිච්චි කරන්න පුළුවන්. නමුත්, අපේ බැහැ නේ, එහෙම එකක් කරන්න.

ඊළඟට, financial services ගත්තාම වෙන රටවල insurance companies මේ රටට ඇවිල්ලා ඒවා liberalize කරලා තිබෙනවා. එතකොට ඒ services ලබා දෙන්න පුළුවන්. මම බැලුවා, doctor කෙනෙක් නම් කොහොමද කරන්නේ කියලා. මේ දවස්වල ලොකුවට කථා වෙන දෙයක් තිබෙනවා නේ. අපේ රටවල කට්ටිය පිට රටවලට යනවා. අපේ රටේ දැන් doctorsලා අඩුයි. RCEP එක ඇතුළේ ඉන්නවා නම්, වෙන රටවල doctorsලාට මේ රටට එන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් ගත්තොත්, මා ළඟ මේ තිබෙන්නේ Singapore and Australiaවල තත්ත්වය පිළිබඳ තොරතුරු. Singaporeවල doctor කෙනෙකුට පුළුවන්ද, Mode 4 යටතේ ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා, Free Trade Agreement එක ඇතුළේ තමන්ගේ services provide කරන්න? පුළුවන්; වෙන රටවලටත් පුළුවන්.

හැබැයි, එහෙම කරන්න නම් සිංගප්පූරුවේ තිබෙන ඕස්ට්‍රේලියාවෙන් recognized විශ්වවිද්‍යාලයක් වෙන්න ඕනෑ. ඊට පස්සේ, අවශ්‍ය නම් Australian Medical Council එකේ අනුමැතිය ලබා ගන්න ඕනෑ; IELTS කරන්න ඕනෑ; ඕස්ට්‍රේලියාවේ Medical Board එකේ register වෙන්න ඕනෑ. යම් කාලයක් supervise කරපු practise එකක් කරන්න ඕනෑ. ඊට පස්සේ ඒ වෛද්‍යවරුන්ට සේවා සපයන්න පුළුවන්. ඒවා තමයි Free Trade Agreement එක යටතේ තිබෙන දේවල්. Malaysian doctor කෙනෙකුට තායිලන්තයේත් සේවා සපයන්න පුළුවන්. අපි කිව්වාට, අපේ අපනයන වැඩි කර ගන්න ඕනෑ කියලා, ලෝකයේ tariff war එකක් යනවා අපි දකිනවා. Dynamics වෙනස් වනවා. එහෙම නම් අපි අලුත් markets හොයා ගන්න ඕනෑ. RCEP එක තමයි ලොකුම market එක. ඒ market එකට enter වනවා නම් අපේ liberalization මීට වඩා ගොඩක් කරන්න සිද්ධ වනවා. එහෙම නම් මේ මතය සම්පූර්ණයෙන්ම කණපිට ගහ ගන්න වනවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න බලාපොරොත්තු වුණේ මෙන්න මේ කාරණයයි.

අවසාන වශයෙන් මම එක point එකක් ගැන කථා කරන්න කැමැතියි. අද අපට ලියුමක් එවලා තිබුණා, ලංකාවේ පළමුවැනි සහ විශාලතම electric three-wheelers හදන company එකෙන්. ඒගොල්ලන් තමයි Vega car එකත් හැදුවේ. ඒ Vega car එකේ chassis එක තිබුණු කාලයේ මම ඒකේ නැහලා TRACE Expert City එක වටේ පැදෙව්වා. මම එදාත් විශ්වාස කළා, ඔවුන්ගේ ක්‍රියාවලිය හරහා ලෝකයේ ඉහළම තැනකට මේ රට ගෙනෙන්න පුළුවන් කියලා. අද මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයන් සමඟත් කමිටුවේදී අපි සාකච්ඡා කළා. මෙතැන තිබෙන ගැටලුව තමයි, ඔවුන්ට හැම දේම මේ රටේ හදා ගන්න බැරිකම. සියයට පනස් ගණනක් මේ රටේ හදනවා. නමුත්, සමහර දේවල් ඒගොල්ලන් චීනයෙන් හදලා ගෙනෙනවා. චීනයෙන් හදලා ගෙනාවාට ගරු ඇමතිතුමනි, ඒගොල්ලන්ගේ තිබෙන වෙනස මෙයයි. Innovation, software, battery technology, powertrain, design and prototype, autonomous driving, charging infrastructure, software and firmware, vehicle testing and simulation, research සහ regulatory compliance ලංකාවේ වීම. එතකොට එය කවුරුන් හෝ Complete Knock Down හෝ Semi Knock Down ලෙස ගෙනැල්ලා assemble කරලා විකුණන එකක් නොවෙයි. ඒක ඊට වඩා වෙනස්. එතැන ගොඩක් IPR තිබෙනවා. එතැන ඉංජිනේරුවරු ගොඩක් වැඩ කරනවා. ඒක අපට ඉස්සරහට ගෙන යන්න පුළුවන්. නමුත්, ගැටලුව තිබෙන්නේ අපි හැම දෙයක් ගැනම එකම විධියට හිතන එකයි. සියයට 30ක Customs Duty එකක් ගහන්න ඕනෑ. ඊට පස්සේ ex-bond වුණාම ඒකට තවත් surcharge එකක් ගහන්න ඕනෑ. එතකොට තවත් රුපියල් ලක්ෂ 8ක් විතර ඒකට එකතු වනවා. කමිටුවේදී නිලධාරීන් මට පෙන්වලා දුන්නා, "බලන්න සභාපතිතුමා, එතැන electric three-wheeler එකක් රුපියල් මිලියන 4.4ක් විතර වනවා. රුපියල් මිලියන 4.4ට කොහොමද electric three-wheeler එකක් විකුණන්නේ? කරන්න බැහැ නේ" කියලා. ඉතින්, මෙතැනදී ආණ්ඩුවට ගැටලුවක් තිබෙනවා. ආණ්ඩුවට එහෙම එක එක ආයතනවලට තමන්ට ඕනෑ විධියට Customs Duty එක අයින් කරන්න බැහැ. ඒක නිලධාරීන්ට කරන්න බැහැ. කොච්චර කිව්වත් ඒක කරන්න ඔවුන්ට හැකියාවක් නැහැ. එහෙම නම් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න ඕනෑ. ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නකොට අපි දන්නවා, IMF එකේ රාමුව ඇතුළේ වැඩ කරන්නත් ඕනෑ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Give me only one more minute, Sir.

මම කැමැතියි, ඔබතුමන්ලාට මගේ යෝජනාවක් ඉදිරිපත් කරන්න. අපි බලමු, මේක innovation එකක් හැටියට. බදු ගහන්න පුළුවන්. බදු ගැහුවාට අපට හැකියාවක් තිබෙනවා, ඒ innovation එකට පමණක් subsidy එකක් ලබා දෙන්න. Tax එක වදිනවා; tax එක අය කරපුවාවේ. හැබැයි, අවසානයේදී Rs. 4.4 millionවල ඉඳලා යම් ප්‍රමාණයක් අඩු කර ගන්න පුළුවන්. ඔවුන් එයට එකඟ වුණා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම දන්නවා, ඔබතුමා ඉතාම ඕනෑකමින් මේ සම්බන්ධව අවධානය යොමු කර තිබෙන බව. ඔවුන් එකඟ වූ දේ තමයි, locally value added එකට එහෙම නම් Customs Duty එක ගහන්න ඕනෑ නැහැ; foreign value added එකට විතරයි Customs Duty එක ගහන්න ඕනෑ කියන එක. ඒත් ඒකෙන් reduce කර ගන්න පුළුවන් ප්‍රමාණය අඩුයි. ඒ නිසා Finance Ministry එකෙන් tax එක ගහපුවාවේ. නමුත් විපක්ෂය මේ innovation එකට එකඟ වෙන්නම්. මේ ආයතනය විතරක් නොවෙයි. තවත් ආයතන තිබෙනවා. මේ වාගේ දේශීය කර්මාන්ත ඉහළට ඔසවා ලෝකයේ කර්මාන්ත අතර ප්‍රධාන තැනකට ගෙනෙන යෝජනාවලට විපක්ෂය එකඟ වෙන්නම්. ඒ වෙනුවෙන් විපක්ෂය ඡන්දය දෙන්නම්. අපි පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මෙවැනි innovations හරහා export economy එකට යන්න බලමු. හැබැයි, ඔබතුමන්ලාගේ policy එක නම් වෙනස් කර ගන්න වනවා. එහෙම කර ගන්න බැරි වුණොත් RCEP එකට තියා මොකකටවත් අපට join වෙන්න බැරි වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ எம். நிசாம் காரியப்பர் அவர்கள்! உங்களுக்கு 11 நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.52]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய குழுநிலை விவாதத்தில் எனது பிரதேசம் தொடர்பான ஒருசில விடயங்களைச் சபைக்குக் கொண்டுவர நான் கடமைப்பட்டுள்ளேன். கல்முனை மாநகர சபைக்குட்பட்ட சந்தாங்கேணி விளையாட்டு மைதானத்திற்கு நீண்டநாள் தேவையாக இருந்த pavilion ஒன்றை அமைக்கும் விடயத்தை நாங்கள் ஏதோவொரு வகையில் அந்த மாநகர சபைமூலம் செய்து முடித்திருக்கிறோம். அதுபோல், தமிழ், முஸ்லிம் சமூகங்கள் வாழ்கின்ற இந்தப் பிரதேசத்தின் இளைஞர்கள், யுவதிகள், மாணவ - மாணவிகளுக்காக நீச்சல் தடாக மொன்றை அமைக்க வேண்டிய முக்கியமான தேவை யொன்றும் எங்களுக்கு இருந்தது. நீண்டகாலமாக இருந்து வருகின்ற இந்தத் தேவையை நிவர்த்தி செய்யும்பொருட்டு, 2018ஆம் ஆண்டு எங்கள் பிரதேசத்திலிருந்த பாராளுமன்ற உறுப்பினருடைய வேண்டுகோளின் அடிப்படையில் நீச்சல் தடாகமொன்றை அமைப்பதற்கான அடிக்கல் நாட்டப்பட்டு, இப்பொழுது ஏழு வருடங்களாகிவிட்ட நிலையில் அதன் வேலைகள் முடிவுறும் தறுவாயில் இருக்கின்றன. ஆனால், அதனைப் பயன்பாட்டுக்குக் கொண்டுவருவதில் பிரச்சினை யொன்று காணப்படுகின்றது.

ගරු ඇමතිතුමනි, කල්මුණේ සන්දාන්ගනී ක්‍රීඩාංගණයේ 2018දී පටන් ගත්ත පිහිනුම් තටාකයට මුලින්ම වෙන් කරලා තිබුණේ, රුපියල් මිලියන 53ක මුදලක්. ඒක බොහොම අමාරුවෙන්, අවුරුදු හතක් තිස්සේ -දීර්ඝ කාලයක් තිස්සේ- හදාගෙන, හදාගෙන ඇවිල්ලා, දැන් අවසාන අදියරට ඇවිල්ලා තිබෙනවා. නමුත්, ඒක ප්‍රයෝජනයට ගන්න පුළුවන් විධියට ගෙන එන්න බැරි තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. මොකද, ඒකට විදුලිය සැපයීමේ ලොකු ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ විදුලිය සැපයීමේ ප්‍රශ්නය මතු වෙන්නේ, එතැන විදුලිය සැපයීම සඳහා තිබෙන්නා වූ ට්‍රාන්ස්ෆෝමරවල තිබෙන ශක්තිය මදි නිසායි. ඒකට වෙනම ට්‍රාන්ස්ෆෝමරයක් ගෙනෙන්න වෙනවා. ඒ සඳහා තව රුපියල් මිලියන හතරක් විතර ඕනෑ වෙනවා. මම හිතන විධියට, දැන් රුපියල් මිලියන 60ක් වියදම් කරලා තිබෙනවා. තව රුපියල් මිලියන හතරක් දීලා, ඒ පිහිනුම් තටාකයේ වැඩකටයුතු අවසන් කරන්න කියා මම ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

முக்கியமாக, கல்முனை தமிழ், முஸ்லிம் மாணவ - மாணவிகள் ஏழைகள்! இந்த நீச்சல் தடாகத்தை இங்கே என் கையில் உள்ள படத்தில் காண்பதுபோல் பாவிப்பதற்கோ அல்லது ஒரு சிறிய கட்டணத்தைக் கொடுத்துவிட்டுப் பயன்படுத்துவதற்கோ ஏற்ற பொருளாதார சூழ்நிலை அவர்களிடம் இல்லை. ஆனால், தேக ஆரோக்கியத்துக்கு நீச்சல் என்ற விளையாட்டு மிக முக்கியமானதாகும். எனவே, அதற்கான சந்தர்ப்பம் அவர்களுக்கு வழங்கப்பட வேண்டு மென்று நான் மிகவும் தாழ்மையுடன் கேட்டுக் கொள்கின்றேன்.

ක්‍රීඩා අමාත්‍යාංශයේ අදාළ නිලධාරිනුත් අද මේ පාර්ලිමේන්තුවේ රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්නවා. ඒ කටයුත්තට රුපියල් මිලියන හතරක් අවශ්‍ය වෙනවා. විශේෂ ට්‍රාන්ස්ෆෝමරයක් fix කරලා ඒක අවසන් කරන්න කියලා මම ඉතාම බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව පොඩි කාරණාවක් මම ඔබතුමාට දන්වන්න ඕනෑ. මේ ප්‍රධාන වියදම් ඇස්තමේන්තුවේ, estimate එකේ සඳහන් කර තිබෙනවා - මට වැරදුණාද දන්නේ නැහැ - Ministry of Youth Affairs and Sportsහි දෙමළෙන් සඳහන් කරපු පිටුවේ, "கல்முனை விளையாட்டு அரங்கைப் பூர்த்தி செய்வதற்காக 150 மில்லியன் வழங்கப்பட்டுள்ளது" කියලා. ඒ පිහිනුම් තටාකය එක්කම තිබෙන ක්‍රීඩා සංකීර්ණයක්, ඒ කියන්නේ අභ්‍යන්තර ක්‍රීඩා සංකීර්ණයක් -indoor stadium එකක් - සම්පූර්ණ කිරීමට රුපියල් මිලියන 150ක් වෙන් කර තිබෙන බවට සඳහන් කර තිබෙනවා. ඒකටත් මම හිතන විධියට දැනටමත් කණු ටිකක් සිටුවා තිබෙනවා. ඒකත් 2017දී පටන් ගත්ත project එකක්. ඒකෙත් කටයුතු අවසන් කරන්නේ නැතුව දැන් හිර වෙලා තිබෙනවා. මා ස්තුතිවන්ත වෙනවා, ඔබතුමන්ලා ඒකට රුපියල් මිලියන 150ක් වෙන් කර තිබෙන එක ගැන. නමුත්, මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ක්‍රීඩා සංකීර්ණය සම්බන්ධයෙන් මට විශේෂ ඉල්ලීමක් කරන්න තිබෙනවා. අපේ ගම් පළාත්වල කාන්තාවන් සඳහා, ගැහැනු දරුවන් සඳහා, එහෙම නැත්නම් සිසුවියන් සඳහා, විශේෂයෙන් වෙන් කරන ලද ගෘහස්ථ ක්‍රීඩා පහසුකම් අවශ්‍යයි.

அதாவது, முக்கியமாக அங்கு வாழ்கின்ற பெண் பிள்ளைகள் விளையாடுவதற்காகப் பிரத்தியேகமாக badminton court போன்ற மைதானமொன்று அமைக்கப்பட வேண்டும்.

එබැවින්, මම මේ නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. රුපියල් මිලියන 150ක් වෙන් කර තිබෙන ඒ ක්‍රීඩා සංකීර්ණය -sports complex එක- හදන්නේත් මම කලින් කියපු පිහිනුම් තටාකයට ආසන්නයේ. ඒක නගර මැද්දේ තිබෙන ground එකක්. ඒ පළාතේ ගැහැනු දරුවන්ට, කාන්තාවන්ට, තරුණියන්ට සාමාන්‍යයෙන් ක්‍රීඩාවල යෙදීමට බාධා ගොඩක් තිබෙනවා. ඒ නිසා ඒ ක්‍රීඩා සංකීර්ණය හදන අවස්ථාවේ ඒ අයටම වෙන් කරන ලද අවශ්‍ය විශේෂ ක්‍රීඩාගාර පහසුකම් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

Now, I would like to move on to the other Ministry under discussion, the Ministry of Industry and Entrepreneurship Development. Sir, I wish to bring to the attention of the House a certain matter. When I looked at the pages relevant to the Ministry of Industry and Entrepreneurship Development in the Budget Estimates, I realized the importance of encouraging entrepreneurs in the country as a whole. Now, the biggest challenge our people face is obtaining financial assistance for a start-up. The Hon. Minister is very well aware that one of the biggest issues we face when starting a new project or a venture is finding start-up capital as loans. I wish to know from the Minister concerned - there are thousands of small entrepreneurs who had obtained loans from private banks and who are now being threatened with *parate* execution, and the former Government gave a moratorium and this Government, too, has extended it till the 31st of March, I believe - whether this Government also would further extend that moratorium. පරාටෙ ඇස්කීසි කිරීමේ ක්‍රියාවලිය නැවැත්වීම, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் மாத்திரம் இருக்கின்றது.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you very much, Hon. Presiding Member. I will finish up quickly.

ඒ moratorium එක නැවැත්වීම සම්බන්ධව පමණක් නොවෙයි, අනාගතයේදී කුඩා ව්‍යාපාර පටන් ගන්න ව්‍යවසායකයන් කුමන බැංකුවෙන්, කෙසේ ණය ලබා ගැනීමට කටයුතු කළ යුතු ද කියන එක සම්බන්ධයෙන් ද යම්කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මම දන්නවා, ඒකටම කැප වුණු රජයක් හැටියට ඒ සඳහා ඔබතුමන්ලාට යම් ක්‍රියාමාර්ගයක් ඇති කියලා. නමුත් නීතිඥ මහත්මයෙකු හැටියට මා කියන්නේ පෞද්ගලික බැංකුවකින් සාමාන්‍ය විධියට ණය ලබාගෙන ඒ කුඩා ව්‍යවසායකයන්ට කවදාවත් තමන්ගේ වැඩ කටයුතු කර ගන්න බැරි වෙනවා කියලායි. ලංකාවේ විශේෂ සංවර්ධන බැංකු තිබුණාට ඒවා කොච්චර සාර්ථක ද කියලා අපි දන්නේ නැහැ. මොකද, ඒ බැංකු තම මුදල් යෙදවීම පමණක් නොවෙයි කළ යුත්තේ. ඒ ව්‍යාපෘතියට කෙළින්ම මැදිහත් වෙලා ඒ ව්‍යාපෘතියට අදාළ දේවල් ලබා දීලා, තමන්ට තිබෙන විශේෂඥ දැනුම - expert inputs - ලබා දීලා ඒ තැනැත්තන් දිරිගැන්වීමේ ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා ඔබතුමන්ලා අනිවාර්යයෙන් කටයුතු කළ යුතුයි. නෛතික වශයෙන් සාදන ලද, දැනටමත් ලංකාවේ පවත්වාගෙන යන National Development Bank එක ඒ කටයුත්ත කොච්චර දුරට සාර්ථකව කරගෙන යනවාද දන්නේ නැහැ. මොකද, දැනටත් එහෙම ක්‍රියා පිළිවෙළක් තිබෙනවා නම්, අනිවාර්යයෙන් අපිට පුළුවන් වෙයි, සාමාන්‍ය පෞද්ගලික බැංකුවකට ගිහිල්ලා සාමාන්‍ය ණය ලබා ගැනීමේ ක්‍රියා මාර්ගයෙන් ඔබ්බට යන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් එක කාරණයක් කියන්න තිබෙනවා. මම නීතිඥ මහත්මයෙක් හින්දා *parate* execution නවත්වන්න ඕනෑ තරම් නියෝග අරගෙන තිබෙනවා. එතැනදි දෙපැත්තෙන්ම වරදක් සිදු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைகின்றது.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I just need one more minute, Sir.

මෙතැනදී, ණය ලබා ගන්නා කට්ටියත් අනිවාර්යයෙන් අලුත් කුඩා කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධනය සඳහාම කටයුතු කරන්නේ නැහැ. ඒ පැත්තේත් වරදක් තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව මේ පිළිබඳ කරුණු සියල්ලක්ම සලකා බලලා කාටත් පිළිගත හැකි, යම්කිසි ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ගනීවි කියන බලාපොරොත්තුවෙන් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த சேனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.

[අ.භා. 5.03]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් සාකච්ඡා වන මොහොතේ විපක්ෂයෙන් යොමු වුණු කරුණු කාරණා කිහිපයක් ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. විශේෂයෙන් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සමස්ත ප්‍රස්තුතය ගැන කථා කරන්නේ නැතුව ඉතා සුළු තාක්ෂණික කාරණා දෙකක් මතු කළා. ඒකට බොහොම ස්තුතියි කියලා අපි එතුමාට කියනවා. මොකද, ඒ තාක්ෂණික කාරණා පිළිබඳව අපි ඒ ව්‍යවසායකයන් එක්ක දෛනික වශයෙන් සාකච්ඡා කරමින්, ප්‍රශ්නවලට විසඳුම් සොයමින් ඉන්නේ. හැබැයි ඒ තාක්ෂණික කාරණා ගැන කොච්චර කථා කළත්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධනය දත්තවලින් තමයි අපට බලන්න වෙන්නේ. මොකද, 2015, 2016 වන කොටත් අපේ රටේ අපනයන ආදායම ඩොලර් බිලියන 17ක් පමණ වුණා. 2019 වන කොටත් අපේ රටේ අපනයන ආදායම ඩොලර් බිලියන 17ක් පමණ වුණා. ඒ වන කොට සියයට 2.3කට ආර්ථික වර්ධනය වැටිලා තිබුණා. ඒ නිසා න්‍යායාත්මක දැනුම සහ භූමියේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ වෙනසක් තිබෙනවා.

හැබැයි අපි එතැනින් එහාට ගිහින් රටක් විධියට ගෙන කරුණු විමසා බැලිය යුතුයි. අපි දැන් ලෝකයේ තිබෙන අර්බුද ගැන කථා කළා. ලෝකයේ අර්බුද හැම කාලයේම එනවා. කාලයෙන් කාලයට විවිධ අර්බුද එනවා. ඒ අර්බුද අතරින් රට ව්‍යවසායකත්වයක් විධියට, එහෙම නැත්නම් රටත් බිස්නස් එකක් විධියට ලෝකයේ අනෙක් රටවල් එක්ක තරග කරලා ලෝක වෙළෙඳ පොළ පංගුවෙන් කොටසක් උකහා ගත යුතුය කියන උපායමාර්ගය - strategy එක - තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුවේ උපාය මාර්ගය වන්නේ.

ලෝකයේ අගය දාමයන්ට අප එකතු වන්නේ කොහොමද, ලෝක වෙළෙඳ පොළ පංගුවෙන් යම් ප්‍රමාණයක් අප ලබා ගන්නේ කොහොමද කියන කාරණය ඇතුළේ තමයි අපි නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කළේ. මොකද, ලෝකයේ අගය දාමයට එකතු වෙන්න පුළුවන් නිෂ්පාදන ආර්ථිකයක් පසුගිය අවුරුදු 40ටම මේ රටේ ගොඩනැගුවේ නැහැ. සේවා ආර්ථිකය ගැන පමණක් කථා කරමින් ඉඳලා, අවසානයේදී අපට ඒ දෙකම නැති වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශයේ විශේෂයෙන්ම මේ ක්‍රියාවලියට දායක වන, අපේ ගරු ඇමතිතුමාට සහ මට ශක්තියක් වෙලා ඉන්න අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය තිලකා ජයසුන්දර මහත්මිය ඇතුළු එම නිලධාරී මණ්ඩලයටත්, අපේ පෞද්ගලික කාර්ය මණ්ඩලයටත් මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, අපේ සභාපතිවරුන්, අලුතින් පත් කරපු සභාපතිවරුන් ඇතුළු නිලධාරින්ටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, ඒ සියලු දෙනා මේ සැලසුම් සකස්

කර ගන්න පසුගිය මාස 4 තුළ අපට සෑහෙන සහයක් ලබා දුන්නා. ඒ වාගේම, ඒ සියලු දෙනා මේ රටේ අනාගතය වෙනස් කරන්න, මේ යන මාර්ගය වෙනස් කරන්න දැවැන්ත දායකත්වයක් ලබා දෙමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි කියන්න ඕනෑ, මේ අය වැයට අදාළ වැය ශීර්ෂ ඇතුළේ මෙතෙක් කථා නොකරපු, වෙනස් වන දේවල් මොනවාද කියලා. විශේෂයෙන්ම පසුගිය පාලකයා නැති කරලා ගිය කර්මාන්තවලට බලපා තිබෙන ඉඩම් අහිමි වීම කියන ගැටලුව විසඳන්න අපි යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ප්‍රාග්ධන ගැටලුවට, විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ප්‍රාග්ධන ගැටලුවට විසඳුම් ද අපි මේ අය වැයේ යෝජනා කර තිබෙනවා. වෙළෙඳ පොළ ලබා ගැනීමට තිබුණු ගැටලු නිසා, එහෙම නැත්නම් වෙළෙඳ පොළක් නොමැති නිසා, තමන්ට ලොකු ව්‍යාපාරවලට යොදවන්න සියයට 30ක විතර margin එකක් දෙන්න බැරි නිසා, credit මාස තුනක් දෙන්න බැරි නිසා වෙළෙඳ පොළ අහිමි වෙච්ච ව්‍යාපාරිකයන්ට වෙළෙඳ පොළ ලබා දෙන්න, අවශ්‍ය දැනුම සංවිධිත ආකාරයට ලබා දෙන්න, අවශ්‍ය තාක්ෂණය සහ දත්ත, විශේෂයෙන්ම පර්යේෂණ දත්ත සංවිධිත ආකාරයට ව්‍යාපාර ක්ෂේත්‍රයට ලබා දෙන්න, සහතිකකරණය සහ research and development වාගේම අවශ්‍ය කරන කුසලතා සංවර්ධනය ආදියට දායකත්වය ලබා දෙන්න අපි කටයුතු කරනවා. අපේ වැය ශීර්ෂය තුළ නැති වුණත් කුසලතා සංවර්ධනයට රුපියල් බිලියන 16ක් යොමු කර තිබෙනවා.

ව්‍යාපාර කිරීමට ඇති පහසුව අපහසුතාවක් බවට පත් කරලා තමයි මෙතුමන්ලා අපට ආණ්ඩුව භාර දුන්නේ. මොකද, අපේ රට Ease of Doing Business Index එක අනුව 99 ස්ථානයේ තිබුණේ. 99 වන ස්ථානයේ ඉන්න අපි, රටක් විධියට එම දර්ශකය 60ට වාගේ දියුණු කර ගන්න, භාගෙට භාගයක් ඉදිරියට එන්න තමයි මේ අය වැයේ ප්‍රතිපාදන යොමු කරලා තිබෙන්නේ.

ඒ වාගේම, සාම්ප්‍රදායික ශිල්පීය කුසලතා දියුණු කිරීම සඳහාත් අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම සාම්ප්‍රදායික භාණ්ඩ හා සේවාවල අපේ රටට ආවේණික බවක් තිබෙනවා. ඒ සමස්තයම බිඳ වැටීමෙන්, ඒවා අපේ රටට අහිමි කරමින්, එම ශිල්පීන් සම්පූර්ණයෙන්ම බිමට ඇද දමපු තත්ත්වයක් තමයි තිබුණේ. එවැනි තත්ත්වයක් යටතේ ඒවා ගොඩනගා ගන්න අවශ්‍ය කරන අය වැයක් තමයි අප ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතැනින් එහාට ගියාම, මේ අය වැයේ සමස්ත ක්‍රියාවලිය හරහා ආයතන පද්ධතිය ඒකාබද්ධ කර ගනිමින් collaborative approach එකක් තමයි අපි ගන්නේ. ඒ වාගේම සෑම ව්‍යාපාරයකම ජීවන චක්‍රය -life cycle එක- බලලා, පටන් ගන්නා ව්‍යාපාරයක්, වර්ධනය වන ව්‍යාපරයක්, අපනයන කාර්යය සිදු කරන ව්‍යාපාරයක් යනාදි වශයෙන් ව්‍යාපාරය තිබෙන සන්ධිස්ථානය අනුව අවශ්‍ය විවිධ සේවාවන් අපේ අමාත්‍යාංශයෙන් ලබා දෙන්නේ කොහොමද කියන ඉතාම සංවිධිත වැඩ පිළිවෙළක් යටතේ තමයි අප කටයුතු කරන්නේ. ඒ වාගේම අනෙකුත් අමාත්‍යාංශ -වැවිලි, කෘෂිකර්ම, ධීවර ආදි අමාත්‍යාංශ-, රාජ්‍ය නොවන සංවිධාන, බැංකු, විශ්වවිද්‍යාල ආදිය සමඟ එකතු වෙලා මේ සමස්ත ක්‍රියාවලිය, එහෙම නැත්නම් මේ රටේ ව්‍යවසායකත්ව ක්‍රියාවලිය නංවන්නේ කොහොමද, කර්මාන්තවලට සහය දක්වන්නේ කොහොමද කියන එක ගැනයි අපි සාකච්ඡා කරන්නේ. තැන් තැන්වල එක එක දේවල් කරන්නේ නැතුව, එම කටයුතු පොදු රාමුවක් ඇතුළේ ජාතික වැඩ පිළිවෙළකට ගේන්නේ කොහොමද කියන එක පිළිබඳව තමයි අපි සාකච්ඡා කරන්නේ.

නිශ්චිත වශයෙන් ගත්තොත්, මේ වෙලාවේ තිබෙන අර්බුද කිහිපයකටත් විසඳුම් මේ අය වැය තුළ තිබෙනවා. විශේෂයෙන්ම වාහන එකලස් කිරීමේ කර්මාන්තය දැන් මුහුණ දීලා තිබෙන අර්බුදයට අලුත් SOP එකක්, එහෙම නැත්නම් අලුත් ක්‍රියා පටිපාටියක් අපි නිර්මාණය කරනවා. ඒ වාගේම වර්තමානයේ ඔවුන්ට බදු නිසා ඇති වෙලා තිබෙන අර්බුද පිළිබඳවත් අපි මේ වන කොට මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරමින් සිටිනවා. ඒ වාගේම, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයත් අර්බුදයට ලක් වෙලා තිබෙනවා, අනෙකුත් කර්මාන්තවලට සාපේක්ෂව එහි බිඳ වැටීමක් තිබෙනවා, පසුගිය රජයන් ගත්තු ක්‍රියාමාර්ග නිසා. ඒකටත් අවශ්‍ය කරන වෙනස්කම් ටික අපි මේ වන කොට සාකච්ඡා කරමින් සිටිනවා.

බොහෝ දෙනා මේ රටේ කර්මාන්ත ගැන කථා කළා; අපනයන සහ ආනයන ගැනත් කථා කළා. නමුත් කවුරුවත් කථා කළේ නැහැ, මෙච්චර කාලයක් දේශීය නිෂ්පාදකයාට වෙච්ච අර්බුදය ගැන. අපි පළමුවෙනි වතාවට දැන් anti-dumping policy එක ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. ඊයේ කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන තිබුණා.

මොකද, කුණු කොල්ලයට ගත්ත බඩු -අඩු පිරිවැය දරපු බඩු- වෙළෙඳ පොළට ඇතුළු වෙනවා. ඒක නවත්වන්න වැඩ පිළිවෙළක් ඉතාම ඉක්මනින් එනවා. ඒ වාගේම අපනයන ප්‍රමුඛ ආර්ථිකයක් හදන්න අපි අපනයනය කරන භාණ්ඩවල, අපනයනය කරන නිෂ්පාදනවල යෙදවුම් අමුද්‍රව්‍ය බදු රහිත කිරීමට tariff policy එකක් එනවා. අපි මේ පනත් දෙක ස්ථාපිත කළාම මේ දෙක තමයි අපේ රටේ හැරවුම් ලක්ෂ්‍යය බවට පත් වෙන්නේ.

ඒ වාගේම ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය ඉදිරියට ගිහින් තිබෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්න අපේ කර්මාන්තකරුවන්ට හැකියාවක් තිබෙනවා. නමුත් අපේ සංවර්ධන කටයුතුවලට, විශේෂයෙන්ම විදේශ ආයෝජන විධියට එන සංවර්ධන කටයුතුවලට මේ භාණ්ඩ හා සේවා ලබා ගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි සලකා බලනවා, දැනට අපි හදලා තිබෙන භාණ්ඩ ප්‍රමාණයක් negative list එකට ඇතුළත් කර ගන්නේ කොහොමද කියලා. ඒ වාගේම දේශීයව නිෂ්පාදනය කරන භාණ්ඩවලට රජයේ මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී ප්‍රමුඛතාව ලබා දිය යුතුයි කියලා නීතියක් තිබුණාට, පසුගිය කාලයේ ඒක ඒ ආකාරයෙන් සිද්ධ වෙලා නැහැ. මොකද, තමන්ගේ යහළුවන්ගේ ආයතනවලට ටෙන්ඩරය දෙන්න ඕනෑ විධියට තමයි ටෙන්ඩර් දාලා තිබෙන්නේ. නමුත් අපි ඒ සහාය, ශක්තිය දේශීය කර්මාන්තකරුවන්ට ලබා දෙනවා. පසුගිය අවුරුදු තුන ඇතුළත විවිධ හේතු නිසා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර බිඳ වැටුණා. හැබැයි, ඒ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ප්‍රතිපත්තියක් හදන්න, ඒවා ඉදිරියට තල්ලු කරන්න අවශ්‍ය ජාතික උපදේශන කමිටුවක් මේ වනවිට පත් කරලා තිබෙනවා. විශේෂයෙන් පරාටෝ නීතිය හරහා අර්බුදයට ලක් වෙච්ච දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට තවත් සහන ක්‍රියාවලියක් අපි මේ ඉදිරි සති දෙක ඇතුළත ඉදිරිපත් කරනවා. ඒ අතරින් දැනට අර්බුදයට ලක් වෙලා තිබෙන 20,000ක් පමණ වෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් එකිනෙකා අරගෙන බැංකු සමඟ සාකච්ඡා කරමින් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හරහා ඔවුන් ඉදිරියට ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

ඒ වාගේම ණය ගන්න ක්‍රමයක් නැහැ කියලා කිව්වා. මේ අවුරුද්දේ දැනටමත් ආරම්භ වෙලා තිබෙනවා, credit guarantee schemes. ඒ කියන්නේ, ණය ආරක්ෂණ වැඩ පිළිවෙළක්. එතකොට කාට හෝ ණය මුදලක් ලබා ගන්න අවශ්‍ය නම්, ඒත් ඇපයක් නැත්නම් බැංකුවත් එක්ක එකතු වෙලා credit guarantee ආයතනයකින් සියයට 60ක ආවරණයක් ලබා ගන්න ඕනෑම ක්ෂේත්‍රයකට පුළුවන්. එතකොට ඇපයක් නැතිව ඔවුන්ට ණය ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඒ වාගේම අපි බැංකු කිහිපයක්

[ගරු චතුරංග අබේසිංහ මහතා]

එක්ක කථා කරලා තිබෙනවා, ආරම්භක ප්‍රාග්ධනය විධියට ලක්ෂ 10ක් දක්වා ඇප රහිතව දෙන්න. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හරහා සංවිධිත වැඩ පිළිවෙළ හරහා එන ව්‍යවසායකයන්ට ලක්ෂ 10ක මූලික ප්‍රාග්ධනයක් ඇප රහිතව දීලා එතැනින් එහාට ඔහු තල්ලු කරගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ, ඒ වාගේම IT කර්මාන්තය සහ අනෙකුත් ආරම්භක කර්මාන්තවලට අවශ්‍ය ප්‍රාග්ධන අරමුදලක් නිර්මාණය කිරීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරමින් සිටිනවා.

ඒ වාගේම අද මේ කාරණය පිළිබඳවත් කථා වුණා. විවිධ රාජ්‍ය ව්‍යවසායක ප්‍රමාණයක් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙනවා. ඒවාට SOEs කියලා කියනවා. මේවා ලාභ ලැබිය යුතු ආයතන; ස්වයං මූල්‍යනය සිද්ධ වෙන ආයතන. Treasury එකෙන් මේ ආයතන එකක්වත් සල්ලි ගන්නේ නැහැ. මේවා මෙතැනින් එහාට ගන්න පෞද්ගලික අංශයේ හැකියාව සහිත සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල අපි මේ වන විට පත් කරලා තිබෙනවා. ඕනෑම කෙනෙකුට compare කරලා බලන්න පුළුවන් පසුගිය අවුරුදුවල සිටි සභාපතිවරු, අධ්‍යක්ෂ මණ්ඩල සහ අපි පත්කළ සභාපතිවරු, අධ්‍යක්ෂ මණ්ඩල පිළිබඳව. විශේෂයෙන් බීබීසී ලංකා ආයතනය ඉතිහාසයේ වැඩිම විකුණුම් ප්‍රමාණය පසුගිය මාසයේ වාර්තා කළා. ඒ වාගේම ජාතික ලුණු සමාගම ඉදිරියට යමින් මේ වනවිට ඊළඟ නිෂ්පාදන පියවර තියලා තිබෙනවා. ඒ වාගේම සළුසල, ලක්සල කියලා දැවැන්ත ආයතන දෙකක් තිබෙනවා, අපේ ශිල්පීන්ට උදවු කරන්න, ඒ network එක හදාගන්න. අපි දැන් ඒවා දියුණු කරමින් යනවා. ඒ වාගේම සෙරමික් ආයතනයත් තමන්ට හැකි පමණින් තිබෙන ප්‍රාග්ධනයෙන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපි බලාපොරොත්තු වෙනවා, අනෙකුත් SOEsවලටත් පෞද්ගලික, රාජ්‍ය ඒකාබද්ධ වැඩ පිළිවෙළක්, public-private-people partnerships හරහා මේවා ජාතික තලයට ගේන්න. NEDA, NPS, SED, IDB කියන ආයතන මේ වනවිට ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ඇතුළේ ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඉතින්, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ අපේ රටට හැරවුම් ලක්ෂ්‍යයක් ලබාගන්න, නැත්නම් අපනයන ප්‍රමුඛ නිෂ්පාදන ආර්ථිකයක් බිහිකරගන්න නිර්මාණය කරපු පළමුවැනි අය වැය අපි ඉදිරිපත් කරලා තිබෙන බවයි.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට රුපියල් බිලියන 13ක් ලබා දීලා තිබෙනවා. කර්මාන්ත සහ ව්‍යවසාය සංවර්ධනය සඳහා අගයදාම ශක්තිමත් කිරීම සඳහා අනෙකුත් අමාත්‍යාංශවලට වෙන් කළ මුදලේ එකතුව ගත්තොත්, රුපියල් බිලියන 100කට වඩා ආයෝජනයක් මේ ක්ෂේත්‍රය සඳහා ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම IT කර්මාන්තයට පනවන service tax එකක් ගැන උදේ කථා කළා. ඒක IT කර්මාන්තයත් එක්ක හොඳින් සාකච්ඡා කරලා ගත්ත තීරණයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
මේ සියල්ලම සිද්ධ වෙලා තිබෙන්නේ සමස්ත වැඩ පිළිවෙළක් ඇතුළේ. ඒක නිසා ජාතික ජනබලවේගය ඉදිරිපත් කරපු පළමුවැනි අය වැය එක අමාත්‍යාංශයක් පදනම් කරගෙන නොවෙයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. කර්මාන්ත, ප්‍රවාහන, තාක්ෂණ, කෘෂිකර්ම මේ කියන සෑම අමාත්‍යාංශයකම ක්‍රියාවලියේ ප්‍රතිඵලය තමයි නිෂ්පාදන ආර්ථිකය බිහි වීමේ පළමුවැනි අඩිතාලම බවට පත් වෙන්නේ.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.16]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මුලින්ම සතුටු වෙනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කර්මාන්ත රටේ ආර්ථිකයට දක්වන දායකත්වය ඉතා වැදගත්. අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල කර්මාන්තකරුවන් - නිෂ්පාදන කර්මාන්ත, සේවා කර්මාන්ත, වැවිලි කර්මාන්ත, පශු සම්පත්, ධීවර ආදී සෑම කර්මාන්තයකින්ම- මේ සඳහා ලබාදෙන දායකත්වය ඉතා වැදගත් වෙනවා.

අපේ රටේ මේ දවස්වල වැඩියෙන්ම පාවිච්චි කරපු වචන දෙක තුන තමයි, 76 වසරක ශාපය කියන එක. ඒ, 76 ශාපයත් මේ කර්මාන්ත අඩපණ වීමට බලපෑවා කියන කාරණය ඉස්මතු කරන්න ඕනෑ. මොකද, 1988-89 කාලයේ සන්නද්ධ අරගළයක් තිබුණා. සන්නද්ධ කැරැලිකරුවන් පිරිසක් හිටියා. ඒ කවුරුවත් දැන් නැහැ. ඔවුන් විනාශ කරන ලද ආයතන මොනවාද කියලා මම මුලින්ම මතක් කරනවා. දැව සංස්ථා මධ්‍යස්ථාන, පෙහෙකම්හල්, ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව, තුනී ලෑලි සංස්ථාව, කඳු සංස්ථාව, පොහොර සංස්ථාව, රජයේ පාසල්, ට්‍රාන්ෆෝමර් 132ක් ඒ කැරලිකරුවන් විසින් විනාශ කළා. ඒ වාගේම ඔවුන් විනාශ කරන ලද කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගැනත් මම සිහිපත් කරන්න ඕනෑ. ඔවුන් විදුලි බලාගාර, කෘෂිකර්ම මධ්‍යස්ථාන විනාශ කළා. දැන් ඒ කැරලිකරුවන් කවුරුවත් නැති නිසා එච්චර ප්‍රශ්නයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ අය වැය ලේඛනයේ ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය පිළිබඳව තිබෙන පරිච්ඡේදය ගැන. එහි එක තැනක තිබෙනවා, "විදේශ ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා බිංගිරිය ඇතුළුව නව ආර්ථික කලාප පිහිටුවනවා" කියලා. ඒකට වෙන්කරන මුදල බිලියන 0.9යි. ගරු ඇමතිතුමනි, මම එක පැත්තකින් සතුටු වුණා, එතැන බිංගිරිය කියන නම තිබුණු එක ගැන. නමුත් බිංගිරිය ඇතුළුව නව ආර්ථික කලාප පිහිටුවනවා කියන කොට මට හිනා ගියා. මොකද, බිංගිරිය ආර්ථික කලාපය පිහිටුවලා දැන් අවුරුදු හතක් විතර වෙනවා. 2019 මාර්තු මාසයේ තමයි එහි වැඩ පටන් ගත්තේ. අපි ආරම්භයේදීම එහි කර්මාන්තශාලා පහකට ආයෝජකයන්ට අවස්ථාව දුන්නා. බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ අක්කර 441ක් තිබෙනවා. ජර්මන් වත්තත්, ගොරකගස් අගාර වත්තත් කියලා එහි අදියර දෙකක් තිබෙනවා. එහි කටයුතු 2020න් පස්සේ බොහොම මන්දගාමී වුණා. මේ දක්වා එහි යටිතල පහසුකම් සම්පූර්ණයෙන් දියුණු කරලා නැහැ. බිංගිරිය අපනයන සැකසුම් කලාපයට ආයෝජන මණ්ඩලයත්, රජයත් බිලියන තුනකට වඩා

දැනටමත් වියදම් කරලා තිබෙනවා. තවත් විශාල මුදලක් අවශ්‍යයි. හැබැයි, ඔබතුමන්ලා මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දාලා තිබෙන වාක්‍යය නම් වැරැදියි.

"විදේශ ආයෝජන ප්‍රවර්ධනයට විදේශ ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා බිංගිරිය ඇතුළුව නව ආර්ථික කලාප පිහිටුවනවා" කියලා තිබෙනවා. ඒක වැරැදියි. බිංගිරිය කියන්නේ තිබුණු ආර්ථික කලාපයක්. බිංගිරිය දියුණු කරන අතර තව ආර්ථික කලාප පිහිටුවනවා කියලා තිබුණා නම් තමයි මේක හරි. නේද, හඳුන්නෙත්ති ඇමතිතුමා? බිංගිරිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වාගේම, ඒ අමාත්‍යාංශයේ එවකට රාජ්‍ය ඇමතිවරයා විධියට මේකට මම දක්වපු දායකත්වය මම දන්නවා. මම ආරම්භ කරපු වැඩේ නිසා, මට මේ ගැන පොඩි ආඩම්බරයක් තිබෙන නිසා වචනයේ පොඩි වෙනස්වීමක් වුණත් ඒ ගැන මට පොඩි කැක්කුමකුත් තිබෙනවා. හැබැයි, ඒකට මේ වෙන් කරලා තිබෙන මුදල ප්‍රමාණවත් ද කියන්නකෝ?

බිංගිරියේ අක්කර 441ක් දියුණු කරන්න තව විශාල මුදලක් අවශ්‍යයි. ඊට අමතරව ඔබතුමන්ලා නව ආර්ථික කලාප හදනවා නම් තවත් මුදල් ඕනෑ. මේ සොච්චම, බිලියන 0.9, එහෙම නැත්නම් මිලියන 900ක මුදල බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ ඉදිරි වැඩ කටයුතු ටික දියුණු කරන්නවත්, අඩුම ගානේ ගොරොක්ගස් අගාර වත්තට යන්නවත්, දැන් තිබෙන ජර්මන් වත්තෙන් එහාට යන්නවත් ප්‍රමාණවත් නැහැ.

අපි කියුබික් මීටර් 2,000ක් සඳහා දැනට water supply එකක් හදලා තිබෙනවා. ඒ වාගේම මෙගොවොට් 2ක විදුලි supply එකක් හදලා තිබෙනවා. ඒක මෙගාවොට් 10කට තව වැඩි දියුණු කරන්න ඕනෑ. කියුබික් මීටර් 10,000 දක්වා ජල සැපයුම වැඩි දියුණු කරන්න ඕනෑ. ඊට අමතරව බිංගිරියේ ඉදන් මාදම්පේ දක්වා sea outfall එකක් සැලසුම් කරලා තිබෙනවා, අපද්‍රව්‍ය යවන්න. දැනට dry operations විතරයි පුළුවන්. මේ අක්කර 441ට අමතරව අල්ලපු වැටේ තිබෙන NLDB වත්ත, කොවුල්වැව වත්ත අක්කර 130ක් තිබෙනවා. හීන්වැලි අගාරයේ Chilaw Plantations Limited එකේ අක්කර 550ක් තිබෙනවා. ඒ ඔක්කෝම එක්ක මේක අක්කර 1,100ක් දක්වා දියුණු කරන්න පුළුවන්. රට වටේ ආයෝජන කලාප හදන්න මුදල් වෙන් කරනවා නියා අඩුම ගානේ බිංගිරිය දැවැන්ත අපනයන සැකසුම් කලාපය දියුණු කරන්නවත් මුදල් වෙන් කරලා නැහැ. ඒ නිසා නව ආයෝජන කලාප නොවෙයි, හදපු බිංගිරිය අපනයන සැකසුම් කලාපය දියුණු කරන්න අවශ්‍ය මුදල් වෙන් කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා.

අද කටුනායක, බියගම, කොග්ගල, සීතාවක අපනයන සැකසුම් කලාපවල ඉඩම් නැහැ. ඒ නිසා මේකේ වටිනාම දේ තමයි ඉඩම්. අලුත් ආයෝජකයෙකුට ඉතාම ආකර්ෂණීයම ස්ථානය තමයි බිංගිරිය අපනයන සැකසුම් කලාපය. කොළඹ ඉඳන් කිලෝමීටර 80යි, කටුනායක ඉඳන් කිලෝමීටර 50යි තිබෙන්නේ. හොඳ මිනිස්සු මේ පැත්තේ ඉන්නේ, පාතාලය එහෙම නැහැ. මිනිස්සුන්ට ගිහින් වැඩ කරන්න පුළුවන්, ශ්‍රමය සොයා ගන්න පුළුවන්. බිංගිරිය අපනයන සැකසුම් කලාපය ආයෝජකයන්ට ආකර්ෂණය කරවන්න මේ සොච්චම් මුදලින් බැහැ. ඒ නිසා නව ආයෝජන කලාප ගැන හිතන්නවත් එපා. ඔබතුමන්ලාට ඒ ගැන හිතන්නවත් ප්‍රමාණවත් මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා නැහැ. අඩුම ගානේ බිංගිරිය අපනයන සැකසුම් කලාපය දියුණු කරන්නත් මීට වඩා විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. ජනාධිපතිතුමාත් අවස්ථා ගණනාවකදී කියා තිබෙනවා, ආයෝජන කලාප 10ක්ද කොහේද දානවා කියලා. හැබැයි ඒ සඳහා මුදල් කෝ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? මේ මුදල් ප්‍රමාණවත් නැහැ. දාන්න මුදල් තිබෙන්න එපා යැ. මම දකින විධියට, ඔබතුමන්ලාට තිබෙන එකක් වැඩි දියුණු කරන්න පුළුවන් නම්, ඒකේ අංක එකට තිබෙන්නේ බිංගිරිය.

ඊළඟට, හම්බන්තොට අපනයන සැකසුම් කලාපයත් තිබෙනවා. අපි ඒ කාලයේ එහි කර්මාන්තශාලා කිහිපයක් ආරම්භ කළා. සිමෙන්ති කර්මාන්තශාලාව ඇතුළු කර්මාන්තශාලා කිහිපයක් ආරම්භ කළා. එතැනටත් යන්න පුළුවන්. මේවා අන්ත දෙකක තිබෙන්නේ. හම්බන්තොට වරාය මුල් කරගෙන හම්බන්තොට ආයෝජන කලාපය දියුණු කරන්න පුළුවන්. කොළඹ වරාය ඉලක්ක කරගෙන බිංගිරිය අපනයන සැකසුම් කලාපය දියුණු කරන්න පුළුවන්. ඒ නිසා ප්‍රමාණවත් මුදල් මේ සඳහා වෙන් කිරීම තමයි වැදගත් වෙන්නේ. ඒ වාගේම භූමියේ ඉඩකඩ ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා ආයෝජකයෝ ආකර්ෂණය කර ගන්න වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ඒකට ප්‍රධානතම අවශ්‍යතාව තමයි යටිතල පහසුකම් දියුණු කිරීම. දැනට එතැනට ආයෝජන 7ක් විතර ඇවිල්ලා තිබෙනවා. Pharmaceuticals සම්බන්ධව ඩොලර් මිලියන 48ක දැවැන්ත ආයෝජනයක් තිබෙනවා. දැවැන්ත ගොඩනැඟිලි ඉදි වෙනවා. ඇඟලුම් කර්මාන්තයක් ඇවිල්ලා තිබෙනවා. තවත් කර්මාන්ත 4ක් ඇවිල්ලා තිබෙනවා. ඊයේ පෙරේදා, මේ 9වැනි දාත් එතැනට තවත් ආයෝජකයකු පැමිණියා. ඒ තිබෙන තැන promote කරලා එතැනට ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම තමයි වැදගත් වෙන්නේ. අපේ එරංග ගුණසේකර මන්ත්‍රීතුමා කිව්වා, "මම කළා, මම කළා" කියලා බොරුවට කෑ ගහනවා කියලා. මේක නම් නලින් බණ්ඩාර වන මමම තමයි කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හිටපු ජනාධිපතිවරයාත් බාධා කරද්දී, දිස්ත්‍රික්කයේ අපි දන්නා අයම පොල් ඉඩම් කපනවා, පොල් ගස් කපනවා කියලා බාධා කරද්දී, Cabinet Papers දැම්මාම ඒවා reject කරද්දී, විශාල පරිශ්‍රමයක් දරලා තමයි අපි මේ ආයෝජන කලාපය යථාර්ථයක් බවට පත් කළේ, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි. මම කළාය කියලා කිව්වාට මගේ සල්ලි නම් නොවෙයි, රජයේ සල්ලි. ඒකත් කියන්න ඕනෑ නේ. මම කළා කිව්වාම සමහරු අහනවා නේ, "උඹ ගෙදරින්ද සල්ලි ගෙනාවේ?" කියලා. Facebook එකේ එහෙම ඒ වාගේ අහන කට්ටිය ඉන්නවා. ගෙදරින් සල්ලි ගෙනාවේ නැහැ. අපි ඒ ව්‍යාපෘතිය කරන්න අවශ්‍ය යටිතල පහසුකම් ටික, අවශ්‍ය පියවර, ඒ රාජ්‍ය මැදිහත්වීම, දේශපාලන මැදිහත්වීම, ඒ සම්බන්ධීකරණය කරලා ඒක යථාර්ථයක් බවට පත් කළා. මොකද, රනිල් වික්‍රමසිංහ මහත්මයාත් ආයෝජන කලාප 7ක් ගැන කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි යථාර්ථයක් බවට පත් වුණේ බිංගිරිය විතරයි. එතුමාගේ බොහොම හිතවත් සාගල රත්නායක මහත්මයාගේ වැලිගම ආයෝජන කලාපයක් කරන්න හැදුවා, අකිල විරාජ් මහත්මයාගේ කුලියාපිටිය ආයෝජන කලාපයක් කරන්න හැදුවා, හොරණ වගවත්තේ ආයෝජන කලාපයක් ඇති කරන්න හැදුවා. හැබැයි බිංගිරියේ නලින් බණ්ඩාරගේ ව්‍යාපෘතිය විතරයි යථාර්ථයක් බවට පත් වුණේ. ඒ නිසා කිව්වාට කරන්න ලේසි නැහැ. ඔබතුමන්ලාත් 10ක් 11ක් ගැන ඉලක්කම් කියන්නේ නැතිව, බිංගිරිය අපනයන සැකසුම් කලාපය promote කරලා, ඒකට අවශ්‍ය යටිතල පහසුකම්වලට සල්ලි දීලා ඒක ඉස්සරහට අරගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියන එක මේ අවස්ථාවේදී මම සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කර්මාන්තකරුවන්ට තිබෙන ප්‍රධාන ගැටලු කිහිපය අතරින් එකක් තමයි, දරාගන්න බැරි විදුලි බිල. විශේෂයෙන්ම අපේ ප්‍රදේශයේ පොල් ආශ්‍රිත කර්මාන්ත ගණනාවක් තිබෙනවා. DC කර්මාන්තය තිබෙනවා, ඒ වාගේම පොල්තෙල්, පොල් කිරි, පොල් ආශ්‍රිත උපස්තර අපනයනයන් කරන කර්මාන්ත තිබෙනවා. මේ විධියට පොල් ආශ්‍රිත කර්මාන්ත ගණනාවක් තිබෙනවා. අද පොල් කර්මාන්තයට බරපතළ ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. එක පැත්තකින් පොල් මිල වැඩියි, අනෙක් පැත්තෙන් විදුලිය මිල වැඩියි, ඒ වාගේම ලෝකයේ අනෙක් රටවල් සමඟ තරග කරන්න තිබෙන බාධා සහ අධික බදු, මේ සියලු දේවල් පොල් කර්මාන්තයට බලපානවා.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

පොල් ආශ්‍රිත කර්මාන්තවලින් අපේ ආර්ථිකයට ඇමෙරිකානු ඩොලර් මිලියන 800ක දායකත්වයක් ලැබෙනවා. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ට අවශ්‍ය දිරි ගැන්වීම්, රාජ්‍ය මැදිහත් වීම් සහ ඔබතුමන්ලාගේ සහයෝගය ලැබුණොත් එය ඩොලර් මිලියන 1,000 දක්වා අරගෙන යන්න පුළුවන්. එම නිසා පොල් කර්මාන්තය වැඩිදියුණු කරන්න, ඔබතුමන්ලාගේත්, මේ රජයේත් සහයෝගය අවශ්‍යයි.

පොල් ආනයනය කිරීම සඳහා ඔබතුමන්ලා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තා. පොල් ගෙඩි මිලියන 200ක් ගෙනෙන්න තීන්දු කළා. හැබැයි, මේ දක්වා එක පොල් ගෙඩියක්වත් ගෙනෙන්න බැරි වුණා. මේ වැඩේ කරන්න ගියාම නොයෙක් බාධා එනවා, ප්‍රායෝගික බාධා එනවා කියලා කියන්න පුළුවන්. මම ඒක දන්නවා.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
පොල් ගෙඩි මිලියන 200කට සමාන පොල් මද ගෙනෙන්න තමයි අපි තීන්දු කළේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඒක තමයි. හැබැයි, ගෙනාවේ නැහැ නේ. ගෙනෙන්න බැරි වුණා.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
හෙට එනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
හෙට එනවා ද? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරද්දී බාධා එනවා. Quarantine Unit එකෙන් බාධා ඇති වෙන්න පුළුවන්, CRI එකෙන් බාධා ඇති වෙන්න පුළුවන්. නොයෙක් ප්‍රශ්න ඇති වෙනවා. නමුත් ඒ බාධාවලට විසඳුම් සොයලා ඒවා ක්‍රියාත්මක කරන එක තමයි වැදගත් වෙන්නේ.

විශේෂයෙන්ම අපේ රටේ කර්මාන්තකරුවන්ට බැංකුවලින් දෙන සහාය ගැනත් මම කියන්න ඕනෑ. පරාටේ නීතිය සම්බන්ධව හිටපු ආණ්ඩුව ලබා දුන්නේ බොහොම මන්දාගමී සහායක්. අපි විපක්ෂයේ සිටියදී විපක්ෂ නායකවරයා විධියට සජිත් ප්‍රේමදාස මැතිතුමා ඒ සඳහා විශාල සටනක් ක්‍රියාත්මක කළා. කොවිඩ් ව්‍යසනයෙන් පස්සේ කර්මාන්තකරුවන් විශාල පිරිසකට බැංකුවලින් ලබා දුන් සහන පාරාවළල්ලක් බවට පත් වුණා. ඔවුන් ලබා ගත් loans reschedule කළාම පොලියට පොලිය ගෙවන්න සිදු වුණා. එම නිසා බැංකුවලින් ඔවුන්ගේ දේපළ අත් පත් කර ගන්න තත්ත්වයක් ඇති වුණා. එම නිසා පරාටේ නීතිය පිළිබඳව රජය තවදුරටත් තමන්ගේ දායකත්වය, තමන්ගේ මැදිහත් වීම කරලා කර්මාන්තකරුවන් නහා සිටුවීමට දායකත්වය දෙන්න ඕනෑ.

ක්‍රීඩා අමාත්‍යාංශය ගැනත් මම කථා කරන්න ඕනෑ. බොහොම හොඳ ඇමතිවරයෙක් අද ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට පත් වෙලා ඉන්නවා. ඒ වාගේම ක්‍රීඩා නියෝජ්‍ය ඇමති ගරු සුගත් තිලකරත්න මැතිතුමා ගැනත් මම සතුටු වෙනවා. මට මතකයි, 1993 වර්ෂයේ අනුරාධපුර මහජන ක්‍රීඩාංගණයේදී පැවැති ජාතික පාසල් ක්‍රීඩා තරගාවලියේ මීටර් 400 අවසන් තරගයට එතුමාත් එක්ක මමත් සහභාගි වුණා. මම ඒක කියන්නේ, මට ඒක ලොකු ආඩම්බරයක් නිසායි. හැබැයි, ඔබතුමා ජාත්‍යන්තරයට දුවගෙන ගියා, මම ඔබතුමාට කලින් පාර්ලිමේන්තුවට දුවගෙන ආවා. ඒ කෙසේ වෙතත්, ක්‍රීඩාව මේ රටේ ආර්ථිකයට ශක්තියක් වන තැනට පත් කරන්න ඕනෑ. මේ ලෝකයේ ක්‍රීඩා ආර්ථික තිබෙන රටවල් තිබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි අපට අල්ලපු රට වන ඉන්දියාව. ඔවුන් ක්‍රීඩා ආර්ථිකයක් නිර්මාණය කරගෙන තිබෙනවා. අපේ රටේ ඉන්නේ දුප්පත් ක්‍රීඩකයෝ. අපි දන්නවා, ඔබතුමා නුවරඑළිය දිස්ත්‍රික්කයේ, මස්කෙළිය, විදුලිපුර ගමෙන් ආපු ක්‍රීඩකයෙක් බව. ඒ වාගේ විශාල පිරිසක් ඉන්නවා. විශේෂයෙන් මලල ක්‍රීඩාවට එන්නේ ගම්වල දරුවන්. මලල ක්‍රීඩකයින්ගෙන් අති බහුතරයක් ගම්වල අය. ඒ අයට ශක්තිය අවශ්‍යයි, රාජ්‍ය මැදිහත් වීම අවශ්‍යයි. පාසලෙන් හඳුනා ගනු ලබන ක්‍රීඩකයා, ඊළඟට ජාත්‍යන්තරය දක්වා අරගෙන යන්න අවශ්‍ය මැදිහත් වීම කරන්න පුළුවන් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයට. එහෙම නම් ක්‍රීඩා අමාත්‍යාංශයට වගකීමක් තිබෙනවා. මේ රටේ දක්ෂ දරුවන් හඳුනාගෙන, ඔවුන්ට අවශ්‍ය පහසුකම් දීලා, ඔවුන්ට අවශ්‍ය තාක්ෂණය දීලා, පුහුණුව දීලා, ඔවුන්ව ජාත්‍යන්තරයට අරගෙන යන්න ක්‍රීඩා අමාත්‍යාංශයට පුළුවන් වෙන්න ඕනෑ.

විශේෂයෙන් දකුණු ආසියාව ගත්තාම, අපේ රටේ තමයි දක්ෂ මලල ක්‍රීඩකයෝ ඉන්නේ. ආසියාවම ගත්තත් එහෙමයි. මේ ආසියානු කලාපයේ හැම දාම වාගේ දක්ෂ මලල ක්‍රීඩකයෝ බිහි වුණේ ලංකාවෙන්, සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමනි. ආසියාවේ මලල ක්‍රීඩකයින් බිහි කරන්න පුළුවන් හොඳම භූමිය තමයි, අපේ රට. ඒ නිසා ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයට ඒ සඳහා දැවැන්ත කාර්යභාරයක් පැවරෙනවා. ඒ කාර්යභාරය තුළින් එදා සුසන්නිකා ජයසිංහ මහත්මිය අපට ඔලිම්පික් පදක්කමක් ගෙනාවා වාගේ තවත් ඔලිම්පික් පදක්කම් ඉදිරියේදී ගෙනෙන්න පුළුවන් තැනට අපේ රටේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පත් කරන්න.

මම අවසාන වශයෙන් ගරු ක්‍රීඩා ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් මේ කාරණය ඉදිරිපත් කරන්න කැමැතියි. අනේ, අපට ලොකු උදව්වක් කරන්න. බිංගිරිය ආයෝජන කලාපය ගැන කථා කළා වාගේම බිංගිරියේ තිබෙනවා, පළාත් ක්‍රීඩා සංකීර්ණයක්. අපේ බිංගිරිය නගරය අවට ප්‍රදේශවල සිටින අය හවසට සෙල්ලම් කරපු, musical show එකක් පවත්වපු, උත්සවයක් පවත්වපු ඒ භූමිය දැනට අවුරුදු 8කට ආසන්න කාලයක සිට අපට අහිමි වෙලා තිබෙනවා. ඒ භූමියේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු අපේ දයාසිරි ජයසේකර මැතිතුමා තමයි ආරම්භ කළේ. හැබැයි, ඒ කටයුතු තවම අවසන් වෙලා නැහැ. ඒ නිසා ඔබතුමන්ලා මැදිහත් වෙලා මේ බිංගිරිය පළාත් ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කරන්න. එහෙම නැත්නම් එහි කොටසක් හෝ හදා අවසන් කරන්න. මොකද, මේ වන විටත් මෙයට විශාල වියදමක් දරා තිබෙනවා. ජනතාවට, පළාතේ ක්‍රීඩකයින්ට, රටේ ක්‍රීඩකයින්ට ප්‍රයෝජනයට ගන්න පුළුවන් තැනට මේ ස්ථානය පත් කරන්න වහාම කටයුතු කරන්න කියා මා ඉල්ලනවා. අද වැඩියෙන් කථා කරන්නට යෙදුණේ බිංගිරිය ගැනයි. ඒ ගැනත් සතුටු වෙමින් මගේ කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් කුමාර ගමගේ ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.31]

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)

(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)

(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දිනයේ මේ සාකච්ඡා එක්ක ගන්නකොට අමාත්‍යාංශයක් විධියට අපේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ජාතික තරුණ සේවා සභාව සහ ජාතික යොවුන් සේනාංකය පාවිච්චි කරමින්, ඒවායේ අරමුණු අනුව යමින්, අපේ රටේ තාරුණ්‍යය ගොඩනහන්න බලාපොරොත්තු වෙනවා. ජාතික තරුණ සේවා සභාවටත්, ජාතික යොවුන් සේනාංකයේ ඇඹිලිපිටියේ මධ්‍යස්ථානයටත් අපි මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒ ආයතන නැවත පණ ගන්වා, ඒ හරහා අපේ රටේ තාරුණ්‍යයට ඔවුන් බලාපොරොත්තු වන රට හදලා දෙන්න අපි උත්සාහ ගන්නවා. ඒ වෙනුවෙන් අපි මැදිහත් වෙනවා. දේශපාලන, සමාජයීය සහ ආර්ථික ක්‍රියාවලියේදී නායකයින් සපයන්න පුළුවන් මධ්‍යස්ථාන දෙකක් තමයි අප සතුව තිබෙන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, අපේ තරුණ ප්‍රජාව දක්ෂ, දියුණු තරුණයන් විධියට නිර්මාණය කරගන්න, දියුණු සංස්කෘතියක් සහ නිදහස් චින්තනයක් සහිත තරුණයන් නිර්මාණය කරගන්න.

ක්‍රීඩාව පැත්තෙන් සලකා බැලුවොත්, අපේ රටේ ලියාපදිංචි වෙච්ච ක්‍රීඩා සංගම් 74ක් තිබෙනවා. ලංකාවේ මේ බොහෝ තැන්වල, ක්‍රීඩාව තීරණය කරන්නේ, ක්‍රීඩාවේ දියුණුව තීරණය කරන්නේ, ක්‍රීඩාවේ ජයග්‍රහණ තීරණය කරන්නේ ක්‍රීඩකයන්ට වඩා මෙන්න මේ ක්‍රීඩා සංගම්වල නිලධාරීන්. මේක ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ බෙදවාචකයක් හැටියටයි අපි දකින්නේ. ඒ නිලධාරීන් අතර තිබෙන කඹ ඇදීම, සභාපති, ලේකම් තනතුරුවලට තිබෙන බල පොරය, ඒ තනතුරුවල අවුරුදු ගණන් සිටීම තුළ ඇති වුණු අක්‍රමිකතා, දූෂණ, වංචා කියන මේ සියල්ල අපේ රටේ ක්‍රීඩාවට කණ කොකා හඬන්න හේතු වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ සියල්ලටම උත්තර සපයන්න පුළුවන් ක්‍රීඩා ව්‍යවස්ථාවක්, පනත් කෙටුම්පතක් සහ ගැසට් එකක් ඉදිරිපත් කරලා මේ අර්බුද ටික නුදුරු කාලයේදීම විසඳාගන්නවා. මොකද, මේ අර්බුද විසඳන්නේ නැතුව, මේ ක්‍රීඩා සංගම්වල තිබෙන ප්‍රශ්න ටික විසඳන්නේ නැතිව අපේ රටේ ක්‍රීඩාව ගොඩනහන්න වෙන විධියක් නැහැ, ඒකට මැදිහත් වෙන්න වෙන විධියක් නැහැ. ඒ වෙනුවෙන් අපි පසුගිය කාලයේ සෑහෙන කාලයක් කැප කළා. ඒ වෙනුවෙන් අපි ක්‍රීඩා සංගම්වල නිලධාරීන් කැඳෙව්වා, විශේෂයෙන්ම ප්‍රශ්න තිබෙන අය ගෙන්නුවා, ඒ නඩුවලට මැදිහත් වුණා. අපි බලාපොරොත්තු වෙනවා, මෙන්න මේ ක්‍රීඩා සංගම්වල තිබෙන ගැටලු ටික විසඳාගෙන ක්‍රීඩාව ඉදිරියට ගෙන යන්න. අපි ඉන් සෑහෙන කොටසක් මේ වෙනකොටත් අවසන් කර තිබෙනවා.

මෙවර අය වැයෙන් අපි ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් දියුණු කරන්න විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මේ කාරණය මම විශේෂයෙන්ම මතු කරනවා. ජාතික සමගිය සඳහා උතුරු, නැහෙනහිර පළාත් වෙනුවෙන් අපි ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් විතරක් විශාල මුදලක් වෙන් කර තිබෙනවා.

උදාහරණයක් විධියට, නැහෙනහිර පළාත් ක්‍රීඩා සංවර්ධනයට රුපියල් මිලියන 300ක් අපි වෙන් කරනවා. කිලිනොච්චිය පළාත් ක්‍රීඩා සංකීර්ණයට රුපියල් මිලියන 85ක්, වවුනියා ක්‍රීඩා සංකීර්ණයට රුපියල් මිලියන 40ක්, මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයට රුපියල් මිලියන 348ක්, කල්මුනේ සන්ධන්ගනී ක්‍රීඩා සංකීර්ණයට රුපියල් මිලියන 150ක්, යාපනය දිස්ත්‍රික්කයේ ක්‍රීඩා පිටි සංවර්ධනයට රුපියල් මිලියන 150ක්, උතුරු පළාතේ ක්‍රීඩා පාසල් සංවර්ධනයට තවත් රුපියල් මිලියන 100ක් අපි වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම උතුරු, නැහෙනහිර පළාත්වලට විශාල මුදලක් -අපේ ප්‍රාග්ධන වියදමෙන් පහෙන් එකක් විතර- වෙන් කර තිබෙනවා, මෙතෙක් නොසලකා හැර තිබුණු උතුරු, නැහෙනහිර ගම් බිම්වලට ක්‍රීඩාව අරගෙන යන්න. මම උතුරු පළාතේ යාපනයේ සංචාරයක නිරත වුණා, මීට සති 3කට විතර කලින්. අපි ඒ ගම්වලට ගියා, ගම්වල ක්‍රීඩා තත්ත්වය හොයන්න. ඒ ගම්වල මිනිස්සු කිව්වේ, අපේ ප්‍රදේශයට ඇමතිවරයෙක් ආපු පළමුවෙනි වතාව මෙය කියලායි. මට ඒකත් ලොකු ආඩම්බරයක්. දකුණේ මන්ත්‍රීවරයෙක් උතුරේ ගම්වලට ගියේ පළමුවෙනි වතාවට. ඒගොල්ලන්ට තිබෙන්නේ පොඩි පොඩි අවශ්‍යතා. ලොකු දේවල් ඒ මිනිස්සු ඉල්ලන්නේ නැහැ. ඒ නිසා ගම් ඇතුළේ ක්‍රීඩාව නඟාසිටුවන්න, ඒ මිනිස්සුන්ට ක්‍රීඩා සංස්කෘතියක් ඇති කරන්න අවශ්‍ය වැඩ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා. අපි ඒවා හදාරලා අධ්‍යයනය කරමින් ඉන්නවා. ඒ වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. අපට ඉදිරි මාස ටික තිබෙන්නේ ඒ වෙනුවෙන් වැඩ කටයුතු පටන් ගන්න.

ඒ වාගේම මන්ත්‍රීවරයෙකුත් ඉල්ලීමක් කළා, කල්මුනේ සන්ධාන්ගනී ක්‍රීඩා සංකීර්ණය කාන්තාවන්ට ක්‍රීඩා කරන්න පුළුවන් විධියට හදලා දෙන්න කියලා. අපේ වැඩසටහන් ඇතුළේ අපි විශේෂයෙන්ම අවධානය යොමු කර තිබෙනවා, කාන්තාවන් ක්‍රීඩාවට යොමු කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව. මොකද, අපේ රටේ කාන්තාවන් තමයි ජාත්‍යන්තර ජයග්‍රහණ විශාල ප්‍රමාණයකට උරුමකම් කියන්නේ. කාන්තාවන් ඒ වෙනුවෙන් මැදිහත් වෙනවා. විශේෂයෙන් කාන්තාව වටා තිබෙන පාරිසරික තත්ත්වයන්, ඔවුන් ජීවත් වන සමාජ, ආර්ථික වටපිටාව ඇතුළේ ක්‍රීඩාවට එන්නේ කොහොමද කියන එක අපේ සමාජයේ ගැටලුවක් වෙලා තිබෙනවා. නමුත්, අපි ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් ඒ ගැටලුව නිරාකරණය කර ගන්න පුළුවන් වනවා. විශේෂයෙන්ම ක්‍රීඩාව ගමට ගෙනයන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කර තිබෙනවා. සෑම ග්‍රාම නිලධාරී වසමකටම ක්‍රීඩා සංගමයක්, තරුණ සංගමයක් ගොඩනඟලා, ඒවාට තරුණයන් සහ මිනිස්සු එකතු කරන වැඩ පිළිවෙළක් අපි මේ වනකොට ක්‍රියාත්මක කරගෙන යනවා. අපි බලාපොරොත්තු වනවා, ඒ තුළින් ගම්වල සිටින මිනිස්සු ක්‍රීඩාවට යොමු කරන්න, විශේෂයෙන් සංස්කෘතියක් විධියට ඔවුන් ක්‍රීඩාවට යොමු කරන්න. විශේෂයෙන්ම රාත්‍රී කාලයේ ක්‍රීඩා කරන්න පුළුවන් අවස්ථා සහ කාන්තාවන්ට රාත්‍රී කාලයේ ක්‍රීඩා කරන්න පුළුවන් සංස්කෘතියක් නිර්මාණය කර ගන්න අපි මැදිහත් වෙමින් සිටිනවා.

ඒ වාගේම ක්‍රීඩකයන්ගේ සංවර්ධනය වෙනුවෙනුත් අපි විශාල මුදලක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ජාතික සංචිත සඳහා පෝෂණ ආහාර පාන, ඇඳුම් පැළඳුම් සහ අනිකුත් අවශ්‍යතා සඳහා අපි රුපියල් මිලියන 400ක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම "ක්‍රීඩා ශක්ති" වැඩසටහනට රුපියල් මිලියන 200ක්, ජාත්‍යන්තර ක්‍රීඩා තරග සඳහා පහසුකම් සැපයීමට රුපියල් මිලියන 150ක්, ක්‍රීඩා තරගාවලිවලට රුපියල් මිලියන 500ක් වාගේ විශාල මුදලක් ක්‍රීඩකයන්ගේ සංවර්ධනය වෙනුවෙන් අපි යොදවා තිබෙනවා.

ඒ වාගේම ප්‍රධාන ක්‍රීඩා සංගම් 4ක් - ශ්‍රී ලංකා මෝටර් රථ සම්මේලනය, ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය, ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනය, ශ්‍රී ලංකා රග්බි සංගමය - මේ වනකොට තහනම් වෙලා තිබෙනවා. ඒවායේ නීතිමය බාධා ඉක්මනින් ඉවත් කරගෙන ඒ සංගම් නැවත ක්‍රීඩාවට අරගෙන එන්න අපි උත්සාහ ගන්නවා. මොකද, මේ සංගම් නැතිව අපට ක්‍රීඩාව ඉස්සරහට ගන්න අවස්ථාව නැහැ. ඒ වාගේම ක්‍රීඩා සංගම් 6ක් තාවකාලිකව නවතා දමා තිබෙනවා. අපි ඒවා ගැනත් අධ්‍යයනයක් කරගෙන

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

යනවා, ඇයි ඒ ක්‍රීඩා සංගම් නවතා තිබෙන්නේ, ඒවා නැවත පටන් ගන්න ඕනෑද, එහෙම නැත්නම් ඒවාට මොකක්ද කරන්නේ කියන එක සම්බන්ධව.

ඒ වාගේම ශ්‍රී ලංකා ක්‍රිකට් ගැනත් හැමෝම සාකච්ඡා වනවා. මා ඒ ගැනත් යමක් කියන්න ඕනෑ. අපි කිසිම ක්‍රීඩාවක් හා සම්බන්ධ සංගමයක හෝ ආයතනයක නිලවරණයකට අමාත්‍යාංශයක් විධියට මැදිහත් වෙන්නේ නැහැ. අපි ක්‍රීඩාවට දේශපාලනය ගෙනියන්නේ නැහැ. හැබැයි, ඒ ආයතනවල සිද්ධ වන වංචා, දූෂණ සම්බන්ධයෙන් අපි අනිවාර්යයෙන්ම මැදිහත් වෙනවා. ලංකාවේ ක්‍රීඩාවේ උන්නතිය, ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් අපි ඒ ආයතනවලට මැදිහත් වෙනවා.

මොකද, ක්‍රීඩකයින් සහ ක්‍රීඩාව කියන්නේ අපේ රටේ සම්පත්. ඒ සම්පත්වලට ආණ්ඩුව විධියට අපි වග කියන්න ඕනෑ. ඒක නිසා රජය විධියට අපි ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් අනිවාර්යයෙන්ම මේ හැම ආයතනයක් සම්බන්ධයෙන්ම මැදිහත්වීමක් කරනවා. ඒ වාගේම ක්‍රීඩා සංස්කෘතියක් ඇති කරන්න අපි පියවර ගන්නවා. අපි දැනටමත් ව්‍යායාම කිරීම සඳහා app එකක් වාගේම programme එකක් නිර්මාණය කරමින් යනවා. අපි ඉදිරියේදී ඒක ඉදිරිපත් කරනවා. ඒ වාගේම බයිසිකල් පැදීම වාගේ දේවල් සංස්කෘතියක් කර ගැනීමට අවශ්‍ය කරන වටපිටාව නිර්මාණය කර ගන්න මේ දවස් වනකොට අපි වැඩ කටයුතු කරගෙන යනවා.

අපේ ක්‍රීඩා සංවිතවල ක්‍රීඩකයන්ට නේවාසිකාගාරවලින් ලබා දෙන ආහාර පාන පිළිබඳවත් ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා. අද දිනයේත් අපි ක්‍රීඩකයන් 51දෙනෙකුට අපේ ක්‍රීඩා නේවාසිකාගාරයේ නවාතැන් සපයා තිබෙන බව මම කියන්න කැමැතියි. 95දෙනෙකුට අපි ආහාර පහසුකම් සපයා තිබෙනවා. එතුමා කිව්වා වාගේ නොවෙයි, අපේ නියෝජ්‍ය ඇමතිතුමා මැදිහත් වෙලා, ඒගොල්ලන්ගේ ආහාර plan එක ගැන හොයලා, හොඳ ආහාර වේලක් අපි මේ දවස්වල ඒ ක්‍රීඩකයන්ට ලබා දෙමින් තිබෙනවා. මම හිතන විධියට එතුමන්ලා හිතනවා ඇති, එතුමන්ලාගේ කාලයේ වෙච්ච දේ තවමත් වෙනවා කියලා. එහෙම හිතාගෙන තමයි මේ දේවල් දැන් අපිට කියන්නේ. එම නිසා මම ඒ කාරණයත් මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වෙච්ච විධියටම ක්‍රීඩාවට අදාළව සාධාරණ ප්‍රවේශයක් ලබා ගන්න, ප්‍රමාණවත් යටිතල පහසුකම් සපයන්න, ජාත්‍යන්තර සහයෝගීතාව ලබා ගන්න, වෘත්තීය මට්ටමේ ක්‍රීඩකයන් බිහි කරන්න, ක්‍රීඩා සංස්කෘතියක් නිර්මාණය කරන්න අපි අනිවාර්යයෙන්ම දැනටමත් වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා අපි අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒ වැඩ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා. ඒ නිසා අපි මේ මාස තුන ඇතුළත අපේ පැත්තෙන් උපරිම වශයෙන් කටයුතු කරමින් එම අරමුණ කරා ළඟාවීමට අවශ්‍ය තත්ත්වය නිර්මාණය කරගෙන තිබෙනවා. ඒ අනුව අපේ රටේ ජනතාවට පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගත කරන්න අපේ අමාත්‍යාංශය පැත්තෙන් ලබා දීමට අවශ්‍ය උපරිම දායකත්වය අපේ නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනා සහ අපේ කාර්ය මණ්ඩලය ඉටු කරන්න සූදානමින් ඉන්නවා කියන පොරොන්දුව මම ලබා දෙනවා. ඒ වාගේම මේ අය වැය සකස් කිරීමට උදව් කළ, ඒ වෙනුවෙන් දායක වෙමින් අවංකව එම කටයුතු සාර්ථක කර ගන්න සහයෝගය දැක්වූ සියලු නිලධාරීන්ටත්, කාර්ය මණ්ඩලයටත් ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.42]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිළිතුරු දෙන්න කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම අද දවසේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් අදහස් දැක්වුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ අය වැය විවාද කාලයේම දැකපු විශේෂත්වයක් ඔබතුමාත් දකින්න ඇති කියලා මම හිතනවා. ඒ තමයි, වෙනදාට ගොඩක් ආවේගශීලීව කථා කරන විපක්ෂය නියෝජනය කරන අපේ චාමර සම්පත් හිටපු රාජ්‍ය ඇමතිතුමා අද දවසේ ඉතාම සාමකාමී, විනීත කථාවක් කිරීම. ඒකට හේතුව මොකක්ද කියා දන්නවාද? ඒකට හේතුව දන්නේ එතුමායි, මමයි විතරයි. ඒකට හේතුව එතුමාත් දන්නවා, මමත් දන්නවා. ඒකට හේතුව තමයි, එතුමා කලින් අපේ අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරයා වීම. එතුමාම කියපු විධියට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය භාරව එතුමා ඉඳලා තිබෙනවා. එතුමාට භාර දීලා තිබුණේ ඒකේ එක කොටසයි. ඒ කොටසේ වෙච්ච දේවල් එතුමාත් දන්නවා, මමත් දන්නවා. ඒ නිසා එතුමා ඉතාම පරිස්සම්සහගතව තමයි අද දවසේ කථා කළේ. මම එක උදාහරණයක් කියන්නම්. ඒ වෙනුවෙන් දිවුරුම් සහතිකයක් දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම දිවුරුම් සහතිකය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ලෝටස් ඉන්ටර්නැෂනල් ට්‍රේඩ් (පුද්ගලික) සමාගම, 2020 අවුරුද්දේ තරගකාරී ලංසු කැඳවීමකදී හෙරණියාවක මැණික් පතලේ ව්‍යාපෘතියට රුපියල් මිලියන 140ක ලංසුවක් තැබුවා. ඒ, රජයේ බදු මුදල් සහිතව මැණික් පතලේ ව්‍යාපෘතියකට. හැබැයි, 2020 අවුරුද්දේ ලංසු කැඳෙවූවාට, මේක 2023 අවුරුද්ද වෙනකම්ම සිද්ධ වුණේ නැහැ. අවස්ථා කිහිපයකදීම මේ ගිවිසුම අලුත් කරමින් ගියා. ඊට පස්සේ එතුමන්ලා අපට ලිපියක් එව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ලිපියත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එම ලිපියේ සඳහන් වනවා, " ... මීට පෙර සභාපතිතුමා වූ විරාජ් මහතා අප වෙත දන්වා සිටියේ, මේ සඳහා හිටපු ගරු අමාත්‍ය චාමර සම්පත් දසනායක මැතිතුමාගේ අනුමැතිය ලබා

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගන්නා ලෙසය. නමුත් මෙවන් අනුමැතියක් අවශ්‍ය බව ගිවිසුම සම්බන්ධ මූලික කරුණු කාරණා දැනුවත් කිරීම් අතරතුර නිල වශයෙන් සඳහන් නොකළ බැවින් අදාළ උපදෙස් සැකසගිත විය..." යනුවෙන්.

ඒ කියන්නේ, මෙතුමන්ලාගේ ගිවිසුමේ තිබිලා නැහැ ලු, අදාළ ඇමතිවරයාගේ අනුමැතියක් අවශ්‍යයි කියලා. "...එමෙන්ම හිටපු අමාත්‍ය චාමර සම්පත් දසනායක මැතිතුමා විසින් ඔහුගේ මැතිවරණ බල ප්‍රදේශය තුළ සිදු කෙරෙන සුබසාධක සහ අනෙකුත් ව්‍යාපෘති සඳහා අනුග්‍රහය සහ දායකත්වය ලබා දෙන ලෙස කිහිපවරක් ඉල්ලා සිටි බවද ඔබගේ අවධානයට ගෙන ඒමට අප කැමැත්තෙමු..." කියලා එම ලිපියේ වැඩිදුරටත් සඳහන් වනවා. ඒ කියන්නේ, මට එවපු එක. ඒක දිවුරුම් ප්‍රකාශයේත් තිබෙනවා. ඒ වාගේම එම ලිපියේ තවදුරටත් සඳහන් වනවා, "...උක්ත ලංසු තැබීම මහින් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියට රුපියල් 140,000,000.00ක් වූ විශාල මුදලක් ආයෝජනය කළ සමාගමක් ලෙස මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු සහ කරුණු කාරණාවලට කිසිසේත් අදාළ නොවන අතිරේක අනුග්‍රාහක ඉල්ලීම් මෙලෙස ඉදිරිපත් කිරීම සුදුසු නොවන බව අපගේ දැඩි විශ්වාසයයි. තත්ත්වය එසේ නමුදු අප විසින් කිහිප අවස්ථාවකදී හිටපු අමාත්‍යතුමාගේ ඉල්ලීම් ඉටු කිරීමට දායක වූ අතර, අදාළ සීමාව ඉක්මවූ ඉල්ලීම් අප විසින් අනුගමනය කරනු ලබන ව්‍යාපාර ආචාර ධර්ම සහ සදාචාර පද්ධතීන්ට අනුකූලව ප්‍රතික්ෂේප කිරීමට තීරණය කළෙමු..." කියලා. ඒ කියන්නේ, ඒගොල්ලනුත් වැඩේට පොඩ්ඩක් දායක වෙලා. හැබැයි, සීමාව ටිකක් පැනලා ගිහිල්ලා, දරා ගන්න බැරි වුණාම ඒක නවත්වලා. "...අවධානයට ගත යුතු කාරණය වන්නේ අපගේ මෙම ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතීන්ට අදාළ තීරණය හිටපු අමාත්‍යතුමා විසින් සභාපතිතුමන් වෙත ගිවිසුමට අදාළ ලියකියවිලි අත්සන් කිරීමට අවසර නොදීමට හේතු පාදක කර ගැනීමයි..." කියලා එම ලිපියේ සඳහන් වනවා. ඒක තමයි හේතුව වෙලා තිබෙන්නේ ගිවිසුම අත්සන් නොකරන්න. බලන්න, මේ කාරණා. මම කිව්වේ එක කාරණයක් විතරයි. ඒ වාගේ කාරණා තවත් තිබෙනවා.

එතුමා සිමෙන්ති සංස්ථාව ගැනත් කිව්වා. සිමෙන්ති සංස්ථාවත් එක්ක ආශා මිනරල්ස් කියලා ආයතනයක් මේ වනකොට නඩුවක් කියනවා. ඒ, ආශා මිනරල්ස් කියන ආයතනය නඩු කියන්න හේතුව වෙලා තිබෙන්නේත් ඒ වාගේම එකක් තමයි. ඒගොල්ලන්ට බලපත්‍ර ලබා දෙන්න කියලා කටයුතු කරලා තිබෙනවා. ඒ බලපත්‍ර ලබා දීමේදීත් ක්‍රියාවලියක් සිද්ධ වෙලා තිබෙනවා. මම ඒ ගැන දැන් මේ ගරු සභාවේදී කියන්නේ නැහැ. මොකද, දැනටත් නඩු කටයුත්තක් තිබෙන නිසායි. නඩු කටයුත්තක් තිබෙනවා, ක්‍රියාවලියක් සිද්ධ වෙලා තිබෙනවාය කියලා. මෙන්න මේ ක්‍රියාවලිය තමයි අර්බුදය. දැන් එතුමා කිව්වා නේ, රත්නපුරයේ හිටපු අපගේ නීති අධ්‍යක්ෂිකාව වන ප්‍රියන්ති හරියට වැඩේ කරන්නේ නැහැ කියලා. ප්‍රියන්ති විවාහ වෙලා ඉන්නේ අපේ ආයතනයේ cashier කෙනෙක් එක්කයි, එතැන ගැටුමක් තිබෙනවාය කිව්වා. අපේ අමාත්‍යාංශයේ කිසිම ආයතනයක, එක ආයතනයේම ඉන්න අයට කසාද බඳින්න බාධාවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කසාද බඳින්න පුළුවන්. එහෙම අපි බාධා කරලා නැහැ. හැබැයි, ඒ අය අතරේ කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඔය වාගේ පැමිණිලි තිබුණා. ඒ පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වලා තිබෙනවා. නිර්දෝෂීභාවය ඔප්පු වෙලා තිබෙනවා. ඒක අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරලා තිබෙනවා. ගැටලුවක් නැහැ. ඒගොල්ලන්ගේ පෞද්ගලික ප්‍රශ්න තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ; ඒවා අපි හොයන්නේත් නැහැ. එතැන තිබෙන ප්‍රශ්නය මේකයි. පතල් සඳහා ලයිසන් දෙන එක දේශපාලන සූදුවක් බවට පත් වෙලා තිබුණේ. නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාත් දන්නවා, ඒ කාලයේ පතල් සඳහා ලයිසන් දීපු විධිය කොහොමද කියලා. ඒක සූදුවක් වෙලා තිබුණේ. ඒක ජාවාරමක්. ඒ ජාවාරම අපි නවත්වා තිබෙනවා. හැබැයි, ජාවාරම නැවැත්වූවාම අපට දැන් enforcementවලට නිලධාරීන් මදි; නීති නිලධාරීන් මදි. ඒ නිසා ෆයිල් ගොඩගැහෙන බව ඇත්ත. ඒ නිසා අපි දැන් රජයෙන් ඉල්ලීම් කරලා තිබෙනවා, අපට ඒ සඳහා නීති නිලධාරීන් බඳවා ගන්න අවස්ථාව ලබා දෙන්න කියලා. ඒගොල්ලන්ට ඒ කාලයේ ඒ සඳහා නීති නිලධාරීන් අවශ්‍ය වුණේ නැහැ. නමුත්, වැඩේ කරගෙන ගියා. පතල් කියන්නේ ඖෂධ වාගේම මාෆියාවක්, බිස්නස් එකක්. අපි හොයලා බලලා අවසර දෙන්නේ. අපට වැඩක් නැහැ, ඒවායින් ගැහිලි ගහන්න. එහෙම කරන්නේ නැති අයට විරුද්ධව ඒගොල්ලන් ඇවිල්ලා, තවත් නිලධාරීන් කියන ඒවා මෙතැන කියනවා වෙන්න පුළුවන්. ඒක තමයි ඇත්ත කථාව.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් කිව්වා, එතුමා කියන ප්‍රතිපත්ති සහ අපේ ප්‍රතිපත්ති ගැළපෙන්නේ නැහැ කියලා. ඒක හරි. ගැළපෙන්නේ නැති නිසා නේ අපි දෙගොල්ලන් දෙපැත්තක ඉන්නේ. ඒ විතරක් නොවෙයි. මෙච්චර කාලයක් ජනතාව එතුමන්ලාගේ ප්‍රතිපත්ති පිළිගෙන ප්‍රතික්ෂේප කළ නිසා තමයි මේ රටේ ජනතාව ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් පත් කරගෙන තිබෙන්නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඔළුවෙන් හිටගෙන කිව්වත් අපිව හරවන්න බැහැ. දැන් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා හරි ආසාවෙන් ඉන්නවා, මොකක් හරි ක්‍රමයකට එතුමන්ලා විශ්වාස කරන ප්‍රතිපත්තියකට අපි හැරෙයි, ඒ වාගේම එතුමා බලාපොරොත්තු වන වේගයෙන් liberalization කරයි කියලා. එතුමන්ලා බලාපොරොත්තු වන වේගය තමයි මේ රාජ්‍ය ව්‍යාපාර, SOEs කුණුකොල්ලෙට විකුණන එක. ඒවා ලැයිස්තුගත කරලා තිබුණේ. BCC එක ලැයිස්තුගත කරලා තිබුණේ. අද කොහොමද? පසුගිය පෙබරවාරි මාසයේ BCC එකේ turnover එක රුපියල් මිලියන 102යි. ඒ, තිබුණු ණය ගෙවලාත්. ඒ යටතේ තවමත් තිබෙන්නේ සවරින් බාර් සබන් හා පොල් තෙල් විතරයි. හැබැයි, දැන් ඒ ආයතන ලාභ ලබන තත්ත්වයට පත් කරලා තිබෙනවා.

ඒ වාගේම ලුණු සංස්ථාව සහ සිමෙන්ති සංස්ථාවත් තිබෙනවා. සිමෙන්ති සංස්ථාව ගැන මට කථා කරන්න තිබුණා, සජිත් ප්‍රේමදාස මැතිතුමා මෙතැන හිටියා නම්. විපක්ෂ නායකතුමා මෙතැන හිටියා නම් සිමෙන්ති සංස්ථාව කොහොමද විකුණුවේ කියලා කියන්න තිබුණා. සුප්‍රසිද්ධ තවක්කාල් ගනුදෙනුව ගැන කියන්න තිබුණා. ඒ කාලයේ හැටියට සිමෙන්ති සංස්ථාවේ ආදායම කීයද? සිරිසේන කුරේ තමයි එවකට නිවාස ඇමති විධියට කටයුතු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුප්‍රසිද්ධ තවක්කාල් ගනුදෙනුව සිද්ධ වෙද්දී සිමෙන්ති සංස්ථාවේ නමත් එක්කමයි විකුණුවේ. අදටත් මිනිස්සු පිළිගන්නේ "සංස්ථා සිමෙන්ති" කියන එකයි. අදටත් ලංකාවේ ප්‍රසිද්ධම brand එක "සංස්ථා සිමෙන්ති". "සංස්ථා සිමෙන්ති" කියන brand එකත් එක්ක විකිණුවා, තවක්කාල් ගනුදෙනුවෙන්. අක්කර 5,000ක්. කුණුකොල්ලෙට කළ ගනුදෙනුවක් ඒක. ඒගොල්ලන් කියන්නේ අන්න ඒ විකුණන ක්‍රමයට අපටත් එන්න කියලායි.

සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා දන්නවා ඇති, එතුමා ඉගෙන ගන්නා කාලයේ tuition fees ගෙව්වේ කොහොමද කියලා. Tuition fees ගෙව්වේත් සංස්ථාවෙන්. මේක තමයි ඉතිහාස කථාව. එහෙම යුගයක් පසු කර තමයි අපි ඇවිල්ලා තිබෙන්නේ. මේ ඉතුරු වෙච්ච ආයතන ටික ඉතුරු වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්ති අනුව නොවෙයි, මේ රටේ ජනතාවගේ අරගළය නිසායි. අපිට ජනවරම තිබෙන්නේ ඒකට. ඒ නිසා "මේවා ඉක්මනට විකුණන්න. නිදහස් කරන්න ප්‍රතිපත්ති හදන්න" කියලා හර්ෂ මන්ත්‍රීතුමා ඔළුවෙන් හිටගෙන කිව්වත්, අපි ඒවා කරන්නේ නැහැ. හැබැයි, අපි අලුත් model එකක් සොයා ගන්නවා, රාජ්‍ය අයිතිය තබාගෙන, රාජ්‍ය අයිතිය කුණුකොල්ලෙට දෙන්නේ නැතුව මේවායේ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කාර්යක්ෂමතාව උපරිම කරලා ශක්තිමත් පෞද්ගලික අංශයක් හවුල් කරගෙන රාජ්‍ය-පෞද්ගලික මහජන හවුල්කාරිත්ව පාලනයක් හදන්න. මහජන හවුල්කාරිත්ව පාලනයක්. ඒකේ මහජන කොටස විශාලයි. අපි ගොවි ජනතාවට වගකියන්න ඕනෑ. අපි මේ භූමියේ හිමිකාර ජනතාවට වගකියන්න ඕනෑ.

දැන් ඔබතුමන්ලා යෝජනා කරනවා නේ, තිබෙන ඒවා විකුණන්න කියලා. 2023දී ලංකාවට සීනි ආනයනය කර තිබෙනවා, මෙට්‍රික්ටොන් 653,000ක්. ඒ කියන්නේ ජාත්‍යන්තර ප්‍රමිතිය අනුව ගත්තත්, මනුස්සයෙක් පරිභෝජනය කරන්නේ වසරකට කිලෝ 12යි නම්, දේශීය වශයෙන් පරිභෝජනයට අපි ගන්නේ මෙට්‍රික්ටොන් 240,000යි. ඉතුරු ඒවා කර්මාන්තවලට ගන්නේ. එතකොට මෙට්‍රික්ටොන් 653,000ක් ගෙන්වීමට 2023 අවුරුද්දේ වියදම් කර තිබෙනවා, රුපියල් බිලියන 142ක්. දැන් අපේ වෑයම තමයි පැල්වත්ත, සෙවනගල, ගල්ඔය, ඇතිමලේ, කන්තලේ -කන්තලේ සීනි සමාගම දැන් වසා තිබෙන්නේ. නිෂ්පාදනයක් නැහැ- තිබෙන හෙක්ටෙයාර 30,000ක් පමණ වන ඉඩම් ටික හරියට පාවිච්චි කරන එක. ඒ ඉඩම් හරියට පාවිච්චි කරලා මේ බිලියන 142ක මුදල් ප්‍රමාණය ලංකාව තුළ ඉතුරු කරගන්නේ කොහොමද කියලා අපි බලනවා. ඒක අපි කරනවා. අපි තවම දේශීයව සීනි නිෂ්පාදනය කරන්නේ සියයට 10යි. ඒ, දුඹුරු සීනි. හැබැයි, අපි මේ කටයුත්ත කරන්න උත්සාහ කරනවා. ඒ අතර විවිධාංගීකරණය - diversification - අපට තිබෙනවා. අපි ඒක සංචාරක කර්මාන්තය ඇතුළු විවිධ දේවල්වලට එකතු කරගන්නවා. මේ විවිධත්වය අපි තේරුම් ගන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්. තව මිනිත්තුවකින් කථාව අවසන් කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි.

මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, ස්වේච්ඡාවෙන් වැඩ කරන, කාලය, වැටුප ගැන නොසිතා වැඩ කරන අපේ කාර්ය මණ්ඩලයට. ඒ තුළ අධ්‍යක්ෂ මණ්ඩල ඉන්නවා, සභාපතිවරු ඉන්නවා, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඉන්නවා. මේ පිළිබඳව විශේෂ දැනුමක් සහිතව ප්‍රායෝගිකව වැඩ කරන කෙනෙක් තමයි අමාත්‍යාංශ ලේකම්තුමිය වන නිලකා ජයසුන්දර මහත්මිය. එතුමිය ඇතුළු අතිරේක ලේකම්වරුන්, අධ්‍යක්ෂවරුන් ඇතුළු සියලු කාර්ය මණ්ඩලය කණ්ඩායමක් හැටියට වැඩ කරනවා. අපි කර්මාන්ත පවුලක් හැටියට වැඩ කරනවා. අපේ ඉලක්කය, මහජන අභිලාෂය මේ රටේ කර්මාන්තකරුවා ඉහළට ඔසවන එකයි. අපේ තේමාව, රුපියලක් වියදම් කරනවා නම් ඩොලරයක් උපයන්න සැලසුම් කරන්න කියන එකයි. අපේ රටේ සිටින දරුවාගේ ඉඳලා හැම ව්‍යවසායකයෙක්ම රුපියලක් වියදම් කරන්න ලැහැස්ති වෙනවා නම්, ඩොලරයක් උපයන්න සැලසුම් කරන්න කියන එක තමයි අපේ තේමාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම තේමාවට අපි මේ රට ගෙනියනවා. මේ රටේ පවතින යල් පැන ගිය, මැරුණු, විනාශ කරපු කර්මාන්ත නහාසිටුවා මේ ආර්ථිකය ණය බරින් ගලවා ගැනීම තමයි අපේ අභිප්‍රාය. ඒකට විපක්ෂයේ සිටින ඔයගොල්ලන්ගේ සහාය නැති වුණාට, මේ රටේ ජනතාව අපත් එක්ක ඉන්න බව සහතික කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, point of Order එකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට පොඩි වෙලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාල වේලාව අවසන් වෙමින් පවතින්නේ. ඉතාම කෙටියෙන්, තත්පර 30කින් අවසන් කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම විනාඩියයි ගන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, අර scrap iron export කරන නිසා ලාක්ෂා කර්මාන්තය, තඹ, පිත්තල වාගේ කර්මාන්තවල නියැළෙන සුළු කර්මාන්තකරුවන්ට විශාල බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. දහපහළොස්දහසක් පමණ වන පිරිසක් එම කර්මාන්තවල නියැළෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කියලා තමයි මම ඉල්ලා සිටින්නේ. මගේ කථාවේදී මට ඒ ගැන කියන්න බැරි වුණා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක අපි නවත්වා තිබෙන්නේ. 2005දීම ඒ ගැන තීරණයක් ගත්තා, කැබිනට් මණ්ඩලයෙන්. දැනුත් එය නවත්වා තිබෙන්නේ. දැන් යවන ඒවා යවන්නේ නීත්‍යානුකූල නොවන විධියට. එසේ යවන කවුරු හෝ ඉන්නවා නම් කියන්න, අපි ඒ ගැන සොයා බලා අනිවාර්යයෙන් නීතිය ක්‍රියාත්මක කරනවා. ස්තුතියි.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

පුනරාවර්තන	රු. 4,805,000,000
මූලධන	රු.8,638,000,000

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"26 වන පිටුවේ, 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'මූලධන රු. 9,138,000,000' "

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

"මූලධන වියදම සඳහා රු. 9,138,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 9,138,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය

"தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 3,069,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 8,926,500,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,069,000,000, for Head 149, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 149, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 8,926,500,000, for Head 149, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 149, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

303 වන ශීර්ෂය.- ජේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම්, රු. 343,300,000

"303 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 343,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

303 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම්, රු. 67,700,000

"303 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 67,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

303 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 303.- நெசவுக் கைத்தொழில் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 343,300,000

"தலைப்பு 303, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 343,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 303, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 67,700,000

"தலைப்பு 303, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 67,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 303, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 303.- DEPARTMENT OF TEXTILE INDUSTRIES

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 343,300,000

Question, "That the sum of Rs. 343,300,000, for Head 303, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 303, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 67,700,000

Question, "That the sum of Rs. 67,700,000, for Head 303, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 303, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය
இளைஞர் அலுவல்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சு
MINISTRY OF YOUTH AFFAIRS AND SPORTS

පුනරාවර්තන	රු. 7,100,000,000
මූලධන	රු. 5,000,000,000

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"30 වන පිටුවේ, 6 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'මූලධන රු. 5,500,000,000' "

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"මූලධන වියදම් සඳහා රු. 5,500,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම් සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධනச් செලවුක්කාන අධිකරික්කප්පට්ට රූපාය් 5,500,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් වින විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

මූලධනச් செලවු තිරුත්තප්පට්ටවාරු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the increased sum of Rs. 5,500,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"194 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,325,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

194 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 1,230,000,000

"194 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,230,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

194 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන. - සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,105,000,000

"194 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,105,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

194 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,410,000,000

"194 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,410,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

194 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලෙප්පු 194, නිකුළ්ච්චිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඤ් චෙලවුක් කාන රූපාය් 1,325,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තලෙප්පු 194, නිකුළ්ච්චිත්තිට්ටම් 01, මීණ්ඩුවරුඤ් චෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

නිකුළ්ච්චිත්තිට්ටම් 01.- චෙයල්මුරෛච් චෙයර්පාටුකළ් - මූලතනච් චෙලවු, රූපාය් 1,230,000,000

"තලෙප්පු 194, නිකුළ්ච්චිත්තිට්ටම් 01, මූලතනච් චෙලවුක්කාන රූපාය් 1,230,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තලෙප්පු 194, නිකුළ්ච්චිත්තිට්ටම් 01, මූලතනච් චෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

නිකුළ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් චෙයර්පාටුකළ් - මීණ්ඩුවරුඤ් චෙලවු, රූපාය් 3,105,000,000

"තලෙප්පු 194, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් චෙලවුක් කාන රූපාය් 3,105,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තලෙප්පු 194, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මීණ්ඩුවරුඤ් චෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

නිකුළ්ච්චිත්තිට්ටම් 02.- අපිවිරුත්තිච් චෙයර්පාටුකළ් - මූලතනච් චෙලවු, රූපාය් 1,410,000,000

"තලෙප්පු 194, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් චෙලවුක්කාන රූපාය් 1,410,000,000 අට්ටවණෙයිර් චේර්ක්කප්පටුමාක" එනුම් විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තලෙප්පු 194, නිකුළ්ච්චිත්තිට්ටම් 02, මූලතනච් චෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 1,325,000,000, for Head 194, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 194, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 1,230,000,000

Question, "That the sum of Rs. 1,230,000,000, for Head 194, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 194, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 3,105,000,000

Question, "That the sum of Rs. 3,105,000,000, for Head 194, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 194, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,410,000,000

Question, "That the sum of Rs. 1,410,000,000, for Head 194, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 194, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

219 වන ශීර්ෂය.- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන. - මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 184,000,000

"219 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 184,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

219 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන. - මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 36,000,000

"219 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 36,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

219 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 219.- விளையாட்டுத்துறை அபிவிருத்தித் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 184,000,000

"தலைப்பு 219, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 184,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 219, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 36,000,000

"தலைப்பு 219, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 36,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 219, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 219.- DEPARTMENT OF SPORTS DEVELOPMENT

Question, "That the sum of Rs. 184,000,000, for Head 219, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 219, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 36,000,000

Question, "That the sum of Rs. 36,000,000, for Head 219, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 219, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,486,000,000; මූලධන වියදම, රු. 2,324,000,000

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,486,000,000; மூலதனச் செலவு, ரூபாய் 2,324,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 2,486,000,000; Capital Expenditure, Rs. 2,324,000,000

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2025 කාරක සභා අවස්ථාවේදී, 219 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"30 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 2,486,000,000 රු. 2,824,000,000"

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ, වැය ශීර්ෂ අංක 219 සඳහා අය වැය යෝජනා අංක 27 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු.500,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"219 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,486,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

219 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"219 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 2,824,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

219 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 219, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,486,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 219, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 219, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 2,824,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 219, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப் பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளை யிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,486,000,000, for Head 219, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 219, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 2,824,000,000, for Head 219, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 219, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයි ද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අ.භා. 5.57ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 19වන බදාදා.

பி.ப. 5.57 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 மார்ச் 19, புதன்கிழமை.

At 5.57 p.m., the Hon. Presiding Member left the Chair to report Progress.

Committee report Progress; to sit again on Wednesday, 19th March, 2025.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ශීර්ෂ අංක 149 සහ 219 සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 194 සහ 303 සංශෝධන රහිතව ද කාරක සභාවේ දී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 ඉදිරිපත් කිරීම, ගරු අමාත්‍යතුමා.

ජාතික තරුණ සේවා සභාව: වාර්ෂික වාර්තාව (2021)
தேசிய இளைஞர் சேவைகள் மன்றம்: வருடாந்த அறிக்கை (2021)
NATIONAL YOUTH SERVICES COUNCIL: ANNUAL REPORT (2021)

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(මාණ්පුමිකු சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 31 වගන්තිය යටතේ 2023.10.17 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික තරුණ සේවා සභාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.07.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.09.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

විදෙස්ගත වන ශ්‍රමිකයන් නියාමනය සඳහා නිසි වැඩ පිළිවෙළක්
வெளிநாடு செல்லும் தொழிலாளர்களை ஒழுங்குறுத்துவதற்கான முறையான செயற்றிட்டம்
PROPER PROGRAMME TO REGULATE MIGRANT WORKERS

[අ.භා. 5.58]

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"තම කුටුම්භය තුළ මතුවන ආර්ථික ගැටලුවට විසඳුමක් වශයෙන් බොහෝ කාන්තාවෝ විදෙස්ගතව විවිධ ක්‍රමවේදයන් හි යෙදෙති. නිල සංඛ්‍යා ලේඛන අනුව වර්තමානය වන විට වසරකට විදේශගත වන ශ්‍රමිකයින්ගේ සංඛ්‍යාව ලක්ෂ දෙකකට අධික වන අතර, ලියාපදිංචි නොවී විදේශ ගතවන්නන් ද සමඟ ගත් විට එම සංඛ්‍යාව ඊටත් වඩා බොහෝ සෙයින් වැඩි විය හැක.

මෙයින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය රහිතව විදෙස් රැකියා සඳහා යන්නන්ගෙන් අඩු වැටුප් සහිත අවිනිශ්චිත රැකියාවන්වල නිරත වීම මෙන්ම, ශ්‍රමය සූරාකෑමට, අපයෝජනයට හා අසාධාරණකම්වලට ලක් වන බව නොරහසක්. විශේෂයෙන්ම ලේඛනගත නොකළ ශ්‍රමික කම්කරුවන් ලෙස විදෙස්ගත වූ විට බොහෝ විට ඔවුන්ට නීතිමය ආරක්ෂාව සීමා වන බැවින් එම රටවලින් කිසිදු ප්‍රතිලාභයක් නොලබාම පිටුවහල් කිරීමේ අවදානමට පවා ලක්ව තිබෙනවා.

මේ නිසා නුපුහුණු ශ්‍රමිකයන් සඳහා අර්ථවත්, කල්පවත්නා ආරක්ෂාවක් නිර්මාණය කිරීමට රජය විසින් නිසි වැඩපිළිවෙළක් ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව දැන් කලක පටන් පවතිනවා.

ඒ අනුව, රැකියාවන් සඳහා විදෙස්ගත වන සෑම පුද්ගලයෙක්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය, රැකියා ක්ෂේත්‍රයට අදාළව විධිමත් පුහුණුවක් ලබා දීම, අධ්‍යාපනික හා නිපුණතා සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම, විදෙස්ගත වීමේදී ප්‍රවේශ මාර්ගයන් සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනුම, අවබෝධය ලබා දීම අත්‍යවශ්‍ය කඩිනම් වැඩ පිළිවෙළක් ලෙස සිදු කළ යුතුව ඇත.

ඒ සඳහා, විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඇතුළු ආයතන බලගැන්වීමට සහ නිසි නියාමනයට යටත් කිරීමටත්, අවශ්‍ය නම් නව නීති සම්පාදනය කිරීමටත්, යාවත්කාලීන කිරීමටත් කටයුතු කළ යුතු යැයි මා මෙම ගරු සභාවට යෝජනා කරනවා."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි මේ අවස්ථාවේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න. විදේශගත වෙලා වැඩිපුරම අසරණ බවට පත් වෙලා, තුවාලකරුවන් බවට පත් වෙලා, ලංකාවට එන්න බැරිව හිර වෙලා ඉන්න සුවිශේෂී කණ්ඩායමක් තමයි, කාන්තාවන්. පසුගිය කාලයේ -2022 අවුරුද්දේ- විදේශගත අපේ ශ්‍රමිකයන් වෙනින් පැමිණිලි 4,500ක් ලැබී තිබෙනවා. ඒ පැමිණිලි 4,500න් සියයට 81ක් කාන්තාවන්ගෙන් ලැබුණු පැමිණිලි. 2023දී පැමිණිලි 7,535ක් ලැබී තිබෙනවා. ඒවායෙන් සියයට 80ක් කාන්තාවන්ගෙන් ලැබුණු පැමිණිලි. 2024දී ලැබුණු සමස්ත පැමිණිලි සංඛ්‍යාව 2,478ක්

[ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා]

වෙනවා. 2024දී ලැබුණු පැමිණිලිවලින් කාණ්ඩ - categories - විධියට ගත්තොත්, නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී, බලපත්‍රලාභී නොවන පාර්ශ්වයන්ට එරෙහිව අධිකරණයේ ගොනු කළ නඩු සංඛ්‍යාව 910ක් කියලා Sri Lanka Bureau of Foreign Employmentහි ලේඛනවල සඳහන්ව තිබෙනවා. කණ්ඩායම් 2ක් ඉන්නවා. ඒ, බලපත්‍රලාභීන් සහ නීති විරෝධී කණ්ඩායම්. Sri Lanka Bureau of Foreign Employmentහි "Annual Statistics of Foreign Employment 2023" කියන වාර්තාව ගෙන බැලුවොත්, එහි දත්තවලට අනුව මේ පැමිණිලි ලැබෙන්නේ මොන වාගේ හේතු නිසාද, ලැබෙන පැමිණිලි වර්ග මොනවාද කියන එක සම්බන්ධයෙන් අදහසක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. එක කාරණයක් තමයි lack of communication. ඒ වර්ගයේ පැමිණිලි 507ක් ලැබී තිබෙනවා. ඒ අවුරුද්දේ ලැබී තිබෙන පැමිණිලි 7,535න් 507ක්ම ඒ කියපු වර්ගයේ පැමිණිලි. තවත් එකක්, being stranded without employment කියන කාරණය. සමහර ඒවා communication සම්බන්ධ පැමිණිලි; තවත් සමහර ඒවා අතරමං වීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි. එවැනි පැමිණිලි 611ක් තිබෙනවා. මේ, 2023, 2024, 2025 වසරවල තත්ත්වයන්. ලෝකය දියුණු වෙලා තිබෙනවා. හැබැයි, අපේ මිනිස්සු තවමත් විදේශයන්හි අතරමං වෙනවා. අපේ මිනිසුන්ට කථා කර ගන්න විධියක් නැතුව ඉන්නවා. ඒ අය අර්බුදයකයි ඉන්නේ. අපි අපේ මිනිස්සු රට යවනවා. අපේ රටට ධනය ගෙනෙන, විදේශ විනිමය ගෙනෙන ඒ මිනිස්සු අමාරුවේ වැටිලා ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 2023.03.09 වැනි දින හැන්සාඩ් වාර්තාවෙන් තමයි මේ උපුටා ගැනීම කරන්නේ. එහි තිරු අංක 381හි මෙසේ සඳහන් වෙනවා:

> "ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ පවතින සුරක්ෂා නිවාසවල 2023.02.28 වන දින වන විට රැඳී සිටින ගෘහ සේවිකාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.
>
> ... ඕමාන් 58. කුඛායි 69. ... රියාද් 10. ජිද්දා 04. මුළු එකතුව 141."

මෙන්න, අපේ සේවකයන්ට වෙලා තිබෙන දේ. ඇයි ඒ? නියාමන කාර්යභාරය හරියට ඉෂ්ට සිද්ධ වන්නේ නැහැ. COPE එකේදී අපට අනාවරණය වුණු තොරතුරු අනුව, ආපු නිලධාරීන් දීපු පිළිතුරු අනුව අපි දැක්කා, නියාමන කටයුත්ත කරනවා වෙනුවට විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් පුද්ගලයන් රට යවන්න පටන් ගෙන තිබෙන බවක්. ඒකත්, visit visaවලට. රාජ්‍ය ආයතනයකට එහෙම වැඩ කරන්න පුළුවන්ද? ඒ නිසා මේවා නිවැරදි කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නියාමන කටයුත්ත කරන්න අවශ්‍යයි. විදේශ රැකියාවලට ගිය අපේ සමහර මිනිසුන්ට කටු ගහලා, ඇණ ගහලා තිබෙනවා. රුසියාවේ යුද්ධයට ගිහිල්ලා අපේ අය 80දෙනෙක් මිය ගිහින් තිබෙනවා. මියන්මාරයේ ඉන්න ශ්‍රී ලාංකික තරුණ පිරිසක් හිර වෙලා ඔවුන් වෙනුවෙන් කප්පම ගෙවන්න කියලා දෙමව්පියන්ට කියනවා. කුවේට්වලදී හිරිහැර වූ පිරිසක් දිවයිනට ඇවිත් තිබෙනවා. රුසියානු හමුදාවට බැඳුණු රණවිරුවන් 60දෙනා යළි මෙරටට ගෙන්වා ගන්නවා. මේ වාගේ සිදුවීම් අතිවිශාල ප්‍රමාණයක් වාර්තා වෙනවා.

ඒ වාගේම පුවත්පතක වාර්තා වෙනවා, "විවිධ හිරිහැරවලට ලක් වුණු ගෘහ සේවිකාවන් 58ක් යළි දිවයිනට" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. හිටපු දේශපාලනඥයන්, මෙම අමාත්‍යාංශය භාරව හිටපු අමාත්‍යවරු තමන්ගේ බිස්නස් එක කර ගන්න විදේශ සේවා නියුක්ති කාර්යාංශය වාගේ ආයතන පාවිච්චි කළා. අපි මේවා වෙනස් කරන්න ඕනෑ. අපේ රටේ මිනිසුන්ට ආණ්ඩුව විධියට අපි පොරොන්දු වෙලා තිබෙනවා, යුක්තිය ඉෂ්ට කරන බවට. එම නිසා මෙම සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින් මම මේ අවස්ථාවේ ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, නීති සම්පාදනය කරලා හෝ තිබෙන නීති වෙනස් කරන්න අවශ්‍ය නම් ඒවා සිදු කරලා හෝ අපි අපේ රටේ ජනතාවට, අපේ රටේ දරුවන්ට ඉතාම ඉක්මනින් යුක්තිය සහ සාධාරණත්වය ඉෂ්ට කරමු කියලා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නිලූෂා ලක්මාලි ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.06]

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තැබීමේ යෝජනාව ගෙන ආ අපේ සහෝදර මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම එම යෝජනාව ස්ථිර කරනවා. විදේශගත ශ්‍රමිකයන් පිළිබඳව අදහස් දැක්වීම සඳහා මට අවස්ථාව ලබා දීම ගැනත් මම ස්තුතිවන්ත වෙනවා.

රැකියා සඳහා විදේශගත වන පුද්ගලයන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය, රැකියා ක්ෂේත්‍රයට අදාළව විධිමත් පුහුණුවක් ලබා දීම, අධ්‍යාපනික හා නිපුණතා සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම, විදෙස්ගත වීමේදී ප්‍රවේශ මාර්ග සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම යුගයේ අවශ්‍යතාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විදේශගත ශ්‍රමිකයන්ට භාෂාවන් නොදැනීම ලොකු ගැටලුවක්ව පවතිනවා. භාෂාවන් නොදැනීම නිසා අදහස් ඉදිරිපත් කරන්න බැරිව ඔවුන් බොහෝ අපහසුතාවන්ට පත් වෙනවා; ඒ වාගේම, යන්ත්‍ර සූත්‍ර සම්බන්ධයෙන් පුහුණුවක් නොමැතිකම නිසාත් අනතුරුවලට ලක් වෙනවා. එම නිසා යම් ක්‍රමානුකූල වැඩසටහනක් යටතේ ඔවුන්ට අනිවාර්යයෙන්ම පුහුණුවක් ලබා දීලා, භාෂාව පිළිබඳව යම් දැනුමක් ලබා දීලා රැකියා සඳහා යවනවා නම් ඇත්තටම එය ඔවුන්ගේ ආරක්ෂාවට හේතු වෙනවා. අප මෙසේ කියන්නේ පසුගිය කාලයේ අත් දැකපු දේවල් දිහා බලලායි. තමන්ගේ දරුවන් දාලා කාන්තාවන් විදේශගත වන්නේ ඇත්තටම දරුවන්ට යහපත් අනාගතයක් ලබා දීමේ බලාපොරොත්තුව, යහපත් ආර්ථික වටා පිටාවක් ඇති කිරීමේ බලාපොරොත්තුව නිසාමයි. මොකද, කාන්තාවන් තම දරුවන්ට බෙහෙවින්ම ආදරය කරනවා. එහෙම වුණත්, ඒ අය තම පවුලෙන් දුරස් වෙලා විදේශ

රැකියාවකට යන්නේ, තම දරුවන්ගේ අනාගත ශුභ සිද්ධිය සඳහාම තමයි. ඒ අරමුණින් විදෙස්ගත වූ අම්මාට ආපහු එන්න හැකියාවක් නැති වෙනවා නම්, ඇහ පුරා තුවාල සිදු කර ඇය කෲර වධ හිංසාවලට ලක් කරනවා නම්, තට්ටු තුනහතරක වැඩ එක සැරේ කරලා ඇයට කෑම වේලක්වත් ලබා ගන්න විධියක් නැත්නම් ඇත්තටම ඒක ඉතාම ශෝචනීය තත්ත්වයක්.

විදේශ රටවල සිටින අපේ ගෘහ සේවිකාවන් ඇතුළු අපේ ශ්‍රමිකයන් වෙනුවෙන් ඉදිරියේදී ගන්න බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග අපේ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර තිබෙනවා. ඒ යටතේ, විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය එකාබද්ධ කිරීම, සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලබා දීම, රාජ්‍ය බැංකු එකතු කර ව්‍යවසායකයන්ට ණය ආධාර ලබා දෙන සංවර්ධන බැංකුවක් ඇති කිරීම හරහා විදේශගත වන ශ්‍රමිකයන්ටත් ණය පහසුකම් ලබා දීම, දායකත්ව ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපක් විදේශගත ශ්‍රමිකයන්ට ලබා දීම වාගේම ප්‍රාදේශීය සංවර්ධන කමිටු මඟින් දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය මූලික පහසුකම් සොයා බලන්නත් යෝජනා කර තිබෙනවා. ඒ සියල්ල වෙනුවෙන් අප කටයුතු කරන බව සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.09]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වන්දිම හෙට්ටිආරච්චි මැතිතුමාට මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

නෝම්බියත් එක්කම මෙහි නැවතිලා වතුරෙන් හරි නෝම්බිය ඇරගෙන කථා කරන්න ඕනෑ කියා හිතලා සෑහෙන්න දුරක ඉඳලා මම ආවා. "ගෘහ සේවිකාවන්" කියන වචනයටත් මම කැමැති නැහැ. ඔවුන් පුහුණු කරපු මධ්‍යස්ථානයට Housemaid Training Centre කියලා තමයි ඒ දවස්වල කිව්වේ. ඒ ස්ථානයත් එක්ක මගේ පොඩි පෞද්ගලික සම්බන්ධතාවයක් තිබෙනවා. හිටපු කම්කරු නියෝජ්‍ය ඇමති මොන්ටි ගොපල්ලව මැතිතුමා තමයි පුරවැසි සේවක සේවිකාවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ඉස්සෙල්ලාම ඇති කළේ.

නැහෙනහිර පළාතේ coastal belt එකෙන් තමයි, වැඩියෙන්ම දෙමළ භාෂාවෙන් කථා කරන දෙමළ හා මුස්ලිම් කාන්තාවන් මැද පෙරදිගට ගියේ. මගේ ජීවිතයේ මට තවම දරා ගන්න බැරි, ඉතා සංවේදී සිද්ධිය තමයි, ඉස්ලාම් ආගම අනුව රිසානා නෆීක් දැරියගේ බෙල්ල කපාපු සිද්ධිය. ඒවාට වෙන වෙන හේතූන් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම ඒ දවස්වලත් සංවේගය ප්‍රකාශ කළා. ඒ සමඟ මට ලොකු විවේචන ඇති වුණා. ඒකට කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැහෙනහිර පළාතේ දෙමළ කථා කරන, ගෘහ සේවයට යන අයට කිසිම අවම අධ්‍යාපන දැනුමක් නැහැ. ඒක නිසා තමයි, ඔවුන් පුහුණු කිරීම සඳහා හිටපු කම්කරු නියෝජ්‍ය ඇමති මොන්ටි ගොපල්ලව මහතා මධ්‍යස්ථානයක් ඇති කළේ. ඒගොල්ලන්ට ඕනෑ වෙලා තිබුණා, දෙමළ කථා කරන අය ඉන්න ප්‍රදේශයක ඒ මධ්‍යස්ථානය පිහිටුවන්න නිවසක්, එහෙම නැත්නම් ස්ථානයක් සොයා ගන්න. ඒ දවස්වල ඒකට ලොකු කුලියක් දෙන්න වුණා. එච්චර කුලියක් ගෙවන්න, රජය සූදානම් වෙලා හිටියේ නැහැ. එතකොට මගේ නායක, ඒ.එච්.එම්. අෂ්රොෆ් මැතිතුමා හිටියා. එතුමාගේ මුල් නිවසේ තමයි මමත් හිටියේ. එතුමා මට කිව්වා, කොළඹ ඉන්න නිසා අපි ඒ නිවස පොඩි මුදලකට කුලියට දෙමු කියලා. අපි ඒක දුන්නා. ඒ දීලා, ඒකෙන් සෑහෙන්න හොඳ වැඩ කටයුතු කිහිපයක් කෙරුණා.

හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුතු නියාමනය කිරීමේ නීති ඕනෑ තරම් තිබෙනවා. ප්‍රශ්නය ඒක නොවෙයි. ප්‍රශ්නය තමයි මොන නීතියක් තිබුණත්, නීතියෙන් රිංගලා යන එක. නීතිය පැත්තකට දමමුකෝ. අපේ අය ඉස්සෙල්ලා හිතලා බලන්න ඕනෑ, අපේ කාන්තාවන් මෙහෙකාරකම් සඳහා යවන්නේ ඇයි කියලා. "ගෘහ සේවිකා" කියන වචනයටවත් මම කැමැති නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇයි, ගෘහ සේවකයෙක් වෙන්න බැරිද? මම හරි කැමැතියි ගෙදර වැඩ කරන්න. ගෘහ සේවක-සේවිකා කියන්නේ, skilled job එකක්. ඒක නිසි පුහුණුවක් ඇතිව කළ යුතු, විශේෂ රක්ෂාවක්. ඉතා අධික වේතනයක් ලැබිය හැකි, බටහිර රටවල ඉතා අධික වේතනයක් දෙන රක්ෂාවක්. ඒකට සවුදි අරාබිය වේවා, සයිප්‍රසය වේවා, ඒ රට හෝ ඒගොල්ලන්ගේ ආගම අදාළ නැහැ. එතැන සිදු වෙන්නේ, ඒගොල්ලන් මේ අය වැඩ කිරීමේදී වහල්භාවයක් ඇති කරගෙන තිබෙන එක. ඒවාට මිනිස්සු යවන්නේත් අපේ කට්ටියනේ. අපි නේ යවන්නේ.

අනෙක් එක තමයි, අපි මවුවරුන් පිටරට යවනවා. මවුවරුන් ගැන කථා කරනකොට, රීයේ-පෙරේදා අපේ ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා - I am subject to correction - "බුදු තාත්තේ බොන්න එපා" කියන වචන කියලා කිව්වා, අම්මලා ගිහිල්ලා එච්චර මහන්සි වෙලා සල්ලි සොයලා එව්වාම, මෙහේ ඉන්න තාත්තා ඒක බීලා නැති කරනවා කියලා. මම ඒක අහගෙන හිටියා. නමුත් මට එදා මේ ගරු සභාවට එන්න බැරි වුණා. මොකද, ඒ දවස්වල පක්ෂයේ ලේකම් හැටියට, මට නාමයෝජනා පත්‍ර අත්සන් කරන්න රට වටේම දුවන්න වුණා. නමුත්, මම live අහගෙන ඉන්නකොට, ඒකට වැඩිය තව ගැඹුරු පොඩි පදයක් මට මතක් වුණා. ඒ තමයි, "ප්‍රේමයේ මුනිවරිය අතනෑර ළඟ සිටිය, සසල ලොව ළඟ නිසල සෙනෙහස පිදුව ඔබ" කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හිනා වුණා, මම සින්දුවක්වත් කියන්න යනවාද කියලා. නැහැ, මම සින්දුවක් කියන්නේ නැහැ. ඇත්තටම කාන්තාවක් "ප්‍රේමයේ මුනිවරිය" යනුවෙන් හඳුන්වන්නේ හරි ගැඹුරු අර්ථයක් ඇතිව. ගැඹුරු අර්ථයක් තිබෙන සිංහල සින්දුවක් තමයි ඒක. අම්මාවරුන් ගැන ඕනෑ තරම් සින්දු කියලා තිබෙනවා. නමුත් සිංහල සින්දුවලින් එච්චර ලස්සන ගැඹුරු අර්ථයක් තිබෙන සින්දුවක් මම අහලා නැහැ. ඒ වාගේ දෙමළ සින්දු වුණත් අඩුයි. ඒක නිසා, ශ්‍රී ලංකාවේ කාන්තාවන්, මවක් අපි ගෘහ සේවයට යවන්නේ ඇයි කියන ප්‍රශ්නය මතු කරලා බලන්න ඕනෑ. මොකද, ඒක හරි වැදගත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අම්මා කෙනෙක් රට යවලා, සල්ලි සොයා ගන්නා තත්ත්වයට අපි පත් වෙන්න අවශ්‍ය නැහැ. ඇත්තටම අපට ලොකු ආර්ථික ප්‍රශ්නයක් තිබෙනවා, නැත්තේ නැහැ. නමුත්, "ප්‍රේමයේ මුනිවරිය" කියලා අපි එච්චර උසස් ලෙස හඳුන්වන මවක්, කාන්තාවක් අන්තිමට විදේශ විනිමය සොයන මෙහෙකාරියක් කර ගන්න හොඳ නැහැ නේ. ඉතින් මේ "නියාමනය" කියන එක දැක්ක ගමන් මට හිතුණා, මේ ගැන යමක් කථා කරන්න ඕනෑ කියලා. මම රීයේ- පෙරේදා දැක්කා, ගරු සභානායකතුමා, ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය ගැනත්, මවක් ගැනත් සඳහන් කරලා සංවේදීව කථා කළා. අපි ඔක්කොම අයට ඒ සංවේදීභාවය තිබෙනවා.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

එතුමිය ඇමතිතුමිය හැටියට කරන දේවල් විවේචනය කරන්න අපට තිබෙන අයිතිය, ඒ කාන්තාවක්ද, පිරිමියෙක්ද කියන එකෙන් ඔබ්බට ගිය දෙයක්. නමුත් අපේ කාන්තාවන් පිළිබඳ නියාමනයක් නොවෙයි, නීතියක් අවශ්‍යයි. මම සහෝදර මන්ත්‍රීතුමාටත් කියන්න හැදුවේ ඒකයි. දීර්ඝ කාලයක් තිස්සේ නිවැරදි ලෙස පුහුණුව නොලද කිසිම ගෘහ සේවකයෙක්, සේවිකාවක් විදේශ ගත කිරීමේදී -අතීතයේදී ගොඩක් ප්‍රශ්නවලට මුහුණ දුන් රටවල් පිළිබඳ අපට අත්දැකීම් තිබෙනවා - ඒ වාගේ රටවලට යැවීම පිළිබඳව දැඩි නීති වේලපහින් පනවලා තිබුණා. නමුත් ආර්ථික ප්‍රශ්නයක් නිසා තමයි මේ ප්‍රශ්න මතු වුණේ.

මට තව කාලය තිබුණත්, තව එක කාරණයක් ගැන කියලා මම කථාව අවසන් කරන්න කැමැතියි. මොකද, මටත් නෝම්බි අරින්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී වැඩියෙන්ම ප්‍රශ්නවලට ලක් වෙන්නේ නැඟෙනහිර පළාතේ ඉන්න භාෂාව පිළිබඳ වැඩිය නිපුණතාවක් නොමැති, ඒ රටවල තිබෙන විද්‍යුත් උපකරණ භාවිත කිරීම පිළිබඳ හරි අවබෝධයක් නැති දුප්පත් කාන්තාවන්. මම ඔය පුහුණුව - training - තිබෙනකොට එතැනට ගිහිල්ලා බලාගෙන හිටියා. ඒ රටවල තිබෙන අතිවිශිෂ්ට, සුඛෝපභෝගී විද්‍යුත් උපකරණ පුහුණුව අවස්ථාවේ ඒගොල්ලන්ට දෙන්නේ නැහැ. washing machine එකක් කිව්වාම, maximum, automatic washing machine එකක් තමයි ඒගොල්ලන්ට දෙන්නේ. ඒක කොහොමද ක්‍රියා කරවන්නේ කියලා ඒගොල්ලන්ට උගන්වනවා. නමුත් ඒ රටවලට ගියාම ඊට වැඩිය නූතන ආම්පන්න, උපකරණ තිබෙනවා. එතකොට ඒ කාන්තාවන්ට ඒවා භාවිත කිරීමේ හැකියාව නැහැ. ඒවා වරද්දලා භාවිත කළාට පස්සේ ඒ වැරදි ටික ඒගොල්ලන් පිට පැටවෙනවා. ඒකෙන් ඇති වන අලාභය ඔවුන්ගෙන් අය කරගන්න උත්සාහ කරනවා.

Sri Lanka Bureau of Foreign Employment මඟින් තීරණයක් ගත්තා, කල්මුණේ තිබුණු ගෘහ සේවා මධ්‍යස්ථානය තිබුණු තැනින් ලොකු මුදලක් ඉල්ලලා තිබුණු නිසා ඒ ලොකු මුදල දෙන්න බැහැ කියලා ඒ මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට ගෙනියන්න. ඒ ප්‍රදේශයේත් රජයේ ඉඩමක් නැහැ කියලා office එකක් හදන්න, නැත්නම් ගොඩනැඟිල්ලක් හදන්න ඒ ගොල්ලන්ට සල්ලි නැහැ කියලා ඒක අම්පාරට ගෙනිව්වා. නමුත් ඒ කාන්තාවන්ට අම්පාරට යන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ත්‍රිකුණාමලය, කින්නියා, මූතූර්, පොතුවිල් වැනි ඈත පළාත්වලින් මේ රැකියා සඳහා ඉදිරිපත් වෙන කාන්තාවන්ට සිංහල පිළිබඳ හොඳ දැනුමකුත් නැහැ. ඔවුන් ඒ ස්ථානවලට ගියාම සති දෙකක වාගේ in-house training එකක් කෙරෙන්නේ. ඔවුන් ඒවාට යන්නේත් බයෙන්. ඒක නිසා මේ කටයුතු නියාමනය කරනවා නම් ඉතාම හොඳයි. ඒ නිසා මම ඉතා බැගෑපත්ව ඉල්ලා සිටින්නේ, නැඟෙනහිර පළාතේ ගෘහ සේවිකාවන් පුහුණු කිරීම සඳහා මධ්‍යස්ථානයක් ඇති කරන්න කියලායි. හැබැයි ඒ වාගේම මම කියනවා, ගෘහ සේවිකාවන් - housemaids - කියන ගණයට අයත් රැකියාවලට අපගේ ලක් කාන්තාවන් ඒ රටවලට නොයවා සිටීම සඳහා නීතියක් ගෙන ඒම හොඳයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත්, මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාටත් ස්තුතිය පළ කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.18]

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම හිතනවා මේක ඉතා කාලීන, වැදගත් විවාදයක් කියලා. අපි දන්නවා, අපේ රටේ විදේශ විනිමය ගත්තොත්, එහි දැවැන්ත පංගුවක් දරන්නේ විදේශ රැකියා ක්ෂේත්‍රය කියලා. උදාහරණයක් විධියට ගත්තොත්, පසුගිය අවුරුද්දේ මුල්ම මාස 8 තුළ සමස්ත IMF programme එකෙන් අපට එන්න නියමිතව තිබූ ඒ විදේශ විනිමය මේ හරහා උපයාගන්න අපට පුළුවන්කමක් ලැබුණා. ඒ නිසා ඉතාම හොඳයි, මේ වාගේ වෙලාවක මේ වාගේ වැදගත් සංවාදයක් මතු කරගන්න එක.

ප්‍රථමයෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ. මෙතැනදී අපි සටන් කරන්න ඕනෑ, මාතෘකාවක් තිබෙනවා. ඒක තමයි, අවිධිමත් ආකාරයෙන් පිටරටට යන එක පුළුවන් තරම් නවත්වන්නට ඕනෑකම. එතැනදී ගෘහ සේවිකාවන්ද, වෙනත් විවිධ කාණ්ඩද කියන එක ගැන අපි සාකච්ඡා කරන්නම ඕනෑ. ඒක ඇත්ත. අනෙක් එක, අපේ රටේ ගෘහ සේවිකාවන්ගේ ප්‍රතිශතය ක්‍රමානුකූලව අඩු වෙලා තිබෙනවා. ගිය අවුරුද්දේ ගත්තොත්, සියයට 30කට වඩා අඩු ප්‍රතිශතයක් තමයි ගෘහ සේවිකාවන් විධියට ගිහිල්ලා ඉන්නේ. එතකොට එතැන යම්කිසි ජයග්‍රහණයක් තිබෙනවා. මොකද, ගෘහ සේවයට යන ප්‍රතිශතය ඒ විධියට අඩු වෙලා තිබෙන නිසා.

විදේශ කටයුතු, විදේශ රැකියා කියන මේ ක්ෂේත්‍ර දෙකටම අදාළ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට මම මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි අවිධිමත් ආකාරයෙන් මේ රට දාලා ගිය අය සම්බන්ධ කාරණය. මොකද, ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න ගත්තොත්, අර විධිමත් ආකාරයෙන් ලියාපදිංචි වෙලා රට ගිය අයගේ ප්‍රශ්න අපි handle කරන ආකාරයට වඩා මේක අමාරුයි. ඒ නිසා අපි හැමෝටම කියන්නේ පුළුවන් තරම් විධිමත් ආකාරයෙන් යන්න, හරි පාරෙන් යන්න කියලායි. සමහර අය පිට රටකට visit visa එකක් හරහා ගිහිල්ලා, රැකියා කරනවා. නමුත් අපි කියන්නේ අනිවාර්යයෙන් register වෙන්න කියලායි. මොකද, Sri Lanka Bureau of Foreign Employment registration එක අත්‍යවශ්‍ය දෙයක්. විශේෂයෙන් ඕනෑම ගැටලුවකට අදාළව අපට මැදිහත් වෙන්න පුළුවන් වන්නේ මේ Sri Lanka Bureau of Foreign Employment registration එක තිබුණොත් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තැබීමේ යෝජනාවේ මේ සම්බන්ධයෙන් යම්කිසි කරුණු කාරණා සඳහන් වෙලා තිබුණා. මම ඒක පිළිගන්නවා. පසුගිය කාලවකවානු ගත්තොත්, ඇත්තටම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සිටින අවංක නිලධාරීන්ට හිටපු දේශපාලන අධිකාරිය වැඩ කරන්න දුන්නේ නැහැ. සමහර අය වැඩ තහනම්වලටත් මුහුණ දීලා හිටියා. පසුගිය කාලයේ තිබිච්ච දේශපාලන සංස්කෘතියට හොඳම උදාහරණය තමයි මේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය. දේශපාලන පත්වීම් ලබා ගත් සභාපතිවරු හිටියා. ඒත් එක්කම ඒකට සරිලන විධියට වෙනම Board එකකුත් පත් කරලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු දේම අපි දැන් ශුද්ධ කරන්න පටන් ගෙන තිබෙනවා.

ඒ වාගේම රටක් විධියට පහළටම, විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම සේවා වසම් මට්ටම දක්වාම යම්කිසි

යන්ත්‍රණයක් අවශ්‍යයි කියන එක අපි විශ්වාස කරනවා. ඒකට අදාළ කරන අවම රාමුවක් දැන් තිබෙනවා. නමුත් ඒවා කාර්යක්ෂම විධියට ක්‍රියාත්මක නැති ප්‍රශ්නයක් තිබෙනවා. ඒවා ඉතාම කාර්යක්ෂම විධියට ක්‍රියාත්මක වන යම්කිසි ක්‍රමවේදයක් අපි සකස් කරලා තිබෙනවා. කෙනෙකුට රට යන්න අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒකට අදාළ උපදෙස් වෙන්න පුළුවන්; ඒ පුහුණුවට අදාළ යම්කිසි අදහස් දැක්වීමක් වෙන්න පුළුවන්; ඒ සියලු දේම එම නිලධාරීන් ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම යම්කිසි කෙනෙක් පිට රටකට ගියා නම්, ඒ සම්පූර්ණ පවුල් යන්ත්‍රණය ගැන සොයා බලා, ඒ අදාළ නිලධාරියා විසින් ඔවුන් මුහුණ දෙන ප්‍රශ්නවලට අදාළ මැදිහත්වීමක් කරන්න ඕනෑ. නමුත් ඒකට අදාළ හරි පාරක් කපලා තිබුණේ නැහැ. පසුගිය කාලයේ විවිධ ව්‍යාපෘති යෝජනා වෙලා තිබුණත්, ඒ ව්‍යාපෘති හරියාකාරයෙන් ක්‍රියාත්මක නොකරපු ගැටලුත් තිබුණා කියා අපි දන්නවා. මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී මම ඒ ගැන සඳහන් කළා. ඉතින්, මීට කලින් අත්හිටුවා තිබූ, හරියාකාරයෙන් ක්‍රියාත්මක නොවුණු ව්‍යාපෘති ටික දැන් පටන් ගන්න අපට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඉතාම කාර්යක්ෂම විධියට අපි ඒ කටයුතු අරන් යන්න ඕනෑ. ඒ සඳහා අපට අවශ්‍යතාවක් තිබෙනවා.

මම පෞද්ගලිකව විශ්වාස කරන කාරණාවක් තිබෙනවා. කෙනෙක් තමන්ගේ පවුල අත් හැරලා මේ රට දාලා පිට රටකට යනවා කියන්නේ එතුමාට, නැත්නම් එතුමියට ලැබිලා තිබෙන අවසාන අවස්ථාවක් විධියට තමයි මම එය දකින්නේ. ඒක කවුරුත් කැමැත්තෙන් තෝරා ගන්නා මාවතක් නොවෙයි. එතකොට මේ රටෙත් ප්‍රශ්න තියාගෙන, තමන්ගේ පවුල් තුළත් ප්‍රශ්න තියාගෙන, ආර්ථික අර්බුදය නිසා පිට රටකටත් ගිහිල්ලා යම්කිසි ආකාරයක ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දෙන්නත් සිද්ධ වෙලා තිබෙනවා නම්, මම හිතන විධියට ඒක කිසිසේත්ම අනුමත කරන්න බැරි තත්ත්වයක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් ආණ්ඩුවක් විධියට අපි ඉතාම වගකීමෙන් කටයුතු කරනවා. විශේෂයෙන් අපේ විදේශ කටයුතු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමා විධියට මමත් ඇතුළු අපේ කණ්ඩායම ගත්තොත්, බිස්නස් එකක් කරන්න නොවෙයි අපි ආවේ. මේ ක්ෂේත්‍රය තුළ යම්කිසි නියාමනයක් කරමින්, විදේශගත සියලු දෙනාගේම ආරක්ෂාව තහවුරු කරමින්, මේ රටට හරි මාර්ගයෙන් විදේශ විනිමය ගෙනෙන ඒ කටයුතුවලට සම්බන්ධ වෙන්නයි අපි ආවේ. ඒ වාගේම මේ රටේ සැබෑ ආර්ථික අර්බුදයට තිරසාර විසඳුමක් සොයා ගැනීම තුළ තමයි අපට මේ දේවල් සමස්තයක් විධියට නතර කරන්න පුළුවන් වන්නේ. ජාතික ජන බලවේගය ප්‍රමුඛ ආණ්ඩුව විධියට අපි අනිවාර්යයෙන් අපේ රටේ ආර්ථිකය හදනවා. කාට හෝ බලහත්කාරයෙන් පිට රටකට යන්න සිද්ධ වෙලා තිබුණා නම්, ඒක නතර කරමින්, කෙනෙකුට පිට රටකට ගිහිල්ලා බලලා එන්න පුළුවන් වන ආකාරයට, එහෙම නැත්නම් එතුමාගේ හෝ එතුමියගේ තේරීමක් විධියට පිට රටකට යන්න පුළුවන් වන ආකාරයේ අවස්ථාවක් අපි හදලා දෙන්න ඕනෑ. ඒ වාගේම අපි ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න අනිවාර්යයෙන් කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරපු අපේ ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විපක්ෂය නියෝජනය කරමින් මේ ඉතාම වැදගත් විවාදයට සම්බන්ධ වෙච්ච ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමාටත් අපේ ගරු මන්ත්‍රීතුමියටත් මගේ ස්තුතිය පුද කරනවා.

අපි අනිවාර්යයෙන් මේ ක්ෂේත්‍රය ආරක්ෂා කරගන්නට ඕනෑ. ඒ වාගේම මේ ක්ෂේත්‍රයේ විනිවිදභාවය රැකගත යුතුයි. විධිමත් ආකාරයෙන් පිට රට යන එක ප්‍රවර්ධනය කරමින්, අවිධිමත් ආකාරයෙන් කවුරු හරි යනවා නම්, ඒ යන අයගේ ආරක්ෂාව තහවුරු කරමින් සමස්තයක් විධියට ඒක නතර කරන්නට කටයුතු කළ යුතුයි. අපේ රටට ගෙනෙන විදේශ විනිමය තුළින් අපේ රටේ ආර්ථිකය ශක්තිමත් ආකාරයෙන් ගොඩ නඟමින් by choice කියන එක, by option කියන එක ජනතාවට ලබා දෙන්න පුළුවන් තත්ත්වයක් උදා කරගත් දවසක තමයි අපට මේ සියලු ප්‍රශ්නවලට උත්තරයක් ලබාගන්න පුළුවන් වෙන්නේ. මේ විවාදයට සම්බන්ධවීමට මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.25ට, 2025 පෙබරවාරි 21 වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 19 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.25 மணிக்கு பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 19, புதன்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.25 p.m. until 9.30 a.m. on Wednesday, 19th March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 17 වන කලාපය
தொகுதி 318 - இல. 17
Volume 318 - No. 17

2025 මාර්තු 19 වන බදාදා
2025 மார்ச் 19, புதன்கிழமை
Wednesday, 19th March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 19 වන බදාදා
2025 மார்ச் 19, புதன்கிழமை
Wednesday, 19th March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කාරුණ්‍යය සඳහා වන පාර්ලිමේන්තු සංසදය: ස්ථාපනය කිරීම [පිටුව 2995]
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා පාර්ලිමේන්තුවේදී කරන කථාවල සජීවී විකාශය අත්හිටුවීම [පිටුව 2995]
ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 2998-3012]
අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා [පිටුව 3012]
ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව [පිටුව 3012]
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව [පිටුව 3013]
ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව [පිටුව 3013]
ගෘහ්‍ය කාරක සභාව [පිටුව 3013]
ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව [පිටුව 3014]
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව [පිටුව 3014]
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව [පිටුව 3015]
රජයේ මුදල් පිළිබඳ කාරක සභාව [පිටුව 3015]
ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව [පිටුව 3015]
මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව [පිටුව 3016]
උසස් නිලතල පිළිබඳ කාරක සභාව [පිටුව 3016]
පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව [පිටුව 3016]
විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [විසිහතරවන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 116, 295, 297 - 302 (වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන)] - කාරක සභාවේදී සලකා බලන ලදී [පිටු 3018-3177]
කල්තැබීමේ යෝජනාව:
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2022 මගින් රාජ්‍ය සේවයට ඇතිවන බලපෑම [පිටු 3178-3188]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
இளைஞர்களுக்கான பாராளுமன்ற ஒன்றியம்: தாபித்தல் [ப: 2995]
மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களின் உரைகளை நேரடி ஒலி/ஒளிபரப்புச் செய்வதை இடைநிறுத்துதல் [ப: 2995]
வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2998-3012]
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள் [ப: 3012]
சட்டவாக்க நிலையியற் குழு [ப: 3012]
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு [ப: 3013]
நிலையியற் கட்டளைகள் பற்றிய குழு [ப: 3013]
சபைக் குழு [ப: 3013]
ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழு [ப: 3014]
அரசாங்கக் கணக்குகள் பற்றிய குழு [ப: 3014]
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு [ப: 3015]
அரசாங்க நிதி பற்றிய குழு [ப: 3015]
வழிவகைகள் பற்றிய குழு [ப: 3015]
பொது மனுக்கள் பற்றிய குழு [ப: 3016]
உயர் பதவிகள் பற்றிய குழு [ப: 3016]
பின்வரிசைக் குழு [ப: 3016]
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட இருபத்து நான்காம் நாள்]:
[தலைப்புக்கள்116, 295, 297-302 (வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி)] – குழுவில் ஆராயப்பட்டது [ப: 3018-3177]
ஒத்திவைப்புப் பிரேரணை:
அரச சேவையில் பொது நிருவாகச் சுற்றறிக்கை இல.19/2022இன் தாக்கம் [ப: 3178-3188]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Parliamentary Caucus for Youth: Establishment [Col. 2995]
Suspension of Live Broadcast of Speeches Made by Hon. (Dr.) Ramanathan Archchuna [Col. 2995]
ORAL ANSWERS TO QUESTIONS [Cols. 2998-3012]
MINISTERIAL CONSULTATIVE COMMITTEES [Col. 3012]
LEGISLATIVE STANDING COMMITTEE [Col. 3012]
COMMITTEE ON PARLIAMENTARY BUSINESS [Col. 3013]
COMMITTEE ON STANDING ORDERS [Col. 3013]
HOUSE COMMITTEE [Col. 3013]
COMMITTEE ON ETHICS AND PRIVILEGES [Col. 3014]
COMMITTEE ON PUBLIC ACCOUNTS [Col. 3014]
COMMITTEE ON PUBLIC ENTERPRISES [Col. 3015]
COMMITTEE ON PUBLIC FINANCE [Col. 3015]
COMMITTEE ON WAYS AND MEANS [Col. 3015]
COMMITTEE ON PUBLIC PETITIONS [Col. 3016]
COMMITTEE ON HIGH POSTS [Col. 3016]
BACKBENCHER COMMITTEE [Col. 3016]
APPROPRIATION BILL, 2025 - [Twenty-fourth Allotted Day]:
Considered in Committee - [Heads 116, 295, 297-302 (Trade, Commerce, Food Security and Co-operative Development)] [Cols. 3018-3177]
ADJOURNMENT MOTION:
Impact of Public Administration Circular No. 19/2022 on the Public Service [Cols. 3178-3188]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 19වන බදාදා
2025 மார்ச் 19, புதன்கிழமை
Wednesday, 19th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

තාරුණ්‍යය සඳහා වන පාර්ලිමේන්තු සංසදය: ස්ථාපනය කිරීම
இளைஞர்களுக்கான பாராளுமன்ற ஒன்றியம்: தாபித்தல்
PARLIAMENTARY CAUCUS FOR YOUTH: ESTABLISHMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තාරුණ්‍යය සඳහා වන පාර්ලිමේන්තු සංසදය දසවැනි පාර්ලිමේන්තුව සඳහා ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාවට 2025 මාර්තු 15 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී අනුමතිය හිමි වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

II

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා පාර්ලිමේන්තුවේදී කරන කථාවල සජීවී විකාශය අත්හිටුවීම
மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களின் உரைகளை நேரடி ஒலி/ஒளிபரப்புச் செய்வதை இடைநிறுத்துதல்
SUSPENSION OF LIVE BROADCAST OF SPEECHES MADE BY HON. (DR.) RAMANATHAN ARCHCHUNA IN PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් මෙම සභාව තුළදී හා ඉන් පිටත දී විශේෂයෙන්ම සමාජ මාධ්‍ය භාවිත කරමින් පුද්ගලයින්, පුද්ගල කණ්ඩායම් හා විවිධ සංවිධානවලට එරෙහිව ඉතා පහත් පෙළේ වචන භාවිත කරමින් සිදුකරනු ලැබ ඇති හා සිදුකරමින් පවතින විවිධ මතභේදාත්මක සහ අවමන් සහගත ප්‍රකාශ හේතුවෙන් පෞද්ගලිකව විවිධ පුද්ගලයින්ට සහ විවිධ සමාජ හා ජන කණ්ඩායම්වලට ඇති වී තිබෙන අසහනකාරී තත්ත්වයන් පිළිබඳව මා වෙත විවිධාකාරයෙන් කරන ලද පැමිණිලි කිරීම් පිළිබඳව මෙම සභාවට පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීවරයා විසින් පෞද්ගලිකව කාන්තාවන් ඇතුළුව විවිධ පුද්ගලයින්, විවිධ සමාජ කණ්ඩායම් සහ ආගමික කණ්ඩායම් ඉලක්ක කරමින් එල්ල කරන ලද විවිධ අවමන් සහගත, අශෝභන හා දැඩි මතභේදාත්මක ප්‍රකාශ සම්බන්ධව විවිධ පුද්ගලයින්, විවිධ සමාජ සංවිධාන, එසේම මෙම උත්තරීතර සභාව නියෝජනය කරන ආණ්ඩුවේ හා විරුද්ධ පාර්ශ්වයේ මහජන නියෝජිතයින් ඇතුළු විවිධ පාර්ශ්වයන් මා වෙත පෞද්ගලිකව පැමිණිලි කොට එකී ප්‍රකාශ සම්බන්ධයෙන් ඔවුන්ගේ දැඩි අප්‍රසාදය, කනස්සල්ල හා කනගාටුව පළ කර තිබෙන අතර, එවැනි ක්‍රියා සම්බන්ධව මෙම උත්තරීතර සභාවේ ප්‍රධානියා වශයෙන් නිසි පියවර ගන්නා ලෙස මා වෙත මේ වන විටත් ඉල්ලීම් රාශියක් ඉදිරිපත් කර ඇති බව මෙම සභාවේ දැනගැනීම පිණිස සඳහන් කරනු කැමැත්තෙමි.

විශේෂයෙන්ම මෙම උත්තරීතර සභාව නියෝජනය කරන මහජන නියෝජිතයෙකු ලෙස හිමිව තිබෙන වරප්‍රසාද භාවිත කරමින්, මෙම සභාවට පැමිණ පිළිතුරු ලබා දිය නොහැකි පිරිස් සම්බන්ධව මෙන්ම මෙම සභාව නියෝජනය කරනු ලබන වෙනත් මහජන නියෝජිතයන් සම්බන්ධයෙන් මෙන්ම වෙනත් විවිධ බාහිර සමාජීය හා ආගමික සංවිධාන ඇතුළු විවිධ ජන කණ්ඩායම් හා ජන කොට්ඨාස ඉලක්ක කර ඉතාම පහත් මට්ටමේ වචන භාවිත කරමින් ඔවුන්ගේ පෞද්ගලික ජීවිතවලට අනිශයින් බලපානු ලබන මෙවැනි අවමන් සහගත ප්‍රකාශ සම්බන්ධව කථානායකවරයා වශයෙන් මාගේ බලවත් අප්‍රසාදය පළ කරමි.

මෙම උත්තරීතර සභාව නියෝජනය කරනු ලබන මහජන නියෝජිතයෙකු ලෙස කරනු ලබන මෙම අවමන් සහගත සහ අශෝභන ප්‍රකාශ මඟින් ආයතනයේ උත්තරීතරභාවයට බලවත් කැලලක් හා අවමානයක් සිදුවන බවත් මම අවධාරණය කිරීමට කැමැත්තෙමි. තවද, ඒ තුළින් ජාතික සමගියට හා සංහිඳියාවට බලවත් හානියක් සිදුවන බවත් සඳහන් කිරීමට කැමැත්තෙමි.

මෙවැනි ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙස අවස්ථා කිහිපයකදීම අදාළ මන්ත්‍රීවරයාට මා විසින් විවිධාකාරයෙන් අවවාද කර ඇතත්, එකී උපදෙස් පිළිගෙන කටයුතු කරන ආකාරයක් පෙන්නුම් කිරීමට අදාළ මන්ත්‍රීවරයා විසින් මුළුමනින්ම අපොහොසත් වී ඇති බවත් මම නිරීක්ෂණය කරමි.

මන්ත්‍රීවරයා විසින් සිදු කරනු ලබන මෙම ක්‍රියා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධාන, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ විධිවිධාන සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වර්යාධර්ම සංග්‍රහයේ ඇතුළත් විධිවිධානවලට මෙන්ම, විරාත් කාලයක සිට පැවත එන පැරණි පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට මුළුමනින්ම පටහැනි හා අනනුකූල බව මෙහිලා විශේෂයෙන් අවධාරණය කරමි.

දිගින් දිගටම ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීවරයා විසින් සිදු කරනු ලබන මෙම ප්‍රකාශ පිළිබඳව ඉතා ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් හා සලකා බැලීමෙන් අනතුරුව ඒ තුළින් ජාතික සමගියට හා සංහිඳියාවට එල්ල වන තර්ජන ද සැලකිල්ලට ගෙන කථානායකවරයා ලෙස මා වෙත ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතලවලට අනුකූලව 2025 මාර්තු

[ගරු කථානායකතුමා]

20 සහ 21, 2025 අප්‍රේල් 08, 09 සහ 10 හා 2025 මැයි 06, 07 සහ 08 යන පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දින 08 තුළදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් පාර්ලිමේන්තුව තුළදී සිදු කරනු ලබන කිසිදු ප්‍රකාශයක් ශ්‍රව්‍ය, දෘශ්‍ය හා සමාජ මාධ්‍යවල සජීවී විකාශය කිරීම අත්හිටුවීමට කටයුතු කරන ලෙස මම නියෝග කරමි.

තවද, අවස්ථානුකූලව මන්ත්‍රීවරයා විසින් සිදු කරනු ලබන එවැනි අවමන් සහගත, අශෝභන සහ පහත් පෙළේ වචන යොදා ගනිමින් කරනු ලබන ප්‍රකාශ සියල්ල හැන්සාඩ් වාර්තාවලින් ඉවත් කිරීමට පියවර ගනු ලබන බවත් වැඩිදුරටත් මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

තවද, මෙලෙස සජීවී විකාශය අත්හිටුවීමට කටයුතු කරන කාලය තුළදී මන්ත්‍රීවරයා විසින් පවත්වනු ලබන කථාවල අන්තර්ගතය සහ සිදු කරනු ලබන ප්‍රකාශ පිළිබඳව සැලකිල්ලට ගෙන මෙම තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීම පිළිබඳව සලකා බලනු ලබන බවත් වැඩිදුරටත් සඳහන් කිරීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the University of Vocational Technology for the year 2023.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කෝට්ටේ, මිරිහාන, රජමහා විහාර පාර, අංක 137/3 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඒ. සමන්ප්‍රිය රුද්‍රිගු මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවත, අංක 72 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.අයි. විමර්ශනී මිහිරාණි ද සිල්වා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

ගරු කථානායකතුමනි, ගල්ගමුව, තඹුත්ත, මයිලෑව, අංක 91 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රුවන් මාපලගම මහතා
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

ගරු කථානායකතුමනි, ගම්පහ, යක්කල පාර, ද සේරම් පෙදෙස, අංක 72/4/ඩී දරන ස්ථානයෙහි පදිංචි යූ.ජී.පී.එම්. උඩලමත්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම: විස්තර
சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றம்: விபரம்
SAUMYAMOORTHI THONDAMAN MEMORIAL FOUNDATION: DETAILS

506/2025

1. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுல சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කරන ලද ආයතනයක්ද;

(ii) එහි කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පදනම සතු වත්කම් කවරේද;

(iv) වර්ෂ 2020 සිට 2024 දක්වා එම පදනමට අය වැය මඟින් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් කාල සීමාව තුළදී එම පදනම විගණනයට ලක් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ට මැතිතුමා (பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்) (The Minister of Plantation and Community Infrastructure)

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றமானது பாராளுமன்றச் சட்டத்தினால் கூட்டிணைக்கப்பட்ட நிறுவனமா;

(ii) அதன் பணியாட்டொகுதி உறுப்பினர்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி மன்றத்துக்குச் சொந்தமான சொத்துக்கள் யாவை;

(iv) 2020ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரை மேற்படி மன்றத்துக்கு வரவு செலவுத்திட்டத்தின்மூலம் ஒதுக்கப்பட்ட தொகை ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு;

(v) மேற்படி காலப்பகுதிக்குள் மேற்படி மன்றம் கணக்காய்வுக்கு உட்படுத்தப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether the Saumyamoorthi Thondaman Memorial Foundation is an institution which has been incorporated by an Act of Parliament;

(ii) the number of members of its staff;

(iii) the assets owned by the above foundation;

(iv) the amount allocated to that Foundation by the Budget from 2020 to 2024, for each year separately; and

(v) whether that Foundation has been subjected to an audit during the period referred to above?

(b) If not, why?

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)

(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ சபாநாயகர் அவர்களே, பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர் சார்பாக நான் இந்த வினாவுக்கு விடையளிக்கின்றேன்.

(அ) (i) ஆம்.

2005ஆம் ஆண்டின் 19ஆம் இலக்க பாராளுமன்றச் சட்டத்தால் சௌமியமூர்த்தி ஞாபகார்த்த மன்றமானது நிறுவப்பட்டது.

(ii) சௌமியமூர்த்தி ஞாபகார்த்த மன்றம் மற்றும் அதன்கீழ் செயற்படும் நிறுவனங்களான தொண்டமான் தொழிற்பயிற்சி நிலையம், தொண்டமான் கலாசார நிலையம், தொண்டமான் விளையாட்டு அரங்கு மற்றும் பிரஜா சக்தி நிலையம் ஆகியவற்றுக்கு முகாமைத்துவ சேவைகள் திணைக்களப் பணிப்பாளர் நாயகத்தால் அனுமதிக்கப்பட்ட உத்தியோகத்தர்களின் எண்ணிக்கை 217 ஆகும். இந்நிறுவனத்தில் தற்போது பணிபுரியும் உத்தியோகத்தர்களின் எண்ணிக்கை 181 ஆகும்.

(iii) கீழே குறிப்பிடப்பட்டுள்ள சொத்துக்கள் இம்மன்றத்துக்குச் சொந்தமானவை.

1. தொண்டமான் தொழிற்பயிற்சி நிலையம்

கட்டிடங்கள்	-	22
கணினிகள்	-	54
மேசை மற்றும் கதிரைகள்	-	940
அலுமாரிகள்	-	114
முச்சக்கர வண்டிகள்	-	03
நகல் பிரதி இயந்திரங்கள்	-	03
மின்பிறப்பாக்கி	-	01
மோட்டார் சைக்கிள்கள்	-	15
அச்சு இயந்திரங்கள்	-	17
நீர்ப்பம்பிகள்	-	04
சிற்றுண்டிச்சாலை மேசை மற்றும் கதிரைகள்	-	160
நீர் பவுசர்	-	01
கெப் வண்டி	-	01
கட்டில் மற்றும் மெத்தைகள்	-	416
folding மெத்தைகள்	-	662
சமையலறை உபகரணங்கள் (பீங்கான், கரண்டி, கோப்பை போன்றன அனைத்தும் உள்ளடங்கலாக)	-	5,796
மின் உபகரணங்கள்	-	17

(முழுமையான தகவல்கள் இணைப்பு 01(a-g) இல் தரப்பட்டுள்ளது)

ஏனைய சொத்து விபரங்களை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

---

* *ඇමුණුම් පුස්තකාලයේ තබා ඇත.*

* *இணைப்புகள் நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Annexes placed in the Library.*

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

සභාමේසය මත තබන ලද (අ) (iii)හි පිළිතුරෙහි ඉතිරි කොටස:
சபாபீடத்தில் வைக்கப்பட்ட (அ) (iii) விடையின் எஞ்சிய பகுதி:
Rest of the Answer for (a)(iii) tabled:

2. තොණ්ඩමාන් කලාසාර නිලයම්

කට්ටිඩංකල්	-	10
මින් උපකරණංකල්	-	92
ඉසෛක්කරුවිකල්	-	281
තළපාඩංකල්	-	827

(முழுமையான தகவல்கள் இணைப்பு 02(a - b) இல் தரப்பட்டுள்ளது)

3. තොණ්ඩමාන් විළෙයාට්ටුත් තොකුතී

කට්ටිඩංකල්	-	08
මින් උපකරණංකල්	-	57
තළපාඩංකල්	-	203
කරුවිකල්	-	128
විළෙයාට්ටුක් කරුවිකල්	-	12
උඩර්පයිර්සික් කරුවිකල්	-	197
ඉයන්තිරංකල්	-	07
Volleyball court	-	01
Netball court	-	01
Basketball court	-	01
Cricket practice net	-	01

(முழுமையான தகவல்கள் இணைப்பு 03 மற்றும் 03(a-c)இல் தரப்பட்டுள்ளது)

4. பிරජා සක්ති නිලෙයඞ්කළින් එණ්ණික්කෛ 45 ආකුම්. තර්පෝතු 44 නිලෙයඞ්කළ් මට්ටුමේ සෙයර්පාට්ටිල් උළ්ළන.

කට්ටිඩංකල්	-	48
කණිනිකල්	-	226
මඩික් කණිනිකල් (laptops)	-	59
අච්චු ඉයන්තිරංකල්	-	88
තෛයල් ඉයන්තිරංකල්	-	158
මෝට්ටාර් සෛක්කිල්කල්	-	68
පුකෛප්පටක් කරුවිකල්	-	47
කණිනි මේසෛ මර්රුම් කතිරෛකල්	-	500
Projectors	-	63
නකල් පිරති ඉයන්තිරංකල්	-	07
පිළාස්ටික් කතිරෛකල්	-	1,205
අළුමාරිකල්	-	480
විසේට අතිතිකළුක්කාන කතිරෛකල්	-	130
ඔන්රුකූටල් අරඞ්ක මේසෛ මර්රුම් කතිරෛකල්	-	225
සිරේෂ්ට මේසෛ මර්රුම් කතිරෛකල්	-	180
ඔන්රුකූටල් අරඞ්ක කතිරෛකල්	-	896
උඩර්පයිර්සි කරුවිකල්	-	92
කාවලර් කට්ටිඩංකල්	-	41
ඔලිපෙරුක්කි ඉයන්තිරංකල්	-	43

(முழுமையான தகவல்கள் இணைப்பு 04 மற்றும் 04(b)இல் தரப்பட்டுள்ளது)

(iv) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை இம்மன்றத்துக்கு வரவு செலவுத்திட்டத்தினூடாக ஒவ்வோர் ஆண்டும் ஒதுக்கப்பட்ட நிதி தொடர்பான தகவல்கள் பின்வறுமாறு:

	2020	2021	2022	2023	2024
மூலதனம் (ரூ.மி.)	0.05	1.5	30	14.1	15
தொடர் செலவுகள் (ரூ.மி.)	108	172	106.2	125	125

(v) 2020 மற்றும் 2021ஆம் ஆண்டுகளுக்கான நிதிநிலை அறிக்கை கணக்காய்வு செய்யப்பட்டுள்ளதுடன், 2022 தொடக்கம் 2024 வரையான நிதிநிலை அறிக்கை தயாரிக்கப்பட்டு வருகின்றது.

(ஆ) ஏற்புடையதன்று.

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுல சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුර අනුව අපට පේනවා, නුවරඑළිය දිස්ත්‍රික්කය ඇතුළු මධ්‍යම පළාතේ මෙවන් පදනමක් පාවිච්චි කර ගනිමින් ජනතාවගේ මුදල් සහ දේපළ අවභාවිත කරමින්, විධිමත් විගණනයකට ලක් නොවී ආයතනයක් පවත්වාගෙන යමින් තිබෙන බව. මේකත් අර පවුල් පාලනයේ තෝතැන්නක් වාගේ තත්ත්වයකට පත් වෙච්ච අවස්ථාවක්. රජයේ දේපළ, ජනතාවට හිමි දේවල් තමයි මේ එක්රැස් කරගෙන පෞද්ගලික පෞරුෂ සංවර්ධනය සඳහා, පවුල් දේශපාලනය නඩත්තුව සඳහා යොදාගෙන තිබෙන්නේ. වත්මන් ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයාගෙන් මම අහන්න කැමැතියි, මෙවන් පදනම් පාවිච්චි කර ගනිමින් අය වැයෙනුත් මුදල් වෙන් කරගෙන, ජාත්‍යන්තර රටවලිනුත් මුදල් ලබාගෙන නඩත්තු කරගෙන යන මෙවන් ආයතන සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග මොනවා ද කියලා.

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)
ඇත්තටම මේ සම්බන්ධයෙන් අපි දැනටමත් සාකච්ඡා කරමින් සිටිනවා. ඉදිරියේදී අපි නිවැරදිව ඒ විගණන කටයුතු අවසන් කරලා, ඊට පස්සේ අදාළ ආයතනවලට ඒක අනුබද්ධ කරලා ඉදිරියට ගෙන යනවා.

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜூல சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කය පැත්තෙන් ගත්තාම, ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සඳහා හොඳ විභවතාවක් තිබෙන පරිසරයක් ඇතුළේ, ක්‍රීඩාවට අදාළ බලයත් මේ තොණ්ඩමන් අනුස්මරණ පදනමෙන් පවත්වාගෙන යමින් තිබෙනවා.

අපි දන්නවා, නුවරඑළිය දිස්ත්‍රික්කයටම තිබෙන ඉතාම වැදගත් ක්‍රීඩා පිටියක් තමයි නෝර්වුඩ් ක්‍රීඩා පිටිය. එය ෆුට්බෝල් තරග පවත්වන, ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පිටියක්. ඒ ක්‍රීඩා පිටිය මේ වෙනකොට මේ පදනමට අත්පත් කරගෙන, ප්‍රදේශයේ තරුණ තරුණියන්ට ක්‍රීඩා කිරීමට ඇති වටපිටාව අහිමි කරලා තිබෙනවා. විශේෂයෙන් එක ෆුට්බෝල් තරගයකට රුපියල් 15,000ක් වැනි මුදලක් අය කරලා, තොණ්ඩමන් පදනම පෝෂණය කර ගන්නා තැනකට පත්වෙලා තිබෙනවා. අත හිත දෙනවා වෙනුවට ඒක පාලනය කරගෙන, තමන්ගේ බූදලයක් බවට පත්කර ගත්ත එක වැරදියි. ඒ නිසා ඉදිරියේදී ඒ වාගේ තත්ත්වයන් පාලනය කරලා, මේ පදනම සතු බලය, මේ අයථා පැවැත්ම නැති කරලා, ක්‍රීඩාවට අත හිත දෙමින් ඒ ප්‍රදේශයේ ඉන්න තරුණ තරුණියන්ගේ ක්‍රීඩා ශක්තිය වර්ධනය කිරීම සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා දැන ගන්න කැමැතියි.

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)
ගරු මන්ත්‍රීතුමා, ඇත්තටම ඒක තමයි නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබෙන ලොකුම ක්‍රීඩා පිටිය. අපි දැනට මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරගෙන යනවා. ඇත්තටම ඒ ක්‍රීඩා පිටිය භාර දෙන්න ඕනෑ ක්‍රීඩා අමාත්‍යාංශයට. ඒක පාලනය කරන්න ඕනෑ ක්‍රීඩා අමාත්‍යාංශයෙන්. දැන් අපි ඒ ගැන අගමැතිතුමියත් එක්ක සාකච්ඡා කරමින් සිටිනවා; ක්‍රීඩා ඇමතිතුමා එක්කත් සාකච්ඡා කරමින් සිටිනවා. ඉදිරියේදී අපි එය ක්‍රීඩා අමාත්‍යාංශයට පවරාගෙන, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවට සාධාරණය ඉටු කරනවා.

පුහුණු අලිවැට නඩත්තු සහායකයින්: සේවය ස්ථිර කිරීම
யானைத் தடுப்பு வேலிப் பயிலுநர் உதவியாளர்கள்: சேவையில் நிரந்தரமாக்குதல்
TRAINED ASSISTANTS MAINTAINING ANTI-ELEPHANT ELECTRIC FENCE: CONFIRMATION IN SERVICE

507/2025

2. ගරු දිනේෂ් හේමන්ත මහතා
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති විදුලි අලිවැට ආරක්ෂා කිරීම සඳහා බඳවාගෙන ඇති පුහුණු අලිවැට සහායකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට සේවයේ ස්ථිර කර ඇති පුහුණු අලිවැට සහායකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනතෙක් සේවයේ ස්ථිර කර නොමැති පුහුණු අලිවැට සහායකයන්ගේ සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් නීතිමය බාධාවක් තිබේද;

(iv) නොඑසේ නම්, ඔවුන් සේවයේ ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(v) සේවය ස්ථිර කර නොමැති පුහුණු අලිවැට සහායකයින්ගේ සේවය ස්ථිර කිරීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් තිබේද;

(vi) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள யானைத் தடுப்பு மின்சார வேலிகளைப் பாதுகாப்பதற்காகச் சேர்த்துக்கொள்ளப்பட்டுள்ள யானைத் தடுப்பு வேலிப் பயிலுநர் உதவியாளர்களின் எண்ணிக்கை எத்தனை;

(ii) அவர்களில் தற்போது சேவையில் நிரந்தரமாக்கப்பட்டுள்ள யானைத் தடுப்பு வேலிப் பயிலுநர் உதவியாளர்களின் எண்ணிக்கை எத்தனை;

(iii) இன்றளவில் சேவையில் நிரந்தரமாக்கப்படாத யானைத் தடுப்பு வேலிப் பயிலுநர் உதவியாளர்களைச் சேவையில் நிரந்தரமாக்குவதற்குச் சட்டரீதியான தடைகள் காணப்படுகின்றனவா;

(iv) இன்றேல், அவர்கள் நிரந்தரமாக்கப்படாமைக்கான காரணங்கள் யாவை;

(v) சேவையில் நிரந்தரமாக்கப்படாத யானைத் தடுப்பு வேலிப் பயிலுநர் உதவியாளர்களை நிரந்தரமாக்குவதற்குத் திட்டவட்டமானதொரு வேலைத்திட்டம் காணப்படுகின்றதா;

(vi) ஆமெனின், அவ்வேலைத்திட்டம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of trained assistants who have been recruited to protect the anti-elephant electric fencing in Sri Lanka;

(ii) out of them, the number of those who have been confirmed in their service by now;

(iii) whether there is a legal impediment against confirming the trained assistants who have not been confirmed in service yet;

(iv) if not, the reasons for not confirming them in service;

(v) whether there is a definite course of action to confirm the trained assistants who have not been confirmed in their service; and

(vi) if so, the nature of the said course of action?

(b) If not, why?

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 3,530යි.

(ii) නැත.

(iii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්වේච්ඡා මාර්ගෝපදේශකයන් ලෙස සේවය කරන නිලධාරීන් ස්ථිර ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බඳවා ගැනීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති 278/2023 දරන මූලික අයිතිවාසිකම් නඩුව හේතුවෙන් බහුකාර්ය සංවර්ධන සහායකයින්ගේ පත්වීම ස්ථිර කිරීමට අදාළ සියලු කටයුතු නතර කිරීමට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අතුරු නියෝගයක් පනවන ලදී. එම අතුරු නියෝගය 2024.12.19 වන දින ඉවත් කිරීමට කටයුතු කළ අතර, ඒ අනුව විදුලි වැට නඩත්තු සහායකයින් බඳවා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(iv) උක්ත අතුරු නියෝගය පනවන විටත්, අනුමැතිය සඳහා යොමු කර තිබුණු විදුලි වැට නඩත්තු සහායක බඳවා ගැනීම් පටිපාටිය සඳහා අනුමැතිය ලැබී නොතිබුණු බැවින් අතුරු නියෝගය ඉවත් කිරීමත් සමඟ අදාළ බඳවා ගැනීම් පටිපාටිය අනුමත කර එවන ලෙස නැවතත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් යොමු කර ඇත.

(v) ඔව්.

(vi) ඔව්.

1. සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම්ලාභීන් හඳුනා ගෙන ඇත.
2. පත්වීම් ලිපි නිකුත් කිරීමට අදාළ නාම ලේඛනය පරිගණකගත කර ඇත.
3. අතුරු නියෝගය ඉවත් කිරීමෙන් පසු අදාළ බඳවා ගැනීම් පටිපාටිය කඩිනමින් අනුමත කර එවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2024.12.24 දිනැතිව නැවත ලිපියක් යොමු කර ඇත.
4. වැටුප් ගෙවීම සඳහා සහායකයින්ගේ බැංකු තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගෙන පරිගණකගත කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු දිනේෂ් හේමන්ත මහතා
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

අද වන කොට සමස්ත ලංකාවටම බලපා තිබෙන අලි-මිනිස් ගැටුම වාගේම, වන අලින්ගෙන් වගාවන්ට වන හානි මාතලේ දිස්ත්‍රික්කයේත්, ලග්ගල ආසනයේ මා නියෝජනය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ටත් ප්‍රබල ගැටලුවක් වෙලා තිබෙනවා. එම හානි සිදු වන එක නතර කරන්න මැදිහත් වෙන්න තිබෙන අසීරුතාව කුමක්ද කියලා වනජීවී නිලධාරීන්ගෙන් විමසුවාම ප්‍රධානම ගැටලුවක් විධියට ඒ අය සඳහන් කරන්නේ වනජීවී නියාමක නිලධාරීන්ගේ හිඟය ගැනයි. ප්‍රමාණවත් ශ්‍රම බලකායක්; ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් නොමැති වීමේ ගැටලුව තමයි ඔවුන් ප්‍රධාන වශයෙන් සඳහන් කරන්නේ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි අපේ ඉදිරි සැලසුම් තුළ වනජීවී නියාමක නිලධාරීන් සංඛ්‍යාව වැඩි කිරීමට අදාළව මොනවා හෝ ක්‍රියා මාර්ගයක් ගන්නවාද කියලා.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

ගරු කථානායකතුමනි, එතුමාගේ අතුරු ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් මා කිව යුතුයි, විදුලි වැට ආරක්ෂණ රාජකාරිය සඳහා සහායකයින් 3,530ක් අප නුදුරු දිනයක -ඉතාම ආසන්න දිනයක- බඳවා ගන්නා බව. දැනටමත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒ සඳහා යොදවා ගෙන තිබෙනවා. ඇතැම් ප්‍රදේශවල ඒ සේවක හිඟය පිරිමසා ගන්න අපි ප්‍රජා සහභාගිත්වයක් යොදා ගෙන තිබෙනවා. ඊට අමතරව, තත්කාලීන සේවකයන් කිහිප දෙනෙක් ඉන්නවා, සේවා කාලය අවුරුදු 7ක්, 8ක් පමණ වන. ඒගොල්ලන් ස්ථිර කිරීම සඳහාත් අවශ්‍ය කටයුතු සලකා බලමින් සිටිනවා. ඒ වාගේම රජය විසින් ගනු ලැබූ තීරණයක් අනුව උපාධිධාරීන් 35,000ක් බඳවා ගැනීමේදී වනජීවී දෙපාර්තමේන්තුවට අදාළව සුදුසුකම් සපුරන උපාධිධාරීන්ගෙන් එම නිලධාරීන්ගේ හිඟය පියවා ගැනීමට ඉදිරියේදී අපි කටයුතු කරනවා. ඉතින් අපි විශ්වාස කරනවා මේ වසර අවසානය වන විට නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ හිඟය සැලකිය යුතු ප්‍රමාණයකින් පියවා ගැනීමෙන් වනජීවී දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පුරවා ගැනීමට හැකි වේය කියලා.

ගරු දිනේෂ් හේමන්ත මහතා
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් ඒ හා සම්බන්ධවමයි. වනඅලි-මිනිස් ගැටුම් ඇති වන විට, ඒවා නතර කර ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගැන විමසද්දී ඒ නිලධාරීන්ගෙන් ආපු යෝජනාවක් තමයි, දැනට තිබෙන කාර්යාල ප්‍රමාණය, එහෙම නැත්නම් Beat Offices ප්‍රමාණය වැඩි කර ගන්න පුළුවන් නම් හොඳයි කියන එක. මොකද, දැනට තිබෙන කාර්යාල ප්‍රමාණය යොදාගෙන වනජීවී භූමි සීමාව ආවරණය කරන්න ඔවුන්ට තිබෙන හැකියාව මදි. මොකද, කාර්යාලවලට සාපේක්ෂව භූමි ප්‍රමාණය වැඩියි කියලායි ඒ අය කියන්නේ. ඒ නිසා එම කාර්යාල ප්‍රමාණය තවත් වැඩි කර ගන්න පුළුවන් නම් සහ වාහන ප්‍රමාණය වැඩි කර ගන්න පුළුවන් නම් ඉතා ක්ෂණිකව උත්තර සොයන්න පුළුවන්කමක් තිබෙනවා කියන එකයි ඔවුන්ගේ අදහස වුණේ. මම දැනගන්න කැමැතියි අපේ ඉදිරි වැඩ පිළිවෙළ තුළ එකී කාර්යාල සහ වාහන සම්බන්ධයෙන් ගෙන තිබෙන්නේ මොන වාගේ තීන්දුවක්ද කියලා.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමනි, අපි මේ වන විට එම කාර්යාලවල තිබෙන අඩුපාඩු සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් හදලා තිබෙනවා. මෙවර අය වැයෙන් මුදල් ප්‍රතිපාදනයක් ද කරලා තිබෙනවා. අන්න ඒ ප්‍රතිපාදන උපයෝගි කරගෙන අපි එම කාර්යාලවල තිබෙන අඩුපාඩුකම් සහ අලුත් කාර්යාල ඉදි කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. මේ අවුරුද්දේදී සැලකිය යුතු ප්‍රමාණයකින් ඒ දුබලතාව ඉවත් කිරීමට අපි කටයුතු කරනවා. අය වැයෙන් යොදා ගෙන ඇති ප්‍රතිපාදන වාගේම වනජීවී භාරය සතුව තිබෙන මුදලුත් ඒ සඳහා උපයෝගි

කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම එක එක ආයතනවල, එහෙම නැත්නම් ජනාධිපති ලේකම් කාර්යාලයේත් තිබෙන, අපට දෙන්න පුළුවන් වාහන ප්‍රමාණය අපි ලිඛිතව ඉල්ලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, වාහන කිහිපයක් අපට ලැබෙයි කියලා. ඒත් එක්කම මොබයිල් සේවය සඳහා රාත්‍රී කාලයට අවශ්‍ය වන වාහන ලබා ගැනීමට අපි පොලීසිය, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සාකච්ඡා කරලා ඒවායේ තිබෙන වාහන ලබාගෙන දැනට ඇතැම් ප්‍රදේශවල යොදවා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, වාහන සම්බන්ධයෙන් දැනට අපි අරගෙන තිබෙන්නේ එම තීරණයි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි රජයේ ක්‍රීඩා සංකීර්ණය: විස්තර

குருநாகல் மாவட்டத்தில் அரச விளையாட்டுக் கட்டிடத்தொகுதி: விபரம்

GOVERNMENT SPORTS COMPLEX IN KURUNEGALA DISTRICT: DETAILS

511/2025

3. ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ ක්‍රීඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ ක්‍රීඩා සංකීර්ණයක් පිහිටුවා තිබේද;

(iii) එසේ නම්, එය ස්ථාපිත කර ඇති ස්ථානය කවරේද;

(iv) එම ක්‍රීඩා සංකීර්ණය පළමුව ඉදි කිරීමට යෝජිතව තිබූ ස්ථානය කවරේද;

(v) එය වෙනත් ස්ථානයක ඉදි කිරීමට කටයුතු කරනු ලැබුවේද;

(vi) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම් සැපයීමට නියමිතව තිබූ ක්‍රීඩා කවරේද;

(ii) එම ක්‍රීඩා සංකීර්ණයේ මේ වන විට පහසුකම් සපයා ඇති ක්‍රීඩා කවරේද;

(iii) එම ක්‍රීඩා සංකීර්ණය ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදල කොපමණද;

(iv) එම ක්‍රීඩා සංකීර්ණය සම්පූර්ණයෙන් ඉදි කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள அரச விளையாட்டுக் கட்டிடத்தொகுதிகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) குருநாகல் மாவட்டத்தில் அரச விளையாட்டுக் கட்டிடத்தொகுதியொன்று அமைக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி விளையாட்டுக் கட்டிடத் தொகுதி தாபிக்கப்பட்டுள்ள இடம் யாது;

(iv) மேற்படி விளையாட்டுக் கட்டிடத்தொகுதியை முதலில் நிர்மாணிக்க உத்தேசிக்கப்பட்டிருந்த இடம் யாது;

(v) இதனை வேறோர் இடத்தில் நிர்மாணிக்க நடவடிக்கை மேற்கொள்ளப்பட்டதா;

(vi) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி விளையாட்டுக் கட்டிடத்தொகுதியில் வசதிகளை ஏற்பாடு செய்வதற்கு எதிர்பார்க்கப் பட்டிருந்த விளையாட்டுக்கள் யாவை;

(ii) மேற்படி விளையாட்டுக் கட்டிடத்தொகுதியில் இற்றைவரை வசதிகள் செய்துகொடுக்கப்பட்டுள்ள விளையாட்டுக்கள் யாவை;

(iii) மேற்படி விளையாட்டுக் கட்டிடத்தொகுதியை நிர்மாணிக்கவென மதிப்பீடு செய்யப்பட்டிருந்த தொகை யாது;

(iv) மேற்படி விளையாட்டுக் கட்டிடத்தொகுதியை பூரணமாக நிர்மாணிக்க நடவடிக்கை மேற் கொள்ளப்படுமா;

(v) ஆமெனில், அதன் நிர்மாணப் பணிகள் பூர்த்தி செய்யப்படும் திகதி யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House-

(i) the number of government sports complexes existing in Sri Lanka;

(ii) whether a government sports complex has been established in the Kurunegala District;

(iii) if so, the location of the sports complex referred to above;

(iv) the place where the said sports complex had been proposed to be constructed;

(v) whether action was taken to construct the sports complex at another place; and

(vi) if so, the reasons for that?

(b) Will he also inform this House -

(i) the sports for which facilities were to be provided in the sports complex concerned;

(ii) the sports for which facilities have been provided in the sports complex at present;

(iii) the estimated cost for the construction of the sports complex;

(iv) whether action will be taken to fully complete the construction of the sports complex; and

(v) if so, the date on which the construction of the sports complex will be completed?

(c) If not, why?

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 19කි.

(ii) ඔව්.

(iii) බිංගිරිය

(iv) රණවන වත්ත ඉඩම/ බඩගමුව ආශ්‍රිත ඉඩම, උඩවල්පොළ හිස් ඉඩම, කුරුණෑගල හාල්පාරුඔය මගුරුවත්ත ඉඩම, අටමුණේ ඉඩම ආදි ස්ථාන කිහිපයක ක්‍රීඩා සංකීර්ණය ඉදි කිරීමට යෝජනා වී ඇත.

(v) ඔව්.

(vi) අංක අමප/16/0870/747/008 හා 2016.06.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, බිංගිරිය මහජන ක්‍රීඩාංගණය හා ඊට යාබද රජයට පවරා ගත් කන්ඩක්කුවත්ත නමැති ඉඩමේ වයඹ පළාත් ක්‍රීඩා සංකීර්ණය ඉදි කිරීමට අනුමැතිය ලැබී ඇත.

(ආ) (i) ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පැවැත්වීමට හැකි ක්‍රීඩා:

1. වොලිබෝල්
2. නෙට්බෝල්
3. බාස්කට්බෝල්
4. හෑන්ඩ්බෝල්
5. බැඩ්මින්ටන්
6. ටේබල් ටෙනිස්
7. බර ඉසිලීම
8. කරාතේ
9. ජූඩෝ
10. ටයිකොන්ඩෝ
11. මල්ලවපොර
12. වූෂු
13. ත්‍රෝ බෝල්
14. කැරම්
15. බොක්සිං
16. කබඩි
17. පිහිනුම්

එළිමහන් ක්‍රීඩාංගණයේ පැවැත්වීමට හැකි ක්‍රීඩා:

1. මලල ක්‍රීඩා (සියලු ඉසව්)
2. පාපන්දු
3. හොකී
4. එල්ලේ
5. රග්බි
6. සැහැල්ලු පන්දු ක්‍රිකට්

(ii) පිහිනුම් සහ කායවර්ධන පුහුණුවීම්

(පිහිනුම් තටාකය සහ ශක්තිවර්ධන ශාලාව)

(iii) අංක අමප/16/0870/747/008 හා 2016.06.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 511.89කි.

(iv) ඔව්.

(v) 2025.11.30

(ඇ) පැන නොනඟී.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කුරුණෑගල අවට ක්‍රීඩාවට ගොඩක් ප්‍රසිද්ධ පාසල් තිබෙනවා. ඒ වාගේම තරුණ තරුණියන් ඉන්නවා. එවැනි තැනකට යෝජනා වෙලා තිබියදී, මේ ක්‍රීඩා සංකීර්ණය බිංගිරිය ප්‍රදේශයට ගෙනිහිල්ලා තිබෙන්නේ කාගේ පෞද්ගලික වුවමනාවක් මතද කියන ප්‍රශ්නය තිබෙනවා. අනෙක් පැත්තෙන්, පුත්තලම දිස්ත්‍රික්කයට යාබදව ක්‍රීඩා සංකීර්ණ කිහිපයක් තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ප්‍රශ්න කරනවා, පෞද්ගලික අවශ්‍යතාවක් මතද එතැනට රැගෙන ගියේ කියලා.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු මන්ත්‍රීතුමනි, ඒ දවස්වල හිටපු අමාත්‍යතුමාගේ වුවමනාව මත කියලා තමයි මෙහි තිබෙන්නේ. මොකද, අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව තමයි ඒක සිද්ධ වෙන්නේ.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කුරුණෑගල කියන්නේ, ප්‍රධාන ක්‍රීඩා දෙකකට ප්‍රසිද්ධ දිස්ත්‍රික්කයක්. විශේෂයෙන්ම, දැල්පන්දු ක්‍රීඩාවට කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලය හා ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයත්, ක්‍රිකට් ක්‍රීඩාවට ශාන්ත ආනා විද්‍යාලය හා මලියදේව පිරිමි විද්‍යාලයත් ප්‍රසිද්ධයි. 1988 අවුරුද්දේ රංජිත් මදුරසිංහ ක්‍රීඩකයාත්, 1997 අවුරුද්දේ ලංකා ද සිල්වා ක්‍රීඩකයාත්, 1999 අවුරුද්දේ එරික් උපශාන්ත ක්‍රීඩකයාත්, 1999 අවුරුද්දේ රංගන හේරත් ක්‍රීඩකයාත් පාසල් ක්‍රිකට් කණ්ඩායම් හරහා පැමිණ ලංකාවේ ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කළා.

එතැනින් පස්සේ මේ වෙනකම් ලංකාවේ ජාතික ක්‍රිකට් කණ්ඩායමට ඒ පාසල්වලින් කිසිදු ක්‍රීඩකයෙක් තේරී පත්වෙලා නැහැ. මේ වෙනකොට ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයේ දැල්පන්දු ක්‍රීඩාව ඉතා පහත් තත්ත්වයකට වැටිලා තිබෙනවා. එහි ක්‍රීඩා පුහුණුකරුවෙක් නැහැ. ඒ පාසල අවස්ථා 12කදි ජාතික දැල්පන්දු ශූරතාව දිනලා තිබෙනවා.

අක්කේ අමරජීව කියලා වයස අවුරුදු දහනවයෙන් පහළ පාසල් ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන ක්‍රීඩකයෙක් ඉන්නවා. මම හිතන විධියට ඔහු දැනට ලංකාවේ වයස අවුරුදු පහළොවෙන් පහළ ක්‍රිකට් තරගවලත් සෙල්ලම් කරන ක්‍රීඩකයෙක්. ඔහු තමයි දැනට ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව තුළ වැඩිම දළ ලකුණු වේගය - strike rate එක - තිබෙන ක්‍රීඩකයා. නමුත්

අපට දැනෙනවා, කුරුණෑගල අවට පාසල්වල ක්‍රීඩා අංශයෙන් අනාගතයක් තිබෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා ගමන යන්න අත්වැලක් සපයන්නේ නැහැ කියලා. ක්‍රීඩා කරන old boysලා, old girlsලා මේ අයට බලපෑම් කරනවා. ඒ නිසා අපි ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් අහනවා, අනාගතයක් තිබෙන එවැනි තරුණ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා දිවියේ ඉදිරියට යන්න පහසුකම් සැපයීම සඳහා ඔබතුමන්ලා ගන්න නීතිමය පියවර මොනවාද කියලා.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(මාණ්පුමිකු சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු මන්ත්‍රීතුමනි, අපට මේ වාගේ ප්‍රශ්න විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වෙනවා, විවිධ ප්‍රදේශවලින්. විශේෂයෙන් ක්‍රිකට් තරගවලදි ළමයින්ට අවස්ථාවක් නොදීම සම්බන්ධයෙන්, ක්‍රීඩකයන්ට අවස්ථාවක් නොදීම සම්බන්ධයෙන් විවිධ ප්‍රදේශවල මේ වාගේ ගැටලු තිබෙනවා. ඒවාට අපට තිබෙන විසඳුම් ටිකක් සංකීර්ණයි. නමුත් ඒ සියලු ප්‍රශ්නවලට අපි විසඳුම් සොයන්න ඕනෑ. මොකද, අපේ අමාත්‍යාංශයේ වගකීම තමයි, සුදුසු ක්‍රීඩකයන් ඉදිරියට අරගෙන ඒ අයට ක්‍රීඩා කිරීමේ අවස්ථාව හදලා දෙන එක සහ ඒ ක්‍රීඩාවෙන් ඔවුන් ඉදිරියට ගෙනියන එක. ඒ වාගේ සමහර විශේෂ තැන්වලට අපි මැදිහත් වෙලා තිබෙනවා. මේ පිළිබඳව අපට ලිඛිතව දැනුම් දීමක් කළොත්, ඒ අදාළ පාර්ශ්වය අපට දැනුම්දීමක් කළොත් ඒ පිළිබඳව සොයා බලලා යම්කිසි සහනයක්, යම්කිසි සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -514/2025-(1), ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(මාණ්පුමිකු (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -517/2025-(1), ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අමාත්‍යාංශගීය උපදේශක කාරක සභා
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
MINISTERIAL CONSULTATIVE COMMITTEES

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශගීය උපදේශක කාරක සභාව අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂයභාර අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසි නව දෙනෙකුගෙන් (29) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව
சட்டவாக்க நிலையியற் குழு
LEGISLATIVE STANDING COMMITTEE

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, නියෝජ්‍ය කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு
COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06දින පාර්ලිමේන්තුව විසින් සංශෝධන සහිතව සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් (20) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව
நிலையியற் கட்டளைகள் பற்றிய குழு
COMMITTEE ON STANDING ORDERS

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 116 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දස දෙනෙකුගෙන් (10) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගෘහ්‍ය කාරක සභාව
சபைக் குழு
HOUSE COMMITTEE

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 117 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ගෘහ්‍ය කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතු ය. "

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව
ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழு
COMMITTEE ON ETHICS AND PRIVILEGES

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහ අට දෙනෙකුගෙන් (18) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
அரசாங்கக் கணக்குகள் பற்றிய குழு
COMMITTEE ON PUBLIC ACCOUNTS

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு
COMMITTEE ON PUBLIC ENTERPRISES

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව
அரசாங்க நிதி பற்றிய குழு
COMMITTEE ON PUBLIC FINANCE

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහ අට දෙනෙකුගෙන් (18) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව
வழிவகைகள் பற்றிய குழு
COMMITTEE ON WAYS AND MEANS

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් විසි තුන් දෙනෙකුගෙන් (23) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව
பொது மனுக்கள் பற்றிய குழு
COMMITTEE ON PUBLIC PETITIONS

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් විසි නව දෙනෙකුගෙන් (29) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

උසස් නිලතල පිළිබඳ කාරක සභාව
உயர் பதவிகள் பற்றிய குழு
COMMITTEE ON HIGH POSTS

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් දහනව දෙනෙකුගෙන් (19) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව
பின்வரிசைக் குழு
BACKBENCHER COMMITTEE

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 129 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන ආණ්ඩු පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගෙන් (08) සහ විරුද්ධ පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගෙන් (08) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මේ යෝජනා 13 පිළිබඳව කෙටි අදහසක් ඉදිරිපත් කිරීමට මම ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව කාරක සභා සඳහා සාමාජික මන්ත්‍රීවරයන් පත් කිරීමේදී ස්ථාවර නියෝගයන්හි දක්වා ඇති පරිදි, සාමාජික මන්ත්‍රීවරයන් පත් කිරීමට කටයුතු කිරීම ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රතිපත්තිය වුවත්, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයන්ගේ ඉල්ලීම්වලට අවධානය යොමු කරමින්, ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුතු වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙන්ම, තේරීම් කාරක සභාවේදී ද විරුද්ධ පක්ෂය විසින් දිගින් දිගටම සිදු කරන ලද ඉල්ලීම් සලකා බලා, ඉල්ලීම් කරන ලද සියලුම කාරක සභාවන්හි සාමාජික මන්ත්‍රීවරයන් සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව විරුද්ධ පාර්ශ්වය සඳහා මේ වනවිට කාරක සභාවන්හි සාමාජික මන්ත්‍රීවරයන් සංඛ්‍යාව වැඩි කර දී ඇති ආකාරය - සම්පූර්ණ සංඛ්‍යාව නොවෙයි - සැලකීමේදී එක් එක් අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා සඳහා විරුද්ධ පාර්ශ්වයෙන් සාමාජික මන්ත්‍රී ධුර අටක්ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සඳහා විරුද්ධ පාර්ශවයෙන් සාමාජික මන්ත්‍රී ධුර හය බැගින්ද, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව සඳහා විරුද්ධ පාර්ශ්වයෙන් සාමාජික මන්ත්‍රී ධුර පහක්ද, ගෘහ්‍ය කාරක සභාව, ආචාර්ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව සහ උසස් නිලතල පිළිබඳ කාරක සභාව සඳහා විරුද්ධ පාර්ශ්වයේ සාමාජික මන්ත්‍රීවරයන් තුන බැගින්ද, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව සහ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සඳහා සාමාජික මන්ත්‍රී ධුර දෙක බැගින්ද, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව සඳහා එක් එක් සාමාජික මන්ත්‍රී ධුරයක් බැගින්ද මේ වනවිට වැඩිකර දී තිබෙන බව මෙම සභාවට දන්වා සිටීමට කැමැත්තෙමි.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් කාරක සභා සඳහා සාමාජික මන්ත්‍රීවරයන් පත් කිරීමේදී මෙතෙක් පැවති පරිචයන් හා පිළිගත් ක්‍රමවේදයන් සලකා බැලීමේදී ආණ්ඩු පාර්ශ්වය සහ විරුද්ධ පාර්ශ්වය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ අනුපාතය අනුව කාරක සභාවන්හි සාමාජික මන්ත්‍රී ධුර සංඛ්‍යාව බෙදී ගිය ද, අද දින සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව එක් එක් කාරක සභාවන් සඳහා විරුද්ධ පාර්ශ්වයට සාමාජික මන්ත්‍රී ධුර සංඛ්‍යාව වැඩිවීමේදී ආණ්ඩු පාර්ශ්වයට වැඩි විය යුතු සාමාජිකයන් සංඛ්‍යාව ලෙස අප යෝජනා කරන්නේ, ගෘහ්‍ය කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් වැඩි විය යුතු සංඛ්‍යාව ආණ්ඩු පක්ෂයට 8ක් වුවද, මේ අවස්ථාවේ පත් කරනු ලබන්නේ 3දෙනෙකු පමණි; ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ ආණ්ඩු පක්ෂයට වැඩි විය යුතු සංඛ්‍යාව 7ක් වුවද, පත් කරනු ලබන්නේ 5ක් පමණි; රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ආණ්ඩු පක්ෂයට වැඩි විය යුතු සංඛ්‍යාව 11 බැගින් වුව ද, පත් කරනු ලබන්නේ 5ක් පමණි; රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ ආණ්ඩු පක්ෂයට වැඩි විය යුතු සංඛ්‍යාව 6ක් වුවද, පත් කරනු ලබන්නේ 4ක් පමණි; ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ආණ්ඩු පක්ෂයට 8ක් වැඩි කළ යුතු වුවද, අප විසින් වැඩි කරනු ලබන්නේ 4ක් පමණි; මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් 10ක් වැඩි කළ යුතු වුවද, අප විසින් වැඩි කරනු ලබන්නේ 5දෙනෙක් පමණි; උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ මන්ත්‍රීවරයන් 9ක් වැඩි කළ යුතු වුවද, අප විසින් වැඩි කරනු ලබන්නේ 4දෙනෙක් පමණි; ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව සඳහා මන්ත්‍රීවරයන් 5ක් වැඩි කළ යුතු වුවද, අප විසින් වැඩි කරනු ලබන්නේ 3දෙනෙකු පමණි; අමාත්‍යාංශගීය උපදේශක කාරක සභාවල මන්ත්‍රීවරුන් 12දෙනා බැගින් වැඩි කළ යුතු වුවද, අප විසින් මන්ත්‍රීවරුන් 4දෙනා බැගින් පමණක් වැඩි කර තිබෙන බව වැඩිදුරටත් මෙම සභාවට දන්වා සිටිනවා.

ගරු කථානායකතුමනි, ප්‍රතිශතාත්මකව අපට හිමි සීමාවට යටත්ව හා අවශ්‍යතාවන්ට අනුව ඉහත කාරක සභාවන්හි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවද මෙම සභාවට දන්වා සිටිමි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා විසින් ප්‍රකාශ කළ පරිදි විරුද්ධ පක්ෂය වෙනුවෙන් අප විසින් පාර්ලිමේන්තුවේ කමිටුවලට සාමාජිකයන් වැඩි කර දෙන ලෙස ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කළා. ඒ ගැන කරපු සාකච්ඡාවෙන් පසුව සාමාජිකයන් වැඩි කිරීමට කටයුතු කරලා තිබෙනවා. අපි ඉල්ලපු ප්‍රමාණය නොලැබුණත් යම් ප්‍රමාණයකින් වැඩි කරලා තිබෙනවා. අපි ඒ වැඩි කරපු ප්‍රමාණය සමස්ත විපක්ෂයේ සියලු නියෝජිතයන් සමඟ සාකච්ඡා කරලා ඉදිරි දින දෙක ඇතුළත පත් කිරීමට යෝජනා එවනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2025, විසිහතරවන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී නවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: මාර්තු 18]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 18]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee.- [Progress: 18th March]
[HON. SPEAKER in the Chair.]

116 වන ශීර්ෂය - වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 471,000,000

தலைப்பு 116.- வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 471,000,000

HEAD 116.- MINISTER OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 471,000,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 116, 295 සහ 297 සිට 302 දක්වා.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. Mujibur Rahman. You have 35 minutes.

[පූ.භා. 10.07]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.19වන බදාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 116, 295 සහ 297 සිට 302 දක්වා වන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙම අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේදී වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙය ඉතාම වැදගත් වැය ශීර්ෂයක්. විශේෂයෙන්ම පසුගිය ආණ්ඩුව කාලයේ නොයෙක් නොයෙක් අවස්ථාවලදී වෙළඳ අමාත්‍යාංශයට සම්බන්ධ විවිධ මාතෘකා සම්බන්ධයෙන් සහ ඒවායේ සිදු වුණු ගනුදෙනු සම්බන්ධයෙන් අපි මේ පාර්ලිමේන්තුව තුළ නිතර නිතර කථා කරලා තිබෙනවා. මේ අමාත්‍යාංශය තුළ සිදු වුණු අයථා ගනුදෙනුවලට අදාළව අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි පවා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ සමහර දේවල් සම්බන්ධයෙන් අපි ඒ කාලයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් පැමිණිලි ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අමාත්‍යාංශය ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. මේ අමාත්‍යාංශය අපේ රටේ ජන ජීවිතත් එක්ක ඉතාම සමීපව වැඩ කරන අමාත්‍යාංශයක් හැටියට අපට හඳුන්වන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ රටේ පවතින භාණ්ඩ හා සේවාවල පාලන මිල, ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් ඇති වුවමනාව කියන ඒ සියලු දේවල් මේ අමාත්‍යාංශයත් එක්ක බැඳී පවතිනවා.

2024ට කලින් තිබුණු ආණ්ඩුව කාලයේ මේ අමාත්‍යාංශයේ සිදු වූ නොයෙකුත් ගනුදෙනු පිළිබඳ කරුණුත් අපි මතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම සීනි බදු වංචාව, සුදු ලූනු වංචාව, පොල් තෙල් පිළිබඳව ඇති වුණු වංචාව ආදී ඒ සියලු දේවල් පිළිබඳව අපි එවකට විපක්ෂයේ ඉඳගෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් පැමිණිලි කරලා තිබෙනවා. මේ අමාත්‍යාංශයේ විශේෂත්වයක් තිබෙනවා. එනම්, විශාල වශයෙන් වංචා, දූෂණ සිදු කෙරෙන අමාත්‍යාංශයක් හැටියට තමයි ඉතිහාසය පුරාම මේ අමාත්‍යාංශයට චෝදනා එල්ල වෙලා තිබෙන්නේ. සමහර විට ඒ හින්දාම වෙන්න ඇති, ජනාධිපතිතුමා මේ අමාත්‍යාංශය වසන්ත සමරසිංහ ඇමතිතුමාට භාර දුන්නේ. මොකද, දූෂණ විරෝධී ව්‍යාපාරයේ සභාපතිවරයෙකුව හිටපු නිසාම ඔබතුමාට මේ අමාත්‍යාංශය භාර දෙන්න ඇති, clean කරන්න. ඒ නිසා ඔබතුමාට විශාල වගකීමක් තිබෙනවා, මේ අමාත්‍යාංශය ඇතුළේ, විශේෂයෙන්ම සතොස ආයතනය ඇතුළේ සිදු වන වංචා හා දූෂණ සම්බන්ධව සංශෝධනය කරන්න. ඔබතුමා පසුගිය කාලය පුරාම ඒවා සම්බන්ධව හඬ නඟපු කෙනෙකු හැටියට අද මේ සතොස ආයතනවල සිදු වන දේවල් පිළිබඳව ඉතා ඉක්මනින් ක්‍රියාමාර්ග ගන්න.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දැක්කා, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ මේ ආණ්ඩුව ජනාධිපතිවරණයේදී යම් යම් කාරණා සම්බන්ධව යම් යම් පොරොන්දු ලබා දෙනවා. එත්මන් ජනාධිපතිතුමා ජනාධිපතිවරණ වේදිකාවලදී දුන් පොරොන්දුවක් තමයි, බලය ගත් ගමන් ඉදිරිපත් කරන පළමුවෙනි අය වැයේදීම අත්‍යවශ්‍ය භාණ්ඩවලට පනවා තිබෙන සියයට 18 VAT එක අයින් කරනවා කියන එක. එතුමා කිව්වේ පළමුවෙනි අය වැයෙන්ම ඒක අයින් කරනවා කියලායි. නමුත් අපට පෙනෙනවා, මේ අය වැය යෝජනා තුළින් අත්‍යවශ්‍ය භාණ්ඩවලට ගහපු VAT එක අයින් වෙලා නැහැ කියලා. ඒ විතරක් නොවෙයි. පාසල් උපකරණ සම්බන්ධවත් එතුමා ඔය අදහස දැරුවා. අපට පෙනෙනවා, පාසල් උපකරණ සම්බන්ධව තිබෙන VAT එක අයින් කරන්නත් ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙන බව.

ඊළඟට ජනාධිපතිතුමා වේදිකාවල කථා කළා, පෙට්ල්වලට, ඩීසල්වලට ගහන රුපියල් 50ක බද්දක් ගැන. ඒ බද්ද අනවශ්‍යයි කියලාත් එතුමා කිව්වා. කර්මාන්ත ඇමතිතුමාත් ඒක කිව්වා. මට මතකයි එතුමා අහනවා, "තෙල්වලට බදු ගහනවාද, නැත්නම් බදුවලට තෙල් ගහනවාද?" කියලා. නමුත් දැන් අපට පෙනෙනවා, රුපියල් 50 බද්ද අයින් කරනවා තියා කිසිදු ආකාරයක සහනයක් පෙට්ල් හෝ ඩීසල් මිලෙන් ලබා දෙන්නත් බැරි වෙලා තිබෙන බව. ඒ විතරක් නොවෙයි. පසුගිය කාලය තුළ ලෝක වෙළෙඳ පොළේ බොර තෙල්වල මිල අඩු වුණත්, මිල සූත්‍රය අනුවවත් තවම පෙට්ල් මිලට සහනයක් ලැබුණේ නැහැ.

පසුගිය කාලයේ ජනාධිපතිවරණ වේදිකාවලදී තමුන්නාන්සේලා මේ රටේ ජනතාවගේ ජීවන බර අඩු කරන්න පසුගිය ආණ්ඩුව විසින් පනවපු බදු අයින් කරනවාය කියන සටන් පාඨය අරගෙන ගියා. නමුත්, ජනාධිපතිවරණය අවසන් වුණාට පසුවත් ඒක සටන් පාඨයක් හැටියට තිබුණා මිසක්, ක්‍රියාකාරීව මේ අය වැය යෝජනාවලින් ජනතාවට සහන ලබා දෙන්න පුළුවන් විධියට ඒ අත්‍යවශ්‍ය භාණ්ඩවලට පනවා තිබෙන VAT එක අයින් කරන්න ක්‍රියාමාර්ග අරගෙන නැහැ.

මේ රටේ හාල් අර්බුදයක් මතු වුණාම තමුන්නාන්සේලා හාල් ආනයනය කළා. හාල් ආනයනය කරනකොටත් තමුන්නාන්සේලා රුපියල් 65ක බද්දක් පැනෙව්වා. අපේ රටේ පැවති කිසිම ආණ්ඩුවක්, කවදාකවත් හාල් ගෙන්වනකොට මේ තරම් බදු ගහලා නැහැ, උපරිමය බදු ගහලා තිබෙන්නේ රුපියලේ සිට රුපියල් 10 දක්වා පමණයි. මොකද, හාල් කියන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩයක්. නමුත්, තමුන්නාන්සේලා හාල් කිලෝවකට රුපියල් 65ක බද්දක් ගැහුවා. ඒ කියන්නේ, අපි එදා රුපියල් 220කට ගත්ත හාල් කිලෝ එකකට රුපියල් 65ක බද්දක් ගැහුවා. ඒ කියන්නේ තුනෙන් එකක බද්දක් මිනිස්සුන්ට ගෙවන්න වුණා. රුපියල් 65ක බද්දකුත් ගහලා අනික් පැත්තෙන් හාල් මෝල් හිමියන්ට තමුන්නාන්සේලා විශාල සහනයක් ලබා දුන්නා, ඔවුන් කියන ගණනට හාල් ටික විකුණාගන්න. අපට මතකයි, ඒ කාලයේ තමුන්නාන්සේලා මේ හාල් මාෆියාව නැති කරන්න කථා කළ ආකාරය. මේ මාෆියාව අයින් කරන්න ඕනෑය කියන කථා තමයි ඒ කාලයේ වේදිකාවල ඇහුණේ. නමුත් අපි දැක්කා, තමුන්නාන්සේලා හාල් මාෆියාවට උත්තර දෙනවා වෙනුවට, ඒක පාලනය කරනවා වෙනුවට අන්තිමට හාල් මාෆියාවටත් ඉඩ දුන් ආකාරය. මේ රටේ ජනතාවගේ මුදල්වලින් හාල් කිලෝ එකකින් රුපියල් 65ක බද්දක් අය කරගෙන හාල් මෝල් හිමියන්ට අවශ්‍ය

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ආදායම ලබා ගන්න පුළුවන් පරිසරයක් තමුන්නාන්සේලා හදලා දුන්නා. ජනාධිපතිතුමා පස්වරක් සාකච්ඡා කළා, හාල් මෝල් හිමියන් එක්ක. නමුත් අන්තිමට මොකක්ද වුණේ? ඒ හාල් මෝල් හිමියන්ව සන්තෝෂ කරන්න, එහෙම නැත්නම් ඔවුන්ට උදව්වක් හැටියට ජනාධිපතිතුමා හාල් කිලෝවක මිල රුපියල් 10කින් වැඩි කරලාත් දුන්නා. දැන් අපට පෙනෙන්න තිබෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා විපක්ෂයේ සිටි කාලය පුරාම මේ මෝල් හිමියන් සම්බන්ධව දරපු මතය නොවෙයි, අද ආණ්ඩු බලය ලබා ගත්තාම දරන්නේ. අද ඒ මතය වෙනස් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්නකොට මේ රටේ දුක් විඳින ජනතාවට සහන දෙන්න ඕනෑ, ජනතාවගේ ජීවන බර අඩු කරන්න ඕනෑය කියා නොයෙකුත් මාතෘකා වේදිකාවල කථා කළත්, අද එවැනි තත්ත්වයක් උදා වෙලා නැති බව අපට පෙනෙනවා. අද මිනිස්සු ඉතාම අමාරුවෙන් ජීවත් වන තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඊයේ තමුන්නාන්සේලා ප්‍රකාශයට පත් කළා, අප්‍රේල් 01වැනි දා සිට කිරි පිටි මිල රුපියල් 50කින් වැඩි කරනවා කියලා. එ් අනුව අපි දැක්කා, අප්‍රේල් 01වැනි දා ඉඳලා කිරි පිටි මිල තවත් රුපියල් 50කින් වැඩි වෙනවා කියලා ප්‍රචාරත්ති පළවෙලා තිබෙන ආකාරය. මෙහෙම පාරිභෝගික ද්‍රව්‍යවල මිල වැඩිවීගෙන වැඩිවීගෙන ගිහින් අද වෙනකොට මේ රටේ ජනතාව ඉතාම අමාරු තැනකට පත් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ජාතික පාරිභෝගික මිල දර්ශකය අරගෙන බැලුවොත් අපට පෙනෙනවා, හතරදෙනෙක් සිටින පවුලකට 2019 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී වියදම් වෙලා තිබෙන්නේ රුපියල් 43,391යි කියලා. මේ ජාතික පාරිභෝගික මිල දර්ශකය හදන්නේ භාණ්ඩ 426ක වාගේ ප්‍රමාණයක මිල පදනම් කරගෙනයි. ජාතික පාරිභෝගික මිල දර්ශකයට අනුව හතරදෙනෙක් සිටින පවුලකට 2019 වර්ෂයේදී මසකට වියදම් වෙලා තිබෙනවා, රුපියල් 43,391ක්. නමුත් 2025 වර්ෂයේදී හතරදෙනෙක් සිටින පවුලකට මසකට වියදම් වෙලා තිබෙනවා, රුපියල් 104,851ක්. ඒ කියන්නේ, රුපියල් 60,000ක පමණ වැඩිවීමක් වෙලා තිබෙනවා. ඒකෙන් සියයට 39ක් ආහාර සඳහායි ඔවුන් වියදම් කරන්නේ. සියයට 60ක් වියදම් වනවා, ආහාර නොවන ද්‍රව්‍ය සඳහා.

ඊළඟට, අපි කොළඹ පාරිභෝගික මිල දර්ශකය බලමු. කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව හතරදෙනෙකුගෙන් යුත් පවුලකට මාසයකට 2019 වසරේ රුපියල් 79,923ක් වියදම් වෙලා තිබෙනවා. 2025 වසරේ පෙබරවාරි මාසය වනකොට -පසුගිය මාසය වනකොට- කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව හතරදෙනෙකුගෙන් යුත් පවුලකට රුපියල් 176,409ක් වියදම් වනවා. ඒ මුදල දරා ගන්න බැහැ, ගරු ඇමතිතුමනි. ඒක බරපතළ තත්ත්වයක්. ඒකෙන් මිනිස්සු කෑම කන්න වියදම් කරන්නේ සියයට 26යි. සියයට 73ක් වියදම් කරනවා, ආහාර නොවන වියදම් සඳහා. ඒ කියන්නේ, ළමයින්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් පොත් පත්වලට, school van fee එකට, බෙහෙත්වලට, විදුලි බිල වැඩි වුණු නිසා විදුලි බිල්පත් ගෙවීම සඳහා, ජල බිල්පත් ගෙවීම සඳහා, වැඩි වුණු බස් ගාස්තු ගෙවන්න, දුරකථන ගාස්තු ගෙවන්න. ඒ අමතර දේවල්වලට මිනිස්සු සියයට 73ක් වියදම් කරනවා. මිනිස්සු කන්න වියදම් කරන්නේ සියයට 26යි. මේක ඉතාම භයානක තත්ත්වයක්. මේ තත්ත්වය තුළ ඉදිරි කාලයේදී අපේ රටේ සෞඛ්‍ය ගැටලු මතු වෙන්න පුළුවන්. ඒ නිසා විශාල මුදලක් දැන් සෞඛ්‍ය අංශයට වෙන් කරන්න වෙනවා. මොකද, මිනිස්සු ලාභ කෑම - cheap food - කන්නේ. ඒ, ඇයි? ඒගොල්ලන්ට වියදම් දරා ගන්න බැරි නිසා. මිනිස්සුන්ට වියදම් අඩු කරන්න පුළුවන් වෙන්නේ තමන්ගේ කෑම බීමවලින් විතරයි. මොකද, විදුලිය භාවිතය, ජලය පාවිච්චි කිරීම, ටෙලිෆෝන් බිල, tuition fees, transport වියදම, ළමයාගේ school van fee එක, බෙහෙත්වලට යන වියදම් අඩු කරගන්න බැහැ. ඒ වියදම් අනිවාර්යයෙන්ම දැන් දරන්න සිදු වෙලා තිබෙනවා. අඩු කරගන්න පුළුවන් වියදම් මොනවාද? තුන්වේලක් කෑවා නම් දෙවේලයි කන්න පුළුවන් වෙන්නේ. දෙවේලක් කාපු අයට එක වේලයි කන්න වෙන්නේ. ඒ නිසා මිනිස්සු දැන් පුරුදු වෙනවා, ලාභ කෑම කන්න, street food කන්න, junk food කන්න. මේ කෑම ආහාරයට ගැනීම තුළින් ඉදිරි කාලයේදී සෞඛ්‍ය පිළිබඳ ගැටලු මතු වෙනවා. ඒ හින්දා එක පැත්තකින් සෞඛ්‍ය අමාත්‍යාංශයට විශාල මුදලක් තමුන්නාන්සේලාට වියදම් කරන්න සිද්ධ වෙනවා. මොකද, දරා ගන්න බැරි විධියට ජීවන වියදම ඉහළ යෑම නිසා අපේ රටේ ජනතාව විශාල පිරිසක් ලාභදායී කෑම කන්න ගිහිල්ලා ඔවුන්ට නොයෙකුත් ලෙඩ රෝග වැලඳීමේ අවදානම ඇති වෙලා තිබෙනවා.

මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කළ සංක්ෂිප්ත වාර්තාව අනුව, 2022 වසරේ වයස අවුරුදු 5ට අඩු ළමයින්ගේ කුරුවීම සියයට 9.2යි; 2023 වසරේ එය සියයට 10.3යි. ඊළඟට, කෘශ වීම ගැන බලමු. ඒ කියන්නේ, උසට සරිලන බරක් නොමැති වීම. එය 2022 වසරේ සියයට 10.1යි; 2023 වසරේ සියයට 10යි. ඊළඟට, වයසට සරිලන බර නොමැති වීම - underweight - 2022 වසරේ සියයට 15.3යි; 2023 වසරේ සියයට 17.1යි. ඒ කියන්නේ, 2024 වසරේදී මේ තත්ත්වය අනිවාර්යයෙන්ම තවත් වැඩි වෙලා තිබෙන්න පුළුවන්. මම කිව්වේ වයස අවුරුදු 5ට අඩු ළමයි පිළිබඳවයි. ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාව ජීවන බර දරා ගන්න බැරි වීම මත තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන මුදල් වෙනත් අවශ්‍යතා සඳහා කැප කරන්නේ නැහැ. ඒවා අඩු කරන්න පෙලඹෙන්නේ නැහැ. අනෙකුත් දේවල් අඩු කරගන්න පෙලඹෙන්නේ නැහැ. දෙමව්පියන් තමන්ගේ කෑම වේලට යන වියදම තමයි අඩු කර ගන්න පෙලඹිලා තිබෙන්නේ. ඒක තමයි අපට පෙන්වන්නේ.

ගරු සභාපතිතුමනි, කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව බැලුවොත්, පෙබරවාරි මාසයට රුපියල් 176,409ක් වියදම් වනවා, හතර දෙනෙකුගෙන් යුත් පවුලකට. ඒකෙන් සියයට 26යි ඔවුන් කෑම සඳහා වියදම් කරන්නේ. සියයට 73ක් වියදම් කරනවා, ආහාර නොවන ද්‍රව්‍යවලට. එතකොට අපට පෙනෙනවා, අපේ රට සෞඛ්‍ය පැත්තෙන් ඉතාම බරපතළ තැනකට තල්ලු වෙලා තිබෙන බව. ඒ නිසා තමයි අපි කියන්නේ, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම, VAT අයින් කිරීම වාගේ තමුන්නාන්සේලා මැතිවරණ වේදිකාවල ලබා දුන් පොරොන්දු ඉටු කිරීම අනිවාර්යයෙන්ම මේ සමාජයේ ඉදිරි ගමනට අවශ්‍ය වෙනවා කියලා.

ගරු සභාපතිතුමනි, ඊළඟට අපි සතොස ආයතනය ගනිමු. සතොස ආයතනය පසුගිය කාලය පුරාම වංචා, දූෂණ සම්බන්ධයෙන් විශාල ලෙස චෝදනා එල්ල වෙමින් ආන්දෝලනාත්මක කථා බහට ලක් වුණු ආයතනයක් බව අපි දන්නවා. දැන් ඒ ආයතනය සුද්ද කරන්න තමයි මම කලින් කිව්වා වාගේ දූෂණ විරෝධී ව්‍යාපාරයේ හිටපු සභාපතිවරයාට මේ අමාත්‍ය තනතුර ලබා දුන්නේ. නමුත් ගරු ඇමතිතුමනි, ඔබතුමා දූෂණ විරෝධී ව්‍යාපාරයේ සභාපතිවරයා විධියට කටයුතු කළා වුණත් දැන් සෞඛ්‍ය අංශය හා සතොස ආයතනය තුළ සිදු වන දූෂණ ටික නවත්වා ගන්න ඔබතුමාට බැරිවෙලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒ ඇයි කියලා. ඒක විශාල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. මොකද, ඔබතුමා පසුගිය කාලයේ මේ රටේ සිදු වුණු වංචා, දූෂණ ගැන විශාල ලෙස හඬක් නඟපු කෙනෙක්. ඔබතුමා ඒ වෙනුවෙන් පැමිණිලි විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කරපු කෙනෙක්. නමුත්, ඔබතුමා යටතේ තිබෙන ආයතනය තුළ සිදු වන වංචා, දූෂණ ගැන ඔබතුමාට ක්‍රියාමාර්ග ගන්න බැරි වෙලාද

කියන්න මම දන්නේ නැහැ. ඔබතුමා ක්‍රියාමාර්ග නොගෙන ඉන්නවා ද දන්නේත් නැහැ. එහෙම නැත්නම් ඔබතුමා ඒවා දැක්කේ නැහැ වාගේ ඉන්නවා ද දන්නේත් නැහැ. නමුත්, මේ ආයතනය තුළ විශාල වශයෙන් වංචා, දූෂණ සිදු වෙමින් පවතිනවා, ගරු ඇමතිතුමනි.

මම එක උදාහරණයක් කියන්නම්, ගරු ඇමතිතුමනි. ගෝරලයින් ඉම්පෙක්ස් කියන ආයතනය 2024.12.24වැනි දා ටෙන්ඩර් කැඳවනවා, භාල් ගන්න. ඒ tender එක open කරන්න කලින් භාල් ටික ගන්නවා. ඒ භාල් ටික ගත්තාට පස්සේ දැනට වැඩබලන විධායක නිලධාරිතුමා විශේෂයෙන්ම tender committee එකට කියනවා, "ටෙන්ඩර් ඕනෑ නැහැ, මේ බඩු ටික ගන්න" කියලා. මේ බඩු ටික ගත්තාට පස්සේ Logistics එකේ හිටපු Head of Logistics සංජීව තමයි stores භාරව, logistics භාරව ඉන්නේ. එතුමාව මාරු කරනවා. එතුමාව එලෙස මාරු කරන්නේ එතුමා මේ තොරතුරු National Audit Office එකට දුන්නාය කියායි. ඔබතුමා දන්නවාත් ඇති, දැන් National Audit Office එකෙන් මේ පිළිබඳව inquiry එකක් යනවා කියලා. එතුමා tender procedure කඩ කරලා මේ භාල් අරගෙන තිබෙනවා. නමුත්, මෙතැන තිබෙන විශේෂ කාරණය මෙයයි, ගරු ඇමතිතුමනි. මේ වැඩබලන මාලගේ කියන මහත්මයා acting CEO විධියට එන්නේ 2024 දෙසැම්බර් මාසයේ ඉඳන්. ඔහුගේ තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, අභ්‍යන්තර විගණන. ඔහු ඉන්නේ එම තනතුරේ. නමුත්, එතුමා වැඩබලන CEO හැටියටත් වැඩ කරගෙන යනවා. ඒ කියන්නේ, තනතුරු දෙකක් එතුමා දරනවා. ඒ වාගේම එතුමා භාල් කිලෝග්‍රෑම් 11,500ක් ගන්නවා, 2025 ජනවාරි මාසයේ 21වැනි දා.

ඒ භාල් කිලෝ 11,500 ගන්න කියලා බල කරනවා. අන්තිමට වාර්තා වෙනවා, ඒවායේ quality එක fail කියලා. SMS එකක් මඟින් Quality Controller දන්වනවා, ඒවායේ තත්ත්වය බාලයි කියලා. ඔබතුමන්ලා දන්නවාද, එතුමා සතොස ඉතිහාසයේ නොකරපු වැඩක් කරනවා. ඒ භාල් අරගෙන තිබෙන්නේ, Jayawickrama Rice (Pvt.) Limited එකෙන්. අරගෙන ඒගොල්ලන්ගෙන් ලියුමකුත් ගන්නවා, 2025 ජනවාරි මාසයේ 21වැනි දා. නාඩු භාල් ගන්නවා, කිලෝ 25ක්. ඒ කියන්නේ පැකට් 460ක්. ඒ කොම්පැනිය ලියුමක් දෙනවා, "මෙම එවන ලද සහල් තොගයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් යම් ගැටලුවක් පැන නැඟුණොත්, එම සහල් අප විසින් භාර ගන්නා බවට දැනුම් දෙමි" කියලා. ඒ කියන්නේ ඒ කොම්පැනියෙන් ලියුමක් ගන්නවා, quality එක fail වුණොත් ආපසු භාර ගන්නවාය කියලා. ඉතින් එහෙම කවදාවත් ලියුම් ගන්නේ නැහැ සතොස. මේ පළමුවැනි වතාවට සතොස සැපයුම්කරුවන්ගෙන් ලියුමකුත් අරගෙන තිබෙනවා, quality එක fail වුණොත් ආපහු ගන්නවාය කියලා. එතකොට, ඒ ගන්නේම tender procedure එක ඔක්කෝම බිඳලා. ඉතින් ඒක සම්ප්‍රදාය නොවෙයි. තිබෙන නීති රීති කඩලා තමයි අරගෙන තිබෙන්නේ. මම මේ කාරණා කියන්න ඕනෑ, ගරු ඇමතිතුමාගේ දැන ගැනීම පිණිස. අන්තිමට ඒ භාල්වල quality එක fail වෙනවා. ඔබතුමා දන්නවාද දන්නේ නැහැ ගරු ඇමතිතුමනි, quality එක fail වුණත් ඒ භාල් ඔක්කෝම සතොස outletsවලට දමලා විකුණනවා. දැන් ඒවා විකුණලා ඉවරයි. ඒක බරපතළ ප්‍රශ්නයක්. මම ඒකයි කිව්වේ, දූෂණ විරෝධී ව්‍යාපාරයේ සභාපතිවරයා හැටියට කටයුතු කළ කෙනෙක් හැටියට, මේ රටේ දූෂණ ගැන විශාල වශයෙන් කථා කළ කෙනෙක් හැටියට ඔබතුමාගේ අමාත්‍යාංශයේ සිදුවන මේ දූෂණ ගැන ඔබතුමාට හොයා ගන්න බැරි වීම ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ටෙන්ඩර් කැඳවන්නේ නැතුව තමයි දැන් පොල් ප්‍රවාහනය කරන්න දීලා තිබෙන්නේත්. ටෙන්ඩර් කැඳවලා නැහැ. ඒක හිතවතෙකුට දීලා තිබෙනවා. බිත්තර supply කරන්නත් ටෙන්ඩර් එක නැතුව හිතවතෙකුට තමයි දීලා තිබෙන්නේ. වැඩ බලන විධායක නිලධාරියා - Acting CEO - විසින් තමයි තීන්දු ගන්නේ. ගරු සභාපතිතුමනි, තවත් එක දෙයක් කියන්න තිබෙනවා. මේක තමයි විශේෂම කාරණය. System එක audit කරන්න ටෙන්ඩර් එකක් කැඳෙව්වා. System audit tender එක කැඳවන්නේ, 2025 පෙබරවාරි මාසයේ 28වැනි දා. Tender කැඳෙව්වාම එක සමාගමකට ඒක ලැබෙනවා.

නමුත් ඒ සමාගමට ඒක දෙන්නේ නැහැ. ඒ සමාගමට දෙන්නේ නැතුව ඒගොල්ලන් කියනවා, ෆයිල් එක missing කියලා. *[බාධා කිරීමක්]* ඔව්, ඒ කියන්නේ ඒ ටෙන්ඩර් එක කැඳවපු ෆයිල් එක missing කියලා ඒ ටෙන්ඩර් එක අවලංගු කරනවා. එසේ අවලංගු කරලා අලුත් ටෙන්ඩර් එකක් කැඳවනවා. ගරු සභාපතිතුමනි, ඒ ටෙන්ඩර් එක යනවා, E & Y - Ernst & Young - කියන සමාගමට. ඒ සමාගම කාගේද? ඒ සමාගම ජනාධිපතිතුමාගේ උපදේශක හැටියට වැඩ කරන දුමින්ද හුලන්ගමුවගේ සමාගම. මොකක්ද, ගරු සභාපතිතුමනි, මේ වෙන්නේ? ජනාධිපතිතුමාගේ උපදේශකයාට දෙනවා, ටෙන්ඩර් එක. කොහොමද, එහෙම දෙන්නේ?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
නෑ!

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඔව්. *[බාධා කිරීමක්]* බොරු නොවෙයි. ඇමතිතුමා ඕවා දන්නවාත් ඇති. සමහර විට නොදන්නවාද දන්නේත් නැහැ. නමුත් ඒක එහෙම දීලා තිබෙනවා. ඒ කියන්නේ කලින් ටෙන්ඩර් එකේ ෆයිල් එක missing කියනවා. මොකද, ඒක දුමින්ද හුලන්ගමුවට හම්බ වෙන්නේ නැති හින්දා ඒ ටෙන්ඩර් එකේ ෆයිල් එක missing වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා හොයන්න කොහොමද ඒ ටෙන්ඩර් ෆයිල් එක නැති වුණේ කියලා. ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න. කොහොමද ඒක නැති වුණේ කියලා සොයන්න. එහෙම නැති වෙන්න විධියක් නැහැ. එහෙම නැති වෙනවා නම්, ඒක විශාල වරදක්. රජයේ ආයතනයක ෆයිල් එකක් එහෙම missing වෙන එක විශාල වරදක්. ඒක දීලා තිබෙනවා, හරියට මන්නාරමේ සුළං විදුලි බලාගාරය දුන්නා වාගේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අනෙක් ෆයිල් ගොඩට යට වුණාද දන්නේ නැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු ඇමතිතුමනි, අර 400 ගණනක් ෆයිල් තිබෙනවා නේ. සමහර විට ඒ ෆයිල් ගොඩට මේ ෆයිල් එක යට වුණාද දන්නේත් නැහැ. මොකද වුණේ කියලා ඒ ගැනත් හොයා බලන්න. මොකද, දූෂණ විරෝධී ව්‍යාපාරයේ හිටපු සභාපතිවරයා හැටියට මේක ඔබතුමාටත් හොඳ නැහැ. ඒක නිසා ඒ ෆයිල්වලට මොකද වුණේ කියා හොයා බලන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, සතොස outlets විශාල ප්‍රමාණයක් තිබෙනවා. දෙනියායේත් තිබෙනවා. නමුත් තීන්දුවක් ගෙන තිබෙනවා, දෙනියායේ තිබෙන සතොස outlet එකට මීටර් 100ක විතර දුරින් තව සතොස outlet එකක් විවෘත කරන්න. එම

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගොඩනැඟිල්ලට මාසික කුලිය රුපියල් 400,000යි. දැන් ඒක විවෘත කරන්නත් තීන්දු අරගෙන තිබෙන්නේ. මට ආරංචි විධියට එම විධායක නිලධාරියාගේ ගම දෙනියායේද කොහේද. දෙනියායේ outlet එකක් තිබෙනවා. නමුත් ඒකට මීටර් 100ක විතර දුරකින් තව එකක් විවෘත කරන්න යෝජනා කරලා එම කටයුතු ක්‍රියාත්මක කරගෙන යනවා. ගොඩනැඟිල්ලක් කුලියට අරගෙන තිබෙනවා, මාසයට රුපියල් ලක්ෂ 4ක් ගෙවන්න. එම යෝජනාව reject කළා කියලා DGM (Procurement) ගෙදර යවලා. එම නිලධාරිතුමිය දැන් නැහැ. එතුමියට චෝදනාවක් එල්ල කරලා එතුමියව අයින් කරලා. මම දන්නේ නැහැ, ඔබතුමා මේ ගැන දන්නවාද කියලා. DGM (Procurement) විධියට කටයුතු කළ එම නිලධාරිනිය ජනාධිපතිතුමාට ලියුමකින් දන්වා තිබෙනවා, එතුමියට එල්ල වුණු යම් යම් හිංසන පිළිබඳවත්. *[බාධා කිරීමක්]* මොකක්ද? *[බාධා කිරීමක්]* අරගෙන ගිහිල්ලාද? එහෙම අරගෙන ගිහින් නම් ඔබතුමා ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්න.

ඊළඟ කාරණාව මෙකයි. ඔබතුමා ඔය කියන වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි ඩන්ස්ටන් ලොකු මාලගේ දැන් කොම්පැනි එකක් ලියාපදිංචි කරලා ඇවිල්ලා කියනවා, එම කොම්පැනිය සතොසේ ලියාපදිංචි කරන්න කියලා. මොකටද? ඔහු භාණ්ඩ supply කරන්න. මේක තමයි DGM (Procurement) බැහැයි කියලා කියන්නේ. මේක බැහැයි කිව්වාම තමයි ආරාවුල පටන් ගන්නේ. ඔහු එතැන වැඩබලන ප්‍රධාන විධායක නිලධාරියා - Acting CEO - හැටියට ඉඳගෙන සතොසේ Purchasing Department එකට ඔහුගේ නමින් තිබෙන කොම්පැනි එකක් ගෙනැල්ලා register කරන්නේ කොහොමද? එහෙම කරන්න බැහැ, ඒක, a conflict of interest; ඒක වැරදියි. නමුත් බල කරනවා කරන්න කියලා. ඒක කරන්න බැහැයි කිව්වාම, එතැන හිටපු කෙනාට චෝදනාවක් දාලා එයාව එතැනින් අයින් කරනවා. ඔබතුමා බලන්න, අද වෙනකොට ඒ ආයතනයේ තනතුරුවල සිටි අය විශාල ලෙස ඒවා අතහැරලා ගිහිල්ලා තිබෙනවා. සැප්තැම්බර් මාසයේ ඉඳලා DGM (Procurement) නැහැ; DGM (Purchasing) නැහැ; DGM (Operations) නැහැ; DGM (HR) නැහැ. DGM (Finance) තනතුරේ ඉන්න කෙනා ලබන සතියේ යනවා. DGM (Marketing) විධියට ඉන්න කෙනාත් යනවා. දැන් මේ තනතුරු හයක්ම පාලනය කරන්නේ ඒ ආයතනයේ ඉන්න ඔය කියන විධායක නිලධාරියා. ඔහු තව තනතුරක් දරනවා. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - විගණන තනතුරත් ඔහු දරනවා. ඒක තමයි ඔහුගේ තනතුර. අනෙක් තනතුරේ ඉන්නේ වැඩබලන ලෙසයි. ඊළඟට, ප්‍රශ්නයක් තිබෙනවා මේ තනතුරු දෙකම ඔහු දරන්නේ කොහොමද කියලා.

අපි දන්නවා, පසුගිය දවසක තරුණ සේවා සභාවේ ඇති වුණු සිද්ධියක් එක්ක Auditor-General කිව්වා, එහෙම තනතුරු දෙකක් දරන්න බැහැ කියලා. මොකද, මේ විධායක නිලධාරි කියන තනතුර තුළ සියලු දේවල්වලට බලපෑමක් කරන්න පුළුවන්. ඔහුගේ තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - විගණන. මේවාට බලපෑම් කරන්න පුළුවන් නිසා Auditor-General කියනවා, මේ තනතුර දෙකම ඔහුට දරන්න බැහැ කියලා. නමුත් ඔහු මාස 5ක් තිස්සේ මේ තනතුරු දෙකම දරනවා. මම හිතනවා එය තමුන්නාන්සේලාගේ ආයතන සංග්‍රහය උල්ලංඝනය කිරීමක් කියලා. මේකේ සභාපතිතුමා ඉන්නවා. සභාපතිතුමා ඇයි ක්‍රියාමාර්ග ගන්නේ නැත්තේ කියා අපි දන්නේ නැහැ. අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉන්නවා. අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇයි ක්‍රියාමාර්ග ගන්නේ නැත්තේ? ඒ ගොල්ලන් සියලු දෙනාම නිශ්ශබ්දව ඉන්නවා. මම දන්නේ නැහැ, මෙතුමා කැලණිය විශ්වවිද්‍යාලයේ ඔබතුමාගේ batch mate කියලාත් කියනවා. ඒ නිසාද දන්නේ නැහැ අනෙක් අය ඔහුට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්නේ නැත්තේ- *[බාධා කිරීමක්]* ආ, Batch mate නොවෙයිද? මම දන්නේ නැහැ, ඒකේ ඇත්ත කථාව. ආයතනයේ ඉන්න අය ඔක්කෝම බය වෙලා ඉන්නේ, ඔබතුමාගේ නම තමයි විකුණන්නේ කියලා. ඒකයි මම කිව්වේ, මේවා ඔබතුමා දැනගෙන වෙනවාද, නොදැන වෙනවාද කියා දන්නේ නැහැ කියලා.

ඊළඟට, ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් තිබුණා. ඒ රැස්වීම පවත්වන්නෙත් 2024.12.18වැනි දා. ඒ රැස්වීමට අනුව, විගණන හා කළමනාකරණ කමිටුව රැස් වෙනවා. 2024.12.28වැනි දා. ඒක රැස් වෙලා ඒගොල්ලන් තීන්දුවක් ගන්නවා. ඒ තීන්දුවේදී ඒගොල්ලන් පැහැදිලිව කියනවා, "වර්තමානයේ අභ්‍යන්තර විගණන අංශය කළමනාකරණය කරනු ලබන්නේ විගණන කළමනාකරුවෙකු වන බවත්, නුදුරේදී ප්‍රධාන විධායක නිලධාරි - CEO - තනතුර හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමක් සිදු කළ යුතු බවට කමිටුවේදී තීරණය විය" කියලා. මේ තීන්දුව ගන්නේ 12වැනි මාසයේ. තවම එතැනට CEO කෙනෙක් පත් කරගන්න බැරි වෙලා තිබෙනවා. එතකොට මේ සියලු වැඩ ආවරණය කරන්නේ තනි පුද්ගලයෙක්. ඔහු තමයි සම්පූර්ණයෙන්ම මේ ආයතනය පිළිබඳව තීන්දු ගන්නේ, Acting CEO හැටියට ඉඳගෙන. මම හිතනවා මම මේ හෙළිදරව් කරපු කරුණු කාරණා, දූෂණ, වංචා සිදුවීමට ප්‍රධාන හේතුවක් වෙන්න පුළුවන් කියලා. මොකද, අසීමිත බලයක් ඔහු සතුව තිබෙනවා. ඒ අසීමිත බලයත් එක්ක දේශපාලන අධිකාරියෙන් යම් සහයෝගයක් ලැබෙනවා නම් ඔහුට පුළුවන් වෙනවා ඒ සියලු දේවල් පාලනය කරන්න. අපි ඒක දැක තිබෙනවා ඉතිහාසය පුරාම. ඉතින් අපි දන්නේ නැහැ මාස 3ක් වෙලාත් ඇයි මේ තනතුරුවලට පත්වීම් කරන්නේ නැත්තේ කියලා. ඇයි මේ තනතුරු තවම හිස්ව තියාගෙන ඉන්නේ? මේ, ප්‍රධාන තනතුරු. දැන් මම කිව්වා තනතුරු 6ක් ගැන. ඒ තනතුරු 6න් තනතුරු 4කටම නිලධාරීන් නැහැ. ඒගොල්ලන් අයින් වෙලා ගිහිල්ලා. තව දෙදෙනෙක් ඉදිරියේදී අයින් වෙන්නත් යනවා. මේ නිලධාරියාගේ තිබෙන ඒකාධිපතිත්වය හා වංචා, දූෂණ සම්බන්ධව ඔහු ක්‍රියා කරන ආකාරයත් එක්ක තමයි හුඟක් අය තනතුරු අතහැර ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා තමයි මම කිව්වේ, මේ පිළිබඳව ඉක්මන් ක්‍රියාමාර්ග ගන්න කියලා.

ගරු සභාපතිතුමනි, ජනාධිපතිතුමා ඊයේ පෙරේදා පැවැති රැස්වීමකදී කිව්වා, ජනතාවගේ මුදල් පරිහරණය කිරීමේදී ඉතාම පරිස්සමෙන්, හැම සතයකටම ගණන් බලා පරිහරණය කරන්න ඕනෑ කියලා. ඔබතුමාත් දන්නවා, Acting CEO හැටියට ඔහුගේ තනතුරට අමතරව තනතුරක් දරනවා නම් මූලික වැටුපෙන් සියයට 25යි ඔහුට ගන්න පුළුවන් වෙන්නේ කියලා. නමුත් ඔහු Board Paper එකක් දමා අනුමත කරගෙන තිබෙනවා. ඔහුගේ acting allowance එකෙන් රුපියල් 37,500ක් වැඩිපුර ගන්නවා. Performance allowance එකෙන් රුපියල් 50,000ක් වැඩිපුර ගන්නවා. ඒ වාගේම professional allowance කියලා තව රුපියල් 25,000ක් වැඩිපුර ගන්නවා. මේ ඔක්කොම එකතු කළාම ගරු ඇමතිතුමනි, 491,750ක් ඔහු මාසයකට ගන්නවා.

ඔහු ගන්නා ඒ මුදලේ වැඩිපුර රුපියල් ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. හරි නම් ඒ මුදල එයාට ගන්න බැහැ. නමුත්, මූලික වැටුපෙන් සියයට 25කට වැඩියෙන් එයා ගන්නවා. ඒවා අනුමත වුණේ කොහොමද? මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකුත් එනවා, එහි අධ්‍යක්ෂ මණ්ඩලයට. ඒ අය රාජ්‍ය නිලධාරීන්. දැන් ඒ රාජ්‍ය නිලධාරිනුත් නිශ්ශබ්දව ඉන්නවා. ඒගොල්ලෝ ක්‍රියාමාර්ග ගන්නේත් නැහැ. සභාපතිතුමාගේ පත්වීම දේශපාලන පත්වීමක් කියමුකෝ. නමුත්, ඔහු එක්ක ඉන්න රාජ්‍ය නිලධාරීන්, මුදල් අමාත්‍යාංශයෙන් එන නිලධාරීන් පවා ඒවාට ක්‍රියාමාර්ග ගන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, පෙබරවාරි මාසයේ 10වැනි දා කම්කරු කොමසාරිස්, විමර්ශන අංශයෙන් සභාපතිතුමාට ලියුමක් යවනවා, ආයතනයේ සේවය කරන සේවකයෝ 250කගේ පාරිතෝෂික දීමනාව - gratuity එක - වන රුපියල් 64,530,254.40ක් ගෙවන්න කියලා. එම දීමනාවත් ගෙවලා නැහැ. ඒ දීමනාව ගෙවන්න කියලා ලියුම එන්නේ පෙබරවාරි මාසයේ 10වැනි දා. කම්කරු දෙපාර්තමේන්තුවෙන් කරපු විමර්ශනයකට අනුව දෙපාර්තමේන්තුව සභාපතිතුමාට කියනවා, ඒක ගෙවන්න කියලා. විධායක නිලධාරිතුමා ඒ මුදල ගෙවන්න දෙන්නේ නැහැ. ඒක ගෙවන්න එපා කියනවා. ගරු සභාපතිතුමනි, ඒ අය, අවුරුදු ගණනක් වැඩ කරපු අහිංසක සේවකයෝ. විශේෂයෙන්ම මේ පවතින බඩු මිල, ජීවන බර දරා ගන්න බැරිව ඒගොල්ලෝ බලාගෙන ඉන්නවා තමන්ගේ gratuity එක ලැබෙන කල්. නීත්‍යානුකූලව ඒ සේවකයන්ට ගෙවිය යුතු gratuity එක පවා ගෙවන්නේ නැහැ. ඒකත් නොගෙවා ඉන්නවා. ඒ නිලධාරියා නිකම් කට වචනයෙන් කියනවා, ඒක ගෙවන්න අවශ්‍යතාවක් නැහැ කියලා. මේ වාගේ සිද්ධි විශාල ප්‍රමාණයක් අද වන කොට සතොස ආයතනය තුළ සිදු වෙලා තිබෙනවා. මේ සිදුවීම් පිළිබඳව අදාළ බලධාරීන් ක්‍රියාමාර්ග නොගන්නේ ඇයි කියලා අපි දන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මා කලිනුත් කිව්වා වාගේ සතොස ආයතනය පසුගිය කාලය පුරාම -විශේෂයෙන්ම පසුගිය ආණ්ඩු කිහිපය පැවැති කාල සීමා තුළ- බරපතළ ලෙස චෝදනා ලබපු ආයතනයක්. සතොස ආයතනය මාසයකට රුපියල් බිලියන 3ක, 4ක ප්‍රමාණයක භාණ්ඩ මිල දී ගන්නවා. එම භාණ්ඩ මිල දී ගැනීම සම්බන්ධයෙන් පසුගිය කාලයේ හිටපු ඇමතිවරුන්ට විශාල ලෙස චෝදනා එල්ල වුණා. ඒ මිල දී ගැනීම් විනිවිදභාවයකින් යුතුව කරන්න කියන එක තමයි අප හැමදෙනාගේම ඉල්ලීම. ඒක තමයි අප හැමදෙනාගේම වුවමනාව. නමුත්, එම කටයුතු විනිවිදභාවයෙන් නොකරන තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. අද tender procedures ක්‍රියාත්මක වෙන්නේ නැහැ; එය විනිවිදභාවයකින් සිදු වෙන්නේ නැහැ. ඒවා හරියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එම නිසාම සතොස ආයතනයේ වැඩ කරන සේවකයන් පවා අද අතෘප්තියට පත් වෙලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන සේවක සංගමය පවා ඔබතුමාට මේ වන විට දන්වලාත් ඇති, ඒ විධායක නිලධාරියාගේ ක්‍රියා කලාපය පිළිබඳව. මේ සියලු තනතුරු එක පුද්ගලයෙකුගේ අතට ගියාම විනිවිදභාවයකින් තීන්දු තීරණ ගන්නේ කොහොමද කියන එක තමයි තිබෙන ප්‍රශ්නය. ඒ කාරණය අපි ඔබතුමාට නැවත වතාවක් මතක් කරලා දෙනවා.

ඒ වාගේම, ඔබතුමන්ලා අප්‍රේල් 01වැනි දා සිට රුපියල් 5,000ක සහන මල්ලක් දෙන්න යනවා. මේ වන කොට ඒ සහන මල්ල දෙන්න කොයි තරම් දුරට ලැහැස්ති වෙලා ඉන්නවාද කියන එක ගැනත් මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. මා දන්නා විධියට නම්, තව වනකල් තමුන්නාන්සේලාගේ ආයතනය ඒ සහන මල්ල ලබා දීම පිළිබඳව අවශ්‍ය ටෙන්ඩර් කැඳවලා, ඒ භාණ්ඩ රැස් කර ගන්න ක්‍රියාමාර්ග අරගෙන නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ඒ වාගේම, පසු ගිය කාලයේ STC එක හරහා භාල් වගයක් ආනයනය කළ බව ඔබතුමා දන්නවා. නමුත්, එසේ ආනයනය කළ භාල්වල තත්ත්වය පිළිබඳව අද විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. STC එක හරහා ගෙන්වපු ඒ සහල් එක එක තැන්වලට, මාසයෙන් මාසයට එක එක ගබඩාවලට යවනවා. ඒ නිසා මම ඒ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. STC එකෙන් ගෙන්වපු ඒ භාල්වල තත්ත්වය - quality එක - පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙන නිසා, අර කියපු සහන මල්ලට ඒ භාල් නම් එකතු කරන්න එපා. මොකද, ඒ සහල්වල quality එක පිළිබඳව Quality Controller විසින් දැන් ප්‍රශ්නයක් මතු කර තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කරන්න, ගරු ඇමතිතුමනි. අර කියපු සහන මල්ලට පාවිච්චි කරන්න බැරි, ආහාරයට නුසුදුසු ඒ සහල් එකතු කරන්න එපා. මොකද, සාමාන්‍යයෙන් සතොස ආයතනයේ අළෙවි සැල්වලට බඩු ගන්න එන්නේ, හුඟක් දුරට මේ රටේ ඉන්න අඩු ආදායමිලාභීන්. ඔවුන් අඩු මිලට භාණ්ඩ ගන්නයි එන්නේ. අඩු මිලට භාණ්ඩ ගන්න එන ඒ මිනිසුන්ට අඩු මිලට දෙන භාණ්ඩ quality එකත් එක්කයි දෙන්න ඕනෑ. මිල විතරක් අඩු කරලා මදි. ඒ ලබා දෙන ආහාර ද්‍රව්‍යවල ගුණාත්මකභාවය ගැනත් අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. මොකද, දැනට තිබෙන වාර්තා අනුව, අපේ රටේ ජනතාව ආහාර වෙනුවෙන් මුදල් විශාල ප්‍රමාණයක් වැය කරන්නේ නැහැ. ඒගොල්ලෝ ආහාර වෙනුවෙන් වැය කරන්නේ ඉතා අඩු මුදලක්. අඩු මිලට තිබෙන ආහාර ද්‍රව්‍ය ගන්න තමයි ඔවුන් අද වියදම් කරන්නේ. ඒ නිසා සතොසට තිබෙන වගකීම වන්නේ, අඩු මිලට භාණ්ඩ දෙන එක විතරක් නොවෙයි. ගරු ඇමතිතුමනි, quality එකෙන් අඩු නැති, ගුණාත්මකභාවයෙන් ඉහළ, හොඳ භාණ්ඩ දෙන්න කියලා තමයි අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ගරු සභාපතිතුමනි, අපි ඒ ආයතනවල ඉන්න රාජ්‍ය නිලධාරීන්ටත් යමක් කියන්න ඕනෑ. ඒ අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට මුදල් අමාත්‍යාංශයෙන් එන නිලධාරීන්ට අපි කියනවා, මේ රටේ ජනතාවගේ බදු මුදල් එක්ක සෙල්ලම් කරන්න මේ දේශපාලන පත්වීම් ගත්තු අයට ඉඩ දෙන්න ඔබතුමන්ලාට බැහැ කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. `Member, your time is over.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මම ඉක්මනින් කථාව අවසාන කරන්නම්, ගරු සභාපතිතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි තුනක කාලයක් දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, එතුමාට තවත් විනාඩි තුනක කාලයක් ලබා දෙන්න.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
අපි ඒ නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් අපි ඉල්ලා සිටිනවා, ඔබතුමා ඒ ගැටලු විසඳන්න මැදිහත් වෙන්න කියලා. ඔබතුමා නිශ්ශබ්ද වුණොත් වෙන දේ මොකක්ද? අපි ඔබතුමාට කියනවා, කෙහෙලිය රඹුක්වැල්ලගේ අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමාට වෙච්ච දේ මතක් කර ගන්න කියලා. මේ රටේ රාජ්‍ය නිලධාරීන්ට, අපේ රටේ අධිකරණය විසින් අද පාඩම් රාශියක් උගන්වා තිබෙනවා.

කෙහෙලිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයාගේ ලේකම්තුමා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හිටපු Controller General ඇතුළු සියලුදෙනා දේශපාලනඥයන්, එහෙම නැත්නම් දේශපාලනඥයන් කරන පත්වීම් සඳහා එන අය කියන කියන

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

දේවල් කරන්න ගිහින් අමාරුවේ වැටුණා. අන්තිමට සියලු වගකීම් ඒ මිනිසුන්ගේ කර මතට ඇවිල්ලා අද ඒගොල්ලන්ට හිර ගෙවල්වල ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු ඒ රජයේ නිලධාරින්ට අපි පැහැදිලිව කියනවා, ජනතාවගේ මුදල්වලට වග කියන්න ඕනෑ, තමුන්නාන්සේලා බව. විවිධ ආණ්ඩු බලයට එන්න පුළුවන්; යන්න පුළුවන්. නමුත්, නිලධාරින් හැටියට මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් ජීවත් වන තමුන්නාන්සේලාට දේශපාලනඥයන්ට වඩා වගකීමක් තිබෙනවා කියන එක අපි ඒ රාජ්‍ය නිලධාරින්ට මතක් කර දෙනවා.

ගරු සභාපතිතුමනි, මට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, අවසාන වශයෙන් තවත් කාරණයක් ගැන මතක් කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා අද උදේ කථා කළා, රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ ක්‍රියා කලාපය ගැන. ඒ ක්‍රියා කලාපය ගැන කියනවාත් එක්කම මම තවත් අදහසක් කියන්න ඕනෑ. අපේ ගරු සභානායකතුමාත් මේ මොහොතේ මේ ගරු සභාවේ ඉන්නවා. අපේ ගරු සභානායකතුමා පෙරේදා මෙතැනදී නැඟිටලා වටේටම වෙඩි තියාගෙන යනවා වාගේ චෝදනා කරගෙන ගියා, "මේ මුස්ලිම් මන්ත්‍රීවරු, මුස්ලිම් මන්ත්‍රීවරු" කියලා. ඒ, එතුමන්ලාගේ ඇමතිතුමියකට විපක්ෂය පැත්තේ හිටපු මන්ත්‍රීවරයෙකු මොකක්ද කිව්වා කියලායි. මම එතුමාට කියන්න කැමැතියි, එහෙම "මුස්ලිම් මන්ත්‍රීවරු, මුස්ලිම් මන්ත්‍රීවරු" කියලා බහු වචනයෙන් කථා කරන්න එපා කියලා. ඒ කියන මන්ත්‍රීතුමාගේ නම කියලා ඒවාට උත්තර දෙන්න ඕනෑ. මොකද, අපි උත්තර දෙන්නේ එහෙම තමයි. කවුරු හරි මන්ත්‍රී කෙනෙකු මොකක් හරි චෝදනාවක් කළාම අපි ඒක මේ ඉන්න ඔක්කෝම මන්ත්‍රීවරුන්ගේ ඇහට දාලා කථා කරන්නේ නැහැ. ඒ හින්දා අපි ගරු සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, වටේටම වෙඩි තියනවා වාගේ චෝදනා කරන්නේ නැතුව හරියට ඉලක්කය බලලා වෙඩි තියන්න කියලා. ඒ කාරණාවත් මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු සභාපතිතුමනි, -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු සභාපතිතුමනි, පසුගිය දවස් කිහිපය පුරාම රටේ විශේෂ අවධානයක් යොමු වෙලා තිබුණු කාරණයක් තමයි, 2023.12.31 වන දින වැලිගම පොලිස් වසමේ W15 කියන සංචාරක හෝටලයට සිදු වූ වෙඩි තැබීම් සම්බන්ධයෙන් පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහත්මයා ඇතුළු 6දෙනෙකු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වන කාරණාව.

අද දිනයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායමක් මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට ගිහිල්ලා තිබුණා, දේශබන්දු තෙන්නකෝන් මහත්මයාගේ දේපළ රාජසන්තක කිරීම සම්බන්ධයෙන් උසාවියට කරුණු දක්වන්න. ඒ අතර අද දිනයේදී දේශබන්දු තෙන්නකෝන් මහත්මයා මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට භාර වෙලා තිබෙනවා. ඒ පිළිබඳව තොරතුරු ලැබිලා තිබෙනවා. ඒ වාගේම, ඊයේ දිනයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දේශබන්දු තෙන්නකෝන් මහත්මයා සම්බන්ධයෙන් ඔහුගේ නොමිමර 76/ඒ/7, හත්වැනි පටුමඟ, ගංගානි උද්‍යානය, හෝකන්දර ලිපිනයේ පිහිටි නිවස පරීක්ෂා කරනු ලැබුවා.

ඒ නිවස පරීක්ෂා කිරීමෙන් පසුව විදේශීය මත්පැන් බෝතල් 795ක්, වයින් බෝතල් 214ක් වශයෙන් 1009ක මත්පැන් පොලීසිය භාරයට ගත්තා. ඒ වාගේම තෙන්නකෝන් මහත්මාගේ ගිනි අවිය ලෙස සැලකෙන පිස්තෝල අවියක් පොලීසිය භාරයට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගත්තා. ඒ වාගේම "ඇපල්" වර්ගයේ දුරකථන දෙකක් පොලිස් භාරයට අරගෙන තිබෙනවා. අපි හිතනවා, ඒ දුරකථන හරහා තොරතුරු විශාල ප්‍රමාණයක් අපට අනාවරණය කර ගන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කරනවා, අද දිනයේ. ඒ අනුව ඉදිරි විමර්ශන කටයුතු කරගෙන යනවා. මේ කරුණු සම්බන්ධයෙන් ගරු සභාව දැනුවත් කරනවා. මොකද, මේ පිළිබඳව විශේෂ අවධානයක් රටේම යොමු වෙලා තිබුණු නිසා.

බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Wasantha Samarasinghe. You have 20 minutes.

[පූ.භා. 10.46]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු සභාපතිතුමනි, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධ කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විවාදය සඳහා මුල පුරමින් කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව මගේ අදහස් ඉදිරිපත් කරන්න සූදානම්.

අද අපේ විවාදය තිබෙන්නේ අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන 15ක් සම්බන්ධ කරගෙන. ඒ ආයතන 15 එක්කම තවත් ආයතන දෙකක් තිබෙනවා. ඒ, සතොස යටතේ තිබෙන ආයතන දෙක. එතකොට ඔක්කෝම ආයතන 17ක් තිබෙනවා. මමත්, අපේ ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමාත්, ඒ වාගේම උපාලි සමරසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමාත්, අපේ අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු නිලධාරින්, ඒ වාගේම මේ ආයතනවල සභාපතිවරු සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධව කටයුතු කරනවා.

මේ අමාත්‍යාංශය පිළිබඳව රටේ මතු වෙලා තිබෙන චිත්‍රය, හැදිලා තිබෙන චිත්‍රය වෙනස් කරන්න අපි විශාල වෙහෙසක් ගනිමින් ඒ සඳහා මහන්සි වෙමින් සිටිනවා. ඒ වෙහෙස මහන්සිය පිළිබඳව වාගේම, මේ ආයතනවල වැඩ කරන නිලධාරින් පිළිබඳවත්, ඒ වාගේම යම් නිලධාරින් ඉලක්ක කර ගනිමිනුත් එතුමා චෝදනා ඉදිරිපත් කළා. විශේෂයෙන් ලක් සතොස තමයි මේ retail වෙළඳාමට, සිල්ලර වෙළඳාමට සම්බන්ධ වෙන්නේ. ඉතින් ලක් සතොස පිළිබඳව තමයි මේ විවේචනය වැඩිපුරම ඉදිරිපත් වුණේ. අපේ උපදේශක කාරක සභාව නියෝජනය කරන

අපේ මන්ත්‍රීවරු ගණනාවක් අද මේ පිළිබඳ අදහස් දක්වන්න සූදානම් වෙලා ඉන්නවා. ඒ අය මේ සම්බන්ධ කරුණු ගණනාවක් ඉදිරිපත් කරයි. නමුත් ඉදිරිපත් වෙච්ච සමහර කරුණු පිළිබඳව කරුණු පැහැදිලි කරලා යන්න ඕනෑ කියලා මම හිතුවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ වෙළඳාමට සම්බන්ධව වාගේම ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ අන්තර්ජාතික වෙළඳ ගිවිසුම් පිළිබඳවත් වගකීම තිබෙන්නේ අපේ අමාත්‍යාංශයට. ඒ වාගේම දේශීයව රජය සතු සිල්ලර සහ තොග වෙළඳාම කියන දෙකම CWE සහ සීමාසහිත ලංකා සතොස කියන ආයතන හරහා තමයි ක්‍රියාත්මක වුණේ.

ඒ වාගේම STC ආයතනයත් මේ ක්‍රියාවලියේදී සැලකිය යුතු දායකත්වයක්, කොටසක් උසුලනවා. වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින මේ ආයතනවලින් වැඩිම අවධානය යොමු වෙන ආයතන ටික තමයි මේ ආයතන ටික. අපට තව ආයතන ගණනාවක් තිබෙනවා. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිඵල මණ්ඩලය, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, සීමාසහිත ලංකා සතොස, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, සීමාසහිත රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාංශය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, මිණුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල, වාණිජ දෙපාර්තමේන්තුව, සමුපකාර සේවා කොමිෂන් සභාව සහ ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන කියන ආයතන අපට අයත් වෙනවා. මේ ආයතන සියල්ල අද දවසේ අපි කොතැනටද ගෙනියන්නේ කියන කාරණය පිළිබඳ කරුණු අපි මේ විවාදය ඇතුළේ ඉදිරිපත් කරන්න සූදානම් වෙනවා. මේ ඉදිරිපත් වෙච්ච කරුණු අතරින් මම විශේෂ අවධානයක් යොමු කරන්න සූදානම් වෙන්නේ මේ පිළිබඳවයි. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මේ ආයතන පද්ධතිය ඇතුළත තිබෙන වංචා, දූෂණ පිළිබඳව, නිලධාරීන් පිළිබඳව කරුණු බොහොමයක් කියන්න උත්සාහ කළා. මම ඒ නිලධාරීන් නම් කරන්නේ නැහැ. මන්ත්‍රීතුමා කියපු සමහර නිලධාරීන් පිළිබඳව විනය පරීක්ෂණ තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි. මේ අය තමයි පසුගිය කාලයේ ලක් සතොස ආයතනය කළමනාකරණය කළේ. ගරු සභාපතිතුමනි, එක පුද්ගලයෙක් ඇවිත් හය දෙනෙකුගේ ටෙන්ඩර් පත්‍රිකා එකට අරගෙන යනවා. එක්කෙනෙක් හය දෙනෙකුගේ ටෙන්ඩර් පත්‍රිකා අරගෙන ගිහින් තමයි ගරු සභාපතිතුමනි, ටෙන්ඩර් දමන්නේ. අපි භාර ගන්නකොට ලක් සතොස රුපියල් බිලියන 22ක් පාඩුයි, ගරු මන්ත්‍රීතුමා. රුපියල් බිලියන 22ක්, රුපියල් කෝටි 2,200ක් පාඩුයි. අපි මේ ආයතනය භාර ගන්නකොට වෙළෙඳ සැල් 448ක් තිබුණා. ඒ වෙළෙඳ සැල් 448න් 252ක් පාඩු ලබන ඒවා. අපි ඒ සඳහා ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළා, වැඩබලන මෙහෙයුම් ප්‍රධානියාගේ ප්‍රදේශයේම කඩයක් අරින්න යනවා කියලා. නැහැ. අපි මේ අවුරුද්දේ කඩ, එහෙම නැත්නම් shops 150ක් විවෘත කරන්න සූදානම් වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ shops 150 විවෘත කරන්නේ දැන්වීම් පළ කරලා. අවශ්‍ය ආයතන අපට දැනුම් දෙන්න කියලා තිබෙනවා. ඒ වාගේම ඒ ආයතන පිළිබඳ අපි වෙළෙඳ පොළ සමීක්ෂණයක් කරනවා, කොපමණ වෙළඳාමක් වෙනවාද, එහෙම නැත්නම් ඒ වෙළඳාම අපට කරගෙන යන්න පුළුවන්ද කියන කාරණය පිළිබඳව. අපි මේ පාඩු ලබන ආයතන 252න් සමහර ඒවා වහනවා. සමහර ඒවා relocate කරනවා. ඇයි? සමහර ඒවා අඩුම ගණනේ මාසික කුලිය ගෙවන්නවත් ආදායම සොයන්නේ නැහැ. පඩි නඩි නොවෙයි, කුලිය ගෙවන්නවත් ආදායමක් නැහැ. එහෙමයි තිබුණේ. සමහර දේශපාලනඥයන්ගේ ගෙවල්වල මේවා තිබෙන්නේ. ඒ අයගේ කඩවල මේවා දමලා තිබෙන්නේ. ඒ නිසා අපි ඒවා relocate කරනවා විතරක් නොවෙයි. අලුතින් පටන් ගන්නකොට වෙළෙඳ පොළ සමීක්ෂණයක් කරලා ඒ සමීක්ෂණය අනුව තමයි පටන් ගන්නේ. ඒ නිසා CEOගේද, සභාපතිගේද, එහෙම නැත්නම් ඇමතිවරුන්ගේද කියන එක අදාළ නැහැ. දෙන ඕනෑම තැනක් පිළිබඳ වෙළඳ පොළ සමීක්ෂණයක් කරලා යෝග්‍යතාව බලලා තමයි shop එකක් පටන් ගන්නේ කියන කාරණය අපි අවධාරණය කරලා කියන්න ඕනෑ.

ඒ වාගේම සමහර කරුණු කියනකොට ඔබතුමා කොටසයි නේ කියන්නේ, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි. තමන්ගේ කොටස විතරයි නේ කියන්නේ. DGM (Procurement) ගැන කිව්වා. සතොසට නිලධාරීන් 22ක් බඳවා ගැනීම සඳහා දැන්වීම් පළ කරලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. නිලධාරීන් 22ක් බඳවා ගැනීම සඳහා දැන්වීම් පළ කරලා තිබෙනවා. ඔබතුමාට පුළුවන් දන්න අය, දක්ෂ අය එවන්න. නමුත් මේ තිබෙන පඩියට සමහර අය එන්නේ නැහැ. ඒ නිසා සමහර අය සතොස ඇතුළේ පඩිය වෙනුවට වෙන විධියකට ආදායම් මාර්ග හදාගෙන හිටියේ. ඒ නිසා තමයි සතොස මෙතැනට වැටිලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මම තව කාරණයක් කියන්නම්. 2014 සිට ගත්තොත් මේවා කොහොමද වෙලා තිබෙන්නේ කියලා මම කියන්නම්. 2014 සිට මිලියන 350කට ආසන්න බඩු තොග සතොස ගබඩාවලින් පිටත් වෙලා තිබෙනවා. හැබැයි, දැන් අපි ඉන්නේ 2025 වසරේ. තවම මේ බඩු අතරමඟ තිබෙන්නේ. තවම shopsවලට ඇවිල්ලා නැහැ. නමුත් 2014දී ගබඩාවෙන් පිටත් වෙලා. අවසානයේ මේවා සේවකයන්ගේ අඩුමාන කියලා කපන්න හදනවා. මේවා සේවකයන්ගෙන් කපන්න හදනවා. සේවකයන් 1,179කින් අඩුමාන කපන්න දමලා තිබෙන්නේ. සතොස පාඩු කරපු අය මේ තොරතුරු හරියට කියලා නැහැ. අපේ වෑයම මේකයි. ජනතාවට භාණ්ඩ හා සේවා බෙදා හරීම සඳහා සතොස ආයතනය පවත්වා ගෙන යන්න ඕනෑ. ඒකට තමයි අපේ මැදිහත්වීම තිබෙන්නේ. ඔබතුමා කරුණු කියනකොට සමහර කරුණු කිව්වේ බාගෙට.

ඔබතුමා අපේ රටේ සහල් පිළිබඳව කියනකොට, අපේ ආණ්ඩුව රුපියල් 65ක බද්දක් ගැහුවා කියලා කිව්වා. ඒක වැරදියි මන්ත්‍රීතුමනි. ඉස්සෙල්ලාම රුපියල් 65 බද්ද implement කරන්නේ 2023 මැයි මාසයේ 18වැනි දා. අපි ආණ්ඩුව භාර ගන්නේ, අපේ අනුර දිසානායක සහෝදරයා ජනාධිපති ලෙස පත්වෙන්නේ 2024 සැප්තැම්බර් මාසයේ 14වැනි දා පැවැත්වූ ඡන්දයෙන්.

2023 මැයි මාසයේ 18වැනි දා තමයි සහල්වලට පනවපු බද්ද රුපියල් 65ක් කළේ. ඒක කළේ අපි නොවෙයි. හැබැයි, සහල් සඳහා බද්දක් තිබෙන එක අපේ රටේ ගොවිතැනට, ගොවියාට, ගොවියාගේ වී මිලට උත්තරයක්. ඔබතුමන්ලාම පසුගිය දවස්වල ඇහුවා නේ "වීවලට ගෙවන මිල මදි කියනවා. ගොවියෝ දෙන්නේ නැහැ කියනවා. ඇයි මේ?" කියලා. අපි සහල් වෙළෙඳ පොළ ඇතුළේ ගොවියාත්, සහල් පාරිභෝගිකයාත් දෙදෙනාම ආරක්ෂා කරගෙන තමයි මේ බද්ද නියාගෙන යන්න තීරණය කළේ. එහෙම නැතුව අපි ගහපු බද්දක් නොවෙයි. බද්ද ඒ මොහොතේ තිබුණා. අපි ඒ බද්ද එහෙමම අනුමත කළා.

සතොස ආයතනය පිළිබඳව මම ඔබතුමාට ඒ කරුණු කිව්වේ ඒකයි. ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. පසුගිය ජනාධිපතිවරණය පවත්වන්න කලින් ගිය අවුරුද්දේ විතරක් සතොස සේවකයන් 500කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගෙන තිබෙනවා. 2023 වර්ෂයේ 370ක් බඳවා ගෙන තිබෙනවා. ජනවාරි

[ගරු වසන්ත සමරසිංහ මහතා]

මාසයත් එක්ක 851ක් බඳවා ගෙන තිබෙනවා. ඡන්දයේ නාම යෝජනාවලට කලින් මාසයේ - ජූලි මාසයේ - 336ක් බඳවා ගෙන තිබෙනවා. දැන් කොහේද මේ අය ඉන්නේ? කොළඹ දිස්ත්‍රික්කයේ සතොස වෙළඳ සැල්වල සේවකයන් 259ක් වැඩියෙන් ඉන්නවා. මාතර සේවකයන් 86ක් වැඩියෙන් ඉන්නවා. හිටපු සභාපති ගමේ කට්ටිය කොළඹටයි, මාතරටයි දාලා. සභාපති ලෙස හිටියේ පසඳ යාපා. කාටද burden එක? කාටද මේ තිබෙන බර? සතොසට. හැබැයි, අපි ඒ එක සේවකයෙකුවත් අයින් කරලා නැහැ. අපි ඉස්සරහට අලුතින් ආරම්භ කරන සතොස වෙළෙඳ සැල්වලට ඒ අයව යොමු කරන්න කටයුතු කරනවා. සතොස ලාභ ලැබීම කෙසේ වෙතත් සිල්ලර වෙළඳාමේදී ජනතාවට සහනදායී ලෙස බඩු මිලදී ගන්න පුළුවන් ආයතනයක් බවට පත් කිරීම තමයි අපේ වෑයම.

ඊළඟට, බඩු මිල පිළිබඳව කථා කළා. ගරු සභාපතිතුමනි, බඩුවල මිල ගණන් පිළිබඳව විස්තරයක් මා ළඟ තිබෙනවා. මේ අවස්ථාවේ දී මා එය **සභාගත*** කරනවා.

2024 මාර්තු මාසයේදී සහ 2025 මාර්තු මාසයේදී භාණ්ඩ වර්ග 40ක තිබුණු මිල ගණන් සංසන්දනය කරලා මෙහි දක්වා තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම්, මට ඒ විස්තර කියන්න පුළුවන්. 2025 මාර්තුවල ලොකු ලූනු රුපියල් 185යි; 2024 මාර්තුවල තිබුණේ රුපියල් 400යි. පාකිස්තාන ලොකු ලූනු මේ මාර්තුවල රුපියල් 185යි. පසුගිය අවුරුද්දේ මාර්තුවල රුපියල් 395යි. මේ වාගේ භාණ්ඩ වර්ග 40ක් තිබෙනවා. Brown sugar රුපියල් 430ටයි තිබුණේ. දැන් සතොසේ රුපියල් 285යි. Canned fish තිබුණේ රුපියල් 290ටයි. දැන් රුපියල් 270යි. Local canned fish රුපියල් 475යි. දැන් රුපියල් 380යි. මේ විධියට ගත්තාම භාණ්ඩ වර්ග 40ක් compare කළාම සියයට 20කින් බඩු මිල අඩු කරලා තිබෙනවා. භාණ්ඩ වර්ගවල මිල අඩු කරලා තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම සතොසේ quality එක fail වෙච්ච ඒවාත් ගත්තා. පසුගිය මාස තුන ඇතුළත සැපයුම්කරුවන් තුන්දෙනෙක් අපි blacklist කරලා තිබෙනවා. එක සැපයුම්කරුවෙකු අට පාරක් reject වෙනවා. ඔය quality එකෙන්මයි කරන්නේ. අට පාරක් reject කරනවා, blacklist කරනවා. ඇයි? සතොස තමයි dumpingවලට තියාගෙන ඉන්න තැන. හැබැයි, මේ නිලධාරීන්ම තමයි ඒ කාලයේත් හිටියේ, ගරු මන්ත්‍රීතුමනි. සමහර තනතුරු අද vacant වෙලා තිබෙන්නේ නිකම් නොවෙයි. වගකීම ඉටු කරන්නේ නැතුව, වගකීම ඉටු කරන්න කිව්වාම රස්සාව දාලා යන්න පටන් අරගෙන තිබෙනවා. අපි කියන්නේ යන කට්ටිය යවන්න ඕනෑ. ඇයි? නැත්නම් සතොස හදන්න බැහැ. මම ඔබතුමාට කිව්වේ ඒකයි. මිලියන 350කට ආසන්න භාණ්ඩ ප්‍රමාණයක් අතරමැද අවුරුදු 11ක් පාරවල. එහෙම වෙනවාද, ගරු සභාපතිතුමනි? නැහැ. සතොසේ procurement, සතොසේ transport, සතොසේ ගබඩා - ඒ වාගේ වැඩ කරපු අය තමයි සතොසේ හිටියේ. අපි ඒ ආයතනය හදන්නයි මේ වැඩේ කරගෙන යන්නේ.

ඒ විතරක් නොවෙයි, තව බොහෝ වංචා, දූෂණ සිදු වුණු තැන් වාගේම ටෙන්ඩර් ක්‍රියාවලින් හරහා හොර වැඩ කරපු තැන් තිබෙනවා. මම ඔබතුමාට තව උදාහරණයක්, දෙකක් කියන්නම්. STC ගැනත් කිව්වා. ගරු සභාපතිතුමනි, explosive - ඇමෝනියම් නයිට්‍රේට් - බෙදා හරින්න අපේ ළඟ තමයි ලයිසන් තිබෙන්නේ. ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් මත අදාළ අවශ්‍ය අයට බෙදන්නේ අපි. හැබැයි, අපි භාර ගන්න කොට ඇමෝනියා නයිට්‍රේට් ගෙනාවේ මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 1,145කට. අපි ඒක විවෘත ටෙන්ඩර් දාලා ගෙනාවා. දැන් කීයද? මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 681 ගණනේ අපි ගත්තා. අවුරුද්දකට මෙට්‍රික් ටොන් 2,000ක් අපි ගෙනෙනවා. ඒ මෙට්‍රික් ටොන් 2,000 වෙනුවෙන් අපි අඩු කරපු මුදලින් ගණන් හදලා බැලුවොත්, මෙට්‍රික් ටොන් එකකින් ඩොලර් 464ක් අඩු කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඩොලර් මිලියනයකට ආසන්න මුදලක් ඒ ටෙන්ඩර් ක්‍රියාවලිය ඇතුළේ නිකම් එළියට ගිය ඒවා අපි නවත්වලා තිබෙනවා. අද වනවිට ඒ අයට අඩුවට ඇමෝනියම් නයිට්‍රේට් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ ආයතන පාවිච්චි කරගෙන ඩීල් දාපු ඒවා තිබෙනවා. ගරු අගමැතිතුමිය ඒ පිළිබඳව රේයේ පෙරේදා ප්‍රකාශයක් කළා.

පසුගිය ආණ්ඩුව කාලයේ smart boards ගේන වැඩ පිළිවෙළක් කළා. රජයේ මිලදී ගැනීමේ ආයතනය - STC එක - යොදාගෙන තමයි ඒ වැඩෙත් කළේ. අපේ අමාත්‍යාංශය ඇතුළේ, මේ ක්‍රියාවලිය ඇතුළේ අපට කථා කර ගන්න තව බොහෝ කරුණු තිබෙනවා. මේ ආයතනය හදලා දැන් අවුරුදු 54ක් වෙනවා. මේ අවුරුදු 54න් වැඩිම sales වාගේම, හොඳම කාර්යක්ෂමතාවක් ඇතුව වැඩ කරන කාලය තමයි මේ කාලය. එහි සභාපතිතුමා කාර්ය මණ්ඩලයත් එක්ක ඒ වැඩේ කරගෙන යනවා. මේ ආයතන පද්ධතිය අත්පත් කරගෙන හිටපු බහිරවයෝ, භූතයෝ වාගේ කට්ටිය අයින් කරලා මේ පද්ධතිය ඉස්සරහට අරගෙන යන්න අපි දැන් කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, මම මේ සභාවේ අවධානය යොමු කරවන්න ඕනෑ තවත් විශේෂ කාරණයක් තිබෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රධාන ආයතනයක් තමයි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල. කථා කරගෙන යනකොට මේ මහපොළ පිළිබඳ සාකච්ඡාව හරි අපූරුයි, ගරු සභාපතිතුමනි. අපේ රටේ පාලකයෝ මහපොළ හැදුවේ උසස් අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දෙන්න. අද්දැත් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල 70,000කට ආසන්න දරුවන් ප්‍රමාණයකට මේ ශිෂ්‍යාධාරය ලබා දෙනවා. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් අපට මේකට දායක මුදලක් හම්බ වෙනවා. භාණ්ඩාගාරයෙන් කොටසක් දෙනවා. අපි සතු මුදල් ආයෝජනය කරලා උපයා ගන්නා ලාභ ප්‍රමාණයකුත් තිබෙනවා. මේ සියල්ල එකතු කරලා අපි දරුවන්ට ශිෂ්‍යාධාර ලබා දෙනවා. අපි අය වැය ඉදිරිපත් කරමින් කිව්වා, මේ අවුරුද්දේ සිට ඒ රුපියල් 5,000 ශිෂ්‍යාධාරය රුපියල් 7,500 දක්වා වැඩි කරලා ලබා දෙන්න අපේ ආණ්ඩුව කටයුතු කරනවා කියලා. ගරු සභාපතිතුමනි, ඒ අනුව අපි සියයට 50කින් මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කරලා තිබෙනවා. මට කියන්න ඕනෑ වුණේ මේකයි. මහපොළ ශිෂ්‍යාධාරය සියයට 50කින් නොවෙයි, මීට වඩා වැඩි ගණනකින් වැඩි කරන්න පුළුවන්කම තිබුණා. නමුත්, මේ සඳහා හේතු වුණු කාරණා ගණනාවක් තිබුණා.

ගරු සභාපතිතුමනි, මේ මහපොළ අරමුදල පටන් ගත්තා ආයතනයක්. මහපොළ භාර අරමුදල් මණ්ඩලය තීරණයක් අරගෙන පටන් ගත් මේ ආයතනය රටේ ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති කරපු ආයතනයක් බවට පත් වුණා. පාර්ලිමේන්තුවෙත්, COPE එකේත් මේ ගැන සාකච්ඡා කළා. මාලබේ තිබෙන SLIIT එක පිළිබඳවයි මම මේ කියන්න යන්නේ. මේක පටන් ගන්න තීරණය ගත්තේ 1998 මාර්තු 28වෙනි දා තිබුණු රැස්වීමේදී. 1998.04.01 දින තිබුණු කැබිනට් මණ්ඩල රැස්වීමට එවකට සිටි වෙළඳ අමාත්‍යවරයා සහ අධ්‍යාපන අමාත්‍යවරයා ඒකාබද්ධව Cabinet Paper එකක් ඉදිරිපත් කළා,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ ආයතනය පිහිටුවීම සම්බන්ධව. 1999 සිට මේ ආයතනය පිහිටුවා විවිධ විධියට වැඩ කරගෙන එනවා. මේක උසස් අධ්‍යාපන ආයතනයක් ලෙසයි තීරණය කරන්නේ. මේ ආයතනය පිහිටුවා පවත්වාගෙන යාම සම්බන්ධව මේ රැස්වීමේදී තීරණ ගණනාවක් ගන්නවා. ඒ ගන්න තීරණ අතර තිබෙනවා, මේක යම් දවසක මොරටුව විශ්වවිද්‍යාලයේ පරිපාලනය යටතට පත් කරන්න ඕනෑ බවත්, තවදුරටත් යනකොට විශ්වවිද්‍යාලයක් දක්වා ගෙන යන්න අවශ්‍ය කටයුතු සිදු කරන්න ඕනෑ බවත්. මේ ආයතනය - SLIIT එක - තිබෙන මාලබේ ඉඩම, මහපොළ අරමුදලට අයත් ඉඩමක්. ඒ ඉඩමේ මේ උසස් අධ්‍යාපන ආයතනය -තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනය- ගොඩ නඟනවා. ඒ ආයතනය ගොඩ නැඟීම පිළිබඳව එම ඒකාබද්ධ කැබිනට් පත්‍රිකාවේම දානවා, "තොරතුරු තාක්ෂණය පිළිබඳව ආයතනයක් පිහිටුවීම" කියලා. මේ ආයතනය හදලා, ඊට පස්සේ වැඩ කරගෙන යනවා. වැඩ කරගෙන යනකොට මේ භාර මණ්ඩලය ඇතුළේ අරුම පුදුම වැඩ සිද්ධ වෙනවා. මේ ආයතනය මෙහෙම පවත්වාගෙන යනකොට 2015දී, - ඔන්න මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමන්ලාගේ ආණ්ඩුව - එවකට වෙළෙඳ ඇමති ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වුණා. ඒ වෙනකොට ඒ රැස්වීමට යන්න පුළුවන්කම තිබුණේ මහපොළ අරමුදල භාරව එවකට සිටි අග්‍ර විනිශ්චයකාරවරයා, වෙළෙඳ ඇමතිවරයා, ඇමතිවරයාගේ නියෝජිතයන් තුන්දෙනෙක් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වැනි අයටයි. හැබැයි 2015දී මේ මණ්ඩලයේ රැස්වීම කැඳවන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයාගේ කාමරයේ - Chamber එකේ. මේකට යනවා සරත් අමුණුගම ඇමතිවරයා. සරත් අමුණුගම ඇමතිවරයා ඒකට ගිහිල්ලා බලපෑම් කරලා මහපොළ භාරයේ තිබෙන SLIIT එක පෞද්ගලීකරණය කරන්න, එහෙම නැත්නම් බැහැර කරන්න තීරණයක් ගන්නවා. අවසානයේ ශ්‍රීපවන් අග්‍ර විනිශ්චයකාරවරයා කියනවා අපේ රැස්වීමේදී ගත්තේ නැති තීරණයක් තමයි මේ ක්‍රියාත්මක කරන්න හදන්නේ කියලා. මොකද, ශ්‍රීපවන් අග්‍ර විනිශ්චයකාරවරයා සභාපතිත්වය දරන රැස්වීමට ගිහිල්ලා, ඒකෙදි මේක ගැන කථා කරලා තිබෙනවා. හැබැයි ඊට පස්සේ ඒ කාරණය නොවෙයි, එළියේ වෙනම රැස්වීමක් තියලා මේ ගොල්ලන් තීරණයක් අරගෙන තිබෙනවා, මේක පෞද්ගලික අංශයට භාර දෙන්න. එතකොට, කොහොමද මේක භාර දෙන්නේ? ගරු සභාපතිතුමනි, මේක භාරදෙනකොට ආයතනයට අදාළ ගිණුම් වාර්තා තිබුණා.

මම පසුගිය දවස්වල මේ පිළිබඳ තොරතුරු සෙව්වා. එසේ සොයා ගත් තොරතුරු අතර තිබුණා, 2015දී SLIIT එක භාර දෙන්න යනකොට එම ආයතනයට අදාළව තිබුණු ගිණුම් වාර්තාව. මා එය බැලුවා. ඒ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා ඉදිරිපත් කරපු විගණන වාර්තාවත් මා සතුව තිබෙනවා. ඒ වාර්තාවේත් මේ තොරතුරු ටික තිබෙනවා. මෙහි ඇතුළත් තොරතුරු අනුව SLIIT එක සතුව විශාල මුදලක් තිබෙනවා. SLIIT එක සතුව තිබෙන මුදල් අතර, රඳවා ගත් ලාභය ලෙස රුපියල් මිලියන 1,069ක් තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, you have two more minutes.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු සභාපතිතුමනි, මම තව විනාඩි 5ක කාලයක් ගන්නවා. මගේ පිළිතුරු කථාවෙන් ඒ කාලය අඩු කරනවා.

හැබැයි එදා ඒ ආයතනය දෙන්න තීරණය කළේ කීයකටද, ගරු සභාපතිතුමනි? රුපියල් මිලියන 408කට ගණන් බේරලා අනික් පැත්තට භාර දෙන්න කියලා තමයි තීරණය කරලා තිබුණේ. රුපියල් මිලියන 1,069ක ලාභාංශ තිබෙන ආයතනය, ඇමතිවරයා සහ හොරෙන් ගිය ඇමතිවරයෙකු විසින් වෙන කෙනෙකුට පවරා දෙන්න තීරණය කරනවා. අවසානයේ මෙහි භාර මණ්ඩලයේ සිටි සමහර නිලධාරීන් වැරදි විධියට බැංකු ගිණුමක් ආරම්භ කරලා තිබෙනවා. එසේ ආරම්භ කළ බැංකු ගිණුම තිබෙන්නේ ලංකා බැංකුවේ. ඒකට නමක් දානවා. ඒ කවුද? ගාමිණී ජයවික්‍රම පෙරේරා හිටපු ඇමතිවරයාගේ පෞද්ගලික ලේකම්වරයාගේ නම signatory කෙනෙකු හැටියට ඇතුළත් කරන්න කියලා බැංකුවට දැනුම් දෙනවා. භාරයේ ගිණුම් සම්බන්ධව එහෙම කටයුතු කරන්නේ කොහොමද? එහෙම කටයුතු කරන්න බැහැ. ඒ විතරක් නොවෙයි. ඒ ආයතනය දීලා රුපියල් මිලියන 408ක් ගන්නවා. ඊට පස්සේ අලුත් කොම්පැනි දෙකක් හදලා ඒ මුදල් ටික එම කොම්පැනි දෙකට දානවා. National Wealth Corporation Limited කියලා එකක් හදනවා, NatWealth Securities Limited කියලා තව එකක් හදනවා. ඒ කොම්පැනි දෙකේ සල්ලි ආයෝජනය කරනවා. අවසානයේ, එම ආයෝජන lost. එක කොම්පැනියකට විවිධ අවස්ථාවල රුපියල් මිලියන 985ක් දානවා. එයින් රුපියල් මිලියන 350කට ආසන්න මුදලක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ආපසු භාර දීලා තිබෙනවා. ඉතිරි රුපියල් මිලියන 600ම නැහැ. මෙන්න, මේ අය කරපු බිස්නස්.

ඒ විතරක් නොවෙයි. මේ පිළිබඳව ඊළඟ වැදගත් තීරණය ගන්නේ කවුද? ඒ, 2019දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින්. මොකක්ද, ගනු ලැබූ තීරණය? ගරු සභාපතිතුමනි, 2019දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා Cabinet Paper එකක් දාලා කියනවා, මේ අරමුදලේ සම්පූර්ණ අයිතිය SLIIT එකට දෙන්න කියලා. අපි අහනවා, කොහොමද එහෙම දෙන්නේ කියලා. එතුමාගේ දුව ඒ ආයතනයෙන් ඩිප්ලෝමා එකක් ගත් නිසාද ඒක දෙන්න හැදුවේ? මහපොළ ශිෂ්‍යාධාර අරමුදල තමන්ගේ ඉඩමේ, තමන්ගේ සල්ලි දාලා හදපු මෙම අධ්‍යාපන ආයතනය තුළ 2015 වෙනකොටත් රුපියල් මිලියන 1,064ක රඳවා ගත් ලාභයක් තිබියදී, තවත් රුපියල් මිලියන 483ක් බැංකු ගිණුම්වල තිබියදී, ඒක රුපියල් මිලියන 408කට දෙන්න කියලා කියපු එක තමයි ප්‍රශ්නය. නමුත්, ඒ තීරණය ක්‍රියාත්මක කළා. ජනාධිපතිවරයා ඒ තීරණය ගත්තේ ඇයි? මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා ඒ තීරණය ගත්තේ audit එක නවත්වන්නයි.

ගරු සභාපතිතුමනි, ඒකෙන් පස්සේ අග්‍ර විනිශ්චයකාර ශ්‍රීපවන් මැතිතුමා එහි භාරකාර මණ්ඩලයේ සභාපති පුටුවේ වාඩිවුණේ නැහැ. එතුමා ඒ සම්බන්ධයෙන් සාක්ෂිත් දීලා තිබෙනවා. ඊට පස්සේ තමයි ගරු බිමල් රත්නායක ඇමතිතුමන්ලා පාර්ලිමේන්තුවේදී මේ පිළිබඳව සාකච්ඡා කළේ. ඒ වාගේම මේ පිළිබඳව COPE එකේදීත් සාකච්ඡා කළා. එදා COPE එක කැඳවපු දවසේ -ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාත් හිටපු වෙලාවේ- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ නිලධාරීන්ට එන්න දුන්නේ නැහැ. එදා COPE එක නැවැත්වුවා. ඇයි ඒ? මේ තමයි, ඔක්කෝම අය එකතුවෙලා ආණ්ඩු බලය පාවිච්චි කරලා මහපොළේ දේපළ එළියට දාපු හැටි. එම නිසා, මේ පිළිබඳ අවබෝධයක් ඇති, ඒ වාගේම අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරයෙකු වන විජිත් මලල්ගොඩ මැතිතුමා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති විධියට පත් කළා. එතුමා හරහා අපි මේ පිළිබඳ දැන් පරීක්ෂණ පවත්වමින් යනවා. දරුවන්ට ශිෂ්‍යත්ව දෙන්න තිබුණු මේ අරමුදල දේශපාලන හිතවතුන්ට ධනය රැස් කරන්න දීපු දේපළක් බවට පත් කරලා තිබෙනවා, ධනය බෙදා දෙන තැනක් බවට පත් කරලා තිබෙනවා. ඒ සඳහා කැබිනට්

[ගරු වසන්ත සමරසිංහ මහතා]

මණ්ඩල තීරණ පවා අරගෙන තිබෙනවා, මන්ත්‍රීවරුන් පවා ඒ සඳහා මැදිහත්වෙලා තිබෙනවා. අපි දැන් ඒ හොරකම් පවා හෙළිදරව් කරමිනුයි ඉන්නේ.

ඒ විතරක් නොවෙයි. සමුපකාර දෙපාර්තමේන්තුව ඇතුළේ, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව - CWE එක - ඇතුළේ කරලා තිබෙන අපරාධ පිළිබඳව, ඒ වාගේම මේ රටේ ජනතාවගේ දේපළ කොල්ල කාලා තිබෙන්නේ කොහොමද කියන කාරණා පිළිබඳවත් ඉදිරියේදී අපේ ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් දක්වාවි.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකු කිව්වා වාගේම, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය හොර ගුහාවක් බවට පත්වෙලා තිබුණා. ඒක අපි පියවරෙන් පියවර, පියවරෙන් පියවර නිදහස් කරගෙන හොරුන්ට දඬුවම් දෙනවා විතරක් නොවෙයි, නැවත හොරකම් කරන්න බැරි ක්‍රමයක් යටතේ ජනතාවට පහසුකම් සපයන, දේශීය වාගේම ජාත්‍යන්තර වෙළෙඳාමට අවශ්‍ය පහසුකම් සපයන අමාත්‍යාංශයක් බවට පත් කරන්න මමත්, නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාත්, අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයත්, මගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ඇතුළු සියලුදෙනාත් කටයුතු කරන බව සඳහන් කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Sivagnanam Shritharan. You have 25 minutes.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු சිවஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு -

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(මාණ්පුමිකු සජිත් பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Yes, Hon. Leader of the Opposition?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Chairman, I will speak for 15 minutes. That time has been put under the Hon. Gayantha Karunathilleka.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Leader of the Opposition, now, I have already given the chance to the Hon. Shritharan to speak. Is it okay, Hon. Shritharan, if the Hon. Premadasa is given that chance?

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Okay.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.10]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේ අපි විශ්වාස කරනවා, විශේෂයෙන්ම පාරිභෝගිකයා ආරක්ෂා කිරීම, ඒ වාගේම වෙළඳ ප්‍රවර්ධනය මේ අමාත්‍යාංශය සතු පූර්ණ වගකීමක් කියලා. ඒ වාගේම ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීමත් ඔබ අමාත්‍යාංශය සතු ප්‍රධාන වගකීමක්. විශේෂයෙන්ම පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළේදී අපි විශ්වාස කරනවා, ගුණාත්මකභාවයෙන් ඉහළ, පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂා කරන අලුත් ක්‍රමවේදයකට අපි යා යුතුයි කියලා. ඒ සඳහා නීති රාමුව ශක්තිමත් විය යුතුයි, පාරිභෝගික අධ්‍යාපනය සහ දැනුවත්භාවය ප්‍රවර්ධනය විය යුතුයි, ඵලදායී පැමිණිලි නිරාකරණ යන්ත්‍රණයක් නිබිය යුතුයි, නිෂ්පාදන ආශ්‍රිත ආරක්ෂාව සහ ප්‍රමිතීන් නිර්මාණය විය යුතුයි, යහපත් වෙළඳ දැන්වීම්කරණ සහ අලෙවිකරණ පරිවයන් නිර්මාණය විය යුතුයි, දත්ත ආශ්‍රිත රහස්‍යභාවය සහ සයිබර් ආරක්ෂාව ශක්තිමත් විය යුතුයි, අධීක්ෂණය සහ බලගැන්වීම ක්‍රියාත්මක විය යුතුයි. අපි විශ්වාස කරනවා, මේ වැදගත් ගුණාංග ශක්තිමත් වෙනකොට පාරිභෝගිකයා ආරක්ෂා වන නවතම වැඩ පිළිවෙළක් නිර්මාණය වෙනවා කියලා.

ඒ වාගේම වෙළඳ ප්‍රවර්ධනය ගැන කථා කළොත්, විශේෂයෙන්ම ව්‍යාපාර කිරීමේ පහසුව - ease of doing business, අපනයන ප්‍රවර්ධනය හා වෙළෙඳ පොළ ප්‍රවේශතාව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආරම්භක ව්‍යාපාර වෙත සහාය ලබා දීම, යටිතල පහසුකම් සංවර්ධනය, නවෝත්පාදනය සහ ඩිජිටල් වෙළෙඳාම, පාරිභෝගික විශ්වාසය, ඒ වාගේම රාජ්‍ය-පෞද්ගලික අංශවල සහයෝගිතාව කියන මෙන්න මේ ක්‍රමවේද තුළ අපට හැකියාව ලැබෙනවා, වෙළඳ ප්‍රවර්ධන කාර්යභාරය අගනා ලෙස ඉෂ්ට සිද්ධ කරන්නට.

ඊළඟට, ආහාර සුරක්ෂිතභාවය කියන මාතෘකාව ගැන කථා කරන්න මම කැමැතියි. මෙහිදී ගරු ඇමතිතුමාගෙන් මම අවංකව යමක් අහන්න කැමැතියි. 2025 වර්ෂයේ ජනවාරි මාසයේ නිල දරිද්‍රතා රේඛාව වශයෙන් රටටම දෙන සංඛ්‍යාව අනුව එක් පුද්ගලයෙකු සඳහා මාසයක් ජීවත් වීමට රුපියල් 16,334ක් අවශ්‍ය යැයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තීන්දු කරලා තිබෙනවා. අපි දළ වශයෙන් ගත්තොත්, හතරදෙනෙකු සිටින පවුලකට මාසයක් ජීවත් වීම සඳහා සාමාන්‍යයෙන් මේ නිල දරිද්‍රතා රේඛාවේ ගණනය කිරීම අනුව රුපියල් 65,336ක් අවශ්‍ය වෙනවා.

මම අහන්න කැමැතියි, වර්තමානයේ පවතින බඩු මිලත් එක්ක සන්සන්දනය කරනකොට හතරදෙනෙකු ඉන්න පවුලකට මසකට රුපියල් 65,336ක් ඉපැයීම තුළ ජීවත් වෙන්න පුළුවන්ද, ආහාර සහ ආහාර නොවන වියදම් සපුරා ගන්න පුළුවන්ද කියලා. විශේෂයෙන්ම ආනයනික කිරි පිටි ග්‍රෑම් 400 පැකැට්ටුව අප්‍රේල් මාසයේ මුල සිට රුපියල් 50කින් ඉහළ යනවා ලු. ඒ කියන්නේ, දැනට රුපියල් 1,050ක් වන කිරි පිටි පැකැට්ටුව රුපියල් 1,100ක් වනවා. මේ විධියට බැලුවාම, දුප්පත්කමේ ඉන්නේ නැතුව දරිද්‍රතා රේඛාවේ පොඩ්ඩක් ඉහළින් ඉන්න අපේ රටේ කීයෙන් කී දෙනාටද පුළුවන් වෙන්නේ? බඩු මිල වැඩිවීමත් සමඟ හතරදෙනෙකු ඉන්න පවුලකට මසකට රුපියල් 65,336ක් ඉපැයීම ප්‍රමාණවත්ද? එතකොට රුපියල් 65,336 ගණනය කරන දරිද්‍රතා රේඛාව කොහොමද ගණනය කරන්නේ? කොහොමද ඒක තීන්දු කරන්නේ? මම යෝජනා කරනවා, මේ පිළිබඳව යම්කිසි විපරමක් කිරීම ඉතාම වැදගත් කියලා. අද දරිද්‍රතා රේඛාව මනින ක්‍රමවේදයේ දෝෂ රැසක් තිබෙනවා. මම ඔබතුමාට යෝජනා කරනවා, කරුණාකරලා මේ පිළිබඳව හොයා බලන්න කියලා. මොකද, දත්ත කේන්ද්‍රීයව තමයි රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය වෙන්නට ඕනෑ. වැරදි දත්ත මත රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය වනකොට හැම දේම අවුල් වෙනවා. *[බාධා කිරීමක්]* මගේ කථාවෙන් පස්සේ ඔබතුමා උත්තර දෙන්න, ගරු ඇමතිතුමනි.

බලන්න, අස්වැසුම ප්‍රතිලාභ ලබා දීම එවකට රජය තීන්දු කරනකොට විද්‍යාත්මක baseline survey එකක් කළේ නැහැ. දුප්පත් ප්‍රජාව කවුද කියන එක හරියට නිර්වචනය කළේ නැහැ; අවබෝධ කර ගත්තේ නැහැ. එහෙම නැතුව හිතූ හිතූ විධියට ප්‍රත්‍යක්ෂ කරගන්නට නිකම් survey එකක් කරලා, අස්වැසුම ප්‍රතිලාභීන් එක්කෝ තෝරා ගත්තා. එහෙම නැත්නම් බැහැර කළා. බරපතළ අසාධාරණයක් මේ පිළිබඳව තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ඔබතුමා යටතට එන, මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට විශාල දායකත්වයක් -මම හිතන විධියට, සියයට 60ක්, 70ක් - ලබා දෙන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් අද බරපතළ ගැටලුවකට මුහුණ දෙනවා. ඔව්, පරාටේ නීතිය තාවකාලිකව suspend කළා. නමුත්, ඒක විසඳුමක් නොවෙයි. මේ අයගේ හිඟ ණය ප්‍රශ්න, බොල් ණය ප්‍රශ්න, CRIB එකේ ලැයිස්තුගත වීම, ත්‍රිත්ව බෙදාවාචකය -පාස්කු ඉරිදා ප්‍රහාරය, බංකොලොත්භාවය, කොරෝනා වසංගතය- ඇතුළු මේ හැම එකකින්ම නිර්මාණය වුණු තත්ත්වයන් තුළ දැඩ පොලිය, වැල් පොලිය ඔක්කොම එක්කහු වෙලා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් බරපතළ ව්‍යසනයකට ලක් වෙලා තිබෙනවා. ඇයි, මේ අයගේ ණයබරතාවට තිරසර විසඳුමක් ලබා නොදෙන්නේ? අදටත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් දැඩි අසරණභාවයට පත් වෙලා සිටිනවා, මේ කාරණාව තුළ.

ඒ වාගේම මම මේ කාරණාවත් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ විෂය පථයට අයිති වෙනවා, ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා. ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා පවත්වාගෙන යෑම ඔබතුමාගේ වගකීමක්. දැනට තිබෙනවා, අපේ විවිධ ද්විපාර්ශ්වීය, බහුපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් වාගේම කලාපීය වෙළෙඳ ගිවිසුම්. Indo-Sri Lanka Free Trade Agreement එක තිබෙනවා, ISFTA කියලා. Pakistan-Sri Lanka Free Trade Agreement එක තිබෙනවා, PSFTA කියලා. Sri Lanka-Singapore Free Trade Agreement එක තිබෙනවා, 2018 අවුරුද්දේ ඉඳලා. ඒ වාගේම කලාපීය වෙළෙඳ ගිවිසුම් තිබෙනවා, SAFTA - the Agreement on South Asian Free Trade Area, APTA - Asia-Pacific Trade Agreement - කියලා.

ඒ වාගේම, තවත් වෙළෙඳ ගිවිසුම් රැසක් තිබෙනවා. යෝජිත වෙළෙඳ ගිවිසුම් තිබෙනවා. ඒවා තමයි, ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම; චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම; ශ්‍රී ලංකා-ඉන්දීය ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා එකඟතාව; බංග්ලාදේශ-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම. දැන් මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය මොකක්ද, ඔබතුමන්ලාගේ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය මොකක්ද කියලා. රටට අගයක් එකතු වන ආකාරයට ඔබතුමන්ලා මේ නිදහස් වෙළෙඳ ගිවිසුම් නිර්මාණය කරන්නේ කොහොමද? අපේ රටට සාපේක්ෂ වාසියක් ලැබෙන ආකාරයට ඒ ගිවිසුම් නිර්මාණය කරන්නේ කොහොමද? අපට ඒ තාක්ෂණික හැකියාව තිබෙනවාද? ඒ technical expertsලා ඉන්නවාද, හොඳ strong trade negotiation එකකට යන්න? හොඳ ශක්තිමත් වෙළෙඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නට තරම් අපේ යන්ත්‍රණය, වැඩ පිළිවෙළ, මානව සම්පත තිබෙනවාද? මම ඔබතුමාට මේ කාරණයත් යෝජනා කරනවා. ඇමෙරිකාවේ ඉන්නවා, USTR - United States Trade Representative. අපේ රටටත් විශේෂිත වූ වෙළෙඳ නියෝජිතවරයෙක් - Sri Lanka Trade Representative කෙනෙක් - අවශ්‍යයි. ඔහු යටතේ විශේෂඥයන් කණ්ඩායමක් තීන්දු කරන්නට ඕනෑ, අපේ රටට වාසිදායක නිදහස් වෙළෙඳ ගිවිසුම් මොනවාද කියලා. ඒවා පිළිබඳව ගුණාත්මක සහ සංඛ්‍යාත්මක ගණනය කිරීමක් කරලා, cost-benefit analysis එකක් කරලා, පිරිවැයට වඩා වාසි වැඩි නම්, අපි ඒ වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම මම ඔබතුමාගෙන් මේ කාරණයත් අහන්න කැමැතියි, ගරු ඇමතිතුමනි. යුරෝපා හවුල දැන් GSP Plus පිළිබඳව නැවත වතාවක් සාකච්ඡා කිරීමේ වටය ක්‍රියාත්මක කරනවා, GSP Plus දෙනවාද, නැද්ද කියන එක සම්බන්ධයෙන්. ඔබතුමන්ලා කලබලයක් ඇති කර ගන්නට අවශ්‍ය නැහැ. කවුරු ආණ්ඩුවේ හිටියත්, රටට ආදරය කරන විපක්ෂයක් හැටියට අපි හැමදාම GSP Plus වෙනුවෙන්, පෙනී සිටිනවා. මොකද, ඒ තුළින් අපේ රටේ කර්මාන්ත පද්ධතිය ශක්තිමත් වෙනවා. රැකියා ප්‍රශ්නයට ලොකු විසඳුමක් ලැබෙනවා. අපනයන කේන්ද්‍රීය කර්මාන්ත ඇත්ත වශයෙන්ම ප්‍රවර්ධනය වෙනවා. හැබැයි, මේ GSP Plus රද්දා ගන්න ඔබතුමන්ලාට තිබෙන වෙළෙඳ ප්‍රතිපත්තිය මොකක්ද? මම මේ කියන්නේ යුරෝපා හවුලත් සමඟ සාපේක්ෂව.

ඊළඟට මම මේ කාරණයත් ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ගරු ඇමතිතුමනි. ඔබතුමා දන්නවා ද දන්නේ නැහැ, අපේ රටට GSP Plus duty-free entry facility එකක්, භාණ්ඩ 3,451කට තිබුණු බව. කොහේටද තිබුණේ? ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳ පොළට. මේක 2020 දෙසැම්බර් මාසයේ expire වෙලා තිබෙනවා. මේක අහෝසි වෙලා තිබෙනවා, 2020 දෙසැම්බර් මාසයේ. එදා මෙදා තුර මම දන්නා විධියට එය නැවතත් පණගන්වන්නට කිසිම රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාවලියක් ක්‍රියාත්මක

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

වෙලා තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. බලන්න, අපේ භාණ්ඩ හා සේවාවලට වාසිදායක ප්‍රවේශයක් ඇමෙරිකානු වෙළෙඳ පොළෙන් ලැබෙනවා නම්, එවන් පහසුකමක් තිබෙනවා නම්, අපේ රටේ අපනයන ක්ෂේත්‍රයට එය කොයිතරම් ශක්තියක්ද? දැන් මහ ලොකුවට කිව්වා, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තිබෙනවා කියලා. විශේෂයෙන්ම රාජ්‍ය නායකයන් එක්ක විශේෂ සබඳකම් තිබෙනවා කියලා පසුගිය කාලයේ කිව්වා. මම අහනවා, මේ රාජ්‍ය තාන්ත්‍රික ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ට ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක තිබුණු GSP - Generalized System of Preferences - පහසුකම අපේ රටට දෙන්න බැරි වුණේ ඇයි කියලා. ගරු ඇමතිතුමනි, මම දන්නා විධියට අවුරුදු 5ක් තිස්සේ මේ පහසුකම අපේ රටට නැහැ. *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)
අපි බලයට ඇවිල්ලා තවම මාස 5ක් විතර නේ වෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)
බලයට ඇවිල්ලා තවම මාස 5ක් කියලා ඔබතුමා කියන කාරණය මම පිළිගන්නවා. නමුත්, මාස 5ක් වුණත් ඔබතුමා අවබෝධ කර ගන්න, බරපතළ අභියෝගයක් තිබෙනවා කියන එක. වර්තමාන ඇමෙරිකානු ජනාධිපතිතුමාගේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිපත්තිය, වෙළෙඳ ප්‍රතිපත්තිය, ආර්ථික ප්‍රතිපත්තිය තුළ මේක දිනා ගැනීමේ අවස්ථාව අමාරු දෙයක්. ඒක මම පිළිගන්නවා.

මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි, මේ GSP සහනය, එහෙම නැත්නම් preferential access to US markets දිනා ගන්නට අපේ විපක්ෂයේ සහයෝගයත් ලබා දෙන්න අපි සූදානම් බව. මොකද, ඒ වාගේ දෙයක් තුළින් මොකක්ද වෙන්නේ? රටේ ආර්ථිකය වර්ධනය වෙනවා; කර්මාන්තශාලා බිහි වෙනවා; රැකී රක්ෂා බිහි වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

ඒ වාගේම මම නැවත වරක් ඔබතුමාට ප්‍රකාශ කරන්න කැමැතියි, පාරිභෝගික ක්ෂේත්‍රය පිළිබඳව අපි අලුතෙන් හිතන්නට ඕනෑ බව; වෙළෙඳ ක්ෂේත්‍රය පිළිබඳව අපි අලුතෙන් හිතන්නට ඕනෑ බව. විශේෂයෙන්ම ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කරනකොට නිවැරදිම ක්‍රමවේදයකට යන්න ඕනෑ. නැත්නම් ඔබතුමාටත්, රජයටත්, ජනාධිපතිවරයාටත් සිද්ධ වෙන්නේ, වැරදි දත්ත මත, බොරු දත්ත මත පදනම් වුණු රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමටයි. තවත් කාරණයක් මම කියන්න කැමැතියි. සංඛ්‍යාලේඛන කෙසේ වෙතත් අද අපේ රටේ සමස්ත ජනතාවට ජීවත් වීම පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. ඔය කියන ගණන් හිලවි කොහොම වුණත් මේ රටේ අතිමහත් බහුතරයක් ජීවත් වෙන්නේ, බොහොම අමාරුවෙන්. ඒ නිසා අවසාන වශයෙන් මම ඉල්ලීමක් කරනවා. අපි සම්ප්‍රදායානුකූලව දළ දේශීය නිෂ්පාදිතය ගැන කියනවා; දරිද්‍රතා රේඛාව ගැන කියනවා; දුප්පත්කමේ ප්‍රතිශතය ගැන කියනවා; උද්ධමනය ගැන කියනවා; විරැකියාව ගැන කියනවා; වෙළෙඳ ශේෂය ගැන කියනවා; ගෙවුම් ශේෂය ගැන කියනවා. නමුත් නරකද අලුත් විධියට හිතලා, දළ ජාතික සතුට - Gross National Happiness - ගණනය කළොත්? සමහර ස්කැන්ඩිනේවියානු රටවල්, යුරෝපා රටවල් ඒ ගණනය කරනවා; GNH කියලා කියන්නේ. දැනට කරන ගණනය කිරීම්වලට අමතරව අපට අලුතෙන් Gross National Happiness එකත් ගණනය කරන්න පුළුවන් නම්, සැබැවින්ම අපට තීන්දු කරන්න පුළුවන්, රටේ ජනතාව සතුටෙන් ඉන්නවාද, එහෙම නැත්නම් අතෘප්තිමත් ජීවිතයක් ගත කරනවාද කියලා. අද මහ පාරට බැහැලා random survey එකක් කළොත්, මහ පාරට බැහැලා හම්බ වෙන පළමු දහදෙනාට කථා කරලා ඇහුවොත්, ඔබතුමාටම පරීක්ෂා - check - කර ගන්න පුළුවන්, ජනතාව සතුටෙන් ජීවත් වෙනවාද, තෘප්තිමත් ජීවිතයක් ගත කරනවාද, ඒ අයට යහපත් ආදායමක් ලැබෙනවාද, දරු මල්ලන්ගේ ප්‍රශ්න ගැටලුවලට විසඳුම් ලබා දෙන්න ඒ අයට හැකියාවක් තිබෙනවාද කියලා. ඒ කරුණු කාරණා පිළිබඳව මහ පොළොවේ වාර්තාව බොහොම වැදගත්. ඒ නිසා මම අවසාන වශයෙන් කියනවා, දළ ජාතික සතුට - Gross National Happiness - කියන indicator එක ගැනත් රජයේ අවධානය යොමු කරන්න කියලා.

ඒ වාගේම කරුණාකරලා, ඔබතුමන්ලාට දස ලක්ෂ ගණනින් ආධාර උපකාර කළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්, ව්‍යවසායකයන් අමතක කරන්න එපා කියලාත් මම කියනවා. ඒ අය වෙනුවෙන් පෙනී හිටින්න. ඒ අය වෙනුවෙන් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න.

ස්තුතියි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)
මම විනාඩියයි ගන්නේ ගරු සභාපතිතුමනි. විපක්ෂ නායකතුමා මතු කළ කාරණයක් පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ජාත්‍යන්තර වෙළෙඳාම සහ වෙළෙඳ ගිවිසුම් පිළිබඳව ඔබතුමා විමසුවා, විපක්ෂ නායකතුමනි. US GSP Plus සහනය නැති වෙන්නේ අපට විතරක් නොවෙයි, සියලු රටවලට එය නැති වෙනවා. 2020 දෙසැම්බර් 31වැනි දායින් පසුව සියලුම රටවලට US GSP සහනය ලබා දෙන්න US Congress එක කටයුතු කරලා නැහැ. ඒ සම්බන්ධයෙන් අපි ඉදිරියටත් කටයුතු කරන්න උත්සාහ කරනවා. ලබන සැප්තැම්බර් මාසයේදී ඇමෙරිකාවත් එක්ක joint discussions පවත්වන්න මේ වෙනකොටත් අපි දින නියම කරගෙන තිබෙනවා. ඒ වාගේම ඒගොල්ලන් apparel sector එකට US GSP සහනය ඉවත් කරලා තිබුණේ. ඒ පිළිබඳවත් අපි අවධානය යොමු කරලා තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම ඔබතුමන්ලාගේ සහාය ලබා ගත හැකි අවස්ථාවලදී ලබා ගන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම ජාත්‍යන්තර ගිවිසුම්වල තත්ත්වය සමාලෝචනය කරන්නත් අපි මේ වෙනකොට කථා බහ කරමිනුයි ඉන්නේ.

මොකද, සමහර ඒවායේ ලැයිස්තු තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඒවා දිග ලැයිස්තු. හැබැයි, අපිට වැඩක් වෙලා නැහැ. ඒ නිසා සැබෑ ලෙස අපේ අපනයනකරුවන්ට, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රය තුළ සිටින අපේ නිෂ්පාදකයන්ට මේ ගිවිසුම් හරහා ලබා ගත හැකි පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් මැදිහත් වෙන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම අලුත් ගිවිසුම් කිහිපයක් පිළිබඳව සාකච්ඡා කිරීමට, විශේෂයෙන්ම ව්‍යවසාය වාගේ රටවල් එක්ක නව වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමට අපි කටයුතු කරනවා. ඒ වාගේම ඉරානය එක්ක අපි joint discussions පවත්වනවා. ලබන මැයි මාසයේ අපි එම සාකච්ඡා ආරම්භ කරනවා. ඒ හරහා නව ගිවිසුම්වලට යන්නත් අපි කටයුතු කරනවා. ජනතාව සතුටින් තැබිය හැකි සියලු කටයුතුවලට මැදිහත් වෙලා වෙළෙඳ පොළ තුළ භාණ්ඩ හා සේවාවල මිල පාලනය කරන්න, අඩු කරන්න අපි රජයක් හැටියට කටයුතු කරනවා. ඒ සම්බන්ධයෙන් සහයෝගය ලබා දෙන්න ඔබතුමන්ලා බලාපොරොත්තුවීම ගැන අපි සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා මතු කළ කාරණය වෙනුවෙන් තමයි මම මේ පැහැදිලි කිරීම කළේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කිව්වා, ඇමෙරිකාවේ GSP සහනය අපේ රටට වාගේම රටවල් සමූහයකටම අහිමි වෙලා තිබෙනවා කියලා. මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, ඇහලුම් කම්හල් 200 වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන කොට, වෙනත් කිසිම රටකට නොලැබුණු කෝටාවක් අපේ රටට ලැබුණු බව. එදා තිබුණා, Multi-Fibre Arrangement කියලා එකක්. එදා වෙනත් රටවල්වලට නොලැබුණු වැඩි quota එකක් අපේ රටට ලබා දුන්නා, ඇමෙරිකා එක්සත් ජනපදය. මම මේ උදාහරණයක් ඔබතුමාට කියන්නේ.

රටක් හැටියට අපි government-to-government negotiation එකකට යා යුතුයි. අනෙක් රටවලට නොදුන් කථාව ඇත්ත වෙන්න පුළුවන්. ඒකත් ඔළුවේ තබාගෙන අපේ රට වෙනුවෙන් විශේෂිත වූ අවබෝධතාවකට යන්න අපට පුළුවන්. එවන් අවබෝධතාවකට, එකඟතාවකට යන්න හොඳම නිදර්ශනයක් තමයි ඇහලුම් කම්හල් 200 වැඩසටහනට අදාළව තිබුණු Multi-Fibre Arrangement එක. ඒ Multi-Fibre Arrangement එක හරහා අපේ රටට වැඩිපුර quota ප්‍රමාණයක් ලබා ගෙන තමයි අලුතින්ම - නගරබද නොවෙයි,- ප්‍රාදේශීය මට්ටමින් ඇහලුම් කම්හල් 200ක් ස්ථාපනය කළේ. මම මේ උදාහරණය ඔබතුමාට කිව්වේ විශේෂිත වූ government-to-government, state-to-state negotiation එකකට යෑමේ අවශ්‍යතාව තිබෙන නිසායි. ඒකට ඔබතුමාට අවශ්‍ය වෙයි, විශේෂිත වෙළෙඳ නියෝජිතයෙක්. ඒ කියන්නේ United States Trade Representative - USTR- වාගේ අපිටත් නියෝජිතයෙක් අවශ්‍යයි. මොකද, මේක specialized විෂයයක්; විශේෂිත දැනුමක් තිබිය යුතු විෂයයක්. ඒ Sri Lanka Trade Representative හරහා වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් මම හිතනවා ඕක ජයග්‍රහණය කරන්නට අපට හැකියාව ලැබෙයි කියලා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ අදහස ගැන අපි සැලකිලිමත් වෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාත් දන්නවා, අපේ රටේ කාලයෙන් කාලයට විවිධ උපදේශකයෝ ගෙනැල්ලා වැටුප් විතරයි ගෙවා තිබෙන්නේ කියලා. ඒ නිසා අපි ඇති කර ගන්නා වෙළෙඳ ගිවිසුම් පිළිබඳව අපේ වාණිජ දෙපාර්තමේන්තුවත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්වරයාත්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ මේ සම්බන්ධව තිබෙන ආයතනයත්, විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනත් ඒකාබද්ධ කරගෙන අපි සාකච්ඡා කරමින් සිටින්නේ. ලබන සැප්තැම්බර් මාසයේ අපි ඇමෙරිකාව සමඟ මේ සම්බන්ධව සාකච්ඡාව කරන්න දැනටමත් අපිත් එක්ක ඒගොල්ලන් සාකච්ඡා කරමින් සිටිනවා. අපි සැප්තැම්බර් මාසයේ එම සාකච්ඡා පවත්වනවා. ඇමෙරිකාව තමයි අපේ ලොකුම අපනයන ගැනුම්කරුවා. අපේ රටේ නිපදවන භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් අපනයනය කරන්නේ ඇමෙරිකාවට. ඒ නිසා තනි රටක් හැටියට ඒ සඳහා අපේ පැත්තෙන් ගත යුතු පියවර අපි ගන්නවා; ඒ මැදිහත්වීම අපි කරනවා. එහිදී අපට trade representativesලාගේ support එක වුවමනායි නම්, එවැනි තත්ත්වයක් මතු වෙනවා නම්, මොකක්ද කරන්නේ කියන එක ගැන අපි පාර්ලිමේන්තුවත් දැනුවත් කර කටයුතු කරන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා සඳහන් කළා උපදේශකයෝ විවිධ මිල ගණන්වලට අරගෙන තිබුණාය කියලා. මේ මාතෘකාව පිළිබඳව අපටත් යම් දැනුමක් තිබෙනවා. අපේ උපදේශනය නොමිලේ ලබා දෙන්නට අපි සූදානම්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Prof.) L.M. Abeywickrama. You have eight minutes.

[ප.භා. 11.33]

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු සභාපතිතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරන අද දිනයේ මට මේ අවස්ථාව ලබා දීම ගැන මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

කලින් කථාවේදී ඉතා වැදගත් ක්ෂේත්‍රයක් පිළිබඳව මතු කරනු ලැබුවා, අපේ විපක්ෂ නායකතුමා. ඇත්තවශයෙන්ම ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම්, ද්වි-පාර්ශ්වික ගිවිසුම්, ඒ වාගේම කලාපීය ගිවිසුම් විශාල සංඛ්‍යාවක් පසුගිය කාලයේ අපි අත්සන් කර තිබෙනවා. නමුත් අපට තිබෙන අත්දැකීම තමයි, ඒ ගිවිසුම්වලට අදාළ negotiation roundsවලට අපෙන් සැලකිය යුතු දායකත්වයක් නොලැබුණු නිසා එහෙම නැත්නම් අපේ negotiations බලවත් නොවුණු නිසා අපට අත්පත් කරගන්න තිබුණු ගොඩක් වාසි අත්පත් කරගන්න බැරි වුණා කියන එක.

උදාහරණයක් වශයෙන් කියනවා නම්, අප 1995දී අත්සන් කරපු WTO ගිවිසුම හරහා ලෝකයේ වෙළෙඳ පොළ ප්‍රවේශයන් - market access - කියන category එක යටතේ වාසි අත්පත් කර ගන්න අපට බැරි වුණා. ගරු විපක්ෂ නායකතුමා කියපු ආකාරයෙන්ම අත්පත් කර ගන්න හැකිව තිබුණු සාපේක්ෂ වාසි, නිරපේක්ෂ වාසි අත් පත් කර ගන්න අපට බැරි වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම පසුගිය රජයන් සියල්ල ඒ අවස්ථා මඟ හැර තිබෙන නිසා තමයි අපේ රට ජාත්‍යන්තර වෙළෙඳාම පැත්තෙන් අද ඉතා පහළ මට්ටමක පවතින්නේ. ලෝකයේ රටවල අපනයනයත් එක්ක සාපේක්ෂව බලන කොට අපේ රට අපනයනය පැත්තෙන් ඉතා අවම මට්ටමකයි පවතින්නේ. මේ කාරණා ඔක්කෝම එකතු කරලා පරීක්ෂා කර බැලුවාම අපට ප්‍රශ්නයක් මතු වුණා, ඒ negotiationsවලට -ද්විපාර්ශ්වික වෙන්න පුළුවන්, බහු පාර්ශ්වික වෙන්න පුළුවන්- අපේ රට සහභාගි වෙලා නැද්ද කියලා. නමුත්, අපට පෙනී ගිය කාරණයක් තමයි බොහෝ negotiation roundsවලට අපේ ඇමතිවරුන් සහභාගි වෙලා තිබෙන්නේ ඒ විෂයය සම්බන්ධ විශේෂඥයන් එක්ක නොව, තමන්ගේ පවුලේ අයත් එක්කයි කියන එක. ඒ නිසා තමයි, බොහෝ වෙලාවට ඒ negotiationsවලදී අපේ පැත්තේ දායකත්වය එච්චර strong නැති වූ නිසා තමයි අපට ඒ වාසි අත්පත් කර ගන්න බැරි වෙලා තිබෙන්නේ. ඒක, එක් කාරණයක්.

අනෙක් කාරණය මේකයි. බොහෝ විට අපට අහිමි වෙලා තිබෙනවා ජාත්‍යන්තර වෙළෙඳාමෙන් අපට අත්පත් කර ගන්න තිබුණු අවස්ථා. ඒ සමහර කාරණා අපි නොසලකා හැර තිබෙනවා. උදාහරණයක් වශයෙන් කියනවා නම්, 1995 WTO Agreement එකත් එක්ක බුද්ධිමය දේපළ පනත යටතේ අපට ලැබුණු අවස්ථා මඟ හැරගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම ගිය අවුරුද්ද වනකල්ම ඒ සම්බන්ධව අත්පත් කර ගන්න තිබුණු Geographical Indications ලබා ගැනීම වාගේ අවස්ථා තිබියදීත් ඒවා අත් හැරලා

[ගරු එල්.එම්. අබේවික්‍රම මහතා]

තිබෙනවා. අපේ කුරුඳු, අපේ ගම්මිරිස්, දකුණු පළාතේ තිබෙන ඇඹුල්තියල් වාගේම අපේ විශේෂ ආහාර වට්ටෝරු, නුවර පිත්තල භාණ්ඩ, යාපනයේ කොට්ටකිලංගු වාගේ අපට විශේෂිත වූ විශිෂ්ට නිෂ්පාදන තිබෙනවා. බුද්ධිමය දේපළ පනත, GI certification භාවිත කරලා එකී නිෂ්පාදන සම්බන්ධයෙන් අපට වෙළෙඳ පොළක් අත්පත් කර ගන්න හැකියාව තිබුණා. නමුත්, මෙතෙක් එය අත්පත් කරගෙන නැහැ. අපේ ආණ්ඩුව ආවාම මේ අවුරුද්දේ තමයි අපි කුරුඳු සඳහා GI certification එක අත්පත් කර ගත්තේ. ඇත්තවශයෙන්ම අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. ඒ වාගේම Intellectual Property Rights - IPR යටතේ, එහෙම නැත්නම් බුද්ධිමය දේපළ පනත යටතේ ඒ අත්පත් කර ගැනීම කරන්න Madrid Protocol එකට අපේ රට අත්සන් කරලා තිබුණේ නැහැ; අපේ රට එයට සම්බන්ධ වෙලා තිබුණේ නැහැ. IPR යටතේ, එහෙම නැත්නම් බුද්ධිමය දේපළ පනත යටතේ තමන්ගේ වෙළෙඳ පොළ අත්පත් කර ගන්න මේ වන කොට රටවල් 131ක් Madrid Protocol එකට සම්බන්ධ වෙලා තිබෙනවා. නමුත්, අපි මේ අවුරුද්දේ Budget එකෙන් මුදල් වෙන් කරලා තිබෙනවා, අපි ඒ ආයතන පද්ධති ශක්තිමත් කරන්න අවශ්‍ය පියවර ගෙන තිබෙනවා, Madrid Protocol එකට මේ වසරේ දී අපට සම්බන්ධ වෙන්න පුළුවන් ද කියලා බලන්න. ඒ, ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධවයි.

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ රටේ වෙළෙඳාම සම්බන්ධව තිබෙන්නේ බොහොම අපකීර්තිමත් තත්ත්වයක්. උදාහරණයක් වශයෙන් ගත්තොත්, අපේ රටේ තිබෙන නිෂ්පාදනවල, වෙළෙඳ පොළේ තිබෙන ආනයන භාණ්ඩවල ගුණාත්මකභාවය සහ ඒවායේ තත්ත්වය සම්බන්ධව කිසිම පිළිගත් මට්ටමේ standards අපට නැහැ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, අපේ ජාතික ආර්ථිකය තුළ ආනයන වෙළෙඳ පොළෙන් එන ආනයනික භාණ්ඩවල සහ දේශීය භාණ්ඩවලත් වෙළෙඳ පොළේ සංසරණය වීම සම්බන්ධයෙන්, ගුණාත්මකභාවය සම්බන්ධයෙන් තිබෙන්නේ බොහොම නරක ප්‍රතිරූපයක්. ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳ මතවාද හදලා තිබෙන්නේ -rumours- කටකථාවලින්. අපට මතකයි, පසුගිය කාලයේදී කිරි පිටි සම්බන්ධව -DCD, මෙලමයින් තිබෙන ප්‍රමාණය සම්බන්ධව- කතිකාවක් ඇති වුණ බව. සමහර අය කිරිපිටි බීම නතර කළා. දැන් ආයෙත් සැරයක් බොනවා, ඒවා එහෙමම තිබියදීම. තවත් අවස්ථාවක කතිකාවක් ඇති වුණා පොල් තෙල්වල තිබෙන පිළිකාකාරකයක් -aflatoxin- ගැන. ඒ වාගේම, මිරිස්වල තිබෙන පිළිකාකාරක සම්බන්ධව කතිකාවක් ඇති වුණා. මේ වාගේ විවිධාකාර ආහාරවල තිබෙන රසායන ද්‍රව්‍ය, පිළිකාකාරක ද්‍රව්‍ය පිළිබඳව හිටපු ගමන් කට කථා පතුරනවා, හිටපු ගමන් නතර කරනවා, ආයෙත් පටන් ගන්නවා. ඒවා සම්බන්ධයෙන් පරීක්ෂණ කරලා නියාමනයක් ඇති කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය තිබුණත් ඒකෙන් ලොකු කාර්යභාරයක් පසුගිය කාලයේ ඉටු වෙලා නැති බව අපි කියනවා. නමුත්, මේ වන විට අපි මේ අවුරුද්දේ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවට අවශ්‍ය විද්‍යාගාර නඩත්තු කිරීම ආදියට වුවමනා ප්‍රතිපාදන ලබා දෙමින් මෙවර අය වැයෙන් ලොකු මුදලක් වෙන් කර තිබෙනවා, ප්‍රතීතනය සඳහා සහ ඒ මිනුම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම වෙනුවෙන්.

විශේෂයෙන් මේ වෙලාවේ අපට සිහිපත් වෙනවා, පසුගිය කාලයේ මුහුණ දෙන්න සිදු වුණු ලොකු අර්බුද, ගෑස් ටැංකි පුපුරපු කථා ආදිය ගැන. ඒ කිසිම නිෂ්පාදනයක accredited නිර්ණායක අපට නැහැ. ඒ සම්බන්ධයෙන් මේ අවුරුද්දේ ඉඳලා ලොකු මැදිහත්වීමක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඇත්තවශයෙන්ම මේ කථා කරන තත්ත්වයන් ඇති වෙලා තිබෙන්නේ, පසුගිය රජයන් මේ ක්ෂේත්‍ර සම්පූර්ණයෙන් නොසලකා හැරීම නිසායි. විශේෂයෙන් මා කලින් සාකච්ඡා කරපු විදේශ වෙළෙඳාම සහ දැන් සාකච්ඡා කරන එක එක නියාමනයන් සම්බන්ධවත් අපට ලොකු මැදිහත්වීමක් කරන්න වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් හැකියාවක් තිබෙන, දැක්මක් තිබෙන, ඒ වාගේම වුවමනාවක් තිබෙන කණ්ඩායමක් එකතු වෙලා ඉන්නවා. විවිධ විවේචනවලට මුහුණ දෙන අතරම, මෙයට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කිරීමේ හැකියාව මේ අය වැය තුළින් අපි ඇතිකර දී තිබෙනවා කියන කාරණය මම මතක් කරනවා.

ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is the Hon. Sivagnanam Shritharan. You have 25 minutes.

[மு.ப. 11.40]

ගරු සිවඥානම් ශ්‍රීකරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சுத் தொடர்பாக நடைபெறும் குழுநிலை விவாதத்திலே பேச வாய்ப்பளித்தமைக்கு நன்றி! மிக முக்கியமாக, இந்த நாட்டினுடைய உணவுப் பாதுகாப்பு என்பதும், நுகர்வோரைப் பாதுகாத்தல் என்பதும் மிக முக்கியமானது. உணவு உற்பத்திப் பொருட்கள் தொடர்பாகச் சர்வதேச ஒப்பந்தங்கள் மற்றும் சர்வதேச நிபந்தனைகள் இருந்தாலும்கூட, உள்நாட்டில் உற்பத்தி செய்யப்படுகின்ற பொருட்களுக்கான தர நிர்ணயம், உள்நாட்டில் உற்பத்தி செய்யப்படுகின்ற உணவுப் பொருட்களை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்வதிலே இருக்கின்ற தடங்கல்கள் போன்ற விடயங்கள் இன்னும் இந்த நாட்டில் சரியாகக் கையாளப்படவில்லை. அதனால் இந்த நாட்டினுடைய உழைப்புக்குரிய பலன் அல்லது அந்நியச் செலாவணி வரவுகள் சரியாகக் கிடைக்கவில்லை என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

மிக முக்கியமாக, உணவு உற்பத்தி தொடர்பாகவும், உணவை மக்களுக்கு வழங்குவது தொடர்பாகவும், உணவுப் பொருட்களை இறக்குமதி செய்வது தொடர்பாகவும் சிந்திக்கப்படுகின்றதே தவிர, இந்த நாட்டிலிருக்கின்ற குழந்தைகள் முதல் வயோதிபர் வரையான நுகர்வோருடைய தேவைகள், அவர்களுடைய ஆரோக்கியம், அதனூடான அவர்களுடைய எதிர்காலம் தொடர்பிலோ, அவர்களுக்கான உணவு நிலைப்பாடு தொடர்பிலோ சரியான ஒரு செந்நெறியை எந்த அரசும் முன்னெடுக்கவில்லை. உலக ஒழுங்குகளோடு பார்க்கின்றபொழுது, உலக நாடுகளுடைய உணவுப் பாதுகாப்போடு பார்க்கின்றபொழுது, இந்த நாட்டிலே அது தொடர்பான சரியான நடைமுறைகள் இல்லை என்பதை நாங்கள் இந்த இடத்திலே சிந்திக்க வேண்டும்.

மிக முக்கியமாக, இந்த நாட்டிலே இருக்கின்ற பல அரிசிக் களஞ்சியசாலைகள் இன்று மூடப்பட்டிருக்கின்றன. குறிப்பாக, இந்த நாட்டில் அரிசி விநியோகம் என்பது அரிசி மாபியாக்களால் கையாளப்படுகின்ற நிலை

காணப்படுகின்றது. நெல் உற்பத்தி செய்யப்பட்டு, அறுவடை செய்யப்படுகின்ற பொறுத்த நேரத்தில் இந்த நாட்டில் அரசாங்கங்கள் அரிசியை இறக்குமதி செய்கின்றன. இதனால் இங்கு உற்பத்தி செய்யப்படுகின்ற நெல் மற்றும் அரிசி, அதனுடைய தரம் மற்றும் உகந்த விலையை இழந்து போகின்றது; விவசாயிகள் பாதிக்கப்படுகின்றார்கள்.

குறிப்பாக, இந்த நாட்டினுடைய பருவ மழை என்பது வடக்கு, கிழக்குப் பகுதிகளுக்கு ஒரு காலத்திலும், தெற்குப் பகுதிகளுக்கு வேறொரு காலத்திலுமாகக் கிடைப்பதாக அமைந்திருப்பது உங்களுக்குத் தெரியும். வடக்கு, கிழக்கிலே அறுவடை நடைபெறுகின்ற சனவரி மற்றும் பெப்ருவரி மாத காலத்தில் இந்த நாட்டிலே அரிசி இறக்குமதி செய்யப்படும். அவ்வாறு அரிசி இறக்குமதி செய்யப்படுகின்றபொழுது, அரிசி மாபியாக்கள் வடக்கு, கிழக்குப் பகுதிகளிலே வந்து குறைந்த விலையில் நெல்லைக் கொள்வனவு செய்துகொள்வார்கள். வடக்கு, கிழக்கில் பெரும்பாலும் அதிகமான நெல் உற்பத்தியைக் கொண்டிருக்கின்ற மட்டக்களப்பு, கிளிநொச்சி, மன்னார், அம்பாறை, திருகோணமலை, முல்லைத்தீவு, வவுனியா மாவட்டங்களிலும் யாழ்ப்பாண மாவட்டத்தில் நெல் உற்பத்தி செய்யப்படுகின்ற சில இடங்களிலும் நெல்லைக் களஞ்சியப்படுத்துவதற்கான வசதிகள் சரியான முறையில் மேற்கொள்ளப்படாமையும் இதற்குக் காரணமாகும். இதனால் உணவுப் பாதுகாப்பின்மை மற்றும் உணவு விநியோகத்தில் மிகப்பெரிய குறைபாடுகளை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கிறது. உணவுப் பாதுகாப்பு என்பது எவ்வளவு முக்கியமோ, அதேபோல அவற்றைக் களஞ்சியப் படுத்துவதற்கான வாய்ப்புக்களும் மிகமிகத் தேவையானவை என்பதை உணர்ந்துகொள்ள வேண்டும்.

ஒரு நாட்டினுடைய மிகப்பெரிய சக்தி கூட்டுறவுச் சங்கங்கள்தான். பல நாடுகளிலே இப்பொழுது Co-op City என்று வியாபார நிலையங்கள் இருப்பதைப் பார்க்கலாம். சுவிட்சர்லாந்து, கனடா, அமெரிக்கா ஆகிய நாடுகளில் Co-op Cities மிகப்பெரியளவில் பிரபல்யம் வாய்ந்தவையாக இருக்கின்றன. தனியாரோடு போட்டிபோட்டுத் தங்களுடைய நாட்டின் உற்பத்திப் பொருட்களை மக்களுக்குக் குறைந்த விலையில் வழங்குகின்ற அடிப்படையில் அந்தக் கூட்டுறவுச் சங்கங்கள் -Co-op Cities- மிகப் பிரபல்யமாகச் செயற்படுகின்றன. ஆனால், இலங்கையில் இந்தக் கூட்டுறவுச் சங்கங்கள் என்பது ஓர் அரசியல் மயப்படுத்தப்பட்டதாக, அரசியல் ரீதியாகக் கட்சிகளுக்குப் பின்னால் ஒழிந்திருக்கின்ற நிலையில்தான் இருக்கின்றன. கூட்டுறவுச் சங்கங்களுக்கான எரிபொருள் நிரப்பு நிலையங்களின் அனுமதியை வழங்குவதில்கூட, மாறிமாறி வருகின்ற அரசாங்கங்கள் சரியான நடைமுறைகளைப் பின்பற்றுவதில்லை; அவற்றுக்கான அனுமதி கொடுக்கப்படுவதில்லை. குறிப்பாக, பல கூட்டுறவுச் சங்கங்கள் எரிபொருள் நிரப்பு நிலையங்களுக்காக விண்ணப்பித்திருக்கின்றன. ஆனால், இந்த அரசாங்கமும் சரி, முன்னர் இருந்த அரசாங்கங்களும் சரி, இந்த எரிபொருள் நிரப்பு நிலையங்களுக்கான அனுமதிகளை வழங்காதிருக்கின்ற காரணத்தினால், அந்தக் கூட்டுறவுச் சங்கங்கள் தமது சேவைகளினூடாக வருமானத்தை ஈட்டிக்கொள்வதில் மிகப்பெரிய பின்னடைவுகளைச் சந்திக்கின்றன.

கௌரவ தவிசாளர் அவர்களே, இந்த நாட்டிலே மிகப்பெரிய யுத்தம் தமிழ் மக்கள்மீது கட்டவிழ்த்து விடப்பட்டிருந்த காலத்தில், மிகப்பெரிய பொருளாதாரத் தடை விதிக்கப்பட்டிருந்தது உங்களுக்குத் தெரியும். முட்டைக்குக்கூட அப்போதைய அரசாங்கம் தடை விதித்திருந்தது. சந்திரிகா அரசாங்கத்தோடு இதே JVP கட்சி இணைந்து ஆட்சி செய்த காலத்தில், சந்திரிகாவினால் வடக்கு, கிழக்குப் பகுதிகளுக்கு, குறிப்பாக வன்னிப் பகுதி மற்றும் வாகரை, மட்டக்களப்பு போன்ற பகுதிகளுக்கு உணவுப் பொருட்களைக் கொண்டுசெல்வதிலே மிகப்பெரிய தடை இருந்தது. அப்போது முட்டைகூடப் பொருளாதாரத் தடைக்குட்பட்ட ஒரு பொருளாக இருந்தது. அவ்வாறிருந்தபொழுது, கூட்டுறவுச் சங்கங்கள்தான் மிகப்பெரிய தடைகளுக்கும் சோதனைகளுக்கும் மத்தியில் தென்பகுதிக்கு வந்து பொருட்களைக் கொள்வனவு செய்து, அந்தப் பகுதி மக்களுக்கான உணவுப் பொருட்களை விநியோகம் செய்தன. அவ்வாறான கூட்டுறவுச் சங்கங்கள் அந்தக் காலத்தில் மதிப்போடு மக்களால் பார்க்கப்பட்டது. ஆனால், இன்று தமிழ்ப் பகுதிகளில் இருக்கின்ற கூட்டுறவுச் சங்கங்கள் ஏனைய தனியார் நிறுவனங்களோடு போட்டிபோட்டு வளரக்கூடிய வகையில் அவற்றுக்கான வல்லமையை, நிதி உதவியை அரசு கொடுக்கத் தவறுகின்றது.

குறிப்பாக, நான் வாழுகின்ற கிளிநொச்சி மாவட்டத்தில் கிட்டத்தட்ட 6 நுகர்ச்சிக் கூட்டுறவுச் சங்கங்கள் உண்டு. கரைச்சி கிழக்கு பலநோக்குக் கூட்டுறவுச் சங்கம் நான் வாழுகின்ற பிரதேசத்தில் அமைந்துள்ளது. அவர்கள் ஓர் எரிபொருள் நிரப்பு நிலையத்துக்காக விண்ணப்பித்து ஏழு வருடங்கள் கடந்திருக்கின்றன. ஏழு வருடங்களாகியும் அந்த எரிபொருள் நிரப்பு நிலையத்துக்கு அனுமதி வழங்கப்படவில்லை. கரைச்சி கிழக்கு பலநோக்குக் கூட்டுறவுச் சங்கம் உட்பட கரைச்சி வடக்கு பலநோக்குக் கூட்டுறவுச் சங்கம், கரைச்சி தெற்கு பலநோக்குக் கூட்டுறவுச் சங்கம், அக்கராயன் பலநோக்குக் கூட்டுறவுச் சங்கம், பூநகரி பலநோக்குக் கூட்டுறவுச் சங்கம் போன்ற சங்கங்கள் எல்லாம் சிறந்த முறையில் அவற்றைத் தகவமைத்துக்கொள்வதற்குப் படுகின்ற திண்டாட்டம் மிகப் பெரியது. இதேபோல, யாழ்ப்பாண மாவட்டத்தில் இருக்கின்ற 39க்கும் மேற்பட்ட பலநோக்குக் கூட்டுறவு சங்கங்கள் அவற்றின் இயலுமைக்குகூடாக மக்களுக்குச் சேவையை வழங்க முடியாமல் இருக்கின்றன. குறிப்பாக, நெல் அறுவடை நடைபெறுகின்ற காலத்தில் அந்தச் சங்கங்கள் நெல்லைக் கொள்வனவு செய்து அரிசியாக மாற்றிக் கொடுக்கக்கூடிய வல்லமையைக் கொண்டிருக்கின்றன. ஆனால், அரசினால் அதற்குரிய நிதி உதவிகள் அந்தச் சங்கங்களுக்கு வழங்கப்படுவதில்லை. அதனால், அந்தச் சங்கங்கள் சிறந்த முறையில் தம்மை உருவமைத்துக்கொள்ள முடியாமல் இருக்கின்றன.

கூட்டுறவுச் சங்கங்கள் என்பது நான் முதலில் கூறியதுபோல, இந்த நாட்டினுடைய மிகப் பலம்வாய்ந்த சக்தியாகும். அந்தச் சக்தியைச் சரியான முறையில் அடையாளம் காண அரசு தவறியிருக்கின்றது. 2015 - 2019 காலத்திலே மங்கள சமரவீர அவர்கள் நிதி அமைச்சராக இருந்தபோது, வடக்கு, கிழக்கில் இருக்கின்ற கூட்டுறவுச் சங்கங்கள் தொடர்பாகச் சற்றுக் கரிசனை செலுத்தப்பட்டு, விசேட திட்டமும் கொண்டுவரப்பட்டது. ஆனால், அது அப்படியே கிடப்பிலே கிடக்க விடப்பட்டது. 'பனை நிதியம்' எனும் ஒரு திட்டமும் பேசப்பட்டது. அந்த நிதியமும் உருவாக்கப்படவில்லை; அந்த கூட்டுறவுச் சங்கங்களுக்கான புதிய வடிவமைப்புகளும் உருவாக்கப்படவில்லை.

கௌரவ தவிசாளர் அவர்களே, சமூகத்தின் மக்களுடைய எழுச்சி என்பது, அவர்களுடைய வாழ்க்கை முறை, உணவு மற்றும் வளங்கள் போன்றவற்றை அடிப்படையாகக் கொண்டுள்ளது. ஒரு மனிதனுடைய வாழ்க்கைக்கு அடிப்படைத் தேவைகளான உணவு, உறையுள் என்பன மிக

[ගරු සිවඥානම් ශ්‍රීධරන් මහතා]

முக்கியமானவை. ஆகவே, இந்த உணவு என்ற விடயத்திலே கூட்டுறவுச் சங்கங்களை நீங்கள் சரியாக வழிநடத்தத் தவறியிருக்கிறீர்கள் என்பதை நான் மீண்டும் பதிவுசெய்கிறேன். ஆகவே, அமைச்சினால் இந்த விடயத்தில் முக்கிய கவனம் செலுத்தப்பட வேண்டும்.

இங்கே சில நாட்களாகப் பட்டலந்த சித்திரவதை முகாம் பற்றிய செய்திகள் பரவலாகப் பேசப்படுவதை அவதானிக் கக்கூடியதாக இருந்தது. உங்களுடைய அனுமதியோடு அது தொடர்பில் சில வார்த்தைகளை நான் பேச விரும்புகிறேன். பட்டலந்த என்பது 1988 -1989ஆம் ஆண்டுகளில் இந்த நாட்டிலே இருந்த JVP போராளிகள் கைது செய்யப்பட்டு, சித்திரவதை செய்யப்பட்டுப் படுகொலை செய்யப்பட்ட ஓர் இடமாகும். அது தொடர்பில் தயாரிக்கப்பட்ட அறிக்கை இவ்வளவு காலமும் கிடப்பிலே கிடந்து, அண்மையில் அல்-ஜஸீரா தொலைக்காட்சிக்கு முன்னாள் ஜனாதிபதி ரணில் விக்கிரமசிங்க அவர்கள் வழங்கிய பேட்டிக்குப் பிற்பாடு இப்போது வெளிவந்திருக்கின்றது. ஆனால், ஒன்றை நான் குறிப்பிட விரும்புகின்றேன். 1988 -1989 காலப்பகுதியில் இடம்பெற்ற JVPஇனர் மீதான படுகொலை தொடர்பாக முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஐக்கிய நாடுகள் சபையில் ஓர் அறிக்கையைச் சமர்ப்பித்திருந்தார். அதாவது, JVPஇனர் படுகொலை செய்யப்பட்டது தொடர்பான செய்தியை வெளிக்கொண்டு வந்திருந்தார். ஆனால், அந்தக் காலத்திலும் இதற்கான தீர்வுகள் எட்டப்படவில்லை.

அடுத்துவந்த ஆண்டுகளில் JVPஇனர் சந்திரிகாவோடு சேர்ந்து ஆட்சி செய்தபோதும் இந்தப் பட்டலந்த படுகொலைகள் தொடர்பாக எந்தவிதமான செய்திகளையோ, கோரல்களையோ முன்வைக்கவுமில்லை, மூச்சுக் காட்டவுமில்லை. அது ஏனென்பது தெரியவில்லை. ஆனால், இப்பொழுது அந்த விடயத்தை முன்னெடுத்திருப்பது நியாயபூர்வமானது. இந்த நாட்டிலே படுகொலை செய்யப்பட்ட இளைஞர்கள், யுவதிகள் தொடர்பில் ஒரு விசாரணை வேண்டும்; அதற்கான நீதி வேண்டும். கதிர்காமத்து அழகி மனம்பேரியை சொந்தச் சகோதரர்களான இராணுவத்தினரே நிர்வாணமாக்கிப் படுகொலை செய்தார்கள் என்பது உலக வரலாற்றில் மிகக் கேவலமான ஒரு பதிவு. இதனை நான் அடிக்கடி இந்தச் சபையிலே குறிப்பிட்டிருக்கிறேன். அதற்கு நீதி வேண்டுமென்று நான் பல தடவை சொல்லியிருக்கிறேன்.

அதேபோல, தமிழ்த் தேசிய இனம் சார்ந்த இசைப்பிரியா, கிருஷாந்தி போன்றவர்கள் பாலியல் வன்புணர்வுக்குப் பின்னர் ஸ்ரீலங்கா இராணுவத்தால் படுகொலை செய்யப்பட்டார்கள். அவர்களுக்கான நீதி விசாரணைகளையும் நாங்கள் கோருகின்றோம். தமிழர்கள்மீது நடத்தப்பட்டது மிகப் பெரிய இனப் படுகொலை! ஆனால், சிங்கள மக்களுடைய எழுச்சி, கிளர்ச்சிகளுக்கு எதிராக இவ்வாறான வதைமுகாம்கள் உருவாக்கப்பட்டிருந்தன. கடந்த 80 வருட காலத்தில் தமிழர்கள்மீது படிப்படியாக பல இடங்களிலே இவ்வாறான படுகொலை முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. குறிப்பாக, 1956 - 1958களில் இலங்கையில் தமிழினம்மீதான மிக பாரிய இனப் படுகொலைகள் பதிவுசெய்யப்பட்டிருக்கின்றன. அதேபோல, 1970களில் நடந்த மிகப் பெரிய இனப் படுகொலைகளையும் பதிவு செய்திருக்கிறார்கள். 1983ஆம் ஆண்டிலே நடந்த பாரிய யூலை படுகொலை என்பது மிகப் பெரிய இனப் படுகொலையாக உலக அரங்கிலே பார்க்கப்படுகின்றது. அதற்குப் பிற்பாடு இந்த நாட்டிலே 2006இலே வாகரையிலே நடந்த இனப் படுகொலையும், 2009ஆம் ஆண்டு முள்ளிவாய்க்காலிலே நடந்த இறுதி இனப் படுகொலைகள் என்பனவும் மிக முக்கியமானவை. இவற்றுக்கான விசாரணைகள் எதுவும் நடைபெறவில்லை.

கௌரவ தவிசாளர் அவர்களே, நாங்கள் பாதிக்கப்பட்ட ஓர் இனம்; நாங்கள் அழிக்கப்பட்ட ஓர் இனம். நான் ஏற்கனவே சொன்னதுபோல, உணவுகூட அனுப்பாமல் கொல்லப் பட்டவர்கள் தமிழர்கள்! இறுதி யுத்தம் நடந்தபோது 420,000க்கும் மேற்பட்டவர்கள் முள்ளிவாய்க்கால், முல்லைத்தீவுப் பகுதிகளில் இருந்தார்கள். ஆனால், 70,000 பேர்தான் இருக்கின்றார்கள் என அப்போதிருந்த பாதுகாப்புச் செயலாளர் கோட்டாபய ராஜபக்ஷ அவர்களும் அப்போதைய ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களும் கூறி, 70,000 பேருக்கான உணவுப் பொருட்களை அனுப்பினார்கள். 420,000 பேர் இருந்தபொழுது 70,000 பேருக்கான உணவுகள் அனுப்பப்பட்டிருந்தால் எத்தனைபேர் பட்டினியால் கொல்லப்பட்டிருப்பார்கள்! இது ஓர் இனம் மீதான - தமிழ்த் தேசிய இனம்மீதான மிகப் பெரிய இனப் படுகொலையாக இந்த உலகத்திலே பார்க்கப்படுகின்றது. இந்த விடயம் தொடர்பிலே கனடா நாடு அதனுடைய கரிசனையைக் கொண்டிருக்கின்றது. கனடாவிலே இருக்கின்ற இரண்டு கட்சிகளின் தலைவர்கள், இங்கு நடைபெற்றது இனப்படுகொலை என்பதைத் தாங்கள் ஏற்றுக்கொள் கின்றோம் என்று சொல்லுகிறார்கள். சர்வதேச அடிப்படையிலே இந்த விஷயங்கள் பேசப்படுகின்றன.

இன்று மனித உரிமைகள் ஆணைக்குழுவினுடைய அமர்வுகள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. இந்த அமர்வுகளின்போது இலங்கை பற்றிய விடயங்கள் பேசப்படுகின்றன. ஆனால், இங்கு நடைபெற்றது ஓர் இனப்படுகொலை அல்லவென நீங்கள் வாதிடுகின்றீர்கள்; நீங்கள் அது தொடர்பாகப் பேசுகின்றீர்களில்லை. ஆனால், இங்கு நடைபெற்ற பட்டலந்த வதைமுகாம் படுகொலைகள் பற்றி பேசுவதற்குத் தயாராகிறீர்கள். நாங்கள் அதை எதிர்க்கவில்லை; அதற்கான விசாரணை வேண்டும். யார்மீது குற்றம் நடந்ததோ, யார் அநியாயமாகக் கொல்லப் பட்டார்களோ, யார் நீதிக்குப் புறம்பாகக் கொல்லப் பட்டார்களோ, யார் நீதியின் கண்களுக்கு முன்னால் சித்திரவதை செய்யப்பட்டார்களோ, அவர்களுக்கான நீதி வேண்டும் என்பதை நாங்கள் தமிழர்களாக, வதைப்பட்ட, வலியுணர்ந்த மக்களாக வலியுறுத்துகின்றோம். அதேநேரம், தமிழர்கள்மீது நடந்த இந்த இனப்படுகொலைகள் தொடர்பிலே, தமிழ்த் தேசிய இனத்தின்மீதான படுகொலைகள் தொடர்பிலே ஏன் இந்த அரசு சரியான ஒரு முடிவை எடுக்கமுடியாமல் இருக்கின்றது?

2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் இந்த நாட்டின் வெளிநாட்டலுவல்கள் அமைச்சராக இருந்த மங்கள சமரவீர அவர்கள் நேரடியாக மனித உரிமைகள் ஆணையகத்திலே சொன்னார், "நீங்கள் எடுக்கின்ற முடிவுகளுக்கு நாங்கள் ஒத்துழைப்பு வழங்குகின்றோம். சர்வதேச prosecutorsஐக் கொண்டுவருவதற்கு நாங்கள் அனுமதிக்கின்றோம்; பன்னாட்டு நீதியாளர்களின் ஆலோசனையைப் பெறுகின்றோம்; இந்த technical supportஐ நாங்கள் எடுத்துக் கொள்கின்றோம்; தமிழ் மக்கள்மீது நடைபெற்ற இனப்படுகொலைக்கு ஒரு நீதியைக் காண்பதற்கு நாங்கள் கலப்புப் பொறிமுறையைக் கையாள்கின்றோம்" என்று. அவர் அதனை ஏற்றுக்கொண்டார். ஓர் அரசு இருக்கும்பொழுது இவற்றை ஏற்றுக் கொண்டார்கள்; இன்னோர் அரசு வரும்பொழுது இல்லையென்கிறார்கள்.

கோட்டாபய ராஜபக்ஷ அவர்கள் பதவிக்கு வந்தபோது அதனை நிராகரித்தார்; இந்த அரசினரும் இதனை எதிர்த்து, நிராகரித்திருக்கிறார்கள்.

உங்களுக்குத் தெரியும், நாங்கள் இந்த மண்ணிலே உங்களோடு சேர்ந்து வாழ விரும்புகின்றோம் என்பது. நாங்கள் இதனைப் பல தடவை பதிவு செய்திருக்கின்றோம்; இப்பொழுதும் சொல்லுகின்றோம், நாங்கள் இந்த மண்ணிலே உங்களோடு சேர்ந்து வாழ விரும்புகின்றோம். ஆனால், நீங்கள் நீங்களாகவும் நாங்கள் நாங்களாகவும், எங்களுடைய தனித்துவங்கள், அடையாளங்கள் நிராகரிக்கப்படாமல் வாழ்வதற்கான ஓர் உரிமை எமக்கு இருக்க வேண்டும். அது சமஷ்டி அடிப்படையிலான ஓர் அரசியல் தீர்வின் மூலமாகத்தான் அமைய முடியும். இலங்கையின் ஒற்றையாட்சி முறைமைக்குள் ஓர் இனத்தை மற்றோரினம் சுரண்ட முடியாமல், ஓர் இனத்தை இன்னோர் இனம் கபளிகரம் செய்ய முடியாமல், ஓர் இனத்தை இன்னோர் இனம் அடக்காமல் இருப்பதற்கான வழிமுறை என்பது உருவாக முடியாது. சமஷ்டி அடிப்படையிலான அரசியல் தீர்வு என்பது, ஒரே நாடாக இருந்து, அந்த நாட்டிலே வாழுகின்ற பல்தேசிய இனங்களை அரவணைத்துச் செல்வதற்கான மிகப் பெரிய பாதையாக மாறும்.

பட்டலந்த வதைமுகாம் பற்றிய செய்தி எல்லோருடைய இரத்தங்களையும் உறைய வைத்திருக்கின்றது. அங்கே நடந்தது குற்றமென்றால், அந்தக் குற்றம் நிரூபிக்கப்பட வேண்டும்; உரியவர்கள் கைதுசெய்யப்பட வேண்டும்; தண்டிக்கப்பட வேண்டும் என்பதில் எங்களுக்கு மாற்றுக் கருத்து இல்லை. நாங்கள் அதை நியாயமாக ஏற்றுக் கொள்கின்றோம். அதேபோல, நவாலி சென். பீற்றர்ஸ் தேவாலயத்தின்மீது குண்டுத் தாக்குதல் மேற்கொள்ளப்பட்டு 150க்கும் மேற்பட்ட பொதுமக்கள் கொல்லப்பட்டதை விசாரணை செய்ய ஏன் நீங்கள் தயங்குகின்றீர்கள்? நாகர்கோவிலில் மக்கள்மீது நடந்த படுகொலைகளை விசாரிக்க ஏன் தயங்குகின்றீர்கள்? மண்டைதீவிலே கொல்லப்பட்ட மக்களைப்பற்றி ஏன் நீங்கள் சிந்திக்கத் தயங்குகிறீர்கள்? குமுதினிப் படகிலே கொல்லப்பட்டவர்களுக்கு என்ன நீதி கிடைத்திருக்கின்றது? குருநகர் கடலிலே கொல்லப்பட்டவர்களுக்கு என்ன நீதி கிடைத்திருக்கின்றது? கொக்கட்டிச்சோலையிலே கொல்லப்பட்டவர்களுக்கு என்ன நீதி கிடைத்திருக்கின்றது? வாகரையில் கொல்லப்பட்டவர்களுக்கு என்ன நீதி கிடைத்திருக்கின்றது? திருகோணமலையில், நெடுங்கேணி - ஒலுமடுவிலே, அம்பாறை மாவட்டத்திலே, கொத்துக் கொத்தாகப் பல இடங்களில் கொல்லப்பட்டு அழிக்கப்பட்டிருக்கிறார்கள்.

இந்தப் படுகொலைகள்மூலம் தமிழ்த் தேசிய இனம் தன்னுடைய நிலங்களை இழந்திருக்கின்றது. அந்தத் தமிழ்த் தேசிய இனத்தினுடைய பல இடங்கள் இன்றும் மீளக்குடியேற முடியாமல் இருக்கின்றது. பிடித்து வைத்திருக்கின்ற நிலங்களை வழங்குகின்றார்களில்லை. இதுகூட ஓர் இனஅழிப்பு! இன்றும்கூட வலிகாமம் வடக்கில் 13 கிராம அலுவலர் பிரிவுகளிலுள்ள 3,000 ஏக்கர் வரையான காணிகளிலிருந்து 1990ஆம் ஆண்டில் இடம்பெயர்ந்த மக்கள் - அது அவர்களுடைய சொந்த நிலமாகவிருந்தும் - குடியேறுவதற்கு முடியாமல் இருக்கின்றார்கள். தங்களுடைய சொந்த இடத்திற்குப் போக முடியாமல், சொந்த நிலத்தில் வாழ முடியாமல், அந்த இனம் தடுக்கப்பட்டுள்ளது. இது கட்டமைக்கப்பட்ட ஓர் இனவழிப்பாகும். இது தொடர்ந்தும் நடைபெறுகிறது. ஆனால், அங்கு பௌத்த விகாரைகளை அமைக்கின்றார்கள். அவ்வாறு அமைத்துவிட்டு அங்குள்ள காணிகள் அந்தப் பௌத்த விகாரைக்குச் சொந்தமானது என்கின்றார்கள்; அந்த இடங்களைப் பறிக்கின்றார்கள்; அங்கு இன்னும் இன்னும் இடங்கள் எடுக்கப்படுகின்றன. அப்படியென்றால், இந்த நாட்டினுடைய நீதி என்ன? இதற்கான நீதி எவ்வாறு கிடைக்குமென்று நான் கேட்கின்றேன்.

அண்மையில்கூட யாழ்ப்பாணம் செம்மணி இடுகாட்டிலே மனித எச்சங்கள், மனித எலும்புக்கூடுகள் எடுக்கப்பட்டன. அதற்குரிய நீதி இன்னும் கிடைக்கவில்லை. அதுபோல், இரண்டு ஆண்டுகளுக்குள் முல்லைத்தீவு - குமுழமுனைப் பிரதேசத்தில் வீதி அகலிப்புப் பணியைச் செய்கின்றபொழுது, கிட்டத்தட்ட 36க்கும் மேற்பட்ட மனித எச்சங்கள் கண்டெடுக்கப்பட்டிருக்கின்றன. இவை 2009ஆம் ஆண்டு இறுதி யுத்தத்தின்போது கைது செய்யப்பட்டு, உயிருடன் புதைக்கப்பட்டவர்களின் எச்சங்களாக இருக்கலாமெனத் தடயவியல் நிபுணர்கள் கூறுகின்றார்கள். வரிப்புலிச் சீருடை மற்றும் உள்ளாடைகளுடனும், இலக்கத் தகடுகளோடும் பெண் போராளிகளிக்குரிய எச்சங்கள் குமுழமுனைப் புதைகுழியிலிருந்து எடுக்கப்பட்டுள்ளன. அவர்கள் தாக்கப்பட்ட விதத்தைக்கூடத் தடயவியல் நிபுணர்கள் சொல்லியுள்ளார்கள், அவர்களுடைய வாய்கள் திறக்கப்பட்ட நிலையில் புதைக்கப்பட்டிருக்க வேண்டும் என்று. ஏனென்றால், அவர்களுடைய வாய்கள் திறந்தபடியிருந்தன. இது, அவர்கள் எவ்வளவு சித்திரவதை செய்யப்பட்டு, அரை உயிரோடு புதைக்கப்பட்டுப் படுகொலை செய்யப் பட்டுள்ளார்கள் என்பதையே காட்டுகிறது. கேட்கும்போதே மனிதனுடைய இரத்தம் உறையக்கூடிய அளவுக்கு நிகழ்வுகள் நடைபெற்றுள்ளன.

பட்டலந்த மட்டுமல்ல இந்த நாட்டிலுள்ள வதைமுகாம்! இலங்கையின் வடக்கு, கிழக்கின் பல பகுதிகளில் இவ்வாறான பல இடங்கள் இருந்திருக்கின்றன. திருக்கேதீஸ்வரத்தில் தோண்டினால் எலும்புக்கூடுகள் வருகின்றன; குமுழமுனையில் தோண்டினால் எலும்புக்கூடுகள் வருகின்றன. தமிழர்கள் வாழ்கின்ற எந்தப் பிரதேசத்தில் மண்ணைத் தோண்டினாலும் அவை தமிழர்களுடைய எலும்புக்கூடுகளைக் காணுகின்ற பிரதேசங்களாக மாறியுள்ளன. நாங்கள் பாதிக்கப்பட்டவர்கள்! இந்த மண்ணில் அழிக்கப்பட்ட ஒரு தனித்துவமான தேசிய இனத்தைச் சார்ந்தவர்கள்! இந்தத் தமிழ்த் தேசிய இனத்திற்காக நாங்கள் கேட்பது நீதி! அது நியாயபூர்வமானதாக இருக்க வேண்டும்; சர்வதேசச் சட்டங்களுக்குட்பட்டதாக இருக்க வேண்டும்; சர்வதேச விசாரணைக்கு உட்பட்டதாக இருக்க வேண்டும்; மனித நேயத்திற்கும், மனித உரிமைகளுக்கும் மதிப்பளிப்பதாக இருக்க வேண்டும்.

கௌரவ தவிசாளர் அவர்களே, மிகமிக முக்கியமாக நீங்கள் ஒன்றைப் புரிந்து கொள்ளுங்கள்! மனிதர்களைக் கொல்வதில் மிகப்பெரிய குற்றம் உணவு அனுப்பாமல் கொல்லுதலாகும். மக்கள்மீது 'பராச்' குண்டுகளையும் கொத்தணிக் குண்டுகளையும், பொஸ்பரஸ் குண்டுகளையும் வீசிக் கொல்லுதல், தடை செய்யப்பட்ட மிகப் பெரிய ஆயுதங்களைப் பாவித்தல் என்பன மனித குலத்திற்கு எதிரான மிகப்பெரிய போர்க் குற்றங்கள்! இவையனைத்தும் வாகரையிலும் முள்ளிவாய்க்காலிலும் மிகப்பெரிய அளவில் மேற்கொள்ளப் பட்டன. குறிப்பாக, முள்ளிவாய்க்காலில் 2009ஆம் ஆண்டில் நடைபெற்றது மனித குலத்திற்கு எதிராக நிகழ்த்தப்பட்ட போர்க் குற்றங்கள்! அங்கு வீசப்பட்ட கொத்தணிக் குண்டுகள், பொஸ்பரஸ் குண்டுகள், 'பராச்' குண்டுகளின் தாக்குதல்களிலிருந்து உயிர் தப்பிய மக்கள் பலர் இன்றும்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

அதன் அடையாளங்களுடன், பாதிக்கப்பட்ட அவயவங் களோடு வாழ்ந்து கொண்டிருக்கின்றனர். நான் பல தடவை இந்தச் சபையில் அதனைக் குறிப்பிட்டுள்ளேன்.

அதுபோல், படையினரிடம் உயிரோடு ஒப்படைக்கப்பட்ட பலரைக் காணவில்லை; அவர்களுக்கு நீதி கிடைக்கவில்லை. உணவு அனுப்பாமல் கொல்லப்படுவதென்பது மிகப் பெரிய சர்வதேச போர்க் குற்றம். நான் இங்கு ஏற்கனவே சொன்னதுபோல, 420,000 பேர் இருந்த இடத்தில், 70,000 பேர்தான் இருக்கிறார்களென்று குறைவாக உணவுகளை அனுப்பியதால், அதையும் பல தடவை இடைநிறுத்தி, இடைநிறுத்தி அனுப்பியதால் எத்தனை ஆயிரம் குழந்தைகள் பட்டினியால் கொல்லப்பட்டிருப்பார்கள்? முள்ளிவாய்க்காலில் தமிழர் புனர்வாழ்வுக் கழகம் காய்ச்சி வழங்கிய கஞ்சிக்காகச் சின்னஞ்சிறு குழந்தைகள் கிண்ணங்களுடன் வரிசையில் நின்றபோது 'பராச்' குண்டு வீச்சுக்கு அகப்பட்டு அவர்கள் கொல்லப்பட்ட வரலாறு அந்த மண்ணில் நடைபெற்றது. எனவே, பாதிக்கப்பட்ட இனத்தின் சார்பாக அதனை நேரடியாகக் கண்டவன் என்ற வகையில் கூறுகின்றேன், தயவுசெய்து இவை எல்லாவற்றுக்கும் நீதி விசாரணையைக் கொண்டு வாருங்கள்! அது அந்த மக்கள் நம்பக்கூடிய வகையில் அமைய வேண்டும்; மக்களுக்கு நம்பிக்கையைத் தர வேண்டும். மக்கள் நம்பக்கூடிய வகை என்பது, உலகம் ஏற்றுக்கொள்ளக்கூடிய வகை. அதுதான் உண்மையான சனநாயகமுள்ள, நீதியுள்ள நாட்டின் நல்ல செய்தியாக அமையும்.

பட்டலந்தவில் உங்களுடைய போராளிகளுக்கு நடந்ததை மாத்திரம் விசாரணைக்குட்படுத்துவது ஒருபக்கச் சார்பானதாக மாறும். நாங்கள் உங்கள்மீது மரியாதை கொண்டவர்கள்; 1971இலும், 1988, 1989களிலும் உங்களது அமைப்பில் இருந்தவர்களை JVP போராளிகளாகவே நாங்கள் பார்க்கிறோம்; பயங்கரவாதிகளாகப் பார்க்கவில்லை. JVP போராளிகள் கிளர்ச்சியாளர்கள் என்று சொல்லப்பட்டாலும், உங்களுடைய சகோதரர்கள் இந்த மண்ணிலே கொல்லப்பட்டபோது, அந்தச் செய்திகளைப் பார்த்து இரக்கப்பட்டவர்கள் நாங்கள்; உங்களுக்காகப் பேசியவர்கள் நாங்கள். களனி ஆற்றிலே கழுத்து வெட்டப்பட்ட நிலையில் பல JVP இளைஞர்களின் உடல்கள் மிதந்து வந்தபோது அவற்றைப் பார்த்துக் கவலைப்பட்டவர்களில் மிக முக்கியமானவர்கள் தமிழர்கள். அந்தக் காலத் தைப்போன்ற நிலைமை இன்றும் இருக்கின்றது. உங்கள் போராளிகளுக்கு நடந்த அநியாயங்களுக்கான விசாரணை வேண்டும். அப்பாவி இளைஞர்கள் யார் கொல்லப்பட்டிருந்தாலும், அதற்கான விசாரணை வேண்டுமென்பதில் நாங்கள் தெளிவாக இருக்கிறோம். ஆனால், இதன்மூலம் எமது இனத்துக்கு நேர்ந்தவற்றை வேறு திசைக்குக் கொண்டு செல்ல வேண்டாம். பட்டலந்த தொடர்பான விசாரணையினூடாக, இங்கு எமது இனத்துக்கு நடைபெற்றதெல்லாம் சிறிய அளவான கொலைகள்தான்; அங்கே இருந்ததெல்லாம் சின்னச் சின்ன வதைமுகாம்கள்தான் என்று உலகத்துக்குக் காட்ட முனையாதீர்கள்!

பட்டலந்த ஒரு வதை முகாம். அங்கு உங்களுடைய இனத்தவரே படுகொலை செய்யப்பட்டார்கள். ஆனால், எங்கள்மீது திட்டமிடப்பட்டு 80 வருடங்களாக மெல்ல மெல்ல இன அழிப்பு நடைபெற்றிருக்கின்றது; எங்களுடைய மக்களின் உயிர்கள் காவுகொள்ளப்பட்டிருக்கின்றன; பல இலட்சக்கணக் கானவர்கள் அழிக்கப்பட்டிருக்கின்றார்கள். எங்களுடைய நிலங்கள் பறிக்கப்பட்டிருக்கின்றன; எங்களுடைய கலாசாரம் அழிக்கப்பட்டிருக்கின்றது. எமது மக்கள் அழிக்கப்பட்ட வரலாறு மிக முக்கியமானது. ஓர் இனத்தின்மீது இன்னுமோர் இனத்தின் இராணுவம் நேரடியாகவே இனப் படுகொலை செய்தது. உணவு அனுப்பாமல் இனப் படுகொலை செய்தார்கள்; தடைசெய்யப்பட்ட ஆயுதங்களைப் பாவித்து இனப் படுகொலை செய்யப்பட்டார்கள். இவையெல்லாம் எங்கள்மீது நடைபெற்றன.

ஆகவே, இரண்டு தேசிய இனங்கள் இருக்கின்ற இந்த நாட்டில் தமிழ்த் தேசிய இனத்தின்மீது நடந்த படுகொலைகள் மிகமிகக் கருத்திலே கொள்ளப்பட வேண்டும். இதற்கான நீதி விசாரணை வேண்டும். பட்டலந்த என்ற சொல்லுக்கூடாக இங்கே நடந்த தமிழ் இனத்தின்மீதான இனப் படுகொலைகளைத் தயவுசெய்து மறைத்து விடாதீர்கள்! அது இன்று சர்வதேச அளவிலான ஒரு பேசுபொருள். மனித உரிமை ஆணையகம்கூட அதனைக் கருத்தில் எடுத்திருக்கின்றது; உலகத்தில் இருக்கின்ற பல நாடுகள் அந்த விடயத்தை இன்றும் கருத்தில் வைத்திருக்கின்றன. அதைவிட, இறுதி யுத்தம் நடந்தபோது, பல நாடுகள் தங்களுடைய செய்மதிகளுக்கூடாக - satellite ஊடாக - இங்கு நடந்த படுகொலைகளை மிகத் துல்லியமாகப் படம் பிடித்து வைத்திருக்கின்றன. ஒரு குண்டூசியைப் படம் எடுக்குமளவுக்கு அவர்களிடம் செய்மதிகள் உண்டு. அந்த வகையில், இன்று உலக நாடுகளிடம் உள்ள அது தொடர்பான ஆதாரங்கள், ஆவணங்கள் என்பதைவிட எங்களுடைய தமிழ் மக்களும் சாட்சியங்களாக இருக்கிறார்கள். எனவே, எமது மக்கள்மீதான - தமிழ்த் தேசிய இனத்தின்மீதான- படுகொலை தொடர்பில் சரியான நீதி விசாரணை வேண்டும்.

இந்த நாட்டிலே இருக்கின்ற சிங்கள இனத்தின் கலாசாரம், பண்பாடு, தனித்துவம் தேசிய அடையாளம் என்பவற்றை நாங்கள் மதிக்கிறோம். நாங்கள் உங்களோடு சேர்ந்து வரத் தயாராக இருக்கிறோம். அதேபோல், நீங்களும் தமிழர் களுடைய தனித்துவம், அவர்களுடைய தேசிய அடையாளம், நில அடையாளம், மொழி அடையாளம், கலாசார, பண்பாட்டு அடையாளம் என்பவற்றைத் தயவுசெய்து கருத்திற் கொள்ளுங்கள்! ஒரு தேசிய இனம் அழிக்கப்பட்டிருக்கின்றது; அதற்கான நீதி வேண்டும். அந்த நீதியை எவ்வாறு வழங்குவது என்பது பற்றிச் சிந்தியுங்கள்! பட்டலந்த விசாரணைகள் ஊடாக இதனை மறைக்காமல், தமிழர்களுக்கான நீதி விசாரணைக்குத் தயாராகுங்கள்! அதற்கு மிக முக்கிய சாட்சியங்களாக இருக்கின்ற வலிந்து காணாமல் ஆக்கப்பட்ட உறவுகளின் - அம்மாக்கள், அப்பாக்களின் - போராட்டம் 3,000 நாட்களைக் கடந்து தெருக்களிலே நடைபெறுகின்றது. நீங்கள் அவற்றையெல்லாம் கருத்திலே எடுத்து, நீதிக்கான கதவுகளைத் திறக்க வேண்டும்; அதனூடாக உண்மைகளை வெளிக்கொண்டுவர வேண்டுமென்று கேட்டு, நிறைவுசெய்கிறேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Wijesiri Basnayake. You have nine minutes.

[අ.භා. 12.03]

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

ගරු සභාපතිතුමනි, 2025 පුරවැසි අය වැයේ වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ කාරක සභා අවස්ථාවේ විවාදයේදී අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මේ රටේ තිබෙන ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. එය මේ රටේ සමස්ත ජනතාවගේ මූලික අවශ්‍යතා රාශියක් සපුරන අමාත්‍යාංශයක්. එවැනි වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂ පිළිබඳව තමයි අද අපි මේ විවාද කරන්නේ. මෙම අමාත්‍යාංශය යටතේ ආයතන 15ක් පමණ තිබෙනවා. එම ආයතන අතරින් මම සමුපකාරය හා සම්බන්ධ ආයතන පිළිබඳව කෙටියෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මොකක්ද මේ සමුපකාරය කියන්නේ? ජාත්‍යන්තර සමුපකාර සන්ධානය එය නිර්වචනය කරනවා, "සාමාජිකයන්ගේ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අවශ්‍යතා ළඟා කර ගැනීම සඳහා ස්වේච්ඡාවෙන් එකතු වුණු, ඒ වාගේම ප්‍රජාතාන්ත්‍රිකව පාලනය වන ව්‍යවසායකත්ව සංවිධානය" යනුවෙන්. මම එය කෙටි කළොත්, සමුපකාරය කියන්නේ, of the people, by the people, for the people. ඒ කියන්නේ, මිනිසුන් වෙනුවෙන්, මිනිසුන් සඳහා, මිනිසුන් විසින්ම නිර්මාණය කර ගත් ආයතනයක්. එය දැවැන්ත සංවිධානයක්. ගරු සභාපතිතුමනි, ලංකාවේ අපට "සමුපකාරය" කියන වචනය ඇහෙනකොට අපේ මනසේ ඇඳෙන, මතුවන චිත්‍රයක් තිබෙනවා. ඒ මොකක්ද? ඒ තමයි සොරකම් කරන, මීයෝ දුවන, මකුළු දැල් බැඳිච්ච, කුණු පිරිච්ච තැනක්. ඒක තමයි ලංකාවේ position එක. නමුත්, අපි ලෝකයේ සමුපකාර ව්‍යාපාරය දිහා බැලුවොත් ඒ සමුපකාර ව්‍යාපාරය මීට හාත්පසින් වෙනස් තත්ත්වයක තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, සමුපකාර ව්‍යාපාර තුළින් මානව අවශ්‍යතා - human needs - සියල්ල සපුරන්න අපට පුළුවන්.

ගරු සභාපතිතුමනි, ඔබතුමා කියවා ඇති, ඒබ්‍රහම් මාස්ලෝ කියන සමාජ විද්‍යාඥයා ඉදිරිපත් කරලා තිබෙන අවශ්‍යතා ධුරාවලි න්‍යාය - hierarchy of needs theory එක. එහි මනුෂ්‍යයෙකුගේ අවශ්‍යතා 5ක් ගැන කථා කරනවා. ඒ තමයි, physiological needs, safety needs, social needs, esteem needs සහ self-actualization needs. මෙන්න මේ 5ටම උත්තර දෙන්න පුළුවන් වෙළෙඳ මර්මස්ථානයක් විධියට සමුපකාරය අපට සඳහන් කරන්න පුළුවන්. මනුෂ්‍යයෙකුගේ උපතේ ඉඳලා මරණය දක්වා - from womb to tomb - සමුපකාරය තුළින් විශාල සේවාවක් සපයන්න පුළුවන්. ඒ නිසා තමයි අපි එයට, "විවිධ සේවා" - "multipurpose" - කියන්නේ. ගරු සභාපතිතුමනි, ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ විශාල මෙන්ම විවිධ මට්ටමේ සමුපකාර තිබෙනවා. මම ඒ සියල්ල ගැන කථා කරන්නේ නැහැ. අපි මේ රටේ තිබෙන විවිධ සේවා සමුපකාර සමිති ගත්තොත්, එහි සමිති ජාලයක් තිබෙනවා. අපි ඒවායේ තත්ත්ව විශ්ලේෂණයක් කළොත් මේ මොහොත වන විට විවිධ සේවා සමුපකාර සමිති 309ක් තිබෙනවා. ඒවායේ ආසන්න වශයෙන් සාමාජිකයන් ලක්ෂ 26ක් ගොනුගත වෙලා ඉන්නවා.

මේ තුළ රැකියා කරනවා, 22,000කට ආසන්න පිරිසක්. මේ තුළ තිබෙනවා, විවිධ ව්‍යාපාර ඒකක 6,772ක්. වාහන තිබෙනවා, 788ක්. ඒ විතරක් නොවෙයි. Mini Co-op City outlets 914ක් තිබෙනවා. Mega Co-op City outlets 32,000ක් තිබෙනවා. ඒක හරියට අපේ රටේ තිබෙන මහා පරිමාණයේ සමාගමක් වාගේයි. එය දැවැන්ත ආයතනයක්. දැවැන්ත වත්කම් ප්‍රමාණයක් තිබෙනවා. ලංකාවේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රධාන ව්‍යාපාරික මර්මස්ථාන පිහිටා තිබෙන්නේ නගරවල තිබෙන ප්‍රධාන උපාය මාර්ගික තැන්වල - strategic locationsවල. ගරු සභාපතිතුමනි, හැබැයි මේ සමුපකාරවලින් බොහොමයක් ඒවා අලාභයි. මොකක්ද ඒකට හේතුව? ඒ සමිති පාලනය කරන්නේ ඡන්දයෙන් පත් වන සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල විසින්. ඒවාට කවුද පත්වෙන්නේ? ඒ අයට නැහැ, visionary leadership එකක්. අන්න ඒක තමයි සමුපකාර ව්‍යාපාරය වළ පල්ලට යැමට ප්‍රධාන හේතුව විධියට අපි දකින්නේ. ඒ වාගේමයි සමුපකාර ව්‍යාපාරයේ කළමනාකරණ මණ්ඩල. ඔවුන් professionally not competent; ඔවුන් වෘත්තීමය වශයෙන් නිපුණතාවක් තිබෙන මිනිස්සු නොවෙයි. මෙන්න මේ කාරණා දෙක නිසා මූලික වශයෙන්ම මේ ව්‍යාපාරය පහළට වැටී තිබෙනවා. එහෙම නම්, ඒක අපි ඉහළට ගේන්න ඕනෑ. ඒ සඳහා strategy එකක් තිබෙන්න ඕනෑ. අපට පුළුවන්, මේ සමිතිවලට turnaround strategies දමන්න; ඒවා උඩු යටිකුරු කරන්න ඕනෑ. ඒ සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවටත්, සමුපකාර සේවක කොමිෂන් සභාවටත්, ඒ වාගේම පොල්ගොල්ලේ තිබෙන NICD එකටත් විශාල වගකීමක්, කාර්යභාරයක් පැවරෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ සමුපකාර පාඩු ලැබුවාට ජාත්‍යන්තරයේ තිබෙන සමුපකාර මොන වාගේ තත්ත්වයකද තිබෙන්නේ? ඒකට හොඳම උදාහරණය ඉන්දියාවයි. ඉන්දියාවේ අමුල් සමුපකාරය පටන් ගන්නේ 1946දී. කවුද ඒකට මූලාරම්භය දුන්නේ? Dr. Verghese Kurien. ඔහු පටන් ගන්නවා, ඉන්දියාවේ ක්ෂීර විප්ලවය. අන්න ඒකත් එක්ක අමුල් සමුපකාරය පටන් ගන්නවා. අමුල් සමුපකාරය හරහා අද වෙනකොට ඉන්දියාව ලෝකයේ විශාලතම කිරි නිපදවන්නා බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඉන්දියාවට එහෙම පුළුවන් නම් ඇයි අපට බැරි? අද දවසේ ඒ අමුල් සමාගම අයිති ගොවීන්ට. එහි සාමාජිකයන් ලක්ෂ 36ක් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. නවසීලන්තයේ ෆොන්ටෙරා සමාගම ගත්තොත්, ඒක අයිති වන්නේත් කිරි ගොවීන්ට. ඒකත් සමුපකාරයක්. එය ලෝකයේ කිරි වෙළෙඳ පොළට සියයට 30කට වැඩි ප්‍රමාණයක දායකත්වයක් ලබා දෙනවා. ජාත්‍යන්තරයේ සමුපකාර ඉහළට යනකොට ඇයි අපේ සමුපකාර පහළට වැටෙන්නේ? මොකද, ඒවා හොරු ගිලගෙන තිබෙනවා. සමුපකාරවලට ඡන්දයෙන් පත් වන සභාපතිවරුන්ට කෙටි කාලයකදී මොකක්ද වෙන්නේ? කෝටිපතියන්, ධන කුවේරයන් බවට පරිවර්තනය වෙලා ඔවුන් දිගින් දිගටම ඒ සමිතිවල සභාපති පුටුවල ඉන්නවා. ඒ නිසා අපේ සමුපකාර හොරු අරගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, තඹුත්තේගම සමුපකාර සමිතිය සතුව තිබෙන ඉන්ධන පිරවුම්හල අද එම සමුපකාරයට අයිති නැහැ. ඒකත් හොරු අරගෙන. ඒ විතරක් නොවෙයි. මේ ළඟම තිබෙනවා, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර සමුපකාර සමිතිය. හූවක දුරිනුයි එය තිබෙන්නේ. ඒ සමුපකාරය සතු රාජගිරියේ සපුමල් ප්‍රදේශයේ තිබෙන පර්චස් 39.32ක ඉඩම හොරු අරගෙන දැවැන්ත බිල්ඩින් හදලා ඒ ඉඩම අත්පත් කරගෙන තිබෙනවා. මෙන්න, ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ ඛේදවාචකය.

ගරු සභාපතිතුමනි, එහෙම නම් මෙන්න මේ තත්ත්වයෙන් අපි ගොඩ එන්න ඕනෑ. මේ රටේ අපි බලාපොරොත්තු වන නිෂ්පාදන ආර්ථිකයට දැවන්ත හයියක් මේ සමුපකාර ව්‍යාපාරය හරහා අපට ලබා දෙන්න පුළුවන්. ඒ සඳහා මේ මොහොතේදී සමුපකාර සම්බන්ධයෙන් කටයුතු කරන වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, පොල්ගොල්ලේ පිහිටි NICD එක, ඒ වාගේම සමුපකාරයට මානව සම්පත සපයන සමුපකාර සේවක කොමිෂන් සභාව යන ආයතන එකතු වෙලා, මේ සමුපකාරය ගොඩනඟන්න විශාල සැලැස්මක් සකස් කිරීම අවශ්‍යයි, strategic plan එකක් අවශ්‍යයි. මේ සඳහා අපි විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ටත් ආරාධනා කරනවා. අපි ඔක්කෝම එකතු වෙලා, මේ සමුපකාර ව්‍යාපාරය දියුණු කරලා, අපි බලාපොරොත්තු වන ලස්සන රට නිර්මාණය කරමු. ආසියාවේ ප්‍රබල රට, ඉතාම පිරිසිදු රටක් බවට මේ රට පරිවර්තනය කරමු.

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Rohitha Abeygunawardhana. You have 20 minutes.

[අ.භා. 12.13]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු සභාපතිතුමනි.

අද දවසේ විවාදයට ගැනෙන්නේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයයි. මේ රටේ ජීවත් වන ජනතාවට එදිනෙදා ජීවත් වෙන්න අවශ්‍ය කරන පහසුකම් සලසන ඉතාම වැදගත් අමාත්‍යාංශයක් තමයි, මේ අමාත්‍යාංශය. ගරු ඇමතිතුමා සභාවේ ඉන්නවා. එතුමාගේ කථාවටත් මම ඇහුම්කන් දුන්නා.

ගරු සභාපතිතුමනි, අද උදේ මම රූපවාහිනියෙන් "පත්තරේ විස්තරේ" වැඩසටහන බැලුවා. ගරු ඇමතිතුමනි, ඒ වැඩසටහන බලනකොට, එහි පැහැදිලිව කිව්වා, "කිරිපිටි මිල ඉහළට" කියලා. මම බැලුවාම, කිරිපිටි මිල ඉහළ යන බව කියන්නේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙන දවසේ. ඊයේ තමයි එය තීන්දු කරන්නේ. අද තමයි ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙන්නේ. මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන විවාද කරන දවසේමද කිරිපිටි මිල ඉහළ යන බවත් කියන්නේ? ඇයි, ඒක මේ අය වැය විවාදය පටන් ගන්න ඉස්සෙල්ලා කරන්න තිබුණා නේ. එහෙම නැත්නම්, අය වැය විවාදය ඉවර වුණාට පස්සේ කරන්න තිබුණා නේ. අප්‍රේල් 01වැනි දා සිට තමයි කිරිපිටි මිල ඉහළ යන්නේ.

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමාගේ ලග්නය මොකක්ද? කුම්භද? මම එහෙම අහන්න හේතුව තමයි, සමහර ලග්න තිබෙන අය ඉන්නවා, මේ දවස්වල වැඩිපුර දෝෂාරෝපණයට ලක් වෙන. ඒ අයට වැඩිපුර බැණුම් අහන්න වෙනවා. තමුන්නාන්සේ භාරව ඉන්න අමාත්‍යාංශයත් ලෙහෙසි නැහැ. හිතන්න එපා, ලෙහෙසියි කියලා. ඉතාම අමාරු වුණු අමාත්‍යාංශයක්. හොඳ කළත් වැරදි තමයි අහන්න වෙන්නේ. අර මම කිව්වේ ඒකයි, පොඩ්ඩක් ලග්න එලාඑල බලාගන්න කියලා.

හැබැයි, ඔබතුමන්ලා බේරා ගන්න ක්‍රමයක් තිබෙනවා. මම බැලුවා, ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා පසුගිය කාලයේ විපක්ෂයේ ඉන්නකොට කරපු කථාවක්. ඒ කථාවේ එතුමා පැහැදිලිව කියනවා, මේ රටේ සිටින අහිංසක දරුවන්ට කිරිපිටි අත්‍යවශ්‍යයි කියලා. දරුවන්ට ජීවත් වෙන්න අත්‍යවශ්‍ය දෙයක් තමයි කිරිපිටි, වැඩිහිටියන්ටත් එහෙමයි, එම නිසා කිරිපිටිවල මිල අඩු කරන්න ඕනෑය කියලා එතුමා කියන්නේ තඹුත්තේගමදී. එතුමා ඉපදුණු ගමේදී තමයි මේ කථාව කියන්නේ. ගරු ඇමතිතුමනි, එතුමා කියනවා, කිරිපිටි මිල සම්බන්ධයෙන් ආණ්ඩුවේ වගකීම මොකක්ද කියන එක. ආණ්ඩුවේ වගකීම තමයි, මෙවැනි අත්‍යවශ්‍ය දේවල් සඳහා බදු පැනවීමෙන් වැළකීම. එම නිසා ආණ්ඩුව මේවාට බදු පැනවීම නොකර ඉන්න ඕනෑ. මේවා ආනයනික භාණ්ඩ. අපි කිරිපිටි ආනයනය කරනවා. අපේ රටෙත් යම් ප්‍රමාණයක් හදනවා. නමුත් එතුමා කියනවා, මේ භාණ්ඩ සම්බන්ධයෙන් රජය බදු අය නොකර ඉන්න ඕනෑය කියලා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනා කරනවා, ගරු ජනාධිපතිතුමාව බේරාගන්න කියලා. ගරු ඇමතිතුමනි, මතක තබාගන්න, මුදල් අමාත්‍යාංශයේ ඉන්න නිලධාරින් කවුරුවත් ඡන්දය ඉල්ලන්නේ නැහැ කියලා. ඒ එක්කෙනෙක්වත් ඡන්දය ඉල්ලන්න ගමට යන්නේ නැහැ. මොකද, එහෙම ලණු කාපු අය අපි. දිරපු ලණු හොඳට අඹරලා, මුදල් අමාත්‍යාංශයේ හිටපු සමහර නිලධාරින් අපට හොඳට කවලා තිබෙනවා. ඒවා කාපු නිසා තමයි මම මේ දේවල් කියන්නේ. ඔබතුමන්ලා පරිස්සම් වෙන්න. ඔබතුමාට පුළුවන්, ජනාධිපතිතුමාව බේරාගන්න. මේ වනකොට මේ රටේ මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරුයි. අහිංසක දරුවෝ දිහා බලන තාත්තා කෙනෙකු හැටියටයි මම මේ දේවල් කියන්නේ. තමුන්නාන්සේට ජනාධිපතිතුමාවත් බේරාගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, එහෙම නැත්නම් ජනාධිපතිතුමා එදා කරපු කථාවේ මේ කොටස දාලා ආණ්ඩුවට පහර ගහනවා නේ.

ජනාධිපතිතුමා එදා කරපු කථාවේ එම කොටස දමනවා. ඊට පස්සේ කිරි පිටි මිල ඉහළ ගියා කියලා දමනවා. ග්‍රෑම් 400 කිරිපිටි පැකැට්ටුවක මිල රුපියල් 1,100යි. ඒ වාගේම, කිලෝවක කිරි පිටි පැකැට්ටුවක මිල රුපියල් 2,750යි. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ කාරණය ගැන වැඩි අවධානයක් යොමු කරලා, බදු මුදල අඩු කර කිරි පිටි මිල අඩු කරලා දෙන්න ඔබතුමාට පුළුවන්. මොකද, ඉදිරියේදී සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය එන්නේ. දැන් රාමසාන් කාලය. මේ කාලය ගැන හිතලා, තමුන්නාන්සේ ඇමතිවරයා හැටියට මම යෝජනාවක් කරනවා. ගරු ඇමතිතුමනි, අවංකව කිව්වොත්, අද වනකොට මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරුයි. හැබැයි, මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරුයි කියන එකෙන් මම අදහස් කරන්නේ අපේ කාලයේ ජීවත් වෙන්න ලෙහෙසි වුණාය කියන එක නොවෙයි. ඒ කාලයේත් ජීවත් වෙන්න අමාරුයි. ඒ කාලයේත් හාල්, පොල්, සීනි, පරිප්පු, පාන් ඇතුළු හැම දෙයකම මිල වැඩි නිසා මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරු වුණා. එලෙස ජීවත් වෙන්න අමාරු වෙච්ච මිනිස්සු මොකක්ද ඒ වෙනුවෙන් ගත්ත තීන්දුව? ඒ කාලයේ තිබිච්ච ඒ මිලත් එක්ක ජීවත් වෙන්න අමාරු හින්දා තමයි මිනිස්සු ඔබතුමන්ලාව බලයට ගෙනාවේ. ජනතාව බලන්නේ බලයේ ඉන්න අය කවුද කියලා නොවෙයි, බලයට ඇවිල්ලා අපට හොඳක් කරන්නේ කවුද, අපිට මේ රටේ නිදහසේ ජීවත් වෙන්න අයිතිය දෙන්නේ කවුද කියන එකයි. ඔබතුමන්ලා බොහොම පැහැදිලිව කිව්වේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ඇති කරනවා කියායි. නමුත්, මේ මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරුයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාම දන්නවා, අද හාල්වල තත්ත්වය මොකක්ද කියලා. ඔබතුමන්ලා ආණ්ඩුව ගන්නකොට රුපියල් 180ට, රුපියල් 200ට තිබුණු හාල් කිලෝවක මිල අද රුපියල් 250ට, රුපියල් 260ට, රුපියල් 270ට වැඩිවෙලා තිබෙනවා. මේ දවස්වල කිරි සම්බා හොයා ගන්නත් නැහැ. පොල් ගෙඩියක මිලත් මේ වාගේම වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මිනිස්සුන්ට මේ ජීවත් වීමේ අමාරුව තිබෙනවා, ගරු ඇමතිතුමනි. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මිනිස්සුන්ට ජීවත් වීමේ අමාරුව තිබෙන නිසා ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් ජනතාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න කියලා.

මම දැක්කා, හුහක් මන්ත්‍රීවරු ලක් සතොස ගැන කථා කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ඒකේ තිබිච්ච හොරකම් ගැන. ගරු ඇමතිතුමනි, මම කියන ඒවා ඇත්ත. නමුත් ඒවා හරිම තිත්තයි. මතක තියාගන්න, ආණ්ඩුවලට ව්‍යාපාර කරන්න බැහැ කියලා. ඔබතුමා අද දින හැන්සාඩ් වාර්තාව අරගෙන තියා ගන්න. ආණ්ඩු ව්‍යාපාර කරන්න ගියොත්, ආණ්ඩුවලට මේ නවීන ලෝකයත් එක්ක, මේ යන ක්‍රමවේදයත් එක්ක ඉදිරියට යන්න බැහැ. ඒ, ඇයි? මොකක්ද ඒකට හේතුව වෙන්නේ? අපි සතොසට දාන්නේ මිනිස්සුන්ව නේ. ඇට, මස්,

ලේ, නහර තිබෙන මිනිස්සු ඒකේ ඉන්නේ. ඔබතුමා කිව්වා, මේ වැටුපට සතොසට සේවකයන් එන්නේ නැහැ, මේ වැටුප හින්දා වෙන වැටුපක් තිබෙන රැකියාවක් හොයා ගන්නවා කියලා. සතොසේ ඉන්න මිනිස්සු එළියට දාන්න කියලා නොවෙයි මම තමුන්නාන්සේලාට මේ කියන්නේ. නමුත් මේක තමයි යථාර්ථය. සතොස ගැන කථා කරන්න ගියාම ඒකයි කියන්න තිබෙන්නේ.

සතොසෙන් ඔය කියපු භාණ්ඩවල මිල අඩු කළාය කිව්වා. නමුත්, බඩු මිල අඩු කළාය කිව්වාට සතොසෙන්මද මේ රටේ මිනිස්සු ඔක්කෝම බඩු ගන්නේ, ගරු ඇමතිතුමනි? ඔක්කොටම සතොසෙන් බඩු ගන්න පුළුවන්ද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
අඩුවට බඩු ගන්න පුළුවන්.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අබේගුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
බඩු මිල අඩු වෙලා තිබෙනවා. ඔබතුමා කියන එක හරි. සතොසට අල්ලපු ආයතනය මොකක්ද? "Food City" එක. සතොසට අල්ලපු ආයතනය තව කඩයක්. නමුත්, ඒ දෙකේ බඩු මිල වෙනස්. ගමට ගියාම ගමේ බඩු මිල වෙනස්. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ ජාලය තුළින් රටේ මිනිස්සුන්ට මේ සහනය දෙන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා මේ ගැන අවධානය යොමු කරන්න.

ගරු ඇමතිතුමනි, මම ඊළඟට ඔබතුමාට මේ කාරණය මතක් කරනවා. කවුරුවත් කථා කරන්නේ නැති දේවල් මේවා. ඒ තමයි මත්පැන් මිල. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පසුවත් මත්පැන් මිල ඉහළ ගියා. ගරු ඇමතිතුමනි, මම දන්න විධියට ඔබතුමා මත්පැන් පානය කරන්නේ නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අබේගුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
මෙතැන ඉන්න සමහර අය අඩියක් ගහනවා. *[බාධා කිරීමක්]* ගහනවා, ගහනවා. මමත් අඩියක් ගහනවා. මම එදාත් ඒ ගැන කිව්වා නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
අපි මත්පැන් මිල අඩු කරන්න තමයි try කරන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අබේගුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
මත්පැන් මිල අඩු කරන්න try කරන්න. මේ රටේ ඉන්නේ අහිංසක මිනිස්සු. මේ රටේ මිනිස්සුන්ව මත්පැන් පානය කරන එක එහෙම නවත්වන්න බැහැ; බෙල්ල මිරිකලාවත් නවත්වන්න බැහැ. මිනිස්සු මහන්සි වුණාම හවසට ඉඳලා හිටලා පොඩි අඩියක් ගහනවා. මහුල් ගෙදරකට ගියාම පොඩි අඩියක් ගහනවා. එහෙම මිනිස්සු නේ, මේ රටේ ඉන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක නවත්වන්න ඕනෑ නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අබේගුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
ඒක නවත්වන්න එපා. ඒක නවත්වන්න ගියොත් ඔබතුමන්ලාට එක ඡන්දයක්වත් හම්බ වෙන්නේ නැහැ. හොයලා බලන්නකෝ, සියදෙනෙක් අරගෙන ඒ සියදෙනාගෙන් කීදෙනෙක් බොනවාද, නැද්ද කියලා. මම කියන්නේ වැඩිපුර මත්පැන් බොන බේබද්දෝ ගැන නොවෙයි. මම මේ කියන්නේ සාමාන්‍යයෙන් මත්පැන් බොන අය ගැනයි, ගරු ඇමතිතුමනි. "සුරාබදු අඩු මිලට" කියලා දාලා තිබෙනවා මම දැක්කා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අදත් පත්තරයේ විස්තරයට කිව්වා, "සුරාබදු අඩු මිල බෝතලය ලත් තැනම ලොප් වෙයි" කියලා. තවම ඒක නැහැ. දැන් මිනිස්සු බලාගෙන ඉන්නවා, ඒක දෙනකම්. හුඟක් අය ගල් අරක්කු නේ බොන්නේ. ඒ නිසා ගල් අරක්කු බෝතලයට සමාන මොනවා හරි ඉල්ලනවා. එහෙමත් නැත්නම් මිනිස්සු කසිප්පු බොන්නේ. ගම්වල කසිප්පු වැඩි වෙලා. කසිප්පු බිව්වාම ඊට පස්සේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාට තමයි ලෙඩේ. කසිප්පු බිව්වාම ඊට පස්සේ මොකද වෙන්නේ? ඉස්පිරිතාලවල ගිහිල්ලා ඉන්නවා. *[බාධා කිරීමක්]* අම්මාපල්ල, මරු ඒවා ඔබතුමාත් කියන්නේ. ඔබතුමාත් ඉඳලා ඉඳලා පොඩි ඇඩ එකක් දානවා නේ. හරි. ඒ ඇඩ් එකත් මම පිළිගන්නම්කෝ. හොඳයි. මැදට ඇඩ් එකකුත් එන්න එපායැ. හරි. ඒ හින්දා ඒ ඇඩ් එකත් හොඳයි. ඒක ගෙනැල්ලා බිව්වොත් මදියි නේ. මම මේ කියන්නේ මත්පැන් මිල අඩු කරන්න කියන එක.

මිනිස්සු බොන එක නවත්වන්න බැරි නම්, රටේ අනික් මිනිස්සුන්ගේ දේවල්වලට ආදායම සොයා ගන්නේ බාර් විවෘත කරලා නම් කරුණාකරලා මම කියන මෙන්න මේ දේ ගැනත් සොයන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමාට තමයි මේ සියලු වෝදනා එන්නේ. ඔබතුමාගේ විෂය පථය නිසා අවසානයේ බණින්නේ වසන්ත සමරසිංහට; හාල් මිල වැඩි වුණත් බණින්නේ වසන්ත සමරසිංහට; හාල්වල ගුල්ලෝ හිටියත් බණින්නේ වසන්ත සමරසිංහට; පොල් ගෙඩිය අරගෙන හිරමණයට දාන්න බැරි වුණත් බණින්නේ වසන්ත සමරසිංහට. ඒක හැටියක්. ඔය ඇමතිකම මොකට දුන්නාද, මොකට ගත්තාද කියලාත් මට හිතෙනවා, මේ රටේ තිබෙන තත්ත්වය අනුව. *[බාධා කිරීමක්]* ඔව්, කරන්නත් එපා යැ. අභියෝගයක් නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා අභියෝග භාර ගන්න කෙනෙක්. අභියෝග භාර අරගෙන කටයුතු කරන තරුණ ඇමතිවරයාට මගෙන් දෙන උපදෙස් ටික තමයි මම මේ කියන්නේ. එම නිසා ගරු ඇමතිතුමනි, ඒ ගැන මම මතක් කරනවා. මොකද, අපි විපක්ෂයේ ඉන්නකොට වාගේ නොවෙයි, ආණ්ඩු බලය ගත්තාම, ගරු ඇමතිතුමනි. බලන්න, අපි මේ දවස්වල විපක්ෂයේ නේ. හරි නිදහස්. වෙනදාට උදේට telephone call එකක් එනකොට බුදු අම්මේ! බය වෙලා තමයි ඇහැරෙන්නේ. මොන තරම් භයානක දේවල්ද කථා කරන්නේ කියලා බලනවා. එහෙම තමයි. නමුත් දැන් එහෙම නැහැ. දැන් නිදහසේ ඇහැරෙන්න පුළුවන්. මොකද, දැන් අපි විපක්ෂයේ නේ. හැබැයි, විපක්ෂයේ ඉන්නකොට තරම් සුන්දර නැහැ, ආණ්ඩුවට ආවාම. විපක්ෂයේ ඉන්න තරම් සුන්දර නැහැ, ආණ්ඩුව භාර ගත්තාම. *[බාධා කිරීමක්]* කිව්වා, කිව්වා. ඒක තමයි. මේක හරි අමාරුයි. ගරු ඇමතිතුමනි, දැන් ඔය කරලා තිබෙන වැරැදි වැඩ ටික අල්ලන්න; ආපසු දෙන්න එපා කිසිම චාන්ස් එකක්; වැරදි කළ අය ඉන්නවා නම් හිටපු ඇමතිවරයාගෙන් පටන්ගෙන අවසානයේ කම්කරුවා දක්වා වනතුරුම දඬුවම් දෙන්න නීත්‍යානුකූලව -දේශපාලන වශයෙන් නොවෙයි- තීන්දු ගන්න. ඒකයි ඉතාම සුදුසු

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ක්‍රියාමාර්ගය. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම ඔබතුමාට ඒ ගැන කියන්නම්. විගණකාධිපතිතුමාත් ඉල්ලීම් කරනවා, යම් යම් දවස්වලට COPE එකේදි. ඒක ඔබතුමා දන්නවා නේ. ඔබතුමාත් ඒකේ හිටියා නේ. COPE එක එහෙම ඉල්ලීම් කරනවා. එහෙම ඉල්ලීම් කළා හැරෙන්න කිසිම දවසක මම COPE එක cancel කරලා නැහැ, කාගේවත් වුවමනාවට. ඒක මම වගකීමකින් කියනවා.

ගරු ඇමතිතුමනි, මේක අමාරුයි. ලෙහෙසි නැහැ. සමහර වෙලාවට විපක්ෂයේ ඉන්නකොට අපිත් එහෙම කළා. 1977 අවුරුද්දේ ඉඳන් 1994 අගෝස්තු 16වැනි දා වනතුරු අපිත් හිටියේ විපක්ෂයේ. තමුන්නාන්සේලාත් ඒ විපක්ෂය තුළම තමයි හිටියේ. විපක්ෂය ඇතුළේ ඉන්නකොට සමහර වෙලාවට කවුරු හරි ඉර ගැන කිව්වාම, අපි ඉර ගෙනැත් දෙන්නම් කියලාත් කිව්වා. හඳ ගැන කිව්වාම, හඳත් ගෙනැත් දෙන්නම් කිව්වා. හැබැයි, ඒ විපක්ෂයේ ඉන්නකොට. නමුත් මේ ආණ්ඩුව තුළට ඇවිල්ලා ඒක ක්‍රියාවෙන් කරනකොට තමයි මේකේ අමාරුකම තේරෙන්නේ.

ඔබතුමන්ලා හිතුවාද, උපාධිධාරින් 35,000ක් පොල්දූවට ඇවිල්ලා අඛණ්ඩ උපවාසයක් කරයි කියලා? මේ උපාධිධාරින් 35,000න් මම විශ්වාස කරනවා, අඩුම ගාණේ 30,000ක්වත් ඡන්දය දුන්නේ මාලිමාවට කියලා. නව රජයක්, නව වැඩ පිළිවෙළක්; උපාධිධාරියෙක් හැටියට මෙන්න අපට නිසි තැන ලබා දෙනවා කියන පණිවුඩය ලබා දුන්නා කියලා ඒ අය හිතුවා. ගරු ඇමතිතුමනි, ඒ අය අද මොකක්ද කරන්නේ? ඒ අය ඇවිල්ලා කියනවා, "අනේ, අපට රස්සාවක් දෙන්න" කියලා. මොකද, මේ රටේ උපාධිධාරින්ට හැම ආණ්ඩුවම රස්සා දීලා තිබෙනවා නේ. ඒ නිසා උපාධිධාරින්ට රස්සා දෙන්න කියලා ඉල්ලනවා. සමහර වෙලාවට මේවා සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නවා.

ගරු සභාපතිතුමනි, මට එක් සිද්ධියක් මතකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් ඒ සිද්ධිය මතක් කර ගන්න. කොතලාවල ඇකඩමිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට පනතක් ගේනකොට ජෝසප් ස්ටාලින් ඒකට විරුද්ධව වැඩ කළා. එතුමාගේ විරෝධතාව දැක්වූවා; strike කළා. විරෝධතාව දක්වනකොට අපි හිටපු ආණ්ඩුව මොකක්ද කළේ? එතුමාව උසාවි දාලා, උසාවියෙන් ඇප දුන්නාට පස්සේ ස්ටාලින් මහත්මයා සහ තව කට්ටියක් මුලතිව්වලට අරගෙන ගියා. ඒ මොකටද? නිරෝධායනයට. ඇප දීපු ජෝසප් ස්ටාලින් සහ ඒ කට්ටිය අරගෙන ගිහිල්ලා, මුලතිව්වල නිරෝධායන මධ්‍යස්ථානයට නිරෝධායනයට දැම්මා. ඒ මොකටද? පළිගැනීමේ හේතුවට. පළිගන්න. ගරු ඇමතිතුමනි, එහෙම පළිගන්න කටයුතු කරලා අන්තිමට මොකද වුණේ? ආණ්ඩුවකුත් නැති වුණා. මම මේ කිව්වේ එවැනි එක සිද්ධියක්. මම දැක්කා, ඒ උපාධිධාරින්ට විරුද්ධව 21වැනි දා වනතුරු ඔබතුමන්ලා වාරණ නියෝගයක් අරගෙන තිබෙනවා. උපාධිධාරින්ට තමන්ගේ හිතේ තිබෙන වේදනාව කියන්න ඉඩ දෙන්න. ඔබතුමාත් පාරේ හිටියා නේ. එතුමන්ලාගේ වේදනාව කියන්න ඉඩ දෙන්න. එහෙම නැතුව ඕවාට වාරණ නියෝග ගැනීම තුළින් තවත් මේ තුවාලය පැරෙන එක විතරයි වෙන්නේ. මම ඒකයි කියන්නේ ආණ්ඩු බලය ගත්තාම හරි අමාරුයි කියලා.

මම නම් දකින විධියට ඇමතිතුමා, ආණ්ඩුවත් හරියට මෙන්න මේ විධියයි. කොල්ලෝ විධියට ඉන්න කාලයේ යාළුවෝ වාගේ අපි එකට ඉන්නවා නේ. එහෙම ඉන්නකොට වේලාසනින් එක යාළුවෙක් කසාද බඳිනවාය කියලා අපි හිතමු. ඒ විධියට තව යාළුවෝ තුන් හතර දෙනෙකුත් කසාද බඳිනවා. යාළුවා බඳිනකොට ඒ මහුල් ගෙදරටත් අපි යනවා. ඒවා ඔක්කෝම කරලා, ඊට පස්සේ නෝනාට බබා හම්බ වුණාම බබා බලන්නත් බෝනික්කෝ එහෙම අරගෙන යනවා. මොකද, යාළුවන්ගේ ඒවා නේ. එහෙම ඉන්නකොට අපට ඇහෙනවා, අර යාළුවා ගෙදර නෝනා එක්ක පොඩි පොඩි හුටපට වෙනවා. නෝනා එක්ක බැණ ගන්නවා. දරුවෝ ලොකු වෙනවා. එතකොටත් බැඳලා නැති කෙනා ඉන්නවා නේ.

ඉතින්, තවම බැඳලා නැති එක්කෙනා කියනවා, "ඔයාලාට තේරෙන්නේ නැහැ, පවුල් ජීවිතේ හරියට ගතකරන්න. ඔයාට තේරෙන්නේ නැහැ, නෝනාට හරියට සලකන්න. ඔයාට තේරෙන්නේ නැහැ, දරුවෝ ටික බලාගන්න" කියලා. සමහර වෙලාවට එහෙම කියනවා නේ. එහෙම කියන්නේ බැන්දේ නැති කෙනා නේ. බැඳලා නැති කෙනා කියනවා, "මම බැඳලා හිටියා නම් මගේ නෝනාට කොච්චර ආදරේ කරනවාද? උදේට උම්මා එකක් දෙනවා, සවසට වැඩ ඇරිලා ආවාම උම්මා එකක් දෙනවා. ආදරෙන් බලාගන්නවා" කියලා. එහෙම කියලා වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඊළඟට ඒ කෙනා බඳිනවා නේ. ඒ කෙනා බැන්දාම මොකද වෙන්නේ? බැඳලා හනිමූන් යනවා; බැඳලා මුල් කාලයේ පොඩි ආදරයක් -love එකක්- තිබෙනවා. ඒ වාගේ තමයි ආණ්ඩුවටත් දැනට මාස හයයි නේ. තවම මාස හයයි. මේ මාස හයේ තවම love එක යනවා. ජනතාවත් එක්ක ආණ්ඩුව love එකේ යනවා. පොඩි, පොඩි ඒවා තිබෙනවා. තවම මාස හයයි නේ. දරුවෙක් ලැබෙන්නත් මාස නවයක් යනවා නේ. බඩත් වුට්ටක් ඇවිල්ලා නේ. ගරු ඇමතිතුමනි, දරුවෝ ලැබුණාට පස්සේ තමයි ප්‍රශ්න එන්නේ. දරුවෝ එක්කෙනෙක්, දෙදෙනෙක් හැදුවාම තමයි ප්‍රශ්න එන්නේ. අර කථාවක් තිබෙන්නේ, ගෙදර සුරතලයට හදන බැල්ලි පැටවුන් දැම්මාම සැරයි කියලා. ඒ වාගේ සැර වෙනවා. මතක තියාගන්න, මේකත් හරියට ඒ වාගේ තමයි. හිතන තරම් සුන්දර නැහැ. කසාද බඳින්න ඉස්සෙල්ලා හැමෝටම උපදෙස් දුන්නාට බැන්දාට පස්සේ තමයි ගෙදර ප්‍රශ්න තේරෙන්නේ. ලයිට් බිල්, වතුර බිල් ගෙවන්න ඕනෑ. දරුවන්ට උගන්වන්න ඕනෑ. කන්න දෙන්න ඕනෑ. නෝනාව සනසන්න, නෝනාව shopping එක්කගෙන යන්න ඕනෑ. මේ ඔක්කොම භාර ගන්න වෙනවා. ඒ වාගේ තමයි ඔබතුමාටත්. ඔක්කොම සනසන්න ඕනෑ. මුළු රටේම ඉන්න මිනිසුන් සනසන්න ඕනෑ. බඩගිනි වෙනකොට මතක් වෙන්නේ වසන්ත සමරසිංහව. හාල් කිලෝවක් ගෙනාපු තැනට හාල් ග්‍රෑම් 500ක් ගේන්න වුණාම වසන්ත සමරසිංහව තමයි මතක් වෙන්නේ. ඒ මතක් වීම තුළ ඔබතුමාට හොඳක් කියනවා ඇහෙනවා නම් අන්න හරි. අන්න ආණ්ඩුව සමත්. හැබැයි වැරදි කියනවා ඇහෙනවා නම්, ආණ්ඩුව අසමත් කියලා තමයි කියන්න තිබෙන්නේ. ඉතින්, ඔබතුමාට අභියෝගයක් භාර දීලා තිබෙනවා. මේ අභියෝගය භාර ගන්න, ඇමතිතුමා. මේ අභියෝගය භාර ගන්න.

ඔබතුමන්ලා දන්නවා, පසුගිය කාලයේ අරගළයක් තිබුණා කියලා. මේ රටේ මිනිස්සු ඒ ආණ්ඩුවට විරුද්ධව අරගළ කළා. අරගළ කරන්න සාධාරණ හේතුවක් තිබුණා. ඇයි? මිනිසුන්ට බෙහෙත් ටික ගන්න නැහැ; පෙට්‍රල් ටික ගන්න නැහැ, මිනිස්සු පෙට්‍රල් පෝලිමේදි මැරෙනවා. ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩ නැහැ, කන්න නැහැ, ජීවත් වෙන්න විධියක් නැහැ. ඉතින්, මිනිස්සු අරගළ කළා. හරි, ඒක සාධාරණයි. හැබැයි, අරගළ කරන ක්‍රමවේද දෙකක් තිබෙනවා. මම විශ්වාස කරන විධියට ගෙවල් ගිනි තියලා, මිනිස්සු මරලා, මේ රටේ සම්පත් විනාශ කරන එක නොවෙයි අරගළය කියන්නේ. ඔබතුමාත් ඒක විශ්වාස කරයි. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ආණ්ඩුවට විරෝධය දක්වන ක්‍රමවේද තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදයෙන් පිට ගිහිල්ලා කරන අරගළය ඇතුළේ ඉන්නේ සැබෑ අරගළකරුවන් නොවෙයි. සැබෑ අරගළකරුවෙක් ඉන්න පුළුවන්. නමුත් ඊට පිටුපසින් එන්නේ වෙන පෞද්ගලික හේතූන් මත ආපු මිනිස්සු.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යම් සිද්ධියක් මතක් කරන්නම්. දැනට දින දෙක තුනකට ඉස්සෙල්ලා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරියේ මොකක්ද සිද්ධ වුණේ? සංගීත සංදර්ශනයක් පැවැත්වුවා. මැදිරිගිරියේ සංගීත

සංදර්ශනය වෙලාවේ ගරු ඇමතිතුමනි, -මම ඒ ගායකයන්ගේ නම් කියන්නේ නැහැ- ගායකයින් ඇවිත් සිංදු කිව්වේ නැහැ කියලා ප්‍රශ්නයක් මතු වෙලා තිබුණා, ඔබතුමා දකින්න ඇති. ඒ සංගීත සංදර්ශනය පැවැති ස්ථානයේ තිබුණු භාණ්ඩ ඔක්කොම කුඩු කළා. Sound system එක එල්ලා තිබෙන rack ටික වැට්ටුවා. ඒක මිනිස්සු ඉන්න තැනකට වැටුණා නම් ඇමතිතුමනි, අද අය වැය ගැන නොවෙයි කථා කරන්න වෙන්නේ. මුළු රටේම කථා කරන්න වෙන්නේ ඒ බේදවාචකය ගැන. එතැන මිනිස්සු හිටියා නම්, අඩුම ගණනේ 40ක්, 50ක් මැරෙනවා ඒකට යට වෙලා. මේ මොකක්ද වෙන්නේ? මේ අපි දැකපු දේවල්වල පෙරනිමිති, සෙවණැලි එන්නේ. මේවාට ඉඩ තියන්න එපා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තිබෙන්නේ කියලා අපි මේවායින් සතුටු වෙන්න නොවෙයි මේවා කියන්නේ. මේවාට ඉඩ තියන්න එපා. මේවාට ඉඩ තැබුවොත් තමුන්නාන්සේලාටත් බැරි වෙනවා මේවා වළක්වන්න. රටක නීතියක් තිබෙන්න ඕනෑ. ඊයේ පෙරේදාත් ජනාධිපතිතුමා කිව්වේ නීතියට අපි හැමෝම යටත් වෙන්න ඕනෑය කියලායි.

නීතියට යටත් වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ සිද්ධිය නිසා ඒ මිනිසුන්ට සිදුවූ අලාභය කෝටි හතරක් වෙනවා. කෝටි හතරක අලාභයක්. මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. හැබැයි, නීතිය ක්‍රියාත්මක කරද්දී බලන්න ඕනෑ, මොකද වෙන්නේ කියලා. දවස් හතරක් පහක් ගිහින් මෝසමක් දැම්මාම ඒගොල්ලන්ට ඇප දෙනවා. ඇප දීලා අවුරුදු 20ක්, 25ක් ගත වෙනවා, නඩුව ඉවර වෙන්න. එතකොට වෙන්න ඕනෑ දේවල් වෙලා ඉවරයි. හැබැයි, තව කෙනෙකුට මෙවැනි තැනකට ගිහිල්ලා මෙවැනි කටයුතු කරන්න ඉඩ තියන්න එපා. මේ යන විධියට අපට බයක් තිබෙනවා, ඇමතිතුමනි. මේ විධියට සෙල්ලම් කරන්න ලැහැස්ති වුණොත් මොකද වෙන්නේ? කෙනෙක් මළාට පස්සේ හත් දවසෙත් බණ කියලා දානය දෙනවා; තුන් මාසයෙනුත් බණ කියලා දානය දෙනවා. වැරදිලාවත් හාමුදුරුවෝ බණ කියන්න ආවේ නැත්නම් මේ යක්කු ගෙදර මිනිසුන්ටත් ගහලා යයි. එවැනි තත්ත්වයක් තිබෙන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, රටට පස්සේත් සංගීත සංදර්ශන තිබුණා. සමහර සංවිධායකයන්ගේත් වගකීමක් තිබෙනවා, ටිකට් එක ගත්තු කෙනාගේ ඒ ටිකට් එකට සාධාරණය ඉෂ්ට කරන්න. එහෙම නොවුණාම තමයි මේ ප්‍රශ්න ඇති වෙන්නේ. මේකෙදි නීතිය ක්‍රියාත්මක කිරීම පැත්තෙන් ගත්තාම, මේ වනවිටත් ඒ සිදුවීමට අදාළ 11දෙනෙකු අත්අඩංගුවට අරගෙන නීතිමය කටයුතු ක්‍රියාත්මක වෙනවා කියන කාරණය මම මතක් කරන්න ඕනෑ. නීතිය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අපි ආණ්ඩුවක් හැටියට වගකීමෙන් බැඳෙනවා. ඒ සිද්ධීන් පිළිබඳව අපි ඉතා අවධානයෙන් ඉන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

බොහොම ස්තුතියි, ඇමතිතුමා. රටට පස්සේත් සංගීත සංදර්ශන තිබුණා. ඒවායේ මේ වාගේ සිදුවීමක් වුණේ නැහැ. මම කියන්නේ අපි මේ එක සිදුවීමකින් තව සිදුවීමකට අනුබල නොදිය යුතුයි කියලායි. අපි අනුබල නොදිය යුතුයි. ඒ අයට නිසි දඬුවම දෙන්න ගත යුතු නීතිමය ක්‍රියාමාර්ග සහ ඒකට සම්බන්ධ වුණු අයට අවශ්‍ය පියවර ගන්න ඕනෑ. ඒ සිදුවීම අපි දැක්කා නේ. ඒ වීඩියෝ තිබෙනවා නේ. වීඩියෝ කර ගත්තු ඒවා තිබෙනවා. ෆෝන්වලින් වීඩියෝ කරපු ඒවා සමාජ මාධ්‍යවල සැරිසරනවා. ඒ සිද්ධියට අදාළ හැම කෙනෙකුටම නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. මොකද, මිනිසුන් සතුටින් ඉන්න ඕනෑ. ඒ නිසා මේ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා කියනවා.

ඔබතුමාගේ අමාත්‍යාංශය මම කිව්වා වාගේම රටේ ජනතාවට දැනෙන අමාත්‍යාංශයක්. ඒ වාගේම සමුපකාර ක්ෂේත්‍රය ගැන ආණ්ඩුව, විපක්ෂය කථා කළා. උත්සාහ කරන්න මේ සමුපකාර ක්ෂේත්‍රය ගොඩගන්න. ඒක කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් හොඳයි. හැබැයි, ගරු සභාපතිතුමනි, භාණ්ඩ 40ක මිල අඩු වීම සතොසේ විතරක් වුණා කියලා සමස්ත මිනිසුන්ට දැනෙන්නේ නැහැ.

අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, අපි ආණ්ඩුවක් කරන කොට හුහාක් වෙලාවට අමාත්‍යාංශවලට සහ අපේ වැඩ කටයුතුවලට තමයි ප්‍රමුඛතාව දෙන්නේ. වෙච්ච දේවල් මම මේ කියන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Rohitha Abeygunawardhana, your time is up.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ආණ්ඩු කරන කොට ඒවාට යොමු වුණාම ගමට යැවෙනවා අඩුයි. ගමට යන කොට තමයි ගමේ තිබෙන පණිවුඩය අපට එන්නේ; ගමේ ඇත්ත කථාව දැන ගන්න වෙන්නේ. නැත්නම් ළඟ ඉන්න හතරපස් දෙනෙක් කියනවා, "ගමේ මල් හටගන්නවා, ගෙඩි හටගන්නවා. කට්ටිය අත්පුඩි ගහනවා. කට්ටිය සතුටින් ඉන්නවා" කියලා. ඒක නොවෙයි. තමුන්නාන්සේලා ගමට යන වැඩ පිළිවෙළක් තුළ, ගමේ මිනිසුන්ගේ තිබෙන සැබෑ අමාරුකම තේරුම් ගන්න. ඔබතුමන්ලා ගම එක්ක හිටියේ. ගමේ මිනිසුන්ගේ සැබෑ අමාරුකම තේරුම් අරගෙන මේ රටේ මිනිසුන්ට හොඳ විධියට තමන්ගේ ජීවන තත්ත්වය ගෙන යන්න අවස්ථාව ලබා දෙන්න කියලා බොහොම ගෞරවයෙන් මා ඉල්ලනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පසු, අමර්ෂ පි.ප. 1.00 මණිවරෙ දක්වා විවේකයට ගියේය.

Accordingly, the Sitting was suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[පි.ප. 1.00]

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

இலங்கையில் வாழ்கின்ற அனைத்து முஸ்லிம் நல்லுள்ளங்களுக்கும் ரமழான் கரீம்!

[ගරු ෆස්මීන් ෂරීෆ් මහතා]

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, எமது நாடு அபிவிருத்தி அடைந்துவரும் நாடாகக் காணப்பட்டாலும், தெற்காசியப் பிராந்தியத்தில் மிக முக்கியமானதொரு வர்த்தக நிலையமாகக் காணப்படுகின்றது. முக்கியமாக ஆங்கிலேயரின் வருகையின் பின்னர், எமது நாட்டில் மேற்கொள்ளப்பட்ட தேயிலை, கோப்பி மற்றும் சிறு ஏற்றுமதிப் பயிர்களின் உற்பத்திமூலம் எமது நாட்டின் பொருளாதாரத்துக்குப் பெரும் பங்களிப்புக் கிடைத்ததோடு, எமது நாட்டின் பெயரும் வெளிநாடுகளில் பிரபல்யம் அடைந்திருந்தது. மேலும், மலைநாட்டுப் பகுதியில் உற்பத்தி செய்யப்படும் பூக்கள் மற்றும் மரக்கறி வகைகளின் ஏற்றுமதிமூலம் எமது நாட்டின் பொருளாதாரத்துக்குச் சிறு பங்களிப்பு கிடைக்கக்கூடியதாக இருந்தது. ஆனாலும், நாம் மத்திய மலைநாட்டின் காலநிலை மற்றும் சூழல் அமைப்பு என்பவற்றைப் பயன்படுத்தி, ஒழுங்கானதொரு திட்டத்தை வகுத்து உற்பத்திகளை மேற்கொண்டால், நிச்சயமாக எமது நாட்டின் பொருளாதாரத்துக்குப் பாரிய பங்களிப்பை வழங்கலாம்.

சென்ற அரசாங்கத்தின்மூலம் 'சதொச' நிறுவனம் நஷ்டத்துக்குள்ளாக்கப்பட்டது என்பது எங்களுக்குத் தெரியும்! உதாரணத்துக்கு, STCஇனால் அனுப்பப்பட்ட 3 containers இன்றுவரை 'சதொச'வுக்குக் கிடைக்கப்பெறவில்லை. நான் பிரதிநிதித்துவப்படுத்தும் கம்பளை பிரதேசத்தில் இரண்டு 'சதொச' விற்பனை நிலையங்கள் உண்டு. அதில் ஒன்று முன்னாள் அமைச்சர் ஒருவருடைய உறவினரின் அல்லது நண்பருக்குச் சொந்தமான இடத்தில் அமைந்திருப்பதை அங்கு நான் சென்று பார்த்தபோது அவதானித்தேன். அது பாரிய நஷ்டத்தில் இயங்கிக் கொண்டிருக்கின்றது. அதேபோன்று, இலங்கையில் பல 'சதொச' விற்பனை நிலையங்கள் நஷ்டத்தில் இயங்கிக் கொண்டிருக்கின்றன. இதற்கு முன்னைய அரசாங்கத்தின் தவறான கொள்கைகளும் முடிவுகளுமே காரணமாகும். அவற்றை வெற்றிப் பாதையில் கொண்டு சென்று, இலாபமீட்டக்கூடிய 'சதொச' விற்பனை நிலையங்களாக மாற்றுவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் பாரிய முயற்சிகளை எடுத்து வருகின்றார். அந்த வகையில், இலங்கையில் 'சதொச'ஐ மேம்படுத்துவதற்கு எங்களுடைய அரசாங்கம் பாரிய முயற்சிகளை எடுத்து வருகின்றது.

மத்திய மலைநாட்டுப் பகுதியில் மேற்கொள்ளப்படும் கராம்பு, கோப்பி, தேயிலை போன்ற ஏற்றுமதிப் பொருட்களின் உற்பத்தியை மேலும் விரிவுபடுத்தினால், இந்த நாட்டின் வருமானத்தை அதிகரிப்பதற்கான சந்தர்ப்பங்களை ஏற்படுத்த முடியும். இது சம்பந்தமாகவும் நாம் அதிக கவனத்தைச் செலுத்த வேண்டும். உதாரணத்துக்கு, எமது நாட்டிலிருந்து ஏற்றுமதி செய்யப்படுகின்ற கறுவாப் பட்டையை எடுத்துக் கொள்வோம். நாம் அதை நேரடியாக பட்டையாக ஏற்றுமதி செய்யாமல், கறுவா எண்ணெயாக மாற்றி ஏற்றுமதி செய்தால், மேலும் பல மடங்கு வருமானத்தைப் பெற்றுக்கொள்ளக் கூடியதாக இருக்கும்.

முன்னைய அரசாங்கத்தில் அங்கம்வகித்த சில அமைச்சர்கள் தங்களுடைய உறவினர்கள்மூலம் இந்தோனேஷியாவிலிருந்து கொட்டைப் பாக்கை இறக்குமதி செய்வதாகக் கூறி பாக்கை இறக்குமதி செய்தார்கள். அது இலங்கைக்கு வரும்போது 180 - 200 ரூபாய் cost ஆகும். கடந்த காலங்களில் 1,100 ரூபாய்க்கு விற்கப்பட்ட கொட்டைப் பாக்கு இன்று 550 - 600 ரூபாய்க்கு விற்கப்படுகின்றது. கடந்த அரசாங்கம் பாரிய அளவில் - container கணக்கில் - இதனை இறக்குமதி செய்ததன் விளைவாகவே இந்த நஷ்டம் ஏற்பட்டது. நமது அரசாங்கம் அதன் இறக்குமதியைச் சம்பூரணமாக நிறுத்தி, விவசாயிகளுக்கு அதிகளவு நன்மை பயக்கக்கூடிய வகையில் நடவடிக்கைகளை எடுத்துள்ளது.

அடுத்து, எமது நாட்டில் அனைவரும் விரும்பிச் சாப்பிடும் பலாக்காய்மூலம் நல்ல பல புதிய உற்பத்திகளைத் திறம்படச் செய்து, அதன்மூலம் நல்ல வருமானத்தைப் பெறக்கூடிய எத்தனையோ மக்கள் மத்திய மலைநாட்டில் உள்ளனர். அவர்களின் உற்பத்திகளை அதிகரிக்கக்கூடிய வகையில், நமது அரசாங்கம் அவர்களுக்குக் கைகொடுத்து ஊக்க மூட்டினால், அவர்கள் நல்ல வருமானத்தைப் பெறுவார்கள் எனக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

எமது நாட்டில் அதிகமானோர் விரும்பிச் சாப்பிடும் துரியம்பழம், கொய்யாப்பழம், ரம்புட்டான் போன்றவற்றை எமது நாட்டுக்கு வரும் சுற்றுலாப் பயணிகளும் அதிகமாக விரும்பிச் சாப்பிடுகின்றார்கள். இவை ஒரு வருடத்தில் இரண்டு முறை விளையக்கூடிய பழ வகைகளாகும். இந்தப் பழ வகைகளின் உற்பத்திக்காக அதிக இடங்களை ஒதுக்கி, அவற்றின் உற்பத்தியைப் பெருக்கி, அவற்றை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்வதன்மூலம் அதிகளவு வருமானத்தைப் பெற்றுக்கொள்ளக்கூடிய சந்தர்ப்பம் எமக்குக் கிடைக்கும். இதனை நாம் கவனத்திற்கொண்டு, ஒழுங்கான திட்டமிடல்களைச் செய்து, மக்களை உற்சாகப்படுத்தினால் நல்ல விளைச்சலைப் பெறமுடியும். எனவே, இது சம்பந்தமாகவும் நாம் கூடிய கவனம் செலுத்த வேண்டும். மத்திய மலைநாட்டிலுள்ள அதிகமான நிலங்கள் அரசாங்கத்துக்கும் தனியாருக்கும் சொந்தமானவையாகக் காணப்படுகின்றன. அவற்றில் பொருத்தமான நிலங்களை இனங்கண்டு, அவற்றை மேற்குறித்த பழ உற்பத்தியாளர்களுக்குப் பெற்றுக்கொடுத்தால், மத்திய மலை நாடு மட்டுமல்ல, இந்த நாடும் அதிகளவு வருமானத்தைப் பெறக்கூடியதாக இருக்கும். அதுமாத்திரமன்றி, நம் நாட்டின் பொருளாதார வளர்ச்சிக்குக் கைகொடுக்கக்கூடிய ஒரு பகுதியாகவும் மத்திய மலைநாடு மாறுமென நான் நினைக்கின்றேன். மேலும், இது மத்திய மலைநாட்டின் வளர்ச்சிக்கு நல்லதொரு வழியாகவும் இருக்கும்.

அடுத்து, Commission ஒன்றை நியமித்து, இந்த நாட்டில் இயங்கி வருகின்ற 'சதொச' விற்பனை நிலையங்கள் தொடர்பில் கணக்காய்வு ஒன்றைச் செய்ய வேண்டும். ஏனென்றால், கடந்த அரசாங்கத்தால் அதிக வாடகைக்கு எடுக்கப்பட்ட buildingsஇல்தான் இன்றும் அவை இயங்கிக் கொண்டு இருக்கின்றன. இதனால் அரசாங்கத்துக்குப் பாரிய நஷ்டம் ஏற்பட்டுக்கொண்டு இருக்கின்றது.

மேலும், அண்மையில் கௌரவ அர்ச்சுனா அவர்கள் முஸ்லிம் சமூகத்துக்குச் சேறுபூசும் நோக்கத்துடன், முஸ்லிம்களின் விவாகம் சம்பந்தமாக இங்கு உரையாற்றி இருந்தார். அது முஸ்லிம் மக்கள் மத்தியில் பாரிய பாதிப்பை ஏற்படுத்தியுள்ளது. நான் மதிப்பும் மரியாதையும் வைத்துள்ள தமிழ் சகோதரர்கள் என்னிடம் அவரது உரைக்குப் பதிலுரை கொடுக்குமாறு சொன்னார்கள். சாதி, மதம், இனம் எதனையும் பார்க்காத எங்களுடைய மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களும் முஸ்லிம் சமூகத்தின்மீது அதிகளவு கரிசனையும் மதிப்பும் வைத்துள்ள 159 பாராளுமன்ற உறுப்பினர்களும் இருக்கக்கூடிய இந்தச் சபையில் கௌரவ அர்ச்சுனா அவர்கள் இனவாதத்தையும் சாதிவாதத்தையும் பரப்பக்கூடிய வகையில், முஸ்லிம்களுடைய விவாகம் சம்பந்தமாக தெளிவற்ற, உண்மையற்ற கருத்தொன்றைத் தெரிவித்திருந்தார்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

அவர் அதை மீளப்பெற வேண்டுமெனவும் அதற்காக முஸ்லிம் சமூகத்திடம் பகிரங்கமாக மன்னிப்புக் கேட்க வேண்டுமெனவும் நான் வேண்டிக் கொள்கின்றேன். நேரம் போதாமை காரணமாக எனது உரையின் எஞ்சிய பகுதியை ***ஹன்சாட்டில்** பதிவுசெய்யுமாறு கேட்டு விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු තිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.10]

ගරු තිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද කාරක සභා අවස්ථාවේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ විවාදය පැවැත්වෙන මොහොතේ, අමු කැවුණාම කියන කථා තමයි පසුගිය කාලයේ වාගේම ගොඩක් වෙලාවට අද දවසේත් විපක්ෂයෙන් අපට අහන්න දකින්න ලැබෙන්නේ. එතුමන්ලා මෙච්චර කාලයක් විපක්ෂයේ හිටපු විධියට තමයි කථා කරන්නේ. විශාල කාලයක්, අවුරුදු 76ක් තිස්සේම අපේ රට පාලනය කරමින් ආණ්ඩු පක්ෂයේ කටයුතු කරලා, එච්චර කාලයක් අපි මේ රට පාලනය කළ විධියට තමයි දැන් අපට ඒ සියලු චෝදනා කරන්නේ. ඒ නිසා ඒවා අමු කැවුණාට පස්සේ කියන කථා විධියට තමයි අපට පෙනෙන්නේ.

අපි ඉතාම කෙටි කාලයයි මේ රට භාරගෙන. අපි දැන් මේ රටේ දූෂණ, වංචා සියල්ලම නතර කරලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ මන්ත්‍රීවරු විධියට අපි විශාල කැපකිරීමක ඉන්නවා. ඇමතිවරු, ජනාධිපති සහෝදරයා, අගමැතිනිය ඇතුළු සියලුදෙනා මහා කැප කිරීමක ඉන්නවා. හැබැයි මේ රටේ කවුරුත් ඒ හොඳ කථා කරන්නේ නැහැ; මාධ්‍ය තුළ ඒ හොඳ යන්නේ නැහැ. ඒ වෙනුවට, ජනාධිපතිතුමා මිලියන 1.8කින් පිටරට සංචාරය කළේ කොහොමද කියලා අහනවා මීසක්, මීට කලින් සිටි ජනාධිපතිවරු අති දැවැන්ත මුදලක් පාවිච්චි කළත් එච්චර මුදලක් වියදම් කළේ මොකටද කියලා අහන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

චාමර සම්පත් දසනායක මන්ත්‍රීවරයා පසුගිය දවසක කියනවා රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමියත් එක පන්තියේ හිටියේ කියලා. මම හිතනවා එතුමාට පන්තිය හඳුනා ගන්න බැරි වෙලා තිබෙනවා. නමුත් මේ රටේ ජනතාව පන්තිය මොකක්ද කියලා හඳුනා ගත්ත නිසා තමයි මේ රටේ ජනතාවගේ සැබෑම පන්තිය නියෝජනය කරන ආණ්ඩුවක් බලයට පත් කර ගත්තේ කියන එක අපි කියන්න ඕනෑ.

ඒ කොහොම වුණත්, මම අද දින විවාදයට පිවිසෙන්නම්. මෙම අමාත්‍යාංශය යටතට ආයතන 15ක් ඇතුළත් වෙනවා. ඒ අතරින් ආයතන කිහිපයක් විතරක් අදාළ කර ගනිමින් මේ විවාදයට කරුණු ගොනු කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ගිය අවුරුද්දේ ඒ ආණ්ඩුව සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව වහලා දාලා සේවකයන් අයින් කරලා තිබුණේ. එයට අයත්ව තිබුණු ලොරි රථ පවා විකුණලා තිබුණේ. අපි මේ වෙනකොට සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හදන්න භාරගෙන, වැඩ පටන් අරගෙන තිබෙනවා. අපි සහතිකවම ඒක හදනවා. අපි තොග වෙළෙඳාමට ප්‍රවේශවීම සඳහා තොග වෙළෙඳ පොළට අවශ්‍ය මූලික පදනම් ගැන සාකච්ඡා කරමින්, සකස් කරමින්, ක්‍රියාත්මක වෙමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. අපි මේ වෙනකොට වී මිලදී ගැනීම සඳහාත් අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙනවා.

ලංකා සතොස ගැන කථා කළොත්, මෙය වසා දමන්න තිබුණු ආයතනයක්. මේ ආයතනය තුළ සේවකයන් 4,000ක් පමණ සේවය කරනවා. ගිය සැප්තැම්බර්වලින් පසුව වහන්න ගිය සතොසට තවත් සේවකයන් 700ක් පමණ බඳවා ගන්න අපි කටයුතු කරමින් සිටිනවා, මේ ආයතනය ඉතාම කාර්යක්ෂමව පවත්වාගෙන යන්න. සතොස අළෙවි සැල් 450ක් විතර පවතිනවා. අපි මේ අවුරුද්දේ සිට ඒ ප්‍රමාණය 600 දක්වා වැඩි කරන්න කටයුතු කරනවා. අපි බාර ගන්නකොට මේ ආයතනය කෝටි 2,000කට වඩා වැඩි පාඩුවක්, ඒ කියන්නේ බිලියන 20කටත් වඩා වැඩි පාඩුවකට පත් වෙලා තිබුණා. ඇත්තටම ගත්තොත් සමහර ශාඛාවල සේවකයන් වැඩියි, සේවකයන් විශාල ප්‍රමාණයක් සිටිනවා. නමුත් සමහර ශාඛාවල සේවකයන් අඩුයි. නිවැරදි ප්‍රමුඛතා මත නොවෙයි සේවකයන් බඳවාගෙන තිබෙන්නේ. අපි මේ ආයතන වඩා හොඳ තත්ත්වයකට පත් කරනවා. මෙහි වාර්ෂික ආදායම දැනට තිබෙන්නේ බිලියන 60ක් වාගේ ප්‍රමාණයක්.

නමුත් කාගිල්ස් වාගේ ආයතන ගත්තාම වාර්ෂිකව රුපියල් බිලියන 160ක ආදායමක් දක්වා යනවා. අන්න එවැනි ආදායමකට මේ ආයතනයත් ගෙනයන්න අවශ්‍ය පසුබිම අපි මේ වන විට නිර්මාණය කරමින් ඉන්නේ. ඒ වාගේම මෙම ආයතනයේ ශාඛා හිටපු ඇමතිලාගේ ගෝලබාලයන්ගේ තැන්වල තමයි පවත්වාගෙන ගියේ. මේවා රටට සල්ලි හොයන ආයතන. අනිවාර්යයෙන්ම රජයට සල්ලි හොයන්න තිබෙන මේ ආයතන පසුගිය කාලයේ පාඩු ලබන ආයතන බවට පත් කරලා තිබුණා. එම ආයතන අපි ලාභ ලබන ආයතන බවට පත් කරන්න මැදිහත් වෙනවා සහ කටයුතු කරනවා කියන එක කියන්න ඕනෑ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියත් එහෙමයි. එහි සේවකයන් ගණන ඉතාම අඩුයි. එම නිසා අපි එහි සේවක ප්‍රමාණය 250ක් දක්වා වැඩි කරලා බඳවාගෙන, ඒ ආයතනය අඛණ්ඩව පවත්වාගෙන ගිහිල්ලා ජනතාවට සැබෑ සේවාවක් සපයන්න කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සමුපකාරය ගත්තාම, පසුගිය කාලය පුරාම සමුපකාරය තැන්පතු විධියට මිනිසුන්ගෙන් මුදල් එකතු කළ බව අපි දන්නවා. අද ඒ මුදල්වලට, මිනිසුන්ගේ ඒ තැන්පතුවලට වෙච්ච දෙයක් නැහැ. එය සභාපතිවරු ඇතුළු බිස්නස්කාරයන් පිරිසකගේ තැනක් බවට පත්වෙලා තිබෙනවා. මේ ආයතනය විනාශ කරලා තිබෙන්නේ. එම නිසා ඒක ගොඩ ගන්නත් අපි දැන් අත ගහලා තිබෙනවා. මේ වන විට ඔවුන් සමුපකාරය කියන නමත් අවභාවිත කරලා ඉවරයි. ඒ නිසා අපට ඒකත් හදන්න තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු තිලංක යූ. ගමගේ මහතා]

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ගත්තත් එහෙමයි. ගබඩා කුලියට දෙන එක විතරයි දැනට එම දෙපාර්තමේන්තුව කරන්නේ. ආහාර සුරක්ෂිතතාව ඇති කරන්න එම දෙපාර්තමේන්තුව සැබෑ කාර්යභාරයක් කරන තත්ත්වයට පත් කරන්න අපි මැදිහත් වෙලා තිබෙනවා.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල තුළින් මේ රටට සැබෑම සේවාවක් කරන්න අපට පුළුවන්. පසුගිය කාලයේ මේ ආයතනයත් අවභාවිත වෙලා තිබෙනවා. මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ලබා දුන් ශිෂ්‍යාධාර මුදල රුපියල් 2,500කින් වැඩි කරලා රුපියල් 7,500ක් ලබා දෙන්න දැන් යෝජනා කරලා තිබෙනවා. අපි පසුගිය කාලයේ අරගළ කරලා තමයි රුපියල් 1,000කින් පවා මහපොළ ශිෂ්‍යත්ව දීමනාව වැඩි කර ගත්තේ. නමුත්, එවැනි අරගළ කිරීමකින් තොරව අපි ඒ දීමනාව රුපියල් 2,500කින් වැඩි කරන්න සමත් වෙලා තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ ආයතන සතු රුපියල් ලක්ෂ 120ක් වාගේ වෙළෙඳ පොළ වටිනාකමක් තිබුණු වාහන රුපියල් ලක්ෂ 50ක් වාගේ අඩු මුදලට විකුණලා තිබෙනවා. මෙන්න මේ හොරකම් නවත්වලා වඩා හොඳ සමුපකාර ජාලයක්, සතොස ජාලයක් හදන්න අපි අනිවාර්යයෙන්ම මැදිහත් වෙනවා. මෙතෙක් මේ රටේ කළ හොරකම් සියල්ල නතර කරලා, මෙම ආයතන ලාභ ලබන ආයතන බවට පත් කරමින්, මේ මාතෘ භූමිය වඩා සුන්දර හෙට දවසක් වෙනුවෙන් රැගෙන යෑම සඳහා අපි ඇප කැප වෙනවා කියන ප්‍රකාශය කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.17]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කාරක සභා අවස්ථාවේ ඉතා වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් පිළිබඳව කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන් ඔබතුමන්ලාගේ අය වැය ලේඛනයේ සඳහන් වෙලා තිබෙනවා, "අලුත් අවුරුදු කාලය තුළ සහන මල්ලකට අවශ්‍ය ආහාර ලබා දීම" කියන කාරණය. මගේ කථාව මම එතැනින් පටන් ගන්නම්. ගරු වසන්ත සමරසිංහ මැතිතුමනි, සිංහල හා හින්දු අලුත් අවුරුද්ද තව සති කිහිපයකින් උදා වෙනවා. උත්සව කාලය තුළ සහන මල්ල ලබා දීම සඳහා ඔබතුමන්ලාගේ අය වැය ලේඛනයෙන් රුපියල් බිලියනයක්, එහෙම නැත්නම් රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඔබතුමන්ලා මේ සහන මල්ල දෙන්නේ කාටද කියලා. මේ සහන මල්ල දෙන්නේ අස්වැසුමලාණන්ටද, සමස්ත රටේම වැඩ කරන ජනතාවටද, කාර්යාලවල සේවය කරන ජනතාවටද, එහෙමත් නැත්නම් සියලු පොදු මහ ජනතාවටද කියලා මම දන්නේ නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අද උදේ වරුවේ ඔබතුමන්ලාගේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් මේ ගැන විමසුවා. ඔබතුමාත් දැන් විමසන නිසා සහ මේක වැදගත් මාතෘකාවක් නිසා මම උත්තරයක් දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා, අපි ලබා දෙන්නේ සහන මල්ලක්. මේ සහන මල්ල ලබා දීම සඳහා පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමේදී තීරණයක් ගත්තා. ආහාර සුරක්ෂිතතා කමිටුව ඉල්ලීමක් කළා, මේ සඳහා වෙන් කළ මුදල තව ටිකක් වැඩි කරන්න කියලා. ඒ අනුව රුපියල් මිලියන 1,000 රුපියල් මිලියන 1,500 දක්වා වැඩි කරන්න කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා. මුදල් ඇමතිතුමා ඒ සංශෝධනය අනිද්දාට ඉදිරිපත් කරයි. එ් සහන මල්ල දෙන්නේ කාටද කියලා කිව්වොත්, කැබිනට් මණ්ඩලය තීරණය කළේ මෙහෙමයි. ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් මිලියන 1.7කට අස්වැසුම ලබා දෙනවා. එතකොට, තව 807,000ක් ජනතාව අස්වැසුම අපේක්ෂාවෙන් නව අයදුම්පත් ඉදිරිපත් කරලා තිබෙනවා.

මෙහිදී රුපියල් 5,000ක බඩු මල්ලක් රුපියල් 2,500ක සහන මිලකට අපි ලබා දෙනවා. ඒක රුපියල් 5,000ට ටිකක් වැඩියි. නමුත්, රුපියල් 2,500ට අපි මේ බඩු මල්ල ලබා දෙනවා. මේ බඩු මල්ල ලබා දීමේදී අන්න අර අස්වැසුම නැති, නමුත් අස්වැසුම අපේක්ෂාවෙන් අයදුම්පත් යොමු කර තිබෙන 800,000කට වැඩි පිරිසට තමයි එය ලබා දෙන්නේ. තමන්ට අස්වැසුම හිමිවෙන්න ඕනෑ කියලා හිතලා තමයි ඔවුන් අයදුම්පත් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ තොරතුරු අප සතුව තිබෙනවා. අන්න ඒ 800,000කට වැඩි ප්‍රමාණයට තමයි මේ බඩු මල්ල ලබා දෙන්නේ. අපි ඒ අයට රුපියල් 5,000ක බඩු මල්ල රුපියල් 2,500කට ලබා දීමට කටයුතු කරනවා. ඒ තමයි මේ සහන මල්ල පිළිබඳ කටයුත්ත. ඒ සඳහා අපේ ලංකා සතොස ආයතනය සැපයුම්කරුවන් සමඟ ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය කරන සාකච්ඡා අවසන් කර තිබෙනවා. භාණ්ඩාගාරයෙන් අපි මේ සඳහා advance එකක් ඉල්ලා තිබෙනවා. ඒකත් අරගෙන, ඒ සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවලා මේ කටයුත්ත සූදානම් කරමින් තිබෙනවා. ඔබතුමාට බොහොම ස්තූතියි, ඒ ප්‍රශ්නය මතු කළාට.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම මේ ඔබතුමා කියන ගමන් "ටක්" ගාලා ගණන් හදලා බැලුවා. එතකොට ඔබතුමා කියන ආකාරයට ඔය 800,000ටම මේ සහන බඩු මල්ල දෙන්න ලැබෙන්නේ නැහැ. රුපියල් 2,500න් බෙදලා බැලුවාම 600,000කට විතර තමයි මේ මුදල ප්‍රමාණවත් වෙන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳයි, ඒකත් අපි විසඳලා ඉමුකෝ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
හොඳයි, විවාදය පවත්වාගෙන යමු. කමක් නැහැ. *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක හරි. සතොසට මේ භාණ්ඩ විකුණන්නේ cost එකට. ඒ නිසා සතොසටත් මේකෙන් යම් දැරීමක් තිබෙනවා. සතොස ලබා ගන්නා ලාභයෙන් රුපියල්

751ක් සතොසෙන් අඩු කරනවා. ඉතිරි රුපියල් 1,800කට ආසන්න මුදල මධ්‍යම රජයෙන් මේ සහනාධාර සඳහා වෙන් කර තිබෙන රුපියල් මිලියන 1,500න් ලබා දෙනවා. එහෙම තමයි රුපියල් 2,500 හැදෙන්නේ. ඒ අනුව 833,000කට මේ බඩු මල්ල ලබා දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ*)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමාගේ පැහැදිලි කිරීම හොඳයි.

දැන් ඔබතුමන්ලා කියන ආකාරයට, විශේෂයෙන්ම මේ භාණ්ඩ ගැන කථා කරද්දී, රුපියල් 5,000කට මේ බඩු මල්ලට මොනවාද ඇතුළත් වෙන්නේ කියලා පොඩ්ඩක් අපි ගණනය කරලා බැලුවොත්, මම හිතන හැටියට හාල් කිලෝ 2ක්, සීනි, පරිප්පු, අල, කරවල කියන බඩු ටික දැම්මාම මේ රුපියල් 5,000 cover වෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*මාණ්පුමිකු වසන්ත සමරසිංහ*)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා අවසර දෙනවා නම්, මම ඒ බඩු ලැයිස්තුව ඉදිරිපත් කරන්නම්.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ*)
(The Hon. Nalin Bandara Jayamaha)
හොඳයි, ඔබතුමා බඩු ලැයිස්තුවත් දෙන්න බලන්න. ඒක රටේ ජනතාවට දැනගන්න හොඳයි නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*මාණ්පුමිකු වසන්ත සමරසිංහ*)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා මේ මාතෘකාව සාකච්ඡාවට ගත් එක වැදගත්. අපේ මේ බඩු මල්ලේ බඩු වර්ග 3ක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. එකක්, නාඩු හාල් කිලෝ 5ක් තිබෙනවා. නාඩු හාල් වෙනුවට පාන්පිටි සහ නාඩු හාල් කිලෝ 3ක් දෙන එකක් තිබෙනවා. රතු හාල් සහ පාන්පිටි කිලෝ 2ක් දෙන එකකුත් තිබෙනවා. මම ඔබතුමාට කියන්නම්, අපි සාමාන්‍යයෙන් ලබා දෙන බඩු මල්ල පිළිබඳව. Nadu rice කිලෝ 5ක්, ඊට අමතරව ලොකු ලූනු කිලෝ 2ක්, අල කිලෝ 2ක්, පරිප්පු කිලෝ 2ක්, සැමන් ටින් එකක්, brown sugar කිලෝ 3ක්, පාන්පිටි කිලෝ 2ක්, සම්පෝෂ පැකට් 2ක්, ඒ වාගේම, ග්‍රෑම් 70 සහ ග්‍රෑම් 90 mix එකත් එක්ක හදපු සෝයා මීට් පැකට් 4ක් මේ බඩු මල්ලෙහි ඇතුළත් වෙනවා. මේ අනුව කිලෝ 15ත්, 17ත් අතර ප්‍රමාණයක බඩු මල්ලක් ලැබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ*)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, "ටක්" ගාලා ගණන හැදුවා. ඔබතුමාගේ ගණන හරි. බලන්නකෝ, දැන් මම අහපු නිසා බඩු මල්ලට මොනවා හෝ වැඩි කළාද කියලාත් හිතෙනවා. මමත් සතුටු වෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාගේ මේ අය වැය ලේඛනය හොඳයි, සතුටුයි. 800,000කට ඒ සහනය දෙන එක හොඳයි. ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමා දන්නවා මේ 800,000ක පිරිස කියන්නේ අස්වැසුම් නොලබන අය බව. ඒ වාගේම, මේ රටේ ඉන්නවා තව විශාල පිරිසක්, වැඩ කරන ජනතාව. විශේෂයෙන් ලක්ෂ 65ක් විතර ඉන්නවා, පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අය. ඒ වාගේම, ඔබතුමන්ලාට ශක්තිය දුන් අය රාජ්‍ය සේවයේ ඉන්නවා. එතකොට ඒ අයටත් භාණ්ඩවල යම් මිල අඩුවීමක් වෙනවාද? විශේෂයෙන් මැතිවරණ සමයේ ඔබතුමන්ලා කිව්වා අත්‍යවශ්‍ය භාණ්ඩ මත පනවා ඇති VAT අඩු කරනවාය කියලා. අත්‍යවශ්‍ය භාණ්ඩ මත පනවා තිබෙන VAT අඩු වෙනවා නම්, සහන ලැබිය යුතු විශාල පිරිසකට බොහොම පහසුවෙන් ඒ සහනය ලැබෙනවා. ඔබතුමන්ලාට රජයක් විධියට ඒ සහනය දෙන්න පුළුවන්, VAT ඉවත් කරලා. මේ අත්‍යවශ්‍ය භාණ්ඩ මත පනවා ඇති VAT ඉවත් කරන්න කටයුතු කරන්න පුළුවන්. ඔබතුමන්ලා ඒ කටයුත්තට දායක වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය කාලයේ අපි දිගින් දිගටම සහල් මිල ගැන කථා කළා. ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා මැතිවරණ ව්‍යාපාරයේදී කළ ප්‍රකාශයක් 2024.10.24වන දා "අරුණ" පුවත් පතේ පළවෙලා තිබුණා මට මතකයි.

එතුමා කළ ප්‍රකාශය, එහි මෙසේ සඳහන් වනවා:

> "සංචාරක කර්මාන්තයට අවශ්‍ය සහල් හැර සහල් ඇටයක්වත් රටින් ගේන්නේ නැහැ."

ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා තමයි මේක කිව්වේ. මේ විධියට සහල් ඇටයක්වත් රටින් ගෙනෙන්නේ නැහැ කියපු ඔබතුමන්ලා, ඒ පෙර කියපු කථාව බලයට පත් වුණාට පස්සේ ඉතාම කෙටි කාලයකින් වෙනස් කළා. මම කියන්නේ නැහැ, ඔබතුමන්ලා සහල් ගෙනාපු එක වැරදියි කියලා. හැබැයි, ඔබතුමන්ලා මැතිවරණයට පෙර ප්‍රකාශයට පත් කරපු දේවල් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නට බැරි දේවල් කියන එක අවබෝධ කරගත් එක බොහොම හොඳයි. ඔබතුමන්ලා බලයට පැමිණියා. ඔබතුමන්ලා බලයට පැමිණීමේදී රටේ ජනතාවට පොරොන්දු දුන්නා. ඒ පොරොන්දු මාසයක් දෙකක් යනකොට ඉෂ්ට කරන්නට බැරි, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නට බැරි කාරණා කියන එක රටේ ජනතාවට ඔප්පු කළ එක හොඳයි.

අපට මතකයි, සහල් සම්බන්ධයෙන් ඔබතුමන්ලා විශාල අර්බුදයකට මුහුණ දුන් බව. ඔබතුමන්ලා සහල් සඳහා පාලන මිලක් නියම කළා. ඔබතුමන්ලා පාලන මිල නියම කරද්දීත් මහා පරිමාණ සහල් ව්‍යාපාරිකයෝ තුන් හතර වතාවක් ජනාධිපති ලේකම් කාර්යාලයට කැඳෙව්වා. කැඳවලා ඔවුන් එක්ක සාකච්ඡා කළා; ඔවුන්ට තරවටු කළා. අපි දැක්කා, සමහර සහල් මෝල් පරීක්ෂාවටත් ලක් කළ ආකාරය. හැබැයි, ඔබතුමන්ලාට බැරිව ගියා මේක මට්ටු කරන්න. හැබැයි, මට්ටු කරනවා කියලායි ඔබතුමන්ලා කිව්වේ. අන්තිමට මොකද වුණේ? පාලන මිලත් රුපියල් 10කින් වැඩි කරලා මහා පරිමාණ සහල් ව්‍යාපාරිකයන්ට තව බෝනස් එකක් දුන්නා. එදා රුපියල් 80ට, 90ට තමයි වී මිලදී ගත්තේ. ඒ මිලට ගත් වී තමයි සහල් කරලා, රුපියල් 220ට තිබුණු පාලන මිල රුපියල් 230 දක්වා තව රුපියල් 10කින් වැඩි කරලා දුන්නේ.

ඔබතුමන්ලා කළ යුතුව තිබුණේ සහල් ගෙනෙන එක. අපි ඒක පිළිගන්නවා. සහල් ගෙනැල්ලා වෙළෙඳ පොළ තුළ තරගකාරිත්වයක් ඇති කරන්න ඔබතුමන්ලාට අවස්ථාව තිබුණා. ඔබතුමන්ලා රුපියල් 65ක බද්දක් ගැහුවා. අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් උදේ ඒ ගැන මතක් කළා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*මාණ්පුමිකු වසන්ත සමරසිංහ*)
(The Hon. Wasantha Samarasinghe)
ඒ, තිබුණු බද්ද.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

තිබුණු බද්ද තමයි. ඒ බද්ද තිබෙනවා. හැබැයි, ඒ බද්ද තිබෙන්නේ වෙළෙඳ පොළ තුළ සහල් තිබෙනකොට මේක පාලනය කරන්න. හැබැයි, සහල් හිහයක් ඇති වුණු වෙලාවේ කරන්නේ බද්ද අඩු කරන එක. ඒක තමයි ඉතිහාසයේ කළේ. බද්ද තිබුණාට, රුපියල් 65ක බද්දට හාල් ගෙනාවේ නැහැ, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි. බද්ද අඩු කිරීම තමයි එදා කළ යුතුව තිබුණේ. බද්ද අඩු කළා නම් ආනයනික හාල් වෙළෙඳ පොළට එනවා. ඒ හරහා ආනයනික හාල් සුලබ වනවා. එතකොට මහා පරිමාණ ව්‍යාපාරිකයන්ටත් තරගකාරී මිල අනුව යම් කිසි ප්‍රමාණයකට මිල අඩු කරන්න සිද්ධ වනවා. අද වුණේ මොකක්ද? හාණ්ඩ හිහයක් ඇති වුණා, හාල් හිහයක් ඇති වුණා. ඔබතුමන්ලා පාලන මිලක් නියම කළා. ඒ පාලන මිලටවත් පාලනය කරන්න බැරිව හාල් මිල ඉහළ ගියා. මහා පරිමාණ හාල් ව්‍යාපාරිකයෝ මොකද කළේ? සිල්ලර වෙළෙන්දාට බිල කඩන්නේ නැතිව හාල් ටික බාලා, පාලන මිල විධියට බිලක් පෙන්නලා, සල්ලි වෙනම දාගෙන, වෙන විධියට ඒගොල්ලන්ගේ වැඩේ කළා. මොකද, වෙළෙඳ පොළ තුළ මේක පාලනය වුණා නම් තමයි ඒ සහනය පාරිභෝගිකයාට යන්නේ. හැබැයි, වෙළෙඳ පොළ තුළ මේ තත්ත්වය කළමනාකරණය කරන්න අවශ්‍ය තීන්දුව ඔබතුමන්ලා ගත්තේ නැහැ. රුපියල් 65 බද්ද අඩු කළේ නැහැ. ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි රුපියල් 65 බද්දට විශාල හාල් ප්‍රමාණයක් ආවේ. ඒකත් ඔබතුමන්ලාට වෙලාවට කර ගන්න බැරි වුණා. ඔබතුමන්ලා ටෙන්ඩර් තුනක්ද, හතරක්ද කොහේද දැම්මා. දමපු ටෙන්ඩර්වලින් 3ක්ද කොහේද ක්‍රියාත්මක වුණේ නැහැ. ඔබතුමන්ලා අවශ්‍ය වෙලාවේ ගත්ත තීන්දු තීරණ වැරදි නිසා තමයි තවමත් හාල්වලට විශාල මිලක් වෙළෙඳ පොළ තුළ තිබෙන්නේ. ආනයනික හාල් අඩු මිලට තිබුණා නම් මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට විශාල ලාභයක් ලබන්න තිබුණු අවස්ථාව මහ හැරෙනවා. ඒ වාගේම පාරිභෝගිකයාටත් සාධාරණ මිලට හාල් ගන්න අවස්ථාවක් උදා වෙනවා කියන එක මම මතක් කරන්න ඕනෑ.

ඊළඟට, තිබෙනවා සතොස ආයතනය. ඔබතුමාගේ අමාත්‍යාංශයට ආයතන ගණනාවක් තිබෙනවා. STC එක තිබෙනවා. ඔබතුමන්ලාට මේ රටේ විශාල වපසරියක් තිබෙන අමාත්‍යාංශයක් තිබෙන්නේ. මේ අමාත්‍යාංශය තුළින් ඔබතුමාට විශාල කාර්යභාරයක් ඉටු කරන්න පුළුවන්. මම දන්නේ නැහැ, දැන් ඒ ප්‍රතිපත්ති තිබෙනවාද කියලා. රාජ්‍ය මැදිහත්වීම හරහා වෙළෙඳ පොළ පාලනය කරනවා කියන එකට ඔබතුමාට ලොකු මැදිහත්වීමක් කරන්න පුළුවන්. සතොස තිබෙනවා, ලක් සතොස තිබෙනවා, STC එක තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ රාජ්‍ය මැදිහත්වීම වැඩි කරන්න පුළුවන්. සතොස වෙළෙඳ සැල් වැඩි කරන්න පුළුවන්. ඒකට අවශ්‍ය මුදල් යොදවලා ඔබතුමන්ලාගේ සමුපකාර ව්‍යාපාරය හරහා මේවා දියුණු කරන්න පුළුවන්. ඔබතුමන්ලාගේ පරණ ප්‍රතිපත්ති ගැන මම මේ කියන්නේ. මම දන්නේ නැහැ, දැන් ඒවා ඉදිරියට යනවාද කියලා. ඔබතුමාට විශාල කාර්යභාරයක් කරන්න තිබෙනවා. ඔබතුමන්ලා සතොස ශක්තිමත් කරන්න. සතොස වෙළෙඳ සැල් ගමටත් ගෙනියන්න, නගරයටත් ගෙනියන්න. අපේ රටේ ප්‍රධාන වෙළෙඳ ශාල තිබෙනවා. කීල්ස් සුපිරි වෙළෙඳ සැල, කාගිල්ස් සුපිරි වෙළෙඳ සැල ඇතුළු තව ගොඩක් ඒවා තිබෙනවා.

ඒවාත් එක්ක තරග කරන්න සතොසටත් පුළුවන්. කොළඹටත් ගැළපෙන සතොසක් හදන්න; ගමටත් ගැළපෙන සතොසක් හදන්න. ඔබතුමන්ලා මේ ආයතන තව පුළුල් කරන්න. අන්න ඒ පුළුල් කිරීම හරහා රටේ ජනතාවට සහන දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. මම හිතන විධියට, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා හොඳම අමාත්‍යාංශය භාර දීලා තිබෙන්නේ ඔබතුමාටයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ග දිහා අපි බලාගෙන ඉන්නවා. වර්තමාන ජනාධිපතිතුමා බලයට පත් වෙලා මේ වනකොට අවුරුදු භාගයක් ගතවෙලා අවසන්. ඔබතුමන්ලාත් ආණ්ඩුවක් හදලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මාස කිහිපයක් වෙනවා නේ. නමුත් අපට පෙනෙන්න නැහැ, ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගයේ ඊළඟ පියවර යථාර්ථයක් බවට පත් වෙන තැනට යනවා ද කියලා. ඒ නිසා අපි තව කාලයක් බලනවා. කාර්ය සාධනයට අපි තව මාස 6ක් ඔබතුමන්ලාට දෙනවා. අපි බලනවා, ඔබතුමන්ලා කියපු ආර්ථික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන ක්‍රියාමාර්ග, ඒ පියවර, ඒ ප්‍රගතිය මේ අවුරුද්දේ අග වෙනකොට කුමන තත්ත්වයකද පවතින්නේ කියලා. ඒ සඳහා ඔබතුමන්ලාට හොඳ අවස්ථාවක් තිබෙනවා, හෙට අනිද්දා පළාත් පාලන මැතිවරණය තිබෙන නිසා.

ජනතාව ජනාධිපතිවරණයේදී ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. ජනාධිපතිවරණයේදී සියයට 43ක ඡන්ද ප්‍රතිශතයක් ගත්ත ඔබතුමන්ලාට, ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණයේදී මන්ත්‍රී ආසන 159කට මීටරේ නග්ගලා දුන්නා. ඔබතුමන්ලාම කරන්න, මෙන්න තුනෙන් දෙකකටත් එහා ගිය බලයක් දුන්නා, දැන් කරන්න කියලා මේ රටේ ජනතාව ඡන්දය දුන්නා. දැන් කිසිම බාධාවක් නැතිව ඔබතුමන්ලාට ආණ්ඩුව කරගෙන යන්න පුළුවන්. දැන් ඉන්නේ කඩාකප්පල්කාරී ආකාරයෙන් කටයුතු නොකරන විපක්ෂයක්. වෘත්තීය සමිති හරහා අපි ඒ දේවල් කරන්නේ නැහැ. අපි ඔබතුමන්ලාට සහයෝගය දෙනවා. අපි රට බංකොලොත් කරන්නේ නැහැ. ඔබතුමන්ලා විපක්ෂයේ සිටි කාලයේදී ගත් ක්‍රියාමාර්ග අද අපි ගන්නේ නැහැ. ආයතන කඩාකප්පල් කරන්න, ආයතන වට්ටන්න, රාජ්‍ය යන්ත්‍රණය වට්ටන්න කටයුතු කරන විපක්ෂයක් නොවෙයි මේක. සමගි ජන බලවේගයේ ඉන්නේ බොහොම සුබවාදී විපක්ෂයක්. ඒ නිසා දැන් ඔබතුමන්ලාට ලොකු අවස්ථාවක් තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා ඒ වෙනුවට අද මොකක්ද කරන්නේ? මේ තිබෙන ප්‍රශ්න අමතක කරන්න, රටේ ප්‍රශ්න අමතක කරන්න, ඔබතුමන්ලා තවදුරටත් විපක්ෂයට අවලාද නහන තත්ත්වයක් අපි දකිනවා.

අපි ඊයේ දැක්කා, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා අපේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට විවේචනයක්, චෝදනාවක් කළ ආකාරය. එතුමා මොකක්ද කිව්වේ? හඳුන්නෙත්ති ඇමතිතුමා සිමෙන්ති සංස්ථාව පෞද්ගලීකරණය කිරීම ගැනත් කථා කරලා, තවක්කාල් දූෂණය ගැනත් කථා කරනවා. එතුමා සජිත් ප්‍රේමදාස මැතිතුමාට බරපතළ චෝදනාවක් කරනවා. එක්සත් ජාතික පක්ෂ රජය තමයි ජනතාකරණය හරහා පෞද්ගලීකරණය කියන කටයුත්ත ආරම්භ කළේ. හැබැයි, මේ තවක්කාල් ගනුදෙනුව සම්බන්ධයෙන් ගිවිසුම්ගත වෙලා, සිමෙන්ති සංස්ථාව පෞද්ගලික ආයෝජකයාට දෙන්නේ 1994දී පැවති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ රජය විසින්. ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් කථා කරලා, සජිත් ප්‍රේමදාස මැතිතුමාට tuition fees ගෙව්වේත් මේ කොමිපැනිය කියලා බරපතළ චෝදනාවක් කළා. ඒක ඉතාම නිර්දය ලෙස අපි හෙළා දකිනවා. මොකද ඒකට හේතුව, මේ තවක්කාල් ගනුදෙනුව සිදු වන්නේ එක පැත්තකින් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය බලයේ සිටි කාලයේ. මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ දවස් 3ක විවාදයක් තිබුණා. ඒ, 1996 මාර්තු මාසයේ 10, 20 සහ 21 කියන දවස් තුන. ඒ දින තුනේ හැන්සාඩ් වාර්තාත් මා සතුව තිබෙනවා. අපේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාට මම කියනවා, මේ හැන්සාඩ් වාර්තාත් පොඩ්ඩක් පරිශීලනය කරන්න කියලා. මොකද, ඒ කාලයේත් ඔබතුමන්ලාගේ පක්ෂය නියෝජනය කරමින් නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ හිටියා. හැබැයි, විවාදය ඉල්ලා සිටියේත් එවකට විපක්ෂයේ සිටි එක්සත් ජාතික පක්ෂය. ඒ විවාදය හැන්සාඩ් වාර්තාවල තිබෙනවා. නමුත් ඒ වාර්තාවල

කොතැනකවත් නැහැ, ඒ සමාගම සජිත් ප්‍රේමදාස මැතිතුමාට tuition fees ගෙව්වා කියලා. අපේ නිහාල් ගලප්පත්ති මහත්මයා තියා ආණ්ඩුවේ කිසිම කෙනෙක් එදා මේ කාරණය ගැන කථා කරපු තැනක් එම හැන්සාඩ් වාර්තාවල කොතැනකින්වත් සොයා ගන්න අපට නැහැ.

1993 වර්ෂයේ මැයි මාසයේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ මරණයෙන් පස්සේ සජිත් ප්‍රේමදාස මැතිතුමා විදේශගතව ඉඳලා ලංකාවට ආවා. මම දන්නා විධියට ඊට පස්සේ එතුමා අධ්‍යාපන කටයුතුවල නිරත වුණේ නැහැ. එතුමා හම්බන්තොටට ගිහිල්ලා දේශපාලනය තමයි කළේ. අපේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාත් මෙතැන ඉන්නවා. එතුමා හොඳ වෙලාවට මගේ ළඟින් ඉඳගත්තේ සාක්ෂියට. ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමනි, ඒ දවස්වල අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා හම්බන්තොට, නැත්නම් ලුණුගම්වෙහෙර, එහෙම නැත්නම් තිස්සමහාරාමයේ tuitionවලට එහෙම ගියා ද?

ගරු දිලිප් වෙදආරච්-චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදඅූරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
නැහැ, නැහැ. එතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයට වැඩ කළා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා 1993න් පස්සේ හම්බන්තොට දිස්ත්‍රික්කයට වැඩ කළා මිසක්, වියුෂන් පන්තිවලට නම් ගියේ නැහැ කියන එකට සාක්ෂි විධියට අපේ ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා ඉන්නවා. මෙවැනි චෝදනාවක් තිබුණා නම්, නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාට අවස්ථාව තිබුණා, ඒ දවස්වල ඒක පාර්ලිමේන්තුවේදී කියන්න. හැබැයි, මේ කිසිම තැනක සජිත් ප්‍රේමදාස මැතිතුමාට මේ සම්බන්ධයෙන් චෝදනාවක් නැහැ.

ඒ නිසා ඒ වාගේ බොරු අවලාද නහන්න එපා; චෝදනා කරන්න එපා. මේ තිබෙන ප්‍රශ්න අමතක කරන්න විපක්ෂයට මඩ ගහන්න, බෝම්බ ගහන්න, ලැයිස්තු ඉදිරිපත් කරන්න උත්සාහ කරන්නේ නැතුව ඔබතුමන්ලා එතැනින් එහාට යන්න. ඔබතුමන්ලාගේ ප්‍රගති වාර්තාව දැන් ඉදිරිපත් කරන්න. මාස තුනේ ප්‍රගති වාර්තාව තිබෙනවා; ජනාධිපතිතුමාගේ මාස හයේ -අවුරුදු භාගයේ- ප්‍රගති වාර්තාව තිබෙනවා; අන්න ඒවා ඉදිරිපත් කරන්න. මෙන්න අපි මේවා කළා, මෙන්න මේ ක්‍රියාමාර්ග ගත්තා කියලා, ඒවා ඉදිරිපත් කරලා කියන්න.

මට ඊයේ හම්බ වුණා නේ, ඔබතුමන්ලාගේ අය වැය ලේඛනයේ තිබුණු හොඳම බොරුව. ඒ හොඳම බොරුව තමයි, බිංගිරිය ඇතුළුව අලුතෙන් ආයෝජන කලාප බිහි කරනවාය කියන එක. බිංගිරිය ආයෝජන කලාපය හැදුවේ 2018දී. ඒකත් අලුතෙන් හදන එකක් විධියට දාලා, රුපියල් බිලියන 0.9ක් -කෝටි 90ක්- වාගේ සොච්චම් මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ මුදල බිංගිරිය හදා ගන්නවත් ප්‍රමාණවත් නැහැ. ඒ නිසා ඒ විධියට රටේ ජනතාව රවටන්නේ නැතුව ඔබතුමන්ලා ඇත්තටම ගත්ත ක්‍රියාමාර්ග -පියවර- වාගේම ඒවායේ ප්‍රගතිය රටේ ජනතාවට කියන්න. දැන් ඒ ප්‍රගතිය මනින්න හොඳ අවස්ථාවක් පැමිණ තිබෙනවා. පළාත් පාලන මැතිවරණයට නාම යෝජනා භාර ගන්නා අවසාන දවස තමයි හෙට. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම එකක් කියනවා. බිංගිරියේත්, උඩුබද්දාවේත් ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් පත් වෙන්නේ වෙන කොහෙන්වත් නොවෙයි, අනිවාර්යයෙන්ම සමගි ජන බලවේගයෙන්. ඒ වාගේම මේ පළාත් පාලන ආයතන 300න්, 100කට වැඩි ප්‍රමාණයක සභාපතිවරුන් පත් වෙන්නේ ඔබතුමන්ලාගෙන් නොවෙයි, සමගි ජන බලවේගය ප්‍රමුඛ විපක්ෂයෙන් බව මම කියනවා. මේවා හැන්සාඩ්ගත කරලා තියාගන්න. ලියලා තියාගන්න; සටහන් කරලා තියාගන්න. *[බාධා කිරීමක්]* මොකක්ද? *[බාධා කිරීමක්]* විවිධ කණ්ඩායම් එකතු වුණාට අපි තනි පක්ෂයක් විධියට ඉල්ලන්නේ. ඒ නිසා පැහැදිලිවම රටේ ජනතාව ගමේ බලය දෙන්නේ, ගමේ හයිය තිබෙන මිනිසුන්ට; ගමේ ශක්තිය තිබෙන මිනිසුන්ට.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
සජබයේ සභාපතිතුමා අයින් වුණේ ඇයි කියලා කියන්නකෝ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදඅූරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
ඒක අපේ වැඩක්.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
සජබයේ සභාපතිතුමා අයින් වුණේ, තරුණයන්ට, නවකයන්ට අවස්ථාව දෙන්න. අපි මේ තනතුරු හැමදාම බදාගෙන ඉන්නේ නැහැ. ටිල්වින් සිල්වා මහත්මයා -ඔබතුමන්ලාගේ මහ ලේකම්තුමා- හැමදාම ඔය තනතුර අල්ලාගෙන ඉන්නවා වාගේ අපේ සභාපතිලා, ලේකම්ලා හැමදාම තනතුරු අල්ලාගෙන ඉන්නේ නැහැ, නවකයන්ට අවස්ථාව දෙනවා. මේ පළාත් පාලන මැතිවරණයේදී ඔබතුමන්ලාට යම් ඉඟියක් රටේ ජනතාව දෙයි, ගමේ බලය කාටද දෙන්න ඕනෑ කියන එක ගැන. ගමේ බලය දෙන්න ඕනෑ, ගමේ මිනිස්සු දන්නා හඳුනන, ගමේ මිනිසුන්ගේ දුක සැප දන්නා, ගමට හයියක් දෙන්න පුළුවන්, ගමේ හයිය තිබෙන පැත්තට. ඒක ජනතාව තීන්දු කරයි. ගමේ හයිය තිබෙන්නේ වෙන කාටවත් නොවෙයි, සමගි ජන බලවේගයට බව මේ අවස්ථාවේදී මා මතක් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[ප.ප. 1.37]

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) එස්. ශ්‍රී පවානන්දරාජා)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு முதலில் உங்களுக்கு நன்றி கூறுகின்றேன்.

உணவுப் பாதுகாப்பு, வர்த்தகம், வாணிபம் ஆகிய மூன்றும் ஒன்றுடன் ஒன்று இணைந்திருந்தாலும், உணவுப் பாதுகாப்பு என்பது நாம் முக்கிய கவனம் எடுக்கவேண்டிய ஒரு துறையாக இருக்கின்றது. ஏனெனில், எமது நாட்டு மக்களின் பாதுகாப்பும் ஆரோக்கியமும் தரமான உணவு நுகர்விலேயே தங்கியிருக் கின்றது. அந்த வகையில், உணவு உற்பத்தியிலிருந்து அது நுகர்வோரைச் சென்றடையும் வரையான காலப்பகுதியில் தேவையான பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டு, மக்களுக்குத் தரமான உணவுகளை வழங்குவதன்மூலம் அவர்களை ஆரோக்கியமாக வைத்திருக்க உணவுப் பாதுகாப் பானது உதவுகின்றது.

[ගරු එස්. ශ්‍රී ඛවානන්දරාජා මහතා]

இந்த அமைச்சின்கீழ் கூட்டுறவுத்துறையும் வருகின்ற படியால், அது பற்றியும் நான் இங்கு கூறவேண்டி இருக்கின்றது. கூட்டுறவுத் துறையானது, வட மாகாணத்தின் யாழ்ப்பாண மாவட்டத்தில் மிகவும் முன்னணித் துறையாக முன்னர் இருந்தது. 'கூட்டுறவே நாட்டுயர்வு' என்ற தாரக மந்திரத்தின்படி, மக்களுக்காக அர்ப்பணிப்புடனும் ஆளுமை யுடனும் சேவை நோக்குடனும் இலாபகரமாக இயங்கிவந்த கூட்டுறவுத் துறையானது, இன்று பல்வேறு காரணங்களால் நலிவடைந்துபோய் இருக்கின்றது. அதற்கு மீண்டும் புத்துயிர் அளித்து, அதனைச் சீர்படுத்தவேண்டிய நிலையில் நாங்கள் இன்றிருக்கின்றோம்.

எமது காலப்பகுதியில் கூட்டுறவுத் துறையானது, சுகாதாரம் மற்றும் விவசாயத் துறைகளுடன் இணைந்து இயங்கியதோடு, கிராமிய வங்கிகளை ஸ்தாபித்து மக்களுக்கான சேமிப்பு மற்றும் முதலீட்டுத் திட்டங்களை நடைமுறைப்படுத்தியும் வந்தது. பாரிய சேவைகளைச் செய்துவந்த இந்தக் கூட்டுறவுத்துறையானது, இன்று பல்வேறு காரணங்களால் பாதிக்கப்பட்டுள்ளது. குறிப்பாக, அரசியல் மயமாக்கல், நிர்வாகச் சீர்கேடு, பக்கச்சார்பான நியமனங்கள், தகுதியானவர்கள் உள்வாங்கப்படாமை போன்ற காரணங் களால் இன்று கூட்டுறவுத்துறை நலிவடைந்துள்ளது. எனவே, கூட்டுறவுத்துறையை முன்னேற்றுவதற்குத் தேவையான நடவடிக்கைகளை நாங்கள் எடுக்க வேண்டியிருக் கின்றது.

முன்னர், வட மாகாணத்தில் கூட்டுறவுப் பயிற்சிக் கல்லூரியானது வவுனியா - பூந்தோட்டத்தில் இயங்கி வந்தது. பொல்கொல்லையில் இயங்கி வந்த கூட்டுறவுப் பயிற்சிக் கல்லூயில் எமது ஊழியர்கள் பயிற்சி பெற்று இருக்கிறார்கள். இன்று அந்தக் கூட்டுறவுப் பயிற்சிக் கல்லூரிகள் மூடப் பட்டுள்ளதால், எங்களால் தரமானதொரு கூட்டுறவு நிறுவனத்தை உருவாக்க முடியாமல் உள்ளது. குருநகரில் இருக்கின்ற காணியொன்று கூட்டுறவுப் பயிற்சிக் கல்லூரிக்காக வழங்கப்பட்டிருந்தது. இன்று அந்தக் காணியில் தனியார் அத்துமீறி இருப்பதால், அதனையும் பயன்படுத்த முடியாத நிலையில் நாங்கள் இருக்கின்றோம். கூட்டுறவின் தந்தை என அழைக்கப்படும் வீரசிங்கம் அவர்களின் ஞாபகார்த்த மண்டபத்தில் இன்று அந்தக் கல்லூரி சிறியளவில் இயங்கி வருகின்றது. எனவே, பூந்தோட்டத்தில் இருக்கின்ற கூட்டுறவுப் பயிற்சிக் கல்லூரியை மீளவும் திறப்பதற்கு நடவடிக்கை எடுக்கவேண்டிய தேவை இருக்கின்றது.

நுகர்வோர் பாதுகாப்பு அதிகாரசபையின் சேவையானது, உணவுப் பாதுகாப்பு விடயத்தில் மிக முக்கியமாகக் காணப்படுகின்றது. அந்த அதிகாரசபையின் அதிகாரிகளின் பணிகள் மிகவும் அத்தியாவசியமானது. ஏனெனில், அவர்கள் தான் தரமான அல்லது சுகாதாரமான உணவுகள் மக்களுக்குக் கிடைப்பதில் முக்கிய பங்கு வகிக்கின்றார்கள். எனவே, அந்த ஊழியர்களின் எண்ணிக்கையையும் அவர்களின் சேவையின் தரத்தையும் நாங்கள் அதிகரிக்கவேண்டிய தேவையிருக் கின்றது. இந்த அமைச்சின்கீழ் வரும் 'மஹபொல' கொடுப்பனவானது, பல்கலைக்கழக மற்றும் தொழில்நுட்பக் கல்லூரி மாணவர்களுக்குத் தங்களது கல்வியைத் தொடர உதவுகின்றது. தற்போது இந்தக் கொடுப்பனவானது அதிகரிக்கப்பட்டுள்ளமை மிகவும் வரவேற்கத்தக்கது.

எமது வட மாகாணத்தில் பொருளாதார மையங்கள் உருவாக்கப்படுவதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்பட்டனவே ஒழிய, தற்பொழுது அங்கு எந்தவொரு பொருளாதார மையமும் இல்லை. யாழ்ப்பாணம், கிளிநொச்சி, வவுனியா ஆகிய மாவட்டங்களிலுள்ள பொருளாதார மையங்கள் யாவும் இன்று செயற்படாத நிலையிலேயே காணப்படுகின்றன. அவற்றை விரைவாகச் செயற்படுத்தி, மக்களுக்குச் சேவை வழங்கக்கூடிய நிலையை நாங்கள் உருவாக்க வேண்டும். இன்று யாழ்ப்பாண மாவட்டத்துக்குத் தேவையான மரக்கறி மற்றும் ஏனைய உணவுப் பொருட்கள் தம்புள்ளையிலுள்ள பொருளாதார மத்திய நிலையத்திலிருந்தே வருகின்றன. இதனால் அங்குள்ள வர்கள் உடனுக்குடன் அந்தப் பொருட்களைப் பெற்றுக் கொள்ள முடியாத நிலை காணப்படுகின்றது.

1981ஆம் ஆண்டு யாழ். நூலகம் எரிக்கப்பட்டபோது, யாழ்ப்பாண நகரத்தில் இருந்த சந்தையும் எரிக்கப்பட்டது. அந்தச் சந்தையைப் புதிதாகக் கட்டித்தருமாறு நாங்கள் பலமுறை கேட்டிருக்கிறோம். அதனைச் செய்து தருவதற்கு வணிகர் கழகமும் புலம்பெயர் அமைப்புகளும் தயாராக இருக்கின்றன. எனவே, அதனைச் செய்யவேண்டிய தேவை இருக்கின்றது. யாழ். மாவட்டத்திலுள்ள ஏழு தீவுகளில் நான்கு தீவுகளுக்கு கடல்மூலமாகவே பொருட்களை எடுத்துச் செல்ல வேண்டிய தேவை இருப்பதனால், அதற்கென தனியானதோர் இறங்குதுறையை அமைக்கவேண்டிய அவசியமும் காணப்படுகின்றது. மேலும், யாழ். மாவட்டத்தில் இருக்கின்ற 24 பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களும் நூற்றுக்கும் மேற்பட்ட ஏனைய சங்கங்களும் இன்று இயங்கமுடியாத நிலையில் இன்று காணப்படுகின்றன. அவற்றுக்கு நிதி உதவிகளை அல்லது இலகு கடன் வசதிகளை வழங்கி, அவற்றைத் திரும்பவும் நல்ல நிலைக்குக் கொண்டுவர வேண்டிய கடமை எங்களுக்கு இருக்கின்றது. அதை நாங்கள் செய்வோம் எனக் கூறி, விடைபெறுக்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 1.44]

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයි අද දින කාරක සභා අවස්ථාවේදී අපි සාකච්ඡා කරන්නේ. අපි දකිනවා, කොහොම වගකීමක්ද මේ අමාත්‍යාංශයට තිබෙන්නේ කියලා. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් අපි රටේ ජනතාවට ප්‍රමුඛව පැහැදිලි කර තිබෙනවා, ආහාර ලබා දීම සම්බන්ධව. ජනතාවට අවශ්‍ය ආහාර ලබා දීම අපේ වගකීමක්. අපි දන්නවා, මේ වෙනකොට අපේ රටේ ආහාර සුරක්ෂිතතාව බිඳ වැටී තිබෙන බව. ඒ වාගේම ආහාර සැපයුම් ජාලයේ අඛණ්ඩතාව බිඳ වැටී තිබෙන්නේ. එමෙන්ම මිල සාධාරණත්වය බිඳ වැටී තිබෙන්නේ. මෙම අමාත්‍යාංශයේ වගකීම වන්නේ ජනතාවට අවශ්‍ය ආහාර සුරක්ෂිතව, අඛණ්ඩව වාගේම සාධාරණ මිලකට ලබා දීමයි. ඒක තමයි ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිය වන්නේත්. ඒ මත ඉදිමින් තමයි අපි මේ වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ.

මම දැක්කා, විපක්ෂයේ මන්ත්‍රීවරුන් මෙම විවාදයේදී පදනමක් නැති දේවල් ගැන විවාද කරන ආකාරයක්. ඔවුන්ගේ වගකීම කුමක්ද කියලා දැනගෙන නොවෙයි, ඔවුන් කථා

කරන්නේ. පසුගිය කාලයේ ඔවුන් මේ අමාත්‍යාංශවල වගකීම් දැරුවා. අද වනවිට මේ අමාත්‍යාංශය යටතේ ආයතන 15ක් පමණ තිබෙනවා. එයින් ප්‍රධාන වශයෙන්ම අපි සතොස ගත්තොත්, පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුවේදීම කියැවුණා, සතොසට මොකක්ද කර තිබෙන්නේ කියලා. එහි සිදු වුණු ගනුදෙනු සම්බන්ධව නඩු කටයුතු පවතිනවා. ඒ වාගේම එහි සිදු වුණු වංචා, දූෂණ රාශියක් අපි දැක්කා. ඇත්තටම සතොස වසා දමන තැනට පත් වෙලා, ඒක ඇවර කර තිබුණේ. රුපියල් කෝටි 2,000ක පාඩුවක් ලැබූ ආයතනයක් මේක. නමුත් අපේ ආණ්ඩුව යටතේ මෙම අමාත්‍යාංශය මඟින් සතොස ආයතනය නැවත වතාවක් විධිමත්ව සංවර්ධනය කර ඉදිරියට ගෙනියන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදා තිබෙනවා. පසුගිය කාලයේ එම වගකීම අත්හැරපු කණ්ඩායම ඇත්තටම මේ රටේ ජනතාව ගැන හිතුවාද? ජනතාවට අවශ්‍ය ආහාර ලබා දීම, ආහාර සුරක්ෂිතතාව වාගේම සාධාරණ මිලකට ආහාර ලබා දීම ගැන වගේවගක් නැතුව ඔවුන් සිටියේ. හැබැයි, දැන් ඔවුන් චෝදනා කරන්නේ මේ දේවල් කළ යුතුයි කියායි. හොඳයි, අපි ඒකට සූදානම්. අපි දැන් මේ වැඩ කටයුතු සකසා තිබෙන්නේ ඒ සඳහායි.

සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳව කථා කිරීමේදී සඳහන් කළ යුතුයි, ඒ තුළ බරපතළ බිඳ වැටීමක් සිදුවී තිබුණු බව. ඒ වාගේම වංචා, දූෂණ පිරුණු ආයතන බවට ඒවා පත් වෙලා තිබුණේ. ඒවායේ වගකීම් දැරූ අමාත්‍යවරු තමයි දැන් මේවා ගැන කථා කරන්නේ. අද වනවිට සමුපකාරය කොතැනද තිබෙන්නේ? අපි දන්නවා, ආහාර නිෂ්පාදනයේදී අප කෘෂිකර්ම අමාත්‍යාංශයට, ධීවර අමාත්‍යාංශයට, කර්මාන්ත අමාත්‍යාංශයට සහ වැවිලි අමාත්‍යාංශයට ප්‍රමුඛතාව ලබා දී තිබෙන බව. ඒවා ආහාර නිෂ්පාදනයට දායක වන අමාත්‍යාංශ. හැබැයි, මේ නිෂ්පාදන ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයක් තිබෙන්නේ කොතැනද? එය සිදු වන්නේ සමුපකාරය හරහායි. නමුත් අද වනවිට සමුපකාර බිඳ වැටී තිබෙන්නේ; විනාශ කර තිබෙන්නේ. අද වනවිට පුත්තලම දිස්ත්‍රික්කයේ පවතින සමුපකාරවල තත්ත්වය ගත්තාම, ඒවායේ ගන්න දෙයක් නැහැ. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සනත් නිශාන්තලා වාගේ අය තමන්ගේ පෞද්ගලික දේපළ බවට පත් කරගෙන තිබුණා, ආරච්චිකට්ටුව සමුපකාරය. ඒ සමුපකාරයේ නිලවරණය පැවැති වෙලාවක, ප්‍රකාශිත වුණු ඡන්ද ප්‍රතිඵලයට අනුව ඒ සමුපකාරය පිහිටුවන්න ඉඩ දුන්නේ නැහැ. ඊට පසුව උසාවි ගියා; බොරු චෝදනා එල්ල කළා. දැන් ඒවායේ කටයුතු නවත්වා තිබෙන්නේ. එතැනට ඒවා පත් කරලා. තක්කඩි වාගේ අය ඒවා ඇතුළේ ඉඳිමින් තවම ඒවා භුක්ති විඳිනවා. ඒ නිසා අපි නීති විධිමත්ව ක්‍රියාත්මක කරලා, ඒවායෙන් ජනතාවට සහන ලැබෙන විධියට කටයුතු කරන්න තීන්දු-තීරණ අරගෙන තිබෙනවා. වෙන්නප්පුව ගත්තත් තත්ත්වය එහෙමයි. අපි දන්නවා, ඒ සමුපකාරයට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති මුතුරාජවෙල ඉඩම් වගයක් අත්පත් කර ගැනීම නිසා නඩු මාර්ගවලට ගිහින් තිබෙන බව. ඒවා දූෂිත ආයතන බවට පත් වෙලා. තවදුරටත් ඒවා විනාශ කරගෙන යනවා.

ඒ නිසා මේ සමුපකාර ක්ෂේත්‍රය ගොඩගන්න ඕනෑ. නිෂ්පාදනය කරන ආහාර ටික ජනතාවට විධිමත්ව ලබා දෙන ක්‍රමවේදය තමයි සමුපකාරය තුළ තිබෙන්නේ. නමුත් සමුපකාර බිඳ වැටිලා, දූෂිත තැන් බවට පත් කර තිබෙනවා. අපිට ලොකු වගකීමක් තිබෙනවා, නිෂ්පාදනවල මිල සාධාරණව පවත්වා ගෙන යෑමට. භාණ්ඩ මිල උච්චාවචනය වීම පාලනය කරගන්න අපේ අමාත්‍යාංශයට වගකීමක් තිබෙනවා. එම කටයුතු විධිමත්ව පවත්වා ගෙන යෑමට අලුතින් ආයතන පිහිටුවිය යුතුයි. ධීවර කර්මාන්තය ගත්තත්, ඒ හරහා අපේ රටට අවශ්‍ය මත්ස්‍ය සම්පත ගෙනැල්ලා, ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාව සපුරාලීමට කටයුතු කළ යුතුයි. එහිදී ධීවර ක්ෂේත්‍රය විධිමත් කිරීමට සමුපකාර ක්ෂේත්‍රයත් වැදගත්. ඒ නිසා අපි සමුපකාර ක්ෂේත්‍රය හරහා මත්ස්‍ය සම්පත ජනතාවට විධිමත්ව ලබා දීමට බලාපොරොත්තු වෙනවා.

අපේ අමාත්‍යාංශයට තිබෙන විශේෂ කාර්ය භාරයක් තමයි, සමුපකාර ක්ෂේත්‍රය, සතොස ආයතන විධිමත් කර, සංවර්ධනය කර, ශක්තිමත් කර ජනතාවට සේවය කිරීම. හැබැයි, අපිට පෙනී ගිය විධියට අද විපක්ෂයේ සිටින අය තුළ එදා ඒ දේ කරන්න සූදානමක් තිබුණේ නැහැ. ඔවුන් එදා ඒ කාර්ය භාරය අත්හැර සිටියේ. අද ඔවුන් ඇවිල්ලා, "අපට වැරදුණා. ඔයගොල්ලන් මේක කරන්න." කියලා අපිට කිව්වාට වැඩක් නැහැ. ඔවුන් විසින් බිඳ වටිටපු මේ ආයතන අද නැවත අලුතින් පටන් ගන්න වෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමා, මේවා අලුතෙන් පටන් ගන්න වැඩ කටයුතු හදලා තිබෙනවා. බිඳ වටිටපු අමාත්‍යාංශ, ආයතන නැවත හදනවා කියන්නේ ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. මොකද, ඔවුන් ඒවා හොඳ තැනකට ගෙනැල්ලා ස්ථාවර තැනක තිබුණා නම් එතැන ඉඳලා අපිට ගෙනියන්න පුළුවන්. නමුත් ඒවා බිඳ වටිටලා, බිමට සමතලා කරලා, වංචා දූෂණ කරලා අපිට දීලා තිබෙන්නේ පරඬැල් ටිකක්. මේ පරඬැල් විධිමත් කරලා, සංවර්ධනය කරලා ජනතාවට සේවය කරන ආයතන බවට පත් කරන්න අපි සූදානම් වෙලා තිබෙනවා. ඒ නිසා අපිට චෝදනා කරන්න ඔවුන්ට බැහැ. චෝදනා නැහැ. හැබැයි ඔවුන්ට චෝදනා තිබෙනවා. නමුත් ඒවාට වග කියන්නේ නැහැ. අපේ රටේ දේශපාලනය තුළ, කෙනෙකු පාලනය කරලා වෙනත් පාලනයකට දුන්නාට පස්සේ වගකීමක් නැහැ, වගවීමක් නැහැ, ඒවාට වගකියන්නේ නැහැ. මෙතෙක් කල් වංචා, දූෂණ කරලා එකිනෙකාගේ පිට කසාගෙන තමන් බේරිලා හිටපු දේශපාලන සංස්කෘතියක් තිබෙනවා. හැබැයි අපි මේ හැම ආයතනයක්ම විධිමත් කරනවා. ඒ වාගේම පරීක්ෂණ කරලා ඒ ආයතන විනාශ කරපු අයට දඬුවම් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපේ ජාතික ජන බලවේගයේ රට ගොඩනඟන, ජනතාවට සහන දෙන වැඩ පිළිවෙළ තුළ අපේ අමාත්‍යාංශයට විශේෂ වගකීමක් තිබෙනවා. මොකද, ජනතාවගේ ජීවිත සම්බන්ධව අපිට තිබෙන වගකීම තමයි, ජනතාවට ආහාර ලබාදීම. එහිදී සුරක්ෂිතභාවය ඇතිව සහ මිල සාධාරණව ඒවා ලබා දීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කර තිබෙනවා. වැඩි කල් යන්නේ නැහැ, මේ වගකීම අපි හරියට ඉටු කරමින් රටේ ජනතාවට සහන දෙන වැඩ පිළිවෙළ ඇතුළේ මේවා ආරක්ෂා කරලා, සංවර්ධනය කරලා, විධිමත් කරලා, මිල නියාමනය කරලා, ආහාර සුරක්ෂිතතාව මත රටේ ජනතාවට ආහාර ලබා දීමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරනවා. මේ වැඩ පිළිවෙළ ඉතා සාර්ථකව කරගෙන යද්දී ඔබතුමන්ලාගේ සහයෝගයත් අපිට ඕනෑ වෙයි. ඒ සහයෝගය ලබා දෙන්න. විවේචන කිරීමට එහා ගිහිල්ලා මේ අමාත්‍යාංශයේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යන්න ශක්තිය ලබා දෙන්න කියලා යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.50]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම පළමුවෙන්ම ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාට සුබ පතනවා. කලින් කථා කළ මන්ත්‍රීතුමා කියපු විධියට ආයතන සියල්ල දියුණු කරන්න ඔබතුමාට පුළුවන් වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.

[ගරු ඩී.වී. චානක මහතා]

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, අද මට කථා කරන්න ටිකක් වැඩිපුර වෙලාව තිබෙනවා. ඒ කියන්නේ ඔබතුමාට කථා කරන්න වෙලාව දුන්නත් ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්න කිහිපයක් අහන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මම පළමුවෙන්ම අහන්න කැමතියි මේ වෙනකොට ඔබතුමන්ලා වී මෙට්‍රික් ටොන් කීයක් මිලදී ගෙන තිබෙනවාද කියලා. ඔබතුමන්ලා ඒ සඳහා රුපියල් බිලියන 5ක් වෙන් කළා. බිලියන 5ක් කියන්නේ, සාමාන්‍යයෙන් දවස් හතරහමාරකට අවශ්‍ය වී තමයි මිලදී ගන්න පුළුවන් වන්නේ. එතකොට ඔබතුමා මේ වෙද්දී කොච්චර ප්‍රමාණයක් මිලදී ගෙන තිබෙනවාද? මගේ වෙලාව ගත්තත් කමක් නැහැ, ගරු ඇමතිතුමා. ඔබතුමාට මේ සම්බන්ධයෙන් පිළිතුරක් දෙන්න පුළුවන් නම් හොඳයි. ඔබතුමන්ලා මේ වෙනකොට කොච්චර ප්‍රමාණයක් මිලදී ගෙන තිබෙනවා ද කියලා දැන ගන්න කැමැතියි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, බිලියන 5ක් වෙන් කළේ වී අලෙවි මණ්ඩලයට. ඒක අපේ අමාත්‍යාංශය යටතේ නොවෙයි තිබෙන්නේ. ඔබතුමාට දැන් අහලා තොරතුරු කියන්නම්.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු ඇමතිතුමා මම ඒ ප්‍රශ්නය අහන්න හේතුව, ඔබතුමාට තමයි මිල පාලනය කරන්න තිබෙන්නේ. මොකද, මිල අහස උසට යන වෙලාවේ ඔබතුමන්ලා කියපු කාරණයක් තමයි, රජය සතුව වී නැහැ, රජය සතුව සහල් තිබුණේ නැහැ, ඒ නිසා තමයි සහල් මිල ඉහළට ගියේ කියන එක. ඒක තමයි ඔබතුමන්ලාගේ තිබුණ තර්කය. ඒ නිසා ඇමතිතුමනි, මම විශ්වාස කරනවා ඔබතුමා මීට වැඩිය දත්ත ගැන දැන ගෙන හිටියා නම් හොඳයි කියා. වී අලෙවි මණ්ඩලයෙන් තමයි වී මිලදී ගන්නේ කියලා මම දන්නවා. හැබැයි ඒක සතොසට අරගෙන හෝ ඔබතුමන්ලා මිල පාලනය කරන ක්‍රමවේදයක් ඇති නේ? ඒ නිසා ඒ දත්ත කියයි කියලා බලාපොරොත්තු වෙනවා. මොකද, අද හවස් වෙනකන් ඉන්න වෙන්නේ නැහැ. හෙට nominations භාර දෙන අවසන් දිනය. ඒ නිසා ඔබතුමා කඩිනමින් උත්තරයක් ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අනෙක් කාරණය මේ ආණ්ඩුව බලයට ආවාට පසු -මාලිමාව රජය බලයට පත් වෙලා; ගරු අනුර කුමාර දිසානායක මහත්තයා ජනාධිපති ලෙස පත් වෙලා- සහල් මිල වැඩි වෙන වෙලාවේ මෙතුමන්ලා කියපු දෙයක් තමයි "මේක තමයි ගිය අවුරුද්දෙත් තිබුණු මිල" කියන එක. ඒ කියන්නේ, 2023 ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් වාගේම 2024 ජනවාරි මාසයේ තිබුණෙත් ඔය වාගේම මිල වැඩිවීමක්ය කියලා කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ website එකේ තිබෙනවා අවුරුද්දේ හැම සතියකම සහල්වල මිල ගණන් සහ සෑම අත්‍යවශ්‍ය භාණ්ඩයකම මිල ගණන්. මම ඒ විස්තරවල summary එකක් ගත්තා.

මේ summary එකෙන් 2023 වසරේ ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවල සහ 2024 ජනවාරි මාසයේ මිල ගණන් විස්තර වාගේම මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ 2024 ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවල වාගේම 2025 ජනවාරිවල මිල ගණන් පිළිබඳ විස්තර මම ගත්තා. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ මේ දත්තයන්ට අනුව පසුගිය ආණ්ඩුව තිබෙන වෙලාවේ, 2023 ඔක්තෝබර් මාසයේ රතු නාඩුවල average මිල රුපියල් 205යි.

නොවැම්බර් වෙනකොට එය රුපියල් 217ට ගිහිල්ලා තිබෙනවා; දෙසැම්බර් වෙනකොට රුපියල් 220 වෙලා තිබෙනවා; ජනවාරි මාසයේත් රුපියල් 220යි. හැබැයි 2024දී මාලිමාව ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ 2024 ඔක්තෝබර් මාසයේදී රුපියල් 230යි; නොවැම්බර් මාසය වෙනකොට රුපියල් 240යි; රුපියල් 243ට යනවා දෙසැම්බර් වෙද්දී. 2025 ජනවාරි වෙනකොට රුපියල් 275 දක්වා නාඩු මිල වැඩි වෙලා තිබෙනවා.

ඒ වාගේම සුදු කැකුළු මිල ගත්තොත්, කලින් ආණ්ඩුව බලයේ සිටි වෙලාවේදී, 2023 ඔක්තෝබර් මාසයේ ඉඳලා 2024 ජනවාරි දක්වා රුපියල් 202, 209, 211, 211 ආදී වශයෙන් පැවතිලා තිබෙනවා. ඒ වාගේම රතු කැකුළු මිල ගත්තොත්, රුපියල් 190, 195, 200, 201 ආදී වශයෙන් පැවතිලා තිබෙනවා. හැබැයි මේ මාලිමාව ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ 2024 ඔක්තෝබර් මාසයේදී සුදු කැකුළු මිල රුපියල් 218යි; නොවැම්බර් මාසය වෙනකොට රුපියල් 200යි; දෙසැම්බර් මාසය වෙනකොට රුපියල් 236ට ගිහිල්ලා, 2025 ජනවාරි මාසය වෙනකොට රුපියල් 250ට ගිහිල්ලා තිබෙනවා. රතු කැකුළු මිල ගත්තොත්, රුපියල් 216 ඉඳලා රුපියල් 226යි, 240යි, 280යි ආදී වශයෙන් වැඩි වෙලා තිබෙනවා.

හැබැයි මේ ආණ්ඩුව බලයට එනකොට සැප්තැම්බර් මාසයේදී නාඩු කිලෝවක average මිල රුපියල් 217යි. ඒක රුපියල් 275ට යනවා. සුදු කැකුළු මිල රුපියල් 203යි. ඒක යනවා රුපියල් 250ට. රතු කැකුළු මිල රුපියල් 189යි. ඒක යනවා රුපියල් 280ට. හැබැයි ඔබතුමන්ලා එදා මිල ඉහළ යාමට හේතුව විධියට කිව්වේ, රජය සතුව වී නැහැ කියන එක. හැබැයි ඔබතුමන්ලා රජයට වී මිලදී ගන්න වෙන් කරලා තිබෙන්නේත් රුපියල් බිලියන 5යි. ඒ කියන්නේ උපරිම දවස් හතරහමාරටයි. දවස් හතරහමාරකට වී තියාගෙන ඔබතුමන්ලා කොහොමද මිල පාලනය කරන්නේ? හැබැයි අපට තිබෙන තොරතුරු අනුව ඔබතුමන්ලාට වී ලැබිලා තිබෙන්නේ, දවසෙනුත් හතරෙන් එකකටයි.

දවසකටවත් ඔබතුමන්ලා වී අරගෙන නැහැ. ඔබතුමා තොරතුරු අරගෙන කියන්න. දවසකට අවශ්‍ය සහල්වත් ඔබතුමන්ලා මිලදී ගෙන නැහැ. ජනවාරි මාසය වෙනකොට රුපියල් 280ට තිබුණා නම් හදිසියේ ඡන්දය තියන්න වුවමනා වුණේ ජූනි මාසය වෙනකොට මේ තත්ත්වයම ඇති වෙන හින්දා නේද? ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා, දැනටමත් කීරි සම්බාවල පාලන මිල -සිල්ලර මිල- තිබෙන්නේ, රුපියල් 260ට බව. හැබැයි, දැනට විකුණන්නේ රුපියල් 300ට. ඔන්න, දැන් කීරි සම්බාවලින් පටන් ගෙන තිබෙනවා. තව රතු හාල් වර්ගයක් තිබෙනවා, කුරුළු තුඩ කියලා. ඒ සහල් පාදුක්ක පැත්තේ තිබෙනවා, රුපියල් 280යි. පාලන මිලට වඩා රුපියල් 45ක් වැඩියෙන් තමයි දැනටමත් ඒවා විකුණන්නේ. කීරි සම්බා දැනටත් විකුණන්නේ රුපියල් 40ක් වැඩියෙන්. ඒ හින්දා තමයි ඡන්දය හදිසියේ ආවේ. වෙන කිසිම හේතුවක් නැහැ. ගිය අවුරුද්දේ රුපියල් 80ට, රුපියල් 90ට ගත්ත වී ටිකෙන් හාල් ගන්න වුණේ රුපියල් 280ට නම්, මෙතුමන්ලා කියන විධියටම රුපියල් 130ට වී ගත්තා නම්, රටේ ජනතාවට සහල් ගන්න වෙන්නේ කීයටද? ඒ විධියට බැලුවොත් නම් රුපියල් 330ටත් වඩා ඉහළ යනවා, සහල් කිලෝවක්. ඔබතුමන්ලා කියන විධියට දැන් වී අතේ නැත්නම්,-

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු චානක මන්ත්‍රීතුමා මේ කියන්න උත්සාහ කරන්නේ මොකක්ද? ගිය අවුරුද්දේ රුපියල් 80ට, 90ට ගත්ත වීවලින් අපට හාල් ගන්න වුණේ රුපියල් 230ට, 240ට. මේ අවුරුද්දේ රුපියල් 120ට වී මිලදී ගත්තාම හාල්

රුපියල් 300ට ඉහළ යයි. කිසිසේත් බය වෙන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කිව්වා වාගේ අපට ආණ්ඩුව භාර දෙනකොට ගබඩාවල සහල්, වී පුරවා තිබුණේ නැහැ නේ. ඒක පැහැදිලියි නේ. රටේ වී අස්වැන්නේ අඩුවක් තිබුණා. ඒ නිසා වී ගෙනෙන්න කිව්වා, හාල් ගේන්න කිව්වා. හාල් ගේන්න කියද්දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන අපට, ජනාධිපතිතුමාට කිව්වා, හාල් ගේන්න එපා කියලා. හැබැයි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කිව්වා, මදි වෙන නිසා හාල් මෙට්‍රික්ටොන් 70,000ක්වත් අපි ගෙන්වමු කියලා. අපි හාල් මෙට්‍රික්ටොන් 186,000ක් ගෙන්නුවා. ඒත් ප්‍රශ්නය ඉතිරි වෙලා තිබෙනවා. මේ කන්නයේ අපේක්ෂා කරපු වී අස්වැන්න මෙට්‍රික්ටොන් මිලියන 2.9යි. හැබැයි දැන් ඒක බැහැලා තිබෙනවා, මෙට්‍රික්ටොන් මිලියන 2.4ට. කාලගුණ තත්ත්වයන්, ගංවතුර තත්ත්වයන් නිසා. යම් හෙයකින් මේ තත්ත්වයත් එක්ක සහල් වෙළඳපොළේ ප්‍රශ්නයක් එනවා නම්, අනිවාර්යයෙන් රජයට සිද්ධ වෙනවා, ජනතාවට සහල් ලබා දීම සඳහා සහල් ආනයනය කරන්න.

අපි ඉතාම පැහැදිලිව කිව්වා, ස්වාභාවික අනතුරක්, ආපදාවක් නැති වුණොත් තමයි අපට හාල් ගෙන්වන්න ඕනෑ නැත්තේ කියලා. හැබැයි, අපේක්ෂා කරපු අස්වැන්න මෙට්‍රික්ටොන් ලක්ෂ 5කින් අඩු වෙලා තිබෙනවා. අපි වෙළෙඳ පොළේ පාලන මිලට වඩා සහල් මිල ඉහළ යන්න දෙන්නේ නැහැ. මේ දිනවල පවතින මේ තත්ත්වය පාලනය කිරීම සඳහා අපි කටයුතු කරනවා. මේ වෙනකොට රජයේ බැංකු හරහා සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් සඳහා රුපියල් බිලියන 10ක ණය ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. මහා පරිමාණ මෝල් හිමියන් සඳහා රුපියල් බිලියන 15ක ණය දීලා තිබෙනවා. එය බිලියන 45 දක්වා වැඩි වෙයි කියලා අපේක්ෂා කරනවා. ඒ අනුව සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියනුත් වෙළෙඳ පොළට ප්‍රවිෂ්ට වෙනවා. වීවල දැන් තිබෙන මිල අනිවාර්යයෙන් පහළට වැටෙනවා. මොකද, අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර පැතිවල ගොයම් කැපීම දැන් ආරම්භ වෙලා තිබෙනවා. වී අස්වැන්න වේගයෙන් එනකොට පාලන මිලට වී මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කරනවා.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ඩ.ව්. චානක)
(The Hon. D.V. Chanaka)

ගරු අමාත්‍යතුමනි, මේ මොහොතේත් පාලන මිලෙන් ඉහළයි තිබෙන්නේ. ඔබතුමා වැඩි ඇතක යන්න ඕනෑ නැහැ, මේක හොයලා බලන්න. මේ අවස්ථාවේ කීරි සම්බාවල පාලන මිල රුපියල් 260ක් ලෙස තිබුණාට විකුණන්නේ රුපියල් 300ට. ඔබතුමා පාදුක්කට ගිහිල්ලා කුරුළු තුඩ කියන රතු හාල් ගන්නකෝ. ඒ රතු හාල් තිබෙන්නේ, රුපියල් 280ට. ඉතින් දැනටම පාලන මිලෙන් ඉහළ ගිහිල්ලා නේ. එතකොට ඔබතුමා කියන කාරණය සම්පූර්ණයෙන්ම වෙනස්. තවම රතු හාල්වල මිල වැඩි වෙන්න ගත්තේ නැහැ. නාඩුවල මිල වැඩිවෙන්න ගත්තේ නැහැ. හැබැයි, කීරි සම්බාවල මිල වැඩි වෙන්න පටන්ගෙන තිබෙනවා. ඒ වාගේම කුරුළු තුඩ හාල්වල මිලත් වැඩි වෙන්න පටන්ගෙන තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)

කුඩාවැල්ල පැත්තේ හාල් මේ ගණන් ද දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ ජනතාවගෙන් සියයට 60ත්, 65ත් අතර පරිභෝජනයට ගන්නේ නාඩු සහල්. රතු සහල් පරිභෝජනයට ගන්නවා, සියයට 20ක්, දකුණ සහ විශේෂයෙන් වතුකරය පැත්තේ කට්ටිය. ඉතිරි සියයට 10ත්, 5ත් අතර අය තමයි සම්බා සහ කීරි සම්බා ගන්නේ. ඒ නිසා කීරි සම්බා ප්‍රශ්නය, ඒවා පරිභෝජනය කරන ජනතාවට තිබෙනවා. නැතුව නොවෙයි. හැබැයි, තව ටික දවසක් යනකොට මේ ප්‍රශ්නය අනිවාර්යයෙන් විසඳෙනවා. එහෙම විසඳෙන්නේ නැත්නම් ඒකට අවශ්‍ය පියවරත් අපි ගන්නවා.

ඊළඟට ගරු මන්ත්‍රීතුමාගේ අවධානයට මා යොමු කරනවා ගිය සතියේ අපි සතොස ටෙන්ඩරයෙන් හාල් ගත්තේ කොහොමද කියලා. රතු නාඩු රුපියල් 211.90යි. සුදු නාඩු රුපියල් 212.80යි. නාඩු රුපියල් 210.50යි. සම්බා රුපියල් 235යි. මේ, අපේ සතොස ටෙන්ඩරයට ආපු සහල්වල මිල. ඔබතුමා කියන විධියට යම් විධියකින් වෙළෙඳ පොළ තුළ මේ මිල වැඩි කරන්න උත්සාහ කරන ආකාරයක් තිබෙනවා. හැබැයි, රජය සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් සඳහා ණය ලබා දෙමින් වෙළෙඳ පොළේ වී මිල දී ගැනීමේ ක්‍රියාවලියට ඔවුන් අනුගත කරනවා. මිල දී ගත්තාට පසු ඔවුන්ට වී තියාගෙන ඉන්න බැහැ, සහල් නිෂ්පාදනය කරන්න ඕනෑ. ඒ හරහා වැඩිපුර සහල් මාර්කට් එකට එනකොට අනිවාර්යයෙන්ම පාලන මිලට ගෙනෙන්න පුළුවන්.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ඩ.ව්. චානක)
(The Hon. D.V. Chanaka)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ගිය අවුරුද්දේ statistics බැලුවත්, ඊට කලින් අවුරුද්දේ statistics බැලුවත්, මෙය වී අස්වැන්න වෙළෙඳ පොළට එන වෙලාව. වී අස්වැන්න වෙළෙඳ පොළට එනකොට හැම දාම සහල් මිල අඩු වෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. ඒක නොවෙයි මම කියන්නේ. ගිය අවුරුද්දේත් ප්‍රශ්නය පටන් ගත්තේ කීරි සම්බාවලින්. ලංකාවේ සහල් පරිභෝජනය ගත්තාම කීරි සම්බා පරිභෝජනය සියයට 10යි. මේ දත්ත අනුව නම් එය සියයට 10කට ආසන්න ප්‍රමාණයක්. හැබැයි, ගිය අවුරුද්දේත් ප්‍රශ්නය පටන් ගත්තේ කීරි සම්බාවලින්. ගිය අවුරුද්දේත් මේ සෙල්ලම පටන් ගත්තේ කීරි සම්බාවලින්. ඒකයි මම ඔබතුමාට පළමුවැනි warning එක දුන්නේ.

රතු කුරුළු තුඩ සහල් කියන්නේ, කීරි සම්බා වාගේ සියයට 10ක් පරිභෝජනය කරන සහල් වර්ගයක් නොවෙයි. එය රතු කැකුළු සහල්වල තවත් විශේෂයක්. ඒ සහල් වර්ගයේත් කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 280යි. කුඩා වැල්ලේත් ප්‍රශ්නය එන්නේ, ජුනි මාසයෙන් පසුවයි; දැන් නොවෙයි. ඒක නිසා තමයි මම මේ කාරණය කිව්වේ.

ගරු ඇමතිතුමනි, සහල් පරිභෝජනය සඳහා සාමාන්‍යයෙන් මාසයකට වැය වූ ගණන් මම කියන්නම්. 2023 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ ඉඳන් -ඒ කියන්නේ, ඔබතුමන්ලා ආණ්ඩු බලය ගන්න කලින් ඉඳන්- 2024 ජනවාරි දක්වා කාලය ගනිමු. ඔක්තෝබර් මාසයේ සහල් පරිභෝජනය සඳහා රටේ ජනතාවට වැය වුණේ රුපියල් බිලියන 36.5යි. නොවැම්බර් මාසයේ වැය වුණේ, බිලියන 36.2යි. දෙසැම්බර් මාසයේ වැය වුණේ, බිලියන 36.6යි. 2024 ජනවාරි මාසයේ වැය වුණා, බිලියන 37ක්. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඒක වැඩි වෙනවා. ඔබතුමන්ලා ආණ්ඩු බලය ගත්තාට පසු 2024 ඔක්තෝබර් මාසයේ බිලියන 38.9ක් වැය වෙලා තිබෙනවා. නොවැම්බර් මාසයේ බිලියන 39.4ක් සහ දෙසැම්බර් මාසයේ බිලියන 40.9ක් වැය වෙලා තිබෙනවා. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ බිලියන 42.7ක් වැය වෙලා තිබෙනවා. ඒ අනුව ගිය අවුරුද්දට සාපේක්ෂව ගත්තොත්, රුපියල් බිලියන 16ක් රටේ ජනතාවට අහිමි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් මිලියන 16,000ක්. ඔබතුමන්ලා ආණ්ඩු බලයේ ඉන්න වෙලාවේ රුපියල් මිලියන 16,000ක් මේ රටේ ජනතාවට අහිමි වෙලා තිබෙනවා. COPE එකේ වාර්තාවට අනුව බැඳුම්කර වංචාවෙනුත් ලංකාවේ ජනතාවට අහිමි වුණා කිව්වේ, රුපියල් මිලියන 11,000යි. එදා ඒ කමිටුවේ සභාපතිවරයා ලෙස ගරු සුනිල් හඳුන්නෙත්ති මහත්මයා තමයි හිටියේ. හැබැයි, සහල්වලින් මාස හතරට අහිමි වෙලා තිබෙනවා, රුපියල් මිලියන 16,000ක්; බිලියන 16ක්. 2023 අවුරුද්දේ තත්ත්වයත් 2024 අවුරුද්දේ තත්ත්වයත් ගත්තාම, දෙකම එකයි. රජය සතුව 2023 අවුරුද්දේත් වී තිබිලා නැහැ; 2024 අවුරුද්දේත් වී තිබිලා නැහැ.

[ගරු ඩී.වී. චානක මහතා]

හැබැයි, ඔබතුමන්ලා අසාර්ථක වෙලා තිබෙනවා. ඒකෙ ප්‍රතිඵලය විධියට රටේ ජනතාවට රුපියල් බිලියන 16ක් අහිමි වෙලා තිබෙනවා. එය බැඳුම්කර ගනුදෙනුවටත් එහා ගිය පාඩුවක්. බැඳුම්කර ගනුදෙනුව නිසා වෙච්ච පාඩුව රුපියල් බිලියන 11යි. සහල්වලින් ඔබතුමන්ලා නිසා රුපියල් බිලියන 16ක් අහිමි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ ගරු ඇමතිතුමා ආනයනය ගැනත් කථා කළා. මම ඒ කාරණයට එන්නයි හිටියේ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා සහල් ආනයනය කරනවා කිව්වා. හැබැයි, කලින් සහල් ආනයනය කරද්දී මොකක්ද වුණේ? ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් කාරණයක් දැන ගන්න කැමැතියි. ඔබතුමා කිව්වා, රටේ සහල් මෙට්‍රික්ටොන් 70,000ක gap එකක් තිබෙනවා කියලා. ඒ වෙලාවේ Indian High Commission එක යෝජනා කළා නේද, රජයේ මැදිහත් වීමෙන් සහල් ගෙනැවිත් දෙන්න? එසේ යෝජනා කළාද නැද්ද, ගරු ඇමතිතුමනි? ඊට පසුව ඔබතුමන්ලා කොන්දේසි 8ක් දැම්මා නේද, Indian High Commission එකට?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කවුරුන් හෝ දීලා තිබෙන්නේ වැරදි තොරතුරක්. Indian High Commission එකත් එක්ක අපියි කථා කළේ. මම අමාත්‍යාංශයේදී මහ කොමසාරිස්වරයා සම්බන්ධ වෙච්ච වෙලාවේ ඔහු සමඟ සාකච්ඡා කළා. පවතින තත්ත්වය අනුව සහල් ගෙන්වන්න අපට උදව් කරන්න කිව්වා. ඒ අනුව ඔවුන්ගේ trade සම්බන්ධ attaché ඇවිල්ලා අපිත් එක්ක සාකච්ඡා කළා. කිසිදු කොන්දේසියක් නැහැ.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
ඔබතුමන්ලා කොන්දේසි යැව්වේ නැද්ද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
අපි කිසිදු කොන්දේසියක් යවා නැහැ. *[බාධා කිරීමක්]* අපි කිසිදු කොන්දේසියක් යවා නැහැ. අපි කොන්දේසි යැව්වා කියලා ඔප්පු කළොත්, අමාත්‍යාංශයෙන් අයින් වෙනවා. මොකද කියන්නේ? කිසිදු කොන්දේසියක් යවා නැහැ. බොරු කියන්න එපා.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
පත්තරේ එහෙම වාර්තා වෙනවා. එහෙම නම් නඩු දාන්න එපායැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා බොරු පත්තර-

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
මේ, බොරු පත්තරයක් නොවෙයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
පත්තරය මොකක්ද? පත්තරේ නම කියන්න.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
පත්තරේ නමත් කියන්නම්,-

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා පත්තරේ නම අහගෙන එනකල් මම ඉතුරු ටිකත් කියන්නම්.

ගරු මන්ත්‍රීතුමා, අපි ඉන්දියාවෙන් සහල් ගෙනෙන්න ගත්තත්, G-2-G ක්‍රියාවලියට යනවා නම් අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න ඕනෑ; එහේට ගිහින් අදාළ අය හම්බ වෙන්න ඕනෑ. අපි STC එකත් එක්ක සාකච්ඡා කළා. ලංකාවේ වාගේම, ඉන්දියාවේ වෙන්නායිවල තිබෙන STC එක - ඒ ගොල්ලන්ගේ රටේ තිබෙන State Trading Corporation of India Limited එක - අපට සම්බන්ධ කළා.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
ගරු ඇමතිතුමනි, පත්තරේ නම "Sunday Lankadeepa."

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
මොකක්ද ඒකේ කියලා තිබෙන්නේ?

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
දිනය, 2025.02.16වන දා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, "Sunday Lankadeepa" කියලා, website එකේ තිබෙන එකක් වෙන්න ඇති ඔබතුමා කියනවා ඇත්තේ. ඔබතුමා ඒක සභාගත කරන්න. ඒකට අදාළ නිවැරැදි කිරීම් කරන්න කියලා අපි කියමු. *[බාධා කිරීමක්]*

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D.V. Chanaka)
ගරු ඇමතිතුමනි, නිවැරැදි කිරීමක් කරන්න තිබෙනවා නම්, ඔබතුමා ඒක කරන්න. මා කියන්නේ මේ පත්තරේ තිබෙන දේ අනුවයි. මේ පත්තරේ තිබෙන දෙයට අනුව ඔබතුමන්ලා කොන්දේසි ටිකක් දමනවා. ඔබතුමන්ලා credit ඉල්ලනවා. ඒක එකක්. තවත් එකක් තමයි, ඒ රටෙදීත්, ලංකාවේදීත් check කරන්න ඕනෑ කියන එක. ඒ පිළිබඳව විවාදයක් නැහැ. ඒක හරි. හැබැයි, ඔබතුමන්ලා ටෙන්ඩරය දමද්දී කොහේවත් credit ඉල්ලුවේ නැහැ. ටෙන්ඩරය දමද්දී credit ඉල්ලුවේ නැහැ. ටෙන්ඩරය හතර පාරක් වරදිනවා නේ, ගරු ඇමතිතුමා?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැහැ, නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔය පත්තරයේ තිබෙන බොරුවට වඩා ඇත්ත දැන ගන්න එක නේ වැදගත් වෙන්නේ. Indian High Commission එක සම්බන්ධ කරලා, අපේ සතොස සභාපතිවරයා සහ ඒ ගොල්ලන්ගේ commercial attaché සම්බන්ධ වෙලා ඉන්දියාවත් එක්ක සාකච්ඡා කළා. එහේ ටෙන්ඩරයට අනුව අපි සහල් ගන්න ඕනෑ. සහල් තොගය ගේන්න මාසයක පමණ කාලයක් යනවා. ගරු මන්ත්‍රීතුමනි, අන්න ඒ නිසා තමයි අපි තීරණය කළේ, මාර්කට් එක open කරලා අපේ රටේ ආනයනකරුවන්ට සහල් ගෙන්වන්න ඉඩ දෙන්න.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු ඇමතිතුමනි, පැහැදිලි කිරීමට බොහොම ස්තුතියි. මාසයක් කියන්නේ ලොකු කාලයක් නොවෙයි. ඔබතුමන්ලාගේ පළමුවැනි සහල් තොගය ආවේ මාස එකහමාරකට පස්සේ. ඔබතුමන්ලා ටෙන්ඩරය විවෘත කරලා, මාස එකහමාරක් ගියා සහල් එන්න. හැබැයි, ප්‍රශ්නය ඒක නොවෙයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවස්ථාවේදී මට පිළිතුරු දෙන්න. ප්‍රශ්නය ඒක නොවෙයි. 2023දීත්, 2024දීත් ලංකාවට සහල් ආනයනය කළා. 2023දී සහල් ආනයනය කරන කොට, exchange rate එක අනුව ඇමෙරිකානු ඩොලරයකට ගෙව්වේ, රුපියල් 320යි. ඩොලරයට රුපියල් 320ක් ගෙවද්දී ලංකාවට සහල් ආනයනය කළා. ඒ වෙලාවේ නාඩු සහල් ආනයනය කරලා තිබෙන්නේ, කිලෝවක් රුපියල් 205ට, සුදු කැකුළු සහල් ආනයනය කරලා තිබෙන්නේ කිලෝවක් රුපියල් 188ට. ඒ, විනිමය අනුපාතය රුපියල් 320ට තිබියදී. හැබැයි, ඔබතුමන්ලාට ටෙන්ඩර් හතරත් වරදිනවා. Indian High Commission එකෙන් මාසයක කාලයක් ඉල්ලුවා. ඔබතුමන්ලා ඒකටත් බැහැ කියනවා. හැබැයි, ඒවා ඔක්කොටම බැහැ කියලා, exchange එක රුපියල් 292ට අඩු වෙලා තිබියදී ඔබතුමන්ලා ගෙනාපු සහල් කිලෝවක් රුපියල් 240ට, 242ට තමයි මාර්කට් එකේ විකුණුවේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැහැ.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

මම මේ කියන්නේ සතොස මිල නොවෙයි. ඒ බව පෙන්වන්න, මා ළඟ සාක්ෂි තිබෙනවා. මා ළඟ තිබෙනවා, මේ කථා කරන සියල්ලට අදාළව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ලේඛන. මම ඒ ලේඛන **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමනි, මේ ආණ්ඩුව ඔබතුමන්ලාගේයි. ඒ වාගේම, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තිබෙන්නේත් ජනාධිපතිතුමා යටතේ. ජනාධිපතිතුමා යටතේ තිබෙන ආයතනයකින් මේ දත්ත දීලා තිබෙනවා. එක පැත්තකින්, Indian High Commission එකෙන් හාල් එපා කියනවා. Indian High Commission එක හරහා හාල් ගෙනාවා නම්, සතොස හරහා තමයි බෙදන්නේ. එතකොට හාල් කිලෝව රුපියල් 220ට තමයි විකුණන්න තිබුණේ. හැබැයි, Indian High Commission එකෙන් හාල් එපා කියනවා. ටෙන්ඩරය හතර වතාවක් ෆේල්. ඊට පස්සේ ගෙනාපු හාල් කිලෝවක් රුපියල් 242යි. ඒකෙන් රටේ ජනතාවට විශාල පාඩුවක් සිදු වෙනවා. අනෙක් පැත්තෙන්, ජනාධිපතිතුමා සහල් මෝල් හිමියන්ට රුපියල් 10ක් වැඩි කරලා දීලා අදට දින 100 යි. ඒ කටයුත්ත කරලා අදට දින 100 යි; රටේ ජනතාවට පාඩුව රුපියල් කෝටි 650යි. දවසේ සහල් පරිභෝජනය සහල් කිලෝ මිලියන 6.5යි. ඒක 10න් වැඩි කරන්න, දින 100න් වැඩි කරන්න. සහල් මෝල් හිමියන්ට වෙන දා ගත්තු වීවලටම අද වෙද්දී ලැබෙන extra profit එක, රුපියල් කෝටි 650යි; රුපියල් මිලියන 6,500යි.

ගරු ඇමතිතුමනි, ඉස්සර නම් ඔබතුමා ඔහොම නොවෙයි කිව්වේ. ඉස්සර නම් ජනතාවගේ පැත්තේ හිටියේ. දැන් ඉන්නේ අනෙක් පැත්තේ. දැන් ඉන්නේ ජනතාවගේ පැත්තේ නොවෙයි. ජනතාවගේ පැත්තේ හිටියා නම්, කවදාවත් සහල් කිලෝවකට රුපියල් 10ක් වැඩි කරලා රුපියල් කෝටි 650ක් වැඩිපුර උපයන්න දෙන්නේ නැහැ. ඒ මුදල බැඳුම්කර ගනුදෙනුවෙන් සිදු වුණු පාඩුව වාගේ දෙගුණයක් විතර ප්‍රමාණයක්. මේ ඔක්කොම එකතු කළාම -අර කලින් කියපු, මාස හතරට අහිමි වූ ප්‍රමාණයේ එකතුවයි, ආනයනයට අදාළ ප්‍රමාණයයි, කිලෝවකට ලබා දීපු රුපියල් 10 වාසියයි එකතු කළාම- බැඳුම්කර ගනුදෙනුවෙන් සිදු වූ පාඩුව වාගේ දෙගුණයක පාඩුවක් ඔබතුමන්ලා කරලා තිබෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු නිමල් පලිහේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.10]

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2025 අය වැය කාරක සභා අවස්ථාවේදී මා හට අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මේ වෙලාවේ මා සඳහන් කරන්න කැමැතියි, ගරු ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කරමින්, සමුපකාර ක්ෂේත්‍රය, යටිතල පහසුකම් දියුණුව සහ මූල්‍ය දිරිගැන්වීම් සඳහා වන විශේෂ වෙන් කිරීමක් කරමින්, අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සඳහා රුපියල් මිලියන 2,564ක් වෙන් කරනු ලැබූ බව. මෙතැනදී ගහට පොත්ත වාගේ ජනතාව සමඟ බැඳිච්ච ආයතනයක් ගැන තමයි අපි අද සාකච්ඡා කරන්නේ. මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි, වෙළෙඳ අංශයට නායකත්වය දෙමින්, ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට සිද්ධ කර ගැනීම සඳහා අවශ්‍ය නියාමනය කරමින්, සේවා සැපයීම සඳහා වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන තත්ත්වයකට අවශ්‍ය මූල්‍ය සහයෝගය පළ කිරීම, ඒ සඳහා අවශ්‍ය වපසරිය ගොඩනැඟීම අපි මේ තුළින් අපේක්ෂා කරන බව.

ආයතන රාශියක් මෙම අමාත්‍යාංශය යටතට ගැනුණත්, මේ අවස්ථාවේදී මා සූදානම්, මගේ කථාව ඉතා කෙටි කරුණු කිහිපයකට සීමා කරන්න. ඒ අනුව එක පැත්තකින් සමුපකාරයේ

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூலகிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නිමල් පලිහේන මහතා]

පොදු අර්ථය සහ එයින් අපි අපේක්ෂා කරන්නේ කුමක්ද යන්නත්, අනෙක් පැත්තෙන් සමුපකාර සංවර්ධනයෙහි ලා ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සම්බන්ධයෙන් වන මැදිහත්වීම ගැනත්, මේ රටේ සියලු ක්ෂේත්‍ර සමඟ බැඳිලා තිබෙන සමුපකාරය දියුණු කිරීම ගැනත්, අප අමාත්‍යාංශය යටතේ පවතින සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ගැනත් යම් අදහස් කිහිපයක් දක්වන්න මම කැමැතියි.

මේ අවස්ථාවේදී මම පැහැදිලි කරන්න කැමැතියි, සමුපකාරය පිළිබඳ අපට තිබෙන අත්දැකීම් ගැන. රටක යම් ආකාරයක පොදු අවශ්‍යතාවක්, ව්‍යසනයක්, කරදරයක් වුණාම ඉතිහාසය පුරා බොහෝ වෙලාවට අපි පිහිට පැතුවේ සමුපකාරය හරහා. නමුත් අද වෙනකොට මේ සමුපකාර ක්ෂේත්‍රය තුළ ප්‍රතිලාභ ලබන ජනගහනය මිලියන 8ක විතර ප්‍රමාණයක් මේ රටේ ඉන්නවා. ඒ එක්කම මේ සමුපකාර ජාලයට බැඳිච්ච විශාල ක්ෂේත්‍ර ප්‍රමාණයක් තිබෙනවා. ඒවායෙන් කිහිපයක් තමයි, කෘෂි ක්ෂේත්‍රය සහ වෙළෙඳ ක්ෂේත්‍රය. එයින් කෘෂි ක්ෂේත්‍රය තුළ කිරි නිෂ්පාදනය, ධාන්‍ය නිෂ්පාදනය, පොහොර නිෂ්පාදනය ආදී වූ විවිධ විධියේ කරුණු ඔස්සේ සමුපකාර සමිති ඕනෑතරම් බිහි වෙලා තිබෙනවා. අපට දකින්න තිබෙන තත්ත්වය අනුව මෙතැනදි පැහැදිලි කරගන්න අවශ්‍ය වෙන්නේ, ආපදාවකදී අපට සහායක් ලබා ගන්නවා කියනවාට වඩා, සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යන්න අපි මේ හැඩය කොයි විධියටද සකස් කරගත යුත්තේ කියන කාරණාවයි. සමුපකාර නීති රෙගුලාසිවලට අනුව සමුපකාර ස්ථාපිත කළත්, පාලනමය වශයෙන් අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගනිමින් සමුපකාර කරගෙන යන අවස්ථාවල බොහෝ වෙලාවට අපි දකින්නේ යහපතට වැඩිය අයහපත. හොරකම, වංචාව, දූෂණය සඳහා පෙළඹවීමක් ඒවා තුළ අපි දකිනවා.

විශේෂයෙන්ම මා සඳහන් කරන්න කැමැතියි, බොහෝ වෙලාවට අතුරු ව්‍යවස්ථා අනුමත කරගන්නේ පවතින පාලනයට වාසිදායක විධියට ඔවුන්ම නැවත නැවත පාලනයට එන ආකාරයෙන් කියලා. ඒ නිසා මේ අවස්ථාවේදී මා යෝජනා කරනවා, මේ ක්ෂේත්‍රය තුළ පවතින මේ වාගේ අකටයුතුකම්, අවභාවිත කරුණු ඉවත් කිරීමට, බැහැර කිරීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම, නැත්නම් ඒ සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් පත් කිරීම ආදී කටයුතු සඳහා රජයේ මැදිහත්වීම අවශ්‍යයි කියලා. ඒ සඳහා ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ක්‍රියාත්මක වෙනවා. සමුපකාරයක් කිව්වාම හුදෙක් ගනුදෙනුවක් විතරක් කරන ස්ථානයක් නොවෙයි, සේවක පිරිසක් සහ තොග නඩත්තුවක්, විවිධසේවා සැපයීම්, මුදල් ඉතිරි කිරීම්, මුදල් බැහැර කිරීම්, ණයදීම් ආදී විශේෂ වූ ගනුදෙනු රාශියකට සම්බන්ධ ස්ථානයක්. ඒ නිසා එහෙම නැත්නම් ක්ෂේත්‍රය තුළ සිටින සියලු සේවකයන්ට යුතුකමක් සහ වගකීමක් තිබෙනවා, අවබෝධයෙන් යුක්තව කටයුතු කරන්න. ඒ සඳහා ඔවුන්ව අළෙවි කළමනාකරණය, මූල්‍යකරණය, ගිණුම්කරණය, විගණනය සහ සේවා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම සඳහාත්, වර්තමානය තුළ අපි වේගයෙන් තොරතුරු තාක්ෂණයත් සමඟ බද්ධ වන නිසා ඒ පිළිබඳව ඔවුන්ට තාක්ෂණික අවබෝධය ලබා දීම සඳහාත් විවිධ පාඨමාලා මේ වෙනකොට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ වාගේම, ඉදිරියේදී තවදුරටත් ඒවා සංවිධානය කරන්න මේ අය වැයෙන් කටයුතු සූදානම් කර තිබෙනවා.

ඒ වාගේම සමුපකාර ක්ෂේත්‍රයේ අවභාවිතය ගැන හොඳම උදාහරණයක් ගන්නවා නම්, අනුරාධපුර,-

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තොත්, එහෙමත් නැත්නම් උතුරු මැද පළාත ගත්තොත්, ඉතිරි කිරීම් අරමුණු කරගෙන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වෙච්ච ආයතන කිහිපයක් තිබෙනවා, සෞභාග්‍යා සහ RCD Co-op Bank කියලා. එම ආයතනවලට අරමුදල් සපයන්නේ කොහොමද, ඒවා ක්‍රියාත්මක වන්නේ කොහොමද කියන තොරතුරු නැහැ. සමුපකාර සංකල්පය තුළ ඉඳගෙන ඒවා අවභාවිත කරන බවක් අපි එතැන දකිනවා. අද වෙනකොට ඒ තැන්පත්කරුවන්ගේ තැන්පත් සඳහා අනාරක්ෂිත බවක් තිබෙන බව, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මා දන්නවා. ඒ වාගේ මුළු ලංකාව පුරාමත්, මා දන්නා විධියට කොළඹ දිස්ත්‍රික්කයේත් ඒ තත්ත්වය ඉතා විශේෂයි. ඒ නිසා බරපතළ අවදානමක් තැන්පත්කරුවන්ගේ ඒ ඉතිරි කිරීම් සඳහා පවතිනවා.

ඒ එක්කම මා සඳහන් කරන්න කැමැතියි, විවිධ ව්‍යාපාර ක්ෂේත්‍ර අතර සමාගම් කියන්නේ නෛතික පුද්ගලභාවයක් තිබෙන ආයතනයක් බව. අද ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සමාගම් 225,000ක් පමණ පැවතියත් කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම් තිබෙන්නේ 300කටත් අඩු සංඛ්‍යාවක්. ඉතා විශ්වාසයෙන් යුක්තව පුද්ගලයෙකුගේ අතිරික්ත මුදලක් ආයෝජනය කර ගැනීම, ලාභ උපයා ගැනීම හෝ ප්‍රාග්ධන ලාභ ලබා ගැනීම සඳහා සැකයකින් තොරව ප්‍රවේශ වෙන්න පුළුවන් හොඳ ස්ථානයක් තමයි කොළඹ කොටස් වෙළඳපොළ. අපි උත්සාහ කරනවා, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව ඔස්සේ අපි හදුනා ගත්ත ලියාපදිංචි සමාගම්, ලේඛනගත සමාගම් බවට පරිවර්තනය කරමින් මේ රටේ ජනතාවට වඩා පහසු සේවයක් සලසා ගන්නත්, සුරක්ෂිත ආයෝජන මාර්ගයක් වෙත යොමු වෙන්න අවස්ථාව සලසා දෙන්නත්. ව්‍යාපාරිකයන් වශයෙන් ගත්තත්, බොහෝ වෙලාවට සිද්ධ වෙන කාරණයක් තමයි ප්‍රාග්ධන ඌනතාව නිසා ඔවුන්ගේ ව්‍යාපාර ඇද වැටීම සහ කඩා වැටීම. මා විශ්වාස කරන විධියට කොළඹ කොටස් වෙළඳපොළ ලියාපදිංචි සමාගමකට, නැත්නම් ලේඛනගත සමාගමකට පොලී රහිතව ප්‍රාග්ධනය උත්පාදනය කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා එයට උනන්දු කරවීමට, ඒ සඳහා පෙලඹවීමට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී අපි වැඩසටහන් සංවිධානය කරමින් පවතිනවා. ඒ වාගේම තොරතුරු තාක්ෂණය බද්ධ කරමින් eROC system එක හරහා ඔවුන්ට අවශ්‍ය තොරතුරු ලබා දීමත්, ඒවා තවදුරටත් සංවර්ධනය කර ගනිමින් මේ රටේ සමුපකාර ව්‍යාපාරය දියුණු කියුණු කර රටේ ජනතාවට වඩා යහපත් වූ සේවයක් සලසා දීමට අවශ්‍ය මැදිහත්වීම කිරීමට අමාත්‍යාංශය විධියට කටයුතු කරන බවත් සඳහන් කරමින්, මේ රටේ සමුපකාර ව්‍යාපාරය තුළම මේ රටේ ජනතාවට ජයග්‍රහණය ගෙන දෙන්න පුළුවන් කියන විශ්වාසයෙන්, ඒ වාගේම අපි අපේක්ෂා කරන ඒ පොහොසත් රටේ දියුණු මිනිසුන්, නැත්නම් ලස්සන ජීවිත ගෙවන මිනිසුන් දකින අපේක්ෂාවෙන් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.19]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයයි තිබෙන්නේ. අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා වෘත්තීය සමිති නායකයෙක්. ඒ වාගේම මම හිතන විධියට එතුමා දූෂණ විරෝධී සංවිධානයේත් ලොක්කෙක්. අද එතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී මම වැඩි දේවල් ගැන කථා කරන්නේ නැහැ. කාරණා දෙකයි කථා කරන්නේ.

පළමුවෙන්ම මම මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජනාධිපතිතුමා ජනාධිපති ධුරයට පත් වෙලා මේ සිකුරාදාට මාස 6ක් වෙන බව. ජනාධිපතිවරණ වේදිකාවෙත්, මැතිවරණ වේදිකාවලත්, ඊට පෙරත් කිව්වා, එතුමා පත් වෙච්ච ගමන්ම, පළමු අය වැයෙන්ම ආහාර, අධ්‍යාපනය, සෞඛ්‍ය කියන විෂයයන් තුනේම VAT අයින් කරනවා කියලා. මට මතකයි, ජනාධිපතිතුමා වේදිකාවේ එක වතාවක කිව්වා, ලෙඩ වුණාමත් බදු ගෙවන්න ඕනෑ කියලා; බෙහෙත් ගන්න ගියාම. ඊළඟට, දරුවා ඉගෙන ගන්නත් බදු ගෙවන්න ඕනෑ කියලා. මේ, ජනාධිපතිතුමාගේම වචන. දරුවා ඉගෙන ගන්න ගියාම බදු ගෙවන්න ඕනෑ කිව්වා. බඩගින්නට කන්න බොන්නත් බදු ගෙවන්න ඕනෑ කිව්වා. ජනතා විමුක්ති පෙරමුණේ ඉදිරි පෙළ සාමාජිකයකු වන අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය හරහා තමයි ආහාරපානවලට මේ ගැටලු බලපාන්නේ. නමුත් එතුමාට ඒ කටයුතු තවම කර ගන්න බැරිවීම ගැන මම කනගාටු වෙනවා. ඉදිරියේදීවත් පුළුවන් වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. මොකද, එතුමන්ලාට ඡන්දය දුන් බහුතරයක් කාන්තාවන් YouTube නරඹලා, TikTok බලලා ඡන්දය දුන්නා. "අවුරුදු 76ක් හොරකම් කරපු නිසා තමයි මෙච්චර බදු ගහන්නේ. ඒ හොරකම නතර වෙච්ච ගමන් බදු අඩු වෙනවා, බදු අඩු වෙච්ච ගමන් බඩු මිල අඩු වෙනවා" කියලා කිව්වා. ඒ නිසා ගෙවල්වල ඉන්න ගැහැනු ස්වාමිපුරුෂයා කියන දේත් අහන්නේ නැතිව ගිහිල්ලා ඡන්දය දුන්නා, අනුර කුමාර මහත්මයා දිනලා එක පෝයෙන් ඔක්කොම හරි කියලා හිතාගෙන. මාර වැඩේ කියන්නේ දැන් මාස හයක් ගිහිල්ලාත් තවම බඩු මිල රුපියලකින්වත් අඩු වෙලාත් නැහැ, ජනතාවගේ ආදායම් මර්ග වැඩි වෙලාත් නැහැ. මම දන්නේ නැහැ, එම කාන්තාවන්ට දැන් තමන්ගේ ස්වාමිපුරුෂයාට මුහුණ දෙන්න පුළුවන්ද කියලා. ඒ නිසා ඔබතුමා සානුකම්පිතව ඒ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. බඩු භාණ්ඩ දාහකින් විතර අත්‍යවශ්‍ය නොවන ඒවා ටිකක් ගැන ඇමතිතුමා ඊළඟ කථාවේදී කියයි. හරි, කමක් නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

හෝව්! හෝව්!! මගේ වෙලාව, මගේ වෙලාව. ඔබතුමාගේ කථාවේදී කියන්න. *[බාධා කිරීමක්]* හරි, හරි. ඔබතුමාගේ කථාවේදී කියන්න. මම මේ පොඩි ආරම්භයක් - warm-up එකක් - ගත්තේ. ඔබතුමා ඔහොම පොඩ්ඩක් ඉන්න. මම හොඳම කෑල්ල කියන්න හදන්නේ දැන්. ඇමතිතුමනි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලයේ ලංකාවට පොල් තෙල් ගෙන්නුවා. මම මේ පිළිබඳව මීට පෙර කථා කළා. ඔබතුමා ඊළඟ දවසේ උත්තර දෙනවා කිව්වා. නැහැ, සවස 3.30ට උත්තර දෙනවා කිව්වා. මම 3.30ට ඇවිත් වාඩි වෙලා හිටියා. හැබැයි, ඔබතුමා උත්තර දුන්නේ නැහැ. *[බාධා කිරීමක්]* උත්තර දුන්නේ නැහැ. ඊට පසු මම "ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න" වෙලාවේ ඒ ප්‍රශ්නය ඇහුවා. ගරු ඇමතිතුමනි, මම ඒ කථාවම නැවත කරනවා. මට උත්තර දුන්නේ නැති නිසා මම ඒ කථාවම කරනවා.

මොකද, මේක වංචා දූෂණ නවත්වනවා කියලා ආපු ආණ්ඩුවක්; මහ බැංකු හොරු අල්ලනවා කියලා ආපු ආණ්ඩුවක්. මහ බැංකු බැඳුම්කර කොල්ලයේ පාඩුව බිලියන 10යි. පොල් තෙල් වංචාවේ පාඩුව ජනවාරි මාසය වෙනකොට බිලියන හයකට වැඩියි. දැන් මම ඒ පිළිබඳව කියන්නම්. සමාගම් තුනක් විසින් ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ පළමුවැනි දා ඉඳලා ඔක්තෝබර් මාසයේ අග වෙනකම් පොල් තෙල් කිලෝග්‍රෑම් 38, 814,918ක් ලංකාවට ගෙන්නුවා. මේ ප්‍රමාණය ගෙන්වනකොට, ගෙන්වන්න ගහන බද්ද ගහලා තිබෙනවා. හැබැයි, ගැසට් නිවේදනය අනුව පිරිපහදු නොකළ -crude- පොල් තෙල් මෙහේට ගෙන්වලා බෝතල් කරලා විකුණුවාම සියයට 18ක VAT එකකුයි, සියයට 2.5ක SSCL එකකුයි ගෙවන්න ඕනෑ. මේ කට්ටියම නොවැම්බර් මාසයේ තව පොල් තෙල් ලීටර් බිලියන 1.7ක් ගෙන්නුවා. තව පොල් තෙල් ලීටර් මිලියන 1.486ක් දෙසැම්බර් මාසයේ ගෙන්වුවා. මේ අවුරුද්දේ ජනවාරි මාසයෙත් පොල් තෙල් ලීටර් ලක්ෂ හතහමාරකට ආසන්න ප්‍රමාණයක් ගෙන්වලා තිබෙනවා. වැඩේ තිබෙන්නේ හොරු අල්ලනවා කියලා ආපු කට්ටිය, හොරකම් කරන්න දෙන්නේ නැහැ කියලා ආපු කට්ටිය මොකද කරන්නේ? ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ ඉඳලා කෙරුණු හොරකම් ගැන මම ආණ්ඩුවට චෝදනා එල්ල කරන්නේ නැහැ. දැන් ඔබතුමන්ලාගේ වගකීම ඒක වෙන්න ඉඩ නොදීම සහ කරපු ටිකට අදාළ බදු අය කර ගැනීම. එතකොට මේ කට්ටිය පොල් තෙල් ගෙන්නුවා. ගෙන්වලා ඒවා පිරිපහදු නොකර වික්කා නම් මේ රටේ ජනතාවට වස කවලා තිබෙනවා. පිරිපහදු නොකර වික්කා නම්, මේ රටේ ජනතාවට වස කවලා තිබෙනවා. පිරිපහදු කරලා විකුණුවා නම් ආණ්ඩුවේ ආදායම නැති කරලා තිබෙනවා.

ජනාධිපතිතුමා පසුගිය දවසක මෙතැනදී කිව්වා, ගිය අවුරුද්දේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරාගන්න රුපියල් බිලියන 20යි අඩු වුණේ කියලා. එතකොට රුපියල් බිලියන හයක් මේකෙන් එන්න තිබෙනවා නේ. මේ බිලියන හය අය කර ගත්තා නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අඩු වුණා යයි කියන රුපියල් බිලියන 20, රුපියල් බිලියන 14ක් වෙනවා.

2025 වර්ෂයේ පෙබරවාරි මාසයේ 05වැනි දා මම "ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න" වෙලාවේ මේ පිළිබඳව ගරු අගමැතිතුමියගෙන් ඇහුවා. මගේ ප්‍රශ්නයේ තුන්වැනි කොටසින් මම අහලා තිබෙනවා, "එසේ බලපාන්නේ නම් පිරිපහදු නොකළ පොල් තෙල් ගෙන්වා පිරිපහදුකොට ශ්‍රී ලංකාව තුළ විකිණීමේදී VAT එක හා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද -SSCL එක- ගෙවිය යුතුද?" කියලා. මම මේ 2025.02.05 වැනි දින හැන්සාඩ් වාර්තාවෙන් කියන්නේ. ගරු අගමැතිතුමිය පිළිතුරු දීලා තිබෙනවා, "පිරිපහදු නොකළ පොල් තෙල් ගෙන්වා පිරිපහදු කිරීම නිෂ්පාදනයක් ලෙස සලකන විට එම නිෂ්පාදන ශ්‍රී ලංකාව තුළ විකිණීමේදී VAT සහ SSCL යන බදු ගෙවිය යුතුය." කියලා.

මගේ ප්‍රශ්නයේ හතරවැනි කොටසින් මම අහලා තිබෙනවා, "එසේ ගෙවිය යුතු නම් එම බදු අය කර ගැනීම සඳහා ඇති රජයේ වැඩ පිළිවෙළ කුමක්ද?" කියලා. එම ප්‍රශ්නයට එතුමිය පිළිතුරු දීලා තිබෙනවා, " පිරිපහදු නොකළ පොල් තෙල් ගෙන්වා පිරිපහදු කිරීම නිෂ්පාදනයක් ලෙස සලකා ශ්‍රී ලංකාව තුළ විකිණීමේදී අදාළ වන VAT සහ SSCL බදු අය කිරීම සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ලැබේ." කියලා.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

එතුමිය ඒ උත්තර දීලා දැන් මාස එකහමාරකට වැඩියි. එතුමිය මගේ අතුරු ප්‍රශ්නයකට උත්තර දෙනවා, "ගරු මන්ත්‍රීතුමනි, ඔය කාරණය මතු කිරීම පිළිබඳව සහ ඔය තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳවත් ඔබතුමාට බෙහෙවින් ස්තුතියි. ඔබතුමා ඔය ඉදිරිපත් කරන තොරතුරු මට ලබා දුන්නොත්, අපි අනිවාර්යයෙන් ඒ පිළිබඳව විමර්ශනයක් කරනවා. ඒක පසුගිය ආණ්ඩුව කාලය තුළ වෙච්ච දෙයක් නම්, සීනි වංචාව, සුදු ලූනු වංචාව වැනි එකක් වෙන්න ඇති එතැනත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි අනිවාර්යයෙන් මේ පිළිබඳව සොයා බලනවා. නැවත වතාවක් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ඔය කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳව" කියලා. එතුමිය මගෙන් documents දෙකක් ඉල්ලුවා. ඒ documents දෙක මම එතුමියට ඒ වෙලාවේම ලැබෙන්න සැලැස්සුවා.

පොල් තෙල් ගෙන්වන සමාගම විසින් හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙන් - මුදල් ඇමතිවරයාගෙන් - 2024.07.31වැනි දා කරපු ඉල්ලීමකට අනුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් යවනවා, "Request for a policy direction on the application of the exemption of Value Added Tax (VAT) on imported crude coconut oil subject to a Special Commodity Levy (SCL) and supply to the market as refined coconut oil" කියලා. ඒ සමාගමත් Presidentට ලිව්වා කියලා තිබෙනවා. "This refers to the letter dated 17th July, 2024 addressed to His Excellency the President by the Managing Director of..." කියලා සමාගමේ නම තිබෙනවා. "You are kindly requested to send your observations with regard to this." කවුද? රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා. ඒ ලියුම මම අගමැතිතුමියට දුන්නා.

ඒකට පිළිතුරක් හැටියට 2024.08.29වැනි දා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින්, "Additional Director General, Department of Fiscal Policy, The Secretariat, Colombo 01" ලිපිනයට ලිපියක් යවනවා. එතුමා ඉතා පැහැදිලිව ඒකේ දානවා, මේක ගෙවන්න ඕනෑ කියලා. මෙන්න මෙහෙමයි තිබෙන්නේ.

"Therefore IRD is in a position that the Sena Mills Refineries (Pvt.) Ltd. imports crude coconut oil to Sri Lanka and manufactures refined coconut oil. It is a process of manufacturing and the supply of refined coconut oil liable to VAT with effect from January 1st of 2024."

ඒක මෙහි පැහැදිලිව තිබෙනවා. මම මේ ලියුමත් අගමැතිතුමියට දුන්නා. ඒක නිසා මම මේ කාරණය දැන ගන්න කැමැතියි. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩු කාලයේදී ආරම්භ කරලා ජනවාරි මාසය වෙනකලුත් ආණ්ඩුවට පාඩු කරන එක ගැන අගමැතිතුමිය පොරොන්දු වූ පරිදි ඒ බදු ආදායම් අය කිරීම සඳහා මේ ආණ්ඩුව ගන්නා වූ පියවර මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි. ඒ, දැන් නොවෙයි, ඔබතුමාගේ කථාවේදී. *[බාධා කිරීමක්]* මගේ වෙලාව ගන්න එපා. මගේ වෙලාව ඉතුරු වුණොත් උත්තර දෙන්න ඔබතුමාට අවස්ථාවක් දෙන්නම්.

මම ඇමතිතුමාගෙන් අහනවා, වංචාව, දූෂණය, නාස්තිය නතර කරනවා කියලා ආපු ආණ්ඩුව පෞද්ගලික සමාගම් තුනක් විසින් මේ කරන බදු වංචාව පිළිබඳව ඔබතුමන්ලා මෙතෙක් අරගෙන තිබෙන පියවර මොකක්ද කියලා. ඒ විධියට දිගටම ගෙන්වන්න ඉඩ දෙනවාද, දිගටම ගෙන්වන්න ඉඩ දෙද්දී ඒ අයගෙන් බදු අය නොකර ඉන්නවාද, මෙච්චර කල් කරපු ඒවාට අගමැතිතුමිය පොරොන්දු වූ පරිදි බදු අය කර ගන්න කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම එහෙම කියන්නේ අගමැතිතුමියගෙන් අහපු ප්‍රශ්නයෙන් පස්සේ විමර්ශනයක් ආරම්භ කරනවා කියලා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට තමයි ඇමතිතුමා මේක භාර දීලා තිබෙන්නේ. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අදාළ වෙන්නේ දේශීයව නිෂ්පාදනය කරන පොල්වලින් පොල් තෙල් නිෂ්පාදනය කිරීමයි. මේක, පිට රටින් ගෙනැල්ලා ලංකාවේ පිරිපහදු කරලා බෝතල් කිරීම. ඒකෙන් බදු අය කරන නිසා සෘජුවම අදාළ වෙන්නේ මුදල් අමාත්‍යාංශයට. නිෂ්පාදන ක්‍රියාවලියට යම් බලපෑමක් කරන්න පාරිභෝගික සේවා අධිකාරියට අයිතියක් තිබෙනවා. ඒක නිසා තමයි මම මේ ප්‍රශ්නය මතු කරන්නේ. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට මේක භාර දීපු එක, කාගෙන්ද ගිහිල්ලා වෙන මොකක් හරි අහනවා වාගේ වැඩක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති කාලයේ එතුමා වට කරගෙන හිටියා නේ වෛද්‍යවරු කට්ටියක්. ඒ ගොල්ලන් ගිහිල්ලා ගෝඨාභය රාජපක්ෂට කිව්වා, "Palm oil ගෙන්වන්න දෙන්න එපා" කියලා. Palm oil ගෙන්වන්න දෙන්නේ නැති එක හරි කියමු. ගෝඨාභය රාජපක්ෂ බෝතල් කරපු palm oil ගෙන්වන්න දුන්නේ නැහැ. මේ එහෙම ජනාධිපතිවරු හිටපු රටක්. මේ palm oil වගාව නිසා වතුර හිඳෙනවා කියනවා. මේක වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට ලබා දුන්නේත් ඒ නිසා කියලා තමයි මට හිතෙන්නේ. අඩුම ගණනේ වෙළෙඳ අමාත්‍යාංශයෙන් මූලික විමර්ශනයක් කරනවා නම්, පාරිභෝගික සේවා අධිකාරිය තිබෙනවා. මට ඒක තේරෙනවා. මට සැකයක් තිබෙනවා, මේ බදු අය නොකර ගැනීමේ ක්‍රියාවලියක් තමයි කරන්න යන්නේ කියලා. මේක රබර් කරලා අද්දන වැඩක් තමයි කරන්න යන්නේ කියලා මට සැකයක් තිබෙනවා.

මම ඇමතිතුමාගෙන් තුන්වැනි ප්‍රශ්නය විධියට අහනවා, දැන් මේ සමාගම් තුන බදුවලින් නිදහස් කෙරුවොත් මෙතෙක් crude coconut oil ගෙන්වලා, නිෂ්පාදනය කරලා, බදු ගෙවලා වෙළෙඳ පොළට විකුණපු අයට හෝ refined coconut oil ගෙන්වලා කෙළින්ම විකුණපු අයට මොකක්ද කරන්නේ කියලා. පාඩු දෙකක් ගන්න ආණ්ඩුව කැමති වෙනවාද කියන කාරණයත් මම එතුමාගෙන් අහන්න කැමැතියි. මම පොල් තෙල් සම්බන්ධව ඊට වඩා කථා කරන්නේ නැහැ.

තව පොඩි දෙයක් කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. අපේ නාමල් කරුණාරත්න ඇමතිතුමා දැන් මේ අවස්ථාවේ ගරු සභාවේ නැහැ නේද? හැබැයි, මේ කාරණය එතුමාගේ අමාත්‍යාංශයට අදාළ කාරණයක් නිසා එතුමාට තමයි කියන්න ඕනෑ. 2024 නොවැම්බර් මාසයේ 9වෙනි දා නාමල් කරුණාරත්න මහතා කියනවා, "අපි ආණ්ඩුව ගන්නකොට රජයේ ගබඩාවල වී ඇටයක්වත් නැහැ. ආණ්ඩුව යල කන්නයේ වී මිලදී ගත්තේ නැහැ. ඊට කලින් රුපියල් 120ට ගත්තු වී තිබුණා. ඒ 120ට ගත්තු වීවලට රුපියල් 10කට ආසන්න අමතර පිරිවැයක් දැරුවා. ඒ අනුව රජයේ ගබඩාවල තිබුණු වී කිලෝවක් වෙනුවෙන් රුපියල් 130ක් වියදම් කළා. අන්න, රනිල් වික්‍රමසිංහ-පොහොට්ටුව ආණ්ඩුව කැබිනට් එකේදී තීන්දුවක් ගත්තා, රුපියල් 80ට වී විකුණන්න. ඒකෙන් රජයට වී කිලෝවකින් රුපියල් 50ක් පාඩු කෙරුවා, රුපියල් 50ක් කොමිස් ගැහුවා" කියලා.

ගරු ඇමතිතුමනි, අනෙක් අය කරන හැම එකක්ම කොමිස් ගැහිලි. එතකොට පොල්තෙල්වලිනුත් කොමිස් ගැහුවාද කියලා මට මේ ලේඛනය බැලුවාම අහන්න හිතෙනවා. මම ඒක කියන්න හිටපු දෙයක් නොවෙයි. නමුත්, මේ ලේඛනය දැක්කාම ඒකත් කියන්න හිතුණා.

එතුමා තවදුරටත් කියනවා, "රජයේ ගබඩාවල වී ටික හිස් කෙරුවා. නිකවැරටිය ගබඩාවේ කෝටි 5ක වීත් නැහැ, සල්ලිත් නැහැ. වික්‍රමසිංහ-පොහොට්ටුව ආණ්ඩුව මේක තමයි කළේ" කියලා. මේක හරිද, වැරදිද කියන්න මම උත්සාහ කරන්නේ නැහැ. මේ දේවල් ඇත්ත වෙන්න පුළුවන්. හැබැයි මම අහන්නේ, විපක්ෂයේ ඉන්නකොට වී කිලෝවක් රුපියල් 130ට ගන්න ඕනෑය කියලා බල කළ අය, ආණ්ඩු බලය ගත් පසු වීවලට නියම කළ සහතික මිල කීයද කියලායි. වී කිලෝවකට රුපියල් 130ක් දුන්නාද? දුන්නේ නැහැ. ඇයි? මේ අයත් අද හාල් මාෆියාවට යටයි. දැන් ජනාධිපති කාර්යාලයට ගෙන්වලා සත්තමක් දාලා, මේසයට තට්ටුවක් දාලා තව ගාණක් වැඩි කරලා දෙනවා; හොරට විකුණපු එකට ලයිසන් දෙනවා. හරිද? ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඇයි ආණ්ඩුවට වී මාෆියාවට යට වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ? ඒ පෙර වැරදි හින්දා. පෙර වැරදි හින්දා. දැන් ඔබතුමන්ලා හාල් මාෆියාව කඩන්න ඕනෑ කියන තැන ඉන්නවා නම්, ඒ මතයේ අපිත් ඉන්නවා. වී ගොවියාට හොඳ මිලක් ලබා දෙන ගමන් පාරිභෝගිකයාට අඩු මිලට හාල් ලබා දෙන්නත් ඕනෑ. ඒකට ආණ්ඩුව කටයුතු කරන්න ඕනෑ. හැබැයි, පෙර වැරදි හින්දා ඒක කරන්න බැහැ. අපි ඒක මතක් කළාම, ඒක allergic. පෙර වැරදි මොනවාද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, යටියන වී මෝල මෙට්‍රික්ටොන් 800ක් ගබඩා කරන්න පහසුකම් තිබුණු එකක්. තෙබුවන වී මෝල මෙට්‍රික්ටොන් 300ක් ගබඩා කරන්න පහසුකම් තිබුණු මෝලක්. හසලක වී මෝල මෙට්‍රික්ටොන් 500කට ගබඩා පහසුකම් තිබුණු තැනක්. මීද්දෙනිය වී මෝල. මෙට්‍රික්ටොන් 900කට ගබඩා පහසුකම් තිබුණු තැනක්. මොනරාගල රණහංස වී මෝල මෙට්‍රික්ටොන් 830කට ගබඩා පහසුකම් තිබුණු තැනක්. රන්න-උණාකුරුව වී මෝල මෙට්‍රික්ටොන් 700ක් ගබඩා කරන්න පුළුවන් තැනක්, අංග සම්පූර්ණ යැන්මාර් මැෂින් දෙකකුත් එක්ක. අහුණුකොළපැලැස්ස වී මෝල මෙට්‍රික්ටොන් 800ක් ගබඩා කරන්න පුළුවන් තැනක්. ඒ වාගේම, ඌරගහ වී මෝල, බද්දේගම වී මෝල, කිරිමැටිමුල්ල වී මෝල, කඩපණහ වී මෝල - අනුරාධපුරයේ නොච්චියාගම, යාය 14/13/12/1 වී මෝල - කාශ්‍යප පුර පොළොන්නරුව, යාය 01 - ඇලහැර වී මෝල, යාය - ලීර වී මෝල, සකුනි වී මෝල - කන්තලේ, රතන වී මෝල - ත්‍රිකුණාමලය, පල්ලත්තර වී මෝල - මොදරවාන, සහන වී මෝල - දම්මුල්ල බෙලිඅත්ත වී මෝල. ඒවාට තිබ්බා ගිනි. හරිද? *[බාධා කිරීමක්]* ඒ කවුද කියලා කවුද දන්නේ? මේ වී මෝල් ටික ගිනි තියලා. දැන් ආණ්ඩුවට වී ගබඩා කරන්න තැනක් නැහැ. හාල් මාෆියාවට යට වෙලා තිබෙන්නේ ඒකයි. අපි අතීතයේ දේවල්ම කථා කර ඉඳලා හරියන්නේ නැහැ. ඒවා ගිනි තියපු බව මුළු රටම දන්නවා.

මම ඒකයි කියන්නේ, බටලන්ද ගැන හොයනකොට බටලන්දේ ඉඳලා වටේම හොයන්න ඕනෑ කියලා. ප්‍රේමකීර්ති මරපු විධියත් හොයන්න ඕනෑ, මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මරපු විධියත් හොයන්න ඕනෑ, විජය කුමාරණතුංග මරපු විධියත් හොයන්න ඕනෑ, කොටිකාවත්තේ සද්ධාතිස්ස හාමුදුරුවෝ ඝාතනය කරපු විධියත් හොයන්න ඕනෑ, UNP සාමාජිකයෝ මරපු විධියත් හොයන්න ඕනෑ, හමුදා නිලධාරීන් මරපු විධියත් හොයන්න ඕනෑ, ඔවුන්ගේ පවුල්වල අය මරපු විධියත් හොයන්න ඕනෑ. බටලන්දේ වධකයාට දඬුවම් දෙන ගමන් මේ ඔක්කෝම හොයන්න ඕනෑ. හැබැයි, බටලන්දේ වධකයාට දඬුවම් ලැබෙයිද කියලා මට නම් සැකයක් තිබෙනවා. මොකද, සුපිරි ඩීල් ටිකක් එතැන තිබෙන්නේ. මොකක්ද හේතුව? 1998දීනේ කොමිෂන් වාර්තාව ඉදිරිපත් කළේ. කොමිෂන් වාර්තාව 1998දී ඉදිරිපත් කළා. ආණ්ඩුවට එන්න ජනතා විමුක්ති පෙරමුණ 2004දී තමයි චන්ද්‍රිකා එක්ක එකඟතා හැදුවේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම ඉක්මනින් කථාව ඉවර කරනවා.

හැබැයි, ඒ එකඟතාවට එද්දි මේක ගැන කථාවක් තිබුණේ නැහැ. මහින්ද රාජපක්ෂට "සුනාමී හොරා" යැයි කියා තිබියදී තමයි එතුමා ජනාධිපති කරන්න දළදා මාළිගාවේදී agreement ගැහුවේ. "අනේ, බටලන්දේ මිය ගිය අපේ ආදරණීයයන්ට සාධාරණය ඉෂ්ට කරන්න මේ වාර්තාව ඉදිරිපත් කරන්න" කියලා එතැනදීවත් මහින්ද රාජපක්ෂට කිව්වේ නැහැ. 2010දී අපිත් එක්ක එකතු වෙලා ෆොන්සේකා ජනාධිපති කරන්න JVP එක වැඩ කළා. ඒ වෙලාවේ අපෙන් එහෙම ඉල්ලීමක් කළේත් නැහැ. 2015දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති කරන්න අපට හොරෙන් උදව් කළා. ඒ වෙලාවේ හොරෙන්වත් මේ සම්බන්ධව අපෙන් ඉල්ලීමක් කළේ නැහැ. ඊට පස්සේ 2018දී රනිල් වික්‍රමසිංහත් එක්ක මල පැනලා පළමුවෙනි වතාවට එතුමාගේ පෞද්ගලික ජීවිතය ගැන පවා ප්‍රසිද්ධ වේදිකාවේ කිව්වේ මෛත්‍රීපාල සිරිසේන තමයි. ඇත්තටම ඒ ආදරණීයයන් ගැන තමුන්නාන්සේලාට කැක්කුමක් තිබුණා නම්, ඒ වෙලාවේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයා හිටපු mood එක අනුව "ඔන්න ඔය වාර්තාව එළියට දාන්න" කියලා කියන්න තිබුණා. අවුරුදු 25ක් අඳුරු කුටියක් ඇතුළේ මේ වාර්තාව හංගලා තිබුණා කිව්වාට, චන්ද්‍රිකාගේ ආණ්ඩුවේ ජනතා විමුක්ති පෙරමුණේ 4දෙනෙක් කැබිනට් ඇමතිවරුන් විධියට සිටියා. ඔවුන් සතිපතා Cabinet meetingsවලටත් ගියා. ඒ Cabinet meetingsවලට ගියත්, ඒ වෙලාවේ අඳුරු කුටියේ තිබුණු වාර්තාව ගන්න එතුමන්ලාට වුවමනා වුණේ නැහැ. වැඩිය ඕනෑ නැහැ, ඒ ගැන මෙවර මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කළේත් නැහැ. අල්ජසීරා මාධ්‍යවේදියා මතු කරනකල් ඒ ගැන වචනයක්වත් කථා කළේත් නැහැ. කමක් නැහැ, දැන් හරි ඇහැරිලා 1987-1989 කාලයේ සිදු වූ සියලු ඝාතන ගැන නැවත සම්පූර්ණ විමර්ශනයක් කරනවා නම් හොඳයි කියන එක මම කියන්න ඕනෑ.

ඒ එක්කම, පිටුපස ඉඳලා එක මන්ත්‍රීවරයෙක් කෑ ගැහුවා, එතුමාට දැනගන්න මම මේ කාරණයත් කියන්නම්. අපේ රටේ ඉතිහාසය පුරාම ආණ්ඩුවෙන් ලබා දුන් වාහන පර්මිට් ඔක්කෝම JVP එක ගත්තා. 2015දී ගත්ත පර්මිට් මෙන්න. මගේ ළඟ මේ තිබෙන්නේ බිමල් රත්නායක මැතිතුමා ගත්ත පර්මිට් එක. මෙන්න, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ගත්ත පර්මිට් එක. මෙන්න, අනුර කුමාර දිසානායක මැතිතුමා ගත්ත පර්මිට් එක. මේ අය පර්මිට් 8ක් අරගෙන තිබෙනවා. සියලු පර්මිට් ගත්තා. ඒ නිසා ඒ ගැන කථා කරන්න එන්න එපා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ අයට බැහැ, අපට හොරා කියන්න. අපි හොරකම් කරලාත් නැහැ, ණයත් නැහැ, බයත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මගේ ගැටලුවලට අපේ ඇමතිතුමා පිළිතුරු ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වාහන පර්මිට් එක හම්බවුණේ නැහැ කියලා එතුමාට එච්චර තරහ ගන්න අවශ්‍ය නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා වාහන පර්මිට් එක දුන්නේ නැහැ කියලා තරහ ගන්න එපා.

පොල්තෙල්වලට ගහන බදු සම්බන්ධ ප්‍රශ්නය මතු කරමින් එතුමා හැම දාම යම් කරුණක් කියන්න උත්සාහ කරනවා. පසුගිය මාස 4 තුළ ලංකාවට ගෙනාපු පොල්තෙල් පිළිබඳ විස්තර මම Sri Lanka Customs එකෙන් ගත්තා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
එතකොට crude oil?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ලංකාවට ගෙන්වපු crude oil ප්‍රමාණය ගැනත් මම ඔබතුමාට කියන්නම්. HS code 15132100 යටතේ තමයි crude oil ගෙන්වන්නේ. ගරු මන්ත්‍රීතුමනි, 2024 වර්ෂයේ නවවැනි මාසයේ ඉඳලා දොළොස්වැනි මාසය දක්වා ගෙන්වපු ප්‍රමාණය තමයි මේ තිබෙන්නේ. ඊට පස්සේ bulk හැටියටත් ගෙන්වා තිබෙනවා. ඒ විධියට ගෙන්වපු HS code එක තමයි, 15131910. ඒ යටතේ "in bulk" කියලා ගෙන්වා තිබෙනවා. මේ විධියට ගෙන්වා තිබෙන HS codes මෙහෙමයි. 15131111 - virgin coconut oil; 15131119 - other; 15131129 - other; 15131910 - in bulk oil; 15131990 - other; 15132100 - crude oil සහ 15132900 - other. ඔබතුමා කියපු විධියට මේ ඔක්කෝගේම එකතුව විධියට රුපියල් බිලියන 36.6ක් තිබෙනවා. මම කියන්නේ ඒවායේ වටිනාකම. පොල්තෙල් ගෙන්වද්දී එක බද්දක් තිබෙනවා, crude oil ගෙන්වද්දී තවත් බද්දක් තිබෙනවා. ලංකාව ඇතුළට ගෙනැල්ලා ඒවා නැවත සකස් කරලා විකුණනවා නම් VAT එකක් ගෙවන්න ඕනෑ. ඒක හරි. ආනයනික භාණ්ඩ සඳහා අනුගමනය කරන බදු ප්‍රතිපත්තිය ගැන ඔබතුමා මේ කියන කරුණු හරි. අගමැතිතුමියගෙනුත් ඔබතුමා මේ සම්බන්ධයෙන් කරුණු විමසූ බව කිව්වා. මේ තමයි Sri Lanka Customs එක ඇතුළේ තිබෙන තොරතුරු. මීට අමතරව තව තොරතුරු තිබෙනවා නම් අපට දෙන්න. ඔබතුමා කිව්වා වාගේ මේක කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට දෙන්නේ නිකම් නොවෙයි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට දෙන්නේ නිකම් නොවෙයි. මොකද, ලංකාවට පොල්තෙල් ගෙන ඒම පිළිබඳව අපි මේ දවස්වල ආහාර සුරක්ෂිතතා කමිටුවේදීත් සාකච්ඡා කරනවා. රටේ නිෂ්පාදන අවශ්‍යතා සඳහා සහ අපනයන කර්මාන්තයට අවශ්‍ය නිසා පොල් ගෙඩි මිලියන 200කට සමාන පොල් මද ගෙන්වන්න සිදුවෙලා තිබෙනවා. මේ තිබෙන තොරතුරු මත තමයි Sri Lanka Customs එක බදු අය කරන්නේ. එම නිසා තවදුරටත් මේ පිළිබඳව තොරතුරු සොයන්න. ඒ වාගේම වංචා කරපු කොම්පැනි මොනවාද කියලා තොරතුරු ඔබතුමා සතුව තිබෙනවා නම්, ඒවා අපට ලබා දුන්නොත් ඒ ගැනත් සොයා බලන්න පුළුවන්. අගමැතිතුමියට ලබා දුන් තොරතුරු එතුමිය අදාළ තැන්වලට යොමු කර තිබෙන බව කිව්වා. මම එතුමියට කථා කළා. ඒ අනුව අපි මේ පිළිබඳ පරීක්ෂණ කටයුතු කරනවා. මෙතෙක් සිදු වුණු වංචා ඉදිරියේදී නවත්වන්න ඔබතුමා උත්සාහ කරන්නේ අවංකවම නම්, අපි ඒකට එකඟයි. මොකද, මේ රටේ කළ හොරකම්, වංචා, දූෂණ ගැන ඔබතුමායි අපියි හොඳින්ම දන්නවා. ඔබතුමාගේ හෘදය සාක්ෂියට අනුව ඒක දන්නවානේ. ඒ නිසා මේ ආණ්ඩුව කිසිදු හොරෙක් රකින්නේත් නැහැ, හොරකම් කරන්න ඉඩ දෙන්නේත් නැහැ කියන එක මම වෙලාවේ බොහොම වගකීමෙන් කියනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අපි විවාදයකට නොයා ඉමු නේද, මන්ත්‍රීතුමා?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරට මම ස්තුතිවන්ත වෙනවා. මේ රටේ සිදු වන වංචා නතර කරවීම තමයි මගේත් අරමුණ. ප්‍රමාණය පැත්තෙන් අංක එහා මෙහා වීමක් වෙන්න පුළුවන්, නමුත් බදු ගෙවලා නැහැ කියන එක ඔබතුමාත් පිළිගන්නවානේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගෙන්වනකොට බදු ගෙවලා තිබෙන්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගෙන්වනකොට බදු ගෙවලා තිබෙනවා. නමුත් refine කරලා විකුණනකොට බදු ගෙවලා නැහැ කියලා පිළිගන්නවානේ?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒවාට අදාළ බදු අදාළ තැන්වලට ගෙවන්නම ඕනෑ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඒක තමයි මම කියන්නේ, ගරු ඇමතිතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා කියනවා නම් ගෙවලා නැහැ කියලා, එසේ ගෙවලා නැහැ කියන්න පදනමක් තිබෙන්න එපායැ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මම ඔබතුමාට තවත් ලේසි කරන්නම්, ගරු ඇමතිතුමනි. ඔබතුමාට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විමසා සියලු තොරතුරු ගන්න පුළුවන්. සමාගම් තුනක් පිළිබඳව මම කිව්ව තොරතුරු හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. හැන්සාඩ් දෙපාර්තමේන්තුවෙන් ඒ විස්තර ගන්න පුළුවන්. ඒ, ඒ සමාගම් ගෙන්වපු ප්‍රමාණයත් ඕනෑ නම් මම ඔබතුමාට කියන්නම්. ඒවාත් හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. ඒගොල්ලන් බදු ගෙවපු නැති බව ඔබතුමාට තහවුරු කරගන්න පුළුවන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන්. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.42]

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද විවාදයට ගැනෙන වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කරනකොට විශේෂයෙන්ම අපි දන්නවා, මේ අමාත්‍යාංශය ඉතාම කාර්ය බහුලව තිබිය යුතු, කාර්ය බහුලව තිබෙන අමාත්‍යාංශයක් බව. මේ රටේ පුරවැසියන්ගේ ජීවිත එක්ක ළඟින්ම සම්බන්ධතාව තිබෙන, ළඟින්ම ගැට ගැහුණු අමාත්‍යාංශයක් ගැන තමයි අපි අද කථා බහ කරන්නේ. මේ අමාත්‍යාංශයෙන් අපි බලාපොරොත්තු වන පළමුවන දේ තමයි තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම. ඒ සංවර්ධිත රට ගොඩනඟනකොට ඒ සඳහා මූලික පදනම ගොඩනැඟෙන්නේ මිනිසුන්ගේ ජීවිතත් එක්ක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මෙහිදී විශේෂයෙන් බලාපොරොත්තු වන දෙයක් තමයි, මිනිසුන්ගේ ජීවිත එක්ක ගැට ගැහිලා තිබෙන ආහාර සුරක්ෂිතතාව ගොඩනැඟීම. ඒ වාගේම, මිනිසුන්ට මිලදී ගත හැකි මට්ටමට සුදුසු ආහාර, සුදුසු වෙලාවට, අඛණ්ඩව ලබා ගැනීමට තවත් පහසුකම් ගණනාවක් ඇති කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මිනිසුන්ගේ ජීවිතයත් එක්ක ගැට ගැහුණු අමාත්‍යාංශයක් විධියට තමයි අපි අද මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා බහ කරන්නේ. මේ අමාත්‍යාංශය යටතේ ඒ කාර්යභාරය ඉෂ්ට කරන්න නම්, ඒකට ගැළපෙන නීති රීති, අණ පනත් හදලා, ඒවා සම්මත කරලා, යම් යම් එකඟතා, වෙළෙඳ ගිවිසුම් ආදිය හදලා ඒවා එක්ක සම්බන්ධ වෙලා මිනිසුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න ඕනෑ. ඒ වගකීම මේ අමාත්‍යාංශයට පැවරිලා තිබෙනවා.

අපි දන්නවා, මේ අමාත්‍යාංශය මීට කලින් අමාත්‍යාංශ කිහිපයකට බෙදිලා, කැලි-කැලි වශයෙන් තිබුණු බව. අද සමස්ත ක්‍රියාවලියටම සම්බන්ධව තිබෙන ආයතන ටික ඒකාබද්ධ කරලා - ආයතන 16ක්, 17ක් එකතු කරලා- මේ අමාත්‍යාංශය හදලා තිබෙන්නේ මිනිසුන්ගේ ජීවිතවලට අදාළ ප්‍රශ්නවලට උත්තර හොයන්නයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මේ කාල සීමාව තුළදී සොයා බැලුවා, ඇත්තටම මේ අමාත්‍යාංශයෙන් ඒ කර්තව්‍ය ඉෂ්ට වෙලා තිබෙනවාද කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ පිළිබඳව අපි ගොඩක් සොයා බැලුවා; ආයතන විමර්ශනය කළා. පසුගිය කාලවල ඒ ආයතන වැඩ කරලා තිබෙන්නේ කොහොමද කියලා අපි සොයා බැලුවා. එසේ සොයා බලනකොට අපට හමු වෙච්ච දේ තමයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ආයතන පවත්වාගෙන ගිහින් තිබෙන්නේ බිස්නස් විධියටයි කියන එක. ඒවා තමන්ගේ ආයතන බවට පත් කරගෙන තිබෙනවා. හොරකම් මත පදනම් වෙලා මේ ආයතන තමන්ගේ පෞද්ගලික ජීවිතය ගොඩනඟා ගන්න හදපු ආයතන බවට පත් වෙලා තිබෙනවා. ඒ මත පදනම් වෙලා මේ ආයතන යම් යම් නීති රීති පැත්තකින් තැබුවා. සමහර නීති රීති අලුතින් ගොඩනැඟුවා. සමහර නීති රීති තමන්ට ඕනෑ විධියට වෙනස් කර ගත් තැන් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපි ඒ ආයතන දෙස බැලුවාම එහෙම තත්ත්වයක් පෙනෙන්න තිබෙනවා.

මම පුංචි අදහසක් කියන්නම්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳව. සමුපකාරය සතුව රට පුරා විවිධ මට්ටමේ ඉඩකඩම්, දේපළ තිබෙනවා. අපි දන්නවා, ඒ ඉඩම් අතර ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සමුපකාරය සතුව බදුවත්ත කියලා ඉඩමක් තිබෙනවා. ඒකේ අංක 53පී සහ අංක 39පී කියන ඉඩම් කට්ටි දෙක දේශපාලන මැදිහත්වීමකින් හිටපු අගමැතිවරයාගේ පවුලේ අය විසින් අත්පත් කරගෙනයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ ඉඩම් අත්පත් කරගෙන තිබෙනවා, දිනේෂ් ගුණවර්ධන හිටපු අගමැතිවරයාගේ පවුලේ ඥාතීන් විසින්. ඒ වාගේම, කෝට්ටේ හිටපු නගරාධිපති ජනක රණවකගේ තාත්තා සමුපකාරයේ මුරකරුවකු හැටියට සිටි කාලයේ දේශපාලන කාර්යාලයක් වෙනුවෙන් මේකේ ඉඩමක් අරගෙන තිබෙනවා. ඒ ඉඩමේ දැන් ඔහුගේ පුතෙක් පදිංචි වෙලා ඉන්නවා. ඒ වාගේම අපි දන්නවා, ඒ ඉඩම්වලට වෙළෙඳ අමාත්‍යාංශයේ ආයතනවලින්, සමුපකාර සමිතිවලින් තවමත් වරිපනම් බදු ගෙවන බව.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තඹුත්තේගම පෙට්‍රල් ෂෙඩ් එකේ අයිතිය රාජාංගනය විවිධ සේවා සමුපකාර සමිතිය සතුවයි තිබුණේ. සමුපකාර සමිතිය සතුව තිබුණු ඒ පෙට්‍රල් ෂෙඩ් එකේ අයිතිකරු කවුද? අපි දන්නවා, ඒ ප්‍රදේශයේ හිටපු ප්‍රබලම දේශපාලනඥයා තමයි බර්ටි ප්‍රේමලාල් දිසානායක කියලා. බර්ටි ප්‍රේමලාල් දිසානායකගේ බූදලයක් බවට පත් වුණා, රාජාංගනය විවිධ සේවා සමුපකාර සමිතියේ ෂෙඩ් එක. සමුපකාර ව්‍යාපාරය නැත්නම් සමුපකාරය කියන්නේ, මහජන දේපළක් බවට පත් වෙලා තිබුණු එකක්. පසුගිය කාලයේ මේක එක එක දේශපාලනඥයන්ගේ පෞද්ගලික දේපළක් බවට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, තවත් ගොඩක් තැන්වල සමුපකාර සමිතිවලට අයිති දේපළ අත්පත් කරගෙන තිබෙන බව අපි දන්නවා. ඒවා ඇතුළේ සිදු වෙච්ච හොරකම්, වංචා ගත්තොත්, බස්නාහිර පළාතේ විතරක් සමුපකාර ක්ෂේත්‍රයට අදාළ සමුපකාර සමිතිවල, සමුපකාර ග්‍රාමීය බැංකුවල රුපියල් කෝටි 500කට වැඩි මුදලක් හොරකම් කර තිබෙනවා. රට පුරා තවත් එහෙම දේවල් තිබෙනවා. අපි මේවා පිළිබඳව විමර්ශනය කරමින් යනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම 2010 සිට 2024 දක්වා කාල සීමාව ගත්තොත්, MPCS ආයතන හරහා ණය ප්‍රමාණයක් දීලා තිබෙනවා. ඒ ණය ප්‍රමාණයෙන් රුපියල් බිලියන 1,000ක් වැනි දැවැන්ත මුදලක් අයකර ගන්නේ නැතිව අත්හැරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අතිරික්ත අරමුදලින් ණයට සල්ලි දීලා තිබෙනවා. ඒ අනුව රුපියල් මිලියන 392ක් දීලා තිබෙනවා. ඒකට පොලිය වශයෙන් රුපියල් මිලියන 221ක් හැදිලා තිබෙනවා. ඒකත් එක්ක රුපියල් මිලියන 614ක් අත්පත් කර නොගත් ණය තිබෙනවා. මේ පිළිබඳව හොයා බලන්න. විගණන වාර්තා අනුව ෆයිල් 121ක් පිළිබඳව සොයා බලනකොට, ඒ ෆයිල් 60ක් අතුරුදහන් වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ තුළින් අපට තේරෙනවා, සමුපකාර ක්ෂේත්‍රයේ මොකක්ද වෙලා තිබෙන්නේ කියලා.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

ඒ විතරක් නොවෙයි. සමුපකාර ක්ෂේත්‍රයේ චක්‍රීය අරමුදලක් තිබෙනවා. ඒ චක්‍රීය අරමුදලින් රුපියල් මිලියන 501ක් දීලා තිබෙනවා. ඒ දුන් ඒවායින් එක රුපියලක්වත් නවම අය කරගෙන නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ ආයතන හැම දාමත් තමන්ගේ බුදලයක් බවට පත් කරගෙන තියාගෙන ඉන්නවා. ඒ වාගේම කලින් කථා කළ අනුරාධපුරයේ අපේ මන්ත්‍රීතුමා කිව්වා, සමුපකාර ක්ෂේත්‍රයේ අතුරු සම්මත ගිණුම් හදනවා, අතුරු සම්මත ව්‍යවස්ථා හදනවා කියලා. ඒ අතුරු සම්මත ව්‍යවස්ථා හදලාම තිබෙන්නේ හොරකම් කරන්න පුළුවන් විධියට නීති හදන්නයි. අපි දන්නවා, එහෙම හදපු නීති රීති තිබෙන බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ අමාත්‍යාංශයට අයිති ලංකා සතොස ආයතනය තිබෙනවා. ඔබතුමියත් දන්නවා, පසුගිය කාලයේ ලංකා සතොස පිළිබඳව හොඳ චිත්‍රයක් නොවෙයි ලංකාවේ තිබුණේ කියලා. ලංකා සතොස ආරම්භ කරපු මොහොතේ සිට අමාත්‍යවරුන්ගේ බුදලයක් බවට මේක පත් කර ගත්තා. තමන්ට අවශ්‍ය අයට පත්වීම් ලබා දෙන තැනක් බවට එය පත් කළා. පත්වීම් ලබා දීම විතරක් නොවෙයි, මේක ඇතුළේ තිබෙන සම්පත් තමන්ගේ බුදලය බවට පත් කරගෙන දේශපාලනය කරනකොට මැතිවරණවලදී ඒ සම්පත් පාවිච්චි කළා. අපි දන්නවා, එහෙම දේවල් කරපු අමාත්‍යවරුන්ට නඩු වැටුණු බව. නඩු වැටුණු අමාත්‍යවරු ඒවායෙන් පැනලා ගිහිල්ලා හිටියේ. හැබැයි, සතොසට මොකද වුණේ කියන එක අපි දන්නවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ලංකා සතොස ආයතනය සතුව ලොරි 42ක් තිබුණා. ඒ ලොරි 42 ඒ මොහොතේ තිබෙන මිලට විකුණනවා වෙනුවට අඩු මිලට විකුණුවා. ඒකෙන් සතොසට රුපියල් මිලියන 210ක් පාඩු වුණා. ඒ වාගේම යම් දේපළ ප්‍රමාණයක් කුලියට අරගෙන තිබෙනවා. එ් කුලියට ගැනීම නිසා අපට මාසිකව අමතර වශයෙන් ගෙවන්න වෙනවා, රුපියල් මිලියන 6ක්. ඒ වාගේම අපි දන්නවා, මෙගා හවුස් අඩු කුලියට දීම නිසා මාසිකව රුපියල් මිලියන 12ක් පාඩු වන බව. ඒක අමතරව ලැබෙන්න තිබෙන මුදලක්. විවිධ දේපළ අඩු කුලියට දීම නිසා මසකට රුපියල් මිලියන 60ක පාඩුවක් සිද්ධ වනවා.

ඒ විතරක් නොවෙයි. මේක විශේෂ දෙයක් ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපි දන්නවා, මීට අවුරුදු 10කට, 12කට, 15කට විතර කලින් සාමාන්‍ය ජනතාවට දීලා සවි කරන්න වී මෝල් 137ක් ජාත්‍යන්තර සමාගමකින් ගෙනැල්ලා තිබෙන බව. මේ වී මෝල් 137 ගෙනාවාම සමහර ප්‍රදේශවල ඒවා සවි කළා. හැබැයි, වී මෝල් ටික සවි කළාට ඒවායින් ප්‍රයෝජනයක් ගන්න බැහැ. ඒ, මොකද? තනිකර යකඩ ගොඩක් තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපේ රටේ තිබෙන සාමාන්‍ය වී මේ මෝල්වලට දාලා අඹරන්න බැහැ. අඹරනකොට සහල් කුඩු වෙනවා. මේ යන්ත්‍ර කාන්තා සමිතිවලට දුන්නාට පස්සේ, සවි කරලා ටික දවසකින් නැවත අමාත්‍යාංශයට ගෙනැල්ලා දුන්නා. දැන් අන්න ගබඩාවක දාලා තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ ඒවා දිරමින් තිබෙනවා. දැවැන්ත යකඩ ගොඩක් බවට පත් වෙලා තිබෙනවා. අද වන විට ඒවා යකඩවලට විකුණන මට්ටමට ඇවිල්ලා තිබෙනවා. මේ නිසා රුපියල් මිලියන 219.6ක මුදලක් පාඩු වෙලා තිබෙනවා. මේක සතොස ආයතනය කළ එක ගනුදෙනුවක්. මේ හරහා රුපියල් මිලියන 219.6ක් පාඩු වෙලා තිබෙනවා. දැන් අපි ඒක අත්හරින්නේ නැතිව කල්පනා කරනවා, එක්කෝ මේක යකඩවලටවත් විකුණන්න ඕනෑ කියලා. ඒ අදාළ සමාගමට කථා කරලා කිව්වත් නැවත පාවිච්චි කරන්න පුළුවන් මට්ටමට හදන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒකට අපි උත්සාහ කළා. අඩුම තරමේ ඒවාට රබර් රෝල් යොදලා සාමාන්‍ය මට්ටමේ වී කොටන්න පුළුවන් ද කියලා බලන්න අපි උත්සාහ කළා. හැබැයි, ඒක කරන්න විධියක් නැහැ, මේවා යකඩවලට විතරයි දැන් ගන්න පුළුවන්. එක්කෝ අපි මේවා කොම්පැනියට භාර දෙන්න ඕනෑ. නැත්නම් යකඩවලට විකුණන්න ඕනෑ. අපේ ගබඩාවක් සම්පූර්ණයෙන් පුරවලා තිබෙන්නේ මේ යන්ත්‍රවලින්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපට මේ වෙනකොට ආර්ථික මධ්‍යස්ථාන 18ක් තිබෙනවා. මේ ආර්ථික මධ්‍යස්ථාන ගණනාවක් අපි පසුගිය දවස්වල පරීක්ෂා කර බැලුවා. මේ ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැඟීමේ අරමුණ හොඳයි. ගම් බිම් මට්ටමින් ගොවි ජනතාව කෘෂිකාර්මික නිෂ්පාදන කරනවා. ඔවුන් පලතුරු, එළවලු ඇතුළු වෙනත් දේ නිෂ්පාදනය කරලා විකුණා ගන්න බැරි වෙනකොට, ඒවා විකුණා ගැනීමේ අර්බුද එනකොට, ඒකට උත්තරයක් හොයන්න මේ ආර්ථික මධ්‍යස්ථාන හදපු එක හොඳයි. හැබැයි, හදලා තිබෙන ආර්ථික මධ්‍යස්ථාන බහුතරය ඒ අරමුණින් පිට වැඩ කරන්නේ. අරමුණට අනුව වැඩ කරන ආර්ථික මධ්‍යස්ථාන ගොඩක් අඩුයි. අපි දන්නා තරමින් කැප්පෙටිපොළ, දඹුල්ල, තඹුත්තේගම ඇතුළු තවත් ආර්ථික මධ්‍යස්ථාන කිහිපයක් මේ අරමුණත් එක්ක වැඩ කරනවා. හැබැයි, මේ අරමුණට වැඩ කරන්නේ නැති ආර්ථික මධ්‍යස්ථානත් තිබෙනවා. සමහර ආර්ථික මධ්‍යස්ථානවල තිබෙන්නේ සිල්ලර බඩු විකුණන කඩ විතරයි. ඒවා හදලා තිබෙන්නේ ගොවි ජනතාවගේ බඩු ටික මිලදී ගන්න පුළුවන් ආකාරයේ ආර්ථික මධ්‍යස්ථානයක්. ඒවා විකිණීමේ අන්තර් සම්බන්ධය හදලා සාධාරණ මිලට ගොවියාගේ බඩු ටික විකුණා ගැනීමේ මධ්‍යස්ථාන විධියට ඒ ආර්ථික මධ්‍යස්ථාන නම් කර තිබුණාට, ඒ තත්ත්වය නැහැ. මම ඒ ස්ථාන බලන්න ගියා. ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානයේ පොහොර ගබඩා කර තිබුණා. පොහොර විකුණන ආයතනවල පොහොර ඒ ආර්ථික මධ්‍යස්ථානයේ ගබඩා කර තිබෙනවා. සමහර නගරවල දැවැන්ත කඩ තිබෙනවා. ඒ කඩවල ගබඩාව විධියට මේ ආර්ථික මධ්‍යස්ථානය පවත්වාගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා මේ ආර්ථික මධ්‍යස්ථානවලින් අපි අපේක්ෂා කරන අරමුණ ඉෂ්ට කරගන්න බැරි වෙලා තිබෙනවා. මේ අමාත්‍යාංශය හරහා මේ ආර්ථික මධ්‍යස්ථාන එකට එකතු කරලා යම් වැඩ පිළිවෙළක් හදලා, නීති-රීති ක්‍රියාවලියක් ඇතුළේ එක යාන්ත්‍රණයක් ඇතුළේ මෙහෙයවලා කටයුතු කරන්න පුළුවන් නම්, ගොවියාටත්, ඒ ගොවියාගෙන් මිලදී ගන්නා දේ පාරිභෝගිකයා අතටත් පත් කරන්න පුළුවන් ක්‍රමයක් අමාත්‍යාංශය විධියට මැදිහත් වෙලා කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් සකස් කරමින් යන්නේ.

ඊළඟට, මේ ආර්ථික මධ්‍යස්ථානවලට අමතරව මහපොළ අරමුදල අපේ අමාත්‍යාංශයේ තිබෙනවා. මහපොළ අරමුදල නිර්මාණය කිරීමේ අරමුණක් තිබුණා. ගම් බිම් මට්ටමින් ආර්ථික හැකියාවක් නැතිව අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාල වරම් ලබන දරුවන්ට මේ අරමුදලින් ලොකු සහනයක් ලැබුණා. අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමටත්, විශ්වවිද්‍යාල ජීවිතය ගත කිරීමටත් මේ මහපොළ ශිෂ්‍යත්ව අරමුදල ලොකු දායකත්වයක් ලබා දුන්නා. ඒ කාලයේ මාසිකව රුපියල් 350ක මහපොළ ශිෂ්‍යත්ව අරමුදල අරගෙන මාසයක් ජීවත් වෙන්න පුළුවන් මිනිස්සු බවට අපි පත් වුණා. හැබැයි, මහපොළ ශිෂ්‍යත්ව අරමුදල ලබාදීමේ අරමුණ මේ විධියට තිබුණාට, අපේ ඇමතිතුමා උදේ කිව්වා, SLIIT ආයතනය ගොඩ නහනකොට ඒ මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට මොකක්ද කළේ කියලා.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය දවස්වල ජාඇල වෙළෙඳ ප්‍රදර්ශනයක් පවත්වා තිබෙනවා. නලින් ප්‍රනාන්දු හිටපු ඇමතිවරයා ඒකට මැදිහත් වෙලා, මහපොළ ශිෂ්‍යත්ව අරමුදලින් රුපියල් මිලියන 88.6ක් අරගෙන මහපොළ ප්‍රදර්ශනයක් පවත්වා තිබෙනවා. හැබැයි, මේ මහපොළ ප්‍රදර්ශනය පවත්වන්න ගත්ත මුදල්වලින් රුපියල් මිලියන 53යි ආපසු

මහපොළ අරමුදලට ලබාදී තිබෙන්නේ. රුපියල් මිලියන 35ක් අතුරුදන් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ මහපොළ අරමුදල අරමුණින් පරිබාහිරව පාවිච්චි කරලා විනාශ කරලා තිබෙන්නේ. මීට වඩා සැලකිය යුතු මුදලක් විශ්වවිද්‍යාල දරුවන්ට දෙන්න පුළුවන්කම තිබුණත්, ඒ අරමුදල විනාශ කරලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ විතරක් නොවෙයි. STC ආයතනය 2021-2022 කාලයේදී සහල් ආනයනය කර තිබෙනවා. රුපියල් මිලියන 64ක සතොසට යවපු සහල් තොගයක් තවම අතරමග තිබෙනවා කියනවා. ඒවා යවලා තිබෙන්නේ. නමුත් තවම යනවා. කන්ටේනර් තුනක්! ඉතින් ඒ වාගේ දැවැන්ත වංචා දූෂණ, නාස්තිය පිරිච්ච ආයතන පද්ධතියක් එකතු කරලා තමයි මේ අමාත්‍යාංශය ගොඩනඟලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ විධියට සිද්ධ වුණත් අපට වගකීමක් පැවරිලා තිබෙනවා. අපි ඒ වගකීම පවරාගෙනයි තිබෙන්නේ. අපි ඒ වගකීම පවරාගෙන තිබෙන්නේ නිකම් නොවෙයි. අපට අරමුණක් තිබෙනවා. අපේ ආණ්ඩුවට අරමුණක් තිබෙනවා. ඒ අරමුණ තමයි මේ රටේ ජීවත් වන සාමාන්‍ය ජනතාවගේ ජීවිත පවත්වාගෙන යන්න අවශ්‍ය පහසුකම් ටික අපි මැදිහත් වෙලා ලබා දෙන්න ඕනෑය කියන එක. ඒ සඳහා මේ අමාත්‍යාංශය විධිමත්ව මෙහෙයවන වැඩ පිළිවෙළ අපි පටන් ගන්නවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විපක්ෂයේ බොහෝ අය පසුගිය දවස්වල කථා කළේ, අද උදේ ගිහිල්ලා පොල් පැළයක් හිටවලා පහුව දා උදේ ඇවිල්ලා පැහිලා වැටිච්ච ගෙඩි හොයනවා වාගේ. ඒ වාගේ තමයි මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ගැන කථා කළේ. ඒ මොකද? අපි ආණ්ඩුව භාර අරගෙන මාසයක් යන්න කලින්, සතියක් යන්න කලින් හාල්, පොල් ගැන ප්‍රශ්න ගැන කරන තැනකට ආවා. අවුරුදු 76ක් තිස්සේ හංගත්වයට පත් වෙච්ච රටක් මාස හයකින් ගොඩ නහන්න පුළුවන්ද කියලා හිතා බලන්නේ නැතුව කථා කරනවා.

මම දැක්කා, විපක්ෂයේ මන්ත්‍රීවරු හාල් ගැන කථා කළා. හාල් ප්‍රශ්නය ගැන අපි මීට වඩා විග්‍රහ කරලා මාස ගණනක් තිස්සේ මේ සභාවේදී කථා කළා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. හැබැයි උදේ මෙතැනට එන මන්ත්‍රීවරයා හවසට නැහැ, හවසට එන මන්ත්‍රීවරයා උදේට නැහැ. ඒ නිසා එතුමන්ලා දන්නේ නැහැ, උදේ කථා කළේ මොනවාද, හවස කථා කළේ මොනවාද, අහපු ප්‍රශ්න මොනවාද කියලා. ඒ නිසා සෝද සෝදා මඩේ දමනවා වාගේ හැම වෙලාවේම එකම ප්‍රශ්නය අහනවා. මම හිතන්නේ ඒ ප්‍රශ්නයට දහ වතාවකට වඩා මේ පාර්ලිමේන්තුවේදී උත්තර දීලා ඇති. උදේ කියන දේ හවසට දන්නේ නැති, හවස කියන දේ ඊළඟ දවසේ උදේට දන්නේ නැති, අඩු තරමේ ප්‍රශ්නයක් විමසුවා කියලාවත් දන්නේ නැතුව උදේ හවස ප්‍රශ්න අහන විපක්ෂයක් අද ඉන්නේ.

ඊළඟ කාරණය මේකයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගෙන තිබෙන අද දවසේ, මේ අමාත්‍යාංශය යටතේ ආයතන 16ක්, 17ක් තිබෙද්දී ඒ ගැන කථා කරනවා වෙනුවට, අමාත්‍යාංශයට අදාළව එක වචනයක්වත් කථා නොකර කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ ගැන මම ඉතා කනගාටු වෙනවා. රටටම වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂය විවාදයට ගත් අද දවසේ ඒ විධියට කථා කිරීම පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරමින්, මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සාර්ථක කර ගන්න අපි මැදිහත් වෙනවාය කියන සහතිකය ලබා දෙමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ සෑම මට්ටමකම ජන ජීවිතයට බද්ධ වෙච්ච අමාත්‍යාංශයක වැය ශීර්ෂය තමයි අද විවාදයට ගෙන තිබෙන්නේ. පසුගිය කාලයේ සිද්ධ වෙච්ච වංචා දූෂණ, අල්ලස්, කොමිස් ගැනීම් සියල්ල නතර වෙලා, 2025 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද ලබන්න ඔන්න මෙන්න තිබෙන මේ වෙලාවේ මේ අමාත්‍යාංශයෙන් ජනතාවට යහපතක් සිද්ධ වෙයි කියලා, තමුන්ගේ දෛනික අවශ්‍යතා පහසුවෙන් සපුරා ගන්න පුළුවන් වෙයි කියලා ජනතාව, මේ ආණ්ඩුවට ඡන්දය දුන් බොහෝ ජනතාව විශාල බලාපොරොත්තුවකින් ඉන්නවා.

මාස හයක් මදි කියලා දැන් කිව්වාට, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා කිව්වේ එක පැන් පහරින් වී මාෆියාව නතර කරනවා කියලායි. තමුන්නාන්සේලා දැන් ඒක අමතකයි වාගේ ඉන්නවා. මම දන්නේ නැහැ, අමතක වෙලාද, අමතක වෙලා වාගේ ඉන්නවාද කියලා. මට කලින් කථා කළ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, ඔබතුමා කැප්පෙටිපොළ පැත්තේ ගියේ නැහැ නේද කියලා. යන්න බැහැ. රෙද්දක් ඇඳගෙන, කලිසමක් ඇඳගෙන යන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. රටේ ජනතාවට දෙනවාය කියපු එක දෙයක්වත් දෙන්න අද මේ ආණ්ඩුව සමත් වෙලා නැහැ. මෙතුමන්ලා කියන කථා එළියේ නැහැ. මෙතුමන්ලාගේ අතේ තිබෙනවා වාගේ කියපු බොහෝ දේවල් අද දුක් විඳින ජනතාවට ලැබිලා නැහැ; ලබා ගන්න විධියක් නැහැ.

ඒකට හේතු සොයන්න. ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් යොදන්න. අපේ ඇමතිතුමා කියනවා, හොරු රකින්නේ නැහැ කියලා. ඔය කටින් අපි කොච්චර අහලා ඇතිද ඇමතිතුමා, හොරු රකින්නේ නැහැ කියලා. ඔබතුමන්ලා උදේ ඉඳලා හවස් වනකල් -මේ දැනුත්- කථා කළේ මොන පැත්තේ ඉන්නවා කියලා හිතාගෙනද? අම්මපා ඇත්තමයි, ඔබතුමන්ලා ඉන්නේ ආණ්ඩුවේ! මේ අපි තමයි විපක්ෂයේ ඉන්නේ. මට පෙර කථා කළ අපේ නියෝජ්‍ය ඇමතිතුමා හොරකම් රාශියක් ගැන කිව්වා. ඉතින් ඒ එකෙකුගේ හෝ කනෙන් අල්ලලා හිරේ දමන්නකෝ. අන්න එතකොට ඔබතුමන්ලාට ගෞරවයක් ලැබේවි. අවුරුදු 76ක් තිස්සේ හොරකම් කළා කියලා files හදලා, ආණ්ඩුව අරගෙනත්, තවමත් හොරකම් ගැන කිය කියා ඔබතුමන්ලා ඉන්න එක ගැන ලජ්ජා වෙන්න ඕනෑ, ඇමතිතුමා. එහෙම නේද? දේශබන්දු ඇල්ලුවේ කවුද? ඇල්ලුවේ නැහැ, දේශබන්දු ගිහිල්ලා හාර වුණා. *[බාධා කිරීමක්]* මගේ කථාවට බාධා කරන්න එපා. ඔබතුමාට වෙලාව තිබෙනවා නේ. ඔබතුමාට පිළිතුරු කථාව කරන්න වෙලාවක් වෙන් කර තිබෙනවා නේ, ඇමතිතුමා. ඒකේදී උත්තර දෙන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා කියපු දේට මම උත්තරයක් දෙන්නයි හැදුවේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
උත්තරය දෙන්න, පිළිතුරු කථාවේදී. මගේ කථාව පාඩුවේ කරගෙන යන්න මට ඉඩ දෙන්නකෝ, බාධා නොකර. ඔබතුමන්ලාගේ කථා අහලා, බොරු අහලා අපට හිරිකිත වෙලා ඉන්නේ. ඒ නිසා ආයෙත් නැඟිටලා ඒවා කියන්න එපා. *[බාධා කිරීමක්]* මඩ ගහන එක සහ බොරුවට files හදන එක තමයි

[ගරු චමින්ද විජේසිරි මහතා]

ඔබතුමන්ලාගේ දේශපාලන ජන්මය. *[බාධා කිරීමක්]* දැන් ඒක නැති වෙගෙනයි යන්නේ. *[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා. ඔබතුමන්ලා හොරු රැකපු විධියයි, හොරුන්ගෙන් කාපු විධියයි අපි කියන්නම් කෝ. මේ පාර්ලිමේන්තුවේ කැන්ටිමට ගියා නම්- *[බාධා කිරීම්]* ඒ මිනිස්සු මැරිලා නැහැ.

ඔය පිටුපස පේළිවල ඉඳන් කෑ ගහන ආණ්ඩුවේ මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා මේවා දැන ගන්න. ඔබතුමන්ලා පව්! ඔබතුමන්ලා වාගේ අපිත් සමහරු රැක්කා. හරිද? අපිත් ඒ කාලයේ උදේට ඇවිල්ලා ආණ්ඩු රකින්න මෙතැනදී කථා කළා. ඒ රැකපු උදව්ය හොරා කාලා අපටත් මහ පාරේ යන්න බැරි තත්ත්වයට පත් කළා. ඔබතුමන්ලාටත් ළඟදී ඒක වෙනවා. ඒක මතක තබා ගන්න. අපි ඔබතුමන්ලාට මේවා කියන්නේ ඒකයි. ඔබතුමන්ලා ආධුනික මන්ත්‍රීවරු. මේ ඉදිරි පෙළේ සමහර අය ටයි කෝට් දමාගෙන හිටියාට,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අපේ යහ පාලන ආණ්ඩුව පැවැති කාලයේ පාර්ලිමේන්තුවේ කැන්ටිමේදී හොරුන් එක්ක එකට වාඩි වෙලා කාපු උදව්ය. බිමල් රත්නායක මහත්තයලා, හඳුන්නෙත්ති මහත්තයලා, ඔබතුමන්ලාගේ වර්තමාන නායකයා -ජනාධිපතිතුමා- ඇතුළු ඔක්කෝම විපක්ෂයේ ඉඳන් හොරු ගැන කියමින් කෑ මොර ගැහුවා, අරක හොරකම් කළා, මේක හොරකම් කළා, සීනි වංචාව කළා, බදු වංචාව කළා, පොල්තෙල් වංචාව කළා කියලා. ඒ හැම වංචාවක් ගැනම කිව්වා. එහෙම නේද, ගරු රවි කරුණානායක මැතිතුමනි? හැබැයි, ඒ අය දවල්ට කෑවේ මලික් සමරවික්‍රමත් එක්ක. *[බාධා කිරීමක්]* බොරු නම් ඔබතුමන්ලා ගිහිල්ලා පාර්ලිමේන්තු කැන්ටිමේ ඉන්න නිලධාරින්ගෙන් අහන්න. *[බාධා කිරීම්]* මහත්තයෝ, ලජ්ජා වෙන්න ඕනෑ.

අද මරික්කාර් මන්ත්‍රීතුමා හොරකමක්, වංචාවක් ගැන හෝඩුවාවක් දුන්නා. අන්න ඒ හෝඩුවාවම ඇති ඔබතුමන්ලා ඒ හොරු ගැන මුනිවත රකින්නේ කොහොමද කියන එකට. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් මුදල් අමාත්‍යාංශය අහනවා, "මෙන්න මෙහෙම පොල්තෙල් තොගයක් ගෙනැල්ලා තිබෙනවා, මේකට බදු අය කරලා තිබෙනවාද? මේ සම්බන්ධ observations එවන්න" කියලා. මේ ලියුමම ඇති. දැන් ආයෙත් ඒකට මරික්කාර් මහත්තයාගෙන් තවත් ලියුම් ඉල්ල ඉල්ලා ඉන්න ඕනෑ නැහැ. මොකක්ද මේ කරන්න හදන්නේ? පසුගිය කාලයේත් මේ සෙල්ලම් කළා. මේ රටේ පුරවැසියෝ ඒවා දැනගෙන හිටියේ නැහැ. අපි පුරවැසියන්ට කිව්වත් තේරුම් ගත්තේ නැහැ. අර පිටකොටුවේ ඉන්න පික්පොකට් ගහන හොරු වාගේයි. හොරකම් කරලා, "පොකට් ගැහුවා, පොකට් ගැහුවා" කිය කියා පික්පොකට් ගහපු හොරාම දුවනවා. ඔහු පස්සේ මිනිස්සු දුවනවා, හොරා අල්ලන්න. අන්න එහෙමයි ඒ හොරුත් එක්ක එකතු වෙලා ඒ ගනුදෙනුව කළේ. හොරා කන එක ගැන කියනවා, වංචාව ගැන කියනවා, අල්ලස් ගත්ත ඒවා ගැන කියනවා, ඒ files ගැන කියනවා, ඒ පුද්ගලයාට මඩ ගහනවා. හැබැයි, ඒ පුද්ගලයාත් එක්කම වාඩි වෙලා පාර්ලිමේන්තුවේ කැන්ටිමෙන් දවල්ට කෑම කනවා අපි ඇස් දෙකෙන් දැකලා තිබෙනවා. බොරු නම් අහලා බලන්න. පාර්ලිමේන්තුවේ ඒ නිලධාරින් මැරිලා නැහැ, ජීවතුන් අතර ඉන්නවා. ඒ අය ෆොටෝ ගහලා ගෙනැල්ලා අපට පෙන්නලා කියලා තිබෙනවා, "මෙන්න මන්ත්‍රීතුමා, මීට ටිකකට කලින් අනුර කුමාර මහත්තයා මේ හොරකම ගැන කථා කළා. බිමල් රත්නායක මහත්තයා මේ හොරකම ගැන කථා කළා. හැබැයි, ඒ හොරාත් එක්කම වාඩි වෙලා ඉන්නවා" කියලා. කිසිම ලජ්ජාවක් නැතුව, හිරිකිතයක් නැතුව ඒ හොරකම් වසාගන්න, හොරකමේ ගනුදෙනුව කථා කරන්න මේ පාර්ලිමේන්තු සභා ගර්භයෙන් එළියට ගිහිල්ලා කථා කරපු ආකාරය තමයි අප ඇහින් දැක තිබෙන්නේ.

පසුපෙළේ මන්ත්‍රීවරුනි, මේවා බොරු නොවෙයි. තමුන්නාන්සේලා පව්! තමුන්නාන්සේලාගේ හදවතේ අවංක හැඟීමක් ඇති, මේ රට හදන්න. නමුත්, ඔය ඉදිරි පෙළේ ඉන්න කිසි කෙනෙක් තමුන්නාන්සේලා හිතන, කියන විධියට වැඩ කරන්නේ නැහැ. ඒක තව ටිකක් කල් යන කොට තේරුම් යයි. හැබැයි, තේරුම් යන කොට රටට වෙන්න ඕනෑ දේත් වෙලා ඉවරයි, ඔබතුමන්ලාට වෙන්න තිබෙන දේත් වෙලා ඉවරයි, ඔබතුමන්ලාගේ අවංකත්වයත් ඉවරයි. ඒ නිසා මේවා තේරුම් අරගෙන වැඩ කරන්න.

ඔබතුමන්ලා එදා සුදු ලූනු වංචාව ගැන කථා කළා; පොල්තෙල් වංචාව ගැන කථා කළා. ඒ වංචනිකයන්ට දඬුවම් දෙන දින වකවානු කිව්වා. ගරු ඇමතිතුමනි, මම දැක්කා තමුන්නාන්සේ විදේශ රටකට -සිංගප්පූරුවට ද කොහේදෝ- ගිය අවස්ථාවක කියපු දෙයක්. මගේ ළඟ ඒ වීඩියෝ එක තිබෙනවා. "අපි බලයට පත් වෙලා සති 2යි, 3යි යන්නේ, 60-70ක් ඇතුළට දමනවා" කිව්වා. ඔබතුමාගේම වචනවලින් කියනවා නම්, 60-70ක් ඇතුළට දමනවා කිව්වා. ඉතින් කෝ? කරන්නකෝ. ඒකයි අපේ බලාපොරොත්තුව. හැබැයි, එක එක්කෙනාට මඩ ගහන කටයුත්ත නවත්වන්න. ඔබතුමන්ලාට බලය දීලා තිබෙනවා. ඔබතුමන්ලාට විධායක ජනාධිපතිවරයෙක් ඉන්නවා. ඔබතුමන්ලා කයිවාරු ගහනවා, ඔබතුමන්ලාට මන්ත්‍රීවරු 159ක් පාර්ලිමේන්තුවේ ඉන්නවා කියලා. එහෙම නම් ඔබතුමන්ලා ඒ සියලු දේ පාවිච්චි කරලා කියපු විධියට කටයුතු කරන්න. හැත්තෑහය අවුරුද්දක් කරපු වැරැදි ගැන ඔබතුමන්ලා හෙව්වා කියනවා, ඒවායේ ලිපිගොනු ඔබතුමන්ලාගේ අතේ තිබෙනවා කියනවා. ඒවා තියාගෙන තවත් වමාරන්න එපා. හිරිකිතයි; ගඳ ගහනවා.

ඔබතුමන්ලාගේ නොහැකියාව, ඔබතුමන්ලාගේ බැරියාව මේ රටේ ජනතාව තේරුම් අරගෙන ඉවරයි. රටේ ජනතාවට ඕනෑ මොකක්ද? හොරු අල්ලලා හොරුන්ට දඬුවම් දෙයි කියන බලාපොරොත්තුවෙන් තමයි රටේ ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දුන්නේ. අද හිරිකිතයක් නැතිව ඒ හොරු තමුන්නාන්සේලාට කෝචොක් කරනවා "පුළුවන් නම් අල්ලපල්ලා" කියලා. නමුත් ඒක වෙන්නේ නැහැ. හොරු ඇල්ලීම සිද්ධ වෙන්නේ නැහැ, හොරු අල්ලන්න බැහැ. ඇයි ඒ?

මම හැම දාම කියන කථාවක් තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයා ඔබතුමන්ලාගේ හැම දේම දන්නවා. ඔබතුමන්ලා රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ හැම දේම දන්නවා. ඒ නිසා ඒ තුන්කුට්ටුව එකතු වෙලා මේ රට පාවා දීලා, මේ රටේ ජනතාවගේ ජන අයිතිය යටපත් කරලා සුර සැප විඳින වැඩ පිළිවෙළක් තමයි අද ඔබතුමන්ලාට තිබෙන්නේ. දැන් ඔබතුමන්ලා කියනවා, "යන්නේ පයින්. කන්නේ කඩෙන්. එන්නේ බස් එකෙන්. ඒ වියදම් සියල්ල අඩු කරලා තිබෙනවා. පසුගිය කාලයේ කරපු වියදම් දැන් කරන්නේ නැහැ. V8වල යන්නේ නැහැ. අද සැප වාහනවල යන්නේ නැහැ. ඒ සැප වාහනවල ගියාම වියදම වැඩියි. ඒ වියදම් සියල්ල අපි කළමනාකරණය කළා. දැන් ඒ වියදම් අඩු වෙනවා" කියලා. ඒ වියදම් අඩු වෙනවා නම්, හාල් මිල තවත් අඩු කරන්නකෝ. ඉන්ධන මිල තවත් අඩු කරන්නකෝ. අපි කියන්නේ ඒකයි. ඔබතුමන්ලා කියන විධියට, පසුගිය කාලයේ මේ රටේ හිටපු පාලකයන්, දේශපාලන නායකයන් වින්දේ නැති සුරසැප ඔබතුමන්ලා විඳින්නේ නැත්නම්, ඒවාට ගිය වියදම් ටික ඉතිරි වෙලා තිබෙනවා නම් ඒ වියදම් ටික යන්න ඕනෑ කොහේට ද? ඒවා යන්න ඕනෑ පුංචි, අසරණ මිනිහා අතට; අහිංසක දුක් විඳින ජනතාව අතට; තුන් වේල කන්න නැතිව අඬා වැලපෙන අහිංසක ජනතාව අතට.

නමුත්, එහෙම වෙන්නේ නැහැ; එහෙම කරන්න බැහැ. මොකද, පොල්තෙල් වංචාව හේතුවෙන් අද රුපියල් බිලියන 6ක විතර විශාල මුදලක් ගන්න තිබෙනවා. අපට ආරංචියි, නියෝජ්‍ය ඇමතිවරයෙක් ඒ සියලු දෙනා ගෙනැල්ලා ඒක නොගෙවා ඉන්න අවශ්‍ය පිඹුරුපත් හදනවා කියලා. අත යට ගනුදෙනුව පසුගිය කාලයේ සිද්ධ වෙච්ච විධියටම සිද්ධ වෙනවා. ඒ කාලයේ හොරා කාපු උදව්යට "හොරා" කියලා file එක ඇදලා පෙන්නලා, ඒ හොරාගෙන් සල්ලි ගත්තා. දැන් සෘජුවම හොරා කන එක නතර වෙලා නැහැ. ඒ නිසා බොරුවට මවා පාන්න ටයි කෝට් ඇඳගෙන මොන කතන්දරය කිව්වත් ඔබතුමන්ලා පසුගිය සුපුරුදු ගමන යන බව බත් කන ජනතාව හැටියට රටේ ජනතාවට තේරෙනවා. ඔබ කියන, ඔබ කරපු ඒ සියලු දේවල ප්‍රතිඵලය අද මහ ජනතාවට ලැබෙන්නේ නැත්නම්, ජනතාව අතරට එන්නේ නැත්නම්, ජනතාවගේ ජීවිතය දිනෙන් දින මහා කඳුළක වැටෙනවා නම් ජනතාව දන්නවා මේක බොරුවක්, කයිවාරුවක්, මුසාවක් මිස යථාර්ථයක් නොවෙයි කියලා.

එම නිසාම ඔය පසු පෙළේ ඉඳන් කෑ ගහන මන්ත්‍රීතුමන්ලාට මම කියනවා, උදේ මේහේට ඇවිල්ලා උජාරුවට කථා කරන තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇතුළේ වෙන්නේ මොනවාද කියලා සොයා බලන්න කියලා. ඔය ආණ්ඩුව ඇතුළේ ඉදිරි පෙළේ ඉන්නවා අද මේ අමාත්‍යාංශය ගැන කථා කරන, හොඳම ඩීල් දාපු, හොඳම ඩීල් දාන, හොඳම ඩීල් දාලා උසාවියේ නඩු තිබෙන ඇමතිවරු; ඉඩම් පිළිබඳ නඩු තිබෙන ඇමතිවරු. ඒ ඉඩම් නඩුවලට අදාළ පුද්ගලයන් උසාවියට ඇවිල්ලා කියලා තිබෙනවා, "මගෙන් මෙච්චර මුදලක් ඉල්ලුවා" කියලා. හැබැයි, ඔබතුමන්ලා පම්පෝරි ගහනවා, සුදු ඇඳගෙන. සුදු ඇඳගෙන කොණ්ඩය පැත්තට පීරාගෙන හිටියාට, රාජපක්ෂලා හොරා කන කොට කෑ ගැහුවාට, ඒ හොරකම්වලින්, ගනුදෙනුවලින් සාක්කුවට දා ගත්තා වාගේම, අද ජාතික ජන බලවේගය කියන ආණ්ඩුව අටවා ගෙන මේ වෘත්තිකයන්ට, මේ රටේ සුවහසක් ජනතාව දීපු ඡන්දයට මුවා වෙලා ඒ හොරු කරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කියන කාරණය මතක් කරමින්, කථා කරන්න කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුනිල් බියන්විල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.10]

ගරු සුනිල් බියන්විල මහතා
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

විශේෂයෙන් මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, කෝට් ඇඳගෙන අපේ ඉදිරි පෙළේ ඉන්න නායකයන් පිළිබඳව විශ්වාස කරන්න එපා කියලා. මා ඒ මන්ත්‍රීතුමාට විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි, අපේ ආණ්ඩුවේ 159 දෙනා සම්බන්ධයෙන්ම අපට විශ්වාසයක් තිබෙන බව. එහෙම විශ්වාසයක් නැත්නම් අපි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ නැති බව. විශේෂයෙන් ගත්තොත්, අපේ ආණ්ඩු පාර්ශ්වයේ ඉදිරි පෙළේ ඉන්න අපේ සහෝදරවරුන් ඉතිහාසය පුරා කැපකිරීම් කරලා මෙතැනට ඇවිල්ලා ඉන්නේ ඔබතුමන්ලා පසුගිය කාලයේ කරපු වැඩේ කරන්න නොවෙයි, අලුත් රටක් හදන්න, ආර්ථිකය ශක්තිමත් කරන්න, ජනතාව ඡන්දය දීලා බලාපොරොත්තු වුණු වුවමනාව ඉෂ්ට කරන්නයි. ඒ වුවමනාව තමයි අප හැමෝටම තිබෙන්නේ. මම ඔබතුමාට අභියෝගයක් කරනවා. ඉදිරියේ දී අපේ ඇමතිවරුන් කිසිම දවසක ඔබතුමා ඔය විශ්වාස කරන දේ කළොත්, අපි මේ පාර්ලිමේන්තුවේ දී ඔබතුමා ඉදිරියේ සමාව ගන්නවා. එහෙම කවදාවත් වෙන්නේ නැහැ. අපට සහතිකයක් දෙන්න පුළුවන් අපේ මන්ත්‍රීවරුන් මේ අභියෝගයට මුහුණ දීලා මේ වගකීම ඉෂ්ට කරන බවට. මෙතැන ඉන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් 159දෙනාගෙන් කිසිවෙක් වාහන පර්මිට් ඉල්ලා නැහැ, බාර් පර්මිට් ඉල්ලා නැහැ, වෙනත් කිසිවක් ඉල්ලා නැහැ. ඉල්ලා තිබෙන්නේ, ජනතාව වෙනුවෙන් වැඩ කරන්න අවස්ථාවක් අරගෙන දෙන්න කියලායි.

ඒ ජනතාව බලාපොරොත්තු වුණු අරමුණ අපි හැමෝම එකතු වෙලා ඉෂ්ට කරනවා. ඒ වාගේම මන්ත්‍රීතුමන්ලා කිව්වා අපට ඇඳුම් ඇඳගෙන පාරේ යන්න බැහැ කියලා. ඔව්, අපි ඇඳුම් ඇඳගෙන ඔබතුමන්ලා ගිය V8වල නොවෙයි යන්නේ. අපි පයින් යනවා; ගොවි පොළට යනවා; පාරේ යනවා. ඒ වාගේම වෙළෙඳ පොළටත් යනවා. මිනිස්සු හැමෝම අවබෝධ කරගෙන ඉන්නවා, එදා වාගේම අදත් මාලිමාවේ මන්ත්‍රීවරු පාරේ යනවා, ජනතාව පිළිබඳ අවබෝධයක් තිබෙන මිනිස්සු, මේ රට හදන්න ආපු මිනිස්සු කියලා. ඒක ඔබතුමන්ලාට තහවුරු කර ගන්න පුළුවන් ඊළඟ මැතිවරණයේදී ජනතාව දෙන බලයත් එක්ක.

මීට කලින් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු මෙතැනදී මතු කළා, රුපියල් 65ක බද්දක් ගැහුවා කියලා, හාල්වලට. ඔව්, රුපියල් 65ක බද්දක් ගැහුවා. ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න. පසුගිය ඉතිහාසය පුරාම ගහපු බදු මුදල්වලට මොකක්ද කළේ? ඒ බදු මුදල් ජනතාවගේ කටයුතු සඳහා, මේ රටේ සංවර්ධනය සඳහා යොමු කළාද? නැහැ. ඒ බදු මුදල්වලින් ශත 50ක්වත් අපේ ආණ්ඩුව වියදම් කරන්නේ නැහැ. අපේ මන්ත්‍රීවරු පෞද්ගලික වුවමනාවලට ඒවා වියදම් කරන්නේ නැහැ. අපි ඒ බදු මුදල් කොමිස් හැටියට ගන්නේ නැහැ. ඒ සියලු බදු මුදල් ජනතාවගේ හෙට දවස වෙනුවෙන් වැය කරනවා. ඒ බදු මුදල් රටේ සෞඛ්‍යය, අධ්‍යාපනය ඇතුළු විවිධ ක්ෂේත්‍ර ශක්තිමත් කිරීම සඳහා වැය කරනවා. ඔබතුමන්ලා ඉතිහාසය පුරාම භාණ්ඩවලට ගහපු බද්ද රටේ යහපත සඳහා යොමු කළා නම්, අපට අද බදු ගහන්න වෙන්නේ නැහැ; අද අපි බදු ගහන්නේ නැහැ. ඔබතුමන්ලා කරපු වරද හින්දා තමයි අපට අද බදු ගහන්න වෙලා තිබෙන්නේ.

අපි කවුරුත් දන්නවා, මේ වෙනකොට වෙළෙඳ පොළේ භාණ්ඩවල මිල අඩු වෙමින් පවතින බව. ගිය අවුරුද්දේ මාර්තු මාසය වෙනකොට බී ලූනු කිලෝවක්, අල කිලෝවක්, සීනි කිලෝවක් කීයටද තිබුණේ? අද මිල කොහොමද? ඒවායේ මිල අඩු වෙමින් තිබෙනවා. ඒ වාගේම ආර්ථිකය ශක්තිමත් වෙමින් තිබෙනවා. අපි ඉදිරිපත් කරපු මේ අය වැය තුළින් අප්‍රේල් මාසය වෙනකොට රාජ්‍ය සේවකයාට වැටුප් වැඩි වෙනවාත් එක්කම මේ ආර්ථිකය කොයි තරම් දුරට ප්‍රසාරණය වෙලාද කියලා ඔබතුමන්ලාට බලාගන්න පුළුවන්. අපි හැම වෙලාවකම කටයුතු කරන්නේ, වැඩ හදන්නේ, ආර්ථිකය ශක්තිමත් කරන්නයි. අපි විශ්වාස කරනවා අපේ වැඩ පිළිවෙළ තුළ ඉදිරියේදී මේ ආර්ථිකය ශක්තිමත් වෙයි කියලා.

වී මිල සම්බන්ධයෙනුත් නිතර කථා කරනවා. වී කොච්චරක් මිලදී ගත්තාද කියලා අහනවා. ඔව්, අඩු ප්‍රමාණයක් තමයි අපට මිලදී ගන්න වුණේ. හැබැයි, අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. අපි වී ගබඩා සුද්ද කරලා, ශක්තිමත් කරලා තිබෙනවා. වී මිලදී ගැනීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඒ වැඩේට අපි අත ගහලා තිබෙනවා. ඒක අපි මේ අවුරුද්දේ නවත්වන්න කරපු

[ගරු සුනිල් බියන්විල මහතා]

වැඩක් නොවෙයි. අපි ඒක දිගටම කරගෙන යනවා. යල කන්නයේදී වාගේම, ඊළඟ මාස් කන්නයේදීත් නිෂ්පාදනය වැඩි කරන්න අපි විවිධ කටයුතු සංවිධානය කරමින් තිබෙනවා. පුරන් ඉඩම් වගා කරන්න ලෑස්ති වෙලා තිබෙනවා. ඒ වාගේම ගොවීන්ට වැඩි වැඩියෙන් සහන දෙන්න -පොහොර සහනාධාරය, බිත්තර වී ඇතුළු සියලු දේ දෙන්න- කටයුතු සලස්වමින් ඉන්නවා. ඒ තුළින් අපේ වී සංචිත වැඩි කරගන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි විශ්වාස කරනවා ඊළඟ කන්න වෙනකොට විශාල වී ප්‍රමාණයක් මිලදී ගන්න පුළුවන් වෙයි කියලා.

ඒ වාගේම කවුරුත් දන්න, මේ සභාව තුළ උදෑසන සිටම කථා කරපු සමුපකාර ක්ෂේත්‍රයත් අපේ රටට අතිශය වැදගත්. ඒ වැදගත්කම ආණ්ඩුවක් හැටියට අපි අවබෝධ කරගෙන ඉන්නවා. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය කටයුතු සලස්වමින් ඉන්නවා. අපි දන්නවා, සමුපකාර ක්ෂේත්‍රය පසුගිය ඉතිහාසය පුරාම දේශපාලනීකරණය වෙලා තිබුණු බව. පසුගිය සමුපකාර ඡන්දවලදී බඩු බෙදීම් ඇතුළු විවිධ දේවල් කළා. එහෙම කරලා බලය ගන්නවා. බලය ගන්නේ, සමුපකාරය තුළත් හොරකම් කරන්න. ඒ වාගේම වංචා කරන්න. අන්න ඒක වළක්වන්න අපි මේ වෙලාවේ අපේ ශක්තිය යොදමින් ඉන්නවා. අපි බලය ගන්නවා, බොහෝ සමුපකාරවල. ඒ බලය ගන්න සමුපකාර අපි ශක්තිමත් කරමින් ඉන්නවා. මේ රටේ සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් ව්‍යාපාරයක් හැටියට දියුණු කරලා එහි ප්‍රතිලාභය ජනතාවට අරගෙන දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

අද සතොස සම්බන්ධයෙනුත් විවිධ විවේචන තිබෙනවා. අපි පසුගිය ඉතිහාසය පුරාම දැක්කා සතොස සහ සමුපකාර පිළිබඳව මිනිසුන්ගේ විශ්වාසය කඩ වෙලා තිබුණු බව. ඒ පිළිබඳව මිනිස්සුන්ට විශ්වාසයක් නැහැ. ඒවා හොරකම් කරන ආයතන බවට පත් වෙලා තිබුණේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඒ ආයතන ඒ තත්ත්වයෙන් මුදා ගෙන ශක්තිමත් ආයතන බවට පත් කරලා අපේ රටේ ආර්ථිකයට විශාල කාර්යභාරයක් ඉෂ්ට කරන්න. පසුගිය කාලය පුරාම අපේ සමුපකාර එක තැනකට ලඟු වෙලා තිබුණේ. බඩු විකුණන්න, සමෘද්ධි සහනාධාර දෙන්න, පෙට්‍රල් ෂෙඩ් පටන් ගන්න, මල්ශාලා පටන් ගන්න, ඒ වාගේ කටයුතුවලට තමයි සමුපකාර යොමු වෙලා තිබුණේ. අපි බලාපොරොත්තු වනවා ඉතාම කෙටි කාලයක් ඇතුළත මේ සමුපකාර, නිෂ්පාදන සමුපකාර බවට පත් කරන්න. විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කවල සුළු අපනයන භෝග, වෙනත් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා සමුපකාරය යොමු කරන්න බලාපොරොත්තු වනවා. ඒ වාගේම සමුපකාරයත් එක්ක අපේ බිම් මට්ටමේ ඉන්න ජනතාව බද්ධ කරලා, සමුපකාරය පිළිබඳ විශ්වාසයක් ඇති කරලා, සමුපකාර ශක්තිමත් කරලා, ඒවා නිෂ්පාදන සමුපකාර බවට පත් කරලා තිබෙන තැනින් ඉහළට ගන්න අපි කටයුතු කරනවා. සමුපකාරය තුළින් ජනතාවට බඩු මිලදී ගන්න කටයුත්ත විතරක් නොවෙයි, ජනතාවගේ භාණ්ඩ විකුණා ගැනීම සඳහාත් අවස්ථාව සලසන්න බලාපොරොත්තු වනවා. පෞද්ගලික අංශයෙන් සුළු අපනයන භෝගවලට, වෙනත් භෝගවලට ගොවි ජනතාවට ලැබුණේ අඩු මුදලක්. සමුපකාර තුළින් භාණ්ඩ මිලදී ගැනීම හරහා ඒවාට සාධාරණ මිලක් ලබා දීලා ගොවි ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි සමුපකාර ව්‍යාපාරය පමණක් නොවෙයි, මේ රටේ සියලු ක්ෂේත්‍ර ශක්තිමත් කරලා අපේ රටේ ජනතාව පසුගිය මැතිවරණයේදී මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණු ඒ අපේක්ෂා ඉෂ්ට කරනවා. ඔවුන්ගේ අරමුණ ඉෂ්ට කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපි 159දෙනාම කැප වීමෙන් වැඩ කරනවා. ඔවුන්ට ශක්තියක් දීම සඳහා අපේ කැප කිරීම තව තවත් වැඩි කරමින්, ආදර්ශ දෙන අය බවට පත් වන බවට පොරොන්දුව දෙමින්, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රටට සේවයක් කරන්න පුළුවන් ඉතාම වැදගත් අමාත්‍යාංශයක් ගැන වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. මම හිතන හැටියට වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය ගැන කථා කරද්දී, හාල්, අල, ලූනු හා පොල් ගැන කථා කරන්නේ නැතුව කථා කරන්න අවශ්‍ය වන්නේ, ප්‍රතිපත්ති ඇති කරලා ඒ තුළින් අද රටේ තිබෙන මේ ව්‍යසනයට උත්තරයක් සපයන්න පුළුවන් වන්නේ කොහොමද කියලායි. මම හිතන විධියට ඒක තමයි අපි මූලිකව කළ යුත්තේ. ඒ ආකාරයෙන් රටේ සංවර්ධනයක් ඇති කරන්න තමයි අපි සියලුදෙනාම ඇප කැප වෙන්න අවශ්‍ය. මෙම අමාත්‍යාංශයේ අමාත්‍ය ධුරය හොබවපු කාලය තුළ එහි රැඩිකල් වෙනසක් ඇති කරපු පුද්ගලයකු වශයෙන් මම හිතනවා, ඒ අවශ්‍ය වෙනස්කම් කරන්නේ කොහොමද කියන එක තමයි මේ අවස්ථාවේදී අපි කථා කරන්න අවශ්‍ය වන්නේ කියලා.

මා පළමුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව ගැන කථා කළොත්, කොම්පැනි 221,000ක් පමණ ලියාපදිංචි වී තිබෙනවා. ඉන් කොම්පැනි 50,000ක්, 100,000ක් විතර ක්‍රියාශීලිව සිටින අතර, ඇයි ඒවා ලියාපදිංචි කරන්න වැඩි කාලයක් ගත වෙන්නේ කියන ප්‍රශ්නය අපි හැම දෙනාටම තිබෙනවා. සාමාන්‍යයෙන් කොම්පැනියක් ලියාපදිංචි කරන්න දවස් 5ක් හෝ 6ක් යනවා. හැබැයි කියන්නේ, online කරන බව. රුපියල් 50,000ක්, 75,000ක් විතර යනවා, ඒ ලියාපදිංචිය කරන නීතිඥවරයා අනුව. මා හිතන විධියට ඒ කටයුතුවල වෙනසක් ඇති කරන්න අවශ්‍යයි.

ඒ විතරක් නෙවෙයි. මම මීට පෙරත් කථා කළා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් - small and medium enterprises - ගැන. ලියාපදිංචිය සම්බන්ධයෙන් ඒගොල්ලන්ට තිබෙන්නේ විකල්ප දෙකයි. එකක් තමයි, තනි ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් ඉදිරියට ගෙන යෑම. අනෙක් එක තමයි කොම්පැනියක් වශයෙන් ලියාපදිංචි කිරීම. කොම්පැනියක් ලෙස ලියාපදිංචි කරන්න රුපියල් 50,000ක් හෝ 75,000ක් හෝ 100,000ක් පමණ වැය වනවා. එය වැඩි මිලක් නිසා ඔවුන් අධෛර්යවත් වනවා. එම නිසා ගරු ඇමතිතුමා සහ අමාත්‍යාංශය මේ කාරණය කෙරෙහි අවධානය යොමු කර රුපියල් ලක්ෂ 5ට අඩු වන්කම් සහිත, ඒ කියන්නේ low capital base company එකක් ලියාපදිංචි කිරීමේ ගාස්තු අඩු කිරීමට කටයුතු කරන්න අවශ්‍යයි. ඒක රුපියල් 10,000ක වාගේ තිබුණොත් සුළු පරිමාණ ව්‍යාපාරයකටත් නෛතිකභාවයක් ලැබෙනවා. එක අධ්‍යක්ෂවරයෙක් සහිතව ලියාපදිංචි කළොත් ඒක ලොකු රුකුලක් වෙනවා බැංකු ණයක් ගන්න, වෙළෙඳාම් කරන්න සහ ලෝකය තරණය කරන්න එය ලොකු රුකුලක් වනවා. ඒ විතරක් නොවෙයි, ඉක්මනින් ලියාපදිංචි කිරීමේ හැකියාවත් තිබෙනවා. දැන් Port City එකේ කොම්පැනි 96ක් ආරම්භ කර තිබෙනවා. ඒවාට දවස් දෙකෙන් ලියාපදිංචිය දෙනවා. නමුත්, සාමාන්‍ය කොම්පැනියක් ලියාපදිංචි

කිරීම සඳහා දවස් 5ක්, 6ක් හෝ 10ක් ගත වන්නේ. ඒ නිසා ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගැනීම අවශ්‍යයි. ඊළඟට, online කියන වචනය සැබෑ මට්ටමින්ම ක්‍රියාත්මක කරන්න. ඒ අනුව, ලියාපදිංචිය දවසින් ලබා ගැනීමට කටයුතු සලසන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමා සභාවට එන නිසා මම නැවත මතක් කරන්නම්, මේ කාරණය. ගරු ඇමතිතුමනි, ප්‍රාග්ධනය රුපියල් ලක්ෂ 5ට අඩු කොම්පැනි ලියාපදිංචි කිරීම වහාම ක්‍රියාත්මක කරන්න. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් කරන තරුණයෙක් ව්‍යවසායකයකු බවට පරිවර්තනය කරන්න, තනි ව්‍යාපාරයක් ලියාපදිංචි කරන්න රුපියල් හාරපන්දාහක් යනවා. කොම්පැනියක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රුපියල් 10,000ක් කරලා නෛතිකභාවයක් ඇති කරන්න. එය ඔවුන්ට ලොකු උදව්වක් වන බව මේ අවස්ථාවේ මම මතක් කරනවා.

ඒ වාගේම තවත් වැදගත් ආයතනයක් තමයි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය. 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ තමයි ඒක පිහිටුවා තිබෙන්නේ. ඒක මීට වැඩිය ජනතාවට හිතෛෂී විය යුතුයි. එදා ඒ ආයතනය පටන් ගත්ත අරමුණ අද එහෙ මෙහෙ ගිහිල්ලා තිබෙනවා. මේ ආයතනය රක්ෂා ඇති කරන ආයතනයක් නොවෙයි. ඒකෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ තමයි කරන්න අවශ්‍ය වෙන්නේ. ඒකේ composition එක තිබෙනවා. අපි ගෙනාපු පනතක් වශයෙන් ඒක තිබෙනවා. නැවත ඒකේ වෙනස්කම් කරන්න අවශ්‍ය නැහැ. නමුත්, ඒ ආයතනය තුළින් ජනතා හිතෛෂී වැඩ පිළිවෙළක් ඇති කරන්න අවශ්‍යයි. ඒ වාගේම ලොකු කොම්පැනි වටලන එක විතරක් නොවෙයි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කළ යුත්තේ. ඒ වෙනුවට සමස්තයක් වශයෙන් සියලුදෙනා පාවිච්චි කරන භාණ්ඩ සහ සේවා සම්බන්ධයෙන් කටයුතු කිරීම අවශ්‍යයි.

ඒ වාගේම ඒ ආයතනය ඩිජිටල්කරණය කරන්න. අද තිබෙන ප්‍රශ්නය තමයි, යම් ස්ථානයක් raid කරන්න ඉස්සෙල්ලා, raid කරන්න එනවා කියලා දැන ගන්න එක. ඒ නිසා, මීට වැඩිය outsource කරන ක්‍රමයක් හෝ මොනවා හරි කරන්න. ඒක තමයි අවශ්‍ය වෙන්නේ. එහෙම නැත්නම් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, රජයේ නිලධාරිවාදය ක්‍රියාත්මක වන තවත් ආයතනයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා කියන එක තමයි අපට කියන්න වෙන්නේ. ඒ නිසා අලුත් mechanism එකක් හදලා, මේ කටයුතු කරන්නේ කොහොමද කියලා බලලා ඉදිරියට කටයුතු කරන්න.

ඒ විතරක් නොවෙයි. රජයේ ආයතන සම්බන්ධයෙනුත් කටයුතු කරන්නත් අවශ්‍යයි. අද පෞද්ගලික අංශයේ ආයතන වටා විතරක් යනවා. නමුත්, ඊට වැඩිය අදක්ෂතාවක් සහ ප්‍රශ්න ගණනාවක් තිබෙන රජයේ ඒකාධිකාරියක් තිබෙන ස්ථාන ලෙස තිබෙන ආයතන සම්බන්ධයෙනුත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ක්‍රියා කිරීම අවශ්‍යයි කියන එක මේ අවස්ථාවේදී කියා සිටිනවා. ඒ, ගෑස් සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, තෙල් සම්බන්ධයෙන් වෙන්න පුළුවන්. Public Utilities Commission එක තිබුණාට කමක් නැහැ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තිබෙන්නේ ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න තමයි. දැන් මේ පාන් මිල ගත්තාම, monopoly සහ oligopoly තිබෙන නිසා තමයි මේ ප්‍රශ්න තිබෙන්නේ. නමුත්, ඊට වැඩිය ඕනෑකමින් මේ ආයතනය ඉදිරියට තල්ලු කරන්න අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ වාගේම, මම මේ අවස්ථාවේදී මගේ දේශපාලන ගුරුවරයා වන ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මතක් කරන්නට ඕනෑ. හැකියාව තිබුණා නම්, ආර්ථික පහසුකමක් නැති අවස්ථාවකට උත්තරයක් වශයෙන් තමයි එතුමා මහපොළ සංකල්පය ඉදිරිපත් කළේ. 1981දී මහපොළ සංකල්පය යටතේ පටන් ගත්ත Mahapola Trust Fund එකේ අද වන විට රුපියල් බිලියන 20.5ක අරමුදලක් තිබෙනවා. 1981දී පටන් ගත්ත මේ මහපොළ ශිෂ්‍යාධාරය හිමි ශිෂ්‍යයන් ගණන අද වන විට 660,214ක් වෙනවා කියලා වාර්තා වෙලා තිබෙනවා. මම ඉතා ඕනෑකමින් කියනවා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ඒ තුළින් ඉමහත් සේවයක් මේ තරුණ තරුණියන්ට ඉෂ්ට කරලා තිබෙන බව. මන්ත්‍රීවරුන් ගණනාවක් කියනවා මට ඇහුණා, මහපොළ තුළින් කොතරම් සේවයක් ලබා ගත්තාද කියන එක.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හිටපු ආණ්ඩුවෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලින් හදපු SLIIT එක දෙන්න තීරණයක් අරගෙන තිබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, එක වෙනත් අමාත්‍යාංශයක් තුළින් කටයුතු කරපු එකක්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැහැ, ඒ කැබිනට් මණ්ඩලය තීරණය කරලා තිබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ. ඒ අවස්ථාවේදී අමාත්‍යාංශ වෙන වෙන මට්ටමේ තිබුණා. හැබැයි, SLIIT එක සම්බන්ධයෙන් මට කියන්න පුළුවන් වන්නේ මේකයි.

මේ කාලය අපි ගරු ඇමතිතුමාගෙන් ගනිමු, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එතකොට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

SLIIT එකෙන් වැදගත් දෙයක් සිදු වුණා. එතැන යම් ඉඩම් ප්‍රමාණයක් තිබුණා. ඒ අනුව අදහසක් ආවා; හොඳ අදහසක් ආවා. ඒක ආවේ, කිංස්ලි ටී. වික්‍රමරත්න මහත්මයාගේ කාලයේ. දක්ෂයෝ ගණනාවක් එතැන හිටියා. ඒගොල්ලෝ කිව්වා, "මේ ඉඩම තිබෙනවා, ඒවා මීට වැඩිය වාණිජ කරන්න" කියලා. වෙනත් අමාත්‍යාංශයක් තුළින් ඉදිරිපත් කරපු යෝජනාවකට, ඊට පස්සේ අදහසක් ඇවිල්ලා ඒක, -

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, SLIIT එක සම්බන්ධයෙන් 1998දී තීරණයක් ගත්තා. 1999දී ඒක හදන්න පටන් ගත්තා. ඒ සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලින් සල්ලි දැම්මා. ඒ සල්ලි දාලා, 2015 වෙනකොට ඒකේ රඳවා ගත් ලාභය රුපියල් මිලියන 1,100කට ආසන්නව තිබුණා. තැන්පතු වශයෙන් රුපියල් මිලියන 460ක් තිබුණා. ඔක්කොම රුපියල් මිලියන 1,500ක් විතර තිබුණා. හැබැයි, ආපහු රුපියල් මිලියන 405ක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට දීලා, ඒ ආයතනය වෙන තැනකට පවරන්න ඔබතුමා හිටපු කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන තිබෙනවා. ඔබතුමා ඒ කැබිනට් මණ්ඩලයේ හිටියේ නැද්ද?

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
1998දී අපි හිටියේ නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, 2015දී.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
2015 වෙනතුරු ඒක වෙන විධියකට තිබුණා. SLIIT එක ගැන හොඳ අදහසක් ආවා. ඊට පස්සේ අමාත්‍යාංශය තුළින් ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා වෙනත් අදහසක් ඉදිරිපත් කළා. ඒගොල්ලෝ ඒක ගෙනියපු ආකාරය කොහොම වුණත්, අන්තිමට වුණේ වෙනත් එකක්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා එම කැබිනට් මණ්ඩලයේ හිටපු කෙනෙකු විධියට, ඒ අවස්ථාවේ හිටියාද, නැද්ද කියන එක තමයි මට දැන ගන්න වුවමනාව තිබෙන්නේ. 2015 වර්ෂයේ මැයි මාසයේ තමයි කැබිනට් මණ්ඩලය මේ තීරණය ගන්න මැදිහත් වෙන්නේ. ඊට පස්සේ 2017දී, -

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. ඊට ඉස්සෙල්ලා අරගෙන තිබුණා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, මේ තිබෙන්නේ. මේ Audit Report එක අනුව මම මේ කියන්නේ. SLIIT එක හදන එක නොවෙයි, SLIIT එකේ අයිතිය අතහරින එක ගැන මම කියන්නේ. එහෙම තීරණයක් ගත්තේ කොහොමද? රුපියල් මිලියන 1,500ක් වෙනවා, deposits සහ රඳවා ගත් ලාභය.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
කැබිනට් මණ්ඩලයේදී ගත්ත තීන්දුවක් නොවෙයි, Chief Justice K. Sripavan මැතිතුමා තමයි ඒක preside කළේ. ඒ තුළින් ආපු අදහසක්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ, ඔබතුමා වැරදියි. මේ තීරණය ගත්තාට පස්සේ, මේ ගිවිසුම ගත්තාට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරකේ. ශ්‍රී පවන් මැතිතුමා කියලා තිබෙනවා, එතුමා කොමිසමේ සාක්ෂි දීලා තිබෙනවා, අපේ Board එකෙන් එහෙම තීරණයක් ගත්තේ නැහැ, මේක හොරට ගහපු ගිවිසුමක් කියලා. ඒ අනුව තමයි මේ ආයතනය දීලා තිබෙන්නේ. මේක ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ වෙච්ච දෙයක් නිසායි මම අහන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට යමක් වෙනවා නම් අපි ඒකට විරුද්ධව මොකුත් කරන්නේ නැහැ. මොකද, අපි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පුරවන්න අලුත් ජීවයක් දුන්න නිසා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
එතකොට 2017දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා කැබිනට් පත්‍රිකාව දාලා,- *[බාධා කිරීමක්]* ඒ කැබිනට් පත්‍රිකාවේ අංකයත් එක්කම තිබෙනවා. මම ඒක ඔබතුමාට කියන්නම්. 2017දී එය audit කරන එක සම්පූර්ණයෙන් නවත්වන්න තමයි ඒ තීරණය ගන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙනුවෙන් අපි පුළුවන්තරම් කටයුතු කරලා තිබුණු බව ඔබතුමා දන්නවා. මේ අවස්ථාවේ මට කියන්න පුළුවන්, SLIIT එකෙනුත් ඉමහත් සේවයක් ඉෂ්ට වුණා කියලා. ඒකෙන් සේවයක් ඉෂ්ට නොවුණා නොවෙයි. ඒක වැරදියට තේරුම් ගන්න එපා. දැන් ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා, -

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, SLIIT එක දැනුත් වැදගත් සේවයක් කරමින් තිබෙනවා. හැබැයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. ඊට වඩා අඩු මුදලකට ළමයින්ට උගන්වන්න තිබුණා. හැබැයි එහෙම තිබෙද්දි දැන් මේ ආයතනය ව්‍යාපාරකරණයට ලක් කරලා, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අයිතියත් අතහැරලා තිබෙනවා. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට මේ ආයතනයෙන් අවුරුද්දකට රුපියල් මිලියන 25ක rent එකක් හම්බවුණා. Trust fund එකක දේපළක් එහෙම දෙන්න බැහැ. Trusts Ordinance එක අනුව trust fund එකක දේපළක් එහෙම දෙන්න බැහැ. ඒ නිසා මේ ආයතනය ඉතාම හොරට ගහපු ගිවිසුමක් හරහා තමයි දීලා තිබෙන්නේ. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට එන්න ඕනෑ ආදායම අද කොහේටද යන්නේ? ඒකයි ප්‍රශ්නය.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඒක ඉදිරියේදී බලාගන්න පුළුවන්. ඔබතුමන්ලාට ඒ හැකියාව තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ සඳහා අපි ඉදිරි කටයුතු කරනවා. මට ඒ කරුණු දැනගන්න ඕනෑ වුණේ, ඔබතුමාත් ඒ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයකු විධියට හිටපු නිසායි.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
2017 වසරේ අග භාගයේ සිදු වුණු දෙයක් නිසා ඒ ගැන අපට මොකුත් කියන්න බැහැ. *[බාධා කිරීමක්]* හරි, හරි. ඒ ආයතනයෙන් 40,000ක විතර ශිෂ්‍ය පිරිසක් නැවත එළියට

එනවා. ඔවුන් ඉතා දක්ෂයෝ. *[බාධා කිරීමක්]* රජයේ බිල්ඩිමක් නිකම් තියාගෙන ඉන්නවාට වැඩිය මේ වාගේ දෙයක් කරන එක ඉතා වැදගත්. *[බාධා කිරීමක්]* ඉතින් ඒක වාණිජකරණය කරන්න. ආණ්ඩුව හැම වෙලාවේම ව්‍යවසායකයන් ගැන හිතන්න අවශ්‍යයි. එහෙම නැතිව හැම ආයතනයක්ම ආණ්ඩුවට අයිතියි, හැම එකකම අයිතිය තිබෙන්නේ රජයට කියලා, -

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව තුළින් ආපහු වතාවක් මට හැඟෙනවා, ඔබතුමාත් ඒක රකින්න යනවාද කියලා. මට දැනගන්න වුවමනාව තිබුණේ ඒක.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. මම රකින්නේ ඒ ව්‍යවසායකත්වය, -

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
රවී කරුණානායක මන්ත්‍රීතුමනි, 2015 වෙනකම්ම මේ ආයතනය හොඳට ක්‍රියාත්මක වී ගෙන ආවා නේ. කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ නේ. එහි අයිතිය තිබුණේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට. ඒ ආදායම ලැබෙන්න ඕනෑ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට. ලාභ වැඩි වුණා නම් ඒකත් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට යන්න ඕනෑ. එතකොට ළමයින්ට වැඩිපුර ශිෂ්‍යත්ව දෙන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි නීතිවිරෝධී තීරණයක් අරගෙන ඒ අයිතිය සම්පූර්ණයෙන්ම ඉවත් කළා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සිද්ධ වුණේ මොකක්ද කියන එක ඔබතුමන්ලා බලන්න. ඒක බොහොම හොඳයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුව හැම එකක් ගැනම බල බලා ඉන්න ආණ්ඩුවක් නේ. මේ සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. මම රකින්නේ එක දෙයක්. ඒ, මේකේ තිබෙන වටිනාකම සහ ඒ ව්‍යවසායකත්වය. එතැන ශිෂ්‍යයන් 40,000ක් විතර ඉන්නවා නම් ඒක ඉතා හොඳ දෙයක්. අද 55,000ක ශිෂ්‍ය පිරිසක් නඩත්තු කරන්න රජයේ රුපියල් බිලියන 135ක් වැය වනකොට, සත පහක් නැතුව අද ලෝකය තරණය කරන ඉතා දක්ෂ පිරිසක් මෙතැනින් ඇවිල්ලා තිබෙනවා. ඒක ගැන තමයි ඔබතුමන්ලා බලන්න අවශ්‍ය වන්නේ. ඔබතුමන්ලා කියනවාද, පෞද්ගලික විශ්වවිද්‍යාල නැති කරන්න යනවා කියලා? නැහැ. එහෙම කරන්න එපා. පෞද්ගලික විශ්වවිද්‍යාල පුළුවන්තරම් ඇති කරන්න. ලක්ෂයක් විතර අපොස (උසස් පෙළ) විභාගය සමත් වුණත්, ඒ හැමදෙනාටම විශ්වවිද්‍යාලයට යන්න පුළුවන්කම නැහැ. ඔබතුමා කියන කාරණයත් එක්ක මම තව ඉල්ලීමක් කරනවා. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා වෙනුවෙන් කරුණාකරලා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල තුළින් postgraduate university එකක් ඇති කරන්න. ඒ සඳහා අපි ලියාපදිංචියක් කරලා තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගෙන් අපි ඒ සඳහා ඉල්ලීමක් කළා. නමුත් ඒ කාල පරිච්ඡේදයේ ඒක සාක්ෂාත් කරගන්න පුළුවන් වුණේ නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ලලිත් ඇතුලත්මුදලිගේ නමින් ඕනෑම ආකාරයක postgraduate university එකක් ඇති කරන්න. මම හිතන විධියට University Grants Commission ඒකෙනුත් ඒ ගැන අදහස් ඉදිරිපත් වෙලා තිබුණා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එකට පනතක් ගෙනෙන්න ඕනෑ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඕනෑ එකක්. ඔබතුමා ඇමති නේ. ඒකයි මම කිව්වේ. මේ අමාත්‍යාංශය ගැන හැඟීමක් තිබෙන නිසායි මම මෙහෙම කියන්නේ. ඒ සඳහා මම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙනෙන්නම්. *[බාධා කිරීමක්]*

ඔබතුමන්ලා දන්නවා, ව්‍යවසායකත්වය වැඩි කිරීම තමයි අවශ්‍ය වන්නේ කියලා. මේ හැම දේම රජය තුළින් ගෙනියන්න හදන එක තමයි අපි නවත්වන්න අවශ්‍ය වන්නේ. මේවා සඳහා branding අවශ්‍යයි.

ගරු ඇමතිතුමනි, තවත් ඉතා වැදගත් දෙයක් ඔබතුමාගේ අමාත්‍යාංශයේ තිබෙනවා. ලංකාව brand කරන්න අවශ්‍යයි. Brand කරන එක තමයි කරන්න අවශ්‍ය වන්නේ. අපේ ලංකාව "The Pearl of the Indian Ocean" හරි "Gem of Asia" හරි කරන්න පටන් ගන්න. සිදු වෙලා තිබෙන්නේ මේකයි. මේක අවුරුද්දක්, දෙකක් කරන්න පටන් ගන්නවා, ඊට පස්සේ කඩාගෙන වැටෙනවා. ඒ වාගේම, භාණ්ඩත් brand කරන්න අවශ්‍යයි. දැන් බලන්න, "Dilmah Tea", "Spa Ceylon" ආදී brands ඉතා දක්ෂ විධියට ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. MAS clothing, Hela Clothing වාගේ ඒවා තමයි ඇති කරන්න අවශ්‍ය වන්නේ.

මේ මෑතකදී ඔබතුමන්ලා යම් සංකල්පවලින් බැහැරව ගිහිල්ලා තිබෙන ආකාරය මම දකිනවා. අන්න ඒ සංකල්පවලින් බැහැරව යන එක මම ඉතාම අගය කරනවා. මම කියන්නේ ඔබතුමන්ලාගේ හොඳ දේවල් ගැන.

මම ඔය වාමාංශික සහ ඒ පැත්තේ හොඳ ගුණාංග සියයට එකක්, දෙකක් ගන්නවා. නමුත්, විවෘත ආර්ථිකයේ තිබෙන හොඳ දේවල් අපි ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. ඔබතුමන්ලාත් යැපෙන්නේ ඒකෙන් නේ. ජේ.ආර්. ජයවර්ධන 1978දී විවෘත ආර්ථිකය ගෙනාවාට, ඒකට අවුරුදු 50ක් විතර ගිහිල්ලා තිබුණාට තවම ඒකට විකල්පයක් නැහැ නේ. ඒ නිසා විවෘත ආර්ථිකයේ හොඳ ඒවා අරගෙන නරක ඒවා වීසි කරලා දාන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ප්‍රවෘත්තියක් තිබෙනවා, "President Dissanayake sets ambitious export target of US Dollar 36 billion by 2030" කියලා. මේක බොහොම හොඳයි. මේක කවුරු කිව්වත්, කියන්න තිබෙන දේ තමයි හරියට කියලා තිබෙන්නේ.

ඒ වාගේම export earnings ගැනත් බලන්න. අපට අද තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 16ක අපනයන ආදායමක්. නමුත් ඔබතුමන්ලා කියලා තිබෙනවා, අවුරුදු 5කින් මෙය වැඩි කරන්න ඕනෑය කියලා ඩොලර් බිලියන 36කට. නමුත්, මේ යන විධියට ගියොත් ඒක වෙන්නේ නැහැ. ඉතින් අපි වෙන්නේ නැති එකක් ගැන කථා කරන්නේ නැතුව, එය වෙන්නේ කොහොමද කියලා කථා කරමු. මීට පෙර ආණ්ඩුවලට තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි, හැම දවසේම කොහේ හරි strike එකක්, එහෙම නැත්නම් protest තිබෙන එක. අද ඒවා නැහැ. ඉතින් ඒවා තමයි හොඳ ගුණාංග. අපි විපක්ෂය තුළින් ඒ සංකල්ප ගෙනියන්නේ නැති නිසා, එය අපේ දුර්වලතාවක් ලෙස හිතන්න

[ගරු රවී කරුණානායක මහතා]

එපා. නමුත් මේ ඇතිවෙලා තිබෙන ශක්තිය පාවිච්චි කරලා ආයෝජකයන්ට කියන්න, දැන් ඇවිල්ලා ආයෝජනය කරන්න, ඒ වාගේ දේවල් වෙන්නේ නැහැ කියලා. මේවා තමයි අපි ඉදිරියට ගෙනියන්න අවශ්‍ය වන්නේ. ඔබතුමන්ලාට ඒ හැකියාව සහ උනන්දුව තිබෙන නිසා අපි ඒවා පාවිච්චි කරමු.

ඒ විතරක් නොවෙයි, විජිත හේරත් ඇමතිතුමාත් කථා කරලා තිබුණා. Deglobalization ගැන මම එදාත් ප්‍රශ්නයක් ඇහුවා. ලෝකයම globalization ගැන කථා කරනකොට ඩොනල්ඩ් ට්‍රම්ප් deglobalization ගැන කථා කරනවා. ඉතින් මේ නිසා ලොකු බලපෑමක් ඇති වෙනවා. අද ඇහලුම් කර්මාන්තයේ 850,000ක විතර පිරිසක් වැඩ කරනවා. ඉතින් මේ ඇති වෙලා තිබෙන ගැටලුව විසඳන්න අපි කොහොමද වැඩකටයුතු කරන්නේ? බැරි වෙලාවත් අපේ ඇහලුම් ජාත්‍යන්තරයේ අඩු market එකකට දාන්න ගියොත්, ඒක ලංකාවට බලපානවා. ඒ නිසා ඒක ගැන මේ අවස්ථාවේදී බලන්න වෙයි, කොහොමද ඒවාට රැකවරණය දෙන්නේ කියලා. ගරු ඇමතිතුමනි, ඔබේ අමාත්‍යාංශයෙන් තමයි ඒ කටයුතු කරන්න තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. දැන් market access ඇති කරන්න අවශ්‍යයි කියන්නේ ඇයි? අපි market access ඇති කරන්නේ ලංකාවේ ඉන්න ලක්ෂ 220ක market එක මදි නිසායි. ඒ නිසා තමයි අපි market එක විශාල කරන්න හදන්නේ. ඉතින් market එක විශාල කරන්න නම්, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය සමඟ ගිවිසුම්ගත වෙන්න සිදු වෙනවා. මේවා ගැන ඉස්සෙල්ලා කථා කරනකොට ඔබතුමන්ලා වෙනත් මතයක හිටියේ. නමුත් අද අපි බොහොම සතුටු වෙනවා. Committee on Public Finance එකේදී ඉස්සෙල්ලාම Thailand-Sri Lanka Free Trade Agreement එකක් ගැන කථා කරනකොට, "ඔව්, අපි මේකට කැමැතියි" කියලා ඔබතුමන්ලා කිව්වාම අපි ඇත්තටම බැලුවා, වෙනසක් ඇති වෙලා තිබීම ගැන. නමුත් අපි එදා ආණ්ඩු පක්ෂයෙන් මේවා ගේනකොට මොකක්ද වුණේ? අද ඔබතුමන්ලා යන මාර්ගය හරි. එහෙම තමයි යන්න අවශ්‍ය වන්නේ. නිකම් බොරුවට ගිහිල්ලා, බෝඩිලැලි අල්ලලා ලෝකයෙන් ඈත් වෙලා කටයුතු කරන්න බැහැ. අන්න ඒ වාගේ අපි අලුතින් හිතලා ඉදිරියට යන්න අවශ්‍යයි. මේ වෙළෙඳ ගිවිසුම් කියන්නේ critical mass; ඒ කියන්නේ විවේචනාත්මක ස්කන්ධය. Critical mass එකක් ඇති කරන්න ඕනෑ නිසා තමයි මේ වාගේ Free Trade Agreements අපට අවශ්‍ය වන්නේ. මම හිතන විධියට ඔබතුමන්ලා චීනයට, ඉන්දියාවට වැඩිය ඉදිරියට යන්න අවශ්‍යයි. ETCA ගිවිසුම ගැනත් බලන්න. මීට ඉස්සර ETCA ගිවිසුම ගැන කිව්වාම, ඒක නිකම් තහනම් කුණුහරුපයක් වාගේයි. නමුත් දැන් ඒක ඉතාම ආදර්ශවත් වචනයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඉන්දියාවෙන් පුළුවන් තරම් සහාය ගන්න. US Dollar 10 billion economy එකකින් අපට සියයට 2ක් ගන්න පුළුවන් නම්, එහි තිබෙන වෙළෙඳාමෙන් ලංකාවට කොටසක් ගන්න පුළුවන් නම්, අපේ ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 10,000කට විතර වැඩි වේවි, අවුරුදු දෙක තුනක් යනකොට. මේවා තමයි අපි පාවිච්චි කරන්න අවශ්‍ය වන්නේ. ඉතින් විපක්ෂයෙන් පොල් මිල ගැනයි, හාල් මිල ගැනයි කථා කරනවාට වැඩිය, මේවා ගැන කිව්වාම, ඔබතුමන්ලා මේවා අපීර්ණ දේවල් වශයෙන් ගන්න එපා. මොකද, මේ විධියට තමයි අපි රටක් හදන්න අවශ්‍ය වන්නේ.

ඒ වාගේම Free Trade Agreements ගැන බලන්න. දැන් GSP Plus ගැන කථා කරනවා. අද පත්තරයක තිබෙනවා, "Government is hard-pressed for the fulfilment of obligations including the repeal of the Prevention of Terrorism Act and the amendment of the Online Safety Act" කියලා ප්‍රවෘත්තියක්. මෙවැනි නීත්‍ය ගන්න. PTA අවශ්‍ය නැහැ. මොකද ඔබතුමන්ලාම කිව්වා, දැන් ත්‍රස්තවාදය නැහැ කියලා. ඉතින් එහෙම නම් PTA එකක් ඕනෑ නැහැ. නමුත්, එන්න තිබෙන ත්‍රස්තවාදී කටයුතු ගැන සොයා බලා ඒ සඳහා හරි නීති පද්ධතියක් ගේන්න.

ඒ වාගේම Online Safety Act එක අහෝසි කරන්න ඕනෑ කිව්වා. නීති ගෙනැල්ලා එය අහෝසි කරන්න. ඊළඟට, GSP Plus සහනය තිබෙනවා. මොකද, මෙහිදී සියයට 25ක බදු රහිතව යන්න පුළුවන් හැකියාව තිබුණු එක ලොකු වාසියක්. අද ලංකාවේ ව්‍යාපාරයකයෙකුට වැඳලා පුදලා කියන්න අවශ්‍යයි, "මේ රටේ ව්‍යාපාර කරන එකට බොහොම ස්තුතියි" කියලා. මොකද සියයට 15ක් ගෙවන්න තිබෙනවා, බැංකුවට. සියයට 36ක් බදු ගෙවන්න තිබෙනවා. ඒ වාගේම ඉතාම අධික මිලක් ගෙවන්න තිබෙනවා, වෙනත් සේවාවලට. වතුරට, තෙල්වලට, electricityවලට ආදී වශයෙන්. අන්තිමේ සියයට 2ක්, 3ක් ඉතුරු වෙලා රිම් එකේ යනකොට කොයි ආකාරයෙන්ද මේ අය ව්‍යවසායකයන් බවට පරිවර්තනය වෙන්නේ? ඒ නිසා තමයි මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ කරුණාකරලා කැබිනට් මණ්ඩලයේදී මේ ගැන කථා කරන්න කියලා.

මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී කිව්වා, service exportsවල සියයට 15ක බද්ද නැති කරන්න කියලා. අපි බංකොලොත් වුණාට පසුව අපට එළියට එන්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අත්‍යවශ්‍යයි. නමුත්, ඒගොල්ලන් කියන හැමදේටම අපි නටන්න ඕනෑ නැහැ. මම එදා මුදල් ඇමතිවරයා වශයෙන් 15වෙනි, 16වෙනි tranche එක ගැන කථා කරනකොටත් ඒගොල්ලන් මේ යෝජනාම ගෙනාවා. නමුත් අපි බැහැයි කිව්වා. ඊට පසු මංගල සමරවීර ඇමතිතුමා 2018දීත් මේක ගෙනාවා. මාස හයකින් පසු ආයෙත් හකුළා එළියට දැම්මා. මේක අහිතකරයි කිව්වා. ලැබෙන්න තිබෙන සල්ලි ටික නැති වුණොත් අන්තිමට වෙන්නේ අපට එන්න තිබෙන හොඳ ගුණාංග විකෘති ස්වරූපයක් බවට පරිවර්තනය වීමයි. දැන් ඔබතුමන්ලා මේකට සියයට 15ක් ගෙවනවා. ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලයට පසුගිය සතියේ යෝජනාවක් ගෙනාවා, Colombo Port City එකට අවුරුදු 40ක බදු රහිත ආයෝජන ගේන්න අවසර දෙන්න කියලා. ඉතින්, ඒක පරස්පරයි නේ ඇමතිතුමනි. ඔබතුමා වෙළෙඳ ඇමති වශයෙන් එක තොප්පියක් දාගෙන අපට බදු පනවන්න එපා. අනෙක් අතට අපේ ලාංකිකයන්ට සියයට 15ක් බදු ගහන්න හදනවා. මේකෙන් රුපියල් බිලියන 100යි -කෝටි 1,000යි- නේ හොයන්නේ. මේ විධියට රුපියල් කෝටි 1,000ක් හොයනවාට වැඩිය හොඳයි, ශත 25කින් තෙල් මිල වැඩි කරලා ඒ තුළින් රුපියල් බිලියන 12ක් හොයලා දෙන එක. මෙහෙම තමයි ආදායම හොයන්න ඕනෑ. මේවා කියන්න අපට අවශ්‍යතාවක් නැහැ. නමුත් මම හිතන්නේ ශ්‍රී ලාංකිකයෙකු විධියට. මෙතැන සිටින කවුරුවත් ඒකට විරුද්ධ වෙන්නේ නැහැ නේ. මොකද, ඒකෙන් වෙන්නේ රට හදන්න පුළුවන් දෙයක්. නිකරුණේ වැරදි දෙයක් කරන්න ගිහින් රට අනාගෙන ඩුබායි, සිංගප්පූරුව, බහරේන් කියන රටවල accounts ඇති කරලා සල්ලි එහේ තියලා වැටුප් ගෙවන්න විතරක් පුළුවන් ආකාරයේ ව්‍යාපාර මෙහේ ඇති කරන්න අවශ්‍යද? නැහැ. මෙන්න මේ වෙනස තමයි ඇති කරන්න අවශ්‍ය වන්නේ.

ඔබතුමන්ලා මෙහෙම ඉන්න එක හොඳයි. වසන්ත සමරසිංහ ඇමතිතුමා ලංකාවේ සිටින ඉන්දියන් ජාතිකයන් විසින් සංවිධානය කළ හෝලි උත්සවයකට සහභාගි වූ අවස්ථාවේ ලබා ගත් photograph එකක් මම දැක්කා. අන්න එහෙම තමයි ඉන්න අවශ්‍ය. මේ තත්ත්වය මීට අවුරුදු 15කට ඉස්සෙල්ලා තිබුණා නම්, ඉන්දියාවට ඔව්වර බණින්නේ නැහැ නේ. බොහොම හොඳයි නේ. *[බාධා කිරීමක්]* මම හොඳයි කියනවා නේ. අන්න එහෙම තමයි ඉන්න ඕනෑ. කන්න ඕනෑ, බොන්න ඕනෑ. එතකොට තමයි වෙනසක් ඇති වන්නේ. මම මේ දේවල් කියන්නේ

කුහකභාවයෙන් නොවෙයි. දැන් දිලින් ජයවීර මන්ත්‍රීතුමා කැලණියේ වුණු දේවල් ගැන කථා කරනකොට, අපි කථා කරන්නේ මේ ව්‍යාපාර ඉදිරියට ගෙනියන්නේ කොහොමද කියන එක ගැන. මොකද, රටක් හදන එක විපක්ෂයේ ඉන්න එක තරම් ලේසි නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித் தவிசாளர் அவர்கள்)
The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමා මගේ මිනිත්තු පහක් ගත්තා. ඒක එතුමාගේ එකවුන්ට් එකට දමන්න.

අපි මේවා කියන්නේ එතුමාට උදවු කරන්නයි. මම බොහොම ඕනෑකමින් මේ දේවල් කියන්නේ.

දැන් අපි ලක් සතොස ආයතනය ගැන බලමු. 2001දී ලක් සතොස හොර ගුහාවක් විධියට තිබුණේ. මේ ආයතනය ප්‍රතිව්‍යුහගත කළා. ඊට පසුව වෙනසක් ඇති වුණා. ඒක නැවතත් ආණ්ඩුවට ගත්තා. දැන් ඔබතුමාට රුපියල් මිලියන 7,000ක අලාභයක් පියවාගන්න තිබෙනවා. ඒක හිසරදයක් නොවෙයිද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
රුපියල් මිලියන 20,000ක්.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
2023දී ඒකෙන් රුපියල් බිලියන 11ක් අයින් කළා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක මම දන්නේ නැහැ. කමක් නැහැ. එහෙම නම් ඉතින් ඊට වැඩිය හිසරදයක් - headache එකක් - නේ. මම කියන්නේ, මේවා තමයි තිබෙන ප්‍රශ්න. මේ අලාභය ඉදිරියට ගෙනයනවාට වැඩිය හොඳයි, ඔබතුමා මේ සඳහා තරගකාරී තත්ත්වයක් ඇති කරන එක. හාල් ගෙන්වනකොට මම මේ පාර්ලිමේන්තුව ඇතුළේදීම කිව්වා, කරුණාකරලා රජය ඔය හිසරදය දමාගන්න එපා, permits දාලා ඕනෑ කෙනෙකුට දෙන්න කියලා. මේ tax එක රුපියල් 60 නොවෙයි, 70 වුණත් කමක් නැහැ. මොකද, ගොවියාත් ආරක්ෂා කරන්න ඕනෑ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එහෙම කරන්න එපා කියන අයත් ඉන්නවා නේ.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියන එකයි, කරන එකයි අතර වෙනසක් වෙනසක් තිබෙනවා නේ. මම කියන්නේ මෙතැනදී රුපියල් 75ක් හරි, රුපියල් 80ක් හරි, ඕනෑ බද්දක් දමන්න, හැබැයි ගොවියාත් ආරක්ෂා කරන්න, පාරිභෝගිකයාත් ආරක්ෂා කරන්න. ගොවියාගේ අදක්ෂතාවට පාරිභෝගිකයා ගෙවන්න ඕනෑ නැහැ. ඒ දෙක තුලනය කරන්නේ කොහොමද කියන එකට තමයි මම ඔබතුමාට මේ අදහස් දෙන්නේ. ඔබතුමා Treasury එකෙන් රුපියල් මිලියන 500ක් ඉල්ලා තිබෙනවා. ආයෙත් ඉල්ලීමක් එව්වා, තව රුපියල් මිලියන 500ක් ඕනෑ කියලා. ඔහොම ගියොත් සල්ලි ඉල්ල ඉල්ලා ඉදිරියටත් යන්න වේවි. ඊට වැඩිය හොඳයි, මෙතැන තරගකාරී තත්ත්වයක් ඇති කරන එක. එක්කෙනෙකුට විතරක් දෙන්න එපා. ඩඩ්ලි එක පැත්තකින්, අරුල් තව පැත්තකින්, හමීඩ් තව පැත්තකින්, මේ හැම පැත්තකින්ම තරගකාරී තත්ත්වයක් ඇති වුණොත්, ඔබතුමාට හිසරදයක් නැහැ. එතකොට කියන්නේ ඔන්න තරගකාරී තත්ත්වයක් තිබෙනවා කියලායි.

සිංගප්පූරුවේ වී වගා කරන්නේ නැහැ, ඩුබායිවල වී වගා කරන්නේත් නැහැ. නමුත් ඒ රටවල හාල්වල මිල ගණන් බැලුවොත්, මීට අවුරුදු 15කට පෙර මිලයි, අද මිලයි දෙකම එකයි නේද? එහෙම නම් මොකක්ද මෙතැන තිබෙන්නේ? ඔබතුමන්ලා බලයට ආවේ අවුරුදු 76ක ශාපයක් ගැන, දූෂණ ගැන කියලා නේ. හැබැයි, දූෂණ පැවැති කාලයේ සහ අවුරුදු 76ක ශාපය කාලයේ හාල් මිල අඩුයි. එදා රුපියල් 140ට තිබුණු හාල් කිලෝව අද රුපියල් 280යි. මේවාට ඔබතුමාට බැණලා වැඩක් නැහැ. මොකද, මේ දිහා අපි කුහක මට්ටමින් බලන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු තුනකින් මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මම ඉතාම ඕනෑකමින් ඉල්ලන්නේ මේ සඳහා තරගකාරී තත්ත්වයක් ඇති කරන්න කියලායි. ඒ තුළින් තමයි අවශ්‍ය වෙනස ඇති කරන්නේ. එතකොට ඔය හිසරදයක් ඇති වෙන්නේ නැහැ. මෙන්න, අද හාල් කිලෝවක මිල රුපියල් 150යි, වැස්ස ආවා, ඒ නිසා හාල් කිලෝවක් රුපියල් 250යි. තරගකාරී තත්ත්වයක් තිබුණාම ප්‍රශ්නය ඉවරයි. නැත්නම් ඔබතුමන්ලා වඳුරාටත් බණිනවා, වැදිරිටත් බණිනවා, මොනරාටත් බණිනවා, ගෙදර ඉන්න බල්ලාටත් බණිනවා. එහෙම කරන්න ඕනෑ නැහැ නේ. මේ ඔක්කෝම ජීවත් වෙන්න ඕනෑ.

මම ඉතාම ඕනෑකමින් කියන්නේ මේ අවස්ථාවේ ආණ්ඩුවට බිස්නස් කරන්න බැහැ කියලායි. මම කියන්නේ ඒ අදක්ෂතාව කියලායි. අපි ඒවා regulate කරන්න අවශ්‍යයි. ඒක කරනකොට තමයි හරි මාර්ගයට යන්නේ. ඒ පරිවර්තනයත් මේ කෙටි කාලය තුළ ඇති වෙයි කියා මම විශ්වාස කරනවා.

දැන් බලන්න, ඔබතුමන්ලා හාල් මෙට්‍රික්ටොන් 10,000ක් ගෙනාවා. ඒකෙන් 3,000ක් තිබෙනවා, වැලිවිට-කඩුවෙල. ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ. වෙලාව නාස්ති වෙන නිසා මම ඒ ගැන කියන්නේ නැහැ. නමුත් State Trading (General) Corporation එකේ තිබෙන එක වෙනත් තැනකට ගිහිල්ලා දාන්නේ ඇයි? ඔබතුමා ඒ ගැන හොයා බලා ඒකට උත්තරයක් දෙන්න.

[ගරු රවී කරුණානායක මහතා]

ඒ වාගේම තමයි ලුණු ප්‍රශ්නය. මම හිතන විධියට ඒවා දහදෙනෙකුට ගේන්න කිව්වා නම් ඔබතුමාට හිසරදයක් නැහැ. නැත්නම් ඒවා විකුණන්නත් තිබෙනවා; finance කරන්නත් තිබෙනවා. අන්තිමට ඒ ගැන ලොකු හිසරදයක් තමයි ඔබතුමාට එන්නේ. මම හිටපු වෙළෙඳ ඇමති වශයෙන් තමයි ඒ කාරණය කියන්නේ. මේ රටේ භාණ්ඩයක මිල අඩු කරලා, ඒ භාණ්ඩය හෙට ශත පහකින් වැඩි වුණොත් ඒ ශත පහ වැඩිවීම පිළිබඳව තමයි කථා කරන්නේ. අඩු මිලට ඒවා විකුණපු කාලය අමතක වෙනවා. ඔබතුමන්ලාට බෝඩ් ලෑලි අල්ලාගෙන ඉඳලා ඒවා ගැන මතකයි නේ. මම කියන්නේ ඒක අනෙක් පැත්තටත් කැරකේවි කියන එකයි. ඊට වඩා හොඳයි, ඔවුන් ව්‍යවසායකයන් බවට පරිවර්තනය කරන එක. එහෙම කළොත් මන්ත්‍රීවරුන් 159දෙනාට ඔය කියන හිසරදය නැති වේවි. මම මේ අවස්ථාව පාවිච්චි කරනවා, entrepôt trading ගැන කථා කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවී කරුණානායක මහතා
(*மாண்புமிகு ரவி கருணாநாயக்க*)
(The Hon. Ravi Karunanayake)
හොඳමයි. මම ඒ අවස්ථාව පාවිච්චි කරන්නම් entrepôt trading ගැන කියන්න. *[බාධා කිරීමක්]* අනේ, I would not mind. බලන්න, විපක්ෂය කොච්චර සහෝදරත්වයෙන් ඉන්නවාද කියලා. ඒ සහෝදරත්වය විපක්ෂය පැත්තටත් පරිවර්තනය වෙලා. ඔබතුමන්ලා වෙනස් වෙනකොට අපිත් වෙනස් වෙනවා. අන්තිමට සහෝදරත්වය 159දෙනාගේ විතරක් නොවෙයි, 225දෙනාගේම තිබෙන්න ඉඩ තිබෙනවා. ඔව්, එහෙම තමයි රටක් හදන්න අවශ්‍ය වෙන්නේ. ඒක තමයි මම මේ පෙන්වන්න හදන්නේ, කොහොමද මේ රට හදන්න පුළුවන් වන්නේ කියලා.

Entrepôt tradingවලින් තමයි සිංගප්පූරුවක් හැදුණේ. 1973දී ලී ක්වාන් යූ කිව්වා, "ලංකාව වාගේ සිංගප්පූරුව හදන්න ඕනෑ" කියලා. ඊට පස්සේ එතුමා රට හදන්න පටන් අරගෙන 1982 අවුරුද්දේ නැවත ලංකාව බලන්න ආවා. අපේ රටේ කරුමයට ඒ වෙලාවේ ඔබතුමන්ලාගේ සාමාජිකයන් strike එකක් ඇති කරලා තිබුණා. ඒක දැකලා සිංගප්පූරුවට ගිහිල්ලා කිව්වා, "අනේ දෙයියනේ, මම ලංකාව ගැන හිතුවාට ලංකාව විධියට සිංගප්පූරුව හදන්න ඕනෑ නැහැ" කියලා. එතුමාගේ මතය සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. අද වනවිට සිංගප්පූරුව මොනවාද කරන්නේ? සිංගප්පූරුවේ අවුරුද්දකට කන්ටේනර් මිලියන 45.5ක් හුවමාරු වෙනවා. අපේ තවම කන්ටේනර් මිලියන 7.8යි හුවමාරු වෙන්නේ. සිංගප්පූරුවේ ඇති කර තිබෙන වෙනස තමයි අපිත් ඇති කරන්න තිබෙන්නේ. අපි ඒවා ඔක්කෝම හදාගෙන වෙනස් කරමු. East Container Terminal එක දෙන්න හදනවා. අපි JCT එක හදනවා. නමුත්, පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා මේක පෞද්ගලීකරණය කරමු. ඒ කියන්නේ public-private partnership. ඔන්න හරි වචන පාවිච්චි කරනවා. ඊට පස්සේ West Container Terminal එක හදනවා. ඉන්දියාවට බණින්න එපා. අදානි එළෙව්වා කිව්වා; ආපහු එනවා කිව්වා. ඔවුන්ගේ ආයෝජන ගන්න. ඒ power transmission අවශ්‍යයි, මන්නාරම ඉඳලා හබරණට. එහි ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 800යි. ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 800 පාවිච්චි කරලා, අපට ඒ transmission පාවිච්චි කරන්න පුළුවන්.

අපට free port එකක් ඇති කරන්න අවශ්‍යයි. අපට අවශ්‍ය වෙන්නේ මේකයි. ඕනෑ තැනකින් කුණු ගොඩක්වත් ගෙනැල්ලා මෙහේ නිල ප්‍රමාණයක් එකතු කරලා, ඒක අපනයනය කරන්න පුළුවන් නම් අපට ඩොලර් ප්‍රමාණයක් එකතු කරන්න පුළුවන්. අපනයනය කරලා ඒ ඩොලර් එකතු කිරීම තුළින් තමයි මේ ණය බරින් අපට එළියට එන්න පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවී කරුණානායක මහතා
(*மாண்புமிகு ரவி கருணாநாயக்க*)
(The Hon. Ravi Karunanayake)
අනේ, තව මිනිත්තු දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
ඒ මිනිත්තු දෙකත් එක්ක තමයි.

ගරු රවී කරුණානායක මහතා
(*மாண்புமிகு ரவி கருணாநாயக்க*)
(The Hon. Ravi Karunanayake)
ඒ මිනිත්තු දෙකත් දැන් ඉඳන් මම පාවිච්චි කරන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(*மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson)
එහෙම බැහැ. කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ. වැඩිපුර විනාඩි හතරක් ඔබතුමාට ලබා දීලා තිබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(*மாண்புமிகு ரவி கருணாநாயக்க*)
(The Hon. Ravi Karunanayake)
එතුමාගේ උත්තරය විපක්ෂයෙන් කිව්වා කියලා ඇමතිතුමා කියනවා නම් වැඩේ ඉවරයි. *[බාධා කිරීමක්]* ඔව්, සහෝදරත්වය තමයි ඉදිරියට පවත්වාගෙන යන්න ඕනෑ. හරි වචන තමයි අපිත් ඉගෙන ගන්නේ.

ඔබතුමන්ලා කථා කරනවා, computers ගැන. මේ logistics ඒ ආකාරයෙන්මයි. මම නැවතත් ඉතා බැගෑපත්ව ඉල්ලන්නේ මෙයයි. Service Export Tax එක සියයට 15ක් වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. IMF එකට කියන්න ඔබතුමන්ලාට ඕනෑ වෙන්නේ බිලියන 12 නම්, ඉන්ධනවලට ශත 25ක් වැඩි කරලා ඒ බිලියන 12 ගන්න පුළුවන් කියලා. මේ Service Export Tax එක නැති කරන්න කියලා මම කාරුණික ඉල්ලීමක් කරනවා. මම ඒකට බොහොම කැමැතියි. විපක්ෂය ඒ ගැන හෙට ඉඳන් ආණ්ඩුවට බැණ බැණ ඉඳීවි.

1971දී අපේ රටේ තරුණ අසහනයක් ඇති වුණා. 1988-89දීත් තරුණ අසහනයක් ඇති වුණා. 1983දී ත්‍රස්තවාදයක් ඇති වුණා. අන්තිමට තරුණ තරුණියන් වෙන මාර්ගවලට ගියා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන විධියට සියයට 15ක බදු ගහන්න ගිහිල්ලා මේ තරුණ ව්‍යවසායකයන් නැති කරන්න එපා කියලා මම වගකීමෙන් කියනවා. Entrepôt trading හරහා අපට ලොකු වෙනසක් කරන්න පුළුවන්. මේ රටට වෙන රටවල අමු ද්‍රව්‍ය,-

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි.

ඒ අමු ද්‍රව්‍ය අපේ රටට ගෙනැල්ලා, අපේ රටේ ඉන්න සේවක පිරිසක් එකතු කරලා ඒ කටයුතු ඉදිරියට ගෙන යන්න. එතකොට මෑද පෙරදිගට ඇමෙරිකානු ඩොලර් මිලියන 200ට, 250ට යන අය නැවත අපේ රටට ඒවි, ඇමෙරිකානු ඩොලර් මිලියන 500කට මෙහේ වැඩ කරන්න. ඒක කරන එක තමයි වෙළෙඳ ඇමතිවරයෙකු වශයෙන් ඔබතුමාගේ කාර්යභාරය. ඔය බෝඩ් ලෑලි නැවත අල්ලන්න යන්න එපා. බෝඩ්ලෑලි අල්ලන්න, සියයට එකක් වාගේ ඒවාට.

මේ සභාවේ ඉන්නේ ප්‍රගතිශීලී විපක්ෂයක්. අපේ අදහසුත් අරගෙන රට හදන එක තමයි අපට අවශ්‍ය වෙන්නේ. ඒක නිසා ඒ සඳහා එකතු වෙන්න එන්න. අපි රට ඉලක්ක කරගෙන කටයුතු කරමු. අපට ඕනෑ බෝඩ් ලෑලි නොවෙයි; විවේචන නොවෙයි; අල, පොල්, ලූනු, මිරිස් නොවෙයි. අපට අවශ්‍ය වෙන්නේ කොහොමද වෙළෙඳාම වැඩි කරන්නේ, කොහොමද ව්‍යවසායකයන් ඛවට පරිවර්තනය කරන්නේ, කොහොමද free trade agreements ඇති කරන්නේ කියන ඒවායි.

ඔබතුමන්ලා ඉදිරියේදී වෙළෙඳ කලාප ගණනාවක් ඇති කරනවා කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වේලාව හරස් වෙන නිසා ඔබතුමන්ලාට තවත් අදහස් දෙන්න බැහැ. මම Lobby එකේදී හම්බ වුණාම ඔබතුමාට ඉතුරු අදහස් ටික ලබා දෙන්නම්, ගරු ඇමතිතුමනි. මම මේ අවස්ථාව පාවිච්චි කරන්නම් එක කාරණයක් කියන්න. වමට සිග්නල් දාලා දකුණට හැරෙන්න එපා, එහෙම නැත්නම් දකුණට සිග්නල් දාලා වමට හැරෙන්න එපා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[ப.ப. 3.47]

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்கு எனக்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு உங்களுக்கு நன்றி கூறுகின்றேன்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்தச் சபையில் எதிர்க்கட்சியினர் ஆற்றிய உரைகளை அவதானிக்கும்போது, அவர்கள் கடந்த காலத்தில் செய்த ஆட்சியை சுயவிமர்சனம் செய்வது போலவே இருந்தது. கடந்த காலத்தில் இந்த நாட்டிலுள்ள பல நிறுவனங்களை அவர்கள் வங்குரோத்து அடையச் செய்தார்கள். அவற்றில் பிரதான நிறுவனமாக இருப்பது, 'சதொச' என்று சொல்லப்படுகின்ற கூட்டுறவு மொத்த விற்பனை நிறுவனமாகும். "கூட்டுறவுத்துறையை நாங்கள் நலிவடையச் செய்தோம்; நீங்கள் அதனைக் கட்டி எழுப்புங்கள்" என்று அரசாங்கத்திடம் விநயமாகக் கோரிக்கை முன்வைப்பதுபோல எதிர்க்கட்சியினரின் உரை காணப் பட்டது. இந்தத் துறையைக் கட்டியெழுப்புவதற்கு தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் கடமைப்பட்டுள்ளோம்; தயாராக இருக்கின்றோம். எதிர்க்கட்சியைப் பிரதிநிதித்துவம் செய்கின்ற, இங்குள்ள நாற்காலிகளைக் காலியாக வைத்திருக் கின்ற எதிரணியினருக்கு தங்களை ஒருமுறை சுய விமர்சனம் செய்துகொள்வதற்கான சந்தர்ப்பம் கிடைத்திருக்கின்றதென நான் நினைக்கின்றேன்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நான் மலையகத்தின் தோட்டப்புறத்தைப் பிரதிநிதித்துவம் செய்கின்றவன் என்ற அடிப்படையில், இங்கு ஏனைய விடயங்கள் பற்றி பேசுவதை விட, என்னுடைய சமூகம் சார்ந்தவர்களுக்குக் கடந்த காலங்களில் பெரும் உதவியாக இருந்த கூட்டுறவுச் சங்கம் பற்றி பேசுவது பொருத்தமென நினைக்கின்றேன். கடந்த காலங்களில் எமது சமூகத்தினர் கூட்டுறவுச் சங்கங்களினூடாகவே அநேகமான வேலைகளைச் செய்து கொண்டார்கள். அதாவது, கடன் பெறுவது, தங்களது உற்பத்திகளை விற்பது எனப் பல சேவைகளைப் பெற்றுக் கொண்டார்கள். அதனோடு இணைந்ததாக அவர்கள் கமத்தொழில், கால்நடை வளர்ப்பு போன்ற சுய தொழில் துறைகளில் ஈடுபடுவதற்கும் இந்தக் கூட்டுறவுச் சங்கங்கள் வசதியாக இருந்தன; ஏற்புடையதாக இருந்தன.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இலங்கையில் 1930ஆம் ஆண்டு கூட்டுறவுச் சங்க முறைமை அறிமுகப்படுத்தப்பட்டது. விசேடமாக, தோட்டப்புறத்தைச் சேர்ந்த தோட்டத் தொழிலாளர்களுக்கும் மரக்கறி விவசாயிகளுக்கும் பண்ணை விவசாயிகளுக்கும் இது பேருதவியாக இருந்ததென்பது நம் அனைவருக்கும் தெரிந்த விடயமே! 1930ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட இந்த கூட்டுறவுச் சங்கம் 13ஆவது திருத்தச் சட்டத்தினூடாக மாகாண சபையின்கீழ் கொண்டுவரப்பட்டு, அந்தந்த மாகாணங்களிலுள்ள மக்களுக்குச் சேவை செய்வதற்கு ஏதுவான ஒரு நிறுவனமாக மாற்றியமைக்கப்பட்டது. இங்கு எனக்கு முன்னர் உரையாற்றிய கௌரவ ரவி கருணாநாயக்க அவர்கள், 'இந்தியா' எனப் பல தடவை கூறினார். அது மிகவும் போற்றத்தக்கது. ஏனெனில், இந்தியாவுக்கும் பாரிய பொறுப்பை ஏற்படுத்திக் கொடுத்ததுதான் 13ஆவது திருத்தச் சட்டம்! இலங்கையின் நலனில் அக்கறை செலுத்தி, விசேடமாக சிறுபான்மைத் தமிழருக்கும் தமிழ் மொழி பேசுகின்ற ஏனைய மக்களுக்கும் சில நல்ல நடவடிக்கைகளை முன்னெடுப்பதற்கு ஏதுவாக 13ஆவது திருத்தச் சட்டத்தை அதற்குள் இணைத்திருந்தால் அது அந்த மக்களுக்கு நன்மையாக அமைந்திருக்கும்.

நான் பிரதிநிதித்துவம் செய்வது ஊவா மாகாணத்திலுள்ள பதுளை மாவட்டம் என்பது அனைவருக்கும் தெரியும்! கடந்த காலத்தில் ஊவா மாகாண கூட்டுறவு அமைச்சுக்குப் பொறுப்பாக இருந்தவர் செந்தில் தொண்டமான் அவர்கள்

[ගරු කිට්නන් සෙල්වරාජ් මහතා]

என்றே நான் நினைக்கின்றேன். பதுளை மாவட்டத்தில் தோட்ட வீடமைப்புக் கூட்டுறவுச் சங்கங்கள் 63உம் தோட்டப்புற விற்பனைக் கடைத்தொகுதிச் சங்கங்கள் 03உம் கூட்டுறவுக் கடைச் சங்கங்கள் 06உம் இருக்கின்றன. ஊவா மாகாண கூட்டுறவு அமைச்சைப் பொறுப்பேற்றிருந்த செந்தில் தொண்டமான் அவர்கள் தோட்டப்புறங்களை இணைக்கின்ற, தோட்டப்புறங்களுக்குச் சேவை செய்கின்ற அந்த நிறுவனங்களை நட்டப்படுத்தி இருக்கின்றார் என்பதை நான் இந்த உயர் சபையில் கூறிக்கொள்கின்றேன்.

நான் வசிக்கின்ற பூனாகலைத் தோட்டத்திலுள்ள ULG Divisionஇல் கூட்டுறவுச் சங்கக்கடை ஒன்று இருக்கின்றது. அதேபோல், LLG Divisionஇலும் கூட்டுறவுச் சங்கக்கடை ஒன்று இருக்கின்றது. அதற்குப் பக்கத்தில் இருக்கின்ற அம்பிட்டிகந்தை தோட்டத்திலும் கூட்டுறவுச் சங்கக்கடை ஒன்று இருக்கின்றது. இவை அனைத்தும் கடந்த காலத்தில் இல்லாதெழிக்கப்பட்டு, தற்போது தூர்ந்த நிலையில் இருக்கின்றன. கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் தலைமையிலான தேசிய மக்கள் சக்தி அராசங்கம் ஆட்சிக்கு வந்தவுடன், பூனாகலை தோட்டத்தில் ULG Divisionஇலுள்ள கூட்டுறவுச் சங்கக்கடை புனரமைக்கப்பட்டு, எதிர்வரும் ஏப்பிரல் மாதம் 02ஆம் திகதி திறப்பதற்கு ஏதுவான அனைத்து நடவடிக்கைகளும் முன்னெடுக்கப்பட்டு இருக்கின்றன. கடந்த காலத்தில் ஏழை மக்களுக்கு உதவிகளைப் புரிவதற்கு ஏதுவாக அமைக்கப்பட்ட அந்தக் கூட்டுறவுச் சங்கங்களை நலிவடையச் செய்த, செந்தில் தொண்டமான் போன்றோருக்கு இந்த உயரிய சபையூடாகத் தண்டனையைப் பெற்றுக்கொடுப்பதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுக்க வேண்டும். கடந்த காலத்தில் ஊவா மாகாண முதலமைச்சராக இருந்தவர்தான் தற்போது இந்தச் சபையில் எதிர்க்கட்சியிலிருக்கும் சாமர சம்பத் தசநாயக்க அவர்கள்! அவரும் இதற்குப் பொறுப்புக்கூற வேண்டியவராக இருக்கின்றார். கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, தேட்டப்புறங்களிலுள்ள கூட்டுறவுச் சங்கங்களை நலிவடையச் செய்வதற்கு ஏதுவாகச் செயற்பட்ட இந்தச் சூத்திரதாரிகளுக்கு எதிர்காலத்தில் இந்த அரசாங்கம் தகுந்த தண்டனையை வழங்க வேண்டும்.

இன்று நலிவடைந்த நிலையில் இருக்கின்ற இந்தக் கூட்டுறவுச் சங்கங்களை அபிவிருத்தி செய்து, அதனூடாகத் தோட்டப்புறங்களில் இருக்கின்ற மலையகத் தமிழர்களுக்கு உதவித் தொகைகளை வழங்கி, அவர்களுடைய வாழ்வாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு ஏற்புடைய வேலைத் திட்டங்களை முன்னெடுப்பதற்கு தேசிய மக்கள் சக்தி அரசாங்கம் தயாராக இருக்கின்ற இந்த நேரத்தில், எதிர்கட்சியினரின் சுயவிமர்சனமோ, கூக்குரலோ அல்லது அவர்களின் ஆவேசமான எதிர்ப்பலையோ எந்த விதத்திலும் பாதிப்பாக அமையாது என்பதைக் கூறிக்கொண்டு, எனக்குச் சந்தர்ப்பத்தைப் பெற்றுக்கொடுத்த கௌரவ பிரதித் தவிசாளர் அவர்களுக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.

[3.55 p.m.]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Presiding Member, I am thankful that I have been given the opportunity to speak at the Committee Stage Discussion on the Votes of the Ministry of Trade, Commerce, Food Security and Co-operative Development.

Sir, I would say that we cannot resolve the issues in our country and take the country forward unless we move away from debt and bring in FDIs into the country. Hon. Minister, your Ministry is the backbone of the economy. We have to bring in FDIs and to develop industries. Our closest neighbour, India, has the largest population in the world. We have a Free Trade Agreement with India. We must start industrial zones and give investors incentives. Unfortunately, every successive government felt that investors are waiting to come and start industries in Sri Lanka. But, our energy and labour costs are so high that we need to create a mechanism through which we give incentives to investors for industries to be set up in Sri Lanka.

Then, Hon. Minister, I will be focusing on a very important aspect in bringing in investments and dealing with trade. Unless we have a vibrant Judiciary, we cannot entice investors to come into Sri Lanka. The first concern an investor who wishes to come and invest in Sri Lanka has is, if he would have an issue with the Regulator or with his local partners, how he could resolve it. Unfortunately, if you file a case in the District Court, you will have to wait for 20 years to bear fruits of victory. We have set up a Commercial High Court in Sri Lanka and from the Commercial High Court, there is right to appeal only once. Earlier, from the District Court, you could go to the Court of Appeal and then, to the Supreme Court. Even with this mechanism, for someone to bear fruits of victory of a decree, it will take 10 years. So, we have to revamp our Judiciary with regard to commercial matters, especially when foreigners come to invest in Sri Lanka. We could give investor confidence by ensuring that through a vibrant Judiciary, we would be able to protect their rights.

Also, Hon. Minister, a lot of investors have come to Sri Lanka because there is a dispute recognition mechanism of arbitration. But, there are issues with regard to arbitration. If you take the Arbitration Act, there is no provision to get interim relief and certain arbitrations take a long duration of time. Also, arbitration has become a very costly process. So, I think there needs to be a centre set up by the State by which the cost of

arbitration could be dealt with. When you take leases in Sri Lanka, the leasing agreements have an arbitration clause. When an agreement has an arbitration clause, a small-timer cannot go to court and therefore, the leasing companies do what they want because one could only go to court on a question of law. Normally, an average citizen does not have the resources to go for arbitration because he has to pay for the arbitrator and also the centre. And, invariably, a small-timer does not understand the process of arbitration. But, when you take the legal mechanism of court, a small-timer is protected. So, I would ask you to have discussions with the Ministry of Justice and National Integration with regard to the Arbitration Act and bring in a ceiling, where we could have provision for transactions of lease holders and hire purchase agreements which are less than a certain value to not be referred for arbitration. Therefore, Hon. Minister, I would like you to consider the aspect of revamping our Judiciary for investments and especially the amendments I suggested for the Arbitration Act. We need to bring in changes to entice investors because otherwise, whatever you do, Hon. Minister, with regard to promoting investments and starting new industries, we would not be able to succeed. Unfortunately, you see a great number of foreign investors who have got played out; you must be having various foreign nationals coming and saying that they got played out by their local partner. So, unless the Judiciary is vibrant, they would never have recourse.

Also, if we look at our Judiciary, we have the District Court, the Magistrate's Court and the High Court. There are over 15 vacancies which have not been filled in the High Court from April last year. So, if we do not have a strong Judiciary, we cannot -

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Is it relevant to this Ministry?

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
It is relevant because unless these judicial appointments are made, there would be law's delays and it would also be relevant to an investor who comes into Sri Lanka in this sense.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Bring it to the notice of the Minister of Justice and National Integration.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
I am bringing it to your attention as the Minister of Trade, Commerce, Food Security and Co-operative Development because no investor or person would start a business, if there are law's delays. Therefore, I am bringing it to your attention so that you could tell the Hon. Minister of Justice that there are 15 vacancies in the High Court. The Judicial Service Commission should recommend the names to the President so that they could be appointed. - *[Interruption.]* So, mention it to the Hon. Minister of Justice, if you can. The judges also like to be promoted from the Magistrate's Court to the District Court, from the District Court to the High Court and from the High Court to the Court of Appeal and from the Court of Appeal to the Supreme Court. We need a vibrant Judiciary and these judicial appointments must be made. From April last year, appointments to the High Court have not been made. I am not blaming anybody. The Judicial Service Commission should recommend names to the President so that those appointments could be made. Otherwise, there would be law's delays and if there are law's delays and the court process is not working properly, investors would have problems investing in Sri Lanka. Therefore, I respectfully urge you to look at the suggestions I made with regard to the Judiciary. Also, Hon. Minister, every Magistrate and every District Court Judge likes to be appointed to the High Court. There is an age limit of 60 years for them to serve in the High Court. It is in the interest of the country that I am saying this. You need a vibrant Judiciary to entice investment. So, in that scenario, I beg you to look into the aspect that these 15 judicial appointments to the High Court are made as soon as possible.

Thank you, Hon. Minister.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Hon. Member, I will convey your message to the Minister of Justice and National Integration.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
I am very grateful to you for that, Hon. Minister. Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ (வைத்தியர்) இளையதம்பி சிறிநாத் அவர்கள்! உங்களுக்கு 13 நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.02]

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் எனக்கு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு உங்களுக்கு நன்றி தெரிவிக்கின்றேன்.

"தனி ஒரு மனிதனுக்கு உணவில்லை எனில் இந்த ஜகத்தினை அழித்திடுவோம்"

என்ற பாடல் வரிக்கு அமைய, உணவுப் பாதுகாப்பு என்பதும் உணவு வழங்கல் என்பதும் உணவு கிடைக்கப்பெற வேண்டும் என்பதும் மிக முக்கியமான விடயங்களாக

[ගරු ඉලෙයතම්බි සිරිනාත් මහතා]

இருக்கின்றன. இவற்றை வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சினூடாக உறுதிப்படுத்த வேண்டும். தற்போதைய நிலையில் மக்களுக்கு நியாய விலையில் உணவு கிடைப்பதை உறுதிப்படுத்த வேண்டும்.

பொருளாதார நெருக்கடி இருந்த காலத்தில் மக்களுக்கு உணவு கிடைக்காத சூழ்நிலையில் அவர்கள் வீதிக்கு இறங்கவேண்டிய நிலை இருந்தது. வட, கிழக்கில் கடந்த யுத்த காலத்தில் - நெருக்கடியான சூழ்நிலையில் - பொருளாதாரத் தடை இருந்தபொழுது, அங்குள்ள மக்களுக்கு உணவுப் பொருட்கள் சரிவரக் கிடைக்காத நிலையில் அவர்கள் எவ்வாறான துன்பங்களை அனுபவித்திருப்பார்கள் என்பதை நீங்கள் சற்று சிந்தித்துப் பாருங்கள்! இன்று நாம் விலை அதிகரிப்பு உட்பட பல்வேறு செயற்பாடுகளால் பாதிக்கப்படுகின்றபொழுது, இந்த விடயத்தில் மிக ஆர்வமாகவும் உத்வேகத்துடனும் செயற்படுகின்றோம். எனவே, வட, கிழக்குப் பகுதிகளில் குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தில் கூட்டுறவுத்துறையை மேலும் விரிவுபடுத்தவேண்டிய, மேம்படுத்தவேண்டிய தேவைப்பாடு இருக்கின்றது.

அந்தப் பகுதியில் உணவு உற்பத்திகள் இருக்கின்றன. குறிப்பாக, விவசாய உற்பத்திகள் இருக்கின்றன; கடல் சார்ந்த உற்பத்திகள் இருக்கின்றன; கால்நடைகள் சார்ந்த உற்பத்திகள் இருக்கின்றன. அங்குள்ள மக்களுக்கு உணவுப் பொருட்கள் பாதுகாப்பான முறையிலும் நியாய விலையிலும் கிடைப்பதற்கு ஏற்ற வகையில், அந்தப் பகுதியில் கூட்டுறவுத்துறையை வலுப்படுத்தி, அதை வருமானமுள்ள ஒரு துறையாக மாற்றவேண்டிய பொறுப்பு இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் பல்வேறு இடங்களில் கூட்டுறவு மொத்த விற்பனை நிலையங்கள் இயங்கி வருகின்றன. எனினும், அவை பல்வேறு நெருக்கடிகளுக்கு மத்தியிலேயே இயங்கி வருகின்றன. பல கூட்டுறவு மொத்த விற்பனை நிலையங்கள் வருமானத்தை ஈட்டுகின்ற அதேநேரம், இன்னும் பல நிலையங்கள் நட்டத்தில் இயங்குகின்றன. இதனால் அவற்றைத் தொடர்ந்து நடாத்த முடியாத நிலை இருக்கின்றது. எரிபொருள் நிரப்பு நிலையங்கள் ஊடாக வரும் வருமானத்தை வைத்தே சில இடங்களில் இருக்கின்ற கூட்டுறவு மொத்த விற்பனை நிலையங்கள் இயங்கிக்கொண்டு இருக்கின்றன. வவுணதீவு, வாகரை, வாழைச்சேனை ஆகிய பகுதிகளில் இருக்கின்ற கூட்டுறவு மொத்த விற்பனை நிலையங்கள் எரிபொருள் நிரப்பு நிலையங்களை நடாத்துகின்றபொழுதும், அவற்றுக்கு பெற்றோலை வழங்குவதற்கான விண்ணப்பங்கள் கோரப்பட்டு பல காலமாகியும் அதற்கான அனுமதி இன்னும் வழங்கப்படவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் கூட்டுறவுத் துறைக்குப் பொறுப்பான அமைச்சர் என்ற வகையில், இந்த விடயத்துக்கான அரச அனுமதி அந்தப் பிரதேசங்களில் இருக்கின்ற கூட்டுறவு மொத்த விற்பனை நிலையங்களுக்குக் கிடைப்பதற்கான ஏற்பாடுகளைச் செய்து கொடுக்க வேண்டும்.

கூட்டுறவுத் துறையானது, மாகாண சபையூடாகவே கூடுதலாகப் பரிபாலிக்கப்படுகின்றது. கூட்டுறவுத் துறையை மேலும் மேம்படுத்தி வருமானத்தைப் பெருக்குகின்ற ஒரு துறையாக மாற்றுவதற்கு முதலீடுகள் தேவைப்படுகின்றன. மாகாண சபைகளுக்கு இருக்கின்ற அதிகாரங்களின்படி, அவற்றைப் பெரிய அளவில் வழங்க முடியாமல் இருக்கின்றது. அவை ஆகக் கூடியது 2 மில்லியன் ரூபாய் நிதியையே கடனாகக் கொடுக்கின்றன. நாங்கள் கேட்டுக்கொள்வது என்னவெனில், இந்த விடயம் தொடர்பில் மாகாண சபைகளுக்கு இருக்கின்ற அதிகாரங்கள் வலுப்படுத்தப்பட வேண்டும் என்றுதான். எல்லா விடயங்களிலும் அதிகாரங்களை வலுப்படுத்தி, மாகாண சபைகளுக்கு வரவு செலவுத்திட்டத்தினூடாகப் பாரிய நிதியை ஒதுக்குகின்ற போதுதான் அவற்றினூடான கடன் உதவிகள் கூட்டுறவு மொத்த விற்பனை நிலையங்களைச் சென்றடையும்.

மட்டக்களப்பு மாவட்டத்தில் விவசாயப் பொருட்களைப் பாதுகாப்பதற்கான வசதிகள் பாரியளவில் இல்லை. உதாரணத்துக்கு, நெல் உற்பத்தி பெருமளவில் நடைபெறும்போது மழையால் பாதிக்கப்படுகின்ற நெல்லை உலர்த்துவதற்குக்கூட அங்கு வசதிகள் இல்லை. இந்த விடயத்தை கூட்டுறவு நிறுவனங்களால் செய்ய முடியும். எனினும், அந்தக் கூட்டுறவு நிறுவனங்களுக்கு நெல்லைக் காயவைக்கின்ற பொறிமுறைகளை மேற்கொள்வதற்குப் பாரிய நிதிப் பற்றாக்குறை இருக்கின்றது. அதைப் பெற்றுக்கொள்வதற்கான வழிமுறைகள்கூட அவற்றுக்கு இல்லை. நெல்லைச் சேமித்து வைக்கக்கூடிய களஞ்சியசாலைகளையும் அரிசி ஆலைகளையும் கூட்டுறவு நிறுவனங்களால் நடாத்த முடியும். எனினும், அவற்றைச் செய்வதற்கான அல்லது அவற்றுக்கு முதலீடு செய்வதற்கான நிதி ஒதுக்கீடு இல்லை. இந்த விடயங்களை கூட்டுறவு நிறுவனங்கள் தமது சொந்த வருமானத்தின்மூலம் செய்ய வேண்டும் என்றாலும்கூட, அவற்றுக்கு முதலீடு செய்வதற்கான திட்டமொன்று அந்தப் பிரதேசத்தில் இல்லாமல் இருக்கின்றது. எனவே, இந்த விடயம் தொடர்பிலும் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்தை நான் ஈர்க்க விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இவற்றுக்கு அப்பால் எங்களுடைய பிரதேசத்தில் 'சதொச' நிறுவனமும் உணவுப் பொருட்களை விற்பனை செய்வதில் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றன. நாட்டில் அடிக்கடி அரிசி உட்பட ஏனைய உணவுப் பொருட்களுக்கான தட்டுப்பாடு, விலையேற்றம் ஏற்படும்பொழுது, நீங்கள் சொல்கின்ற விடயம்தான், அந்தப் பொருட்கள் 'சதொச' நிறுவனங்கள் ஊடாக நாடு முழுவதும் விநியோகிக்கப்படுகின்றது என்று. ஆனால், ஆறு இலட்சம் மக்கள் வாழுகின்ற, மிகவும் பரந்துபட்ட மட்டக்களப்பு மாவட்டத்தில் மூன்று 'சதொச' விற்பனை நிலையங்கள் மட்டுமே இருக்கின்றன. 14 பிரதேச செயலாளர் பிரிவுகள் இருக்கின்ற, பாரியளவு தொகை மக்கள் வாழ்கின்ற அந்தப் பிரதேசத்தில் அதிகளவான 'சதொச' விற்பனை நிலையங்கள் அமைக்கப்பட்டு, அங்குள்ள மக்களுக்குத் தேவையான உணவுப் பொருட்களைப் பாதுகாப்பாகவும் தட்டுப்பாடான காலப்பகுதியில் நியாய விலையிலும் கொடுப்பதற்கு நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கூட்டுறவு மொத்த விற்பனை நிலையங்களில் அரச உத்தியோகத்தர்களுக்குப் பற்றாக்குறை நிலவுகின்றது. மிக முக்கியமாக மாவட்டத்துக்குப் பொறுப்பான ACDP உத்தியோகத்தர்கள் நிரந்தரமில்லாமல் தற்காலிக அடிப்படையிலேயே பணிபுரிகின்றார்கள். இது பொதுச் சேவைகள் ஆணைக்குழுவின் appointmentஆக இருந்தாலும்கூட, அதை வழங்குவதற்கான செயற்பாடுகள் துரித கதியில் இடம்பெற்றிருக்கவில்லை. அதனோடு இணைந்ததாக, 50க்கும் மேற்பட்ட CDO - Cooperative Development Officer - பற்றாக்குறையும் கிழக்கு மாகாணம் முழுவதும் இருக்கின்றது. இந்த விடயங்களை உடனடியாகக் கருத்திற்கொண்டு, மாகாண சபைகளினூடாவது நிவர்த்தி செய்தால்தான் அங்கு வினைத்திறனான கூட்டுறவு -

cooperative - செயற்றிட்டத்தை நடைமுறைப்படுத்த முடியும். உங்களுடைய அரசாங்கத்தில் மிக நம்பிக்கையான நிலைமை இருக்கின்றது. எனவே, கூட்டுறவுச் செயற்றிட்டத்தை வினைத்திறனான முறையில் செய்வதற்கு நீங்கள் உடனடியாக இவற்றைக் கருத்திலெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றோம். இதற்கு அப்பால், நேற்றைய தினம் இடம்பெற்ற விவாதத்தில் நாங்கள் எமது பிரதேசத்திலுள்ள வர்த்தக, வாணிபம் சம்பந்தமான பல்வேறு முதலீடுகள் பற்றி சொல்லியிருந்தோம். அந்த விடயங்களை கூட்டுறவுத் துறையினூடாக முன்னெடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். ஏனென்றால், மட்டக்களப்பு மாவட்டம் வறுமையான ஒரு மாவட்டமாகும். அங்கு முதலீடு செய்வதற்கான முதலீட்டாளர்கள் மாவட்ட ரீதியில் பெரியளவில் இல்லை.

தனியார் சிலர் அங்கு முதலீடுகளைச் செய்தாலும், வேலைவாய்ப்புகளைக் கொடுக்கக்கூடிய வகையில் வெளிநாட்டிலிருந்து முதலீடுகளைச் செய்யக்கூடிய நிலைமைகள் இல்லை. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயங்களைக் கருத்திற்கொண்டு, முதலீட்டுத் திட்டங்களை கூட்டுறவு அமைப்பின் ஊடாகச் செய்வதற்கான வேலைத்திட்டங்களை முன்னெடுப்பீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. அதனோடு இணைந்ததாக, உணவுப் பாதுகாப்பு, சீரான உணவு விநியோகம் சம்பந்தமான செயற்பாடுகளிலும் நீங்கள் கவனம்செலுத்தி, உங்களுடைய அமைச்சின் ஊடாக மட்டக்களப்பு மாவட்டம் முழுவதும் சிறப்பான சேவைகளைச் செய்து, கூட்டுறவுத்துறை தொடர்பான நம்பிக்கையை மக்களிடம் ஏற்படுத்த வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி!

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නැහෙනහිර පළාත නියෝජනය කරමින් ඉදිරිපත් කළ කරුණු සලකා බැලීමේදී, විශේෂයෙන්ම ඔබතුමාගේ කරුණුවලින් කියැවුණා, එම දිස්ත්‍රික්කයටම තිබෙන්නේ සතොස වෙළෙඳ සැල් 3යි කියලා. මේ වසරේ සතොස වෙළෙඳ සැල් 150ක් ඇති කිරීම සඳහා අපි සැලසුම් කරමින් යනවා. ඒ ප්‍රදේශවල ඒකට යෝග්‍යතාව තිබෙනවා නම්, වෙළෙඳ ආයතනයක් පවත්වාගෙන යන්න පුළුවන්කමක් තිබෙනවා නම්, අපි ඒවා වේගයෙන් ක්‍රියාත්මක කරන්න සූදානම් කරනවා. ඒ වාගේම, ඉදිරියේදී විශාල ප්‍රමාණයේ, මධ්‍ය ප්‍රමාණයේ, සාමාන්‍ය ප්‍රමාණයේ සහ franchise ප්‍රමාණයේ - ඒ කියන්නේ ඉතාම කුඩා ප්‍රමාණයේ - වශයෙන් සතොස වෙළෙඳ සැල් වර්ග 4ක් සූදානම් කරන්නත් අපි කටයුතු කරනවා. ඒ අනුව, ලංකාවේ දැනට තිබෙන 450කට ආසන්න වෙළෙඳ සැල් ඉදිරි අවුරුදු තුන ඇතුළත 1,000 දක්වා වැඩි කරනවා. එහිදී නව වෙළෙඳ සැල් ප්‍රමාණයක් ඒ දිස්ත්‍රික්කය තුළත් ව්‍යාප්ත කරන්න කටයුතු කරන්න අපි මැදිහත් වෙනවා.

ඒ වාගේම, ඔබතුමා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධව මතු කළ කරුණ පිළිබඳවත් කියන්න ඕනෑ. මේ දෙපාර්තමේන්තුව වහන්න තීරණය කර තිබුණු එකක්. ඒ නිසා මෙවාට සේවකයන් බඳවා ගත්තේ නැහැ. ඉදිරියේදී අපි මේ ආයතනවලට සේවකයන් බඳවා ගැනීම පමණක් නොවෙයි, ඒ අයට අවශ්‍ය පුහුණුව ලබා දෙමින් සමුපකාර බැංකු සහ පාරිභෝගික සේවා පවත්වාගෙන යන අපේ විවිධ සේවා සමුපකාර පද්ධතියත් ශක්තිමත්ව අපේ රටේ වෙළෙඳ සැල් ජාලය තුළ ක්‍රියාත්මක කරන්න අවශ්‍ය මැදිහත්වීමත් කරනවා. බැංකු තැන්පතුකරුවාගේ ආරක්ෂාවට අවශ්‍ය මැදිහත් වීම කරන්න අවශ්‍ය ලෙස සමුපකාර සේවකයන් පුහුණු කරන්නත් කටයුතු කරනවා කියන කාරණයත් ඔබතුමාට මතක් කරනවා. බොහොම ස්තුතියි, ඔබතුමා ඒ අදහස් ඉදිරිපත් කළාට.

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

Thank you for your response, Hon. Minister. We and our people hope that your Government would take necessary action to address the issues in the North and the East. Again, thank you so much for your response.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.13]

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් යන දැක්ම සහිත වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය සිදු කරන අද දවසේ මීට පෙරාතුව කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා දක්වපු අදහස් කිහිපයක් සමඟ මේ විවාදයට එකතු වෙන්නට මා අදහස් කරනවා. විශේෂයෙන්ම ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ජාතික ජන බලවේගයේ අපට රෙද්දක්, කලිසමක් ඇඳගෙන ගමට ගිහිල්ලා ඡන්දයක් කරන්නට බැහැ කියලා. අපි එතුමාට ඉතාම කාරුණිකව මතක් කරලා දෙනවා, තිරණාත්මක මැතිවරණයක් පක්ෂය අභිමුව තිබියදී අඩුම ගණනේ එතුමාගේ පක්ෂයේ සභාපතිවරයාවත් පක්ෂයේ රඳවාගන්නට බැරි වෙච්ච උදවිය තමයි අද අපට අවලාද නඟමින් ඉන්නේ කියලා. ආණ්ඩු පක්ෂයේ ඇඳිවත නොවෙයි, විපක්ෂයේ ඉතිරි වෙලා තිබෙන ඇඳිවතත් ගළවා ඉවත් කරන මැතිවරණයක් බවට මේ එළඹෙන පළාත් පාලන මැතිවරණය පත් වෙනවා. ඒ වාගේම, එතුමා මතක් කළා මීට පෙරාතුව තිබුණු පාර්ලිමේන්තුවලදී අපේ පක්ෂයේ නායකයන්, විවිධ දූෂිත මන්ත්‍රීවරුන් එක්ක කැන්ටින් එකට ගිහින් කෑම කෑවා, තේ බිව්වා කියලා. අපි දන්නා තරමින් මන්ත්‍රීවරුන්ට මේ පාර්ලිමේන්තුව ඇතුළේ තිබෙන්නේ එක කැන්ටින් එකයි. හැබැයි, දූෂිතයන්ට, හොරුන්ට, ජනතාවගේ දේපළ අමු අමුවේ කොල්ල කාපු අයට වෙන් කරපු කැන්ටින් එකක් -ආපණ ශාලාවක් - තිබුණා නම්, අන්න ඒකට කිසි ලෙසකින්වත් අපේ මන්ත්‍රීවරු යන්නේ නැහැ. අදූෂිතයන්ට වෙන් කරපු කැන්ටින් එකක් තිබුණා නම්, අන්න ඒකට තමයි අපි යන්නේ. ඒ නිසා එතුමාට ඒකත් මතක් කරලා දෙන්න ඕනෑ.

ඒ වාගේම මරික්කාර් ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වමින් හොරු අල්ලන්න ආපු කට්ටිය, පොල්තෙල්වලින් කොමිස් ගැහුවාද කියා සැකයක් තිබෙනවා කිව්වා. ඒ වාගේම, වී මාෆියාවට, හාල් මාෆියාවට අපි යට වෙලා ඉන්නවාද කියලා එතුමා ඇහුවා. එතුමාගේ සැකය එක පැත්තකින් සාධාරණයි. මොකද, විපක්ෂයේ සියලුදෙනාම නොමැති වුණත් සමහර මන්ත්‍රීවරු දේශපාලනය තෝරාගෙන තිබෙන්නේ එක්කෝ වැලි මංකඩක් ලබා ගන්න, එක්කෝ බාර් පර්මිට් එකක් ලබා ගන්න, එක්කෝ පෙට්‍රල් ෂෙඩ් එකක් ලබා ගන්න, එහෙම නැත්නම් තමන්ගේ නායකයා ගාව දණින් වැටිලා කාර් පර්මිට් එකක්, කාර් එකක් ලබා ගන්න. ඒ නිසා ඒගොල්ලන්ට එහෙම හිතෙන එක සාධාරණයි. නමුත් අපේ හෘදය සාක්ෂිය දන්නවා, කිසිදු දූෂිතයෙක් රකින්න මේ ආණ්ඩුවේ කිසිවෙක් ඉදිරිපත් වෙලාත් නැහැ, ඉදිරිපත් වෙන්නෙත් නැහැ.

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන අද කිසිවෙක් බටලන්ද කොමිෂන් සභා වාර්තාව පිළිබඳව කථා කළේ නැහැ.

[ගරු සුනිල් රත්නසිරි මහතා]

හැබැයි ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීවරයාට ලොකු ප්‍රශ්නයක් තිබුණා බටලන්ද ගැන. අපටත් ප්‍රශ්නයක් තිබෙනවා, රනිල්ට ගහද්දී මරික්කාර් අඬන්නේ ඇයි කියලා. අපටත් එහෙම ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයේදී විපක්ෂයේ මන්ත්‍රීවරු අප්‍රේල් මාසයේ ඉඳලා කිරි පිටි මිල රුපියල් 50කින් වැඩි වෙනවා කියලා පුරෝකථනයක් කළා. හැබැයි ඒගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා ඒගොල්ලන් මිල්කෝ ආයතනය සම්පූර්ණයෙන්ම විනාශ කරලා දාලා, ඒකට ස්වාභාවික මරණයක් අත්පත් කරලා දීලා තිබියදී, අපි බලයට පත් වුණාට පස්සේ කිරි ගොවියා ආරක්ෂා කර ගනිමින්, කිරි ලීටරයකට වැඩි මිලක් ලබා දෙමින්, සේවකයන්ට එතෙක් අහිමි වෙලා තිබුණු වරදාන, වරප්‍රසාද ටික ලබා දෙමින්, ඒ වාගේම එතෙක් අරගෙන තිබුණු ණයවලින්, බැංකුවලට තිබුණු ණයවලින් සියයට 50ක් මේ වෙනකොට ගෙවා අවසන් කරලා මිල්කෝ ආයතනය නැවත ලාභ ලබන තත්ත්වයට පරිවර්තනය කරගෙන තිබෙන බව. අපි ඒ ආයතනය එතැනට ගෙනැල්ලා තිබෙනවා. දියර කිරි නිෂ්පාදනය වේගවත් කිරීමත් එක්ක, කිරිවලින් රට ස්වයංපෝෂිත කිරීමත් එක්ක, අපට පිට රටින් තවදුරටත් කිරි පිටි ගෙන්වීම අවශ්‍ය වෙන්නේ නැහැ. මේ සඳහා අපි ආර්ථික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් සිටිනවා.

අපේ රටේ ජනතාව විශාල ප්‍රමාණයක් දරිද්‍රතාවට පත් වෙලා තිබෙනවා කියලා ගරු විපක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රකාශ කරනවා. අපි අහනවා, බහුමාන දරිද්‍රතාවකට අපේ රටේ ජනතාව පත් වෙලා තිබෙන එකට වග කියන්න ඕනෑ අපි බලය අරගෙන මාස 6 ඇතුළතද, එහෙම නැත්නම් ඒගොල්ලන පාලනය කළ අවුරුදු 76 ඇතුළතද කියලා. ඒ වාගේම, ඒගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයට පසුගිය කාලය පුරාවට සිද්ධ කළ මහා දැවැන්ත විනාශය. ජොන්ස්ටන් ප්‍රනාන්දු පදනමට සතොසෙන් රුපියල් ලක්ෂ 52ක භාණ්ඩ ලබාගෙන ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ ජොහාන් ප්‍රනාන්දු තමන්ගේ මැතිවරණවලදී දන්සැල් දුන්නා. ඒවා ඒගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා. ඒ වාගේම රිසාඩ් බදියුදීන් ඇමතිවරයා වෙලා ඉන්න අවස්ථාවේ 2017දී, සතොස වී තොග ලබාගෙන රුපියල් කෝටි 6ක් වංචා කරලා තිබෙනවා. සහල් ලබා දෙනවා කියන පොරොන්දුව දීලා ඒවා භාර ගත්තා. හැබැයි, සහල් ලබා දුන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් විශේෂ කාරණාවක් තිබෙනවා. මගේ අතේ තිබෙනවා, උමංදාව ආයතනය සම්බන්ධ විශේෂ විමර්ශන වාර්තාව. උමංදාවේ හාමුදුරුවෝ අපේ විශ්වවිද්‍යාලයේ අපිත් එක්ක microbiology කරපු හාමුදුරුනමක්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව පැත්තෙන් මෙතුමාට තව විනාඩි තුනක කාලයක් ලබා දෙනවා.

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

උමංදාවේ අපේ හාමුදුරුවෝ කැලණිය විශ්වවිද්‍යාලයේ microbiology කරපු හාමුදුරුනමක්. උන්වහන්සේ පසුගිය ආණ්ඩුවට ඉතාම ළැදිව කටයුතු කරන්න හේතුව මොකක්ද කියලා මම සොයලා බැලුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය පිහිටි කුලී ගොඩනැගිල්ලේ බිම් මහලේ ස්ථාපිත කර ඇති උමංදාව ශ්‍රීන් හට් වෙළෙඳ ආයතනයට එම බිම් මහල උප බදු දීමේදී සිදු කරන ලද විශාල ප්‍රමාණයේ වංචාව මෙන්න තිබෙනවා. එහි මූලික කටයුතු ආරම්භ කිරීම සඳහා ආයතන දෙකක් ඉල්ලීම් කර තිබුණා. එකක් තමයි "ආර්ච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය. ඒ ගොල්ලෝ රුපියල් මිලියන 28ක මිලක් දෙනවා. ඒ වාගේම "ලීමා කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම" මූලික වැඩකටයුතු ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 34ක මිලක් දෙනවා. හැබැයි, මෙහිදී "ලීමා කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම" විසින් ඉදිරිපත් කර ඇති මිල රුපියල් මිලියන 34ක් වුවද, අභිලාෂ විවෘත කිරීමේ කමිටු වාර්තාවේ "ලීමා කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම" විසින් ඉදිරිපත් කර ඇති රුපියල් මිලියන 34 වෙනස් කරලා රුපියල් මිලියන 73ක් බව දක්වා තිබෙනවා. කාගේ වුවමනාවකට ඒක වැඩි කළාද? එහෙම වැඩි කරලා ඊට පස්සේ ඒක "ආර්ච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනයට ලබා දෙනවා. ලබා දෙනවා විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "ආර්ච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය වෙත මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත්තේ 2021.12.29 දින වන අතර, කොන්ත්‍රාත්තුව පිරිනැමූ දිනම එකවර රුපියල් මිලියන 20ක් ගෙවීමේ පදනම හඳුනාගත නොහැකි විය.

අලියා ගහලා මැරෙනකොට, වගා පාළු වෙනකොට, දරුවෝ මන්දපෝෂණයට ලක් වෙනකොට, ගර්භිණී අම්මාට ත්‍රිපෝෂ ටික යවන්න ප්‍රමාද වෙනකොට ඒවා සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගන්නේ නැති ආණ්ඩු, මෙන්න ගිවිසුම අත්සන් කරපු මොහොතේම "ආර්ච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනයට රුපියල් මිලියන 20ක මුදල දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. සෑම මාසයකම එහි කුලිය ලෙස රුපියල් 327,600ක් ගෙවන්න ඕනෑ. හැබැයි, ඒ කුලිය ගෙවලා තිබෙන්නේ අමාත්‍යාංශය මඟින්. උමංදාවේ හාමුදුරුවෝ ගෙවන්න ඕනෑ කුලිය අමාත්‍යාංශය විසින් තමයි සෑම මසකම ගෙවාගෙන ඇවිල්ලා තිබෙන්නේ. මෙන්න, කරලා තිබෙන වංචා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුපකාර ක්ෂේත්‍රය කියන්නේ අපේ රටේ තිබෙන විශාලතම ව්‍යාපෘතිය. අද්‍යත් අසූපන්ලක්ෂයක සාමාජිකයෝ සමුපකාර ක්ෂේත්‍රය තුළ ඉන්නවා. ඒ වාගේම විවිධ සේවා සමුපකාර 305කට අධික ප්‍රමාණයක් ලංකාව පුරා පවත්වාගෙන යනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ විවිධ සේවා සමුපකාර සමිති 9ක් තිබෙනවා. අපි බලය ලබා ගත්තාට පස්සේ මැදිරිගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය උතුරු මැද පළාතේ වැඩියෙන්ම ලාභ ලබන සමුපකාර සමිතිය බවට පත් කර තිබෙනවා. 2013 වර්ෂයේ මේ සමුපකාර සමිතිය මඟින් NC PI 6535 අංකය දරන KDH වෑන් රථය මිලදී ගන්නවා. එහි වෙළෙඳ පොළ වටිනාකම රුපියල් ලක්ෂ 60ක්. හැබැයි, මේක මිලදී ගෙන තිබෙන්නේ රුපියල් ලක්ෂ 88කට. ආයතන 3කින් ඉල්ලුම් පත්‍ර අරගෙන තිබෙනවා. ආර්.සී.එන්. ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම නිට්ටඹුව, සුරේන් ඔටෝ මාර්ට් කොහුවල, ස්මාර්ට් කලෙක්ෂන් පුද්ගලික සමාගම, වත්තේගම විධියට ආයතන තුනක් දාලා තිබුණාට, ආයතන 2ක් බොරු -ව්‍යාජ- නම් ඉදිරිපත් කර තිබෙන්නේ. මේ වාගේ විශාල වංචා ප්‍රමාණයක් පසුගිය කාලයේ මේ අමාත්‍යාංශය ඇතුළේ සිදු කර තිබෙනවා. ඒ දේවල් ගැන එකින් එක කියන්නට පුළුවන්. නමුත්, කාල වේලාව ප්‍රමාණවත් නොවන නිසා මට කථාව අවසන් කරන්න සිද්ධ වෙනවා.

අවසාන වශයෙන්, ගරු විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ ජනතාව අලුත් ආණ්ඩුවක් හැදුවා; අලුතින් හිතන ආණ්ඩුවක් හැදුවා. හැබැයි, ඔබතුමන්ලා හාල්, සීනි, තෙල් එක්ක දේශපාලනය කරන, පැරණි, යල් පැනපු, කුණු වෙච්ච, ඔද්දල් වෙච්ච විපක්ෂයක්. ඒ නිසා කරුණාකරලා වෙනස් වෙන්න, අලුත් වෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයට අදාළව කාරක සභා අවස්ථාවේ විවාදයේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මම බෙහෙවින්ම සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රථමයෙන්ම ග්‍රාමීය සමුපකාර වැඩ පිළිවෙළ ගැන කථා කරන්නම්. මම ගරු අමාත්‍යතුමාට යෝජනා කරනවා, ග්‍රාමීය සමුපකාර වැඩ පිළිවෙළ හැකි ඉක්මනින් රටේ ක්‍රියාත්මක කරන්න කියලා. අද රටේ ග්‍රාමීය ජනතාවට අවශ්‍ය සියලු දේ ලබාගන්න පුළුවන් ආයතනය තමයි, ග්‍රාමීය සමුපකාරය. ඒ නිසා ග්‍රාමීය සමුපකාර වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීමට කටයුතු කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මට මතකයි, එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ ග්‍රාමීය සමුපකාර අති සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ බව. ගමේ ජනතාවට පරිභෝජනයට අවශ්‍ය සියලු බඩු මුට්ටු, සියලු දේවල් ඒ තුළින් ලබා ගන්න පුළුවන් වුණා. ග්‍රාමීය ජනතාවට අඩු මුදලට, පිරිසිදුව අවශ්‍ය සෑම දෙයක්ම ග්‍රාමීය සමුපකාරයෙන් ලබා ගන්න පුළුවන්. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා එදා "ජන සවිය" ලබා දුන්නා. ග්‍රාමීය සමුපකාර හරහා රුපියල් 25,000ක මුදලක් ලබා දුන්නා. ඒ රුපියල් 25,000ක මුදලින් මාසයකට අවශ්‍ය බඩු ටික ගන්න පුළුවන් වුණා. අවශ්‍ය ඉදල, කොස්ස, කළගෙඩිය, ලාම්පුව ආදී සෑම දෙයක්ම ග්‍රාමීය සමුපකාරයේ තිබුණා. ගමේ සමුපකාරයෙන් ගමේ ජනතාවට අවශ්‍ය සෑම භාණ්ඩයක්ම ලබා ගන්න පුළුවන්කම තිබුණා. ඒ නිසා මම එය නැවත ස්ථාපිත කරන්න කියලා ඉල්ලනවා. අද යම් යම් ප්‍රදේශවල ග්‍රාමීය සමුපකාරය ගරා වැටිලා තිබෙනවා. ඒ සියල්ල ප්‍රතිසංස්කරණය කරලා, විශේෂ උනන්දුවක් දක්වලා සමුපකාර ක්‍රමය ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාගේ සංකල්පයකට අනුව තමයි, ග්‍රාමීය ධීවර සමුපකාර සමිති ආරම්භ කළේ. අද ලංකාව වටේම සමුපකාර විශාල ආර්ථිකයක් ගොඩ නහාගෙන තිබෙනවා. සමුපකාර තුළ හොඳ ධනයක් තිබෙනවා. තංගල්ල ධීවර සමුපකාර සමිතියේ හොඳ ධනයක් තිබෙනවා. ග්‍රාමීය ධීවර සමුපකාර සමිති ජෝශප් මයිකල් පෙරේරා ආරම්භ කරපු හොඳ වැඩ පිළිවෙළක්. ධීවර සමුපකාර ක්‍රමය පළාත් සභා ක්‍රමය යටතේ තිබෙන්නේ. ඒකත් මහා ආණ්ඩුව යටතට එකතු කරලා, ග්‍රාමීය ධීවර සංවිධාන සහ ධීවර සමුපකාර ඒකාබද්ධ කරලා වැඩ පිළිවෙළක් සකස් කරන්න කටයුතු කරන්නය කියා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තමයි, මේ සමුපකාර නිලවරණ. දැන් ලංකාව පුරාම සමුපකාර නිලවරණ පවත්වනවා. ජාතික ජන බලවේගය රටේ ඡන්ද 68 ලක්ෂයක් ගත්තත්, මේ සමුපකාර නිලවරණවලදී සමගි ජන බලවේගය සමුපකාර ආයතනවලින් භාගයට භාගයක් විතර ජයග්‍රහණය කරමින් පවතිනවා. දැන් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් අපි වැඩි සමුපකාර ප්‍රමාණයක් ජයග්‍රහණය කර තිබෙනවා. සමුපකාර නිලවරණ ගැන කථා කරද්දී මම මතක් කරන්න ඕනෑ, වීරකැටිය විවිධ සේවා සමුපකාර සමිතිය ගැන. එහි නිලවරණය 2025.03.16වන දින පැවැත්වූවා. අතිරේක මැතිවරණ කොමසාරිස්වරයා ලිඛිතව දැනුම් දීලා තිබෙනවා, 2025 මැයි මාසයේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පවත්වන නිසා මේ නිලවරණය 2025.03.09වන දිනට පෙර පවත්වන්න, ඉන් පසුව පවත්වන්න එපා කියලා. මා සතුව මේ තිබෙන්නේ මැතිවරණ කොමිෂන් සභාවෙන් එවපු ලිපිය, ගරු ඇමතිතුමනි. නමුත්, ඒ අනුව ක්‍රියාත්මක වෙලා නැහැ.

ඊළඟට, හම්බන්තොට සහකාර මැතිවරණ කොමසාරිස්වරයා ලිඛිතව දන්වා තිබෙනවා, ".....2025.03.08 දින මැතිවරණ කොමිෂන් සභාවේ පැවැති තේරීම් භාර නිලධාරීන්ගේ රැස්වීමේදී ලබා දුන් උපදෙස් පරිදි මේ වන විට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කර ඇති බැවින්, සමුපකාර සමිතිවලට අදාළ නිලවරණ හා මහා සභා රැස්වීම් පැවැත්වීමට අවසර ලබා දිය නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි." කියලා. එසේ ලිඛිතව දන්වා එවා තිබෙන්නේ 2025.03.11වැනි දා. මැතිවරණ කොමිෂන් සභාව හරහා අතිරේක මැතිවරණ කොමසාරිස්තුමා ලිපිය නිකුත් කර තිබෙන්නේ 2025.03.02වැනි දා.

මැතිවරණ පවත්වන්න කියලා නැවත නැවතත් ඉල්ලීම් කරනකොට, නැවත වතාවක් 2025.03.13වැනි දා හම්බන්තොට මැතිවරණ කාර්යාලය විසින් වීරකැටිය විවිධ සේවා සමුපකාර සමිතියට, සමුපකාර සංවර්ධන කොමසාරිස්, දකුණු පළාත නමින් ලියුමක් එවා තිබෙනවා. එහි සඳහන්ව තිබෙනවා, ".....2025.03.16 දින මහා සභා රැස්වීම පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් අවසර ලබා දී ඇති අතර, මේ වන විට පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කර ඇති බැවින්, සමුපකාර සමිතිවලට අදාළ නිලවරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අවසන්වීමෙන් පසුව පැවැත්වීමට කටයුතු කරන ලෙසටත් දන්වා සිටිමි." යනුවෙන්. ඒ අනුව, මේ සම්බන්ධයෙන් 2025.03.13වැනි දා ලිපි නිකුත් කර තිබෙනවා, 2025.03.11වැනි දා ලිපි නිකුත් කර තිබෙනවා, මැතිවරණ කොමිෂන් සභාවත් ලිපි නිකුත් කර තිබෙනවා. මේ සියලු ලිපිවල සඳහන් කරුණු උල්ලංඝනය කරලා වීරකැටිය විවිධ සේවා සමුපකාර සමිතියේ නිලවරණය මේ 16වැනි දා පැවැත්වූවා. ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමනි, මේක තමයි ඔබතුමන්ලාගේ දෙවැනි ත්‍රස්තවාදී වැඩේ. පළමුවැනි එක ජනාධිපතිවරණයේදී කළා, විදුහල්පතිවරු නවදෙනෙක් මැතිවරණ නීති උල්ලංඝනය කිරීම සම්බන්ධව. හම්බන්තොට මැතිවරණ කොමසාරිස්වරයා අධ්‍යාපන ඇමතිතුමියට ලිඛිතව දැනුම් දුන්නා, මේ ගැන විනය පරීක්ෂණයක් කරන්න කියලා. නමුත්, ඒ සඳහා නීතිය ක්‍රියාත්මක වුණේත් නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන මැතිවරණයට අදාළ නාම යෝජනා කැඳවා අවසන් වන්නේත් 20වැනි දා, එනම් හෙට. එතකොට මැතිවරණයට අදාළ නාම යෝජනාවලින් පස්සේ නොවෙයි ඒ සමුපකාර මැතිවරණය පවත්වා තිබෙන්නේ. ඔය වාගේ ලිපි ඇවිල්ලා තිබෙනවා. මෙම නිලවරණ නොපැවැත්වූවොත් හොඳයි කියලායි කියා තිබෙන්නේ. නමුත්, එපා කියලා නැහැ. ඔබතුමා ඔය කියපු ලිපියේ එය සඳහන්ව තිබෙන්නේ කොහොමද?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
"...මේ වන විට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කර ඇති බැවින්, සමුපකාර සමිතිවලට අදාළ නිලවරණ හා මහා සභා රැස්වීම් පැවැත්වීමට අවසර ලබා දිය

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි." කියලා තමයි මෙහි තිබෙන්නේ. එතකොට වැරැද්දක් නේ කරලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ වීරකැටියේ ඉන්න ගෝලයන්ට කියන්න, මේවා කැත වැඩ, මේවා නින්දිත වැඩ කියලා. මේවා ඔබතුමන්ලාගේ ගෞරවයට හොඳ නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා. ඔබතුමන්ලාගේ ගෞරවයටයි මම මේ දේවල් කියන්නේ.

ගරු අරවින්ද සෙනරත් මහතා
(මාණ්පුමිකු අරවින්ද සෙනරත්)
(The Hon. Aravinda Senarath)
මේවා නීති විරෝධීව කරන වැඩ නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. මේවා පනත හරහා කරන වැඩ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
කොහේද පනතේ එවැනි එකක් තිබෙන්නේ?

ගරු අරවින්ද සෙනරත් මහතා
(මාණ්පුමිකු අරවින්ද සෙනරත්)
(The Hon. Aravinda Senarath)
වීරකැටිය විවිධ සේවා සමුපකාර සමිතියේ නිලවරණය තිබුණේ පෙබරවාරි මාසයේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
නැහැ, ඒක තිබුණේ මාර්තු 16වැනි දා. මේ මාසයේ 16වැනි දා එම නිලවරණය තිබුණේ. තේරුමක් නැති දේවල් කථා කරන්න එපා මන්ත්‍රීතුමා. බොරු කියන්න එපා. වීරකැටිය සමුපකාරයේ නිලවරණය පැවැත්වුයේ මේ මාසයේ 16වැනි දා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ කොමිෂන් සභාවෙනුත්, හම්බන්තොට මැතිවරණ කාර්යාලයෙනුත් එවා තිබෙන ලිපිවල පිටපත් සහ ඡන්දය දමන ආකාරය සඳහන් ඡායාරූප සහ ඊට අදාළ ලේඛනත් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මේ නිලවරණය පැවැත්වුයේ මාර්තු 16වැනි දා. මේ ඡායාරූපවල තිබෙනවා, ඡන්දය දමන හැටි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක තිබුණේ පෙබරවාරි මාසයේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
නැහැ, මාර්තු 16වැනි දා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
මාර්තු 16 තිබුණේ මහා සභාව.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
මහා සභාවක් තිබුණේ නැහැ, නිලවරණය තිබුණේ. මගේ ළඟ ඡන්දය දමන ආකාරය සඳහන් ඡායාරූපත් තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
මාර්තු 16 තිබුණේ මහා සභාව, ගරු මන්ත්‍රීතුමා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
මහා සභාවක් තියන්නත් බැහැ, ගරු ඇමතිතුමා.

ගරු අරවින්ද සෙනරත් මහතා
(මාණ්පුමිකු අරවින්ද සෙනරත්)
(The Hon. Aravinda Senarath)
16වැනි දා කියන්නේ පෙරේදා ද?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
ඔව්, පෙරේදා. මහා සභාවක් තියන්නත් බැහැ. මැතිවරණ කොමිෂන් සභාවෙන් නිකුත් කර තිබෙන ලිපිවල ඒ බව තිබෙනවා නේ. ඇයි ඉතින් මේ නීති උල්ලංඝනය කරන්නේ?

මැතිවරණ කොමසාරිස්වරයා, මැතිවරණ කොමිසම පනවපු නීති උල්ලංඝනය කරලා තමුන්නාන්සේලා කටයුතු කළා. ජාතික ජන බලවේගය දෙවැනි වැරදි වැඩේ කළේ හම්බන්තොට දිස්ත්‍රික්කයට. මහ මැතිවරණයේදී විදුහල්පතිවරු නවදෙනෙක් චූදිතයන් හැටියට නම්කර කොමිසමට තොරතුරු එවා තිබෙනවා. ඒක පළමුවන එක. ඒ ගැන පරීක්ෂණයක් කරන්න කියලා මම කිව්වා. මම මේ සභාවේ ඒ ගැන දවස් දෙකක් කථා කළා. නමුත් ඒ ගැන කටයුතු කළේ නැහැ. මේ දෙවැනි එක. මේ ෆයිල් දෙක තුනම මගේ ළඟ තිබෙනවා. මම මේවා ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලා ඇත්ත කථා කරන, සාධාරණය කථා කරන අය නේ. එහෙම නම් ඇයි මෙහෙම වැඩ කරන්නේ කියලා මම අහන්න කැමැතියි. ඒ ඡන්දය ප්‍රකාශ කළ අවස්ථාවේ ඡායාරූප, මැතිවරණ කොමිසමෙන් එවපු ලියුම් මම සභාගත කළා. මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. නමුත් ඒක එතැනින් ඉවරයි. ඔබතුමන්ලාට ලජ්ජාවක් ඇති වෙන්න ඇති. නිහාල් ගලප්පත්ති මැතිතුමා මෙතැන හිටියා නම් ලජ්ජා වෙලා මට අදත් බණිනවා. ඒකත් කියන්න එපා යැ. එතුමා දැන් සභාවේ නැහැ නේ. *[බාධා කිරීමක්]* බොරු කියන්නේ කොහේද? ඇයි බොරු කියන්නේ? මම බොරු කියන්නේ නැහැ. මේ තිබෙන්නේ ඒ වාර්තාව. මම මේ වාර්තාව සභාගත කළා.

ගරු අරවින්ද සෙනරත් මහතා
(මාණ්පුමිකු අරවින්ද සෙනරත්)
(The Hon. Aravinda Senarath)
මහා සභාව තිබුණේ 16වැනි දා. නිලවරණය තිබුණේ ජනවාරි මාසයේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)
(The Hon. Dilip Wedaarachchi)
මාර්තු 16 තමයි නිලවරණය තිබුණේ.

ගරු අරවින්ද සෙනරත් මහතා
(මාණ්පුමිකු அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
මාර්තු 16 තිබුණේ මහා සභාව.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මහා සභාව තිබුණේ නැහැ. මේ නිලවරණය පවත්වපු එක ගැන ඔක්කෝම වාර්තා තිබෙනවා. මහා සභාව කොහේද තිබුණේ? *[බාධා කිරීමක්]* මේ තිබෙන්නේ ඔක්කෝම විස්තර. නිලවරණය තියපු හැටි, පස්දෙනෙක් තෝරා ගත්ත හැටි මේ විස්තරවල තිබෙනවා. මේ තිබෙන්නේ ඡන්දය දමපු හැටි. ගරු ඇමතිතුමා බලන්න. ඒ ෆොටෝ ඔක්කෝම තිබෙනවා. ඉතින් ඒ නිලවරණයට සහභාගි වෙලාත් තිබෙනවා නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මහා සභාව පවත්වන්න පුළුවන්. නිලවරණය පවත්වන්න බැහැ. ඔබතුමා පටලවාගෙන තිබෙනවා කියලායි මට නම් පෙනෙන්නේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මම පටලවාගෙන නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රී අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමාත් -ඔබතුමන්ලාගේ මන්ත්‍රීතුමා- එදා -පෙරේදා - එයට සහභාගි වෙලා තිබෙනවා. එදා මහා සභාව නොවෙයි, නිලවරණය තිබුණේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මැතිවරණ කොමිසමෙන් දීපු උපදෙස් අනුව මහා සභාව පවත්වන්න පුළුවන්, නිලවරණය පවත්වන්න බැහැ. නිලවරණය පවත්වා තිබෙන්නේ පෙබරවාරි මාසයේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
නැහැ, නිලවරණය තිබුණේ. මේ ඡායාරූප අනුව ඡන්දයත් පාවිච්චි කරලා තිබෙනවා නේ. මම ඒ වාර්තා සභාගත කළා, ඔබතුමා බලන්න. හරි, ඒ ප්‍රශ්නය ඉවරයි. ඇයි එහෙම කරන්නේ කියලායි මම ප්‍රශ්න කරන්නේ. *[බාධා කිරීමක්]* නිලවරණය කල් තැබුවා කියලා ඊට පසුව හදිසියේ නිලවරණය පැවැත්වුවා. ඒ, මැතිවරණ කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරයක් නැතිව. එතකොට අපේ මිනිස්සු ලැස්ති වෙලා හිටියේ නැහැ, නිලවරණයට. ඉතින් ඔබතුමන්ලා නිලවරණ පහම දිනුම්. අඟුණුකොළපැලැස්සත් දිනුම්, හුංගමත් දිනුම්. ඔබතුමන්ලා ඒවා දිනා ගත්තා, වැරදි වැඩ කරලා. ඒ නිසා කට වහගෙන ඉන්න.

ගරු අරවින්ද සෙනරත් මහතා
(මාණ්පුමිකු அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
බොරු. පරාදයි, ඒ සමිති දෙකම පරාදයි.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
හරි, හරි. පරදිනකල් බලන් ඉන්න. *[බාධා කිරීමක්]* හරි, හරි. දැන් ඒ ප්‍රශ්නය ඉවරයි. *[බාධා කිරීමක්]* හරි, හරි. පළාත් පාලන මැතිවරණය දිනලා පෙන්වන්නකෝ ඔබතුමන්ලා. *[බාධා කිරීම්]* හරි, හරි. මම කථා කරන්නම්.

ඔබතුමන්ලා ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව නිවැරදි ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න. අද බහුතරයක් ජනතාව ජීවත් වෙන්නේ අන්ත අසරණ තත්ත්වයක, ගරු ඇමතිතුමනි. ඔබතුමන්ලා සමීක්ෂණයක් කරලා කියා තිබෙනවා, රුපියල් 16,334කින් එක පුද්ගලයෙකුට මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලා. අද හාල් කිලෝ එකක් කීයද? රුපියල් 280යි; 300ට කිට්ටු වෙනවා. හාල් කිලෝ එක රුපියල් 280ට-300ට කිට්ටු වෙනකොට පොල් ගෙඩියක් කීයද? ඔබතුමන්ලාගේ වී ගබඩා කිරීමේ වැඩ පිළිවෙළ සාර්ථක වුණේත් නැහැ. ඩඩ්ලි සිරිසේන ඇතුළු ව්‍යාපාරිකයන්ගේ වැඩ පිළිවෙළ සාර්ථක වුණා. රජයේ ගබඩාවල වී සංචිත නැහැ. එතකොට හදිසියේ හරි ව්‍යසනයක් ආවොත්, කොරෝනා වසංගතය වාගේ අවුරුදු දෙක තුනක ව්‍යසනයක් ආවොත් අපේ ජනතාවට හාල් ගන්න වෙන්නේ රුපියල් 500ට-600ට. ඒ නිසා වී සංචිත තබා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා.

දැන් පොල් කීයද? පොල් ගෙඩියක් රුපියල් 250යි. ටිකක් වඳුරෝ කනවා. අනෙක් ටික රට පටවනවා. අපට කන්න පොල් නැහැ. අපේ ලාල් කාන්ත සහෝදරයා ප්‍රකාශ කළා, රිළවුන් ටික මරන්න ඕනෑ කියලා. මමත් ඒක අනුමත කරනවා. ලෝකයේ අලි ගහනය වැඩි වෙනකොට අලි මරනවා නම්, ලෝකයේ නොයෙක් රටවල සත්ව ගහනය වැඩි වෙනකොට මරලා පාලනය කරන්න කටයුතු කරනවා නම්, රිළවුන් මැරුවාට ප්‍රශ්නයක් නැහැ කියලා මම යෝජනා කරනවා. ලාල් කාන්ත ඇමතිතුමාගේ යෝජනාව හරි. ගොවීන්ට දෙන්න ආයුධ. තිබුණු ආයුධ අසූ ගණන්වල ඔබතුමන්ලා එක්කහු කර ගත්ත නිසා ගොවීන් ළඟ දැන් ආයුධ නැහැ. ඉතින් රිළවුන් වැඩි වුණා. ඒ නිසා රිළවුන් සඳහා මොකක් හරි වැඩ පිළිවෙළක් දියත් කරන්න. නැත්නම් අපට කන්න පොල් නැති වෙනවා. දකුණේ මිනිසුන්ට තුන් වේලටම පොල් ඕනෑ, බත් ඕනෑ, මාළු ඕනෑ. ඒක අපේ ප්‍රධාන ආහාරය. ඒ නිසා පොල් ප්‍රශ්නය විසඳන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තමයි ලුණු. ඒ කාලයේ අපි රුපියල් පහට ලුණු පැකට් එක ගත්තේ, හම්බන්තොට ලේවායෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(මාණ්පුමිකු திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තවත් විනාඩියක කාලයක් දෙන්න.

පසුකාලීනව රුපියල් 120ට තිබුණු ලුණු කිලෝ එක දැන් රුපියල් 220ක් වෙලා. හම්බන්තොට ලුණු ලේවායෙන් ආදායම තිබුණා. හම්බන්තොට ලුණු ලේවායේ සේවකයන් විශාල ප්‍රමාණයක් - එක්දහස් ගණනක් - ඉන්නවා. ස්ථිර සේවකයෝ 953ක් පමණ ඉන්නවා. තාවකාලික සේවකයෝ 750ක් පමණ ඉන්නවා. ගරු ඇමතිතුමනි, 2022 අවුරුද්දේ ලුණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 70,061ක්. 2023 අවුරුද්දේ ලුණු මෙට්‍රික් ටොන් 61,700ක් නිෂ්පාදනය කර තිබෙනවා. 2024දී මෙට්‍රික් ටොන් 26,736ක් නිපදවා තිබෙනවා. ඒ කියන්නේ 2024 අවුරුද්ද වෙනකොට නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 35,000කින් පමණ අඩු වෙලා. එසේ නිෂ්පාදනය අඩුවීමට හේතුව මොකක්ද කියලා ඔබතුමන්ලා පරීක්ෂා කර බලන්න.

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ඔබතුමන්ලා මේ වනවිට කළමනාකරුවෙක් පත් කර තිබෙනවා. 2024 අවුරුද්දේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 35,000 ගණනකින් අඩු වෙලා තිබෙනවා. ලුණු ලේවාය කියන්නේ අපේ ජාතික සම්පතක්. ඒ හරහා රටට නිෂ්පාදනයක් එනවා. එය වසරකට ලුණු මෙට්‍රික් ටොන් 71,000ක් පමණ නිෂ්පාදනය කරපු තැනක්. දේශපාලන හිතවත්කම් අනුව නුසුදුසු සේවකයන් කළමනාකරණයට පත් කළ නිසා එහි නිෂ්පාදනය අඩු වෙලාය කියනවා. වර්ෂාවත් ඒකට බලපා තිබෙනවා. ඒ වාගේම කාරම් ජල කළමනාකරණයට අවශ්‍ය පොම්ප, හෝස් වැනි දේවල් මිලදී ගැනීමේදී ප්‍රමිතියෙන් තොර භාණ්ඩ කොමිස්වලට ලබා ගැනීමත් ඊට එක හේතුවක් වෙලා තිබෙනවා. කළමනාකරුවන්, අධ්‍යක්ෂ මණ්ඩලය එම නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදු නොකළ නිසා ඒ පාඩුව සිදු වී තිබෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ආහාර සුරක්ෂිතතා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්, වී සුරක්ෂිත කරනවා නම්, ලුණු වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සම්බන්ධවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙසට.

හම්බන්තොට ලුණු ලේවාය කියන්නේ ජාතික සම්පතක්. එහි සේවකයන් දහස් ගණනක් ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන් වෙනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තව විනාඩි 2ක් ලබා ගන්න කිව්වා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද කිව්වේ?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
අපිට කියා තිබෙන්නේ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* මට කිව්වා, කියන්නය කියලා. *[බාධා කිරීම්]* වේලාව ඉල්ලා ගන්නය කිව්වා. විනාඩි 20ක් තිබුණා.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මගේ වෙලාවෙන් විනාඩි 2ක් මෙතුමාට ලබා දෙනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
Thank You. හම්බන්තොට තිබෙන්නේ මහා ලේවායක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක පාවිච්චි කර දේශපාලනය කරන්න එපා. ඒක ආර්ථිකයට හොඳ ආදායමක් උත්පාදනය කරන තැනක්. ඒ නිසා එහි කටයුතු විධිමත්ව සිදු කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. දැන් ඔබතුමන්ලා නිලධාරීන් පත් කර තිබෙනවා. ලබන අවුරුද්ද වෙනකොට එහි ආදායම් උත්පාදනය ගැන මම බලනවා; මම ඒ ගැන අහනවා. මොකද, එය රටේ ආර්ථිකයට ආදායමක් ලබා දෙන අපේ දිස්ත්‍රික්කයේ තිබෙන වටිනා සම්පතක්.

තව කාරණයක් ගැන මම කියන්න ඕනෑ. කිරි පිටි මිල රුපියල් 50කින් ඉහළ යනවා. ග්‍රෑම් 400 කිරි පිටි පැකට්ටුවක් රුපියල් 1,050ට තිබුණේ. ඒ මිල රුපියල් 50කින් වැඩි වුණා. ඒ අනුව ග්‍රෑම් 400 කිරි පිටි පැකට්ටුවක මිල රුපියල් 1,100ක් වෙනවා.

රිදියගම තිබෙනවා, NLDB Dairy Farm එක. එතැන හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. 2023 වර්ෂයේ එම ගොවිපළ තුළින් කිරි ලීටර් 15,000ක්-20,000ක් පමණ ලබා ගත්තා. නමුත් අද වනවිට ලබා ගන්නේ කිරි ලීටර් 3,500ක් විතර. ඒ කාලයේ ඒකේ කිරි හරක් 2,500ක්-3,000ක් විතර හිටියා. ඒ කිරි හරක් විකුණාගෙන කාලා. ඒවායේ හිටපු අය ඒක සුන් කරලා. අපේ ජාතික සම්පත් මේවා. දැන් ඒකේ මී හරක් ඉන්නේ 1,500ක් විතර. කිරි හරක් ඉන්නේ 750ක්-800ක් විතර. අනික් සතුන්ට මොනවා වෙලාද දන්නේ නැහැ. ඒ ගැන පරීක්ෂණයක් කරන්න. ඔබතුමන්ලාගේ නියෝජිතයෙක් පත් කර තිබෙනවාය කියලා මට දැනුම් දුන්නා. එසේ නිලධාරීන් පත්කර ඒවා ගැන හොයා බලන්න. හම්බන්තොට ලුණු ලේවාය සහ රිදියගම ගොවිපළ කියන්නේ අපේ දිස්ත්‍රික්කයේ තිබෙන ජාතික සම්පත් දෙකක්. ඒවායෙන් අපේ ආර්ථිකයට ආදායම් උත්පාදනය කරන්න පුළුවන්. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන සියලු පාසල්වල දරුවන්ට කිරි වීදුරුවක් ලබා දෙන්න පුළුවන්, Ridiyagama NLDB Dairy Farm එක නිසි විධියට පවත්වාගෙන යනවා නම්. ඊට අදාළ වැඩ පිළිවෙළක් සකස් කරන්න අපි බලාපොරොත්තුවෙන් හිටියා. නමුත් අපිට ඒක කරගන්න බැරි වුණා. මම ඔබතුමන්ලාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, රිදියගම ගොවිපළ නිසි ලෙස පවත්වාගෙන යෑමට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. *[බාධා කිරීම්]*

ඊළඟට, අස්වැසුම ප්‍රතිලාභීන් ගැනත් මම කිව යුතුයි. *[බාධා කිරීමක්]* මට සභානායකතුමා බලය පවරා ගියේ, ඕනෑ තරම් වේලාව ගන්නය කියලා. මට එතුමා බලය පවරා ගියේ. *[බාධා කිරීම්]* - කවුරුවත් නැහැ, මට වේලාව දෙන්නය කියලා කිව්වා. *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා,- *[බාධා කිරීමක්]* ගිහිල්ලා වේලාව අරගෙන ආපසු කථා කරන්න.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු ඇමතිතුමනි, අස්වැසුම ප්‍රතිලාභ ලබා දෙනකොට කලින්ම කට්ටිය තෝරා ගත්තා. නමුත් ඒ තුළ දුප්පත් අය සියයට 50ක්වත් නැහැ. ඒ නිසා ගොඩක් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අස්වැසුම ගැන දිගටම කථා කළ නිසා ඒ ගැන මම සඳහන් කළ යුතුයි. මොකද, මෙතෙක් කල්

අස්වැසුම ප්‍රතිලාභ ලබා දී තිබෙන ආකාරයත්, නැවත ඒ සඳහා ඉල්ලුම් කර තිබෙන ඒවා ගැනත් සලකා බලා අදාළ නිර්ණායක - criteria - අනුව නැවත තෝරා ගැනීම් කරන්න අවශ්‍ය කටයුතු කරනවා. ඉදිරි මාස කිහිපය තුළ අපි එම කටයුතු අවසන් කරනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු ඇමතිතුමනි, ග්‍රාම සේවා වසම් මට්ටමින් සිටින අදාළ රාජ්‍ය නිලධාරීන් පස්දෙනාගෙන් සැදුම්ලත් තේරීම් කමිටුවක් මේ සම්බන්ධව වසමෙන් වසමට පත් කරන්න. එතකොට ඒ වසම්වල ඉන්නා දුප්පත් මිනිස්සු ඔක්කෝම තෝරා ගන්න පුළුවන්. මම කියන්නේ ඒකයි. මේ ගැන ඇත්ත කථා කරන්න ඕනෑ.

VAT එක අඩු කරනවා නම් පාරිභෝගික භාණ්ඩවල මිල අඩු වෙනවා. එතකොට ඒ සහනය හැමෝටම ලැබෙනවා නේ. නමුත්, මේ සහනය දුප්පත් මිනිහාට ලැබෙන්නේ නැහැ. කලින් තෝරපු ලැයිස්තුවලට අනුව මේ භාණ්ඩ ටික ලැබෙනවා. සිංහල හා හින්දු අලුත් අවුරුද්දට රුපියල් 5,000ක් වටිනා භාණ්ඩ ටිකක් රුපියල් 2,500කට ලබා දෙනවා කියලා ඔබතුමා ප්‍රකාශ කළා. ඒක හොඳයි. ඒක හොඳ දෙයක්. ඒ සහනය දුප්පත්, අහිංසක මිනිස්සු හැමෝටම ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේක අමාරුම අවස්ථාවක්. ඒ අමාරුම අවස්ථාවේ ඒ ජනතාවට සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් ඒ සහනය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමාගේ යෝජනාවක්.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
අපට වැඩක නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හැමෝටම නොවෙයි. අපි අස්වැසුම ප්‍රතිලාභය ලබා දෙන කට්ටියක් ඉන්නවා නේ. ඒ අස්වැසුම ප්‍රතිලාභය වෙනුවෙන් ලබා දෙන දීමනාවත් අපි වැඩි කළා. අස්වැසුම ප්‍රතිලාභය ලැබෙන්නේ නැති, ඔබතුමා කියන විධියේ අස්වැසුම ප්‍රතිලාභය ඉල්ලන කට්ටියකුත් ඉන්නවා. ඒ ප්‍රමාණය ලක්ෂ 8කට වැඩියි. අන්න, ඒ අයට තමයි අපි මේ සහනය ලබා දෙන්නේ. මොකද, ඒ අයට කීයක්වත් ලැබිලා නැහැ නේ. එම නිසා ඒ අයට මේ සහනය ලබා දෙන්න තමයි ආණ්ඩුව තීරණය කළේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඒ සහනය නොලැබෙන අයටත් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඒක ප්‍රාදේශීය ලේකම් මට්ටමින් ක්‍රියාත්මක කරන්න කියාත් මම ඉල්ලීමක් කරනවා.

දුප්පත්, අහිංසක ජනතාවට සමුපකාරයෙන් විශාල සේවාවක් ඉෂ්ට වෙනවා. ඒ සේවාව ඉෂ්ට කිරීමට කටයුතු කරන්න කියලා ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් සඳහා මිනිත්තුවක කාලයක් පමණයි මම ගන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති පිළිබඳව ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. ඒ සමුපකාර සමිතිවලට අදාළ නිලවරණ පවත්වන්නේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මිසක් ජනතා විමුක්ති පෙරමුණ නොවෙයි. ඒ වාගේම මේ නිලවරණ සියල්ලක්ම සමුපකාර සමිතිවල පවත්වා තිබෙන්නේ මැතිවරණ ප්‍රකාශ වෙන්න පෙර.

විශේෂයෙන්ම එතුමා සඳහන් කරපු වීරකැටිය විවිධ සේවා සමුපකාර සමිතියේ නිලවරණය පැවැත්වූයේ දෙසැම්බර් මාසයේ 29වැනි දා. එහි මහා සභාව පැවැත්වූයේ මාර්තු මාසයේ 16වැනි දා. ඒ වාගේම එතුමා ප්‍රකාශ කළා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩි සමුපකාර ප්‍රමාණයක් සජබය දිනුවා කියලා. නමුත්, ඒ එකක්වත් සජබය දිනුවේ නැහැ. වීරකැටිය, හුංගම, තිස්ස, වලස්මුල්ල විවිධ සේවා සමුපකාර සමිති සියල්ලම මාලිමාව ජයග්‍රහණය කළා. ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ අධ්‍යාපන සමුපකාරය වෙනුවෙන් ඉදිරිපත් වෙන්න කෙනෙක් හිටියේ නැහැ. සියලු කලාප කාර්යාල ජයග්‍රහණය කළේ අපේ කණ්ඩායම. ඒ නිසා මේ බොරු, අවලාද සියල්ලම අපි බැහැර කරනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවත්වපු විවිධ සේවා සමුපකාර සමිතිවල නිලවරණ සියල්ලෙන්ම මාලිමාව ජයග්‍රහණය කරලා තිබෙනවා.

බොහොම ස්තුතියි.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මැතිවරණ කොමිෂන් සභාවේ,- *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා.

ගරු දිලිප් වෙදආරච්-චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
"පළාත් පාලන ආයතන ඡන්ද විමසීමෙන් පසුව සමුපකාර සමිතිවලට අදාළ නිලවරණ පැවැත්වීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි" කියලා ඒ ලිපියේ සඳහන් වෙනවා. ඒ නිසා නිලවරණයක්වත් පවත්වන්න බැහැ. රැස්වීමක්වත් පවත්වන්න බැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ කොමිසමට ඒ ගැන පැමිණිලි කරන්න කෝ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට එහෙම කරන්න වැඩක් නැහැ. මැතිවරණ කොමිසමට පැමිණිලි කරන්න නොවෙයි, ඔබතුමන්ලා කරන දුෂණ මම මේ ගරු සභාවට ඇවිල්ලා කථා කරන්න එපායැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
පාර්ලිමේන්තුවට ඒ පැමිණිලි ඉදිරිපත් කරන්න බැහැ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
පාර්ලිමේන්තුවේදී මේවා ඉදිරිපත් කරන්නේ නැත්නම් අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා වැඩක් නැහැ නේ. අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට කරපු දුෂණ, හොරකම් ගැන මම මේ කියන්නේ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්නේ නැතිව වෙන කොහේද මේවා කියන්නේ?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
බොරු නේ කියන්නේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මොන බොරුවක්ද? මම බොරු කියන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.ජී. විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක් තිබෙනවා.

[අ.භා. 4.48]

ගරු ආර්.ජී. විජේරත්න මහතා
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජන ජීවිතයට බොහෝ සෙයින් බලපාන වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධයෙන් පැවැත්වෙන අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවසරයි.

අද උදේ අපේ ගරු ඇමතිතුමා සඳහන් කළා, මේ අමාත්‍යාංශයට අයත් වන ආයතන පිළිබඳව. මේ අමාත්‍යාංශයට අයත් වන ආයතන 15ක් තිබෙනවා. සමහර ආයතන ගත්තාම, ඇත්තටම ඒවා නමට පමණක් සීමා වෙච්ච ආයතන. උදාහරණයක් විධියට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ගනිමු. ඒකේ ක්‍රියාවලිය මොකක්ද කියලා ගත්තොත්, ගොඩනැඟිලි කිහිපයක් බදු දීම පමණයි සිදු වෙන්නේ. එවැනි නිෂ්ක්‍රිය ආයතන බොහොමයක් තිබියදී, විශේෂයෙන් ගොවි ජනතාවගේ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වන ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන පිළිබඳව මට ලැබී තිබෙන මේ සීමිත කාලය තුළ අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නයි මම බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන් පසුගිය අවුරුදු 20ක වාගේ කාලය ඇතුළත ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන 18ක් පමණ ඉදි කරලා තිබෙනවා. ඇත්තටම මෙයින් යන්තමින් හෝ ක්‍රියාත්මක වෙන්නේ ආර්ථික මධ්‍යස්ථාන 14ක් පමණයි. ආර්ථික මධ්‍යස්ථාන 4ක් අදටත් සක්‍රිය තත්ත්වයේ නැහැ. ඒ ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවද්දී අරමුණු සඳහන් කරලා තිබුණා. ඇත්තටම ඒවා ඉතාම හොඳ අරමුණු. මොනවාද ඒ අරමුණු? එකක් තමයි, කෘෂිකාර්මික සහ ආහාර නොවන නිෂ්පාදන සඳහා ඒ නිෂ්පාදකයන්ට සාධාරණ මිලක් ලබා දීම. ඒ අරමුණ හොඳයි. ඒ වාගේම ප්‍රාදේශීය වශයෙන් අළෙවිකරණ ක්‍රියාවලිය කර ගැනීමට නොහැකිව සිටින නිෂ්පාදකයන් වෙනුවෙන් අළෙවිකරණ පහසුකම් සැලසීම. ඒ අරමුණත් හොඳයි. ඊළඟට, දිවයින පුරා ශක්තිමත් බෙදා හැරීමේ ජාලයක් ක්‍රියාත්මක කිරීම. අවසාන වශයෙන්, දැරිය හැකි මිලකට පාරිභෝගිකයන්ට භාණ්ඩ මිලදී ගැනීමේ අවස්ථාව සලසා දීම. ඇත්තටම ඒ අරමුණු සියල්ල ඉතාම හොඳයි. එහෙත් පසුගිය කාලය තුළ ඒ ආර්ථික මධ්‍යස්ථානවලින් එවැනි අරමුණු සාක්ෂාත් වුණාද කියන එක පිළිබඳව විමසා බලන්න අපි මේ මොහොත යොදා ගනිමු.

මම මුලින්ම කිව්වා, ආර්ථික මධ්‍යස්ථාන 4ක් ක්‍රියාත්මක තත්ත්වයේ නැහැ කියලා. එහෙත් ඒ ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම වෙනුවෙන් මොන තරම් ධනයක් වැය කර තිබෙනවාද? උදාහරණයක් ගත්තොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික මධ්‍යස්ථාන 3ක් සඳහා වැය කරපු මුදල් සම්බන්ධ විස්තර මා සතුව තිබෙනවා. යාපනය ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් දහනවකෝටි අසූඅටලක්ෂ දහදහස්හාරසියවිසිහතක මුදලක් වැය වෙලා තිබෙනවා. වවුනියාව ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් විසිනවකෝටි දහසයලක්ෂ හතළිස්දහසක මුදලක් වැය වෙලා තිබෙනවා. ඒ වාගේම කිලිනොච්චිය ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් එකොළොස්කෝටි හතළිස්හයලක්ෂ දෙදහස්දෙසියහැත්තෑනවයක් වැය වෙලා තිබෙනවා. මේ ආර්ථික මධ්‍යස්ථාන 3 ඉදිකිරීම වෙනුවෙන් පමණක් රුපියල් කෝටි 50ක පමණ ධනස්කන්ධයක් වියදම් කරලා තිබෙනවා. මොන තරම් විනාශයක්ද? මේ කිසිවක් අද සක්‍රිය තත්ත්වයේ නැහැ. ඒ නිසා අපට පෙනෙන්න තිබෙන්නේ, ඒ ආර්ථික මධ්‍යස්ථාන බිහි කිරීමේ සැබෑ අරමුණු සාක්ෂාත් වෙලා නැහැ කියන එකයි.

ඒ වාගේම යම් තරමකින් හෝ ක්‍රියාත්මක වන ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය පිළිබඳව අපි මදක් විමසා බලමු. මා නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙනවා, ආර්ථික මධ්‍යස්ථානයක්. ඒ ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 138ක් ඉදි කරලා තිබෙනවා. එහෙත් කෘෂිකාර්මික තොග වෙළඳාම් පවත්වන කඩ තිබෙන්නේ 15ක් පමණයි. එහෙම නැත්නම් ව්‍යාපාරිකයෝ 15දෙනෙකු පමණයි ඉන්නේ. ඒ නිසා ඒ ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීමේ අරමුණ ඉෂ්ට වෙලා නැහැ. ඒ විතරක් නොවෙයි, නුවරඑළිය අවට කඳපොළ, මීපිළිමාන, ශාන්තිපුර වැනි ප්‍රදේශවල දිනකට එළවලු කිලෝ ලක්ෂ 6ක් පමණ නිෂ්පාදනය වෙනවා. එහෙත් ඒ ආර්ථික මධ්‍යස්ථානය හරහා මිලදී ගන්නේ කිලෝ 120,000කට ආසන්න එළවලු ප්‍රමාණයක් පමණයි. ඒ කියන්නේ, මුළු නිෂ්පාදනයෙන් සියයට 20ක් පමණයි ආර්ථික මධ්‍යස්ථානය හරහා මිලදී ගැනීම සිද්ධ වන්නේ. ඉතිරි සියයට 80ම ආර්ථික ක්‍රියාවලිය සිද්ධ වන්නේ, වෙනත් පෞද්ගලික වෙළඳුන් හරහායි. ඒ විතරක් නොවෙයි, මෙහි කිසිදු මිල නියාමනයක් සිද්ධ වන්නේ නැහැ. විශේෂයෙන් නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයේ සිටින, මම සඳහන් කළ ව්‍යාපාරිකයන් 15දෙනා ඔවුන්ට කැමැති මිලක් උදේට ප්‍රකාශයට පත් කරනවා. ඒ මධ්‍යස්ථානයේ කළමනාකාරතුමා විසින් ඔවුන්ගේ මිල ගණන් සියල්ල අරගෙන සාමාන්‍ය අගයක් ප්‍රකාශයට පත් කරලා එළවලු කිලෝවක මිල තීන්දු කරනවා. ඔබ අපි කවුරුත් දන්නවා, යම් නිෂ්පාදන භාණ්ඩයක් වෙනුවෙන් මිල තීරණය කරන්න ඕනෑ ඒ නිෂ්පාදකයා විසින් බව. ඒ සඳහා වැය වෙච්ච අමුද්‍රව්‍ය, ශ්‍රම ශක්තිය ඒ සියල්ල වෙනුවෙන් ගණනය කරලා තමයි මිල තීන්දු කරන්න ඕනෑ. එහෙත් ගොවියාට තමන්ගේ නිෂ්පාදනය වෙනුවෙන් මිල තීන්දු කිරීමේ අයිතිය අද නැති වෙලා තිබෙනවා. ඒක මොන තරම් අසාධාරණයක්ද? ඒ විතරක් නොවෙයි, ඒ ආර්ථික මධ්‍යස්ථාන පවත්වාගෙන යන්නේ කළමනාකාර භාරයක් -management trust- හරහායි. ඒ කළමනාකාර භාරවල අතිවිශාල මුදල් සම්භාරයක් තිබෙනවා. උදාහරණයක් හැටියට නුවරඑළියේ රුපියල් දහහතරකෝටි තිස්පන්ලක්ෂයක පමණ අරමුදලක් තිබෙනවා. ඒ අරමුදල පාවිච්චි

කරලා ඒ ආර්ථික මධ්‍යස්ථානය වැඩිදියුණු කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ඔවුන්ට නිසි නියාමනයක් නැහැ. එහෙම නම් මේ ආර්ථික මධ්‍යස්ථාන ඵලදායී විධියට යොදා ගැනීම වෙනුවෙන් අපි කටයුතු කළ යුත්තේ කොහොමද? පළමු කාරණය හැටියට, රට පුරා ශක්තිමත් බෙදා හැරීමේ ජාලයක් ක්‍රියාත්මක කර ගන්න ඕනෑ. ඒ නිසා වෙළෙඳ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව පමණක් නොවෙයි, අනෙකුත් අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කරලා, රට පුරා ශක්තිමත් බෙදා හැරීමේ ජාලයක් ආරම්භ කරන්න මේ වර්ෂය තුළ අපි කටයුතු කරමින් පවතිනවා.

විශේෂයෙන් එළවලු වගාවේ පසු අස්වනු හානිය ගැනත් කියන්න ඕනෑ. නිෂ්පාදනයෙන් සියයට 30කට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රවාහනයේදී විනාශයට ලක් වනවා. එම නිසා නූතන විද්‍යාත්මක ක්‍රම භාවිත කරමින් ප්‍රවාහනය සඳහා සහ ඇසුරුම් සඳහා නිසි කළමනාකරණයක් කරන්න, ඒ සඳහා වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන්න අපි මේ වසර තුළදී බලාපොරොත්තු වනවා.

ඒ වාගේම තමයි මා මුලින් සඳහන් කරපු කළමනාකාර භාරවල අරමුදල් විනිවිදභාවයකින් පාවිච්චි කරනවාද කියන කාරණය පිළිබඳව සොයා බැලීම සඳහා වෙළෙඳ අමාත්‍යාංශය හා අනුබද්ධිත විශේෂ ඒකකයක් පිහිටුවීමටත් මෙම වසරේදී අපි බලාපොරොත්තු වෙනවා. රට පුරා ඇති බෙදා හැරීමේ ජාලය ශක්තිමත් කරමින් අපි මුලින් සඳහන් කරපු ඒ ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ සැබෑ අරමුණ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ගොවියාට සාධාරණ මිලක්, ඒ වාගේම පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට මිලදී ගැනීමේ හැකියාව ලබා දීම වෙනුවෙන් කටයුතු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ මේ වසර පුරා යෝජනා සැලසුම් රාශියක් අපි ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වෙනුවෙන් සියලුදෙනාම අත්වැල් බැඳගන්න කියන ආයාචනය කරමින්, මම නවතිනවා.

මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අදුත්තු, கௌரவ එම්. නිසාම් කාරියප්පර් අවර්කළ්! උංකළුක්කු 10 නිමිටංකළ් උණ්ටු.

[අ.භා. 4.58]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිනිත්තු 10න් මිනිත්තු 3ක් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ලබා දෙන්න. මගේ කාලය මිනිත්තු 7කට සීමා කර ගන්නවා. මේක පොඩි deal එකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට පෙර පොඩි කථාවක් කියන්න අවසර ඉල්ලා සිටිනවා. අද සුබ දවසක්. මම ගගනගාමීන් පිළිබඳ සෑහෙන ඇල්මක් දක්වන පුද්ගලයෙක්. ඊයේ රෑ තිස්සේ ඉඳලා අද උදේ දක්වා මම අපේ වීර කාන්තාවක් වන සුනීතා විලියම්ස් සහ බුච් විල්මෝර් දෙදෙනාගේ පැමිණීම බලාගෙන හිටියා. ඇත්තෙන්ම පුදුම සන්තෝෂයි, ආඩම්බරයි. ඒ වීර කාන්තාව සතියකට ගියේ. මාස නවයක් එතැන හිර වෙලා රැඳිලා හිටියා. මට මතකයි, "Gravity" කියලා film එකක් ආවා. එය අභ්‍යාකාශයේ අතරමං වුණු ගගනගාමී වීර කාන්තාවකගේ කථාවක්. නමුත් මේ සිදුවීම අපි ඇසින්ම දුටුවා. ඇයට අපේ ප්‍රශංසාවත්, ඇය බේරාගෙන ඒම සම්බන්ධයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයටත් මගේ සුබ පැතුම් පිරිනමනවා. Actually, I wish Sunita Williams and her colleague a speedy recovery from any health issues that they might face since they had to spend nine months in space.

දෙවන සන්තෝෂම කාරණය තමයි, අද පාර්ලිමේන්තුව ආරම්භයේදී ගරු කථානායකතුමා විශේෂ තීන්දුවක් දුන්නා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වනවා. කා සමඟවත් මගේ පෞද්ගලික තරහක් නැහැ. නමුත්, පාර්ලිමේන්තුවේ ගරුත්වය රැකීම සඳහා එතුමා තීන්දුවක් දුන්නා. ඒ, අපේ ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා සම්බන්ධයෙන්. මම විශ්වාස කරනවා එතුමා නැවත පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපට මේ ලැබෙන වරප්‍රසාදය, එහෙම නැත්නම් ටීවී එකට වන exposure එක නිවැරදිව භාවිත කරයි කියලා. විශේෂයෙන් ජනතාව අතර වෛරී තත්ත්වයක් මතු නොකරන්න කටයුතු කරයි කියලා. මොකද, එය ඉතා වැදගත්. Easter Sunday attack එකට පස්සේ අපි බොහොම අමාරුවෙන් බේරිලා ඉන්න ගමන් එවැනි තත්ත්වයක් නැවත මතු වෙන්න හොඳ නැහැ. මම මුලින්ම ඔය ප්‍රශ්නය ඉදිරිපත් කළා. ඉන්පසුව විශේෂයෙන්ම ගරු සභානායකතුමාත් කාරණාවක් ඉදිරිපත් කළා. ඒ සියල්ල ගොනු කරලා ලස්සනට ස්ථාවර නියෝග යටතේ ගරු කථානායකතුමා නීත්‍යානුකූලව දෙන ලද ඒ නියෝගය අපි පිළිගන්නවා. ඒ පිළිබඳව අපේ ප්‍රශංසාව ගරු කථානායකතුමාට පිරිනමනවා. ඒ වාගේම, අපි බලාපොරොත්තු වෙනවා, ඒ බාධා පැනවීම හරහා ඒ ගරු මන්ත්‍රීතුමාත් එතුමාගේ ක්‍රියා කලාපය වෙනස් කරගෙන කටයුතු කරගෙන යාවි කියලා.

තුන්වැනි සුබ ආරංචිය තමයි, අපේ හිටපු පොලිස්පතිතුමා භාර වෙලා තිබෙනවාය කියන එක. එතුමා අත් අඩංගුවට ගත්තේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න හැදුවේ මෙකයි. වරෙන්තු නිකුත් කරලා තිබෙන සැකකරුවෙකු පොලීසිය අත් අඩංගුවට ගන්න යන කොට සිද්ධ වන දේ සම්බන්ධ කථාව මම කලින් කිව්වා. මේ කථාව අම්පාරේ මගේ මිත්‍රවරුන් දන්නවා. මමත් මහාධිකරණයේ කටයුතු කර තිබෙනවා. සැකකරු එක්කර ගෙන එන්න කියලා, පොලිස් සැරයන්ට වේලපහ කියනවා නේ. ඒ මනුස්සයා ටක් ගාලා message එක දෙනවා, OICට. අපි ඇතුළේ බලාගෙන ඉන්නවා, motion එක දාලා surrender කරලා කියක් හරි හොයාගන්න. නමුත්, ගේට්ටුව ළඟදී ඒ මිනිහා අල්ලාගෙන, ආපහු පොලීසියට එක්කරගෙන ගිහිල්ලා, වටේ ගිහිල්ලා, "සොයා ගත්තා, අල්ලා ගත්තා" කියලා, වරෙන්තුවට අදාළව උසාවියට ඉදිරිපත් කරලා, ඇප දෙනවාටත් විරුද්ධ වෙනවා.

හැබැයි, හිටපු පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහත්මයාගේ නම් වාසනාව. එතුමාට එහෙම මොකුත් වුණේ නැහැ. එතුමා බොහොම හොඳට, කිසි ප්‍රශ්නයක් නැතුව මාතර උසාවියට ගිහිල්ලා ඉදගෙන හිටියා. ඒකේ හොඳක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ මොකක්ද දන්නවා ද? එතුමාට විතරක් නොවෙයි, මේ රටේ ඉන්න සියලු සැකකරුවන්ට, අධිකරණයට භාර වීම සඳහා බාධාවක් නැතුව එන්න පොලීසිය අවස්ථාව සලසා දෙන්න ඕනෑ. ඒ අවස්ථාව තිබිය යුත්තේ එතුමාට විතරක් නොවෙයි. අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් දැන් මේ සභාවේ ඉන්නවා. මීට පස්සේ අපි අධිකරණයට එවැනි ඉදිරිපත් කිරීම් කරන කොට අපට කියන්න පුළුවන්, හිටපු පොලිස්පති දේශබන්දු මූලධර්මයට අනුව අපේ සැකකරුවන් ද අතර මහදී අල්ලන්නේ නැතුව, අධිකරණයට ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

ගරු ඇමතිතුමනි, ඒ කාරණා ටික කියලා, ඔබතුමාගේ අමාත්‍යාංශය පිළිබඳ පොඩි කාරණයක් විතරක් කියන්න මම කැමැත්තෙන් සිටිනවා. ඒ, වාලච්චේන කඩදාසි කම්හල

[ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා]

සම්බන්ධවයි. මේ කාරණය පිළිබඳව මම හරියටම දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඇමතිතුමා දන්නවා ඇති, නැඟෙනහිර පළාතේ පිහිටි වාලච්චේන කඩදාසි කම්හල ගැන.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் 2 நிமிடங்களே இருக்கின்றன.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
All right. Two minutes தாராளமாகப் போதும்.

කුඹුරු කරන ගොවීන්ටත් සහනයක් දෙන්න ඕනෑ, වෙළෙඳ පොළත් යහපත්ව පවත්වාගෙන යන්න ඕනෑ, පාරිභෝගිකයාත් බලා ගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන ලොකුම ප්‍රශ්නය ඒක නේ.

අපේ පැත්තේ ගොයම් කපලා, අස්වනු නෙළුවාට පස්සේ පිදුරු ලැබෙනවා නේ. ඒ දවස්වල ඒ පිදුරු එකතු කරන්න වෙනම මධ්‍යස්ථාන තිබුණා. එතැන ඉඳන් ඒ පිදුරු වාලච්චේනට යැවිවා. විදේශිකයන් ඇවිල්ලා අපේ රටේ වාලච්චේන කඩදාසි කම්හල එතැන ආරම්භ කළේ, කඩදාසි හදා ගන්න අවශ්‍ය අමු ද්‍රව්‍ය එතැන තිබුණු නිසා. නමුත්, මට දැන් කියනවා, පිදුරුවලින් කඩදාසි සෑදීමේ යන්ත්‍රයේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒ ගොල්ලන් දැන් පාවිච්චි කරන්නේ, old papers for recycling. ඒ කියන්නේ, පරණ කඩදාසි ප්‍රතිචක්‍රීකරණය සඳහා විතරයි පාවිච්චි කරන්නේ. ඒ පිළිබඳව පොඩ්ඩක් සොයා බලන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ වැය ශීර්ෂය දැක්කාම මට නම් හරියට දුක හිතුණා. බලන්න කෝ, ඔබතුමාට Recurrent Expenditure, Rs. 2,167,000,000යි, Capital Expenditure, Rs. 397,000,000 යි. මොන අසාධාරණයක්ද? ඔබතුමාට ඒකෙන් දෙන්න වෙනවා for modernization of the Hingurakgoda rice mill, රුපියල් මිලියන 125ක්. ඒක දුන්නාට පස්සේ, වාලච්චේන කඩදාසි කම්හලට මොකුත් නැහැ. මම කියන්නේ, එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම් එය විසඳලා, එය නැවත සාමාන්‍ය පරිදි ක්‍රියා කරන තත්ත්වයට ගෙන එන්න උත්සාහ කරන්න කියලායි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒක මට නොවෙයි අයිති වෙන්නේ. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට තමයි වාලච්චේන කඩදාසි කම්හල අයත් වෙන්නේ.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
එහෙම නම්, ඒ පිළිබඳව මම සමාව ඉල්ලා සිටිනවා. මම බැලුවේ, ඒ ප්‍රශ්නය පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරන්නයි. හැබැයි, ඒක හරිම වැදගත් දෙයක්. මොකද, ඒක කුඹුරයි, කඩදාසි කම්හලයි එකට බැඳී තිබෙන දෙයක්. ගරු ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන් නම්, ගරු කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිතුමාට ඒ පිළිබඳව දැනුම් දෙන්න.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 23ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගැනෙන්නේ, වැදගත් අමාත්‍යාංශයක් වන, අපේ ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවයි.

මම මෙහිදී කරුණු කිහිපයක් මතු කරන්න කැමැතියි. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය ගැන මම පළමුවෙන්ම කියන්න ඕනෑ. මා හිතන්නේ ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට එන ආයතනයක්. ඒ ආයතනය සම්බන්ධව බරපතළ ගැටලු ගණනාවක් දැන් මතු වෙලා තිබෙනවා. SLIM එකට අදාළ 1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සමාලෝචනය කිරීම තමයි, මූලික වශයෙන් මගේ බලාපොරොත්තුව වෙන්නේ. එම පනතේ 4වැනි වගන්තිය අනුව, එහි මූලික කාර්යභාරය හැටියට සඳහන් කර තිබෙනවා, විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල අලෙවිකරණ අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම සහ සහාය වීම කියන කාරණය.

එම වගන්තියේ තුන්වැනි කාරණය විධියට "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත පිළිගත් විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟතාවෙන් පමණක් විභාග පැවැත්වීම සහ සහතික හෝ ඩිප්ලෝමා නිකුත් කිරීම" යනුවෙන් සඳහන් වෙනවා. හැබැයි, මේකෙන් පැහැදිලි වන ප්‍රධාන කාරණය තමයි, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයට අධ්‍යාපන සුදුසුකම් ස්වාධීනව පිරිනැමීමට කිසිදු නීතිමය බලයක් නැහැ කියන එක. ඒ වාගේම, සහතික සහ ඩිප්ලෝමාවල වලංගුභාවය පිළිබඳවත් බරපතළ ගැටලුවක් මතු කරනවා. මොකද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙනුත්, විදේශ විශ්වවිද්‍යාලවලිනුත් මේ certificate එක පිළිගන්න බැරි තැනකට තල්ලු වෙලා තිබෙනවා. වසර 50කට වැඩි කාලයක්, දහස් ගණනක් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, උපාධිධාරීන් මෙම සුදුසුකම් ලබා ගැනීම සඳහා මුදල් වැය කරලා තිබෙනවා; කාලය වැය කරලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, 1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා නීතිමය වශයෙන් පුළුල් සමාලෝචනයක් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒක හරියට සිද්ධ වෙලා නැත්නම් සිසුන්ගේ සහ උපාධිධාරීන්ගේ සුදුසුකම් වලංගු කර ඒ අය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් අනාගතයේදී අනිවාර්යයෙන් සකස් කරන්න කියාත් මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම, අධ්‍යාපන ආයතනවලට සහ සිසුන්ට අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම එක්ක සාකච්ඡා කරලා මෙම ගැටලුව සම්බන්ධයෙන් පැහැදිලි මඟ පෙන්වීමක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියාත් මම ඉල්ලා සිටිනවා. ගරු වෙළෙඳ ඇමතිතුමනි, ඔබතුමාට නොවෙයි කිව්වේ. නමුත් මම හිතුවා, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය කිව්වාම ඔබතුමාගේ අමාත්‍යාංශයට එන එකක් කියලා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ ගැන අවධානය යොමු කරලා අදාළ ඇමතිවරයෙකුට යොමු කරන්නම්. නමුත්, ඒක මගේ අමාත්‍යාංශයට අයිති නැහැ තවම. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, ඊළඟට ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ කාරණා ගැන කියන්න තමයි මේ හදන්නේ. අද සීනි පිළිබඳ විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේක වැදගත් වන හේතුව මේකයි. විශේෂයෙන්ම අපේ රටේ සුදු සීනි සහ දුඹුරු සීනි පිළිබඳව විශාල අර්බුදයක් දැන් මතු වෙලා තිබෙනවා. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත ප්‍රකාර රජයේ නියෝගයට අනුව, එහි දෙවැනි වගන්තිය යටතේ සුදු සීනි අත්‍යවශ්‍ය භාණ්ඩයක් ලෙස නම් කරලා තිබෙනවා. ඒක VATවලින් සහ SSCLවලින් බැහැර කරලා තිබෙනවා. ඒ අනුව කිලෝග්‍රෑමයකට රුපියල් 50ක වෙළෙඳ භාණ්ඩ බද්දක් තමයි සුදු සීනිවලින් අය කර ගන්නේ. නමුත් දුඹුරු සීනි ගත්තාම, ඒක අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයක් විධියට සලකා තිබෙනවා. ඒකට සියයට 2.5ක SSCL බද්දක් වැටෙනවා; සියයට 18ක VAT එකක් අය කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාම දන්නවා, මේ අනුව ගත්තාම සුදු සීනි සහ දුඹුරු සීනි මිල අතර අතිවිශාල පරතරයක් දැන් ඇති වෙලා තිබෙන බව. ඔබතුමන්ලා පසුගිය කාලයේම කථා කළේ දුඹුරු සීනිවලට මේ රට පුරුදු කළ යුතුයි කියන කාරණයයි. මෙතැන අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්න නිසායි මම මේක කියන්නේ. මේ පිළිබඳව විශේෂයෙන් කල්පනා කරලා බලන්න.

මිල පැත්තෙන් ගත්තාම, අද විදේශ රටවලින් ගේන සුදු සීනිවල සහ ලංකාවේ දුඹුරු සීනි අතර විශාල පරතරයක් තිබෙනවා. හැබැයි අනෙක් අතට, හැමකෙනාම කියන්නේ දුඹුරු සීනි පාවිච්චියට ගන්න කියන කාරණයයි. විශේෂයෙන්ම ස්ප්‍රිතු හදන්න molasses යොදා ගන්නවා. Molasses කියන්නේ සීනි නිෂ්පාදනයේ අතුරු නිෂ්පාදනයක්. ඒක පරිසරයට මුදා හරින්න බැහැ. මොකද, පරිසර ගැටලු ඇති වෙන නිසා. ඒ වාගේම, සීනි නිෂ්පාදනයෙන් ජනනය වන molasses ස්ප්‍රිතු සැදීම සඳහා භාවිත කරන්නම ඕනෑ. දැන් වෙලා තිබෙන දේ මේකයි. උක් වගාව ආශ්‍රිතව සීනි නිෂ්පාදනය පමණක් සිදු කරලා හරි යන්නේ නැහැ. සීනි නිෂ්පාදනයේ අතුරු නිෂ්පාදනයක් වන molasses යොදාගෙන අනිවාර්යයෙන් ස්ප්‍රිතු නිපදවන්න ඕනෑ. ඒ නිසාම දැන් සිදු වෙලා තිබෙන දේ තමයි, ස්ප්‍රිතු නිෂ්පාදනය කරන්න දැන් විශාල වශයෙන් බඩ ඉරිහු ගෙන්වීම. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ලංකාවේ නිෂ්පාදනය කරන බඩ ඉරිහු ප්‍රමාණය ගත්තාම, ලංකාවේ කුකුල් කෑම නිෂ්පාදනයට අවශ්‍ය කරන ප්‍රධානම සංඝටකය ලෙස පාවිච්චි කරන්නේ බඩ ඉරිහු බව. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් බඩ ඉරිහු පාවිච්චි කරනවා, ස්ප්‍රිතු නිෂ්පාදනය කරන්න, බියර් හදන්න. ඒවා නිෂ්පාදනයට දැන් විශේෂයෙන්ම බඩ ඉරිහු පාවිච්චි කරනවා. ඒ නිසා මොකද වෙලා තිබෙන්නේ? බඩ ඉරිහුවල නිෂ්පාදන වියදම කොයි තරම් ප්‍රමාණයක් වුණත්, ලංකාවේ නිපදවන ප්‍රමාණය අඩු වීම නිසා බඩ ඉරිහු විශාල වශයෙන් පිටරටින් ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙනවා. Molasses භාවිතයෙන් ස්ප්‍රිතු නිෂ්පාදනය කරන කර්මාන්ත තිබෙන්නේ ඌව සහ නැගෙනහිර ප්‍රදේශවල. හැබැයි, බඩ ඉරිහුවලින් ස්ප්‍රිතු නිෂ්පාදනය කරන ආයතන තිබෙන්නේ කොළඹ සහ අවට ප්‍රදේශවල. ඒ නිසා දැන් මොකද වෙලා තිබෙන්නේ? අද මේ ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා molasses පාවිච්චි කිරීම වෙනුවට ත්‍රිපෝෂ නිෂ්පාදනයට ගන්නා බඩ ඉරිහු පාවිච්චි කරන නිසා, කුකුළු ආහාර නිෂ්පාදනය, කුඩා දරුවන්ගේ ආහාර නිෂ්පාදනය විශාල අර්බුදයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රමාණවත් තරම් බඩ ඉරිහු නැතිවීමේ ප්‍රතිඵලය මත විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අද මොකද වෙලා තිබෙන්නේ? කුකුළු ආහාර නිෂ්පාදන වියදම වැඩි වෙලා තිබෙනවා. ලංකාවේ නිෂ්පාදනය වන බඩ ඉරිහු ප්‍රමාණය මදි නිසා විශේෂයෙන් පිට රටින් බඩ ඉරිහු ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ නිසා විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1980 ජූලි 17වෙනි දා සහතික කරන ලද 1980 අංක 26 දරන ආහාර පනතේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා,"සෞඛ්‍යයට අහිතකර වන ස්වාභාවික හෝ එකතු කරන ලද හානිකර ද්‍රව්‍යයක් අඩංගු කිසිදු ආහාරයක් පුද්ගලයෙක් විසින් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදා හැරීම නොකළ යුතු බව." ඒ අනුව පැහැදිලිව මම කියන්න කැමැතියි, molassesවලින් ස්ප්‍රිතු නිෂ්පාදනය කරන එක පැත්තකින් තියලා ඒ සඳහා බඩ ඉරිහු පාවිච්චි කිරීම නිසා විශාල අර්බුදයක් ඇති වෙන්න පුළුවන් බව. ඒ නිසා මම ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලනවා, අපේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් එක්කත් ඒ ගැන සාකච්ඡා කරන්න කියලා. විශේෂයෙන් ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්න නිසා එතුමා එක්කත් සාකච්ඡා කරලා මේ සඳහා නිවැරදි තීන්දුවක් ගන්න. මොකද, රතු සීනි මේ රටේ භාවිත කිරීම වැඩි කිරීම වැදගත්. සීනි හදන හැම උක් කර්මාන්තශාලාවකම Molasses තිබෙනවා. නමුත් අද මේවා විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඒවා පාවිච්චි කරන්න, විදේශවලින් සීනි ආනයනය කරන්නේ නැතුව. ඒ වාගේම ලංකාවේ දුඹුරු සීනි පරිභෝජනය පුරුදු කරන වැඩපිළිවෙළක් හදන්න. විශේෂයෙන්ම ගරු ඇමතිතුමා, ඔබතුමා යටතේ 450ක් විතර තිබෙන සතොස අළෙවි සැල් හරහා අඩු මිලට ලබා දීලා මිනිස්සුන්ට දුඹුරු සීනි පුරුදු කරන වැඩ පිළිවෙළක් හදන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. මොකද, අපනයනය සම්බන්ධයෙන් ගත්තාම, ඔබතුමා Minister of Trade විධියටත් වැඩ කරනවා. ලංකාවට අතිවිශාල අපනයන ආදායමක් ලැබිලා තිබෙන්නේ පොල් නිෂ්පාදන හරහා. පොල් නිෂ්පාදනයෙන් ඩොලර් මිලියන 850ක පමණ ආදායමක් ලබනවා. ඒගොල්ලන්ගේ වැඩ පිළිවෙළ තිබෙන්නේ ඩොලර් බිලියන 1.5කට යන්න, පොල් ආශ්‍රිත නිෂ්පාදන තුළින්. මේක ඔබතුමාට විතරක් අයිති කාරණයක් නොවෙයි, වැවිලි කර්මාන්ත ඇමතිතුමාත්, කර්මාන්ත ඇමතිතුමාත්, ඔබතුමාත් යන තුන්ගොල්ලම එකතු වෙලා කථා කරන්න ඕනෑ කාරණයක්. ඒ නිසා ඩොලර් බිලියන 1.5ට මේ කර්මාන්තය ගෙන යන්න නම්, ඇත්ත වශයෙන් ලංකාවේ මේ තිබෙන පොල් ලෙලි ප්‍රමාණය මදි. පොල් පර්යේෂණ ආයතනය තමයි මේ සම්පූර්ණ විනාශය කරන්නේ. මොකද, මේ ගොල්ලන් එක දවසකට කියනවා, පොල්වලින් ඩොලර් මිලියන 850ක ආදායමක් එනවා කියලා. ඒ වාගේම කියනවා, මේ පාර පොල්වලින් මිලියන 1,200ක ආදායමක් එනවා කියලා. ඒ වාගේම කියනවා, ලබන පාර පොල් ගෙඩි බිලියන 3ක් හැදෙනවා කියලා. නමුත් ඔන්න ආපසු ඒ ගණන අඩු වෙනවා කියනවා. දැන් ගෙඩි බිලියන 4.5ක් හැටියට ඒක කියනවා. නමුත් මේවා එහෙම පිටින්ම බොරු. මොකක්ද, මේ නිසා වෙන්නේ? මේ නිසා වෙන්නේ සම්පූර්ණයෙන් මේ කර්මාන්තය විනාශ වීමයි. මේ රටේ forward transactions කරලා තිබෙන කට්ටිය, අනාගතයේ පොල් නිෂ්පාදන දෙන්න හදන කට්ටියට, ඒ කොහු බත් වෙන්න පුළුවන්, පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වෙන්න පුළුවන්, නමුත් ඔවුන්ට මේ නිෂ්පාදන දෙන්න විධියක් නැහැ. මොකද, පොල් පර්යේෂණ ආයතනය, විශාල ගණනක් දෙන්න පුළුවන් කිව්වාට ඇත්ත වශයෙන් කරන්න බැරි තැනට දැන් මේ කර්මාන්තය පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම කියන්න කැමැතියි, විශේෂයෙන් මේ අමාත්‍යාංශ තුන -ඔබතුමාගේ අමාත්‍යාංශයත්, කර්මාන්ත අමාත්‍යාංශයත්, ඒ වාගේම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත් කියන තුන් ගොල්ලම- එකතු වෙලා සාකච්ඡා කරලා කරුණාකරලා ලංකාවට පොල් ලෙලි ගෙන්වන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. මේක ලොකු ප්‍රශ්නයක් නොවෙයි.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

National Plant Quarantine Service එක මේකට කැමැතියි. ඔබතුමන්ලා කල්පනා කරන්න ඕනෑ, ලෝකයේ අනික් රටවල් ගැන. ඔබතුමා දන්නවා, Thailandවල විශාල වශයෙන් මේවා අපනයනය කරන බව. හැබැයි, ඉන්දුනීසියාවෙන් ගෙනැල්ලා; පිලිපීනයෙන් ගෙනැල්ලා. ඒ රටවල්වලට එහෙම කරන්න පුළුවන් නම්, ලංකාවට මොකක්ද තිබෙන ප්‍රශ්නය? හැබැයි, මේ සම්බන්ධව අඩුම තරමින් තාක්ෂණය ගැනත්, මොකක්ද මේ තිබෙන ප්‍රශ්නය කියලාවත් මේ අයට පහදා දෙන්න. කරුණාකරලා පොල් පර්යේෂණ ආයතනයේ නිලධාරින්ට ටිකට් එකක් දීලා මේ රටවලට යවන්න. Thailandවලට යවන්න, Philippinesවලට යවන්න, Indonesiaවලට යවන්න කොහොමද මේ රටවල් මේවා හදන්නේ කියලා බලන්න. මේවා ගැන දන්නේ නැතුව, මේ අය මේ කටයුතු නතර කිරීමේ වැඩ පිළිවෙළ තමයි ක්‍රියාත්මක කරන්නේ. මතක තියා ගන්න, ඔබතුමන්ලා වැඩ පිළිවෙළක් සකස් කරනවා ලබන අවුරුද්ද වෙනකොට බිලියන 19ක අපනයන ආර්ථිකයකට යන්න. බිලියන 19ක අපනයන ආර්ථිකයක් හදන්නේ කොහොමද පොල් පර්යේෂණ ආයතනය මේ විධියට වැඩ කරලා? ඒ නිසා කරුණාකරලා ඔබතුමන්ලා පෞද්ගලිකව මේ සඳහා මැදිහත් වෙන්න. අපේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් සහාවේ ඉන්නවා. මම මේ ගැන තුන් හතර පාරක් කිව්වා, පොඩ්ඩක් බැලුවොත් හොඳයි. මේ ගැන අනිවාර්යයෙන් බලන්න. මොකද, ඔබතුමන්ලා කල්පනා කරනවා නේ, බිලියන 19ක අපනයන ආර්ථිකයකට යන්න. එපමණ අපනයන ආදායමක් ගේන්න විධියක් නැහැ. මොකද, අපනයන ආදායම් ලබා ගන්න අවශ්‍ය පොල් ලෙලි මේ රටේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. මේකට වගකියන්න ඕනෑ, පොල් පර්යේෂණ ආයතනය. ඒගොල්ලන් හැම දාම මේක block කරන එක කරන්නේ. ඒගොල්ලොත් එක්ක සාකච්ඡා කරලා, ඒ අය පිටරටවලට යවලා හරි කමක් නැහැ මේ බඩු ටික ගෙනැත් දෙන්න. මතක තියාගන්න, මේ අවුරුද්දේ ඩොලර් බිලියන 1.5ක් ගේන්න පුළුවන් ව්‍යාපාරයක් තමයි මේ කඩා වට්ටන්නේ. මම ඒ ගැනත් විශේෂයෙන් මතක් කරන්න කැමතියි.

ඒ වාගේම තවත් කාරණයක් සඳහන් කළ යුතුව තිබෙනවා. ඔබතුමා අලුතින් සතොස වෙළෙඳ සැල් 150ක් පිහිටුවන්න හදනවා. එතකොට සතොස වෙළඳ සැල් 450ක් වෙනවා. කරුණාකරලා සතොස වෙළෙඳ සැල්වලට ගිහින් බලන්න. අද මම check කරලා බැලුවා. අල නැහැ, ලූනු නැහැ. සතොස වෙළඳ සැල් ගණනාවකට කථා කරලා check කරලා තමයි මම මේ කථා කරන්නේ. ඔබතුමාට අවශ්‍ය නම් මම ඒ නම් ටිකත් එක්ක කියන්නම්. සමහර ආයතනවල මේ භාණ්ඩ නැහැ. දැන් ඔබතුමන්ලා මොකද කරලා තිබෙන්නේ? ඔබතුමන්ලා කිව්වා, දේශපාලනය මේකට සම්බන්ධ කර ගන්නේ නැහැ කියලා.

වීරවිල තොග ගබඩාවේ හිටියා, උපුල් කියලා කෙනෙක්. එයා පසුගිය කාලයේ පොහොට්ටුවේ සමිතියේ සභාපති. මෙවර තමුන්නාන්සේලාගේ සමිතියේ සභාපති. දැන් මොකක්ද එයා කරලා තිබෙන්නේ? දැන් union එකේ leader විධියට,- *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
දයාසිරි මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කාලය දෙන්නම්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එයා කොහොමද ගෙනාවේ?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
සම්පූර්ණ වැරදි කථාවක්. කවුරු හරි ඔබතුමා නොමඟ යවලා තිබෙන්නේ. Union එක හදපු දවසේ ඉඳන් එයා අන්තර් සමාගම් සේවක සංගමයේ සංවිධායක ලේකම්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි. දැන් මොකද කළේ? තමුන්නාන්සේලා එයා අරගෙන ආවා. සාමාන්‍යයෙන් stock එක hand over කරන්නේ නැතිව කෙනෙක් කොළඹට ගේන්න බැහැ. ඔබතුමා මොකද කළේ? එයාට තිබෙන සුදුසුකම් මොනවාද? Qualifications තිබෙනවාද? නැහැ. මොකක්ද කළේ? සුදුසුකම් තිබෙන ජ්‍යෙෂ්ඨ කළමනාකරු යවලා, සංජීව් කෝට්ටගොඩ Engineering Section එකට දමලා තමුන්නාන්සේලා වැඩ බලන පුද්ගලයා විධියට මෙයා කුළුබඩු බෙදා හැරීමට දැම්මා. සාමාන්‍යයෙන් shop එකක manager කෙනෙක් අයින් කරනවා නම්, අනිවාර්යයෙන්ම තොග ගණනයක් කරලා තමයි එතැනින් අයින් කරන්න ඕනෑ. නමුත් ඒක කරලා නැහැ. කලින් හිටපු සභාපතිතුමාගේ DGM (Audit) වැඩ බලන ප්‍රධාන විධායක ලෙස තමුන්නාන්සේලා පත් කළා. එයා පත් කළාට පස්සේ දැන් එතැන ඉන්න සියලු සේවකයන් ඉවත් වෙවී යනවා. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මිලදී ගැනීම්) ගියා. මොකද, මිලදී ගැනීම්වලට බලපෑම් කරන නිසා. ඊළඟට, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ධම්මික මහත්මයා. ඊළඟට, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ජගත් (මෙහෙයුම්). මේ සියලුදෙනා දැන් ඉවත් වෙලා යනවා. මොකක්ද හේතුව? ඒ අයට වෙන ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. තිබෙන්නේ තර්ජන සහ බලපෑම්.

ඊළඟට මම තවත් කාරණයක් කියන්නම්. Ceylon Biscuits Limited. මට මේ ගැන හිතාගන්න බැහැ. තමුන්නාන්සේලා Ceylon Biscuits Limited එකත් එක්ක හරි සම්බන්ධයි. ධම්මික පෙරේරා එක්ක මේ ආණ්ඩුවට පුදුම සම්බන්ධයක් තිබෙන්නේ. SriLankan Airlines එකට ගෙනැත් දමන සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය තනිකරම ධම්මික පෙරේරාගේ අය. මොකක්ද තමුන්නාන්සේලාට ධම්මික පෙරේරාත් එක්ක තිබෙන සම්බන්ධය කියලා මට තේරෙන්නේ නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒගොල්ලන් ව්‍යාපාරිකයෝ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, ව්‍යාපාරිකයෝ. හරි, හරි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ අය ව්‍යාපාර ක්ෂේත්‍රයේ professionalsලා. ඉතින් මොකක්ද ප්‍රශ්නේ?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක නේ. ඔබතුමාට තිබෙන ප්‍රශ්නය කියන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ධම්මික පෙරේරා ළඟ විතරද ඔය professionalsලා ඉන්නේ? හරි. පොඩ්ඩක් ඉන්න. මට කථා කරන්න දෙන්න. සමීත පෙරේරා මේ සේවකයන්ට කථා කරන විධිය, ඒ අය මර්දනය කරන විධිය ලොකු ප්‍රශ්නයක්. ඒ විතරක් නොවෙයි. Ceylon Biscuits Limited එකෙන් තමුන්නාන්සේලාට දෙන්න තිබෙනවා, මිලියන තුනක,- *[බාධා කිරීමක්]* Ceylon Biscuits Limited එකත් ගෙවන්න තිබෙනවා. බලන්න, Rs. 3 millionවලට වැඩිය තිබෙනවා. There is a conflict of interest. තමුන්නාන්සේලා බඩු ගන්න ආයතනයක කෙනෙක් ගෙනැත් සතොස ආයතනයේ සභාපති කරනවා. එතකොට conflict of interest එකක් නැද්ද? *[බාධා කිරීමක්]* නැත්තේ මොකද? තමුන්නාන්සේලා බඩු ගන්න ආයතනයක්. *[බාධා කිරීමක්]* අයින් වෙලා ඉන්නවා. හැබැයි, ඔහු තමයි එතැන හිටපු ප්‍රධානියා. ඔහු තමයි එන්නේ. Rs. 3 million තමුන්නාන්සේලාට සතොස ගෙවන්න තිබෙනවා. කරුණාකරලා ඒ සල්ලි ටික ගෙන්වා ගන්න.

ඒ වාගේම අස්වැසුම ප්‍රතිලාභීන්ට බඩු බෙදීම පිළිබඳව තමුන්නාන්සේ කිව්වා. දෙන්න යන්නේ රතු සීනි පැකට් තුනයි, සෝයා මීට්, සම්පෝෂ, නූඩ්ල්ස්, අල, බී ලූනු. මේ ටික තමයි තමුන්නාන්සේලා දෙන්න හදන්නේ. මම අහන්න කැමතියි, රුපියල් 5,000 එකක් රුපියල් 2,500ට දෙනකොට තමුන්නාන්සේලා ඉතිරි මුදල පියවා ගන්නේ කොහොමද කියලා. අපි මේවා දිගටම කථා කරපුවා. ඔබතුමාත් කථා කළා, අපිත් කථා කළා. සතොස ආයතනය හදලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිටරටින් භාණ්ඩ ගෙන්වලා සතොස වෙළඳ සැල්වලට බෙදන වැඩ පිළිවෙළක් සකස් කරන්න. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද පිටකොටුවේ ඉන්න වෙළෙන්දන්ගෙන් බඩු ගන්න තමයි සතොස පුරුදු වෙලා ඉන්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ අභියෝගය භාර ගන්න කියලා. ඒකම තමයි හැමෝම කළේ. සතොසේ නියම තත්ත්වය ඔබතුමා දන්නවා. අපි මේවා ගැන දිගටම කථා කළා. අපි ඉස්සර මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කළා. හැබැයි, අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? තවමත් පිටකොටුවේ වෙළෙඳ ව්‍යාපාරිකයෝ රුපියල් දෙකක්, තුනක් තියාගෙන දෙන දේ තමයි අද ගන්න සිදු වෙලා තිබෙන්නේ. මොකක්ද එතකොට වෙන්නේ? කෙළින්ම තව මාෆියාවක් මේක ඇතුළේ ගොඩ නැහෙනවා. ඔබතුමා ඒ සඳහා අවශ්‍ය කටයුතු කරයි කියලා මම හිතනවා.

මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. තමුන්නාන්සේලා කැබිවලට මෙච්චර ආසා මොකද කියලා මට තේරෙන්නේ නැහැ. හරියට කැබ් එක්කම ඉපදුණා වාගේ. තමුන්නාන්සේලාට කැබ් එක්කම තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ සම්බන්ධ කාරණයක් ගැන කියලා තිබෙනවා මම දැක්කා. විශේෂයෙන්ම මේ කැබ් ඕනෑ වෙලා තිබෙන්නේ මොකටද කියලා මට හිතා ගන්න බැහැ. අපේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල සී.කේ. පෙරේරා සීමා සහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා පෞද්ගලික සමාගමට ලිපියක් එවනවා, "ඔබ ආයතනය සතු ඩබල් කැබ් රථ පහක් ප්‍රවාහන, මහා මාර්ග අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සම්බන්ධවයි" කියලා. ඔබතුමන්ලා සීමා සහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා පෞද්ගලික සමාගමේ තිබෙන වාහන ටික ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයට ගන්නවා. තමුන්නාන්සේලා බලයට ආපු පළමු දවස්වල ගෝල්ෆේස් එකට ඇවිල්ලා මොකක්ද කළේ? එතකොට ඔය වාගේ ටයි කෝට් ඇන්දේ නැහැ. නිකම් ඇඳුමක් ඇඳගෙන හිටියේ. එතැනට ගිහිල්ලා දුන් පොර ටෝක් එක මොකක්ද? "මේ ඔක්කෝම අපි විකුණනවා. තව ගණනක් ගෙනෙන්න තිබෙනවා. මේ බලන්න, හොරකම් කරලා තිබෙන හැටි" කියලා කිව්වා.

කරුණාකරලා ඒ වාහන ටික ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයට දෙන්න. නමුත් දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? සීමා සහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා පෞද්ගලික සමාගමේ නිලධාරීන් පාවිච්චි කරන අලුත්ම කැබ් රථ පහක් තමුන්නාන්සේලා ගෙනෙනවා. ඒ මොකටද? ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයට. එහෙම ගෙනැල්ලා මොකක්ද කරන්නේ? ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයේ තිබෙන කැඩිලා, බිඳිලා, කුඩු වෙච්ච, නන්නත්තාර වෙච්ච වාහන පහක් යවනවා, සීමා සහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා පෞද්ගලික සමාගමට.

සීමා සහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා පෞද්ගලික සමාගම කල්පනා කරනවා, අපි කොහොමද එහෙම වාහන එක්ක අපේ ආයතනයේ කටයුතු පවත්වාගෙන යන්නේ කියලා. කාටද මේ වාහන පහ ගෙනෙන්නේ? මහාමාර්ග අමාත්‍යාංශයේ තමුන්නාන්සේලාගේ ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරුන්ට තමයි මේ වාහන පහ ගෙනෙන්නේ. ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයේ කැඩිච්ච වාහන පහක් ගුවන් තොටුපොළ සමාගමට යවනවා. මොකක්ද තමුන්නාන්සේලා මේ කරන්නේ? නිලධාරීන්ට පාවිච්චි කරන්න තිබෙන වාහන තමයි මේ විනාශ කරන්නේ? මේ කැබ් පාවිච්චි කරන්නේ මොකටද? තමුන්නාන්සේලා අපට කිව්වේ, "V8වලින් ගියා, අරවායින් ගියා, මේවායින් ගියා" කියලා. අපි මේවායේ තණකොළ ඇද්දේ නැහැ. අපි ඒවාවල cut-outs උස්සාගෙන ගියේ නැහැ. අපි ඒවා අරගෙනත පෝස්ටර් ගහන්න ගියේත් නැහැ. කැබ් එක ලේසියි, පෝස්ටරය ගහන්න; cut-outs ගහන්න තව team එකක් දාගෙන යන්න. එක්කෙනෙක් කැබ් එකක් අරගෙන ගිහිල්ලා තණ කොළ ඇද්ද හැටි දැක්කා නේ. ඒ වාගේ දේවල් කරන්න තමයි මේ කැබ් ගන්නේ. නමුත් අනුන්ගේ වාහන පාවිච්චි කරන්න එපා.

විශේෂයෙන් මම තව කාරණයක් කියන්න කැමැතියි. වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමා යටතේ තමයි පාරිභෝගික සේවා අධිකාරිය තිබෙන්නේ. පසුගිය කාලයේ වී මිලදී ගැනීම් සම්බන්ධව සහ හාල් මාෆියාවක් හොයන්න ඔබතුමන්ලා පුදුම මහන්සියක් ගත්තා. මෙතැන ඉන්නවා, පැය 24න් හාල් මෝල් වටලපු අපේ වීරයා, නාමල් කරුණාරත්න මැතිතුමා. එතුමා තමයි ලෝකයෙන්ම පළමුවැනි වතාවට හාල් මෝල් පැය 24න් වහලා, හාල් මෝල් හිමියන් දණ ගස්සවලා, රුපියල් 10කින් මිල වැඩි කරලා, ආනයනය කරපු සහල් රුපියල් 65කින් වැඩි කරලා තව රුපියල් 10ක් ඩඩ්ලිලා ඇතුළු හාල් මාෆියාකාරයන්ටත් දීලා, රුපියල් 75ක් පාරිභෝගික ජනතාවගෙන් සූරා කාපු ඉතිහාසගතවන නායකයා. එතුමා තමයි අපේ නාමල් කරුණාරත්න මැතිතුමා. එතුමා කිව්වා, "අපට බලය දෙන්න, පැය 24ක් ඇතුළත අපි කරලා පෙන්වන්නම්" කියලා. එහෙම නේ ඔබතුමන්ලා කිව්වේ. අවසානයේ මොකක්ද වුණේ? මොකක්වත් වුණේ නැහැ. *[බාධා කිරීමක්]* මම ඉඩ දෙන්නේ නැහැ. ඒක නිසා මම කියන්න කැමැතියි, -

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමාගේ වෙලාවෙන් ගන්න.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඔබතුමා කිව්වේ, සම්පූර්ණ බොරුවක්. පැය 24ක් ඇතුළත කථාවක් මම කිව්වේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ ටොම් පව ගහන්න එපා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මෙහෙමයි. පව කීම ජාතික කලාවක් බවට පත් කර ගත්තු මිනිසුන්ට මීට වඩා දෙයක් කියන්න බැහැ, මහත්තයෝ. මොකද හේතුව? තමුන්නාන්සේලා කියපු දේවල් මට එකින් එක කියන්න පුළුවන්. *[බාධා කිරීම්]* කලබල වෙන්න එපා. පවකාරයෝ පව ඔක්කෝම දඟලනවා. පොඩ්ඩක් ඉන්න කෝ. පව කියපු අය තමයි කථා කරන්නේ.

තමුන්නාන්සේලාට දැන් මොකද වුණේ? ඒ වැඩේ කරගන්න බැරි වුණා. තමුන්නාන්සේලා කියපු දේවල් ගන්න බැරිව ගියා? තමුන්නාන්සේලා මොකක්ද කිව්වේ? වී මෙට්‍රික්ටොන් විශාල ප්‍රමාණයක් මිලදී ගන්නවා කිව්වා. සාමාන්‍යයෙන් මහ කන්නයේ වී මෙට්‍රික්ටොන් මිලියන 3.2ක් සහ යල කන්නයේ වී මෙට්‍රික්ටොන් මිලියන 2.6ක අස්වැන්නක් ලැබෙනවා. නමුත් වී මිලදී ගන්න තමුන්නාන්සේලා වෙන් කළේ, රුපියල් බිලියන පහයි. ගිය සිකුරාදා වෙනකොට අරගෙන තිබෙන්නේ වී මෙට්‍රික්ටොන් 48යි. තමුන්නාන්සේලා ලංකාව පුරාම ෂෝ එක දැම්මා. ඔක්කෝම මන්ත්‍රීවරු යනවා, සමහරු ගිහිල්ලා තමුන්නාන්සේලා ගිනි තියපු වී මෝලුත් අලුත් වැඩියා කරනවා. මට මතකයි එකක්. අපේ වසන්ත සමරසිංහ අමැතිතුමා එක වී මෝලකට ගිහින් කියනවා, "බලන්නකෝ මාර ප්‍රශ්නයක්නේ. පරණ මෝල් ඔක්කෝම වල්වැදිලානේ තිබෙන්නේ" කියලා. වල්වැදිලා නොවෙයි තමුන්නාන්සේලා ගිහින් ශුද්ධ කළේ තමුන්නාන්සේලා ගිනි තියපු එකක්. මම පෙන්වන්නද? ඒක ගැන කියන්නද? *[බාධා කිරීමක්]* ඒක තමයි, ඕනෑ නම් මම ගිනි තියපු වී මෝල් ටික ඔක්කෝම මුල ඉඳන් කියන්නම්. ඒ ටික සුද්ධ කරලා තමුන්නාන්සේලා මොකක්ද කළේ? තමුන්නාන්සේලා බැලුවා ඒ ටික සුද්ධ කරලා ෂෝ එක දාන්න. නමුත් හරි ගියේ නැහැ. මොකද වුණේ? මා ළඟ තිබෙනවා විනාශ කළ වී මෝල් ටිකේ විස්තර. ඒ එකින් එක මම කියන්නම්.

යටියන වී මෝල, වී මෙට්‍රික්ටොන් මිලියන 800ක් ගබඩා කරන්න පහසුකම් තිබුණු එකක්. එහි වී කොටන මැෂින් තුනක් තිබුණා. තෙබුවන වී මෝල, තමුන්නාන්සේලා ඒකට ගිනි තිබ්බා. හසලක වී මෝල, මෙට්‍රික්ටොන් මිලියන 500කට ගබඩා පහසුකම් තිබුණු තැනක්. මිද්දෙණිය වී මෝල, තමුන්නාන්සේලා ගිනි තිබ්බා. රණහංස වී මෝල, මොනරාගල. රන්න, උණාකුරුව වී මෝල. වී මෙට්‍රික්ටොන් මිලියන 700ක් ගබඩා කරන්න පුළුවන් තැනක්. අගුණකොළපැලැස්ස වී මෝල, වී මෙට්‍රික්ටොන් 900ක් ගබඩා කරන්න පුළුවන් තැනක්. බද්දේගම වී මෝල, ගාල්ල. කිරිමැටිමුල්ල වී මෝල, මාතර. කඩ පණහ වී මෝල, නොච්චියාගම. යාය 14/13/12/11 වී මෝල, කාශ්‍යප පුර, පොළොන්නරුව. යාය 01, ඇලහැර වී මෝල, පොළොන්නරුව. යයා ලිර වී මෝල, යාපහුව. සකුනි වී මෝල, ආන්දම්කුලම්, කන්තලේ. රත්න වී මෝල, ත්‍රිකුණාමලය. පල්ලත්තර වී මෝල, මොදරවාන, බෙලිඅත්ත. සහන වී මෝල, දම්මුල්ල, බෙලිඅත්ත. මේ විධියට ලංකාවේ සියයට 60ක් සහල් සපයන්න පුළුවන් වී මෝල් තමයි තමුන්නාන්සේලා ගිනි තිබ්බේ. *[බාධා කිරීමක්]* දැන් මේ කථා කරන්න යන්නේ ගිනි තිබ්බ එක්කෙනා නම් කරුණාකරලා- *[බාධා කිරීමක්]* ගිනි තිබ්බ එක්කෙනා නම් කථා කරන්න යන්නේ, - *[බාධා කිරීමක්]* තමුන්නාන්සේ කථා කරනවා නම් තමුන්නාන්සේලාගේ වේලාව අරගෙන කථා කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට නියමිත කාලය අවසානයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම මේ කිව්වේ ජනතා විමුක්ති පෙරමුණ විසින් ගිනි තිබ්බ වී මෝල් සංඛ්‍යාව ගැන. දැන් මේ නැඟිටින ඇමතිතුමා ඒ ගිනි තිබ්බ එක්කෙනා නම්, තමුන්නාන්සේලා ගිනි තිබ්බා කියලා පිළිගන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට තව විනාඩි 2ක කාලයක් දෙන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ලේඛනයක් කියෙව්වා. මෙට්‍රික්ටොන් මිලියන 500යි, මෙට්‍රික්ටොන් මිලියන 700යි කියලා කිව්වා. මම හිතන විධියට ලංකාවේ නොවෙයි ඔය මෝල් තිබෙන්නේ. මොකද, ලංකාවේ තිබෙන මෝල්වල අවුරුද්දේම වී අස්වැන්න තිබෙන්නේ මෙට්‍රික්ටොන් මිලියන 4.5යි. එතුමා කියපු ඒවායේ මෙට්‍රික්ටොන් මිලියන 700යි, 500යි. *[බාධා කිරීමක්]* බොරු කියන්න එපා කියලා, - *[බාධා කිරීමක්]* එක එක බොරු කියන්න එපා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොරු කියන්න එපා. මෙට්‍රික්ටොන් මිලියන 4.6 මහ කන්නයේ හැදෙන්නේ. *[බාධා කිරීමක්]* හරි, ඉන්න ඉතින්. ඒක තමයි කියන්නේ. කන්න දෙක තුනේම වී ගබඩා කරන්න පුළුවන් තත්ත්වයක් තිබුණා. ඒවා තමයි තමුන්නාන්සේලා ගිනි තිබ්බේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද යන්තම් හිටපු පොලිස්පතිගේ ගෙදරට පොලිසියෙන් පැන්නා. පොලිස්පතිගේ ගෙදරට පොලිසියෙන් පැනලා අල්ලා ගත්තා. *[බාධා කිරීමක්]* එතුමා අල්ලා ගත්තේ නැහැ, විස්කි බෝතල් 800ක් ගත්තා. තමුන්නාන්සේලාට පසුගිය දවස් විසි ගාණක් තිස්සේම මේ රටේ පොලිස්පති අල්ලා ගන්න බැරිව හිටියා. ගිය සතියේ ලෆාර් තාහීර් මැතිතුමා කිව්වා අපට මතකයි, අභියාචනාධිකරණයේ මාස තුනකට කලින් ඇති වුණු එකඟවීමක් අනුව තමයි 17වෙනි දා මේ කථා කළේ කියලා. 16වෙනි දා පොලිසිය නිවේදනයක් නිකුත් කරනවා, කට්ටිය ඔක්කොම එකතු වෙලා සාකච්ඡා කරලා එකඟතාවට ආවා කියලා මේ 6දෙනා අත්අඩංගුවට ගන්නේ නැහැයි කියලා. මම අහන්න කැමතියි, කොහොමද එහෙම වෙන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඊයේ රාත්‍රියේ පැය ගාණක්, පැය තුනහමාරක පමණ කාලයක් හිටපු පොලිස්පති, -අපි පොලිස්පති කියලා කියමුකෝ- දේශබන්දු තෙන්නකෝන් මහත්තයාගේ ගෙදර හෙව්වා. පැය තුනහමාරක් බිංකුණ්ඩෝ හෙව්වාද ගේ ඇතුළේ? පැය තුනහමාරක් හොයලා හොයලා අන්තිමට දේශබන්දු සොයා ගන්න බැරි වුණා, ඊට පස්සේ එයාගේ විස්කි බෝතල් ටික අරගෙන ආවා. සුනිල් වටගල මහත්තයා රූපවාහිනියට ගිහිල්ලා බොහොම පැහැදිලිව කිව්වා, දේශබන්දු ඉන්න තැනත් දන්නවා, සෙව්වන්දි ඉන්න තැනත් දන්නවා කියලා. මේ සියල්ල හංගාගෙන හිටපු ආණ්ඩුවේ ප්‍රධානියා කවුද? *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.29]

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය ආරම්භ කරමින් විපක්ෂයේ මුජීබුර් රහුමාන් මන්ත්‍රීවරයා 2019 ඉඳලා 2024 දක්වා අය වැය පිළිබඳ දත්ත වගයක් ඉදිරිපත් කළා. ඒක අහගෙන ඉන්නකොට අපට හිතුණේ, අපි මේ විවාද කරන්නේ 2024 වර්ෂයේ අය වැය කියලායි. අපි ආණ්ඩුව අරගෙන ඉතා කෙටි කාලයක් යනකොට, ඒ චෝදනා ඔක්කෝම ජාතික ජන බලවේග ආණ්ඩුවට දාලා තමයි එතුමන්ලා කථා කළේ.

ඒ වාගේම පසුගිය ආණ්ඩුව විසින් රටේ ජනතාව ඇදලා දාපු තැන බලන්න. රටේ සිටින ජනතාවගෙන් ලක්ෂ 70ක් දවස අවසාන වෙනකොට ආහාර වේල් දෙකයි අරගෙන තිබුණේ. ඒ දේවලුත් අපේ ඇහට දාලා, අපි කළා වාගේ තමයි එතුමන්ලා කථා කළේ. ඒ වාගේම එතුමා කිව්වා, අපි දෙණියායේ සතොස අලෙවිසැල් දෙකක් විවෘත කරන්න ලැහැස්ති කරලා තිබෙනවා කියලා. පරණ එක තිබියදී අලුත් එක ඒ ආඝන්නයෙන් විවෘත කරන්න ලැහැස්ති කරලා තිබෙනවා කිව්වා. ඇත්තටම ගත්තොත්, ඒ සතොස ගොඩනැඟිල්ල අයිති නිපුණ රණවකගේ තාත්තාට. රුපියල් ලක්ෂ 3ක මාසික කුලී පදනම මත තමයි ඒක අරගෙන තිබුණේ. එතැන වර්ග අඩි 2,730ක් තිබෙනවා. හැබැයි, පසුගිය කාලයේ එම ගොඩනැඟිල්ලේ කුලිය රුපියල් ලක්ෂ 7 දක්වා වැඩි කළා. අපි දන්නවා, සාමාන්‍යයෙන් කේවල් කරනකොට හිතවතුන්ට තමයි ඒවා දීලා තිබුණේ. ඒ කාලයේ නම් මේවා ඒ මිලටත් ගියා. ඔන්න, ගජ මිතුරොත් එක්ක එකතුවෙලා කරපු දේවල්. හැබැයි, එහෙම ආණ්ඩුවක් නොවෙයි අද තිබෙන්නේ. ඒ නිසා අපි මොකක්ද කළේ? මාසික කුලිය රුපියල් ලක්ෂ 3කට ඒ ආඝන්නයෙන් බිල්ඩින් එකක් ගත්තා. එහි වර්ග අඩි 4,949ක් තිබෙනවා.

දෙණියාය සතොස වාගේම තවත් සතොස වෙළෙඳ සැල් තිබෙනවා. ඒවා අයිති කාටද කියලා අපි ඉදිරියේදී බලමු. කොට්ටාව, මඩු, ගම්පහ, සියනෑ, බදුල්ල, බදුරලිය, වැලිමඩ සතොස වෙළඳ සැල්වල අයිතිය සම්බන්ධයෙනුත් ගැටලු තිබෙනවා. ආණ්ඩුවක් විධියට ඉදිරියේදී අපි ඒවා සම්බන්ධයෙනුත් සොයා බලන්න කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි දැක්කා, පසුගිය කාලයේ සතොසට තේමා ගීතයක් හදලා තිබුණා. ඒ තේමා ගීතය සඳහා රුපියල් මිලියන 6.7ක් වියදම් කරලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 67ක් වියදම් කරලා 2019දී සතොසට තේමා ගීතයක් හදලා තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වටිනා ගීතයක්.

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
ඔව්, වටිනා ගීතයක්. සාමාන්‍යයෙන් අපේ රටේ ගායකයෙක් සිංදුවක් හැදුවාම මෙච්චර ගණනක් ලැබෙනවා නම් බෙල්ලේ වැල දමාගෙන තමයි නතර වෙන්නේ. ඒක ලොකු ගණනක්. ඔන්න, පහුගිය කාලයේ වැඩ කරපු විධිය. ඒ වාගේම පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුව තුළදී හෙළිදරව් වුණා, බාර් ටික, ෂෙඩ් ටික, ජනාධිපති අරමුදලේ මුදල් ටික කාටද ලබා දුන්නේ කියලා. ඒ ඔක්කෝම හිතවතුන්ට තමයි දීලා තිබුණේ. සතොස, සමුපකාර ඇතුළු වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ සියලු ආයතන පාවිච්චි කරලා තිබෙන්නේත් ඒ විධියටමයි.

ඒ වාගේම 1949 අංක 47 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා පනතින් තමයි එම ආයතනය පිහිටුවන්නේ. අපේ රටේ තිබෙන පැරණිම රාජ්‍ය සංස්ථාව තමයි, සමුපකාර තොග වෙළඳ සංස්ථාව. හැබැයි, අපි මේ ආණ්ඩුව ගන්නකොටත් මේ ආයතනය 2024.09.02වන දින ඇවර කරන්න දාලා තිබුණා. අපේ ගරු ජනාධිපතිතුමා, ඒ වාගේම ඇමතිවරුන් මැදිහත්වෙලා ඇවර කරන්න තීරණය කර තිබුණු සමුපකාර තොග වෙළඳ සංස්ථාව ඇවර කිරීම අත්හිටුවලා 2024.12.30 දින නැවත නියෝග නිකුත් කළා. එහෙම කරලා පාරිභෝගිකයෝ ආරක්ෂා කරන්න අපි කටයුතු කළා.

ඒ වාගේම පාරිභෝගිකයාට සහ ගොවි ජනතාවට සාධාරණ වෙළෙඳ පොළක් වෙනුවෙන් තිබෙන මේ ආයතනය අපි තොග අළෙවිය සඳහාත් ලැහැස්ති කරලා තිබෙනවා. විශේෂයෙන්ම මේ අය වැය තුළින් කොළඹ, මාතර සහ කුරුණෑගල කියන ස්ථානවල තොග අළෙවි මධ්‍යස්ථාන තුනක් ස්ථාපිත කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම සතොසට සහ සමුපකාරයට ඍජුවම භාණ්ඩ ආනයනය සඳහා අවසර දෙන්නත් ආණ්ඩුවක් විධියට අපි ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. විශේෂයෙන්ම ගත්තොත්, කලින් කිව්වා වගේ මේ ක්‍රියාවලිය හරහා මේ රටේ අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක මිල අඩු වෙමින් තිබෙනවා. පරිප්පු, සීනි, ලොකු ලූනු, අර්තාපල්, සෑමන්, පාන් පිටි ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක මිල අඩුවෙලා තිබෙනවා.

ඔබතුමන්ලා දකින්න ඇති, පසුගිය කාලයේ අපි උද්ධමනය පාලන මට්ටමකට ගෙනැල්ලා තිබුණු බව.

[ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා]

ඒවාටත් මේ සමුපකාර ජාලයේ තරගකාරිත්වය ඇතුළේ අපි වැඩ කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි, 2025 වසරේ සතොස සහ සමුපකාරය එක්ව වී මෙට්‍රික්ටොන් ලක්ෂයක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් ඉන්නවා. දැනුත් මේ මන්ත්‍රීවරුන් කථා කළා වී මාෆියාවක්, හාල් මාෆියාවක් ගැන. අන්න, සතොස ආයතනය විසින් පසුගිය කාලයේ වහලා තිබුණු වී මෝල්, අක්‍රිය වෙච්ච වී මෝල් නැවත පටන්ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, හිඟුරක්ගොඩ, පන්නෙගමුව කියන වී මෝල් අලුත්වැඩියා කරලා හාල් මිල පාලනය කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළත් අපි ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. අපි එතැනින් නතර වෙලා නැහැ. අපි මේ අමාත්‍යාංශය භාර ගත් පසු ඒ යටතේ තිබෙන සතොස ප්‍රවාහන සේවය, ආරක්ෂක සේවය, ඉදිකිරීම් කටයුතු, ඉන්ධන පිරවුම්හල් කියන සියල්ල නැවත පණ ගන්වා යළි ජනතාවට ප්‍රතිලාභ ලැබෙන ආයතන බවට ඒවා පත් කරන්න කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කථා කළා, සතොස වෙළෙඳ සැල් 451ක් ගැන. ඒ 451ක්වූ වෙළෙඳ සැල්වලින් 225ක්ම දැනට පාඩු ලබන මට්ටමේ තමයි තිබෙන්නේ. අපි දැන් ඒවා කළමනාකරණය කරමින් ඉන්නවා, ලාභ ලබන ආයතන බවට පත් කරගන්න. ඒ කියන්නේ සමස්ත outletsවලින් සියයට 50ක් relocate කරන්න අපි ලැහැස්ති කර තිබෙනවා. ඒ වාගේම අලුතින් වෙළෙඳ සැල් 150ක් පමණ විවෘත කරලා, නැවත ආදායම් ලබන තැන් බවට ඒවා පත් කරන්නත් අපි ලැහැස්ති කර තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, වෙළෙඳ පොළ අළෙවි ප්‍රමාණය ගත්තොත්, වාර්ෂිකව රුපියල් බිලියන 500ක් තමයි සියලු අළෙවි සැල්වල අළෙවියෙන් එකතු වන මුදල වෙන්නේ. ඒ මුදලේ පංගුවක් විධියට ගත්තොත්, සතොස ආයතනය රුපියල් බිලියන 60ක් ගන්නවා. වාර්ෂික වෙළඳාම වන රුපියල් බිලියන 500න් රුපියල් බිලියන 60ක් තමයි සතොස ආයතනය ගන්නේ. ඒ අනුව කාගිල්ස් ආයතනය පළමු ස්ථානයේත්, කීල්ස් ආයතනය දෙවන ස්ථානයේත්, සතොස ආයතනය තුන්වන ස්ථානයේත් තමයි ලංකාව තුළ ස්ථානගත වෙලා තිබෙන්නේ. එහෙමනම්, එතැනට තාක්ෂණය අවශ්‍යයි, පුහුණු ශ්‍රමිකයන් අවශ්‍යයි. අපි දැන් ඒ සියල්ල ලැහැස්ති කරලා තිබෙනවා.

මේ අය වැය ඇතුළේ ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය තුළින් ඩිජිටල්කරණය සඳහා රුපියල් බිලියන 21.8ක් වෙන් කළා. ඒකෙන් රුපියල් බිලියන 7.1ක් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයටත්, රුපියල් බිලියන 14.7ක් වෙනත් ආයතන සඳහාත් වෙන් කරලා තිබෙනවා. අපේ ආණ්ඩුවේ ප්‍රධාන ප්‍රතිපත්තියක් තමයි ඩිජිටල්කරණය. අන්න, එහෙනම් ඒ මුදලින් කොටසක් යොදවා වෙළඳාම, තොග වෙළඳාම, දේපළ ආදායම් සියල්ල අපි නැවත ඩිජිටල්කරණයට ගෙනයන්න ලැහැස්ති කර තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මට තව තත්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමයි.

සතොස ආයතනය වාගේ ආයතන ගත්තොත්, Goods Received Note - GRN - නැති, ස්ථාවර වත්කම් ලේඛනයක් නැති, අඩුම ගණනේ වාර්ෂික අය වැයක්වත් නැති ආයතන බවට ඒවා පත් වෙලා තිබෙනවා. මේවා ප්‍රාථමික මට්ටමේ ආයතන බවට පත් වෙලා තිබුණා. එවැනි ආයතනවලට නවීකරණය, නූතනත්වය ගෙනැල්ලා, රටට ගැළපෙන, පෞද්ගලික අංශය එක්ක තරග කරන්න පුළුවන්, ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න අවශ්‍ය වැඩකටයුතු මේ අය වැය ඇතුළේ අපි සම්පාදනය කර තිබෙනවා. ඒ නිසා මේ අය වැය ජනතාවාදී අය වැයක් කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த சேனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.

[අ.භා.5.39]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ අමාත්‍යාංශය වන වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට සහභාගි වෙමින් අදහස් දැක්වූ සියලු මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට අපේ ස්තුතිය පිරිනමනවා. මේ විවාදය අවසන් කිරීම සඳහා අදහස් දක්වන වෙලාවේ පිළිතුරු දෙන්න මතු වෙච්ච කරුණු ගණනාවක් තිබෙනවා. ඒ ගැනත් මම කියන්න ඕනෑ. විශේෂයෙන් අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විවිධ සමාගම් ගැන කිව්වා. විශේෂයෙන් හේලීස් සමාගම ගැන, ධම්මික පෙරේරා ගැන කිව්වා. මම ඔබතුමාට කියනවා, අපි පත් කරපු අධ්‍යක්ෂ මණ්ඩල දෙස, සභාපතිවරුන් දෙස බලන්න කියලා. ලංකාවේ තිබෙන හොඳම corporatesවල, සමූහ ආයතනවල සිටි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, සමහර ආයතනවල හිටපු සභාපතිවරුන් ඒ තනතුරුවලින් ඉවත් වෙලා ඇවිත් තිබෙනවා, අපේ රජයේ ආයතනවල තනතුරු භාරගන්න. ඒ, ඇයි? වෙන දා ඔබතුමන්ලා කළේ මේ රටේ රාජ්‍ය දේපළ, රාජ්‍ය ආයතන විකුණපු එක. අදත් රවී කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, ආණ්ඩුවට බිස්නස් කරන්න බැහැ කියලා. ලෝකයේ කිසිදු රටක් බිස්නස් කරන්න බැරි ආණ්ඩු හදලා නැහැ. ලෝකයේ හැම රටකම ආණ්ඩු සතු ව්‍යාපාර තිබෙනවා. අපේ රටේ බිස්නස් කරන්න බැහැ කියලා ඒ බිස්නස් විතරක් නොවෙයි, ගිණුම්වල තිබුණු සල්ලිත් එක්ක තමයි මේගොල්ලන් ඒවා පෞද්ගලීකරණය කළේ. ගිණුම්වල තිබුණු සල්ලිත් එක්ක තමයි ඒවා විකුණුවේ. ඒ නිසා අපි මේ රටේ පෞද්ගලික අංශයේ සාර්ථක ආයතනවල සිටින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ගණනාවක් රාජ්‍ය ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරු සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් බවට පත් කර

තිබෙනවා. අපි ඔවුන්ට මේ ආයතන සාර්ථක ආයතන බවට පත් කිරීමේ වගකීම දීලා තිබෙනවා. ඒ විකුණන්න නොවෙයි. රජය සතුව පවතින වත්කම් සක්‍රියව, ඵලදායීව, ඒ වාගේම සාර්ථකව ඉස්සරහට ගෙනියන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ තමයි අපි ඔවුන්ට භාර දීලා තිබෙන්නේ. ඔවුන් අද ඒ වගකීම ඉටු කරද්දී තමන්ගේ ෙෙල් එක ඒගොල්ලන්ගේ ෙෙල් එකක් බවට පත් කරන්න විපක්ෂය උත්සාහ කරනවා. අපි ආණ්ඩුවක් හැටියට තීරණයක් ගෙන තිබෙනවා, පෞද්ගලික අංශයේ තිබෙන දැනුම අද රාජ්‍යය තුළට එකතු කර ගැනීමට. ඒ වාගේම මේ ආයතන ගොඩනැඟීම සඳහා අපි කටයුතු කර තිබෙනවා.

විශේෂයෙන්ම සතොස ගැන කියද්දී දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත්, වමින්ද විජේසිරි මන්ත්‍රීතුමාත්, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් සමහර කරුණු කියලා ගියා. සමහර වෙලාවට, කියන කෙනා කියන්නේ තමන්ගේ පැත්තේ කරුණු විතරයි; බොරු කියනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාටත් කියන්න ඕනෑ, 21දෙනෙකු ගන්න අපි දැන්වීම් පළ කර තිබෙනවා, පුළුවන් නම් සතොසට එවන්න, සුදුසුකම් තිබෙන අය අපි බඳවා ගන්නවා කියලා. පසුගිය කාලයේ මේ ආයතනවල හිටපු මිනිස්සු වැඩ කරපු ආකාරය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. මේ අය රස්සා දාලා යනවා නොවෙයි. ඒ අයට යන්න වෙලා තිබෙනවා. ඒ සමහර අයට දැන් CID පරීක්ෂණ පැවැත්වෙනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, වී තොග, හාල් තොග සම්බන්ධයෙන් සමහර අයට CID පරීක්ෂණ පැවැත්වෙනවා. ඔබතුමා උදේ වරුවේ මේ ගරු සභාවේ හිටියේ නැහැ. මම උදේත් කිව්වා, 2014 අවුරුද්දේ ඉඳලා -මේ 2025 අවුරුද්ද. අවුරුදු 11ක්- සතොස ගබඩාවෙන් පිටවෙලා තවම shop එකට ඇවිල්ලා නැතිව අතරමඟ රුපියල් මිලියන 350ක බඩු තොග තිබෙනවා කියලා. රුපියල් මිලියන 350ක බඩු තොග තවම මහ එනවා. මේ විධියට තමයි ඒ අය වැඩ කළේ. හැබැයි, අපි ඒ අය වෙනස් කරන්න මැදිහත් වුණා. හිටපු DGM (Internal Audit) තමයි අපි වැඩ බලන්න ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා - CEO - හැටියට පත් කළේ. අද මේ අය පිළිබඳව වැරදි චිත්‍ර මවන්න හදනවා. අවශ්‍ය නම් මට ගිය අයයි, ඒ ගිය අයට තිබෙන චෝදනා ගැනයි සඳහන් වන මේ ලේඛනයම කියන්න පුළුවන්. උදේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියන්න උත්සාහ කළා, වැඩබලන ප්‍රධාන විධායක නිලධාරියාගේ ගමේ තමයි අලුත් සතොස දැම්මේ කියලා. නැහැ. රණවකගේ අප්පච්චිගේ සතොස තමයි අයින් කරන්නේ. වර්ග අඩි 2,500ට රුපියල් ලක්ෂ 7ක් ඉල්ලුවාම, අපි වර්ග අඩි 4,000ට වැඩි එකක් රුපියල් ලක්ෂ 4ට ගන්නේ. ඒ වාගේ ආයතන 252ක් තිබෙනවා. අපේ මන්ත්‍රීතුමා කිව්වා, දේශපාලනඥයෝ දාලා තිබෙන තව සතොස ආයතන ගණනාවක් ගැන. ඒ ගාස්තු වැඩියි. ආයතන 252ක් පාඩු ලබනවා. අපි මේවා relocate කරනවා. ඒවා කරලා සතොස ආයතනය ගොඩනඟන්න අපි වැඩ කරනවා. සභාපතිවරයාට අයිතියක් තිබෙනවා, ඕනෑම සමාගමක වැඩ කරන්න. ඔහු ඒ සමාගමෙන් අයින් වෙලා සතොස ආයතනයේ වැඩ කරනවා. එහෙම කරන්න ඔබතුමන්ලාට බැරි වුණාට අපට පුළුවන් වෙලා තිබෙනවා. මෙතෙක් තිබුණු ආණ්ඩුවලට එහෙම මිනිස්සු එකතු වුණේ නැහැ. හැබැයි, අපේ ආණ්ඩුවත් එක්ක මිනිස්සු එකතු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ප්‍රධාන විධායක නිලධාරිතුමා කොම්පැනියක් හදලා ඒකෙන් සතොසට බඩු දානවා කිව්වා. පට්ටපල් බොරු කියන්නේ. එහෙම ඒවා කරලාත් නැහැ. සාමාන්‍යයෙන් අපි එහෙම ඒවා කරන්න දෙන්නේත් නැහැ. මොකද, conflicts of interest එනවා කියලා අපි දන්නවා. මේ නිලධාරින් ඉතා හොඳින් මේ ආයතනය ගොඩනඟන්න කටයුතු කරද්දී, මෙතෙක් කල් මේ ආයතනයේ හිටපු, සමහර චෝදනාවලට ලක් වූ නිලධාරීන් ඉල්ලා අස් වුණා. ඒ සමහර අයට එරෙහිව CID එකට පැමිණිලි කර තිබෙනවා. එතකොට සමහර අය දාලා ගියා.

එක නිලධාරිනියක් ගැන උදේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා. ඇයගේ වැඩ තහනම් කළා. ඇයට කොන්ත්‍රාත් කාලය ඉවර වෙලා යන්න වුණා. කොන්ත්‍රාත් කාලය ඉවර වෙලා යනකොට ඇය මොකක්ද කළේ? කොන්ත්‍රාත් කාලය ඉවර වෙලා යනකොට, computer එකේ තිබුණු data ටිකත් මකලා ගියේ. දැන් ඒ වෙනුවෙන් පැමිණිල්ලක් තිබෙනවා. ඒ විධියට මේ ආයතන විනාශ කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. මේ ආයතන අපි ගොඩනඟන්නයි හදන්නේ. මේ ආයතන සම්බන්ධයෙන් මට කියන්න ඕනෑ වුණේ මේකයි.

සතොස හාල් මිලදී ගැනීමක් ගැන කිව්වා. ජයවික්‍රම හාල් මෝලෙන් අපි හාල් ගත්තා කිව්වා. ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ, සතොස ආයතනයේ හාල්වල තෙතමනය බලන මීටර් දෙකක් තිබුණු බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීටර් දෙකක් තිබුණා. Reject කරන්න ඕනෑ නම් වැරදි මීටරයෙන් මනිනවා. ගබඩාවලින් එහෙම නැත්නම් වී මෝල්වලින් market එකට දාන හාල් reject කරනවා, සතොස ආයතනය. එහෙම නිලධාරීන් හිටියා. ඒ අයට අපි යන්න කිව්වා. වගකීමක් නැති අයට අපි චෝදනා පත්‍ර දීලා සමහර අය වෙන තැන්වලට මාරු කරලා තිබෙනවා. තෙතමනය බලන්න මීටර් දෙකක් තියාගෙන හිටියා. ඒ නිසා අපි සැපයුම්කරුවන්ගෙන් ලියුම් ගත්තා, බැරි වෙලාවත් quality එක ෙෙල් වුණොත් reject කරනවා කියලා. මේ ප්‍රශ්නය අපට බේරා ගන්න කෙටි කාලයක් ගත වුණා. අපි ඒ ප්‍රශ්න දැන් බේරාගෙන තිබෙන්නේ. ඒ නිසා සතොස සම්බන්ධයෙන්, සතොස ආයතනයේ නිලධාරීන් සම්බන්ධයෙන් මතු කරන්න හදන්නේ අමූලික බොරුවක්.

ඊට පස්සේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වාහන ගැන ඇහුවා. එතුමා මේ සභාවෙන් පිටතට ගියේ නැතිව සභාවේ ඉන්නවා නේ. රජය සතු ජනාධිපති ලේකම් කාර්යාලයට භාර දීපු වාහන 816කින්, 254ක් අපි මේ වෙනකොට ආයතනවලට භාර දීලා තිබෙනවා. සමහර ආයතනවල වාහන තවත් තිබෙනවා. වාහන පාවිච්චි කරන්න ඕනෑ නැති අයත් ආයතනවල වාහන පාවිච්චි කරනවා. අපි ඒවා අදාළ තැන්වලට, අවශ්‍ය තැන්වලට දෙනවා. ඒ විතරක් නොවෙයි. සුඛෝපභෝගී වාහන විකුණන්නත් දාලා තිබෙනවා කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ.

මේ කාරණාවලට අමතරව අපේ ගරු මරික්කාර් මන්ත්‍රීතුමාත් ප්‍රශ්නයක් ඇහුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා මේ වනවිට තුන් වතාවක් මේ ප්‍රශ්නය අසා තිබෙනවා. අපි බදු හොරු රකිනවා කියමින් බදු හොරු රකින කථාවක් එතුමා කියන්න උත්සාහ කළා. ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි කියන්න ඕනෑ, අප කිසිසේත්ම කිසිම හොරෙක් රකින්නේත් නැහැ, හොරකම් කරන්න දෙන්නේත් නැහැ කියලා. බොහොම වගකීමෙන් අපි ඒ කාරණය කියනවා. එතුමා ආයතන කිහිපයක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනවා. ඒ ආයතන කිහිපය සම්බන්ධයෙන් මම විස්තර ගත්තා, බදු ගෙවපුවාත් එක්කම. ආයතන කිහිපයක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළත්, ඒ එක් ආයතනයක් VAT සඳහා ලියාපදිංචි වෙලාත් නැහැ. ඒ නිසා මේ පිළිබඳව අපි ඉදිරියේදී පරීක්ෂණ කරනවා. දැන් එතුමන්ලා කියන්න උත්සාහ කළා නේ, පරීක්ෂණ කරන්නේ නැහැ කියලා. නමුත්, අපි ඒ සම්බන්ධයෙන් තොරතුරු හොයලා මේ වනවිට පරීක්ෂණ කෙරීගෙන යනවා. ඉදිරියට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඇතුළු ඊට අදාළ සියලු ආයතන හරහා අපි මේ පරීක්ෂණ කරනවා. එහෙම නැතුව අපි නිකම් ඉන්නේ නැහැ. එතුමා ආයතන කිහිපයක් ගැන කිව්වා. Amro Refiner Pvt. Ltd. එක VATවලට register වෙලා තිබෙනවා. නමුත් පසුගිය අවුරුද්දේ returns submit කරලා නැහැ; accounts submit කරලා නැහැ; VAT එක ගෙවලාත් නැහැ. RG Brothers VATවලට register වෙලා නැහැ. ඊට පස්සේ Sena

[ගරු වසන්ත සමරසිංහ මහතා]

Mills Refineries (Pvt.) Ltd. එක තිබෙනවා. මේගොල්ලන් 2025.01.21වැනි දාට රුපියල් මිලියන 17.4ක් VAT ගෙවා තිබෙනවා. 2025.02.21වැනි දාට රුපියල් මිලියන 18.3ක් VAT ගෙවා තිබෙනවා. ඒ වාගේම, Sena Mills Refineries කියලා තව ආයතනයක් තිබෙනවා. VAT එක ගෙවන්න මේගොල්ලන් register වෙලා තිබෙනවා. හැබැයි, අවසාන වතාවට VAT ගෙවලා තිබෙන්නේ 2023.08.25වැනි දා. ඒ වාගේම, Amro Sugars කියලා ආයතනයක් ගැන එතුමා කිව්වා. ඒ ආයතනය VATවලට register වෙලා නැහැ. සමහර අය බලාගෙන ඉන්නවා, ආණ්ඩුව ආපු ගමන් මේ දේවල් අල්ලලා අවශ්‍ය කටයුතු කරයි කියලා. අපි මේකට අදාළ ක්‍රියා මාර්ග නීත්‍යානුකූලව අරගෙන තමයි මේ වැඩ ටික කරමින් යන්නේ. ඒ නිසා මම කියන්න කැමතියි, අපි මේ කටයුත්ත මේ වනවිට කරමින් සිටින්නේ කියන එක.

ඒ වාගේම, අද උදේ මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් සමහර සමාගම් පිළිබඳව කියන්නට උත්සාහ කළා. සතොසට computer system එක දුන්නේ අපි බලයට ඇවිල්ලා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සතොසට computer system එක දුන්නාට, ඒ computer system එකේ ප්‍රශ්නයක් තිබෙනවා. තොග යනවා එකක; වෙළෙඳාම යනවා තව එකක. අපට මේ දෙකම එකට එකතු කරන්න වෙන්නේ අහින්. එහෙමයි දැන් වැඩේ වෙලා තිබෙන්නේ. ඒ නිසා දැන් අපි අලුත් system එකක් ගැන කථා කරමින් යනවා. මොකද, අද දවසේ සවස් වෙනකොට කොයි shop එකද, කොතැනද වෙළෙඳාම කළේ, කොච්චරද කළේ කියලා අපි දැනගන්න ඕනෑ. ඒ, ඒ shopsවල විතරක් නොවෙයි, අපි සතුව තිබෙන තොග කොච්චර ද කියාත් අපි දැනගන්න ඕනෑ. ඒ නිසා මේ ආයතනවල සියලු පද්ධතිවලම තිබ්බිව අවිධිමත්කමයි මෙයින් පෙනෙන්නේ. නිකම් නොවෙයි, මේවා වහන්න දාපු ආයතන. 2023දී ලක් සතොසත් වසා දමන්න තමයි හැදුවේ.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෘත්තීය සමිති නායකයෙක් ගැන කිව්වා. 2004 අවුරුද්දේ මේ සතොස හදපු දවසේ ඉඳන් අන්තර් සමාගම් සේවක සංගමයේ හිටපු කෙනෙක් ගැන තමයි එතුමා ඒ කිව්වේ. ඔහු අදත් ඉන්නවා. ඔවුන්, ඔවුන්ගේ සුදුසුකම්වලට තමයි තනතුරුවලට පත් කරලා තිබෙන්නේ. වෘත්තීය සමිතියක හිටියා කියලා සුදුසු නැති කෙනෙක් කිසිම තනතුරකට අපි පත් කර නැහැ. ඒ නිසා තනතුරුවල ඉන්න නුසුදුසු අය අද ඒ තනතුරු දාලා යනවා.

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ පැවති ආණ්ඩු මේ සේවකයන් දඩයම් කළා. වැරදි චෝදනා දාලා, බොරු චෝදනා එල්ල කරලා, බොරු කරුණු කියලා සේවකයන් දඩයම් කළා. ඒ නිසා අපි අධිකරණවල පවතින නඩුවලට මාසිකව විශාල මුදලක් ගෙවනවා. සමහර පරීක්ෂණ මණ්ඩලවලට අපි සැහෙන්න මුදලක් වියදම් කරනවා. ඒ නිසා අපි ඒවාත් නිවැරදි කරලා, මේ සියලුදෙනාත් එක්ක එකතු වෙලා සතොස ආයතනය ගොඩනැඟීමට අවශ්‍ය කටයුතු කරනවා.

මේ අතරම කියන්න උත්සාහ කළා, E&Y එක ජනාධිපතිතුමාගේ උපදේශකයෙකුගේ සමාගමක්, ඒකට අපි ටෙන්ඩර් දුන්නා කියලා. නැහැ, ටෙන්ඩර් පටිපාටිය යටතේ කාටද හම්බ වෙන්නේ, ඒ අයට ඉස්සරහටත් හම්බ වෙයි. මොකද, මේ පාර්ලිමේන්තුවේම ඉන්න සමහර මන්ත්‍රීවරුන්ට අයිති කොම්පැනිවලට රජයේ ආයතනවල ටෙන්ඩර් දැනුත් හම්බ වෙලා තිබෙනවා. මම ඒ අයගේ නම් කියන්න ඕනෑ නැහැ. ටෙන්ඩර් පටිපාටිය යටතේ තමයි ඒගොල්ලන්ට ඒවා හම්බ වුණේ. ඒක ඒ අයට අදාළයි. ටෙන්ඩර් එක අඩුම ගාස්තුවට දෙනවා නම් අපි ඒක දෙනවා. එහෙම නැතුව හිතවතුන්ට, යහළුවන්ට, කියලා නම් කර ගත්ත අයට වාගේ අපි මේවා දෙන්නේ නැහැ. ඒ නිසා අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන පද්ධතිය තවදුරටත් අපේ රටේ ජනතාවට පහසුකම් සපයන්න පුළුවන් ආයතන පද්ධතියක් ලෙස අපි ගොඩනඟනවා.

ඒ වාගේම තමයි, සමුපකාර ව්‍යාපාරය. සමුපකාර ව්‍යාපාරය වසා දමන්න හදපු ව්‍යාපාරයක්. සමුපකාර අරමුදල්වලින් ණය දීලා පසුගිය කාලයේ ඒ ණය එකතු කරගෙන නැහැ කියලා අපේ නියෝජ්‍ය අමාත්‍ය ගරු ආර්.එම්. ජයවර්ධන මැතිතුමා කිව්වා. ඒ දවස්වල මේවා දුන්නේ හිතවත්කම්වලට තමයි. අද ඒ සමුපකාර ව්‍යාපාරය ගොඩනැඟීම පිළිබඳව අපි කථා කරද්දී බොහෝ තැන්වලින් අපට ඒ පිළිබඳ ආරාධනා එනවා. අපි ඒ සියලුදෙනාට කියනවා, ඔබතුමන්ලාගේ ඉදිරිපත් කරපු අදහස් අපි සැලකිල්ලට ලක් කරනවා කියලා. සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීම වෙනුවෙන් 2027 අවුරුද්ද වෙනකොට නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති දහසක් හදලා, අපේ රටේ නිෂ්පාදන ක්‍රියාවලියට මේ අය එකතු කරන්න අපි කටයුතු කරනවා. ඒ විධියට සමුපකාර ව්‍යාපාරය අපි ශක්තිමත් කරනවා.

ඒ විතරක් නොවෙයි. සමුපකාර බැංකු තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සමුපකාර බැංකු ණය දෙනවා. තැන්පතු එකතු කරනවා; ණය දෙනවා. අවසානයේදී අධ්‍යක්ෂ මණ්ඩල නැහැ, තැන්පතුකරුවන්ගේ තැන්පතුත් නැහැ. අපේ නියෝජ්‍ය ඇමතිතුමා මේ ගැන කිව්වා. කොළඹ ගත්තොත්, මහරගම සමුපකාර සමිතියේ රුපියල් මිලියන 1,000ක් නැහැ, තැන්පතුකරුවන්ගේ සල්ලි. දෙහිවල, ගල්කිස්ස සමුපකාර සමිතියේ රුපියල් මිලියන 1,300ක් නැහැ. සීතාවක, අවිස්සාවේල්ල සමුපකාර සමිතියේ රුපියල් මිලියන 980ක් නැහැ. ඒ විධියට උකුවෙල, ගම්පහ ඇතුළු රට පුරා පිහිටි සමුපකාර ණය දෙන සමිති 68කට ආසන්න ප්‍රමාණයක තැන්පතුකරුවන්ගේ මුදල්වලට වග කියන්නේ නැති තත්ත්වයකට අද ඒවා පත්වෙලා තිබෙනවා. මොකක්ද හේතුව?

"සමුපකාර" කියලා පටන් ගත්තා, බිස්නස්. දකුණේ තිබුණා, "Wealth" කියලා ආයතනයක්. දැන් ඒක "Wealth Co-operative" බවට පත්වෙලා. "සමුපකාර" කියන නම අවභාවිත කරනවා. උතුරුමැද හිටපු ආණ්ඩුකාරවරයා පටන් ගත්තා, ඒ වාගේ එකක්. ඌව පළාතේ මන්ත්‍රීවරයෙක් එක්ක සම්බන්ධ තවත් සමුපකාරයක් තිබෙනවා. එහෙම කොහේද සමුපකාර තිබෙන්නේ? කළු සල්ලි සුදු කරන්න සමුපකාර හදලා නැහැ ලෝකයේ. හැබැයි අපේ රටේ කළු සල්ලි සුදු කරන්න සමුපකාර හදලා තිබෙනවා. ඒ නිසා අපි සමුපකාර ව්‍යාපාරය ගොඩනැඟීම සඳහා සමුපකාර නීතිය සංශෝධනය කරනවා. දැන් ඒවා තිබෙන්නේ පළාත් සභා යටතේ. අපි සමුපකාර නීතිය සංශෝධනය කරනවා. අපි ඒකට පනත් කෙටුම්පත් තුනක් හදමින් තිබෙනවා. පළාත් සභාවල තිබෙන සමුපකාර එහෙම ක්‍රියාත්මක වෙද්දී, ඒ බැංකු monitor වෙන්නේ නැහැ. බැංකුව තවත් ශාඛාවක් පිහිටුවද්දී අවසර ගන්නේ නැහැ. අද අපේ රටේ ප්‍රධාන බැංකුවක් වුණත්, මුදල් තිබුණත්, ශාඛාවක් පිහිටුවනවා නම් මහ බැංකුවේ අනුමැතිය ගන්න ඕනෑ. හැබැයි මේ බැංකු? මේ බැංකු ගම් ඇතුළට ගිහිල්ලා "බැංකු" කියලා බෝඩ් එක ගහගෙන සල්ලි එකතු කරනවා. අවසානයේදී බැංකුවත් නැහැ; මිනිසුන්ට ඉඳගෙන ඉන්න බංකුවත් නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ අවිධිමත්, වසා දමන්න නියමිතව තිබුණු සමුපකාර ව්‍යාපාරය විධිමත්ව ගොඩනැඟීම සඳහා, නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති, පාරිභෝගික සමුපකාර සමිති, බැංකු පද්ධතිය ඇතුළු මේ ක්‍රියාවලිය ශක්තිමත් කරද්දී එයටම අවශ්‍ය රැකවරණය ලබා දීමේ රක්ෂණයකුත් අවශ්‍යයි.

දැන් Co-operative Insurance Company Limited කියලා තිබෙනවා. ඒක අයිති කාටද? ඒක සමුපකාර සමිතිවලටයි අයිති. සමුපකාර සමිතිවල කොටස්වලින් තමයි Co-operative Insurance Company Limited එක සකස් වෙලා තිබෙන්නේ. හැබැයි, අද කොටස් වෙළෙඳ පොළේ තිබෙනවා ඒක. හැබැයි අපේ සමුපකාර හරි, අපේ ආයතන හරි insurance කරනවා වෙනුවට අපි වෙන වෙන ඒවා කරමින් ඉන්නවා. ඒ නිසා

සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කරද්දී ඒකට අවශ්‍ය රැකවරණය, රක්ෂණය ලබා දීම සඳහා අපි සමුපකර රක්ෂණ සමාගමත් ශක්තිමත් සමාගක් බවට පත් කරන්න ඕනෑ.

ඒ සමාගම ඇතුළේ පසුගිය කාලයේ චෝදනා ලැබුවන් හිටියා. අපි කියන්නේ ඒක අද listed company එකක්. ඒ නිසා අදාළ ගිණුම් භාර දෙන එකත්, අවශ්‍ය කටයුතු කරන එකත් company එකක් හැටියට අද ඒ ආයතනයේ වගකීමක්. ඒ වාගේම අදාළ සමුපකාර අධ්‍යක්ෂවරු තෝරද්දී ඒ අධ්‍යක්ෂවරයා තෝරා යැවීමේ වගකීම තිබෙන්නේත් අදාළ සමුපකාරයට. මොකද, එක එක සමුපකාරවල කොටස් හිමිකමට තමයි අධ්‍යක්ෂවරයෙක් පත් වෙන්නේ. ඒ අනුව සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස ගොඩනඟන්න අපි කටයුතු කරනවා.

සමාගම් මැදුර අපට තමයි අයිති වෙන්නේ. ඒ නිසා සමාගම් මැදුර යටතේ අපි තවදුරටත් ප්‍රාග්ධන වෙළෙඳ පොළට යන්න ඕනෑ. සමාගම් 254යි තිබෙන්නේ කොටස් වෙළෙඳ පොළේ. ඒ 254න් අපට යන්න බැහැ. සාමාන්‍යයෙන් රුපියල් බිලියන 10කට වඩා වැඩි වත්කම් තිබෙන සමාගම් 75කට-77කට ආසන්න සංඛ්‍යාවක් අපේ රටේ තිබෙනවා. රුපියල් බිලියනයකට වඩා වැඩි වත්කම් තිබෙන සමාගම් 800කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. ඒ නිසා රුපියල් මිලියන 200කට වැඩි වත්කම් සහිත සමාගම් කොටස් වෙළෙඳ පොළට ගෙන ඒම සඳහා ඉදිරියේදී ඒ සමාගම්වල නියෝජිතයන් සමඟ සාකච්ඡා කරලා අපි කටයුතු කරනවා. අපි ප්‍රාග්ධන වෙළෙඳ පොළ ශක්තිමත් කරන්න කටයුතු කරනවා.

ඒ වාගේම ලෝක වෙළෙඳාමේදී අපට තිබුණු බාධාවක් තමයි Geographical Indication එක නොමැති වීම. 2003දී ගෙනාපු පනත 2022දී සංශෝධනය කළත් අපට GI එක ගන්න බැරි වුණා. ඒ නිසා අපි ඒකට අවශ්‍ය නීති සංශෝධනය කරලා, අපේ රටේ නිෂ්පාදකයන් සඳහා GI එක අරගෙන දෙන්න කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි, අපි එතැනින් එහාට යන්න ඕනෑ. අපේ නිෂ්පාදකයන්, අපේ නිෂ්පාදන වාගේම, අපට උරුම වෙච්ච සංගීතය වෙන්න පුළුවන්, සාම්ප්‍රදායික කලාව වෙන්න පුළුවන්, සාම්ප්‍රදායික නිෂ්පාදන වෙන්න පුළුවන්, නව සොයා ගැනීම් වෙන්න පුළුවන්, මේවාත් එක්ක අපි ලෝක වෙළෙඳ පොළට යද්දී ඒ අවශ්‍ය රැකවරණය අපේ රටේ නිෂ්පාදකයන්ට ලබා ගැනීම සඳහා අපි මේ අවුරුද්ද ඇතුළත Madrid Protocol එක අත්සන් කරන්න කටයුතු කරනවා. එවැනි විශාල කටයුත්තක් කරන්න අපි අපේ අමාත්‍යාංශය හරහා වැඩ කරමින් ඉන්නවා. නමුත් අපට විවිධ චෝදනා එල්ල කළා. මම කිව්වේ ඒකයි. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන ගත්තොත්, අපි සතොස, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව ශක්තිමත් කරනවා. ශක්තිමත් කරන්නේ නිකම් නොවෙයි. අපි ඉස්සරහට පිටකොටුවේ හරි පොළොන්නරුවේ හරි-

ගරු චානක මාදුගොඩ මහතා
(මාණ්පුමිකු சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු ඇමතිතුමනි, -

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චානක මාදුගොඩ මහතා
(මාණ්පුමිකු சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
භාණ්ඩ මිල අඩු කිරීම සඳහා රජය පැත්තෙන් මොනවා හෝ විසඳුමක් තිබෙනවාද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
සමහර ආයතනවල තිබෙන භාණ්ඩ සම්බන්ධව ඔබතුමා මතු කරන ඔය ප්‍රශ්නය තිබෙනවා. නමුත් ඔබතුමාට අපි කියනවා, ප්‍රධාන භාණ්ඩ වර්ග 40ක මිල අඩු කර සතොස හරහා ලබා දෙන බව. මගේ අතේ තිබෙන මේ ලේඛනය මම අද සභාගත කළා, මේක මෙතැනදී කියවන්න වෙලාව නැති නිසා. ප්‍රධාන, අත්‍යවශ්‍ය භාණ්ඩ වර්ග 40ක මිල අපි සියයට 20කින් අඩු කර තිබෙනවා, පසුගිය ජනවාරි මාසය එක්ක සංසන්දනය කරන විට. තවදුරටත් භාණ්ඩ මිල අඩු කර සහන ලබා දීමට අපි කටයුතු කරනවා. ඔබතුමා කියන එක හරි. *[බාධා කිරීමක්]* මම කියන්නම්. ඒකට හේතුව දයාසිරි මන්ත්‍රීතුමා කියපු කාරණයම තමයි. අපි දැන් බඩු ගන්නේ කොහෙන්ද? අපට සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව තිබෙනවා. හැබැයි, ඒ අය බඩු ගෙනෙන්නේ නැහැ, ඒක වහලා. ඒක ලොරි ටිකත් එක්ක කුණුකොල්ලෙට විකුණලා පසුගිය ආණ්ඩු. ඒක ලොරි ටිකත් එක්ක කුණුකොල්ලෙට විකුණලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙලාව අවසන්, ගරු ඇමතිතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
සතොස ආයතනවලට භාණ්ඩ ගෙනෙන්න තිබෙන ආයතනය. තොග වෙළෙඳාමට සම්බන්ධ වෙන ආයතනය වසා දමලා ගරු මන්ත්‍රීතුමනි. නමුත් අපි ඒක නැවත ආරම්භ කරනවා. මේ අවුරුද්ද ඇතුළත තොග වෙළෙඳ මධ්‍යස්ථාන තුනක් කොළඹ, මාතර සහ කුරුණෑගල ආරම්භ කරනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
Orders [Col. 3345]

RAJARATA UNIVERSITY OF SRI LANKA:
Annual Report (2021) [Col. 3346]

CEYLON PETROLEUM STORAGE TERMINALS LIMITED (CPSTL):
Annual Report (2021) [Col. 3347]

CEYLON PETROLEUM STORAGE TERMINALS LIMITED (CPSTL):
Annual Report (2022) [Col. 3347]

NATIONAL INSTITUTE OF OCCUPATIONAL SAFETY AND HEALTH:
Annual Report (2020) [Col. 3348]

NATIONAL INSTITUTE OF OCCUPATIONAL SAFETY AND HEALTH:
Annual Report (2021) [Col. 3348]

INLAND REVENUE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and Passed [Cols. 3349– 3378]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 20වන බ්‍රහස්පතින්දා
2025 மார்ச் 20, வியாழக்கிழமை
Thursday, 20th March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXIX කොටස; සහ
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXVIII හා XXIX කොටස්, සිව්වැනි කාණ්ඩයේ XX හා XXI කොටස් සහ හයවැනි කාණ්ඩයේ XXVI, XXVII, XXVIII හා XXIX කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 08 දිනැති අංක 2418/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

මෙම නියමය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2020 සහ 2021 වර්ෂ සඳහා ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) අංක 01/2025 දරන මත්පැන් සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් සුරාබදු ආඥාපනතේ (52 පරිච්ඡේදය) 22 වන වගන්තිය යටතේ සුරාබදු නිවේදනය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නියමය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ නියමය;

(iv) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ, ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර එළඹී ගිවිසුම සංශෝධනය කරන ලද සන්ධාන පත්‍රය; සහ

(v) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තා මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මම මේ ගැන සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, එක කාරණාවක් පැහැදිලිව ඔබතුමාට ඉදිරිපත් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. සිගරැට් සම්බන්ධයෙන් තිබෙන බද්දේ යම්කිසි සංශෝධනයක් කරන්න රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමැතිය ඉල්ලුවාම අපි ඒ අවස්ථාවේදී ඒ සඳහා අනුමැතිය දුන්නේ නැහැ. ඔවුන්ට නැවතත් ඒ කාරක සභාවට පැමිණිලා ඒක logically අපට විශ්ලේෂණය කරන්න කියලා කිව්වා. ඔවුන් ඒක කළා. ඔබතුමන්ලාට විසර්ජන පනත් කෙටුම්පත සම්මත කර ගන්න අවශ්‍ය නිසා අපට ඒක තවවුරටත් කල් දාන්න බැරි නිසා අපි එය සම්මත කළා. මොකද, නැත්නම් මෙතැන අවුලක් ඇතිවන නිසා.

ගරු කථානායකතුමනි, නමුත් මේ සිගරැට් බද්ද ගහන විධිය වැරදියි. ඔබතුමන්ලා අහගෙන ඉන්නවා නම්, අද මගේ කථාවෙන් මම ඒක විශ්ලේෂණය කරලා පෙන්වන්නම්. ලෝක සෞඛ්‍ය සංවිධානය, UNDP එක ඇතුළු ඒ හා සම්බන්ධ සියලු සංවිධාන කියලා තිබෙන්නේ tax-in-price කියලා. ඒ කියන්නේ සිගරැට් එකක් විකුණන කොට ඒකට සියයට 75ක බද්දක් පනවන්න ඕනෑ. ඒ බදු ප්‍රමාණය වසර කිහිපයක් තුළ පහළට එමින් පවතිනවා. මොනයම් හෝ හේතුවක් නිසා ආණ්ඩුවට එන ආදායමට වඩා ආයතනයට ලැබෙන ලාභය වැඩියි. ඒ, මොනයම් හෝ හේතුව මොකක්ද කියලා අපි දන්නවා. මම මේ චෝදනාවක් එල්ල කරනවා නොවෙයි. මේක හරියට විශ්ලේෂණය කර නොගත් නිසා ආයතනයට ලැබෙන ලාභය අතිවිශාලයි, ආණ්ඩුවට ලැබෙන ආදායමට වඩා. එම නිසා මම යෝජනා කරනවා, සිගරැට්වලට ගහන බද්ද සම්බන්ධයෙන් අලුතින් හිතන්න කියලා. ඒ ගැන අපි මෙතැන සාකච්ඡා කළා. ආණ්ඩුවෙන් පෙන්වා දුන්නා, උද්ධමනයට තවත් සියයට හතරක් එකතු කරලා තමයි මේ බද්ද ගහන්නේ කියලා. ඒගොල්ලන් කියනවා, උද්ධමනය සියයට 1.9යි කියලා. ඒ වාගේම සියයට 4 කියන ඉලක්කමත් ඒගොල්ලන් ඉදිරිපත් කරනවා. ඒකට හරියටම තර්කයක් ඉදිරිපත් වෙන්නේත් නැහැ. නමුත් ඒ සියයට 4යි, සියයට 1.9යි එකතු කරලා සියයට 5.9කට මේ බද්ද ගහලා තිබෙනවා. ඒ පැත්තෙන් බැලුවාම, අපි පෙන්වලා දුන්නා ඇත්ත වශයෙන්ම පසුගිය අවුරුද්දේ උද්ධමනය සියයට 1.9 නොවෙයි, සියයට 1.2යි කියලා. එහෙම නම් ඔය බද්ද වදින්න ඕනෑ සියයට 5.2ට, සියයට 5.9ට නොවෙයි. නමුත් ගෝල්ඩ් ලීෆ්, කැප්ස්ටන්, ජෝන් ප්ලේයර් ගෝල්ඩ් ලීෆ් කියන මේ ඔක්කෝටම එක බද්ද ගහනකොට automatically මේකේ discrepancy එකක් නිර්මාණය වෙනවා. එහෙම discrepancy එකක් නිර්මාණය වෙනකොට අලුත් සිගරැට් ඉදිරිපත් කරලා ඒවාට කට්ටිය අල්ලා ගන්නවා. ඒකට තර්කය තමයි, එහෙම නැති වුණොත් ඒ කට්ටිය බීඩි බොන්න උනන්දු වෙනවා කියන එක.

මම මේ අවස්ථාවේදී මෙම ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කරනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හැටියට අපි මේක සම්මත කළේ අය වැය pass කර ගැනීමේ අවශ්‍යතාව නිසායි. එහෙම නැතුව වෙන මොකක්වත් නිසා නොවෙයි. අලුතෙන්ම සිගරැට් බද්ද පැනවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ තීරණයක් ගන්න ඕනෑ කියන එක තමයි මගේ යෝජනාව, ගරු කථානායකතුමනි. අපිත් ඒ සඳහා සහභාගි වෙන්නම්. බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා. පළමුවෙනි කාරණය මෙයයි. Budget එක pass කර ගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් තිබෙන යෝජනාව pass කර ගැනීම සඳහා මේ යෝජනාව අනුමත කර දුන්නා කියන එක සාධාරණ ප්‍රකාශයක් නොවෙයි. මොකද, කමිටුවක් විධියට මේක deliberate කරලා, මේ පිළිබඳව විශ්ලේෂණය කරලා, කමිටුව විසින් එකඟතාවකට ඇවිල්ලා තමයි ඒ approval එක දෙන්නේ. තනි පුද්ගල මතයක් නොවෙයි එතැන නියෝජනය වෙන්නේ. මේ සඳහා approval එක දුන්නේ සෑහීමකට පත් වීමෙන් පසුවයි. ඔබතුමා ඒ කමිටුව තුළදී එදාත් ප්‍රශ්න කළා, ජාත්‍යන්තරය සිගරැට්වලට සියයට 75ක් tax ගහනවා, ඒක විශ්ලේෂණය කරලා බැලුවාද කියලා. රාජ්‍ය නිලධාරීන් එම කාරක සභාවේදී දත්ත සපයමින් පෙන්නුවා, මේ කලාපය - region එක - දිහා බලලා, ශ්‍රී ලංකාවේ ඉතිහාසය දිහා බලලා, ශ්‍රී ලංකාව තුළ මෙම බද්ද අය කරන ප්‍රතිශතයට සාධාරණ basis එකක් තිබෙනවා කියලා. ඒ පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසුව තමයි මේකට එකඟතාව පළ කළේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මට පොඩි කාලයක් ලබා දෙන්න, මේ කාරණය වැදගත් දෙයක් නිසා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණාව පිළිබඳව අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේ ඔබතුමාට නියමිතව තිබෙන කථාවේදී ඉදිරිපත් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම ඉක්මනට කථා කරන්නම්, ගරු කථානායකතුමනි. මට විනාඩියක කාලයක් ලබා දෙන්න. *[බාධා කිරීමක්]* මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ මතය මම ප්‍රතික්ෂේප කරනවා. මම මේ කාරක සභාවේ සභාපති වුණේ අද ඊයේ නොවෙයි. අවුරුදු 15ක් අපි කාරක සභාවල ඉඳලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක විවාදයක් කර ගන්න බැහැ. කරුණාකරලා අසුන් ගන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, කාරක සභාවේ සභාපති හැටියට මට මේක විසඳා ගන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක විවාදයක් කර ගත යුතු කාරණාවක් නොවෙයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
විවාදයක් නොවෙයි, ගරු කථානායකතුමනි. කාරක සභාවේ සභාපති හැටියට මම එහි වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ පැහැදිලි කිරීම් සඳහා මට විනාඩියක කාලයක් ලබා දෙන්න. මම ඔබතුමාට කරදර කරන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා වාර්තාව ඉදිරිපත් කළා. අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදීත් ඔබතුමාට කථාවක් තිබෙනවා නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මගේ මතය සම්බන්ධයෙන් මට විවෘතව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව දෙන්න. මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරක සභාවේ සභාපතිතුමා ඉදිරිපත් කරන තර්කයට පරස්පර අදහසක් එහි සාමාජිකයෙක් විසින් ඉදිරිපත් කරන්න ගියාම ඒක ගැටලුසහගතයි. මොකද, වාර්තාවක් ඉදිරිපත් කරනකොට ඒ වාර්තාව,-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම කාරක සභාවේ සභාපති. ඒ නිසා මට විනාඩියක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කාරක සභාව තුළ ඔය ප්‍රශ්නය විසඳා ගන්නවා නම් වඩාත් සුදුසුයි කියලා මම හිතනවා. මේ පිළිබඳව ගරු කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමියත් මා සමඟ සාකච්ඡා කළා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ හරයට අපි කවුරුත් එකඟයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමා ඒකට එකඟ නැහැ නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ, එතුමාත් එකඟයි. *[බාධා කිරීමක්]* ඔබතුමා කියපු වචනයක් සම්බන්ධයෙන් නේ එතුමා පැහැදිලි කළේ. එහෙම නැතුව මේ cigarette tax එක සම්බන්ධව නොවෙයි වාදය තිබෙන්නේ. ඔබතුමා මේක අනුමත කළේ මේ පදනම නිසාය කියලා කියපු එකත් එක්කයි ඒ කාරණය මතු කළේ. *[බාධා කිරීමක්]* අපි කවුරුත් ඔබතුමා කරන මේ සේවයට ගරු කරනවා, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි. ඔබතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සිදු කරන සේවයට අපි ගරු කරනවා. ඒක මම කලිනුත් කියලා තිබෙනවා. මම හිතන විධියට, ප්‍රශ්නය ආවේ මෙන්න මේ නිසා. ආණ්ඩුවට අය වැය සම්මත කරගන්න ඕනෑ නිසා cigarette tax එක සම්මත කරලා දුන්නා කිව්වාම, එහි වෙන implication එකක් තිබෙනවා. ලංකාවේ ඉන්නවා නේ නයි අරින media ටිකකුත්.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීතුමියක් වන ගරු කෞෂල්‍යා ආරියරත්න මැතිනියත් මට මේ ගැන මීට දින කිහිපයකට කලින් කිව්වා. මමත් මේ ගැන උනන්දුසහගත පුද්ගලයෙක්. මම කැමැතියි, ඔබතුමාගේ අවසරය මත Institute of Policy Studies of Sri Lanka විසින් නිකුත් කළ "The Case for

[ගරු බිමල් රත්නායක මහතා]

Raising Tobacco Taxes in the National Budget for 2023" නැමැති Policy Paper එක ඉදිරිපත් කරන්න. අපි IPS එකේ Policy Papers ගොඩක් පිළිගන්නවා. ඒකේ නිශ්චිත කරුණක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එහි මෙසේ සඳහන් වනවා:

> "IPS estimates that the government could have earned LKR 23.6 billion in additional excise tax revenue if a single excise tax for cigarettes of all lengths was introduced according to the formula in 2021."

මම කියන්නේ, මේවා එකක්වත් අපි දේව වාක්‍ය ලෙස ගන්න ඕනෑ නැහැ කියන එකයි. නමුත්, මේ cigarette tax එකේ manipulation එකක් තිබෙනවා. මේකට influence එකක් තිබෙනවා කියන එක මම හිතන විධියට අපි කවුරුත් දන්නා දෙයක්. ඒ නිසා මම හිතනවා, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා යෝජනා කළ විධියට ඒ කාරක සභාවේ මන්ත්‍රීතුමන්ලාට මේක කරගන්න පුළුවන් කියලා. මොකද, ඒක බොහොම constructive debates යන කාරක සභාවක්. ඒ නිසා එම කාරක සභාව එකතු වෙලා මේක රටට වාසිදායක වන විධියටත්, මිනිස්සුන්ගේ health එකට වාසිදායක වන විධියටත් තීන්දු කරන්න කියන ඉල්ලීම තමයි මට කරන්න තිබෙන්නේ. මම මේ අවස්ථාවේදී Policy Paper එකේ printed copy එක **සභාගත*** කරනවා.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මොරටුව, කල්දමුල්ල, ඊබට් පටුමග, අංක 62 දරන ස්ථානයෙහි පදිංචි අයි.එන්. වැලිගම මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නුගේගොඩ, ජම්බුගස්මුල්ල මාවත, 9 වැනි පටුමග, අංක 16 දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්.එන්. සේනානායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු අශෝක ගුණසේන මහතා
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, දඹදෙණිය, කුරුණෑගල පාර යන ලිපිනයෙහි පදිංචි ස්වර්ණ මූර්ති රණතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, ගම්පහ, විජය පාර, අංක 96/1 දරන ස්ථානයෙහි පදිංචි පද්මා මාලිනී මහගමාරච්චි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යැවිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

රජයේ ආයතන: ආරක්ෂාව සපයන සමාගම්
அரச நிறுவனங்கள்: பாதுகாப்பு வழங்கும் கம்பனிகள்
GOVERNMENT INSTITUTIONS: COMPANIES PROVIDING SECURITY

4/2024

1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු මුළු රජයේ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ ආරක්ෂක සේවා සපයනු ලබන ආරක්ෂක සමාගම්වල නම් කවරේද;

(iii) ඒ අතරින් රජයේ සමාගම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් රජයේ ආයතනවල ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවා සමාගම්වලට ගෙවන ලද මුදල එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රජයේ ආයතනවලට ආරක්ෂාව සැපයීමට අදාළ කොන්ත්‍රාත් ලබා ගැනීමේදී වංචනික ක්‍රියා සිදු වන බව දන්නේද;

(ii) එසේ නම්, රජයේ ආයතනවලට ආරක්ෂක සේවා සැපයීම, රජය සතු ආරක්ෂක සමාගම්වලට ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදු නිරුවාහ, මාකාණ සපෙකල් මත්‍රුම් උල්ලූරාට්චි අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் தற்பொழுதுள்ள அமைச்சுகள், திணைக்களங்கள், நியதிச் சட்ட சபைகள் உள்ளிட்ட மொத்த அரச நிறுவனங்களின் எண்ணிக்கை எத்தனை;

(ii) மேற்படி ஒவ்வொரு நிறுவனத்திலும் பாதுகாப்புச் சேவைகளை வழங்குகின்ற பாதுகாப்புக் கம்பனிகளின் பெயர்கள் யாவை;

(iii) அவற்றுள் அரச கம்பனிகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை;

(iv) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரையில் மேற்படி ஒவ்வோர் அரச நிறுவனத்தினதும் பாதுகாப்புச் சேவைக்காக தனியார் பாதுகாப்புக் கம்பனிகளுக்குச் செலுத்தப்பட்ட பணத்தொகை ஒவ்வொரு கம்பனியின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரச நிறுவனங்களுக்குப் பாதுகாப்பை வழங்குவது தொடர்பான ஒப்பந்தங்களைப் பெறுகின்றபோது மோசடி நடவடிக்கைகள் இடம்பெறுகின்றது என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அரச நிறுவனங்களுக்குப் பாதுகாப்புச் சேவை வழங்கும் செயற்பாட்டை அரசுக்குரிய பாதுகாப்புக் கம்பனிகளுக்கு வழங்குவதற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House the -

(i) total number of government institutions including Ministries, departments and statutory boards existing in Sri Lanka at present;

(ii) names of the security companies providing security services at each of the institutions;

(iii) number of government companies among them and their names; and

(iv) amount paid to each private security service company for the provision of security services at each of the aforesaid government institution from the year 2015 to up to now, separately?

(b) Will he also inform this House -

(i) whether he is aware that frauds take place in obtaining contracts relating to provision of security in government institutions; and

(ii) if so, what measures will be taken to assign State-owned security companies to perform the task of providing security services to government institutions?

(c) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අංක 2412/08 හා 2024 නොවැම්බර් මස 25 වැනි සඳුදා දින නිකුත් කර ඇති අති විශේෂ ගැසට් පත්‍රය අනුව,

අමාත්‍යාංශ	- 24
දෙපාර්තමේන්තු	- 87
ව්‍යවස්ථාපිත මණ්ඩල	- 376

(ii) 2015 සිට 2024 දක්වා කාලය තුළ අමාත්‍යාංශ වරින් වර වෙනස් වීම හේතුකොටගෙන පිළිතුරු ගොනු කිරීමේ අපහසුතා බොහෝ ආයතනයන්ට පැන නැඟී ඇති බැවින් පිළිතුරු ලබා දීම සඳහා කල් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත් දන්වා සිටින අතර දැනට ලැබී ඇති පිළිතුරු පහත පරිදි ඉදිරිපත් කරමි.

1. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය - ඇමුණුම 01
2. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය - ඇමුණුම 02
3. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය - ඇමුණුම 03
4. කම්කරු අමාත්‍යාංශය - ඇමුණුම 04
5. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය - ඇමුණුම 05
6. බලශක්ති අමාත්‍යාංශය - ඇමුණුම 06
7. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය - ඇමුණුම 07
8. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - ඇමුණුම 08
9. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - ඇමුණුම 09
10. කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය - ඇමුණුම 10
11. ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය - ඇමුණුම 11
12. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ඇමුණුම 12
13. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - ඇමුණුම 13
14. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - ඇමුණුම 14
15. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - ඇමුණුම 15
16. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - ඇමුණුම 16
17. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය - ඇමුණුම 17
18. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය - ඇමුණුම 18
19. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය - ඇමුණුම 19
20. ආරක්ෂක අමාත්‍යාංශය - ඇමුණුම 20
21. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය - ඇමුණුම 21

අදාළ පිළිතුරු 1 සිට 21 දක්වා වූ ඇමුණුම්වල ඇතුළත් කර තිබෙනවා.

(iii) රජයේ සමාගම් සංඛ්‍යාව දෙකකි.

01. සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම
02. සී/ස එල්.ආර්.ඩී.සී. සේවා (පෞද්ගලික) සමාගම

ඊට අමතරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ද ආරක්ෂක සේවාවන් සපයනු ලබයි.

(iv) අදාළ තොරතුරු අංක 1 සිට 21 දක්වා වූ ඇමුණුම්වල ගොනු කර ඇත.

(ஆ) (i) අදාළ තොරතුරු අංක 1 සිට 21 දක්වා වූ ඇමුණුම්වල ගොනු කර ඇත.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(ii) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු සහ රජයේ සමාගම්, රාජ්‍ය සංස්ථා සඳහා ආරක්ෂක සේවා ලබා ගැනීමට අදාළව 2010.08.12 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ 445 එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කර ඇත. එය ඇමුණුම 22 ලෙස ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව, රජය සතු ආරක්ෂක සමාගම්වලින් රජයේ ආයතනවලට ආරක්ෂක සේවා සපයා ගැනීමට හැකියාව ඇත.

(ඇ) අදාළ නොවේ.

පිළිතුරට අදාළ අංක 1 සිට 22 දක්වා ඇමුණුම් ඇතුළත් සීඩී තැටි දෙකක් මම **සභාගත*** කරනවා.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(මාණ්පුමිකු හේෂා විතානකේ අංකුම්පුර ආරච්චි)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු ඇමතිතුමනි, (ආ) (i) පිළිතුරට අදාළ ආයතනවලින් මුල් දෙක තුන කියන්න පුළුවන්ද?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ඒ.එස්.එම්.එස්. අපයරත්න)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

අදාළ තොරතුරු අංක 1 සිට 21 දක්වා වූ ඇමුණුම්වල ගොනු කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(මාණ්පුමිකු හේෂා විතානකේ අංකුම්පුර ආරච්චි)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, සාර්ථක පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, අපේ රටේ රාජ්‍ය ආයතන ඉතා විශාල ප්‍රමාණයක් තිබෙන බව පැහැදිලියි, මේ පිළිතුරත් එක්ක. අමාත්‍යාංශ 24ත්, ව්‍යවස්ථාපිත මණ්ඩලත් ඇතුළුව මම හිතන විධියට ආයතන 400කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. එයින් ඉතාම කුඩා ප්‍රමාණයකට තමයි රාජ්‍ය ආයතනයක් විසින් ආරක්ෂාව සැපයීම සිදු කරන්නේ. රාජ්‍ය ව්‍යාපාර රාශියක් තිබෙනවා. එයින් බොහොමයක් ව්‍යාපාර පාඩු ලබනවා. ඉතා අතළොස්සක් ව්‍යාපාර ලාභ ලබනවා. මේ ව්‍යාපාරය පාඩු ලබන ව්‍යාපාරයක් නොවෙයි. ඒ නිසා අපට බැරිද රජයේ ඔය තිබෙන ආයතන දෙක පුළුල් කරලා, එක්කෝ ඒ ආයතන දෙකට අවශ්‍ය පහසුකම් ටික සපයලා මේ කටයුත්ත කරගන්න? මම ගරු අධ්‍යාපන ඇමතිතුමියගේත් අවධානයට මෙය යොමු කරනවා, පසුගිය කාලයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් විශාල වංචාවක් සිදුවෙලා, පාර්ලිමේන්තුවේත් කථා කළා. අපට බැරිද ගරු ඇමතිතුමනි, රජයේ ආයතන දෙක ශක්තිමත් කරලා මේ කටයුත්ත කරගන්න? යුද හමුදාවෙන් විශ්‍රාම යන පිරිස් ඉන්නවා. ඔබතුමා කිව්වා වාගේ සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන් ඉන්නවා. ඒ සියලුදෙනා එකතු කරගෙන, රජයේ ව්‍යාපාර වශයෙන් තිබෙන ඒ ආයතන දෙක පුළුල් කරලා, අපේ රටේ රාජ්‍ය ආයතනවලට ආරක්ෂාව ලබා දීමේ වගකීම ඒ ආයතන දෙකට ගන්න පුළුවන් නම් හොඳයි. මොකද, මහා විශාල වංචා, දූෂණ සිදු වෙනවා. ඔබතුමාට ඒ ලැයිස්තුව කියන්න බැරි වුණා. ආයතන ගණනාවක් කොන්ත්‍රාත් ලබා දීමේදී වංචා, දූෂණ සිදු කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ කියන්නේ ඔය ටික ඔක්කෝම. ඒ නිසා ඒ සම්බන්ධයෙන් රජයේ මැදිහත්වීමක් කරන්න පුළුවන්ද, බැරි නම් මොකක්ද තිබෙන අපහසුතාව කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ඒ.එස්.එම්.එස්. අපයරත්න)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා කියපු කාරණයට මම එකඟයි. මම ඒ ලේඛන ටික කලින් සභාගත කළා. අපි ඉදිරියේදී ඒ ගැන සලකා බලනවා. දැනටමත් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 445 යටතේ ඊට අවශ්‍ය ප්‍රතිපාදන සපයා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වීමේදී පසුගිය කාලයේ ගැටලු පැන නැගෙන්න ඇති. අපි ඒ පිළිබඳව අවධානය යොමු කරලා ඉදිරියේදී ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්න සූදානම්.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(මාණ්පුමිකු හේෂා විතානකේ අංකුම්පුර ආරච්චි)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ රටේ දූෂණ, වංචා, රාජ්‍ය දේපළ කොල්ලකෑම වාගේ දේවල් පිළිබඳව සොයනවා කියන එක මාතෘකා විතරයි. ඒවා ගැන කථා එළියට එනවා. ඒවා ආයෙත් කාලයේ වැලි තලාවෙන් වැසී යනවා. ඒ වාගේ එකක් තමයි ඇවන්ට් ගාර්ඩ් සිද්ධියත්. ඇවන්ට් ගාර්ඩ් සිද්ධිය ගැන මේ පාර්ලිමේන්තුවේ සති ගණන් කථා කළා. හැබැයි, ඒකට මුල පුරපු, ඒකට හයිය දීපු, ඒකට සම්බන්ධ සියලු දෙනා අද වනතුරුත් නිශ්ශබ්දව ඉන්නවා. අධිකරණමය ක්‍රියාමාර්ග ගන්නවා කියලා කවුරුහරි කියන්න පුළුවන්. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාත් මෙහි සිටින මේ වෙලාවේ මම කියනවා, සමාජය තුළ කතිකාවක් බවට පමණක් පත් වෙලා තිබුණු ඇවන්ට් ගාර්ඩ් මහා විශාල මුදල් වංචාව නිසා මේ රටට අහිමි වුණු මුදල් නැවත ලබා ගැනීමටත්, එම සිද්ධියට චෝදනා ලැබූ පිරිස සම්බන්ධව නිවැරැදි ක්‍රමවේදයක් හරහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමටත් මේක හොඳ වෙලාව බව.

ගරු ඇමතිතුමනි, මෙය ඔබතුමාගේ විෂය පථයට අදාළ නොවුණත් මේ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ගන්නවා කියා ඔබතුමා සමාජයට පොරොන්දුවක් දෙනවා ද, ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා යම්කිසි ආකාරයකට ක්‍රියාත්මක වෙනවා ද කියා මා දැනගන්න කැමැතියි. මොකද, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට මමත් පෞද්ගලිකව ඉතාම කැමැතියි, මේ කාරණා වෙනුවෙන් ක්‍රියාමාර්ග ගන්නවා නම්. පසුගිය කාලයේ මේ ගැන විවාද කළා විතරයි. ඒ විවාදවල ප්‍රතිඵලයක් නැහැ.

ගරු ඇමතිතුමනි, පෙරේදා ක්‍රිකට් ආයතනය ගැන කථා කරද්දී, ක්‍රිකට් ආයතනයෙන් හොඳ ගණනක් දීපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

එකම කොළය බලාගෙන ලස්සනට කථා කරනවා මම දැක්කා. විළිලජ්ජයි! ඒ තත්ත්වයට මේ රට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම අහනවා මේ වාගේ සිද්ධි නැවත ඇති නොවෙන්න ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රවේශයක් ගන්න මේ වන විට ඔබතුමන්ලා සූදානම් ද කියලා.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ඒ.එස්.එම්.එස්. අපයරත්න)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණයට අදාළව ගත්තොත්, අපි මේවා සාකච්ඡාවලට පමණක් සීමා කරන්නේ නැහැ කියන කාරණය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අවධාරණය කරන්න ඕනෑ. එසේ අයුතු ලෙස කටයුතු කරලා තිබෙන ආයතනවලට සහ පුද්ගලයන්ට එරෙහිව අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. ඒ නිසා කලබල වෙන්න එපා. අපි ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -63/2024- (2), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -75/2024- (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -211/2024- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -393/2025- (1), ගරු චාමර සම්පත් දසනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

රජයේ ආයතන ඩිජිටල්කරණය: ක්‍රියාමාර්ග
அரச நிறுவனங்களை டிஜிட்டல் மயப்படுத்தல்:
நடவடிக்கை
DIGITIZATION OF GOVERNMENT INSTITUTIONS: STEPS TAKEN

63/2024

2. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi on behalf of the Hon. Chaminda Wijesiri)
ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ලෝකයේ බොහෝ රටවල ආර්ථික කටයුතු ඇතුළු විවිධ කටයුතු සඳහා මේ වන විට ඩිජිටල් තාක්ෂණය භාවිත කරන බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ රජයේ ආයතන තුළ සිදු වන විවිධ දූෂණ හා වංචා වළක්වා ගැනීම සඳහා එම ආයතන තුළ ඩිජිටල්කරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

டிஜிட்டல் பொருளாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உலகில் அநேகமான நாடுகளில் பொருளாதார நடவடிக்கைகள் உள்ளிட்ட பல்வேறு நடவடிக்கைகளுக்கு இன்றளவில் டிஜிட்டல் தொழில்நுட்பம் பயன்படுத்தப்படுகின்ற தென்பதை அறிவாரா என்பதையும்;

(ii) இலங்கையில் அரச நிறுவனங்களில் இடம் பெறும் பல்வேறு ஊழல் மற்றும் மோசடிகளைத் தடுப்பதற்கு அந்த நிறுவனங்களை டிஜிட்டல் மயப்படுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Digital Economy:

(a) Will he inform this House -

(i) whether he is aware that digital technology is used at present in many countries of the world for various activities including economic activities; and

(ii) the courses of action to be taken in order to implement digitization in Government institutions of Sri Lanka in order to prevent various acts of fraud and corruption occurring in such institutions?

(b) If not, why?

ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
ගරු කථානායකතුමනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ශ්‍රී ලාංකික පුරවැසියන් සහ ව්‍යාපාර සඳහා නිරවුල් රජයේ සේවා සැපයීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය දියුණු කිරීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

1. ආර්ථිකය තුළ ඩිජිටල්කරණය හඳුන්වා දීම

ආර්ථික වර්ධනය සඳහා ඩිජිටල්කරණය අත්‍යවශ්‍ය මූලික අංගයක් වී ඇති අතර, මෙම රජය තාක්ෂණය උපයෝගී කර ගනිමින් ආර්ථිකය නව්‍යකරණය කිරීමට කැප වී ඇත. රජයේ ඩිජිටල් ප්‍රතිපත්තිය ප්‍රජා සේවා ඩිජිටල්කරණයට සහ මූල්‍ය ගනුදෙනු රහිත (cashless) ක්‍රම සලකා බැලීමට වැඩි අවධානය යොමු කරයි. ඩිජිටල් ක්‍රියාවලිය වේගවත් කිරීමෙන්, වඩා ඵලදායී පරිපාලනයක් සහිත, විනිවිදභාවයෙන් යුත් සහ තරගකාරී ආර්ථිකයක් ඇති කිරීමට අපි උත්සාහ කරමු.

2. ඩිජිටල්කරණය මඟින් අධික රෙගුලාසි සහ අවිධිමත් පරිපාලනය අඩු කිරීම

- ඉතා වේගයෙන් ඩිජිටල් ක්‍රම ක්‍රියාත්මක කිරීම මඟින් රජය මුහුණ දෙන දිගු කාලීන අපහසුතා නිරාකරණය කළ හැක. මෙහි ප්‍රධාන ප්‍රයෝජන නම්:
- රජයේ සේවා ක්‍රියාවලිය සැලකුම්ලත් කිරීම: රාජ්‍ය සේවා සහ ගෙවීම් ඩිජිටල්කරණය කිරීම මඟින් කාලය බෙහෙවින් අඩු කරමින් සේවා සැපයුමෙහි ඵලදායිතාව වැඩි කළ හැක.
- පරිපාලන ක්‍රියාවලි ස්වයංක්‍රිය කිරීම: ලියකියවිලි සත්‍යාපනය සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රිය කළ හැකි අතර, වර්තමානයේ පවතින කාලය ගතවන ක්‍රියාවලි අවම කාලයකින් සිදු කළ හැක.
- විනිවිදභාවය ඉහළ නැංවීම: ගනුදෙනු ඩිජිටල් කිරීම මඟින් ක්‍රියාවලීන් හොඳින් නිරීක්ෂණය කිරීමේ හැකියාව ලැබෙන අතර, වංචා අවම කරමින් විනිවිදභාවය ද වැඩි කළ හැක.
- වඩාත් හොඳ තීරණ ගත හැකි වීම: සජීවී දත්ත සහ ඩිජිටල් මෙවලම් උපයෝගී කර ගනිමින්, රජයේ ආයතනවලට වඩාත්ම වේගවත් සහ තොරතුරු සහිත තීරණ ගත හැක.

2.1 රජයේ ඩිජිටල්කරණ උපාය මාර්ගය
පවතින රජය පහත දැක්වෙන ප්‍රධාන ව්‍යාපෘති වහාම ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත:

[ගරු එරංග වීරරත්න මහතා]

- ශ්‍රී ලංකා ඒකාබද්ධ ඩිජිටල් හැඳුනුම්පත (SLUDI): මෙම ව්‍යාපෘතිය පුද්ගලයන්ගේ ජීවදත්ත (උදා: ඇඟිලි සලකුණු, මුහුණේ හැඩය, නෙත් සහ කළු ඉංගිරියාව හඳුනා ගැනීම) මත පදනම්ව ආරක්ෂිත සහ විශ්වසනීය හැඳුනුම්පත් පද්ධතියක් ලබා දීමට රජයට හැකියාව ලැබේ.

- උප්පැන්න, විවාහ සහ මරණ සහතික ලබා ගැනීම සඳහා මාර්ගගත වේදිකාව: 2025 පෙබරවාරි 7 දින, ජනාධිපතිතුමා විසින් විදේශගත ශ්‍රී ලාංකිකයන්ට මාර්ගගත ක්‍රමයට මෙම සහතික ලබා දීමේ සේවාවක් ආරම්භ කරන ලදී.

- ජනාධිපති අරමුදල සඳහා මාර්ගගත අයදුම් පත් භාර දීම: 2025 පෙබරවාරි 7 දින ජනාධිපතිතුමා විසින් මේ සඳහා වන මාර්ගගත වේදිකාව ක්‍රියාත්මක කරන ලදී. මෙයින් පුරවැසියන්ට මංගතව ඉතා පහසුවෙන් සහ ඉක්මනින් අයදුම්පත් භාර දිය හැකි වන අතර, කාර්ය සාධනය ද වැඩි කරන ලදී. මෙය මුළුමනින්ම ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය උදෙසා රජය ගෙන ඇති ප්‍රධාන පියවරකි.

3. මුදල් භාවිතයෙන් තොර සමාජයක් නිර්මාණය කිරීම:

- මුදල් රහිත ගනුදෙනු (Cashless transactions) ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඩිජිටල් ආර්ථිකයක් බවට හැරවීමේ ප්‍රධාන අංගයක් වේ. භෞතික මුදල් මත විශ්වාසය අඩු කිරීමෙන්, ඩිජිටල් ගෙවීම් මඟින් පහත වාසි ලබා දිය හැක:

- ප්‍රවේශය වැඩි දියුණු කිරීම - ජංගම පසුම්බි (Mobile wallets) සහ ඩිජිටල් කාඩ්පත් වැනි මුදල් නොමැති පද්ධති, ආර්ථික සේවා භාවිත කිරීම පහසු කරයි, විශේෂයෙන්ම දුර ඈත සිටින ප්‍රදේශවල ජනතාවට මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ලැබේ.

- කාර්යක්ෂමතාව වර්ධනය කිරීම - ඩිජිටල් ගෙවීම් වේගවත් හා අඩු වියදමින් සිදු වන අතර, භෞතික මුදල් කළමනාකරණය සඳහා වන පරිපාලන පිරිවැය අවම කරයි.

- අධික නිලධාරිවාදය සහ පරිපාලන බාධක අඩු කිරීම - සාම්ප්‍රදායික පරිපාලන ක්‍රියාවලීන් සඳහා දීර්ඝ කාලයක් ගත වන අතර, ලියකියවිලි භාවිතය ද ඉහළ නංවයි. ගෙවීම් හා සේවා ඩිජිටල්කරණය කිරීමෙන්, ශ්‍රී ලංකාවට නිලධාරීන් මඟින් ලියවිලි භාවිතයේදී වන වැරදි හා අඩු පාඩු අවම කර අකාර්යක්ෂමතාවන් ද මහ හරවා ගත හැක.

3.1 මුදල් භාවිතයෙන් තොර සමාජයක් නිර්මාණය කිරීමේ ආණ්ඩුවේ උපායමාර්ග:

චන්මන් ආණ්ඩුව ශ්‍රී ලංකාවේ මුදල් භාවිතයෙන් තොර සමාජයක් නිර්මාණය කිරීමට මූලික පියවර කිහිපයක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත.

- GovPay සේවාවේ දියුණු කිරීම - 2025 පෙබරවාරි 7 වන දින ජනාධිපතිතුමා විසින් මෙම රාජ්‍ය ගෙවීම් ජාල GovPay සේවාව අරඹන ලදී. මෙය ජනතාවට රජයේ සේවා සඳහා ඩිජිටල්ව ගෙවීම් කිරීමට හැකියාව ලබා දේ. ආරම්භයේ දී රජයේ ආයතන 16ක් සම්බන්ධ වන අතර, 2025 අප්‍රේල් වන විට ආයතන 30ක් ද, 2025 හතරවන කාර්තුව වන විට ආයතන 100ක් GovPay හරහා ගෙවීම් කිරීම සඳහා සූදානම් වීමට නියමිතය. පරිශීලනය වැඩි කිරීමට ගනුදෙනු ගාස්තුව රුපියල් 50 සිට රුපියල් 15 දක්වා අඩු කර ඇත.

- LankaQR මඟින් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම - QR කේතය ඔස්සේ සිදු වන ගෙවීම් ව්‍යාපාරවලට, පාරිභෝගිකයන්ට සහ විශේෂයෙන් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) සඳහා ආරක්ෂාකාරී, කාර්යක්ෂම, පහසු සහ අඩු වියදම් සහිත විසඳුමක් වශයෙන් ක්‍රියා කරයි. එයට අමතරව, QR ගෙවීම් මඟින් විනිවිදභාවය වැඩි කරන අතර මූල්‍යමය වංචා අවදානම අඩු කරයි. මෙය තවදුරටත් ජනප්‍රිය කරවමින් ප්‍රවර්ධනය කරන අතර, ගනුදෙනු ගාස්තුව අඩු කිරීමට ද වැඩි උත්සාහයක් ගනිමින් ඇත. ආරම්භයේදී මෙම ගාස්තුව සියයට 1ක් විය. කොවිඩ්-19 සමයේදී සියයට 0.5ක් දක්වා අඩු කළ ද, පසුව නැවත සියයට 1ක් දක්වා ඉහළ නංවන ලදී. ඉන්දීය ආර්ථිකයේ පරිදි මෙම ගාස්තුව ශූන්‍ය කිරීමට ආණ්ඩුව විවිධ ක්‍රමවේද පරීක්ෂා කරමින් පවතී.

- දේශීය ගනුදෙනු සඳහා ඩිජිටල් ගෙවීම් කාඩ්පතක් හඳුන්වා දීම - ශ්‍රී ලංකාවේ දෛනික ගනුදෙනු සඳහා, විශේෂයෙන්ම ප්‍රවාහන සේවා (බස්, දුම්රිය, මහාමාර්ග අයකිරීම්) සඳහා මුදල් රහිත ගෙවීම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා රජය නව ඩිජිටල් ගෙවීම් කාඩ්පතක් හඳුන්වා දීමට සැලසුම් කර ඇත. මෙය ජනතාවට ප්‍රවාහන සේවා සඳහා සරලව ඩිජිටල් වශයෙන් ගෙවීම් කිරීමට හැකියාව ලබා දෙන අතර, භෞතික මුදල් අවශ්‍යතාව අඩු කරයි.

(ආ) අදාළ නොවේ.

වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: පානීය ජල පහසුකම්

வவுணதீவு பிரதேச செயலாளர் பிரிவு: குடிநீர் வசதிகள்

VAVUNATHIVU DIVISIONAL SECRETARY'S DIVISION: DRINKING WATER FACILITIES

75/2024

3. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා (ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)

(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)

(The Hon. Hesha Withanage Ankumbura Arachchi on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි-බටහිර වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පනෙයියරුප්පාන්, පන්චේනෙයි වාදක්කල්මඩු, පාවට්කොඩිච්චේනෙයි, උන්නිච්චෙයි හා නෙඩියමඩු යන ප්‍රදේශ සඳහා මේ වනතෙක් පානීය ජල පහසුකම් ලබා දී නොමැති බව දන්නේද;

(ii) උන්නිච්චෙයි සිට වෙනත් බොහෝ ස්ථාන සඳහා පානීය ජලය සපයනු ලැබුව ද මේ වනතෙක් උන්නිච්චෙයි ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලැබී නොමැති බව දන්නේද;

(iii) ඉහත ප්‍රදේශවලට පානීය ජල පහසුකම් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම ප්‍රදේශ සඳහා පානීය ජල පහසුකම් ලබා දෙන කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் மண்முனை மேற்கு - வவுணதீவு பிரதேச செயலாளர் பிரிவிலுள்ள பனையறுப்பான், பன்சேனை வாதக்கல்மடு, பாவற்கொடிசேனை, உன்னிச்சை, நெடியமடு ஆகிய பிரதேசங்களுக்கு இற்றைவரை குடிநீர் வசதிகள் வழங்கப்படவில்லை என்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) உன்னிச்சையிலிருந்து வேறு பல பிரதேசங் களுக்குக் குடிநீர் விநியோகிக்கப்பட்டபோதிலும் இற்றைவரை உன்னிச்சை பிரதேச மக்களுக்கு குடிநீர் கிடைக்கவில்லை என்பதை அவர் அறிவாரா என்பதையும்;

(iii) மேற்படி பிரதேசங்களுக்கு குடிநீர் வசதிகளை வழங்குவதற்குத் தேவையான நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், இப்பிரதேசங்களுக்கு குடிநீர் வசதிகள் வழங்கப்படவுள்ள காலப்பகுதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether he is aware that drinking water facilities have not been made available so far to the areas of Paneyyaruppan, Pancheney, Vadakkalmadu, Pawatkodichhenai, Unnichchai and Nediyamadu, which belong to the Manmunai-West Vavunathivu Divisional Secretary's Division in the Batticaloa District;

(ii) whether he is aware that although drinking water is supplied from Unnichchey to many other places, the people of the Unnichchey area have not been provided with drinking water to date;

(iii) whether steps will be taken to provide drinking water facilities to the above areas; and

(iv) if so, the timeframe of providing drinking water facilities to these areas;

(b) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)

(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)

(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) දැනට නෙඩියමඩු ගම්මානය තුළ සියයට 90 ජල නළ පහසුකම් ඇති අතර, ජල සම්බන්ධතා 206ක සංඛ්‍යාවක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ලබා දී ඇත. අනෙකුත් අය විසින් ඉල්ලීම් ඉදිරිපත් කර නොමැත.

උන්නිච්චිය ගම්මානය තුළ සියයට 50 ජලනළ පහසුකම් ඇති අතර, ජල සම්බන්ධතා 217ක සංඛ්‍යාවක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ලබා දී ඇත. ඉතිරි ප්‍රදේශ උස් බිම් සහිත ප්‍රදේශ බැවින් එකී ප්‍රදේශ දැනට පවතින බෙදා හැරීම් නළ පද්ධතියෙන් ආවරණය කිරීමට නොහැකි වී ඇත.

පනයියරුප්පාන්, පන්චේනෙයි, වතක්කාලිමඩු, පවක්කෝඩෙයි යන ප්‍රදේශවල දැනට පවතින අඩු පීඩන කත්ත්වය හේතුවෙන් නළ දිර්ඝ කර ජල සම්බන්ධතා ලබා දිය නොහැකි වේ.

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් උන්නිච්චිය වාර්මාර්ග වැව මඟින් අමු ජලය (Raw water) ලබාගෙන අනෙකුත් ප්‍රදේශ සඳහා පානීය ජලය සපයනු ලබයි. මේ මඟින් උන්නිච්චිය ප්‍රදේශයෙන් සියයට 50ක ප්‍රදේශයක් ආවරණය වී ඇති අතර, ජල සම්බන්ධන 217ක් පමණ ලබා දී ඇත. ඉතිරි ප්‍රදේශ උස්බිම් වන අතර, දැනට පවතින බෙදාහැරීම් නළ පද්ධතිය මඟින් ආවරණය කිරීමට නොහැකි වී ඇත.

(iii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ඉහත ප්‍රදේශවල ජලනළ දිර්ඝ කිරීම් සඳහා දැනට පියවර ගෙන ඇත. Package plants ඉදි කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති අතර, එම සැලසුම් හා ක්‍රම සම්පාදන කටයුතු **ඇමුණුමෙහි**** දක්වා ඇත.

අදාළ ප්‍රදේශ සඳහා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති ආරම්භ කර නොමැත. මේ වන විට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති භෞතික හා මූල්‍ය සම්පත් සීමාව තුළ නව ව්‍යාපෘති ආරම්භ කිරීමක් ද සිදු නොකරයි.

(iv) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් උන්නිච්චිය package plants ඉදි කිරීම හා ජලනළ මාර්ග දිර්ඝ කිරීම සඳහා ඇමුණුමෙහි දක්වා ඇති පරිදි කටයුතු කර ඇත. ආසන්න වශයෙන් වසරක පමණ කාලයක් මේ සඳහා ගත වනු ඇත. (මෙම කාල සීමාව බාහිර තත්ත්වයන් මත වෙනස් විය හැක.)

(ආ) අදාළ නොවේ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව: පුරප්පාඩු
தொல்பொருளியல் திணைக்களம்: வெற்றிடங்கள்
DEPARTMENT OF ARCHAEOLOGY: VACANCIES

211/2024

4. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා (රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)

(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)

(The Hon. Hesha Withanage Ankumbura Arachchi on behalf of the Hon. Rohana Bandara)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවකයන් සංඛ්‍යාව සහ මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අවශ්‍ය සම්පත් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

පුත්තසාසන, සමය මත්‍රුම් කලාසාර අලුවල්කළ් අමෙච්සරෛක් කේට්ට විනා:

(அ) (i) தொல்பொருளியல் திணைக்களத்துக்கு அங்கீகரிக்கப்பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

மற்றும் தற்போது காணப்படுகின்ற வெற்றிடங் களின் எண்ணிக்கை ஆகியன ஒவ்வொரு பதவிக்கும் ஏற்ப வெவ்வேறாக எத்தனை;

(ii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

(iii) தொல்பொருளியல் திணைக்களத்துக்குத் தேவை யான வளங்களைப் பெற்றுக்கொடுப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House the -

(i) approved cadre and the number of vacancies currently available for each position separately in the Department of Archaeology;

(ii) measures that will be taken to fill the above-mentioned vacancies; and

(iii) measures that will be taken to equip the Department of Archaeology with the necessary resources?

(b) If not, why?

ගරු(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම 01හි** දක්වා ඇත.

(ii) ඇමුණුම 02හි** දක්වා ඇත.

(iii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය මානව සම්පත් සපයා දීම සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කමිටුව වෙත යොමු කර දෙපාර්තමේන්තුව තුළ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. එමෙන්ම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර දෙපාර්තමේන්තුවට අවශ්‍ය භෞතික සම්පත් සපයා ගනු ලබයි.

(ආ) අදාළ නොවේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ජනාධිපති අරමුදල කාර්යාලය පවත්වාගෙන ගිය ගොඩනැඟිලි: මාසික වියදම්
சனாதிபதி நிதிய அலுவலகம் இயங்கிய கட்டிடங்கள்: மாதாந்தச் செலவுகள்
BUILDINGS HOUSING PRESIDENT'S FUND OFFICE: MONTHLY EXPENSES

393/2025

5. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා (ගරු චාමර සම්පත් දසනායක මහතා වෙනුවට)
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி - மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க சார்பாக)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi on behalf of the Hon. Chamara Sampath Dasanayake)

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනාධිපති අරමුදල කාර්යාලය "ලේක් හවුස්" ගොඩනැඟිල්ලේ 3වන මහලේ පිහිටුවා ඇති බව දන්නේද;

(ii) මේ වන විට එම කාර්යාලය ඉහත ගොඩනැඟිල්ලෙන් ඉවත් කර වෙනත් ගොඩනැඟිල්ලක ස්ථානගත කර තිබේද;

(iii) එසේ නම්, එම කාර්යාලය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැඟිල්ලකද; නොඑසේ නම්, පෞද්ගලික ගොඩනැඟිල්ලකද;

(iv) එම කාර්යාලය මුලින් තිබූ ස්ථානයේ පවත්වාගෙන යෑම සඳහා දරන ලද මාසික වියදම කොපමණද;

(v) එම කාර්යාලය වර්තමානයේ පවත්වාගෙන යනු ලබන ස්ථානයේ පවත්වාගෙන යෑම සඳහා කුලිය සහ අනෙකුත් පහසුකම් වශයෙන් දරන මාසික වියදම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) சனாதிபதி நிதியத்தின் அலுவலகம் "லேக்ஹவுஸ்" கட்டிடத்தின் 3வது மாடியில் அமைந்துள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) தற்போது இந்த அலுவலகம் மேற்குறிப்பிட்ட கட்டிடத்திலிருந்து அகற்றப்பட்டு பிறிதொரு கட்டிடத்தில் தாபிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், இந்த அலுவலகம் தாபிக்கப் பட்டிருப்பது அரசாங்கக் கட்டிடத்திலா இன்றேல் தனியார் கட்டிடத்திலா என்பதையும்;

(iv) மேற்படி அலுவலகத்தை முன்பிருந்த இடத்தில் பேணிவருவதற்குச் செலவிடப்பட்டுள்ள மாதாந்தச் செலவு யாதென்பதையும்;

(v) இந்த அலுவலகத்தைத் தற்போது தாபித்துள்ள இடத்தில் செயற்படுத்துவதற்கான வாடகை

மற்றும் ஏனைய வசதிகளுக்காகச் செய்யப்படும் மாதாந்தச் செலவு யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that the Office of the President's Fund is located on the 3rd floor of the "Lake House" building;

(ii) whether the said office has been removed from the said building and relocated to another building at present;

(iii) if so, whether the said office is housed in a government building or a private building;

(iv) the monthly expenditure incurred in running the said office at its previous location; and

(v) the monthly expenditure incurred as rent and for other facilities in running the said office at its current location?

(b) If not, why?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2024.12.31 දින දක්වා ලේක් හවුස් ගොඩනැගිල්ලේ පිහිටුවා තිබුණි.

(ii) ඔව්.

(iii) පෞද්ගලික ගොඩනැගිල්ලක් වන ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකු ගොඩනැගිල්ලේ ස්ථානගත කර තිබේ.

(iv) ජනාධිපති අරමුදල ලේක්හවුස් ගොඩනැගිල්ලේ පවත්වා ගෙන යෑම සඳහා දරන ලද මාසික වියදම

විස්තරය	වියදම රුපියල් (2024 දෙසැම්බර්)
මාසික කුලී මුදල (බදු සහිත)	1,330,450.00
මාසික විදුලි බිල්පත (සාමාන්‍ය)	167,042.19
මාසික ජල බිල්පත (සාමාන්‍ය)	9,735.00
මුළු වියදම	1,507,227.19

(v) ජනාධිපති අරමුදල නව ස්ථානයේ පවත්වා ගෙන යෑම වෙනුවෙන් කිසිදු අමතර වියදමක් නොදරයි. ජනාධිපති කාර්යාලය විසින් 2006 වර්ෂයේ සිට කුලියට ගෙන තිබූ පෞද්ගලික ගොඩනැගිල්ලක ප්‍රයෝජනයට නොගත් පහළ මාලයේ ජනාධිපති අරමුදල ස්ථාපනය කර ඇත.

(ආ) අදාළ නැත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සහ ළමා ගිණුම් සඳහා රඳවා ගැනීමේ බද්ද අය කිරීම
மூத்த பிரஜைகளின் வைப்புத்தொகைகள் மற்றும் குழந்தைகளின் வங்கிக் கணக்குகள்மீது விதிக்கப்படும் நிறுத்தி வைத்தல் வரி
WITHHOLDING TAX CHARGED ON DEPOSITS OF SENIOR CITIZENS AND CHILDREN'S ACCOUNTS

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට යහ ජීවිතයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වටපිටාව සකස් කර දීම අප සියලුදෙනාගේ සදාචාරාත්මක වගකීමක් වෙනවා. නමුත්, පසුගිය කාලයේ දී බොහෝ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ එකම ආදායම් මාර්ගය බවට පත් වූ ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා වූ පොලී ප්‍රතිශතය කප්පාදු කිරීමත් සමඟ තවත් අසරණ තත්ත්වයකට පත්වීමට ඔවුන්ට සිදු වුණා. බොහෝ පිරිසකට සිය වෛද්‍ය පහසුකම් ලබා ගැනීම, අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර පාන ලබා ගැනීමට පවා නොහැකිව අර්බුද රැසකට මුහුණ දීමට සිදුව තිබෙනවා. එබැවින්, මෙරට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඔවුන්ගේ මූලික ගැටලුවලට විසඳුම් ලබා දීම කෙරෙහි මම රජයේ විශේෂ අවධානය යොමු කරවනවා. මා විශේෂයෙන්ම කථා කරන්නේ අධිපොහොසතුන් හෝ ධනවතුන් ගැන නොව, මේ රටේ සාමාන්‍ය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳවයි. ඒ අය වෙනුවෙන් පහත සඳහන් ප්‍රශ්න මම ඉදිරිපත් කරනවා.

01. දැනට තැන්පතු සඳහා අය කරනු ලබන රඳවා ගැනීම් බදු ප්‍රතිශය කොපමණද? අය වැය මඟින් මෙම රඳවා ගැනීම් බදු - Withholding Tax - ප්‍රතිශතය ඉහළ නැංවීමට සූදානම් වන්නේද? එසේ නම් ඒ කොපමණ ප්‍රතිශතයකින්ද?

02. සමස්ත ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු මඟින් රඳවා ගැනීම් බදු අය කිරීමක් සිදු වන්නේද? නොඑසේ නම්, එසේ රඳවා ගැනීම් බදු අය කරනු ලබන සීමාව කවරේද?

03. මෙම අය කරනු ලබන රඳවා ගැනීම් බදු නැවත ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා ගැනීමේ ක්‍රමයක් තිබේද? එම ක්‍රමය කුමක්ද? මෙම ක්‍රමය තුළින් අඩු සාක්ෂරතාවක් සහිත ඇතැම් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දැඩි අපහසුතාවට පත් වන බව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

රජය දන්නේද? එසේ නම්, රඳවා ගැනීම් බදු නැවත ලබා ගැනීමට සරල ක්‍රමයක් අනුගමනය කිරීමට රජය කටයුතු කරන්නේද? නොඑසේ නම්, ඒ මන්ද?

04. ළමා තැන්පතු සඳහා රඳවා ගැනීම් බදු අය කිරීමක් සිදු වේද? එසේ නම්, එම අය කරගත් බදු ප්‍රමාණ නැවත ලබාගත හැකි වන ක්‍රමය කුමක්ද? ළමා තැන්පතු රඳවා ගැනීම් බදුවලින් නිදහස් කළ නොහැකි වන්නේද? ඒ මන්ද?

05. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් අතුරින් බොහෝදෙනෙක් අද ගත කරන්නේ අතිදුෂ්කර ජීවන ගමනකි. පසුගිය යහ පාලන ආණ්ඩුව මඟින් ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා ලබා දුන් සියයට 15ක තැන්පතු පොලිය අවම වශයෙන් ලක්ෂ 20ට අඩු තැන්පතු සඳහා හෝ යළිත් ක්‍රියාත්මක කළ නොහැකිද?

යහ පාලන ආණ්ඩුව පමණක් නෙවෙයි, බොහෝ රජයන් පසුගිය කාලයේ මේ ප්‍රතිශතය ලබා දෙන්නට කටයුතු කළා. ඒක අවලංගු කිරීමක් සිදු වුණේ පසුගිය රජය සමයේ.

06. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රාජ්‍ය ඔසුසල් මඟින් ඖෂධ මිලදී ගැනීමේදී සහන මිලට ලබා ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද? මෙම සහනය පෞද්ගලික ඔසුසැල් මඟින්ද ලබා ගත හැකි ක්‍රමයක් සකස් කළ නොහැකිද? ඒ මන්ද?

ගරු කථානායකතුමනි, මම මතක් කරන්න කැමැතියි, දැනට පවතින පොලී අනුපාතය දිහා බැලුවොත්, Bank of Ceylon එකේ, ස්ථාවර තැන්පතු පොලී අනුපාතය - fixed deposit rate - වසර දෙකකට සියයට 7.5යි. රජය යෝජනා කරලා තිබෙනවා, අමතර සියයට 3ක් ලබා දෙන්න කියලා. ඒ අනුව, සියයට 10.5ක පොලී අනුපාතයක් තුළ යම් කිසි ආදායම් මාර්ගයක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා දෙන්න. අපි කියනවා ඒක ප්‍රමාණවත් නැහැ කියලා. ඒක අනිවාර්යයෙන්ම සියයට 15 විය යුතුයි. ඒ වාගේම, අඩුම ගණනේ රුපියල් ලක්ෂ 20ක තැන්පතු දක්වා ඒ පොලී අනුපාතය ක්‍රියාත්මක විය යුතුයි කියන එක තමයි අපේ මතය. මේ රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සහනදායී පිළිතුරක් මේ අවස්ථාවේදී අපි රජයෙන් බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

රඳවා ගැනීමේ බද්ද කියන්නේ තවත් බද්දක් නොවන අතර, එය යම් තැනැත්තෙකු බද්දට යටත් ආදායම මත ගෙවිය යුතු බදු ප්‍රමාණය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අය කර ගන්නා එක් ක්‍රමයක් පමණයි. ඒ අනුව යම් තක්සේරු වර්ෂයක් අවසානයේදී ආදායමේ තක්සේරුව මත වර්ෂය අවසානයේදී ද, ස්වයං තක්සේරු ක්‍රමය මත කාර්තුමය වශයෙන්ද ආදායම ජනනය වන මොහොතේදී, එනම් ප්‍රභවයේදී - at source - අදාළ බදු ප්‍රමාණය අය කර ගැනීමේ ක්‍රම තිබෙනවා. ආදායම, ප්‍රභවයේදී පැනනඟින අවස්ථාවේ අදාළ බදු ප්‍රමාණය අය කර ගැනීම තමයි රඳවා ගැනීමේ බද්ද - Withholding Tax - ලෙස හඳුන්වන්නේ. සමහර විට පුද්ගලයෙකු ඒ ඒ බදු මූලාශ්‍රයට අදාළව ගෙවිය යුතු සම්පූර්ණ මුදලම රඳවා ගැනීමේ බද්දක් ලෙස ප්‍රභවයේදී අය කරන අවස්ථාද තිබේ. උදාහරණයක් ලෙස, දැනට වැටුප් ආදායම මත Advance Personal Income Tax ක්‍රමය යටතේ සම්පූර්ණ බදු වගකීම ම අය කරනු ලබනවා. එහිදී එම තැනැත්තාගේ බද්දට යටත් සම්පූර්ණම ආදායම වැටුපෙන් පමණක් ලැබෙනවා ය යන උපකල්පනය මත අදාළ රඳවුම් බද්ද අය කරනු ලබයි. ඒ අනුව වැටුප් ආදායම මත බින්දුවේ සිට සියයට 36 දක්වා වූ බදු අනුපාතයට යටත්ව මුළු බදු ප්‍රමාණයම රඳවා ගැනීමේ බද්දක් ලෙස අය කරයි.

ඊළඟට තිබෙනවා, පොලී ආදායම මත අය කරන රඳවා ගැනීමේ බද්ද සම්බන්ධයෙන් වන ප්‍රශ්නය. පොලී ආදායම මත රඳවා ගැනීමේ බද්දක් ලෙස දැනට අය කරනුයේ සියයට 5ක ප්‍රතිශතයකි. බදු අනුකූලතාව ඉහළ නංවා ගැනීමේ අරමුණිනුත්, බදු පදනම පුළුල් කර ගැනීමේ අරමුණිනුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ දෙවැනි සමාලෝචනයේදී සාකච්ඡා වූ පරිදි 2025 ආදායම් පුරෝකථනය වෙනුවෙන් එකඟ වී තිබූ ආකාරයටත් මෙම ප්‍රතිශතය සියයට 10 දක්වා ඉහළ දමා තිබෙනවා. කෙසේ වෙතත්, පොලී ආදායම ලබන පුද්ගලයා වාර්ෂික බදු නිදහස් සීමාවට වඩා අඩුවෙන් ආදායම් උපයන්නේ නම් -වර්ෂයකට රුපියල් ලක්ෂ 18කට වඩා අඩුවෙන් ආදායම් උපයන්නේ නම්- ප්‍රභවයේදී අය කරනු ලබන සියයට 10 බදු ප්‍රමාණය ආපසු ලබා ගැනීමේ හැකියාව ඇත.

එසේම බදු නිදහස් සීමාව ඉක්මවා ආදායම් උපයන්නේ නම්, තමන්ගේ මුළු බදු වගකීම ගෙවන අවස්ථාවේදී ඉහතින් අය කළ සියයට දහයේ රඳවා ගැනීමේ බද්ද බදු බරක් - tax credit එකක් - ලෙස අඩුකර ගැනීමේ හැකියාව තිබෙනවා.

කෙසේ වෙතත්, බදු අය කර ගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහාත්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ හා බදු නිදහස් සීමාවට වඩා අඩුවෙන් ආදායම් උපයන්නන්ගේ පහසුව සඳහාත්, අදාළ පුද්ගලයා විසින් තම ආදායම පිළිබඳ ප්‍රකාශයක් බැංකුවට හෝ අදාළ මූල්‍ය ආයතනය වෙත ලබා දීම පදනම් කර ගනිමින් ඔහුගේ හෝ ඇයගේ තක්සේරු ආදායම රුපියල් ලක්ෂ 18 ඉක්මවන්නේ නැති නම්, පොලී ආදායම මත ප්‍රභවයේදී සියයට 10ක් රඳවා නොගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ අවශ්‍ය උපදෙස් බැංකු සහ මූල්‍ය ආයතනවලට අපි දැන් ලබා දෙමින් සිටිනවා. ඒ වාගේම ළමා තැන්පතු සඳහාද මෙම ක්‍රමවේදය වලංගු වන අතර, එහිදී ළමයාගේ භාරකරු මේ සඳහා මැදිහත් විය යුතු අතර, ඔහුගේ හෝ ඇයගේ ආදායම හා ලබා දෙන ප්‍රකාශය සලකා බැලීමෙන් අදාළ කටයුතු සිද්ධ කරනවා.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට යහපත් ජීවිතයක් පවත්වාගෙන යාමට අවශ්‍ය වන මූල්‍ය අවශ්‍යතාව සලකා බලා ලක්ෂ 10ට අඩු තැන්පත්කිරීම්වලින් සඳහා අමතර සියයට 3ක තැන්පතු පොලියක් රජය විසින් ලබා දීමට මෙවර අය වැයෙන් ප්‍රතිපාදන සලසා තිබෙනවා. 2025 අය වැය යෝජනාවලට අනුව, 2025 ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ස්ථාවර තැන්පතු සඳහා සංශෝධිත විශේෂ පොලී යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත. මෙම යෝජනා ක්‍රමය වයස අවුරුදු 60 සහ ඊට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා අදාළ වේ. බැංකු කිහිපයක තැන්පතු ගණන නොසලකා, තැන්පතුකරුවෙක් සඳහා උපරිම තැන්පතු මුදල රුපියල් මිලියනයක් සඳහා මෙය අදාළ වේ. තැන්පතුකරුවන්ට ඔවුන්ගේ මුළු තැන්පතු මුදල රුපියල් මිලියනය නොඉක්මවන තාක් කල්, බැංකු කිහිපයක වුණත් ස්ථාවර තැන්පතු විවෘත කළ හැකිය. මෙම යෝජනා ක්‍රමය යටතේ තැන්පතුවක් පවත්වාගෙන යාම සඳහා වසරක කාලයක් ලැබෙන අතර, පොලිය මාසිකව ලබා ගත හැකිය.

ඒ වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් රාජ්‍ය ඔසුසල් මඟින් ඖෂධ මිලදී ගැනීමේදී කාඩ් පත් භාවිතයෙන් ගෙවීම් සඳහා සියයට තුනක වට්ටමක්ද, මුදල් ගෙවීම් සඳහා සියයට පහක වට්ටමක්ද දැනටමත් ප්‍රදානය කරනු ලැබේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
මීලඟට, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්ඩලික සජිත් ප්‍රේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමකට අවස්ථාවක් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, අපේ විපක්ෂ නායකතුමාට පැහැදිලි කර ගැනීමක් කර ගන්න ඕනෑ බව කියනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්ඩලික සජිත් ප්‍රේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මීට පෙරත් ප්‍රශ්න අහපු අයට අවස්ථාව ලබා දීලා තිබෙනවා. මම ඉල්ලීමක් කරනවා, මට පැහැදිලි කර ගැනීමකට අවස්ථාව ලබා දෙන්න කියලා.

ඔබතුමාගේ පිළිතුරේදී ප්‍රකාශ කළා, බදු කාර්යක්ෂමතාව වැඩි කර ගන්නට තමයි සියයට 5 සිට සියයට 10 දක්වා මේ වැඩි කිරීම කරන්නේ කියලා. බදු කාර්යක්ෂමතාව වැඩි කර ගන්නේ අය කරන බදු ප්‍රතිශතය වැඩි කරලා නොවෙයි, ඇමතිතුමනි. බදු කාර්යක්ෂමතාව වැඩි කර ගන්නට ඕනෑ, බදු ව්‍යුහය - tax structure එක - තුළ කාර්යක්ෂම ක්‍රමවේද අනුගමනය කරමිනුයි. බද්ද වැඩි කරලා නොවෙයි. ඉතින් මම ඔබතුමාගෙන් බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා, ඒක අවබෝධ කරගෙන ඔබතුමා එය නිවැරදි කරන්න කියලා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(මාණ්ඩලික (කලානිති) අනිල් ජයන්ත)
(The Hon. (Dr.) Anil Jayantha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්ඩලික සජිත් ප්‍රේමදාස)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. මට ඔබතුමාගෙන් තවත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

බදු කාර්යක්ෂමතාව කියලා සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම සුදුසු නැහැ. ඒක වැරදියි. අනෙක් කාරණාව තමයි ආපසු ලබාගන්නට තිබෙන ක්‍රමවේදය සාමාන්‍ය ජනතාවට අනුගමනය කරන්න ඉතාම අමාරු ක්‍රමවේදයක්. අපේ යෝජනාව, ඒ ක්‍රමවේදය සරල කරන්නට යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ කියන එකයි.

අනෙක් කාරණාව මෙකයි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා ආණ්ඩු ගණනාවක් අඛණ්ඩව ලබා දුන් සියයට 15ක පොලිය නොගෙවා, ඒ වෙනුවට දැනට වෙළෙඳ පොළේ පවතින පොලී අනුපාතය සියයට තුනකින් වැඩි කර දීම ප්‍රමාණවත් වන්නේ නැහැ කියලායි මම හිතන්නේ. විශේෂයෙන් දැනට වෙළෙඳ පොළේ තිබෙන පොලී අනුපාතය සියයට 7.5ක් නම්, ඒක සියයට 15 දක්වා වැඩි කිරීම ඉතාම වැදගත්. මේක මේ රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ බලවත් ඉල්ලීමක් කියන එක මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(මාණ්ඩලික (කලානිති) අනිල් ජයන්ත)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, මම කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්නම්. ඇත්තටම මගේ පිළිතුරේදී ඉතා පැහැදිලිව මම කිව්වා, බදු කාර්යක්ෂමතාව කියන්නේ එක කාරණයක් පමණයි කියලා. බදු කාර්යක්ෂමතාව, බදු පදනම පුළුල් කිරීම, දෙවැනි සමාලෝචනයේදී 2025 වෙනුවෙන් කරන ලද පුරෝකථනයන්ගේ සම්පිණ්ඩනයෙන් කරපු වැඩක්. බදු කාර්යක්ෂමතාව එක් කාරණයක් පමණයි. අපි යන්නට යන්නේ වඩාත් transparent, සාධාරණ, බදු පදනම පුළුල් කර ගැනීමේ ක්‍රමවේදයකට. ඒ ප්‍රශ්නය මතු කළේ පිළිතුරේ එක කොටසකට පමණයි. ඒක වැරදි අර්ථකථනයක්.

දෙවැනි කාරණය තමයි, ඒක ආපසු ගෙවීමේදී අනුගමනය කරන ක්‍රමය. අපි දැන් ආපසු ගෙවන්න ක්‍රමයක් යෝජනා කරනවා නේ. විපක්ෂ නායකතුමා කියනවා ඒක හරි අමාරු එකක් කියලා. ඉතින් මම දන්නේ නැහැ, අපි යෝජනා කළ ක්‍රමය භාවිතයට ගන්නෙත් නැතිව, දකින්නෙත් නැතිව උපකල්පන මත ඒක අමාරු එකක් කියලා කියන්නේ කොහොමද කියලා. අපි පොදුවේ පිළිගන්නවා refunding system එකේ ගැටලු තිබෙනවා කියලා. ඒවා තේරුම් අරගෙන දැනට මේ පිළිබඳව සාකච්ඡා කරලා අවුරුද්දකට ලක්ෂ 18 ඉක්මවන බදු ගෙවන්නන්ට මේක කාර්යක්ෂමව ආපසු ලබා දෙන්නත්, එහෙම නැති අයගෙන් සියයට 10 අය කර නොගන්නවා කියන එකත් මගේ පිළිතුරේ ඉතාම පැහැදිලිව කිව්වා. ඒ සඳහා අදාළ ප්‍රකාශනය ලබා ගැනීමටත්, තාක්ෂණය භාවිතයටත් අදාළ කටයුතු සූදානම් කරලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක වෙනකොට බලමු, ඒ වාගේ ගැටලුවක් තිබෙනවාද කියලා. උපකල්පන මත නිගමනයකට එන්න බැහැ.

ඊළඟ කාරණය, සියයට 15ක පොලිය ලබා දීම. පොලිය විධියට සියයට 15ක් හෝ එකක්, දෙකක් ලබා දීම කියන එක ස්ථාවරව තිබෙන එකක් නොවෙයි. ඒක ආර්ථිකය මත පවතින තත්ත්වයක්. සියයට 15ක් ලබා දෙන වෙලාවේ රටේ බැංකු පද්ධතියේ පොලී අනුපාතයත් ඒ හා කිට්ටුවෙන් තිබුණේ; පොලී අනුපාතය සියයට 10, 11, 12 වාගේ තිබුණේ. අද පොලී අනුපාතය පහළට ඇවිල්ලා තිබෙනවා. 2022දී විතර සියයට 15 පොලී අනුපාතය යෝජනා කරලා තිබියදී ඇත්තටම මොකක්ද වුණේ? පොලී අනුපාතය ශීඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා සියයට 30කට ආසන්නයට ගියා. එතකොට ස්වයංක්‍රීයව සියයට 15 වැඩ පිළිවෙළ අත්හරින්න සිදු වුණා. ඒ වෙලාවේ සියයට 15ක් දෙනවා කියලා කවුරු හරි කිව්වොත් මොකක්ද වෙන්නේ? සියයට 30ක්, සියයට 20ක් බැංකුවලින් ප්‍රදානය කරන කොට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සියයට 15යි දෙන්නේ කියන නිශ්චිත අගයක හිටියොත් ඒක වැරදියි. ඒක කරන්න බැරි නිසාම බැංකු ඒක අත්හැර දාලා තිබෙනවා.

අපි තවම ස්ථාවර වෙමින් තිබෙන ආර්ථිකයක්. හොඳින් ස්ථාවර වන ආර්ථිකයක පොලී අනුපාතය ක්‍රමිකව පහළට යන්න ඕනෑ. එලෙස පොලී අනුපාතය පහළ යනකොට ජනතාවගේ ආදායම ස්ථාවර වෙන ක්‍රමයකට, ක්‍රය ශක්තිය වැඩිවෙන ක්‍රමයකට වැඩ පිළිවෙළ සකස් කරමින් තිබියදී තමයි අතිරේක සියයට තුනක ප්‍රදානය අපි ලබා දීලා තිබෙන්නේ. ස්තුතියි.

II

වාලව්චේන කඩදාසි කම්හල යළි පණගැන්වීම
வாழைச்சேனை காகிதத் தொழிற்சாலையை மீள இயக்குதல்
REVIVAL OF VALAICHCHENAI PAPER FACTORY

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர் கௌரவ சுனில் ஹந்துன்னெத்தி அவர்களிடம் நான் பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்.

இலங்கையில் ஆரம்பிக்கப்பட்ட கைத்தொழிற்சாலைகளில் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள வாழைச்சேனை காகிதத் தொழிற்சாலை 1960களில் பல நூற்றுக்கணக்கானவர்களுக்கு வேலைவாய்ப்பை வழங்கிய பெரு நிறுவனமாகும். இலங்கையில் நடைபெற்ற உள்நாட்டு யுத்தத்தை காரணமாகக் கொண்டு இத்தொழிற்சாலை கடந்த 30 ஆண்டுகளுக்கும் மேலாக மூடப்பட்டிருந்தது. கிழக்கு மாகாணத்தின் மிகப் பெரிய வேலை வழங்கும் நிறுவனமாக இருந்த இத்தொழிற்சாலை மீள இயங்குமானால் பல இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்பை வழங்க முடியும்.

1. இத்தொழிற்சாலை அமைந்துள்ள நிலப்பரப்பு எத்தனை ஏக்கர் விஸ்தீரணம் உடையது?
2. என்ன காரணத்துக்காக இத்தொழிற்சாலை மீள ஆரம்பிக்கப்படாமல் உள்ளது?
3. காகிதத் தொழிற்சாலையை மீள இயக்க முடியாதெனின், அவ்விடத்தில் உருவாக்கப்படக்கூடிய புதிய தொழிற்றுறை பற்றி ஆராயப்பட்டுள்ளதா?
4. அத்தகைய தொழிற்றுறையை ஆரம்பிப்பதற்கான கருத்திட்டங்கள் எவையேனும் தற்போது அரசின் கைவசம் உள்ளனவா?
5. இத்தொழிற்சாலையை இயக்குவதற்கு ஏற்கனவே முன்னெடுக்கப்பட்ட முயற்சிகளையும் அவை வெற்றி பெறாமைக்கான காரணங்களையும் கௌரவ அமைச்சர் அவர்கள் தெளிவுபடுத்துவாரா?

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම කාලීන ප්‍රශ්නයක්. පසුගිය කාලවල පැවති පාලනයන් යටතේ මේ රාජ්‍ය ආයතන සම්පූර්ණයෙන්ම කුණුකොල්ලෙට විකුණලා, එහෙම නැත්නම් වසා දමා තිබුණා. ඒවා නැවත පණ ගැන්වීම තමයි අපේ ආණ්ඩුව ඉදිරිපත් කරලා තිබෙන මේ අය වැයේ වැඩ පිළිවෙළ වන්නේ.

1. මෙම කර්මාන්තශාලාව පිහිටි භූමි ප්‍රමාණය අක්කර 330කි.
2. වාලව්චේන කර්මාන්තශාලාව 2014 වර්ෂයේ දෙසැම්බර් මස සිට අකර්මණ්‍යව පැවති අතර, 2020 වර්ෂයේදී නැවත එහි කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර තිබෙනවා. නව රජය පත්වන අවස්ථාවේදී යන්ත්‍ර සූත්‍රවල බිඳ වැටීම් හේතුවෙන් එහි නිෂ්පාදන කටයුතු නැවතී තිබුණි. අනතුරුව නව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කළ පසු යන්ත්‍රවල බිඳවැටීම් අලුත්වැඩියාකොට නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී. දැන් එය operation මට්ටමේ තිබෙන්නේ. ඒ අනුව වාලව්චේන කර්මාන්තශාලාව මේ වන විට සක්‍රියකොට ඇති අතර, මෙහෙයුම් ලාභයක් ඇති වන තත්ත්වයට පත් කරගෙන තිබේ. දැනට මසකට ටොන් 200ක නිෂ්පාදනයක් කරනු ලබන අතර, තවදුරටත් සිදු කරනු ලබන වැඩිදියුණු කිරීම් හේතුකොටගෙන අප්‍රේල් මස සිට මසකට ටොන් 300ක් නිෂ්පාදනය කිරීම තමයි අපේ සැලැස්ම වන්නේ.
3. ඇත්තටම මේ ප්‍රශ්නය අදාළ නැහැ.

   ඉහත සඳහන් පරිදි වාලව්චේන කඩදාසි කම්හල සක්‍රියකොට තිබෙන නිසා තවදුරටත් මෙම භූමිය ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම සඳහා විවිධාංගීකරණ ව්‍යාපෘති වෙනුවෙන් සැලසුම් සකස් කරමින් පවතී, ඉදිරි කටයුතු වෙනුවෙන්.
4. මේ වන විට කාර්මික සංවර්ධන මණ්ඩලයේ මැදිහත්වීමෙන් සම් භාණ්ඩ කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. ඊට අමතරව ඉහත සඳහන් කර ඇති පරිදි විවිධාංගීකරණ ව්‍යාපෘති - multi-product zones - ආරම්භ කිරීමටත් අපේ අදහසක් තිබෙනවා.
5. බිඳ වැටීම් නිසා අක්‍රියව තිබූ යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීමට මේ වන විට කටයුතු කර තිබෙනවා. එමඟින් නිෂ්පාදනය ආරම්භකොට මසකට ටොන් 200ක් නිෂ්පාදනය කිරීම තුළින් ආයතනය සමතුලිත - break-even - මට්ටමට ගෙන ඇත. ඉදිරි මාසයන් තුළ මසකට ටොන් 300ක මට්ටමක් හා මේ වර්ෂය තුළදී මසකට ටොන් 500ක ඉලක්කයක් ළඟා කර ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

   දැනට වාලව්චේන කම්හල තුළ සේවකයන් 120ක් සිටින අතර, ඉදිරි වැඩිදියුණු කිරීම් අනුව රැකියා අවස්ථා ඉදිරියේදී ඇති වනු ඇත. පැරණි යන්ත්‍ර යොදා ගනිමින් ඉහත සඳහන් නිෂ්පාදනයන් සිදු කරනු ලබන අතර, රජයේ ප්‍රතිපත්තියක් වන රාජ්‍ය, පෞද්ගලික සහ ජනතා සහභාගිත්ව ක්‍රමය - PPPP - හරහා නව යන්ත්‍ර සූත්‍ර සවිකොට කර්මාන්තශාලාව දියුණුකොට පැරණි කඩදාසි නගරය ලෙස පෙර තිබූ තත්ත්වයට වාලව්චේන කර්මාන්තශාලාව ගෙන ඒමට අප බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ඉදිරියේදී එමඟින් මඩකලපුව දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ට විශාල රැකියා අවස්ථා ඇති වනු ඇත.

නමුත් මෙහි තාක්ෂණය හරිම පරණයි. අපට ගොඩක් ඉස්සරහට යන්න බැරි නිසා public-private partnership එකක් හරහා අලුත් technology ගෙනැල්ලා ඉස්සරහට යන්න අපි උත්සාහ කරනවා. මේ වෙනකොට සේවකයින් 120ක් විතර එහි වැඩ කරනවා. අලුත් partnerships හරහා ඉදිරියේදී එම සේවක පිරිස අනිවාර්යයෙන්ම වැඩි වෙනවා.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களுடைய பதில்களுக்கு நன்றி! இந்த நாட்டில் கழிவுத் தாள்கள் - பாவிக்கப்பட்ட papers - நிறையவே இருக்கின்றன. அவ்வாறான papersஐ கூழாக்கி, திரும்பவும் புதிய papersஆக மாற்றக்கூடிய தொழில்நுட்பங்கள் உலகத்தில் வளர்ந்திருக்கின்றன. அதேபோல, இன்று பிளாஸ்டிக் பொருட்கள் பல இடங்களிலும் வீசப்படுகின்றன. அவற்றைக்கூட திரும்பவும் மூலப்பொருளாக மாற்றக்கூடிய தொழில்நுட்பங்கள்

உலகத்தில் வளர்ந்திருக்கின்றன. கிழக்கு மாகாணத்தில் 330 ஏக்கர் நிலப்பரப்பில் மிகப் பெருமளவிலான வேலைவாய்ப்பை வழங்கியிருந்த இந்த காகிதத் தொழிற்சாலையை மீண்டும் பிரமாண்டமானதொரு தொழிற்சாலையாக மாற்றியமைப் பதற்கு கழிவு papersஐயும் பிளாஸ்டிக் கழிவுகளையும் பயன் படுத்த முடியும். இப்பொழுது வாழைத்தாறில் இருந்துகூட papers தயாரிப்பதற்கான மூலப்பொருளைக் கண்டுபிடித்து இருக்கிறார்கள். இவ்வாறான நவீன முறைகளைக் கண்டு பிடித்தால் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள மூலப் பொருட் களை அடிப்படையாகக்கொண்டே அங்கு காகித உற்பத்தியை மேற்கொள்ளலாமென நான் நினைக்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම කෙටි කරන්න.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, ஒரு நிமிடம் தாருங்கள்!

இது தொடர்பாக கடந்த 2015 - 2019ஆம் ஆண்டு காலப் பகுதியில் முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சீனித்தம்பி யோகேஸ்வரன் அவர்களும் தற்போதைய பாராளுமன்ற உறுப்பினர் ஸ்ரீநேசன் அவர்களும் கடும் முயற்சி எடுத்திருந் தார்கள். அந்த முயற்சி வெற்றிபெறுவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் தயவுசெய்து ஒத்துழைக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඇත්තටම ඒක ඉතාම හොඳ යෝජනාවක්. කඩදාසි කම්හලට අවශ්‍ය කරන කඩදාසි ප්‍රමාණය සම්පූර්ණයෙන්ම රාජ්‍ය ආයතනවලින් ලබා දීම සඳහා මේ වෙනකොට කැබිනට් තීරණයක් අරගෙන තිබෙනවා. ඒ වාගේම ප්ලාස්ටික් සහ අනෙකුත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ලංකාවේ ඉදිරියට එන විශේෂ කර්මාන්තයක් වාගේම ජාතික වැඩ පිළිවෙළක් විධියටත් පරිසර ආරක්ෂාව සඳහා කරන වැඩ පිළිවෙළක් විධියටත් හඳුන්වන්න පුළුවන්. මඩකලපුව දිස්ත්‍රික්කයෙන් එම යෝජනා ආවොත්, ඒ සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය උපරිම සහයෝගය දෙන්න බලාපොරොත්තු වෙනවා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල හා 2025 පෙබරවාරි 21 දින සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 8.00 දක්වා ද විය යුතු ය. අ.භා. 8.00ට කථානායකතුමා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, විසිපස්වන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය:මාර්තු 19]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 19]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee.- [Progress: 19th March]
[HON. SPEAKER in the Chair.]

102 වන ශීර්ෂය - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 248,693,718,000

தலைப்பு 102.- நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 248,693,718,000

HEAD 102.- MINISTER OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 248,693,718,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 102, 237 සිට 252 දක්වා සහ ශීර්ෂ අංක 280, 296, 323, 324, 329, 333 සහ 338.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, the Hon. (Dr.) Harsha de Silva. You have 49 minutes.

[පූ.භා. 10.16]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභාපතිතුමනි, "2025 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.03.20වන බ්‍රහස්පතින්දා විවාදයට ගැනෙන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 102, 237 සිට 252, 280, 296, 323, 324, 329, 333 සහ 338 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය"යි මම යෝජනා කරමි.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ගරු සභාපතිතුමනි, අපි මේ විවාදය පටන් ගන්නකොට විපක්ෂය වෙනුවෙන් මට ගරු විපක්ෂ නායකතුමා අවස්ථාව දුන්නා, විවාදයේ ආරම්භක කථාව කරන්න. අපි එතැනදී පෙන්වන්න උත්සාහ කළා, රජය ක්‍රියාත්මක කරන දේ සහ මේ ආණ්ඩුව බලයට එන්න කලින් ජනතාවට ඔවුන් දීපු පොරොන්දු අතර තිබෙන දැවැන්ත වෙනස. ඇත්තවශයෙන්ම මම කිව්වා, පල්ලියේ පූජකතුමා පන්සලේ බණ කියන්න ඉදනවා වාගේ වැඩක් වෙන්නේ, මොකද, එළියේ කුමක් කිව්වත් ගැඹුරින් තමන් විශ්වාස කරන දේ පිළිබඳව අවුලක් තිබෙනවා කියලා. දැන් අපට පුළුවන් ChatGPT එකට ගිහින් කියන්න, මෙන්න මේ විධියට speech එකක් ලියලා දෙන්න කියලා. එතකොට ChatGPT එක ඒ speech එක ලියලා දෙනවා. හැබැයි, ඒක කියවනකොට සහ කියවීමෙන් පසු ඒක ක්‍රියාත්මක කරනකොට තමන්ට හොඳ අවබෝධයක් තිබෙන්න ඕනෑ ඇයි මම මේ දේ කියන්නේ කියලා. මේ දවස් කිහිපය තුළ අපි දැක්කා, පරස්පර මත ඉදිරිපත් වෙනවා. මම ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්නම්.

අද අපේ මුදල් අමාත්‍යාංශය ගැනයි කථා කරන්නේ. මෙච්චර කල් අපි කථා කළේ අධ්‍යාපනයට කීයද, සෞඛ්‍යයට කීයද, ක්‍රීඩාවට කීයද වශයෙන් වියදම් කරන එක සම්බන්ධයෙනුයි, ගරු සභාපතිතුමනි. නොයෙකුත් අය, පක්ෂ - විපක්ෂ මන්ත්‍රීවරු වාද විවාද කළා, මෙකට මදි, මෙකට වැඩියි කියලා. ඒක හොඳයි.

ඒක තමයි අපි වියදම් කරන ප්‍රමාණය. අද තිබෙන වෙනස මෙකයි. වියදම් කරන්න ආදායමක් කොහෙන්ද කියන එක සම්බන්ධයෙන් අදයි, හෙටයි තමයි ප්‍රථම වතාවට මේ පාර්ලිමේන්තුවේ විවාදයට ගැනෙන්නේ. අපි විශ්වාස කරනවා, රජය පැත්තෙන් අද ආදායම පිළිබඳව කථා කරයි කියලා. මොකද, මාසයක් තිස්සේ කථා කළේ වියදම ගැන. අපේ පාර්ලිමේන්තුවේ තිබෙන අනෙක් අවුල තමයි, අපේ විසර්ජන පනත් කෙටුම්පතේ හෝ අපි ඉදිරිපත් කරන අය වැයේ අප ලබා ගන්නා ණය පිළිබඳව විවාදයක් ඇති නොවීම, ගරු සභාපතිතුමනි. ඇත්ත වශයෙන්ම එක වාක්‍යායයි තිබෙන්නේ,"මෙන්න මෙච්චර ණය ප්‍රමාණයක් ගන්න ඕනෑ" කියලා.

මට මතකයි, මම පාර්ලිමේන්තුවට ආපු මුල් දවස්වල නඩුවක් දැම්මා. සුප්‍රීම් උසාවිය දුන් ඒ තීන්දුවට අනුව රජය ණය ගන්න කලින් පාර්ලිමේන්තුව දැනුවත් කරලා කියන්න ඕනෑ, මෙන්න මේ ණය තමයි ගන්නේ කියලා. නමුත්, එහෙම නොකළොත් මොකක්ද වෙන්නේ කියන එක පිළිබඳව සුප්‍රීම් උසාවියෙන් තීරණයක් දීලා තිබුණේ නැහැ. මොකද, ඒක practical නැති නිසා. රජය හැම දාම ණය ගන්නවා. ආණ්ඩුවට එන්න කලින් විපක්ෂයේ ඉන්නකොට ඔබතුමන්ලාගේ පක්ෂයේ අය කිව්වා, මෙච්චර මොනවාටද ණය ගන්නේ, ඇයි ණය ගන්නේ කියලා. ඇත්ත වශයෙන්ම මේ ණය හොර ණය. මේවා පිළිබඳ debt audit එකක් කරන්න ඕනෑ. මේවා odious ණය. ඇත්ත වශයෙන්ම සමහර ඒවා ගෙවන්න අවශ්‍යතාවකුත් නැහැ වාගේ කථාවක් කිව්වා. හැබැයි, ඔබ අද ගිහිල්ලා ආණ්ඩුව ඊයේ කොච්චර ණය ගත්තාද කියලා බැලුවොත් ඔබට දැනගන්න පුළුවන්, රුපියල් බිලියන කීයක් ණය ගත්තාද කියලා. මොකද, ඒක හැම දාම වෙන දෙයක්. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ ඒ ගන්න ණය ප්‍රමාණය අඩු කර ගන්න එක සහ ඒ ණය මොනවාටද යොදවන්නේ කියන එක පිළිබඳව හොඳ සාකච්ඡාවක්, සංවාදයක් කරන එකයි. නමුත්, අපේ පාර්ලිමේන්තුවේ ඒකට අවස්ථාවක් නැහැ. මොකද, ඒක අපේ ව්‍යවස්ථාවෙන්ම තිබෙන ප්‍රශ්නයක් හැටියට තමයි මම දකින්නේ. ඒ කෙසේ වෙතත්, අද සාකච්ඡා වෙන්නේ ආදායම ලබා ගැනීම පිළිබඳවයි. ආණ්ඩුව පැත්තෙන් ISB holdersලාත් එක්ක එකහ වෙච්ච ගිවිසුම ඉදිරිපත් කරන්න සූදානම් නම් අපි සතුටු වෙනවා. මොකද, ඔබතුමන්ලා කිව්වා, ඒ ගිවිසුම වෙනස් කරනවා, DSA එක වෙනස් කරනවා කියලා. නමුත්, ඒ කිසි දෙයක් කළේ නැහැ. අපි දන්නවා, අලුත් ආණ්ඩුව පත් වුණාට පස්සේ IMF එක ඇවිල්ලා සාකච්ඡා කළාම විනාඩි කිහිපයකින් රජය, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව විසින් එකඟ වූ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ ඒ ආකාරයෙන්ම කරගෙන යනවා කියලා පිළිගත්ත බව.

ගරු සභාපතිතුමනි, අද මම ඔබතුමාට කියනවා, කිසිම වෙනසක්, අංශු මාත්‍රයක වෙනසක්, එක ඩොලරයක වෙනසක් මේ ආණ්ඩුව කළේ නැහැ කියලා. ඒක ඒ විධියටම ක්‍රියාත්මක වුණා. දැන් වැඩේ ඉවරයි නේ. දැන් market-sensitive information මෙතැන නැහැ නේ. ඔබතුමන්ලා එකඟ වෙච්ච ISB holdersලාත් එක්ක අත්සන් කරපු යෝජනාව පුළුවන් නම් ඉදිරිපත් කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒක, පළමුවන කාරණය.

දෙවන කාරණය මෙයයි. අපි ජපානය, චීනය, Paris Club සහ non-Paris Club රටවල් සමඟ bilateral agreementsවලට එකඟ වුණා. ඊයේ චීනයේ තානාපතිතුමා කියා තිබෙනවා මම දැක්කා, ණය ප්‍රතිව්‍යුහගත කිරීම නිසා චීනයට ඩොලර් බිලියන 7ක පාඩුවක් සිද්ධ වුණා කියලා. ඒක ඔවුන් ලංකාව කෙරෙහි තිබෙන විශ්වාසය මත කරපු දෙයක් හැටියට කියා තිබුණා. ඒක අනිශයින්ම වැදගත් දෙයක්. ඒ සම්බන්ධයෙන් අපේ කෘතඥතාව පළ කරන්න කැමැතියි. ඉන්දියාවත් අපට එහෙම කළා. අනෙක් රටවලුත් අපට අවශ්‍ය වෙලාවේදී ඒ සහයෝගය ලබා දුන්නා. දැන් මේ bilateral agreementsවලත් තිබෙනවා, clawback clause කියලා එකක්. ඒ කියන්නේ, comparability of treatment කියලා තිබෙනවා. යම් විධියකට මොවුන් අත්සන් කරපු macro-linked bond කියන එක, ඒ කියන්නේ රටේ ආර්ථිකය අපේ benchmark එකට වඩා වැඩිපුර වර්ධනය වුණොත්, ඒ වර්ධනයේ ප්‍රතිලාභය අපේ රටට නොවෙයි ලැබෙන්නේ; ඒ ප්‍රතිලාභ ලැබෙන්නේ ඒ bond holdersලාට, එහෙමත් නැත්නම් creditorsලාට. ඒකට බලපාන හේතු කිහිපයක් තිබෙනවා. මෙතැනදී ඒ පිළිබඳව දීර්ඝව විශ්ලේෂණය කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් macro-linked bond එකට සාපේක්ෂව, ගරු සභාපතිතුමනි, අනෙක් රටවල් කියා තිබෙනවා, "ඔවුන්ට ඒ සහනය දෙනවා නම්, අපිටත් ඒ සහනය ලැබෙන්න ඕනෑ" කියලා.

මම අපේ විවාදය පටන් ගන්නකොට කිව්වා, සමගි ජන බලවේගයෙන් අපි අර්ථසාධක අරමුදලටත් එවැනි clawback clause එකක්, comparability of treatment ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා කියලා. අපි කවුරුත් දන්නවා, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඒ පහර සම්පූර්ණයෙන්ම වැදුණේ මේ රටේ වැඩ කරන ජනතාවට බව. අපි බලාගෙන හිටියා, මේ විවාද තුළ එක දවසක් හෝ ඇත්තවශයෙන්ම ජනතාව වෙනුවෙන් යැයි කියා ගන්නා පුද්ගලයන් ඒ සම්බන්ධයෙන් වචනයක්වත් කථා කරයි ද කියලා. අවම වශයෙන් අපි හිතුවා, "ඔව්, සජබයෙන්, විපක්ෂයෙන් මෙවැනි දෙයක් යෝජනා කර තිබෙනවා. අපි ඒක සලකා බලන්නම්" කියලාවත් ඔවුන් කියයි කියලා. නමුත්, එහෙමවත් කියැවුණේ නැහැ.

මම මේ කියන්න හදන්නේ මේකයි, ගරු සභාපතිතුමනි. අපි වියදම ගැන දීර්ඝව කථා කළා; ආදායම පිළිබඳව කථා කළේම නැහැ; ණය පිළිබඳවත් කථා වීම අතිශයින්ම අඩුයි. මම කියන්නේ අරයා ණය ගත්තා, මෙයා ණය ගත්තා, මේ ණය අව්චර වැඩි වුණා, මෙච්චර වැඩි වුණා කියන එක නොවෙයි. තාක්ෂණිකව, විශ්ලේෂණාත්මකව මේ ණය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න ඕනෑ. ඒ වාගේම නව ව්‍යවස්ථාවක් ගෙනෙනවා නම්, ඒ ව්‍යවස්ථාවේත් අපි යම් කිසි විධියකට මේවා ඇතුළත් කරන්න ඕනෑ. එදා මම විපක්ෂයේ ඉන්නකොට, බන්දුල ගුණවර්ධන මහත්මයා ඇමතිතුමා විධියට

ඉන්නකොට කාරක සභාවක් තිබුණා. මට මතක නැහැ, ජේවීපී එකෙන් කවුද හිටියේ කියලා, මම හිතන විධියට සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වෙන්න ඕනෑ. අපි යෝජනා ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කළ යෝජනාවලින් එකක් තමයි ණය පිළිබඳව පාර්ලිමේන්තුවේ සංවාදයක් ඇති විය යුතුයි කියන එක. අද ඒවා ගැන කථා කරනවාට වඩා මම බලාපොරොත්තු වෙන්නේ, ආදායම ගැන කථා කරන්න.

ගරු සභාපතිතුමනි, IMF එකේ ප්‍රධානියා වන ක්‍රිස්ටලීනා ජෝර්ජියේවා මහත්මිය ගරු ජනාධිපතිතුමා එක්ක meeting එකක් තිබුණා, මේ මාසයේ 9 වැනි දා. මම මේ උපුටා දක්වන්න යන්නේ, "Newsfirst.lk"හි press report එකේ කොටසක්. Ms. Kristalina Georgieva had said,

"So my very first message to you, Mr. President, is bravo."

මෙහිදී, ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාට මගේ ප්‍රථම පණිවුඩය 'bravo'" කියලා කියනවා. සාමාන්‍යයෙන් "bravo" කියන්නේ, කෙනෙක් වැඩක් අතිශයින්ම හොඳට කළොත්. එතකොට IMF එකේ ප්‍රධානියා ගරු ජනාධිපතිතුමාට කියන පළමුවැනි දෙය තමයි "bravo" කියන එක. She had further said,

"Congratulations for what you have achieved."

හොඳයි. අපි කියන්න උත්සාහ කරන්නේ නැහැ, IMF ගනුදෙනුවෙන් එළියට යන්න කියලා. එහෙම කුහකයෝ නොවෙයි අපි. ඇත්ත වශයෙන්ම මට හොඳට මතකයි, IMF එකට යන්න කියලා ඉස්සර වෙලාම කිව්වෙත් අපි, 2020දී. *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාට "bravo" කිව්වේ නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට "bravo" කිව්වාද, නැද්ද කියන එක වෙනම කථාවක්, ගරු සභානායකතුමනි. මම ඒක වෙනම බලා ගන්නම්. මම නොවෙයි නේ ඔබ. ඒක තමයි මම කියන්නේ. මගේ මිත්‍රයා, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කියනවා, "හර්ෂ ඔළුවෙන් හිටගෙන කිව්වත් එයා කියන දේ අපි කරන්නේ නැහැ" කියලා. නමුත් ගරු සභානායකතුමා කියනවා, මට "bravo" කියන්නේ නැතුව අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට "bravo" කියපු එක සම්බන්ධයෙන් මට අවුලක් තිබෙනවාය කියලා. එහෙම එකක් නොවෙයි.

මම කියන්නේ මේකයි. අපි කියපු දේ, සජබයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සහ "The Blueprint" එකේ පිටු 42ක් තුළ කියපු දේ ඔබලා යම් විධියකට ක්‍රියාත්මක කරන බවක් -තේරුම් ගත්තත්, නැතත්- පෙනෙන්න තිබෙනවා. හැබැයි, ඊටත් එහාට ගිහිල්ලා රනිල් වික්‍රමසිංහ විසින් එකඟ වුණු ඒ Agreement එක ඒ ආකාරයෙන්ම වචනයක්වත් වෙනස් කරන්නේ නැතුව ඉස්සරහට කරගෙන යනවා. මම,- *[බාධා කිරීමක්]*ට disturb කරන්න එපා, බිමල් ඇමතිතුමා; do not disturb my train of thought. Please, speak after me.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හඳුන්නෙත්ති මැතිතුමා කියා තිබුණේ අර Bond scam එක වෙලාවේ ඔබතුමා footnotes සම්බන්ධව කියපු දේවල් ඔළුවෙන් හිටගෙන කිව්වත් කරන්නේ නැහැ කියලායි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි. එහෙම නම් ඒ සම්බන්ධයෙන් අපි විවාදයක් පවත්වමු. ඒක කියපු එක හොඳයි. මේකට ජනාධිපති කොමිසමක් පත් කර තිබුණා. ගරු සභාපතිතුමනි, footnotes තිස්ගණනක් තිබුණා මම හිතන විධියට. එම ජනාධිපති කොමිසමට ඒ තිස්ගණනම ඉදිරිපත් වුණා. ඒ තිස්ගණනම -හැම එකම- ජනාධිපති කොමිෂන් සභාවෙන් අනුමත කර තිබෙනවා, ඒවා සත්‍යයි සහ නිවැරදියි කියලා. මේක සමහරු දේශපාලන football එකක් කරගත්තා. මා ළඟ ඒවා තිබෙනවා. මම ඒවා සභාගත කරන්නම්. ඒවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න, ජනාධිපති කොමිෂන් සභාවේදී ඔය Treasury Bonds සම්බන්ධයෙන් මතු වුණු කාරණා. අපි කිසිම දවසක හොරකම් කරලා නැහැ, ගරු සභාපතිතුමනි. මම අවුරුදු 15ක් පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. අපි එහෙම කරන ජාතියේ අය නොවෙයි. අපේ දෙමව්පියන් රජයේ සේවකයන්. ඒ අය අපිව උස්මහත් කර හැදුවේ හොරකම් කරන්න නම් නොවෙයි. ඒක තමයි අදටත් මිනිස්සු අපිට ඡන්දය දෙන්නේ. ඒක තමයි මිනිස්සුන්ගේ ඇස් දෙක දිහා බලාගෙන අපට අදටත් කථා කරන්න පුළුවන්කම තිබෙන්නේ; හැකියාවක් තිබෙන්නේ. අහපු නිසා මම කියන්නම්, මේකේ අවුල මොකක්ද කියලා. මේකේ එක තැනක කියනවා, රජයෙන් බැඳුම්කරයක් රුපියල් 100ට වඩා අඩුවෙන් විකිණුවොත්, ඒක රජයට පාඩුවක් කියලා.

ගරු සභාපතිතුමනි, මගේ ආචාර්ය උපාධියේ කොටසක් හැටියට Treasury Bonds සම්බන්ධයෙන්, finance පැත්ත ගැන ඉගෙන ගෙන තිබෙනවා. මම ඒ විෂයය විශ්වවිද්‍යාලයේ උගන්වා තිබෙනවා. මම ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ MBA එකේ economics and dynamics of finance කියන විෂයය උගන්වා තිබෙනවා. ඊට අමතරව මම ප්‍රධාන බැංකුවක භාණ්ඩාගාරික - treasurer - කෙනෙක් හැටියට වැඩ කර තිබෙනවා. ඒ නිසා මම bond trade එක ගැන හොඳටම දන්නවා.

අපේ තර්කය වුණේ මේකයි. රුපියල් 100ට, එහෙමත් නැත්නම් par value එකකට යම් කිසි බැඳුම්කරයක් විකුණන්න පුළුවන්ද, බැරිද කියා තීරණය වන්නේ එවකට වෙළෙඳ පොළේ තිබෙන පොලිය අනුවයි.

ගරු විපක්ෂ නායකතුමා සියයට 15ක පොලියක් දෙන්න පුළුවන් ද බැරිද කියලා අහනකොට ගරු අනිල් ජයන්ත ඇමතිතුමා කිව්වා, ඒ වෙලාවේ තිබෙන market එකට අනුව තමයි ඒ පොලිය තීරණය වෙන්නේ කියලා. එහෙම තමයි Treasury Bond එකක් price වෙන්නේ. තමන්ගේ අතේ තිබෙනවා නම් අවුරුද්දකින් mature වන සියයට 12ක Bond එකක්, ආණ්ඩුව සියයට 12ක පොලියක් ගෙවිවොත් විතරයි ඒක රුපියල් 100ට විකුණන්න පුළුවන් වෙන්නේ. සියයට 10ක පොලියක් ගෙවිවොත් රුපියල් 100ට නොවෙයි, රුපියල් 98ට හෝ රුපියල් 97ට තමයි විකුණන්න වෙන්නේ. ඒක සරලයි. ඉතින් කරුණාකර කල්පනා කර බලන්න. මේකේ තිබෙන ඒවා එකක්, දෙකක් මම කියවන්නම්. මගේ වෙලාව යනවා. නමුත්, බලාපොරොත්තු වූ වෙලාවටත් වඩා වෙලාව ලැබුණු නිසා මම කියවන්නම්. Treasury Bonds සම්බන්ධයෙන් වන ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 661වන පිටුවේ "The Footnotes to the Report " යටතේ මෙසේ සඳහන් වෙනවා:

"Footnotes 1, 2 and 3
The observations made in these Footnotes are factually correct, as established by the evidence before us.

Footnotes 4, 5 and 6
The observations... are factually correct,…

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Footnote 7
The observations... are factually correct,…

Footnote 8
The observations made in this Footnote are factually correct,…

Footnote 9
...correctly observes that, it may not have been possible,..."

ගරු සභාපතිතුමනි, කවුරුන් හෝ කවදා හරි මේ ගැන කථා කරන්න ඕනෑ. ඉතින් footnote එකක් කියන්නේ තාක්ෂණික කාරණාවක්. නමුත්, මෙකෙන් කියන්නේ නැති දේ තමයි, කාටත් අමතක වෙච්ච දේ තමයි - මේ footnote දැම්මා ද, නැද්ද කියන එක නොවෙයි අදාළ වෙන්නේ - සියලු මන්ත්‍රීවරු මේ වාර්තාවේ සියලු නිර්දේශවලට සියයට සියයක් එකඟයි කියලා මුල් පිටුවේ සඳහන් කර තිබෙන එක. ඒක කවදාවත් ජේවීපී එකේ කට්ටිය කියන්නේ නැහැ. පළමු පිටුවේ තිබෙන කාරණාව කියන්නේ නැහැ. බිමල් රත්නායක මැතිතුමා මගේ train of thought වෙනස් කරන්න උත්සාහ කළා. ඒ වුණාට ඒක එතුමාට කර ගන්න ලැබුණේ නැහැ. ඒ නිසා මම මේ ලේඛනය **සභාගත*** කරනවා, ගරු සභාපතිතුමනි.

පසු දවසක හෝ මේක ඔබතුමන්ලා කියවන්න. මේක කියවලා තේරුම් ගන්න, නිකම් මිනිස්සුන්ට මඩ ගහනවා වෙනුවට. හැබැයි, අපි මේකේ පිළිගන්න එක දෙයක් තිබෙනවා. අපි මේකේ කියනවා, වංචාවක් සිද්ධ වුණා, ඒ සිද්ධ වෙච්ච වංචාවට අදාළ කට්ටියට දඬුවම් දිය යුතුයි කියලා. ඒක පැහැදිලිවම - සියයට 100ක් - කියලා මේකේ අත්සන් කර තිබෙනවා.

තව කාරණයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. මෙහි footnote එකක තිබෙනවා, forensic audit එකක්, එහෙම නැත්නම් වෝහාරික විගණනයක් කරන්න කියලා. ඒක Report එකේ නැහැ, ගරු සභාපතිතුමනි. වෝහාරික විගණනයක් කරන්න කියලා තිබෙන්නේ, මේ footnote එකක. ඉතින්, මොනවාද මේ කට්ටිය කථා කරන්නේ? ඒ ගැන මේ සභාවට පැහැදිලි කරන්න අවස්ථාවක් ලබා දුන්නාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මට වැඩිපුර විනාඩි 5ක් දෙන්න, එතුමන්ලා විසින් මගේ කාලය කා දැමූ නිසා.

මේ තිබෙන්නේ, ආණ්ඩුවේ ඔබතුමන්ලා පෙබරවාරි 11 දින IMF එකට ඉදිරිපත් කරපු ලියුම. ඒකේ කියනවා, I quote:

"Ms. Kristalina Georgieva,
Managing Director.

Dear Ms. Georgieva,

Implementation of our programme has been strong. We have completed the prior actions on relaxing…are on track to completing the prior actions..."

මේ ලියුම පිටු එකහමාරක් දිගයි. මේ ලියුම මම **සභාගත*** කරනවා.

මෙහි තිබෙනවා, "Dear Ms. Georgieva, අපි ඔබගේ සියලුම නිර්දේශවලට එකඟ වෙලා තිබෙනවා, ඒවා ඒ විධියටම කරගෙන යනවා" කියලා. This letter further states, I quote:

"The programme will continue to be monitored though semi-annual reviews,…"

කවුද අත්සන් කරන්නේ? Anil Jayantha Fernando, Acting Minister of Finance, Planning and Economic Development. මේක මහින්ද රාජපක්ෂ මහත්තයාත් කළා. මට මතකයි, එතුමා අත්සන් කරන්න ඕනෑ දවසේ රට ගියා. රට ගියාම සරත් අමුණුගම මහතා වැඩ බලන ඇමතිවරයා හැටියට තමයි අත්සන් කළේ. ඊටපස්සේ කිව්වා, "මම අත්සන් කළේ නැහැ" කියලා. දැන් බලන්න, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා හරියටම එදා රට ගිහිල්ලා නේ. එතුමා එදා ඩුබායි ගිහිල්ලා. මෙතුමාව වැඩ බලන්න පත් කරලා, මෙතුමාට පෑන දීලා ඩුබායි ගිහිල්ලා. මෙතුමා අත්සන් කර තිබෙනවා. බලන්න, මේ තිබෙන්නේ.

දැන් බලන්න, third tranche එකෙන් පසුව ඉදිරිපත් කරලා තිබෙන වාර්තාව. මේ වාර්තාවේ එක පිටුවක් ගැන විතරයි අද මගේ අවධානය යොමු කරන්නේ. ඒ තමයි, 12වැනි පිටුව. ඒ පිටුවේ තිබෙන්නේ, 2025 වර්ෂයේ ආදායම ලබා ගන්න ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එකයි. අපි දන්නවා, 2024 අවුරුද්දේ ආර්ථිකය ශීඝ්‍රයෙන් වර්ධනය වුණු බව. දන්ත තිබෙන නිසා එහෙම වුණේ නැහැ කියලා කාටවත් කියන්න බැහැ. ඒකට ඔබතුමන්ලාට credit එක ගන්න හැකියාවක් නැහැ. 2025 අවුරුද්දේ, එදා ලැබිච්ච සියයට 12.4 ආදායමට වඩා තව සියයට 1.6ක ආදායමක් ලබා ගන්න අවශ්‍ය වෙනවා.

සමස්ත බදු - tax - ආදායම සියයට 12.4 ඉඳලා සියයට 13.9ට වැඩි කර ගන්න වෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ඉදිරිපත් කර තිබෙනවා, කාරණා 6ක් හෝ 7ක්. පළමු කාරණාව තමයි, "Introduce CIT of 15 percent on export of services". දැන් මේක අහගන්න. මේක හොඳට අහගන්න. CIT කියන්නේ, Corporate Income Tax එක. ඒ කියන්නේ, ආයතනික ආදායම් බදු. එය සියයට 15 යි. ඒකෙන් දළ වශයෙන් රුපියල් බිලියන 6.8ක් සොයා ගන්න බලාපොරොත්තු වෙනවා. හරි නේද? හැබැයි දිගින් දිගටම කියනවා අප අහගෙනයි, "අපි මේ බද්ද ගහලා තිබෙන්නේ පුද්ගලයන්ට. සියයට 36ක් ගෙවන්න ඕනෑ නැහැ. සියයට 30ක් ගෙවන්න තිබුණා. නමුත්, අපි එය සියයට 15ට අඩු කළා. එම නිසා online මුදල් ඉපැයීම් කරන කට්ටිය කලබල වෙන්න එපා. ඔයගොල්ලන්ගේ යාළුවන් සියයට 36ක් ගෙව්වාට ඔයගොල්ලන්ට ගෙවන්න වෙන්නේ සියයට 15යි" කියලා. මම මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. පිළිතුරු කථාව කරන්න විෂය භාර අමාත්‍යවරයා හැටියට ජනාධිපතිතුමා එයිද දන්නේ නැහැ. එතුමාගෙන් හෝ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් - ඒ එන කෙනෙකුගෙන් - මම අහන්න කැමැතියි, පුද්ගලයන්ට CIT එකක් අය කරන්නේ කොහොමද කියලා. පුද්ගලයන්ගෙන් අය කරන්නේ PIT එකක්. ඒ කියන්නේ, Personal Income Tax එකක්. Hon. Sir, you pay Income Tax as an individual, not as a corporate. අපි දැනගෙන හිටියා, සියයට 30ක බද්ද වෙනුවට සියයට 15ක බද්දක් පනවන බව කිව්වේ corporationsවලටයි කියලා. හැබැයි, ගැසට් නිවේදනය නිකුත් කරන කොට කිව්වා, පුද්ගලයන්ගෙනුත් අය කරනවා කියලා. නමුත්, වැඩ බලන මුදල් ඇමතිතුමා අත්සන් කරලා "Dear Ms. Georgieva" කියා අමතමින් IMF එකට යවපු ලිපියේ, ජෝර්ජියේවා මහත්මිය "bravo" කියලා ජනාධිපතිතුමාට කරපු සඳහනේ Personal Income Tax ගැන නැහැ. ඒකේ තිබෙන්නේ Corporate Income Tax ගැන විතරයි. ඒකෙන් තමයි Rs. 6.3 billion හොයාගන්න බලාපොරොත්තු වන බව කියන්නේ. ඒක වහලා ගැහුවාද, නොදැන ගැහුවාද කියා මම දන්නේ නැහැ. This is an oxymoron. Sir, in the English language, it is called an "oxymoron".

ඊළඟ කාරණාව තමයි, "Increase CIT rate from 40 to 45 per cent on betting and gaming, tobacco and liquor". අපි ඒ ගැන තමයි කථා කරන්න බලාපොරොත්තු වුණේ. නමුත්, ගරු සභානායකතුමා යම් හේතුවකට මාව එතැනින් distract කරන්න

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

උත්සාහ කළා. දැන් බලන්න, ගරු සභාපතිතුමනි, සිගරට් බද්ද ගැන එතුමා IPS එකේ document එකක් දුන්නා. ඒ IPS document එකේ තිබෙනවා, formula එකක්. මම මේ වෙලාවේ ඒ ලේඛනයත් **සභාගත*** කරනවා.

ඒ formula එකේ තිබෙනවා බද්ද ගහන කොට tax එක විය යුත්තේ ගිය අවුරුද්දේ tax එකට "π+g+4" කියලා. මෙතැන "π" කියලා තිබෙන්නේ ඒ අවුරුද්දට inflation එක, "g" කියන්නේ growth rate එක, "4" කියන්නේ constant එකක්.

මේක තමයි පාවිච්චි කරන්නේ කියලා අපට කිව්වාට, මේ formula එකෙන් එකක් දැන් හැලිලා; "g" එක හැලිලා. As I said, "π" means inflation. So, π+4 තිබෙනවා. කෝ, "g" එක? T'=T (1+(π+g+4/100) නම්, කෝ, "g" එක? Inflation එක 1.9 නම්, constant එක 4 නම්, එකතුව 5.9යි. කෝ, "g" එක? ඒ "g" එක තිබෙන්න එපායැ 5ක් විතර. එතකොට 10කට වඩා වැඩි වෙනවා නේ. ගරු සභාපතිතුමනි, මම මේ ලේඛනය සභාගත කළා. හැබැයි, මෙහි කියන්නේ, ඒ formula එක පාවිච්චි කරන්න කියලායි. ඒ formula එක පාවිච්චි වුණාද, නැද්ද කියන එක පිළිබඳව අපේ සංවාදයක් තිබුණා. මම මේ අවස්ථාවේ ඔබතුමන්ලාට පෙන්වන්න කැමැතියි, මුදල් අමාත්‍යාංශයෙන් අපට කරපු presentation එකකට අදාළ ලේඛනයක්. මම මේ ලේඛනයත් **සභාගත*** කරනවා.

මේ බලන්න ගරු සභාපතිතුමනි, මේ presentation එකේ තිබෙන ලස්සන කථාව. ඒ presentation එක දිහා බැලුවොත්, මේ තමයි සිගරට්වලින් ලැබුණු revenue එක. මේ පහළට එන නිල් ඉරෙන් තමයි සිගරට් පාවිච්චි කිරීම පෙන්නුම් කරන්නේ. ඒක යම්කිසි ප්‍රමාණයකට, සිගරට් බිලියන හතරේ ඉඳලා දෙකකට ද කොහේදෝ අඩු වෙලා තිබෙනවා. හැබැයි, මේ chart එකේ මම මේ රතු පාටින් පෙන්වන්නේ, අලුතින් introduce කරපු සිගරට් එකක්. ඒක 2020දී තමයි introduce කරන්නේ. ඊට පස්සේ 2021දී සෑහෙන්න market share එකක්, 2022දී ඊට වඩා ලොකු market share එකක් තිබෙනවා. 2024 වන කොට ඒකට තමයි ලොකුම market share එක තිබෙන්නේ. හැබැයි, 2020 වනතුරු එහෙම එකක් තිබුණේ නැහැ. ඇයි එහෙම වෙන්නේ? ඇයි එහෙම වුණේ?

ඊළඟට, Excise Duty collection එක ගෙන බලන්න. Excise Duty collection එකට අර අලුත් සිගරට් එකෙන් එන දායකත්වය එන්න එන්නම වැඩි වෙනවා. මේ, දැක්කාද? හැබැයි, ආණ්ඩුව එකතු කර ගන්නා ආදායම අඩු වෙනවා. ඇයි ඒ? හේතුව මේකයි. Costly එකෙන් lower-cost එකකට switch කර ගන්නවා. එතකොට ඒ switch එක වෙන්නේ brands ඇතුළේ. ඒ switch එක වෙනකොට, දැන් වැඩියෙන් විකුණන brand එකේ Excise Tax එක අඩු නම්, ආණ්ඩුවට ලැබෙන Excise Duty revenue එක අඩු වෙනවා. ඒ එක්කම මම කිව්වා නේ, affordability එක සියයට 75 තියාගන්න ඕනෑ කියලා. මේ බලන්න, මේ අලුතින් ආපු සිගරට් එකට අදාළව එය සියයට 67.8ට තමයි තිබෙන්නේ. ඉතින්, මේ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ කියන tax-in-price benchmark එක සියයට 75ට තියාගන්න ඕනෑ කියලා කිව්වාට, ඒගොල්ලන් යෝජනා කරලා approve කරපු එකෙන් එන්නේ සියයට 67.8යි.

මට මේ ගැන දීර්ඝව සාකච්ඡා කරන්න පුළුවන්. නමුත්, වෙලාව මදි නිසා මම එය කරන්නේ නැහැ. Verite Research ආයතනයෙන් analysis එකක් ඉදිරිපත් කරලා තිබෙනවා; Institute of Police Studiesත් - IPS එකෙනුත් - analysis එකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ දෙකම මම **සභාගත*** කරනවා.

වැඩිපුරම විකිණෙන සිගරට් එකේ - the most sold brand එකේ - tax එක හරියාකාරව තිබුණා නම් ගිය අවුරුද්දේ ඒකෙන් රුපියල් බිලියන 9.4ක් හොයා ගන්න තිබුණා කියා පෙන්වා තිබෙනවා. මම කලින් කියපු ආකාරයට export කරන කොට ගහන බද්දෙන් බලාපොරොත්තු වන්නේ රුපියල් බිලියන 6.8යි. මම ඒ ගැන කිව්වා ඔබතුමාට මතක ඇති, ගරු සභාපතිතුමනි. හැබැයි, මේක හරියට price කළා නම් රුපියල් බිලියන 9.4ක් හොයා ගන්න පුළුවන්, එක brand එකකින් විතරක්. ඒකයි මම කියන්නේ "මෙතැන ලොකු අවුලක් තිබෙනවා. මේ අවුල බේරුම් කරගන්න ඕනෑ" කියලා.

ගරු සභාපතිතුමනි, විවේචනයට එහා ගිහින් මම යෝජනා කරන්න කැමැතියි, මේ බද්ද වෙනස් විය යුත්තේ කොයි විධියට ද කියලා. Verite Research ආයතනයෙන් ඉදිරිපත් කරපු මේ වාර්තාවේ තිබෙන ආකාරයට ඒ යෝජනාව මා කියන්නම්. මම මේ වාර්තාවත් **සභාගත*** කරනවා.

මේවා මම හදපු වාර්තා නොවෙයි. මේවා research ආයතන දවස් ගණන් විශ්ලේෂණය කරලා හදපු වාර්තායි. මේ කරුණු ඇතුළත් වාර්තාව Verite Research ආයතනයෙනුයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. JP Gold Pro - 67-72 mm - එක ගත්තාම, ඒක benchmark කරලා තිබෙන්නේ JP Gold Leaf කියන most sold brand එකට. ඒකට Excise Tax එකක් පනවා තිබෙනවා, රුපියල් 81ක. JP Gold Pro එකට පනවා තිබෙන්නේ රුපියල් 71.5ක බද්දක්. ඇත්තවශයෙන්, ඒකට පනවන්න ඕනෑ රුපියල් 69.4ක බද්දක්. The corrected Excise Tax per cigarette is Rs. 69.40 instead of Rs. 71.50. හැබැයි මා කියපු JP Gold එකට පනවා තිබෙන්නේ රුපියල් 50.2ක බද්දක්. හැබැයි, පනවන්න ඕනෑ රුපියල් 64.6ක බද්දක්. Capstan - below 60 mm - එකට පනවා තිබෙන්නේ රුපියල් 19.4ක බද්දක්. හැබැයි මේ ලේඛනයට අනුව පනවන්න ඕනෑ රුපියල් 57.9ක බද්දක්. මෙහි ඒ ආදි වශයෙන් තොරතුරු සඳහන් වෙනවා.

අපට මේ ගැන දීර්ඝව සාකච්ඡා කරන්න පුළුවන්. ඒකයි මම කිව්වේ මේ බදු ආදායම ලබා ගැනීම සඳහා මෙහිදී මීට වඩා සාකච්ඡා කළ යුතුයි කියලා. මේවා සම්බන්ධයෙන් අපට කාරක සභාවේ සාකච්ඡාවකට තිබෙන්නේ කෙටි කාලයයි. ඔබතුමන්ලා අපට එවනවා, pass කරලා දෙන්න කියලා. විපක්ෂයේ කුහකයෙකු හැටියට මටත් කියන්න පුළුවන්, "නැහැ මම මේක කරන්නේ නැහැ" කියලා. කාරක සභාවේ තවත් සාමාජිකයන් ඉන්න බව ඇත්ත. නමුත්, මම තමයි එහි සභාපති. ඒ නිසා අපිත් දන්නවා, පාර්ලිමේන්තුවේ කොහොමද වැඩ කරන්නේ කියලා.

ඒක ඇවිල්ලා, tobacco සම්බන්ධයෙන්. ඒ වාගේම මම පෙන්වන්නම්, ඒකේ තිබෙන gaming සම්බන්ධයෙන්. එතකොට මේ gaming සම්බන්ධයෙන් casino revenue එක,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Leader of the House?

.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, අපි දන්නවා, ස්ථාවර නියෝග අනුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය විපක්ෂයට පැවරිලා තිබෙන බව. හැබැයි, විපක්ෂයට පැවරුණා කියලා වගකීම් විරහිතව හැසිරෙන්න බැහැ. ඒ විධියට කවුරු හරි කෙනෙක් කල්පනා කරනවා නම්, එවැනි අත්දැකීම් ලැබුණොත්, අපි යෝජනා කරනවා ඒ ස්ථාවර නියෝගය අත්හිටුවලා යන්න කියලා. අපි කවුරුත් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න ඕනෑ. ඒ ලැබිලා තිබෙන අයිතිය blackmail කරන්න, තර්ජනාත්මකව පාවිච්චි කරන්න විපක්ෂයට අයිතියකුත් නැහැ, ආණ්ඩුවට අයිතියකුත් නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හරි, මම අහගෙන හිටියා. මේක කළා, ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුවත්. ඒගොල්ලන් මෙතැනට ඇවිල්ලා, ස්ථාවර නියෝග suspend කරලා තමයි අප පත් කරන්නේ නැතුව, ඒගොල්ලන්ම පත් කර ගත්තේ. ඒ නිසා පූර්වාදර්ශයකුත් තිබෙනවා. ඕනෑ කෙනෙකුට පුළුවන් මාව අයින් කරන්න. ඒකේ අවුලක් නැහැ. හැබැයි, මම ඔබතුමාට සද්භාවයෙන් කිව්වේ, පාර්ලිමේන්තුවේ මීට වඩා මේ ගැන විවාදයට අවස්ථාව ලබා දෙන්න ඕනෑ කියන එක.*[බාධා කිරීමක්]* මගේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න; please do not disturb.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, ඒක තර්ජනාත්මකව තමයි ඉදිරිපත් වුණේ. ඒ නිසා තමයි මම ඉදිරිපත් වුණේ.

ඔබතුමා දන්නවා, මේ හැම දෙයක්ම press එකේ යන බව. ඔබතුමා දන්නවා නේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය ස්ථාවර නියෝගවල නැතුව තිබියදීත්, අපි විපක්ෂයට දීලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා අපි කරලා තිබෙන දේවල් පිළිබඳව ඇගයීමක් සහිතව කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම තර්ජනාත්මකව කටයුතු කරන්න එපා කියලාත් අපි අදාළ පුද්ගලයාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභාපතිතුමනි, මේක සිගරට් ගැන. අනික් එක තමයි කැසිනෝ. දැන් බලන්න, උගුර ලේ රහ වෙනකම් මෙතැන කියනවා, කැසිනෝ බදු හරියට එකතු කර ගන්න කියලා. මේකට Casino Regulator කෙනෙක් දාන්න. නමුත් ඒක වෙන්නේ නැහැ. ආණ්ඩුව ඇවිල්ලත් දැන් මාස හයක් වෙනවා. අපි හැමදාම කියනවා, මේ online casinos හැම තැනම තිබෙනවා කියලා. දැන් ගිහිල්ලා බලන්න, online casinos තිබෙනවා. නමුත් ඒවායින් ශත පහක් බදු ගහන්නේ නැහැ. හැබැයි, මේ මම පෙන්නුවා වාගේ වෙන බදු ගහගෙන, ගහගෙන යනවා. නමුත් ඇයි මේක කරන්නේ නැත්තේ?

ගරු සභාපතිතුමනි, 2022.11.24වන දා සිට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හරහා ඒ සම්බන්ධයෙන් වෙච්ච වැඩ පිළිවෙළ මම **සභාගත*** කරන්න කැමැතියි.

දැන් බලන්න, හරියට අපට නියාමන කොමිසමක් තිබෙනවා නම්, මේ ගහපු බදු ප්‍රමාණයෙන් මීට වඩා මහ ගොඩක් ලබා ගන්න පුළුවන්. බලන්න, 2020දී ලැබිලා තිබෙන්නේ බිලියන 1.1යි; 2021දී 1.5යි; 2022දී 6.2යි; 2023දී 6.7යි; 2024 අලුත් licence එකක් දීපු නිසා බිලියන 13.4යි. මේ අවුරුද්දට දැනට බිලියන 1.6යි. මොකක්ද මේ? මේක අනුව entrance levy එකත් තිබෙනවා. බෙදලා බැලුවාම ගරු සභාපතිතුමනි, ශ්‍රී ලාංකිකයෝ එක දවසකට මේ කැසිනෝ එකකට සාමාන්‍ය වශයෙන්, on average, ගිහිල්ලා තිබෙන්නේ 17දෙනායි. මේ 17දෙනාට ගහන ඩොලර් 50, ඩොලර් 100 කරන්න හදනවා. ඒක නොවෙයි විය යුත්තේ. 17දෙනෙකුගේ ඩොලර් 50, ඩොලර් 100 කරලා කීයක්ද එකතු කර ගන්න පුළුවන්? ඩොලර් 850යි. හැබැයි, එකතු කරන්නේ නැති බදු කොච්චර තිබෙනවාද? ඒ නිසා මෙතැනට ඇවිල්ලා මිනිස්සුන්ට කියන්න පුළුවන්, "ඔව්, අපි සිගරට් බදු, අරක්කු බදු, කැසිනෝ බදු වැඩි කරනවා" කියලා. නමුත් ඒවා කොළේට විතරයි සීමා වෙලා තිබෙන්නේ. ඒක ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් නැහැ. මෙතැනට ඇවිල්ලා බොහෝ කට්ටිය, බොහෝ දේ කිව්වාට, මේවා කළ යුතු දේවල්. මේවා කොළේට සීමා කරන්න එපා.

ඊළඟ කාරණාව, සියයට 40 ඉඳලා 45 දක්වා වැඩි කරනවා කිව්වා නේ Corporate Tax එක. කැසිනෝවල Corporate Tax එක කීයද කියලා දන්නේත් නැහැ. ඒක monitor කරන්න කිසිම විධියක් නැහැ.

ඊළඟට තිබෙනවා, ආහාරවලට ගහන SCLඑක පිළිබඳව "Replace SCL with VAT at a rate of 18 per cent" කියලා. ඔබතුමන්ලා කිව්වා ආහාරවලට බදු ගහන්නේ නැහැ කියලා. හැබැයි, VAT එකක් තිබුණේ නැහැ. තිබුණේ Special Commodity Levy එකක්. ඒක අයින් කළේ නැහැ, ගරු සභාපතිතුමනි. ඊයේ පෙරේදාත් ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ බර ගණනක ඒවා සම්මත කර ගත්තා. මම නිකම් ඒකෙන් කිහිපයක් හෝ කියවන්නම්.

හාල් මැස්සන් කිලෝවකට රුපියල් 100යි, කරවල කිලෝවකට රුපියල් 100යි, රතු ලූනු කිලෝවකට රුපියල් 50යි, බොම්බයි ලූනු කිලෝවකට රුපියල් 10යි, මුං ඇට කිලෝවකට රුපියල් 300යි යනාදි වශයෙන් තිබෙනවා. යම් කිසි කෙනෙකු මේක සාධාරණය කරන්න පුළුවන්, ගොවි මහත්වරු අස්වැන්න නෙළන කාලයට මේක conflict එකක් වෙන්න පුළුවන් කියලා. ඒක හරි. හැබැයි, ඒක නොවෙයි ඔබතුමන්ලා කිව්වේ. ඔබතුමන්ලා කිව්වේ ආහාරවලට පනවා ඇති බදු අයින් කරනවා කියලායි. තව නොයෙකුත් දේවල් කිව්වා. මම ඒවා ගැන මේ අවස්ථාවේ කථා කරන්නේ නැහැ. මොකද, මම දේශපාලනයට වඩා ආනයන ගැන කථා කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

ඊළඟට කියනවා, "Introduce VAT on supply of digital services" කියලා. සියයට 10ක VAT එකක් ගහනවා කියනවා. දැන් බලන්න ගරු සභාපතිතුමනි, මේක පටන් ගත්තේ Uber එකෙයි, PickMe එකෙයි තිබෙන අවුල නිසායි. Uber එකේ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

platform එකට VAT එක වදින්නේ නැහැ. PickMe එකේ platform එකට VAT එක වදිනවා. මේක සාධාරණය කරන්න ඕනෑ කියන එක තමයි අපි මුලින්ම කිව්වේ. මේක අද ඊයේ වෙච්ච දෙයක් නොවෙයි. එතකොට ලංකාවේ සියලුදෙනා නම් consume කරන්නේ, the jurisdiction of consumption must be the jurisdiction for taxes කියන එක තමයි අපේ මතය වුණේ. ඒකට තමයි මේ යන්න හදන්නේ. හැබැයි, අවුල තිබෙන්නේ,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතකොට අවුල තිබෙන්නේ මෙතැනයි. අප්‍රේල් මාසයේ පළමුවැනි දා සිට Google එකටයි, Airbnb එකටයි, Booking.com එකටයි, Meta එකටයි සියයට 18ක VAT එක ගහන්න හදනවා. දැන් ඒගොල්ලන් නඩු දමලා තිබෙනවා, අපට මේක සතියෙන් කරන්න බැහැ කියලා. අපි කොහොමද සතියෙන් මේක වෙනස් කරන්නේ කියනවා. Google එකේ කලාපයේ ප්‍රධානියා ලියුමක් එවලා තිබෙනවා, ඔවුන්ට මේ සඳහා අවුරුද්දක්වත් අවශ්‍යයි කියලා. මම ඒ ලිපිය **සභාගත*** කරන්න කැමතියි.

අපි දන්නවා Uber එකත් නඩු දාලා තිබෙනවා කියලා. අපට ආරංචි වෙන විධියට ආණ්ඩුව කියලා තිබෙනවා, "හරි, එහෙම නම් මේ VAT වෙනස් කිරීම අපි තාවකාලිකව අත්හිටුවනවා. ඔක්තෝබර් මාසය වෙනකම් මේක ගහන්නේ නැහැ" කියලා. මේක නේ. මොකක් හරි වෙනස් කරන්න යනවා නම්, මේක මෙහෙම කරනවා කියලා කලින් දැනුවත් කරන්න ඕනෑ නේ.

අනෙක් කාරණය මේකයි. මම අහගෙන විදේශ ඇමති විජිත හේරත් මැතිතුමා කියනවා, ලංකාවේ Booking.com බදු ගෙවන්නේ නැහැ, හොර වැඩක් කරනවා වාගේ කථාවක්. ඔවුන්ට තරග කරන්න ලංකාවේ තව කොම්පැනි හදනවා කිව්වා. මොනවාද මේ කියන්නේ? කවුද ගරු විදේශ ඇමතිතුමාට මේ බොරු අවවාද දුන්නේ? විදේශ ඇමතිතුමා විදේශ අමාත්‍යාංශයේ economic team එකෙන් අහන්න ඕනෑ, "මෙහෙම කථාවක් කියන්න තමුසෙලාට පිස්සුද අයියේ?" කියලා. බදු ගෙවන්න නැත්නම් මොනවාටද බදු ගෙවන්නේ? බදු ගෙවන්න තිබෙන ව්‍යුහය තමයි මේ ඉදිරිපත් කරන්න ලෑස්ති වෙන්නේ.

ඊළඟට කියනවා, "Lifting import ban on motor vehicles" කියලා. මේක තමයි ඔයගොල්ලන්ගේ ප්‍රධානම ආදායම් එකතු කිරීමේ වැඩ පිළිවෙළ. ඒකෙන් - import ban එක lift කිරීමෙන් - රුපියල් බිලියන 340ක් බලාපොරොත්තු වෙනවා. ඊට පසුව බලාපොරොත්තු වෙනවා, රුපියල් බිලියන 68ක්. සියයට 30ක Import Duty එකක් දමනවා. මේ දෙකෙන් බලාපොරොත්තු වෙනවා, රුපියල් බිලියන 400කට වැඩි ප්‍රමාණයක්. රුපියල් බිලියන 400ක් කියන්නේ කොච්චරක්ද? අපි සාමාන්‍යයෙන් සොයලා බැලුවා, වාහනයක average cost එක කීයද කියලා. එදා කියපු විධියට CIF value එක එන්නේ ඩොලර් 20,000ක් විතර. එතකොට මම හිතන්නේ දිනකට,- මම ඒ ගණන හැදුවා. මාසයකට වාහන 2,000ක් විතර ගේන්න ඕනෑ, ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන ආදායම ලබාගන්න. ඒ ප්‍රමාණය ගෙනෙයිද? දැන් ගේනවාද? දැන් බලන්න, එක ඇමතිවරයෙක් ගිහින් කිව්වා, මේ බදු වැඩි නම් බදු අඩු කරනවා කියලා. මේක market එකක් නේ. එහෙම කිව්වාම market එකේ participantsලා මොකද කරන්නේ? ඒගොල්ලන් බලාගෙන ඉන්නවා බදු අඩු වෙනකම්. That is how the market works. Market එකක වැඩ කරලා තිබෙනවා නම්, ඔබතුමන්ලාට මේක හොඳට තේරෙනවා. Market participant කෙනෙක් ආණ්ඩුවේ policy එකත් විශ්ලේෂණය කරලා තමන්ගේ system එක ඇතුළට දාගන්නේ කොහොමද කියලා තේරෙනවා නේ. ඒ නිසා එහෙම කිව්වේ මොකද කියලා මම දන්නේ නැහැ. දැන් ඒ අය බලාගෙන ඉන්නවා, බදු අඩු කරනකම්. එහෙම නම් බදු අඩු කරන්න වෙයි. එහෙම නැත්නම් වෙන බද්දක් ගහන්න වෙයි. ක්‍රිස්ටලීනා ජෝර්ජීයේවාට එවපු ලියුමේ තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "මොන ක්‍රමයකින් හෝ අපි මේ ආදායම ගේනවා, ගේනවාමයි. වැරදිලාවත් යම් කිසි තැනකින් ආදායම අඩු වුණොත්, වෙන තැනකින් ඒ ආදායම ගේනවා. වෙන බද්දක් ගහනවා" කියලා. මම නම් විශ්වාස කරන්නේ නැහැ, රුපියල් බිලියන 400ක ප්‍රමාණයක් මේ අවුරුද්දේ ඉතුරු කාලයේ සොයා ගන්න පුළුවන් වෙයි කියලා. එහෙම නම් මම ඔබතුමන්ලාට යෝජනා කරන්නේ, දැන්මම විකල්ප මාර්ග සොයා ගන්න කියලායි.

ඊළඟට කියනවා, "Improving the VAT compliance" කියලා. මොකක්ද ඒකෙන් කියන්නේ? VAT compliance එකෙන් කියන්නේ මේ SVAT එක අයින් කරනවා කියලා. කලින් තිබුණා, Suspended VAT කියලා. අපනයනකරුවන් භාණ්ඩ විකුණන කොට VAT එකක් ගහන්නේ නැති නිසා, ඒගොල්ලන්ට VAT එක cost එකක් වන නිසා ඒගොල්ලන්ට Suspended VAT කියලා එකක් තිබුණා. නමුත් රාජපක්ෂ ආණ්ඩු කාලයේ මොකක්ද කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි? ඒ කාලයේ එක එක හෙංචයියෝ ඇවිල්ලා කිව්වා, අපටත් SVAT එක දෙන්න කියලා. අපනයනකරුවන් වෙනුවට local producersලාගෙන් තෝරා ගත් සමහර කණ්ඩායම්වලට SVAT එක දුන්නා. එතකොට VAT එක ගෙවන්න ඕනෑ නැහැ. ඒකට කොළ කැල්ලක් දෙනවා. ඒක IRD එකට යවනවා. ඒකට ඒගොල්ලන් කිව්වා, Simplified VAT කියලා. ඒක SVAT එකම තමයි; Suspended VAT නොවෙයි, Simplified VAT. මේක දෙකක්. ආණ්ඩුව Budget එක මුලින්ම IMF එකට ඉදිරිපත් කරලා pass කර ගන්න ඕනෑ. මේකේ තිබෙනවා, "අපි මේක approve කරනවා. ඒක නිසා ඔයගොල්ලන් පාර්ලිමේන්තුවේ මේක approve කර ගන්න" කියලා. IMF එකෙන් approve වුණු Budget එක මේ තිබෙන්නේ. ඒකේ කියනවා, "නැහැ, නැහැ. මේ deemed exportersලාට මේක දෙන්න බැහැ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ කියන්නේ කවුරු හරි ෂර්ට් එකක් හදලා පිට රටට අපනයනය කරනවා නම් ඒකට yarn හදලා දෙන පුද්ගලයා indirect exporter කෙනෙක්. Exporterට විතරක් නොවෙයි, indirect exporterටත් දෙන්න ඕනෑ. ඒකට අපි කියනවා, backward integration කියලා. අපේ සමගි ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සහ "The Blueprint" එකේ අපි සඳහන් කරලා තිබෙනවා, කොහොමද මේ ප්‍රශ්නයට ඇත්ත

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

විසඳුමක් ගෙනෙන්නේ කියලා. IMF විසඳුමට එහා ගිය විසඳුමක් ලබා දෙන්න ඕනෑ. IMF එක කියපු පළියට SVAT එක අයින් කරන්න එපා.

IMF programme එක ඇතුළේ ඉන්න වෙන රටවල SVAT කියන නම වෙනුවට වෙන නමක් තිබෙනවා. අපි කියලා තිබෙන්නේ, පළමුවැනි Suspended VAT එකට යන්න, Suspended VAT ගත්තාම exporters and deemed exportersලාට තමයි මේ VAT එකේ සහනය ලැබෙන්නේ කියලා.

අනෙක් කාරණය මෙයයි. මහ ලොකුවට කියනවා, අපි බදු එකතු කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කරලා තිබෙනවා කියලා. ඔබතුමන්ලාම අත්සන් කරලා ලිපියක් යවලා තිබෙනවා, "Dear Ms. Georgieva, අපට ඒ වැඩේ කරගන්න බැරි වෙනවා. අපි බලාපොරොත්තු වුණා, කාර්යක්ෂමතාව වැඩි කරලා, හොරකම අඩු කරලා දළ දේශීය නිෂ්පාදනයෙන් දශම තුනක් හොයා ගන්න පුළුවන් වෙයි කියලා. නමුත් දශම තුන වෙනුවට අපි බලාපොරොත්තු වෙන්නේ දශම එකයි" කියලා. තුනෙන් දෙකක් අඩු වෙලා. හොඳට නැඟිටලා තැන් තැන්වල කියන්න පුළුවන්, ලස්සනට. හැබැයි, කොළේ ලියලා අත්සන් කර ගන්න බැහැ. ඔන්න ඔක තමයි ඇත්ත කථාව.

ඊළඟට කියනවා, Withholding Tax එකට අය කරන interest එක සියයට 5 ඉඳලා සියයට 10 දක්වා වැඩි කරනවා කියලා. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව කියනවා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සහ වර්ෂයකට රුපියල් මිලියන 1.8ක ආදායමක් නොලබන පුද්ගලයන්ට බැංකුවට ලියුමක් දෙන්න පුළුවන් කියලා, Withholding Tax එක කපා ගන්න එපා කියලා. එහෙම කරන්න පුළුවන් නම් ඒකට වැඩ පිළිවෙළක් ඕනෑ; නීතියක් ඕනෑ; රෙගුලාසියක් ඕනෑ. කියපු පළියට බැංකුවලට එහෙම කරන්න බැහැ. නීතිය සම්පාදනය වෙන්නේ මේ පාර්ලිමේන්තුවෙන්. පාර්ලිමේන්තුවේ නීතිය සම්මත වෙන්නේ නැතුව කාටවත් ලියුමක් ලියලා කියන්න බැහැ, මේ ගොල්ලන්ගෙන් බදු අය කරන්න එපා කියලා. එහෙම කරන්න බැහැ.

නමුත් ඒකට ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවා අපි තවම දැකලා නැහැ. මාසයක් තිස්සේ කථා කළා වියදම් කරන එක ගැන. අද ඔබතුමන්ලා මේවාට පිළිතුරු දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. පිළිතුරු දීලා කියයි, කොහොමද අපි මේ ආදායම ලබා ගන්න බලාපොරොත්තු වෙන්නේ කියලා. මූලාසනාරූ ගරු මන්ත්‍රීතුමියනි, ඔය විධියට තමයි ඔවුන් ආදායම ලබා ගන්න බලාපොරොත්තු වෙන්නේ.

තව කාරණා දෙකක් තිබෙනවා. ඒ කාරණා දෙක තමයි, ඔබතුමන්ලා අත්සන් කරලා, "Bravo!" කියපු IMF Country Reports 25/056හි 75වැනි පිටුවේ සහ 76වන පිටුවේ තිබෙන්නේ. මම ඒ කාරණා දෙකත් සඳහන් කරන්නම්. එම වාර්තාවේ 75වන පිටුවේ මෙහෙම තිබෙනවා:

> "We have made some progress in building an adequate database on properties and related transactions"

එහි තිබෙනවා, ගෙවල් 5,000ක් ගිහිල්ලා බැලුවා ලු. වටිනාකම කුමක්ද? ඒගොල්ලන්ගේ rent එක කොච්චර ගන්න පුළුවන්ද? Register එකක් දැනට හදලා ඉවරයි ලු. ඒක ලු, මේක ක්‍රියාත්මක කිරීමේ පළමුවැනි step එක. ඊට පසුව කියනවා, ඒ අය මේ අවුරුද්දේ property tax එකක්, එහෙමත් නැත්නම් වත්කම් සම්බන්ධ බද්දක් ඉදිරිපත් කරන්න යනවා කියලා. මට හරියටම ඒ තැන හොයා ගන්න බැහැ; මාසය හොයා ගන්න බැහැ. Database එකක් ඉදිරිපත් කරලා ඒ වැඩේ කරන්න යන කථාව තමයි කියන්නේ.

ඊළඟට තව කථාවක් තිබෙනවා. I quote:

> ".... we will restore cost reflective energy pricing by allowing the existing automatic adjustment mechanism to function ...."

එහි 76වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

> "We will maintain the electricity tariff at its cost-recovery level (overall across different types of final consumers) with quarterly formula-based adjustments on a forward-looking basis (effective from January 1, April 1, July 1, and October 1)."

> "...we will use tariff surcharges in the periods between revisions to restore cost recovery in case CEB is making losses...."

> "We will monitor CEB's financial performance on a continuous basis and stand ready to increase the tariff as soon as losses emerge."

මොකක්ද මේ කියන්නේ? "අපි ඕනෑම වෙලාවක විදුලි බිල වැඩි **කරන බව** IMF එකට කියලා තිබෙනවා; අපි ඒක කරනවා" කියලා.

ජනවාරි 01වෙනි දා, අප්‍රේල් 01වෙනි දා, ජූලි 01වෙනි දා සහ ඔක්තෝබර් 01වෙනි දා කරන සංශෝධනවලට අමතරව අපට යම්කිසි විධියකට සංශෝධනයක් කරන්න අවශ්‍ය නම්, වහාම ඒ සංශෝධනය කරන්න ඔබතුමන්ලා IMF එකෙන් අවසර ඉල්ලා තිබෙනවා. අපි කරන්නම් කියලා සඳහන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ සම්බන්ධයෙන් කිසිම දෙයක් මාසයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ කථා කළේ නැහැ; මෙන්න මේ විධියට බදු ගහනවා, අර විධියට බදු ගහනවා කියලා අපි කථා කළේ නැහැ. හැබැයි මේක ඇතුළේ යමක් තිබෙනවා. අපි ඒකට වැරැද්දක් කියන්නේ නැහැ. ඒ තමයි වැටුප් වැඩි කිරීම. ඒ වැටුප් වැඩි කිරීම නිසා රුපියල් බිලියන 51ක විතර ප්‍රමාණයක් අඩු වෙනවා කියලා තිබෙනවා. ඒ අඩුවීම මකා ගන්නත් එක්ක තමයි බදු වැඩි කරලා තිබෙන්නේ. ඔබතුමන්ලා විතරක් නොවෙයි. සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වුණත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වුණත් ඒ සියලුදෙනාම කියලා තිබුණා, මේ වැටුප් වැඩි කිරීම කරනවා කියලා. ඒක කළාට අපට කිසිම අවුලක් නැහැ. නමුත් ඒ සම්බන්ධයෙන් කාරණා කිහිපයක් මම කියන්න අවශ්‍යයි.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය දැන් රජයේ ප්‍රතිපත්තිය හැටියට කැබිනට් එකෙන් approve කරලා තිබෙනවා. එතකොට ඒක තමයි ප්‍රතිපත්තිය. ඒකේ තිබෙනවා, "පුද්ගලයන් සඳහා වන වාර්ෂික බදු නිදහස් සීමාව ලක්ෂ 12 සිට ලක්ෂ 24 දක්වා වැඩි කිරීම, බදු කාණ්ඩ සහ බදු අනුපාත - brackets සහ tax rates - සාධාරණ ලෙස සංශෝධනය කිරීම" කියලා. මේ එකක්වත් කළේ නැහැ. ඕක 100,000 සිට 200,000 දක්වා ගෙනිච්චොත් මොකද වෙන්නේ කියලා අපි දිගින් දිගටම ඇහුවා. ඒගොල්ලන්ගේ දෙවනි කාරණාව, බදු මූල ධර්මවලට අනුකූලව බදු පදනම - tax base - පුළුල් කරනවා කියන එක. ඕක බදු පදනම පුළුල් කරනවා නොවෙයි, බදු පදනම තවදුරටත් පටු කරනවා කියලා අපි කිව්වා. ඇත්තටම ඒක තමයි වුණේ. අවසානයේදී බදු නිදහස් සීමාව 100,000 සිට 200,000 දක්වා ගෙනිච්චේ නැහැ. ඒක අමූලික බොරුවක් කියලා දැන් මිනිස්සු දන්නවා. එය 100,000 සිට

150,000ට ගියා. මම හිතන විධියට මුදල් අමාත්‍යාංශය එදා අපේ කමිටුවේ සාකච්ඡා කළ ආකාරයට ඒ හරහා ලක්ෂ 2ක විතර ප්‍රමාණයක් බදු දැලෙන් ඉවත් වෙනවා. දැනට බදු ගෙවන පුද්ගලයෝ ඉන්නේ අතිශයින් සුළු ප්‍රමාණයක්. මට හිතා ගන්නත් අමාරුයි. 350,000ක් පමණ ප්‍රමාණයක් තමයි ඉන්නේ PAYE Tax ගෙවන අය, තව voluntarily ගෙවන කට්ටිය ඉන්නවා 150,000ක් විතර. තව නොයෙකුත් බදු ගෙවන කණ්ඩායම් ඉන්නවා. මේ ඔක්කෝම එකතු කළාම බදු ගෙවන මුළු ප්‍රමාණය සිටින්නේ 800,000ක් විතර. ඒකෙන් 200,000ක් විතර අඩු වෙලා, බදු පදනම පුළුල් වෙනවා වෙනුවට පටු වෙනවා.

හැබැයි එකක් කියන්න ඕනෑ. ඒ තමයි IRD එක දැන් technology පාවිච්චි කරනවා. බදු ගෙවන හැමෝටම emails එනවා. මටත් email එකක් ආවා. ඒක ආවේ මාර්තු 18වෙනි දා. මේකේ තිබෙන්නේ, "Dear Taxpayer," කියලා ආමන්ත්‍රණය කරලා, name එක දාලා, "Paying-In-Slip for Payment Period Code.." කියලා මාතෘකාව දාලා, "This can be used to make payments due on 15th July...." "Yours Sincerely, Commissioner General, Inland Revenue Department" කියලා ලියා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up now.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Okay, Madam. Please give me two more minutes and I will stop.

මේක හොඳයි. එතකොට බදු ගෙවන සියලුදෙනාට මතක් කරනවා, ඔබට මේ දිනයට බදු ගෙවන්න තිබෙනවා කියලා. තාක්ෂණය පාවිච්චි කරලා SMS එකක් ගහලා, email එකක් එවලා මතක් කරනවා, මෙන්න මේ වෙලාවට බදු ගෙවන්න කියලා. හැබැයි, ඔබතුමන්ලා කථා නොකරන දෙයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු 5ක් ලැබෙනවා කියලා දැනුම් දීලා තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
බොහොම ස්තුතියි.

මම මේ කාරණය කියලා කථාව අවසන් කරන්නම්. ස්වේච්ඡාවෙන් බදු ගෙවන කට්ටිය ඉන්නවා, ඊළඟට PAYE හරහා බදු ගෙවන කට්ටිය ඉන්නවා. අපට තිබෙන අවුල තමයි, දැන් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළා නේ. දුමින්ද හුලන්ගමුව ලු, මහින්ද සිරිවර්ධන වෙනුවට මුදල් අමාත්‍යාංශයේ ලේකම් විධියට එන්නේ. අපි දන්නේ නැහැ, අපි සමාජ මාධ්‍යයේ දැක්කා. මම දකින විධියට මෙච්චර කල් මෙතැන ලොකු conflict of interest එකක් තිබුණා. එයා තමයි E&Y එකේ sitting Country Managing Partner. එතුමා තමයි Ceylon Chamber of Commerceහි සභාපති.

එතකොට ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක හැටියට එතුමා නම් මේ Budget එක පිටුපස සම්පූර්ණයෙන්ම ඉන්නේ, Budget එකෙන් වෙන්න තිබෙන දේවල් ඔවුන් සම්පූර්ණයෙන්ම දන්නවා. විශේෂයෙන්ම ඔවුන් ඒවා කලින් දැනගන්නවා. ඒක සාධාරණ නැහැ. එතැන තිබෙනවා, conflict of interest එකක්. දැන් කියනවා නම්, "නැහැ, මම මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙන්න ඒකෙන් ඉල්ලා අස්වෙනවා" කියලා ඒකත් අපි බලන්න ඕනෑ. මොකද, ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක වශයෙන් ඉන්න ගමන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙන්න බැහැනේ. So, I see a major conflict of interest and I have told it to his face; මම එතුමාටම ඒක කිව්වා. මම කිව්වා, මේ වැඩ පිළිවෙළ මම නම් පිළිගන්නේ නැහැ කියලා. ස්වේච්ඡාවෙන් වැඩ කරන එක ඇත්ත. ඒක වෙනම දෙයක්. හැබැයි, රජයේ සියලු දත්ත ඒ ආයතනවලට යනවා. එතකොට කොහොමද E&Y එක මේ විධියට වැඩ කරගෙන යන්නේ?

ඒ කෙසේ වෙතත් ඔහු කිව්වා, පළාත් සභාවල, රජයේ ආයතනවල සිටින පහළොස් ලක්ෂයක් පමණ වන සේවක සංඛ්‍යාව 750,000ට අඩු කරන්න ඕනෑය කියලා. වැටුප් වැඩි කරන වාර්තාවේ මොකක්ද කියන්නේ? වැටුප් වැඩි කරන වාර්තාවෙන් කියන්නේ මෙන්න මෙකයි; "ඔව්, අපි වැටුප් වැඩි කරමු. පුද්ගලයන්ට වැටුප් වැඩි කරන්න ඕනෑ" කියලා. එදා මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා නේ, 2019දී 4දෙනෙකුගෙන් යුතු පවුලකට කොළඹ මාසයක් ජීවත් වෙන්න වැය වුණේ රුපියල් 79,000යි, හැබැයි අද වෙනකොට රුපියල් 176,000ක් වැය වෙනවා කියලා. ඉතින් වැටුප් වැඩි වෙන්න ඕනෑ. වැටුප් වැඩි වෙනකොට අය මෙන්ම වැය ගැනත් බලන්න ඕනෑ. බදු ගහලා ජනතාවගෙන් යම් මුදල් ප්‍රමාණයක් රජය අය කර ගන්නවා. එතකොට ඔවුන්ගේ වැය කිරීම් සීමාසහිත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ස්තුතියි. එහෙම නම්, ඔබතුමන්ලාගේ ඇත්ත කථාව කෝ? ඔබතුමන්ලා රජයේ සේවකයින් සංඛ්‍යාව අඩු කරන ප්‍රමාණය කොපමණද කියලාත් කියන්න. හුලන්ගමුව මහත්මයා කිව්වා, එම පිරිස 750,000ට අඩු කරනවා කියලා. එතුමා නම් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙන්නේ, "ඒ ගැන හරියටම මම දන්නේ නැහැ" කියලා ලු, කිව්වේ. ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක හැටියට එතුමා ඒක කිව්වා. ඔබතුමන්ලාත් කියන්න, රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කීයකටද අඩු කරන්නේ කියලා. එහෙම නැත්නම්, රාජ්‍ය සේවය පවත්වාගෙන යන්නේ කොහොමද කියන එකත් කියන්න.

අනික් කාරණය මෙයයි. රාජ්‍ය සේවක වැටුප් ගෙවන්න අපි රුපියල් බිලියන 1,200ක් විතර වියදම් කරනවා. ඒ වාගේම pension එක ගෙවන්න රුපියල් බිලියන 450ක විතර ප්‍රමාණයක් වියදම් කරනවා. නමුත්, pension එක සඳහා අපි ශත 5ක්වත් - W&OP කපන එක වෙනම දෙයක් - දායක කර ගන්නේ නැහැ. දායක නොවන pension එකක් තිබෙන්නේ. මම දවසක් study කරලා බැලුවා, ලෝකයේ රටවල් අතරින් ඒ පරතරය වැඩිම රට තමයි අපේ රට. ගරු ඇමතිතුමනි, ඔබතුමා Minister of Labour හැටියටත් දන්නවා, Deputy Minister of Finance and Planning හැටියටත් දන්නවා, සමහරුන්ට තමන්ගේ last salary එකෙන් සියයට 85ක්, 90ක්, 95ක් වාගේ ප්‍රමාණයක් pension එක හැටියට ලැබෙන බව. හැබැයි, දායකත්වය බින්දුවයි. සමහර වෙලාවට අපේ රටේ එම පරතරය සියයට 85යි, 90යි, 95යි. ලෝකයේ කිසිම

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

රටක එවැනි පරතරයක් නැහැ. එහෙමනම් අපි ඇත්ත කථා කරමු. බොරු කියන්න ඕනෑ නැහැ. ඇත්ත තමයි, pension එක ගෙවන්න නම් යම් දායකත්වයක් තිබෙන්න ඕනෑය කියන එක. එහෙම නම් ඒ දායකත්වය ලබා ගන්න එක පිළිබඳව ඔබතුමන්ලා වචනයක්වත් කථා කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මම කථා කළේ ආදායම් පැත්ත ගැන විතරයි. ආණ්ඩුවට මගේ ධනාත්මක විවේචනය භාරගන්න බැරි නිසා මගේ අවධානය වෙන තැනකට යොමු කරන්න උත්සාහ කළා. මගේ මිත්‍රයා මාව වෙනත් තැනකට යොමු කළා. මම ඒකට හරි උත්තරයක් දුන්නා. මම ඒ තොරතුරු සභාගත කරන්න කිව්වා. සත්‍ය කුමක්ද කියලා දැනගන්න අවශ්‍යයි. එහෙම කරලා අද මගේ උත්සාහය වුණේ මොකක්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන් වෙලා තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම කථාව ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද මගේ උත්සාහය වුණේ, ඔබතුමන්ලා කොළේ වහලා, ආදායම ලබා ගැනීම සඳහා කරන්න යන වැඩ පිළිවෙළ සමාජයට ඉදිරිපත් කිරීමයි. ඒකට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොමත්ම ස්තුතියි. මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී මම පොඩි පැහැදිලි කිරීමක් කරනවා. දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා විපක්ෂ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සංශෝධනයෙන් ඇහුවා, විශේෂයෙන්ම සේවා අපනයනය සඳහා වන බදු අය කිරීමේදී CIT - Corporate Income Tax - විතරයි තිබෙන්නේ, පුද්ගලයන්ගෙන් බදු අය කරන්නේ කොහොමද කියලා. එතුමාට එතැන වැරදීමක් වෙලා තිබෙනවා.

අපි ඉදිරිපත් කර තිබෙන දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පතේ 3 වන වගන්තියේ (ඈ) යටතේ සඳහන් වනවා, "(6) (1ඇ) වන උපඡේදයේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 2025 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, යම් පුද්ගලයකුගේ - individual කෙනෙකුගේ - පහත දැක්වෙන ලැබීම් සහ ලාභ මත සියයට 15ක උපරිම අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය:-" කියලා. එහි තවදුරටත් සඳහන් වනවා, "(2ඇ) 2025 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක බදු අය කළ හැකි ආදායමෙහි ඇතුළත් වන ..." යනුවෙන්. එතැන තමයි සමාගමකට අදාළ බදු සඳහන් වෙන්නේ. ඒ කියන්නේ එම කාරණා දෙකම මෙම පනත් කෙටුම්පතේ වෙන වෙනම සඳහන් වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක මම පිළිගන්නවා. ඔබතුමන්ලා ඒක මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා. ඒක තමයි මම කිව්වේ, oxymoron කියලා. මොකද, Personal Income Tax එක සියයට 36ක් වෙනකල් යනවා. Personal Income Tax එක සියයට 15න් නවතින්නේ නැහැ. එතකොට එකම පුද්ගලයා එක් පැත්තක corporate හැටියටත්, අනෙක් පැත්තට personal හැටියටත් තමයි මෙතැනදී බලන්නේ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩියක් ලබා දෙන්න.

ඇත්තටම බද්දට යටත් වෙන්නේ තැනැත්තෙක්, a person. "Person" define කරනකොට companies ඉන්නවා, body corporate ඉන්නවා, පුද්ගලයන් ඉන්නවා. එතකොට මේ සාකච්ඡාවලදී, විවාදයේදී ප්‍රශ්න මතු කළේ සාමාන්‍ය පුද්ගලයින් පිට රටින් සේවා අපනයනය කිරීමේදී ලබා ගන්නා බද්දක් සම්බන්ධව. ඒ නිසා තමයි ඒ උත්තරය දුන්නේ, පුද්ගලයන්ට. එහෙම නැත්නම් මේක සමාගම්වලටත් අදාළයි. සමාගම්වලදී සියයට 30ක Corporate Tax එකක් තිබෙන්නේ. නමුත්, සේවා අපනයනයේදී සියයට 15ක්. මේ, කරුණු දෙකක්. ඒ කරුණු දෙක වෙන වෙනම සාකච්ඡා කළ යුතුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.12]

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍යාංශයට අදාළ විවාදයේදී අපි විශේෂ අවධානයක් යොමු කරනවා, මේ Budget එකේ ආදායම සම්බන්ධයෙන්, ඒ වාගේම වියදම සම්බන්ධයෙන් සහ කළමනාකරණය සම්බන්ධයෙන්. මේ කථා බහේදී මේ අය වැය සූදානම් කරලා තිබෙන්නේ මේ රට අනාගතයට ගෙන යන්නේ කොහොමද කියන ගමන පිළිබඳව රට දැනුවත් කරන්නට සහ ඒකට රටේ ජනතාව එකතු කරවන්නට ආයතන ව්‍යුහය සූදානම් කරවීම සඳහායි. එහෙම නැතිව, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියන විධියට මේ රට බංකොලොත් කරන ගමනට දායක කරගන්නට නොවෙයි. ඔබතුමන්ලාගේ ඔය අදහස් ක්‍රියාත්මක කරපු ආකාරය නිසා තමයි මේ රට බංකොලොත් වුණේ.

මීට මොහොතකට කලින් හර්ෂ මන්ත්‍රීතුමා සභාගත කළා, footnote පිළිබඳ විස්තර වගයක්. ඔය කියන වැඩ පිළිවෙළටම අදාළව එදා COPE එකේත්, අදාළ අනෙක් කමිටුවලත් සාකච්ඡා යන වෙලාවේ, අදාළ perpetratorsලාට, චූදිතයන්ට දුරකථනයෙන් සම්බන්ධ වෙමින් තොරතුරු හුවමාරු වෙච්ච බවට අපි විස්තර අහලා තිබෙනවා. ඒ වාගේම මෙන්ඩිස් සමාගම සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කෙරීගෙන යන පරීක්ෂණ කටයුතු අනුව හෙළිදරව් වෙලා තිබෙනවා, මෙන්ඩිස් සමාගමේ ගිණුමෙන් ඔබතුමා සභාගත කරපු ඔය කියන වාර්තාවට අනුකූල ඒ වැඩේ සම්බන්ධයෙන් සුජීව සේනසිංහට, හර්ෂණ රාජකරුණාට, දයාසිරි ජයසේකරට සහ තව සේනානායක කියලා පුද්ගලයෙකුටත් මුදල් ගෙවා තිබෙන බව. මීට අමතර පිරිසකුත් මෙතැන ඉන්නවා. අපි ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, අන්න ඒ පිළිබඳ වාර්තාත් සභාගත කරන්න කියලා. මේ

selective distortion එක කරන්න එපා, මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලාට වාසි සහගත වන විධියට කථා කරලා ඒ තොරතුරු සභාගත කරන්නයි, ඔබතුමන්ලා එකතු වෙලා කණ්ඩායමක් විධියට, -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒකෙදි මගේ විතරක් නොවෙයි, අනුර කුමාර දිසානායක මැතිතුමාගේ telephone එකත්, මගේ telephone එකත් ඇතුළුව ඒ කාරක සභාවේ සියලුදෙනාගේ telephones පරීක්ෂා කළා. අනුර කුමාර දිසානායක මැතිතුමාගේ telephone එකට calls බින්දුවයි, WhatsApp බින්දුවයි, texts බින්දුවයි. හර්ෂ ද සිල්වා කියන මගේ telephone එකටත් calls බින්දුවයි, WhatsApp බින්දුවයි, texts බින්දුවයි. ඒ නිසා ඔබතුමන්ලා අපට චෝදනා කරනකොට හරියට තොරතුරු දැනගෙන චෝදනා කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට calls ආවේ නැති වුණාට හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා නියෝජනය කළේ ඒ පක්ෂය, ඒ කණ්ඩායම. ඒ නිසා Perpetual Treasuries එක අයිති ඇලෝසියස්ගේ තාත්තායි, ඇලෝසියසුයි, ඒ W.M. Mendis and Company එකට අදාළව private බැංකුවක තිබුණු account එකකින් විතරක් cheques 168කින් රුපියල් මිලියන 1,098ක් දුන්නා, මන්ත්‍රීතුමා. මම හිතන විධියට ඔබතුමා ඒ විස්තර දන්නවා. ඔබතුමාට calls ආවේ නැති වුණාට ඔබතුමා විස්තරය හොඳටම දන්නවා කියලා තමයි මම මේ කියන්නේ. ඒ ටිකත් පාර්ලිමේන්තුවට කියන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරණය පැහැදිලියි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කථාව කරගෙන යන්න.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කාලයෙන් විනාඩි 10ක් උදේ වරුවටත්, ඉතිරි කාල සීමාව දවස අවසානයේදීත් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කළා.

ගරු මන්ත්‍රීතුමනි, නැවත වතාවක් මම ඔබතුමාට මතක් කරලා දෙනවා, ඕක සද්භාවයෙන් කරපු ප්‍රකාශයක් නම් මේ කියන කාරණා පිළිබඳ විස්තරත් සභාගත කරන්න මැදිහත් වෙන්න කියලා.

Hon. Presiding Member, as I mentioned, the Budget is prepared to manage the revenue, the expenditure, investments and to ensure transparency and accountability in its implementation. In this Budget, we are focusing on Rs. 4,200 plus billion of primary expenditure with a Recurrent Expenditure of Rs. 2,970 billion, a Capital Expenditure of Rs. 1,315 billion and Rs. 4,550 billion for public debt servicing, which comprises of interest payments of Rs. 2,950 billion and debt repayments of Rs. 1,600 billion. This leads to a total expenditure of Rs. 8,835 billion for the Government, as estimated for the year 2025.

Madam, in order to facilitate this expenditure and investments, the revenue generation is expected to be to the tune of Rs. 5 trillion or Rs. 5,042 billion, to be précise, and out of the remaining amount of Rs. 3,800 billion, Rs. 3,100 billion is expected to be financed through domestic financing and Rs. 700 billion through external financing, which is a total of Rs. 4,000 billion. මේක තමයි මේ සමස්ත අය වැයේ breakdown එක; අපේ ආදායම, වියදම, ආයෝජනය සහ ඒකට අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගන්නේ කොහොමද කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැය විවාදයේ අවසාන දින දෙක තුළ තමයි අපි මේ ඉන්නේ. මෙහිදී වැදගත් වැඩ පිළිවෙළක් තිබෙනවා, මේ අය වැය ඉදිරිපත් කළා වාගේම අය වැය ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන්, about the implementation of the Budget. Under the Ministry of Finance, Planning and Economic Development, predominantly, there are 23 departments engaged in implementation and facilitation activities of the Budget along with the other relevant ministries and departments. Just to mention a few of those departments, the Department of National Planning, the Department of Fiscal Policy, the Department of External Resources, the Department of National Budget, the Department of Public Enterprises, the Department of Management Services, the Department of Development Finance, the Department of Trade and Investment Policies et cetera and the list goes on.

At today's Committee Stage Discussion, we expect our team to cover the respective angles, the observations and the implementation of the Budget, as to how we are going to achieve the targets in this Budget during the year. I will take time to speak on Public Debt Management because, as I mentioned earlier, a significant component of our Budget comes through borrowings, to be precise, nearly Rs. 4,000 billion, of which Rs. 3,100

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

billion would be through domestic financing and the remainder would be from external sources. To ensure that we do it in a transparent manner, a Public Debt Management Office has been established for regulation and the Office has been resourced. It is important to note that a Public Debt Coordinating Committee and a Debt and Cash Management Committee have also been established to facilitate this service. Similarly, domestic borrowing operations and issuance of loan guarantees are already in motion. The external borrowing operations currently conducted by the Central Bank of Sri Lanka are to be taken over by the Public Debt Management Office. Similarly, several other arrangements are being made to ensure that public debt management is done in a transparent manner.

පසුගිය කාලයේ වාගේ commercial ratesවලට ණය අරගෙන රට බංකොලොත් කළ වැඩ පිළිවෙළ වෙනුවට රටට ගැළපෙන ක්‍රමවේදයක් අනුව ණය ගන්න වැඩ පිළිවෙළක් අප සූදානම් කර තිබෙනවා. ඒ වාගේම අද හවස විශේෂයෙන් විවාදයක් සූදානම් කර තිබෙනවා, Inland Revenue Bill එක සම්බන්ධයෙන්. එහිදී අපි ආර්ථිකයට බලපාන Withholding Tax එක, Export Services Tax එක, vehicle tax එක සහ SVAT එක යනාදිය පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

හැබැයි, මම මෙය අවස්ථාවක් කර ගන්නවා, SVAT එක සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්නට. SVAT එක හිතුමතයට කරන දෙයක් නොවෙයි. කාලාන්තරයක් තිස්සේ ආපු වැඩ පිළිවෙළ තුළ ව්‍යාපාරිකයන්ට, නිෂ්පාදකයන්ට, අපනයනකරුවන්ට කිසිම අසාධාරණයක් නොවන විධියට, ඒගොල්ලන්ගේ cash flow එකට ගැටලුවක් නොවන විධියට මේකට අවශ්‍ය digital system එක implement කිරීමෙන් පසුව තමයි, SVAT ක්‍රමය අහෝසි කරවලා ඒ වෙනුවට මේ අලුත් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට එකඟතාවකට ඇවිල්ලා තිබෙන්නේ. ඒකට අපි කාල නිර්ණයක් තීරණය කරගෙන තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් එක්ක ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. මේ වනකොට ඒ වැඩ පිළිවෙළ නිසි දිනයට ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සියල්ල සූදානම් වෙමින් පවතිනවා. අපි ඒක closely monitor කරනවා. ගරු මන්ත්‍රීතුමා, Withholding Tax එක පිළිබඳව, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
කරුණාකරලා මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මෙහිදී ඩිජිටල් තාක්ෂණය සම්බන්ධ කරගෙන Withholding Tax එක පිළිබඳව විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට අපි සූදානම් කර තිබෙනවා, පුරවැසියන් අපහසුතාවට පත් නොවන විධියටත්, ඒගොල්ලන්ට අවශ්‍ය ප්‍රතිලාභය ලැබෙන විධියටත්. මම මුලින් කිව්වා වාගේ සවස් වරුවේ මගේ කථාවේදී සහ අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයෙන් පසුව පැවැත්වෙන දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී වැඩිදුරටත් මේ පිළිබඳව කරුණු පැහැදිලි කරන්නටත් මා බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂ නායක, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 29ක කාලයක් තිබෙනවා.

[ප.භා. 11.23]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින ආර්ථික කළමනාකරණය වාගේම ආර්ථිකය හැසිරවීම කියන කාරණය කේන්ද්‍ර කරගෙන සිදු කරන මේ විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන මම සතුටු වනවා. විශේෂයෙන්ම පසුගිය කාලයේ අපි දැක්කා, සාර්ව ආර්ථිකය, ක්ෂුද්‍ර ආර්ථිකය - macroeconomy, microeconomy - පිළිබඳවත් කථා කරනවා. විශේෂයෙන්ම මැතිවරණ සමයේදී කිව්වා, කොයි ආකාරයටද මේ සාර්ව ආර්ථිකය, ක්ෂුද්‍ර ආර්ථිකය හසුරුවන්නේ කියන එක පිළිබඳව. ඒ පිළිබඳව පොරොන්දු මාලා රැසක් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් ලබා දුන්නා. රජය එවකට විපක්ෂයේ සිටිනකොට ජනතාවට ඉදිරිපත් කරපු සමාජ ගිවිසුම - social contract එක - අපි හරියට හොයලා බැලුවොත්, අද මේ සමාජ ගිවිසුම අමු අමුවේ උල්ලංඝනය වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම සාර්ව ආර්ථිකය ගැන කථා කරනකොට ඊට ආර්ථික වර්ධන වේගය, උද්ධමනය, විරැකියාව, වෙළෙඳ ශේෂය, ගෙවුම් ශේෂය, අය වැය හිඟය යනාදී ක්ෂේත්‍ර අයිති වනවා. ක්ෂුද්‍ර ආර්ථිකය - microeconomy එක - ගැන කථා කරනකොට ගෘහ ඒකක, ව්‍යාපාර, කර්මාන්ත සහ තනි පුද්ගලයන් - households, firms, individuals - වශයෙන් සාමාන්‍ය ආර්ථික න්‍යාය තුළ නිර්වචනය වනවා. මේ හැම අංශයකටම ඔබ ආමන්ත්‍රණය කළා. මේ හැම අංශයකටම "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාව තුළ බලාපොරොත්තු රැසක් ලබා දුන්නා; පොරොන්දු රැසක් ඉදිරිපත් කළා.

අද මොකක්ද, ඒ පොරොන්දුවලට ඉෂ්ට සිද්ධ වෙලා තිබෙන්නේ? විශේෂයෙන්ම ඔබතුමන්ලා කිව්වා, අලුත් Debt Sustainability Agreement එකකට යනවාය කියලා. ඒක මම හිතන විධියට රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන කිසිම පුද්ගලයෙකුට, කිසිම ඇමතිවරයෙකුට ප්‍රතික්ෂේප කරන්න බැහැ. මොකද, ඒක ඔබතුමන්ලාගේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. නමුත් අවසානයේ මොකක්ද වුණේ? අවසානයේදී Debt Sustainability Agreement එක, ණය තිරසරභාවය වෙනුවෙන් ඇති කරන අලුත් ගිවිසුම පැත්තකින් තියලා පසුගිය රජය නිර්මාණය කරපු, රටටත්, රටේ ජනතාවටත් අතිශය පීඩනකාරී, අතිශය අසහනකාරී, සාමාන්‍ය ජනතාවගේ කරපිට, නිස මත බර පටවන, ජනතාවට ඉතාම වෛරී, ජනතාවගෙන් පළිගන්නාසුලු IMF එකඟතාවකට, ද්විපාර්ශ්වීය ණය එකඟතාවකට, ඒ වාගේම ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් සමඟ එකඟතාවකට මේ රජය ප්‍රවේශ වුණා. කොටින්ම කියනවා නම්, IMF එක කියන පදයට නටන, IMF එකේ රූකඩයක් බවට පත් වෙච්ච රජයක් අද නිර්මාණය වෙලා තිබෙනවා.

දැන් බලන්න, ආර්ථික වර්ධන වේගය, සියයට 5 ඉලක්කය කරා යන්නට ඕනෑ. මොකද, debt sustainability curve එක අනුව, තිරසර ණය පවත්වා ගෙන යාමේ වැඩසටහන අනුව 2028දී ණය ගෙවීමේ තත්ත්වයට අපේ රට පත් වෙනකොට මේ ආර්ථික වර්ධන වේගය සම්පූර්ණ කරන්නට ඕනෑ. පොලී අනුපාතයත් ඉලක්කයක් සහිතව ක්‍රියාත්මක කරන්නට ඕනෑ. රාජ්‍ය ආදායම් ඉලක්ක සම්පූර්ණ කරන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම අපි ප්‍රාර්ථනා කරනවා, සියයට 5ක නොවෙයි, ඊට වැඩි ආර්ථික වර්ධන වේගයක් කරා යන්නට හැකියාව ලැබේවා කියලා. ඒකයි අපේ ප්‍රාර්ථනාව. හැබැයි, මේ ආර්ථික වර්ධන වේගය හරහා රටේ දළ දේශීය නිෂ්පාදිතය ප්‍රවර්ධනය කරන්නට තිබෙන රජයේ වැඩ පිළිවෙළ මොකක්ද? කොහොමද, රජය කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කරන්නේ? කොහොමද, කර්මාන්ත ක්ෂේත්‍රයෙන් දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය වර්ධනය කරන්නේ? ඒ තුළින් දළ දේශීය නිෂ්පාදිතය ඉහළ තලයකට ගෙන යන්නේ කොහොමද? කොහොමද, කෘෂිකර්මාන්තය දියුණු කරන්නේ? මොකක්ද, ඒකට තිබෙන වැඩ පිළිවෙළ? කොහොමද, කෘෂිකර්මාන්තයෙන් දළ දේශීය නිෂ්පාදිතයට තිබෙන දායකත්වය ඉහළට ගෙන යන්නේ? ඒ තුළින් රටේ දළ දේශීය නිෂ්පාදිතය ප්‍රවර්ධනය කරන්නේ කොහොමද? ඒ සඳහා වැඩ පිළිවෙළක් නැහැ; සැලැස්මක් නැහැ; දර්ශනයක් නැහැ. කොහොමද, සේවා අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට තිබෙන දායකත්වය ඉහළට ගෙන යන්නේ? ඒ තුළින් දළ දේශීය නිෂ්පාදිතය ඉහළට ඔසවා තබන්නේ කොහොමද? මොකක්ද, සේවා අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා තිබෙන විධිමත්, පැහැදිලි වැඩ පිළිවෙළ? කෝ, දර්ශනය? කෝ, මාර්ග සිතියම? කෝ, කාල වකවානු සහිත ඉලක්ක? ඇත්ත වශයෙන්ම ඒ හැම අංශයක් දිහාම බලනකොට අපට පෙනෙන්නේ, IMF එක කියන ආකාරයට, IMF එක කියන ඕනෑම දෙයකට "එහෙයි, ස්වාමීනී" කියලා එකඟ වෙන, මහා විශාල ජන වරමක් ලබපු, එනමුත් ලබපු ජන වරම අමු අමුවේ උල්ලංඝනය කරන රජයක් රට ඉදිරියේ තිබෙන බවයි.

අපනයන ප්‍රවර්ධනය - export promotion - කරන්න තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? අපි හැමෝම පිළිගන්නවා, අපනයන ප්‍රවර්ධනය අත්‍යවශ්‍යම කාරණාවක් කියලා. අපනයන ප්‍රවර්ධනය හරහා රැකීරක්ෂා ප්‍රවර්ධනය වෙනවා; රැකීරක්ෂා අවස්ථා නිර්මාණය වෙනවා; අලුතින් කර්මාන්තශාලා බිහි වෙනවා. ඒ තුළින් විවිධ සැපයුම්දාම සහ ඉල්ලුම්දාම - supply chains and demand chains - නිර්මාණය වෙලා, economic multiplier effect එකක් සිද්ධ වෙනවා. ඒ කියන්නේ, ආර්ථිකය ශක්තිමත් කරන්නට යම්කිසි දායකත්වයක් ලැබෙනකොට ඒ ප්‍රතිලාභය රටට අත්පත් වීම බහුවිධ ආකාරයෙන් වැඩි වෙනවා. ඒකට කියන්නේ economic multiplier කියලායි. කෝ, ඉතින් වැඩ පිළිවෙළක්? මොකක්ද වැඩ පිළිවෙළ? අපනයන ප්‍රවර්ධන වැඩසටහනක් තිබෙනවා ද? එහෙම නැත්නම් ඒ කාරණාවේදීත් අනුගමනය කරන්නේ IMF එක කියන කියන ආකාරයට තමන් රහපාන වැඩ පිළිවෙළ ද?

අපි හැමෝම පිළිගන්නවා, අපේ රටට ඉහළ ආයෝජන ප්‍රතිශතයක් අවශ්‍යයි කියලා. ඒක අත්‍යවශ්‍යම කාරණාවක්. ආයෝජන ප්‍රවර්ධනය කරන්නට සැලසුම්සහගත, විධිමත් වැඩසටහනක් අවශ්‍යයි. රජය සතුව එවන් වැඩසටහනක් තිබෙනවා ද? තිබෙනවා නම් මොකක්ද ඒ වැඩසටහන? වෙනදාටත් වැඩිය ආයෝජන ක්ෂේත්‍රයේ ඉහළ ඉලක්ක කරා යන්නේ කොහොමද? වියට්නාමය, ඉන්දුනීසියාව, මැලේසියාව, සිංගප්පූරුව, ඉන්දියාව - මම මේ රටවල් කිහිපයක් විතරයි කිව්වේ- වැනි රටවල් එක්ක තරග කරලා, ඒ රටවල් අභිභවා ගිහිල්ලා අපි වැඩි ආයෝජනයක් අපේ රටට ගෙන එන්නේ කොහොමද? මොකක්ද තිබෙන වැඩ පිළිවෙළ? මොකක්ද තිබෙන සැලැස්ම? මොකක්ද තිබෙන දර්ශනය? පැහැදිලිවම මේ රජයට එවන් වැඩ පිළිවෙළක් නැහැ. IMF එක කියන කියන ආකාරයට හැසිරෙන, IMF එක විසින් හසුරුවන රජයක් තමයි අද අපේ රටේ තිබෙන්නේ. මම එහෙම කියන්නේ ඇයි? වැඩ කරන ජනතාව වෙනුවෙන්, කම්කරු පන්තිය වෙනුවෙන් ඔබතුමන්ලා තරම්, මේ රජය තරම් හඬක් නඟපු, කෑ ගහපු, පෙනී හිටපු, වීදි සටන් කරපු, මහ මග උද්ඝෝෂණ පවත්වපු කණ්ඩායමක් මේ රටේ ඉතිහාසයේ තවත් බිහිවෙලා තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. හැබැයි, පසුගිය රජය දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී EPF, ETF මුදල් පික්පොකට් ගහනකොට; වැඩ කරන ජනතාවගේ අරමුදල් සූරා කනකොට එදා විපක්ෂයේ හිටපු අද ආණ්ඩුවේ ඉන්න අය කිව්වේ මේක වහාම වෙනස් කරනවා කියලායි. IMF එකත් එක්ක කථා කරලා, ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන් එක්ක සාකච්ඡා කරලා, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය හිමිකරුවන් එක්ක සාකච්ඡා කරලා, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් අපේ රටේ මාතෘ භූමියේ වැඩ කරන ජනතාවට සිදු වුණු අසාධාරණය නිවැරදි කරනවා කියලා එදා ඔබතුමන්ලා කිව්වා. හැබැයි, අදටත් ඒකට උත්තරයක් නැහැ; වැඩ පිළිවෙළක් නැහැ. වැඩ පිළිවෙළකට යන්නට බැහැ. ඒ මොකද, IMF එක කියන කියන පදයට නටන රජයක් නිර්මාණය වෙලා තිබෙන නිසා. අපි අවස්ථා කිහිපයකදීම මතු කළා, විශ්‍රාමිකයන්, එහෙම නැත්නම් වැඩිහිටි ප්‍රජාවට, -මම මේ කථා කරන්නේ සාමාන්‍ය ජනතාව ගැනයි- කාලයක් පුරාවටම ආණ්ඩු ගණුනාවක් ලබා දුන්නු සියයට 15ක ඒ පොලී ආදායම නැවත වරක් ලබා දෙන්න කියලා.

නමුත්, ඒකට මොකක්ද දුන්නු පිළිතුර? බදු ව්‍යුහය පුළුල් කරන්න රඳවා ගැනීමේ බද්ද - Withholding Tax - වැඩි කරනවා කිව්වා. කාලයෙන් කාලයට වෙනස් වන පොලී අනුපාතයත් එක්ක තමන්ට හැසිරෙන්න සිද්ධ වෙනවා කිව්වා. රට බංකොලොත් වුණු කාල වකවානුව තුළ පොලී අනුපාතය ඉහළ තලයකට යන කොට ඒක පවත්වාගෙන යෑම යෝග්‍යයි කියන තර්කයට මම එකඟ වෙනවා. නමුත්, මේ මොහොතේ අප ඉදිරිපත් කරන්නේ මේ රටේ සාමාන්‍ය වැඩිහිටි ප්‍රජාවගේ, මේ රටේ විශ්‍රාමික ප්‍රජාවගේ හඬයි; ඒ අයගේ ඉල්ලීමයි; ඒ අයගේ බලාපොරොත්තුවයි; ඒ අයගේ අදෝනාවයි. නමුත්, අපට පෙනෙන විධියට ඒ අයගේ දුක, කඳුළු, වේදනාව රජයට අද දැනෙන්නේ නැහැ.

උපාධිධාරීන්ට රැකීරක්ෂා ලබා දීමේ වැඩ පිළිවෙළක් ගැනත් කිව්වා. උපාධිධාරීන් 35,000ක් බලාගෙන ඉන්නවා, රජය පොරොන්දු ඉෂ්ට සිද්ධ කරන කල්. මම අහන්න කැමැතියි, උපාධිධාරීන් 35,000කගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් නොලැබෙන්නේ IMF එකේ උපදෙස් මත ද, IMF එක කියන නිසා ද කියලා.

මේ රටේ පාරිභෝගික ප්‍රජාවට විශාල වශයෙන් ඉන්ධන සහනාධාරයක් ලබා දෙනවා කිව්වා. වරායෙන් ඉන්ධන බාන කොට එක මිලක්, පාරිභෝගිකයාට ලබා දීමේදී තව මිලක්, ඒක ඉතාම වැරදි වැඩක් කිව්වා; ඒක හරිම අසාධාරණයි කිව්වා. එහෙම කිව්වේ ආණ්ඩුවේ සිටියදීමයි. එමඟින් දූෂණය ක්‍රියාත්මක වෙනවා කිව්වා; වෙනමම බදු බරක් පැටවෙනවා කිව්වා. නමුත්, මේ රටේ පාරිභෝගික ජනතාව, ධීවර, ගොවි, කම්කරු ඇතුළු සාමාන්‍ය ප්‍රජාව; සිවිල් පුරවැසියන් බලාපොරොත්තු වුණු ඉන්ධන සහනාධාරය තවම ලැබී නැහැ. අපි යෝජනා කරනවා, මේ රටේ ඉහළම පොහොසතුන් හැරුණු කොට, ඉහළම ධනපතියන් හැරුණු කොට, සාමාන්‍ය ප්‍රජාවට ඉන්ධන සහනාධාරය ලබා දෙන සූත්‍රයකට රජය යොමු වෙන්න ඕනෑ කියලා; එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා. ඒවා ඔබතුමන්ලා වේදිකාවලදී මේ රටේ ලක්ෂ 220ක් වන ජනතාවට ලබා දුන් බලාපොරොත්තු. ඒ බලාපොරොත්තු කඩ කරන්න එපා; ඒ බලාපොරොත්තු සුන් කරන්න එපා.

මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 50කට වැඩි දායකත්වයක් ලබා දෙන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කර්මාන්තකරුවන් අත්ත අසරණභාවයට පත් වෙලා ඉන්නේ. තව දින ගණනාවකින් පරාටේ නීතිය අත්හිටුවා තිබුණු කාලය අවසන් වෙනවා. පසුගිය ආණ්ඩුව පරාටේ නීතිය යම් කාලයකට අත්හිටෙව්වා. ඒක හොඳ දෙයක්. මේ ආණ්ඩුවත් පරාටේ නීතිය යම් කාලයකට අත්හිටෙව්වා. ඒක හොඳ දෙයක්. හැබැයි, අඩුපාඩුව මොකක්ද? ගිය ආණ්ඩුවටත් බැරි වුණා, මේ ආණ්ඩුවටත් බැරි වෙලා තිබෙනවා, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ගේ හිඟ ණය, ඒ අසාධුලේඛනගත කිරීම, වැල් පොලිය, ගිනි පොලිය ආදියට සහනයක් ලබා දෙන්න. ඒකට ඔබ අපොහොසත් වෙලා තිබෙනවා. මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 50කට වැඩි දායකත්වයක් ලබා දෙන -සමහරු තර්ක කරනවා, එම දායකත්වය සියයට 60ක්, 70ක් කියලාත්- දසලක්ෂ සංඛ්‍යාත ක්ෂුද්‍ර, කුඩා, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ලබා දුන් බලාපොරොත්තු ඇයි අද කඩ කරන්නේ?

ඒ අයගේ ප්‍රශ්නවලට තිරසර විසඳුම් ලබා දෙනවා කියමින් මැතිවරණ වේදිකාවක් වේදිකාවක් පාසා දුන් පොරොන්දු ඇයි කඩ කරන්නේ කියන ප්‍රශ්නය මම අහන්න කැමැතියි. ඒ වාගේම මතකද, වේදිකාවක් වේදිකාවක් පාසා යමින් මේ රටේ ජනතාවට පැතුම් සහ අපේක්ෂාවන් ලබා දුන් හැටි? සාමාන්‍ය පුද්ගලයන්ට වාහනයක අයිතිය ලබා ගැනීමේ අවස්ථාව ඔබ ලබා දෙනවා කියපු බව මතකද? මේ රටේ පාරිභෝගික ප්‍රජාවට, මේ රටේ පොදු ජන ප්‍රජාවට රුපියල් ලක්ෂ 12ක් වැනි මුදලකට පුංචි වාහනයක් අයිති කර ගැනීමේ අවස්ථාව ඔබ ලබා දෙනවා කියා ප්‍රකාශ කළා මතකද? ඒ දැවැන්ත ප්‍රකාශය, වේදිකාවක් වේදිකාවක් පාසා රැව් පිළිරැව් දුන්නු ඒ ප්‍රකාශය, ඔබට මතකද? එසේ නොමැති නම්, IMF උපදෙස් හමුවේ ඒ පොරොන්දුවත් ඔබට අමතක වෙලාද කියලා මම අහන්න කැමැතියි.

ඔබතුමන්ලා කිව්වා පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරනවා කියලා, වැඩිදියුණු කරනවා කියලා, ඒකට වැඩි අවස්ථා ලබා දෙනවා කියලා. ගල් අඟුරු, ඩීසල් බලාගාර මාෆියාවට යට වෙන්නේ නැහැ කිව්වා. පුනර්ජනනීය බලශක්තියට මුල් තැන ලබා දීලා සූර්ය බලශක්තිය ක්‍රියාත්මක කරන කණ්ඩායම්වලට වැඩි අවස්ථා ලබා දෙනවා කිව්වා. නමුත්, අද වන විට සූර්ය බලශක්ති ක්ෂේත්‍රයේ ඒ පුංචි ව්‍යාපාරිකයන් සමඟ අත්සන් තබපු ගිවිසුම්, ඇති කරගෙන ඇති අවබෝධතාවන් ක්‍රියාත්මක කරන්නට අද ඔබතුමන්ලා කටයුතු කරන්නේ නැහැ. ඒ අය ලබා දෙන සුනිත්‍ය බලශක්තිය, සූර්ය බලශක්තිය මිල දී ගන්නා මුදල - tariff rate එක - පහත හෙළන්නට අද ඔබතුමන්ලා කටයුතු කරනවා. ඒ තුළින් මොකක්ද සිද්ධ වෙන්නේ? ඒ තුළින් පුනර්ජනනීය බලශක්තියට සත්‍ය වශයෙන්ම මරු පහරක් එල්ල වෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ශක්තිමත් කරන්නට ඔබතුමන්ලා වාචිකව පමණක් නොව ක්‍රියාවෙනුත් කටයුතු කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ගරු සභාවේ සාකච්ඡාවට භාජන වුණා Booking.com සඳහා අලුත් බද්දක් පැනවීම පිළිබඳව. මම අහන්න කැමැතියි. ඒ බද්ද ගැන කථා කරන කොට සංචාරක ක්ෂේත්‍රය තුළ ඇති විය හැකි හානිදායක, අගනිගාමී ප්‍රතිඵල පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කර තිබෙනවාද කියලා. Booking.com හරහා මේ රටේ සංචාරක කර්මාන්තයට ලැබෙන ශක්තිය, ඒ හරහා මේ රටට ප්‍රවේශ වන දෙස් විදෙස් සංචාරකයන්ට ලැබුණු විවිධ පහසුකම් අහිමි වී යෑමේ තත්ත්වයක් නිර්මාණය වෙයි කියන එක ගැන මොහොතකටවත් ඔබ හිතලා තිබෙනවාද? අපි විශ්වාස කරනවා ආර්ථික කළමනාකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පැහැදිලි, ප්‍රායෝගික ක්‍රියාකාරී දර්ශනයක් ඔබ සතුව නැහැ කියලා. සත්‍ය වශයෙන්ම එවැන්නක් තිබුණා නම් අඩුම තරමින් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය සත්‍යවාදීව ක්‍රියාවට නංවන්න ඕනෑ. එය සත්‍යවාදීව ක්‍රියාවට නැංවුවා නම් අද රුපියල් 3,000 විදුලි බිල රුපියල් 2,000 වෙලා. රුපියල් 9,000 විදුලි බිල රුපියල් 6,000 වෙලා. එහෙම නම්, සියයට 33කින් විදුලි බිල අඩු වෙලා. නමුත්, ඔය හැම අංශයකම විදුලි බිල අඩු වුණේ සාමාන්‍යයක් හැටියට සියයට 20ක ප්‍රමාණයක්.

එහෙම වුණෙත් PUCSL එක හරහා මේ රටේ සිවිල් ප්‍රජාව එල්ල කරපු බලපෑම නිසා. මේ රටේ ප්‍රගතිශීලී මහජන නියෝජිතයන් කරපු ඒ දැවැන්ත සටන නිසා තමයි විදුලිබල අමාත්‍යවරයාට, මුදල් අමාත්‍යාංශයට සිද්ධ වුණේ, මාස 6ක් යනතුරු විදුලි බිල අඩු කරන්නේ නැතැයි කියන ප්‍රතිපත්තිය ආපසු හරවලා, ජනතා ඉල්ලුමට, ජනතා බලපෑමට එකඟ වෙන්න. විශේෂයෙන්ම මා මේ අවස්ථාවේ කියන්න කැමැතියි, මේ ආර්ථිකය කළමනාකරණය කර ගැනීමේදී පැහැදිලි දර්ශනයක්, පැහැදිලි වැඩ පිළිවෙළක් තුළ ඉලක්ක සහගතව, කාලසටහන් සහිතව මේ ගමන යෑම ඉතාම වැදගත් කියන එක. අමතක කරන්න එපා, 2028 සිට මහා ණය බරක් ගෙවීමේ වගකීම - debt obligation - ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙන බව. විශේෂයෙන්ම මේ IMF ගිවිසුමට, ද්විපාර්ශ්වීය ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ගිවිසුම්වලට උපදෙස් දුන්නු කණ්ඩායම් දැන් ආපසු හැරී තිබෙන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒගොල්ලන් දැන් කථා කරනවා, "එනපොට හරි යන්නේ නැති වෙයි වාගේ. වේලාසනින්ම තව ණය ප්‍රතිව්‍යුහගතකරණයකට - pre-emptive debt restructuring එකකට - යෑම යෝග්‍යයි" කියලා. එය පසුගිය රජයට උපදෙස් දුන්නු ආර්ථික විශේෂඥයන්ගේ කථා බහට ලක් වෙලා තිබෙනවා. මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරලා, විශේෂයෙන්ම මේ රට වැටී තිබෙන ප්‍රපාතයෙන් ගොඩ ගන්නට අවශ්‍ය විධිමත් ප්‍රායෝගික වැඩසටහන්, රජයේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න. IMF එක කියන කියන විධියට නිර්මාණය වෙන වැඩ පිළිවෙළක් නොවෙයි, ඔබේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්න. අපි පිළිගන්නවා, IMF රාමුව තුළ වැඩ කරන්න ඕනෑ කියලා. නමුත්, අපි ඔබෙන් ඉල්ලා සිටිනවා, හැකියාවක් තිබෙනවා නම් IMF එකත් සමඟ, ද්විපාර්ශ්වීය, බහු පාර්ශ්වීය ණය නිම්කරුවන් සමඟ අලුත් සාකච්ඡාවකට ගිහිල්ලා රටේ ජනතාවගේ කර පිට පටවා තිබෙන අසාධාරණ බර ඉවත් කරලා මේ රටේ පොදු ජනතාව ජීවත් කරවන, රටත් සුරකින අලුත් වැඩසටහනක්, අලුත් වැඩ පිළිවෙළක් පටන් ගන්න කියලා. ඒ සඳහා අපේ සහයෝගයත් ඔබට ලැබෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.49]

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

මේ විවාදය අතරතුර අදහස් දැක්වීමට මට සුළු කාලයක් ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා. පෙරේදා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ගැන මම මේ පාර්ලිමේන්තුවේ කරන ලද කථාව පිළිබඳව අද පුවත්පත් ගණනාවක වැරදි පුවත් මවා තිබෙන ආකාරය මම දැක්කා. මම

මේ කරන හැම ප්‍රකාශයක්ම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත් එක්ක වෛරයෙන්වත්, එහි සිටින නිලධාරීන් එක්ක වෛරයෙන්වත් නොවෙයි කරන්නේ. ඒ ආයතනය යහමහට ගන්න පුළුවන් ආකාරයට ගරු අමාත්‍යවරයාට යම්කිසි සහයෝගයක් දක්වන්න තොරතුරු ලබා දීම තමයි මම කරන්නේ. එදා මම කිව්වා, පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් යම්කිසි ගෙවීමක් කරනවා කියලා. ඊයේ ප්‍රකාශයක් කර තිබුණා, එතුමන්ලා එහෙම ගෙවීමක් කරන්නේ නැහැ, කරලා නැහැ, එවැනි ආකාරයේ තීන්දු තීරණ අරගෙන නැහැ කියලා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කරපු වංචා, දූෂණ සම්බන්ධව මම මේ පාර්ලිමේන්තුවේ ඇති තරම් කථා කළා. ඊට අදාළ ලේඛන පවා සභාගත කර තිබෙනවා. එතුමන්ලා ඊයේ මාධ්‍යයට හෙළි කර තිබෙනවා, එහෙම ගෙවීමක් කරලා නැහැ, එහෙම තීන්දුවක් අරගෙන නැහැ කියලා. ඒ නිසා, 2021 ජූලි මස 30වැනි දින වත්මන් උපසභාපතිතුමා සභාපතිත්වය දරමින් නවලෝක රෝහලේදී පවත්වපු ඒ විධායක කමිටුවේ Minutes මම අද සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ Minutesවල මේ විධියට සඳහන් වනවා:

"Advisor to the Security Consultant

The Executive Committee decided to appoint Deshabandu Tennakoon, Senior Deputy Inspector-General in Sri Lanka, in charge of the Western Province, to the position of Advisor to the Security Consultant of SLC on the below terms and conditions:

2-year contract (Consultant Category - to be renewable) effect from 16/08/2021

Allowance of Rs. 150,000/- P.M.
Fuel Allowance - 200L P.M.
Mobile Allowance - 5,000/- P.M.
Laptop/Mobile phone
Medical Insurance"

එතුමන්ලාගේ ඒ ExCo එකේ Minutes මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතනවා, මාධ්‍යවලට මේක රුකුලක් වෙයි කියලා. මොකද, බොරු කියලා මේ රටේ ජනතාව රවටමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තවදුරටත් ඉදිරියට යන්න කටයුතු කරනවා නම්, මෙන්න අවශ්‍ය කරුණු කාරණා ටික හෙළි දක්වනවා. අපට මේ මොහොතේ පැහැදිලියි, ඉදිරි දින කිහිපය තුළ, එහෙම නැත්නම් මාර්තු 31වැනි දා පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණයට මේ චෝදනා ලබා තිබෙන කණ්ඩායම ඉදිරිපත් වීම අත්හිටුවීමට වත්මන් ආණ්ඩුව කිසිදු සූදානමක් නැහැ කියලා. ඇමතිවරයාගේ ප්‍රකාශය තුළින් ඒක පැහැදිලියි. එම නිසා අපි මේ රටේ ජනතාවට, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය දක්වන පිරිසට කියනවා, අපට වත්මන් ආණ්ඩුවෙන් සාධාරණයක් බලාපොරොත්තු වෙන්න බැහැ කියලා. ඒ කල්ලිය, ඒ කණ්ඩායම, ඒ දූෂිත වළල්ලට වත්මන් ආණ්ඩුවේ ක්‍රීඩා අමාත්‍යවරයා සෘජුවම සම්බන්ධ වෙලා තිබෙනවා. එම නිසා අපි මේ කාරණය සම්බන්ධයෙන් මේ රටේ අධිකරණය ඉදිරියට යනවා. අධිකරණයෙන් ඒක විසඳාගෙන මේ රටේ ජනතාවට සාධාරණය ඉටු කරලා දෙන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා කියලා රටට කියනවා. දේශබන්දු තෙන්නකෝන් මැතිතුමාට ඒ ලබා දුන් මුදල් ඒ ලබා දුන් සම්පත් ලබා දුන්නේ නැහැ කියනවා නම් ඒක වැරදියි. දුන්නාද නැද්ද කියන එක අපට අදාළ නැහැ. විධායක සභාව සම්මත කරගත්, විධායක සභාව අනුමත කරගත් වාර්තාවේ පිටපතක් තමයි මා සභාගත කළේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි පසුගිය කාල සීමාව තුළ පෙන්වූවා මේ රටේ රංගන ශිල්පිනියන් අරගෙන ගිහිල්ලා T20 World Cupවල ජෝගි දමපු විධිය. ඒ වාගේම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිල මුද්‍රාව, නිල ලිපි ශීර්ෂය භාවිත කරමින් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වෙන්න අවශ්‍ය වීසා ලබා දීලා, අවශ්‍ය වට පිටාව හදලා දීලා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සමහර අය අහිංසක මිනිසුන් පාවිච්චි කරමින් සාක්කුවලට මුදල් දමා ගත්ත ඒවා තිබෙනවා. ඒ වාගේ වංචා, දූෂණ කරලා, තවදුරටත් අපි ඒවා ගැන කථා කරන එක වහන්න උත්සාහ කරනවා නම්, අපි එහෙම ලේසියෙන් වහන්න ඉඩ දෙන්නේ නැහැ. එක එක YouTube channelsවලට විස්තර දීලා අපට ෂොට් එකක් දෙන්න හිතාගෙන ඉන්නවා නම් ඒවා අපි සත පහකට ගණන් ගන්නේ නැහැ. අපට එහෙම චෝදනා කරනවා නම්, අපට චෝදනා කළ හැකි, ඔප්පු කළ හැකි දේවල් තිබෙනවා නම් අපි මේ වාගේ විවෘතව කථා කරන්න එන්නෙත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය. ශ්‍රීලංකා ක්‍රිකට් ආයතනය මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව හදන්න, ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන්, ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් දැන් ප්‍රගතිශීලි යෝජනා ගෙනෙනවා නම් ඒවාට අපේ එකඟතාව තිබෙනවා. හැබැයි, ඒක නොවෙයි කරන්නේ. මේ ටික අද මම එළියේ කථා කළා නම් මොකද්ද කරන්නේ? ගිහිල්ලා නඩුවක් දමනවා. මේ වනකොට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් මුදල් ගෙවලා පෙනී ඉන්න නඩු කිහිපයක් තිබෙනවා. අපි මේ කරන ප්‍රකාශ නිසා ඔවුන්ට අපහාස වුණා කියලා අධිකරණයේ නඩු කිහිපයක් පවරා තිබෙනවා. ඒ නඩු වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මිලියන ගණනක් වියදම් කරනවා. අපි ඒවාට බය නැහැ. අපි අධිකරණයට ගිහිල්ලා අවශ්‍ය කරුණු දැක්වීම කරලා සාධාරණය වෙනුවෙන් අවශ්‍ය මැදිහත්වීම කරනවා. හැබැයි, අපට තිබෙන කනගාටුව මෙයයි. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මම වගකීමෙන් කියනවා, ක්‍රීඩා අමාත්‍යාංශයේ කාරක සභා විවාදය වෙලාවේ මා කරපු කථාවට පිළිතුරු කථා කළේ විපක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙදෙනෙක්. සාමාන්‍යයෙන් විපක්ෂයෙන් යම්කිසි චෝදනාවක් නැගුවාම ඒකට පිළිතුර හෝ පැහැදිලි කිරීම කරන්න ඕනෑ ආණ්ඩු පක්ෂයෙන් නේ. හැබැයි, අපි දැක්කා විපක්ෂයේම මන්ත්‍රීවරු දෙදෙනෙක් එකම කථාව කළා. කොළයක ලියා දුන් එකම කථාව ගරු සභාවේදී කියවනවා. වත්මන් පාර්ලිමේන්තුවේ නොවෙයි, මීට පෙර තිබුණු පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු ගණනාවක් ෂම්මි සිල්වා මහත්මයාගේ ලැයිස්තුවේ ඉඳගෙන පඩි අරගෙන, මේ පාර්ලිමේන්තුවේදී කළ කථා හරහා ඒ අවශ්‍ය හයිය ඒ අයට ලබා දුන්නා. හැබැයි, ඒ මන්ත්‍රීවරු සියලුදෙනා අද ගෙදර. ඒ මන්ත්‍රීවරුන්ට මේ රටේ ජනතාව සාධාරණය ඉටු කළා. මේ රටේ ජනතාව ඒක තේරුම් ගත්තා. මම කියනවා, වත්මන් මන්ත්‍රීවරුන්ටත් සුජීව ගොඩලියැද්ද මහත්මයාගේ account එකෙන් කීයක් හරි ලැබිලා ඇති. ඒ නිසා අඩුම ගණනේ මොළේ පාවිච්චි කරලා ඒ දෙදෙනාම එකම කියවන්නේ නැතුව පොඩ්ඩක් වෙනස් කරලා කියවන්න තිබුණා නේ.

මේ රටේ ඉන්නේ හරක් නොවෙයි නේ. මේක මාධ්‍ය තුළින් ජනතාව දකිනවා. දෙදෙනාම එකම කථාව එක පේළියක්වත් අතහරින්නේ නැතුව කියෙව්වා. ඒ නිසා ක්‍රිකට් ආයතනයේ සල්ලිවලට මේ රටේ ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියන විශ්වාසය තිබෙනවා නම්, කරුණාකරලා ඒක නැති කර ගන්න. මේ රටේ ජනතාව ඊට වැඩිය ප්‍රබලයි. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ තිබුණු බලපරාක්‍රමය බිඳපු, රටේ පාලන බලය වෙනස් කරන්න පුළුවන්, රටට ආදරය කරන මිනිස්සු ටිකක් මේ රටේ සිටිද්දි ෂම්මි සිල්වා ඇතුළු මේ ක්‍රිකට් ආයතනය වෙනස් කරන්න මේ රටේ ජනතාවට කොන්දක් නැහැ කියලා හිතන්න එපා කියන එකත් මම මතක් කරනවා.

අවසාන වශයෙන් මම මෙකත් කියනවා. මම මේ කාරණාව එදා කිව්වේ නැහැ, අද කියනවා. හිටපු ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල්

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

රාජපක්ෂ මහත්මයාත් ගරු සභාවේ ඉන්නවා. එත්මන් ආණ්ඩුවේ ගරු ආගමාත්‍යතුමිය ඇතුළු කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන් අහගෙන ඉන්නවා නම්, මම ඔබලාගෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ ක්‍රීඩාව හදන්න නේද මේ අමාත්‍යාංශය තිබෙන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති අමතර කාලය එක්ක තව මිනිත්තු දෙකක් තිබෙනවා.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මට ඒ කාලය ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

ඒ වාගේම මම චෝදනාවකුත් කරනවා. පසු ගිය කාලයේ ක්‍රීඩා අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යවරයාගේ නිල කාමරයේ ඇඳකුත් දමාගෙන, සුර සැප විඳපු තත්ත්වයක් තමයි තිබුණේ; එවැනි අමාත්‍යවරුන් තමයි සිටියේ. එතුමාගේ නිල කාමරයේ ඇඳක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම දන්නේ නැහැ, ක්‍රීඩා අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ නිල කාමරයට ඇඳක් මොකටද කියලා. එත්මන් ඇමතිතුමා සිටින කාමරයේ ඒ ඇඳ දැන් ඉවත් කරලාද දන්නේ නැහැ. හොඳ සුඛෝපභෝගී ඇඳක් දමාගෙන තිබුණා, එදා. ඇමතිවරයාගේ ඉඳලා නිලධාරී මණ්ඩලය දක්වා මේ දූෂිත වළල්ලෙන් පෝෂණය වෙනවා. එත්මන් ක්‍රීඩා ඇමතිතුමා ගැන මට ගෞරවයක් තිබුණා, මේ දූෂිත වළල්ලෙන් ඈත් වෙලා යමක් කරයි කියලා. නමුත්, එතුමාගේ ප්‍රකාශ හා හැසිරීම දිහා බැලුවාම එතුමා කිසිදු පියවරක් ගන්නේ නැහැ කියන එක පෙනෙනවා. ඒ නිසා ගරු අධිකරණය හරහා අපි මේ රටේ ජනතාවට සාධාරණය ඉටු කර දෙන්න කටයුතු කරනවා. ඒ වාගේම, මේවා බොරු කියලා පත්තරවල දාලා, ක්‍රිකට් ආයතනය බේරෙන්න හදනවා නම්, ඒ සියලු තොරතුරු එක්ක තමයි අපි කථා කරන්නේ කියන එකත් මම කියන්න ඕනෑ. මම සභාගත කරපු ලියවිල්ල මේ රටේ සියලු ජනතාවට දැක ගන්න පුළුවන් වෙයි.

පසු ගිය කාලයේ දේශබන්දු මහත්මයා රජයේ සේවකයකු විධියට ඉඳගෙන මේ ක්‍රිකට් ආයතනයෙන් වැටුප් ගත්තේ කොහොමද? මේකේ අපරාධ චෝදනාවක් තිබෙනවා. අපරාධ නඩුවක් ගොනු කිරීමට අවශ්‍ය සියලු සාක්ෂි තිබෙනවා. ඒ අනුව ඉදිරි පියවර ගන්න පොලිස්පතිතුමා කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.58]

ගරු නිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේ දී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. පසු ගිය කාලපරිච්ඡේද ගණනාවක් පසු කරමින්, මේ රට දැන් තිබෙන ආර්ථික තත්ත්වයට ඇද දමන්නට මේ රටේ වැරැදි ආර්ථික ක්‍රමෝපායන් අනුගමනය කිරීම හේතු වූ බව අපි දන්නවා. ආර්ථික විද්‍යා විෂය ගැන අවබෝධයක් තිබෙන ඕනෑම කෙනෙකුට පැහැදිලි වෙනවා, පසු ගිය කාලයේ නිවැරැදි ආර්ථික වැඩ පිළිවෙළක් නැතුව, ඒ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල තමයි අද භුක්ති විඳින්නට ලැබිලා තිබෙන්නේ කියන එක. කිසිදු ඇගැයීමකින් තොරව, නිවැරැදි අවබෝධයකින් තොරව, පසු ගිය කාලයේ මේ රටට විශාල ණය ප්‍රමාණයක් ගත් බව අපි දන්නවා. ණය අරගෙන, අරගෙන මහා ණය කන්දක් බවට පත් කළා. ඒ ණය අරගෙන අනාගත පරම්පරාවට මහ බරක් පටවලා තිබෙනවා. අපි රජයක් විධියට මේ රට භාර ගැනීමෙන් පසුව අන්න ඒ ප්‍රශ්නය විසඳීම අප හමුවේ තිබෙනවා.

ඒ වාගේම වැරැදි ආර්ථික ප්‍රතිසංස්කරණ භාවිත කරලා, ඒ ප්‍රතිසංස්කරණ හේතුවෙන් මේ රටේ අහිංසක, දුප්පත් ජනතාව අද ඒවාට වන්දි ගෙවන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අන්න ඒ අහිංසක, දුප්පත් ජනතාවගේ අනාගත ජීවිතය මේ ආණ්ඩුවට භාර ගැනීමට අපට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා රටක් විධියට ගත්තාම, සැබෑ ආර්ථික ගමන් මාවතක් මේ රටේ ජනතාවට උදා කර දීලා, සැබෑ ආර්ථික වැඩ පිළිවෙළක්, ආර්ථික මොඩලයක් මේ රටට හඳුන්වා දීලා, මේ රටේ ජනතාව මේ දුක්ඛිතභාවයෙන් මුදා ගන්නට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ, මෙවර අය වැයත් එක්ක අපි ආරම්භ කරලා තිබෙනවා. අපි දන්නවා, දුක්ඛිතභාවයෙන් පෙළෙන රටවල් දර්ශකයේ, රටවල් 195ක් අතරින් ශ්‍රී ලංකාව 11වැනි තැනට දමා තිබෙන බව. ආසියාවෙන් අංක එක බවට පත් කළා, අපේ රට. එහෙමයි, මේ රටේ පාලකයෝ පසු ගිය කාලපරිච්ඡේදය පුරාම මේ රට අරගෙන ආවේ. එහෙම නැතුව, අපිට ඉතා විශිෂ්ට රටක්, ඒ වාගේම විදේශ වත්කම්වලින් පිරුණු රටක්, ඒ වාගේම ආර්ථික අර්බුදවලින් තොර රටක් භාර දුන්නේ නැහැ. අපිට මේ භාර දුන් රට ආර්ථික අර්බුදයේ පතුලටම ඇද වටිටලා, දුක්ඛිතභාවයේ පතුලටම ඇද දමලා තිබුණා. ඒ වාගේම පීඩිත ජනතාව හෙට දවසේ ජීවත් වෙන්නේ කොහොමද, තුන් වේල කන්නේ කොහොමද, දරුවන්ට උගන්වන්නේ කොහොමද, ඉස්පිරිතාලයකට ගිහිල්ලා බෙහෙත් ටිකක් ගන්නේ කොහොමද, ප්‍රවාහන පහසුකම් ටික සපයා ගන්නේ කොහොමද, හරියාකාර මාර්ගයක් නැතුව තමන්ගේ එදිනෙදා ගමන් පහසුකම් ටික සපයා ගන්නේ කොහොමද කියන ප්‍රශ්න එක්ක තමයි අපට මේ රට භාර දීලා තිබෙන්නේ.

මේ පිළිබඳව හොඳ අවබෝධයකින් යුතුව සැබෑ ආර්ථික ගමන් මාර්ගයක් තුළට මේ රට අරගෙන යන්න අවශ්‍ය ඒ ආර්ථික වැඩ පිළිවෙළ තමයි අපි මේ දියත් කරමින් සිටින්නේ. ඒ වෙනුවෙන් තමයි අපේ මංගල අය වැය සකස් කරලා තිබෙන්නේ. මේ රට ඉදිරියට අරගෙන යන්න අවශ්‍ය කරන ඒ ආර්ථික ගමනට, අදාළ track එකට, ඒ ගමන් මාර්ගයට මේ මංගල අය වැයෙන් අපි පිවිසිලා තිබෙනවා.

අපේ රටේ බදු ක්‍රමය ගත්තාම, පහුගිය කාලයේම ගොඩක් වෙලාවට සාධාරණ බවේ මූලධර්මය මත පිහිටලා නොවෙයි බදු පැනෙව්වේ කියලා අපි දන්නවා. හැබැයි, ඒ සාධාරණ බවේ මූලධර්මය මත පදනම් වෙලා තමයි අපි මේ බදු ක්‍රමය හසුරුවන්නේ. ඒ වාගේම තමයි, ප්‍රාග්ධන වියදම් ගත්තාම, පසුගිය කාලයේ ප්‍රාග්ධන වියදම් ඉතාම පහළ මට්ටමක තිබුණා. මොකද, ප්‍රාග්ධන වියදම්වලට හරියාකාරව ඉඩ ප්‍රස්ථාව ලබා දුන්නේ නැහැ. ඒ වාගේම, පසුගිය කාලයේ මේ රටේ සංවර්ධන ක්‍රමෝපායන් තෝරද්දි ඒවා යම් ප්‍රදේශයකට පමණක් සීමා කරලා තිබුණා. නමුත් මේ රට තුලනය වන ආකාරයට, සෑම පළාතක්ම නියෝජනය වන ආකාරයට, ඒ දුප්පත් ග්‍රාමීය ජනතාව මේ රටේ ආර්ථිකයට බද්ධ කරගන්න ආකාරයට තමයි අපි මෙවර අය වැය

නිර්මාණය කරලා තිබෙන්නේ. මේ රටේ දිළිඳු ජන කොටස්, සෑම ක්ෂේත්‍රයක්ම නියෝජනය කරන ජන කොටස් මේ ආර්ථිකයත් එක්ක බද්ධ කරමින් ඒ ආර්ථික වැඩ පිළිවෙළට දායක කර ගැනීම සඳහා අවශ්‍ය කරන ඉඩ ප්‍රස්ථාව මේ අය වැය තුළ අපි හදලා තිබෙනවා. අපි විශාල වශයෙන් මේ ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ දියත් කරනකොට, ඒ ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ ගමට එනකොට, ඒ මුදල් ටික ගමට වියදම් කරනකොට ජනතාවට මුදල් ගලාගෙන යන ක්‍රමවේදයක් මේ අය වැය තුළ නිර්මාණය වෙලා තිබෙන බව ඒ තුළින් පැහැදිලි වෙනවා. ඒ මුදල් ටික ගමට ගිහිල්ලා වියදම් වෙනකොට, ගමේ පාරවල් හැදෙනකොට, ගමේ කර්මාන්තශාලා ටික ගොඩනැඟෙනකොට අන්න ඒ තුළින් ගමේ ජනතාවට රැකියා බිහි වෙනවා, ගමේ ජනතාවට ආදායම් ගලාගෙන එන්න පටන් ගන්නවා. අන්න එතකොට ඔවුන් වියදම් කරන්න පටන් ගන්නවා. වියදම් කිරීම ඇතුළේ තමයි ආර්ථිකයක් ප්‍රසාරණය වෙන්නේ.

පසුගිය කාලයේ ඇති වුණු ආර්ථික අර්බුදය හමුවේ මේ ආර්ථිකය හැකිළුවා කියලා අපි දන්නවා. ආර්ථික අර්බුදයකදී ආර්ථිකය හකුළන්න ඕනෑ. නමුත් දැන් ආර්ථික අර්බුදය සමනය වෙමින් යනකොට ආර්ථිකය ප්‍රසාරණය කරන්න ඕනෑ. ඒ නිසා ආර්ථිකය ප්‍රසාරණය කරන්න අවශ්‍ය කරන ඉඩ ප්‍රස්ථාව මේ අය වැය තුළ ලබා දී තිබෙනවා. ආර්ථිකය ප්‍රසාරණය කිරීමේදී තමයි මේ රටේ ජනතාවට මුදල් ගලාගෙන යන්නේ. එසේ මුදල් ගලාගෙන යනකෙට තමයි ජනතාව ඒ මුදල් වියදම් කරන්නේ. ඒ මුදල් වියදම් කිරීම ඇතුළේ නිෂ්පාදනයට ඉඩ ප්‍රස්ථාව හැදිලා, ආර්ථික වර්ධනය වේගවත් වෙලා, ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ මේ රටේ ජනතාවට සාධාරණ ක්‍රමයක් ඇතුළේ බෙදිලා යන system එකක් අපි හදලා තිබෙනවා. අන්න ඒ system එක ඇතුළේ තමයි මේ රටේ සෑම ජනතාවක්ම වඩා හොඳ ජීවන තත්ත්වයක් අත්පත් කරගන්නේ. ඒ නිසා අපි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විධියට එක පැත්තකින් පොහොසත් රටක් හදන්න අවශ්‍ය කරන ආර්ථික වැඩ පිළිවෙළ හදලා, ඒ පොහොසත් රටේ ජනතාවට සතුටින් ජීවත් වෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ දියත් කරන්න අවශ්‍ය කරන ක්‍රමෝපායන් සම්බන්ධයෙන් කිරලා මැනලා බලලා තමයි තීරණ අරගෙන තිබෙන්නේ.

ණය කියන්නේ අපරාධයක් නොවෙයි කියලා අපි දන්නවා. හැබැයි පසුගිය කාලයේ ණය පිට ණය ගත්තා. මහ ණය කඳු ගොඩ ගැහුවා. ඒක අනාගතයට බරක් බවට පත් කරලා තිබෙනවා. හැබැයි අපි ණයක් ගන්නවා නම්, අනාගත පරම්පරාවටත් බරක් වන විධියට යොදවන්න නොවෙයි අපි ඒ ණය ගන්නේ. මේ රටේ ජනතාව ආර්ථිකයට බද්ධ කරගෙන; දිළිඳු ජන කොටස් -සෑම දුප්පත් ග්‍රාමීය ජනතාවක්ම- ආර්ථිකයට බද්ධ කරගෙන, ආර්ථික වර්ධනය උකහාගන්නා වැඩ පිළිවෙළක් සඳහා තමයි අපි ඒ ණය මුදල් හරි පරිස්සමෙන් යොදවන්නේ. පසුගිය කාලය පුරාවටම අපේ රටට හරියාකාරව ආයෝජන ආවේ නැහැ කියලා අපි දන්නවා. ආපු ආයෝජනත් හරියාකාරව යෙදෙව්වේ නැහැ. කුලුනු ගැහුවා. ඒ වාගේ කිසි වැඩකට නැති වැඩ පිළිවෙළ තමයි ඒවායෙන් ක්‍රියාත්මක කළේ. හැබැයි, පසුගිය දා අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා චීන සංචාරයෙන් පසුව මේ රටට ඉතා වටිනා ඉන්ධන පිරිපහදුවක් සෑදීම සඳහා ඩොලර් බිලියන 3.7ක ආයෝජන කැන්දාගෙන ඇවිල්ලා තිබෙනවා. ඉන්ධන පිරිපහදුව වාගේ දේවල් මේ ආර්ථිකයේ විශාල නිෂ්පාදන. ඒ වාගේම, ග්‍රාමීය කර්මාන්ත ඇතුළේ වසා දමා තිබුණු කඩදාසි කර්මාන්තශාලා, සීනි කර්මාන්තශාලා, එප්පාවල පොස්පේට් නිධිය ප්‍රයෝජනයට ගන්න, ඒ කර්මාන්ත නැවත නිර්මාණය කරන වැඩ පිළිවෙළ වෙනුවෙන් අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපනය, සෞඛ්‍ය සඳහා අවශ්‍ය කරන මුදල් වෙන් කරලා තිබෙනවා. අධ්‍යාපනය, සෞඛ්‍ය කියන ඒවා මේ රටේ ජනතාවට මහා බරක් බවට පත් කරලායි තිබුණේ.

හැබැයි, ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණය මෙවර අය වැයෙන් අපි අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවා. ඒ, රුපියල් බිලියන 619ක්. ඒ වාගේම මෙවර අය වැයෙන් අපි සෞඛ්‍යයට රුපියල් බිලියන 604ක් වෙන් කරලා තිබෙනවා. ඒවා තුළින් තමයි ජනතාවගේ බර නිදහස් වෙන්නේ. පතුලටම හින්දලා වට්ටපු මේ ආර්ථිකයෙන් ජනතාව ගොඩ ගන්න අවශ්‍ය කරන ඒ වැඩ පිළිවෙළ වෙනුවෙන් තමයි අපි මේ ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන්නේ. පසුගිය කාල පුරාම මේ රටේ විවිධ ආණ්ඩු ක්‍රියාත්මක වුණා. ඒ ආණ්ඩුවල හිටියා, දැවැන්ත ආර්ථික ඔස්තාර්ලා යැයි කියා ගන්නා අය. නමුත් ඒ අය ආර්ථික ඔස්තාර්ලා විධියට කරපු දේවල් අපි දන්නවා. 2015 වර්ෂය වෙනකොට ආර්ථික වර්ධනය සියයට 5යි. ඔවුන් ඒ ආණ්ඩුවෙන් යද්දි සියයට 2.2ට මේ ආර්ථිකය හින්දලා තමයි ගියේ. හැබැයි මහා ලොකුවට දැන් කථා කරනවා, ආර්ථිකය හදන්නේ මෙහෙමයි, ආර්ථික වැඩ පිළිවෙළ මෙහෙම වෙන්න ඕනෑ, ඕක වැරදියි කියලා. හැබැයි, ඒ පාලකයන්ට කවදාවත් මේ කියන විධියේ ආර්ථිකයක් හදාගන්න බැරි වුණා. ඔවුන් අද මහ ලොකුවට කථා කළාට එහෙම තමයි එදා වුණේ. ඒ නිසා අපි දැන් ඒ සඳහා සැබෑ වූ වැඩ පිළිවෙළක් ගෙනැල්ලා තිබෙනවා.

ගරු ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරමින් කළ ප්‍රකාශයක් මතක් කරමින් මගේ කථාව අවසාන කරන්නම්. 2025 අය වැය කථාවේ සමාජ්තියේ පිටු අංක 49හි සහ 50හි මෙසේ සඳහන් වනවා:

> "අපේ රටේ ජනතාව නැවත කිසි විටෙකත් එකිනෙකාට එරෙහිව බෙදෙන්නේ නැති බව අපට සහතිකයි. ඒ වාගේම, තමන්ගේ දේශපාලනික හෝ පෞද්ගලික ලාභ සඳහා අපේ රටේ ජනතාව එකිනෙකාට එරෙහිව පොලඹවා ගැනීමට උත්සාහ කරන්නන්ගෙන් මුළා නොවන බවට සහතිකයි."

ඒ නිසා අපි සහතික වශයෙන්ම මේ රට හදනවා. මෙවර අය වැයත් එක්ක රටේ ජනතාවට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වාගේම, අපි මේ රටේ අනාගතය හදන මාර්ගය මේ මංගල අය වැයෙන්ම සකස් කර තිබෙනවා කියන එකත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.08]

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අය වැයට අදාළ කථා බහේ අවසාන දවස් දෙකේ විවාදයේ තමයි අපි මේ නිරත වෙලා සිටින්නේ.

විශේෂයෙන් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ, පසුගිය දින කිහිපය ඇතුළේ අපේ අය වැයට අදාළව විපක්ෂයේ විග්‍රහ කිරීම් අනුව මෙය පැරණි අය වැයක්, එහෙම නැත්නම් විශේෂ වෙනසක් නොමැති අය වැයක් කියන අදහසක් ඔවුන්ගෙන් නිතරම ප්‍රකාශ වුණු බව. මේ පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත්

[ගරු තිළිණ සමරකෝන් මහතා]

කරද්දී, රටට අදාළව අය වැය ඉදිරිපත් කරද්දී, ඇත්තටම පසුගිය අවුරුද්දට අදාළ තොරතුරු, විස්තර මත පදනම් වෙලා තමයි ඊළඟ වර්ෂයට අදාළ අය වැය සකස් කරන්නේ. විශේෂයෙන්ම පසුගිය වර්ෂයේ සංඛ්‍යා දත්ත, තොරතුරු මත පදනම් වෙලා. ඒ වාගේම දෙපාර්තමේන්තු අතර පසුගිය වර්ෂයට අදාළව වියදම් බෙදී යෑම පදනම් කරගෙන තමයි මේ වර්ෂයේ අය වැය සකස් කරන්නේ. ඒ නිසා අපට සම්පූර්ණයෙන්ම කණපිට ගහපු, එහෙම නැත්නම් සම්පූර්ණයෙන්ම වෙනස් කරපු අය වැයක් ඉදිරිපත් කරන්න හැකියාවක් නැහැ. පසුගිය වර්ෂයට අදාළ තොරතුරු පදනම් කරගෙන, ඒ මත base වෙලා තමයි අපේ අය වැය අපි හදන්න ඕනෑ. එතකොට ගිය වර්ෂයේ වැටුප් ගෙවීමට අදාළ පුනරාවර්තන වියදම්, ඒ වාගේම ප්‍රාග්ධන වියදම් මේ වර්ෂයේ අය වැයට පදනම් කරගන්න අවශ්‍යයි. විශේෂයෙන්ම අතරමඟ නතර කරපු ව්‍යාපෘති පදනම් කරගෙන, ඒ දේවල් නැවත start කරන්න, එහෙම නැත්නම් ඒ දේවල් නැවත ආරම්භ කිරීමට අදාළව මෙවර අපි යම් මැදිහත්වීමක් කරන්න ඕනෑ. ඒ අනුව අපට සිද්ධ වෙනවා, පසුගිය කාරණාත් එක්ක අපේ වැඩ කටයුතු ටික සකස් කර ගන්න.

ඒ වාගේම ප්‍රාග්ධන වියදම් සම්බන්ධව කටයුතු කරද්දී, මාර්ග පද්ධතිය වෙන්න පුළුවන්, වාරි පද්ධතිය වෙන්න පුළුවන්, ඒ දේවල් සිද්ධ කරනකොට අනිවාර්යයෙන් පසුගිය වර්ෂයට අදාළව නතර කරපු තැන් ගැන අපට සැලකිලිමත් වෙන්නට වෙනවා. ඒ වාගේම අවශ්‍යයි, මේ අය වැය ඇතුළේ පසුගිය වර්ෂයට අදාළ කාරණා මතු කරලා, ඒකට අදාළ මැදිහත්වීම අපේ පැත්තෙන් අපි කරනකොට, එය වඩාත් හොඳම විධියට, ගුණාත්මක විධියට කර ගැනීම. ඒ වාගේම අවශ්‍යයි, ප්‍රමාණාත්මකව වඩාත් හොඳම මැදිහත්වීම කර ගැනීම.

උදාහරණයක් විධියට රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම ගනිමු. වෘත්තීය සමිති ක්ෂේත්‍රයට අදාළව ගත්තොත්, නිශ්චිත ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ කාල සීමාවකින් තොරව, එහෙම නැත්නම් ආණ්ඩුව විසින්ම සලකා බලා මූලික වැටුප සියයට 64කින් ඉහළ දමන්නට අවශ්‍ය මැදිහත්වීම අපි කළා. එතකොට ඒ හරහා රටේ මිනිසුන්ගේ ක්‍රය ශක්තිය වැඩි වෙනවා. ඉල්ලුම වැඩි වෙනවා. ඉල්ලුම වැඩිවීමත් එක්ක නිෂ්පාදනය වැඩි වෙනවා. නිෂ්පාදනය වැඩි වෙනවාත් එක්කම ආයෝජනයට තිබෙන අවස්ථා ප්‍රමාණය වැඩි වෙනවා. මෙන්න මේ විධියට අය වැය ඇතුළේ පසුගිය වර්ෂවල කාරණා පදනම් කරගෙන, පසුගිය වර්ෂවල කාරණා base කරගෙන අපි අපේ ආර්ථිකය ප්‍රසාරණය කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම කළා.

අපේ ආර්ථිකය අපි බලාපොරොත්තු වන විධියට ප්‍රසාරණය කරන්න නම්, නිෂ්පාදනය වැඩි කරනවා කියන කාරණය ඇතුළේ, එහෙම නැත්නම් නිෂ්පාදනය ඉදිරියට ගන්නවා කියන කාරණය ඇතුළේ අපි ආයෝජන අවස්ථා වැඩි කරන්න ඕනෑ.

ආර්ථිකය ප්‍රසාරණය කිරීමේදී අපි නිශ්චිතවම සැලකිල්ලට භාජන කළ යුතු කාරණයක් තමයි, අපේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය. එහෙම නැත්නම් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය සහ ඒ ආශ්‍රිතව ගොඩ නැඟුණු කර්මාන්ත පද්ධතිය සැලකිල්ලට අරගෙන තමයි අපි එම වැඩ කටයුතු ටික කරන්නට ඕනෑ. මෙන්න මේ දේවල් කිරීම සඳහා අපි අපේ අය වැය ඇතුළේ යම් කිසි විධියකට සැලකිය යුතු අවධානයක් යොමු කරලා තිබෙනවා. ආයෝජන අවස්ථා පුළුල් කිරීම තුළින් අපි බලාපොරොත්තු වෙනවා, රට ඇතුළේ ආර්ථික ක්‍රියාකාරිත්වය වැඩි කරන ගමන් රට නව දිශාවකට, එහෙම නැත්නම් නිෂ්පාදන ආර්ථිකයකට ගෙනයන්නට අවශ්‍ය මැදිහත්වීම කරන්නට. කෘෂි කාර්මික ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, පශු සම්පත් ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, අගය එකතු කරන සේවා සැපයීම වෙන්න පුළුවන්, මේවා සඳහා අවශ්‍ය මැදිහත්වීම කරන්නට අපි මේ අය වැය තුළින් අවධානය යොමු කරලා තිබෙනවා.

මේ වෙලාවේ මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ අය වැය ඇතුළේ රුපියල් බිලියන 38.6ක මුදලක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම සඳහා අපි යොදවා තිබෙනවා. නව ව්‍යවසායකයන් වෙන්නට පුළුවන්, දැනට ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යවසායකයන් වෙන්න පුළුවන්, සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙන්නට පුළුවන්, ඔවුන්ට ආයෝජන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීමට රුපියල් මිලියන 20,000ක් අපි මේ අය වැය ඇතුළේ වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම බිඳ වැටුණු ව්‍යාපාර යම් කිසි තැනකට ගන්නට අවශ්‍ය මුදල් වෙන් කිරීමකුත් මේ අය වැය ඇතුළේ අපි සිද්ධ කරලා තිබෙනවා. ආණ්ඩුව විධියට, භාණ්ඩාගාරය විධියට, මුදල් අමාත්‍යාංශය විධියට අපි මේ වෙන් කරපු රුපියල් බිලියන 38.6ට අමතරව ඉදිරියේදී රාජ්‍ය අංශය සතු ප්‍රධාන බැංකු පද්ධතිය හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය මුදල් ප්‍රමාණයක් ගලාගෙන එන්න අවශ්‍ය මැදිහත්වීමත් අපි මේ වන විට කරමින් ඉන්නවා. ආණ්ඩුව විධියට අපි රුපියල් බිලියන 20ක් වෙන් කළත්, මේ මුදල රුපියල් බිලියන 50ක් දක්වා වර්ධනය කරගන්නට අවශ්‍ය සැලසුම් අපි සකස් කරලා තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය බැංකු පද්ධතිය පාවිච්චි කරලා -ලංකා බැංකුව වෙන්න පුළුවන්, මහජන බැංකුව වෙන්න පුළුවන්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙන්න පුළුවන්, ඔන්න ඔය බැංකු පද්ධතිය පාවිච්චි කරලා- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ඉදිරියේදී තවදුරටත් සපුරා ගන්නට අපි බලාපොරොත්තු වෙනවා.

අපි මේ දේවල් කරගෙන යන අතරතුර මුදල්, එහෙම නැත්නම් අරමුදල් ඔවුන්ට සපයනවා වාගේම ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය පවත්වාගෙන යෑමට තිබෙන මූලික බාධා ඉවත් කිරීමට, එහෙම නැත්නම් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටත් බලාපොරොත්තු වෙනවා. අය වැය නිරීක්ෂණයේදී හැම තැනකදීම මෙන්න මේ මූලික යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීමක් කර තිබෙන බව පෙනෙනවා.

මේ කාරණා ඉෂ්ට කරගෙන යන අතරතුර අපි දැක්කා, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මූලිකව බලපා තිබෙන ප්‍රශ්න කිහිපයක් පිළිබඳව. ඒ ප්‍රශ්නවලට විසඳුම් තමයි, අපි මේ හරහා ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. To limited access to finance, අපි යම් කිසි විසඳුමක් දීලා තිබෙනවා. Limited business skills and inability to retain human resources, ඒ කියන්නේ මානව සම්පතේ ගැටලුව, low market share and limited access to markets, lack of information and data on MSME Scheme, ඒ වාගේම impact of the pandemic and other developments කියන මෙන්න මේ ගැටලුවලට විසඳුම් ලබා දෙන්න නිසි ප්‍රවේශයක් අපි මේ අවස්ථාවේ අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශය හරහා, උපදේශක කාරක සභාව හරහා පසුගිය කාලයේදීත් අපි සාකච්ඡා කළා, මෙන්න මේ ගැටලු විසඳීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් අපි මොකක්ද කරන්නට ඕනෑ කියලා. දිස්ත්‍රික් මට්ටමින් යම් කිසි සම්බන්ධීකරණ වැඩ පිළිවෙළක් හදලා, ඊට පසුව ඒක ප්‍රාදේශීය මට්ටමට ගෙනැල්ලා කර්මාන්තකරුවන් නිරතුරුව මුහුණ දෙන ප්‍රශ්න සඳහා යම් කිසි මැදිහත් වීමක් කරන්නට අපි උත්සාහ දරනවා.

විශේෂයෙන්ම බස්නාහිර පළාත මූලික කරගෙන පවත්වා ගෙන යන කර්මාන්ත පද්ධතිය වෙන්න පුළුවන්, ව්‍යවසායකයන් වෙන්න පුළුවන්, ඒ කටයුතු වෙනත් පළාත් තුළටත් ගෙනිහිල්ලා ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවත් මේ සඳහා දායක කර ගැනීමට අවශ්‍ය සැලසුම් ටික අපි දැන් හදලා තිබෙනවා. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් අපි සපයාගෙන යද්දී, ඔවුන්ට guarantee එකක්, එහෙම නැත්නම් සුරැකුම් ඉදිරිපත් කිරීමේ ගැටලුවක් පැන නැඟිලා තිබෙනවා.

අපි National Credit Guarantee Institution Limited කියන ආයතනය හදලා ඒ හරහා ඔවුන්ගේ සුරැකුම් සඳහා යම්කිසි ආවරණයක් ලබා දෙන්න ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. සාමාන්‍ය ව්‍යවසායකයන් ගොඩනැඟීමට අවශ්‍ය උපරිම මැදිහත්වීම කරලා තිබෙනවා කියන එක මේ අය වැය අධ්‍යයනය කරද්දී අපට නිශ්චිතවම පැහැදිලි වෙනවා. අය වැය තුළ අපට ගොඩක් ක්ෂේත්‍ර ගැන කථා කරන්නට පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි.

අපි මේ අය වැය තුළින් රටේ නිෂ්පාදනය ඉදිරියට ගෙනෙන ක්‍රමවේදය පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා. අපේ රටේ නිෂ්පාදනය යම්කිසි සැලසුමකින් ඉදිරියට ගෙනැල්ලා, රට නිශ්චිතවම ගොඩනඟන දිශාවට අවශ්‍ය කරන මැදිහත්වීම අපි කරමින් ඉන්නවා. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් හෘදය සාක්ෂියට එකඟව න්‍යායාත්මක ලෙස දන්නවා, දවසින් දවස අපේ රට ඉදිරියට යනවා කියලා. ඒ දෙස බලාගෙන ඉන්න ඔවුන්ට යම්කිසි අපහසුවක් ඇති. අපි ඔවුන්ට කියන්නේ අපේ රට ඉදිරියට යන ආකාරය පිළිබඳව බලාගෙන ඉඳලා ඔබටත් හැකි නම් යම්කිසි දායකත්වයක් ලබා දීලා, ඒ තුළින් මේ රට යහපත් තැනකට ගනිමු කියන එකයි. ඒ වෙනුවෙන් කැප වුණු, වෘත්තීමය අවබෝධයක්, දැනුමක් සහිත මන්ත්‍රී මණ්ඩලයක්, ඇමති මණ්ඩලයක් වාගේම රාජ්‍ය නිලධාරීන් පිරිසක් ඉන්නවා. අපි නිශ්චිතව අපේ රටේ නිෂ්පාදනය වැඩි කරලා, මේ රට යහපත් ආර්ථිකයක් සහිත රටක් බවට පත් කරන්න අවශ්‍ය කරන මැදිහත්වීම් කරන බවට පොරොන්දු වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.17]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අද මුදල් අමාත්‍යාංශයට අදාළ ආයතන 23ක් සම්බන්ධව අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙනවා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා විතරයි මේ අවස්ථාවේදී විපක්ෂය පැත්තේ ඉන්නවා මම දැක්කේ. ඔව්, එතුමා මේ සභාවේ ඉන්නවා. කොහොම වුණත් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාවත් මේ සභාවේ ඉන්න එක හොඳයි. විපක්ෂයේ එහෙම කෙනෙක්වත් නැත්නම් අපි මේ විවාදය පවත්වන එකේ තේරුමක් නැහැ. මන්ත්‍රීවරුන් මේ සභාවට ඇවිල්ලා හිතෙන හිතෙන මොනවා හරි දෙයක් කියලා යනවා වෙනුවට මුදල් අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් වෙලාවේ එයට සක්‍රියව සම්බන්ධ වෙන්න ඕනෑ. මොකද, විපක්ෂයට තමයි වැඩි කාර්යභාරයක්, වැඩි වෙලාවක් වෙන් කරලා දීලා තිබෙන්නේ. හැබැයි, හර්ෂ මන්ත්‍රීතුමා හැලුණොත් විපක්ෂයක් නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. මේ යන විධියට මම හිතන්නේ හර්ෂ මන්ත්‍රීතුමා ඉදිරියේදී විපක්ෂ නායක වෙයිද දන්නේත් නැහැ. එහෙම වුණොත් හොඳයි. මොකද, හර්ෂ මන්ත්‍රීතුමාවත් පාර්ලිමේන්තුවේ ඉතුරු වෙයි නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, මේ අමාත්‍යාංශයට අදාළව විවිධ සාකච්ඡා, සංවාද ඉතිහාසය පුරාවට මතු වුණා. අද කථා කරන්න තිබෙන ආයතන අතර වෙළෙඳ අමාත්‍යාංශය හැටියට මගේ අමාත්‍යාංශයටත් සම්බන්ධ වෙන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වාගේ ආයතනත්, Department of Trade and Investment Policies වාගේ ආයතනත් අපිත් එක්ක සෘජුව සම්බන්ධයක් තිබෙනවා. එම නිසාම ඒ ආයතන ගැනත් මේ විවාදයේදී අදහස් දක්වන්න මම සූදානම්. ඒ වාගේම මුදල් අමාත්‍යාංශයට අදාළ ක්‍රියාවලිය තුළ ඉතිහාසයේ විසඳුණේ නැති ප්‍රශ්න තිබෙනවා. මට මතක විධියට, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා උදේ COPE එකේ footnote කල්ලියේ කොටසක් සභාගත කළා. හැබැයි, පරීක්ෂණ යනකොට අපි දැක්කා, තවත් හෙළිදරව් නොවුණු කාරණා ගැන පරීක්ෂණ කරන්න තිබෙනවා කියලා. අපේ ආණ්ඩුවට තමයි මේ පරීක්ෂණ කරන්න සිදු වෙලා තිබෙන්නේ.

2015 වර්ෂයේදී තමයි මහ බැංකු බැඳුම්කර වංචාව සිදු වුණේ. අපි දැන් ඉන්නේ 2025 වර්ෂයේ. 2024 වර්ෂයේ අවසානයේ මේ ආණ්ඩුව භාර ගන්නකොට අපි කිව්වා, දේශපාලනඥයන්ට, හිතවතුන්ට සල්ලි බෙදපු account එකට අදාළ විස්තරත් මේ සභාවේ සභාගත කරන්න කියලා. උදේ හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ ගැන කිව්වා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට ඒක සභාගත කරන්න බැරි වුණත් ඉදිරියේදී ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වනවා. නම් කිහිපයක් හෙළිදරව් වුණා. ඇලෝසියස්ගේ තාත්තයි, ඇලෝසියසුයි එකට අත්සන් කරලා සෙලාන් බැංකු ගිණුමකින් තමයි මේ සල්ලි බෙදලා තිබෙන්නේ. එහෙම බෙදපු වෙක් පත් 156ක් තිබෙනවා. ඒක සුප්‍රසිද්ධ කථාවක්. සෘජුව සල්ලි හම්බ වෙච්ච දේශපාලනඥයන්ගේ නම් කිහිපයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, ඊට අමතරව සල්ලි දීලා තිබෙන්නේ අරුම පුදුම විධියකට. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, සල්ලි දීලා තිබෙන්නේ වයින් ස්ටෝර්ස්වලට. ඒ කියන්නේ වයින් ස්ටෝර්ස් තමයි දේශපාලනඥයන්ට ගනුදෙනු බේරලා තිබෙන්නේ. වයින් ස්ටෝර්ස් මෙන්ඩිස් සමාගමෙන් අරක්කු ගත්තා නම්, මෙන්ඩිස් සමාගමට නේ සල්ලි ගෙවන්න ඕනෑ. දැන් මෙන්ඩිස් සමාගමෙන් වයින් ස්ටෝර්ස්වලට සල්ලි ගෙවලා. මොකක්ද මේ ඩීල් එකේ අනෙක් පැත්ත? ඒගොල්ලන් තමයි ඒ ගනුදෙනුව දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ට බේරලා ගිහිල්ලා තිබෙන්නේ. ඒ ගනුදෙනුවත් එක්ක ඉතුරු අය හෙළිදරව් වෙනකොට මම හිතන්නේ වයින් ස්ටෝර්ස් හිමිකරුවන්ට දැන් සාක්ෂි දෙන්න වෙයි, මෙන්ඩිස් සමාගමෙන් චෙක් එක හම්බ වුණ් ඇයි, ඒ චෙක් එක දුන්නේ කාටද කියලා. ගරු හර්ෂ මන්ත්‍රීතුමනි, ඒක අපි ඉදිරියේදී හෙළිදරව් කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි, මට පොඩි වෙලාවක් ලබා දෙන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මගේ වෙලාවෙන් පොඩි වෙලාවක් එතුමාට දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි ඒකට සියයට සියයක් එකඟයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
බොහොම ස්තුතියි. ඔබතුමා එකඟයි කියලා අපි දන්නවා නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මොකද, එහෙම නැත්නම් carpet-bomb දානකොට අහිංසක මිනිස්සුන්ටත් වදිනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අහිංසක මිනිස්සුන්ට වදින්න විධියක් නැහැ, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක තමයි මම කියන්නේ. ඒ නිසා ඔය ලැයිස්තුව එළියට දාන්න, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අනිවාර්යයෙන් ඒක කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔය ලැයිස්තුව එළියට දාන්න. සියයට දාහක් මම ඒකට එකඟයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විධියට ඔබතුමාට බොහොම ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකාවක්. අනාගතයේ දවසක ඔබ සියලුදෙනාට මේ ගැනත් කථා කරන්න පුළුවන් වෙයි. ඒ ලැයිස්තු අපි එළියට නොදා ඉන්නේ නැහැ. අපි ආණ්ඩුව භාර අරගෙන තවම මාස 5යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවුරුදු 10ක් පරණ ඒවා විතරක් නොවෙයි, අවුරුදු 15ක් පරණ පරීක්ෂණත් සිද්ධ වෙනවා. සමහරු දැන් දන්නවා, ඒ පරීක්ෂණ ගැන. ඒ පිළිබඳව මම කියන්න ඕනෑ. මොකද, මේ කාරණය මම කිව්වේ නිකම් නොවෙයි. සමහරු ඉතිහාසය අමතක කරලා යන්න හදනවා. හැබැයි, ඉතිහාසය අමතක කරන්න බැහැ. මොකද, මේ රටේ ඉතිහාසයේ ගනුදෙනු ටික බේරන්නම ඕනෑ. මේ රටේ ජනතාවට කළ හානිය සහ ජනතාවගේ මුදල් කොල්ල කාපු ඒවාට අදාළ පරීක්ෂණ කරලා, ඊට අදාළ චූදිතයන්ට දඬුවම් ලැබෙන්නම ඕනෑ. ඒ අදාළ පරීක්ෂණ අපේ නීතිය පසිඳලන ආයතන විසින් සිදු කරමින් සිටිනවා. අපි ඉස්සරහට ඒ කටයුතු කරනවා.

ආණ්ඩුවක් හැටියට මේ වෙනකොට අපි සිදු කරන කාර්යය අතරතුර ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පැත්තෙන් විශාල වැඩ කොටසක් කරනවා. විශේෂයෙන් digitalization process එක සම්බන්ධයෙන්. ආනයනකරුවන්ට, අපනයනකරුවන්ට තමන්ගේ ක්‍රියාවලිය පහසු කරන්න අවශ්‍ය කරන තාක්ෂණික පහසුකම්, licences ලබා දීම online ක්‍රමයට දෙන ක්‍රියාවලියකුත් තිබෙනවා. සමහර ඒවා අපි එහෙම දෙන්නේ නැහැ. සමහර ක්‍රියාවලි වේගවත් කරන්න අවශ්‍ය කරන පහසුකම් හදන්න අපි කටයුතු කරමින් සිටිනවා. ඒ digitalization process එකත් එක්ක අපි යන්නේ digital economy එකකට. මේක අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න තිබෙන එක පැත්තක් කියලා අපි කිව්වා. ඒ පැත්තෙන් ආනයනකරුවන්ට, අපනයනකරුවන්ට අවශ්‍ය කරන සහතික ලබා දීම ඇතුළු ක්‍රියාවලිය සිදු කරනවා වාගේම අපේ රටේ කෘෂිකාර්මික නිෂ්පාදන ආරක්ෂා කරන්න, ඒවා පාලනය කරන්නත් අවශ්‍ය මැදිහත්වීම අපි කරනවා. ඒ වාගේම License Control System. Agricultural productsවලට අදාළ License Control System එක තවදුරටත් විධිමත් කරලා, ඒ digitalization process එක හරහා ඒවා check කෙරෙන විධියක් තිබෙන්න ඕනෑ. මොකද, ඒ ක්‍රියාවලිය ඇතුළේ තමයි අපට ආහාර සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල safety එකක් ඇති කරගන්න පුළුවන් වෙන්නේ. අපේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව ඒ පැත්තෙන් වැදගත් රාජකාරියක් කරනවා. ඔවුන් රටට අත්‍යවශ්‍ය රාජකාරියක් කරන්නේ. ඒ රාජකාරිය ශක්තිමත්ව ඉදිරියට කරගෙන යන්න අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබා දීම සිදු කරනවා වාගේම කළ යුතු වෙනස්කම් කරලා, අපේ රට digital economy එකත් එක්ක ඉස්සරහට යද්දී කලාපීය ලෙස ශක්තිමත් ආර්ථිකයක් ගොඩනඟා ගන්න අවශ්‍ය කටයුතු ටිකත් අපි කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම trade and investment polices පැත්තෙන් අපේ ආණ්ඩුව මේ වෙනකොට හදුනාගෙන තිබෙනවා, National Tariff Policy එක හදන කටයුත්ත; ජාතික බදු ප්‍රතිපත්තීන් හදන කාර්යය. ඒ තීරු බදු ප්‍රතිපත්ති හදන වැඩේට අදාළව දැන් අපි කටයුතු ආරම්භ කරලා තිබෙනවා. අපි වාගේ රටකට මේක අත්‍යවශ්‍ය වෙන්නේ ඇයි? අපි පසුගිය කාල පුරාවට දැක්කා, සමහර අය යාළුවන්ට බදු සහන දීලා තිබෙනවා. සමහර ආයෝජනවලට බදු සහන දීලා තිබෙනවා. නමුත්, සමහර ආයෝජනවලට බදු සහන දීලා නැහැ. මෙහෙම සාකච්ඡා තිබෙනවා. එහෙම වුණාම රටට ආයෝජකයෝ එන්නේ නැහැ. මොකද, බදු ප්‍රතිපත්ති ස්ථාවර වුණාම තමයි ආයෝජකයෝ රටකට එන්න පටන් ගන්නේ. ඒ නිසා මේ පිළිබඳව ආණ්ඩුවක් හැටියට අපි අරගෙන තිබෙන ක්‍රියාමාර්ග ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගැන කථා කරන්න ඕනෑ කියලා මම හිතුවා.

විශේෂයෙන් අපි බදු ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. National Tariff Policy එකක් අපට ඕනෑ වෙන්නේ ඇයි? විශේෂයෙන් අපි ලෝකයේ රටවල් එක්ක ගනුදෙනු කරද්දී, අපේ ආර්ථිකයේ ස්ථාවරත්වය හදද්දී, රැකියාවල සුරක්ෂිතතාව හදද්දී, ආයෝජන කැඳවා ගනිද්දී, අපේ දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගනිද්දී, මේ සියලු කාරණා ගැන අපට හිතන්න වෙනවා. ඒ සියලු කාරණා ගැන හිතමින් තමයි අපි වැඩ කරන්නේ. එහෙම වැඩ කරද්දී අපි

ලෝකයේ තිබෙන බදු ප්‍රතිපත්ති ගැනත් සලකා බලනවා. දැනට ලෝකයේ තිබෙන හොඳම, නිදහස්ම වෙළෙඳ පොළ බදු ප්‍රතිපත්තිය අනුගමනය කරන්නේ සිංගප්පූරුව. මොකද, ඒක පොඩි දූපතක්. ඒ නිසා ලංකාවේ අපට ඒක අනුගමනය කරන්න බැහැ. අපට ආරක්ෂා කළ යුතු කෘෂිකාර්මික නිෂ්පාදන සහ දේශීය කර්මාන්ත විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා අපි බලන්න ඕනෑ, ඒ බදු ප්‍රතිපත්තිවලින් ගන්න පුළුවන් මොනවාද කියායි.

ඒ වාගේම ස්විට්සර්ලන්තය වාගේ රටවල් අනුගමනය කරන්නේ අඩු බදු ප්‍රතිපත්ති. ඒගොල්ලන් අනුගමනය කරන්නේ low tariff policies. ඒවායින් අපට ගන්න පුළුවන් මොනවාද කියලා අපි බලන්න ඕනෑ. එන්න දෙන්නේ නැහැ, හැම දේටම. බදු අඩුයි තමයි. හැබැයි, හැම දේටම රට ඇතුළට එන්න බැහැ. ඒගොල්ලන් control එක ගාණට හදලා තිබෙන්නේ. ජර්මනිය EU Common External Tariff ප්‍රතිපත්තිය තමයි අනුගමනය කරන්නේ. ඒ වුණත් ජර්මනිය වෙළෙඳ ගිවිසුම්වල සාකච්ඡාවලට - trade negotiationsවලට - අදාළව, ඒ bargainingවලට අදාළව, negotiationsවලට අදාළව විශේෂ පහසුකමක් ලබාගෙන තිබෙනවා. ඒගොල්ලන් අනුගමනය කරන ප්‍රතිපත්ති ඇතුළේ පහසුකම් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, චීනය කියන්නේ ලෝක ආර්ථිකයේ දෙවැනි විශාලතම බලවතා. ඒගොල්ලන් පාවිච්චි කරන්නේ strategic Tariff Adjustment Policy එක.

ඒ හරහා ඒගොල්ලන් දේශීය කර්මාන්ත ආරක්ෂා කරන්න අවශ්‍ය කරන කටයුත්ත කරන ගමන්, high-tech investments රට ඇතුළට එනවා නම්, අන්න ඒවාට සහන දෙනවා; ඒවාට බදු අඩු කරනවා. එහෙම අඩු කරලා චීනය තුළ දේශීය කර්මාන්ත වැඩි කරනවා වාගේම, දේශීය කර්මාන්තවලට ආරක්ෂාව දෙනවා වාගේම, නව තාක්ෂණය ගෙන එන කර්මාන්තවලට ඒ අය රට ඇතුළේ වැඩි පහසුකම් ලබා දෙනවා. ඒ වාගේම මේ ක්‍රියාවලිය යනකොට ලෝකයේ තවත් දියුණු රටවල්, උදාහරණයක් විධියට ඇමෙරිකා එක්සත් ජනපදය වාගේ රටක් පාවිච්චි කරන්නේ tariff flexibility කියන එක. ඒ අය නම්‍යතාවක් සහිත බදු ප්‍රතිපත්තියක් පාවිච්චි කරන්නේ. Economic growth එක සහ political stability කියන දෙකෙන්ම political goals achieve කරන්නේ කොහොමද කියන කාරණයත් එක්ක තමයි ඇමෙරිකාව වාගේ රටවල් බදු ප්‍රතිපත්තිය අනුගමනය කරන්නේ. එතැනදීත් ඒගොල්ලෝ කරන්නේ මොකක්ද? එතැනදීත් දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගනිමින්, while protecting domestic industries තමයි ඇමෙරිකාව මේ කටයුත්තට යන්නේ. එම නිසා trade negotiationsවලදී tool එකක් හැටියට ඒගොල්ලෝ tariff flexibility එක පාවිච්චි කරනවා. ඒ වාගේම මේ පිළිබඳව ලෝකයේ විවේචනත් තිබෙනවා. ඇමෙරිකාව ඇතුළේම විවේචනයක් තිබෙනවා. ඒගොල්ලන් අනුගමනය කරන මේ ක්‍රියාවලිය හරහා excessive tariffවලින් වෙන්න පුළුවන් දෙයක් තිබෙනවා. මොකද, බඩු මිල වැඩි වෙන්න පුළුවන්. ඒ නිසා සමහර විට cost එක consumerට transfer වෙන්න පුළුවන් කියන කාරණා මේක ඇතුළේ සාකච්ඡා වෙනවා.

කැනඩාව පාවිච්චි කරන්නේ balanced protection එකක්. ඒ නිසා මේ free trade ක්‍රියාවලිය අතුළේ ඒගොල්ලෝ මේ balanced protection එක හරහා තමයි තමන්ගේ බදු ප්‍රතිපත්තිය තීරණය කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකාවේ අපි මේක ගැන කල්පනා කරන්නේ, අපි අපේ රටේ ආර්ථික වර්ධනය ඇති කර ගන්න ඕනෑ, ඒ වාගේම රට සංවර්ධනය කර ගන්න ඕනෑ, කර්මාන්ත දියුණු කර ගන්න ඕනෑ, නව ආයෝජන ගෙන්වා ගන්න ඕනෑ, දේශීය කර්මාන්තය ආරක්ෂා කර ගන්න ඕනෑ කියන කාරණා එක්කයි. මේ බදු ප්‍රතිපත්තිය හරහා කර්මාන්ත ඇති වෙනවා වාගේම ඒවා අතර තරගකාරිත්වයක් ඇති වෙන්නත් ඕනෑ. අන්න ඒක ඉලක්ක කරගෙන, දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කර ගැනීම, ඒ වාගේම විදේශීය ආනයන හරහා අපට විය හැකි තර්ජනවලින් අපේ කර්මාන්ත ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අපේ ජාතික බදු ප්‍රතිපත්තිය සකස් කරද්දී අපි මේ ගැන කල්පනා කර තිබෙනවා.

අපි, අපේ රටේ ආර්ථික සංවර්ධනය අත් පත් කර ගන්නවා වාගේම බදු වැඩි කර ගැනීමත් කරන්න ඕනෑ. බදු වැඩි කර ගැනීමේදී අපට තිබෙන විවිධ බදු වර්ග වෙනුවට නව බදු ප්‍රතිපත්තියකට යන්න ඕනෑ. බදු ආදායම තමයි අපේ රටේ වාගේම ලෝකයේ ගොඩක් රටවල ආදායම. එම නිසා බදු ආදායම වැඩි කර ගැනීම ගැනත් අපි හිතලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ජනතාවට සහන සැලසීම වෙනුවෙනුත් අපට බදු අය කර ගැනීම කරන්න වෙනවා. එම නිසා වැඩිපුර ආදායම එකතු කර ගන්න ජනතාවට පීඩනයක් ඇති නොවන බදු ප්‍රතිපත්තියක් ලෙස තමයි මේ ප්‍රතිපත්තිය අපි ක්‍රියාත්මක කරන්න කල්පනා කරන්නේ. ඒ වාගේම වෙළෙඳ ශේෂ හිඟය පියවා ගැනීම වෙනුවෙන් සහ foreign exchangeවල අපට තිබෙන issues පාලනය කර ගැනීම වෙනුවෙන්, සියලු භාණ්ඩ ගෙන එනවා වෙනුවට අවශ්‍ය භාණ්ඩ රට ඇතුළට ගෙන්වා ගැනීම හරහාත්, ආනයන අපනයන සීමා කිරීම් හරහාත් මේ බදු ප්‍රතිපත්තිය manage කර ගන්න අපට පුළුවන් වෙනවා.

පාරිභෝගිකයා ආරක්ෂා කිරීම වාගේම අපි මේ රටේ quality control එක ඇති කර ගන්න ඕනෑ. ඒ වාගේම, dumpingවලට ඉඩ දෙන්න හොඳ නැහැ. අද අපේ රටේ කර්මාන්තකරුවන්ට dumping පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධවෙලා තිබෙනවා. එම නිසා ඒ වෙනුවෙන් අපේ අමාත්‍යාංශය හරහා anti-dumping regulations පනවන්න පසුගිය පාර්ලිමේන්තුවේදී අදාළ නීති සම්පාදනය කර ගත්තා. ඒ හරහා තමයි අපේ රටේ දේශීය කර්මාන්තකරුවන් ආරක්ෂා කර ගන්න පුළුවන් වෙන්නේ. එම නිසා අපි මේ බදු ප්‍රතිපත්තිය ගේන ගමන්, anti-dumpingවලට අදාළ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පැනවීමට අවශ්‍ය කරන Regulations පනවන්න ඇමතිවරයා හැටියට වෙළඳ ඇමතිවරයාට අවශ්‍ය කරන නීති අපි සකස් කරගෙන තිබෙනවා.

ඊළඟට, මේ ක්‍රියාවලිය ඇතුළේ දේශීය ආරක්ෂිත සහ තත්ත්වයෙන් ඉහළ නිෂ්පාදනවලට කර්මාන්තකරුවන් පොළඹවන්න අවශ්‍ය කරන උනන්දුව හදන්න වෙන්නේත් ඒ controlling හරහාම තමයි. ඒ වාගේම මේ බදු ප්‍රතිපත්තිය හරහා රටේ රැකියා සුරක්ෂිතතාව වාගේම කර්මාන්තවල ආරක්ෂාව ගැනත් කල්පනා කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් වැඩ කරන්නත් අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම විදේශීය අත්‍යවශ්‍ය භාණ්ඩ මත යැපීම වෙනුවට අපි අපේ රට ඇතුළේ strategically control වෙන්න ඕනෑ. එම නිසා විදේශීය ආනයනික භාණ්ඩ මත යැපීම වෙනුවට ඉදිරියේදී දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනයට අවශ්‍ය කරන උනන්දුව හදන්නත් මේ බදු ප්‍රතිපත්තිය අපට ඉවහල් වෙනවා.

ඒ වාගේම, රටක් හැටියට විදේශීය ආයෝජන උනන්දු කරවන්න නම් අපේ රටට තිබිය යුතුයි විශ්වසනීය සහ පැහැදිලි බදු ප්‍රතිපත්තියක්. ඒක තමයි මූලික වෙන්නේ. එතකොට තමයි ආයෝජකයන් රට ඇතුළට එන්න පටන් ගන්නේ, ආයෝජනවල ස්ථාවරතාව හැදෙන්නේ. බදු ප්‍රතිපත්තිය අවුරුද්දෙන් අවුරුද්ද, නැත්නම් මාස 6න් 6ට වෙනස් වෙනවා වෙනුවට වසර කිහිපයක් අනුගමනය කරන බදු ප්‍රතිපත්තිය මෙකයි කියලා දැනගත්තාම ආයෝජකයන් විශ්වසනීය ලෙස ආයෝජනය කරන්න පටන් ගන්නවා. ඒ හරහා රටේ ආයෝජන වැඩි වෙන්න පටන් ගන්නවා. මුදල් අමාත්‍යාංශය හරහා සිදු කරමින් තිබෙන මේ ක්‍රියාවලි

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ඇතුළේ අපේ රටේ ආර්ථිකය තවදුරටත් ඉස්සරහට යන්න අවශ්‍ය නීති පද්ධති සංශෝධනය වෙන්න ඕනෑ, සකස් වෙන්න ඕනෑ කියලා අපි හිතනවා. බදු නීතිය හැදෙනවා වාගේම, anti-dumping law එකට regulations පනවන්න අවශ්‍ය කටයුතු කරන්නත්, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව digitalize කරලා ආනයනකරුවන්ට, අපනයනකරුවන්ට බාධාවකින් තොරව තමන්ගේ කටයුතු කරගන්න පුළුවන් වාතාවරණය සැලසීමත්, රට ඇතුළට ගෙනෙන්න ඕනෑ නැති ඒවා පාලනය කරන්නත්, මේ රටේ මෙතෙක් කල් සිද්ධ වෙච්ච ඒ වැරදි practices වෙනුවට නිවැරදි practice එක, නිවැරදි භාවිතාව රටේ ඉස්සරහට ගෙනයන්න අවශ්‍ය කරන මැදිහත්වීම කරන්නත් අප කටයුතු කරනවා. මුදල් ඇමතිවරයා ලෙස අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ඒ කටයුත්තට නායකත්වය දෙනවා. නියෝජ්‍ය මුදල් ඇමතිවරු දෙදෙනෙක් අපට ඉන්නවා. ආචාර්ය අනිල් ජයන්ත සහෝදරයාත්, ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම සහෝදරයාත් මේ කටයුත්තේදී ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරනවා. එයට සහයෝගය ලබාදෙන මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ඒ නිලධාරිනුත්, මේ කටයුත්ත ඉස්සරහට කරගෙන යන්න මැදිහත් වන දෙපාර්තමේන්තු 23හි ප්‍රධානීනුත් ඉතිහාසයේ තිබුණු ඒ සමහර practices වෙනස් කරලා මේ රට නිවැරදි track එකට, නිවැරදි පාරට ගෙන එන්න අවශ්‍ය කරන මැදිහත් වීම් කරන්න කටයුතු කරද්දී, ඒ ගැන විවාද කරන්නට විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ නැති වීම ගැන කනගාටු වෙමින්, මේ සභාවේ රැඳී සිටීම පිළිබඳව හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Presiding Member)

Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටවනු ලැබේ.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පසු, අමර්ෂ පි.ප. 1.00 මණිවරෙ ඉිටෙනිරුත්තප්පට්ටු මීණ්ටුන් තොටංකිර්රු. පිරතිච් චපානායකර් අවර්කළ් [මාණ්ඩුමිකු (වෛත්තියර්) රිස්වි චාලි] තලෛමෛ වකිත්තාර්කළ්.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

ගරු සභාපතිතුමා
(මාණ්ඩුමිකු තවිචාලර් අවර්කළ්)
(The Hon. Chairman)

The Hon. Gnanamuththu Srineshan. You have 24 minutes.

[පි.ප. 1.00]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(මාණ්ඩුමිකු ඥානමුත්තු ශ්‍රීනේසන්)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களைக் கூற விரும்புகின்றேன்.

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி என்பன எமது நாட்டின் முதுகெலும்பாக இருக்கவேண்டிய விடயங்களாகும். நாங்கள் வரலாற்றைச் சற்று பின்நோக்கிப் பார்ப்போம். எமது நாடு சுதந்திரம் அடைந்தபோது, பொருளாதார ஸ்திரநிலையில் ஆசியாவில் நான்காவது இடத்தில் இருந்ததாகக் குறிப்பிடப்படுகின்றது. அதாவது, ஆசியாவில் யப்பான், மலேசியா என்பன முறையே முதலாம், இரண்டாம் இடத்தில் இருந்தபோது, எமது நாடு நான்காவது இடத்தில் இருந்திருக்கிறது. அதன் பின்னர், எமது நாட்டை ஆட்சி செய்த ஆட்சியாளர்களின் செயற்பாடுகளால் எமது நாடு வங்காளதேசத்திடம் கடன் வாங்கக்கூடிய ஒரு நாடு என்ற நிலைக்குத் தள்ளப்பட்டு இருக்கின்றது. அப்படியென்றால், எமது நிதி விடயம், திட்டமிடல் விடயம், அபிவிருத்திச் செயற்பாடுகள் சார்ந்த விடயம் என்பன எந்தளவுக்குப் பின்தள்ளப்பட்டு இருக்கின்றன என்பதை நாங்கள் சிந்திக்க வேண்டும்.

இந்தியக் கவிஞர் ஒருவர் தனது நாட்டின் சுதந்திரம் பற்றி கூறும்போது, "வெள்ளை இருட்டை வெளியேற்றிவிட்டு கறுப்பு இருட்டை கட்டியணைத்த நாள்தான் சுதந்திர நாள்" எனக் கூறியிருக்கிறார். இந்த விடயம் எங்களுக்கும் பொருந்தும். "அந்நியர் செய்த விலங்குகளைக் கழற்றிவிட்டு சொந்த நாட்டவர் செய்த விலங்குகளைப் பூட்டிக்கொண்ட நாள்தான் இலங்கையின் சுதந்திர நாள்" என நாங்கள் சொல்லலாம். வெள்ளைக்கார ஆட்சியாளர்கள் எமது நாட்டை விட்டுச் செல்லும்போது, எமது நாடு பொருளாதாரத்தில் ஆசியாவில் நான்காவது இடத்தில் இருந்திருக்கிறது. எமது நாட்டவர்கள் மாறி மாறி 77 ஆண்டுகள் ஆட்சிசெய்த பின்னர், எமது நாட்டின் பொருளாதாரதம் அதலபாதாளத்துக்குள் வீழ்ந்திருக்கிறது என்பதை நாங்கள் அறிவோம். 1971ஆம் ஆண்டு உருவாக்கப்பட்ட வாங்காளதேசத்திடமிருந்து கடன் பெறக்கூடிய ஒரு நாடாக எமது நாடு மாற்றியமைப்பட்டு இருக்கின்றது என்பதை நான் இங்கு வேதனையுடன் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

சுதந்திரத்துக்குப் பின்னர், 1948 - 2024 வரை இந்த நாட்டை ஐக்கிய தேசியக் கட்சி, ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி, பொதுஜன பெரமுன போன்ற கட்சிகள் ஆட்சி செய்திருக்கின்றன. இந்தக் கட்சிகளின் ஆட்சியின்போது, இந்த நாட்டில் சமூக ஒற்றுமை, பொருளாதார அபிவிருத்தி, இன நல்லிணக்கம் என்பன ஏற்படவில்லை என்பதை நீங்கள் நன்கு அறிவீர்கள். இப்போது புதிதாக தேசிய மக்கள் சக்தியினராகிய நீங்கள் ஆட்சியமைத்து இருக்கின்றீர்கள். நீங்கள் என்ன செய்யப் போகின்றீர்கள் என்பதை எமது மக்கள் மிகவும் விழிப்பாகப் பார்த்துக்கொண்டு இருக்கின்றார்கள். நீங்கள் ஆட்சிக்கு வந்து மூன்று மாதங்களே என்றபடியால், உங்களுடைய அரசாங்கத்தை கடுமையாக விமர்சனம் செய்ய முடியாது. சுமார் 77 ஆண்டுகளாக இடம்பெற்றுவந்த குறைபாடுகளை மூன்று மாதங்களில் சீர்செய்துவிடலாமென நம்புவதற்கு நாங்கள் அந்தளவுக்கு அறிவீனமானவர்கள் அல்லர்.

குண்டுவிழும் தொகை அதிகரிக்க அதிகரிக்க, நாட்டில் துண்டுவிழும் தொகையும் அதிகரித்துக்கொண்டு செல்வதாக யுத்த காலத்தில் சொன்னார்கள். யுத்தம் இல்லாமல் போனால், நிச்சயமாக இந்த நாடு அபிவிருத்தியடையும் என்றும் நாட்டில் பொருளாதார மாற்றத்தை ஏற்படுத்தலாம் என்றும் நாங்கள் வியாக்கியானப்படுத்திக் கூறியிருந்தோம். இன்று யுத்தம் முடிவடைந்து 16 ஆண்டுகள் கடந்திருக்கின்றன. எனினும், நாங்கள் அபிவிருத்தி விடயத்தில் பின்னோக்கியே போகின்றோம். எமது நாட்டில் குண்டு விழாமல் இருந்தாலும், துண்டுவிழும் தொகை அதிகரித்துக்கொண்டு செல்வதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. எனவே, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி விடயத்தில்

நாங்கள் என்ன செய்துகொண்டு இருக்கின்றோம் என்பது பற்றி ஆழமாகச் சிந்திக்கவேண்டி உள்ளது. கடந்த ஆட்சிக் காலத்தில் நிதிக் கொள்கை மற்றும் திட்டமிடல் விடயத்தில் பாரதூரமான தவறுகள் இழைக்கப்பட்டு இருக்கின்றன. அந்தக் காலத்தில் 16 இலட்சம் வரி இறுப்பாளர்கள் காணப்பட்டார்கள். அதை 12 இலட்சத்தால் குறைத்து, 4 இலட்சம் வரி இறுப்பாளர்கள் மாத்திரம்தான் இந்த நாட்டுக்கு வரிசெலுத்த வேண்டுமென்ற நிதிக் கொள்கை கடந்த சனாதிபதி மூலமாகப் பின்பற்றப் பட்டது.

இந்தப் பிழையான அல்லது தவறான செயற்பாடு காரணமாக இந்த நாட்டுக்கு 60,000 கோடி ரூபாய் இழப்பு ஏற்பட்டதாகச் சொல்கின்றார்கள். அதேபோன்று, உர விடயத்தில் கையாளப்பட்ட பிழையான அணுகுமுறையால் விவசாயத்துறையில் 26,000 கோடி ரூபாய் நஷ்டம் ஏற்பட்டதாகவும் சொல்லப்படுகின்றது. இவற்றின்மூலம் தவறான நிதி முகாமைத்துவம், தவறான திட்டமிடல், தவறான அரசியல் செயற்பாடுகள் நடைபெற்றிருக்கின்றன என்பதை நாங்கள் வெளிப்படையாக அறிந்து கொள்ளக்கூடியதாக இருக்கின்றது. இந்த அரசாங்கம் என்ன செய்யப்போகின்றது என்பதுதான் எங்களுடைய கேள்வியாக இருக்கின்றது. உண்மையிலேயே கடந்த காலத்தில் பல்வேறுபட்ட விடயங் களில் குறைபாடுகள் இருந்தன. அந்தக் குறைபாடுகளை நீங்கள் தீர்க்க வேண்டும் என்பதுதான் எங்களுடைய தாழ்மையான வேண்டுகோளாகும்.

சமூக அபிவிருத்திக்கு உணவு, உடை, உறையுள் என்பன மிகவும் முக்கியமான தேவைகளாக இருக்கின்றன. சமூக அபிவிருத்தி என்ற அடிப்படையில், கடந்த காலத்தில் தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையால் வீட்டுத்திட்டங்கள் வழங்கப்பட்டன. இதன் அடிப்படையில், மட்டக்களப்பு மாவட்டத்திலுள்ள 12 பிரதேச செயலாளர் பிரிவுகளில் 147 வீடமைப்புத் திட்டங்கள் அமுல்படுத்தப்பட்டன. அத்திட்டங் களில் 3,325 வீடுகள் அரையும் குறையுமாகக் காணப் படுகின்றன. அதாவது, அத்திவாரம் போடப்பட்ட நிலை, யன்னல் மட்டம் வரை கட்டப்பட்ட நிலை, lintel வரை கட்டப்பட்ட நிலை, கூரைபோடப்படாத நிலை, plaster பண்ணப்படாத நிலை எனப் பல நிலைகளில் அவை காணப்படுகின்றன. வறுமையின் பிடியில் சிக்கியவர் களுக்கென கடந்த 'நல்லாட்சி' அரசாங்க காலத்தில் கட்டப்பட்ட இந்த வீடுகளை அதற்குப் பிறகு வந்த அரசாங்கம், இவை வேறோர் அரசாங்கத்தால் கட்டப்பட்ட வீடுகள் என்றபடியால், பூரணப்படுத்தாமல் அப்படியே விட்டுவிட்டது.

உண்மையிலேயே அந்த மக்கள் ஏழைகள்! இந்த அரசாங்கத்தைச் சேர்ந்த நீங்கள் வர்க்க ரீதியாகச் சிந்திக்கக் கூடியவர்கள். ஏழை மக்கள்மீதும் தொழிலாள வர்க்கம்மீதும் நீங்கள் கரிசனை காட்டுவீர்கள்; இரக்கப்படுவீர்கள் என அந்த மக்கள் நம்புகின்றார்கள். மட்டக்களப்பு மாவட்டத்தில் அரையும் குறையுமாகக் காணப்படுகின்ற 3,325 வீடுகளின் நிர்மாணப் பணிகளை இந்த அரசாங்கம் முடிவுறுத்த வேண்டுமென அந்த மக்கள் எதிர்பார்க்கின்றார்கள். ஏனெனில், அவையும் அரசாங்க நிதிமூலம் கட்டப்பட்ட வீடுகள்! அவை அரையும் குறையுமாகக் காணப்படுமாக இருந்தால், நிச்சயமாக அங்கு அரச நிதி வீணாக விரயமாகும். அதாவது, அங்கு கட்டப்பட்டுள்ள கட்டிடங்கள் அப்படியே அழிந்துபோகுமாக இருந்தால், அங்கு அரச நிதி வீணாக விரயமாகும்.

நான் சொல்லக்கூடிய விடயம் என்னவென்றால், புதிய சிந்தனையோடு ஆட்சிக்கு வந்திருக்கின்ற இந்த அரசாங்கம், மட்டக்களப்பு மாவட்டத்தில் கட்டிமுடிக்கப்படாமல் இருக்கின்ற இந்த 3,325 வீடுகளையும் கட்டிமுடிப்பதற்குரிய நிதியை அளிக்க வேண்டும் என்றுதான். இது அடிப்படைத் தேவைக்குரிய ஒரு விடயமாக இருக்கின்றபடியால், இதை இந்தப் பாராளுமன்றத்தில் அழுத்தம் திருத்தமாகக் கூறுமாறு எமது மக்கள் கூறியிருக்கிறார்கள். நாங்கள் இது பற்றி இங்கு பல தடவை கூறியிருக்கிறோம். இந்த விடயத்துக்கு 85 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருப்பதாக அங்கிருந்து எனக்கு தகவல் கிடைத்திருக்கின்றது. இந்த வீடுகளைக் கட்டி முடிக்கவேண்டிய தார்மீகப் பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். 2018-2019ஆம் ஆண்டு காலப்பகுதியில் இதற்கு 1,235.47 மில்லியன் ரூபாய் தேவையென மதிப்பிடப்பட்டது. Revised evaluationபடி, இப்போது அதற்கு 2,724.79 மில்லியன் ரூபாய் தேவைப்படுகின்றது. எனவே, அரசாங்கமானது இந்த ஏழை மக்களுக்காக இரங்கி, அந்த வீடுகளை முடித்துக்கொடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் மிகவும் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

இன்னும் சில விடயங்களில் பல குறைபாடுகளைக் காணக்கூடியதாக இருக்கின்றது. அவை கடந்த காலக் குறைபாடுகளாக இருந்தாலும்கூட, பொறுப்புள்ள ஓர் அரசாங்கம் என்ற வகையில், தேசிய மக்கள் சக்தி அரசாங்கம் அவற்றைத் தீர்த்துவைக்க வேண்டுமென மக்கள் விரும்புகின்றார்கள். எனவே, அந்த விடயங்களையும் அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டுவரவேண்டிய பொறுப்பு எனக்கு இருக்கின்றது.

கடந்த ஆட்சியில், பாதிக்கப்பட்ட பாராளுமன்ற உறுப்பினர்களுக்கும் அமைச்சர்களுக்கும் தாராளமாக இழப்பீடு கொடுக்கப்பட்டு இருக்கின்ற அதேவேளை, வெள்ளத்தால் பாதிக்கப்பட்ட ஏழை விவசாயிகளுக்கும் நேரடியாக உற்பத்தியில் ஈடுபடுகின்ற விவசாயிகளுக்கும் தேவையான உதவிகள் கொடுக்கப்படவில்லை என்ற குற்றச்சாட்டு இருக்கின்றது. விவசாயிகள் என்பவர்கள் இந்த நாட்டில் மிக முக்கியமான தொழிலைப் புரிகின்ற, இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்குப் பங்காற்றுகின்ற ஒரு பகுதியினர் என்பதை நாங்கள் மறந்துவிடக் கூடாது.

காணாமலாக்கப்பட்டவர்கள் விடயமாக எமது உறவுகள் 4,000 நாட்களைக் கடந்தும் போராடிக்கொண்டு இருக்கின்றார்கள். எனினும், அவர்களது விடயத்தில் நீதி கிடைக்கவில்லை. அதுமாத்திரமன்றி, அதற்குப் பரிகாரமாக அவர்களுக்கான நஷ்டஈடும் வழங்கப்படவில்லை. பாதிக்கப் பட்டவர்கள் என்ற அடிப்படையில், பாராளுமன்ற உறுப்பினர் களுக்கும் அமைச்சர்களுக்கும் தாராளமாக இழப்பீடு கொடுக்கப்பட்டு இருக்கின்றபோது, உறவுகளை இழந்து மிகவும் கஷ்டமான சூழலில் இருக்கின்ற தமக்கு, தார்மீக அடிப்படையிலான நீதியோ, நீதியின் அடிப்படையிலான இழப்பீடோ கிடைக்கவில்லை என காணாமலாக்கப்பட்டவர் களின் உறவினர்கள் கூறுகின்றார்கள்.

கடந்த அரசாங்கத்தில் விஜயதாஸ ராஜபக்ஷ அவர்கள் அமைச்சராக இருந்தபோது, காணாமலாக்கப்பட்ட உறவுகளின் போராட்டத்தைக் கொச்சைப்படுத்தக்கூடிய விதத்தில், இழப்பீடு என்ற பெயரில் இழப்பைச் சந்தித்த உறவுகளுக்குத் தலா இரண்டு இலட்சம் ரூபாயைக் கொடுத்து, அந்த விடயத்தைச் சமாளித்து விடுவதற்கு முயற்சித்தார். எனினும், அந்த மக்கள் அவரது ஏமாற்றுவித்தைக்குள் அகப்படாமல் தப்பித்துக் கொண்டார்கள் என்பதை நான் இந்த இடத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அவர்களுடைய

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

போராட்டம் முடியவில்லை; இன்றும் தொடர்ந்துகொண்டுதான் இருக்கின்றது. பாதிக்கப்பட்ட ஓர் உயிருக்கு இரண்டு இலட்சம் ரூபாய் என்று மதிப்பிடுவது, பாதிக்கப்பட்ட தமிழ் மக்களை மலினப்படுத்துகின்ற அல்லது அவர்களுடைய உறவின் இழப்பை மிகவும் குறைத்து மதிப்பிடுகின்ற ஒரு செயற்பாடாகும் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, திட்டமிடல் என்ற விடயத்துக்கு வருவோம். திட்டமிடப்படாத பல செயல்கள் எங்களுக்கு நட்டத்தை ஏற்படுத்தி இருக்கின்றன. கடந்த காலத்தில் ஒரு பக்கம் உள்நாட்டு உற்பத்தி நடைபெற்றுக்கொண்டு இருக்கையில், மறுபக்கம் வெளிநாடுகளிலிருந்து பொருட்கள் இறக்குமதி செய்யப்பட்டன. இறக்குமதி என்பது Commission பெறுவதற்கான ஒரு மார்க்கம் என்ற அடிப்படையிலும் கடந்த காலத்தில் செயற்பாடுகள் நடைபெற்றன. சீனி இறக்குமதி, வெள்ளைப் பூண்டு இறக்குமதி, வெங்காய இறக்குமதி, தேங்காய் எண்ணெய் இறக்குமதி எனப் பலவிதமான பொருட்களின் இறக்குமதி இடம்பெற்றது. இவ்வாறான இறக்குமதிகள் நடைபெறும்போதெல்லாம் அவற்றின்மூலம் மக்களுக்கு நன்மை கிடைக்கின்றதா என்பதைவிட, எந்தளவுக்கு மற்றவர்கள் இந்தக் commissionமூலம் உழைத்துக் கொண்டு இருக்கின்றார்கள் என்பதைத்தான் நாங்கள் எண்ணிப்பார்க்க வேண்டும்.

திட்டமிடலோடு தொடர்புடைய ஒரு புள்ளிவிபரத்தை நான் பார்க்கக்கூடியதாக இருந்தது. அது உற்பத்தித் திறன் அடிப்படையில் நாடுகளின் நிலைமையைப் பற்றிக் குறிப்பிடுகின்ற ஒரு புள்ளிவிபரமாகும். அது இற்றைப்படுத்தப் படாத ஒரு பழைய புள்ளிவிபரமாகும். அதில் யப்பானின் உற்பத்தித் திறன் 60ஆகக் காணப்படுகின்றது. அதாவது, வெளியீடுகளை உள்ளீடுகளால் வகுத்து, 100ஆல் பெருக்கும்போது வருகின்ற தொகை 60ஆகக் காணப் படுகின்றது. மேலும், அதில் இந்தியாவின் உற்பத்தித் திறன் 14ஆக இருக்கும்போது, எமது நாட்டின் உற்பத்தித் திறன் 1.6ஆகக் காணப்படுகின்றது. இதன்மூலம் நாங்கள் எவ்வளவு தூரம் வினைத்திறனற்ற, விளைதிறனற்ற உற்பத்திகளைச் செய்துகொண்டு இருக்கின்றோம் என்பதை அறியக்கூடியதாக இருக்கின்றது.

அடுத்து, அபிவிருத்தி என்ற விடயத்தில் ஆக்கத்துறையின் பங்களிப்பு பற்றி பார்ப்போம். கல்வி ஓர் ஆக்கத்துறையாக இருக்கின்றது. அதேபோன்று, சுகாதாரமும் ஓர் ஆக்கத்துறையாக இருக்கின்றது. மேலும், விவசாயம், கைத்தொழில் போன்றவையும் ஆக்கத்துறைக்குள் அடங்கு கின்றன. கடந்த காலத்தில் நாங்கள் ஆக்கத்துறைக்கு வழங்கிய முக்கியத்துவம் குறைந்த மட்டத்திலேயே காணப்பட்டது. எமது நாட்டில் அழிவை ஏற்படுத்திய விடயத்துக்கு யுத்தத்தை உதாரணமாகச் சொல்லலாம். யுத்தத்துக்காகப் படையினரைச் சேர்ப்பதற்கும், அவர்களைப் பராமரிப்பதற்கும், ஆயுதங்களைக் கொள்வனவு செய்வதற்கும் ஒதுக்கப்படுகின்ற நிதியென்பது உச்சமாகக் காணப்படுகின்றது. யுத்தம் முடிந்துவிட்டால் பாதுகாப்புத்துறைக்கு ஒதுக்கப்படுகின்ற நிதியின் அளவு குறைந்துவிடும். அந்த நிதியைக்கொண்டு ஆக்கத்துறையில் அபிவிருத்திகளைச் செய்வதற்கான வாய்ப்புகள் அதிகமாக ஏற்படும் என்றெல்லாம் சொன்னார்கள்.

இன்று யுத்தம் முடிந்துவிட்டது. எனினும், சென்ற முறையைவிட இம்முறை துண்டுவிழும் தொகை 160 பில்லியனாக அதிகரித்திருக்கின்றது. இந்தியாவிலுள்ள படையினரின் அளவை எடுத்துக்கொண்டாலும் சரி, பிரித்தானியாவிலுள்ள படையினரின் அளவை எடுத்துக் கொண்டாலும் சரி, அவற்றை அங்கிருக்கின்ற மக்களின் எண்ணிக்கையோடு ஒப்பிட்டுப் பார்க்கும்போது, எமது நாட்டில் காணப்படுகின்ற படையினரின் அளவு அதிகமாகும். இங்கு ஒரு புள்ளிவிபரம் குறிப்பிடப்பட்டது. அதன்படி, முல்லைத்தீவில் இரண்டு பேருக்கு ஒரு படைவீரர் என்ற அடிப்படையில் படையினர் குவிக்கப்பட்டு இருக்கின்றார்கள். யாழ்ப்பாணத்தில் 14 பேருக்கு ஒரு படைவீரர் என்ற அடிப்படையில் படையினர் குவிக்கப்பட்டு இருக்கின்றார்கள். இந்த நாட்டில் யுத்தமற்ற சூழ்நிலையிலும், படையினருக்குக் கூடுதலான நிதி ஒதுக்கப்படுவது எந்த வகையில் நியாயமென நான் இந்த இடத்தில் கேட்கின்றேன். யுத்தம் முடிந்தால் நன்மை கிடைக்குமென மக்கள் எதிர்பார்த்துக்கொண்டு இருந்தார்கள். எனினும், நாட்டில் குண்டுவிழாத நிலையிலும் துண்டுவிழும் தொகை அதிகரித்துக்கொண்டு செல்வதையே நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

இன்று நாங்கள் அபிவிருத்தி விடயத்தில் பல இடங்களில் பின்தங்கி இருக்கின்றோம். யுத்தத்துக்கு முற்பட்ட காலத்திலும் ஏன், யுத்த காலத்திலும்கூட மட்டக்களப்பில் காகித ஆலை இயங்கியது. இந்த ஆலைமூலமாக 4,000க்கும் மேற்பட்டோர் தொழில்வாய்ப்புகளைப் பெற்றுக்கொண்டதுடன், தமது வாழ்வாதாரத்துக்கான நிதியையும் பெற்றுக் கொண்டனர். அந்தக் காலத்தில் அந்தத் தொழிற்சாலைமூலம் பல உற்பத்திகள் கிடைக்கக்கூடியதாக இருந்தது. குறிப்பாக, உள்நாட்டுக்குத் தேவையான காகிதப் பொருட்களைப் பெறக்கூடியதாக இருந்தது. இப்பொழுது அது பெயரளவுக்கே இயங்கிக்கொண்டு இருக்கின்றது. அங்கு ஏறத்தாழ 300 பேர்தான் தொழில்புரிந்துகொண்டு இருக்கின்றார்கள். அதே போன்று, கும்புறுமுனை என்ற இடத்தில் ஓர் அரச அச்சகம் காணப்பட்டது. அது இப்போது அடியோடு இல்லாத நிலையே காணப்படுகின்றது. அதாவது, அதன் அத்திவாரம்கூட இல்லாத நிலைமை காணப்படுகின்றது. அதேபோன்று இலுப்பட்டிச்சேனை, மண்டூர் போன்ற இடங்களில் ஓட்டுத் தொழிற்சாலை காணப்பட்டது. அவையும் இப்போது இல்லை. அதேபோன்று, அரிசி ஆலைகள் காணப்பட்டன. அவையும் இப்போது இல்லை.

மொத்தமாக ஒரு மதிப்பீட்டைச் செய்து பார்க்கும்போது, இன்று வடக்கு, கிழக்குக்கு வெளியே கிட்டத்தட்ட 96 சதவீதமான தொழிற்சாலைகள் காணப்படுகின்றன. அதனை 97 சதவீதம் என்றுகூடச் சொல்லாம். அப்படியென்றால், வடக்கு, கிழக்கில் காணப்படுகின்ற தொழிற்சாலைகள் 3 சதவீதமாகும். அதிலும் கிழக்கு மாகாணத்தில் அம்பாறையில் தொழிற்சாலைகள் காணப்படுகின்ற அதேநேரம், மட்டக் களப்பிலும் திருகோணமலையிலும் தொழிற்சாலைகள் இயங்காத நிலைமை காணப்படுகின்றது. இந்த அரசாங்கம் கைத்தொழிற்றுறையை அபிவிருத்தி செய்வதாக இருந்தால், கிழக்கில் மூடப்பட்டுள்ள தொழிற்சாலைகளைத் திறக்க வேண்டும். அதேபோன்று, வடக்கில் மூடப்பட்டுள்ள தொழிற்சாலைகளும் திறக்கப்படுமாக இருந்தால், உற்பத்தி அதிகரிக்கப்படுவதுடன் தொழில்வாய்ப்புகளும் கிடைக்கும். இதனால் எமது மனித வளம் வெளிநாடுகளுக்குச் செல்வது குறைவடைந்து, அவர்கள் உள்நாட்டில் தொழில்வாய்ப்பு களைப் பெறக்கூடிய ஒரு நிலைமை ஏற்படும்.

நாங்கள் மனித வளத்தை அவ்வளவு பெரிதாக நினைப்பதில்லை. அண்மையில் அநுராதபுரத்தில் ஒரு பெண் வைத்தியர் பாலியல் பலாத்காரம் செய்யப்பட்டு இருக்கின்றார்.

இது வெறுமனே ஒரு நிகழ்வு என்று நீங்கள் நினைக்கக் கூடாது. இதனால் இந்த நாட்டில் தொழில்செய்ய முடியாது என்று நினைக்கின்ற பல வைத்தியர்கள் நாட்டைவிட்டு வெளியேறக்கூடிய நிலை அதிகரிக்கும். பாலியல் பலாத்காரம், பயமுறுத்தல், கொலை அச்சுறுத்தல் என்பன காரணமாக கடந்த காலத்தில் பல புத்திஜீவிகள் நாட்டைவிட்டு வெளியேறி இருக்கின்றார்கள். இன்று ஏறத்தாழ 15 இலட்சம் தமிழர்கள் வெளிநாடுகளில் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். கனடாவில் நீதி அமைச்சராக இருக்கின்றவர் ஹரி ஆனந்தசங்கரி என்பது உங்களுக்குத் தெரியும்! சிலவேளை அவர் 1983 கலவரத்தில் அகப்பட்டிருந்தால், அவரும் காணாமலாக்கப்பட்டு இருப்பார். நான் இந்த இடத்தில் ஹரி ஆனந்தசங்கரி அவர்களுக்கு வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். அவர் புலம்பெயர்ந்து சென்றாலும், அந்த நாட்டில் தன்னுடைய செல்வாக்காலும் அர்ப்பணிப்பான பணிகளாலும் இன்று அமைச்சராக இருக்கின்றார். இந்த நாட்டில் தமிழ் மக்கள் இரண்டாந்தரப் பிரஜைகளாகக் கருதப்பட்டாலும், அவர்கள் பிற நாடுகளுக்குச் செல்லும்போது அங்கு அவர்களுக்கு மதிப்பு கொடுக்கப்படுகின்றது. அங்கு அவர்கள் அர்ப்பணிப்புடன் தங்களுடைய சேவையை வழங்கிக்கொண்டு இருக்கின்றார்கள். இனவாதம், மதவாதம், இனத்துவேசம் காரணமாக இங்கிருந்து வெளியேறிய மக்கள் அந்த நாடுகளை வளப்படுத்துகின்ற பணிகளில் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றார்கள்.

தேசிய இனப் பிரச்சினையானது நியாயமான முறையில் தீர்க்கப்படுமாக இருந்தால், அந்த மனித வளத்தை எமது நாட்டுக்குக் கொண்டுவந்து, இந்த நாட்டை மிகவும் உயர்ந்த நிலைக்குக் கொண்டு செல்லாம்; அபிவிருத்தி செய்யலாம். இந்தப் புதிய அரசாங்கமாவது அந்த மனித வளத்தைப் பயன்படுத்தக்கூடிய விதத்தில் நடவடிக்கைகளை எடுக்க வேண்டும். குறிப்பாக, புலம்பெயர்ந்து சென்றுள்ள எமது புத்திஜீவிகளை - பெறுமதியுள்ள அந்த மனித வளத்தை - இங்கு கொண்டுவருவதற்கு, நியாயமான முறையில் இனப் பிரச்சினையைத் தீர்க்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, கடந்த காலத்தில் ஏற்பட்ட சில குறைபாடுகளை நான் அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். கடந்த காலத்தில் வீதி அபிவிருத்தி நடவடிக்கைகளுக்கென தற்காலிகமாக இணைத்துக் கொள்ளப்பட்ட கூலித் தொழிலாளிகள் இன்னும் நிரந்தர மாக்கப்படாமல் இருக்கின்றார்கள். அதேபோன்று, காட்டு யானைகள் வீடுகளுக்குள்ளும் கிராமங்களுக்குள்ளும் நுழை வதைத் தடுப்பதற்காக கடந்த அரசாங்க காலத்தில் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தால் பாதுகாவலர்கள் என்ற அடிப்படையில் நியமிக்கப்பட்டவர்கள் இன்னும் நிரந்தரமாக்கப்படவில்லை. அவர்கள் இன்றும் 22,000 ரூபாய் சம்பளத்தோடுதான் வேலை செய்கின்றார்கள். அதேபோல், டெங்கு கட்டுப்பாட்டு உத்தியோகத்தர்களும் 22,000 ரூபாய் சம்பளத்துடனேயே வேலை செய்கின்றார்கள். அவர்களும் நிரந்தரமாக்கப்படவில்லை. இவ்வாறு நீங்கள் விரும்புகின்ற தொழிலாளர் வர்க்கத்தினர் குறைந்த சம்பளத்தைப் பெற்றுக்கொண்டே இன்றும் பணிபுரிகின் றார்கள். எனவே, நீங்கள் இந்த விடயத்தில் கவனம் செலுத்தவேண்டிய தேவை இருக்கின்றது.

அடுத்து, கடந்த அரசாங்க காலத்தில் வழங்கப்பட்ட பொதுசன மாதாந்த உதவித் தொகை பற்றி சொல்ல வேண்டும். இதை எமது கிராமங்களில் 'தர்ம பணம்' என்று சொல்வார்கள். இந்த உதவித் தொகையைப் பெறுபவர்கள் வயோதிபர்களாக இருக்கின்றார்கள்; ஏழைகளாக இருக்கின்றார்கள்; நோயாளிகளாக இருக்கின்றார்கள். இவர்களுக்கு மாதாந்தம் கொடுக்கப்படுகின்ற தொகை 250 ரூபாய் தொடக்கம் 500 ரூபாய் ஆகும். இந்தத் தொகையைப் பெறுவதற்காக அவர்கள் செல்லவேண்டிய தூரம் அதிகமாகும். இந்தத் தொகையைப் பெறுவதற்கு முச்சக்கரவண்டியில் சென்றால், பெறுகின்ற தொகையைவிட செலவு அதிகமாகும். இது, 'சுண்டைக்காய் காற்பணம், சுமை கூலி முக்காற்பணம்' போன்றது. எனவே, அவர்களுக்கு வழங்கப்படுகின்ற அந்த தர்ம பணத்தொகையை அதிகரிக்கவேண்டிய தேவை இருக்கின்றது. அத்துடன், அவர்களை அலையவிடாமல், அவர்கள் வாழுகின்ற இடத் துக்குப் பக்கத்தில் ஓர் உப தபாலகத்தை அல்லது ஒரு நிலையத்தை அமைத்து, அந்தத் தொகையை வழங்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இப்போது பட்டலந்த சித்திரவதை முகாம் பற்றி பேசப்படுகின்றது. அங்கு எப்படியான சித்திரவதைகள் நடைபெற்றன என்பதை நான் ஓர் ஒளிநாடாமூலம் அறிந்து கொண்டேன். அங்கு இடம்பெற்ற விடயங்கள் மிகவும் பாரதூரமானவை. அவற்றுக்கு எதிராக நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென நானும் விரும்புகின்றேன். மனித உரிமைகளை மீறியவர்களுக்கு, உறவுகளைக் காணாம லாக்கியவர்களுக்கு, படுகொலைகளைச் செய்தவர்களுக்கு, கடத்தல்களைச் செய்தவர்களுக்கு, மனித நாகரிகத்துக்கு அப்பாற்பட்ட முறையில் செயற்பட்டவர்களுக்கு எதிராக நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

1990ஆம் ஆண்டு சத்துருக்கொண்டான் என்ற இடத்தில் மிக மோசமான, மிலேச்சத்தனமான, மிருகத்தனமான ஒரு சம்பவம் இடம்பெற்றது. ஒரே நாளில் நான்கு கிராமங்களைச் சேர்ந்த மக்களை பட்டப்பகலில் அழைத்துச் சென்று, அன்றிரவே அவர்களைப் படுகொலை செய்தார்கள். அவர்களில் குழந்தைகள், சிறுவர்கள், பெண்கள், முதியவர்கள், மாற்றுத்திறனாளிகள் என்போரும் உள்ளடங்குகிறார்கள். நடக்க முடியாதவர்களைக்கூட தூக்கிக்கொண்டு வருமாறு சொல்லப்பட்டு இருக்கிறது. அங்கு வலைந்து காணப்பட்ட ஒரு மரத்தில் குழந்தைகளை வைத்து, மீன்களை வெட்டுவது போன்று படைமுகாமில் இருந்தவர்கள் வெட்டிக் கொலை செய்ததாகச் சொல்வார்கள். கடத்திச் செல்லப்பட்டு சத்துருக் கொண்டானிலுள்ள முகாமில் கொல்லப்பட்டவர்களின் உறவினர்களுக்கு இன்னும் நியாயம் கிடைக்கவில்லை.

கிழக்குப் பல்கலைக்கழகம் அகதிமுகாமாக இருந்தபோது, அங்கு இருந்தவர்கள் இரண்டு தடவைகளில் கடத்திச் செல்லப்பட்டு, நாவலடி படை முகாமுக்குக் கொண்டு செல்லப்பட்டு, கொலைசெய்யப்பட்டார்கள். அவர்களின் உடல்கள் எங்கு புதைக்கப்பட்டுள்ளதென இன்றுவரை தெரியாது. இவ்வாறு மொறக்கொட்டாஞ்சேனை, கல்லடி, கரடியனாறு, ஊறனி, கொண்டவெட்டுவான் போன்ற பிரதேசங்களிலுள்ள முகாம்களுக்குக் கொண்டுசெல்லப்பட்ட அப்பாவிகள் கொலைசெய்யப்பட்டு இருக்கின்றார்கள்; காணாமலாக்கப்பட்டு இருக்கின்றார்கள். அவர்கள் இன்னும் மீளவில்லை. பட்டலந்த சித்திரவதை முகாமில் நடத்தது போன்று, வடக்கு, கிழக்கிலுள்ள பல முகாம்களிலும் சித்திரவதைகள் நடைபெற்று இருக்கின்றன. அது சம்பந்தமான காணொளிகளைப் பார்க்கும்போது, ஆட்களை தலைகீழாகத் தொங்கவிட்டு அடிப்பதும், அமிலத் திரவத்துக்குள் அமிழ்த்தி கொலை செய்வதும் என நவீன சித்திரவதைகளுக்கு அவர்கள் உள்ளாக்கப்பட்டிருப்பது புரியும். இவற்றை நினைக்கும்போது மிகவும் வேதனையாக இருக்கின்றதென்றால், அதை அனுபவித்தவர்களது நிலைமை எப்படி இருந்திருக்கும் என்பதை நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும்.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

நாங்கள் மிகவும் அழுத்தம் திருத்தமாக ஒரு விடயத்தைச் சொல்லிக்கொள்ள விரும்புகின்றோம். கடந்த காலங்களில் மனித உரிமை மீறல்கள் நடைபெற்றிருக்கின்றன. சுமார் 77 ஆண்டுகளாக இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற எந்தவொரு பிரச்சினையும் உள்நாட்டுப் பொறிமுறைமூலம் தீர்க்கப்படவில்லை. உள்நாட்டுப் பொறிமுறையானது, சக்தி இழந்த அல்லது ஓர் இனத்துக்குரிய அல்லது ஒரு வர்க்கத்துக்குரிய பொறிமுறையாகவே காணப்படுகின்றது. எனவே, உள்நாட்டுப் பொறிமுறை மூலமாக அல்லாமல், சர்வதேச பொறிமுறை மூலமாக இங்கு காணப்படுகின்ற குறைபாடுகள், அழிவுகள், மக்களின் ஏக்கங்கள், மனக் கொதிப்புகள் சம்பந்தமான பிரச்சினைகளுக்குத் தீர்வுகளைக் காணவேண்டிய அவசியம் இருக்கின்றது.

இன்று மக்கள் மிகவும் வேதனையோடு இருக்கின்றார்கள். நாங்கள் பச்சைக் கட்சியைப் பார்த்து விட்டோம்; நீலக் கட்சியைப் பார்த்து விட்டோம். இந்த அரசாங்கம், சிவப்பு கட்சி! அதாவது, இடதுசாரிக் கட்சி; சமத்துவத்தைப் பேசுகின்ற கட்சி! இந்த அரசாங்க ஆட்சிக் காலத்திலாவது அந்த மக்களுக்குரிய நீதி கிடைக்க வேண்டும். இனம், மதம், பிரதேசம் பார்க்காமல், பாதிக்கப்பட்டுள்ள சகல மக்களுக்கும் நீதி கிடைக்க வேண்டும். அதற்குரிய நடவடிக்கைகளை இந்த அரசாங்கம் எடுக்க வேண்டும் என்பதுதான் மக்களின் எதிர்பார்ப்பாக இருக்கின்றது எனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Chathuranga Abeysinghe. You have 12 minutes.

[1.28 p.m.]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

Hon. Chairman, this particular Ministry is the heart of the economy, taking the country towards growth. Now, we are at a juncture where we need to shift from failed neoliberal economics to development economics, and this Government is taking steps to make those critical changes.

Whilst we discuss and debate about these economic transformations, it is very important for us to understand the context of our economy. The Members on the other side, who try to advise the Government and find fault with the proposals we have made, brought about a country with a Rs. 2 trillion deficit, with which they continued and for which they had no solution. They also created a country with a trade deficit of US Dollars 8 billion, which continued to increase and now, we are in trouble because currency issues came up through that trade deficit. Then, we went into borrowing ISBs from the market. Especially, ISBs worth US Dollars 12 billion were borrowed by the regime from 2015 to 2019, which is now talking about economics, bringing this country to this bankrupt position. Also, mismanagement and corruption brought us to where we are today.

Now, it is time for us to present a Budget, a financial plan, which would allow Sri Lanka to recover. We all understand the limitations and the constraints that have been forced upon us by the framework of the IMF Agreement, which this Government has agreed to move along with for the next three years in enabling us to repay our debts by 2029. We know it is difficult and that our hands are tied, but with the limited amount of manoeuvring we could do, we know how to transform this country. What we need to understand is that these kinds of constraints on the fiscal policy were there even when the corrupt rulers were ruling this country for the past 70 years.

So, at this point, how do we handle these constraints on the fiscal policy differently? One way is to look at it from a perspective of optimization and the other is to look at it from a perspective of prioritization. From an optimization perspective, now, we are trying hard to collect the revenue which has been lost. Tax collection has never been efficient in this country. Those who now talk here, making various suggestions and giving ideas had been unable to improve our tax efficiency and to widen the tax net. But, now, we are trying to use certain taxes which have the least bearing on the public and investments. We have to impose certain taxes in order for us to achieve a revenue target of 15.1 per cent of GDP.

At the same time, ours is the only Government that has a focus on reducing wasteful expenditure, which has been continued with over the years unnecessarily wasting the tax money collected. To give a very simple example, in our Ministry, on the line item of the Minister, we have spent only Rs. 11 million for the last four months, whereas in the previous year, there had been an expenditure of Rs. 28 million. So, from a perspective of prioritization, now, we need to prioritize on our Recurrent Expenditure, with regard to which we cannot do much. But, we can do it in terms of the 4 per cent Capital Expenditure.

So, how do we really prioritize it in terms of bringing about the economic growth that we target? We all, as people who read about economics, know that there are contractionary policies as well as expansionary policies.

Now, we are in a position to run expansionary policies in this country. But, we can run them only from an expenditure perspective because we have no control over the tax perspective. When you give tax benefits, tax reductions, all that would induce the economy to grow. Unfortunately, we are not in a position to use tax as a tool, but only to use expenditure as a tool. A lot of expenditure that is purposefully made, especially the salary increase that is proposed for public servants, which would amount to Rs. 110 billion, is going to impact directly on the economy as a consumption. And, it would also reduce the disruptions which could be expected from the Government Services as people would be happy to work for this change. At the same time, the expenditure

we are making on welfare, giving packages to the suffering people is also going to directly impact on the economy. That is again going to improve the aggregate demand of Rs. 749 billion, which has been planned for. If we go back to 1936 and look at the economic theory of Keynes, he has stated in his book "The General Theory of Employment, Interest and Money" that if you ask your employees to dig a hole, fill it back and dig it again and you still pay them money, that would boost the economy. So, that is the nature of Government expenditure; that is where growth is going to come in this year, especially on the Capital Expenditure of Rs. 1.3 trillion and also on money we are paying directly to the people.

Now, we are also investing in the digital transformation which the previous governments failed to do. It is mainly to ensure that transparency takes place and it is also going to bring us a huge tax collection. So, we are banking on expanding the tax net through this digital transformation. Therefore, Rs. 21 billion has been allocated for this purpose, which the previous governments failed to do. It is also going to increase the efficiency of doing business; the ease of doing business would increase with this digital transformation carried out by the Government. At the same time, the investment that has been made on the road network and transportation is about Rs. 433 billion and they are going to boost the economy in multiple ways because, when you spend on construction, that has a trickle-down effect, improving circulation of money and providing access to industrialization across the country, which we did not have earlier. Then, if we take investments in the energy sector, especially by the private sector, the main intention is to bring down the energy cost by one-third in the next few years.

The investment that has been planned in this Budget to reboost or support the SME sector is about Rs. 39 billion. These are huge investments, which the previous governments did not prioritize on. Then, the investments on health and education are going to give us the next phase of growth with the creation of the skills required. Especially on technical skills, Rs. 15.1 billion is going to be spent. The expenditure on health is going to give us a strong, healthier workforce to drive this economy forward. Also, enough attention has been given to R & D - research and development - as well. So, you can see the differences between the economic theories that had been adopted previously and which have been adopted in this Budget? Now, if we look at the Rs. 4.3 trillion this Government is going to spend both on CapEx and OpEx, there would not be a single rupee to be wasted. We know the amount of wasteful expenditure made by previous regimes, which were never directly related to economic growth. But, we can assure that the Rs. 4.3 trillion that is going to be spent through this Budget would be directly connected to economic growth.

Then, the previous governments or regimes always wanted to sell off all the SOEs under them without a strategic view on SOEs and without thinking about the additional income to the Treasury. We are not going to sell off our SOEs, but to strengthen them through public-private partnerships and through strategic investments and strengthening these businesses to greater heights, we are also trying to improve the revenue brought to the Treasury.

Also, the economic theory that the market could solve all the problems has been proven false, not only in Sri Lanka, but even in the US. They have realized how they should protect their country by moving away completely from that free market thinking. So, this Budget is designed in a way where the State, the co-operatives and the private sector would play a significant role in making a competitive environment for business and also giving the best to the consumer through competition. All these three institutions or structures, along with regulations, would continue to ensure that there would be a competitive environment for the goods and services catered to the people.

At the same time, we are opening the economy for FDIs for technology, capital and market needs. There is a huge amount of potential for Sri Lanka, especially in the energy sector, which needs to grow. Then, we expect maritime investments across our seas under "The Blue Economy." Then, with regard to industrial parks, there is an opportunity for the private sector to come in and play a vital role. So, there are many sectors that have been opened up for foreign as well as local investors to be part of.

Sir, this is a historic moment for Sri Lanka. After 1997, we are shifting the economic model of this country to achieve the greater heights that have been achieved by India, Vietnam and South Korea. The economic theories of the experts who had ruled this country have brought us to our knees, losing a certain amount of sovereignty in terms of our economic capabilities. We are leaving behind the neoliberal economics plus the corrupt political culture we have had in the previous decades and are moving towards a development economic process where the Government would play a pivotal role. So, this particular Government would be structured and made efficient with the political will to make changes, especially in creating a strong base for production, agriculture, exports and trade through strengthening our co-operative system and going forward. Therefore, I urge the public to become aware how this Budget is designed. It is an integrated approach.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chathuranga Abeysinghe, your time is up.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Sir, give me 30 seconds, please.

Not only the Ministry of Finance, but also all the Ministries are integrated in this process. There is a cohesive, integrated strategy and we would invite industrialists to be part of this strategization that would

[ගරු චතුරංග අබේසිංහ මහතා]

take place within the next six months in order to achieve the Rs. 45 billion targeted revenue through exports by 2030, to make the economy to continue to grow at a 6 per cent rate and to create a better life for everyone in a prosperous country.

Thank you.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Namal Rajapaksa. You have been allotted 19 minutes.

[අ.භා. 1.40]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, 2025 අය වැය කාරක සභා අවස්ථාවේදී අද අපි විවාද කරන්නේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවයි. අද මේ යටතේ ඉතාම හොඳ concepts තමුන්නාන්සේලා ඉදිරිපත් කළා. හැබැයි, ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමනි, ප්‍රායෝගිකව තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙන්නේ ආනයනය මත පදනම් වෙච්ච ආර්ථිකයක්ද, එහෙම නැත්නම් සේවා සහ අපනයනය මත පදනම් වෙන ආර්ථිකයක්ද කියන ගැටලුව පැන නැහෙනවා. මොකද, මේ තිබෙන බදු ප්‍රතිපත්ති සහ මේ තිබෙන ප්‍රතිපත්ති මාලාව ඇතුළේ පැහැදිලිවම අපට දැනෙන්නේ ආනයනය මත රාජ්‍ය ආදායම උත්පාදනය කර ගැනීමේ ක්‍රමවේදයක් ඔබතුමන්ලාගේ ආණ්ඩුව අනුගමනය කරනවා කියන කාරණයයි. ඒකට නොයෙක් කාරණා ඔබ ඉදිරිපත් කරනවා. විටෙක IMF එක ගැන කථා කරනවා. තවත් විටෙක පසුගිය ආණ්ඩුවලින් ගත්ත ණය ගැන කථා කරනවා. ඔව්, ආණ්ඩුවක් වුණාම මේ හැම කාරණයකටම මුහුණ දෙන්න ඕනෑ. ඔබතුමන්ලා ආණ්ඩුවක් භාර ගන්නකොට, පසුගිය ආණ්ඩු වාගේම ඉතිහාසයේ යම් අතපසුවීම් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒවා නිවැරදි කර ගන්නත් එක්ක තමයි ඔබතුමන්ලාට බලය දෙන්නේ. "දැන් අපි IMF එකත් එක්ක ඉදිරිපත් කළේ අපේ අය වැය නොවෙයි, අපේ අය වැයක් ඉදිරිපත් කරන්න වෙන්නේ තව අවුරුදු 5කට, අවුරුදු 10කට පස්සේ" කියනවා නම්, ඔබතුමන්ලා අද ඉදිරිපත් කර තිබෙන අය වැයෙන් අපේක්ෂිත ඉලක්කවලට කිසිසේත්ම යන්න බැහැ කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා, 2030 අවුරුද්ද වනවිට අපේ රට මැදි ආදායම් ලබන රටක් බවට පත් කරනවා කියලා. පසුගිය කාර්තුවේ තිබුණු සියයට 5ක ආර්ථික වර්ධන වේගයෙන් ඊළඟ අවුරුදු ගණනාවම ගියත්, අපේ රට මැදි ආදායම් ලබන රටක් බවට පත් වෙන්න තව අවුරුදු 27ක් ගත වෙනවා. ඒ කියන්නේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා 2048 වනවිට නේ අපේ රට දියුණු රටක් කරනවා කිව්වේ. ඊටත් තව අවුරුදු දෙකක් විතර එකතු කරන්න වෙනවා. එහෙම නැත්නම්, ඔබ මවපු චිත්‍රය අනුව අද සිංගප්පූරුවේ තිබෙන ආර්ථිකයට අපි පරිවර්තනය වෙන්න ඕනෑ නම්, මේ වේගයෙන්ම ගියත් ඒ තැනට යන්න අපට තව අවුරුදු 65ක්වත් ගත වෙනවා.

ගරු සභාපතිතුමනි, අපි කොහොමද, අපේ රටේ ආර්ථිකය සියයට 6ට වැඩි, සියයට 7ක, 8ක ආර්ථික වර්ධන වේගයකට ගෙනියන්නේ? මේකේ යම් jump එකක්, shift එකක් අපි බලාපොරොත්තු වෙන්න ඕනෑ. ඒ සඳහා ආණ්ඩුවක් විධියට රැඩිකල් තීන්දු ගන්න ඕනෑ. සමහර විට ඒ රැඩිකල් තීන්දු IMF එක ඇතුළේ නැහැ. හැබැයි, අපි හිතනවා ආණ්ඩුවට ආදායම් උත්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් සහ සැලැස්මක් තිබෙනවා නම් මේක කරන්න පුළුවන් කියලා. මොකද, ආණ්ඩුවට පැහැදිලිව වියදම් කිරීමේ සැලැස්මක් තිබෙනවා. තමුන්නාන්සේලා එක් එක් අමාත්‍යාංශවල සහ හිටපු ජනාධිපතිවරුන්ගේ වියදම් කප්පාදු කළාය කිව්වා. ඒ තුළින් කොච්චර මුදලක් ඉතුරු වුණාද කියන්න නම් අපි දන්නේ නැහැ. මේ අය වැය දිහා බැලුවාම ඒක අපට පැහැදිලි නැහැ. ඒ තුළින් කොපමණ ඉතිරියක්, කොච්චර impact එකක් මේ රටේ ආර්ථිකයට තිබෙනවාද කියලා කියන එක පැහැදිලි නැහැ. හැබැයි ඔබතුමන්ලා, අපි සහ මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන ඒ දැවැන්ත පරිවර්තනයට යන්න නම්, ඒ IMF රාමුව ඇතුළේ පවා රැඩිකල් තීන්දුවලට මේ ආණ්ඩුවට පරිවර්තනය වෙන්න වෙනවා, ගරු සභාපතිතුමනි.

අද වනවිට අපේ රටේ සමස්ත රාජ්‍ය ආදායම බදුවලින් තමයි බලාපොරොත්තු වෙන්නේ. ඒ ආදායමෙන් සියයට 60ක්, ඒ කියන්නේ රුපියල් ට්‍රිලියන 2.9ක්, -දළ වශයෙන් රවුම් figure එකක් මම කියන්නේ- පොලී වශයෙන් අපට ගෙවන්න වෙනවා. රුපියල් ට්‍රිලියන 5ක් ආදායම් උපයනකොට, රුපියල් ට්‍රිලියන 3ක් පොලී ගෙවන්න ඕනෑ. තව රුපියල් ට්‍රිලියන 2ක් තමයි සමස්ත ආණ්ඩුව පවත්වාගෙන යන්නත්, රට හදන්නත්, දියුණු කරන්නත්, digitalize කරන්නත් කියන මේ හැම එකකටම ඉතුරු වෙන්නේ. පසුගිය ISBsවලට අපි චෝදනා කරමින් හිටියා කියන කාරණය තුළ ඊළඟ අවුරුදු 5 පවත්වාගෙන යනවාය කියන එක සාධාරණ නැහැ. යම් වැඩ පිළිවෙළක් බලාපොරොත්තුවෙන් තමයි ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. අනෙක් පැත්තෙන්, මේ තිබෙන බදු ප්‍රතිපත්තියට යටත්ව අද අපේ රටට ආයෝජකයන්ට එන්න පුළුවන්ද, බැරිද කියන කාරණා පිළිබඳව ආණ්ඩුව මීට වඩා අවධානය යොමු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා, ගරු සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා digital transformation ගැන කථා කළා. දැන් digital transformation හරහා citizen services digitalize කිරීම පිළිබඳව ගැටලුවක් නැහැ. හැබැයි, ඒකට අවශ්‍ය මූලික investment එක කොහෙන්ද එන්නේ? ඒක මේ අය වැය ඇතුළේ කොහොමද ඔබ උත්පාදනය කරන්නේ? ඒ වාගේම, ඔබතුමන්ලා sustainable energy ගැන කථා කළා. ඒක හොඳයි. Renewable energyවලට අපි පරිවර්තනය වෙන්න ඕනෑ. අපි grid එකට විදුලිය උත්පාදනය කරන්න ඕනෑ. හැබැයි, පසුගිය මාස 6 තුළ Sri Lanka Sustainable Energy Authority එකෙන් එක ව්‍යාපෘතියක්වත් -project එකක්වත්- provincial approvalවලටවත් තවම ගිහිල්ලා නැහැ; මේ පසුගිය මාස 6 තුළ එහෙම එක ව්‍යාපෘතියක්වත් ගිහිල්ලා නැහැ. Provincial approval කියන්නේ පළමුවැනි approval එක.

එතැනටවත් රාජ්‍ය ආයතන කාර්යක්ෂම වෙලා නැත්නම් මොකද වෙන්නේ? ඒ අතරතුර අපි දකිනවා, පසුගිය කාලයේ ආපු ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සමහර ආයෝජකයෝ යම් යම් හේතු නිසා ආපසු හැරිලා යනවා. දැන් ඔබ කෘෂි කර්මාන්තයට වෙන් කළ මුදල වාගේ 13 ගුණයක් ගෙවන්න ඕනෑ පොලී විධියට. මේ මුදල හොයන්නේ කොහෙන්ද? මේකට අවශ්‍ය මුදල් ටික ලබා ගන්න තිබෙන සැලැස්ම මොකක්ද? මොකක්ද, investment path එක? මොන sector එකද ඔබ ආකර්ෂණය කරගන්න බලාපොරොත්තු වෙන්නේ? එක පැත්තකින් ඔබ කියනවා, digital sector එකේ, IT sector එකේ, නැත්නම් IT servicesවල බිලියන 5ක ආර්ථිකයක් හදනවා කියලා. හැබැයි, සියයට බින්දුවේ තිබුණු tax එක සියයට 15ට ගෙන යනවා. සියයට 15ට ගෙනිහින් ඒකට දෙන excuse එක නැත්නම් ගොතන කථාව තමයි, සියයට 30ක තිබුණු එක අපි සියයට 15 කළා කියන එක, ගරු සභාපතිතුමනි. හැබැයි, බින්දුවේ තිබුණු එක තමයි සියයට 15 කළේ. එහෙම නැතුව සියයට 30ට තිබුණු එක සියයට 15ට ගෙනාවේ නැහැ.

අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තවත් පැත්තකින් මේ cross -boarder transactionsවලට, payment gatewaysවලින් යන servicesවලට ඔබතුමන්ලා යම් tax එකක් බලාපොරොත්තු වෙනවා, VAT වශයෙන්. ඒක කොහොමද ඔබ එකතු කරන්නේ? මේකට උත්තරයක් අවශ්‍යයි, ගරු සභාපතිතුමනි. මුදල් නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ මුදල් එකතු කරන්න බලාපොරොත්තු වෙන්නේ කොහොමද? ඔබතුමන්ලාට මේ මුදල් එකතු කරන්න සැලැස්මක් තිබෙනවාද? ඔබතුමා phone call එක අවසන් වෙලා හරි කමක් නැහැ, මේකට උත්තරයක් දෙන්න. කොහොමද මේකට අවශ්‍ය සැලැස්ම එකතු කරන්නේ? අද වෙනකොට මේ sector එකත් එක්ක මේ ගැන කථා කරලා තිබෙනවාද? අපි Google එකට ගිහින් කියන්නද, අපට VAT එක, සියයට 18 ගෙවන්න කියලා? එහෙම නැත්නම් Facebook එකට කථා කරලා කියන්නද? මම දැක්කා, Booking.com එකෙන් tax ගහන්න ඕනෑ කියලා තිබෙනවා, ඔවුන් ලාභයක් උපයනවා කියලා. ඔවුන් කරන්නේ ව්‍යාපාරයක්. හැබැයි, ඒකට යම් mechanism එකක් හදන්න ඕනෑ නම්, registration process එකක් හදලා ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. හැබැයි, අද වෙනකල් අපේ e-commerce sector එකේ e-commerceවල අළෙවි කරන අයගෙන්, service එක දෙන කෙනාටද, එහෙම නැත්නම් මිලදී ගන්න කෙනාටද, එහෙම නැත්නම් turnover එක base කරගෙනද, කාටද බද්ද ගහන්නේ කියන කාරණය පිළිබඳව ආණ්ඩුවට අවබෝධයක් නැහැ. හැබැයි, අප්‍රේල් 01වැනි දා ඉඳලා මේක ක්‍රියාත්මක වෙනවා. අප්‍රේල් 01වැනි දා ඉඳලා මේක ක්‍රියාත්මක වෙනකොට එක පැත්තකින් servicesවලට බද්ද ගන්නවා. ඒ කියන්නේ, පිට රට ගිහින් රැකියාවක් කරලා ඩොලර්වලින් හම්බ කළත්, ලංකාවේ ඉඳලා අන්තර්ජාලය හරහා ව්‍යාපාරයක් කරලා ඩොලර්වලින් හම්බ කළත්, සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර්වලින් හම්බ කරලා ලාභයක් උත්පාදනය කළත්, තවත් පැත්තකින් YouTuber වෙන්න පුළුවන්, blogger කෙනෙක් වෙන්න පුළුවන්, digital economy ඇතුළේ, creator economy ඇතුළේ ආදායමක් හම්බ කළත් සියයට 15ක tax එක වදිනවා. අනික් පැත්තෙන් මොකක්ද වෙන්නේ? අනික් පැත්තෙන්, ලංකාවේ ලියාපදිංචි නොවුණත් ලංකාව ඇතුළේ තිබෙන අනෙක් ජාත්‍යන්තර බිස්නස්වලට මොකද වෙන්නේ? ඒ අයට ඉදිරිපත් කර තිබෙන VAT එක එකතු කරගන්නේ කොහොමද කියන එක පිළිබඳවත් සැලැස්මක් නැහැ. හැබැයි, උපකල්පනය කරන්න පුළුවන්, "මේවා ජාත්‍යන්තර සමාගම්, ඒවා අසීමිත ලාභ ලබනවා, එහෙම අසීමිත ලාභ ලබන නිසා අපි මේවාට බදු ගන්න ඕනෑ" කියලා.

හැබැයි, ඒ අය මේ බද්ද ගෙවන්න මෙහේට එන්නේ නැහැ. ඒ අය ඒක vendorට පටලවනවා. එහෙම නැත්නම් අන්තර්ජාලය හරහා මිලදී ගන්න කෙනාට ඒ බද්ද පටලවනවා. එතකොට ආයෙත් මොකක්ද වෙන්නේ? ලංකාවේ cost එක වැඩි වනවා මිසක්, ඒ සමාගමේ ලාභයෙන් අඩුවක් වෙන්නේ නැහැ. අනෙක් පැත්තෙන්, මේ ආයතනවලට ලංකාවේ දේශීය නිෂ්පාදන අළෙවි කරනවා, මේ platforms හරහා. ඒ platforms හරහා දේශීය නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳ පොළට අළෙවි කළාට පස්සේ මොකක්ද වෙන්නේ? එක පැත්තකින් VAT එක වැඩි වෙලා මිල වැඩි වෙනවා. අනෙකුත් රටවල ඒ භාණ්ඩය හා සමාන භාණ්ඩ එක්ක තිබෙන competition එකේදී අපි පිටුපසට එනවා. එහෙම කරලාත් විකුණා ගන්න ගිහිල්ලා නැවත වතාවක් සියයට 15ක බද්දක් වදිනවා, ලංකාවට ආවාම. මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්ද? මේකට double tax වදිනවාද? එහෙම නැත්නම් එක තැනකින් මේක නතර කරනවාද? එහෙම නැත්නම් ආණ්ඩුව මැදිහත් වෙලා මේ ආයතන ලියාපදිංචි කරලා, ලියාපදිංචි කරපු ආයතනවල විතරක් ජාත්‍යන්තර සමාගම්වලට ලංකාවේ ව්‍යාපාර කරන්න අවසර දෙනවාද? එහෙමත් නැත්නම් බදු ගෙවිවේ නැහැ කියලා මේවා තහනම් කරලා වහලා දමන්න කියනවාද? මේ පිළිබඳව තමුන්නාන්සේලාගේ ස්ථාවරය මොකක්ද කියා අපි මුදල් අමාත්‍යවරයාගෙන් දැනගන්න කැමැතියි.

ඊළඟට තිබෙනවා, SVAT එක. අපි exports දිරිගන්වන්න ඕනෑ කියලා ඔබතුමන්ලාත් දැන් කියනවා. එහෙම කළොත් තමයි ලංකාවට ඩොලර් එන්නේ. ඩොලර්වලින් උපයන අයට අඩු බද්දක්, රුපියල්වලින් උපයන අයට වැඩි බද්දක්, ඒ හින්දා මේක සාධාරණයි කියන එක නොවෙයි අපි කියන්නේ. හැබැයි, යම්කිසි ක්‍රමවේදයක් සකස් කරලා, මේ රටට විදේශ විනිමය ගෙන එන අයට සාධාරණයක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒ අයට සාධාරණයක් කරන්න එන ගමන තුළ SVAT එක අයින් කිරීම තුළින් මේ රටේ ව්‍යාපාරිකයාට මුහුණ දෙන්න වෙන අපහසුතා පිළිබඳව ඔබතුමාත් දන්නවා. ඒ සහනය දුන්නා කියලා ව්‍යාපාරිකයාට පහසුවක් වනවා මිසක්, ආණ්ඩුවට අලාභයක් වෙන්නේ නැහැ. මොකද, ආණ්ඩුව නැවත වතාවක් එකතු කරලා මේක ගෙවනවාද එහෙම නැත්නම් ව්‍යාපාරිකයා දිරිගන්වන්න මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවාද කියන ප්‍රශ්නය පිළිබඳව ආණ්ඩුව තීන්දුවක් ගන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඊළඟට ආයෝජකයෝ ගැන කථා කරනවා. ලෝකයේ competition එකක් තිබෙනවා. අනෙක් පැත්තෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාට මේ වෙලාවේ අපේ මාර්කට් එකේ විශාල අර්බුදයකට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. මූල්‍යමය ප්‍රතිපාදනවලට යන්න - access to finance සඳහා - අපහසුතාවක් තිබෙනවා. තවත් පැත්තකින්, විදේශ ආයෝජකයෝ ලංකාවට ගෙන ඒම පිළිබඳ ලොකු අභියෝගයක් තිබෙනවා. පසුගිය මාස 6ට ආයෝජකයෝ කී දෙනෙක් අපේ රටට ඇවිල්ලා තිබෙනවාද? පසුගිය මාස හයේ ඔබ විසින් අනුමත කළ ආයෝජන කීයක් තුළ රැකියා කීයක් ලංකාවේ උත්පාදනය වෙලා තිබෙනවාද? ආණ්ඩුවකට පැවතීම සඳහා බදු ක්‍රමය මත යැපෙනවා නම් ඔය ට්‍රිලියන 3 හෝ ට්‍රිලියන 2.9 එන්න එන්න එකතු කරගෙන, වැඩි කරගෙන, ඊළඟ ආණ්ඩුවට භාර දෙනකොට තමන්ගේ අය වැයෙන් සියයට 60, සියයට 80 දක්වා පොලී ගෙවන තැනට පරිවර්තනය කරනවාද, එහෙම නැත්නම් ලංකාවේ ආර්ථිකයට අවශ්‍ය දායකත්වය ලබා දීලා ආයෝජකයෝ ගෙනැල්ලා ඒ ආයෝජකයෝ හරහා රැකියා උත්පාදනය කරලා, අපේ ආර්ථිකය ප්‍රසාරණය කරනවාද කියන තීන්දුව තමුන්නාන්සේලාට ගන්න වෙනවා. IMF එක හින්දා මේක කරන්න විධියක් නැහැ, IMF එක ආවොත් මේ ප්‍රශ්නය විසඳෙනවා, ලොකු සමාගම්වලට සහන දීම තුළ මේ රටට වාසියක් වෙන්නේ නැහැ කියන මානසිකත්වයේ ඉඳලා ආයෝජකයෝ දිහා බලන්න ගියොත් ඔය කිසිම ආයෝජකයෙක් අපේ රටට ඇවිල්ලා ආයෝජනය කරන්නේ නැහැ. මොකද, ඒ අයට ලෝකයේ ඕනෑ තරම් රටවල් තිබෙනවා, ගිහිල්ලා තමන්ගේ ආයෝජනය කරලා, රැකියා උත්පාදනය කරලා, තමන්ගේ ව්‍යාපාර කිසිම ප්‍රශ්නයක් නැතුව ඒ ඒ රටවල ක්‍රියාත්මක කරන්න.

අපි රාජ්‍ය සේවය digitalize කරමු. හැබැයි, මේවාට තමුන්නාන්සේලා මුදල් උත්පාදනය කරන විධියත් මේ ගරු සභාවට කියන්න ඕනෑ. මුදල් කොහොමද හොයන්නේ? බැලූ බැල්මට බදුවලින් පමණක් යැපෙන ආර්ථිකයක් බවට මේ රට පරිවර්තනය කර තිබෙනවා. අනෙක් පැත්තෙන්, තමුන්නාන්සේලා දීර්ඝ කාලීනව මේකට ලබා දෙන විසඳුම මොකක්ද කියන ප්‍රශ්නයට පිළිතුරක් මේ ගරු සභාවට ලබා දෙයි කියලා මම හිතනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මේ Digital Services Tax එක cross-boarder transactionsවලට ගන්නේ කොහොමද කියන එක පිළිබඳවත් ඔබතුමන්ලා මේ සභාවට පිළිතුරක් දෙන්න ඕනෑ. මොකද, ජාත්‍යන්තර සමාගම් එක්ක තමයි ඔබතුමන්ලාට ගනුදෙනු කරන්න තිබෙන්නේ. ඒ සියලුදෙනාට ඒක විශාල අභියෝගයක් වෙනවා. තවත් පැත්තකින් රාජ්‍ය සේවය තුළ වෘත්තිකයන්ට තිබෙන තැන, රාජ්‍ය සේවය තුළ ඉන්න වෘත්තිකයන්ගේ හෙට

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

දවස පිළිබඳවත් බලන්න ඕනෑ. දැන් අද තිබෙන වෛද්‍යවරුන්ගේ ගැටලුවට ඔබතුමන්ලා සානුකම්පිතව ඇහුම්කන් දෙන්න. ඒ අය මුදල් ඉල්ලන්නේ නැහැ. 1980 ඉඳලා පැවැත එන 1/80 කියන සංකල්පය ආරක්ෂා කර දෙන්න කියලායි ඉල්ලන්නේ. ඒකෙන් 2/3ක වැටුප ගෙවන්න. නැත්නම් 1/120 දීමනාව දෙන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි වෛද්‍යවරු ඉල්ලන්නේ, 1/80 කියන සංකල්පය වෙනස් කරන්න එපා කියලායි; නිවාඩු දිනයක වැඩ කළාම ලැබන 1/20ක දීමනාව 1/30 කරන්න එපා කියලායි. හෙදියන්ගේ - nursesලාගේ - ඉල්ලීමත් ඒක. 1/160, 1/200 කරනවා ලු. හැබැයි එක පැත්තකින් එකම ක්ෂේත්‍රය තුළ ඉන්න දෙකොටසකට අසාධාරණ විධියට සැලකීම තුළ, කාලාන්තරයක් තිස්සේ පැවැත ආපු ක්‍රමවේදය වෙනස් කිරීම තුළ ආණ්ඩුව බලාපොරොත්තු වෙන්නේ මොකක්ද, ඒකෙන් මූල්‍යමය ලාභයක් ආණ්ඩුවට ලැබෙන්නේත් නැත්නම් මේ වෙලාවේ? මොකද, ඒ අය මුදල් ඉල්ලන්නේ නැහැ. පැවැති ක්‍රමවේදය, nursesලාගේ 1/160, 1/200 කරන්න එපා, වෛද්‍යවරුන්ගේ 1/80, 1/120 කරන්න එපා, ඒ දෙගොල්ලන්ගේම නිවාඩු දිනයක වැඩ කිරීම වෙනුවෙන් ලබාදෙන 1/20ක දීමනාව 1/30 කරන්න එපා කියලා තමයි ඉල්ලන්නේ. දෙන්න සල්ලි නැත්නම්, 1/80න් 2/3ක් ගෙවන්න; 1/160න් 2/3ක් ගෙවන්න. ඒ තුළ මුදල් වැඩි වෙන්නේ නැහැ. පසු කාලීනව ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් කාලයේදී මුදල් හොයා ගන්න පුළුවන් වුණොත් ගෙවන්න. නැත්නම් අපේ ආණ්ඩුවක් කාලයේදී අපි ගෙවන්නම්, ඒ අවශ්‍ය කාරණය සඳහා. නේද, රවි කරුණානායක මැතිතුමනි? *[බාධා කිරීමක්]* ඒක අපි කර ගන්නම්. *[බාධා කිරීමක්]* විහිළුවක් වාගේ තේරෙයි, යනකොට. තව ටික දවසක් ඉන්න. *[බාධා කිරීමක්]* ඔව්. තව ටික දවසක් ඉන්න. ඉන්නකොට තේරෙයි.

ගරු සභාපතිතුමනි, අද ආණ්ඩුවට සැලැස්මක් නැහැ. ඕක තමයි ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා, ප්‍රශ්නය. අපි කියනකොට ඔබතුමන්ලාට විහිළුවක් වාගේ දැනෙනවා ඇති. මොකද, ඔබතුමන්ලාට දීපු උපදෙස් අනුව ඔබතුමන්ලා අර පරණ කාලයේ කියපු බොරු ටිකම repeat කර කර ඉන්නවා. ගරු සභාපතිතුමනි, වැඩ පිළිවෙළක් එක්ක ඉස්සරහට යාම තමයි ඕනෑ ආණ්ඩුවකින් බලාපොරොත්තු වෙන්නේ. මොකද, අපි විපක්ෂයේ, ඔබතුමන්ලා ආණ්ඩුවේ කියලා ඔබතුමන්ලා විපක්ෂයේ හිටපු කාලයේ හැසිරුණු විධියට විනාශකාරීව හැසිරෙන්න අපි සූදානම් නැහැ. අපි ඇත්ත කියනවා. අපි දකින දේ අපි කියනවා. ඒක පිළිගන්නවාද, නැද්ද කියන එක ඔබතුමාගේ ප්‍රශ්නයක්, ගරු ඇමතිතුමා. දැන් ඔබතුමාට වී මිලදී ගන්නත් බැහැ නේ, අමාත්‍යාංශය තිබුණාට; import කරන්න විතරයි නේ පුළුවන්. ඊයේ චානක මන්ත්‍රීතුමා ඇහුවාම කිව්වා නේ, ඔබතුමාට වී මිලදී ගන්න අයිතියක් නැහැ කියලා. ඒකටත් දිලා තිබෙන්නේ රුපියල් බිලියන 5යි. ඒකෙන් මෙට්‍රික් ටොන් 41,000යි මිලදී ගන්න පුළුවන්. ඒ නිසා එතැනින් එහාට ඒ ගැන කථා කරලා වැඩක් නැහැ. එතැනින් එහාට ඒ ගැන කථා කරලා වැඩක් නැහැ, ගරු සභාපතිතුමනි. මෙතුමාට වී මිල තීන්දු කරන්න අයිතියක් නැහැ. මොකද, වී මිලදී ගන්නේ තවත් එක්කෙනෙක්; import කරන්නේ මෙතුමා. මෙතුමාට සතොසයි, සමුපකාරයයි විතරයි කරගෙන යන්න තිබෙන්නේ. ඒ කෙසේ වෙතත්, ගරු ඇමතිතුමනි, ඔබතුමා ගැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. රටට අවශ්‍ය ප්‍රතිපත්තිය සහ ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ පිළිබඳව තමයි ගැටලුව තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මෑත ඉතිහාසයේ පොලීසිය සහ හමුදාව ගැන ලොකු කතිකාවක් ගොඩනැඟුණා, පාතාලයේ හිස එසවීමත් එක්ක. මේකෙදි පොදුවේ -සමස්තයක් විධියට- හමුදාවට චෝදනා කරනවා. යම් පිරිසක් යම් නීති විරෝධී කටයුත්තක් කරන්න පුළුවන්. ඒ කාරණය පිළිබඳව නොවෙයි මම මේ කථා කරන්නේ. හැබැයි සමස්තයක් විධියට අරගෙන, යම් හේතු නිසා - සාධාරණ හේතු වෙන්න පුළුවන්, පෞද්ගලික හේතු වෙන්න පුළුවන්, අසාධාරණ හේතු වෙන්න පුළුවන් - ත්‍රිවිධ හමුදාවෙන් ඉවත් වෙච්ච සියලුදෙනාම පාතාලය එක්ක සම්බන්ධයි කියලා එක රාමුවක් ඇතුළට දමලා අත්අඩංගුවට ගන්නවා. මම හිතන විධියට, ඒක එතරම් සාධාරණ නැහැ. වැරදි කරපු යම් පිරිසක් ඉන්නවා නම්, ඒ අයට දඬුවම් දෙන්න. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. අනෙක් පැත්තෙන්, ආණ්ඩුවට පුළුවන් මේ පිළිබඳව මීට වඩා පුළුල් සංවාදයක් ගොඩනඟලා, නීත්‍යානුකූලව අයින් වෙන්න කැමැති අය ඉන්නවා නම්, දැනටත් ත්‍රිවිධ හමුදාවේ absent වෙච්ච අය ඉන්නවා නම්, ඒ අයට නීත්‍යානුකූලව අයින් වෙන්න අවසරයක් දීලා, නීත්‍යානුකූලව අයින් කරලා, ඒ අනුව monitoring process එකක් හදා ගන්න. ඒ තුළ ඔබතුමන්ලා ඔය කරගෙන යන වැඩ පිළිවෙළට යම් සාධාරණයක් සහ යම් සහායක් ලැබෙයි. එහෙම නැතුව පොදුවේ ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය හැර ගිය අය ඉලක්ක කරගෙන, පොදුවේ යම් කොටියාසයක් ඉලක්ක කරගෙන කටයුතු කරන්න එපා; පොදු hunt එකක් කරන්න එපා. පොදුවේ ත්‍රිවිධ හමුදාවට, ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්ට සහ සෙබළුන්ට පහර ගහන්නේ නැතුව යම් වැඩ පිළිවළක් එක්ක, සැලැස්මක් එක්ක, ඒ අයටත් සාධාරණයක් ඉටුවන විධියට ඒ තීන්දු ගත්තොත් හොඳයි කියලා මම හිතනවා.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, ඔබතුමන්ලා වියදම් කිරීම ගැන නම් හොඳට සඳහන් කරලා තිබෙන බව. හැබැයි ආදායම් උත්පාදනය කිරීම ගැන නම් අපට තවම ගැටලුවක් තිබෙනවා කියන එකත් මතක් කරන්න ඕනෑ. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Chandana Sooriyaarachchi. You have nine minutes.

Order, please! The Hon. Aravinda Senarath will now take the chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த சென்ரத் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.

[අ.භා. 1.57]

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවයි අද දින මෙම කාරක සභා අවස්ථාවේදී අප විවාද කරන්නේ. අද දවසේ මෙම විවාදය ආරම්භ කරමින් විපක්ෂයේ මන්ත්‍රීවරුන් -මට පෙර අදහස් දැක්වූ මන්ත්‍රීවරයා දක්වා- මේ සභාව තුළදී ඒ සම්බන්ධයෙන් විවිධ අදහස් දැක්වුවා. එතුමන්ලා එසේ දැක්වූ අදහස් සම්බන්ධයෙන් අප තුළ කනගාටුවක් වාගේම බරපතළ හාස්‍යයකුත් නිර්මාණය වෙනවා.

ඒකට හේතුව තමයි පසුගිය දශක ගණනාව පුරාම අපේ රටේ ජනතාව එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, යහපාලන ආණ්ඩුව යනාදී විවිධ කණ්ඩායම්වලට වරින් වර ආණ්ඩු බලය ලබා දුන්නේ අපේ රටේ

ආර්ථිකය ගොඩනගන්නයි; නිෂ්පාදනය වැඩි කරන්නයි; කර්මාන්ත ආරම්භ කරන්නයි; ඒ වාගේම හොඳ දේශපාලන සංස්කෘතියක් පවත්වා ගෙන යන්නයි. එවන් වැඩ පිළිවෙළක් තමයි පසුගිය කාලයේ පැවැති ආණ්ඩුවලින් ජනතාව අපේක්ෂා කළේ. නමුත් ඒ ඒ ආණ්ඩු විසින් බලය ලැබුණාට පසුව මොකක්ද කළේ? එක්සත් ජාතික පක්ෂය ගත්තාම, දශක ගණනාවක් ඒ ආණ්ඩුවට තනි පාලන බලයක් තිබුණු බව අපි දන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගත්තාම, ඒ අය ඊට වඩා වැඩි කාලයක් රට පාලනය කළා. හැබැයි, ඒ කාල වකවානු තුළ ආණ්ඩු කරපු වත්මන් විපක්ෂයේ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා තවම බලයට ඇවිත් මාස 5ක් පමණ වන ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට කියනවා, මේ රටේ ආර්ථිකය හදන්න පුළුවන් කියලා. එහෙම කියලා ඒ සම්බන්ධයෙන් විවිධ අදහස්, යෝජනා ඉදිරිපත් කරනවා. හැබැයි, වත්මන් විපක්ෂයේ සිටින මේ ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ට වගකීම පැවරී තිබුණු අවස්ථාවල; ඒ වකවානු තුළ මේ රටේ ආර්ථිකය හදන්න, තිබුණු මට්ටමෙන් ආර්ථිකය ගොඩගන්න කටයුතු කළා නම්, අද මේ සභාවේදී එතුමන්ලා මේ ආණ්ඩුවට ඉදිරිපත් කරන යෝජනා එදා ප්‍රායෝගිකව ක්‍රියාවට නැඟුවා නම් අපේ රට ආර්ථික වශයෙන් බංකොලොත් වෙන්නේ නැහැ; එහෙම නම් අපේ රට දුප්පත් වෙන්නේ නැහැ; ලෝකයේ අසාර්ථක රාජ්‍යයක් බවට මේ ශ්‍රී ලංකාව පත් වෙන්නේ නැහැ. එදා ඒ තාත්තලා, පුතාලා, බාප්පලා, ලොකු තාත්තලා එකතු වෙලා මාරුවෙන් මාරුවට මේ රට පාලනය කරමින් මේ රටේ ආර්ථිකය ඒ තත්ත්වයට පත් කළ නිසා තමයි අද අපිට ඒ කටයුතු නිවැරදි කරලා හරි මාර්ගයට රටේ ආර්ථිකය අරගන්න වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දශක කිහිපයක් ඇතුළේ වැරදි ආර්ථික ප්‍රතිපත්තියකට ගෙන ගිය මේ රට, වැරදි දේශපාලන සංස්කෘතියක් තුළ ගමන් කරවපු මේ රට නිවැරදි ආර්ථික ප්‍රතිපත්තියකට ගෙන ඒමේ වැඩ පිළිවෙළක්, ඒ වාගේම රටේ ජනතාවට ගැළපෙන, මේ රටේ ආර්ථිකයට ඔරොත්තු දෙන දේශපාලන සංස්කෘතියක් තුළ මේ රට ක්‍රමානුකූලව හරි පාරට ගෙන ඒම සඳහා වන වැඩ පිළිවෙළක් තමයි අද ජාතික ජන බලවේගයේ අපි; වත්මන් ජනාධිපති අනුර දිසානායක මැතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව ආරම්භ කර තිබෙන්නේ. අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියනවා, ඔබතුමන්ලාගේ අදහස්, යෝජනා අපට දෙන්න කියා. ඒවා වටිනවා. හැබැයි, එදා ඔබතුමන්ලාට බලය තිබුණු කාලයේ ඔබතුමන්ලා අද කියන මේ සියලු දේවල් සිදු කර තිබුණා නම්, අද වනවිට ප්‍රශ්න ගොඩක් විසඳී අවසන්. කොහොම වුණත් එදා ඔබතුමන්ලා මේ රටේ ආර්ථිකය නිවැරදි මාවතට ගෙනෙන්න, ආර්ථිකය ගොඩනගන්න, නිෂ්පාදනය ශක්තිමත් කරන්න, මේ රටට ගැළපෙන ආර්ථික ප්‍රතිපත්තියකට රටේ ආර්ථිකය ගෙනෙන්න කටයුතු නොකළත්, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි ඒ වගකීම භාර ගන්නවා. ඒ වෙනුවෙන් අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම ක්‍රමානුකූලව, විධිමත්ව මේ රටේ ජනතාවගේත් අවබෝධය සහිතව අපි ඉදිරියට ක්‍රියාත්මක කරනවා.

අපි මෙතැනදී කිව යුතු තවත් විශේෂ දෙයක් තිබෙනවා. මට කලින් කථා කරපු මන්ත්‍රීවරයාගේ කථාව තුළ කියැවුණා ත්‍රිවිධ හමුදාවට ගෞරවයක් දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ හිටපු පාලකයෝ, ඒ අයගේ පුතුන්, විවිධ අය මේ රටේ හමුදාව misuse කළේ කොහොමද කියලා අපි දන්නවා. ඒ අය හමුදාව වැරදි විධියට පාවිච්චි කළේ කොහොමද කියලා අපි දැක්කා. බල්ලන් නාවන්න, සාරියට කටු ගහන්න, සාරියේ කටු ගලවන්න, සෙරෙප්පු දමන්න, සෙරෙප්පු ගලවන්න, තමතමන්ගේ වතුවල පොල් අහුලන්න වාගේ දේවල්වලට තමයි ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයෝ එදා ඒ අය පාවිච්චි කළේ.

හැබැයි, ඒ සියලු හමුදා සාමාජිකයන්ට තමන්ගේ ව්‍යක්තීය ගරුත්වය ඇතුළේ රාජකාරි කරන්න අවශ්‍ය වටපිටාව, ඒ ස්වාධීනත්වය ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ අපි නිර්මාණය කර තිබෙනවා.

අද විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු අදහස් දක්වද්දී අපට හිතෙනවා, අප මීට මාස 5කට කලින් හිටියේ ලංකාවේ නොවෙයි ද කියලා. ඒ ප්‍රශ්නය, ඒ අදහස අපට මතු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ වෙතත් අපට දැන් වගකීමක් තිබෙනවා. ඒ තමයි, අපේ රටේ ආර්ථිකය නිවැරදි පැත්තකට ගෙන යමින් අපේ රටේ ජීවත් වන සෑම පුරවැසියෙකුටම ආර්ථික අගහිඟතාවකින් තොරව, කාලා බීලා ජීවත් වෙන්න පුළුවන් නිදහස් රටක්, ආර්ථිකයක් හැදීමේ වගකීම. ඒ සඳහා අපට කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන වැඩ පිළිවෙළක් තිබෙනවා. වසර 5ක් සඳහා ජාතික ජන බලවේගය ලබා ගත්තු ජනවරම අනුව ඒ සඳහා වන වැඩ පිළිවෙළක් යටතේ රට ක්‍රමානුකූලව ඉදිරියට ගෙන යන්න අපි සැලසුම් කර තිබෙනවා. ඒ නිසා අපේ පළමු අය වැයේ මූලික අරමුණ තමයි මෙතෙක් වැරැදි ආර්ථික ප්‍රතිපත්තියක ගමන් කළ මේ රට හරි පාරකට යොමු කර ගැනීම. අපි ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා. බිඳ වැටපු ආර්ථිකයක් තමයි පසුගිය කාලයේ තිබුණේ. ඒ වෙනුවට ආර්ථිකයේ ස්ථාවරත්වයක් නිර්මාණය කර ගැනීමට අපේ පළමු අය වැය තුළින්ම අපි සැලසුම් කර තිබෙනවා. ඒ නිසා වැරැදි ප්‍රතිපත්තියක් එක්ක ගමන් කරපු මේ රටේ ආර්ථිකය හරි පාරකට යොමු කර ගැනීම වාගේම පසුගිය කාල සීමාවේ බිඳ වැටපු, බංකොලොත් කරපු ආර්ථිකය යම් ස්ථාවරත්වයකට ගෙන ඒමත් අපේ අරමුණක්. මෙවර අය වැයේ තිබෙන අනෙක් සුවිශේෂී අරමුණ තමයි ප්‍රාදේශීය වශයෙන් තිබෙන ආර්ථික විෂමතාව අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

මේ වන කොට අපි ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වාගේම සමාජ සුභසාධන වැඩ පිළිවෙළ ශක්තිමත් කරලා, අඩු ආදායම්ලාභී ජනතාවගේ ප්‍රතිලාභ වැඩි කරලා, වැඩිහිටි ප්‍රජාවගේ මාසික දීමනාව වැඩි කරලා, ආබාධ සහිත තැනැත්තන්ගේ දීමනාව වැඩි කරලා, නිදන්ගත රෝගවලින් පෙළෙන්නන් සඳහා දෙන මාසික දීමනාව වැඩි කරලා, ප්‍රාදේශීය වශයෙන් පැවතුණු ආර්ථික විෂමතාව සහ පරස්පරතාව අවම කිරීම සඳහා අපි මේ අය වැය තුළින් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් අය වැයක් ආසන්නයේ, මාස කිහිපයක් තිස්සේ අපේ රටේ වැඩ කරන ජනතාව වැටුප් වැඩි කිරීම සඳහා අරගළ කරනවා. හැබැයි, වත්මන් ආණ්ඩුව එවැනි අරගළවලින් තොරව, ඉල්ලීමකින් තොරව අපේ රටේ රාජ්‍ය සේවකයාගේ වැටුප් සහ වැටුප් වර්ධක වැඩි කිරීමක් කළා. ඇයි ඒ? තමන්ගේ මාසික වැටුප යහමින් තිබුණොත් තමයි තමන්ට මිල දී ගැනීමේ හැකියාව වැඩි වෙන්නේ. එහෙම වැඩි වුණොත් තමයි වෙළෙඳ පොළ ශක්තිමත් වෙලා ආර්ථිකය නිසි පරිදි හැසිරෙන්න පටන් ගන්නේ. අන්න ඒ නිසා වත්මන් ආණ්ඩුව රාජ්‍ය සේවකයන්, වැඩ කරන ජනතාව මාසිකව ගෙදර ගෙන යන වැටුපේ අගය ඉහළ දමා තිබෙනවා. ඒක කලින් ලැබුණේ මොන ආකාරයකට ද, ඒ ප්‍රතිශතය මොකක් ද, ඒක කලින් ලැබුණේ මොන ඒකකයක් යටතේ ද කියන කාරණාවලට වඩා, මාසය අවසානයේ තමන් ගෙදර ගෙන යන වැටුපේ අගය ඉහළ දමමින්, තමන්ට වෙළෙඳ පොළේ මිල දී ගැනීමේ හැකියාව වැඩි කරමින් මාසික වැටුප් වැඩි කිරීමක් වත්මන් ආණ්ඩුව විසින් කරලා තිබෙනවා. ඉතින්, එවැනි අරමුණු ගණනාවක් එක්ක තමයි අප මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අවසාන වශයෙන්, මම තවත් කාරණයක් පැහැදිලිව කිව යුතුව තිබෙනවා. අද මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව පවත්වන මේ විවාදයේදී අපට ජනතාවට පැහැදිලිව කියන්න තිබෙන්නේ, අප මේ අය වැය මූලික වශයෙන් ඉලක්ක කරගෙන තිබෙන්නේ, නිෂ්පාදනය, අපනයනය වාගේම ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීම ආදිය වන බවයි. එවැනි ආකාරයේ නිවැරැදි ආර්ථික ප්‍රතිපත්තියකට අපේ වැඩ පිළිවෙළ ප්‍රවේශ කරන ආරම්භක අය වැය මෙයයි කියන කාරණාව අපි ඉතා පැහැදිලිව කියනවා. ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 34ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාව මා උපයෝගී කර ගන්නේ, මේ තත්ත්වයෙන් පවතින රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන අදහස් ටිකක් ඉදිරිපත් කරන්නයි.

ආර්ථිකය කළමනාකරණය කරන ආකාර 4ක් ගරු ජනාධිපතිතුමා පෙන්වා දී තිබුණා. ඉන් පළමුවන එක තමයි, ආර්ථික කළමනාකරණයේ තරගකාරී තත්ත්වය. අපි ඒක පිළිගන්නවා. ඒක හොඳයි. දෙවැනි එක තමයි, ආර්ථිකය නියාමනය කිරීම, regulating the economy. ඒක කළ යුතු දෙයක්. තුන්වැනි එක තමයි, තෝරාගත් ක්ෂේත්‍රවල අභියෝග හා සැපයුම් කළමනාකරණය සඳහා සක්‍රීයව රජය සහභාගි වීම. එයට උදාහරණයක් වශයෙන් ගෙන තිබුණේ, යුද්ධ හමුදාව පාවිච්චි කරලා සහල් මෝල් ආදිය control කරන එක. මා හිතන විධියට එය නොවෙයි, ආණ්ඩුව කළ යුතු දේ. තරගකාරී තත්ත්වයක් ඇති කළ යුතුයි. ප්‍රශ්නයක් ඇති වූ අවස්ථාවක මැදිහත් වීමක් කරනවා මිස සාමාන්‍යයෙන් රජයේ සහභාගිත්වය අවශ්‍ය නැහැ.

ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු හතරවැනි කාරණය තමයි, තෝරා ගත් ක්ෂේත්‍රවල නිෂ්පාදනයට රජය සෘජුව සහභාගි වීම. එයට උදාහරණයක් වශයෙන් පෙන්වා දී තිබෙන්නේ SriLankan Airlines ආයතනයයි. එම ආයතනයට හොඳ සභාපතිවරයෙකු පත් කළාට රජය මේ ව්‍යාපාර කරගෙන යෑම එච්චර සාර්ථක කටයුත්තක් නොවෙයි කියන එක පසුගිය අවුරුදු 77 තුළ පෙන්නුම් කර තිබෙනවා. නිදහස ලබා අවුරුදු 77ක් වුණාට, ශ්‍රී ලංකාව නිධානයක් උඩ ඉඳගෙන හිඟමනේ යන රටක් බවට තමයි පත් වෙලා තිබෙන්නේ. මොන ආණ්ඩුව බලයට ආවත්, මොනවා කිව්වත් අන්තිමට ඒ කියපු තත්ත්වය තමයි දැනට පෙන්නුම් කරමින් තිබෙන්නේ. ඔබතුමන්ලා අනුගමනය කරන්නේ නිෂ්පාදන ආර්ථිකයක් ද, සේවා ආර්ථිකයක් ද, එහෙම නැත්නම් ආනයනය කරලා වෙළෙඳාම් කරන ක්‍රමවේදයක් ද කියන එක වටහාගෙන කටයුතු කරන්න අවශ්‍යයි. ඒකෙන් තමයි රටක ආර්ථිකය ඉදිරියට ගෙන යන්න පුළුවන්ද කියන එක තීරණය වන්නේ. Lee Kuan Yew once said, "A good plan today is better than a great plan tomorrow." මේ තිබෙන අවස්ථාවට අනුව රට ඉදිරියට ගෙන යන්න අපට පුළුවන් වන්නේ කොයි ආකාරයෙන්ද කියන එක ගැන අදහස් හුවමාරු කර ගැනීම තමයි අප කළ යුතුව තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව පළමු අය වැයයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. පනතේ මූලික සිද්ධාන්තයක් තමයි, වියදම් සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක් වෙන් කිරීම. ඒකෙන් සියයට 4ක් ප්‍රාග්ධන වියදම් සහ සියයට 9ක් පුනරාවර්තන වියදම් ලෙස වෙන් කරලා තිබෙනවා. මීට පෙර ගියේ අත්තනෝමතිකව කටයුතු කරමින් යන ගමනක් වුණාට දැන් වියදම් සීමා කරලා තිබෙනවා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5ක් ලෙස.

මේ අය වැය හිඟය පියවන්න ඉදිරිපත් කර තිබෙන්නේ රුපියල් බිලියන 700ක් -ඒ කියන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3ක්- පිට රටවලින් සෙවීමයි. දේශීය වශයෙන් රුපියල් බිලියන 3,100ක් සොයන්න බලාපොරොත්තු වෙනවා. මේ සම්බන්ධයෙන් වැදගත්ම දේ තමයි primary surplus එක. ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.4ක් විය යුතුයි කියලායි සඳහන්ව තිබෙන්නේ. ඒ කියන්නේ, පොලී ප්‍රමාණය අඩු කරලා වියදම් කරන්න පුළුවන් හැකියාවයි. අන්තිමට සම්පූර්ණ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 94ක් විය යුතුයි කියන එක ගැන දැනුවත් කරලා තිබෙනවා. මේ ආකාරයට ගමන යන කොට අපට පෙනෙනවා, මේ අවුරුද්දේ අය වැය ඇස්තමේන්තු අනුව වියදම රුපියල් බිලියන 8,835යි කියලා; අය වැය හිඟය රුපියල් බිලියන 2,200යි කියලා. අපි රුපියල් බිලියන 1,315ක් ප්‍රාග්ධන වියදම් විධියට වෙන් කර තිබෙනවා. ප්‍රාග්ධන වියදම තමයි අත්‍යවශ්‍ය දේ. නමුත්, ආණ්ඩුවට දැනටමත් මාස තුනක් ගත වෙලා තිබෙනවා. ඉදිරි දිනවල සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය නිසාත්, ඊට පසුව පැවැත්වෙන ඡන්දය නිසාත් කටයුතු පටන් ගන්න කලින් එක කාර්තුවක් අවසන් වෙනවා. පළමු කාර්තුවේ වියදම් වෙනුවෙන් රුපියල් බිලියන 1,315න් වියදම් කරනවාද, නැත්නම් ඇස්තමේන්තු කරලා තිබෙනවා විතරක්ද කියන ප්‍රශ්නය තමයි අන්තිමට අපට අහන්න තිබෙන්නේ. මා එය කිව්වේ, එය අත්‍යවශ්‍ය කාරණයක් වන නිසා. අද ප්‍රාග්ධන වියදම් දරන්නේ හෙට ආදායමක් ඉපැයීමේ මාර්ගයක් ලෙසයි. ඒක තමයි අප සියලුදෙනා දන්නා සිද්ධාන්තය. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15ක ආදායමක් හොයන ආකාරයක් ගැන දැන් කියනවා නේ. ඒ කියන්නේ, ඒකෙන් රුපියල් බිලියන 5,000ක් -ට්‍රිලියන 5ක්- හොයන්න තිබෙනවා. ඒක එසේ මෙසේ කාර්යභාරයක් නොවෙයි. මේ වතාවට වඩා සියයට 24ක වැඩි වීමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගඡේන්ද්‍රන් කියලා tax consultant කෙනෙක් ඉන්නවා. එතුමා මාර්තු 9වැනි දා "Sunday Observer" පත්තරයට කියලා තිබෙනවා, "Meeting this year's tax revenue target very unlikely" කියලා.

ඒක ප්‍රායෝගිකව කියලා තිබෙන දෙයක්. ඒ කියන්නේ මෙතැන ඉලක්කම් දමන එක නොවෙයි, කොහොමද අපි මේ ආදායම සොයා ගන්නේ කියන එක. ඒ නිසා අපි නිර්මාණශීලි විය යුතුයි, අලුත් ආකාරයකට ආදායම් සොයා ගන්නේ කොහොමද, අපේ වියදම් පාලනය කර ගන්න පුළුවන් වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව. අපට පාලනය - control - කරන්න පුළුවන් වියදම් තිබෙනවා. ඒ වාගේම, පාලනය කරන්න බැරි වියදම් තිබෙනවා. ඒ වාගේම, input cost එකක් හෝ cost inflation එකක් පිටස්තරව ආවොත්, ඒ කියන්නේ තෙල් මිල වැඩි වුණොත්, අපි කොහොමද ඒක handle කරන්නේ. මෙවර තමයි වැඩිම පොලී ප්‍රමාණයක්, අපේ ආදායම එක්ක සංසන්දනය කරලා බැලුවාම, සියයට 58ක්, ඒ කියන්නේ රුපියල් බිලියන 2,950ක් වන පොලී ප්‍රමාණයට අපි ආදායම ඇස්තමේන්තු කරලා තිබෙන්නේ, රුපියල් බිලියන 5,042යි. ඒ සම්බන්ධයෙන් මට කියන්න පුළුවන් වෙන්නේ, අපි මේ ඉදිරිපත් කරලා තිබෙන පුරෝකථන ප්‍රායෝගිකව ඉෂ්ට කරන්න පුළුවන් කොයි ආකාරයෙන්ද කියන එකයි. 2024 වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ආදායම් ඇස්තමේන්තුව ලෙස රුපියල් බිලියන 1,950ක් ඉදිරිපත් කරලා තිබෙනවා, මෙවර එය රුපියල් බිලියන 2,250 දක්වා වැඩි කරලා තිබෙනවා. 2024දී ශ්‍රී ලංකා රේගුව රුපියල් බිලියන 1,550ක් ඉදිරිපත් කරලා තිබුණා. මෙවර ඒක රුපියල් බිලියන 2,070ට වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, 2024දී ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 214ක් ඉදිරිපත් කරලා තිබුණා. ඒක රුපියල් බිලියන 240ට වැඩි කරලා තිබෙනවා. ඒකත් එක්ක මට කියන්න පුළුවන්, කාර්

සම්බන්ධයෙන් ඉදිරිපත් කරලා තිබෙන ආදායම ප්‍රමාණය ඉක්මවා තිබෙනවා කියන එකයි. ඒකෙන් රුපියල් බිලියන 360ක් හෝ 370ක්, ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.2ක් විතර වෙන් කරලා තිබෙනවා. මම හිතන විධියට මේ මොහොතේ ප්‍රායෝගිකව මීට වැඩිය සාධාරණ මට්ටමකට අපි කටයුතු කරන්න අවශ්‍යයි.

ඒ ඔක්කොම කියන අවස්ථාවේදී debt servicing සඳහා, ඒ කියන්නේ, ණය පොලී සහ ප්‍රාග්ධන වියදම් එක්ක රුපියල් බිලියන 4,550ක් මේ අවුරුද්දේ වෙන් කරලා තිබෙනවා. අන්තිමට කොහොමද අපි මේක පරිපාලනය කරන්නේ කියන ප්‍රශ්නය තිබෙනවා. මීට පෙර පැවැති හැම ආණ්ඩුවක්ම ඔය වාගේ හොඳ සිද්ධාන්ත තුළින් අය වැය ඉදිරිපත් කරනවා. ඒ ඉදිරිපත් කළාට, අන්තිමට ඒක ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙනකොට, වියදම වැඩි වෙලා, ආදායම අඩු වෙලා, අය වැය හිඟය වැඩි වෙලා යන ගමනක් තමයි තිබෙන්නේ කියන එක අපට පෙනෙනවා. මෙවර පනතක් තිබෙන නිසාත්, පළමුවන වතාවට ඒ පනත ක්‍රියාත්මක කරන නිසාත්, මේක කොයි ආකාරයෙන්ද අපි ක්‍රියාත්මක කරන්නේ කියන එක බැලිය යුතුයි.

මේ ඔක්කොම කියනකොට හැම වෙලාවේම මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරුන් සංසන්දනය කරන්නේ, මීට අවුරුදු ගණනාවකට පෙර මේ රට පාලනය කරපු ආණ්ඩු එක්කයි. ඒ ආණ්ඩු තුළත් යම් විධියේ සාර්ථකත්වයක් තිබිලා තිබෙනවා. අවුරුදු 76ක ශාපය කියලා කිව්වාට, 2015දී මම අය වැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවේ රාජ්‍ය සේවකයන්ගේ පඩිය රුපියල් 10,000කින් වැඩි කළා. සමෘද්ධි දීමනාව සියයට 200කින් වැඩි කරලා, ගෙවල් හදන්න රුපියල් මිලියන 25,000ක් වෙන් කරලා, රක්ෂණ ක්‍රමයක් දීලා කටයුතු කළා. ඒ වාගේම, උපාධිධාරීන්ට පොලී රහිත ණය දීලා, භාණ්ඩ 15ක මිල අඩු කරලා, තෙල් මිල අඩු කරලා කටයුතු කළා. ඉංග්‍රීසියෙන් කියනවා නම්, the Government must act. You cannot leave the war only in the hands of the soldiers. The generals must take command. මේ අවස්ථාව තමයි, මම හිතන විධියට හරිම වේලාව. ඒ දේශපාලන අර්ථකථනය දීලා, ඒ තුළින් අපට ඉදිරියට මෙය කරන්න පුළුවන් වෙන්නේ කොහොමද කියන එක බලන්න ඕනෑ.

අනෙක් පැත්තෙන් බැලුවාම, ඉතිරි කිරීම් තිබෙනවා. ඔබතුමන්ලාගේ ආදර්ශ තුළින්, කථා තුළින් කියලා තිබෙන්නේ, ඇමතිකම් අඩු කරනවා, කාර්වලට යන වියදම අඩු කරනවා, ගෙවල් පාවිච්චි කරන්නේ නැහැ, හෙලිකොප්ටර්වලට වියදම් යන්නේ නැහැ, දුෂණය නැහැ, pension නැහැ කියලායි. ඒ විධියට ඔක්කොම කරලා, ඒ ඉතිරි කරපු ඒවා කොහේටද ගිහිල්ලා තිබෙන්නේ? අපට පෙන්වන්න පුළුවන් නම්, ඒ ඉතිරි කිරීම් නිසා රුපියල් බිලියන 500ක්, 600ක් අපි ප්‍රාග්ධන වියදමට යොමු කරනවා කියලා, අන්න ඒක අපට ඉතා සතුටින් පිළිගන්න පුළුවන්. ඒක වාචිකව විතරක් නොවෙයි, ඇත්ත වශයෙන්ම ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, රටට කරන ලොකු ආයෝජනයක් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. මොකද, ඒ කාලයේ තිබුණු විධියට මේ රටේ ඉන්න අය පිටරට ගිහිල්ලා වැඩ කරන එක නොවෙයි, අපේ රටින් ගෘහ සේවිකාවන් පිටරට ගිහිල්ලා වැඩ කරන එක නොවෙයි, පිටරට ඉන්න සුද්දියෝ මේ රටට ගෙනැල්ලා, මේ රටේ වැඩ කරන්න පුළුවන් විධියට කටයුතු කරන එක තමයි කළ යුත්තේ. මම හිතන විධියට අපි එවැනි වෙනසක් කරන්න පුළුවන් ගමනක් යන්න ඕනෑ. ඉංග්‍රීසියෙන් කියන විධියට, walk the talk තමයි දැන් අපි කරන්න අවශ්‍ය වෙන්නේ. ඒ ඔක්කොම තුළ සුබවාදී දේවල් කියලා තිබුණා. ජනාධිපතිතුමා ඉතාම ඕනෑකමින් කියලා තිබුණා, ආයෝජකයන්ට බාධා ගණනාවක් තිබෙනවා කියලා. 2025 ජනවාරි 31වැනි දා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉදිරිපිටදී තමයි ඒක කියන්නේ: "Bottlenecks galore for investors, approval needed from 83 institutions."

මේක බොහොම හරි. කොහොමද ඒක නැති කරන්න පුළුවන් වන්නේ? ඒක එක පැන් පාරකින් නැති කරනවාද, නැත්නම් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඒ තිබෙන පනත් සම්මත කරලා කටයුතු කරනවාද? මම හිතන විධියට, හොඳම දේ මේකයි. රජයේ නිලධාරීන් සිටිනවා නේ. රජය තීන්දුවක් ගත්තාට පස්සේ පැය 24 කින් ඒක ක්‍රියාත්මක කරන මාර්ගය ඒ අයට දිය යුතුයි. ඒ අයට ඒක ඉදිරිපත් කරලා ඒකට උත්තරයක් ආවේ නැත්නම් ඒක affirmative, ඒකට හරියාකාරව උත්තරයක් ලැබුණා සේ සලකලා ඉදිරියට යන්න අවශ්‍යයි. එස්ටෝනියාවේ ඒක කරනවා. අද නැහෙනහිර යුරෝපා රටවල් ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙලා කටයුතු සිදුවීමේ සාර්ථකත්වය ගැන තමයි මම මේ අවස්ථාවේ කියන්නේ.

ලංකාව අද කැපී පෙනෙන රටක් බවට වෙලා තිබෙන්නේ නව ආණ්ඩුවක් ඇවිල්ලා, අලුත් අදහස් ඉදිරිපත් කරලා තිබෙන නිසා. අද ලංකාව දෙස ලෝකයම බලාගෙන සිටිනවා. අපට ඉතා මිත්‍රශීලිව ඉදිරියට ගමන් කරන රටවල් දෙකක් තමයි ඉන්දියාව සහ චීනය. මීට මාස දෙකකට ඉස්සෙල්ලා ඉන්දියාවේ අය වැය ඉදිරිපත් කළා. ඊට පස්සේ චීනයේ ප්‍රතිපත්ති ප්‍රකාශය මීට මාසයකට විතර කලින් ඉදිරිපත් කළා. මම ඒ දෙක සංසන්දනය කරනවා. ඉන්දියාව කියලා තිබෙනවා, ඒගොල්ලන්ගේ මුළු ආර්ථිකයම රඳා පවතින ඉතා වැදගත්ම කටයුත්ත වන්නේ, Unique Identity Card එක හා සම්බන්ධ Aadhaar System එක කියලා. ඒකේ control aspect එක ගෙනැල්ලා ඒක තුළින් තමයි රට ශීඝ්‍රයෙන් ඉදිරියට ගෙනියන්න පුළුවන් හැකියාව ලැබිලා තිබෙන්නේ. ඒ නිසා ඒකට තව ආයෝජනය කරනවා. ඊට පස්සේ ඒගොල්ලෝ අවුරුදු 10ක Corporate Plan එකක් ඉදිරිපත් කරනවා. ඊට පස්සේ ඉන්දියාවේ අඩු පොලී ප්‍රමාණයකට ලක්ෂ 10ක ව්‍යවසායකයන් පිරිසක් ඇති කිරීමට කටයුතු කරන්න පටන් ගෙන තිබෙනවා. 2025දී US Dollars 5 trillion වන ඉන්දියාවේ ආර්ථිකය 2030 වෙනකොට US Dollars 12 trillion වෙනවා. 2047දී, ඒ කියන්නේ ඉන්දියාව නිදහස ලබලා අවුරුදු 100කට පසුව ඒගොල්ලන්ගේ ආර්ථිකය US Dollars 20 trillion දක්වා වැඩි වෙනවා.

ඊට පස්සේ මම ඒ සමඟ චීනයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ මොනවාද කියලා තිබෙන්නේ කියලා සංසන්දනය කරලා බැලුවා. ඒගොල්ලන්ගේ 2024 ආර්ථිකය US Dollars 20 trillion. 2030 වෙනකොට අපේක්ෂිත ආර්ථිකය US Dollars 27 trillion. ඒ වාගේම එය සියයට 5ක වර්ධනයක් එක්ක තිබෙන්නේ. ඒගොල්ලන් 14වැනි වතාවට අවුරුදු 5ක ආර්ථික සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා. එහිදී වැදගත්ම දේ වන්නේ චීනය වාගේ රටක් පෞද්ගලික අංශය මත රඳා පවතින ආර්ථිකයක් ඇති කරලා තිබෙන එක. මේක මීට පෙර කිව්වා නම් හිනාවෙන්න පටන් ගන්නවා. නමුත් අද චීනය private sector-led growth එකක් එක්ක තමයි ලෝකයත් එක්ක තරග කරගෙන යන්නේ. එක පැත්තකින් ඇමෙරිකාව පළමු ස්ථානයේ තිබෙනකොට චීනය ඒ ළඟින්ම දෙවැනි ස්ථානය බවට පරිවර්තනය වෙලා කටයුතු කරගෙන යනවා. ලෝක වෙළෙඳාමෙන් සියයට 30ක් ඒගොල්ලන් හරහා කරනවා; 30 per cent of global trading is done through China. අනෙක් එක, මා හිතන විධියට artificial intelligence තුළින් ඒගොල්ලන් ලෝකය තරණය කරන්න පුළුවන් ලොකු වැඩ පිළිවෙළක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒකෙන් ජේනවා, කොයි ආකාරයෙන්ද මේ රටවල් දෙක ඉදිරියට ගිහිල්ලා තිබෙන්නේ කියන එක. එක රටක බිලියන 1.6ක ජනගහනයක් ඉන්නවා. අනෙක් රටේ බිලියන 1.2ක ජනගහනයක් ඉන්නවා. ලෝකයේ සියයට 55ක ජනගහනයක් ඉන්න රටවල් දෙකක් ලංකාවට ආදර්ශයට ගන්න පුළුවන් වන්නේ කොහොමද?

මම හිතුවා, සංසන්දනය කරන්න අවශ්‍ය වන්නේ අද ලෝකයේ තිබෙන ආර්ථික තත්ත්වයත් එක්ක කියලා. මම

[ගරු රවී කරුණානායක මහතා]

ඉදිරිපත් කරනවා, "Visualizing the Pyramid of Global Wealth Distribution" කියන මේ ලිපිය. ඒ තුළ ඉදිරිපත් කරලා තිබෙන දේ බැලුවාම පෙනී යනවා, ලෝකයම ඉතා දුක්වන තත්ත්වයක් තමයි තිබෙන්නේ කියලා. Worldwide net private wealth stood at US Dollar 454.4 trillion in 2022. Of that, more than US Dollars 1 million තිබෙන අය මිලියන 59.4යි. එය මුළු ලෝකයේම ජනගහනයෙන් සියයට 1.1ක්. ඊට පස්සේ ඇමෙරිකානු ඩොලර් ලක්ෂයේ ඉඳන් ඇමෙරිකානු ඩොලර් මිලියනයක් දක්වා ආදායම් ලබන අය මිලියන 642ක් සිටිනවා. ඒක මුළු ලෝකයේම ජනගහනයෙන් සියයට 12යි. ඒ වාගේම, ඇමෙරිකානු ඩොලර් 10,000 ඉඳන් ඇමෙරිකානු ඩොලර් ලක්ෂය වෙනකම් ආදායම් ලබන බිලියන 1.8ක පිරිසක් සිටිනවා. ඒක ලෝකයේම ජනගහනයෙන් සියයට 34ක්. අනෙක් එක ඇමෙරිකානු ඩොලර් 10,000ට අඩු ආදායම් ලබන මුළු ජනගහනය බිලියන 2.8යි. එය සමස්ත ලෝකයේම ජනගහනයෙන් සියයට 52.5ක් නියෝජනය වනවා. ඒ අනුව කොච්චර විෂමතාවක් තිබෙනවාද මේ ආදායම් තුළ? මේ ලෝකයෙන් සියයට 1ක ජනගහනයක් සියයට 45ක ආදායමක් උපයාගෙන තිබෙන අවස්ථාවේදී, ඒ තුළ මොන වාගේ විෂමතාවක් තිබෙනවාද කියන එක මේ අවස්ථාවේදී මම මතු කරන්න කැමැතියි.

ඒ වාගේම, මා නැවත සංසන්දනය කරනවා, USA, China, India, Saudi Arabia, Russia, United Kingdom, Germany, France, Japan, South Korea යන රටවල් 10ක military expenditures in 2025. මේකේ ඇමරිකානු ඩොලර් බිලියන 1,625යි කියලා සඳහන් වෙනවා.

ඒ ඇමරිකානු ඩොලර් බිලියන 1,625 රටවල් 3ක් සඳහා. අපට ආසන්න ආසියානු රටවල් තුනක් මෙයට ඇතුළත් වෙනවා. චීනය, ඉන්දියාව, පාකිස්තානය ගත්තොත්, ඒ සමස්ත වියදමෙන් සියයට 25ක් බලපාන්නේ මේ රටවල් තුන සඳහායි. ඇයි, මේ වාගේ අනවශ්‍ය වියදමක් කරන්නේ? මේ වාගේ නාස්තිකාර වියදම්වලට යොදවන්නේ ඇයි? මේ රටේ සංවර්ධනයට, ලෝකයේ සංවර්ධනයට මේ මුදල අපට පාවිච්චි කරන්න බැරි ඇයි? ඇමරිකානු ඩොලර් බිලියන 1,625න් ලංකාවට 0.005ක ප්‍රමාණයක් ලබා ගත්තා නම්, අපේ දළ දේශීය නිෂ්පාදනයේ තිබෙන සම්පූර්ණ ණය බරතාව එක පෑන් පාරකින් නැති කරන්න පුළුවන්. මම මේ සංසන්දනය කළේ, එයින් පෙන්නුම් කරන්න හැදුවේ කොයි තරම් විෂමතාවක් මේ රටවල තිබෙනවාද කියන එකයි. දුගී දුප්පත්කමක් තිබෙනකොට, ඒක නැති කරන්න පුළුවන් සාධක අතේ තියාගෙන, ඒ වාගේම ආදායමක් අපි පාවිච්චි කරනවා, රට නන්නත්තාර කරන වැඩ පිළිවෙළක් සඳහා.

ඒ වාගේම, බංකොලොත් වුණු රටක් ප්‍රතිව්‍යුහගත කිරීමක් කරලා තිබෙනවා. ඒ තමයි ලංකාව. මා හිතන විධියට ඉතාම වැදගත් අවස්ථාවක් ලෙස තමයි අද ලෝකය අප දිහා බලන්නේ. අවුරුදු දෙකකට පෙර බංකොලොත් වෙලා, ඊට පසුව ප්‍රතිව්‍යුහගත කිරීමක් ඇති වෙලා, අද මේ රට අලුත් දිශාවකට ගමන් කරන එක ලොකු දෙයක්. මේ ලැබෙන ප්‍රතිව්‍යුහගත කිරීම හරහා නැවත 2028 වර්ෂය වන විට අපි ණය ගෙවන්න පටන් ගන්නේ කොයි ආකාරයටද කියන ප්‍රශ්නය තමයි දැන් තිබෙන්නේ. 2028 වෙනකොට අපට multilateral සහ bilateral ණය ගෙවන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස් වේ.

ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.
அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.
Accordingly, Parliament resumed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නිවේදනයක් ඉදිරිපත් කිරීමට තිබෙනවා.

මේ අවස්ථාවේ කථානායක ගැලරියේ රැඳී සිටින වියට්නාම් ජාතික සභාවේ නියෝජ්‍ය කථානායක ගරු යෙන් ඩක් හායි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් වියට්නාම් නියෝජිත පිරිස මෙම සභාව විසින් සාදරයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී.-
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பட்டது.-
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.-
[THE HON. PRESIDING MEMBER in the Chair.]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Ravi Karunanayake, you may continue.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Presiding Member, I, too, warmly welcome the Vietnam Delegation that has come to visit Parliament today. Vietnam is a country which has been a success story and which we also should emulate. I hope they could learn something from Sri Lanka as well and wish them all the best!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බංකොලොත් වුණු රටක් නැවත 2028 සිට ද්විපාර්ශ්වික ණය වශයෙන් බිලියන 3ක් ගෙවන්න තිබෙනවා. ඒ වාගේම 2028 සිට 2033 වෙනතුරු අපට Paris Club එකට, ඉන්දියාවට, චීනයට, ජපානයට, US Dollars 3 billion සහ තව බිලියන 3ක් ගෙවීම පටන් ගන්න තිබෙනවා. ඒ වාගේම 2033 ISBs සම්බන්ධයෙන් ගත්තොත්, ඒක සාර්ථකව ප්‍රතිව්‍යුහගත කරලා තිබෙන නිසා 2033 ඉඳන් multilateral bonds බිලියන 9ක් ගෙවන්න පටන් ගන්න එක තමයි ඒ අවස්ථාවේදී කරන්න තිබෙන්නේ. ඒ නිසා අපි 2028 වෙනතුරු ඉන්නේ නැතුව; 2033 වෙනතුරු ඉන්නේ නැතුව, දැන් සිටම ඒ සඳහා යම් ප්‍රමාණයක contingency fund එකක් ලැහැස්ති කරලා තියන්නේ කොහොමද? ඒ ගමන තකා අපට මුදල් වෙන් කරගන්න පුළුවන් වන්නේ කොයි ආකාරයෙන්ද කියන එක සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතුයි. ඒ සඳහා අපට ආර්ථිකය සවිශක්තිමත් කරන්නට අවශ්‍යයි. අපනයනය වැඩි කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන්නට අවශ්‍යයි. Foreign direct investments ගෙනෙන්න අවශ්‍යයි. සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීමත් අවශ්‍යයි. ඒ වාගේම ප්‍රේෂණ වැඩි කරන්නත් අවශ්‍යයි.

Hon. Presiding Member, since the Vietnam Delegation is here, I would like to say how they have moved forward from a socialist background to conquer the capitalist world today, using their labour force to position themselves as a country which supplies labour as

a cheap commodity that gives a quality service to investors. As a result, they have been able to match the two and export labour to other countries.

අපිත් වියට්නාමය කරපු දේ ඉගෙන ගත යුතුයි. ලේබල් ගහන්න අවශ්‍යතාවක් නැහැ. අපි ඒ වෙනුවෙන් ප්‍රායෝගිකව කටයුතු කරන්නේ කොහොමද කියන එක තමයි වැදගත් වන්නේ. අපේ රට බංකොලොත් වුණාට පසුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක යා යුතුමයි. එහෙම ගියාට අපි ඒගොල්ලන් කියන හැම දෙයටම නටන්න අවශ්‍යතාවක් නැහැ කියන එකත් මම මතක් කරන්න අවශ්‍යයි. හැබැයි, ප්‍රායෝගිකව අපි කටයුතු කරන්න අවශ්‍යයි.

මම මුදල් ඇමති වශයෙන් කටයුතු කළ අවස්ථාවේ 16වැනි වතාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක කථා කළා. ඒ අවස්ථාවේ මේ වාගේ නොයෙක් අභියෝග ආවා. ඒ අභියෝග තිබූ අවස්ථාවේ කකුල් දෙකෙන් හිටගෙන අපට ඒ අයට කියන්න පුළුවන් වුණා, "අපටත් ශ්‍රී ලාංකික විද්වතුන් සිටිනවා. ඒ අයට ඔය කියන අදහස්වලට වැඩිය හොඳ අදහස් දෙන්න පුළුවන්" කියලා. මම ඒක උදාහරණයක් වශයෙන් පසුව ගන්නම්. නමුත් අද කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා, ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් එක සම්බන්ධයෙන්. මේ ආයතනය වාණිජකරණය කරන්න අවශ්‍යයි. ඒක මම බොහොම අගය කරනවා. ඇමතිතුමා කොයි ආකාරයේ ප්‍රතිචාරයක් දක්වනවාද කියන එක මම දන්නේ නැහැ. නමුත් එහෙම තමයි කරන්න අවශ්‍ය වන්නේ. මම එදත් කිව්වා, මේ ආයතනය රජයේ බූදලයක් වශයෙන් තියාගෙන ඉන්නේ නැතිව කරුණාකරලා ලෝකයත් එක්ක එකතු වෙලා මේක commercialize කරන්න කියලා. මම මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කථා කරන්නම්.

ඒ වාගේම තමයි, ලංකා විදුලිබල මණ්ඩලය - CEB එක - ප්‍රතිව්‍යුහගත කරන්න අවශ්‍යයි කියලා කියනවා. ඒක වහාම කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය මොකක්ද කියන එක ඉදිරිපත් කරන්න අවශ්‍යයි.

ඊළඟ කාරණය තමයි - මම හිතන විධියට, ඒක රටටත් ලොකු ආදර්ශයක් කියලායි - the IMF warns Sri Lanka trade unions against strike over pay demand. දැන් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්නේ මොකක්ද? ඇත්තටම සාධාරණ වැටුප් වැඩි කිරීම් අවශ්‍යයි. මේ සම්බන්ධයෙන් කටයුතු කරලා සාධාරණීකරණයක් ඇති කරන්නම අවශ්‍යයි කියන එක මේ අවස්ථාවේ මම මතක් කරනවා. අපි IMF එකෙන් මේ අවස්ථාවේ ප්‍රශ්නයක් අහනවා. ඒගොල්ලන් මේ රටට ආයෝජන ගෙනෙන්න ඕනෑය කියලා කියනවා. ඒගොල්ලන් කියනවා, මේ රටට ණයබරතාවෙන් එළියට එන්න පුළුවන් වන්නේ අපනයනය වර්ධනය කිරීම තුළින් විතරයි කියලා. අපි ඒක පිළිගන්නවා. නමුත් අද වනවිට මේ රටේ ආයෝජන ඉතාම අඩු මට්ටමක තිබෙනවා. මේ මාස නවය තුළ ඇවිත් තිබෙන ආයෝජනය මොකක්ද? එහෙම ආයෝජන ඇවිත් නැත්නම්, හෙටත් මේ රටට එන ආයෝජන ප්‍රමාණය අඩු නම් ඒක ප්‍රශ්නයක් නොවෙන්නේද? එහෙම නම් අපට ආයෝජන දිරිගන්වන්න පුළුවන් වන්නේ කොහොමද? අද ඉදිරිපත් කරලා තිබෙනවා, සියයට 15ක ආදායමක් අපනයන ක්ෂේත්‍රයෙන් ලබාගන්න පුළුවන් කියලා. මා කියන්නේ කරුණාකරලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කථා කරලා අහන්න, "ඔබතුමන්ලා බිලියන 10ක ආදායමක් සොයන්න අපට හිරිහැර කරන්නේ ඇයි? අපේ වැදගත් ව්‍යවසායකයන්ට මෙවැනි ප්‍රශ්නයක් ඇති කරන්නේ ඇයි?" කියලා. ඒ බිලියන 10, 12 අපි වෙන තැනකින් සොයලා දෙන්නම් කියලා කියන්න. එතැනට substitute කරන්න පුළුවන් වෙන ආදායමක් යෝජනා කරන්න මේ අවස්ථාව උපයෝගි කරගන්න. ඊළඟට, tax exemptions are there. ඒ කියන්නේ, ආයෝජකයන් මේ රටට ගෙන්වා ගන්න අපි ඔවුන්ට සහන දෙන්න ඕනෑ. දිරිගැන්වීම් දෙන්නේ නැතිව මේ රටට ආයෝජකයන් ගෙන්වා ගන්න පුළුවන්ද කියලා මම අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජනාධිපතිතුමා, බිමල් රත්නායක ඇමතිතුමා, විජිත හේරත් ඇමතිතුමා චීනයට ගියා. සයිනොපෙක් ආයතනයට කියනවා යූඑස් ඩොලර් බිලියන 3.7ක් ලංකාවේ ආයෝජනය කරන්න කියලා. කිසිම බදු විරාමයක් නැතිව, කිසිම tax rebate එකක් දෙන්නේ නැතිව ඒගොල්ලන් මේ රටට ඇවිත් ආයෝජන කරයි කියලා හිතනවාද? එහෙම කරනවා නම් පෙන්වන්න කියන්න, ඒ රටේ කරන්න පුළුවන් දේ මේ රටට ඇවිල්ලා සියයට 36ක් බදු ගෙවලා කරන්න ඕනෑ වන්නේ ඇයි කියලා. මේ සම්බන්ධයෙන් අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කියන්න අවශ්‍යයි. ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් අපට උදව් කරනවා වාගේම අපට ප්‍රායෝගිකව අපේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙනයන්න අවස්ථාවක් දෙන්න ඕනෑ කියන එකත් ඒ අයට මතක් කරන්න අවශ්‍යයි.

ඒ වාගේම තමයි, හෙට දවසේ මේ රටේ සියයට 15ක බද්දක් පනවන්න කථා කරන මේ අවස්ථාවේ මම ඉතා බැගෑපත්ව ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. ගරු අගමැතිනියත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. ඔබතුමියගේ කැබිනට් එකට ඉදිරිපත් කරලා, මේ වෙනුවෙන් සහනයක් දෙන්න. මම කියන්නේ මේක අහිතකර ආදායමක් උපයන ක්‍රමයක් කියලායි. මේක එක පැත්තකින් සාධාරණීකරණය කරනවා, ලෝකයත් එක්ක බලනවා කියලා. ඔබතුමන්ලා ඒ අවස්ථාවේ දීම යෝජනාවක් ගෙනාවා, Colombo Port City එකේ අවුරුදු 40කට කිසිම බද්දක් ගෙවන්නේ නැතිව ව්‍යාපාර ඇති කරන්න. ඉතින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවේ සිටිමින්, තත්ත්ව දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. එතකොට, Colombo Port City එකේ කරන එක අපට ශ්‍රී ලංකාව ඇතුළේ කරන්න බැරි ඇයි?

ශ්‍රී ලංකාවේ පොළොන්නරුව, අනුරාධපුරය, හම්බන්තොට, නුවරඑළිය, යාපනය වැනි ප්‍රදේශවල ඉන්න කොල්ලෙකු, කෙල්ලෙකු උපයන ආදායමට සියයට 15ක බද්දක් ගැහුවත්, Colombo Port City එකේ ඉන්න සුද්දෙකුට අපේම සේවකයන් පාවිච්චි කරලා බදු රහිතව ලාභ ලබන්න අවස්ථාව දෙනවා. කරුණාකරලා මම ඉල්ලන්නේ ඉන්ධනවලට ශත 25ක බද්දක් එකතු කරන්න කියලායි. ශත 25ක් එකතු කරලා ඒකෙන් ලැබෙන ආදායම ඒ රුපියල් බිලියන 10ට ආදේශ කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. මොකද, සියයට 15ක බද්දක් අය කරන එක බොහොම අහිතකරයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරීන් 2016දී ඇවිල්ලා බලහත්කාරයෙන් අපට කිව්වා, මේ බද්ද දාන්න ඕනෑය කියලා. අපි බැහැ කිව්වා. 2018දී මංගල සමරවීර ඇමති වුණාට පස්සේ ඒක දැම්මා. නමුත්, මාස හයකින් ඒක නැවත අයින් කළා. මේ රටට එන්න තිබෙන ආදායම tripartite system එකෙන් මේ රටට එන්න පටන් ගත්තා. ඒක තමයි අද ඇඟලුම් කර්මාන්තයෙනුත් කරන්නේ. මේ වාගේ දිවි නසා ගන්නා ක්‍රියා කරුණාකරලා කරන්න එපා. අපට කියන්න පුළුවන්, ඒක ආණ්ඩුව ගෙනෙනවා, විපක්ෂයට ඒක ලොකු බෝනස් එකක් කියලා. නමුත්, ඒ විධියට රටක් ගෙන යන්න බැහැ. අපි ඒ විධියේ කුහක සතුටක් ලබා ගන්නේ නැහැ. අවුරුදු 76ක ශාපයක් ගැන ඔබතුමන්ලා කියනවා. දැන් 77වන අවුරුද්ද. අවුරුදු 76න් ලැබුණු හොඳ ගුණාංග පාවිච්චි කරලා අපි කොහොමද මේ රට ඉදිරියට අරගෙන යන්නේ කියන එක ගැන කල්පනා කරන්න ඕනෑ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරීන්ට කියන්න අවශ්‍යයි, මේ අය වැය තුළින් සියයට 36ක බදු පැනවීම අසාධාරණයි

[ගරු රවී කරුණානායක මහතා]

කියලා. ඔබතුමන්ලා අපෙන් අහයි, ඔබතුමන්ලාගේත් ජනාධිපති කෙනෙක් හිටියා නේද කියලා. ඔව්, හිටියා. ඒ අවස්ථාවේදී අපි කිව්වා, නමුත් ඇහුවේ නැහැ. රජයේ නිලධාරීන් ඒ සම්බන්ධව සාකච්ඡා කරනකොට දරුණු මට්ටමකට කථා කළේ නැහැ. සුළුවෙනුයි ඒ ගැන කථා කළේ. විස්තර දුන්නා, ගියා. මේ අවස්ථාවේ අපට ඊට වැඩිය සටන් කරන්න තිබුණා. සියයට 36ක් බදු පැනවූවාම මේ වාගේ දුප්පත් රටකට ගෙවන්න පුළුවන් වන්නේ කොහොමද? ඒ ආදායම නැවත ගෙවන්න පුළුවන් හැකියාවක් තිබෙනවාද? Is there affordability? There must be sustainability in paying. මේ වාගේ ඒවා සම්පූර්ණයෙන් cross-party කාරණා. ඒ සම්බන්ධයෙන් විපක්ෂයත් support කරයි. බදු ප්‍රතිශතය උපරිම සියයට 20ත්, සියයට 22ත් අතර ප්‍රමාණයක් එක්ක, PAYE Tax එක සියයට 20කට විතර අඩු කරන්න පුළුවන් නම් මම හිතන විධියට රට හරි විධියට යාවි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරීන්ට අපි කියන්න අවශ්‍යයි, "ඔබතුමන්ලා අපෙන් ඉල්ලන්නේ කීයද? අපි ඒක හොයලා දෙන්නම්. නමුත් අපට කියන්න එපා, ඒක හොයන්නේ කොහෙන්ද කින්ද මන්ද ආකාරය" යනුවෙන්. මා මේ අවස්ථාවේදී එය නැවත මතක් කරනවා.

ඒ වාගේම තමයි, We have a high corporate tax rate with a very low revenue collection. ඒක පොත් පත්වල තිබිලා මොකටද, අපට ඒක උපයන්න බැරි නම්. අපි නැවත ඒක හදාගනිමු.

මම ඉතාම ඕනෑකමින් ආණ්ඩුවෙන් මේ කාරණය අහනවා. මේ සභාවේ මේ වෙලාවේ අගමැතිනියයි, බිමල් රත්නායක ඇමතිතුමායි ඉන්නවා. ඔබතුමන්ලා ඒ ගැන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරීන් එක්ක සාකච්ඡා කළාද? ඔබතුමන්ලාට පුළුවන්, කථා කරන්න. සියයට 30ක බද්දක් දැම්මේ නැහැ. එය උපකල්පනය කරලා හිතුවා පමණයි. ඒ සියයට 30, සියයට 15ට ගෙනෙන්න පුළුවන් නම් කියන්න සියයට 15 ප්‍රමාණය සියයට බින්දුව කරන්න කියලා. Colombo Port City එකේ ආයෝජන කරන විදේශිකයින්ගෙන් අය කරන බද්ද බින්දුව කරන්න පුළුවන් නම්, ඇයි ලංකාවේ ආයෝජකයින්ට ඒක කරන්න බැරි වෙන්නේ? මම ඉතාම ඕනෑකමින් මේ රටේ තරුණ ජනතාව වෙනුවෙන් ඉල්ලන්නේ ඒකයි.

1972දී ප්‍රශ්නයක් තිබුණා. 1989දී ප්‍රශ්නයක් තිබුණා. 1983 ඉඳලා අවුරුදු 30ක් මේ රටට හෙණ ගහනවා වාගේ අනවශ්‍ය ප්‍රශ්නයක් තිබුණා. මේ රටේ තරුණ තරුණියෝ නිවැරැදි මාර්ගයේ යන්නේ නැතුව මේ වාගේ අවස්ථාවක් ඇති වුණාම මොකක්ද වෙන්නේ? අද ව්‍යාපාරයක් කරන්න ගියාම වැඳලා පුදලා ඒ අයට කියන්න අවශ්‍ය වෙනවා, ස්තුතිවන්ත වෙනවා, ඒ අය ව්‍යාපාර කරනවාට. සියයට 20ක පොලී අනුපාතයක් ගෙවලා, ඉතා අධික සේවක පිරිසකට පඩිනඩි ගෙවලා, ආසියාවේ වැඩිම විදුලි බිල ගෙවලා, ඒ වාගේම අහස උසට තිබෙන වතුර බිලත් ගෙවලා, ඊට පස්සේ අනෙක් ඔක්කෝම හිරිහැර විඳලා තමයි ඔවුන්ට ව්‍යාපාරයක් කරන්න සිදු වෙන්නේ. සමහර රජයේ නිලධාරීන් සමහර ව්‍යාපාරවලට පර්මිට් එකක් දෙන්න අවුරුදු දෙකක් ගත කරලා තිබෙනවා. ජනාධිපතිතුමාගේ කථාවේදීත් ඒක කියනවා. මම පිළිගන්නවා, ඒක වැරැද්දක් නොවෙයි. ඒ වාගේ අවස්ථාවක අපි අන්තිමට ලබපු ලාභයෙනුත් සියයට 36ක් මේ ආණ්ඩුවට ගෙවන්න ඕනෑ නම් මොකටද මේ රටේ ව්‍යාපාර කරලා. ඊට වඩා හොඳයි, ඩුබායිවලට හරි, ඉන්දියාවට හරි, මලයාසියාවට හරි ගිහිල්ලා සම්පූර්ණයෙන්ම global earnings උපයන එක.

අද මලයාසියාවේ ඉන්න කෙනෙකුගෙන් අය කරන බදු ප්‍රමාණය බින්දුවයි. ඩුබායිවල ශත පහක් ගෙවන්නේ නැහැ. ඒ වාගේ අවස්ථා තිබෙන කොට ඇයි අපේ දක්ෂයෝ මේ රටින් පිට රටට තල්ලු කරන්න හදන්නේ? අපේ දොස්තරලාටත් ඔය ප්‍රශ්නයමයි තිබෙන්නේ. මේ රටේ මිනිසුන්ට බදු මුදල් ගෙවන්න බැරි එක නොවෙයි, ජීවත් වෙන්න බැරි ප්‍රශ්නයක් තිබෙන්නේ. ඒ රටවලට ගිහිල්ලා මෙහාට ආදායම් එවන එකට වැඩිය මෙහෙන් දිරි ගන්වන වැඩක් කරන්න. හැම කෙනාටම එක හා සමානව සලකන්න බැරි වුණාට ක්ෂේත්‍රය අනුව වැඩ කටයුතු කරන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

අපි විපක්ෂයෙන් යෝජනා කරන්නේ, මේ සම්බන්ධව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අභියෝග කරන්න කියලායි. කරුණාකරලා අපටත් අවස්ථාව දෙන්න, අපගේ ජනතාව ආරක්ෂා කරන්න කියලා ඔවුන්ට කියන්න. ආදායම රුපියල් බිලියන 10ක් නැති වෙනවා නම්, මෙන්න ඒ රුපියල් බිලියන 10 කියලා ඉන්ධනවලින් හරි ඒක හොයලා දෙන්න. ඒ දෙක ආදේශ කරලා මේ ප්‍රශ්නය විසඳන්න කියලා මේ අවස්ථාවේ මම ඔබතුමන්ලාට මතක් කරනවා.

මේ අය වැය තුළින් යෝජනා වුණා, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයට රුපියල් කෝටි 2,000ක මුදලක් වෙන් කරන්න. මම මේ අවස්ථාවේ කියනවා, ඒකත් හරි අපරාධයක් කියලා. මේ රටේ රුපියල් බිලියන 650ක ණයක් තිබෙන අවස්ථාවක, සුළු හා මධ්‍ය කාලීන ණය රුපියල් බිලියන 360ක් තිබෙන අවස්ථාවක, රුපියල් බිලියන 70ක බැංකු අයිරාවක් තිබෙන අවස්ථාවක, මේ ආයතනයට රුපියල් බිලියන 20ක් දීලා මොනවාද කරන්න පුළුවන් වන්නේ? මම ඉතාම ඕනෑකමින් කියනවා, ඒ රුපියල් බිලියන 20 පාවිච්චි කරන්න කියලා, pension ගිහිල්ලා වයෝවෘද්ධව ඉන්න අයගේ ඉතුරුම්වල පොලිය සියයට 7 ඉඳලා සියයට 15 දක්වා වැඩි කරන්න. අවශ්‍යතාව තිබෙන්නේ පුළුවන් තරම් ඉක්මනට මේ ගුවන් සේවය commercialize කිරීමයි. ව්‍යවසායකයෙක් එක්ක එකතු වෙලා ඒ කටයුත්ත කරන්න. මේ තුළින් තමයි ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය ඉදිරියට ගෙනියන්න පුළුවන් වෙන්නේ.

අත්දැකීමක් තිබෙන නිසායි මම මේ දේවල් කියන්නේ. SriLankan AirLines Group එකට තිබෙනවා, SriLankan Catering, SriLankan Ground Handling සහ SriLankan Engineering. මේ, ලාභ ලබන ආයතන තුනක්. ඒ කියන්නේ subsidiaries තුනක්. SriLankan AirLines Group එක අලාභයක් ලබන්නේ පියාසර කටයුතුවලදී පමණයි. Sovereign guarantees දීලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 207කට. ඊයේ මේ ගැන තොරතුරු හොයා බලනකොට තමයි මම දැනුවත් වුණේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 207කට sovereign guarantees දීලා තිබෙනවා කියලා. ඒ වාගේම BOC එකයි, People's Bank එකයි ඇමෙරිකානු ඩොලර් මිලියන 330ක ණයක් දීලා තිබෙනවා. මේ දෙකටම sovereign guarantee එකක් තිබෙන්නේ. මේ ඔක්කෝම එකතු වුණාම ඇමෙරිකානු ඩොලර් බිලියන 165යි, ඒ කියන්නේ කෝටි 16,500යි. මේ, legacy debt එකක්. මම හිතන විධියට ඒක තමයි හරි වචනය. මොකද, මේ ගුවන් සේවය එමිරේට්ස් ආයතනය ගත් පසු ලාභ ලැබුවා. ඉන් අනතුරුව තමයි මේ අලාභය ඇති වුණේ. අපට පුළුවන් නම් ඒ ඇමෙරිකානු ඩොලර් බිලියන 165 රජයට අරගෙන, ඒකට guarantee එකක් දාලා කොම්පැනියෙන් එළියට ගන්න, එතකොට ඒගොල්ලන්ට මාසයකට ගෙවන ඇමෙරිකානු ඩොලර් මිලියන 7ක, 8ක පොලිය නැති වෙනවා.

බිමල් රත්නායක ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ සිටිනවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් ක්‍රියාශීලීව වැඩ කරන නිසා ඒ අදහස ඉදිරිපත් කරන්න. මේ ආයතනය රජය බදාගෙන හිටියාට වැඩක් නැහැ. කවුරු දැම්මත් එන අවුරුද්ද වෙනකොට මේ

ආයතනය සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වෙනවා. අපි මේ වාගේ අදහස් ඉදිරිපත් කරන්නේ මේ ආයතනය කරගෙන යන හැටි දැකලා ඔය වාගේ සුරංගනා ලෝක තුළින් ගමන් කරලා තිබෙන නිසායි. අන්තිමට ඕක crash වුණාට පසුව කියන්නේ කොරෝනා නිසා, මේක නිසා, අරක නිසා වුණා කියලායි. ඊට වැඩිය හොඳයි, හොඳ airline partner කෙනෙකුට සියයට 49ක් දෙන එක. *[බාධා කිරීමක්]* Right, okay. But, you are the Line Minister. ඔබතුමන්ලා ඔක්කෝම ඉතාම ප්‍රබල ඇමතිවරු නේ. අගමැතිතුමියත් සභාවේ ඉන්නවා නේ, එතුමියටත් මේ සම්බන්ධව කැබිනට් මණ්ඩලයට කියන්න පුළුවන්. සියයට 51ක් ඔබතුමන්ලා තියාගෙන සියයට 49ක් විකුණලා, සියයට 100ක් management එක එළියට දෙන්න. ඒක තමයි එකම උත්තරය. ඔය මොනවා කළත් ඒකෙන් තමයි මේ ආයතනය ඉදිරියට ගෙනියන්න පුළුවන් වන්නේ. මම යෝජනා කරනවා, මේ legacy debt එක, ඒ කියන්නේ ඒ බිලියන 165 ආණ්ඩුවට ගන්න කියලා. ආණ්ඩුවට අරගෙන ඉදිරියට යන්න. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයේ carry-forward debt එක ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4යි - රුපියල් බිලියන 600යි.

මම හිතන විධියට, මේ අවස්ථාව වෙනකොට හරියට plan කළොත් aircraft 35ක් විතර මේ ආයතනයට අවශ්‍ය වනවා. දැන් තිබෙන්නේ 22යි. ඒ 22නුත් engines දෙක තුනක් හද හදා යන්නේ. හැබැයි, ඒ පරණ ඒවා. Qatar Airways එක්ක, Emirates එක්ක, Singapore Airlines එක්ක, Malaysia Airlines එක්ක අපට තරග කරන්න අවශ්‍ය නම් අවම වශයෙන් aircraft 35ක්වත් තිබෙන්න ඕනෑ. එංගලන්තයට දවසකට ගමන් වාර 2ක් යන්න පුළුවන් හැකියාව අපට තිබෙනවා. ජපානය, ඕස්ට්‍රේලියාව වාගේ රටවලට තමයි අපි යන්න අවශ්‍ය වෙන්නේ. ඉන්දියාවට සුමානයකට ගමන් වාර 200ක් විතර යනවා. ඒවා තමයි අපේ cash cows. ඒවා පාවිච්චි කරලා ඉදිරියේදී ලාභ උපයන්න පුළුවන් airline එකක් බවට මෙය පරිවර්තනය කරන්න.

ජනාධිපතිතුමා මේ ආයතනය සම්බන්ධව public-private partnershipsවලට යනවාය කියා ප්‍රකාශයක් කළ බව "ඩේලිමිරර්" පුවත් පතේ සඳහන් වෙනවා. ගරු ඇමතිතුමනි, මේක ඔබතුමාගේ විෂය පද්ධතිය වුණත් ජනාධිපතිතුමා ප්‍රකාශ කරන විධියට public-private partnershipsවලට යනවා නම්, ඒක තමයි හරි දේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු 17ක අමතර කාලයක් ලැබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාගේ සම්පූර්ණ කාලයත් මට ලබා දීලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ අනුව ඔබතුමාට තව මිනිත්තු 17ක අමතර කාලයක් ලැබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආණ්ඩුවට අපි ඒ වාගේ අදහස් යොමු කළාම අපට බැණ බැණ වුණත් ඒවා පාවිච්චි කරලා අප කියන මාර්ගයේ යන්න පුළුවන්. *[බාධා කිරීමක්]* අපි කියන ක්‍රමය පාවිච්චි කරලා, අපට බැණලා ඒ පාරේම යන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් අවුරුදු 76ක ශාපය ගැන කිව්වාට අපි ඔක්කෝම එකයි. ඔය පැත්තේ ඉන්න අයගේ සහෝදරත්වය වාගේම මේ පැත්තේත්,- *[බාධා කිරීමක්]* මොකක්ද ප්‍රශ්නය? අගමැතිනියගේ time එකෙන් මිනිත්තු දෙක තුන ගන්න, මට ප්‍රශ්නයක් නැහැ. කථානායක ගැලරියේ හිටපු වියවිනාම නියෝජිත පිරිස දැන් භය වෙලා ගිහිල්ලා වෙන්න ඇති.

ඉදිරියේදී අපි මේ රට කොහොමද ඉස්සරහට අරගෙන යන්නේ? අපි මේ රට හරි මාර්ගයට අරගෙන යෑම අවශ්‍යයි. දැන් මේ රටේ registered companies 222,000ක් තිබෙනවා. අපේ ශ්‍රම බලකාය - workforce එක - තුළ ලක්ෂ 80ක් සිටිනවා. එයින් අද වෙනකොට තිබෙන්නේ ක්‍රියාශීලී EPF numbers ලක්ෂ 26යි. එතැන non-active membersලා ලක්ෂ 181ක් ඉන්නවා. මේ සම්බන්ධයෙන් අපට ඉතාම පුදුමසහගත තත්ත්වයක් ඇති වුණා. දැනට තිබෙන EPF files ප්‍රමාණයෙන් සියයට 4යි අද බදු ගෙවන්නේ. ඒ කියන්නේ, tax filesවලින් 350,000ක් Advance Personal Income Tax එක ගෙවනවා. 150,000ක් Advance Self Declaration එක ගෙවනවා. ඉතින්, මේක පුදුමසහගත රටක් නොවේද? මේ අවස්ථාවේදී අපි මේ මඟින් දිරිගන්වන්න ඕනෑ වෙන්නේ කාවද? ඒකයි මම කියන්නේ, අපි කීයක් ගෙවන්න ඕනෑද කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සුද්දෝ ඇවිල්ලා අපට කියන්න ඕනෑ නැහැ කියලා. සියයට දහහතහමාරක් ගෙවන්න කිව්වා නම් හැම එක්කෙනාම ගෙවනවා. සියයට 36ක්, 40ක් ගෙවන්න කිව්වාම,-

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Say that in English.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will say that in English as well. Hon. Prime Minister, I am talking about the practicability of the situation. Tell the IMF that a 36 per cent tax is ill-affordable. It is not permissible in a country like this to tax people beyond their expectations. So, ensure that we pay nothing more than 20 per cent. Why do they not tell the same thing to OECD - we are not a signatory to that - countries? So, on that basis, ensure that we pay no more than 20 per cent. The PAYE Tax also should be subjected to a maximum of 20 per cent. Your loss of revenue may be around Rs. 100 billion, but that Rs. 100 billion could be caught up through much more motivational aspects. Now, since I communicated that in English, I hope it would be communicated in the same manner, that the IMF would get this message. If the Government cannot do it, we, as the Opposition, would help you to force them. After all, it is the Sri Lankans who have got to live in this country, not the IMF. There are only one or two countries which have come up as success stories through IMF programmes. Korea is one of them and the other countries are still trying to. Sri Lanka is a close second because we had the Hon. Ranil Wickremesinghe rendering a gigantic service to bring back Sri Lanka from a debt-ridden country to what it is today, but he had to pay the price. The operation was successful, but the

[ගරු රවී කරුණානායක මහතා]

patient died and today, you all are in Government. That is the issue. So, what I am basically saying is, if you do not do the same thing, the same operation will have to be rerun for the second time.

අපට පෙනෙනවා, ලක්ෂ 80ක් වන EPF filesවලින් බදු ගෙවන files තිබෙන්නේ සියයට 4ක් පමණයි කියන එක. එහෙම නම් මේක පුදුමාකාර රටක් නොවෙයිද? ඒ වාගේම State-owned enterprises 527ක් තිබෙනවා. ඒවායින් ලාභ ලබන කොම්පැනි 85ක් තිබෙනවා. මේ ඔක්කෝම අරගෙන බැලුවාම, ඉතුරු කොම්පැනි 400 ගණන රුපියල් බිලියන 80ක අලාභයක් සහිතව පවත්වාගෙන යනවා. අපි කොහොමද ඒවා ලාභ ලබන තත්ත්වයට පරිවර්තනය කරන්නේ? එම නිසා පුළුවන් තරම් මේ රටට ආයෝජන ගෙන්වා ගන්න මේක තමයි හොඳම අවස්ථාව.

අද එළියට බැස්සාම බෝර්ඩ් අල්ලාගෙන ස්ට්‍රයික් කරන කට්ටිය දකින්න නැහැ නේ. දැන් ඒ කිසි දෙයක් නැතුව මේ රට ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න හදනවා. බලන්න, දැන් විපක්ෂයෙන් කොච්චර සහයෝගයක් ලැබෙනවාද කියලා. අපි ඔබතුමන්ලා වාගේ බෝර්ඩ් ලෑලි අල්ලාගෙන ඉන්නේ නැහැ නේ. අපට ඒවාට වෙලාව නැහැ. අපට අවශ්‍ය වෙන්නේ රටක් හදන්න පුළුවන් මාර්ගයක්. ඉතින්, දැන් බෝර්ඩ් ලෑලි අල්ලන ප්‍රශ්නය නැති අවස්ථාවේදී මේ රටට ආයෝජන ඇවිල්ලා තිබෙනවාද? මේ වසරේ ඉදිරියට තව මාස කිහිපයක් තිබෙනවා. අපේ රටට ආයෝජන එන්න අවශ්‍යයි. අපි මෙතැනදී කියනවා, කරුණාකරලා ආයෝජන ගේන්න කියලා. වමට සිග්නල් දාලා දකුණට හැරෙන්න එපා කියලා අපි කියනවා. මෙවැනි තත්ත්වයක් තුළ මේ රටේ ආයෝජනය කරන්න සුද්දන්ට මීට වැඩිය අවස්ථාවක් තිබෙනවාද?

ඒ නිසා මම ඉතාම ඕනෑකමින් කියනවා, මේ අවස්ථාවේ පුළුවන් තරම් ආයෝජන ගෙන්වා ගන්න කටයුතු කරන්න කියලා. මේ රටේ අපට එවැනි අවස්ථා ගණනාවක් අහිමි වුණා. 1956දී "Sinhala Only" කියන සංකල්පය නිසා අපට මේ රට ඉදිරියට ගෙන යන්න තිබුණු අවස්ථාව නැති වුණා. ඉන්දියාවත් ඒකම කළා. ඉන්දියාව මව් භාෂා ලෙස භාෂා තුන හතරක් පාවිච්චි කරන්න පටන් ගත්තා. මේ රටේ මව් භාෂා හැටියට සිංහල, දෙමළ, ඉංග්‍රීසි තිබුණා නම් රට කොච්චර ඉදිරියට යයිද? 1983දී ජාතිවාදීන් නිසා රට නැති වුණා.

ඊට පස්සේ අපේ රටේ තරුණ අසහනය නිසා ප්‍රශ්න ඇති වුණා. ඒ වාගේම සුනාමි ප්‍රශ්නය ඇති වුණා. පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය නිසා ප්‍රශ්න ඇති වුණා. මේ ඔක්කොම සිදු වුණේ අපේ රටේ. රටක් සංවර්ධනය වීගෙන යන අවස්ථාවේදී අප රට නැත්තටම නැති වෙන අවස්ථා ගණනාවක් ඇති වුණා. ඒ නිසා නැවත එවැනි අවස්ථා ඇති නොවෙන විධියට කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරනකොට NCMC එක ගැන කියන්න ඕනෑ. දොස්තරවරු කොපමණ ප්‍රමාණයකට මේ තුළින් එළියට එන්න පුළුවන් වුණාද? NCMC එක තිබුණා නම් අද අපට දොස්තරවරු නිර්මාණය කරලා ලෝකයට යවන්න හැකියාව ලැබෙනවා. හැබැයි, අද වනකොට නේපාලය, බෙලාරුස්, චීනය වාගේ රටවලින් දොස්තරවරු ඇවිල්ලා අපේ රටෙත් නියෝජනය වෙනවා ඇති. නමුත් මෙහේ ඒ NCMC එක තිබුණා නම් අපට කොතරම් සාර්ථක තත්ත්වයක් ඇති වෙනවාද කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. මම මේවා ඔබතුමන්ලාට කියන්නේ මේ නිසායි. අවුරුදු 76ක කාලයෙන් ලබා ගන්න පුළුවන් හොඳ ගුණාංග ටික පාවිච්චි කරලා, ඔබතුමන්ලා ඒකට තමන්ගේ උප්පැන්න සහතිකය දීලා වැඩේ එළියට දාන්න කියන එක තමයි මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

මේ අවස්ථාවේ අපේ ආදායම් උපයන මාර්ග දෙස බැලුවොත්, ඒකේත් විෂමතා ගණනාවක් තිබෙන බව මට පෙනෙනවා. සුරාබදු සම්බන්ධයෙන් මගේ අදහස වන්නේ මේ ආණ්ඩුව කසිප්පු මුදලාලිලාට, සිගරට්, බීඩි නිෂ්පාදනකරුවන්ට උදවු කරනවා කියන එකයි. මම අරක්කු බොන්නේත් නැති, සිගරට් බොන්නේත් නැති කෙනෙක් නිසා මට ඒ ගැන ගාණක් නැහැ. මේවා තහනම් කළත් මට ප්‍රශ්නයක් නැහැ. සියයට සියයක් මේවායේ මිල වැඩි කළත් මට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒවාට ආදේශ කරන්න පුළුවන් මට්ටමක් තිබෙනවා. මේ මිල සියයට සියයක් වැඩි කරන්න පුළුවන්. ඒ තුළින් ආදායම සියයට සියයක් වැඩි වෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ මිල සියයට සියයක් වැඩි වුණොත් අන්තිමට වෙන්නේ සිගරට් බොන කෙනා ගිහිල්ලා බීඩි කොටයක් බොන එකයි. නැත්නම් අද අරක්කු බොන කෙනා ගිහිල්ලා කසිප්පු ටිකක් බොනවා. ඒකයි මම බලන්නේ, මේ ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවාද කියලා. මොකද, රජයේ නිලධාරීන් මේ සම්බන්ධයෙන් හරියට කියන්න අවශ්‍යයි. මෙතැන ඇවිල්ලා සියයට 10ත් බද්ද වැඩි කරලා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඕනෑ නිසා indexations ගෙනැල්ලා, ඒ වාගේ කටයුතු කිරීම තුළින් මේ රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ නිසා මම ඉතාම ඕනෑකමින් කියනවා, ආණ්ඩුවක් වශයෙන් මේ දෙස ප්‍රායෝගිකව බලන්න කියලා. මම කිව්වා වාගේ හැම වෙලාවේම යුද්ධය කරන්න බැහැ, සොල්දාදුවන්ටම. Generalsලා දැන් මේක අතට අරගෙන ඒ කටයුතු කරන්න අවශ්‍යයි. දැන් මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව එක කොම්පැනියකින් බිලියන 70ක් ලබා ගන්න එක බොහොම හොඳයි. ඊටත් වඩා ගන්න පුළුවන් නම් හොඳයි. නමුත් ඒ වාගේ හොරට මේ රටට එනවා නම් ඒ ප්‍රශ්නය ආදේශ කරන්න පුළුවන් උත්තරයක් සපයන්නම අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

දැන් සාමාන්‍යයෙන් ඇස්තමේන්තු කරලා තිබෙනවා, බිලියන 9ක සිගරට් හෝ ඒ වෙනුවෙන් ආදේශ කරන ප්‍රමාණයක් මාර්කට් එකේ තිබෙනවා කියලා. ඒ ප්‍රමාණයෙන් අද සිගරට් විකුණා තිබෙන්නේ බිලියන 1.9යි. ඒ කියන්නේ සියයට 75ක් විතර ව්‍යාජ දේවල්. බීඩිවලින් එන ආදායම කීයද කියලා ඇහුවොත් ඒගොල්ලන් කියනවා, රුපියල් මිලියන 10ක්, 15ක්, 20ක් විතරයි තිබෙන්නේ කියලා. ඒක නිසා තමයි මම අහන්නේ මේ මිල වැඩි කිරීම තුළ අපි උදවු කරන්නේ ඒ නිල නොවන මට්ටමට බීඩි නිෂ්පාදනය කරන අයටද කියලා. මොකද, ඒවා නිෂ්පාදනය කරන අයම ඉල්ලා තිබෙනවා, මේක නියාමනය කරන්න කියලා. ඒ නිසා ඒගොල්ලන් කියනවා, අවශ්‍යතාවක් තිබෙනවා, හැබැයි නියාමනය කරන්නේ නැහැ කියලා. 2025 මාර්තු 09වැනි දා "Sunday Observer" පුවත් පතේ ශීර්ෂ පාඨයක මේ විධියට සඳහන් වෙනවා: "Illicit liquor causes Rs. 80-100b revenue loss annually". දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 7ක විතර ආදායමක් හොයන්න පුළුවන් මාර්ගයක් අපි පෙන්වා දෙනකොට, ඇයි මේ සම්බන්ධයෙන් නිල නොවන මට්ටමට ගිහිල්ලා ප්‍රශ්නයක් ඇති කරන්නේ?

ඒ වාගේම අපි විදේශ විනිමය සොයා ගන්නම අවශ්‍යයි. මේක තමයි රටට අත්‍යවශ්‍යම දේ. මේ විදේශ විනිමය සොයන ආකාරය ගනිමු. 2024දී "Economy Next" සහරාවෙන් ආදායම හැටියට පෙන්වා තිබෙනවා, 2024 වර්ෂයට merchandise exports ඇමෙරිකානු ඩොලර් බිලියන 12.7ක් තිබුණා කියලා. 2024 වර්ෂයට ඇමෙරිකානු ඩොලර් බිලියන 26ක් තිබුණා, cash flows

ඔක්කොමත් එක්ක. පුරෝකථනය කර තිබෙනවා, 2025 වර්ෂයට merchandise exports ඇමෙරිකානු ඩොලර් බිලියන 14ක් කියලා. Service inflows, ඒ කියන්නේ tourismවලට ඇමෙරිකානු ඩොලර් බිලියන 8යි, ඒ වාගේම computer, IT ඇතුළු ඔක්කොමත් එක්ක ඇමෙරිකානු ඩොලර් බිලියන 8යි. Worker remittances, ඒ කියන්නේ ප්‍රේෂණ වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 8ක් 2025 වර්ෂයේ මේ රටට එන්න. ඒ කියන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 30යි. දැන් මේ ඇමෙරිකානු ඩොලර් බිලියන 30 ඇතුළේ අද ඔබතුමන්ලා ගේන්න යන සියයට 15 බද්දත් තිබෙනවා. අන්තිමට වෙන්නේ මේකයි. පසුගිය අවුරුද්දේ ප්‍රායෝගිකව ඇවිල්ලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 848ක්.

මේ බද්ද දැම්මාට පසුව මේක අඩු වේවි, US Dollars 100 millionවලට. එතකොට ඔබතුමන්ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සුද්දෙක් කිව්වාම, just because a white-skinned person comes and tells you to impose this 15 per cent tax, are you going to lose US Dollars 848 million or be proactive and find US Dollars 10 billion and tell them, “Here is the opportunity of substituting the two and protecting our Sri Lankan entrepreneurs", ensuring that the country is put on a firm footing or in the right direction?

ඒ වාගේම මම මේ අවස්ථාව උපයෝගි කර ගන්නවා, මේ කාරණයත් සඳහන් කරන්න. මම මේ ගැන විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථා විවාදයේදීත් ඉදිරිපත් කළා. අද වනකොට අපේ රටට සංචාරකයන් ලක්ෂ 25ක් විතර එනවා. එවැනි තත්ත්වයක් තුළ දකුණු ප්‍රදේශයේ හුහක් ස්ථාන ලියාපදිංචි වෙලා නැහැ. ජනාධිපතිතුමා ගරු සභාවට ඇවිල්ලා අය වැය ඉදිරිපත් කරනකොට කිව්වා, point of sale machinesවලින් මේ රටේ ආර්ථිකය හරියාකාරව ගොඩ නහන්න මුදල් වෙන් කර තිබෙනවා කියලා. ඒක හරි. අපිත් ඒක 2015 දී, 2016 දී කළා. නමුත්, රජයේ නිලධාරින්ට ඒක ඉදිරියට ගෙනියන්න හැකියාවක් නැති වුණා. ඒ නිසා කරුණාකරලා මේ මාර්ගයෙන් ආයෝජන කරන්න. Point of sale machines මේ රටට ගෙනෙන්න. ගෙනැල්ලා ක්‍රියාත්මක කරන්න. අද දකුණට ගියාම credit card එකක් දුන්නොත් බිල ගෙවනවා. අන්තිමට ඒ සල්ලි ඊශ්‍රායලයට හරි රුසියාවට හරි යනවා. ඒ විධියට ගිහිල්ලා සල්ලි එළියට යනවා. එතකොට VAT ගෙවන්නෙත් නැහැ; ඒ වාගේම PAL ගෙවන්නෙත් නැහැ. මෙලෝ දෙයක් ගෙවන්නේ නැතිව අපේ සම්පත් මේ රටින් එළියට යනවා. එහෙම නම් දැන දැන මොකක්ද මේ කරන්න හදන්නේ? මේක අනිවාර්යයෙන්ම ලියාපදිංචි කරන්න. ඒ කිව්වා වාගේම මේ රටේ restaurants දාලා bring your own booze - BYOB - කියන්නේ නැතිව ඕනෑ කෙනෙකුට licence එකක් දෙන්න. සුද්දෙක් එනවා නම් එයාට නීත්‍යානුකූලව දෙන්න පුළුවන් නම්, ඕකට licence එකක් දෙන්න මොකටද ලජ්ජා වෙන්නේ? ලක්ෂයක් වියදම් කරලා ඒ licence එක අරගෙන ඒක ක්‍රියාත්මක කරන්න දෙන්න. ඊට පස්සේ මේ අය මේ වාගේ POS machinesවලට වෙනත් රටක credit cardsවලින් එවනවා. මම නම් කැමැතියි, මේ රටට ඕනෑම කෙනෙකුට - ඊශ්‍රායලය වෙන්න පුළුවන්, රුසියාව වෙන්න පුළුවන්- එන්න දෙන්න. ඒකෙන් මේ රටට ඩොලරයක් හොයා ගන්න පුළුවන් නම් ඒක තමයි අවශ්‍ය වෙන්නේ. මේක ඊට පස්සේ නියාමනය කරන්න පුළුවන්, අපි මේක පොහොසත් රටක් කළාට පසුව. එහෙම වෙන්න ඉස්සෙල්ලා අපි “clean suit, empty pocket”වලින් ප්‍රතිපත්ති ඇති කරනවා. අන්තිමට රට යන්නේ එක පැත්තකට, ගෙනියන්න තිබෙන්නේ තව මාර්ගයකට කියන එක තමයි කියන්න වෙන්නේ. මේක දැන් වෙනවා. මේකෙන් අපට අඩුම වශයෙන් බිලියන 50ක, 60ක විතර අලාභයක් වෙනවා. ඒ නිසා ඒ ක්‍රමය ඇති කරන්න.

Today, there is some flirtation going on between two of the biggest world leaders, Donald Trump from the United States and Vladimir Putin from Russia. So, when the world talks of sanctions on Russia, we, Sri Lankans, get scared and say, “We cannot use Rubles” even though it is not a prohibited currency. Why do you not ensure that we get Russians to come and spend in Rubles here? Ensure that we collect that, buy the fertilizer, oil and coal that we require. Then, you are basically utilizing what they bring. They are unable to spend their currency. They like to come and spend it here. But, they do not have the capacity to do that and they have to buy dollars from the black market. So, ensure that you adopt it as a policy to allow Russians to bring Rubles into the country and have it as foreign exchange. It is not a prohibited currency. You only have to ask the Central Bank to get up from its sleep because their job is to ensure that we take the path with least resistance. So, why create a problem when there is no problem? It is the country that is facing a problem with the innocent younger generation waiting to see how they could get integrated into the economy. So, these are opportunities that you get. Therefore, ensure that you dictate to them that this is our necessity and ensure that you get it done.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විනාඩි 17නුත් තව වෙලාව තිබෙනවා නේද? මම පුළුවන් තරම් ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

අද ආදායම වැඩි වන මාර්ග ගැන කථා කරනකොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. විදේශිකයන් මේ රටට ඇවිල්ලා ඉඩම් ගන්නේ නැහැ. ඒගොල්ලන් lease එකට ඉඩම් ගන්නවා. Lease එකට ගත්තාට පසුව වෙන්නේ මේකයි. ඒගොල්ලන් අවුරුදු 99කට ගත්ත lease එකේ ගෙවන්නේ අවුරුදු 20කටයි. ඒකෙනුත් ඒගොල්ලන් හිතුමතයට ගෙවන්නේ. එතකොට ඉඩම් ටිකත් යනවා. අපට මෙහේ licence එකත් නැති වෙනවා. අන්තිමට වෙන්නේ ආදායමක් නැති වන එක. ඒ නිසා වහාම මේක නිවැරදි කරන්න. මේවා කියනවා විතරයි. ඒවා වෙන්නේ නැති වුණාම අන්තිමට අපට ආදායමක් නැති වනවා.

ඒ වාගේම මේ රටේ විගණකාධිපති ඉදිරිපත් කළ වාර්තාවල තිබෙනවා, රජයේ වාහන 5,000ක් අතුරුදහන් කියලා. දැන් මේක කියලා අවුරුද්දක් විතර වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් assets register එකක් නැත්තේ ඇයි? මේවා ඉස්සෙල්ලා තිබුණා. ඇයි, මේක ක්‍රියාත්මක කරන්නේ නැත්තේ? මේවා තමයි අය වැයකින් ඉදිරිපත් කරන්න අවශ්‍ය. මා හිතන විධියට, මේ අවස්ථාවේදී අවශ්‍යම දෙයක් තිබෙනවා.

Sir, businesses are profit-driven; economies are policy -driven. If business confidence is lost, then that would be the biggest problem we would have. So, ensure that we create business confidence. Today, investments do not get tax relief. It is a lagging area. So, why would anyone come and invest here when there is no reciprocal benefit

[ගරු රවී කරුණානායක මහතා]

for them? Today, our business ventures, whether it is MAS or Brandix, have gone and invested in India simply because, there, they are getting everything for nothing while Sri Lanka is charging 36 per cent on their global earnings. Remember, when it comes to tax on global earnings, it is zero in Singapore; it is also zero in Bahrain and Dubai. So, ensure that we emulate them to some degree and also that we get back to the correct track.

Then, US President Donald Trump is pursuing deglobalization. We have got market access to the US. So, ensure that we protect that without any commitments, that we discuss with them and open up our market.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

I guess it is time for uniting as global citizens to confront cross border challenges. I saw Foreign Minister Hon. Vijitha Herath saying something very similar in the same language. Ensure that it is put in place and that we engage with them.

රජය කියනවා, that it targets six key sectors to attract foreign direct investments: hospitality, logistics, renewable energy, technology, agriculture, apparel and textiles. මේවා thrust industries කියලා, ඒවාට බදු ගහනවා. මේ කියන හය, අවුරුදු 15ක් තිබුණු ආයතන. මේවාම ආයෙත් relabel කරලා එළියට දමන්න ද හදන්නේ? මම හිතන විධියට BOI එකේ බොහොම හොඳ සභාපතිවරයෙක් ඉන්නවා. එතුමා සහ මම එකම පන්තියේ හිටපු අය. එතුමා හොඳයි. නමුත්, එතුමාට මේකෙදි දෙන්න තිබෙන්නේ එතැන ඉඳන් කටයුතු කරන්න පුළුවන් දේවල්. ඔහුට මොකුත් විකුණන්න බැරි වුණාම, රජය මොනවත් අවස්ථාව දෙන්නේ නැති වුණාම මොනවත් විකුණන්න දෙයක් නැහැ. මෙතැනදී tax incentives දෙන්න; interest rates දෙන්න. Port City එකේ තිබෙන benefit එක හොයලා බලන්න. හැම එකම දෙන්න බැහැ. සමහර ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා අපට තිබෙන්නේ ඒක හරියාකාරව ඒ මට්ටමට ගේන්න.

කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා මම කෙටියෙන් මේ කාරණයත් කියන්නම්. මේ රට digitizationවලට ගේන්න අවශ්‍යයි. අපි පුළුවන් තරම් මේකෙදි faceless operation එකක් ඇති කරන්න අවශ්‍යයි, Inland Revenue Department, Sri Lanka Customsවලට. මා හිතන විධියට customs clearanceවලදී වැරදියට වටහාගෙන තිබෙනවා, පැය 24ක් කියන එක පිළිබඳව. මම කියන්නේ, අද රාත්‍රී 12.00ට ගිහිල්ලා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම විපක්ෂ නායකතුමාගෙන් ඒ කාලය ඉල්ලා දෙන්නම්, ප්‍රශ්නයක් ඇති නොවන ආකාරයට කටයුතු කරන්නම්.

ගරු ඇමතිතුමනි, මේකෙදි පැය 24ක් කියන්නේ මේකයි. රාත්‍රී 10.00ට customs entry එකක් ගෙනැත් දුන්නොත්, Sri Lanka Customs පැය 24 වැඩ කරන එක නොවෙයි, ඔබතුමාට අද රාත්‍රී 10.00ට එන එක, හෙට උදේ 5.00 වෙනකොට clear කරන්න පුළුවන් නම්, අන්න ඒක තමයි මම කියන්නේ පැය 24ක system එක කියලා. අද Port Klang සහ Port of Fujairah වාගේම Singaporeවලත් මේවා තිබෙනවා. මේකෙදි customs පැය 24ක් වැඩ කරනවා කියනවා. ඒක නොවෙයි, පැය 24 කියන්නේ. ඕනෑම වෙලාවක ගෙන එන pre-shipments, post audit මේවා තමයි කරන්න අවශ්‍ය වන්නේ.

ඒ වාගේම අපට පෙනුණා, ඉන්දියාවේ මෝදි අගමැතිතුමා ආවාට පසුව අනවශ්‍ය නීති-රීති සහ forms 1,700ක් අවුරුදු 8කින් නැති කළ බව. ලංකාවේත් මේ වාගේ තිබෙනවා. මම දන්නා විධියට තැන් එකකින්, දෙකකින් පුරවන්න තිබෙන දේ, පිටු 6කින්, 7කින් පුරවන්න තිබෙනවා. මේවා නැති කරන්න. මේවා නැති කිරීම තුළින් තමයි අපිට ගතානුගතික ආර්ථික ක්‍රමයකට යන්නේ නැතිව අලුත් ආකාරයකට යන්න හැකි වන්නේ. Cashless ආර්ථිකයක් හදන්න. මේවා තුළින් තමයි අපට ඉදිරියට යන්න පුළුවන් වන්නේ. එතකොට smart bureaucrats ඇති කරන එක සහ මේ රටේ bureaucratic terrorism eradicate කරන එක, ඒ කියන්නේ, රාජ්‍ය නිලධාරි ත්‍රස්තවාදය නැති කරන එකත් අත්‍යවශ්‍යයි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට. ඒ වාගේම පරාටේ නීතිය. ඔබේ Chambersවලින්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. ඔබතුමා වැඩියෙනුත් විනාඩි 3ක කාලයක් අරගෙන තිබෙනවා. දැන් කථාව අවසන් කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්. මම මුදල් ඇමතිවරයා විධියට ඉන්නකොට පිට රට වැඩ කරන අයට අවම වශයෙන් මාසයකට ඩොලර් මිලියන 350ක වැටුපක් තිබුණා. ඒක අද ඩොලර් 200ට අඩු වෙලා තිබෙනවා. මොකද, කොරෝනාවලට පසුව. කරුණාකරලා ඔබතුමා නැවත ඒ අවස්ථාව ගන්න. මේක නැවත ඩොලර් 350 දක්වා වැඩි කරලා අපට අඩු ගාණේ ඩොලර් බිලියන 1.2ක් අලුතින් ගන්න පුළුවන් දේවල් ඇති කරන්න. Tea auction එක ඩොලර්වලින් ඇති කරන්න. එම නිසා මම ඉතාම ඕනෑකමින් කියන්නේ අපි මේ හැම දෙයක්ම අලුත් ආකාරයට ඉදිරිපත් කරමු කියලායි. අපි අලුත් රටක් හදමු. මේක ඔබතුමන්ලා තනියම හදනවාට වැඩිය, අපේ විපක්ෂය පැත්තෙන් දක්ෂයෝ ඉන්නවා. අපට අවශ්‍ය වන්නේ මේ රට නිවැරදි මාර්ගයේ ගමන් කරන එකයි. අපට ආණ්ඩුව නොවෙයි ඕනෑ වන්නේ. රට නිවැරදි මඟ යන්නයි අපට ඕනෑ වන්නේ. මොකද, අපි දන්නවා අවුරුදු 76ක් හරි මාර්ගයේ ගිහිල්ලා derail වෙලා තිබෙන බව.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.01]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාසයක් වාගේ කාලයක් තුළ ජාතික ජන බලවේගයේ මංගල අය වැය විවාදයට ගනිමින් එහි අවසාන දින එකහමාරට තමයි අපි දැන් මේ ඇවිල්ලා ඉන්නේ. ඒ අවස්ථාවේ මටත් කථා කරන්න ලැබීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මේ කාලය පුරාවට, මේ මාසය තුළම අපි පාර්ලිමේන්තුව තුළත්, එළියේදීත් මේ අය වැය පිළිබඳ විවාදයක යෙදුණා; සංවාදවල යෙදුණා; විවිධ සාකච්ඡාවලට සම්බන්ධ වුණා. මේ කාලය තුළ අපි වෘත්තීය සමිති සංගම් වාගේම විවිධ සමිති, ආයතන, විවිධ පුද්ගලයන් මුණ ගැහිලා මේ අය වැය පිළිබඳව සාකච්ඡාවල යෙදුණා. මම මේ වෙලාවේ කියන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සාකච්ඡා, සංවාද අපට ඉතාම ප්‍රයෝජනවත් වුණු බව.

ඒ වෘත්තීය සමිති නායකයන්ගෙන් වාගේම සමාජයේ විවිධ කණ්ඩායම්වලින් අපට ලැබුණු යෝජනා, ඉදිරිපත් කළ විවේචන තුළින් අපේ අය වැය තවත් ශක්තිමත් කරන්නත්, අපේ යෝජනා, අපේ සංවාද, අප ගත්තු ස්ථාවර තවත් පුළුල් කරන්නත්, තවත් තීව්‍ර කරන්නත් අපට හැකියාව ලැබුණා. ඒ සියලුදෙනාටත් මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කථාවලට සවන් දෙමින් මම බැලුවා මුල් දවස්වලදී විපක්ෂයෙන් කළ කථාත්, මේ මාසයක් ගත වෙලා අවසාන දවස්වලදී කළ කථාත් අතර මොකක් හරි වෙනසක් තිබෙනවාද කියලා. මොකද, අප මාසයක් තිස්සේ සංවාදයක් ගෙන යන කොට ඒ සංවාදය හරහා යම්කිසි විධියක වෙනසක්, වර්ධනයක් අපි බලාපොරොත්තු වෙනවා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් සියලුදෙනාගේ නොවුණත් සමහර මන්ත්‍රීවරුන්ගේ කථාවලින් මට දැනුණේ, විපක්ෂයේ කථා තවම එතැනම තිබෙන බවකුයි. අප විපක්ෂයෙන් බලාපොරොත්තු වන විධියට ඒ සංවාදය හරහා එහි අන්තර්ගතය වෙනස් වෙන්නේ කොහොමද, ඒ සංවාද ගොඩ නැඟුණේ කොහොමද කියන එක විපක්ෂයේ සමහර කථාවලට ඇහුම්කන් දෙන කොට මට මතු වුණු ප්‍රශ්නයක්. එකම දේ මතුරන ස්වභාවයක් තිබෙන බව හැඟුණු අවස්ථා නැතුවා නොවෙයි. ඒ වාගේම, මේ විවාදය තුළ අපට එල්ල වෙච්ච සමහර චෝදනා ආවේ ego එකට hurt වෙච්ච තැන්වලින් ද කියලාත් සමහර වෙලාවට මට හිතුණා. ඒවා නම් අපට මේ විවාදය තුළින් හෝ මේ අය වැය තුළින් විසඳන්න බැරි ප්‍රශ්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයට ඇහුම්කන් දෙන කොට, පාර්ලිමේන්තුව තුළතදීත් ඉන් පිටතදීත් මේ අය වැය පිළිබඳව ඇති වේච්ච සංවාදයට ඇහුම්කන් දෙන කොට, ඒක නිරීක්ෂණය කරන කොට මට එක දෙයක් තේරුම් ගියා. ඒ තමයි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව කරන්න උත්සාහ කරන system change එක සිදු වෙමින් පවතිනවා කියන එක. ඒක ගැන විශාල confidence එකක් මටම දැනුණා. මොකද, මේ තුළ ඇති වෙලා තිබෙන සංවාදය සහ මේ අය වැයට ඉදිරිපත් වෙලා තිබෙන විවේචන දිහා බලන විටත් ඒ system change එක සිදු වෙමින් පවතිනවා කියන විශ්වාසය මට ඇති වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියලුදෙනාම දන්නවා system change එකක් කරන්න, එහෙම නැත්නම් පද්ධතියක් වෙනස් කරන්න උත්සාහ කරන කොට ඒක එක තැනකින් සිදු වන වෙනසක් නොවෙයි කියලා; ඒ සමාජය තුළ තිබෙන සම්බන්ධතාවලත්, බලය මත තිබෙන සම්බන්ධතාවලත් වෙනසක් සිද්ධ වෙනවා කියලා. ඒක අනිවාර්යයි. එහෙම නැතුව system එකක් change වෙන්නේ නැහැ. System change එකක් කියන්නේ එක විධියකට සංවිධානය වෙලා තිබෙන සම්බන්ධතා තවත් තැනකට ගෙන යෑමක්.

මේ අය වැය ගැන විවේචන එන්නේ කොතැනින්ද, රිදිලා තිබෙන්නේ කාටද කියා බලන කොට ඒ අදහස් එන තැන් ගැන යම්කිසි විධියකට නිරීක්ෂණයක් කරන කොට තමයි තේරුම් යන්නේ, ඇත්තටම ඒ කියපු system change එක සිදු වෙමින් යනවා කියලා. මොකද, බරපතළ විවේචන එල්ල කරමින්, සමහර විට අය වැය තුළ තිබෙන දේවලින් පිට යමින්, එහෙම නැත්නම් අය වැයේ තිබෙන දේවල් විකෘති කරමින් කරන කථා අහන කොට අපට තේරෙන්නේ, මේ විවේචන එන්නේ, මේ විවේචන මතු වෙන්නේ අර පරණ system එක තුළ බලයක් දරපු, තමන්ගේ බලය වරප්‍රසාදයක් බවට පත් කරගෙන ඒ බලය තුළින් තමන්ගේ තැන තහවුරු කර ගන්න, ඒ වරප්‍රසාද ආරක්ෂා කර ගන්න, ඒ වරප්‍රසාද තුළින් බලපෑම් කර කර තමන්ගේ ගොඩ, ඒ bargaining power එක වැඩි කර ගන්න උත්සාහ කරපු කණ්ඩායම්වලින් බවයි. ඒ අයගෙන් බහුලව විවේචන එල්ල වන බවක් තමයි මේ විවාදය තුළ අපට දකින්න ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම වරප්‍රසාද මත සහ ඒ වරප්‍රසාද entitlement එකක් හැටියට තිබෙන සමාජයක්, වැඩි වැඩියෙන් ඒ මත සංවිධානය වෙලා තිබෙන සමාජයක් කිසිසේත්ම ප්‍රජාතන්ත්‍රවාදී නැහැ, inclusive නැහැ. ඒක වෙනස් කරන්න තමයි අප මේ උත්සාහ කරන්නේ. වරප්‍රසාද මත හරිම exclusive විධියට බලය පරිහරණය වෙච්ච, බලය enjoy කරපු ඒ සමාජය වෙනස් කරන්න තමයි අප උත්සාහ කරන්නේ.

මොකද, වරප්‍රසාද මත ගොඩ නැගුණු එවැනි සමාජ ගොඩක් අය බැහැර කරලායි - exclude කරලායි - යන්නේ, එවැනි සමාජ ගොඩක් අය හලලායි, ප්‍රතික්ෂේප කරලායි යන්නේ. අප ඒ සමාජ ක්‍රමය වෙනස් කරන්න තමයි මේ උත්සාහ කරන්නේ.

බලන්න, අද මේ විවාදය නිසා සතුටු වෙච්ච කොටස් මොනවාද කියලා. අපේ ව්‍යාපාරිකයන් ගෙන බලන්න. මහන්සි වෙලා වැඩ කරන, තමන්ගේ ආයෝජන ඉතාම සාධාරණ ලෙස යොදවන්න උත්සාහ කරන, ethically හැසිරෙන, වගකීම්සහගතව හැසිරෙන ඒ ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයන් අද සතුටට පත් වෙලායි ඉන්නේ. ඒ ගොල්ලන් සතුටට පත් වෙලා ඉන්නේ ඇයි? ඒ ගොල්ලන්ට තමන්ගේ ව්‍යාපාරය කරගෙන යන්න, තමන්ගේ ව්‍යාපෘතිය කරගෙන යන්න අර දේශපාලනඥයා පිටුපස, මේ දේශපාලනඥයා පිටුපස, ඇමතිවරුන් පිටුපස තවදුරටත් දුවන්න අවශ්‍ය වන්නේ නැහැ. ඔවුන්ට නිදහසේ වැඩ කරන්න පුළුවන්. ඔවුන්ට පෙනෙනවා, අවුරුදු දෙකතුනක සැලැස්මක් තිබෙන බව. ඒ සැලැස්ම consistent විධියට යනවා. ඒ ගොල්ලන්ට plan කරන්න පුළුවන්, forecast කරන්න පුළුවන්. එවැනි අය අද ඉන්නේ සතුටින් කියන එක අපට ඉතාම පැහැදිලියි. මහන්සි වෙලා වැඩ කරන, රාජ්‍ය සේවයේ ඉන්න අය අද තමන්ගේ හැකියාවට තැනක් ලැබිලා තිබෙන බවක් කියනවා. ඔවුන් එය

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහතා]

අගය කරනවා. තමන්ගේ වැඩවලට අගය කිරීමක් ලැබී තිබෙනවා කියන විශ්වාසය, තමන්ට decent living wage එකක් කරා යන්න පුළුවන් කියන විශ්වාසය ඒ අය තුළ ඇති වෙලා තිබෙනවා. තමන්ට ගෞරවනීයව සලකනවා කියා, තමන් අගය කරනවා කියා, තමන් පිළිගන්නවා කියා, තම රාජකාරි වැඩ තමන්ට කරන්න නිදහස තිබෙනවා කියා සතුටු වන කණ්ඩායම් ඉන්නවා.

බොහෝ අවස්ථාවල සමාජය තුළින් මහ හැරුණු අය, ඒ කියන්නේ කාන්තාවන් වෙන්න පුළුවන්, ආබාධ සහිත පුද්ගලයන් වෙන්න පුළුවන්, තරුණ තරුණියන් වෙන්න පුළුවන්, ගම් පළාත්වල ඉන්න අය විතරක් නොවෙයි නගර තුළ වුණත් අප "වතු" කියා හඳුන්වන තැන්වල ඉන්න අය වෙන්න පුළුවන්, ඒ අයටත් සහනයක් ලැබී තිබෙනවා. ඔවුන්ට පෙනෙනවා, අනාගතයේ තමන්ගේ ආර්ථිකය දියුණු කරන්න පුළුවන් මාර්ග විවර වෙමින් යන බව. ඒ ගැන ඔවුන්ට විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. ආර්ථික ප්‍රතිලාභ ලැබෙන විධිය සැලසුම් සකස් කරන කොට මෙතෙක් කල් මේ සමාජය තුළ මහ හැරි සිටි, පෙනෙන්නේ නැතුව - invisible වෙලා - සිටි විශාල ජන කොටසකටත් අප ඉදිරිපත් කර තිබෙන අය වැය හරහා යම්කිසි එළියක් ලැබී තිබෙනවා, ඉදිරියට යන්න පුළුවන් මාර්ගයක් ලැබී තිබෙනවා. ඒ නිසා එළියේ තිබෙන සංවාද අනුවත්, ඒ අය අප සමඟ කරන දේවල් අනුවත් පෙනී යනවා ඒ පිරිස මේ අය වැය ගැන සතුටු වෙමින් සිටින බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ මාසය පුරාම රැකියා විරහිත තරුණ තරුණියන් ගැන විශාල වශයෙන් වාද විවාද කරමින් සිටියා. අපට චෝදනාවක් එල්ල කළා, අපේ දේශපාලනය තුළ ඉදිරිපත් කරපු පොරොන්දු අපි ඉෂ්ට කරලා නැහැ කියා. නමුත් ඇත්ත කථාව ගත්තොත්, සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපේ රටේ තරුණ තරුණියන්ට නිකම්ම රැකියා දෙනවා වෙනුවට, ලොතරැයි දිනුම් අදිනවා වාගේ රැකියා දෙනවා වෙනුවට, තමන්ගේ ව්‍යක්තියෙන්, තමන් කරන රැකියාවෙන් තෘප්තිමත් වෙන්න බැරි විධියට ඔහේ නිකම් රැකියා දෙන system එකක් වෙනුවට ඒ අයට තමන්ගේ ව්‍යක්තිය ගැන ඇත්ත වශයෙන්ම තෘප්තිමත් වෙන්න පුළුවන් විධියේ, තමන්ගේ qualificationsවලට අගයක් දෙන, වටිනාකමක් දෙන, දියුණු වෙන්න පුළුවන් විධියේ, තමන්ගේ ජීවිතය ගොඩනගා ගන්න පුළුවන් විධියේ රැකියා තරුණ තරුණියන්ට ලබා දෙන ක්‍රමයක් අපි හදමින් යන්නේ. එවැනි ක්‍රමයක් හදමින් යනවා විතරක් නොවෙයි, අපි දැනටත් රැකියා ගණනාවක් දෙන්න අවශ්‍ය මාර්ගය විවෘත කරලායි තිබෙන්නේ.

අපට මීටත් වඩා ශීඝ්‍රයෙන් එම කටයුත්ත කරන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි? පසුගිය ආණ්ඩුවලින් ගෙන තිබුණු තීන්දු තීරණ නිසා ඇති වී තිබෙන ආරාවුල් හේතුවෙන් මේ වන කොටත් මහාධිකරණයේ තිබෙන ඇතැම් නඩුවලින් යම් යම් සීමා පනවා තිබෙනවා. ඒ නිසාත් අපට මේ කටයුත්ත ශීඝ්‍රයෙන් කරන්න බැරි වෙලා තිබෙනවා. අපි හිතනවා, අපේ කැබිනට් මණ්ඩලය ගත්තු තීන්දු තීරණ අධිකරණයට වාර්තා කළාට පසුව එම කටයුතු තවදුරටත් බේරුම් කර ගන්න අපට පුළුවන් වෙයි කියලා. මෙතැන තිබෙන වටිනාම දේ මොකක්ද? රැකියාවක වටිනාකමක් දැකලා රැකියාව තුළින් කෙනෙකුට දියුණු වෙන්න පුළුවන් ආකාරයේ path එකක් හැදෙන විධියටයි අප විරැකියාවට වුණත් විසඳුම් හොයන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මිනිස්සුන්ට තිබෙන දැවෙන ප්‍රශ්න ඉදිරියට දා ගෙන තමන්ගේ දේශපාලන හෝ වරප්‍රසාද හෝ bargaining power එකක් හෝ රැක ගන්න හැසිරෙන්න උත්සාහ කරන අයට අපේ අය වැය ගැන විවේචන ඇති. ඒගොල්ලන්ට අපේ අය වැය ගැන කියන්න බොහෝ කථා ඇති. නමුත් ඇත්තටම මේ අය වැය ගැන ඔවුන් ගෙනාපු ඒ යෝජනාවලට අපි ඇහුම්කන් දුන්නා. මම දන්නවා අද මේ වෙනකොටත් අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධව සාකච්ඡා කරමින් ඉන්නේ. යම් කිසි කණ්ඩායමක් නියෝජනය කරමින් ඉදිරිපත් වන යෝජනා වෙනුවෙන් අපට මේ අය වැය තුළින් තවදුරටත් කරන්න පුළුවන් මොනවාද කියන කාරණා සම්බන්ධයෙන් තමයි අපි ඒ සාකච්ඡා කරමින් ඉන්නේ. අපි කොච්චර දුරට මේ අය වැය තුළින් සියලුදෙනාටම සාධාරණයක් කරන්න පුළුවන් ද කියන එක වෙනුවෙන් කෙතෙක් සාකච්ඡා කළාද, අපේ නිලධාරින් සියලුදෙනා එකතු වෙලා කොච්චර මහන්සි වුණා ද කියන කාරණය අපි දන්නවා. විශේෂයෙන්ම 'සාධාරණය' කියන principle එක මත ඉදගෙන කිසි කෙනෙක් මහ නොහැරෙන විධියේ තීන්දු-තීරණ ගන්න පුළුවන්ද කියන එක ගැන කොච්චර මහන්සි වෙමින් ඒ වෙනුවෙන් කැප වුණාද කියන එක මම දන්නවා. ඒ සාකච්ඡා තුළින්, ඇති වෙච්ච සංවාද තුළින් අපට මේ අය වැය තවත් සාධාරණ කර ගන්න පුළුවන් වීම ගැනත්, ඒ යෝජනා තුළින් අපේ අය වැය තවත් ශක්තිමත් කරන්න හැකියාව ලැබීම පිළිබඳවත් මම සතුටු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමියට තවත් විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් කරන්නම්.

මම ඒ පිළිබඳව බෙහෙවින්ම සතුටු වෙනවා වාගේම, ඒ සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් වශයෙන් කියන්න ඕනෑ මේකයි. මේක තමයි system change කියන්නේ. System change එකක් ආරම්භ වෙනකොට මෙවැනි සංවාද ඇති වෙන එක සාමාන්‍ය දෙයක්. ඒක පිළිගන්න ඕනෑ. ඒක බලාපොරොත්තු වෙන්න ඕනෑ. මේ නිසා පරණ ක්‍රමය තුළ වරප්‍රසාද ලබපු, පරණ ක්‍රමය තුළ ප්‍රතිලාභ ලබපු කණ්ඩායම්වලට යම් තිගැස්සීමක් සිද්ධ වෙලා තිබෙනවා. මේ system එක වෙනස් කරමින් අලුත් ක්‍රමයකට මාරු වෙනකොට අනිවාර්යයෙන්ම මොනවා හරි loss එකක් වෙන කණ්ඩායම් ඉන්න පුළුවන්. ඒක වෙන්න පුළුවන්. ඒ පරණ ක්‍රමය රකින්න හදන අයගෙන් තමයි අපට ලොකුම විවේචන එල්ල වෙලා තිබෙන්නේ. ඒ පරණ ක්‍රමය තුළ තමන්ගේ වරප්‍රසාද වෙනුවෙන් තවදුරටත් ඒවා තුළ එල්ලී ගෙන ඉන්න කණ්ඩායම් තුළින් තමයි අපට ලොකුම විවේචන ඇවිල්ලා තිබෙන්නේ. නමුත්, මේ පරණ ක්‍රමය වෙනස් විය යුතුයි. අපි අලුත් මාවතකට යන්න ඕනෑ කියන ඒ අදහස තුළ ඉන්න අයගෙන් අපට ආපු විවේචන, අපට ආපු යෝජනා අනිශයින්ම ප්‍රයෝජනවත් වාගේම, අනිශයින්ම වටිනවා කියලාත් අපට හිතෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට තුළ තීරණාත්මක සහ ඉතාම බැරෑරුම් පරිවර්තනයක් වෙනුවෙන් ඉදිරිපත් වුණු මේ පළමුවෙනි අය වැය මේක. මෙම අය වැය ඉදිරිපත් කිරීමට අපේ ගරු ජනාධිපතිතුමාත්, මුදල් නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාත්, මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් සියලු අමාත්‍යාංශවල මහන්සි වුණු ඒ සියලු නිලධාරින්ටත්, මේ අය වැය වෙනුවෙන් අපට විවිධ යෝජනා ඉදිරිපත් කරමින්, විවේචන ඉදිරිපත් කරමින් අපි යන මහ තවත් නිවැරදි කරන්න සහභාගි වුණු සියලුදෙනාටත් ස්තුති කරන්න මෙය අවස්ථාවක් කර ගන්න මම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අපේ ආරම්භයක්. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව තුළදීත් අපට මේ මාසය තුළ පුදුම සහයෝගයක් ලැබුණා. මේ කථාව ස්තුති කථාවක් නොවෙයි. ස්තුති කථාව හෙටයි කරන්නේ. නමුත්, අපට විවිධ යෝජනා දුන්න ඒ සියලු දෙනාගෙන් ලැබුණු සහයෝගයටත්, මහන්සියටත්, මේ පරිවර්තනීය ගමන යන්නට දායක වෙන සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු අරවින්ද සෙනරත් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, මාණ්පුමිකු කිට්නන් සෙල්වරාජ් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. ARAVINDA SENARATH left the Chair and THE HON. KITNAN SELVARAJ took the Chair.

[ප.ව. 3.18]

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(මාණ්පුමිකු මුහම්මට් පෛසල්)
(The Hon. Muhammad Faizal)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

අස්සලාමු අලෙක්කුම්! ආයුවෙව්වන්! වණක්කම්!

කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, இන්රෛය තිනම් නටෙපෙරුකින්ර නිති, තිට්ටමිටල් මර්රුම් පොරුළාතාර අපිවිරුත්ති අමෛච්චින් නිති ඔදුක්කීටු මීතාන කුழුනිලෛ විවාතත්තිල් එනක්කුම් සන්තර්ප්පම් තන්තමෛක්කු නන්රියෛත් තෙරිවිත්තුක් කොළ්කින්රේන්.

අරසින් සොත්තුක්කළ්, පොරුට්කළ් මර්රුම් සෙලවෛ මුකාමෛත්තුවම් සෙය්තු, අවර්රෛක් කණ්කාණිප්පතන්මූලම් இන්ත නාට්ටින් පොරුළාතාරත්තෛ මේම්පටුත්තුවතර්කාක CGOආනතු 2017ආම් ආණ්ටු මාර්ච් මාතම් 07ආම් තිකති නිති අමෛච්චින්කීழ් උරුවාක්කප්පට්ටතු. இන්කු පේසිය එතිර්ක් කට්චිප් පාරාළුමන්ර උරුප්පිනරුම් මුන්නාළ් නිති අමෛච්චරුමානවර් එමතු නාට්ටෛ ඔරු වළමාන නාටාක මාර්ර මුටියුමා? එනක් කේට්ටාර්. එමතු නාට්ටින් පොරුළාතාරම් වීழ්ච්චියටෛවතර්කුක් කාරණම්, එමතු නාට්ටිල් ටොලර් இල්ලාමල් පෝනමෛයේ ආකුම්. අතර්කුක් කාරණම් මුන්නෛය අරසාංකත්තින් සෙයර්පාටාකුම්. අතාවතු, අලිපාපාවුම් නාර්පතු තිරුටර්කළුම් පෝන්රු එමතු වංකි කළිල් இරුන්ත ටොලර්කළෛ අප්පටියේ අවර්කළ් අள්ளිච්චෙන්රු විට්ටාර්කළ්. இවාරු එමතු නාටු මිකවුම් වංකුරෝත්තු අටෛන්ත නාටාක මාරුවතර්කු අවර්කළේ කාරණමාක இරුන්තාර්කළ්. අතුමට්ටුමල්ල, අරස නිරුවනංකළින් කණක්කරික්කෛකළ් චරියාන මුරෛයිල් වළංකප් පටාමෛයාලුම්, තාමතමාක වළංකප්පට්ටමෛයාලුම්, එමතු නාට්ටින් පොරුළාතාර වළර්ච්චියෛච් චරියාන මුරෛයිල් අටෛන්තුකොළ්ළ මුටියාමල් පෝනතු.

කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, එමතු නාට්ටිල් පොරුළාතාර වළර්ච්චියෛ එර්පටුත්තුවතර්කාකවුම්, අරස නිරුවනංකළින් කණක්කරික්කෛකළෛ විරෛවාකච් චමර්ප්පිප්පතර්කාකවුම් මාණ්පුමිකු චනාතිපති අවර්කළ් இන්ත වරවු චෙලවුත්තිට්ටත්තිල් ටිජිට්ටල් මයමාක්කලෛ මුන්මොළින්තුළ්ළාර්. එමතු නාට්ටිලුළ්ළ චොත්තුක්කළ් කුරිප්පාක කාණිකළ්, කට්ටිටංකළ්, වාකනංකළ් එන්පන චරියාන මුරෛයිල් පයන්පටුත්තප්පටාමෛයුම් එමතු නාට්ටින් පොරුළාතාරම් වීழ්ච්චියටෛවතර්කුක් කාරණමාක இරුන්තිරුක්කිරතු. එනතු තොකුතියාන පුත්තළත්තිල්කූට, මුන්නෛය අරසාංකංකළාල් කට්ටප්පට්ට අතිකමාන කට්ටිටංකළ් இන්නුම් මක්කළ් පාවනෛක්කුක් කෛයළික්කප් පටාත නිලෛයිල් කාණප්පටුකින්රන. පුත්තළම්-කොළුම්පු වීතියිල් අමෛක්කප්පට්ටුළ්ළ උල්ලාචප් පයණිකළුක්කාන වළිකාට්ටල් මෛය කට්ටිටම් இන්රුවරෛ පයන්පටුත්තප්පටාත නිලෛයිල්, ආටු, මාටු, නාය් මුතලිය විලංකුකළ් තංකුකින්ර இටමාක මාරි இරුක්කින්රතු.

අන්තක් කට්ටිටත්තෛ තනියාර් නිරුවනමොන්රුක්කුක් කුත්තකෛක්කුක් කොටුප්පතන්මූලම් වරුමානත්තෛප් පෙර්රුක් කොළ්ළ මුටියුම්. පුත්තළම් නකරිල් පයන්පටුත්තප්පටාමල් இරුන්ත තිරන්ත පල්කලෛක්කළකත්තින් කට්ටිටමොන්රු පල වරුටංකළුක්කු මුන්නර් සුකාතාරත් තිණෛක්කළත්තුක්කුක් කොටුක්කප්පට්ටතු. இතු එමතු පුත්තළම් වාழ් මක්කළුක්කුප් පෙරියතෝර් උතවියාක இරුන්තු වරුකින්රතු. இවාරු නාංකළ් තිරන්ත පල්කලෛක්කළකත්තින් අන්තක් කට්ටිටත්තෛච් චිරප්පාන මුරෛයිල් පයන්පටුත්ති වරුකින්රෝම්. තර්පෝතු අන්තක් කට්ටිටම් පාවනෛක්කු උකන්තතල්ල එන කට්ටිට නිපුණර්කළ් කූරියිරුක්කිරාර්කළ්. එනවේ, අන්තප් පල්කලෛක්කළකත්තුක්කුප් පුතියතොරු කට්ටිටත්තෛක් කට්ටික් කොටුප්පතු තොටර්පිල් කෞරව උයර් කල්වි අමෛච්චර් අවර්කළ් කවනමෙටුක්ක වේණ්ටුමෙන නාංකළ් කේට්ටුක් කොළ්කින්රෝම්.

එමතු පුත්තළම් තොකුතියිලුළ්ළ පුළුතිවයල් කිරාමත්තිල් இරුක්කින්ර ආරම්ප සුකාතාර නිලෛයත්තෛ වෛත්තිය චාලෛයාකත් තරමුයර්ත්තුවතර්කුත් තේවෛයාන ward වසතියුටන්කූටිය කට්ටිටංකළ් කට්ටප්පට්ටුම්, இන්නුම් අවෛ මක්කළින් පාවනෛක්කුක් කෛයළික්කප්පටාමල් අප්පටියේ இරුක්කින්රන. இතනෛත් තරමුයර්ත්තිනාල් අන්තක් කිරාමත්තෛච් චූழවුළ්ළ අතිකමාන මක්කළ් චිකිච්චෛක්කාක අවවෛත්තියචාලෛයෛප් පයන්පටුත්තුවාර්කළ්. අතුමාත්තිරමන්රි, පුත්තළම් තළ වෛත්තියචාලෛක්කුච් චෙල්ලුම් නෝයාළර්කළින් එණ්ණික්කෛයුම් කුරෛවටෛයුම්. කෞරව සුකාතාර අමෛච්චර් අවර්කළෛච් චන්තිත්තු, පුත්තළම් තළ වෛත්තියචාලෛයෛත් තරමුයර්ත්තිත් තරවේණ්ටුමෙන නාංකළ් කේට්ටුක්කොණ්ටතර්කමෛය, අතර්කාන එල්ලා නටවටික්කෛකළුම් නිච්චයමාක එටුක්කප්පටුමෙන අවර් කටන්ත පාරාළුමන්ර අමර්විල් කූරියිරුන්තාර්. අතර්කාක අවරුක්කු නාංකළ් නන්රි තෙරිවික්කින්රෝම්. පුත්තළම් තොකුතියිල් இවවළවු අරස කට්ටිටංකළ් පයන්පටුත්තප්පටාමල් இරුක්කුමාක இරුන්තාල්, නාටු මුළුවතුම් එවවළවු අරස කට්ටිටංකළ් පයන්පටුත්තප්පටාමල් இරුක්කුම් එන්පතෛ නාංකළ් සර්රු චින්තිත්තුප් පාර්ක්ක වේණ්ටුම්.

කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, එමතු නාට්ටිල් අතිකමාන චනාතිපති මාළිකෛකළෛ කටන්ත කාල අරසාංකංකළ් උරුවාක්කියිරුන්තන. අවර්රෛප් පරාමරිප් පතර්කු අතික චෙලවු ඒර්පටුකින්රතු. இන්ත චනාතිපති මාළිකෛකළෛ මක්කළ් පාවනෛක්කාකවුම් නාට්ටින් වරුමානත්තුක්කාකවුම් පයන්පටුත්තුවතාක මාණ්පුමිකු චනාතිපති අවර්කළ් වරවු චෙලවුත්තිට්ටත්තිල් කූරියිරුක්කිරාර්. இවාරු இන්ත නාට්ටෛ වළප්පටුත්තුවතර්කාන චිරප්පානතොරු වරවු චෙලවුත්තිට්ටත්තෛ මාණ්පුමිකු

[ගරු මුහම්මදු නයිසාල් මහතා]

சனாதிபதி அவர்கள் முன்மொழிந்து இருக்கிறார். கொழும்பில் அதிகமான அரச கட்டிடங்கள் இருந்தும்கூட, ராஜகிரியவில் இருக்கின்ற ஒரு கட்டிடத்தை வாடகைக்கு எடுத்திருக்கிறார்கள்.

மேலும், மன்னார், முசலிப் பிரதேசத்தில் bus standக்காக 4 கோடி ரூபாய் செலவில் ஒரு கட்டிடம் கட்டப்பட்டது. அது மூன்று முறை புனரமைப்புச் செய்யப்பட்டும் இன்னும் அது பயன்படுத்தப்படாமல் அப்படியே இருக்கின்றது. அதேபோன்று, முசலி DS Officeஇல் பணிபுரிகின்ற பெண்களுக்காகக் கட்டப்பட்டுள்ள விடுதியும் எந்தவிதமான பாவனையும் இல்லாமல் அப்படியே இருக்கின்றது. இவ்வாறு ஒருசில இடங்களில் குறிப்பிட்டளவு கட்டிடங்கள் பயன்படுத்தப்படாமல் இருக்குமென்றால், நாடு முழுவதும் எவ்வளவு கட்டிடங்கள் பாவனைக்கு உட்படுத்தப்படாமல் இருக்கும்? சென்ற அரசாங்கங்கள் இந்தக் கட்டிடங்களைச் சரியான முறையில் பயன்படுத்தவில்லை.

அதுமட்டுமல்ல, புத்தளத்தில் அதிகமான காணிகள்கூட சரியான முறையில் பயன்படுத்தப்படாமல் இருக்கின்றன. எமது புத்தளம் மாவட்டத்தில் அதிகமான தென்னந்தோட்டங்கள் இருக்கின்றன. அவை 100 ஏக்கர், 200 ஏக்கர், 500 ஏக்கர் என்றளவில் இருக்கின்றன. அவற்றை 99 வருடங்களுக்கு குத்தகைக்கு வழங்கி இருக்கின்றார்கள். அவற்றைக் குத்தகைக்கு எடுத்தவர்கள்கூட, அவற்றை வளப்படுத்தாமல், அவற்றிலிருந்து வருமானத்தைப் பெறுவதை மட்டுமே குறிக்கோளாகக்கொண்டு செயற்படுகின்றார்கள். சென்ற அரசாங்கங்கள் தென்னந்தோட்டங்களைச் சரியான முறையில் பராமரிக்கவில்லை. தற்போது பேசுபொருளாக இருக்கின்ற தேங்காய்ப் பிரச்சினைக்கு அதுவும் ஒரு காரணமாக இருக்கின்றது. எமது புத்தளம் பகுதியில் காணப்படுகின்ற டச்சு கால்வாய்களை அண்மித்த இடங்களை பிரதேச செயலகம் ஊடாக அந்தப் பிரதேச மக்களுக்குக் கொடுப்பதன்மூலம் வருமானத்தைப் பெற்றுக்கொள்ள முடியும். இவ்வாறு அதிகமான அரச காணிகள் புத்தளத்தில் இருக்குமென்றால், நாடு பூராவும் எவ்வளவு காணிகள் இருக்கும்?

இவற்றின்மூலம் எமது நாட்டுக்கு வருமானத்தைப் பெற்றுக்கொள்ளக்கூடிய வகையில், மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த வரவு செலவுத்திட்டத்தினூடாகச் சில நடவடிக்கைகளை எடுத்துள்ளார். அரச நிறுவனங்களில் மட்டுமல்ல, சென்ற அரசாங்கங்களில் இருந்த பாராளுமன்ற உறுப்பினர்கள்கூட, வாகனங்களை முறையற்ற விதத்தில் பயன்படுத்தியதன் காரணமாக எமது நாட்டில் அதிகமான செலவுகள் ஏற்பட்டன. அந்த வாகனங்களை அவர்களாகவே கொழும்பிலுள்ள Galle Faceஇல் அவசரமாகக் கொண்டுவந்து நிறுத்திவிட்டு, தாங்கள் யார் என்று தெரியாத விதத்தில் சென்றிருந்தார்கள். இன்னும் அதிகமான வாகனங்கள் எங்கே என்று தெரியாமல் இருக்கின்றன.

யுத்த காலத்தில் புத்தளத்தில் வந்து குடியேறிய மக்கள், தங்களை புத்தளத்தில் பதிவுசெய்துகொண்டு இருக்கின்றார்கள். அவர்கள் புத்தளத்திலிருந்து மன்னாருக்குச் செல்வதற்கு மிக நீண்ட தூரம் பயணம் செய்யவேண்டி இருப்பதனால், புத்தளம் - மறிச்சுக்கட்டி - மன்னார் வீதியைத் திறந்து, அவர்களின் போக்குவரத்தை இலகுபடுத்த வேண்டுமென நான் கௌரவ போக்குவரத்து அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன். தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, எமது நாட்டை வளமானதொரு நாடாக மாற்றுவதற்காக முன்வைத்துள்ள முதலாவது வரவு செலவுத்திட்டம் இதுவாகும். இந்த அரசாங்கத்தைக் கவிழ்த்துவிடலாம் என்று எதிர்க்கட்சி உறுப்பினர்கள் கனவு காண்கின்றார்கள். எதிர்வரும் காலங்களில் எமது அரசாங்கம் சிறந்த வரவு செலவுத் திட்டங்களை முன்வைத்து, இந்த நாட்டை வளமானதொரு நாடாக மாற்றி, மக்களுக்கு அழகான வாழ்க்கையை உருவாக்கிக் கொடுக்கும் என்று கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ வீ.எஸ். இராதாகிருஷ்ணன் அவர்கள்! உங்களுக்கு பதினைந்து நிமிடங்கள் உண்டு.

[பி.ப. 3.27]

ගරු (ආචාර්ය) වී.එස්. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாண்புமிகு சனாதிபதி அவர்களின்கீழ் வருகின்ற நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் இன்றைய தின குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு சில விடயங்களைப் பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறுகின்றேன்.

இந்த வருடம் இந்த அமைச்சுக்கு கிட்டத்தட்ட 714.2 பில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இந்த அமைச்சின்கீழ் 23 நிறுவனங்கள் இருக்கின்றன. இந்த 23 நிறுவனங்களும் மிக முக்கியமான நிறுவனங்களாகும். இந்த நாட்டுக்கு வருவாயை ஈட்டிக்கொடுக்கின்ற நிறுவனங்கள், இந்த நாட்டு மக்களிடமிருந்து வரியைத் திரட்டுகின்ற நிறுவனங்கள் எனப் பல நிறுவனங்கள் இந்த அமைச்சின்கீழ் வருகின்றன. எனவே, இந்த அமைச்சு மிக முக்கியமான அமைச்சாகக் காணப்படுகின்றது. வரவு செலவுத்திட்டத்தின் மொத்த நிதி ஒதுக்கீட்டில் இந்த அமைச்சுக்கு 16.9 சதவீதம் ஒதுக்கப்பட்டுள்ளது. இந்த அமைச்சின்கீழ் வருகின்ற நிறுவனங்கள் எல்லாம் முறையாகச் செயற்படுவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். ஏனென்றால், ஒரு நாட்டில் பொருளாதாரம் வளம்பெறுவதற்கும், சுபிட்சம் ஏற்படுவதற்கும், அபிவிருத்தி ஏற்படுவதற்கும் நிதிக்கொள்கை, நிதிநிலைமை என்பன நன்றாக இருக்க வேண்டும். கடந்த காலங்களில் நிதி நிலைமை மோசமடைந்ததனால்தான் எமது நாட்டின் பொருளாதாரம் வீழ்ச்சியடைந்தது. பொருளாதாரம் வீழ்ச்சியடைந்ததன் காரணமாக இந்த நாட்டின் உற்பத்தி வீழ்ச்சியடைந்தது. அதுமாத்திரமன்றி, நாடு வங்குரோத்து நிலைக்குப் போகக்கூடிய சூழ்நிலையும் ஏற்பட்டது. எனவே, நிதிக்கொள்கை, நிதி முகாமைத்துவம் என்பன ஒரு நாட்டின் வளர்ச்சியில் முக்கிய பங்கு வகிக்கின்றது. ஆகையால், இந்த அமைச்சின் செயற்பாடு சரியாக இருக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

வரவு, செலவைக் கையாளுகின்ற ஒரு நாட்டில், பொருளாதார வளர்ச்சியைத் தீர்மானிக்கும்பொழுது, அதன் செயற்பாட்டிலும் மிக அக்கறையாக இருக்க வேண்டும். அத்துடன், சரியான திட்டமிடல் இருக்க வேண்டும். அதன் அடிப்படையில், திட்டங்களை வகுக்க வேண்டும். அவற்றைக் கண்காணிக்க வேண்டும்; மதிப்பீடு செய்ய வேண்டும். ஏனோதானோவென்று செயற்படக் கூடாது. அரச நிதியை யாருக்காவது கொடுத்து, அதை வீண்விரயமாக்குகின்ற செயற்பாடுகளை நாங்கள் செய்யக் கூடாது. கடந்த

காலங்களில் அம்பாந்தோட்டைப் பகுதியில் அரச நிதி வீணாகச் செலவழிக்கப்பட்டது. அது இந்த நாட்டில் பொருளாதார நெருக்கடி ஏற்படுவதற்கு ஒரு காரணமாக இருந்தது. இவ்வாறான நிலைப்பாட்டில் மாண்புமிகு சனாதிபதி அவர்கள் இருக்கக் கூடாது என்பதை நாங்கள் இந்த நேரத்தில் வலியுறுத்திக் கூற விரும்புகின்றோம். ஆட்சி மாறும்போது - சனாதிபதி அல்லது பிரதமர் மாறும்போது - கொள்கை மாற்றங்கள் இடம்பெறுவது வழமையாகும்.

உதாரணமாக, கோட்டாபய ராஜபக்ஷ அவர்கள் ஆட்சிக்கு வந்தபோது இரசாயன உரத்தைப் பாவிக்கக்கூடாது என்ற கொள்கையைக் கொண்டு வந்தார். அதனால் நாங்கள் பொருளாதார ரீதியாக மிகவும் வீழ்ச்சியடைந்தோம். எல்லாத் துறைகளையும் digitalize பண்ண வேண்டும், ஊழலற்ற அரசாங்கத்தை உருவாக்க வேண்டும் என்ற கொள்கையை இன்று மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் கொண்டுவந்து இருக்கின்றார். உண்மையிலேயே இது வரவேற்கக்கூடிய ஒரு விஷயமாகும். அமெரிக்காவை எடுத்துக்கொண்டால், அன்று சனாதிபதியாக இருந்த ஜோ பைடன் அவர்கள் போர் செய்வதற்காக உக்ரைனுக்குப் பணத்தை அள்ளிக் கொடுத்தார். இன்று டொனால்ட் டிரம்ப் அவர்கள் போர் தேவையில்லை என்று சொல்லி அதை நிறுத்தியிருக்கிறார். எனவே, ஒவ்வோர் அரசாங்கத்துக்கும் ஒவ்வொரு கொள்கை இருக்கும். அதேநேரம், அவற்றுக்கு இடையில் வித்தியாசங்களும் இருக்கும். இந்த வரவு செலவுத்திட்டமானது, இந்த அரசாங்கத்தின் முதலாவது Budget என்பதால் நாங்கள் அதிகமாக விமர்சனம் செய்ய முடியாது. இருந்தாலும், எங்களுக்குத் தெரிந்த சில விஷயங்களை உங்களுக்குச் சொல்லலாம். அதாவது, எதிர்காலத்தில் இந்த நாடு நன்றாக இருக்க வேண்டுமென்றால், நீங்கள் உங்களுடைய கொள்கையில் உறுதியாக இருக்க வேண்டும்; அந்தக் கொள்கையைக் கடைப்பிடிக்க வேண்டும். ஊழல் இல்லாத அரசாங்கத்தை உருவாக்குவதற்கு நாங்கள் உங்களுக்கு 100 சதவீதம் ஆதரவாக இருப்போம் என்பதை இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

வரவு செலவுத்திட்டம் என்றால் என்ன? பொருட்களின் விலையை மிகவும் அதிகரித்து, மக்களைத் துன்பப்படுத்துகின்ற ஒரு சூழ்நிலையை உருவாக்குவதா வரவு செலவுத்திட்டம்! அப்படி இருக்கக் கூடாது. மக்களுக்கு ஏற்றதொரு பொருளாதார நிலையை உருவாக்க வேண்டும். அப்படி யென்றால், அன்றாடம் மக்கள் பயன்படுத்துகின்ற பொருட்களின் விலையைக் குறைப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இன்று நாட்டில் பணவீக்கம் அதிகரித்திருக்கின்ற காரணத்தால், பொருட்களின் விலையைக் குறைக்கின்ற அதேநேரம், சம்பளத்தை உயர்த்துவதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும். இந்த இரண்டும் balanceஆகப் போனால்தான் மக்கள் சந்தோஷமாக இருப்பார்கள். Parliamentஇலுள்ள 225 பேரும் சந்தோஷமாக இருப்பதோ, நாட்டிலுள்ள பணக் காரர்கள் சந்தோஷமாக இருப்பதோ முக்கியமல்ல. இந்த நாட்டிலுள்ள ஏழை மக்களும் சாதாரண மக்களும் சந்தோஷமாக இருக்க வேண்டும். எனவே, அதற்கேற்ற நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும்.

உதாரணத்துக்கு, இந்தியாவை எடுத்துக் கொள்வோம். உலகத்தில் மிகப் பெரிய பணக்காரனும் இந்தியாவில்தான் இருக்கிறான்; மிகப் பெரிய பிச்சைக்காரனும் இந்தியாவில்தான் இருக்கிறான். அங்கு சமமான நிலை இல்லை. அந்த நிலை எங்களுடைய நாட்டில் உருவாக்கப்படக் கூடாது. இப்பொழுது எமது நாட்டில் வருமானம் குறைந்த மக்கள் அதிகமாக இருக்கின்றார்கள். அவர்களுடைய நலன் சார்ந்த விடயங்களில் நிதி அமைச்சு கவனம் செலுத்த வேண்டும் என்பதே எங்களுடைய கருத்தாக இருக்கின்றது. அதாவது, ஒரு வீட்டில் 5 பிள்ளைகள் இருந்தால், அவர்கள் அனைவரும் சமமாகப் பார்க்கப்பட வேண்டும். ஒரு பிள்ளையை அதிகமாகவும் இன்னொரு பிள்ளையைக் குறைவாகவும் கவனிப்பது எந்த விதத்திலும் நியாயம் இல்லை என்பதுதான் என்னுடைய கருத்தாக இருக்கின்றது.

மேல் மாகாணத்தை - Western Province - எடுத்துக் கொண்டால், இங்குள்ள மக்களுக்கு அதிக வருமானம் இருக்கின்றது. அவர்கள் அதிக வருமானத்தைப் பெற்று எல்லா வசதி வாய்ப்புகளுடனும் இருக்கின்றார்கள். அதுமாத்திரமன்றி, இங்கு கைத்தொழிற்சாலைகளும் அமைந்திருக்கின்றன. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஊவா மாகாணத்தை எடுத்துக்கொள்ளுங்கள்! அங்குள்ள மக்களுக்கு என்ன வழிகளில் வருமானம் வருகின்றது? அந்த மாகாணத்தில் இருக்கின்ற மக்களுக்கு மேல் மாகாணத்தில் இருக்கின்றவர் களுக்குக் கிடைக்கின்ற வருமானத்தைவிட மிகக் குறைவான வருமானம்தான் கிடைக்கின்றது. ஏனெனில், அங்கு கைத்தொழில் பேட்டைகள் இல்லை. மேல் மாகாணத்தை ஒரு மாதிரியாகவும் ஊவா மாகாணத்தை இன்னொரு மாதிரி யாகவும் மத்திய மாகாணத்தை வேறொரு மாதிரியாகவும் பார்க்க முடியாது. எல்லா மாகாணங்களையும் சமமாகப் பார்க்க வேண்டும் என்பதுதான் எங்களுடைய நோக்கமாக இருக்கின்றது. அப்படியென்றால், பின்தங்கிய பகுதிகளில் அதிகமான அபிவிருத்திகளைச் செய்வதற்கு அரசாங்கம் முன்வர வேண்டும். அந்தப் பகுதிகளுக்கும் நிதி ஒதுக்கீடுகள் பாரபட்சமின்றிப் போய்ச் சேர வேண்டும் என்பதே எங்களுடைய கருத்தாக இருக்கின்றது.

மேலும், Inland Revenue Department, Import and Export Control Department, Sri Lanka Customs, Excise Department என்பவற்றுக்கு இடையில் சுமுகமான உறவு இருக்க வேண்டும். இன்றைக்கு இந்த நாட்டில் ஊழல் மலிந்த திணைக்களங்களாக இவை காணப்படுகின்றன. இந்த மூன்று திணைக்களங்களிலும் corruption இல்லாமல் இருந்தால், இந்த நாட்டின் வருமானத்தை அதிகரிக்கலாம். அதற்கான வழிவகைகளைச் செய்ய வேண்டும். ஊழலற்ற அரசாங்கத்தை உருவாக்குவதுதான் இந்த அரசாங்கத்தின் நோக்கமாக இருப்பதால், அவற்றை இந்த அரசாங்கம் செய்யுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

அடுத்து, நாங்கள் எதிர்பார்க்கின்ற இன்னுமொரு விஷயம் பற்றிச் சொல்ல வேண்டும். இங்குள்ள 225 பாராளுமன்ற உறுப்பினர்களில் 159 பேர் ஆளும் கட்சியில் இருக்கிறார்கள். ஏனையவர்கள் எதிர்க்கட்சியில் இருக்கிறார்கள். தங்களுக்கு வாக்களித்த மக்களுக்கு ஏதாவது செய்ய வேண்டும் என்ற எண்ணம் எதிர்க்கட்சியில் உள்ளவர்களுக்கும் இருக்கின்றது.

அவர்களுக்கும் DCBஇன்கீழ் - பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத்திட்டத்தின்கீழ் - மேலதிக நிதியை ஒதுக்கிக் கொடுக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். எங்களைப் பொறுத்தவரையில், தோட்டப் பகுதிகளிலுள்ள கோயில்களுக்கு சிறு உதவியைக்கூட செய்ய முடியாமல் இருக்கிறது. ஏனெனில், DCBஇன்கீழ் நிதி ஒதுக்கப்பட்டாலும், அது போதாது. உங்களுடைய circularஇன்படி,10 projectsஐக் கொடுத்து அவற்றைச் செய்யச் சொல்கின்றீர்கள். எங்களுடைய பகுதிகளில் தோட்டங்கள் அதிகமாக இருப்பதனால் அங்குள்ள வீதிகளைப் புனரமைப்பதற்கும், சிறுவர் பராமரிப்பு நிலையங்களைப் பராமரிப்பதற்கும்,

[ගරු (ආචාර්ය) වී.එස්. රාධාකිෂ්ණන් මහතා]

பாடசாலைகளில் அபிவிருத்திகளைச் செய்வதற்கும் அந்த நிதி போதாமல் இருக்கின்றது. எனவே, DCBஇன்கீழ் - பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத்திட்டத்தின்கீழ் - ஒதுக்கப்படுகின்ற நிதியை அதிகரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதை நான் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அதேபோல், வளப் பற்றாக்குறையுள்ள மக்களுக்கும் அதிக நிதியை ஒதுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். இது பற்றி நான் ஏற்கெனவே சொல்லியிருக்கிறேன்.

"கைத்தொழில் ஒன்றை கற்றுக்கொள்; கவலை உனக்கில்லை ஒத்துக்கொள்" என்று சொல்வார்கள். யாராவது ஒருவர் கைத்தொழில் ஒன்றைச் செய்தால், நிச்சயமாக அது அந்தப் பகுதியில் இருக்கும் மக்களுக்குப் பிரயோசனமாக இருக்குமென நாங்கள் எண்ணுகின்றோம். எங்களுடைய பகுதிகளில் கைத்தொழில் பேட்டைகளை அமைப்பதற்கான வசதி வாய்ப்புகள் அதிகமாக இருக்கின்றன. ஏனெனில், அங்கு மூடப்பட்டுள்ள தொழிற்சாலைகள் நிறைய இருக்கின்றன; வளங்கள் இருக்கின்றன; இட வசதி இருக்கின்றது. எனவே, மலையகப் பகுதிகளில் கைத்தொழில் பேட்டைகளை உருவாக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். எல்லாவற்றையும் கொழும்பு, கண்டி போன்ற பகுதிகளுக்கு வழங்காமல், மலையகப் பகுதிகளுக்கும் வழங்க வேண்டும். அங்கு பல தொழிற்சாலைகளை உருவாக்கி, அங்குள்ளவர்கள் அங்கேயே வேலைசெய்வதற்கான வாய்ப்புகளை உருவாக்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பது என்னுடைய கருத்து மட்டுமல்ல, உங்களுடைய சனாதிபதி அவர்களுடைய கருத்தும் அதுவாகத்தான் இருந்திருக்கிறது. அவர் தேர்தல் காலங்களில் அது தொடர்பில் பேசியிருக்கிறார். அதாவது, ஹட்டன், தலவாக்கலையில் இருக்கும் பிள்ளைகள் கொழும்புக்கு வந்து வீடுகளில் வேலை செய்யக் கூடாது என்றும் அவர்கள் அங்கேயே வேலை செய்ய வேண்டும் என்றும் அவர் சொல்லியிருக்கிறார். அது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். அதை நடைமுறையில் சாத்தியப்படுத்துவதற்காக அங்கு கைத்தொழில் பேட்டைகளை அதிகரிப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

மேலும், ஒரு நாட்டில் ஆன்மீகம் சார்ந்த செயற்பாடுகள் இருப்பது மிக முக்கியமானது. அவை இல்லாவிட்டால், அந்த நாட்டால் சரியான பாதையில் செல்ல முடியாமல் போய்விடும். பௌத்தர்களுக்கு பௌத்த மதக் கோட்பாடுகள் இருப்பது போல, முஸ்லிம்களுக்கு இஸ்லாம் மதக் கோட்பாடுகள் இருப்பதுபோல, கிறிஸ்தவர்களுக்கு கிறிஸ்தவ மதக் கோட்பாடுகள் இருப்பதுபோல, இந்துக்களுக்கு இந்து மதக் கோட்பாடுகள் இருக்கின்றன. அந்த வகையில், அந்தந்தப் பகுதிகளில் இருக்கின்ற மக்கள் தத்தமது மதக் கோட்பாடுகள் சார்ந்த செயற்பாடுகளைச் செய்வதற்கு ஏற்ற வசதி வாய்ப்புகளைச் செய்துகொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இன்று மலையகப் பகுதிகளிலுள்ள பல கோவில்களில் கும்பாபிஷேகம் செய்யப்படாமல் இருக்கின்றது. இது மிகவும் வருத்தத்துக்குரிய ஒரு விடயமாகும். ஒரு நாடு நன்றாக இருக்க வேண்டுமென்றால், அந்த நாட்டில் தெய்வீக பலம் இருக்க வேண்டும். எனவே, மலையகப் பகுதிகளில் வாழ்கின்ற மக்களுடைய மதம் சார்ந்த நடவடிக்கைகளைச் செய்வதற்கான வசதி, வாய்ப்புகளை ஏற்படுத்திக்கொடுக்க வேண்டுமென்பது என்னுடைய கருத்தாக இருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்களும் மலையகப் பகுதியைச் சார்ந்தவர். நீங்களாவது தோட்டப் பகுதிகளில் இருக்கும் ஆலயங்களுக்கு ஏதாவது உதவி செய்வதற்கான நடவடிக்கைகளை எடுப்பதற்கு முயற்சிக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இப்பொழுது fixed depositors இடமிருந்து அறவிடப்படுகின்ற five per cent Withholding taxஐ 10 சதவீதமாக அதிகரிக்கப்போவதாக சனாதிபதி அவர்கள் சொன்னதாகப் பலரும் சொல்கின்றார்கள். அவ்வாறு அதிகரித்தால், அவர்களுக்கான taxஉம் 36 சதவீதமாக அதிகரிக்கப்படும். ஒருவருடைய savingsஇன் பெரும்பகுதி taxக்குப் போனால் மிகுதி எதுவும் இருக்காது. இன்று காசை வைத்திருப்பதைவிட, தங்கத்தை வாங்கி வைத்திருப்பது இலாபமாக இருக்குமென நான் நினைக்கின்றேன். அதேபோல், காசை deposit பண்ணி வைத்திருப்பதற்குப் பதிலாக தங்கத்தை வாங்கி வைத்திருந்தால் எந்தவிதப் பிரச்சினையும் ஏற்பட்டிருக்காது. காசை deposit பண்ணவில்லை என்றால், bankக்கு revenue வராது. காசை FDஇல் இட்டால்தான் bankக்கு revenue வரும். Bankக்கு revenue இல்லை என்றால், பணத்தைச் சுழற்சி முறையில் சேகரிப்பதற்கான வாய்ப்புகள் வங்கிகளுக்கு இல்லாமல் போய்விடும். எனவே, அரசாங்கம் இதனைச் சரிசெய்ய வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

இந்த நாட்டில் 1971, 1989ஆம் ஆண்டுகளில் உருவான JVPஇனரின் கிளர்ச்சியும், LTTEஇனரின் போராட்டமும் இந்த நாட்டின் கோடிக் கணக்கான ரூபாய் வீணாவதற்குக் காரணமாக இருந்திருக்கின்றன. அவற்றைக் கட்டுப்படுத்து வதற்காக அன்று கோடிக்கணக்கான பணத்தைச் செலவழித்து இருக்கிறார்கள். அதனைச் சரி செய்வதற்கு இன்று நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அதிகளவு பணம் Defence Ministryக்கு ஒதுக்கப்படுவதாகச் சொல்கின்றார்கள். எமது நாட்டில் பிரச்சினை இல்லையென்றால், Defence Ministryக்கு அதிகளவு நிதியை ஒதுக்கத் தேவையில்லை.

இன்று இந்த நாட்டில் பாதுகாப்பு சார்ந்த பிரச்சினைகள் இருக்கிறது என்றுதான் சொல்ல வேண்டும். ஏனெனில், இந்த நாட்டில் எந்த நாளும் கொலை, கொள்ளைகள் நடந்துகொண்டே இருக்கின்றன. இந்த நாட்டில் இவ்வளவு பிரச்சினைகள் நடந்தபொழுதும், மலையக மக்கள் இந்த நாட்டுக்கு வருமானத்தை ஈட்டிக்கொடுத்துக்கொண்டே இருக்கின்றார்கள். கொரோனா தொற்றுக் காலத்திலும் அவர்கள் கொழுந்து பறித்தார்கள்; JVPஇனரின் கிளச்சி ஏற்பட்டபோதும் கொழுந்து பறித்தார்கள்; LTTEஇனரின் போராட்டம் நடந்தபொழுதும் கொழுந்து பறித்தார்கள். இவ்வாறு அவர்கள் இந்த நாட்டுக்கு வருமானத்தை ஈட்டிக் கொடுப்பதில் முக்கிய பங்கு வகித்து வருகின்றார்கள். ஆனால், இன்றும் அந்த மக்களுடைய வாழ்க்கை கேள்விக் குறியாகத்தான் இருக்கின்றது. எனவே, அரசாங்கமானது அதிகளவு நிதியை ஒதுக்கி, அவர்களுடைய வாழ்க்கை முறையை மாற்றுவதற்கும், வாழ்க்கைத் தரத்தை உயர்த்து வதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும். இன்று நீங்கள் எல்லோரும் degitalization பற்றி பேசுகின்றீர்கள். அந்த மக்களுடைய வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்கு நீங்கள் என்ன நடவடிக்கைகளை எடுக்கப் போகிறீர்கள் என்பதை இந்தச் சபையில் சொல்ல வேண்டும் என்றும் அதற்குரிய நடவடிக்கைகளை மாண்புமிகு ஜனாதிபதி அவர்கள் எடுக்க வேண்டும் என்றும் நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன். இந்த நாட்டில் எந்தவிதப் பாகுபாடும் இல்லாமல் அனைத்து மக்களும் சமமாக வாழ்வதற்கு இந்த NPP அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும். அதற்காக நாங்கள் உங்களுக்கு ஒத்துழைப்போம் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.42]

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂය සඳහා අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කරලා, අය වැය කාරක සභා අවස්ථාවේදී අපි අද සාකච්ඡා කරමින් ඉන්නේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳවයි. මේ රට දශක ගණනාවක් තිස්සේ දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දීලා, දැවැන්ත කඩා වැටීමකට ලක් වුණු රටක්. මේ රට ගොඩනැඟීම සඳහා අපි එළියේදී දේශපාලන අරගළයක් කළා. ඒ වාගේම, දැන් ආණ්ඩු බලය අරගෙන, මේ රට ගොඩනැඟීම සඳහා අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කරමින් එය භූමියේ යථාර්ථයක් බවට පත් කරන්න කටයුතු කරමින් සිටින මොහොතක්, මෙක. අපේ ආණ්ඩුවේ මංගල අය වැය ඉදිරිපත් කරලා, ඒකේ තිබෙන ආකාරයට අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 6ක් දක්වා ගෙනියන්න අපි ආණ්ඩුවක් විධියටත්, රාජ්‍ය යන්ත්‍රණය නියෝජනය කරන රාජ්‍ය නිලධාරීන් විධියටත්, සමස්ත පුරවැසියන් ඒකාබද්ධ කර ගැනීම සඳහා වූ සැලසුම් සකස් කරමින් ඉන්නවා.

අද උදේ කථා කරපු සමහර මන්ත්‍රීවරුන් වාගේම පසුගිය ආණ්ඩු නියෝජනය කරමින් අමාත්‍යවරුන් විධියට හිටපු අය දැන් මන්ත්‍රීවරුන් වෙලා අපෙන් අහනවා, ආණ්ඩුව මේ රට මෙහෙයවමින් ඉන්නේ, ආනයනය මත රඳා පවතින ආර්ථිකයක් කරාද කියලා. හැබැයි, මේ දශක හතරකට ආසන්න ඉතිහාසය පුරාම අපේ රටේ නිෂ්පාදනය කඩා වට්ටලා, නිෂ්පාදනය ගොඩනඟන්න සැලසුම් හැදුවේ නැතුව සියල්ල පිට රටින් ගෙනැල්ලා, ආනයන මත රඳා පවතින ආර්ථිකයක් බවට මේ රටේ ආර්ථිකය පත් කරපු මහත්වරුන් අපෙන් අහනවා, "මොකක්ද, ඔබේ ආර්ථික ප්‍රතිපත්තිය? ආනයනය මත ගෙනියන ආර්ථිකයක් නේද?" කියලා. අපේ ආර්ථික ප්‍රතිපත්තිය පැහැදිලිවම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත්, අපි ඉදිරිපත් කරපු අය වැය ලේඛනය තුළත් සඳහන් වෙනවා. ගරු ජනාධිපතිතුමා අය වැය තුළින් ඉදිරිපත් කළේ නිෂ්පාදන ආර්ථිකයකට මේ රට මෙහෙයවා ගැනීමට අවශ්‍ය සියලු සැලසුම් තමයි. ඒ නිසා මේ රටේ පුරවැසියන්ට, බලාපොරොත්තු සහිත තරුණ ප්‍රජාවට අපි මේ මොහොතේ සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි, දශක හතරක් තිස්සේ අපට අහිමි වෙච්ච නිෂ්පාදන ආර්ථිකය මේ රටට ගෙනැවිත් දෙන්න 2025 මංගල අය වැය තුළින් අපි යෝජනා ඉදිරිපත් කර තිබෙන බව. ඒ නිසා පැහැදිලිවම අපේ රට නිෂ්පාදන ආර්ථිකයකට මෙහෙයවීම සඳහා අවශ්‍ය සැලසුම් අපි මේ අය වැය තුළින් ඉදිරිපත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු ආණ්ඩුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් මීට ටික වේලාවකට කලින් කථා කරනකොට ගණන් හදලා අපිට කියනවා, මේ විධියට ගියොත් අපේ රට සිංගප්පූරුව වාගේ රටක් කරන්න අවුරුදු 27ක් විතර ගත වෙනවා කියලා. චීනය වාගේ රටක් නිර්මාණය කර ගන්න අවුරුදු 50කට වැඩි කාලයක් යයි කියාත් එතුමා කිව්වා. කවුද මේ එහෙම කියන්නේ? මේ රට දශක කිහිපයක් පාලනය කරපු, තාත්තලා, බාප්පලා, පුත්තු එකතු වෙලා, මේ රට මෙහෙයවපු මහත්වරුන් අපෙන් අහනවා, අපේ රටේ සංවර්ධනය කවදාද ළඟා කර ගන්නේ කියලා. අපි ඒ මහත්වරුන්ට මතක් කරලා දෙන්න කැමැතියි, සිංගප්පූරුව දැන් මේ තිබෙන මට්ටමට ගොඩනැඟෙන්න අවුරුදු 30කට ආසන්න කාලයක් ගත කරලා තිබෙන බව. චීනය දැන් තිබෙන මට්ටමට එන්න දශක 6කට ආසන්න කාලයක් සැලසුම් කරලා, ලොකු කැප කිරීම් කරලා තිබෙනවා. වියට්නාමය අද පවතින මට්ටමට එන්න, සියයට 9කට වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගන්න, ඒ රටේ ප්‍රජාව, ඒ රටේ ආණ්ඩු දැවැන්ත කැප කිරීමක් කරලා, අවුරුදු 45කට ආසන්න කාලයක් ඒ වෙනුවෙන් ගත කරලා තිබෙනවා. හැබැයි, අපි කියන්නේ මේ රට ඒ තත්ත්වයට ගෙන එන්න එතරම් කාලයක් අප ගත කරන්නේ නැහැ කියන එකයි. නමුත්, ඔය කාරණා මතක් කරන මහත්වරුන්ට මම කියනවා, ඒ රටවල් යම් සැලැස්මකට ගෙනැල්ලා තමයි, අද ඒ නිශ්චිත තැනක තියලා තිබෙන්නේ කියන එක. හැබැයි, නිදහසින් පස්සේ ගත වුණු අවුරුදු 76දී අපේ රට එහෙම විධිමත් සැලැස්මකට, යම් නිශ්චිත පාලනයකට නතු කරලා මෙහෙයවුයේ නැහැ. ඒ නිසා තමයි, ලෝකයේ බංකොලොත්ම, කඩා වැටිච්ච රටක් බවට අපේ රට පත් වුණේ. ඒ නිසා මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ අපේ රට යම් නිශ්චිත ඉලක්කයකට, යම් නිශ්චිත කාල රාමුවක් ඇතුළේ, ආර්ථික වර්ධනයක් අත්පත් කර ගනිමින් වේගයෙන් ආසියාවේ සංවර්ධිත රටක් බවට පත් කිරීම සඳහායි. ඒ නිසා මාස හයට ආපු ආයෝජන ගැන අහන මහත්වරුන්ට අපි මතක් කරලා දෙන්න කැමැතියි, 1977න් පස්සේ මේ රටට ආපු ආයෝජන මොනවාද කියලා සොයා බලන්න කියලා.

විවෘත ආර්ථිකය හඳුන්වා දීලා, අපේ රට වේගවත් සංවර්ධනයට ලක් කරනවා කියලා විවෘත ආර්ථිකයේ කප්පිත්තෝ අපට කිව්වත්, ගත වෙච්ච අවුරුදු 48 තුළ මේ රට ගොඩනහන්න තරම් ප්‍රමාණවත් ආයෝජන ගේන්න ඒ පාලක කණ්ඩායම් දෙකතුනම අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි සැලසුම් කර තිබෙනවා, ආයෝජන ගේන්න. මේ අවුරුදු 5 ඇතුළේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියා තිබෙන ආර්ථික වර්ධනය ළඟා කර ගන්න අවශ්‍ය ආයෝජන මේ රටට ගේන්න අපි සියලු සැලසුම් හදමින් තිබෙනවා. එවැනි වටපිටාවකයි අපි මේ අය වැය ඉදිරිපත් කරන්නේ. මේ රට, දශක ගණනාවක් තිස්සේ බදු මත යැපෙන රටක්. ජනතාවගේ සීනි කිලෝවට, හාල් කිලෝවට, පිටි පැකැට්ටුවට බදු ගහලා, වක්‍ර බදු මත පවත්වාගෙන යන රටක් නිර්මාණය කරපු මහත්වරු අපෙන් අහනවා, මේ මාස 6ට ඔබ මොනවාද කළේ, මේ බදු අඩු කරන්න ඔබ හදපු සැලසුම් මොනවාද කියලා. අපි කලබල වෙන්නේ නැහැ. පියවරෙන් පියවර මේ රට ගොඩනඟන සැලසුම් අපි ඉදිරිපත් කරමින් තිබෙනවා. ඒ නිසා තමයි මේ අය වැය තුළ අධ්‍යාපනයට ඉතිහාසයේ වැඩිම මුදල අපි වෙන් කළේ. මේ අය වැයෙන් රුපියල් බිලියන 619ක් අපි අධ්‍යාපනයට වෙන් කර තිබෙනවා. මේ රට ගොඩනඟද්දී, මේ රටේ සංවර්ධනය ඉදිරියට ගෙන යද්දී අධ්‍යාපනය ඉතා වැදගත් ආයෝජනයක් කියන එක මේ ආණ්ඩුව විශ්වාස කරන නිසා අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම මේ රට ගොඩනඟද්දී නීරෝගී සම්පන්න, සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් නිර්මාණය කර ගන්න ඉතිහාසයේ වැඩිම මුදලක් සෞඛ්‍යයට වෙන් කර තිබෙනවා. ඒ, රුපියල් බිලියන 604ක්. මේ, අපේ දැක්ම. රට හදන වැඩ පිළිවෙළ තුළ මුදල් වෙන් කරද්දී මුදල් අමාත්‍යාංශය ඒ පිළිබඳ නිශ්චිත ගවේෂණයකින්, නිශ්චිත අධ්‍යයනයකින් යුතුව ඒ ඒ ක්ෂේත්‍ර ගොඩනඟන්න මුදල් වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශය යටතේ ඉතා වැදගත් ආයතනයක් තිබෙනවා. ඒ ආයතනය තමයි, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.

අද දවස පුරා ගොඩක් මන්ත්‍රීවරු කථා කළා සුරාබදු දෙපාර්තමේන්තුව පිළිබඳව. 1912 අංක 8 දරන සුරාබදු ආඥාපනත ස්ථාපිත කරලා, 1913 ඉඳලා තමයි පනත ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. නීති විරෝධී මත්පැන් සමාජගත වීම

[ගරු අරවින්ද සෙනරත් මහතා]

වැළැක්වීම සඳහා නීත්‍යානුකූලව මත්පැන් බලපත්‍ර ලබා දෙමින් සමාජයේ පුරවැසියන් ඒ සඳහා යොමු කිරීම තමයි එහි අරමුණු අතර මූලිකම අරමුණක් බවට පත් වුණේ. හැබැයි, මත්පැන් බලපත්‍ර ලබා දීලා රජය යම් නිශ්චිත ආදායමක්, බදු මුදලක් උපයද්දී එම බලපත්‍ර ඉතිහාසය පුරාම ලබා දීලා තිබෙන්නේ - සියයට 90කට වඩා ලබා දීලා තිබෙන්නේ- දේශපාලන හිතවත්කම් මත. මේ බලපත්‍ර ලබා දෙද්දී මැතිවරණ ඉලක්ක කරලා තමන්ගේ ගෝලයන්ට, තමන්ට වැඩ කරපු සංවිධායකයන්ට ආදායම් මාර්ග හදා ගන්න බලපත්‍ර ලබා දීපු ඉතිහාසයක් තිබෙන්නේ. එම ඉතිහාසය ඇතුළේ 2022.01.01 දින සිට 2024.04.30 දින දක්වා බලපත්‍ර 431ක් ලබා දීලා තිබෙනවා. ඒ කියන්නේ, පසුගිය ආණ්ඩුව, රනිල් වික්‍රමසිංහ මහත්මයා මැතිවරණය අත ළඟ තබාගෙන තමන්ගේ ගෝලයන්ට ආදායම් උපයා ගන්න ඉඩ හදන්න බලපත්‍ර 431ක් දීලා තිබෙනවා. ලංකාවේ දැනට බලපත්‍රලාභී සුරාසැල් 3,884ක් පවතිනවා. 2024 අපේක්ෂිත ආදායම වුණා, රුපියල් බිලියන 32ක්. හැබැයි උපයා ගත්තේ රුපියල් බිලියන 27යි. ඒ වාගේම 2025 අපේක්ෂිත ආදායම විධියට තිබෙනවා, රුපියල් බිලියන 242ක්. සුරාබදු දෙපාර්තමේන්තුව කියන්නේ රටේ ජනතාවත් එක්ක ගැට ගැහුණු වැදගත් ආයතනයක්. පාර්ලිමේන්තුව ඇතුළේ විවිධ තර්ක තිබෙන්න පුළුවන්. අද උදේ කථා කරපු මන්ත්‍රීවරු කිව්වා, මත්පැන්වල මිල වැඩියි කියලා. හැබැයි ක්‍රමානුකූලව මේවා මත යැපෙන තැනකට ගෙනැල්ලා තිබෙනවා. අපි කැමැති වුණත්, අකැමැති වුණත් සමාජයේ පුරවැසියෝ මේවා පරිභෝජනය කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව මිනිත්තුවක කාලයක් ලබා දෙන්න.

සමාජය ඉල්ලා සිටිනවා, නීත්‍යානුකූලව, රජය විසින් සපයන ආයතනවලින් අඩු මිලට මත්පැන් බෝතලයක් ලබා දෙන්න කියලා. ඒ, සමාජයේ කථා බහ වෙන දේවල්. අපි මත්පැන් පානය කළත් නැතත් මේක තමයි සමාජයේ දැනට පවතින තත්ත්වය. ඒක කුටුම්භයට ලොකු වාසියක් ගෙනැත් දෙන්න පුළුවන්. අද දවසේ රුපියල් 3,000ක ආදායමක් ලබන කෙනා මත්පැන් සඳහා වැඩි මුදලක් වෙන් කරද්දි තමන්ගේ දරුවාට කෑම ටික දෙන්න ගිහින් තමයි කුස්සියේ අර්බුදය පැන නඟින්නේ. එම නිසා අපි ආණ්ඩුව විධියට ඒ යෝජනාත් අරගන්න ඕනෑ.

සුරාබදු දෙපාර්තමේන්තුව ඉතා වැදගත් ආයතනයක්. මේ ආයතනය තුළ ඉතිහාසයේ වෙච්ච වැරදි ටිකක් තිබෙනවා. මත්පැන් බලපත්‍ර දෙද්දි අවට පරිසරය පිළිබඳව සොයා බැලුවේ නැහැ. මගේ ආසනයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට බලපත්‍ර ලබා දීලා තිබෙනවා. ඒ ආණ්ඩුව නියෝජනය කරපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට තමයි එම බලපත්‍ර දුන්නේ. එම ආණ්ඩුව නියෝජනය කරපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ නමින් ගත් බලපත්‍ර ගණනාවක් තිබෙනවා. ඒවා දෙද්දි වටපිටාවේ ඉන්න පුරවැසියන්ගේ අවශ්‍යතා ගැන සෙව්වේ නැහැ. එම නිසා අද අර්බුද ගණනාවක් මතු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අය වැයෙන් කර්මාන්තකරුවන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ආයෝජන සඳහා ආකර්ෂණය කර ගැනීමට දැවැන්ත මුදලක් වෙන් කර තිබෙනවා. එම නිසා මේ රට ගොඩනඟන්න පුළුවන් පුරවැසි කණ්ඩායමක් විධියට අපට සතුටක් තිබෙනවා, මේ ආණ්ඩුව ඉදිරිපත් කරපු පළමු අය වැයෙන්ම මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න පුළුවන් නිෂ්පාදන ආර්ථිකයට පණ දෙන්න පුළුවන් යෝජනා ඉදිරිපත් කර ගන්න පුළුවන් වුණා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාස හය ඇතුළත රටේ ආර්ථික කළමනාකරණයක් ඇති කරලා අපේ ආහාරවල මිල ගණන් අඩු කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය හැම දාම තිබෙන එකක් නැහැ. ඒක වෙළෙඳ පොළේ ඉල්ලුම හා සැපයුම අනුව සිදු වන දෙයක්. හැබැයි, කියන්න සතුටුයි රුපියල් 385ට තිබුණු දුඹුරු සීනි කිලෝග්‍රෑම් එකක මිල අද වනකොට රුපියල් 265 දක්වා අඩු වෙලා තිබෙනවා. රුපියල් 460ට තිබුණු බී ලූනු කිලෝග්‍රෑම් එක අද වනකොට රුපියල් 180, 160 දක්වා අඩු වෙලා තිබෙනවා. රුපියල් 400ට තිබුණු අර්තාපල් කිලෝග්‍රෑම් එක අද වනකොට රුපියල් 160, 170ට අඩු වෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා මේ මාස හය තුළ අපි ආර්ථිකය කළමනාකරණය කරලා මේ කරපු වෙනස ඇතුළේ ජනතාවට විශාල සහන ලැබෙමින් තිබෙනවා කියලා. ඒ ගැන අපි සතුටු වනවා. මේ මාස හයේ ආණ්ඩුව ආර්ථිකය කළමනාකරණය කරන්න මැදිහත් වීම නිසාත්, මේ අය වැය තුළිනුත් රටට ජයග්‍රහණ ගොඩක් අත්පත් කර ගන්න පුළුවන්. ඒ තුළින් සමාජ වෙනසක්, රටේ වෙනසක් ඇති කර ගන්න අපි සමත් වනවා කියන විශ්වාසය තිබෙනවා. මෙය ජනතාවාදී අය වැයක්. මේ අය වැය ක්‍රියාත්මක වෙලා බිම් මට්ටමට ප්‍රතිලාභ ලැබෙන තෙක් ගම්වල පුරවැසියෝ සතුටින් බලාගෙන ඉන්නවා. අපි ධෛර්යයෙන් මේ කටයුත්තත් එක්ක සම්බන්ධ වෙලා ඉන්නවා කියමින්, මගේ කථාව අවසන් කරනවා. අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.53]

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අය වැය කාරක සභා අවස්ථාවේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ මොහොතේ මම කියන්න කැමැතියි, මෙම අය වැය තුළ ඉතාම සාධනීය අංග බොහෝ ප්‍රමාණයක් තිබෙන බව.

ඒ අතර තිබෙන එක් සාධනීය ලක්ෂණයක් තමයි, මේ අය වැය තුළ සෑම ප්‍රදේශයකටම මුදල් විසිරෙන විධියට; ව්‍යාප්ත වන විධියට ව්‍යාපෘති සහ වැඩසටහන් තෝරලා තිබීම. ඒක මේ අය වැයේ තිබෙන සාධනීය ලක්ෂණයක්. අපි දන්නවා, පසුගිය කාලයේ මේ ව්‍යාපෘති තෝරා ගනිද්දී, අය වැය තුළින් ඒවාට මුදල් වෙන් කරගනිද්දී කටයුතු සිදු වුණේ කොහොමද කියලා. එක්කෝ ඇමතිතුමා ඉන්න පැත්තට, නැත්නම් ජනාධිපතිතුමා ඉන්න පැත්තට, එහෙමත් නැත්නම් පවුලේ ඉන්න ඇමතිකම් දරන අයගේ අමාත්‍යාංශවලට තමයි වැඩියෙන් මුදල් වෙන් වෙලා තිබුණේ. හැබැයි මෙවර අය වැයෙන් සියලු ක්ෂේත්‍ර නියෝජනය වන විධියට, සියලු ප්‍රදේශ නියෝජනය වන විධියට මුදල් වෙන් වෙලා තිබෙනවා. උතුරටත්, නැහෙනහිරටත්, බටහිරටත්, දකුණටත් මුදල් වෙන් වෙලා තිබෙනවා. විශේෂයෙන් වතුකරයට

මුදල් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම, ක්ෂේත්‍ර විධියට ගත්තොත්, කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය ඇතුළු අනෙකුත් කර්මාන්ත සඳහා මෙන්ම ග්‍රාමීය මාර්ග සැදීම වැනි සියලු ක්ෂේත්‍රවලට මුදල් වෙන් වෙලා තිබෙනවා. එය මේ අය වැයේ තිබෙන සාධනීය ලක්ෂණයක් ලෙස අපට අගය කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන ගල්ගමුව ආසනයේ ග්‍රාමීය මාර්ග තිබෙනවා, කිලෝමීටර 1,300කට වැඩි ප්‍රමාණයක. පසුගිය අවුරුද්දේ මේ මාර්ග හදන්න, පිළිසකර කරන්න රුපියලක්වත් වියදම් කරලා නැහැ. ඒ ගැන මට කියන්න කනගාටුයි. ඒ මාර්ගවලට එක බොරලු ඇටයක්වත් දාලා නැහැ. ඒ නිසා ඒ මාර්ග පද්ධතිය අබලන් වෙලා තිබෙන්නේ; සමස්ත මාර්ග පද්ධතියම අබලන් වෙලා තිබෙන්නේ. පාසල් යන දරුවෝ ඉතාම අමාරුවෙන් පාසලට යන්නේ. රැකියාවලට යන අය, බස් රථ රියැදුරන් මේ සියලු දෙනා අමාරුවෙන් තමයි ප්‍රවාහන කටයුතු කරමින් සිටියේ. හැබැයි ගරු ජනාධිපතිතුමා, ප්‍රවාහන සහ මහාමාර්ග ඇමතිතුමා ප්‍රමුඛ අපේ රජය ඉදිරිපත් කළ අය වැය ඇතුළේ ග්‍රාමීය මාර්ග නවීකරණය සඳහා; අලුත්වැඩියා කිරීම සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. රුපියල් මිලියන 29,680ක ප්‍රතිපාදනයක් වෙන් කරලා තිබෙනවා, ග්‍රාමීය මාර්ග අලුත්වැඩියා කරන්න. ඒක අපිට අගය කරන්න පුළුවන්, යෝජනාවක් විධියට. ඒ වාගේම ග්‍රාමීය පාලම් නවීකරණය කරන්න රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ග්‍රාමීය ප්‍රදේශවලට මුදල් ගලායන විධියට ගල්ඔය, රාජාංගනය, මින්නේරිය, හුරුළුවැව යෝජනා ක්‍රමවල පහළ සංවර්ධන කටයුතු කරන්න රුපියල් මිලියන 2,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, රාජාංගනය ජල ව්‍යාපාරය ඇතුළේ අවුරුදු ගණනාවකින් ඇළ වේලි ප්‍රතිසංස්කරණය වෙලා නැහැ කියලා. මේ ව්‍යාපාරය තුළ පහළට ජලය ගෙනියන්න හැකියාවක් නැහැ. මෙවර අය වැයෙන් රුපියල් මිලියන 500කට අධික මුදලක් වෙන් කරලා ඒ යෝජනාව ක්‍රියාත්මක කරනවා.

අපි දන්නවා, වියළි කලාපයේ ගිරිබාව, එප්පාවල, ගල්ගමුව වැනි ප්‍රදේශ අවුරුදු ගණනාවක් වියළි බවෙන්, ජලය නැතිකමෙන්, සුදුසු පානීය ජලය නැතුව ජනතාව පීඩාවට පත්වෙච්ච ප්‍රදේශ කියලා. මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා, ඒ ප්‍රදේශවල ජනයාගේ පානීය ජල සැපයුම විධිමත් කරන්න; යථාවත් කරන්න. ඒ වාගේම, පහුගිය කාලයේ -2003 වසරේ- සියඹලන්ගමුව ඔය හරස් කරලා මහගල්ගමුව වැවට ජලය ගේන්න රුපියල් මිලියන 510ක් වෙන් කරලා ආරම්භ වෙච්ච ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ ව්‍යාපෘතිය 2016 වෙද්දී නැවතිලා තිබෙනවා. එහි මුදල් අක්‍රමිකතා, වංචා, දූෂණ, නාස්තිය සිදුවී තිබෙනවා. හැබැයි ඒ ව්‍යාපෘතිය නිම කළා නම්, ඒ ව්‍යාපෘතිය යටතේ එක අවුරුද්දකට අලුතෙන් කුඹුරු අක්කර 2,000ක් අස්වද්දන්න පුළුවන්. දැනට තිබෙන කුඹුරු අක්කර 2,000ක් අලුතෙන් වැඩ කරන්න පුළුවන්. අවුරුද්දකට යල, මහ කන්න දෙකේම අලුතෙන් අක්කර 600ක් අස්වද්දන්න පුළුවන්. මේ ව්‍යාපෘතිය 2016 ඉඳලා 2024 වෙනකම් ක්‍රියාත්මක වුණා නම්, අන්න ඒ අවුරුදු 8 ඇතුළේ කුඹුරු අක්කර 2,000ක් වැඩ කළා නම් මේ ව්‍යාපෘතියට වැය වුණු මුදල අපේ ජාතික ආදායමට එකතු කරගන්න තිබුණා. හැබැයි අපේ ජනාධිපතිතුමා, ඇමතිතුමා ග්‍රාමීය අර්ථිකය ශක්තිමත් කිරීමට ඒ ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කරන්න අදාළ මුදල් වෙන් කරලා තිබෙනවා.

සියල්ල ගත්තොත්, සමස්ත වාරිමාර්ග ක්ෂේත්‍රය සඳහා රුපියල් මිලියන 78,000ක දැවැන්ත මුදලක් වෙන් කරලා තිබෙනවා, ග්‍රාමීය ප්‍රදේශවලට සංවර්ධනය ගේන්න. ඒ වාගේම අලි -මිනිස් ගැටුම නවත්වන්න රුපියල් මිලියන 640ක මුදලකුත් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා අපි කියන්න සතුටුයි, සෑම ප්‍රදේශයකටම මුදල් සංසරණය වෙන විධියට, හැම ප්‍රදේශයකටම මුදල් ගලා යන විධියට මේ අය වැය තුළින් කටයුතු කර තිබෙන බව. ඒ පැත්තෙන් මේ අය වැය සාර්ථකයි.

ඊළඟට අපි දන්නවා, පසුගිය කාලයේ අපේ රටේ පැවති ව්‍යාපෘති ගැන. ආර්ථිකයට දායක වෙන්නේ නැති, බද්ධ වෙන්නේ නැති ව්‍යාපෘති ගණනාවක් මේ රටේ සිද්ධ වුණා. ඒ වෙනුවෙන් අපේ රටේ ජනතාව මුදල් ගෙවමින් ඉන්නවා. අපි දන්නවා, කුලුනු හදපු බව; ක්‍රීඩා නොකරන ප්‍රදේශවල ක්‍රීඩා පිටි හදපු බව. ඒවා තුළින් මේ ආර්ථිකයට යමක් දායක වෙන්නේ නැහැ. හැබැයි, මෙවර සියලු යෝජනා හරහා ජනතාවට වඩා ඵලදායී ව්‍යාපෘතිවලට මුදල් යොදලා තිබෙනවා. ඒක මේ අය වැයේ තිබෙන විශේෂ ලක්ෂණයක්. ඒත් එක්කම මේ සියලු ව්‍යාපෘති වඩාත් ඵලදායී විධියට අපේ අලුත් දේශපාලන සංස්කෘතිය ඇතුළේ, මේ බිමේ ක්‍රියාත්මක වෙද්දී, වඩාත් ප්‍රතිඵලදායක ලෙස අපට ඒවා අවසන් කර ගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අස්වැසුම ක්‍රියාවලිය ගත්තොත්, ඒක ඇතුළේ පසුගිය කාලයේ තිබුණු ගැටලු නිරාකරණය කරමින් අපි විශාල සහන ප්‍රමාණයක් ජනතාවට ලබා දෙමින් යනවා. සංක්‍රාන්ති සමාජ කාණ්ඩයෙන් ඉවත් වෙන්න හිටපු අයගේ ඒ සහන කාලය අපි දීර්ඝ කරලා තිබෙනවා. රුපියල් 8,500ක මාසික ප්‍රතිලාභ දීමනාව, රුපියල් 10,000 දක්වා වැඩි කළා. ඒ වාගේම රුපියල් 15,000 දීමනාව, රුපියල් 17,500 දක්වා වැඩි කළා. අස්වැසුම ලබන හැම පවුලකම දරුවෙකුට රුපියල් 6,000ක් පොත් පත් ගන්න ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දරුවන් 300ට අඩු පාසල්වල ඒ සියලු දරුවන්ටත් මේ සහනය ලබා දුන්නා. ඒ වාගේම ආබාධිතයින් සඳහා ලබා දෙන දීමනාව, වකුගඩු රෝගීන් සඳහා දෙන දීමනාව රුපියල් 7,500 සිට රුපියල් 10,000ට වැඩි කළා. වැඩිහිටි දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කළා. ඒත් එක්කම අවුරුදු කාලයට සහන අවශ්‍ය පවුල්වලට බඩු ගන්න රුපියල් 5,000ක බඩු මල්ලක් දෙන්නත් අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒත් එක්කම අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 4ක් සංවර්ධනය කරන්නත් අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම රැඳවුම් නිවාසවල ඉන්න දරුවන්ට රුපියල් 5,000ක මාසික දීමනාවක් දෙන්නත්, 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වලාභී දරුවන්ට ලබා දුන් ශිෂ්‍යාධාර මුදල රුපියල් 750 සිට රුපියල් 1,500 කරන්නත්, ඒ වාගේම ක්‍රීඩා පාසල්වල සිසුන්ට ලබා දෙන මාසික පෝෂ්‍යදායී ආහාර දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 10,000 වැඩි කරන්නත්, විශ්වවිද්‍යාල සිසුන් සඳහා ගෙවනු ලබන මහපොළ ශිෂ්‍යාධාර ගෙවීම රුපියල් 5,000 සිට 7,500 දක්වා වැඩි කරන්නත් ආණ්ඩුවෙන් විශාල විධියට මුදල් වෙන් කරලා තිබෙනවා.

ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අද විපක්ෂය කලබල වෙලා තිබෙන්නේ ගමට මුදල් ගිහිල්ලා, ගමේ ආර්ථිකය ශක්තිමත් වෙලා, ඒත් එක්කම ගමේ ජනතාව ආණ්ඩුවත් එක්ක අත් වැල් බැඳ ගනිවි කියන බිය නිසායි. ඒත් එක්කම සහන අවශ්‍ය සියලු කාණ්ඩ අත නොහැර ඒ සියලු දෙනා වෙනුවෙන් ආණ්ඩුව මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ සියලු දෙනා ඒකාබද්ධ කර ගත්ත, ඒ සියලු දෙනා ගැන බලන, සියලු දෙනා වෙනුවෙන් පෙනී සිටින අය වැයක් බවට මේ අය වැය පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ රට අලුත් යුගයකට ගෙන යන ඒ ගමනේ ආරම්භය මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙනවා කියලා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ சிவஞானம் சிறீதரன் அவர்கள்! உங்களுக்கு 13 நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.02]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு 15 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்து. தற்பொழுது அது 13 நிமிடங்களாகக் குறைக்கப்பட்டு இருக்கிறது. முதலில் நான் இந்தச் சபையில் உங்களுடைய அனுமதியோடு இறந்துபோன எங்களுடைய மூன்று மூத்தவர்கள் பற்றிய பதிவுகளைச் செய்ய விரும்புகின்றேன்.

முக்கியமாக, 'ஞாயிறு தினக்குரல்' பத்திரிகை மற்றும் "Thinakkural" online paper ஆகியவற்றின் முன்னாள் பிரதம ஆசிரியரும் 'வீரகேசரி' வட பிராந்திய பதிப்பின் ஆசிரியருமான மூத்த பத்திரிகையாளர் இராஜநாயகம் பாரதி அவர்கள் தனது 63ஆவது வயதில் கடந்த 2025.02.09ஆம் திகதி, ஞாயிற்றுக்கிழமை காலமானார். 'தினக்குரல்' பத்திரிகையின் முன்னாள் உதவி ஆசிரியரான தேவகியின் துணைவரான பாரதி ஒரு பிள்ளையின் தந்தையும் ஆவார். யாழ்ப்பாணம், திருநெல்வேலியைப் பிறப்பிடமாகக்கொண்ட பாரதி, 1980களில் 'ஈழமுரசு' பத்திரிகையின் ஆசிரிய பீடத்தில் பணியாற்றினார். அதன்பின்னர், அவர் 'முரசொலி' பத்திரிகையின் ஆசிரிய பீடத்தில் பணியாற்றிய நிலையில், கொழும்பை வதிவிடமாக்கிக் கொண்டதுடன், 'வீரகேசரி' பத்திரிகையின் ஆசிரிய பீடத்தின் உதவி ஆசிரியராகவும் பணியாற்றினார். இந்நிலையில் 1997ஆம் ஆண்டு 'தினக்குரல்' பத்திரிகை தோற்றம் பெறவே, அதில் தன்னை இணைத்துக் கொண்ட பாரதி, 'ஞாயிறு தினக்குரல்' பத்திரிகையின் பிரதம ஆசிரியராக 2021ஆம் ஆண்டு வரை பணிபுரிந்ததுடன், "Thinakkural" online paperஇன் ஆசிரியராகவும் இருந்தார்.

இந்நிலையில் மீண்டும் தனது மண்ணுக்குத் திரும்பிய பாரதி, 'ஈழநாடு' பத்திரிகையின் பிரதம ஆசிரியராகப் பணியாற்றினார். 'வீரகேசரி' பத்திகையின் வட பிராந்திய பதிப்பின் ஆசிரியராகப் பணிபுரிந்த வேளையிலேயே அவர் காலமானார். 'ஞாயிறு தினக்குரல்' பத்திரிகையில் ஆர். பாரதி, அபிமன்யு, பார்த்தீபன் ஆகிய பெயர்களில் இவர் பல்வேறு கட்டுரைகளை எழுதி வந்ததுடன், சர்வதேச ஊடகங்களுக்கு அரசியல் கருத்துகளையும் செவ்விகளையும் வழங்கி வந்தார். பல மாவட்டங்களில் நடாத்தப்பட்ட ஊடகப் பயிற்சிப் பட்டறைகளில் வளவாளராகப் பயிற்சிகளையும் வழங்கி யுள்ளார். அதுமட்டுமன்றி, தமிழ் ஊடகவியலாளர் ஒன்றியத்தின் ஸ்தாபக உறுப்பினரான பாரதி, பின்னர் அதன் தலைவராகவும் செயலாளராகவும் இருந்துள்ளார்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு மேலும் 2 நிமிடங்கள் வழங்கப்படுகின்றன.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
நன்றி!

அடுத்து, அனைத்துலக BBCஇன் - பிரித்தானிய ஒலிபரப்புக் கூட்டுத்தாபனத்தின் - நீண்டகால செய்தி வாசிப்பாளராக இருந்த, தமிழர் உரிமை விடயத்தில் தன்னுடைய கரிசனையைக் கொண்டிருந்த, குறிப்பாக வடக்கு, கிழக்கு, மலையகம் சார்ந்த மக்களுடைய விடயங்களை வெளியுலகத்துக்குக் கொண்டுவந்த ஊடகவியலாளரான ஆனந்தி சூரியப்பிரகாசம் அவர்கள் 2025.02.21ஆம் திகதி, வெள்ளிக்கிழமை இயற்கை எய்தியிருந்தார். இவர்கள் இருவருக்கும் இந்தச் சபையில் எனது அஞ்சலியைச் செலுத்திக் கொள்கின்றேன்.

அடுத்து, தினக்குரல், யாழ். தினக்குரல் பத்திரிகை, 'நொதென் சென்றல்' வைத்தியசாலை ஆகியவற்றின் ஸ்தாபகரும் தலைவரும் நாட்டின் முக்கிய தொழிலதிபர்களில் ஒருவருமான எஸ்.பி. சாமி என அழைக்கப்படும் செல்லையா பொன்னுச்சாமி தனது 89ஆவது வயதில் 2025.02.19ஆம் திகதி, புதன்கிழமை இரவு யாழ்ப்பாணத்தில் காலமானார். நான்கு பிள்ளைகளின் தந்தையான செல்லையா பொன்னுச்சாமி, 1936ஆம் ஆண்டு தை மாதம் 1ஆம் திகதி தீவகம், வேலணை மண்ணில் பிறந்தார்.

நீண்டகாலம் கொழும்பில் வசித்த அவர், அத்தியாவசிய உணவுப் பொருட்கள் ஏற்றுமதி, இறக்குமதி சங்கத்தின் தலைவராகவும் கொழும்பு - புறக்கோட்டை வர்த்தக சங்கத்தின் தலைவராகவும் பதவி வகித்தார். தமிழ் இனப்பற்றுக்கொண்ட எஸ்.பி. சாமி அவர்கள், தமிழ் மக்கள்மீது இழைக்கப்பட்ட கொடூரங்களை நேரில் எதிர்கொண்ட அனுபவத்தையும் அவற்றுக்கு நீதி மறுக்கப்பட்ட வலியையும் அறிந்து, அச்சுத்துறை சார்ந்து நீண்டகாலம் தனக்கிருந்த அனுபவத்தைக்கொண்டு, 1997ஆம் ஆண்டு தமிழ் மக்களின் தன்மானக் குரலாக தினக்குரல் பத்திரிகை நிறுவனத்தை கொழும்பில் ஸ்தாபித்து, தமிழ் பத்திரிகை வரலாற்றில் முத்திரை பதித்தார். மேலும், வடக்கு, கிழக்கிலுள்ள தமிழ் மக்களின் துயரங்களை வெளிக்கொண்டுவரும் முகமாக யாழ். தினக்குரல் பத்திரிகை நிறுவனத்தை வடக்கிலும், கிழக்குத் தினக்குரல் பத்திரிகை நிறுவனத்தை மட்டக்களப்பிலும் ஸ்தாபித்து தமிழ் ஊடகப் பரப்பில் தவிர்க்க முடியாத சக்தியாகவும் தமிழ் மக்களுக்கு எதிரான அநீதிகளை வெளிக்கொண்டு வந்தவராகவும் விளங்கினார்.

வர்த்தக, ஊடகத்துறையில் மட்டுமன்றி, இறுதி யுத்தத்தின் கொடுமைகளை அனுபவித்து யாழ்ப்பாணம் வந்த மக்களை அரவணைத்த சமய, சமூக அமைப்புகளின் செயற்பாடுகளிலும் எஸ்.பி. சாமி முக்கிய வகிபாகத்தை வகித்தார். அதுமட்டுமன்றி, போருக்குப் பின்னர் மீள்குடியேறிய மக்களின் பிரச்சினைகளைப் பத்திரிகையூடாக வெளிப்படுத்துவதிலும் பாதிக்கப்பட்டவர்களுக்கான உதவிகளை வழங்குவதிலும் தீவிர கவனம் செலுத்தினார். யுத்தம் நிறைவடைந்த பின்னர், 'தினக்குரல்' பத்திரிகையூடாக 'கருணைப்பாலம்' எனும் அமைப்பை உருவாக்கி, அதனூடாக வன்னியில் போரால் பாதிக்கப்பட்ட பல்லாயிரக்கணக்கான மக்களின் வாழ்வாதாரத்துக்குக் கைகொடுத்தார். இவருடைய சேவைகளைப் பகிர்ந்துகொள்கின்ற அதேநேரம், இவருக்கும் என்னுடைய அஞ்சலியை இந்த உயர்ந்த சபையில் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இங்கு முக்கியமானதொரு விடயத்தைப் பதிவுசெய்ய வேண்டும். நேற்றைய தினம் இந்தச் சீருயர் சபையில் கௌரவ சபாநாயகர் அவர்களால் பாராளுமன்ற உறுப்பினர் இராமநாதன் அர்ச்சுனா அவர்கள்மீது சில தடைகள் விதிக்கப்படுவதாக அறிவிக்கப்பட்டது. குறிப்பாக, எட்டு நாட்களுக்கு அவருடைய பேச்சுக்கள் ஒளி, ஒலிபரப்புச் செய்யப்படாமல் இருப்பதற்கும், பாராளுமன்றத்துக்குப் பொருத்தமில்லாத கூற்றுக்கள் ஹன்சாட்டில் பதியப்படாமல்

இருப்பதற்கும் நடவடிக்கை எடுத்திருப்பதாக அவர் அறிவித்திருந்தார். கௌரவ அர்ச்சுனா அவர்கள் பாராளுமன்றத்துக்குப் புறநிலையான சொற்களை - unparliamentarily words - பாவித்திருந்தார் என்ற விடயம் சபாநாயகர் அவர்களால் சுட்டிக் காட்டப்பட்டது. கௌரவ சபாநாயகர் அவர்கள் இந்தச் சீருயர் சபையின் தலைவர், பொறுப்பாளர் என்ற வகையில், அவர் எடுக்கும் முடிவுகளை நாங்கள் ஏற்று, அவற்றுக்கு கட்டுப்பட்டு நடக்கின்றோம். கௌரவ உறுப்பினர் அவர்கள் தனக்குள்ள சிறப்புரிமையைப் பயன்படுத்தி இந்தச் சபையில் பெண்களுக்கு எதிரான வன்மங்களைக் கொட்டுவதையோ அல்லது ஒரு சமயத்தைச் சார்ந்தவர்களுக்கு - முஸ்லிம் சகோதரர்களுக்கு - எதிரான வன்மங்களைக் கொட்டுவதையோ நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை.

நீண்ட காலமாக எங்களுக்கும் முஸ்லிம் சகோதரர்களுக்கும் இடையில் தமிழ் பேசும் மக்களாக ஓர் அன்னியோன்னிய உறவு இருந்து வந்தது. எனினும், கடந்த யுத்த காலத்தில் ஏற்பட்ட மனக்கசப்புகள் அந்த உறவைப் பாதித்திருக்கிறது. அவர்களுக்கும் எங்கள்மீது காயங்கள் உண்டு. அதேபோல், எங்களுக்கும் அவர்கள்மீது காயங்கள் உண்டு. அவற்றைத் திரும்பத் திரும்ப தோண்டிப் பார்ப்பதல்ல எங்களுடைய நோக்கம். நாங்கள் தமிழ் பேசும் மக்களாக மற்றவர்களுடைய மார்க்கம், சம்பிரதாயம், கலாசாரம், பண்பாடு என்பவற்றை மதித்து நடக்கின்றவர்கள் என்ற வகையில், அவற்றுக்கு எதிரானவர்கள் அல்லர். தமிழ் மக்கள் ஒருகாலமும் அவற்றை எதிர்க்கவுமில்லை. கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்கள் பேசிய விடயங்களில் தவறுகள் இருக்கலாம். அவ்வாறு தவறுகள் இருந்தால், அதற்காக நாங்கள் ஒட்டுமொத்த தமிழ் மக்கள் சார்பிலும் மன்னிப்புக் கேட்கின்றோம். அவற்றை முஸ்லிம் மக்கள் பெரிய விடயமாக எடுத்துக் கொள்ளக்கூடாது என்பது எங்களுடைய மிக விநயமான வேண்டுகோளாகும். ஒரு தமிழ் பாராளுமன்ற உறுப்பினரான இராமநாதன் அர்ச்சுனா அவர்கள் மீதான தடை இந்தப் பாராளுமன்றத்தில் முதன்முதல் வந்திருப்பது, ஓர் ஆரோக்கியமான விடயமா? என நான் பல தடவை யோசித்ததுண்டு. நீண்ட நேர யோசனையின் பின்னர், நான் இந்தப் பதிவை இங்கு செய்ய விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1988-1989ஆம் ஆண்டு காலப்பகுதியில், UNP அரசாங்கம் இருந்த காலத்தில் - ஜே.ஆர். ஜெயவர்தன, ஆர். பிரேமதாஸ அவர்களுடைய ஆட்சிக் காலத்தில் - JVPஇன் போராளியாகக் கைதுசெய்யப்பட்டு, கைவிரல்களிலுள்ள நகங்கள் பிடுங்கப்பட்டு சித்திரவதைகளுக்கு உள்ளாக்கப்பட்டவர்களில் நீங்களும் ஒருவர். நீங்கள் பாராளுமன்றத்துக்கு முதல் தடவையாக தெரிவாகி, இன்று இந்தச் சபைக்குத் தலைமைதாங்கும் ஒருவராக மாறியிருக்கின்றீர்கள் என்றால், அதற்குக் காரணம் உங்களுடைய 50 வருடகால பொறுமையும் காத்திருப்பும் உழைப்புமே ஆகும். இந்தச் சபை எத்தனையே மனிதர்களைக் கண்டிருக்கிறது. அதேநேரம், எத்தனையோ பேர் வந்து போய்க்கொண்டு இருக்கிறார்கள். இவ்வாறான நிலையில், ஒரு பாராளுமன்ற உறுப்பினர்மீது விதிக்கப் பட்டுள்ள தடையானது, நாளை இன்னும் எத்தனை பேர்மீது பாயும்? யார், யாரை என்னென்ன வழிகளில் அடக்க முடியும்? இது தேசிய நல்லிணக்கத்துக்குக் குந்தகமானது என்ற விடயங்கள் எங்களை சில தேடல்களை நோக்கி நகர்த்தி இருக்கின்றன.

பெரியசாமி சந்திரசேகரன் அவர்கள் பிரதி அமைச்சராக இருந்தவர்; ஒரு தமிழ்த் தேசியவாதி! கிளிநொச்சி மண்ணில் கலாசார மண்டபத்தைக் கட்டித்தந்த பெருமைக்குரியவர். மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்க காலத்தில் அவருடைய பெயரில் இருந்த அந்தக் கலாசார மண்டபத்தை அடியோடு பெயர்த்தெறிந்து விட்டார்கள். இன்று அதன் அடையாளம்கூட இல்லை. தமிழீழ விடுதலைப் போராட்டத்தையும் மேதகு பிரபாகரன் அவர்களையும் நேசித்த பெரு மனிதனான அவர் கைதுசெய்யப்பட்டபொழுது - அவர்மீது நடவடிக்கை எடுக்கப்பட்டபொழுது - இந்தச் சபையிலிருந்த யாரும் அவருக்காகக் குரல் கொடுக்கவில்லை என்ற ஆதங்கம் எங்களுக்கு நீண்ட நாட்களாக உண்டு. அந்த நிலைமையில்தான் நான் மிகவும் யோசித்து இந்தப் பதிவை மேற்கொள்கின்றேன்.

மிக முக்கியமாக, இந்தச் சீருயர் சபையில் அப்பாப்பிள்ளை அமிர்தலிங்கம் அவர்களுக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டபொழுது, கண்டி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்திய சிங்கள சமூகத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினரான ஷெல்டன் ரணராஜா அவர்கள் அதை எதிர்த்தார். அதற்காக அவரை சிங்களச் சகோதரர்கள் 'ஷெல்டன் நடராஜா' என நையாண்டி செய்தார்கள். அந்தப் பிரேரணையை சௌமியமூர்த்தி தொண்டமான் அவர்களும் எதிர்த்திருந்தார். அவர் ஒரு தமிழனாக அதை எதிர்த்திருந்தார். அதேநேரம், ஷெல்டன் ரணராஜா அவர்கள் ஒரு சிங்களவராக அதை எதிர்த்திருந்தார். இது இந்தப் பாராளுமன்றத்தில் ஒரு காலகட்டத்தில் நடைபெற்ற விடயமாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 47 வருடங்களுக்கு முன்னர், அதாவது 1978ஆம் ஆண்டு மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்த ஒரு தமிழ் அமைச்சரைக்கொண்டு பயங்கரவாதத் தடைச் சட்டத்தைக் கொண்டுவந்தார்கள். இது உங்களுக்குத் தெரியும் என்று நினைக்கின்றேன். பயங்கரவாதத் தடைச் சட்டத்தைக் கொண்டுவரும்பொழுது, ஜே.ஆர். ஜெயவர்தன அவர்கள் மிகவும் தந்திரமாகப் பேசியிருந்தார். அவர் இலங்கையில் 'நரித் தந்திரசாலி' என்று அழைக்கப்பட்ட ஒருவர். அந்தநேரம் எங்களுடைய தமிழர் விடுதலைக் கூட்டணி சார்பாக 18 பேர் இருந்தார்கள். அவர்களில் ஒருவரான ராஜதுரை அவர்கள் ஜே.ஆர். ஜெயவர்தன அவர்களின் பக்கம் சென்றிருந்த நிலையில், அமிர்தலிங்கம் அவர்களின் பக்கம் 17 பேர் இருந்தார்கள். அன்று ஜே.ஆர். ஜெயவர்தன அவர்கள் அமிர்தலிங்கம் அவர்களிடம், "நான் மூன்று மாதங்களில் இந்தச் சட்டத்தை மீளப் பெற்றுவிடுவேன். ஆகையால், நீங்கள் இதை எதிர்க்க வேண்டாம்" என்று சொல்லியிருந்தார். அந்த நேரம் அந்த வரலாற்றுத் தவறை தமிழர் விடுதலைக் கூட்டணி செய்திருந்தது. அப்பாப்பிள்ளை அமிர்தலிங்கம் அவர்கள் அப்போது எதிர்க்கட்சித் தலைவராக இருந்தார். எதிர்க்கட்சித் தலைவராக இருந்த எங்களுடைய சம்பந்தன் ஐயாவும் அந்த நேரம் ஒரு பாராளுமன்ற உறுப்பினராக இருந்தார். அந்த நேரம் பயங்கரவாதத் தடைச் சட்டத்தை தமிழர்களாகிய நாங்கள் யாரும் எதிர்க்காமல் விட்டது வரலாற்றுத் தவறாகும். அந்த வரலாற்றுத் தவறின் காரணமாக நாங்கள் 47 வருடங்களாகப் பல்லாயிரக்கணக்கான உயிர்களைக் காவுகொடுத்து இருக்கின்றோம்; கோடிக்கணக்கான பெறுமதியுள்ள சொத்துக்களை இழந்திருக்கின்றோம். இன்றும் நாங்கள் இந்த மண்ணில் அந்தச் சட்டத்துக்கூடாக வதைபடுகின்றோம். இது மிக மோசமானது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1988-1989 காலப்பகுதியில் இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்துக்குக்கீழ்தான் நீங்களும் சித்திரவதைகளை அனுபவித்திருப்பீர்கள் என நான் நினைக்கின்றேன். இந்தப்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

பயங்கரவாதத் தடைச் சட்டத்தை தேவநாயகம் என்ற தமிழர்மூலம் இந்தச் சீருயர் சபையில் சமர்ப்பித்து, அதற்கு ஆதரவாக 141 பாராளுமன்ற உறுப்பினர்களை வைத்திருந்த ஜே.ஆர். ஜெயவர்தன அவர்கள், இந்த விடயத்தை மிகத் தந்திரமாகக் கையாண்டிருந்தார். இந்த வரலாறு மிக முக்கியமானது; யாரும் மறந்துவிட முடியாது!

அதேபோல், சிறில் மெத்தியு அவர்கள் இந்தப் பாராளுமன்றத்தில் ஓர் அமைச்சராக இருந்தவர். அவர் 1977ஆம் ஆண்டு காலப்பகுதியில் தமிழ் இனத்துக்கு எதிராக மிக மோசமான வார்த்தைகளைக் கொட்டினார். அதுமாத்திர மன்றி, தேசிய நல்லிணக்கத்துக்கு எதிரான வார்த்தைகளையும் அள்ளி வீசினார். எனினும், அவர்மீது இந்தச் சபை ஒருபோதும் நடவடிக்கை எடுக்கவில்லை; அவருடைய பேச்சுக்களை ஹன்சாட்டிலிருந்து நீக்கவுமில்லை. அவர் அவ்வாறு நடந்துகொண்டதற்காக எந்த விடயங்களையும் கையாளாமல் போனதை நான் இந்த இடத்தில் பதிவுசெய்ய விரும்பு கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் 2 நிமிடங்கள் மாத்திரமே உண்டு.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
தயவுசெய்து, எனக்கு மேலதிகமாக ஒரு நிமிடம் தாருங்கள்!

மிக முக்கியமாக, இந்த நாடாளுமன்றத்தால் பிரதமரானவரும், நாடு தழுவிய மக்களால் சனாதிபதியாக ஆக்கப்பட்டவருமான ஜே.ஆர். ஜெயவர்தன அவர்கள் லண்டனிலிருந்து வெளிவரும் "Daily Telegraph" என்ற பத்திரிகைக்கு 1983 யூலை 11ஆம் திகதி அளித்த நேர்காணலில் கூறிய வார்த்தைகள் - அதாவது, கறுப்பு யூலைக்கு 12 நாட்களுக்கு முன்னர் கூறிய வார்த்தைகள் - எவ்வளவு இனவாதமாக, தமிழின அழிப்புக்குக் காரணமாக இருந்தன என்பதைப் பார்ப்போம். அதில் அவர்,

> "யாழ்ப்பாண மக்களின் அபிப்பிராயத்தைப் பற்றி எமக்கு எதுவும் கவலையில்லை. அவர்களைப் பற்றி எம்மால் எதுவும் யோசிக்க முடியாது. அவர்களின் உயிர்களைப் பற்றியோ, எங்களைப் பற்றி அவர்கள் என்ன நினைக்கிறார்கள் என்பது பற்றியோ எமக்குக் கவலையில்லை."

என்று குறிப்பிட்டிருந்தார்.

1934ஆம் ஆண்டிலிருந்து தொடர்ந்து அரை நூற்றாண்டுக்கும் மேலாக - 56 ஆண்டுகள் - இலங்கையின் அரசியலை வழிநடத்திச் சென்ற ஒருவர், பல அமைச்சுப் பதவிகளை வகித்த ஒருவர், பிரதமர் பதவியை வகித்த ஒருவர், ஒன்றுக்கு இரண்டு முறை தொடர்ந்து சனாதிபதிப் பதவியை வகித்த ஒருவர், இப்படி தமிழ் மக்களை இனப்படுகொலை செய்வதில் தமக்குக் கவலையில்லை என்று கூறியிருந்தார்.

இவர்கள் எல்லாம் இப்படிப் பேசியபொழுது, தேசிய நல்லிணக்கம் கருதி அந்த நேரத்தில் இந்தச் சபையில் எந்தவித நடவடிக்கையும் எடுக்கப்படவில்லை. அதனால்தான் நான் இதனை இங்கு குறிப்பிடுகின்றேன். கரு ஜயசூரிய அவர்கள் சபாநாயகராக இருந்தபொழுது, நீங்கள் இருக்கின்ற இதே சபையில் மிளகாய்தூளால் வீசி அடித்தார்கள்; இங்கிருந்த புத்தகங்களைத் தூக்கி எறிந்தார்கள். அதுமாத்திரமன்றி, வணக்கம் செலுத்துகின்ற, சத்தியம் செய்கின்ற புத்தகங்களைக்கூட தூக்கி எறிந்தார்கள். இவ்வாறு மிக மோசமாக நடந்து கொண்டார்கள். இந்த நாட்டில் ஆர். பிரேமதாஸ அவர்களுக்குப் பின்னர் சனாதிபதியாக இருந்த டி.பீ. விஜேதுங்க அவர்கள், "சிங்களவர்களாகிய நாம் மரம் என்றால், தமிழர்களாகிய நீங்கள் ஒரு கொடிபோல எங்களில் படரலாமே தவிர, மரமாக நினைக்கக் கூடாது" எனச் சொல்லியிருந்தார். இவை எவ்வளவு வக்கிரமமான வார்த்தைகள்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் நிறைவடைந்துவிட்டது.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒரு நிமிடம் தாருங்கள்!

இந்த நாட்டின் சனாதிபதியாக இருந்தவர்கள், பிரதமராக இருந்தவர்கள், இந்த நாட்டில் இனவாதத்தைத் தூண்டினார்கள்; தேசிய நல்லிணக்கத்துக்கு எதிராகச் செயற்பட்டார்கள். இறுதியாக நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். 1990ஆம் ஆண்டு நடுப்பகுதியில் மக்கள் வங்கியால் வெளியிடப்பட்ட 'பொருளியல் நோக்கு' என்ற சஞ்சிகையில், அப்பொழுதிருந்த ஈழப்புரட்சி அமைப்பான 'ஈரோஸ்' அமைப்பின் ஸ்தாபகர்களில் ஒருவரும், பின்நாளில் தமிழீழ விடுதலைப் புலிகளின் மூத்த உறுப்பினருமாக இருந்த பாலகுமாரன் அவர்கள், "இது சமாதானத்துக்கான கடைசிச் சந்தர்ப்பம்" என்று குறிப்பிட்டிருந்தார். அதாவது, அந்தக் காலம் சமாதானத்துக்கான கடைசிச் சந்தர்ப்பம் என்று குறிப் பிட்டிருந்தார். அவ்வாறு பாலகுமாரன் கூறி இன்று எவ்வளவோ வருடங்கள் கடந்துவிட்டன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் முடிவடைந்துவிட்டது.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
முடிக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ அர்ச்சுனா இராமநாதன் அவர்களுடைய விடயத்தில் கௌரவ சபாநாயகர் அவர்கள் எடுக்கும் முடிவுகளுக்கு நாங்கள் கட்டுப்படுகின்றோம். கடந்த காலங்களிலும் இந்தச் சபையில் தமிழர்களுக்கு எதிரான விடயங்கள் வந்தபொழுது, அவை கருத்திற்கொள்ளப்படவில்லை. தமிழரான அவருக்கு இவ்வாறானதொரு நிலை வரும்பொழுது, நாங்கள் பேசாமல் இருப்பது வரலாற்றுத் தவறாகும் என்பதால்தான் நான் இதனைப் பதிவுசெய்தேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.17]

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවයි විවාද කරන්නේ. අපි දන්නවා, මේ රට දැවැන්ත ආර්ථික කඩා වැටීමකට ලක්ව තිබුණු රටක් බව. ඒ නිසා ඉතාම නිවැරදි ආර්ථික කළමනාකරණයක් කරයි කියන විශ්වාසයෙන් මේ රටේ ජනතාව අපට පාලන බලය ලබා දුන්නා. අපි ඒ විශ්වාසය රැක ගනිමින් මේ රටේ ජනතාවගේ බදු ආදායම නිවැරදිව කළමනාකරණය කිරීම වෙනුවෙන් අදාළ සැලසුම්, වැඩසටහන් ක්‍රියාත්මක කළා. සාමාන්‍යයෙන් ගත්තාම, මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තමයි වැදගත්ම වැය ශීර්ෂය බවට පත් වෙන්නේ. මොකද, ආදායම එකතු කර ගන්න විධියත්, ඒ ආදායම වියදම් කරන විධියත් පිළිබඳව ඉතාම විද්‍යාත්මකව කරුණු පැහැදිලි කරන්න අවශ්‍යතාවක් තිබෙන නිසා.

ආදායම එකතු කර ගැනීමේදී බදු ආදායම තමයි ප්‍රධාන ආදායම් ප්‍රභවයක් විධියට තිබෙන්නේ. හැබැයි, පසුගිය වකවානුවල, පසුගිය පාලන කාලවල තිබුණු වැරදි ආර්ථික ප්‍රතිපත්ති සහ රටේ ජනතාවට ඉතාම වැරදි විධියට සපයපු ආදර්ශ නිසා ජනතාව රජයට බදු ගෙවීමෙන් වැළකී සිටියා. සමහර අවස්ථාවලදී බදු දැලෙන් ගැලවිලා යන්න ජනතාව උත්සාහ කළා. මොකද, ජනතාවට අදහසක් තිබුණා, ආණ්ඩුවට නැත්නම් ඒ ප්‍රතිපත්තිවලට බදු ගෙවනවාට වඩා හොඳයි ඒකෙන් මහ හැරලා යන එක කියලා. එවැනි තත්ත්වයක් තමයි අපි දිගටම දැක්කේ. උදාහරණයක් විධියට ගත්තොත්, එදා මහා පරිමාණ බදු වංචා දකින්න ලැබුණා. සමහර මුදල් ඇමතිවරු ගත්ත තීන්දු තීරණ නිසා මේ රටට ලැබෙන්න තිබුණු ලොකු බදු ආදායමක් අහිමි වෙන තැනට රට පත් වෙලා තිබුණා. ඒ නිසා අනෙක් සැම කෙනෙක්ම කල්පනා කළා බදු නොගෙවා ඉන්නේ කොහොමද කියලා.

හැබැයි අද කියන්න සතුටුයි, මේ රටේ ජනතාව නිවැරදි තැනකට ඇවිත් තිබෙනවා, නිවැරදි ආකාරයෙන් රජයට බදු ගෙවන්න ඕනෑ කියලා. ඒ බදු නිවැරදි විධියට කළමනාකරණය වෙනවා කියන විශ්වාසය මේ රටේ ජනතාව තුළ අද ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අද අපට සතුටුක් තිබෙනවා. මොකද, දැන් බදු එකතු කර ගැනීම වෙනුවෙන් මහන්සියක් ගන්න අවශ්‍ය නැහැ. රටේ ජනතාව බදු ගෙවන්න සූදානමින් ඉන්නවා. ඒ වාගේම, ඒ බදු මුදල් නිවැරදිව කළමනාකරණය කරනවා කියන විශ්වාසයෙන් මේ රටේ ජනතාව ඉන්නවා. දැන් අපට කරන්න තිබෙන්නේ මේ රටේ ආර්ථික කළමනාකරණය නිවැරදිව කරගෙන යෑමයි. ඒ වෙනුවෙන් හදපු වැඩසටහන් පිළිබඳ අපි මේ මාසය පුරාම කථා කළා.

ඒ වාගේම විද්‍යාත්මකව නිර්මාණය කරන ලද අමාත්‍යාංශවලට ඉතාම හොඳ, ප්‍රශංසනීය විධියට මුදල් බෙදලා දීලා තිබෙනවා. ඒ මුදල් නිසි පරිදි වියදම් කරන්න පුළුවන් විධියට මේ රටේ ආර්ථිකය කළමනාකරණය වුණා. ඒ ආර්ථික කළමනාකරණය ඇතුළේ තමයි අපි අද පසුවෙන්නේ. ඒ නිසා අද අපට සතුටුයි. හෙට දවසේ මේ අය වැය තුන්වනවර කියවා සම්මත කර ගන්නවා. හෙට දවසෙන් පස්සේ ඒ සම්මත කර ගත්ත අය වැයේ ප්‍රතිඵල ගමට යනවා. මේ රටේ හැම ක්ෂේත්‍රයක් කෙරෙහිම මේ අය වැයේ ප්‍රතිපාදන බෙදිලා යනවා. ඒ නිසා ආර්ථික වශයෙන් රටේ ජනතාව දියුණු වෙනවා කියන සහතිකය අපට ලබා දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ආදායම ලබා ගන්න තවත් ප්‍රධාන ක්‍රමයක් තමයි ණය ලබා ගැනීම. අපි දන්නවා, ණය ගන්න ඕනෑ කියලා. හැබැයි, අපි පසුගිය කාලයේ දැක්කේ මොකක්ද? කොමිස් මත ඒ ණය මුදල් ලබා ගත්තා. ඒවා නිවැරදිව කළමනාකරණය කළේ නැහැ. ඒකේ ප්‍රතිඵල තමයි අද අපි භුක්ති විඳින්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, අපි නිවැරදි ව්‍යාපෘතිවලට ණය ගන්න ඕනෑ කියලා. මේ රටේ නිවැරදි ව්‍යාපෘතිවලට ණය ගන්න ඕනෑ. ඒ ණය අරගෙන කරන ඒ ව්‍යාපෘති තුළින් මේ රටේ ආර්ථික වර්ධනය ඇති කරන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙනවා, අපි ඒ වෙනුවෙන් දේශපාලන ක්‍රියාවලිය ඉදිරියට ගෙනයනවා කියන කාරණය විශේෂයෙන් අද කියන්න ඕනෑ.

ඒ වාගේම පසුගිය ඉතිහාසය පුරාවට රජයේ ව්‍යාපාර නිවැරදිව කළමනාකරණය කළේ නැහැ.

රටේ බදු ආදායම යෙදුවේ පාඩු ලබන ව්‍යාපාරවලට. රජයේ ව්‍යාපාර පාඩු ලබන තැනට පත් කරලා තිබුණා. එහෙම කරලා ඒවා විකුණන තැනට පත් කරලා තිබුණා. ඒවා ලාභ ලබන තැනට පත් කළේ නැහැ. හැබැයි, මේ වෙනකොට හැම ව්‍යාපාර ආයතනයක්ම ලාභ ලබන තැනට පත් කරන්න, ඒ සඳහා අවශ්‍ය මැදිහත් වීම කරමින්, එහි කළමනාකරණය වෙනස් කරමින් කටයුතු කරමින් යනවා. රටේ ආදායම වැඩි කරන්න රජයේ ව්‍යාපාර අද ලාභ ලබන ව්‍යාපාර බවට පත් කිරීමට අදාළ මැදිහත් වීම් කරමින් යනවා.

තව අවුරුද්දක්, දෙකක් යනකොට මේ රටේ රජය මැදිහත් වෙලා කරන ව්‍යාපාර ලාභ ලබන ව්‍යාපාර බවට පත් කරන්න පුළුවන් වෙනවා. ඒ කාරණා එක්ක අද විපක්ෂයේ බොහෝ අයට ලොකු විරෝධයක්, ලොකු කලකිරීමක් ඇති වෙලා තිබෙනවා. මොකද තමන්ට කරගන්න බැරි වෙච්ච දේවල් අද නිවැරදි කළමනාකරණයකින් මේ රට ඇතුළේ සිදු වෙනවා කියන එක නිසා. අපි ආර්ථිකය කළමනාකරණය කරන්නේ නිකම් නොවෙයි. සීතල කාමරවල ඉඳගෙන කරන කළමනාකරණයක් නොවෙයි. ඇත එපිට ගම්මානවල ඉඳලා, නාගරීකරණය වෙච්ච නගරයේ ජනතාව ඇතුළු සියලු දෙනා එකාබද්ධ කරන්න පුළුවන් විධියට අපි ආර්ථික කළමනාකරණයක් කරමින් යනවා.

මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කය මේ වනකොට සූදානම් කරමින් ඉන්නවා, පුරන් වෙච්ච කුඹුරු අස්වද්දලා මේ රටේ ආර්ථිකයට යම් දායකත්වයක් සපයන්න පුළුවන් වන විධියට සකස් කරන්න. ඒ වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න මේ වෙනකොට කටයුතු කරමින් ඉන්නවා. පළාත් සභාව වේවා, ප්‍රාදේශීය සභාව වේවා ඒ හැම ක්ෂේත්‍රයකම නිවැරදි කළමනාකරණයකට ගෙනෙන්න සූදානමින් ඉන්නවා.

මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුවට අනුව මේ රටේ නිවැරදි ආර්ථික කළමනාකරණයක් කරන්න පුළුවන්. ඒ ආර්ථික කළමනාකරණය කිරීමට හැකි කණ්ඩායමක් අපි එක්ක එකතු වෙලා ඉන්නවා. කණ්ඩායමක් විධියට අපි සියලු දෙනා එකතු වෙලා මේ රට නිවැරදි දිශාවට ගෙන යන්න සූදානම්. විශේෂයෙන්ම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. එළඹෙන ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් අපි ශක්තිමත් බලයක් ලබා ගන්නවා. ඒ ශක්තිමත් බලය හරහා ගම ඇතුළට මුදල් ගලාගෙන යන්න පුළුවන් විධියට, ගමේ පාරවල් ටික හදන්න පුළුවන් විධියට, මෙතෙක් කල් බිඳ වැටුණු ආර්ථිකය -ගමේ ආර්ථිකය- නඟා සිටුවන්න පුළුවන් විධියට ඒ බලය අපි පාවිච්චි කරමින් ඉතා

[ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා]

නිවැරැදි දිශාවට මේ රටේ පාලන බලය ගෙන යනවා. ඒ වෙනුවෙන් මේ රටේ ජනතාව පෙළගස්වනවා. ඒ වාගේම අපේ කොටියාස සහා හරහා යෝජනා අරගෙන ගමේ ආර්ථිකය දියුණු කරන්න අවශ්‍ය සැලසුම් හදලා තිබෙනවා. ඒ සැලසුම් එක්ක ගම දියුණු වෙලා ගමේ ආර්ථිකය දියුණු වෙනවාත් එක්කම ඒ දියුණු වෙච්ච ජනතාවගෙන් යම් බදු මුදලක් අරගෙන මේ රටේ රාජ්‍ය පවත්වාගෙන යන්න අවශ්‍ය කටයුතු සැලසුම් කරලා තිබෙනවා.

අපි මේ වෙලාවේ විශේෂයෙන්ම මේ රටේ ජනතාවට කියන්න ඕනෑ, ඒ සහනදායී අවස්ථාව අපි ඔබලාට උදා කර දෙනවා කියලා. ඒ වෙනුවෙන් අපි සියලු දෙනා නොපැකිලිව කටයුතු කරනවා කියමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු උපාලි පන්නිලගේ මහතා. ඔබතුමා විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධ අය වැය විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ එතුමා අමාත්‍ය ධුරය දරන අමාත්‍යාංශයක් බව. මේ අමාත්‍යාංශය 2025 වර්ෂයට රුපියල් බිලියන 714.1ක්, එනම් සමස්ත අය වැය ගත්තොත් සමස්ත වැයෙන් සියයට 16කට ආසන්න ප්‍රමාණයක් අපි වෙන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය කියන්නේ අපට ඒ අමාත්‍යාංශයේ තිබෙන ආයතනවලට හෝ එහි තිබෙන විෂය පථයට පමණක් සීමා කරලා සාකච්ඡා කළ යුතු අය වැය විෂය පථයක් නොවෙයි.

මොකද, ඔවුන්ගේ කාර්ය භාරයට සමස්ත අය වැය සකස් කිරීම සහ අධීක්ෂණයත් ඇතුළත් වෙනවා. මාසයකට අධික කාලයක් පුරා පැවති මේ අය වැය විවාදයේදී අප වෙත ඉදිරිපත් කරනු ලැබූ විවේචන පිළිබඳව විශේෂයෙන්ම පොදුවේ අවධානය යොමු කරන්න මා කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාසයකට අධික කාලයක් පුරා මේ අය වැය විවාදය තුළ ප්‍රධාන වශයෙන්ම අපට ඉදිරිපත් කළ විවේචන කිහිපයක් තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේත්, ඒ වාගේම බාහිර සමාජයෙනුත් විශාල විවේචනයක් ඉදිරිපත් වුණු, සාකච්ඡාවට ලක් වුණු කාරණයක් තමයි අප විසින් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාමත් පැහැදිලිව කියන්න ඕනෑ, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරනකොට අපි එහි කිසිම තැනක සඳහන් කළේ නැහැ, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරනවා කියලා. නමුත් අපි ස්ථාන දෙකක ඒ සම්බන්ධයෙන් සඳහන් කරලා තිබුණා. ඒ තමයි ශ්‍රමයට නිසි ගෞරවයක් ලබාදීම පිළිබඳව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එක තැනක සඳහන් කරලා තිබුණා. නිෂ්පාදන සාධක අතර ශ්‍රමය කියන්නේ සුවිශේෂම, වටිනාම සාධකය කියලා අපි විශ්වාස කරනවා. ඒ ශ්‍රමය skilledද, unskilledද කියන එක නොවෙයි. පුහුණුද, නුපුහුණුද කියන එක නොවෙයි. ශ්‍රමයට නිසි ගෞරවය ලබා දිය යුතුයි කියන එක පිළිබඳව ජාතික ජන බලවේගයේ රජය විධියට අපි කල්පනා කරනවා. අන්න ඒ නිසා, ශ්‍රමයට නිසි වටිනාකම ලබාදීම සඳහා තමයි අපි මේ අය වැයෙන් ඒ වැටුප් වැඩි කිරීම යෝජනා කළේ. ඒ වාගේම අපි තවත් එක ස්ථානයක සඳහන් කළා, ගුරුවරුන්ගේ වැටුප්, මේ රටේ ඉහළම වැටුප් තල 10 අතරට ගෙනෙනවා කියලා. ඔන්න ඔය ස්ථාන දෙකේදී පමණයි අපි ප්‍රතිපත්තියක් විධියට රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම පිළිබඳව සඳහන් කළේ. මේ මූලික අදහස් දෙකට සමපාත වන විධියට තමයි අපි ඒ වැටුප් වැඩි කිරීම කළේ.

රටේ ආර්ථිකය ඉතාමත් බරපතළ ස්ථානයක තිබෙන්නේ කියන එක අපි තේරුම් ගෙන තිබෙනවා. ඒ තත්ත්වයන් සැලකිල්ලට අරගෙන තමයි වැටුප්වල ව්‍යුහාත්මක වෙනසක් ඇති කළේ. අපි දන්නවා, මෙතෙක් තිබුණු ක්‍රමයට වඩා ව්‍යුහාත්මක වෙනසක් අපි වැටුප් structuresවල ඇති කරලා තිබෙන බව. ඒ වෙනසත් එක්ක අපි සැලකිය යුතු වැටුප් වැඩි කිරීමක් මෙවර රාජ්‍ය සේවකයන්ට ලබා දුන්නා. ඒ සඳහා අමතරව රුපියල් බිලියන 110ක් අපි මේ අය වැය ලේඛනයෙන් 2025 වර්ෂයට වෙන් කළා. නමුත් විශේෂයෙන් සමාජයේ ඉහළ යැයි සම්මත සමහර ස්ථරවල කොටස්වලින් මේ ව්‍යුහාත්මක වෙනස සම්බන්ධයෙන් යම් යම් විවේචන ඉදිරිපත් වුණා. අපට දැන් තේරෙනවා ඒ ව්‍යුහාත්මක වෙනස සම්බන්ධයෙන් ඔවුන් ඉදිරිපත් කළ විවේචන අඩු වෙලා තිබෙනවා කියලා. ඔවුන් සමඟ කළ සාකච්ඡාවලින් ඔවුන් ඒ කාරණය අවබෝධ කරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඉදිරිපත් වුණු දෙවෙනි විවේචනය තමයි අපි අනුගමනය කරන ආර්ථික මොඩලය කුමක්ද කියන එක. මේ අය වැය ලේඛනය පුරා දිව යන ආර්ථික මොඩලයක් තිබෙනවා. අපට විවිධ විධියේ අර්ථකථන එනවා, අපට විවිධ විධියේ උපදේශන එනවා. අපි ඒ modelsම අනුගමනය කරන්න නම් අපේ ආණ්ඩුවක් පිහිටුවා ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතෙක් අනුගමනය කළ සියලු ආර්ථික models, ඒ ක්‍රම සියල්ල ජනතාව විසින් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඒ නිසා, "ඔබ අනුගමනය කරන්නේ ධනවාදී ආර්ථික ක්‍රමයද, ඔබ අනුගමනය කරන්නේ සමාජවාදී ආර්ථික ක්‍රමයද, ලිබරල්ද, නව ලිබරල්ද" කියලා අපෙන් අහලා වැඩක් නැහැ. දේශපාලන ව්‍යාපාරයක් විධියට මැතිවරණ වේදිකාවේදීත් අපෙන් ඒ ගැන ඇහුවා. අපි කිව්වා කැමති නමක් දා ගන්න, අපට නම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය ඔබතුමාත් ඉතාම හොඳින් දන්නවා. අපි යන්නේ චීන ක්‍රමයටද, රුසියන් ක්‍රමයටද කියලා ලෝකයේ කථාබහක් ඇති වුණු එක අවස්ථාවක ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා කිව්වා, අපට රුසියන් සපත්තුව ලොකු වැඩියි, අපට චීන සපත්තුව පොඩියි කියලා. මෙහි අදහස කුමක්ද? අපි යන්න ඕනෑ චීන ක්‍රමයටවත්, රුසියන් ක්‍රමයටවත්, එහෙම නැත්නම් අදට ගැළපෙන වියට්නාම් ක්‍රමයටවත්, එහෙම නැත්නම් අපිට පෙන්වලා දෙන සිංගප්පූරු ක්‍රමයටවත්, ඇමෙරිකානු ක්‍රමයටවත් නොවෙයි.

අපි ආර්ථික ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. තිබෙන ආර්ථික ක්‍රමයේ වෙනස සඳහා, එහි ව්‍යුහාත්මක වෙනසක් සඳහා - structural change එකක් සඳහා - අපි මූලික අඩිතාලම දාලා තිබෙනවා. ඒක තමයි ලාංකීය ක්‍රමය. ලාංකීය ක්‍රමයකට අපි අපේ ආර්ථිකය ගෙනියන්න ඕනෑ. හැබැයි, මේ ගෝලීයකරණයත් එක්ක අද ලෝකය ගමන් කරමින් තිබෙන තත්ත්වය අපි ඉතා හොඳින් අධ්‍යයනය කරමින් තමයි මේ ක්‍රමය හඳුන්වා දී තිබෙන්නේ. අපි අනුගමනය කරන ආර්ථික මොඩලය සඳහා අපි ලෝකයෙන් අත්දැකීම් ගන්නවා. හැබැයි, අපි අත්දැකීම් ගත්තත් ඒවා ඒ විධියටම මෙහේ පැළ කරන්න සූදානම් වෙන්නේ නැහැ. ඒ නිසා අපේ රටේ වර්තමාන ආර්ථික තත්ත්වය, අපේ සමාජ සංස්කෘතික තත්ත්වයන්, භූගෝලීය පිහිටීම, අපේ රටේ මානව සම්පත කියන මේ සියල්ල කැටි කරගෙන අපේම වූ ක්‍රමයක් තමයි අපි හඳුන්වා දීලා තිබෙන්නේ. අන්න ඒ සඳහා අපි ලෝකයත් එක්ක බද්ධ වෙච්ච ක්‍රමයක් හඳුන්වා දෙනවා. අන්න ඒ ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ මූලික අඩිතාලම තමයි අපේ ආණ්ඩුවේ මංගල අය වැයෙන් අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපට යම් යම් සුවිශේෂී විවේචනත් ඉදිරිපත් වුණා. ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා මෙතැන සිටියා නම් හොඳයි. ආණ්ඩුවක් විධියට අප තුළ එතුමාට නිසි ගෞරවයක් තිබෙනවා. එතුමා කෘතහස්ත දේශපාලනඥයෙක්. එතුමා මතක් කළා වාගේම අප්පාපිල්ලෙයි අමිර්තලිංගම් මහත්මයා 1978දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 8ට බැහැපු වෙලාවේ මගේ මතකයේ හැටියට ආසන 16ක් දිනාගෙන විපක්ෂ නායක වුණා. සම්පන්දන් මැතිතුමාත් එහෙමයි. එතුමන්ලා කෘතහස්ත දේශපාලනඥයෝ.

නමුත් ගරු කථානායකතුමා විසින් ගනු ලැබූ තීරණය ජන වාර්ගික පදනමින් පැහැදිලි කිරීමට යෑමෙන් සමාජයට වැරදි පණිවුඩයක් යනවා. එම නිසා රජය විධියට අපි කියන්න ඕනෑ, එතැන කිසිම ආකාරයක ජන වාර්ගික ගැටලුවක් නැති බව. ඒ නිසා මේක ජන වාර්ගික පදනමින් ගන්න එපා. අපේ ආණ්ඩුව පිහිටුවපු අවස්ථාවේ ඉඳලාම අපි හොඳින් සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කාරණයක් තමයි, මේ රටේ ජන වාර්ගික සමගිය. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී වූ සියලු ජනතාව ශ්‍රී ලාංකිකයන් විධියට සලකන ආණ්ඩුවක් අපට තිබෙන්නේ. ඒ නිසා මම එතුමාට නැවත වතාවක් නිසි ගෞරවයෙන් යුතුව කියනවා, මේක ජන වාර්ගික පදනමින් ගන්න එපා කියලා. මේක එක් මන්ත්‍රීවරයෙක් සම්බන්ධයෙන් ගරු කථානායකතුමා විසින් ලබා දුන් තීන්දුවක්. ඒ තීන්දුවට අපේ ආණ්ඩුවේ කිසිම සම්බන්ධයක් නැහැ. එම නිසා ඒ තීන්දුව දෙස ජන වාර්ගික දෘෂ්ටි කෝණයකින් බලා අර්ථ කථනය කරන්න එපා කියලා මම මේ ගරු සභාවට විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට, තුන්වැනි කාරණය මෙයයි. පසුගිය කාල සීමා සම්බන්ධයෙන් විවේචන කරන්න එපාය කියලා අපට කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි යථාර්ථය. යථාර්ථය තමයි, පසුගිය අවුරුදු 76 කෙසේ වෙතත්, පසුගිය අවුරුදු 46ක කාලය පුරා අපේ රටේ ආර්ථිකය කඩාගෙන වැටුණු එක. යථාර්ථය තමයි, අපේ රටේ ප්‍රාදේශීය විෂමතාව එන්න එන්නම වැඩි වෙනවා කියන එක. ඒ වාගේම දැන් තිබෙන යථාර්ථයක් තමයි, අපේ රටේ ජාතික ආදායමෙන් සියයට 44ක් විතර එන්නේ බස්නාහිර පළාතෙන් කියන එක. එතකොට උතුරු පළාත ගත්තාම ඒ පළාතෙන් එන්නේ සියයට 5ක වාගේ ප්‍රමාණයක්. මේ යථාර්ථයට සැබෑ ලෙසම වගකිව යුතු වන්නේ පසුගිය ආණ්ඩු අනුගමනය කළ වැරදි ආර්ථික දර්ශනය, වැරදි ආර්ථික ක්‍රම, ඔවුන් විසින් කරපු වංචා, ඔවුන් විසින් කරපු දූෂණ ආදියයි. ඒවා තේරුම් ගන්නේ නැතුව අපට ඉදිරියට යන්න බැහැ. එතැන ඉඳලා තමයි අපි අපේ ආර්ථික ගමන සැලසුම් කරලා තිබෙන්නේ.

ගරු අගමැතිතුමිය කිව්වා වාගේ අපි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ ක්‍රමයේ වෙනසක් - system change එකක් - සඳහායි, ව්‍යුහාත්මක වෙනසක් සඳහායි. අන්න ඒ ව්‍යුහාත්මක වෙනස සඳහා තමයි අපි ප්‍රාදේශීය සංවර්ධනයට, ඒ වාගේම දිස්ත්‍රික් සංවර්ධනයට අතිවිශාල මුදලක් මේ අය වැය තුළින් වෙන් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම ප්‍රාදේශීය සංවර්ධනයටත්, දිස්ත්‍රික් සංවර්ධනයටත් වෙනමම රුපියල් මිලියන 13,250ක් වෙන් කළේ මෙන්න මේ ප්‍රාදේශීය විෂමතා හැකිතාක්දුරට අවම කර ගැනීම සඳහායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තත්ත්වය තේරුම් අරගෙන තමයි රජයක් විධියට අපට මේ අය වැය ලේඛනය සකස් කරන්නට සිදු වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම තවත් කාරණයක් සඳහන් කරන්නට කැමැතියි. අපි ආර්ථික සංවර්ධනය සඳහා කටයුතු කරනවා වාගේම, මෙහිදී අපි සමාජ ආරක්ෂණය පිළිබඳවත් සුවිශේෂ අවධානයක් යොමු කරනවා.

මේ සමාජ ආරක්ෂණය පිළිබඳව බොහෝ වෙලාවට අපේ සාකච්ඡාව යොමු වුණා. ඒක ඉතාම හොඳයි. සමාජ ආරක්ෂණය අවශ්‍ය වන දිළිඳුම, එහෙම නැත්නම් අර vulnerable කියන, marginalized කියන මෙන්න මේ කණ්ඩායම් ආරක්ෂා කර ගැනීමත් රජයක් විධියට අපේ වගකීමක්. ඒ වෙනුවෙන් තමයි අපි මේ 2025 වර්ෂයේ අපේ අය වැයෙන් රුපියල් බිලියන 749ක් වෙන් කරලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙහිදී අපි මාසිකව ලබා දෙන ඒ ආධාර ප්‍රමාණය, මුදලේ වටිනාකම පිළිබඳව සාකච්ඡා කළා. නමුත් මම විශේෂයෙන්ම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ සතියේ කැබිනට් මණ්ඩලයත් අනුමත කළා, අපි මාසිකව ලබා දෙන රුපියල් 7,500ක මුදල රුපියල් 10,000ක් දක්වා වැඩි කිරීම වැනි කාරණාවලට වඩා ප්‍රමාණාත්මකවත් මේ ගැන බලන්න ඕනෑය කියන කාරණය. උදාහරණයක් විධියට ගත්තොත්, අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී පවුල්වල සිටින වැඩිහිටියන් සඳහා මේ වන විට රුපියල් 3,000ක මාසික ආධාරයක් ලබා දෙනවා. නමුත්, එම ආධාරය ලබා දෙන්නේ 800,000කට ආසන්න පිරිසකටයි. අපි තීරණයක් ගත්තා, එම ආධාරය ලබා දෙන පිරිස 1,000,000 දක්වා වැඩි කරන්න. ඒ වාගේම ආබාධ සහිත දරුවන්ට, ආබාධ සහිත පුද්ගලයින්ට මේ වෙනකොට මාසිකව ලබා දෙනවා, රුපියල් 7,500ක දීමනාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ දීමනාව ලබා දෙන්නේ 138,000ක පිරිසකටයි. මෙකට සීමාවක් පනවා තිබෙනවා. ඒ සීමාව අනුව දීලා තිබෙන්නේ මාසිකව රුපියල් 6,000යි. රුපියල් 6,000කින් අද පවුලකට මාසයක් ජීවත් වෙන්න බැහැ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මාසිකව ඉදිරිපත් කරන poverty line එක මේ වන විට රුපියල් 16,000ක් ඉක්මවා ගිහින්. ඒ නිසා අපි මේක වෙනස් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි රුපියල් 16,000 දක්වා වූ සීමාව අඩු ආදායම්ලාභීන්ය කියා තීරණය කරලා, ඒ අනුව එම දීමනාව ලබා දෙන පුද්ගලයින් සංඛ්‍යාව 138,000ක සිට 310,000 දක්වා වැඩි කරන්න තීරණය

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ මුදලේ ප්‍රමාණය රුපියල් 7,500 සිට 10,000 දක්වා වැඩි වෙනවා වාගේම, එම දීමනාව ලබා දෙන පුද්ගලයින් සංඛ්‍යාවත් 138,000 සිට 310,000 දක්වා වැඩි කළා. සමස්තයක් විධියට සමාජ ආරක්ෂණය පිළිබඳවත් අපි සුවිශේෂ අවධානයක් යොමු කරනවා කියන එක මතක් කරමින් මම නවතිනවා. ඔබතුමාට බෙහෙවින් ස්තුතියි, කාලය ලබා දීම සම්බන්ධව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
අදුත්තු, කෞරව නිසාම් කාරියප්පර් අවර්කළ්! උංකළුක්කු 16 නිමිඩංකළ් උණ්ඩු.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්)
(The Hon. M. Nizam Kariapper, PC)
එනක්කු 20 නිමිඩංකළ් ඔදුක්කප්පට්ටිරුන්තතු. කුරෛත්තු විට්ටීර්කළා?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඉප්පොළුතු උංකළුක්කු 16 නිමිඩංකළ්තාන් ඔදුක්කප් පට්ටුළ්ළතු.

[4.40 p.m.]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්)
(The Hon. M. Nizam Kariapper, PC)
சரி, பரவாயில்லை!

Hon. Presiding Member, at the outset, I think I have a duty to convey my wishes and congratulations to the Hon. (Dr.) Harsha de Silva. So, I am taking this opportunity to extend my sincere congratulations to the Hon. (Dr.) Harsha de Silva on his insightful and well-articulated speech. His contribution was not just a critique, but an educational discourse delivered in a civilized and gentlemanly manner, laying out the realities of our economic situation with clarity and depth. At a time when the nation faces immense economic challenges, the Hon. (Dr.) de Silva's approach was refreshing; his speech was fact-based, constructive and solution-oriented. He did not merely point out the shortcomings of the Government's financial policies, but also proposed a practical pathway for economic stability and growth. That, we have to appreciate.

It is this kind of discourse that elevates the quality of debate in this House, Sir. Rather than engaging in political rhetoric - sometimes, I am even shocked and surprised to see Government Members of Parliament doing it - the Hon. (Dr.) de Silva upheld the true spirit of Parliamentary democracy by putting forward rational and well-researched arguments which would benefit not only the Members of this House, but also the public at large.

In fact, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. එතුමා එක වෙලාවකදි කිව්වා - ඒක මට කියන්නම වෙනවා - මුදල් ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමා අත්සන් නොකර එතුමා විදේශගත වෙලා සිටින අවස්ථාවක නියෝජ්‍ය ඇමතිතුමා හරහා IMF එකට ලියුමක් යැව්වා, ඒක රාජපක්ෂ හිටපු ජනාධිපතිගේ කාලයේත් සිදු වුණාය කියලා. නමුත්, ඒක හාස්‍යයටවත්, සම්චිචලයටවත් ලක් කළේ නැහැ. ඒ මහත්මා ගුණයට අපි ප්‍රශංසා කළ යුතුයි. මොකද, ඒක හාස්‍යජනකව, සම්චිචලයට ඉදිරිපත් කළා නම් අද මිනිත්තු 5ක් යනකොට ඒකට 100k "Likes" එනවා. අපට හරිම දුකයි, අපි කොච්චර research කරලා, මහත්මා ගතිගුණයෙන් මේ පාර්ලිමේන්තුවේ කථා කළත් ඒකට නොලැබෙන විශාල කීර්තියක් අර හාස්‍යයට, සම්චිචලයට ලක්වන දෙයට ලැබෙන එක සම්බන්ධයෙන්. මේවා හරි වැදගත්.

මම හදාගෙන ආපු මගේ speech එක දැන් ඉදිරිපත් කරන්නම්. ආර්ථිකය ගැන කථා කරනකොට අපි කියනවා නේ, සේවා පදනම මත ඇති වන ආර්ථිකයක් - service-oriented economy එකක් - ගැන. මම හිතන විධියට චීනයට පසුව ආසියාවේ ඉස්සරහින්ම සිටින, ආර්ථික මොඩලයක් තිබෙන රට තමයි, ජපානය. ඒක service-oriented ආර්ථිකයක්. ඒ ආර්ථිකයේ ප්‍රධානම foundation එක තමයි ඒගොල්ලන්ගේ විනය, සංස්කෘතික ලැදියාව. මම හිතන විධියට විනය තමයි වැඩියෙන්ම ඒ අය ඉදිරිපත් කරන දෙය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වුණු system change එක හරහා සියයට 90ක විනය සහිත පාර්ලිමේන්තුවක් අද අපට ලැබිලා තිබෙනවා. That is the truth. ආණ්ඩුවෙනුත්, විපක්ෂයෙනුත් එක්කෙනෙක්, දෙදෙනෙක් ඒකට අහු නොවුණත්, සමස්තයක් වශයෙන් මම හිතන විධියට ඊළඟ දශක දෙක හිමි විය යුත්තේ පක්ෂ දෙකකටයි. ජාතික ජන බලවේගයටත් - தேசிய மக்கள் சக்திக்கும், සමගි ජන සන්ධානයටත් තමයි මම හිතන්නේ ඊළඟ දශක දෙක හිමි විය යුත්තේ. මොකද, විනීත, දූෂණ චෝදනාවලට ලක් නොවූ, අවංක, සමගි ජන බලවේගයේ නායක අපේ විපක්ෂ නායකතුමා ඉන්නවා; මහත්මා ගතිගුණයෙන් හෙබි, ආර්ථිකය පිළිබඳ පරිපූර්ණ දැනුමක් තිබෙන විපක්ෂයේ මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා ඉන්නවා. දේශපාලන මතිමතාන්තරවලින් ඔබ්බට ගිහිල්ලා, පටු දේශපාලන මත භේදවලින් තොරව සැමවිටම තමන්ගේ නිපුණත්වය, තමන්ගේ දැනුම මේ රටට ලබා දීමට එතුමන්ලා සූදානමින් සිටිනවා.

Now, I will get back to the economy of this country. Actually, after I was inspired by the Hon. (Dr.) Harsha de Silva's speech, I did a little bit of research. I was watching it on live telecast since we were involved in handing over the nomination papers, which ended at 12 o' clock. We were tensed as to which nomination papers would get rejected; it was another tension, but be that as it may. If we look at the Japanese economic model, it is one of the success stories in the region and we all talk about that. So, let us talk about something else for a change. One of the first things they looked at is a skilled workforce and human capital. Then, technological infrastructure and innovation, the business environment and the regulatory framework, an advanced financial and banking system and tourism and hospitality development. Those are the benchmarks that they looked at. They also look at their cultural and soft power influence, focus on high-value services, sustainable urban development and smart cities, cultural adaptability and global outlook. Sometimes, one may wonder why, when we are almost at the bottom of the list, we are looking at number two. We have to look at number two. When Singapore was at the

bottom, they looked at us. They did not, at that time, say, "We cannot aspire to be another Sri Lanka since so much of resources are found in that country and we are a small nation." Actually, it was a small island used by ships which went across to dump things. It was virtually thrown to the dustbin by Malaysia. But, Lee Kuan Yew took the challenge and brought it up. So, there is no reason why we should not look at Japan as a model because a service-oriented economy seems to be the way forward.

Sir, whatever we say goes with the new culture that we all are aspiring to achieve.

අලුත් සංස්කෘතියක්, system change එකක් බලාපොරොත්තු වෙන මේ වකවානුවේ ජනතාව සියයට 90ක වරමක් ලබා දීලා තිබෙන්නේ අලුත් පිරිසකට. ඔක්කෝම අය හිතන්නේ, NPP - National People's Power එකට- එහෙම නැත්නම් ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාට දීපු වරම විතරයි ජනතාව system change එකට දුන්නේ කියලා. නැහැ. මට කියන්න පුළුවන්, අපේ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයට ලැබුණු ඡන්ද බැලුවාම, අලුත් මුහුණුවලට තමයි ඉඩ ලැබුණේ කියන එක. ඒකෙන් පැහැදිලිව පෙනෙන දෙය තමයි පක්ෂය මොනවා වුණත් හැම පක්ෂයකින්ම අලුත් මුහුණු පත් කරලා, අලුත් සංස්කෘතියක්, අලුත් change එකක් ඇති කරන්න ජනතාව බලාපොරොත්තු වුණා කියන එක. විපක්ෂයේත් ඒ අලුත් සංස්කෘතියට හැඩ ගැහිලා ආපු සෑහෙන මන්ත්‍රීවරු පිරිසක් ඉන්නවා. හැම එක්කෙනාම කියලා මට කියන්න බැහැ, නමුත් සෑහෙන කොටසක් ඉන්නවා.

Sir, I was just looking at the challenges we would have to face when we try to follow the economic model of Japan and the high standards they have set. We lack a skilled workforce and there are also educational gaps. But, are we not geared to achieve those skills? අනිවාර්යයෙන්ම. ශ්‍රී ලංකාවේ ජනතාවගේ නිපුණත්වය, දක්ෂකම මුළු ලෝකයම පිළිගන්නවා. දක්ෂ ජනතාවක් සිටින රටක් හැටියට තමයි ශ්‍රී ලංකාව හඳුන්වන්නේ; we are one of the countries with a highly skilled people.

But, they are not the problem; the problem is the educational gap. I think the Hon. Prime Minister is looking into it. We have to gear ourselves to a level where the education is changed to have a more skilled workforce. Once that is done, we also can aspire to become another economy like Japan. Why not?

The next challenge is, weak digital and technological infrastructure. Leave alone the President's new initiative of digitalization. I said this earlier also. Whether there is a Ministry for digitalization, whether there is a policy by the Government for digitalization or whether we like it or not, people are going towards digitalization. Today, I was able to get all this information at the click of a button. My son and daughter are more skilled than us and their children will be far better than them. We are also looking at the artificial intelligence. So, in those scenarios, we have to and we can reach that target. The Sri Lankans are the best when it comes to technology. The only thing is, they use it for the wrong purposes. So, digital and technological infrastructure is the second challenge we face and which, I believe, we can definitely get over.

Then, there are regulatory and business environmental challenges. That is what we are now talking about. When the Hon. Presiding Member looks at the clock, I get worried.

Then, we also have limited foreign direct investment and funding.

I think a lot was spoken about that. I am not an expert in that subject. I think the Hon. (Dr.) Harsha de Silva spoke about it; many Members of the Government spoke about it. Now, with the new development in the Port City and the harbor in Mattala -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කිටිනන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Chairman, it is a privilege for me to speak when you are in the Chair.

The fifth challenge we have to look at is, the underdeveloped financial and banking services. I think it is something that I am also a bit worried about. I also spoke about the absence of a fully-equipped development bank which should work beyond profit-oriented policies. We have to look at it very seriously.

Then, the next challenge is, infrastructure and connectivity issues. Yes, that is where the capital expenditure comes in. We have a lot of challenges, but we have a railway network. We have a lovely railway network. But, what have we done with that?අපේ දුම්රිය පාරවල් - railway tracks - ගැන බලන්න. මම හිතන විධියට මේ region එකේ වැඩියෙන්ම infiltrated railway tracks තිබෙන රටක් තමයි ශ්‍රී ලංකාව. අපි ඒවා පාවිච්චි කරන්නේ නැහැ. අපි මොකටද කන්ටේනර් ටිකයි, බවුසර් ටිකයි නිකම් පාරේ යවන්නේ? ඔබතුමන්ලා දන්නවා ඇති, මඩකලපුවේ හැම දුම්රිය ස්ථානයකම වෙනම තිබෙනවා, පෙට්‍රල් ෂෙඩ් එකක්. අපට බැරිද නීතියක් ගෙන එන්න, දුම්රිය ස්ථාන දෙකක් අතරතුර බවුසර්වලින් පෙට්‍රල් ගෙන යනවා නම්, high toll එකක් ගෙවන්න ඕනෑ කියලා? මොකද, they must be encouraged to use the railway. We have the railways, but we are not making the best use of it.

Then, dependence on a low-value system. That is another challenge we face. In traditional sectors, most service jobs belong to low-value sectors. So, that has to be changed.

Then, political and economic instability. Now, we have come to a point where there is a big change. The recent economic crisis should be a thing in the past, not something which should take place again in the future. With political instability, our people decided to go for a

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

system change and selected you all and us. Remember that and do not try to have this system change exclusively for yourself. It was not only for you that people voted; they voted for us as well. About 95 per cent of the people voted for us as well. That is why, today, except for the Samagi Jana Sandhanaya, all other political parties have become minorities. That is the reality, accept it. By the outlook of the people, the Samagi Jana Sandhanaya is the alternative. So, look at that reality. That is what I am saying. From a political point of view, political stability has set in. Then, we must get over the economic crisis as well.

You also have weak global integration and trade policies. That is where I think we have to concentrate on more. We have limited trade agreements with other countries and we have to interact with global superpowers to have trade transactions. So, I would say that if Sri Lanka wants to achieve a developed service-based economy like Japan has, we must invest in education and vocational training, improve digital infrastructure to boost IT services and e-commerce, simplify business regulations to attract FDIs and startups, strengthen financial and banking services, modernize transport, diversify high-value services like tech and ensure political and economic stability.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you, Sir.

I think if I wind up today without talking about Gaza, I would be failing in my duty. Sir, I stand before this esteemed Assembly to express my profound condemnation of the Israeli regime's recent and egregious violations of international law through its renewed military operations in Gaza. The abrupt resumption of hostilities marked by relentless airstrikes and ground offensive has resulted in the tragic loss of lives of over 400 Palestinians, predominantly women and children, during this sacred month of Ramadan.

This blatant breach of the ceasefire not only undermines the prospects for lasting peace, but also constitutes a direct assault on our shared humanity.

The aggression extends beyond Gaza's borders. Recent reports indicate that Israeli forces have conducted operations in Yemen, Syria and Lebanon, targeting civilian populations including women, children and humanitarian aid workers. Such actions exacerbate the humanitarian crisis and represent flagrant violations of international law, Sir. The international community cannot remain silent in the face of these atrocities.

Sir, it is deeply concerning that the United States continues to provide their unwavering support to Israel, thereby emboldening its unlawful actions and perpetuating a cycle of violence. So, that has to be condemned.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, just give me half a minute and I will finish up.

This endorsement not only fuels further conflict, but also undermines the foundations of peace in the region. I call upon the Arab leaders and the broader international community to unite in resisting these policies. Finally, I urge the Government to take a clear stand on this matter.

Thank you very much, Sir, for giving me this opportunity.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. (Dr.) Rizvie Salih. You have 11 minutes.

[4.57 p.m.]

ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)
Hon. Chairman, thank you very much for the time allotted for me to speak on the Votes of the Ministry Finance, Planning and Economic Development during the Committee Stage Discussion.

As you know, Sir, in order to bring this country out of bankruptcy and for us to come out of this pathetic situation we are in, we have earmarked tourism as one of the main avenues that generate income and foreign exchange for this country. Our economic stabilization depends on the tourism industry, for which we have ambitious plans and projects, portraying our country as a preferred tourist destination to the world.

However, Sir, the article in the "Daily Mirror" of 18th March, 2025 titled "The bane of over tourism and Israel occupation in Sri Lanka" is indeed very disturbing. It gives details as to how Israeli tourists who come here on tourist visas operate businesses outside our legal system and framework. They operate illegally on tourist visas and engage in physical encounters with locals and other foreigners. They have opened shops, restaurants and hotels, for which bookings are made in their own country. That does not benefit the Sri Lankans or our economy to any significant extent or bring in foreign exchange. News

of their actions and violent behaviour is spreading the world over.

Sir, you know that Sri Lanka is a very sought-after surfing destination. We have beautiful beaches in places such as Hikkaduwa and Ahangama in the South, while in Arugam Bay and other places in the East also, we have beautiful beaches and seas ideal for surfing. In fact, Sri Lanka is a surfing paradise during the whole 365 days of the year. We have encountered those Israeli tourists and received many complaints about how they dominate the surf, how unfriendly they are and about their violent predisposition towards other surfers.

When it comes to surfing, Sir, there are etiquettes in sharing the waves. We have also heard about how these tourists from Israel dominate the surf without allowing other surfers to be there, so much so that a lot of surfers, as I was told and as this article also goes on to state, might overlook Sri Lanka as a surfing destination in the future. Sri Lanka is also known the world over as a land of smiling people and a haven of peace and tranquillity. I would like to mention, Sir, that this article even goes on to state that the influx of Israeli tourists started after October, 2024 because there are many countries in the world which have prohibited them from coming. So, that is one reason why they have chosen Sri Lanka. This article further goes onto state, I quote:

> "They are patronizing their own places; they dine at Israeli restaurants, they go for Israeli parties, stay at hotels run by Israelis and since some of this money is siphoned off straight to Israel, Sri Lanka is not benefiting from it."

Again, I would like to say that this article carries the headline, I quote:

> "The bane of over tourism and Israeli occupation in Sri Lanka."

Sir, now, I would like to mention about the events that have been unfolding in Gaza in recent times. One of the most catastrophic humanitarian crises of our time is unfolding there right now. I stand before this august Assembly today to bring to your urgent attention the renewed Israeli aggression against the Palestinian people in Gaza, which began on 09th March, following the breakdown of ceasefire negotiations. Sir, we are witnessing not merely a military conflict, but an unprecedented assault on innocent civilian lives. According to the latest reports, since the escalation of violence in the recent days, 436 Palestinians have been killed, a significant portion of whom had been innocent civilians. The breakdown includes at least 183 children, 94 elderly individuals and 125 men with an additional 678 individuals sustaining severe injuries.

The coordinated strikes executed by Israeli forces have targeted 23 specific sites that had previously been designated as humanitarian safe zones.

Sir, the Palestinian Ministry of Health reports that since October, 2023, at least, 49,547 Palestinians had been confirmed dead and 112,719 wounded, meaning that one in every 50 individuals had been killed and one in every 20 had been wounded in Gaza. The humanitarian situation in Gaza has deteriorated beyond imagination. Medical infrastructure remains severely compromised with only 12 hospitals supported by UNFPA delivering services in Gaza. We must acknowledge the gravity of this situation: there is pure genocide against Palestinians in Gaza. According to Amnesty International, Israel has unleashed hell and destruction on Palestinians, brazenly continuing with total impunity.

Sir, the rhetoric from Israeli officials is deeply disturbing. The Israeli National Security Minister has openly admitted that conditions in Israeli prisons have indeed worsened. He has dismissed the basic rights as "perks" for Palestinian detainees.

Sir, Sri Lanka has historically been supportive of Palestine. Governments and leaders of the past had always maintained a friendly attitude towards the people and the cause of the nation of Palestine; they have stood up for the rights of the Palestinian people. Today, we have the Leader of the House, the Hon. Bimal Rathnayake, as the President of the Sri Lanka Committee for Solidarity with Palestine. Similarly, past leaders of political parties which held governments in Sri Lanka had always been sympathetic towards and upheld the cause of the Palestinian people. When former Palestinian President Mahmoud Abbas visited Sri Lanka in 2008 and 2012, he expressed gratitude for our support throughout Palestine's struggle for international recognition. Our nation supported the historic UN Resolution that enhanced Palestine's status and continues to support its application for full UN membership.

Sir, as I conclude, I urge this House to reaffirm Sri Lanka's commitment to international humanitarian law and human rights. We must condemn the genocidal actions taking place in Gaza, call for an immediate ceasefire and demand accountability for war crimes.

Today, in Sri Lanka, we see synagogues mushrooming in all parts of the Island, which has angered the local population. These are people who have opened businesses, cafes and hotels in our country after coming on tourist visas. So, if this is left unchecked, we may again face a disastrous situation in our own land.

Our nation's moral authority stems from its historical support for just causes. So, let us stand united in solidarity with the Palestinian people and work towards a peaceful resolution that respects the dignity and the rights of all. Let us take meaningful steps and actions which would, in the long term, benefit our nation, not just economically, but also in its image as a compassionate, multi-cultural and multi-ethnic land which stands up for those who are unable to do so themselves.

Sir, once again, I would like to thank you for the time afforded to me to speak on this very important topic, which is significant not only to us, Sri Lankans, but to the world as a whole.

Thank you, very much.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Sunil Kumara Gamage. You have 14 minutes.

[අ.භා. 5.07]

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු සභාපතිතුමනි, අපගේ ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන මංගල අය වැය -2025 අය වැය- ගැන අදහස් කීපයක් දක්වන්න මම බලාපොරොත්තු වෙනවා. අපි දන්නවා, අපේ රට තිබෙන්නේ ආර්ථික ගැටලුවක බව. අප මේ ආර්ථික ගැටලුව තේරුම් ගන්නේ කොහොමද, අප මේ ආර්ථික ගැටලුව විසඳා ගන්නේ කොහොමද කියන එක ගැන අප සාකච්ඡා කරන්නේත්, ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග හොයන්නේත් මේ අය වැය තුළයි. ඒ නිසා මේ ආර්ථික ගැටලුව සහ අය වැය කියන්නේ එකට සම්බන්ධ වුණු කාරණා දෙකක්. අප කොහොමද අපේ මේ මංගල අය වැය තුළින් මේ රටේ තිබෙන ආර්ථික ගැටලුව විසඳා ගන්නේ? අපි මොනවාද, ඒ සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග? ඒ සඳහා මේ Budget එක හසුරුවන්නේ කොහොමද? ගරු සභාපතිතුමනි, මෙන්න මේවා ගැන අදහසක් ඇති කර ගැනීමේදී අපට කාරණා කිහිපයක් ගැන සාකච්ඡා කරන්න වෙනවා. එකක් තමයි, අප මුහුණ දීපු මේ ආර්ථික අර්බුදයේ ඓතිහාසික තත්ත්වයන්. මොකද, අප මොනවා කිව්වත්, ඕනෑම ගැටලුවක් විසඳීමේදී ඒ ගැටලුවේ තිබෙන ඓතිහාසික තත්ත්වයන් ගැනත් අදහසක් ඇති කර ගන්නම වෙනවා. ඒ ඓතිහාසික තත්ත්වයන් ගැන කථා කරන කොට තමයි 76 වසරක් පුරා අපේ රට අනුගමනය කළ ආර්ථික ක්‍රමවේද ගැනත් සාකච්ඡා කරන්න අපට සිදු වෙන්නේ. මොකද, ඒවා ගැන සාකච්ඡා නොකර, ඒ ආර්ථික ක්‍රමවේද ගැන හදාරන්නේ නැතුව, ඒ ආර්ථික ක්‍රමවේදවල තිබුණු දුර්වලතා හඳුනා ගන්නේ නැතුව මේ ගැටලුවට උත්තරයක්, අලුත් ආර්ථික මොඩලයක් සොයා ගන්න අපට බැහැ. ඒ නිසා අප කොච්චර කිව්වත් ඒ 76 වසර තුළ පැවැති ඓතිහාසික තත්ත්වය ගැන මේ විවාදය තුළ සාකච්ඡා කරන්න අපට සිදු වෙනවා.

මේ ආර්ථික ගැටලුවේ ඓතිහාසික තත්ත්වය ගැන සාකච්ඡා කරන කොට අපට පෙනී යනවා, අප දශක ගණනාවක් තිස්සේ නිෂ්පාදන සිදු නොකරපු ජාතියක් බව. ඒක අපි හැමෝම දන්නා කාරණයක්. ගරු සභාපතිතුමනි, ඒ නිසාම අපේ රටේ ආර්ථිකය දශක ගණනාවක් තිස්සේ විශාල වෙළෙඳ පරතරයකයි තිබුණේ. බොහෝ අවස්ථාවල අපේ අපනයන වාගේ දෙගුණයක් ආනයන සිද්ධ වුණා. මේක තමයි අපේ ආර්ථිකයේ ඉතිහාස කථාව. ඒකත් අපේ රටේ ආර්ථික අර්බුදයට බලපෑවා.

ඊළඟ කාරණය මේකයි. ඉතිහාසයේ අපේ රටේ හිටපු ඇතැම් පාලකයන් අපට තිබුණු වාසිසහගත දේශීය සම්පත් බොහොමයක් විකුණා දමලා තිබෙන්නේ; එහෙම නැත්නම් විනාශ කර දමලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, අපේ ආර්ථික ප්‍රතිපත්තිය ගොඩ නගනකොට, අපට එම කාරණය ගැනත් සලකා බලන්න වෙනවා. ඒ වාගේම, අපේ ඓතිහාසික තත්ත්වයන් හදාරද්දී අපට හමු වෙනවා, මීට පෙර අනුගමනය කරපු වැරදි ආර්ථික ප්‍රතිපත්ති. අලුත් ආර්ථික ක්‍රමවේදයක්, අලුත් ආර්ථික ප්‍රතිපත්තියක් හදන්න යද්දී ඒකත් අපට වැදගත් වෙනවා.

ගරු සභාපතිතුමනි, පැවැති ඓතිහාසික තත්ත්වයන් වාගේම අප බලය ලබා ගන්නා මොහොත වන විට අපේ රටේ ආර්ථිකය තිබුණේ කොහොමද කියන එකත් අපට වැදගත් වනවා. ඒකට අපි කියනවා, විෂය මූලික තත්ත්වයන්, එහෙම නැත්නම් වාස්තවික තත්ත්වයන් කියලා. අප බලය ගන්න කොට මේ රටේ තිබුණේ මොන වාගේ ආර්ථිකයක්ද, අපට අය වැය හදන්න වුණේ මොන වාගේ ආර්ථිකයක් ඇතුළේ ද, අපට අභියෝගයක් විධියට තිබෙන්නේ මොන වාගේ ආර්ථිකයක් ද කියන කාරණා ගැනත් අපි මේ අය වැය හදන විට සාකච්ඡා කළා; ඒ ගැනත් අවධානය යොමු කළා.

අපි හැමෝම දන්නවා, බලය ගන්නකොට අපි බංකොලොත් රාජ්‍යයක් බව. අප විශාල ණය උගුලකට හිර කළ, ණය උගුලකට තල්ලු කරපු ආර්ථිකයක් තමයි බලය ගන්නකොට අපට ලැබුණේ. මේ අය වැයට ඒක කොච්චර බලපානවාද කිව්වොත්, 2025 අපේ මුළු බදු ආදායම රුපියල් බිලියන 4,590යි. අපට 2025 අවුරුද්දේ ණය වාරික සහ පොලිය ගෙවන්න වෙනවා, -අපි ඒවාට කියනවා, ණය සේවාකරණ ගෙවීම් කියලා- රුපියල් බිලියන 4,550ක්. අපට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක, ආසන 159ක බලය හම්බ වුණාට මේ වාස්තවික තත්ත්වය වෙනස් වෙන්නේ නැහැ. අපි ගෙවන්න තිබෙන රුපියල් බිලියන 4,550 ණය වාරිකය වෙනස් වෙන්නේ නැහැ. එතකොට ඒක මේ අය වැය හදනකොට අපට ගැටලුවක් විධියට එනවා.

මෙතැන මුළු බදු ආදායම රුපියල් 4,590යි. ණය වාරික පොලී ගෙවීම රුපියල් බිලියන 4,550යි. අපි හරියට ගණන් හැදුවොත්, අපට ආර්ථිකය ගෙනියන්න ඉතුරු වෙන්නේ රුපියල් බිලියන 40යි. ඒක නිසා අපේ මුළු අය වැයේ මුළු වියදම -ප්‍රාග්ධන වියදම සහ පුනරාවර්තන වියදම කියන දෙකම- රුපියල් බිලියන 4,285යි. ඉතින් ණය වාරික පොලී ගෙවන්න තිබෙන එක ගැන, අපි බලය ගන්නකොට තිබුණු තත්ත්වය ගැන අනිවාර්යයෙන්ම සාකච්ඡා කරන්න ඕනෑ, සැලකිල්ලට ගන්න ඕනෑ. ඒක අමතක කරලා අපි ආර්ථිකය ගැන කොහොමද කථා කරන්නේ? ඒක අමතක කරලා කථා කරන්න පුළුවන් විධි දෙකයි තිබෙන්නේ. පළමුවෙනි එක, අපේ ණය හිමියෝ අපේ ණය අමතක කරනවා නම්, අපට ඒක අමතක කරලා කථා කරන්න පුළුවන්. දෙවැනි එක, ඒ ගත්ත ණය අපි හරියට ආයෝජනය කරලා ප්‍රතිලාභ එනවා නම්, අපට ඒක අමතක කරලා කථා කරන්න පුළුවන්. ඒ දෙකම නැති තත්ත්වයක් තුළ මේ ණය කථාව අමතක කරලා කථා කරන්න බැහැ. ඒවා පදනම් කරගෙන තමයි අපට අපේ අය වැය පිළියෙළ කරන්න සිද්ධ වෙන්නේ.

ඊළඟට, අපි බලය ගන්නකොට තිබුණු තත්ත්වය බලමු. අපේ රටට ලැබෙන ඩොලර් ආදායම අඩු වෙලා තිබුණේ. අපි හිටියේ ඩොලර් සංචිත අර්බුදයක. අපේ රට ඩොලර් අර්බුදයක තිබුණා. ඒකත් අපි අපේ ආර්ථික ප්‍රතිපත්ති හදනකොට සලකා බැලිය යුතු කාරණාවක්. මොකද, ඒක අපි මුහුණ දෙන තත්ත්වයක්. ඒ වාගේම, අපේ රටට ආයෝජකයන් නොඑන තත්ත්වයක අපි හිටියේ. අපේ රටට ආයෝජකයෝ එනේන් නැහැ. ඒගොල්ලන් අපේ රට විශ්වාස කරන්නේ නැහැ. මොකද, බංකොලොත් රාජ්‍යයක්, අන්ත දූෂිත රාජ්‍යයක්. අපේ පැරණි පාලකයෝ එකතු වෙලා නිර්මාණය කරපු රාජ්‍යය අයෝජකයෝ විශ්වාස කරන්නේ නැතිව ගියා. එතකොට ආයෝජකයෝ එන්නේ නැහැ. ආයෝජකයෝ එන්නේ නැති රාජ්‍යයක අය වැය තමයි අපට හදන්න වෙන්නේ. ඒකේ තත්ත්වය වෙනස්. ඒ නිසා අපි බලය ගන්නකොට අපට තිබුණු විෂය මූලික තත්ත්වය, අපට ලැබුණේ මොන වාගේ ආර්ථිකයක්ද කියන එක අතිශය වැදගත් වනවා. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරු අපෙන් ප්‍රශ්න කරන්නේ ඔබලාට දිව්‍යලෝකයක් වාගේ එකක් දුන්නා, දැන් මොකද වෙන්නේ කියලා අහනවා වාගෙයි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ලෝකයේ සංවර්ධනය සහ විද්‍යාවේ දියුණුව සාපේක්ෂව අපි අත්පත් කරගෙන තිබුණේ නැහැ. ඒක එක කාරණයක්. ඒක කොච්චර ගැඹුරුද කිව්වොත්, අපේ ප්‍රධාන නාළිකාවක පෙන්වනවා ගහ දෙබෑ කරගෙන නයෙක් එනවා කියලා. විද්‍යාවේ සහ සංවර්ධනයේ දියුණුව තුළ ඒ වාගේ ප්‍රාථමික සමාජයක අපි හිටියේ. ඒක නිසා අපට ඒවා ගැනත් සාකච්ඡා කරන්න වෙනවා.

ඊළඟ කාරණය මෙයයි. සමහර දේවල් අපි වියුක්තව සාකච්ඡා කරන්නේ. අපි ඒවා සංයුක්ත අදහසකට ගෙනෙන්නේ නැහැ. බොහෝ වෙලාවට විපක්ෂයේ මන්ත්‍රීවරු යම් කිසි දෙයක් අරගෙන සාකච්ඡා කරන්නේ, වියුක්තව.

අපි ඉගෙන ගෙන තිබෙනවා, යම්කිසි දෙයක් වියුක්තව අරගෙන සාකච්ඡා කරන එක වැරැදියි කියලා. උදාහරණයක් විධියට කිව්වොත්, පොල් ගෙඩියක් රුපියල් 200යි කියනවා. හැබැයි, අපි කථා කරන්නේ නැහැ, පොල් ගෙඩියක් රුපියල් 200 වුණාට, chicken මිල කීයකින් අඩු වුණාද කියලා. අපි කථා කරන්නේ නැහැ, අනෙක් ආහාර පාන කීයකින් අඩු වුණා ද කියලා. අපි කථා කරන්නේ නැහැ රට ලූනු, එළවලු, කරවල මිල කීයකින් අඩු වුණාද කියලා. අපි අපේ වාසියට එක factor එකක්, එක කාරණයක්, අපි දන්නා කාරණයක් අරගෙන අපි ආර්ථිකය ගැන වියුක්තව කථා කරනවා. අපි පොල් මිලෙන් මුළු ආර්ථිකයම පෙන්වනවා. ඒක ආර්ථික විද්‍යාව අනුව වැරැදියි. මොකද, අපේ සාකච්ඡාවට එන්නේ නැහැ, පොල් මිලට අමතරව විනිමය අනුපාතයට මොකද වුණේ, පොලී අනුපාතයට මොකද වෙලා තිබෙන්නේ, උද්ධමනයට මොකද වුණේ, සමස්ත බඩු මිලට මොකද වුණේ කියන ඒවා පිළිබඳව. අපි ඒවාත් එක්ක තමයි පොල් මිල ගැන සාකච්ඡා කරන්න ඕනෑ. හැබැයි, අපි ඒවා සංයුක්තව ගන්නේ නැතිව, එයින් එකක් වියුක්තව අරගෙන කෑගහලා, පෙන්වලා ආර්ථිකය විග්‍රහ කරනවා. අන්න ඒ ක්‍රමය සම්පූර්ණ වැරැදියි.

ඒ වාගේම, සමහර වෙලාවට අපට IMF එක ගැන කියනවා. "ඔබතුමන්ලා IMF එකෙන් ණය ගන්නවා නේ" කියලා. ඒ අය දැන් IMF එකෙන් ණය ගත්ත එක ගැන අපෙන් අහනවා. හැබැයි, සමස්ත ණය ක්‍රියාවලිය පිළිබඳව, ඒ කියන්නේ "අපි මෙච්චර ණය අරගෙන තිබෙනවා, අපි මෙච්චර ණය විනාශ කරලා තිබෙනවා, ඒ ණයවලින් අපට ප්‍රයෝජනයක් නැහැ, ඒ ණය ගත්තේ අපේ පාලන කාලයේ තමයි, ඒක නිසා තමයි ඔබතුමන්ලාටත් IMF එකට ගිහිල්ලා ණය ගන්න වෙලා තිබෙන්නේ" කියන කාරණය සාකච්ඡා කරන්නේ නැතිව, සමස්තය අමතක කරලා IMF එකේ ණය වාරිකය ගැන විතරක් කථා කරනවා. එතුමන්ලා මේ සමස්තය අතහැරලා සමහර කෑලිවල විතරක් එල්ලෙනවා. සමහර අය අහනවා, IMF එකෙන් ණය ගන්න එක අයිති වෙන්නේ සමාජවාදයට ද, ඒක අයිති වෙන්නේ ධනවාදයට ද, එහෙම නැත්නම් IMF එකෙන් ණය ගන්න එක අයිති වෙන්නේ මේ පවතින තත්ත්වය තුළ ලිබරල්වාදයට ද කියලා. මේ රට, මේ ආර්ථිකය පවතින තත්ත්වය ඇතුළේ IMF එකෙන් ණය ගන්න එක අයිති වෙන්නේ මොකකටද? කොහොමද අපි ඒක ආර්ථික ක්‍රමයකින් විග්‍රහ කරන්නේ? අපි ඒ ගැන මේ අය වැයෙන් අවධානය යොමු කරලා තිබෙනවා.

ඊළඟට, අපේ ආර්ථික මොඩලය ගැනත් ගොඩක් අය අහන නිසා මට ඒ ගැනත් කියන්න අදහසක් තිබෙනවා. මේ කාරණා තුන ගැන සලකා බලා තමයි අපි කථා කළේ. ඒ කියන්නේ, ඓතිහාසික තත්ත්වය, ඒ මොහොතේ පවතින වාස්තවික තත්ත්වය සහ වියුක්තව නැතිව සංයුක්තව කරුණු අරගෙන තමයි අපි කථා කළේ. ඊට අමතරව අපේ ආර්ථික මොඩලය ගැන කොටස් තුනකින් කථා කරනවා. නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැඟීම, ආර්ථිකයට ජනතාව බද්ධ කර ගැනීම සහ ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණව බෙදෙන ක්‍රමයකට තමයි අපේ ආර්ථික මොඩලය හදලා තිබෙන්නේ. ඒ කොටස්වලට තමයි අපේ අය වැය අපි එකතු කරලා තිබෙන්නේ. ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට ලැබෙන විධිය කිව්වොත්, සෞඛ්‍ය සේවා සැපයීම වෙනුවෙන් රුපියල් බිලියන 473ක්, නොමිලේ පාසල් පොත් බෙදාදීමට රුපියල් මිලියන 15,500ක්, දුෂ්කර පාසල්වල සිසුන්ට පාවහන් දෙන්න රුපියල් මිලියන 2,500ක්, පොහොර සහනාධාරයට රුපියල් මිලියන 35,000ක් වෙන් කර තිබෙනවා. ඒ ආකාරයෙන් ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට එන්න තමයි අපි මේ අය වැය හදලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නඟන්න අපි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශයට රුපියල් මිලියන 20,000ක් වෙන් කර තිබෙනවා. බලශක්ති ක්ෂේත්‍රයට රුපියල් මිලියන 21,142ක් වෙන් කර තිබෙනවා. කර්මාන්ත සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 10,955ක් වෙන් කර තිබෙනවා. අන්න එහෙම තමයි අපේ මේ අය වැය ඇතුළේ නිෂ්පාදන ආර්ථිකය ගොඩ නඟන්නේ. ගරු සභාපතිතුමනි, ආර්ථිකය ජනතාවට බද්ධ කරන්න අපි ධීවර කර්මාන්තයේ පුනර්ජීවනය සඳහා රුපියල් මිලියන 3,000ක්, වැවිලි සංවර්ධනයට රුපියල් මිලියන 9,565ක්, අතහැර දාලා තිබෙන කර්මාන්තශාලා නැවත අරඹන්න කෘෂිකර්ම සංවර්ධනයට මිලියන 113,524ක් වෙන් කර තිබෙනවා, අපේ රටේ ආර්ථිකයට ජනතාව බද්ධ කර ගන්න. එහෙම නම් අපේ මොඩලය මොකක්ද? අපේ ඇමතිතුමා කිව්වා වාගේ ඒකට ඕනෑම නමක් දා ගන්න. අපේ මූලධර්මය තමයි, මේ අය වැය අපි පාවිච්චි කරලා තිබෙනවා නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැඟීම ඉලක්ක කරගෙන. එහෙම නැතිව මේ ප්‍රශ්නයෙන් අපට ගැලවෙන්න විධියක් නැහැ. අපේ ආර්ථිකයට ජනතාව බද්ධ කර ගන්න විධියට අපි මේ අය වැය සකස් කර තිබෙනවා. අපි ඒ ආකාරයට මේ අය වැය පාවිච්චි කර තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is over.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණව බෙදී යන ක්‍රමවේදයක් අපි මේ අය වැයේ හදලා තිබෙනවා. අපේ model එක ඇතුළේ අපේ රටේ ආර්ථික අර්බුදයට පිළියම් යොදා ගන්න පුළුවන් වන විධියට අපි මෙවර අය වැය ඉතා සාර්ථකව ඉදිරිපත් කරලා තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. අර්බුද ඇතුළේ ගිලිච්ච, බංකොලොත් වෙච්ච රටක මෙච්චර සාර්ථක අය වැයක් ඉදිරිපත් කරන්නට පුළුවන් වීම ගැන අතිගරු ජනාධිපතිතුමාට - අපේ මුදල් ඇමතිතුමාට - අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපි ඒ ගැන සතුටු වෙන බවත් ප්‍රකාශ කරමින් මම මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Harshana Suriyapperuma. You have 13 minutes.

[5.22 p.m.]

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

Hon. Chairman, in the morning also I indicated how the Budget has been structured for its benefits to go down to the citizens of this country. The Hon. Members of the Opposition spoke about how they look at the so-called challenges and I would like to address some of them.

Firstly, the Hon. Ravi Karunanayake made suggestions with regard to the SriLankan Airlines and spoke about how it is currently being managed and the way the Government has allocated billions to settle its debt, which, in his opinion, may not be the right thing to do. Sir, we need to understand that those legacy debts have been incurred over several decades through mismanagement, politicization and without allowing competent people to contribute to the development of those institutions, whereas the present Government has segregated it. The President has very clearly mentioned even during the Budget Speech that there would not be any more funding from the Government for its operational purposes. We can see light or kind of sparks coming up at the end of the tunnel because of the way the present management is handling that entity, trying to restructure its operations and engaging capable people to ensure that we get the best out of it. And, its debt has to be serviced. That creates confidence that the Government is not abandoning any of its obligations and is clearing any debts the country has incurred.

Sir, another matter that was raised was *parate* execution. Since the current Government took over, we extended the relief package that was introduced through the banking mechanism for another 12 months' period.

පරාටේ නීතියට අනුව දේපොළ බැංකුවලට පවරා ගැනීමට නියමිතව තිබියදී, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ඒ සඳහා නිසි ක්‍රමවේදයක් සූදානම් කර දුන්නා. මෙහිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට බැංකු පද්ධතියත් එක්ක සම්බන්ධ වෙලා මාර්තු මස 31වැනි දිනට පළමුව ඇවිල්ලා සාකච්ඡා කරලා වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරවන්න කියලා තවත් මාස 12ක කාල සීමාවක් ලබා දුන්නා. අපි නිරන්තරයෙන් මේ සම්බන්ධයෙන් හොයා බලනවා. බැංකුවලින් අවශ්‍ය දත්ත සපයා ගෙන මේ පිළිබඳව විමසා බලනවා. ගරු සභාපතිතුමනි, මහ බැංකුවත් සම්බන්ධ කරගෙන ව්‍යාපාර 20,000කට වඩා තෝරා ගෙන, ඒවා මොනවාද යන්න identify කරගෙන සිටියා, මේ තුළින් benefit එක ලබා ගන්නට පුළුවන් කියලා. නමුත්, පෙබරවාරි මාසය අවසානයේ තිබෙන දත්ත පරීක්ෂා කරද්දී අපිට දකින්නට ලැබුණා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් දහසකටත් අඩු ප්‍රමාණයක් තමයි මේ දක්වා ඒ සහනය ලබා ගන්නට පැමිණිලා තිබෙන්නේ කියලා. ඒකට හේතුව, මේ සම්බන්ධව තිබෙන දැනුවත්භාවය පිළිබඳ ගැටලුවක් කියලා අපි හිතන්නේ නැහැ. මොකද, බැංකු පද්ධතිය දිගින් දිගටම මේ ගොල්ලන්ව සම්බන්ධ කරගෙන තිබුණා. නමුත්, එතැනින් නවතින්නේ නැතිව නැවත වතාවක් අපි සියලු බැංකු පද්ධතිවලට දැන්වූවා මේ ව්‍යාපාරිකයන්ව ලිඛිතව සම්බන්ධ කර ගන්න, දුරකථන මාර්ගයෙන් සම්බන්ධ කර ගන්න, තම තමන්ගේ branch එකේ network එක හරහා කළමනාකරුවන්ව සම්බන්ධ කරගෙන මේ සාකච්ඡාවට ගෙනෙන්න කියලා. හේතුව, ඒ ලබා දී තිබෙන කාලය මාර්තු 31වන දාට අවසාන වන නිසා ඒ අයට නැවත වතාවක් මේකට සහභාගි වෙන්නට ආරාධනා කරන්න කියලා කිව්වා. මේ සඳහා සිංහල මාධ්‍යයෙන්, දෙමළ මාධ්‍යයෙන්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළ වන පත්තරවල advertisements දැම්මා; සමාජ මාධ්‍ය - social media - හරහා advertisements දැම්මා. මේ සියල්ල තුළින් අපි දැනුවත් කිරීම් කරලා තිබෙනවා, තව තවත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සම්බන්ධ වෙලා මේ සහන ලබා ගන්නට එකතු වෙන්නට කියලා.

ගරු සභාපතිතුමනි, ඊළඟට අපි මෙන්න මේ වැඩ පිළිවෙළ Budget එක තුළින් ක්‍රියාත්මක කිරීම - implementation - සඳහා focus කරලා තිබෙනවා. ඒ තමයි, "ජාතික තනි කවුළුව" - National Single Window - ව්‍යාපෘතිය තුළින් අපේ අපනයනකරුවන්ට, ආනයනකරුවන්ට ඒ ක්‍රියාවලිය සාර්ථකව කර ගන්න හොඳ වැඩ පිළිවෙළක් සූදානම් කරලා තිබෙනවා. ඒ සඳහා මේ වන විටත් නිතර සාකච්ඡා වට පවත්වමින් chamber එකට අවශ්‍ය වෙන ආයෝජන, එම ව්‍යාපාරික කමිටු සම්බන්ධ කරගෙන ඒ වැඩ පිළිවෙළ මසක් පතා අපි විමර්ශනය කරමින් ඉදිරියට කරගෙන යනවා. ගරු සභාපතිතුමනි, මේ වැඩ පිළිවෙළේ බලාපොරොත්තුව තමයි මෙතුවක් කල් වචනයට පමණක් සීමා වෙච්ච මේ වාගේ රටකට අත්‍යවශ්‍ය කරන දේවල් හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරවීම. ඊට අවශ්‍ය කාලය හා මුදල් වෙන් කරලා තිබෙනවා වාගේම ව්‍යාපාරිකයන්ට, අපනයනකරුවන්ට, ආනයනකරුවන්ට ඔවුන්ගේ වැඩ කටයුතු පහසු කරවා ගන්න අතරමැදි වැඩ පිළිවෙළක් -intermedial arrangement එකක් - මේ වෙනකොටත් සූදානම් කරලා තිබෙනවා. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ සඳහා කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම මේ කඩා වැටුණු ආර්ථිකය තුළ අපහසුතාවට පත් වෙලා සිටින අය වෙනුවෙන් සමාජ සුබසාධන වැඩ පිළිවෙළක් තුළින් සහන සැලසීම සඳහා මෙවර Budget එකෙන් අපි විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. එහි එක් අංගයක් පිළිබඳව ප්‍රගතිය වාර්තා කරන්න මම කැමතියි, ගරු සභාපතිතුමනි. අස්වැසුම සහනාධාරයෙන් පිට හිටපු පාසල් දරුවන්ට අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීම සඳහා අතිවිශාල මුදල් ප්‍රමාණයක් අය වැයෙන් වෙන් කර දීලා තිබුණා. මම මෙතැන දී සඳහන් කරන්න කැමැතියි, ඩිජිටල්කරණය කියන එක වචනයට පමණක් සීමා නොකර, පෞද්ගලික අංශය, දේශපාලන මහ පෙන්වීම සහ රාජ්‍ය අංශයේ මැදිහත්වීමෙන් මේ කටයුත්ත අපි සාර්ථකව ඉෂ්ට කළේ කොහොමද කියලා. මේ සිසු දරුවන්ට රුපියල් 6,000ක මුදල ලබා දීම සඳහා ඉක්මන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය වුණා. අපි ඒ අවශ්‍යතාව පිළිබඳ සාකච්ඡා කරමින් සිටියදී, ඩයලොග් ආයතනය සහ MillenniumIT ආයතනය ඒ සඳහා ඉදිරිපත් වුණා. Sir, I need to put that on record that they informed කිසිම වියදමක් සඳහා ගාස්තුවක් අය නොකර ඉන්ධනවලට - fuelවලට - develop කරපු QR code system එකම වැඩි දියුණු කරලා, පාසල් දරුවන්ට QR code system එක පාවිච්චි කරලා පොත් සාප්පුවකට - bookshop එකකට - ගිහිල්ලා මේ රුපියල් 6,000ට පොත් පත් ලබා ගන්න වැඩ පිළිවෙළක් සූදානම් කරන්න කැමතියි කියලා ඒ අය කිව්වා.

ගරු අගමැතිතුමියත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින්වත් ඒ කටයුත්තට සම්බන්ධ කරගත්තා. ඒ නිලධාරින් ඉතාම කැපවීමෙන් ඒ වැඩ කටයුත්තට දායක වුණා. ඔවුන්ගේ කැපවීමත් අපි අගය කරන්න ඕනෑ. ඒ develop කර තිබෙන system එකට අනුව මේ වෙනකොට එම වැඩසටහන ක්‍රියාත්මක වනවා. ලංකාව පුරාම එම වැඩසටහන ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සියලුම වැඩ අපි බොහෝදුරට අවසන් කරමින් පවතිනවා. ඒ කියන්නේ එය අවසාන අදියරේ තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ඒ අනුව මට

මගේ phone එකෙන් log වෙලා dashboard එකෙන් බලන්න පුළුවන්, ලංකාව පුරාම - දිස්ත්‍රික්කයක් දිස්ත්‍රික්කයක් පාසා - දරුවන් කී දෙනෙකුට මේ තුළින් ප්‍රතිලාභ ලැබුණාද, ඒකට වියදම් වුණු රුපියල් ප්‍රමාණය කොපමණද, දරුවන් කී දෙනෙක් සමස්ත රටටම ඉන්නවාද, අවශ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද, පොත් සාප්පු ප්‍රමාණය කොපමණද කියලා. මේක තමයි අපි කිව්වේ digital economy එකකට අපි මේ රට ගෙනියනවා කියලා. අපි ඒක වචනයකට සීමා කළේ නැහැ. ඒක implementation දක්වා ගෙන ගිහිල්ලා මේ වෙනකොට ඉතාම සාර්ථකව ඒ කටයුත්ත අවසන් කර තිබෙනවා. අපේ බලාපොරොත්තුව තිබෙන්නේ, ඒ තුළින් මේ සමාජයට, මේ රටට, ව්‍යාපාරිකයන්ට, රාජ්‍ය ආයතනවලට, අපේ රටේ පුරවැසියන්ට ආදර්ශයක් දෙන්නයි, ඔව්, ඒවා කරන්න පුළුවන්, yes, it is possible කියලා. අපි ඒවා වචනයකට සීමා කළේ නැහැ. මේ කටයුත්ත සාර්ථක කර ගන්න Sri Lanka CERT එක, ICTA එක digital economy එක සම්බන්ධයෙන් වැඩ කටයුතු කරන ගරු Deputy Minister ඇතුළු සියලුදෙනාම එකතු වෙලා එක team එකක් විධියට වැඩට බැහැලා සුමාන කිහිපයක් ඇතුළත - මාස එකහමාරක් වාගේ කාලයක් ඇතුළත - from concept to delivery, අපි අවසාන කරලා තිබෙනවා. දැන් මේක achievement එකක් විධියට අපට දැනෙනවා. මේක පොඩි දෙයක් වුණාට අපි බලාපොරොත්තු වෙනවා, මෙය roll out කරලා, මේ concepts තව වැඩි කරලා සියලුම ක්ෂේත්‍රවලට මේවායේ benefits ලබා දෙන්න. National Single Window එකටත් මේ වාගේම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි සූදානම් කරමින් යනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රශ්න කරනකොට ඇහුවා, වාහන ආනයනය කිරීමේ - vehicle importation - වැඩ පිළිවෙළ සාර්ථකව වෙනවාද, ඒවා බලාපොරොත්තු වෙන්න බැරිද කියලා. ඒ පිළිබඳව ඔවුන් විවිධ සංඛ්‍යා දත්ත ගෙන හැර පෑවා, බෙදලා පෙන්නුවා, මේ විධියට ගියොත් මේක කරන්න ලැබෙන්නේ නැහැ කිව්වා. ගරු සභාපතිතුමනි, අපි ඒක බොහොම කල්පනාකාරීව regularly monitor කරනවා. LCs open වෙන්නේ කීයක්ද, ඒකට value එක විධියට කොච්චර එළියට යනවාද, ඒ තුළින් කොච්චර බදු ආදායමක් රටට එනවාද, මේ system එක තුළ අපහසුතා තිබෙනවාද, රජයේ මැදිහත්වීම අවශ්‍ය වෙනවාද, අකටයුතුකම් වෙනවාද කියන මේ සියල්ලම නිරන්තරයෙන් අපි සොයා බලනවා. මේ regular reviewsවලට අනුව අපෙන් එළියට යන විදේශ විනිමය පිළිබඳව අපට පුරෝකථනයක් තිබුණා, මෙතරම් ප්‍රමාණයක් මේ මාස කිහිපයට එළියට යයි, මේ තුළින් අහවල් ප්‍රමාණයක බදු ආදායමක් උපයා ගන්න ලැබෙයි කියලා. ඒ සියල්ලම මේ වෙනකොට බොහොම සාර්ථකව සිද්ධ වේගෙන යනවා. විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් කිව්වා, අපි එක වෙලාවක කිව්වා ලු, බද්ද ගහනවා කියලා. තව වෙලාවක කිව්වා ලු, බද්ද අඩු කරනවා කියලා. කිසිම confusion එකක් නැහැ. ඉතාම සාර්ථකව ඒ වැඩ පිළිවෙළ කෙරේගෙන යනවා. මේ සාර්ථකත්වය පිළිබඳව වචනවලින් මම කියනවාට වඩා හොඳින් ක්‍රියාවෙන් බලන්න පුළුවන්. අපේ සංචිත දිහා බැලුවාම ඒක පෙනී යනවා. මහ බැංකුව වාර්තා කරනවා, සංචිත බොහොම සාර්ථක ලෙස හෙමින් හෙමින් ඉහළට යන බව. අපේ exchange rate එක බැලුවාම සමහර අය හිතුවේ exchange rate එක කඩාගෙන වැටෙයි කියලායි. බොහොම stable මට්ටමෙන් exchange rate එක නඩත්තු වෙනවා. ඒ වාගේම තමයි රටට අවශ්‍ය වාහන විශාල ප්‍රමාණයක් මේ වෙනකොටත් ලැබෙමින් පවතිනවා. මේවා ක්‍රියාත්මක කිරීමේදී - implementation එකේදී - අපහසුතාවලට පත් වෙනවා නම් ඊට අවශ්‍ය මැදිහත් වීම කරන්නත් අපි සූදානම්. ඒ අනුව අපි ඊයේ ගැසට් පත්‍රිකාවක් මඟින් මේ වැඩ පිළිවෙළ තවත් සුමට ලෙස කරගෙන යන්න අවශ්‍ය කරන facilitation එක කර දීමේ වැඩ පිළිවෙළක් සූදානම් කළා. නිරන්තරයෙන් මේ පිළිබඳව පසු විපරම් කිරීම - regularly monitor කිරීම - ඒකට හේතුවයි. මේ වාගේ වැඩ පිළිවෙළ රාශියක් අපේ අය වැය තුළ ක්‍රියාත්මක වෙනවා. අය වැය ලියවිල්ලකට පමණක් සීමා නොවී මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපි වැඩි අවධානයක් යොමු කර තිබෙනවා.

මේ අය වැය ගැන බලනකොට, මේ රටේ අනාගතය මීට වඩා ශක්තිමත් කරන්න නම් අපි මේ සමාජයට ආයෝජනයක් කරන්න වෙනවා.

ඒ කියන්නේ, public investment තුළින්. Public investment වෙනුවෙන් රුපියල් බිලියන 1,300ක් - ට්‍රිලියන 1.3ක් - මේ අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා. අපේ බලාපොරොත්තුව තමයි, සියලු දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතන සහ ව්‍යාපාරිකයන් මැදිහත් කරගෙන සමස්ත රට වෙනුවෙන් ආයෝජනය කරන්නට තිබෙන public investment ඉදිරි මාස නවයක කාලය තුළ නිසි ලෙස disburse කරලා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම. ගරු සභාපතිතුමනි, එම ආයෝජන තුළින් තමයි ඊළඟ අවුරුද්දේ රටට ප්‍රතිලාභ ලැබෙන්නේ. අප සියලුදෙනාට වගකීමක් තිබෙනවා, යුතුකමක් තිබෙනවා, එකතු වෙලා මේ ආයෝජන නිසි ලෙස කරගෙන යෑමට. ඒකට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ තිබෙන ආයතන ව්‍යුහයත් අපි පාවිච්චි කරලා තිබෙනවා. ඒ සඳහා Project Monitoring Division එකක් වෙනම තිබෙනවා. Disbursementsවලට සහ Treasury operationsවලට වෙනම unit එකක් තිබෙනවා. ඒ සියලු දේ පාවිච්චි කරලා අපේ බලාපොරොත්තුව තමයි, අපි ඉදිරිපත් කරපු මේ වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාවට නැංවීම. මේකට විශාල පිරිසක් කැප වෙලා ඉන්න බව අපි දන්නවා. මෙතැන ඉන්න සුළු පිරිස පමණක් නොවෙයි, සමස්ත රටටම පුරවැසියන්ගේ දායකත්වයෙන් ඉදිරියට ගිහිල්ලා අපි මේ ගමන සාර්ථක කරගන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
විසර්ජන පනත් කෙටුම්පත - 2025 කාරක සභා අවස්ථාවේ විවාදය කල් තැබීම, ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු සභාපතිතුමනි, "මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය 2025 මාර්තු මස 21වන සිකුරාදා පූ.භා. 10.00 තෙක් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ඊට අනුකූලව, අ.භා. 5.38ට විවාදය කල් තබන ලදී. කාරක සභාව නැවත රැස්වීම 2025 මාර්තු 21වන සිකුරාදා.

அதன்படி, பி.ப. 5.38 மணிக்கு, விவாதம் ஒத்திவைக்கப்பட்டது. குழு மீண்டும் கூடுவது 2025 மார்ச் 21, வெள்ளிக்கிழமை.

Accordingly, at 5.38 p.m., the Debate stood adjourned. Committee to sit again on Friday, 21st March, 2025.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 15 දක්වා ඉදිරිපත් කිරීම.

මුදල් පනත: නියෝගය
நிதிச் சட்டம்: ஒழுங்குவிதி
FINANCE ACT: REGULATION

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2012 අංක 12 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු 2013 අංක 12 දරන මුදල් පනතේ 12 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 නොවැම්බර් 22 දිනැති අංක 2411/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.14 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

දේශීය ආදායම් පනත: යෝජනාව
உண்ணாட்டு இறைவரிச் சட்டம்: தீர்மானம்
INLAND REVENUE ACT: RESOLUTION

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සම්බන්ධයෙන් 2013 ජූලි 26 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, 2013 සැප්තැම්බර් 17 දිනැති අංක 1828/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර එළඹී ගිවිසුම සංශෝධනය කරමින් 2024 දෙසැම්බර් 16 දින ඇති කරගත් 2025.02.20වැනි දින ඉදිරිපත් කරන ලද සන්ධාන පත්‍රය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත: නියෝග
காப்புறுதித் தொழிலை ஒழுங்குபடுத்தல் சட்டம்: ஒழுங்குவிதிகள்
REGULATION OF INSURANCE INDUSTRY ACT: REGULATIONS

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2024 දෙසැම්බර් 22 දිනැති අංක 2415/79 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்: ஒழுங்குவிதிகள்
IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 27 දිනැති අංක 2421/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

සුරාබදු ආඥාපනත: නිවේදනය
மதுவரிக் கட்டளைச் சட்டம்: அறிவித்தல்
EXCISE ORDINANCE: NOTIFICATION

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තිය යටතේ මත්පැන් සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 10 දිනැති අංක 2418/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.27 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2025 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත: නියමය
உற்பத்தித் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம்: கட்டளை
EXCISE (SPECIAL PROVISIONS) ACT: ORDER

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 10 දිනැති අංක 2418/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.27 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත: නියමය
விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம்: கட்டளை
SPECIAL COMMODITY LEVY ACT: ORDER

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 දෙසැම්බර් 31 දිනැති අංක 2417/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.03.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 27 දිනැති අංක 2421/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.03.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව (2021)
இலங்கை ரஜரட்ட பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கை (2021)
RAJARATA UNIVERSITY OF SRI LANKA: ANNUAL REPORT (2021)

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2023.07.05 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.08.24 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.09.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම: වාර්ෂික වාර්තාව (2021)
இலங்கை பெற்றோலிய களஞ்சிய முனையம்: வருடாந்த அறிக்கை (2021)
CEYLON PETROLEUM STORAGE TERMINALS LIMITED (CPSTL): ANNUAL REPORT (2021)

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2023.12.13 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම: වාර්ෂික වාර්තාව (2022)
இலங்கை பெற்றோலிய களஞ்சிய முனையம்: வருடாந்த அறிக்கை (2022)
CEYLON PETROLEUM STORAGE TERMINALS LIMITED (CPSTL): ANNUAL REPORT (2022)

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2024.03.05 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය: වාර්ෂික වාර්තාව (2020)
தேசிய தொழில்சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம்: ஆண்டறிக்கை (2020)
NATIONAL INSTITUTE OF OCCUPATIONAL SAFETY AND HEALTH: ANNUAL REPORT (2020)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වගන්තිය යටතේ 2023.07.18 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.08.24 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.09.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය: වාර්ෂික වාර්තාව (2021)
தேசிய தொழில்சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம்: ஆண்டறிக்கை (2021)
NATIONAL INSTITUTE OF OCCUPATIONAL SAFETY AND HEALTH: ANNUAL REPORT (2021)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වගන්තිය යටතේ 2023.07.18 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.08.24 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.09.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 16, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම.

කම්කරු අමාත්‍ය, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත
உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்
INLAND REVENUE (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා.

ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[5.41 p.m.]

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

Hon. Speaker, the Inland Revenue (Amendment) Bill relates to the provisions made in the Budget. It is important to understand that the limited number of changes which are going to be implemented from 01st of April, 2025 are what is encapsulated in this Bill. And, there are a few important areas I wish to touch upon as I go on.

මෙහිදී පළමුවැනි කාරණය විධියට අපි දැක්කා, සේවා අපනයනකරුවන් වෙනුවෙන් සියයට 15ක tax එකක් දාලා තිබෙනවා කියලා වැරැදි මතයක් සමාජගත කරන්නට විපක්ෂයේ කිහිපදෙනෙක් උත්සාහ දරනවා. ඒ වාගේම ඒ තුළින් සේවා අපනයනකරුවන්ට අවාසියක් වෙනවා කියලා සමාජ මාධ්‍ය තුළත් සමහර අය මතයක් හදන්නට උත්සාහ කළා. නමුත්, ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් නිවැරැදි විස්තරය මේකයි. පසුගිය රජය IMF framework එක තුළ සියයට 30ක බද්දක් අය කර ගැනීම සඳහා එකඟ වෙලා තිබුණා. ඒ කියන්නේ, සියලු ව්‍යාපාරික ආයතන සියයට 30ක බද්දට යටත් කියන concept එක යටතේ, එහෙම නම් service exportersලාත් ඒ සියයට 30ක බද්දට යටත් විය යුතුයි. ඒ වාගේම, සියලු තනි පුද්ගලයෝ - individualsලා - සියයට 36ක tax එකකට යටත් විය යුතුයි. Sir, let me focus on several misconceptions relating to IT exports. ඒ දුර්මත අතර පළමුවැනි එක තමයි, වර්තමාන ආණ්ඩුව සියයට 15ක බද්දක් පැනවූවාය කියන එක. මම කලිනුත් කිව්වා වාගේ, කලින් තිබුණු රජය සියයට 30ක බද්දක් පැනවීමට එකඟ වෙලා තිබුණා. වර්තමාන රජය IMF එකත් එක්ක සාකච්ඡා කරලා, එම සියයට 30ක බද්ද සියයට 15 දක්වා අඩු කළා. එය සියයට 50කින් බදු අඩු කිරීමක්.

ඊළඟ කාරණය මෙයයි. ඒ බද්ද අඩු කරනවා විතරක් නොවෙයි, මේ service exportersලාට තව අමතර වාසි කීපයක් ලබා දී තිබෙනවා. ඉන් පළමුවන වාසිය තමයි, ඒ අනුව ද්විත්ව බදු ගිවිසුම් - double taxation treaties - තමන් service අපනයනය කරන රටත් එක්ක තිබෙනවා නම්, ඒ රටේදී යම්කිසි බද්දක් ගැහුවාම නැවත වතාවක් ලංකාවේදී තමන්ගේ බදු ගණනය කිරීමේදී විදේශයකදී ගෙවන ලද බද්ද අඩු කර ගැනීමට අවස්ථාව ලැබීම. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්, තේරුම් ගැනීමේ පහසුව සඳහා. ලංකාවේ IT service exporter කෙනෙක් යම්කිසි රටක රජයකට service එක export කළාම ඒ රටේදී සියයට 20ක බද්දක් ගහනවා නම් ඔහුට නැවත ලංකාවේ කිසිම බද්දක් අය කරන්නේ නැහැ. ඒක මෙම බදු ක්‍රමයේ තිබෙන ප්‍රධාන වාසියක්. ඒ රටේදී සියයට 12ක බද්දක් තමයි ගැහුවේ කියලා අපි උදාහරණයකට ගත්තොත්, එහෙනම් මේ පනතට අනුව ලංකාවේදී අය කරන්නේ සියයට 3ක බද්දක් විතරයි. මේවා තුළින් තමයි වාසිය ලබා දීලා තිබෙන්නේ. මේක තමයි මේ service exportersලාට ලබා දුන් දෙවැනි වාසිය.

මෙම බදු ක්‍රමයේ තුන්වැනි වාසිය මෙයයි, ගරු කථානායකතුමනි. මෙතැනදී වෙන්නේ ලැබෙන සම්පූර්ණ මුදලට බදු ගැහීමක් නොවෙයි. ඒ මුදලෙන් තමන්ගේ වියදම් අඩු කරගන්නත් අවස්ථාව ලැබෙනවා. මේ service exportersලාට, YouTube එකට සම්බන්ධ වෙලා නැත්නම් වෙනත් ක්‍රමවේදයකින් වැඩ කටයුතු කරන තරුණ දරුවන්ට laptop එකක්, කැමරාවක්, microphone එකක්, lightings ගන්න අවශ්‍ය කරනවා. තමන් Internet බිල ගෙවනවා නම්, විදුලි බිල් ගෙවනවා නම්, rent එකක් ගෙවනවා නම් ඒ සියලු වියදම් අඩු කරගෙන ඒකෙන් ලැබෙන ලාභයට තමයි මේ බද්ද අය කරන්නේ. සමාජයේ වැරදි මතයක් ගොඩනඟන්නට හැදුවා, මේ ලැබෙන සම්පූර්ණ මුදලට සියයට 15ක tax එකක් ගහනවා කියලා. ඒක වැරදියි. නිවැරදි කථාව තමයි, සියලු වියදම් අඩු කරගන්නට දීලා - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රමවේදයක් තිබෙනවා, වියදම් අඩු කර ගැනීම සඳහා- ඒ ක්‍රමවේදයට යටත්ව වියදම් අඩු කළාම ඉතුරු වෙන මුදලට තමයි මේ බද්ද අය කරන්නේ කියන එක.

හතරවැනි වාසිය තමයි, මේ අය කරන බද්ද සියයට 15ට වඩා වැඩි වෙන්නේ නැති එක. ඒක තව විධියකින් පැහැදිලි කරනවා නම්, this tax is capped at 15 per cent. මම පළමුව උදාහරණයක් අරගෙන ඒ ගැන පැහැදිලි කරලා දෙන්නම්. යම්කිසි පුද්ගලයෙක් IT ක්ෂේත්‍රයේ සේවා අපනයනයක් තුළින් වසරකට රුපියල් මිලියනයක ආදායමක් ලබා ගත්තොත්, මේ බදු ක්‍රමය යටතේදී ශතයකවත් බද්දක් අය කෙරෙන්නේ නැහැ. හේතුව තමයි, ඒ පුද්ගලයා ලබන ආදායමෙන් රුපියල් මිලියන 1.8 දක්වා බද්දෙන් නිදහස් වීම. ඒක තමයි සූදානම් කරලා තිබෙන ක්‍රමවේදය.

අපි දෙවනුව උදාහරණයට ගනිමු, ඒ දරුවා මේ සේවා අපනයනය කරලා රුපියල් මිලියන 2ක ආදායමක් ලබා ගත්තා කියලා. රුපියල් මිලියන 2ක ආදායමක් ලබා ගත්තා නම්, පළමුවැනි රුපියල් මිලියන 1.8 බද්දෙන් එයා නිදහස්. ඒ අනුව දෙවැනි රුපියල් ලක්ෂ දෙකට තමයි බදු අය කළ යුත්තේ.

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

ඒකෙනුත් තමන්ට තිබෙන වියදම් අඩු කරගන්නට දීලා ඉතුරු ප්‍රමාණයට තමයි සියයට 6ක බද්ද ගහන්න පටන් ගන්නේ.

අපි තුන්වැනි උදාහරණය විධියට ගනිමු, මේ තුළින් කෙනෙකුට රුපියල් ලක්ෂ 30ක ආදායමක් ලැබෙනවාය කියලා. එතකොට හරි නම් මම ළඟ තිබෙන මේ වගුවට අනුව ඒ දරුවාට, නැත්නම් ඒ තරුණයාට ලැබෙන ආදායම මත ඊළඟ tax slab එකට ගිහිල්ලා සියයට 18 මට්ටමින් tax අය කරන්නට අවශ්‍ය කරනවා. නමුත් එහෙම කෙරෙන්නේ නැහැ. ඒක තමයි මෙහි තිබෙන හතරවැනි වාසිය. එතැන ඉඳලා ආදායම් සීමාව කොතරම් ඉහළට ගියත්, මේ අය කරන බද්ද සියයට 15න් නතර වෙනවා.

මෙහි පස්වැනි වාසිය මෙයයි. මේක, මේ ආදායම බැංකු පද්ධතිය තුළට ලැබෙනකොට Withholding Tax එක වාගේ තමන්ගේ account එකට සල්ලි වැටෙන වෙලාවේ බද්ද අය කරගන්න වැඩ පිළිවෙළක් නොවෙයි. ඒ වෙනුවට ඒ තරුණයාට, ඒ අපනයනකරුට - ආයතනයක් වේවා, තනි පුද්ගලයෙක් වේවා - ඒ මුදල පාවිච්චියට අරගෙන තමන්ගේ වැඩ කටයුතු කරගෙන ගිහිල්ලා කාර්තුව අවසානයේදී - at the end of the quarter - කරන ගණනය කිරීම්වලට අනුව තමයි මේ බද්ද ගෙවන්නට අවශ්‍ය කරන්නේ. එතකොට cash flow advantage එකකුත් ලැබෙනවා.

ඊළඟට මෙහි හයවැනි වාසිය මෙයයි. තමන් ගෙවාගෙන ගිය බදු පිළිබඳව ගණනය කර බලා තව අමතර ප්‍රමාණයක් ගෙවිය යුතු නම් වසර අවසානයේදී ඒ එකතුව ගණනය කරලා තමයි එය ගෙවන්නට තිබෙන්නේ. මේ යනාදී සහන රැසක් එක්ක තමයි මේ වැඩකටයුත්ත පළමුවැනි වතාවේ ක්‍රියාත්මක කරන්න ආරම්භ කරලා තිබෙන්නේ.

අපි දන්නවා, මේ බදු ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී සාධාරණත්වය පිළිබඳ මූලධර්මය අපට අනුගමනය කරන්නට වෙනවා කියලා.

අපේ ඇහලුම් කර්මාන්තයේ යෙදෙන තරුණියන්, ඒ කර්මාන්තයේ වැඩ කරලා රටට ඩොලර් උපයන කර්තව්‍යයට සම්බන්ධ වෙලා ඉන්නවා. නමුත් ඒ වැඩ කරන තරුණියන්ට, ඒ ඇහලුම් කර්මාන්තවල වැඩ කරන පිරිසගෙන් සියයට 36 දක්වා බද්දක් අය කෙරෙනවා. නමුත් ඒ උපයන ඩොලර් තමයි අපිට පාවිච්චි කරන්නට වෙන්නේ, මේ IT ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ඉන්න පිරිසට අවශ්‍ය laptops, servers, racks, hardware, software යනාදී සියලු instruments ආනයනය කරන්නට. එතකොට විදේශ විනිමය කළමනාකරණය කිරීමේ වැඩ කටයුත්තේදී මම හිතනවා, හැමෝම එකඟ වෙනවා ඇති කියලා සෑම දෙනෙක්ම මේ බදු ක්‍රියාවලියට සම්බන්ධ විය යුතුයි කියන කාරණයට. නමුත් අපි සාධාරණව පිළිගන්නවා, පසුගිය කාල සීමාව තුළ රටේ පුරවැසියන්ට විශ්වාසයක් තිබුණේ නැහැ, තමන් ගෙවන මේ බදුවල ප්‍රතිලාභ තමන්ට ලැබෙනවාය කියලා. ඒ වෙනුවට මේ ගෙවන බදු, දේශපාලකයෝ හිතූ හිතූ හැටියට නාස්ති කර දමලා අවසානයේ නතර වුණේ රටත් බංකොලොත් කරලයි. නමුත් වර්තමාන රජයේ මේ මන්ත්‍රී පිරිස සහ ඇමතිවරු එකතු වෙලා නව දේශපාලන සංස්කෘතියක් හරහා මේ රට නව මාවතකට, යොමු කරන්නට පටන් අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි වියදම් අඩු කරන බව ආදර්ශයෙන් පෙන්වලා තිබෙනවා. ඒ සඳහා වන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල තමයි මේ Budget එක තුළින් පෙනෙන්න තිබෙන්නේ. අපේ විදේශ ණය ගැනීම් අවම කර ගන්නට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම දේශීය වශයෙන් ණය ගැනීම් අවම කර ගන්නට අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ financial discipline එක නිසා, මූල්‍ය කළමනාකරණය නිසා. ඒක මම වචනයෙන් කියනවාට වඩා අපට පෙනෙන්නට තිබෙනවා. රජය තමයි මෙතුවක් කල් රටේ බැංකු පද්ධතියෙන් විශාලම ණය ගන්නා විධියට හිටියේ. නමුත් මේ අලුත් ක්‍රමවේදය තුළ රජය විසින් වෙළඳපොළෙන් ගන්න ණය ප්‍රමාණය ටිකෙන් ටික අඩු වෙලා තිබෙන නිසා අපට පෙනෙනවා, market එකේ තිබෙන interest rate එක අඩු වෙලා, අඩු වෙලා ඇවිල්ලා, දරා ගන්න පුළුවන් මට්ටමකට පහළට ඇවිල්ලා තිබෙන බව. අපි සතුටු වෙනවා, මෙය මීටත් වඩා තව ටිකක් පහළට ගියොත්. නමුත් මේ තිබෙන අවස්ථාවේ හැටියට ඒකෙන් පෙන්නුම් කරන්නේ මේ රජයේ මූල්‍ය කළමනාකරණයේ තිබෙන සාර්ථකත්වයයි. මොකද, මාස කිහිපයක් ඇතුළත ඉතාම සාර්ථක ලෙස මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. තව ගමනක් ඉදිරියට යන්න තිබෙනවා. මේක තව improve කර ගන්නට අපට අවශ්‍ය කරනවා. ඒ, එක කොටසක්.

ඊළඟ කාරණාව, මේ Digital Services Tax එකට අමතරව, Withholding Tax එකක්, එහෙම නැත්නම් රඳවා ගැනීමේ බද්දක් පිළිබඳව මේ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත තුළ සඳහන් වෙලා තිබෙනවා. මේ Withholding Tax එක සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම තුළින් යම්කිසි පිරිසකට අසාධාරණයක් වෙනවාය කියලා මතයක් ගොඩනඟන්නට හැදුවා. ගරු කථානායකතුමනි, මම දැනුවත් කරන්නට කැමැතියි, අපේ ක්‍රමවේදය තමයි ඩිජිටල් ක්‍රමවේදය හරහා ඉතාම පහසුවෙන්, අපේ පුරවැසියන්ට මේ සම්බන්ධ කටයුතු කරගැනීමට සැලැස්වීම. තමන්ගේ මාසික ආදායම 150,000ට වඩා අඩු ප්‍රමාණයක් නම්, තමන්ගේ ළඟම තිබෙන බැංකු ශාඛාවට ගිහිල්ලා -රට පුරා විසිරුණු බැංකු ශාඛා 5,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. පෞද්ගලික මූල්‍ය සමාගමක නම්, ආයෝජනය කරලා තිබෙන්නේ; තැන්පතු දාලා තිබෙන්නේ ශාඛා 1,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා- declaration එකක් ලබා දුන්නාම, ඒ declaration එක බැංකුව විසින් IRD එකට, නැත්නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට access කරන්න පුළුවන් system එකකට upload කරන්නට අවශ්‍ය මූලික වැඩකටයුතු දැනටමත් අපි සූදානම් කරලා තිබෙනවා. ඒ තුළින් කිසිම රස්තියාදුවකින් තොරව පුරවැසියන්ට Withholding Tax එකෙන් තමන්ට අවාසියක් නොවෙන විධියට ඒ වැඩ කටයුත්ත කර ගන්නට පුළුවන් ක්‍රමවේදයක් සූදානම් කරලා තිබෙනවා.

ඊට අමතරව, අපි ලක්ෂ 10 සීමාවට නම් මේ අවශ්‍ය වරප්‍රසාදය දෙන්නේ, යම්කිසි පුරවැසියෙක් තමන්ට තිබෙන මුදලින් වෙනත් විධියකට වාසි ගන්නට උත්සාහ කරනවා නම්, -උදාහරණයක් විධියට සියයට 3ක interest එක වැඩිහිටි පුරවැසියන්ට ලබා දෙන්නට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ තුළ කෙනෙකුට ලක්ෂ 30ක deposit එකක් තිබෙනවා නම්, එය කොටස් තුනකට කඩලා, බැංකු තුනකට දාලා, තුන් සැරයක් වාසිය - advantage එක - ලබා ගන්නට උත්සාහ කරනවා නම්, අපට මේ පරිගණක පද්ධතිය තුළින් ඒකටත් අවශ්‍ය විසඳුම ලබා ගන්නට පුළුවන් වෙයි කියලා හිතනවා. ඒකට අවශ්‍ය මූලික වැඩකටයුතු මේ වෙනකොටත් අපි සූදානම් කරගෙන තිබෙනවා. ඒ තුළින් ඉතාම පහසුවෙන් මේ ක්‍රමය ක්‍රියාත්මක කරවන්නට අවස්ථාව ලැබෙයි කියා අපි කල්පනා කරනවා. ඒ වාගේම ඒ තුළින් රටේ පුරවැසියන්ට විශාල සහනයක් ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මේ දේශීය ආදායම් බදු පනතට ගෙනැවිත් තිබෙන සංශෝධනය තුළින් liquor, tobacco, betting and gaming සඳහා අවශ්‍ය කරන බදු සියයට 40 ඉඳලා සියයට 45 සීමාව දක්වා වැඩි

කරලා තිබෙනවා. ඒ වාගේම අපේ අලුත් Personal Income Tax table එක update වෙලා තිබෙනවා. මොකද, රටේ පුරවැසියන්ට අපි මැතිවරණයේදී පොරොන්දුවක් දුන්නා, යම්කිසි සහනයක් ලබා දෙනවා කියලා. ඒ අනුව, මේ රට දැන් තිබෙන තත්ත්වය අනුව බලලා රුපියල් 100,000ක සීමාවේ තිබුණු බදු අය කිරීම රුපියල් 150,000 සීමාවට ගෙනියන්න කටයුතු කළා. මේ වෙලාවේ පුළුවන් හැටියට ඒ පොරොන්දුව ජනතාවට අපි ඉෂ්ට කරලා තිබෙනවා. අපි සතුටු වෙනවා, ගරු කථානායකතුමනි, ඒක රුපියල් 200,000ක සීමාවට ගෙනියන්න ලැබුණා නම්. නමුත් මේ වෙලාවේ රට තිබෙන තැන අනුව බලලා අපි ඒ සහනය ලබා දීලා තිබෙනවා.

අපි එතැනින් නතර වුණේ නැහැ. අපි ඊළඟ tax slab එක normal විධියට ගණනය කරනවා නම් - calculation එක කරනවා නම් - ලක්ෂ පහෙන් පහට tax slab එක වෙනස් වෙනවා. මෙහිදී මේ tax slab එක වෙනස් කරලා තිබෙනවා, නැවත වතාවක් පුරවැසියන්ට සහනය දෙන්නට. පළමුවැනි එක විධියට ලක්ෂ 10කින් තමයි tax slab එක වෙනස් වෙන්නට පටන් ගන්නේ, ලක්ෂ පහෙන් පහට නොවෙයි. මේ බදු ගණනය කිරීමේදී ඒ තුළිනුත් පුරවැසියන්ට වාසියක් ලැබෙනවා.

ඒ වාගේම මේ පනත් සංශෝධනය තුළින් තවත් කාරණාවක් සිදු වෙනවා. ඒ, බදු සීමාව රුපියල් 150,000ක සීමාවට වැඩි කිරීම තුළින් පුරවැසියෙකුගේ අවම බදු ගෙවීමේ සීමාව රුපියල් ලක්ෂ 12 සිට ලක්ෂ 18 - Rs. 1.8 million - දක්වා ඉහළ යාම. ඒ වාගේම මේ tax system එක ක්‍රියාත්මක කරවීමේදී අවශ්‍ය කරන simplification එකට අවශ්‍ය වැඩ පිළිවෙළක් මේකට සමගාමීව ක්‍රියාත්මක කරවන්නට දැනටමත් අපි කටයුතු සූදානම් කරලා තිබෙනවා. මේ තුළින් රටක් විධියට අපි එකතු කර ගන්නා ආදායම ඉහළ දමා ගන්නටත්, බදු එකතු කරන්නට යන වියදම, කළමනාකරණය කරන්නට යන වියදම අඩු කරන්නටත්, මෙහි කාර්යක්ෂමතාව වැඩි කරන්නටත්, ඒ තුළින් සියලු දෙනාටම අවශ්‍ය ප්‍රතිලාභ ලබා දෙන්නටත් අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි, අවස්ථාව ලබා දුන්නාට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. (Dr.) Harsha de Silva. You have five minutes.

[අ.භා. 5.57]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, විනාඩි පහකින් නම් බොහෝ දේ කියන්න අමාරුයි.

නියෝජ්‍ය ඇමතිතුමා කථා කරනවා මම අහගෙන හිටියා. එතුමා මහ බැංකුව කරපු දේවල්වලටත් - interest rate එක සම්බන්ධයෙන් - credit එක ගන්න හදනවා. මහ බැංකුව independent කරන්න පනත ගෙනෙනකොට විරුද්ධ වුණා. Governorට කැත වචනයෙන් බැන්නා. ඒ නිසා ඒ අය කරපු දේට ඒ අයට credit එක දෙන්න.

ඊළඟට කිව්වා, tax slab එක ලක්ෂ 5 සිට ලක්ෂ 10ට වැඩි කළාය කියලා. සියයට 6, සියයට 12, සියයට 18 තමයි තිබුණේ. දැන් සියයට 12 අයින් කරලා තිබෙන්නේ. සියයට 6ට පස්සේ සියයට 18 තිබෙන්නේ. සියයට 6, ඊළඟට සියයට 18. ඒක ගැන තමයි ඔය ලොකුවට කථා කරන්නේ.

කෙසේ වෙතත්, ඔබතුමා කරුණු හයක් ගැන කථා කළා. ඉස්සෙල්ලාම කිව්වා, "සියයට 30කට තමයි එකඟ වෙලා හිටියේ, අපි සියයට 15ට ඒක අඩු කළා" කියලා. මගේ කථාවේදී මම කිව්වා, මේක corporateද, personal ද කියලා. ඒක ගැන මම නැවත කථා කරන්න යන්නේ නැහැ. හැබැයි, මොකක්ද වුණේ? මම කියන්නම් වෙච්ච දේ. ඔබතුමන්ලාගේ පොතේ කිව්වා, ආහාර ද්‍රව්‍යවලට පනවන බදු අයින් කරනවා කියලා. නමුත් ආහාර ද්‍රව්‍යවලට පනවන බදු අයින් කළේ නැහැ. ඒකෙන් ඔබතුමන්ලා බිලියන 13.6ක් බලාපොරොත්තු වෙනවා. ඒක තමයි ඔය සියයට 30 සිට සියයට 15ට අඩු කරලා තිබෙන්නේ. මොකද, සියයට 30ට ගහලා තිබුණා නම්, ඒගොල්ලන් -ගිය ආණ්ඩුව- බලාපොරොත්තු වුණේ බිලියන 13.6ක්. ඔය ගොල්ලන් ඒක සියයට 30ට සිට සියයට 15ට ගෙනාවාම දැන් බලාපොරොත්තු වෙන්නේ බිලියන 6.8යි. හැබැයි, ආහාර ද්‍රව්‍යවල බද්ද අයින් නොකරපු නිසා ඒකෙන් බිලියන 13.6ක් ලැබෙනවා. දැන් ඔන්න ගණන හදාගන්න, ගරු කථානායකතුමනි. දැන් ගණන හදාගන්න පුළුවන්. ඒක තමයි පළමුවැනි කාරණය. ඒ නිසා මම කියන්න කැමැතියි, නිකම් මිනිසුන්ට කොළේ වහන්න එපා, කියනවා නම් ඇත්ත කියන්න කියලා; "අපි ආහාර ද්‍රව්‍යවල බද්ද අයින් කළේ නැහැ, ඒක එහෙමම තිබ්බා, අද ඒක පාස් කර ගන්නවා" කියලා කියන්න. අද බදු 16ක් දැම්මා නේ. ඒවායින් එකක් තමයි ඔය ආහාර ද්‍රව්‍යවලට පනවන බද්ද, Special Commodity Levy එක.

දෙවැනි එක තමයි ද්විත්ව බදු පිළිබඳ කාරණය. වෙන රටක බදු ගනනවා නම් මෙහේ බදු ගහන්නේ නැති ලු. ඔබතුමා පාර්ලිමේන්තුවට ළඟදී ආවාට මට කරන්න දෙයක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ අනන්තවත් ද්විත්ව බදුකරණ සම්මුති ගෙනැවිත් තිබෙනවා; there had been so many of these double-taxation treaties. මේක අලුතින් දීපු සහනයක් නොවෙයි. මේක කාටත් කවදත් ලැබෙනවා. ඒක රටවල් දෙකක් අතර විදේශ අමාත්‍යාංශය අත්සන් කළා නම් ලැබෙනවා. එක රටක12ක් ගෙවනවා නම්, මෙහේ 15යි නම් 3යි තමයි ගෙවන්නේ. ඒක තමයි හැටි; ඒක තමයි ක්‍රමය.

ඊළඟට, සියලු මුදල්වලට සියයට 15 tax එක, එක පාරට වදින්නේ නැති ලු. එක පාරට වදින්නේ නැහැ තමයි. බැංකුවට ආපු ගමන් සල්ලිවලට tax වදින්නේ නැහැ නේ. කවුරු හෝ export කරනවා නම්, ඒකේ cost එක අයින් කරලා තමයි කරන්නේ. Consultantගෙනුත් එහෙමයි, architectගෙනුත් එහෙමයි, lawyerගෙනුත් එහෙමයි. හැමෝටම එහෙම තමයි. මේක අලුත් දෙයක් නොවෙයි.

ඊළඟට කියනවා, සියයට 36 වෙනකම් බදු ගහන්නේ නැති ලු. මොන බොරුද? මට local business එකක් තිබෙනවා නම්, මම සියයට 36කට ගෙවනවා. ඔයගොල්ලන්ගේ පොතේ කිව්වේ, දේශීය ෂෘදුකාංගවලට බදු අයින් කරනවා කියලා. ඒක නේ කිව්වේ. දැන් ඔබතුමන්ලා ඒ අයට සියයට 36ක් බදු ගහනවා. මට පොඩි YouTube චැනල් එකක් තිබෙනවා නම්, ඒක ඇමෙරිකාවේ බලනවා නම්, ඒකෙන් ආදායමක් එනවා නම් ඒකට තමයි ඔය සියයට 30ක බද්ද තිබෙන්නේ.

ලංකාවේ විකුණුවා නම් සියයට 36ක් බදු ගහනවා. ඔබතුමන්ලා කිව්වා, එය සියයට 36ක් නොවෙයි, සියයට බින්දුවක් කරනවා කියලා. අපේ විෂය භාර නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. IT සම්බන්ධයෙන් වන එම බද්ද සියයට බින්දුව කරනවා කිව්වා. නමුත් තමුන්නාන්සේලා එය සියයට 36ට ගෙනිච්චා. ඒවා ගැන කියන්නේ නැහැ. ඒවා ගැනත් කියන්නකෝ.

හතරවැනි කාරණාව මෙකයි. මිලියන 3ක් හම්බ වෙනවා නම් සියයට 18ට යන්නේ නැහැ, සියයට 15න් cap වෙනවා කිව්වා.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

සියයට 15න් cap වෙන්නේ export කරන ඒවාට විතරයි; local ඒවාට සියයට 36ක් වදිනවා. නැත්නම් "නැහැ" කියන්න; නැතිටලා කියන්න. "නැහැ" කියන්න බැහැ. බැංකු පද්ධතියේ account එක ඒ වෙලාවේම -

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නියෝජ්‍ය ඇමතිතුමා නැගිට්ටා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sorry, go ahead, Hon. Deputy Minister. කියන්න, කියන්න ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
This tax is on service exportation. Based on the income you receive into your bank account on service exports only, this tax would be applied. - *[Interruption.]* Even though you laugh, the reality is that we have not taxed anything beyond 15 per cent.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තේරෙනවා. මට සිංහලත් තේරෙනවා; ඉංග්‍රීසිත් තේරෙනවා. මම සිංහලෙන් ඇහුවාම ඉංග්‍රීසියෙන් කිව්වා මට තේරෙන්නේ නැහැ කියලා හිතලා. එහෙම එකක් නැහැ. I will explain, Hon. Speaker. මම සිංහලෙන් කියන්නම්. මම ලංකාවේ software විකුණන පුද්ගලයෙක් කියලා හිතන්න. ඔබතුමන්ලාගේ පොතේ කිව්වා, ඒ වෙනුවෙන් වන tax එක සියයට බින්දුවට අඩු කරනවා කියලා. ඔබතුමන්ලා එය අඩු කළේ නැහැ, සියයට 36 දක්වා වැඩි කළා. එ් වාගේම, මම විදේශ කණ්ඩායමකටත් මගේ software එක විකුණනවා කියලා හිතන්න. ඒකට මෙච්චර කල් බදු ගැහුවේ සියයට බින්දුවයි. ඒක ඔබතුමන්ලා සියයට 15 දක්වා වැඩි කළා. ඕක තමයි ඇත්ත කථාව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I will finish up.

මම හතරවැනි කාරණාවේ සිටියේ. දැන් පස්වැනි කාරණාව කියන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Your time is over.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Please give me one more minute, Sir.

පස්වැනි කාරණාව මෙකයි. Account එකෙන් කාර්තුවෙන් කාර්තුවට ගෙවන්න ඕනෑ, ඒක සහනයක්, අවුරුද්ද අන්තිමටයි ගෙවන්නේ කිව්වා. කොහොමත් එහෙම නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. ඒක ඔබතුමන්ලා දීපු සහනයක් නොවෙයි. මමත් ගෙවන්නේ එහෙමයි. ඔබතුමාත් ගෙවන්නේ එහෙමයි. මොකක්ද මේකේ තිබෙන සහනය? කෝ සහනය? කථා කරන කොට වැදගත් විධියට ඇත්ත කථා කරන්න.

අවසාන කාරණය මේකයි. මෙතුමා මහ ලොකුවට කියනවා, දේශපාලනඥයෝ ඔක්කෝම හොරකම් කළා කියලා. හොරකම් කළා නම්, හත්දෙයියනේ අල්ලලා හිරේ දාන්න. ඔබතුමන්ලාට ඒක නේ ඡන්දය දුන්නේ. ඒකම කිය කියා ඉන්නවා. ඒකම ජප කරනවා, ජප කරනවා, ජප කරනවා! අල්ලලා හිරේ දාන්න. මාර කෙළියක් නේ මේක! ඔබතුමන්ලා කියන්නේ හරියට නිකම්, අපි හොරකම් කළා වාගේ නේ. හොරකම් කරපු මිනිස්සු ඉන්නවා නම් අල්ලලා හිරේ දාන්න.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Ravi Karunanayake. You have 20 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER took the Chair.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, before I start, may I seek a clarification? Will the Meeting of the Committee of Selection be held after this Debate?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I am informed that they are going to start in a little while.
0

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Then, there would be no representation from the Opposition. That Meeting earlier scheduled at 5.00 p.m. has been postponed to 6.00 p.m. If it could be postponed till 6.15 p.m., it would be appreciated because you all changed the time three times.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I understand. However, the Hon. Speaker has already left for the Committee.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
But, there would not be any representation from the Opposition.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will bring that to his notice.

[6.04 p.m.]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, I also rose to add on to the suggestions that had been made earlier. I do not think we need to labour the points all over again as they have already been discussed. However, all I could say is that it is a suicidal tax that has been brought in. Nice words do not make much of a change, if the ultimate objective is to earn revenue.

If I may refer to what the Hon. Deputy Minister mentioned, previously, had you been an accountant, a logistics service provider giving consultancy to those overseas or a doctor or an engineer contracted by those outside the country for your knowledge and you were charged under Section 15(c)(c) of the Act, you were granted an exemption. And why was the exemption granted? Because your knowledge had been imparted or services had been rendered outside the country and not within the country. So, there was a fillip given to bring the monies into the country. But, now, what would this suicidal attempt do? You have said that you are going to do very much more, but you have not done anything. The moral obligation of walking the talk is far greater than simply introducing something and then claiming, "Now, it is justified across the board." In that case, you may charge 45 per cent across the board for everyone, rather than applying 15 per cent to one group and 45 per cent to another. It does not stand to justification when you say, "I am only looking at it from the country's perspective. I am pointing out what is beneficial and relevant for the country." You should not allow the IMF to come here and tell you, "You have got to do this." They have rendered us a good service. As I said, when a country is in bankruptcy and in order to get out of that situation, you need the IMF. But, that does not mean it is a panacea for all ills.

Let them be the guiding force, not the ruling force. You have been elected to govern based on the mandate given by the Sri Lankans.

So, why do I differ here? Here is a situation where you are trying to achieve a target of Rs. 10.2 billion or 0.04 per cent, which is going to be detrimental to you. You should do it in a way that would benefit us because it is highly contested and I am saying this for the sake of the national economy. If you are an accountant providing services to the Maldives, Dubai and Singapore, why should you bring that money back to Colombo and pay 15 per cent, where, peviously,you were paying zero per cent tax? We require foreign exchange, not a meager Rs. 10 billion in order to get to that equation process. The Hon. Minister and the two Hon. Deputy Ministers, I am sure, would be looking at this from a different perspective. Hon. Deputy Minister(Dr.) Anil Jayantha, you could simply add 25 cents to the petrol price and earn Rs. 12 billion to Rs. 15 billion, rather than wasting time on this. Discouraging the smaller players is one thing, but what about the bigger ones? They will simply ensure that invoicing takes place in a country with zero taxes, as I mentioned this morning.

I would now like to **table*** this document which gives countries where global income is tax-free, countries which have territorial tax systems, countries which have no personal taxes and some others which offer a Special Residency Tax System.

If I may mention the countries with no personal income tax, they include the United Arab Emirates, Bahrain, the Bahamas, Bermuda, the Cayman Islands, Monaco, Vanuatu and Brunei, where one could register. So, it would be like what the textile industry did when they were imposed on unreasonable taxes despite requests not to do that. What they did was, they floated a company in that country and had their parent company here. Their sales invoices are sent to that country while only their labour requirements are sent from here. Then, what is your earning? Your earning will be Rs. 100, minus Rs. 99, leaving a profit of one rupee. But previously, your turnover, the foreign exchange which came into this country, was US dollars 1 billion. These are the areas where the impractical use of this suicidal tax, as I would call it, is going to be done. So, both the theoretical and practical aspects need to be addressed.

The next one is the Territorial Tax System. Singapore has worldwide earnings, profits made outside Singapore, 100 per cent tax-free.

Then, you are telling this House that you do not charge any tax within the Colombo Port City, but outside the Colombo Port City, you charge 15 per cent. Now, tell me the rationale behind this particular decision. Under the same tax system that you brought in to Parliament, you say that a 40-year tax holiday would be granted to investors in the Colombo Port City. I like that. Do not say that we are opposing this. I am opposing the imposition of the tax, but I am supporting the zero per cent tax provided to the Colombo Port City because that is what would attract all professionals to come here. We would love to see Indians coming to Sri Lanka utilizing that "pay no taxes" policy and bringing in foreign exchange to

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවී කරුණානායක මහතා]

this country. Why is Dubai what it is today? It is because a lot of people visit that country and Dubai earns more dollars through that than they do from oil and today, that country is a success story. That is what we also must do here. So, do not listen to some white clerks from the IMF who come here and tell us to charge 15 per cent as tax when you could earn billions of dollars by imposing different taxes as the revenue you want.

Peter Brewer, the former IMF Mission Chief for Sri Lanka, who had finished his term, did a very good job under difficult circumstances, no question about it. But, it is not individualistic egos that are required here. The IMF is an institution which must do what is good for the country and what is good for the institution. When it comes to our country, we must negotiate and not do what is imposed by them. What they basically say is, "Do what I say, but do not do what I do." The Hon. Prime Minister and some Cabinet Ministers are here. I once again tell you, this is something injurious to the country. So, please ensure that you rectify this. If a lawyer renders his service to India, why should you tax him for that service rendered outside our country? He has the entrepreneurship to go out and bring foreign exchange from outside to Sri Lanka as dollars. On that particular basis, you say that there would not be an imposition of taxes when it comes to banks. Well and good. In any case, it is a system where you register your self-declaration of income by November and you have to pay tax from there onwards. So, Hon. Minister, these are things that are going on.

Now, I quote what SLASSCOM Chairman, Mr. Nishan Mendis, whom we laud for doing a fantastic service, said to the "Sunday Observer" of 16th March, 2025: "SLASSCOM targets US Dollars 5 billion revenue" and "plans to set up 1,000 start-ups by 2030." I am sure the Hon. Deputy Minister is one of the prime movers of that. I am not an expert on IT, Hon. Deputy Minister, but what I have heard is that you are moving things in the right direction. But, why do you not tell your Colleagues that this is a suicidal tax that they are bringing forth? You are trying to earn only Rs. 10 billion from that and I gave you an example how you could collect US Dollars 20 billion. All what you have to do is, add 25 cents more on the price of petrol. As the oil prices have come down, in any case, if you add 25 cents more, then, you would get at least US Dollars 17 billion. That is the way to collect revenue.

So, the younger generation who went astray in 1972, 1983 and 1989 due to the fact that there had been no jobs created because of the economic impact, looked at other alternatives. When they find that they cannot enjoy here the benefits of what they legally earn, they may adopt three different approaches. The first one is, they would keep the monies outside the country. The second one is, they would have a dummy company set up somewhere else and get the money to come in. The third approach is, they seek overseas jobs, go abroad and bring the money in. Then, you lose the foreign exchange you made on the travel out of the country. So, what are we doing? We are trying to save pennies and lose billions of rupees on the other side. Are we saying this just to oppose the Government? No, Hon. Deputy Minister. I am sure you have more practical knowledge than that. So, ensure you look into this issue and address it.

Now, I would like to quote what SLASSCOM has stated. But, I cannot quote the exact date they mentioned that. They say that this is an inimical tax on the industry. So, they are calling upon the Government to relook at it. Once again, they have two options. They will move from the John Keells building. Earlier, they decided to take 20 floors, but they had taken only 10 floors and now, they are going into the Colombo Port City. Then, that 15 per cent charge you have been targeting would not be obtained. So, what is the fun? That is why I said in the morning that we should be radical in our thinking, we should emulate ourselves and export ourselves out of the debt crisis we are in. We have a debt of US Dollars 100 billion with 53 per cent local debts and the balance being foreign debts. Of those, some have been rescheduled.

If we do not gear ourselves to ensure that we earn foreign exchange to the tune of US Dollars 3 billion from today till 1928, US Dollars 6 billion and US Dollars 9 billion from then onwards, we would run into a debt crisis again. I am warning you all now, because otherwise, you would say that as knowledgeable people, we did not advise. So, let us work together to solve this problem. I am telling you, think about this in a different way.

I would like to say that in 2016, when we were discussing about the 16th tranche of the IMF, they came up with the same impositions. We told them, "Sorry, we cannot do that and there must be some rationality. You can give your ideas, but sovereignty should be in our hands." And, we asked them, "What is the revenue required?" They mentioned that it was an "X" amount. The current Secretary, Mr. Siriwardana, Dr. Samaratunga, who was the then Secretary and Mr. Seneviratne, who is the DST now could bear testimony to that. People like them got involved in that process. We told them, "You give us the ideas and we will earn the revenue", and they got what they wanted and we got what we wanted. They proposed the imposition of this tax and we said we cannot do it. Then, in 2018, the Hon. Mangala Samaraweera was the Minister of Finance. They imposed that and in six months, he withdrew it because of the inimicalness of this tax. I would not saying anything else since I have labored enough on that.

Then, when it comes to the 45 per cent tax on betting and gaming, my belief is that you must have a regulatory authority first and with that regulatory authority in place, you can get this types of things coming in. You are adding 40 to 45 per cent just because it is a low-hanging fruit. But yet, 45 per cent is not the answer. If that is the case, then, you can make it 75 per cent. You are detracting from the real sources of getting it into superior sources. So, once again, when we tax, there must be an equitableness as well as sustainability. When, it comes to taxes on gaming and betting, these are sin taxes, I would say. It is well and good, if we ensure that we get the optimum benefit out of collecting revenue. But, if you are

only imposing that 45 per cent just for the sake of imposing it, then you could have imposed 80 per cent and be morally happy that you have put a figure.

It is also the same with the Ceylon Tobacco Company. This company basically has 85 per cent of taxes on its production. On the basis of this, the more prices you increase, it goes into the substitute that is there. Out of the Rs. 9 billion worth sticks, - you cannot call those cigarettes, but sticks - Rs. 1.9 billion is the actual revenue of the cigarettes sold by the Ceylon Tobacco Company. Rs. 7 billion is the revenue from beedi. I am sure there are Hon. Members representing the Kegalle District and the beedi industry is a thriving small industry there. What do they do? There is a legally registered beedi suppliers/ manufacturers' association led by Mr. Lakshman, as I can remember, and the other lot is spurious, who basically import this without paying any taxes anywhere. They themselves have told them, "Legalize us so that we could afford to pay legally and ensure that we come into the formal system." But, that is not being listened to by the Excise Department. If you impose 2 to 3 per cent tax on this Rs. 7 billion worth beedi industry, the beedi manufacturers say they could guarantee a Rs. 15 billion revenue. Now, instead of collecting Rs. 10 billion by imposing that tax on services exported, you could have imposed Rs. 2 tax on those people who are doing this freelancing operation and other things, collect revenue and tell the IMF that we could give you Rs. 15 billion while you wanted Rs. 10 billion from us. So, these are the areas that you need to have corrections, rectifications and practical attainments made in doing collecting revenue. So, I would like to mention once again that the imposition of the figure is yours, but the practical attainment in trying to get what we think of putting in through that tax is what we are recommending to you.

So, the next matter I want to mention is with regard to the interest rates on the savings of the senior citizens. The interest rates given to senior citizens could be compared to what we did in 2015. When we came to power, we gave the senior citizens a 15 per cent interest and if was given when we tried to drive down the interest rates for lending purposes. Because the lending rate should be single digit - we were trying to achieve a rate in the range of 8 to 10 per cent - we had a dichotomy in order to reduce the rate and increase the saving rate for the senior citizens.

So, we did two things. We had an imposition from the Ministry of Finance. We gave in to the banks, whoever who had an interest rate of 15 per cent for a deposit and capped at Rs. 1.5 million, and I still remember the difference was about Rs. 20 billion. Here, you have increased it to 3 per cent when the promise given was 15 per cent in total. When a senior citizen goes to these 1,000 branches that the Hon. Minister mentioned, he has to basically give his own affidavit. If that is accepted, well and good. But, why do you not go for Point of Sale - POS - machines? Your President spoke of that. I think, it is a good and the right thing. So, ensure that you invest money through these particular POS machines. Then, it would be done online. When you have that online facility, you have no problem of needing an affidavit or the actual implementation of it.

How do you know whether a Rs. 1.5 million is from one particular senior citizen, whether he is the sixty-year-old husband or the fifty-eight-year-old wife? You would not get that difference. How is that issue addressed? I think you should attend to these matters much more practically. You should look at the materialness across the board. When you impose a figure, the administration cost would be far greater than the actual receipt of the revenue. This does not seem to be followed at this particular moment.

So, all I could basically say is that ensure we have a system where collecting revenue is a must. We have targeted 15 per cent of GDP, well and good. Without running after pennies, run after dollars and millions of rupees. You have to ensure that the economy is expanding instead of contracting. Expansion of economy means, you have to develop the economy from all areas. But, if you have things happening at the moment, you would see a downward trend instead of the upward swing required. Once again, I would request you to please relook at the export services and ensure you take those up to the correct level.

Generate enthusiasm among the younger generation. IT is a thrust industry that could be shaken up. I think the President mentioned here that we need to create two million jobs in the IT sector. So, ensure that that is done by giving the younger generation freedom to operate in that area. Why do I ask you to not tax them? By imposing that, you will not be able to get the revenue targeted. That is the difference. So, instead of discouraging them, encourage them, driving them onto a motivational path and ensure that we take them to a better tomorrow.

Sir, all I could basically say is that let us bring some sense of rationality in, let us bring some logic in and let us bring some sanity at this particular moment, where there is no cash flow into the country today. You all are talking about this anti-inflationary approach while sucking out all the monies that are there. That does not help you to get the economy moving. I am saying this because we need to earn Rs. 5 trillion at the end of this year. Already three months have gone by out of this year. If you are to get Rs. 5 trillion coming in, we should have at least a 4 to 5 per cent growth expansion. In order to have growth expansion, you have to have more investments. In order to have more investments, you must have low-lending rates. That is how the small and the medium enterprises would get moving. That is why I am so conscious about these matters because we cannot afford to have anymore insurrections or civil disturbances owing to not guiding the economy in a professionally attributed manner for all of us to deliver what is required at this moment.

Thank you very much.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Anura Karunathilaka. You have ten minutes.

[අ.භා. 6.23]

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්කම් ඇති වෙනකොට ඒ සඳහා නීතිමය පදනම සැලසෙන අණපනත් වෙනස් විය යුතු බව අපි කවුරුත් දන්නවා. අපි අද සාකච්ඡා කරන 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සංශෝධන සැලකිල්ලට ගන්න ඕනෑ මෙන්න මේ කරුණුත් එක්කයි. සාමාන්‍යයෙන් ලෝකයේ පිළිගත් බදු මූලධර්ම අතරේ විශේෂයෙන් සඳහන් වන කරුණු කිහිපයක් තිබෙනවා. ඒ අතරින් අදායම හා ධනය බෙදා හැරීමේ විෂමතාව අවම කිරීම, ඒ වාගේම කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සම්පත් කළමනාකරණය, බදුවල තිබෙන සරල බව, පහසු බව, සාධාරණ බව, නම්‍යශීලී බව, පිරිමැසුම් සහගත බව වාගේ කාරණා, බදු පිළිබඳ සාකච්ඡාවේදී බොහොම සරල සහ ප්‍රාථමික අදහස් බව අපි කවුරුත් දන්නවා.

මේ පනත් කෙටුම්පත තුළින් යෝජනා වන සංශෝධන ගණනාවක් අතරින්, විශේෂයෙන් පුද්ගල ආදායම් බදු සම්බන්ධයෙන් වන සංශෝධන පිළිබඳව අවධානය යොමු කරන්න මම කැමැතියි. මොකද, අපි විශේෂයෙන් සැලකිල්ලට ගතයුතු කරුණක් තමයි උපයන විට ගෙවීමේ බදු පිළිබඳව කථා කරනකොට ඒ තුළ පැවැතිය යුතු සාධාරණ බව. විශේෂයෙන් අපි අදාළ බදු පනවනකොට ඒ බදු ගෙවන්නාට දැරිය හැකි බව, ඒ බදු මඟින් ඔහුගේ ජීවන තත්ත්වයට විශාල වශයෙන් හානියක් නොවන බව සහතික වීම, ඒ වාගේම ඔහුගේ ජීවන තත්ත්වය වෙනස් වීමට සහ ඔහුගේ පවුලේ ජීවන රටාවට ලොකු හානියක් නොවීම වැනි කරුණු සැලකිල්ලට ගත යුතුයි. ඒ කරුණු තමයි සාමාන්‍යයෙන් එම බද්දට අදාළව "සාධාරණ බව" කියන එක පැත්තෙන් අපට හිතන්නට වෙන්නේ.

අපට මතකයි, මීට කලින්, 2023දී IMF යෝජනාවලියක් හැටියට ඉදිරිපත් වුණු රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා උපයන විට ගෙවීම් බදු අසාධාරණ ලෙස සංශෝධනයට ලක් වුණු බව. සමහර මන්ත්‍රීවරු දැන් මෙතැන කථා කරනවා, IMF එකට අදාළ අය වැය යෝජනා තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. ඒකට හොඳ උදාහරණයක් තමයි, IMF ක්‍රියාවලියෙන් අය වැය යෝජනාවලට මොනවා ඇතුළත් වුණා වුණත්, ඒ යෝජනා තුළින් සාමාන්‍ය ජන ජීවිතයට ඇති වන බලපෑම අවම කර ගැනීම සඳහා රජය පැත්තෙන් ගෙනෙන යෝජනා. 2023 දී මේ යෝජනා එනකොට, මේ රටේ වෛද්‍යවරු, ඉංජිනේරුවරු, ගණකාධිකාරිවරු ඇතුළු විවිධ වෘත්තිකයන් ඒ අසාධාරණ බද්දට එරෙහිව විශාල හඬක් නැඟුවා, අපට මතකයි. නමුත් ඒ කිසිම වෘත්තිකයෙක් කිව්වේ නැහැ, "අපි ආණ්ඩුවට බදු ගෙවන්න සූදානම් නැහැ" කියලා. ඔවුන් ඉල්ලපු දේ තමයි, "සාධාරණ බද්දක් අය කරන්න, ඒ වාගේම අපේ බදු විනිවිදභාවයකින් යුතුව කාර්යක්ෂම ලෙස වැය කරන්න. ඒ වාගේම බදු වශයෙන් ගනු ලබන මහජන මුදල් දූෂණයට, නාස්තියට සහ වංචාවලට ලක් වෙන්න ඉඩ නියන්න එපා" කියන එක. ඒ වෙනුවෙන් ඔවුන් සංවිධානය වුණා. මට මතකයි, Professionals' Trade Union Alliance කියලා සංවිධානයක් හදලා රජයත් එක්ක සාකච්ඡා කළ බව. රජය මොකක්ද කිව්වේ? අපිත් එක්ක සාකච්ඡා කරලා වැඩක් නැහැ, මේක IMF එකෙන් ගෙනාපු යෝජනාවක්. ඒ නිසා IMF එකත් එක්ක සාකච්ඡා කරලා බදු අඩු කරන්න කියලා කිව්වා. එනකොට, සාධාරණ බද්දක් වෙනුවෙන් කටයුතු කරපු, හඬ නඟපු වෘත්තිකයන්ට, පාරට බැහැලා උද්ඝෝෂණය කරපු අයට සමහර තැන්වලදී කඳුළු ගෑස් ගැහුවා, පොලිසිය සහ හමුදාව මැදිහත් කරලා ඔවුන්ගේ පා ගමන් නතර කළා. ඒ උද්ඝෝෂණවලදී විශ්වවිද්‍යාල ආචාර්යවරු හැටියට අපිත් කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක් වුණා, මට මතකයි. දැන් යෝජනා වෙලා තිබෙන උපයන විට ගෙවීමේ බදුවලට යම් ප්‍රමාණයක සහනයක් දෙන්න කටයුතු කරන්නේ, අන්න ඒ සාධාරණ බව ඔවුන්ට අත් පත් කර දීම සඳහායි. ඒ තත්ත්වය තුළ තමයි මේ බදු සහනය පිළිබඳව අපට කල්පනා කරන්නට වෙන්නේ.

මෙහි තිබෙන අනුපාත ගැන මම මේ වෙලාවේ කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, මේ වෙනස්වීම නිසා, මේ බදු සහනය ලැබීම නිසා සමහර වෘත්තීන් සම්බන්ධයෙන් මොන වාගේ සහනයක්ද ලැබෙන්නේ කියන එක සංඛ්‍යාලේඛන කිහිපයක් මඟින් ඉදිරිපත් කරන්න මම කැමැතියි. මම මේ ගැන කථා කරනකොට මේක සමහර කණ්ඩායම්වල විවේචනයට ලක්වෙන්න පුළුවන්. නමුත්, මට පුරුදු වෘත්තියෙන් මම පටන් ගන්නම්. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට මේ බදු බලපාන්නේ කොහොමද, ඒ බදුවලින් සහනය ලැබෙන්නේ කොහොමද කියලා මම මුලින්ම කියන්නම්.

මාර්තු මාසයේදී විශ්වවිද්‍යාල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුගේ ආරම්භක වැටුප රුපියල් 529,397යි. දැන් පවතින උපයන විට ගෙවන බදු ක්‍රමය අනුව ඔහු බදු වශයෙන් රුපියල් 117,082.92ක් ගෙවනවා. අපි දන්නවා, අප්‍රේල් මාසයේ ඔහුගේ වැටුප විශාල වශයෙන් වැඩි වෙන බව. ඒ අනුව රුපියල් 529,397ක් වන ඔහුගේ වැටුප රුපියල් 560,038ක් දක්වා වැඩි වෙනවා. ඒ, gross salary එක. දැන් තිබෙන බදු ක්‍රමය නම් දිගටම ක්‍රියාත්මක වෙන්නේ, ඔහු විසින් රුපියල් 128,113ක් PAYE Tax එක හැටියට ගෙවන්න ඕනෑ. නමුත්, යෝජනා කරලා තිබෙන මේ බදු සහනයත් එක්ක ඔහුට ගෙවන්න වෙන්නේ රුපියල් 118,383ක් විතරයි. එතකොට රුපියල් 529,397 ඉඳලා රුපියල් 560,038 දක්වා රුපියල් තිස්එක්දහස් ගණනකින් තමන්ගේ වැටුප වැඩි වෙනකොට ගෙවන්න වෙන PAYE Tax එක වැඩි වෙන්නේ රුපියල් 1,000කට ආසන්න මුදලකින් විතරයි. 2027 වර්ෂය අවසානයේදී ඔහුගේ වැටුප රුපියල් 619,869 දක්වා වැඩි වෙනවා. දැන් තිබෙන PAYE Tax එකේ සංශෝධනයක් නොවුණා නම් ඔහුට 2027දී ගෙවන්න සිද්ධ වෙනවා, රුපියල් 149,653ක්. නමුත් අද යෝජනා වන බදු සංශෝධනයත් එක්ක ඔහුට ගෙවන්න සිද්ධ වෙන්නේ රුපියල් 129,153ක් පමණයි. එතකොට රුපියල් 529,397ක වැටුප රුපියල් 619,869 දක්වා වැඩි වෙනකොට බදුවල වෙනස්කම් ඇති වෙන්නේ රුපියල් 118,383 ඉඳලා රුපියල් 129,153 දක්වා විතරයි. ඒ අනුව රුපියල් 12,000කට ආසන්න ගණනක් විතරයි ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුගේ ආදායම් බදු ගෙවීමේ ප්‍රමාණය වැඩි වෙන්නේ.

අද වෙනකොට මහාචාර්යවරයෙකුගේ ආරම්භක වැටුප රුපියල් 422,913යි. ඔහු PAYE Tax එක හැටියට රුපියල් 85,948ක් මාසිකව ගෙවනවා. අප්‍රේල් මාසය වෙනකොට ඔහුගේ වැටුප රුපියල් 468,292 දක්වා වැඩි වෙනවා. දැන් තිබෙන බදු අනුපාතය අනුව අප්‍රේල් මාසයේදී ඔහු විසින් ගෙවිය යුතුව තිබුණා, රුපියල් 95,085ක්. නමුත්, අලුත් බදු සහනයත් එක්ක ඔහුට ගෙවන්න සිද්ධ වෙන්නේ රුපියල් 74,585යි. එතකොට ඔහු ගෙදර ගෙනියන gross salary එක වැඩි වෙනවා, රුපියල් 442,913 ඉඳලා රුපියල් 468,292ට. නමුත් උපයන විට ගෙවීමේ බද්ද අඩු වෙනවා, රුපියල් 85,948 ඉඳලා රුපියල් 74,585 දක්වා. ඒ විතරක් නොවෙයි. 2027දී ඔහුගේ වැටුප රුපියල් 442,913 ඉඳලා රුපියල් 515,844ට වැඩි වෙනවා. ඔහු දැන් තිබෙන බදු ප්‍රතිශතය අනුව 2027දී PAYE Tax එක ගෙවිවොත්, රුපියල් 112,203.84ක් ගෙවන්න ඕනෑ. නමුත්, දැන් ඇත්ත වශයෙන්ම

අලුත් බදු සහනයත් එක්ක ඔහුට ගෙවන්න සිද්ධ වෙන්නේ රුපියල් 91,703ක් පමණයි. එතකොට රුපියල් 85,948 ඉඳලා බදුවල වැඩිවීම ඔහුට තිබෙන්නේ රුපියල් හයදහස් ගණනක් විතරයි. නමුත්, ඔහුගේ වැටුප රුපියල් 442,913 ඉඳලා රුපියල් 515,844 දක්වා රුපියල් 73,000කට ආසන්න ප්‍රමාණයකින් වැඩි වෙනවා.

තව positions දෙකක් ගැන විතරක් කථා කරලා මම සංඛ්‍යාලේඛන ගෙන හැර දැක්වීම නතර කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ ඉන්න කෙනෙකුට දැන් තිබෙන ආරම්භක වැටුප රුපියල් 295,798යි. ඒ අනුව දැන් තිබෙන PAYE Tax එකේ අනුපාතය අනුව ඔහු ගෙවන්න ඕනෑ, රුපියල් 33,739ක් මාසිකව. අප්‍රේල් මාසයේ ඔහුගේ වැටුප වැඩි වෙනවා, රුපියල් 295,798 ඉඳලා රුපියල් 314,123 දක්වා. දැන් තිබෙන බදු අනුපාතයට අනුව බදු ගෙව්වා නම් ඔහු ගෙවන්න ඕනෑ, රුපියල් 39,584ක්. නමුත් මේ අලුත් බදු යෝජනාවත් එක්ක, බදු සහනයත් එක්ක ඔහු ගෙවන්න ඕනෑ රුපියල් 21,889ක් විතරයි. එතකොට මාසිකව ගෙවපු රුපියල් 33,739ක් වූ උපයන විට බද්ද රුපියල් 21,889 දක්වා අඩු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Anura Karunathilaka, you have two minutes of your allocated 10 minutes.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම රුපියල් 295,798ක්ව තිබුණු තමන්ගේ මූලික වැටුප 2027දී රුපියල් 345,216 දක්වා වැඩි වෙද්දී ගෙවන්න තිබෙන ආදායම් බද්ද රුපියල් 33,739 ඉඳලා රුපියල් 31,065 දක්වා අඩු වෙනවා. ඇත්ත වශයෙන්ම තමන් ගෙවන ආදායම් බද්දේ අඩුවීමක් තමයි තිබෙන්නේ. මේක විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට විතරක් ලැබෙන සහනයක් නොවෙයි. සියලුම වෘත්තිකයන්ට මේ ආදායම් බද්දට අද යෝජනා වෙලා තිබෙන බදු සහනය ලැබෙනවා.

අපි කැමැතියි, මේ රටේ පුද්ගල ආදායම් බදු ගෙවන සියලුදෙනාට, විශේෂයෙන් වෘත්තිකයන්ට මේ අවස්ථාවේදී යමක් කියන්න. අපි දන්නවා, රටේ තිබෙන ආර්ථිකයේ ස්වභාවය. ඒ ආර්ථිකයේ තෙරපුම, අවදානම සැලකිල්ලට ගෙන ඊට සාපේක්ෂව තමයි මේ සාධාරණ බදු ව්‍යුහය මේ අවස්ථාවේදී යෝජනා වෙලා තිබෙන්නේ. ආර්ථිකය තවදුරටත් ශක්තිමත් වෙනකොට, ආර්ථිකයට තවදුරටත් මේ තත්ත්වය දරාගන්න පුළුවන් වෙනකොට මේ බදු සහනය තවදුරටත් ලබා දෙන්න ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කටයුතු කරනවා කියන එකත් මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

මා අර මුලින් කිව්වා වාගේ අපේ රටේ බදු ගෙවන ජනතාව ඉල්ලන දෙයක් තමයි, අපට සාධාරණ බද්දක් දෙන්න කියන එක. මේ අනුව සාධාරණ බදු ක්‍රමයක් යෝජනා වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔවුන් ඉල්ලන දේ තමයි, අපි ගෙවන බද්ද නාස්ති කරන්නේ නැතුව ක්‍රමවත්ව රටේ දියුණුවට යොදවන්න කියන එක. මම කැමැතියි, මේ අය වැයෙන් යෝජනා වෙලා තිබෙන, ඔබ ගෙවන බදු යෙදවිලා තිබෙන ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න. මාර්ග, පාලම්, දුම්රිය වාගේ ප්‍රවාහන කටයුතු සඳහා රුපියල් බිලියන 483කුත්, සෞඛ්‍ය සඳහා රුපියල් බිලියන 604කුත්, අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 619කුත්, විශේෂයෙන් උසස් අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 135කුත්, ඒ වාගේම පානීය ජලසම්පාදනය සඳහා රුපියල් බිලියන 108කුත් ආදී වශයෙන් මේ රටේ බදු ගෙවන ජනතාවගේ මුදල් රටේ ජනතාවගේ ජන ජීවිතය නැංවීමට යොදවන්න මේ අය වැය තුළ යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා.

ඒ වාගේම දේශපාලන සංස්කෘතියේ වෙනසත් ඔබ සියලුදෙනා මේ අවස්ථාවේදී සැලකිල්ලට ගන්න ඕනෑ. අපි දන්නවා, වාහන පේළිවල ගමන් කරන ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් අද දකින්න නැහැ කියලා. බොහොම සරල ජීවිතයක් ගත කරන මැති, ඇමතිවරුන් තමයි දැන් ඉන්නේ. මහජන මුදල් නාස්ති කරන ඒ දේශපාලන සංස්කෘතිය වෙනුවට මහජන මුදල් අනිසි ලෙස භාවිත නොකරන දේශපාලන සංස්කෘතියක් අපි හඳුන්වා දී තිබෙනවා. මෙන්න මේ සාධනීය තත්ත්වයත්, නව පරිවර්තනයත් දෙස අපි බලමු.

මම දන්නවා, සමහර තැන්වල මේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් සමහර සාකච්ඡා ඇති වී තිබෙන බව. අපි දන්නවා, සියයට 100ක්ම හැම ප්‍රශ්නයක්ම ආමන්ත්‍රණය කරන්න මේ වැටුප් ව්‍යුහ තුළ බැරි වෙන්න ඇති කියලා. ඒ වාගේම අපි පිළිගන්න ඕනෑ පොදු කාරණයක් තමයි, හැම දෙනාගේම වැටුප වැඩි වෙලා තිබෙන බව. ගෙදර ගෙන යන වැටුප අපි හිතුවාට වඩා ලොකු ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. අපේ තිබෙන සමහර දේවල් සම්බන්ධයෙන් අපට සාකච්ඡා කරන්න පුළුවන්. මම අර කලින් කිව්වා වාගේ අපේ ආර්ථික තත්ත්වය වෙනස් වෙනවාත් එක්කම, ආර්ථිකය ශක්තිමත් වෙනවාත් එක්කම, අන්න ඒ කරුණු පිළිබඳව ඉදිරියේදී කල්පනා කරලා, සාකච්ඡා කරලා ඒ සඳහා සාධනීය යෝජනා ක්‍රියාත්මක කරන්නත් අපට කටයුතු කරන්න පුළුවන්. ඒ නිසා මේ තත්ත්වය තුළ තිබෙන පොදු බව, මේ දේශපාලන සංස්කෘතිය තුළ තමන්ගේ වැටුප් වර්ධනය නිසා ආර්ථිකයේ තිබෙන ශක්තිමත් බව, ඒ වාගේම උපයන විට ගෙවන බදු ප්‍රතිශතය අඩු කිරීම හරහා මේ රටේ ජනතාවට -විශේෂයෙන් වෘත්තිකයන්ට- ලැබී තිබෙන සහනය දෙස බලන්න. මෙන්න මේ ආලෝකය දකින්න. ඒ ආලෝකය දැකලා අපි ඔක්කෝම එකතු වෙමු. වෘත්තිකයන් හැටියට අපට දේශපාලනයේදී වෙනස් අදහස් තිබෙන්න පුළුවන්. ආගමික විශ්වාස අතර වෙනස් අදහස් තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ වෙනස්කම් එහෙමම තිබියදී අපි ඔක්කෝම එකට එකතු වෙලා හොඳ රටක් හදමු. මේ රටේ ජනතාවට හොඳ ජීවිතයක් ලබා දෙන්න අපි එකතු වෙලා වැඩ කරමු. ඒ වෙනුවෙන් එක් වෙන්න කියලා ආරාධනා කරමින් මම නිහඬ වෙනවා. කාලය ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ajith P. Perera. You have five minutes.

[අ.භා. 6.37]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් ඉදිරිපත් කර තිබෙන ප්‍රතිපත්තිවල අඩුපාඩු ගැන සෑහෙන පමණකට කථා වුණා. විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ශක්තිමත් කරනවා, බදු නැති කරනවා, ඒ හරහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ආයෝජන දිරිමත් කරනවා, දේශීය ව්‍යවසායකයන් ශක්තිමත්

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කරනවා කියලා මේ රජය බලයට පත් වුණා. නමුත්, අද වනකොට දේශීය ව්‍යවසායකයන් අධෛර්යවත් කරන, මෙතෙක් නොතිබුණු බදු පනවන ක්‍රියාවලියකට ආණ්ඩුව යොමු වෙමින් තිබෙනවා. ඒ නිසා තමයි අපට මේ පනත් කෙටුම්පතට එකඟ වෙන්න බැරි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද බොහෝ පිරිසක් මේ වෘත්තියේ නියැළී ඉන්නවා. හරියටම සමීක්ෂණයක් කරලා නැතත් මේ රටේ තිබෙනවා, ඉතාම විශ්වාසවන්ත Online Entrepreneurs' Club කියන private Facebook group එකක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලාංකිකයෝ 199,000ක් මේ Online Entrepreneurs Club කියන private group එකේ ඉන්නවා. හැමෝටම මේකේ සාමාජිකයෝ වෙන්න බැහැ. තෝරාගත් අය පමණක් බඳවා ගන්නවා. මේ සියලුදෙනාම එදිනෙදා වෘත්තීය කටයුතුවල නියැළෙන්නේ නැති වුණත්, නිසැක ලෙසම මේ රටේ ජනතාවගෙන් ලොකු පිරිසක් -තරුණ, ඒ වාගේම මැදිවියේ ඉන්න අය- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය හරහා රටට ඍජුව හෝ වක්‍රව මුදල් ගෙන එන බව ඒකෙන් පෙනෙනවා. මේ අය අධෛර්යවත් කරලා, නැති බදු පැනවීමම අවසානයේ වෙන්නේ දක්ෂයෝ මේ රට දාලා යන එකයි. මේ රට ඉන්න ආශා හිතෙන තැනක් වෙනුවට දාලා යන්න හිතෙන තැනක් බවට පත් කරනවා. ආණ්ඩුව බලයට එන්න එකක් කිව්වා. දැන් කරන්නේ තව එකක්. ඒ නිසා මේ බදුකරණ ප්‍රතිපත්ති ආයෝජන ගෙන ඒමට හිතකර වෙන්න ඕනෑ. ආණ්ඩුවේ ආයෝජන වැඩ පිළිවෙළත් ආයෝජන ගෙන ඒමට පහසුකම් සපයන්න ඕනෑ. ඒ, එක පැත්තකින් බදුකරණය හරහා. අනෙක, අනෙකුත් පහසුකම් හරහා.

මුදල් අමාත්‍යාශයට වෙන් වෙච්ච අද දිනයේ මම විශේෂයෙන් තවත් කාරණයක් කියන්න කැමැතියි. මට උදෑසන විවාදයට සම්බන්ධ වෙන්න බැරි වුණා, මැතිවරණ නාම යෝජනා කටයුතු නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජකයන් දිරිමත් කරන්න පසුගිය අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන සුවිශේෂ කාරණයක් තමයි, පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව ආයෝජන කලාප ගොඩනඟනවා කියන එක. මේ ආයෝජන සොයා දෙන්න පසුගිය කාලයේ ආයෝජන මණ්ඩලයට ආපු බොහෝදෙනෙක්ව හරවා යැවූ බව මම දන්නවා. ඒ, අවශ්‍ය ඉඩම් නැත, පහසුකම් දෙන්න බැරිය, බස්නාහිර පළාතේ ඉඩම් නැත කියලායි. නමුත්, මේක සත්‍යයක් නොවෙයි. අපි ආරම්භ කළ මිල්ලනිය ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අක්කර 244ක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 38(2) වගන්තිය යටතේ පවරා ගෙන ඉවරයි. ඒ වාගේම තවත් අක්කර 166ක මැනුම් කටයුතු කර තිබෙනවා, පවරා ගැනීමට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. මේ පිළිබඳව Horana Plantations PLC එක නඩුවක් පැවරුවා, ඔවුන්ගේ රබර් වගාවට ලැබෙන වන්දිය මදි කියලා. පවරා ගැනීම වැරදියි කියලා නොවෙයි, වන්දිය මදි කියලා. ඒක විසඳා ගන්න තිබුණු ප්‍රශ්නයක්. සාමාන්‍යයෙන් රබර් ගසක ඵලදාව තිබෙන්නේ අවුරුදු 20යි. දැනටමත් අවුරුදු 15ක් ගත වෙලා. ඊළඟ අවුරුදු පහේ ඵලදාව හරියාකාරව ගණන් හැදුවා නම් ඒ ප්‍රශ්නය විසඳා ගන්න තිබුණා. නමුත්, දැන් අවුරුදු ගණනාවක් වෙනවා, මේ නඩුව විසඳා ගන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මේ ව්‍යාපෘතිය සඳහා දැනට රුපියල් බිලියනයක් විතර වියදම් කර තිබෙනවා. මම දන්නේ නැහැ, මුදල් අමාත්‍යාංශයට මේ පිළිබඳව හරි අවබෝධයක් තිබෙනවාද කියලා.

BOI එකම 2025.03.04වැනි දා මහාමාර්ග අමාත්‍යාංශයට යොමු කළ ලිපියක සඳහන් වනවා, මේ කලාපය සඳහා යටිතල පහසුකම් ලබා දෙන්න ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට, ලංකා විදුලිබල මණ්ඩලයට, මාර්ග සංවර්ධන අධිකාරියට අතිවිශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙන බව. මාර්ග පුළුල් කිරීම සඳහාත්, ඒ වාගේම දකුණු අධිවේගී මාර්ගයේ පැල්පොල ප්‍රවේශය ඉදි කිරීම සඳහාත් අතිවිශාල මුදල් ප්‍රමාණයක් දැනටමත් වෙන් කර තිබෙනවා. මේ සඳහා රුපියල් කෝටි 10කට වැඩි මුදලක් සාමාන්‍ය මිනිස්සුන්ට ගෙවා අවසන්. ඒවා පවරාගෙන තිබෙන්නේ. භුක්තියත් අරගෙන තිබෙන්නේ. ඉදිකිරීම් කටයුතු පවා යම්දුරක් ආරම්භ කර තිබෙනවා. දකුණු අධිවේගී මාර්ගයට මීටර් ගණනක් දුරින් දැනටමත් අක්කර 244ක් පවරා ගෙන තිබෙද්දී, ඒ වාගේම අක්කර 166ක මැනුම් කටයුතු කරලා ආයෝජනය සඳහා ඉතාම ගැළපෙන ආකාරයට සකස් වෙලා තිබෙද්දී, පොළොව යටින් ජල නළ එළලා තිබෙද්දී, ලංකා විදුලිබල මණ්ඩලයට grid substationsවලට අවශ්‍ය මුදල්වලින් කොටසක් ගෙවා තිබෙද්දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට, මුදල් අමාත්‍යාංශයට එන ආයෝජකයන්ව හරවා යවනවා, බස්නාහිර පළාතේ සුදුසු ඉඩම් නැහැ, ඒ වාගේම සේවකයන් සපයා ගන්න බැහැ, highway එකට යාබදව කොළඹට, හම්බන්තොටට ප්‍රවේශ වෙන්න පුළුවන් විධියේ ඉඩම් නැහැ කියලා. මේකට හේතුවක් තිබෙනවා. ඔබතුමන්ලාට දැනගන්නයි මම මේ කාරණය කියන්නේ. BOI එකේ හිටපු සභාපතිවරයෙක් තමයි Horana Plantations PLC එකේ හිමිකාරිත්වයේ වැඩි කොටසක් දරන්නේ. ඔහුට හිතවත්කම් තිබෙනවා. Horana Plantations PLC එක සතු ඉඩම් BOI එක හරහා හෝ වෙනත් රජයේ ව්‍යාපෘතියක් හරහා යනවාට ඔවුන් කැමති නැහැ. මේ අරගළය ගැන මම දන්නවා. ඒ නිසා BOI එකේ ඉන්න නිලධාරීන් කම්මැලිකමට, නොදන්නාකමට සහ දේශ ද්‍රෝහීකමට මේ ව්‍යාපෘති අත්හරින්නයි උපදෙස් දෙන්නේ. එහි ප්‍රතිඵලයක් විධියට 2024.04.02වැනි දා ඔවුන් ඉඩම් අමාත්‍යාංශයට ලියනවා, "වර්තමානයේ පවතින ආර්ථික තත්ත්වය හා ආනුෂංගික හේතූන් මත මෙම ඉඩම දැන් අවසතු කරන්නට අපි තීරණය කර තිබෙනවා" කියලා. හැබැයි, මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොකද, මේක ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ? පසුව ඉඩම් අමාත්‍යාංශයට තේරුම් යනවා, රුපියල් බිලියනයක් විතර මේ ව්‍යාපෘතියට දැන් වියදම් කර තිබෙනවා කියලා. ඒ ප්‍රදේශවල මිනිස්සු බලාපොරොත්තුවෙන් ඉන්නවා, මේ ව්‍යාපෘතිය සාර්ථක වෙයි කියලා. මේ ප්‍රදේශවල ඉන්න ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්නවා, රැකියා උත්පාදනය කරන විදේශීය ආයෝජකයන් තමන්ගේ ප්‍රදේශයට ඇවිල්ලා රැකියා ප්‍රශ්නයට විසඳුම් දෙනකම්. අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා, අපේ රට දියුණු කරන ප්‍රධාන උපාය මාර්ගික මධ්‍යස්ථානයක් හැටියට මිල්ලනිය ආයෝජන ප්‍රවර්ධන කලාපය වෙනුවෙන් ඉදිරි පියවර ගන්නකම්. හැබැයි, එහෙම තිබියදී විදේශීය ආයෝජකයන් ඇවිල්ලා අහනවා, අපට අක්කර, දෙක, තුන, හතර නොවෙයි, මහා පරිමාණ ආයෝජන කරන්න, ආයෝජන කලාප ප්‍රවර්ධනය කරන්න, ඒවාට අවශ්‍ය කරන සුදුසු ඉඩම් කොහේද තිබෙන්නේ කියලා. හැබැයි, ආයෝජන මණ්ඩලයේ එක නිලධාරියෙක්වත් පසුගිය වසර කිහිපය පුරා මේ ඉඩම දිහා බැලුවේ නැහැ. අදටත් එය පනතේ 38 (2) වගන්තිය යටතේ ආණ්ඩුවට අයිති වෙච්ච ඉඩමක්. එහෙම තිබියදී හොර රහසේ මේක නැවත වරක් Horana Plantations PLC එකට ලබා දෙන්න යනවා. ඒ වාගේම, Pelpola highway entrance එක නතර කරන්න කටයුතු කරනවා.

මම මේ රජයේ වග කිවයුතු ඇමතිවරුන්ටත් විශේෂයෙන්ම මේ ගැන කියනවා. කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ ආණ්ඩුවේ ශක්තිමත් මන්ත්‍රීවරයෙකු විධියට කටයුතු කරන, මේ පක්ෂයේ ලේකම්වරයෙකු විධියටත් කටයුතු කරන අපේ ගරු නිහාල් අබේසිංහ මැතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. ඔබතුමා ඒ ප්‍රදේශය ගැන හොඳට දන්නවා. කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය සහ ඒ අවට ප්‍රදේශවල සිටින මිනිස්සු හරිම දුප්පත්. ඒ වාගේම, මේ ප්‍රදේශවල උගත් තරුණයින් විශාල පිරිසක් ඉන්නවා. ඒ වාගේම, විශාල කම්කරු සම්පතක් තිබෙනවා. එමෙන්ම highway එක මායිමෙන් යන්නේ. Highway එකේ

entrance එකක් නැහැ. ගැලනිගම ඉඳලා මතුගම, දොඩන්ගොඩ දක්වා කිලෝමීටර 23ක් තිබෙනවා, entrance එකක් නැතුව. කළුතර නගරයට ප්‍රවේශයකුත් නැහැ. මේ සියල්ල ගැනම සැලසුම් කරපු විධිමත් සැලැස්මක් තිබෙනවා. බදු අය කර ගන්න කර්මාන්ත තිබෙන්න එපා යැ. තිබෙන කර්මාන්තවලට බදු ගහලා, ඉන්න මිනිස්සු රටින් යවන තැනට කටයුතු කරන තත්ත්වයකට අද මේ පරිසරය ගොඩ නැහෙමින් තිබෙනවා. හැබැයි, මම ඉතාම ආදරයෙන් කියන්නේ මෙයයි. කලින් රජයන්වලින් ආරම්භ කරලා, ජනතාවගේ මුදල් අතිවිශාල ප්‍රමාණයක් වැය කරපු ඒවා ගැනත් ඔබතුමන්ලා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව නියෝජනය කරන ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා කිව්වා, නාස්තිය නැති කරනවා කියලා. කරුණාකරලා මට ඒ ගැන කියන්න. පසුගිය මාස තුනහමාරක් තිස්සේ මම මේ ගැන කිව්වා. මම මේ සභාවේ අද තුන්වැනි වතාවටයි මේ ගැන කියන්නේ. මම මේ ප්‍රදේශය නියෝජනය කෙනෙක්; මේ ප්‍රදේශයේ ඉපදිච්ච කෙනෙක්; මේ ප්‍රදේශයේ ජීවත් වන කෙනෙක්. මේ මිල්ලනිය ආයෝජන ප්‍රවර්ධන කලාපයේ රුපියල් බිලියනයක් විතර වියදම් කරලා, පාරවල් යටින් ජල නළ යොදලා, ලංකා විදුලිබල මණ්ඩලයට substations හදන්න මුදල් දීලා, highway entrance එක භාගෙට හදලා, මේ තරම් වටිනා පහසුකම් ගොඩනඟලා තිබියදී ආයෝජන මණ්ඩලයට එන ආයෝජකයන්ව හරවලා යවන්නේ කවුද? එහෙම කරනවා නම් ඒ අය ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ආදරේ මිනිස්සු නොවෙයි; රටට ආදරේ මිනිස්සුත් නොවෙයි; මේ ව්‍යාපෘති ගැන අවබෝධයක් තිබෙන මිනිස්සුත් නොවෙයි. ගරු අනුර කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමා ඒකට උත්තරයක් දෙනවාද?

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක)
(The Hon. Anura Karunathilaka)

මිල්ලනිය ආයෝජන ප්‍රවර්ධන කලාපය නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තිබෙන එකක්. එම නිසා මට ඒ සම්බන්ධයෙන් අදහස් තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන්නේ මිල්ලෑව ගැන. මේ ගැන ගරු නිහාල් අබේසිංහ මැතිතුමා දන්නවා. හොරණ ආසනයේ තිබෙන මිල්ලෑව තමයි නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තිබෙන්නේ. මේ ආයෝජන ප්‍රවර්ධන කලාපය තිබෙන්නේ බණ්ඩාරගම ආසනයේ මිල්ලනියේ. Milleniya BOI Zone එක, UDA එකේ zone එක. ඒක තමයි මේ පැටලිලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට නොවෙයි මම මේවා කියන්නේ, සමාවෙන්න. ඔබතුමා මේ පළාතෙන් පිට කෙනෙක් නේ. මේ නිලධාරින් මිල්ලෑව දන්නේත් නැහැ, මිල්ලනිය දන්නේත් නැහැ. කළුතර දිස්ත්‍රික්කයේ ඉතාම දුෂ්කර තත්ත්වයක සිටින මිනිස්සු රැකියා නැතුව කිලෝමීටර සිය ගණන් ඈත පළාත්වලට යනවා. ජීවත් වෙන්න බැරි වුණාම ළමයි දාලා පිට රටවලට ගිහින් ඒ අය දුක් විඳිනවා. මේකට වටිනා සම්පත්, වටිනා ඉඩම් අත්පත් කරගෙන තිබෙනවා. බලන්න, අක්කර 244ක්. මේ ගරු සභාවේ මැති ඇමතිවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා. ආයෝජකයන් ආවාම ඉඩම් සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය තමයි අහන්නේ. පහසුකම්, පාරවල්, ජලය, නළ ජලය ගැන තමයි අහන්නේ. මෙච්චර පහසුකම් තිබෙන, මූලික කටයුතු කරපු, මැනුම් කටයුතු කර අවසන් වෙච්ච අක්කර 500කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් මෙතැන තිබෙනවා. දින කිහිපයකට කලින් ලියන ලද මේ ලිපියේ ඒ ගැන කියලා තිබෙනවා. මේවා අවසානු කරන්න කටයුතු කරන්නේ කවුද? Horana Plantations PLC කියන සමාගම හොඳ සමාගමක්. හැබැයි, ඔවුන් කැමති නැහැ, ඔවුන්ගේ ඉඩම් වෙන කවුරුවත් පරිභෝජනය කරනවාට. ඔවුන්ට බදු අයිතියක් පමණයි තිබෙන්නේ. අවුරුදු 50න් දැන් සෑහෙන කාලයක් ගෙවිලා. බදු අයිතියක් පමණක් තිබෙන Horana Plantations PLC එකට මේ රටේ සංවර්ධන උපායමාර්ග, මෙතෙක් ක්‍රියාත්මක වෙමින් ආපු ව්‍යාපෘති නතර කරන්න පුළුවන්ද? ඒක නිසා මේක බරපතළ තත්ත්වයක්, ගරු අගමැතිතුමියනි. බදු ගහලා, බදු ගහලා මේ රට සංවර්ධනය කරන්න බැහැ. රටේ කර්මාන්ත හදලා ඒවා දියුණු කරලා, ව්‍යාපාර ගොඩනඟලා ඒවාට බදු ගහන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. අද තිබෙන දේවල්වලට බදු ගහනවා. අහිංසක මිනිසුන්ට බදු ගහනවා. ඒ වාගේම IT ක්ෂේත්‍රයට බදු ගහනවා. මේ රටේ මිනිස්සු අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නේ. ඒවාට වගකියන්න ඕනෑ කවුද කියන එක ගැන විවිධ මත තිබෙන්න පුළුවන්. නමුත් මෙච්චර වටිනා සම්පත් තිබෙද්දී ඒවා පසෙකලා අලුත් දේවල් කථා කරන එක තේරුමක් නැහැ. මේ අය වැය යෝජනාවල තිබෙන පෞද්ගලික, ජාත්‍යන්තර හෝ දේශීය ව්‍යවසායකයන්ගේ සහයෝගය ලබාගෙන ඒ ආයෝජන කලාප ගොඩනඟලා, ඒ හරහා ආයෝජකයන් මේ රටට ගෙන්වා ගන්න අවශ්‍ය කරන ව්‍යාපාරික පරිසරය ගොඩනැඟීම සඳහා අපි සහයෝගය ලබා දෙනවා. ඒ සඳහා ඔබගේ අවධානය යොමු වෙයි කියලා මම කල්පනා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Anil Jayantha. You have fifteen minutes.

[අ.භා. 6.48]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

Thank you very much. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විවාදයට බඳුන් කර තිබෙන දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අදහස් දැක්වීමේදී මම පළමුවෙන්ම කියන්න ඕනෑ, ඇත්තටම මෙය අත්‍යවශ්‍ය සංශෝධන පනත් කෙටුම්පතක් බව. 2025 වර්ෂය සඳහා අපේ ඇස්තමේන්තුගත ආදායම් යෝජනා සම්බන්ධයෙන් විය යුතු සංශෝධන ඇතුළත් කරලා තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ විවාදයේදී බොහෝ දුරට අපේ බදු මූලධර්ම, ආදායම එකතු කරගන්නා ක්‍රමවලට පටහැනි සහ වැරදි කථා ගොඩක් ඉස්මතු වුණා. මම එයින් එකකින් පටන් අරගෙන කථාවට ප්‍රවිෂ්ට වෙන්නම්. සේවා අපනයනය සඳහා බදු පැනවීමේදී සියයට 15ක බදු පැනවීම suicidal situation එකක් කියලා සඳහන් කළා. ඊට කලින් විපක්ෂයේ තවත් මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, අදහසක් මතු කළා, මේක මෙතෙක් නොතිබුණු විධියේ බදු පැනවීමක්, මහා විනාශයක් කරන ආකාරයේ බදු පැනවීමක් කියලා. ඇත්ත වශයෙන්ම මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මතක් කර දෙන්න ඕනෑ, මේ බදු පැනවීම සිද්ධ කරන්නේ ආදායම මත, සේවා අපනයන ආදායම මත කියන එක. අපේ ආදායම මත බදු පැනවීමට පදනම් වන නීතිය තමයි 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත. ඒ පනත යටතේ පළමුවෙන්ම බදු පැනෙව්වේ, මම හිතන විධියට ඔබතුමන්ලාත් ආණ්ඩුවේ හිටපු කාලයේ. සමහර විට ඒක දැනුවත්ව සද්ද නැතුව හිටියාද දන්නේ නැහැ. ඒ යටතේ 2018

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

අප්‍රේල් 1වැනි දා ඉඳලා සේවා අපනයනයට බදු පැනවුණා; භාණ්ඩ අපනයනයට බදු පැනවුණා. එතැනදී සමාගම්වලට පනවා තිබුණු බද්දට සියයට 50ක discount එකක් දුන්නා. ඒ වෙලාවේ සමාගම් සඳහා තිබුණු බදු ප්‍රතිශතය සියයට 28යි. ඒ අනුව තමයි සියයට 14ක් වුණේ. නමුත් අද කියනවා, මහා විශාල බද්දක් පැනෙව්වාය කියලා. එතුමන්ලාත් ආණ්ඩුවේ හිටපු කාලයේ මේ බද්ද පනවා තිබුණා. හැබැයි අපි කවුරුත් දන්නවා, ආදායම් බදු පමණක් නොවෙයි අනෙක් බදුත් අය කර ගැනීමේදී ඉතාම සූක්ෂ්ම වෙන්න ඕනෑ බව. ඒකට හේතුව, "ආදායම් බද්ද" කිව්වාට ඒක ඇත්තටම "ආදායම්" නොවෙයි. රට තුළ නිෂ්පාදනය වන ආදායමේ වටිනාකම ආණ්ඩුව වෙත විතැන් කර ගැනීමකට තමයි අපි ආදායම් බද්ද කියන්නේ. ඒක වෙනත් ආදායමක් නොවෙයි. ඒ නිසා හිතුමතේ, හිතුවක්කාරී ලෙස, අදූරදර්ශී ලෙස බදු ප්‍රතිපත්තිය අනුගමනය කළොත්, ගැටලු මතු වෙනවා.

2018 අප්‍රේල් 1වැනි දා ඉඳලා දිගින් දිගටම සියයට 14ක බද්ද පවත්වාගෙන ආවා. නමුත් අපි දන්නවා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ජනාධිපති ධුර කාලයේදී -2019 වසරේදී- විශාල ලෙස බදු කපා හැරිය බව, tax cuts දුන්න බව; මේ බද්ද විතරක් නොවෙයි, තවත් ඒවාත්. ඒ යටතේ තමයි සේවා අපනයනය සඳහා බද්ද ඉවත් කරන්නේ. ඒ වෙලාවේ ගොඩක් විවේචන ආවා, බදු ආදායම පහළ යාම පිළිබඳව. අපි දන්නවා, ඒක දුර දිග නොබලා ගත්ත තීන්දුවක් බව. නමුත් අපි තීන්දු ගන්නේ දුර දිග බලලා; කරුණු කාරණා සැලකිල්ලට භාජන කරලා. ඒ නිසා විපක්ෂයට අපි කියනවා, කලබල වෙන්න එපා කියලා. අපි නිසි පාරේ යනවා. ඔබතුමන්ලා කියනවා නම් මේකෙන් විශාල හානියක් වෙනවාය කියලා, අපි ඒ ගැන බලමු. හැබැයි අනෙක් පැත්තෙන් ඔබතුමන්ලා මේ ආණ්ඩුව බිඳ වැටෙනකල් තමයි බලාගෙන ඉන්නේ. අපි මේ ගත්ත ක්‍රියාව නිසා ආර්ථිකය බිඳ වැටිලා ආණ්ඩුව කඩා වැටුණොත්, ඔබතුමන්ලාගේ තර්කය පැත්තෙන් හොඳයි. ඉතින් මම හිතනවා, එක්කෝ ඔබතුමන්ලා ඇත්ත වශයෙන්ම මේ පිළිබඳව නිසි ආකාරයෙන් කරුණු අධ්‍යයනය නොකර, නොදැන කථා කරනවා. එහෙමත් නැත්නම් සමහර විට මේ බදු නොගෙවා සිටීම්, පැහැර හැරීම් පිළිබඳව නොදැන සිටිනවා. විශේෂයෙන් තාක්ෂණය දියුණු වීමත් එක්ක සේවා අපනයනය සහ සේවා ක්ෂේත්‍රයට පනවන බදු සම්බන්ධයෙන් ගැටලු පැන නඟිනවා. බදු අනුකූලතාවන්ට එන්නේ නැහැ. සේවා අපනයනය එකක්. ඒ වාගේම තමයි තාක්ෂණික ක්ෂේත්‍රය තුළ සිටිනවා YouTubersලා, freelancersලා වාගේ විශේෂ ආදායම් උපයන කණ්ඩායම්. ඒගොල්ලන් දැනටත් මේ බද්දට යටත්; ආදායම් බද්දට යටත්. නමුත් බදු ගෙවීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම-

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

2018දී මේ බද්ද ගෙනාවා කියලා ඔබතුමා කිව්වා. ඒකයි මම කිව්වේ, මංගල සමරවීර මැතිතුමා ඒ කාලයේ මේ නීතිය ගෙනැල්ලා, මාස හයකින් ඒක withdraw කළා. ගෝඨාභය රාජපක්ෂ- *[බාධා කිරීමක්]* ඒක මම කිව්වා. *[බාධා කිරීමක්]* මාස හයෙන් මංගල සමරවීර මහත්මයාම ඒක ගැලෙව්වා. ඉතින් මම ඒ කිව්වේ, ඒ කාලාන්තරයේම- *[බාධා කිරීමක්]* ගෝඨාභය රාජපක්ෂ කාලයේ-

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

හරි. අපි කියන්නේ මේකයි, ගරු මන්ත්‍රීතුමා. මේක මේ ජාතික ජන බලවේගය ආණ්ඩුවෙන් අලුතෙන්ම පනවලා තාක්ෂණය බිඳ වටිටන්න ගෙනාපු මහා බිල්ලෙක් විධියට මතු කරණ කාරණය වැරදියි, මේ බද්ද 2018 ඉඳලාම තිබුණු එකක් කියන කාරණය තමයි මම කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඊළඟ කාරණයට ආවොත්, මේ බදු පිළිබඳ සංකීර්ණතාව පොඩ්ඩක් තේරුම් ගන්න ඕනෑ. ප්‍රධාන වශයෙන් බදු කොටස් දෙකකට වෙන් වෙනවා, වක්‍ර බදු සහ ඍජු බදු වශයෙන්. වක්‍ර බදු බොහෝ දුරට පැනවෙන්නේ වටිනාකම මත පදනම්ව. අපි කියනවා, *ad valorem* taxes කියලා. රටක ආදායමෙන්, ආණ්ඩුවක ආදායමෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයක් *ad valorem* taxes, එහෙම නැත්නම් indirect taxes, වක්‍ර බදු. ඉතින් ඒවා පිළිබඳව අපි වැඩිය සාකච්ඡා කරන්නේ නැහැ. නමුත් අද පනත් කෙටුම්පත තිබෙන්නේ ආදායම් බදු සම්බන්ධව. ඒ කියන්නේ, ඍජු බදු. ආදායම් බදු අය කිරීමේදී මූලධර්ම ගණනාවක් සැලකිල්ලට භාජන කරනවා. මොකද, හේතුව ඒක සාධාරණ වෙන්නට ඕනෑ; සරල වෙන්නට ඕනෑ; පහසු වෙන්නට ඕනෑ. මේ පිළිබඳ ගැටලු ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම මෙම සංශෝධනවලදී අපි අවධානය යොමු කළා, බදු ගෙවීම සරල වීම, පහසු වීම සහ සාධාරණ බව පුළුවන් උපරිමයෙන් ආරක්ෂා කරගන්නට. ඉදිරියේදීත් තව ගොඩක් වැඩ කටයුතු කරන්න තිබෙනවා.

ඒ වාගේම තමයි ආදායම ජනනය වෙනකොට, ආදායම් බද්දට යටත් වන ප්‍රධාන කාණ්ඩ දෙකක් ඉන්නවා, සමාගම් සහ පුද්ගලයන් වශයෙන්. ඒ කියන්නේ තැනැත්තා - person - කොටස් දෙකකට වෙන් වෙනවා, පුද්ගලයා සහ body corporate වශයෙන්. ඒ සංකීර්ණතාව ඇතුළේත් ආදායම ඉපැයෙන මාර්ග - sources - විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි ව්‍යාපාරයක් ගත්තොත්, එයින් අපි ලාභයක් උපයනවා. ඒක ආදායමක්. ඒ වාගේම අපි සේවයක් සපයනවා නම් ඊට අදාළ සේවා නියුක්ති ආදායම ලැබෙනවා. ඒකත් අපේ ආදායමක්. ඊට අමතරව ලාභාංශ, ආයෝජන ආදී වශයෙන් වූ ආදායම් මාර්ග - sources - අපට ඉදිරිපත් කරන්න පුළුවන්. සමහර ආදායම් මාර්ගවලට අය කරන බදු අනුපාත වෙනස් වෙනවා. සමහර ඒවාට පොදුවේ තිබෙනවා. ඒ අර්ථයෙන් ගත්තාම සමාගම් උපයන ආදායම්වලට දැනට පොදුවේ නිශ්චිත අනුපාතයක් දීලා තිබෙනවා, සියයට 30යි කියලා. ඒත් ආදායම් බදු. පුද්ගලයන්ට ඒ බදු අනුපාත විවිධ මාර්ගවලින් ගළපන විට, පොදුවේ ගත්තාම සියයට 6 සිට සියයට 36 දක්වා අය වෙනවා. ඒක ඇතුළේත් සමහර preferential tax rates තිබෙනවා. උදාහරණයක් විධියට ලාභාංශ ආදායම ගත්තාම, දැනට ඒක උපරිමයකට යටත් කර තිබෙනවා, cap කර තිබෙනවා සියයට 15කට. මෙන්න මේ සංකීර්ණතාව අපි තේරුම් ගන්නට ඕනෑ. අපි උපයන ප්‍රාග්ධන ආදායමට අදාළව බදු අය කිරීමේදී ඒකත් සියයට 36 දක්වාම ගමන් කරන්නේ නැහැ. ඒකට වෙන ප්‍රතිශතයක් තිබෙන්නේ.

සේවා අපනයනය තමයි මේකෙන් මහ හැරිලාම තිබුණේ. කිසිම ආකාරයක බද්දකට එය යටත් වෙන්නේ නැහැ. යම් කිසි පුද්ගලයෙක් සේවා අපනයනයෙන් නම් සමස්ත ආදායම උපයා ගෙන තිබෙන්නේ, ඔහු කිසිම බද්දකට යටත් වෙන්නේ නැත්නම්, බදු ගෙවන්නේ නැත්නම් බදු අනුකූලතාව; බදු ගෙවීමේ සාධාරණ තත්ත්වය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මම නැවතත් මේ තොරතුරු තහවුරු කරගත්තා. මේ අපනයන ආදයම බද්දෙන් නිදහස් කළේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ ඉදිරිපත් කළ සංශෝධනය මඟින්, 2020.01.01 දින සිට. මම මේ කියපු කාරණා අනුව අපි තේරුම් ගන්නට ඕනෑ දෙය තමයි, ආදායමට අනුව විවිධ අනුපාතයන් යටතේ බදු පනවනවා කියන එක. ඒ අනුව සේවා ආදායමට අදාළ බද්ද අපි උපරිමය සියයට 15කට cap කර තිබෙන්නේ; යටත් කර තිබෙන්නේ පවතින තත්ත්වයත් තේරුම් අරගෙනයි. ඒ, තාක්ෂණයේ මැදිහත්වීම්වලට උපකාරයක් කිරීමටත්, සාධාරණ බව රැකීමටත්. හැබැයි, ඒකට මුවා වෙලා යම් කිසි සමාගමක්, යම් කිසි පුද්ගලයෙක් බදු අනුකූලතාව මහ හරින්න උත්සාහ දරනවා නම්, මම හිතන විධියට ඒක සාධාරණ නැහැ. මොකද, දැන් ජාතික ජන බලවේගය යන්න උත්සාහ කරන්නේ වංචාව, දූෂණය කියන සියල්ල නවත්වා, විශේෂයෙන්ම දේශපාලන දූෂණය නවත්වා යන ගමනක් කියන එක අපි කවුරුත් දන්නවා.

මහ ජනතාවගේ මුදල්, රාජ්‍ය මූල්‍ය පරිහරණය කිරීමේදී නව ප්‍රවිෂ්ටයක් අපට අවශ්‍ය කරනවා. ඒ ප්‍රවිෂ්ටය සඳහා අපිට ආදායම් දෙන විට, ඔබට බදු ගෙවන්න පුළුවන් නම්, ගෙවිය හැකි මට්ටමක ඔබ ඉන්නවා නම් මේ සමාජය මේ යන ගමන සඳහා ඔබගෙන් වන කැප කිරීම බදු නොගෙවා ඉන්නා එකද, මහ හරින එකද? මොකද, ඔබට ව්‍යාපාර පහසු කරගන්න අවශ්‍ය කරන සහන ලබා දීම, අනෙකුත් යටිතල පහසුකම්, මහ පෙන්වීම, රාජ්‍ය මැදිහත්වීම යනාදී කටයුතු අපි අනිවාර්යයෙන්ම සිද්ධ කරනවා. ඒ නිසා මම හිතන්නේ නැහැ බදු ගෙවීම කිසිම විධියක අසාධාරණ මට්ටමක තිබෙනවා කියලා. ඒක ඒ අර්ථයෙන් ගත්තාම අපි විශේෂයෙන්ම විමසිලිමත්ව සලකා බැලිය යුතු කාරණයක්.

ඊළඟට, පුද්ගල ආදායම් බද්ද. පුද්ගල ආදායම් බද්ද ගැන අපි මැනිවරණයට කලිනුත් ප්‍රකාශ කළා. අපිට පුළුවන් නම් ඒ බදු නිදහස් සීමාව වර්ෂයකට මිලියන 2.4ට, ඒ කියන්නේ මාසයකට ලක්ෂ 2 දක්වා උඩට ගෙනියනවා කියලා අපි ප්‍රකාශ කළා. නමුත් තිබුණු තත්ත්වය අනුව ගණනය කිරීමේදී අපේ පුරෝකථන එක්ක ඒ කියපු ප්‍රමාණයට යන්න බැරි නිසා තමයි 150,000ක සීමාවේ තිබ්බේ. එතැනදී විශේෂයෙන්ම පහළම, අඩුම ආදායම් ලබන කාණ්ඩයට සුවිශේෂී වාසියක් අත්පත් කරදෙන විධියට තමයි එය සිදු කළේ. එතැනදී චෝදනාවක් ආවා, paradox එකක් වාගේ; බදු සීමාව ලක්ෂ 2ට ගෙනෙනවාය කිව්වා, නමුත් 150,000ට තමයි තිබ්බෙ; දීපු පොරොන්දුව ඉෂ්ට කළේ නැහැ කියලා. ඒ වාගේම තවත් පැත්තකින් චෝදනා කරනවා, 100,000ට තිබුණු බදු සීමාව 150,000 කරපු නිසා කලින් 100,000ට අදාළව හදා තිබුණු බදු files විශාල ප්‍රමාණයක් අහිමි වුණා කියලා. එතකොට එතුමන්ලා කියන විධියට, අපි බදු අය කරන සීමාව රුපියල් 200,000 දක්වා වැඩි කළා නම්, මොකද කියන්නේ? ඇත්තටම අපේ උත්සාහය රුපියල් 200,000 නොවෙයි. ඊටත් වඩා මේ නිදහස් සීමාව ඇත් කරලා, මිනිස්සුන්ට වියදම් කරන්න පුළුවන් විධියට හොඳ ආදායමක් අතට එන ආර්ථිකයක් නිර්මාණය කරන එකයි අපේ උත්සාහය. හැබැයි, ඔයගොල්ලන්ගේ තර්කයට අනුව අපි බදු නිදහස් සීමාව රුපියල් 200,000ට ගෙන ගියා නම් මොකක්ද කියන්නේ? අන්න බදු ෆයිල් ඔක්කෝම නැති කරගෙන බදු පදනම විනාශ කරගත්තා කියන තර්කය එතකොට එයි. ඒ අදහස් පරස්පර විරෝධියි; ඒක paradox එකක්. මොකක් හෝ එක තර්කයක් තිබෙන්න ඕනෑ. අපේ බදු පදනම පුළුල් කර ගැනීම කියලා කියන්නේ හුදෙක් බදු ෆයිල් සංඛ්‍යාව වැඩි කර ගැනීම නොවෙයි. අපි කවුරුත් දන්නවා, ලංකාවේ බදු පදනමට - tax base එකට - අදාළව පුද්ගලයන්ගේ අඩුවීමකුත් තිබෙන බව. ඒ වාගේම, බදු මහ හැරීම සහ බදු පැහැර හැරීම - tax avoidance and tax evasion - කියන concepts දෙක හරහා විශාල බදු මුදල් ප්‍රමාණයක් අය වෙන්නේ නැහැ. ඒ නිසා ඒ කණ්ඩායම මෙතැනට එකතු කර ගැනීම තමයි මූලික පදනම; ඒ සඳහා තාක්ෂණය කැඳවීම තමයි මූලික පදනම. එහෙම නැතිව බදු ෆයිල් ප්‍රමාණය වැඩි වූ පමණින් බදු පදනම වැඩි වෙන්නේ නැහැ, බදු ආදායම වැඩි වෙන්නේත් නැහැ. මම දෙන්නම් ඒකට හොඳ සාක්ෂියක්. මේ ආසියානු කලාපයට අදාළව තිබෙනවා Fiscal Monitoring Report එකක්. මේ ආසියානු කලාපයේ රටවල ආණ්ඩුවේ සාමාන්‍ය බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම, සියයට 22ක් තිබෙනවා. මා එය නැවත කියන්නම්. ආසියානු කලාපයේ රටවල ආණ්ඩුවේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 22ක් තිබෙනවා. මෙවැනි වැඩි අනුපාත තිබිලාත් අපේ රටේ බදු ආදායම ලෙස දළ දේශීය නිෂ්පාදිතයෙන් ඉතාම අඩු අගයක් තිබෙන්නේ. ඒකෙන්ම ගම්‍ය වෙනවා ගණිතමය පැත්තෙන් ගත්තත් බදු ආදායමේ විශාල කාන්දුවීම් ප්‍රමාණයක් තිබෙනවා කියලා. අප ඒ ප්‍රශ්න ද විසඳා ගනිමින්, මේ සහනය ලබා දෙමින් සාධාරණ මූලධර්මය රකිමින් තමයි බදු පිළිබඳ සහනය ලබා දෙමින් ඉදිරියට ගමන් කරන්නේ. එතැනදී ලැබුණු සහනය පිළිබඳව අපේ අනෙකුත් කථිකයන් විවිධ අවස්ථාවල කරුණු ඉදිරිපත් කළා. මම ඒ ගැන පුංචි පැහැදිලි කිරීමක් විතරක් කරන්න කැමැතියි.

මාසයකට ලඝු කර ගත්තොත්, ඔබගේ ආදායම කලින් රුපියල් 100,000ක් තිබුණා නම් බද්දට යටත් වුණා. දැන් ආදායම රුපියල් 150,000කට වැඩි නම් තමයි බද්දට යටත් වෙන්නේ. කොහොමද, මේ සහනය ලැබෙන්නේ? මාසයකට රුපියල් 150,000ට වඩා වැඩිපුර උපයා ගන්නා රුපියල් 41,666ට අදාළව දැන් බද්දට යටත් වෙන්නේ සියයට 6 අනුපාතයෙන්. ඒ වාගේම වැඩිපුර ගන්නා දෙවැනි රුපියල් 41,666ට අදාළවත් බද්දට යටත් වෙන්නේ සියයට 6 අනුපාතයටයි. කලින් තිබුණු තත්ත්වය සැසඳීමේ දී එය සියයට 12යි. එතැනදී අර රුපියල් 50,000ට අදාළ වාසියට අමතරව විශේෂ වාසියක් ලැබෙනවා, වැඩිපුර ගන්නා රුපියල් 41,666ට අදාළ බදු අනුපාතය සියයට 6ක් වීම නිසා. මම විශේෂයෙන් ආරාධනා කරනවා බදු පිළිබඳව අධ්‍යයනය කරන අයට, විශේෂයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට, මේකේ බලපෑම මොකක්ද කියලා අධ්‍යයනය කරලා බලන්න කියලා. නිරපේක්ෂව ගත්තාම මේ සහනය ලැබෙන්නේ කොහොමද? රුපියල් 100,000ට තිබුණු සීමාව රුපියල් 150,000 ලෙස වෙනස් කිරීමෙන් රුපියල් 50,000කට අදාළව වටිනාකමක් ලැබෙනවා. මොකක්ද, එතැන ලැබෙන සහනය? අපි කවුරුත් දන්නවා බදු අනුපාතය 6 සිට සියයට 36 දක්වා වන බව. උඩ සිටින කණ්ඩායමට -වැඩිපුර ආදායම උපයන අයට- බදු අනුපාතය සියයට 36ක් කිව්වාට එච්චර ප්‍රතිවිරෝධයක් එන්නේ නැහැ කියලායි මා හිතන්නේ. ඒ නිසා රුපියල් 50,000කින් වැඩි කරලා shift කළාම, එනම් කලින් තිබුණු රුපියල් 100,000 සීමාව රුපියල් 150,000 කළාම ලැබෙන උපරිම බදු ලාභය තමයි සියයට 36. සියයට 36 වැඩි කිරීම රුපියල් 50,000 කියන්නේ රුපියල් 18,000යි. ඒක තමයි නිශ්චිත නිරපේක්ෂ අගය. දෙවැනි නිරපේක්ෂ අගය තමයි, මා අර කලින් කියපු පරිදි යටම ඉන්න කණ්ඩායමට වාසි වන විධියට බදු කාණ්ඩය පුළුල් කිරීම. මෙහිදී සාධාරණ බවයි රැකලා තිබෙන්නේ. රුපියල් 41,666ට තවත් සියයට 6ක් එකතු වුණාම එතැන රුපියල් 2,500යි. ඒ අනුව රුපියල් 20,500ක නිරපේක්ෂ අගයක් ලැබෙනවා. මෙන්න මේ නිරපේක්ෂ අගය විවිධ බදු කාණ්ඩ යටතේ, විවිධ ආදායම් යටතේ ලබා ගත්තාම මේ කියන සාධාරණ බව රැකෙන්නේ කොහොමද කියලා ඒ අදාළ සංඛ්‍යා දත්ත විශ්ලේෂණ අරගෙන බලන්න. රුපියල් 150,000ක් ලැබෙන පුද්ගලයෙකුට කලින් තත්ත්වයට සාපේක්ෂව සියයට සියයක බදු වාසියක් ලැබෙනවා. රුපියල් 200,000ක් උපයන කෙනෙකුට සියයට 71.4ක වාසියක් ලැබෙනවා. රුපියල් 250,000ක් උපයන කෙනෙකුට සියයට 62ක වාසියක් ලැබෙනවා. ඒ වාගේ රුපියල් 50,000න්, 50,000ට පහළට ආවොත් සියයට 47ක්, සියයට 38ක්, සියයට 29ක්, සියයට 23ක් යනාදී වශයෙන් පහළට එනවා. ආදායම වැඩි වෙනකොට සාපේක්ෂ වාසිය අඩුයි; ආදායම අඩු වෙනකොට සාපේක්ෂ වාසිය වැඩියි. මා හිතන්නේ, සාධාරණ බව රැකීම බදු මූලධර්ම පැත්තෙන් වඩාත්ම හොඳ තත්ත්වයක් කියලායි.

මේ සංශෝධන පනත් කෙටුම්පත ගැන කථා කරද්දී කිව යුතුයි, අප ආදායම් උපයා ගන්නා මාර්ග අතර සිගරට්, මත්පැන්, ඔට්ටු ඇල්ලීම් සහ සූදු ක්‍රීඩා සඳහා -ඒ ව්‍යාපාර සඳහා- සියයට 40ට තිබ්බව බදු අනුපාතය සියයට 45 දක්වා වැඩි කරන බව. එතැනදී දෙපැත්තක් රකින්න ඕනෑ. එක පැත්තකින්, ව්‍යාපාරිකයන්. ඒවාට sin industries කියලාත් කියනවා. ඒවාට අදාළ බදු අනුපාතය අනවශ්‍ය විධියට ඉහළට ගෙන යන්නත් බැහැ. නමුත්, සැලකිය යුතු වැඩි බදු ආදායමක් අය කර ගන්න පුළුවන් නිසා පැවැති බදු අනුපාතය අපි සියයට 45 දක්වා වැඩි කර තිබෙනවා. එතැනදී මිල ඉල්ලුම් නම්‍යතාවත් සැලකිල්ලට භාජන කරලා තමයි ඒ කාරණය සිදු කරලා තිබෙන්නේ.

අප අවසාන කොටසට ආවොත්, මේ සංශෝධන පනත් කෙටුම්පත තුළ ඇති තවත් කාරණයක් ගැන කිව යුතුයි. ඒ තමයි, බැංකු තැන්පතු පොලිය සඳහා වන රැඳවුම් බද්ද. ඒ පිළිබඳවත් ගොඩක් සාකච්ඡා කළා; විවේචන ද එල් වුණා. මේ සම්බන්ධයෙන් කිව යුතු පළමු කාරණය මෙකයි. පොලිය සඳහා වන රැඳවුම් බද්ද සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීමේ තර්කනය තමයි බදු එකතු කර ගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සහ ස්වයං අනුකූලතාව - self compliance - වැඩි කර

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ගැනීම. කොහොමද ඒක සිද්ධ වෙන්නේ? සාමාන්‍යයෙන් රටක පුද්ගලයන්ගේ බදු අනුපාතයේ අවම සීමාවට වඩා වැඩි විධියට ප්‍රභවයේදී බදු අය කරන එක තමයි කාර්යක්ෂම වෙන්නේ. හොඳ රටක තාක්ෂණය ස්ථාපිත වෙලා තිබෙනවා නම්, එකම platform එකක පුද්ගලයන්ගේ ආදායම් ගණනය වෙනවා නම්, ඇත්තටම ප්‍රභවයේදී බදු අය කර ගන්නා එක තමයි හොඳම ක්‍රමය. බදු සම්බන්ධයෙන් අපි කවුරුත් ඒක පිළිගන්නවා. අද පුද්ගලයෙකු සම්බන්ධයෙන් බදු අනුපාත පටන් ගන්නේ සියයට 6න්. දැනට පොලිය සම්බන්ධයෙන් තිබෙන්නේ, සියයට 5යි. ඒ කියන්නේ, අපි ප්‍රභවයේදී අය කර ගැනීම, කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම කියන කාරණා අඩුවෙන් තියලා පුද්ගලයන්ගේ පළමුවෙනි කාණ්ඩයේ බදු අනුපාතය සියයට 6කින් වැඩි කරලා තිබෙනවා. කාර්යක්ෂමතාව පිළිබඳ ගැටලුත් තිබෙන නිසා අපි සියයට 10ට යනවා. එතැනදී අර අපි කිව්ව ස්වයං බදු අනුකූලතාව වැඩි කර ගැනීමේ පරමාර්ථයෙන් හැම කෙනෙකුම තමන් බද්දට යටත් වෙනවා නම් අදාළ පොලියට අය කරන සියයට 10 කිසිම ගැටලුවක් නැතුව, අදාළ තක්සේරු වර්ෂයට තමන්ගේ tax return එක, බදු ෆයිල් එක දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දෙන කොට එය අඩු කරන්න පුළුවන්. ඒක බදු බරක්, tax credit එකක්. ඒ කියන්නේ ප්‍රභවයේදී අය කරන එක වෙනම බද්දක් නොවෙයි. ප්‍රභවයේදී අය කිරීම කියන්නේ, බදු අය කර ගන්නා ක්‍රමයයි. බද්ද පැන නඟින මොහොතේ අය කර ගන්නවා, එහෙම නැත්නම් කාර්තුමය වශයෙන් අය කර ගන්නවා, එහෙමත් නැත්නම් වාර්ෂිකව අය කර ගන්නවා. අපි කාටත් සරලව තේරෙනවා, යම්කිසි ආදායමකින් බද්දක් අය කර ගන්නවා නම් අවුරුද්දක් ඉඳලා අය කර ගැනීමද කාර්යක්ෂම, මාස 3ක් ගිහිල්ලා අය කර ගැනීමද කාර්යක්ෂම, ඒක පැන නඟින මොහොතේම අය කර ගැනීමද කාර්යක්ෂම කියලා. පැන නඟින මොහොතේම අය කර ගන්නවා. හැබැයි, එතැනදීත් බදු ගෙවන කෙනාගේ, බදු ගෙවීමට යටත් වෙන කෙනාගේ බොටුව මිරිකලා සියල්ලම ගන්න යන්නේ නැහැ. එතැනදී ගන්නේ සියයට 10යි. හැබැයි, අපි ඒක ඔහු හෝ ඇය ගෙවිය යුතු අවසාන බද්දෙන් අඩු කරලා දෙනවා. ඒ නිසා එතැන ගැටලුවක් පැන නඟින්නේ නැහැ.

ඒත් එක්කම අපි දන්නවා, ඒ තැන්පතු සිද්ධ කරලා තිබෙන්නේ ඉතාම අඩු වටිනාකම්වලින් බව. ගිණුම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා යම් තර්කයක් සමාජයේ හඳුන්න පුළුවන්, "ඒගොල්ලන්ගෙන් පොලියට සියයට 10ක් අය කළාට ඒගොල්ලන් බදු ගෙවන්නේ නැහැ. ඒගොල්ලන්ගේ මාසික ආදායම 150,000ට වඩා අඩුයි. ඒ නිසා ඔවුන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගිහිල්ලා තමන්ගේ බදු ෆයිල් එක පෙන්නලා ඒ සල්ලි ආපසු ඉල්ලා සිටින්නේ නැති වෙයි. එය ඉල්ලා සිටින්න ගියත් යම් මුදලක් වියදම් වෙයි. ඒ නිසා මේක අත් හැර දමනවා. ඒ නිසා මේක අසාධාරණයි" කියලා. ඔව්, අපි ඒ කාරණය සැලකිල්ලට භාජන කළා. එසේ සැලකිල්ලට භාජන කරලා ඒ අනුව මේ වනකොට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් ඉන්නවා, බැංකු සහ මූල්‍ය ආයතනවලට අදාළ උපදේශය දෙන්න. එතැනදී තාක්ෂණයත් උපරිම වශයෙන් භාවිත කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

අපි කවුරුත් දන්නවා, මේ හැම කෙනෙක්ම බැංකුවට යන බව. එසේ බැංකුවට යන අවස්ථාවේදී ඔහු හෝ ඇය බද්දට යටත් නොවන්නේ නම් ඒ අය කිරීම සිදු නොකර ඉන්න අවශ්‍ය ප්‍රතිපාදන හදනවා. ඒකත් අපි අර කියපු තාක්ෂණය ගෙනැල්ලා සිදු කරනවා.

අපට තර්කයක් ගේන්න පුළුවන් නේ බැංකු ගිණුම් ගොඩක් පවත්වා ගෙන යනවා, ඒ නිසා විවිධ නම්වලින් accountsවල දාලා බදු නොගෙවා ඉන්න උත්සාහ කරනවා කියලා. අපට මොන චෝදනා එල්ල කළත් අපි හිතනවා, මේ මොහොතේදී මේ සමාජයේ සිදු වන පරිවර්තනය, මේ ආණ්ඩුව වැඩ කටයුතු කරන ආකාරය දැක්කාම, අමාත්‍යාංශවල, අනෙකුත් රාජ්‍ය ආයතනවල දැන් වැඩ කටයුතු කරන විධිය දැක්කාම, මේ රට ගැන ආදරයක්, කැක්කුමක් ඇති, මේ රටේ පරිවර්තනයක් කරන්න ඕනෑ කියලා හිතන සෑම කෙනෙකුටම සාධාරණ හැඟීමක් දැනෙනවා, 'මම ආදායම් බද්දට යටත් නම් මම ඒක ගෙවිය යුතුයි' කියලා. මම හිතනවා ඒක එහෙම විය යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Anil Jayantha, your time is up.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පර කිහිපයක් දෙන්න. මම කථාව ඉක්මනින් අවසාන කරන්නම්.

ඇත්තටම, අවංකවම කාගේ හෝ ආදායම අඩු මට්ටමක තිබෙනවා නම්, ඔහුට හෝ ඇයට බැංකුවට හෝ මූල්‍ය ආයතනයට ගිහිල්ලා ඒ declaration එක ඉදිරිපත් කරන්න පුළුවන්, "මම බද්දට යටත් වෙන්නේ නැහැ" කියලා. එවිට අපි අනිවාර්යයෙන්ම එය අඩු කරනවා. හැබැයි, අපේ තාක්ෂණය යොදාගෙන අදාළ විගණන කටයුතු සහ පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යනවා. එම නිසා ඇත්තටම declaration එක දිය යුතු වන්නේ අවංක ලෙස, බදු නොගෙවා ඉන්න අයයි.

ඊළඟට, බාල වයස්කාර දරුවන්ගේ - minorsලාගේ - ගිණුම් පිළිබඳවත් ප්‍රශ්නයක් නැඟුවා. එය ප්‍රශ්නයක් නොවෙයි. බාල වයස්කාර දරුවන්ට අදාළව ඕනෑ තරම් ගිණුම් තිබෙන්න පුළුවන්. හැබැයි, ඔවුන්ට භාරකාරයෙක් ඉන්න ඕනෑ. මොකද, සමාජයීය වශයෙන් ගත්තාම අම්මා, තාත්තා, දරුවා එකම පවුලක් වුණාට දේශීය ආදායම් පනතට අනුව ආදායම් බදු ගෙවන කොට husband and wife කියන්නේ දෙදෙනෙක්, legally two persons. A family is one unit, but the husband and wife are legally two persons. Husbandගේ සහ wifeගේ නමට වෙන වෙනම accounts තිබුණත් ප්‍රශ්නයක් නැහැ. ඒ අනුව බදු ගණනය කිරීම කරනවා. හැබැයි, දරුවා බාල වයස්කරුවෙකු නම් අම්මා හෝ තාත්තා භාරකරු වශයෙන් ඉන්න ඕනෑ. අපි ඒකත් පරීක්ෂණයට ලක් කරනවා. ඒ අනුව අදාළ අඩු කිරීම කරනවා විතරක් නොවෙයි, ඉතාම සාධාරණ පදනමකින් මේ වැඩකටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා වැදගත් වූ මෙම දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී බලාපොරොත්තු වුණු ආදායම් ඉලක්කය, අප ඊළඟ වර්ෂයේදී අය වැය මෙහෙයවීමේදී ප්‍රධාන වශයෙන් ආදායම් ලබා ගැනීම සඳහා දායක වෙනවා. ඒ අනුව මේ පැහැදිලි කිරීමත්, ඒ ගැන අවබෝධයත් ඇතිව අපි ඉදිරියේදී වැඩ කටයුතු කරමු කියා යෝජනා කරමින්, මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය

යුතු ය.'' -[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

தீர்மானிக்கப்பட்டது:

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. DEPUTY SPEAKER in the Chair.]

1 සහ 2 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ආම්, 2ආම් වාසකඞ්ගළ් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටු මෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clauses 1 and 2 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Clause 3, does the House agree?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Ravi Karunanayake?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, we would like to express our disapproval on Clause 3(2)(c)(a) and (b). With regard to the tax on tobacco and gaming, there is no problem. It is only to the 15 per cent tax that we are opposing. So, very clearly the taxes on tobacco and gaming are not an issue. But, Clause 3(2)(c)(a) and (b) are the Subclauses to which we are voicing our opposition. But, there is no need of taking a Vote; we only want to express our opposition.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, Hon. Ravi Karunanayake, we shall note down your objection.

3 සිට 6 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ආම් වාසකත්තිලිරුන්තු 6ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clauses 3 to 6 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය, දීර්ඝ නාමය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் விரிவுப் பெயரும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause, Long Title and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Chairman, -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Member?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Again, Sir, very clearly, to the tax on tobacco and gaming, we are not opposing at all, but only to the other two subject matters under Clause 3(2)(c)(a) and (b). So, let it be very clear and do not allow it be misinterpreted anywhere that we opposed that, too.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
We shall note it down as you proclaimed.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Sir, I move,

"That the Bill be now read the Third time."

Sir, I also request for permission to correct the language, the typographical errors, the grammatical errors, the numerical errors and the consequential amendments to the Bill.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 7.13ට, 2025 පෙබරවාරි 21වන දින සභා සම්මතිය අනුව, 2025 මාර්තු 21වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி, பி.ப. 7.13 மணிக்கு பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 மார்ச் 21, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.13 p.m. until 9.30 a.m. on Friday, 21st March, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

318 වන කාණ්ඩය - 19 වන කලාපය
தொகுதி 318 - இல. 19
Volume 318 - No. 19

2025 මාර්තු 21 වන සිකුරාදා
2025 மார்ச் 21, வெள்ளிக்கிழமை
Friday, 21st March, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 මාර්තු 21 වන සිකුරාදා
2025 மார்ச் 21, வெள்ளிக்கிழமை
Friday, 21st March, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

කථානායකතුමාගේ සහතිකය [තීරුව 3379]

කාරක සභා සඳහා සාමාජිකයන් නම් කිරීම [තීරුව 3379]

රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම [තීරුව 3392]

"ආර්ථික අර්බුදයෙන් පසු දරිද්‍රතාවයේ වෙනස්වීම්" මැයෙන් පවත්වන සම්මන්ත්‍රණය [තීරුව 3392]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 3394-3406]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

වත්මන් රජයේ බලශක්ති උත්පාදන ප්‍රතිපත්තිය [තීරුව 3406]

ගරු මහින්ද ජයසිංහ මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම [තීරුව 3413]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [විසිහයවන වෙන් කළ දිනය]

[ශීර්ෂ 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන)] - කාරක සභාවේදී සලකා බලන ලදී

තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 3417-3616]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

சபாநாயகரது சான்றுரை [ப: 3379]

குழுக்களுக்கான உறுப்பினர்கள் நியமனம் [ப: 3379]

ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர்கள் நியமனம் [ப: 3392]

பொருளாதார நெருக்கடிக்குப் பின்னர் வறுமையில் ஏற்பட்ட மாற்றங்கள் பற்றிய கருத்தரங்கு [ப: 3392]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 3394-3406]

தனி அறிவித்தல் மூல வினா:

தற்போதைய அரசாங்கத்தின் வலுசக்தி உற்பத்திக் கொள்கை [ப: 3406]

மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹவினது சொந்த விளக்கம் [ப: 3413]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட இருபத்தாறாம் நாள்]:

[தலைப்புக்கள் 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி)] – குழுவில் ஆராயப்பட்டது

மூன்றாம்முறை மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 3417-3616]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate [Col. 3379]

Nomination of Members for Committees [Col. 3379]

Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection: Nomination of Members [Col. 3392]

Seminar on Post-Economic Crisis Poverty Dynamics [Col. 3392]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 3394-3406]

QUESTION BY PRIVATE NOTICE:

Power Generation Policy of the Present Government [Col. 3406]

PERSONAL EXPLANATION BY HON. MAHINDA JAYASINGHE [Col. 3413]

APPROPRIATION BILL, 2025 - [Twenty-sixth Allotted Day]:

Considered in Committee - [Heads 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (Finance, Planning and Economic Development)]

Read the Third time, and passed as amended [Cols. 3417-3616]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 මාර්තු 21 වන සිකුරාදා
2025 மார்ச் 21, வெள்ளிக்கிழமை
Friday, 21st March, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2025 මාර්තු 20 දින "දේශීය ආදායම් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

II

කාරක සභා සඳහා සාමාජිකයන් නම් කිරීම
குழுக்களுக்கான உறுப்பினர்கள் நியமனம்
NOMINATION OF MEMBERS FOR COMMITTEES

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුව විසින් 2025 මාර්තු 19 දින සම්මත කරන ලද යෝජනා සහ 2025 මාර්තු 20 දින තේරීම් කාරක සභාවේ අනුමතිය ප්‍රකාරව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා, පහත සඳහන් විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභාවලට සහ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාවලට නම් කරන ලද සාමාජික මන්ත්‍රීවරයන්ගේ නාම ලේඛන භාෂාත්‍රයෙන්ම මම සභාගත* කරමි.

- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව;
- රජයේ මුදල් පිළිබඳ කාරක සභාව;
- ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව;
- ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව;
- ගෘහ්‍ය කාරක සභාව;
- ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව;
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව;
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව;
- ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව;
- මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව;
- උසස් නිලතල පිළිබඳ කාරක සභාව;
- පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව;
- මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව;
- කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව; සහ
- බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව

** සභාමේසය මත තබන ලද නාමලේඛනය:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப்பட்டியல்:*
** List of names tabled:*

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு
COMMITTEE ON PARLIAMENTARY BUSINESS

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115හි විධිවිධාන පරිදි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்
The Hon. Rauff Hakeem, Attorney-at-Law

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව
அரசாங்க நிதி பற்றிய குழு
COMMITTEE ON PUBLIC FINANCE

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121හි විධිවිධාන පරිදි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
ගරු අජිත් අගලකඩ මහතා
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු සුනිල් රාජපක්ෂ මහතා
ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා

மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்
மாண்புமிகு அஜித் அகலகட
மாண்புமிகு எம்.கே. எம். அஸ்லம்
மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து
மாண்புமிகு சுனில் ராஜபக்ஷ
மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி

The Hon. Rauff Hakeem, Attorney-at-Law
The Hon. Ajith Agalakada
The Hon. M.K.M. Aslam
The Hon. Chithral Fernando, Attorney-at-Law
The Hon. Sunil Rajapaksha
The Hon. Champika Hettiarachchi

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව
சட்டவாக்க நிலையியற் குழு
LEGISLATIVE STANDING COMMITTEE

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113හි විධිවිධාන පරිදි ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா
மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்
மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ
மாண்புமிகு அர்கம் இல்யாஸ்
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே
மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து
மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்
மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்

The Hon. Faiszer Musthapha, PC
The Hon. Amirthanathan Adaikkalanathan
The Hon. (Dr.) Nihal Abeysinghe
The Hon. Arkam Ilyas
The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law
The Hon. Chithral Fernando, Attorney-at-Law
The Hon. Bhagya Sri Herath, Attorney-at-Law
The Hon. M. Nizam Kariapper, PC

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව
நிலையியற் கட்டளைகள் பற்றிய குழு
COMMITTEE ON STANDING ORDERS

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 116හි විධිවිධාන පරිදි ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු අනුර කරුණාතිලක මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු නීතිඥ සරත් කුමාර මහතා
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

மாண்புமிகு அனுர கருணாதிலக்க
மாண்புமிகு இம்ரான் மஹ்ரூப்
மாண்புமிகு சமிந்த விஜேசிறி
மாண்புமிகு சட்டத்தரணி சரத் குமார
மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா

The Hon. Anura Karunathilaka
The Hon. Imran Maharoof
The Hon. Chaminda Wijesiri
The Hon. Sarath Kumara, Attorney-at-Law
The Hon. (Dr.) S. Sri Bavanandarajah

ගෘහ්‍ය කාරක සභාව
சபைக் குழு
HOUSE COMMITTEE

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 117හි විධිවිධාන පරිදි ගෘහ්‍ය කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු වසන්ත පියතිස්ස මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
ගරු නන්දන පත්මකුමාර මහතා

மாண்புமிகு வசந்த பியதிஸ்ஸ
மாண்புமிகு திலிப் வெதஆரச்சி
மாண்புமிகு ஜே.சீ. அலவத்துவல
மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா
மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன
மாண்புமிகு கிங்ஸ் நெல்சன்

மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத
மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை
மாண்புமிகு நந்தன பத்மகுமார

The Hon. Wasantha Piyathissa
The Hon. Dilip Wedaarachchi
The Hon. J.C. Alawathuwala
The Hon. K. Sujith Sanjaya Perera
The Hon. (Mrs.) Rohini Kumari Wijerathna
The Hon. Kins Nelson
The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law
The Hon. M.S. Uthumalebbe
The Hon. Nandana Pathmakumara

ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව
ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழு
COMMITTEE ON ETHICS AND PRIVILEGES

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන පරිදි ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු වසන්ත පියතිස්ස මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා
ගරු දීප්ති වාසලගේ මහත්මිය

மாண்புமிகு வசந்த பியதிஸ்ஸ
மாண்புமிகு அஜித் பீ. பெரேரா
மாண்புமிகு அநுராத ஜயரத்ன
மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்
மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்
மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி
மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி
மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்
மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா
மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார
மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே

The Hon. Wasantha Piyathissa
The Hon. Ajith P. Perera
The Hon. Anuradha Jayaratne, Attorney-at-Law
The Hon. Amirthanathan Adaikkalanathan
The Hon. G.G. Ponnambalam
The Hon. Lakshman Nipuna Arachchi
The Hon. Hesha Withanage Ankumbura Arachchi
The Hon. Gnanamuththu Srineshan
The Hon. Aboobucker Athambawa
The Hon. (Prof.) Sena Nanayakkara
The Hon. (Mrs.) Deepthi Wasalage

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
அரசாங்க கணக்குகள் பற்றிய குழு
COMMITTEE ON PUBLIC ACCOUNTS

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119හි විධිවිධාන පරිදි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු වාමර සම්පත් දසනායක මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
ගරු ටී.කේ. ජයසුන්දර මහතා
ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
ගරු චානක මාදුගොඩ මහතා

மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்
மாண்புமிகு கபீர் ஹஷீம்
மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்
மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன
மாண்புமிகு ஜே.சீ. அலவத்துவல
மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க
மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி
மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன
மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்
மாண்புமிகு அஜந்த கம்மெத்தெகே
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ
மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர
மாண்புமிகு எம். ஏ. எம். தாஹிர்
மாண்புமிகு சானக மாதுகொட

The Hon. Sundaralingam Pradeep
The Hon. Kabir Hashim
The Hon. (Dr.) M.L.A.M. Hizbullah
The Hon. Rohitha Abeygunawardhana
The Hon. J.C. Alawathuwala
The Hon. Chamara Sampath Dasanayake
The Hon. Hector Appuhamy
The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana
The Hon. Kaveenthiran Kodeeswaran
The Hon. Ajantha Gammeddage
The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law
The Hon. T.K. Jayasundara
The Hon. M.A.M. Thahir
The Hon. Chanaka Madugoda

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு
COMMITTEE ON PUBLIC ENTERPRISES

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120හි විධිවිධාන පරිදි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු මනෝ ගනේසන් මහතා
ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
ගරු ඩී.වී. චානක මහතා
ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු එස්.එම්. මරික්කාර් මහතා
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
ගරු දිලිත් ජයවීර මහතා
ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු දිනේෂ් හේමන්ත මහතා

[ගරු කථානායකතුමා]

மாண்புமிகு மனோ கணேசன்
மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ
மாண்புமிகு டி.வீ. சானக
மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன
மாண்புமிகு நலின் பண்டார ஜயமஹ
மாண்புமிகு எஸ்.எம். மரிக்கார்
மாண்புமிகு சமிந்த விஜேசிறி
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி
மாண்புமிகு திலித் ஜயவீர
மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க
மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்
மாண்புமிகு தினேஷ் ஹேமந்த

The Hon. Mano Ganesan
The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law
The Hon. D. V. Chanaka
The Hon. Anuradha Jayaratne, Attorney-at-Law
The Hon. Nalin Bandara Jayamaha
The Hon. S.M. Marikkar
The Hon. Chaminda Wijesiri
The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law
The Hon. Dilith Jayaweera
The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga
The Hon. (Dr.) Pathmanathan Sathiyalingam
The Hon. Dinesh Hemantha

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව
வழிவகைகள் பற்றிய குழு
COMMITTEE ON WAYS AND MEANS

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124හි විධිවිධාන පරිදි ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
ගරු රෝහණ බණ්ඩාර මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු දිලිත් ජයවීර මහතා
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

மாண்புமிகு அசோக சபுமல் ரன்வல
மாண்புமிகு மனோ கணேசன்
மாண்புமிகு அஜித் பீ. பெரேரா
மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ
மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க
மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா
மாண்புமிகு ரோஹண பண்டார
மாண்புமிகு சத்துர கலப்பத்தி
மாண்புமிகு திலித் ஜயவீர
மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்
மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே

The Hon. Asoka Sapumal Ranwala
The Hon. Mano Ganesan
The Hon. Ajith P. Perera
The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law
The Hon. Chamara Sampath Dasanayake
The Hon. K. Sujith Sanjaya Perera
The Hon. Rohana Bandara
The Hon. Chathura Galappaththi
The Hon. Dilith Jayaweera
The Hon. (Dr.) Sellaththamby Thilaganathan
The Hon. (Dr.) Nandana Millagala
The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව
பொது மனுக்கள் பற்றிய குழு
COMMITTEE ON PUBLIC PETITIONS

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125හි විධිවිධාන පරිදි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු උපාලි සමරසිංහ මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු වරුණ ලියනගේ මහතා
ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
ගරු චමින්ද ලලිත් කුමාර මහතා
ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
ගරු චානක මාදුගොඩ මහතා
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු ජගත් විතාන මහතා

மாண்புமிகு உபாலி சமரசிங்ஹ
மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன
மாண்புமிகு திலிப் வெதஆரச்சி
மாண்புமிகு கே. காதர் மஸ்தான்
மாண்புமிகு இம்ரான் மஹ்ரூப்
மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன
மாண்புமிகு வருண லியனகே
மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம
மாண்புமிகு சமிந்த லலித் குமார
மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்
மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ
மாண்புமிகு சானக மாதுகொட
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ
மாண்புமிகு ஜகத் விதான

The Hon. Upali Samarasingha
The Hon. Rohitha Abeygunawardhana
The Hon. Dilip Wedaarachchi
The Hon. K. Kader Masthan
The Hon. Imran Maharoof
The Hon. (Mrs.) Rohini Kumari Wijerathna
The Hon. Waruna Liyanage
The Hon. U.P. Abeywickrama, Attorney-at-Law
The Hon. Chaminda Lalith Kumara
The Hon. M.A.M. Thahir
The Hon. (Dr.) Sandaruwan Madarasinghe
The Hon. Chanaka Madugoda
The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law
The Hon. Jagath Vithana

උසස් නිලතල පිළිබඳ කාරක සභාව
உயர் பதவிகள் பற்றிய குழு
COMMITTEE ON HIGH POSTS

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127හි විධිවිධාන පරිදි උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු වසන්ත සමරසිංහ මහතා
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்
மாண்புமிகு வசந்த சமரசிங்ஹ
மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த
மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே
மாண்புமிகு றிஸாட் பதியுதீன்
மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா
மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர
மாண்புமிகு கே. காதர் மஸ்தான்
மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே
மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்

The Hon. Ramalingam Chandrasekar
The Hon. Wasantha Samarasinghe
The Hon. (Dr.) Anil Jayantha
The Hon. (Dr.) Upali Pannilage
The Hon. Rishad Bathiudeen
The Hon. Faiszer Musthapha, PC
The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law
The Hon. K. Kader Masthan
The Hon. Kathiravelu Shanmugam Kugathasan
The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law
The Hon. M. Nizam Kariapper, PC

පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව
பின்வரிசைக் குழு
BACKBENCHER COMMITTEE

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 129හි විධිවිධාන පරිදි පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු බී. ආරියවංශ මහතා
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු චානක මාදුගොඩ මහතා
ගරු සුරංග රත්නායක මහතා
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා

மாண்புமிகு பி. ஆரியவங்ஷ
மாண்புமிகு லசித் பாஷண கமகே
மாண்புமிகு சத்துர கலப்பத்தி
மாண்புமிகு சானக மாதுகொட
மாண்புமிகு சுரங்க ரத்நாயக்க
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ
மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்

The Hon. B. Ariyawansha
The Hon. Lasith Bhashana Gamage
The Hon. Chathura Galappaththi
The Hon. Chanaka Madugoda
The Hon. Suranga Rathnayaka
The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law
The Hon. (Dr.) Elayathamby Srinath

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
MINISTERIAL CONSULTATIVE COMMITTEES

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධානවල කුමක් සඳහන් වුවද 2025 මාර්තු මස 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

1. මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
   ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
   ගරු සුරංග රත්නායක මහතා

2. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
   ගරු ඉම්රාන් මහරූෆ් මහතා
   ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

3. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
   ගරු ඩී.වී. චානක මහතා
   ගරු කේ. කාදර් මස්තාන් මහතා
   ගරු එම්.එස්. උවුමාලෙබ්බේ මහතා
   ගරු දිලිත් ජයවීර මහතා

4. **විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු ජේ.සී. අලවතුවල මහතා
   ගරු චමින්ද විජේසිරි මහතා
   ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
   ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

5. **වාරිමාර්ග, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
   ගරු කේ. කාදර් මස්තාන් මහතා
   ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
   ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
   ගරු තුරෙරාසා රවිකරන් මහතා

6. **කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු රිසාඩ් බදියුදීන් මහතා

7. **ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු රිසාඩ් බදියුදීන් මහතා
   ගරු චාමර සම්පත් දසනායක මහතා
   ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
   ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

[ගරු කථානායකතුමා]

8. වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු බී. ආරියවංශ මහතා
ගරු ජගත් විතාන මහතා

9. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

10. කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

11. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු මනෝ ගනේසන් මහතා

12. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

13. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු මනෝ ගනේසන් මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

14. විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා

15. බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

16. කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු තුරෛරාසා රවිකරන් මහතා

17. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

1. **නිති, තිට්ටමිටල් මහා පොරුලාතාර අභිවිරුත්ති අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු චට්ටත්තරණි අර්ජූන සුජීව සේනසිංහ
මාණ්බුමිකු කතිරවේලු චණ්මුකම් කුකතාසන්
මාණ්බුමිකු සුරංග රත්නායක්ක

2. **කල්වි, උයර් කල්වි මහා තොළිර්කල්වි අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු (කලානිති) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ්
මාණ්බුමිකු ඉම්රාන් මහ්රූප්
මාණ්බුමිකු ඥානමුත්තු ශ්‍රීනේසන්

3. **කමත්තොළිල්, කාල්නටෛ වළංකළ්, කාණි මහා නීර්ප්පාසන අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු ටී.වී. සානක
මාණ්බුමිකු කේ. කාදර් මස්තාන්
මාණ්බුමිකු එම්.එස්. උතුමාලෙප්පෙ
මාණ්බුමිකු තිලිත් ජයවීර

4. **වෙළිනාට්ටලුවල්කළ්, වෙළිනාට්ටු වේලෛවාය්ප්පු මහා චුර්‍රුලා අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු ජේ.සී. අලවත්තුවල
මාණ්බුමිකු සමින්ත විජේසිරි
මාණ්බුමිකු එම්.ඒ.එම්. තාහිර්
මාණ්බුමිකු සනාතිපති චට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්

5. **කටර්ප්පොළිල්, නීරියල් මහා චුම් කටල් වළංකළ් අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු (කලානිති) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ්
මාණ්බුමිකු කේ. කාදර් මස්තාන්
මාණ්බුමිකු අමිර්තනාතන් අටෛක්කලනාතන්
මාණ්බුමිකු එම්.ඒ.එම්. තාහිර්
මාණ්බුමිකු තුරෛරාසා රවිකරන්

6. **කෛත්තොළිල් මහා තොළිල් මුයර්සියාණ්මෛ අපිවිරුත්ති අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු රිසාට් පතියුතීන්

7. **පෝක්කුවරත්තු, නෙටුංචාලෛකළ්, තුරෛමුකංකළ් මහා චිවිල් විමාන සේවෛකළ් අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණපුමිකු රිසාට් පතියුතීන්
මාණ්බුමිකු චාමර චම්පත් තසනායක්ක
මාණ්බුමිකු චට්ටත්තරණි (තිරුමති) චමින්තිරාණි කිරිඑල්ලේ
මාණ්බුමිකු සනාතිපති චට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්

8. **පෙරුන්තෝට්ට මහා චමූක උට්කට්ටමෛප්පු වසතිකළ් අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු පී. ආරියවංෂ
මාණ්බුමිකු ජගත් විතාන

9. **චුකාතාරම් මහා වෙකුසන ඌටක අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා
මාණ්බුමිකු (වෛත්තියර්) පත්මනාතන් චත්තියලිංගම්

10. **තොළිල් අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු චිවඥානම් චිරීතරන්

11. **නකර අපිවිරුත්ති, නිර්මාණිප්පු මහා වීටමෛප්පු අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු මනෝ කණේසන්

12. **පොතු නිරුවාක, මාකාණ චපෛකළ් මහා උළ්ළූරාට්චි අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු කවීන්තිරන් කෝඩීස්වරන්
මාණ්බුමිකු සනාතිපති චට්ටත්තරණි එම්. නිසාම් කාරියප්පර්

13. **කිරාමිය අපිවිරුත්ති, චමූකප් පාතුකාප්පු මහා චමූක වළුවූට්ටුකෛ අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු මනෝ කණේසන්
මාණ්බුමිකු (වෛත්තියර්) පත්මනාතන් චත්තියලිංගම්
මාණ්බුමිකු ඉස්මායිල් මුත්තු මොහම්මට්

14. **විඥාන මහා තොළිල්නුට්ප අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු ඥානමුත්තු ශ්‍රීනේසන්
මාණ්බුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා

15. **වළුචක්ති අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු චට්ටත්තරණි අර්ජූන සුජීව සේනසිංහ

16. **මකළිර් මහා චිරුවර් අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු තුරෛරාසා රවිකරන්

17. **පුත්තචාසන, චමය මහා කලාචාර අලුවල්කළ් පත්‍රිය අමෛච්චාර් ආලෝසනෛක් කුළු**
මාණ්බුමිකු ඉස්මායිල් මුත්තු මොහම්මට්

1. Ministerial Consultative Committee on Finance, Planning and Economic Development
   The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law
   The Hon. Kathiravelu Shanmugam Kugathasan
   The Hon. Suranga Rathnayaka

2. Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education
   The Hon. (Dr.) M.L.A.M. Hizbullah
   The Hon. Imran Maharoof
   The Hon. Gnanamuththu Srineshan

3. Ministerial Consultative Committee on Agriculture, Livestock, Land and Irrigation
   The Hon. D. V. Chanaka
   The Hon. K. Kader Masthan
   The Hon. M.S. Uthumalebbe
   The Hon. Dilith Jayaweera

4. Ministerial Consultative Committee on Foreign Affairs, Foreign Employment and Tourism
   The Hon. J.C. Alawathuwala
   The Hon. Chaminda Wijesiri
   The Hon. M.A.M. Thahir
   The Hon. M. Nizam Kariapper, PC

5. Ministerial Consultative Committee on Fisheries, Aquatic and Ocean Resources
   The Hon. (Dr.) M.L.A.M. Hizbullah
   The Hon. K. Kader Masthan
   The Hon. Amirthanathan Adaikkalanathan
   The Hon. M.A.M. Thahir
   The Hon. Thurairasa Ravikaran

6. Ministerial Consultative Committee on Industry and Entrepreneurship Development
   The Hon. Rishad Bathiudeen

7. Ministerial Consultative Committee on Transport, Highways, Ports and Civil Aviation
   The Hon. Rishad Bathiudeen
   The Hon. Chamara Sampath Dasanayake
   The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney at Law
   The Hon. M. Nizam Kariapper, PC

8. Ministerial Consultative Committee on Plantation and Community Infrastructure
   The Hon. B. Ariyawansha
   The Hon. Jagath Vithana

9. Ministerial Consultative Committee on Health and Mass Media
   The Hon. (Dr.) Ramanathan Archchuna
   The Hon. (Dr.) Pathmanathan Sathiyalingam

10. Ministerial Consultative Committee on Labour
    The Hon. Sivagnanam Shritharan

11. Ministerial Consultative Committee on Urban Development, Construction and Housing
    The Hon. Mano Ganesan

12. Ministerial Consultative Committee on Public Administration, Provincial Councils and Local Government
    The Hon. Kaveenthiran Kodeeswaran
    The Hon. M. Nizam Kariapper, PC

13. Ministerial Consultative Committee on Rural Development, Social Security and Community Empowerment
    The Hon. Mano Ganesan
    The Hon. (Dr.) Pathmanathan Sathiyalingam
    The Hon. Ismail Muththu Mohamed

14. Ministerial Consultative Committee on Science and Technology
    The Hon. Gnanamuththu Srineshan
    The Hon. (Dr.) Ramanathan Archchuna

15. Ministerial Consultative Committee on Energy
    The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law

16. Ministerial Consultative Committee on Women and Child Affairs
    The Hon. Thurairasa Ravikaran

17. Ministerial Consultative Committee on Buddhasasana, Religious and Cultural Affairs
    The Hon. Ismail Muththu Mohamed

III

රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම

ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர்கள் நியமனம்

SECTORAL OVERSIGHT COMMITTEE ON GOVERNANCE, JUSTICE AND CIVIL PROTECTION: NOMINATION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111හි විධිවිධාන සහ 2025 මාර්තු 17 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙහි සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
ගරු වන්දන සූරියආරච්චි මහතා
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

IV

"ආර්ථික අර්බුදයෙන් පසු දරිද්‍රතාවයේ වෙනස්වීම්" මැයෙන් පවත්වන සම්මන්ත්‍රණය

பொருளாதார நெருக்கடிக்குப் பின்னர் வறுமையில் ஏற்பட்ட மாற்றங்கள் பற்றிய கருத்தரங்கு

SEMINAR ON POST- ECONOMIC CRISIS POVERTY DYNAMICS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ආර්ථික අර්බුදයෙන් පසු දරිද්‍රතාවයේ වෙනස්වීම්" යන මැයෙන් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් සංවිධානය කර ඇති සම්මන්ත්‍රණයක් 2025 මාර්තු 21 වන සිකුරාදා, එනම් අද දින පෙ.ව. 11.00 සිට ප.ව. 1.00 දක්වා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 05හිදී

[ගරු කථානායකතුමා]

පැවැත්වීමට නියමිතය. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙම සම්මන්ත්‍රණයට සහභාගි වීමට හැකි බව දැනුම් දෙමි.

V

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்

MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 මාර්තු 21 සිකුරාදා, එනම් අද දින පූර්ව භාග 11.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

Hon. Speaker, on behalf of the Hon. Prime Minister and Minister of Education, Higher Education and Vocational Education, I present the Annual Report of the Vocational Training Authority of Sri Lanka for the year 2023.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්

மனுக்கள்

PETITIONS

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කොළඹ 05, කිරුළපන, ශ්‍රී සිද්ධාර්ථ පාර, අංක 60 සී දරන ස්ථානයෙහි පදිංචි සුමංගල රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු වරුණ ලියනගේ මහතා - [සභා ගර්භය තුළ නැත.]

ගරු චමින්ද ලලිත් කුමාර මහතා - [සභා ගර්භය තුළ නැත.]

ගරු රජීවන් ජෙයවන්දමූර්ති මහතා - [සභා ගර්භය තුළ නැත.]

ගරු කංචන වැලිපිටිය මහතා
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

ගරු කථානායකතුමනි, දේවාලගම, ජීවාන, බෙරුවල, බී/16 එම් ඩී දරන ස්ථානයෙහි පදිංචි ටී.එම්.එස්. තෙන්නකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)

Hon. Speaker, I present the following petitions:

1. A petition from Mr. G. Godage of No. 184/1, Edirisinghe Mawatha, Kithulampitiya, Uluwitike, Galle;
2. A petition from Mrs. P.R. Malani Swarnalatha of No. 421, Dimbulgamuwa, Madawala Ulpatha; and
3 A petition from Mrs. W.M. Lalitha Kumarihami of No. 398/7, Sanju Uyana, Naiwala Road, Udugampola, Gampaha.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

2024 ජනාධිපතිවරණයේ සිට මුදල් නෝට්ටු හා කාසි නිෂ්පාදනය: විස්තර

2024 ஜனாதிபதித் தேர்தலுக்குப் பிறகு நாணயத் தாள்கள் மற்றும் நாணயக் குற்றிகளின் உற்பத்தி: விபரம்

PRODUCTION OF CURRENCY NOTES AND COINS SINCE PRESIDENTIAL ELECTION, 2024: DETAILS

127/2024

1. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 වර්ෂයේ දී පැවති ජනාධිපතිවරණයෙන් පසුව මේ දක්වා මුද්‍රණය කරන ලද නෝට්ටු හා කාසිවල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් කොපමණද;

(ii) එම නෝට්ටු හා කාසි මුද්‍රණය කරන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iii) මුද්‍රණය කරන ලද නෝට්ටු සහ කාසි වර්ග සහ එම එක් එක් නෝට්ටු හා කාසි වර්ගයෙන් මුද්‍රණය කරන ලද වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒවා මුද්‍රණය කිරීමට හේතු කවරේද;

(v) එම නෝට්ටු හා කාසි මුද්‍රණය කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද;

(vi) එම නෝට්ටු හා කාසි භාවිත කර ඇති අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉදිරියේදී නෝට්ටු හා කාසි මුද්‍රණය කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, එම නෝට්ටු හා කාසිවල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024ஆம் ஆண்டு நடைபெற்ற சனாதிபதித் தேர்தலுக்குப் பின்னர், இதுவரையில் அச்சிடப்பட்டுள்ள நாணயத் தாள்கள் மற்றும் வார்க்கப்பட்டுள்ள நாணயக் குற்றிகளின் பெறுமதி இலங்கை ரூபாயில் எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி நாணயத் தாள்கள் மற்றும் நாணயக் குற்றிகள் அச்சிடப்பட்ட சந்தர்ப்பங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) அச்சிடப்பட்ட நாணயத் தாள்கள் மற்றும் வார்க்கப்பட்ட நாணயக் குற்றிகளின் வகைகள் மற்றும் அந்த ஒவ்வொரு நாணயத் தாள் மற்றும் நாணயக் குற்றி வகைகளில் அச்சிடப்பட்ட பெறுமதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) அவ்வாறு அச்சிடப்படுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி நாணயத் தாள்கள் மற்றும் நாணயக் குற்றிகளை அச்சிடுவதற்கான அங்கீகாரம் யாரால் வழங்கப்பட்டது என்பதையும்;

(vi) மேற்படி நாணயத் தாள்கள் மற்றும் நாணயக் குற்றிகள் உபயோகிக்கப்பட்ட நோக்கங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) எதிர்காலத்தில் நாணயத் தாள்கள் மற்றும் நாணயக் குற்றிகளை அச்சிட எதிர்பார்க்கப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த நாணயத் தாள்கள் மற்றும் நாணயக் குற்றிகளின் பெறுமதி எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the value of the currency notes printed and coins minted after the Presidential Election held in the year 2024 up until now in Sri Lankan Rupees;

(ii) the number of times it has been done;

(iii) the denominations of the currency notes and the coins so produced and the total values of the currency notes and coins produced, separately;

(iv) the reasons for producing such notes and coins;

(v) by whom the approval was given for producing notes and coins referred to above; and

(vi) the purpose for which such notes and coins have been used?

(b) Will he also inform this House -

(i) whether currency notes and coins are expected to be produced in future; and

(ii) if so, what the values of such notes and coins are going to be?

(c) If not, why?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2024 ජනාධිපතිවරණයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 වර්ෂයට අදාළව වාර්ෂික මුදල් නෝට්ටු 2024.10.20 දින ලබා දෙන ලද අතර, ඊට අදාළ තොග කිසිවක් මෙතෙක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබී නොමැත. ඒ අනුව 2024 වර්ෂයේ ජනාධිපතිවරණයේ සිට මේ දක්වා මුද්‍රණය කර නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

නමුත් සාමාන්‍යයෙන් මුදල් මුද්‍රණය කිරීමට, ඇණවුම් කිරීමට හේතුවක් ලෙස 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 44 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය සහ අධිකාරී බලය මහ බැංකුව සතුය. මහ බැංකු පනතේ 52 වන වගන්තිය ප්‍රකාරව, සංසරණය සඳහා කවර හෝ හේතුවක් නිසා යෝග්‍ය නොවන සියලුම ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි මහ බැංකුව විසින් සංසරණයෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර, ප්‍රායෝගිකව හැකි ඉක්මනින් සහ පාලක

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

මණ්ඩලය විසින් තත් කාර්ය සම්බන්ධයෙන් සාදනු ලබන රීතිවලට යටත්ව, ඒ මුදල් නෝට්ටු සහ කාසි වෙනුවට භාවිතයට යෝග්‍ය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි හුවමාරු කිරීම මණින් ප්‍රතියෝජනය කරනු ලැබිය යුතුය.

තවද, මහ බැංකු පනතේ 54 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සැපයුම නිතිපතා පවත්වාගෙන යෑම තහවුරු කිරීම පිණිස මහ බැංකුව විසින් ව්‍යවහාර මුදල් තොග ඇති කර පරිපාලනය කරනු ලැබිය යුතුය.

මහජන ඉල්ලුම සපුරාලීමට සහ නිසි ගුණාත්මක බවින් යුතු නෝට්ටු හා කාසි අවශ්‍ය ප්‍රමාණයෙන් පවත්වා ගැනීම තහවුරු කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම් සපුරාලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නෝට්ටු මුද්‍රණය සහ කාසි නිකුත් කිරීම සිදු කරනු ලැබේ.

(v) මහ බැංකු පනතේ 44 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය සහ අධිකාරී බලය මහ බැංකුව සතුය. මහ බැංකු පනතේ 50 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවහාර මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සහ කාසි නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සිටින වෙනත් යම් තැනැත්තකු සමඟ ගිවිසුම්වලට ඇතුළත් වීමට මහ බැංකුවට අධිකාරී බලය තිබිය යුතුය.

ඒ අනුව, මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ සහ කාසි නිකුත් කිරීමේ ඇණවුම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබේ.

(vi) මහ බැංකු පනතේ 47(1) වගන්තිය ප්‍රකාරව මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලුම ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි ඕනෑම වටිනාකමක් ගෙවීම සඳහා ශ්‍රී ලංකාවේ වලංගු මුදල් පවතී.

එමෙන්ම, මහ බැංකු පනතේ 47(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ වාසිකයන් අතර සිදු කරන හෝ පියවනු ලබන යම් ගනුදෙනුවක්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ කාර්යය සඳහා මහ බැංකුව විසින් අන්‍යාකාරයෙන් බලය ලබා දී ඇත්නම් මිස, ශ්‍රී ලංකා රුපියල්වලින්ම සිදු කළ යුතුය. ඒ අනුව, උක්ත ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට අනුකූලව දේශීය ගනුදෙනු සඳහා වන මහජන ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි භාවිත කරනු ලැබේ.

(ආ) (i) ඔව්.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කරමින් ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම මත පදනම්ව අනාගතයේදී ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිෂ්පාදනය කර නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන අඛණ්ඩ ඉල්ලුම් පුරෝකථනය - demand forecast එක - තක්සේරු කිරීම් මත පදනම්ව එසේ අවශ්‍ය කරන මුදල් නෝට්ටු ප්‍රමාණය සහ කාසි ප්‍රමාණය නිකුත් කිරීම සඳහා වාර්ෂික හෝ අර්ධ වාර්ෂික පදනම මත ඇණවුම් ලබාදෙනු ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. 2025 මාර්තු 05වැනි දා වන විට ඔබතුමන්ලා ණය ලබාගෙන තිබෙනවා, රුපියල් බිලියන 3,775ක් භාණ්ඩාගාර බිල්පත් ලෙසත්, රුපියල් බිලියන 1,063ක් භාණ්ඩාගාර බැඳුම්කර ලෙසත්, ලෝක බැංකුවෙන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින්, ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවෙන් තව ඩොලර් මිලියන 1,084ක් වශයෙන්. සමස්තය ගත්තාම, රුපියල් බිලියන 5,156ක විතර ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒ කියන්නේ, කෝටි 515,600ක්. මම අහන්න කැමැතියි ඔබතුමාගෙන්, මේ අරගෙන තිබෙන ණය පාවිච්චි කරලා තිබෙන්නේ මොනවාටද කියලා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(*மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும*)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කර තිබෙන මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න යොමු කරනවා නම් හොඳයි. ඔබතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ කාසි සහ නෝට්ටු මුද්‍රණය කිරීම සම්බන්ධයෙන්. නමුත් ඔබතුමාගේ දැනගැනීම පිණිස මම ඒ අතුරු ප්‍රශ්නයට උත්තරයක් දෙන්නම්. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, ණය පියවීම සඳහා වර්තමාන රජය ඉතාම කාර්යක්ෂමව, අරපිරිමැස්මෙන් රටේ ජනතාවගේ මුදල් පරිහරණය කරමින්, අවශ්‍ය දේවල්වලට නිසි වෙලාවට යොදවමින් සහ නිසි ආයෝජන කරන නිසා අපේ වෙළෙඳ පොළට පැමිණ ණය ගැනීමේ අවශ්‍යතාව අඩුවෙලා තිබෙනවා.

ඒ අඩුවීමට සාපේක්ෂව රටේ බැංකු පොලී අනුපාතයත් පහළ ගිහිල්ලා තිබෙන බව අපට පෙනෙනවා. ඒ අනුව, ඔබතුමා අහපු ප්‍රශ්නයට සවිස්තර විස්තරයක් අවශ්‍ය නම් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් යොමු කරන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම දැක්කා, Booking.com සම්බන්ධව විජිත හේරත් මැතිතුමා කර තිබුණු ප්‍රකාශයක්. විශේෂයෙන්ම Booking.com එක ලංකාවෙන් ඉවත් විය යුතුයි, ඔවුන් tax ගෙවන්නේ නැත්නම් ඒක කළ යුතුයි කියලා ප්‍රකාශයක් කර තිබුණා. ලංකාවට සියයට 40ක් සංචාරකයෝ එන්නේ Booking.com හරහා බව මම කියන්න කැමැතියි. මේ වාගේ ඒවාට tax එකක්, ආදායමක් එකතු කරගන්න වැඩ පිළිවෙළක් තවම ඔබතුමන්ලා හදලා නැහැ. රටේ එහෙම නීතියක් නැහැ. ඒ නිසා මේ වාගේ ප්‍රකාශයක් කිරීම තුළ අපට ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා. විශේෂයෙන් අපේ රටට ඩොලර් බිලියන 2,900ක් විතර එන්නේ ඇඟලුම් කර්මාන්තයෙන්, USAවලින්. එක පැත්තකින් මේ වාගේ ප්‍රකාශ තුළින් ඩොනල්ඩ් ට්‍රම්ප් වාගේ ජනාධිපතිවරයෙකුට තව අවස්ථාවක් දෙන්න තමයි මේ හදන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මුදල් අමාත්‍යාංශයත් එක්ක කථා කරලාද මේ ප්‍රකාශය කර තිබෙන්නේ? එහෙම නැත්නම්, Booking.com එක ඉවත් කරනවා කියන එකෙන් අදහස් වෙන්නේ මොකක්ද කියලා කරුණාකර අපට කියන්න.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් අහන්නේ අතුරු ප්‍රශ්නයක් නේ. අතුරු ප්‍රශ්න අසද්දී මුල් ප්‍රශ්නයට අදාළ වන කාරණයක් ගැන තමයි ඇසිය යුත්තේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මුදල් නෝට්ටු සම්බන්ධයෙන් මුල් ප්‍රශ්නයේදී අහලා, අතුරු ප්‍රශ්නවලදී වෙනත් දෙයක් ගැන අහනවා. කරුණාකර මේ

කාරණාව හොඳට තේරුම් ගන්න. ඔබතුමා ප්‍රශ්නයක් ඇසුවාට පස්සේ අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන් වන්නේ මුල් ප්‍රශ්නයට අදාළ වන කාරණාවක් සම්බන්ධයෙන් විතරයි. ඔබතුමා කරුණාකර ස්ථාවර නියෝග කියවන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අපි අවුරුදු ගණනක් තිස්සේ කථා කරලා සිදු කරන කාරණයක් තිබෙනවා. සාමාන්‍යයෙන් *-[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න; මට පොඩ්ඩක් කියන්න දෙන්න. සාමාන්‍යයෙන් ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා කැමැත්ත දක්වනවා නම් අපට ඒ අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, නැහැ. ඔබතුමා මේ කාරණය මතක තියා ගන්න. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මුදල් අමාත්‍යාංශය සම්බන්ධයෙන් අපි මතු කරන කරුණු කාරණා ඔබතුමා සීමා කරන්න යන්න එපා. නියෝජ්‍ය ඇමතිතුමාට පුළුවන් කැමති නම් ඒකට උත්තර දෙන්න. මම ඇසූ පළමුවැනි අතුරු ප්‍රශ්නයට එතුමා උත්තරයක් දුන්නා; වෙනත් ප්‍රශ්නයක් විධියට ඒ ගැන අහන්න කියලා කිව්වා. මම ඒක ඇහුවා. දෙවැනි අතුරු ප්‍රශ්නයත් ඒ ආකාරයට අහන්න කියනවා නම් ඒකත් මම එහෙම අහන්නම්.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කරපු මේ අතුරු ප්‍රශ්නය සාකච්ඡා කරපු මුල් ප්‍රශ්නයට කිසිසේත්ම අදාළ නැහැ. එතුමාට ඒ ප්‍රශ්නයට පිළිතුරක් අවශ්‍ය නම් වෙනම ප්‍රශ්නයක් විධියට ගරු අමාත්‍යවරයා වෙත එය ඉදිරිපත් කරන්න කියන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, මෙහෙම කරන්න, අරහෙම කරන්න කියලා කථානායකවරයාට නියෝග දෙන්න මන්ත්‍රීවරයකුට හෝ කාට හෝ පුළුවන්කම තිබෙනවාද, මේ පාර්ලිමේන්තුවේ? එහෙම තිබෙන්නේ මොන ස්ථාවර නියෝග යටතේද? එහෙම කරන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පැහැදිලිවම බැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම දන්නා සම්ප්‍රදාය අනුව කොහෙත්ම නැහැ. කථානායකතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන් ඕනෑම කෙනෙකුට. කථානායකතුමාට නියෝග දෙන්න කාටවත් අයිතියක් නැහැ. කථානායකතුමාගේ ගෞරවය කියන්නේ මේ පාර්ලිමේන්තුවේ ගෞරවය. ඒක ආරක්ෂා කර ගන්න අපි කවුරුත් බැඳිලා ඉන්නවා. මොකක්ද මේ හැමදාම කරන විහිළුව? *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමා,*-[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මට කථා කරන්න පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට නියෝග දෙන්න ආවේ නැහැ. මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, මම ඔබතුමාට නියෝග දෙන්න ආවේ නැහැ කියන එක. නියෝග දෙන්න එන උදවිය ඉන්නේ ඒ පැත්තේ. ඒ නිසා ඒක ඒ අයට කියන්නය කියන්න. මම ඔබතුමාට නියෝග දෙන්න ආවේ නැහැ.

මම කිව්වේ සාමාන්‍ය සම්ප්‍රදායයි. ගරු කථානායකතුමනි, මෙතුමන්ලා විපක්ෂයේ සිටියදී මේ පාර්ලිමේන්තුවේ ඇමතිවරුන්ගෙන් ඇති වෙන්න ප්‍රශ්න අහපු අය, උදේ ඉඳලා රෑ වනකල්. ආණ්ඩුවට ආවාම දැන් තමයි එතුමන්ලාට අමාරුව තේරිලා තිබෙන්නේ. වෙනදා ඔබතුමන්ලා අහන්නේ නැද්ද, ප්‍රශ්න? මට කියන්නකෝ. *[බාධා කිරීමක්]* හරියටම ඇහුවා ද? *[බාධා කිරීමක්]* දැන් ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගත්තාම තමයි ප්‍රශ්න අහන එකේ අමාරුව තේරෙන්නේ. වෙනදා උදේම ඇවිල්ලා මරන්න වාගේ ප්‍රශ්න අහනවා. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, එතුමා කැමැති නම් ඒකට උත්තර දෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මේ තරම් සාධාරණව කටයුතු කරන කථානායකවරයෙක් කවදාවත් දැක්කාද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

හරි, හරි. අපි දැකලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඇති වෙන්න දැකලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මෙහෙම නම් දැකලා නැහැ. *[බාධා කිරීමක්]*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

කථානායකවරු "Order, please!" කියලා කියනවා හීනෙන් දැක්කත් වාඩි වෙච්ච අය, ඔබතුමන්ලා. නමටත් බයයි. වමල් රාජපක්ෂ කථානායකතුමා හිටපු කාලයේ බයයි, ඔබතුමන්ලා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

කවුද? *[බාධා කිරීම්]* වමල් මහත්මයා එක්ක අපි හැප්පුණු විධිය මම කියන්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම දන්නවා නේ, ඉතින්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේක අහගන්න. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 33 (1)හි මෙසේ සඳහන්ව තිබෙනවා:

"...එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මඟින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැහැනිමින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය."

ඒ අනුවයි කටයුතු කළ යුත්තේ.

ප්‍රශ්න අංක 2 -191/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ආරක්ෂිතව ගර්භිණීභාවය අවසන් කිරීම පිළිබඳ යෝජිත නීති: ක්‍රියාත්මක කිරීම
பாதுகாப்பான முறையில் கர்ப்பத்தைக் கலைத்தல் தொடர்பான உத்தேச சட்டங்கள்: நடைமுறைப்படுத்தல்
PROPOSED LAWS FOR SAFE MEDICAL TERMINATION OF PREGNANCY: IMPLEMENTATION

221/2024

3. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "ආරක්ෂිතව ගර්භිණීභාවය අවසන් කිරීම" සම්බන්ධයෙන් 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ඉදිරිපත් කරන ලද පොරොන්දුව ඉටු කිරීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සම්බන්ධ නව නීති කඩිනමින් සම්පාදනය කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "பாதுகாப்பான முறையில் கர்ப்பத்தைக் கலைத்தல்" தொடர்பாக 2012ஆம் ஆண்டு இலங்கையின் சட்ட ஆணைக்குழுவால் சமர்ப்பிக்கப்பட்ட முன்மொழிவுகளை நடைமுறைப் படுத்துவதற்கு, "வளமான நாடு-அழகான வாழ்க்கை" என்ற கொள்கைப் பிரகடனத்தினூடாக முன்வைக்கப்பட்ட வாக்குறுதியை நிறைவேற் றுவதற்கு இன்றளவில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

(ii) அது தொடர்பான புதிய சட்டங்களைத் துரிதமாக இயற்றுகின்ற நடவடிக்கையில் தாமதம் ஏற்படுவதற்கான காரணங்கள் யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) the steps that have been taken so far to fulfill the promise made through "A Thriving Nation - A Beautiful Life" Policy Statement to implement the proposals submitted by the Law Commission of Sri Lanka in 2012 regarding "Safe Medical Termination of Pregnancy"; and

(ii) reasons for the delay in expediting the formulation of new laws regarding this matter?

(b) If not, why?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law- Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද "Safe Medical Termination of Pregnancy" සම්බන්ධ යෝජනාව මඟින් වෛද්‍ය හේතූන් මත ගර්භිණීභාවය අවසන් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ දැනට පවතින විධිවිධාන පුළුල් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, එවකට සිටි අධිකරණ අමාත්‍යවරයා විසින් ඊට අදාළව කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර කැබිනට් මණ්ඩලය විසින් 2017.01.17 වන දින හිටපු ජනාධිපතිතුමා විසින් ලබා දී ඇති නිර්ණ්ෂණවලට යටත්ව ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත. එකී නිර්ණ්ෂණවල සඳහන් වන්නේ යෝජිත පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එන්නේ නම්, ඊට පෙර අදාළ ආගමික නායකයින් සමඟ සාකච්ඡා කළ යුතු බවයි. ඒ අනුව ආගමික නායකයින් සමඟ පැවැති සාකච්ඡාවලදී බහුතරය ඊට විරුද්ධ වීම මත 2017 වර්ෂයේදී එකී ප්‍රයත්නය අසාර්ථක වී ඇත.

ඉන් අනතුරුව නැවත 2022 වර්ෂයේදී මේ සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශයේදී සාකච්ඡා පවත්වා ඇති අතර, එහිදී 1995 වර්ෂයේදී හා 2017 වර්ෂයේදී ද මෙම නීතිය සමාජගත කිරීමට දරන ලද ප්‍රයත්නයන් සහ එම ප්‍රයත්නයන් අසාර්ථක වී ඇති ආකාරය පිළිබඳව අවධානය යොමු කරන ලදී. තවද, මෙම සාකච්ඡාවේදී නැවතත් වෛද්‍ය හේතු මත ගර්භිණීභාවය අවසන් කිරීම සම්බන්ධව දැනට පවතින විධිවිධාන පුළුල් කිරීම සම්බන්ධව නීති හඳුන්වා දීම පිළිබඳව සාකච්ඡා පවත්වා ඇති අතර, එලෙස පුළුල් කිරීමෙන් වන සමාජයීය බලපෑම සම්බන්ධව ද විශේෂ අවධානයක් යොමු

කර ඇත. තවද, එලෙස පුළුල් කළ හැකි අවස්ථා විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාව ද එම සාකච්ඡා වලදී අවධානය යොමු කර ඇත. එමෙන්ම මෙම නීතිය පුළුල් කිරීමෙන් සිදු වන සමාජයීය බලපෑම සාධාරණීකරණය කිරීම සඳහා අදාළ වන දත්ත හා නිර්දේශ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කිරීමට තීරණය වී ඇත.

මෙම යෝජනාව වරින් වර පැවැති රජයන් නීතියට හඳුන්වා දීමට ගත් උත්සාහය විවිධ ආගමික නායකයන් හා සමාජයෙන් එල්ල වුණු විරෝධතා හේතුවෙන් අසාර්ථක වී ඇති බව අප පිළිගත යුතුය. මෙවැනි නීතියක් ගෙන එය පුළුල් ජනතා කතිකාවක් තුළින් ඉදිරිපත් කළ යුතු බවද නිරීක්ෂණය කරමි. මෙකී නිර්දේශ 2012දී එවකට පැවැති නීති කොමිෂන් සභා වාර්තාවක් මත පදනම්ව ඇති අතර, වර්තමානයේ වෙනත් රටවල නීති හා අන්තර්ජාතිකව පිළිගත් ක්‍රමවේදයන්ගේ වෙනස්වීම් තිබිය හැකිය. එබැවින්, මේ සම්බන්ධව නැවත නීති කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමටත්, ඒ අනුව ඉදිරි පියවර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

(ii) පුරා වසර 30ක කාලයක් තුළ විවිධ අවස්ථාවන්හිදී මෙම නීතිය සමාජගත කිරීමට දරන ප්‍රයත්න ව්‍යර්ථ වී ඇති පසුබිමක නැවත මෙම සංවේදී නීති රාමුව අප ජීවත් වන සමාජයට හඳුන්වා දීමට ගනු ලබන ප්‍රයත්නය, සමාජයීය ප්‍රතිරෝධය අවම වන පරිදි පුළුල්ව විශ්ලේෂණය කොට හඳුන්වා දීමේ අවශ්‍යතාව පෙන්වා දෙමි.

(ආ) අදාළ නොවේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. වෛද්‍ය හේතු මත, ඉතා බරපතළ විකෘතිභාවයන්ට කලලය ලක් වෙලා තිබෙන අවස්ථාවක, ඒ පිළිබඳව විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සනාථ වුණු අවස්ථාවක ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු ඉතිහාසය නිවැරැදියි.

පසුගිය මැතිවරණයේදී ඔබතුමන්ලා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මේ කාරණය ඇතුළත් කරලා තිබුණා. ඒක ඉතා නිවැරදියි. ඒක කළ යුතු දෙයක්. සාමාන්‍යයෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කරන්නේ, කරන දේවල්. ජනතාව දැන් ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් ලබා දීලා අනුමැතිය දීලා තිබෙනවා. විධායක ජනාධිපතිවරයෙකුත් මේ ප්‍රතිපත්ති මාලාව මත පත් කරලා තිබෙනවා. සාමාන්‍ය සිහිබුද්ධිය තිබෙන ඕනෑම කෙනෙකුට තේරෙනවා, මේවා සරල කාරණා නොවෙයි කියලා. කලලය බරපතළ ලෙස විකෘති වුණු බවට වෛද්‍යවරුන් සනාථ කළ පසු ඒ සම්බන්ධව ගත යුතු පියවර කුමක් ද කියන ප්‍රශ්නය මතු වෙනවා. ලෝකයේ ශිෂ්ටාචාරයක් තිබුණු හැම රටක්ම මේ සම්බන්ධව පියවර ගෙන තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ සංවේදී බව පිළිබඳ කාරණය මේ ප්‍රශ්නය යොමු කරන කොටත් මම දන්නවා. මේ ප්‍රශ්නය යොමු කරන එක ප්‍රශ්නයක් බවත් මම දන්නවා. මේකට උත්තර දෙන එක ඔබතුමාට ප්‍රශ්නයක් බවත් මම දන්නවා. හැබැයි, දැන් තිබෙන්නේ බෙහෙවින් ශක්තිමත් ආණ්ඩුවක්. ඔබතුමා කියන ආකාරයට, මේ වාගේ ආණ්ඩුවක් ඉතිහාසයේම තිබුණේ නැහැ. මේ තරම් ශක්තිමත් ආණ්ඩුවක් තිබිලාත් ආපහු සැරයක් වටේ යවන්නේ නැතිව, පක්ෂ, විපක්ෂ භේදයක් නැතිව නිර්භීතව මේ සම්බන්ධව ලෝකයේ පිළිගත්තු ප්‍රමිතීන්ට අනුකූලව ව්‍යවස්ථාදායකය වන අපි මේ නීතිය සම්මත කරමු. මේවා ගැන තවදුරටත් හතර වටෙන් විමසන්න යන එක නොවෙයි කරන්න තිබෙන්නේ. මේවා තමන්ට අදාළ නොවනවාය කියා හිතන, තමන්ගේ හුදු මතවාද තුළ පමණක් ඉන්න පුද්ගලයන් හෝ කණ්ඩායම්වල මතයට වඩා, මේ ශිෂ්ටාචාරය තුළ දැනට ක්‍රියාත්මක වන, ප්‍රායෝගික ජීවිතයේ භාවිතයන් තුළ මුහුණ දෙන මේ කාරණා පිළිබඳව අපි මීට වඩා සෘජුව සහ නිර්භීතව පියවර ගත යුතුව තිබෙනවා.

නැත්නම් වෙන්නේ මේ අවුරුදු පහ අවසානයේදීත් මේ වැඩේ කෙරෙන්නේ නැති එක. මේ පිළිබඳව මම ඇමතිකම් දරපු ආණ්ඩුත් උත්සාහ කළා. ඒත් අසමත් වුණා. ඊට කලින් තිබුණු ආණ්ඩුත් උත්සාහ කළා; අසමත් වුණා. හැබැයි, මේක කළ යුතු දෙයක්. ශිෂ්ට සම්පන්න සමාජයක් පිළිබඳව විශ්වාස කරන, වෛද්‍ය විද්‍යාව විශ්වාස කරන, විද්‍යාව මත පදනම් වෙලා තීරණ ගන්න සමාජයක අනිවාර්යයෙන්ම තිබිය යුතු සංශෝධනයක් මෙය. ඒ නිසා මේ ශක්තිමත් ආණ්ඩුව තුළ මේ පියවර කඩිනමින් ගන්නට ඔබතුමා කටයුතු කළ යුතුව තිබෙනවා.

මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දමනකොටම දන්නවා නේ මේක කරන්න ඕනෑ කියලා. මෙහිදී මම 2012 ගැන සඳහන් කිරීම හරිම වැදගත්. මොකද, 2012දී තමයි සවිස්තරාත්මකව මේ ප්‍රශ්නය ආවේ. එතකොට විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් වුණා. ඔබතුමන්ලා ජනාධිපතිවරණයේ ප්‍රතිපත්ති සම්පාදනයේදී, ඒ විස්තරාත්මක වාර්තාව කෙරෙහි අවධානය යොමු කරලා, ජනතාව ඒක ඉහළින්ම අනුමත කරලා තිබෙද්දී තවදුරටත් වටේ යන්නේ මොකද?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඒ ප්‍රශ්නයත් ඉතා වැදගත්, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි. ඒ වාගේම ඔබතුමා මෙම පනතට දක්වන සහයෝගය මා අගය කොට සලකනවා. මොකද, ඒක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන දෙයක්. අපි පැහැදිලි කළේ ගරු මන්ත්‍රීතුමනි, මේක වටේ යනවා හෝ නොකර ඉන්න හදනවා කියන එක නොවෙයි. නමුත්, යමක් ක්‍රියාත්මක කිරීමේදී ඒකට සුදුසු ක්‍රමයක් තිබෙනවා. ඒක ඇමතිවරයෙකුට තනියම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මම පැහැදිලිව කියනවා, තව අවුරුදු හතරහමාරක් අපේ රජයට තිබෙනවා. මේ වැඩේ කරන්න අපට අවුරුදු හතරහමාරක් අවශ්‍ය වෙන්නේ නැහැ. නමුත්, ඒක කිරීමේදී ගත යුතු පියවර තිබෙනවා. අන්න ඒ පියවර ගනිමින් ඉන්නවා කියලායි අපි කියන්නේ. එහෙම නැතුව, මේක නොකර ඉන්නවා කියන්නේ නැහැ. මට සෑහෙන්න විශ්වාසයි, ඔබතුමා දක්වන ඒ සහයෝගයත් එක්ක අපට මේක කරගන්න පුළුවන් කියලා. මේ පිළිබඳව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා. ඔව්, අපි කරනවා. ඒක කිරීමේ ක්‍රමය පිළිබඳව තමයි ගරු මන්ත්‍රීතුමනි, මා කිව්වේ. එහෙම නැතුව වටේ යෑමක් නොවෙයි.

මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, ඔබතුමා ඒ දක්වපු සහයෝගයට. අපි ඒක කඩිනමින් කරලා ඔබතුමාත්, ගරු සභාවත් දැනුවත් කරන්න පුළුවන්. ඒකට අපි වැඩි කාලයක් ගන්නේ නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, මේ හා සම්බන්ධව අද වෙන තුරු ඔබතුමාගේ අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර මොනවාද?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷண நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මේ සම්බන්ධයෙන් සහ තවත් අණපනත්, නීති 60 ගණනකට අධික ප්‍රමාණයක් අපි අධ්‍යයනය කරමින් ඉන්නවා. මේ සියල්ල අධ්‍යයනය කරන ලැයිස්තුවේ පවතින්නේ. මේවාට ක්‍රම හදන එක තමයි දැන් අපි කරන්නේ. ඔබතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නත් කලින් Law Commission එකට මේක යොමු කරන්න ඕනෑ කියන තීන්දුව අපි ගත්තා. මේ මාස හතරහමාරේදී කරන්න පුළුවන් වුණේ ඒ ටික විතරයි. නමුත් මම තරයේ කියනවා, අපට තව අවුරුදු හතරහමාරක් තිබෙනවා. ඒ අවුරුදු හතරහමාරේදී අපි මේක නොකළොත් විවේචන එල්ල කරන්න ඔබතුමාට හැකියාව තිබෙනවා. මම කලින් කිව්වා වාගේ මේක කරන ක්‍රමය හොයා ගැනීම සහ ඒ ක්‍රමය ක්‍රියාත්මක කිරීම මිසක්, අපි මේක නොකර ඉන්න හදනවා නොවෙයි. මොකද, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් කරන යෝජනා අපි ක්‍රියාත්මක කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -294/2024- (1), ගරු රවුෆ් හකීම් මහතා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -305/2024- (1), ගරු රවී කරුණානායක මහතා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 2 -191/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

වර්තමාන රජයේ බලශක්ති උත්පාදන ප්‍රතිපත්තිය
தற்போதைய அரசாங்கத்தின் வலுசக்தி உற்பத்திக் கொள்கை
POWER GENERATION POLICY OF PRESENT GOVERNMENT

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, පුනර්ජනනීය ක්ෂේත්‍රය තුළ සූර්ය විදුලිබල උත්පාදනය සඳහා හිමිවන්නේ සුවිශේෂ ස්ථානයක්. පරිසර හිතකාමී - green energy - සහ අඩු වියදම් බලශක්ති උත්පාදක වන නිසා අප ද රටක් හැටියට සූර්ය විදුලිබල උත්පාදනයට වැඩි වශයෙන් යොමු වී තිබෙනවා, රටක් හැටියට. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 165වන පිටුවේ සඳහන්ව ඇති පරිදි සූර්ය බලය මඟින් මෙගාවොට් 2,000ක් ක්‍රමිකව ජාතික පද්ධතියට එක් කර ගැනීමට යෝජනා කර තිබුණත්, ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව ආණ්ඩුව ගනු ලබන ඇතැම් තීන්දු තීරණ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයට පටහැනි වෙනවා. එබැවින්, වත්මන් රජයේ බලශක්ති සැලැස්මේ ප්‍රතිපත්තිය පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරනවා.

01. මෙරට පවතින ගල් අඟුරු සහ ඩීසල් බලාගාර සංඛ්‍යාව කොපමණද? ඒ මොනවාද? එහි රජයට අයත් නොවන ඩීසල් බලාගාර තිබෙද? ඒ කවරේද? ඒ බලාගාරවල හිමිකරුවන් කවුරුන්ද? දැනට ඩීසල්, ගල් අඟුරු, ජල විදුලිය සහ සූර්ය ශක්තිය මඟින් විදුලි ඒකකයක් නිපදවීමට රජය වැය කරන මුදල කොපමණද? පෞද්ගලික බලාගාර

මඟින් විදුලි ඒකකයක් මිලදී ගැනීම සඳහා රජය වැය කරන මුදල කොපමණද? එක් එක් බලාගාර මඟින් විවිධ විදුලි උත්පාදන ප්‍රභේද ඔස්සේ ජාතික විදුලි පද්ධතියට එකතු කරනු ලබන මෙගාවොට් ප්‍රමාණය වෙන් වෙන්ව දක්වන්නේද?

02. ලංකා විදුලිබල මණ්ඩලයේ දීර්ඝ කාලීන විදුලි ජනන සැලැස්ම අනුව සූර්ය විදුලි ව්‍යාපෘති මඟින් කොපමණ විදුලි ධාරිතාවක් නිපදවිය යුතු බවට පුරෝකථනය කර ඇත්ද? එයින් කොපමණ ධාරිතාවක් මේ වන විට සපුරා තිබේද? එය ප්‍රතිශතාත්මකව කොපමණද? තවත් කොපමණ විදුලි ධාරිතාවක් ජාතික පද්ධතිය වෙත එකතු කළ යුතුව ඇත්ද? එය සපුරාලීම උදෙසා රජය ගෙන ඇති පියවර කවරේද?

03. මෙරට ස්ථාපිත සමස්ත සූර්ය විදුලිබල ධාරිතාවන්ගෙන් පියස මත සහ පොළොව මත ඉදි කළ සූර්ය විදුලි ව්‍යාපෘති මඟින් ලබා දී ඇති දායකත්වය වෙන් වෙන් වශයෙන් කොපමණද? පියස මත ඉදි කළ සූර්ය විදුලි ව්‍යාපෘති මඟින් මිලදී ගන්නා විදුලිය සඳහා දැනට ගෙවන මිල ගණන් කොපමණද? එම මිල ගණන් ඉදිරියේදී සංශෝධනය කිරීමට රජය අපේක්ෂා කරන්නේද? ඒ කෙසේද? මිල ගණන් සංශෝධනය මඟින් මෙම කර්මාන්තය සඳහා ඇති කරනු ලබන අහිතකර බලපෑම් සඳහා රජය ලබා දෙන විසඳුම් මොනවාද?

04. පොළොව මත සවි කරන සූර්ය විදුලි ව්‍යාපෘති මඟින් මිලදී ගන්නා විදුලිය සඳහා දැනට ගෙවන මිල ගණන් කවරේද? එම මිල තවදුරටත් කප්පාදු කිරීමට රජය අපේක්ෂා කරන්නේද? එසේ නම්, එය මෙම ව්‍යාපෘති සඳහා යොමු වන නව ආයෝජකයින් අධෛර්යවත් කිරීමක් නොවේද? මෙරට පොළොව මත සවි කරන සූර්ය විදුලි ව්‍යාපෘති කොපමණ සංඛ්‍යාවක් දැනට ක්‍රියාත්මක වන්නේද? තවත් මෙවැනි නව ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට ඉල්ලුම්පත් යොමු වී ඇත්ද? ඒ කොපමණද? එම නව ව්‍යාපෘති යෝජනා අතුරින් කොපමණ සංඛ්‍යාවකට සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව සහ විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත්ද? නොඑසේ නම්, ඒ සඳහා අනුමැතිය ලබා දීම ප්‍රමාද වීමට හේතු වූ කරුණු කාරණා කවරේද?

05. 2025 මාර්තු 17වැනි දා නිකුත් කළ චක්‍රලේඛ අංක 2025/GM/08/DCC මඟින් සූර්ය විදුලිබල පද්ධති ජාලා සීමා කිරීමට කටයුතු කර ඇත. එය සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘති සඳහා යොමුවීම අඩපණ කිරීමක් නොවන්නේද? එසේම, එය පොසිල ඉන්ධන පදනම් වූ විදුලි ජනනය, අඩු මිලැති සූර්ය හා සුළං ප්‍රමුඛ පුනර්ජනනීය ප්‍රභව වෙත යොමු කරන බවට වූ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය පිළිබඳ ජනතාවගේ විශ්වාසය මුළුමනින්ම බිඳ දැමීමක් නොවේද? රජයේ ප්‍රයත්නය ඩීසල් විදුලි බලාගාර මඟින් විදුලි උත්පාදනය ප්‍රවර්ධනයටද? නොඑසේ නම්, සූර්ය විදුලිබල උත්පාදනය කිරීමේ කර්මාන්තය තවදුරටත් ඉහළ නංවාලීම සඳහා වත්මන් රජය විසින් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

06. විදුලිබල පනත කඩිනමින් සංශෝධනය කිරීමට හෝ නව පනතක් ගෙන ඒමට රජය කටයුතු කරන්නේද? එසේ නම් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ කුමන කාල වකවානුකවද කියන එකත් මම අහන්න කැමැතියි.

ස්තුතියි.

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, මා වෙත ඊයේ අපර භාගයේ ලැබුණු මෙම ප්‍රශ්න පත්‍රය තුළ ප්‍රශ්න 6ක් අසා තිබුණා. එය, ප්‍රශ්න අංක 01 යටතේ ප්‍රශ්න 8ක්ද, ප්‍රශ්න අංක 02 යටතේ ප්‍රශ්න 5ක්ද, ප්‍රශ්න අංක 03 යටතේ ප්‍රශ්න 5ක්ද, ප්‍රශ්න අංක 04 යටතේ ප්‍රශ්න 8ක්ද, ප්‍රශ්න අංක 05 යටතේ ප්‍රශ්න 4ක්ද, ප්‍රශ්න අංක 06 යටතේ ප්‍රශ්න 2ක්ද වශයෙන් අනු ප්‍රශ්න 32කින් සමන්විත ප්‍රශ්න පත්තරයක්.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2)හි සඳහන් මෙම කොටස මම පළමුවෙන්ම උපුටා දක්වන්නම්:

> "……..එසේ වුවද, ප්‍රශ්න අවසානයේදී පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම්දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂයක නායකවරයකු විසින් අසනු ලැබිය හැකිය."

එසේ ප්‍රතිපාදන ඇතත්, ඉහත පරිදි ප්‍රශ්න ඉදිරිපත් කිරීම ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීමක් ලෙස මාහට හැඟී යයි. ඒ වාගේම මාගේ අමාත්‍යාංශයට අමතරව ඒ යටතේ ඇති ආයතන කිහිපයකින් විශාල තොරතුරු ප්‍රමාණයක් ලබාගන්න ඕනෑ. මේවාට "ඔව්", "නැහැ", "බැහැ" කියන උත්තර නොවෙයි තිබෙන්නේ. මේවායේ දත්ත තිබෙන්නේ. ආයතනවල නම් ගම්, ඉලක්කම් වැනි දත්ත ගොඩක් තිබෙනවා. ඒ නිසා, ඉතා කෙටි කාලයක් තුළ තොරතුරු ප්‍රමාණයක් ලබාගෙන අමාත්‍යවරයා විසින් පරීක්ෂා කර, අනුමත කර, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපහසු බව කරුණාවෙන් වුවද දැනුම් දීමට සිදුව ඇත. මොකද, ඊයේ දවසේ පැය තුනක විතර කාලයක් තමයි ඒ සඳහා අපට ලැබුණේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර මෙම ස්ථාවර නියෝග එහි අරමුණට නොගැළපෙන ලෙස එසේ යොදා නොගන්නා ලෙස අදාළ පාර්ශ්වයන්ට උපදෙස් ලබා දෙන මෙන් කරුණිකව ඉල්ලා සිටිමි. ඒ වාගේම, මෙම ප්‍රශ්නය නිවැරදි ස්ථාවර නියෝග යටතේ ඉදිරිපත් කරන්නේ නම් එයට පිළිතුරු ලබාදීමට කිසිම පැකිළීමක් නොමැති බවද දන්වා සිටිනවා. එම නිසා මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් හෝ මට ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම අවධාරණය කරන්න කැමැතියි, ස්ථාවර නියෝගවලට අනුකූලවයි මම මේ ප්‍රශ්න මාලාව ඉදිරිපත් කළේ කියන එක. මම මේ ප්‍රශ්න මාලාව ඉදිරිපත් කළේ පුනර්ජනනීය බලශක්තිය වෙනුවෙන්. එහෙම නැතුව ඩීසල් විදුලිබල මාෆියාව ආරක්ෂා කරන්නට නොවෙයි. ඉතින් මේක බරපතළ ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි. මොකද, සුනිත්‍ය බලශක්තිය පිළිබඳව, සූර්ය බලශක්තිය පිළිබඳව රජයේ ප්‍රතිපත්තිමය මතයත්, ඒ කියන්නේ මැතිවරණ කාලයේ දේශපාලනය කරනකොට කියූ මතයත්, දිගටම අපේ මතයත් එකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විනාඩියක් දෙන්න, පැහැදිලි කිරීමකට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අද පෙර වරු 11.00ට තිබෙනවා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක්. එම කාරක සභාවට මම මේ ප්‍රශ්නය යොමු කරනවා. අපි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව එතැනදී එකඟතාවකට එමු, කොහොමද වෙන්නේ කියලා. ගරු විපක්ෂ නායකතුමනි, දැන් ඒ කාරණාව ඉවරයි. අපි ඊළඟ කාරණාවට යමු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ, ගරු විපක්ෂ නායකතුමා. ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමා ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නය මම බැලුවා. ඒකේ ප්‍රශ්න 32ක් තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
විපක්ෂ නායකතුමාට පොඩි ඉඩක් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඔය වැඩේ කරන්න එපා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන ප්‍රශ්න 32ක් තිබෙනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ, - *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
විපක්ෂ නායකලා එක්කෙනායි ඉන්නේ. [බාධා කිරීම්] ඔය වැඩේ වැරදියි, ගරු කථානායකතුමනි. මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීම්] විපක්ෂ නායකතුමාට කථා කරන්න බැරිද? එතුමාට විනාඩියක් දෙන්න. මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මීට පෙර අවස්ථාවල ස්ථාවර නියෝග 27(2) යටතේ විපක්ෂයෙන් අහපු ප්‍රශ්න කිහිපයක් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම ඒ ප්‍රශ්න අහපු අයගේ නම් කියන්න යන්නේ නැහැ. එම ප්‍රශ්න ස්ථාවර නියෝග 27(2) යටතේ විපක්ෂයෙන් මීට පෙර අහලා තිබෙන ප්‍රශ්න. ඒ ප්‍රශ්න අහපු ක්‍රමවේදයේත්, මම ප්‍රශ්න අහපු ක්‍රමවේදයේත් කිසිම වෙනසක් නැහැ. ඒ නිසා මම ඒ ප්‍රශ්න සභාගත කළා. මම ඔබතුමාටත් මේවායේ පිටපත් එවන්නම්. මම මේ ප්‍රශ්නය අහපු ක්‍රමයේ කිසිම වරදක් නැහැ. අහලා තිබෙන ප්‍රශ්නයේ ලොකුම ගැටලුව වෙලා තිබෙන්නේ, මේකෙදි ඩීසල් මාෆියාව රැක ගන්නවාද, එහෙම නැත්නම් පුනර්ජනනීය සූර්ය බලශක්තියට අපි මුල් තැන දෙනවාද කියන එකයි. ඕක තමයි ගැටලුව. ඒ නිසා කරුණාකරලා මේ ප්‍රශ්නයට උත්තරයක් ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා පැහැදිලි අදහසක් ඉදිරිපත් කළා, Parliamentary Business Committee එකේදී මේ පිළිබඳව සාකච්ඡා කරමු කියලා. පළමුවැනි කරුණ මේකයි. මා මෙය කෙටියෙන් කියන්න කැමැතියි. ස්ථාවර නියෝග 27(2) යටතේ මේ ගැන පැහැදිලිව කියා තිබෙනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ කියන්නේ, Questions for Oral Answers අවසානයේ දී පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම්දීමකින් අනතුරුව අහන්න පුළුවන් කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, ස්ථාවර නියෝග 27(2) යටතේ වන ප්‍රශ්නයකට පිළිතුරු දීමට ඇමතිවරයාට පැය 12ක කාලයක්වත් හරියට ලැබෙන්නේ නැහැ කියලා. මේක පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්න අහන්න පක්ෂ නායකයින්ට තිබෙන අවස්ථාවක්. ඔබතුමා බලන්න, මේ ප්‍රශ්නය දිහා. ඇමතිවරුන් ඇමතිකම් කරන්නත් ඕනෑ. ඒ අයගේ අමාත්‍යාංශවල වැඩ කරන්නත් ඕනෑ. මේවාට නිවැරදිව තොරතුරු ලබා දෙන්නත් ඕනෑ. ඔබතුමා කල්පනා කරලා බලන්න, අය වැය විවාදයක් පැවැත්වෙන කාලයකදී මෙතරම් තොරතුරු ප්‍රමාණයක් ස්ථාවර නියෝග 27(2) යටතේ වන ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ලබා දෙන්න පුළුවන් මොන අමාත්‍යාංශයටද කියලා. ගරු කථානායකතුමනි, ඕනෑම පක්ෂ නායකයෙකුට, ඕනෑම මන්ත්‍රීවරයෙකුට මේ ප්‍රශ්නය වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් ලෙස අහන්න පුළුවන්. එහෙම නැත්නම් අදාළ උපදේශක කාරක සභාවේදී හෝ අහන්න පුළුවන්. ඒ නිසා මේ අවස්ථාව මේ විධියට පාවිච්චි කළොත් මොකක්ද වෙන්නේ ? ඔබතුමා එදා අවසර දුන්නා නේ, ඒක ඔබතුමාගේ බලය. ඔබතුමාට කලින් practice එක පිළිබඳව වාගේම, කලින් practice එකේ අඩු පාඩු තිබෙනවා නම් ඒවා නිවැරදි කරන්නත් බලය තිබෙනවා.

ඊයේ තවත් පක්ෂ නායකවරයෙක් ප්‍රශ්නයක් අහලා තිබුණා. ගරු කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙනවා අවශ්‍ය වුණොත් පක්ෂ නායක රැස්වීමේදී ඒක ඉදිරිපත් කරන්න. එතැනත් ප්‍රශ්න 12ක් තිබෙනවා. ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම ඇහුවා, ඒකට තොරතුරු එකතු කරන්න කොච්චර වෙලාවක් ගතවුණාද කියලා. පැය හතරක් ගත වෙලා තිබෙනවා. මේ මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙන වෙලාව. ගරු කථානායකතුමනි, ඇමතිවරුන්ට රට පාලනය කරන්නත් තිබෙනවා, පාර්ලිමේන්තුවට වග කියන්නත් තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබතුමන්ලා මේ ගැන කල්පනා කරලා බලන්න. අද අහලා තිබෙන මේ ප්‍රශ්නය ඕනෑම අවස්ථාවක අහන්න පුළුවන් එකක්. ඒක රටේ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් බව

ඇත්ත. නමුත් ඒක ඉතාම හදිසියෙන් පැය 4කදි, 5කදි උත්තර ලබා ගත යුතු ප්‍රශ්නයක්ද, නැද්ද කියලා ඔබතුමාම බලන්න. ඒ නිසා මේ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමා කිව්ව විධියට Parliamentary Business Committee එකේදී අපි කථා කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. අපි ප්‍රශ්නවලට උත්තර දෙනවා. අපට උත්තර දෙන්න බැරි ප්‍රශ්නයක් නැහැ. මොන මාෆියා එක්කද ඉන්නේ කියන එක ඔබතුමන්ලා බලන්න. ඩීසල් මාෆියාව එක්ක කවුද හිටියේ, සිගරැට් මාෆියාව එක්ක කවුද ඉන්නේ, මහ බැංකු හොරුත් එක්ක කවුද හිටියේ, අලෝසියස්ලාත් එක්ක කවුද හිටියේ කියන ඒවා ගැන කථා කරන්න අපට ඕනෑ නැහැ. අපි ඔප්පු කරලා තිබෙනවා, අපි කවුද කියන එක. ඒ ගැන අපට වහෙන් ඔරෝ කියන්න ඕනෑ නැහැ, කෙළින් කියන්න.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් කරුණාකරලා ඉල්ලා සිටින්නේ මෙයයි. ස්ථාවර නියෝග 27(2) යටතේ වන අවස්ථාව විරුද්ධ පක්ෂයේ පක්ෂ නායකයින්ට තිබෙන අවස්ථාවක්. අපි ඒකට ගරු කරනවා. අපි එම ප්‍රශ්නවලට උත්තර දෙනවා. අපි සංඛ්‍යාලේඛන ඇසුරෙන් පෙන්නුවා, අපි කොපමණ ප්‍රශ්න ප්‍රමාණයකට උත්තර දීලා තිබෙනවාද කියලා. ගරු කථානායකතුමනි, මෙතෙක් කල් උත්තර දෙන්න කල් අරගෙන තිබෙන්නේ අතිවිශාල දත්ත ප්‍රමාණයක් ඉල්ලන ස්ථාවර නියෝග 27(2) යටතේ වන ප්‍රශ්නවලට පමණයි. අතිවිශාල දත්ත ප්‍රමාණයක් ඉල්ලන ඒවා තිබෙනවා. ඔබතුමන්ලා බලන්න, සමහර ඒවා theses.

සමහර ඒවා PhD thesis level එකේ තිබෙන්නේ. සමහර ඒවා Diploma level එකේ තිබෙන්නේ. ඔබතුමා මේවා බලන්න. අපට අමාත්‍යාංශවල කටයුතු කරන්නත් තිබෙනවා. මීට කලින් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අහන අවස්ථාව ඔබතුමන්ලා පාවිච්චි කළේ කොහොමද කියලා මම දන්නේ නැහැ. කවුරු හරි එය mis-use කළා නම් අපිත් ඒ tradition එක ගෙන යන්න අවශ්‍ය නැහැ. විපක්ෂයේ නායකතුමන්ලාගෙන් අපි ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලා ඒ අවස්ථාව හොඳින් පාවිච්චි කරන්න, ඒ වාගේම මේකේ තිබෙන සාරයත්, අරමුණත් තේරුම් අරගෙන කටයුතු කරමු කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇත්තවශයෙන්ම මේ ප්‍රශ්න ඇසීම තුළින් අපි අපේ වගකීමයි ක්‍රියාත්මක කරන්නේ. මම එක දෙයක් කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මේ තොරතුරු, කරුණු කාරණා පිළිබඳව අලුතෙන් දත්ත එකතු කිරීමක් සිද්ධ කරන්න තිබෙනවා නම් ගරු අමාත්‍යතුමාට වැඩි කාලයක් ඉල්ලන්න පුළුවන්. ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා දන්නවා, එතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවා, මම හිතන විධියට එතුමාට අවශ්‍ය ප්‍රමාණයටම කාලය ලබා දුන්නා. මම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමාගෙන් ඇහුවේ නැහැ, කෝ උත්තරය, කෝ උත්තරය කියලා; මම එහෙම කළේ නැහැ.

ගරු කථානායකතුමනි, මම තව එක කාරණයක් කියන්න ඕනෑ, මට පොඩි අවස්ථාවක් දෙන්න. මේක අය වැය විවාදයක් පවත්වන අවස්ථාවක්. එතකොට සියලු විෂයයන් පිළිබඳව සියලු දත්ත, සියලු කරුණු කාරණා පරීශීලනය කරලා තමයි අය වැය ඉදිරිපත් කරන්නේ. ඇමතිතුමා නැඟිටලා කිව්වා නම් මට මේ ප්‍රශ්නයට පිළිතුරු සපයන්න යම් කාලයක් අවශ්‍යයි කියලා, අපි විරුද්ධ වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම ඉල්ලීමක් කරනවා, හැන්සාඩ්ගත කරන්න කියලා ඒ අහපු ප්‍රශ්න ටික. එතකොට හැමෝටම තේරෙයි, අපට එක නීතියක්, එතුමන්ලාට තව නීතියක් කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි ඊළඟ කාරණාවට යමු. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමනි, මම දැන් කිව්වා, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී මේ පිළිබඳව කථා කරමු කියලා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අහපු ප්‍රශ්නය තුළ ප්‍රශ්න 32ක් තිබෙන බව කියනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ රටේ වැදගත් ප්‍රශ්නයක් අහන්න පුළුවන්. පිටු දෙකක් තුළ අඩංගු ප්‍රශ්න ප්‍රමාණය නොවෙයි එහිදී අදාළ වෙන්නේ. ඒ විතරක් නොවෙයි. ස්ථාවර නියෝග 27 (2) යටතේ අහන්නේ එවකට රටේ තිබෙන වැදගත් ප්‍රශ්නයක්. මම ප්‍රශ්නයක් අහලා තිබෙනවා, ඩොනල්ඩ් ට්‍රම්ප් deglobalization තුළින් tariff හරහා මේ රටේ ප්‍රශ්නයක් ඇති කිරීම සම්බන්ධව. *[බාධා කිරීමක්]* ඉන්නකෝ, ප්‍රශ්නය ඉදිරිපත් කරන තෙක්. ඒ ප්‍රශ්නයට මාස දෙකකින් උත්තර දුන්නොත් මොකක්ද වෙන්නේ? අප්‍රේල් මාසයේ 01වෙනි දා ඒ tariff එක එනවා. ඉතින් ඒ සම්බන්ධව තමයි ප්‍රශ්නය තිබෙන්නේ. අමාත්‍යාංශයට උත්තරය සකස් කරන්න පැය 4ක් යනවාද, නැද්ද කියන එක අදාළ නැහැ. ඒ අමාත්‍යාංශයේ නිලධාරීන් 1,900ක් ඉන්නවා, මේවාට උත්තර දෙන්න. ඒ අය මේ සඳහා බැඳී සිටිනවා. ඉතින් මේ ප්‍රශ්නයට පිළිතුර දැනගන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, මේ කාරණය අදාළ ඔබතුමා අහන ප්‍රශ්නයට නොවෙයි, අද අහපු ප්‍රශ්නයට නේ. දැන් ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නය ගැන තමයි මේ කථා කළේ. අපි මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී කථා කරමු. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඉඳගන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා ස්ථාවර 27(2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයට පිළිතුරක් හම්බ වුණා නේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඉඳගන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔය කාරණාව ගැන මම ඔබතුමාට කිව්වා නේ, ගරු මන්ත්‍රීතුමා. මම පැහැදිලිව කිව්වා නේ ඒ ගැන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී කථා කරමු කියලා. තවත් මොනවාද කථා කරන්නේ? කරුණාකර ඔබතුමා ඉඳගන්න. මට මේ සභාවේ කටයුතු කරගෙන යන්න ඕනෑ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* අද පෙර වරු 11.00ට Parliamentary Business Committee එක රැස් වෙනවා. එතැනදී ඔය ගැන කථා කරමු.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් වශයෙන්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Parliamentary Business Committee එක අද පෙර වරු 11.00ට රැස් වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, තව පැයක් යන්නේ නැතිව එය රැස් වෙනවා. අපි එතැනදී ඔය ගැන කථා කරමු. කරුණාකර ඔබතුමා දැන් ඉඳගන්න.

පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, කම්කරු නියෝජ්‍ය අමාත්‍ය ගරු මහින්ද ජයසිංහ මහතා.

ගරු මහින්ද ජයසිංහ මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹவினது சொந்த விளக்கம்
PERSONAL EXPLANATION BY HON. MAHINDA JAYASINGHE

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේදී මට නමකුත් පටබැන්දා, "පුනරුද රාළහාමි" කියලා. මේ අවස්ථාවේදී ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් සභාව තුළ ඉන්නවා. ඒ වාගේම මාධ්‍ය ගණනාවකත් මා සම්බන්ධයෙන් මේ පිළිබඳව විවිධ විවේචන එල්ල වුණා. පසුගිය දිනක ඉඹුල්ගොඩ ප්‍රදේශයේ තිබෙන ඉඩමකට ඇතුළුවීමක් සම්බන්ධයෙන් තමයි මේ ප්‍රශ්නය මතු වුණේ. මම ඉතාම පැහැදිලිව අවධාරණය කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මම පන්සලකට බලහත්කාරයෙන් ඇතුළු වෙන්න ගියා කියලා තමයි ප්‍රවෘත්තිවල පළ වුණේ.

ගරු කථානායකතුමනි, එම ඉඩම්වලට අදාළ සියලුම පත්ඉරු මම අරගෙන තිබෙනවා. දැන් ඒවා මා සතුව තිබෙනවා. එම ඉඩම් පන්සලකට අයිති බවක් මෙම පත්ඉරු කිසිවක සඳහන් වෙන්නේ නැහැ. එම ඉඩම්වලින් කිහිපයක් පිළිබඳව විතරක් මම විස්තර කරන්නම්.

2012.03.02වැනි දා ඉඩම් ගණනාවක් අත්පත් කරගෙන තිබෙනවා. එක ඉඩමක් තිබෙනවා, ඉඹුල්ගොඩ, ඉහළ යාගොඩ, කේ.ඩී. පරාක්‍රම යාගොඩ නමැති මහත්මයාට අයිති. එම ඉඩම අත්පත් කරගෙන තිබෙන්නේ, හෝමාගම, දියගම "මහින්ද රාජපක්ෂ ස්පෝර්ට්ස් සහ ස්පිරිවුවල් ඩිවලොප්මන්ට් පවුන්ඩේෂන්" එකට. ඒකට තමයි මේ ඉඩම රුපියල් ලක්ෂ 5කට අත්පත් කරගෙන තිබෙන්නේ. පසුව ඒ ඉඩම රුපියල් ලක්ෂ 10කට විකුණලා තිබෙනවා. ඒ ගැන මම වෙනම සඳහන් කරන්නම්.

ඒ වාගේම 2012.03.02වැනි දා ඉඩම් ගණනාවක් ලියාපදිංචි කරලා තිබෙනවා. ඒ අතර එක ඉඩමක් තිබෙනවා, ඉහළ ඉඹුල්ගොඩ, අංක 317හි පදිංචි එච්.ටී. තමීර ප්‍රේමචන්ද්‍ර, එච්.පී. ප්‍රේමචන්ද්‍ර සහ එන්.එල්.එම්. ස්වර්ණලතා යන අයට අයිති.

මෙම ඉඩම අත්පත් කරගෙන තිබෙන්නේ තංගල්ල, මාතර පාර, කාල්ටන් හවුස්, නො. 96හි පදිංචි ශිරන්ති වික්‍රමසිංහ රාජපක්ෂ කියලා කෙනෙක්. ඇයගේ NIC Number එක විධියට තිබෙනවා, 535253314V. ඒත් මම බැලුවා මේ ශිරන්ති රාජපක්ෂයි, අර හැඳුනුම්පතේ දෙකේ ඒවා 8ක්ද කොහේද තිබුණු කෙනායි එක්කෙනෙක්ද කියලා. දෙකේ ඒවා 9ක් තිබුණු කෙනායි, මේ තැනැත්තියයි දෙදෙනෙක්ද කියලා මම දන්නේ නැහැ. මේ ඉඩම අත්පත් කරගෙන තිබෙනවා, රුපියල් ලක්ෂ 5කට.

ඊළඟට, මාකොළ උතුර, තැඹිලිගස්මුල්ල පදිංචි අයෙකුට අයත් තව ඉඩමක් තිබෙනවා. එම ඉඩමත් අත්පත් කරගෙන තිබෙන්නේ තංගල්ල, මාතර පාර, කාල්ටන් හවුස්, නො: 96 පදිංචි ශිරන්ති වික්‍රමසිංහ රාජපක්ෂ මහත්මිය. ඇයගේ National Identity Card Number එක හැටියටත් තිබෙන්නේ 535253314V. මේ විධියට ගරු කථානායකතුමනි, මේ ඉඩම් සියල්ලට අදාළ සියලු පත්ඉරු මා ළඟ තිබෙනවා. මා ඒ පත්ඉරු සියල්ල මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ පත්ඉරු කිසිවක සඳහන් වන්නේ නැහැ, පන්සලක හෝ ස්වාමීන් වහන්සේ කෙනෙකුගේ නමක්.

ඊළඟට ගරු කථානායකතුමනි, මේ සියලු ඉඩම් 2023.10.10වැනි දා නැවත පවරා දී තිබෙනවා, මේ පත්ඉරුවල සඳහන් වන ආකාරයට නො: 132A, එස්. ද එස්. ජයසිංහ මාවත, නුගේගොඩ පදිංචි අමිල සමරරත්න කොඩිකාර කියා මහත්මයෙකුට. ඔහුගේ National Identity Card Number එක ලෙස සඳහන් වෙන්නේ 920620035V. ප්‍රශ්නය මේකයි. මේ රුපියල් ලක්ෂ 5ට, 10ට ගත්ත ඉඩම් රුපියල් ලක්ෂ 120ට තමයි විකුණා තිබෙන්නේ. 2012දී රුපියල් ලක්ෂ 5ට ගත්ත ඉඩම අවුරුදු 11ක් ගිය තැන රුපියල් ලක්ෂ 120ට, රුපියල් ලක්ෂ 10ට ගත්ත ඉඩම රුපියල් ලක්ෂ 120ට තමයි මේ කියන අමිල සමරරත්න කොඩිකාර කියන මහත්මයාට පවරා තිබෙන්නේ.

මම තවත් ලොකු වෙලාවක් ගන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේක තමයි මේ කියපු ඉඩමේ ඇත්ත කථාව. ඒ ප්‍රදේශවාසීන්ට බරපතළ ප්‍රශ්නයක් තිබුණා, මේ ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව. මේවා කොහොමද අත්පත් කර ගත්තේ? මොකද, මා දන්නා තරමින් සමහර ඉඩම්වලට ඔප්පු ලියලා තිබෙන්නේ අරලියගහ මන්දිරයට ගෙනැල්ලායි; අරලියගහ මන්දිරය ඇතුළේ තමයි මේ ඉඩම්වල ඔප්පු ලියලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මේකෙදි මා පිළිබඳව, අපේ දේශපාලන පක්ෂය පිළිබඳව, මේ ආණ්ඩුව පිළිබඳව විවිධ විවේචන එල්ල කළා. මම එදාත් පැහැදිලි කළා, කිසිදු ලෙසකින් අපට පන්සල්වලට අතපොවන්න හෝ මැදිහත් වෙන්න කිසිදු වුවමනාවක් නැහැ කියලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ජාතික ජන බලවේගයේ කිසිවෙකුට එවැනි කිසිදු වුවමනාවක් නැහැ. නමුත්, මේ පත්ඉරුවලින් ඉතා පැහැදිලි වනවා, මේ ඉඩම් කිසිවක් සම්බන්ධයෙන් නිමිකාරිත්වයක් පන්සලකට හෝ ස්වාමීන් වහන්සේ නමකට නැහැ කියලා. බෝර්ඩ් එකක් ගහලා තිබෙනවා, එතැන බෞද්ධ මධ්‍යස්ථානයක. ඔක තමයි මේ පන්සලේ, එහෙම නැත්නම් මේ ඉඩම්වල ඇත්ත කථාව. මට අවශ්‍ය වුණේ ඒක කියන්නයි. පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේදීත්, ඒ වාගේම මාධ්‍යවලත් මේ සම්බන්ධයෙන් කථා බහ වුණා. මම ඒ මාධ්‍යවේදීන්ගෙනුත් ඉල්ලීමක් කරනවා. මම දැක්කා, අද උදේ පත්තරවල විස්තර කියවනවා. පසුගිය කාලයේ පරාජය වෙච්ච, කුජීත වෙච්ච එක දේශපාලනඥයෙකුගේ පත්තර වාර්තාවක් එක මාධ්‍යවේදියෙක් කියවද්දී විවිධ නම් පටබඳිමින් විවිධ විවේචන එල්ල කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, කෙටියෙන් කියන්න.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මේ කාරණයත් කියලා මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

මේක තමයි මේ ඉඩම්වලට අදාළ ඇත්ත කථාව. මම අපේ පොලිස්පතිතුමාගෙන් ඉල්ලා තිබෙනවා, මේ සම්බන්ධයෙන් CID විමර්ශනයක් කරන්න කියලා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරවමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට කෙටි නිවේදනයක් කරන්න අවශ්‍යයි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව අද පෙර වරු 11.00ට සම්මන්ත්‍රණයක් organize කර තිබෙනවා. ඒකේ title එක තමයි, "ආර්ථික අර්බුදයෙන් පසු දරිද්‍රතාව වෙනස් වීම" කියන එක. ඒ සම්මන්ත්‍රණය කරන්නේ මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා සහ ආචාර්ය එච්.එම්. ගුණතිලක මහතා. අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හැටියට සියලු මන්ත්‍රීවරුන්ට හැකි නම් පෙර වරු 11.00ට කමිටු කාමර අංක 05ට පැමිණෙන්න කියලා ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවධානය පිණිස මම කාරණයක් ඉදිරිපත් කරනවා. අද හදිසියේම පෙර වරු 11.00ට Parliamentary Business Committee එක කැඳවලා තිබෙනවා. මේ සභාවේදී දැන් කියැවුණා, ඇමතිවරුන්ට බොහෝ වැඩ තිබෙන නිසා එක එක වෙලාවට මේ Parliamentary Business Committee එක කැඳවන්න බැරි කථාවක්. අපේ විපක්ෂ නායකතුමාටත් අද පෙර වරු 11.00ට වැඩමුළුවක් තිබෙනවා. ඒ නිසා Parliamentary Business Committee එක ඒ වැඩමුළුවට ඉස්සෙල්ලා පවත්වන්න පුළුවන්කමක් තිබෙනවාද කියා මා දැනගන්න කැමැතියි. මොකද, හදිසියේම කැඳවීමක් කළාම එතුමා වාගේ අයත් අපහසුතාවට පත් වනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අප ආණ්ඩු පක්ෂය පැත්තෙන් Parliamentary Business Committee එක අද පවත්වන්න යෝජනා කළේ අය වැය විවාදයේ අවසන් දවස නිසායි. මොකද, පොදු අවබෝධයක් තිබෙනවා, අද සාමාන්‍යයෙන් ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සෑම මන්ත්‍රීවරයෙකුම මේ සඳහා සහභාගි වන බවට. ඒ වාගේම අය වැය විවාදය අද අවසන් වූ පසුව පාර්ලිමේන්තුව සති කිහිපයකට පස්සේ තමයි නැවත රැස් වෙන්නේ. විශේෂ සාකච්ඡාවක් සඳහා නොවෙයි අද පක්ෂ නායක රැස්වීම කැඳවන්නේ. ඊයේ තමයි අපි කවුරුත් මැතිවරණය පවත්වන දිනය දැනගත්තේ. මැයි මාසයේ පාර්ලිමේන්තු රැස්වීම් මැයි 6, 7, 8 සහ 9 දිනවලට schedule කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඊයේ තමයි අපි කවුරුත් දැනගත්තේ මැතිවරණ දිනය. ඒ අනුව මැයි මාසයේ පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්විය යුතු දින තීරණය කර ගැනීම සඳහා තමයි අද දිනයේ අපි පක්ෂ නායක රැස්වීමක් කැඳවන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටියේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතකොට වෙලාව?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි සාකච්ඡා කරලා අපේ කණ්ඩායමට පුළුවන් වෙලාව තමයි ඔබතුමාට යෝජනා කළේ.

ඒ නිසා විපක්ෂ නායකතුමාට පුළුවන් වේලාවකුත්, අපට පුළුවන් වේලාවකුත් බලලා කටයුතු කරමු. ගරු කථානායකතුමනි, අද ඔබතුමා Staff Advisory Committee එකත් දාලා තිබෙනවා. ඒකත් හදිසියේ දැම්මේ. ඒකත් ඊයේ තමයි අපට කිව්වේ. ඒ වාගේම, කලින්ම දැනුවත් කර තිබෙනවා, අද සවස 3.00ට Sri Lanka-China Parliamentary Friendship Association එක හදන්න. ඒ වාගේම, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා සහ ගරු සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමා සංවිධානය කර තිබෙන ක්‍රීඩා උත්සවයක ත්‍යාග ප්‍රදානෝත්සවයකටත් අපට එන්න කියා තිබෙනවා. ඒ වාගේම, අද පාර්ලිමේන්තුවේත් ගොඩක් වැඩ යොදාගෙන තිබෙනවා. අපට කමක් නැහැ, මේක accommodate කරන්න පුළුවන් විධියට accommodate කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාගේ ක්‍රීඩා උත්සවයක් ගැන කිව්වා. ඒක ගරු සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලුදෙනා එකතු වෙලායි කරන්නේ. ගරු කථානායකතුමනි, clash නොවෙන්න මේකට වේලාවක් දමා ගන්න පුළුවන් වෙයි ද? *[බාධා කිරීමක්]* ඒක තමයි. මේකට වේලාවක් දමා ගන්නේ කොහොමද, ගරු කථානායකතුමනි?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමාත්, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාත් එකතු වෙලා ඒ ක්‍රීඩා උත්සවය සංවිධානය කරනවා කියලා තමයි මම කිව්වේ. ඒක මම කිව්වා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවලින් හා 2025 පෙබරවාරි 21 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2025, විසිහයවන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: මාර්තු 20]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: மார்ச் 20]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 20th March]
[HON. SPEAKER in the Chair.]

102 වන ශීර්ෂය - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාවරයා
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 248,693,718,000

තලෙප්පු 102.- நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 248,693,718,000

HEAD 102.- MINISTER OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 248,693,718,000

ඉදිරිපත් කරන ලද සංශෝධනය : [මාර්තු 20] වැඩ සටහන රුපියල් 10කින් කපා හැරිය යුතුය. [ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

எடுத்தியம்பப்பட்ட திருத்தம்: [மார்ச் 20] "நிகழ்ச்சித்திட்டம் 10 ரூபாயால் குறைக்கப்படுமாக." [மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா]

Amendment proposed: [20th March] "That the Programme be reduced by Rs. 10". [The Hon. (Dr.) Harsha de Silva]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.
வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.
Question again proposed.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

2025.03.20වන දින කල්තබන ලද මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය තවදුරටත් පැවැත්වීම. පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

The Hon. Dayasiri Jayasekara. You have 17 minutes.

[පූ.භා. 10.27]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම, ඊයේ ඇති වූ සිදුවීමක් සම්බන්ධයෙන් මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. ඊයේ මේ සම්බන්ධව වුණු කථාවකදී අපේ ගරු හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් සල්ලි ගත්ත අයගේ නම් අතරට මගේ නමත් ඇතුළත් කරලා කියා තිබුණා. මම එතුමාට කියන්න කැමැතියි, කරුණාකර තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩුවේ ඉන්නා අය ආණ්ඩුව ගන්නා තෙක් කියපු බොරු, දැන් මෙතැනට ඇවිල්ලාත් කියන්න එපා කියලා. කරුණාකරලා මම දන්නු කටඋත්තර CID එකට ගිහිල්ලා අරගෙන, ඒකේ මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් මට විරුද්ධව නඩු පවරන්න. මම සල්ලි අරගත්තේ නැහැ කියලා බොහොම පැහැදිලිව කියා තිබෙනවා; කටඋත්තර ලබා දී තිබෙනවා.

මම හිතුවේ නැහැ, තමුන්නාන්සේත් ඒ තත්ත්වයට වැටෙයි කියලා. නමුත් තමුන්නාන්සේත් ඒ තත්ත්වයට වැටිලා තිබෙනවා. ඒකයි තිබෙන ගැටලුව.

ඒ වාගේම විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, කෝප් එකේදී ඔය කියන footnote ගහන වැඩේට මම සම්බන්ධ වුණේ නැති බව; සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් කියාවි. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ඒ වෙව්ව වැරැද්ද සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම ඔවුන් corner කරන්න අවශ්‍ය වැඩ කටයුතු ටික කළා මිසක් අපි ඔවුන් ආරක්ෂා කරන්න වැඩ කටයුතු කළේ නැහැ කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. කෝප් එකේ ඉඳලා අපි කළේ, ඒ තිබුණු වැරැද්ද පැහැදිලිව පෙන්වා දීපු එක. එදා මහ බැංකුවේ නියෝජ්‍ය ප්‍රධානියා විධියට මහ බැංකු අධිපතිතුමා ගෙන්වලා ප්‍රශ්න කළේ මමයි. ඒක මතක තියා ගන්න. එකින් එක අරගෙන මම අහපු ප්‍රශ්නවලින් තමයි අර්ජුන මහේන්ද්‍රන් ඒ වෙලාවේ කරපු මැදිහත්වීම සොයා ගත්තේ. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, මෙවැනි චෝදනා කරන තැනට තමුන්නාන්සේත් වැටුණු එක ගැන මම කනගාටු වෙන බව. මොකද, මේ පාර්ලිමේන්තුවේ දැන් විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, තමුන්නාන්සේලා දවස ගණනේ ඇවිල්ලා බොරු කියන එක. ඒ නිසා දැන් පාර්ලිමේන්තුව ඇතුළේදී ශික්ෂා පද පහෙන් "මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමී" කියන ශික්ෂා පදය ඉවත් කරන්න වෙලායි තිබෙන්නේ. මෙක විශාල අර්බුදයක් බවට පත්වෙලා තිබෙනවා.

දැන් අදත් තරුණ තරුණියන් දහස් ගණනක් පොල්දූවට ඇවිල්ලා ඉන්නවා. 35,000කට රක්ෂා දෙනවාය කියලා තමුන්නාන්සේලා කියපු බොරුවේ ප්‍රතිඵලයක් විධියට අදත් ඒ අය පාර්ලිමේන්තුව අවට රැස්වෙලා ඉන්නවා. අගමැතිතුමිය දවස් දෙක තුනකට කලින් අපේ විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්නයකට උත්තර දීලා කිව්වා, මේ වෙනකොට 10,000ක් රැකියාවලට බඳවාගෙන තිබෙනවාය කියලා. මම ඊයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට කථා කළා, මුදල් අමාත්‍යාංශයට කථා කළා; එක උපාධිධාරියෙක්වත් මේ වනතුරු බඳවාගෙන නැහැ. හැබැයි, 15,000ක් විතර වන පුරප්පාඩු ටික තමුන්නාන්සේලා හොයාගෙන තිබෙනවා. නමුත් බඳවාගැනීම් තවම ආරම්භ කරලා නැහැ. අගමැතිතුමියගේ කටිනුත් එවැනි අසත්‍ය කියනවා නම්, ඒක ලොකු ප්‍රශ්නයක්. අනික තමුන්නාන්සේ කොටස් වෙළෙඳ පොළේ ඉන්නකොට තමයි මේ රටේ අර විශාල insider dealings ගියේ; කෝටි ගණන් හොරකම් කිරීම් ගැන කථා කළේ. මම මඩ ගහන්න සූදානම් නැහැ. හැබැයි මේ කාරණය කිව්වේ, ඒක නිසා.

අපේ කම්කරු ඇමතිතුමාත්, මුදල් නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්න නිසා, මම කියන්න කැමැතියි ලංකාවේ කොටස් වෙළෙඳ පොළ සම්බන්ධව තිබෙන තත්ත්වය, price of earnings 9.27යි.

අනෙක් රටවල් එක්ක ගත්තාම, අපේ රටේ EPF, ETF, Bank of Ceylon, Sri Lanka Insurance Corporation යනාදියේ දිගින් දිගටම විශාල වාසියක් තිබෙන බව අපට පෙනෙනවා. ඉන්දුනීසියාව ගත්තොත් price of earnings 23.88යි; ඉන්දියාවේ 21.3යි; ජපානයේ 20.8යි; තායිලන්තයේ 17.4යි; මලයාසියාවේ 14.3යි; සිංගප්පූරුවේ 12.6යි; පිලිපීනයේ 11.1යි; ශ්‍රී ලංකාවේ 9.27යි. විශේෂයෙන්ම අද වනවිට Commercial Bank එකේ, Sampath Bank එකේ කොටස්වල අගය සියයට 20කින් විතර වැඩිවෙලා තිබෙනවා. Commercial Bank එකේ 9.3යි, Sampath Bank එකේ 9.5යි. ඒ වාගේම dividends එක්ක ගත්තාම, සියල්ල එකතු වුණාම මම හිතන විධියට සියයට 25ක විතර එකතුවක් ලැබෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. කොළඹ කොටස් වෙළෙඳ පොළ - Colombo Stock Exchange එකේ - තත්ත්වය වැඩි කරන්න වුවමනා නම්, විශේෂයෙන් EPF එක, ETF එක, Bank of Ceylon, Sri Lanka Insurance Corporation වාගේ ආයතන සියයට 10ක පමණ ප්‍රමාණයකින් හෝ කොටස් වෙළෙඳ පොළට ඇතුළත් කළොත් තමයි අනෙකුත් ආයෝජකයන්ට විශාල ශක්තියක් එන්නේ කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලනවා, එම ක්‍රියාවලිය සිදු කරන්න කියලා. එදා මංගල සමරවීර මැතිතුමා Sri Lanka Telecom එක අරගෙන එම කටයුත්ත කළා, LECO එක අරගෙන කළා. ඒ කාලයේදී තමුන්නාන්සේලා විතරක් නොවෙයි, සියලු දෙනාම ඒකට විරුද්ධව කථා කළා. අද වනවිට Sri Lanka Telecom එකේ dividends ගත්තාම, ඒකේ තිබෙන වාසි ගත්තාම අපට පෙනී යනවා, ඒ තුළ විශාල වර්ධනයක් තිබෙනවා කියලා. ඒ නිසා ඒ ගැන හිතන්න කියා මා පළමුවෙන්ම ඉල්ලීමක් කරන්න කැමැතියි.

දෙවැනි කාරණය මෙකයි. විශේෂයෙන්ම විමධ්‍යගත අරමුදල් ලබා දීමේදී තමුන්නාන්සේලා මේ අවුරුද්දේ සෑම මන්ත්‍රීවරයෙකුටම මිලියන 10 බැගින් වෙන් කරනවා කියා සඳහන් කර තිබෙනවා. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ කාලයේ එම ප්‍රමාණය මිලියන 15 දක්වා වැඩි කළා. නමුත් රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව පැවැති කාලයේ තමන්ට කැමැති, තමන්ට උදවු කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පමණයි මෙවා දුන්නේ. මිලියන 100, මිලියන 200 ඉඳලා මිලියන 300, මිලියන 400 දක්වා දුන්නා, සමහර අයට. අද තිබෙන තත්ත්වය අනුව තමුන්නාන්සේලා මිලියන 10ක් දෙනවා කිව්වාට, ඒක ලැබෙන්නේ සංවර්ධන කමිටුවේ සභාපතිවරයාගේ අනුමැතිය ඇතුව. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේක ලැබෙන්නේ නැහැ. ලැබුණත්, VAT එක අයින් කළාට පසුව ලැබෙන්නේ 8,250,000යි කියන එක අපි තමුන්නාන්සේලාට කියන්න කැමැතියි. මේ 8,250,000න් සියයට 10යි ඍජු ප්‍රතිපාදන වශයෙන් දෙන්න පුළුවන් වන්නේ. ඒ කියන්නේ, සාමාන්‍යයෙන් අපි විභාරස්ථානයකට, නැත්නම් මරණාධාර සමිතියකට, එහෙම නැත්නම් වෙනත් සමිතියකට යම් කිසි ප්‍රතිපාදනයක් දෙනවා නම් රුපියල් ලක්ෂ අටහමාරයි දෙන්න පුළුවන් වන්නේ. ඉතින් කොහොමද කරන්නේ? මොකද, ඍජු ප්‍රතිපාදන තමයි අපෙන් වැඩිපුර ඉල්ලන්නේ. මෙතැන ඉන්නා මන්ත්‍රීවරුන් දන්නවා, විපක්ෂයේ ඉන්නා කාලයේ එවැනි ඒවා තමයි අපි කළේ. ආණ්ඩුවේ තමුන්නාන්සේලාට සල්ලි තිබෙන නිසා ලොකු ව්‍යාපෘතිවලට යොදවන්න පුළුවන්. නමුත් අපට ඒවාට යොදවන්න විධියක් නැහැ. විශේෂයෙන් තමුන්නාන්සේලා ඝාතඝ්ඡා කරලා යාපනයේ ඉන්න මන්ත්‍රීවරුන්ට නිකම්ම රුපියල් ලක්ෂ 100 ගණනේ දෙනවා. හැබැයි, අනෙක් අයට නැහැ. එකතාවක් ඇවිල්ලා තිබෙනවා ඒගොල්ලන්ට රුපියල් ලක්ෂ 100 ගණනේ දෙන්න සූදානම් කියලා. හැබැයි, අනෙක් පළාත්වල මන්ත්‍රීවරුන්ට ඒක ලැබිලා නැහැ. ඒ නිසා මේ සම්බන්ධව කරුණාකර ක්‍රියාත්මක වෙන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය ආණ්ඩුව කාලයේ SriLankan Airlines එකේ ඩොලර් මිලියන 500ක සමස්ත ණය මහා භාණ්ඩාගාරය දරා ගත්තා. මේ වතාවේදී රුපියල් මිලියන 10,000ක් ණය ගෙවීමට, රුපියල් මිලියන 10,000ක් පොලිය ගෙවීමට වශයෙන් අය වැයෙන් රුපියල් මිලියන 20,000ක් තමුන්නාන්සේලා වෙන් කරලා තිබෙනවා. එම සමාගමේ planes 24ක් තිබෙනවා. ඒවායින් ගුවන්ගත කරන්නේ 18යි. දැන් මේ සම්බන්ධයෙන් ඇහුවාම අපේ ගරු හර්ෂණ සූරියප්පෙරුම මහත්තයා කිව්වා, planes 3ක් දැන් මාස ගණනක් තිස්සේ ගුවන්ගත නොකර තියාගෙන ඉන්නවා කියලා. මම අහන්න කැමතියි ඒ planes 3න් කියක් ගුවන්ගත කරනවාද කියලා. මොකද, තවමත් ඒ අවශ්‍ය කරන කොටස් ගන්න විධියක් නැතිවයි ඉන්නේ, ගරු සභාපතිතුමනි. මේ ප්‍රශ්නය මතු වුණේ කොවිඩ් වසංගතයත් එක්කයි. එහෙම නැතිව මේක කාගේවත් පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. ලෝකය වටේම තිබෙන planesවලට මේ ප්‍රශ්නය ආවා. මෙහිදී විශේෂයෙන් New Engine Option - NEO version - සම්බන්ධ අඩු පාඩු ටික තිබෙනවා. මේ සඳහා ලෝකයෙන්ම ඉල්ලුම වැඩි වුණා. වැඩි වුණාට පස්සේ මොකක්ද වුණේ, ground කරන්න වුණා IndiGo වාගේ airlinesවල planes; ඉන්දියාවේ IndiGo සමාගමේ planes 60ක් විතර අද බිම තිබෙන්නේ. අපේ planes හයක් බිම තිබුණා. මේක අදටත් තිබෙන ප්‍රශ්නයක්. මේක නිකම් කාරණාවක් නොවෙයි. ඒ නිසා මම කියන්න කැමතියි, මේ සම්බන්ධව කරුණාකරලා අවශ්‍ය කරන කටයුතු ටික කරන්න කියලා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු සභාපතිතුමනි, කරුණු දෙකක් පිළිබඳව මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කාරණයක් කිව්වා, මම කොළඹ කොටස් වෙළෙඳ පොළේ වැඩ කරන කාලයේ වුණු දෙයක් කියලා. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයක්. මම කොළඹ කොටස් වෙළෙඳ පොළේ වැඩ කළේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අනෙක් එක, ඔබතුමා කිව්වා, planes 3ක් තිබුණා, තවමත් ගුවන්ගත කරලා නැහැ කියලා. ඉන් එක් plane එකක් හදලා දැනටමත් ගුවන්ගත කරලා fleet එකේ වැඩ කරනවා. ඒ planes තුන මාස 36කට වැඩි කාලයක් තිබුණා. දෙවැනි ගුවන් යානයත් මේ වෙනකොට repair කරලා clearance ලබා ගනිමින් ඉන්නවා. එකක් fly කරනවා; දෙවැනි plane එක සූදානම් කරලා තිබෙනවා. ඔබතුමා දැනුවත් කිරීම සඳහායි මම මේ කාරණා කිව්වේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු සභාපතිතුමනි, point of Order එකක් ආණ්ඩුව පැත්තෙන් ආවාම බොහොම නම්‍යශීලීයි නේ. අපි ප්‍රශ්නයක් අහන්න ගියාම අපේ කට වහනවා. අපිත් අහන්නේ ඒ වාගේ ප්‍රශ්නයක් තමයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, එතුමාගේ නම කිව්වා නේ. එතුමාගේ නම කිව්වාම එතුමාට කියන්න අයිතිය තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි. සාමාන්‍යයෙන් මෙහෙම දෙයක් තිබෙනවා. මම කථා කරන්න ඉඩ දෙන්නේ නැත්නම්, දෙන්නේ නැහැ. නමුත් බලන්න, ඔබතුමා ඒකට ඉඩ දුන්නා. හැබැයි, මගේ කථාව- *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි,- *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ආපහු මට බාධා කරන්න එපා. කරුණාකර ඉඳගන්න. මට කථා කරන්න දෙන්නකෝ. මගේ flow එක කඩන්න එපා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, අපි ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මන්ත්‍රීවරුන්ට යම්කිසි ක්‍රමයකට කථා කරන්න, ආමන්ත්‍රණය කරන්න කියලා. තර්ජනාත්මකව කථා කරන්න එපා. අපටත් පුළුවන් ඒක කරන්න.

ගරු සභාපතිතුමනි, අපි දැන් අය වැය කාරක සභා අවස්ථාවේයි ඉන්නේ. අය වැය කාරක සභා අවස්ථාවේදී ඇති තරම් මන්ත්‍රීවරු, ඇමතිවරු තමන්ගේ කථාවලදී අවසර ඇතුවත්, සමහර වෙලාවට අවස්ථාව ඉල්ලලාත් කරුණු පැහැදිලි කිරීම් සිදු කරනවා. නමුත්, මෙතැනදී වුණේ මොකක්ද? එතුමාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීමක්, ඒක. Committee Stage එකේදී මැති ඇමතිවරු ඕනෑ තරම් අවස්ථාව ඉල්ලා තිබෙනවා. සමහර මන්ත්‍රීවරු වෙලාව දෙනවා, "ඇමතිතුමා, කථා කරන්න" කියලා. ඒක තමයි constructive and democratic discourse එක.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අන්න ඒ constructive discourse එක අපේ පැත්තටත් දෙන්න තිබුණා නම් හොඳයි. ගරු සභාපතිතුමනි, මගේ වෙලාව දෙන්න. මම එතුමාගේ වෙලාව ගන්නේ නැහැ. ඒ democracy ඒගොල්ලන්ට හොඳයි; අපට democracy නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ. මේ කාරණය තවත් ඇදගෙන යන්න මට වුවමනාවක් නැහැ.

SriLankan Airlines එක විකුණන්න දාලා තිබුණා. ඒකට "හේලීස්" එකෙනුත් ඉල්ලීමක් කර තිබුණා. "රොසෙල්" එකේ founder තමයි අද SriLankan Airlines එකේ සභාපති. Hayleys Fabric PLC එකේ Managing Director තමයි රොහාන් ගුණතිලක මහත්මයා. රොහාන් ගුණතිලක කිව්වාම අපේ වසන්ත සමරසිංහ මහත්මයා මා දිහා බලනවා. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමා වැඩ භාරගත්තු වෙලාවේ එතුමා පිටුපසට වෙලා හිටගෙන හිටියා. ඒ, ඔබතුමාගේ ඉතා හොඳ යාළුවෙක්. *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු සභාපතිතුමනි, එතුමා මගේ නම කිව්වා. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇයි, නම කියන්න බැරිද? මොකක්ද කරලා තිබෙන්නේ? *[බාධා කිරීමක්]* කියන්න, කියන්න. හැබැයි, මගේ වෙලාව ගන්න එපා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු සභාපතිතුමනි, එතුමා දැන් මගේ නම කියලා කිව්වා, මම එතුමාගේ මුහුණ බලනවා කියලා. මම එතුමාගේ මුහුණ නොවෙයි එතුමාගේ ඔක්කොම විධිය දන්නවා. Category එකත් එක්ක කියන්නම්, මම. හැබැයි, ප්‍රශ්නය අහගන්න. අපි ජාතික ජන බලවේගයේ Economic and Business Council එකක් හැදුවා. ව්‍යාපාරික ප්‍රජාව ඒකේ ඉන්නවා. ලංකාවේ තිබෙන ප්‍රධාන corporatesවල ඉන්න අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෝ ඒකේ ඉන්නවා. මම පසු ගිය දවසකත් කිව්වා. සරත් ගනේගොඩ, රොහාන් ගුණතිලක විතරක් නොවෙයි, තවත් බොහෝ පිරිසක් ඒකේ ඉන්නවා. මොකක්ද ප්‍රශ්නය?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇයි, මට කියන්න බැරිද? මොකක් හරි කිව්වාම- *[බාධා කිරීමක්]* හරි ඉතින්, ඔබතුමා මගේ මුහුණ බැලූ හින්දා නේ මම ඒක කිව්වේ. කරුණාකර දැන් ඉඳගන්න. එහෙම නම් මම ඔබතුමාගේ මුහුණ දිහා බලන්නේ නැතුව ඉන්නම්. වෙන මුහුණක් දමා ගෙන තියාගන්න.

ගරු සභාපතිතුමනි, ඒ සඳහා අභිලාෂ කැඳවන කොට "හේලීස්" එකත් ඒකේ කොම්පැනියක්. මම අහන්න කැමැතියි එය conflict of interest එකක් නොවෙයිද කියලා. මොකද, SriLankan Airlines එක ගන්න හදන සමාගමේ කෙනෙක් ඉන්නවා, SriLankan Airlines එකේ සභාපති හැටියට. දැන් මොකද වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කලින් එහෙම තිබුණේම නැද්ද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට කලින් ඒවා වැඩක් නැහැ. මම කියන්නේ තමුන්නාන්සේලා මහා ලොකු කට්ටිය නේ. තමුන්නාන්සේලා තරම් සුවඳවත්, වැරදි නොකරපු කට්ටිය කවුරුත් නැහැ, ලෝක ඉතිහාසයේ. ඒකයි මම මේ කියන්නේ. ඒවා කරන්න කියලා නොවෙයි තමුන්නාන්සේලාට කිව්වේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා Securities and Exchange Commission එකේ වැඩ කළේ. කොටස් වෙළෙඳ පොළේ කියලා මම කිව්වාට, Securities and Exchange Commission එකේයි ඔබතුමා වැඩ කළේ. ඔබතුමා ඒක පිළිගන්නවා නේද? ඔය කියන කාලයේ තමයි ඒවා සිදු වුණේ.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් කිව්වා, conflict of interest එකක් ගැනත්. අද SriLankan Catering එකේ ground handlingවලින් ඩොලර් මිලියන 100ක් විතර ලැබෙනවා. එසේ ආදායම් ලැබෙන එක තමයි දැන් තමුන්නාන්සේලා විකුණන්න හදනවා කියන්නේ. හරියටම මම දන්නේ නැහැ, විකුණන්න හදනවා ද, නැද්ද කියලා. මම දන්නේ නැහැ ඒකට මොනවා කරන්න හදනවාද කියලා. මොකද, ණය සහ පොලී ගෙවන්න ඔබතුමන්ලා වෙන් කරන මිලියන 20,000ට, උඩ බලාගෙන plane එක යන දිහා බලාගෙන ඉන්න ගොවියෙකුත් අද රුපියල් 50,000ක් ගෙවනවා. *[බාධා කිරීම්]* ඒක මතක තියාගන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ, ඔබතුමන්ලා කරපු වරදක්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ, අපි කරපු වැරැද්දක් නොවෙයි. තමුන්නාන්සේලා තමයි ඒක කරන්න දුන්නේ නැත්තේ. ඒ ආයතනය පාඩු ලබන කොට විකුණන්න හැදුවාම තමුන්නාන්සේලා ඒකට ඉඩ දුන්නේ නැහැ. තමුන්නාන්සේලා තමයි ඒක කෑවේ. දැන් තමුන්නාන්සේලා ඒ වගකීම අනෙක් පැත්තට දාන්න හදනවා. *[බාධා කිරීමක්]* අපි ඕවාට සම්බන්ධ නැහැ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම Load Control Officersලා, ground handlingවල professionalsලා වසරකට 150දෙනෙක් විතර ඉවත් වෙනවා. ඒගොල්ලන්ට වැටුප රුපියල් 60,000ක විතර ප්‍රමාණයක් තමයි හම්බ වෙන්නේ. පිටත ඇතැම් ආයතන රුපියල් ලක්ෂ පහක විතර වැටුපකට ඒ අය ඉල්ලනවා. එම නිසා එහි විශාල පිරිසක් සේවයෙන් ඉවත් වෙමින් යනවා. මේ ක්‍රියාදාමය තුළ ground handling සම්පූර්ණයෙන් කඩා වැටෙයිද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

වෙනත් රටවල flight එකක් හරවලා දෙන්න සාමාන්‍යයෙන් පැයක විතර කාලයක් දෙනවා, බඩු check in කරලා අදාළ ඔක්කෝම කටයුතු අවසන් කරන්න. ඒ service එක කරන්න පුළුවන් තත්ත්වයක් නැහැ. මොකද හේතුව, විශාල ප්‍රමාදයක් මේ රට ඇතුළේ දැන් තිබෙනවා. ඒ නිසා පුළුවන් තරම් වැටුප් වැඩි කරලා, රඳවා ගැනීම තුළ තමයි ඒ අයව ආරක්ෂා කරන්න පුළුවන් වන්නේ. එම නිසා මේ කාරණය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම කියන්න කැමැතියි, මත්පැන් බලපත්‍ර පිළිබඳ තත්ත්වය ගැනත්. මත්පැන් බලපත්‍ර සම්බන්ධව Stay Order එකක් අරගෙන තිබෙනවා, 2025.06.02 දක්වා. ඒක දුන්නේ ඉස්සෙල්ලාම 2024.10.15 දක්වා. දැන් එය දීර්ඝ කර තිබෙනවා. ඒ අනුව මත්පැන් බලපත්‍ර ලබා දීම සම්පූර්ණයෙන් තහනම් කරලා තිබෙනවා, අභියාචනාධිකරණය විසින් මේ සම්බන්ධව දීලා තිබෙන තීන්දුවත් එක්ක. දැන් මොකද වෙලා තිබෙන්නේ? 2024 ඔක්තෝබර් මාසයේ 21වැනි දා ජනාධිපති ලේකම් ආචාර්ය එන්.එස්. කුමානායක මැතිතුමා ලිපියක් යවනවා, "නැවත දැනුම් දෙන තෙක් කිසිදු සුරාබදු බලපත්‍රයක් නිකුත් නොකරන ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි තවදුරටත් දන්වමි" කියලා. එහෙම සඳහන් කරලා එතුමා ලිපියක් යවනවා. ඒ ලිපියට පස්සේ කුමානායක මැතිතුමාම කරුණු පහක් දක්වලා තවත් ලිපියක් යවනවා, මෙන්න මේ කරුණු පහ යටතේ බලපත්‍ර ලබා දෙන්න හැකියාව තිබෙනවා කියලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? 2025.01.28වන දා -ඒ කියන්නේ මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ- සහකාර සුරාබදු කොමසාරිස් විසින් උකුවෙල, ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යවනවා, "නව මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම, හංගලිගෙදර ලසන්ත චන්ද්‍රසිරි, නො: 98, නුවර පාර, දියබුබුළ, මාතලේ, ර.බී. 4 බලපත්‍රයක් සම්බන්ධව තිබෙන විරෝධතා ගෙනෙන්න" කියලා සඳහන් කරමින්. දැන් තමුන්නාන්සේලා කිව්වා, මේ සම්බන්ධව කිසිදු ආකාරයකින් බලපත්‍ර නිකුත් කිරීමක් කරන්නේ නැහැ කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes left out of your allotted time.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට වෙලාව තිබුණා. ආණ්ඩු පක්ෂයේ අය තමයි ඒ වෙලාව ගත්තේ, ගරු සභාපතිතුමනි. ඒගොල්ලන් කාපු වෙලාවත් මගෙන් ගන්න එපා.

ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, මට තව විනාඩි 5ක් විතර දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තවත් විනාඩි 4ක කාලයක් ලබා දෙන්න, ගරු සභාපතිතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
විශේෂයෙන් මම මේ කාරණය මතු කරන්නේ ඇයි? මම තමුන්නාන්සේලාට ඒ ක්‍රියාදාමය ගැන එළිදරව් කරන්නම්. ග්ලෝබ් බිලෙන්ඩින් නමැති අරක්කු සමාගමේ වින්ටේජ් වයින් ඇන්ඩ් ස්පිරිට් සමාගමට මත්පැන් බලපත්‍රයක් දීලා තිබෙනවා. මේ ගැන වැඩියෙන්ම කථා කරපු කෙනා අපේ වසන්ත සමරසිංහ මැතිතුමා. ගරු ඇමතිතුමා, ඔබතුමා අහගත්තොත් හොඳයි, ඒ සම්බන්ධයෙන් මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මම ඔබතුමාට ඒ විස්තර ටික දෙන්නම්. විශේෂයෙන් මුදල් භාර ගන්නා විට වින්ටේජ් වයින් ඇන්ඩ් ස්පිරිට් සමාගම ලියාපදිංචි කරලා නැහැ. 2024.01.18වන දා තමයි මුදල් භාර ගන්නේ. ගරු සභාපතිතුමනි, මේ කොම්පැනිය ලියාපදිංචි කරන්නේ 2024.02.12වන දා. එතකොට ව්‍යාපාරයක් ලියාපදිංචි කරලා නැති

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

සමාගමකට තමයි ඒ මත්පැන් බලපත්‍රය දෙන්නේ. මේ සම්බන්ධව තවත් තොරතුරු තිබෙනවා. පසුගිය රජයේ හිටපු අමාත්‍යවරයකු වුණු ප්‍රසන්න රණතුංග මහත්මයාගේ සමීප ආධාරකරුවෙකු වූ එල්.ඩී. විජේසේකර කියන පුද්ගලයා ගැනත් කිව යුතුයි. මම මේ නම එළියේත් කිව්වා. මට එන්තරවාසියකුත් එවලා තිබුණා. මම කිව්වා, පුළුවන් නම් එන්තරවාසිය ඉදිරියට ගෙන යන්න කියලා. නමුත් එතැනින් එහාට ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. සුරාබදු දෙපාර්තමේන්තුවේයි එතුමා වැඩ කරන්නේ. මේ ක්‍රියාදාමය ඉදිරියට යන කොට මොකද වුණේ? කලින් ඒක පවරා තිබුණේ වෙනත් කෙනෙකුට; නිලකනායක අධිකාරී මුදියන්සේලාගේ ප්‍රියන්ත කුමාර කියලා කෙනෙකුට තමයි දීලා තිබුණේ, විජේසේකර නමැති නමට. නමුත් ඒක වෙනස් කරනවා. ඒක වෙනස් කරන්නේ කවුද? ඒක වෙනස් කරන්නේ එවකට ගම්පහ හිටපු ප්‍රාදේශීය ලේකම් කේ.කේ.එස්.එල්. ගුණසේකර. ගුණසේකර ප්‍රාදේශීය ලේකම්තුමිය දැන් ඉන්නේ සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරියක් විධියට. මොකක්ද ඔබතුමන්ලාගේ ඊළඟ ක්‍රියාදාමය? නිශාන්ත ජයවීර තමයි විශේෂයෙන් සුරාබදු, දේශීය ආදායම්, රේගු පිළිබඳව කටයුතු කරන නිලධාරියා. එතකොට ඔහු දන්නේත් නැහැ මේ පිළිබඳව. මත්පැන් නිෂ්පාදන බලපත්‍ර ගත්තාම, මේ බලපත්‍රය දෙනවා නම වෙනස් කරලා. එහෙම නම වෙනස් කරන්න පුළුවන්ද කියලා මම අහන්න කැමැතියි. එහෙම නම වෙනස් කරපු එකක් තිබෙනවා. ඒ කියන්නේ තිබෙන නම කපලා අනින් ලියලා තමයි අලුත් නමට හදලා දෙන්නේ. මේක සම්පූර්ණයෙන් වැරදියි. හැබැයි, එහෙම ලබා දෙනවා, අර මම කියපු නිලකනායක අධිකාරී මුදියන්සේලාගේ ප්‍රියන්ත කුමාර නැමැති අයට ගම්පහ ප්‍රාදේශීය ලේකම් විධියට වැඩ කරපු ගුණතිලක මහත්මියගේ අනුමැතිය ඇතිව.

තමුන්නාන්සේලා දන්නවා, මත්පැන් නිෂ්පාදන බදු වැඩි කළා කියලා. ගැසට් පත්‍ර 108ක් අස්සේ තමයි ඒ ගැසට් එකත් තිබුණේ. ඒක අත්සනට ආවාම, සමහර වෙලාවට මුදල් ඇමතිතුමා ඒ ගැන දන්නේත් නැහැ. ඔබතුමාට මතක ඇති, මේ ඔක්කෝම ගැසට් අස්සේ සියයට 5.7කින් මත්පැන් බදු වැඩි කරන එකත් දාලා තිබුණ බව. ජනාධිපතිතුමා රට යන්න කලින් ලොකු pack එකක් ඇවිල්ලා තිබුණා, අත්සනට. ඉතින් මේකත් ඒ අස්සට එකතු කළා. සාමාන්‍ය ඒවා අස්සට දාලා මේකත් අත්සන් කළා. ඒක නියෝජ්‍ය ඇමතිතුමා දන්නේත් නැහැ. මේවා මේ විධියට ගියොත්, පාර්ලිමේන්තුව විසුරුවා හරින ගැසට් එකත් ජනාධිපතිතුමාට දෙන්න පුළුවන්, අත්සනට. මොකද, එතුමා ටක් ටක් ගාලා අත්සන් කරලා යවනවා. මම එදා මේ ගැන අහනකොට අපේ නියෝජ්‍ය මුදල් ඇමතිතුමා ටිකක් මේ ගැන concern වුණා. මම ඔබතුමාට මේ details ටික දෙනවා. කරුණාකරලා මේ ගැන බලන්න.

අනික් කාරණය මේකයි. විශේෂයෙන්ම වසන්ත සමරසිංහ ඇමතිතුමා එදා කිව්වා, මේ මත්පැන් බලපත්‍ර ගත්ත අයගේ නම් ටික හෙළිදරව් කරනවා කියලා. මත්පැන් බලපත්‍ර 29ක්. තවම මට ඒ බලපත්‍ර ටිකේ නම් ටික හම්බ වුණේත් නැහැ. කියපු කට්ටිය හම්බ වුණේත් නැහැ, මොකුත් නැහැ. පරණ බලපත්‍ර තිබුණා, 360ක්. ඒ 360න් 172ක් දැන් දීලා තිබෙනවා. අනික් ඒවා හෙමින් හෙමින් ක්‍රමානුකූලව ඇතුළෙන් දෙන වැඩ පිළිවෙළක් තමයි මේ ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ. නමුත් මා ළඟ තිබෙනවා, ඒ නම් ටික. මම ඒ ලේඛනය **සභාගත*** කරනවා. මොකද, එය කියවන්න මට වේලාවක් නැහැ.

එකෝ හෙරිටේජ් වෙන්චර්ස් එක යටතේ දීලා තිබෙනවා, ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාගේ දෙවැනි පුත්‍ර රත්නයට. ඒ වාගේම ඉමන්දි හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම යටතේ දීලා තිබෙනවා, සුමිත් උඩුකුඹුර මන්ත්‍රීතුමාට. කුඩා විදානලාගේ අනුද ජීනාජිත් සමරකෝන් බණ්ඩාර, එනම් ශාන්ත බණ්ඩාර මැතිතුමාගේ පුත්‍ර රත්නයට දීලා තිබෙනවා. රංගෙ බණ්ඩාර මැතිතුමාගේ පුත්‍ර රත්නයට තව එකක් දීලා තිබෙනවා. ඒ වාගේම ෆෝචූන් රිටේල් එකට, මෙන්ඩිස් කොම්පැනියට දීලා තිබෙනවා. තව එකක් මධ්‍යම - මහනුවර, නාවලපිටිය නගර සභාවේ හිටපු නගරාධිපතිතුමාට දීලා තිබෙනවා. ඔහු ව්‍යාපාර සහකරුවෙක්. ඒ වාගේම මධ්‍යම - මහනුවර, හිටපු රාජ්‍ය ඇමති දිලුම් අමුණුගම ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් හැටියට කටයුතු කරපු රුවන් බණ්ඩාරගේ රුක්මන් තිලකරත්නට දීලා තිබෙනවා. ඒ වාගේම මධ්‍යම - මහනුවර, මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් ඊරියගම ගෙදර රාජපක්ෂලාගේ රනිල් රාජපක්ෂට දීලා තිබෙනවා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අංගජන් රාමනාදන් මැතිතුමාගේ ඥාති පුත්‍රයෙකු වන විතුසන් වින්සන්රාජ්ට දීලා තිබෙනවා. ලබා දීලා තිබෙන බලපත්‍ර ටික ගැනයි මම මේ කිව්වේ.

ගරු සභාපතිතුමනි, දිගින් දිගටම නියම වැඩක් යනවා. අපේ නියෝජ්‍ය මුදල් ඇමතිතුමාත් මේක දැන ගත්තොත් හොඳයි. සාමාන්‍යයෙන් එක බලපත්‍රයක් පුද්ගලයෙකුගෙන් තව බලපත්‍රලාභියෙකුට යනකොට කෝටි එකහමාරක transfer ගාස්තුවක් ගන්නවා. හැබැයි, දැන් මොකද කරලා තිබෙන්නේ? දැන් කරලා තිබෙන්නේ එකම කොම්පැනියට බලපත්‍ර 8ක් දෙනවා. එම බලපත්‍ර ගැන තමයි මම දැන් කියන්නේ. බලපත්‍ර 8ක් දීලා තිබෙනවා, ධම්මික කාරියවසම්ට හංසගිරි චේන් යටතේ. මේ අයට දීලා තිබෙනවා, බලපත්‍ර 8ක්. බස්නාහිර - කොළඹ, බස්නාහිර - කොළඹ, බස්නාහිර - ගම්පහ, බස්නාහිර - කළුතර, බස්නාහිර - කළුතර, දකුණ - ගාල්ල, ඌව - බදුල්ල ආදී වශයෙන් දිවයින පුරා දීලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මෙහි ඉන්නවා, කාරියවසම් ඉඳිපාලගේ රිසන්දි දිහාසා කාරියවසම් කියලා තැනැත්තියක්. ඇයගේ වයස අවුරුදු 21ට අඩුයි. අවුරුදු 21ට අඩු අයෙකුට මත්පැන් බලපත්‍ර දෙන්න බැහැ. මේ documents ටිකත් මා ළඟ තිබෙනවා. *[බාධා කිරීමක්]* අපේ යාළුවෝ නොවෙයි, ඔබතුමන්ලාගේ යාළුවෝ. දැන් මම කියන්නම් කවුද මේකට බලපෑම් කරන්නේ කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have exhausted your additional time also.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තව විනාඩියක් මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

ඊළඟට, සංජය ප්‍රනාන්දු කියන පුද්ගලයාට ලබා දීපු බලපත්‍ර සම්බන්ධයෙන් ගත්තොත්, එතුමාටත් දීලා තිබෙනවා බලපත්‍ර ගණනාවක්. ඒ වාගේම මා ළඟ තව බලපත්‍ර විශාල සංඛ්‍යාවක් තිබෙනවා, මෙතැන. හැම තැනම වෙලා තිබෙන්නේ මේ විධියට. මම ඔබතුමාට කියන්නම්. ඒ බලපත්‍රලාභියාට සම්බන්ධ "ලංකා මාතා පාර්" කියලා පාරක් තිබෙනවා. මේ පාරේ ඉන්නවා, පවුල් 17ක්. මේ පවුල් 17න් පවුල් 15ක්ම මත්පැන් බලපත්‍රලාභීන්. මට ඒකයි හිතා ගන්න බැරි. මෙහෙම බලපත්‍ර දෙන්න පුළුවන්ද? නමුත් එහෙම දීලා තිබෙනවා. දැන් ඒවා සොයා ගෙන යන්න. මම දන්නවා, සමහර බලපත්‍ර සම්බන්ධව මේ වෙනකොට ආණ්ඩුවේ ඇමතිවරු කථා කරලා තිබෙනවා, සුරාබදු කොමසාරිස්තුමාට ගරු හඳුන්නෙත්ති මැතිතුමනි. කථා කරලා තිබෙනවා, සුරාබදු කොමසාරිස්ට; මාතර එකක් ගැන එක්කෙනෙක් කථා කරලා තිබෙනවා. මම ඒක කියන්නම්. මම ඔබතුමාට මේ නිකම් කිව්වේ. තව ඒ වාගේ කට්ටිය ඉන්නවා. වටගල මැතිතුමනි, ඔබතුමාත්

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூலகிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දන්නවා, ඊයේ පෙරේදා එක්කෙනෙකුට කථා කරලා තිබෙනවා. ගෙදරට ගිහිල්ලා හම්බ වෙලා තිබුණා, සුරාබදු කොමසාරිස්. මා ළඟ photo එකක් තිබෙනවා. එතැනට ගිහිල්ලා බහින photos ඔක්කොම තිබෙනවා. මම දන්නේ නැහැ ඒ ගෙදර කාගේද කියලා. මේ අය දැන් සුරාබදු කොමසාරිස්ට බලපෑම් කරනවා, ආණ්ඩුවේ මැති ඇමතිවරු. මම හොයලා බලන්නම් මේ ගෙදර කාගේද කියලා. මා සතුව photos ටික තිබෙනවා. *[බාධා කිරීමක්]* මම එවන්නම්. මේ photos ටික සභාගත කරන්න බැහැ. Phone එකේ photos තිබෙන නිසා phone එක සභාගත කරන්න වෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)
Printout එකක් ගන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම printout එකක් අරගෙන සභාගත කරන්නම්. දැන් බලපෑම් එනවා මේ ටික දෙන්න කියලා.*[බාධා කිරීමක්]* Phone එක සභාගත කළොත් වෙන දෙයක් ලැබෙයි.

ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමනි, මම මේ ගැන දිගටම කිව්වා. මම ඊයේත් මේ ගැන කථා කළා. රුපියල් 3,680ක් වන මත්පැන් බෝතලයකින් ඔබතුමන්ලා රුපියල් 2,780ක් බදු වශයෙන් අය කරනවා. ගරු සභාපතිතුමනි, මත් පැන් නිෂ්පාදනය කරන companiesවලට මේ පනත අනුව කවදාවත් distribution ගන්න බැහැ. ඒ අයට ඒ බලපත්‍ර තියාගන්න බැහැ. මොකක්ද මේ ගොල්ලන් කරන්නේ? මේ companies මත් පැන් නිෂ්පාදනය කරනවා. නිෂ්පාදනය කරලා බඩු ටික උදේ 10.00 විතර වෙනකොට යවනවා. ගල් නම් ගල්, පොල් නම් පොල්, ඒ ඔක්කොම යවනවා. යැව්වාම මොකද වෙන්නේ? මම කිව්ව ගණන අනුව රුපියල් 2,780 ගණනේ බෝතල් ලක්ෂයක් එළියට ගියොත්, ඒ සල්ලි ටික කාටද අහිමි වෙන්නේ? මේ සල්ලි ටික අහිමි වෙන්නේ රටේ භාණ්ඩාගාරයට. මම අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ පිළිබඳ පරීක්ෂණයක් කරන්න කියලා. මත් පැන් නිෂ්පාදනය කරන අයට මත් පැන් විකිණීමේ බලපත්‍ර විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. ඒකයි මම ඔබතුමාට කිව්වේ. කරුණාකරලා ඒවා අහෝසි කරන්න. මොකද, මේවා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට එන්න තිබෙන ආදායම. තමුන්නාන්සේලා රුපියල් බිලියන 200යි මේකෙන් බලාපොරොත්තු වෙන්නේ. නමුත් රුපියල් බිලියන 500ක් සොයන්න පුළුවන් වැඩ පිළිවෙළක් මේ තිබෙන්නේ. හැබැයි, ඒක නතර කරලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා මේ හොරකම් ටික නතර කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා
(*மாண்புமிகு தவிசாளர் அவர்கள்*)
(The Hon. Chairman)
Hon. Member, could you please wind up?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම විනාඩියෙන් අවසාන කරනවා, ගරු සභාපතිතුමනි.

අවසාන කරුණ වශයෙන් මම කියන්නම්, ඊයේ දිලීප පිරිස් මහත්මයා කියලා තිබුණු කථාව. එතුමා කියලා තිබුණා, "දැන් මට උසාවි එන්න බැහැ. ආරක්ෂාව සහිතව තමයි උසාවි එන්න වෙලා තිබෙන්නේ" කියලා. ලංකාවේ ඉන්න නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තමයි එහෙම කියන්නේ. මහජන ආරක්ෂාව භාර ඇමති කිව්වා, "අපි පොලිස්පති අත්අඩංගුවට ගන්න හැදුවා. ඔහුගේ දේපළ රාජසන්තක කරන්න හැදුවා. ඒක නිසා තමයි ඔහු ටක් ගාලා ඇවිත් භාර වුණේ" කියලා. මොකක්ද අවසානයේ වුණේ? භාර වුණාට පසු දිලීප පීරිස් මහත්මයා කියනවා, "මේ පොලිස්පතිට අඩුම තරමින් ඡන්ද අයිතියවත් නැහැ. පදිංචි තැන ඡන්ද අයිතිය නැහැ. ඡන්ද හිමි නාමලේඛනයේ නම ලියාපදිංචි කරලා නැහැ. අඩුම තරමින් push cycleඑකක්වත් නැහැ. එයා ghost කෙනෙක්" කියලා. එහෙම තමයි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් කිව්වේ. මේවා ගැන කථා කළාම තමුන්නාන්සේලා මොනවාද කියන්නේ? කවුද එයා මෙච්චර දවසක් -දවස් විසි ගණනක් යනකම්- ආරක්ෂා කළේ? කවුද එයා ආරක්ෂා කළේ? අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමා කෙළින්ම කිව්වා, පොලිස්පති ඉන්න තැනත් දන්නවා, අපි වෙලාවට ඔහු අත්අඩංගුවට ගන්නවා කියලා. ඉතින් කොහේද අත්අඩංගුවට ගත්තේ? ඊළඟට, සෙව්වන්දි ඉන්න තැනත් දන්නවා කිව්වා.

ගරු සභාපතිතුමනි, මේ වාගේ ක්‍රියාදාම තුළින් මේ රටේ නීතිය රකින මිනිස්සු විතරක් නොවෙයි අමාරුවේ වැටෙන්නේ. පළමුවැනි වතාවට නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් කියනවා, "මම මේ නඩුවට එන්නේ නැහැ. මට ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මගේ කනිෂ්ඨ අය මේ නඩුව කරගෙන යයි" කියලා. මෙන්න මෙතැනට රටේ නීතිය වැටිලා තිබෙනවා. ඒකයි මම කියන්නේ. කරුණාකරලා මේ පිළිබඳ කල්පනා කරන්න කියමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(*மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்*)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු සභාපතිතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, කාරණා දෙකක් කියන්නට ඕනෑ. එක, ආයෝජන සහ කොටස් වෙළෙඳ පොළ ඉලක්ක කරලා කරුණක් මතු කළා. දර්ශකයක් ගැන සහ අපේ කොටස් වෙළෙඳ පොළේ ගැටලුවක් තිබෙන නිසා ආයෝජකයන් එන්නේ නැති තත්ත්වයක් ගැන, "price of earnings" කියලා එකක් කිව්වා. නමුත් මම කියන්න කැමතියි, මූල්‍ය වෙළෙඳ පොළේ, කොටස් වෙළෙඳ පොළේ price of earnings කියලා දර්ශකයක් නැහැ කියලා. මම හිතන විධියට එතුමා අදහස් කරන්න ඇත්තේ Price-to-Earnings, එහෙම නැත්නම් Price-Earnings කියන, මිල ඉපයුම් අනුපාතය කියන එක වෙන්න ඇති. ඒකෙන් අදහස් කරන්නේ සමාගමක් තමන්ගේ ඉපැයීම වෙනුවෙන් වෙළෙඳ පොළේ මිලත් එක්ක කොච්චර අවුරුදු ගණනක් බලාගෙන ඉන්න ඕනෑද කියන එක. මේක සාපේක්ෂ මිල දර්ශකයක්. ඉපැයීම රුපියල් 10 නම්, කොටස් වෙළෙඳ පොළේ මිල රුපියල් 50 නම්, ඔහුගේ ආයෝජනය recover වෙන්න අවුරුදු 10ක් යනවා. එතකොට ඒක සංසන්දනය කරන්න බැහැ, රටවල් රටවල් අතර. ලංකාවේ Price-to-Earnings Ratio එක 9.2යි. ඒකේ අනෙක් පැත්ත ගත්තාම, ඔහු යොදන ආයෝජනයට ප්‍රතිලාභය ලැබෙනවා, earnings yield - ඉපැයීම් එලදා - අනුපාතය අනුව සියයට 11ක් පමණ. ඒ කියන්නේ ලංකාවේ තිබෙන පොලි අනුපාතත්, අනෙක් අනුපාතත් එක්ක ගත්තාම මේක ඉතා සමපාතයි. ඒක වෙනත් රටවල් එක්ක සංසන්දනය කරලා කිව්වා, අපි පහළට වැටිලා ඉන්නේ කියලා. නමුත් වෙන රටවල පොලී අනුපාතය අඩුයි. ඒ නිසා සංසන්දනය කරන්න බැරි එවැනි දත්ත ඉදිරිපත් කිරීම වැරදියි.

ඊළඟට, මත්පැන් සම්බන්ධ කාරණය. ඒක හංගලා ගහපු එකක් නොවෙයි. ආර්ථිකය ස්ථායී කරගෙන එනකොට

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

උද්ධමනයත් එක්ක ගැළපීම් සිද්ධ කරන්න ඕනෑ භාණ්ඩ වර්ගවල කාණ්ඩ ගණනාවක් තිබෙනවා. අපේ අත්‍යවශ්‍ය භාණ්ඩ තිබෙනවා. සමහරු තර්ක කරනවා, අත්‍යවශ්‍ය නැහැයි කියලා. නමුත් අපි කවුරුත් දන්නවා, එතැනදී තෝරා ගත් භාණ්ඩ, ඒ කියන්නේ මත්පැන් සහ electronics වැනි භාණ්ඩවල මිල ගණන් යම් adjust කිරීමක් කරන්න ඕනෑ බව. මොකද, අපි මේ බිඳ වටිටපු ආර්ථිකයක් තමයි නැවත හෙමින් ස්ථායී කරගෙන යන්නේ. එතැනට යොදලා තිබුණු අනුපාතයට අනුව, ඒ කියන්නේ සියයට 4කුත්, උද්ධමන අනුපාතය වන සියයට 1.9කුත් ගළපලා තමයි මේ බදු අනුපාතය සකස් කරලා තිබෙන්නේ. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Next, the Hon. Sunil Handunnetti, you have 15 minutes.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Hon. Sunil Watagala, please make it short. We are pressed for time.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, සමාජ මාධ්‍යවලත්, දයාසිරි ජයසේකර මැතිතුමා කියපු කාරණය අනුවත් මම ප්‍රකාශයක් කරලා තිබෙනවා ලු, දේශබන්දු තෙන්නකෝන් සිටින තැන මම දන්නවා කියලා. *[බාධා කිරීමක්]* ඔව්, මම දන්නවා කියලා කිව්වා ලු. මම එහෙම ප්‍රකාශයක් කරලා නැහැ, ගරු සභාපතිතුමනි. මම කියලා තිබෙන්නේ ඒ සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙනවා, ඒ වාගේම නීතිය ක්‍රියාත්මක කරලා තිබෙනවා කියන එකයි. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 60, 61 සහ 62 වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත් නිසා තමයි දේශබන්දු තෙන්නකෝන් ගරු අධිකරණයට ඇවිල්ලා තිබෙන්නේ. මම තවදුරටත් විපක්ෂයට කියනවා, මේ අසත්‍යය සමාජගත කරන්න එපා කියලා. සෙව්වන්දි හෝ දේශබන්දු තෙන්නකෝන් සිටින තැන මම දන්නවා කියලා මම කිසිම තැනක කියලා නැහැ. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන බව, නීතිය ක්‍රියාත්මක කරනවා කියලා තමයි මම කියා තිබෙන්නේ. ඔබතුමා කොයි තරම් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්ද? ඒ නිසා මේ අසත්‍යය සමාජගත කරන්න එපා කියලා මම දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කියනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැන් හරි නේ, දැන් ඇති නේද? *[බාධා කිරීමක්]* ඇති නේද? ඔය phone එක පොළොවේ ගහන්නේ නැතිව තියන්නකෝ. *[බාධා කිරීමක්]* ඔය phone එක හැන්සාඩ්ගත කරන්න නම් එපා. මොකද, ඕකේ තිබෙනවා අර්ජුන මහේන්ද්‍රන්ගේ කාලයේ ඉඳලා තිබෙන ඒවා. *[බාධා කිරීමක්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, I will give you 15 seconds.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මෙතුමා රූපවාහිනියට ගිහිල්ලා කළ ප්‍රකාශය ගැන මම කිව්වේ. මම අසත්‍ය සමාජගත කරන්නේ නැහැ. එතුමා කළ ප්‍රකාශය තමයි, "පොලිස්පති ඉන්න තැනත් අපි දන්නවා, ඉෂාරා සෙව්වන්දි ඉන්න තැනත් දන්නවා. අපි නියම වෙලාවට ඒගොල්ලන්ව අත්අඩංගුවට ගන්නවා" කියන එක. ඒ recording එක තිබෙනවා. මම දැන් මෙතැන ඒක දාන්නේ නැහැ. මම ඒක ඉදිරිපත් කරන්නම්. එතකොට සභාගත කරන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

[පූ.භා. 10.58]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම 2025 අය වැය විවාදයේ අවසාන දවසේ මුදල් අමාත්‍යාංශයට අදාළ කාරණා කිහිපයක් ගැන කථා කරන්න ඕනෑ. අපි රජයක් හැටියට බලාපොරොත්තු වුණු ප්‍රධාන දේ තමයි අපේ රටේ දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය සහ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම. දැන් ඉතා පැහැදිලිව දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු ඇතුළු මේ පාර්ලිමේන්තුවේ 159දෙනාගෙන් කිසි කෙනෙක් ආර්ථිකය පිළිබඳවත්, රටේ දේශපාලනය පිළිබඳවත්, රටේ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් ඇහිලි ගහන්නේ නැහැ.

දැන් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, "මාතර හඳුන්නෙත්ති දන්නවා බලපත්‍ර දෙන හැටි" කියලා. එහෙම කිව්වාම implication එකක් යනවා, - *[බාධා කිරීමක්]* නැහැ, ඒක තමයි. මාතර ඉන්න අයට බලපත්‍ර ගන්න හඳුන්නෙත්ති උදවු කරලා වාගේ කියන ඇහැවීමක් - implication එකක් - යනවා. එහෙම නේ? මොකද, ඒකට හේතුවක් තිබෙනවා. ඒකට හේතුව තමයි මීට කලින් මහින්ද රාජපක්ෂගේ, බැසිල් රාජපක්ෂගේ ආණ්ඩුවේ මැති ඇමතිවරු එහෙම තමයි කළේ. ඒගොල්ලන් වැඩ කළේ එහෙමයි. මට මතකයි, එක පාර බලපත්‍ර 200ක් දුන්නා. ඡන්ද කාලය කිට්ටු වෙනකොට මොකද කරන්නේ? බලපත්‍ර දෙනවා. බලපත්‍ර දෙන්නේ මන්ත්‍රීවරුන්ගේ නමට. ඒ වාගේම ඔවුන්ගේ ඥාතීන්ට දෙනවා. ඒවා ගත්ත කට්ටිය මෙතැන ඉන්නවා. ඒගොල්ලන් හිතාගෙන ඉන්නවා, අපිත් එහෙම තමයි කියලා. ගරු සභාපතිතුමනි, අපිත් එහෙමයි කියලා හිතනවා. අපි එහෙම නැහැ. බලපත්‍ර ගත්ත අපේ කෙනෙක් ඉන්නවා නම්

වාචිකව හෝ ලිඛිතව කියන්න කියලා මම අභියෝග කරනවා, අසත්‍ය කථා කියන්නේ නැතිව.

මේ ගොල්ලන් phone එකේ තොරතුරු තිබෙනවා කියලා phone එක සභාගත කළොත් එහෙම, අර්ජුන මහේන්ද්‍රන්ගේ ඉඳලා තොරතුරු එහි තිබෙනවා, ගරු සභාපතිතුමනි. අනෙක් එක, ඔය phonesවල තිබෙන ඒවා මේ රටේ දරුවන්ටවත් බලන්න බැහැ. ඒක නිසා සභාගත කරන්න නම් එපා, ඔය phonesවල තිබෙන ඒවා.

විශේෂයෙන් අද අපි අපේ රටේ දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා තිබෙනවා. නීතියේ ආධිපත්‍යයට කිසි කෙනෙක් ඇඟිලි ගහන්නේ නැහැ. ඊළඟට, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන නිසා තමයි අද නිලධාරින්ට කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අපිට අද ආයෝජකයෝ ආයෝජන ගෙනෙන්නේ මොකද? අද විදේශ ආයෝජකයෝ එන්නේ ඇයි? ඒ වාගේම ලංකාවේ ආයෝජකයෝ ඇහැ ඇරලා තිබෙන්නේ ඇයි? අද භයක් සැකක් නැතිව ආයෝජන ගෙනෙන්න පුළුවන්, පගාව ඉල්ලන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, අද අපේ රටේ ආර්ථිකමය වටිනාකමක් ඇති ඉඩම් ඉතුරුවෙලා තිබෙනවා නම් තිබෙන්නේ ඒ වෙන කිසිවක් නිසා නොවෙයි. අපට සාක්ෂිත් එක්ක කියන්න පුළුවන්, මේ ගොල්ලෝ දෙපැත්තට බෙදිලා කොල්ල කන්න ගිහිල්ලා දෙගොල්ලෝ කුලල් කාගෙන ඉතිරි වුණු ඒවා තමයි ඒ ඉතිරි වෙලා තිබෙන්නේ. අද මාතර, පොල්හේන, මඩිහ ප්‍රදේශයේ මුහුදු අයිනේ රජයේ ඉඩමක් තිබෙනවා, ඒ ඉඩම ඉතුරුවෙලා තිබෙන්නේ දෙගොල්ලන් පොරකාපු නිසයි. පොරකාපු නිසා ඒ ඉඩම ඉතුරුවෙලා තිබෙනවා. නාමල් රාජපක්ෂගේ කට්ටිය පොරකනකොට ඩලස්ගේ කට්ටිය විරුද්ධයි, ඩලස්ගේ කට්ටිය පොරකනකොට ලක්ෂ්මන් යාපාගේ කට්ටිය විරුද්ධයි. ඒ නිසා අන්තිමේදී කාටවත් ඒක බෙදාගන්න බැරි වුණා. මේ රටේ රජයේ ඉඩම් ඉතුරුවෙලා තිබෙනවා නම් තිබෙන්නේ, මේ ගොල්ලෝ පොරකාලා ඉතුරු වෙච්ච ඒවා. ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා අද උදේ ලැයිස්තුවක් සභාගත කළා. ඇත්තටම මම සඳහන් කරන මේ ගොල්ලන්ගේ "හක්කෙ බුදු රැස්, බොක්කෙ දඩ මස්" ප්‍රතිපත්තිය මේ රටට පෙන්වන්න ඕනෑ; හෙළිදරව් කරන්න ඕනෑ. දැන් සුදු ඇඳගෙන කෑ ගහන මේ හොරුන්ගේ වැඩ හෙළිදරව් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, පගාව ගත්ත, නොගත්ත කට්ටිය කවුද කියලා හරියට පෙන්වන්න මුදල් ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමා විසින් ජනාධිපති කොමිසමක් පත් කරන්න ඕනෑ. විවෘත හා ස්වාධීන ජනාධිපති කොමිසමක් පිහිටුවන්න කියලා මම ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

පසුගිය ආණ්ඩු කාලයේ මේ ගොල්ලෝ ආයෝජකයින්ගෙන් පගාව ගත්ත හැටි කියන්න දිවුරුම් පෙත්සම් දෙන්න ලැහැස්ති ආයෝජකයිනුත් ඉන්නවා. මේ ගොල්ලෝ කොච්චර පගාව ගත්තාද කියලා ඒගොල්ලෝ කියයි. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ ඇමතිකම් අරගෙන පිල් මාරු කරපු හුඟදෙනෙක් ඉන්නවා, පගා මරුවෝ. ආයෝජකයෝ ආයෝජනය කරන්නේ නැතුව දාලා ගියේ ඒ නිසායි. සමහරුන්ට feasibility report එකක් ඉදිරිපත් කරන්න හම්බවෙන්නේ නැහැ, ඊට කලින් ඩොලර් මිලියන ගණන් ඉල්ලනවා. එවැනි තත්ත්වයක් තමයි තිබුණේ. ඒ ගොල්ලෝ අදත් බයයි, ඒවා විවෘතව කථා කරන්න. මොකද, මේ ගොල්ලන්ගේ හස්තයන් ඒ තරමට බලවත්ව තිබුණා.

දවස් ගණනක් යනකල් දේශබන්දු අත්අඩංගුවට ගත්තේ නැත්තේ ඇයි කියලා අභියෝග කරන කට්ටිය, දේශබන්දු තමන් ළඟින්ම තියාගෙන ඇමතිකම් කළා, ආණ්ඩු තියාගෙන සිටියා, මිනිසුන්ව මර්දනය කළා. අද නීතිඥයින්ටත්, නඩුකාරයින්ටත්, සොලිසිටර්ජනරාල්ටත් කට ඇරලා කෙළින් කථා කරන්න පුළුවන්. රාජපක්ෂ ආණ්ඩුව කාලයේ ඔහොම කිව්වා නම් මොකද වෙන්නේ? ගරු සභාපතිතුමනි, රාජපක්ෂගේ ආණ්ඩුව කාලයේ දේශබන්දු "තගෙක්" කියලා කිව්වා නම් ඉන්න හම්බවෙනවාද? අද කට ඇරලා කෙළින් කථා කරන්න නිලධාරින්ට බලය දීලා තිබෙන්නේ කවුද? මේ තුනෙන් දෙකේ ආණ්ඩුව. තුනෙන් දෙකේ බලයක් තිබෙන ආණ්ඩුව තමයි අද මෙහෙම කථා කරන්නේ. මේ අය මාධ්‍යවලට පෙනෙන්න මේ පාර්ලිමේන්තුව ඇතුළේ චණ්ඩින් වගේ සද්දෙ දමන්නේ මොකද? ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලාගේ තිබෙන නිහතමානීකම නිසා. ඒ වාගේම ගරු කථානායකතුමාගේ තිබෙන නිහතමානීකම නිසා.

අපි දන්නවා, පසුගිය කාලයේ චමල් රාජපක්ෂ ඔය කථානායක පුටුවේ සිටියා. එතුමා මේ අය ඉන්න පැත්ත හැරෙනකොට මේ කට්ටියට වූ යනවා. ඇත්ත කථාව, ඒක. ඒ පැත්ත හැරිලා බලනකොට මේ ගොල්ලෝ බයයි. කථා කරන්න දෙයක් නැහැ. කථානායකතුමා එතුමාගේ ආසනයේ ඉඳලා, බැසිල් මෙතැන ඉඳලා නැඟිටිනත් ඇති. කට්ටිය වාඩි වෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා පාර්ලිමේන්තුවේ Chamber එකේ නොවෙයි, එළියට යනකොට වාගේම වැසිකිළියට ගියත් ඔක්කෝම කට්ටිය පස්සෙන් යනවා. කැන්ටීන් එකට යනකොටත් එහෙමයි. නාමල් බේබි පිරිවරාගෙන යන්නේ. මෙහෙම හිටපු කට්ටිය අද කොන්ද කෙළින් තියාගෙන විපක්ෂයේ ඉඳගෙන කථා කරන්නේ ඇයි? ඔබතුමන්ලාගේ තිබෙන නිහතමානීකම නිසායි, ගරු සභාපතිතුමනි. ස්ථාවර නියෝග උල්ලංඝනය කරලා, පාර්ලිමේන්තු සම්ප්‍රදායන් උල්ලංඝනය කරලා පැය ගණන් කථා කරනවා. අද 159ක් වන අපේ මන්ත්‍රීවරු නිහතමානීව බලාගෙන ඉන්නේ ඇයි? ඒ මොකද කියලා කල්පනා කරලා බලන්න. මේ රටේ ජනතාව අපට දුන් ජන වරම ආරක්ෂා කරන්න, දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න ඕනෑ නිසා.

මාසයකට ආසන්න කාලයක් මේ අය වැය විවාදය පැවැත්වුණා. රුපියලක් හෝ වංචා කළා කියලා, හොරකම් කළා කියලා එක ඇමතිවරයෙකුට හෝ නියෝජ්‍ය ඇමතිවරයෙකුට හෝ විරුද්ධව ඇඟිල්ල දිගු කළාද? චෙනදා අය වැය විවාදයක් පැවැත්වුණා නම් මෙතැන රෙදි ගැලවිලා ඉවරයි. අපි ප්‍රශ්න අහලා තිබෙනවා, ඇත්ත. අපි කථා කරලා තිබෙනවා, ඇත්ත. හැබැයි, තොරතුරු සහ දත්ත - facts and figures - නැතුව අපි කිසිම දෙයක් කථා කරලා නැහැ, ගරු සභාපතිතුමනි. මේ අය අමු අවලාද නහන්නේ. දැන් මෙතැන අහවන්න හදනවා, ඒගොල්ලන්ගේ කාලයේ බලපත්‍ර දුන්නා වාගේ අපිත් එහෙම කරනවා කියලා. ශ්‍රීලන්කන් ගුවන් සේවයට දැම්මේ ඒ අයගේ ඥාතීන්. ප්‍රධාන විධායක නිලධාරි ලෙස හිටපු කපිල චන්ද්‍රසේන ඔවුන්ගේ ඥාතියෙක්. එහි හිටපු සභාපති නිශාන්ත වික්‍රමසිංහ, ශිරන්තිගේ මස්සිනා. බල්ලා ගේන්න සිංගප්පූරුවට plane එකක් යැව්වා. බල්ලෝ ගේන්න plane යවපු කට්ටිය ආරක්ෂා කරපු අය දැන් කථා කරන වේගය, දැන් කථා කරන සද්දේ කොහොමද? සරත් ගනේගොඩ කියන්නේ වැටුප් ගන්නේ නැතුව අපිත් එක්ක ස්වේච්ඡාවෙන් වැඩ කරන කෙනෙක්. මේගොල්ලන්ට තිබෙන ඊර්ෂ්‍යාව මොකක්ද කියලා දන්නවාද? මෙතුමන්ලාගේ කුහකකම මොකක්ද? මේ ගොල්ලෝ විකුණාගෙන කන්න හදපු රාජ්‍ය ව්‍යාපාර, රාජ්‍ය ආයතන අපි විකුණන්නේ නැති එක. දැන් මේ ගොල්ලන්ට තිබෙන ලොකුම ප්‍රශ්නය ඒක. මේ ගොල්ලෝ දණ ගහගෙන ගිය IMF එක ඉස්සරහා අපි රටක් හැටියට කොන්ද කෙළින් තියාගෙන කථා කරලා ණය ගන්න එකයි මේ ගොල්ලන්ට තිබෙන ප්‍රශ්නය. ඇයි, මේ අය ඒ ගොල්ලන්ගේ කකුල් ලෙව කෑවා.

ඒගොල්ලෝ ඉල්ලන්න කලින් දුන්නා. දැන් ඒගොල්ලන් අපට කියනවා, ඇයි ඔය ගොල්ලෝ එහෙම කරන්නේ නැත්තේ කියලා. ඕක තමයි ප්‍රශ්නය. කල්පනා කරලා බලන්න, මේ ගොල්ලන්ට ඕනෑ මොකක්ද? මේ ගොල්ලන්ට ඕනෑ, මේ ගොල්ලන් කරපු විධියට අපිත් කරන්නයි. හැම තිස්සේම මේ කියන්නේ ඒකයි. මේ ගොල්ලන්ට විශාල කුහකකමක් තිබෙනවා, විශාල ඊර්ෂ්‍යාවක් තිබෙනවා. ගම්වලින් ඇවිල්ලා, නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගෙන විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා, මේ රටේ ජාතික සම්පත්වලට ආදරය කරන මිනිස්සු ටිකක් මේ පැත්තේ වාඩිවෙච්ච එකේ ඊර්ෂ්‍යාවයි මේ ගොල්ලන්ට තිබෙන්නේ. මේ මුළු විවාද කාලයේම පිපිරුවේ මොකක්ද, විපක්ෂයෙන්? ඒගොල්ලන්ගේ පන්තියේ බල දේශපාලනය බිඳ වටිටපු ගමේ මිනිස්සුන්ගේ බලය. එච්චරයි.

ඊළඟට කියනවා, විමධ්‍යගත ප්‍රතිපාදන ගැන. අපි රුපියල් මිලියන 2,250ක් වෙන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුවේ කිසි කෙනෙක් කියලා නැහැ, විපක්ෂයේ කාටවත් විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දෙන්නේ නැහැ කියලා. මගේ සාක්ෂිය, මාතර දිස්ත්‍රික්කයේ විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දීමේදී මට ඉන්නේ විපක්ෂයේ එක මන්ත්‍රීවරයායි. ඒ චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. එතුමාට හෘදය සාක්ෂියක් තිබෙනවා නම් එතුමා මෙතැනට ඇවිල්ලා ඒ ගැන කියාවි. මම මුලින්ම චතුර මන්ත්‍රීතුමාට කිව්වා, ඔබතුමා යෝජනා දෙන්න, අපි ඔක්කෝම එකතු වෙලා වැඩ කරමු කියලා. සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරුන් හැමෝම විපක්ෂයේ හැම මන්ත්‍රීවරයෙකුටම කියනවා, යෝජනා දෙන්න කියලා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දැන් ගෙනැල්ලා දෙන්නකෝ යෝජනා ටික, ක්‍රියාත්මක කරන්නේ නැද්ද කියලා බලන්න. හැබැයි, පගා ගහන්න බැහැ, හොරකම් කරන්න බැහැ. අපි නිලධාරින්ගේ වැඩවලට ඇඟිලි ගහන්න යන්නේ නැහැ. අපි නිලධාරින්ට කියන්නේ නැහැ, අරක කරන්න එපා, මේක කරන්න, අර මන්ත්‍රීගේ යෝජනාව කපන්න කියලා. අපි එහෙම නැහැ. මේ ආණ්ඩුවේ තිබෙන විශේෂත්වය ඒකයි, ගරු සභාපතිතුමනි.

ඊළඟට මේකත් කියන්න ඕනෑ, නිලධාරින්ටත් නිසි ගෞරවය සහිතව. සාමූහිකත්වය. වෙනදා දිස්ත්‍රික්කයේ ඇමතිවරුන් තුන්දෙනෙක් සිටියා නම්, දිස්ත්‍රික් ලේකම් ඒ තුන්දෙනාම කියපු විධියට කථා කරන්න ඕනෑ, ඒ තුන්දෙනාට ඕනෑ විධියට වැඩ කරන්න ඕනෑ. අද දිස්ත්‍රික් ලේකම්වරුන්ට නිදහස තිබෙනවා, අපි කණ්ඩායමක් හැටියට වැඩ කරන නිසා. ඒ නිලධාරින්ගේ වැඩවලට අපි ඇඟිලි ගහන්නේ නැහැ. අපි කිසි කෙනෙකුට බාධා කරලා නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මට විනාඩියක් ලබා දෙන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, දෙන්නකෝ බලන්න ඒ විනාඩිය, මොකක්ද කියන්නේ බලන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, you can have one minute.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තරහා ගන්න එපා. අපට විමධ්‍යගත ප්‍රතිපාදන සම්බන්ධව තවම ලිපි ඇවිල්ලා නැහැ. ඒ සම්බන්ධව ලිපි එව්වා නම් අපි අපේ යෝජනා ටික එවනවා. හැබැයි, දැන් එවා තිබෙන චක්‍රලේඛ අනුව තිබෙන්නේ සංවර්ධන කමිටුවෙන් යෝජනාව ඉදිරිපත් කරන්න කියලා. *[බාධා කිරීමක්]* නැහැ, අපට ලිපියක් එවන්න එපායැ. සාමාන්‍යයෙන් අපට මුදල් අමාත්‍යාංශයෙන් ලිපියක් එවනවා. ඒ ලිපිය තවම එවා නැහැ. අපට කියා තිබෙන්නේ සංවර්ධන කමිටුවෙන් යෝජනාව ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, එහෙම නොවෙයි නේ මීට පෙර කළේ. ඔබතුමාට මතකයි නේ, ගරු ඇමතිතුමනි. ඔබතුමා විපක්ෂයේ ඉන්න කාලයේ ඔබතුමාට මුදල් අමාත්‍යාංශයෙන් ලිපියක් එවනවා, මෙන්න මේ කරුණු මත ඔබගේ යෝජනා එවන්න කියලා. ඒ ටික අපි යවනවා, දිස්ත්‍රික් ලේකමට. දිස්ත්‍රික් ලේකමට යැව්වාට පසු දිස්ත්‍රික් ලේකම් විසින් ඒක මුදල් අමාත්‍යාංශයට යවනවා. දැන් එහෙම එකක් නැහැ. මම කියන්නේ අන්න ඒ ගැනයි. සම්බන්ධීකරණ කමිටුවෙන් හෝ අපට ලිපියක් එවන්න කියන්න. නැත්නම් දිස්ත්‍රික් ලේකම්ට කියන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි. මම ඒ ගැන පැහැදිලි කරන්නම්. ගරු සභාපතිතුමනි, ඉස්සර ඔහොම තමයි කළේ. මන්ත්‍රීවරුන්ට වෙන වෙනම රුපියල් ලක්ෂ 100, 50 වෙන් කරලා ලියුම් එවනවා, මන්ත්‍රීවරයා ඊට පස්සේ මීටර් 50ට, 100ට යෝජනා ඉදිරිපත් කරනවා. පසුගිය අවුරුදු 5 තුළ මමත් පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ නේ. මමත් හිතුවේ ඒ සම්ප්‍රදාය තමයි තවමත් තිබෙන්නේ කියලා. නමුත්, පසුගිය ආණ්ඩු කාලයේම -අපි නොවෙයි- දිස්ත්‍රික් විමධ්‍යගත වැඩ පිළිවෙළ වෙනුවට එක මධ්‍යස්ථානයක් හැටියට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යෝජනා අරගෙන, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කරන වැඩ පිළිවෙළ හදාගෙන තිබෙනවා. *[බාධා කිරීමක්]* එතකොට වුණේ මොකක්ද? දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ මේ ගොල්ලන් ඉන්න කාලයේ ආණ්ඩුවට විතරයි බෙදාගත්තේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ කාලයේ අපි විපක්ෂයේ සිටියේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔය මන්ත්‍රීතුමා ඉතින් කොයි පැත්තේ හිටියාද කියලා හොයාගන්න බැහැ නේ. හිටපු ගමන් ඒ පැත්තේ, හිටපු ගමන් මේ පැත්තේ, අර පැත්තේ, විපක්ෂයේ, ආණ්ඩු පැත්තේ, මැද, හැම තැනම ඉන්නවා නේ. මම කියන්නේ පොදු කථාව.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ වෙලාව කන්න එපා, දයාසිරි මන්ත්‍රීතුමා. ඔබතුමා දවසම නාස්ති කරනවා නේ. *[බාධා කිරීමක්]* මම කියන්නේ ඒක නොවෙයි. ගරු සභාපතිතුමනි, එදා තිබුණු සම්ප්‍රදාය වෙනස් වෙලා තිබෙනවා. ඒක හොඳයි. දැන් ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඔක්කෝම එකට අරගන්නේ. *[බාධා කිරීමක්]* මගේ වෙලාව නම් දෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, he is not permitting you. After he finishes, you may speak.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ වෙලාව දෙන්නේ නැහැ. ඔබතුමා ඕනෑ නම් විපක්ෂ නායකතුමාගෙන් වෙලාවක් ඉල්ලාගෙන කථා කරන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා කථා කරලා ඉවරයි දැන්. *[බාධා කිරීමක්]* ගරු සභාපතිතුමනි, මගේ වෙලාව දෙන්නේ නැහැ. වැරදි ආදර්ශයක් දෙන්න එපා. *[බාධා කිරීමක්]* නැහැ, ඕනෑ නැහැ. මම වෙලාව දෙන්න කැමැති නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Speak after the Hon. Minister finishes. - *[Interruption.]*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, මම වෙලාව දෙන්න කැමැති නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා තීරණය කරන්න, මම වෙලාව දෙන්න කැමැති නැහැ. ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරන්න. මේක කෝලම් මඩුවක් කරන්න දෙන්න එපා. මගේ වෙලාව කන්නත් එපා. මම සාධාරණ වෙලා එතුමාට වෙලාව ලබා දුන්නා. *[බාධා කිරීමක්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, from the time allotted to the Opposition, you can take time.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම ඉල්ලීමක් කරනවා, මගේ වෙලාව දෙන්න එපා. That is my humble request, Sir. - *[Interruption.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
That is not the - *[Interruption.]*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
No!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Please settle down! Hon. Dayasiri Jayasekara, take your time from the time allotted to the Opposition. You can make use of that time.- *[Interruption.]* Order, please!

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පෙන්වන්න. ස්ථාවර නියෝගය මොකක්ද කියලා කියන්න. ස්ථාවර නියෝගය හරියට, ගැළපෙන විධියට පැහැදිලි කරලා දෙන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 91(ආ) අනුව, - *[බාධා කිරීමක්]*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මොකක්ද, ස්ථාවර නියෝග 91(ආ) යටතේ තිබෙන්නේ? කියවන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 91(ආ) යටතේ මෙසේ සඳහන් වනවා:

"රීති ප්‍රශ්නයක් මත හෝ කථා කරනු ලබන මන්ත්‍රීවරයා විසින් මැදිහත්වීමට අවසරය දෙනු ලැබුවහොත් මිස, කිසිම මන්ත්‍රීවරයකුට බාධා කරනු නොලැබිය යුත්තේ ය."

ඒකෙන් කියන්නේ ඔබතුමාට පුළුවන් බව. එම නිසා ඒ සම්බන්ධව ඉඩක් දෙන්න. ඒ අවස්ථාව දෙන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, you have not raised a point of Order. Let the Hon. Minister finish his speech. Then, when you are allowed, you can take time from the time allotted to the Opposition.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Thank you, Hon. Chairman. - *[Interruption.]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker will be from the Opposition. You can take time from that Hon. Member.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
I can intervene.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
You can intervene, if the Hon. Minister gives way.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Thank you. ගරු සභාපතිතුමනි, මම ඉතාම ගරු කරනවා, ඔබතුමා පාර්ලිමේන්තු සම්ප්‍රදාය ක්‍රියාත්මක කරනවාට. මේ ආදර්ශය මීට කලින් මේ පාර්ලිමේන්තුවේ තිබුණේ නැහැ. මම ඔබතුමාට ගොඩක් ගරු කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Minister has not permitted his time to be taken. He wants to keep the sequence of his speech, Hon. Member. You can take your time when the Opposition is listed to speak, please.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ මීට කලින් මන්ත්‍රීවරුන්ට වෙන වෙනම සල්ලි බෙදාගෙන තිබුණා, විමධ්‍යගත ප්‍රතිපාදන විධියට. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වුණා. ඒක මාත් පිළිගන්නවා. අපි විපක්ෂයේ ඉන්නකොට අපට ඒ සම්බන්ධව උද්ඝෝෂණය කරන්නත් වුණා. හැබැයි, පසුගිය පාර්ලිමේන්තුව කාලයේ ඉඳලා විමධ්‍යගත ප්‍රතිපාදන වෙන් කිරීම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කරලා කරන්නේ. ඒක හොඳ දෙයක්. එතකොට එක නිර්ණායක පද්ධතියකට ඒක කරනවා. අපේ ආණ්ඩුව කිසිම වෙලාවක විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් කරලා නැහැ. ඒක උතුරට වෙනම දුන්නා, ඒ වාගේ බයිලා කියලා වැඩක් නැහැ. එහෙම දීලාත් නැහැ. උතුරට, දකුණට කියලා අපි වෙනසක් කරන්නේ නැහැ. විපක්ෂයේ කියලා වෙනසක් කරන්නේත් නැහැ. ඇත්ත ඒකයි. නමුත්, මීට කලින් එහෙම තිබුණේ නැහැ. මීට කලින් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට එක මොහොතක් දුන්නේත් නැහැ. අපි කියන්නේ, අදත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියලා වෙනම නැහැ, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කරලා යෝජනා ටික දෙන්න පුළුවන් බව. මම ඇත්තටම ඒක කියලා තිබෙනවා. චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා මාතර දිස්ත්‍රික්කයේ. මම එතුමාට කියලා තිබෙනවා, එතුමාගේ යෝජනා දෙන්න කියලා. *[බාධා කිරීමක්]* අනෙක් අයත් එහෙමයි. නොලැබුණු අය ඉන්නවා නම් ඒක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී කථා කරන්න. මෙතැනට ඇවිල්ලා බොරුවට රටට පෙනෙන්න පළාත් පාලන මැතිවරණය නිසා ලකුණු දමාගන්න කෑ ගහන්නේ නැතිව. ඒකයි මම කියන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sunil Handunnetti, you have two more minutes of your allocated time.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක නේ අන්තිමට වෙන්නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, ඉවරයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, මේගොල්ලන්ට කුහකකම, ඉරිසියාව තිබෙන්නේ. වෙන මොකක්වත් නොවෙයි. මේ රටේ දේශපාලනය මහජනතාව වෙනස් කළ බව තවම මේගොල්ලන් දන්නේ නැහැ. මේගොල්ලන් හිතාගෙන ඉන්නේ මේගොල්ලන්ගේ පෙළැන්තියටයි, පරම්පරාවටයි, හොර ගුහාවලටයි මේවා බෙදා දීලා තිබුණා කියලා. ඒක එහෙම නැහැ. මම ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මමත් COPE එකේ සභාපතිවරයා හැටියට මැදිහත් වෙච්ච අර්ජුන මහේන්ද්‍රන්ගේ, ඇලෝසියස්ගේ බැඳුම්කර ගනුදෙනුවේ සියලුම කරුණු නැවත අධිකරණයට ගෙනෙන්න කියලා. ඒ සඳහා ජනාධිපති කොමිසම නැවතත් හරියට ක්‍රියාත්මක කරන්න. ඒක හරියට ක්‍රියාත්මක කළොත් telephonesවල තිබෙන ඒවා, කථා කරපුවා, බෙදා ගත්ත ඒවා ඔක්කෝම හෙළිදරව් වෙනවා. ඒ වාගේම තමයි ආයෝජකයෝ ඇවිල්ලා ඉන්නවා. පගාව ගත්ත ඒවා, බලපෑම් කරපුවා, බලපෑම් කරලා කරපු දේවල් පිළිබඳව විවෘතව ඒ ආයෝජකයන්ට, රටින් ගිය අයට, රට ඉන්න අයට, විදේශිකයන්ට, දේශීය අයට එළියට ඇවිල්ලා කථා කරන්න පුළුවන් ස්වාධීන ජනාධිපති කොමිසමක් පත් කරන්න කියලා අපි ජනාධිපතිතුමාට කියනවා. අපි මේ රටේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය නැවත හකුළන්න දෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sunil Handunnetti, your time is over.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ රටේ දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය නැවත අපි හකුළන්න දෙන්නේ නැහැ. ඒක ආරක්ෂා කරන්න තමයි මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා ඔබතුමාටත්, ගරු කථානායකතුමාටත් ඇත්තටම අපි ස්තුතිවන්ත වෙනවා, මේ තිබෙන නිහතමානිත්වය වාගේම පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් ආරක්ෂා කරනවාට. අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්නේ, අපිත් එක්ක එකහතාවෙන් වැඩ කරමු කියලායි. චණ්ඩි පාටවලින් නොවෙයි. ඔයගොල්ලන්ගේ චණ්ඩි පාටි දේශපාලන පක්ෂ ඇතුළේ තියාගන්න. තමන්ගේ පක්ෂය බෙරාගන්නවත් බැහැ. ඒවා පොල් මල පොළොවේ ගැහුවා වාගේ සී සී කඩ විසිරිලා යනවා. පක්ෂ සභාපතිවරුන් අයින් වෙනවා. නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප වෙනවා. ඒ ඔක්කෝම තිබියදී මෙහේ ඇවිල්ලා චණ්ඩි පාට දානවා. එහෙම කරන්නේ අපේ නිහතමානීකම නිසා නම් ඒක වැරදියි.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Chandrasekar?

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු සභාපතිතුමනි, මගේ වෙලාවෙන් විනාඩි 2ක් එතුමාට ලබා දෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මේ පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් නවක වෙන්න පුළුවන්. හැබැයි, අපි හොරකම් කරන අය නොවෙයි. අපි මේ රටේ මහජනතාවගේ ධනය නාස්ති කරන අය නොවෙයි. අපි දේශපාලන බලපෑම් කරලා නිලධාරින්ව යටපත් කරන අය නොවෙයි. අද නිලධාරින්ට ප්‍රමුඛත්වය ලබා දී තිබෙනවා, ඔවුන්ගේ දක්ෂතාව අනුව වැඩ කරන්න. විවේචන තිබෙනවා නම් අපට ඉදිරිපත් කරන්න. අපි නැවතත් කියන්නේ ඒකයි. මේ පාර්ලිමේන්තුව මේ රටේ ජනතාවගේ. අපි ඒක ආරක්ෂා කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මම එක කාරණයක් කියන්න ඕනෑ. දැන් විශාල කථා බහක් යනවා නේ, උත්සව කාලයේ බඩු මිල වැඩියි, මේ ආණ්ඩුව මොකුත් කරලා නැහැ කියලා. නමුත්, ඒක එහෙම නොවෙයි.

මා ළඟ තිබෙනවා, භාණ්ඩ 39ක නම් ඇතුළත් ලැයිස්තුවක්. මේ භාණ්ඩ සියල්ලම අත්‍යවශ්‍ය භාණ්ඩ. ගරු සභාපතිතුමනි, මම මේ භාණ්ඩ ලැයිස්තුවත් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

වෙළෙඳ පොළේ දුඹුරු සීනිවල මිල පසුගිය අවුරුද්දේ මාර්තු 24වැනි දා ඉඳලා මේ අවුරුද්දේ මාර්තු මාසය වෙනකොට රුපියල් 145කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම, වියළි මිරිස් මිනිස්සු ගොඩක් පරිභරණය කරනවා. වියළි මිරිස් කිලෝග්‍රෑමයක මිල රුපියල් 360කින්, ඒ කියන්නේ සියයට 30කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම, රුපියල් 1,195ට තිබුණු මුංඇට කිලෝග්‍රෑමයක මිල රුපියල් 555කින් - සියයට 46කින් - අඩු වෙලා දැන් රුපියල් 640යි. පසුගිය අවුරුද්දේ රුපියල් 1,075ට තිබුණු කව්පි කිලෝග්‍රෑමයක මිල රුපියල් 310කින් අඩු වෙලා, දැන් රුපියල් 765යි. ඒ කියන්නේ, සියයට 29කින් මිල අඩු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, භාණ්ඩ 39කින් බහුතර භාණ්ඩ ප්‍රමාණයක මිල අඩුයි.

ඒ විතරක් නොවෙයි. අප්‍රේල් මාසයේ සිට වැටුප් වැඩි වෙනවා. අප්‍රේල් 10වැනි දා වෙනකොට රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි වෙනවා. ඒ වැටුප් වැඩි වන අයගේ ආදායම මිනිස්සු අතරට යනවා. එතකොට වියදම් කිරීමේ හැකියාව ඇති වෙනවා. ඒ නිසා අද ඉදිකිරීම් ක්ෂේත්‍රය ඇතුළු සියලු දේ ගත්තාම විමධ්‍යගත මුදල්වල ඉඳලා හැමදේම යන්නේ මහ ජනතාවගේ අතට. ඒවා හොරු අතට යන්නේ නැහැ; කොමිස් ගහන අය අතට යන්නේ නැහැ; විදේශ ආයෝජකයන් අතට යන්නේ නැහැ. මේ රටේ ජාතික සම්පත් විකුණන්නේ නැතුව ආර්ථිකය ආරක්ෂා කරලා, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරලා, නිදහස ක්‍රියාත්මක කරලා, අද රටේ ජනතාව සතුටින් ඉන්නවා. නමුත්, මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න කුහක ටික දෙනා තවම ඉරිසියාවෙන් කෙදිරි ගානවා. ඒක තමයි වෙනස, ගරු සභාපතිතුමනි. මට අමතර කාලයක් ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, you are utilizing the time allotted to the Opposition.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මම මේ කාරණය කියන්න කැමැතියි. මම දන්නවා, මම කොහේද ඉන්නේ කියලා. මම එහෙම ඉන්න ගමන් වධකයන්ට උදවු කරන්න විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා නැහැ. මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු මිනිස්සු පාර්ලිමේන්තු සම්ප්‍රදායය සුරකින්න හදනවා කියන එක ගැන අපි සියලුදෙනාම සන්තෝෂ වෙනවා. ඒක තමයි මට කියන්න තිබෙන්නේ. ඒ නිසා බෙදා දෙන එක සාධාරණව බෙදා දෙන්න. සෑම මන්ත්‍රීවරයෙකුටම අයිතියක් තිබෙනවා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු සභාපතිතුමනි, මෙතුමා මෙච්චර මරාගෙන මැරුණේ මේක කියන්නද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක කියන්න ඉඩ දුන්නේ නැහැ නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

දැන් මේක කියන්න ද එතුමා මරාගෙන මැරුණේ? *[බාධා කිරීමක්]* ගරු සභාපතිතුමනි, මට මොහොතක් දෙන්න. මේ මන්ත්‍රීතුමා මේක කියන්න ද ස්ථාවර නියෝග යටතේ කාලය ඉල්ලා සිටියේ? දැන් මෙතුමා කිව්වේ කථාවෙන් පස්සේ පැහැදිලි කරනවා කියායි. මෙතැනදීත් තිබෙන්නේ ඉරිසියාව නේ. *[බාධා කිරීම්]* මෙතැනදී අතීතයේ බෝම්බ ගහපුවා, ඒවා මේවා මතක් කරන්නේ මොකටද? *[බාධා කිරීම්]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Could we move on to the next speaker? - *[Interruption.]* The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. - *[Interruption.]* The Hon. (Dr.) Pathmanathan Sathiyalingam, please.

[மு.ப. 11.18]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சி அடைகின்றேன்.

இந்த நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்தக்கூடிய முக்கிய அமைச்சுகளில் இந்த அமைச்சும் ஒன்றாகும். ஒரு நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துவதற்கு நிதிவளம், திட்டமிடல் என்பன மிகவும் முக்கியமானவை. அந்த வகையில், நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு இந்த நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துவதற்காகக் கொண்டுவருகின்ற நல்ல திட்டங்களுக்கு நாங்கள் நிச்சயமாக

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

உறுதுணையாக இருந்து, இந்த நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துவதற்குத் தயாராகவிருக்கின்றோம். இந்தச் சபையில் பேசப்படுகின்ற சில விடயங்களைப் பார்க்கும்போது வெட்கமாக இருக்கின்றது. யுத்தம் முடிந்ததும் நாங்கள் பயத்துடன் - பீதியுடன் - வாழ்ந்த காலமொன்று இருந்தது. ஆனால், சகோதரர் சுனில் ஹந்துன்னெத்தி அவர்கள் கூறிய ஒரு விடயம் சிரிப்புக்கிடமாக இருக்கின்றது. அதாவது, பாராளுமன்ற உறுப்பினர்கள்கூட பயத்தோடு வாழ்ந்ததாக அவர் குறிப்பிட்டார்.

கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் இந்த நாட்டின் நிதித் திட்டமிடலிலும் பொருளாதாரத் திட்டமிடலிலும் விட்ட பாரிய பிழைகளே இந்த நாடு கையேந்துகின்ற நிலைக்குச் செல்வதற்குக் காரணமாகும். யுத்தம் முடிவடைந்து 15 வருடங்களாகியும் வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள எங்களுடைய மக்களின் பொருளாதாரத்தை மேம்படுத்துவதற்கு அல்லது மேம்படுகின்ற பொருளாதாரத்தின் ஊடாக இந்த நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துவதற்கு எந்தவிதமான வசதி வாய்ப்புகளும் கடந்த அரசாங்கங்களால் எங்களுடைய மக்களுக்குச் செய்து கொடுக்கப்படவில்லை. எனினும், பொருளாதாரத்துக்கு உறுதுணையாக இருக்கக்கூடிய திட்டங்களை விட்டுவிட்டு, தேவையில்லாத திட்டங்களில் பலகோடி ரூபாயை முதலீடு செய்தன. எங்களுடைய மக்கள் யுத்தத்தால் இடம்பெயர்ந்து, முகாம்களில் அடைக்கப்பட்டு, பின்னர் அங்கிருந்து விடுவிக்கப்பட்டு, மீள்குடியேற்றத்துக் காகத் தங்களது இடங்களுக்குச் சென்று, அங்கு மரங்களுக்குக்கீழ் தற்காலிகமாகத் தகரங்களைப் போட்டு பல வருடங்கள் வாழ்ந்தார்கள்.

கடந்த கால ஆட்சியாளர்கள் முறையானதொரு திட்டம் இல்லாமல், வடக்கு மாகாணத்தில் காங்கேசன்துறை - மயிலிட்டிப் பிரதேசத்தில் பலகோடி ரூபாய் செலவில் சனாதிபதி மாளிகை ஒன்றைக் கட்டினார்கள். அந்த மாளிகை இன்றுவரை பாவிக்கப்படாத ஒரு மாளிகையாகவே இருக்கின்றது. எங்களுடைய மக்கள் மரத்துக்குக்கீழ் வாழும்போது, அவர்களைப் பற்றிச் சிந்திக்காமல், பல கோடி ரூபாய் செலவில் மாளிகையைக் கட்டினார்கள். எங்களுடைய முல்லைத்தீவு மாவட்டத்திலுள்ள 'செஞ்சோலை' என்ற அமைப்பில் அநாதரவான குழந்தைகள் வாழ்ந்து வந்தார்கள். யுத்தத்தால் பாதிக்கப்பட்ட அந்தக் குழந்தைகளை அங்கிருந்து வவுனியாவுக்குக் கொண்டுவந்து, 10'x10' அளவுடைய roomஇல் அடைத்து வைத்திருந்தார்கள். அதைப் பற்றி கவலைப்படாதவர்களாக அங்கு மாளிகை கட்டினார்கள். என்னுடைய வேண்டுகோள் என்னவென்றால், இன்றுவரை பாவிக்கப்படாமல் இருக்கின்ற அந்த மாளிகையை மக்களுடைய நலனுக்காக அல்லது இந்த நாட்டின் பொருளாதாரத்தை அபிவிருத்தி செய்வதற்காகப் பயன்படுத் துவதற்குரிய ஏற்பாட்டை இந்த அரசாங்கம் செய்ய வேண்டும் என்பதுதான்.

எங்களுடைய மக்களின் பொருளாதாரத்தை மேம்படுத்துவதாக இருந்தால், எங்களுடைய பிரதேசத்தில் கிராமியப் பொருளாதாரத்தை மேம்படுத்த வேண்டும். வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள எங்களுடைய மக்களின் பொருளாதாரம் மேம்பட வேண்டுமாக இருந்தால், அவர்கள் உற்பத்தியாளர்களாக மாற வேண்டும். அவர்கள் உற்பத்தியாளர்களாக மாற வேண்டுமாக இருந்தால், எங்களுடைய பிரதேசங்களில் இருக்கின்ற சிறிய நீர்ப்பாசனக் குளங்கள் புனரமைக்கப்பட வேண்டும். உற்பத்தியைப் பெருக்கக்கூடிய வகையில், எங்களுடைய பிரதேசத்திலுள்ள சிறிய நீர்ப்பாசனக் குளங்கள் புனரமைக்கப்பட வேண்டும் என்பதை நான் இங்கு மீண்டும் மீண்டும் வலியுறுத்திச் சொல்கின்றேன். எங்களுடைய வட மாகாணத்தில் குறிப்பாக, வன்னித் தேர்தல் தொகுதியில் அரச திணைக்களங்கள் எல்லைக் கற்களை இட்டுள்ளதால் அங்குள்ள பல குளங்களையும் வயல் நிலங்களையும் மக்கள் பயன்படுத்த முடியாத நிலை இருக்கின்றது. எனவே, சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் இதில் நேரடியாகத் தலையிட்டு, அந்தக் குளங்களையும் வயல் நிலங்களையும் விவசாயக் காணிகளையும் மக்களின் பயன்பாட்டுக்கு ஏற்ற வகையில் மிக விரைவாக விடுவித்து, அவற்றை மக்களிடம் கையளிக்க வேண்டும்.

இன்று நாங்கள் உற்பத்திப் பொருளாதாரம் பற்றி பேசுகின்றோம். ஆனால், எங்களுடைய பாரம்பரிய வைத் தியத்துக்குத் தேவையான மருந்துகளைப் பெற்றுக் கொள்வதற்காக வெளிநாடுகளுக்குப் பெருமளவு டொலர்களைக் கொடுத்துக்கொண்டு இருக்கின்றோம். நான் ஏற்கெனவே கூறியபடி, எங்களுடைய பாரம்பரிய வைத்தியத்துறையை முன்னேற்றக்கூடிய வகையில், தேவையான மருந்துகளை உற்பத்தி செய்யக்கூடிய ஒரு தொழிற்சாலையை எமது மாகாணத்தில் உடனடியாக அமைக்கவேண்டிய தேவையிருக்கின்றது. நாங்களும் இந்த நாட்டின் குடிமக்கள்! யுத்தம் முடிவடைந்து 15 ஆண்டுகள் கடந்தும்கூட, எங்களுடைய பிரதேசத்தில் யுத்தத்துக்கு முன்னர் இருந்த தொழிற்சாலைகள் இன்னும் புனரமைக்கப்படாத நிலையிலேயே இருக்கின்றன.

எனவே, எங்களுடைய பிரதேசங்களில் இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்புகளை வழங்கக்கூடிய வகையில், புதிய தொழிற்சாலைகளை அரசாங்கம் ஆரம்பிக்க வேண்டும். இந்த நாட்டின் பொருளாதாரம் பற்றி நாங்கள் பேசுகின்றோம்; அது தொடர்பான கொள்கைகளை வகுக்கின்ற இடமாக இந்தப் பாராளுமன்றம் இருக்கின்றது. அடிப்படையிலேயே மிக மோசமான பொருளாதார நிலையில் இருக்கின்ற எங்களுடைய மக்களினதும், இந்த நாட்டினதும் பொருளாதாரத்தை மேம்படுத்தக்கூடிய வகையில், உற்பத்திப் பொருளாதாரத்தை நோக்கி நகரவேண்டிய தேவையிருக் கின்றது. எங்களுடைய பாரம்பரிய வைத்தியர்களின் அறிவையும் திறமையையும் மேம்படுத்துவதற்காக அங்கு இருந்த ஒரேயொரு நிறுவனமான லங்கா சித்த ஆயுர்வேத மருத்துவக் கல்லூரி இன்று பூட்டப்பட்ட நிலையில் உள்ளது. தயவுசெய்து, அந்தக் கல்லூரியை மீண்டும் இயக்குவதற்குரிய ஏற்பாட்டைச் செய்ய வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற உள்ளூராட்சி மன்றங்கள் தமது வருமானத்தை மேம்படுத்தக்கூடிய வகையில், வரியை அறவிட முடியாத சூழ்நிலையில் இருக்கின்றன. ஒவ்வோர் உள்ளூராட்சி மன்ற அதிகாரப் பிரதேசத்திலும் ஒருசில வட்டாரங்களில்தான் வரி அறவீடு நடைபெறுகின்றது. வரியைத் தீர்மானிக்கக்கூடிய அல்லது சொத்துக்களை assessment செய்யக்கூடிய officers அங்கு போதியளவு இல்லாமையே இதற்குக் காரணமெனச் சொல்கின்றார்கள். எங்களுடைய உள்ளூராட்சி மன்றங்கள் தமது வருமானத்தை மேம்படுத்தி, அதனூடாக கீழ்த்தட்டு மக்களுடைய அடிப்படை வசதிகளை மேம்படுத்தக்கூடிய நிலையை தயவுசெய்து, நீங்கள் ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Pathmanathan Sathiyalingam, could you please wind up now?

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தவிசாளர் அவர்களே, நான் சில விடயங்களைச் சிங்கள மொழியில் சொல்ல வேண்டும். ஆகையால், தயவுசெய்து இன்னும் ஒருசில நிமிடங்களைத் தாருங்கள்!

අපි හැම වෙලාවේම අපට සල්ලි දෙන්න කියලා ඉල්ලනවා කියා ඔබතුමන්ලා හිතන්න එපා. ඇත්තටම අපේ ප්‍රදේශවල මිනිස්සු ගැන බලන්න. Thirty-year යුද්ධයක් තිබුණා. ඒකෙන් පස්සේ දැන් 15 years ගතවෙලා ඉවරයි. හැබැයි ඒ මිනිස්සු ආර්ථික වශයෙන් තවම උඩට ඇවිල්ලා නැහැ. රටේ ඉන්න අනෙක් මිනිසුන් හා සමාන තත්ත්වයට ඒගොල්ලන් ඇවිල්ලා නැහැ. ඒ නිසා තමයි අපි හැමදාම ඉල්ලන්නේ, අපේ ප්‍රදේශ වෙනුවෙන් වැඩිපුර සල්ලි ටිකක් allocate කරන්න කියලා. ඒ නිසා මේ අවුරුද්දේදී අපේ Northern Province සහ Eastern Province සඳහා වැඩි සල්ලි ප්‍රමාණයක් වෙන් කරලා, අපේ ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථිකය strengthen කරන්න උදව් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Nimal Palihena. You have 10 minutes.

[පූ.භා. 11.27]

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
ගරු සභාපතිතුමනි, 2025 වසර වෙනුවෙන් ඉදිරිපත් කර ඇති අය වැය පිළිබඳ විවාදයේ අවසන් දිනය අදයි. අප අද විවාදයට ලක් කරන්නේ, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයයි. අපේ රජයේ මංගල අය වැයේ වැඩිම වැය බරක් ස්ථාපිත කරලා තිබෙන්නේ මෙම අමාත්‍යාංශයට, ගරු සභාපතිතුමකි. එය ප්‍රතිශතයක් විධියට ගත්තොත් ආසන්න වශයෙන් සියයට 17ක් වෙනවා.

මෙම අමාත්‍යාංශය හරහා ආයතන රාශියක් ක්‍රියාත්මක වෙනවා. ඒ ක්‍රියාකාරිත්වය තුළ අපි අපේක්ෂා කරන්නේ, අපේ ප්‍රතිපත්තියේ සඳහන් කළ ආකාරයටම මේ රටේ මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කරමින්, වඩා ඉහළ ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගනිමින් මේ රට පවත්වාගෙන යාමයි. වැය ශීර්ෂ යටතේ අපි කොච්චර මුදල් වෙන් කළත්, අපි අපේක්ෂා කරන ආකාරයට ඒ මුදල් වියදම් වෙනවාද කියන කාරණාව අපි ඉස්සරහ තිබෙන අභියෝගයක්. මොකද, ඉතිහාසය විසින් අපට ඔප්පු කරලා තිබෙන, එහෙම නැත්නම් අපට පෙන්වා දීලා තිබෙන තත්ත්වයන් ඇතුළේ අපි දකින එක ඇත්තක් තිබෙනවා. ඒ තමයි, වැය ශීර්ෂ වශයෙන් මෙතැන අනුමත වුණත්, එය නීතියක් බවට පත් වුණත්, ඒ අදාළ වැය ශීර්ෂ තුළ රටට ජයග්‍රහණ අත්කර ගත්තාද, එසේ නැත්නම් රට විසින් නිර්මාණය කිරීමට අපේක්ෂිත ඒ වත්කම් නිර්මාණය වුණාද කියන කාරණාව.

එතැනදී විශේෂයෙන් මුදල් අමාත්‍යාංශයේ කටයුතු යටතේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වාගේ ආයතනයක් අපි ගත්තොත්, ඔවුන්ගේ වගකීම වන්නේ, මේ සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජයට සම්බන්ධ අනෙකුත් ආයතනවල සමස්ත වැය ශීර්ෂ සම්බන්ධයෙන් මාසිකව, කාර්තුගතව සහ වාර්ෂිකව ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමයි. ඉතිහාසය පුරාවට මේ උත්තරීතර සභාව තුළ අනුමත වෙච්ච අය වැය තුළින් කොයි තරම් දුරට මේ රටට සේවයක් කළාද කියලා අපට වාර්ෂික ගිණුම් වාර්තා හරහා හොයාගන්න පුළුවන්. සමහර අවස්ථාවලදී අපි දකිනවා, විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන වාර්තාවේ කියැවෙනවා, රට කොයි තරම් ණය වුණාද කියනවා නම්, ඒ ණය ප්‍රමාණයට සාපේක්ෂව වත්කම් ගොඩනැඟිලා නැහැ කියලා. එවැනි ගැටලුකාරී තත්ත්වයන් ඇතිවෙලා තිබෙන්නේ එම ආයතනවල ක්‍රියාකාරිත්වය හමුවේ, සමහර විට පරිපාලනමය වශයෙන්, එහෙම නැත්නම් තාක්ෂණික වශයෙන්, තවදුරටත් සඳහන් කරනවා නම් තොරතුරු තාක්ෂණය අපි කොයි තරම් දුරට අදාළ කර ගන්නවාද කියන කාරණාව සම්බන්ධයෙන් තිබෙන ගැටලු නිසා වෙන්න පුළුවන්. නමුත් අපි රජයක් විධියට මෙවර අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ සඳහන් ආකාරයට "ඩිජිටල්කරණය" කියන මාතෘකාව යටතේ රටේ සියලු ආයතන එකම පද්ධතියක් තුළට ගැනීමට කටයුතු කරන අවස්ථාවකයි ඉන්නේ.

ඒ සම්බන්ධයෙන් මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විධියට මේ වන විට ITMIS - Integrated Treasury Management Information System - එක වාගේම, පරිගණකගත කරන ලද රජයේ ගිණුම් පද්ධතිය හරහා මේ සියලු තොරතුරු ආයතනික මට්ටමින් වාර්තා කරමින් මේ වෙනකොටත් මාර්තු 31 දිනට පසුගිය වසරට අදාළ ගිණුම් සකස් කරමින් තිබෙන්නේ කියන එක. ඒ වාගේම, මේ වර්ෂයේ වැය ශීර්ෂය තුළ අප විසින් තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් කරනු ලබන බර තැබීම, ඒ වාගේම මේ සේවා ඉෂ්ට කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය කරන පුහුණුව සහ ඒ තාක්ෂණික දැනුම ලබා දීම ආදී කටයුතු තුළින් අපි උත්සාහ කරනවා, මේ වැය ශීර්ෂය ඇතුළේ වෙන් කරනු ලබන සෑම සතයකටම වටිනාකමක් දෙමින් මේ රටට සංවර්ධනය අත්කර දෙන්න. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් වගකීමෙන් කටයුතු කරන ආයතනයක් විධියට මම දකිනවා. ඒ නිලධාරිනුත් මේ වෙනකොට මේ සම්බන්ධයෙන් ඉතා යුහුසුලුව කටයුතු කරමින් අවශ්‍ය මැදිහත්වීම කරනවා වාගේම ඉදිරි සංවර්ධන කටයුතු සඳහා ඔවුන්ගේ සූදානමක් තිබෙන බවත් අපි දකිනවා. ඒ වාගේම, ආදායම් උත්පාදනය කිරීම, වියදම් තවත් පැත්තකින් ගත්තොත් අත්තිකාරම් ගිණුම් සහ තැන්පතු ආදී මේ සියලු තොරතුරු ක්ෂණිකව අපට ලබා ගත හැකි ආකාරයේ තත්ත්වයක් අද වෙනකොට නිර්මාණය වෙලා තිබෙනවා. අපේ මේ පළමුවැනි අවුරුද්දේ වැය ශීර්ෂ ඇතුළේ අපි අපේක්ෂා කරන්නේ මේ තත්ත්වයන් තවත් කාර්යක්ෂම කරමින්, වෙන් කරන හැම රුපියලක්ම, හැම සතයක්ම මේ රටේ ජන ජීවිත යහපත් කිරීමට එහෙම නැත්නම් ආර්ථික අභිවෘද්ධිය සඳහා ඵලදායී ලෙස වෙන් කිරීමටයි.

ඒ වාගේම, මම මේ අවස්ථාවේදී මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. මුදල් අමාත්‍යාංශය යටතේ තවත් එක්තරා වූ විශේෂ ආයතනයක් පිහිටුවනු ලැබුවා, 2017 මාර්තු 07වැනි දා.

මොකද, හිටපු පාලකයන් විසින් සියලු ආයතන සඳහා මුදල් වෙන් කරනු ලැබුවත්, ඒ වෙන් කරන ලද මුදල අදාළ, නිශ්චිත වූ කාර්යය සඳහා වැය වුණාද කියන එක සම්බන්ධව ගැටලු සහගත තැන් ඕනෑ තරම් ඉතිහාසය තුළ තිබෙනවා. ඒ අනුව ස්ථාපිත කරනු ලැබූ කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය රජයේ සියලු වත්කම් සම්බන්ධයෙන් සොයා බැලීමට ඒ අවශ්‍ය මැදිහත්වීම් කරනු ලබනවා. ඒ වාගේම රජයේ සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල සිට පළාත් සභා සහ ප්‍රාදේශීය සභා යන පහළ පරිපාලන ආයතන දක්වාම පවතින මුදල් නොවන සියලු වත්කම් වාර්තා කිරීම ඔවුන්ගේ වගකීම වෙනවා. එපමණක් නොවෙයි, ඔවුන්ගේ කාර්යභාරය තුළ මේ වත්කම් නිසි ආකාරයට කළමනාකරණය කරමින් ඉතා කාර්යක්ෂමව ඒවා මේ රටේ සංවර්ධනය සඳහා යොදා ගැනීම සඳහා යොමු කිරීමත්, ඒ වාගේම නුසුදුසු වත්කම්

[ගරු නිමල් පලිහේන මහතා]

පවතිනවා නම් ඒවා ඉවත් කිරීම සම්බන්ධයෙන් ඇගැයීම් කර නිසි විධියට ඒවා ඉවත් කිරීම, එහෙම නැත්නම් අළෙවි කිරීම කියන කාරණය සම්බන්ධයෙන් මැදිහත්වීම සිද්ධ කරනවා. ඒ වාගේම ඒ ආකාරයෙන් ලැබෙන ආදායම් නියම පරිදි අය කර ගැනීමට; ඒක රාශි කර ගැනීමට මෙම දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු යොදනු ලබනවා.

මෙම අංශයේ ක්‍රියාකාරිත්වය තවදුරටත් වර්ධනය කිරීම සඳහා මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙමින් පසුගිය සැප්තැම්බර් මාසයේ සිට අවශ්‍ය පරිදි මැදිහත්වීමක් කර තිබෙනවා. ඕනෑම ආයතනයක් සතුව පවතින ඉඩමක්, ගොඩනැඟිල්ලක්, එහෙම නැත්නම් වාහනයක්, යන්ත්‍ර සූත්‍ර ආදී මුදල් නොවන සියලු වත්කම් පිළිබඳ තොරතුරු මේ පද්ධතිය තුළින් අපට අනාවරණය කරගන්න පුළුවන්. ඉතිහාසය පුරා රජයන් විසින් එවැනි වත්කම් නිසියාකාරයෙන් ඇගැයීමක් නොකර අළෙවි කරපු තත්ත්වයන් පිළිබඳව අපි සමහර අවස්ථාවල පුවත් පත්වලින් දකිනවා වාගේම බොහෝ විවාදවලට ලක් වන අවස්ථා තිබෙනවා. නමුත් මෙම තොරතුරු පද්ධති හඳුන්වා දීම තුළ සහ නීත්‍යානුකූල පදනමකින් යුක්තව ඒවා නිසි ආකාරයකට ඇගැයීමට ලක් කරමින් පවත්වා ගෙන යාම තුළ ඉදිරියේදී කාටවත් මේ වත්කම් අවභාවිත කරන්න, රටේ සම්පත් අනිසි විධියට ප්‍රයෝජනයට ගන්න ඉඩක් ලැබෙන එකක් නැහැ කියා අපි විශ්වාස කරනවා. ඒ ආකාරයට තොරතුරු තාක්ෂණයේ අපි අපේක්ෂා කරන ඒ සාධනීය ලක්ෂණ මෙම කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අය වැය කථාවේ 97වැනි පිටුවේ සඳහන් වෙනවා, Public Assets Management Act එක introduce කරන එක ගැන. ඒ තුළින් අපට තවදුරටත් තහවුරුවක් හදා ගන්න පුළුවන්, මේ රට තුළ දැනට ස්ථානගත වෙලා තිබෙන රජයට අයිති සියලු දේපළ මේ හරහා නිසි පාලනයකට, කළමනාකරණයකට ලක් වන බව. අපි අපේක්ෂා කරන ජනතා ජයග්‍රහණ අත්කර දීම සඳහා, ඒ ජයග්‍රහණ අරමුණු කරගෙන රටේ සම්පත්, එහෙම නැත්නම් මේ තිබෙන වත්කම් සියල්ල සෑම ආකාරයකින්ම යොදවා ගැනීමේ හැකියාව ඒ හරහා මේ ආයතනවලට ලැබෙනවා.

මෙවර අය වැයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට වෙන් කරන ලද රුපියල් බිලියන 714.2ක මුදල ඉතා සාර්ථකව යොදවමින් අපි අපේක්ෂා කරන ආර්ථික සංවර්ධනය ළඟා කර ගනිමින්, යහපත් වූ ජීවිතයක් ගත කරන්න මිනිසුන්ට සහාය සලසන්න අමාත්‍යාංශය විධියට -ඒ සියලු කාර්ය මණ්ඩල හා අනෙකුත් ආයතන- මේ වනකොට සූදානමින් ඉන්නවා. ඒ වාගේම අපිත් වගකීමෙන් යුක්තව ඒ සඳහා කටයුතු කරනවා කියා සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Rohitha Abeygunawardhana. You have an allocation of 16 minutes.

[පූ.භා. 11.37]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු සභාපතිතුමනි, අද වනවිට මාසයකුත් දින 4ක් තිස්සේ 2025 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරපු මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන්; මෙම ලියවිල්ල සම්බන්ධයෙන් අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළදී විවාද කළා; යෝජනා, අදහස් ඉදිරිපත් කළා. ආණ්ඩුවක් හැටියට සිටින කැබිනට් අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් වාගේම විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් මේ සම්බන්ධව යෝජනා සහ අදහස් ඉදිරිපත් කළා.

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුව තුළ වර්ෂයෙන් වර්ෂයට අය වැය ඉදිරිපත් කරනවා. මම මේ පාර්ලිමේන්තුවේ අඛණ්ඩව අවුරුදු 25ක් අය වැය යෝජනා සම්බන්ධයෙන් කථා කරලා තිබෙනවා. මම ආණ්ඩු පක්ෂයේත් ඉඳලා තිබෙනවා, විපක්ෂයේත් ඉඳලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, රටේ ජනතාව අය වැය යෝජනාවලියකින් බලාපොරොත්තු වන්නේ මොනවාද? විශේෂයෙන් මේ 2025 වර්ෂයේ අය වැය යෝජනාවලියෙන් බලාපොරොත්තු වුණේ මොකක්ද?

2024 වර්ෂය විශේෂයෙන්ම හැරවුම් ලක්ෂ්‍යයක්; සම්පූර්ණයෙන්ම හැරවුම් ලක්ෂ්‍යයක්. රටේ තිබුණු දේශපාලනය සම්පූර්ණයෙන් වෙනස් කරපු අවුරුද්දක් බවට එය පත් වුණා. ප්‍රධාන හැරවුම් ලක්ෂ්‍යය තමයි, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ජනතාවගේ වැඩි කැමැත්ත සහිතව මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කර ගැනීම. එහෙම නේද, ගරු ඇමතිතුමා? ජනතාව තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු 159දෙනෙකු පාර්ලිමේන්තුවට තෝරා පත් කර එව්වා. ඒ කියන්නේ, ජනතාව බලාපොරොත්තු වුණා වෙනසක්. ජනතාව ඉල්ලුවා පැවැති ක්‍රමයට වඩා වෙනසක් දෙන්න කියලා. ඒ වෙනුවෙන් ජනතාව දැන් ආණ්ඩු වෙනසක් කරලා තිබෙනවා. ඒ වෙනස කරපු ජනතාව බලාපොරොත්තු වුණේ මොනවාද?

ඒ වෙනස කරපු ජනතාව බලාපොරොත්තු වුණා වෙනස කරන්න කලින් ඔබතුමන්ලා වේදිකාවේ කියපු ඒවා ඉටු කරාවි කියලා. ඔබතුමන්ලා මොනවාද වේදිකාවේ කිව්වේ? වේදිකාවේ කියපු දේවල් ඉටු කරයි කියලා ජනතාව බලාපොරොත්තු වෙනවා. මා දැන් මේක කිව්වාට පස්සේ කියන්න එපා, 'අවුරුදු 5කින් කරනවා' කියලා. ඒවා කරන්න ආරම්භයක් තිබෙන්න ඕනෑ. ජනතාව මොනවාද බලාපොරොත්තු වුණේ?

පළමුවෙන්ම බලාපොරොත්තු වුණේ ජනතාවගේ ලොකුම ප්‍රශ්නයක්ව තිබෙන ඉන්ධන මිල අඩු කිරීමයි. අප හැමෝටම ඉන්ධන ඕනෑ කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් ඉන්ධන -පෙට්‍රල් ටික, ඩීසල් ටික- ඕනෑ වෙනවා. අභිංසක මිනිසුන්ට භූමිතෙල් ටික ඕනෑ වෙනවා. එහෙම නම්, මිනිස්සු බලාපොරොත්තුවෙන් හිටියා, එදා වේදිකාවේ කිව්වා වාගේම ඉන්ධන ලීටරයකින් නියත වශයෙන්ම රුපියල් 160ක් අඩු වෙයි කියලා. ධීවරයාත් එහෙම බලාපොරොත්තුවෙන් හිටියා. ප්‍රවාහන ක්ෂේත්‍රයේ අයත් එහෙම බලාපොරොත්තුවෙන් හිටියා. මුළු රටෙම මිනිස්සු බලාපොරොත්තුවෙන් හිටියා, රුපියල් 160කින් ඉන්ධන ලීටරයක මිල අඩු කරනවා කියා මේ අය වැය ලියවිල්ල තුළ සඳහන්ව තිබෙවි කියලා. නමුත්, එහෙම වෙලා නැහැ.

ජනතාව ඊළඟට මොකක්ද බලාපොරොත්තු වුණේ? විදුලි බිලෙන් තුනෙන් එකක් අඩු වෙයි කියලා. විදුලි බිලෙන් තුනෙන් එකක් අඩු වෙනවා කියන්නේ මොකක්ද? ගරු සභාපතිතුමනි, විදුලි බිල රුපියල් 15,000ක් නම්, එයින් තුනෙන් එකක් අඩු කළාම රුපියල් 10,000 යි. එහෙම වුණොත් මිනිසුන්ට ලෙහෙසියි නේ. ආර්ථික වශයෙන් අමාරුමේ වෙලාවේ මිනිසුන්ට එය ලෙහෙසියි නේ. මේවා තමයි ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දෙන්න හේතු. ඉන්ධන මිල අඩු කර ගන්න, විදුලි බිල අඩු කර ගන්න ඡන්දය දෙන්න කිව්වා. ඒවා කරවාගන්න තමයි ජනතාව බලාපොරොත්තු වුණේ. ඒ බලාපොරොත්තුවලට මොකක්ද සිද්ධ වුණේ කියන එක තමයි මා අහන්නේ.

ගරු සභාපතිතුමනි, ජනතාව ඊට පස්සේ මොකක්ද බලාපොරොත්තු වුණේ? ඔවුන් අඩු මිලට වාහනයක් ගන්න බලාපොරොත්තු වුණා. ගරු සභාපතිතුමනි, හැමෝම කැමැතියි නේ වාහනයක යන්න. ෆුට් බයිසිකල් එකක යන කෙනා බලනවා මෝටර්සයිකලයක යන්න. මෝටර් සයිකලයක යන කෙනා බලනවා පොඩි කාර් එකක යන්න. ඔහු ආයෙත් බලනවා තවත් හොඳ කාර් එකක, ජීප් එකක යන්න. ඒකයි බලාපොරොත්තුව. පෘථග්ජන මිනිස්සු නේ. ජනතාව ඒ දේවල් බලාපොරොත්තු වුණා. නමුත්, දැන් මොකද වුණේ කියලා බලන්න, ගරු සභාපතිතුමනි. වාහන ගෙන්නුවා නේ. වාහන ගෙන්නුවාම මොකක්ද වුණේ? Alto car එක ලක්ෂ 71ක් බවට පරිවර්තනය වුණා. මේකේ පොඩි වරදක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශයට මම කලින් දවසකත් මෙය කිව්වා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ගැන බලන්න වෙනවා. ඒ සමහර වාහනවලට බදු අය කිරීමේ දී වර්ග කරලා බදු ගැහුවා. පොඩි මිනිහාගේ වාහනයට බදු ගැහුවා. ඒ බද්ද පොඩි මිනිහාට වැදුණා; ලොකු මිනිහාට වැදුණේ නැහැ; ලොකු companyවලට වැදුණේ නැහැ. Brand new වාහන ලංකාවට ගෙන්වන අයට බදු වැදුණේ නැහැ. හැබැයි, මෝටර්සයිකල් එකක් කීයද? මෝටර්සයිකල් එකක් රුපියල් ලක්ෂ 12යි. ත්‍රිරෝද රථයක් රුපියල් ලක්ෂ 20යි. හැබැයි, මෙරටට ගෙන්වන V8, BMW, Prado සහ Mercedes-Benz වාගේ brand new වාහනවල මිල අඩු වුණා. කොම්පැනිකාරයාත් එක්ක ඩීල් එකක් ද? මුදල් අමාත්‍යාංශයේ අය කථා කරන්න, මේවා ගැන. මොකක්ද, කරලා තිබෙන්නේ? මෙහෙමයි සිද්ධ වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මේවා ගැන අවධානයෙන් ඉන්න ඕනෑ. අපි දන්නේ නැහැ, මොකක්ද වුණේ කියලා. ඇයි කොම්පැනිකාරයන්ට චිතරක් බදු නොගහන්නේ? ඊළඟට company එකට තවත් යෝජනා හා අදහස් ඉදිරිපත් කරන්න කියනවා. වාහනය ගෙන්නුවාම ආයෙත් company එකෙන් සහතිකයක් ගන්න ඕනෑ ලු. කමක් නැහැ, එහෙම ගත්තාට. හැබැයි එහෙම නම්, කොම්පැනිය වාහන විකුණන්නේ නැතිව ඉන්න ඕනෑ. මම ඒ කොම්පැනිවල නම් කියන්නේ නැහැ. මෙන්න මේකයි සිද්ධ වෙච්ච දේ, ගරු සභාපතිතුමනි.

ඊළඟට අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගනිමු. අපි දන්නවා මේ වන කොට අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ ගිහින් තිබෙන බව. මෙවර අය වැයෙන් බලාපොරොත්තුවෙන් හිටියා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පහළ යයි කියලා. සමහර වෙලාවට සතොස මඟින් අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දෙනවා. නමුත්, සතොස මඟින් ලබා දෙන ටික ජනතාවට මදි.

ගරු සභාපතිතුමනි, සියයට 18යි VAT එක. මිනිස්සු බලාපොරොත්තු වුණා VAT එක අඩු කරයි කියලා. එහෙම කළා නම්, හාල් මිල, පිටි මිල, පරිප්පු මිල, උම්බලකඩ මිල, කරවල මිල, ටින් මාළු මිල, අල මිල අඩු වෙනවා. මෙන්න මේ භාණ්ඩ සියල්ල VAT එකෙන් නිදහස් කළා නම් ඒවායේ මිල අඩු කරන්න පුළුවන් වෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සතොස මිල අඩුයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මම දැක්කා, ගරු මන්ත්‍රීතුමා. මම දැක්කා සතොසේ මිල අඩු වෙලා තිබෙනවා. හැබැයි මම ඔබතුමන්ලාට කියන්නේ මේකයි. සතොසෙන්ම චිතරක් මේ රටේ මිනිස්සු බඩු ගන්නවා නම් වැඩේ හරි. එහෙම වෙන්නේ නැහැ. කඩේ යන්නකෝ බලන්න. කඩේ යන්න මගෙ දෙයියෝ! කඩේ ගිහිල්ලා තිබෙනවාද? කඩේ ගියාම තමයි රහේ දැනෙන්නේ. හැම කඩේම එකම ගණනට ගන්න තිබෙනවාද? එහෙම නැහැ. මම මේ කියන්නේ ඔබතුමන්ලා පොරොන්දු වෙච්ච දේවල්. තවත් මොනවාද අපේ රටේ තරුණ තරුණියන්ට පොරොන්දු වුණේ? යම් ව්‍යාපාරයක් කර ගන්න ඇපකරයක් නැතුව බැංකුවකින් මුදල් ලබා දෙනවා කිව්වා. එය මේ යෝජනාවලියේ තිබෙනවා. ඒක කළොත් හොඳයි. මේ යෝජනාවලියේ ඒක තිබෙනවා. නමුත්, ඇපකරයක් නැතුව බැංකුවකින් ණය දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නාර්ථය අප ඉදිරියේ, ඔබ ඉදිරියේ තිබෙනවා. කියන්න නම් පුළුවන්. ඕනෑ තරම් කියන්න පුළුවන්. හැබැයි, කියනවා වාගේ නොවෙයි, කරලා පෙන්නන්න වෙනවා.

ඒ විතරක් නොවෙයි, තව දෙයක් කියන්න තිබෙනවා. මොකක්ද ඒ? අපේ රටේ මොකක්ද වුණේ? ඇයි අරගළයක් ඇති වුණේ? ඒ කාලයේ අපේ රටේ ඩොලර් සම්පූර්ණයෙන්ම හිඳිලා ගියා. සංචිත තිබුණේ නැහැ. තෙල් නැව ගෙන්වා ගන්න විධියක් තිබුණේ නැහැ. පොහොර නැව ගෙන්වා ගන්න විධියක් තිබුණේ නැහැ. බෙහෙත් ටික ගෙන්වා ගන්න විධියක් තිබුණේ නැහැ. මිනිස්සු පාරේ මැරුණා. ඩොලර් සංචිත වැඩි කරන ක්‍රමවේදය මොකක්ද? රටවිරුවන් එවන මුදල් ද? මේ ආණ්ඩුව හදන්න විදේශ රටවල ඉන්න ශ්‍රී ලාංකික ශ්‍රමිකයෝ ඇවිල්ලා ඡන්දය දුන්නා. ඒ අය ඩොලර් 500 ගණනේ ලංකාවට එවලා අපේ සංචිත වැඩි කරනවා කිව්වා. එක සංගීත කණ්ඩායමක නායකයෙකු කියනවා මම දැක්කා, එයාගේ යාළුවන් පිටරටවල ඉන්නවා, ඒ යාළුවන්ට කියලා ඩොලර් 500 ගණනේ එවනවා කිව්වා කියලා. දැන් ඒ සංගීත කණ්ඩායමත් නැහැ, යාළුවෝත් නැහැ, ආපු ඩොලර් 500කුත් නැහැ. මම මේ කියන්නේ ඔබතුමන්ලා වේදිකාවේ කියපු ඒවා. එහෙම නැතුව මේ වෛරයෙන්, ක්‍රෝධයෙන් කියනවා නොවෙයි. මේ අය වැයෙන් මේ දේවල් ටික ඉටු කරයි කියලා මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා. මේ කියපු කාරණා ටික ඉටු කළා නම් අපට අද හොඳ මාවතක යන්න පුළුවන් කියන එක තමයි ජනතාවගෙන් ඇහෙන කථාව, ගරු සභාපතිතුමනි. හැබැයි, මේ වන විට ජනතාවට ලැබුණේ මොනවාද? ජනතාව ඉල්ලපු ටික මම දැන් කිව්වා. ගරු සභාපතිතුමනි, මොනවද ජනතාවට ලැබුණේ?

මේ මාසයකුත් දවස් 4 තුළ මොනවාද අපි මේ පාර්ලිමේන්තුවේ වැඩිපුර කථා කළේ? අපට මාතෘකා තිබුණා, කථා කරන්න. ඒ, අය වැය ගැන නොවෙයි. අපට තිබුණා, සුබ නැකතට, එක මීටකට රිළවුන් ගණින්න. ඒ සතුන් ගණින්න කොළයක් ඔබතුමන්ලාටත් ආවා නේ; ගෙදරට පොඩි කොළයක් ආවා නේ. සුබ නැකතට, නිසි වෙලාවට රිළවුන් ගණින්න තිබුණා. ඒවා තමයි අපට කරන්න තිබුණු දේවල්. ඉතින්, අපි රිළවුන් ගැන්නා. අපේ ගෙදරටත් ඒ කොළය ඇවිත් තිබෙනවා මම දැක්කා. ඒක කියවන්න චීනක්කණ්ණාඩියක් දමන්න ඕනෑ. මොකද, පොඩියි ඒ කොළ කැබැල්ල. ඉතින්, ගැන්නා කියමුකෝ ඒ රිළවුන් ටික. කීයද ගණන? ලංකාවේ රිළවුන් කීයද? දඩු ලේනුන් කීයද? මොනරුන් කීයද? මේවා තමයි අපට හම්බ වෙච්ච දේවල්.

ඊළඟට අවේ මොකක්ද? ඊළඟට ආපු මාතෘකාව, බටලන්ද කොමිසමේ වාර්තාව. බටලන්ද කොමිසමේ වාර්තාවට අනුව, මේ රටේ තරුණ තරුණියන් මරපු, විනාශ කරපු අයට අනිවාර්යයෙන්ම දඬුවම් දෙන්න. ඒකේ කිසිම තර්කයක් නැහැ. අවුරුදු ගණන කීය වුණත් කමක් නැහැ, ඔවුන්ට දඬුවම් දෙන්න. ඔවුන්ට නීත්‍යානුකූලව දඬුවම් දෙන්න. ගරු සභාපතිතුමනි, සමහර වෙලාවට මේවා backfire වෙනවා. ආපහු හැරෙනවා. මෙන්න හැරිලා. ඊයේ මම දැක්කා, "හිරු" නාළිකාවේ "බලය" වැඩසටහනේදී ජනතා විමුක්ති පෙරමුණේ හිටපු - *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මොකක්ද, නාළිකාව?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
"හිරු" නාළිකාව. මට අදාළ නැහැ ඒ මොකක්ද කියන එක. ඔබතුමා ඇහුවාම මම එය කියන්න එපා යැ. සහෝදර මන්ත්‍රීවරයෙකු දෙයක් ඇහුවාම උදව් කරන්න ඕනෑ.

"හිරු" නාළිකාවේ "බලය" වැඩසටහනට නන්දන ගුණතිලක මහත්මයා ආවා. එතුමා මගේ දිස්ත්‍රික්කයේ. තමුන්නාන්සේලාගේ ජනතා විමුක්ති පෙරමුණේ පළමුවෙනි ජනාධිපති අපේක්ෂකයා. මට පුද්ගලවාදයක් නැහැ. එතුමා කියපු දෙයක් මම මේ කියන්නේ. එතුමා කරපු ප්‍රකාශය බලන්න. එතුමා තමුන්නාන්සේලාගේ පක්ෂයේ හිටපු ප්‍රධාන ලේකම්. ඒ, තමුන්නාන්සේලාගේ පක්ෂයේ -ජනතා විමුක්ති පෙරමුණේ- හිටපු ප්‍රධාන ලේකම්. එතුමා එක අවස්ථාවක තමුන්නාන්සේලාගේ ජනාධිපති අපේක්ෂකයා. ඒ වාගේම තමයි අපිත් එතුමන්ලාත් -අනුර කුමාර දිසානායක මැතිතුමා, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ඇතුළු ඔක්කොම- එකතු වෙලා තමයි 2004දී පාද යාත්‍රා ගිහින් චන්ද්‍රිකා නෝනාව බලයට ගෙනාවේ. අපි හොඳ යාළුවෝ. කරට අත දමාගෙනයි ආවේ. අපි හොඳ මිත්‍රයෝ. අපි ඉස්සර වේදිකා හදලා නිලුයි, රතුයි කොඩි දෙක වැනුවේ එකට, කොසු මිටේ දාලා. අපේ ඉතිහාසයයි මම මේ මතක් කළේ.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මතකයි නේ. ඔබතුමා අනෙක් පැත්තේ හිටියේ. අපි චන්ද්‍රිකා නෝනා දිනෙව්වා. ඒක තමයි මම හැම දාම කියන්නේ. දේශපාලනයේ සදාකාලික මිතුරෝත් නැත, සදාකාලික හතුරෝත් නැත. දැන් නන්දන ගුණතිලක ප්‍රකාශ කරනවා, එදා බටලන්දේ මැරුවා වාගේම, ගමේ සිටිය පොලීසියේ නිලධාරියා, හමුදා නිලධාරියා, ග්‍රාම සේවකත් මැරුවා කියලා. මම කියන්නේ අපට ලැබුණු ඒ හැම තොරතුරක් ගැනම හොයන්න වෙනවා.

ඊළඟට මොකක්ද වුණේ? අන්තිමට පසුගිය දවස්වල මොකක්ද වුණේ? සිංහල අවුරුද්ද එන්නේ අප්‍රේල් 14, 15 දිනවල. ඊට ඉස්සෙල්ලා අවුරුදු උත්සව තිබුණා නේ. එතකොට සැඟවුණු අමුත්තා හොයනවා. දැන් පොලිස්පතිතුමා හොයනවා, සෙව්වන්දි හොයනවා. අපි සොයන්න ගත්තා, ළමයෙකුට ගහපු ගුරුවරයෙක්. මේ අපට හම්බ වෙච්ච දේවල්. මේවා අපි ඉල්ලපු දේවල් වෙනුවට හම්බ වෙච්ච දේවල්. ඊළඟට, ජනාධිපති අරමුදලින් බෙහෙත් ගන්න සල්ලි ගත්ත අයගේ ලැයිස්තු ඉදිරිපත් කළා. ඒ, හම්බ වෙච්ච දේවල්. මම කියන්නේ අපට හම්බ වෙච්ච දේවල් ගැන. *[බාධා කිරීම්]* කවුරු ගත්තත් කියන්න ඕනෑ. රෝහිත අබේගුණවර්ධන ගත්තා නම් ඒත් කියන්න ඕනෑ. මම කියන්නේ ඔබතුමන්ලා ඉදිරිපත් කරපු දේවල්. මේක නොවෙයි ජනතාව බලාපොරොත්තු වුණේ.

ඊළඟට මොකක්ද බලාපොරොත්තු වුණේ? මහින්ද ජනාධිපතිතුමා නිල නිවසෙන් යැවීම. එතුමා මේ රටේ අවුරුදු 30ක යුද්ධයක් අවසන් කරපු නායකයා. මොන විධියෙන් කිව්වත් එතුමා මේ රටේ තිබුණු ප්‍රශ්නය අවසන් කරපු නායකයා. ඒවායේ ප්‍රශ්න ඇති. හැබැයි, එතුමා ගෙදරින් දොට්ට දැමීමත් මේ අය වැය අස්සේ තමයි තිබුණේ. මේවා තමයි අපට ලැබුණු දේවල්. ඉල්ලුවේ එකක්. ලැබුණේ තව එකක්.

ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණයකට මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේවා ඔබතුමන්ලා ඔළුවට ගන්න. තමුන්නාන්සේලාට සියයට 60ක් මේ රටේ ආදායම් එකතු කරන්නේ කවුද? සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව. මේ සියයට 60 ආවොත් තමයි, ඒ කියන්නේ, මේ පොතේ දෙන ඉලක්කය බිලියන 200 නම්, ඒ බිලියන 200 ආවොත් තමයි, මේ කියපු වියදම් ටික කරන්න පුළුවන් වෙන්නේ. මේ ආදායම ගන්න ඕනෑ. හැබැයි, මේ දේශපාලන ඉතිහාසයේ කිසිම කෙනෙක් මේ දීපු ඉලක්ක සපුරලා දීලා නැහැ. නිලධාරින්ට මම අභියෝග කරනවා. පුළුවන් නම් පෙන්වන්න. අපි මේවරයි පොරොන්දු වුණේ, දෙසැම්බර් 31වැනි දාට ඒ ඔක්කෝම ගෙනැල්ලා දීලා තිබෙනවා කියලා, පුළුවන් නම් පෙන්වන්න. පෙන්වන්න බැහැ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම ඒකට එක හේතුවක් කියන්නම්. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මත්පැන් බලපත්‍ර ගැන කිව්වා. හැම තිස්සේම බෝතලය ගැන කථා කරනවා කියයි. නමුත්, කථා කරන්න වෙනවා. දැන් බාර් ගැන කියැවුණා. බාර්වලට -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rohitha Abeygunawardhana, you have two minutes remaining from your allotted time.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු සභාපතිතුමනි, ඔබතුමාමයි මම කථා කරනකොට මූලාසනයේ ඉන්නේ. හරිම සතුටුයි. ඔබතුමාත් හිනා වෙලා ඉන්නේ. අපි වාගේම කෙනෙක්.

ගරු සභාපතිතුමනි, ඉස්සර ගම්වල බාර් තිබුණේ තනි මිනිහාට. තනි තනි තැන්වල තිබුණේ, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි. දැන් ලංකාවේ බාර් තිබෙන්නේ කොහොමද? දැන් එක මිනිහෙකුට බාර් 150යි, 170යි. බාර් ටික දැන් කොම්පැනි වෙලා තිබෙන්නේ. ඒකට හේතුව මොකක්ද? හේතුවක් තිබෙනවා. මේ රටේ මිනිස්සු වැඩිපුර බොන්නේ මොනවාද? ගල් අරක්කු. එහෙම නැත්නම් පොල් අරක්කු. අපේ ගම්වල රේන්ද රස්සාව තිබෙන්නේ; මහ රා කර්මාන්තය. මහ රාවලින් පෙරලා, ස්ප්‍රිතු අරගෙන තමයි පොල් අරක්කු හදන්නේ. ඒක මිනිසුන්ට එච්චර අගුණයක් නැහැ. අරක්කු බොන එක හොඳ නැහැ. හැබැයි, එච්චර අගුණයක් නැහැ. නමුත් දැන් කොහොමද පොල් අරක්කු හැදෙන්නේ? දැන් හැදෙන්නේ හදන රාවලින්. ඊස්ට් දාලා, සීනි දාලා දිය කරලා රා හදලා, ඒ රාවලින් තමයි අරක්කු හදන්නේ. එතකොට ප්‍රශ්නය තිබෙන්නේ මොකක්ද? ගල් අරක්කු- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. අපි දේශපාලනය හරියට කරමු.

ගරු සභාපතිතුමනි, මම එකක් පැහැදිලිව කියනවා. මේ වෙනකොට ගල් අරක්කු බෝතලයකින් රුපියල් 2,780ක් රජය බදු ගන්නවා. අනෙකුත් අරක්කු වර්ගවලට වැඩියෙන් බොන්නේ ගල් අරක්කු. රුපියල් 2,780ක් බදු අය කරන ගල් අරක්කු වයින් ස්ටෝර්ස් එකක මාසයකට බෝතල් 50,000 විකුණනවා නම්, ඒ 50,000න් 10,000ක් විතරයි original ඒවා විධියට එන්නේ. ඉතුරු 40,000 එන්නේ ව්‍යාජ - fake - ඒවා. එතකොට ඒ බෝතල් 40,000ක බදු ආදායම එනවාද සුරාබදු දෙපාර්තමේන්තුවට? සුරාබදු දෙපාර්තමේන්තුවට එන්නේ නැහැ. ඒ එකම බෝතලයකින්වත් අය කරන බද්ද සුරාබදු දෙපාර්තමේන්තුවට එන්නේ නැහැ. ඒ ආදායම රජයට ලැබෙන්නේ නැහැ. එක පැත්තකින්, ඒ ආදායම් ටික එන්නේ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Rohitha Abeygunawardhana, you have utilized your time.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මම තව විනාඩියයි ගන්නේ, ගරු සභාපතිතුමනි.

ආදායම් එන්නේ නැහැ. අනෙක් පැත්තෙන් ආදායම් නොලැබෙනවා වාගේම, මිනිසුන්ට පොවනවා, තනිකරම වස විස. කසිප්පු පොවන්නේ. බෝතලයේ දාලා ගල් කියලා තමයි තිබෙන්නේ. හැබැයි, ඇතුළේ තිබෙන්නේ කසිප්පු.

අවසාන වශයෙන් මම තව දෙයක් කියනවා, ගරු සභාපතිතුමනි. අද අපේ අය වැය විවාදය අවසන් වෙන දවස. ඉදිරියේ අභියෝගයක් තිබෙනවා. මොකක්ද ඒ අභියෝගය? පළාත් පාලන මැතිවරණය. තමුන්නාන්සේලායි, අපි දෙගොල්ලන්ටම ඒ අභියෝගය තිබෙනවා. අපි විපක්ෂය; තමුන්නාන්සේලා ආණ්ඩුව. දැන් වැටුප් වැඩි වෙනවා. ඒකේ සතුටින් අපේ රාජ්‍ය සේවකයෝ තමුන්නාන්සේලාට ඡන්දය දෙයි කියලා විශ්වාස කරනවා. අපට ජනතාව විශ්වාස කරන්න බැහැ. ජනතාව කියන්නේ නුවරඑළියේ දේශගුණය වාගේ. එක වේලාවක වහිනවා, පායනවා, සීතලයි. හරිම අමාරුයි විශ්වාස කරන්න. ඒ නිසා තමුන්නාන්සේලාගේ ඡන්ද ප්‍රතිශතය යම් විධියකින් අඩු වුණොත් මොකද වෙන්නේ? තමුන්නාන්සේලා දැන් ඉන්නේ ඇදේ. අපි ඇදේ ඉඳලා වැටුණා; කොන්ද කැඩුණා. තමුන්නාන්සේලාගේ ඡන්ද ප්‍රතිශතය අඩු වුණොත්, ඇඳෙන් වැටිච්ච ගමන් කැඩෙනවා, කොන්ද. අපි ඉන්නේ පැදුරේ. පැදුරේ ඉඳන් වැටුණාට ප්‍රශ්නයක් නැහැ. මොකද, පොඩි පරතරයක් තිබෙන්නේ. සීතල විතරයි දැනෙන්නේ සිමෙන්ති පොළවට වැටිලා. ඒක නිසා මම කියනවා, ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලා ගෙන යන මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න කියලා. ඒකට සුබ පතනවා. මේ අය වැයට මම විරුද්ධ නැහැ. මම පැහැදිලිව කියනවා, මේ අය වැයට මම විරුද්ධ නැති බව. මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. මම මේ අය වැයට විරුද්ධ නැහැ. හැබැයි, අපි කියපු යෝජනා ඉදිරියට අරගෙන මේ ආණ්ඩුව හොඳට යන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, මට වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Nishantha Samaraweera. You have nine minutes.

[පූ.භා. 11.54]

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු සභාපතිතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව තමයි අද දිනයේත් අප කථා කරන්නේ. මේ විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම ගත්තොත්, මූලිකව අපි මේ මතු වෙච්ච කාරණා යටතේ කථා කරනවා නම්, ජනතාව ඉල්ලපු දේ දැන් ජනතාවට ලැබෙමින් තිබෙනවා. ජනතාව ඒ ගැන අවබෝධයකින් ඉන්නවා. ඒ නිසා අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් මොන ආකාරයෙන් කිව්වත්, ජනතාව දන්නවා, මේ ආණ්ඩුව ජනතාව ඉල්ලපු දේ වෙනුවෙන් පෙනී සිටින, ඒ වෙනුවෙන් කැප වෙලා ඉන්න, ඒ වෙනුවෙන්ම කටයුතු කරන ආණ්ඩුවක් බව. ඒ නිසා ඔය කියපු බොහෝ දේවල්වලට ජනතාව නිසි උත්තරය ලබා දෙනවා කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ වාගේම බොරු කීම පුරුද්දක් විධියට කරගෙන ආපු අය පන්සිල් පද පහ පවා පාවිච්චි කරලා නැවත කියන්නේ බොරුවක් වුණාම, ඒක මේ පාර්ලිමේන්තුවට සුදුසු නැහැ කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, පොහොට්ටුව පැත්තෙන්, සජබය පැත්තෙන්, සිලින්ඩරය පැත්තෙන් ගත්තාම, මේ පාර්ශ්ව තුනේම තිබුණා, පොදු ස්වභාවයක්, පසුගිය දවස්වල පැවැති අය වැය විවාදයේදී. ඒ වාගේම ඒ චෝදනාවලත් පරස්පරතාවක් තිබෙනවා. විපක්ෂයේ එක කණ්ඩායමක් කරන චෝදනාවම අනෙක් කණ්ඩායම විසින් නිෂ්ප්‍රභ කරපු එකක් තමයි මේ ක්‍රියාවලිය ඇතුළේ අපට දකින්නට තිබුණේ. ඒ ගැන ටිකක් වැඩිපුර කථා කරන්න ඕනෑ වේලාව අරගෙන, වෙනම.

ගරු සභාපතිතුමනි, මම කැමැතියි, මේ අය වැය යෝජනාවට මූලික කාරණයක් විධියට එකතු කරන්න, විශේෂයෙන්ම COPE සභාවේදීත් අපේ අත්දැකීමට ලක් වෙච්ච, අවධානයට ලක් වෙච්ච කාරණයක් ගැන. විශේෂයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, ඒ වාගේම Department of National Budget සහ Department of Management Services යනාදී දෙපාර්තමේන්තු ගණනාවක් මේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනවා. මේ දෙපාර්තමේන්තුවල කාර්යභාරය සැලකිල්ලට ගත්තොත්, විශේෂයෙන් රජය සතු ව්‍යාපාර ලෙස ප්‍රධාන වශයෙන් දැනට හඳුනාගෙන තිබෙනවා, ව්‍යාපාර 430ක් විතර. ඒ කියන්නේ සංස්ථා, මණ්ඩල සහ ඒ උප ආයතන විධියට. මේ සියල්ලම පිළිබඳ යම් කාර්ය සාධන අධීක්ෂණයක් සහ පාලනයක් කිරීමේ වගකීම පැවරිලා තිබෙනවා, විශේෂයෙන්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට. ඒ වෙනුවෙන් ඔවුන්ගේ ක්‍රියාවලිය හැඩ ගස්වලා තිබෙනවා. ඇත්තටම ගත්තාම, රජය වෙනුවෙන් මෙන්න මේ රාජ්‍ය ව්‍යාපාරවල භාරය දරන්නේ, ඒ වගකීම දරන්නේ මේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව.

ඒකට සහයෝගයට National Budget Department එකත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවත් ස්ථානගත වෙලා තිබෙනවා. කොහොම වුණත් අපිට දකින්න තිබෙන කාරණය තමයි, මෙන්න මේ ව්‍යාපාරවලට රජය යොදපු ප්‍රාග්ධනය පිළිබඳව සොයා බැලීමේ වගකීම මේ දෙපාර්තමේන්තු විසින් දරමින් සිටිනවාය කියන එක. ඒ තුළ විශේෂයෙන්ම සංස්ථා, මණ්ඩල වාගේ ඒවායේ අධීක්ෂණ කාර්යභාරය යම් පමණකට සිදු වෙනවා. එය ප්‍රශස්ත මට්ටමකින් සිදු වෙමින් තිබෙනවා. නමුත්, පසු ගිය කාලයේ COPE එකේදී පවා දකින්න තිබුණු කාරණයක් තමයි මේ පාලිත ආයතන - subsidiaries - එහෙම නැත්නම් පරිපාලිත ආයතනවල - sub-subsidiariesවල - අධීක්ෂණය සහ පාලනය කියන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් විය යුතුව තිබෙනවා කියන එක. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමාත් සභාවේ සිටින අවස්ථාවේදී මම මතක් කරන්නට ඕනෑ, මෙවැනි ආයතන පද්ධතියක් රාජ්‍ය ව්‍යවසායන් යටතේ, එහෙම නැත්නම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වගකීම යටතේ රට තුළ තිබෙන බව. නමුත්, ඒවා හරිම සාර්ථක ලෙස monitor කර ගන්න, අධීක්ෂණය හා පාලනය කිරීමේ හැකියාව තවදුරටත් අත් පත් කර ගත යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් කටයුතු කළ යුතුව තිබෙනවා. උදාහරණයක් විධියට ජාතික තරුණ සේවා සභාව ගත්තොත්, ඒක National Budget Department එක යටතේ තමයි පනත අනුව

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

පිහිටුවා තිබෙන්නේ. ජාතික තරුණ සේවා සභාව සෘජුව අධීක්ෂණය හා පාලනය කරන්න පුළුවන් බලයක්, හැකියාවක් ජාතික අය වැය දෙපාර්තමේන්තුවට තිබෙනවා. නමුත්, ජාතික තරුණ සේවා සභාව වාගේ ආයතන පදනම් කරගෙන, නැවත බිහි වෙලා තිබෙන උප ආයතන විධියට තරුණ සේවා පෞද්ගලික සමාගම, නිස්කෝ සමුපකාරය, තරුණ සේවා සම්මේලනය වාගේ ආයතන තිබෙනවා. ඒ වාගේ ආයතනවල සියලු අධීක්ෂණ හා පාලන කටයුතු කර ගන්න පුළුවන් මට්ටම තවදුරටත් සංවර්ධනය කර ගත යුතුව තිබෙනවා. ඒ පිළිබඳව තමයි අපි විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, අපි බලාපොරොත්තු වන ආකාරයට මේ රටේ මූල්‍ය විනය, ඒ වාගේම සමස්ත රටේ ජනතාවගේ බලාපොරොත්තුව වුණු මේ පාර්ලිමේන්තු ක්‍රියාවලිය හරහා, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය හරහා, රටේ මහජනතාවගේ අරමුදල් නිසි පරිදි මෙහෙයවීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරන්න නම්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වාගේම, ඊට අනුබද්ධ ආයතන පද්ධතියම නැවත නැවත සොයා බලමින්, ශක්තිමත් කළ යුතුව තිබෙනවා.

පසු ගිය කාලාන්තරය පුරාම ගත්තාම, මේ ආයතනවලට යොමු වූ අවධානය සම්බන්ධව අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපේ අලුත් ආණ්ඩුව යටතේ ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, තවදුරටත් මේ සංවර්ධන කටයුතු, ඒ අධීක්ෂණ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා මැදිහත් විය යුතුව තිබෙනවා. අපේ මෙවර අය වැය යටතේ මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච කාර්යභාරය සාර්ථකව ඉෂ්ට කරන්න නම්, මෙන්න මේවායේ අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කළ යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up. Could you please wind up now?

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
හොඳයි, ගරු සභාපතිතුමනි.

මෙවැනි ක්‍රියාවලියකට වෙහෙස වෙන ගමන්, මෙවැනි ක්‍රියාවලියකට කාලය කැප කරන ගමන් තමයි අපි ඉදිරිපත් කරපු මේ අය වැය යටතේ සියලු ආයතනවලට, සියලු අංශවලට මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම ක්‍රියාවලියක් යෝජනා කරමින් සිටින්නේ. මම කලිනුත් මතක් කළා වාගේම, විවිධ පාර්ශ්ව පසු ගිය විවාද කාලය පුරාවටම එම කාලය විනාශ කරමින් කරපු දේ තමයි, ප්‍රයෝජනවත්, තාර්කික සාකච්ඡාවක් ගන්නවා වෙනුවට පදනම් විරහිත, ඒ වාගේම අතාර්කික කරුණු ගොනු කරමින් මේ ගරු සභාව නොමඟ යවන්න උත්සාහ කරපු එක. අපි නවක මන්ත්‍රීවරුන් විධියට, යම් වගකීමක් භාර ගත් දේශපාලන ව්‍යාපාරයක සාමාජිකයන් විධියට, මේ රටේ අනාගතය භාර ගත් දේශපාලන ව්‍යාපාරයක සාමාජිකයින් විධියට, පාර්ලිමේන්තුව වාගේ උත්තරීතර ආයතනයකදී හැම දවසකම උදේ වරුවේ මේ කරන අතාර්කික කටයුතු වෙනුවෙන් විපක්ෂය කරන මැදිහත්වීම ගැන අපි ඇත්තටම කනගාටු වෙනවා.

ඒක සැලකිල්ලට ලක් කරන්න ඕනෑ කාරණයක්. අද දවස ගත්තත්, ඉතාම සාමකාමී ලෙස, වැදගත් ලෙස කාලය ගත කළ යුතු අවස්ථාවකයි අද දවසේ අපි ඉන්නේ. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කළ යුතු, නොකළ යුතු දේවල් සම්බන්ධව සාධනීය සාකච්ඡාවක වුවමනාව අපට තිබෙනවා. එවැනි මොහොතක, -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Samaraweera, your time is up.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මම අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

මේ සාකච්ඡාවට ප්‍රයෝජනවත් නොවෙන, එකිනෙකට පරස්පර කාරණා ගොනු කරමින් එක්කෙනෙක් කියනවා, තව බදු අය කරන්න පුළුවන් කියලා. බදු අය කරපු විධිය වැරදියි කියලා තව කෙනෙක් කියනවා. මේක ආනයන ආර්ථිකයකට ගෙනියනවා කියලා සමහර අවස්ථාවල කියනවා. තව අවස්ථාවක කියනවා, නිෂ්පාදන -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Samaraweera, your time is up. Could you please wind up now?

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මේ වාගේ විවිධ පරස්පරතා තමයි විපක්ෂය පැත්තෙන් මතු කරමින් හිටියේ. මේ සාධනීය සාකච්ඡාවට සම්බන්ධ වෙච්ච ගරු මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට අපි බොහොම ස්තුතිවන්ත වෙන බවත් සඳහන් කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු සභපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Rauff Hakeem. You have 14 minutes.

[12.04 p.m.]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Chairman, today happens to be the final day of the Committee Stage Discussion of the Appropriation Bill and I am deeply conscious of the fact that we need to finally make our comments relating to the Budget performance of the Ministry of Finance, Planning and Economic Development. Since the horrible incidents that had taken place in Gaza over the last few days, I rise today wearing this shawl to invite the conscience of this House to look at the terrible incidents that are now unfolding in Gaza once again.

Sir, Israel has resumed military operations in Gaza after refusing to renew or renegotiate the ceasefire and that has led to significant humanitarian, social, political and legal concerns in the region. Already, over 500 Palestinians, including women and children, had died and it is

reported that casualties are rising day by day. The Palestinians in Gaza are in the midst of Ramadan like every Muslim around the world is. It is the month of patience, resilience, caring and sacrifice and deep spiritual reflection for Muslims all over the world. Unconscionably, the hapless Palestinians are attacked even at a time when they are engaged in taking their pre-dawn meal to start the fast. However, the reality is that the area they are cramped in is under military siege, where food supplies and access to medical care and life-saving emergency health services have been completely cut off. Almost all the medical facilities in Gaza are non-operational, worsening their health conditions. It was a result of continued bombings on hospitals and the killing of doctors and nurses, both now and earlier, before the ceasefire and over the last 15 months. Children and women are apparently clear targets of these highly abominable attacks and mass displacements of families are reported, exacerbated by genocidal conditions imposed on the Gazan population. Destruction of homes, hospitals, schools, universities and UN facilities continues to escalate. It adds further to the debris that the civilian infrastructures have been reduced to for the past 15 months, leaving civilians without basic necessities.

Sir, the United Nations has condemned the airstrikes as violations of international law and demanded civilian protection. A few western countries and Saudi Arabia have urged for a ceasefire and have affirmed their commitment to jointly leading efforts to ensure that a two-State solution is vigorously pursued. Even the Arab League and the OIC have done the same. But, there is a catch here, Sir. For a two-State solution to be of any relevance at all, first and foremost, Israel should be denied legitimacy for its relentless campaign aimed to "create facts on the ground". Sadly, it is on this point that some otherwise influential Arab countries, unfortunately, including the UAE and Turkey, need to do more beyond mere exhortations. Countries including Jordan, Egypt, Qatar, Saudi Arabia, Turkey and Iran have condemned Israeli attacks, labelling them as war crimes and urging an immediate ceasefire. Sir, it is absolutely shocking, however, that the United States continues to back Israel despite global calls for restraint. President Trump got financial and military assistance worth US Dollars 18 billion approved in an effort to enable Israel to finish its "unfinished job". In a comment that outraged the conscience of humanity, he stated publicly that the United States would take over and develop Gaza as a "Riviera of the Middle East". This drew in widest possible protest from the Arab and Islamic world and from other quarters as well.

Arab countries led by Egypt, Saudi Arabia and Qatar met in Egypt immediately following this statement to offer an alternative plan for reconstruction of Gaza and restoration of political authority, demonstrating their commitment to taking responsibility into their hands without the US involvement.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

Anyway, Gaza is not for sale.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Exactly! Thank you for saying that. But, that is what they think. It is not up for sale. It is for grabbing land; not even to pay and take it, but they want to grab the land for themselves. Although in a subsequent remark President Trump was reported to have said, "Nobody was asking the people of Gaza to leave"; all signals coming from the US as well as Netanyahu's brutal military onslaught indicate beyond any shadow of doubt that the US is making the people of Gaza hear a completely opposite message through the language of the US-empowered barrels, the Israeli genocidal guns and the airstrikes.

Sir, despite the US-Israeli thrust on a manipulative campaign to avoid developing countries from joining and condemning the outrageous violations of international law and laws of warfare, several countries have stood up to expose their genocidal war crimes. Bangladesh urged the UN to act immediately and protect the civilians. Bolivia and Belize severed diplomatic ties with Israel, citing human rights violations. Chile and Columbia recalled ambassadors, condemning the violence as disproportionate and illegal. Honduras condemned what it describes as genocide against Palestinians. Many Asian and African countries have taken similar or more courageous stands. South Africa, for instance, condemned Israeli military campaign and gross violations of human rights and humanitarian law, in no uncertain terms. It filed an application, argued seeking provisional measures and obtained orders from the International Court of Justice on the grounds that Israel was committing genocide in Gaza. The ICJ ordered Israel to take steps to prevent acts of genocide and facilitate humanitarian aid. Our biggest neighbour, India, seems, however, to have lost its moral voice, with allegations mounting that some citizens of that country are fighting alongside Israeli defence forces. Very unfortunate! The Hon. Minister of Foreign Affairs of Singapore Vivian Balakrishnan, the counterpart of our Hon. Minister of Foreign Affairs Vijitha Herath, stated recently in Parliament, "Singapore supports the right of Palestinian people to a homeland of their own. We believe that the only viable path for achieving a comprehensive, just and a durable solution to this long-standing conflict is a negotiated two-State solution consistent with the relevant UN Security Council resolutions."

Sir, the Israeli war on Gaza and its oppressive, inhuman occupation of the Palestinian Territory including the West Bank and East Jerusalem have caused horrendous violations of human rights and humanitarian law. The failure to distinguish between civilians and combatants violates the Geneva Conventions. Civilian casualties and infrastructure destruction contravene proportionality principles. The blockade on essential supplies amounts to collective punishment, which is prohibited under international law. Strikes on hospitals, schools, and UN facilities breach legal protections for civilian infrastructure.

When we stood accused relating to the final phase of the war in Puthumathalan and Mullivaikkal, the entire international community was urged by western countries and many others, even our diaspora, to take action against us. Now, we also have to conscientiously stand up against

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

these attacks on Gaza. While the ICJ has determined that Israeli actions leading to most of these concerns are a direct violation of human rights and humanitarian law, the International Criminal Court has issued an arrest warrant against Netanyahu on potential charges of war crimes.

Sir, these most abominable and most horrendous attacks on Gaza and the hapless Palestinians should stop immediately. It is important that Sri Lanka should join growing international call for an immediate ceasefire, to stop hostilities and to prioritize humanitarian aid. Sir, our country should also support the demand for accountability for violations of international humanitarian and human rights law by the Israelies. We are a nation that has given moral leadership to the cause of Palestine over decades. We should now cast off the recent months' strategic stupor, make our presence felt in the anti-colonial, anti-occupation camp of independent nations and demonstrate leadership to the international community, especially smaller nations, to amplify their voices and push for justice and peace. There are increasing calls globally for arms embargoes and sanctions against Israel. Sri Lanka needs to watch developments carefully and should study what it could do to help achieve peace in the wider region through restoring our one-time globally acclaimed disarmament and non-proliferation leadership.

So, as a responsible nation, it is prudent without further delay to do all that is possible to keep Palestine and its people from falling victim to Israeli strategic designs. We cannot be so gullible as to be made enemy of each other and to cause mayhem and chaos in this country just because there is love for Israeli money and their investments in our land and on infrastructure.

The Ministry of Foreign Affairs should refocus its attention on the Israeli-Palestinian question and show initiative and leadership in addressing concerns with a view to warding off any future challenges to the country. The Ministry of Defence should dispassionately do an assessment of its national and international security interests and concerns and get its priorities right. National reconciliation and unity can never be advanced by facilitating or turning a blind eye to undue and coercive Israeli influence on Sri Lanka. It is all the more urgent that the Government issues a statement, clearly expressing its stand in relation to the brutally oppressive Israeli occupation and the horrendous Israeli war on Gaza and the Palestine people as a whole.

Therefore, Sir, I urge that the Ministry of Foreign Affairs take note of this, come out of its slumber and issue a statement condemning what has happened in the Gaza Territory during the last few days, at least call for immediate restraint. We are keeping mum. What is the meaning of this? Our Ministry of Foreign Affairs must now speak up as many other countries have spoken up. This is why I thought I should make use of this opportunity to bring some pressure on the Government to take a bold stand now, decrying the actions of the Israelis in the Occupied Territories.

Thank you, Sir.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is the Hon. (Ms.) Lakmali Hemachandra. You have nine minutes.

[අ.භා. 12.18]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, අය වැය කාරක සභා අවස්ථාවේදී අද දිනත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගැනෙනවා. ඒ වාගේම අද මෙම අය වැය විවාදයේ අන්තිම දවස.

අපේ ගරු නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමාත් අය වැය සම්බන්ධව කථා කරනකොට මේ කාරණය මතු කළා. ආණ්ඩුවක් හැටියට ගත්තොත්, අපි අලුත් ආණ්ඩුවක්. ඒ වාගේම, මේ පාර්ලිමේන්තුවේ අලුතින් පත් වෙච්ච මන්ත්‍රීවරු, ඇමතිවරු ඉන්නේ. ඒක හින්දා අපිට හදා ගන්න දේවල් තිබෙනවා නම්, අලුතින් කථා කරන්න දේවල් තිබෙනවා නම් අපිත් විවෘතව, අවංකව බලාපොරොත්තු වෙනවා, ඒ වාගේ සාකච්ඡාවක්. මේ අය වැය විවාදය කියන එක විපක්ෂය විසින් කැඳවා ගන්න විවාදයක්. අය වැයේ සඳහන් රජයේ වියදම්, රජයේ ආදායම් ඉතා හොඳින් නිරීක්ෂණය කිරීම, අධීක්ෂණය කිරීම, මේ සම්බන්ධව යෝජනා තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන එක විපක්ෂයේ කාර්යභාරයක්. මේ අය වැය විවාදය තුළදී අපි දැකපු ඉතාම කනගාටුදායක දේ තමයි, අපේ විපක්ෂය තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කිරීමට අපොහොසත් වීම. ගරු නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙතුමන්ලා ඒ වෙනුවට හැම දාම උදේ වරුවේ මාධ්‍යයේ අවධානය ලබා ගැනීම සඳහා -මාධ්‍ය focus කරගත්ත - මොකක් හරි යම් සන්දර්ශනයක් අමතරව කරනවා. ඒ වාගේම, මේ අය වැය සම්බන්ධයෙන් සාකච්ඡා කරන අවස්ථාවේ අඩු ගණනේ මේ සභා ගැබේ රැඳී ඉඳලා ඒකට දායකත්වයක් දක්වන්නවත් විපක්ෂය උනන්දුක් දැක්වූවේ නැහැ. අපි ඇත්තටම ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, මේ ගැන හොඳින් අවධානය යොමු කරමින් වැඩ කරන විපක්ෂයක් ඉන්නවා නම් ආණ්ඩුවක් හැටියට අපිත් කැමැතියි. අපිටත් කනගාටුවක් තිබෙනවා, එහෙම විපක්ෂයක් ලංකාවේ නැතිවීම ගැන.

ගරු සභාපතිතුමනි, මේ අය වැය විවාදයේ මතු කරගත යුතුම කාරණය තමයි, මේ අය වැය තුළ ප්‍රාග්ධන වියදම් හැටියට කොච්චර මුදලක් වෙන් කරලා තිබෙනවාද කියන එක. ලංකාවේ ආර්ථිකයේ විශාලතම ආයෝජකයා වෙන්නේ රජයයි. රජය තමයි ලංකාවේ ආර්ථිකයේ විශාලම ආයෝජකයා. ආර්ථිකයක් වර්ධනය වෙන්නේ, සංවර්ධනය වෙන්නේ, දියුණු ආර්ථිකයක තත්ත්වයට ලංකාව ගොඩනඟා ගැනීමට පුළුවන් වෙන්නේ රජයේ ආර්ථික කාර්යභාරය තුළ රජයේ ආයෝජන ශක්තිමත් කිරීමෙන් හා රජයේ ආයෝජන වැඩි කිරීමෙන් පමණයි. අපි දන්නවා, පසුගිය අවුරුදු කිහිපය තුළ අපේ රටේ ආර්ථික ප්‍රතිපත්තිය වුණේ රජයේ ආයෝජන කප්පාදු කරමින් රජයේ කාර්යභාරය නිෂ්ක්‍රිය කිරීමයි කියලා. ඒක ඇත්තටම වියදම් කප්පාදු කිරීමකට සීමා වෙච්ච කාර්යයක් නොවෙයි, ගරු සභාපතිතුමනි. මේ අවස්ථාව වනවිට - මේ අය වැය විවාදය වනවිට- අදත් ලොකු සාකච්ඡාවක් ඇතිවෙලා තිබෙනවා, රාජ්‍ය සේවය සම්බන්ධයෙන්. නමුත් ජනතාවට සේවා සැපයීමට, ආර්ථිකය සංවර්ධනය කිරීමට, ආර්ථික ප්‍රතිලාභ රට පුරාම ගෙනයෑමට, මේ ආර්ථික ප්‍රතිලාභ ප්‍රාදේශිකව ගම්වලට බෙදා හැරීමට රජය හැටියට; ආණ්ඩුව හැටියට අය වැය තුළ අපි වෙන් කරන මුදල් -රුපියල් ට්‍රිලියන

1.3ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ- කාර්යක්ෂමව වියදම් කරමින් මේ සංවර්ධන කාර්යභාරය ඉෂ්ට කිරීමේ මූලිකම වගකීම පැවරී තිබෙන්නේ රජයේ සේවයටයි. ඒ නිසා මේ රජයේ සේවය යහපත්ව, ප්‍රමිතිගතව, කාර්යක්ෂම මට්ටමකින් පවත්වාගෙන යෑම ආර්ථික සංවර්ධනය සඳහා ඉතාම වැදගත්. නමුත් අපි පසුගිය දශක කිහිපය තුළම දැක්කේ එවැනි දේවල් නොවෙයි. මේ දවස්වල විශේෂයෙන් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන කතිකාව තුළත් අපිට බොහොම පැහැදිලියි, ලංකාවේ දේශපාලන නායකත්වයන්, ආණ්ඩු විසින් රාජ්‍ය සේවය මුළුමනින්ම කඩා දමා තිබෙන්නේ කොහොමද කියලා.

එතකොට ඒක මේ මුදල් වියදම් කිරීම, එහෙම නැත්නම් මුදල් වෙන් කිරීම අඩු කිරීම පමණක් තුළින් නොවෙයි, රාජ්‍ය සේවය දේශපාලනීකරණය කිරීම තුළිනුත් සිද්ධ වනවා.

අපි මේ අය වැය පුරාවට කථා කළා වාගේම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්මයාත් කිහිප වතාවක් කථා කළා, "රැකියා විරහිත උපාධිධාරින්ට රැකියා ලබා දෙන්න, රැකියා ලබා දෙන්න" කියලා. ඔව්, රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දෙන්නට අවශ්‍යයි. විරැකියාවට විසඳුමක් අවශ්‍යයි. උපාධිධාරින්ට රැකියා ලබා දෙන්නට අවශ්‍යයි කියන කාරණය අපි පිළිගන්නවා.

හැබැයි, ඒ වාගේම අපි රාජ්‍ය සේවය තාර්කික කිරීම - rationalize කිරීම - අවශ්‍යයි. රාජ්‍ය සේවය තිබෙන්නේ රැකියා ලබා දීමේ කාර්යය සඳහා පමණක් නොවෙයි. නමුත් ඇත්තටම මෙච්චර කල් හිටපු පාලකයින් රජයේ සේවය දිහා බැලුවේ එහෙමයි. ජනතාවට සේවා සැපයීමට හෝ ආර්ථික සංවර්ධන කාර්යභාරය සඳහා තිබෙන ප්‍රධානම අංශය හැටියට නොවෙයි, මේ රජයේ සේවය දිහා බලන්නේ. තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කර ගැනීමට, එහෙම නැත්නම් තමන්ගේ හිතවතුන්ට අවස්ථා ලබා දීමට, රැකියා ලබා දීමට තිබෙන අවස්ථාවක් හැටියට තමයි රජයේ සේවය දිහා බලන්නේ. ඒ නිසා තමයි ඇත්තටම අපේ රටේ රජයේ සේවයේ තත්ත්වය, ගුණාත්මකභාවය, ජනතාවට ලබා දෙන සේවාවේ ගුණාත්මකභාවය, ආර්ථික සංවර්ධනයේ ගුණාත්මකභාවය අතිශය පහළ මට්ටමකට වැටිලා තිබෙන්නේ. අපට කැට තියලා කියන්න පුළුවන්, රජයේ සේවය කාර්යක්ෂම නැත්නම් ආර්ථිකයක් සංවර්ධනය වෙන්නේ නැති බව, ගරු සභාපතිතුමනි. අපේ රටේ මේ පවතින රජයේ සේවයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතියත් සමඟ ඇත්තටම රජයක් හැටියට අපට විශාල කාර්යභාරයක් පැවරී තිබෙනවා. ඒ කියන්නේ, රාජ්‍ය සේවය නැවත කාර්යක්ෂම කිරීම අවශ්‍යයි. මේ අවස්ථාවේදී කිසිසේත්ම රජයේ සේවයට අපි මේ අගෞරව කරනවා නොවෙයි.

කථාවක් තිබෙනවා, රජයේ සේවය කප්පාදු කරන්න ඕනෑද කියලා. පසුගිය අවුරුදු කිහිපය තුළ රාජ්‍ය සේවයට බඳවා ගැනීම නවත්වා තිබුණා; රජයේ සේවකයින් බඳවා ගැනීම නවත්වා තිබුණා; freeze කර තිබුණේ. ඒ හරහාත් මේ රාජ්‍ය සේවාවට වෙච්ච හානියක් තිබෙනවා. එම නිසා ඒ ප්‍රතිපත්තිය මේ අය වැය තුළින් අපි නැවත හරවා තිබෙනවා. අපි පුරප්පාඩු නැවත පුරවමින් යනවා. ඒ පුරප්පාඩු පුරවනකොට නිසි පරිදි බොහොම හොඳින් අධ්‍යයනය කරලා, විද්‍යාත්මකව තමයි ඒ පුරප්පාඩු පුරවන්නේ. මොකද, රජයේ සේවය කියන්නේ ආණ්ඩුවක රැකියා ලබා දීමේ අංශයක් විතරක් නොවෙයි. රජයේ සේවය කියන්නේ ජනතාවට සේවා ලබා දීම සඳහා, සංවර්ධනය සඳහා තිබෙන අංශයක් කියන කාරණය අපි අවධාරණය කරගත යුතුයි.

ගරු සභාපතිතුමනි, අපේ අය වැය තුළ මේ දැක්ම බොහොම බරපතළ ලෙස අපි ඉදිරිපත් කරලා තිබෙනවා. රජයේ සේවය අපි ආරක්ෂා කරනවා. අපි රජයේ සේවය කප්පාදු කරන්නේ නැහැ. රජයේ සේවකයින්ගේ වැටුප් වැඩි කරලා තිබෙනවා. ඔවුන්ගේ ගෞරවනීයත්වය අපි නැවත ඔවුන්ට ලබා දීලා තිබෙනවා. අපි රාජ්‍ය සේවය නිර්දේශපාලනීකරණය කරලා තිබෙනවා. දේශපාලනඥයන් අතපොවන්නේ නැහැ, රජයේ සේවකයින්ගේ තීරණ සම්බන්ධයෙන් වාගේම ඔවුන්ව transfer කිරීම ආදිය සම්බන්ධයෙන්. අපි බොහොම පැහැදිලිව දන්නවා, ගරු සභාපතිතුමනි, වෙන අවුරුදුවල ආණ්ඩුවක් පත් වුණාම කොහොමද රජයේ සේවකයින්ව transfer කළේ කියලා. ඔවුන්ව හැල්ලුවට ලක් කරනවා, දේශපාලන පළිගැනීම්වලට ලක් කරනවා. අපි මේ කිසිම දෙයක් කරලා නැහැ. අපි ඔවුන්ගේ ගෞරවය නැවත තහවුරු කරලා තිබෙනවා. ඒ ගෞරවය නැවත අපි ඇති කරලා තිබෙනවා. හැබැයි, ඒ ගෞරවය ඇති කරන ගමන්ම අපි අවධාරණය කරගත යුතු කාරණය තමයි, රජය සිටින්නේ රට සංවර්ධනය කිරීමටයි කියන එක. අපි හැමෝම ඒ ඉලක්කය ඇතුව තමයි ආණ්ඩු බලය අරගෙන තිබෙන්නේ. මේ ආණ්ඩුව සිටින්නේ රට සංවර්ධනය කිරීම හරහා ජනතාවගේ ජීවිත යහපත් කිරීමේ අරමුණ සඳහා පමණයි. ඒ සඳහා අපට තිබෙන ප්‍රධානම අංශය තමයි රජයේ සේවය. ඒක හින්දා තමයි රාජ්‍ය ආයෝජන මේ තරම් ප්‍රමාණයකින් අපි ඉහළ දාලා තිබෙන්නේ. ඒ රාජ්‍ය ආයෝජන ජනතාව වෙතට යන්න නම්, ජනතාව අතට මේ ප්‍රතිලාභ ලැබෙන්න නම්, අපි නැවත රජයේ සේවය කාර්යක්ෂම, ප්‍රමිතිගත, ගුණාත්මක, ජනතාවාදී සේවයක් බවට පත් කරන්නට අවශ්‍යයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
I will wind up, Hon. Chairman.

මම හිතනවා, ඇත්තටම මේ කාරණය ජනතාව වාගේම රජයේ සේවකයෝත්, අපේ ගරු විපක්ෂයත් අවධාරණය කර ගනියි කියලා. මොකද, හැම තිස්සේම රජයේ සේවය සහ රජය අතර අනවශ්‍ය ප්‍රශ්න ඇති කරන්නයි උත්සාහ කරන්නේ. අපි මෙච්චර පහසුකම් ලබා දීලා තිබියදී, මෙච්චර අවධාරණයක් කරලා තිබියදී, මෙච්චර වැටුප් වැඩි කරලා තිබියදී, හැම තිස්සේම උත්සාහ කරන්නේ අපේ රටේ රජයේ සේවය සහ ආණ්ඩුව අතර ප්‍රශ්නයක් ඇති කරන්නයි. ඒක ඇත්තටම සංවර්ධනයට බාධාවක්; ජනතාවට සේවා සැපයීමට බාධාවක්. ඒ බාධාව නවත්වන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. ගරු සභාපතිතුමනි, මට කථා කරන්න වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Thurairasa Ravikaran. You have three minutes.

[ப.ப. 12.27]

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தவிசாளர் அவர்களே, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்களே, அதன் பிரதி அமைச்சர் அவர்களே, நான் இந்தச் சந்தர்ப்பத்தில் ஓய்வூதியர்களைப் பற்றி பேசலாமென நினைக்கின்றேன். வட மாகாண ஓய்வூதியர் உரிமைகளைப் பேணிப் பாதுகாக்கும் அமைப்பினர் தங்களுக்குள்ள குறைகளைப் பின்வருமாறு

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

තෙරිවික්කින්‍රාර්කළ් එන්පතෙ ඉය්වූතියර්කළින් නලන්කරුති නාන් ඉංකු කූරුකින්‍රේන්.

2016-2019 වරෙයාන කාලප්පකුතියිල් ඉය්වුපෙර්‍ර වර්කළුක්කු 2020.01.01ඉල් වළංකවේණ්ටිය කොටුප්පනවානතු, නාට්ටින් නිලෙමෛ කාරණමාක කෝට්ටාපය රාජපක්ෂවින් අමෛච්චරවෙයාල් තර්කාලිකමාක නිරුත්ති වෛක්කප්පට්ටතු. ඉතු තොටර්පාක තේසිය මක්කළ් චක්ති චාර්පාන ඉය්වූතියර් චංකත්තිනර් මේන්මුරෙයීට්ටු නීතිමන්‍රත්තිල් වළක්කුත් තාක්කල් චෙය්තතුටන්, පෝරාට්ටංකළෙයුම් මුන්නෙටුත්තු වන්තනර්. එනිනුම්, අන්ත වළක්කු තළ්ළුපටි චෙය්යප්පට්ටතු. අප්පෝතු ඉතර්කාකප් පෝරාටිය තේසිය මක්කළ් චක්ති ආතරවු තොළිර්චංකංකළ්, තාංකළ් ආට්චි අමෛත්තාල් ඉන්තප් පිරච්චිනෛක්කුත් තීර්වු කාණප්පටුමෙන නම්පික්කෛයූට්ටි වන්තනර්. තේසිය මක්කළ් චක්ති අරචාංකත්තින් මුතලාවතු වරවු චෙලවුත්තිට්ටත්තිල් ඉතර්කුත් තීර්වු කිටෛක්කුමෙනප් පාතික්කප්පට්ට ඉය්වූතියර්කළ් එතිර්පාර්ත්තනර්.

2020ඉල් කිටෛක්කවේණ්ටිය කොටුප්පනවෛ 2025 වරෙ ඉන්තු ආණ්ටුකළාකප් පෙරමුටියාමල් කාත්තිරුන්තවර්කළුක්කු, ඉන්ත වරවු චෙලවුත්තිට්ටත්තිනූටාක අන්තක් කොටුප්පනවෛ මූන්රු කට්ටංකළාක 2027 වරෙ වළංකුවතර්කු කාලනීට්ටිප්පුච් චෙය්යප්පට්ටුළ්ළතු. අන්තක් කොටුප්පනවෛප් පෙරවේණ්ටිය කිට්ටත්තට්ට 2,000 ඉය්වූතියර්කළ් ඉරන්තුවිට්ටනර්. ඉතු නාටු මුළුවතුමානතු. ඉන්ත නිලෛයිල්, තර්පෝතෛය අරචාංකමුම් ඉය්වූතියර්කළින් වාළ්වුක්කාලම් පර්රි චින්තික්කාතු, අන්තක් කොටුප්පනවෛ වළංකුවතෛ මේලුම් මූන්රු ආණ්ටුකළුක්කුප් පිර්පෝට්ටුළ්ළතු එන පාතික්කප්පට්ට ඉය්වූතියර්කළ් කවලෛයතෛකින්‍රනර්. කෞරව අමෛච්චර් අවර්කළේ, මක්කළුක්කාන අරච පණියිල් තංකළුතෛය පණියෛක් කරිචනෛයුටන් පණ්පාකච් චෙය්තු, ඉන්රු ඉය්විලිරුක්කුම් චේවෛයාළර්කළ් නිම්මතියාකත් තමතු ඉය්වුක් කාලත්තෛක් කළිප්පතර්කු උතවි චෙය්යුංකළ්! අතාවතු, අන්තක් කොටුප්පනවු අවර්කළුක්කුක් කූටිය විරෛවිල් කිටෛප්පතර්කු ආවන චෙය්යුංකළ් එන්රු කේට්ටු, විටෛපෙරුකින්‍රේන්. නන්රි!

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිචාළර් අවර්කළ්)
(The Hon. Chairman)
Order please! The Sitting is suspended till 1.30 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පටි, අමර්වු පි.ප. 1.30 මණිවරෙ ඉටෛනිරුත්තප්පට්ටු මීණ්ටුන් තොටංකිර්රු. කුලුක්කළින් පිරතිත් තවිචාළර් අවර්කළ් [මාණ්පුමිකු (තිරුමති) හේමාලි වීරසේකර] තලෛමෛ වකිත්තාර්කළ්.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(මාණ්පුමිකු පිරතිත් තවිචාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 24ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.30]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (කලානිති) අනිල් ජයන්ත - තොළිල් අමෛච්චරුම් පොරුළාතාර අපිවිරුත්තිප් පිරති අමෛච්චරුම්)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

අද විවාදයට ගැනෙන මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ අදහස් දැක්වීමේදී මම යොදා ගන්නවා, අපේ 2025 විසර්ජන පනත් කෙටුම්පත; අය වැය ලේඛනය. මේ අය වැය ලේඛනය දෙස සාම්ප්‍රදායිකව බැලුවොත් අපට පෙනෙන්නේ, 2024 වර්ෂය අවසන් වුණා, මේක තමයි 2025 අය වැය ලේඛනය යනාදි වශයෙන් තවත් එක් වර්ෂයක අය වැය ලේඛනයක් විධියට විතරයි. නමුත්, ඒක එහෙම නොවෙයි.

අපි කවුරුත් දන්නවා, අපට විශේෂ වූ ජනවරමක් ලැබුණු බව. ඒකට හේතු කාරණා සමාජයේ සාකච්ඡා වුණා. ඒ ජනවරම ඇතුළේ මහ ජනතාව ප්‍රධාන වශයෙන්ම බලාපොරොත්තු වුණා, විශාල වශයෙන් සමාජයීය, දේශපාලන සහ ආර්ථික පරිවර්තනයක් සිදු කිරීමක්. ඒ සඳහා අවශ්‍ය සැකසුම, පළමුවැනි අඩිතාලම දැමීම තමයි මේ 2025 අය වැයෙන් සිද්ධ වෙන්නේ. ඒ නිසා මේ අය වැය ඇතුළේ තිබෙන සංඛ්‍යාලේඛනවලින්ම පමණක් මෙහි හොඳ, නරක හෝ දිශානතිය තේරුම් ගන්නට අමාරුයි. මේ දෙස විශ්ලේෂණාත්මකව බලන්නට ඕනෑ. එහිදී අපි අවධානය යොමු කළ කාරණා ගණනාවක් තිබෙනවා.

අපට රට භාර දෙන කොටත් අපි දැනගෙන හිටියා, රට බිඳ වැටිලා තත්ත්වයක් තිබෙන්නේ, එතැනින් එහාට යන්න නම් රට ස්ථායීකරණය කර ගැනීමේ වැඩ පිළිවෙළ තමයි ප්‍රමුඛස්ථානයක් ගන්නේ කියන එක. ඒ ස්ථායීකරණය ඇතුළේ අපි ක්‍රමයෙන් ඉදිරියට ගමන් කරන කොට රටේ දුප්පත්භාවය තුරන් කර ගන්න ඕනෑ. ඒ වාගේම ප්‍රශ්න ගණනාවකට විසඳුම් සෙවීමේදී, ඩිජිටල් තක්ෂණය හරහා මේ වැඩ කටයුතු කිරීමේදී දිගු කාලීන ආර්ථික ස්ථායීකරණය සහ සංවර්ධනය ඉලක්ක කරගෙන තමයි මේ අය වැයේ මූලික දේවල් කෙටුම්පත් වෙන්නේ. එහිදී විශේෂ අවධානය යොමු කළ කාරණා ගණනාවක් තිබෙනවා. ඒවායෙන් තෝරාගත් කිහිපයක් ගැන මම සඳහන් කරන්නම්.

පළමුවැනි කාරණය මෙකයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපට අනිවාර්යයෙන්ම අවශ්‍ය කරනවා, තිරසාර ලෙස ප්‍රමාණවත් ආර්ථික වෘද්ධියක්. අපි දන්නවා, පසුගිය කාලයේ ආර්ථික වෘද්ධිය ඍණ මට්ටමට වැටිලා තිබුණු බව. ගොඩක් අය පුරෝකථනය කළා, ගොඩ එන්න අමාරුයි, ඒ සඳහා තවත් අවුරුදු ගණනාවක් - අවුරුදු 10ක්, 20ක් විතර- යනවා කියලා. ඇත්තවශයෙන්ම අපේ අවුරුදු 10ක ආර්ථික වෘද්ධිය විනාශ කර දමලායි තිබෙන්නේ. ඒ වාගේම ඒගොල්ලන් පුරෝකථන හැදුවා, මින් එහාට යන්නත් අමාරුයි කියලා. ඇත්තටම විපක්ෂයේ කණ්ඩායම් බලයේ හිටියා නම්, හොඳ පුරෝකථනයක් එන්නේ නැහැ. සියයට 2ක, 3ක පුරෝකථනයකින් හැම තිස්සේම හිර කරන ලද ආර්ථිකයක් ඇතුළේ බිල්ලෙකු මවලා බය කරලා මේ ආර්ථිකයට ඉදිරියට යන්න බැහැ කියන තත්ත්වය නිර්මාණය කළා. හැබැයි, ආර්ථික වෘද්ධිය සියයට 2කට, 3කට පුරෝකථනය කරලා තිබියදීත් ඉතා කෙටි කාලයක් ඇතුළත, එනම් 2024 අවසාන කාර්තුවේදී ආර්ථික වෘද්ධිය ධන සියයට 5.4කින් ඉදිරියට ගෙන එන්න අපට පුළුවන් වුණා. ඒක මේ ආර්ථික පුරෝකථනයේ ඉතාම වැදගත් අත්පත් කර ගැනීමක් විධියට අපි දකිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි දැන් අණ පනත් -රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ අණ පනත්, රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ අණ පනත්- සකස් කරලා තිබෙනවා. ඒවා තුළ ඉඳගෙන දෙන ලද ඕනෑම තත්ත්වයකදී වැඩ කරන්න පුළුවන් ආණ්ඩුවක්, කණ්ඩායමක් අපේ දේශපාලන ව්‍යාපාරය. ඒ තත්ත්වයේදී රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමටත්, අය වැය පරතරය කළමනාකරණය කිරීමටත් අපට පුළුවන් වුණා.

ඉතාම කෙටි කාලයක් තුළ මේ රට දියුණු කිරීමට අවශ්‍ය ආයෝජන කැන්දන කොට විදේශිකයන්ගේ සහ ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩ නහා ගැනීම වඩාත් වැදගත් වෙනවා. ඒ සඳහා වැදගත් වන කාරණයක් තමයි, ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම ඉදිරියට ගන්නා එක. දැන් ඒ කටයුත්තත් ඉදිරියට ඇවිල්ලා. අපේ ණය ශ්‍රේණිගත කිරීම ඉදිරියෙන් තිබෙන්නේ.

අද සමාජයේ විශාල කොටසක් -ජනගහනයෙන් සියයට 50කට වැඩි පිරිසක්- ජීවත් වෙන්න අසීරු තත්ත්වයක සිටිමින්, සහනාධාර ඉල්ලමින් ඉන්න තත්ත්වයකදී ඔවුන්ට ප්‍රමාණාත්මක සමාජ සහනාධාරයක් ලබා දෙමින්, විශ්වාසය ගොඩ නහමින් ඔවුන් වේගයෙන් ආර්ථික ක්‍රියාවලියට බද්ධ කර ගැනීම අවශ්‍ය වෙනවා. ඒ අනුව සමාජයීය ස්ථායීකරණ පරමාර්ථයෙනුත් අපි විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කළා. එහිදී කලින් ක්‍රියාත්මක කරගෙන ආපු "අස්වැසුම" යටතේ ලබා දුන් ප්‍රතිලාභ ප්‍රමාණය අපි වැඩි කළා. කාල සීමා වෙනස් කරමින් ප්‍රතිලාභීන්ගේ ආදායම පුළුවන් තරම් දුරට ශක්තිමත් කරලා ඔවුන් සවිබලගන්වන මට්ටමට අපි වැඩ කටයුතු සිද්ධ කළා.

නිෂ්පාදන ක්‍රියාවලියේදී ප්‍රාග්ධනය, මූල්‍යය ඉතාම වැදගත් වෙනවා. අවශ්‍ය උපකරණ මිල දී ගැනීම, අමු ද්‍රව්‍ය මිල දී ගැනීම, සේවකයන් කාර්යයට කැඳවීම, කර්මාන්තශාලා බිහි කිරීම, යන්ත්‍රෝපකරණ මිලට ගැනීම ආදියට අදාළ ක්‍රියාවලියේදී ප්‍රාග්ධනය ඉතාම වැදගත් වනවා. ඒ සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, කොටස් වෙළෙඳ පොළ, ආයෝජකයන් කැඳවීම ආදියට අදාළ වටපිටාව අපි නිර්මාණය කර තිබෙන නිසා දැන් ඔවුන්ගේ විශ්වාසය ගොඩ නැඟෙමින් තිබෙනවා.

ඒ වාගේම අපි හැම ආයෝජකයෙකුටම සාධාරණ, සම පරිසරයක් ඇතුළේ ක්‍රියාත්මක වෙන්න පුළුවන් වන විධියට වැඩ කටයුතු සලස්වා තිබෙනවා. ඔවුන් ආයෝජන කැන්දන කොට අවශ්‍ය පහසුකම් යටතේ ප්‍රමුඛස්ථානයක් දෙනවා, යටිතල පහසුකම්වලට. මේ මොහොතේ අපට සියලු යටිතල පහසුකම් සපුරාලීම කරන්න බැහැ. එහෙම නම්, අපි මොකක්ද තෝරා ගත්තේ? යටිතල පහසුකම්වලදී විශේෂයෙන්ම ප්‍රවාහන පද්ධතිය වැදගත් වනවා. එය, මාර්ග ප්‍රවාහනය වෙන්න පුළුවන්, railway ප්‍රවාහනය වෙන්න පුළුවන්, ගම්බද පාරවල ප්‍රවාහනය වෙන්නත් පුළුවන්. ඒ සියල්ල ඇතුළුව ප්‍රවාහන පද්ධතිය සකස් කිරීම වැදගත් වනවා. ඒ වාගේම, කෘෂි කර්මාන්තය ඉලක්ක කර ගත්තු වාරිමාර්ග තාක්ෂණය, නිෂ්පාදනයට දිරි දෙන, කාර්මීකරණයට, කෘෂිකර්මයට, සේවා සඳහා දිරි දෙන, අවශ්‍ය යටිතල පහසුකම් සහ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා අපි මේ අය වැයෙන් මුදල් සම්පාදනය කර තිබෙනවා.

ණය කළමනාකරණය ගැන මම භාණ්ඩාගාර මෙහෙයුම් කියන කාරණය යටතේ කථා කරන්නම්. අපට මොන චෝදනා එල්ල කළත් අපි ණය කළමනාකරණයත් නිසි පරිදි කර තිබෙනවා. අප ණය වැඩි කරලා තිබෙනවා, අපත් කලින් අය විධියටම ණය ගන්නවා කියලා අපට විවිධ චෝදනා එල්ල කරනවා. නමුත් අපි ඉතාම සූක්ෂ්ම විධියට ණය කළමනාකරණය කරමින් සිටිනවා.

රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීම ගත්තොත්, කවුරුත් බලාපොරොත්තු වුණේ නැති විශාල වැටුප් වැඩි කිරීමක් අපි කළා. ඕනෑ නම් ආණ්ඩුවට මේ මොහොතේදී වැටුප් වැඩි නොකර යන්නත් තිබුණා; එහෙම නැත්නම් කිසියම් දීමනාවක් දීලා යන්නත් තිබුණා. හැබැයි, අපි තීන්දුවක් ගත්තා, එතැනත් වෙනසක් සිදු විය යුතුයි කියලා. ඔවුන්ට වැටුප් වැඩි කරලා ලබා දෙන විට ඔවුන්ගේ ක්‍රය ශක්තිය වැඩි වෙනවා. ඔවුන්ට ඉතාම වැදගත් වෙන්නේ මූලික වැටුප වැඩි කරන එකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වැටුපක ප්‍රධාන කොටස් 2යි, මූලික වැටුප සහ දීමනා වශයෙන්. දීමනා සමන්විත වෙනවා, නිශ්චිත දීමනා සහ මූලික වැටුපට ගැට ගැහුණු වෙනස් වන දීමනා ලෙස. මේ මොහොතේ අපි තීන්දු කළේ මූලික වැටුප වැඩි කරලා දෙන්නයි. අපි මූලික වැටුපත්, වැටුප් වර්ධකයත් වැඩි කළා. වැටුප් වර්ධකය සියයට 80කිනුත්, මූලික වැටුප සියයට 60-80 පරාසය තුළ විශාල පරිමාණයකිනුත් වැඩි වෙනවා. නමුත්, අවාසනාවකට සමාජයේ යම් කථාබහක් ඇති වී තිබෙනවා, මේ වැටුප් සංශෝධනයෙන් මිනිසුන්ගේ වැටුප් කපනවා, අඩු වෙනවා කියලා. ඒ කථාබහ නිර්මාණය වුණා ද, නිර්මාණය කළා ද කියා අපි දන්නේ නැහැ. එවැනි අදහස් ඉදිරිපත් වුණා. අපි ඒවා බැහැර කරනවා. මේ වැටුප් වැඩි වීම තුළ සුවිශේෂී කාරණයක් තිබෙනවා. අපි උත්සාහයක ඉන්නවා මේ වැටුප් වැඩි කිරීම ඔබගේ අප්‍රේල් මාසයේ පඩිපතට -අප්‍රේල් 10වෙනි දා- ලබා දෙන්න. අපි විශ්වාස කරනවා ඒක කරන්න පුළුවන් වෙයි කියලා. ඒ වැටුප් වැඩි වීමේදී ඔබගේ මූලික වැටුප වැඩි වන ආකාරය මම උදාහරණයකින් පෙන්වන්නම්. ඔබ විශ්වවිද්‍යාල පද්ධතියේ තාක්ෂණ නිලධාරියෙකු නම්, ඔබගේ දැනට තිබෙන මූලික වැටුප රුපියල් 31,625යි. ඔබට අප්‍රේල් 10වෙනි දා පඩිපත එනකොට එහි ලියැවෙනවා ඔබගේ මූලික වැටුප, -අපි එකඟ වුණු සමස්තය- රුපියල් 51,095යි කියලා. ඒ වාගේම, lecturer කියන category එක යටතේ මූලික වැටුප දැනට තිබෙන්නේ රුපියල් 69,580යි. අප්‍රේල් මාසයේ එම පඩිපතේ සඳහන් වෙනවා රුපියල් 118,305ක්. ඒ කියන්නේ, එක මාසයක් ඇතුළත, කෙටි කාලයක් ඇතුළත තමන්ගේ මූලික වැටුප සියයට 60-80ත් අතර ප්‍රමාණයකින් වැඩි වෙනවා. එය ඔහුගේ ක්‍රය ශක්තිය පැත්තෙන්, ඔහුගේ අනන්‍යතාව පැත්තෙන්, ඔහුගේ ශ්‍රමයට කරන ගරුත්වය පැත්තෙන් විශාල අගය කිරීමක් වනවා. එය බැංකුවකින් ණයක් ලබා ගන්න ගියත්, ඔහුගේ අනෙකුත් දීමනා සමඟත් ගැට ගැහිලා තිබෙනවා. සමස්ත වැඩි වීම ඔබගේ වැටුප් පතෙහි පෙන්වනවා. ඒක තමයි අපි කිව්වේ. නමුත්, අපි ඒ ගෙවීම කරන කොට අදියර තුනකින් ගෙවන්නේ. ඔබට පළමුවෙනි අදියරේදී හම්බ වෙන්නේ නැති වැටුප නොගෙවූ වැටුප් ලෙස අපි අඩු කරනවා. ඒක ඊළඟ අදියර දෙකේදී ගෙවනවා. මම හිතනවා ඒ උදාහරණ තුළින් එහි තත්ත්වය තේරුම් ගන්න පුළුවන් වෙයි කියලා. ඊළඟට, ඩිජිටල් ගෙවීමේ ක්‍රමවේද පුළුල් කිරීමටත්, ඩිජිටල් ආර්ථිකය පුළුල් කිරීමටත් විශාල වැය බරක් අපි මේ අය වැය ඇතුළේ යොදා තිබෙනවා.

කෘෂි කර්මාන්තය දියුණු කිරීම සහ ආහාර සුරක්ෂිතභාවයත් ඉතාම වැදගත්. කෘෂි කර්මාන්තය, එක පැත්තකින් අපේ නිෂ්පාදන ක්ෂේත්‍රයක් වාගේම අපේ ජීවිතත් එක්ක ගැට ගැහිලා තිබෙන ප්‍රධාන සාධකයක්. අපේ සංස්කෘතිය, සදාචාරය වාගේ මූලික කටයුතු කෘෂි කර්මාන්තයත් එක්ක ගැට ගැහිලා තිබෙනවා. එය හුදු ආර්ථික ක්‍රියාවලියකට එහා ගිය කාරණයක්. කෘෂි කර්මාන්තයත් එක්ක ගැට ගැහිලා තිබෙනවා, ආහාර සුරක්ෂිතතාව. ලෝකයේ හැම කෙනෙකුම ආහාර සුරක්ෂිතතාව ගැන කථා කරනවා. ඒකට ප්‍රධාන හේතුවක් තිබෙනවා. ලෝකයේ කිසිම රටක් තමන්ගේ ආහාර සුරක්ෂිතභාවය අත්පත් කර ගත්තේ නැතිව තමන් සංවර්ධිතයි කියලා ඉස්සරහට ඇවිල්ලා නැහැ. එහෙම නම්, ආහාර ඉතාම තීරණාත්මකයි. ඉතිහාසයේ ඉඳලාම මේ සමාජය විකාශනය වෙන කොට මූලිකම දේ බවට පත් වුණේ ආහාර. ඒ නිසා ආහාර සුරක්ෂිතභාවය ගොඩ නැඟීමටත්, කෘෂි කර්මාන්තය දියුණු කිරීමටත්, කෘෂි කර්මාන්තය ආශ්‍රිතව වටිනාකම් එකතු වුණු නිෂ්පාදන වැඩි කිරීමටත් සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් මේ අය වැය තුළ වෙන් කර තිබෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

මානව සම්පත දියුණු කිරීමේ කාර්යය ගැන අපි නිරන්තරයෙන් සාකච්ඡා කළා; ඒ සඳහා මුදල් වෙන් කිරීම් කළා. අපි සෞඛ්‍ය සේවයට සහ අධ්‍යාපනයට ප්‍රමාණාත්මක මුදලක් වෙන් කර තිබෙනවා.

මීට පෙර සංවර්ධන කාර්යය කරන කොට කොළඹ නගරය, බස්නාහිර පළාත කේන්ද්‍රගත කරගෙන සිදු කරන තත්ත්වයක් තමයි තිබුණේ. ඒ අනුව අපේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 45ක් විතර මේ අවස්ථාව වන කොටත් තිබෙන්නේ බස්නාහිර පළාත ඉලක්ක කරගෙනයි. ඒක වෙනස් කරන්න ඕනෑ. සංවර්ධනයේදී එක්තරා අරමුණක් තමයි, සංවර්ධනයේ ආර්ථික වෘද්ධිය තමයි, ප්‍රාදේශීය විෂමතා අවම කර ගැනීම.

අන්න ඒ ප්‍රාදේශීය විෂමතා අවම කර ගැනීම සඳහා කර්මාන්ත ඇනි කිරීම, ඒ කර්මාන්ත ගමට ගෙන යෑම, යටිතල පහසුකම් ගමට ගෙන යෑම කෙරෙහි වැඩිපුර අවධානය යොමු කරලා තිබෙනවා. අපි කොළඹ නගරයේ ඉලක්ක කර ගත් තැන්වලට විදේශීය ආයෝජන සහ වෙනත් කටයුතු රැගෙන ඒම සඳහා ප්‍රමුඛතාව දීලා තිබෙනවා.

ඒ වාගේම මානව සම්පත ගොඩනැඟීමේදී, සෞඛ්‍ය, අධ්‍යාපනය, ප්‍රාදේශීය සංවර්ධනය වාගේම, තවත් තැන් කෙරෙහිත් අවධානය යොමු කරලා යම් මුදල් වෙන් කිරීම් කරලා තිබෙනවා. ඒ තමයි, ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම. ඒ පිහිටීම ඇතුළේ, විශේෂයෙන් භූ දේශපාලනීය ගැටුම හරහා අපට වාසිදායක සහ අවාසිදායක තත්ත්ව නිර්මාණය වෙන්නත් පුළුවන්. නමුත්, අපි ඒ භූ දේශපාලන ගැටුමේ කොටස්කරුවෙක් වෙන්නේ නැතුව, උපක්‍රමශීලීව භෞතික පිහිටීම සැලකිල්ලට භාජන කරමින්, විශේෂයෙන්ම ඒ භෞතික පිහිටීම නාවුක කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ගනිමින් නාවුක සේවා සැපයීමටත්, වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමටත් වැඩ කටයුතු ගණනාවක් යෝජනා වෙලා තිබෙනවා. ඒවාට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා.

ඊළඟට, මේ අය වැය ඇතුළේ අපේ වියදම් කළමනාකරණය කරන්නේ කොහොමද කියලා මම අවධානය යොමු කරන්න කැමැතියි. ණය වාරික ආපසු ගෙවීම හැර, අපේ ආණ්ඩුවේ සමස්ත වියදම බවට පත් වෙන්නේ රුපියල් බිලියන 7,190යි. මේ වියදම ඇතුළේ අපි යම් හිරවීම් ගණනාවක් එක්ක, යම් යම් බාධක සහිතව තමයි මේ වැඩ කටයුත්ත කරන්නේ. ඒ අතර ප්‍රධාන බාධකයක් තිබෙනවා. ප්‍රාථමික වියදම සඳහා තමයි අපට වියදම් කරන්න පුළුවන්. ප්‍රාග්ධන වියදම් සහ පොලිය හැර පුනරාවර්තන වියදම්වල එකතුව තමයි ප්‍රාථමික වියදම කියන්නේ. මෙන්න මේ ප්‍රාථමික වියදම අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13යි. ඒ අනුව මේ අවුරුද්දේ ප්‍රාථමික වියදම හැටියට රුපියල් බිලියන 4,240ක් වෙන් කරලා තිබෙනවා. සමස්ත වියදමින් ප්‍රාථමික වියදම අයින් කළාට පස්සේ පොලිය විධියට රුපියල් බිලියන 2,950ක් ඉතුරු වෙනවා. අන්න එතැනදී අපට විලංගුවක් තිබෙනවා. ඒක අපි විසින් නිර්මාණය කර ගත්ත එකක් නොවෙයි. ඔබ බලන්න, අපේ අපේක්ෂිත වියදම රුපියල් බිලියන 7,190ක් වෙනකොට, පොලිය ගෙවීම සඳහා -ණය වාරික නොවෙයි- රුපියල් බිලියන 2,950ක් වැය කරනවා. එය සමස්ත වියදමින් සියයට 60කට ආසන්නයි. ඒ පොලිය තුළ විශාල ප්‍රමාණයක් තිබෙන්නේ කලින් ලබා ගත් ණය. ඒ වාගේම අපි දන්නවා, සියයට 30ටත් වඩා වැඩි පොලී අනුපාත යටතේ ණය ලබාගෙන තිබෙන බව.

අද වාගේම නිරන්තරයෙන් සාකච්ඡාවට බඳුන් වෙච්ච බැඳුම්කර වංචාව පිළිබඳ කාරණය ගත්තොත්, එතැන අනවශ්‍ය පොලී වැඩි කිරීමක් සිද්ධ කළා. එතැන අලාභයක් සිද්ධ වුණා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු අදහස් ඉදිරිපත් කරන්න ලෑස්ති වුණා. ඇත්තටම ඒක අලාභයක් නොවෙයි, ඒගොල්ලෝ insider trading කළේ. ඒ හරහා තමයි මේ ගැටුම ආවේ. ඒ කොහොමද? ඒ වෙනකොට වෙළෙඳ පොළේ පැවැති පොලී අනුපාතය සියයට 9ක්, 9.5ක් අතර ප්‍රමාණයක් වුණා. රුපියල් බිලියනයක බැඳුම්කර නිකුත් කරන්න ආණ්ඩුව යෝජනා කර තිබුණු අවස්ථාවක, ඒ වෙනුවට පැය භාගයක් ඇතුළත රුපියල් බිලියන 10ක බැඳුම්කර නිකුත් කරන්න යෝජනා වෙනවා. එතකොට, තමන්ගේ හිතවත් පාර්ශ්ව එතැනට ඇවිල්ලා ඒ බැඳුම්කර සඳහා ඉල්ලුම් කරනවා. එසේ ඉල්ලුම් කළාම, ඔවුන්ට ගෙවන ඵලදා පොලී අනුපාතය සියයට 11.75 දක්වා වැඩි වෙනවා. ඒක හිතාමතාම කරපු දෙයක් කියලා අපි හිතනවා. අපි ඒ පරීක්ෂණ කරනවා. දැනට යම් කරුණු ප්‍රමාණයක් හෙළිදරව් වෙලා තිබෙනවා. මොකද, ඒ වන විටත් වෙළෙඳ පොළේ පැවතුණේ සියයට 9.5ක වාගේ ඵලදා පොලී අනුපාතයක් වුණාට, මේ බැඳුම්කරවලට කූපන් අනුපාතය - coupon rate - සියයට 11.5කට වාගේ උඩින් තියලා තිබුණේ මේ වාගේ වැඩකටද කියන එක පැහැදිලි වෙනවා. මම මේ හෙළිදරව් කළේ, අධික පොලියට ණය ගැනීම ඇතුළුව කලින් ආණ්ඩු ගත් වැරැදි ක්‍රියාමාර්ග නිසා පොලී බර විශාල ප්‍රමාණයක් තිබෙන බව පෙන්වීමටයි. කමක් නැහැ, අපි මේ කාරණය හෙමින් කළමනාකරණය කරනවා.

අපේ මුදල් සම්පාදනය ගත්තොත්, වියදම් සඳහා රුපියල් බිලියන 7,190කුත්, ණය වාරික ගෙවීම සඳහා රුපියල් බිලියන 1,600කුත්, අවශ්‍ය ගැළපීම් සඳහා රුපියල් බිලියන 45කුත් වශයෙන් මේ අවුරුද්ද සඳහා රුපියල් බිලියන 8,835ක මුදල් ප්‍රමාණයක් සම්පාදනය කර ගැනීමට නියමිත වෙනවා. ඒ වාගේම අපේ අය වැය පරතරය රුපියල් බිලියන 2,200ක් වෙනවා. අපි නිසි පරිදි ණය කළමනාකරණය කරන අතර, එයින් රුපියල් බිලියන 75ක් විතරයි විදේශීය අංශවලින් ගන්නේ. ඉතිරි රුපියල් බිලියන 2,125ක ප්‍රමාණය අපි දේශීය අංශවලින් තමයි ලබා ගන්නේ.

ඒ වාගේම, ප්‍රාථමික වියදම් කියන කාරණය එනකොට, එතැන ප්‍රාථමික ශේෂයක් තිබෙනවා. ඒ ප්‍රාථමික ශේෂය රුපියල් බිලියන 750ක්. අපි ඒ රුපියල් බිලියන 750 ඉතාම උචිත පරිදි ණය ආපසු ගෙවීම සඳහා පාවිච්චි කරන්න උත්සාහ කරනවා. මොකද, ණය ආපසු ගෙවීමේදී ආණ්ඩුවකට තිබෙන්නේ ක්‍රම දෙකයි. එකක් තමයි, අලුතින් ණය අරගෙන ණය ගෙවන එක. ඒ කියන්නේ, refinancing. ඒක වඩාත් උචිත ක්‍රමය වෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් ආණ්ඩුවකට ඒ සඳහා බලයක් තිබෙනවා. අතීතයේදී එවැනි වැඩ කරපු නිසා තමයි මේ ප්‍රශ්න සියල්ලම ඇතිවෙලා තිබෙන්නේ. දිගු කාලීන ව්‍යාපෘතිවලට ණය ගන්නවාට වඩා refinancing සඳහාම ණය ගත්තා. එහෙම වෙනකොට කොහේ හෝ තැනක හිර වෙනවා.

විශේෂයෙන් ISBs සම්බන්ධයෙන් සාකච්ඡාවේදී පැන නැඟුණු ප්‍රශ්නය ඒකයි. විවෘත වෙළෙඳ පොළෙන් ණය ගත්තා. ඒ ණය ගත්තේ ණය ආපසු ගෙවීම - refinancing - කියන කාරණයට. ඉතින් අපි වළක්වන්න බැරි හේතුවක් තිබෙනවා නම් refinancing සඳහා යනවා. නමුත්, අපි ප්‍රධාන වශයෙන් මේ රුපියල් බිලියන 750 පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙනවා, ණය ආපසු ගෙවීමට.

ඒ වාගේම, 2024 අවසාන වෙනකොට 2024දී අපේක්ෂා කළාට වඩා ප්‍රාථමික ශේෂයක් ලබා ගැනීමට හැකියාව ලැබුණා. අපේක්ෂා කළේ රුපියල් බිලියන 250ක ප්‍රාථමික ශේෂයක්. එය රුපියල් බිලියන 650කින් ඉවර වුණා. ඒ අනුව, ඒ රුපියල් බිලියන 650න් අපට පුළුවන්කම ලැබුණා ණය සේවාකරණය සඳහා රුපියල් බිලියන 377ක් පාවිච්චි කරන්න. වෙළෙඳ පොළේ මුදල් ස්ථාවරත්වය ආරක්ෂා කරගන්නකොට පොලී අනුපාතය ඉතාම වැදගත් වෙනවා. එහිදී පොලී අනුපාතය ආරක්ෂා කර ගන්න යම්

සුරක්ෂිත buffer එකක් අපේ Treasury Operations Department එකට අවශ්‍යයි. ඒ නිසා මේ ඉතිරි රුපියල් බිලියන 373ත් එතැන අපි ආරක්ෂා සහිතව තබාගෙන තිබෙනවා.

මම ඊළඟට වියදම් කළමනාකරණය පැත්තෙන් ආදායම් කළමනාකරණයට එන්නම්. ගොඩක් වෙලාවට චෝදනාවක් ආවා අපි වියදම් කළමනාකරණය කරලා තිබෙනවා, ආදායම් කළමනාකරණය කරලා නැහැ කියලා. නැහැ, මේ ආදායම් පිළිබඳ නිවැරදි පුරෝකථනයක් කරලා තිබෙන්නේ. සාරාංශයක් විධියට ගත්තොත්, අපේ සමස්ත ආදායම රුපියල් බිලියන 4,990යි. ඒ කියන්නේ, රුපියල් බිලියන 5,000කට ආසන්නයි. ඉන් බදු ආදායම පමණක් රුපියල් බිලියන 4,590ක් වෙනවා. ඒකෙන් රුපියල් බිලියන 1,167ක් ආදායම් බදු. එය සමස්ත බදු ආදායමින් සියයට 25ක්. ඒ වාගේම VAT එක, දේශීය සහ ආනයනය සඳහා එකතු වෙලා සියයට 35ක් තිබෙනවා. සුරාබදු, වෙනත් බදු වර්ග, Social Security Contribution Levy - SSCL - එක මේකට දායක වෙනවා. ඒ වාගේම අපනයනය සඳහා රුපියල් බිලියන 651ක් සම්බන්ධ වෙනවා. ඒ අනුව තමයි රුපියල් බිලියන 4,590ක බදු ආදායම හැදෙන්නේ. ඊට අමතරව අපට බදු නොවන මාර්ගවලින් ලැබෙන ආදායම් තිබෙනවා. එනම්, දේපළ ආදායම්, කුලී, පොලී, ලාභාංශ, දඩ හා ගාස්තුවලින් රුපියල් බිලියන 370ක් ලැබෙනවා. ප්‍රදාන වශයෙන් රුපියල් බිලියන 30ක් ලැබෙනවා. මේ පිළිබඳ තොරතුරු, දත්ත සහිතව නිරන්තරයෙන් පුරෝකථනය කරමින්, ඒවා විමර්ශනය කරමින්, පසුවිපරම් කරමින් තමයි මේ කටයුත්ත යන්නේ. කොහොමද අපි එහෙම කියන්නේ? උදාහරණයක් විධියට ගත්තොත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සෑම මාසයකම අපි දීලා තිබෙනවා ඇස්තමේන්තුගත ඉලක්ක - targets. ජනවාරි මාසයේත්, පෙබරවාරි මාසයේත්, ඒ වාගේම මාර්තු මාසයේ 17වැනි දා වෙනකල් තිබුණු targets අරගෙන බලපුවාම, ජනවාරි මාසයේත්, පෙබරවාරි මාසයේත් මේ වෙනකල් තිබුණු සියලු targets අබිබවා ගිහින් තිබෙනවා. ප්‍රතිශතයක් විධියට ගත්තාම, අපි අපේක්ෂා කළ බදු ආදායම වාගේ සියයට 123ක් එකතු කර ගෙන තිබෙනවා. ඒක සංඛ්‍යාවක් විධියට ගත්තොත්, ඇස්තමේන්තුගත රුපියල් මිලියන 356,825 වෙනුවට රුපියල් මිලියන 438,991ක් අපි අත්පත් කර ගෙන තිබෙනවා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන්.

ඒ වාගේම, රේගුව සම්බන්ධයෙන් විවිධ ගැටලු මතු කරනවා, වාහන ආනයනයෙන් බදු අය කිරීමේදී ඒවා අය කරගන්න බැරි වෙයි කියලා. ප්‍රශ්නයක් නැහැ. අපි ඒවා නිසි පරිදි සුපරීක්ෂණයෙන් සහ මැදිහත්වීමෙන් විමර්ශනය කරමින් ඉදිරියට යනවා. එහි දත්ත අපි ඉදිරිපත් කළොත්, 2024 වර්ෂයේදීත් අපට පුළුවන්කම ලැබුණා අවසානයේදී ආදායම පොඩ්ඩක් පහළ යන්න තිබුණු තත්ත්වය කළමනාකරණය කරගෙන සියයට 100ක ඉලක්කය - target එක - achieve කරන්න. ඒ වාගේම, මේ වෙනකොටත් - මේ මාස දෙක තුන ඇතුළතදී - ඒ ඉලක්කය හඹා යනවා. ජනවාරි මාසය අවසාන වෙනකොට අපට දීලා තිබුණු ඇස්තමේන්තුව රුපියල් මිලියන 135,000යි. අපි ඒ ඇස්තමේන්තුව ඉක්මවා රුපියල් මිලියන 142,590ක් දක්වා ගිහින් තිබෙනවා. ඒ අනුව, අපට ඉතා පැහැදිලියි මේ තත්ත්වය හෙමින් හෙමින් කළමනාකරණය කර ගෙන අපට ඉස්සරහට එන්න පුළුවන් කියලා.

ඊළඟට මම මේ කාරණයත් ඉක්මනින් සඳහන් කරන්නම්. අපේ මුදල් අමාත්‍යාංශයේ විවිධ ක්ෂේත්‍ර තිබෙනවා; ආයතන ගණනාවක් තිබෙනවා. ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳව අපි සාකච්ඡා කළා. මම විශේෂ අවධානයක් යොමු කරනවා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු මොන වාගේ මට්ටමකද තිබෙන්නේ කියන්න. අපි සන්තෝෂයට පත් වෙනවා, මේ වෙනකොට ඔවුන් ලබා ගත් අත්දැකීම්, වැඩ කිරීම, අපට තිබෙන සහයෝගය, ඒ වාගේම ඒ තාක්ෂණය කැඳවීම හරහා ඉතාම කාර්යක්ෂම ලෙස මුදල් ප්‍රවාහය - cash flow එක - පරිපාලනය කිරීමේ හැකියාව දැන් ලැබී තිබෙන එක ගැන. ඒ වාගේම, ඔවුන්ට හැකියාව ලැබී තිබෙනවා ස්ථාවර buffer එකක් ගොඩ නඟා ගන්න, ආරක්ෂිත ආන්තිකයක් ගොඩනඟාගන්න මුදල් වෙළෙඳ පොළේදී පොලී අනුපාතය පාලනය කර ගැනීමට කොච්චර ප්‍රමාණයක් ණය ගන්නවාද කියන කාරණය වෙනුවෙන්. පොලී අනුපාතය පාලනය කර ගැනීමේදී මහ බැංකුව ස්වාධීනව ඒගොල්ලන්ගේ policy rates භාවිත කරනවා. Open market operations, එහෙම නැත්නම් විවට වෙළෙඳ කටයුතු. ඒගොල්ලන්ගේ තව තිබෙනවා suasions. ඒ විවිධ කටයුතු ඔවුන් කරනවා. හැබැයි, ඒ කාරණය ඇතුළේ Fiscal Policy එක, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේත්, අපේ වැදගත්කමත් එතැනට සම්බන්ධ වෙනවා. මේ දෙකේ සංයුතියකින් තමයි පොලී අනුපාතය ස්ථාවර වෙන්නේ. දැන් ඒ පොලී අනුපාතය ක්‍රමිකව පහත වැටෙමින් තිබෙනවා. ප්‍රමාණවත් buffer එකක් අපි නිර්මාණය කර තිබෙනවා.

අපි දන්නවා Treasury එකට බිල්පත් ආවාම, කලින් අවුරුද්දක් විතර බිල්පත් ගෙවීම පරක්කු වුණු බව. එතකොට කොන්ත්‍රාත්කරුවෝ ඒ කොන්ත්‍රාත්වලට එන්නේ නැහැ, අත හරිනවා. ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබුණා. දැන් අපි සහතිකයක් දෙන්න කැමැතියි, ඕනෑම බිල්පතක් ඒ අදාළ තොරතුරු සහිතව නිවැරදිව ඉදිරිපත් කළාම දින 30කට අඩු කාල පරිච්ඡේදයක් ඇතුළතදී ඒවා ගෙවා දැමීමේ වැඩ පිළිවෙළක් අපේ Treasury Operations Department එකෙන් සූදානම් කර තිබෙන බවට. ඒ වාගේම ඒ බිල්පත් එවීමේදී අදාළ තොරතුරු සහතික කිරීම ඉතාම වැදගත් වෙනවා.

ඊළඟ අභියෝගය මේකයි. අපේ Treasury Operations Department එකේ බිල්පත් ගෙවීමේදී, විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ගෙවීම් සිදු කිරීමේදී කලින් මාස 3ක්, 4ක් පමණ ගත වුණා. දැන් එයත් අපට මාසයකින් ගෙවන්න පුළුවන්. ඒ වාගේම තමයි පාරිතෝෂිකය. වැඩි මුදලක් ලැබෙන්නේ එතැනින්. ඒක පසුගිය අවුරුදු දෙක තුන ඇතුළත සමහර අවස්ථාවලදී මාස 18ක්, මාස 24ක්, ඒ කියන්නේ අවුරුදු දෙකක් පමා වෙලා තිබෙනවා. දැන් Treasury Operations Department එකෙන් මාසයක් ඇතුළතදී අනිවාර්යයෙන්ම ඒක ගෙවනවා. ඒ වාගේම මම මේ කාරණයත් සඳහන් කරන්නට ඕනෑ. මේ වනකොට නිසි පරිදි බිල්පත් ආවොත් ක්ෂණිකව ගෙවනවා කිව්වා. එය සන්සන්දනාත්මකව බැලුවොත්, දැනට Treasury Operations Department එකේ තිබෙන්නේ රුපියල් මිලියන 100කටත් අඩු බිල්පත් ප්‍රමාණයක්. ඒකත් පුංචි පුංචි තාක්ෂණික අඩුපාඩු මිසක් වෙන කාරණා නොවෙයි. එය සන්සන්දනාත්මකව බැලුවොත්, අවුරුදු දෙකකට කලින් රුපියල් මිලියන 242,000ක් තිබුණා. ඒ කියන්නේ, රුපියල් බිලියන 242ක් ගොඩ ගැහිලා, හිර වෙලා තිබිලා තමයි මේ ගෙවීම් ප්‍රමාද වුණේ. දැන් අපි කොන්ත්‍රාත්කරුවන්ට, ආණ්ඩුවට සේවා සපයන්නන්ට කියනවා, ඔබ මිල කිරීම් කරනකොට අනවශ්‍ය විධියට පොලියක් එකතු කරලා මිල වැඩි කරන්න එපා. එතකොට ඒ අදාළ factors load කරන්නේ නැතිව තරගකාරී මිලකට එන්න ඔබටත් පුළුවන්.

ඒ වාගේම වෛද්‍ය සැපයුම් අංශය ඉතාම වැදගත්. අපේ බෙහෙත් හේත්වලට නොගෙවීමේ ප්‍රශ්නයක් තිබුණා. වෛද්‍ය සැපයුම්වලටත් ඉතාම කෙටි කාලයක් ඇතුළත - දින 30ක් ඇතුළත - අපි ගෙවීම් කරනවා. වෛද්‍ය සැපයුම් සඳහා ගෙවීම් සිදු කරනකොට පසුගිය වසරේ අපට ලැබුණු සියලුම දේවල් ගෙවා නිම කර තිබෙනවා. මේ වසරේදීත් ඒ වෙන් කර තිබෙන ප්‍රමාණයට මේ මාසය ඇතුළත ලැබුණු රුපියල් බිලියන 15 දැනටමත් නිදහස් කර තිබෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඒ වාගේම ඊළඟට වැදගත් වන කාරණය තමයි, ණය ගැනීම. කලිනුත් මම සඳහන් කළා වාගේ ඇත්තටම අපි ණය පාවිච්චි කරන්නට ඕනෑ යම් ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට. ඒක leverage එකක්. ඒ නිසා ණය ගැනීමේදී වෙළෙඳ පොළ උද්ධමනකාරී බලපෑමක් නොවන විධියටත්, ආර්ථිකයට රුකුල් දෙන විධියටත් මේ ණය ගැනීම සිද්ධ කරන්න ඕනෑ. අපි ණය සීමාවකට යටත් වෙලා තිබෙනවා. ඒක ඇතුළේ වැඩිපුර අවධානය යොමු කරනවා, දේශීය වෙළෙඳ පොළෙන් අඩු පොලියට ණය ලබාගෙන ණය කළමනාකරණය ඉදිරියට අරගෙන යන්න. ඒ වාගේම ණය කළමනාකරණය ඇතුළේ රාජ්‍ය පංගුව ඉතා වැදගත් වනවා. රාජ්‍ය වියදම් කිරීමේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20ක විතර ප්‍රමාණයක් තමයි අවසානයේදී අපට තිබෙන්නේ. නමුත්, ලෝකයේ ප්‍රවණතාව දියුණු වනකොට සමස්ත ආර්ථිකය ඇතුළේ සියයට 35ක්, 40ක් වාගේ රාජ්‍ය මැදිහත්වීම සිද්ධ කරන්න පුළුවන් නම් තමයි හොඳ. නමුත්, මේ තිබෙන මට්ටම අනුව අපට එතැනට ළඟා වෙන්න බැරි වෙලා තිබෙනවා. කෙසේ වුවත්, අනාගතයේදී මේ ණය කළමනාකරණය කිරීම සම්බන්ධව අපි යම් උත්සාහයක් ගන්නවා. මොකද, 2028 වනකල් යම් හුස්ම ගැනීමේ ඉඩකඩක් අපට නිර්මාණය වෙලා තිබෙනවා. එය ප්‍රයෝජනයකට අරගෙන නිසි ණය කළමනාකරණයකට යනවා. ඒ ණය කළමනාකරණයේදී වැදගත් වෙන්නේ පොලී අනුපාතය. පසුගිය 12වැනි දා නිකුත් කළ බැඳුම්කර සම්බන්ධයෙන් බැලුවාම ඒ පොලී අනුපාතය ඔබට බලා ගන්න පුළුවන්. අවුරුදු 4, අවුරුදු 7, අවුරුදු 9 කියන බැඳුම්කරවල පොලී අනුපාතය - coupon rate එක - වෙළෙඳ පොළ තුළ ක්‍රමිකව පහළට එමින් තිබෙනවා, ස්ථාවර වෙමින් තිබෙනවා. එය සුබදායක ලක්ෂණයක්.

ඒ වාගේම දේශීය වශයෙන් රාජ්‍ය ණය පියවීමේදී රාජ්‍ය ආදායම භාවිත කරනවා. ඊට අමතරව refinancing යනවා. විදේශීය ණය තීරණාත්මකයි. විදේශීය ණයවලදී හැකිතාක් දුරට මේ වනකොට අපි IMF programme එකක ඉන්නවා. එතැනින් ලැබෙන අරමුදල් භාවිත කරනවා. ඒ වාගේම බහු පාර්ශ්වීය ණයකරුවෝ ඔවුන්ගේ වැඩ පිළිවෙළ තුළ සිටින ලෝක බැංකුවෙන්, ADB එකෙන් ලැබෙන මුදල් භාවිත කරමින් යම්තාක් දුරට කළමනාකරණය කරනවා. මේ සඳහා ව්‍යාපෘති නොවන වැඩසටහන් යටතේත් අපට ණය ලබා ගන්න පුළුවන්, budgetary supportවලට. තිරසර විධියට ණය කළමනාකරණය කිරීමට අපි අවධානය යොමු කරන්නේත්, විදේශීය සංචිත ගොඩ නඟා ගැනීමට අපි අවධානය යොමු කරන්නේත් අපනයන වර්ධනය කිරීමත්, දිගුකාලීන foreign direct investments වර්ධනය කිරීමත්, ඒ වාගේම විදේශ ප්‍රේෂණ වැඩි කර ගැනීමට සහ සංචාරක කර්මාන්තය දියුණු කර ගැනීමත් සඳහායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, Department of Treasury Operations හරහා තාක්ෂණය යොදාගෙන දැනටමත් ඒගොල්ලන්ගේ තිබෙන Integrated Treasury Management Information System එක හරහා රේගු දෙපාර්තමේන්තුවේ තිබෙන ASYCUDA, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තිබෙන RAMIS, ඒ වාගේම සුරාබදු දෙපාර්තමේන්තුවේ implement කරන්න තිබෙන RASED යන systems සියල්ල එකට එකතු කරලා මේ වනකොටත් සියයට 90ක් පමණ ආයතන අපි ඒකාබද්ධ කර තිබෙනවා.

ඉතා කෙටි කාලයක් ඇතුළතදී රාජ්‍ය පද්ධතියේ තිබෙන සියලු ආයතන මෙතැනට එකතු කර ගත්තාට පස්සේ ඔවුන්ගේ වියදම් කළමනාකරණය කිරීම කාර්යක්ෂම කරන්න පුළුවන්. ඒ අනුව 2025 අය වැය තුළින් මුදල් අමාත්‍යාංශය යටතේ මේ වැඩ කටයුතු කිරීම අනිවාර්යයෙන්ම මේ රටේ ගමන් මාර්ගය වෙනස් කිරීමට බොහෝ සෙයින් ඉවහල් වන බව සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.56]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊයේ දිනයේදී වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා, අස්වැසුමට apply කරපු අඩු ආදායම්ලාභීන් ප්‍රමාණය 807,000ක් කියලා. ඒ 807,000ට රුපියල් 5,000ක් වටිනා බඩු මල්ලක් රුපියල් 2,500ට ලබා දෙනවා කියලා කිව්වා. ඒක ඉතා හොඳ දෙයක්. ඒක ලබා දෙන්නේ පළාත් පාලන මැතිවරණය නිසා නොවෙයි කියලා අපි හිතනවා. හැබැයි, ඒක ඉතා හොඳ දෙයක්. මේ බඩු මල්ල ඇතුළේ සහල් කිලෝග්‍රෑම් 5ක් තිබෙනවා. ඒ සහල් කිලෝග්‍රෑම් 5 නාඩු සහල්වලින් ගන්නත් පුළුවන්; නැත්නම් සුදු කැකුළු, රතු කැකුළු ආදී කැමැති මොනවා හරි සහල් වර්ගයක් ගන්නත් පුළුවන්. ඒ වාගේම, මේ බඩු මල්ල ඇතුළේ ලොකු ලූනු කිලෝග්‍රෑම් 2ක් තිබෙනවා, අල කිලෝග්‍රෑම් 2ක් තිබෙනවා, පරිප්පු කිලෝග්‍රෑම් 2ක් තිබෙනවා, සැමන් ටින් එකක් තිබෙනවා, දුඹුරු සීනි කිලෝග්‍රෑම් 3ක් තිබෙනවා, පාන් පිටි කිලෝග්‍රෑම් 2ක් තිබෙනවා, සෝයාමීට් පැකට් 4ක් තිබෙනවා, සම්පෝෂ පැකට් 2ක් තිබෙනවා. සහල් දෙන එක හරි. ලූනු දෙන එකත් හරි. පරිප්පු දෙන එකත් හරි. සෝයාමීට් දෙන එකත් හරි. එතකොට, ඇයි මේ සම්පෝෂ පැකට් දෙකක් දෙන්නේ?

ගරු අග්‍රාමාත්‍යතුමියනි, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලංකාවේ ගර්භිණී මාතාවන්ට ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මඟින් ත්‍රිපෝෂ හදලා දෙන බව ඔබතුමියත් දන්නවා ඇති. ගර්භිණී මාතාවන්ට සම්පූර්ණයෙන්ම නොමිලේ තමයි ත්‍රිපෝෂ ලබා දෙන්නේ. ඒ වාගේම, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේම නිෂ්පාදනය කරන, ඕනෑම අයෙකුට මිලදී ගන්න පුළුවන් නිෂ්පාදනයක් තමයි සුපෝෂ. සුපෝෂ කියන්නේ සියයට සියයක්ම රජය සතු ආයතනයක් මඟින් නිෂ්පාදනය කරන දෙයක්. මේකේ ජාන විකෘති කරලාත් නැහැ; මේක රටම පිළිගත්ත නිෂ්පාදනයක්. හැබැයි, රජයෙන් සහන මිලට දෙන පැකට් දෙකට සම්පෝෂ තමයි පාවිච්චි කරන්නේ. ඇයි මේකට සුපෝෂ පාවිච්චි කරන්නේ නැත්තේ? මේක කෝටි 30ක බිස්නස් එකක්. මේක රජයේ ආයතනයට ලබා දුන්නා නම් රුපියල් මිලියන 300ක්. මේකෙදි සියයට 10ක ලාභයක් තිබුණා නම් රජයට රුපියල් මිලියන 30ක් ඉතිරි කර ගන්න තිබුණා. රජය මැදිහත් වෙන්නේ නැතිව ඒ රුපියල් මිලියන 30න්, ඒ සුපෝෂවල ආදායමෙන් විතරක් ගර්භිණී මාතාවන් 60,000කට ඒ සහනය දෙන්න හැකියාව තිබුණා.

මොකද, රුපියල් 500ක් තමයි ත්‍රිපෝෂ පැකට් එකකට යන්නේ. හැබැයි, වෙළෙඳ අමාත්‍යතුමා සතොසෙන් මොකක්ද කරන්නේ? මේ දේවල් රජයේ ආයතනයෙන් මිලදී ගන්නවා වෙනුවට, එතුමා යනවා සමපෝෂ ගන්න. Ceylon Biscuits Limited - CBL - එකේ හිටපු CEO/Director තමයි අද සතොස ආයතනයේ Chairman විධියට ඉන්නේ. එතුමා පඩි ගන්නේත් නැහැ කියලා කිව්වා. හැබැයි, පඩි ගන්නේ නැති සභාපතිතුමා රටේ ජනතාවට නොමිලේ බඩු පාර්සලයක් දෙන්න ගියාම රජයේ ආයතනයේ නිෂ්පාදිත සුපෝෂ දිහා බලන්නේ නැතිව, අන්තිමට සමපෝෂ අරන් රටේ ජනතාවගේ බදු මුදල් මෙහෙම නාස්ති කරන එක සාධාරණද? ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රජයේ ආයතනයකට වෙන්න පුළුවන්, යුද හමුදාවට වෙන්න පුළුවන්, Ceylon Electricity Board එකට වෙන්න පුළුවන්, තෙල් ඕනෑ වුණොත් යන්නේ Ceylon Petroleum Corporation එකට. ඒගොල්ලන් IOC එකට යන්නේ නැහැ නේ. ඒගොල්ලන් Sinopec එකට යන්නේ නැහැ නේ. හැබැයි, රජයේ බදු මුදල්වලින් රටේ ජනතාවට සහන මිලට බඩු මල්ලක් දෙනකොට සුපෝෂ අතහැරලා ඇයි සමපෝෂවලට යන්නේ? කාටද මේ ලබැඳියාව තිබෙන්නේ? ඇයි සමපෝෂ හොඳ? ඇයි CBL හොඳ? ඇයි, සෞඛ්‍ය අමාත්‍යාංශය හොඳ නැද්ද කියලා අපි දැනගන්න කැමැතියි. ඒ වාගේම, අපි මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙලාවේදීත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කෙරෙව්වා.

ඊළඟට, මම මුදල් අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, වෛද්‍යවරුන්ගේ දීමනා පිළිබඳ ප්‍රශ්නය. වෛද්‍යවරු දිගින් දිගටම කියනවා, එතුමන්ලාගේ අමතර වැඩවලට ගෙවන 1/80ක ප්‍රමාණය, 1/120 කරන්න එපා කියලා. ඒ වෙනුවට 1/120 සඳහා ගෙවන මුදලම ගෙවන්න, අර 1/80න් තුනෙන් දෙකක් ගෙවන්න කියලා. ඒ වාගේම තමයි, නිවාඩු දිනයක වැඩ කළාම ගෙවන 1/20ක ප්‍රමාණය 1/30 කරනවා වෙනුවට, එතුමන්ලා කියනවා තුනෙන් දෙකක් ගෙවන්න කියලා. එතුමන්ලා කියනවා, මේ වෙලාවේ අය වැයේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, මුදල් නැත්නම් ලබන අවුරුද්දේත් එපා කියලා; 2025දීත් එපා, 2026දීත් එපා, 2027දීත් එපා, 2028දී අර පරණ arrears එකත් එපා, අර තුනෙන් එකෙන් භාගයක් දෙන්න, ඊළඟ අවුරුද්දේ 6න් එකක් දෙන්න කියලා තමයි ඔවුන් ඉල්ලන්නේ. මේ ඉල්ලීම අතිසාධාරණයි.

මේ ඉල්ලීම කරන්නේ අවුරුදු තුනකටත් එහාට. උද්ධමනය බලා මාස හයෙන් හයට පඩි වැඩි කරනවා කියලා තමයි අනුර කුමාර දිසානායක මහත්මයා කිව්වේ. දැන් අවුරුදු තුනටම එකයි. වෛද්‍යවරුන් අවුරුදු 4ක් එහාට ඉල්ලුවාමත් ඒක දෙන්න බැහැ කියනවා. ඒ ගැන අපි කනගාටු වෙනවා.

ඒ වාගේම තමයි, හෙද නිලධාරීන්ගේ ගැටලුවත්. ගරු අග්‍රාමාත්‍යතුමියටත් මතක ඇති, අර Galle Face සිද්ධිය වෙලාවේ ඉස්සෙල්ලාම දුවගෙන ආවේ හෙද නිලධාරීන් බව. TV එකෙනුත් අපි දැක්කා, ඔවුන් පෝලිමට ආවා. ඒ හෙද නිලධාරීන් මහ රෝහලේ ඉඳලා පයින් ආවේ. අද ඒ හෙද නිලධාරීන්ට තමයි මේ ආණ්ඩුවෙන් ඉස්සෙල්ලාම ගහලා තිබෙන්නේ. හෙද නිලධාරීන්ට III වන ශ්‍රේණියේ ඉඳලා II වන ශ්‍රේණිය දක්වා උසස්වීම් ලබන්න තිබුණු කාලය අවුරුදු 5යි. ඒ අවුරුදු 5ක කාලය අවුරුදු 10කට වැඩි කරලා තිබෙනවා. II වන ශ්‍රේණියේ ඉඳලා I වන ශ්‍රේණියට යන්න තිබුණු අවුරුදු 7ක කාලය අවුරුදු 11ක් කරලා තිබෙනවා. ඒ වාගේම III වන ශ්‍රේණියේ ඉඳලා අධි ශ්‍රේණියට යන්න තිබුණු අවුරුදු 22ක කාලය අවුරුදු 31ක් කරලා තිබෙනවා. මෙහෙම තමයි ඔවුන්ට සලකන්න ඕනෑ! ඔබතුමන්ලාගේ ආණ්ඩුව පිහිටුවන්න උපරිම සහයෝගය ලබා දීපු අයගේ උසස්වීම් පවා නැති කරලා තිබෙන්නේ. ඔවුන්ගේ 1/160 ලෙස ගෙවපු OT එක, 1/200 කරලා තිබෙනවා. නිවාඩු දිනයක වැඩ කළාම ගෙවන 1/20ක දීමනාව 1/30 කරලා තිබෙනවා. මෙහෙම තමයි ඔබතුමන්ලාට සහයෝගය දීපු හෙද නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පක්ෂයක් විධියට අපි -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ- මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවා. අද හවස් වෙනකොට මාලිමාවෙන්ම සමාජ මාධ්‍යවල පළ කරනවා, ඩී.වී. චානක, නාමල් රාජපක්ෂ, චානක මාදුගොඩ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්න හේතු මෙන්න මේවාය කියලා. ඒ නිසා මම කලින්ම ඒ හේතු ටික කියන්නම්.

පළමුවැනි හේතුව තමයි, රටේ ජනතාවට බොන්න දෙන ජලයේ ප්‍රමිතිය බාල කරන්න නීති සම්පාදනය කිරීම. ISO standards අනුව ලංකාවේ ජලයේ තිබෙන්න ඕනෑ ප්‍රමිතිය බාල කරපු නිසා අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවා. ඒ වාගේම containers 323ක් පන්නලා තිබෙනවා. අද Sri Lanka Customs එකෙන් කියනවා, ඒවායේ මත් ද්‍රව්‍ය තිබුණාද, ආයුධ තිබුණාද, එහෙම නැත්නම් අධි මිලැති වාහන තිබුණාද කියලා දන්නේ නැහැ කියලා. ඒ නිසාත් අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවා. ඒ වාගේම තමයි තෙල්වලට පනවා තිබෙන බදු අයින් කරලා, පළමුවැනි අය වැයෙන්ම රුපියල් 50ක් අඩු කරලා රටේ ජනතාවට සහන දෙනවාය කිව්වා. ඒ රැවටීම නිසාත් අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය ලබා දෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, උපාධිධාරීන් 35,000කට පළමුවැනි අය වැයෙන්ම රැකියා ලබා දෙනවාය කියලා ඔවුනුත් රැවටුවා. දැනුත් ඔවුන් පාර්ලිමේන්තුව ඉස්සරහ ඉන්නවා. ඔවුන් රැවටීම නිසාත් අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවා. ඒ වාගේම විදුලි බිල ඉතාම කෙටි කාලයක් තුළ සියයට 30කින් අඩු කරනවාය කියලා, PUCSL එක කිව්වාම සියයට 20ක් අඩු කළා. දැන් ඇමතිතුමා කියනවා, නැවත වතාවක් විදුලි බිල වැඩි කරනවාය කියලා. මැතිවරණයෙන් පස්සේ අඩු කරපු සියයට 20යි, තවත් සියයට 15කුයි එකතු කරලා සියයට 35කින් විදුලි බිල වැඩි කරන්න බලාගෙන ඉන්නේ. ඒ නිසාත් අපි අය වැයට විරුද්ධව ඡන්දය දෙනවා. ඒ වාගේම තමයි ජනතාවට පුංචි කාර් සිහිනයක් පෙන්වලා, තිබුණු බද්දටත් අලුතෙන් luxury tax එකක් පනවලා, කෝටිපතියන්ට විතරක් වාහන මිලදී ගන්න පුළුවන් පරිසරයක් හැදුවා. රජයේ නිලධාරියාට, මධ්‍යම පාන්තිකයාට, ගමේ මනුස්සයාට ත්‍රී රෝද රථයක්, මෝටර් බයිසිකලයක්වත් ගන්න බැරි වෙන්න බදු පැනෙව්වා. ඒ නිසාත් අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවා. ඒ වාගේම කියන්න ඕනෑ, රොබින් හුඩ් පන්නයේ අය වැයක් තමයි ඔබතුමන්ලා ගෙන එනවාය කිව්වේ. ලොකු ව්‍යාපාරිකයන්ට තමයි බදු ගහනවා කිව්වේ. හැබැයි, ඒ වෙනුවට -විශේෂයෙන්ම තැන්පතුවලට - රඳවා ගැනීමේ බද්දක් ගැහුවා. තැන්පතුවල දාලා තිබෙන්නේ, එක්කෝ ETF, EPFවලින් ලැබුණු සල්ලි, එහෙම නැත්නම් pension එකෙන් හම්බ වෙච්ච සල්ලි, එහෙම නැත්නම් පොඩි ළමයින්ගේ කැකුළු ගිණුම්, අර ගිණුම් මේ ගිණුම්වල තිබෙන සල්ලි. ඒවා තමයි තැන්පතු කියන්නේ. හැබැයි ඒ තැන්පතු ඔක්කෝටම සියයට 5ක්ව තිබුණු බද්ද සියයට 10ක් දක්වා වැඩි කරලා, රටේ ජනතාව මත අනවශ්‍ය බදු පැනවීම නිසාත් අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවා.

ඔබතුමන්ලා කිව්වේ මේ රටේ පනවා තිබෙන බදු වැඩියි කියලායි. රනිල් වික්‍රමසිංහ මහත්මයා බදු ගහනවා වැඩියි කියලායි කිව්වේ. හැබැයි, අද ඒ බදු නැවතිව්ව තැනින් ඉස්සරහට යනවා මිසක් ඉන් එකක්වත් අඩු වෙන්නේ නැහැ. පාසල් උපකරණවලට පනවා තිබෙන බදු අයින් කරනවා කිව්වා. පාසල් උපකරණවලට පනවා තිබෙන වැට් එක අයින් කරනවා කිව්වා. ආහාර ද්‍රව්‍යවලට පනවා තිබෙන බදු අයින් කරනවා කිව්වා. හැබැයි, ඊයේ දිනයේ නැවත වතාවක් සියයට 15ක බද්දක් එකතු කරලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමන්ලාට උදව් කරපු යූටියුබ් ක්‍රියාකාරීන්, ෆේස්බුක් ක්‍රියාකාරීන් යන සියලුදෙනා සඳහා අලුතෙන් සියයට 15ක බද්දක් පනවා තිබෙනවා.

[ගරු ඩී.වී. චානක මහතා]

මේ විධියට සමස්ත රටේ ජනතාව මත බදු පනවා තිබෙනවා. විශේෂයෙන්ම අනුර කුමාර දිසානායක මහත්තයාට රටේ ජනතාව ඡන්දය දුන්නේ එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට. ඒ වාගේම අග්‍රාමාත්‍යතුමිය ඇතුළු තුනෙන් දෙකක ආණ්ඩුවට මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුමත කරලා. හැබැයි, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියපු දේවල් අද වන විට අය වැයේ නැතිවීම නිසාත් මේ අය වැයට විරුද්ධව අපි ඡන්දය ලබා දෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.06]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ජාතික ජන බලවේගය ඉදිරිපත් කළ මංගල අය වැය පිළිබඳ විවාදයේ අවසන් දිනය අදයි. අපි ඉතා කැමැත්තෙන්ම අද එයට විරුද්ධව ඡන්දය දෙනවා. අපි ඒ ගැන කියන්න ඕනෑ. මොකද, මේ අය වැය කථාව සුරංගනා කථාවක් කියලායි අපට කියන්න වෙන්නේ. වැය තිබෙනවා, හැබැයි අය තිබෙනවාද කියලා දන්නේ නැහැ. එහෙම නේද? අය ගැන අපට විශාල සැකයක් තිබෙනවා.

අපේ අගමැතිතුමිය සභාවේ සිටින නිසා මම යම් කාරණයක් ගැන කියන්න ඕනෑ. එතුමිය කළ ප්‍රකාශයක් සම්බන්ධව දමිළ පත්තරයක පළ වී තිබුණු පුවතක් මා දැක්කා. ඒ පුවත් පත "වීරකේසරී" ද, "ටැමිල් මිරර්" ද කියලා මට මතක නැහැ. එතුමිය කියා තිබුණා, කඳුකරයේ දමිළ ජනතාව පිළිබඳව ඔබේ ආණ්ඩුව යෝජනා මාලාවක් ඉදිරිපත් කර තිබෙනවා කියලා. හොඳයි, එහෙම කරන්න. හැබැයි, එහෙම කර තිබෙනවා කියා මට දැනෙන්නේ නැහැ. මොකද, ඒකට හේතු වන කාරණාවක් තිබෙනවා.

මේ සැරේ අය වැයෙන් ඔබතුමන්ලා රුපියල් මිලියන 7,200ක් විතර කඳුකර දෙමළ ජනයා වෙනුවෙන් වෙන් කර තිබෙන බව අපි දන්නවා. ඒකෙන් මිලියන 4,100ක් Indian commitment එක. ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ නිවාස හදන්නට, smart classrooms හදන්නට ඒවා ලබා දුන්නේ අපි. ඉන්දීය අගමැතිතුමා එක්ක කථා කරලා, ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ජයශංකර් මැතිතුමා එක්ක කථා කරලා, තානාපතිවරුන්ට කථා කරලා අපි ඒ කාලයේ - අපට නොවෙයි - ලංකාවට ඒ ප්‍රතිපාදන ලබා දුන්නා. ඒක අපි ඔයගොල්ලන්ට භාර දීලා තිබෙනවා. ඒ නිසා අපට ඒ ගෞරවය ලබා දෙන්න, ඒ කටයුත්ත කරන්න.

පසුගිය දවසක විද්‍යාරත්න ඇමතිතුමා මේ ගරු සභාවේ කථා කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය තමයි ඒ අවස්ථාවේත් මූලාසනයේ සිටියේ. අවුරුදු 4ක පමණ කාලයක් පැවැති යහ පාලන ආණ්ඩුවේ අපි සිටියදී කළ දේවල් ගැන කථා කළා, ලැයිස්තු කළා; ඒ කාලයේ කරපු දේවල් ඔක්කෝම ලැයිස්තු කළා. ඒ නිසා අගමැතිතුමියනි, කඳුකර දෙමළ ජනයා නියෝජනය කරමින් ඔබතුමියලාගේ ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට අපේ කාලයේ කරපු දේවල් මොනවාද කියලා කියා දෙන්න. මොකද, අපි ඒ කාලයේ මොකුත් කළේ නැහැ කියලා කියන්න බැහැ. අපි ඒ කාලයේ කළ දේවල් තිබෙනවා. චන්ද්‍රසේකර් ඇමතිතුමාට නම් අපි මොකුත් කියන්නේ නැහැ. එතුමා ජාතික කාර්යභාරයක් කරනවා. ඒ නිසා එතුමාට මොකුත් කියන්නේ නැහැ. අනෙක් අයට කියා දෙන්න ඕනෑ. මොකද, සමහරු මෙතැනට ඇවිල්ලා අඬන්න පටන් ගන්නවා. අඳෝනා නහනවා, අපේ කාලයේ මොකුත් කළේ නැහැ කියලා. නමුත් අපි වැඩ කර තිබෙනවා. අපි පටන් ගත් ගමන ඉදිරියට ගෙන යන්න. අන්න බලන්න, අගමැතිනිය සභාවෙන් යනවා. කමක් නැහැ, ප්‍රශ්නයක් නැහැ.

ඔබතුමන්ලා දැන් මේ කටයුතු ටික සිදුකර දෙන්න. අපේ කාලයේ ඉන්දියානු ආධාර ක්‍රමය යටතේ නිවාස හදන්න පටන් ගත්තා. ඒ වාගේම ඉඩම් දෙන්න පටන් ගත්තා. ඒවා ඉදිරියට කරගෙන යන්න. ඒ අය, මේ රටේ ඉන්න දියුණු නොවුණු, කොන් වුණු ජන කණ්ඩායමක්. අපි ඒ ගැනත් කියන්න ඕනෑ.

ගරු අගමැතිතුමියට කිව යුතු තව කාරණයක් තිබෙනවා. මම අගමැතිතුමිය සමඟ අපේ විශේෂ අවශ්‍යතාවක් ගැන කථා කළා. කොළඹ දිස්ත්‍රික්කය තුළ භාෂා 3න් උගන්වන පාසල් 3ක් නම් කළා. ඒ තමයි, Royal College එක, Isipathana College එක සහ D. S. Senanayake College එක. ඒ පාසල් තුනම ජාතික පාසල්. ඒ පාසල් තුනේම භාෂා තුනෙන්ම උගන්වනවා. ඒවායේ තිබෙන දමිළ පන්ති ඉතා සැලසුම්සහගතව අඩු කරගෙන යනවා. අඩු කරලාත් තිබෙනවා. ඒ ගැන කියනකොට මට මතක් වෙනවා, Royal College එකේ පළමු ශ්‍රේණියට Sinhala medium පන්ති 12ක් විතර තිබෙන බව. හැබැයි, දෙමළ පන්ති 2යි තිබෙන්නේ. ඇත්තටම බලනකොට radius එකෙන්ම ඇතුළු කරගන්නවා. Radius එක අනුව බලනකොට කොළඹ නගරය තුළ දෙමළ භාෂාව කථා කරන ළමයි සහ සිංහල භාෂාව කථා කරන ළමයි එක හා සමානව - 50:50 වාගේ - ඉන්නවා. නමුත් විවිධ කාරණා උඩ අර කියපු දේ වුණා. ඔයගොල්ලන් system එක change කරන්නේ ඇවිල්ලා තිබෙන්නේ. අපි සතුටින් ඒකට සහයෝගය ලබා දෙනවා. ඒ අනුව මේකත් වෙනස් කරන්න. වෙනස් කරලා දමිළ මාධ්‍ය පන්ති ටික වැඩි කරන්න, Royal College, Isipathana College සහ D. S. Senanayake College කියන පාසල් තුනේම.

මේ තුළ වෙනත් කාරණාවකුත් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ සභා ගර්භයේ ගැලරියේත් පාසල් දරුවන් ඉන්නවා, මට පෙනෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එක වහලක් යට සිංහල ළමයින්ට, දමිළ ළමයින්ට සහ මුස්ලිම් ළමයින්ට එකට ඉගෙන ගන්න පුළුවන් නම්, ඒක තමයි ජාතික සංහිඳියාවට දමන අඩිතාලම. අපි කියන්නේ ඒකයි. ළමයි පොඩි කාලයේ අපි මොකක්ද කියන්නේ? ළමයින්ට කියනවා, ඔයගොල්ලන් සිංහල පාසලේ ළමයි, ඔයගොල්ලන් හින්දු පාසලේ දෙමළ ළමයි, ඔයගොල්ලන් මුස්ලිම් පාසලේ මුස්ලිම් ළමයි කියලා. එහෙම කියලා වෙන් කරලා අවසානයේ ඒ ළමයින්ට වයස අවුරුදු 18ක් වුණාට පසුව කියනවා, ශ්‍රී ලාංකිකයන් හැටියට නැඟිටලා එන්න කියලා. එතකොට ඒ ළමයින්ට ඒක කරන්න බැහැ නේ. ඒගොල්ලන් කුඩා කාලයේම වෙන් කරලා ඉවරයි. එහෙම දෙයකුත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධ්‍යාපනය කියන කාරණය තුළ තිබෙන්නේ ඥානය ලබා දීම පමණක්ම නොවෙයි. ජාතික සංහිඳියාවට අඩිතාලම දැමීමත් ඒ තුළ තිබෙනවා.

එම නිසා ඒ කටයුත්ත කොළඹින් පටන් ගන්න කියලා අපේ ගරු අගමැතිතුමියට -කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමියට, විෂය භාර ඇමතිතුමියට- මම කියන්න කැමතියි. ඒ කටයුත්ත ඉක්මනින් පටන් ගන්න කියන එක මම මතක් කරනවා.

ඒ කාලයේ පෞද්ගලික විශ්වවිද්‍යාල සම්බන්ධව ඔයගොල්ලන්ට විවිධාකාර ස්ථාවර තිබුණා. දැන් ඒ ස්ථාවර වෙනස් වෙලා ද කියන්න මම දන්නේ නැහැ. වෙනස් වෙන්න ඕනෑ නේ දැන්. ඒවා දැන් වෙනස් කර ගන්න. ජාත්‍යන්තරව තිබෙන ප්‍රසිද්ධ විශ්වවිද්‍යාල නිල වශයෙන් ලංකාවේ ක්‍රියාත්මක වෙන්න අවස්ථාව ලබා දෙන්න. එතකොට වෙනස් වෙනවා නේ.

ඒ කාලයේ හම්බන්තොට තෙල් පිරිපහදුව ගැන කථා කරනකොට ඔයගොල්ලන් කිව්වා, "ඔන්න, ලංකාව චීන කොලනියක් කරනවා" කියලා. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ගැන කථා කරනකොට ටිල්වින් සිල්වා මහ ලේකම්තුමා උද්ඝෝෂණ පවත්වමින් කිව්වා, "ඔන්න, ලංකාව ඉන්දියාවේ කොලනියක් කරනවා" කියලා. දැන් ඒවා වෙනස් වෙලා තිබෙනවා නේ. නමුත්, ඔයගොල්ලන් එහෙම කියලා තිබෙනවා නේ. ඒකත් වෙනස් කර ගන්න. ලංකාවේ අපේ ළමයින්ට අවස්ථාව ලබා දෙන්න, ජාත්‍යන්තරව දියුණු වෙච්ච අධ්‍යාපන ක්‍රමයට ඇතුළත් වෙන්න. ඒ අධ්‍යාපන ක්‍රමය ලංකාවට ගෙනෙන්න කටයුතු කරන්න. Make Sri Lanka an education hub; ලංකාව education hub එකක් කිරීමට අවශ්‍ය කටයුතු කරන්න. අපි ඒ වෙනුවෙන් සහයෝගය ලබා දෙන්නම්. ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම තවත් කාරණයක් කියන්න ඕනෑ. මා හිතවත් සහෝදර ගරු බිමල් රත්නායක ඇමතිතුමා මේ අවස්ථාවේදී සභාවේ නැහැ. මොකද, එතුමා මේ පාර්ලිමේන්තුව පටන් ගන්නකොට දීපු පොරොන්දුවක් තිබෙනවා. මොකක්ද ඒ පොරොන්දුව? ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාත් ඒ ගැන දන්නවා. බිමල් රත්නායක ඇමතිතුමා කිව්වා, බාර් ලයිසන් ගත්ත අයගේ ලැයිස්තුව දෙන්නම් කියලා. හැබැයි, තවම ඒක දීලා නැහැ නේ. මට මතකයි එතුමා කිව්වා, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා දේශපාලන අල්ලස් - political bribes - විධියට බාර් ලයිසන් දීලා කට්ටිය අල්ලා ගත්තා කියලා. අපි ඒවා අහගෙන හිටියා. ඊට පස්සේ එතුමා කිව්වා, ඔන්න බලන්න, ඉදිරි දවසක මම බාර් ලයිසන් ගත්ත අයගේ ලැයිස්තුව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාය කියලා. නමුත්, තවමත් ඒ ලැයිස්තුව ඉදිරිපත් කළේ නැහැ. ඊට පස්සේ, හදිසියේ බාර් ලයිසන් දීපු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ටික නම් කළා. ඒ ලැයිස්තුව නොවෙයි, මට ඕනෑ. ඔබතුමා කිව්වා නේ bribes කියලා. Bribe කියන්නේ දකුණු අතින් දීලා, වම් අතින් ගන්න එක නොවෙයි නේ; right hand එකෙන් දීලා, left hand එකෙන් ගන්න එක නොවෙයි නේ. Bribe කියන්නේ පුද්ගලයන් කිහිප දෙනෙක් තවත් පුද්ගලයන් කිහිප දෙනෙකුට නීති විරෝධීව යමක් දීලා නීතිය නවන එකයි, නීතිය කඩන එකයි. ඒකට නේ අල්ලස් - bribes - කියන්නේ. ඒකට නේ "පගා" කියලා සාමාන්‍ය වචනයෙන් කියන්නේ. කෝ ඒ ලැයිස්තුව? ඒ ලැයිස්තුව තවමත් නැහැ නේ. බාර්, නැත්නම් වයින් ස්ටෝර්ස් පවත්වාගෙන යන එක නීති විරෝධී වැඩක් නොවෙයි. මත් ද්‍රව්‍ය තමයි නීති විරෝධී. කසිප්පු තමයි නීති විරෝධී. නමුත්, බාර් නැත්නම් වයින් ස්ටෝර්ස් පවත්වාගෙන යන එක නීති විරෝධී දෙයක් නොවෙයි. හැබැයි, එකම වෙලාවක බාර් ලයිසන් 100ක්, 200ක්, 300ක්, 500ක් විතර සමහර මන්ත්‍රීවරුන්ට දීලා, එතුමන්ලා ඒවා අත්පත් කර ගත්තා කියලා රනිල් වික්‍රමසිංහ මහත්තයාට චෝදනා එල්ල කළා. එහෙම චෝදනා එල්ල කළ එක හරිද? අපිත් හිතනවා, එහෙම චෝදනා එල්ල කිරීම හරියි කියලා. නමුත්, ඒ නම් ලැයිස්තුව කෝ? ඒ නම් ලැයිස්තුව තවමත් දුන්නේ නැහැ නේ. ගරු බිමල් රත්නායක මහත්තයා මෙතැනට ඇවිල්ලා හැම දාම ලැයිස්තු ඉදිරිපත් කරනවා. මේ ආණ්ඩුව දැන් ලැයිස්තු ආණ්ඩුවක් වෙලා නේ. එතුමා බාර් ගත්ත ලැයිස්තුවක් ගැන කියනවා. වයින් ස්ටෝර්ස් ගත්ත ලැයිස්තුවක් ගැන කියනවා. ඊට පස්සේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා පෙට්ටල් ෂෙඩ් ලබා ගත්ත අයගේ ලැයිස්තුවක් කියනවා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, අපි මේ අය වැය Discussion එක පුරාම ඒක දැක්කා නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
හොඳයි, බොහොම ස්තුතියි. තවත් විනාඩියක් විතර වැඩි කරන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඊට පස්සේ මොකක්ද කියන්නේ? ජනාධිපති අරමුදලෙන් මුදල් ගත්ත අයගේ ලැයිස්තුවක් ගැන කිව්වා. ඊයේ පෙරේදා එවැනි ලැයිස්තුවක් ගැන කිව්වා. කිසිම ලැයිස්තුවක මගේ නම නම් නැහැ. මම කවදාවත් බාර් ලයිසන් ගත්තේ නැහැ. 2001 අවුරුද්දේ ඉඳන් මම පාර්ලිමේන්තුවේ ඉන්නවා. මොන ලැයිස්තුවකවත් මගේ නම නැහැ. ඒ කිසිම ලැයිස්තුවක මගේ නම තිබුණේත් නැහැ. අල්ලා ගත්තේත් නැහැ. මම ඒවා ලබා ගත්තේත් නැහැ. දේශපාලන වුවමනාවට, මගේ පෞද්ගලික වුවමනාවට ආණ්ඩුවේ අරමුදලින් මම මුදල් ලබා ගත්තේත් නැහැ. ආණ්ඩුවේ දේපළ අවභාවිත කළේත් නැහැ. මම දන්නවා, මගේ අත් දෙක පිරිසිදු බව. ප්‍රශ්නයක් නැහැ. ඒ ලැයිස්තුව ලබා දෙනවා කියලා එතුමා කිව්වා නේ. එම නිසා ඒ ලැයිස්තුව ලබා දෙන්න. මේවා ගැන කියන්න එපා, ඒවා ක්‍රියාවට නංවන්න.

මේ ගරු සභාවේ මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. මේ මන්ත්‍රීවරුන්ට සහ ඇමතිවරුන්ට වරදාන හා වරප්‍රසාද කියලා වාහන ලබා දෙන එකත්, නිවාසයක් ලබා දෙන එකත් කඩාකප්පල් කරන්න එපා. ඔබතුමන්ලා ඒවා වේදිකාවේ කියලා ඇති. නමුත්, ඔබතුමන්ලා එදා වේදිකාවේ කියපු දේවල් දැන් වෙනස් කරලා තිබෙනවා නේ. මොකද, මන්ත්‍රීවරයෙකුට facilities ඕනෑ: වාහනයක් ඕනෑ; නිවසක් ඕනෑ; හොඳ පඩියක් ඕනෑ; personal staff එකක් ඕනෑ. නැත්නම් වැඩ කරන්න බැහැ. මම නම් කැබිනට් ඇමති ධුරයේ ඉන්නකොට නිල නිවාස ගත්තේ නැහැ. නමුත්, නිල නිවාස ගත්ත මිනිස්සු වැරදියි කියලා මම කියන්නේ නැහැ. Everybody is entitled to that, but I did not take it because I was able to live in my own house. That was not an issue for me. ඒවා ලබා දෙන්න. ඒ facilities ලැබුණොත් තමයි වැඩ කරන්න පුළුවන්. නැත්නම් වැඩ කරන්න බැහැ. ඒ මන්ත්‍රීවරුන්ට වැඩ කරන්න අවස්ථාව ලබා දෙන්න. ඔබතුමන්ලා ඒ කාලයේ ඒවා සද්භාවයෙන් කියලා ඇති. නමුත්, දැන් ඒක වෙනස් වෙලා තිබෙනවා. එතුමා හිටපු ගමන් මේ ගරු සභාවට ඇවිල්ලා කියනවා, වාහන පර්මිට් දෙන එක නැවැත්වුවා කියලා. ඒක ඊයේ නැවැත්වූවේ නැහැ. 2016 අවුරුද්දේ, වාහන පර්මිට් දෙන එක නැවතුණා.

මට මතකයි, 2016 අවුරුද්දේ අවසානයේත් ඒ වාහන පර්මිට් ලැබුණා. ඊට පස්සේ මන්ත්‍රීවරුන්ට වාහන පර්මිට් ලැබුණේ නැහැ; පළාත් සභාවල අයටවත්, කාටවත් ලැබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

හොඳ කාරණයක් කියනකොට මාව නවත්වනවා. පොඩ්ඩක් ඉන්නකෝ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. Unsuspecting, innocent people are made to believe that you came and stopped it. No, it is not so; එහෙම දෙයක් නැහැ. නීතිගරු ඇමතිතුමා ආණ්ඩුවට ආවේ නැහැ. ඒකට හේතුව මේකයි. බටලන්ද පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව පිළිබඳ debate එක තිබෙනවා. ඒ debate එක කල් දමන්න කියනකොට කියනවා, ඔයගොල්ලන් එපා, රනිල් වික්‍රමසිංහට ඔයගොල්ලන් සහයෝගය දෙනවා කියලා. අපි රනිල් වික්‍රමසිංහට සහයෝගය දෙන්නේ නැහැ. වැරදි කරලා තිබෙනවා නම් රනිල් වික්‍රමසිංහ එල්ලුම් ගස් යවන්න. ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි කියන්නේ මේකයි. අද, හෙට අපි ප්‍රචාරක කටයුතු කරනවා. පළාත් පාලන මැතිවරණය තිබෙනවා. ඒ නිසා ඒ කාරණය තේරුම් අරගෙන ප්‍රායෝගිකව වැඩ කරන්න කියලා ආණ්ඩුවට, අනුර කුමාර සහෝදරයාට අපි කියනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[ප.ව. 2.17]

ගරු කේ. ඉලංකුමාරන් මහතා
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, 2025 வரவு செலவுத்திட்ட விவாதத்தை நான் இதுவரை காலமும் முகநூல் ஊடாகவும் ஊடகங்கள் ஊடாகவுமே பார்த்தேன். விபத்துக்குள்ளானதன் காரணமாக என்னால் இந்தச் சபைக்கு வருகைதர முடியவில்லை. இன்றையதினம் இந்தச் சபையில் எனக்கு உரையாற்றுவதற்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் யாழ். பொது நூலகத்துக்கு 100 மில்லியன் ரூபாயை ஒதுக்கியுள்ளார். அதற்காக அவருக்கு எமது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். எமது வட மாகாணமானது கல்வியில் தலைசிறந்து விளங்கிய ஒரு மாகாணமாகும். அங்குள்ள யாழ். பொது நூலகத்துக்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் முன்னர் ஒரு தடவை சென்ற சமயம் எல்லோரும் பாதணிகளைக் கழற்றிவிட்டு உள்நுழைவதை அவதானித்திருக்கிறார். இதிலிருந்து தமிழ் மக்கள் கல்விக்குக் கொடுக்கும் முக்கியத்துவத்தைப் புரிந்துகொண்ட அவர், வெளிநாடு சென்றபோதும் யாழ். நூலகத்தைப் பெருமைப்படுத்திக் கூறியிருக்கிறார். அதன் அடிப்படையில்தான் அதனை அபிவிருத்தி செய்வதற்காக அவரால் நிதி ஒதுக்கப்பட்டுள்ளது. அதன்மூலம் அது இன்னும் வளம் பெறும்!

எமது நாட்டில் 30 வருட கால யுத்தம் ஏற்படுவதற்கு மூலகாரணமாக இருந்ததே இந்த யாழ். பொது நூலக எரிப்புத்தான். நான் விபத்துக்குள்ளாகி வீட்டிலிருந்தபோது, பட்டலந்த வதை முகாம் பற்றிய விடயம் பேசுபொருளாக மாறியிருந்ததை அவதானித்தேன். தமிழ், சிங்கள இளைஞர்களின் இறப்புக்குக் காரணமானவரே அன்று கல்வி அமைச்சராக இருந்தபோது எமது யாழ். பொது நூலகத்தையும் எரித்து தமிழர்களின் உணர்வுகளைத் தூண்டினார். அது தொடர்பான விசாரணையும் இன்று எமக்குத் தேவையாக உள்ளது. ஏனெனில், இதனால் இரண்டு இனத்தைச் சேர்ந்த இளைஞர்களும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். 30 வருட கால யுத்தத்தால் இலங்கை பொருளாதாரத்தில் மிகவும் பின்தங்கி இருக்கின்றது.

இந்த யுத்தத்தால் தமிழ் இளைஞர்கள் மட்டுமல்ல, சிங்கள இளைஞர்களும் உயிரிழந்து இருக்கிறார்கள். தமிழ் இளைஞர்களாக இருக்கட்டும் அல்லது சிங்கள இளைஞர்களாக இருக்கட்டும், உயிரிழந்தவர்கள் அனைவரும் சாதாரண குடும்பங்களைச் சேர்ந்த அம்மா, அப்பாவின் பிள்ளைகளே என்பதை நாங்கள் உணர்கின்றோம். இதற்கு மூலகாரணமாக இருந்த அன்றைய கல்வி அமைச்சரான ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் அப்போது யாழ்ப்பாணத்தில் இருந்ததாகக்கூட ஒரு தகவல் இருக்கின்றது. எனவே, இது தொடர்பில் விசாரணை செய்வதற்கென ஒரு குழு நியமிக்கப்பட வேண்டும். பட்டலந்த வதை முகாம் தொடர்பில் விசாரணை நடத்தியதுபோல், யாழ். பொது நூலகம் எரிக்கப்பட்டமை தொடர்பிலும் ஒரு விசாரணைக் குழுவை நியமித்து, தமிழ் மக்களுக்கு நீதியைப் பெற்றுக்கொடுக்க வேண்டுமென நான் இந்த உயரிய சபையில் வேண்டிக் கொள்கின்றேன்.

பருத்தித்துறை கரையோரப் பிரதேசத்திலுள்ள வீதியானது, இதுவரை காலமும் எவராலும் புனரமைக்கப்படாமல் இருந்தது. ஏதோ ஒரு வகையில் அந்தப் பிரதேசத்தை ஒதுக்கிவைத்தே வந்தார்கள். இந்த வரவு செலவுத்திட்டத்தினூடாக அந்த வீதியைப் புனரமைப்புச் செய்வதற்கென நிதி ஒதுக்கீடு செய்து தந்தமைக்கு மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்து, கடற்றொழிலாளர் சமூகம் சார்ந்த ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். பருத்தித்துறை கரையோரப் பகுதியில் இருக்கும் அவர்களுடைய படகுகள் கடல் அலைகளால் சேதமடைந்துகொண்டு இருந்தன. அதனை அவதானித்த எங்களுடைய கடற்றொழில் அமைச்சர் அவர்கள், அந்த இடத்தில் பாதுகாப்பு அணையொன்றை அமைப் பதற்கான அனுமதியைப் பெற்றுக்கொடுத்தார். தற்போது அதற்குரிய வேலைகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. அதற்காக அவருக்கு எமது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

எம்மைப் பொறுத்தவரையில், இந்த வரவு செலவுத்திட்டத்தினூடாக ஒதுக்கப்படுகின்ற நிதியைக் கொண்டு நாட்டை முன்னேற்றிவிட வேண்டும் என்பதே நோக்கமாகும். வரவு செலவுத்திட்டத்தினூடாக ஒதுக்கப் படுகின்ற நிதிக்கு அப்பால், எமது வட மாகாணத்தில் பாரிய தொழிற்சாலைகளை உருவாக்குவதற்காக கைத்தொழில் அமைச்சரான கௌரவ சுனில் ஹந்துன்னெத்தி அவர்கள், வரவு செலவுத்திட்ட விவாதம் நடைபெறுகின்ற இந்தக் காலகட்டத்தில்கூட, தனது நேரத்தை ஒதுக்கி, ஒரே நாளில் வடக்கின் பல இடங்களுக்கும் சென்று பார்வையிட்டு இருக்கிறார். வேலைப்பளு காரணமாக மதிய உணவைக்கூட அன்றைய தினம் அவரால் சாப்பிட முடியவில்லை.

எதிர்வரும் காலத்தில் வட மாகாணத்தில் பல தொழிற்சாலைகள் உருவாகும். இன்று எதிர்க்கட்சியில் இருப்பவர்கள் குறிஞ்சாதீவு உப்பளம் பற்றி கூறினார்கள். கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களும், கௌரவ கைத்தொழில் அமைச்சர் அவர்களும் வெள்ளத்துக்கூடாகச் சென்று, நேரடியாக அந்த இடத்தைப் பார்வையிட்டு இருக்கிறார்கள். இதனைப் பார்த்துவிட்டு, இன்றுதான் இவ்வாறான கருத்துக்களை எதிர்க்கட்சியில் இருப்பவர்கள் கூறுகின்றார்களே ஒழிய, முன்னர் கூறவில்லை. கிளிநொச்சி என்பது வந்தாரை வாழ வைத்த மண்ணாகும். ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் சனாதிபதியாக இருந்த காலத்தில் அங்கு மதுபானசாலை அனுமதிப் பத்திரங்கள் அதிகளவில் வழங்கப்பட்டன. அதற்கெதிராக DCC meetingஇல் குரல் எழுப்பப்பட்டபோது, மதுபானசாலைகளை அமைத்தால் கசிப்பு உற்பத்தியை ஒழிக்கலாமெனச் சொன்னார்கள். ஆனால், இன்று அங்கு இரண்டும் பாரிய பிரச்சினையாக மாறி இருக்கின்றது. கிளிநொச்சி மண்ணை பாரிய தொழிற்றுறை வலயமாக மாற்றினால், இவ்வாறான பிரச்சினைகளிலிருந்து நீங்கி முன்னோக்கி நகரலாம் என்ற நம்பிக்கை எமக்கு இருக்கின்றது.

இந்த உயரிய சபையில் ஒருவர் எமது பெண்களை இழிவுபடுத்தும் விதமாகக் கருத்துக்களைக் கூறியிருக்கிறார். பெண்கள் எங்களது சகோதரிகள். வட பகுதி மக்கள் கல்வியில் தலைசிறந்து விளங்கியவர்கள். அவர்கள் யுத்தம் காரணமாகப் பல இன்னல்களுக்கு மத்தியிலும் தமது கல்வியைத் தொடர்ந்து, இன்று உயர் பதவிகளில் இருக்கின்றார்கள். இந்தச் சபையில் இன்னுமொரு விடயத்தைக் கூறவேண்டிய கடப்பாடு எனக்கு இருக்கின்றது. தற்போதைய கடற்றொழில் அமைச்சர் அவர்கள் வட மாகாணத்தைச் சேர்ந்தவராக இல்லை என்றாலும், அவர் பத்து வருடங்களுக்கும் மேலாக வட மாகாணத் தமிழ் மக்களின் உணர்வுகளைப் புரிந்தவர் என்ற வகையில், பாரிய அர்ப்பணிப்புகளைச் செய்திருக்கிறார். குறிப்பாக, வட மாகாணத்தைக் கல்வி ரீதியாக முன்னேற்றுவதற்குப் பாரிய அர்ப்பணிப்புகளைச் செய்திருக்கிறார். எம்மைக்கூட வளப்படுத்துவதற்கு அவர் பாரிய அர்ப்பணிப்புகளைச் செய்துள்ளதுடன், அறிவுரைகளையும் கூறியிருக்கிறார்.

பாரிய திட்டங்களைச் செய்யும்போது planning தேவையெனச் சொல்கின்றார்கள். ஆனால், இன்று அவர்களிடமே planning இல்லை. அவர்களது தொழில் வாழ்க்கையில் மட்டுமல்ல, தனிப்பட்ட வாழ்க்கையிலும் planning இல்லை. அதுமாத்திரமன்றி, பாராளுமன்றத் தேர்தலில் போட்டியிடும்போதும் தலைமைத்துவத்தை வழங்கக்கூடிய பண்பு அவர்களிடம் இல்லை. ஏனெனில், பாராளுமன்றத் தேர்தலின்போது, அவர்களுடைய கட்சிக்குள்ளேயே போட்டித் தன்மை ஏற்பட்டிருந்ததை நாங்கள் அவதானித்தோம். மேலும், எதிர்வருகின்ற உள்ளூராட்சி மன்றத் தேர்தலில் போட்டியிடுவதற்கான வேட்புமனுப் பத்திரத்தைக்கூட ஒழுங்காக நிரப்பத் தெரியாமல், இன்று தேர்தல் களத்திலிருந்து விலக்கப்பட்டு இருக்கிறார்கள். உங்களுக்குப் planning தேவையென்றால், அது தொடர்பில் எங்களது ராமலிங்கம் சந்திரசேகர் அவர்களிடம் கேளுங்கள்! ஏனெனில், அவர் மிகவும் பொறுமையானவர்; நிதானமானவர். அவருக்கு எதிராக விமர்சனங்கள் முன்வைக்கப்பட்டபோது, நான் அது தொடர்பில் அவரைத் தொடர்புகொண்டு கேட்டேன். அப்போது அவர், "என்னை விமர்சிக்கலாம். ஆனால், சாதாரண சகோதரிகளை விமர்சிக்கக்கூடாது" எனக் கவலைப்பட்டார்.

மாரித் தவக்கையானது மழை காலத்தில் கத்திக் கத்தித் தானாக இறக்கும். அதுபோல, இன்னும் சில மாதங்களில் தேர்தல் ஒன்று வர இருப்பதனால், இந்த உயரிய சபையிலுள்ள ஒருவர் எம்மீது அவதூறுகளையும் பொய்யான செய்திகளையும் பரப்பிக்கொண்டு இருக்கிறார். அண்மையில் நான் விபத்துக்குள்ளானபோது, எனக்கொரு பிள்ளை இருப்பதாக இந்தச் சபையில் அவர் கூறியிருந்தார். உண்மையிலேயே எனக்குக் குழந்தை இல்லை. இந்தச் சிறிய விடயத்தைக்கூட, அவரால் உணர்ந்துகொள்ள முடியாமல் பொய்யான தகவலைச் சொல்லியிருக்கிறார். இன்று அவர் தனது நிலையை உணர்ந்திருக்கிறார். அவர் வேட்புமனுத் தாக்கல் செய்துவிட்டு வெளியில் வரும்போது, "எனக்குத் தமிழ் மக்களே எதிர்ப்புத் தெரிவிப்பார்கள்" என்று ஊடகத்துக்கு முன்னால் கூறியிருக்கிறார். ஏனெனில், இன்று அவருக்கு வட பகுதியிலிருந்து எதிர்ப்புகள் வரத் தொடங்கியுள்ளன. அவர் நீண்ட காலம் கொழும்பை மையப்படுத்தியே வேலை செய்தார். அதனால் அவர் இன்னும் தமிழ் மக்களின் உணர்வுகளைப் புரிந்துகொள்ளவில்லை என்று நான் நினைக்கின்றேன். இன்று அவர் அவற்றைப் புரிந்துகொள்ள நினைக்கிறார். ஏனென்றால், "எனக்குத் தமிழ் மக்கள் மத்தியிலிருந்து எதிர்ப்புவரும்" என்று அவர் ஏற்கெனவே சொல்லி இருக்கிறார். எதிர்வரும் காலத்தில் எமது தமிழ் மண்ணை முன்னேற்றுவதற்கும் புதியதொரு சமூகத்தை உருவாக்குவதற்கும் மனிதநேயம்கொண்ட ஓர் அமைப்பு என்ற ரீதியிலும், மனிதநேயம்கொண்ட ஓர் அரசாங்கம் என்ற ரீதியிலும் நாங்கள் பொதுப்படச் சிந்தித்துச் செயற்படுவோமென திடசங்கற்பம் பூண்டிருக்கிறோம்.

இதுவரை காலமும் எவருக்கும் கொடுக்காத பெரும்பான்மை ஆதரவை, எமது கட்சிக்கு வட மாகாண மக்கள் உட்பட ஒட்டுமொத்த இலங்கையர்களும் பெற்றுக் கொடுத்து இருக்கிறார்கள். இதிலிருந்து தெரிகிறது, இந்த நாட்டில் இனிமேலும் இனவாதம் தேவையில்லை என்று. இந்த நாட்டை முன்னேற்றிப் புதியதொரு சகாப்தத்தைப் படைப்பதற்காக அனைத்து மக்களும் ஒன்றிணைந்து செயற்பட வேண்டும். இந்த நாடு பாரிய இடையூறுகளுக்கு மத்தியில் முன்னேறிய நாடு என்ற ரீதியில் இல்லாது, சாதாரண நிலையிலிருந்து சிறந்ததொரு வரவு செலவுத்திட்டத்தை நாங்கள் முன்வைத்திருக்கிறோம். அதுமாத்திரமன்றி, அரச உத்தியோகத்தர்களுக்குச் சம்பள உயர்வையும் வழங்கியிருக் கிறோம். இவற்றின்மூலம் நாங்கள் எதிர்காலத்தில் இந்த நாடு சிறந்ததோர் அபிவிருத்திப் பாதையில் பயணிப்பதற்கான அடித்தளத்தை இட்டிருக்கிறோம் என்பதை இந்த இடத்தில் கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.25]

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව ඊයේ සිට පැවැත්වෙන මේ විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. මෙම අමාත්‍යාංශය මේ අය වැය ඇතුළේ තිබෙන ප්‍රධාන අමාත්‍යාංශයක්. මෙහි ප්‍රධාන අරමුණ වෙන්නේ, අපේ රට ඉදිරියට ගෙන යාමට අවශ්‍ය පදනම සකස් කරගැනීමයි. විශේෂයෙන් අපි අපේ පදනම බවට පත් කරගෙන තිබෙන්නේ, මේ රට තිබෙන තැනින් ඉහළට ඔසවා, තිබෙන ප්‍රශ්න නිරාකරණය කරගෙන ඉදිරියට යන්නේ කොහොමද කියන කාරණයයි.

පසුගිය කාලයේ අපේ රටේ නිර්මාණය වෙච්ච තත්ත්වයන් නිසා අතරමඟ නැවතුණු ව්‍යාපෘති විශාල වශයෙන් තිබුණා. ඒ ව්‍යාපෘති යාවත්කාලීන කර, රටේ සංවර්ධනය වෙනුවෙන් ඒවායේ දායකත්වය ගන්නේ කොහොමද කියන කාරණය අපි ආණ්ඩුවක් විධියට ප්‍රධාන වශයෙන් කල්පනා කර තිබෙනවා. අධ්‍යාපනය, අනෙක් පැත්තෙන් ගත්තාම මහා මාර්ග, සෞඛ්‍ය, කෘෂිකර්මාන්තය ඇතුළු හැම ක්ෂේත්‍රයක් ගැනම එහෙමයි. ඒ නිසා මේ රට තිබෙන තැනින් ඉහළට ඔසවා තැබීමට මූලික අවධානය යොමු කරනකොට, නැවතී තිබෙන ව්‍යාපෘති අපි නැවත ආරම්භ කරලා ඒවා රටේ අනාගතය වෙනුවෙන් විධිමත්ව පාවිච්චි කරගන්න ඕනෑ කියලා අපි කල්පනා කළා. එහි ප්‍රධාන පංගුවක් තමයි අපේ රටේ කෘෂිකර්මාන්තය.

අපි දන්නවා අද ආහාර සුරක්ෂිතතාව ගැන විශේෂයෙන් කථා බහ වෙන බව. දිගින් දිගටම එකම දේ ගැන ප්‍රශ්න මතු කරන තත්ත්වයට අද විපක්ෂය පත් වෙලා තිබෙනවා. හැබැයි, අපි ආණ්ඩුවක් විධියට කල්පනා කර තිබෙනවා, අපේ රටේ කෘෂි නිෂ්පාදන, කෘෂි ආර්ථිකය ශක්තිමත් කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. එහි ප්‍රධාන කොටස් කිහිපයක් තිබෙනවා. ඒ අනුව අපේ රටේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, ඒ වාගේම පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ කටයුතු ආදී වශයෙන් පැහි කිහිපයකින් අපේ රටේ කෘෂිකර්මාන්තයට අදාළ මැදිහත් වීම කරන්න ඕනෑකම තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ආණ්ඩුවක් විධියට අවධානය යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි කෘෂිකර්ම ක්ෂේත්‍රය වෙනුවෙන් රුපියල් බිලියන 56.8ක් වෙන් කර තිබෙනවා. අනෙක් පැත්තෙන්, වාරිමාර්ග ක්ෂේත්‍රයේ කටයුතු වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් බිලියන 78.1ක් වෙන් කර තිබෙනවා. රුපියල් බිලියන 78ක් කියන්නේ, විශාල මුදලක්. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට තමයි මේ මුදල වෙන් කර තිබෙන්නේ. මම පෙර කිව්වේ ඒකයි. අපි දැක්කා, පසුගිය කාලයේ උතුරුමැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය ආරම්භ කළ ආකාරය. එහෙටත් නැහැ, මෙහෙටත් නැහැ. හබරණ නගරය යටින් යන උමඟේ කිලෝමීටර 28න් කිලෝමීටර 16ක විතර වැඩ මේ වෙනකොට නිම කර තිබෙනවා.

හැබැයි, මොරගහකන්දෙන් ආපහු ඒ උමඟට - tunnel එකට - සම්බන්ධ කරන ඇළ කපලා නැහැ. ඒ නිසා අපි රුපියල් මිලියන 32,000කට වැඩි මුදල් ප්‍රමාණයක් උතුරුමැද මහ ඇළ ව්‍යාපෘතියට පමණක් වෙන් කරලා තිබෙනවා. ඒ ආකාරයට වාරිමාර්ග ක්ෂේත්‍රය තුළ නව පිබිදීමක් වෙනුවෙන්, අලුත් ආරම්භයක් වෙනුවෙන් අපි ආණ්ඩුවක් විධියට අවධානය යොමු කරලා තිබෙනවා. ඒ හා බැඳී තිබෙන මහවැලි අධිකාරියටත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ ප්‍රධාන තැනක් මහවැලි අධිකාරියට හිමි වන බව. එය එම ක්ෂේත්‍රයේ හදවත බවට පත් වෙලා තිබෙනවා.

ඉතිහාසයේ අපේ රටේ කුඩා වැව් 32,000ක් තිබුණා. දැන් තිබෙන්නේ 14,000ක් විතර ප්‍රමාණයක්. හැබැයි, ඒ කුඩා වැව්වලින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ තිබෙන වැව් ගත්තොත්, ඒවායෙන් විශාල සංඛ්‍යාවක් ජලය ගබඩා කරන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අන්න ඒ කුඩා වැව් ටික රොන්මඩ ටික ඉවත් කරලා ඒවා අපේ රටේ ගොවියාට නැවත දායාද කරන්නේ, භාර කරන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් අපි අවධානය යොමු කර තිබෙනවා.

අනෙක් අතට, ප්‍රධාන වශයෙන් අපේ රටේ කෘෂි ආර්ථිකය තුළ නිෂ්පාදන සිදු කරන ගොවියා වගා කටයුතු කරන්නේ, එකී කටයුත්තේ නියැළෙන්නේ සතුටින්ද කියා සොයා බැලුවොත්, එය සතුටුදායක තැනක නොවෙයි තිබෙන්නේ. එම ගොවි ජනතාව හැම දාමත් කුඹුරට යනවා, හේනට යනවා; මාසයක්, දෙකක්, තුනක්, හතරක්, පහක් මහන්සි වෙනවා; අලින් ඇතුළු සතා සිව්පාවුන්ගෙන් තමන්ගේ කුඹුර, හේන මහන්සි වෙලා ආරක්ෂා කරගෙන, අස්වැන්න කපලා ගෙට ගෙනෙන කොට හිටපු තැනින් ආපස්සට ගිහිල්ලායි තිබෙන්නේ. බැංකුවෙන් ගත්තු ණය ගෙවා ගන්න බැරි තරමටම අපේ රටේ ගොවි ජනතාව අපහසුතාවට පත් වෙලා ඉන්නවා. ඒක තමයි අපේ රටේ වර්තමාන තත්ත්වය. දුවා දරුවන් ඉස්කෝලයට යවා ගන්න බැරි මට්ටමටම ගොවි ජනතාවගේ ආර්ථිකය බිඳ වැටිලා තිබෙනවා.

අපේ රජයේ ප්‍රධාන වැඩ පිළිවෙළක් තමයි "Clean Sri Lanka" වැඩසටහන, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම වාගේම ඩිජිටල්කරණය. ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ කටයුත්තේදී ආණ්ඩුව විධියට අප හිතලා තිබෙන ප්‍රධාන දෙයක් තිබෙනවා. ගම්වල ඉන්න ජනතාව වැඩි වශයෙන් ගැට ගැහිලා ඉන්නේ ගොවිතැනත් එක්ක; කෘෂි කර්මාන්තයත් එක්ක. ඒ නිසා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේදී අපේ රටේ ගම්බිම්වල ඉන්න ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම කරන්නේ කොහොමද කියන කාරණය කෙරෙහි අපි වැඩි අවධානය යොමු කර තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. හැබැයි, විපක්ෂයේ බොහෝදෙනෙකුට හිතෙන්න පුළුවන්, මෙය මේ දක්වා ආපු ගමනේම තවත් දිගුවක් කියලා. ඒ සම්බන්ධයෙන් විවිධ කථා කියන්න පුළුවන්; විවිධ කාරණා ඉදිරිපත් කරන්න පුළුවන්. විවිධ කාරණා ඉදිරිපත් කළත්, විවිධ කථා කිව්වත් අපි දන්නවා ආණ්ඩුවක් විධියට අප ඉතා ශක්තිමත්ව ආරම්භයක් තබා තිබෙන බව. අපේ රටේ ජීවත් වන සෑම පුරවැසියෙකුටම පෝෂ්‍යදායී ආහාර වේලක් සපයන්න ඕනෑ කියන අර්ථයෙන් තමයි ආණ්ඩුව විධියට, කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත මේ ලබා දීලා තිබෙන මූල්‍යමය පහසුකම යොදා ගන්න සැලසුම් හදලා තිබෙන්නේ.

අපේ රටේ කෘෂි කර්මාන්තයත් එක්ක ගැට ගැසී තිබෙන අනෙක් ප්‍රධාන ක්ෂේත්‍රය තමයි පශු සම්පත් ක්ෂේත්‍රය. පශු සම්පත් ක්ෂේත්‍රය හා බැඳුණු කිරි කර්මාන්තයේ, කුකුළු කර්මාන්තයේ හා සූකර කර්මාන්තයේ නියුතු ගොවි ජනතාවගේ ජීවිත තුළින් නැඟෙන අදෝනාව පසුගිය කාලයේ දිගින් දිගටම අපට අසන්නට ලැබුණා. එම කර්මාන්තයේ යෙදිලා ඉන්න ගොවි ජනතාව ජීවිතයක් නැති තරමටම, නිදහසක් නැති තරමටම අවිවේකී මිනිසුන් බවට පත් වෙලා සිටිනවා. රටට දළ දේශීය නිෂ්පාදනයෙන් යම් පංගුවක් අත්පත් කර දෙන්න මහන්සි වුණත්, වෙහෙස වුණත්, දහඩිය වැගුරුවත් ඔවුන්ට නිසි ඇගයීමක් නැහැ. ඒ ක්ෂේත්‍රයේ නියැළිලා ඉන්න බොහෝදෙනෙකුට අත් වෙලා තිබෙන්නේ එවැනි ඉතාම බේදනීය තත්ත්වයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අප ආණ්ඩුව විධියට කල්පනා කරලා තිබෙන්නේ

පශු සම්පත් ක්ෂේත්‍රය, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය ආදි හැම ක්ෂේත්‍රයකම සිදු වූ දේවල් සම්බන්ධව ඒ ගෙවිච්ච ඉතිහාසයට දොස් කිය කියා ඉන්නවා වෙනුවට අලුතින් හිතලා හැම ක්ෂේත්‍රයක්ම නැවත නහාසිටුවන්නයි. නිෂ්පාදන සහ කෘෂි ආර්ථිකය නහාසිටුවන්නේ කොහොමද කියලා අපි කල්පනා කර තිබෙනවා. කොහොමද බීජ ටික සපයන්නේ, කොහොමද ගොවි ජනතාවට පොහොර සහනාධාරය ලබා දෙන්නේ, කොහොමද ඒ කටයුතු තවත් විධිමත් කර ගන්නේ කියා අපි කල්පනා කර තිබෙනවා.

ඊයේ පෙරේදා පොඩි ප්‍රශ්නසහගත තත්ත්වයක් නිර්මාණය වුණා. පසුගිය කාලයේ පොහොර සහනාධාරය දෙන කොට සිදු වූ විවිධ අක්‍රමිකතා සම්බන්ධයෙන් දැන් සාකච්ඡා වෙමින් තිබෙනවා.

මේ වන විට පරීක්ෂණ කරමින් ඉන්නවා. විපක්ෂයේ බොහෝ දෙනෙක් අහනවා, කෝ දැන් පරීක්ෂණ කරනවාද, ඒ ගිය විධියටම නේද තවමත් යන්නේ කියලා. එහෙම නැහැ. අපි විපක්ෂයට කියනවා, ගෙවිච්ච ඉතිහාසය තුළ සහ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කාලය -මේ ආණ්ඩුව කාලය- තුළ කොයි තරම් පරීක්ෂණ ප්‍රමාණයක් කරලා තිබෙනවාද, වැරැදි කරපු නිලධාරීන්, වැරැදි කරපු දේශපාලනඥයන් කී දෙනෙකු නම් උසාවිවලට කැඳවා තිබෙනවාද කියා හොඳට ඇස් දෙක ඇරලා බලන්න, කන් දෙකෙන් අහන්න කියලා. නමුත්, වැරැදි කරපු අය අතින් අල්ලාගෙන ගිහින් හිරේට දාන්න අපට බැහැ. අපේ රටේ නීතියක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, අපේ රටේ පොහොර සහනාධාරය ලබා දීමේදී වෙච්ච ඒ අක්‍රමිකතා ගැන සෙවීම සම්බන්ධවත් අපි මැදිහත් වෙමින් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. ඒ නිසා අපි මේ ආයතන ඇතුළේ සිදු වන ඒ අක්‍රමිකතා අවම කරගෙන ඉදිරියට යන්නේ කොහොමද කියන කාරණයටත් අවධානය යොමු කරලා තිබෙනවා. මේ ආයතන ඇතුළේ සිදු වන අක්‍රමිකතා, ගැටලු සියයට 100ක් එක පාරට අවසන් කරන්න අපට බැහැ. මේ ආයතන ඇතුළේ තිබෙන ප්‍රශ්න ටික සියයට 100ක් නිරාකරණය කරන්න අපට බැහැ. ඒවා පියවරෙන් පියවර විසඳාගෙන ඉදිරියට යෑම වෙනුවෙන් අපි අපේ අවධානය, මැදිහත් වීම යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එම නිසා අපි මේ විපක්ෂයේ බොහෝ දෙනාට වාගේම රටේ ජනතාවටත් මේ කාරණය කියනවා. විපක්ෂයේ බොහෝ දෙනෙක් අදෝනා නැඟුවාට, ආණ්ඩුව විධියට විශ්වාසයෙන් යුක්තව අපි අපේ ගමන ආරම්භ කරලා තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරලා, ආහාර සුරක්ෂිතතාව ආරක්ෂා කරලා අපේ රටේ ජීවත් වන සෑම පුරවැසියෙකුටම පෝෂ්‍යදායී ආහාර වේලක් භුක්ති විඳීමට අදාළ මැදිහත් වීම සිදු කිරීම වෙනුවෙන් අපි ආරම්භයක් තියලා තිබෙනවා. අපි රටේ ජනතාවගෙන් -විශේෂයෙන් මේ මහ පොළවත් එක්ක ඔට්ටු වන, පොර බඳන ජනතාවගෙන්, හැමදාමත් ජීවිතය දුකින් ගත කරන ජනතාවගෙන් - ඉල්ලනවා, ඔබගේ විශ්වාසය සහිතව කටයුතු කරගෙන යමු කියලා. ආණ්ඩුව විධියට ඔබට ලබා දිය යුතු සියලු පහසුකම් ටික දීලා ඔබේ ජීවිතය සැපවත් කරන්න අප සූදානම් කියන පණිවුඩය අපි මේ රටේ ජනතාවට ලබා දෙනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.36]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

අද 2025 අය වැය විවාදයේ අන්තිම දවස. දැන් අහන්න ලැබුණා, සුපුරුදු කථාවක්. පසුගිය ජනාධිපතිවරණයට වාගේම පාර්ලිමේන්තු මැතිවරණයට පෙර වේදිකාවේ කරපු කථාවම අය වැය විවාදයේ අන්තිම දවස වෙච්ච අදත්, තවමත් කරමින් ඉන්නවා. ඒ ගැන අපි එක පැත්තකින් සතුටු වෙනවා; අනෙක් පැත්තෙන් දුක් වෙනවා. මොකද, රටේ ජනතාවට ඔය කථාවලින් වැඩක් නැහැ. රටේ ජනතාවට ඕනෑ වැඩ. දැන් ඔබතුමන්ලා මේ ඉදිරිපත් කරපු අය වැයත් ගැන රටේ ජනතාව සෑහීමකට පත් වෙනවා ද? ඒ, රාජ්‍ය සේවයේ වැටුප් වෙන්න පුළුවන්; පෞද්ගලික අංශය සම්බන්ධ කාරණා වෙන්න පුළුවන්. ඒ සියලු දේ එකට අරගෙන තව මාසයක් යද්දී, ඔබතුමන්ලාට අහන්න ලැබෙයි, ජනතාවගේ සද්දය මොකක්ද කියලා, ජනතාවගේ කථාව මොකක්ද කියලා. ඒ නිසා ජනතාවගේ කථාව හඳුනා ගෙන ඉදිරි කාලයේදී කථා කරනවා මිස ඔබතුමන්ලා ඒ කාලයේ ඉඳන් කරන්න පුරුදු වෙච්ච කථාව කරන්න සූදානම් වෙන්න එපා. ඒකට ජනතාව සූදානම් නැහැ කියන කාරණාව අප බොහෝ තැන්වලට ගිහින් කථා කරද්දී අපට දැන ගන්නට ලැබෙනවා.

විශේෂයෙන් අද මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධව කථා කරන්න තිබුණත්, අද අය වැය විවාදයේ අවසාන දවස නිසා තවත් කරුණු කාරණා කිහිපයක් මගේ කථාවට එකතු කරන්න මම බලාපොරොත්තු වෙනවා.

අපි දන්නවා, මේ අය වැයත් එක්ක අපට ආදායම් එකතු කර ගන්න තිබෙන මාර්ග ටික, ඒ ප්‍රභවයන් ටික මොනවාද කියලා. ඒවා තමයි, විදේශ රටවලින් විදේශ විනිමය හැටියට අපට ලබා ගන්න තිබෙන ආදායම් සහ දේශීය වශයෙන් ලංකාවේ මුදල්වලින් අපට ලබා ගන්න තිබෙන ආදායම් ටික. ඒ ආදායම් ටික තමයි මේ රටේ ජනතාවට පහසුකම් සපයන්න සහ සියලු ආයතන ටික නඩත්තු කරන්න අප වියදම් කරන්නේ. ශ්‍රී ලංකාවේ සමස්ත ක්‍රියාවලිය සිදු කරන්නේ මේ මාර්ග දෙක හරහා ලැබෙන ආදායමින්. ඔබතුමන්ලා හරියට අරගෙන බලන්න, මේ අය වැය තුළින් ඉදිරිපත් කරලා තිබෙන, ඔබතුමන්ලා දේශීය වශයෙන් එකතු කර ගන්න හදන ආදායම් ප්‍රමාණය එකතු කර ගන්න පුළුවන්ද කියලා. අප අරගෙන තිබෙන සංඛ්‍යා ලේඛන, සොයා බැලීම් සහ සියලු තොරතුරු අනුව පෙනෙනවා, ඔබතුමන්ලාට එතැනට යන්න බැහැ කියලා. ඒක කරන්න බැහැ. එතකොට කාගෙන්ද, ඔබතුමන්ලා ණය ගන්නේ, කොයි රටින්ද ණය ගන්නේ, කාටද මොනවා හරි විකුණන්නේ? එහිදී අර පරණ කරපු දේවල් කරන්නේ නැහැ කියලා ඔබතුමන්ලා කියනවා නේ. එහෙම නම්, දැන් ඔබතුමන්ලා ඒ ප්‍රශ්නය විසඳා ගන්නා ආකාරය සම්බන්ධව පැහැදිලි විස්තරයක් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට කියන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා උපයාගන්න බලාපොරොත්තු වන, මේ පෙන්වා තිබෙන ආදායම් මාර්ග මොනවාද කියා ඉදිරිපත් කරන්න බැරි නම්, ඒ ඉලක්ක සම්පූර්ණ කරන්න බැරි නම් ඔබතුමන්ලාට ණය ගන්න සිදු වෙනවා. ඒ ණය ලබා ගන්නේ කාගෙන්ද? ණය ගන්නේ කොයි විධියටද? ඒ ණය ගන්නා ආකාරය විතරක් නොවෙයි, ඒ ණය ගනිද්දී දායක කර ගන්නා රටවල් සහ ඒ රටවල් එක්ක ඇති කර ගන්නා ගිවිසුම් ටිකත් කරුණාකර මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා විශේෂයෙන් ඔබතුමන්ලාගෙන් අපි ඉල්ලා සිටිනවා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ඒ වාගේම මේ වෙලාවේ විශේෂයෙන් මතක් කළ යුතු තවත් කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා වුණු දවසේ මම පැහැදිලිව කිව්වා, driving licence එක සම්බන්ධව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා කියලා.

යුරෝපීය රටවල් කිහිපයකින් පටන් ගත්ත ඒ driving licence ප්‍රශ්නය, අද වන විට ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය ඇතුළු රටවල් විශාල ප්‍රමාණයකට ගිහිල්ලා තිබෙනවා. මේ වෙනකොට සමහර රටවල් අපේ licence එක තබා ගෙන වාහන පදවපු අය අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඒ ප්‍රශ්නය වහාම විසඳන්න. මොකද, තමුන්නාන්සේලා ජයග්‍රහණය කරද්දී වැඩිපුර ප්‍රමාණයක් සහයෝගය ගත්තේ, විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන්. එහෙම නම් ඒ ශ්‍රී ලාංකිකයන් අද ඒ තැන්වල අනාථ කරන්න එපා, ඒ අයට ප්‍රශ්න ඇති කරන්න එපා. ඒවාට අවශ්‍ය විසඳුම් දෙන්න කියලා විශේෂයෙන් මම ඉල්ලීමක් කරනවා. අර ඉතාලි වීසා ටික දුන්නේ, ඔබතුමන්ලා මැදිහත් වෙලා කිව්වා. ඒක පට්ටපල් බොරුවක්. ආයෙත් දිගින් දිගටම බොරු කියන්න එපා. ඒ ඉතාලි වීසා ටික දුන්නේ, ඉතාලියේ හාම්පුතුන් එක්ක කථා කරලා. ඒ හාම්පුතුන්ගෙන් ඇහුවා, "ඔබතුමන්ලා එවලා තිබෙන වීසා එකට ඔබතුමන්ලාට මේ පුද්ගලයා අවශ්‍යද?" කියලා. ඔවුන් අවශ්‍යයි කිව්වාට පස්සේ තමයි, ඒ ක්‍රියාවලිය ක්‍රියාත්මක වුණේ. ඒක කරුණාකරලා ඔබතුමන්ලාට දමා ගන්න එපා. එහෙම දමා ගන්න එපා. ඔබතුමන්ලාට තව ඇහේ දමා ගන්න දේවල් තිබෙනවා. හැබැයි, මේ හැමදේම ඇහේ දමා ගන්න එපා. මොකද, ඒක ඉතාලි රටින් කරපු වැඩක්, මෙහෙන් කරපු එකක් නොවෙයි.

ඊළඟට මම විශේෂයෙන්ම කියන්න ඕනෑ මැටි, වැලි, බොරලු සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය. ඔබතුමන්ලා ඒ බලපත්‍ර ලබා දීම නවත්වලා තිබෙනවා. විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ අපේ ජනතාව ගත්තොත්, ගල් පෝරනු කරන අභිංසක, දුප්පත් පුංචිම ව්‍යාපාරිකයෝ මේ අය අතර ඉන්නවා. ඒ තැන්වල වැඩ කරන්නේ එදිනෙදා පඩි නඩි ගන්න කණ්ඩායමක්. අද ඒ සියලුදෙනා අනාථ වෙලා සිටිනවා. ඒ නිසා ඒවා ගැන නිවැරැදි සොයා බැලීමක් කරමින්, ඒ අය ආරක්ෂා කර ගන්නා වැඩ පිළිවෙළත් එක්ක තමයි, මේ බලපත්‍ර නතර කරනවා නම්, ඒ නතර කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක විය යුත්තේ. ඒ අයට යම් කිසි විසඳුමක් ලබා දෙන්න ඕනෑ. ගල් පෝරනුවක් කරන අභිංසක මනුෂ්‍යයෙක් ජීවත් වෙන්නේ ඒකෙන් නම්, එතැන අභිංසක මිනිස්සු වැඩ කරනවා නම්, ඒ අයට වැටුප් නැති වුණාම මේ සිංහල අවුරුදු කාලයේ ඒ ගොල්ලන්ට කන්න දෙයක් ලැබෙන්නේ නැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා විසඳුමක් දීමේදී ඒ පිළිබඳව හොඳින් සොයා බලා තීන්දු ගන්න කියලා අපි ඉල්ලනවා.

ඒ වාගේම ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, සිංහල අවුරුද්දට බත් ටික දෙනවා නේද? හාල් ටික හරි විධියට දෙනවා නේද? කෑම ටික ඔක්කොම දෙනවා නේ. ඊට පස්සේ අපෙන් නොවෙයි ප්‍රශ්න එන්නේ, සිංහල අවුරුදු කාලයේදී ඔබතුමන්ලාගේ සහෝදරයන්ගෙන් තමයි ප්‍රශ්න එන්නේ. ඒකට සූදානම් වෙන්න කියලා ඉල්ලනවා. ඒ වාගේම, මේ සිංහල අවුරුදු සමයේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙනුත් කියන්න ඕනෑ. අපි දැන් පාර්ලිමේන්තුව ඇතුළට එනකොට, ඉස්සර පරීක්ෂා කරපු විධියට නොවෙයි දැන් පරීක්ෂා කරන්නේ. බරපතළ විධියට පරීක්ෂා කරනවා. ඒ කියන්නේ, රටේ ජාතික ආරක්ෂාවට බරපතළ ගැටලුවක් තිබෙනවා කියන එක. *[බාධා කිරීමක්]* ඒ අපි දිහා නොවෙයි. ඒ බරපතළ ගැටලුව විසඳන්න. එහෙම නිකම් ආවාට ගියාට ඒගොල්ලෝ පරීක්ෂා කරන්නේ නැහැ, ඒ ගොල්ලන්ට අවිශ්වාස නිසා තමයි, රටේම පරීක්ෂා කරන්නේ. ඒ නිසා මතක තබා ගන්න. පාර්ලිමේන්තුවට එද්දීත් ආරක්ෂාවක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියලා අපට තොරතුරු ලැබෙනවා නම්, වහාම මේ රටේ ජාතික ආරක්ෂාව සහතික කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා ඒක කළ යුුතුයි. මොකද, ඒක නොකළොත් රටේ සමස්ත ජනතාව ඉදිරියේදී ව්‍යාපාරික කටයුතු සියල්ල නොකර බියෙන් ගෙවල් අස්සට වෙලා ජීවත් වෙයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
භය කරන්න එපා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
භය කරන්න දෙයක් නැහැ. ඔබතුමා පාර්ලිමේන්තුවට ඇතුළු වෙද්දීත් භය කරලා තමයි එවන්නේ. හරි, කමක් නැහැ. ඒ කෙසේ වෙතත්, ඔබතුමන්ලා ගත්ත තීන්දු තීරණ අනුව නම්, අපට පෙනෙන්නේ මේ අය වැය එච්චරම සාර්ථක නැහැ කියලා. හැබැයි, එය සාර්ථක කර ගන්න එක ඔබතුමන්ලාගේ වැඩක්. අපි ඉල්ලනවා, කරුණාකරලා පළාත් පාලන මැතිවරණය තිබෙන මේ සමයේ, ආපහු වේදිකාවල බොරු ගොත ගොතා, කිය කියා නම් යන්න එපා කියලා. මොකද, අපි මේ පළාත් පාලන මැතිවරණය කරන්න හදන්නේ යම් කිසි තේමාවකට අනුව. ඒ තේමාව ඔබතුමන්ලා ඇහේ ගා ගන්න එපා. අපි, "බොරුවට නිත. සත්‍යයට ඉඩ" කියන තේමාව යටතේ තමයි, මේ පළාත් පාලන මැතිවරණය කරන්න හදන්නේ. ඒ නිසා ඔබතුමන්ලා ඒක ඇහේ ගා ගන්න අවශ්‍ය නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, සියලු ජනතාවට සිංහල හා හින්දු අලුත් අවුරුද්දට සුබ පතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට කලින් මට පොඩි වේලාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කරීකයෙක් මේ පාර්ලිමේන්තුවේදී යම් කිසි කරුණක් සඳහන් කරලා තිබුණා. මේ ආණ්ඩුව එළැඹෙන අවුරුදු සමයත් එක්ක ලබා දෙන්න යන බඩු මල්ල පිළිබඳව විපක්ෂය පැත්තෙන් සහ සමාජ මාධ්‍ය පැත්තෙන් සාවද්‍ය, පට්ටපල් බොරු කියනවා. ඒ සමාජ මාධ්‍යවල තිබෙන ඒවා ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කියනවා. මම ඒක නිසා ඉතාම වුවමනාවෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා, ඒ බොරු, සමාජ මාධ්‍යවල තිබෙන ඒවා මෙතැන කියන්න එපා කියලා. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන විවාද කළ දවසේ ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා මේ ගැන අහන වෙලාවේ මම ඉතා පැහැදිලිව කිව්වා, ඒ භාණ්ඩ මල්ලට එකතු කරන බඩු ලැයිස්තුව මොකක්ද කියලා.

ඒක කියන ගමන්ම මම කිව්වා, මේ බඩු මල්ලේ තිබෙන්නේ සමපෝෂ නොවෙයි, 'සුපෝෂ' කියලා. සුපෝෂ හදන්නේ අපේ ත්‍රිපෝෂ ෆැක්ටරියෙන්. නමුත් විපක්ෂයෙන් මේක සමපෝෂ කරන්න හදනවා. ඒ නිසා මම ඉල්ලනවා කරුණාකරලා ඒක කරන්න එපා කියලා. මේ බඩු මල්ලේ තිබෙන්නේ සුපෝෂ ග්‍රෑම් 200 පැකට් දෙකක්. ඒවායේ මිලත් රුපියල් 370යි කියලාත් කියනවා. මම ගාව සමාජ මාධ්‍යවල පළ වුණු පෝස්ට් දෙකක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒවායේ මිල 370යි කියලා දාලා තිබෙනවා. නැහැ, එය වැරදියි. රුපියල් 135 ගණනේ තමයි ග්‍රෑම් 200 සුපෝෂ පැකට් එකක් අපි ගන්නේ. රුපියල් 135 ගණනේ ගත්තාම, පැකට් දෙකට රුපියල් 270යි යන්නේ. අපි දැන් ඒ කොම්පැනියත් එක්ක කථා කරමින් යනවා, අවශ්‍ය ප්‍රමාණයට මෙවා නිෂ්පාදන කරගන්න. ඒගොල්ලෝ අපට සුපෝෂ පැකට් 675,000ක් දැනට දෙන්නම් කියලා තිබෙනවා මේ කටයුත්තේ ආරම්භක සතිය ඇතුළත. ඉතුරු ටිකත් ලබා දෙන්න කටයුතු කරන්නම් කියනවා. විපක්ෂය පාර්ලිමේන්තුව පාවිච්චි කරලා මෙතැනට ඇවිල්ලා සමාජ මාධ්‍යයේ තිබෙන ඒවා මෙතැනදී කියනවා නම් ඒක ඉතාම පහත් ගණයේ ක්‍රියාකාරකමක්. ඒ නිසා ඒවා කරන්න එපා. මම වෙළෙඳ ඇමතිවරයා හැටියට මේ බඩු මල්ලේ තිබෙන භාණ්ඩවල අන්තර්ගතය මොකක්ද කියලාත් නිශ්චිතව කිව්වා. අපි රතු සීනි ගන්නේ පැල්වත්ත සමාගමෙන්. වෙන කොහෙන්වත් ගන්නේ නැහැ. ඒක රජයේ සමාගමක්.

STC එකේ හාල් ගැන අපේ මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඒ වෙලාවේ කිව්වා. දවස් 21න් 21ට ඒවායේ quality එක බලනවා, ගරු මන්ත්‍රීතුමනි. STC එකේ හාල් ටික මේ බඩු මල්ලට දෙන්න තමයි ලෑස්ති කරන්නේ. ඇයි ඒ? අපට මේ හාල් කිලෝවක් රුපියල් 211.50යි වෙන්නේ. එහෙම cost එක අඩු කරලා මේ රුපියල් 5,000 බඩු මල්ල රුපියල් 2,500ට දෙන්න හදන්නේ අස්වැසුම හම්බ වෙන්නේ නැති, දෙවැනි වටයේ අස්වැසුම ඉල්ලා තිබෙන 807,000ක් වන දැනට ලියාපදිංචි වෙලා තිබෙන අයට. ඒ නිසා කරුණාවෙන් ඉල්ලනවා, සමාජ මාධ්‍ය කියන බොරු මෙතැන කියන්න එපා, යම් කරුණක් තිබෙනවා නම් ඒ ගැන ඇත්ත කියන්න දැනගන්න කියලා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.46]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ වෙළෙඳ ඇමතිතුමා අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. එතුමාට මම නැවත මතක් කරනවා STC එකේ හාල් නම් මේ බඩු මල්ලට දාන්න එපා කියලා. මොකද, ඒවායේ quality එක ෆේල් වෙලා තිබෙන්නේ. ඒ හින්දා ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියනවා ඒ හාල් නම් දාන්න එපා කියලා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නැවත නැවත අසත්‍ය කියන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
නැහැ, නැහැ. මම දන්න විධියට ඔබතුමාත් මේ ගැන දන්නවා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා STC එකේ quality report එක සභාගත කරන්නකෝ, මට බලන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා ඒක සභාගත කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)Quality Report
Madam, I rise to a point of Order. ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඒවායේ quality report එක සභාගත කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මොකක්ද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඒ quality report එක සභාගත කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මොන quality report එකක්ද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
STC එක ඉන්දියාවෙන් ගෙනාපු හාල්වල quality එක හොඳයි කියලා ලබාගත්ත තත්ත්ව වාර්තාව සභාගත කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක සභාගත කරන්න ඕනෑ නම්, ඔබතුමා එහෙම ඉල්ලන්න. ඔබතුමා වෙන බොරු කියන්න එපා. අවශ්‍ය නම් පාර්ලිමේන්තුවට මම ඒක අද සභාගත කරන්නම්. *[බාධා කිරීමක්]* තේරුණාද? නමුත් ඔබතුමා බොරු කිව්වාම, මම බොරු වාර්තා සභාගත කරන්න ඕනෑ නැහැ, ඔබතුමාගේ බොරුව නිවැරදි කරන්න. ඒවායේ quality එක ෆේල් කියලා ඔබතුමා කියන්නේ කොහොමද? ඔබතුමා බොරු කියන්න එපා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතුමා ඉදිරිපත් කළ භාණ්ඩ වර්ගවල අනෙකුත් භාණ්ඩ ගැන මම කථා කළේ නැහැ. මම කථා කළේ හාල් ගැන විතරයි. එතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේ මගේ කථාවේදී මම කිව්වා, STC එකේ හාල් සම්බන්ධව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙන බවට තොරතුරු ලැබිලා තිබෙනවා කියලා. ඒ නිසා ඔබතුමා ඒ වාර්තාව සභාගත කරලා ඒක නිවැරදි කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ඔබතුමා ඒ තොරතුරු ඉදිරිපත් කළේ නැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

මගේ තොරතුරු මම ඔබතුමාට කිව්වා. අමාත්‍යවරයකු හැටියට මට වැඩිය ඔබතුමාට ඒ ගැන හොයලා බලන්න පුළුවන්. මොකද, ඔබතුමා මීට කලින් දූෂණ විරෝධී හඬ සංවිධානයේ නායකයෙක් නේ. ඒ හින්දා ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඒ වාගේ දූෂිත දේවල් වෙනවා නම් ඔබතුමාට තිබුණා, පොඩ්ඩක් අපි කියන එකට සවන් දීලා ඒ ගැන හොයලා බලලා අපට ඒකේ ඇත්ත නැත්ත කියන්න. ඒකයි අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ වැය ශීර්ෂ විවාදයට අදාළ මුදල් අමාත්‍යාංශය යටතේ ආයතන ගණනාවක් තිබෙනවා. අපි දන්නා හැටියට, මේ අය වැය විවාදය තුළදී ආණ්ඩුව පැත්තෙන් ඉදිරිපත් කරපු අය වැය යෝජනාවල ආදායම් මාර්ග වැඩි කර ගැනීම පිළිබඳව විශාල කතිකාවක් ආවේ නැහැ. ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරනකොට මේ මුදල් ටික පියවාගන්නේ කොහොමද කියන එක වාර්තාවක් හැටියට අපට ඉදිරිපත් කළේ නැහැ. ඒ ගැන විශාල කථාවක් ආවේත් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මැතිවරණ කාලයේ මේ ආණ්ඩුව ලබා දීපු පොරොන්දු තිබෙනවා. විශේෂයෙන්ම VAT එක අයින් කිරීම ඇතුළු නොයෙකුත් දේවල් සම්බන්ධව ලබා දීපු පොරොන්දු රාශියක් තිබෙනවා. දැන් මා ළඟ තිබෙනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය. මේකේ 103වැනි පිටුවේ, සාර්ව ආර්ථික ස්ථායීකරණ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති යටතේ මෙහෙම සඳහන් වෙනවා:

> "දේශීයව නිෂ්පාදනය කරන කිරි, බිත්තර ඇතුළු අත්‍යවශ්‍ය ආහාර, ළදරු කිරි, ඖෂධ, පාසල් පොත් හා උපකරණ, සහරා, පුස්තකාල සේවා, කෘෂි උපකරණ, පොහොර, සූර්ය පැනල සහ උපාංග, පුනර්ජනනීය බලශක්ති ජනන යන්ත්‍ර, ආබාධ සහිත පුද්ගලයන් භාවිත කරන වාහන උපකරණ පරිපථ, දේශීය නිෂ්පාදන මෘදුකාංග, තොරතුරු තාක්ෂණ සේවා, පර්යේෂණ හා සංවර්ධන සේවා සඳහා වැට බද්ද සියයට බින්දුවේ අනුපාතයට ගෙන ඒම."

මේක තමයි මැතිවරණයේදී ලබා දුන් පොරොන්දුව. මේ පොරොන්දුව අහලා හුහක් අය, මේ කර්මාන්තවල යෙදී සිටින අය ඡන්දය ලබා දුන්නා. විශේෂයෙන්ම VAT එක zero කරනවා කිව්වා; එය බින්දුවට ගේනවා කිව්වා. අත්‍යවශ්‍ය භාණ්ඩවලට තිබෙන VAT එක අයින් කරනවා කිව්වා. නමුත් අපට පෙනෙනවා, අත්‍යවශ්‍ය භාණ්ඩවල VAT එක අයින් කරලා නැහැ කියලා. විශේෂයෙන්ම මේ IT sector එකේ සිටින විශාල ප්‍රමාණයකගේ ඡන්ද ගන්න IT sector එකට අදාළ VAT එක zero කරනවා කියලා කිව්වත්, ඒක කළෙත් නැහැ. අන්තිමට තමුන්නාන්සේලා ඇවිල්ලා මොකක්ද, කළේ? IT sector එකේ, එහෙම නැත්නම් software industry එකේ වැඩ කරන ඒගොල්ලන්ගේ ඒ නිෂ්පාදන සඳහා, ඒ තොරතුරු තාක්ෂණ සේවා සඳහා, ඒ තොරතුරු තාක්ෂණ සේවා අපනයනය සඳහාත් සියයට 15ක බද්දක් අප්‍රේල් 01 වෙනිදා ඉඳලා පනවා තිබෙනවා; අප්‍රේල් 01 වෙනිදා ඉඳලා තොරතුරු තාක්ෂණ සේවා පැත්තෙන් වැඩ කරන අයට සියයට 15ක බද්දක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. නමුත් තමුන්නාන්සේලා ඡන්දය ගන්න කිව්වේ, ඒගොල්ලන්ට තිබෙන VAT එක අයින් කරනවා කියලා. *[බාධා කිරීමක්]* ඔව්, සියයට 18ක VAT එක අයින් කරනවා කියලා තමයි තමුන්නාන්සේලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන පොතේ 103 වෙනි පිටුවේ පැහැදිලිව සඳහන් කරලා තිබෙන්නේ. එහෙම පොරොන්දුවක් ලබා දීලා, නමුත් මැතිවරණයෙන් පස්සේ VAT එක අඩු කරනවා වෙනුවට තව බද්දක් දාලා තිබෙනවා, සියයට 15ක.

විශේෂයෙන්ම තමුන්නාන්සේලා පසුගිය මැතිවරණ කාලවල දිගින් දිගටම ලබා දීපු පොරොන්දු එකින් එක අද වෙනකොට කැඩිලා තිබෙන බව අපට පෙනෙනවා. අද වෙනකොට ඒවා ඉෂ්ට කර ගන්න බැරි වෙලා තිබෙනවා. දූෂණ, වංචා ගැන වෙන්න පුළුවන්, මහ බැංකු මංකොල්ලය ගැන වෙන්න පුළුවන්. ඒවා පිළිබඳව නොයෙකුත් කථා වේදිකාවල ඇති වුණා. අර්ජුන මහේන්ද්‍රන්ව ගෙන්වනවා කිව්වා. රනිල් වික්‍රමසිංහව හිරේ දානවා කිව්වා. නමුත් ඒවා ඔක්කෝම දැන් වෙන වෙන කථාවලට යන බව අපට පෙනෙනවා. දැන් මහ බැංකු බැඳුම්කර වංචාව සොයනවා වෙනුවට ඔබතුමන්ලා බටලන්ද කොමිෂන් සභා වාර්තාව ගෙනැල්ලා තිබෙනවා. බටලන්ද කොමිෂන් සභා වාර්තාව ගෙනැල්ලා, දැන් වෙන පැත්තකට යනවා. නමුත් කිව්වේ, මහ බැංකු බැඳුම්කර වංචාව ගැන සොයනවා කියලායි. නමුත් දැන් බටලන්ද වාර්තාව ඉස්සරහට දාලා තිබෙනවා. තමුන්නාන්සේලා කිව්වේ නම්, සිංහබාහු පෙන්වනවා කියලා. සිංහබාහු පෙන්වන්න ආපු උදව්ය අද අන්දරේලා පෙන්වන තත්ත්වයට පසු බැහැලා තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව. ලක්ෂ 68ක් ටිකට් ගත්තේ සිංහබාහු බලන්න. නමුත් දැන් බලන්න වෙලා තිබෙන්නේ, අන්දරේලා. ඉතින්, තමුන්නාන්සේලා කියපු දේවල් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊළඟට අපි බලමු, ශ්‍රී ලංකා රේගුව ගැන. රේගුවේ නිලධාරීන් අදත් මෙතැනට ඇවිල්ලා ඉන්නවා. ශ්‍රී ලංකා රේගුව තමයි මේ රටට විශාල ආදායම් මාර්ග ගෙනෙන ස්ථානය. ඒ ආදායම වැඩි වෙන ස්ථානය. අපේ රටේ ආදායමට විශාල කර්තව්‍යයක් ඉෂ්ට කරන ස්ථානය. නමුත් දැන් බැලුවොත්, ඒ රේගුව හරහා අද මේ රටේ සාමාන්‍ය ව්‍යාපාරිකයන් විශාල සංඛ්‍යාවකට හිරිහැර සිද්ධ වෙන බව පෙනෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

විශාල හිරිහැරයක් සිද්ධ වෙනවා. ඒ හිරිහැරය තමයි, මේ රටේ මධ්‍යම පරිමාණ වෙළඳුන්ගේ, ඒ වාගේම සුළු ව්‍යාපාරිකයන්ගේ කඩවල්වලට රේගුවේ ඉන්න අර බණ්ඩාර කියන මහත්මයාගේ මූලිකත්වයෙන් යුත් කණ්ඩායමක් නිතර කඩා පනින එක. කඩා පැනලා ඒගොල්ලන්ගේ තිබෙන invoices සහ ෆයිල් ඔක්කෝම බලනවා. බලලා, ඒගොල්ලන්ව ගෙන්වලා ඒ අයට දඩ ගහනවා. මේකේ තිබෙන විශේෂ දේ තමයි රේගු ආඥා පනතට පිටින්

ගිහිල්ලා වැඩ කරන එක. ඒ කියන්නේ telephone එක පවා අරගෙන යනවා. කඩවල්වල වැඩ කරන අයගේ telephone එක බලහත්කාරයෙන් ගෙනියනවා. එතකොට ඒ මනුෂ්‍යයාගේ කඩේ වැහුවාම, ඒ ව්‍යාපාර ස්ථානය අවට සිටින අනෙකුත් වෙළඳුන්ට ඔහු පිළිබඳව තිබෙන විශ්වාසය සහ ඒ සියලු දේවල් බිඳ වැටෙනවා. ඒගොල්ලන්ගේ කීර්තිනාමය -goodwill එක- ඉවරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ශ්‍රී ලංකා රේගුවෙන් බඩු එළියට දානකොට ආයතන ගණනාවක් ඒ සම්බන්ධව වැඩ කටයුතු කරනවා. කන්ටේනරයක් නිකම් එළියට එන්නේ නැහැ. Revenue Task Force එක, Preventive Directorate එක තිබෙනවා. Preventive Directorate එක යටතේ තව ආයතන ගණනාවක් තිබෙනවා. ඒ වාගේම PCAB එක, VIU එක, CIB එක තිබෙනවා. එතකොට මේ වාගේ ආයතන ගණනාවක් හරහා ගිහිල්ලා තමයි කන්ටේනර් එකක් එළියට එන්නේ. නමුත් එහෙම ආපු කන්ටේනර් එකක් කඩේකට ගියාම තමයි මේ බණ්ඩාර මහත්මයාගේ unit එක කඩා පනින්නේ. මේ කන්ටේනර් එක එළියට දැමීමේ කටයුත්තට සහභාගි වෙච්ච, ඒවාට approvals දීපු නිලධාරීන් ගැන ප්‍රශ්න කරන්නේ නැහැ. ඒ කන්ටේනර් එක එළියට ගිහිල්ලා, ඒ කියන්නේ ඒ invoice එක undervalue කරලා, මොකක් හරි කරලා එළියට ගිහිල්ලා තිබෙනවා නම්, ඒ invoice එක approve කරපු නිලධාරීන් - officersලා - ඉන්නවා නේ. ඒගොල්ලන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්නේ නැහැ. මේ ෆයිල් එක ඇරලා බැලුවාම, ඒකේ unofficial payments තිබෙනවා. ඒ වාගේම official payments තිබෙනවා. නමුත් official payments ගැන තමයි ප්‍රශ්න කරන්නේ. නමුත් නිලධාරීන්ට unofficially ගෙවපු ඒවා තිබෙනවා, ඒවා ගැන අහන්නේ නැහැ. මොන නිලධාරියාටද ගෙව්වේ, කාටද මේ කන්ටේනර් එක release කර ගන්න සල්ලි දුන්නේ කියලා, ඒ මොකුත් අහන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා අපේ රටේ ව්‍යාපාරිකයන් විශාල පිරිසක් අද වෙනකොට ඩුබායි, මලයාසියාව, තායිලන්තය වැනි රටවලට සංක්‍රමණය වෙන්න පටන් අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මම අවසාන කරන්නම්.

අපි දන්නවා, පසුගියදා රේගුව විසින් කන්ටේනර් 323ක් release කළ බව. ඒ කන්ටේනර් 323 අයිති අයගේ නම් සභාගත කරන්න අද වෙනකම් බැරි වුණා. ඒ, කාට අයිති බඩුද තිබුණේ කියලා සභාගත කළේ නැහැ. නමුත් අපි දැක්කා, පසුගිය ආණ්ඩුවේ සමහර ඇමතිවරුන්ගේ, සමහර නායකයන්ගේ ලැයිස්තු හැම දාම එළියට එනවා. ඒක හොඳයි. ඒවා එළියට දමන්න. එහෙම දමන ගමන් තමන්ගේ ආණ්ඩුවේ සිදු වුණු මහා වංචාවක් වන කන්ටේනර් 323ක් රේගුව විසින් පරීක්ෂා නොකර එළියට දමපු එක ගැනත් ලැයිස්තු එළියට දමන්න කියන එක අපි තමුන්නාන්සේලාට මතක් කර දෙනවා. බොහොම ස්තුතියි.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, මම තමයි "සුපෝෂ" ගැන කථා කළේ. ඔබතුමා එදා කථා කරද්දිත් මම මෙතැන හිටියා. මා සතුව ඒ recording එක තිබෙනවා. ඔබතුමා "සමපෝෂ" කියලා කියනවා. මම recording එක දමලා පෙන්වන්නද? මේක අහගන්න.

(මේ අවස්ථාවේදී හඬ පටයක් ඇසෙන්නට සලස්වන ලදී.)
(இவ்வேளையில் ஒலிப்பதிவொன்று ஒலிக்க விடப்பட்டது.)
(At this stage, an audio recording was played.)

මේ කොටස තිබෙන video එක තිබෙනවා. මම දැන් හැන්සාඩ් වාර්තාව ඉල්ලුවා. හැන්සාඩ් වාර්තාව තවම print කරලා නැහැ. හැන්සාඩ් වාර්තාව ලැබෙන්නේ ඉදිරියේදී. හැන්සාඩ් වාර්තාව ලැබුණාම බලමු, ගරු ඇමතිතුමනි. ඔබතුමා "සුපෝෂ" හිතේ තියාගෙන කටින් "සමපෝෂ" කියලා කිව්වාද මම දන්නේ නැහැ. ඔබතුමා recording එක දමලා බලන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය සම්බන්ධව, එදා මම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව මම නැවත ඔබතුමාට ඉදිරිපත් කරනවා. මට හිතෙන විධියට, එතකොට මේක ලෙහෙසියි.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Recording එකට වැඩිය මොකක්ද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඉන්න, ඉන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ බඩු මල්ලට ඇතුළත් වෙන භාණ්ඩ තොගය පිළිබඳ මම එදාත් කිව්වා. Nadu rice කිලෝ 5ක්, සෝයා මීට් පැකට් 4ක්, ලොකු ලූනු කිලෝ 2ක්, අල කිලෝ දෙකක්, පරිප්පු කිලෝ දෙකක්, සැමන් ටින් - canned fish - 1ක්, brown sugar කිලෝ 3ක්, පිට් කිලෝ 2ක්, සුපෝෂ ග්‍රෑම් 200 පැකට් දෙකක් තමයි මේ බඩු මල්ලේ තිබෙන්නේ. ඔබතුමා කඩේට ගිහින් ඉල්ලනකොටත් ලැබෙන්නේ සමපෝෂ කියලා තමයි. සුපෝෂ, සමපෝෂ සහ තව වර්ගයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* රජයේ එක සුපෝෂ. *[බාධා කිරීමක්]* ඒක තමයි. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, ලංකා සතොසේ සභාපති මන්වි එකෙන් ආවාය කියනවා. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සභාපති හේලිස් එකෙන් ආවාය කියනවා. EDB Chairman, Browns and Company එකෙන් ආවාය කියලා කියනවා. ඉතින් ලංකාවේ ලොකු ආයතනවල ඔක්කොම කට්ටිය අපි ගත්තා. ඒ අය එතැන හිටියා කියලා ඒ අයගේ ආයතනවලට හෝ හිටපු ආයතනවලට දෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ටෙන්ඩර් එකෙන් මේක දෙන්නේ. රජයේ ආයතන දෙකක් අපි නිශ්චිතව තෝරාගෙන තිබෙනවා. සුපෝෂ ගැනීම සඳහා අපේ ත්‍රිපෝෂ නිෂ්පාදනය කරන, - *[බාධා කිරීමක්]* මේක ත්‍රිපෝෂ කොම්පැනිය කියලා නේ අපි කියන්නේ.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ත්‍රිපෝෂ කොම්පැනිය කියලා නේ අපි මේක දන්නේ. ඒකේ හදන පොඩි පැකට් එක තමයි සුපෝෂ කියන්නේ. Brown sugar ගන්නේ අපේ රටේ තිබෙන පැල්වත්ත සීනි සමාගමෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එදා මගේ අතින් එහෙම කියැවුණා නම්, - දැනුත් මේ ලැයිස්තුව තිබෙනවා. මේක තමයි ආහාර සුරක්ෂිතතා කමිටුව ඉදිරිපත් කරපු ලැයිස්තුව. ඒ ලැයිස්තුව තමයි මම එදාත් කියෙව්වේ; අදත් කියෙව්වේ. ඒ නිසා වැරැද්දක් තිබෙනවා නම් හදාගමු. *[බාධා කිරීමක්]* එහෙම නම් අහන්න එපා යැ, මෙහෙම එකක් කරනවාද කියලා. එහෙම නැතිව නේ මේ අහන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා ඉතාම පැහැදිලිව, - *[බාධා කිරීමක්]* දැන් මේ recording එක දාගන්නකෝ. මේ recording එක දාගන්නකෝ. එතකොට හරි. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද උදේ මෙම ගරු සභාවේදී දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මා යමක් පැවසුවා යැයි කියන හඬ පටයක් සභාගත කළාය කිව්වා. මම ගිහින් ලේකම් මණ්ඩලයෙන් විමසුවා, එහෙම හඬ පටයක් සභාගත කළාද කියලා. එතුමා ඒක ලබා දීම ප්‍රතික්ෂේප කළා කියලා කිව්වා. විපක්ෂය තමන්ගේ පජාත දේශපාලනය කරන්න මේ ගරු සභාව පාවිච්චි කරනවා නම්, ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මෙතැන කථාව කරලා දිගටම ගිහින් තවත් කාටද ඒක පෙන්වලා යන්න ගියා. දේශබන්දු ඉන්න තැන මම දන්නවා කිව්වා කියලා එතුමා බොරුවක් මේ සභා ගර්භයේදී කිව්වා. මේක practice එකක් විධියට කරන්න දෙන්න බැහැ. වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වෙත් ඒ වාගේම කාරණයක්. සමාජ මාධ්‍යයේ තිබෙන දේවල් මෙතැනට අරගෙන ඇවිත් බොරු සමාජගත කරන තැනක් බවට මේ ගරු සභාව පත් කරන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මා සම්බන්ධ හඬ පටය සභාගත කළාය කියලා නේ එතුමා කිව්වේ. අඩු ගණනේ ලේකම් මණ්ඩලය හෝ ක්‍රියාත්මක වෙලා දැන් එතුමාට කියන්න, ඒක ලබා දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.59]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වෙළෙඳ ඇමතිතුමා ඒ වැරැද්ද නිවැරදි කර ගත්තා නම් හොඳයි. හැබැයි අපි දන්නා විධියට ඊයේ වෙනකම්ම තිබුණේ සමපෝෂ. ඒකට ටෙන්ඩර් එකක් කැඳවන්න යනවා, කෝටි 29-30 අතර ප්‍රමාණයක. ඒ කියන්නේ රුපියල් 370 ගානේ 807,000කට. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඉන්න, ඉන්න. *[බාධා කිරීමක්]* මගේ වෙලාව ගන්න එපා. මගේ කථාවෙන් පස්සේ ඔබතුමා කථා කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමියනි, මම ඉතාම පැහැදිලිව කිව්වා, අපි ගන්නේ රුපියල් 135ට කියලා. සමාජ මාධ්‍යවල තිබෙන ඒවා බොරුවට කියන්න එපා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මෙහෙමයි. ඊයේ වෙනකම් ම තිබුණේ සමපෝෂ කියලා. ඔබතුමා දැන් තමයි ඒක නිවැරදි කර ගත්තේ. ඔබතුමා ඔය ටිකිරි මොළෙන් හිතලා, මන්ච් ටිකිරි මාරි කෑල්ලකුත් දා ගන්න, එතකොට මිතුරන්ට වැඩේ හරි යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජේ.ආර්. ජයවර්ධන සහ රොනල්ඩ් රේගන් දෙන්නා එකිනෙකාට කථා කර ගත්තේ දෙමස්සිනෝ වාගේ කියලා කියනවා. ඒ වාගේම සර් ජෝන් කොතලාවල, නේරු අගමැතිතුමාත් එක්ක කථා කර ගත්තේ අයියයි මල්ලියි වාගේ කියලා අපි අහලා තිබෙනවා. ඒ වාගේම සිරිමාවෝ මැතිනිය, ඉන්දිරා ගාන්ධි මැතිනියත් එක්ක කථා කර ගත්තේ අක්කයි නංගියි වාගේ කියලා අපි අහලා තිබෙනවා. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මහත්තයාත්, ඩේවිඩ් කැමරන් අගමැතිතුමාත් කථා කර ගත්තේ classmatesලා වාගේ කියලාත් අපි අහලා තිබෙනවා. දැන් අපි දැක්කා, අපේ රටේ රාජ්‍ය නායකයා වන අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාටත් ඒ විධියේ යාළුවෙක් ඉන්නවා. ඒ තමයි, IMF ලොක්කි Kristalina Georgieva. එතුමියගේ "X" පණිවුඩය අනුව ඒ දෙදෙනා නෑනා මස්සිනාලා වාගේයි, අක්කා මල්ලි වාගේයි, අයියා නංගි වාගේයි. ඉතින් මම එතුමියට කියනවා, "Kristalina, you are the best. Congratulations!" කියලා.

අපි මේ විවාදය පුරාම දැක්කා, ක්‍රිස්ටලීනා තමයි හොඳටම කරලා තිබෙන්නේ කියලා. ලංකාව IMF එකේ 50වෙනි සාමාජිකයා කියලා හුහක් අය දන්නවා. අපි 16 වතාවක් IMF ණය අරගෙන තිබෙනවා. ඒ 16 වතාවෙන් 6 වතාවක්ම ගිවිසුම්ගත වුණු මුදල ලංකාවට ලැබුණේ නැහැ. ඒකට හේතුව තමයි, කොන්දේසි ඉටු කර ගන්න බැරිව අත්හැර දැමීම. 1965දී ජේ.ආර්. ජයවර්ධන හා යූ.බී. වන්නිනායක දෙපළට ලැබුණේ ගිවිසුම්ගත මුදලින් සියයට 75යි. 1974දී ෆිලික්ස් ඩයස් බණ්ඩාරනායකට ලැබුණේ සියයට 29යි. 1978දී ආ ජේ.ආර්. ජයවර්ධනගේ බලවත් ආණ්ඩුවට 1993දී ලැබුණේ සියයට 50යි. 1994දී ඩී.බී. විජේතුංග, එහෙම නැත්නම් චන්ද්‍රිකා බණ්ඩාරනායක පාලන යුගයේ ලැබුණේ සියයට 83යි. ඒ වාගේම තමයි, 2003දී රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාව එළවා දමා ජනතා විමුක්ති පෙරමුණ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියත් එක්ක එකතු වෙලා හදපු පරිවාස ආණ්ඩුවට ලැබුණේ සියයට 14යි.

හැබැයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ IMF වැඩසටහන අද අනුර කුමාර දිසානායක මහත්තයා රනිල් වික්‍රමසිංහ මහත්තයාටත් වඩා හොඳට කරගෙන යනවා. අද IMF කියන්නේ ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකාව කියන්නේ IMF කියන තැනට ඇවිල්ලා තිබෙනවා. හැබැයි මෙහෙම වුණාට අපේ ඇමතිවරුන්ට කියන්න ඕනෑ, -මම අද මේ දේ කිව්වා කියලා මතක තියාගන්න- මේ කියන මුදල්වලින් බලශක්ති අමාත්‍යාංශයට, මහාමාර්ග අමාත්‍යාංශයට, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට, සෞඛ්‍ය අමාත්‍යාංශයට, අධ්‍යාපන, ධීවර, කෘෂිකර්ම වාගේ අමාත්‍යාංශවලට අය වැයෙන් වෙන් කළ ප්‍රාග්ධන මුදලින් සියයට 60ක්වත් ලබා ගන්න පුළුවන් වුණොත්, එහෙම නැත්නම් සියයට 65කට වඩා ගන්න පුළුවන් වුණොත් අපි ක්‍රිස්ටලීනා මැතිනියගේ

පිළිරුවක් ලංකාවේ හදමු කියලා. එය මම යෝජනා කරනවා. *[බාධා කිරීමක්]* ආ, අපට හදාගන්න කියන්නේ, අපට ආණ්ඩුව දෙනවා නේ. හරි, හොඳයි.

මම දැක්කා, මහ බැංකුව ගැනත් බොහෝ අය දිගින් දිගටම කථා කරනවා. මහ බැංකු මංකොල්ලය ගැන කථා කරනකොට රනිල් වික්‍රමසිංහගේ බැංකු ප්‍රේමය ගැනත් කථා කළා. මම කියන්න ඕනෑ, බැංකු කැඩීම හොඳටම කළේ ඔබතුමන්ලා බව. 1985-1990 කාලය තුළ බැංකු 62ක් කඩලා තිබෙනවා, මුදල් පැහැර ගැනීම් කරලා තිබෙනවා. ඒ ගැන අපි අද කථා නොකර ඉඳිමු කියලා මම කියනවා. මොකද අපට දවසක් එනවා, ඒ ගැන කථා කරන්න. අපි එදාට ඒ ගැන කථා කරමු. *[බාධා කිරීමක්]*

ඔයගොල්ලන් මහ දවල් තමයි කැඩුවේ. *[බාධා කිරීමක්]* ඔබතුමා දන්නේ නැතුව ඇති. ඒවාට සම්බන්ධ අය ඔය පැත්තේ ඉන්නවාද කියලා තමතමන්ගේ හෘදය සාක්ෂියෙන් අහන්න.

අද මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කරනකොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. රටක වටිනාම සම්පත තමයි, මානව සම්පත. මිනිස්සු තමයි වටිනාම දේ. එම නිසා අපි මේ මානව සම්පත සංවර්ධනය කරන්න ඕනෑ. අපට ඇහුණා, ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ළඟදී ලංකාවට එනවා කියනවා. අපේ රජය ඉන්දියාව සමඟ දැවැන්ත සංස්කෘතික, ආර්ථික හා සමාජයීය බැඳීමක් තිබෙනවා, අපි ඒක ඉදිරියටත් අරගෙන යනවා කියලා ඔබතුමන්ලා කියනවා. අපට ඉන්දියානු මහා ආර්ථිකය හැරදා ඉදිරියට යන්න බැරි බව අපි දන්නවා. ඒක අනුර කුමාර දිසානායක මැතිතුමා දැන් අවබෝධ කරගෙන සිටින බව අපට පෙනෙනවා. ඒක ඉතාම යහපත්. මේ සභාවේ සිටින ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන් 158දෙනාම ඒ අවබෝධයෙන් ඉන්න එක සහ එම ගනුදෙනු කිරීමේ වැදගත්කම ගැන අවබෝධයෙන් ඉන්න එක ඉතාම වැදගත් කියලා මම හිතනවා. අදානි සමාගම නැවත චානාවක් එනවා, ඒ අයත් එක්ක ගනුදෙනු කරනවා අපි දැක්කා. ඒක බොහොම හොඳයි. ඔබතුමන්ලා ඉන්දියානු රජයත් එක්ක සාම්පූර් සූර්ය විදුලි බලාගාරයට මුල්ගල තබන බව කියනවා. ඒවා ඉතාම හොඳ දේවල්. අද ඔබතුමන්ලාට ආපු ප්‍රඥාව එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාටත් ආවා. ඒ නිසා තමයි එදා එතුමා ඉන්දියාවත් එක්ක වැඩකටයුතු කළේ. වසර 38කට පස්සේ අද ඔබතුමන්ලාට ඒ ප්‍රඥාව පහළ වීම ගැන අපි සතුටු වෙනවා.

හැබැයි, මේ ප්‍රඥාව තිබුණු එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ, පාක්ෂිකයෝ, වෘත්තීය සමිති නායකයෝ, තරුණ නායකයෝ, කාන්තා සමිති නායිකාවෝ 1,100කට වඩා ඝාතනය වුණා, එදා මේ රටේ තිබුණු තත්ත්වයත් එක්ක. එහෙම වුණේ ඔවුන් එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් වූ නිසායි. එහෙම නැත්නම් ඉන්දියාව සමඟ කරන ඉතා වැදගත්, ගෞරවනීය සම්බන්ධතාව සහිත ගනුදෙනුව කරලා මේ රට ගොඩ නහන්න ඕනෑය කියන විශ්වාසය තිබුණු නිසාම තමයි එදා ඒ පිරිස ඝාතනයට ලක් වුණේ. ඉන්දියාව සමඟ එකතුවෙලා මේ කටයුත්ත කරන්න පුළුවන් කියලා විශ්වාස කරපු එකම තමයි එදා ඒ අයව ඝාතනය වෙන්නත් හේතු වුණේ. ඝාතනයට ලක් වුණු එක්සත් ජාතික පාක්ෂිකයන් 1,783දෙනෙකුගේ සහ අනෙකුත් පක්ෂවල තවත් 1,661ක පිරිසගේ නම්වලින් 1,300කගේ නම් සඳහන් ලේඛනයක් මා අද **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

හරි, හරි. *[බාධා කිරීම්]* ඒක දිනේෂ් මන්ත්‍රීතුමාගෙන් අහගන්න, එතුමා පැහැදිලි කරලා කියයි. ගරු සභානායකතුමනි, එදා ඔබතුමා බටලන්ද සිද්ධිය ගැන මෙතැනදී ඉතාම සංවේදී කථාවක් කළා. හැබැයි, නම් 4ක්, 5ක් විතරයි කිව්වේ. ජේවීපී එකේ තුවක්කුවෙන්, එහෙම නැත්නම් කඩුවෙන්, කැත්තෙන්, පිහියෙන් ඝාතනය වුණු 1,300කගේ නම් ඇතුළත් ලේඛනයක් මම දැන් සභාගත කළා. *[බාධා කිරීමක්]* ඔබතුමාට හරි දුකයි නේ. ඔහොම පොඩ්ඩක් ඉන්න. නිශ්ශබ්දව අහගෙන ඉන්නකෝ, ඔබතුමා හොඳ ගුරුවරයෙක්නේ. අහගෙන ඉන්න. මම මේ නම්වලින් පස්දෙනෙකුගේ විස්තර විතරක් කියන්නම්, නිශ්ශබ්දව අහගෙන ඉන්න. එල්ටීටීඊ එකටත් කලින් ළමා සොල්දාදුවන්ව ඇති කළේ ජනතා විමුක්ති පෙරමුණ. ඒකට හොඳම උදාහරණය තමයි, කන්තලේ බෝනික්කි.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමිය අය වැය ගැන කථා කරන්න.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අය වැයට එනවා, පොඩ්ඩක් ඉන්න. ඒ, අවුරුදු 13ක දරුවෙක්. ඒ දරුවා ලවා අවුරුදු 70ක එක්සත් ජාතික පක්ෂයේ කාන්තාවක් ඝාතනය කෙරෙව්වා. මේක තමයි ඇත්ත. ඊළඟට, දෙවැනි කෙනා ගැනත් මම කියන්නම්. අද ඔබතුමාට ගුරු වෘත්තීය සමිතිය ගැන කථා කරන්න හරි පුළුවන් වෙලා තිබෙනවා. ගුරු සේවයේ අසභාය වෘත්තීය සමිති නායකයෙක් එදා සිටියා. ඒ තමයි, කොම්යුනිස්ට් පක්ෂයේ ජෝර්ජ් රත්නායක මැතිතුමා. එතුමාව ඝාතනය කළේත් දරුවෙක් ලවා.

අද මෙතැන අපේ සංවිධායකතුමා සිටියා නම් හොඳයි. ඒ වාගේම ගරු අගමැතිතුමියත් දන්නවා ඇති, අහලා ඇති, ගාල්ලේ "බැංකු ධර්මේ" ගැන. එතුමාගේ බිරිඳ ගර්භිණී මාතාවක්. ඒ ගර්භිණී මාතාවගේ බඩ කපලා දරුවා අරන් stool එකක් උඩ තැබුවේ, ඒ බැංකු ධර්මේ එක්සත් ජාතික පාක්ෂිකයෙකු වීම නිසායි. ඒ වාගේම ලග්ගල, පල්ලේගම මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති රන්බණ්ඩා මහත්මයාව ගේට්ටු කණුවට හේත්තු කරලා ඝාතනය කළේ, එදාට කලින් දවසේ දරුවන්ව පාරට දුන්නේ නැහැයි කියලා. ඒ වාගේම ප්‍රේමවතී මනම්පේරි වාගේම සාගරිකා ගෝමස්වත් නිරුවත් කරලා වෙරළේ ඝාතනය කරලා දැම්මේත් ඔයගොල්ලන්ගේ කණ්ඩායම කියන එක මම කියනවා. මම ගරු කථානායකතුමාගෙන් අහනවා, මේවාට ඇඩෙන්නේ නැද්ද කියලා. එලෙස ඝාතනයට ලක් වූ අයගේ පවුල්වල අද වන විටත් ජීවත්වෙලා සිටින සාමාජිකයන් 920කගේ පමණ නම් මීට පෙර මම සභාගත කළා. ඒ හැමෝටම නමක්, ගමක්, ආත්මයක් තිබෙනවා. ඒක හොඳට මතක තියාගන්න ඕනෑ.

ඉන්දියාවත් එක්ක එකතු වෙලා කරන ආර්ථික ගමන ගැන දැක්මක් තිබුණු නිසා තමයි ඒ අයව ඝාතනයට ලක් වුණේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ අය ගැන විතරක් නොවෙයි, එදා මේ ඉන්දියන් විරෝධය මනසට දාලා දං ගෙඩියට යවපු 41,813දෙනාටත් යුක්තිය ඉටු වෙන්න ඕනෑ කියන එක මම මේ වෙලාවේ මේ ගරු සභාවට මතක් කරනවා.

ඒ වාගේම තමයි මේ අය වැය කථාවේදී,-

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
අර 60,000 ගැන විස්තරත් සභාගත කරන්න.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒක තමයි. ඒක කරන්න ඕනෑ. ඒ හැමෝටම යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑ. මේ කොයි මීනී වළ හෑරුවත් අන්තිමට ඉතුරු වෙන්නේ දුක -කනගාටුව- කියන එක හොඳට මතක තබා ගන්න ඕනෑ. ඒවායෙන් ඉණිමං බැඳලා දේශපාලනයේ උඩට ආපු ඔබතුමන්ලා අද කථා කරන දේ ගැන ඒ පවුල්වල අය හිතන දේ අපි දන්නවා.

ඊළඟට, මම මේ කාරණය කියන්න ඕනෑ. මේ අය වැය කථාවේදී කිව්වා, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ දැනට පවතින රුපියල් 21,000ක අවම මාසික වැටුප, 2025 වසරේ අප්‍රේල් මස රුපියල් 27,000ක් ලෙසත්, 2026 වසරේ සිට රුපියල් 30,000ක් ලෙසත් ඉහළ නැංවීමට සේවායෝජකයන්ගේ සංගමය - Employers' Association එක - එකඟ වෙලා තිබෙනවා කියලා. මේ ගැන අපි web එකේ හොයනකොට කිසිම සඳහනක් නැහැ. මේක ලංකාවේ කොහේද තිබෙන්නේ කියන එක කියන්න. මේකේ අපට දකින්න එක දෙයක් තිබෙනවා. මම ඊට අදාළ විස්තර ඇතුළත් ලේඛනය **සභාගත** කරන්න බලාපොරොත්තු වෙනවා.

Employers' Federation of Ceylon කියලා එකක් නම් තිබෙනවා. එතකොට ඔය කියන කාරණයට අදාළව ගිව්සුම්ගත වුණේ කොයි සමාගමත් එක්කද, කොයි association එකත් එක්කද කියන එක මේ සභාවට පැහැදිලි කරන්න. ඒ වාගේම, ඔබ ඒ සඳහා දෙන සහතිකය මොකක්ද කියන එකත් මම මේ වෙලාවේ ප්‍රශ්න කරනවා.

මට තව කොච්චර කාලය තිබෙනවාද, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි?

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමියට තව මිනිත්තු 3ක කාලයක් තිබෙනවා.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මේ ආණ්ඩුව බලයට පත් වෙලා දැන් මාස 5ක් වෙනවා. මේ මාස 5ට ආණ්ඩුව භාණ්ඩාගාර බිල්පත්, බැදුම්කර මඟින් රුපියල් බිලියන 5,200ක් ණයට අරගෙන තිබෙනවා. රුපියල් කෝටි 520,000කට වඩා ණය අරගෙනත් තිබෙනවා. ගිය අවුරුද්දේ මේ රටේ ආදායම රුපියල් බිලියන 40,000යි. මේ මාස 5ට රුපියල් බිලියන 5,200ක් ණය අරගෙන තිබෙනවා. හරි නේද, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි? මම අභියෝග කරනවා, මේ මුදලින් කරපු වැඩ 5ක් කියන්න කියලා. ඔබතුමන්ලා මේ මුදලින් කරපු වැඩ 5ක් කියන්න කියලා මම නැවතත් ඉල්ලා සිටිනවා.

මම මේ මැතිවරණ ව්‍යාපාරය අතරතුර ඔක්තෝබර් මාසයේදී මේ ගැන කියනකොට ඔබතුමන්ලාගේ සමාජ මාධ්‍ය සහ ඔබතුමන්ලාගේ වේදිකාවල මාව පතුරු ගැහුවා, මම බොරු කියනවා කියලා. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව පසුගිය දවස් 13ට රුපියල් කෝටි 41,900ක ණය ගත්තා කියලා මම කිව්වාම, ඔබතුමන්ලා මට අපහාස කළා. මම අහනවා, එහෙම කළේ නැද්ද කියලා. හැබැයි, මහ බැංකුව සහතික කළා, එහෙම වුණා කියන එක. මාස 5ට රුපියල් කෝටි 520,000ක ණය අරගෙන තිබෙනවා. හැබැයි, මම මහ බැංකුවට ස්තුති කරන්න ඕනෑ, ඔක්තෝබර් මාසයේ මහ බැංකුව රුපියල් බිලියන 100ක් පිටුපස දොරින් හොර පාරෙන් අව්වු ගහපු බව මම හෙළිදරව් කළාට පසුව ඒ අය ඒගොල්ලන්ගේ ක්‍රියාමාර්ගය වෙනස් කරගෙන තිබුණු එක ගැන. දැන් දවස් 7න්, දවස් 14න්, හොර පාරෙන් interbanking system එක හරහා අඩු පොලියට සල්ලි පොම්ප කරන එක, අව්වු ගහන එක සීමා කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මොකක්ද? *[බාධා කිරීමක්]* හරි, හරි. ඔබතුමන්ලා නිශ්ශබ්දව මම කියන එක අහගෙන ඉන්න. ඔබතුමා මේ රටේ, සමාජයේ කථා කරපු දේවල් අපි දැක්කා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මහ බැංකු අධිපති එළවනවා කියලා කිව්වා.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඔව්, මහ බැංකු අධිපති එළවනවා කිව්වා. කෝ, දැන්? දැන් ගෙනැත් දෙන්න කියනවා, අඬනවා ඔබතුමන්ලා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා මොනවාද කථා කරන්නේ? මොනවාද කිව්වේ? බලයට ඇවිල්ලා සතියෙන්, හිටපු මහ බැංකු අධිපති ගේනවා කිව්වා. කෝ, දැන්? හිටපු මහ බැංකු අධිපති ගෙනැත් දෙන්න කියනවා. පොලිස්පති හාර වුණේ නැත්නම් පොලිස්පතිව අල්ලා ගන්නත් බැහැ. ඒක තමයි ඇත්ත.

ඒ නිසා මම අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. එදා හාල් කිලෝ 10ක් දෙනකොට ඔබතුමන්ලා කිව්වා, මේ රටේ කැකුළු හාල් හිඟයක් ආවේ හාල් කිලෝ 10 දීපු නිසාය කියලා. මම යෝජනා කරනවා, අඩු ආදායම්ලාභී අයට ජීවත් වෙන්න අපි සහනයක් දෙන්න ඕනෑ, ඒ අය නහාසිටුවන්න වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියලා.

අද ඔබතුමන්ලා ඒ අයට හාල් බෙදනවා. හාල් කිලෝ 10කින් සතියක් ජීවත් වෙන්න බැහැ නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එතකොට අපි හිතුවා, මේ දරුවන්ට කන්න දෙන්න හෝ පවුලකට හාල් කිලෝ 20ක්වත් දෙයි කියලා. හැබැයි, දැන් දෙන්නේ කීයද? හාල් කිලෝ 5යි. ඒ නිසා මම ඔබතුමන්ලාට යෝජනා කරනවා, මේ රටේ අඩු ආදායම්ලාභීන්ට මීට වඩා සහන ගෙන දෙන්න මේ ආර්ථිකය නැවත වෙනස් කර ගන්න තිබෙන තැන්වල එය කරන්න. මොකද, ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. අද හාල් කිලෝවක මිල රුපියල් 250ට වඩා එහාට ගිහිල්ලා. පොල් ගෙඩියක මිල අද වනකොට රුපියල් 250ට ආසන්න මිලකට ඇවිල්ලා තිබෙනවා. චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා නේ, පොල් සම්බෝලත් කන්න එපා, කිරි හොඳිත් කන්න එපා කියලා. ඔබතුමාට වාගේ හැම්බෙකන් නැහැ නේ, ගම්වල මිනිස්සුන්ට. ගම්වල මිනිස්සුන්ට පොල් සම්බෝලයක් තමයි කන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මම යෝජනා කරනවා, මේ රටේ ජනතාවට, රජයේ සේවකයන්ට දුන් පොරොන්දු ඉෂ්ට කරන්න කියලා. ගුරුවරුන්ට සුදුසුකම් සපුරාගෙන එන්න කියන්න එපා. ගුරුවරුන්ගේ සුදුසුකම් නැහැයි කියන එක පිළිගන්න. වෘත්තීය සමිති නායකයෝත් එක්ක ආපු ගුරුවරු අද ඔබතුමන්ලාට පාඩමක් කියලා දෙන්න ඊළඟ මැතිවරණය එනකල් බලාගෙන ඉන්නවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමිය
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (මහාචාර්ය) සේන නානායක්කර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[பி.ப. 3.16]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, என்னுடைய இன்றைய பேச்சில் மூன்று விடயங்களைத் தொட்டுப் பேச விரும்புகின்றேன்.

வடக்கு, கிழக்கில் போர் நடைபெற்ற காலப்பகுதியிலும் அதற்குப் பிற்பாடும் அபிவிருத்தி என்ற பெயரில் முதலீடுகள் ஊடாக நடைபெற்ற முன்னேற்றங்கள் மிகவும் குறைவாகும். இது உங்களுக்கும் தெரியும்! அதற்குப் பல காரணங்கள் இருக்கலாம். ஆனாலும், அதுதான் யதார்த்தம்! இப்படியான நிலையில், அங்கு வாழ்கின்ற மக்கள் பொதுவாகத் தாங்கள் சேமித்து வைத்திருக்கின்ற நிதியை வங்கிகளிலும் finance நிறுவனங்களிலும் deposit செய்து, அதன்மூலம் கிடைக்கின்ற interestஐ வைத்துத்தான் தங்களுடைய வாழ்கையை நடாத்திக்கொண்டு இருக்கின்றார்கள். யாழ்ப்பாணம் உட்பட வடக்கு வாழ் மக்கள், விசேடமாக ஓய்வுபெற்ற மக்கள் The Finance Companyஇல் கணிசமான முதலீடுகளைச் செய்திருக்கிறார்கள். துரதிருஷ்டவசமாக, போர் காலத்திலும் அதற்குப் பிற்பாடும் செய்யப்பட்ட அந்த முதலீடுகளின் நிலைமை 2019ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் 23ஆம் திகதிக்குப் பின்னர் மிகப் பெரிய கேள்விக்குறியாக மாறி இருக்கின்றது. ஏனென்றால், The Finance Companyஆனது liquidationக்குள் சென்று, இன்று மத்திய வங்கியாலும் நீதிமன்றத்தாலும் கையாளப்படுகின்ற நிலைமைக்குத் தள்ளப்பட்டு இருக்கின்றது.

ஏற்கெனவே செய்யப்பட்டிருந்த முதலீடுகளைப் பிரித்து வழங்குவதற்குரிய முயற்சிகள் இப்பொழுது நடைபெற்றுக் கொண்டிருக்கின்றன. எனினும், இதுவரை 6,400க்கும் மேற்பட்ட முதலீட்டாளர்களுக்கு அவர்கள் முதலீடு செய்த தொகையிலிருந்து ஒரு சதம்கூட கிடைக்கவில்லை. இந்த நிறுவனம் முழுமையாக liquidate பண்ணப்பட்டு, அதன் சொத்துக்கள் அனைத்தும் auctionமூலம் விற்கப்பட்டு எதிர்காலத்திலாவது அவர்களுடைய பணம் மீள வழங்கப்படுமா? என்பதுகூட, இன்றைக்கு மிகப் பெரிய கேள்விக்குறியாக மாறி இருக்கின்றது. The Finance Companyஇன் சொத்துக்கள் இன்றைக்கு இருக்கக்கூடிய market valueக்குக்கூட விற்கப்படாமல், மிகக் குறைந்த விலைக்கு விற்கப்பட்டு, முதலீட்டாளர்களுக்கு இதுவரை ஒரு சதம்கூட கொடுக்கப்படாத நிலையில், அந்த நிதி பிரிக்கப்பட்டு வருவதால் அவர்கள் மிகவும் வேதனைப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள்.

இன்று தென்னிலங்கையில் இருக்கக்கூடிய நிலைமையில் அங்கு வாழுகின்ற மக்களுக்குப் பல தெரிவுகள் இருக்கின்றன. ஆனால், வட, கிழக்கில் அப்படியல்ல. அதற்காகத்தான் நான் இதை இன்று நடைபெறுகின்ற நிதி அமைச்சின் குழுநிலை விவாதத்தில் சொல்கின்றேன். எனக்கு நன்றாக ஞாபகம் இருக்கின்றது. 2001ஆம் ஆண்டு Ceasefire Agreement கைச்சாத்திடப்பட்டு, நான் முதற் தடவையாக இந்தப் பாராளுமன்றத்துக்குத் தெரிவு செய்யப்பட்டிருந்த ஒரு சூழலில், நடைபெற்ற முதலாவது வரவு செலவுத்திட்ட விவாதத்தில் இவ்விடயம் தொடர்பில் பேசப்பட்டது. அப்போது National Savings Bankஇல் இருந்த depositorsஇல் கிட்டத்தட்ட 75 சதவீதமானவர்கள் வடக்கு மாகாணத்தைச் சேர்ந்தவர்கள். ஏனெனில், எங்களுடைய மக்கள் தங்களிடம் இருக்கக்கூடிய நிதியை வங்கிகளில் fixed deposits செய்து அல்லது finance companiesஇல் முதலீடு செய்து, அதனூடாகக் கிடைக்கின்ற வருமானத்தின் மூலம்தான் வாழ்கின்றார்கள். அப்படிப்பட்ட ஒரு நிலையில், The Finance Companyஇலும் எங்களுடைய தமிழ் மக்கள் மிகப் பெரிய அளவில் முதலீடுகளைச் செய்திருக்கிறார்கள். விசேடமாக, வட, கிழக்கில் போரால் பாதிக்கப்பட்ட பிரதேசங்களில் இருக்கக்கூடிய மக்களின் பங்களிப்பு இதில் மிக அதிகமாக இருக்கின்ற சூழலில், அவர்களுக்கு நியாயம் கிடைக்க வேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

இதற்கு முன்னர் இருந்த அரசாங்கங்கள் சாதாரண பொது மக்களுடைய பிரச்சினைகளைக் கணக்கில் எடுக்கவில்லை. இதற்கு முன்னர் இடம்பெற்ற ஒவ்வொரு வரவு செலவுத்திட்ட விவாதத்திலும், நானும் வட, கிழக்கைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற ஏனைய பாராளுமன்ற உறுப்பினர்களும் இந்த finance companyஉடைய பிரச்சினைகள் பற்றி பேசியிருக் கின்றபோதிலும், அது கணக்கில் எடுக்கப்படவில்லை. சனாதிபதி அவர்களுடைய பொறுப்பின்கீழ் Finance Ministry வருகின்றபொழுதும்கூட, இந்த விடயம் கணக்கில் எடுக்கப்படாமல்தான் இருந்தது. ஆனால், இந்த அரசாங்கத்தின் நிலைப்பாடு வேறு! சாதாரண பொது மக்களுடைய, கஷ்டப்படுகின்ற மக்களுடைய முதலீடுகளைக் காப்பாற்றவேண்டியது தமது கடமை என்று சொல்லிக்கொண்டிருக்கின்ற இந்த அரசாங்கம், கடந்த கால அரசாங்கங்கள் போன்று செயற்பட முடியாது. அந்த அடிப்படையில்தான் நான் இந்த விடயத்தை இங்கு முன்வைக்கின்றேன்.

The Finance Companyஆனது, 2019ஆம் ஆண்டு பெப்ருவரி மாதம் 15ஆம் திகதி மூடப்படுகின்றது. அதாவது, liquidationக்குள் போகின்றது. அதற்கு 2 கிழமைக்கு முன்னர், அதாவது, 2019ஆம் ஆண்டு சனவரி மாதம் 1ஆம் திகதியிலிருந்து 31ஆம் திகதி வரையான காலப்பகுதியில் ஒரு பில்லியன் ரூபாயை மேலதிகமாகச் சேகரிப்பதற்கான மிகத் தீவிர முயற்சியும் நடைபெற்றிருக்கிறது. Finance company ஒன்று ஒன்றரை மாதத்துக்குள் மூடப்படப் போகின்றது என்பதைத் தெரிந்துகொண்டு, எந்த அடிப்படையில் இப்படிப்பட்ட ஒரு முயற்சியை எடுக்க முடியும்? ஒரு பில்லியன் ரூபாயை - ஆயிரம் மில்லியன் ரூபாயை - குறிவைத்து, முதலீட்டாளர்களைச் சேர்த்து, நிதியைச் சேகரிப்பதற்கான ஒரு முயற்சி நடைபெற்று, அதன்மூலம் கிட்டத்தட்ட 946 மில்லியன் ரூபாய் சேகரிக்கப்பட்டது. அவ்வாறு செய்யப்பட்டு இரண்டு

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

කිழමைகளில் இந்தக் கம்பனியை மூடுவதென ஒரு முடிவு எடுக்கப்படுகின்றது என்றால், இதற்கு மேல் ஓர் அநியாயம் இருக்கலாமா? இது இந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்தில் நடைபெற்ற ஒரு சம்பவமாக இல்லாவிட்டாலும்கூட, தாங்கள் சேகரித்த பணத்தை இப்படிப்பட்ட ஒரு companyஇல் முதலீடு செய்துவிட்டு மிக மோசமான நிதி நிலைமையில் இருக்கின்ற அந்த வட, கிழக்கு மக்களை நடுத்தெருவில் விடுவதென்பது பொருத்தமான ஒரு செயலல்ல!

நான் நினைக்கின்றேன், இந்த நிதி நிறுவனத்தில் முதலீடு செய்தவர்கள் மத்திய வங்கியின் ஆளுநர் அவர்களை கடைசியாக 2022ஆம் ஆண்டுதான் சந்தித்தார்கள். அப்பொழுது அவர்களுக்குச் சொல்லப்பட்டு இருக்கிறது, முதலீடு செய்த தொகையில் கிட்டத்தட்ட 33 சதவீதம் மட்டும் சிலவேளை கிடைக்கலாம் என்று. அதனையும் உறுதியாகச் சொல்ல முடியாதெனக் குறிப்பிட்டு இருக்கிறார்கள். எனவே, இந்த விடயத்தை கட்டாயம் நிதி அமைச்சு கவனத்தில் எடுத்து, அந்த முதலீட்டாளர்களுக்கு நியாயத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும். அது யாராக இருந்தாலும் பரவாயில்லை! நான் வெறுமனே வட, கிழக்கில் உள்ளவர்களைப் பற்றியோ அல்லது தமிழர்களைப் பற்றியோ மட்டும் கதைக்கவில்லை. உண்மையிலேயே கஷ்டப்படுகின்ற மக்களுடைய அதுவும் ஓய்வுபெற்றவர்களுடைய முதலீடுதான் இவை. எனவே, நீங்கள் ஏதோவொரு வகையில், அவர்கள் முதலீடு செய்த தொகையை அவர்களுக்குத் திரும்ப வழங்குவதோடு, அதற்கு மேலதிமாக interestஐயும் வழங்கி, அவர்களுக்கு நீதியையும் நியாயத்தையும் நிச்சயமாகப் பெற்றுக்கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, யாழ்ப்பாணத்தைச் சேர்ந்த 14 சமூர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள் 2006ஆம் ஆண்டு Grade IIஇலிருந்து Grade Iக்குச் செல்வதற்காக நேர்முகப் பரீட்சைக்குத் தோற்றியிருக்கிறார்கள். அவர்களிடம் அப்பதவிக்குத் தேவையான கல்வித்தகைமை உட்பட எல்லாத் தகுதிகளும் இருந்தன. அதுமாத்திரமன்றி, அவர்கள் எதுவித ஒழுக்காற்று நடவடிக்கைக்கும் உட்பட்டிருக்கவில்லை. எனினும், மருதங்கேணி பிரதேச செயலகத்தால் நடாத்தப்பட்ட நேர்முகப் பரீட்சைப் புள்ளிகள் தமக்குக் கிடைக்கவில்லை என மாவட்ட செயலகத்தால் தெரிவிக்கப்பட்டு, அந்த 14 பேருக்கும் Grade Iக்குரிய நியமனம் வழங்கப்படவில்லை.

2012ஆம் ஆண்டு மீண்டும் நேர்முகப் பரீட்சைக்குத் தோற்றிய அவர்கள், Grade-Iக்குத் தகுதி பெற்றிருப்பதாக அறிவிக்கப்பட்டது. எனினும், அவர்களுக்கு 2012ஆம் ஆண்டு சனவரி மாதம் 1ஆம் திகதியில் இருந்தே Grade-Iக்குரிய நியமனம் வழங்கப்பட்டிருக்கிறது. கிட்டத்தட்ட 6 வருடங்கள் கழித்துத்தான் அவர்களுக்கு இந்தப் பதவி உயர்வு வழங்கப்பட்டு இருக்கின்றது. உண்மையிலேயே அவர்களுக்கு 2006ஆம் ஆண்டு கிடைக்கவேண்டிய அந்தப் பதவி உயர்வு கிடைக்காமல் போனதற்குக் காரணம், மருதங்கேணி பிரதேச செயலகத்தால் விடப்பட்ட தவறாகும். இதற்கு இடைப்பட்ட காலப் பகுதியில் அவர்கள் இவ்விடயம் தொடர்பில் பல தடவை ஆட்சியில் இருந்தவர்களிடம் நியாயம் கேட்டும், அவர்களுக்கு எந்தவிதமான தீர்வும் கிடைக்கவில்லை. அப்படிப்பட்ட ஒரு சூழலில்தான் அவர்கள் என்னிடம் வந்து, இந்த அரசாங்கத்திடம் இந்தப் பிரச்சினையை முன்வைத்து, அந்த 6 வருடங்களில் தங்களுக்குக் கிடைக்கவேண்டிய சேவை மூப்பையும் சம்பளப் படிநிலையையும் பெற்றுத்தருமாறு கேட்டார்கள். இன்றைக்கு இருக்கக்கூடிய பொருளாதாரச் சூழலில், மிகவும் கஷ்டப்படுகின்ற நிலையில்தான் அவர்கள் இந்த விடயத்தைச் செய்து தருமாறு என்னிடம் கேட்டார்கள். எனவே, இந்த விடயத்தையும் நிச்சயமாக இந்த அமைச்சு கருத்திற்கொண்டு, உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அந்த 14 உத்தியோகத்தர்களின் விபரங்கள் அடங்கிய ஆவணத்தை நான் சபைக்குச் *சமர்ப்பிக்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
තව විනාඩි 3යි. මට විනාඩි 14ක් තිබෙනවා කියලා නේ කිව්වේ.

அடுத்து, எங்களுடைய மாவட்டத்தின் DCCஇன் தலைவராக இருக்கின்ற கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் இங்கு இருக்கும்போது, நான் ஒருசில கருத்துக்களைச் சொல்ல விரும்புகின்றேன். கடந்த DCC கூட்டத்தில் அவர் எங்களிடம், யாழ்ப்பாணத்துக்கு விசேட நிதியாக 500 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருப்பதாகக் கூறி, அதை எவ்வகையில் செலவு செய்வது என்பது பற்றி எங்களிடம் ஆலோசனை கேட்டிருந்தார். அதற்காக நான் அவருக்கு நன்றி கூறுகின்றேன். உண்மையிலேயே இதுவல்ல நடைமுறை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போரால் பாதிக்கப்பட்டு கிட்டத்தட்ட 30 வருடங்கள் பின்னிலையில் இருக்கக்கூடிய ஒரு பிரதேசத்தை, போர் இடம்பெற்ற காலப் பகுதியில் மாறி மாறி ஆட்சிக்கு வந்த ஒவ்வோர் அரசாங்கத்தாலும் எடுக்கப்பட்ட கொள்கை ரீதியான முடிவுகளால் குறிப்பாக பொருளாதாரத் தடை உட்பட எத்தனையோ விடயங்களால் மக்களுடைய பொருளாதாரம் மிகவும் பலவீனமாக இருக்கக்கூடிய ஒரு பிரதேசத்தைக் கட்டியெழுப்புவதற்குச் சரியானதொரு திட்டமிடல் அவசியமாகும். அது முழுமையான திட்டமிடலுடன்கூடிய ஒருங்கிணைக்கப்பட்ட ஒரு முயற்சியாக அமைய வேண்டும். Needs assessment ஒன்றைச் செய்ய வேண்டும். அந்த வகையில், எந்தெந்த இடங்களில் எவ்வாறான தேவைகள் உள்ளன என்பதை அறிந்து, கிடைக்கப்பெறுகின்ற இவ்வாறான நிதியை முறைப்படி ஒதுக்க வேண்டுமே தவிர, ஒரு கூட்டத்தில் வைத்து 500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருப்பதாகச் சொல்லி, அதன்மூலம் என்ன செய்ய விரும்புகிறீர்கள் எனக் கேட்பது முறையல்ல! அப்படிப்பட்ட ஒரு செயற்பாட்டைத்தான் இந்த அரசாங்கம் செய்யப் போகின்றதா? உண்மையிலேயே அந்த 500 மில்லியன் ரூபாய் தொடர்பில் DCC கூட்டத்தில் எல்லோருடைய கருத்துக்களையும் கேட்டு, முறைப்படி முடிவுகளை எடுப்பது இந்த அரசாங்கத்தின் நோக்கமல்ல. கேட்ட உடனேயே கிடைக்கின்ற பதில் உருப்படியான பதிலாக இருக்காது என்பது அவர்களுக்கு நன்றாகத் தெரியும்!

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

அப்படிப்பட்ட ஒரு சூழலில், அந்த நிதியை அவர்கள் தாங்கள் விரும்பியபடி பயன்படுத்தும் நோக்கில், கடமைக்காகக் கேட்கப்பட்ட ஒரு கேள்வியாகவே அந்தக் கேள்வி இருந்தது.

இந்த வரவு செலவுத்திட்டத்தின் இரண்டாவது வாசிப்பின் மீதான விவாதத்தில் நான் கலந்துகொண்டு சொன்ன விடயத்தை மீண்டும் சொல்கின்றேன். அதாவது, போரால் பாதிக்கப்பட்டு, கிட்டத்தட்ட 30 வருடங்கள் பின்னிலையில் இருக்கக்கூடிய வடக்கு, கிழக்குப் பிரதேசங்களை அபிவிருத்தி செய்வதாக இருந்தால், ஆகக் குறைந்தது needs assessment ஒன்று செய்யப்பட்டு - தேவைகளைக் கண்டறியக்கூடிய முழுமையான ஆய்வொன்று செய்யப்பட்டு - அதன் பிரகாரம்தான் நிதி ஒதுக்கீடு செய்யப்பட வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் முடிக்கிறேன்.

அவ்வாறு செய்யாமல் நாங்கள் முடிவுகளை எடுப்போமாக இருந்தால், அந்த மக்களுடைய உண்மையான அபிவிருத்தியை எங்களால் அடைய முடியாது. அந்த முடிவுகள் வெறுமனே *ad hoc* ஆகத்தான் இருக்கப்போகின்றன. 'சும்மா' படம் காட்டுவதற்காக, நாங்கள் இவ்வளவு நிதியை எடுக்கிறோம், அதில் இவ்வளவு நிதியைக் கொடுக்கிறோம் என்று சொல்லி, மக்களை ஏதோவொரு வகையில் சமாளித்து, ஏனைய மிகப் பெரிய தொகையை வேறு வேறு இடங்களுக்குக் கொண்டு செல்வதற்காகத்தான் இவ்வாறு செய்யப்படுகின்றதே ஒழிய, உண்மையிலேயே அந்தப் பிரதேசங்களைக் கட்டியெழுப்பி, அந்த மக்களுடைய பொருளாதாரத்தைப் பாதுகாத்து, பலப்படுத்துவதற்காக அல்ல எனக் கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.31]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் நிதியொதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் பங்குகொள்வதையிட்டு நான் மனமகிழ்வு அடைகின்றேன்.

ஒரு நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டுமென்றால், நிதித் திட்டமிடல் சரியான முறையில் இருக்க வேண்டும். கடந்த காலத்தில் இந்த நாட்டை ஆட்சி செய்த ஒவ்வோர் அரசாங்கமும் நிதித் திட்டமிடலையும் பொருளாதாரத்தையும் சரியான முறையில் கைக்கொள் ளாமையால்தான் இந்த நாடு மிகவும் பாரதூரமான விளைவுகளைச் சந்திக்கவேண்டி ஏற்பட்டது. இன்று இந்த நாடு கடனாளியாக மாறி இருக்கின்றது. அதுமாத்திரமன்றி, வேறு நாடுகளை நம்பியிருக்கவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமைக்குள்ளும் தள்ளப்பட்டு இருக்கின்றது. நாங்கள் இந்த நாட்டைக் கட்டியெழுப்ப வேண்டுமென்றால், இந்த நாட்டின் பொருளாதாரத்தை வலுப்படுத்த வேண்டுமென்றால், பெறுகின்ற கடனை அல்லது நிதியைச் சரியான முறையில், சரியான திட்டங்களுக்குப் பயன்படுத்த வேண்டும். அவ்வாறு செய்து, வேலைவாய்ப்புகளை உருவாக்கி, இந்த நாட்டைச் செல்வச் செழிப்புள்ள ஒரு நாடாக மாற்றவேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. கடந்த கால அரசாங்கங்களால் வடக்கு, கிழக்குக்கு ஒதுக்கப்பட்ட நிதி மிகக் குறைவாகும். அதேபோல், இந்த அரசாங்கத்தாலும் வடக்கு, கிழக்குக்கு ஒதுக்கப்பட்டுள்ள நிதி மிகக் குறைவாகும். அங்கு யுத்த காலத்தில் மூடப்பட்ட பல தொழிற்சாலைகள் இன்றும் திறக்கப்படாமல் இருக்கின்றன. அந்தத் தொழிற்சாலைகளை மீளத் திறந்து, அங்கிருக்கின்ற மக்களுக்குத் தொழில் வாய்ப்புகளை வழங்கவேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது.

கடந்த 'நல்லாட்சி' அரசாங்கத்தால் பல திட்டங்கள் கொண்டுவரப்பட்டன. அதன் அடிப்படையில், 2016-2017 காலப்பகுதியில் திருக்கோவில் பிரதேசத்தில் கனியமணல் அகழ்வுக்கான ஒரு திட்டம் கொண்டுவரப்பட்டது. அப்போது அதற்கு எதிராக ஆயிரக்கணக்கான மக்கள் போராட்டங்களை நடத்தியிருந்தார்கள். அவர்கள் ஓரிரு போராட்டங்களை அல்ல, 20க்கும் மேற்பட்ட போராட்டங்களை நடத்தியிருந்தார்கள். அந்தக் காலப்பகுதியில் அந்தத் திட்டத்துக்கு எதிராக தற்போதைய NPP அரசாங்கத்தில் இருக்கின்றவர்கள்கூட குரல் கொடுத்தார்கள். குறிப்பாக, அந்தத் திட்டத்தைத் தடுத்துநிறுத்த வேண்டுமென இந்தப் பாராளுமன்றத்திலும் குரல் கொடுத்தார்கள். பின்னர் அந்தத் திட்டம் தடுத்து நிறுத்தப் பட்டது. தற்பொழுது அங்கு கனியமணல் அகழ்வுக்கான பரிசோதனை ஒன்றை மேற்கொள்ள முனைகின்றார்கள். அங்கு கனியமணல் அகழ்வதால், எதிர்காலத்தில் அந்தப் பிரதேசத் திலுள்ள மக்கள் பாரிய விளைவுகளை எதிர்நோக்கவேண்டி ஏற்படும். குறிப்பாக, அந்தப் பகுதியில் இருக்கின்ற மண் திட்டுகள் அழிவடையக்கூடிய வாய்ப்பு இருக்கின்றது. 2004ஆம் ஆண்டு சுனாமி அனர்த்தம் ஏற்பட்டபோது, அங்குள்ள மக்கள் பாதுகாக்கப்பட்டது அந்த sand dunesஆல்தான் - மண் திட்டுகளால்தான். இல்லாவிட்டால் கூடுதலான மக்கள் இறந்திருப்பார்கள்.

அதுமட்டுமல்ல, திருக்கோவில் பிரதேசத்தில் வாழ்ந்து வருகின்ற 15,000க்கும் மேற்பட்ட மீனவர்களின் வாழ்வாதாரம் பாதிப்படையக்கூடிய சூழ்நிலை ஏற்படும். அதேபோல், அப்பகுதியில் காணப்படுகின்ற கண்டல் தாவரங்கள் அழிவடையக்கூடிய சூழ்நிலை ஏற்படும். மேலும், அங்கிருக்கின்ற coralsஇல் காலத்துக்குக் காலம் மீனினங்கள் முட்டையிட்டு குஞ்சு பொரிக்கும் செயற்பாட்டிலும் பாரிய பாதிப்பு ஏற்படும். அந்தப் பகுதியில் ஆயிரக்கணக்கான தென்னை மரங்கள் இருக்கின்றன. கனியமணல் அகழ்வால் அவைகூட அழிவடைந்து போகக்கூடிய சூழ்நிலை ஏற்படும். நாட்டில் தேங்காய்க்குத் தட்டுப்பாடு ஏற்பட்டு இருக்கின்றது; தென்னை மரங்களைப் பாதுகாக்க வேண்டும்; வெளிநாட்டிலிருந்து தேங்காய் இறக்குமதி செய்வதைத் தடுத்து நிறுத்த வேண்டுமென்று இப்பொழுது ஆட்சிக்கு வந்திருக் கின்ற அரசாங்கமானது சொல்கின்றது. எனினும், இன்று அந்த மரங்கள் அழிவடையக்கூடிய சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது.

அதேபோல், விவசாயத்தைக் கட்டியெழுப்ப வேண்டும் என்றும் அரசாங்கம் சொல்கின்றது. கனியமணல் அகழ்வை மேற்கொள்ளும்போது, அந்த இடத்துக்குப் பக்கத்தில்

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

இருக்கின்ற வயல் நிலங்கள் அனைத்தும் உப்புத் தன்மை யுடையதாக மாறக்கூடிய சூழ்நிலை காணப்படுகின்றது. இவை மட்டுமல்ல, இன்னும் பல பிரச்சினைகள் ஏற்பட வாய்ப்புள்ளது. குறிப்பாக, சுற்றுலாத்துறை பாதிப்படையக் கூடிய சூழ்நிலை காணப்படுகின்றது. ஏனெனில், பொத்துவிலில் இருந்து திருக்கோவில் வரையுள்ள கரையோரப் பகுதி - coastal belt - சுற்றுலாப் பயணிகள் வந்துபோகக்கூடிய இடமாகக் காணப்படுகின்றது. திருக்கோவில் பிரதேசத்தின் ஒரு பக்கத்தில் கடலும், மறுபக்கத்தில் ஆறும் காணப்படு கின்றது. ஆற்று நீர் உப்பு நீராக மாறும்போது, அதில் வாழுகின்ற மீன் குஞ்சுகளும் அரிய வகை உயிரினங்களும் அழிவடையக்கூடிய நிலைமை ஏற்படும். இன்னும் பத்து வருடங்களில் அந்தப் பிரதேசம் வனாந்தரமாக மாறக்கூடிய சூழ்நிலையும் காணப்படுகின்றது. எனவே, அங்கு கனியமணல் அகழ்வுக்கான பரிசோதனையைச் செய்வதற்கு அனுமதியளிக்கக் கூடாதென நான் இந்த அரசாங்கத்திடம் கேட்டுக் கொள்கின்றேன். ஏன் அந்த இடத்தில் பரிசோதனை செய்யப்பட வேண்டும்? கனியமணல் அகழ்வதற்காகத்தானே! 'டம்சிலா' என்ற தனியார் கம்பனிதான் அங்கு கனியமணல் அகழ்வதற்கான பரிசோதனையை மேற்கொள்ள இருக்கின்றது. இந்த அரசாங்கம் அதற்கான அனுமதியைக் கொடுக்கக் கூடாது.

அடுத்து, வட்டமடுவில் இருக்கின்ற மேய்ச்சல் தரைக் காணியை நம்பித்தான் ஆலையடிவேம்பு மற்றும் திருக்கோவில் பிரதேசங்களிலுள்ள பண்ணையாளர்கள் இருக்கின்றார்கள். 4,000 ஏக்கர் அளவுடைய அந்த மேய்ச்சல் தரைக் காணியின் ஒரு பகுதியை வேளாண்மை செய்வதற்கு அனுமதியளிப் பதற்காக தேசிய மக்கள் சக்தி அரசாங்கத்தைச் சேர்ந்த Chairman அவர்கள் அம்பாறை மாவட்ட செயலகத்தில் கூட்டம் ஒன்றை நடத்தியிருந்தார். அந்தக் காணியில் 300 ஏக்கரை விவசாயம் செய்வதற்குக் கொடுக்க வேண்டுமென அவர் கூறியிருந்தார். அந்தக் காணியானது, அந்தப் பகுதியில் இருக்கின்ற பண்ணையாளர்களின் சொத்து! பண்ணையாளர் களுக்கு gazetteமூலம் கொடுக்கப்பட்ட 4,000 ஏக்கர் அளவுடைய அந்தக் காணியில் விவசாயம் செய்வதற்கு எந்தவிதத்திலும் அனுமதி அளிக்கக் கூடாது. அவர்களுக்கு இன்னும் 2,000 ஏக்கர் காணியைக் கொடுத்தால்தான் அங்கு பால் உற்பத்தியை மேற்கொள்ள முடியும். ஆலையடி வேம்பிலும் திருக்கோவிலிலும் இருக்கின்ற பண்ணையாளர் களைப் பாதுகாக்க வேண்டும். ஏனெனில், அவர்கள் மிகவும் கஷ்டமான சூழ்நிலையில் இருக்கின்றார்கள். மேலும், அங்கு பால் உற்பத்தி சம்பந்தமான தொழிற்சாலைகளை உருவாக்க வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Sir, give me one more minute, please.

இன்று பாலுக்குக் கட்டுப்பாட்டு விலை இல்லாமல் இருக்கின்றது. பண்ணையாளர்களிடம் இருந்து குறைந்த விலைக்கே பாலைக் கொள்வனவு செய்கின்றார்கள். பால் உற்பத்தியைப் பெருக்க வேண்டுமென்றால், அவர்களின் உற்பத்திக்கு நியாய விலையைப் பெற்றுக்கொடுக்க வேண்டும். மேலும், அந்த இடத்தில் பால் தொழிற்சாலைகளையும் பால்மா உற்பத்தித் தொழிற்சாலைகளையும் உருவாக்க வேண்டும். இப்படியான விடயங்களை அங்கு மேற்கொள்ள வேண்டுமென நான் இந்த இடத்தில் அரசாங்கத்தைக் கேட்டுக் கொள்கின்றேன். தயவுசெய்து, ஆலையடிவேம்பு மற்றும் திருக்கோவில் பிரதேசங்களில் வாழ்கின்ற மக்களின் வாழ்வாதாரத்தில் கைவைக்க வேண்டாமென நான் அரசாங்கத்திடம் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இன்று arts, fine arts, வணிகம் போன்ற துறைகளில் பட்டப்படிப்பை முடித்த பலர் வேலையில்லாமல் இருக்கின்றார்கள். அவர்களுக்கான வேலைவாய்ப்பை வழங்க வேண்டும். இன்று தொழில்நுட்பம், digital, biotic போன்ற துறைகளில்தான் கூடுதலான தொழில்வாய்ப்புகளைக் கொடுக்க முடியும் என்றால், இவர்கள் என்ன செய்வது? எனவே, முறையானதொரு கல்வித் திட்டத்தை வகுத்து, அவர்களுக்கான பயிற்சிகளை வழங்கி, தொழில்வாய்ப்பு களைப் பெற்றுக்கொடுக்க வேண்டுமென நான் இந்த அரசாங்கத்திடம் தயவாகக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු ඇමතිතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න. මොකද, මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා එදා දවසේත්, අද දවසේත් මේ කථාව කියන්න ගත්තා. දැන් ආණ්ඩුවට කරන්න වෙන විවේචන නැති නිසා මේ වාගේ බොරු බිල්ලෝ මවන එක විපක්ෂයේ කටයුත්ත කරගෙන තිබෙනවා. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිකුත් කරන ලද මේ සහතිකය මා සතුව දැන් තිබෙනවා. STC මගින් ගෙන්වන ලද හාල්වලට අදාළ තොරතුරු මෙහි තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඒ උදවිය මේ report එකෙන් කරුණු 4යි කරුණු දක්වන්නේ. මෙහි "Subject: MILLED RICE " සහ "Your reference: STC/CHOF/Rice/2024/05 and letter dated 30.12.2024" කියලා සඳහන් වෙනවා. මේකට අදාළ දිනය දාලා තිබෙන්නේ. මේ ආනයනික riceවලට අදාළව සංසටක 4ක් - arsenic, lead, cadmium, mercury කියන මේ බැරලෝහ - තිබෙනවා ද කියන එක තමයි මේ වාර්තාවෙන් අපට කරුණු දක්වලා තිබෙන්නේ. මේ අනුව, limit එක තිබෙන්නේ, arsenic - 0.2 maximum. හැබැයි, මේ සහල්වල තිබෙන්නේ 0.1යි. ඊළඟට, lead - 0.2 maximum. අපට තිබෙන මේ සහල්වල තිබෙන්නේ less than 0.1. ඊට පස්සේ cadmium තිබෙන්නේ less than 0.1. ඒකෙත් maximum limit එක 0.2. ඊට පස්සේ mercury තිබෙන්නේත් less than 0.1. එහි maximum limit එක හැටියට තිබෙන්නේ, 0.1. ඒ නිසා සහල් පිළිබඳව බොරු බියක් හදලා මේ වැඩේ අවුල් කරන්න කථා කියන එක වෙනුවට, අඩුම තරමින් මේ වාර්තාවක්වත් අනේ තියාගෙන ඒවා කිව්වා නම් හොඳයි. මෙන්න එතුමා අහපු STC මගින් ගෙන්වන ලද සහල් පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලබා දුන්නු වාර්තාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වාර්තාව **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** தானிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා.

[பி.ப. 3.43]

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (වීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வரவு செலவுத்திட்ட விவாதத்தின் கடைசி நாளான இன்று நிதி அமைச்சு தொடர்பாக நடைபெறுகின்ற விவாதத்தில் கலந்து கொள்வது எனக்கு மிகவும் மகிழ்ச்சியளிக்கிறது. காலையிலிருந்து இங்கு உரையாற்றிய எதிர்க்கட்சி உறுப்பினர்கள் பலரும் அவர்கள் வழமையாக முன்வைக்கின்ற குற்றச்சாட்டுக்களுக்கு அப்பால், வேறெதையும் சொல்ல முடியாத ஒரு நிலைமையில் இருந்ததைக் காணக்கூடியதாக இருந்தது. அந்த வகையில், இங்கு கௌரவ முஜிபுர் ரஹுமான் அவர்கள் மிகவும் தெளிவாகக் குறிப்பிட்ட ஒரு விடயத்தைப் பற்றிச் சொல்ல வேண்டும். அவர் எங்களுடைய கௌரவ அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்கள்மீது அபாண்டமான பழிகளைச் சுமத்த முயற்சி எடுத்ததைக் காணக்கூடியதாக இருந்தது. அதனால் நான் கௌரவ முஜிபுர் ரஹுமான் அவர்களுக்கு ஒரு விடயத்தை மிகவும் தெளிவாகச் சொல்கின்றேன். கௌரவ முஜிபுர் ரஹுமான் அவர்களைப் பற்றியும் அவருடைய ஆரம்பகால அரசியல் எப்படியான தென்றும் எனக்கு நன்றாகத் தெரியும்.

அன்றைய காலத்தில் சிறந்த அரசியல்வாதியாக இருந்த அவர் இன்று அரசியலில் மிகவும் சீரழிந்துபோன நிலைமையில் இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. கடந்த காலத்தில், விசேடமாக உள்ளூராட்சிச் சபை தேர்தல் வந்தபோது, அவர் மேயர் பதவியைக் கைப்பற்றுவதற்காகத் திடீரெனத் தனது பாராளுமன்ற உறுப்பினர் பதவியிலிருந்து விலகி, மிகவும் கங்கணத்தோடு செயற்பட்டதைக் காணக்கூடியதாக இருந்தது. ஆனால், இந்த முறை அவரை அங்கு காணக் கிடைக்கவில்லை. அதனால், வேறு வேறு கதைகளை அளந்து இந்தச் சபையின் நேரத்தை வீணடிக்க வேண்டாமெனக் கௌரவ முஜிபுர் ரஹுமான் அவர்களிடம் கேட்டுக்கொள்வதோடு, நீங்கள் உங்களுடைய மாளிகாவத்தைப் பிரதேசத்துக்குச் சென்று உங்களுடைய வட்டாரத்தையாவது பாதுகாத்துக்கொள்ளத் தயாராகுங்கள் என்றும் சொல்லிக்கொள்ள விரும்புகிறேன். ஏனென்றால், இம்முறை கொழும்பு மாநகர சபையை வெல்லப்போவது வேறு யாருமல்ல, தேசிய மக்கள் சக்தியே ஆகும். அதன் மேயர் வேறுயாருமல்ல, எங்களுடைய ராய் சகோதரிதான் என்பதையும் நான் இந்த இடத்தில் சொல்லிக்கொள்ள விரும்புகிறேன்.

அதேபோன்று, கௌரவ உறுப்பினர் ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் மிகவும் அபாண்டமான விடயங்களைக் கூறினார். இந்த வரவு செலவுத்திட்ட விவாதத்தின்போது மிகவும் ஆரோக்கியமான உரையாடல் இடம்பெறும் அல்லது எதிர்க்கட்சி உறுப்பினர்கள் ஆரோக்கியமான கருத்துகளை முன்வைப்பார்கள் என்று பார்த்தால், அவ்வாறின்றி அவர்கள் தொடர்ந்து இந்த நாட்டின் கொலைப் பட்டியல் அல்லது கொலைக் கலாசாரத்தைப் பற்றி பேசுகின்றவர்களாகவே இருக்கின்றார்கள். அந்த நபர்களுக்கு நாங்கள் ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். அது என்னவென்றால், 1948ஆம் ஆண்டு இந்த நாட்டுக்குச் சுதந்திரம் கிடைத்ததன் பிறகு, இந்த நாட்டிலே கொலைக் கலாசாரத்தை நிர்மாணித் தவர்கள், மக்களைக் கொன்றவர்கள் வேறு யாருமல்லர், ஐக்கிய தேசியக் கட்சியினர் ஆவர்; அது ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய கட்சியாகும்.

அந்த வகையில் தேடிப் பாருங்கள், 1956 மற்றும் 1958ஆம் ஆண்டுகளில் எங்களுடைய மக்களைக் கொலை செய்தவர்கள் யார் என்பது உங்களுக்குத் தெரியும்! பிறகு, 1977-78ஆம் ஆண்டுகளில் இந்த நாட்டிலே இனக் கலவரத்தைத் தூண்டியவர்கள் யார் என்பதும் தெரியவரும்! 1979ஆம் ஆண்டு அவசரகாலச் சட்டம் மற்றும் பயங்கரவாதத் தடைச் சட்டத்தைக் கொண்டுவந்து, இந்த நாட்டின் இளைஞர், யுவதிகளைப் படுகொலை செய்கின்ற படுகொலைக் கலாசாரத்தையும், சித்திரவதைக் கலாசாரத்தையும் நிர்மாணித்தவர்கள் யார் என்றால், அது வேறு யாருமல்லர், ஐக்கிய தேசியக் கட்சியைச் சார்ந்தவர்களாவர். பிறகு, 1981ஆம் ஆண்டு யாழ். நூலகத்தை எரித்துச் சாம்பலாக்கி, 97,000 புத்தகங்களைக் கொளுத்திய பாவிகள் யார் என்றால், வேறு யாருமல்லர், இதே கட்சியைச் சார்ந்தவர்கள்தான் என்பது எங்கள் எல்லோருக்கும் தெரியும்! இன்று அவர்கள் எங்களைப் பார்த்துக் கொலைகாரர்கள் என்று சொல்கின்றார்கள்.

அதுமட்டுமன்றி, அன்று அவ்வாறான நிலைமைகளின் போது உங்கள் எல்லோருக்குமே தெரியும், விசேடமாக 1983ஆம் ஆண்டு யூலை மாதம் 25 மற்றும் 28ஆம் திகதிகளில் சிறைச்சாலைகளில் தடுத்து வைக்கப்பட்டிருந்த குட்டிமணி மற்றும் ஜகன் உள்ளிட்ட 53 தமிழ் அரசியல் கைதிகளைக் கொன்று, குட்டிமணியின் கண்களைத் தோண்டி எடுத்த காடைத்தனம் நடைபெறக் காரணமாக இருந்தது அன்றைய ஜே.ஆர். ஜயவர்தனவுடைய அரசாங்கமாகும் என்பது. அந்த வகையில், இந்த நாட்டில் பிரிவினைவாதம் மற்றும் ஆயுதப் போராட்டம் ஆகியவை முன்னெடுக்கப்படுவதற்கு உந்து சக்தியாக இருந்த 1983ஆம் ஆண்டு யூலை கலவரத்தைச் செய்த பாவிகள் இன்று இந்தச் சபையிலிருந்து தாங்கள் என்னவோ புனிதர்களாக மாறிவிட்டதாகக் கொக்கரிக் கின்றார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விசேடமாக, இன்று நான் பல்வேறு விடயங்கள் பற்றி பேச நினைத்துக் கொண்டிருந்தபோது, இந்தச் சபையிலே எங்கள்மீது முன்வைக்கின்ற குற்றச்சாட்டுகளைக் கேட்டுக்கொண்டு பொறுத்துக்கொண்டிருக்க முடியாது என்பதால் இந்த விடயங்களைக் குறிப்பிடவேண்டி நேரிட்டது. அதற்காக மன்னித்துக்கொள்ள வேண்டும். ஏனென்றால், 1983, 1989ஆம் ஆண்டு காலகட்டங்களில் இலட்சக் கணக்கானவர்களைச் சித்திரவதை செய்து கொன்றவர்கள், சித்திரவதை செய்து ருசித்தவர்கள் மற்றும் அதைப் பார்த்து விசில் அடித்தவர்கள் போன்ற நரித்தனமான நபர்கள் இன்றும்கூட இருக்கின்றார்கள். அந்த நரித்தனமானவர்களிடம் இதனை நாங்கள் சொல்ல வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இங்கு விசேடமாக எல்லோரும் பேசுகின்ற அபிவிருத்தி என்ற விடயத்தில், வட, கிழக்கு அபிவிருத்தியென்பது மிகவும் முக்கியமானது. ஏனென்றால், 30 வருடங்களுக்கும் மேலாக யுத்தத்தால் பாதிக்கப்பட்டவர்களாக அந்த மக்கள் இருக்கின்றார்கள். யுத்தத்தின்போது சகலதையும் இழந்த மக்களாக இருக்கின்ற அதேவேளை, அபிவிருத்தியையும் இழந்த மக்கள் அவர்கள். அந்த மக்களுக்கு நாங்கள் அபிவிருத்தியைப் பெற்றுக்கொடுப்பது எப்படி என்பது

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

සම්පන්තමාක ඉන්‍රෑක්කු නාන් ඔරු විටයත්තෙ මාත්තිරම් සොල්ලික්කොළ්ළ විරුම්පුකින්රේන්. අතාවතු, නාංකළ් ඉන්ත අපිවිරුත්ති වේලෛත්තිට්ටංකළෙ මුන්නෙටුප්පතර්කු මුන්පු, මාණ්පුමිකු සනාතිපතියවර්කළ් මිකත් තෙළිවාකක් කුරිප්පිට්ටිරුක්කින්ර විටයත්තෛක් කරුත්තිල් කොළ්ළ වේණ්ටුම්. අතාවතු, "ඉන්ත නාට්ටිලුළ්ළ කිරාමංකළෙ නෝක්කි නිතිප් පාය්ච්චලෛච් චෙය්තු, අතන්මූලමාක ඉන්ත නාට්ටින් අපිවිරුත්ති වේලෛත්තිට්ටංකළ් මුන්නෙටුක්කප්පට වේණ්ටුම්" එන්පතු අවර් කුරිප්පිට්ටිරුක්කින්ර විටයමාකුම්.

අන්ත වකෛයිල්, විසේටමාක වට, කිළක්කුප් පිරතේසංකළ් තොටර්පාකක් කූටුතලාන කවනත්තෛච් චෙලුත්තවේණ්ටියිරුක් කින්රතු. අතනටිප්පටෛයිල්, විසේටමාක ඉන්රෑක්කු නාංකළ් වටක්කෛ නෝක්කිප් පාරිය අපිවිරුත්ති තිට්ටංකළෛ මුන්නෙටුප්පතර්කුත් තීර්මානිත්තිරුක්කින්රෝම්. අන්ත වකෛයිල්, කුරිකාට්ටුවාන් පාලත්තෛ මීළ් පුනරමෛප් පතර්කාන වේලෛ, වට්ටුවාකල් පාලත්තෛප් පුනරමෛප් පතර්කාන වේලෛ එන්පවර්රෛ ආරම්පික්ක ඉරුක්කින්රෝම්. තර්පෝතු චෙය්පටාතිරුක්කින්ර පරන්තන් ඉරචායනත් තොළිර්චාලෛයින් චෙය්පාටුකළෛ මීළක් කට්ටියෙළුප්පු වතර්කාන චෙයර්පාටුකළෛ මුන්නෙටුක්ක ඉරුක්කින්රෝම්. අතේපෝන්රු, ඔට්ටුසුට්ටාන් පිරතේසත්තිලිරුක්කින්ර ඔට්ටුත් තොළිර්චාලෛයෛ මීළප් පුනරමෛත්තු කටන්ත වාරම් අතෛත් තිරන්තු වෛත්තිරුක්කින්රෝම්. අතුමාත්තිරමල්ල, ඉම්මාතම් 29ආම් තිකති ආනෛයිර්පු උප්පළත්තෛ මීළත් තිරන්තු වෛක්ක ඉරුප්පතු මාත්තිරමල්ල, කුරිඤ්චාත්තීවු උප්පළත්තෛ මීළප් පුනරමෛප්පතර්කාන චෙයර්පාටුකළෛයුම් නාංකළ් මුන්නෙටුප්පතර්කුත් තීර්මානිත්තිරුක්කින්රෝම්. අතුපෝල, KKS පිරතේසත්තිල් මික නවීන මුරෛයිල් තොළිල් වලයම් ඔන්රෛ උරුවාක්කුවතර්කාන ඒර්පාටුකළෛ මේර්කොළ්ළ ඉරුක්කින්රෝම්.

විසේටමාක, මුල්ලෛත්තීවු මාවට්ටත්තෛප් පර්රි එටුත්තුච් චොල්ලවේණ්ටුමෙන්රාල්, අංකු 20ක්කුම් අතිකමාන පුතිය මුතලීට්ටාළර්කළ් මුතලීටු චෙය්වතර්කාක මුන්වන්තිරුක් කින්රාර්කළ්. නිච්චයමාක මුල්ලෛත්තීවු මාවට්ටත්තෛත් තාංකළ් කට්ටියෙළුප්පුවෝමෙන්ර උත්තරවාතත්තෛ අවර්කළ් තන්තිරුක්කිරාර්කළ්. අතුමාත්තිරමන්රි, විසේටමාක ඉන්රු මුර්රාක අළිත්තොළික්කප්පට්ටිරුක්කින්ර පරුත්තිත්තුරෛක් කටර්කරෛප් පිරතේසත්තෛ තාංකළේ නිති ඔතුක්කීටු චෙය්තු මීළක් කට්ටියෙළුප්පුවතර්කු අංකිරුක්කින්ර තමිළ්ත් තෝළර්කළ් පලර් මුන්වන්තුළ්ළාර්කළ්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(මාණ්පුමිකු රාමලිංකම් චන්තිරසේකර්)
(The Hon. Ramalingam Chandrasekar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

අතේපෝන්රු එංකළ් එල්ලෝරුක්කුම් තෙරියුම්, පරුත්තිත්තුරෛක් කරෛයෝරප් පිරතේස වීතිකළ් අතුනාළ් වරෛක්කුම් පුනරමෛක්කප්පටවිල්ලෛ එන්පතු. අතුපෝල්, වල්වෙට්ටිත්තුරෛ පිරතේසම් පිරපාකරනින් පිරන්ත ඌරෙන්රු ඉතුනාළ් වරෛක්කුම් අන්තප් පිරතේසත්තිල් යාරුමේ කෛවෛක්කවිල්ලෛ. ආනාල්, ඉන්ත මුරෛ පෝක්කුවරත්තු, නෙටුඤ්චාලෛකළ් අමෛච්චින්කීළ්, කෙරව අමෛච්චර් පිමල් රත්නායක්ක අවර්කළාල් අන්තප් පිරතේස වීතිකළෛප් පුනරමෛප්පතර්කු නටවටික්කෛ එටුක්කප්පටවිරුක්කින්රතු. අන්ත වකෛයිල් යාළ්ප්පාණත්තිල් පාරිය අපිවිරුත්තිකළෛ මුන්නෙටුප්පතර්කාන අටික්කට්ටුමාන වේලෛකළෛච් චෙය්වතර්කු ආරම්පිත්තිරුක්කින්රෝම්. අව්වාරාන වේලෛ කළෛච් චෙය්කින්රපෝතු, ඔරුචිල තමිළ් අරචියල්වාතිකළ් විමර්චනංකළ් එතුවුමිල්ලාමෛයාල්, එංකළෛප් පාර්ත්තු ඌළෛයිටුවතර්කු ආරම්පිත්තුළ්ළාර්කළ්. අන්ත ඌළෛකළෛක් කණ්ටු නාංකළ් ඕටි ඔතුංකප් පෝවතිල්ලෛ. ඒනෙන්රාල්, මක්කළ් ආණෛ එංකළුටෛය පක්කමිරුක්කින්රතු.

නේර්රෛය තිනම්කූට යාළ්ප්පාණත්තිල් නාංකළ් 17 පිරතේස චපෛකළුක්කුරිය වේට්පුමනුක්කළෛ මුන්වෛත්තිරුක් කින්රෝම්. අංකු එන්ත ඔරු චපෛයිලුම් එන්ත ඔරු නපරුම් නිරාකරික්කප්පටාත වේට්පුමනුක්කළ් වේරු යාරුටෛයතුමල්ල, තේසිය මක්කළ් චක්තියුටෛය වේට්පුමනුක්කළ් මාත්තිරමේ! අතනාල්, ඉම්මුරෛයුම් යාළ්ප්පාණත්තිල් නාංකළ් වෙර්රික් කොටියෛ නාට්ටප්පෝවතු තවිර්ක්ක මුටියාතෙන්පතෛක් කූරික්කොණ්ටු, අන්ත මක්කළුක්කු මීණ්ටුම් එංකළුටෛය නන්රියෛත් තෙරිවිත්තු, නිරෛවු චෙය්කින්රේන්. වණක්කම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[ප.ව. 3.53]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් ඉරාචමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
කෙරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්රෛය නිති, තිට්ටමිටල් මර්රුම් පොරුළාතාර අමෛච්චිනුටෛය කුළුනිලෛ විවාතත්තිල් කෙරව කටර්රොළිල්, නීරියල් මර්රුම් කටල් වළංකළ් අමෛච්චරුටෛය උරෛක්කුප් පින්නර් පේචක් කිටෛත්තමෛයිට්ටු මකිළ්ච්චියටෛකින්රේන්. කෙරව අමෛච්චර් උළ්ළූරාට්චි මන්රත් තේර්තලුක්කුත් තයාරාකිය නිලෛයිල් චිල කරුත්තුකළෛක් කූරිනාර්. කෙරව අමෛච්චරුක්කු නාන් චොල්ල වේණ්ටුම්, වට මාකාණම් යාළ්ප්පාණත්තිලුම්, කිළක්කිලුම් ඉලංකෛත් තමිළරචුක් කට්චියුටෛය වේට්පු මනුක්කළ් එතුවුම් නිරාකරික්කප් පටවිල්ලෛ. මන්නාරිල් මට්ටුම් ඔන්රු; අතර්කාක නීතිමන්රුක්කුච් චෙල්ලප් පෝකිරෝම්. තේසිය මක්කළ් චක්තියිනුටෛයතු මට්ටුමල්ල, ඉලංකෛ තමිළරචුක් කට්චියිනරාල් යාළ්. මාවට්ටත්තිල් තාක්කල් චෙය්යප්පට්ට අනෛත්තු වේට්පුමනුක්කළුම් ඒර්රුක් කොළ්ළප්පට්ටුළ්ළන. අතේපෝන්රු, නාංකළ් අනෛත්තුච් චපෛකළිලුම් ආට්චියමෛප්පෝම්. අතේනේරම්, තලෛවර් පිරපාකරන් අවර්කළුටෛය පෙයරෛක්කූට උච්චරික්කුම් අළවුක්කු වන්තුළ්ළීර්කළ් එන්පතෛයිට්ටු වාළ්ත්තුකිරෝම්. ඒනෙන්රාල්, නීංකළ් තේර්තලිල් වෙට්රිපෙර වේණ්ටුමෙන්පතර්කාක අවරුටෛය ඌරෛප් පර්රියුම් අවරෛප් පර්රියුම් චොල්ලියමෛක්කාක වාළ්ත්තුකින්රෝම්.

ආනාල්, වටක්කු, කිළක්කු මාකාණංකළුටෛය අපිවිරුත්තිච් චෙයර්පාටුකළ් වායළවිල් මට්ටුම්තාන් ඉරුක්කිරතේ තවිර, ඉතුවරෛයාන ආට්චික් කාලත්තිල් නීංකළ් ඉතුවරෛක්කුම් එතනෛයුම් චෙය්යවිල්ලෛ එන්පතෛයුම්

நாங்கள் சொல்லுகின்றோம். மிக முக்கியமாக, எங்களுடைய வட மாகாணத்திற்கு நீங்கள் எதுவும் செய்யவில்லை, செய்யப் போவதுமில்லை. அதனை மக்கள் உணர்ந்து விட்டார்கள். Batalanda Commission, Paranagama Commission, LLRC Report and Udalagama Commission அறிக்கைகளை பாராளுமன்றத்தில் சமர்ப்பித்த நீங்கள், கொல்லப்பட்ட தமிழ் மக்கள் பற்றி இந்தச் சபையில் ஒரு வார்த்தைகூட முன்வைக்கவில்லை. அமைச்சர் அவர்கள் சபையைவிட்டு ஓடிச் செல்கின்றார்.

අද දිනයේ අප විවාදයට ගන්නේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ නිසා විශේෂ කාරණා දෙකතුනක් ගැන අවධානය යොමු කරන්න මම කැමැතියි. මේ අය වැය දෙවන වර කියවීමේ විවාදය පටන් ගත් දින සිටම මම දිගින් දිගටම මේ ආණ්ඩුවෙන් ප්‍රශ්න කළා, බදු සහන දීම සහ බදු ගැසීම පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ගැන. අපි ඒ ගැන පැහැදිලිවම ඇහුවා. සිගරට් කොම්පැනියට විතරක් සියයට 56ක බද්දක් ගසා තිබෙනවා. අනෙකුත් productsවලට සියයට 90ක්, 100ක් වෙනකම් බදු ගසා තිබෙනවා. ඇයි, සිගරට් කොම්පැනියෙන් බදු අය කරගන්නේ නැත්තේ කියන ප්‍රශ්නය ඉතා පැහැදිලිව අපි ඇහුවා. ඒකට පිළිතුරු නැහැ. පසුගිය කාලයේ කිව්වා, සිගරට් කොම්පැනියෙන් පගා අරගත් ඇමතිවරුන් තමයි බදු ගහන්න දුන්නේ නැත්තේ කියලා. මේ ආණ්ඩුවත් එහෙමද දන්නේ නැහැ.

ඊට පසුව අපි ඇහුවා, පසුගිය රජය කාලයේ මහ පරිමාණ ව්‍යාපාරවලට බිලියන 964ක පමණ බදු සහන දීලා තිබුණා, මේ රජයෙන් කුඩා මිනිහාට බදු ගහන්නේ නැතුව අර බිලියන 964ක බදු නැවත අය කරගන්න මොනවා හෝ ක්‍රමවේදයක් තිබෙනවාද කියලා. ඒකටත් මොකුත් උත්තරයක් නැහැ. ඒ බදු සහනය එහෙමම දීලා තිබෙනවා. ඒ වාගේම මහජන බැංකුව, ලංකා බැංකුව වාගේ ඒවා අය කර නොගත් මුදල් - non-performing loans - තිබෙනවා, assets තිබෙනවා. ඒවා අය කරගන්නවාද කියලා පසුගිය කාලයේ අපි දිගටම ඇහුවා. මොකුත් සද්දයක් නැහැ.

හැබැයි, මේ ආණ්ඩුව හරහා පොඩි මිනිහාට සෑහෙන අපරාධයක් කර තිබෙනවා. කොහොම අපරාධයක් කර තිබෙනවාද කියලා කිව්වොත්, මේ වෙනකොට වැඩිහිටියන්ටත්, ඒ කියන්නේ අවුරුදු 60ට වැඩි කට්ටියටත් -මේ රටේ සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ටත්- අසාධාරණයක් කර තිබෙනවා. මා ළඟ ලිපියක් තිබෙනවා, වැඩිහිටි පුරවැසි සාමූහිකයෙන් නිකුත් කරපු. මේගොල්ලන් ඉල්ලීමක් කර තිබෙනවා, මේ Withholding Tax එක සියයට 10කට වැඩි කිරීම තුළින් වෙන අසාධාරණය සම්බන්ධව. මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාගෙනුත් ඇහුවා, එහෙම කරන්න පුළුවන්ද කියලා. ඒගොල්ලන් affidavit එකක් දුන්නොත් බදු ගහන්නේ නැහැ කිව්වා ලු. අර ගෝඨාභය රාජපක්ෂ, "මගේ වචනය තමයි circular එක" කිව්වා වාගේ කථාවක් තමයි මේකත්. Affidavit එකක් දීලා බදු ගෙවන්නේ නැතුව ඉන්න පුළුවන් කියලා කියනවා.

මේ තුළ ඇත්තටම වෙන්නේ මොකක්ද? මේගොල්ලන් බදු ගෙවන්නේ නැති අය කියලා නීත්‍යානුකූලව ඔප්පු කරන්න නම් ඒගොල්ලන් tax accountant කෙනෙක් hire කරගන්න වෙනවා. එතකොට මේ බදු ගහන එකටත් වඩා දෙයක් වෙන්නේ. ඒ Withholding Tax එක ගැහුවත්, නැතත් ඒ මුදල tax accountantට ගෙවන්න වෙන එකක් තමයි ඒකෙන් වෙන්නේ. දැන් ඒගොල්ලන් ඒ සම්බන්ධව ඉල්ලීම් කරලා තිබෙනවා. අද වනවිට සියයට 7ක් වාගේ සුළු පොලී අනුපාතයක් යටතේ ලැබෙන පොලී මුදලක් වෙනුවෙන් තමයි ඒ අය fixed deposits තියාගෙන ඉන්නේ. ඒකෙන් ලැබෙන සුළු මුදලින් තමයි ඒ කට්ටිය තමන්ගේ ජීවිත ගත කරන්නේ. පසුගිය කාලයේ තිබුණා වාගේ අඩුම තරමේ සියයට 15ක අනුපාතයක් හෝ මේගොල්ලන්ගේ තැන්පතු වෙනුවෙන් දෙන්න කියලා අපි දිගින් දිගටම ඉල්ලීම් කළා. මේ ආණ්ඩුව වැඩිහිටියන්ටත්, senior citizensලාටත් පහර දීලා මහා පරිමාණ සමාගම්වලට බිලියන 964ක බදු සහන දෙන ආණ්ඩුවක්; සිගරට් කොම්පැනියට බදු සහන දෙන ආණ්ඩුවක්. ඒක නිසා මේ ආණ්ඩුවේ ක්‍රියා කලාපය පිළිබඳව ජනතාව ඉතා අප්‍රසාදයෙන් සිටින බව පැහැදිලියි.

මේ ආණ්ඩුවේ සිටින comments ගහන මඩ බලකාය දැන් මේ වාගේ කථා සම්බන්ධයෙන් අපට විරුද්ධව comments ගහයි; දිගටම පුළුවන් තරම් comments ගහයි. මේ comments බලකාය මෙහෙයවන අයට එක දෙයක් කියන්න ඕනෑ. මම දැක්කා පසුගිය කාලයේ හාමුදුරු නමක් කියා තිබුණු එකකටත් comments බලකාය comment එකක් දමා තිබුණා. එකම comment එක ගහන්නේ. මට ගහන එකම තමයි ඒ ස්වාමීන් වහන්සේට විරුද්ධවත් දමන්නේ. ඒක නිසා මේ comments බලකාය තියාගෙන තව කොච්චර කල් යන්න පුළුවන්ද කියලා බලමු.

අද දින මුදල් අමාත්‍යාංශය යටතේ තව කාරණයක් ගැන කථා කළ යුතුයි. පසුගිය කාලයේ දේශපාලන වේදිකාවලදී කිව්වා, ගිය ආණ්ඩුවෙන් දීලා තිබෙන බාර් පර්මිට් cancel කරනවා කියලා. පසුගිය ආණ්ඩුවෙන් පගා හැටියට දීලා තිබුණු බාර් පර්මිට් 172න් 150ක් තවම තිබෙනවා. ජනාධිපතිවරයා බලයට ඇවිල්ලා මාස 6ක් වෙනවා. මුදල් අමාත්‍යාංශයෙන් තමයි මේවා ලබා දුන්නේ. මේවා දේශපාලනයට දුන් අල්ලස් කියලා කිව්වේ. 1926 Excise Ordinance එක යටතේ සඳහන් කර තිබෙනවා, යම් ප්‍රදේශයක වයස අවුරුදු 18ට වැඩි 10,000ක් ඉන්නවා නම් තමයි බාර් පර්මිට් එකක් දෙන්න පුළුවන් කියලා. කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ඉන්නේ ඡන්ද දායකයන් 94,000යි. හැබැයි, කිලිනොච්චි දිස්ත්‍රික්කයට බාර් පර්මිට් 17ක් දීලා තිබෙනවා. එහෙම බැලුවොත් 5,000කට එකක් වෙන්න තිබෙනවා. වයස අවුරුදු 18ට වැඩි 10,000ක් ඉන්නවා නම් තමයි දෙන්න පුළුවන්. ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමනි, මේ වාගේ දේවල් සම්බන්ධයෙන් කටයුතු කළා නම් හොඳයි, උතුර ගැන බොරු කිය කියා ඉන්නේ නැතුව.

ඒ වාගේම මෙන්ඩිස් සමාගමටත් දීලා තිබෙනවා. නිෂ්පාදනය - manufacturing - සිදු කරන companiesවලට බාර් පර්මිට් දෙන්න බැහැ කියලා 1926 Excise Ordinance එකේ තිබෙනවා. හැබැයි, මෙන්ඩිස් සමාගමට දීලා තිබෙනවා. ඇමතිවරුන් ඇවිල්ලා මේ මෙන්ඩිස් සමාගම ගැනත් කථා කළා. ඒ වාගේම තමයි, ද ෆිනෑන්ස් ආයතනය සම්බන්ධවත් විශාල ගැටලුවක් තිබෙනවා. ද ෆිනෑන්ස් ආයතනයේ මුදල් තැන්පත් කරපු 6,400දෙනෙකුගේ මුදල් තවම නැවත ලබා දීලා නැහැ. හැබැයි, 2019 ජනවාරි මාසයේදී Central Bank එකෙන්ම තමයි කිව්වේ, depositorsලාට මේකේ සල්ලි තැන්පත් කරන්න කියලා. මිලියන 1,000ක්; බිලියනයකට ආසන්න ප්‍රමාණයක් ද ෆිනෑන්ස් ආයතනයේ තැන්පත් කළාට පසුව එම ආයතනය නැවත වාරයක් liquidate කර තිබෙනවා. මේ වෙනකොට 6,400කට වැඩි පිරිසක් ඉන්නවා, ද ෆිනෑන්ස් ආයතනය නිසා affect වෙච්ච. අපි ඇත්තටම බලාපොරොත්තු වුණේ, මේ ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයෙන් මෙන්න මේ දේවල් සඳහා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගනියි කියලායි. නමුත් එහෙම කරලා නැහැ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පාර්ලිමේන්තුවේ සිටින කැබිනට් ඇමතිවරයෙකු සම්බන්ධයෙන් තිබෙන වංචා, දූෂණ චෝදනා පිළිබඳව මම දිගින් දිගටම මතු කළා. ඒකට පිළිතුරු දෙන්න කියලා මම සාධාරණ කාලයක් දුන්නා. ආණ්ඩුව කිව්වා, එවැනි කවුරු හරි ඉන්නවා නම් පරීක්ෂණ පවත්වලා ඒ අයව ඉවත් කරනවා කියලා. Discipline ගැන කථා කරන්න කැමති ඇමතිවරු මේ ආණ්ඩුවේ ඉන්නවා නේ.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

මේ පිළිබඳව මට ඒ ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න තිබෙනවා. 2004දී අනුර කුමාර දිසානායක මැතිතුමා Minister of Agriculture හැටියට ඉන්නකොට පත්වීම් 3ක් දීලා තිබෙනවා. ඉන් එකක්, Procurement Manager. ඒක දීලා තිබෙන්නේ ජයකොඩි කියලා මහත්මයෙකුට. අනෙක් පත්වීම HR Manager. ඒක දීලා තිබෙන්නේ මල්ලිකාරච්චි කියලා මහත්මයෙකුට. අනෙක් පත්වීම Technical Manager. ඒක දීලා තිබෙන්නේ දිසානායක කියලා මහත්මයෙකුට. 2015 වෙනකොට මේ HR Manager interdict වෙලා තිබෙනවා. 2012-2013 කාලය තුළ පොහොර සංස්ථාව ඇතුළේ පාරක් හදන්න රුපියල් මිලියන 40කට වැඩි කොන්ත්‍රාත්තුවකට tender කරලා තිබෙනවා. ඒ tender procedure එක අනුව, advanced payment bond එක සියයට 20ක් ලබා ගන්නවා නම්, contract period එක සහ මාසයක් යනකම් bank guarantee එකක් දෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ Procurement Manager, එක මාසයක bank guarantee එකක් එක්ක මේ contract එක දීලා තිබෙනවා. ඊට පස්සේ ඒ contract එක හරියට කරන්නේ නැතිව එයා පැනලා ගිහිල්ලා තිබෙනවා. මේ සිද්ධියට සම්බන්ධ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ඉන්නවා. ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

සම්බන්ධයෙන් තිබෙන මේ සිද්ධියට අදාළව මම අහන්න කැමැතියි, ඒක ඇත්ත ද, බොරුද කියලා. මේක ඇත්ත නම් එයාට වහාම ඉල්ලා අස්වෙන්න කියන්න. පසුව මේ පුද්ගලයාව interdict කරලා තිබෙනවා. ඊට පස්සේ එයා ගිහිල්ලා තිබෙනවා Labour Tribunal එකට. එයා 2015-2016 කාලයේ තමයි Labour Tribunal එකකට ගිහිල්ලා තිබෙන්නේ. Labour Tribunal එකේදි මේ case එක reject වෙලා තිබෙනවා. ඊට පස්සේ එයා ඉල්ලා අස්වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ රජයට රුපියල් මිලියන 40ක පාඩුවක් කරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ඉන්නවා. ඔබතුමන්ලා ඒක පිළිගන්නවා ද, නැද්ද? පිළිගන්නේ නැත්නම් ඒ සම්බන්ධයෙන් නිදහසට කරුණු ඉදිරිපත් කරන්න. නැත්නම්, ඒ පුද්ගලයාට ඉල්ලා අස්වෙන්න කියන්න. මොකද, JVP එක කියන්නේ හොරකම් කරලා පුරුදු නැති උදවිය නොවෙයි. ධර්මන් වික්‍රමරත්න මහත්මයාගේ පොතේ තිබෙනවා ඔබතුමන්ලා කරපු හොරකම් ගැන.

නුවර, දිගන බැංකුවකින් මුදලින් රුපියල් ලක්ෂ 60ක් සහ කිලෝ 54ක රත්තරන් බඩු හොරකම් කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ඔක්කෝම 1989 කාලයේ සිදු වුණු දේවල්. මොරටුව, කටුබැද්ද ලංකා බැංකුවෙන් රුපියල් ලක්ෂ 60ක රන් භාණ්ඩ සහ මුදලින් රුපියල් ලක්ෂ 82ක්, ඒ වාගේම වැල්ලවත්ත මහජන බැංකුවෙන් මුදලින් රුපියල් ලක්ෂ 222ක රන් භාණ්ඩ හොරකම් කරලා තිබෙනවා. මේ බලන්න, 1989 සිට JVP එක කරලා තිබෙන දේවල්. මේ ධර්මන් වික්‍රමරත්නගේ පොතේ ඒ දේවල් තිබෙනවා. මම මේකේ කොපියක් දෙන්නම්. ඒ කියන්නේ, මේ හොරකම් කරලා පුරුදු නැති අය නොවෙයි නේ. අන්න ඒ නිසා තමයි මෙවැනි පැහැදිලි චෝදනාවක් ඉදිරිපත් කළේ. Discipline ගැන කථා කරන, වංචා දූෂණ නවත්වන්න කියලා බලයට ආපු ආණ්ඩුව මෙන්න මේවාටත් පිළිතුරු දෙයිද? මේ හොරකම් නවත්වයිද? ඒ මොනවත් නවත්වන්නේ නැහැ. ජනතාව ඇන්දීමක් තමයි සිදු වුණේ. ඒ නිසා ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී මේ රටේ ජනතාව මේ ආණ්ඩුවට හොඳ පාඩමක් උගන්වයි කියන එක මම මතක් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

මම සභාවේ හිටපු නැති වෙලාවේ වටගල නියෝජ්‍ය ඇමතිතුමා ඇවිල්ලා මම අසත්‍යයක් කියපු බව කියලා තිබෙනවා. දේශබන්දු සහ සෙව්වන්දි ඉන්න තැන් පිළිබඳව එතුමන්ලා ළඟ තොරතුරු තිබෙනවා, අවශ්‍ය වෙලාවට ඒ අයව අත්අඩංගුවට ගන්නම් කියලා එතුමා කියපු recording එක ඇතුළත් CD එක මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කරුණාකරලා මේ කරුණු ලියලා හරි කමක් නැහැ, හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න. මගේ ළඟ ඒ ප්‍රකාශය තිබෙනවා. ඕනෑ නම් මට ප්‍රචාරය කරන්න පුළුවන්. නමුත් මම ප්‍රචාරය කරන්නේ නැහැ, සාම්ප්‍රදායිකව අපි එහෙම කරන්නේ නැති නිසා. ඒ නිසා කරුණාකරලා මේකේ තිබෙන කරුණු හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා මම ඉල්ලනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 4.03]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වැඩිපුර කාලයක් දෙන්න පුළුවන් කියලා මහ ලේකම්තුමිය දැනුම් දුන්නා, කරීකයන්ගේ අඩුකමත් එක්ක. නමුත් ඒක ඔබතුමා තීරණය කරන්න කාලයත් එක්ක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ ජනතාවාදී ආණ්ඩුවේ පළමුවැනි අය වැය විවාදයේ අවසාන දවස අද. අද මේ අය වැය සම්මත වීමට නියමිතව තිබෙනවා. මගේ දැනීමේ හැටියට ගරු ජනාධිපතිතුමාත් මේ සභාව ඇමතීම සඳහා පැමිණීමට නියමිතව තිබෙනවා. ජනතාව දුන් ජන වරමට අනුව අපි අපේ පළමුවැනි අය වැය සමඟ හෙට උදේ ඉඳලා අපේ ගමන පටන් ගන්නවා. අපේම වූ වැඩ පිළිවෙළක්, අපේම වූ වැඩසටහන් වැඩි ප්‍රමාණයක් සහිත අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

මේ අය වැය පිළිබඳව ඉතාම සාධාරණව, තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා හිටියා. අපි ස්තුතිවන්ත වෙනවා, එතුමන්ලාගේ ඉතාම සාධාරණ, විවේචනාත්මක අදහස් දැක්වීම්වලට. ඒ වාගේම වෙනස් වෙන්න බැරි කණ්ඩායමකුත් ඉන්නවා. අපි මොකක්ද කරන්නේ කියලා තේරුම් ගන්න බැරිව එතුමන්ලා දිගටම එකම තැන ළ තැවෙන එක ගැන අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳව ඔබතුමන්ලා යම් කිසි තීරණයක් ගන්නවා නම්, ඒ ගැන දැනුම් දුන්නොත් ඊට අනුව අනිවාර්යයෙන්ම මගේ කථාව ලෑස්ති කර ගන්නම්. නමුත් මම හිතුවා, මූලික අදහස් ප්‍රමාණයක් මෙසේ ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, political literatureවල තිබෙනවා, English literatureවලත් තිබෙනවා, Frequently Asked Questions, FAQs - "නිතර අසන ප්‍රශ්න" - කියලා දෙයක්. සමහර ආයතන ගැන, සමහර කාරණා ගැන නිතර අසන ප්‍රශ්න තිබෙනවා. අපේ මේ විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා ගැන මට කියන්න තිබෙන්නේත් ඒ වාගේ දෙයක්. ඒ නිසා මම ඇත්තටම ඒක වෙනස් කරනවා, "නිතර අසන ප්‍රශ්න" නොවෙයි, "නිතර ගසන මඩ" - Frequently Slung Mud, FSM - කියලා. එතුමන්ලා නිතර ගසන මඩ කිහිපයක් ගැන මේ අවස්ථාවේ කථා කරන්න මම හිතුවා. මොකද, එතුමන්ලා හිතනවා, ලොකු ප්‍රචාරක වැඩසටහනකින් - propaganda campaign එකකින් - යම් මත ටිකක් තහවුරු කරන්න පුළුවන් කියලා. ඒකේ පළමුවැනි එක තමයි, "ආණ්ඩුවේ කයිය විතරයි වැඩ නැහැ" කියන එක. ඒක මම හිතන විධියට, ඒක අපේ ආණ්ඩුව බලයට පත්වුණු දවසේ ඉඳලාම කියන දෙයක්. ඒක සමහරු දැන් වෙනස් කරගෙන තිබෙනවා. අපි දැක්කා, සමහර මන්ත්‍රීතුමන්ලා අත්දැකීම් තුළ ඉගෙනගෙන ආණ්ඩුව අගය කරලා කථා කළා; ආණ්ඩුවේ තිබෙන හොඳ දේවල් ගැන කථා කළා. තව පිරිසක් ඉන්නවා, හීනයක ජීවත් වෙන. එතුමන්ලා ඒ හීනයේ ඉඳගෙන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා කරන විවේචන ඇහුවාම, අපි වුණත් සමහර වෙලාවට තිගැස්සෙනවා අපි එච්චර වැරදි කරලා තිබෙනවාද කියලා. නමුත් මේ සභාවෙන් එළියට ගිහිල්ලා මේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ඉන්න සේවක මණ්ඩලය හමු වුණාම, සමහර විට පාරට ගියාම, ගමට ගියාම එහෙම දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් මෙතැනදී අපට හිතෙන්නේ, අපි විශාල ලෙස වැරදි කරලා තිබෙනවා කියලායි.

හැබැයි, එළියට ගියාම එහෙම එකක් නැහැ. ඒ නිසා frequently mud slinging කණ්ඩායමට මම කියන්න කැමැතියි, ඔබතුමන්ලා කරන විවේචන පිළිබඳව ඔබතුමන්ලාට කනගාටු වෙන්න වෙයි කියලා. ඔබතුමන්ලා කරන හැම විවේචනයකටම අපි මොකක්ද කරන්නේ? ඔබතුමන්ලා කියන දෙයක් තමයි, අපේ කයිය විතරයි, වැඩ කරන්නේ නැහැ කියන එක. එතකොට අපි මොකක්ද කරන්නේ? අපි තව වැඩිපුර වැඩ කරනවා. අපි තව වැඩිපුර වැඩ කළාම ඔබතුමන්ලාට "සොරිම" වෙනවා. ඒ නිසා අප එච්චර motivate කරන්න එපා. මොකද එතකොට ඔබතුමන්ලාට ඇඩ්‍රස් නැති වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද අපි කණ්ඩායමක් හැටියටයි වැඩ කරන්නේ. අපි සැලැස්මකටයි වැඩ කරන්නේ. අපි දැනුත් මහන්සි වෙලා වැඩ කරනවා, අපේ නිලධාරි මහත්වරුත් එකතු කරගෙන. නමුත්, මේ කරන අසාධාරණ චෝදනා ඇහුණාම මටයි, අගමැතිතුමියටයි පුදුම හිතුණා. මම කලින් අවස්ථාවකත් මේක කිව්වා. අපට මේ සමහර විවේචන ඇහෙද්දී, ඇත්තටම මෙච්චර බැණුම් අහන්න මොකක්ද අපි කරලා තිබෙන වැරැද්ද කියලා හිතෙනවා. ඒ නිසා ඔබතුමන්ලා දිගටම මඩ ගහගෙන ඔබේ සිහිනයේ ඉන්න, අපි ඉස්සරහට යනවා කියන එක මම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කයිය විතරයි වැඩ නැහැ" කියන එකට අපි කරපු වැඩ ටිකක් මම උදාහරණ විධියට කියන්න ඕනෑ නේ. මේ රටේ සෑම ආණ්ඩුවක්ම පාලම්, බෝක්කු හදලා තිබෙනවා, පාරවල් හදලා තිබෙනවා, ඉස්කෝල පොත් දීලා තිබෙනවා, රාජ්‍ය සේවකයන්ට පඩි දීලා තිබෙනවා, විවිධ ආණ්ඩු පඩි වැඩි කරලාත් තිබෙනවා. හැබැයි, පසුගිය 76 අවුරුද්දටම කරන්න බැරි වුණු දෙයක් තමයි, -විශේෂයෙන්ම අන්තිම අවුරුදු 50, 60 තුළ- හොඳ දේශපාලන සංස්කෘතියක් හදන එක. එ් කියන්නේ කිසිම ආණ්ඩුවකට කරන්න බැරි වුණු දෙයක් තමයි, ඥාති සංග්‍රහය අවසන් කිරීම. ඔබතුමාත් දන්නවා, මේ පාර්ලිමේන්තුවේ කථානායකතුමෙක් හිටියා, එතුමාගේ හත්මුතු පරම්පරාවම මෙතැන හිටියා. ඒ වාගේම රාජපක්ෂලා ඔක්කෝම වාගේ මෙතැන හිටියා. "රාජපක්ෂ" නාමය කොහේ හෝ ගෑවිලා තිබෙනවා නම්, බලංගොඩ මානවයාගේ ඉඳලාම connections හොයාගෙන ඒ ඔක්කෝම රාජපක්ෂලාට තනතුරු දීලා තිබුණා.

නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඇමති මණ්ඩලයට ඥාතීන් පත් කරලා නැහැ. ජනාධිපතිගේ, අගමැතිතුමියගේ, ඇමතිවරුන්ගේ, නියෝජ්‍ය ඇමතිවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අපි කිසිම ඥාතියෙක් පත් කරලා නැහැ. අපි තානාපති සේවයට ඥාතීන් පත් කරලා නැහැ. සංස්ථාවලට දහදහස් ගණනක් -අනුර කරුණාතිලක ඇමතිතුමා හරිම ඉලක්කම දන්නවා- විතර තිබෙනවා, appoint කරන්න. නමුත්, අපි කිසිම ඥාතියෙකු පත් කරලා නැහැ. සමහර විට සුදුසුකම් තිබුණත් ඥාති නිසා පත් කරලා නැහැ. අපි ඔන්න, කයිය වෙනුවට වැඩ කරපු හැටි! ඔබතුමන්ලාට 76 අවුරුද්දක් තිස්සේ මේ ගැන හිතන්න බැරි වුණා.

අපට කාලය කා දමන්න බැරි නිසා ඔබතුමන්ලාගේ සමහර අයගේ තොරතුරු හොයන්න යන්නේ නැහැ. හැබැයි, හෙව්වොත් අපට තොරතුරු හම්බ වෙනවා, කොහොමද ඒ අය ඔබතුමන්ලා සම්බන්ධ වෙලා තිබෙන්නේ කියලා. නමුත් ඒ ගැන වචනයක් කියන්නේ නැහැ. ඒක තමයි 76 අවුරුද්දක් තිස්සේ කරන්න බැරි වුණු දේ. අපට ඉස්කෝලේ යාළුවෝ නැද්ද? අපට ඥාතීන් නැද්ද? අපේ පාක්ෂිකයෝ නැද්ද? ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේ

[ගරු බිමල් රත්නායක මහතා]

අනුරාධපුර දිස්ත්‍රික්කය. ඔබතුමාට මිත්‍ර විශ්වවිද්‍යාල උගතුන් කොයි තරම් නම් ඇත්ද? නමුත්, ඔබතුමා ඒ අයට තනතුරු දීලා තිබෙනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාටවත් හිතන්න බැරි දෙයක් අපි කරලා තිබෙනවා. තව අවුරුදු 25කටවත් මේගොල්ලන්ට ඒ දේ කරන්න බැහැ. ඒ මොකක්ද? ඥාති සංග්‍රහයෙන් තොර රාජ්‍ය පාලනයක් කරනවා නම්, ඒ අනුර දිසානායක සහෝදරයාගේත්, හරිනි අමරසූරිය අගමැතිතුමියගේත් නායකත්වයෙන් යුතු මේ ආණ්ඩුව විතරයි ඒක කරන්නේ. අපි අභියෝග කරලා කියනවා, ඔබතුමන්ලාට ප්‍රාදේශීය සභාවකවත් එහෙම කරන්න බැහැ කියලා. වැරදිලාවත් ඔබතුමන්ලා කොහේ හෝ එක ප්‍රාදේශීය සභාවක්, කණා ඟොට් එකකට හරි මැදවිච්චිය වාගේ අපි reject වෙච්ච තැනක් දිනුවොත් ඔබතුමන්ලාට ඥාති සංග්‍රහයක් නොකර ඉන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තනතුරු දීලා තිබෙන්නේ සුදුසුකම් මත. කයිය විතරයි වැඩ නැහැ කියලා කිව්වාට, මේ ආණ්ඩුවේ නාස්තිය අවම කිරීම ගැන මේගොල්ලන් එක වචනයක් කියනවාද? ආණ්ඩුවේ නාස්තිය අවම කිරීම ගැන වචනයක් කියන්නේ නැහැ. ඒවා තමයි රටේ තිබුණු ප්‍රධාන ප්‍රශ්න. අනික, ජනතාව අපට ඡන්දය දීලා තිබෙන්නේ මාස 60කට. මාස 60කට අපි පත් වෙලා තිබෙන්නේ. මාස 4න් ඔක්කෝම කළාම ඉතිරි මාස 56 තුළ මොනවාද අපි කරන්නේ?

Snooker ගහන්නද? දැන් අප වැඩිපුර twenty-twenty කරන්න එපා, ඔබතුමන්ලාට සොරි වෙනවා. තවමත් මේ පාර්ලිමේන්තුව පත් වෙලා මාස හතරයි. ජනාධිපතිතුමායි, අගමැතිතුමියයි, විජිත හේරත් ඇමතිතුමායි පත් වෙලා මාස දෙකක ආණ්ඩුවක් තිබුණේ. ඒකට Government කියලා කිව්වාට, basically ගත්තාම full functioning Government එකක් නොවෙයි. ඇත්තටම ගත්තොත් පාර්ලිමේන්තුව පත් වෙලා තවම මාස 4යි. අපි මේ කාලය තුළ ආණ්ඩුවේ නාස්තිය අවම කරලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරියගේ පෙර පැවැති සන්දර්ශනාත්මක ප්‍රභූ ආරක්ෂක ක්‍රම ඔක්කෝම අපි නතර කරලා තිබෙන බව. ඒ ගැන වචනයක් කියන්න ධෛර්යයක් ඔබතුමන්ලාට නැහැ නේ. ඇයි, හොඳ දේට හොඳයි කියන්න බැරි?

ඔබතුමන්ලාගේ හිටපු සමහර ඇමතිවරු ගැන මම යුද්ධය පැවති කාලයේදීත් මේ ගරු සභාවේදී ඇති තරම් කියලා තිබෙනවා. ඕනෑ නම් මම නමින්ම කියන්නම්. ඒ එක්කෙනෙක් තමයි, එස්.එම්. චන්ද්‍රසේන. අපේ සුසන්ත මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා. එස්.එම්. චන්ද්‍රසේන මාවිල්ආරුවේ කරපු හොරකමක් ළඟදී අහු වුණා නේ. ඒගොල්ලන් යුද්ධයෙන් පසුවත් කොහොමද ගියේ? යුද්ධයෙන් පසුවත් ඒගොල්ලන් ගියේ දෙපැත්තෙන්ම STFලා යොදාගෙන. මම යුද්ධය පැවති කාලයේදීත් කියලා තිබෙනවා, මූලතිව්වලට නිකම් ඇවිදගෙන ගියත්, LTTE එකෙන් ඒ වාගේ ගැරඩින්ට මොකුත් කරන්නේ නැහැ කියලා. හැබැයි, එහෙම තමයි ඒගොල්ලන් ගියේ. අද අපේ කිසිම කැබිනට් ඇමතිවරයෙක් කිසිම පොලිස් ආරක්ෂකයෙක් අරගෙන නැහැ. ඇයි තමුන්නාන්සේලා ඒ ගැන කියන්නේ නැත්තේ? අමාත්‍යාංශ 24, 21ට අපි අඩු කරලා තිබෙනවා.

ඔබතුමන්ලාගේ පක්ෂයේ සභාපතිතුමා ළඟදී අස් වුණා. ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා තියා ගන්න බැරි නම් ඔය පක්ෂයේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය මොකක්ද? ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා අයින් වුණේ ඇයි කියලා කවුරුත් දන්නවා. බලන්නකෝ අපි ගැන. අමාත්‍යාංශ 24, ඇමතිවරු 21යි. ඒවා කර ගන්න බැරිව තිබුණු දේවල්. නමුත්, අපි ඒවා කරලා තිබෙනවා. අපි කයිය විතරක් නොවෙයි, වැඩත් කරලා පෙන්වා තිබෙනවා.

ඒ වාගේම මැතිවරණ ව්‍යාපාරවලදී රාජ්‍ය දේපළ භාවිත කිරීම පිළිබඳවත් මම කියන්න කැමතියි. ඔබතුමා දන්නවා, මහ මැතිවරණයේදී අපට ඕනෑ හැටියට ඒවා පාවිච්චි කරන්න තිබුණා කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, අපි එහෙම පාවිච්චි කළේ නැහැ. ඒවා ඔබතුමන්ලාට කර ගන්න බැරි වෙච්ච දේවල්. ඒවා තමයි අමාරු වැඩ. Tax අඩු-වැඩි කරනවාට වඩා අමාරුයි, එවැනි සංස්කෘතියක් හදන එක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. Tax අඩු-වැඩි කරන එක සමහර විට යම් ආකාරයක technical තීන්දුවක්. එතැනදී පොඩි පොඩි consequences එන්න පුළුවන්. අපේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිහාල් අබේසිංහ මහතා, නිහාල් ගලප්පත්ති මහතා අපේ පක්ෂය වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරලා වැඩ කරපු මිනිස්සු. නමුත්, අපි එතුමන්ලාට ඇමතිකම් දීලා නැහැ. හැබැයි, ඒ ගැන එතුමන්ලාගේ කෙදිරියක් තිබෙනවාද? නමුත්, පොඩ්ඩ බැරි වෙනකොට ඔබතුමන්ලාගේ කට්ටිය upset යනවා. ඒ නිසා මම කියන්න කැමතියි, අපි එවැනි දේවල් කරලා තිබෙන බව.

ඒ වාගේම අපි රාජ්‍ය දේපළ අවභාවිත කරලා නැහැ. ජනාධිපති මන්දිර හා අගමැති බංගලා ආර්ථික වශයෙන් ඵලදායී කාර්යයන්ට අපි යොමු කරනවා. ඔබතුමන්ලා මේ ගරු සභාවේදී කිව්වා, අපි වාහන ෂෝ එකක් කරනවා කියලා. ඒ වාහන වෙන්දේසි කරලා රුපියල් මිලියන 800ක්ද කොහේද ගන්නයි හදන්නේ. මම හරියටම ඒ ගණන කීයද කියලා කියන්න දන්නේ නැහැ. කෙසේ හෝ ඒ වාහන විකුණන්න දැන් පටන් අරගෙන තිබෙනවා. මගේ දැනීමේ හැටියට මේ පාර්ලිමේන්තුවේත් කථානායකතුමාට වාගේ අයට වෙන් කරලා තිබෙන ඉහළ මට්ටමේ වාහන වෙන්දේසිය පටන් අරගෙන තිබෙනවා. ඔබතුමන්ලා හිතලාවත් තිබුණාද ඒ වාගේ දේවල් කරන්න?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හිටපු ජනාධිපතිවරුන්ගේ සේවයට අනුයුක්ත කරලා තිබුණු ආරක්ෂකයන් අපි ඒ ආරක්ෂක නියාමනය අනුව අඩු කරලා තිබුණා. ඒ ගැන දමපු නඩු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අහන්නේ නැතිවම එළියට දැම්මා. අපි මන්ත්‍රීවරුන්ට දීලා තිබුණු තීරු බදු රහිත වාහන බලපත්‍ර ලබා දීම නතර කළා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ඒ සඳහා ඉදිරියේදී පනතක් ගෙනෙන්න. Chitrasiri Committee එකේ වාර්තාව ඇවිල්ලා තිබෙනවා, මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කරන්න. ඒවා අපේ තීරණ. ඒවා ඔබතුමන්ලා කවදාවත් කරපුවා නොවෙයි. ඒ වාගේම ජාතිවාදී දේශපාලනයට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම අපි අවසන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ ඉන්න එක්කෙනෙකුට වැලඳිලා තිබෙන රෝගය මොකක්ද කියන්න මම දන්නේ නැහැ. 2005-2009 කාලයේ ලංකාවේ පැවැති යුද්ධය අවසන් කරන්න යම් ආකාරයකට අපේ යම් සම්බන්ධයක් තිබුණා. අපි රට බෙදීමට විරුද්ධ වෙනවා වාගේම, යුද්ධයේ අපේ භූමිකාව පිළිබඳ ස්වයං විවේචනාත්මකව හැරිලා බලපු පක්ෂයක්. 2009 අවුරුද්ද වෙනකොට අපට රාජපක්ෂලා සහ ඒ ක්‍රමය තිත්ත වෙලා තිබුණේ. අපට ඉතා වේගයෙන් එතැනින් අයින් වෙන්න ඕනෑකම තිබුණා. හැබැයි, 2005දී රටේ තිබුණු විශේෂ තත්ත්වය නිසා අපි කොන්දේසි සහිතව විපක්ෂයේ සිටීමින් රාජපක්ෂට සහයෝගය දක්වන්න තීන්දු කරනකොට, රාජපක්ෂලා අද මේ කරලා තිබෙන පව් කන්දරාව එතරම් කරලා තිබුණේ නැහැ. හැබැයි, කවුරුන් හෝ කෙනෙක් 2009 අවුරුද්දෙන් පසුව රාජපක්ෂලාට සම්බන්ධ වෙනවා නම්, 2010 අවුරුද්දෙන් පස්සේ රාජපක්ෂලාට සම්බන්ධ වෙනවා නම්, ඒ පක්ෂයට සම්බන්ධ වෙනවා නම් ඒගොල්ලන් ගැන වෙනම හොයන්න ඕනෑ.

එහෙම කෙනෙක් තමයි අද විපක්ෂය පැත්තේ එක කෙළවරක ඉඳගෙන කථා කළේ.

ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා නම් හොඳයි. අපේ මන්ත්‍රීතුමන්ලාට දැන් බැණලා ගිය ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ මන්ත්‍රීතුමා කවුද? මම එතුමාගේ නම කියන්නේ නැහැ. මොකද, ඊට පස්සේ එතුමා නම පාවිච්චි කළා කියලා කථා කරන්න අවස්ථාව ගන්නවා නේ. කවුද ඒ? ඒ තමයි, 2012, 2013 කාලයේ නිල් බලකායේ තනතුරු ගත්ත පුද්ගලයෝ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ, කැතයි නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සාධාරණ දෙමළ මිනිහෙකුට රාජපක්ෂලාත් එක්ක යන්න පුළුවන්ද, 2010 අවුරුද්දෙන් පස්සේ? එහෙම යන්න පුළුවන් පිල්ලෙයාන්ටයි, කරුණාටයි. පිල්ලෙයානුයි, කරුණායි එක්ක ගිය කෙනෙක් තමයි එතුමා. ඔබතුමන්ලා දන්නවා, පසුගිය ජනාධිපතිවරණයට කලින් රනිල් වික්‍රමසිංහ -"crashed Ferrari" - විපක්ෂයේ මන්ත්‍රීවරු බාගන්න දිස්ත්‍රික් සංවර්ධන අරමුදලින් රුපියල් මිලියන 500, 600, 700 බෙදපු බව. මම හිතන විධියට, සජබයේ සමහර මන්ත්‍රීවරුන්ටත් ඒ මුදල් ලැබුණා, සමහරුන්ට ලැබුණේ නැහැ. වික්‍රමසිංහට බාගන්න පුළුවන් ජාතියේ කට්ටියට ඒ මුදල් ලැබුණා. සමහරුන්ට ලැබුණේ නැහැ. පොඩි ගණන් නොවෙයි, රුපියල් මිලියන 600ක් තමයි ඒ විධියට ලැබුණේ.

මම ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි, ඔය කථා කරලා ලොකුවට කෑ ගහපු මන්ත්‍රීතුමාට රුපියල් මිලියන 600 ගණනක් රනිල් වික්‍රමසිංහ දුන්නේ නැද්ද කියලා. ඔබතුමාටත් ලැබුණාද ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමනි? නැහැ, ලැබුණේ නැහැ. ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමාට ඒ මුදල් ලැබුණේ නැහැ. ශ්‍රීනේසන් මන්ත්‍රීතුමාට ලැබුණේත් නැහැ. ඒ මුදල් ලැබුණා, දැන් කෑ ගහපු මන්ත්‍රීතුමාට. එතුමා, 2013 අවුරුද්දේ රාජපක්ෂලාත් එක්ක ගිය කෙනෙක්. ඒ වාගේම 2023 අවුරුද්දේ රනිල් වික්‍රමසිංහලාත් එක්ක ගිය කෙනෙක්. එතුමා දැන් ඇවිල්ලා අපේ සදාචාරය ගැන ප්‍රශ්න කරනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. ඉලංගෙයි තමිළ් අරසු කච්චි කියන්නේ, මේ රටේ ඉතාම ප්‍රබුද්ධ දේශපාලනඥයන් නිර්මාණය කරපු පක්ෂයක්. නමුත් හැම පැත්තටම විකිණිච්ච ඒ වාගේ මන්ත්‍රීවරු ඇත්තටම හොඳ පොහොට්ටුවට. රාජපක්ෂ අවතාරයක් තමයි ඉලංගෙයි තමිළ් අරසු කච්චි එකේ ඒ ඉන්නේ. කිසි quality එකක් නැහැ. මූලාසනයේ සිටින ඔබතුමාත් දන්නවා, රවිරාජ් හිටපු මන්ත්‍රීතුමන්ලා යුද්ධය කාලයේදී මෙතැන වාද කරලා තිබෙන බව. යුද්ධය තිබෙද්දී, දෙපැත්තේ මිනිස්සු සිය ගණන් මැරෙද්දී මෙතැන අපි කථා කරලා තිබෙනවා. අපි, විපක්ෂය පැත්තේ සිටියේ. අපි කවදාවත් මූලාසනයට ඒ විධියට කථා කරලා නැහැ. දැන් අන්තිම third-class එකට ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂය පත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බාර් පර්මිට් ගැන කිව්වා. බාර් පර්මිට් ගැන හෙළි කළේ අපි. රනිල් වික්‍රමසිංහ බාර් පර්මිට් දෙනකොට එතුමාට රුපියල් මිලියන 600ක් දුන්නා. බාර් පර්මිට් එකක් කීයද කියන්න මම දන්නේ නැහැ. බාර් පර්මිට් එකක් කීයද, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි? සාමාන්‍යයෙන් රුපියල් මිලියන 100ක් පමණ වෙනවාද? *[බාධා කිරීමක්]* එතුමා බොන්නේත් නැහැ, දන්නේත් නැහැ ලු. මම දන්නේ නැහැ, බාර් පර්මිට් එකක් කොච්චර ගණනකට විකුණන්න පුළුවන්ද කියලා. කොහොම හරි බාර් පර්මිට් එකට වඩා වැඩි ගණනක් "Ferrariගෙන්" ගත්ත කෙනෙක් තමයි එතුමා. ඒ වාගේ third-class කට්ටිය තමයි අපේ ජයකොඩි ඇමතිතුමා විවේචනය කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, ඒ සිද්ධිය. අපි ඒක නොදන්නවා නොවෙයි. එතුමා වැරදිකරු කළේ දුම්න්ද දිසානායක කෘෂිකර්ම ඇමතිතුමා වුණාට පස්සේ. මට මතක විධියට 2005 අවුරුද්දෙන් පසුව. 2005 අවුරුද්දේ අපි චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුවෙන් අයින් වුණාට පස්සේ තමයි ඒ කට්ටිය එහෙම කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව පොඩ්ඩක් වෙන පැත්තකට ගියා. මොකද, එතුමා මෙතැන ලොකුවට කෑ ගැහුවා නේ. ඒත් අපි වැඩිය ගණන් ගන්නේ නැහැ. නමුත් අද මම හිතුවා, එතුමාට පොඩ්ඩක් ඒ ගැන මතක් කර දෙන්න ඕනෑ කියලා.

අපි ජාතිවාදී දේශපාලනයට කිසිම අනුග්‍රහයක් දක්වා නැහැ. ඔබතුමන්ලා දන්නවා, අපි ජාතිවාදී දේශපාලනය පාවිච්චි කරන්නේ නැති බව. ඒ වාගේම උතුරට, නැගෙනහිරට, කඳුකරයට, පීඩාවට පත් වෙච්ච ජන කණ්ඩායම්වලට, මුස්ලිම් ජනතාවට, වතුකරයේ ජනතාවට, පීඩිත නාගරික ජනතාවට, ආබාධිත ජනතාවට ඉතා සමාජ සාධාරණ අය වැයක් තමයි අපි ඉදිරිපත් කර තිබෙන්නේ. මීට කලින් මෙහෙම මිනිස්සු ඉන්නවාද කියලා හිතපු නැති පාලනයක් තමයි තිබුණේ. එවැනි කණ්ඩායම්වලට මේ අය වැයෙන් අපි මුදල් වෙන් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඔවුන් හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා කයිය නොවෙයි, වැඩ කියන්නේ ඔන්න ඔවාටයි කියන එක මම කියන්න කැමතියි. මෙවා අමාරු වැඩ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන්ගේ තව frequent mud-slinging slogan එකක් තමයි, "වැඩ බැහැ, ආධුනිකයි" කියන එක. ඒ තමයි, මේගොල්ලන් හිතාගෙන හිටපු දේ. ළඟදී මන්ත්‍රීතුමෙක් කිව්ව දේ මොකක්ද? IMF-Managing Director, ක්‍රිස්ටලීනා ජෝර්ජියේවා මැතිතුමිය අපේ ජනාධිපතිතුමාට "Bravo!" කිව්වාය කියලා ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණා. ඇත්තටම ඔබතුමන්ලා "Amadeus Mozart" කියන film එක බැලුවා නම් තේරෙනවා, එය වෘත්තීය ඉරිසියාව - jealousy - සම්බන්ධ කථාවක් බව.

මෙතැනත් මොකක්ද මේ තිබෙන්නේ? ඒ වාගේම ඕනෑ නම් මට කියන්න පුළුවන් මනමේ කුමාරයාගේ කථාවටත් ටිකක් සම්බන්ධයක් තිබෙනවා කියලා. මනමේ කුමාරයා හිතාගෙන හිටියා, මනමේ කුමාරි එයාට තමයි අයිනි කියලා. හැබැයි, ටික කාලයක් යනකොට කුමාරි තේරුම් ගත්තා, මේ කුමාරයා ඒ රටේ, ඒ ප්‍රදේශයේ එච්චර authentic leadership එකක් නොවෙයි, එයා පොරක් නොවෙයි, එයා නිකම් පරණ පොරක්, වැඩක් නැහැ කියලා. පස්සේ ඒ කුමාරි අර රජ්ජුරුවන්ට කැමැති වුණා. නැත්නම් කඩුව දුන්නා කියලා නේ, කියන්නේ. දුන්නාද, නැද්ද මම දන්නේ නැහැ. දෙන්න උත්සාහ කළා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වැදි රජ්ජුරුවන්ට.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්කෝලෙ යන කාලයේ අපටත් ඔහොම වෙලා තිබෙනවා සමහර වෙලාවට. අපි හිතාගෙන ඉන්නවා, සමහර ගැහැනු ළමයි අපට කැමතියි කියලා. අපිත් ඉතින් එක එක දේවල් කරනවා. ලියුම් ලියන්න ට්‍රයි කරනවා. ඒ කාලයේ SMS තිබුණේ නැහැ. ඉතින් එක එක දේවල් කරනවා. *[බාධා කිරීමක්]* නමුත් ඇත්තටම වෙන දේ තමයි ඒ ළමයා වෙන කෙනෙක් එක්ක

[ගරු බිමල් රත්නායක මහතා]

යනවා. අද සජබයේ ආර්ථික ඔස්තාර්ලාට වෙලා තියෙන්නේත් ඒකයි. ඒගොල්ලන් හිතුවා, IMF එක ඒගොල්ලන්ට truly love කියලා. හැබැයි, IMF එකත් බලනවා නේ, IMF එකටත් success story එකක් ඕනෑ නේ. IMF එකට දැනට තිබෙන success story එක තමයි South Korea. ඒගොල්ලන් bailout කරපු රටවල් 93 අතරින් ඒගොල්ලන්ට success story එකක් තිබෙන්නේ South Koreaවල විතරයි. ඒකත් ඇත්තටම හොඳම success story එකක් නොවෙයි. South Koreaවල විශාල industrial base එකක් තිබුණා. ඒ වාගේම බිල් ක්ලින්ටන් වාගේ ජනාධිපති කෙනෙක් South Koreaවල donor conference එක chair කරලා සල්ලි හොයලා දුන්නා. ඒ වාගේම මාස දෙකහමාරෙන් ඒගොල්ලන් 217 tons of gold එකතු කර ගත්තා. එහෙම තමයි ඒගොල්ලන් IMF එකත් එකතු කරගෙන අවුරුදු තුනෙන් ගොඩ ගියේ. දැන් IMF එකටත් ඕනෑ, success story එකක්. IMF එක බලනවා ඒ ගැන. ගරු මන්ත්‍රීතුමනි, අපි කැමැත්තෙන් IMF එකට ගියේ නැහැ. ඔබතුමන්ලා තමයි අපි බලයට එනකොට ඒ ගිවිසුම අත්සන් කරලා තිබුණේ. ඔබතුමන්ලා කිව්වාට, ඔබතුමන්ලාම නොවෙන්න පුළුවන්. රවී කරුණානායක මන්ත්‍රීතුමා ඇතුළු පක්ෂයේ අය ගියා. ඒ වාගේම තවත් අය. හැබැයි, ඔබතුමාට වඩා championලා හිටියා, IMF එක තමන්ගේ කියලා කියන්න. රනිල් වික්‍රමසිංහ මහත්තයා IMF එකට යනකොට, ඒක 100 per cent endorse කරපු කට්ටිය හිටියා, සජබයේ. ඔබතුමන්ලාට වඩා කසකාරයෝ හිටියා. හැබැයි, අවසානයේ මොකක්ද වුණේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, IMF එකත් බලනවා නේ, වැඩක් කරන්න පුළුවන් කාටද කියලා. ඉස්සර මොකක්ද වුණේ? ඉස්සර ජනාධිපතිවරු මේ වාගේ ගණන් ඉලක්කම් පාඩම් කරන්නේ නැහැ. කිසිම දෙයක ඇතුළාන්තයට ගිහිල්ලා බලන්නේ නැහැ. ඒක නිසා IMF එකත් එක්ක කථා කරනකොට කියනවා, හරි, ඔක්කෝම කරන්නම් කියලා. එච්චරයි කියන්නේ. ඊට පස්සේ ඇවිල්ලා, බලනකොට ඒ මොකුත් කරන්න බැහැ. මොකද, කථා කරන්නේ කිසිම දත්තයක්, කිසිම තර්කයක් ඇතුව නොවෙයි. නමුත් අනුර දිසානායක සහෝදරයා එහෙම නොවෙයි. එතුමා මේකේ මුල සිට අගට පාඩම් කරනවා. මේක ගැන තර්ක කරනවා. ඒ නිසා IMF එකට තේරෙනවා, මේ මනුස්සයා competent කියලා. මේ මනුස්සයා true to his word, කියන දේ කරන, බැරි දේ බැහැ කියන බව.

දැන් කියනවා, DSA එක වෙනස් කළේ නැහැ කියලා. DSA එක වෙනස් කරපු හැටි ලක්මාලි මන්ත්‍රීතුමිය මෙතැන කරුණෙන් කරුණ පෙන්වා දුන්නා මට මතකයි. ඔව්, අපි දන්නවා, DSA එක සම්පූර්ණයෙන් අපට වෙනස් කරන්න බැහැ කියලා. හැබැයි, DSA එක වෙනස් කළා. අපි අහන්න කැමැතියි, IMF එකේ යෝජනාවේ, රනිල්ගේ යෝජනාවේ තිබුණාද, පාසල් දරුවන්ට රුපියල් 6,000ක stationery දෙන්න? තිබුණාද? තිබුණේ නැහැ. පාසල් දරුවන්ට shoes සඳහා රුපියල් 3,000 ගණනේ දෙන්න තිබුණාද? තිබුණේ නැහැ. ඒ විතරක් නොවෙයි. දැන් අස්වැසුම ප්‍රතිලාභ ක්‍රමය දෙසැම්බර් 31ට අවසන් වෙන්න තිබුණු පවුල් ලක්ෂ හතරකට අපි අප්‍රේල් 30 දක්වා දීර්ඝ කර තිබෙනවා. එහෙම තිබුණාද?

මේ වැටුප් වැඩි කිරීම ගැන බලන්න. මම හිතන විධියට, IMF එක දන්නේත් නැහැ ලොක්කා මේක වැඩි කළේ කොහොමද කියලා. *[බාධා කිරීමක්]* ඒක තමයි. අප්‍රේල් 10වෙන කල් ඉන්න. ඡන්දය තිබෙන්නේ මැයි 6වන දා. ඒ නිසා හොඳම දේ තමයි ඉවසන එක. මම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා, තව දවස් 20යි තිබෙන්නේ, පඩි වැඩි වෙන්නේ නැහැ කියලා කියන්න ගිහිල්ලා සවුත්තු වෙන්න එපා. මේ සැරේ ආයේ ලොවෙත් නැති වෙන්න පඩි වැඩි වෙනවා. මම මේ අවංකව ඔබතුමාට උදව්වක් වශයෙන් කියන්නේ. කරුණාකරලා ඒකේ එල්ලෙන්න එපා. මොකද, ලොක්කා ඕකේ ගණිතය හරියටම පාඩම් කරලායි තිබෙන්නේ. ඒ නිසා දෙනවා කියන ටික ඔක්කෝම දෙනවා. ඉතින් ඒ නිසා තමයි IMF එක කිව්වේ, "Bravo, Mr. President!" කියලා. කලින් ජනාධිපතිවරු ඔහේ රස්තියාදු ගහ ගහ එක එක ඒවා කරලා ගිහිල්ලා, IMF එකත් එක්ක වාඩි වෙනවා. මොකක්ද දන්නේත් නැහැ, කියන්නේ මොකක්ද කියලා දන්නේත් නැහැ, "හරි ඔක්කෝම හරි" කියනවා. නමුත් කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපි ආර්ථිකය ස්ථායීකරණය කරලා තිබෙනවා. අපි අහන්න කැමැතියි, share market එක ගැන. අද විපක්ෂය පැත්තෙන් කථා කරපු පළමු කථිකයා share market එක ගැන දන්නේත් නැහැ, Securities and Exchange Commission එක ගැන දන්නේත් නැහැ. රවී කරුණානායක මන්ත්‍රීතුමනි, UNP එකට SJB එකට ගිය කලක්! *[බාධා කිරීමක්]* රවී කරුණානායක මන්ත්‍රීතුමා දන්නවා. මම කියන්නේ, අද Debate එක open කරපු මන්ත්‍රීතුමා දන්නේ නැහැ, share market එකේයි, Securities and Exchange Commission එකේයි වෙනස. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජෝර්ජියේවා ඒ වාගේ කට්ටියට "Bravo!" කියන්නද? වීසා තිබුණොත්, වීසා cancel කරගෙන කලින් යනවා!

අපට කියන්න තිබෙන්නේ මේකයි. අපි කටයුතු කරන්නේ සීමිත කොන්දේසි යටතේ තමයි. අපි IMF එකේ තිබුණු programme එකට ගියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා අපි ගිහිල්ලා, නිවැරදිව තර්කානුකූලව කටයුතු කරලා, පුළුවන් තරම් ලංකාව වෙනුවෙන් කරන්න පුළුවන් දේවල් ඉතුරු කරගෙන, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තුන්වැනි සමාලෝචනයත් කරලා, ඒ වාරිකයත් අරගෙන තිබෙනවා. දැන් ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා. කොටස් වෙළඳපොළ සෑහෙන ප්‍රමාණයකට වැඩි වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ නැහැ, කොටස් වෙළඳපොළ ඉස්සර සනත් ජයසූරිය බැට් කරනවා වාගේ ඉහළට යනවා කියලා. කොටස් වෙළඳපොළේ හැමදාම centuries ගහන්නේ නැහැ. නමුත් ඔබතුමන්ලා කවුරුත් පිළිගන්නවා, කොටස් වෙළඳපොළේ shares වැඩි වෙලා තිබෙන්නේ කොහොමද කියලා. ඔබතුමන්ලා තමයි ගොඩක් සමාගම් හිමියෝ. ඔබතුමන්ලා දන්නවා, ඔබතුමන්ලාගේ shares වැඩි වෙලා තිබෙන්නේ කොහොමද කියලා. මට නම් කොටස් වෙළඳ පොළේ මොකක්වත් නැහැ, මම මේ කිව්වාට. මම දන්නේත් නැහැ, ඒකේ තිබෙන practice එක ගැන. ඔබතුමන්ලා තමයි ඒක දන්නේ. ඒ වාගේම ඩොලරය ස්ථාවර කරලා තිබෙනවා. ඒවා ඉබේ, අතින් අල්ලලා කරන්න පුළුවන් දේවල් නොවෙයි. අපට තිබෙන්නේ කයිය විතරයි කිව්වා නේ. ඒකයි මම කිව්වේ. කයිය නොවෙයි, මේවා තමයි වැඩ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක විතර කාලයක් තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

හොඳයි. බලමු, වේලාව තිබෙනවා නම් ගන්නම්. නැත්නම් අවසන් කරන්න පුළුවන්.

අපි ගොවීන්ට පොරොන්දු වුණේ නැහැ, මහ කන්නයට පොහොර සහනාධාරය දෙනවා කියලා. එවැනි කිසිම ඡන්ද පොරොන්දුවක් නැහැ. ඔබතුමන්ලාගේ Manifesto එකට වඩා අපේ Manifesto එක කියවන එක හොඳයි. එහෙම හොඳයි. ඇත්තටම මම ඒක අගය කරනවා. විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරු අපේ Manifesto එක අපට මතක් කළා. ඒක වටිනවා. අපට ඒක අමතක වෙන්න දෙන්න හොඳ නැහැ. අපි අමතක කරන්නේ නැහැ. නමුත් අපි කියන්න කැමැතියි, අපි කිසිසේත්ම පොරොන්දු වුණේ නැහැ, පසුගිය මහ කන්නයට පොහොර සහනාධාරය දෙනවා කියලා. නමුත් අපි දන්නා. කෘෂිකර්ම ඇමතිතුමා මෙතැන ඉන්නවා. අපි පොරොන්දු වුණේ නැහැ, ධීවරයන්ට ඉන්ධන සහනාධාර දෙනවා කියලා. ඒවාත් දන්නා. මිනිස්සු ඒවා දන්නවා. ඒවා කයිය නොවෙයි, කරලා තිබෙන ඒවා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

මේ යල කන්නයේ කුඹුරුවල වගා කරන අනික් භෝගවලටත් දෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔව්, අතුරු භෝගවලටත් දෙනවා, යල කන්නයේ. දැන් ඉස්සරහට එන්න තිබෙන කන්නයේ. ඒ වාගේම විපක්ෂයේ ඔබතුමන්ලා අපට කිව්වා, පෙට්ටි කඩයක්වත් කරන්න දන්නේ නැහැ කියලා. අද ඔබතුමන්ලා දන්නවා, වහලා තිබෙන factories කීයක් පටන් අරගෙන තිබෙනවාද කියලා. Especially, උතුරේ. ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ගිහිල්ලා පටන් ගත්තා, ඔඩ්ඩුසුඩාන්වල - යුද්ධය අවුරුදු 30ක් එක දිගට තිබුණු LTTE-controlled area එකේ - තිබුණු උළු කම්හලක්. ඊට පස්සේ ඔබතුමා ගිහිල්ලා තව එකක් පටන් ගත්තා, Elephant Passවල. ලංකාවටම ලුණු ගෙනෙන්න යනවා, Elephant Pass factory එකෙන්. ආණ්ඩුව ඔක්කෝම බිස්නස් කරන්න යනවා කියලා තමයි දැන් රවී කරුණානායක මන්ත්‍රීතුමා හිතන්නේ. නැහැ, එහෙම නොවෙයි. නමුත් ආණ්ඩුවත් player කෙනෙක් විධියට ඉන්න ඕනෑ. ලුණු නැති වුණොත්, ආණ්ඩුව වැටෙනවා. ලුණු නැති වුණොත්, ඩොලර් නැති වුණාට වඩා අමාරුයි.

මිල්කෝ ආයතනය ඔබතුමන්ලා යනකොට බිලියන 1.8ක් පාඩුයි. මම හිතන විධියට අද වන විට ඒ භාගයක් ණය ගෙවලා තිබෙනවා. ඒ නිසා success stories තමයි තිබෙන්නේ. අපි කරලා පෙන්වලා තිබෙනවා.

ඒ වාගේම අපි කියන්න කැමැතියි, විදුලි බිල අඩු කිරීම ගැනත්. විදුලි බිල අඩු කිරීමේදී මහජන උපයෝගිතා කොමිසමේ - PUCSL එකේ - මැදිහත් වීමක් තිබුණා. ඒගොල්ලන්ට තමයි බලය තිබෙන්නේ විදුලි බිල අඩු කරන්න. හැබැයි, දැන් අඩු වුණේ නැද්ද? ඇයි, ඒක නොකියන්න කුහක වෙන්නේ? ඒ අඩු වීම කර්මාන්තවලට, tourismවලට හොඳයි නේ. ඔබතුමන්ලා හිතනවාද, social mediaවලින් මෙවා පිළිබඳව බොරු කිව්වාම, මිනිස්සු පිළිගන්නවා කියලා? මම ඒකයි කිව්වේ. අපට කිව්වා කයිය විතරයි, වැඩ බැහැ කියලා. ඒ වාගේම අපි ආධුනිකයි වැඩ බැහැ කිව්වා. අපි මාස හතරක් ඇතුළතදී ඒ දෙකම වැරදියි කියලා ඔප්පු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න මෙතැන පෙනෙන්න තිබෙන මේ young talent එක. අපි ආසාවෙන් බලාගෙන ඉන්නවා. With all respect, අපේ පක්ෂයේම සමහර තරුණ මන්ත්‍රීවරුන්ගේ නම් මම දන්නේත් නැහැ. අවංකවම මම ඒක කියන්නේ. ඉතා ඉක්මනින් ඒ නම් දැන ගන්න ඕනෑ. ඒ අය brilliant. අලුත් මන්ත්‍රීතුමියලා ඇවිල්ලා තිබෙන්නේ. අපි දැකලා තිබෙනවා, ඒගොල්ලන් මහා ආර්ථික ඔස්තාර්ලාගේ තර්ක සම්පූර්ණයෙන්ම බිඳිනවා, ගෞරවනීය විධියට. මම දැක්කා, ළඟදි එක මන්ත්‍රී කෙනෙක් එයාගේ phone එක අරගෙන "ජනතා විමුක්ති පෙරමුණේ ආධ්‍යාත්මික නායකයා" කියලා බොරුවක් කළා. කවුද, ඒකට උත්තර දෙන්න නැහිටිවේ? මේ පාර්ලිමේන්තුවේ ඉන්න ළාබාලම මන්ත්‍රීතුමිය තමයි ඒකට attack කළේ.

ඒක නිවැරැදිව, Standing Orders අනුව, හරි පිළිවෙළට, හරිම polite විධියට කළා. "අව්වට වයසට යනවා" කියනවා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිහිටියන් කියන්නේ කවුද? Experience හරහා wisdom එන්නේ. Truly වැඩිහිටියෙක් වෙන්න ඕනෑ. එතකොට තමයි wisdom එන්නේ. අව්ව වැටුණාම, බාල ගස්වල කොළ කහ පාට වෙනවා නේ. එහෙමයි මේ සමහර වැඩිහිටි අය. කොණ්ඩය සුදු වෙලා තිබෙන්නේ පීනසට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, කාලය අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විපක්ෂය අපට කිව්වා, ශක්තිමත් විදේශ සබඳතා නැහැ කියලා; ජාත්‍යන්තර සහයෝගය නැහැ කියලා. සජබ සමහර මන්ත්‍රීතුමන්ලා ගරු විජිත හේරත් ඇමතිතුමාට ස්තුති කළා මම දැක්කා, එතුමා ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ විදේශ සබඳතා හරියට පවත්වා ගෙන යනවා කියලා. මම ඒ මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, ජනාධිපතිතුමා මෑතකදී විදේශ සංචාර තුනකට - India, China and Dubai කියන රටවලට - ගිය බව. ඒවා රාජ්‍ය නිල සංචාර. ඒ වාගේම, ඩුබායි රටේ රාජ්‍ය නායක සමුළුවේ එතුමා ප්‍රධාන ආරාධිතයා වුණා. මේ සමහරුන් වාගේ invitations ගෙන්වා ගෙන රට යන කෙනෙක් නොවෙයි, අපේ ජනාධිපතිතුමා. එහෙම ආවත් වැඩිපුර යන්නේ නැති කෙනෙක්. අපි ලෝක මට්ටමේදී, ජාත්‍යන්තර වශයෙන් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඉතා හොඳින් හදාගෙන තිබෙනවා, ඉන්දියාව, චීනය ඇතුළු ඔක්කොම රටවල් එක්ක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියේ ආධිපත්‍යය පිහිටුවීම ගැනත් කියලා මම කථාව අවසන් කරන්නම්. ඔබතුමා දන්නවා, පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන. පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන අපි පරීක්ෂණ පටන් අරගෙන තිබෙන බවත් ඔබතුමන්ලා දන්නවා. ඒ පරීක්ෂණ ගැන මම ලොකුවට දන්නේ නැහැ. නමුත්, මට දැඩි විශ්වාසයක් තිබෙනවා, පාස්කු ඉරුදින ප්‍රහාරයට නිශ්චිතව සම්බන්ධ පුද්ගලයන්ටත්, ඒවා plan කරපු අයටත්, අනිවාර්යයෙන්ම දඬුවම් දෙන බවට.

ඔබතුමන්ලා දන්නවා, හිටපු පොලිස්පති දැන් අත්අඩංගුවේ බව. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, අපේ ආණ්ඩුව ඇවිල්ලා සති තුනකින් Arugam Bay attack එකක් ගැනත් ආරංචි වුණු බව. ජනාධිපතිතුමා ඉතා professional විධියට, කිසිම කලබලයක්

[ගරු බිමල් රත්නායක මහතා]

නැතුව, ඉතාම හොඳින් අධ්‍යයනය කරලා, Security Council එකේ රැස්වීම් ගණනාවක් අරගෙන කිසිම ප්‍රශ්නයක් නැතුව, business එකට harm කරන්නේත් නැතුව, tourism industry එක වට්ටන්නේත් නැතුව, ආරක්ෂාවට ප්‍රශ්නයක් වෙන්න දෙන්නේත් නැතුව, ජාත්‍යන්තර දේශපාලනය අවුල් කර ගන්නේත් නැතුව, ජාතිවාදය මතු වෙන්න දෙන්නේත් නැතුව smart විධියට එය විසඳා තිබෙනවා. මෙතුමන්ලා කළා නම් මොකද වෙන්නේ? හත්පොළේ ගා ගන්නවා.

ඒ වාගේම අපි කියන්න කැමැතියි, අපි නීතියේ ආධිපත්‍යය හදලා තිබෙන බව. තව ටික දවසක් යයි ඒක යම්කිසි මට්ටමකට එන්න. ඔබතුමන්ලා උත්සාහ කළා, කොටුවේ උසාවියේ වෙච්ච සිදුවීම පාවිච්චි කරලා විශාල ප්‍රශ්නයක් හදන්න. නමුත්, මා හිතන විධියට අද ඒක විසඳිලා තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මෙවර අපේ investment එක ඇමෙරිකානු ඩොලර් බිලියන 5යි. රුපියල් බිලියනවලින් කිව්වාම තේරෙන්නේ නැහැ නේ. මෙවර ආණ්ඩුව තමයි ලොකුම investor. Capital Expenditure එක ඇමෙරිකානු ඩොලර් බිලියන 5යි. අපි Central Expressway එක හදන්න පටන් ගන්නවා. ඒ විතරක් නොවෙයි, අපි ලොකුම ports හදන්න පටන් ගන්නවා. ඒ වාගේම, අපි විශාල කර්මාන්තශාලාවලට අවශ්‍ය කරන පෞද්ගලික අංශයේ ආයෝජන ගෙන්වනවා. අපි ලෝකයේ රටවලින් ආයෝජකයන් ගෙන්වනවා. දැනටත් යම් ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. මේ ආණ්ඩුවේ අපේ අය වැයත් එක්ක තමයි, ඒ ගොඩක් අය ඉස්සරහට යන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒ නිසා මම කියන්න කැමැතියි, අපි මේ අය වැයේදී රටට ඉදිරිපත් කරලා තිබෙන්නේ, එක පැත්තකින් සමාජ සාධාරණත්වයේ අය වැයක් බව. අනෙක් පැත්තෙන්, අපට පුළුවන් වෙලා තිබෙනවා, රටේ කාර්මීකරණය වෙනුවෙනුත් එම අය වැය ඉදිරිපත් කරන්න. මොකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාර්මීකරණයෙන් තොරව මිනිසුන්ගේ සංස්කෘතිය වෙනස් කරන්න බැහැ. රටේ objective situation එක වෙනස් කළාම, මිනිසුන් වෙනස් වෙන්නේ කොහොමද කියන එකට මම පොඩි උදාහරණයක් කියන්නම්. මිනිස්සු පිටකොටුව bus station එකේදී හැසිරෙන විධියට නොවෙයි, Makumbura Multimodal Center එකේදී හැසිරෙන්නේ. පිටකොටුව bus station එකේදී මිනිස්සු ඉන්නේ විකාර වෙලා. හැබැයි, ඔබතුමා ගිහිල්ලා බැලුවොත් Makumbura Multimodal Center එකට, ඒ environment එක විසින්ම මිනිස්සු discipline කරනවා. ඒ නිසා industrialization කියලා කියන්නේ, නිකම්ම නිකම් ආයෝජකයෙකු ගැන කථා කරන එක නොවෙයි. ඒක මිනිසුන්ගේ culture එකත් එක්ක සම්බන්ධයි. ජපානයේ මිනිස්සු වෙලාවට වැඩ කරන්නේ ඇයි? වෙලාවට වැඩ නොකළොත්, factory එක පවත්වාගෙන යන්න බැහැ. ජර්මනියේ මිනිස්සු වෙලාව වෙනුවෙන් බෙහෙවින් වද වෙන්නේ ඇයි? හරියට වෙලාවට ගිහිල්ලා වැඩ කළේ නැත්නම්, factory chain එක දුවන්න බැහැ. ඒ නිසා වෙලාවට වැඩ කරන එක සිද්ධ වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ලෝකයේ විනාඩි කටුව ආවේ කවදාද? Period of Capitalism තුළ, 1815-1820 වාගේ කාලයේ. ලෝකයේ ඉස්සෙල්ලාම factoriesවල තමයි ඔරලෝසු කණු ගැහුවේ, අපේ රටේ 1990දී හන්දිවල ඔරලෝසු ගහගෙන ගියාට. Factory එකට තමයි වෙලාව ඕනෑ වුණේ. ඒ නිසා වෙලාවට වැඩ කිරීම industrialization එක්ක සම්බන්ධයි, discipline එකත් එක්ක industrialization එක සම්බන්ධයි.

මිනිසුන්ගේ තනතුරුවලට ගරු කරන එක, රැකියාවට ගරු කරන එක අත්‍යවශ්‍යයි. අපේ රටේ එහෙම නැහැ. අපේ රටේ අඩු වැටුප් ලබන මිනිසුන්ට ගරු කරන්නේ නැහැ. වැඩි වැටුප් ලබන අයට තමයි ගරු කරන්නේ. ඇයි ඒ? අපට හොඳ industrialization එකක් නැහැ. හොඳ industrialization එකක් තිබෙන රටක නම් දන්නවා, factory floor එක අතුගාන කෙනා සහ තේ එක හදලා ගෙනැත් දෙන කෙනා එතැන solidarity එක හදන්න කොච්චර important ද කියලා. ඔබතුමන්ලාත් ඒක දන්නවා. අපි ජර්මනියේ හෝ යුරෝපයේ හෝ ගියාම අපට පේනවා, ඕනෑම තැනක ඕනෑම වෘත්තියකට ගරු කරලා කථා කරන ආකාරය. මා කියන්නේ ඒකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අන්න එවැනි plan එකක් එක්ක තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට වැඩිපුරත් එක්ක වෙලාව ලබා දීම සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ අය වැය සම්මත වුණාට පස්සේ හෙට උදේ ඉඳලා අලුත් ගියර් එකක් මාරු කරනවා. අපි මුළු රටටම ආරාධනාවක් කරනවා. අප දිහා මාස 3ක්, 4ක් ඔබතුමන්ලා බලාගෙන ඉන්න ඇති, අප වැඩ කරන්නේ කොහොමද කියලා. මම හිතනවා, අපි deliver කරගෙන යනවා කියලා. අපි පෙන්වා තිබෙනවා, අපි මේක කරන්න ලැහැස්තියි කියලා. අපට මිනිස්සු පාරෙදි හම්බ වුණාම, මේ Parliament staff එක පවා අපට කියනවා, "සර් ඔහොම යන්න. අපි පරිස්සමෙන් මේක ගෙනියමු" කියලා. අපි සන්සුන්ව යනවා. අපට කිසිම කලබලයක් නැහැ. තවත් මාස 56ක් අපට තිබෙනවා, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා දැන් මොකක්ද කරන්නේ? ඔබතුමන්ලාගේ media strategy එක මොකක්ද? ඔබතුමන්ලාගේ media strategy එක තමයි, "අරක කළේ නැහැ, මේක කළේ නැහැ" කියලා කියන එක. අපට කාලයක් තිබෙනවා ඒවා කරන්න. අපි හැම දෙයක්ම හරියට කිරලා මැනලා කරනවා. අප අවසාන වශයෙන් මේ රටේ ජනතාවට කියන්නේ, ඔබ අපට දුන්නු ජනවරම දිවි හිමියෙන් ආරක්ෂා කරගෙන අපි වැඩ කරනවා කියලායි. කයිය විතරයි, වැඩ බැහැ කියලා ඔබතුමන්ලා කියපු ඉතිහාසය අවසන් කරලා ඔබතුමන්ලාත් අලුත් තත්ත්වයකට පත් වෙන්න කියා ඉල්ලා සිටිමින්, සාධාරණව අපව විවේචනය කළ මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය පළ කරමින් මාගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා, යම් සාධාරණීකරණයක් කරන්න අවශ්‍යයි කියලා. 2022 වර්ෂයේ රට බංකොලොත් වෙලා, ඊට පස්සේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති විධියට පත් වුණාට පසුව එතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා බංකොලොත් වූ රට 2024 සැප්තැම්බර් මාසයේ බංකොලොත්භාවයෙන් එළියට ආපු එක ගැන අපි මතක් කළ යුතුයි. ඒ වාගේම, ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන එක

ගැන අපි ප්‍රශංසා කරනවා. ඒක තමයි හරි දේ. අපි එදා හරි දේ කළා කියන පිළිගෙන එය ඉදිරියට ගෙන යන එක තමයි දැන් අවශ්‍ය වන්නේ. ආර්ථිකය ඉදිරියට ගෙන යන්න ආර්ථිකය තුළින්ම ආයෝජන කරන්න ඕනෑ කියන එක තමයි අපි එදා මතක් කළේ. අපි මේ ආර්ථිකය ඉදිරියට ගෙන යමු. පාර්ලිමේන්තුවේ අප අතර මොන මත තිබුණත්, පක්ෂයේ භූතයෝ දෙදෙනෙක්, තුන්දෙනෙක් ඒ තිබුණු තත්ත්වය නැති කරන්න හැදුවත්, එදා ඒ කරපු වැඩ පිළිවෙළ තුළින් අද රට ශක්තිමත්භාවයට ඇවිල්ලා තිබෙනවා කියන එක මා මතක් කළ යුතුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට තවත් විනාඩි 2ක් ලබා දීලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 8යි තිබුණේ. ඒක විනාඩි 10ක් කළා.

[අ.භා. 4.38]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. අපේ ගරු සභානායකතුමා එතුමන්ලාගේ ආණ්ඩුව මේ ගත වුණු කාල සීමාවේ කරපු දේවල් පිළිබඳව විශාල විග්‍රහයක යෙදුණා. එතුමන්ලා ආරම්භ කරපු හොඳ දේවලට කුහක නොවී හොඳයි කියන්න අපට කොන්දක් තිබෙනවා. අපි ඉතා පැහැදිලිවම කියනවා, මේ දේශපාලන සංස්කෘතියේ යම් වෙනසක් සිදු කරන්න තිබුණා කියලා. ඒ දේශපාලන සංස්කෘතියේ හොඳ අතට යම් වෙනසක් වෙච්ච තැන්වලදී ඒක හොඳයි. තමුන්නාන්සේලා දැන් මහා ලොකු ආරක්ෂාවක් නොගෙන, අමාත්‍යවරුන් පවා ආදර්ශවත් විධියට යෑම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒ වාගේම, තව තව කාරණා පිළිබඳවත් අපට සතුටක් තිබෙනවා. නමුත්, ඔබතුමන්ලා අද හැසිරුණේ ඔබතුමන්ලා පළමුවැනි වතාවට ජනාධිපතිවරයෙකු පත් කළා වාගේයි. අනුර කුමාර දිසානායක මැතිතුමා නොවෙයි තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම ජනාධිපතිවරයා හැටියට පත් කළේ. තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම ජනාධිපතිවරයා හැටියට පත් කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමායි. ඒ, 2005දී. මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005දී ජනාධිපති හැටියට පත් කරන්න වැඩියෙන්ම මහන්සි වෙච්ච කණ්ඩායම තමයි මෙතැන මේ ගරු සභාවේ ඔය ඉස්සරහින් ඉන්නේ. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ කැබිනට් මණ්ඩලයේ හිටියේ අපි නොවෙයි, මෙතැන ඉන්න මේ ප්‍රධානීන්. ඒ අපි නොවෙයි. තමුන්නාන්සේලා අද මෙතැනදී කියනවා, ශිරන්ති රාජපක්ෂ ඉඩම් ගත්තා කියලා. කවුද ඒ තැනට පත් කළේ? මහින්ද රාජපක්ෂ මහත්මයා ජනාධිපති කළේ කවුද? අපි ද? මේක මාර කථාවක් නේ. දැන් අපට කියනවා; අපට ඇඟිල්ල දිගු කරනවා, අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාව ජනාධිපති ධුරයට පත් කළා වාගේ.

තමුන්නාන්සේලා වේදිකාවක් වේදිකාවක් ගානේ ගිහිල්ලා, ගෙයින් ගෙට ගිහිල්ලා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ හොඳ කියලා මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති විය යුතුමයි කිව්වා. එහෙම කිව්වේ අපි ද? මෙතැන ඉන්න අපේ සමගි ජන බලවේගයේ මගේ මිත්‍රයෝ කවුරුත් එහෙම කිව්වේ නැහැ. අපි කවුරුත් එහෙම කළේ නැහැ. අපි ඒ වේදිකාවලට නැග්ගේ නැහැ. ඒ වේදිකාවලට නැගලා මහින්ද රාජපක්ෂ ජනාධිපති කරන්න කියලා අපි කවුරුවත් කිව්වේ නැහැ. තමුන්නාන්සේලා එහෙම කියලා ඒ අය ජනාධිපති කරවලා දැන් කියනවා, "කෑවෝ කෑවෝ" කියලා. මේක පුදුම කථාවක් නේ. එතකොට අපි තමයි වැරදිකාරයෝ. තමුන්නාන්සේලා මේ පසුගිය අවුරුදු කාලය පුරාම මොනවත් කරලා නැහැ!

ඒ විතරක් නොවෙයි, අපි නිහතමානිව අපේ අඩුපාඩු භාර ගන්නවා වාගේම, තමුන්නාන්සේලාත් ඒ අඩුපාඩු භාර ගන්න ඕනෑ. ඒ කොන්ද තිබෙන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් කිරීම අපි කරපු වැරැද්දක් කියලා තමුන්නාන්සේලා ජාතියෙන් සමාව ගන්න. ඒ වාගේම, 88-89 කාලයේදී ඇති වෙච්ච ඒ විනාශයට ජනතා විමුක්ති පෙරමුණ වග කියන්න ඕනෑ කියන එකත් නිහතමානිව පිළිගන්න. අපි සතුටු වෙනවා, ඔබතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයකට එක්වීම පිළිබඳව. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒක එසේ විය යුතුයි. ඒක වෙන්න ඕනෑ. ඔබතුමන්ලා ඒ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයට ඒමට කරපු ඒ කර්තව්‍යය අපි අගය කරනවා. හැබැයි, ඊට කලින් මොකක්ද වුණේ කියන එකත් තමුන්නාන්සේලා කොන්දක් තියෙනවා නම් කියන්න. 88-89 යුගයේ ඒ වෙච්ච දේවල්වලට තමුන්නාන්සේලාත් වග කියන්න ඕනෑ. ඒ කාලයේ ඒ රජයන්ගෙන් අඩුපාඩු වුණා. ඒ ගැන විවාදයක් නැහැ. යුද්ධ කාලයේදී ඒ ත්‍රස්ත ක්‍රියාවලට මුහුණ දෙනකොට යම් යම් අඩුපාඩු වෙලා තිබෙනවා. ඒවා අපි පිළිගන්නවා.

බටලන්ද ගැන තමයි දැන් කථාව. බටලන්ද ගැන ඉතුරු ටික මම ඊළඟ විවාදයේදී කියන්නම්. ඊළඟ විවාදයේදී බටලන්ද ගැන අපි කියන්නම්. ඒ ගැන අපි වෙනම කථා කරමු. තව සතියකින්, දෙකකින් ඒ විවාදය එනවා නේ. එතකොට අපි ඒ ගැන කථා කරමු. හැබැයි, තමුන්නාන්සේලාගෙන් පසුගිය ඉතිහාසයේ මොනවත් වුණේ නැහැ, තමුන්නාන්සේලා මොනවටත් සම්බන්ධ නැහැ, පසුගිය කාලසීමාවේ මේ එක වැරැද්දකටවත් තමුන්නාන්සේලාගේ ගනුදෙනුවක්, සම්බන්ධයක් නැහැ කියන එක මම හිතන හැටියට වැරදියි. තමුන්නාන්සේලාට පුළුවන් වෙන්න ඕනෑ ඒක නිවැරදි කරන්න. තමුන්නාන්සේලා තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති කළේ. ඒ වාගේම තමුන්නාන්සේලා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ කැබිනට් මණ්ඩලයේ හිටියා. ඒ විතරක් නොවෙයි, ඊට පස්සේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා පත් කරන්නත් තමුන්නාන්සේලාගේ සහයෝගය අපට ලබා දුන්නා. සරත් ෆොන්සේකා මැතිතුමාගේ ජනාධිපති මැතිවරණ වේදිකාවේ තමුන්නාන්සේලා අපිත් එක්ක එකට අත්වැල් බැඳගෙන හිටියා. තමුන්නාන්සේලා-අපි එකට වේදිකාවල හිටියේ. නේද? ඒක නේ, ඇත්ත තත්ත්වය. තමුන්නාන්සේලා මෙච්චර විවේචනය කරපු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් එක්ක එකට හිටියා නේ. ඒක නැහැ කියන්න පුළුවන්ද? එහෙමත් හිටියා. ඉතින් ඒ කාල වකවානුවලදී තමුන්නාන්සේලා ඒ තීන්දු තීරණ ගත්තා.

ඒ වාගේම අපි සතුටු වෙනවා, නැවතත් මම කියනවා, මේ ආණ්ඩුව යම් යම් හොඳ දේවලුත් සිදු කළා කියන එක. හැබැයි, දැන් මේ මහ ලොකුවට කිව්ව දේවල් බලන්න. උදාහරණයක් හැටියට කිව්වොත්, මා මිත්‍ර බිමල් රත්නායක මැතිතුමා කියනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෙන්ෂන් එක අහෝසි කරනවා කියලා. හොඳයි. ඒ පෙන්ෂන් එක අහෝසි කරනවා කියලා දැන්

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

කිව්වාට, තමුන්නාන්සේලාත් මෙච්චර කාලයක් පෙන්ෂන් එක ගත්තා නේ. පෙන්ෂන් එක ගන්නේ නැතුව හිටියාද? මීට කලින් පාර්ලිමේන්තුවේ හිටපු ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරපු මන්ත්‍රීවරු සියලුදෙනා පෙන්ෂන් එපා කියලා ඒවා ආපසු මහා භාණ්ඩාගාරයට යැව්වාද? එහෙම යවපු කවුරුත් ඉන්නවාද? නැහැ නේ. තමුන්නාන්සේලා ඒ ඔක්කෝම ගත්තා. ඒ ඔක්කෝම අරගෙන ඉවර වෙලා දැන් කියනවා, අපි පෙන්ෂන් එක නතර කරනවා කියලා. ඒ වාගේමයි, වාහන පර්මිට් ගැන කියපු කථාවත්. දැන් තමුන්නාන්සේලා වාහන පර්මිට් කැන්සල් කරනවා කියනවා. හිටපු හැම මන්ත්‍රීවරයෙක්ම වාහන පර්මිට් ගත්තේ නැද්ද? ගත්තේ නැති මන්ත්‍රීවරයෙක් ඉන්නවාද? තමුන්නාන්සේලා සියලුදෙනා වාහන පර්මිට් ගත්තා. අරගෙන මොකක්ද කළේ? ඕනෑ නම්, "අනේ, අපි ආදර්ශවත් විධියට වාහන පර්මිට් නොගෙන ඉන්නවා" කියන්න තිබුණා නේ. තමුන්නාන්සේලා එහෙම කියලා තිබෙනවාද? නැහැ, එහෙම කියලා නැහැ, අරගෙන තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා මේ රටේ මතයක් ඇති කළා, අපි පඩි ගන්නේ නැහැ කියලා. සමාවෙන්න, අපි පඩි ගන්නවා. තමුන්නාන්සේලායි ගන්නේ නැත්තේ. තමුන්නාන්සේලා පඩි ගන්නේ නැහැ කිව්වා. පඩි ගන්නේ නැතිව ගරු සේවයක් කරනවා කියපු තමුන්නාන්සේලා ගැන හොයලා බලනකොට මොකද වෙන්නේ? පඩි ගන්නේ නැහැ. ඔව්, ඒක ඇත්ත. හැබැයි, පක්ෂ අරමුදලට යනවා, ඒ පඩිය. පක්ෂ අරමුදලට ගියාට අපට මොකද? ඒකෙන් මේ රටේ ජනතාවට මොකක්ද වෙන්නේ? රටේ ජනතාවට මොකුත් වෙන්නේ නැහැ නේ. ඒකෙන් රටේ ජනතාවට වාසියක් වෙන්නේ නැහැ. රටේ ජනතාවට වාසියක් වෙන්න නම් ඒක මහා භාණ්ඩාගාරයට යන්න ඕනෑ. ඒක මහා භාණ්ඩාගාරයට ගියා නම් හරි. හැබැයි, තමුන්නාන්සේලා ඒක පක්ෂ අරමුදලට යවලා පසුව වක්‍රව ගන්නවා. මොකක්ද තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට කරපු විහිළුව? *[බාධා කිරීමක්]* අනේ ඇමතිතුමා, නිකම් බාල කථා කියන්න එපා. ඒවා විහිළු කථා නේ. ඒක කළේ නැත්නම් ඒකත් සොරකම් කරනවා කියලා ඔබතුමා කියනවා. Pension එක නැති කරනවා නම්, vehicle permit එක නැති කරනවා නම්, තමුන්නාන්සේලා සියලුදෙනා නිල නිවාස පවිච්චි කරන්නේ නැත්නම් මම සතුටු වෙනවා. හැබැයි, ඇමතිවරු 20දෙනෙක් නිල නිවාස ගන්නේ නැති වුණාට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ටික ඔක්කොම නිවාස අරගෙන තිබෙනවා නේ. එතකොට ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. එතකොට ඒවා නිල නිවාස නොවෙයිද? අපි කියන්නේ නිල නිවාස තිබිය යුතුයි කියලා. තමුන්නාන්සේලා තමයි කිව්වේ, "අපි එපා කිව්වා, කැන්ටින් වහනවා කිව්වා, pension එක එපා කිව්වා, salaries එපා කිව්වා" කියලා. තමුන්නාන්සේලා තමයි එහෙම කිව්වේ. අපි එහෙම කිව්වේ නැහැ. අපි විශ්වාස කරනවා, ඒ සාධාරණ දේවල් ලබා දිය යුතුයි කියලා. හැබැයි, තමුන්නාන්සේලා තමයි කිව්වේ, අපි ඒවා ඔක්කොම අතහරිනවා කියලා. එහෙමයි තමුන්නාන්සේලා කිව්වේ. එහෙමයි මේ රටේ මතයක් ඇති කළේ. තමුන්නාන්සේලා නිවැරදි දේවල් කරනකොට අපි සතුටු වෙනවා. ඒවාට අපි කුහක වෙන්නේ නැහැ. හැබැයි, මේ රටේ යම් යම් අඩු පාඩුකම් සිදුවෙනකොට, විශේෂයෙන් 1994න් පස්සේ සිදු වූ අඩු පාඩු සියල්ලටම ජනතා විමුක්ති පෙරමුණේ ඔබ වගකීම දැරියි යුතුයි කියන එක ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. ඒක නැහැ කියන්න බැහැ. තමුන්නාන්සේලා ඒක කියන්න නිහතමානී වෙන්න. ඒක කියන්න, ඒක පිළිගන්න කොන්දක් තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඇත්තටම සතුටු වෙනවා. අද රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් වැඩමුළුවක් පැවැත්වුවා. ඉතාම කනගාටුයි කියන්න. එම වැඩමුළුවට ආණ්ඩු පක්ෂයේ එක්කෙනෙක්වත් සහභාගි වුණේ නැහැ. ඒ, උද්ධව්වකම නිසාද දන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ එක පර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්වත් ඒ අවස්ථාවට සම්බන්ධ වුණේ නැහැ. දැන් තමුන්නාන්සේලා සියලුදෙනා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. තමුන්නාන්සේලා ඒ අවස්ථාවට සහභාගි වුණේ නැතත් නැවතත් අවධානය යොමු කරලා ඒ මාහාචාර්යතුමා කිව්වා, නැවතත් එන්නම් කියලා.

අදත්, වර්තමානයෙත් රටේ ජනතාවගෙන් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් දරිද්‍රතාවෙන් පෙළෙනවා. සියයට 50කටත් වැඩියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
හොඳයි.

ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න. මේ රට ඉදිරියට යෑමේදී විපක්ෂ නායකතුමා ඇතුළු සමගි ජන බලවේගයේ අපි සියලුදෙනා සම්පූර්ණ සහයෝගය තමුන්නාන්සේලාට ලබා දෙනවා. ඔබතුමන්ලා රට වෙනුවෙන් ගන්න සෑම ගුණාත්මක, ධනාත්මක වැඩසටහනකටම අපි සහයෝගය ලබා දෙන්න කටයුතු කරනවා. එහි කිසිම ගැටලුවක් නැහැ. ඔබතුමන්ලා කිව්වා නේ Twenty20 ගහලා අපට ඇඩ්‍රසුත් නැති වෙයි කියලා. අපට ඇඩ්‍රස් නැති වුණාට කමක් නැහැ, රටට ඇඩ්‍රස් එකක් තිබෙනවා නම්, රටේ ජනතාවට ඇඩ්‍රස් එකක් තිබෙනවා නම්. ඒ නිසා අප ගැන සිතන්නේ නැතිව රට ගැන හිතලා තමුන්නාන්සේලාට සුබ පතමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩබ්ලිව්.එම්.අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.49]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අය වැය පිළිබඳ විවාදයේ අවසාන දවසේ සමහර ක්ෂේත්‍ර පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියලා මට පුරවැසියන්ගෙන් ලැබුණු යෝජනා කිහිපයක් තිබෙනවා.

පළමුවැනි කාරණය මෙකයි. ලංකාවේ බුලත් වගාව කරන අයගේ පොඩි පොඩි ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒකට සම්බන්ධ අමාත්‍යවරයාගේ අවධානය මේ සඳහා යොමු කරන්න. බුලත් වගා කරන අයට අවශ්‍ය කොවුල් ලී ටික අරගෙන එනකොට ඒකට පර්මිට් ගන්න ඕනෑ කියලා තිබෙනවා. ඇඟිල්ලක් විතර ප්‍රමාණයේ ලී කෝටුවලට පර්මිට් ගන්න තිබෙන ප්‍රශ්නය නිසා ඒ වගා කටයුතුවලට ඇති වෙලා තිබෙන බාධා ගැන ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියලා මම පළමුව ඉල්ලනවා.

දෙවැනි කාරණය මෙකයි. විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ වළං කර්මාන්තයේ නියැළෙන අයට අවශ්‍ය මැටි ගෙන එන්නේ වයඹ පළාතේ ඉඳලා. ඒ අය උදැල්ලෙන් කපලා, මැටි බෝල විධියට හදලා අරගෙන එද්දිත් සාමාන්‍ය පස් අරගෙන එන විධියේ ක්‍රමවේදය අනුව තමයි යන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ දෙවැනි ක්ෂේත්‍රය කෙරෙහිත් ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අවධානය යොමු කරන්න; ඒ අදාළ අමාත්‍යවරුන්ගේ අවධානය යොමු කරන්න.

තුන්වෙනි එක තමයි, කජු නිෂ්පාදන ක්‍රියාවලිය. විශේෂයෙන්ම වනසතුන්ගෙන් සිද්ධ වෙන හානිය කජු නිෂ්පාදනය සඳහාත් විශාල ලෙස බලපාන බවට අපේ ආසනවල ඉන්න අයගෙන් දැනුවත් වෙනවා. මම ඇමතිතුමාගෙන් කවර හෝ අවස්ථාවක දැනගන්න කැමැතියි, ඔබතුමන්ලාගේ සංගණනයේ ප්‍රතිඵලය අනුව මොකක්ද කරන්න බලාපොරොත්තු වුණේ කියලා. ඒ කියන්නේ මේ ඉන්න සත්ව ගහනය අනුව මොන මොන ක්‍රමවේදයන්ද භාවිත කරන්න බලාපොරොත්තු වෙන්නේ කියන එක. විශේෂයෙන් කජු ව්‍යාපාරිකයන් කියන කථාව තමයි ගස්වල විශාල වශයෙන් හැදෙන කජු අස්වැන්න සතුන් විනාශ කරනවා කියන එක. ඒ නිසා ඔබතුමන්ලාගේ ඉක්මන් අවධානය ඒ වෙනුවෙන් යොමු කරන්න. වේවැල් කර්මාන්තයේ යෙදෙන අය, -මේ අය වැය විවාදය තුළ සාකච්ඡාවට ගත්තේ නැති ක්ෂේත්‍ර- වෙන රටවලින් ලංකාවට වේවැල් ගෙන්වනවා. ඒවායේ මිල අධිකයි. ඒ වාගේම, අලුත් තාක්ෂණය වේවැල් කර්මාන්තයට යෙදෙන්නේ නැහැ. එතකොට සාම්ප්‍රදායික භාණ්ඩ ටික විතරයි විකිණෙන්නේ. ඒ වාගේම වෙළෙඳ පොළ ග්‍රහණය කර ගන්න බැරිව යනවා. ඒ නිසා අලුත් පුහුණුව සහ වේවැල් අඩු මිලට ලබා දීමට ඒ අංශ භාරව සිටින ඔබතුමන්ලාගේ නිලධාරීන්ගේ අවධානය යොමු කරවන්න.

ඊළඟ කාරණය මෙකයි. ගම්පහ දිස්ත්‍රික්කයේ සඟඋස සමිතියක් සම්බන්ධව ආයෝජන පිළිබඳ කථාවක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. සමුපකාර විෂය භාර ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. එතැන විශාල වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අය දවසින් දවස ඇවිල්ලා ඒ ගැන කියනවා. මම ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ටත් ඒ ගැන කිව්වා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. මොකද, ඒක සමුපකාරයේ ලියාපදිංචි ආයතනයක්. එතකොට සමුපකාරයට ඒ ගැන වගකීමක් තිබෙනවා කියලා ඒ ජනතාව කියනවා. ඒ නිසා ඒ අයගේ මුදල් ආයෝජනය කිරීම පිළිබඳ කාරණය ගැනත් ඔබතුමා පොඩ්ඩක් සොයා බලන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඊළඟට තවත් කාරණයක් තිබෙනවා, කියන්න. යම් යම් දිනුම් ඇදීම් කරනවා කියලා සාමාන්‍ය ජනතාවගෙන් දුරකථන හරහා රුපියල් 5,000, 10,000 වාගේ මුදල් ගන්නවා. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයක් තිබෙන නිසා මේ පිළිබඳවත් අවධානය යොමු කරවන්න මම කැමැතියි. ඒවාට අහුවෙන අය පොලීසියකට ගිහින් පැමිණිල්ලක් දැම්මාම පොලීසිය කියන කථාව තමයි නීතිය ක්‍රියාත්මක කරන්න ඒකට අදාළ නීති නැහැ කියන එක. ඒ නිසා ඒ සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීම පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියන කාරණයත් මම කියන්න කැමැතියි. මේ කියන හැම ක්ෂේත්‍රයක් ගැනම අදාළ අමාත්‍යාංශවල අවධානය යොමු කරවන්න. අය වැය විවාදය තුළදී මේ පිළිබඳව සාකච්ඡාවට ගත්තේ නැති නිසායි මම මේවා ගැන සඳහන් කළේ.

පොල් තෙල් සහ ෆාම් ඔයිල් සම්බන්ධව තිබෙන ප්‍රශ්නය ගැනත් මම කියන්න ඕනෑ. ලංකාවට ෆාම් ඔයිල් ගෙන එනවා. ඒ ගෙන එන්නේ බිස්කට් සහ බේකරි කර්මාන්තයට. හැබැයි, ඒ ආශ්‍රිතව අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් රැගෙන එමින් අවුරුදු ගාණක් තිස්සේ විශාල වංචාවක් සිදු කළා. ඒ හරහා ආණ්ඩුවට ලැබෙන්න තිබෙන විශාල ආදායමක් අහිමි වෙමින් පවතින බව දැනගන්නට ලැබෙනවා. ඒ වාගේම තමයි පොල් තෙල් ගෙනැල්ලා ප්‍රතිඅපනයන කරන විට ලංකාවේ virgin coconut oil විධියට ඒවා යවනවා. ඒ හැම තැනකම අපේ රජයට එකතු වෙන්න තිබෙන, රටට ලැබෙන්න තිබෙන මුදල් වංචනික ලෙස ව්‍යාපාරිකයන් සහවා ගන්නා බවක් පේනවා. මෙන්න මේ කරුණු පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම මම කරන්න කැමැතියි. මේවා අය වැය විවාදය තුළ සාකච්ඡාවට ගත්තේ නැති, නමුත් ජනතාවගේ ප්‍රශ්න කිහිපයක්. ඊළඟ අය වැය විවාදයේදී මේ මාතෘකා ගැන කථා කරන්නට සිද්ධ නොවන තැනට කටයුතු කිරීම පිළිබඳව අවධානය යොමු කරන්නය කියලා ඔබතුමන්ලාගේ කාර්යක්ෂම ආණ්ඩුවෙන් මම ඉල්ලීමක් කරනවා.

අද දවසේත් මේ අය වැය විවාදයේදී අපට IMF එක ගැන අහන්න ලැබුණා. විශේෂයෙන්ම සහානායකතුමා IMF පෙම්වතිය ගැනත් කිව්වා. ඇත්තටම IMF පෙම්වතියට වැඩිම පද ප්‍රමාණයක් හදපු කට්ටිය තමයි ඔබතුමන්ලා. වැඩියෙන්ම පද හදලා අන්තිමට පෙම්වතිය ගැන ගුණ ගායනා කරන්නට සිද්ධ වීම තමයි මේකේ තිබෙන අගය. අපි හැම දාම කිව්වේ ඒක හොඳයි, ඒ වෙලාවේ හැටියට IMF එකට යන්න ඕනෑ කියලා. අන්තිමට පද හදපු අයම ගුණ වර්ණනා කරමින් අපට බණිනවා. ඒක තමයි මේකේ තිබෙන ලස්සනම කථාව.

ඊළඟට, අරවා දුන්නා, මේවා දුන්නා, ඒවා දුන්නා කියලා ඔබතුමන්ලා දිගින් දිගටම කිව්වා. ඒ කියන්නේම අර විනාශකාරී වසර 76 තුළදී ආණ්ඩුවට ඕනෑ ආදායම් ටික සොයලා නේ. මොකද, ඔබතුමන්ලා ඇවිල්ලා එක පාරට අලුතෙන් බදු ගහගෙන ගහගෙන ගියේ නැහැ නේ. මිනිස්සුන්ගෙන් බැණුම් අහ අහා, විශේෂයෙන්ම අන්තිම අවුරුදු දෙකේ ආර්ථිකය කඩා වැටුණු වෙලාවේ අපේ පක්ෂය නොවුණත්, දකුණු කඳවුර විනාශ කළත්, රනිල් වික්‍රමසිංහ සහ ශෙහාන් සේමසිංහ වැනි අය මේ ආර්ථිකය ස්ථායී කරන්න විශාල සේවයක් කළා. ඔබතුමන්ලාට එක වචනයක් කියන්න බැහැ, ඒ මිනිස්සුන්ට ස්තුතිය පළ කරන්නවත්. හැබැයි, ඒ විධියට එකතු කර ගත්ත මුදල් ටික ඔබතුමන්ලා අතැනට යැව්වා, මෙතැනට යැව්වා. මම හැම දාම කියන දෙයක් තමයි, මේ රටේ හැම දාම වැය පිළිබඳව විතරයි කථා කරන්නේ. අය හම්බ කරන්න උත්සාහ කරන හැමෝටම, -මේ ආණ්ඩුවටත් ඒක බලපායි- සල්ලි හම්බ කරන්න උත්සාහ කරන හැම ඇමතිවරයකුටම විවේචන ඉදිරිපත් වෙනවා. ආණ්ඩුවට සල්ලි සොයන්න උත්සාහ කරන හැමෝටම අන්තිමට බැණුම් විතරයි ඉතුරු වෙන්නේ. ඔබතුමන්ලාටවත් බැහැ, ඒ පිළිබඳව අලුත් නිර්වචනයක් ලබා දෙන්න.

"අය", "අය", "අය" තමයි මේ රටේ ප්‍රශ්නය. අය වැය විවාදය ආරම්භ කරපු දවසේ ඉඳලාම මම ඇහුවා, ආදායම සොයන ක්‍රම. විශේෂයෙන්ම ලංකාව ඇතුළට ඩොලර් ගෙන එන්නට, පෙර නොගත් ඔබේ ආණ්ඩුවෙන් ගත් අලුත් ක්‍රියාමාර්ග මොනවාද කියලා. පසුගිය දවස්වල ඔබ කියනවා මම දැක්කා, වෙනත් රටවලින් උපදේශකවරු ඇවිල්ලා අපේ රටට සේවය කරනවා කියලා. ඒක ඉතා හොඳ දෙයක්. හැබැයි, පෙර සිටි උපදේශකවරුන්ට වඩා අලුත් උපදේශකවරු මේ රට වෙනුවෙන් ලබා දුන් උපදෙස් මොනවාද, ඒ අයගේ කාර්යක්ෂමතාව සහ ක්‍රියාකාරිත්වය කොහොමද කියලා අය වැය විවාදයේ කොහේ හෝ තැනකදී අහන්න ලැබුණා නම්, අපට සතුටු වෙන්නට පුළුවන්.

මේ වෙද්දී මීට වඩා වෙනස් ප්‍රශ්නයක් ලෝකයේ තිබෙනවා. චීනය සහ අනෙකුත් රටවල් ඉලක්ක කරගෙන ඇමෙරිකාව අලුත්

[ගරු අමිල ප්‍රසාද් මහතා]

tax එකක් ගහලා තිබෙනවා. සමහර විට අපේ රට වාගේ රටවල්වලට ඉදිරි කාලයේදී ඒ tax ගහන්න ඉඩ තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක චීනය ලෝකයේ අලුත් වෙළෙඳ පොළවල් සොයන්න උත්සාහ කරනවා. චීනය ඇමෙරිකාවට යවන භාණ්ඩවලට tax වදිනකොට චීනය අලුත් වෙළෙඳ පොළක් සොයන්න උත්සාහ කරද්දී, අපේ වෙළෙඳ පොළට චීනය අලුත් තරගකරුවෙක් බවට පත්වෙනවා. ඔබේ ආණ්ඩුව ඒ අලුත් තරගකරුවා වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන සැලසුම් මොනවාද කියලා කියනවා මම කොතැනකවත් දැක්කේ නැහැ.

ඒ වාගේම චීනයේ ආදායම අඩු වෙනකොට, අපි චීනයෙන් ගෙනෙන අමුද්‍රව්‍යවලට ඉදිරි කාලයේදී යම් tax එකක් ගහන්න අනිවාර්යයෙන්ම ඉඩ තිබෙනවා. එහෙම වුණොත්, අපේ නිෂ්පාදනවල මිල ඉහළ යනවා. අපේ නිෂ්පාදනවල මිල ඉහළ යනකොට අපට ලෝක වෙළෙඳ පොළේ තරග කරන්න බැහැ. එක පැත්තකින් අලුත් තරගකරුවෙක් එනවා, අනෙක් පැත්තෙන් නිෂ්පාදනවල මිල ඉහළ යනවා. එම නිසා රාජ්‍ය තාන්ත්‍රිකව ද්විපාර්ශ්වික සාකච්ඡාවලින් හෝ නිදහස් වෙළෙඳ ගිවිසුම් හරහා හෝ මෙන්න මේ ක්ෂේත්‍ර ගැන අවධානය යොමු නොකළොත් ඔබ අපේක්ෂා කරන ආර්ථික දියුණුව ලබා ගන්නට බැහැ.

ඒ වාගේම ඔබ දිගින් දිගටම දියුණු, පොහොසත් රටක් ගැන කියනවා. කලින් ආණ්ඩුවේ ජනාධිපතිවරයා කිව්වා, 2048දී තමයි මේ රට පොහොසත් රටක් කරන්නේ කියලා. ඔබ ඒක දිගටම විවේචනය කරනවා. හිටපු ජනාධිපතිවරයා කියූ පරිදි 2048දී අපිව ගෙනියනවා කියන තැනට ඔබේ ආණ්ඩුව රට ගෙනියන්නේ කවදාද කියලා අය වැය විවාදයේ අවසන් කථාවේදී හෝ අපි අහන්න කැමැතියි. ඒ, 2028දී ද, 2030දී ද, 2032දී ද, 2035දී ද? ඒ කොයි කාලයේද කියලා කියන්න. ඒ කාරණාව පිළිබඳව මම ඔබෙන් අහන්න කැමැතියි. විශේෂයෙන්ම ආණ්ඩුව අලුත් ව්‍යාපාර ආරම්භ කරපු බව කිව්වා. ඒ වාගේ උත්සාහයන් දරන එක පිළිබඳව ඉතාම සතුටුයි. ඔබේ අලුත් ව්‍යාපාරවලට සාර්ථකත්වය ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම සංචාරක ව්‍යාපාරය තව දියුණු කරන්න බලාපොරොත්තු වන බව මේ ආණ්ඩුව දිගින් දිගටම කියනවා අහන්න ලැබුණා. සංචාරකයන් මේ රටට ස්වභාවිකව පැමිණීම දිගින් දිගටම සිදු වෙනවා. සාමකාමී සහ කිසියම් විශේෂ විනාශකාරී කාලයක් නොවන අවස්ථාවල සංචාරකයින් එනවා. ඉදිරි කාල සීමාවේ අලුත් සංචාරකයන් පිරිසක් මේ රටට ගෙන්වා ගන්න එම කාලය සඳහා අලුතින් හදලා තිබෙන සැලසුම් මොනවාද කියලා මම දැන ගන්න කැමැතියි. අතීතයත් එක්කමයි හැම කථාවක්ම ගොඩනැහෙන්නේ. අපේ ප්‍රශ්නය තිබෙන්නේ අනාගතයේ. ඒ අනාගත රට අපි කොහොමද හදාගන්නේ කියන කාරණාව තමයි දැන් අපට තිබෙන්නේ. එම නිසා ගිය වසරවලට වඩා මේ වසර තුළ සංචාරකයින් වැඩි පිරිසක් මේ රටට ගෙන්වාගන්න අලුතින් කරන්න බලාපොරොත්තු වෙන්නේ මොනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

ඒ වාගේම මේ රටට ආයෝජනයන් පැමිණෙන බවත්, විශේෂයෙන්ම රජය ආයෝජනවලට යොමු වන බවත් කිව්වා. ඒ කාරණය ගත්තාම මම දිගින් දිගටම කියමින් තිබෙන දෙයක් තමයි, මේ රටේ ආයෝජන සම්බන්ධයෙන් කටයුතු කරනකොට ඉඩම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා කියන කාරණය. ඒ වාගේම අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. එම නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොකර මේ රටට ආයෝජකයන් ආකර්ෂණය කර ගන්න අපට බැහැ. පසුගිය කාල සීමාව -අවුරුදු 20ක්, 25ක්, 30ක්- අරගෙන බැලුවාම, ලාභ ශ්‍රමය සොයාගෙන තමයි අපේ රටට ආයෝජකයන් ආවේ. නමුත් දැන් එහෙම එන්නේ නැහැ. දැන් ලාභ ශ්‍රමය තිබෙන රටවල් අල්ලාගෙන ඉවරයි. දැන් ලාභ ශ්‍රමය මඟින් මේ රටට ආයෝජකයින්ගේ ආකර්ෂණය දිනාගන්න බැහැ. එම නිසා ඉඩම් ප්‍රතිපත්තිය සහ අධ්‍යාපන ප්‍රතිපත්තිය ආයෝජකයන් ආකර්ෂණය කරන ආකාරයෙන් සිද්ධ කරන්න කියලා මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. හේතුව, අපි මේ රට කවුරුන් හෝ මාර්ගයෙන් හදා ගත්තේ නැත්නම්, අපට ඉදිරි කාල සීමාවේ දීත් ඔබ විධියටම කියව කියවා ඉන්න විතරයි සිද්ධ වෙන්නේ. එම නිසා, "කවර විධියකටද මේක කරන්නේ?" කියන කාරණය තමයි අපට අහන්න තිබෙන්නේ.

ඒ වාගේම අය වැය විවාදය පුරාවටම වාගේ මම අදත් අහගෙන සිටියා, රුපියල් **බිලියන** 5,000ක ආදායමකුයි, 7,000ක වියදමකුයි කියන කාරණාව අමතක කරලා තමයි මේ අය වැය ගැන හැමෝම කථා කළේ. ආදායම සහ වියදම අතර රුපියල් බිලියන 2,000ක වෙනසක් තිබෙනවා. ඒ 2,000 උපයාගන්නට අලුතින් මුදල් අච්චු ගහනවාද, නැත්නම් අලුත් බදු ක්‍රම හඳුන්වා දෙන්න කටයුතු කරනවාද? ඒ 2,000 සොයාගන්නා ක්‍රමය පිළිබඳව අද අවසන් කථාවේදී හෝ තව දුරටත් පැහැදිලි කරන්න පුළුවන් නම් අපට සතුටු වෙන්න පුළුවන්. ඒ වාගේම මේ සමස්ත ක්‍රියාවලියෙන් පසු ලබන නොවැම්බර් මාසයේ ඔබේ ඊළඟ අය වැය එනකොට මේ අය වැයේ සාර්ථකත්වය, අසාර්ථකත්වය පිළිබඳව අපට සාකච්ඡා කරන්න පුළුවන්. ඔබේ අය වැයේ "අය" පාර්ශ්වය හදාගෙන "වැය" ටික වියදම් කරගෙන සාර්ථක ක්‍රියාවලියකින් පසු නොවැම්බර් මාසයේ ඊළඟ අය වැයත් එක්ක අපට හම්බවෙන්න ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින්, මේ අය වැය විවාදයට අදාළ මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.00]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි අය වැය පිළිබඳව හෝ අනෙක් කාරණා පිළිබඳව හෝ විවේචනය කරද්දී සභානායකතුමා කියනවා, අපි බණිනවා කියලා.

ඊයේ අගමැතිතුමිය කියනවා මම අහගෙන හිටියා, එකම කාරණාව දිගින් දිගටම කියනවා කියලා. අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී සමස්ත අය වැය පිළිබඳව අපි කථා කළා. අද එකම කාරණාව වුණත් කියන්න වෙනවා, කරන්නේ නැත්නම්. එහෙම නැත්නම් ඇහිලාත්, ඇහෙන්නේ නැතුව වාගේ ඉන්නවා නම්.

ලංකාවට crude coconut oil ගෙනැල්ලා නැවත නිෂ්පාදනය කරලා වෙළෙඳ පොළට දැමීමේදී කරන හොරකම් ගැන මේ පාර්ලිමේන්තුව තුළ මම අද කථා කරන්නේ හතරවැනි වතාවට. වසන්ත සමරසිංහ ඇමතිතුමාටත් මම එදා ඒ විස්තර ලබා දුන්නා. *[බාධා කිරීමක්]* නැහැ, එදා දුන්නා. ඒ Reply එකෙන් සෑහීමකට පත් වෙන්න බැරි නිසායි මම අදත් ඒ සම්බන්ධව මේ කරුණු දක්වන්නේ. ඇත්ත වශයෙන්ම ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ

01වැනි දා ඉඳලා මේ අවුරුද්දේ ජනවාරි මාසයේ 01වැනි දා වෙනකල් පොල්තෙල් කිලෝග්‍රෑම් මිලියන 42ක් විතර ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. ඇමතිතුමනි, මේ පොල්තෙල්වලින් අය විය යුතු ගණන දළ වශයෙන් රුපියල් බිලියන 6කට වැඩියි. මුදල් ඇමති හැටියට ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා අය වැය කථාව ඉදිරිපත් කරනකොට කිව්වා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගිය අවුරුද්දේ ලබා දීලා තිබුණු target එක සපුරන්න රුපියල් බිලියන 20යි අඩු කියලා. මට තේරෙන්නේ නැහැ, ඇයි මේ රුපියල් බිලියන 6 අය කර නොගන්නේ කියලා. මොකද හේතුව, ගිය ආණ්ඩුවේ හිටපු මුදල් ඇමතිවරයාගෙන් තමයි ගිය අවුරුද්දේ 7 වැනි මාසයේ 31වැනි දා request කරලා තිබෙන්නේ මේ tax එක අයින් කර දෙන්න කියලා. ඊට පසුව Inland Revenue Department එක ගිය අවුරුද්දේ 08 වැනි මාසයේ 29වැනි දා ලිඛිතව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට දන්වා තිබෙනවා, මේ සියයට 20.5 ගෙවන්න ඕනෑය කියලා, VAT එක සියයට 18කුයි මේ tax එකයි. මම අගමැතිතුමියගෙන් පෙබරවාරි 07වැනි දා මේ පිළිබඳව ප්‍රශ්නයක් ඇහුවා. එතුමිය ඊට ඉතා පැහැදිලි, සාර්ථක පිළිතුරක් ලබා දුන්නා. මම නැවත ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, ඒ ගැන. නමුත් එකම දේ තමයි, මාස එකහමාරක් ගිහිල්ලාත් ඒ පිළිබඳව යම් සාධනීය පියවරක් ක්‍රියාත්මක නොවීම, අගමැතිතුමියනි. මම ඔබතුමියගේ අවධානයට යොමු කරනවා, ඒ ගැන හොයා බලන්න කියලා. ඔබතුමිය නිවැරදිව උත්තර දුන්නා. නමුත්, ඒ පාරේ යන්නේ නැහැ.

ඔබතුමිය උත්තර දුන් පසු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මේ ගැන පරීක්ෂණයක් කරනවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ පරීක්ෂණයට අදාළ වෙන්නේ, දේශීයව නිෂ්පාදනය කරන පොල් සහ පොල්තෙල්. පොල්තෙල් පිටරටින් ගෙන්වන එකට Sri Lanka Customs එකෙන් tax එකක් ගහනවා. හැබැයි, නැවත refine කරලා වෙළෙඳ පොළට විකුණන එක සම්පූර්ණයෙන්ම අයිති මුදල් අමාත්‍යාංශයට. මට ආරංචියි, එක්තරා නියෝජ්‍ය ඇමතිවරයෙක් මේ ගැනුම්කරුවන් ඔක්කෝම එක්ක සාකච්ඡාවක් පවත්වා මේක reverse කරන්න පුළුවන්ද කියා හොයා බලනවා කියලා. තව පිරිසක් ඉන්නවා, බදු ගෙවපු. බදු ගෙවපු අය අහනවා, ඔවුන් ගෙවපු බදු මුදල් ටික නැවත ලැබෙනවාද කියලා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අනුව නම් මේ බදු අනිවාර්යයෙන්ම ගෙවන්න ඕනෑ. මේක නොගෙවා ඉන්නේ ඇයි කියලා මම දන්නේ නැහැ. මොකද මහ බැංකු බැඳුම්කර වංචාව නිසා සිදු වූ පාඩුව රුපියල් බිලියන 10යි. දැන් පොල්තෙල්වලින් බදු නොගෙවූ මාස 13කට පාඩුව රුපියල් බිලියන 6යි. මම අගමැතිතුමියගෙන් නැවත මේ ඉල්ලීම කළා. මම හිතුවා, මුදල් නියෝජ්‍ය ඇමතිතුමා අද මේ වෙලාවේ සභාවේ ඉඳිවි කියලා. එතුමාගෙන්වත් අහන්න බලාගෙන සිටියේ මේ මොකද වෙන්නේ, මුදල් අමාත්‍යාංශය මේ සම්බන්ධව උපදෙස් දෙන්නේ නැත්තේ ඇයි කියලා. සමහර විට එතුමා මේ ගැන දන්නේත් නැතිව ඇති. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, එම කරුණ එතුමාගේ අවධානයට යොමු කරන්න.

ඔන්න, අපි ආණ්ඩුවට උදව්වක් කරන්නේ. එහෙම නැතුව, මම මේ ආණ්ඩුව විවේචනය කිරීමක්වත්, ආණ්ඩුවට ඇහිල්ල දික් කිරීමක්වත් නොවෙයි කරන්නේ. ගිය ආණ්ඩුවක් කාලයේ තමයි මේක පටන් ගත්තේ. මේකට අනුග්‍රහය ලබා දුන්නේ පසුගිය ආණ්ඩුව. හැබැයි මේ ආණ්ඩුව ඇවිල්ලාත් වැඩේ දිගටම යනවා. අදට මේ ජනාධිපතිතුමා පත් වෙලා මාස 6යි. එතුමාගේ ධුර කාලයෙන් සියයට 10ක් ගෙවී අවසන්. මම මේ අය වැය ගැන, ඒ වාගේ ඒවා ගැන තව දීර්ඝව කථා කරන්නේ නැහැ. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට ආණ්ඩුවට ආවඩන්නවත්, ආණ්ඩුව කරන හැමදේම හොඳයි කියලා කියන්නවත් නොවෙයි අපි ඉන්නේ. ආණ්ඩුව හොඳ දේවල් කරන්න ඕනෑ නිසා තමයි ජනතාව ඡන්දය දීලා ඒගොල්ලන්ව පත් කරලා තිබෙන්නේ. ආණ්ඩුව මේක කළා, ආණ්ඩුව අරක කළා කියලා කියන්න අර පිටුපස පේළියේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් ඉන්නවා. අපි ඉන්නේ ඒවාට නොවෙයි. අපි අඛුපාඩු පෙන්වා දෙනවා. ඒ නිසා ඒකට අපට දොස් කියන්න එපා.

බලශක්ති ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. මම එතුමාගේ අවධානයට යොමු කරනවා, මේ කාරණය. ඊළඟ පාර්ලිමේන්තු සතියේදී මම සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන්නම්. ලංකා ගල් අඟුරු සමාගමේ සිද්ධ වෙන්නේ මොකක්ද කියලා හොයා බලන්න, ගරු ඇමතිතුමනි. මොකද, ඒකේ ඉන්නේ මා දන්නා තරමට එක්සත් ජාතික පක්ෂයේ business council එකේ හිටපු පුද්ගලයෙක්. එතුමා එක්ක ගොල්ෆ් ගහන අයත් එක්ක මොකක්ද කරන්න යන්නේ කියන එක ඔබතුමා හොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීමක්]* නැහැ, දැන් ඉන්න කෙනා. ඔබතුමන්ලා දාලා ඉන්න කෙනා පරණ යූඑන්පීකාරයෙක්. ඒකයි, ඒ ගැන හොයා බලන්න කියන්නේ. ඒක නේ අපි ඒ කෙනා ගැන දන්නේ. ඒ නිසා ඒ ගැන හොයා බලන්න කියලා ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදාළ විෂය භාර අමාත්‍යවරුන්ට මම තව කාරණා 2ක් ගැන කියන්න කැමැතියි.

ගරු අගමැතිතුමියනි, ආර්ථික අර්බුදයක් පැවති පසුගිය කාලයේ ෂෙල් ගෑස් සමාගමේ විශාල හොරකම් ප්‍රමාණයක් සිද්ධ වුණා. ඩොලර් 104කට පමණ ගන්න ඕනෑ එක මට මතක විධියට ඩොලර් 129කට පමණ ගත්තා. මම COPE එකේ සාමාජිකයෙකු විධියට අවස්ථා ගණනාවකදී මේ සම්බන්ධව ලිඛිතව ඉල්ලීම් කළා, මේ සමාගමේ නිලධාරීන් ගෙන්වන්න කියලා. නමුත්, ගෙන්වූයේ නැහැ. මම දන්නවා, ඒක ඉහළ පෙළේ ආශීර්වාදය ඇතිවයි කල් දමමින් හිටියේ කියලා. මොකද, ලංකාවේ බෝයාවලට ලොකු නැව්වලට එන්න බැරි බව දැනගෙන පොඩි නැව්වලට premium එකත් එක්ක දුන්නා. ඒක පෝලිම් නැති කරන්න එක පාරක් දුන්නා නම් කමක් නැහැ. නමුත්, දිගින් දිගටම දුන්නා. ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා, මේකෙන් කොමිස් ගත්ත පිරිස හොයන්න. ඔබතුමන්ලාගේ වැරැද්දක් නොවෙයි. මේක වුණේ ගිය ආණ්ඩුව කාලයේ. මේ දේ වුණා, නමුත් COPE එකට ඒ නිලධාරීන් ගෙන්වූයේම නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව කාරණයක් මම බලශක්ති ඇමතිතුමාට යොමු කරනවා. ඔය අර්බුද කාලයේදීම තමයි, NRR කියන ක්‍රමයට තෙල් ගෙන්වූයේ. NRR කියන්නේ, තෙල් සංස්ථාවයි, ගෙන්වන කෙනායි, මහ බැංකුවයි එකතු වෙලා කරන එකක්. උදාහරණයක් කිව්වොත්, අඩු ලන්සුලාභියාට තෙල් ගේන්න අවස්ථාව දුන්නාම ඔහුට ලබා දෙන order එක ඩොලර් මිලියන 50ක් නම් සියයට 10ක් ගෙවන්න ඕනෑ. හැබැයි ඒ වෙලාවේ මහ බැංකුවට සල්ලි නැහැ, ඩොලර් මිලියන 5ක් ගෙවන්න. ඊට පස්සේ බිලී කොක්ක දාගෙන එනවා, දෙවෙනි කෙනා. ඒ දෙවෙනි කෙනා එනවා, "හරි, මම තෙල් ගේන්නම්, හැබැයි මගේ ගාන මේකයි" කියමින්. එතකොට මේගොල්ලන් පෝලිම් නැති කිරීමේ මුවාවෙන් ඒකට අනුමැතිය ලබා දෙනවා. හැබැයි, මාසයක් විතර ගිහිල්ලා නැව එනකොට මාසයකට කලින් ඩොලර් මිලියන 5ක් තිබුණේ නැති මහ බැංකුවට ඩොලර් මිලියන 50ක් එනවා. රුපියල් load කරලා තෙල් සංස්ථාවෙන්, කොහොමද එක පාරටම මාසෙකින් ඩොලර් මිලියන 50ක් එන්නේ? තව ඒවා තිබෙනවා. Brent crude oil ගේනවා කියලා සයිබීරියන් නැව් ආවා, ගිය වතාවේ. අර්බුදය කළමනාකරණය කිරීමේ මුවාවෙන් මේවා කළේ. ඔන්න ඇමතිතුමා, ඕනෑ තරම්

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

case තිබෙනවා. අර්බුදය කළමනාකරණය කිරීමේ මුවාවෙන් ගසා කාපුවා හොයන්න පුළුවන්. ඔබතුමන්ලාට ගිය ආණ්ඩුවේ හිටපු ජනාධිපතිත් එක්ක ඩීල් එකක් නැත්නම් මේ ටික හොයන්න. මොකද, තෙල් සංස්ථාවේ ඩීල් ටික ගියේ මහ මන්දිරවලම තමයි. ඒක ඇමතිවරයා හිටපු තැන්වලටත් වඩා එහා තැන්වලින් ගියේ. NRRවලින් තෙල් ගෙනාවේ කොහොමද, ටෙන්ඩර් cancel කරලා හදිසි මිලදී ගැනීම් කියලා අවුරුදු ගණනක් ගෑස් ගෙනාවේ කොහොමද කියන එකත් හොයන්න.

තව කියන්න ගොඩක් දේවල් තිබුණත්, මගේ ඉතිරි වෙලාව මම කබීර් හෂීම් මැතිතුමාට ලබා දෙනවා. මොකද, අද විවේචනය කරන්න එපා කියලා තිබෙන නිසා අඩුපාඩු පෙන්වා දීමයි කළේ. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.08]

ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මුණීර් මුලාපර් - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කරන්න කාලය වෙන් කර දීම ගැන මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, මේ මොහොතේ ඊශ්‍රායලය විසින් පලස්තීනයට ප්‍රහාරයක් එල්ල කරලා පැය 72ක් තුළ 590දෙනෙක් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා, ඒ වාගේම තුවාලකරුවන් 1,042ක් සිටිනවා කියන එක. විශේෂයෙන් මේ සභාව තුළ උදේ වරුවේ අපෙන් ප්‍රශ්නයක් ඇසුවා, මේ මොහොතේ සිද්ධ වන මේ ප්‍රහාරය පිළිබඳව අප දරන ස්ථාවරය මොකක්ද කියලා. ඒ ප්‍රශ්නය අහපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයාට මම කියන්න කැමැතියි, ඉතිහාසය පුරාවට දුෂ්ටත්වයට එරෙහිව ජාතික ජන බලවේගය හැම විටම හිටගෙන තිබෙන බව. අපේ රට තුළ වේවා, විදේශයන්හි වේවා දුෂ්ටත්වයට එරෙහි ඕනෑම අවස්ථාවක ජාතික ජන බලවේගය ලෙස අපි ඒකට එරෙහිව හිටගෙන තිබෙනවා.

මම මතක් කරන්න කැමැතියි, 2025 ජනවාරි මාසයේ 19වැනි දා මේ යුද කලාපය තුළ සටන් විරාමයක් ආරම්භ වුණු බව. ඒ සටන් විරාමයත් කඩ කරමින්, උපවාස සමය තුළ නැවත මේ ප්‍රහාර දියත් වුණා. විශේෂයෙන් මේ ප්‍රහාරයෙන් විශාල වශයෙන් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙන්නේ කුඩා දරුවන්. මම හිතන විධියට කිසිම කෙනෙකු මේ ප්‍රහාරය අනුමත කරන්නේ නැහැ. හැමෝම එය තරයේ හෙළා දකිනවා කියන එක මා විශ්වාස කරන දෙයක්.

ඒකට හේතුව මෙයයි. පලස්තීනය යනු මුස්ලිම්, කතෝලික, ක්‍රිස්තියානි ජනතාව ඇතුළු සාමයට ලැදි ඊශ්‍රායලය පුරවැසියන් පවා ජීවත් වන භූමියක්. ඒ සියලුදෙනාම සාමයට ලැදි, සාමය පිළිබඳ බලාපොරොත්තුවෙන් ජීවත් වන පිරිස්. මේ ප්‍රහාරයත් එක්ක සටන් විරාමය කඩ කරමින් ඒ මිලේච්ඡත්වය ඔවුන් ලෝකයට පෙන්වා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් සඳහන් කළ පරිදිම මේ ප්‍රහාරය දෙස බලද්දී අපි දකින්නේ සදාචාරාත්මක බංකොලොත්භාවයයි. මේ ප්‍රහාරය පිළිබඳව රජය ගන්නා ස්ථාවරය සහ මේ ආණ්ඩුව පිළිබඳව ප්‍රශ්න කරපු ඒ මන්ත්‍රීවරයාට මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි, පලස්තීන සහයෝගිතා සංවිධානයේ සභාපතිත්වය දරන්නේත් ජාතික ජන බලවේගයයි කියන එක.

එම නිසා ඒ සහයෝගිතාවත් එක්ක කටයුතු කරන අපි කිසිම අවස්ථාවක මෙවැනි ප්‍රහාර අනුමත කරන්නේ නැහැ. මෙවැනි ප්‍රහාර එල්ල කරන විට ඔබේ ස්ථාවරය කුමක්ද කියලා ප්‍රශ්න කරන උදවියට මම කියන්න කැමැතියි, අපි කවදාවත් මේ ප්‍රශ්නය දේශපාලනීකරණය කරගෙන නැහැ කියන එක. අපි මේ ප්‍රශ්නය දෙස බලන්නේ මානුෂීය පැත්තෙන්. ආගමික, වාර්ගික ප්‍රශ්නයකට එහා ගොස් විශේෂයෙන්ම මානුෂීය මෙහෙවරක, මානුෂීය පැත්තෙන් තමයි මේ ප්‍රශ්නය දෙස අපි බලන්නේ. අපි හැමකෙනාම දන්නවා, ලෝකය තුළත්, විශේෂයෙන්ම මැද පෙරදිග කලාපය තුළත් යුද තත්ත්වයක් ඇති වනවිට එයින් අපේ රටත් විශාල ලෙස පීඩා විඳින බව. විශේෂයෙන්ම අපේ රටේ පුරවැසියන් විශාල පිරිසකුත් ඒ කලාපය තුළ ඉන්නවා. ඒ නිසා අපේ ස්ථාවරය මම ඉතා කෙටියෙන් සඳහන් කරන්නම්. ඉතිහාසය පුරාවටම අපට බලය නැති වෙලාවේදීත්, දේශපාලන ව්‍යාපාරයක් ලෙස සිටින වෙලාව තුළදීත් පැහැදිලිවම පලස්තීනයේ නිදහස වෙනුවෙන්, ඔවුන්ට සාධාරණත්වය ලැබිය යුතුයි කියන ස්ථාවරය ඇතුව කටයුතු කරපු පිරිසක්, අපි. දිගින් දිගටම ඒ ප්‍රදේශය තුළ මෙවැනි දේ සිද්ධ නොවී එය සාමකාමී කලාපයක් විය යුතුයි කියන එක තමයි අපේ ප්‍රාර්ථනාව සහ මේ ලෝකය තුළම ජීවත් වන සියල්ලන්ගේම ප්‍රාර්ථනාව කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රහාර මුල් කරගෙන පාර්ලිමේන්තුවේදීත් ප්‍රශ්න කරනවා, මෙවැනි ප්‍රහාරයක් එල්ල වෙලා තිබෙනවා, ඔබේ ස්ථාවරය මොකක්ද කියලා. එවැනි දේ ප්‍රශ්න කිරීම තුළ ව්‍යංගයෙන් අපට ලබා දෙන උපදෙස් තමයි, ඔවුන් මේ වෙනුවෙන් පෙනී සිටිනවා, නමුත් රජය මේ වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ කියන කාරණාව. ඒ කාරණාව කියමින් එළඹෙන පළාත් පාලන මැතිවරණය තුළ තමන්ට ලකුණු දමා ගැනීම සඳහා සමහරු උත්සාහ කරනවා. අපි ඒ තත්ත්වයට පත් වෙන්නේ නැහැ. මැතිවරණ තිබුණත්, නොතිබුණත්; අපි බලයේ හිටියත්, නොසිටියත් හැමදාමත් දුෂ්ටත්වයට එරෙහිව අපි හඬ නඟා තිබෙනවා. අපි හැමදාමත් ඒ දුෂ්ටත්වය පරාජය කිරීම වෙනුවෙන් කටයුතු කරනවා, කොතැන වුවත් අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා කියන කාරණාව මතක් කරමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 40ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.14]

ගරු කබීර් හෂීම් මහතා
(මාණ්පුමිකු කබීර් හෂීම්)
(The Hon. Kabir Hashim)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගෝලීය මට්ටම ගත්තාම, රටවල් විශාල ප්‍රමාණයක් ණය අර්බුදයට හිරවෙලා ඉන්න අවස්ථාවක් තමයි මේ අවස්ථාව. ශ්‍රී ලංකාවත් ඒ රටවල් අතුරින් එකක්. 2022දී අපේ රට

බංකොලොත්භාවයට පත් වුණා. හැබැයි මම දකිනවා, අද වනකොට අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමායි, ජාතික ජන බලවේගය ආණ්ඩුවයි වාසනාවන්තයි කියලා. මම එසේ කියන්න හේතුව මොකක්ද? 2022දී අපි බංකොලොත් වෙච්ච අවධියේ සහ 2024 අවුරුද්දේ අග භාගයේදී ජාතික ජන බලවේගය මේ රට භාර ගන්නකොට ලොකු වෙනසක් ඇතිවෙලා තිබුණා. 2022 අවුරුද්දේදී අපේ විදේශ සංචිතය බින්දුවට වැටිලා තිබුණේ; ඍණ අගයකට ගිහිල්ලා තිබුණේ. 2024 අවුරුද්දේ අග භාගයේදී මේ ආණ්ඩුව රට භාර ගන්නකොට විදේශ සංචිතය ඩොලර් බිලියන 6.1කට වැඩි වෙලා තිබුණා.

උද්ධමනය ගත්තොත්, 2022 අවුරුද්දේදී උද්ධමනය සියයට 70කට වැඩි වෙලා තිබුණා. ආහාර උද්ධමනය සියයට 98කට වැඩිවෙලා තිබුණා. හැබැයි, 2024 අවුරුද්දේ අග භාගයේදී මේ ආණ්ඩුව රට භාර ගන්නකොට උද්ධමනය සියයට 2.5කට අඩු වෙලා තිබුණා.

මේ ආණ්ඩුව ඉතා වාසනාවන්තයි නේ. රාජ්‍ය ආදායම, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම 2022දී සියයට 7යි. රාජ්‍ය ආදායම එච්චර අඩු වෙලා තිබුණා. හැබැයි, ඔබතුමන්ලා රට භාර ගන්නකොට රාජ්‍ය ආදායම සියයට 12.5ත් ඉක්මවා ගිහිල්ලායි තිබුණේ.

ඊළඟට පොලී අනුපාතය ගන්න. 2022දී පොලී අනුපාතය සියයට 36 දක්වා වැඩිවෙලා තිබුණා. ඔබතුමන්ලා 2024 අවුරුද්දේ අග භාගයේදී ආණ්ඩුව භාර ගන්නකොට පොලී අනුපාතය සියයට 10ට අඩුවෙලා තිබුණා. ඒ අනුව ඔබතුමන්ලා බොහොම වාසනාවන්තයි. ඔබතුමන්ලා මේ රට භාර ගන්නකොට හැම ආර්ථික දර්ශකයක්ම ධනාත්මක පැත්තට හැරිලා තිබුණේ. හැබැයි, ඒ දර්ශක ධනාත්මක කරන්න ලොකු කණ්ඩායමක් ඒ වෙනුවෙන් කැප වුණා; ඔවුන් පීඩනයට පත් වුණා; ඒ වෙනුවෙන් විශාල කැප කිරීමක් කළා. මොකද, පොළොවේ තිබුණු තත්ත්වය වෙනස්. ඒ තත්ත්වය තවම තිබෙනවා. ඒ වෙනස් තත්ත්වය අපි දැනගන්න ඕනෑ.

එලෙස ඒ වෙනුවෙන් විශාල කැප කිරීමක් කළ එක කොටස්‌යාසයක් තමයි, මේ රටේ පහළ මට්ටමේ ඉන්න මිනිස්සු. ඔවුන් ඒ වෙනුවෙන් කරපු කැපවීම සහ ලබා දුන් දායකත්වය බලන්න. එක පැත්තකින් ගත්තාම මේ කාල පරිච්ඡේදය තුළ දරිද්‍රතා රේඛාවට පහළින් ඉන්න පවුල් ප්‍රමාණය සියයට 45කින් වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, 2022 අවුරුද්දෙන් පසුව. ඒ වාගේම වේලක් හැර වේලක් කන පවුල් ප්‍රමාණය වර්ධනය වෙලා තිබෙනවා.

තවත් කණ්ඩායමක් තමයි, මැද පන්තියේ ජනතාව. ඔවුන් තමයි සැඟවුණු දුප්පතුන්, “the hidden poor" කියන්නේ. මොකද, අර්බුදයත් එක්ක, රට බංකොලොත්භාවයට පත් වුණාට පසුව විදුලි බිල වැඩි වුණා; ගෑස් මිල වැඩි වුණා; තෙල් මිල වැඩි වුණා; පොලී අනුපාතය වැඩි වුණා; van hire එකට ගෙවන ගණන වැඩි වුණා. තමන්ගේ සීමිත පඩියත් එක්ක ඒ තත්ත්වයට ඔරොත්තු දෙන්න බැරිව විශාල පීඩනයකට ලක් වෙච්ච පිරිසක් හිටියා. ඒ පිරිස තුළ හිටියා, රාජ්‍ය සේවකයන්, පෞද්ගලික අංශයේ විධායක නිලධාරීන් ආදී විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පහළ මැද පන්තියේ ජනතාව.

ඒ වාගේම එලෙස පීඩනයට පත් වෙච්ච, කැපවීම් කළ, මේ රටේ මේ ආර්ථික දර්ශක ටික හදන්න කැප වෙච්ච තවත් කොටසක් ඉන්නවා. ඒ කොටස තමයි, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්. ඔවුන්ගේ කර්මාන්ත කඩාගෙන වැටුණා. මොකද, ඔවුන්ගේ අක්‍රිය ණය වැඩි වුණා. CRIB එකට ඇතුළත් වුණු ප්‍රමාණය වැඩි වුණා. පරාටෙ නීතිය ක්‍රියාත්මක කරන්න වුණු ප්‍රමාණය වැඩි වුණා. ණය පොලිය සියයට 36ට වැඩි වුණා. ඔවුන්ට ණයක් ගන්න බැරි වුණා. අමුද්‍රව්‍යවල මිල වැඩි වුණා. වෙළෙඳ පොළ නැති වුණා. ඒ තුළ අවිධිමත් අංශයේ -ස්වයං රැකියා කරන, පෞද්ගලික අංශයේ වැඩ කරන- සමස්ත ජනතාවත් කැපවීම් කරලා තමයි මේ රටේ මේ ආර්ථික දර්ශක ටික ධන අගයකට ගෙන එන්න කටයුතු කළේ.

ජවිපෙ ආණ්ඩුව මැතිවරණයේදී කිව්වා, මේ පොළොවේ තිබෙන අසමාන තත්ත්වය සමාන කරනවාය කියලා. මේ අසාමාන්‍ය බර, එක කණ්ඩායමකින් -සාමාන්‍ය මිනිසුන්ගෙන්- අය කරන බද්ද -ඔවුන් කරන කැපවීම- නිවැරදි කරලා, සාමාන්‍ය කරලා, සමබර තත්ත්වයක් ඇති කරන්නට ඔබතුමන්ලා පොරොන්දු වුණා. සමාජයේ වරප්‍රසාද ලත් කොටසක් නිදහසේ ඉන්නවා, ඔවුන් බදු ගෙවන්නේ නැහැ, ඒ නිසා වැඩ කරන ජනතාව මත විතරක් පටවා තිබෙන බර වරප්‍රසාද ලත් බලවතුන්ටත් - හැමෝටම - සමානව බෙදී යන ක්‍රමයක් හදන්න කටයුතු කරන බවට ජනතා විමුක්ති පෙරමුණු ආණ්ඩුව පොරොන්දු වුණා. ඔබතුමන්ලා පොරොන්දු වුණේ ඒ වෙනස කරන්න නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ තිබෙන ගිවිසුම සංශෝධනය කරන්න; ඒ වාගේම ණය ආපසු ගෙවීම -ප්‍රතිව්‍යුහගත කිරීම- සංශෝධනය කරන්න; ආර්ථික මොඩලය සම්පූර්ණයෙන් වෙනස් කරලා, අලුත් මොඩලයක් ගෙන එන්න; බලවතුන්ගේ මාෆියාව කඩන්න, දූෂණය සම්පූර්ණයෙන් නතර කරන්න. ඒ ටික ඔක්කෝම කරනවාය කියලා මේ රටේ ජනතාවට පොරොන්දු වෙලා තමයි මේ ආණ්ඩුව ඡන්දය ගත්තේ. හැබැයි, මේ අය වැයෙන් ඒ එකක්වත් ආමන්ත්‍රණය කරලා තිබෙනවාද? මේ අය වැයේදී ඔබතුමන්ලා විශ්වාස කරපු, මේ රට වෙනුවෙන් කැප වුණු සාමාන්‍ය ජනතාව ආමන්ත්‍රණය කරලා තිබෙනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා. විවිධ දේවල් වැඩි කරලා ඇති, සීමාසහිතව. ඒක ප්‍රමාණවත්ද? System change එකක් සිදුවන තරමට ඒවා වෙනස් කරලා තිබෙනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ තමයි මහ බැංකුව, භාණ්ඩාගාරය තිබෙන්නේ. එතකොට ඒ ප්‍රධාන ආයතන දෙකට තමයි ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සම්පූර්ණ බලය තිබෙන්නේ. බොහෝ ආර්ථික විශේෂඥයන්, ජාත්‍යන්තර මට්ටමේ ආර්ථික විශේෂඥයන් මේ ණය අර්බුදය ගැන කියනවා, මේ තමයි ලෝක ඉතිහාසයේ ඇති වෙච්ච දරුණුම ණය අර්බුදය කියලා. ඒක අපි කවුරුත් දන්නවා. බරපතළ විධියට දැන් ඒක ව්‍යාප්ත වෙනවා. රටවල් කිහිපයක් ඒ තුළට වැටිලා තිබෙනවා. දියුණු වෙමින් පවතින රටවල -developing countries- කිව්වාම අපිත් ඒ ගොඩට අයිති වෙනවා සම්පූර්ණ රාජ්‍ය ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 29යි. එතකොට ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 29ක් ඒ රටවල් ගෙවන්න තිබෙනවා. ලෝක ජනගහනයෙන් 1/3ක පිරිසක් දියුණු වෙමින් පවතින රටවල ජීවත් වෙනවා. ඒ කියන්නේ, බිලියන 3.3ක්.

අපේ වාගේ රටවල ඉන්නා අයට අධ්‍යාපනයටයි, සෞඛ්‍යයටයි වියදම් කරන ප්‍රමාණයට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් වාර්ෂික ණය පොලිය ගෙවන්න වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක තමයි ලංකාවේ තත්ත්වය. අපි තවම ගොඩ ගිහිල්ලා නැහැ. අපිට තව සෑහෙන වැඩ කොටසක් කරන්න තිබෙනවා. Many economic experts see the global financial architecture as dysfunctional. ඒ කියන්නේ බොහෝ විශේෂඥයෝ විශ්වාස කරනවා, මේ ගෝලීය මූල්‍ය වාස්තුව, නැත්නම් ගෝලීය මූල්‍ය රාමුව දුර්වලයි, අභාවිතයි කියලා. ආර්ථික විශේෂඥයෝ එහෙම හිතනවා. මේ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබියදී, එක්සත්

[ගරු කබීර් හෂීම් මහතා]

ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා වන ඇන්ටෝනියෝ ගුටරෙස් මහතා ඒක තවදුරටත් තහවුරු කර කියනවා, ගෝලීය මූල්‍ය රාමුව විශ්වාස භංගත්වයට පත් වෙච්ච, ඒ වාගේම සදාචාර භංගත්වයට පත් වෙච්ච එකක් කියලා. That is a very powerful statement. The Secretary-General of United Nations, António Guterres says, "the global financial system is morally bankrupt". මේ වාගේ පරිසරයක් ලෝකයේ දැන් ඇති වී ගෙන යනවා. තවදුරටත් ගෝලීය මූල්‍ය රාමුව එක්සත් ජනපදයට, බටහිර රටවලට අයුතු වාසියක් ලබා දෙන අතර, සාමාන්‍යයෙන් ගෝලීය දකුණට අයත් වන අපි වාගේ දුප්පත් රටවලට අවාසිසහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන බවට මේ විශේෂඥයන් කථා කරනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයත් මේක ප්‍රකාශ කරනවා.

On the 11th of February, 2025, there was a special UN-HRC session held on reform on international debt. The whole session was on reform on international debt and the UN tied debt restructuring to human rights and the SDGs. So, you can imagine how important it has become. මානව හිමිකම්වලට ණය ප්‍රතිව්‍යුහගත කිරීම ඒකාබද්ධ කළා, එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන්. මේ මුළු ලෝකයම, ගෝලීය උතුර, ගෝලීය දකුණට අසාධාරණ විධියට බලපෑමක් කරලා මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කරනවා කියලා මතයක් ඇති වෙලා තිබෙන පරිසරයක ඇයි, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමායි, ජනතා විමුක්ති පෙරමුණයි රනිල් වික්‍රමසිංහ සාකච්ඡා කරපු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මොඩලයට අනුවම එකඟ වුණේ? මොකද, ඒ මොඩලයේ සංශෝධනය කළ යුතු යම් යම් තැන් තිබුණා. හැබැයි, ඒ කිසි දෙයක් ගැන බලන්නේ නැතුව කටයුතු කර තිබෙනවා. අද මේ ලෝක පරිසරය වෙනස් වෙලා තිබෙන හැටි බැලුවාම, සමහර විට අපි ආපසු ගෙවන ණයවලට වැඩි වට්ටමක් ලැබෙන ආකාරයක් ගැන හරියට සාකච්ඡා කරලා තිබුණා නම්, තර්ක-විතර්ක කරලා තිබුණා නම්, මීට වඩා වැඩි වට්ටමක් ලබා ගෙන මීට වඩා අඩු ප්‍රමාණයක් ගෙවීමට අපට එකඟ වෙන්න තිබුණා. හැබැයි, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමායි, මේ ආණ්ඩුවයි කිසිම සාකච්ඡාවක් කළේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහතා අත්සන් කරපු කොළයටම අත්සන් කරලා හැම කොන්දේසියකටම එකඟ වුණා. මම හිතනවා ඒකෙන් අපට පාඩුවක් වුණාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට දැන් ණය ගෙවන්න පටන් ගන්න වෙන්නේ 2028දී. අපි 2028 සිට ණය ගෙවන්න ඕනෑ. මේ වසරේ අපි ණය ගෙවන්නේ නැහැ. හැබැයි, මේ වසරේ ගෙවීම්වල ලොකු බරක් තිබෙනවා. අපි ඒක දැන ගන්න ඕනෑ. මහ බැංකුවේ External Resources Department එකෙන් අරගෙන තමයි මම මේ සංඛ්‍යාලේඛන කියන්නේ. මම විශ්වාස කරනවා, මේ සංඛ්‍යාලේඛන නිවැරදියි කියලා. අපේ විදේශ විනිමය සංචිතය දැන් වෙනකොට ඩොලර් බිලියන 6.1යි. ඒක ලොකු ගණනක්, අපි හිටපු තැන අනුව බැලුවාම. Asian Clearing Union කියලා එකක් තිබෙනවා. Asian Clearing Union කියන්නේ මොකක්ද? අපි ආසියානික රටවල් එක්ක කරන හැම ආනයන අපනයන ගනුදෙනුවක්ම එම Asian Clearing Union එක හරහා තමයි බෙරා ගන්නේ. 2022 සිට අපි ගෙවීම් කරලා නැහැ. අපි බංකොලොත් වෙනකොට අපි ගෙවීම් කළේ නැහැ, නැවැත්තුවා. ඒකෙන් අපි ආනයනවලට ගෙවිය යුතු ලොකු ගණනක් එකතු වුණා. 2023 ඔක්තෝබර් මාසයේ සිට Reserve Bank of India, swap ණයක් බවට අපි එසේ ගෙවන්න ඕනෑ මුදල් ටික පරිවර්තනය කළා. ඒකට දැන් අපි මාසිකව ගෙවන්න ඕනෑ, ඩොලර් මිලියන 75ක්. මේ වසරේත් ගෙවන්න ඕනෑ. මාසයකට ඩොලර් මිලියන 75 ගණනේ ගත්තාම අපි මේ වසර තුළ Reserve Bank of India වෙත ඩොලර් මිලියන 900ක් ගෙවන්න ඕනෑ, අපේ විදේශ සංචිතවලින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අනුව බලනකොට මේ ප්‍රමාණය අපි හැම මාසයේම ගෙවන්න ඕනෑ.

මේක විතරක් නොවෙයි. අපි ද්විපාර්ශ්වික ණයවලට - bilateral loansවලට - ඩොලර් මිලියන 200ක් තව ගෙවන්න ඕනෑ, මේ වසරේ. ඒ විතරක් නොවෙයි, ජවිපෙ ආණ්ඩුව බලයට ආවාට පසුව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එකතු වෙලා තිබෙන හිඟ පොලී ප්‍රමාණය ඩොලර් මිලියන 800ක්. මේ වසරේ අනිවාර්යයෙන්ම එය ගෙවිය යුතුයි. ඒක -ද්විපාර්ශ්වික ණය සහ වාණිජ ණය ඩොලර් බිලියනය- අර ඩොලර් මිලියන 900ට එකතු වුණාම, ඒකත් ගෙවන්න ඕනෑ. ඒ කියන්නේ තව ඩොලර් බිලියනයක්.

ඒකත් මේ වසරේ ගෙවන්න ඕනෑ. දැන් ණය ගෙවන්න පටන් අරගෙනවත් නැහැ. ඊළඟට, 2025දී බහු පාර්ශ්වික ණය - multilateral loans - වශයෙන් ADB එකට, World Bank එකට, OPEC එකට තවත් ඩොලර් බිලියන 1.1ක් ගෙවන්න තිබෙනවා. අපි IMF එකෙන් ණය ගන්නවා. අපිට IMF එකෙන් උදව් කරනවා කියලා කියනවා. හැබැයි, IMF එකටත් අපි ණය පොලී ගෙවන්න ඕනෑ. ඒ ණය සේවාකරණයට ඩොලර් මිලියන 300ක් මේ වසරේ අපි ගෙවන්න ඕනෑ. මේ ඔක්කෝම එකතු කළාම මේ වසරේ ඩොලර් බිලියන 3.3ක් අපිට ආපහු ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. අපේ විදේශ සංචිතයේ ඩොලර් බිලියන 6.1ක් තිබෙනවා. ඒකෙන් ඩොලර් බිලියන 1ක් People's Bank of China දීපු swap එකක්. ඒක කොන්දේසි මත විතරයි භාවිත කරන්න පුළුවන් වෙන්නේ. එතකොට ඒක පැත්තක තිබ්බා නම් අපේ විදේශ සංචිතයේ පාවිච්චි කරන්න පුළුවන් මුදල් තිබෙන්නේ ඩොලර් බිලියන 5.1යි. ඒකෙන් ඩොලර් බිලියන 3.3ක් වැය වුණා නම් මෙන්න මේ ණය ගෙවන්න ඩොලර් බිලියන 1.8යි ඉතිරි වෙන්නේ. වාහනවලට ඩොලර් බිලියන 1.5ක් වෙන් කළා නම් අපේ විදේශ සංචිතය මේ වසර අවසන් වන විට බින්දුව බවට පත් වෙනවා. මම කියන්නේ නැහැ, නිකම්ම එහෙම වෙයි කියලා. නැවත ඩොලර් එයි, විවිධ තැන්වලින් ආපහු ඩොලර් ආදායම උපයා ගන්න පුළුවන්. හැබැයි, අපිට මේක ඉස්සරහට ඔරොත්තු දෙන්න ප්‍රමාණවත් ද කියලා තමයි මම අහන්නේ. ඒකට රජය මේ අය වැයෙන් සූදානම් ද කියලා අපව දැනුවත් කරලා නැහැ. කොහොමද, අපි අපේ ඩොලර් ආදායම වැඩි කරන්නේ? අපනයන ආදායම වැඩි කරන්නේ? 2025-2026 වර්ෂයන් ගත්තොත්, බාහිර ගෙවීම් මේ වසරේයි ලබන වසරේයි වැඩි වෙනවා. ඒ වාගේම 2028 සිට අපිට නිල වශයෙන් ණය ගෙවන්න සිද්ධ වෙනවා. ඒකට ඔරොත්තු දෙන්න පුළුවන් අපනයන ආදායමක් දැනට තිබෙනවාද, නැත්නම් එය වැඩි කරන්න රජයට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා.

සමගි ජන බලවේගයේ අපි - ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඇතුළු අපි කණ්ඩායම - විසින් ඉදිරිපත් කරපු "The Blueprint" එකේ අපි යෝජනා කරලා තිබුණා ගෝලීය අගය දාමයට අපේ රට එකතු කරමින් අතරමැදි භාණ්ඩ නිෂ්පාදනය වැඩි කරන්නටත්, ආයෝජකයන් මේ රටට ගෙනෙන වැඩ පිළිවෙළක් සකස් කරලා ඒ සම්බන්ධ විවිධ උපාය මාර්ග ගැනත්. ඒවා ගැන එහි අපි කථා කරලා තිබුණා. අපේ plan එකක් තිබුණා, ඩොලර් ආදායම වැඩි කරන්න ඕනෑ කියලා. නැත්නම් අපට මේකෙන් ගොඩ යන්න බැහැ. අපි තව තවත් ණය උගුලකට ගිහිල්ලා නැවත ණය ගෙවන්න බැරිව හිර වෙන්න සිද්ධ වෙනවා.

මේ රජය මේ අය වැයෙන් එක දෙයක් කිව්වා. ඒ තමයි, ඩොලර් බිලියන 19ක අපනයන ඉලක්කයක් හදනවා කියලා කිව්වා. ඒ කියන්නේ සියයට 17ක වර්ධනයක්. කොහොමද, මේක

කරන්නේ? සියයට 17ක වර්ධනයක් කියන්නේ වසරක් තුළ විශාල වර්ධනයක්. හැබැයි, අය වැයේ ඒ සඳහා උත්තේජනයක්, ඉදිරිපත් කරපු අය වැයේ අපනයන ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙළක් අපි දැක්කේ නැහැ. උදාහරණයක් වශයෙන්, මහා මාර්ග අමාත්‍යාංශයට පාරවල්වලට රුපියල් බිලියන 400ක් වෙන් කරලා තිබෙන අතර, කර්මාන්ත සංවර්ධනයට රුපියල් බිලියන 8යි වෙන් කරන්නේ. ආයෝජන ප්‍රවර්ධනයට වෙන් කරන්නේ රුපියල් බිලියන 2යි. ඒකෙන් අපනයනයට උත්තේජනයක් දෙනවා කියලා අපි කියන්නේ කොහොමද? පාරවල් හදනවාද, නැත්නම් අපනයනය වැඩි කරන්න ප්‍රමුඛත්වය දෙනවා ද කියන ප්‍රශ්නය මතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජබයේ අපි හිතා ගෙන හිටියේ, අපි අපේ "The Blueprint" එකේ කිව්වේ, කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත, දේශීය කර්මාන්ත නඟා සිටුවන්න ඒ අයව අපනයන වෙළෙඳ පොළට සම්බන්ධ කිරීම තමයි අපිට තිබෙන හොඳම මාර්ගය කියලා. හැබැයි, ඔබතුමන්ලා ඒ ගැන මොකක්ද කරන්නේ? ලියාපදිංචි ව්‍යාපාරවලින් සියයට 85ක්ම තිබෙන්නේ කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත. කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත ලක්ෂ 10කට ආසන්න ප්‍රමාණයක් ලංකාවේ තිබෙනවා. ඔවුන් දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය සියයට 52යි. රැකියාවලට දෙන දායකත්වය සියයට 50කට වැඩි ප්‍රමාණයක්. හැබැයි, රට 2022දී බංකොලොත් වන විට ඔවුන් ලොකු ප්‍රශ්න රාශියකට මුහුණ දුන්නා. ඔවුන්ගේ ණය ගන්නා පොලී අනුපාතය සියයට 36 දක්වා වැඩි වුණා. ඔවුන්ගේ අමු ද්‍රව්‍යවල මිල වැඩි වුණා. වෙළෙඳ පොළවල් නැති වුණා. ඔවුන්ට මේකට ඔරොත්තු දෙන්න බැරි වුණා. හැබැයි, ඔවුන් කඩා ගෙන වැටෙනකොට ඔවුන්ට අත දෙන්න කවුරුවත් හිටියේ නැහැ. ඔවුන්ගේ ණය ප්‍රතිව්‍යුහගත කරන්නට කවුරුත් ඉදිරිපත් වුණේ නැහැ. අපි රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව තිබෙන කාලයේ දිගටම කිව්වා, ඔවුන්ට ඒ සහය දෙන්න කියලා. අපි විවිධ අවස්ථාවල මැදිහත් වුණා. සජිත් ප්‍රේමදාස මහත්තයා මැදිහත් වෙලා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඔවුන්ට සහනයක් හැටියට විශේෂ වැඩසටහනක්; ඩොලර් මිලියන ගණනක් ලබා දුන්නා. මේ ඔක්කෝම කළා. හැබැයි, මේ අය වැයෙන් ඒක සිද්ධ වෙලා නැහැ. ඒගොල්ලන්ට උත්තේජනයක් දීලා නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්තයා ගිය අය වැයේ දී රුපියල් බිලියන 20ක් වෙන් කරලා තිබුණා කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තවලට. ඒ ගණනම තමයි මෙවර අය වැයෙන් ඔබතුමන්ලාත් ඒ වෙනුවෙන් වෙන් කර තිබෙන්නේ. ප්‍රායෝගිකව වාණිජ බැංකුවලින් ඔය කර්මාන්තවලට, කර්මාන්තකරුවන්ට සතයක්වත් ලබා දෙන්නේ නැහැ. ඒක එහෙමම කැරකිලා ආපහු භාණ්ඩාගාරයටම යන එක තමයි ප්‍රතිඵලය.

දැන් අක්‍රිය ණයවලට ඒවා දෙන්නේත් නැහැ. CRIB එකේ ඉන්න අයට ඒ උදවු කරන්නේත් නැහැ. මේවා සම්බන්ධයෙන් කොහොමටත් විශේෂ වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. IMF එකේ උපදෙස් මත වාණිජ බැංකු ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා රුපියල් බිලියන 450ක් 2024 අය වැයෙන් වෙන් කරන්න කියලා තිබුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවෙන් රුපියල් බිලියන 450ක් වාණිජ බැංකුවලට වෙන් කරලා තිබුණා. හැබැයි, ඒ වාණිජ බැංකු සුපිරි ලාභයක් උපයා තිබුණා. දැන් ඒගොල්ලන් අවදානම් තත්ත්වයක ඉන්නවා කියලා බොහෝ දෙනෙක් කියනවා නේ. හැබැයි, ඒගොල්ලන්ගේ Capital Adequacy Ratio එක ගත්තාම Basel III Standard එකට වඩා ඉහළින් ඒ බැංකු ටික ඉන්නවා. ඒ වාගේම ඔවුන් crisis bonds ගත්තු වෙලාවේ ඔවුන්ට සුපිරි ලාභයක් ලැබුණා. හැම වසරකම ඔවුන්ට භාණ්ඩාගාරයෙන් රුපියල් කෝටි 51,000ක පොලී ආදායමෙන් විතරක් ලැබෙනවා. ඒක ප්‍රතිව්‍යුහගත කළේ නැහැ. එතැනත් ඔවුන්ට ඒ chance එක තිබෙනවා.

අපේ වාණිජ බැංකු ගත්තාම, Commercial Bank එක ගිය වසරේ - 2024 වසරේ - උපයා තිබෙන ලාභය - profit after tax - රුපියල් කෝටි 3,100යි. Seylan Bank එක රුපියල් කෝටි 1,000යි. HNB එක රුපියල් කෝටි 4,100යි. DFCC බැංකුව රුපියල් කෝටි 990යි. Nations Trust Bank එක රුපියල් කෝටි 1,700යි. Pan Asia Bank එක රුපියල් කෝටි 4,100යි. NDB එක රුපියල් කෝටි 2,430යි. හැම බැංකුවක්ම කෝටි ගණනක් ආදායම් උපයා තිබෙනවා. හැබැයි, IMF එක කියනවා, ඔවුන්ට රුපියල් බිලියන 450ක් ප්‍රතිව්‍යුහගත කිරීම් සඳහා දෙන්න කියලා. අපේ කඩා වැටිච්ච SME sector එකට මේ ගැන හිතලා සතයක්වත් ඔබතුමන්ලා වෙන් කරලා නැහැ. එහෙම නම් IMF එකට කථා කරලා කියන්න තිබුණා නේ, ගිය වසරේ වෙන් කරපු බිලියන 450 වියදම් වෙලා නැහැ කියලා. හොඳ වෙලාවට එය බැංකුවලට පාවිච්චි කළේ නැහැ. මොකද, වුවමනාවක් තිබුණේ නැහැ. බැංකුවලට ඕනෑ තරම් සල්ලි තිබුණා. හැබැයි, ඔබතුමන්ලාට වුවමනාවක් තිබුණා නම් IMF එකත් එක්ක කථා කරලා මේ ප්‍රතිපාදන ටික මේ වසරේ SME sector එකට අරගෙන දෙන්න තිබුණා. එහෙම නම් ඒක කොච්චර වැදගත්ද? මොකද, SME sector එක කියන්නේ අපේ දේශීය කර්මාන්ත නඟා සිටුවන්න අවශ්‍යම sector එක. මේක නේ system change කියන්නේ. හැබැයි, ඒ ගැන කථා කරන්න ඔබතුමන්ලා අපොහොසත් වුණා. ඔබතුමන්ලා මේ අංශය ගැන බැලුවේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු සභාපතිතුමනි, ඒක නේ system change එක කියන්නේ. මේ වන කොට ඔබතුමන්ලා කුඩා සහ මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන්ට අවශ්‍ය සහය ලබා දී නැහැ කියලා මම කියා සිටිනවා.

[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]

[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]

[At this stage, The Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]

මේ අවස්ථාවේ ගරු ජනාධිපතිතුමාත් ඇවිල්ලා ඉන්නවා. මේක හොඳ වෙලාව. SME sector එක ගැන අපි නිතරම කථා කළා. එතකොට IMF එකේ උපදෙස් පරිදි ගිය වසරේ වාණිජ බැංකුවලට රුපියල් බිලියන 450ක් වෙන් කළා. නමුත් එය ක්‍රියාත්මක වුණේ නැහැ. වාණිජ බැංකුවලට සල්ලි ඕනෑ නැහැ. ඔවුන්ගේ තත්ත්වය හොඳයි. ඔවුන් සුපිරි ලාභ උපයා තිබෙනවා ගිය වසරේ. හැබැයි ඒ රුපියල් බිලියන 450 මේ අය වැයේදී ඔබතුමන්ලාට ඉල්ලන්න තිබුණා SME sector එකට දෙන්න කියලා. හැබැයි, ඔබතුමන්ලා ඒ ගැන කථා කළේ නැහැ.

[ගරු කබීර් හෂීම් මහතා]

කර්මාන්ත ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා දැනට කර්මාන්තකරුවන් එක්ක කථා කරමින් යනවා. ඔවුන්ගේ ඒ අක්‍රිය ණය, CRIB එකේ වැටිලා තිබෙන ඒවා නඟා සිටුවූයේ නැත්නම් අපට ලොකු ප්‍රශ්නයක් ඉදිරියේදී ඇති වෙනවා. ඒ නිසා දේශීය කර්මාන්තකරුවන්ට, තරුණ, දක්ෂ ව්‍යවසායකයන්ට පරාටේ නීතිය වෙනුවෙන් අලුත් නීතියක් ගේන්න ඕනෑ. පරාටේ නීතිය කල් දමමින් යන්න බැහැ. මොකද, පරාටේ නීතිය නවත්වන එක නොවෙයි විසඳුම. Bankruptcy law එකක් අලුතින් ගේන්න ඕනෑ. ඒ ගැන මේ අය වැයේදීවත් සඳහන් කරන්න තිබුණා. පරාටේ නීතිය අයින් කරලා අපි අලුත් නීතියක් ගේනවා කියලා කියන්න තිබුණා. නමුත්, ඒ ගැන ඔබතුමන්ලා හිතුවේවත් නැහැ. ඒ කියන්නේ SME sector එක ගැන හරියාකාරව කල්පනා කරලා නැහැ. ඒක ලොකු ප්‍රශ්නයක්. ඔවුන්ව CRIB එකෙන් ඉවතට ගන්නේ කොහොමද කියන එක ගැන මීට වඩා ප්‍රායෝගිකව මේ අය වැයේදී ඔබතුමන්ලාට කථා කරන්න තිබුණා. මොකද, ඒගොල්ලන්ට ඔබතුමන්ලා ගැන විශ්වාසයක් තිබුණා. මේ SME sector එකේ ආයතන ලක්ෂ 10ක් තිබෙනවා. හැබැයි ඒ ආයතන ලක්ෂ 10න් ලක්ෂ 3ක් පමණයි ලංකාවේ අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ලියාපදිංචි වෙලා තිබෙන්නේ. මේක භයානකයි. චීනය ගත්තාම අපනයනයෙන් සියයට 40ක්ම ඒ දායකත්වය ලැබෙන්නේ කුඩා සහ මධ්‍යම පරිමාණයේ කර්මාන්ත කරුවන්ගෙන්. ආසියාවේ සමස්ත අපනයනය ගත්තාම ඒකෙන් සියයට 30කම දායකත්වය කුඩා සහ මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන්ගෙන්. හැබැයි, ලංකාවේ මුළු අපනයනයට සියයට 5ක් පමණයි කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ගෙන් දායකත්වය දෙන්නේ.

මේ තත්ත්වය වෙනස් කරන්න තමයි අපි හිතාගෙන හිටියේ. සමගි ජන බලවේගය ඉලක්කයක් ඇති කරගෙන හිටියා, අපි බලයට ආවාම ගෝලීය අගයදාමයට ඒ අයව සම්බන්ධ කරන්නේ කොහොමද කියලා.

ගරු සභාපතිතුමනි, JVP එක - ජනතා විමුක්ති පෙරමුණ - කලින් ආණ්ඩුවල හිටියා; ඇමතිකම් ද කළා. හැබැයි, විධායක බලය, ව්‍යවස්ථාදායක බලය සහ පූර්ණ බලය මෙවර පළමු වරට ලබා ගත්තා. ඔබතුමන්ලා වසර 60ක් දිගටම අන් අයගේ ප්‍රතිපත්ති දැඩි ලෙස විවේචනය කළා. පැවතුණු ආර්ථික මොඩලයට හාත්පසින් වෙනස් ප්‍රතිපත්තියක්, මොඩලයක් මේ රටට හඳුන්වා දෙනවා කියලා විටින් විට කිව්වා. ඒකට තමයි කිව්වේ, system change කියලා. System change එකක් ගැන නිතරම කිව්වා. දවසක් මේ ගරු සභාවේදී මම අභියෝගය කළා, JVP එක විශ්වාස කරන මතවාදයක් තිබෙනවා නම්, ඔබ කථා කරපු system change එක ගෙනෙන්න හොඳම වෙලාව මේකයි; අය වැයේදී ඒ මොඩලය ඉදිරිපත් කරන්න; ඔබගේ චින්තනය ඉදිරිපත් කරන්න; එහෙම නම්, ඒක තමයි road map එක කියලා. හැබැයි, කියන්න කනගාටුයි, කිසිම පදනමක් නැති, JVP එක එදා ප්‍රතික්ෂේප කරපු, සමගි ජන බලවේගය එදාත් ප්‍රතික්ෂේප කරපු සහ අදත් ප්‍රතික්ෂේප කරන අන්ත නව ලිබරල්වාදී පාරක තමයි මේ අය වැය ගෙන යන්නේ. අපි කවදාවත් එම ප්‍රතිපත්තියේ ඉඳලා නැහැ. අපි එදාත් ඒකට විරුද්ධ වුණා. අපි අදත් ඒකට විරුද්ධවයි පෙනී සිටින්නේ. මේ අය වැය විවාදයේදී ඔබ අසමත් වෙලා තිබෙනවා, ඔබේ චින්තනයේ වැඩ පිළිවෙළ, ඒ system change එක මේ රටේ ඔබට ජන්දය දීපු අයට හෝ කියන්න. අපට කියන්න බැරි වුණත්, ඔබට ජන්දය දීපු අයට කියන්නවත් ඔබට බැරි වෙලා තිබෙනවා. ඔබ එහිදී ෆේල් වෙලා තිබෙනවා.

විපක්ෂයේ අපි මෙතැනදී අහපු ප්‍රශ්න ඔබතුමන්ලා වල්පල්, තර්ජන, අවලාද ලෙස සැලකුවා; ඒවා පාච්චල් කරලා කථා කළා. ඒවාට උත්තර දුන්නේ නැහැ. අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී විපක්ෂය අහපු ප්‍රශ්නවලට උත්තර දුන්නේ නැහැ. හරියට අර විශ්වවිද්‍යාලයේ අන්තරේ ශිෂ්‍යයන් වාගෙයි. වෙනත් ශිෂ්‍යයන් මතවාදයක් ඉදිරිපත් කළ ගමන් ඒගොල්ලන් ඒ ශිෂ්‍යයන්ට කථා කරන්න දෙන්නේ නැහැ. ඔවුන්ගේ කටවල් වහනවා. අන්න ඒ වාගේ තමයි පාර්ලිමේන්තුවේදීත් සමහර අවස්ථාවල ආණ්ඩු පක්ෂය හැසිරුණේ; කටයුතු කළේ. ඒක සාධාරණ නැහැ. ඉතාම උද්ධච්ච විධියට පාර්ලිමේන්තුවේදී විපක්ෂය සමඟ කටයුතු කළා කියන එක අප කියන්න ඕනෑ.

පාර්ලිමේන්තු ඉතිහාසයේ සිට පැවත ආ සම්ප්‍රදායක් තිබෙනවා. ඒ සම්ප්‍රදාය තමයි, අය වැය දෙවැනි වර කියවීමේ විවාදය අවසානයේ පිළිතුරු කථාව -අවසන් කථාව- සාමාන්‍යයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සිදු කිරීම; එහෙම නැත්නම් මුදල් රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කිරීම. මා ළඟ ඒ list එක තිබෙනවා. එම සම්ප්‍රදාය එක වතාවක් හෝ දෙවතාවක් විතරයි කඩලා තිබෙන්නේ. 2010දී නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා පිළිතුරු කථාව කරලා තිබෙනවා. අනෙක් හැම වතාවේම වාගේ මුදල් ඇමතිවරයා හෝ මුදල් නියෝජ්‍ය ඇමතිවරයා තමයි අය වැය දෙවැනි වර කියවීමේ විවාදයේදී උත්තර දීලා තිබෙන්නේ. හැබැයි, මෙවර අය වැය දෙවන වර කියවීමේ විවාදයේ පිළිතුරු කථාවේදී විපක්ෂය අහපු ප්‍රශ්නවලට උත්තර දීම කළේ නැහැ. නිකම් joke එකක් කරලා සභානායකතුමා තමයි පිළිතුරු කථාව කළේ.

මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ යන ක්‍රම සහ විධි ගැන දැන ගන්න අපි ඒවා ගැන ඇහුවා. මූල්‍ය ප්‍රතිපත්ති ගැන, ආයෝජන ප්‍රතිපත්ති ගැන, අපනයන ප්‍රතිපත්ති ගැන අපි ඇහුවා. හැබැයි, ඒවාට පිළිතුරු දෙනවා වෙනුවට සභානායකතුමා පාර්ලිමේන්තුවේ මොනවාද කථා කළේ? පාර්ලිමේන්තුවේ අපේ හැසිරීම ගැනයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම ගැනයි කථා කළේ. හරියට පන්තියක වාගෙයි. ආර්ථිකය ගැන අහපු බරපතළ ප්‍රශ්න ටිකෙන් එකකටවත් උත්තර දුන්නේ නැහැ. ඒ, මේ ආණ්ඩුවේ පළමුවැනි ක්‍රියා කලාපය. මේක joke එකක් නොවෙයි.

ජනතා විමුක්ති පෙරමුණ සහ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාව විශ්වාස කරපු සමාජ ස්තරයක් ඉන්නවා. ඔබතුමන්ලාව විශ්වාසය කරපු පිරිසක් ඉන්නවා. තරුණයෝ, වෘත්තිකයන්, රාජ්‍ය සේවකයන් හා පෞද්ගලික අංශයේ අය වාගේම, විධායක ශ්‍රේණියේ ඉන්න සේවකයන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ද ඔබතුමන්ලාව විශ්වාස කරලා ඡන්දය පාවිච්චි කළා. ඒ වාගේම තවත් කණ්ඩායමක් හිටියා. ඒ අය තමයි කළු කඩකාරයෝ, මාෆියාකාරයෝ, වාණිජ මණ්ඩලයේ ලොක්කෝ, ලොකු ව්‍යාපාරිකයෝ. ඒ අයත් ඔබතුමන්ලාව විශ්වාස කළා. එහෙම නැත්නම් තුනෙන් දෙකේ බලය ගන්න බැහැ නේ. ඒ සියලුදෙනා ඔබතුමන්ලාව විශ්වාස කළා. හැබැයි, අන්තිමට JVP එක බලයට ආවාට පසුව, පෙනී සිටින්නේ අර සමස්ත බහුතරය වෙනුවෙන් නොවෙයි, සුළුතරයක් වෙනුවෙන්. ඒ කියන්නේ, මේ මාෆියාව, මේ වරප්‍රසාද ලත් ව්‍යාපාරික ප්‍රජාව, ඒ වාගේම කණ්ඩායමක් වෙනුවෙන්. ඒ සුළුතර කණ්ඩායම වෙනුවෙන් ඔබ පෙනී සිටිනවා කියන එක අප දකින්නේ මේ අය වැයෙන්. අපි එය නිකම් කියන්නේ නැහැ. එහෙම කියන්නේ, මේ අය වැය දිහා බලලායි. මා ඇයි එහෙම කියන්නේ? ක්‍රියාවෙන්, ප්‍රතිපත්තියෙන් එය ඔප්පු කරන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මම එහෙම කියන්නේ ඇයි? දැන් බදු අය කිරීම පොඩි මිනිසුන්ට අසාමාන්‍ය විධියට බරක් වෙලා තිබුණා. විපක්ෂයේ ඉන්න කොට අපි ඒ ගැන දිගින් දිගටම කථා කළා. අපි එදාත් කථා කළා, අදත් කථා කරනවා. මම කිව්වා, අපේ ආර්ථික දර්ශක ඔක්කෝම ඉහළ නැනකට ඇවිල්ලා තිබෙනවා කියලා. හැබැයි, අපේ රටේ මහ ජනයා තවම ඒ ඉහළ නැනට ඇවිල්ලා නැහැ. තවත් සියයට 45කට වැඩි පිරිසක් දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වෙනවා. තවත්

ඉන්නවා එක වේලක් කාලා, එක වේලක් නොකා ඉන්න මිනිස්සු. ඒ මිනිස්සු තමයි කැප වුණේ. ඒ මිනිස්සු තමයි බර ඇද්දේ. ඒගොල්ලන්ට මොකක්ද මේ අය වැයෙන් දීලා තිබෙන සහනය?

ඍජු බදු සහ වක්‍ර බදු අතර තිබෙන පරතරය පිළිබඳව මම මේ සභාවේ කථා කරනකොට, අනුර කුමාර දිසානායක මැතිතුමාත් විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට අනන්ත අප්‍රමාණව ඍජු බදු, වක්‍ර බදු පරතරය නැති කරන්නට, ඒ වක්‍ර බදු ප්‍රතිශතය අඩු කරන්න කියලා කථා කරලා තිබෙනවා. හැබැයි, ඔබතුමාගේ පළමුවැනි අය වැයේදී මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? 2024/2025 කාලය බලනකොට, වක්‍ර බදු ප්‍රතිශතය වැඩි වෙලා තිබෙනවා. වක්‍ර බදු කියන්නේ ප්‍රතිගාමී බද්දක්. 2024දී රනිල් වික්‍රමසිංහ මැතිතුමා අය කරපු -මම ගණන් හදලා බැලුවා, මම විශ්වාස කරනවා, මම හරි කියලා- ඒ ඍජු බදු ප්‍රමාණය සියයට 28යි, වක්‍ර බදු සියයට 72යි. මම හිතන හැටියට, අනුර දිසානායක ජනාධිපතිතුමාගේ කාලයේ ඍජු බදු සියයට 25යි, වක්‍ර බදු සියයට 75යි. ඒ නිසා තමුන්නාන්සේලා බලන්නේ VATවලින් ආදායම වැඩි කර ගන්නයි. ඒ නිසා VATවලින් තමයි ඒ අය කිරීම තව තව වැඩි වෙලා තිබෙන්නේ. එතකොට ඍජු බදු ගෙවිය යුතු අයගෙන් හරි බද්දක් අය කරලා තිබෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය මතු වෙනවා. ඒක තව පැත්තකින් බලනකොට ජනතා විමුක්ති පෙරමුණ බලයට ගෙනාපු අය අමතක කරලා තිබෙනවා කියන එක තමයි මගේ විශ්වාසය; අපේ විශ්වාසය.

ආර්ථික පීඩනයට පත් වෙච්ච ජනතාවට ජනාධිපතිතුමා දිගටම කිව්වා, ආහාරවලට VAT එක අය කරන්නේ නැහැ, ඒක නිදහස් කරනවා කියලා. හැබැයි, අද ඒක තවම කරලා නැහැ. ආහාරවලට අය කරන බද්ද නිදහස් කරලා නැහැ. එතකොට ඒ කණ්ඩායම, ඒ නියෝජනය කරන පිරිසට ඔබතුමන්ලා කරන්න ඕනෑ ටික කරලා නැහැ. අනෙක් පැත්තෙන්, ඍජු බදු වැඩි කරලා නැත්තේ ඇයි? මේ tax net එක ව්‍යාප්ත කරන්න නම්, ආණ්ඩුවට හයිය තිබෙන්න ඕනෑ. ආදායම් බදු දෙපාර්තමේන්තුවේ RAMIS මෘදුකාංග පද්ධතිය හරියට වැඩ කරන්නේ නැහැ. ඒක හදන කල් මේ වැඩේ කරන්න බැහැ. හැබැයි, මේ අය වැයේ කියලා නැහැ, ඒකේ මොකක්ද තිබෙන ප්‍රශ්නය, ඒකට තිබෙන වැඩපිළිවෙළ මේකයි, ඒක හදලා digitalize කරනවා කියලා. Digitalization ගැන කථා කළාට, IRD එකේ තිබෙන ප්‍රශ්නයට විසඳුමක්, මේ බදු දැල ව්‍යාප්ත කිරීම සඳහා වූ ප්‍රායෝගික වැඩ පිළිවෙළක් අය වැයේ කියලා නැහැ. ඊයේ හර්ෂ ද සිල්වා මැතිතුමා පෙන්වලා දුන්නා, කැසිනෝ regulate කරන්න තවම Regulator කෙනෙක් නැහැ කියලා. එතකොට කැසිනෝවලින් ගන්න ඕනෑ බද්ද ගන්නේ නැහැ, සිගරට්වලින් ගන්න ඕනෑ බද්ද ගන්නේ නැහැ, ලොකු මිනිසුන්ගෙන් ගන්න ඕනෑ බද්ද ගන්නේ නැහැ, කළුකඩකාරයන්ගෙන් ගන්න ඕනෑ බද්ද ගන්නේ නැහැ. ඒ වාගේ තව වෘත්තිකයන් ඉන්නවා. ටියුෂන් ගුරුවරු, වෛද්‍යවරු, නීතිඥවරු කෝටි ගණනක් හම්බ කරනවා. නමුත් තඹ සතයක් බදු ගෙවන්නේ නැහැ. අපි හිතුවා, ඔබතුමන්ලා ආවාම සාධාරණයක් ඉටු වෙයි කියලා. හැබැයි, ඒක වෙලා නැහැ. බලයට ආවාට පස්සේ ඔබ නියෝජනය කරන්නේ වෙනත් පන්තියක්. ඒක තමයි ප්‍රශ්නය. ඒක තමයි අපි දකින්නේ. ඒ වෙනස, system change එක මේකයි කියලා මම හිතනවා. පැහැදිලිව, ඔබට ඡන්දය දුන් ඒ තරුණ වැඩ කරන ජනතාව, රාජ්‍ය සේවකයන්, පෞද්ගලික අංශය, විධායක ශ්‍රේණිවල නිලධරයන්, ගොවීන්, SME sector එකේ ඉන්න ඒ ඔක්කෝම අය ඔබතුමන්ලා අමතක කරලා තිබෙනවා, මේ අය වැයෙන්. ඒකයි අපි දකින්නේ.

ආර්ථික අර්බුදය තමයි ජනතා විමුක්ති පෙරමුණ බලයට ගෙනෙන්නේ. ආර්ථික අර්බුදය නිසායි ඔබතුමන්ලා බලයට එන්නේ. ඔබතුමන්ලාට ඒක ප්‍රධාන සාධකයක් වුණා. අනුර කුමාර දිසානායක මැතිතුමා ඇත්තක් කිව්වා. ඒ දවස්වල කිව්වා, මේ ගමන යන්න වෙන්නේ වැල් පාලමෙන් කියලා. වෙන විකල්පයක් නැහැ, වැල් පාලමෙන්ම යන්න වෙනවා කිව්වා. හැබැයි, මේ මාස හතර රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ වැල් පාලමේම ඇවිල්ලා, JVP එකේ මන්ත්‍රීවරු, ඇමතිවරු, JVP එකේ නායකයෝ ටික ඒ වැල් පාලමෙන් ගොඩ ගියා. ඒක හරි. ඔබතුමන්ලා ගොඩ ගියා. හැබැයි, අර බබා වැල් පාලමේ තියලා අතරමං කරලා ඔබතුමන්ලා ආවා. බබා වැල් පාලමෙන් අත්හැරියා. දැන් බබාට කියනවා ඔයා තනියෙන් එන්න කියලා. බබා කියන්නේ, ඔබතුමන්ලාට ඡන්දය දීපු ඡන්ද දායකයෝ; ඔබතුමන්ලාගේ කාඩරය. ඒ ඔක්කෝම අය වැල් පාලමේ තියලා දැන් ඔබතුමන්ලා ගොඩ ගිහිල්ලායි ඉන්නේ. දැන් මේක නේ ප්‍රශ්නය. දැන් මොකක්ද කරන්නේ? ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ, ඇමතිවරු වැල් පාලමෙන් ගොඩ ගිහිල්ලා ඉන්නවා නේ. ඒ දවස්වල කලිසම, කමිසය යාළුවෝ දෙනවා කිව්වා. ඒවාත් යාළුයෝ තමයි දෙනවා කිව්වේ. හැබැයි, දැන් යාළුවෝ ටිකත් ගොඩ ගිහිල්ලා වාගේ මට පෙනෙනවා. ඒ දවස්වල කලිසමයි, කමීසයයි දුන්නේ. දැන් ටයි කෝට් අරගෙන දෙනවා. දැන් අපට පෙනෙනවා, මේ ඇමතිවරු ඔක්කෝම ඉන්නේ ටයි කෝට් ගහගෙන. ඉතින් යාළුවොත් දැන් ගොඩ ගිහිල්ලා; ඔබතුමන්ලාත් ගොඩ ගිහිල්ලා. හැබැයි, අර කට්ටිය ගොඩ ගිහිල්ලා නැහැ. ඒගොල්ලන් දැන් අර වැල් පාලමේ හිල් වෙච්ච යට ඇදුමත් නැතුව තමයි ඉන්නේ. ඒ අයට තමයි ඔබතුමන්ලා මේ අය වැයේදී ආමන්ත්‍රණය කරලා නැත්තේ. *[බාධා කිරීම්]* මම දැක්කා. *[බාධා කිරීම්]*

ගරු සභාපතිතුමනි, අපේ රටේ මිනිස්සු මුළා කරන්න හරි ලේසියි. දැන් බලන්න බටහිර ලෝකයේ තිබෙනවා, Mother's Day - මව්වරුන්ගේ දිනය - කියලා සංකල්පයක්. ඒගොල්ලන්ගේ රටවල Mother's Day කියන්නේ මේකයි. ඒගොල්ලන් අම්මලා දානවා, අනාථ මඩමකට. අවුරුද්දකට වතාවක් යනවා අම්මා බලන්න. ඒ දවස Mother's Day කියලා තෑගි බෝග අරගෙන ගිහිල්ලා කාඩ් එකක් දීලා එනවා. අපේ මිනිස්සුත් ඒක දැකලා මෙහේත් Mother's Day කියලා එකක් දැම්මා, මව්වරුන්ගේ දිනය කියලා. අපි අපේ අම්මලා හැම දාම අපි දකිනවා. අපේ ළමයි ඉස්කෝලේ යනකොට අම්මාගේ කකුල් දෙක අල්ලලා වැඳලා යන්නේ. ඉතින් හැම දාමට අපට Mother's Day.

අපට මොනවාටද Mother's Day එකක්? ඒක බහු ජාතික සමාගම් රුපියල් කෝටි ගණනක් මුදල් උපයා ගන්නා ව්‍යාපාරයක්. මිනිස්සු cards ගන්නවා, gifts ගන්නවා. ඒක එක දිනයක්. ඒක මදිවට තවත් එකක් තිබෙනවා, Valentine's Day කියලා. "ආදරවන්තයන්ගේ දිනය" කියලා අපේ ළමයි මෙහේ Valentine's Day සමරනවා. ඒකෙනුත් අර බහු ජාතික සමාගම් කෝටි ගණනක් මුදල් උපයා ගන්නවා. හැබැයි, ඒ ළමයින්ගෙන් ඇහුවොත් කවුද "වැලන්ටයින්" කියලා, ඒ කවුරුත් වැලන්ටයින් ගැන දන්නේ නැහැ. වැලන්ටයින් කියන්නේ ඉතාලියේ හිටපු නාපසයෙක්. එයා ගෙනාපු Valentine's Day එක තමයි අපි සමරන්නේ, මෙහේ. හැබැයි, එදා JVP වේදිකාවේ අනුර කුමාර දිසානායක මහත්මයා මේ රටේ වැලන්ටයින් වුණා. ජනාධිපතිතුමා රටේ වැලන්ටයින් වුණා. මොකද, මැතිවරණයට කලින් ඔක්කොම වැලන්ටයින්ලා. අනුර කුමාර දිසානායක මහත්මයා මැතිවරණයට කලින් වැලන්ටයින් වුණා. දැන් මැතිවරණයට පස්සේ, අනුර කුමාර දිසානායක මහත්මයා IMF එකේ වැලන්ටයින් වෙලා තිබෙනවා. එදා ජනතාවගේ වැලන්ටයින්, අද IMF එකේ වැලන්ටයින්. මොකද, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඊයේ කියපු විධියට, "Bravo!" කියලා, ක්‍රිස්ටලිනා ජෝර්ජීයේවා දැන් මෙතුමා ගැන තමයි කථා කරන්නේ, වැලන්ටයින් වාගේ. දැන්

[ගරු කබීර් හෂීම් මහතා]

ඒක තමයි වෙලා තිබෙන system change එක. System change එක අනුව, ජනතාවගේ වැලන්ටයින් IMF එකේ වැලන්ටයින් වෙලා. ඒක ලස්සනයි, බොහොම ලස්සනයි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටත් ඒ chance එක තිබෙනවා.

මේ රටේ තරුණ තරුණියන් අනුර කුමාර දිසානායක මහත්මයා දැක්කාම වශී වුණා. ඒ දවස්වල වශී වුණා, ප්‍රීතියෙන් කුල්මත් වුණා. මොකද, එතුමා එච්චර ලස්සනට කථා කළා. අර මම කියපු විධියට ඒ හදවත් ටික අල්ලා ගත්තා. ඒ දවස්වල එතුමා ඩබල් පොකට් කමිසයක් ඇඳගෙන යනකොට, "ඩබල් පොකට් අනුර" කියලා කිව්වේ. ඒකට එච්චර ආශා හිතුණා. "ඩබල් පොකට් අනුර" කියලා කිව්වේ. හැබැයි, දැන් ඒක වෙනස් වෙලා. එදා කිව්වේ, "ඩබල් පොකට් අනුර" කියලා. දැන් කියනවා, "පික්පොකට් අනුර" කියලා. මොකද, ඒගොල්ලන්ගේ ඡන්ද පික්පොකට් කළා කියනවා. ඒගොල්ලෝ කියනවා, අපේ ඡන්ද පික්පොකට් කළා, දැන් අපට කියපු දේවල් කරන්නේ නැහැ කියනවා. ඒක තමයි ප්‍රශ්නය. එතකොට මේ අය වැයෙන් ඔබතුමන්ලා ඒ අය ආමන්ත්‍රණය කරන්න ෆේල් වෙලා තිබෙනවා කියන එක තමයි අපේ හැඟීම.

ගරු සභාපතිතුමනි, මම තවදුරටත් කථා කරන්නේ නැහැ. මගේ කථාව අවසන් කරනවා. මම ජනප්‍රිය සින්දුවක පද දෙකක් කියන්න කැමැතියි. මට හොඳට සින්දු කියන්න බැහැ, හැබැයි, මේ පද දෙක කියන්නම්. පැතුම් එස්. අගම්පොඩි රචනය කරපු, කසුන් ඕපාත ගායනය කරපු, "කලදසාව" කියන ගීතය. ගරු සභාපතිතුමනි, ඒ ගීතය ගැළපෙනවා, JVP නායකයන්ට සහ 156දෙනෙක් වන මේ මන්ත්‍රීවරුන්ට,- *[බාධා කිරීම්]* හරි, හරි, ඒකටත් ගැළපෙන කොටසක් තිබෙනවා. 159දෙනාටම ගැළපෙනවා. උදේ සවස මේක සිහිපත් කර ගන්න. අවුරුදු 60ක්ම JVP එක වෙනුවෙන් පරිත්‍යාග කරපු cadre එක, ඔබතුමන්ලාට වැඩ කරපු මිනිස්සු, ඔබතුමන්ලාට කැප වෙලා මෙවර ඡන්දය දීපු අය මෙන්න මේ පද ටික කියන කොට්ටට මතක් වෙයි.

"පඩිය නැඟලා උඩට යද්දී අඩිය ගැන සිහි තියා ගන්න - වතුර උගුරක් පවා දුන් අය පපුව මැද්දෙන් ලියා ගන්න"

මෙන්න මේක හොඳට මතක තබා ගන්න. මේක මතක තබා ගත්තා නම්, ඔබතුමන්ලාට වරදින්නේ නැහැ. මම අවසාන වශයෙන් කියන්න ඕනෑ, ඔබතුමන්ලා අපට පහරදීලා එක එක දේවල් කරනවා. විශේෂයෙන්ම සභානායකතුමාට කියන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ අපි තමයි විපක්ෂය. අපි අපේ කාර්යභාරය කරනවා. ආණ්ඩුවේ සභානායක ඇමතිලාට අපි කියන්න ඕනෑ, බලයෙන් විතරක් මත් වෙන්න එපා කියලා. ඔබතුමන්ලාගේ හැසිරීමත් හරියට තිබෙන්න ඕනෑ. මෙන්න මේක තමයි, ඒ සින්දුවේ අන්තිම පදය.

"මොන තරම් දළ ඇතෙක් වුවත් කුඹියාටත් ගරු කරන්න - මදුරුවෙකුටත් හැකිය මේ කය කර උඩක මිනියක් කරන්න"

මේක හොඳට මතක තබා ගත්තා නම්, ඔබතුමන්ලා අනා ගන්නේ නැහැ. ඒ නිසා මේ වෙලාවේ අපි විපක්ෂයක් හැටියට අපේ කාර්යභාරය ඉටු කරනවා. මේ අය වැයේදී ඔබතුමන්ලා කථා කරපු නැති ඒ කණ්ඩායම් වෙනුවෙන් අපි අද කථා කළා. ඔබතුමන්ලා ඒකට අවශ්‍ය පිළිතුර ලබා දෙයි කියලා අපි විශ්වාස කරනවා.

ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජනාධිපතිතුමා.

[අ.භා. 5.49]

ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

ගරු සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුව තුළ දීර්ඝතම කාලයක්, මීට කලින් ඉදිරිපත් කරපු අය වැය ලේඛන සම්බන්ධ විවාදය සඳහා ඒ අදාළ දින ගණනවත් ලබා දුන්නේ නැති බව ඔබතුමන්ලා දන්නවා. නමුත්, අපි සම්පූර්ණ දින ගණන ලබා දීලා විවාදයක් පැවැත්වුවා. ඒ විවාදය දෙස බලාගෙන ඉන්නකොට, සමහර අය වේදනාවෙන් ඉදිරිපත් කරපු කරුණු තිබුණා. සමහර අය කෝපයෙන් ඉදිරිපත් කරපු කරුණු තිබුණා. සමහර සාධනීය කරුණු තිබුණා.

ඒ අය වේදනාවට පත්වීම හෝ කෝපයට පත්වීම අපිට පුදුමයක් නොවෙයි. හන්තානේ ඉඩම් අහිමි වෙනකොට ඒ අය වේදනාවට ලක් වෙන එක අපට අලුත් දෙයක් නොවෙයි. එතකොට දුකක් තිබෙනවා. දුකක් තිබෙනවා නේ? ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබුණු ෆයිල් එක නැහැ. ඒවා ඉල්ලුවේ කවුද, ආපසු cancel කළේ කොහොමද? එනවා කියනකොට ඒවා දෙන්න බලන් හිටියා. එන්නේ නැහැ කියනකොට cancel කළා. අපිට ඒ අයගේ වේදනාව තේරුම් ගන්න පුළුවන්, කෝපය තේරුම් ගන්න පුළුවන්. හැබැයි යම් යම් කරුණු සාධනීය ලෙස මේ පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරනවා නම්, අපි ඒ සාධනීය කරුණුවලින් යහපත් දේ උකහාගන්නත්, අයහපත් දේ ප්‍රතික්ෂේප කරන්නත් සූදානම් දේශපාලන ව්‍යාපාරයක්. මේ ගමන් කරමින් තිබෙන ආර්ථිකය තිරණාත්මක ලෙස අලුත් හැරවුමකට භාජන කළ යුතුයි කියලා විශ්වාස කරන, ඒ වෙනුවෙන් වැඩ කරන දේශපාලන ව්‍යාපාරයක්, අපි. හැබැයි, අපි ඒ හැරවුම ගන්නේ කොහොමද කියන එක ගැනත් අවබෝධයක් සහිත දේශපාලන ව්‍යාපාරයක්. ඉතාම යහපත්, අර්බුදවලින් තොර ආර්ථිකයක් අප සතුව තිබෙනවා නම් ඒ හැරවුම ඉතා වේගවත් හැරවුමක් වෙනවා. ආර්ථිකය ඉතාම අසීරු තැනක නම් තිබෙන්නේ, ඒ හැරවුම යම් කාලයක් ගනිමින් සැලසුම්සහගතව ලබා ගත යුතු හැරවුමක්. ඔබතුමන්ලා දක්වන කලබලය අපට ඉතා හොඳින් තේරුම් ගන්න පුළුවන්. අපි ඉතා නිවැරදි ලෙස රටටත්, ජනතාවටත් හිතකර ලෙස දීර්ඝ කාලයක් අනුගමනය කරමින් තිබුණු ආර්ථික ප්‍රතිපත්තියේ තිරණාත්මක හැරවුම ගන්නවා. ඒ හැරවුම ගැනීමට නම් අපි පළමුව කළයුතු වන්නේ කුමක්ද? මේ තිබෙන ආර්ථික තත්ත්වය ස්ථාවරභාවයකට ගෙන එන එක. ස්ථාවරභාවයකට ගෙන එන්නේ නැතුව අර්බුද රාශියකට මුහුණ දී තිබෙන ආර්ථිකයක් විශාල හැරවුම්වලට ඔරොත්තු දෙන්නේ නැහැ. අන්න ඒක හොඳින් තේරුම්ගන්න. රෝද ගිලිහුණු රථයකට හැරවුම් ගන්න බැහැ. ඉස්සෙල්ලා රෝද ටික සවිකරගන්න ඕනෑ. ඒ නිසා අපි ඉතාම සැලසුම්සහගත ලෙස ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා කටයුතු කරමින් තිබෙනවා.

අපේ රටේ තිබුණු ආර්ථිකය කුමක්ද? එක පැත්තකින් නිල වශයෙන් බංකොලොත්භාවයට පත් වෙච්ච රාජ්‍යයක් අපිට ලැබෙන්නේ. නිල වශයෙන් බංකොලොත් රාජ්‍යයක්. නිල

වශයෙන් පමණක් නොවෙයි, යථාර්ථයේදීත් බංකොලොත් රාජ්‍යයක් අපිට ලැබෙන්නේ.

ඒ වාගේම, අපේ ආදායම් සහ වියදම් අතර පරතරය ගැනත් කියන්න ඕනෑ. 2025 අය වැය ලේඛනය අනුව අපේ මුළු ආදායම විධියට අපි රුපියල් බිලියන 4,999ක් අපේක්ෂා කරනකොට අපේ පොලිය ගෙවීම් සඳහා රුපියල් බිලියන 2,950ක් අවශ්‍යයි, රාජ්‍ය සේවයේ වැටුප් ගෙවීම සඳහා රුපියල් බිලියන 1,352ක් අවශ්‍යයි, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රුපියල් බිලියන 442ක් අවශ්‍යයි. ඒ කියන්නේ මුළු ආදායම රුපියල් බිලියන 4,990යි; පොලිය ගෙවීම, රාජ්‍ය සේවයේ වැටුප් ගෙවීම, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රුපියල් බිලියන 4,744ක් අවශ්‍යයි; එතකොට ඉතුරු වෙන්නේ රුපියල් බිලියන 256යි. මේක තමයි අපේ රටේ තිබෙන ආර්ථිකය. ඒ නිසා මේක එහෙම හරවන්න පුළුවන්; කඩිමුඩියේ කලබල කරලා හරවන්න පුළුවන් ආර්ථිකයක් නොවෙයි. ඒක මතක තබාගන්න. ප්‍රධානම වියදම් පාර්ශ්ව තුනටත් සමාන ඊට වඩා පොඩ්ඩක් වැඩි ආදායමක් සහිත රාජ්‍යයක් අප වෙත ලැබෙන්නේ. ඒක තමයි මේ වෙලාවේ අපි හමුවේ තිබෙන ආර්ථිකයේ ස්වභාවය.

ඒ විතරක් නොවෙයි. අප සතුව තිබෙන රාජ්‍ය ආයතන පාඩු ලැබුවා. මම එයින් කීපයක් ඔබතුමන්ලාට කියන්නම්. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව බැලුවොත්, ඒකේ ගිය අවුරුද්දේ පාඩුව රුපියල් මිලියන 256යි. එහි රුපියල් මිලියන 1,837ක ණය තිබෙනවා. මේවා අපේ රටේ රාජ්‍ය ආයතන. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව බැලුවොත්, එහි ගිය අවුරුද්දේ පාඩුව රුපියල් මිලියන 152යි. එහි රුපියල් මිලියන 1,603ක ණය තිබෙනවා.

ITN නාළිකාව බැලුවොත්, එහි රුපියල් මිලියන 1,476ක ණය තිබෙනවා. ඒ වාගේම Lanka Sugar Company Private Limited බැලුවොත්, එහි රුපියල් මිලියන 11,165ක ණය තිබෙනවා. රාජ්‍ය වැවිලි සංස්ථාව බැලුවොත්, රුපියල් මිලියන 3,216ක ණය තිබෙනවා. මිල්කෝ ආයතනය බැලුවොත්, රුපියල් මිලියන 15,096ක ණය තිබෙනවා. SriLankan Airlines බැලුවොත්, රුපියල් බිලියන 340කට ආසන්න ණයක් තිබෙනවා. මා ගොඩක් ආයතන ගැන කියන්න යන්නේ නැහැ. මේ කුමක්ද තිබෙන්නේ? විශාල ණය බරවලින් පෙළුණු, වාර්ෂිකව විශාල ලෙස පාඩු ලබපු රාජ්‍ය ආයතන සමූහයක් තමයි අප වෙත ලැබුණේ. උපයා ගන්නා ආදායම මා කලින් කියන ලද ශීර්ෂ පාඨයන්ට පමණක් ප්‍රමාණවත් වෙන ආදායමක් සහිත රාජ්‍යයක් අපට ලැබෙනවා. ආදායම ඉතා අතළොස්සක් අත කේන්ද්‍රගත වුණු රාජ්‍යයක් අපට ලැබෙනවා. ආර්ථිකයට දායකත්වය දෙන කණ්ඩායම්, ඉතා කුඩා කණ්ඩායමක් අතර සංකේන්ද්‍ර වුණු රාජ්‍යයක් අපට ලැබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, අපේ අපනයන ආදායමෙන් සියයට 90ක් උපයන්නේ අපනයනකරුවන් සියයට 10යි. අපේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම්වලින් සියයට 69කට ආසන්න ප්‍රමාණයක් ලබා දෙන්නේ, ෆයිල් 600කට විතර ආසන්න ප්‍රමාණයක්. ඒකෙන් කියන්නේ, අපේ ආර්ථිකය ඉතාම කුඩා කණ්ඩායමක් අත සංකේන්ද්‍ර වුණු ආර්ථිකයක් බවයි.

අනෙක් පැත්තෙන් අපි ලෝකය හමුවේ බංකොලොත්භාවයට පත් වෙච්ච රාජ්‍යයක්; ණය මුදලක් ලබා ගන්න බැරි, බැංකු පද්ධතිය කෙරෙහි විශ්වාසය බිඳ වැටුණු, රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳව අවිශ්වාසය ගොඩනැගුණු රාජ්‍යයක්. එහෙම නම්, පළමුව කරන්න ඕනෑ මොකක්ද? පළමුව කළ යුතු වන්නේ, ආර්ථික ස්ථාවරභාවය නිර්මාණය කර ගැනීමයි. ආර්ථික ස්ථාවරභාවය නිර්මාණය කර ගැනීමකින් තොරව අපි හැරවුම් ගන්න සූදානම් නැහැ. මතක තබා ගන්න, ආර්ථික ස්ථාවරභාවයක් ඇති නොකොට සිදු කරන සෑම හැරවුමක්ම නරක ප්‍රතිවිපාක ගෙනැවිත් දෙන බව. **අපේ** ආර්ථිකය ස්ථාවර කර ගැනීම සඳහා ප්‍රමුඛතාව යොදවන බව අපේ මැතිවරණ ව්‍යාපාරය තුළ අපි ඉතා පැහැදිලිව පෙන්නුම් කළා. එහෙම නම්, ආර්ථික ස්ථාවරභාවය වැදගත්.

අපි බලයට එනකොට අපි එකඟද, නැද්ද; හොඳද, නරකද කියන සංවාදයක් සහිත අවුරුදු 4ක විස්තීර්ණ ණය වැඩසටහනකට - programme එකකට - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක අපේ රට ඇතුළු වෙලා තිබුණා. ඔබ කියන හැරවුම අපි ගන්න නම්, මොකක්ද කරන්න ඕනෑ? අපිට පාරවල් දෙකක් තිබුණා. එක්කෝ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක තිබෙන විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ ඉදිරියට යන්න ඕනෑ. එහෙම නැත්නම් අත් හරින්න ඕනෑ. ඔබ බලාපොරොත්තු වුණේ අත් හරියි කියලා. මතක තබා ගන්න, ඒ උගුලේ අපි වැටෙන්නේ නැහැ. ඒවා උගුල්. මොකද අපි දන්නවා, අපේ ආර්ථිකය තිබෙන තත්ත්වය අනුව අපි කුඩා ප්‍රමාණයකින් කර ගන්නා අත් වැරදීම් වුවත් බරපතළ විනාශකාරී අත්දැකීම් ගෙනැවිත් දෙන බව. එහෙම ආර්ථිකයක් මේක. ***[බාධා කිරීමක්]*** ඔව්, ඔය මහත්වරු පාලනය කරපු රට හොඳේ, මේක. අපි පාලනය කරපු රට නොවෙයි. මේ, ඔයගොල්ලෝ පාලනය කරපු රට. ඔයගොල්ලෝ පාලනය කරපු මේ රටේ; අප හමුවේ තිබෙන්නේ කුඩා අත් වැරැද්දත් බරපතළ ගණයේ ප්‍රතිවිපාක රටටත්, ආර්ථිකයටත් උරුම කර දෙන තත්ත්වයක්. ඒ නිසා ආණ්ඩුවක් හැටියට අප කළ යුත්තේ කුමක්ද? ඔයගොල්ලෝ බරපතළ වැරදි කරලා, බරපතළ විනාශ කරලා ඇති කරපු ආර්ථිකය යළි ස්ථාවරභාවයට පත් කර ගැනීමේදී අපේ වගකීම තමයි කුඩා ප්‍රමාණයකින්වත් වරදවා ගැනීමක් නොකර සිටීම. අපි ඒක කරලා තිබෙනවා.

අපේ පළමු අභිප්‍රාය වුණේ කුමක්ද? පළමු අභිප්‍රාය වුණේ ආර්ථික ස්ථාවරභාවය නිර්මාණය කර ගැනීමයි. ආර්ථික අස්ථාවරභාවයක් තිබෙනවා කියලා අද කාට හරි කියන්න පුළුවන්ද? නැහැ, අපි විශාල ප්‍රයත්නයක් දැරුවා, මේ ආර්ථික ස්ථාවරභාවය නිර්මාණය කර ගන්න. අපි නොවැම්බර් මාසයේ 21වැනි දා තමයි කැබිනට් මණ්ඩලය පිහිටෙව්වේ. ජනාධිපති ධුරය, පාර්ලිමේන්තු බලය, කැබිනට් මණ්ඩලය එක්ව අපි පූර්ණ වශයෙන් ආණ්ඩුවක් හැදුවේ නොවැම්බර් මාසයේ 21වැනි දා.

අද මාර්තු මාසයේ 21වැනි දා. එතකොට අපේ ආණ්ඩුවට දැන් මාස හතරයි. අපට සුබවාදී අනාගතයකට යා හැකියි කියන විශ්වාසයක් ගොඩනැඟෙන තරමේ ස්ථාවරභාවයක් අපි මේ මාස හතර ඇතුළත මේ රටේ නිර්මාණය කළා. ඒ ගැන අපි ඉතා සතුටු වෙනවා. මා ඒ එකින් එක කියන්නම්.

පළමුවැනි එක, අපි නිල වශයෙන් දෙසැම්බර් මාසයේ 21වැනි දා බංකොලොත්භාවයෙන් නිදහස් වීම. අපි පසුගිය දෙසැම්බර් මාසයේ 21වැනි දා දක්වා ගත්ත ණය ගෙවන්නේ නැතිව පැහැර හැරපු රාජ්‍යයක්. දෙසැම්බර් මාසයේ 21න් පසුවත් අපි ණය ගෙවන්නේ නැහැ. හැබැයි, දැන් අපි ණය නොගෙවීම පිළිබඳව එකඟතාවකට ආපු රාජ්‍යයක්. වෙනසක් නැද්ද? බලහත්කාරයෙන් ඒකපාර්ශ්වීය ලෙස ගත්ත ණය ගෙවන්නේ නැහැ කියන රාජ්‍යයක සිට, ණය ගත්ත අයත්, ණය දීපු අයත් එක්ක එකඟතාවකට ආපු රාජ්‍යයක් තමයි දැන් අපි. ඒ, අපේ ස්ථාවරභාවය. "2028 වර්ෂය තෙක් අපි ඔබගේ ණය ගෙවන්නේ නැහැ" කියලා දැන් අපි එකඟතාවකට ඇවිත් තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද? දෙසැම්බර් මාසේ 21වැනි දා තමයි අපි නිල වශයෙන් අපේ බංකොලොත්භාවයෙන් නිදහස් වුණේ. ඒ අනුව මොකක්ද වුණේ?

බංකොලොත්භාවයට පත්වීම නිසා අපට විශාල හානියක් සිදුවී තිබෙනවා. මම ඔබට ඒ ගැන කියන්නම්. කඩවත-මීරිගම අධිවේගී මාර්ගයේ කොටසට චීනයේ එක්සිම් බැංකුවෙන් තමයි ණය ආධාර ලබා දුන්නේ. අපේ කොන්ත්‍රාත් සමාගම තවත් චීන සමාගමකට කොන්ත්‍රාත්කරුවෙකු හැටියට වැඩ කළා. අපි ගත්ත ණය ගෙවන්නේ නැහැ කිව්වාට පස්සේ මොකක්ද වුණේ? චීනයේ එක්සිම් බැංකුව ඉතිරි ණය මුදල දුන්නේ නැහැ, ව්‍යාපෘතිය කරන්න. අපි කොන්ත්‍රාත්කරුවාත් එක්ක අත්සන් කළ ගිවිසුමක්

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

තිබෙනවා, ඔබ ඉදිකරන්න අපි සල්ලි ගෙවන්නම් කියලා. හැබැයි, අපට සල්ලි ගෙවන්න ක්‍රමයක් නැතිව යනවා. එම නිසා මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම-කඩවත කොටසේ ඉදිකිරීම් අවුරුදු තුනකට වඩා වැඩි කාලයක් නතර වෙනවා. එලෙස ඉදිකිරීම් නතර වීම නිසා ඉදිකිරීම් කරපු සමාගමට අද ගෙවිය යුතු වන්දිය ගණනය කරලා තිබෙනවා, රුපියල් බිලියන 46ක් ලෙස. ඒ, කුමක් නිසාද? බංකොලොත්භාවයට පත්වීමේ ප්‍රතිවිපාක හේතුකොටගෙන අපට එක්සිම් බැංකුවෙන් ණය ලබා දෙන්නේ නැහැ, ණය ලබා නොදීම හේතුකොටගෙන කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් එක ඉදිරියට ගෙන යන්න බැහැ, ඔහු අපෙන් claim කරනවා, රුපියල් බිලියන 46ක්. මේ, බංකොලොත්භාවයේ ප්‍රතිවිපාක.

කටුනායක පිහිටි Bandaranaike International Airport එක පුළුල් කිරීමේ ව්‍යාපෘතියත් ඒ වාගේමයි. ඔබතුමන්ලා හොයන ප්‍රසිද්ධ සාධක තමයි මේවා. බංකොලොත්භාවය හේතුකොටගෙන එම ව්‍යාපෘතියත් නතර වෙනවා. 2023දී එම ව්‍යාපෘතිය අවසන් වීමට නියමිතව තිබුණා. හැබැයි, අද ඒ ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන්න කටයුතු කරනවා. 2028 වර්ෂය වෙනකොට එම ව්‍යාපෘතියත් අපි අවසන් කරනවා. ඒත් එදා අපි ඇස්තමේන්තු හැදුවාට වඩා ඩොලර් මිලියන 50ත්, 100ත් අතර වැඩි ප්‍රමාණයක් අපට මේ සඳහා දැන් ගෙවන්න සිද්ධ වෙනවා. ඒකෙනුත් පෙන්නුම් කරන්නේ මොකක්ද? බංකොලොත්භාවයේ ප්‍රතිවිපාකයයි.

ඊළඟට, ජපන් රජය විසින් ක්‍රියාත්මක කරමින් තිබුණු ව්‍යාපෘති 11ක් නතර වුණා. හැබැයි, දෙසැම්බර් මාසයේ 21වැනි දා අපි නිල වශයෙන් බංකොලොත්භාවයෙන් නිදහස් වුණා. ජපන් රජය එම ව්‍යාපෘති 11ම යළි ආරම්භ කරන්න තීරණය කළා. ඒක ස්ථාවරභාවය පිළිබඳ සංඥාවක්.

චීන රජය විසින් අපට ලබා දීලා තිබුණු -මා කලින් කියපු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඇතුළු- ව්‍යාපෘති සියල්ල නතර වුණා. අපිට විශාල වන්දි මුදලක් ඒ වෙනුවෙන් ගෙවන්න තිබෙනවා. චීනයේ සිදුකළ සංචාරයත් සමඟ අපි චීනය සමඟ එකඟතාවකට ආවා, නතර වී තිබෙන ව්‍යාපෘති යළි ආරම්භ කරන්නත්, අලුත් ව්‍යාපෘති ඇතුළු ව්‍යාපෘති 76ක් යළි ලංකාවේ ආරම්භ කරන්නත්. ඒ, අපේ ස්ථාවරභාවයේ සංඥාව.

2022න් පසුව අපේ රටේ ආරම්භ කරපු එක අලුත් ව්‍යාපෘතියක් කියන්න. මොකුත් නැහැ. මේක කඩා වැටුණු රාජ්‍යයක්. එහෙම රාජ්‍යයක් තමයි අපට ලැබෙන්නේ. ඉන්දියානු රජය සහ ලංකාවේ විදුලිබල මණ්ඩලය එකඟතාවකට ආවා, සාම්පූර්වල බලාගාරයක් ඉදිකරන්න.

ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට සියයට 50කුත්, ඉන්දියානු සමාගමට සියයට 50කුත් අයිති ඒකාබද්ධ සමාගමක් පිහිටුවනවා. ඒ ඒකාබද්ධ සමාගම විසින් සාම්පූර්වල මෙගාවොට් 120කට ආසන්න විදුලි බලාගාරයක් ඉදි කරනවා. ඒකේ නිෂ්පාදනය කරන විදුලිය අපේ විදුලිබල මණ්ඩලය මිලදී ගන්නවා. මෑත කාලයේ විදුලිබල මණ්ඩලය සූර්ය බලයෙන් නිෂ්පාදනය කරන විදුලි ඒකකයක් මිලදී ගන්නා අඩුම මිල වන ඩොලර් ශත 5.97ට ඒ බලාගාරයෙනුත් විදුලිය මිලදී ගන්න අපි ඒ මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කළා. මේ, අපේ ස්ථාවරභාවය. බංකොලොත් වෙච්ච රාජ්‍යයකට ආයෝජන එන්නේ නැහැ, මතක තබා ගන්න. කවුද බංකොලොත් වෙච්ච රාජ්‍යයකට ආයෝජන අරගෙන එන්නේ? අන්න ඒ සාම්පූර් බලාගාරය ඉදි කිරීමේ කටයුතු අප්‍රේල් මාසයේ 05වෙනි දා ඉන්දියානු අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාගේ පැමිණීමත් සමඟ ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක තමයි අපේ ස්ථාවරභාවය. එහෙමයි රටක් ස්ථාවර වෙන්නේ. මට කියන්නකෝ, පසුගිය අවුරුදු දෙක, තුන ඇතුළත ප්‍රබල රාජ්‍ය නායකයෙක් ලංකාවට ආවාද කියලා? එන්නේ නැහැ. මොකද, මේ බංකොලොත් වෙච්ච රටක්. නමුත්, අද අපි ස්ථාවරභාවයේ සංඥාව දීලා තිබෙනවා.

මාස දෙකකට ආසන්න කාලයක් ඇතුළත සියඹලාණ්ඩුවේ නව සූර්ය බලාගාරයකුත්, මන්නාරමේ සුළං බලයෙන් මෙගාවොට් 50ක් නිෂ්පාදනය කරන නව බලාගාරයකුත් අපි ආරම්භ කරනවා. ඒ ඔක්කෝම ප්‍රදානය කරලා අවසන්. ඒ, අපේ ස්ථාවරභාවය. දැන් අපි ස්ථාවර වෙමින් තිබෙන රටක්. ඒ සාධකවලින් පෙන්නුම් කරන්නේ මොකක්ද? අපි ස්ථාවරභාවයට රට ගෙනැල්ලා තිබෙනවා. ව්‍යාපාරිකයන්ට, ආයෝජකයන්ට, විදෙස් මූල්‍ය සමාගම්වලට අපේ රට තුළ ඩොලරයට තිබුණු වටිනාකම ගැන තිබුණු විශ්වාසය මොකක්ද? ඩොලර් හංගාගෙන තියාගෙන ඉන්නවාද, බැංකුවට ගිහිල්ලා මාරු කරනවාද කියන අවිනිශ්චිත තත්ත්වයක් ඒ අයට තිබුණා. මොකද ස්ථාවර නැහැ, අපේ මුදල් ඒකකය. නිරන්තරයෙන් උච්චාවචනය වන මුදල් ඒකකයක් තිබුණේ. නමුත් අපි මේ මාස 4 ඇතුළත රුපියල් 300ට ආසන්න ප්‍රමාණයට ඩොලරයේ අගය ස්ථාවර කරලා තිබෙනවා, අඛණ්ඩව. ඒක අවුරුදු 3කට පසුව ඇති වී තිබෙන තත්ත්වයක්. හොඳ නැද්ද ඒක? මම අහන්නේ ඒක හොඳ නැද්ද? අවුරුදු 3කට පසුව ලංකාවේ පළමු වතාවට මාස 4කට ආසන්න කාලයක් එක දිගට ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ස්ථාවර මට්ටමකට දැන් අපි ගෙනැල්ලා තිබෙනවා. ඒ, අපේ ස්ථාවරභාවය.

ලෝකයේ rating ආයතන විසින් අපේ රට විශාල ණය අවදානම් රාජ්‍යයක සිට ණය අවදානම අඩුවෙන් තිබෙන රාජ්‍යයක් දක්වා ratingsවලින් දැන් උසස් කරලා තිබෙනවා; අපි ස්ථාවරභාවයට ගෙනැල්ලා තිබෙනවා. හොඳ නැද්ද?

ඊළඟට, අපේ බැංකු පද්ධතිය කෙරෙහි තිබුණු විශ්වාස බිඳ වැටිලා තිබුණා. අපේ බැංකු පද්ධතිය කෙරෙහි ජාත්‍යන්තර මූල්‍ය සමාගම්වල විශ්වාසය යළි තහවුරු කරලා තිබෙනවා; විශ්වාසය ගොඩ නඟලා තිබෙනවා. ඒ චිතරක් නොවෙයි. බැංකු පොලී අනුපාතය තනි ඉලක්කමකට ගෙනැත් තිබෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ මේ බැංකු පොලී අනුපාතය තනි ඉලක්කමක රඳවා ගන්න ඕනෑ වුණා. දැන් අපි සමත් වී තිබෙනවා, බැංකු පොලී අනුපාතය තනි ඉලක්කමක රඳවා ගැනීමට.

උද්ධමනය බලන්න. දැන් එහි යම් අවධමන තත්ත්වයක් තිබෙනවා. ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. නමුත් ඉතා ශීඝ්‍ර ලෙස උද්ධමනය ඉහළ යමින් තිබුණු රාජ්‍යයක්, මේක. සියයට 70ටත් ගියා උද්ධමනය, මතක තබා ගන්න. අද ඒ මහත්වරුන් පාර්ලිමේන්තුවේ නැහැ. හිටියා නම් තාත්තලා, බාප්පලා රට පාලනය කළ හැටි මට කියන්න තිබුණා. ලංකා ඉතිහාසයේ පළමු වතාවට උද්ධමනය සියයට 70ට ගියා. අද අවධමනකාරී තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒකත් ආර්ථිකයට හොඳ තත්ත්වයක් නොවෙයි. මේ අවුරුද්දේ මැද භාගය වෙනකොට එය යම් ධන උද්ධමනයක් දක්වා පරිවර්තනය වේවි කියා අපි අපේක්ෂා කරනවා. අවධමනය ආර්ථිකයකට ඒ තරම්ම හොඳ තත්ත්වයක් නොවෙයි. අපි එතැනට අද ගෙනැත් තිබෙනවා.

ඒ චිතරක් නොවෙයි. විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගෙන් එන සංක්‍රාම බලන්න. මෑත ඉතිහාසය ගත්තාම පසුගිය මාස දෙකේ විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් ආ වැඩිම මුදල් ප්‍රමාණය ගලාගෙන ඇවිල්ලා තිබෙනවා. පසුගිය මාස දෙකේ ඇවිල්ලා තිබෙනවා, ඩොලර් මිලියන 1,121ක්. මේ, ආර්ථිකය පිළිබඳ විශ්වාසයයි. පසුගිය කාලයේ තිබුණේ ඩොලරයට හෙට මොකක් වෙයිද, අනිද්දා මොකක් වෙයිද කියලා බලාගෙන ඉන්න ඕනෑ තත්ත්වයක්.

මුදල් එවලා ව්‍යාපාරයක් පටන් ගන්න බැරි තත්ත්වයක් නම් තිබෙන්නේ, ඔවුන් මුදල් එවන්නේ කන්න බොන්න විතරයි. ලංකාව තුළ ඩොලරයේ වටිනාකම පිළිබඳව අවිනිශ්චිතභාවයක් නම් තිබෙන්නේ, විදෙස්ගත ශ්‍රමිකයන් මුදල් එවන්නේ මේ මොහොතේ ජීවත් වීම සඳහා විතරයි. හැබැයි, මේ මාස දෙකේ ඩොලර් මිලියන 1,121ක් ලැබිලා තිබෙනවා. ඒකෙන් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොව මේ ආර්ථිකය පිළිබඳව තිබෙන විශ්වාසය තහවුරු වෙමින් තිබෙනවා කියන එකයි.

ඒ විතරක් නොවෙයි. සංචාරකයින්ගේ පැමිණීම ගත්තොත්, ඔබතුමන්ලා දන්නවා සංචාරකයින්ගේ ඉතා හොඳ පැමිණීමක් වාර්තා වෙලා තිබෙන බව. මේ අවුරුද්දේ මාර්තු මාසයේ 17වැනි දා වෙනකොට 610,000 ඉක්ම වූ සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. අපි ඔබට එක සහතිකයක් දෙන්නම්. ඒ තමයි, මේ අවුරුද්ද ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් එන වසර බවට පත් වෙනවා කියන එක. ඉතින්, ආර්ථිකය යන්න ඕනෑකම තිබෙන්නේ මේ විධියට නොවෙයිද?

ඒ විතරක් නොවෙයි. අපේ ආදායම් ඉලක්ක ගැන කිව්වොත්, ඇස්තමේන්තුගත ආදායමයි, සත්‍ය ආදායමයි අතර තිබුණු වෙනස්කම් මේ පාර්ලිමේන්තුවේදී අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. ඇස්තමේන්තුගත ආදායමයි, සත්‍ය ආදායමයි අතර සියයට 20, සියයට 25 ප්‍රමාණයේ වෙනස්කම් තිබුණා. හැබැයි අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, 2024 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමට සමාන ආදායමක් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් අපට ලබා දීම පිළිබඳව. ඒ, අපේක්ෂා කරන ලද ආදායමට සමාන වූ ආදායමක්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායමේ වෙනස බවට පත් වුණේ රුපියල් බිලියන 35ක වාගේ ප්‍රමාණයක්. ඒ කියන්නේ, සියයට 99කට ආසන්න ප්‍රමාණයකින් ඇස්තමේන්තුගත ආදායම, සත්‍ය ආදායම බවට පරිවර්තනය කර ගන්න අපි සමත් වුණා. ඒක හොඳ නැද්ද? ආර්ථිකයක් එහෙම තමයි යන්න ඕනෑ. ඉස්සර පෙන්නුවේ බොරු ඉලක්කම්. "ඇස්තමේන්තු", "ඇස්තමේන්තු" කියලා එකක් හදනවා. හැබැයි, ඊළඟ මහ බැංකු වාර්තාවෙන් කියනවා, මොකක්ද ඇත්ත කියලා. අපි ඔබට කියන්න කැමැතියි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - IRD එක - මේ අවුරුද්දේ මාර්තු මාසයේ 17වැනි දාට ඇස්තමේන්තුගත ආදායම විධියට අපේක්ෂා කළේ රුපියල් බිලියන 356ක් බව. හැබැයි, මාර්තු මාසයේ 17වැනි දා වෙනකොට ආදායම විධියට රුපියල් බිලියන 438ක් ලැබිලා තිබෙනවා. අපේක්ෂා කරන ලද ආදායමට වඩා වැඩි ආදායමක් මේ මාස කිහිපය ඇතුළත අපි අරගෙන තිබෙනවා.

ඒ වාගේම ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ - Sri Lanka Customs එකේ - ජනවාරි මාසයේ ආදායමත් අපි ඇස්තමේන්තු කරන ලද ආදායමට වඩා වැඩියෙන් ලැබිලා තිබෙනවා. ඒවා ආර්ථික ස්ථාවරභාවය පිළිබඳ සංඥා; ආර්ථිකය ඉතා හොඳින් කළමනාකරණය කරමින් ඉදිරියට එනවාය කියන සංඥා. මේ පාර්ලිමේන්තුවේ පරණ පොත් ඕනෑ තරම් තිබෙනවා. ඒවා අවුස්සලා බලන්න. පාර්ලිමේන්තුවේ ලොකු පොත් තිබෙන්නේ, අවුස්සලා බලන්න. ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම අතර සියයට 20ක, සියයට 25ක වෙනස්කම් තිබුණා. අපි ඒ වෙනස ඉතා සමීප තැනකට ගේනවා. අපේ විශාල අපේක්ෂාවක් තිබෙනවා, මේ අවුරුද්දේ අපේක්ෂා කරන ලද ආදායමට වඩා වැඩි ආදායමක් ලබා ගන්න. ඒ වෙනුවෙන් අපි පොර බදනවා. මේ ස්ථාවරභාවය අවශ්‍යයි. මේ ස්ථාවරභාවය අත්පත් කර ගන්නේ නැතුව ආර්ථිකයේ විශාල හැරවුම් ගන්න බැහැ. කඩා වැටුණු ආර්ථිකයක, අර්බුදකාරී තත්ත්වයක් තිබෙන ආර්ථිකයක කොහොමද හැරවුම් ගන්නේ? ඒ නිසා මේ ආර්ථිකය ඉතාම ශක්තිමත් ස්ථාවරභාවයකට ගෙන ඒම තමයි අපේ පළමු ප්‍රයත්නය.

පෞද්ගලික ව්‍යවසායකයන්ට අපි පිළිබඳවත්, අපේ ආර්ථිකය පිළිබඳවත් අවිශ්වාසයක් තිබුණා. අපේ ආර්ථිකයට සම්බන්ධ වන කණ්ඩායම්වල විශ්වාසය තහවුරු කරන්නේ නැතුව ආර්ථිකයට ඉදිරියට ගෙන යන්න බැහැ කියලා අපි දන්නවා. අද අපට ව්‍යවසායකයන්ගේ, කර්මාන්තකරුවන්ගේ, බැංකු පද්ධතියේ, ජාත්‍යන්තර මූල්‍ය සමාගම්වල, විදෙස් ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු වන ආර්ථිකයක් ඕනෑ. එහෙම නැතුව හැඟීම්වලින් ආර්ථිකය පාලනය කරන්න බැහැ. දත්ත මත, දත්ත මත ඇති කර ගන්නා විශ්ලේෂණ මත, ඒ විශ්ලේෂණයන් මඟින් ගනු ලබන නිගමනයන් මත අපි ආර්ථිකය හසුරුවමින් තිබෙනවා.

මා දන්නවා, මෝටර් රථ ආනයනය කිරීම පිළිබඳ ප්‍රශ්නයේදී අපට විශාල අවදානම් සහිත තීන්දුවක් ගන්න වුණු බව. මම නිකම් නොවෙයි මේ කාරණය කියන්නේ. 2018දී අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 1,950ක මෝටර් රථ ආනයනය කරලා තිබුණා. අපි අවුරුදු 5ක් වාහන ආනයනය කරලා තිබුණේ නැහැ.

අපි නැවත වාහන වෙළෙඳ පොළ විවෘත කිරීම අපේ ආර්ථිකයට, අපේ ඩොලර් ආදායමට දරා ගන්න බැරි තෙරපුමක් වීමේ අනතුරක් තිබුණා. වහන්න ලෙහෙසියි, අරින්න අමාරුයි. මතක තබා ගන්න, වහන්න ලෙහෙසියි. අද ගැසට් එකක් ගහනවා, වාහන ගෙන්වන්නේ නැහැ කියලා. මුකුත් වෙන්නේ නැහැ. හැබැයි, විවෘත කරන්න ගියාම? නැවත විවෘත කිරීමේදී දැඩි අවදානම් සහිත, පරෙස්සම්කාරී තීන්දුවක් ගන්න වෙනවා. මොකද, ඇති තරම් ඩොලර් තිබෙන ආර්ථිකයක් නොවෙයි අපට තිබෙන්නේ. අපේ ඩොලර් ආදායම මත අපි අපේක්ෂා නොකරන තෙරපුමක් ආවොත් නැවත ආර්ථිකයේ විශාල අර්බුදයක් නිර්මාණය වීමේ අනතුර අපට තිබුණා. අපි මොකක්ද කළේ? මතක තබා ගන්න, දිනපතා ඉතා හොඳින් අධ්‍යයනය කරමින් තමයි අපි ඒ කටයුත්ත කළේ. ඊයේ වෙනකොට අපි LCs open කරලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 207ක. තව පොඩ්ඩකින් තොරතුරු එයි අද කීයද කියලා. අපි අපේක්ෂා කරන ඉලක්කයක් තිබෙනවා, මෙච්චර ඩොලර් ප්‍රමාණයක් මේ අවුරුද්දේ වාහන ආනයනය සඳහා අපට දරා ගත හැකියි කියලා. අන්න ඒ අපි අපේක්ෂා කරන ඩොලර් සීමාව ඇතුළේ වාහන ආනයනය රඳවා ගන්නේ කොහොමද? මා ඔබට විවෘතව ඒ ගැන කියන්නම්. අපි අපේක්ෂා කරන ඩොලර් ප්‍රමාණය ඇතුළේ වාහන ආනයනය රඳවා ගැනීම පමණක් නොවෙයි, ඒ ප්‍රමාණය ඇතුළේ අපේ ආදායමත් අපි අපේක්ෂා කරලා තිබෙනවා. ඒ නිසා අපි මේක මෙතැනට සම්පාත කරගන්නම ඕනෑ. මේක ඉක්මවා ගියොත් ඩොලර්වල අර්බුදයක් ඇති වෙනවා. මේක පහළට වැටුණොත් ආදායම්වල අර්බුදයක් ඇති වෙනවා. ඒ නිසා අපි මොකක්ද කරන්නේ? දිනපතා සමාලෝචනය කරමින්, මේ ඉලක්කය කරා මෙහෙයවීමට අපි සැලසුම් සකස් කරමින් තිබෙනවා. එහෙමයි ආර්ථිකයක් ස්ථාවර කරන්නේ. මා නැවත කියනවා, මේ විවෘත කිරීම් ඉතාම අවදානමක් තිබෙන, අවධානයෙන් ගත යුතු විවෘත කිරීම් බව. අපි ඒ කටයුත්ත කරමින් තිබෙනවා. දැන් කාට හෝ ඒ ගැන ප්‍රශ්නයක් තිබෙනවාද? මතක තබා ගන්න, අපි ඉතාම සැලසුම්සහගතව තමයි මේ කටයුත්ත කරන්නේ. මා නැවත නැවතත් කියනවා, මේ ආර්ථිකයේ ස්ථාවරභාවය නිර්මාණය කරන්න අපි විශාල ප්‍රයත්නයක් දරමින් සිටිනවා කියන එක.

මා ඔබතුමන්ලාට තව කාරණයක් කියන්නම්. ඔබතුමන්ලා ඕනෑ තරම් දේශපාලනය කරන්න. හැබැයි, ආර්ථිකය අස්ථාවර වීම සඳහා හේතු වන බොරු, අසත්‍ය කරුණු සමාජගත කරන්න එපා. සමහර අයට ඔබගේ ආර්ථික විශේෂඥයින් ලෙස නාමකරණයන් තිබෙනවා. ඒක මම දන්නේ නැහැ. හොඳට මතක තබා ගන්න, ඒ වාගේ අය විසින් කරන ප්‍රකාශ වගකීම් සහිත ප්‍රකාශ බවට පත් විය යුතුයි. එවැනි ප්‍රකාශයක් තුළින් යළි අපේ රටේ මූල්‍ය වෙළෙඳ පොළේ විශාල අස්ථාවරභාවයක් නිර්මාණය කළ හැකියි. මේ ආර්ථිකය ස්ථාවර කර ගැනීමට අපි හැමදෙනාම

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

භිතනවා නම්, ඒක ආණ්ඩුවක් හැටියට අපේ වගකීමක් විතරක් නොවෙයි. මේ ආර්ථිකය ස්ථාවර කර ගැනීම පුරවැසියන් ලෙස වාගේම මහජන නියෝජිතයන් ලෙස අපි හැමදෙනාගේම වගකීමක්. අපි දේශපාලන පිටියේ ඕනෑ තරම් රණ්ඩු වෙමු, ඕනෑ තරම් එකිනෙකාට ප්‍රහාර එල්ල කර ගනිමු. හැබැයි, මම ඔබෙන් ඉල්ලා සිටිනවා, ආර්ථිකය පිළිබඳ අවදානම් සහිත, අසත්‍ය කරුණු සමාජයට ඉදිරිපත් කරන්න එපා කියලා. හෙට එය කොටස් වෙළෙඳ පොළට බලපෑමක් ඇති කළ හැකියි. හෙට එය අපේ බැංකු පද්ධතිය කෙරෙහි වන විශ්වාසයට බලපෑමක් ඇති කළ හැකියි. හෙට එය අපේ රට දෙස බලාගෙන ඉන්නා ආයෝජකයන් තුළ අවිශ්වාසයක් නිර්මාණය කළ හැකියි. ඇයි, ඒ? හොඳින් සුමටව ගලාගෙන යන ආර්ථිකයකදී ඒ ප්‍රකාශවලට බරපතළභාවයක් එන්නේ නැහැ. හැබැයි, කඩා වැටුණු ආර්ථිකයකට, ඉතාම ප්‍රවේශමෙන් නැවත ස්ථාවරභාවය නිර්මාණය කරමින් තිබෙන ආර්ථිකයකට සැකය හදන්න එපා. සැකයක් තිබෙනවා නම් පළමුව අපව හමුවෙලා කථා කරන්න. කොතැනක හෝ සැකයක් තිබෙනවා නම් අපව හමුවෙලා කථා කරන්න. කථා කරලා, ඒ සැකය නිරවුල් වෙන්නේ නැත්නම් එළියට කියන්න. සැක මත කරුණු අවිචාරාත්මකව එළියට කියන්න එපා. සැකයක් තිබෙනවා නම් ඕනෑ වෙලාවක අපව හමුවෙලා කථා කරන්න. ඔබතුමන්ලා අපි දන්නා අය. වෙන අය වාගේ නොවෙයි, අපි දන්නා අය. එකට වාඩිවෙලා හිටපු එකම මුහුණු. විපක්ෂය පැත්තේ ආසනවල එකට වාඩිවෙලා හිටපු අය. ඒ නිසා සැකයක් තිබෙනවා නම් ඕනෑම වෙලාවක අපෙන් අහන්න, "මෙතැන සැකයක් තිබෙනවා" කියලා. අපි ඒ ගැන කියන්නම්. හැබැයි, සැකය සහිතව අවදානම් සහගත කරුණු එළියේ කියන්න එපා. ඒකෙන් අපේ රටේ ආර්ථිකය ස්ථාවර කර ගැනීම සඳහා මේ වෙලාවේ දරන ප්‍රයත්නයට විශාල බලපෑමක් ඇති වෙනවා. මේක අපි හැමදෙනාම වගකීමෙන් යුතුව හැසිරිය යුතු වෙලාවක්, මේ ආර්ථිකය ස්ථාවර කර ගැනීම සඳහා දරන ප්‍රයත්නය සාර්ථක කර ගැනීම වෙනුවෙන්.

ඊළඟට, විශේෂයෙන්ම ගත්තොත් මේ ආර්ථිකය ස්ථාවර වන තෙක්, අපට පුරවැසියන්ගේ ජීවිත ඒ විධියටම අයාලේ ගලාගෙන යන්න ඉඩ දෙන්න බැහැ.

ක්‍රමානුකූලව අපේ රටේ නිෂ්පාදනය දිරිගන්වා ගැනීම සඳහාත්, සාමාන්‍ය ජනතාවගේ ජීවිත සුරක්ෂිත කර ගැනීම සඳහාත් අවශ්‍ය වන සහන අපි ලබා දිය යුතුයි. ඒ අනුව අපි හෙක්ටෙයාරයක් සඳහා තිබුණු රුපියල් 15,000ක පොහොර සහනාධාරය රුපියල් 25,000 දක්වා වැඩි කළා. ඒ, **ඉහත** කී ආර්ථික තත්ත්වය හමුවේ. පසුගිය කැබිනට් මණ්ඩලයේදී අපි තීන්දුවක් ගත්තා, කුඹුරුවල වගා කරන අතිරේක භෝග සඳහාත් රුපියල් 15,000ක පොහොර සහනාධාරයක් ලබා දෙන්න. මීට කලින් දුන්නේ වී වගාව සඳහා විතරයි. දැන් කුඹුරුවල වගා කරන අතිරේක භෝග සඳහාත් අපි පොහොර සහනාධාරය ලබා දෙනවා.

ඊළඟ කාරණය තමයි අස්වැසුම සහනාධාරය. මා දැක්කා ඉස්සෙල්ලා මන්ත්‍රීවරයෙක් කිව්වා, මේගොල්ලන් බලාගන්න ඕනෑ කියලා. ඔව්, බලා ගන්න ඕනෑ. අස්වැසුම කොටස් දෙකකට තිබුණේ. එක කණ්ඩායමක් රුපියල් 8,500ක් ලබා ගත්තා. අනෙක් කණ්ඩායම රුපියල් 15,000ක් ලබා ගත්තා. අපි ආ විගස මොකක්ද කළේ? රුපියල් 8,500ක් ලබා ගන්න කණ්ඩායමේ දීමනාව රුපියල් 10,000ක් දක්වා වැඩි කළා. මේ, ජනවාරි මාසයේ ඉඳලා. රුපියල් 15,000ක් ලබා ගන්නා කණ්ඩායමේ දීමනාව රුපියල් 17,500ක් දක්වා වැඩි කළා. ඇයි? මේ ජනතාව බලා ගන්න ඕනෑ නිසා. ඒක අපේ වගකීමක්. අපි ඒක අත්හරින්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, 2024 දෙසැම්බර් මාසයේ 31වැනි දා පවුල් ලක්ෂ 8ක් අස්වැසුම වැඩසටහනෙන් එළියට වැටෙන්න තිබුණේ. ඒකෙන් පවුල් ලක්ෂ 4කට අපි ඒ කාල සීමාව මාස 4කින් දීර්ඝ කළා. තව පවුල් ලක්ෂ 4කට අපි ඒ කාල සීමාව මාස 12කින් දීර්ඝ කළා. මේ සියල්ල කළේ අසිරුතා මධ්‍යයේ. පසුගිය දෙසැම්බර් මාසයේ 31වැනි දා සිට අස්වැසුම වැඩසටහනෙන් එළියට වැටෙන්න හිටපු පවුල් ලක්ෂ 8ක් යළි අස්වැසුම වැඩ පිළිවෙළේ රඳවා ගන්න අපි තීරණය කළා. මොකද, අපි සමීක්ෂණය කළාම තේරුණා ආර්ථිකය සුබදායක තත්ත්වයට පත් වෙලා නැහැ, ඔවුන් එළියට වැටීම සාධාරණ නැහැ කියලා. මේ තත්ත්වය ඇතුළේ අපි ජනතාව බලා ගන්නවා.

ඒ විතරක් නොවෙයි, අපි දන්නවා, පාසල් දරුවන්ගේ අධ්‍යාපන උපකරණ මිලදී ගැනීමේදී ප්‍රශ්නයක් මතු වෙලා තිබුණු බව. පාසල් නිවාඩුව ලැබුණා, අධ්‍යාපන උපකරණ මිලදී ගැනීම සඳහා දරුවන්ගේ දෙමව්පියන්ට හැකියාවක් නැති බව තේරුණා. ඒ නිසා අපි දරුවෙකුට රුපියල් 6,000ක් ලබා දෙන්න තීරණය කළා. අපේ ආණ්ඩුවේ ඉලක්කය තමයි, ආධාර ලැබිය යුතු කෙනා ඉලක්ක කර ආධාර ලබා දීම. ඒක තමයි ප්‍රතිපත්තිය වෙන්න ඕනෑ. මොකද, ආධාර ලබා දීමේදී ආධාර ලැබිය යුතු කෙනාටයි, නොලැබිය යුතු කෙනාටයි ඒ ඔක්කොටම ආධාර ලබා දෙන්නේ නැහැ. ආධාර ලබා දිය යුතු කණ්ඩායමක් ඉන්නවා. අපි පාසල් දරුවෝ ලක්ෂ 16කට මේ අවුරුද්දේ පාසල් පොත් සහ උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් 6,000ක දීමනාවක් ලබා දුන්නා. පළමු වතාවට මෙම වැඩසටහන් ක්‍රියාත්මක වෙන්නේ හොඳින්ම සුවපත් වූ ආර්ථිකයක් තුළ නොවෙයි. අපි තවම ආර්ථිකයේ විශාල පරිවර්තනයක් ඇති කරලා නැහැ. එහෙත් අපි ඒ අය බලාගත යුතුයි. මම මේ දේවල් නැවත කියන්නේ මේවා අවධාරණය කළ යුතු නිසායි.

පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා දන්නවා, වකුගඩු රෝගීන්ට මාසිකව රුපියල් 7,500ක දීමනාවක් තමයි ලැබුණේ කියලා. මේ අප්‍රේල් මාසයේ ඉඳලා ඒක රුපියල් 10,000 දක්වා අපි වැඩි කළා. රුපියල් 3,000ක්ව තිබුණු වැඩිහිටි දීමනාව රුපියල් 5,000 දක්වා අපි වැඩි කළා. එහෙම කළේ ජනතාව බලා ගන්න. ඒ වාගේම අපි ආරම්භයේදීම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප රුපියල් 3,000කින් වැඩි කළා, ජනතාව බලා ගන්න. දැන් කිව්වා නේ, අපි ජනතාව අත් හැරලා කියලා. නැහැ. අපේ වගකීම් සහිත බැඳීම තිබෙන්නේ කුමන ජන කණ්ඩායමටද කියන එක පිළිබඳව අවබෝධයෙන් වැඩ කරන දේශපාලන ව්‍යාපාරයක් අපි. අපේ වගකීම සහ අපේ බැඳීමක් තිබෙනවා. ඒ නිසා අපි මේ ජනතාව බලා ගන්න ඕනෑ. ඔවුන් ආර්ථික වශයෙන් ඉදිරියට ගන්න ඕනෑ. මා පසුව ඒ ගැන කියන්නම්.

ඒ විතරක් නොවෙයි. රුපියල් 5,000ක්ව තිබුණු මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 7,500 දක්වා වැඩි කළා. ශිෂ්‍යාධාර සඳහා ලබා දෙනු ලබන රුපියල් 4,000ක මාසික දීමනාව රුපියල් 6,500 දක්වා වැඩි කළා. මා කලින් කියපු ආර්ථිකය ඇතුළේ මේවා කරන්නේ. ඒ විතරක් නොවෙයි, ආයතනවල ජීවත් වන දරුවන්ට, දෙමව්පියන් නැති වීදි දරුවන්ට රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන්නත්, රුපියල් 3,000ක් ඔවුන්ගේ ස්ථාවර ගිණුමක තැන්පත් කරන්නත් අපි තීරණය කළා. රුපියල් 3,000ක් ලබා දෙනවා, මාසිකව ඔවුන්ගේ ස්ථාවර ගිණුමක තැන්පත් කරන්න. අනාථ කඳවුරක සිටින දරුවෙකු විවාහ වනවා නම් -විශේෂයෙන්ම ගැහැණු දරුවෙකු විවාහ වනවා නම්- නිවාසයක් ඉදි කර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 10ක් අපි ලබා දෙනවා.

නැත්නම් කවුද ඒ දරුවන්ව බලා ගන්නේ? අපි ඒ දරුවන්ව බලා ගන්න ඕනෑ. අනාථ කඳවුරක ඉන්න දරුවෙක් විවාහයක් කර ගත්තාට පස්සේ ඒ දරුවාට ඉන්න තැනක් නැහැ. හැබැයි, අපි ඒ දරුවන්ට රුපියල් ලක්ෂ 10ක් ලබා දෙනවා. මේ ආණ්ඩුව ජනතාව

බලා ගන්නා ආණ්ඩුවක් කියන්නේ ඒකයි. ඒ වාගේම, පෙර පාසල් දරුවකුට ආහාර වේලකට ගෙවූ රුපියල් 60ක මුදල අපි රුපියල් 100ක් දක්වා වැඩි කළා. අර ගරු මන්ත්‍රීතුමා කියපු නිසායි මම මේ ටික මතක් කළේ. අපි, ජනතාවට වගකියන, ජනතාවත් එක්ක බැඳීමක් තිබෙන පාලනයක්.

ඊළඟට මම කියන්නම්, රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම පිළිබඳව. අපි අපේ රාජ්‍ය සේවයේ තිබෙන ගැටලු දෙකක් හඳුනා ගත්තා. පළමුවැනි කාරණාව තමයි, අපේ රාජ්‍ය සේවයේ යම් විශේෂ ව්‍යත්තීමය නිපුණතාවක් තිබෙන කණ්ඩායම් රට අතහැර යන ප්‍රවණතාවක් තිබෙනවා. දෙවැනි එක තමයි, යම් හැකියාවක්, ව්‍යත්තීමය නිපුණතාවක් තිබෙන කෙනෙක් රාජ්‍ය සේවයට ආකර්ෂණය කර ගන්න බැරි දුබලතාවක් තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ රටේ කෘෂිකර්ම අමාත්‍යාංශය ගත්තොත්, එහි ලේකම්වරයා විශාල සේවක සංඛ්‍යාවකට වාගේම විශාල ජනතාවකට කාර්යයන් වෙනුවෙන් මැදිහත් වන ලේකම්වරයෙක්. හැබැයි, යම් සමාගමක - සමහර සමාගම්වල - ප්‍රධාන විධායක නිලධාරියා රුපියල් මිලියන 4ක, 5ක වැටුපක් ගන්නකොට, අපේ ලේකම්වරයෙකුට ලැබෙන්නේ සොච්චම් වැටුපක්. ඒ පිළිබඳව capacity එකක් - ධාරිතාවක් - තිබෙන නිලධාරීන්, කණ්ඩායම් රාජ්‍ය සේවයට ආකර්ෂණය කර ගන්න බැහැ. ඇයි? රාජ්‍ය සේවයේ වැටුප් ඉතාම පහළ තලයක තිබුණේ. මේ හේතුවෙන් හැකියාවන් සහිත කණ්ඩායම් රට අතහැර යෑමේ ප්‍රවණතාවක් සහ හැකියාවන් සහිත කණ්ඩායම් රාජ්‍ය සේවයට ආකර්ෂණය කර ගැනීමේ දුබලතාවක් තිබුණා. ඒ නිසා අපි කල්පනා කළා මේ අසීරුතා මධ්‍යයේ වුවත් රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුපේ ඉතාම දැනෙන වැඩි කිරීමක් කරන්න ඕනෑ කියලා. අපි ඒක කළා. මම පසුගිය කාලසීමාව තුළ ව්‍යත්තීය සමිති ගණනාවක් හමු වුණා. ඒ හැම ව්‍යත්තීය සමිතියක්ම කියපු කථාව මොකක්ද? අපි අපේක්ෂා නොකරන ලද මූලික වැටුපේ වැඩිවීමක් වෙලා තිබෙනවා කියන එකයි ඔවුන් කිව්වේ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමා හිතුවේත් නැහැ. ඒ සේවකයන් හිතුවේත් නැහැ, තමන්ගේ මූලික වැටුප මේ ආකාරයට වැඩිවෙයි කියලා. රුපියල් 53,000ක මූලික වැටුපක් ගන්න කෙනෙකුගේ වැටුප රුපියල් 94,000ක් දක්වා වැඩි වෙනවා. මේක සටන් කරලා ඉල්ලුවේ නැහැ. මෙවැනි මූලික වැටුප් වැඩිවීමක් පිළිබඳව සංවාදයක් තිබුණේවත් නැහැ. අපට හරිම ලේසියි රාජ්‍ය සේවකයාගේ වැටුපට රුපියල් 10,000ක් එල්ලාගෙන ගියා නම්. අපිට ඒ විධියට එල්ලන්න තිබුණා. රුපියල් 25,000ක් එල්ලන්න තිබුණා. නමුත්, විද්‍යාත්මක ක්‍රමයකට මේ මූලික වැටුප් වැඩි කිරීම් පිළිබඳව අපි තීරණයක් ගත්තා. මොකද, අපේ රාජ්‍ය සේවයට ඒ ධාරිතාව තිබෙන කණ්ඩායම් කැඳවන්න ඕනෑ.

අද අපේ රාජ්‍ය සේවයට හොඳ accountant කෙනෙක් ගන්න අමාරුවක් තිබෙනවා. අපි විශේෂයෙන්ම IT ක්ෂේත්‍රය පිළිබඳව අධ්‍යයනයක් කරමින් සිටිනවා. වෙනම package එකක් අපි දෙන්න ඕනෑ IT ක්ෂේත්‍රයේ අය අපේ රාජ්‍ය සේවයට ගේන්න. එහෙම නැත්නම් මේක කරන්න බැහැ. අපි මේ කරන වැඩේට යන්න නිකම් කොම්පියුටර් ඔබන අය විතරක් ඉඳලා හරියන්නේ නැහැ. මොකද, විශේෂ හැකියාවක්, විශේෂ ධාරිතාවක් තිබෙන කණ්ඩායම් රාජ්‍ය සේවයට කැඳවන්න නම්, ඒ රාජ්‍ය සේවයේ යම් ආකර්ෂණීය වැටුප් තලයක පිහිටුවන්නට ඕනෑ. අපි ඒ දේ කළා. ඒ කියන්නේ අපි ආකාර කිහිපයකින් සහන දුන්නා. පළමුවැනි එක, අපි ඒ උදවියගේ මූලික වැටුපේ වැඩි කිරීමක් කළා. දෙක, ඒ උදවිය අමතර දිනයක වැඩ කරනවා නම්, නිවාඩු දිනයක වැඩ කරනවා නම්, නිවාඩු දිනයක වැඩ කරද්දී ලැබෙන මුදල් ප්‍රමාණය වැඩි කළා. මේ කාලයේ කවුරු හරි කෙනෙක් නිවාඩු දිනයක වැඩ කළා නම්, ඒ නිවාඩු දිනයේ වැඩ කළාට ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් අප්‍රේල් මාසයේ පළමුවැනිදායින් පස්සේ නිවාඩු දිනයක වැඩ කළාම හම්බ වෙනවා. කවුරු හරි කෙනෙක් අමතර රාජකාරි හෝ අමතර කාලයක් වැඩ කළා නම්, පැයක් වැඩ කළා නම්, දැන් පැයකට ගෙවන මුදලට වැඩි මුදලක් අප්‍රේල් මාසයේ ඉඳන් හම්බ වෙනවා. අපි ඒවා වැඩි කළා.

ඊළඟට, වැටුප් වර්ධක සම්බන්ධයෙන් කවදාවත් සාකච්ඡාවක් තිබුණේ නැහැ. සාකච්ඡාවකදී කවුරුවත් කිව්වේ නැහැ වැටුප් වර්ධක වැඩි කරන්න කියලා. රාජ්‍ය සේවකයාට ඉතා සොච්චම් වැටුප් වර්ධකයක් තිබෙන්නේ. අපි තීරණය කළා, සියයට 80කින් මේ වැටුප් වර්ධකය වැඩි කරන්න ඕනෑ කියලා. රුපියල් 250ක වැටුප් වර්ධකයක් තිබෙන කෙනෙකුට දැන් රුපියල් 450ක් ලැබෙනවා. රුපියල් 500ක වැටුප් වර්ධකයක් තිබෙන කෙනෙකුට රුපියල් 900ක් ලැබෙනවා. අපි එය වැඩි කළා. ඒ විතරක් නොවෙයි. රාජ්‍ය සේවකයාගේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ලොකු දුක්ගැනවිල්ලක් තිබුණා, තමන්ගේ වැටුපෙන් දරා ගන්න බැරි බද්දක් කැපෙනවා කියලා. අපි රුපියල් ලක්ෂයක් ලෙස තිබුණු බදු සීමාව ලක්ෂ එකහමාර දක්වා වැඩි කළා.

ඊයේ කියා තිබෙනවා මා දැක්කා, සියයට 6න් පස්සේ සියයට 18ක බද්දක් ගෙවිය යුතුයි කියලා. සියයට 6න් පස්සේ ඊළඟටත් සියයට 6යි. ඊළඟටයි සියයට 18. තේරුණාද? සියයට 6 ඒවා දෙකක් තිබෙනවා. පළමු රුපියල් ලක්ෂ 18 මුළුමනින්ම නිදහස්. ඊළඟ ලක්ෂ 5ට සියයට 6යි. ඊළඟ ලක්ෂ 5ට සියයට 12ක්ව තිබුණේ. දැන් ඒකත් සියයට 6යි. ඊළඟ ලක්ෂ 5ට සියයට 18යි. වැඩි වන පළමු ලක්ෂ 5ට සියයට 6ක් තිබුණා. සියයට 12ක්ව තිබුණු එකත් සියයට 6ට ගෙනාවා. ඒ කියන්නේ පළමුවෙනි රුපියල් ලක්ෂ 5ට සියයට 6යි. දෙවැනි ලක්ෂ 5ට සියයට 12ක්ව තිබුණා. තුන්වැනි ලක්ෂ පහට සියයට 18ක්ව තිබුණා. අපි මොකක්ද කළේ? පළමු ලක්ෂ 5ට සියයට 6යි. දෙවැනි ලක්ෂ 5ටත් සියයට 6යි. තුන්වෙනි ලක්ෂ 5ට තිබුණු තැනමයි. ඒකෙන් මොකක්ද ලැබෙන ප්‍රතිලාභය?

මාසිකව රුපියල් 150,000ක් වැටුප් ලබන කෙනෙකුගේ බද්ද සියයට 100ක් නිදහස්. රුපියල් 200,000ක් වැටුප් ලබන කෙනෙකුගේ බද්ද සියයට 72ක් නිදහස්. සියයට 36 සීමාව ඉක්මවා යන කෙනෙකුට රුපියල් 20,500ක බදු අඩු වීමක් අප්‍රේල් මාසයේ ඉඳන් සිද්ධ වෙනවා. හොඳ නැද්ද? මතක තබා ගන්න, ඒ වෙනුවෙන් ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් බිලියන 50කට, 60කට ආසන්න මුදලක් රජයට අහිමි වෙනවා. ගිය අවුරුද්දේ ලැබුණු බද්දක් මේ අවුරුද්දේ අහිමි වෙනවා. ඒ කියන්නේ, ගිය අවුරුද්දේ ආණ්ඩුවට ලැබුණු බද්දක් මේ අවුරුද්දේ අහිමි වෙනවා. හැබැයි, ඒ රුපියල් බිලියන 50ක,60ක මුදල ඒ බදු ගෙවපු අයට පෙරළා යනවා. ඔවුන් ඒක වියදම් කරාවි. අපි ඒක දන්නවා. ඊට පසුව නැවත ආර්ථිකයේ චලනයක් ඇති කරයි; ආර්ථිකයේ යෙදවුම්වලට යොදවයි. එතකොට ආර්ථිකයේ වෙනත් අවස්ථාවක් අපට එනවා. අපි එහෙම කල්පනා කළා. හැබැයි, ඊට පසුව ප්‍රශ්නයක් පැන නැගුණා, ක්ෂේත්‍ර කිහිපයක. විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ. ඒගොල්ලන්ගේ OT පැය හෝ අමතර රාජකාරි පැය ගණනය කරපු ක්‍රමයක් තිබුණා. වෛද්‍යවරුන්ගේත් එය ගණනය කළා, 80න් බෙදලා; nursesලාගේ ගණනය කළා, 160න් බෙදලා. එහෙම බෙදලා ගණනය කළා. හැබැයි, එදා තිබුණු මූලික වැටුප 80න් බෙදුවාම ලැබුණු මුදල, අද තිබෙන මූලික වැටුප 120න් බෙදුවාම ලැබෙන මුදලටත් වඩා අඩුයි. ඒ කියන්නේ, අද තිබෙන මූලික වැටුප 120න් බෙදුවත් එදා මුදලට වඩා වැඩියි. අද ඒ තරමට වැඩි කරලා තිබෙනවා, මූලික වැටුප. ඒක නේ ඒකෙන් කියන්නේ. ඒ කියන්නේ 80න් බෙදපු එකක් 120න් බෙදන විටත් වැඩි වීමක් තිබෙනවා නම්, ඒ වැඩි වීමෙන් පෙන්නුම් කරන්නේ, මූලික වැටුප ඒ තරම් ප්‍රමාණයකින් වැඩි කරලා තිබෙනවා කියන එකයි. ඉතින් මේ කියන අමතර රාජකාරි පැය, අතිකාල -OT- දීමනා ආදියට අදාළ සූත්‍රයක් තිබුණා. 80න් බෙදපු එක අපි 120න් බෙදන්න තීරණය කළා; 120න් බෙදපු එක 160න්

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

බෙදන්න තීරණය කළා; 160න් බෙදපු එක 200න් බෙදන්න තීරණය කළා; 200න් බෙදපු එක 240න් බෙදන්න තීරණය කළා. එතකොට සමහර වෘත්තීන්ගෙන් ආවා, අයිතිවාසිකම් කප්පාදුව පිළිබඳ අදහසක්.

අපට ඕනෑ නම් තවත් අමතර යෝජනාවක් තිබුණා. 80න් බෙදන එකම ආරක්ෂා කරගෙන මූලික වැටුප ඒකට ගැළපෙන්න තියන්න තිබුණා. මූලික වැටුප 80න් බෙදුවාම ලැබෙන ගණනම ලැබෙන්න සලස්වන්න තිබුණා. ඒ වියදමම දරන්න අපට තිබුණා. හැබැයි, අපි මුහුණ දුන්නා, ප්‍රශ්නයකට. මොකක්ද? අපි වැටුප් අනුපාතය 1:4 ලෙස තියා ගන්න ඕනෑ. "1" කියන්නේ, පහළම කෙනා. උඩ ඉන්න කෙනාගේ වැටුප දැනෙන්න යම් ප්‍රමාණයකින් වැඩි වුණේ නැත්නම්, පහළම කෙනාට එහෙමවත් වැඩි වෙන්නේ නැහැ. උඩ ඉන්න කෙනාගේ වැටුප වැඩි වුණොත් තමයි පහළ ඉන්න කෙනාගේ වැටුප වැඩි වෙන්නේ. ඒ නිසා තමයි අපි මූලික වැටුප වැඩි කරන්න වැඩි බරක් තිබ්බේ. ඒ නිසා තමයි අප කියන්නේ, අවම වැටුප දැනටමත් රුපියල් 15,550කින් වැඩි වෙනවා කියලා. අවම වැටුප රුපියල් 15,550කින් වැඩි වෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි; එය උපරිම වැටුපෙන් 1/4 යි. උපරිම වැටුප අඩු වුණොත්? අවම වැටුප ලැබෙන කෙනාගේ වැඩි වීම අඩු වෙනවා. ඒ නිසා අපි මොකද කළේ? උපරිම වැටුප වැඩි කළා. වැඩි කරලා අපි කිව්වා, "දැන් ඔය ගොල්ලන්ට දෙන දීමනා අපි මේ විධියට සංශෝධනය කරන්නම්" කියලා. ඒ පිළිබඳව පොඩි සංවාදයක් මතු වෙලා තිබෙනවා. අවශ්‍ය නම් අපි ඒක සංශෝධනය කරන්නම්, මෙන්න මේ විධියට. ඔබට දැන් ලැබෙන, - දැන් ලැබෙන කියන්නේ, මෙහෙමයි. මේ බෙදීම ගණනය කරන්නේ, 2027 ජනවාරි මාසයේදී ලැබෙන වැටුපට. ඒ කියන්නේ, 120න් බෙදන්න මේ යෝජනා කළේ, මේ අප්‍රේල් මාසයේ ලැබෙන වැටුප නොවෙයි. අවසානයේදී ලැබෙන පූර්ණ වැටුප තමයි 120න් බෙදන්නේ.

අපි යම් සංශෝධනයක් ගෙනෙන්න කැමැතියි, මෙන්න මෙහෙම. 80න් බෙදන අයගේ මූලික වැටුප 80න්ම බෙදලා, ඒකෙන් 2/3ක් ලබා දෙනවා. හරි නේ. ඊට පසුව - *[බාධා කිරීමක්]* තේරෙනවා නේද? 120න් බෙදීමක් නැහැ. 80න් බෙදපු එක 80ම තියනවා. තියලා ඒකෙන් 2/3ක් ලබා දෙනවා. 120න් බෙදපු එක, 160 වුණා නේ. ඒක 120න්ම බෙදලා 3/4ක් ලබා දෙනවා. 160න් බෙදපු එක 200 වුණා නේ. 200 කරන්නේ නැතුව ඒක 160න්ම බෙදලා 4/5ක් ලබා දෙනවා. ඊළඟට, 200න් බෙදපු එක 240 වුණා නේ. ඒක 200න්ම බෙදලා 5/6ක් ලබා දෙනවා. *[බාධා කිරීමක්]* ඉතුරු ටික ආර්ථිකයට ඉතාම හොඳ ස්ථාවරභාවයක් නිර්මාණය වුණාම අපි ලබා දෙනවා. ඒගොල්ලන් කියනවා නම්, මූලික වැටුප 80න් බෙදීම ඒගොල්ලන්ගේ අයිතියක් කියලා, අපි ඒ අයිතිය ආරක්ෂා කරලා දෙන්නම්. හැබැයි, මේ වැටුප් වැඩි වීමේදී දෙන්නේ ඒකෙන් 2/3 යි. 120න් බෙදීම ඔවුන්ගේ අයිතියක් නම්, අපි 120න් බෙදන්නම්. මේ කාලයේ ලබා දෙන්නේ 3/4යි. 160න් බෙදීම ඔවුන්ගේ අයිතියක් නම්, 160න් බෙදන්නම්. ලබා දෙන්නේ 4/5යි. 200න් බෙදීම ඔවුන්ගේ අයිතියක් නම්, 200න් බෙදන්නම්. නේද? ඒකත් අර කියපු විධියට ලබා දෙන්නම්. හරි නේ. මා හිතන විධියට, එතකොට හරි. එතකොට අපි ගොල්ලන්ගේ මූලධර්මය ආරක්ෂා කර දීලා තිබෙනවා; අභිමානය ආදි සියල්ල රැක දීලා තිබෙනවා. හරි නේ.

ඊළඟට, විශේෂ ප්‍රශ්නයක් මතු වෙලා තිබුණා, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන්. ඒ තමයි, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ආධුනික කථිකාචාර්යවරයකුගේ වැටුප ඊට සමාන වෘත්තීන්හි වැටුපට වඩා අඩුයි කියන එක. අපි දන්නවා, සාමාන්‍යයෙන් කථිකාචාර්යවරයෙකු වශයෙන් බැඳෙන්න පළමු පන්තියේ උපාධියක් හෝ දෙවැනි පන්තියේ උපාධියක් තිබෙන්න ඕනෑ බව. එහෙම උපාධියක් ගත්තු කෙනෙකු තමයි ආධුනික කථිකාචාර්යවරයෙකු හැටියට බඳවා ගන්නේ. හැබැයි, ඊට වඩා අඩු සුදුසුකම් සහිත කෙනෙක් ඊට ගැළපෙන වෘත්තියකට යනවා. ඒ කෙනාගේ වැටුප වැඩියි, ආධුනික කථිකාචාර්යවරයෙකුගේ වැටුප අඩුයි. රුපියල් 3,000ක විතර අඩුවක් තිබෙනවා. ආධුනික කථිකාචාර්යවරුන්ට වන අන්න ඒ අසාධාරණය දැකලා අපි ඒක නිවැරදි කිරීම සඳහා ඒ අයගේ වැටුප ආපහු රුපියල් 3,035කින් වැඩි කරනවා. එතකොට ඒ ප්‍රශ්නයත් අවසන්. මා හිතන විධියට, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ඒ ප්‍රශ්නයත් එතකොට අවසන්. එහෙම නේද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ඒක හරි.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
අපි ඒකත් බේරන්නම්. එතකොට ආධුනික කථිකාචාර්ය-වරයෙකුට තිබුණු ප්‍රශ්නය විසඳෙනවා. අපි ඒ වෘත්තිය සමීති එක්කත් සාකච්ඡා කළා. නේද? ඔවුන්ගේ ඉල්ලීම වුණේ, ආධුනික කථිකාචාර්යවරයෙකුගේ වැටුප සමහර වෘත්තීන්වලට අදාළ වැටුපට වඩා උඩින් තිබෙන්න ඕනෑ කියන එකයි. අපි ඒක ආරක්ෂා වන විධියට සංශෝධනය කරන්නම්. අපි ඒ විධියට තමයි කටයුතු කර තිබෙන්නේ.

මේ සියල්ලෙන්ම අපේක්ෂා කරන්නේ කුමක්ද? අපට ඉතාම හොඳ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් අවශ්‍යයි. මම පසුව කියන්නම්, වැටුප් ලබා ගන්නා අයට තිබෙන වගකීම මොකක්ද කියලා. අපි ඒක කියන්න ඕනෑ.

හැබැයි, ඊට ප්‍රතිපක්ෂව මොකක්ද කරමින් තිබුණේ? ඊට ප්‍රතිපක්ෂව දේශපාලන අධිකාරිය මොකක්ද කරමින් තිබුණේ? ඒ සමහර ඒවා අපි දැන් තමයි දන්නේ. මම ජනාධිපති වුණාම මට මන්ත්‍රීවරයාගේ විශ්‍රාම වැටුපක් හම්බ වෙනවා. කලින් හිටපු අයටත් හම්බ වෙලා. ඒ කියන්නේ, ජනාධිපති වැටුපට අමතරව, මට මන්ත්‍රීවරයාගේ විශ්‍රාම වැටුපත් හම්බ වෙනවා. මම අද ලියුමක් දුන්නා, මන්ත්‍රී විශ්‍රාම වැටුප මට එපා කියලා. පටන් ගන්න ඕනෑ, මේ රට හදන්න. මතක තබා ගන්න. මේවා සැහවුණු ආදායම්. කොතැනකවත් කවුරු හෝ කෙනෙක් දැනගෙන සිටියා ද, මන්ත්‍රීවරයෙකු ජනාධිපති වුණාට පසුව එයාට මන්ත්‍රීවරයාට හිමි විශ්‍රාම වැටුප හම්බ වෙනවා, ජනාධිපති වැටුපත් හම්බ වෙනවා කියලා? ඒ දෙකම සාක්කුවේ දමාගෙන හොර පූසෝ වාගේ හිටියේ, හිටපු team එක. ඒ කට්ටිය එහෙමයි. අපි ඒක දැන ගත්තා. ඇත්තටම මම දැනගෙන හිටියේ නැහැ, එහෙම හම්බ වෙනවා කියලා. පසුව තමයි දැනගත්තේ ජනාධිපතිට මන්ත්‍රී විශ්‍රාම වැටුපත් හම්බ වෙනවා කියලා. ඒක දැනගත් හැටියේ පාර්ලිමේන්තුවට ලියුමක් දුන්නා, මට විශ්‍රාම වැටුප එපා කියලා.

ඒ වාගේම, මන්ත්‍රීවරයෙකු ඇමති වුණාම, ඇමතිට වැටුපක් හම්බ වෙනවා; මන්ත්‍රී වැටුපත් හම්බ වෙනවා. මෙහෙම නේ මේවා වවාගෙන කාලා තිබෙන්නේ. ඔබතුමන්ලා කවදාවත් හිතුවාද, මෙහෙම රටක් ඇති කියලා? සාමාන්‍යයෙන් හිතන්න, වෛද්‍යවරයෙක් ඉන්නවා කියලා. ඒ වෛද්‍යවරයා වෛද්‍ය අධ්‍යක්ෂ වෙනවා. වෛද්‍ය අධ්‍යක්ෂ වුණාම එයාට වෛද්‍ය අධ්‍යක්ෂ තනතුරේ වැටුපත්, වෛද්‍යවරයා හැටියට හිටපු කාලයේ වැටුපත් හම්බ වෙනවා ද? එහෙම වෙන්නේ නැහැ නේ. හිතන්න, ගුරුවරයෙක් ඉන්නවා කියලා. ගුරුවරයා විදුහල්පති වෙනවා. ඊට පස්සේ එයාට විදුහල්පති වැටුපත් හම්බ වෙනවා, ගුරුවරයාගේ වැටුපත් හම්බ වෙනවා. එහෙම හම්බ වෙනවාද?

නැහැ. හැබැයි, ජනාධිපතිට එහෙම හම්බ වෙනවා. ඒ කියන්නේ ඒ අයට ලොකු හැදි තිබුණා, බෙදා ගන්න; කැමති විධියට බෙදා ගත්තා. ඒ අනුව තමයි මන්ත්‍රීවරයා ඇමතිවරයා වෙනකොට මන්ත්‍රී වැටුපත් හම්බ වෙන්නේ, ඇමති වැටුපත් හම්බ වෙන්නේ. ඒ නිසා අපි තීරණයක් ගත්තා, අපේ ඇමතිවරු නියෝජ්‍ය ඇමතිවරු ගන්නේ මන්ත්‍රී වැටුප විතරයි කියලා. අපි ඒ ලියුම් දීලා තිබෙන්නේ. හැබැයි, ඇමතිවරුන්ට තෙල් දීමනාවක් හම්බ වෙනවා. හැබැයි, මන්ත්‍රීවරයාට දෙන තෙල් දීමනාවත් අයින් කරලා වැටුප දෙන්නේ. ඇමතිවරයාට, නියෝජ්‍ය ඇමතිවරයාට රජයෙන් ඉන්ධන දීමනාවක් දෙනවා. ඒ ඉන්ධන දීමනාව දෙන ගමන් මන්ත්‍රීවරයා නමින් ආයෙත් ඉන්ධන දීමනාවක් දෙනවා. කැත නැද්ද මේවා මේ රටේ? හැබැයි අපි ඇමතිවරයාට, නියෝජ්‍ය ඇමතිවරයාට හිමි ඉන්ධන දීමනාව ගන්නවා. මන්ත්‍රීවරයාට හිමි වැටුපෙන් ඉන්ධන දීමනාව අයින් කරනවා. අපි සාධාරණ වෙන්න ඕනෑ මේ රට හදන්න. ඒ සඳහා අපි කැප කිරීම් කරලා තිබෙනවා. මේ රට වෙනස් කරන්න නම් මේ දේශපාලනය වෙනස් වෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඔබතුමා නම් මන්ත්‍රීවරුන්ට ලොකු වැටුපක් දෙන්න ඕනෑ කියන ස්ථාවරයක ඉන්න කෙනෙක්. ඔව් මේ රට ගොඩනඟලා නම් අපි හැමදෙනාටම වැටුපක් ලබා ගැනීම ඉතා යුක්තිසහගතයි කියන මානසිකත්වයක් අපට ඇති වෙනවා. අපි මේ වෙලාවේ ජනතාවගේ බදු මුදල් එතරම් ප්‍රමාණයක් ඒ වෙනුවෙන් ලබා ගැනීම යුක්තිසහගත නැහැ. යුක්තිසහගතව අපි ඒක කරමු. එතකොට අපි ඒ වෙලාවේ දී ඒ ගැන බලමු. ඒ වාගේම, සමාවෙන්න. මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කරනවා. ඒ පනත ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවට ගෙනෙනවා. ඊළඟට, ජනාධිපතිවරයන්ගේ වරප්‍රසාද වෙනුවෙන් තිබෙන පනත සංශෝධනය කරනවා. ඒ පනතත් ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවට ගෙනෙනවා. පාර්ලිමේන්තුවේ ඔක්කෝම එකට එකතු වෙලා අත උස්සන්න පුළුවන් පනත් කෙටුම්පත් කිහිපයක් ගෙනෙනවා; ඉක්මනින් ගෙනෙනවා සංශෝධනය කරන්න. ඒවාට අත උස්සන්න ලෑස්ති වෙලා ඉන්න.

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරු සඳහා රුපියල් ලක්ෂ 10ක රක්ෂණාවරණයක් දෙනවා. මේ රක්ෂණාවරණය රුපියල් ලක්ෂ 10 බවට පත් කර ගත්තේ රටේ දැඩි ආර්ථික අර්බුදයක් තිබෙන වෙලාවක. ආර්ථිකය විශාල අර්බුදයක තිබෙන වෙලාවක තමයි මන්ත්‍රීවරුන්ගේ ලක්ෂ දෙකහමාරේ රක්ෂණය රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කළේ. තවමත් මේ රටේ ආර්ථිකය හොඳ නැහැ. මම හිතන විධියට, ඒ රුපියල් ලක්ෂ 10 රක්ෂණාවරණය අගෝස්තු මාසයේ අවසන් වෙන්නේ. නේද? රුපියල් ලක්ෂ 10 සඳහා දැනට අගෝස්තු මාසය දක්වා බැඳීම් තිබෙනවා. අගෝස්තු මාසයෙන් පස්සේ අපි ඒ රක්ෂණය අලුත් කරනකොට රුපියල් ලක්ෂ 10 රුපියල් ලක්ෂ දෙකහමාර දක්වා අඩු කරනවා, තරහා වෙන්න එපා. මම කලිනුත් කිව්වා වාහන පර්මිට් හම්බ වෙන්නේ නැහැ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා, "මන්ත්‍රීවරුන්ට ධුර කාලයේ දී වාහනයක් ලබා දෙන්න ඕනෑ" කියලා. අපි ඒ ප්‍රතිපත්තියේ ඉන්නවා. නමුත්, මේ අය වැය ලේඛනයෙන් එහෙම වාහනයක් අපට මේ අවුරුද්දේ ලබා දෙන්නත් බැහැ. අපි පසුව ඒ ගැන සැලකිල්ලක් කරමු.

ගරු සභාපතිතුමනි ඊළඟට ගත්තොත්, අපි අමාත්‍යවරු ප්‍රමාණය 21ට අඩු කරලා තිබෙනවා. නියෝජ්‍ය අමාත්‍යවරු ඊට සරිලන ලෙස ගොඩනඟලා තිබෙනවා. අමාත්‍යවරුන්ට ලබා දෙන නිල නිවාස ඔක්කොම අයින් කරලා තිබෙනවා. ඒ මොකක් වෙනුවෙන්ද? අපට අවශ්‍යයි දේශපාලන ස්ථාවරභාවයක් නිර්මාණය කරන්න. මන්ත්‍රීවරු, දේශපාලන අධිකාරිය මේ රට ගොඩනැඟීම සඳහා යම් කැපකිරීමේ ආදර්ශය දෙනවා නම්, මම හිතනවා රාජ්‍ය සේවකයනුත් ඒ සඳහා සූදානම් විය යුතුයි කියලා. ඒක අපි කරනවා. ඒ නිසා "අභිමානය" වාගේ චූටි ඒවායේ පැටලි පැටලී ප්‍රශ්න කරන්න එපා.

ගරු සභාපතිතුමනි, අපි විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා රැකියා විරහිත උපාධිධාරීන් පිළිබඳව. අපි පිළිගන්නවා මේ රටේ හැම තරුණයෙකුටම රැකියාවක් කිරීමේ යුක්තිසහගත අයිතියක් තිබෙනවා කියලා. හැබැයි. රැකියා නිර්මාණය වෙන්න ඕනෑ. රජය විසින් එළියේ රැකියා නිර්මාණය කරන්න ඕනෑ. අපි දන්නවා, අපේ ගොඩක් ලංකාවේ පුරවැසියන් විදෙස්ගත වෙලා රැකියාවල නිරත වෙනවා. හැබැයි, ඒ කවුරුවත් මේ රටවල ආණ්ඩුවේ රක්ෂා කරන්නේ නැහැ. ඒ රාජ්‍ය මැදිහත් වෙලා ආර්ථිකයක් එළියේ හදලා තිබෙනවා. ඒ එළියේ හදලා තිබෙන ආර්ථිකය ඇතුළේ තමයි ඒ රස්සා නිර්මාණය වෙන්නේ. හැබැයි, අපේ රටේ වැරදි සංස්කෘතියක් ගියා. ආණ්ඩුවක් මැදිහත් වෙලා එළියේ රක්ෂා නිර්මාණය කරනවා වෙනුවට, ආණ්ඩුව ඇතුළේ රක්ෂා නිර්මාණය කරනවා. අන්තිමට රැකියා දෙන ඒජන්සියක් බවට ආණ්ඩුව පරිවර්තනය වුණා. ඒකේ ප්‍රතිවිපාකවලට අද මුළු රාජ්‍ය දේහයම උරදෙමින් තිබෙනවා.

ඒ නිසා අපි කාර්යයක් නැති, තනතුරක් නැති, පුටුවක් නැති, ඉලක්කයක් නැති අය bulk පිටින් ආණ්ඩුවේ රැකියාවලට ගන්නේ නැහැ. විපක්ෂ නායකතුමා මේ අවස්ථාවේ හිටියා නම් මම දැනගන්න කැමැතියි, එතුමා ඒකට කැමතිද නැද්ද කියලා. මෙතැන කවුරුහරි ඉන්නවාද bulk පිටින් ආණ්ඩුවට ගන්න ඕනෑ කියන ස්ථාවරයේ ඉන්න? ඔබතුමන්ලා ඔළුව වැනීමෙන් පෙන්නුම් කරන්නේ නැහැ කියලා නේ. එහෙම ගත්තු අය ඉන්නවා නේ. ඒ ගත්ත අයට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ අයට උසස්වීමක් නැහැ, කාර්යයක් නැහැ, පුටුවක් නැහැ. සමහර ප්‍රාදේශීය ලේකම්වරු සමහර නිලධාරීන්ට කියනවා, "ඔයා බදාදාට විතරක් ඇවිල්ලා අත්සන් කරලා යන්න. ඔයාට වාඩි වෙන්න පුටුවක් දෙන්න නැහැ" කියලා. ඒ උපාධිධාරියාට ඒ රැකියාවෙන් වැඩකුත් නැහැ, ආණ්ඩුවට වැඩකුත් නැහැ. ඒ නිසා රැකියා දීම සම්බන්ධයෙන් අපි ප්‍රතිපත්තියක් හදලා තිබෙනවා. දැනට ඉහළ තලයේ ඉන්න අයගේ විශාල අර්බුදයක් නැහැ. පහළ අයගේ අතිරික්තයක් තිබෙනවා. මැද layer එකේ හිඟයක් තිබෙනවා. ඒ නිසා රාජ්‍ය සේවය අඩපණ වීමේ අනතුරකත් අපි ඉන්නවා. විශේෂයෙන්ම වෘත්තීමය නිපුණතා තිබෙන layer එකක් තිබෙනවා, රාජ්‍ය සේවයේ. ඒ අය රාජ්‍ය සේවයේ අද නැහැ. එතැන පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා අපි තීරණය කළා මේ පුරප්පාඩු පුරවන්න. ඒ පුරප්පාඩු පුරවනකොටත් මගේ අමාත්‍යාංශයට මම පුරප්පාඩු පුරවනවා,- අර කිව්වේ, මගේ එක මම පුරවනවා, උගේ එක ඌ පුරවනවා කියලා. මතක නේ කිව්වා. අපි එහෙම කරන්නේ නැහැ. අපි මොකක්ද කරන්නේ? අගමැතිතුමිය සහ එතුමියගේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අපි කමිටුවක් පත් කර තිබෙනවා. හැම අමාත්‍යාංශයක්ම, දෙපාර්තමේන්තුවක්ම ඇවිල්ලා තමන්ගේ දෙපාර්තමේන්තුවේ තිබෙන කාර්යභාරය, ඒ පුරප්පාඩුවල තිබෙන හිඟය විසින් ඇති කරන දුබලතා, ඒ නිසා ඒවා නිසි පරිදි කර ගෙන යන්න විධියක් නැහැ කියලා ඒ කමිටුවට හේතු දක්වනවා. ඒ හේතු දැක්වූවාට පසුව ඒ කමිටුව විසින් අනුමැතිය දෙනවා, මෙන්න මෙච්චර ප්‍රමාණයක් බඳවා ගන්න කියලා. එහෙම නැතුව තම තමන්ට තිබෙන තැන්වල තම තමන් පුරවන ප්‍රතිපත්තියක් නොවෙයි අපට තිබෙන්නේ. හොඳ නැද්ද මෙහෙම ආණ්ඩුවක් ඔයගොල්ලන්ට? මෙහෙම ආණ්ඩුවක් ඕනෑ මේ රටට.

අපි දැනටමත් පුරප්පාඩු 15,300ක් හඳුනා ගෙන තිබෙනවා. ඒ කමිටුවෙන් පුරප්පාඩු 15,300ක් පුරවන්න දැන් අපට අවසර ලබා දීලා තිබෙනවා. සංවර්ධන නිලධාරීන් ලොකු නඩුවක පැටලිලා තිබෙනවා. අපි ඉතා ඉක්මනින් අධිකරණයට ගිහිල්ලා Motion එකක් දමලා ඔවුන්ගේ ගැටලුවත් විසඳන්න බලාපොරොත්තු වෙනවා. දැනට ආයතන ඔක්කොම ඒ කමිටුවට ආවේ නැහැ. අපි අපේක්ෂා කරනවා, රජයේ පුරප්පාඩු 30,000ක් පුරවන්න. හැබැයි,

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

පුරප්පාඩු පුරවනකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පුරවන්න ඕනෑකම තිබෙන්නේ එහි තිබෙන පුරප්පාඩු ප්‍රමාණයට. හැබැයි, ඉල්ලුම්පත්‍ර විශාල ප්‍රමාණයක් ලැබෙන්න පුළුවන්. එහෙම නම් මොකක්ද කරන්න ඕනෑ? විභාගයකට වාඩි වෙන්න ඕනෑ. ඒ ඒ තනතුරුවලට බඳවා ගැනීමේ නිසි පටිපාටියක් තිබෙනවා. ඒ පටිපාටියට අනුව විභාගයට වාඩි වෙන්න. එහෙම නැතුව bulk පිටින් රස්සා ඉල්ලන්න එපා. මේ පාර්ලිමේන්තුවේ කිසි කෙනෙක් ඒකට උඩ ගෙඩි දෙන්න එපා. ඔයගොල්ලන් හොඳින් තේරුම් ගන්න, රාජ්‍ය සේවය විශාල අර්බුදයකයි තිබෙන්නේ.

අපි, රාජ්‍ය සේවය පිළිගන්නා පාලනයක්. හැබැයි, අපි මේ රාජ්‍ය සේවය ලබා දීම සඳහා දරන වැය බර වැඩියි. අපි ඒ වැය බර අඩු කිරීම සඳහා සැලසුම් හදලා තිබෙනවා. අපි අගමැතිතුමිය සහ එතුමියගේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර තිබෙනවා. එකම කාර්යය කරන රාජ්‍ය ආයතන කිහිපයක් තිබෙනවා. සමහර රාජ්‍ය ආයතන ගොඩ නැඟිලා තිබෙනවා. හැබැයි, ඒවා ගොඩ නැඟිච්ච යුගයේදී තිබුණු කාර්යභාරය දැන් අවසන් වෙලා තිබෙනවා. තවදුරටත් ඒ රාජ්‍ය ආයතන ඕනෑද? ඒ සමහර ආයතන වසා දමන්න, සමහර ආයතන ඒකාබද්ධ කරන්න, සමහර ආයතනවල අරමුණු වෙනස් කරන්න කියලා දැනට එම කමිටුව විසින් අපට නිර්දේශ ලබා දීලා තිබෙනවා. සමහර ආයතන එක යුගයකදී ඒ කාර්යභාරය සඳහා ඕනෑ වුණා. හැබැයි, දශක ගණනාවක් ගිහිල්ලාත් ඒ අවශ්‍යතාව ඒ රාජ්‍ය ආයතනයට අද නැහැ. හැබැයි, අපි ඒක අර බරවා කකුල වාගේ බරක් හැටියට ගෙනියනවා. අවශ්‍ය නැහැ නේ. එහෙම කරන්න ඕනෑ නැහැ නේ. ඒ හින්දා අපි ඒකාබද්ධ කරන්න පුළුවන් ආයතන ඒකාබද්ධ කරනවා. හඳුනා ගෙන තිබෙන, වසා දැමිය යුතු ආයතන වසා දමන්න ඕනෑ. අරමුණු වෙනස් කරන්න ඕනෑ ආයතනවල අරමුණු වෙනස් කරන්න ඕනෑ. ඒ පිළිබඳ වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ලැබී තිබෙනවා. අපි ඒක අනුමත කර තිබෙනවා. නැවත ඒ ක්ෂේත්‍රවල ගැටලුවක් තිබෙනවා නම්, ඒ ගැටලුවට මුහුණ දෙන අයට පුළුවන් මේවා ගැන දැන් සාකච්ඡා පටන් ගන්න. අපි දැන් ඒ පත්‍රිකාව දමා තිබෙනවා. දැන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිළිබඳ යම් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. නමුත්, දැනට තීන්දුවක් තිබෙනවා.

නමුත් ඒක අවසන් තීන්දුව නොවෙයි. ඒ ආයතනවල නිලධාරීන්ට ඇවිල්ලා කියන්න පුළුවන්, "නැහැ, මේ ආයතනය පවත්වා ගැනීම සඳහා මෙන්න මෙහෙම වුවමනාවක් තිබෙනවා, මේ ආයතනය මේ වෙනුවෙන් අපට වැදගත්" කියලා. එහෙම කියනවා නම්, නැවත ඒ ආයතනය පවත්වාගෙන යාම පිළිබඳව සැලකිල්ලක් කරන්න පුළුවන්. හැබැයි, මේ රටේ කවුරු හරි මේ වැඩේ කරන්න ඕනෑ නැද්ද? අපි ආවේ ඒකට තමයි. ඒකට තමයි system change කියන්නේ, හොඳේ. අපි ආවේ මේ තිබෙන එක මේ විධියටම කරගෙන යන්න නම්, අපට හරි ලෙහෙසියි. හැබැයි, අපි ආවේ මේ තිබෙන ක්‍රමය රටටත්, ජනතාවටත් සුබදායී ලෙස පරිවර්තනය කිරීම සඳහායි. ඒක තමයි මේ කරමින් ඉන්නේ; ඒ පරිවර්තනය තමයි මේ කරමින් ඉන්නේ. එතැනදී, අපේ ව්‍යාපාර කරන පිරිසට විශාල කාර්යභාරයක් තිබෙනවා කියා මා හිතනවා. මම ඔවුන්ගේ සමුළුවකටත් ගිහිල්ලා කිව්වා, හැම කෙනාම නිසි පරිදි බදු ගෙවිය යුතුයි කියලා. බදු පැහැර හරින අය ඉන්නවා නම්, බදුවලින් රිංගන අය ඉන්නවා නම්, බදු වංචා කිරීම සඳහා කවුරු හරි සූදානම් වෙනවා නම්, ඒ හැම දෙනාටම විරුද්ධව අපි නීතිය තවත් ශක්තිමත් කරලා ක්‍රියාත්මක කරනවා. මොකද, සාධාරණ බද්දක් ගෙවන්න ඕනෑ. හැබැයි, අපි ඒගොල්ලන්ට සහතිකයක් දෙන්නම්, ඔබ ගෙවන බද්දේ සෑම රුපියලක්ම දේව කාර්යයක් වාගේ අපි බලා ගන්නවා කියලා. සෑම රුපියලක්ම. මා දන්නවා, බදු ගෙවන පුරවැසියන්, ඒ කර්මාන්තකරුවන් තමන් මහන්සිවෙලා, තමන්ගේ ව්‍යාපාරය රැක බලා ගෙන, තමන් විශාල ලෙස දායකත්වය සපයලා, ගොඩ නඟලා ආර්ථිකයක් හදලා තිබෙන බව. ඒකෙන් ආණ්ඩුව බද්දක් ගන්නවා. ඒක සරල නැහැ. එයාගේ ව්‍යාපාරයෙන් එයා උපයන ලාභයෙන් ආණ්ඩුව ගාණක් ගන්නවා. මොකක්ද, වෙන්න ඕනෑ? අන්න, ආණ්ඩුවට ලබා දෙන හැම රුපියලක්ම අපි පරිස්සම් කරන්න ඕනෑ. අන්න ඒ බැඳීම අපි ආණ්ඩුවක් හැටියට ඉටු කරනවා. "සෑම රුපියලකටම අපි වග කියනවා. ඔබ බදු ගෙවන්න, අපි ආරක්ෂා කරන්නම්" කියන තැනට එන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ඒ බදු ගෙවන අය පිළිබඳව විශේෂ ලෙස රජයෙන් ලබා දිය යුතු විවිධ පැකේජ ගැන අපි යෝජනා කරලා, කථා කරලා තිබෙනවා. Airport එකේදී, තවත් අවස්ථාවලදී එසේ විශාල ලෙස බදු ගෙවන අයට යම් විශේෂයක් ලබා දිය යුතුයි. ඒ ගැනත් අපි කල්පනා කරමින් සිටිනවා. මොකද, බදු අවශ්‍යයි. හැබැයි, අපේ රටේ බදු අධෛර්යයට පත් වුණේ ඇයි කියලා අපි දන්නවා. මට එක ව්‍යාපාරිකයෙක්; ලංකාවේ ප්‍රධානම ව්‍යාපාරිකයෙක් කිව්වා, ඔහු පාරේ colour lightsවල නතර වෙලා සිටියදී මේ පැත්තට ගියා කිව්වා, වාහන පේළියක් එක්ක හමුදාවේ උසස් නිලධාරීන්. අනෙක් පැත්තට ආවා කිව්වා, ambulance එකක් එක්ක රටේ නායකයෙක්. එයා කිව්වා, බදු ගෙවපු මම පාරේ නතර කරගෙන, බදු වියදම් කරන කෙනා මාවත් පහු කරගෙන යනවා කියලා. ඉතින් ගෙවයිද, බදු? මෙන්න මේ දේශපාලන සංස්කෘතිය අපි ඇති කරන්නේ ඒ නිසා තමයි. ඔවුන්ට විශ්වාසයක් ඇති කළ යුතුයි, "පාලනයක් ගොඩනැඟී තිබෙනවා; ගෙවන බදු ඉතාම හොඳින් ආරක්ෂා කරන පාලනයක්; රැක බලා ගන්නා පාලනයක් ගොඩ නැගී තිබෙනවා" කියලා. ඒ සංඥාව දුන්නොත්, ඒගොල්ලෝ බදු ගෙවනවා. බදු ගෙවන කෙනෙක් ආඩම්බරයෙන් කියනවා, "මම බදු ගෙවන පුරවැසියෙක්" කියලා. එහෙම කියන්න කැමැතියි; "මම ව්‍යාපාරයක් කරනවා; මම මෙච්චර ලාභයක් උපයනවා; මම රජයට මෙච්චර බද්දක් ගෙවනවා" කියලා. හැබැයි, එහෙම ගෙවන්න කම්මැළි වුණා, එකඟ නොවුණා. මොකක් නිසාද? ඒ එකඟ නොවුණේ වෙන මොකුත් නිසා නොවෙයි, ඒ බදු වලට සිද්ධ වෙන දේ ඒගොල්ලන් මහ දවල් දැක්කා. එතකොට මොකටද බදු ගෙවන්නේ කියලාට කාටත් හිතෙනවා. නොගෙවා බැරිකමට බදු ගෙවන රාජ්‍යයක් තමයි අපේ රාජ්‍යය. නොගෙවා බැරිකමට. හැබැයි, අපි හදනවා බදු ගෙවන්න හිතෙන රාජ්‍යයක්. ඒ තැනට අපි මේ රාජ්‍යය පරිවර්තනය කරනවා. අද එහෙම වෙනවා. මා ඔබට පෙන්නුවා, IRD එකේ මේ මාස දෙක ඇතුළත අපි අපේක්ෂා නොකරන ලද, අපේක්ෂා කළ ආදායමට වඩා වැඩි ආදායමක් ලැබෙන්නේ කොහොමද කියලා. මොකද, විශ්වාසයක් හදලා තිබෙනවා, අපි මේ බදු පරිස්සම් කරනවා කියලා. අන්න, system change එක! පුරවැසියන්ගේ මනසේ මේක ඇති වෙනවා.

ඒ වාගේම ගත්තොත්, අපේ ව්‍යාපාරිකයෝ දින්ටත් විශාල කාර්යභාරයක් පැවරී තිබෙනවා. අපි රාජ්‍ය වැටුප් වැඩි කරලා දීලා තිබෙනවා. හැබැයි, හැම දෙනාම වැඩ කරන්න ඕනෑ. කොතැනක හෝ කෙනෙක් රාජ්‍යයෙන් කෙරෙන්න ඕනෑ කාර්යභාරය වෙනුවෙන්, එම කාර්යභාරය ලබා ගන්නා කෙනා යම් ගෙවීමක් කරන්න සිදු වෙන තත්ත්වයක් මේ රටේ ඇති නොකළ යුතුයි. මොකද, ඔවුන්ට වැටුපක් ගෙවනවා.

එම පුරවැසියන් ගෙවලා තිබෙන බදු මුදලින් ඔවුන්ට වැටුපක් ගෙවනවා. හැබැයි, වැඩක් කර ගන්න ආවාම, එයාගෙන් ගාණක් ගන්න බැහැ. ආණ්ඩුව එයාට ගාණ දීලා තිබෙන්නේ. අපි හැමදාමත් කිව්වා, මේ රටේ අල්ලස රාජ්‍ය සේවය අකර්මණ්‍ය කරනවා කියන එක. මේ අල්ලස විසින් අපේ ආර්ථික වර්ධනයට බාධා ඇති කරනවා. අල්ලස විසින් ඒ වෙලාවේ කළ යුතු

ව්‍යාපෘතිය ආපසු යනවා. අල්ලස විසින් නොකළ යුතු ව්‍යාපෘති සිද්ධ කරනවා. ඒ නිසා අල්ලස කියන්නේ ආර්ථික අපරාධයක්. සිදු විය යුතු දෙයක් සිදු වෙන්නේ නැහැ. අවශ්‍ය දේ වෙන්නේ නැහැ. අනවශ්‍ය දේ සිද්ධ වෙනවා. ඒ වාගේම අවශ්‍ය වෙලාවේදී වෙන්නේ නැහැ. පහුවෙලා සිද්ධ වෙනවා. අල්ලස කියන්නේ ආර්ථික අපරාධයක්. ඒ නිසා අල්ලස පිළිබඳව අපි දැඩි තීන්දු ගන්නවා. හැම රාජ්‍ය නිලධාරි මහත්මයෙකුටම අපි කියන්නේ මේකයි. තමන්ට පැවරී තිබෙනවා කාර්යභාරයක්, මහජනයාගේ බදු මුදලින් තමන්ට වැටුපක් ගෙවනවා, ඔබට වගකීමක් පැවරිලා තිබෙනවා, කරුණාකරලා ඒ වගකීම ඉටු කරන්න, අමතර ගාස්තු නැතුව. ඒ වාගේ වෙච්ච සිදුවීම් කිහිපයක් සම්බන්ධයෙන් අපි කටයුතු කරලා තිබෙනවා. මා එම ආයතනවල නම් කියන්නේ නැහැ. සමහර ආයතනවල සේවකයින්ගේ මේ වන විටත් අපි වැඩ තහනම් කරලා තිබෙනවා. සමහර ආයතනවල සේවකයින් ගෙදර යවලා තිබෙනවා. මොකද, මේ රාජ්‍යය ප්‍රතිෂ්ඨාපනය කරන්න ඕනෑ. අපේ රාජ්‍ය යන්ත්‍රණය පුරා පැතිරී තිබෙන අල්ලසේ සංස්කෘතිය ඉවත් කරන්න ඕනෑ, මේ රට ගොඩනඟන්න. ඒක ඉවත් කරන්න නම් මොකක්ද වෙන්න ඕනෑ? පළමුකොටම දේශපාලන අධිකාරිය ඒ සංඥාව දෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මෙතැන ටෙන්ඩර් කිහිපයක් ගැන සාකච්ඡා වුණා, මා දැක්කා. මතක තියා ගන්න, එකක් මන්නාරමේ සුළං බල ව්‍යාපෘතිය ගැන කථා වුණා. මොකක්ද, සිද්ධ වුණේ? මන්නාරම සුළං බල ව්‍යාපෘතියට අපි කැඳෙව්වා, ටෙන්ඩරයක්. එක ටෙන්ඩර්කරුවෙක් මොකක් හරි හේතුවක් නිසා Technical Evaluation Committee එකෙන් පැත්තකින් තිබ්බා. අනෙක් ටෙන්ඩර්කරුවෝ තෝරා ගත්තා, bid එක විවෘත කරන්න. මෙයා ගියා, Appeals Board එකට. Appeals Board එකට ගියාට පසුව කිව්වා, එයාගේ ටෙන්ඩරයත් විවෘත කරන්න කියලා. විවෘත කරලා බැලුවාම, ඒ අඩුම කෙනා. අපි තෝරා ගත්තේ කවුද? අඩුම කෙනා තෝරා ගත්තේ. ලංකාවේ පළමුවෙනි වතාවට මන්නාරමට මෙගාවොට් 50ක සුළං විදුලි බලාගාරයක් ලබා දීලා තිබෙනවා, ඒකකය ඩොලර් ශත 4.57ට. ඩොලර් ශත 8.22ට මේවා තිබුණේ, හොඳේ. දැන් ඩොලර් ශත 4.57ට ලබා දීලා තිබෙනවා. ඇයි? ඒකටත් මෙතැන චෝදනා කරනවා, මා දැක්කා. අපි හරි දේ කරලා තිබෙනවා. මතක තබා ගන්න, මම හෝ අපේ දේශපාලන අධිකාරියේ කිසිවෙක්,- මම ඔබට සහතිකයක් දෙන්නම්. ඔබ කිව්වා, මේ වැල් පාලමෙන් අපි ගොඩ වුණා කියලා. නැහැ, මතක තබා ගන්න. අපි මේ වැල් පාලමේ ගමන් කරමින් සිටින්නේ මහජනයාගේ බර කරට අරගෙනයි. දරුවා නොවෙයි, බර. අපේ ඇමතිවරු ගොඩ වුණා කියලා කියන්නේ මොනවා අරගෙනද? තිබෙන ඇමති පඩිය කපලාද, නිවාස අත්හැරලාද, ලයිට් බිල්, වතුර බිල් අත්හැරලාද? - කුමන ව්‍යාපෘතියක් වෙනුවෙන් හෝ රුපියලක අල්ලසක් ඉල්ලන්නේ නැහැ, මතක තබා ගන්න. එහෙම එක්කෙනෙක් මෙතැන නැහැ. මේ හැම කෙනා ගැනම, මට වාගේම මේ හැම කෙනා ගැනම සහතිකයක් දෙන්න පුළුවන්. එහෙමයි ආණ්ඩු හදලා තිබෙන්නේ. මේ ආණ්ඩුවද, එපා කියන්නේ? මේ ආණ්ඩුවද, අසමත් කියලා කියන්නේ? මේක තමයි ආණ්ඩුව. ලංකාවේ පළමු වතාවට ජනතාවට ආණ්ඩුවක් ලැබිලා තිබෙනවා. මෙච්චර කල් ජනතාවට ආණ්ඩු ලැබුණේ නැහැ. කල්ලි ලැබුණේ, පවුල් ලැබුණේ, ගජ මිතුරෝ ලැබුණේ. පළමු වතාවට පුරවැසියන්ගේ ආණ්ඩුවක් ලැබිලා තිබෙනවා. එහෙමයි ආණ්ඩු. අපි මේ රටේ පුරවැසියන්ට ආදර්ශයක් දෙන්නම්, "ආණ්ඩු" කියන්නේ මොකක්ද කියලා.

ගරු සභාපතිතුමනි, ඕනෑම ආයෝජකයෙකුගේ මුහුණට හම්බ වෙලා අපට කියන්න පුළුවන්, අපට ඔබගෙන් ඇල්වතුර වීදුරුවක්වත් එපා කියලා. ඕනෑම ආයෝජකයෙකුට අපි කියන්නම්. මේ ළඟදී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සම්බන්ධයෙන් ටෙන්ඩරය දැම්මා. දෙසැම්බර් මාසයේ ඒක විවෘත කළා. ජාත්‍යන්තර සමාගම් ගණනාවක් ඉල්ලලා තිබුණා. අඩුම ඉල්ලීම තිබුණේ කාටද? ජෝර්ජ් ස්ටුවර්ට් සමාගම. අපි දන්නා, කොහේවත් ඒක කියැවෙන්නේ නැහැ නේ. අපි ඒ අයගේ දේශපාලන පසුබිම බැලුවාද, කවුද කියලා බැලුවාද, විරුද්ධවාදියෙක්ද කියලා බැලුවාද? අඩුම ටෙන්ඩරයට අපි දීලා තිබෙනවා. එහෙමයි ආණ්ඩු කරන්නේ. හැබැයි, ඒ විධියටම නෙළුම් කුලුනත් දීලා තිබෙනවා. නමුත් ඒක ගැන හොයනවා. මොකද, ඒ විධියට නොවෙයි, නෙළුම් කුලුනේ ආපනශාලාව තියාගෙන යන්නේ. ඒක වෙනම හොයනවා, හොඳේ. නෙළුම් කුලුනට පාඩුයි. නියෝජිත ආයතනය ලාභයි. අපේ හෝටලයේ අපි උයන්නේ; කන්න දෙන්නේ අපි; අපේ සේවකයෝ. ඒගොල්ලන් නමට ලාභ ගන්නවා.

එහෙම බිස්නස් කරන්න බැහැ. ඒක ගැන අපි පරීක්ෂණ කරන්නම්. හැබැයි, ඒ සමාගම තමයි ප්‍රතිරක්ෂණය සඳහා අඩුම ටෙන්ඩරය ඉදිරිපත් කළේ, ඒ සමාගම තමයි, ලංකාවේ නියෝජිත ආයතනය, ඒ සමාගමට අපි ඒ ටෙන්ඩරය දුන්නා. ඔබ අහලා තිබෙනවාද, මේ රටේ වෙනත් දේශපාලන පක්ෂයක නායකයෙක් ටෙන්ඩරයක් දැම්මාට පස්සේ, ඒ කෙනාට ටෙන්ඩරය ලැබුණා කියලා? නමුත් අපි එහෙම දීලා තිබෙනවා. අපට වෙන බැඳීම් නැහැ, මතක තබාගන්න. රටට, ජනතාවට හිතකරද කියන බැඳීම විතරයි අපි බලන්නේ. අන්න එහෙම ආණ්ඩුවක් මේ හදලා තිබෙන්නේ. ඒ නිසා අපි හිතනවා, මේ රට ගොඩනැඟීම සඳහා අවශ්‍ය පදනම අපි නිර්මාණය කරලා තිබෙනවා කියලා. අපි දැන් ආර්ථික ස්ථාවරභාවය නිර්මාණය කරලා තිබෙනවා. ශක්තිමත් රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා අපි දැන් පය තබා තිබෙනවා. ඊට පස්සේ ගත්තොත්, දේශපාලන අධිකාරිය ඒ සඳහා අදිටනින් වැඩ කරන තැනකට ඇවිල්ලා තිබෙනවා. නීතියේ විධානයේ ආධිපත්‍යය අපි තහවුරු කරමින් තිබෙනවා.

මම දැක්කා, පොලිස්පතිවරයාගේ ප්‍රශ්නය විශාල ආන්දෝලනයකට තුඩු දී තිබෙන බව. ඒකට අපි ඇඟිලි ගහලා නැහැ. එක්තරා ජනාධිපතිවරයෙක් ඉන්නවා, ඒ ජනාධිපතිවරයා පත් කරපු පොලිස්පති හිරේ, ඒ ජනාධිපතිවරයා පත් කරපු මහ බැංකු අධිපති රටින් පැනලා, Red Notice. හැබැයි, එතුමා ගිහිල්ලා TVවලටත් කථා කරනවා නේ. එතුමාගෙන් අහන්නකෝ, ඔබතුමා පත් කරපු මහ බැංකු අධිපතිවරයා කියලා. මේ රටේ මහජනයාගෙන් විශාල විරෝධයක් තිබියදී, ඔබතුමා පත් කරපු පොලිස්පති කෝ? හිරේ. ඒ අයද රටවල් පාලනය කරන්නේ? අපි රාජ්‍ය සේවයට, ශ්‍රේෂ්ඨාධිකරණයට, අධිකරණ පද්ධතියට පත්වීම් ගණනාවක් කළා. පවතින පුරප්පාඩු සඳහා මෑත කාලයේ අපි පත් කිරීම් කරලා තිබෙනවා. හැබැයි, ඒ කිසි කෙනෙකුට ඇඟිල්ල දිගු කරන්න පුළුවන්ද, මේ කෙනා වැරැදියි කියලා? අපි ඔවුන්ව දන්නේ නැහැ, අපි ඔවුන් ඇසුරු කරලා නැහැ. අපි පත්වීම දෙනකොට විතරයි, ඒ අය දන්නේ. හැබැයි, අපි ඒ අයගේ පෞද්ගලික ලිපිගොනුව ගෙනැල්ලා හොඳට පරීක්ෂා කරලා තමයි, අදාළ තනතුරු පිරිනමලා තිබෙන්නේ. තවමත් පොඩි පොඩි අබල දුබලතා තිබෙන සමහර තැන් තිබෙනවා. අපි ඒවා වෙනස් කරන්නම්. එහෙම කරන්න ඕනෑ. මේ රට ගොඩනැඟීම සඳහා අවශ්‍ය වන ඒ යන්ත්‍රණය අපි ශක්තිමත් කරමින් තිබෙනවා. ඒ සඳහා පදනම තමයි, රාජ්‍ය සේවය, දේශපාලන අධිකාරිය, ආර්ථිකයේ ස්ථාවරභාවය, නීතියේ විධානයේ ආධිපත්‍යය. සෑම කෙනාටම සමානව නීතිය ක්‍රියාත්මක වන රටක් අද තිබෙන්නේ. අද ජාතික ජන බලවේගයේ ආණ්ඩුව නොතිබෙන්න, පොලිස්පතිවරයා දවසකට හෝ රිමාන්ඩ් වෙයිද කියලා මට කියන්න. කවුරු හරි නැඟිටලා කියන්න, අපේ ආණ්ඩුවක් යටතේ ඒක වෙනවා කියලා? එහෙම වෙන්නේ නැහැ. අපි දන්නවා නේ, වෙන්නේ නැහැ. අපි ඒක කරනවා. අපට වෙන බැඳීම් නැහැ, මතක තබාගන්න. මේ රට පිළිබඳවත්, මේ රටේ මහජනයා පිළිබඳවත් තිබෙන බැඳීම විතරයි අපට තිබෙන්නේ. ඒ නිසා අපි පදනම හැදුවා. මෙතැනින් පස්සේ අපේ රටේ ආර්ථිකය ගොඩනැඟීම සඳහා වන දිශානතිය ගැන අපි කල්පනා කරමින් තිබෙනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

විශේෂයෙන් ගත්තොත්, ඒ සඳහා අපට කරුණු කිහිපයක් සම්පූර්ණ කර ගන්න අවශ්‍යයි. එකක් තමයි, මේ ඩිජිටල්කරණ ව්‍යාපෘතිය. ඒක ඉතා වේගයෙන් සම්පූර්ණ කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. 2012 වර්ෂයේ ඉඳන් සාකච්ඡා කරමින් තිබෙන UDI එක සම්බන්ධව, ඔවුන් අපට යම් කාලයක් කියලා තිබෙනවා. ඒ කාලය තව ටිකක් වැඩි කරලා මම කියන්නම්. අවුරුදු දෙකහමාරක් ඇතුළත මේ ඩිජිටල් හැඳුනුම්පත ලංකාවේ ක්‍රියාත්මක කරනවා. ඔවුන් ඊට වඩා අඩු ඉලක්කයක් මට දීලා තිබෙනවා. මම ටිකක් වැඩිපුර කාලයක් දාලා කිව්වේ, කාර්යය අසාර්ථක වුණොත්, කර ගන්න බැරි වුණොත් කියලා තමයි මම අවුරුදු දෙකහමාරක් කිව්වේ. එතකොට අපේ සියලු ගනුදෙනු ඒ පද්ධතියට ගෙන එන්න අපි සැලසුම් කරනවා. ඒ හා සමාන ලෙස අපි ක්‍රමානුකූලව අපේ රටේ මුදල් නෝට්ටු පරිහරණය අවම කිරීම සඳහා සැලසුම් හදමින් තිබෙනවා. අපේ රටේ මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, මහ බැංකු අධිපතිතුමා ඇතුළු කණ්ඩායමක් එකතු වෙලා, මේ කඩදාසි නෝට්ටු පාවිච්චි කිරීම අඩු කරන්න ගත යුතු ප්‍රතිපත්තිමය තීරණ මොනවාද කියලා සාකච්ඡා කරනවා. මේ අය වැයෙන් පස්සේ අපි ප්‍රධාන තීරණ කිහිපයක් දැනුම් දෙන්නම්, මෙන්න මේවා අපි තීරණය කරනවා කියලා. මේ මුදල් නෝට්ටු පරිහරණය අපි නතර කරන්න ඕනෑ. අද අපේ රටේ විශාල ලෙස අල්ලස සිදු වෙන්නේ මේ මුදල් නෝට්ටුවලින්. පොහොර බෑග්වල දමාගෙන සල්ලි අරගෙන ඇවිල්ලා තිබෙනවා. Briefcasesවල සල්ලි දමාගෙන ගිහින් ඉඩම් ගනිපු ඉතිහාසයක් අපි දැක්කා. ඒ ඔක්කෝම මේ නෝට්ටු එක්ක සිද්ධ වෙලා තිබෙන ගනුදෙනු. ඒ නිසා අපි නෝට්ටු රහිත ආර්ථිකයකට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම් හදමින් තිබෙනවා. ඒ තමයි ඩිජිටල්කරණය.

අනෙක් පැත්තෙන් ගත්තොත්, මේ ඩිජිටල්කරණය හරහා අපේ ගම සහ නගරය අතර තිබෙන දූරස්ථභාවය අවම කිරීම සඳහාත් අපි සැලසුම් හදනවා. එයට ප්‍රවිශ්ට වෙලා නගරයේ කෙනෙකුට දත්ත, තොරතුරු ලබා ගන්න පුළුවන් ආකාරයෙන්ම ගමේ කෙනාටත් ඒවා ලබා ගත හැකි විය යුතුයි. ඔවුන් ගමේ ජීවත් වන හේතුව මත, ඔවුන් නගරයේ ජීවත් වන හේතුව මත, ඔවුන්ට දත්ත, තොරතුරු වෙත ප්‍රවිෂ්ටවීමේ හැකියාව වෙනස් නොවිය යුතුයි.

ඒ නිසා ගම සහ නගරය අතර තිබෙන දූරස්ථභාවය සමනය කිරීම සඳහා මේ ඩිජිටල්කරණ ව්‍යාපෘතිය අපි ක්‍රියාත්මක කරනවා. අනෙක් පැත්තෙන්, අපි එය කාර්යක්ෂම කරනවා. ඉස්සර ජනාධිපති අරමුදලෙන් මුදල් ගන්න ෆයිල් එක අරගෙන ජනාධිපති ලේකම් කාර්යාලයට එන්න ඕනෑ. අපි දැන් එය ප්‍රාදේශීය ලේකම් කාර්යාල දක්වා ව්‍යාප්ත කරලා තිබෙනවා. අපට online ක්‍රමයට application එක එවන්න. අපි ඒක අනුමත කරනවා, ඊට පස්සේ account එකට මුදල් යවනවා. අපි දැන් ඒක කරලා තිබෙනවා. අපි හිතුවාටත් වඩා වැඩි වේගයෙන්, සියයට 60කින් ජනාධිපති ලේකම් කාර්යාලයට ෆයිල් උස්සාගෙන එන එක දැන් අඩු වෙලා තිබෙනවා. ඉතුරු සියයට 40ත් ඉතා ඉක්මනින් අඩු වෙයි කියලා අපි හිතනවා. ඒ කියන්නේ පුරවැසියන් මේ online ක්‍රමයට, මේ ඩිජිටල්කරණයට ඉතා ඉක්මනින්ම අනුගත වෙන්න ලැහැස්තියි කියන එකයි. අපි විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ උප්පැන්න සහතික, මරණ සහතික, විවාහ සහතික online ක්‍රමය ඔස්සේ ලබා ගැනීම සඳහා අවස්ථාව ලබා දී තිබෙනවා. වෙනදා ඒවා තානාපති කාර්යාල හරහා මල්ලේ පුරවලා මේ රටට ඇවිල්ලා මෙහේ අත්සන් ගහලා ඒ රටවලට යවන්න ඕනෑ. දැන් අපි ඒ ක්‍රමය වෙනස් කරලා තිබෙනවා.

ඒ වාගේම අපි GovPay පද්ධතිය හරහා ගෙවීම් කටයුතු කරන්න දැනට රාජ්‍ය ආයතන කිහිපයක් තෝරාගෙන තිබෙනවා. එන්න එන්න අපි ඒ සංඛ්‍යාව වැඩි කරනවා. රජයේ සියලු ගෙවීම් GovPay පද්ධතිය හරහා, ඒ platform එක හරහා ගෙවන්න පුළුවන් විධියට අපි සැලසුම් හදමින් තිබෙනවා. රජයේ සියලු ගනුදෙනු ඩිජිටල් පද්ධතියක් හරහා කිරීම සඳහා අපි දැන් කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා ඩිජිටල්කරණය සඳහා හදලා තිබෙන සැලසුම පියවරෙන් පියවර ඉදිරියට යමින් තිබෙනවා. කාර්යක්ෂමතාව, වියදම් අඩු කිරීම, නාස්තිය අවම කිරීම ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා. ගනුදෙනුවට අදාළ දෙදෙනා කවුන්ටරය ළඟ මුණ ගැහුණොත් තමයි මේ අනෙක් ගනුදෙනු සිද්ධ වෙන්නේ. හැබැයි ගනුදෙනුව සිද්ධ වෙන්නේ virtual ලෝකයේ නම් කවුන්ටරය ළඟ ඒ දෙදෙනා මුහුණට මුහුණ මුණගැහෙන එක නතර වෙනවා. ආයෝජන මණ්ඩලයේ අනුමැතියක් ගන්න අවශ්‍ය වුණාම අනුමැතිය දෙන කෙනායි, අනුමැතිය ගන්න කෙනායි කවුන්ටරය ළඟ හම්බ වුණාම වෙනස් ගනුදෙනු සිදුවනවා. මේ ක්‍රමය මඟින් ඔවුන් මුණගැහෙන එක නතර කරනවා. එතකොට ඔවුන් virtual ලෝකයේ විතරයි හම්බ වෙන්නේ. එතිදී application එක එවනවා, ඒකෙන් අනුමැතිය දෙනවා. එහෙම කරන්න වුණොත් අපි එහෙම කරනවා. ඒ විධියට අපේ ප්‍රධාන සැලැස්මක් හැටියට ඩිජිටල්කරණ ඉදිරි ඉලක්ක සඳහා අපි කටයුතු කරමින් තිබෙනවා.

ඊළඟට බලශක්තිය ගත්තාම, මේ කලාපයේ අපට බලශක්තිය කියන්නේ ඉතා ඉහළ දරාගන්න බැරි වියදමක් කියලා අපි දන්නවා. එය මේ කලාපයේ වැඩිම බලශක්ති වියදම. හැබැයි, දැන් විදුලි බිල අඩු වැඩි වෙන්නේ අව්ව, වැස්ස මත. වහින කාලයට විදුලි බිල අඩු වෙනවා, පායන කාලයට විදුලි බිල වැඩි වෙනවා. දැන් මේ අඩුවීම්, වැඩිවීම් තිබෙන්නේ ස්ථාවර ලෙස නොවෙයි, විදුලිබල පද්ධතියේ නිෂ්පාදන වියදමේ හේතුවක් මත නොවෙයි. අව්ව, වැස්ස මත විදුලි බිල තීරණය වන රටක් අපට තිබෙන්නේ. ආර්ථිකයකට එහෙම ඉස්සරහට යන්න බැහැ. අඩුම තරමේ අවුරුදු කිහිපයකට හෝ විදුලි බිලෙහි ස්ථාවරභාවයක් අපි ඇති කරන්න ඕනෑ. අපි තවමත් ඒකට අසමත් වෙලා තිබෙනවා. තවම තිබෙන්නේ උච්චාවචනය වෙන විදුලි බිලක්. ඒක නිරන්තරයෙන් අඩු වෙනවා, වැඩි වෙනවා. විදුලි බිලක් එහෙම පවතින්න බැහැ. ඒ නිසා අවුරුදු තුනක් වාගේ කාලයක් ඇතුළත අපි අපේක්ෂා කරනවා, අපේ විදුලි බිල ස්ථාවර මට්ටමකට ගේන්න. දැන් අපේ විදුලි ඒකකයක cost එක ඩොලර් ශත 13ක් වෙනවා. අපි අපේක්ෂා කරනවා, ඒක ඩොලර් ශත 8 දක්වා අඩු කරන්න. නිෂ්පාදන පිරිවැය ඩොලර් ශත 5 දක්වා අඩු කරන්න අපි දැන් සැලසුමක් හදමින් යනවා. ඒ අනුව අපි බලශක්ති ක්ෂේත්‍රයේ කටයුතු විශාල සැලසුමක් අනුව කරමින් තිබෙනවා. බලශක්ති ඇමතිතුමා සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය එක්ක එකතු වෙලා සුළං බලයෙන් බලාගාර ආරම්භ කරන්න පුළුවන් ඉඩම්, සූර්ය බලයෙන් බලාගාර ආරම්භ කරන්න පුළුවන් ඉඩම් තිබෙන තැන් හඳුනාගන්න කියලා දැන් කියා තිබෙනවා. ඒ ඉඩම්වල ධාරිතාවත් එක්ක අඩුම මිලට විදුලිය ඒකකය දෙන කෙනාට ඒ ටෙන්ඩරය ලබා දෙන ප්‍රතිපත්තිය අපි ක්‍රියාත්මක කරන්නම්.

ඊළඟට, සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය වැඩි කරන්නත් අපි අපේක්ෂා කරනවා. ඒ නිසා ආයෝජනයට පහසු පරිසරයක් අපි නිර්මාණය කරනවා. අපි ආයෝජන ආරක්ෂණ පනතක් ගේනවා. අපි ඒ සඳහා සැලසුම් කරලා තිබෙනවා. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගත්තොත්, ඒක ඉතා ම අභිතකර ලෙස අවභාවිතාවට ලක් වෙච්ච පනතක්. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත කිව්වාම, ඒ අනුව ඇමතිවරයාට පුළුවන්, ඕනෑම ව්‍යාපෘතියක් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස නම් කරලා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා බදු සහන දෙන්න. ඒ නිසා අපි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත වෙනස් කරලා යාළු-මිත්‍රකම් මත පදනම් නොවී, ඒ ආයෝජනයේ ප්‍රමාණය, ජාතික අවශ්‍යතාවේ ස්වභාවය යන කරුණු ගැන කල්පනා කරලා නව බදු

සහන දෙන පනත් කෙටුම්පතක් ඉතා ඉක්මනින්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කටයුතු කරනවා. ඒ අනුව ආයෝජන දිරිගැන්වීම වෙනුවෙන් අපි අවධානය යොමු කරමින් තිබෙනවා.

ඊළඟට, අධ්‍යාපනයේ විශාල ප්‍රතිසංස්කරණයක් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. අපේ අධ්‍යාපනයේ විශාලම ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා, පාසල් පද්ධතිය තුළ. අපේ පාසල්වලින් සියයට 18ක වාගේ ප්‍රමාණයක ළමයි 50ට වඩා අඩුයි. ඒ හින්දා පාසල්වල විශාල විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ළමයි 6දෙනා ඉන්න පාසල් පවා තිබෙනවා. ගිය අවුරුද්දේ ළමයින් ඇතුළත් කිරීමේ application එකක්වත් ආවේ නැති පාසල් තිබෙනවා. පාසල්වල විශාල විවිධත්වයක් නිර්මාණය වෙලා, විශාල ප්‍රශ්නයක් මතු වී තිබෙනවා. ඒ නිසා මේ පාසල් යළි විධිමත්භාවයට පත් කිරීමට අවශ්‍ය ව්‍යාපෘති අපි ආරම්භ කරනවා. අඩුම තරමින් තරගයක් තියන්න පුළුවන්, trip එකක් යන්න පුළුවන්, සෙල්ලම් කරන්න පුළුවන් ළමයි ප්‍රමාණයක්වත් පාසලක ඉන්න ඕනෑ.

ගමේ ළමයි වාගේම විවිධ සමාජ ස්තර නියෝජනය කරන ළමයි ඒ පාසල් නියෝජනය කරන්න ඕනෑ. පාසලෙන් එහාට අලුත් ජීවිතයක් ඔවුන්ට උරුම කරලා දෙන්න ඕනෑ. ඒ නිසා පාසල් පද්ධතියේ අලුත් පරිවර්තනයක් අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම අගමැතිතුමිය අධ්‍යාපන ඇමතිතුමිය ලෙස විශාල වෙහෙසක් දරමින් අපේ විෂය නිර්දේශ වෙනස් කිරීම පිළිබඳව, පාඨමාලා මුළුමනින්ම වෙනස් කිරීම ආදිය සඳහා සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ අනුව අපි 9 ශ්‍රේණියේදී පමණ මාවත් ගණනාවක් හදුන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. අපේ අධ්‍යාපනය තිබුණේ ඒක රේඛීය පාරක. පළමු පන්තියට ඇතුළත් වෙනවා; 5 ශිෂ්‍යත්ව විභාගය කරනවා; O/L කරනවා; හොඳ ලකුණු ගත්තොත්, විද්‍යා, ගණිත විෂයයන් හදාරනවා; දොස්තරවරයෙක් වෙනවා, ඉංජිනේරුවරයෙක් වෙනවා. ලක්ෂ තුනක් පාසල්වලට ඇතුළත් වුණාට, අපේ අධ්‍යාපනයේ එක පාරයි තිබෙන්නේ. ළමයි 2,000ක් විතර ගන්නවා, medical faculty එකට. ලොකු පාරක ඇවිල්ලා, පුංචි පාරකින් ගමන කෙළවර වෙනවා. ඒ නිසා අපි 9 ශ්‍රේණියෙන් පසුව පැතුරුණු පාරවල් ගොඩක් හදනවා, දරුවාට යන්න. ඒ හැම පාරක්ම සමාජ වටිනාකමක් තිබෙන පාරක් බවට අපි පත් කරනවා. ව්‍යක්තීය පුහුණුව, අධ්‍යාපනයේ යන්න ඕනෑ මාවත පිළිබඳව අපි සැලසුම් කරනවා. ඒ පිළිබඳව ඉක්මනින්ම ඔබතුමන්ලාටත් මේ පාර්ලිමේන්තුව ඇතුළේ වැඩ මුළුවක් තියලා දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපනයට අලුත් පාරක්. මේ අධ්‍යාපන ක්‍රමය මුළුමනින්ම ප්‍රතිසංස්කරණයට භාජන කළ යුතුයි. දරුවන් ඒක රේඛීය පාරක ගිහිල්ලා, දොස්තරවරයෙක්, ඉංජිනේරුවරයෙක් පමණක් වෙනවාය කියන තමන්ගේ ඔළුවේ සිහිනය හදාගෙන යන මේ අධ්‍යාපන මාවත වෙනස් වෙන්න ඕනෑ. අධ්‍යාපනය කියන්නේ පැතුරුණු පාරවල් ගොඩක්. ඒකට අවශ්‍ය වෙන පරිවර්තනය අපි ඇති කරනවා.

ඊළඟට, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගැන බලන්න. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගොඩක් කථා කරනවා මා දැක්කා. ඇත්ත, දැනටමත් අපේ කර්මාන්ත අමාත්‍යාංශය හඳුනාගෙන ඉන්නවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 40,000ක් පමණ සිටින බව. ඔවුන්ගේ කර්මාන්ත කඩාගෙන වැටිලා. එහෙත් ඔවුන්ට කර්මාන්ත ගොඩනඟා ගැනීම සඳහා විභවතාවක් තිබෙනවා. ඔවුන් බැංකුවට ණය වෙලා. ඒ නිසා ඔවුන්ට අලුත් ප්‍රාග්ධනයක් ගන්න බැහැ. නමුත්, ඒ කර්මාන්ත දෙස බැලුවාම, ඒවා නැවත ආරම්භ කරන්න පුළුවන් විභවතාවක් තිබෙන කර්මාන්තකරුවන් 40,000ක් විතර ඉන්නවා නේද? අන්න ඒ 40,000ට අපේ සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රය ආරක්ෂා කර ගැනීම සඳහා නැවත සහන දෙන්න අපි ලැහැස්තියි. විශේෂයෙන්ම අපි බැංකු එක්ක සාකච්ඡා කරමින් සිටිනවා, තව සහන ලබා දෙන්න. ඔබ කියූ පරිදිම ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය ලබාගෙන තිබෙනවා. පෞද්ගලික අංශය විශේෂයෙන්ම කල්පනා කරන්නේ ඒගොල්ලන්ගේ ණය ගෙවීමේ අනුපාතය ගැන විතරයි. ඒ නිසා විශාල ලෙස මේ ණය ඇනහිටලා තිබෙනවා. අපි සොයා බැලුවා, බැංකු පද්ධතියේ ණය දීම වැඩි වෙලා තිබෙනවා. ණයවලින් සියයට 80ක් ලබා දීලා තිබෙන්නේ, corporate sector එකට. නමුත් අඩුම තරමින් මෙයින් සියයට 40ක්වත් SME sector එකට යන්න ඕනෑකම තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය වන රෙගුලාසි සකස් කරමින්, ඒ සඳහා වන සාකච්ඡාව අපි කරන්න ලැහැස්තියි. මොකද, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ හිටපු කර්මාන්තකරුවෝ කඩාගෙන වැටිලා ඉන්නවා. ඒගොල්ලන්ට සහාය ලබා දීම සඳහා අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීම වෙනුවෙන් අවස්ථා අපි නිර්මාණය කළ යුතුයි. ඒ පිළිබඳව අපි සැලකිල්ලක් කරනවා. මේ කර්මාන්තකරුවන් 40,000ට ඉතා ඉක්මනින්ම නැවත කර්මාන්ත ආරම්භ කරන්න පුළුවන් ආකාරයට, ඒගොල්ලන්ගේ කර්මාන්ත ඉදිරියට ගෙන යෑම සඳහා වන සැලසුම අපි නිර්මාණය කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයක් ඇති කරන්නත් අපි බලාපොරොත්තු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි අවධානය යොමු කරලා තිබෙනවා. වරාය ආශ්‍රිත නාවුක කේන්ද්‍රය සහිත ආර්ථිකය පිළිබඳව අපි විශාල ලෙස සැලසුම් සකස් කරලා තිබෙනවා. විශේෂයෙන් ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක අපි එකඟතාවකට එමින් තිබෙනවා. පසුගිය දා කැබිනට් මණ්ඩලය ඉඩම නිදහස් කර ගත්තා, කෙරවළපිටියේ බහලුම් මධ්‍යස්ථානය පිහිටුවීමට. එතැන ශක්‍යතා අධ්‍යයනය කරලා, අපි එය ඉක්මනින් පටන් ගන්න සැලසුම් කරලා තිබෙනවා. මේ සියල්ල තුළින් ආර්ථිකය ස්ථාවරභාවයට ලක් කරලා, ඉදිරි ඉලක්ක සහිතව ආර්ථිකය මෙහෙයවමින් තිබෙනවා. මේ රටේ පුරවැසියන්ගෙන් සහ ඔබෙන් මම අහන්නේ, මොකක්ද මේකේ තිබෙන වැරැද්ද කියලායි. මොකක්ද, තිබෙන වැරැද්ද? මේක වෙනස් කරන්න ඕනෑද? මේ ගමනට ශක්තියක් දීලා ඉස්සරහට යන්න නොවෙයිද තිබෙන්නේ?

මම කියන්නම්, ඔබගේ දේශපාලන අනාගතය රඳා පවතින්නේ කොහොමද කියලා. මේ ව්‍යාපෘතිවලට අකුල් හෙළීමෙන් ඔබ දේශපාලනය කරන්න හිතනවා නම්, ඔබගේ දේශපාලනය දිනපතා අවලංගු වෙනවා කියන එක මතක තියා ගන්න. මේ ව්‍යාපෘතිය - මේ වැඩසටහන - බිඳ වැටෙන්න බැහැ, හොඳද? මේ ව්‍යාපෘතිය බිඳ වැටෙන්න බැහැ. මේ ව්‍යාපෘතියට බාධා කරන්න, අකුල් හෙළන්න කටයුතු කරන දවසක් දවසක් පාසා තමුන්නාන්සේලාගේ දේශපාලනය අවලංගු වෙනවා. ඔබට තිබෙන්නේ අන් කවරක්වත් නොවෙයි. මේක තමයි තිබෙන පාර; මේක තමයි තිබෙන ගමන් මාවත. මේ ගමන් මාවත සඳහා දිරිදීම සහ ඒ හරහා දේශපාලනය තමයි ඔබට ඉතිරි වී තිබෙන පාර. අද මම කියන්නම්, වෙන පාරක් නැහැ කියන එක. ඒ කාරණය මතක තබා ගන්න. මීට වඩා හොඳ දෙයක්, මීට වඩා යහපත් දෙයක්, මීට වඩා වෙනස් විය යුතු දෙයක් මට කියන්න. ඔබට එහෙම කියන්න දෙයක් නැහැ. ඔබට ඉතිරි වී තිබෙන එකම දේශපාලනය මෙයට ආශීර්වාද කිරීම සහ මීට අනුගතවීම පමණයි. වෙන මොකක්ද ඉතුරු වෙන්නේ? උදේට කෑ ගහන්න පුළුවන්, TV telecast එකට. ඒකෙන් මුකුත් වෙන්නේ නැහැ.

මාධ්‍ය අපේ රටේ දේශපාලනය කරපු කාලය ඉවරයි. අපේ රටේ මාධ්‍ය නම් දේශපාලනය කළේ, මම මේ රටේ ජනාධිපති වෙන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවට අපෙන් 159දෙනෙක් එන්නේ නැහැ. මාධ්‍ය දේශපාලනය 2019 අවුරුද්දේ මුළුමනින් අවසන් වුණු බව මතක තියා ගන්න. 2019දී මාධ්‍ය සතුව තිබුණු සමස්ත දේශපාලන බලය අවලංගු වුණා. ඇයි, ඒ? මාධ්‍ය විසින්

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

මාධ්‍යවල තිබුණු වලංගුතාවද නැති කරගෙන දේශපාලන න්‍යාය පත්‍රයකට ආවා. නැත්නම් නයි වඩම්මයිද? ඒ නාළිකාවලට ආයෙත් දේශපාලන නායකයින් හදන්න පුළුවන්ද? එහෙම කරන්න බැහැ. ඒ නිසා මාධ්‍ය මත යැපෙන, මාධ්‍යවලින් ගොඩනැහෙන එක තමයි දේශපාලන ව්‍යාපාරය කියලා ඔබතුමන්ලා තවදුරටත් හිතනවා නම්, ඒක එහෙම නැහැ. ඒක දැන් පැරණි යුගය. අද තිබෙන්නේ ජනතාවත් එක්ක කෙරෙන සංවාදය. නිරන්තරයෙන් ජනතාව මුහුණට මුහුණ මුණ ගැසීම. අපි හැම වෙලාවේම ජනතාවත් එක්ක සංවාදයේ යෙදෙන, ජනතාව මුණ ගැසෙන දේශපාලන ව්‍යාපාරයක්. එතැන තමයි අනාගත දේශපාලනය තිබෙන්නේ.

මේ අය වැය විවාදය කාලයේදීත් අපි කිව්වා, අපේ මන්ත්‍රීවරු ඔක්කොම එන්න එපා, මොකද, මේගොල්ලන් මොකක් හරි ඡන්දයක් ඉල්ලුවොත් වැඩිම ඉන්නේ 56යි, ඒ නිසා 60ක් ආවොත් ඇති කියලා; 60දෙනෙකුට වැඩිය එන්න ඕනෑ නැහැ කියලා අපි කිව්වා. අපි 60දෙනායි තියා ගත්තේ. අනෙක් ඔක්කොටම ගම්වලට යන්න කිව්වා. දේශපාලනය තිබෙන්නේ එතැන. තවදුරටත් මේ media gimmicks අපේ රටේ දේශපාලනයේ අවසන්. ඒ නිසා උදේ කරන ගෝරනාඩුව වාසියි නොවෙයි, අවාසියි. තමන්ට ස්වයං චින්දනයක් ලැබෙන්න පුළුවන්; ස්වයං තෘප්තියක් ලැබෙන්න පුළුවන්. රාත්‍රී 7.00ට ප්‍රවෘත්ති බලනකොට මුහුණ තිබෙනවා. ඒක තමන්ට විතරයි. කියන ඒවා ඇහුවාම සමහර වෙලාවට ගෙදර අයටත් එපා වෙලා ඇති. මම ඒ ගැන දන්නවා. සමහර අය කියන ඒවා ඇහුවාම ගෙදර අයත් අහනවා ඇති, මොනවාද මේ කියන්නේ කියලා. මතක තියා ගන්න, ඒ දේශපාලන යුගය දැන් ඉවරයි. ඒ දේශපාලන යුගය තවමත් අපේ රටේ යථාර්ථය නම් අපි බලයට එන්නේ නැහැ. ඒක හොඳට තේරුම් ගන්න. සම්පූර්ණ පරිවර්තනයක් සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ පරිවර්තනයට තමුන්නාන්සේලා එන්නේ නැතුව අර පැරණි දේශපාලනයම, පැරණි මාවතම, පැරණි කථාවම නම් තමුන්නාන්සේලාට තිබෙන්නේ, මම ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාද කළ දවසේත් සඳහන් කළ ආකාරයට තමුන්නාන්සේලා දේශපාලනයේ පොසිල. කවදා හෝ දේශපාලන ඉතිහාසඥයින් සොයන්න පුළුවන්, දේශපාලන පොසිල වගයක් 2025 අවුරුද්දේ පාර්ලිමේන්තුවේ හිටියා නේද කියලා. ඔව්වරයි. වෙනස් වෙන්න. කිසි කෙනෙක් එක්ක අපේ පෞද්ගලික තරහක් නැහැ. මේ ඔක්කොම දන්න අය; කථා බහ කරන අය; මුණගැසුණු අය; විවිධ අවස්ථාවල එකට දේශපාලනය කරපු අය. හැබැයි, අපි කියන්නේ රටට අවස්ථාවක් ඇවිත් තිබෙනවා කියන එකයි. මේ රටට නැවත නැඟිටින්න අවස්ථාවක් ඇවිත් තිබෙනවා. එහෙම අවස්ථා එන්නේ නැහැ. මම කියන්නේ නැහැ, මේක අවසන් අවස්ථාව කියලා. හැබැයි, මිනිසුන්ට, රටට අවස්ථාවක් එනවා. අපි ඉතිහාසයේ අවස්ථා මඟ හැරපු මිනිස්සු.

1948දී අපට අවස්ථාවක් ආවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඇතුළු බටහිර රාජ්‍යයන් අවුරුදු 450කට ආසන්න කාලයක් අපේ රට පාලනය කරලා ඔවුන් අපේ රට දාලා ගියා. 1815 ඉඳලා 1948 දක්වා අවුරුදු එකසිය ගණනක ඍජු යටත් විජිතයක් බවට අපේ රට පත් වෙලා තිබුණා, පරම්පරා තුනක් හතරක්. සුද්දාගේ ආධිපත්‍යයේ ඉඳලා 1948දී අපි නිදහස ලබා ගත්තා. නිදහස ලබා ගන්නකොට අපට අවස්ථාවක් ආවා. නමුත්, අපි ඒ අවස්ථාව උකහා ගන්න සමත් වුණේ නැහැ. 1949දීම පුරවැසි පනත ගෙනැත් වතුකරයේ දෙමළ ජනතාවගේ ඡන්ද බලය අහෝසි කළා. වෙල්වනායගම් මහත්මයා උතුරට ගිහින් වෙනම දෙමළ පක්ෂයක් හැදුවා, 1949දී. ඒ, ෆෙඩරල් පක්ෂය. ඇයි, ඒ? 1948දී නිදහස ලැබුණාට පස්සේ මේ අයව ඒකාබද්ධ කරලා මේ රට ඉදිරියට ගෙන යන්න බැරි වුණා. හැබැයි, ඉන්දියාව 1947 නිදහස ලබා ගත්තාම ඔවුන්ට ජාතික දැක්මක්, ඉලක්කයක් තිබුණා. ඔවුන් අභ්‍යවකාශය තරණය කරන ඉන්දියාවක් හදන්න පටන් ගත්තා, නිදහස ලබා අවුරුදු 100 පිරෙන්න කලින්. අපි 2048 වෙනකොට කන්න බොන්න තිබෙන රටක් හදන්නම් කිව්වා. ලජ්ජයි නේ. අපි වරද්දා ගත්ත බව මතක තබා ගන්න. 1948දී ඒ අවස්ථාව අපි ඉතා හොඳින් උපයෝගී කර ගත්තා නම්, අපට මේ රට යළි ශ්‍රේෂ්ඨ රාජ්‍යයක් බවට පත් කරගැනීමේ අවස්ථාව තිබුණා. නමුත් ඒක අත්හැරුණා. නැවත අවස්ථාවක් ආවා. ඒකත් අත්හැරියා. මම කියනවා, දැන් ආපහු අපේ රටට අවස්ථාවක් ඇවිත් තිබෙනවා කියලා.

මම ඔබෙන් අහන්නේ, මේ අවස්ථාව අපි අත්හරිනවාද? පුද්ගලයෙක් ලෙසත්, ආණ්ඩුවක් ලෙසත් අපි කිසිසේත්ම මේ අවස්ථාව අත්හරින්නේ නැහැ. මේ රට පත් වී තිබෙන අසීරුතාවෙන් මුදා ගන්න ඕනෑ. මතක තබා ගන්න, මට හෝ අපේ අමාත්‍යවරු කිසිවෙකුට පෞද්ගලිකව තමන්ට කියලා අභිලාෂයක් නැහැ, තමන්ගේ කියලා අභිලාෂයක් නැහැ. අපට තිබෙනවා මේ රටත්, මේ රටේ ජනතාවත් පිළිබඳ සුබ සිහිනයක්. ඒ සිහිනය යථාර්ථයක් කර ගැනීම සඳහා අපි පොරබදනවා. මම ඔබතුමන්ලාට සහතිකයක් දෙන්නම්, අපි ඒක යථාර්ථයක් බවට පත් කරනවා. මම ඔබතුමන්ලාට ආරාධනා කරන්නේ ඔබ එහි පංගුකරුවන් සහ කොටස්කරුවන් බවට පත් වෙන්න කියලායි. මේ අවස්ථාව අත්හරින්න දායක වුණු මිනිස්සු, මේ අවස්ථාවට අකුල් හෙළපු මිනිස්සු විධියට ඔබලා ඉතිහාසය ලියන්න එපා, ඉතිහාසගත වෙන්න එපා. ඔබලා ඉතිහාසගත වෙන්න රටට අවස්ථාවක් ආවා, ඒ අවස්ථාව ඉතා හොඳින් උකහා ගැනීම සඳහා විපක්ෂයේ සිටද උදවු දීපු ව්‍යාපාරයක් ලෙස. ඒකයි මේ අවස්ථාව. හරි, අපි යවලා ඔබතුමන්ලා ආණ්ඩුවක් ගත්තා කියලා හිතන්න; *[බාධා කිරීමක්]*

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු සභාපතිතුමනි, මේක කාරක සභා අවස්ථාව නේ. මට ගරු ජනාධිපතිතුමාගෙන් පැහැදිලි කිරීමක් කරගන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමනි, මම ඔබතුමාගේ කථාව අහගෙන හිටියා. ඔබතුමා කිව්වා, ආර්ථිකය අස්ථාවර කිරීම ඉලක්ක කරගෙන බරපතළ ප්‍රකාශ විපක්ෂයෙන් සිදු වෙනවා කියලා. *[බාධා කිරීමක්]* ඒ ප්‍රකාශ කළේ කවුද කියලා කිව්වේ නැතිවාට කමක් නැහැ. මොකක්ද ඒ ප්‍රකාශය කියලා පැහැදිලි කරන්න, ගරු ජනාධිපතිතුමනි.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)

මෙහෙමයි. "ආණ්ඩුව අපේක්ෂා කරනවා මේ අවුරුද්දේ මෙච්චර ආදායමක්, ඔය ආදායම ලැබෙන්නේ නැහැ. වාහන වෙළෙඳ පොළ විවෘත කිරීම තුළින් ආණ්ඩුව අපේක්ෂා කර තිබෙනවා මෙච්චර ආදායමක්. ඔය ආදායම ලැබෙන්නෙත් නැහැ" කියලා කිව්වා නේ. තේරුණාද දන්නේ නැහැ. එහෙම කිව්වා නේ. *[බාධා කිරීමක්]* නැහැ, ඒකෙන් කියන්නේ මොකක්ද? ඒකෙන් කියන්නේ අන් කවරක්වත් නොවෙයි, අවිනිශ්චිතතාව නිර්මාණය කරන්නේ. ඔබ පළමුකොටම ප්‍රශ්නය අහන්න.

ඒ වාගේම ඔබලා කිව්වා ආයෝජකයෝ එන්නේ නැහැ, ආයෝජකයෝ දාලා යනවා කියලා. මට කියන්න දාලා ගිය එක ආයෝජකයෙක් ගැන. ඔබලා කිව්වේ නැද්ද, එහෙම එකක්?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම කිව්වා.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)

ආයෝජකයෝ එන්නේ නැහැ, ආයෝජකයෝ දාලා යනවා කිව්වා. මට කියන්න එහෙම දාලා ගිය එක ආයෝජකයෙක් ගැන? දැන් නැතිටලා කියන්න. දැන් නැතිටලා කියන්න, දාලා ගිය එක්කෙනෙක්? හැබැයි, ඔබතුමන්ලා ආයෝජකයන්ට දෙන සංඥාව මොකක්ද? "ලංකාවට ආයෝජකයෝ එන්න එපා, ඉන්න අයත් දාලා යනවා" කියන එකයි ඔබතුමන්ලා කියන්නේ. මට කියන්න එකක්. දැන් නැතිටලා කියන්න, මෙන්න මේක ගියා කියලා. ඉක්මනට කියන්න? නැහැ, අස්ථාවරත්වය. ඒ නිර්මාණය කරන්නේ මොකක්ද? *[බාධා කිරීමක්]* ඉතින් අජිත් පී. පෙරේරාගෙන් අහන්නකෝ අදානි ඉන්න ඕනෑද යන්න ඕනෑද කියලා. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ press statement එක මම බැලුවා. *[බාධා කිරීමක්]* කෙටියෙන්, කෙටියෙන් කියන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඩොලර් සත 8.26ට අදානි ඉන්න ඕනෑ නැහැ. අපේ සම්පත් සඳහා අනිවාර්යයෙන් අපි තරග කරලා හරි මිලකට, තරගකාරී මිලකට, තරගකාරී ක්‍රමවේදයකට සුළං සහ සූර්ය විදුලිය ලබා ගත යුතුයි. ඒ ගැන සැකයක් නැහැ. ඩොලර් සත 8.26ට අදානි ඕනෑ නැහැ. හැබැයි ඩොලර් සත 5ට විතර දෙනවා නම්, තරගකාරී මිලට දෙනවා නම් ගැටලුවක් නැහැ. ඒ සඳහා අවශ්‍ය තරගකාරී ක්‍රමවේදය අපි හදා ගනිමු. ඒක තමයි හදන ක්‍රමය.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)

ඒක තමයි අපි දෙන ස්ථාවරය. ඔක තමයි ස්ථාවරය. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔක තමයි ස්ථාවරය. *[බාධා කිරීම්]* නැහැ, නැහැ. මම දන්නවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක තමයි අපේ ස්ථාවරයත්.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
නැහැ, නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔබතුමාට මතක ඇති, අපි තමයි ඉස්සෙල්ලාම මේ තරගකාරීත්වය ගෙනාවේ, ගරු ජනාධිපතිතුමනි. ඔබතුමායි, අපියි ඔක්කෝම එක පැත්තේ ඉඳලා එකට කථා කළේ ඕකට ජනාධිපතිතුමා. *[බාධා කිරීමක්]* ඕක නේ කථා කළේ.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
බොහොම ස්තුතියි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි.

හැබැයි ඔබතුමාට අදානි සමාගමෙන් නිවේදනය ආපු හැටියේ පොඩි කලබලවීමක් වුණා, එහෙම නම්. කලබල වෙලා ඇහුවා, "මේ ව්‍යාපෘතිය ගියා, තව කවුද එන්නේ?" කියලා. මම දැක්කා ඔබතුමාගේ voice cut එකක්, මා ළඟ තිබෙනවා. *[බාධා කිරීමක්]* "මේක ගියා, ආයේ කවුරු එයිද, ඩොලර් බිලියනයක ව්‍යාපෘතියක්" කිව්වා. බිලියනයකුත් නැහැ එතැන. එතැන කියපු ඉලක්කමත් වැරදියි. ඔබතුමා කිව්වේ ඩොලර් බිලියනයක ව්‍යාපෘතියක් ගියා කියලා. බිලියනයක් නැහැ එතැන. *[බාධා කිරීමක්]* ඩොලර් මිලියන 900කුත් නැහැ. තව ලංසු තියන්න පුළුවන්.

ආයෝජකයෝ ගියේ නැහැ. නමුත් මතයක් හදනවා, ආයෝජකයෝ යනවා කියලා. එතකොට ආයෝජකයෝ යන රටකට -මම කියන්නේ, එහෙම හදාගෙන තිබෙන අය ඒවා කිව්වාම- ආයෝජකයෝ එන්නේ නැහැ නේ. එතකොට ප්‍රශ්නයක් තිබෙනවා නේ. ඒවා ඉතා පැහැදිලියි. හරි නේද මනෝ ගනේසන් මන්ත්‍රීතුමා? ඔක තමයි අපේ තිබෙන තත්ත්වය.

මම අවසාන වශයෙන් කියන්නේ මේකයි.

මම හිතනවා, මේක තමයි අවස්ථාව, මේ අවස්ථාවේ ඔබතුමන්ලා මේ වැඩ පිළිවෙළත් එක්ක එකතු වෙනවාද, නැත්නම් අකුල් හෙළනවාද කියලා තීරණය කරන්න. මම නැවත කියන්නේ, අපේ රටේ දේශපාලනය මීට වඩා හොඳ දෙයකින් මිසක්, ආපහු මීට වඩා නරක දෙයකින් පුරවන්න බැහැ.

රෝමයේ අධිරාජ්‍යවරු ගණනාවක් සිටියා. ඒ අතර ඉතාම කෲර අධිරාජ්‍යවරු සිටියා. හැබැයි එක් අධිරාජ්‍යවරයෙක් ආවා, ඔහු බොහොම සාමකාමී අධිරාජ්‍යවරයෙක්. ඊට පස්සේ රෝමය තුළ කෲර අධිරාජ්‍යයන් ගොඩනැඟුණේ නැහැ. ඔහු හැරවුම දුන්නා. අපිත් හැරවුම දෙන්නම්. මීට පස්සේ පැරණි, අසාර්ථක, විනාශකාරී දේශපාලන සංස්කෘතීන් සහ ආර්ථික සංස්කෘතීන් සහිත ආණ්ඩු අපේ රටේ හැදෙන්නේ නැහැ. අපි ප්‍රතිපත්ති නිර්මාණය කරලා තිබෙනවා. දේශපාලකයාගේ ප්‍රතිපත්ති, රාජ්‍ය නිලධාරියාගේ ප්‍රතිපත්ති අපි නිර්මාණය කරලා තිබෙනවා. අපි ඉතාම හොඳ තැනක සංඥා කණු සිටුවා තිබෙනවා. මේ සංඥා කණු ඉක්මවා යන්න ඔබට පුළුවන්. එහෙම නැතුව මේ සංඥා කණුවල පිටුපස සිටියොත් ඔබට දේශපාලන අනාගතයක් නැහැ. ඒක හොඳට මතක තබාගන්න.

අපි කැමැතියි, ඔබතුමන්ලාත් ඉතාම ශක්තිමත් ව්‍යාපාරයක් බවට පත් වෙනවා නම්. ඒ නිසාම තමයි මේක කියන්නේ. බලන්නකෝ, ලංකාවේ පළමුවැනි වතාවට වෙනස් විධියේ ආණ්ඩුවක් හැදිලා තිබෙනවා. 2000 වසරේ ඉඳලාම මම මේ පාර්ලිමේන්තුවේ සිටියා. මේ පාර්ලිමේන්තුවට ඡන්දයෙන් මන්ත්‍රීවරු ඇවිල්ලා ආණ්ඩු හැදුණා. හැබැයි, ටික දවසක් යනකොට ජනතාව විපක්ෂයට එවපු අය ආණ්ඩුවේ ඉන්නවා, ආණ්ඩුවට එවපු අය විපක්ෂයේ ඉන්නවා. අවුරුද්දයි, දෙකයි යන්නේ ආණ්ඩුව කවුද විපක්ෂය කවුද කියලා සොයා ගන්න බැහැ. මම දන්නවා, විශේෂයෙන්ම අය වැය කාලයේ සමහර ඇමතිවරු හෝටල්වල හංගාගෙන තමයි බේරා ගත්තේ. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති නේ. සමහරු සිංගප්පූරුවේ හැංගුණේ නැද්ද? ඒ විධියට තමයි බේරා ගත්තේ. මේවා අලුත් කථා නොවෙයි. හෝටල්වල තියාගෙන සිටියා, සිංගප්පූරුවේ හංගලා තැබුවා. ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාටත් මතක ඇති නේ. එහෙමයි මේ කට්ටිය බේරා ගත්තේ. ආපහු එවැනි දේශපාලන සංස්කෘතියක් ඇති වෙන්නේ නැහැ. ජනතාව එව්වා ආණ්ඩුවක්, ඒක ආණ්ඩුව. ජනතාව එව්වා විපක්ෂයක්, ඒක විපක්ෂය. ආණ්ඩුව නම් ආණ්ඩුවේ, විපක්ෂය නම් විපක්ෂයේ. ලංකාවේ පළමුවැනි වතාවට තමයි එහෙම වෙන්නේ. මීට කලින් මෙහෙම එකක් හැදිලා නැහැ. එහෙම නේද? ඒ නිසා ගරු විපක්ෂ නායකතුමාට මෙතැන සිටියා නම් මම කියන්නේ, කිසිසේත්ම බය වෙන්න එපා කියන එකයි. වෙනදාට විපක්ෂ නායකතුමා තීන්දු ගන්න බය වෙනවා. දැන් එහෙම ඕනෑ නැහැ. තව තීන්දු ගන්න.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

